# නව සංශෝධිත ශුද්ධ බයිබලය

## Sinhala New Revised Version

2006, 2018

© Ceylon Bible Soci-
ety

# නව සංශෝධිත ශුද්ධ බයිබලය
# Sinhala New Revised Version

*Language: Sinhala*
*Country:*
*Publisher: Bible Society of India and Ceylon*
*Copyright: © Ceylon Bible Society*
*Last Updated: 2022-10-28*
*ID: SINNRV*
*ISO: sin*
*ISBN:*

DIGITAL BIBLE SOCIETY
www.DBS.org

උත්පත්ති ................................ 4
නික්මයාම ............................ 53
ලෙවී ව්‍යවස්ථාව ................ 95
ගණන් කථාව .................... 124
ද්විතීය නීති සංග්‍රහය .... 165
ජෝෂු .................................. 201
වීරාවලිය ............................ 225
රූත් ..................................... 250
1 සාමුවෙල් ........................ 254
2 සාමුවෙල් ........................ 287
1 රාජාවලිය .................... 314
2 රාජාවලිය .................... 346
1 වංශාවලිය .................. 376
2 වංශාවලිය .................. 405
එස්රා ................................. 439
නෙහෙමියා ........................ 450
ජෝබ් ................................. 465
ගීතාවලිය .......................... 496
හිතෝපදේශ ..................... 577
ධර්මදේශකයා ................. 601
ප්‍රේම ගී .......................... 609
යෙසායා ............................. 615
ජෙරමියා ............................ 676
විලාප ගී ........................... 734
එසකියෙල්ගේ .................. 740
දානියෙල් ........................... 790
හොසියා ............................ 806
ජෝවෙල් ........................... 815
ආමොස් ............................. 819
ඔබදියා .............................. 826
ජෝනා ............................... 828
මීකා .................................. 831
නාහුම් ................................ 836
හබක්කුක් .......................... 838
ශෙපනියා ........................... 841
හග්ගයි .............................. 844
සෙකරියා ........................... 846
මලාකි ................................ 855
ශුද්ධවර මතෙව් ................ 858
ශුද්ධවර ජොහන් ................. 0
ශුද්ධවර ජොහන් ................. 0
ශුද්ධවර ජොහන් ............. 949
රෝම ..................................... 0
රෝම ............................... 1009
එපීස ..................................... 0
එපීස ..................................... 0
එපීස ..................................... 0
එපීස ............................... 1050
පිලිප්පි ............................ 1056
1 තිමෝති ............................. 0
1 තිමෝති ............................. 0
1 තිමෝති ............................. 0
1 තිමෝති ....................... 1066
2 තිමෝති ....................... 1070
පිලෙමොන් ........................... 0
පිලෙමොන් ...................... 1074
හෙබ්‍රෙව් ........................ 1075
ජාකොබ් .......................... 1086
2 පේදුරු ................................ 0
2 පේදුරු .......................... 1093
එළිදරව්ව .............................. 0
එළිදරව්ව .............................. 0
එළිදරව්ව .............................. 0
එළිදරව්ව .............................. 0
එළිදරව්ව ........................ 1099

# උත්පත්ති

### දෙවියන් වහන්සේ ලෝකය මැවීම

1 ආරම්භයේ දී දෙවියන් වහන්සේ අහසත්
පොළොවත් මැවූ සේක. 2 පොළොව හිස් ව
පාළු ව තිබිණි. මහ සයුර මත අන්ධකාරයක් විය.
දේවාත්මානුභාවයජලය මතු පිට හැසුරුණේ ය. 3 2
කොරි 4:6 එවිට දෙවියන් වහන්සේ, “ආලෝකය වේ
වා!”යි වදාළ සේක; ආලෝකය විය. 4 ආලෝකය
මනහර බව උන් වහන්සේ දුටු සේක. උන් වහන්සේ
අන්ධකාරයනේ ආලෝකය වනේ කර 5 ආලෝකයට
“දවාල” කියා ද, අන්ධකාරයට “රාත්‍රිය” කියා ද නම්
තැබූ සේක. සවස ගත විය, උදය උදා විය, ඒ පළමු
වන දවස ය.
6 ඉන්පසු දෙවියන් වහන්සේ, “ජලය ස්ථාන දකෙක
වනේ වනේ ව පවතින පිණිස එය වනේ කරන අහස්
කුස වේ වා!”යි වදාළ සේක. එසේ ම විය. 7 මසෙේ
උන් වහන්සේ අහස් කුස සාදා, ඊට යටින් තිබනෙ
ජලය, ඊට උඩින් තිබනෙ ජලයනේ වනේ කර 8 2
පේදු 3:5 අහස් කුසට “අහස” කියා නම් තැබූ සේක.
සවස ගත විය, උදය උදා විය, ඒ දෙ වන දවස ය.
9 ඉන්පසු දෙවියන් වහන්සේ, “ගොඩබිම මතු වන
පිණිස අහස යට තිබනෙ ජලය එක තැනකට රැස්
වේ වා!”යි වදාළ සේක. එසේ ම විය.
10 ගොඩබිමට “පොළොව” කියා ද, ජලයට
“සාගරය” කියා ද උන් වහන්සේ නම් තැබූ සේක.
එය මනහර බව උන් වහන්සේ දුටු සේක.
11 එවිට දෙවියන් වහන්සේ, “බීජ උපදවන ඇට
සහිත පල දරන, සියලු වර්ගවල ගස්කොළෙන්
භූමියේ හටගැනේ වා!”යි වදාළ සේක. එසේ ම
විය. 12 මසෙේ භූමිය බීජ උපදවන, ඇට සහිත පල
දරන, සියලු වර්ගවල ගස්කොළෙන් නිපදවිය. එය
මනහර බව දෙවියන් වහන්සේ දුටු සේක. 13 සවස
ගත විය, උදය උදා විය, ඒ තුන් වන දවස ය.
14 ඉන්පසු දෙවියන් වහන්සේ, “දවාල රාත්‍රියනේ
වනේ කිරීම සඳහාත්, දවස්, අවුරුදු හා මංගල්‍ය
වකවානු දක්වනු සඳහාත් අහස් කුසහෙි ආකාශ
වස්තු වේ වා!” කියා ද, 15 “පොළොවට එළිය දීමට
ඒවා අහසහෙි බැබළේ වා!” කියා ද වදාළ සේක.
එසේ ම විය. 16 මසෙේ දෙවියන් වහන්සේ ප්‍රධාන
ආලෝක දකෙක්, එනම් දවාල පාලනය කිරීම සඳහා
ලොකු ආලෝකය ද, රාත්‍රිය පාලනය කිරීම සඳහා
කුඩා ආලෝකය ද සෑදූ සේක; තාරකා ද සෑදූ සේක.
17 දෙවියන් වහන්සේ මේ අලෝකයන් අහසේ
තැබුවේ පොළොවට ආලෝකය දීම සඳහාත්,
18 දවාල හා රාත්‍රිය පාලනය කිරීම සඳහාත්, අඳුරින්
ආලෝකය වනේ කිරීම සඳහාත් ය. එය මනහර බව
දෙවියන් වහන්සේ දුටු සේක. 19 සවස ගත විය,
උදය උදා විය, ඒ සතර වන දවස ය.
20 ඉන්පසු දෙවියන් වහන්සේ, “ජලය, අසංඛ්‍ය
ජීවමාන සතුන්ගනේ පිරී ඉතිරේවා!” කියා ද,
“පක්ෂීහු පොළොවට උඩින් අහස් කුස හරහා පියඹා
යත් වා!” කියා ද වදාළ සේක. එසේ ම විය.
21 මසෙේ දෙවියන් වහන්සේ දැවැන්ත තල්මසුන් ද
ඔබමොබ ජීනන නන් වැදෑරුම් ජලජ සතුන් ද නන්
වැදෑරුම් පක්ෂීන් ද මැවූ සේක. එය මනහර බව
දෙවියන් වහන්සේ දුටු සේක. 22 තවද, දෙවියන්
වහන්සේ ඔවුන්ට ආසිරි පතමින්, “බෝ වී වැඩි
වර්ධනය වී මුහුදු ජලය පුරා පැතිරතේ වා!” කියා ද,
“පක්ෂීහු පොළොවේ බෝවතේ වා!” කියා ද පැවසූ
සේක. 23 සවස ගත විය, උදය උදා විය, ඒ පස් වන
දවස ය.
24 ඉන්පසු දෙවියන් වහන්සේ; “විවිධ ගවමහිෂයන්
ද උරගයන් ද වන මෘගයන් ද යන ජීවමාන
සත්ත්වයෝ පොළොවනේ නිපදතේ වා!”යි වදාළ
සේක. එසේ ම විය. 25 මසෙේ උන් වහන්සේ
විවිධාකාර වන මෘගයන් ද ගවමහිෂයන් ද උරගයන්
ද පොළොවනේ ඉපද වූ සේක. එය මනහර බව
දෙවියන් වහන්සේ දුටු සේක.
26 1 කොරි 11:7 ඉන්පසු දෙවියන් වහන්සේ;
“අපගේ ස්වරූපය අනුව, අපගේ සමානත්වය ලසෙ
මනුෂ්‍යයා මවමු, ඔහු මුහුදේ මසුන් ද අහසේ
පක්ෂීන් ද ගවමහිෂයන් ද මුළු පොළෝ තලයහෙි
සියලු වන මෘගයන් ද උරගයන් ද පාලනය
කරේවා!”යි අණ කළ සේක.
27 මතෙ 19:4; මාක් 10:6 දෙවියන් වහන්සේ තම
ස්වරූපය අනුව මිනිසා මැවූ සේක;
q2[27] දෙවියන් වහන්සේගේ ම ස්වරූපය අනුව ඔවුන්
මවා වදාළ සේක;
q2[27] පුරුෂයා ද ස්ත්‍රිය ද වශයනේ ඔවුන් මැවූ
සේක.
28 උත් 5:1-2 දෙවියන් වහන්සේ ඔවුන්ට ආසිරි
පතමින්, “නුඹලා දරුසම්පත් ලබා, වැඩි වර්ධනය වී,
පොළොව පුරා පැතිර එය යටත් කරගන්න. මුහුදේ
මසුන් කරෙහෙි ද, අහසේ පක්ෂීන් කරෙහෙි ද,
පොළොවේ සැරි සරන සියලු සතුන් කරෙහෙි ද
බලය පවත්වන්නැ”යි ඔවුන්ට වදාළ සේක. 29 තවද,
උන් වහන්සේ, “මුළු පොළෝ තලයහෙි ධාන්‍ය දරන
සියලු පැළෑටි ද බීජ සහිත පල දරන සියලු ගස් ද
නුඹලාගේ ආහාරය පිණිස වේ වා! 30 එසේම,
පොළොවේ සියලු වන සතුන්ට ද අහසේ පක්ෂීන්ට

ද උරගයන්ට ද සියලු ජීවමාන සතුන්ට ද ආහාර
පිණිස නිල් පලා දෙමේ”යි වදාළ සේක. එසේ ම විය.
31 දෙවියන් වහන්සේ තමන් මවා වදාළ සියලු දේ
නරඹා, එය ඉතා මනහර බව දුටු සේක. සවස ගත
විය, උදය උදා විය, ඒ සය වන දවස ය.

2 මෙසේ අහසත්, පොළොවත් එහි ඇති සියලු
දේත් මවා නිම කරන ලද්දේය. 2 හෙබ්‍රෙ
4:4-10දෙවියන් වහන්සේ තමන් කළ කාර්යය සත්
වන දවසෙහි නිමවා, එදින සියලු වැඩ නතර කළ
සේක. 3 නික්ම 20:11 මෙසේ උන් වහන්සේ සත්
වන දවසට ආසිරි පතා එය ශුද්ධ දවසක් ලෙස වෙන්
කර වදාළ සේක. එසේ කළේ ඒ දවසේ උන්
වහන්සේ සිය මැවීමේ කාර්යය නිමවා, වැඩ නතර
කළ හෙයිනි.
4 අහසත් පොළොවත් මැවීමේ පුවත එසේ ය.

### මැවීම පිළිබඳ තවත් විස්තරයක්

4 දෙවි සමිඳාණන් වහන්සේ අහසහා පොළොව
මවන විට 5 පොළොවෙහි හටගත් පැළෑටියක් වත්,
පැලවුණු බීජයක් වත් නො වී ය. එසේ වූයේ දෙවි
සමිඳාණන් වහන්සේ පොළොව පිට වැස්ස නොඑවූ
නිසාත්, භූමිය වගා කිරීමට කිසිවකු නොසිටි
නිසාත් ය. 6 එහෙත් පොළොවෙන් ජලය මතු වී භූමි
තලය පුරා ගලා ගියේය.
7 1 කොරි 15:45 දෙවි සමිඳාණන් වහන්සේ
පොළොවේ දූවිල්ලෙන් මනුෂ්‍යයා මවා ඔහුගේ නාස්
පුඩු තුළට ජීවන හුස්ම හෙළූ සේක. මෙසේ
මනුෂ්‍යයා ජීවමාන කෙනෙක් විය.

### ඒදන් උයන

8 දෙවි සමිඳාණන් වහන්සේ පූර්ව දිශාවේ, ඒදන්හි
උයනක් තනා තමන් මැවූ මනුෂ්‍යයා එහි පිහිටවූ
සේක. 9 එළිද 2:7; 22:2,14 තවද, උන් වහන්සේ
දැකුම්කලු, ප්‍රණීත පලදෙන සියලු ගස් ද උයන මැද
ජීවන වෘක්ෂය ද හොඳ-නරක අවබෝධ කිරීමේ ගස
ද භූමියෙන් හටගන්නට සැලැසූ සේක.
10 උයනට ජලය සැපයීම සඳහා ඒදන්
ප්‍රදේශයෙන් ගඟක් ගලා ගියේය. උයනින් පිටත දී
එය අතු ගංගා සතරකට බෙදිණි. 11 පළමු වන අතු
ගංගාවේ නම පිෂොන් ය; මුළු හවීලා පෙදෙස වටා
ගලා යන ගංගාව එය වේ; ඒ පෙදෙසෙහි රත්රන්
ඇත. 12 එහි ඇති රත්රන් අමිශ්‍ර ය; ගන්ධරස හා
නබමාණික්‍ය ද එහි ඇත. 13 දෙ වන අතු ගංගාවේ
නම ගීහෝන් ය; එය මුළු කූෂ් ප්‍රදේශය වටා ගලා
යයි. 14 තෙ වන අතු ගංගාවේ නම ටයිග්‍රීස් ය; එය
අෂූර් දේශයට පෙරෙදිගින් ගලා බසියි. සතර වන අතු
ගංගාව යුප්‍රටීස් ය.
15 ඒදන් උයන වගා කර එය රැක බලා ගැනීම
පිණිස දෙවි සමිඳාණන් වහන්සේ මිනිසා රැගෙන
ඔහු එහි පදිංචි කරවූ සේක. 16 තවද, උන්
වහන්සේ මිනිසාට අණ කරමින්, “උයනේ සියලු ම
ගස්වලින් ගෙඩි කෑමට නුඹට නිදහස ඇත.
17 එහෙත්, හොඳ-නරක අවබෝධ කිරීමේ ගසින්
පමණක් නොකෑ යුතු ය; නුඹ යම් දවසක ඒ ගසින්
කන්නෙහි ද ඒ දවසෙහි මරණය නුඹට ඒකාන්ත
ය”යි වදාළ සේක.
18 පසුව දෙවි සමිඳාණන් වහන්සේ කතා කොට,
“මිනිසා තනි ව විසීම සුදුසු නැත; ඔහුට සුදුසු
සහකාරියක මවා දෙන්නෙමි”යි වදාළ සේක.
19 මෙසේ උන් වහන්සේ භූමියෙන් වනයේ සියලු
සතුන් ද අහසේ සියලු පක්ෂීන් ද මැවූ සේක.
ඉන්පසු මිනිසා උන්ට කුමන නම් තබන්නේ දැ යි
බලනු පිණිස උන් මිනිසා වෙත ගෙනා සේක. මිනිසා
එක එකාට තැබූ නාම, උන්ගේ නාම විය. 20 මෙසේ
මිනිසා සියලු ගවමහිෂයන්ට ද අහසේ පක්ෂීන්ට ද
සියලු මෘගයන්ට ද නම් තැබී ය. එහෙත්, ඔහුට සුදුසු
සහකාරියක් නොවුවා ය.
21 එවිට දෙවි සමිඳාණන් වහන්සේ මිනිසා බර
නින්දකට පත් කළ සේක. ඔහු නිදා සිටිය දී උන්
වහන්සේ ඔහුගේ ඉල ඇටවලින් එකක් ගෙන ඒ
ස්ථානය වසා දැමූ සේක. 22 උන් වහන්සේ
ඔහුගෙන් ගත් ඉල ඇටයෙන් ස්ත්‍රියක මවා ඔහු
වෙත ගෙනා සේක. 23 එවිට මිනිසා කතා කොට,
23 “දැන් ඉතින්, මාගේ ඇටවලින් ගත් ඇටය වන,
මාගේ මාංසයෙන් ගත් මාංසය වන මැය,
මිනිසාගෙන් ගත් හෙයින්, ඈට ‘ස්ත්‍රී’ කියා කියනු
ඇතැ”යි
23 පැවසී ය. 24 මතෙ 19:5; මාක් 10:7-8; 1 කොරි
6:16; එෆී 5:31 මිනිසකු තම පියා ද මව ද අත් හැර
සිය භාර්යාවට බැඳෙන්නේ එබැවින් ය. මෙලෙස
ඔව්හු එක් මාංසයක් වන්නෝ ය. 25 මිනිසාත්,
භාර්යාවත් දදෙනො ම නග්න ව සිටි නමුත් ඔව්හු
ලජ්ජා නොවූ හ.

### මිනිසාගේ වැටීම

3 එළිද 12:9; 20:2 දෙවි සමිඳාණන් වහන්සේ
මැවූ වනයේ සියලු සතුන්ට වඩා සර්පයා
උපායෙහි දක්ෂ විය. ඌ ස්ත්‍රියට කතා කොට,
“උයනේ කිසි ම ගහක ගෙඩි කන්නට එපා කියා
දෙවියන් වහන්සේ කළ තහනම ඇත්ත දැ”යි ඇසී ය.
2 ස්ත්‍රිය සර්පයාට උත්තර දෙමින්, “උයනේ ඕනෑ ම
ගහක ගෙඩි කන්නට අපට අවසර ඇත. 3 එහෙත්,
උයන මැද තිබෙන ගහේ ගෙඩි කන්නටත්, ඒවාට
අත ගසන්නටත් දෙවියන් වහන්සේ අපට තහනම්
කර ඇත. එසේ කළොත් අප මැරෙනවාම ය”යි කීවා
ය.
4 එවිට සර්පයා පිළිතුරු දෙමින්, “සැබැවින් ම ඔබ
මැරෙන්නේ නැත. 5 ඔබ ඒ ගසේ ගෙඩි කන දවසේ
දී ඔබගේ ඇස් පෑදී, දෙවියන් හා සමාන වී, ඔබත්
හොඳ-නරක අවබෝධ කරගන්න බව දෙවියන්
වහන්සේ දන්න නිසා එසේ වදාළ සේකැ”යි කී ය.
6 ස්ත්‍රිය ද ගස පෙනුමට කෙතරම් රමණීය ද පල
කෙතරම් ප්‍රණීත ද නුවණ වැඩුමට කෙතරම් කදිම
ද කියා දුටු විට එයින් ගෙඩි කීපයක් කඩා කෑවා ය.
තමා සමඟ සිටි සිය සැමියාට ද ඉන් සමහරක් දුන්
විට ඔහු ද කෑවේ ය. 7 එවිට ඔවුන් දදෙනොගේ ම

ඇස් පෑදී තමන් නග්න ව සිටි බව ඔව්හු
තේරුම්ගත්හ. එබැවින් ඔව්හු අත්තික්කා කොළ
එකට මසා ඉණ වැසුම් සාදාගත්හ.
8 ඉක්බිති එදින සිසිල් සුළං හමන සැඳෑ සමයෙහි
දෙවි සමිඳාණන් වහන්සේ උයනේ සක්මන් කරන
හඬ ඔවුන්ට ඇසී, මිනිසා හා ඔහුගේ භාර්යාව
උයනේ ගස් අතර උන් වහන්සේගෙන් සැඟවුණාහ.
9 එහෙත්, දෙවි සමිඳාණන් වහන්සේ මිනිසාට හඬ
ගසමින්, “නුඹ කොහේ දැ”යි ඇසූ සේක. 10 “ඔබ
වහන්සේගේ කටහඬ උයනේ මට ඇසිණි. එහෙත්,
මා නග්න බැවින්, බිය වී සැඟවුණාමි”යි ඔහු උත්තර
දුන්නේ ය. 11 එවිට උන් වහන්සේ, “නුඹ නග්න බව
කීවේ කවරෙක් ද? මා නුඹට තහනම් කළ ගසින්
නුඹ ගෙඩි කෑවෙහි දැ”යි ඇසූ සේක. 12 ඔහු ද
පිළිතුරු දෙමින්, “ඔබ මට සහකාරිය වශයෙන් දුන්
ස්ත්‍රිය ඒ ගසේ ගෙඩි කඩා මට දුන්නා ය; මමත්
කෑවෙමි”යි පැවසී ය. 13 2 කොරි 11:3; 1 තිමෝ 2:14
එවිට දෙවි සමිඳාණන් වහන්සේ ස්ත්‍රියට කතා
කොට, “නුඹ මයෙ කළේ මන්දැ”යි ඇසූ සේක.
“සර්පයා මා රැවටී ය; මමත් කෑවෙමි”යි ඈ පිළිතුරු
දුන්නා ය.

### දඬුවම් නියම කිරීම

14 එවිට දෙවි සමිඳාණන් වහන්සේ සර්පයාට කතා
කොට මෙසේ වදාළ සේක:
q2 14 “තා මයෙ කළ බැවින් සියලු ගමහිෂයන්ට ද
වනයේ සියලු මෘගයන්ට ද වඩා තෝ සාප ලද්දකේ
වේ වා!
q2 14 දිවි ඇති තාක් උර ගා යමින් තෝ දූවිලි
කන්නෙහි ය.
15 එළිද 12:17 තා සහ ස්ත්‍රිය අතර ද තගේ
වංශය සහ ඈගේ වංශය අතර ද බද්ධ වෛරය
තබන්නෙමි.
q2 15 ඔහු තගේ හිස පොඩි කරන්නේ ය;
q2 15 තෝ ද ඔහුගේ විලුඹ දෂ්ට කරන්නෙහි ය.”
16 උන් වහන්සේ ස්ත්‍රියට කතා කොට මෙසේ
වදාළ සේක:
q2 16 “නුඹේ ගැබ් ගැනීමේ වේදනා මම බොහෝ
සේ වැඩි කරන්නෙමි.
q2 16 විලි රුදා ඇති ව නුඹ දරුවන් ප්‍රසූත
කරන්නෙහි ය.
q2 16 එහෙත්, නුඹේ දැඩි ආශාව සැමියා කෙරෙහි
වන්නේ ය.
q2 16 ඔහු නුඹ පාලනය කරන්නේ ය.”
17 තවද උන් වහන්සේ මිනිසාට ද කතා කොට
මෙසේ වදාළ සේක:
q2 17 “භාර්යාවගේ වචනයට සවන් දී, ‘නොකෑ යුතු
ය’යි මා තහනම් කළ ගසේ ගෙඩි කෑ බැවින්, නුඹේ
මේ ක්‍රියාව නිසා පොළොවට සාප වේ වා!
q2 17 දිවි ඇති තාක් නුඹ වෙහෙස මහන්සි වී එයින්
ආහාර ලබාගන්නෙහි ය;
18 හෙබ්‍රෙ 6:8 පොළොවේ නුඹට කටු පඳුරු ද
වල් පැළෑටි ද උපදින්නේ ය, නුඹට වනයේ පලා
කන්නට සිදු වන්නේ ය.
19 භූමියෙන් වූ නුඹ, යළි භූමියට යන තෙක්,
ඩහදිය මහන්සියෙන් අහර උපයන්නෙහි ය.
q2 19 දූවිල්ලෙන් වූ නුඹ දූවිල්ලට ම යන්නෙහි ය.”
20 මිනිසා සිය බිරිඳට ‘ඒව’ යන නම දුන්නේ ය.
මන්ද, ඈ ජීවමාන සියල්ලන්ගේ මාතාව බැවිනි.
21 දෙවි සමිඳාණන් වහන්සේ හම් වස්ත්‍ර සාදා
ආදම්ට සහ ඔහුගේ භාර්යාවට හැඳවූ සේක.
22 එළිද 22:14 එවිට දෙවි සමිඳාණන් වහන්සේ
කතා කොට, “හොඳ-නරක අවබෝධ වීම නිසා දැන්,
මිනිසා ද අපගෙන් කෙනෙකු හා සමාන වී ඇත.
එබැවින් ජීවන වෘක්ෂයට අත පා, එයින් වළඳා
සදහට ම ජීවත් වීමට ඔහුට ඉඩ නොදිය යුතු ය”යි
වදාළ සේක. 23 මෙසේ කියා, භූමියෙන් වූ ඔහු
භූමිය වගා කරන පිණිස දෙවි සමිඳාණන් වහන්සේ
මිනිසා ඒදන් උයනින් නෙරපා දැමූ සේක.
24 මෙසේ උන් වහන්සේ, මිනිසා පලවා හැර, ඒදන්
උයනට පෙරදිගින්, කෙරුබ්වරුන් තැබූ සේක. තවද,
ජීවන වෘක්ෂයට යන මාර්ගය රැකවල් කරනු පිණිස
සෑම අතට කරකැවෙන, ගිනි විහිදුවන කඩුවක් ද
තැබූ සේක.

### කායින් සහ ආබෙල්

4 ආදම් සිය භාර්යාව වන ඒව සමඟ එක් විය.
ඈ දරුවකු පිළිසිඳගෙන, ඔහු උපන් කල,
“සමිඳාණන් වහන්සේගේ උපකාරයෙන් මම
මිනිසකු ලදිමි”යි කීවා ය. එබැවින් ඈ ඒ දරුවාට
කායින් යන නම දුන්නා ය. 2 පසු ව ඈ ඔහුගේ
සොහොයුරු වූ ආබෙල් ද ලැබුවා ය. ආබෙල් බැටළු
එඬේරෙක් විය, කායින් ගොවියෙක් විය. 3 කලක්
ගත වූ පසු කායින් පොළොවෙන් නිපද වූ අස්වැන්න
පඬුරක් වශයෙන් සමිඳාණන් වහන්සේට පූජා කළේ
ය. 4 හෙබ්‍රෙ 11:4 ආබෙල් ද සිය බැටළු රැළේ
කුලුඳුල් පැටවුන්ගෙන් සමහරකු ද ඔවුන්ගේ හොඳ
ම කොටස් ද ගෙන සමිඳාණන් වහන්සේට පූජා
කළේ ය. සමිඳාණන් වහන්සේ ද ආබෙල් සහ
ඔහුගේ පඬුර සතුටින් පිළිගත් සේක. 5 එහෙත්, උන්
වහන්සේ කායින් සහ ඔහුගේ පඬුර නොපිළිගත්
සේක. එබැවින් කායින් තදින් කිපී, දුර්මුඛ විය.
6 සමිඳාණන් වහන්සේ ද කායින්ට කතා කොට,
“නුඹ මෙතරම් කිපී, දුර්මුඛ වී සිටින්නේ මන් ද?
7 නුඹ යහපත කරන්නෙහි නම් නුඹ පිළිගනු
ලබන්නෙහි ය. නුඹ අයහපත කරන්නෙහි නම් පාපය
රකුසකු සේ නුඹේ දොරකඩ ලැග සිටින්නේ ය. ඌ
නුඹ මැඩලීමට බලාගෙන සිටියි; එහෙත්, නුඹට ඌ
දමනය කළ හැකි ය”යි වදාළ සේක.
8 මතෙ 23:35; ලූක් 11:51; 1 ජොහ 3:12 ඉක්බිති
කායින් සිය සොහොයුරු ආබෙල් අමතා, “අපි
එළිමහනේ කෙතට යමු”යි කී ය. මෙසේ ඔවුන් ගිය
විට කායින් සිය සොහොයුරු ආබෙල්ට විරුද්ධ ව
නැඟිට ඔහු මරාදැමී ය.

9 එවිට සමිඳාණන් වහන්සේ කායින්ට කතා
කොට, “නුඹේ සහෝදර ආබලේ කොහේ දැ”යි ඇසූ
සේක. කායින් ද උත්තර දමින්, “මම නොදනිමි. මම
මාගේ සහෝදරයාගේ භාරකරු දැ”යි ඇසී ය.
10 හෙබ්රෙ 12:24 සමිඳාණන් වහන්සේ ද, “නුඹ කළ
මේ දේ කුමක් ද? බලන්න, නුඹේ සහෝදරයාගේ
ලේ පොළොවෙනේ මට මොරගසයි. 11 මින් මතු නුඹ
පොළෝ තලය මත සාප ලද්දකේ වේ වා! නුඹ
අතින් හළෙ නුඹේ සහෝදරයාගේ ලයෙ උරා බීමට
මනේ පොළොව කට අයාගනෙ ඇත. එම
පොළොවෙනේ නුඹ නරෙපාදමනු ඇත. 12 මතෙන්
සිට නුඹ බිම වගා කරන විට, එය නුඹට පලදාව
නොදනේනේ ය. නුඹ ගයෙක් දොරෙක් නැති, මිහි පිට
ඉබාගාතේ යන මිනිහකේ වන්නහෙි යැ”යි වදාළ
සේක.
13 එවිට කායින් සමිඳාණන් වහන්සේට කතා
කොට, “මාගේ දඬුවම දැරිය නොහැකි තරම් දරුණු
ය. 14 ඔබ මදෙින මේ පොළොවෙනේ මා නරෙපාදමන
සේක. මා ඔබගනේ සැඟවී, ගයෙක් දොරෙක් නැති,
මිහි පිට ඉබාගාතේ යන්නකෙු විය යුතු ය. මා
හමුවට එන කවරකේ වේ වා, මා මරා දමනු
ඇතැ”යි කී ය. 15 එහතේ, සමිඳාණන් වහන්සේ
උත්තර දමින්, “එසේ නොවනෙු ඇත. යම් කනෙකේ
කායින් මැරුවොත් ඔහුගනේ එමනේ සත් වරක් දරුණු
ලසෙ පළිගනු ලබන්නේ ය”යි වදාළ සේක. එබැවින්
සමිඳාණන් වහන්සේ ද යමකෙුට කායින් මුණ
ගැසුණොත් කායින් නොමරන පිණිස ඔහු පිට
ලකුණක් තැබූ සේක. 16 එවිට කායින් සමිඳාණන්
වහන්සේ වතෙින් අහක් ව ගොස් ඒදන් උයනට
පරෙදිගින් පිහිටි “නොද්” ප්රදේශයේ පදිංචි විය.

## කායින්ගේ පළෙපත

17 කායින් සිය භාර්යාව සමඟ එක් විය. ඈ පිළිසිඳ
ඒනොක් නම් දරුවා ලැබුවා ය. කායින් ද නුවරක් ඉදි
කර තම පුත්රයාගේ නාමය අනුව ඊට ඒනොක් යයි
නම් තැබී ය. 18 ඒනොක්ට ඊරාද් නම් පුතකේ
උපන්නේ ය. ඊරාද්ට දාව මහෙුයායලේ ද,
මහෙුයායලේට දාව මතෙුෂායලේ ද, මතෙුෂායලේට
දාව ලාමකේ ද උපන්නෝ ය.
19 ලාමකේ ස්ත්රීන් දදෙනෙකෙු සරණ පාවාගත්තේ
ය. එක් කනෙකෙුගේ නම ආදා ය, අනික් තැනැත්තිය
ශිල්ලා ය. 20 ආදා, ජාබල් ලැබුවා ය. මොහු
කූඩාරම්වල වසන ගොපල්ලන්ගේ ආදි පියා ය.
21 මොහුගේ සහෝදරයාගේ නම ජුබාල් ය; ඔහු
වීණා වයන, නළා පිඹින සියලු සංගීතකරුවන්ගේ
ආදි පියා ය. 22 ශිල්ලාට ද තුබල්-කායින් උපන්නේ
ය. මොහු ලෝකඩ සහ යකඩ උපකරණ සාදන
සියලු ලෝකුරුවන්ගේ ආදි පියා ය. තුබල්-කායින්ගේ
සහෝදරී නාමා ය. 23 ලාමකේ සිය භාර්යාවන්ට
කතා කොට,
q2 23 “ආදා හා ශිල්ලා මට සවන් දනේන.
q2 23 මා බිරිඳනෙි, මා බසට කන් යොමන්න.
q2 23 මිනිසකේ මට පහර දුනි, මම ඔහු මරාදැමීමි.
q2 23 තරුණයකේ මට තුවාළ කළෙේ ය, මම ඔහුත්
මරාදැමීමි.
24 මතෙ 18:22 කායින්ට පහර දනේනේ කවරකේ
ද?
q2 24 ඔහුගනේ පළිගැනීම හත් වරක් වේවි.
q2 24 මට පහර දනේනේ කවරකේ ද?
q2 24 ඔහුගනේ පළිගැනීම හැත්තෑ හත් වරක්
වේවි”යි පැවසී ය.

## සතේගේ පළෙපත

25 ආදම් ද යළි සිය භාර්යාව සමඟ එක් විය. ඈ
පුතකෙු ලැබූ කල, “කායින් මැරූ ආබලේ වනෙුවට
දවේයන් වහන්සේ මට පුතකෙු දුන් සේකැ”යි කීවා
ය. එබැවින් ඈ ඔහුට සතේ යන නාමය තැබුවා ය.
26 සතේට ද පුතකේ උපන්නේ ය. ඔහු ඒනොෂ් යන
නාමය ඔහුට තැබී ය. මනුෂ්යයන් ‘යාවේ’ හවෙත්
සමිඳාණන් වහන්සේ කියා උන් වහන්සේට පළමු
වරට නමස්කාර කරන්නට පටන්ගත්තේ ඒ කාලයේ
දී ය.

## ආදම්ගේ පළෙපත

(1 වංශා 1:1-4)

5 උත් 1:27-28 ආදම්ගේ පළෙපතේ නාමාවලිය
මසෙේ ය: දවේයන් වහන්සේ මිනිසා මවන
විට සිය සමානත්වය ඇති ව ඔහු මැවූ සේක.
2 මතෙ 19:4; මාක් 10:6 ස්ත්රී-පුරුෂ වශයනේ ඔවුන්
මැවූ සේක. උන් වහන්සේ ඔවුන් මවන විට ඔවුන්ට
ආශීර්වාද කරමින් ‘මිනිසා’ යන නාමය ඔවුන්ට තැබූ
සේක. 3 ආදම්ට වයස අවුරුදු එකසිය තිහක්(130)වූ
විට තමාගේ ම සමානත්වය හා ස්වරූපය ඇති
පුතකේ ඔහුට ලැබිණි. මොහුට සතේ යන නාමය
තැබී ය. 4 සතේගේ උපතින් පසු ආදම් තව අවුරුදු
අටසියයක්(800)ජීවත් විය. ඔහුට දාව තව දරුදැරියෝ
උපන්හ. 5 ඔහු අවුරුදු නවසිය තිහක්(930)ආයු වළඳා
මියගියේය.
6 සතේගේ වයස අවුරුදු එකසිය පහක්(105)වූ විට
ඔහුට දාව ඒනොෂ් උපන්නේ ය. 7 ඒනොෂ් උපන්
පසු ඔහු තව අවුරුදු අටසිය හතක්(807)ජීවත් විය.
තවත් දරුදැරියෝ ඔහුට උපන්හ. 8 ඔහු අවුරුදු
නවසිය දොළොසක්(912)ආයු වළඳා මියගියේය.
9 ඒනොෂ්ට වයස අවුරුදු අනූවක්(90)වූ විට ඔහුට
දාව කේනාන් උපන්නේ ය. 10 කේනාන් උපන් පසු
ඒනොෂ් තව අවුරුදු අටසිය පසළොසක්(815)ජීවත්
විය. තවත් දරුදැරියෝ ඔහුට උපන්හ. 11 ඔහු අවුරුදු
නවසිය පහක්(905)ආයු වළඳා මියගියේය.
12 කේනාන්ට වයස අවුරුදු හැත්තෑවක්(70)වූ විට
ඔහුට දාව මහලලලේ උපන්නේ ය. 13 මහලලලේ
උපන් පසු කේනාන් තව අවුරුදු අටසිය
සතළිසක්(840)ජීවත් විය. තවත් දරුදැරියෝ ඔහුට
උපන්හ. 14 ඔහු අවුරුදු නවසිය දහයක්(910)ආයු
වළඳා මියගියේය.

15 මහලලලේට වයස අවුරුදු හැටපහක්(65)වූ විට
ඔහුට දාව ජරදේ උපන්නේ ය. 16 ජරදේ උපන් පසු
මහලලලේ තව අවුරුදු අටසිය තිහක්(830)ජීවත් විය.
තවත් දරුදැරියෝ ඔහුට උපන්හ. 17 ඔහු අවුරුදු
අටසිය අනූපහක්(895)ආයු වළඳා මියගියේය.
18 ජරදේට වයස අවුරුදු එකසිය හැටදෙකෙක්(162)වූ
විට ඔහුට දාව ඒනොක් උපන්නේ ය. 19 ඒනොක්
උපන් පසු ජරදේ තව අවුරුදු අටසියයක්(800)ජීවත්
විය. තවත් දරුදැරියෝ ඔහුට උපන්හ. 20 ඔහු අවුරුදු
නවසිය හැටදෙකෙක්(962)ආයු වළඳා මියගියේය.
21 ඒනොක්ට වයස අවුරුදු හැටපහක්(65)වූ විට
ඔහුට දාව මතුසලෝ උපන්නේ ය. 22 මතුසලෝ
උපන් පසු ඒනොක් දෙවියන් වහන්සේ සමඟ
සුහදතාවනේ හැසිරමේන් තව අවුරුදු
තුන්සියයක්(300)ජීවත් විය. ඔහුට තවත් දරුදැරියෝ
උපන්හ. 23 ඔහුගේ මුළු ජීවිත කාලය අවුරුදු තුන්සිය
හැටපහක්(365)විය. 24 හබ්රෙ 11:5; ජූද් 14
ඒනොක් දෙවියන් වහන්සේ සමඟ සුහදතාවනේ
හැසුරුණේ ය. උන් වහන්සේ ඔහු රුගත් බැවින් ඔහු
අතුරුදහන් විය.
25 මතුසලෝට වයස අවුරුදු එකසිය
අසූහතක්(187)වූ විට ඔහුට දාව ලාමකේ උපන්නේ
ය. 26 ලාමකේ උපන් පසු මතුසලෝ තව අවුරුදු
හත්සිය අසූදෙකෙක්(782)ජීවත් විය. ඔහුට දාව තවත්
දරුදැරියෝ උපන්හ. 27 අවුරුදු නවසිය
හැටනවයක්(969)ආයු වළඳා ඔහු මියගියේය.
28 ලාමකේට වයස අවුරුදු එකසිය අසූදෙකෙක්(182)වූ
විට ඔහුට දාව පුතකේ උපන්නේ ය. ලාමකේ ඔහුට
නෝවා යන නාමය තැබී ය. 29 ඔහු එසේ කළේ,
'සමිඳාණන් වහන්සේ සාප කළ පොළොවනේ මොහු
අපට, අපගේ වැඩවල දී ද වෙහෙස මහන්සියේ දී ද
සහනය ගනෙ දනෙු ඇත' යන අදහසින් ය.
30 ලාමකේ තව අවුරුදු පන්සිය අනූපහක්(595)ජීවත්
විය. ඔහුට තවත් දරුදැරියෝ උපන්හ. 31 අවුරුදු
හත්සිය හැත්තෑහතක්(777)ආයු වළඳා ඔහු
මියගියේය.
32 නෝවාගේ වයස අවුරුදු පන්සියයක්(500)වූ විට
ඔහුට දාව ෂමේ, හාම් සහ ජපතේ යන පුත්තු
තිදනෙ උපන්හ.

### මිනිසාගේ දූෂ්ටකම

6 එකල පොළොවේ තලය මත ජන සංඛ්‍යාව
බහුල විය; ජනතාවට දූවරු උපන්නාහ.
2 මිනිස්-දූවරුන් සුරූපී බව දුටු දිව්‍ය-පුත්‍රයෝ, තම
තමන් රිසි වූවන් සරණ පාවාගත්හ. 3 එවිට
සමිඳාණන් වහන්සේ, "මිනිසා මැරනෙ සුලු බැවින්
මාගේ ජීවන හුස්ම ඔහු තුළ සදහට ම පැවතීමට
ඉඩ නොතබමි; මින් මතු ඔහුගේ ජීවිත කාලය
අවුරුදු එකසිය විස්සකට වැඩි නොවන්නේ ය"යි
වදාළ සේක.
4 ගණන් 13:33 ඒ කාලයේ දීත්, ඉන්පසු වත්, මිහි
පිට යෝධයෝ සිටියහ. මොවුහු මිනිස්-දූවරුන් හා
දිව්‍ය-පුත්‍රයන්ගනේ උපන් අය වතේ; මොවුහු
දුරාතීතයේ සිටි, සුප්‍රකට, ශ්‍රේෂ්ඨ වීරයෝ ය.
5 මිහි පිට මිනිසාගේ දැඩි දුෂ්ටකම හා මිනිසා
නිතර ම නපුරු සිතුවිලිලනේ කල් යවන බව
සමිඳාණන් වහන්සේ දුටු විට 6 මිහි පිට මිනිසා
මැවීම ගැන උන් වහන්සේ ශෝක වූ සේක; උන්
වහන්සේගේ හදවත සොවින් පෙළුණි. 7 එබැවින්
උන් වහන්සේ, "මා විසින් මවන ලද මිනිසා මම මිහි
පිටින් වනසාලමි; ඔහු සමඟ ගවමහිෂයන් ද
උරගයන් ද අහසේ පක්ෂීන් ද වනසාලමි; ඔවුන්
මැවීම ගැන මම තැවමේ"යි වදාළ සේක. 8 මතෙ
24:37; ලූක් 17:26; 1 පේදු 3:20 එහතේ උන්
වහන්සේ අබිමුවෙහි නෝවා කරුණාව ලැබී ය.
9 2 පේදු 2:5 නෝවා පිළිබඳ පුවත මසෙේ ය; ඔහු
සත්ගුණවත් මිනිසෙකි. ඔහුගේ පරම්පරාවේ නිදොස්
මිනිසා ඔහු විය. ඔහු දෙවියන් වහන්සේ සමඟ
සුහදතාවනේ හැසුරුණේ ය. 10 තවද, ඔහුට ෂමේ,
හාම්, ජපතේ කියා පුත්තු තිදනෙකේ උපන්හ.
11 එහතේ, ලෝවැසි සෙසු හැම දෙන ම දෙවියන්
වහන්සේ අබිමුවෙහි දූෂ්‍ය වී සිටියහ; ඔව්හු
සැහැසිකමින් පිරී සිටියහ. 12 දෙවියන් වහන්සේ
ලෝකය දසෙ බලා එය දූෂ්‍ය වී ඇති බව දුටු සේක.
මිහි පිට මිනිසාගේ කල්ක්‍රියා දරුණු ලසෙ දූෂ්‍ය වී
තිබුණේ ය.

### නෝවා නැවක් සෑදීම

13 තවද, දෙවියන් වහන්සේ නෝවාට කතා කොට
මසෙේ වදාළ සේක: "සියලු මිනිසුන් වනසාලීමට මා
තීරණය කර ඇත. මන්ද මිනිසා නිසා පොළොවේ තලය
ම සැහැසිකමින් පිරී තිබේ. එබැවින් මම ඔවුන්
සමඟ පොළොවේ තලය විනාශ කරදමමි. 14 නුඹ
සඳහා ගෝපරේ නම් ලීයනේ නැවක් සාදාගන්න; එහි
කාමර තනා, නැව ඇතුළත හා පිටත කීල් තාර
ගාන්න. 15 නැවේ සැලැස්ම මසෙේ විය යුතු ය. එහි
දිග මීටර් එකසිය තිස්තුනකි; පළල මීටර් විසිදෙකෙකි;
උස මීටර් දහතුනකි. 16 නැවට උඩින් පියස්සක් තනා,
ඒ ආවරණය හා බිත්ති අතර සනේටිමීටර්
හතළිස්හතරක පරතරයක් තැබිය යුතු ය. පළමු වන,
දෙ වන, තෙ වන වශයනේ තට්ටු තුනක් ඇති ව
නැව සාදා එහි එක පැත්තක දොර තබන්න.
17 අහස යට සියලු සත්ත්වයන් වනසාලන පිණිස
මම පොළොවේ තලය මත ජලගැල්මක් පමුණුවන්නමේ.
එවිට පොළොව පිට ඇති සියලු දේ වැනසී යන්නේ
ය. 18 එහතේ, නුඹ සමඟ මම මගේ ගිවිසුම
පිහිටුවන්නමේ. නුඹ ද නුඹ සමඟ නුඹේ පුතුන් ද
නුඹේ භාර්යාව ද නුඹේ පුතුන්ගේ භාර්යාවන් ද
නැවට ඇතුළු විය යුතු ය. 19 පණ පිටින් රැකගනු
පිණිස එක එක වර්ගයේ, සියලු සතුන්ගනේ
ගැහැණු-පිරිමි සතුන් වශයනේ දදෙනෙකු බැගින්
නුඹ සමඟ නැව තුළට රැගනෙ යා යුතු ය.
20 නොමැරී බේරාගනු පිණිස සෑම වර්ගයක ම

පක්ෂීන්ගනේ ද සිවුපාවුන්ගනේ ද උරගයන්ගනේ ද
දදෙනො බැගින් නුඹ සමඟ නැවට ඇතුළු විය යුතු ය.
21 කෑම පිණිස විවිධ ආහාර රැස් කරගනෙ යන්න;
ඒවා නුඹට ද ඔවුන්ට ද ආහාර පිණිස විය යුතු ය.”
22 හබ්රෙ 11:7 මසෙේ දවේයන් වහන්සේ අණ
කළ සියල්ල නෝවා නොපිරිහළො ඉටු කළෙේ ය.

### මහා ජලගැල්ම

7 සමිඳාණන් වහන්සේ නෝවාට කතා කොට,
“නුඹ ද, නුඹේ මුළු පවුල ද නැවට ඇතුළු
වන්නේ; මන්ද, මිනිසුන් අතර නුඹ පමණක් මා
ඉදිරියහෙි දැහැමි බව මම දුටුවමේ. 2 තවද, නන්
වැදෑරුම් සත්ත්ව වර්ග පොළෝ තලයහෙි නොකඩව
බෝ වන පිණිස සියලු පවිත්‍ර සතුන්ගනේ ගැහැණු-
පිරිමි සතුන් වශයනේ ජෝඩු හත බැගින් ද සියලු
අපවිත්‍ර සතුන්ගනේ ගැහැණු-පිරිමි වශයනේ
ජෝඩුවක් බැගින් ද 3 ආකාශ පක්ෂීන්ගනේ ගැහැණු-
පිරිමි සතුන් වශයනේ ජෝඩු හත බැගින් ද රැගනෙ
යන්න. 4 තව හත් දවසකින් පොළොව මත දවල්
සතළිසක් හා රාත්‍රි සතළිසක් වැසි වස්වන්නමේ.
මලෙසෙ මා මැවූ ජීවමාන සියල්ලක් ම පොළෝ
තලයනේ ඉවත් කරදමන්නමේ”යි වදාළ සේක.
5 නෝවා ද සමිඳාණන් වහන්සේ අණ කළ සියල්ල
ඉටු කළෙේ ය.
6 පොළොව මත ජලගැල්ම පැතිරනෙ විට නෝවාට
වයස අවුරුදු හයසියයක් විය. 7 මතෙ 24:38-39; ලූක්
17:27 ජලගැල්මනේ බේරීමට නෝවා, සිය පුතුන් ද
භාර්යාව ද පුතුන්ගේ භාර්යාවන් ද කැටුව නැවට
ඇතුළු විය. 8 පවිත්‍ර සතුන්ගනේ ද අපවිත්‍ර
සතුන්ගනේ ද පක්ෂීන්ගනේ ද උරගයන්ගනේ ද
9 ගැහැණු-පිරිමි සත්තු ජෝඩුව බැගින් දවේයන්
වහන්සේ නෝවාට අණ කළ ලසෙ නෝවා සමඟ
නැවට ඇතුළු වූ හ. 10 සත් දවසකට පසු මිහි පිට
ජලගැල්ම ඇති විය.
11 2 පේතෘ 3:6 නෝවාට වයස අවුරුදු හයසියයේ දී,
දවෙන මාසයේ හරියට ම දාහත් වන දින මහා
සමුද්‍රයේ සියලු උල්පත් බිඳී ජලය ගලා ගියේ ය;
අහසේ කවුළු විවෘත විය. 12 දවල් සතළිසක් හා
රාත්‍රි සතළිසක් තිස්සේ පොළොව පිට වැසි
වැස්සේ ය.
13 ඒ දවසහෙි ම නෝවා ද ඔහුගේ භාර්යාව ද
ෂමේ, හාම් හා ජපතේ යන පුත්තු තිදනෙ ද
ඔවුන්ගේ භාර්යාවෝ ද නැවට ඇතුළු වූ හ. 14 ඔවුන්
සමඟ සෑම වර්ගයේ වන මෘගයෝ ද ගවමහිෂයෝ
ද උරගයෝ ද පක්ෂීහු ද පියාපත් සහිත සත්තු ද
නැවට ඇතුළු වූ හ. 15 සප්‍රාණික සියලු සත්තු,
ගැහැණු-පිරිමි වශයනේ ජෝඩුව බැගින් නැවට ඇතුළු
වූ හ. 16 දවේයන් වහන්සේ ඔහුට අණ කළ ලසෙ
සියලු සත්තු ගැහැණු-පිරිමි වශයනේ ජෝඩුව බැගින්
ඔහු සමඟ නැවට ඇතුළු වූ හ. සමිඳාණන් වහන්සේ
නෝවා නැවට ඇතුළු කොට දොර වැසූ සේක.
17 පොළොව මත ජලගැල්ම දවස් සතළිසක් පුරා
ගැලී ය. ජල මට්ටම නැගතේ ම නැව පොළොවනේ
ඉලිප්පිණි. 18 මිහි පිට ජලය නොනැවතී නැගින්න,
නැගින්න නැව දියත් විය. 19 පොළොව මත ගංවතුර
වගේවත් ලසෙ ගැලීමත් සමඟ අහස යට පිහිටි
ඉතා උස් කඳු සියල්ල වතුරට යට විය. 20 කඳු යට
කර, කඳු මුදුන්වලට ද ඉහළින් මීටර් හතරක්
ගංවතුර නැංගේ ය.
21 පොළොව මත වීසූ පක්ෂීහු ද ගවමහිෂයෝ ද
වන මෘගයෝ ද උරගයෝ ද මිනිසා ද යන සියල්ලෝ
මියගියෝ ය. 22 ගොඩබිම වීසූ පණ ඇති සියලු
සත්ත්වයෝ මියගිය හ. 23 උන් වහන්සේ ජීවමාන
සියල්ල වන මිනිසා ද සිවුපාවුන් ද උරගයන් ද
අහසේ පක්ෂීන් ද වනසා ඔවුන් මිහි පිටින්
පහකරදැමූ සේක.
23 නෝවා සහ ඔහු සමඟ නැවේ සිටි අය පමණක්
ඉතිරි වූ හ. 24 පොළෝ තලය මත දවස් එකසිය
පණහක් ම ජලගැල්ම පැවැතිණි.

### ජලගැල්ම නැවතීම

8 දවේයන් වහන්සේ නෝවා ද, ඔහු සමඟ
නැවේ සිටි සියලු වන මෘගයන් හා
ගවමහිෂයන් ද සිහි කර, පොළොව මත සුළඟක්
හමන්නට සැලැසූ සේක. ගංවතුර ක්‍රමයනේ බැස
ගියේය. 2 මහා සමුද්‍රයේ උල්පත් හා අහසේ කවුළු
වැසිණි. අහසින් වැටුණු වැස්ස ද නැවතිණි;
3 පොළෝ තලයනේ ගංවතුර ටිකින් ටික බැස
යන්නට විය. දවස් එකසිය පණහකට පසු ගංවතුර
බැස ගියේය. 4 සත් වන මාසයේ දහහත් වන දින
නැව අරරත් කඳු වැටිය මත නැවතිණි. 5 ගංවතුර
දස වන මාසය දක්වා නොනැවතී බැස ගියේ ය; දස
වන මාසයේ පළමු වන දින කඳු මුදුන් පනේණි.
6 දවස් සතළිසකට පසු නෝවා තමා සෑදූ නැවේ
කවුළුව ඇර 7 කපුටකෙු පිටතට යැවී ය. ඌ
පොළොව මත ජලය සිඳනෙ තුරු ඔබමොබ පියාඹා
ගියේය. 8 පසුව නෝවා පොළොව මත ජලය බැස
ගොස් තිබේ දැ යි බලනු පිණිස පරවේයකෙු පිටතට
යැවී ය. 9 එහතේ පොළොව මත තවමත් ජලය රැඳී
තිබුණු බැවින් ඌට පා තැබීමට තැනක් නොලැබ ඌ
නෝවා වතෙ නැවට ආපසු පැමිණියේ ය. එවිට ඔහු
අත දිගු කර ඌ අල්ලා නැව තුළට ගත්තේ ය.
10 ඔහු තව සත් දවසක් බලා සිට පරවේයා නැවනේ
පිටතට යළිත් යැවී ය. 11 සවස් කාලයේ දී ඌ ආපසු
පැමිණියේ ය. පුදුමයකි! උගේ හොටහෙි අමු ඔලීව
දළුවක් තිබිණි. මේ කරුණින් පොළොවනේ ගංවතුර
බැස ගොස් ඇති බව නෝවා දැනගත්තේ ය.
12 එවිට නෝවා තව දවස් සතක් බලා සිට පරවේයා
යළිත් පිටතට යැවී ය. ඌ ආපසු ඔහු වතෙ
පැමිණියේ නැත.
13 නෝවාට අවුරුදු හයසිය එකක් වූ කල පළමු
වන මාසයේ පළමු වන දින පොළොව මතු පිටින්
ජලය බැස ගොස් තිබිණි. එබැවින් නෝවා නැවේ
ආවරණය ඉවත් කර පිටත බැලූ විට, පොළෝ තලය

වියළී තිබුණු බව දිටී ය. 14 දෙ වන මස විසිසත් වන
දින පොළොව සම්පූර්ණයෙනේ ම වියළී තිබිණි.
15 එවිට දෙවියන් වහන්සේ නෝවාට කතා කොට,
16 "නුඹ, නුඹේ භාර්යාව ද නුඹේ පුත්‍රයන් ද
ඔවුන්ගේ භාර්යාවන් ද සමඟ පිටතට එන්න. 17 නුඹ
සමඟ සිටින ජීවමාන සියලු සතුන් වන, පක්ෂීන් ද
ගවමහිෂයන් හා උරගයන් ද පොළොව පිට බහුල ව
බෝ වී, වැඩී වර්ධනය වන පිණිස පිටතට
ගෙනෙන්නැ"යි වදාළ සේක. 18 මලෙසෙ නෝවා
සමඟ ඔහුගේ බිරිඳ ද ඔහුගේ පුත්තු ද ඔවුන්ගේ
බිරින්දෝ ද පිටතට පැමිණියහ. 19 සියලු මෘගයෝ ද,
ගවමහිෂයෝ ද පක්ෂීහු ද උරගයෝ ද තම වර්ගය
අනුව රංචු ගැසී නැවෙනේ පිටතට ආහ.

## නෝවා යාගයක් පූජා කිරීම

20 එවිට නෝවා සමිඳාණන් වහන්සේට
පූජාසනයක් තනා, එක එක වර්ගයේ සියලු පවිත්‍ර
සතුන්ගනේ හා පක්ෂීන්ගනේ එක එකා බැගින්
පූජාසනය මත දවන පඬුරක් මනේ පූජා කළේ ය.
21 සමිඳාණන් වහන්සේ ඒ යාග පූජාවන්හි මිහිරි
සුවඳ ආඝ්‍රාණය කර මසෙේ සිතා ගත් සේක:
"මිනිසා නිසා මින් මතු කවදා වත් මම පොළොවට
සාප නොකරමි; යොවුන් වියේ පටන් මිනිසාගේ සිත
නපුරට ඇදී යන බව මම දනිමි; මා මවෙර කළාක්
මනේ මින් මතු කවදා වත් සියලු ජීවමාන සතුන්
විනාශ නොකරන්නමේ.
22 පොළොව පවතින තකේ, වැපිරීම හා කැපීම ද
ශීත හා උණුසුම ද සිසිර හා ගිම්හානය ද දවාල හා
රාත්‍රිය ද නොකඩවා පවතිනු ඇත."

## නෝවා සමඟ දෙවියන් වහන්සේගේ ගිවිසුම

9 උත් 1:28 දෙවියන් වහන්සේ නෝවාටත්,
ඔහුගේ පුත්‍රයන්ටත් ආශීර්වාද කරමින්
මසෙේ වදාළ සේක: "නුඹලා දරුසම්පත් ලබා, වැඩී
වර්ධනය වී, පොළොව පුරා පැතිර යන්න.
2 පොළොවේ සියලු වන සතුන් තුළ ද, අහසේ
සියලු පක්ෂීන් තුළ ද, උරගයන් තුළ ද, මුහුදේ සියලු
මසුන් තුළ ද නුඹලා කෙරෙහි බිය හා තැතිගැන්ම
ඇති වන්නේ ය. මම උන් කෙරෙහි බලය නුඹලාට
පවරමි. 3 මා නිල්වන් පැළෑටි නුඹලාට දුන් ලෙසෙ
සියලු සතුන් ද, නුඹලාට ආහාර පිණිස දමේ. 4 ලෙවී
7:26-27; 17:10-14; 19:26; ද්වි.නී. 12:16,23;
15:23එහතේ, ජීව ධාතුව වන ලයෙ සමඟ මස්
නුඹලා නොකෑ යුතු ය. 5 යමකෙු නුඹ මැරුවොත්
මම ඔහුට මරණීය දඬුවම දමේ. සතකෙු හෝ
මිනිසකෙු හෝ නුඹ මැරුවොත් මම ඌ හෝ ඔහු
හෝ වනසා දමමි. මිනිසා මිනිසකෙු මැරුවොත් මම
ඔහු ද වනසාලමි.
6 මිනිසා, මිනිසකෙුගේ ලේ වගුරුවයි ද ඔහුගේ
ලේ ද මිනිසකෙු විසින් ම වගුරුවනු ලැබේ.
q26 උත් 1:26; නික්ම 20:13 ඒ මන්ද, මිනිසා,
දෙවියන් වහන්සේගේ ස්වරූපය අනුව මවනු ලැබූ
බැවිනි.
7 උත් 1:28 "නුඹලා දරුසම්පත් ලබා, වැඩී වර්ධනය
වී, ලොව පුරා පැතිර එය යටත් කරගන්න."
8 දෙවියන් වහන්සේ නෝවාට ද ඔහුගේ
පුත්‍රයන්ට ද කතා කොට, 9 "මනේන, මම නුඹලා
සමඟ ද නුඹලාගේ පළෙපත සමඟ ද 10 නුඹලා
සමඟ නැවෙනේ නික්මුණු සියලු ජීවමාන සතුන් වන,
පක්ෂීන්, ගවමහිෂයන් හා මෘගයන් සමඟ ද
ගිවිසුමක් පිහිටුවමි. 11 නුඹලා සමඟ පිහිටුවන ලද
ගිවිසුම වනාහි මින්පසු කවදා වත් ජලගැල්මකින්
සියලු ජීවමාන සතුන් විනාශ කරනු නොලබන බවත්,
මින්පසු කවදා වත් ජලගැල්මකින් මහ පොළොව
වනසනු නොලබන බවත් ය"යි වදාළ සේක.
12 තවද, දෙවියන් වහන්සේ කතා කොට, "මා හා
නුඹලා ද, නුඹලා සමඟ සිටින සියලු ජීවමාන සතුන්
ද අතර, මතු සියලු පරම්පරාවන් සඳහා මා පිහිටුවන
ගිවිසුම් ලකුණ නම් මයෙ යි. 13 වලාකුළුවල මම
මාගේ දේදුන්න තබමි; මා හා ලෝකයා අතර
පිහිටුවන ලද ගිවිසුම් ලකුණ එය වන්නේ ය.
14 පොළොවට ඉහළින් වලාකුළු පැමිණ වලාකුළු
අතර දේදුන්න දිස්වන කල, 15 මා හා නුඹලා ද,
සියලු ජීවමාන සතුන් ද අතර මින් මතු කවදා වත්
ජලගැල්මකින් සියලු ජීවමාන සතුන් විනාශ
නොකිරීමට පිහිටුවාගත් ගිවිසුම සිහි කරන්නමේ.
16 වලාකුළු අතර දේදුන්න පනෙනෙ විට, මම එය
දසෙ බලන්නමේ. එය දැක, මා හා මිහි පිට සියලු
ජීවමාන සතුන් අතර පිහිටවූ සදාතන ගිවිසුම සිහි
කරන්නමේ"යි වදාළ සේක.
17 දෙවියන් වහන්සේ නෝවාට කතා කොට, "මා
හා මිහි පිට සියලු ජීවමාන සතුන් අතර පිහිටුවන
ලද ගිවිසුම් ලකුණ මේ ය"යි වදාළ සේක.

## නෝවා සහ ඔහුගේ පුත්‍රයෝ

18 නැවෙනේ පිටතට පැමිණි නෝවාගේ පුත්‍රයෝ
නම් ෂමේ, හාම් සහ ජපතේ ය. හාම් කානාන්ගේ
පියා ය. 19 පොළොව පුරා මුළු ජනගහණය ඇති
වූයේ නෝවාගේ මේ පුතුන් තිදනෙගනේ ය.
20 ගොවියකෙු වූ නෝවා මිදි වත්තක් වැවූ පළමු
මිනිසා විය. 21 ඔහු මිදියුස පානය කොට, වෙරිමත්
ව, සිය කූඩාරමහෙි නග්න ව වැතිර සිටියේ ය.
22 කානාන්ගේ පියා වන හාම් සිය පියාගේ නග්න
භාවය දුටු විට, ඔහු ගොස් පිටත සිටි තමාගේ
සහොදෙයුරන් දදෙනොට එපවත් කී ය. 23 එවිට
ෂමේ හා ජපතේ සළුවක් ගනෙ, උරහිස් මත තබා
ගනෙ, පස්සනේ පස්සට ගොස්, සිය පියාගේ නග්න
භාවය වසා දැමූ හ; ඔව්හු තම පියාගේ නග්න
භාවය නොදකින ලසෙ තමන්ගේ මුහුණු අහකට
හරවා ගනෙ සිටිය හ.
24 නෝවා ද, වෙරි මත සිඳුණු පසු පිබිද, තම බාල
පුත්‍රයා තමාට කළ දේ දැන ගත් විට,
25 "කානාන් සාප ලද්දකේ වේ වා!
q225 ඔහු තම සහෝදරයන්ගේ දාසයන්ට දාසයකේ
වේ වා!"යි කී ය.

26 ඔහු තවදුරටත් කතා කරමින්, “ෂෙම්ගේ දෙවි
සමිඳාණන් වහන්සේට ප්‍රශංසා වේ වා!
q2 26 කානාන් ෂෙම්ගේ වහලකේ වේ වා!”යි ද,
27 “දෙවියෝ ජපතේ වර්ධනය වන්නට සලසත් වා!
q2 27 ඔහුගේ පළෙපත ෂෙම්ගේ ජනයා සමඟ වාසය
කරත් වා!
q2 27 කානාන් ජපතේගේ ද වහලකේ වේ වා”යි ද කී
ය.
28 මහා ජලගැල්මනේ පසු නෝවා අවුරුදු තුන්සිය
පණහක් ජීවත් වීය. 29 ඔහු අවුරුදු නවසිය පණහක්
ආයු වළඳා මියගියේය.

### නෝවාගේ දරු පරම්පරාව

(1 වංශා 1:5-23)

10 නෝවාගේ දරුවන් වන ෂමේ, හාම් සහ
ජපතේ යන තිදනොගේ පරම්පරා මසෙේ ය.
මහා ජලගැල්මනේ පසු ඔවුන්ට පුත්‍රයෝ උපන්නා
හ.
2 ජපතේගේ පුත්‍රයෝ නම්: ගොමරේ, මාගොග්,
මාදයි, ජාවාන්, තුබල්, මෙෂෙකේ සහ තීරස් ය.
3 ගොමරේගේ පුත්‍රයෝ නම්: අෂ්කනෙස්, රිපත්
සහ තොගර්මා ය. 4 ජාවාන්ගේ පුත්‍රයෝ නම්:
එලිෂා, තර්ෂිෂ්, කිත්තිම් සහ දදොනිම් වැසියෝ ය.
5 මොවුන්ගනේ වරෙළබඩ පදෙසේවලට සහ
දිවයින්වලට ජනතාව පැතිරී ගිය හ. කණ්ඩායම්
වශයනේ තමන්ගේ ම භාෂාව කතා කරන, විවිධ
ගෝත්‍රවලට අයත්, විවිධ රටවල වසන මොවුහු
ජපතේගේ පරම්පරාවනේ පැවත එන්නෝ වති.
6 හාම්ගේ පුත්‍රයෝ නම්: කුෂ්, මිශ්‍රයිම්, පූට් සහ
කානාන් ය. 7 කුෂ්ගේ පුත්‍රයෝ නම්: ෂබො, හවිලා,
සබ්තා, රාමා සහ සබ්තකො ය. රාමාගේ පුත්‍රයෝ
නම්: ෂබො සහ දදොන් ය. 8 කුෂ්ට දාව නිම්රොද්
නම් පුතකේ උපන්නේ ය. ඔහු ලෝකයේ පළමු වන
බලසම්පන්න පාලකයා විය. 9 සමිඳාණන් වහන්සේ
ඉදිරියහෙි ඔහු විශිෂ්ටතම දඩයම්කාරයා ද විය.
“සමිඳාණන් වහන්සේ ඉදිරියහෙි විශිෂ්ටතම
දඩයම්කාරයා වූ නිම්රොද් වාගේ ය”යි යන කියමන
ද ඇති වූයේ එසේ ය. 10 ෂිනාර් දේශයහෙි ඔහු
පාලනය කළ පළමු වන රාජ්‍යයට බාබලේ, එරකේ,
අක්කද් සහ කල්නේ යන පදෙසේ අයත් විය. 11 ඒ
දේශයනේ අසිරියාවට නික්ම ගොස් නිනිවය ද
රහෙොබොත්-ඊර් නගරය ද කලා ද 12 නිනිවය සහ
කලා අතර වූ මහ නගරයක් වන රසෙනේ ද
ගොඩනැඟී ය.
13 මිශ්‍රයිම් වනාහි ලුදිම්වරුන්ගේ ද
අනාම්වරුන්ගේ ද ලහොබිම්වරුන්ගේ ද
නප්තුහිම්වරුන්ගේ ද 14 පත්‍රුසිම්වරුන්ගේ ද
කස්ලුහිම්වරුන්ගේ ද කප්තොරිම්වරුන්ගේ ද පියා
විය. පිලිස්තිවරුන්ගේ පළෙපත ආයේ
කප්තොරිම්වරුන්ගනේ ය.
15 කානාන් වනාහි සිය කුලුදුල් පුත් වන
සීදොන්ගේ ද හතේගේ ද 16 ජබුසිවරුන්ගේ ද
අමෝරිවරුන්ගේ ද ගිර්ගාෂිවරුන්ගේ ද
17 හිවිවරුන්ගේ ද අර්කිවරුන්ගේ ද සිනීවරුන්ගේ ද
18 අර්වාදිවරුන්ගේ ද ශමොරිවරුන්ගේ ද
හමාතිවරුන්ගේ ද පියා විය. ඉන්පසු
කානානිවරුන්ගේ ගෝත්‍රයෝ පැතිරී ගියෝ ය.
19 කානානිවරුන්ගේ දේශ සීමා සීදොන් සිට ගරොර්
දසෙට පිහිටි ගාසා දක්වා ද සොදොම්, ගොමොරා,
අද්මා සහ ශබෝයිම් දසෙට පිහිටි ලාෂා දක්වා ද
පැතිරී ඇත. 20 විවිධ ගෝත්‍රවලට අයිති ව, තම
තමන්ගේ ම භාෂා කතා කරමින්, විවිධ දේශවල
වසන, විවිධ ජාතීන්ට අයිති මොවුහු හාම්ගේ
පළෙපතින් පැවත එන්නෝ ය.
21 එබරේගේ සියලු පුත්‍රයන්ගේ මීමුතු පියා ද,
ජපතේගේ වැඩිමහල් සහෝදරයා ද වූ ෂමේටත්
පුත්‍රයෝ උපන්නෝ ය. 22 ෂමේගේ පුත්‍රයෝ නම්:
ඒලාම්, අෂූර්, අර්පක්ෂද්, ලුද් සහ අරාම් ය.
23 අරාම්ගේ පුත්‍රයෝ නම්: ඌශ්, හූල්, ගතෙරේ
සහ මෂ් ය. 24 අර්පක්ෂද් ෂලොගේ පියා ය. ෂලො
ඒබරේගේ පියා ය. 25 ඒබරේට පුත්‍රයෝ දදෙනෙකේ
උපන්නෝ ය; එක් කනෙකුගේ නම පලෙගේ ය;
මිහි පිට මුළු මනුෂ්‍ය වර්ගයා බදේී ගියේ ඔහුගේ
කාලයේ දී ය. ඔහුගේ සහෝදරයාගේ නම
ජොක්තන් ය. 26 ජොක්තන්ට දාව අල්මෝදාද්,
ෂලෙපේ, හශාර්මාවතේ, ජරො, 27 හදෝරාම්, ඌසාල්,
දික්ලා, 28 ඕබාල්, අබිමායලේ, ෂබො, 29 ඕෆිර්,
හවිලා සහ ජෝබාබ් උපන්නෝ ය. මේ සියල්ලෝ
ජොක්තන්ගේ පුත්‍රයෝ ය. 30 ඔවුන් විසූ ප්‍රදේශය
මේෂා පටන් පරෙදිග කඳු දක්වා පිහිටි ෂෙෆාර් අතර
විය. 31 විවිධ ගෝත්‍රවලට අයිති ව, තම තමන්ගේ
ම භාෂා කතා කරමින්, විවිධ දේශවල වසන, විවිධ
ජාතීන්ට අයත් මොවුහු ෂමේගේ පළෙපතින් පැවත
එන්නෝ ය.
32 විවිධාකාර පරම්පරාවලට හා ජාතීන්ට අයත්
මොවුහු නෝවාගේ පළෙපතින් පැවතනෙ
ගෝත්‍රයෝ ය. මහා ජලගැල්මනේ පසු පොළෝ
තලයහෙි සියලු ජාතීහු මොවුන්ගනේ පැවත එන්නෝ
වති.

### බාබලේ කොත

11 තවද, ඒ කාලයේ දී සකල ලෝවැසි මිනිසුන්
කතා කළෙේ එක ම භාෂාවකි; භාවිත
කළෙේ ද එක ම වචන මාලාවකි. 2 නැගනෙහිර
දිශාවට යන අතර ෂිනාර් නම් ප්‍රදේශයේ
තැනිතලාවක් සම්බ වී, ඔව්හු එහි පදිංචි වූ හ.
3 ඔව්හු එකිනකොට කතා කරමින්, “එන්න, අපි
ගඩොල් සාදා, ඒවා හොඳට පුළුස්සමු”යි කී හ.
මසේ ඔව්හු ගල් වනෙුවට ගඩොල් ද, හුණු බදාම
වනෙුවට කීල් ද පාවිච්චි කළහ. 4 එවිට ඔව්හු කතා
කොට, “එන්න, අපි අහස උසට නඟින කොතක්
ඇති නගරයක් අපට ම ගොඩනඟා, කීර්තිමත් වමු.
නැත්නම් මිහි පිට අපට සීසීකඩ විසිර යන්නට සිදු
වනු ඇතැ”යි කී හ.
5 ඒ මිනිසුන් ගොඩනැගූ නගරය සහ කොත බැලීම
සඳහා සමිඳාණන් වහන්සේ බැස වැඩිය සේක.
6 උන් වහන්සේ, “බලන්න, මේ සියල්ලෝ එක ම

ජනතාවකි; ඔව්හු සියල්ලෝ ම එක ම භාෂාවක්
කතා කරති; මේ ඔවුන් කරන්නට යන දේවල මුල්
පියවර ය. වැඩි කල් යන්නට පෙර ඔවුන්ට කළ
නොහැකි කිසි යම් දෙයක් නොවෙනු ඇත. 7 එබැවින්
අපි බැස ගොස්, ඔවුන් එකිනෙකාට නොවැටහෙන
පරිදි, ඔවුන්ගේ භාෂාව අවුල් වියවුල් කරමු”යි වදාළ
සේක. 8 මෙසේ උන් වහන්සේ පොළෝ තලය මත
ඔවුන් විසුරුවා හැරිය සේක. ඔව්හු ද නගරය
ගොඩනැඟීම නැවැත්වූ හ. 9 සමිඳාණන් වහන්සේ ඒ
නගරයෙහි දී මුළු ජනතාවගේ භාෂාව අවුල් වියවුල්
කළ බැවින් ඊට ‘බාබලේ’ යැයි නම යෙදිණි. එතැනින්
සමිඳාණන් වහන්සේ ඔවුන් මහ පොළොව පුරා
විසිර වූ සේක.

### ෂෙමේගේ පෙළපත
(1 වංශා 1:24-27)

10 ෂෙමේගේ පෙළපත මෙසේ ය: ෂෙමේට අවුරුදු
සියයක් වයස් වූ කල, මහා ජලගැල්මෙන්
දැවුරුද්දකට පසු, ඔහුට අර්පක්ෂද් උපන්නේ ය.
11 ඉන්පසු ඔහු තව අවුරුදු පන්සියයක් ජීවත් විය.
ඔහුට තවත් දරුදැරියෝ උපන්නෝ ය.
12 අර්පක්ෂද්ට අවුරුදු තිස්පහක් වයස් වූ කල
ඔහුට ෂේලා උපන්නේ ය. 13 ඉන්පසු ඔහු තව
අවුරුදු හාරසිය තුනක් ජීවත් විය. ඔහුට තවත්
දරුදැරියෝ උපන්නෝ ය.
14 ෂේලාට අවුරුදු තිහක් වයස් වූ කල ඔහුට
ඒබෙර් උපන්නේ ය. 15 ඉන්පසු ඔහු තව අවුරුදු
හාරසිය තුනක් ජීවත් විය. ඔහුට තවත් දැරුදැරියෝ
උපන්නෝ ය.
16 ඒබෙර්ට අවුරුදු තිස්හතරක් වයස් වූ කල ඔහුට
පෙලෙග් උපන්නේ ය. 17 ඉන්පසු ඔහු තව අවුරුදු
හාරසිය තිහක් ජීවත් විය. ඔහුට තවත් දරුදැරියෝ
උපන්නෝ ය.
18 පෙලෙග්ට අවුරුදු තිහක් වයස් වූ කල ඔහුට
රෙයූ උපන්නේ ය. 19 ඉන්පසු ඔහු තව අවුරුදු දෙසිය
නවයක් ජීවත් විය. ඔහුට තවත් දැරුදැරියෝ
උපන්නෝ ය.
20 රෙයූට අවුරුදු තිස්දෙකක් වයස් වූ කල ඔහුට
සෙරූග් උපන්නේ ය. 21 ඉන්පසු ඔහු තව අවුරුදු
දෙසිය හතක් ජීවත් විය. ඔහුට තවත් දරුදැරියෝ
උපන්නෝ ය.
22 සෙරූග්ට අවුරුදු තිහක් වයස් වූ කල ඔහුට
නාහෝර් උපන්නේ ය. 23 ඉන්පසු ඔහු තව අවුරුදු
දෙසියයක් ජීවත් විය. ඔහුට තවත් දරුදැරියෝ
උපන්නෝ ය.
24 නාහෝර්ට අවුරුදු විසිනවයක් වයස් වූ කල
ඔහුට තේරා උපන්නේ ය. 25 ඉන්පසු ඔහු තව
අවුරුදු එකසිය දහනවයක් ජීවත් විය. ඔහුට තවත්
දරුදැරියෝ උපන්නෝ ය.
26 තේරාට අවුරුදු හැත්තෑවක් වයස් වූ කල ඔහුට
ආබ්‍රම්, නාහෝර් සහ හාරාන් යන පුතුන් තිදෙනෙ
උපන්නෝ ය.

### තේරාගේ පෙළපත

27 තේරාගේ පෙළපත මෙසේ ය: තේරා වනාහි
ආබ්‍රම්, නාහෝර් සහ හාරාන්ගේ පියා ය. හාරාන්
ලොත්ගේ පියා ය. 28 හාරාන් තමා උපන් රටේ ඌර්
නම් කල්දිවරුන්ගේ නුවරෙහි, තම පියා වූ තේරා
එතෙක් ජීවතුන් අතර සිටිය දී මියගියේ ය. 29 තවද
ආබ්‍රම් ද නාහෝර් ද භාර්යාවන් පාවාගත්තෝ ය.
ආබ්‍රම්ගේ භාර්යාවගේ නම සාරයි ය; නාහෝර්ගේ
භාර්යාවගේ නම මිල්කා ය. ඈ ඉස්කාගේ පියා වූ
හාරාන්ගේ දුව ය. 30 සාරයි වඳ ස්ත්‍රියක වූයෙන්
ඈට දරුවෙක් නොවී ය.
31 තේරා තමාගේ පුත්‍රයා වන ආබ්‍රම් ද තම
මුණුබුරා වන ලොත් ද ආබ්‍රම්ගේ බිරිඳ වූ, තම
ලේලි වන සාරයි ද කැඳවාගෙන ඔවුන් සමඟ
කානාන් දේශය බලා යන පිණිස ඌර් නම්
කල්දිවරුන්ගේ නුවරින් පිටත් විය. එහෙත්, ඔව්හු
හාරාන් දක්වා ගොස් එහි පදිංචි වූ හ. 32 තේරා
අවුරුදු දෙසියපහක් ආයු වළඳා හාරාන්හි දී
මියගියේය.

### ආබ්‍රම්ගේ කැඳවීම

12 ක්‍රියා 7:2-3; හෙබ්‍රෙ 11:8 සමිඳාණන්
වහන්සේ ආබ්‍රම්ට කතා කොට, “නුඹේ මවු
බිම ද නුඹේ නෑදෑයන් ද නුඹේ පියාගේ ගෘහය ද
අත්හැරදමා, මා පෙන්වන්නට යන දේශයට යන්න.
2 මම නුඹ මඟින් විශාල ජාතියක් ඇති කරන්නෙමි;
මම නුඹට ආශීර්වාද කරන්නෙමි; නුඹේ නාමය ආසිරි
පැතීමේ නාමයක් වන සේ කීර්තියට පමුණුවන්නෙමි.
3 ගලා 3:8 නුඹට ආසිරි පතන අයට මමත් ආසිරි
පතමි.
q2 3 නුඹට දෙස් තබන අයට මමත් දෙස් තබමි.
q2 3 නුඹ මගින් ආසිරි ලත් අයුරින් මිහි මත සව්
සත ආසිරි ලබනු ඇතැ”යි
3 වදාළ සේක. 4 ආබ්‍රම්ට වයස අවුරුදු
හැත්තෑපහක් වූ කල සමිඳාණන් වහන්සේ ඔහුට
වදාළ ලෙසට, ඔහු හාරාන් දේශයෙන් පිටත් විය.
ලොත් ද ඔහු සමඟ ගියේය. 5 මෙසේ ආබ්‍රම් සිය
බිරිඳ වන සාරයි ද තම සොහොයුරාගේ පුත් වන
ලොත් ද හාරාන් දේශයෙන් රැස් කරගත් සියලු
සම්පත් හා දැසිදසුන් ද රැගෙන කානාන් දේශය බලා
නික්ම ගොස් එහි සැපත් විය.
6 ආබ්‍රම්, ඒ දේශය ඔස්සේ ගමන් කර ෂෙකෙම්
නගරයේ ශුද්ධ භූමිය වන මෝරෙහි ආලෝන අරඹ
දක්වා පැමිණියේ ය. එකල ඒ රටේ කානානිවරු
සිටියෝ ය. 7 ක්‍රියා 7:5; ගලා 3:16 එවිට සමිඳාණන්
වහන්සේ ආබ්‍රම්ට දර්ශනය වී, ඔහුට කතා කොට,
“මම මේ දේශය නුඹේ පෙළපතට දෙන්නෙමි”යි
වදාළ සේක. ආබ්‍රම් එහි දී තමන්ට දර්ශනය වූ
සමිඳාණන් වහන්සේට පූජාසනයක් ඉදි කළේ ය.
8 ඉන්පසු ඔහු බෙතෙල් නගරයට නැගෙනහිරින්
පිහිටි කඳුකර පෙදෙසට ගමන් කළේ ය. මෙසේ
ගමන් කොට, බටහිරින් බෙතෙල් නගරය ද,

නැගෙනහිරින් ආයි නගරය ද අතර තම කඳවුර
පිහිටුවාගත්තේ ය. එහි දී ඔහු පූජාසනයක් ඉදි කර
සමිඳාණන් වහන්සේගේ නාමය කියා යච්ඤා
කළේ ය. 9 ඉන්පසු ඔහු එක තැනක නොරැඳා
අනුක්‍රමයෙන් ගොස් 'නේගෙබ්' ප්‍රදේශයට
පැමිණියේ ය.

## ආබ්‍රම් මිසර දේශයට පැමිණීම

10 එහෙත්, ඒ දේශයෙහි සාගතයක් පැවතිණි.
සාගතය අති උග්‍ර වූ බැවින්, ආබ්‍රම් තාවකාලික
පදිංචියට මිසරයට ගියේය. 11 ඔහු මිසරයට සමීප
වූ කල සිය බිරිඳ වන සාරයි අමතා, "මට සවන්
දෙන්න, ඔබ කෙතරම් සුරූපී කාන්තාවක් දැ යි මම
දනිමි. 12 මිසර වාසීන් ඔබ දුටු විට, 'මේ ආබ්‍රම්ගේ
බිරිඳ ය'යි කියා ඔබ ගැනීමට මා මරාදමා ඔබ
බේරනු ඇත. එබැවින්, කරුණාකර, 'මම ඔහුගේ
සහෝදරී ය'යි ඔවුන්ට කියන්න. 13 උත් 20:2; 26:7
එවිට ඔබ නිසා ඔවුන් මාගේ පණත් බේරා මට
හොඳින් සලකනු ඇතැ"යි කී ය. 14 ආබ්‍රම් මිසරයට
පිවිසි කල ඔහුගේ බිරිඳ ඉතා සුරූපී තැනැත්තියක
බව මිසර වාසීහු දුටහ. 15 පාරාවෝගේ ඇමතිවරු ඈ
දැක, ඇගේ රූපශ්‍රීය ඔහුට වර්ණනා කළෙන් ඇය
රජ මාලිගාවට ගෙනෙයනු ලැබුවා ය. 16 රජ තමේ
ද, ඇය නිසා ආබ්‍රම්ට හොඳින් සලකා ඔහුට එළු
බැටළුවන් ද ගවයන් ද කොටළුවන් ද සේවක
සේවිකාවන් හා කොටළු දෙනුන් හා ඔටුවන් ද
ප්‍රදානය කළේ ය.
17 එහෙත්, පාරාවෝ ආබ්‍රම්ගේ භාර්යාව වූ සාරයි
තබාගත් බැවින්, පාරාවෝ රජුට ද රජ වාසල අයට ද
සමිඳාණන් වහන්සේ ඉතා දරුණු වසංගත පැමිණවූ
සේක. 18 එවිට පාරාවෝ ආබ්‍රම් කැඳවා, "ඔබ මට
කළ මේ හදිය කුමක් ද? 19 ඈ ඔබේ බිරිඳ බව මට
නො කීවේ මන් ද? ඈ ඔබේ සහෝදරිය ය කියා
මට කීවේ කුමක් නිසා ද? මා ඈ පාවා ගත්තේ ඒ
නිසා ය. මෙන්න, ඔබේ බිරිඳ, ඇය රැගෙන පිටත් ව
යන්නැ"යි කී ය. 20 තවද, පාරාවෝ සිය පිරිසට ද
අණ දුන් බැවින්, ඔව්හු ආබ්‍රම්, ඔහුගේ බිරිඳ සහ
ඔහු සන්තක සියල්ල ද සමඟ රටින් පිටත් කර
හැරියෝ ය.

## ආබ්‍රම් ලොත්ගෙන් වෙන් වීම

13 ආබ්‍රම් සිය බිරිඳ හා තමන් සතු සියල්ල
රැගෙන මිසර දේශයෙන් පිටත් වී නේගෙබ්
පළාත බලා ගියේය. ලොත් ද ඔහු සමඟ ගියේය.
2 ආබ්‍රම් ගවමහිෂයන්ගෙන් හා රන් රිදීයෙන් ඉතා
ධනවතෙක් වීය. 3 එවිට ආබ්‍රම් නේගෙබ් සිට
කඳවුරෙන් කඳවුර ගෙවා බෙතෙල් දිශාවට යමින්,
බෙතෙල් හා ආයි නුවර අතර, පළමුවෙන් කඳවුරු
බැඳි ස්ථානයට පැමිණියේ ය. 4 පළමුවෙන් ඔහු
පූජාසනයක් ඉදි කළේ මේ ස්ථානයේ ය. මෙහි දී
ඔහු සමිඳාණන් වහන්සේගේ නාමය කියා යච්ඤා
කළේ ය.

5 ආබ්‍රම් සමඟ ගමන් කළ ලොත්ට ද එළු බැටළු,
ගවමහිෂයන් සහ ඔහු සමඟ කඳවුරු බැඳගත්
පිරිසක් ද වූ හ. 6 එබැවින් ඔවුන් දෙදෙනාට ම
පොදුවේ ජීවත් වීමට තරම් සෑහෙන තණ බිම් එහි
නොතිබිණි. ඔවුන්ට අයිති ගවසම්පත් බොහෝ වූ
බැවින් දෙදෙනාට එක් ව විසීමට නොහැකි විය.
7 එහෙයින් ආබ්‍රම්ගේ ගොපලුන් හා ලොත්ගේ
ගොපලුන් අතර ආරාවුල් හට ගැනිණි. එකල
කානානිවරු ද පෙරෙස්සිවරු ද එම දේශයෙහි වාසය
කළෝ ය.
8 එවිට ආබ්‍රම් ලොත්ට කතා කොට, "අප
දෙගොල්ල ම නෑදෑයින් බැවින් ඔබ හා මා අතරත්,
ඔබේ ගොපලුන් හා මාගේ ගොපලුන් අතරත්
ආරාවුල් නො තිබිය යුතු ය. 9 මේ මුළු දේශය ම
ඔබ ඉදිරියෙහි ඇත; කරුණාකර ඔබ මගෙන් වෙන් වී
යන්න. ඔබ වමතට යන්නෙහි නම්, මම දකුණතට
යමි. ඔබ දකුණතට යන්නෙහි නම්, මම වමතට
යමි"යි කී ය.
10 උත් 2:10 ලොත් ද නෙත් ඔසවා ශෝවර් දිශා
භාගය දක්වා මුළු ජෝර්දාන් තැනිතලාව දෙස බැලී
ය. එහි හැම තැනට ම, සමිඳාණන් වහන්සේගේ
උයනට මෙන් ද, මිසර දේශයට මෙන් ද මැනවින්
ජලය සැපයුණු බව දිටී ය. මෙය සමිඳාණන්
වහන්සේ සොදොම් සහ ගොමොරා නගරයන්
විනාශ කිරීමට පෙර ය. 11 එබැවින් ලොත් තමාට
මුළු ජෝර්දාන් තැනිතලාව ම තෝරාගෙන
නැගෙනහිර දෙසට ගියේ ය; ඒ දෙදෙනා මෙලෙස
එකිනෙකාගෙන් වෙන් වූ හ. 12 ආබ්‍රම් කානාන්
දේශයෙහි පදිංචි විය. ලොත් තැනිතලාවේ නගර
අතර පදිංචි වී සොදොම් නගරය අසල කඳවුරු
බැන්දේ ය. 13 සොදොම් නුවර වාසීහු සමිඳාණන්
වහන්සේට විරුද්ධ ව පව් කළ, නපුරු, මහ
අපරාධකාරයෝ වූ හ.

## ආබ්‍රම් හෙබ්‍රොන් දෙසට යෑම

14 ලොත් වෙන් වී ගිය පසු, සමිඳාණන් වහන්සේ
ආබ්‍රම්ට කතා කොට, "නුඹ සිටින තැන සිට නෙත්
ඔසවා උතුර ද දකුණ ද නැගෙනහිර ද බටහිර ද
දෙස සැලකිල්ලෙන් බලන්න. 15 ක්‍රියා 7:5 නුඹට
පෙනෙන මේ මුළු රට ම නුඹටත්, නුඹේ
පෙළපතටත් සදහට ම මම දෙන්නෙමි. 16 ගණනින්
පොළොවේ දූවිලි හා සමාන වන ලෙස නුඹේ
පරපුර වැඩි වර්ධනය කරන්නෙමි. යමකුට
පොළොවේ දූවිලි ගණන් කළ හැකි නම්, නුඹේ
පෙළපත ද ගණන් කළ හැකි වේ. 17 දැන් නුඹ
නැඟිට රට පුරා ම ඇවිදින්න. මම මේ සියල්ල ම
නුඹට දෙන්නෙමි"යි වදාළ සේක. 18 මෙසේ ආබ්‍රම්
සිය කඳවුර රැගෙන විත් හෙබ්‍රොන්හි පිහිටි
මම්රේහි ආලෝන අරඹ ළඟ පදිංචි වී, සමිඳාණන්
වහන්සේට එහි පූජාසනයක් ඉදි කළේ ය.

### ආබ්‍රම් ලොත් මුදාගැනීම

14 එසමයෙහි ෂීනාර්හි රජ වූ අම්රාපලේ ද,
එල්ලාසාර්හි රජ වූ අරියොක් ද, එලාම්හි රජ
වූ කදෙඔර්-ලායොමෙර් ද, ගෝයිම්හි රජ වූ තිදාල් ද
යන රජවරු වූ හ. 2 මොවුහු සොදොම්හි රජ වූ
බෙරා ද, ගොමොරාහි රජ වූ බිර්ෂා ද, අද්මාහි රජ
වූ ෂිනාබ් ද ශබොයිම්හි රජ වූ ෂමේබෙර් සහ
බෙලාහි හෙවත් ශෝවර්හි රජ ද යන රජවරු
පස්දෙනාට විරුද්ධ ව යුද්ධ කළහ. 3 මකී රජවරු
පස්දෙන දැන් මළ මුහුද නමින් හැඳින්වෙන සිද්දිම්
මිටියාවතෙහි සමගි පෙරමුණක් බැඳ ගත්හ.
4 දොළොස් අවුරුද්දක් තිස්සේ කදෙඔර්-ලායොමෙර්
රජු යටතේ වහල් මෙහෙවර කළ මොවුහු දහතුන්
වන අවුරුද්දේ දී කැරලිගැසූ හ. 5 දහහතර වන
අවුරුද්දේ දී කදෙඔර්-ලායොමෙර් සිය මිත්‍ර රජවරුන්
සමඟ විත්, අෂ්තරෙතොත්-කර්ණායිම්හි විසූ රෙෆායිවරුන්
ද හාම්හි සිටි සුසිවරුන් ද කිරියාතායිම් තැනිතලාවේ
විසූ ඒමිවරුන් ද 6 කාන්තාර මායිමේ ඒල්-පාරාන්
දක්වා සේයිර් කඳුකරයේ සිටි හෝරිවරුන් ද පරාජය
කළේ ය. 7 ඔව්හු හැරී ඇවිත් කාදෙෂ් හෙවත්
‘විමංසන-උල්පත’ යන අර්ථය ඇති ඒන්-මිෂ්පාට්
දක්වා පැමිණ, අමලකේවරුන්ගේ මුළු දේශය ද,
හශශොන්-තාමාර්හි විසූ අමෝරිවරුන් ද පරාජය
කළහ.
8 එවිට සොදොම්, ගොමොරා, අද්මා, ශබොයිම්
සහ බෙලා හෙවත් ශෝවර් යන නුවරවල රජවරු
පස්දෙනා නික්ම ගොස් සමගි පෙරමුණක් බැඳ,
9 ඒලාම්හි රජ වූ කදෙඔර්-ලායොමෙර් ද, ගොයිම්හි
රජ වූ තිදාල් ද, ෂීනාර්හි රජ වූ අම්රාපලේ ද,
එල්ලාසාර්හි රජ වූ අරියොක් ද යන රජවරුන්
සතරදෙනාට විරුද්ධ ව සිද්දිම් මිටියාවතෙහි යුද්ධ
කළහ. මයෙ පස්දෙනෙකු, සතරදෙනෙකුට විරුද්ධ ව
කරන සටනක් විය. 10 තවද, සිද්දිම් මිටියාවතෙහි
බොහෝ කීල් පතල් තිබිණි. සොදොම් හා
ගොමොරාහි රජවරු පලා ගොස්, ඒවායේ වැටුණාහ.
සෙසේසෝ කඳුකරයට පලා ගියහ. 11 ජයග්‍රාහී
රජවරු සොදොම් සහ ගොමොරාහි ධනසම්පත් ද,
ඔවුන්ගේ ආහාර පාන ද රැගෙන යන්න ගියහ.
12 මෙසේ යන විට ඔව්හු සොදොම්හි විසූ
ආබ්‍රම්ගේ බෑණා වන ලොත් සහ ඔහුගේ
වස්තුවත් රැගෙන ගියහ.
13 එහෙත් ඔවුන්ගෙන් ගැළවී පැමිණි කෙනෙක්
හෙබ්‍රෙව් ජාතික ආබ්‍රම්ට සියල්ල සැළ කළේ ය.
එකල ආබ්‍රම් පදිංචි වී සිටියේ එෂ්කොල්ගේ හා
අනෙර්ගේ සහෝදරයා වූ, අමෝරිය ජාතික
මම්රේගේ ආලෝන අරඹ සමීපයේ ය. මොවුහු
දෙදෙන ආබ්‍රම් සමඟ මිත්‍ර ගිවිසුමක් කරගෙන
සිටියහ. 14 ආබ්‍රම් ද සිය ඥාතිවරයා සිරකරුවෙකු
ලෙස අල්ලාගෙන ගිය බව ඇසූ විට, ඔහු සිය
කඳවුරේ ම උපන් යුද්ධ පුහුණුව ලත් සේවකයන්
තුන්සිය දහඅටදෙනෙකු රැගෙන, දාන් දක්වා සතුරන්
ලුහුබැඳ ගියේය. 15 එහි දී ඔහුගේ පිරිස කණ්ඩායම්
දෙකකට බෙදී රාත්‍රි කාලයේ සතුරන්ට පහර දී
ඔවුන් පරාජය කළහ. මෙසේ පරාජය කොට
දමස්කස් නුවරට උතුරින් පිහිටි හෝබා දක්වා ඔවුන්
ලුහුබැඳ ගියෝ ය. 16 තවද, ආබ්‍රම් සියලු වස්තුව ද
තම ඥාතිවර ලොත් ද ඔහුගේ ධන සම්පත ද
ස්ත්‍රීන් හා අල්ලාගත් සෙනඟ ද ආපසු ගෙනාවේ ය.

### මෙල්කිසදෙක් ආබ්‍රම්ට ආශීර්වාද කිරීම

17 සොදොම්හි රජ තෙමේ ආබ්‍රම් කදෙඔර්-
ලායොමෙර් හා මොහුගේ මිත්‍රපාක්ෂික රජවරුන් ද
පරාජය කර ආපසු පැමිණි විට, ‘රාජකීය දණිය’
නම් වූ ෂාවේ මිටියාවතට ඔහු හමුවීම පිණිස
ගියේය. 18 හෙබ්‍රෙ 7:1-10 තවද, සාලම්හි රජ වූ
පරමෝත්තම දෙවියන් වහන්සේගේ පූජක වූ
මෙල්කිසදෙක් රොටි සහ මිදියුස ගෙනැවිත්
19 ඔහුට ආශීර්වාද කරමින්,
q2 19 “අහසත්, පොළොවත් මවා වදාළ පරමෝත්තම
දෙවියන් වහන්සේ ආබ්‍රම්ට ආශීර්වාද කරන සේක්
වා!
q1 20 ඔබේ සතුරන්, ඔබ අතට පාවා දුන්
පරමෝත්තම දෙවියන් වහන්සේට තුති පැසසුම් වේ
වා!”යි
20 කීවේ ය. ආබ්‍රම් ද සියල්ලෙන් දසයෙන් එක
ඔහුට දුන්නේ ය.
21 එවිට සොදොම්හි රජ ආබ්‍රම්ට කතා කොට,
“ධනසම්පත් ඔබට තබාගන්න. මාගේ සෙනඟ
පමණක් මට දෙන්නැ”යි කී ය. 22 එහෙත්, ආබ්‍රම්
රජුට පිළිතුරු දෙමින්, “අහසත්, පොළොවත් මවා
වදාළ, පරමෝත්තම දෙවි සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි මම දිවුරා කියමි: 23 ඔබ සතු දෙයින් එක
නූල් පොටක් වත්, සෙරෙප්පු පටියක් වත් මම
නොගනිමි. ‘ආබ්‍රම් පොහොසතකු කළේ මම ය’යි
කීමට ඔබට ඉඩක් මම නොතබමි. 24 මාගේ පිරිස
අනුභව කළ දේ හා මා සමඟ ගිය මිනිසුන්ගේ
කොටස මිස, මා සඳහා ම කිසිවක් මම නොගනිමි.
අනේර් ද එෂ්කෝල් ද මම්රේ ද තම තමන්ගේ
කොටස් ගනිත් වා”යි කී ය.

### ආබ්‍රම් සමඟ දෙවියන් වහන්සේ කළ ගිවිසුම

15 කලකට පසු සමිඳාණන් වහන්සේ ආබ්‍රම්ට
දර්ශනය වී, පණිවුඩයක් දෙමින්, “ආබ්‍රම්,
බිය නොවන්න;
q2
15 නුඹ රක්නා පලිහ මම ය;
q2
15 නුඹේ වාසනාව අතිවිසල් ය”යි වදාළ සේක.
2 එහෙත්, ආබ්‍රම් උත්තර දෙමින්,
“මහෝත්තම දෙවි ස්වාමීනි, දරුවෙකු නැති මට, ඔබ
වෙනෙ කුමක් දුන්නත් කුමන පලක් ද? මාගේ
උරුමකරු දමස්කස්හි එලියේසර් වන මොහු ය.
3 ඔබ මට දරුසම්පත් දී නැත. එබැවින් මාගේ ගෙදර
උපන් වහලෙක් මාගේ උරුමකරු වන්නේ ය”යි කී ය.
4 එවිට සමිඳාණන් වහන්සේ නැවතත් ඔහු

අමතමින්, “මවෙන්නකේ නුඹ‍ේ උරුමකරු
නාෙවන්නෙ‍් ය. නුඹට දාව උපන් නුඹෙ‍් ම දරුවකේ
නුඹෙ‍් උරුමකරු වන්නෙ‍් ය”යි වදාළ සෙ‍්ක. 5 රෝම
4:18; හබේරෙ 11:12 සමීඳාණන් වහන්සෙ‍් ද ඔහු
පිටතට රැගනෙ ගාෙස්, “අහස දසෙ බලා, හැකි නම්,
ඔය තාරකා ගණාන් කරන්න; නුඹෙ‍් දරු පරපුර එසෙ‍්
ම වන්නෙ‍් ය”යි වදාළ සෙ‍්ක. 6 රෝම 4:3; ගලා 3:6;
ජාකා 2:23 ආබ්රම් ද සමීඳාණන් වහන්සෙ‍් අදහා
ගත්තෙ‍් ය. ඒ ඇදහිල්ල ඔහුගෙ‍් ධර්මිෂ්ඨකම
වශයනේ උන් වහන්සෙ‍් පිළිගත් සෙ‍්ක.
7 එවිට සමීඳාණන් වහන්සෙ‍් ඔහුට කතා කාෙට,
“මෙ‍් රට නුඹට උරුමයක් කර දනෙු පිණිස ඌර් නම්
කල්දිවරුන්ගෙ‍් නුවරින් නුඹ පිටතට ගනො
සමීඳාණන් වහන්සෙ‍් මම ය”යි වදාළ සෙ‍්ක.
8 එහතේ, ආබ්රම්; “මහාෙත්තම දවේ ස්වාමීනි, මට
එය උරුම වන්නට යන බව මා දැනගන්නෙ‍් කසෙෙ‍්
දැ”යි ඇසී ය. 9 උන් වහන්සෙ‍් ද ඔහුට පිළිතුරු
දමේින්, “තුන් අවුරුදු වැස්සියක ද තුන් අවුරුදු
එළුදනෙකෙ ද තුන් අවුරුදු බැටළුවකෙු ද
කාෙබයියකෙු හා පරවේ පැටවකෙු ද මා වතෙ
ගනෙන්නේැ”යි වදාළ සෙ‍්ක. 10 ආබ්රම් ද මෙ‍්
සියල්ල උන් වහන්සෙ‍් වතෙ ගනෙ අවුත් ඔවුන්
දපෙළු කාෙට, පළු දකෙ එකිනකෙට මූණලා තැබී ය.
එහතේ ඔහු පක්ෂීන් දපෙළු කළෙෙ‍් නැත. 11 මෙ‍්
මළසිරුරු පිට ගිජු ලිහිණියන් පාත් වූ කල ආබ්රම්
උන් එළවාදැමී ය.
12 ජාෙබ් 4:13,14 තවද, ඉර බැස යන විට ආබ්රම්
බර නින්දකට වැටිණි. රුදුරු භීතියකින් ඔහු වළෙී
ගියෙ‍්ය. 13 නික්ම 1:1-14; ක්රියා 7:6 සමීඳාණන්
වහන්සෙ‍් ද ඔහුට කතා කාෙට, “මයෙ සැබැවින් ම
දැනගන්න; නුඹනේ පැවතනෙ පළෙපත විදෙ‍්ශීය
රටක විදෙ‍්ශික ව සිටිනු ඇත. එහි දී ඔව්හු වහල්
සෙ‍්වය කරමින් අවුරුදු හාරසියයක් තිස්සෙ‍් තාඩන
පීඩන විඳින්නාහ. 14 නික්ම 12:40-41; ක්රියා 7:7
එහතේ, මා ඔවුන් මසෙෙ‍් වහල්කමට පත් කළ ඒ
ජාතිය විනිශ්චය කළ පසු, ඔව්හු බාෙහාෙ සම්පත්
රැගනෙ පිටත් ව යන්නාහ. 15 නුඹ යහතින් දවස්
යවා, ඉන්පසු දිගායු සම්පත් වළඳා භූමදාන කරනු
ලබන්නහෙ ය. 16 එහතේ, සතර වන පරම්පරාවෙ‍් දී
ඔව්හු නැවත මහෙි පැමිණනේනාෙ ය. මන්ද,
අමාෙරිවරුන්ගෙ‍් දුෂ්ටකම තව ම නිම වී නැති
හයෙිනැ”යි වදාළ සෙ‍්ක.
17 තවද, ඉර බැස යයි; අඳුර පැමිණයෙි; දපෙළු
කරන ලද සතුන් මැදින් යන දුම් නඟින උදුනක් ද,
දිළිසනෙ ගිනි හුළක් ද, පනෙෙ‍්. 18 ක්රියා 7:5ඒ
දවසෙ‍් දී සමීඳාණන් වහන්සෙ‍් ආබ්රම් සමඟ
ගිවිසුමක් පිහිටුවමින්, “මිසරයෙ‍් ගංගාවෙ‍් සිට
යුප්රටීස් මහ ගංගාව දක්වා 19 කෙ‍්නිවරුන් හා
කනෙිස්සිවරුන් ද, කද්මාෙනිවරුන් හා 20 හිත්තීවරුන්
ද, පරෙිස්සිවරුන් හා රපොවරුන් ද, 21 අමාෙරිවරුන්
හා කානානිවරුන් ද, ගිර්ගාෂිවරුන් හා ජබෙුසිවරුන් ද
සතු මෙ‍් දෙ‍්ශය නුඹෙ‍් පළෙපතට මම දමේ”යි වදාළ
සෙ‍්ක.

### හාගර් සහ ඉෂ්මායලේ

16 ආබ්රම්ගෙ‍් භාර්යාව වන සාරයිට දරුවකේ
උපන්නෙ‍් නැත. එහතේ, ඇට හාගර් නම්
මිසර ජාතික වහල් කලේලක් සිටියා ය. 2 එබැවින්
සාරයි ආබ්රම්ට කතා කාෙට, “බලන්න, සමීඳාණන්
වහන්සෙ‍් මා දරු පල ලැබීමනේ වළක්වා ඇත.
කරුණාකර, මාගෙ‍් වහල් කලේල වතෙ යන්න.
සමහරවිට ඇගනේ මට දරුවකෙු ලැබනේන
පුළුවනැ”යි කීවා ය. ආබ්රම් ද සාරයිගෙ‍් කීමට
එකඟ විය.
3 මලෙසෙ ආබ්රම් කානාන් දෙ‍්ශයහෙි අවුරුදු
දහයක් විසූ පසු, ආබ්රම්ගෙ‍් භාර්යාව වන සාරයි
මිසර ජාතික සිය වහල් කලේල වන හාගර් සිය
සැමියා වන ආබ්රම්ට භාර්යාව කාෙට දුන්නා ය.
4 ඔහු ඈ සමඟ එක් වූ පසු ඈ පිළිසිඳගත්තා ය.
හාගර් පිළිසිඳගත් බව ඈ දැනගත් පසු, ඈ ඇගෙ‍්
ස්වාමිදුව සුළු කාෙට සැලකුවනේ, 5 සාරයි ආබ්රම්ට
කතා කාෙට, “මට අවමානයක් සිදු වූයෙ‍් ඔබෙ‍්
වරදින් ය. මම මාගෙ‍් වහල් කලේල ඔබට අඹුවක
වශයනේ පාවා දුනිමි. තමා පිළිසිඳගත් බව ඈ
දැනගත් පසු, ඈ මා සුළු කාෙට සිතන්නී ය. වරද
කාගෙ‍් ද කියා දවේියන්ට පනෙෙ‍් වා!”යි කීවා ය.
6 ආබ්රම් ද සාරයිට උත්තර දමේින්, “මනේන, ඔබෙ‍්
වහල් කලේල, ඔබ ම ඈ බාරගන්න. ඔබ කැමැති
දයෙක් ඇයට කරන්නැ”යි කී ය. එවිට සාරයි, ඇයට
තදින් හිරිහැර කළෙනේ ඈ තම ස්වාමිදුව වතෙින්
පලා ගියා ය.
7 මසෙෙ‍් හාගර් පලා යද්දී ෂූර් දක්වා යන
මාර්ගයහෙි තිබනෙ පාළුකරයෙ‍් දිය උල්පතක් ළඟ දී
සමීඳාණන් වහන්සෙ‍්ගෙ‍් දූතයාට ඈ හමු වූවා ය.
8 ඔහු ද කතා කාෙට, “හාගර්, සාරයිගෙ‍් වහල්
කලේල, ඔබ ආවෙ‍් කාෙහනේ ද? යන්නෙ‍් කාෙහෙ‍්
දැ”යි ඇසී ය. ඈ උත්තර දමේින්, “මම මාගෙ‍් ස්වාමිදූ
වන සාරයි වතෙින් පලා යමි”යි කීවා ය. 9 එවිට
සමීඳාණන් වහන්සෙ‍්ගෙ‍් දූතයා ඇට කතා කාෙට,
“නුඹෙ‍් ස්වාමිදූ වතෙ ආපසු හැරී යන්න. ගාෙස්
ඇයට යටත් ව සිටින්නැ”යි කී ය. 10 ඔහු තවදුරටත්
මසෙෙ‍් කී ය.
q210 “බාෙහාෙ දරු පල මම ඔබට දමේ;
q210 ගණාන් නාෙකළ හැකි තරම් විපුල දරු පල
ඔබට දමේ.
11 ඔබ දරුවකු පිළිසිඳ ඇත;
q211 පුතකු බිහි කරනු ඇත;
q211 හිමිතුම ඔබ පීඩා හඬ ඇසූ බැවින් ඔහුට
ඉෂ්මායලේ යන නම තබන්න.
12 ඒ මිනිසා වල් මීමකේ.
q212 කාටත් ඔහු එරහෙි වෙ‍්වී.
q212 කවුරුත් ඔහුට එරහෙි වෙ‍්වී.
q212 නෑදැයින් හැරදමමින් කල් යවාවී.”
13 තවද, ඈ තමාට කතා කළ සමීඳාණන්
වහන්සෙ‍්ට, ‘ඔබ සියල්ල දකින දවේියාෙ ය.’ යන
අර්ථය ඇති එල්-රායෝි කියා නම් කළා ය. ඒ මන්ද,

‘මා දුටු තැනැන් වහන්සේ මාත් දැක මම තව ම
ජීවත් ව සිටිනවා නොවෙමේ දැ’යි ඈ තමාගනේ ම
ප්‍රශ්න කළ බැවිනි. 14 කාදේෂ් සහ බරෙදේ අතර
පිහිටි ඒ ළිඳට මා දක්නා ජීවමාන තැනැන්
වහන්සේගේ ළිඳ යන අර්ථ ඇති ‘බයෙර්-ලහයි-
රෝයි’ යන නම තබන ලද්දේ එබැවිනි. 15 ගලා 4:22
හාගර් ආබ්‍රම්ගනේ පුත්‍රයකු ලැබුවා ය. ආබ්‍රම්
ඔහුට ඉෂ්මායලේ යන නම තැබී ය. 16 මකෙල
ආබ්‍රම්ගේ වයස අවුරුදු අසූහයක් විය.

### ගිවිසුම් ලකුණ: චර්මඡේදනය

17 ආබ්‍රම් අවුරුදු අනූනවයක් ආයු වැළඳූ පසු
සමිඳාණන් වහන්සේ ඔහුට දර්ශනය වී: “මම
වනාහි සියලු බලැති දවේයන් වහන්සේ වමේ. නුඹ
දිවි ඇති තාක් මට කීකරු වී, නිදොස් ව සිටින්න,
2 මම මාගේ ගිවිසුම නුඹ සමඟ පිහිටුවමි; නුඹේ
පළෙපත ද බොහෝ සේ වැඩි කරන්නමේ”යි වදාළ
සේක.
3 එවිට ආබ්‍රම් පසඟ පිහිටුවා වැඳ වැටිණි.
දවේයන් වහන්සේ ද ඔහු සමඟ කතා කරමින්
මසෙේ වදාළ සේක: 4 “මා නුඹ සමඟ පිහිටුවන
මාගේ ගිවිසුම නම් මේ ය; නුඹ බොහෝ
ජාතීන්ගේ පියා වන්නහෙි ය. 5 රෝම 4:17 මින්පසු
නුඹේ නාමය ‘උතුම් පියා’ යන අර්ථය ඇති ආබ්‍රම්
නොව ‘ජාතීන්ගේ පියාණෝ’ යන අර්ථය ඇති
‘ආබ්‍රහම්’ යයි කියනු ලබන්නේ ය. මන්ද, මා නුඹ
බොහෝ ජාතීන්ගේ පියා කළ බැවිනි. 6 මම නුඹට
බොහෝ දරුසම්පත් දමේ; නුඹනේ ජාතීන්
උපදවන්නමේ; නුඹනේ රජවරු පහළ වන්නාහ.
7 ලූක් 1:55 “නුඹ සමඟ ද, නුඹනේ පසු පරපුරනේ
පරපුරට නුඹනේ පැවතනෙ නුඹේ පළෙපත සමඟ ද,
මාගේ ගිවිසුම පිහිටුවමි. මම නුඹේ ද, නුඹනේ පසු
පැවතනෙ නුඹේ පළෙපත්වල ද දවේයන් වහන්සේ
වන බවට මාගේ සදාතන ගිවිසුම පිහිටුවමි.
8 ක්‍රියා 7:5 නුඹ දැන් ආගන්තුක ව වසන මේ
දේශය-මේ මුළු කානාන් දේශය, නුඹට ද, නුඹනේ
පසු පැවතනෙ නුඹේ පළෙපතට ද මම සදහට ම
අයිති කොට දමේ. මම ද ඔවුන්ගේ දවේයන්
වහන්සේ වන්නමේ.”
9 දවේයන් වහන්සේ තවදුරටත් කතා කරමින්
මසෙේ වදාළ සේක: “නුඹ ද, නුඹනේ පසු පරපුරනේ
පරපුරට පැවතනෙ නුඹේ පළෙපත ද මාගේ ගිවිසුම
ආරක්ෂා කළ යුතු ය. 10 ක්‍රියා 7:8; රෝම 4:11 නුඹ
ද, නුඹේ පළෙපත ද සමඟ පිහිටුවන, නුඹ රැකගත
යුතු, මාගේ ගිවිසුම නම් මේ ය: එනම්, නුඹලාගේ
සියලු පිරිමි දරුවන් චර්මඡේදනය කළ යුතු ය.
11 නුඹලා නුඹලාගේ ලිංගාග්‍ර චර්මය ඡේදනය කළ
යුතු ය. මයෙ නුඹලාත් මාත් අතර පිහිටුවන
ගිවිසුමේ සංකේතය වන්නේ ය. 12 නුඹලාගේ
පළෙපත්වල සියලු පිරිමි දරුවන් දින අටක් වයස් වූ
කල ඔවුන් චර්මඡේදනය කළ යුතු ය. ඔව්හු නුඹේ
ගෘහයහෙි උපන්නෝ වුව ද, නුඹේ පළෙපතට අයත්
නැති, විදේශිකයකුෙගනේ මිලට ගත් අය වුව ද,
ඔවුන් චර්මඡේදනය කළ යුතු ය. 13 ගෘහයහෙි උපන්
තැනැත්තෝ වතේ වා; නුඹ මිල දී ගත් තැනැත්තෝ
වතේ වා; ඔවුන් චර්මඡේදනය කළ යුතු ය. මාගේ
ගිවිසුම සදාතන ගිවිසුමක් ලසෙ නුඹේ මාංසයහෙි
සලකුණු කරනු ලැබිය යුතු ය. 14 ලිංගාග්‍ර චර්මය
ඡේදනය නොකළ අචර්මඡේදිත පිරිමි දරුවා ඔහුගේ
පළෙපතින් නරෙපොදමනු ලැබේ. මන්ද, ඔහු මාගේ
ගිවිසුම කඩ කර ඇති බැවිනි.”
15 තවද, දවේයන් වහන්සේ ආබ්‍රහම්ට කතා
කොට, “නුඹේ භාර්යාව වන සාරයිට ‘නින්දා ලද්දී’
යන අර්ථය ඇති ‘සාරයි’ යන නම නොකියන්න.
මින්පසු ඇගේ නම ‘කාරුණික’ යන අර්ථය ඇති
‘සාරා’ වේ. 16 මම ඈට ද ආශීර්වාද කරමි. මම
ඇගනේ නුඹට පුත්‍රයකු දමේ. සැබැවින් මම ඈට
ආශීර්වාද කරන්නමේ. ඈ ද බොහෝ ජාතීන්ගේ
මාතාව වන්නී ය, ඇගේ පරපුරහෙි බොහෝ
ජාතීන්ගේ රජවරු පහළ වන්නෝ ය”යි වදාළ සේක.
17 එවිට ආබ්‍රහම් පසඟ පිහිටුවා වැඳ, මඳක් සිනහ
පාමින්, “සියක් අවුරුදු පිරුණු කනෙකුට දරුවකු
උපදිනු හැකි ද? අනූ අවුරුදු වයසැති, සාරා දරුවකු
ලබන්නී දැ”යි තමාට ම කියා ගත්තේ ය.
18 ආබ්‍රහම් ද දවේයන් වහන්සේට කතා කොට,
“ඔබ වහන්සේ ඉෂ්මායලේ රැක බලා දනෙ සේක්
වා!”යි කී ය.
19 එහතේ, උන් වහන්සේ උත්තර දමේන්,
“සැබැවින් ම නුඹේ බිරිඳ වන සාරා නුඹට පුතකු
ලබා දනේනී ය. ඔහුට ‘සිනාසීම’ යන අර්ථය ඇති
‘ඊසාක්’ යන නම දනේන, මම ද මාගේ ගිවිසුම,
සදාතන ගිවිසුමක් වශයනේ ඔහු සමඟ ද, ඔහුගනේ
පැවතනෙ පළෙපත සමඟ ද පිහිටුවමි. 20 ඉෂ්මායලේ
ගැන කළ නුඹේ ඉල්ලීමට මම සවන් දුනිමි. මනේන,
මම ඔහුට ද ආශීර්වාද කරමි; ඔහුට දරුසම්පත් දී,
ඔහුගනේ විශාල පළෙපතක් ඇති කරමි; ඔහුට දාව
රාජ කුමාරවරු දොළොස් දනෙකේ උපදින්නාහ. මම
ඔහුගේ පළෙපත විශාල ජාතියක් බවට පත් කරමි.
21 එහතේ, ලබන අවුරුද්දේ මේ කාලයේ දී සාරා
නුඹට උපදවන ඊසාක් සමඟ මම මාගේ ගිවිසුම
පිහිටුවමි”යි වදාළ සේක. 22 මසෙේ කතා කොට
නිම කළ පසු දවේයන් වහන්සේ ආබ්‍රහම් වතෙින්
ඉවත් ව ගිය සේක.
23 එවිට ආබ්‍රහම්, ඔහුගේ පුත් ඉෂ්මායලේ ද තම
ගෘහයේ උපන් සියලු දනො ද ඔහු මිල දී ගත් සියලු
දනො ද ඇතුළු තම ගෘහයේ සියලු පිරිමින් ද
රැගනෙ, එක ම දවසේ දී දවේයන් වහන්සේ කී
පරිදි ඔවුන් සියල්ලන් චර්මඡේදනය කළේ ය.
24 ආබ්‍රහම් චර්මඡේදනය කරනු ලබන විට ඔහුට
වයස අවුරුදු අනූනවයකි; 25 ඉෂ්මායලේට අවුරුදු
දහතුනකි. 26 ආබ්‍රහම් ද, ඔහුගේ පුත් ඉෂ්මායලේ
ද චර්මඡේදනය කරනු ලැබුවේ එක දවසේ ය.
27 ආබ්‍රහම් සමඟ තම ගෘහයේ උපන් පිරිමින් ද,
විදේශීන්ගනේ මිලට ගත් අය ද ඇතුළු සියලු පිරිමි
චර්මඡේදනය කරන ලදහ.

## ඊසාක්ගේ උපත

18 තවද, සමිඳාණන් වහන්සේ මම්රේහි
ආලෝන අරඹ ළඟ දී ආබ්‍රහම්ට දර්ශනය වූ
සේක. ඔහු දවාලේ තද අව්‍රස්නය ඇති වේලාවේ
කූඩාරමේ දොරකඩ වාඩි වී සිටියේ ය. 2 හෙබ්‍රෙ
13:2 ඔහු නෙත් ඔසවා බැලූ විට, පුදුමයකි! තමාට
නුදුරින් මිනිසුන් තිදෙනෙකු සිටිනු දිටී ය. ඔවුන් දුටු
විට ඔහු ඔවුන් හමුවීමට ගොස් හිස නමා, වැඳ
වැටුණේ ය. 3 මෙසේ ආචාර කොට, “ස්වාමීනි,
කරුණාකර, ඔබේ දාසයා ළඟ නැවතී යන මෙන්
ඉල්ලමි. 4 මට අවසරයි; මම වතුර ටිකක්
ගෙනෙන්නෙමි; ඔබ පාද සෝදාගෙන, ගස යට
විවේක සුවය විඳින්න. 5 මම ද කෑම ටිකක්
ගෙනෙන්නෙමි. එය වළඳා, ඔබේ ගත සිත
සනසාගෙන, මේ ගමන යන්න. ඔබේ දාසයාගේ
නිවසට ඔබ පැමිණියේ ඒ නිසා යැ”යි කී ය. ඔව්හු ද,
“ඔබ කී ලෙස කරන්නෙමු”යි පිළිතුරු දුන්හ.
6 ආබ්‍රහම් ද වහා කූඩාරම තුළට ගොස්, සාරාට
කතා කොට, “හොඳ ම පිටි ගෝණියක් ඉක්මනින්
ගෙන, එයින් ටිකක් අනා, උදුන මත තබා රොටි
පුළුස්සන්නැ”යි කී ය. 7 තවද, ඔහු ගව පට්ටියට දුව
ගොස්, කඩිම ළපටි වස්සෙකු ගෙන දාසයාට දුන්නේ
ය. දාසයා ද ඌ ඉක්මනින් පිළියෙළ කළේ ය.
8 තවද, ආබ්‍රහම්, වෙඬරු හා කිරි ද, පිසින ලද වහු
මස් ද ගෙන ආගන්තුකයන් ඉදිරියෙහි තැබී ය. ඔවුන්
ඒවා වළඳන විට ඔහු ද ගස යට ඔවුන්ට සමීප ව
සිටියේ ය.
9 එවිට ඔව්හු ආබ්‍රහම්ට කතා කොට, “නුඹේ
බිරිඳ සාරා කොහේ දැ”යි ඇසූ හ. “ඈ කූඩාරම තුළ
ය”යි ඔහු උත්තර දුනි. 10 රෝම 9:9 එවිට අමුත්තා
කතා කොට, “දරු උපතට නියම කාලය පැමිණි විට
සත්තකට ම මම නුඹ වෙත නොවරදවා ආපසු එමි.
එවිට නුඹේ භාර්යාව වන සාරා පුතෙකු ලබන්නී
ය”යි කී ය. අමුත්තාට පිටුපසින් පිහිටි, කූඩාරමේ
දොරකඩ සිටි සාරාට එය ඇසිණි.
11 ආබ්‍රහම් ද සාරා ද මහලු ව හොඳට ම වයස්
ගත ව සිටිය හ. සාරාට ඔසප් වීම ද නැවතී තිබිණි.
12 1 පේදු 3:6 එබැවින් සාරා, “දරු උපතක්
නොලැබිය හැකි මහලු වියට පැමිණි පසුත්, මා අඹු-
සැමි ප්‍රීතිය භුක්ති විඳින්න ද? ඇරත් මාගේ
සැමියාත් දැන් මහල්ලෙකි”යි කියාගනිමින් සිනාසුණා
ය. 13 එවිට සමිඳාණන් වහන්සේ ආබ්‍රහම්ට කතා
කොට, “මහලු වියට පැමිණි පසුත් හැබෑවට ම දරු
උපතක් ලැබිය හැකි දැ යි කියාගනිමින් සාරා
සිනාසුණේ ඇයි? 14 ලූක් 1:37 සමිඳාණන් වහන්සේට
බැරි දෙයක් ඇද් ද? දරු උපතට නියම කාලය පැමිණි
විට මම නුඹ වෙත ආපසු එමි. එවිට සාරා පුතෙකු
ලබන්නී ය”යි වදාළ සේක. 15 සාරා ද බිය වී, “මා
සිනාසුණේ නැතැ”යි කීවා ය. එහෙත්, අමුත්තා,
“නැහැ, නුඹ සිනාසුණා ය”යි කී ය.

## ආබ්‍රහම් සොදොම් නුවර ගැන මැදහත් වීම

16 අමුත්තෝ තිදෙන ද එතැනින් නික්ම සොදොම්
නුවර බලා පිටත් වූ හ. ආබ්‍රහම් ද මඟපෙන්වීමට
ඔවුන් සමඟ ගියේය. 17 සමිඳාණන් වහන්සේ: “මා
කරන්නට යන දෙය මම ආබ්‍රහම්ගෙන් සඟවම් ද?
18 මොහුගේ පෙළෙපත මහත් බලසම්පන්න ජාතියක්
වන්නේ ය. මිහි පිට සියලු ජාතීන්, මා ආබ්‍රහම්ට
ආශීර්වාද කළ ලෙස ඔවුන්ටත් ආශීර්වාද කරන මෙන්
මගෙන් අයැදිනු ඇත. 19 ආබ්‍රහම් දැහැමිකමින් හා
යුක්තියෙන් ජීවත් වෙමින් තමාගේ දරුවන්ට ද,
තමාගෙන් පැවතෙන පෙළෙපතට ද සමිඳාණන්
වහන්සේගේ මාර්ගය ආරක්ෂා කිරීමට අණ දෙන
පිණිස මම ඔහු වෙන් කොට ගතිමි. මෙලෙස
සමිඳාණන් වහන්සේ ආබ්‍රහම්ට පොරොන්දු වූ දේ
ඔහුට ඉටු කරන සේකැ”යි තමන්ට ම කියාගත්
සේක.
20 පසුව උන් වහන්සේ කතා කොට, “සොදොම්
හා ගොමොරා නුවරවලට විරුද්ධ ව නඟින චෝදනා
කෙතරම් දරුණු ද? ඔවුන්ගේ පාපය කෙතරම්
බරපතල ද? 21 එබැවින් මම දැන් බැස ගොස් මා
වෙත පමුණුවා ඇති චෝදනාවල ඇත්ත නැත්ත
විභාග කරමි”යි වදාළ සේක.
22 එවිට අමුත්තෝ එතැනින් නික්ම සොදොම් බලා
පිටත් වූ හ. එහෙත්, ආබ්‍රහම් සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි ම නැවතී සිටියේ ය. 23 ආබ්‍රහම් ද උන්
වහන්සේට සමීප වී, “සැබැවින් ම ඔබ අදමිටුන්
සමඟ දමිටුන් වත් වනසන සේක් ද? 24 හොඳයි!
නුවරෙහි දමිටුන් පණස්දෙනෙක් සිටිත් නම්, මේ
පණස්දෙන නිසා නුවර නොවනසා ඊට සමාව
නොදෙන සේක් ද? 25 අදමිටුන් සමඟ දමිටුන්
වනසාලීමේ අදහස ඔබෙන් දුරින් දුරු වේ වා!
අදමිටුන් සමඟ දමිටුන් එක ම මිම්මෙන් මැනීම
ඔබේ කැමැත්ත නො වේ වා! මුළු මිහි තලයේ
විනිශ්චයකාරයාණෝ සාධාරණ ලෙස යුක්තිය ඉටු
නොකරන සේක් දැ”යි ඇසී ය. 26 එවිට සමිඳාණන්
වහන්සේ උත්තර දෙමින්, “සොදොම් නුවරෙහි
දමිටුන් පණස්දෙනෙක් සිටිත් නම් ඔවුන් නිසා ඒ මුළු
නුවරට මම සමාව දෙන්නෙමි”යි වදාළ සේක.
27 ආබ්‍රහම් නැවතත් කතා කරමින්, “අළු හා
දූවිල්ල පමණක් වූ මා, මාගේ සමිඳාණන් වහන්සේ
සමඟ කතා කිරීමට තරම් නිර්භීත වීම ගැන මට
සමාවන්න. 28 හොඳයි! නුවරෙහි දමිටුන්
සතළිස්පස්දෙනෙක් සිටිත් නම් පස්දෙනෙකු අඩු නිසා
ඔබ මුළු නුවර වනසාලන සේක් දැ”යි ඇසී ය. “එහි
දමිටුන් සතළිස්පස්දෙනෙක් සිටිත් නම්, මම එය
නොවනසමි”යි උන් වහන්සේ වදාළ සේක.
29 ආබ්‍රහම් යළිත් කතා කරමින්, “ඇතැම් විට එහි
දමිටුන් සතළිස්දෙනෙකු සිටින්නට පුළුවනැ”යි කී ය.
“ඒ සතළිස්දෙනා නිසා මම නුවර නොවනසමි”යි උන්
වහන්සේ උත්තර දුන් සේක.

30 ආබ්‍රහම් නැවතත් කතා කරමින්, “ස්වාමීනි,
ඔබ මා සමඟ නොකිපෙන සේක් වා! මම නැවතත්
කතා කරමි. හොඳයි! එහි තිස්දෙනෙකු පමණක්
සිටින්නට පුළුවනැ”යි කී ය. “ඒ තිස්දෙනා නිසා මම
නුවර නොවනසමි”යි උන් වහන්සේ ද උත්තර දුන්
සේක.
31 ආබ්‍රහම් තවදුරටත් කතා කරමින්, “සමිඳාණන්
වහන්සේ සමඟ වාද කිරීමට ඉදිරිපත් වීම ගැන
කමා වන්න. හොඳයි! එහි දමිටුන් විසිදෙනෙකේ
පමණක් ඇතැ යි හිතමු”යි කී ය. “ඒ විසිදෙනා නිසා
මම නුවර නොවනසමි”යි උන් වහන්සේ පිළිතුරු දුන්
සේක.
32 එවිට ආබ්‍රහම් යළිත් මෙසේ කී ය: “සමිඳාණන්
වහන්සේ මා සමඟ නොකිපෙන සේක් වා! තව එක
වරක් පමණක් කතා කිරීමට මට අවසරයි. හොඳයි!
එහි දමිටුන් දහදෙනෙකේ පමණක් ඇතැ යි හිතමු.”
“ඒ දහදෙනා නිසා මම නුවර නොවනසාලමි”යි උන්
වහන්සේ උත්තර දුන් සේක.
33 ආබ්‍රහම් සමඟ කතා කොට නිම වූ පසු උන්
වහන්සේ යන්න ගිය සේක. ආබ්‍රහම් ද සිය
නිවසෙට හැරී ගියේය.

## සොදොම් නගරයේ පව්වූ ජීවිතය

19 දූතයන් දදෙනො සවස් කාලයේ සොදොම්
නුවරට පැමිණි විට නුවර වාසල් දොරකඩ
ලොත් වාඩි වී සිටියේ ය. ලොත් ඔවුන් දුටු විට,
නැඟිට ඔවුන් හමු වීමට ගොස්, හිස නමා වැඳ,
2 “මහතුනි, කරුණාකර, මේ ඔබේ දාසයාගේ
නිවසට ඇතුළු වන්න, පාද සෝදාගෙන අද රෑ මෙහි
නවතින්න. අලුයම නැඟිට ඔබ යන ගමන යන්නට
පුළුවනැ”යි කී ය. එහතේ ඔව්හු පිළිතුරු දමින්,
“නැත, මුළු රෑය ම අපි වීදියේ ගත කරන්නමෙු”යි කී
හ. 3 එහතේ, ඔහුගේ බලවත් පරෙුත්තය නිසා,
ඔව්හු ඔහු සමඟ නිවසට ඇතුළු වූ හ. ඔහු ද
නුමුහුන් රොටි පුළුස්සා, භෝජනයක් පිළියෙළ කළ
පසු ඔව්හු එය වැළඳූ හ.
4 එහතේ, අමුත්තන් නින්දට යන්නට පරෙ ඒ
සොදොම් නුවර සතර දිශාවනේ පැමිණි, බාල මහලු
සියල්ලෝ ගයෙ වට කර, 5 විනිසු 19:22-24 ලොත්ට
හඬගසමින්, “අද රෑ ඔබ වතෙ පැමිණි මිනිස්සු
කොහේ ද? අප ඔවුන් සමඟ කම් සැප විඳින පිණිස
ඔවුන් පිටතට ගනෙනේනැ”යි කී හ.
6 ලොත් ද දොර වසාගනෙ ඔවුන් වතෙ පිටතට
ආයේ ය. 7 ඔහු ඔවුන් අමතා, “මිතුරනේි, මම වැඳ
ඔබට කියමි: මවෙනි නපුරුකමක් නොකරන්න.
8 මනේන, කන්‍යා දූවරු දදෙනෙකේ මට සිටිති. මම
ඔවුන් ඔබ වතෙ ගනෙනේනමේ. ඔබ කැමැති පරිදි
ඔවුන් සමඟ හැසිරනේන. එහතේ, මේ මිනිසුන්ට
නම් කිසි නපුරක් නොකරන්න. ඒ මන්ද, මොවුහු
මාගේ නිවසට පැමිණි අමුත්තෝ ය”යි කී ය.
9 එහතේ ඔව්හු උත්තර දමින්, “මතෙනින් ඉවතට
යව. විජාතිකයකෙු මනේ ඇවිත් නතර වූ මිනිසා දැන්
ලොකු මිනිහකෙු වනේන යන හැටි! අර අයටත් වඩා
සැර ගිනිගඩේයක් අපි නුඹට දමු”යි කී හ. මසෙේ
කියා ඔව්හු ලොත් තදින් තල්ලු කරගනෙ අවුත්
දොර කැඩීමට කිට්ටු වූවෝ ය. 10 එහතේ, ඇතුළේ
සිටි අමුත්තෝ දෑත දිගු කර, ලොත් ගයෙ ඇතුළට
ඇද, දොර වසාදැමූ හ. 11 2 රාජා 6:18 පසුව, ඔව්හු
පිටත දොර ළඟ සිටි ලොකු කුඩා සියල්ලන්ගේ ඇස්
අන්ධ කළෝ ය. එයින් ඔවුන්ට දොර සොයාගැනීමට
නොහැකි විය.

## ලොත් සොදොම් නුවරින් පිටත් වීම

12 එවිට අමුත්තෝ දදෙනෙ ලොත්ට කතා කොට,
“ඔබට මෙහි වනෙ කවුරුත් ඇද් ද? ඔබේ බෑණාවරුන්
ද දරුදැරියන් ද මේ නුවර ඔබට සිටින සියල්ලන් ද
රැගනෙ මතෙනින් පිටත් ව යන්න. 13 අපි මේ නුවර
විනාශ කරන්නට යන්නමෙු. මෙහි වසන්නන්ට විරුද්ධ
ව සමිඳාණන් වහන්සේ වතෙ නැඟී ඇති චෝදනා
ඉතා දරුණු බැවින්, මයෙ විනාශ කිරීමට උන්
වහන්සේ අප එවූ සේකැ”යි කී හ. 14 ලොත් ද
පිටතට ඇවිත්, තමාගේ දූවරුන් සරණ පාවා ගන්නට
සිටි බෑණාවරුන්ට කතා කොට, “කඩිනමින් මතෙනින්
ඉවතට යන්න, සමිඳාණන් වහන්සේ මේ නුවර
විනාශ කිරීමට යන සේකැ”යි කී ය. එහතේ, එය
ඔහුගේ විහිළුවකැ යි බෑණාවරු සිතූ හ.
15 පහන් වූ කල දූතයෝ ලොත් ඉක්මන් කරවමින්,
“ඔබේ භාර්යාව ද මෙහි සිටින ඔබේ දූවරුන්
දදෙනො ද රැගනෙ හනික පිටතට යන්න. එසේ
නොකළොත් මේ නුවර වනසාලීමේ දී ඔබත් මැරී
යත හැකි ය”යි කී හ. 16 1 පේදු 2:7 එවිට ලොත්
අදිමදි කළෙේ ය. එහතේ, සමිඳාණන් වහන්සේ
ඔහුට අනුකම්පාව දැක්වූ සේක. අමුත්තෝ, ඔහු ද,
ඔහුගේ බිරිඳ ද, දූවරුන් ද අතින් අල්ලාගනෙ නිවසින්
පිටතට ගනෙ ගොස් නුවරින් පිටත නතර කළහ.
17 නුවරින් පිටතට ඔවුන් ගනෙ ගිය පසු, එක
දූතයකේ ඔවුන්ට කතා කොට, “දැන් පණ
බේරාගනෙ ගැළවී යන්න; ආපසු නොබලන්න.
මිටියාවතේ කිසි තැනක නොනවතින්න; නොමැරනෙ
පිණිස කඳුකරයට පලා යන්නැ”යි කී ය. 18 එහතේ,
ලොත් ඔවුන්ට උත්තර දමින්, “ස්වාමීනි, එසේ නො
වේ වා! 19 ඔබේ දාසයා වන මට අනුකම්පා
කරමින්, මාගේ පණ බේරාගැනීමට මට
මඟපනේවීමනේ ඔබ මට කරුණාව දක්වා ඇත.
එහතේ, කඳුකරයට පලායාම නම් මට නොහැකි ය.
මඟ දී කිසි යම් විපතකට අසු වී මා මැරනේන
පුළුවන. 20 බලන්න, අර නගරය, එය කුඩා වුවත්
පලායාමට මට එය කිට්ටු ය. ගැළවී එහි යන්නට
මට අවසරයි! ඒ කුඩා නගරයක් නොවේ ද? එහතේ,
මට එහි සුරක්ෂිත ව ඉන්නට පුළුවනැ”යි කී ය.
21 දූතයා ද ඔහුට පිළිතුරු දමින්, “මනේන, ඔබ මේ
කියන දේටත් මම එකඟ වමේ, ඔබේ කීම නිසා
මම ඒ නගරය විනාශ නොකරමි. 22 කඩිනම්
කරන්න. ගැළවීමට එහි දුවන්න. ඔබ එහි පැමිණනෙ
තකේ මට කිසිවක් කළ නොහැකි ය”යි කී ය.

මලෙසෙ 'සුළු' යන අර්ථයෙන් ඒ නගරයට ශෝවර්
යන නම කියන ලදී.

### සොදොම් සහ ගොමොරො නගර විනාශ කිරීම

23 ලොත් ශෝවර් නුවරට ඇතුළු වූ කල හිරු උදා
වී තිබිණි. 24 මතෙ 10:15; 11:23-24; ලූක් 10:12;
17:29; 2 පේදු 2:6; ජූද් 7 එවිට සමිඳාණන් වහන්සේ
සොදොම් සහ ගොමොරො නගර පිට අහසින්
ගෙන්දගම් සහ ගිනි වර්ෂා වහින්න සැලැස්වූ සේක.
25 උන් වහන්සේ ඒ නගර ද මුළු මිටියාවත ද නගර
වාසීන් සෑම දෙනා ද පොළොවේ ගස්කොළන් ද
විනාශ කරදැමූ සේක. 26 ලොත්ගේ භාර්යාව
ආපසුහැරී බැලුවා ය. එවේලේ ම ඈ ලුණු කණුවක්
වූවා ය.
27 ආබ්‍රහම් උදෑසනින් නැඟිට, කලින් සමිඳාණන්
වහන්සේ හමු වූ ස්ථානයට ගියේය. 28 ඔහු
සොදොම් සහ ගොමොරො දෙසෙ ද මුළු මිටියාවත
දෙසෙ ද බැලූ විට, පුදුමයෙන් පුදුමයකි! පොළොවෙන්
බුර බුරා නඟින දුම් කඳ, උදුනකින් දමන දුමක් මෙන්
දිටී ය. 29 එහෙත්, දෙවියන් වහන්සේ මිටියාවතේ
නගර විනාශ කරන විට උන් වහන්සේ ආබ්‍රහම්
සිහි කළ සේක. ලොත් විසූ නගර වනසන විට ඒ
විපතින් උන් වහන්සේ ලොත් ගළවා හැරිය සේක.

### මෝවබ්වරුන්ගේ සහ අම්මොන්වරුන්ගේ උත්පත්තිය

30 තවද, ලොත් ශෝවර්හි පදිංචි වීමට බිය වූයෙන්
ඉන් පිටත් වී සිය දූවරුන් දෙදෙනා සමඟ කඳුකරයට
ගොස් එක් ගුහාවක ජීවත් විය. 31 මෙසේ සිටිය දී,
දූවරුන් දෙදෙනාගෙන් වැඩිමහල් සොහොයුරිය, බාල
සොහොයුරියට කතා කොට; "අපේ පියා දැන් මහලු
ය. ලෝක සම්මත පිළිවෙළට අප සමඟ විවාහ වීමට
මිහි පිට මිනිසෙක් නැත. 32 එන්න, අපි පියාට මිදියුස
පොවා, පියාගේ පෙළපත රැකෙන පිණිස ඔහු සමඟ
සේවනයෙහි යෙදෙමු"යි කීවා ය. 33 එදින රූ තම
පියාට මිදියුස පොවා අක්කා පියා සමඟ සයනය
කළා ය. එහෙත්, ඈ කොතරම් වේලාවක් තමා
සමඟ එක් ව සිටියා ද කවර වේලාවක නැඟිට්ටා ද
කියා ඔහු නොදත්තේ ය.
34 පසු දින අක්කා නංගීට කතා කොට, "බලන්න,
ඊයේ රූ මම පියා සමඟ සේවනයෙහි යෙදුණෙමි;
අද රූටත් අපි ඔහුට මිදියුස පොවමු; පොවා, ඔබ
ඇතුළු වී අප පියාගේ පෙළපත රකිනු පිණිස ඔහු
සමඟ සේවනයෙහි යෙදෙන්නැ"යි කීවා ය. 35 එදින
රූ ද ඔව්හු පියාට මිදියුස පෙවූවෝ ය. පසුව නංගී ද
ඔහු සමඟ සේවනයෙහි යෙදුණා ය. එහෙත්, ඈ
කොතරම් වේලාවක් එක් ව සිටියා ද කවර
වේලාවක නැඟිට්ටා ද කියා ඔහු නොදත්තේ ය.
36 මෙසේ ඔහුගේ දූවරු දෙදෙනා ම පියාට දාව
දරුවන් පිළිසිඳගත්තාහ. 37 වැඩිමහල් සොහොයුරීට
පුත්‍රයෙක් උපන්නේ ය. ඈ ඔහුට මෝවබ් යන නම
තැබුවා ය. වර්තමාන මෝවබ්වරුන්ගේ ආදි පියා
මොහු ය. 38 බාල සොහොයුරියට ද පුත්‍රයෙක්
උපන්නේ ය. ඈ ඔහුට බෙන්-අම්මි යන නම තැබුවා
ය. තත්කාලීන අම්මොන්වරුන්ගේ ආදි පියා මොහු
ය.

### ආබ්‍රහම් සහ අබිමලෙක් රජ

20 ආබ්‍රහම් මම්රේ පෙදෙසින් නික්ම නේගෙබ්
පළාත බලා ගොස්, කාදෙෂ් සහ ෂූර් අතර
පිහිටි ගෙරාර්හි කලකට පදිංචි විය. 2 උත් 12:13;
26:7 තවද, ආබ්‍රහම් සිය බිරිඳ වන සාරා තමාගේ
සහෝදරිය යි කී බැවින් ගෙරාර්හි රජ වූ අබිමලෙක්
ඇය තමා වෙත ගෙන්වාගත්තේ ය. 3 එදින
රාත්‍රියේ දෙවියන් වහන්සේ ස්වප්නයකින්
අබිමලෙක්ට දර්ශනය වී, "නුඹ ගත් ස්ත්‍රිය
විවාහක ස්ත්‍රියක වන හෙයින් නුඹ මැරෙන්නෙහි
ය"යි වදාළ සේක. 4 එහෙත්, සාරාට සමීප නො වූ
අබිමලෙක් උන් වහන්සේට කතා කොට, "ස්වාමීනි,
ඔබ නිදොස් ජනයා පවා මරන සේක් ද? 5 ආබ්‍රහම්
පවා ඈ තමාගේ සහෝදරී යැයි කීවා නොවේ ද? ඈ
වුව ද ඔහු ඇගේ සහෝදරයා ය යි කීවා ය. මා
මෙය කළේ හෘදය සාක්ෂියට එකඟ ව අවංක
සිතකිනි"යි කී ය.
6 දෙවියන් වහන්සේ ද ස්වප්නයක් මඟින් ඔහුට
පිළිතුරු දෙමින්, "සැබැවින් ම ඔබ මෙය කළේ
අවංක සිතකින් බව මම දනිමි. මට විරුද්ධ ව පව්
කිරීමෙන් මම ද නුඹ වළක්වාලීමි; ඈට අත තැබීමට
මා නුඹට ඉඩ නුදුන්නේ ඒ නිසා ය. 7 එබැවින් දැන්
එම බිරිඳ සිය සැමියාට ආපසු බාර දෙන්න. ඔහු
දිවැසිවරයෙකු බැවින් ඔහු නුඹ උදෙසා යාච්ඤා කරනු
ඇත. නුඹ නොමැරෙන්නෙහි ය; එහෙත් නුඹ ඈ
ආපසු බාර නොදෙන්නෙහි නම්, නුඹත්, නුඹ සතු
සියල්ලත් නියත වශයෙන් ම මැරෙන බව
දැනගන්නැ"යි වදාළ සේක.
8 පසු දින අලුයම අබිමලෙක් අවදි ව, තම
සේවකයන්ට අඬගසා, ඔවුන් ඉදිරියෙහි මේ සියල්ල
කීවේ ය. ඔව්හු ද අතිශයින් බිය වූ හ. 9 එවිට
අබිමලෙක් ආබ්‍රහම් කැඳවා, "යසයි, ඔබ අපට කළ
දේ! මා පිටත්, මාගේ රාජ්‍යය පිටත් මේ සා
බරපතල පාපයක් පැවරීමට මා ඔබට කළ වැරැද්ද
කුමක් ද? ඔබ මට කර ඇත්තේ කොතරම්
නොකටයුතු දෙයක් ද? 10 මෙය කිරීමට ඔබ
පෙළඹුණේ කුමක් නිසා දැ"යි ඇසී ය. 11 ආබ්‍රහම්
උත්තර දෙමින්, "ඇත්තෙන් ම දෙවියන් වහන්සේට
බිය ඇති කෙනෙකු මෙහි නොසිටින බැවින් මාගේ
භාර්යාව ලබාගැනීමට ඔවුන් මා මරාදමනු ඇතැ යි
මම සිතුවෙමි. 12 එහෙත්, සැබැවින් ම ඈ මාගේ
සොහොයුරී ය. ඈ මගේ මවගේ නොව පියාගේ
දූව ය. මම ඈ සමඟ විවාහ වුණෙමි. 13 තවද,
දෙවියන් වහන්සේ මාගේ පියාගේ ගෘහයෙන් පිට වී
යන්නට මට සැලැසූ විට, 'නුඹට මා වෙනුවෙන්
පෙන්විය හැකි එක ම කරුණාව නම්, අප යන යන
තැන, 'ඔහු මාගේ සහෝදරයා ය'යි කියන මෙන් මම
ඇගෙන් ඉල්ලීමි' "යි කී ය.

14 එවිට අබිමෙලෙක් ආබ්‍රහම්ගේ බිරිඳ වන සාරා
ඔහුට ආපසු දුන්නේ ය. ඒ සමඟ ම බැටළුවන් ද
ගවමහිෂයන් ද දාසදාසීන් ද රැගෙන ඔහුට දුන්නේ
ය.
15 තවද අබිමෙලෙක් ඔහු අමතා, “මෙන්න, මාගේ
රට ඔබ ඉදිරියෙහි ය. ඔබ එහි කැමැති තැනකට
ගොස් පදිංචි වන්නැ”යි කී ය. 16 තවද, රජ තමෙ
සාරාට කතා කොට, “මෙන්න, මම ඔබේ
සහෝදරයාට රිදී මිල දහසක් දුනිමි. එය ඔබ සමඟ
සිටින සියල්ලන් ඉදිරියෙහි ඔබේ නිදොස් බව ඔප්පු
කිරීමට සාක්ෂියක් වේ වා. ඔබ වැරැද්දක් නොකළ
බව සියලු දෙන ම දැනගන්නෝ ය”යි කී ය.
17 ආබ්‍රහම් ද දෙවියන් වහන්සේට යච්ඤා
කළේ ය. උන් වහන්සේ ද අබිමෙලෙක් සුවපත් කළ
සේක; ඔහුගේ භාර්යාවට හා දාසීන්ට දරුසම්පත්
ලැබෙන සේ ඔවුන් සුවපත් කළ සේක. 18 එසේ
කළේ ආබ්‍රහම්ගේ භාර්යාව වූ සාරා නිසා
අබිමෙලෙක්ගේ ගෘහයෙහි සියලු ම කාන්තාවන් උන්
වහන්සේ වඳ බවට පත් කර තිබුණු හයිනි.

### ඊසාක්ගේ උපත

21 තවද, සමිඳාණන් වහන්සේ වදාළ පරිදි උන්
වහන්සේ සාරාට කරුණාව දැක්වූ සේක. උන්
වහන්සේ ඇට දුන් පොරොන්දුව ඉටු කළ සේක.
2 හෙබ්‍රෙ 11:11 සාරා ද පිළිසිඳගෙන, දෙවියන්
වහන්සේ වදාළ නියමිත කාලයෙහි, ආබ්‍රහම්ගේ
මහලු වයසෙහි ඔහුට දාව පුත්‍රයෙකු ලැබුවා ය.
3 ආබ්‍රහම්, තම පුත්‍රයාට ඊසාක් යන නම තැබී ය.
4 උත් 17:12; ක්‍රියා 7:8 ඊසාක් වන තම පුතුට දින
අටක් වූ කල දෙවියන් වහන්සේ අණ කළ පරිදි
ආබ්‍රහම් ඔහු චර්මඡේදනය කළේ ය. 5 ඊසාක්
උපදින විට ආබ්‍රහම්ට වයස අවුරුදු එකසියයකි.
6 සාරා ද කතා කරමින්, “දෙවියන් වහන්සේ මා
හිනැස්සූ සේක. මේ ගැන අසන සියල්ලන් මා සමඟ
සිනාසෙනු ඇත.
7 සාරා දරුවන්ට තනකිරි දෙති යි ආබ්‍රහම්ට
කියන්නට කවරෙක් සිතුවේ ද?
q27 ඔහුගේ මහලු වියෙහි දී මම ඔහුට පුතෙකු
දුනිමි”යි
7 කීවා ය. 8 දරුවා වැඩී කිරි වැරුවේ ය. කිරි වැරූ
දිනයෙහි ආබ්‍රහම් මංගල්‍යයක් පැවැත්විය.

### හාගර් සහ ඉෂ්මායලේ නෙරපාදැමීම

9 ආබ්‍රහම්ට දාව මිසර ජාතික හාගර්ගෙනේ ලැබූ
ඉෂ්මායලේ තම පුත්‍රයා වන ඊසාක්ට සරදම් කරනු
එක් දිනක් සාරා දුටුවා ය. 10 ගලා 4:29-30 එබැවින්
ඈ ආබ්‍රහම්ට කතා කොට, “මේ දාසියත්, ඇගේ
පුතාත් එලවා දමන්න, මේ දාසියගේ පුතු මාගේ
පුත්‍රයා වන ඊසාක් සමඟ උරුමකරු නොවිය යුතු
ය”යි කීවා ය. 11 ඉෂ්මායලේ ඔහුගේ පුත්‍රයා වන
බැවින්, මේ ඉල්ලීම නිසා ආබ්‍රහම් දැඩි සිත්
වේදනාවට පත් විය. 12 රෝම 9:7; හෙබ්‍රෙ 11:18
එහෙත්, දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට කතා කොට,
“නුඹ හාගර් හා ඉෂ්මායලේ නිසා කණගාටු
නොවන්න. සාරා නුඹට කී සියල්ලට ම සවන් දෙන්න.
ඒ මන්ද, නුඹේ පළෙපත ඇති වන්නේ ඊසාක් මඟින්
ය. 13 හාගර්ගේ පුත්‍රයා ද නුඹට දාව උපන් බැවින්
ඔහුට ද මම පළෙපතක් දෙන්නෙමි”යි වදාළ සේක.
14 පසු දින උදේ පාන්දරින් ආබ්‍රහම් නැඟිට රොටී
ද වතුර බෝතලයක් ද ගෙන හාගර්ට දී, දරුවා ද
ඇගේ කරේ තබා ඈ යන්න හැරියේ ය. ඈ ද නික්ම
ගොස් බයෙර්-ෂෙබා නම් පාළුකරයේ මංමුළා වී
ඇවිද්දා ය. 15 බෝතලයේ වතුර ඉවර වූ පසු ඈ
පඳුරක් යට දරුවා තබා 16 හී සැරයක් පමණ දුර
ගොස් වාඩි වූවා ය. “දරුවා මැරෙනවා මා බලා
ඉන්නේ කොහොම දැ”යි කියමින් ඈ ගොස් ඈතින්
හිඳගත්තා ය.දරුවා ද කෑගසමින් හැඬුවේ ය.
17 දරුවාගේ හඬ දෙවියන් වහන්සේට ඇසිණි. උන්
වහන්සේගේ දූතයා ස්වර්ගයේ සිට හාගර්ට කතා
කොට, “ඔබ කරදර වී ඉන්නේ කුමක්නිසා ද? බිය
නොවන්න. දරුවාගේ හැඬීම දෙවියන් වහන්සේට
ඇසී ඇත. 18 නැඟිටින්න, දරුවා ඔසවා අතට ගන්න,
මම ඔහුගෙනේ විශාල පළෙපතක් ඇති කරමි”යි කීවේ
ය. 19 දෙවියන් වහන්සේ ඇගේ නෙත් පැහැදූ විට ඈ
වතුර ඇති ළිඳක් දුටුවා ය. ඈ ද ගොස් භාජනය
පුරවා, දරුවාට බීමට දුන්නා ය. 20 දෙවියන් වහන්සේ
ද ඒ දරුවා සමඟ වූ සේක. ඔහු වැඩී, පාළුකරයේ
පදිංචි වී දුනුවායෙක් විය. 21 ඔහු පදිංචි වූ පාළුකරය
පාරාන් නම් විය. ඔහුගේ මව ඔහුට මිසර
දේශයෙනේ බිරිඳක ගෙන දුන්නා ය.

### ආබ්‍රහම් සහ අබිමෙලෙක් රජ අතර ගිවිසුම

22 ඒ කාලයෙහි අබිමෙලෙක් තමාගේ සෙනේපති
පීකොල් සමඟ විත්, ආබ්‍රහම්ට කතා කොට, “ඔබ
කරන සියල්ලෙහි දී දෙවියන් වහන්සේ ඔබ සමඟ
ය.උත් 26:26 23 එබැවින් ඔබ මට හෝ මාගේ දරු
මුණුබුරන්ට හෝ වංචා නොකරන බවටත්, මා ඔබට
දැක්වූ කරුණාව ලෙසෙ මටත්, ඔබ විදේශී ව වසන
මේ දේශයටත්, කරුණාව දක්වන බවටත් දෙවියන්
වහන්සේගේ නාමයෙනේ දැන් මෙහි දිවුරන්නැ”යි
කීවේ ය. 24 ආබ්‍රහම් ද පිළිතුරු දෙමින්, “මම
දිවුරමි”යි කී ය.
25 ඉන්පසු අබිමෙලෙක්ගේ සේවකයන්
බලහත්කාරයෙනේ පැහැරගත් එක්තරා ළිඳක් ගැන
ආබ්‍රහම් අබිමෙලෙක්ට පැමිණිලි කළේ ය.
26 එවිට අබිමෙලෙක් උත්තර දෙමින්, “මයෙ කළේ
කවුදැ යි මම නොදනිමි. ඔබ ද මේ ගැන මට
දැන්වූයේ නැත. මා මේ ගැන ඇසුවෙතේ අද ය”යි කී
ය. 27 ආබ්‍රහම් බැටළුවන් සහ ගවයන් රැගෙන
අබිමෙලෙක්ට දුන්නේ ය. මෙලෙසෙ දෙදෙන ගිවිසුමක්
පිහිටුවාගත්හ. 28 තවද, ආබ්‍රහම් රැළෙනේ බැටළු
දෙනුන් හත්දෙනෙකු වෙනේ කළේ ය. 29 අබිමෙලෙක්
එවිට ආබ්‍රහම්ට කතා කොට, “ඔබ මේ බැටළු
දෙනුන් හත්දෙනෙකු වෙනේ කළේ මන්දැ”යි විචාළේ
ය. 30 ඔහු ද උත්තර දෙමින්, “මේ ළිඳ මා විසින්
කැණුණු බවට සාක්ෂියක් වශයෙනේ මේ බැටළු

දනුන් හත්දනො මාගේ අතින් ඔබ බාරගන්න
පිණිස ය"යි කී ය. 31 එබැවින් ඒ ස්ථානයට ඔහු
'බයෙර්-ෂබො' යන නම තැබී ය. මන්ද, ඔවුන්
දදෙනො ම එතැන්හි දී දිවුරුම් දුන් බැවිනි.
32 මලෙසෙ ඔව්හු බයෙර්-ෂබොහි දී ගිවිසුමක්
කරගත්හ. පසුව අබීමලෙකේ ද ඔහුගේ සනේපති
පීකොල් ද නැඟිට, පිලිස්තිවරුන්ගේ දේශයට හැරී
ගියහ. 33 ආබ්රහම් ද බයෙර්-ෂබොහි ඒෂලේ නම්
ගසක් පැළ කොට එහි දී සදාතන දවේ සමිඳාණන්
වහන්සේගේ නාමය කියා යව්ඤා කළෙේ ය.
34 ඔහු බොහෝ කාලයක් පිලිස්තිවරුන්ගේ
දේශයහෙි පදිංචි ව සිටියේ ය.

### ඊසාක් පූජා කරනු ලැබීම

22 හබේරෙ 11:17-19 ඉනික්බිති දවේයන්
වහන්සේ ආබ්රහම් පරීක්ෂා කරමින්,
"ආබ්රහම්" කියා ඔහුට හඬගැසූ සේක. ඔහු ද,
"ස්වාමීනි මම මෙහි ය" කියා උත්තර දුනි. 2 2 වංශා
3:1 එවිට උන් වහන්සේ "නුඹ දැන්, නුඹේ පුත්රයා-
නුඹ ප්රේම කරන නුඹේ එක ම පුත්රයා වන
ඊසාක් ගෙන මොරියා දේශයට යන්න, එහි ගොස්,
මා නුඹට පනේවන කන්ද මත දවන යාග පූජාවක්
මනේ ඔහු මට ඔප්පු කරන්නැ"යි වදාළ සේක.
3 ආබ්රහම් උදෑසනින් නැඟිට, තම කොටළුවාට
සෑදලය යොදා, සේවකයන් දදෙනෙකු ද සිය පුත්
ඊසාක් ද රැගෙන, දවන යාග පූජාව සඳහා දර ද
පළාගෙන දවේයන් වහන්සේ වදාළ ස්ථානයට පිටත්
ව ගියේය. 4 තුන් වන දින, ආබ්රහම් හිස ඔසවා
බැලූ විට, දුරින් පිහිටි එම ස්ථානය දිටී ය. 5 එවිට
ඔහු සිය සේවකයන්ට කතා කොට, "කොටළුවා
සමඟ මෙහි නවතින්න, දරුවා ද මම ද අතනට
ගොස්, වැඳ පුදා ආපසු එන්නමෙු"යයි කීවේ ය.
6 මෙසේ කියා ආබ්රහම් දවන යාග පූජාවට
සූදානම් කළ දර සිය පුත් ඊසාක් මත තබා, තම
අතට ගින්දර ද පිහිය ද ගෙන, දදෙනො ම එක් ව
යන්න පිටත් වූ හ. 7 මෙසේ යද්දී, ඊසාක් තම පිය
ආබ්රහම්ට, "තාත්තේ" කියා ඇමතූ විට, "පුතා, මම
මෙහි ය"යි ඔහු පිළිතුරු දුනි. එවිට ඊසාක්, "තාත්තේ,
මෙහි දරත් ඇත; ගින්දරත් ඇත; නමුත් පූජාවට
බැටළු පැටවා කොහේ ද" කියා ඇසී ය. 8 එවිට
ආබ්රහම්, "පුතා, දවේයන් වහන්සේ ම පූජාව සඳහා
බැටළු පැටවා දනෙ සේකැ"යි පිළිතුරු දුනි. මලෙසෙ
දදෙනො ම ගමන් කළහ.
9 ජාකො 2:21 මෙසේ ගමන් කොට දවේයන්
වහන්සේ වදාළ ස්ථානයට ඔවුන් පැමිණි විට,
ආබ්රහම් එහි පූජාසනයක් ඉදි කර, පිළිවළෙට දර
කැලි තබා, තම පුත් ඊසාක් බැඳ, පූජාසනය පිට
තැනූ දර සෑය මත තැබී ය. 10 මෙසේ තබා ඔහු අත
දිගු කොට, සිය පුතු මරනු පිණිස පිහිය ගත්තේ ය.
11 එවිට සමිඳාණන් වහන්සේගේ දූතයා ස්වර්ගයේ
සිට, "ආබ්රහම්, ආබ්රහම්" කියා හඬගැසී ය. "මම
මෙහි සිටිමි"යි ඔහු කී ය. 12 එවිට දූතයා, "ළමයාට
අත නොගසන්න, ඔහුට කිසි අනතුරක් නොකරන්න,
ඔබේ පුත්රයා, ඔබේ එක ම පුත්රයා පූජා කිරීමට
තරම්, ඔබ දවේ ගරුබිය ඇත්තකෙු බව මට දැන්
පනෙේ ය"යි පැවසී ය. 13 එවිට ආබ්රහම් හිස
ඔසවා බැලූ විට ඔහුට පිටුපසින් අංවලින් පඳුරක
පැටලී සිටි බැටළුවකෙු දිටී ය. ආබ්රහම් ඌ වතෙ
ගොස් බැටළුවා ගෙන, සිය පුත්රයා වනෙුවට දවන
යාග පූජාවක් මනේ ඌ පූජා කළෙේ ය. 14 තවද,
ආබ්රහම් ඒ ස්ථානයට "ජෙහොවා-ජීරේ" යන නාමය
තැබී ය. මීට අද දක්වා "සමිඳාණන් වහන්සේගේ
කන්දේදී සපයන ලදී" යන කීම ව්යවහාර වේ.
15 සමිඳාණන් වහන්සේගේ දූතයා දෙ වන වරටත්
ස්වර්ගයේ සිට ආබ්රහම්ට කතා කොට, 16 හබේරෙ
6:13-14 "සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන
සේකැ යි මම දිවුරා කියමි. ඔබේ පුත්රයා, ඔබේ
එක ම පුත්රයා පවා මට බිලි පූජා කිරීමට කැමැති
වී මලෙසෙ ක්රියා කළ බැවින් 17 හබේරෙ 11:12 මම
බොහෝ සයෙින් ඔබට ආශීර්වාද කරමි. ඔබේ දරු
පළෙපත අහසේ තාරකා මනේ ද වරෙළේ වැලි
මනේ ද බහුල වන සේ වර්ධනය කරමි. ඔබේ
පළෙපත සතුරන් පරදා රට හිමි කරගන්නෝ ය.
18 ක්රියා 3:25 ඔබ මාගේ හඬට කීකරු වූ බැවින්,
මිහි පිට සියලු ජාතීහු ඔබ මඟින් ආසිරි ලබන්නෝ
ය"යි කී ය. 19 ආබ්රහම් පසු ව තම සේවකයන්
වතෙ ආපසු ගිය විට, ඔව්හු සියල්ලෝ ම නැඟිට
ගොස් බයෙර්-ෂබොවහෙි පදිංචි වූ හ.

### නාහෝර්ගේ පළෙපත

20 ඉනික්බිති තම සොහොයුරු නාහෝර්ගනේ
මිල්කා දරුවන් ලැබූ බව ආබ්රහම්ට දැනගන්නට
ලැබිණි. 21 ඔවුන් නම්, කුලුඳුල් පුත්රයා වූ ඌශ් ද,
ඔහුගේ සහෝදර වූ බුශ් ද, ආරම්ගේ පියා වූ
කමෙුවලේ ද, 22 කසෙදේ ද හශෝ ද, පිල්දාෂ් ද,
ජිද්ලප් ද බතෙුයලේ ද ය. 23 මිල්කා ආබ්රහම්ගේ
සහෝදර වූ නාහෝර්ගනේ මේ දරුවන් අටදනො
ලැබුවා ය. තවද, බතෙුයලේට දාව රබෙකො උපන්නා
ය. 24 නාහෝර්ගේ උපභාර්යාව වන රයෙුමා, තබො,
ගහම්, තහෂ් හා මයකා යන දරුවන් ලැබුවා ය.

### සාරාගේ අවමඟුල

23 සාරා අවුරුදු එකසිය විසිහතක් ආයු වළඳා
2 කානාන් දේශයේ හබේරොන් හවෙත්
කිර්යත්-අර්බාහි දී මියගියා ය. ආබ්රහම් ඈ ගැන
හඬා වැලපුණේ ය.
3 පසුව ඔහු ඇයගේ මළසිරුර ළඟින් නැඟිට,
හිත්තීවරුන්ට කතා කොට, 4 ක්රියා 7:16; හබේරෙ
11:9,13 "ආගන්තුකයකේ වූ මම ඔබ සමඟ ටික
කලකට වාසය කරන්නකේමි. මාගේ භාර්යාවගේ
මළසිරුර ගෙන ගොස් වැළලීම පිණිස මට ම උරුම
වන ලසෙ සොහොනේ පොළෙක් මට දනේනැ"යි කීවේ
ය. 5 හිත්තීවරු ඔහුට පිළිතුරු දමේන්, 6 "ස්වාමීනි
අපට සවන් දනෙු මැනවි. ඔබ අප අතර
බලසම්පන්න අධිපතියකේ. අපගේ සොහොනේ
ගවෙලින් ඉතා අගනා එකක ඔබේ මියගිය බිරිඳ

වළලනු මැනවි. අප අතරෙන් කිසිවකේ, මළ අය
වැළලීම සඳහා, තමන්ට හිමි සොහොන් පොළෙක්
ඔබට නො දී නොසිටින්නේ ය"යි කී හ.
7 ආබ්රහම් ද නැඟිට, දේශවාසී හිත්තීවරුන්
ඉදිරියෙහි හිස නමා ආචාර කොට, 8 ඔවුන් අමතා,
"මා විසින් මගේ මියගිය බිරිඳ වැළලීම පිණිස ඔබ
කැමැති නම්, මට සවන් දී, ශොහර් පුත්
එප්රොන්ගේ ඉඩමෙහි කෙළෙවර තිබෙන, 9 ඔහු සතු
මක්පේලාගේ ගුහාව මට දෙන ලෙස, මා වෙනුවෙන්,
කරුණාකර, ඔහුගෙන් ඉල්ලනු මැනවි. එහි වටිනාකම
අනුව සෑහෙන මිලකට සොහොන් බිම ඔබ
ඉදිරියෙහි හිමි කර දෙන ලෙස කියන්නැ"යි පැවසී ය.
10 එප්රොන්, හිත්තීවරුන් මැද වාඩි වී සිටියේ ය.
හිත්තීය ජාතික ඔහු හිත්තීවරුන්ට හා නුවර වාසල
දොරටුව ළඟ සිටි සියල්ලන්ට ඇසෙන පරිදි,
ආබ්රහම්ට කතා කොට, 11 "ස්වාමීනි, එසේ නො
වේ වා! මට සවන් දෙන්න, ඉඩම ද එහි ඇති ගුහාව
ද මම ඔබට දෙමි. මාගේ ජනයා ඉදිරිපිට මම එය
ඔබට දෙමි. ඔබේ මියගිය බිරිඳ එහි වළලනු
මැනවැ"යි කී ය. 12 ආබ්රහම් ද රටේ ජනයා
ඉදිරිපිට නැමී ආචාර කොට, 13 ඔවුන්ට ඇසෙන පරිදි
ඔහු එප්රොන්ට කතා කොට, "ඔබ මට එය දෙන්න
කැමැති නම්, කරුණාකර, මට සවන් දෙන්න, ඉඩමේ
වටිනාකමේ මුදල් මම දෙමි, එය බාරගන්න, මාගේ
මියගිය බිරිඳ මම එහි වළලමි"යි කීවේ ය. 14 එවිට
එප්රොන් ආබ්රහම්ට උත්තර දෙමින්, 15 "ස්වාමීනි,
මට සවන් දෙන්න. බිම් කැබැල්ලේ වටිනාකම රිදී
මිල හාරසියයක් පමණ ය. ඒක ඔබත් මාත් අතර
ලොකු දෙයක් ද? ඔබේ මියගිය බිරිඳ එහි භූමදාන
කරන්නැ"යි කී ය. 16 ආබ්රහම් ද ඔහුගේ කීමට
එකඟ විය. තවද, ඔහු හිත්තීවරුන්ට ඇසෙන පරිදි
එකලට වලංගු වෙළෙඳ මිල අනුව රිදී කාසි
හාරසියයක් එප්රොන්ට කිරා දුන්නේ ය.
17 මෙසේ මම්රේ ඉදිරියෙහි වූ මක්පේලාවෙහි
තිබුණු එප්රොන්ගේ ඉඩම හා එහි ගුහාව ද
ඉඩමෙහි හා එය වට කළ මායිම්වල තිබූ
ගස්කොළන් ද 18 හිත්තීවරුන් හා නුවර වාසල්
දොරටුවෙන් ඇතුළු වූ සියලු දෙනා ඉදිරිපිට
ආබ්රහම්ට සින්නක්කර කොට දෙන ලදී. 19 පසු ව
ආබ්රහම්, කානාන් දේශයේ හෙබ්රොන් එනම්,
මම්රේ ඉදිරියෙහි වූ මක්පේලාවෙහි ඉඩමේ තිබූ
ගුහාවෙහි සිය බිරිඳ වන සාරා භූමදාන කළේ ය.
20 මෙලෙස ඉඩම ද එහි ගුහාව ද හිත්තීවරුන් විසින්
ආබ්රහම්ට සොහොන් බිමක් ලෙස සින්නකර දෙන
ලදී.

## ඊසාක්ගේ විවාහය

24 ආබ්රහම් වයස්ගත මහල්ලෙක් විය;
සමිඳාණන් වහන්සේ ද හැම අතින් ම ඔහුට
ආශිර්වාද කොට තිබිණි. 2 ඔහු තමා සතු සියල්ල
බලාහදාගත් නිවසේ දෙටු මෙහෙකරුවාට කතා
කොට, "කරුණාකර, මාගේ කලවය යට නුඹ අත
තබන්න; 3 මා පදිංචි වී සිටින කානාන් දේශයේ
කාන්තාවන් අතුරින් භාර්යාවක මාගේ පුත්රයාට නුඹ
තෝරා නොගන්නා ලෙසත්, 4 මාගේ රටට, මාගේ
ඥාතීන් අතරට නුඹ ගොස්, මා පුත් ඊසාක්ට
භාර්යාවක ගන්නා ලෙසත්, ස්වර්ගයේ දෙවියන්
වහන්සේ ද, පොළොවේ දෙවියන් වහන්සේ ද වන
සමිඳාණන් වහන්සේගේ නාමයෙන් මම නුඹ
දිවුරවමි"යි කීවේ ය. 5 මෙහෙකරුවා එවිට ඔහුට
කියනුයේ, "සමහරවිට ඒ කාන්තාව මා සමඟ මේ
රටට ඒමට අකමැති වන්නට පුළුවන, එසේ
වුවහොත් ඔබ නික්ම ආ රටට ම, මා ඔබේ පුත්රයා
ගෙන යා යුතු දැ"යි ඇසී ය.
6 ආබ්රහම් උත්තර දෙමින්, "මාගේ පුතා නම්
නැවත එහි නොගෙන යෑමට තරයේ සිතට ගන්න.
7 මාගේ පියාගේ ගෘහයෙන් ද මාගේ ඥාතීන්ගේ
දේශයෙන් ද මා ගෙනා, මට දිවුරා වදාළ,
ස්වර්ගයෙහි දෙවි සමිඳාණන් වහන්සේ, 'මේ රට
නුඹේ පෙළපතට දෙන්නෙමි. නුඹට පෙරටු ව උන්
වහන්සේ සිය දූතයා යවන සේක. නුඹ ඒ රටින්
මාගේ පුත්රයාට භාර්යාවක ගත යුතු ය'යි මට
වදාළ සේක. 8 නුඹ කැටුව ඒමට ඒ කාන්තාව
අකමැති වුවහොත් මා ඉදිරියෙහි දුන් දිවුරුමෙන් නුඹ
නිදහස් ය. එහෙත්, නුඹ මා පුත්රයා නම්, එහි යළි
නොගෙන යා යුතුය"යි කීවේ ය. 9 එවිට
මෙහෙකරුවා තම ස්වාමියා වන ආබ්රහම්ගේ
කලවය යට අත තබමින් මේ කරුණ ගැන දිවුරුම්
දුන්නේ ය.
10 ඉන්පසු මෙහෙකරුවා, තම ස්වාමියාට අයත්
ඔටුවන්ගෙන් දස දෙනෙකු ද, ඔහු සතු සම්පතින්
ඉස්තරම් කොටසක් ද රැගෙන පිටත් ව ගොස්,
මෙසොපොතේමියේ නාහෝර් නම් නගරයට
පැමිණියේ ය. 11 ඔහු සවස් භාගයෙහි, කාන්තාවන්
වතුර ඇදීමට එන වේලාවෙහි, නුවරින් පිටත ළිඳ
ළඟ තමාගේ ඔටුවන් දණගැස්වී ය. 12 පසුව ඔහු
කතා කොට, "මාගේ ස්වාමියා වන ආබ්රහම්ගේ
දෙවි සමිඳාණන් වහන්සේ, මට කරුණාකර, මෙදින
මාගේ ගමන සාර්ථක කර මාගේ ස්වාමියාට
කරුණාව දක්වන සේක්වා. 13 මෙන්න, මම ළිඳ ළඟ
සිටිමි. මේ නගරයේ කාන්තාවන් දැන් එනු ඇත.
14 මම යම් තරුණියක අමතා, 'කරුණාකර, මට වතුර
ටිකක් බීමට ඔබේ කළය ඇල කරන්නැ'යි කියමි ද,
එවිට ඒ තරුණිය, 'බොන්න, මම ඔබේ ඔටුවන්ටත්
වතුර දෙමි'යි කියන්නී ද, අන්න ඒ තරුණිය ඔබගේ
දාසයා වන ඊසාක්ගේ බිරිඳ වීමට ඔබ නියම කළ
තැනැත්තිය වේ වා! මෙලෙස ඔබ මාගේ ස්වාමියාට
කරුණාව දැක්වූ බව මම දැනගන්නෙමි"යි කී ය.
15 ඔහු මෙසේ කියා නිම කරන්නටත් පෙර
රබෙකා නම් තරුණිය තම උරහිස මත කළය
තබාගෙන ආවා ය. ඈ ආබ්රහම්ගේ සොහොයුරු
වන නාහෝර්ගේ බිරිඳ වූ, මිල්කාගේ පුත්රයා වන
බෙතුයෙල්ගේ දුව ය. 16 ඒ තරුණිය රූමත් ය. ඈ
කන්යාංගනාවක්; කිසි ම පුරුෂයකු සමඟ
සම්බන්ධයක් නොවී ය. ඈ ළිඳට බැස කළය
පුරවාගෙන, උඩට පැමිණියා ය. 17 ආබ්රහම්ගේ
මෙහෙකරුවා ද ඈ වෙත දිව ගොස්, "කරුණාකර,

ඔබේ කළයෙන් වතුර ටිකක් බොන්න මට ඉඩ
හරින්නැ”යි කීවේ ය. 18 “භවතාණනි, බොන්නැ”යි
කියමින්, ඈ ඉක්මනින් කළය අතට ගෙන, ඔහුට
බොන්න දුන්නා ය. 19 මෙසේ ඈ ඔහුට බොන්න දුන්
පසු, “ඔබේ ඔටුවන්ටත් උවමනා තරම් වතුර ඇද
දමේ”යි කියා, 20 හනික වතුර කළය ගව ඔරුවේ
වත් කොට, ඔටුවන් සියල්ලන්ට ම වතුර ඇදීම
පිණිස නැවත ළිඳට දිව ගියා ය. 21 මෙහෙකරුවා ද
නිහඬ ව, ඈ දෙස බලාගත්ගමන්, ‘සමිඳාණන්
වහන්සේ තමාගේ ගමන සාර්ථක කළ සේක් ද
නැද්දැ’යි සිත සිතා සිටියේ ය.
22 ඔටුවන් වතුර බීවාට පසු ඔහු ඇගේ නාසයට
වටිනා රන් මුද්දක් ද, ඇගේ අත්වලට වටිනා රන්
වළලු දෙකක් ද දමා, 23 “ඔබ කාගේ දියණියන් දැ යි
කරුණාකර මට කියන්න; අපට නවාතැන් ගැනීමට
ඔබ පියාගේ ගෘහයෙහි ඉඩකඩ ඇත් දැ”යි ඇසී ය.
24 ඈ ද, “මම, නාහෝර් හා මිල්කාගේ පුත්
බෙතුයෙල්ගේ දුව වෙමි. 25 අප ළඟ සෑහෙන තරම්
පිදුරුත්, සිව්පාවුන්ට දෙන කෑමත්, නැවතීමට
ඉඩකඩත් ඇතැ”යි තවදුරටත් කීවා ය. 26 ඔහු ද හිස
නමා සමිඳාණන් වහන්සේට නමස්කාර කොට,
27 “මාගේ ස්වාමියා වන ආබ්‍රහම්ගේ දෙවි
සමිඳාණන් වහන්සේට ප්‍රශංසා වේ වා! උන්
වහන්සේ තම කරුණාවත්, යහපත්කමත් ඔහු
වෙතින් ඉවත් නොකළ සේක. ඔහුගේ
සහෝදරයාගේ ම ගෙදරට කෙළින් ම මා ගෙන ආ
සේකැ”යි කී ය.
28 තරුණිය දිව ගොස් සිදු වූ සියල්ල තම මවගේ
නිවාසයෙහි සිටි අයට කීවා ය. 29 රබෙකාට ලාබන්
නම් සහෝදරයෙක් විය. මොහු ළිඳ ළඟ සිටි මිනිසා
වෙත දිව ගියේ ය. 30 මොහු තම සොහොයුරිය වන
රබෙකා පැළඳ සිටි නාසාභරණය ද, ඇගේ අත්වලට
දැමූ වළලු ද දැක, “ඒ මිනිසා මට මෙසේ කතා
කළේ ය”යි ඈ පැවසූ වචන ඇසූ විගස ම
ආබ්‍රහම්ගේ මෙහෙකරුවා වෙත පැමිණියේ ය.
මෙහෙකරුවා ද ළිඳ ළඟ ඔටුවන් සමඟ සිටියේ ය.
31 එවිට ලාබන් ඔහු අමතමින්, “සමිඳාණන්
වහන්සේගෙන් ආසිරි ලත් භවතාණනි, පිටත
සිටින්නේ මන් ද? ඇතුළට එන්න. මම නිවාසය ද
ඔටුවන්ට ස්ථානයක් ද පිළියෙළ කෙළෙමි”යි කී ය.
32 මෙහෙකරුවා නිවසට ඇතුළු විය. එවිට ලාබන්
ඔටුවන්ගේ සෑදල ලිහා උන්ට පිදුරු ද කෑම ද දුන්නේ
ය. තවද, ඔහු ආබ්‍රහම්ගේ මෙහෙකරුවාට හා
පිරිසට පාද සේදීමට වතුර ද දුනි. 33 පසුව ඔහු
ඉදිරියෙහි කෑමට ආහාර තබන ලදී. එහෙත්,
මෙහෙකරුවා කතා කොට, “ආහාර වළඳන්නට
පළමුවෙනේ මා ආ කාරිය කියන්න ඕනෑ ය”යි දැන්වී
ය. ලාබන් ද, “එය කියන්නැ”යි පිළිතුරු දුනි.
34 එවිට ඔහු මෙසේ කී ය: “මම ආබ්‍රහම්ගේ
මෙහෙකරුවෙක්මි. 35 සමිඳාණන් වහන්සේ මාගේ
ස්වාමියාට ඉමහත් ලෙස ආශීර්වාද කළ සේක. ඔහු
දැන් ධනවතෙකි. උන් වහන්සේ ඔහුට එළු බැටළු
පට්ටි ද ගව පට්ටි ද රන් රිදී ද දැසිදසුන් ද ඔටුවන්
හා කොටළුවන් ද දී තිබේ. 36 තවද, මාගේ
ස්වාමියාගේ බිරිඳ වන සාරා ඇගේ මහලු වයසේ
මාගේ ස්වාමියාගෙනේ පුතකු ලැබුවා ය. ආබ්‍රහම්
තමන් සතු සියල්ල ඔහුට පවරා ඇත. 37 තවද,
ඔහුගේ පුතු හට තමා වසන කානාන් දේශයේ
කාන්තාවන් අතුරින් භාර්යාවක නො ගන්න ලෙසත්,
38 ඔහුගේ පියාගේ ගෙවැසියන් හා ඥාතීන් වෙත
ගොස් තම පුතු හට බිරිඳක නොගතහොත් මට
සාපයක් වන ලෙසත් ස්වාමියා ඉදිරියේ මාගෙනේ
දිවුරුම් ගත්තේ ය. 39 එවිට මම ඔහු අමතමින්, ‘ඒ
කාන්තාව මා කැටුව ඒමට අකමැති විය හැකි’යි
ආබ්‍රහම්ට කීවෙමි. 40 එවිට ඔහු මට කතා කොට,
‘මා සේවය කරන සමිඳාණන් වහන්සේ නුඹ කැටුව
සිය දූතයා එවමින් නුඹේ ගමන සාර්ථක කරන
සේක. නුඹ මාගේ පුතු හට මාගේ ඥාතීන් අතුරින්
හා මාගේ පියාගේ ගෘහයෙනේ බිරිඳක ගත යුතු ය.
41 නුඹ මාගේ ඥාතීන් වෙත පැමිණි විට මට දුන්
දිවුරුමෙනේ නුඹ නිදහස් ය, ඔව්හු නුඹට කාන්තාවක
නොදෙන්නෙනෝ නම් මට දුන් දිවුරුමෙනේ නුඹ නිදහස්
ය’යි කීවේ ය.
42 “මම ද අද ළිඳ ළඟට පැමිණ, මාගේ ස්වාමීන්
වන ආබ්‍රහම්ගේ දෙවි සමිඳාණන් වහන්ස, ඔබ මා
යන ගමන සාර්ථක කරන සේක් නම්, 43 මෙන්න,
මම ළිඳ ළඟ සිටිමි. දැන් කන්‍යාවක වතුර ඇදීමට
පැමිණි විට මම ඈ අමතා, ‘කරුණාකර, මට වතුර
ටිකක් බීමට ඔබේ කළය ඇල කරන්නැ’යි
කියන්නෙමි. 44 ‘ඔබත් බොන්න. ඔබේ ඔටුවන්ට ද
මම වතුර අදින්නෙමි’ කියා යම් කන්‍යාවක් මට
කියන්නී ද, අන්න, ඒ තැනැත්තී සමිඳාණන් වහන්සේ
මාගේ ස්වාමියාගේ පුත්‍රයා හට නියම කළ බිරිඳ
වේවා යි මම සිතුවෙමි.
45 “මලෙසෙ මා සිතූ විගස ම පුදුමයකි, රබෙකා
කළය උරහිස මත තබාගෙන පැමිණියා ය; ඈ ළිඳට
බැස ගොස් වතුර අදින විට, ‘කරුණාකර, මට වතුර
ටිකක් බොන්න ඉඩ හරින්නැ’යි කීවෙමි. 46 ඈ ද
කඩිනම් කොට කළය ඇලකර, ‘බොන්න, මම ඔබේ
ඔටුවන්ටත් වතුර දමේ’යි කීවා ය. මෙසේ මා
බීවායින් පසු ඈ මගේ ඔටුවන්ට ද වතුර දුන්නා ය.
47 පසුව මම, ‘ඔබ කාගේ දියණියන් දැ’යි ඇසීමි. ඈ
ද, ‘මම නාහෝර්ගෙනේ මිල්කා ලැබූ පුත්‍රයා වන
බෙතුයෙල්ගේ දුව වෙමි’යි කී විට, මම ඇගේ
නාසයට මුදුව ද අත්වලට වළලු ද දැමීමි. 48 ඉන්පසු
මම හිස නමා සමිඳාණන් වහන්සේට නමස්කාර
කළෙමි. ඇරත්, මාගේ ස්වාමියා වන ආබ්‍රහම්ගේ
පුත්‍රයාට ඔහුගේ සොහොයුරුගේ දියණිය ලැබෙන
පිණිස මා යන මඟ ගෙන ගිය, ඔහුගේ දෙවි
සමිඳාණන් වහන්සේට ප්‍රශංසා කළෙමි. 49 දැන්
ඔබ මාගේ ස්වාමියාට කරුණාව හා හිතවත්කම
දක්වන්න කැමැති නම් මට එසේ කියන්න; අකමැති
නම් එය ද කියන්න; එවිට කුමක් කළ යුතුදැ යි මම
තීරණය කරමි.”
50 එවිට ලාබන් සහ බෙතුයෙල් පිළිතුරු දෙමින්,
“මෙය සමිඳාණන් වහන්සේගෙනේ පැමිණි දෙයකි,
කැමැත්ත හෝ අකමැත්ත හෝ දැක්වීම අපට
නුපුළුවන. 51 මෙන්න, රබෙකා ඔබ ඉදිරියෙහි සිටියි.

ඈය රැගනෙ යන්න. සමිඳාණන් වහන්සේ වදාළ
ලසෙ ඈ ඔබ ස්වාමියාගේ පුත්රයාගේ භාර්යාව වේ
වා"යි කී හ. 52 ඔවුන්ගේ මේ වචන ඇසූ විට
ආබ්රහම්ගේ මහෙකෙරුවා පසඟ පිහිටුවා
සමිඳාණන් වහන්සේට නමස්කාර කළෙේ ය.
53 තවද, ඔහු රන් රිදී ආභරණ ද වස්ත්ර ද ගනෙ
රබෙකොට ප්රදානය කළෙේ ය. ඇගේ සහෝදරයාට
හා මවට ද වටිනා තෑගි බෝග දුන්නේ ය.
54 ආබ්රහම්ගේ මහෙකෙරුවා හා පිරිස කා බී මුළු
රාත්රිය එහි ගත කළහ. උදෑසන ඔවුන් නැඟිට් පසු
ඔහු කතා කොට, "මාගේ ස්වාමියා වතෙ යෑමට මට
අවසර දනේනැ"යි කී ය. 55 එවිට රබෙකොගේ
සහොයුරා සහ මව කතා කරමින්, "තරුණිය අප
සමඟ තව ටික දිනක්, අඩු ගානේ දහ දිනක් වත්
සිටියා වේ. පසු ව ඈට යත හැකිය"යි පිළිතුරු දුන්හ.
56 එහතේ, මහෙකෙරුවා ඔවුන් අමතා, "මා පමා
නොකරන්න. මාගේ ගමන සාර්ථක කළෙේ
සමිඳාණන් වහන්සේ ය. මාගේ ස්වාමියා වතෙ
යෑමට මට ඉඩ හරින්නැ"යි කී ය. 57 එවිට ඔව්හු,
"අපි තරුණිය කැඳවා ඇගනේ විමසමු"යි පිළිතුරු
දුන්හ. 58 ඔවුන් ද රබෙකො කැඳවා, "ඔබ මේ
මිනිසා කැටුව යන්න කැමැති දැ"යි ඇසූ විට, "කැමැති
ය"යි ඈ උත්තර දුන්නා ය. 59 ඉන්පසු ඔව්හු තම
සහොයුරිය වන රබෙකො ද ඇගේ කිරි මව ද
ආබ්රහම්ගේ මහෙකෙරුවා හා ඔහුගේ පිරිස ද
පිටත් කර යැවූ හ. 60 මසෙේ යන විට ඔව්හු
රබෙකොට ආසිරි පතමින්,
q260 "අප සහොයුරිය වන ඔබ, දහස් වර දසදහස්
ගණනකගේ මෑණියෝ වතේ වා!
q260 ඔබ පළෙපත සතුරන් පරදා වාසල් දොරටු
පැහැරගනිත් වා"යි
60 කී හ. 61 ඉන්පසු රබෙකො සහ ඇගේ
සේවිකාවෝ නැඟිට, ඔටුවන් පිට නැඟී ආබ්රහම්ගේ
මහෙකෙරු කැටුව ගියහ.
62 එකල නේගබේ ප්රදශේයෙහි පදිංචි ව සිටි
ඊසාක්, ලහයි-රොයි නම් ස්ථානයේ ළිඳ අසල
පාළුකරයට පැමිණ සිටියේ ය. 63 ඉර බැස යද්දී ඔහු
කතෙහෙි ඇවිදිමින්, හිස ඔසවා බලන විට ඔටුවන්
එනු දුටුවේ ය. 64 රබෙකො ද හිස ඔසවා බලන විට
ඊසාක් දුටුවා ය. එවිට ඈ ඔටුවා පිටින් බැස
65 මහෙකෙරුවා අමතා, "අප හමුවීමට කතෙහෙි සිට
ඇවිදගනෙ එන මේ මිනිසා කවරකේ දැ"යි විචාළා
ය. ඔහු ද පිළිතුරු දමේන්, "ඒ මාගේ ස්වාමියා ය"යි
කී ය. එවිට ඈ සළුව ගනෙ මුහුණ වසාගත්තා ය.
66 මහෙකෙරුවා තමා කළ සියල්ල ඊසාක්ට පැවසී ය.
67 ඊසාක් ද, රබෙකො තම මවගේ කූඩාරමට
ගනෙවිත්, ඇය සරණ පාවාගත්තේ ය. ඈ ඔහුගේ
බිරිඳ වූවා ය. ඔහු ඇයට ප්රේම කළෙේ ය. මලෙසෙ
ඊසාක් තම මවගේ මරණින් පසු සැනසීමට පත් විය.

### ආබ්රහම්ගනේ පැවතුණු තවත් පළෙපතක්
(1 වංශා 1:32-33)

25 ආබ්රහම් නැවත කතෙුරා නම් බිරිඳක සරණ
පාවාගත්තේ ය. 2 ඈ ඔහුගනේ සිම්රාම්,
ජොක්ෂාන්, මදොන්, මිදියාන්, ඉෂ්බාක් සහ ෂූවා
ලැබුවා ය. 3 ජොක්ෂාන්ට දාව ෂබො සහ දදොන්
ඉපදුණෝ ය. දදොන්ගේ පුත්රයෝ නම් අෂුරිම්,
ලටෙුෂිම් සහ ලයුෙම්මිම් ය. 4 මිදියාන්ගේ පුත්රයෝ
නම්, ඒපා, ඒපරේ, හනොක්, අබිදා සහ එල්දායා ද ය.
මේ සියල්ලෝ කතෙුරාගේ දරුවෝ ය.
5 ආබ්රහම් තමන් සතු සියල්ල ඊසාක්ට පවරා
දුන්නේ ය. 6 එහතේ, තම උපභාර්යාවන්ගේ පුතුන්ට
තෑගි දී, තමන් ජීවත් ව සිටිය දී ම, ඊසාක්ගනේ ඒ
පුත්රයන් ඈත් කොට, ඔවුන් නැගනෙහිරින් පිහිටි
පරෙදිග රටට යැව්වේ ය.

### ආබ්රහම්ගේ මරණය හා භූමදානය

7 ආබ්රහම් ජීවත් වූ මුළු කාලය අවුරුදු එකසිය
හැත්තෑපහක් විය. 8 මසෙේ ඔහු දිගායු වළඳා පූර්ණ
මහලු වයසේ දී අවසන් හුස්ම හළො මරණයට පත්
වූ පසු පවුලේ සුසාන භූමියේ තැන්පත් කරන ලදී.
9 එවිට ඊසාක් සහ ඉෂ්මායලේ වන ඔහුගේ
පුත්රයෝ මම්රේ ඉදිරියෙහි වූ හිත්තීය ජාතික
ශොහර්ගේ පුත් එප්රොන්ගේ ඉඩමහෙි පිහිටි
මක්පේලාගේ ගුහාවහෙි ඔහු භූමදානය කළහ.
10 උත් 23:3-16 යථෝක්ත ඉඩම ආබ්රහම්,
හිත්තීවරුන්ගනේ මිලට ගත් එකකි. එහි ආබ්රහම් ද
ඔහුගේ බිරිඳ වන සාරා ද භූමදාන කරනු ලැබූ හ.
11 ආබ්රහම්ගේ මරණින් පසු දවේයන් වහන්සේ
ඔහුගේ පුත් ඊසාක්ට ආශීර්වාද කළ සේක. ඊසාක් ද
ලහයි-රොයිහි ළිඳ අසල පදිංචි විය.

### ඉෂ්මායලේගේ පළෙපත
(1 වංශා 1:28-31)

12 පහත දක්වනුයේ ආබ්රහම්ගේ පුත්
ඉෂ්මායලේගේ පළෙපත ය; සාරාගේ සේවිකාව වන
මිසර ජාතික හාගර්, ආබ්රහම්ට දාව ඉෂ්මායලේ
ලැබුවා ය. 13 පළෙපත් අනුව ඉෂ්මායලේගේ
පුත්රයන්ගේ නාමාවලිය මසෙේ ය: ඉෂ්මායලේගේ
කුලදුලා නබොයොත් ය; ඉන්පසු කේදාර්,
අද්බයෙලේ, මිබ්සාම්, 14 මිෂ්මා, දූමා, මස්සා, 15 හදද්,
තේමා, ජතෙුර්, නාපීෂ් සහ කේදමො යන මොවුහු
ය. 16 මේ දැක්වූයේ ජනපද හා කඳවුරු අනුව
ඉෂ්මායලේගේ පුත්රයන්ගේ නාමාවලිය වේ.
මොවුහු ගෝත්ර දොළසක ගෝත්රපතීහු දොළසකි.
17 ඉෂ්මායලේ අවුරුදු එකසිය තිස්හතක් ආයු වළඳා,
අවසන් හුස්ම හළො මියගිය පසු පවුලේ සුසාන
භූමියේ තැන්පත් කරන ලදී. 18 ඔහුගනේ
පැවතනේනෝ හවිලාහි සිට අසිරියාවට යන මගහෙි
මිසර දශේයට පරෙදිගින් පිහිටි ෂූර් දක්වා වාසය
කළහ. ඔව්හු තම ඥාතීන්ගනේ ඈත් ව ජීවත් වූ හ.

### ඒසව් හා ජාකොබ්ගේ උපත

19 පහත දක්වනුයේ ආබ්‍රහම්ගේ පුත් ඊසාක්ගේ
පළපෙත ය. ආබ්‍රහම්ට දාව ඊසාක් ඉපදිණි.
20 මොහු පදන්-අරාම්හි අරමීය ජාතික බතුෙයලේගේ
දුව හා අරමීය ජාතික ලාබන්ගේ සොහොයුරිය ද
වන රබෙකො සිය බිරිඳ මනේ සරණපාවාගන්න
කල්හි ඔහුගේ වයස අවුරුදු සතළිසකි. 21 ඈ වඳ
ස්ත්‍රියක වූයනේ, ඔහු තම බිරිඳ උදසො බැගෑපත්
ලසෙ සමිඳාණන් වහන්සේ අයැදී ය. උන් වහන්සේ
ඔහුගේ ඉල්ලීමට සවන් දුන් සේක. රබෙකො
ගැබ්ගත්තා ය. 22 ඇගේ කුසහෙි හුන් දරුවන්
දඟලන්න ගත් විට, "තත්ත්වය මහෙමෙ නම් මා
ඉඳලා කුමකට දැ"යි කියමින්, ඕ සමිඳාණන්
වහන්සේගනේ විමසීමට ගියා ය. 23 රෝම 9:12
සමිඳාණන් වහන්සේ ඈට කතා කොට මසෙේ වදාළ
සේක:
q223 "ජාතීන් දකෙක් ඔබ කුස තුළ ඇත;
q223 දවෙර්ගයක සනෙඟක් ඔබ කුසනේ බදේී
නික්මතේ.
q223 එක සනෙඟක් අනිකට වඩා බලවත් වනේ;
q223 වැඩිමලා බාලයාට මහෙ කෙරනු ඇත."
24 ඇගේ ප්‍රසූත කාලය සම්පූර්ණ වූ විට, මනේන,
ඇගේ කුසහෙි නිඹුල් දරුවෝ සිටියහ.
25 පළමුවැන්නා උපන්නේ ය. ඔහු රතු පාට ය,
ඔහුගේ ඇඟ පුරා ම ලෝම වැස්මක් මනේ විය.
එබැවින් ඔහුට ඒසව් යන නම දනෙ ලදී. 26 ඉන්පසු
උපන්නේ ඔහුගේ සහෝදරයා ය. ඔහු තම අතින්
ඒසව්ගේ විලුඹ අල්ලාගනෙ සිටියේ ය. එබැවින්
ඔහුට ජාකොබ් යන නම දනෙ ලදී. රබෙකොට
මොවුන් ලැබනෙ විට ඊසාක්ගේ වයස අවුරුදු හැටකි.

### ඒසව් සිය ජන්ම උරුමය විකිණීම

27 දරුවෝ දදෙනෙ වැඩුණාහ. ඒසව් එළිමහනේ
වසන දක්ෂ දඩයම්කාරයකේ විය. ජාකොබ්
කූඩාරම්වල වසන නිශ්චල මිනිසකේ විය. 28 ඊසාක්,
ඒසව් ගනෙ මුව මස් කෑ හයෙින් ඔහුට වඩා කැමැති
විය; එහතේ රබෙකො වඩා කැමැති වූයේ ජාකොබ්ට
ය.
29 දිනක් ජාකොබ් ව්‍යංජනයක් පිළියළෙ කළේ ය.
එවිට ඒසව් බොහෝ විඩාවට පත් ව, කතෙහෙි සිට
පැමිණියේ ය. 30 ඔහු ජාකොබ්ට කතා කොට,
"කරුණාකර, ඔය රතු පාට ව්‍යංජනයනේ කෑමට මට
දනේන; බලන්න, මට හරි මහන්සි ය"යි කී ය. මේ
කරුණ නිසා ඔහුට ඒදොම් යන නම දනෙ ලදී.
31 එවිට ජාකොබ් ද, "එසේ නම් කුලුඳුල්කමේ
උරුමය අද දින මට විකුණන්නැ"යි කී ය. 32 එවිට
ඒසව් පිළිතුරු දමෙින්, "මම දැන් මරණාසන්න ව
සිටිමි. කුලුඳුල්කමේ උරුමයනේ මට කුමන වැඩක්
දැ"යි පැවසී ය. 33 හබේ‍රෙව් 12:16 ජාකොබ්, "එසේ
නම් අද මා ඉදිරියහෙි දිවුරන්නැ"යි කීවනේ, ඒසව්
ඔහු ඉදිරියහෙි දිවුරුවේ ය. මලෙසෙ ඒසව්
කුලුඳුල්කමේ උරුමය ජාකොබ්ට විකිණී ය.
34 ඉන්පසු ජාකොබ් රොටි සහ එලවළු ව්‍යංජනය
ඒසව්ට දුනි. ඔහු කා බී, නැඟිට යන්න ගියේය.
මසෙේ ඒසව් සිය කුලුඳුල්කමට හිමි උරුමය සුළු
කොට සැලකී ය.

### ඊසාක් මුහුණ පෑ ගැටළුව

26 එකල රටහෙි සාගතයක් විය. මයෙ
ආබ්‍රහම්ගේ කාලයහෙි වූ පළමු සාගතයට
පසු පැමිණි එකකි. ඊසාක්, එවිට ගරොර්හි
පිලිස්තිවරුන්ගේ රජු වූ අබිමලෙකේ වතෙ ගියේය.
2 සමිඳාණන් වහන්සේ ඔහුට දර්ශනය වී මසෙේ
වදාළ සේක:
q22 "මිසර දේශයට නොගොස්, ඔබට මා කියන
දේශයහෙි පදිංචි වන්න.
3 උත් 22:16-18 මඳ කලක් මරෙට වසන්න.
q23 මම ඔබ සමඟ සිටිමි, ඔබට ආසිරි දමේි;
q23 ඔබට ද ඔබ පරපුරට ද මේ මුළු දේශය මම
දමේි.
q23 මලෙසෙ ඔබ පිය ආබ්‍රහම් හට මා දිවුළ දිවුරුම
ඉටු කරමි.
4 අහසේ තරු මනේ, ඔබ පළෙපත මම වැඩි කරමි.
q24 මේ මුළු රට ඔබේ පළෙපතට මම දමේි.
q24 මිහි පිට සියලු ජාතීහු, ඔබ මඟින්, තමන්ට
ආශීර්වාද කරගන්නාහ.
5 එසේ වනුයේ, ආබ්‍රහම් මා හට කීකරු ව,
මාගේ අණපණත් ද මාගේ නීති ව්‍යවස්ථා ද පිළිපැදි
හයෙිනි."
6 ඊසාක් ගරොර්හි පදිංචි විය. 7 උත් 12:13; 20:2
එහි සිටි මිනිස්සු ඔහුගේ භාර්යාව ගැන ඔහුගනේ
විමසුවෝ ය. ඔහු ද, "ඈ මාගේ සහෝදරීය"යි කී ය.
"ඈ මගේ භාර්යාව ය"යි කීමට ඔහු බිය වූයේ,
රබෙකො රූමත් බැවින් ඈ නිසා 'ඔවුන් මා මරති'යි
සිතූ නිසා ය. 8 ඔහු එහි කාලයක් විසූ පසු,
පිලිස්තිවරුන්ගේ රජු වූ අබිමලෙකේ කවුළුවකින්
පිටත බැලූ විට, පුදුමයකි, ඊසාක් තම බිරිඳ වන
රබෙකොට පමේ කරනු දිටී ය. 9 අබිමලෙකේ ඊසාක්
කැඳවා, "නිසැක ව ම ඈ ඔබේ භාර්යාව ය; එසේ
නම්, 'ඈ මාගේ සහෝදරී ය'යි ඔබ කීවේ කසෙේ
දැ"යි ඇසී ය. ඊසාක් ඔහුට කතා කොට, "ඈ නිසා
මට මැරනේන වේ යයි සිතා මම එසේ කීවමේ"යි
පිළිතුරු දුනි. 10 එවිට අබිමලෙකේ, "ඔබ අපට කළ
මේ දේ කුමක් ද? සනෙඟගනේ කනෙකේ
ලහෙසියනේ ම ඈ සමඟ සේවනයහෙි යදෙනේනට
තිබිණි. එසේ වී නම්, ඔබ නිසා අප පිට වරද
පැමිණනේනට තිබුණේ ය"යි කීවේ ය. 11 තවද රජ
තමෙ, "යමකේ මේ මිනිසාට හෝ ඔහුගේ
භාර්යාවට හෝ අත තැබුවහොත් ඇත්තනේ ම ඔහු
මරනු ලැබේ ය" කියා නියෝගයක් සිය සනෙඟට
පැණ වී ය.
12 ඉන්පසු ඊසාක් එම රටහෙි ධාන්‍ය වපුරා එම
අවුරුද්දහෙි ම සිය ගුණයක් සරු අස්වැන්නක්
නළොගත්තේ ය. සමිඳාණන් වහන්සේ ඔහුට
ආශීර්වාද කළ සේක. 13 ඔහු ද ධනවතෙකු මනේ

සමෘද්ධ වී, මහා බලවතෙකු බවට පත් විය.
14 මන්ද, ඔහු සතු එළු බැටළු හා ගව පට්ටි වූ හ.
දැසිදස්හු ද විශාල පිරිසක් වූ හ. එහතේ පිලිස්තිවරු
ඔහුට ඊර්ෂ්යා කළහ. 15 එබැවින්, තම පියා වන
ආබ්රහම්ගේ කාලයේ දී ඔහුගේ මෙහෙකෙරුවන්
කැණූ ළිං සියල්ල ම පිලිස්තිවරු පස් පුරවා වසාදැමූ
හ.
16 අබිමලෙකේ ඊසාක් අමතා, “ඔබ අපට වඩා
බොහෝ බලසම්පන්න බැවින්, අප කරෙනේ ඉවත් ව
යන්නැ”යි කී ය. 17 ඊසාක් ද එතැනින් නික්ම,
ගරොර්හි මිටියාවතහෙි තම කඳවුර පිහිටුවා, එහි
පදිංචි විය. 18 ආබ්රහම්ගේ මරණින් පසු,
පිලිස්තිවරුන් ළිං සියල්ල වසාදමා තැබූ හයින්,
ඔහුගේ පියාගේ කාලයහෙි කණින ලද වතුර ළිං
ඊසාක් නැවත කැණී ය. තවද, තම පියා දුන්
නම්වලින් ම ඔහු ඒ ළිං හැඳින් වී ය.
19 ඊසාක්ගේ මෙහෙකෙරුවන් මිටියාවතේ ළිං කණින
විට ඔවුන්ට එහි දිය උල්පත් සහිත ළිඳක් සම්බ විය.
20 එහතේ ගරොර්හි ගොපල්ලෝ, “මේ වතුර
අපගේ ය” කියමින් ඊසාක්ගේ ගොපලුන් සමඟ
කලහ කළහ. ඔවුන් ඔහු සමඟ මලෙසෙ කලහ කළ
බැවින් ඒ ළිඳට ‘ඒසකේ’ යන නම ඔහු දුනි. 21 ඔවුන්
තවත් ළිඳක් කැණූ විට ගරොර්හි ගොපල්ලෝ ඒ
ගැන ද කලහ කළහ. එබැවින් ඊට ‘සිත්නා’යි නම
දුනි. 22 ඊසාක් ඉන්පසු එතැනින් නික්ම ගොස්, තවත්
ළිඳක් කැණී ය. එහතේ ඒ ගැන ඔවුන් කලහ
නොකළ බැවින් එය ‘රහෙොබොත්’ යන නමින්
හැඳින්විය. ළිඳ මසෙේ හඳුන්වා, “දැන් ඉතින්
සමිඳාණන් වහන්සේ අපට මේ රටහෙි ඉඩ කඩ දුන්
සේක. අපි මේ රටහෙි සමෘද්ධ වන්නමෝ”යි කී ය.
23 පසුව ඔහු එතැනින් පිටත් ව, බයෙර්-ෂබොවට
ගියේය. 24 එම රාත්රියහි ම සමිඳාණන් වහන්සේ
ඔහුට දර්ශනය වී මසෙේ වදාළ සේක;
q224 “නුඹ පිය ආබ්රහම්ගේ දවෙිඳාණෝ මම ය.
q224 බිය නොවන්න.
q224 නුඹ සමඟ ද මම සිටිමි;
q224 නුඹට ආසිරි දමේි.
q224 මාගේ දාසයා වන ආබ්රහම් නිසා,
q224 නුඹේ පළෙපත මම වැඩි වර්ධනය කරමි.”
25 ඊසාක් ද එහි පූජාසනයක් ඉදි කොට,
සමිඳාණන් වහන්සේගේ නාමය කියා යාච්ඤා
කළේ ය. තවද, එහි ඔහු තම කඳවුර පිහිටුවිය.
එම ස්ථානයහෙි ද ඊසාක්ගේ මෙහෙකෙරුවෝ ළිඳක්
කැණූ හ.

## ඊසාක් සහ අබිමලෙකේ රජ අතර ගිවිසුම

26 උත් 21:22 එකල ගරොර්හි සිට අබිමලෙකේ ද,
ඔහුගේ මිතුරකෙු වන අහුස්සත් ද, තම හමුදාවේ
සේනාධිපති වන ඵීකොල් ද ඊසාක් වතෙ ගියහ.
27 එවිට ඊසාක් ඔවුන් අමතා, “මට වරෛ කර, ඔබ
වතෙින් මා පලවා හැරිය ඔබ හැම දැන් මා වතෙ
එන්නේ මන්දැ”යි ඇසී ය. 28 ඔව්හු ද, “සමිඳාණන්
වහන්සේ ඔබ සමඟ වන බව අපට ඒකාන්තයනේ
ම පැහැදිලි ය. එබැවින්, ‘දැන් ඉතින් ඔබ හා අප
අතර දිවුරුමක් තිබිය යුතු ය. ඔබ සමඟ අපි,
ගිවිසුමක් කරගනිමු’යි කියා අපි කතා කරගත්තමෝ.
29 ඒ අනුව අප ඔබට අත වත් නොතබා, යහපත ම
පමණක් කර, සාමදානයනේ ඔබ පිටත් කර හැරිය
ලසෙ ඔබත් අපට හිරිහැර නොකළ යුතු ය. ඔබ
ඒකාන්තයනේ ම සමිඳාණන් වහන්සේගේ ආශීර්වාද
ලත් තැනැත්තා ය”යි කී හ. 30 ඊසාක් ඔවුන්ට මංගල
භෝජනයක් පිළියළෙ කළ පසු, ඔව්හු කා බී, 31 පසු
දින උදය වේලොසනින් නැඟිට තම තමන් අතර
දිවුරුම් දුන්හ. ඊසාක් ඔවුන් පිටත් කර හැරිය විට,
ඔව්හු සාමදානයනේ ඔහු වතෙින් නික්ම ගියහ.
32 ඒ දවසේ ම ඊසාක්ගේ මෙහෙකෙරුවෝ විත්
ඔවුන් කැණූ ළිඳක් ගැන කතා කරමින්, “අපට වතුර
සම්බ විය”යි ඔහුට කී හ. 33 ඔහු එය ෂිබා යන
නමින් හැඳින් වී ය. එබැවින් අද දක්වා ම ඒ
නගරයේ නම බයෙර්-ෂබො වේ.
34 තවද, ඒසව්ට වයස අවුරුදු සතළිසක් වූ කල
ඔහු හිත්තීය ජාතික බයෙේරිගේ දුව වන ජුඩිත් ද,
හිත්තීය ජාතික එලොන්ගේ දුව වන බසෙමත් ද
යන කාන්තාවන් සරණ පාවාගත්තේ ය. 35 මොවුහු
ඊසාක්ගේ හා රබෙකොගේ සිත් වේදනාවට හේතු
වූ හ.

## ජාකොබ් ඊසාක්ගනේ ආශීර්වාදය ලබාගැනීම

27 ඊසාක් මහලු වයසට පැමිණ, ඔහුගේ ඇස් ද
නොපනෙනෙ තරමට අඳුරු වී තිබිණි. ඔහු
තම දටෙු පුත් ඒසව් කැඳවා, “පුතා” කියා ඇමතී ය.
ඔහු ද, “ඇයි තාත්තේ” කියා උත්තර දුනි. 2 එවිට
ඔහු කතා කොට, “බලන්න, දැන් මම මහලු ය.
කවදා මා මැරේ දැ යි නො දනිමි. 3 එබැවින්
කරුණාකර නුඹ දැන් නුඹේ දඩයම් උපකරණ වන හී
කොපුව සහ දුන්න රැගනෙ වනයට ගොස්, මට මුව
මස් රැගනෙ, 4 මා ප්රිය කරන ප්රණීත ආහාරයක්
පිළියළෙ කර එය ගනෙැවිත්, මට කන්න දනේන.
එවිට මම මැරනේනට පරෙ නුඹට ආශීර්වාද
කරන්නමේ”යි කී ය.
5 ඊසාක් සිය පුත් ඒසව්ට මයෙ කියනු රබෙකො
අසාගනෙ සිටියා ය. ඒසව් ද දඩයම් කර මුව මස්
ගනෙනෙු පිණිස වනයට පිටත් විය. 6 එවිට
රබෙකො, තම පුත් ජාකොබ් අමතා, “මයෙ
අහගන්න, නුඹේ පියා නුඹ සහොදරයා ඒසව්ට
කතා කොට, 7 ‘මට මුව මස් ගනෙැවිත් ප්රණීත
ආහාරයක් පිස දනේන; මම ද එය අනුභව කොට මා
මැරනේනට පරෙ සමිඳාණන් වහන්සේ ඉදිරියහෙි මම
නුඹට ආශීර්වාද කරන්නමේ’යි කියනු මම අසාගනෙ
සිටියමේි. 8 එබැවින් මාගේ පුත්රයා, දැන් මා කියන
දේ කරන්න. 9 එළු රැළට ගොස්, හොඳ එළු පැටවුන්
දනේනකෙු මට ගනෙැවිත් දනේන; එවිට මම නුඹේ
පියා ප්රිය කරන ප්රණීත ආහාරයක් එයින් පිළියළෙ
කරමි. 10 නුඹ ද එය නුඹේ පියා වතෙ රැගනෙ
යන්න. එවිට ඔහු එය අනුභව කොට මැරනේනට
පරෙ, නුඹට ආශීර්වාද කරනු ඇතැ”යි කීවා ය.

11 එහෙත්, ජාකොබ් තම මව වන රෙබෙකාට
කතා කොට, “මාගේ සහෝදර ඒසව් ඇඟ පුරා
මයිල් ඇති මිනිසෙකි. එහෙත්, මම සිනිඳු හමක් ඇති
කෙනෙක්මි. 12 අහම්බෙන් වත් මාගේ පියා මා
අතගා බැලුවහොත්, මා කපටියකු මෙන් ඔහුට
පෙනෙන්න පුළුවන. එසේ වුණොත් ආශීර්වාදයක්
නොව මට ම සාපයක් කරගනු ඇතැ”යි කීවේ ය.
13 එවිට මව ඔහු අමතා, “පුතා, ඒ සාපය මා පිට
වැටේ වා! මට කීකරු ව, මා කී දේ සොයාගෙන
එන්නැ”යි කීවා ය. 14 ඔහු ද ගොස්, එළු පැටියන්
දෙන්නකු රැගෙන මව වෙත ගෙනාවේ ය. මව
ඔහුගේ පියා ප්‍රිය කරන ප්‍රණීත ආහාරයක් එයින්
පිසුවා ය. 15 පසුව ඈ, ගෙදර තිබුණු දෙටු පුත්
ඒසව්ගේ අගනා වස්ත්‍ර රැගෙන, තම බාල පුත්
ජාකොබ්ට හඳවා, 16 ඔහුගේ අත් දෙක හා
බෙල්ලේ සිනිඳු හරිය එළු හම්වලින් වසා, 17 ඈ පිසූ
ප්‍රණීත ආහාරය ද රොටි ද ඔහු අත තැබුවා ය.
18 ඔහු ද පියා වෙත පැමිණ, “තාත්තේ” කියා
ඇමතී ය. පියා ද, “ඇයි පුතා, උඹ කවරෙක් දැ”යි
ඇසී ය. 19 එවිට සිය පියාට ජාකොබ් උත්තර
දෙමින්, “මම ඔබේ කුලුඳුල් පුත් ඒසව් ය. ඔබ කී
පරිදි මම ඉටු කෙළෙමි. කරුණාකර, නැඟිට, වාඩි වී,
මාගේ මුව මස් අනුභව කරන්න. එවිට මට
ආශීර්වාද කරන්න ඔබට පුළුවනැ”යි කී ය. 20 ඊසාක්
තම පුතුට කතා කරමින්, “පුතා, උඹ මේවා මෙතරම්
ඉක්මනින් සොයාගත්තේ කෙසේ දැ”යි ඇසී ය.
“ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ මේවා මට
ඉක්මනින් ලැබෙන්නට සැලැසූ සේකැ”යි ඔහු උත්තර
දුනි.
21 එවිට ඊසාක් ජාකොබ් අමතමින්, “පුතා, උඹ
මේ මාගේ පුත්‍ර ඒසව් ද නැද්දැ යි අතගා බලන්න,
කරුණාකර මට කිට්ටු වෙන්නැ”යි කී ය. 22 ජාකොබ්
ද පියා සමීපයට කිට්ටු වූ විට පියා ඔහු අතගා
බලමින්, “කටහඬ නම් ජාකොබ්ගේ වගයි; අත්
දෙක නම් ඒසව්ගේ හැඩය”යි කී ය. 23 සිය
සොහොයුරුගේ අත් දෙක මෙන් ඔහුගේ අත්
ලොම්වලින් වැසී තිබුණ බැවින්, ඔහු තම පුතා
හැඳින නොගත්තේ ය. එබැවින් ඔහු ආශීර්වාද
කරන්නට අරඹමින්, 24 “නුඹ මාගේ පුත් ඒසව් ම
දැ”යි ඇසී ය. “එසේ ය”යි ඔහු ද උත්තර දුනි.
25 “එසේ නම් නුඹ පිළියෙළ කළ මුව මස් අනුභව
කොට මා නුඹට ආශීර්වාද කරනු පිණිස එය මා
ළඟට ගෙනෙන්නැ”යි ඊසාක් කී ය. ඔහු එය පියා
ළඟට ගෙනා විට පියා එය අනුභව කෙළේ ය. තවද
ජාකොබ් මිදියුස ද ගෙනා විට, පියා එය ද පානය
කෙළේ ය. 26 ඉන්පසු ඔහුගේ පියා වන ඊසාක්, ඔහු
අමතමින්, “පුතා, දැන් මා ළඟට කිට්ටු වී මා
සිඹින්නැ”යි ඉල්ලී ය. 27 හෙබ්‍රෙ 11:20 ඔහු ද ළඟට
කිට්ටු වී පියා සිඹගත්තේ ය. එවිට පියාට තම
පුත්‍රයාගේ වස්ත්‍රවල සුවඳ දැනී, ඔහුට මෙසේ
ආශීර්වාද කෙළේ ය:
q2 27 “බලන්න, මා පුතු සුවඳ, සමිඳුන් ආසිරි දුන්
කෙතෙක සුවඳ මෙනි.

28 අහසින් පිනි ද පොළොවේ සරු බව ද බොහෝ
ධාන්‍ය හා මිදියුස ද දෙවිඳාණෝ නුඹ හට දෙන
සේක් වා!
29 උත් 12:3 ජනයෝ නුඹට මෙහෙකෙරත් වා!
q2 29 ජාතීහු නුඹට හිස නමත් වා!
q2 29 සොහොයුරන්ගේ අධිපති නුඹ වේ වා!
q2 29 නුඹේ මවගේ පුත්තු නුඹට හිස නමත් වා!
q2 29 නුඹට සාප කරන්නාට සාප වේ වා!
q2 29 නුඹට ආසිරි දෙන්නාට ආසිරි ලැබේ වා!”
30 ඊසාක් ජාකොබ්ට ආශීර්වාද දී නිමවා, ඔහු තම
පියා වෙතින් යද්දී ම ඔහු සොහොයුරු වන ඒසව්
දඩයමෙන් හැරී ඇවිත් ගෙට ඇතුළු විය. 31 ඔහු රස
මුසු ආහාරයක් පිළියෙළ කොට, පියා වෙත
ගෙනැවිත්, ඔහුට කතා කරමින්, “තාත්තේ, නැඟිට,
මට ආශීර්වාද කරනු පිණිස ඔබ පුතු ගෙනා මුව මස්
අනුභව කරන්නැ”යි ඉල්ලී ය. 32 එවිට තම පියා වූ
ඊසාක් ඔහුට කතා කරමින්, “නුඹ කවරෙක් දැ”යි
ඇසූ විට, “මම ඔබේ කුලුඳුල් පුත් ඒසව් යැ”යි ඔහු
උත්තර දුනි.
33 ඊසාක් ද තදින් තැති ගෙන, ගැහි ගැහී, “එසේ
නම් දඩයම් කර මුව මස් මා වෙත ගෙනාවේ
කවරෙක් ද? නුඹ එන්න පෙර මම ඒ සියල්ලෙන්
අනුභව කොට ඔහුට ආශීර්වාද කෙළෙමි. සැබැවින්
ම ඒ ආශීර්වාදය ඔහු සමඟ පවතින්නේ යැ”යි කී ය.
34 පියාගේ මේ වචන ඇසූ විට ඒසව් ඉතා දැඩි සිත්
වේදනාවෙන් කෑගසා, හඬා වැලපී, පියාට කතා
කොට, “අනේ මගේ තාත්තේ, මට ආශීර්වාද
කරන්න, මටත් ආශීර්වාද කරන්නැ”යි කියා ඉල්ලී ය.
35 පියා ද උත්තර දෙමින්, “කූට උපායකින් නුඹේ
සහෝදරයා පැමිණ නුඹේ ආශීර්වාදය උදුරාගත්තේ
ය”යි කී ය.
36 උත් 25:29-34 එවිට ඒසව්, “ඔහු දෙවරක් ම මට
ලැබිය යුතු දේ උදුරාගත්තේ ඔහුගේ නම ජාකොබ්
නිසා වෙන්න ඇත. ඔහු කලින් මාගේ කුලුඳුල්කමේ
උරුමය ගත්තේ ය. මෙන්න, දැන් මාගේ
ආශීර්වාදයත් උදුරාගත්තේ ය. ඔබ මටත්
ආශීර්වාදයක් ඉතිරි කර නැද්දැ”යි ඇසී ය.
37 හෙබ්‍රෙ 12:17 ඊසාක් ද පිළිතුරු දෙමින් ඔහුට
කියනුයේ, “බලන්න, මම ජාකොබ් නුඹේ අධිපතියා
කෙළෙමි, ඔහුගේ සියලු සහෝදරයන් සේවකයන්
කොට මම ඔහුට දුනිමි. ධාන්‍යයෙන් හා මිදියුසින්
මම ඔහු සමෘද්ධ කෙළෙමි. මා පුත්‍රය, දැන් මා
නුඹට කුමක් කරන්න දැ”යි ඇසී ය. 38 ඒසව් ද ඔහුට
පිළිතුරු දෙමින්, “තාත්තේ, ඔබට ඇත්තේ එක ම
ආශීර්වාදයක් පමණක් ද? අනේ තාත්තේ, මටත්,
මේ මටත්, ආශීර්වාද කරන්නැ”යි ඉල්ලා, මහ හඬින්
කෑගසා හැඬී ය. 39 හෙබ්‍රෙ 11:20 එවිට ඔහුගේ
පියා වන ඊසාක් උත්තර දෙමින් මෙසේ කීවේ ය:
q2 39 “මේ බලන්න, පොළොවේ පලදාව ද, අහසේ
පිනි ද නුඹේ ගෙවතුවලින් තොර වේ.
40 උත් 36:8; 2 රාජා 8:20 කඩුවෙන් නුඹ ජීවත්
වන්නෙහි ය.
q2 40 සොහොයුරු හට මෙහෙ කරන්නෙහි ය.

q2 40 එහෙත් නුඹ ඔහු යටත් කළ විට ඔහුගේ
වියගස නුඹේ කරින් ගසාදමනු ඇත.”
41 තම පියා ජාකොබ්ට දුන් ආශීර්වාදය නිසා ඒසව්
ජාකොබ්ට වෛරෙ බැන්දේ ය. “මාගේ පියාණන් ගැන
වැලපෙනෙ දවස් දැන් ආසන්න ය. එවිට මම මාගේ
සහොහොයුරු ජාකොබ් මරන්නෙමි”යි ඔහු තමාට ම
කියාගත්තේ ය.
42 දෙටු පුත් ඒසව්ගේ මේ වචන රබෙකොට
දන්වන ලදින් ඈ පණිවුයක් යවා, තම බාල පුත්
ජාකොබ් කැඳවා, “මෙන්න, නුඹේ සහොහොයුරු ඒසව්
නුඹ මරා, නුඹනේ පළිගන්න අදහස් කරයි.
43 එබැවින් දැන් ඉතින් පුතේ, නැඟිට හාරාන්හි
මාගේ සහෝදර ලාබන් වෙත පලායන්න,
44 පලාගොස්, නුඹ සහොහොයුරුගේ දරුණු කෝපය
පහ වී, 45 ඔහුගේ කෝපාග්නිය නිවී, නුඹ ඔහුට
කළ දේ අමතක වන තුරු මාගේ සහෝදරයා සමඟ
ටික කලක් නවතින්න. පසුව මම නුඹට පණිවුඩයක්
එවා, එහෙනේ නුඹ ගෙන්වාගන්නෙමි. එක දවසේ ම
මා නුඹලා දදෙනො ම නැති කරගන්නේ කුමට දැ”යි
කීවා ය.

## ජාකොබ් ලාබන් වෙත යෑම

46 රබෙකො ඊසාක්ට කතා කොට, “හතේගේ
දූවරුන් නිසා මට ජීවිතය එපා වී තිබේ. ජාකොබ් ද
මේ රටේ ස්ත්රීන් වැනි, හතේගේ දූවරුන්ගනේ
කාන්තාවක සරණ පාවාගත්තොත් මට මාගේ
ජීවිතයනේ මොන වැඩක්දැ”යි කීවා ය.
28 ඊසාක් ද, ජාකොබ් කැඳවා, ඔහුට ආශීර්වාද
කොට අණ කරමින්, “නුඹ කානානිය
ස්ත්රීන්ගනේ භාර්යාවක සරණ පාවා නොගත යුතු
ය. 2 නැඟිට, මසෙොපොතමේියාවේ නුඹේ මවගේ
පියා වන බතුෙයලේගේ ගදෙරට යන්න; එහි ගොස්
නුඹේ මවගේ සහෝදර වූ ලාබන්ගේ දූවරුන්ගනේ
භාර්යාවක සරණ පාවාගන්න; 3 සියලු බලැති
දවෙියන් වහන්සේ නුඹට ආශීර්වාද කොට, නුඹ
සමෘද්ධ කර, නුඹ ජාතීන් සමූහයක් වන පිණිස, උන්
වහන්සේ නුඹ වැඩි වර්ධනය කරන සේක් වා!
4 උත් 17:4-8තවද, උන් වහන්සේ ආබ්රහම්ට දුන්,
නුඹ දැන් විදශේිකයකෙු ව වසන රට, නුඹට උරුම
වන පිණිස, ආබ්රහම්ගේ ආශීර්වාදය නුඹටත් නුඹේ
පළෙපෙතටත් දානය කරන සේක් වා”යි කී ය.
5 මලෙසෙ කියා, ඊසාක් ජාකොබ් පිටත් කොට
හැරියේ ය. ඔහු මසෙොපොතමේියාවේ අරමීය
ජාතික බතුෙයලේගේ පුත් ලාබන් වෙත ගියේය.
ලාබන්, ජාකොබ්ගේ හා ඒසව්ගේ මව වන
රබෙකොගේ සහෝදරයා ය.
6 ඊසාක් ජාකොබ්ට ආශීර්වාද කොට,
මසෙොපොතමේියාවනේ බිරිඳක සරණ පාවාගනු
පිණිස එහි යැවූ බව ද, ඔහු ආශීර්වාද කරද්දී,
“කානානිය ස්ත්රීන්ගනේ බිරිඳක පාවා නොගත යුතු
ය”යි ඔහුට අණ කළ බව ද, 7 ජාකොබ්, පියාට හා
මවට කීකරු ව මසෙොපොතමේියාවට ගිය බව ද
ඒසව් දිටී ය. 8 මසෙේ ඒසව් තම පිය ඊසාක්ට,
කානානිය කාන්තාවන් රිසි නොවූ බව තේරුම්ගත්
විට 9 ඔහු ඉෂ්මායලේ වෙත ගොස්, තමාට සිටි
භාර්යාවන්ට අමතර ව, ආබ්රහම් පුත්
ඉෂ්මායලේගේ දූව වන නබොයොත්ගේ සහෝදරී
මහලත් ද, තම භාර්යාව වශයනේ සරණ
පාවාගත්තේ ය.

## ජාකොබ් දුටු සිහිනය

10 ජාකොබ් බයෙර්-ෂබොයනේ නික්ම හාරාන් බලා
ගියේය. 11 ඔහු එක්තරා ස්ථානයකට පැමිණ, ඉර
බැස ගිය හයෙින්, මුළු රාත්රිය ම එහි ගත කළෙේ
ය. තවද, ඔහු එතැනින් ගලක් රැගනෙ, එය මත හිස
තබාගනෙ නිදන්නට විය. 12 ජොහ 1:51 එවිට ඔහු
සිහිනයක් දිටී ය. පුදුමයකි! පොළොවෙහි තබන ලද
ඉණිමඟකි. එහි මුදුන අහස දක්වා විය. මෙන්න,
දවෙියන් වහන්සේගේ දූතයෝ එහි නඟිමින් ද
බසිමින් ද සිටියෝ ය. 13 උත් 13:14-15 සමිඳාණන්
වහන්සේ එයට ඉහළින් සිට, “මම වනාහි නුඹේ
පියා වූ ආබ්රහම්ගේ දවෙියන් වහන්සේ ද
ඊසාක්ගේ දවෙියන් වහන්සේ ද වන සමිඳාණන්
වහන්සේ වමේ. නුඹ සැතපී සිටින දේශය මම
නුඹටත්, නුඹේ පළෙපෙතටත් දනේනමේ. 14 උත් 12:3;
22:18 තවද, නුඹේ පළෙපෙත පොළොවේ දූවිලි මනේ
වැඩි වී, උතුරු, දකුණු, බටහිර, නැගනෙහිර දිශාවල
පැතිර යන්නේ ය. මිහි පිට සියලු ජාතීහු නුඹ හා
නුඹේ පළෙපෙත මඟින් තමන් ආශීර්වාද කරගන්නෝ
ය. 15 මෙන්න, මම ද නුඹ සමඟ සිටිමි. නුඹ යන
සියලු තැන්හි මම නුඹ රැක බලාගනෙ මමෙ
දේශයට ම නුඹ නැවත ගනෙනේනමේ. මන්ද, මා
නුඹට කී දේ ඉටු කරන තුරු මම නුඹ අත්
නොහරින්නමේ”යි වදාළ සේක. 16 ජාකොබ්
නින්දනේ අවදි ව, “සැබැවින් ම සමිඳාණන් වහන්සේ
මමෙ ස්ථානයෙහි වැඩ සිටින සේක. එහෙත් මම
එය නොදැන සිටියමේ”යි කී ය. 17 ඔහු බිය වී, “මේ
ස්ථානය කතෙරම් බියකරු ද? මයෙ අනකෙක් නොව
දවෙියන් වහන්සේගේ ගෘහයකි; මයෙ ස්වර්ගයේ
දොරටුව ය”යි පැවසී ය.
18 ජාකොබ් අලුයම නැඟිට, තම හිසට තැබූ ගල
ගනෙ, සිහිවටනයක් කොට එය සිටුවා, එහි මුදුනේ
තලේ වත් කළෙේ ය. 19 තවද, ඔහු ඒ ස්ථානයට
දවෙියන් වහන්සේගේ ගෘහය යන අර්ථය ඇති
බතෙලේ යයි නම් කළෙේ ය. එහෙත් ඒ නගරයට
ඊට කලින් තිබූ නම ලූස් ය. 20 ඔහු භාරයක් ඔප්පු
කරමින්, “දවෙියන් වහන්සේ මා සමඟ වැඩසිට,
මසෙේ මා යන මඟ ආරක්ෂා කර, මට කන්නට
ආහාර ද අඳින්නට වස්ත්ර ද දනෙ සේක් නම්,
21 අනතුරුක් නොමැති ව මාගේ පියාගේ ගෘහයට
මට ආපසු යන්න සලස්වන සේක් නම්, සමිඳාණන්
වහන්සේ මාගේ දවෙියන් වහන්සේ වන සේක.
22 තවද, සිහිවටනයක් මනේ මා සිටවූ මේ ගල
දවෙියන් වහන්සේගේ ගෘහය වන්නේ ය. ඔබ මට
දනෙ සියල්ලනේ සැබැවින් ම මම ඔබට දසයනේ
කොටසක් දනේනමේ”යි කී ය.

## ජාකොබ් ලාබන්ගේ නිවසට පැමිණීම

29 ජාකොබ් ගමන් කොට පෙරදිග ජනයාගේ
දේශයට පැමිණියේ ය. 2 එවිට ඔහු බැලූ
කල පුදුමයකට පිට්ටනියේ ළිඳක් ද, ළිඳ ළඟ වැතිර
සිටි බැටළු රැළවල් තුනක් ද දිටී ය. බැටළුවන්ට
වතුර දෙන ලද්දේ ඒ ළිඳෙනේ ය. තවද, ළිං කටේ
තැබූ විශාල ගලක් විය. 3 බැටළු රැළවල් සියල්ල ම
එතැනට එකතු වූ විට, එඬේරු ළිං කටින් ගල
පෙරළා බැටළුවන්ට වතුර දුන් පසු, ළිං කටේ තිබූ
තැන ම ගල නැවත තැබූ හ.
4 ජාකොබ් එඬේරුන් අමතා, "සහෝදරයෙනි, ඔබ
කොහේ සිට ආවහු දැ"යි ඇසූ විට, "අපි හාරාන්
දේශයෙනේ ය"යි ඔව්හු කී හ. 5 ඔහු නැවත කතා
කරමින්, "නාහෝර්ගේ පුත් ලාබන්, ඔබ දන්නහු
දැ"යි ඇසූ විට, "අපි ඔහු දන්නමු"යි ඔව්හු පිළිතුරු
දුන්හ. 6 එවිට ජාකොබ් ඔවුන් අමතමින්, "ඔහු සුව
සේ සිටී දැ"යි ඇසූ විට, "ඔහු සුව සේ සිටියි. අර
බැටළුවන් සමඟ එන්නී ඔහුගේ දියණිය වන රාකෙල්
ය"යි ඔව්හු කී හ. 7 එවිට ජාකොබ්, "තවමත්
මද්දහන ය. බැටළු රැළවල් රැස් කරන වේලාව
නොවෙයි; එබැවින් බැටළුවන්ට වතුර දී, තණ බිමට
ඔවුන් ආපසු ගෙනයන්නැ"යි කී ය. 8 ඔව්හු උත්තර
දෙමින්, "බැටළු රැළවල් සියල්ල ම එකතු කර, ළිං
කටින් ගල පෙරළාදමන තුරු, අපට එසේ කළ
නොහැක. බැටළුවන්ට වතුර දෙන්නේ එවිට ය"යි කී
හ.
9 ජාකොබ් මෙසේ ඔවුන් සමඟ කතා කරමින්
සිටිය දී රාකෙල් තම පියාගේ බැටළුවන් සමඟ
පැමිණියා ය. මන්ද, උන් රැකබලාගත්තේ ඈ ය.
10 ජාකොබ් තම මාමා වන ලාබන්ගේ දුව වන
රාකෙල් ද තම මාමාගේ බැටළුවන් ද දුටු විට, ඔහු
ළං වී, ළිං කටින් ගල අහකට පෙරළා, තම මාමාගේ
බැටළුවන්ට වතුර බොන්න දුන්නේ ය. 11 පසුව ඔහු
රාකෙල් සිඹගෙන, මහ හඬින් හැඬී ය. 12 තවද,
තමා ඇගේ පියාගේ නෑයකු බවත්, රෙබෙකාගේ
පුත්‍රයා බවත් ඔහු රාකෙල්ට දැන්වී ය. ඈ ද දිව
ගොස් තම පියාට ඒ බව දැන්වූවා ය. 13 ලාබන් තම
සොහොයුරීගේ පුත් ජාකොබ්ගේ වගතුග ඇසූ විට,
ඔහු හමු වීමට දිව ගොස්, ඔහු සිප වැළඳගෙන තම
නිවසට ඔහු ගෙනාවේ ය. 14 එවිට ලාබන් ඔහුට
කතා කොට, "සැබැවින් ම ඔබ මාගේ ම මස් හා
ලේ නෑයකේ ය"යි කී ය. ජාකොබ් ද ඔහු සමඟ
මාසයක් විසී ය.

## ජාකොබ්ගේ විවාහය

15 ඉන්පසු ලාබන් ජාකොබ්ට කතා කොට, "ඔබ
මාගේ ඥාතියකු නිසා නොමිලයේ මට සේවය
කිරීම යුතු ද? ඔබේ වේතනය කුමක් දැ යි මට
දන්වන්නැ"යි කී ය. 16 ලාබන්ට දූවරු දදෙනෙකේ
සිටියාහ. වැඩිමලාගේ නම ලයො ය; බාලයාගේ නම
රාකෙල් ය. 17 ලයොගේ ඇස් සිවුමැලි ය; රාකෙල්
රූමත් ය, සුකොමල ය, 18 ජාකොබ් රාකෙල්ට පෙමේ
බැඳ, "ඔබේ බාල දූ වන රාකෙල් නිසා අවුරුදු සතක්
මම ඔබට සේවය කරන්නමේ"යි කී ය. 19 ලාබන් ද
කතා කොට, "වෙන මිනිසෙකුට ඈ පාවා දෙනවාට
වඩා, ඔබට ඈ දීම හොඳ ය. එබැවින් මා සමඟ
නවතින්නැ"යි උත්තර දුනි. 20 ජාකොබ් ද රාකෙල්
නිසා අවුරුදු සතක් සේවය කළේ ය. එහෙත්, ඔහු
ඇට ප්‍රේම කළ බැවින් ඒ ගත කළ කාලය ස්වල්ප
දවසක් මෙනේ ඔහුට හැඟිණි.
21 ඉන්පසු ජාකොබ් ලාබන්ට කතා කොට, "මාගේ
සේවා කාලය දැන් සම්පූර්ණ වී ඇත. මාගේ
භාර්යාව සමඟ එක් වනු පිණිස ඇය මට දෙන්නැ"යි
ඉල්ලී ය. 22 ලාබන් එහි සිටි සියලු මිනිසුන් කැඳවා
මංගල භෝජනයක් පැවැත්වී ය. 23 පසුව එම
රාත්‍රියේ ඔහු, තම දුව වන ලයො කැඳවා ගෙන
ජාකොබ් වෙත ගෙනාවේ ය. ජාකොබ් ද ඈ සමඟ
එක් විය. 24 තවද, ලාබන් තම දාසිය වන ශිල්පා,
ලයොගේ සේවිකාව වශයෙනේ තම දුවට දුන්නේ ය.
25 පසු දින උදය පහන් වූ කල පුදුමයකට මෙනේ, එහි
සිටියේ ලයො ය. එවිට ඔහු ලාබන් අමතා, "ඔබ මට
කළ මේ දේ කුමක් ද? මා ඔබට සේවය කළේ
රාකෙල් නිසා නොවේ ද? ඔබ මා රැවටුවේ මන්දැ"යි
ඇසී ය. 26 ලාබන් ද උත්තර දෙමින්, "වැඩිමලාට
කලින් බාලයා සරණ පාවා දීම අපේ රටේ සිරිත
නොවේ. 27 ඇගේ මංගල සතිය සම්පූර්ණ කරන්න,
ඔබ මට තව සත් අවුරුද්දක් සේවය කරන්නෙහි නම්
රාකෙල් ද ඔබට සරණ පාවා දෙන්නෙමේ"යි කී ය.
28 ජාකොබ් ද එසේ කර, මංගල සතිය සම්පූර්ණ
කළ පසු, ලාබන් ඔහුට තම දුව වන රාකෙල්, බිරිඳ
වශයෙනේ සරණ පාවා දුන්නේ ය. 29 ඔහු, තම දාසිය
වන බිල්හා, තම දුව වන රාකෙල්ට ඇගේ සේවිකාව
වශයෙනේ දුනි. 30 ජාකොබ්, රාකෙල් සමඟ ද එක්
වුණි. ඔහු ලයොට වඩා රාකෙල්ට ප්‍රේම කළේ ය.
තව අවුරුදු සතක් ද ලාබන්ට සේවය කළේ ය.

## ජාකොබ්ගේ දරුසම්පත

31 තවද, ලයො සිය සැමියාට නුරුස්සන බව
සමිඳාණන් වහන්සේ දුටු විට, උන් වහන්සේ ඇට
පිළිසිඳගන්නට සැලැස්සූ සේක. එහෙත්, රාකෙල් වඳ
ස්ත්‍රියක් වූවා ය. 32 ලයො ගැබ්ගෙන පුතකු
ලැබුවා ය. එවිට ඈ, "සමිඳාණන් වහන්සේ මාගේ
දුක බැලූ සේක. දැන් වත් මාගේ සැමියා මට ප්‍රේම
කරනු ඇතැ"යි කියමින් ඈ ඔහුට රූබන් යන නම
දුන්නා ය. 33 ඈ නැවතත් ගැබ්ගෙන පුතකු ලැබුවා
ය. "මා නුරුස්සන බව සමිඳාණන් වහන්සේ දුටු
බැවින් උන් වහන්සේ මට මේ පුතු ද, දුන් සේකැ"යි
කියමින් ඈ ඔහුට සිමියොන් යන නම තැබුවා ය.
34 ඈ නැවතත් පුතකු ලැබුවා ය. "මා මාගේ ස්වාමි
පුරුෂයා හට පුතුන් තිදෙනෙකු දුන් බැවින් දැන් වත්
ඔහු මට ඇලුම් වන්නේ ය" කියා ඈ ඔහුට ලෙවී
යන නම තැබුවා ය. 35 ඈ නැවතත් ගැබ්ගෙන
පුතකු ලැබුවා ය. ඈ, "දැන් මම සමිඳාණන්
වහන්සේට ප්‍රශංසා කරන්නමේ"යි කියමින් ඔහුට

ජුදා යන නම දුන්නා ය. ඉන්පසු ඇගේ ගැබ් ගැනීම
නැවතිණි.
30 රාකලේ තමා ජාකොබ්ට දාව දරුවන්
නොලැබූ බව දුටු විට ඈ සිය සොහොයුරියට
ඊර්ෂ්‍යා කරමින්, ජාකොබ් අමතා, “මට දරුවන්
දනේන, නැත්නම් මම නසිමි”යි කීවා ය. 2 එවිට
ජාකොබ් ඈ සමඟ කෝපයෙනේ දැවී, “මට
දවේයන්ගේ තැන ගත හැකි ද? ගැබ්ගැනීමනේ ඔබ
වළක්වා ඇත්තේ උන් වහන්සේ ය”යි පැවසී ය. 3 ඈ
ද කතා කරමින්, “මනේන, මාගේ සේවිකාව වන
බිල්හා, ඈ සමඟ එක් වන්න. ඇගනේ මට දරුවන්
ලබාගත හැක. මලෙසෙ ඈ මඟින් මට දරුවන් ඇති
වේ ය”යි කීවා ය. 4 මසෙේ කියා ඈ තම සේවිකාව
වන බිල්හා ජාකොබ්ට බිරිඳ වශයනේ පාවා දුන්නා
ය. ඔහු ද ඈ සමඟ එක් වුණි. 5 ඈ ගැබ්ගනෙ,
ජාකොබ්ට දාව පුතකෙු ලැබුවා ය. 6 එවිට රාකලේ,
“දවේයන් වහන්සේ මට යුක්තිය ඉටු කළ සේක.
උන් වහන්සේ මාගේ හඬටත් සවන් දී, මට පුතකෙු
දුන් සේකැ”යි කියා ඔහුට දාන් යන නාමය තැබුවා
ය. 7 රාකලේගේ සේවිකාව වන බිල්හා නැවතත්
ගැබ්ගනෙ ජාකොබ්ට දාව දෙ වන පුතකෙු ද ලැබුවා
ය. 8 එවිට රාකලේ, “මාගේ සහෝදරී සමඟ මාර
යුද්ධයක් කර ජය ගතිමි”යි කියා ඔහුට නප්තලී යන
නාමය තැබුවා ය.
9 ලයො ද, තම ගැබ්ගැනීම නැවතුණු බව දුටු විට
ඈ ඇගේ සේවිකාව වන ශිල්පා රැගනෙ, ජාකොබ්ට
බිරිඳ වශයනේ පාවා දුන්නා ය. 10 ශිල්පා ද
ගැබ්ගනෙ ජාකොබ්ට දාව පුතකෙු ලැබුවා ය.
11 එවිට ලයො, “මම කතෙරම් වාසනාවන්ත ද” කියා
ඔහුට ගාද් යන නාමය තැබුවා ය. 12 ලයොගේ
සේවිකාව වන ශිල්පා ජාකොබ්ට දාව දෙ වන
පුතකෙු ද ලැබුවා ය. 13 එවිට ලයො, “මම කතෙරම්
භාග්‍යවන්ත ද? ස්ත්‍රීහු මා ‘භාග්‍යවන්තී ය’යි
පවසන්නෝ ය” කියා ඈ ඔහුට ආෂරේ යන නාමය
තැබුවා ය.
14 තිරිඟු අස්වැන්න නළෙන කාලයේ දී රූබන්
කතෙට ගොස්, එහි, දූදායිම් නම් පැළ කීපයක්
සොයාගනෙ විත් තම මව වන ලයොට දුනි. එවිට
රාකලේ ඈට කතා කොට, “කරුණාකර, මට ඔබේ
පුත්‍රයා ගනො දූදායිම් පැළවලින් ටිකක් දනේනැ”යි
කීවා ය. 15 ඈ රාකලේට උත්තර දමේන්, “ඔබ මාගේ
සැමියා පාවාගත්තා මදි ද? දැන් මා පුතුන්ගේ දූදායිම්
පැළ ටිකත් පැහැරගන්න ද යන්නේ?” කියා කීවා ය.
එවිට රාකලේ ද, “හොඳයි, එසේ නම් ඔබ පුතුන්ගේ
දූදායිම් පැළ මට දුන්නොත් අද රාත්‍රියේ මාගේ
සැමියා සමඟ ඔබට සැතපනේනට පුළුවනැ”යි කීවා
ය.
16 සවස් කාලයේ දී ජාකොබ් කතෙේ සිට එන
විට, ලයො ඔහු හමුවීමට ගොස්, “ඔබ මා වතෙ
පැමිණිය යුතු ය. මා පුතුන්ගේ දූදායිම් පැළ දීමනේ
මම ඔබ කුලියට ගත්තමේ”යි ඈ කීවනේ එදා
රාත්‍රියේ ඔහු ඈ සමඟ සැතපුණේ ය. 17 දවේයන්
වහන්සේ ලයොට සවන් දුන් සේක; ඈ ගැබ්ගනෙ
ජාකොබ්ට දාව පස් වන පුතකෙු ලැබුවා ය. 18 එවිට
ලයො, “මාගේ සේවිකාව මාගේ සැමියාට දුන්
බැවින් දවේයන් වහන්සේ මාගේ කුලිය ගවේූ
සේකැ”යි කියා ඔහුට ඉස්සාකර් යන නාමය තැබුවා
ය. 19 ලයො නැවතත් ගැබ්ගනෙ, ජාකොබ්ට දාව සය
වන පුතු ලැබුවා ය. 20 “දවේයන් වහන්සේ මට
මහඟු දායාදයක් දුන් සේක. මාගේ සැමියාට දාව මා
පුතුන් සය දනෙකෙු ලැබූ බැවින් දැන් වත් ඔහු මට
ගරු කරන්නේ ය”යි කියා ඈ තම පුතුට සාබුලෝන්
යන නාමය දුන්නා ය. 21 පසුව ඈ දුවක ලැබුවා ය.
ඈට දීනා යන නාමය තැබුවා ය.
22 තවද, දවේයන් වහන්සේ රාකලේ සිහි කර ඈට
සවන් දී, ඈට ගැබ්ගැනීමට සැලැස්සූ සේක. 23 ඈ ද
ගැබ්ගනෙ පුතකෙු ලැබුවා ය. “දවේයන් වහන්සේ
මාගේ නින්දාව පහකළ සේකැ”යි කියමින්, 24 ඈ
ඔහුට ජෝසපේ යන නාමය දී, “සමිඳාණන් වහන්සේ
මට තවත් පුතකෙු එකතු කරන සේක් වා!”යි කියා
පැතුවා ය.

## ලාබන් සමඟ ජාකොබ්ගේ ගනුදනෙුව

25 රාකලේ ජෝසපේ ලැබූ පසු ජාකොබ් ලාබන්ට
කතා කොට, “මාගේ ම ගෘහයට, මාගේ ම
දේශයට යන පිණිස මා යන්න හරින්න. 26 මාගේ
භාර්යාවන් මට දනේන, මම ඔවුන් නිසා ඔබට
සේවය කළෙමි. මාගේ දරුවන් ද මට දී මා යන්න
හරින්න. ඔබට මා කළ සේවය ඔබ දන්නහෙි ය”යි
කී ය. 27 ලාබන් ඔහුට උත්තර දමේන්, “ඔබ මට
කරුණාව දක්වන්නහෙි නම් මට සවන් දනේන. මන්ද,
සමිඳාණන් වහන්සේ ඔබ නිසා මට ආශීර්වාද කළ
බව මම නිමිති බැලීමනේ දැනගතිමි. 28 ඔබේ කුලිය
නියම කරන්න; මම එය ඔබට ගවෙන්නමේ”යි කී ය.
29 එවිට ජාකොබ් ඔහු අමතමින්, “ඔබට මම
කසෙේ සේවය කළෙමේ ද කියාත්, ඔබේ ගව පට්ටි
මා බාරේ සිටි සැටිත් ඔබ දන්නහෙි ය. 30 මා
පැමිණෙන්නේ පරෙ ඔබ සතු ස්වල්ප දේ, දැන් ඉමහත්
ලසෙ බහුල වී ඇත. මා පැමිණි පසු සමිඳාණන්
වහන්සේ ඔබට ආශීර්වාද කළ සේක. දැන් ඉතින්
මාගේ පවුලේ අභිවෘද්ධිය තකා මම යමක්
සපයන්නේ කවරදා දැ”යි ඇසී ය.
31 ඔහු ද උත්තර දමේන්, “මා ඔබට කුමක් ගවේිය
යුතු දැ”යි ඇසූ විට, “ඔබ මට කිසිවක් දනේන
උවමනා නැත. මා මේ කියන්න යන දේ ඔබ මට
ඉටු කරන්නහෙි නම්, මම නොකඩවා ම ඔබේ
බැටළු රැළ කවා පොවා රැකබලාගන්නමේ. 32 මම
අද ඔබේ බැටළු පට්ටි මැදින් ගමන් කරමි.
බැටළුවන්ගනේ කළු පාට ඇති සියලු සතුන් ද
එළුවන්ගනේ තිත් සහ පුල්ලි ඇති උන් ද වනේ
කරමි. මාගේ කුලිය එය වේ. 33 තවද, මාගේ
අවංක භාවය ද ඔබට සොයාගත හැක. ඔබ මාගේ
කුලිය ගැන සෝදිසි කර බලන විට, එළුවන් අතරනේ
තිත් හෝ පුල්ලි හෝ නැති එකකෙු වත් බැටළුවන්
අතරනේ කළු පාට නැති එකකෙු වත් මට සිටියොත්
ඌ සොරාගත් එකකෙු සැටියට ඔබට ගණන් ගත
හැකි ය”යි කීවේ ය. 34 ලාබන් ද, “හොඳයි, ඔබ කී

ලසෙ සිදුවේවා"යි පිළිතුරු දුනි. 35 එහතේ, ලාබන්
එදින එළුවන්ගනේ වයිරම් සහ පුල්ලි වැටුණු උන් ද,
එළු දනෙුන්ගනේ තිත් සහ පුල්ලි සහිත සියලු සතුන්
ද, සුදු පාට ඇති උන් ද, බැටළුවන්ගනේ කළු පාට
ඇති සියලු සතුන් ද වනේ කර, තම පුතුන් හට බාර
දී 36 ජාකාබ්ගනේ වනේ ව තුන් දිනක් දුර ගමන්
කළෙේ ය. ජාකාබ් ද ලාබන්ගේ ඉතිරි බැටළු
රැළවල් පරෝෂණය කළෙේ ය.
37 ඉන්පසු ජාකාබ්, ලිබ්නාේ, ලූස් සහ ආර්මාන්
යන ගස්වලින් අමු දඬු ගනෙ, ඒවායේ සුද පනෙනෙ
ලසෙ, පටු තීරු වශයනේ පාතු ගලවා, 38 එළු
බැටළු රැළවල් වතුර බාන්න ආ විට, උන් ඉදිරිපිට,
වතුර ඔරුවල ඒවා තැබුවේ ය. උන් ද වතුර බාන්න
ආ කල පට්ටි ගැසුණි. 39 මසේ ඒ සත්තු, දඬු
ඉදිරියහේි පට්ටි ගැසී, ගැබ්ගනෙ, වයිරම් වැටුණු,
තිත් සහ පුල්ලි ඇති පැටවුන් බිහි කළහ. 40 පසුව
ඔහු බැටළුවන් වනේ කර ලාබන්ගේ රැළේ සිටි කළු
පාට වූ ද, වයිරම් වැටුණා වූ ද සතුන් දසෙට ඔවුන්
හැරවේවේ ය. ඇරත් ඔහු තමාගේ පට්ටි, ලාබන්ගේ
සතුන් සමඟ මිශ්‍ර නාකර, උන් වනේ කාට තැබී
ය. 41 තවද, ඔහු, වඩා ශක්තිමත් සතුන් පට්ටි ගසන
සැම විට ම, දඬු ඉදිරියේ ගැබ්ගන්න පිණිස, සතුන්
ඉදිරියේ වතුර ඔරුවල ඒවා තැබී ය. 42 එහතේ,
සත්තු බලෙහීන ව සිටියාේ නම්, ඔහු ඒ දඬු
නාතැබී ය. මසේ කිරීමනේ බලෙහීන සත්තු
ලාබන්ගේ වූ හ. ශක්තිමත් වූවාේ ජාකාබ්ගේ වූ
හ. 43 මලෙසේින් ජාකාබ් අතිශයින් ධනවත් විය.
ඔහුට බාහාේ එළු බැටළු රැළවල් ද දාස දාසීහු ද
ඔටුවාේ ද කාටළුවාේ ද වූ හ.

## ජාකාබ් පලායාම

31 "ජාකාබ් අපේ පියා සතු සියල්ල
පැහැරගත්තේ ය. අපේ පියා සතු දයෙින් ඔහු
තම සියලු සම්පත් ලබා ගත්තේ ය" කියා ලාබන්ගේ
පුතුන් කියනු ජාකාබ්ට ඇසිණි. 2 ඇරත් තමා
කරෙහේි ඔහු කලින් මනේ ප්‍රිය මනාප නා වූ බව
ලාබන්ගේ මුහුණින් ම ජාකාබ්ට පනේී ගියේය.
3 තවද, සමිඳාණන් වහන්සේ ඔහුට කතා කාට,
"ඔබේ පියවරුන්ගේ දශේයට, ඔබේ නෑයන් වතෙට
ආපසු යන්න. මම ද ඔබ සමඟ සිටිම්"යි වදාළ
සකේ.
4 එවිට ජාකාබ්, රාකලේ සහ ලයො වතෙ
පණිවුඩයක් යවා, තමාගේ සතුන් සිටි පිට්ටනියට
ඔවුන් කැඳවා, 5 "ඔබේ පියා මා කරෙහේි කලින්
මනේ ප්‍රිය මනාප නාවන බව ඔහුගේ මුහුණින්
මට පනෙේ. එහතේ, මාගේ පියාගේ දවේියන්
වහන්සේ මා සමඟ වැඩ සිටින සකේ. 6 තවද,
මාගේ මුළු ශක්තිය යාදා මා ඔබේ පියාට සවේය
කළ බව ඔබ දන්නහු ය. 7 එහතේ, ඔබේ පියා මා
රවටා, මාගේ කුලිය දස වාරයක් වනෙස් කළෙේ ය.
එහතේ, මට නපුරක් කිරීමට දවේියන් වහන්සේ
ඔහුට ඉඩ නුදුන් සකේ. 8 'ඔබේ කුලිය පුල්ලි
වැටුණු සතුන්ය'යි ඔහු කී විට සත්තු සියල්ලාේ ම
පුල්ලි වැටුණු පැටවුන් ගැසූ හ. 'ඔබේ කුලිය වයිරම්
වැටුණු සතුන්ය'යි ඔහු කී විට සත්තු සියල්ලාේ ම
වයිරම් වැටුණු පැටවුන් ගැසූ හ. 9 මලෙසෙ දවේියන්
වහන්සේ ඔබේ පියාගේ සතුන් රුගනෙ මට දුන්
සකේ.
10 "තවද සතුන් ගැබ්ගන්න කාලයේ දී මම
සිහිනනේ, නතේ යාමා බැලූ විට මවෙන්නක් දිටිමි:
එනම්, දනෙුන් සමඟ පට්ටි ගසන බැටළුවාේ
සියල්ලාේ ම වයිරම් වැටුණු, පුල්ලි සහ තිත්
ඇත්තාේ වූ හ. 11 එවිට දවේියන් වහන්සේගේ
දූතයා සිහිනනේ මට කතා කරමින්, 'ජාකාබ්' කියා
මා ඇමතුවනේ, මම ද, 'මම මහේි ය' කියා පිළිතුරු
දුනිමි. 12 එවිට ඔහු, 'දනෙුන් සමඟ පට්ටි ගසන
සියලු බැටළුවන් ම වයිරම් වැටුණු, පුල්ලි සහ තිත්
සහිත සතුන් බව නතේ යාමා බලන්න. එසේ
වන්නේ, ලාබන් ඔබට කරන සියල්ල මා දුටු හයෙිනි.
13 උත් 28:18-22 ඔබ සිහිවටන ස්ථම්භයක් ආලපේ
කර, මට භාරයක් පාරාන්දු වූ ස්ථානය වන
බතෙලේහි දී ප්‍රකාශ වූ දවේියන් වහන්සේ මම ය.
දැන් නැගිට, මේ දශේයනේ පිටත් වී, නුඹ උපන්
දශේයට ආපසු යන්න' කියා කීවේ යැ"යි ඔවුන්ට
සැළ කළෙේ ය.
14 එවිට රාකලේ සහ ලයො පිළිතුරු දමේින්, "අපේ
පියාගේ ගෘහයහේි අප වනෙුවනේ, තව යම් කිසි
කාටසක් හෝ උරුමයක් හෝ තිබේ ද? 15 ඔහු අප
අමුත්තන් මනේ සලකනවා නාවේ ද? මන්ද, ඔහු
අප විකුණා ඇත. අපේ සම්පත ද යසට කාදමා ඇත.
16 තවද, දවේියන් වහන්සේ අපේ පියාගනේ රුගත්
සියලු සම්පත අපේ ය; අප දරුවන්ගේ ය. දැන්
ඉතින් දවේියන් වහන්සේ යමක් ඔබට වදාළ සකේ
නම් එය ඉටු කරන්නැ"යි කීවාේ ය.
17 එවිට ජාකාබ් ද සූදානම් ව, තම පුතුන් හා
භාර්යාවන් ඔටුවන් පිට නංවා,
18 මසාපාතමේියාවහේි දී තමා හිමිකරගත් එළු
බැටළු රැළවල් ද, උපයාගත් සියලු සම්පත් ද,
තමාගේ සතුන් ද දක්කාගනෙ කානාන් දශේයේ තම
පියා වන ඊසාක් වතෙ යන පිණිස නික්මිණි.
19 ලාබන් තමාගේ බැටළුවන්ගේ ලාම කපන්නට
ගාස් සිටිය දී රාකලේ තම පියාට අයිති කුල
දවේතා රූප සාරා ගත්තා ය. 20 ජාකාබ් තමා
පලායන බව අරමේිය ජාතික ලාබන්ට නාදැන්වූයනේ,
ඔහු රැවටී ය. 21 මසේ ජාකාබ් තමා සතු සියල්ල
සමඟ පලාගාස් යුප්‍රටීස් නම් ගංගාවනේ එතරෙ
වී, ගිලියද් කන්ද බලා ගියේය.

## ලාබන් ජාකාබ් ලුහුබැඳ යාම

22 තුන් වන දින ජාකාබ් පලාගිය බව ලාබන්ට
දන්වන ලදී. 23 ඔහු තමා කැටුව සිය පිරිස රුගනෙ,
සත් දිනක් ජාකාබ් ලුහුබැඳ ගාස් ගිලියද් කන්දේ
දී ඔහුට ළඟා විය. 24 තවද, රාත්‍රි කාලයේ දී
දවේියන් වහන්සේ, ස්වප්නයකින් අරමේිය ජාතික
ලාබන් වතෙ පැමිණ, ඔහුට කතා කාට, "ඔබ
ජාකාබ්ට කිසිවක් නාකියන ලසෙ ප්‍රවසේම්

වන්නැ"යි වදාළ සේක. 25 ලාබන් ද කන්ද උඩ සිය
කඳවුරු බැඳ සිටි ජාකොබ් වෙතට පැමිණියේ ය.
ලාබන් සිය පිරිස සමඟ කඳවුරු බැඳ සිටියේ ගිලියද්
කන්දෙහි ය.
26 එවිට ඔහු ජාකොබ්ට කතා කොට, "මා රවටා
මාගේ දූවරුන් කඩුවෙන් හිරබාරයට ගත්තවුන් මෙන්
රැගෙන යාමෙන් ඔබ මට කළේ කුමක් ද? 27 ඔබ
රහසින් පලාගියේ මන් ද? මට හොරෙන් ගියේ
ඇයි? ප්‍රීති ඝෝෂාවෙන් හා ගීයෙන් ද කිංකිණි රබන්
හඬින් හා වීණා නාදයෙන් ද ඔබ පිටත් කර හැරීමට
මට හැකි වන සේ, මට නොදැන්නුවේ මන් ද?
28 ඇරත් මාගේ මුණුබුරන් හා දූවරුන් සිඹගැනීමට
ඔබ මට ඉඩ නොහැරියෙහි ය. මෙසේ කිරීමෙන් ඔබ
පිස්සෙකු මෙන් හැසිරී ඇත. 29 ඔබට හිංසා කිරීමට
මා අත බලය ඇත. එහෙත් ඊයේ රාත්‍රියේ ඔබේ
පියාගේ දෙවියන් වහන්සේ මට කතා කරමින්, 'නුඹ
ජාකොබ්ට කිසිවක් නොකියන ලෙස ප්‍රවේසම්
වන්නැ'යි වදාළ සේක. 30 ඔබේ පියාගේ ගෘහය
බලා යෑමට ඔබට බලවත් ආශාවක් ඇති වූ නිසා,
පිටත් ව ගිය බව මම දනිමි. එහෙත්, ඔබ මා සතු
කුල දේවතා රූප සොරාගත්තේ මන්දැ"යි ඇසී ය.
31 එවිට ජාකොබ් ඔහුට උත්තර දෙමින්, "ඔබ
බලහත්කාරයෙන්, ඔබේ දූවරුන් මාගෙන්
පැහැරගන්නට තැත් කරති යි කියා මම බිය වුණෙමි.
32 එහෙත්, ඔබ සතු කුල දේවතා රූප යමෙකු ළඟ
තිබී ඔබට සම්බ වේ ද, ඒ තැනැත්තා ජීවතුන් අතර
නොසිටියාවේ. අප පිරිස ඉදිරිපිට අප ළඟ ඇති දේ
සොයා බලා, ඔබට සතු දේ ගන්නැ"යි කී ය. එහෙත්,
රාකෙලේ ඒ කුල දේවතා රූප සොරාගත් බව
ජාකොබ් දැන සිටියේ නැත.
33 එවිට ලාබන් ජාකොබ්ගේ කූඩාරමට ඇතුළු විය.
පසුව ලෙයාගේ කූඩාරමට සහ සේවිකාවන්
දෙදෙනාගේ කූඩාරම්වලට ද ඇතුළු විය. එහෙත් කුල
දේවතා රූප ඔහුට සම්බ නොවී ය. ඉන්පසු ඔහු
ලෙයාගේ කූඩාරමින් පිට වී, රාකෙලේගේ කූඩාරමට
ඇතුළු විය. 34 ඈ ඒ දේවතා රූප රැගෙන ඔටුවාගේ
සෑදලයේ දමා, ඒවා උඩ හිඳගෙන උන්නා ය. ලාබන්
ද කූඩාරම තුළ සෙවූ නමුත්, ඒවා ඔහුට සම්බ නොවී
ය. 35 ඈ තම පියාට කතා කරමින්, "තාත්තා ඉදිරියේ
මට නැඟිට සිටීමට නොහැකි වීම ගැන, ඔබ අසතුටු
නොවන්න. මන්ද, මාසික ඔසප් වීම මට දැන්
ඇතැ"යි කීවා ය. ලාබන් ද ඒ රූප සෙවූ නමුත් ඒවා
ඔහුට සම්බ නොවී ය.
36 එවිට ජාකොබ් තදින් රොස් වී, ලාබන්ට බැණ
වැදුණේ ය. "ඔබ මා පසුපස්සේ මෙතරම් වේගයෙන්
ලුහුබැඳ ඒමට මා කළ වැරැද්ද කුමක් ද? මා කළ
අපරාධය කුමක් ද? 37 මා සතු සියල්ල ඔබ සොයා
බැලූ නමුත්, ඔබ සතු කිසිවක් සොයාගත්තෙහි ද?
යමක් සොයාගත්තෙහි නම්, එය මාගේ පිරිස හා
ඔබේ පිරිස ඉදිරියෙහි තබන්න. එවිට අප දෙදෙනා
අතර විනිශ්චය ඔවුන්ට තීරණය කළ හැක. 38 මේ
අවුරුදු විස්ස මම ඔබ සමඟ සිටියෙමි. ඔබේ බැටළු
දෙනුන් හා එළු දෙනුන්ගෙන් කිසිවෙකු ගබ්සා වූයේ
නැත. ඇරත් ඔබේ රැළවල, එක බැටළුවෙකේ වත්
මම නොකෑවෙමි. 39 තවද, වල් සතුන් මරාදැමූ
ඔබේ සිවුපාවුන් මම ඔබ වෙත නොගෙනාවෙමි. ඒ
පාඩුව, මම විඳදරාගත්තෙමි. රෑ කාලයේ වේ වා,
දවල් කාලයේ වේ වා, පැහැරගන්නා ලද සතුන්ගේ
වන්දිය ඔබ මගෙන් අය කළෙහි ය. 40 දවල්
කාලයේ දී අව් රස්නයෙන් ද රාත්‍රි කාලයේ දී
ශීතලයෙන් ද මම වෑහැරී ගියෙමි. නින්ද පවා මාගේ
ඇස්වලින් බැහැර ගියේය. 41 ඔබේ ගෘහයෙහි මා
විසූ අවුරුදු විස්ස මෙසේ ගතවිණි. ඔබේ දූවරුන්
දෙදෙනා නිසා අවුරුදු දහහතරක් ද, ඔබේ එළු බැටළු
පට්ටි නිසා අවුරුදු හයක් ද මම ඔබට සේවය
කළෙමි. එහෙත්, ඔබ මාගේ කුලිය දස වාරයක්
වෙනස් කළෙහි ය. 42 මාගේ පියාගේ දෙවියන්
වහන්සේ ද ආබ්‍රහම්ගේ දෙවියන් වහන්සේ ද
ඊසාක් භය භක්තිය වූ දෙවියන් වහන්සේ ද මා
සමඟ නොසිටි සේක් නම්, ඔබ දැන් මා හිස් අතින්
පිටත් කර හරිනවා සිකුරුයි. එහෙත්, දෙවියන්
වහන්සේ මාගේ දුක් පීඩාවත්, මාගේ අත්වල
ශ්‍රමයත් දැක ඊයේ රෑ ඔබට තරවටු කළ සේකැ"යි
කීවේ ය.

### ජාකොබ් හා ලාබන් අතර ගිවිසුම

43 එවිට ලාබන් ද ජාකොබ්ට පිළිතුරු දෙමින්, "මේ
දූවරු මාගේ දූවරු ය; මේ මුණුබුරෝ මාගේ
මුණුබුරෝ ය; මේ සිවුපාවෝ මාගේ සිවුපාවෝ ය.
ඔබට පෙනෙන සියල්ල ද මාගේ ය. ඉතින් මේ
දූවරුන්ටත්, ඔවුන් බිහි කළ ඔවුන්ගේ දරුවන්ටත් අද
දින මා විසින් කුමක් කළ හැකි ද? 44 එබැවින්,
එන්න, ඔබත් මමත් ගිවිසුමක් පිහිටුවා ගනිමු. එය
ඔබත් මාත් අතර සාක්ෂියක් පිණිස වේ වා!"යි
කීවේ ය.
45 පසුව ජාකොබ් ගලක් රැගෙන සිහිවටනයක්
මෙන් එය සිටවූවේ ය. 46 ඔහු එය සිටුවා, තම
පිරිස අමතා, "ගල් රැස්කරන්නැ"යි කීවෙන් ඔව්හු
ගල් ගෙන, ගොඩක් ගසා, එය මත වාඩි වී, ආහාර
අනුභව කළෝ ය. 47 ලාබන් ඊටත් ජගෙර්-සාහදූතා
යයි නම් කළේ ය. එහෙත් ජාකොබ් ඊට ගල්යේද්
කියා නම් කළේ ය. 48 ඉන්පසු ලාබන් කතා කොට,
"මේ ගල් ගොඩ, අද ඔබත් මාත් අතර සාක්ෂියක්
පිණිස වේ වා!"යි කී ය. එබැවින් ඊට ගල්යේද් යන
නාමය දෙන ලදී. 49 තවදුරටත් ඔහු කතා කරමින්,
"අප දෙදෙනා එකිනෙකාගෙන් වෙන් වූ කල
සමිඳාණන් වහන්සේ ඔබත් මාත් දෙස
සුපරීක්ෂාවෙන් බලා සිටින සේක් වා!"යි කීවේ ය.
එබැවින් ඒ ගල් ගොඩට මිස්පා යන නාමය දෙන
ලදී. 50 නැවත ඔහු කතා කොට, "ඔබ මාගේ
දූවරුන්ට වෙනස්කම් කළොත්, ඔබ මාගේ දූවරුන්ට
අමතර ව වෙන භාර්යාවන් පාවාගතහොත්,
කිසිවෙකු අප සමඟ නොසිටියත් දෙවියන් වහන්සේ
ඔබත් මාත් අතර සාක්ෂිකාරයාණන් බව සිහි
කරන්න. 51 ඔබත් මාත් අතර ගොඩ ගැසූ මේ ගල්
ගොඩත්, මේ සිහිවටනයත් දෙස හොඳින් බලන්න.
52 නපුරක් කරනු සඳහා මා මේ ගල් ගොඩ පසු කර

ඔබ වෙත නො එන බවටත්, ඔබ ද මේ ගල් ගොඩ
සහ සිහිවටනය පසු කර මා වෙත නො එන බවටත්
මේ ගල් ගොඩ සාක්ෂියක් වේ වා! මේ සිහිවටනය
සාක්ෂියක් වේ වා! 53 තවද, ආබ්රහම්ගේ දෙවියන්
වහන්සේ ද, නාහෝර්ගේ දෙවියන් වහන්සේ ද අප
අතර විනිශ්චය කරන සේක් වා!"යි කීවේ ය.
ජාකොබ් ද තම පියා වන ඊසාක් භය භක්තිය වූ
දෙවියන් වහන්සේගේ නාමයෙන් දිවුරුම් දුන්නේ ය.
54 ඉන්පසු ඔහු කන්ද මත යාග පූජාවක් පිදූ පසු,
ආහාර අනුභව කිරීමට සිය පිරිස කැඳෙව්වේ ය.
ඔව්හු ද ආහාර අනුභව කොට කන්ද මත මුළු
රාත්රිය ම ගත කළහ. 55 ලාබන් ද උදය අලුයම
නැඟිට තම මුණුබුරන් හා දූවරුන් සිඹගෙන ඔවුන්ට
ආසිරි පතා, පිටත් වී තමාගේ ගෘහයට ආපසු
ගියේය.

## ජාකොබ් ඒසව් හමු වීමට සූදානම් වීම

32 ජාකොබ් තම ගමන යන විට, ඔහුට
දෙවියන් වහන්සේගේ දූතයෝ
මුණගැසුණාහ. 2 ඔහු ඔවුන් දුටු විට, "මේ දෙවියන්
වහන්සේගේ සේනාව ය" කියා ඒ ස්ථානයට
මහනායිම් යන නම තැබී ය.
3 තවද, ඔහු ඒදොම් දේශයේ සේයිර් රටේ තම
සොහොයුරු වන ඒසව් වෙත තමාට පෙරටුවෙන්
දූතයන් යැවී ය. 4 ඔහු ඔවුන්ට අණ කරමින්, "නුඹලා
මාගේ ස්වාමීන් වන ඒසව්ට කතා කොට, 'ඔබේ
දාසයා වන ජාකොබ් මෙසේ කියන්නේ ය: මම
ලාබන් සමඟ නැවතී, මෙතෙක් එහි සිටියෙමි.
5 තවද, ගවයන් ද කොටළුවන් ද එළු බැටළු පට්ටි ද
දැසිදසුන් ද මට ඇත. ඔබ ඉදිරියෙහි ප්රසාදය ලබන
පිණිස මම මාගේ ස්වාමීන් හට දැන්වීමට මෙම
පණිවුඩය එවමි'යි සැළ කළ යුතු යැ"යි කීවේ ය.
6 දූතයෝ ජාකොබ් වෙත ආපසු වීත්, "අපි ඔබ
සොහොයුරු වන ඒසව් වෙත ගියෙමු, ඔහු ද ඔබ
හමු වීමට එන්නේ ය. ඇරත් ඔහු සමඟ හාරසියයක
පිරිසක් සිටිති"යි කී හ. 7 ජාකොබ් අතිශයින් බියවී
කැළඹිණි. ඔහු තමා කැටුව සිටි පිරිස ද එළු බැටළු
පට්ටි ද ගව පට්ටි ද ඔටුවන් ද කණ්ඩායම් දෙකෙකට
බෙදා, 8 "ඒසව් යම් විටක එක කණ්ඩායමක් වෙත
පැමිණ, ඊට පහර දුන්නොත්, ඉතිරි අනික්
කණ්ඩායමට ගැළවී යත හැකි ය"යි සිතී ය.
9 ජාකොබ් තවදුරටත් කතා කරමින්, "මා පිය
ආබ්රහම්ගේ දෙවිඳුනි, මා පිය වූ ඊසාක්ගේ
දෙවිඳුනි, 'ඔබේ දේශයට ද ඔබේ ඥාතීන් වෙත ද
ආපසු යන්න, මම ඔබට යස ඉසුරු සලසන්නෙමි'යි
මට වදාළ ස්වාමීනි, 10 ඔබ වහන්සේගේ දාසයා වන
මා හට පෑවා වූ සියලු කරුණාව හා
විශ්වාසවන්තකම ලැබීමට මා සුදුස්සෙක් නොවෙමි.
මන්ද, මා මේ ජෝර්දානෙන් එතරෙ වූයේ මාගේ
සැරයටියේ ආධාරයෙන් පමණ ය. එහෙත්, දැන් මා
කණ්ඩායම් දෙකෙක් වී ඇත. 11 ඔබ වහන්සේ
කරුණාකර, මාගේ සහෝදරයාගේ බලයෙන්,
ඒසව්ගේ අතින්, මා මුදාගත මැනව. ඔහු අප වෙත
පැමිණ මටත්, මවුවරුන්ටත්, දරුවන්ටත් පහර දෙතැ යි
මම ඔහුට බිය වෙමි. 12 උත් 22:17 ඇරත්, 'මම
ඔබට ඇත්තෙන් ම ඉසුරු සලසන්නෙමි, ඔබේ
පළපෙත ද මුහුදේ වැලි මෙන් ගණනින් විශාල වන
ලෙසෙ වැඩි කරන්නෙමි' කියා ද ඔබ වහන්සේ වදාළ
සේකැ"යි පැවසී ය.
13 ඔහු මෙසේ පවසා එම රාත්රිය එහි ගත කර,
තම සොහොයුරු වන ඒසව් හට තමා ළඟ තිබුණු
දෙයින් තෑග්ගක් ද තෝරා ගත්තේ ය. ඒ තෑග්ග
නම්: 14 එළු දෙනුන් දෙසියයක් ද එළුවන් විස්සක් ද
බැටළු දෙනුන් දෙසියයක් ද බැටළුවන් විස්සක් ද
15 කිරි දෙන ඔටු දෙනුන් තිහක් හා උන්ගේ වස්සන්
ද එළ දෙනුන් සතළිසක් ද ගොනුන් දහයක් ද
කොටළු දෙනුන් විස්සක් හා කොටළුවන් දහයක් ද වූ
හ. 16 ඉන්පසු ඔහු මේ රංචු, වෙනේ, වෙනේ වශයෙනේ
තම මෙහෙකෙරුවන්ට බාර දී, "නුඹලා රංචුවෙනේ
රංචුව ඈත් කර මට පෙරටුව යන්නැ"යි කීවේ ය.
17 තවද, ඔහු, මුලින් ම ගිය මෙහෙකෙරු අමතා,
"මාගේ සොහොයුරු ඒසව් ඔබ හමු වී, 'ඔබ කාගේ
කවු ද? ඔබ යන්නේ කොහේ ද? ඔබට පෙරටුව
දක්කාගෙන යන මේ සත්තු කාගේ ද?' කියා ඇසූ
විට, 18 'මේ සත්තු ඔබ සහෝදර ජාකොබ්ගේ ය,
මා ස්වාමීන් වන ඒසව් වෙත ඔහු එවන තෑග්ගකි.
ඇරත් ඔහු ද අප පසුපස්සේ එන්නේ ය'යි
කියන්නැ"යි අණ කළේ ය. 19 මෙසේ ඔහු
දෙවැනියාටත්, තුන්වැනියාටත්, සතුන් රංචු
දක්කාගෙන ගිය සියල්ලන්ටත් අණ කරමින්,
"නුඹලාට ඒසව් මුණගැසුණු විට ඔහුට මෙලෙසෙ
කියන්න. 20 ඇරත්, 'ඔබේ සේවක ජාකොබ් අපට
පිටුපසින් එන්නේ ය' කියා ද පවසන්නැ"යි කීවේ ය.
මන්ද, 'මට පෙරටුව යවන තෑග්ගෙන් ඔහුගේ සිත
දිනාගත් පසු මට ඔහු මුණගැසෙන්නේ හැකි වනු ඇතැ
යි ද, එවිට, ඔහු මා පිළිගන්නේ ය'යි ද ඔහු සිතී ය.
21 මෙලෙසෙ ඔහු තමාට පෙරටුව තෑගි හැරිය නමුත්
ඔහු ඒ රාත්රිය කඳවුරෙහි ගත කළේ ය.

## ජාකොබ්ගේ අද්භූත පොරබැදීම

22 ඒ රාත්රියේ ඔහු නැඟිට, තමාගේ භාර්යාවන්
දෙදෙනා ද සේවිකාවන් දෙදෙනා ද පුතුන්
එකොළොස්දෙනා ද රැගෙන ජබ්බොක් නම්
තොටුපොළෙන් එගොඩ විය. 23 ඔහු ඔවුන් රැගෙන
ගඟින් එගොඩ කළ පසු, තමා සතු දේ ද එතරෙට
යැවී ය. 24 හොසි 12:3-4 එහෙත් ජාකොබ් තනි ව
සිටියේ ය.
24 එවිට එක්තරා මිනිසෙක්, පහන් වන තුරු ඔහු
සමඟ පොරබැදී ය. 25 ඒ තැනැත්තා ද
ජාකොබ්ගෙන් තමාට ජය නොලැබෙන බව දුටු විට,
ඔහුගේ කලවා සන්ධියට පහරක් ගැසී ය. එවිට
ඔහුගේ කලවා සන්ධිය විසන්ධි විය. 26 ඒ
තැනැත්තා ද, "පහන් වේගෙන එන බැවින් මට යන්න
හරින්නැ"යි කී විට ජාකොබ්, "ඔබ මට ආශීර්වාද
කළොත් මිස මම ඔබට යන්න නොහරින්නෙමි"යි
උත්තර දුනි. 27 එවිට ඒ තැනැත්තා, "ඔබේ නම

කුමක් දැ”යි ඇසූ විට ඔහු ද, “ජාකොබ්” යයි
කීයනේ, 28 උත් 35:10 “මින්මතු ඔබ ජාකොබ්
නොවනු ඇත. ඔබ දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා
සමඟ පොරබදා ජයගත් බැවින් ඔබේ නම
ඉශ්‍රායලේ වන්නේ ය”යි කී ය. 29 විනි 13:17-18
ජාකොබ් කතා කොට, “කරුණාකර ඔබේ නම ද මට
කියන්නැ”යි ඉල්ලී ය. එවිට ඔහු, “ඔබ, මාගේ නම
අසන්නේ මන්දැ”යි කියා ජාකොබ්ට එහි දී ආශීර්වාද
කළේ ය.
30 “මා දෙවියන් වහන්සේ මුහුණට මුහුණ ලා දුටු
පසුත් මාගේ ජීවිතය තවමත් ආරක්ෂා වී ඇත” කියා
ජාකොබ් එම ස්ථානයට පනුෙයලේ යයි නම තැබී ය.
31 ඔහු ද පනුෙයලේ පසු කර යද්දී, ඉර උදාවිය.
තමාගේ කලවයේ වේදනාව නිසා ඔහු
කොරගසමින් ගියේය. 32 මේ සිද්ධිය නිසා
ඉශ්‍රායලේ ජනතාව කලවා සන්ධිය මත වූ මස්
ගොබය අද දක්වා අනුභව නොකරති. ඒ මන්ද,
ජාකොබ් පහර ලද්දේ කලවයේ එම සන්ධියට
බැවිනි.

### ජාකොබ් ඒසව් හා සමගි වීම

33 ජාකොබ් නතේ ඔසවා බැලූ විට, පුදුමයකි,
ඒසව් ද ඔහු සමඟ හාරසියයක පිරිසක් ද
එනු දිටී ය. එවිට ඔහු ලයො, රාකලේ සහ
සේවිකාවන් දදෙනෙ අතර දරුවන් බදො දී,
2 සේවිකාවන් සහ ඔවුන්ගේ දරුවන් ඉස්සරහින්
සිටවේවේ ය. ඔවුන්ට පිටුපසින් ලයො සහ ඇගේ
දරුවන් ද ඔවුන්ටත් පිටුපසින් රාකලේ සහ ජෝසපේ
ද සිටවේවේ ය. 3 ජාකොබ් ද ඔවුන්ට පරෙටුව
ගොස්, තම සොහොයුරා වතෙ පැමිණනෙ තකේ සත්
වරක් බිමට නැමී වැන්දේ ය. 4 එවිට ඒසව් ඔහු
හමුවීමට දිව ගොස් ඔහු බදාගනෙ, ඔහුගේ ගලෙ
වැළඳගනෙ ඔහු සිඹගත්තේ ය. පසුව ඔව්හු
අඬන්නට වූ හ. 5 ඒසව් නතේ ඔසවා බැලූ විට,
ස්ත්‍රීන් හා දරුවන් දැක, “ඔබ සමඟ සිටින මේ අය
කාගේ දැ”යි ඇසූ විට, ජාකොබ් පිළිතුරු දමේන්,
“දෙවියන් වහන්සේ ඔබේ දාසයා හට කරුණාව පා
දුන් දරුවෝ ය”යි කී ය. 6 එවිට සේවිකාවෝ ද
ඔවුන්ගේ දරුවෝ ද ළඟට පැමිණ, ආචාර කළහ.
7 ලයො තම දරුවන් සමඟ පැමිණ ආචාර කළ පසු
ජෝසපේ සහ රාකලේ ද ළඟට පැමිණ ආචාර කළහ.
8 එවිට ඒසව් ජාකොබ්ට කතා කොට, “මට හමු වූ
මේ සතුන් සියල්ලන් ම කුමක් පිණිස දැ”යි ඇසූ විට,
“මාගේ ස්වාමීන් ඉදිරියෙහි අනුග්‍රහය ලැබීම පිණිස
යැ”යි ඔහු උත්තර දුනි. 9 එකල ඒසව් කතා කොට,
“මා සොහොයුර, මට උවමනා තරම් ඇත. ඔබට
අයිති දේ ඔබ ම තබා ගන්නැ”යි කීවේ ය. 10 එවිට
ජාකොබ් ඔහුට උත්තර දමේන්, “එසේ නො වේ වා,
කරුණාකර ඔබ ඉදිරියෙහි මම ඔබේ ප්‍රසාදය ලදිම්
නම්, මා අතින් මාගේ තෑග්ග පිළිගන්න. ඔබ මා
සාදරයනේ පිළිගන්නෙහි නම්, මට ඔබේ මුහුණ
දැකීම හරියට දෙවියන් වහන්සේගේ මුහුණ දැකීම
හා සමාන ය. 11 එබැවින්, කරුණාකර ඔබ වතෙ
ගනෙො මාගේ තිළිණය පිළිගන්න. මන්ද, දෙවියන්
වහන්සේ මට කරුණා පෑ බැවින් මට උවමනා තරම්
ඇතැ”යි කියා ඔහුට පරෙුත්ත කළනේ ඒසව් එය
බාරගත්තේ ය.
12 පසුව ඒසව්, “අපි ගමනට පිටත් ව යමු. මම
ඔබට පරෙටුව යන්නමේ”යි කී විට, 13 ජාකොබ් ද
පිළිතුරු දමේන්, “දරුවන් සුකුමාර බවත්, පැටියන්
සහිත බැටළු පට්ටි හා ගව පට්ටි මට ඇති බවත්
ස්වාමීන්ට පනෙේ. එක දවසක් වත්, මිනිසුන්,
පමණට වඩා ඉක්මන් කර සතුන් දැක්කුවොත් මුළු
රැළ මැරී යනු ඇත. 14 කරුණාකර, මාගේ ස්වාමීහු
ඔහුගේ දාසයාට පරෙටුව යතේ වා. මට ඉස්සරහින්
යන ගවයන්ට හා දරුවන්ට යත හැකි ප්‍රමාණයට,
සේයිර්හි මාගේ ස්වාමීන් වතෙ පැමිණනෙ තකේ
හමේන් හමේන් ගමන් කර මම එන්නමේ”යි කීවේ
ය.
15 එවිට ඒසව් කතා කොට, “එසේ නම් මා සමඟ
සිටින පිරිසනේ සමහර දනෙකු ඔබ සමඟ
නවතාලමි”යි කී විට ජාකොබ් ද, “එවැන්නක් කුමට
ද? මට උවමනා මා ස්වාමීන්ගේ ප්‍රසාදය පමණකි”යි
උත්තර දුනි. 16 ඉන්පසු එදින ඒසව් සේයිර් බලා
ආපසු ගියේය. 17 එහතේ ජාකොබ් සුක්කොත්
දක්වා ගොස්, තමා ම ගයෙක් ඉදි කොට, සිය
ගවයන් සඳහා මඩු තැනී ය. එබැවින් එම ස්ථානයට
සුක්කොත් යන නම තබන ලදී.
18 මලෙසෙ ජාකොබ් මසොපොතමේියාවේ සිට
ආපසු අවුත් කානාන් දේශයේ ෂකෙමේ නුවරට
සුවනේ සැපත් ව, නුවර ඉදිරියෙහි සිය කඳවුර බැඳී
ය. 19 ජෝෂු 24:32; ජොහ 4:5 තවද ඔහු
ෂකෙමේගේ පිය වූ හාමොර්ගේ පුත්‍රයන්ගනේ, සිය
කඳවුර පිහිටවූ බිම් කැබැල්ල රිදී කාසි සියයක්
ගවො මිලට ගත්තේ ය. 20 එහි ඔහු පූජාසනයක්
ඉදි කර, ඊට ඉශ්‍රායලේහි දෙවියන් වහන්සේ යන
අර්ථය ඇති ‘එල්-එලොහේ-ඉශ්‍රායලේ’ යන නාමය
තැබී ය.

### ජාකොබ්ගේ දුව දූෂණය කරනු ලැබීම

34 ජාකොබ්ට දාව ලයො ලැබූ දුව වන දීනා,
දේශයේ කාන්තාවන් හමුවීමට නික්ම ගියා
ය. 2 එවිට දේශයේ අධිපති වූ, හිවීය ජාතික
හාමොර්ගේ පුත්, ෂකෙමේ ඈ දැක, ඈ පැහැරගනෙ
ගොස් ඈ සමඟ සැතපී, ඈ දූෂණය කළේ ය.
3 ඔහුගේ සිත ද ජාකොබ්ගේ දුව වන දීනා
කරෙහෙි තදින් ඇදී ගියනේ, ඔහු තරුණියට පමේ
කර, ඈ අස්වැසී ය. 4 ෂකෙමේ සිය පියා වන
හාමොර්ට කතා කොට, “මේ තරුණිය මට බිරිඳ
කොට ලබා දනේනැ”යි ඉල්ලී ය.
5 ඔහු තම දුව වන දීනා දූෂණය කළ බව ජාකොබ්
දැනගත්තේ ය. එකල ඔහුගේ පුතුන්, ඔහුගේ
ගවයන් සමඟ තණ පිට්ටනියේ සිටිය බැවින්, ඔවුන්
එන තකේ ජාකොබ් නිහඬ ව සිටියේ ය.
6 ෂකෙමේගේ පියා වන හාමොර් ද ජාකොබ් සමඟ
කතා කිරීමට ඔහු වතෙ පිටත් ව ගියේය.

7 ජාකොබ්ගේ පුත්‍රයන් තණ පිට්ටනියෙන් පැමිණි
පසු ඔව්හු මෙය අසා, කම්පා වී කෝපාවිෂ්ට වූ හ.
මන්ද, ෂෙකෙම්, ජාකොබ්ගේ දූව දූෂණය කිරීමෙන්
ඉශ්‍රායෙල් ජනයා අතර නොකටයුතු සැහැසිකමක්
කළ හෙයිනි. 8 හාමොර් ද ඔවුන් සමඟ කතා
කරමින්, "මාගේ පුත්‍ර ෂෙකෙම්, ඔබේ දියණියට
පෙම් බැඳ සිටියි. ඇය ඔහුට භාර්යාව මෙන් පාවා
දෙන ලෙස මම අයැද සිටිමි. 9 ඇරත්, ඔබ අප සමඟ
විවාහ ගිවිසුම් කරගන්න. ඔබේ දූවරුන් අපට දී,
අපේ දූවරුන් ඔබ ගන්න. 10 මෙලෙස ඔබට අප
සමඟ වාසය කළ හැක. රට ද ඔබ ඉදිරියෙහි ඇත.
එහි වාසය කොට, නිදහසේ වෙළෙහෙළඳාම් කර
වතුපිටි අයිති කරගන්නැ"යි කී ය.
11 එවිට ෂෙකෙම් ඇගේ පියාට හා ඇගේ
සොහොයුරන්ට කතා කොට, "ඔබ හැම මට
කරුණාව පෙන්වනු මැනව! ඔබ මාගෙන් යමක්
ඉල්ලන්නහු ද, එය මම දෙන්නෙම්. 12 තරුණිය මට
භාර්යාව කොට දෙන්නහු නම්, ඉතා විශාල
දායාදයක් හා තෑගි භෝග මාගෙන් ඉල්ලන්න, ඔබ
මාගෙන් ඉල්ලන ඕනෑ ම දෙයක් මම ඔබට
දෙන්නෙම්"යි කීවේ ය.
13 ෂෙකෙම්, ඔවුන්ගේ සහෝදරී වන දීනා දූෂණය
කළ බැවින් ජාකොබ්ගේ පුත්‍රයෝ ද ෂෙකෙම් සහ
ඔහුගේ පියා වන හාමොර්ට කපටි ලෙස උත්තර
දුන්හ. 14 "අපට මෙබඳු දෙයක් කළ නොහැක.
අචර්මඡේදිත කෙනෙකුට අපේ සහෝදරී දීම අපට
නින්දාවකි. 15 එහෙත් ඔබ අතර සෑම පිරිමියෙක් ම
චර්මඡේදිත වී අප හා සමාන වන්නහු නම්, ඔබ
කියන දේට අපට එකඟ විය හැක. 16 එවිට අපේ
දූවරුන් දී ඔබේ දූවරුන් අපි ගන්නෙමු. ඇරත් අපි ඔබ
සමඟ වාසය කරමින් එක ජනතාවක් වන්නෙමු.
17 එහෙත් ඔබ චර්මඡේදිත වීම ගැන අපට
ඇහුම්කන් නොදෙන්නහු නම්, අපි අපේ දූව රැගෙන
යන්නෙමු"යි කීවෝ ය.
18 ඔවුන්ගේ කීමට හාමොර් සහ ඔහු පුත්
ෂෙකෙම් කැමැති වූ හ. 19 තරුණයා ද ජාකොබ්ගේ
දූවට ඇලුම් ව සිටි බැවින්, ඔහු ද යෝජිත දේ
කිරීමට පමා නො වී ය. තවද, ඔහු තම පියාගේ
ගෘහයේ ඉතා ම වැදගත් තැනැත්තා විය.
20 එබැවින් හාමොර් සහ ඔහු පුත් ෂෙකෙම්, නුවර
වාසල් දොරටුවට අවුත්, නුවර වැසියන් සමඟ කතා
කරමින්, 21 "මේ මිනිසුන් අපට හිතවත් ය. එබැවින්
රටෙහි පදිංචි වී, එහි නිදහස් ව යන්න එන්න
ඔවුන්ට ඉඩ හරිමු. බලන්න, රටෙහි ඔවුන්ටත්
සෑහෙන තරම් ඉඩ ඇත. අපි ඔවුන්ගේ දූවරුන්
භාර්යාවන් කොට ගෙන, අපේ දූවරුන් ඔවුන්ට දෙමු.
22 එහෙත්, අප සමඟ එකට වාසය කර එක
සෙනඟක් වීමට ඒ මිනිසුන් කැමැති වන්නේ, අප
අතර සිටින සෑම පිරිමියෙකු ම, ඔවුන් චර්මඡේදිත වී
ඇති ලෙස, චර්මඡේදිත වුවහොත් පමණ ය.
23 ඔවුන්ගේ ගව පට්ටි ද ඔවුන්ගේ වස්තුව ද
ඔවුන්ගේ සියලු සතුන් ද අපේ නොවන්නේ ද?
එබැවින් අපි ඔවුන් හා එකඟ වෙමු. එවිට ඔව්හු අප
සමඟ වාසය කරන්නෝ ය"යි කී හ. 24 වාසල්
දොරටුවෙන් පිට වූ සියල්ලෝ ම හාමොර්ට සහ ඔහු
පුත් ෂෙකෙම්ට ඇහුම්කන් දුන්හ. මෙලෙස වාසල්
දොරටුවෙන් පිට වූ සියලු ම පිරිමි චර්මඡේදනය
කරනු ලැබූ හ.
25 තුන් දිනකට පසු, ඔවුන් තවමත් තුවාළවලින්
වේදනා විඳින කල්හි, ජාකොබ්ගේ පුතුන් දෙදෙනෙකු
වන, සිමියොන් සහ ලෙවී යන දීනාගේ
සහෝදරයෝ, තම කඩු රැගෙන, රහසින් නුවරට
වැද, සියලු පිරිමින් මරාදැමූ හ. 26 තවද, ඔව්හු
හාමොර් සහ ඔහු පුත් ෂෙකෙම් ද කඩු පහරින් මරා,
ෂෙකෙම්ගේ ගෙයින් දීනා රැගෙන පිට වී ගියහ.
27 ජාකොබ්ගේ පුත්‍රයෝ ද තුවාළ ලැබූවන් පිටට
පැන පහර දී නුවර කොල්ලකෑ හ. මන්ද, ඔහු තම
සොහොයුරී දූෂණය කළ හෙයිනි. 28 ඔව්හු
ඔවුන්ගේ එළු බැටළු පට්ටි ද ගව පට්ටි ද
කොටළුවන් ද නුවර හා පිට්ටනියේ තැබූ දේ ද
29 ඔවුන්ගේ වස්තුව ද ගත්තෝ ය. ඔවුන්ගේ සියලු
ම කුඩා දරුවන් ද භාර්යාවන් ද අල්ලාගෙන,
ඔවුන්ගේ ගෙවල තිබූ සියල්ල ද කොල්ලකෑ හ.
30 එවිට ජාකොබ් සිමියොන්ට සහ ලෙවීට කතා
කොට, "මේ දේශයේ වැසියන් වන කානානිවරුන්
සහ පෙරෙස්සිවරුන් අතර, මා දුගඳක් මෙන් පිළිකුලට
ලක් කිරීමෙන් නුඹලා මට ලොකු අවැඩක් කර
තිබේ. මට ඇත්තේ ගණනින් සුළු පිරිසකි. එබැවින්
ඔවුන් මට විරුද්ධ ව එක පෙරමුණක් ගෙන, මා
මරාදමනු ඇත. මෙසේ මාගේ මුළු පවුලත් මමත්
විනාශ වී යන්නෙමු"යි කී ය. 31 එවිට ඔව්හු උත්තර
දෙමින්, "ඔහු අපේ සහෝදරිය වෙසඟනක ලෙස
සැලකීම හරි දැ"යි ඇසූ හ.

## ජාකොබ්ට ආශීර්වාද කිරීම

35 උත් 28:11-17 දෙවියන් වහන්සේ ජාකොබ්ට
කතා කොට, "නැඟිට, බෙතෙල් කරා ගොස්,
එහි පදිංචි වන්න, නුඹේ සොහොයුරු ඒසව්ගෙන්
නුඹ පලායද්දී නුඹට දර්ශනය වූ දෙවියන් වහන්සේට
පූජාසනයක් එහි සාදන්නැ"යි වදාළ සේක. 2 එවිට
ජාකොබ් තම පවුලේ වැසියන් හා තමා සමඟ සිටි
සියල්ලන් අමතා, "ඔබ ළඟ ඇති විදේශීය දේවතා
රූප ඉවත් කොට, පවිත්‍ර වීමේ වත්පිළිවෙත් කර,
ඔබේ ඇඳුම් මාරු කරගන්න. 3 එවිට අපි නැඟිට
බෙතෙල් කරා යමු, මාගේ ආපදාවේ දවසේ දී මට
ඇහුම්කන් දුන්, මා ගිය ගිය තැන මා සමඟ වැඩ
සිටි දෙවියන් වහන්සේට මම එහි දී පූජාසනයක්
සාදන්නෙම්"යි කීවේ ය. 4 ඔවුන් ද, තමන් ළඟ තිබූ
සියලු ම විදේශීය දේවතා රූප හා ඔවුන් පැළඳ හුන්
කර්ණාභරණ ද ජාකොබ්ට දුන් විට ඔහු ෂෙකෙම්
නම් ස්ථානය අසල තිබූ ආලෝන ගස යට ඒවා
සැඟවී ය.
5 ඔව්හු යන්න ගියෝ ය. එහෙත් ඔවුන් අවට තිබූ
නගරවල වැසියන් භියෙන් තැතිගත් බැවින් කිසිවෙක්
ජාකොබ්ගේ පුත්‍රයන් ලුහුබැඳ නොගියෝ ය.
6 මෙසේ ජාකොබ් ද ඔහු සමඟ සිටි සියලු සෙනඟ
ද කානාන් දේශයේ ලූස් හෙවත් බෙතෙල් නම්

ස්ථානයට පැමිණියෝ ය. 7 එහි දී ඔහු පූජාසනයක්
තනා, එම ස්ථානයට එල්-බෙතෙලේ යන නම තැබී ය.
මන්ද, ඔහු සිය සහෝදරයුරා වෙතින් පලායන විට,
එහි දී දෙවියන් වහන්සේ ඔහුට දර්ශනය වූ බැවිනි.
8 තවද, රෙබෙකාගේ කිරි මව වූ දෙබෝරා මළ
බැවින්, ඇය බෙතෙලේ නම් ස්ථානයට පහළින්
ආලෝන ගස යට භූමදාන කරනු ලැබුවා ය. එබැවින්
ඊට අල්ලෝන්-බාකුත් යන නම දෙන ලද්දේ ය.
9 ජාකොබ් මෙසොපොතේමියාවෙන් මෙසේ හැරී
එන විට දෙවියන් වහන්සේ නැවතත් ඔහුට දර්ශනය
වී ආශීර්වාද කළ සේක. 10 උත් 32:28 උන් වහන්සේ
ඔහුට කතා කොට, “නුඹේ නම ජාකොබ් ය. එහෙත්
මින්පසු නුඹේ නම ජාකොබ් යයි හඳුන්වනු
නොලැබ, නුඹේ නම ඉශ්රායලේ වන්නේ ය”යි වදාළ
නිසා ඔහුට ඉශ්රායලේ යන නම තබන ලදී. 11 උත්
17:4-8 තවදුරටත් දෙවියන් වහන්සේ ඔහු අමතමින්,
“මම සියලු බලැති දෙවියන් වහන්සේ වෙමි. නුඹ
සමෘද්ධ වී, වර්ධනය වන්න. නුඹෙන් ජාතියක් හා
ජාතීන් සමුදායක් බිහි වන්නෝ ය. නුඹට දාව රජවරු
පවා උපදින්නෝ ය. 12 මම ආබ්රහම්ට සහ ඊසාක්ට
දුන් දේශය නුඹට දෙන්නෙමි; නුඹෙන් පසුව නුඹේ
පරපුරට එය දෙන්නෙමි”යි වදාරා 13 උන් වහන්සේ
ඔහු සමඟ කතා කළ ස්ථානයේ දී, ඔහු වෙතින්
ඉවත් ව ගිය සේක. 14 උත් 28:18-19 ඉන්පසු
ජාකොබ් උන් වහන්සේ සමඟ කතා කළ
ස්ථානයෙහි සිහිවටනයක්, එනම්, ගලින් කළ
සිහිවටනයක් ඉදිකොට, එය මත පානීය පූජාව ඔප්පු
කොට තෙල් ද වත් කළේ ය. 15 තවද, දෙවියන්
වහන්සේ තමා සමඟ කතා කළ ස්ථානයට ඔහු
බෙතෙලේ යන නම තැබී ය.

### රාකෙල්ගේ මරණය

16 ඔව්හු බෙතෙලේ සිට නික්ම ගියහ. එහෙත් ඔවුන්
එප්රාත් නම් ස්ථානයට පැමිණෙන්නට මඳක් දුර
තිබිය දී, රාකෙල්ට ප්රසව වේදනා ඇති වී, එය
උග්ර විය. 17 මෙලෙස ඈ උග්ර ලෙස ප්රසව වේදනා
විඳින විට, වින්නඹු මාතාව ඈට කතා කොට, “බිය
නොවන්න, ඔබට ලැබෙන්නේ තවත් පුත්රයෙකි ය”යි
කීවා ය. 18 එහෙත්, රාකෙල් මළා ය. ඈ පණ අදින
විට ඔහුට බෙනෝ-ඕනි යන නම තැබූ නමුත් ඔහුගේ
පියා ඔහුට බෙන්ජමින් කියා නම් කළේ ය.
19 මෙසේ රාකෙල් මළ පසු, එප්රාත් හෙවත්
බෙත්ලෙහෙමට යන මාර්ගයෙහි ඈ භූමදාන කරනු
ලැබුවා ය. 20 ජාකොබ් ද ඇගේ සොහොන පිට
සිහිවටනයක් ඉදි කළේ ය. අද දක්වා ම
රාකෙල්ගේ සොහොන මත සිහිවටනය ඇත.
21 ඉශ්රායලේ ගමන් කොට, මිග්දාල්-එදෙර් නම්
ස්ථානයට එහා, තම කඳවුර පිහිටුවාගත්තේ ය.

### රූබන්ගේ අනාචාරය

22 උත් 49:4 තවද, ඉශ්රායලේ ඒ රටේ පදිංචි ව
සිටිය දී රූබන් ගොස්, තම පියාගේ අනියම් බිරිඳ
වන බිල්හා සමඟ සැතපුණේ ය. ඉශ්රායලේට ද
එපවත් සැළ විය.

### ජාකොබ්ගේ පුත්රයෝ
(1 වංශා 2:1-2)

22 ජාකොබ්ට පුත්රයෝ දොළොස්දෙනෙකේ සිටියහ.
23 ලෙයාගේ පුත්රයෝ නම්, ජාකොබ්ගේ කුලුඳුලා
වන රූබන්, සිමියොන්, ලෙවී, ජුදා, ඉස්සාකර් සහ
සාබුලොන් ය. 24 රාකෙල්ගේ පුත්රයෝ නම්
ජෝසෙප් සහ බෙන්ජමින් ය. 25 රාකෙල්ගේ
සේවිකාව වන බිල්හාගේ පුත්රයෝ නම් දාන් සහ
නප්තලී ය. 26 ලෙයාගේ සේවිකාව වන සිල්පාගේ
පුත්රයෝ නම් ගාද් සහ ආෂෙර් ය.
මෙසොපොතේමියාවේ දී ජාකොබ්ට දාව උපන්
ඔහුගේ පුත්රයෝ මොවුහු ය.

### ඊසාක්ගේ මරණය

27 උත් 13:18 ජාකොබ් ද ආබ්රහම් සහ ඊසාක්
තාවකාලික ව පදිංචි වූ ආලෝන අරඹ හෙවත්
කිර්යත්-අර්බා හෙවත් හෙබ්රොන් නම් ස්ථානයේ
ඊසාක් වෙත පැමිණියේ ය. 28 ඊසාක්ගේ වයස
අවුරුදු එකසිය අසූවක් වූයෙන් 29 ඔහු දිගායු වළඳා
පූර්ණ මහලු වයසේ දී මියගොස් තම මුතුන්මිත්තන්
හා එක්විය. ඔහුගේ පුත්රයන් වූ ඒසව් සහ
ජාකොබ් ඔහු භූමදාන කළහ.

### ඒසව්ගේ පරපුර
(1 වංශා 1:34-37)

36 ඒසව් හෙවත් ඒදොම්ගේ පරපුර මෙසේ
ය. 2 උත් 26:34 ඔහු තම භාර්යාවන් සරණ
පාවාගත්තේ කානානිය ස්ත්රීන් අතුරින් ය. මොවුහු
නම් හිත්තීය ජාතික එලොන්ගේ දුව වූ ආදා, හිවීය
ජාතික සිබයොන්ගේ දුව වූ අනාගේ දුව වන
ඔහොලිබාමා 3 උත් 28:9 සහ නබායෝත්ගේ
සහෝදරී වූ ද, ඉෂ්මායලේගේ දුව වූ ද බාසමෙත් ය.
4 ඒසව්ට දාව, ආදාගෙන් එලිපස් ද, බාසමෙත්ගෙන්
රෙවුයෙලේ ද, 5 ඔහොලිබාමාගෙන් ජෙවුෂ් ද, ජලාම්
ද, කෝරා ද උපන්හ. කානාන් දේශයේ දී ඒසව්ට
දාව උපන් ඔහුගේ පුත්රයෝ මොවුහු ය.
6 ඒසව් තම භාර්යාවන් ද පුත්රයන් ද දූවරුන් ද
ගෙදර වැසි සියල්ලන් ද ගවයන් ද සියලු මෘගයන් ද
කානාන් දේශයේ දී තමන් උපයාගත් සියලු වස්තුව
ද රැගෙන, තම සොහොයුරු වන ජාකොබ් වෙතින්
අන් රටකට ගියේ ය. 7 මන්ද, ඔවුන්ට එකට පදිංචි
වීමට නොහැකි තරමට ඔවුන්ගේ ධනය විශාල විය.
ඇරත් ඔවුන් විදේශිකයන් මෙන් විසූ රටෙහි,
ඔවුන්ගේ ගොවිපළවල් නිසා ඔවුන්ට ඉඩ මදි විය.
8 මෙලෙස ඒසව් හෙවත් ඒදොම් සේයිර් කන්දෙහි
පදිංචි විය.

9 සේයිර් කන්දෙහි විසූ ඒදොම්වරුන්ගේ පියා වන
ඒසව්ගේ පෙළපත හා 10 ඔහුගේ පුත්‍රයන්ගේ
නාමාවලිය මෙය වේ: ඒසව්ගේ භාර්යාව වූ ආදාගේ
පුත්‍ර එලිපස්, බාසෙමත්ගේ පුත්‍ර රෙවුයෙල්,
11 එලිපස්ගේ පුත්‍රයන් වන තේමාන්, ඕමාර්,
ශෙපෝ, ගයිතාම් සහ කෙනස් ය. 12 තවද, තිම්නා
ඒසව්ගේ පුත්‍ර එලිපස්ගේ අනියම් බිරිඳ වූවා ය.
ඇයගෙන් එලිපස්ට දාව අමලෙක් උපන්නේ ය.
ඒසව්ගේ භාර්යාව වූ ආදාගේ පුත්‍රයෝ මොවුහු ය.
13 රෙවුයෙල්ගේ පුත්‍රයෝ නම් නහත්, සෙරා,
ෂම්මා සහ මිස්සා ය. මොවුහු ඒසව්ගේ භාර්යාව වූ
බාසෙමත්ගේ මුණුබුරෝ ය.
14 ශිබෙයොන්ගේ පුත්‍රයා වන අනාගේ දුව වූ
ඒසව්ගේ භාර්යාව වූ ඔහොලිබාමාගේ පුත්‍රයෝ
නම්, ඇයගෙන් ඔහුට දාව උපන් ජෙවුෂ්, ජලාම් සහ
කෝරා ය.
15 ඒසව්ගේ පෙළපතේ අධිපතීහු නම් ඔහුගේ
කුලුඳුල් පුත් එලිපස්ගේ පුත්‍රයෝ ය. මොවුහු නම්
අධිපතීන් වන තේමාන්, ඕමාර්, ශෙපෝ, කෙනස්,
16 කෝරා, ගයිතාම් සහ අමලෙක් ය. ඒදොම්
දේශයේ එලිපස්ගෙන් පැවත ආ අධිපතීහු මොවුහු
ය. තවද මොවුහු ආදාගේ පුත්‍රයෝ ය.
17 ඒසව්ගේ පුත්, රෙවුයෙල්ගේ පුත්‍රයෝ නම්
අධිපතීන් වන නහත්, සෙරා, ෂම්මා සහ මිස්සා ය.
ඒදොම් දේශයේ රෙවුයෙල්ගෙන් පැවත ආ මේ
අධිපතීහු ඒසව්ගේ භාර්යාව වන බාසෙමත්ගේ
පුත්‍රයෝ ය.
18 ඒසව්ගේ භාර්යාව වූ ඔහොලිබාමාගේ
පුත්‍රයෝ නම් අධිපතීන් වන ජෙවුෂ්, ජලාම් සහ
කෝරා ය. මොවුහු අනාගේ දුව ද, ඒසව්ගේ
භාර්යාව ද වූ ඔහොලිබාමාගෙන් පැවත ආ
අධිපතියෝ ය. 19 ඒදොම් හෙවත් ඒසව්ගේ
පුත්‍රයන් සහ ඔවුන්ගේ අධිපතීහු මොවුහු ය.

## සේයිර්ගේ පෙළපත
(1 වංශා 1:38-42)

20 ඒ දේශයෙහි විසූ හෝරිය ජාතික සේයිර්ගේ
පුත්‍රයෝ නම් ලෝතාන්, ෂෝබාල්, ශිබෙයොන්, අනා,
21 දීෂොන්, එශෙර් සහ දීෂාන් ය. මොවුහු ඒදොම්
දේශයෙහි වූ සේයිර්ගේ පෙළපත වන
හෝරිවරුන්ගේ අධිපතීහු ය. 22 ලෝතාන්ගේ දරුවෝ
නම් හෝරි සහ හේමාම් ය. ලෝතාන්ගේ සහෝදරී
තිම්නා ය. 23 ෂෝබාල්ගේ දරුවෝ නම් අල්වාන්,
මානහත්, ඒබාල්, ෂෙපෝ සහ ඕනාම් ය.
24 ශිබෙයොන්ගේ දරුවෝ ආයා සහ අනා ය.
තමාගේ පියා වූ ශිබෙයොන්ගේ කොටළුවන්ට පාළු
තැන්නෙහි තණ කවමින් සිටිය දී උණු දිය උල්පත්
සම්බ වූයේ මේ අනාට ය. 25 අනාගේ දරුවෝ නම්
දීෂොන් සහ අනාගේ දුව වූ ඔහොලිබාමා ය.
26 දීෂොන්ගේ දරුවෝ නම් හෙම්දාන්, එෂ්බාන්,
ඉත්‍රාන් සහ කෙරාන් ය. 27 එශෙර්ගේ දරුවෝ නම්
බිල්හන්, සයවාන් සහ අකාන් ය. 28 දීෂාන්ගේ
දරුවෝ ඌශ් සහ අරාන් ය. 29 හෝරිවරුන්ගෙන්
පැවත ආ අධිපතීහු නම් ලෝතාන්, ෂෝබාල්,
ශිබෙයොන්, අනා, 30 දීෂොන්, එශෙර් සහ දීෂාන් ය.
මොවුහු සේයිර් දේශයෙහි තමන්ගේ ගෝත්‍ර අනුව
හෝරිවරුන්ගේ අධිපතියෝ ය.

## ඒදොම් දේශයෙහි රජවරු
(1 වංශා 1:43-54)

31 ඉශ්‍රායෙල්වරුන්ගේ රජෙකු එහි රජකම් කිරීමට
පෙර ඒදොම් දේශයෙහි රජකම් කළ රජවරු මොවුහු
ය. 32 බෙයෝර්ගේ පුත් බෙලා ඒදොම්හි රජකම්
කළේ ය. ඔහුගේ නුවරේ නම දින්හාබා ය.
33 බෙලා මළ පසු, ඔහු වෙනුවට බොශ්රායේ
ගෙරාගේ පුත්‍ර ජෝබාබ් රජකම් කළේ ය.
34 ජෝබාබ් මළ පසු ඔහු වෙනුවට තේමානිවරුන්ගේ
දේශයේ හුෂාම් රජකම් කළේ ය. 35 හුෂාම් මළ
පසු, ඔහු වෙනුවට මෝවබ් දේශයේ මිදියන්වරුන්
පරාජය කළ බෙදද්ගේ පුත් හදද් රජකම් කළේ ය.
ඔහුගේ නුවරේ නම අවිත් ය. 36 හදද් මළ පසු, ඔහු
වෙනුවට මස්රේකාහි ෂම්ලා රජකම් කළේ ය.
37 ෂම්ලා මළ පසු, ඔහු වෙනුවට ගංගාව අසල
රෙහොබොත්හි ෂාවුල් රජකම් කළේ ය. 38 ෂාවුල්
මළ පසු, ඔහු වෙනුවට අක්බෝර්ගේ පුත් බාල්-
හනන් රජකම් කළේ ය. 39 අක්බෝර්ගේ පුත්‍ර
බාල්-හනන් මළ පසු, ඔහු වෙනුවට හදාර් රජකම්
කළේ ය. ඔහුගේ නුවරේ නම පායු ය. ඔහුගේ
භාර්යාවගේ නම මෙහෙතබෙල් ය. ඈ මෙසාහබ්ගේ
දුව වූ මත්‍රෙද්ගේ දූ ය.
40 තම තමන්ගේ පෙළපත හා තම තමන්ගේ
පේරුව අනුව, ඒසව්ගෙන් පැවත ආ අධිපතීන්ගේ
නාමාවලිය නම් තිම්නා, අල්වා ජෙතේත්, 41 අධිපති
ඔහොලිබාමා, ඒලා, පීනොන්, 42 අධිපති කෙනස්,
තොමාත්, මිබ්ශාර්, 43 අධිපති මග්දීයෙල් සහ ඊරාම්
ය. මොවුහු, දේශයේ තමන්ට උරුම වූ වාසස්ථාන
අනුව ඒදොම්හි අධිපතීහු ය. එනම්, ඒදොම්වරුන්ගේ
පියා වන ඒසව්ගේ පෙළපත ය.

**37** තමාගේ පියා තාවකාලික ව නැවතී සිටි රට
වන කානාන් දේශයේ ජාකොබ් පදිංචි විය.
2 ජාකොබ්ගේ පෙළපත් කතාව මේ ය.

## ජෝසෙප් සහ ඔහුගේ සහෝදරයෝ

2 ජෝසෙප්ට වයස අවුරුදු දාහතක් වූ විට, ඔහු
තම සහෝදරයන් සමඟ බැටළුවන්ට තණ කවමින්
සිටියේ ය. ඔහු සිටියේ තම පියාගේ භාර්යාවන් වන
බිල්හාගේ ද, ශිල්පාගේ ද පුත්‍රයන් සමඟ ය.
ජෝසෙප් ඔවුන්ගේ නපුරු ක්‍රියා ගැන පියාට
දැන්වූයේ ය.
3 ඉශ්‍රායෙල් තම දරුවන් සියල්ලන්ට ම වඩා
ජෝසෙප්ට ප්‍රේම කළේ ය. මන්ද, ඔහු තම මහලු
වියේ ලත් පුත්‍රයා බැවිනි. ඒ නිසා ඔහු ජෝසෙප්ට
අත් ඇති, දිග විශේෂ ඇඳුමක් සාදා දුනි. 4 ඔවුන්ගේ
පියා, ඔවුන් සියල්ලන්ට ම වඩා ජෝසෙප්ට ප්‍රේම
කරන බව දැක ඔහුගේ සහෝදරයෝ ඔහුට වෛර
කළහ. එබැවින් ඔහු සමඟ මිත්‍ර ලීලාවෙන් කතා
කිරීමට ඔවුන්ට නොහැකි විය.

5 ජෝසෙප් සිහිනයක් දැක, තම සොහොයුරන්ට
එය කීවේ ය. ඒ නිසා ඔව්හු ඔහුට වඩ වඩාත්
වෛර කරන්නට වන්හ. 6 ඔහු ද ඔවුන්ට කතා
කොට, “කරුණාකර, මා දුටු සිහිනයට ඇහුම්කන්
දෙන්න. 7 මෙන්න, අපි කෙතෙහි ගොයම් මිටි
බඳිමින් සිටියෙමු. එවිට, පුදුමයකි, මාගේ ගොයම්
මිටිය නැඟිට කෙළින් සිටියේ ය. ඔබ හැමගේ
ගොයම් මිටි, එය වටේට සිටගෙන, මාගේ ගොයම්
මිටියට නැමී ආචාර කළේ ය”යි කීවේ ය. 8 එවිට
ඔහුගේ සහෝදරයෝ, “ඇත්තට ම ඔබ අප කෙරෙහි
රජකම් කරන්නට යන්නෙහි ද? සැබැවින් ම ඔබ අප
කෙරෙහි අධිපති බලය පාන්න යන්නෙහි දැ”යි ඇසූ
හ. එබැවින් ඔව්හු මේ සිහින නිසාත්, ඔහුගේ කියුම්
නිසාත් ඔහුට තව තවත් වෛර කළහ.
9 තවද, ඔහු තවත් සිහිනයක් දැක, එය ද තම
සොහොයුරන්ට දන්වමින්, “මේ අහන්න, මම තවත්
සිහිනයක් දිටිමි. පුදුමයකි, ඉර, හඳ හා තාරකා
එකොළහක් මට නැමී ආචාර කළේ ය”යි කී ය.
10 තවද, ජෝසෙප් තම පියාටත්, තම
සහෝදරයන්ටත් එය දැන්වී ය. එවිට ඔහුගේ පියා
ඔහුට බැණ වදිමින්, “නුඹ දුටු මේ සිහිනයේ තේරුම
කුමක් ද? ඇත්තට ම, නුඹේ අම්මාත්, නුඹේ
සහෝදරයෝත්, මමත් බිමට නැමී නුඹට ආචාර
කරන්ට එන්නෙමු දැ”යි ඇසී ය. 11 ක්‍රියා 7:9
ඔහුගේ සහෝදරයෝ ඔහුට ඊර්ෂ්‍යා කළහ. එහෙත්
ඔහුගේ පියා, ඔහු කියූ කරුණු සිතේ තබාගත්තේ
ය.

### ජෝසෙප් මිසරයට විකුණනු ලැබීම

12 ඔහුගේ සහෝදරයෝ ද තම පියාගේ එළු
බැටළු පට්ටි බලාගනු පිණිස ෂෙකෙමේ නම් පෙදෙසට
ගියහ. 13 එවිට ඉශ්‍රායෙල් ජෝසෙප්ට කතා කරමින්,
“නුඹේ සහෝදරයන් ෂෙකෙමේහි එළු බැටළු පට්ටි
බලාගන්නවා නොවේ ද? එන්න, මම නුඹ ඔවුන්
වෙත යවමි”යි කී විට, ජෝසෙප් ද, “මම ලෑස්ති ය”
කියා උත්තර දුනි. 14 ඔහුගේ පියා තවදුරටත් කතා
කරමින්, “කරුණාකර, යන්න, නුඹේ සහෝදරයොත්
එළු බැටළුවොත් සුව සේ සිටිත් දැ යි බලාගෙන
ඇවිත් මට දන්වන්නැ”යි කී ය. මෙසේ කියා ඔහු
හෙබ්රොන් නම් මිටියාවතින් ජෝසෙප් පිටත් කර
හැරියේ ය.
14 ජෝසෙප් ෂෙකෙමේ පෙදෙසට පැමිණ, එහි
තැනින් තැන යන විට, 15 එක්තරා මිනිසකුට ඔහු
හමු වී, “ඔබ කුමක් සොයන්නෙහි දැ”යි ඒ මිනිසා
ඔහුගෙන් විචාළේ ය. 16 ඔහු ද කතා කොට, “මම
මාගේ සොහොයුරන් සොයමි. ඔවුන් බැටළුවන්ට
තණ කවන්නේ කොහේ ද කියා කරුණාකර මට
කියන්නැ”යි උත්තර දුන්නේ ය. 17 එවිට ඒ මිනිසා,
“ඔබේ සහෝදරයන් මෙතෙනින් යන්න ඇත. ‘අපි
දොතාන් නම් පෙදෙසට යමු’යි ඔවුන් කියනු මට
ඇසිණි”යි කීවේ ය. එවිට ජෝසෙප් තම
සොහොයුරන් සොයා යන විට, දොතාන්හි දී ඔව්හු
ඔහුට හමු වූ හ.
18 ඔහුගේ සහෝදරයෝ ඔහු දුර සිට දුටු හැටියේ
ම, ඔවුන් වෙත එන්නටත් පෙර, ඔහු මරාදැමීමට
කුමන්ත්‍රණය කළහ. 19 ඔව්හු එකිනෙකා අමතමින්,
“ඔය එන්නේ ස්වප්නකාරයා. 20 දැන් ඉතින්
වරෙල්ලා, අපි ඔහු මරා වළකට දමා, ‘මොකෙක් හරි
නපුරු වන සතෙක් ඔහු කාදැමුවේ ය’යි කියමු. එවිට
ඔහුගේ සිහිනවලට සිදුවන දේ බලමු”යි කතා
කරගත්හ.
21 රූබන් ඒ අසා, ඔවුන් අතින් ඔහු මුදාගැනීමට
බලමින්, “අපි ඔහුගේ ජීවිතයට හානියක්
නොකරමු”යි කී ය. 22 තවදුරටත් ඔහු ඔවුන්ට කතා
කොට, “ලේ බිඳක් නොහෙළා, පාළු තැන්නේ ඇති
මේ වළට අපි ඔහු විසිකර දමමු. ඔහුට නම් අත
නොතබන්නැ”යි කීවේ ය. ඔහු මෙසේ කීවේ
ඔවුන්ගෙන් ඔහු බේරාගෙන, තම පියාට නැවත ඔහු
මුදා දෙනු පිණිස ය. 23 ජෝසෙප් තම සොහොයුරන්
වෙත පැමිණි විට ඔව්හු ඔහුගේ ඇඳුම, අත් ඇති,
දිග, විශේෂ ඇඳුම ගලවාදමා, 24 ඔහු රැගෙන
වළකට දැමූ හ. ඒ වළ ද වතුර නැති හිස් එකක්
විය.
25 ඉන්පසු ඔව්හු ආහාර අනුභව කිරීමට වාඩි වී,
හිස ඔසවා බලන්නාහු ගිලියද්හි සිට මිසරයට ගෙන
යන පිණිස කුළු බඩු ද සුවඳ ද්‍රව්‍ය සහ දුම්මල ද
ඔටුවන් පිට පටවාගෙන යන ඉෂ්මායෙල්වරුන්ගේ
තවලමක් දුටුහ. 26 එවිට ජුදා තම සොහොයුරන්
අමතමින්, “අපේ සහෝදරයා මරා දමා, ඔහුගේ ලේ
සැඟවීමෙන් කුමන පලක් ද? 27 එන්න, අපි ඔහු පිට
අත නොතබා, ඉෂ්මායෙල්වරුන්ට විකුණමු. ඇත්තට
ම ඔහු අපේ ම සහෝදරයා නො වේ ද; අපි එක
පියකුගේ දරුවෝ නො වෙමු දැ”යි කී ය. ඔහුගේ
සහෝදරයෝ ද එකඟ වූ හ. 28 ක්‍රියා 7:9 මිදියන්
ජාතික වෙළෙඳුන් ඔවුන් අසලින් යන කල, ඔව්හු
ජෝසෙප් වළෙන් ගොඩට ගෙන, ඉෂ්මායෙල්වරුන්ට
රිදී කාසි විස්සකට වික්කෝ ය. ඔව්හු ද ජෝසෙප්
මිසරයට ගෙනාහ.
29 එහෙත්, රූබන් ආපසු වළ ළඟට ආ විට
පුදුමයකි, ජෝසෙප් වළේ නොසිටි බැවින්, ඔහු දුකින්
පිරී තම වස්ත්‍ර ඉරා ගෙන, 30 සිය සොහොයුරන්
වෙත නැවත පැමිණ, “ළමයා නැත, ඉතින් මම කුමක්
කරන්න දැ”යි කී ය.
31 ඔව්හු ද එළු පැටියකු මරා, ජෝසෙප්ගේ
වස්ත්‍රය ගෙන, එය එහි ලේවල ගැල්වූ හ. 32 පසුව
අත් ඇති, දිග, එම විශේෂ ඇඳුම තමන්ගේ පියා
වෙත ගෙනැවිත්, “මෙය අපට සම්බ විය, එය ඔබ
පුත්‍රයාගේ වස්ත්‍රය ද, නැද්ද යි කියා සොයා
බලන්නැ”යි කී හ.
33 ඔවුන්ගේ පියා වන ජාකොබ් ද, එය බලා
හඳුනාගෙන, “මෙය මාගේ පුතාගේ වස්ත්‍රය ම යි.
නපුරු සතකු අනුමානයක් නැති ව ම ඔහු කෑලිවලට
ඉරාදමා ඇත” කියා, 34 දුකින් තම වස්ත්‍ර ඉරාගෙන,
තම ඉණ වටා හණ රෙදි ඇඳගෙන, බොහෝ දිනක්
තම පුත්‍රයා නිසා වැලපුණේ ය. 35 ඔහුගේ පුත්තු
හා දූවරු සියල්ලෝ ම ඔහු සනසන්නට නැඟිට ආහ.
එහෙත් ඔහු සනසනු ලැබීමට අකමැති ව, “මම

වැලපෙමින් ම මාගේ පුතු වෙත මිනීවළට
යන්නෙමි"යි කී ය. මෙලෙසෙ ඔහුගේ පියා ඔහු නිසා
හඬා වැලපුණේ ය.
36 මිදියන්වරු, මිසරයේ දී පාරාවෝ රජුගේ වාසල
ඇමති හා මුර සෙන්පති වන පෝතිපර්ට ජෝසෙප්
විකුණුවෝ ය.

## ජුදා සහ තාමාර්ගේ කතාව

38 එකල ජුදා තම සහෝදරයන්ගෙන් වෙන් වී
අදුල්ලම් නම් නගරයේ වැසියෙකු වන හීරා
නමැත්තෙකු සමඟ වාසය කිරීමට ගියේ ය. 2 එහි දී
ඔහු කානානිය ජාතික, ෂූවා නමැත්තෙකුගේ දුවක
දැක, ඈ සරණ පාවාගෙන, ඈ සමඟ විසුවේ ය. 3 ඈ
ගැබ්ගෙන පුතෙකු ලැබුවා ය. ජුදා ඔහුට ඒර් යන
නම තැබී ය. 4 ඈ නැවතත් ගැබ්ගෙන පුතෙකු
ලැබුවා ය. ඈ ඔහුට ඕනාන් යන නම තැබුවා ය.
5 ඈ තව වරක් ගැබ්ගෙන පුතෙකු ලැබුවෙන්, ඔහුට
ෂේලා යන නම තැබුවා ය. ඈ ෂේලා ලැබූ විට, ජුදා
සිටියේ කසිබ් නම් ස්ථානයේ ය.
6 ජුදා තම කුලුඳුල් පුත් ඒර්ට තාමාර් නමැති
ස්ත්‍රියක විවාහ කොට දුනි. 7 එහෙත් ජුදාගේ
කුලුඳුල් පුත් ඒර්, සමිඳාණන් වහන්සේට විරුද්ධ ව
බොහෝ පව් කළ හෙයින් උන් වහන්සේ ඔහු
මැරෙන්නට සැලැස්සූ සේක. 8 එවිට ජුදා ඕනාන්ට
කතා කොට, "නුඹ සහෝදරයාගේ වැන්දඹුව සරණ
පාවාගෙන, මස්සිනා කෙනෙකු නිසා ඈ වෙත යුතුකම
ඉටු කර සහෝදරයාට දරුවන් උත්පාද කරන්නැ"යි කී
ය. 9 එහෙත්, ඕනාන්, දරුවන් තමාගේ නොවෙන බව
දැනගෙන, තම සහෝදරයාගේ වැන්දඹුව සමඟ
සයනය කළ සැම විට ම සිය සහෝදරයාට දරුවන්
නො දෙනු පිණිස තම පුරුෂ ධාතු බිම වැගිරෙන්නට
සැලැසී ය. 10 ඔහු කළ ක්‍රියාව සමිඳාණන්
වහන්සේට අප්‍රසන්න වූ හෙයින්, උන් වහන්සේ
ඔහු ද මැරෙන්නට සැලැස්සූ සේක. 11 එවිට ජුදා තම
ලේලිය වන තාමාර්ට කතා කොට, "මාගේ පුත්‍ර
ෂේලා වැඩිවියට පැමිණෙන තෙක් ඔබේ පියා වෙත
වැන්දඹුවක මෙන් ආපසු යන්නැ"යි කීවේ ය. ඔහු
මෙසේ කීවේ, 'ඔහුගේ සහෝදරයන්ට වූ ලෙසෙ ම
ඇතැම් විට ඔහුත් මැරෙන්නට පුළුවනැ'යි සිතූ නිසා
ය. එවිට තාමාර් ගොස්, තම පියාගේ ගෘහයෙහි
පදිංචි වූවා ය.
12 කලක් ගිය පසු ෂූවාගේ දුව වූ ජුදාගේ
භාර්යාව මළා ය. ඔහු ද අවමංගල්‍ය කාලය නිම වූ
පසු, අදුල්ලම් නගරවැසි තම මිත්‍ර හීරා සමඟ, තම
බැටළුවන්ගේ ලොම් කපන මිනිසුන් වෙත, තිම්නා
නම් ස්ථානයට ගියේ ය. 13 "ඔබේ මාමණ්ඩි ඔහුගේ
බැටළුවන්ගේ ලොම් කපන පිණිස තිම්නාට යන්නේ
ය" කියා තාමාර්ට දන්වන ලදින්, 14 ඈ තම
කනවැන්දුම් ඇඳුම් ඉවත ලා, මුහුණු වැස්මකින් තම
මුහුණ වසා, පොරවාගෙන තිම්නාවට යන මඟ,
ඒනයිම් නම් නුවරට ඇතුළු වන ස්ථානයෙහි වාඩි
වූවා ය. මන්ද, ෂේලා වැඩිවියට පැමිණි නමුත්, ඔහුට
ඈ භාර්යාව කොට නුදුන් බව ඈ දුටු හෙයිනි.
15 ජුදා ඈ දුටු විට ඈ තම මුහුණ වසාගෙන සිටි
බැවින් 'ඈ වේශ්‍යාවකැ'යි ඔහු සිතී ය. 16 ඔහු ද
මඟ අසල සිටි ඈ වෙත ගොස්, "කරුණාකර, එන්න,
ඔබ සමඟ සයනය කිරීමට මට ඉඩ හරින්නැ"යි කී
ය. මන්ද, ඈ තම ලේලිය බව ඔහු නොදත් හෙයිනි.
ඈ ද උත්තර දෙමින්, "මා සමඟ සේවනයෙහි
යෙදෙනු පිණිස ඔබ මට කුමක් දෙන්නෙහි දැ"යි
ඇසුවා ය. 17 "පට්ටියෙන් එළු පැටියෙකු
එවන්නෙමි"යි ඔහු කී විට, "හොඳයි, ඔබ එය
එවනතුරු මට අත්තිකාරමක් දෙන්නෙහි දැ"යි විචාළා
ය. 18 එවිට ඔහු ද, "කුමන අත්තිකාරමක් ඔබට
දෙන්න දැ"යි ඇසුවෙන්, ඈ ද, "ඔබගේ මුද්‍රාවත්,
මාලයත්, අතේ තිබෙන සැරයටියත් ය"යි උත්තර
දුන්නා ය. ඔහු ඒවා ඈට දුන් පසු, ඈ සමඟ සයනය
කළේ ය. ඈ ද පිළිසිඳගත්තා ය. 19 පසුව ඈ
නැඟිට, පිටත් ව ගොස්, සළුව ඉවත ලා, කනවැන්දුම්
ස්ත්‍රියකගේ ඇඳුම් ලාගත්තා ය.
20 ජුදා අදුල්ලම් නගරවාසී, තම මිතුරා අත,
ස්ත්‍රියගෙන් අත්තිකාරම ආපසු ලබාගන්නා පිණිස
එළු පැටියෙකු යැවී ය. එහෙත් ඔහුට ඈ සම්බ නො
වූවා ය. 21 එවිට ඔහු එහි සිටිය මිනිසුන්ට කතා
කොට, "ඒනයිම් නම් ස්ථානයේ මඟ අසල සිටි
වේශ්‍යාව කොහි දැ"යි ඇසූ විට, "එහි වේශ්‍යාවක්
සිටියේ නැතැ"යි ඔව්හු උත්තර දුන් හ. 22 පසුව ඔහු
ජුදා වෙත ආපසු ගොස්, "මට ඈ සොයාගන්නට බැරි
ය, ඇරත් එහි සිටි මිනිස්සු පවා එහි වේශ්‍යාවක්
සිටියේ නැත කියා කීවෝ ය"යි සැළ කළේ ය.
23 එවිට ජුදා කතා කොට, "ඈ ගත් දේ ඈ ම
තබාගත්තාවේ; නැත්නම් මිනිසුන් අපට
සිනාසෙන්නට පුළුවනි. ඔබට ඈ සම්බ නුවූ නමුත්,
බලන්න, මම මේ බැටළු පැටියා ඈ වෙත යැවීමි"යි
කී ය.
24 මාස තුනක් පමණ ගත වූ පසු, "ඔබේ ලේලිය
වන තාමාර් වේශ්‍යාකම් කළා ය" කියා ද, "ඇරත්
වේශ්‍යාකමින් ඈ පිළිසිඳගෙන සිටින්නී ය" කියා ද
ජුදාට දන්වන ලදින්, ඔහු ද, "ඈ පිටත ගෙනවුත්
පුළුස්සා දමන්නැ"යි කීවේ ය. 25 ඈ ද පිටතට
ගෙනෙනු ලැබූ විට, තම මාමණ්ඩිට පණිවුඩයක්
යවමින්, "මේවා යම් කෙනෙකුගේ ද, ඒ මිනිසාට
දාව මම පිළිසිඳ ගත්තෙමි. එබැවින් කරුණාකර මේ
බඩු වන, මුද්‍රාවත්, මාලයත්, සැරයටියත් කාගේ ද
කියා විමසා බලන්නැ"යි කීවා ය. 26 ජුදා ද ඒවා
හඳුනාගෙන, "මා පුත් ෂේලා ඈට නුදුන් බැවින් මට
වඩා හරි දේ කර ඇත්තේ ඈ ය"යි කී ය. එහෙත්,
ඉන්පසු ඈ සමඟ ඔහු සයනය කළේ නැත.
27 ඈ ප්‍රසව වේදනාවෙන් පසු වන විට, පුදුමයකි,
ඇගේ කුසේ නිඹුල්ලු සිටියහ. 28 ඈ දරුවන් ලබන
කල, එක දරුවෙක් අත පිටතට දැමී ය. වින්නඹු මව
ද එය ගෙන, "මොහු පළමුවෙන් පිට වී ය"යි කියා,
ඔහුගේ අතේ තද රතු නූලක් බැන්දා ය. 29 එහෙත්
ඔහු අත ඇතුළට ඇදගත් විට, ඔහුගේ සහෝදරයා
බිහි විය. එවිට වින්නඹු මව ද, "ඔබ කඩා බිඳගෙන
ආ හැටි යස යි" කියා ඔහුට පෙරෙශ් යන නම
තැබුවා ය. 30 ඉන්පසු, තම අතේ තද රතු නූල බැඳි

ඔහුගේ සහෝදරයා බිහි විය. ඔහුට ශරො යන නම
දෙන ලදී.

## ජෝසෙප් මිසරයෙහි වාසය කිරීම

39 ජෝසෙප් මිසරයට ගෙනෙයනු ලැබී ය. එකල
පාරාවෝගේ වාසල ඇමති හා මුර සෙනෙප්පති
වූ මිසර ජාතික පොතිපර්, ජෝසෙප් එහි ගෙන ගිය
ඉෂ්මායලේවරුන්ගෙන් ඔහු මිලයට ගත්තේ ය.
2 ක්‍රියා 7:9 සමිඳාණන් වහන්සේ ජෝසෙප් සමඟ
වැඩසිටියෙන් ඔහුගේ හැම කටයුත්තක් ම සාර්ථක
විය. ඔහු මිසර ජාතික තම ස්වාමියාගේ නිවසෙහි
වාසය කළේ ය. 3 ඔහුගේ ස්වාමියා ද සමිඳාණන්
වහන්සේ ජෝසෙප් සමඟ වැඩසිටි බවත්, ඔහු කළ
සියල්ල සාර්ථක වීමට උන් වහන්සේ සැලැසූ බවත්
දිටී ය. 4 එහෙයින් ජෝසෙප් ඔහුගේ ප්‍රසාදයට
පාත්‍ර විය. ජෝසෙප් ඔහුට සේවය කළේ ය. තවද
පොතිපර්, ඔහු තම ගෘහයේ කළමනාකරු කොට
පත් කර, තමා සතු සියල්ල ඔහුගේ පාලනයට බාර
දුනි. 5 ජෝසෙප් ගෘහයේ හා එහි සියල්ලේ
කළමනාකරු හැටියට පත් කළ දින පටන් සමිඳාණන්
වහන්සේ මිසර ජාතිකයාගේ ගෘහයට ආශීර්වාද
කළ සේක. ඇරත් ඔහුගේ ගෘහයේ හා වතුපිටිවල
සියල්ල කෙරෙහි ඒ ආශීර්වාදය විය. 6 පොතිපර්
තමා සතු සියල්ල ජෝසෙප්ගේ අතට බාර දුනි. ඔහු
තමා අනුභව කළ ආහාර ගැන මිස තමා සතු අන්
කිසිවක් ගැන සැලකුවේ නැත.

## ජෝසෙප් පෙළෙඹවීමේ තැත

6 ජෝසෙප් කඩවසම් පෙනුමක් ඇති, රූපසම්පන්න
කෙනෙක් විය. 7 ටික කලක් ගත වූ පසු, ඔහුගේ
ස්වාමියාගේ බිරිඳ ජෝසෙප් වෙත නෙත් හෙළා, "මා
සමඟ සයනය කරන්නැ"යි කීවා ය. 8 එහෙත් ඔහු
එය ප්‍රතික්ෂේප කර, තම ස්වාමියාගේ බිරිඳ
අමතා, "බලන්න, මා ගෙදර ඉන්න නිසා, කිසි ම
දයෙක් ගැන මාගේ ස්වාමියාට බරක් නැත. ඇරත්
ඔහු සතු සියල්ල ම මා අතට පවරා දී ඇත. 9 මේ
නිවස කෙරෙහි ඔහුට මෙන් ම මට ද පාලන බලය
ඇත. ඔබ ඔහුගේ භාර්යාව නිසා ඔබ හැරෙන්නට,
අන් සියල්ල ම මට බාර දී ඇත. එසේ නම් මම මෙ
වැනි මහා දුෂ්ට ක්‍රියාවක් කොට, දෙවියන්
වහන්සේට විරුද්ධ ව කෙසේ පව් කරම් දැ"යි ඇසී
ය. 10 දවසින් දවස, ඈ සමඟ සයනය කිරීමට හෝ
ඈ ළඟ සිටීමට හෝ ඈ ජෝසෙප්ට කතා කළ නමුත්,
ඔහු ඈට ඇහුම්කන් නුදුන්නේ ය.
11 එක් දිනක් තම සේවා කිරීම පිණිස ජෝසෙප්
ගෙටෙ ඇතුළු විය. ගෘහයේ සේවකයන්ගෙනේ
කිසිවෙක් ද එහි ඇතුළත නො සිටියේ ය. 12 ඈ
ඔහුගේ වස්ත්‍රයෙන් අල්ලාගෙන, "මා සමඟ සයනය
කරන්නැ"යි කීවා ය. එහෙත් ඔහු තම වස්ත්‍රය
ඇගේ අතේ හැරදමා ගයින් පිටතට පලා ගියේය.
13 ඈ ද, ඔහුගේ වස්ත්‍රය තමාගේ අතේ හැරදමා,
ඔහු පලා ගිය බව දුටු විට, 14 තම ගෘහයේ
සේවකයන් කැඳවා, ඔවුන්ට කතා කරමින්, "බලන්න,
මාගේ සැමියා අපට අවමන් කිරීමට අප වෙත
හෙබ්රෙව් ජාතිකයකු ගෙනොවේ ය. මා සමඟ
සයනය කිරීමට ඔහු මා ළඟට පැමිණියේ ය, මම ද
මහ හඬින් කෑගැසුවෙමි. 15 මා මහ හඬින් කෑගසන
බව ඔහුට ඇසුණු විට, මා අත ඔහුගේ වස්ත්‍රය
හැරදමා ගයින් පිටතට පලා ගියේ ය"යි කීවා ය.
16 මෙසේ කියා තම ස්වාමි පුරුෂයා එන තුරු, ඈ
ඔහුගේ වස්ත්‍රය තමා ළඟ තබාගත්තා ය. 17 ඔහුට
ද ඈ එම කතාව කියමින්, "අප වෙත ඔබ ගෙනෙ
හෙබ්රෙව් ජාතික සේවකයා, මට නිග්‍රහ කිරීමට මා
ළඟට පැමිණියේ ය. 18 මා මහ හඬින් කෑගැසූ විට
ඔහු තම වස්ත්‍රය මා වෙත හැරදමා පලා ගියේ
ය"යි සැළ කළා ය.
19 ජෝසෙප්ගේ ස්වාමියා ද, 'ඔබේ සේවකයා
මලෙසෙ කළේ ය'යි තම භාර්යාව කී වචන ඇසූ
විට, කෝපයෙන් දිළිහී, 20 ඔහු අත්අඩංගුවට ගෙන
රජුගේ සිරකරුවන් තබන සිරගෙයි දැමී ය. මෙසේ
ඔහු සිරගෙදර නැවතී සිටියේ ය. 21 ක්‍රියා 7:9
එහෙත්, සමිඳාණන් වහන්සේ ජෝසෙප් සමඟ
වැඩසිට, ඔහුට කරුණාව පෙනේවා, සිරගෙදර
පාලකයාගේ ප්‍රසාදය ද ඔහුට ලබා දුන් සේක.
22 සිරගෙයි පාලකයා ද සිරගෙදර සිටි සියලු
සිරකරුවන් ජෝසෙප්ගේ පාලනයට බාර දුන්නේ ය.
ඔවුන් එහි කළ සියල්ල පිළිබඳ වගකීම ජෝසෙප්
අතෙහි විය. 23 තවද, ජෝසෙප්ගේ පාලනයට පවරා
දුන් කිසිවක් ගැන සිරගෙයි පාලකයාට ප්‍රශ්නයක්
නො වී ය. මන්ද, සමිඳාණන් වහන්සේ ඔහු සමඟ
වැඩසිට, ඔහු කළ සියල්ල ම සාර්ථක කිරීමට සැලැසූ
නිසා ය.

## ජෝසෙප් සිරකරුවන්ගේ සිහින තෝරා දීම

40 මීට ස්වල්ප කලකට පසු මිසරයේ රජුගේ
කුසලාන පිරිනමන්නා හා පූප සාදන්නා
ඔවුන්ගේ ස්වාමියා වන මිසරයේ රජතුමාට විරුද්ධ
ව වැරදි කොට තිබිණි. 2 පාරාවෝ රජ කුසලාන
පිරිනමන්නන්ගේ ප්‍රධානියා හා පූප සාදන්නන්ගේ
ප්‍රධානියා යන මේ නිලධාරීන් දදෙනොට විරුද්ධ ව
කිපී, 3 මුර සෙනෙප්පතියාගේ නිවසෙහි වූ, සිරගෙදර
ඔවුන් දැමී ය. ජෝසෙප් ද සිරගත ව සිටියේ එම
ස්ථානයේ ය. 4 මුර සෙනෙප්පති ඔවුන් ජෝසෙප්ට බාර
දුන්නේ ය. ඔහු ඔවුන් බලාගත්තේ ය. ඔව්හු
සෑහෙන කාලයක් සිරගත ව සිටියහ.
5 එකල සිරගත ව සිටි මිසර රජුගේ කුසලාන
පිරිනමන්නා හා පූප සාදන්නා යන දදෙනො ම තම
තමන්ට ම අදාළ වූ තේරුම් ඇති සිහිනයක් බැගින්,
එක ම රාත්‍රියේ දී දුටහ. 6 උදය කාලයේ දී
ජෝසෙප් ඔවුන් වෙත පැමිණ, ඔවුන් දෙස බැලූ කල,
ඔවුන් කණස්සල්ලෙන් සිටිනු දිටී ය. 7 එවිට ඔහු තම
ස්වාමියාගේ නිවසෙහි තමා සමඟ හිරගත ව සිටි
පාරාවෝගේ වාසල නිලධාරීන්ට කතා කොට, "අද
ඔබ මෙතෙරම් මළානික ව සිටින්නේ මන්දැ"යි
විචාළේ ය. 8 ඔව්හු ද ඔහුට උත්තර දෙමින්, "අපි
දදෙනෙ ම සිහිනයක් බැගින් දුටිමු. එහෙත්, එහි

තේරුම කියා දෙන්නෙ කෙනෙකේ නැතැ"යි කී හ. එවිට
ජෝසෙප් ඔවුන් අමතා, "තේරුම දෙවියන් වහන්සේ
සතු දයෙක් නො වේ ද? කරුණාකර, මට ඒවා
කියන්නැ"යි පැවසී ය.
9 එවිට ප්‍රධාන කුසලාන පිරිනමන්නා ජෝසෙප්ට
කතා කොට, තමාගේ සිහිනය දන්වමින්, "මම,
සිහිනයේ මා ඉදිරියෙහි මිදි වැලක් දිටිමි. 10 මිදි
වැලේ රිකිලි තුනක් විය. තවද එහි, දලු ලියලා මල්
හට ගත්තේ ය. එහි වලුවල ඉදුණු මිදි ගෙඩි තිබිණි.
11 පාරාවෝගේ කුසලාන මා අතේ විය. මම මිදි
ගෙඩි ගෙන, පාරාවෝගේ කුසලානට ඒවා මිරිකා,
පාරාවෝ අතට කුසලාන දුනිමි"යි කීවේ ය.
12 ජෝසෙප් ඔහුට කතා කොට, "එහි තේරුම නම්
මෙයෙ යි. රිකිලි තුන දින තුනකි. 13 තුන් දිනක්
ඇතුළත පාරාවෝ ඔබ සිරගෙයින් පිට කර ඔබේ
නිලය නැවත ඔබට දෙන්නේ ය. ඔබ, කලින්
එතුමාගේ කුසලාන පිරිනමන්නා මෙන් සිටිය දී කළ
පරිදි නැවත පාරාවෝ අතට කුසලාන දෙන්නෙහි ය.
14 ඉතින් ඔබට හොඳ කාලයක් ආ විට මා සිහිකර,
කරුණාකර, මට ප්‍රසාදය දක්වන්න. පාරාවෝට ද මා
ගැන සඳහන් කොට, මේ සිරගෙයින් මා පිටතට
ගන්න. 15 මන්ද, ඇත්තට ම, මම හෙබ්‍රෙව්වරුන්ගේ
දේශයෙන් පැහැරගනු ලැබීමි. මෙහි දී පවා මේ
සිරගෙයි දමනු ලැබීමට මම කිසිවක් නො
කළෙමි"යි කීවේ ය.
16 ප්‍රධාන පූප සාදන්නා ද එහි තේරුම කදිම බව
දුටු විට, ඔහුත් ජෝසෙප්ට කතා කොට, "මම ද
සිහිනයේ, මාගේ හිස මත පූප පෙට්ටි තුනක් ඇති
ව සිටිනු දිටිමි. 17 උඩින් ම තිබූ පෙට්ටියේ පාරාවෝ
සඳහා පිසූ විවිධ ආහාර වර්ග තිබිණි. පක්ෂීහු අවුත්
මාගේ හිස මත තිබූ පෙට්ටියෙන් ඒවා කෑ හ"යි
කීවේ ය. 18 එවිට ජෝසෙප් පිළිතුරු දෙමින්, "එහි
තේරුම මෙයෙ යි. පෙට්ටි තුන නම් දින තුනකි. 19 දින
තුනක් ඇතුළත පාරාවෝ ඔබ සිරගෙයින් පිට කර,
ඔබ ගසක එල්ලන්නේ ය. කුරුල්ලෝ ඔබේ සිරුරෙන්
මස් කොටා කන්නෝ ය"යි කී ය.
20 තවද, තුන් වන දින, පාරාවෝගේ
ජන්මෝත්සවය වූයෙන්, ඔහු සියලු නිලධාරීන් සඳහා
මංගල භෝජනයක් පිළියෙළ කළේ ය. ඔහු
නිලධාරීන් ඉදිරියෙහි කුසලාන පිරිස්නමන්නන්ගේ
ප්‍රධානියා හා පූප සාදන්නන්ගේ ප්‍රධානියා
සිරගෙයින් පිට කර, 21 කුසලාන පිරිනමන්නන්ගේ
ප්‍රධානියා යළි එම නිලයට ම පත් කළේ ය. ඔහු
පාරාවෝ අතට කුසලාන පිරිනැමී ය. 22 එහෙත්, ඔහු
පූප සාදන්නන්ගේ ප්‍රධානියා එල්ලාදැමී ය. මෙසේ
ජෝසෙප් ඔවුන්ට තේරුම් කර දුන් ලෙස ම සියල්ල
සිදු විය. 23 එහෙත් කුසලාන පිරිනමන්නා නම්
ජෝසෙප් ගැන නොසිතා ඔහු අමතක කර දැමී ය.

### ජෝසෙප් පාරාවෝගේ සිහින තෝරා දීම

41 අවුරුදු දෙකෙකට පසු පාරාවෝ සිහිනයේ
තමා නයිල් ගංගාව අසල සිටිනු දිටී ය.
2 එවිට, බලන්න ලස්සන, තරබාරු එළදෙන්නු
හත්දෙනෙකේ ගඟින් නැඟී අවුත්, බට පඳුරු අතර
තණ කන්නට වූ හ. 3 උන්ට පසුව, අවලස්සන,
කෑහැටු, තව එළදෙන්නු හත්දෙනෙකේ ගඟින් නැඟී
අවුත්, ගං ඉවුරේ පෙර කී එළදෙන්නු ළඟ සිටගත්හ.
4 තවද, අවලස්සන, කෑහැටු එළදෙන්නු, ලස්සන
තරබාරු එළදෙනුන් හත්දෙනා කා දැමූ හ. එවිට
පාරාවෝ අවදි විය.
5 ඔහු නැවත නිදාගත්තේ ය. දෙ වන වරටත්, ඔහු
සිහිනයේ, ගොයම් ගහක හටගත් කදිම, රන්වන්
ගොයම් කරල් හතක් දිටී ය. 6 ඉන්පසු එහි, පෙරදිග
සුළඟින් වියළීගිය තව කෝඩෑරි කරල් හතක් මතු
විය. 7 තවද, කෝඩෑරි කරල් හත, කදිම, රන්වන්
කරල් හත ගිලදැමී ය. එවිට පාරාවෝ නින්දෙන් අවදි
විය. එය සිහිනයක් බව ඔහු තේරුම්ගත්තේ ය.
8 දානි 2:2 උදෑසන ඔහුගේ සිත කැළඹෙන්නට විය.
ඔහු මිසර දේශයේ ඉන්ද්‍රජාලිකයන් හා ප්‍රාඥයන්
සියල්ලන්ට පණිවුඩ යවා, ඔවුන් කැඳවා, ඔවුන්ට තම
සිහිනය දැන්වී ය. එහෙත්, පාරාවෝට එය
තේරුම්කර දීමට පුළුවන් කිසිවෙකේ නො වී ය.
9 එවිට රාජකීය කුසලාන පිරිනමන්නා පාරාවෝට
කතා කොට, "මා අතින් වූ වරද දැන් මට මතක්
වෙයි. 10 ඔබතුමා ඔබේ නිලධාරීන් සමඟ කිපී, මා
සහ පූප සාදන්නන්ගේ ප්‍රධානියා මුර සෙනෙපතිගේ
නිවසෙහි වූ හිරගෙයි දැමුවෙහි ය. 11 ඔහුත්, මමත්
එක ම රාත්‍රියෙහි සිහින දුටුවෙමු. අප දුටු සිහින ද
අප එක් එක්කෙනාට අදාළ තේරුම් ඇති සිහින විය.
12 තවද, මුර සෙනෙපතිගේ සේවකයකු වූ,
හෙබ්‍රෙව් ජාතික තරුණයෙකේ එහි විය. අප ඒවා
ඔහුට කී විට අපගේ සිහින ඔහු අපට තේරුම්
කොට දුනි. ඔහු අපට ඒවා තේරුම් කොට දුන්නේ
අප එක් එක්කෙනා දුටු සිහිනයට ගැළපෙන පරිදි ය.
13 ඇත්තට ම ඔහු අපට තේරුම් කළ ලෙස ම
සියල්ල සිදුවිය. එනම් මම නැවත නිලයට පත් කරන
ලදිමි. එහෙත් පූප සාදන්නා එල්ලාදමන ලදි"යි කීවේ
ය.
14 එවිට පාරාවෝ පණිවුඩයක් යවා ජෝසෙප්
කැඳවූ විට, ඔව්හු නොපමාව ඔහු හිරගෙයින් පිටතට
ගෙනාහ. ඔහු ද, රැවුළ කපා, තම ඇඳුම් මාරු කර,
පාරාවෝ ඉදිරියට පැමිණියේ ය, 15 පාරාවෝ
ජෝසෙප්ට කතා කොට, "මම සිහිනයක් දිටිමි. එය
තේරුම් කර දීමට හැකි කෙනෙකේ නැත. එහෙත්, නුඹ
සිහිනයක් ඇසූ විට, එය තේරුම් කොට දීමට
සමතකු බව මා අසා තිබේ ය"යි කී ය.
16 ජෝසෙප් උත්තර දෙමින්, "සමතා මම නොවෙමි.
දෙවියන් වහන්සේ පාරාවෝට සතුටුදායක පිළිතුරක්
දෙන සේකැ"යි කීවේ ය.
17 එවිට පාරාවෝ ජෝසෙප්ට කතා කොට,
"සිහිනයේ, මම ගං ඉවුරේ සිටිනු දිටිමි. 18 එවිට
පුදුමයකි! බලන්න ලස්සන තරබාරු, එළදෙන්නු
හත්දෙනෙකේ ගඟින් නැඟී අවුත් බට ගස් අතරෙහි
තණ කන්නට වූ හ. 19 උන්ට පසුව වැහැරුණු, ඉතා
අවලස්සන, කෑහැටු එළදෙන්නු හත්දෙනෙකේ ද නැඟී
ආහ. මෙබඳු අවලස්සන සතුන් මුළු මිසර දේශයෙහි
මීට පෙර මා කවදාවත් දැක නැත. 20 තවද, කෙට්ටු,

අවලස්සන එළදන්නේනු, පළමු තරබාරු එළදන්නේනු
හත්දෙන කා දැමූ හ. 21 උන් කා දැමූ පසු, උන් කෑ
බවක් දැනගන්නට වත් බැරි විය. මන්ද, කලින්
සිටියාක් මෙන් ම අවලස්සන තත්ත්වයක සිටි නිසා
ය. එවිට මම පිබිදුණෙමි.
22 තව වරක් මම සිහිනයේ, එක ගසෙයම් ගහක
හටගත් කදිම, රන්වන් කරල් හතක් දිටිමි. 23 ඊට
පසු මැළවුණු, නිසරු, පෙරදිග සුළඟින් වියළී ගිය තව
කරල් හතක් එහි මතු විය. 24 එවිට නිසරු කරල්,
රන්වන් කරල් ගිලදැමී ය. මම මයෙ
ඉන්ද්‍රජාලිකයන්ට කීවෙමි, එහෙත්, එය මට තේරා
දීමට සමත් කිසිවෙක් නැතැ”යි කීවේ ය.
25 එවිට ජෝසෙප් පාරාවෝට කතා කොට,
“පාරාවෝ දුටු සිහිනවල ඇත්තේ එක ම තේරුමකි.
දෙවියන් වහන්සේ කරන්න යන දෙය පාරාවෝට
පෙන්වා දුන් සේක. 26 හොඳ එළදෙනුන් හත්දෙන
අවුරුදු හතකි; හොඳ කරල් හත ද අවුරුදු හතකි;
සිහිනය එක ම යි. 27 තවද, උන්ට පසුව නැඟී ආ
කෑහැටු, බලන්න තරම් අවලස්සන එළදෙනුන්
හත්දෙන ද පෙරදිග සුළඟින් වියළීගිය බොල් කරල්
හත ද සාගතයක් පවතින අවුරුදු හතකි. 28 මයෙ වූ
කලී, මා පාරාවෝට කී පරිදි දෙවියන් වහන්සේ
කරන්න යන දෙය උන් වහන්සේ පාරාවෝට කල්තියා
පෙන්වාදීමකි. 29 මෙන්න, මුළු මිසර දේශය පුරා
ඉතා සරුසාර අවුරුදු හතක් පැමිණෙන්නේ ය.
30 ඉන්පසු සාගතයේ අවුරුදු හතක් පැමිණේ. එවිට
මිසර දේශයේ සියලු සමෘද්ධිය අමතක වී ගොස්,
සාගතය රට කා දමන්නේ ය. 31 පසුව එන සාගතය
ඉතා දරුණු වන හෙයින් එහි තිබූ සමෘද්ධිය නොදැනී
යන්නේ ය. 32 තවද, ඔබට ඒ සිහිනය දෙවරක් ම
පෙනුණේ, දෙවියන් වහන්සේ දැනට ම මේ සිද්ධිය
නියම කර තිබෙන නිසාත්, නුදුරු අනාගතයේ දී එය
සිදුවන්නේනට උන් වහන්සේ සලසන නිසාත් ය.
33 “දැන් ඉතින් පාරාවෝ, දක්ෂ, විචක්ෂණ
මිනිසකු සොයා බලා, මිසර දේශයේ පරිපාලනය
ඔහුට බාර දිය යුතු ය. 34 පාරාවෝ මයෙ කළ පසු,
රටට නිලධාරීන් පත් කොට, සශ්‍රීක අවුරුදු හත
තුළ, ඉඩකඩම්වලින් පහළේ පංගුවක බද්දක් අය
කළ යුතු ය. 35 ඔවුන් ඒ සශ්‍රීක අවුරුදු හත තුළ
ඇති වන සියලු ආහාර වර්ග එකතු කළ යුතු ය.
තවද, ධාන්‍ය, පාරාවෝගේ පාලනය යටතේ ගබඩා
කරමින්, ආහාර වර්ග නගරවල තබා ආරක්ෂා කළ
යුතු ය. 36 මිසර දේශයේ ඇතිවන්නේනට යන සාගත
අවුරුදු හත වළක්වාලීම සඳහා ඒ ආහාර රටේ
ගබඩා කොට තැබුවහොත් සාගතයෙන් රට විනාශ
නොවෙනු ඇතැ”යි කීවේ ය.

### ජෝසෙප් මිසර දේශාධිපති වීම

37 ඔහුගේ යෝජනාව පාරාවෝට ද ඔහුගේ
නිලධාරීන් සියල්ලන්ට ද සතුටුදායක විය. 38 එවිට
පාරාවෝ තම නිලධාරීන් අමතා, “තමන් තුළ දෙවියන්
වහන්සේගේ ආත්මයාණන් වැඩසිටින මෙබඳු
කෙනෙකු අපට තවත් සොයාගත හැකි දැ”යි ඇසී ය.
39 මෙසේ විචාරා, ඔහු ජෝසෙප්ට කතා කොට,
“දෙවියන් වහන්සේ මේ සියල්ල ඔබට පෙන්වා
වදාළ හෙයින් ඔබ වැනි බුද්ධිමත්, දක්ෂ විචක්ෂණ
තව කෙනෙකේ නම් නැත. 40 ක්‍රියා 7:10 මගේ රටේ
පාලනය මම ඔබට බාර දෙමි. මාගේ සෙනඟ සියලු
දෙනා ම ඔබේ කීම අනුව පාලනය කරනු ලබති. මා
ඔබට වඩා උසස් වන්නේ හුදකේ රාජ ධූරයෙන්
පමණකි. 41 බලන්න, මුළු මිසර දේශාධිපති කොට
මම ඔබ පත් කරමි”යි කියා, 42 දානි 5:29 ඔහු තම
ඇඟිල්ලෙන් පේරුස් මුදුව ගලවා, ජෝසෙප්ගේ
ඇඟිල්ලෙහි දමා, අගනා සිනිඳු වස්ත්‍ර ඔහුට හඳවා,
ඔහු ගලෙ රන් මාලයක් පැළඳ විය.
43 පසුව පාරාවෝ තමා සතු දෙ වන රාජකීය
රථයේ ඔහු නංවාලී ය. රාජකීය මුර බළ ඇණිය,
“දණ නමව්” කියා කෑගසමින් පෙරටුව ගියහ. මෙසේ
පාරාවෝ මුළු මිසර දේශාධිපති කොට ඔහු පත්
කළේ ය. 44 තවද, ඔහු ජෝසෙප් අමතමින්, “මම
පාරාවෝ වෙමි, එහෙත් ඔබේ අවසරය නැති ව, මුළු
මිසර දේශයෙහි කිසිවෙකු අත වත්, පය වත්
නොසෙල්විය යුතු ය”යි කීවේ ය. 45 ඔහු ජෝසෙප්ට
ශාපේනත්-පනේයා යන නම තබා, ඕන් යන
පූජාස්ථානයේ පූජක වන පොතිපෙරගේ දුව වන
ආසෙනත් ඔහුට බිරිඳ කොට සරණ පාවා දුන්නේ ය.
ජෝසෙප් ද මුළු මිසර දේශය පුරා නිල චාරිකාවක
යෙදුණේ ය.
46 මිසරයේ රජ වන පාරාවෝගේ සේවයට
ජෝසෙප් බැඳෙන විට ඔහුට වයස අවුරුදු තිහකි.
ඔහු පාරාවෝ ඉදිරියෙන් නික්ම මුළු මිසර දේශය
පුරා නිල චාරිකාවක යෙදිණි. 47 සමෘද්ධිමත් වූ
අවුරුදු හත තුළ භූමිය ද සුවිශාල අස්වැන්නක්
නිපදවිය. 48 ඔහු සත් අවුරුද්ද තුළ මිසර දේශයෙහි
වූ සියලු ආහාර වර්ග රැස් කොට, ඒවා නගරවල
ගබඩා කළේ ය. සෑම නගරයක් අවට තිබූ ආහාර
ද ඔහු එලෙස ම ගබඩා කොට තැබී ය. 49 ඇරත්,
ඔහු මුහුදේ වැලි මෙන් විශාල ප්‍රමාණයකට ධාන්‍ය
රැස් කළේ ය. ධාන්‍ය මැනීමට බැරි තරම් අධික
වූයෙන් ඔහු ඒවා මැනීම නතර කළේ ය.

### ජෝසෙප්ගේ පුත්‍රයෝ

50 ඕන් නම් පූජාස්ථානයේ පූජක වන
පොතිපෙරගේ දුව වන ආසෙනත් සාගත කාලය
පැමිණෙන්නේනට පෙරෙ ජෝසෙප්ට දාව පුත්‍රයන්
දෙදෙනෙකු ලැබුවා ය. 51 “දෙවියන් වහන්සේ මාගේ
සියලු දුක් කරදර සහ මාගේ පියාගේ මුළු පවුල ද
අමතක කිරීමට මට සැලැසූ සේකැ”යි කියා ඔහු තම
කුලුඳුල් පුතුට මනස්සේ යන නාමය දුනි.
52 “දෙවියන් වහන්සේ අපල දේශයේ දී මා සඵල
කළ සේකැ”යි කියා ඔහු දෙවැන්නාට එප්‍රායිම් යන
නම තැබී ය.
53 තවද, මිසර දේශයෙහි පැවති සමෘද්ධිමත්
අවුරුදු හත කෙළවර විය. 54 ක්‍රියා 7:11ජෝසෙප් කී
පරිදි සාගත අවුරුදු හත පැමිණෙන්නේන පටන්ගති.
සාගතය සියලු රටවල ම පැවතිණි. එහෙත්, මුළු

මිසර දේශය තුළ ම ආහාර තිබුණේ ය. 55 ජොහ
2:5 මුළු මිසර දේශය ම සාගතයෙන් පෙළුණ විට,
සෙනඟ ද ආහාර ඉල්ලා පාරාවෝට මොරගැසූ හ.
පාරාවෝ ද සියලු මිසර වාසීන්ට කතා කොට,
“ජෝසප් වෙත යන්න, ඔහු නුඹලාට කියන දයෙක්
කරන්නැ”යි කී ය. 56 සාගතය ද මුළු පොළොවේ තලය
පුරා පැවතිණි. ජෝසප් ගබඩා සියල්ල විවෘත
කොට, මිසර වාසීන්ට ධාන්‍ය වික්කේ ය. මුළු මිසර
දේශය තුළ සාගතය තදින් බලපෑවේ ය. 57 ධාන්‍ය
මිලට ගැනීම සඳහා සෑම රටවලින් ම සෙනඟ
ජෝසප් වෙත මිසර දේශයට ගලා එන්නට වූ හ.
සෑම රටක ම සාගතය දරුණු ලෙස පැවතිණි.

### ජෝසප් හා සහෝදරයන් මුණගැසීම

42 මිසරයෙහි ධාන්‍ය තිබෙනෙ බව ඇසූ ජාකොබ්
තම පුතුන්ට කතා කොට, “නුඹලා එකිනෙකො
දෙස බල බලා නිකම් ඉන්නේ මන් ද? 2 ක්‍රියා 7:12
බලන්න, මිසරයෙහි ධාන්‍ය තිබෙනෙ බව මා අසා
ඇත. නුඹලා එහි ගොස්, අප නොමැරී ජීවත් වන
පිණිස අපට ධාන්‍ය එහෙන් මිලයට ගන්නැ”යි කීවේ
ය. 3 එවිට ජෝසප්ගේ සහෝදරයෝ දසදෙනො
මිසරයේ ධාන්‍ය මිලයට ගනු පිණිස ගියහ. 4 එහෙත්
ජාකොබ්, ජෝසප්ගේ සහෝදරයා වන
බෙන්ජමින්ට ‘සමහරවිට අනතුරක් වේ ය’යි සිතා
ඔහුගේ සහෝදරයන් සමඟ ඔහු නොහැරියේ ය.
5 මෙලෙස කානාන් දේශයේ ද සාගතය පැවතිණි,
ධාන්‍ය මිලට ගැනීමට ආ අය අතර ඉශ්රායලේගේ
පුත්‍රයෝ ද වූ හ. 6 ජෝසප් රටේ අධිපති වූවාක්
මෙන් ම, රටේ මිනිසුන් සියල්ලන්ට ම ධාන්‍ය
විකුණුවේ ද ඔහු ය. ඔහුගේ සහෝදරයෝ පැමිණ,
ඔහු ඉදිරියෙහි මුණින්තලා වී වැන්දා හ. 7 ජෝසප්
ඔහුගේ සහෝදරයන් දැක, ඔවුන් හඳුනාගත් නමුත්,
තමා නාඳුනන්නාක් මෙන් හඟවා, ඔවුන්ට තදින් කතා
කරමින්, “නුඹලා ආවේ කිනම් රටකින් දැ”යි ඇසී ය.
“ආහාර මිලට ගනු පිණිස කානාන් දේශයෙන් ය”යි
ඔව්හු කී හ.
8 ජෝසප් තම සොහොයුරන් හැඳින ගත් නමුත්,
ඔව්හු ඔහු හැඳින නොගත් හ. 9 උත් 37:5-10 ඔවුන්
ගැන දුටු සිහින ද ඔහුට මතක් වී, ඔවුන්ට කතා
කොට, “නුඹලා ඔත්තුකාරයෝ ය; නුඹලා පැමිණියේ
රටේ දුබල තැන් බැලීමට ය”යි කීවේ ය. 10 එවිට
ඔව්හු ඔහුට උත්තර දෙමින්, “නැත ස්වාමීනි, ඔබේ
දාසයන් පැමිණියේ ආහාර මිලට ගැනීමට පමණ ය.
11 අපි සියල්ලෝ ම එක මිනිසකුගේ පුත්‍රයෝ
වමු. අපි අවංක මිනිස්සු ය. ඔබේ දාසයෝ
ඔත්තුකාරයෝ නොවෙති”යි කී හ. 12 එවිට ජෝසප්
නැවතත් ඔවුන්ට කතා කරමින්, “එසේ නොවේ,
නුඹලා ආවේ රටේ දුබල තැන් බලාගන්නට පමණ
ය”යි කී ය. 13 ඔව්හු ද පිළිතුරු දෙමින්, “ඔබේ
දාසයෝ වනාහි කානාන් දේශයේ එක ම
මිනිසකුගේ පුත්‍රයන් වන සහෝදරයෝ
දොළොස්දෙනෙකි. ඇත්තට ම බාල ම තැනැත්තා අද
අපේ පියා සමඟ ය. එක් කෙනෙකු නම් ආගිය
අතක් නැතැ”යි කී හ. 14 ජෝසප් ද නැවතත් ඔවුන්
අමතමින්, “ ‘ නුඹලා ඔත්තුකාරයෝ ය’යි මා
නුඹලාට කීවේ අන්න ඒ නිසයි. 15 නුඹලා කවුරු ද
කියා මම පරීක්ෂා කර බලන්නට යමි. නුඹලාගේ
බාල ම සහෝදරයා මෙහි එන තුරු නුඹලා මෙතැනින්
නොයෙන්නහු ය යි පාරාවෝගේ නාමයෙන් දිවුරා
කියමි. 16 නුඹලාගෙන් කෙනෙකු පිටත් කර හරින්න,
ඔහු නුඹලාගේ සහෝදරයා කැඳවාගෙන ආ යුතු ය.
තවද, නුඹලා අවංක අය ය යි කියන කීම පරීක්ෂා
කර බලන තුරු නුඹලා හිරබාරයේ තබනු ලබන්නහු
ය. එසේ නොවී නම්, නුඹලා ඔත්තුකාරයෝ ය කියා
පාරාවෝගේ නාමයෙන් මම දිවුරා කියමි”යි පැවසී ය.
17 ඔහු ඔවුන් සියල්ලන් දින තුනක් ම හිරබාරයේ
තැබී ය.
18 තුන් වන දින ජෝසප් ඔවුන්ට කතා කොට,
“මම දෙවියන් වහන්සේ කෙරෙහි ගරුබිය
ඇත්තෙක්මි. එබැවින් නුඹලා පණ බේරාගන්න
කැමැති නම් මෙසේ කරන්න; 19 නුඹලා අවංක අය
නම්, සොහොයුරන් වන නුඹලාගෙන් කෙනෙකු, මේ
සිරගෙයි සිර අඩස්සියේ තබා අනෙක් අය නුඹලාගේ
පවුල්වල ඇති සාගතය සඳහා ධාන්‍ය රැගෙන යන්න.
20 එහෙත්, බාල ම සහෝදරයා මා වෙත ගෙනෙ යුතු
ය. මෙලෙස නුඹලා ඇත්ත කී බව ඔප්පු වීමෙන්
මරණයෙන් බේරෙන්නෙහු ය”යි කී ය.
20 ඔව්හු ද ඊට එකඟ වූ හ. 21 ඉන්පසු ඔව්හු
එකිනෙකො අමතමින්, “අපි ඇත්තෙන් ම අපගේ
සහෝදරයාට කළ දේ ගැන වරදකරුවෝ වමු. ඒ
මන්ද, ඔහු අපට කන්නලව් කරද්දී ඔහුගේ වේදනාව
දැක දැකත්, අපි ඇහුම්කන් නුදුන්නෙමු. මේ විපත
අපට පැමිණියේ ඒ නිසා ම ය”යි කීවෝ ය.
22 උත් 37:21-22 එවිට රූබන් පිළිතුරු දෙමින්, “
‘ළමයාට විරුද්ධ ව පව් නොකරන්න,’ කියා මා ඔබට
කීවා නොවේ ද? එහෙත්, ඔබ ඇහුම්කන් නුදුන්නහු
ය. එබැවින්, මෙන්න, ඔහුගේ ලේ ගැන අප දැන්
වන්දි ගෙවිය යුතු ය”යි කී ය.
23 ඔවුන් කී දේ ජෝසප් තේරුම් ගත් බව ඔව්හු
දැන නොගත්හ. මන්ද, ඔහු ඔවුන්ට කතා කළේ
තෝල්කයෙකු මඟින් බැවිනි. 24 ඔහු ද ඔවුන්ගෙන්
ඉවතට ගොස් හැඬී ය. පසුව යළි ඔවුන් වෙත
පැමිණ ඔවුන් සමඟ කතා කොට, ඔවුන් අතරෙන්
සිමියොන් රැගෙන, ඔවුන් ඉදිරිපිට ම ඔහු බැන්දේ
ය.

### ජෝසප්ගේ සහෝදරයන් හැරී යාම

25 ඉන්පසු ජෝසප්, ඔවුන්ගේ ගෝණි ධාන්‍යයෙන්
පුරවා, සෑම දෙනාගේ ම මුදල් එකිනෙකාගේ
ගෝණිවල දැමීමටත්, ගමනට උවමනා ආහාර
ඔවුන්ට දීමටත් අණ කළෙන්, ඔවුන්ට එලෙසෙ කරන
ලදී. 26 ඔව්හු කොටළුවන් පිට ධාන්‍ය පටවාගෙන
එතැනින් නික්ම ගියහ. 27 රාත්‍රියේ නැවතුම්
පොළේ දී ඔවුන්ගෙන් කෙනෙක් තම කොටළුවාට
කෑම දෙන පිණිස තම ගෝණිය හැරිය විට, තමාගේ
මුදල් ගෝණි කටේ තිබෙනු දිටී ය. 28 එවිට ඔහු

තම සහොහොයුරන්ට කතා කොට, “මාගේ මුදල්
ආපසු දමා ඇත. බලන්න, එය මාගේ ගෝණිය තුළ
ය”යි කී විට, ඔවුන්ගේ සිත් වියවුල් වී, ඔව්හු
බියනේ එකිනකො අමතමින්, “දවේයන් වහන්සේ
අපට කළ මේ දේ කුමක් දැ”යි කියන්නට වූ හ.
29 ඔව්හු කානාන් දේශයේ තම පියා වන ජාකොබ්
වෙත පැමිණ තමන්ට සිදුවූ සියල්ල ම ඔහුට
දන්වමින්, 30 “දේශාධිපතියා වූ තැනැත්තා අපට
තදින් කතා කොට ඒ රටේ ඔත්තුකාරයන් ලසෙ අප
සැලකී ය. 31 අපි ද ඔහු අමතා, අප අවංක අය
බවත්, ඔත්තුකාරයන් නොවන බවත් කීවමු.
32 ඇරත් අපි එක ම පියකුගේ පුතුන් වන
සහෝදරයන් දොළොස්දනෙකුෙන් බවත්, එක්
කනෙකු නැති බවත්, බාලයා දැන් කානාන් දේශයේ
අපගේ පියා සමඟ සිටින බවත් කීවමු. 33 එවිට
දේශාධිපතියා වූ ඒ මනුෂ්යයා අපට කතා කොට,
‘නුඹලා අවංක අය බව මයෙින් දැනගන්නමේ. එනම්,
නුඹලාගේ සහෝදරයන්ගනේ කනෙකු මා ළඟ
නවත්වා නුඹලාගේ පවුල්වල සාගතය සඳහා ආහාර
රුගනෙ පිටතට යන්න. 34 තවද, නුඹලාගේ බාල ම
සහෝදරයා මා වෙත ගනෙනේන; මයෙින් නුඹලා
ඔත්තුකාරයන් නොවන බවත්, අවංක මිනිසුන් බවත්
මම දැනගන්නමේ. එවිට නුඹලාගේ සහෝදරයා
ආපසු මම නුඹලාට දනේනමේ. නුඹලාට ද රටේ
වළෙහළෙඳාම් කළ හැකි ය’ කියා කීවේ ය”යි සැළ
කළහ.
35 ඔව්හු තමන්ගේ ගෝණි හිස් කළ විට,
එකිනකොගේ මුදල් පොදිය ඒ ඒ අයගේ ගෝණියේ
තිබනු දුට හ. ඔව්හු ද, ඔවුන්ගේ පියා ද මුදල්
පොදි දුටු විට බිය වූ හ. 36 එවිට ඔවුන්ගේ පියා
වන ජාකොබ් ඔවුන් අමතමින්, “නුඹලා දරුවන්ගනේ
මා වියෝ කළහු ය. ජෝසපේ දැන් නැත. සිමියොන්
ද නැත, බනේජමින් ද රුගනෙ යෑම නුඹලාට උවමනා
වී තිබේ. මේ සියලු දුක් විඳින්නා මම ය”යි කීවේ
ය. 37 එවිට රූබන් තම පියාට කතා කොට, “ඔබ
වෙත මා ඔහු ආපසු නොගනොවොත්, මාගේ දරුවන්
දදෙනෙ මරාදමන්න; මට ඔහු බාර දනේන: මම
ආපසු ඔහු ඔබ වෙත ගනෙනේනමේ”යි කීවේ ය.
38 ජාකොබ් එවිට පිළිතුරු දමේින්, “නුඹලා සමඟ
මාගේ පුත්රයා නම් නොයනු ඇත, ඒ මන්ද, ඔහුගේ
සහෝදරයා මළ පසු, ඉතිරි වී ඇත්තේ ඔහු පමණ
යි. නුඹලා යන අතරමඟ දී ඔහුට අනතුරක් සිදු
වුණොත් වයස් ගත මට දුක් පමුණුවා, නුඹලා මා
මරාදමන්නහු ය”යි කීවේ ය.

### බනේජමින් මිසරයට ගනෙ යාම

43 සාගතය රටේ තදබල විය. 2 මිසරයනේ
ගනො ධාන්ය කා නිම කළ පසු, ඔවුන්ගේ
පියා ඔවුන්ට කතා කොට, “නැවත ගොස් කෑම
ටිකක් අපට මිලයට ගන්නැ”යි කී ය. 3 එවිට ජූදා
ඔහු අමතා, “ ‘නුඹලාගේ සහෝදරයා නුඹලා සමඟ
සිටියොත් මිස නුඹලා නම් මා ඉදිරියට නොපැමිණිය
යුතු ය’යි ඒ මිනිසා අපට තදින් අවවාද කළෙේ ය.
4 ඔබ අපගේ සහෝදරයා අප සමඟ යවන්නහෙි නම්,
අපි ගොස් ඔබට ආහාර මිලයට ගන්නමෙු. 5 එහතේ
ඔබ ඔහු යවන්නේ නැත්නම්, අපි ද නොයන්නමෙු. ඒ
මන්ද, ‘නුඹලාගේ සහෝදරයා නුඹලා සමඟ
නැත්නම් නුඹලා මා ඉදිරියට නොපැමිණිය යුතු ය’යි
ඒ මිනිසා අපට කීවේ ය”යි පැවසී ය.
6 එවිට ඉශ්රායලේ කතා කොට, “නුඹලාට ‘තව
සහෝදරයකෙු ඇතැ’යි කීමනේ මට වද කරන්නේ
මන්ද”යි ඇසී ය. 7 ඔව්හු ද පිළිතුරු දමේින්, “
‘නුඹලාගේ පියා තව ම ජීවත් ව සිටිනවා ද?
නුඹලාට තව සහෝදරයකේ ඉන්නවා ද?’ කියා
මිනිසා අප ගැනත්, අපේ පවුල ගැනත් දිගට ම
අසන විට අපි ද ඒ ප්රශ්න අනුව උත්තර දුනිමු.
‘නුඹලාගේ සහෝදරයා ගනෙ ආ යුතු’යි කියන්න යන
බව අප දන්නේ කසෙේ දැ”යි ඇසූ හ. 8 ජූදා තම
පියා වන ඉශ්රායලේට කතා කොට, “ළමයා මා
සමඟ යවන්න, එවිට අපත්, ඔබත්, අපේ කුඩා
දරුවනුත් නොමැරී ජීවත් වන පිණිස අපි නැඟිට
පිටත් ව යන්නමෙු. 9 මම ඔහු ගැන ඇපකාරයකේ
වමේ. ඔහු ගැන වගකීම මා පිට පවරන්න. මම ඔබ
වෙත ඔහු ගනෙවුත් ඔබ ඉදිරියහෙි ඔහු
නොසිටුවන්නමේ නම්, සදහට ම ඒ ගැන මම
වරදකරු වන්නමේ. 10 අපි මහෙි නළෙංගු වී
නොසිටියමෙු නම් ඇත්තනේ ම දෙ වන වරටත්
ගොස් ආපසු එන්න තිබුණි”යි කී ය.
11 එවිට ඔවුන්ගේ පියා වන ඉශ්රායලේ, එනම්
ජාකොබ්, ඔවුන් අමතමින්, “දැන් ඉතින් එලසෙ විය
යුතු ම නම්, මයෙ ද කරන්න; අපේ රටේ ඇති
ඉස්තරම් දේවල් වන ගුගුල් ටිකක් හා මී පැණි
ටිකක් ද කුළු බඩු හා ගන්ධරස ද ඇට වර්ග හා
කොට්ටම්බා ද ඔබේ පොදිවල දමාගනෙ ඒ මිනිසාට
තෑග්ගක් වශයනේ ගනෙ යන්න. 12 තවද, මුදල්
දගුෙණයක් අතේ ගනෙ යන්න; නුඹලාගේ
ගෝණිවල කටේ තිබුණු මුදල් ද අතේ රුගනෙ
යන්න; ඇතැම් විට එය ප්රමාද දෝෂයකින් වූවක්
වනේන පුළුවන. 13 නුඹලාගේ සොහොයුරු රුගනෙ,
නැඟිට ඒ මිනිසා වෙත ආපසු යන්න; 14 තවද, ඒ
මිනිසා නුඹලාගේ අනකේ සහෝදරයා ද බනේජමින්
ද ආපසු එවන ලසෙ, සියලු බලැති දවේයන්
වහන්සේ ඔහු හමුවහෙි නුඹලා හට ප්රසාදය
ලැබනේනට සලසන සේක් වා! මාගේ දරුවන්
නැතිවනෙවා නම් ඔව්හු නැතිවතේ වා!”යි කීවේ ය.
15 ඔව්හු තෑගි ගනෙ, තමන්ගේ පසුම්බිවල මුදල්
දගුෙණයක් ලාගනෙ, බනේජමින් ද රුගනෙ, නැඟිට,
මිසරය බලා ගොස් ජෝසපේ ඉදිරියහෙි සිටගත්හ.
16 ජෝසපේ ඔවුන් සමඟ බනේජමින් සිටිනු දුටු විට,
තම ගෘහයේ කළමනාකරුට කතා කොට, “මේ
මිනිසුන් මාගේ ගෘහයට ගනෙ යන්න; සතකු මරා
පිළියළෙ කරන්න; මාගේ ගෘහයේ ඔවුන් මා සමඟ
දිවා භෝජනය වළඳනු ඇතැ”යි කීවේ ය. 17 ඔහු
ජෝසපේ කී ප්රකාර කර ජෝසපේගේ ගෘහයට
ඔවුන් කැඳවාගනෙ ආවේ ය.

18 ජෝසෙප්ගේ ගෘහයට ඔවුන් ගෙනා බැවින්,
ඔව්හු බිය වී, “අප මෙහි ගෙනාවේ පළමු වර අප
ගෝණිවල ආපසු දමා තිබූ මුදල් නිසා ය, ඔහු අපට
අඩන්තේට්ටම් කොට පහර දී, අප වහලුන් කොට,
අපගේ කොටළුවන් ද ගන්නට යන්නේ ය”යි කී හ.
19 පසුව ඔව්හු ජෝසෙප්ගේ ගෘහයේ කළමනාකරු
වෙත පැමිණ, ගෙදර දොර අසල ඔහු සමඟ කතා
කරමින්, 20 “මහතාණෙනි, පළමු වරක් ද ආහාර
මිලට ගැනීම සඳහා අපි ඇත්තෙන් ම පැමිණියෙමු.
21 අප නැවතුම් පොළට පැමිණ අපගේ ගෝණි ඇරිය
විට සෑම මිනිසකුගේ ම මුදල්, හරි කිරුම් බරට
ගෝණි කටේ තිබෙනු අපි දුටුවෙමු. අපි ද එය
නැවත ගෙනාවෙමු. 22 ඇරත් ආහාර මිලට ගැනීම
සඳහා තවත් මුදල් ද අප අතේ ගෙනාවෙමු. අපගේ
ගෝණිවල මුදල් දැමුවේ කවුද කියා නොදනිමු”යි කී
හ.
23 එවිට ඔහු උත්තර දෙමින්, “ඔබට ආසිරි වේ වා!
බිය නොවන්න, ඔබේ දෙවියන් වහන්සේ ද, ඔබේ
පියාගේ දෙවියන් වහන්සේ ද, ඔබේ ගෝණිවල
ඔබට නිධානයක් දුන් සේක. ඔබේ මුදල් මට
ලැබුණේ ය”යි කී ය. ඉන්පසු ඔහු සිමියොන් ඔවුන්
වෙත කැඳවාගෙන ආවේ ය.
24 පසුව ඔහු, ඔවුන් ජෝසෙප්ගේ ගෘහයට
ගෙනැවිත්, ඔවුන්ට වතුර දුන් විට ඔව්හු තමන් පාද
සෝදාගත්හ. ඉන්පසු ඔහු ඔවුන්ගේ කොටළුවන්ට
ආහාර දුනි. 25 එම ගෘහයෙහි තමන් ආහාර වැළඳිය
යුතු බව ඔවුන් අසා තිබුණෙන්, මද්දහනේ දී
ජෝසෙප් එන විට තෑග්ග දීමට ඔව්හු සූදානම් වූ හ.
26 ජෝසෙප් ගෘහයට පැමිණි විට ඔව්හු තමන් ළඟ
තිබූ තෑග්ග ඔහුට පිරිනමමින් බිමට නැමී වැන්දා හ.
27 ඔහු ඔවුන්ගේ සුවදුක් අසමින්, “නුඹලා කී මහලු
පියාගේ සැපසනීප කොහොම ද? ඔහු තව ම ජීවත්
ව සිටී දැ”යි විමසී ය. 28 ඔව්හු ද පිළිතුරු දෙමින්,
“ඔබේ දාසයා වූ අපගේ පියා හොඳ සනීපයෙන් සිටී;
ඔහු තව ම ජීවත් ව සිටින්නේ ය”යි කියා හිස
පහත් කොට නමස්කාර කළහ.
29 ජෝසෙප් හිස ඔසවා බැලූ කල තම මවගේ
පුත්‍රයා වන, තම සහෝදර බෙන්ජමින් දැක, “නුඹලා
මට කී නුඹලාගේ බාල ම සහෝදරයා මොහු දැ”යි
අසා, “මා පුත, ඔබට දෙවි සරණ ලැබේ වා!”යි
කීවේ ය. 30 තම සහෝදරයා කෙරෙහි ජෝසෙප්ගේ
සිත කම්පා වී, තම නෙත් කඳුළින් පිරී ගියෙන්, ඔහු
වහා පිටත ගොස්, තම කාමරයට ඇතුළු වී,
හඬන්නට විය. 31 පසුව ඔහු මුහුණ සෝදාගෙන,
පිටතට අවුත් තමා ම හික්මවා ගනිමින්, “කෑම
මේසය පිළියෙළ කරන්නැ”යි කී ය.
32 සේවකයෝ ජෝසෙප්ට වෙන ම මේසයක් ද
ඔහුගේ සහෝදරයන්ට වෙන ම මේසයක් ද ඔහු
සමඟ වැළඳූ මිසර වාසීන්ට වෙන ම මේසයක් ද
පිළියෙළ කළහ. මන්ද, මිසර වැසියන් හෙබ්‍රෙව්වරුන්
සමඟ කෑම නොකෙන බැවිනි. එසේ කළොත් මිසර
වැසියන්ට එය පිළිකුලකි. 33 ජෝසෙප්ගේ
සහෝදරයෝ ද ඔහුට මුණ ලා, වැඩිමලා පටන්
බාලයා දක්වා වයස් අනුව පිළිවෙළට වාඩි කරවන
ලදහ. ඔව්හු විස්මිත වී එකිනෙකා දෙස බැලූ හ.
34 පසුව ජෝසෙප් තම මේසයෙන් ඔවුන්
එකිනෙකාට ආහාර යැව්වේ ය. එහෙත්,
බෙන්ජමින්ගේ කොටස අනික් අයගේ කොටස්
මෙන් පස් ගුණයක් විය. ඔව්හු ද ඔහු සමඟ බීම
පානය කොට ප්‍රීති ප්‍රමෝද වූ හ.

## නැති වූ කුසලාන

44 ජෝසෙප් තම ගෘහයේ කළමනාකරුට කතා
කොට, “මොවුන්ගේ ගෝණි මොවුන්ට
උසුලාගෙන යන්න හැකිතරම් ආහාරවලින් පුරවා,
එකිනෙකාගේ මුදල් ඒ ඒ අයගේ ගෝණි කටේ
දමන්න. 2 තවද, මාගේ කුසලාන එනම් මාගේ රිදී
කුසලාන, බාලයාට අයිති ගෝණියේ කටේ ඔහු
ධාන්‍යවලට ගෙවූ මුදලත් සමඟ දමන්නැ”යි අණ
කළේ ය. ඔහු ද ජෝසෙප් කී හැටියට ම ඉටු
කළේ ය.
3 උදය පහන් වූ කල ජෝසෙප්ගේ සහෝදරයෝ
ඔවුන්ගේ කොටළුවන් සමඟ පිටත් කර හරින ලදහ.
4 මොවුන් නගරයෙන් පිටතට ගොස්, වැඩි දුරක්
යන්නට ප්‍රථම, ජෝසෙප් තම කළමනාකරුට කතා
කොට, “නැඟිට අර මිනිසුන් ලුහුබැඳ යන්න, නුඹට
ඔවුන් හමු වූ කල ඔවුන්ට කතා කොට, ‘හොඳක්
කළා ම නරකක් කළේ මන් ද? නුඹලා මාගේ රිදී
කුසලාන සොරකම් කළේ ඇයි? 5 මාගේ ස්වාමියා
පානය කරන්නටත්, දිවැස් කියන්නටත් භාවිත
කරන්නේ මෙය නොවේ ද? මෙසේ කිරීමෙන් නුඹලා
කර ඇත්තේ දුෂ්ටකමක්’ කියා කියන්නැ”යි කීවේ ය.
6 කළමනාකරු ඔවුන් හමු වූ විට එසේ ම කී ය.
7 එවිට ඔව්හු ඔහුට කතා කොට, “ස්වාමිනි, ඔබ
මෙසේ කීමෙන් අදහස් කරන්නේ කුමක් ද?
මෙවැන්නක් කිරීමට ඔබේ දාසයන් හීනෙන් වත්
සිතන්නේ නැත. 8 බලන්න, අපගේ ගෝණි කටේ තිබී
සම්බ වූ මුදල් ද කානාන් දේශයේ සිට නැවත ඔබ
වෙත අපි ගෙනාවෙමු. එසේ නම් ඔබ ස්වාමියාගේ
ගෘහයෙන් රිදී හෝ රත්රන් හෝ අප සොරකම්
කරන්නේ කොහොම ද? 9 ඔබගේ දාසයන් අතර
යම් කෙනෙකු ළඟ තිබී එය සොයාගතහොත් ඔහු
මැරුණා වේ! අපි ද අප ස්වාමින්ගේ වහල්ලු
වන්නෙමු”යි කී හ. 10 ඔහු පිළිතුරු දෙමින්, “හොඳයි,
නුඹලා කී ලෙස ඉටු වේ වා! කවුරුන් හෝ ළඟ තිබී
එය සම්බවුවහොත් ඔහු මාගේ වහලා වන්නේ ය;
නුඹලා නිදහස් වන්නහු ය”යි කීවේ ය. 11 එවිට
ඔව්හු කඩිනම් කොට එකිනෙකා තම තමාගේ
ගෝණි බිමට බා, තම තමාගේ ගෝණි ඇරියෝ ය.
12 ඔහු ද වැඩිමලාගෙන් පටන්ගෙන බාලයා දක්වා
ඒවා අවුස්සා බැලූ විට බෙන්ජමින්ගේ ගෝණියේ
තිබී කුසලාන සම්බ විය. 13 එවිට ඔව්හු දුකින් තම
වස්ත්‍ර ඉරාගෙන, තම තමන් කොටළුවන් පිට බඩු
පටවාගෙන ආපසු නගරය බලා පැමිණියෝ ය.
14 මෙසේ ජුදා සහ ඔහුගේ සහෝදරයන්
ජෝසෙප්ගේ ගෘහයට ආපසු පැමිණි විට ජෝසෙප්
එතෙක් එහි සිටියෙන්, ඔව්හු ඔහු ඉදිරියෙහි බිම

වැටී වැන්දා හ. 15 ඔහු ඔවුන් අමතමින්, “නුඹලා කළ
මේ දේ කුමක් ද? මා වැනි කෙනෙකුට ඇත්තෙන් ම
දිවැස් කීමට හැකි බව නුඹලා නොදන්නහු දැ”යි ඇසී
ය. 16 එවිට ජුදා කතා කොට, “මාගේ ස්වාමීන් හට
අප කුමන පිළිතුරක් දෙන්නෙ ද? අප කුමක් කියන්න
ද? අපි කෙසේ නම් මේ ගැන නිදොස් වමු ද?
දෙවියන් වහන්සේ ඔබේ දාසයන්ගේ දුෂ්ටකම
මතුකර පෙනෙන්නට සැලැසූ සේක. මෙන්න, තමා
ළඟ කුසලාන තිබී සම්බ වූ තැනැත්තාත් අපිත්,
මාගේ ස්වාමීන්ගේ වහල්ලු වන්නමෝ”යි කීවේ ය.
17 ජෝසෙප් එවිට උත්තර දෙමින්, “එසේ නො වේ
වා! මම එවැන්නක් නොකරමි. එහෙත්, යමෙකු ළඟ
තිබී කුසලාන සම්බ වූයේ ද ඔහු පමණක් මාගේ
වහලා වන්නේ ය. නුඹලා සැම දෙන නැඟිට
නුඹලාගේ පියා වෙත සාමදානයෙන් යන්නැ”යි කී ය.

## ජුදා මැදහත් වීම

18 එවිට ජුදා ජෝසෙප් ළඟට පැමිණ, “මාගේ
ස්වාමීනි, කරුණාකර, ඔබට පෞද්ගලික ව වචනයක්
කීමට ඔබේ දාසයාට අවසර දෙනු මැනව. ඔබේ
දාසයාට විරුද්ධ ව ඔබේ කෝපය නොඇවිළේ වා!
ඔබ ඇත්තෙන් ම පාරාවෝ හා සමාන ය.
19 ‘නුඹලාට පියෙකු හෝ සහෝදරයෙකු හෝ සිටී
දැ’යි මාගේ ස්වාමීන් වන ඔබ දාසයන් වන අපෙන්
ඇසුවෙහි ය. 20 අපි මාගේ ස්වාමීන් අමතා, ‘මහලු
වියේ සිටින පියෙකු ද මහලු වියේ ඔහු ලැබූ කුඩා
ළමයෙකු ද අපට ඇත. ඔහුගේ සහෝදරයා මළේ ය.
මවගේ දරුවන්ගෙන් ඉතිරි ව ඇත්තේ ඔහු පමණ යි,
ඔහුගේ පියා ද ඔහුට ප්‍රේම කරයි’ කියා කීවෙමු.
21 එවිට ඔබ ඔබේ දාසයන් අමතා, ‘මට ඔහු බලා
දැකගන්න පිණිස ඔහු ගෙනෙන්නැ’යි කීවෙහි ය.
22 අපි එවිට, ‘ළමයාට නම් පියා අත්හැර එන්න බැරි
ය; පියාගෙන් ඔහු වියෝ වී ආවොත් පියා මැරේවි’
කියා කීවෙමු. 23 ඔබ එවිට ඔබේ දාසයන් අමතා,
‘නුඹලාගේ බාල සහෝදරයා නුඹලා සමඟ ආවොත්
මිස මින්පසු නුඹලා මා ඉදිරියට නො ආ යුතුය’යි
කීවෙහි ය.
24 “තවද, අපි ඔබේ දාසයා වන මාගේ පියා වෙත
පැමිණි විට, මාගේ ස්වාමියා කී දේ ඔහුට සැළ
කළෙමු. 25 අපගේ පියා, ‘නැවත ගොස් කෑම ටිකක්
අපට මිලයට ගන්න ය’යි කීවේ ය. 26 එවිට අපි,
‘අපට නම් යන්න බැරි ය; අපේ බාල ම සහෝදරයා
අප සමඟ යතොත් නම් අපි යමු; මන්ද, අපේ බාල
ම සහෝදරයා අප සමඟ නැත්නම් අප අධිපති තැන
ඉදිරියට නොයා යුතු ය’යි කීවෙමු. 27 එවිට ඔබේ
දාසයා වන මාගේ පියා අපට කතා කොට, ‘මාගේ
බිරිඳ මට දාව පුත්‍රයන් දෙදෙනෙකු බිහි කළ බව
නුඹලා දන්නහු ය. 28 එක් කෙනෙකු මාගෙන් වියෝ
වී ගිය විට, ඇත්තෙන් ම සතෙකු ඔහු කෑලි
කෑලිවලට ඉරාදමා ඇතැ යි මම කීවෙමි. මන්ද, එවක්
පටන් මම ඔහු නුදුටිමි. 29 ඔබ මොහු වත් මාගෙන්
රැගෙන ගොස් මොහුට අනතුරක් වූයේ නම්, නුඹලා
මා පැසුණු හිසකේ එක්ක වළපල්ලට අරින්නට
හදන්නහු දැ’යි කී ය. 30 දැන් ඉතින් ඔබේ දාසයා
වන මාගේ පියා වෙත මා පැමිණි විට අප සමඟ
ළමයා නැත්නම්, ඔහුගේ පණ කෙන්ද ළමයාගේ
පණ කෙන්ද සමඟ වෙළී පවතින බව මට පෙනෙන
නිසා, 31 අප සමඟ ළමයා නැති බව ඔහු දැක ඔහු
නසින්නේ ය. මෙලෙසෙ ඔබේ දාසයෝ ද ඔබ දාසයා
වන අපේ මහලු පියාට දුක් දී, මරණයට පත්
කරන්නෝ ය. 32 ඔබේ දාසයා වන මම, ‘ඔහු ඔබ
වෙත නො ගෙනොවොත් ඒ වරද, මාගේ පියා
ඉදිරියෙහි මම සදහට ම බාර ගන්නෙමි’ කියා මාගේ
පියාට ළමයාගේ ඇපකරු වූයෙමි. 33 දැන් ඉතින්,
මාගේ ස්වාමීන් වෙත ළමයා වෙනුවට මේ ඔබේ
දාසයා වහලෙකු මෙන් සිටින්නේ ය. කරුණාකර,
ළමයාට ඔහුගේ සහෝදරයන් සමඟ යන්න ඉඩ
හරිනු මැනවි. 34 ළමයා මා සමඟ නැති ව මම
කෙසේ නම් මාගේ පියා වෙතට යන්නෙම් ද? මාගේ
පියාට පැමිණෙන්නට යන විපත මාගේ ඇස්වලින්
බලන්න බැරි ය”යි කීවේ ය.

## ජෝසෙප් තමා හඳුන්වා දීම

45 ක්‍රියා 7:13 එවිට ජෝසෙප්ට තමා ළඟ සිටි
පිරිවර ඉදිරියේ තමන් සිත වාවාගත
නොහැකි වී, “සියල්ලන් ම මා වෙතින් ඉවතට යන්න
හරින්නැ”යි හඬනැඟුවේ ය. මෙසේ ජෝසෙප්
ඔහුගේ සහෝදරයන්ට තමන් ම හඳුන්වා දෙන විට
ඔහු සමඟ අන් කිසිවෙකු එහි නොසිටියේ ය. 2 ඔහු
මහ හඬින් හැඬී ය. මිසර වාසීන්ට ද, පාරාවෝගේ
රජ වාසල අයට ද එය ඇසිණි. 3 ජෝසෙප් ඔහුගේ
සහෝදරයන් අමතමින්, “මම ජෝසෙප් ය. මාගේ
පියා තව ම ජීවත් ව සිටී දැ”යි ඇසී ය. ඔහුගේ
සහෝදරයන් ඔහු දැකීමෙන් තුෂ්ණීම්භූත ව සිටි
හයෙන් ඔහුට උත්තර දීගන්නට ඔවුන්ට නොහැකි
විය.
4 නැවත ජෝසෙප් තම සහෝදරයන් අමතා,
“කරුණාකර, මා ළඟට එන්නැ”යි කී විට ඔවුන් ද ළං
වූයෙන්, “ඔබ මිසර දේශයට විකුණූ ඔබේ
සහෝදරයා වන ජෝසෙප් මම ය, 5 ඔබ මා මෙහි
විකුණූ නිසා කරදර නො වන්න; නො තැවෙන්න.
මන්ද, ඔබේ ජීවිතය රකිනු පිණිස ඔබට පෙරටුව
දෙවියන් වහන්සේ මා මෙහි එවූ සේක. 6 මේ
සාගතය රටේ පැවතෙන දෙ වන අවුරුද්ද ය;
සීසෑමක් හෝ අස්වැන්න නෙළීමක් හෝ නැති අවුරුදු
පහක් තව ඇත. 7 මිහි පිට ඔබට පෙළෙපතක්
පවතින පිණිසත්, ඔබගෙන් බොහෝ දෙනෙකු ගළවා
ඔබේ ජීවිත ආරක්ෂා කිරීමටත් දෙවියන් වහන්සේ
ඔබට පෙරටුව මා එවූ සේක. 8 එබැවින් මා මෙහි
එවූයේ ඇත්තෙන් ම ඔබ නොව දෙවියන් වහන්සේ
ය. තවද, උන් වහන්සේ පාරාවෝ හට මා පියෙකු
කොට, ඔහුගේ රජ වාසල මුදලිඳු වශයෙන් ද, මුළු
මිසර දේශාධිපති වශයෙන් ද මා පත් කළ සේක.
9 ක්‍රියා 7:14 “ඔබ සැම කඩිනම් කොට මා පියා
වෙත ගොස් ඔහුට කතා කොට, ඔබේ පුත්‍රයා වන
ජෝසෙප් මෙසේ පවසයි: ‘දෙවියන් වහන්සේ මුළු

මිසරයේ අධිපති වශයෙන් මා පත් කළ සේක. පමා
නොවී මා වෙත පැමිණෙන්න. 10 ඔබ, ගොෂෙන් නම්
පළාතේ පදිංචි වී, එහි ඔබ ද ඔබේ දරුවන් ද
දරුවන්ගේ දරුවන් ද ඔබේ එළු බැටළු පට්ටි හා ගව
පට්ටි ද ඔබ සතු සියල්ලන් ද මට කිට්ටුවෙන් සිටිය
යුතු ය. 11 තව පස් අවුරුද්දක් සාගතය පවතින
බැවින් ඔබත්, ඔබ ගෙවැසියනුත්, ඔබ සතු සියල්ලත්
ආරක්ෂා කොට, ඔබට අගහිඟයක් නැති වන සේ
මම එහි දී ඔබට සියල්ල ම සපයමි'යි කී ය.
12 තවද, ඔබට කතා කරන්නේ ජෝසෙප් ම බව ඔබ
සැමගේ නෙත්වලටත්, මා සොහොයුරු
බෙන්ජමින්ගේ නෙත්වලටත් පෙනේ ඇත.
13 ඇරත්, මිසරයේ මාගේ ශ්‍රේෂ්ඨතම පදවියත්,
ඔබ දුටු සියල්ලත් පියාට දන්වා, හනික ගොස්
මාගේ පියා මෙහි කැඳවා ගෙන එන්නැ"යි කීවේ ය.
14 ඉන්පසු ඔහු තම සොහොයුරු බෙන්ජමින්ගේ
ගෙල වැළඳගෙන හැඬී ය. බෙන්ජමින් ද ඔහුගේ
ගෙල වැළඳගෙන හැඬී ය. 15 තවද, ඔහු තම
සහෝදරයන් සියල්ලන් ම සිඹ වැළඳගෙන හැඬී ය.
පසුව ඔහුගේ සහෝදරයෝ ඔහු සමඟ කතා කළහ.

## පාරාවෝගේ ආරාධනය

16 තවද, ජෝසෙප්ගේ සහෝදරයන්ගේ පැමිණීමේ
ආරංචිය පාරාවෝගේ ගෘහයේ රැව් දිනි. මෙය
පාරාවෝට ද ඔහුගේ නිලධාරීන්ට ද ප්‍රීතිදායක විය.
17 එවිට පාරාවෝ ජෝසෙප්ට කතා කොට, "ඔබේ
සහෝදරයන් අමතා, 'මෙය කරන්න; එනම්, ඔබේ
සතුන් පිට බඩු පටවාගෙන යන්න; කානාන් දේශයට
ගොස්, 18 ඔබගේ පියා ද පවුල් ද රැගෙන මා වෙත
පැමිණෙන්න; මිසරයේ නිපදවන ඉස්තරම් දේ මම
ඔබට දෙමි; ඔබ ද රටේ ඉතා අගනා පලදාව
වළඳන්නහු ය'යි දැන්විය යුතු ය. ඔබ ද ඔවුන්ට
මෙසේ කරන්න කියා අණ කරන්න. 19 එනම්: 'ඔබේ
කුඩා දරුවන් හා භාර්යාවන් ද සඳහා මිසර දේශයේ
රථවාහන රැගෙන ගොස් ඔබේ පියා කැඳවාගෙන
එන්න. 20 ඇරත් ඔබේ දේපළ ගැන කරදර
නොවන්න, මන්ද, මිසර දේශයේ ඉස්තරම් පෙදෙස
ඔබට අයිති වන්නේ ය' කියා දන්වන්නැ"යි සැළ
කළේ ය.
21 ඉශ්‍රායලේගේ දරුවෝ ද එලෙස කළහ.
පාරාවෝගේ අණ පරිදි ජෝසෙප් ඔවුන්ට රථවාහන
ද මඟට ආහාර ද සැපයී ය. 22 ඔවුන් එක්
එක්කෙනාට අලුත් ඇඳුම් කට්ටලයක් බැගින් දුන්නේ
ය. එහෙත්, ඔහු බෙන්ජමින්ට රිදී කාසි තුන් සියයක්
ද, අලුත් ඇඳුම් කට්ටල පහක් ද දුනි. 23 තවද, ඔහු
තමාගේ පියාට මිසරයේ ඉතා අගනා දේ පටවන
ලද කොටළුවන් දසදෙනෙකු ද, මාර්ගයේ දී ඔහුට
උවමනා ධාන්‍ය ආහාර සහ මස් මාංස පටවන ලද
කොටළු දෙනුන් දසදෙනෙකු ද යැවී ය. 24 මෙලෙස
ඔහු තම සොහොයුරන් පිටත් කර හැරියේ ය. ඔවුන්
නික්ම යන විට, "අතරමඟ දී දබර නොකරන්නට
බලාගන්නැ"යි ඔහු ඔවුන්ට කීවේ ය.
25 ඔව්හු මිසරයෙන් පිටත් ව කානාන් දේශයට
අවුත් තම පියා වන ජාකොබ් වෙත පැමිණ,
26 ඔහුට කතා කොට, "ජෝසෙප් තව ම ජීවත් ව
සිටියි. ඇරත් මුළු මිසර දේශයට ම අධිපති ඔහු ය"යි
සැළ කළහ. ජාකොබ් ද පුදුමයට පත්වී ඔවුන්
විශ්වාස නො කළේ ය. 27 ඔව්හු ජෝසෙප් තමන්ට
කී සියල්ල ම ජාකොබ්ට දැන්වූ හ. ඔහු ගෙන යාමට
ජෝසෙප් එවූ රථවාහන ජාකොබ් දුටු විට ඔහු යළි
ප්‍රාණවත් විය. 28 එවිට ජාකොබ් හෙවත්
ඉශ්‍රායලේ කතා කරමින්, "දැන් ඇති, මා පුත්
ජෝසෙප් තව ම ජීවත් ව සිටියි, මා මැරෙන්න කලින්
ගොස් ඔහු දැකගත යුතු ය"යි කීවේ ය.

## ජාකොබ් මිසරය බලා යාම

46 ජාකොබ් හෙවත් ඉශ්‍රායලේ තමන් සතු
සියල්ල රැගෙන ගමනට පිටත් ව බෙයෙර්-
ෂෙබාවට පැමිණ තම පියා වූ ඊසාක්ගේ දෙවියන්
වහන්සේට යාග පූජා ඔප්පු කළේ ය. 2 දෙවියන්
වහන්සේ ද රාත්‍රියේ දී ජාකොබ්ට දර්ශනය වී,
"ජාකොබ්, ජාකොබ්" කියා ඔහු ඇමතූ සේක. ඔහු,
"මම මෙහි ය" කියා උත්තර දුනි. 3 එවිට උන්
වහන්සේ කතා කරමින්, "මම වනාහි දෙවියන්
වහන්සේ වෙමි; නුඹේ පියාගේ දෙවියන් වහන්සේ
වෙමි. මිසරයට යෑමට බිය නොවන්න. මන්ද, මම
එහි දී නුඹේ පෙළපතින් මහත් ජාතියක් ඇති
කරන්නෙමි. 4 මම නුඹ සමඟ මිසරයට ගොස් යළි
මම ම නුඹ ආපසු ගෙනෙන්නෙමි. තවද, නුඹ මැරෙන
විට ජෝසෙප්ගේ අත නුඹේ ඇස් පියවන්නේ ය"යි
වදාළ සේක.
5 පසුව ජාකොබ් බෙයෙර්-ෂෙබාවෙන් පිටත් විය.
ජාකොබ්ගේ පුත්‍රයෝ තම පියා ද, තමන්ගේ කුඩා
දරුවන් ද, තම භාර්යාවන් ද පාරාවෝ ඔවුන් ගෙන
යෑමට එවූ රථවල රැගෙන ගියහ. 6 ක්‍රියා 7:15
තවද, තමන්ගේ ගව පට්ටි ද, කානාන් දේශයේ දී
තමන් උපයාගත් වස්තුව ද රැගෙන ජාකොබ් සහ
ඔහු කැටුව ඔහුගේ මුළු පෙළපත මිසරයට
පැමිණියහ. 7 මෙලෙස ඔහු තම පුත්‍රයන් ද
පුත්‍රයන්ගේ පුත්‍රයන් ද පුත්‍රයන්ගේ දූවරුන් ද මුළු
දරු පෙළපත ද තමන් කැටුව මිසරයට ගෙන ආවේ
ය.

## ජාකොබ්ගේ පෙළපත

8 මිසරයට ගිය ජාකොබ්ගේ පෙළපතේ නාමාවලිය
මෙය යි: එනම්, ජාකොබ් සහ ඔහුගේ පුත්‍රයෝ:
ජාකොබ්ගේ කුලුඳුලා වන රූබන්; 9 රූබන්ගේ
පුත්‍රයන් වන හනොක්, පල්ලු, හෙශ්‍රොන් සහ
කර්මි; 10 සිමියොන්ගේ පුත්‍රයන් වන ජමුවෙල්,
ජාමින්, ඔහද්, ජාකින්, ශොහාර් සහ කානානිය
ස්ත්‍රියකගේ පුත්‍ර ෂාවුල්; 11 ලෙවීගේ පුත්‍රයන්
වන ගේර්ෂොන්, කොහාත් සහ මෙරාරි; 12 ජුදාගේ
පුත්‍රයන් වන ඒර්, ඕනාන්, ෂේලා, පෙරෙශ් සහ
ශෙරා ය. එහෙත්, ඒර් සහ ඕනාන් කානාන් දේශයේ
දී මළහ. පෙරෙශ්ගේ පුත්‍රයන් වන හෙශ්‍රොන් සහ

හාමුල්; 13 ඉස්සාකර්ගේ පුත්‍රයන් වන තෝලා, පුවා,
ජෝබ් සහ ෂිම්රොන්; 14 සාබුලොන්ගේ පුත්‍රයන්
වන සරෙදේ, ඒලොන් සහ ජාලයෙලේ; 15 මොවුහු
සහ ජාකොබ්ගේ දූව වන දීනා, ලයො
මසොපොතේමියාවේ දී ජාකොබ්ට දාව ලැබූ
දරුවෝ ය. ඔහුගේ දරුදැරියෝ සියල්ලෝ
තිස්තුන්දෙනෙකි.
16 ගාද්ගේ පුත්‍රයන් වන ශපියොන්, හග්ගි, ෂූනි,
එශ්බොන්, ඒරි, අරෝද් සහ අරේලී ය;
17 ආෂරේගේ පුත්‍රයන් වන ඉමනා, ඉෂ්වා, ඉෂ්වී,
බරියා හා ඔවුන්ගේ සහෝදරී වන සරො;
බරියාගේ පුත්‍රයන් වන හබෙරේ සහ මල්කියලේ
ය; 18 මොවුහු ලාබන් තම දූව වන ලයොට
සේවිකාව වශයෙන් දුන් ශිල්පාගේ පුත්‍රයෝ ය. ඈ
ජාකොබ්ට දාව මොවුන් ලැබුවා ය. මොවුන්ගේ
ගණන දහසයදෙනෙකි.
19 ජාකොබ්ගේ භාර්යාව වූ රාකලේගේ පුත්‍රයන්
වන ජෝසෙප් සහ බෙන්ජමින් ය. 20 උත් 41:50-52
තවද, මිසර දේශයේ දී ඕන් නම් පූජ්‍ය ස්ථානයේ
පොතිපෙරා නම් පූජකයාගේ දූව වන ආසනෙත්,
ජෝසෙප්ට දාව මනස්සේ සහ එප්‍රායිම් ලැබුවා ය.
21 බෙන්ජමින්ගේ පුත්‍රයන් වන බෙලා, බෙකෙරේ,
අෂ්බෙලේ, ගේරා, නාමාන්, ඒහී, රොෂ්, මුප්පීම්,
හුප්පීම් සහ ආරද් ය; 22 මොවුහු ජාකොබ්ට දාව
උපන් රාකලේගේ පුත්‍රයෝ ය. ඒ සියල්ලෝ
දහසතරදෙනෙකි.
23 දාන් සහ ඔහුගේ පුත්‍රයා වන හුෂිම් ය;
24 නප්තලීගේ පුත්‍රයන් වන ජාශයෙලේ, ගුනී,
ජේශෙරේ සහ ෂිල්ලමේ ය; 25 මොවුහු නම් ලාබන්
තම දූව වන රාකලේට සේවිකාව වශයෙන් දුන්
බිල්හාගේ පුත්‍රයෝ ය. ඈ ජාකොබ්ට දාව මොවුන්
ලැබුවා ය. ඒ සියල්ලෝ සත්දෙනෙකි.
26 ජාකොබ්ගේ පුත්‍රයන්ගේ භාර්යාවන් හැර,
ඔහුට දාව උපන්, ඔහු සමඟ මිසරයට ගිය අයගේ
මුළු ගණන හැටහයදෙනෙකි. 27 ක්‍රියා 7:14
මිසරයේ දී ජෝසෙප්ට දාව උපන් පුත්‍රයන්ගේ
ගණන දදෙනෙකි. මිසරයට පැමිණි ජාකොබ්ගේ
පවුලට අයත් සියල්ලෝ හැත්තෑදෙනෙක් වූ හ.

## ජෝසෙප් ඔවුන් පිළිගැනීම

28 තවද, ජාකොබ්, ජෝසෙප් ඉදිරියට පැමිණෙන
පිණිස, තමාට පෙරටුව ඔහු වෙත ජුදා එව් ය. ඔව්හු
ගෝෂෙන් නම් පෙදෙසට පැමිණියා හ. 29 එවිට
ජෝසෙප් තම රථය සූදානම් කොට, තම පියා වන
ජාකොබ් හමු වීමට ගෝෂෙන් බලා ගියේය. තම
පියා දුටු කෙණෙහි ම ඔහු ඔහුගේ ගෙලෙ බදාගෙන
බොහෝ වේලාවක් ගෙලෙ මත හැඬී ය. 30 එවිට
ජාකොබ් ජෝසෙප්ට කතා කොට, "ඔබේ මුණ දැක
ඔබ තව ම ජීවත් ව සිටින බව දුටු හෙයින් දැන්
ඉතින් මා මළත් කම් නැතැ"යි කීවේ ය.
31 ඉන්පසු ජෝසෙප් තම සහෝදරයන්ට හා තම
පියාගේ ගෙවැසියන්ට කතා කොට, "මම ගොස්
පාරාවෝ ඉදිරියේ පෙනී සිට, 'කානාන් දේශයේ සිටි
මාගේ සහෝදරයන් හා පියාගේ පවුලේ සියල්ලන්
මා වෙත පැමිණ ඇත. 32 ඔව්හු එඬේරු ය, සත්ත්ව
ගොවිපළවල් පාලනය කරන අය ය. ඔවුන් තමන්ගේ
එළු බැටළු රැළ ද ගව රැළ ද තමන් සතු සියල්ල ද
ගෙනැවිත් ඇත' කියන්නමේ. 33 පාරාවෝ ඔබ
කැඳවා, 'ඔබේ රැකියාව කුමක් දැ'යි ඇසූ විට,
34 ඔබ ද, 'ඔබේ දාසයන් වන අපිත්, අපේ පියවරුත්
තමන් තරුණ වියේ පටන් අද දක්වා සත්ත්ව
ගොවිපළවල් රැකබලාගත්තමෝ'යි කියන්න. මෙලෙස
ඔබට ගෝෂෙන් පෙදෙසේ පදිංචි වීමට අවසර
ලැබේ ය"යි කීවේ ය. ඔහු මෙසේ කීවේ, එඬේරුන්
මිසර වාසීන්ට පිළිකුලක් වන බැවිනි.

## පාරාවෝ හමු වීම

47 එවිට ජෝසෙප් පාරාවෝ වෙත අවුත්, ඔහුට
කතා කොට, "මාගේ පියා හා සහෝදරයෝ
ද, ඔවුන්ගේ එළු බැටළු රැළ හා ගව රැළ ද, ඔවුන්
සතු සියල්ල ද කානාන් දේශයෙන් නික්ම ආවා හ.
දැන් ඔව්හු ගෝෂෙන් පෙදෙසේ සිටිති"යි කීවේ ය.
2 තවද, ඔහු තම සහෝදරයන්ගෙන් පස්දෙනෙකු
රැගෙන පාරාවෝ වෙත ඉදිරිපත් කළේ ය.
3 පාරාවෝ ඔහුගේ සහෝදරයන් අමතමින්,
"නුඹලාගේ රැකියාව කුමක් දැ"යි ඇසූ විට, ඔව්හු
පාරාවෝට පිළිතුරු දෙමින්, "අපිත්, අපේ පියවරුත්
ඔබේ දාසයන් වන එඬේරු වෙමු. 4 තවද, අප ආවේ
මේ රටේ ටික කලක් පදිංචි වීමට ය. මන්ද, කානාන්
දේශයේ සාගතය ඉතා දරුණු බැවින් ඔබේ
දාසයන්ගේ එළු බැටළු රංචුවලට කෑමට තණ බිම්
නැත. දැන් ඉතින්, කරුණාකර ගෝෂෙන් පෙදෙසෙහි
ඔබේ දාසයන් හට පදිංචි වීමට අවසර දුන මැනව"යි
කී හ. 5 එවිට පාරාවෝ ජෝසෙප් අමතමින්, "ඔබේ
පියා හා සහෝදරයන් ඔබ වෙත පැමිණ ඇත. 6 මුළු
මිසර දේශය ම ඔබ ඉදිරියෙහි ඇත. රටේ හොඳ ම
පළාතේ ඔබේ පියා හා සහෝදරයන් පදිංචි
කරවන්න. මොවුන් ගෝෂෙන් පෙදෙසෙහි පදිංචි
වුණා වේ. ඇරත් ඔවුන් අතර කාර්යක්ෂම මිනිසුන්
ඇති බව ඔබ දන්නෙහි නම් මාගේ සත්ත්ව
ගොවිපළ බලාගැනීමට ඔවුන් පත් කරන්නැ'යි කී ය.
7 එවිට ජෝසෙප් තම පියා වන ජාකොබ්
කැඳවාගෙන විත් පාරාවෝ වෙත ඉදිරිපත් කළ විට
ඔහු පාරාවෝට ආශීර්වාද කළේ ය. 8 පාරාවෝ
ඔහු අමතා, "ඔබේ වයස කොපමණ දැ"යි ඇසූ විට,
9 ජාකොබ් ඔහුට පිළිතුරු දෙමින්, "මිහි පිට මාගේ
සැරිසැරීමේ කාලය අවුරුදු එකසිය තිහකි; මා ගෙවූ
ජීවිතය කෙටි ය: දුෂ්කර ය. මාගේ මුතුන්මිත්තන්
මිහි පිට සැරිසැරූ කාලයට එය සම කළ නොහැකි
ය"යි කීවේ ය. 10 ජාකොබ් යළි පාරාවෝට සතේ
පතා ඔහුගෙන් නික්ම ගියේය. 11 ඉන්පසු ජෝසෙප්
පාරාවෝගේ නියමය පරිදි තම පියා හා
සහෝදරයන් පදිංචි කරවා, මිසර දේශයෙහි
රාමසෙස් නම් පළාතෙන් හොඳ ම ඉඩකඩම්
ඔවුන්ට උරුම කොට දුන්නේ ය. 12 තවද, ජෝසෙප්
තම පියාට ද, සහෝදරයන්ට හා පියාගේ

ගවෙසියන් සියලු දනොට ද ඔවුන්ගේ පවුල් අනුව
ආහාර සපයා දුන්නේ ය.

### ජෝසෙප්ගේ පරිපාලන ක්‍රම

13 එකල මුළු රටහෙි ම ආහාර නොතිබිණි.
සාගතය කෙතරම් දරුණු වී ද යත්, මිසර දේශය හා
මුළු කානාන් දේශය දුර්භික්ෂය නිසා සාගින්නෙනේ
පළෙණි. 14 ජෝසෙප් මිනිසුන්ට ධාන්‍ය විකුණා මිසර
දේශයහෙි හා කානාන් දේශයහෙි සියලු මුදල් එකතු
කොට ඒ මුදල් රාජකීය භාණ්ඩාගාරයහෙි තැන්පත්
කළේ ය.
15 මිසරයේ හා කානාන් දේශයේ මුදල් ඉවර වූ
විට මිසර වාසි සියල්ලෝ ම ජෝසෙප් වෙත අවුත්,
"අපට ආහාර දනේන, නැත්නම් ඔබ බලාගනෙ සිටිද්දී
ම අප මැරනෙු ඇත. අපේ මුදල් ඉවර ය"යි කී හ.
16 එවිට ජෝසෙප් පිළිතුරු දමෙින්, "එසේ නම් ඔබේ
ගව පට්ටි ගනෙනේන. මුදල් ඉවර නම් ඔබේ ගව
පට්ටි හිලව්වට මම ඔබට ආහාර දනේනමේ"යි කී ය.
17 ඔව්හු තමන්ගේ ගව පට්ටි ජෝසෙප් වෙත
ගනොහ. ඔහු අසුන්, එළු බැටළු රංචු, ගව රැළ හා
කොටළුවන් හිලව්වට ඔවුන්ට ආහාර දුන්නේ ය.
මලෙසෙ අවුරුද්ද තුළ දී ඔවුන්ගේ ගව පට්ටි
සියල්ලේ හිලව්වට ඔහු ඔවුන්ට ආහාර දී පෝෂණය
කළේ ය.
18 ඒ අවුරුද්ද අවසාන වූ විට, දෙ වන අවුරුද්දේ දී
ඔව්හු වෙත අවුත්, ඔහුට කතා කොට, "ස්වාමිනි,
ඔබනේ කරුණු සැඟවීමට නම් බැරි ය; අපේ මුදල්
ඉවර ය; අපේ ගව පට්ටි ද ස්වාමින් සතු ය. අපගේ
ශරීර හා ගම්බිම් ඇරනේන වනෙ කිසිවක් ස්වාමින්
ඉදිරියහෙි අපට නැත. 19 අප ද අපේ ගම්බිම් ද ඔබ
බලාගනෙ සිටිද්දී විනාශ වී යා යුතු ද? ආහාර
සැපයීමේ හිලව්වට අප ද අපේ ගම්බිම් ද මිලයට
ගන්න. එවිට අපි ද, අපගේ ගම්බිම් සමඟ
පාරාවෝට වහල්ලු වන්නමු. අප නොමැරී ජීවත්
වනෙ පිණිසත්, ඉඩකඩම් පුරන් වී නොයන පිණිසත්
අපට බිත්තර වී දනේනැ"යි කී හ.
20 මසෙේ ජෝසෙප්, මිසරයේ ඉඩකඩම් සියල්ල ම
පාරාවෝ සඳහා මිලට ගති. මන්ද, සාගතය ඔවුන්
කරෙහෙි දරුණු වූ බැවින්, සෑම මිසර වැසියකු ම
තම ඉඩකඩම් විකුණුවනේ මුළු රට ම පාරාවෝ සතු
විය. 21 තවද, ජෝසෙප් මිසරයේ එක සීමාවක
පටන් අනික් සීමාව දක්වා ජනතාව වහල් ගොවියන්
බවට පත් කළේ ය. 22 පූජකයන්ගේ ඉඩකඩම්
පමණක් ඔහු මිලට නොගත්තේ ය. මන්ද, පූජකයෝ
පාරාවෝගනේ ආධාර මුදලක් ලබමින්, පාරාවෝ
ඔවුන්ට දුන් ඒ මුදලින් ජීවත් වූ හ. එබැවින්
තමන්ගේ ඉඩකඩම් විකිණීමට ඔවුන්ට සිදු නොවී
ය. 23 එවිට ජෝසෙප් ජනයාට කතා කොට,
"මනේන, මම අද නුඹලා ද නුඹලාගේ ඉඩකඩම් ද
පාරාවෝ උදසො මිලයට ගතිමි. කතෙේ වැපිරීම
සඳහා මනේන නුඹලාට ධාන්‍ය. 24 තවද, අස්වැන්න
නළෙන කාලයේ දී නුඹලා පහනේ එක පංගුවක්
පාරාවෝට දිය යුතු ය. පංගු හතරක් කතෙේ වැපිරීම
පිණිසත්, නුඹලාගේ ද නුඹලාගේ ගවෙසියන්ගේ හා
කුඩා දරුවන්ගේ ද ආහාර පිණිසත් නුඹලාට වන්නේ
ය"යි කී හ. 25 ඔව්හු පිළිතුරු දමෙින්, "ඔබ අපේ
ජීවිත ආරක්ෂා කළෙහෙි ය. අප ස්වාමියා වන ඔබ
හමුවහෙි අපට ප්‍රසාදය ලැබේ වා! අපි ද
පාරාවෝගේ වහල්ලු වන්නමු"යි කී හ. 26 මසෙේ
ජෝසෙප් මිසරයේ දේපළ සම්බන්ධයනේ අද දක්වා
වලංගු වන රජයට පහනේ පංගුව දීමේ පණත
පැනවී ය. පූජකයන්ගේ ඉඩකඩම් පමණක්
පාරාවෝට අයිති නොවී ය.

### ජාකොබ්ගේ අන්තිම කැමැත්ත

27 ඉශ්‍රායලේ හවෙත් ජාකොබ් මිසර දේශයහෙි
ගෝෂනේ නම් පදෙසෙහෙි වාසය කළේ ය. ඔවුන්ට
එහි ගම්බිම් අයිති විය. ඔව්හු සඵල ව බොහෝ
සයෙින් වැඩී වර්ධනය වූ හ. 28 තවද, ජාකොබ්
මිසර දේශයහෙි අවුරුදු දහහතක් ජීවත් විය.
මලෙසෙ ඔහුගේ මුළු වයස අවුරුදු එකසිය
හතළිස්හතක් විය. 29 උත් 49:29-32; 50:6 ඉශ්‍රායලේ
නසින කාලය ආසන්න වූ විට ඔහු තම පුත්
ජෝසෙප් කැඳවා ඔහුට කතා කොට, "දැන් ඉතින්
ඔබ මට ප්‍රසාදය දක්වන්නහෙි නම්, කරුණාකර,
මාගේ කලවය යට ඔබේ අත තබා, මා වෙත
පක්ෂපාතකම හා හොඳ හිත දක්වමින්, මා මිසර
දේශයහෙි භූමදාන නොකරන බවට පොරොන්දු
වන්න. 30 මාගේ පියවරුන් මනේ මා මරණයට පත්
වූ විට ඔබ මිසරයනේ මා ගනෙ ගොස් ඔවුන්ගේ
සොහොනේ භූමියහෙි මා භූමදාන කරන්නැ"යි කී ය.
"ඔබ කී පරිදි ම මම ඉටු කරමි"යි ජෝසෙප් පිළිතුරු
දුනි. 31 තවද, ජාකොබ් කතා කොට, "එය ගැන මට
දිවුරන්නැ"යි ඉල්ලුවනේ ජෝසෙප් ද ඔහු ඉදිරියහෙි
දිවුළේ ය. එවිට ඉශ්‍රායලේ යහනේඇන්ද මත ඇළ
විය.

### ජාකොබ් ජෝසෙප්ගේ පුතුන් දදෙනොට ආශීර්වාද කිරීම

48 කලක් ගිය පසු, "ඔබේ පියා ලඩේන් සිටී"ය
යි ජෝසෙප්ට දන්වන ලදුව, ඔහු තම පුතුන්
දදෙනෙ වන මනස්සේ සහ එප්‍රායිම් තමා කැටුව
ගනෙ ගියේය. 2 එවිට, "ඔබේ පුත්‍රයා වන
ජෝසෙප් ඔබ වෙත එන්නේ යැ"යි ජාකොබ්ට
දන්වන ලදින්, ඔහු ශක්තිය යළි උපදවාගනෙ ඇඳහෙි
වාඩි විය. 3 උත් 28:13-14 ජාකොබ් ජෝසෙප්
අමතමින්, "සියලු බලැති දවෙියන් වහන්සේ කානාන්
දේශයේ ලූස් නම් ස්ථානයේ දී මට දර්ශනය වී මට
ආශීර්වාද කළ සේක. 4 තවද, උන් වහන්සේ මට
කතා කරමින්, 'බලන්න, මම නුඹ සඵලවත් කොට,
නුඹ වැඩි වර්ධනය කරන්නමේ. නුඹේ පළෙපතින්
මම විශාල සනෙඟක් ඇති කරන්නමේ. ඇරත් මම
මේ දේශය නුඹනේ පසු පැවතනෙ නුඹේ
පරම්පරාවට සදහට උරුම කොට දමේ'යි වදාළ
සේක. 5 තවද, මා නුඹ වෙත මිසරයට එන්නට
පරෙ, නුඹට දාව මිසර දේශයේ දී බිහි වුණ නුඹේ

පුත්තු දදෙනෙ මාගේ වන්නෝ ය. රූබන් සහ
සිමියොන් මෙන් ම එප්රායිම් සහ මනස්සේ මාගේ
වන්නෝ ය. 6 එහෙත්, ඔවුන්ට පසු නුඹට දාව
උපදින දරුවෝ නුඹේ වන්නෝ ය. ඔව්හු උරුමය
ලබනු සඳහා ඔවුන්ගේ සහෝදරයන්ගේ නාමයෙන්
හඳුන්වනු ලබන්නෝ ය. 7 උත් 35:16-19 මා මෙසේ
කරන්නේ මෙසොපොතේමියාවේ සිට මා එන විට
එප්රාත් නම් ස්ථානයට මඳක් දුර තිබිය දී, කානාන්
දේශයේ අතරමඟ දී නුඹේ මව රාකෙලේ මා දුකට
පත් කරමින් මළ නිසා ය. මම ද එප්රායිම් හෙවත්
බෙත්ලෙහෙමට යන මාර්ගයෙහි ඈ භූමදාන
කළෙමි”යි කීවේ ය.
8 ඉශ්රායෙලේ ජෝසෙප්ගේ පුත්රයන් දුටු විට,
“මොවුහු කාගේ දැ”යි ඇසී ය. 9 ජෝසෙප් එවිට තම
පියාට උත්තර දෙමින්, “මොවුහු දෙවියන් වහන්සේ
මෙහි දී මට දුන් මාගේ පුත්රයෝ ය”යි කී ය. එවිට
ඔහු, “කරුණාකර, මා ළඟට මොවුන් ගෙනෙන්න, මම
මොවුන්ට ආශීර්වාද කරමි”යි කීවේ ය. 10 වයස
නිසා ඉශ්රායෙල්ගේ පෙනීම දුර්වල වී තිබුණෙන්
ඔහුට පෙනුණේ නැත. ජෝසෙප් ද ඔවුන් ඔහු වෙත
ගෙනා විට, ඔහු ඔවුන් සිප වැළඳගත්තේ ය.
11 ඉශ්රායෙලේ ජෝසෙප්ට කතා කොට, “නුඹේ
මුහුණ බැලීමට ලැබේ ය යි මා නම් සිතුවේ නැත.
එහෙත් පුදුමයකි, දෙවියන් වහන්සේ නුඹේ පළෙපත
ද මට පෙන්වා වදාළ සේක”යි කී ය. 12 පසුව
ජෝසෙප් තම පුතුන් පියාගේ තුරුල්ලෙන් ඉවතට
ගෙන, මුණින්තලා වී වැන්දේ ය.
13 ජෝසෙප් ඔවුන් දදෙනා රැගෙන, එප්රායිම්,
ජාකොබ්ගේ වම් පැත්තට සිටින පරිදි ඔහු තම
දකුණතින් ද, මනස්සේ, ජාකොබ්ගේ දකුණු පැත්තට
සිටින පරිදි ඔහු තම වමතින් ද අල්ලාගෙන,
ජාකොබ්ට ළං විය. 14 එවිට ජාකොබ්, සිය දකුණත
දිගු කොට එය බාලයා වන එප්රායිම්ගේ හිස මත
ද, සිය වමත වැඩිමලා වන මනස්සේගේ හිස මත ද
තම අත් මාරු කොට තැබී ය. 15 මෙලෙස අත් තබා
ඔහු ජෝසෙප්ට මෙසේ ආශීර්වාද කළේ ය:
q2 15 “මාගේ පියවරුන් වන ආබ්රහම් සහ ඊසාක්,
යම් දෙවි කෙනෙකුන් අබිමුව විසුවෝ ද, ඒ දෙවියන්
වහන්සේ, අද දක්වා මා මුළු ජීවිතය තුළ මා
එඩේරාණන් වන ඒ දෙවියන් වහන්සේ,
16 සියලු නපුරෙන් මා මුදාලූ ඒ දූතවරයාණෝ, මේ
දරුවන්ට ආශීර්වාද කරන සේක් වා!
q2 16 මාගේ නම ද මා පියවරුන් වූ ආබ්රහම්ගේ හා
ඊසාක්ගේ නම ද ඔවුන් සමඟ නොමැකී පවතී වා!
q2 16 ඔව්හු මිහි මත සඵල විපුල මහ ජනතාවක්
වෙත් වා!”
17 සිය පියා ඔහුගේ දකුණත එප්රායිම්ගේ හිස
මත තැබූ බව ජෝසෙප් දුටු විට ඔහු කලබල වී, එය
එප්රායිම්ගේ හිසින් ඉවතට ගෙන මනස්සේගේ හිස
මතට ගෙන එන්න තම පියාගේ අත අල්ලාගෙන,
18 පියාට කතා කොට, “පියාණෙනි, මෙසේ නොවේ.
කුලුඳුලා මොහු ය, ඔබේ දකුණත මොහුගේ හිස
මත තබන්නැ”යි කීවේ ය. 19 එහෙත්, ඔහුගේ පියා
එය ප්රතික්ෂේප කරමින්, “මම එය දනිමි, මා පුත,
මම එය දනිමි, ඔහු ද ජනතාවක් වන්නේ ය. ඔහු ද
බලවතකු වන්නේ ය. එහෙත් සැබැවින් ම ඔහුගේ
බාල සහෝදරයා ඔහුට වඩා බලවත් වන්නේ ය,
ඔහුගේ පළෙපත විශාල සෙනඟක් වන්නේ ය”යි කී
ය.
20 හෙබ්රෙ 11:21 එදින ඔහු ඔවුන්ට ආශීර්වාද
කරමින්, “ඉශ්රායෙලේ ජනතාව අතර ආසිරි පැතුමක්
දෙන විට ඔබේ නමින් මෙසේ කියමින් දෙවියන්
වහන්සේ ඔබ එප්රායිම් සහ මනස්සේ සමාන කරන
සේක් වා කියනු ඇතැ”යි කී ය. මෙලෙස ඔහු
එප්රායිම් මනස්සේට පෙරටුව තැබී ය.
21 ඉන්පසු ඉශ්රායෙලේ ජෝසෙප් අමතමින්,
“බලන්න, මාගේ අවසානය ළඟ ය. එහෙත්, දෙවියන්
වහන්සේ ඔබ සමඟ වැඩසිට, ඔබ නැවත ඔබේ
පියවරුන්ගේ දේශයට ගෙනෙන සේක. 22 තවද,
ඔබේ සහෝදරයන්ට මා දුන්නාට වැඩියෙන් මාගේ
කඩුවෙන් සහ දුන්නෙන් මා අමෝරිවරුන්ගෙන් රැගත්
ෂෙකෙම් පෙදෙස, මම ඔබට දෙන්නෙමි”යි කීවේ ය.

### ජාකොබ් තම පුතුන් ගැන දිවැස් කීම

49 ජාකොබ් තම පුතුන්ට කතා කොට මෙසේ
කීවේ ය: “මතු දවස නුඹලාට පැමිණෙන්නට
යන දේ ගැන, මා නුඹලා හට ප්රකාශ කරන පිණිස
එකට රැස් වන්න.
2 ජාකොබ්ගේ පුතුනි, එක්රැස් වන්න, සවන්
දෙන්න, ඔබ පිය ඉශ්රායෙලේ හට කන් දෙන්න.
3 රූබන්, ඔබ මාගේ කුලුඳුලා ය, ඔබ මාගේ බල
විකුම ය, මාගේ පුරුෂ ශක්තියේ නාඹුල් පලය ඔබ
ය.
q2 3 ඔබ උදාරත්වයෙන් අගතැන්පත් වේ.
q2 3 බල මහිමයෙන් මුදුන්මල්කඩ වේ.
4 එහෙත්, ඔබ මැඩලිය නොහැකි ගංවතුරකි, ඔබට
ප්රමුඛත්වය නොලැබෙන්නේ ය.
q2 4 ඒ මන්ද, ඔබ පියාගේ යහනට නැඟ, මා දුක්
ගන්වා, එය කෙලෙසූ බැවිනි.
5 සිමියොන් සහ ලෙවී සහෝදරයෝ ය.
q2 5 මැරවරකම් කරනු වස් ඔව්හු අවි අතට ගත්හ.
6 එම්බා, මා අධ්යාත්මය, ඔබ ඔවුන්ගේ
කුමන්ත්රණවලට නොබැඳේ වා!
q2 6 එම්බා, මාගේ කීර්ති නාමය, ඔවුන්ගේ
සමාගම්වලට එකතු නො වේ වා!
q2 6 ඒ මන්ද, ඔව්හු කිපී මිනිසුන් මැරූ හ.
q2 6 හිතුමතේ ගොනුන්ගේ සතර ගාතය සිඳදැමූ හ.
7 ඔවුන්ගේ කෝපයට සාප වේ වා! මන්ද, එය
දරුණු ය;
q2 7 කුරිරු ය.
q2 7 ජාකොබ්ගේ දේශය තුළ මම ඔවුන් වෙන්
කරලමි.
q2 7 ඉශ්රායෙලේ ජනතාව අතර ඔවුන් විසුරුවා හරිමි.
q1 8 ජුදා, ඔබේ සහෝදරයෝ ඔබ පසසති.
q2 8 ඔබ අත සතුරන් ගෙලෙ මත ඇත.
q2 8 ඔබ පියාගේ දරුවෝ ඔබ අබිමුව වැඳ වැටෙති.

9 ගණන් 24:9; එළිද 5:5 ජුදා සිහ පොව්වකෙි,
මපුත, ඔහු ගොදුරු කා යළි ගුහාව බලා එයි.
q29 ඔහු සිහ රදකුෙ මනේ ද සිහ දනෙක මනේ ද
වක ගැසී වැතිර සිටියි.
q29 ඔහු නැඟිටුවන්නනේ කවරකේ ද?
10 රාජ ජයකොන්තය හිමි තැනැත්තා එන තකේ,
ජුදා කරෙනේ එය පහනොවෙ.ේ
q210 රාජ යෂ්ටිය ඔහු පා අතරින් පහනොවෙ.ේ
q210 ජනතාවෝ ඔහුට කීකරු වතේ,
11 මිදි වැලේ, ඔහු තම කොටළු නාම්බා දිගලේි
කරයි, හොඳ ම මිදි වැලේ කොටළු පැටියා දිගලේි
කරයි, ඔහු, තම ඇඳුම් මිදිපැනින් ද, තම සළුව
මිදියුසින් ද සෝදයි.
12 ඔහු නතේ මිදිරසින් රතු ය, ඔහු දත් කිරනේ සුදු
ය.
13 සාබුලොන් වසන්නනේ මුදුබඩ ය, ඔහුගේ වරෙළ
නැව්වලට වරායකි, සීදොන් දක්වා, දේශ සීමා දික්
වේ,
14 ඉස්සාකර් සවි බලැති කොටළුවකෙි, ඔහු සෑදල
මැද දිගා වී ලගියි.
15 විශ්රාමය කදිම බව ඔහු දිටී, රට ද සුන්දර බව
දිටී, එබැවින් ඔහු, බඩු පොදියට කර දුන්නනේ, බර
වැඩට වහලකේ වී ය.
16 දාන්, තම සනෙඟගේ විනිසකරුවකෙි.
q216 ඒ සනෙඟ ඉශ්රායලේ ගෝත්රවලින් එකකි.
17 දාන් මඟ ලගින සර්පයකේ වේ වා!
q217 මාවතේ රුක සිටින පොළඟකේ වේ වා!
q217 ඔහු අසුගේ කුරය දෂ්ට කරයි, අසරුවා ද
පස්සට වැටයෙි.
18 අහෝ සමිඳුනි, ඔබ ගැළවීම මම බලා සිටිමි.
19 ගාද්ට සොර සතුරු මුළක් පහර දේවි!
q219 පහරට පහර දී ඔහු උන් ලුහුබඳීවි!
20 ආෂරේගේ රට අගනා ආහාර නිපදවයි, ඔහු
රජකුෙට නිසි රස මස'වුලු සපයයි.
21 නප්තලී නිදැල්ලේ දුවන මුව දනෙකි, සුමිහිරි
බස් තපෙලයි.
22 ජෝසපේ පල දරන වැලකි, උල්පතක් ළඟ පල
දරන වැලකි, එහි රිකිලි බිත්තියට උඩින් විහිදයෙි.
23 දුනුවායෝ ඔහු කුපිත කළහ, ඔහුට විද පහර
දුන්හ.
24 ඔවුන්ගේ දුනු දරුණු ලසෙ කැඩිණි, ඔවුන්ගේ
බාහු මාංස පේශී ද ඉරී ගියේය.
q224 එසේ කරන ලදුයේ, ජාකොබ්ගේ සියලු බලැති
දවේඳුන්ගේ බලෙනේ, ඉශ්රායලේගේ පර්වතය වන
එඬේරාණන් විසිනි;
25 ඔබට ආධාර කළ ඔබ පියාගේ දවේඳුන් විසිනි;
q225 ඔබට ආසිරි සිරි දනෙ සියලු බලැති දවේඳුන්
විසිනි, ඉහළ අහසින් ආසිරි ද පහළ ගැඹුරින් ආසිරි ද
පියයුරු හා කුස තුළ ආසිරි ද
26 ධාන්ය හා කුසුම්හි ආසිරි ද පුරාතන කඳුවල
ආසිරි ද සදාතන හලේවල හොඳ හොඳ දේ ද
ජෝසපේගේ හිස මත පතිත වේ වා!
q226 තම සොහොයුරන් අතර කැප කරන දේ ද
ඔහුගේ හිස් මුදුන්හි පතිත වේ වා!
27 බනේජමින් ගිජු වෘකයකෙි, උදය ඔහු තම
ගොදුරු ගිලදමයි.
q227 සවස කොල්ල කෑ දේ බදො දයෙි."
28 ඉශ්රායලේහි ගෝත්ර දොළොස මොවුහු
සියල්ලෝ ය, ඔවුන්ගේ පියා ඔවුන්ට ආශීර්වාද
කරමින් ඔවුන් අමතා කීවේ එලසෙ ය. එකිනකොට
නිසි ආසිරි දමේන් ඔහු ඔවුන්ට ආශීර්වාද කළෙේ ය.

## ජාකොබ්ගේ මරණය

29 ඉන්පසු ජාකොබ් ඔවුන්ට අණ කරමින් කතා
කොට, "මම මාගේ සනෙඟට එකතු වන්නෙ යමි.
හිත්තීය ජාතික ඒප්රොන්ගේ ඉඩමහෙි ඇති
ගුහාවහෙි, 30 උත් 23:3-20 එනම්, කානාන් දේශයේ
මම්රේ ඉදිරිපිට මක්පේලාගේ ඉඩමහෙි තිබනෙ,
ආබ්රහම් සොහොන් බිමක් වශයනේ ඉඩමක් සමඟ
ඒප්රොන්ගනේ මිලට ගත් ඔහුට අයිති ගුහාවහෙි,
මාගේ පියවරුන් ළඟ මා භූමදාන කරන්න. 31 උත්
25:9-10; 35:29 ආබ්රහම් සහ ඔහුගේ බිරිඳ වන
සාරා භූමදාන කරන ලද්දේ එහි ය. ඊසාක් සහ
ඔහුගේ බිරිඳ වන රබෙකො භූමදාන කරන ලද්දේත්
එහි ය. මා, ලයො භූමදාන කළෙේත් එහි ය.
32 ඉඩම සහ එහි ඇති ගුහාව හතේගේ
සනෙඟගනේ මිලයට ගන්නා ලදී"යි කීවේ ය.
33 ක්රියා 7:15 මසෙේ ජාකොබ් තම පුතුන්ට
උපදසේ දී නිම කළ කල්හි, ඔහු තම පාද යහනට
ගනෙ, අවසන් හුස්ම හළො තම සනෙඟට එක් විය.

## ජාකොබ්ගේ භූමදානය

50 එවිට ජෝසපේ තම පියාගේ මුහුණ
බදාගනෙ හඬමින් ඔහු සිඹින්නට විය.
2 පසුව ඔහු තම සවේක වදෙදුරන්ට තම පියාගේ
මළමිනිය නොදිරන පිණිස බහෙතේ ගැල්වීමට අණ
කළෙේ ය. වදෙදුරෝ එය ඉටු කළහ. 3 ඒ සඳහා
දින හතළිහක් ගත විය. මිනියකට බහෙතේ කැවීමට
ගත වන කාලය දින හතළිහකි. මිසර වාසීහු දින
හැත්තෑවක් අවමංගල වත්පිළිවතේ පැවැත්වූ හ.
4 අවමංගල වත්පිළිවතේ අවසාන වූ විට ජෝසපේ
පාරාවෝගේ නිලධාරීන් අමතා, "දැන් ඉතින් ඔබ මට
කරුණාව පාන්නහු නම්, කරුණාකර, පාරාවෝට මගේ
පණිවුඩය යවන්න. 5 උත් 47:29-31 එනම්, 'මාගේ
පියා මට කතා කොට, මනේන, මාගේ අවසානය
ළඟ ය, කානාන් දේශයේ මා සඳහා මා කැණූ
සොහොන් බිම මා භූමදාන කළ යුතු ය' කියා මා
දිවුරවේවේ ය. දැන් ඉතින්, මාගේ පියා භූමදාන
කරනු පිණිස මා යන්න හරින්න; මම ආපසු
එන්නමේ"යි කී ය. 6 පාරාවෝ කතා කොට, "යන්න,
ඔබේ පියාට ඔබ දිවුරු ලසෙ, ඔහු භූමදාන
කරන්නැ"යි උත්තර දුනි.
7 එවිට ජෝසපේ තම පියා භූමදාන කරනු පිණිස
ගියේය. තවද, ඔහු කැටුව පාරාවෝගේ නිලධාරීහු
සියලු දනෙ ද ඔහුගේ රාජ සභාවේ ජ්යෂ්ඨ
නිලධාරීහු ද මිසර දේශයේ ජ්යෂ්ඨ නිලධාරීහු
සියලු දනෙ ද 8 ජෝසපේගේ ගෘහවාසී සියලු දනෙ ද

ඔහුගේ සහෝදරයෝ ද ඔහුගේ පියාගේ
ගෘහවාසීහු ද ගියහ. ඔවුන් ගෝෂනේ ප්‍රදේශයේ
ඉතිරි කර ගියේ ඔවුන්ගේ කුඩා දරුවන් ද එළු බැටළු
පට්ටි ද ගව පට්ටි ද පමණි. 9 තවද, ඔවුන් සමඟ
අශ්ව රථ හා අශ්වාරෝහකයෝ ද පිටත් වූ හ. එය
අති විශාල අවමඟුල් පරෙහැරක් විය.
10 ඔව්හු ජෝර්දානනේ එගොඩ අතාද් නම්
ස්ථානයේ කමතට පැමිණ, එහි මහත්
සංවේගයකින් තදින් වැලපුණාහ. ජෝසපේ ද දවස්
හතක් අවමංගල වත්පිළිවෙත් ඉටු කළේ ය. 11 එම
දේශයේ වැසියන් වූ කානානිවරු අතාද් කමතේ
පැවැත්වූ අවමංගල කෘත්‍යය දැක, “මයෙ මිසර
වැසියන්ගේ ප්‍රසිද්ධ අවමංගල පිළිවෙතෙක් ය” කියා
ජෝර්දානනේ එතරෙ වූ එම ස්ථානයට ආබලේ-
මිශ්‍රායිම් යන නාමය තැබුවෝ ය.
12 තවද, ජාකොබ්ගේ පුත්‍රයෝ ඔහුගේ අණ පරිදි
සියල්ල ඉටු කළහ. 13 ක්‍රියා 7:16 මලෙසෙ ඔව්හු
කානාන් දේශයට ඔහු ගෙන ගොස් ආබ්‍රහම් විසින්
හිත්තීය ජාතික ඒප්‍රොන්ගෙන් සොහොන් බිමක්
ලෙස ඉඩමක් සමඟ සින්නක්කරේට මිලට ගත්
මම්රේ ඉදිරිපිට වූ මක්පේලාගේ භූමියේ ගුහාවෙහි
ඔහු භූමදාන කළහ. 14 තම පියා භූමදාන කළ පසු
ජෝසපේ ද ඔහුගේ සහෝදරයෝ ද ඔහුගේ
පියාගේ භූමදානය සඳහා ගිය සියල්ලෝ ද ආපසු
මිසරයට පැමිණියෝ ය.

### ජෝසපේ තම සහෝදරයන්ගේ බිය පහකිරීම

15 ජෝසපේගේ සහෝදරයෝ තම පියා මළ බව
දුටු විට තමන් අතරේ කතා කරමින්, “ඇතැම් විට
ජෝසපේ අපට වෛර කරන්න පුළුවන, ඇත්තට ම
අප ඔහුට කළ සියලු නපුරු දේ ගැන ඔහු අපනේ
පළිගත හැකි ය”යි කී හ. 16 එබැවින් ඔව්හු
ජෝසපේ වෙත පණිවුඩයක් යවමින්, “ඔබේ පියා
මැරෙන්න කලින් අපට කතා කොට, 17 ‘දැන් ඉතින්
ඔබේ සහෝදරයන් ඔබට කළ සියලු
නපුරුකම්වලටත්, ඔවුන්ගේ ඒ අපරාධයට හා
පාපයටත් කරුණාකර ඔවුන් කමා කරන්නැ’යි
ජෝසපේට දැන්වීමට අපට අණ කළේ ය. එබැවින්
දැන් කරුණාකර, ඔබ පියාගේ දෙවියන්ගේ දාසයන්
වන අප කළ අපරාධයට සමාව දෙන්නැ”යි කී හ.
එහෙත් එලෙසෙ ඔහුට කී විට, ජෝසපේ හඬන්නට
විය.
18 ඔහුගේ සහෝදරයෝ ගොස් ඔහු ඉදිරියෙහි
වැඳ වැටී, “මෙන්න, අපි ඔබගේ දාසයෝ වෙමු”යි කී
හ. 19 එහෙත් ජෝසපේ ඔවුන්ට කතා කොට, “බිය
නොවන්න, දෙවියන් වහන්සේට හිමි තැන මට ගත
හැකි ද? 20 ඔබ නම් මට විරුද්ධ ව නපුරුකම්
සිතුවහු ය. එහෙත් අද සිදු වී තිබෙන පරිදි, දෙවියන්
වහන්සේ බොහෝ මිනිසුන්ගේ ජීවිත ගළවනු පිණිස
ඒවා යහපතට හැරවූ සේක. 21 එබැවින් දැන්
ඉතින් බිය නොවන්න, මම ඔබ ද ඔබේ කුඩා දරුවන්
ද නඩත්තු කරන්නමේ”යි, ඔවුන් සනසමින්, ඔවුන්
අමතා කාරුණික ලෙසෙ කතා කළේ ය.

### ජෝසපේගේ මරණය

22 මලෙසෙ ජෝසපේ ද ඔහුගේ පියාගේ පවුල ද
මිසරයේ පදිංචි වූ හ. ජෝසපේ අවුරුදු එකසිය
දහයක් ජීවත් විය. 23 තවද, ඔහු එප්‍රායිම්ගේ
දරුවන් තුන් වන පරම්පරාව දක්වා දිටී ය.
මනස්සේගේ පුත්, මාකීර්ගේ දරුවෝ ද ජෝසපේ
විසින් සිය පවුලට බාරගන්නා ලදහ. 24 ඔහු තම
සොහොයුරන් අමතා, “මාගේ අවසානය ළඟ ය.
දෙවියන් වහන්සේ ද සැබැවින් ම ඔබ ආරක්ෂා
කොට උන් වහන්සේ ආබ්‍රහම්ට, ඊසාක්ට හා
ජාකොබ්ට දිවුරා පොරොන්දු වූ රටට, මේ රටින්
ඔබ ගෙන යන සේකැ”යි කී ය. 25 නික්ම 13:19;
ජෝෂු 24:32; හබ්‍රෙ 11:22 ඉන්පසු ඔහු ඔවුන්
අමතමින්, “දෙවියන් වහන්සේ සැබැවින් ම ඔබ
ආරක්ෂා කරන විට ඔබ ද මාගේ ඇටකටු මතෙනින්
ගෙන යා යුතු ය” කියා ඉශ්‍රායලේගේ දරුවන්ගෙනේ
දිවුරුම් ගත්තේ ය. 26 ජෝසපේ අවුරුදු එකසිය
දහයක් ආයු වළඳා මළේ ය. පසුව ඔව්හු ඔහුගේ
මෘත ශරීරයට බෙහෙත් කවා එය මිසරයෙහි මිනී
පෙට්ටියක තැන්පත් කළහ.

# නික්මයාම

### ඉශ්රායලේ ජනයාගේ වහල් සේවය

1 උත් 46:8-27 ජාකොබ් සමඟ මිසරයට තම
තමන්ගේ පවුල් කැටුව පැමිණි ඉශ්රායලේ
ජනයාගේ නාම මෙසේ ය: 2 රූබන්, සිමියොන්, ලෙවී
සහ ජුදා; 3 ඉස්සාකර්, සාබුලොන් සහ බෙන්ජමින්;
4 දාන් සහ නප්තලී, ගාද් සහ ආෂෙර් ය.
5 ජාකොබ්ගේ පළෙපතින් පැවත ආ සියල්ලෝ
හැත්තෑදෙනෙක් වූ හ. ජෝසෙප් එවකට මිසරයෙහි
සිටියේ ය. 6 කලකට පසු ජෝසෙප් ද, ඔහුගේ
සහෝදරයෝ සියලු දෙන ද, ඒ මුළු පරපුර ද මළහ.
7 ක්රියා 7:17එහෙත් ඉශ්රායලේ ජනයා සමෘද්ධ වී,
බොහෝ සේ වර්ධනය වී, ගණනින් ද වැඩී වී,
අතිශයින් බලවත් වූයෙන්, ඔවුන්ගෙන් රට පිරී ගියේ
ය.
8 ක්රියා 7:18 එකල ජෝසෙප් ගැන කිසිවක්
නොදත් අලුත් රජෙක් සිංහාසනාරූඪ විය. 9 ඔහු තම
සෙනඟට කතා කොට, “බලන්න, ඉශ්රායලේ
ජනතාවගේ සෙනඟ අපට වඩා ගණනින් වැඩී වී,
බලවත් ව, අපට තර්ජනයක් වී ඇත. 10 ක්රියා
7:19දැන් ඉතින් කන් දෙන්න, ඔවුන්ගේ සංඛ්යාව
වැඩි වීම වළකන පිණිස අපි ඔවුන් සම්බන්ධයෙන්
සිහි නුවණින් ක්රියා කරමු. යම් හයෙකින් යුද්ධයක්
ඇති වුවහොත්, ඔවුන් ද අපේ සතුරන් සමඟ
පරෙමුණු බැඳගෙන, අපට විරුද්ධ ව සටන් කොට රට
පාලනය කරන්න පුළුවනැ”යි කී ය. 11 එබැවින්
ඔවුන්ගෙන් බර වැඩ ගෙන, ඔවුන්ට පීඩා කරන
පිණිස ඔව්හු ඔවුන් කෙරෙහි විධායකයන් පත් කළහ.
මෙලෙසෙ ඉශ්රායලේ ජනයා පාරාවෝ සඳහා, පීතොම්
සහ රාමසෙසේ යන ගබඩා-නගර ගොඩනැඟුවෝ ය.
12 එහෙත් පීඩා විඳින්න, විඳින්න ඔව්හු වඩ වඩා
වැඩී වී, වර්ධනය වූ හ. මිසර දේශ වාසීහු ද
ඉශ්රායලේ සෙනඟට බිය වී, 13 ඔවුන්ගෙන්
බලහත්කාරයෙන් වැඩ ගත්හ. 14 මෙලෙසෙ කුඹල්
කර්මාන්තය, ගඩොල් කර්මාන්තය හා කෙත්වල
විවිධ කෘෂිකර්මාන්ත වැනි දරුණු වහල් මෙහෙවරින්
ඔව්හු ඔවුන්ගේ ජීවිත දැරිය නොහැකි තත්ත්වයකට
පත් කළහ. තවද, ඔව්හු ඔවුන්ගෙන්
බලහත්කාරයෙන් සියලු ආකාර බර වැඩ ගත්හ.
15 මිසර දේශයේ රජතුමා හෙබ්රෙව් වින්නඹුවන්
වන ෂිප්රා හා පුවාට කතා කොට, 16 “නුඹලා
හෙබ්රෙව් ස්ත්රීන්ට වින්නඹුකම් කරන විට
බිහිවන්නට යන්නේ පුතකේ ද දුවක් ද කියා හොඳින්
බලන්න; පුතකේ නම් මරන්න. දුවක් නම් ඈ ජීවත්
වුණා වේ” කියා පැවසී ය. 17 එහෙත්, වින්නඹුවෝ
දේව භය ඇති අය වූ නිසා මිසරයේ රජතුමා අණ
කළ පරිදි ඉටු නොකොට, පිරිමි දරුවන්ට ජීවත්
වන්න ඉඩ හැරියා හ. 18 එවිට රජතුමා වින්නඹුවන්
කැඳවා, ඔවුන්ට කතා කොට, “නුඹලා මේ දේ
කළෙේ මන් ද? පිරිමි දරුවන්ට ජීවත් වන්න ඉඩ
දුන්නේ ඇයි දැ”යි විචාළේ ය. 19 ඔව්හු පිළිතුරු
දමෙන්, “හෙබ්රෙව් ස්ත්රීහු මිසර දේශීය ස්ත්රීන්
මෙන් නොවෙති. ඔව්හු ශක්ති සම්පන්න ය.
වින්නඹුවන් ඔවුන් වෙත එන්නට පෙර ඔව්හු ප්රසූත
කරති”යි කී හ. 20 දෙවියන් වහන්සේ වින්නඹුවන්ට
මහා කරුණාව පෑ සේක. සෙනඟ ද සංඛ්යාවෙන්
වැඩී වී ඉතා බලසම්පන්න වූ හ. 21 තවද,
වින්නඹුවන් දේව භය ඇති අය වූ නිසා උන්
වහන්සේ ඔවුන්ට දරුසම්පත් දුන් සේක. 22 ක්රියා
7:19එවිට පාරාවෝ මුළු සෙනඟ අමතා,
“හෙබ්රෙව්වරුන්ට උපදින හැම පිරිමි ළමයකු ම
නයිල් ගඟට විසි කළ යුතු ය; සෑම දුවකට ජීවත්
වන්න ඉඩ දිය යුතු ය”යි අණ කළෙේ ය.

### මෝසෙස්ගේ උපත

2 එකල ලෙවී ගෝත්රයේ මිනිසෙක්, එම
ගෝත්රයේ කාන්තාවක සරණ පාවාගත්තේ ය.
2 ක්රියා 7:20; හෙබ්රෙ 11:23ඒ ස්ත්රිය ගැබ්ගෙන,
දරුවකු ලැබූ පසු දරුවා රුවැති බව දුටු ඈ, තමෙසක්
ඔහු සඟවා තැබුවා ය. 3 ඔහු තවත් සඟවා
තබාගැන්මට නොහැකි වූ කල, ඈ පන් පටේටියක්
ගෙන, එය පිට කීල් හා මැලියම් තවරා, දරුවා එහි
බහා, ගං ඉවුරේ බට ගස් අතර එය තැබුවා ය.
4 තවද, දරුවා හට කුමක් වේ දෝ කියා
දැනගැන්මට ඔහුගේ සහෝදරිය ඈතින් බලා සිටියා
ය.
5 එවිට ගඟේ ස්නානය කරනු පිණිස පාරාවෝගේ
දූ කුමරිය පැමිණියා ය. ඇගේ සේවිකාවෝ ගං ඉවුර
දිගේ ඇවිදිමින් සිටියා හ. ඈ බට ගස් අතර වූ
පටේටිය දැක, සේවිකාවක යවා, එය ගනේවාගෙන,
6 ඇරිය විට එහි දරුවකු දුටුවා ය. බලන්න, දරුවා ද
අඬමින් සිටියේ ය. එවිට ඈ ඔහු කෙරෙහි අනුකම්පා
උපදවා, “මේ හෙබ්රෙව් ජාතික දරුවකෙු”යි කීවා ය.
7 එවිට ඔහුගේ සොහොයුරිය පාරාවෝගේ දූ
කුමරියට කතා කොට, “ඔබ උදෙසා දරුවාට කිරි
දෙන්නට මා ගොස් හෙබ්රෙව් ජාතික කිරි මවක
කැඳවාගෙන එන්න දැ”යි විචාළා ය. 8 පාරාවෝගේ
දියණිය ඈට, “යන්නැ”යි කීවෙන්, ඈ ගොස් දරුවාගේ
මව කැඳවාගෙන ආවා ය. 9 එවිට කුමරිය ඈ අමතා,
“මේ දරුවා රැගෙන ගොස්, මා වෙනුවෙන් ඔහුට කිරි

දන්නේ, මම ද ඔබට කුලිය දෙමි"යි කී විට ඈ දරුවා
රැගෙන ගොස් ඔහුට කිරි දී හැදුවා ය. 10 ක්‍රියා
7:21දරුවා වැඩුණු පසු ඈ ඔහු පාරාවෝගේ දියණිය
වෙත ගෙනාවෙන්, ඔහු ඈට පුතෙකු සේ විය. තවද
ඈ, "මම ඔහු වතුරෙන් ගොඩ ගතිමි"යි කියා ඔහුට
මෝසෙස් යන නම තැබුවා ය.

### මෝසෙස් මිදියන් දේශයට පලා යෑම

11 හෙබ්‍රෙව් 11:24 එකල මෝසෙස් වයසින් වැඩුණු
පසු ඔහු තමාගේ සෙනඟ බලන්නට ගිය විට, ඔවුන්
කළ බර වැඩ දිටී ය. තවද, ඔහු තමාගේ ම
හෙබ්‍රෙව් ජාතිකයෙකුට මිසර වැසියෙකු පහර
දෙනවා දිටී ය. 12 එවිට ඔහු වට පිට බලා, කිසිවෙකු
නොසිටි බව දැක මිසර වැසියා මරා මළකඳ
වැල්ලෙහි සැඟවී ය. 13 පසු දින ඔහු නික්ම යන විට
හෙබ්‍රෙව් ජාතික දෙදෙනෙකු ගහගනිමින් සිටිනු දිටී
ය. වැරැද්ද කළ තැනැත්තාට ඔහු කතා කොට,
"ඔබේ සහෝදරයාට ඔබ පහර දෙන්නේ මන්දැ"යි
විචාළේ ය. 14 ක්‍රියා 7:23-28ඔහු පිළිතුරු දෙමින්,
"අපට අධිපතියෙකු හා විනිසකරුවෙකු ලෙස ඔබ පත්
කළේ කවරෙක් ද? ඔබ මිසර වැසියා මැරුවා සේ ම
මාත් මරන්න හදන්නෙහි දැ"යි ඇසී ය. එවිට
මෝසෙස් බිය වී, "ඇත්තට ම කාරණය එළි වී තිබේ
ය"යි කියාගත්තේ ය. 15 ක්‍රියා 7:29; හෙබ්‍රෙව්
11:27එපවත් සැළ වූ විට පාරාවෝ මෝසෙස්
මරාදැමීමට සෙවී ය. එහෙත්, මෝසෙස් පාරාවෝ
වෙතින් පලා ගොස් මිදියන් දේශයෙහි පදිංචි විය.
ඔහු එහි ළිඳක් ළඟ වාඩි වී සිටියේ ය.
16 මිදියන්හි පූජකවරයාට දූවරු සත්දෙනෙක් වූ හ.
ඔව්හු පැමිණ ළිඳෙන් වතුර ඇද, තම පියාගේ
බැටළුවන්ට පොවන පිණිස, දිය ඔරු පිරෙව්වෝ ය.
17 එහෙත්, එඬේරු පැමිණ ඔවුන් පන්නාදැමූ හ.
එවිට මෝසෙස් නැඟිට, ඔවුන්ට ආධාර කරමින්
බැටළුවන්ට වතුර පෙවී ය. 18 තවද, ඒ දූවරුන් තම
පියා වන රූවෙල් වෙත පැමිණි විට, ඔහු කතා
කරමින්, "අද නුඹලා මෙතරම් ඉක්මනින් ආපසු
ආවේ කෙසේ දැ"යි ඇසී ය. 19 ඔව්හු උත්තර
දෙමින්, "මිසර වැසියෙක් එඬේරුන් අතින් අප
බේරාගත්තේ ය. එපමණක් නොව, අපට වතුර ඇද
දී, බැටළුවන්ටත් පෙවී ය"යි කී හ. 20 එවිට ඔහු තම
දූවරුන් අමතමින්, "ඒ මිනිසා කොහේ ද? නුඹලා ඔහු
හැරදමා ආවේ මන් ද? කෑම කන පිණිස ඔහු
කැඳවන්නැ"යි කීවේ ය. 21 මෝසෙස් මිදියන්හි
පූජකවරයා සමඟ පදිංචි වීමට සතුටු විය. ඔහු
මෝසෙස්ට තම දුව වන ශිප්පෝරා සරණ
පාවාදුන්නේ ය. 22 ඈ ඔහුට දාව පුතෙකු
ලැබුවෙන්, මෝසෙස් "මම අමුතු රටක අමුත්තෙකු
මෙන් සිටියෙමි" කියා ඔහුට ගේර්ෂොම් යන නාමය
තැබී ය.
23 බොහෝ කලක් ගත වූ පසු, මිසරයේ රජතුමා
මියගියේ ය. ඉශ්‍රායෙල් ජනයා වහල් සේවය නිසා
සුසුම්ලමින්, මොරගැසූ හ. ඔවුන්ගේ වහල් සේවය
නිසා ම ඔවුන්ගේ කන්නලව්ව දෙවියන් වහන්සේ
වෙත පැමිණියේ ය. 24 උත් 15:13-14දෙවියන්
වහන්සේ ඔවුන්ගේ කන්නලව්වලට සවන් දී, තමන්
වහන්සේ ආබ්‍රහම්, ඊසාක් සහ යාකොබ් සමඟ
කළ තම ගිවිසුම සිහි කළ සේක. 25 උන් වහන්සේ
ඉශ්‍රායෙල් ජනයාගේ දුක බලා ඔවුන්ට කරුණාව
පෙන්වූ සේක.

### දෙවියන් වහන්සේ මෝසෙස් කැඳවීම

3 මෝසෙස් තම මාමණ්ඩිය වූ මිදියන්හි පූජක
තැන වන යෙත්‍රෝගේ එළු බැටළු පට්ටි
රැකබලාගනිමින් සිටියේ ය. ඔහු ඒ පට්ටි පාළුකරය
හරහා දක්කාගෙන ගොස්, හොරෙබ් නම්, දෙවියන්
වහන්සේගේ කන්දට පැමිණි කල, 2 ක්‍රියා
7:30-34සමිඳාණන් වහන්සේගේ දූතයා පඳුරක් මැදින්
නැඟුණු ගිනි ජාලාවක ආකාරයෙන් ඔහුට දෘශ්‍යමාන
විය. ඔහු බැලූ විට පඳුර ගින්නෙන් ඇවිළී ගිය නමුත්
එය නොදැවෙන බව දිටී ය. 3 මෝසෙස්, "මෙය
පුදුමයකි. මම දැන් ඊට ළං වී, පඳුර නොදැවෙන්නේ
මන්ද කියා බලමි"යි තමාට ම කියාගත්තේ ය.
4 ඔහු එය බලන පිණිස ඊට ළං වන බව සමිඳාණන්
වහන්සේ දුටු විට, දෙවියන් වහන්සේ පඳුර මැදින්,
"මෝසෙස්, මෝසෙස්" කියා ඔහුට හඬගැසූ සේක.
ඔහු ද, "මම මෙහි ය"යි කීවේ ය. 5 එවිට දෙවියන්
වහන්සේ කතා කොට, "මෙතැනට ළං නොවන්න;
නුඹේ පාදවලින් වහන් ගලවාදමන්න; නුඹ සිටින
ස්ථානය ශුද්ධ භූමියකැ"යි වදාළ සේක.
6 තවදුරටත් උන් වහන්සේ කතා කරමින්, "නුඹේ
පියාගේ දෙවියන් වහන්සේ මම ය, ආබ්‍රහම්ගේ
දෙවියන් වහන්සේ ද ඊසාක්ගේ දෙවියන් වහන්සේ
ද යාකොබ්ගේ දෙවියන් වහන්සේ ද මම ය"යි වදාළ
සේක. මෝසෙස් ද දෙවියන් වහන්සේගේ මුහුණ
දෙස බැලීමට බිය වූ බැවින් තම මුහුණ වසාගත්තේ
ය.

### මෝසෙස්ගේ දූතික සේවාව

7 සමිඳාණන් වහන්සේ ඔහුට කතා කොට මෙසේ
වදාළ සේක: "මිසරයේ සිටින මාගේ සෙනඟගේ
දුඃඛිත තත්ත්වය මම දිටිමි. ඔවුන්ගේ විධායකයන්ට
විරුද්ධ ව නඟින මොරගැසීමට මම සවන් දුනිමි.
ඔවුන්ගේ දුක් වේදනා මම හොඳින් දනිමි. 8 මිසර
ජාතීන්ගේ අතින් ඔවුන් මුදා, ඒ රටින් ඔවුන් පිට
කරවා, සාරවත් විශාල දේශයකට, කිරෙන් හා මී
පැණියෙන් ඉතිරෙන දේශයකට, එනම්
කානානිවරුන්ගේ හා හිත්තීවරුන්ගේ ද
අමෝරිවරුන්ගේ හා පෙරෙස්සිවරුන්ගේ ද
හිව්වරුන්ගේ හා යෙබුසිවරුන්ගේ ද දේශයට ඔවුන්
පමුණුවාලීම සඳහා මම බැස ආවෙමි. 9 දැන් ඉතින්,
මෙන්න, ඉශ්‍රායෙල් ජනතාවගේ මොරගැසීම මා
වෙත නැඟී ඇත. තවද, මිසර වාසීන් දෙන දරුණු
පීඩාවන් ද මා දැක ඇත. 10 එබැවින් දැන් ඉතින්
එන්න, මාගේ සෙනඟ වන ඉශ්‍රායෙල් ජනතාව
මිසරයෙන් පිටතට ගෙන යන පිණිස, මම නුඹ
පාරාවෝ වෙත යවමි."

11 එවිට මෝසෙස් දෙවියන් වහන්සේට කතා
කොට, “පාරාවෝ වෙත යාමටත්, ඉශ්රායලේ ජනයා
මිසරයෙන් පිටතට ගෙන ඒමටත් මම කවරෙක් දැ”යි
ඇසී ය. 12 දෙවියන් වහන්සේ උත්තර දෙමින්, “මම
නුඹ සමඟ සිටිමි. මා නුඹ එවූ බව දැනගැනීමට
නුඹට දෙන ලකුණ මෙය වේ: එනම්, නුඹ සෙනඟ
මිසරයෙන් පිටතට ගෙනෝ විට, මේ කන්ද මත
නුඹලා දෙවියන් වහන්සේ වන මා හට වැඳුම්පිදුම්
කරන්නහු ය”යි වදාළ සේක.

### දේව නාමය අනාවරණය කිරීම

13 නික්ම 6:2-3 එවිට මෝසෙස් දෙවියන්
වහන්සේට කතා කොට, “එසේ නම් මා, ඉශ්රායලේ
සෙනඟ වෙත ගොස්, ‘නුඹලාගේ පියවරුන්ගේ
දෙවියන් වහන්සේ මා නුඹලා වෙත එවූ සේකැ’යි කී
විට, ඔවුන් ද, ‘උන් වහන්සේගේ නම කුමක් දැ’යි
මාගෙන් අසන කල මම ඔවුන්ට කුමක් කියම් දැ”යි
ඇසී ය. 14 එළිද 1:4,8උන් වහන්සේ මෝසෙස්ට
පිළිතුරු දෙමින්, “මම වනාහි ස්වයම්භූ නම් තැනැන්
වහන්සේ වෙමි. ‘ස්වයම්භූ තැනැන් වහන්සේ ඔබ
වෙත මා එවූ සේකැ’යි නුඹ ඉශ්රායලේ ජනයාට කිව
යුතු ය”යි වදාළ සේක. 15 තවදුරටත් උන් වහන්සේ
මෝසෙස්ට කතා කරමින්, මෙසේ වදාළ සේක: “
‘ආබ්රහම්ගේ දෙවියන් වහන්සේ ද ඊසාක්ගේ
දෙවියන් වහන්සේ ද ජාකොබ්ගේ දෙවියන්
වහන්සේ ද වන නුඹලාගේ පියවරුන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේ ඔබ වෙත මා එවූ සේකැ’යි
කිව යුතු ය; සදහට ම මෙය මාගේ නාමය වේ; මතු
සියලු පරම්පරාවෝ මේ නාමයෙන් මට
ආමන්ත්රණය කරති.”

### මෝසෙස්ගේ සේවාව ගැන උවදෙස්

16 “නුඹ ගොස් ඉශ්රායලේ ජනයාගේ ප්රජා
මූලිකයන් රැස් කොට, ඔවුන් අමතා, ‘ආබ්රහම්ගේ ද
ඊසාක්ගේ ද ජාකොබ්ගේ ද දෙවියන් වහන්සේ වන,
ඔබේ පියවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ මට
දර්ශනය වී කතා කොට, මම සැබැවින් ම ඔබ වෙත
පැමිණ, මිසර වාසීන් ඔබට කරන දේ දිටිමි.
17 එබැවින් ඔබ පීඩා විඳින මිසර දේශයෙන් මා ඔබ
පිටත්කොට කානානිවරුන්ගේ හා හිත්තීවරුන්ගේ ද
අමෝරිවරුන්ගේ හා පෙරෙස්සිවරුන්ගේ ද
හිව්වරුන්ගේ හා ජෙබුසිවරුන්ගේ ද දේශය වන,
කිරෙන් හා මී පැණියෙන් ඉතිරෙන දේශයකට ඔබ
ගෙන එන්ට මම ඉටාගෙන සිටිමි’යි කියන්න.
18 ඔව්හු ද නුඹේ හඬට සවන් දෙනු ඇත. නුඹ ද
ඉශ්රායලේගේ ප්රජා මූලිකයන් ද මිසරයේ රජු
වෙත ගොස් ඔහුට කතා කොට, ‘හෙබ්රෙව්වරුන්ගේ
දෙවි සමිඳාණන් වහන්සේ අපට හමු වූ සේක.
එබැවින් අපගේ දෙවි සමිඳාණන් වහන්සේට පුද
පූජා ඔප්පු කරන ලෙස, තුන් දවසක ගමනක්,
පාළුකරයට යන්නට අපට අවසර දෙන ලෙස අපි
ඔබෙන් බැගෑපත් ව ඉල්ලමු’යි කියන්න. 19 එහෙත්
මිසරයේ රජ, තදින් බල කරනු ලැබුවොත් මිස
නුඹලාට යන්නට අවසර නොදෙන බව මට සහතික
ය. 20 මම ද මාගේ බාහු බලය පා, මා එහි කරන්ට
යන හාස්කම් සියල්ලෙන් මිසරයට පහර දෙන්නෙමි.
ඉන්පසු ඔහු නුඹලාට යන්ට අවසර දෙනු ඇත.
21 නික්ම 12:35-36 තවද, මම මිසර දේශ වාසීන්
ඉදිරියෙහි මේ සෙනඟට අනුග්රහය පාන්නෙමි.
එබැවින් නුඹලා පිටත් වී යන විට හිස් අතින්
නොයන්නහු ය. 22 සෑම කාන්තාවක ම තම
අසල්වැසියාගෙන් ද ඇගේ ගෘහයේ නැවතී සිටින
තැනැත්තියගෙන් ද රිදී හා රන් ආභරණ ද වස්ත්ර ද
ඉල්ලා ගන්නී ය. නුඹලා ඒවා නුඹලාගේ පුත්රයන්ට
ද දූවරුන්ට ද පැළඳවිය යුතු ය. මෙලෙසෙ නුඹලා මිසර
වාසීන්ගේ වස්තුව කොල්ල කෑ යුතු ය.”

### මෝසෙස්ට හාස්කම් පෑමේ බලය දීම

4 එවිට මෝසෙස් පිළිතුරු දෙමින්, “හොඳයි,
ඔව්හු මා විශ්වාස නොකොට, මාගේ හඬට
සවන් නො දී, සමිඳාණන් වහන්සේ ඔබට දර්ශනය
නො වූ සේකැ’යි කීවොත් කුමක් කරන්න දැ”යි ඇසී
ය. 2 සමිඳාණන් වහන්සේ ඔහුට කතා කොට,
“නුඹේ අතේ තිබෙන්නේ කුමක් දැ”යි ඇසූ සේක.
ඔහු, “සැරයටියකැ”යි කී ය. 3 උන් වහන්සේ කතා
කොට, “එය බිම දමන්නැ”යි වදාළ සේක. ඔහු එය
බිම දැමී ය, එය සර්පයෙක් විය. එවිට මෝසෙස් ඌ
ඉදිරියෙන් අහකට පැන්නේ ය. 4 සමිඳාණන්
වහන්සේ ඔහු අමතමින්, “නුඹේ අත දිගු කොට
උගේ වල්ගයෙන් අල්ලාගන්නැ”යි වදාළ සේක.
මෝසෙස් ද අත දිගු කොට, ඌ වල්ගයෙන් අල්ලා
ගත් විට, ඌ ඔහුගේ අතෙහි සැරයටියක් බවට
හැරිණි. 5 උන් වහන්සේ ද, “ආබ්රහම්ගේ දෙවියන්
වහන්සේ ද ඊසාක්ගේ දෙවියන් වහන්සේ ද
ජාකොබ්ගේ දෙවියන් වහන්සේ ද වන ඔවුන්ගේ
පියවරුන්ගේ දෙවියන් වහන්සේ නුඹට දර්ශනය වූ
බව ඔවුන් විශ්වාස කරන පිණිස මෙය කරන්නැ”යි
වදාළ සේක.
6 තවදුරටත් උන් වහන්සේ ඔහුට කතා කරමින්,
“දැන් නුඹේ අත ළයෙහි තබන්නැ”යි වදාළ සේක.
ඔහු තම අත ළයෙහි තැබී ය. ඔහු එය අහකට ගත්
විට, පුදුමයකි, ඔහුගේ අත හිම මෙන් සුදු
කුෂ්ඨයකින් වැසී තිබිණි. 7 යළිත් උන් වහන්සේ
කතා කොට, “නැවත නුඹේ අත ළයෙහි තබන්නැ”යි
වදාළ විට ඔහු තම අත ළයෙහි තැබී ය. එය ළයෙන්
ඉවතට ගත් විට, පුදුමයකි, එය තම මාංසය මෙන්
ප්රකෘති ස්වභාවයට හැරී තිබිණි. 8 එවිට උන්
වහන්සේ ඔහු අමතමින්, “පළමු වන හාස්කමින්
ඔව්හු නුඹ විශ්වාස නොකරත් නම්, නුඹේ හඬට
සවන් නොදෙත් නම්, දෙ වන හාස්කමින් ඔවුන්
නුඹේ කීම විශ්වාස කරනු ඇත. 9 ඔව්හු මේ
හාස්කම් දෙකෙ ම විශ්වාස නොකරත් නම්, නුඹ
ගංගාවෙන් වතුර රැගෙන වියළි පොළොවට වත්
කරන්න; එවිට නුඹ ගංගාවෙන් ගත් වතුර වියළි
පොළොව මත ලේවලට හැරෙන්නේ ය”යි වදාළ
සේක.

10 ඉන්පසු මෝසෙස් සමිඳාණන් වහන්සේ අමතා,
“මාගේ ස්වාමීනි, ඔබ වහන්සේ ඔබේ දාසයා හා
සමඟ කතා කළ පසු වේ වා, ඊට පෙර වේ වා, මම
ව්‍යක්ත කථිකයෙක් නො වෙමි. කීමෙහි බිණීමෙහි
දුබල ය, දිව ගොතගහන සුලු ය”යි කී ය.
11 සමිඳාණන් වහන්සේ ඔහුට උත්තර දෙමින්,
“මිනිසාගේ මුඛය නිර්මාණය කළේ කවරෙක් ද?
යමෙකු ගොළු කරන්නේ හෝ බිහිරි කරන්නේ හෝ
යමෙකුට පෙනීම දෙන්නේ හෝ යමෙකු අන්ධයෙකු
කරන්නේ හෝ කවරෙක් ද? එසේ කරනුයේ
සමිඳාණන් වහන්සේ වන මම නො වෙමි ද?
12 එබැවින් දැන් ඉතින් යන්න, නුඹට කතා කිරීමට
මම උදව් වෙමි, නුඹ කිව යුතු දේ මම නුඹට කියා
දෙමි”යි වදාළ සේක. 13 එහෙත්, ඔහු පිළිතුරු දෙමින්,
“අනේ මාගේ ස්වාමීනි, කරුණාකර, ඔබ කැමැති අන්
කෙනෙකු යැව්ව මැනවැ”යි කී ය.
14 එවිට සමිඳාණන් වහන්සේ මෝසෙස් සමඟ
උදහසින් ඇවිළී, “නුඹේ සහෝදරයා වන ලෙවීයෙකු වූ
ආරොන් ඉන්නවා නොවේ ද? ඔහු කතාවට
දක්ෂයෙකු බව මම දනිමි. මෙන්න, නුඹ හමු වීමට
ඔහු එනු ඇත; ඔහු ද නුඹ දකින විට තම හද
පත්ලෙන් සතුටු වනු ඇත. 15 නුඹ ඔහුට කතා කොට
ඔහු කුමක් කිව යුතු දැ යි කියා දෙන්න. මම නුඹට
හා ඔහුට ද කතා කිරීමට උදව් වන්නෙමි. තවද, නුඹ
කුමක් කළ යුතු දැ යි උගන්වන්නෙමි. 16 ඔහු නුඹ
වෙනුවෙන් සෙනඟට කතා කරනු ඇත. මෙසේ ඔහු
නුඹේ නියෝජිතයා වන්නේ ය. නුඹ දෙවියන්
වහන්සේ මෙන් ඔහුට කුමක් කිව යුතු දැ යි කියා
දෙන්නෙහි ය. 17 ඇරත්, නුඹ මේ සැරයටිය අතේ
ගෙන ගොස් එයින් හාස්කම් පෑ යුතු ය”යි වදාළ
සේක.

## මෝසෙස් මිසරයට ආපසු යාම

18 මෝසෙස් තම මාමණ්ඩි වන ජෙත්රෝ වෙත
ආපසු ගොස්, ඔහුට කතා කොට, “මිසරයේ සිටින
මාගේ ඥාතීන් වෙත ආපසු ගොස් ඔව්හු ජීවත් ව
සිටිත් දැ’යි බලනු පිණිස මට යන්න, කරුණාකර,
අවසර දෙන්නැ,”යි ඉල්ලී ය. ජෙත්රෝ ද, “සුව සේ
යන්නැ”යි මෝසෙස්ට කීවේ ය. 19 සමිඳාණන්
වහන්සේ මිදියන්හි දී මෝසෙස් අමතමින්, “මිසරයට
ආපසු යන්න, නුඹව මරන්නට සෙව්වෝ සියල්ලෝ ම මළ
හ”යි වදාළ සේක. 20 මෝසෙස් ද තම බිරිඳ හා
පුතුන් රැගෙන, ඔවුන් කොටළුවෙකු පිට නංවාගෙන
යළි මිසර දේශයට ගියේ ය. දෙවියන් වහන්සේ දුන්
සැරයටියත් ඔහු අතට ගත්තේ ය. 21 උන් වහන්සේ
ඔහුට කතා කොට, “නුඹ මිසරයට ආපසු ගිය විට,
මා නුඹට ඉටු කරන්න බලය දුන් ඒ සියලු හාස්කම්
පාරාවෝ ඉදිරියෙහි පෑ යුතු ය. එහෙත්, මම ඔහුගේ
හිත දැඩි කරමි. සෙනඟට පිට වී යාමට ඔහු ඉඩ
නොදෙනු ඇත. 22 නුඹ ද පාරාවෝට කතා කොට,
‘සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේකැ’යි
කියන්න: ‘ඉශ්රායලේ ජනතාව මාගේ කුලුඳුල් පුත්‍ර
රත්නය ය. 23 නික්ම 12:29එබැවින් මට පුද පූජා
ඔප්පු කරන පිණිස මාගේ පුතුට යන්න අවසර
දෙන්නට මම ඔබට කියමි. එහෙත්, ඔබ ඔවුන්ට
යන්න අවසර නොදෙන්නෙහි නම් මෙන්න, මම
ඔබේ කුලුඳුල් පුත්‍රයා මරාදමන්නට යමි’යි
කියන්නැ”යි වදාළ සේක.

## මෝසෙස්ගේ පුත්‍රයා චර්මඡේදනය කිරීම

24 මෝසෙස් මෙසේ යන විට, එක්තරා නවාතැනක
දී සමිඳාණන් වහන්සේ ඔහුට හමු වී, ඔහු
මරාදැමීමට සෙව්වූ සේක. 25 එවිට ශිප්පෝරා මුවහත්
ගලක් ගෙන ඇගේ පුතුගේ චර්මාග්‍රය කපා
මෝසෙස්ගේ පාද එයින් ස්පර්ශ කොට, “දැන් ඉතින්
ඔබ චර්මඡේදනය ලැබූ සැමියෙකි”යි කීවා ය. 26 උන්
වහන්සේ එවිට මෝසෙස්ට ජීවත් වෙන්න ඉඩ හැරිය
සේක. චර්මඡේදනය නිසා, ‘ඔබ චර්මඡේදනය ලැබූ
සැමියෙකි’ යි ඈ කීවේ එවිට ය.

## මෝසෙස් ආරොන් හමු වීම

27 සමිඳාණන් වහන්සේ ආරොන්ට කතා කොට,
“මෝසෙස් හමු වීමට පාළුකරයට යන්නැ”යි වදාළ
සේක. ඔහු එහි ගොස් දෙවියන් වහන්සේගේ
කන්දෙහි දී මෝසෙස් හමු වී, ඔහු සිපගත්තේ ය.
28 එවිට දෙවියන් වහන්සේ තමා එවූ විට වදාළ
සියලු දේ ද තමාට උන් වහන්සේ අණ කළ සියලු
හාස්කම් ද ආරොන්ට දැන්වී ය. 29 පසුව මෝසෙස්
සහ ආරොන් ගොස් ඉශ්රායලේ ජනතාවගේ ප්‍රජා
මූලිකයන් සියලු දෙනා රැස් කරවූ හ. 30 ඉන්පසු
ආරොන්, සමිඳාණන් වහන්සේ මෝසෙස්ට වදාළ
සියල්ල කියා දී, සෙනඟ ඉදිරිපිට හාස්කම් පෑවේ ය.
31 සෙනඟ ද ඔවුන් විශ්වාස කළහ. සමිඳාණන්
වහන්සේ ඉශ්රායලේ ජනතාව බලන්නට පැමිණ,
ඔවුන් විඳින දුක බලා එය තේරුම්ගත් නිසා, ඔව්හු
හිස නමා නමස්කාර කළහ.

## මෝසෙස් පාරාවෝ බැහැදැකීම

5 ඉන්පසු මෝසෙස් ද ආරොන් ද පාරාවෝ වෙත
පැමිණ, “ ‘පාළුකරයෙහි මාගේ නාමයෙන්
මංගල්‍යයක් පවත්වනු පිණිස මාගේ සෙනඟට යන්න
අවසර දෙන්න’ කියා ඉශ්රායලේවරුන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේ, වදාරන සේකැ”යි කී හ.
2 පාරාවෝ පිළිතුරු දෙමින්, “සමිඳාණන් වහන්සේ
නම් කවරෙක් ද? ඉශ්රායලේ ජනයාට යන්න අවසර
දීමට මා ඒ හඬට අවනත විය යුත්තේ මන් ද? මම
සමිඳාණන් වහන්සේ නාඳුනමි. ඉශ්රායලේ ජනයාට
යන්න මා අවසර දෙන්නේ නැතැ”යි කී ය. 3 ඔව්හු
යළි කතා කොට, “හෙබ්රෙව්වරුන්ගේ දෙවියන්
වහන්සේ අපට හමු වූ සේක. අපේ දෙවි සමිඳාණන්
වහන්සේට පුද පූජා ඔප්පු කරනු පිණිස පාළුකරයට,
තුන් දිනක ගමන් දුර යෑමට, කරුණාකර, අපට
අවසර දෙන්න, එලෙස නුදුන්නොත් උන් වහන්සේ
අපට වසංගතයෙන් හෝ කඩුවෙන් හෝ පහර දෙන
සේකැ”යි කී හ. 4 එවිට මිසරයේ රජ ඔවුන්
අමතමින්, “මෝසෙස් සහ ආරොන්, සෙනඟ

ඔවුන්ගේ වැඩවලින් ඉවත් කරන්න නුඹලා අදහස්
කරන්නේ මක්නිසා ද? බර වැඩට ආපසු යන්නැ"යි කී
ය. 5 පාරාවෝ වැඩිදුරටත් කතා කරමින්, "දැන්
මොව්හු දේශීය ජනතාවට වඩා බහුල ව සිටිති.
නුඹලා අදහස් කරන්නේ ඔවුන්ගේ බර වැඩ
නවත්වා දැමීමට දැ"යි ඇසී ය.

## විධායකයන්ට හා නිලධාරීන්ට උවදෙස්

6 ඒ දවසේ ම, පාරාවෝ ජනතාවගේ
විධායකයන්ට හා නිලධාරීන්ට අණ කරමින්,
7 "නුඹලා මෙතෙක් කළ පරිදි ගඩොල් සෑදීම සඳහා
මිනිසුන්ට පිදුරු නොදිය යුතුයි. ඔවුන් ම ගොස් පිදුරු
සොයාගත යුතුයි. 8 එහෙත්, මේ දක්වා ඔවුන් සෑදූ
ගඩොල් ගණන ම තැනිය යුතුයි. ඉන් කිසිවක් අඩු
නොකරන්න, ඔව්හු දැන් අලස ය. එබැවින්, 'අපගේ
දෙවියන් වහන්සේට පුද පූජා ඔප්පු කරන්න අපට
යන්න දෙන්නේ' කියා මොරගසති. 9 තවද,
නොනවත්වා ම වැඩ කරන පිණිසත්, වැඩකට නැති
කතාවලට කන් නොදෙන පිණිසත් ඔවුන් පිට බර
වැඩ පැවරිය යුතු ය"යි කී ය.
10 ජනතාවගේ විධායකයෝ ද නිලධාරීහු ද පිටත්
ව ගොස් සෙනඟට කතා කොට, "පාරාවෝ මෙසේ
අණ කොට ඇත. එනම්, 'මම නුඹලාට පිදුරු
නොදෙමි, 11 නුඹලා ම ගොස් පුළුවන් තැන්වලින්
පිදුරු සොයාගන්න, හැබැයි, නුඹලාගේ වැඩ කිසිවක්
අඩු නොවිය යුතු ය' කියා කීවේ යැ"යි කී හ.
12 එවිට සෙනඟ පිදුරු නැති නිසා ඉපනැලි එකතු
කිරීමට මුළු මිසර දේශයෙහි ම විසිර ගියහ.
13 විධායකයෝ කතා කරමින්, "පිදුරු තිබුණු කල්හි
මෙන් ම නුඹලාට නියමිත දිනපතා වැඩ කොටස
සම්පූර්ණ කළ යුතු ය"යි ඔවුන් ඉක්මන් කරවූ හ.
14 තවද, ඔව්හු පාරාවෝගේ විධායකයන් විසින් පත්
කරන ලද ඉශ්‍රායලේ ජනයාගේ නිලධාරීන්ට පහර
දී, "මෙතෙක් කළ පරිදි ඊයෙත්, අදත් නියමිත
ගඩොල් ගණන සාදා නිම නොකළේ මන්දැ"යි ඇසූ
හ.

## හෙබ්‍රෙව් නිලධාරීන්ගේ පැමිණිලි

15 එවිට ඉශ්‍රායලේ ජනයාගේ නිලධාරීහු පාරාවෝ
වෙත ගොස් පැමිණිලි කරමින්, "ඔබේ දාසයන්ට ඔබ
මෙසේ කරන්නේ මන් ද? 16 ඔබ ඔවුන්ට පිදුරු
සපයන්නේත් නැත; එහෙත්, 'පිදුරු නැති ව ගඩොල්
සාදන්නැ'යි අපට කීම හරි පුදුම කීමකි. ඔව්හු ඔබේ
දාසයන්ට පහර දෙති. එහෙත්, වරද ඇත්තේ ඔබේ
ම සෙනඟ අතේ නොවේ දැ"යි ඇසූ හ. 17 එවිට
පාරාවෝ කතා කොට, "නුඹලා අලස ය, කම්මැලි ය,
'අපි ගොස් සමිඳාණන් වහන්සේට පුද පූජා ඔප්පු
කරමු'යි නුඹලා කියන්නේ ඒ නිසා ය. 18 දැන් ඉතින්
වැඩට ආපසු පලයව්; නුඹලාට කොහෙත් ම පිදුරු
සපයනු නොලැබේ. එහෙත්, නියමිත ගඩොල් ගණන
බාර දිය යුතු ම ය"යි කී ය.

19 'නුඹලා දිනපතා සෑදිය යුතු ගඩොල් ගණනින්
කිසිවක් අඩු නොකළ යුතු ය'යි පාරාවෝ කී පසු,
ඉශ්‍රායලේ ජනයාගේ නිලධාරීහු තමන්ට අපල
කාලයක් උදා වී තිබෙන බව දුටහ. 20 ඔවුන්
පාරාවෝ වෙතින් ආපසු එන විට, ඔවුන් එන තෙක්
අතර මඟ බලා සිටි මෝසෙස් සහ ආරොන් හමු වී,
21 "සමිඳාණන් වහන්සේ ඔබ වෙත බැල්ම හෙළා,
ඔබට දඬුවම් කරන සේක් වා! මන්ද ඔබ, පාරාවෝ
සහ ඔහුගේ නිලධාරීන් ඉදිරියෙහි අප පිළිකුලක්
කොට මරාදමනු පිණිස ඔබ ඔවුන්ගේ අත්වලට
කඩුවක් දුන්නහු ය"යි ඔව්හු කීවෝ ය.

## මෝසෙස්ගේ යැදුම

22 මෝසෙස් සමිඳාණන් වහන්සේ වෙත ආපසු
ගොස්, "ස්වාමීනි, ඔබ වහන්සේ මේ සෙනඟට
මෙතරම් දරුණු ලෙස ක්‍රියා කරන්නේ මන් ද? ඔබ
වහන්සේ මා යැව්වේ කුමක්නිසා ද? 23 මා පාරාවෝ
වෙත ගොස් ඔබේ නාමයෙන් කතා කළ දවසේ
පටන් ඔහු මේ සෙනඟට පීඩා කරයි. ඔබ වහන්සේ
ද ඔබ සෙනඟ මුදාලීමට කිසි ම දෙයක් කර නැතැ"යි
කීවේ ය.

6 එවිට සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතා,
"මා පාරාවෝ හට කරන්න යන දේ නුඹට දැන්
පෙනෙනු ඇත. බාහු බලයෙන් ඔවුන්ට පිට වී යන්න
ඉඩ හරින ලෙසත් බාහු බලයෙන් සිය රටින් පිටමං
කරන ලෙසත් ඔහුට බල කරමි"යි වදාළ සේක.

## මෝසෙස් යළි කැඳවනු ලැබීම

2 උත් 17:1; 23:3; 35:11; නික්ම 3:13-15 දෙවියන්
වහන්සේ මෝසෙස්ට කතා කොට මෙසේ වදාළ
සේක: "මම සමිඳාණන් වහන්සේ ය. 3 මම
ආබ්‍රහම්ට ද ඊසාක්ට ද ජාකොබ්ට ද සර්ව
පරාක්‍රම දෙවියන් වහන්සේ මෙන් ප්‍රකාශ වූයෙමි.
එහෙත් මම, සමිඳාණන් වහන්සේ යන නාමයෙන්
ඔවුන් හට ප්‍රකාශ නොවූයෙමි. 4 මම ද ඔවුන්
කලක් විදේශීන් ව විසූ කානාන් දේශය ඔවුන්ට
දීමට ඔවුන් සමඟ ගිවිසුමක් පිහිටුවා ගතිමි. 5 තවද,
මිසර වාසීන් විසින් වහල් බැම්මෙන් බැඳගන්නා ලද
ඉශ්‍රායලේ ජනතාවගේ සුසුම්ලෑමට සවන් දී, මාගේ
ගිවිසුම සිහි කළෙමි. 6 එබැවින් නුඹ ඉශ්‍රායලේ
ජනතාවට කතා කොට, 'මම වනාහි සමිඳාණන්
වහන්සේ ය. මිසර වාසීන් නුඹලා පිට පටවා ඇති
බරපතල වැඩවලින් නුඹලා මුදා, ඔවුන්ගේ වහල්
සේවයෙන් නිදහස් කොට, මාගේ හස්තය දිගු
කොට දරුණු ලෙස ඔවුන්ට දඬුවම් දෙමින් මම
නුඹලා ගළවාගන්නෙමි. 7 තවද, මාගේ ම සෙනඟ
මෙන් නුඹලා භාරගෙන, මම නුඹලාගේ දෙවියන්
වහන්සේ වන්නෙමි. මිසර වාසීන්ගේ බර වැඩවලින්
නුඹලා මුදන, නුඹලාගේ දෙවි සමිඳාණන් වහන්සේ
මා බව නුඹලා එවිට දැනගන්නහු ය. 8 පසුව
ආබ්‍රහම්ට ද ඊසාක්ට ද ජාකොබ්ට ද දෙන ලෙස මා
දිවුළ දේශයට මම නුඹලා ගෙනෙන්නෙමි. මම එය
නුඹලාට උරුම කොට දෙන්නෙමි. සමිඳාණන්

වහන්සේ මම වෙමි'යි කියන්න." 9 මෝසෙස් මෙසේ
ඉශ්‍රායලේ ජනතාවට කී නමුත් ඔවුන්ගේ දැඩි සිත්
වේදනාව හා දරුණු වහල්කම නිසා ඔව්හු ඔහුට
සවන් නුදුන්හ.
10 එවිට සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට, 11 "නුඹ මිසරයේ රජු වන පාරාවෝ වෙත
ගොස්, 'ඔහුගේ රටින් පිට වී යන්න ඉශ්‍රායලේ
ජනතාවට අවසර දෙන්නේ' කියා කියන්නැ"යි වදාළ
සේක. 12 එවිට මෝසෙස් සමිඳාණන් වහන්සේට
කතා කොට, "බලන්න, ඉශ්‍රායලේ ජනයා මට සවන්
දෙන්නේ නැත්නම්, කතාවෙහි චතුරත්වයක් නැති
මට පාරාවෝ කෙසේ සවන් දෙන්නේ දැ"යි විචාළේ
ය. 13 එවිට ඉශ්‍රායලේ ජනතාව මිසර දේශයෙන්
පිටතට ගෙන යන ලෙස සමිඳාණන් වහන්සේ
තමන්ට නියම කළ බව ඉශ්‍රායලේ ජනයාට හා
මිසරයේ රජු වන පාරාවෝට දන්වන ලෙස උන්
වහන්සේ මෝසෙස්ට හා ආරොන්ට අණ කළ සේක.

## මෝසෙස්ගේ සහ ආරොන්ගේ පෙළපත්

14 පහත දැක්වෙනුයේ ඔවුන්ගේ පිය පෙළපත්වල
ප්‍රධානීහු ය. ජාකොබ්ගේ කුලුඳුලා වූ රූබන්ගේ
පුත්‍රයෝ නම් හනොක්, පල්ලු, හෙස්රොන් සහ
කර්මී ය. මොවුහු රූබන්ගේ පෙළෙන්තියට අයිති
වූවෝ වෙති.
15 සිමියොන්ගේ පුත්‍රයෝ නම් ජමුවෙල්, ජාමීන්,
ඕහද්, ජාකීන්, ශොහර් සහ කානානිය ස්ත්‍රියකගේ
පුත්‍ර වූ ෂාවුල් ය. මොවුහු සිමියොන්ගේ
පෙළෙන්තියට අයිති වූවෝ වෙති.
16 ගණන් 3:17-20; 26:57-58; 1 වංශා 6:16-19
තමන්ගේ පරම්පරා අනුව ලෙවීගේ පුත්‍රයන්ගේ
නාම මෙසේ ය: ගර්ෂොන්, කොහාත් සහ මෙරාරී
ය. ලෙවී අවුරුදු එකසිය තිස්හතක් ජීවත් විය.
17 ඔවුන්ගේ පෙළපත් අනුව ගර්ෂොන්ගේ
පුත්‍රයෝ නම් ලිබ්නි සහ ෂිමයි ය.
18 කොහාත්ගේ පුත්‍රයෝ නම් අම්රාම්, ඉශ්හාර්,
හෙබ්රොන් සහ උශ්ශියෙල් ය. කොහාත් අවුරුදු
එකසිය තිස්තුනක් ජීවත් විය.
19 මෙරාරීගේ පුත්‍රයෝ නම් මාලී සහ මූෂී ය.
ඔවුන්ගේ පරම්පරා අනුව ලෙවීගේ පෙළපත් මේවා
ය.
20 තවද, අම්රාම් තම පියාගේ සහොදරිය වූ
ජොකෙබෙද් බිරිඳ කොට සරණ පාවාගත්තේ ය.
ඇය ඔහුට දාව ආරොන් සහ මෝසෙස් ලැබුවා ය.
අම්රාම් අවුරුදු එකසිය තිස්හතක් ජීවත් විය.
21 ඉශ්හාර්ගේ පුත්‍රයෝ නම් කෝරා, නෙපෙග්
සහ ශික්රී ය.
22 උශ්ශියෙල්ගේ පුත්‍රයෝ නම් මිෂායෙල්,
එල්ෂාපාන් සහ සිත්රී ය.
23 ආරොන් අම්මීනාදබ්ගේ දුව වූ නාෂොන්ගේ
සහෝදරී වූ එලිෂෙබා බිරිඳ කොට සරණ
පාවාගත්තේ ය. ඈ ඔහුට දාව නාදාබ්, අබිහු,
එලයොසර් සහ ඊතාමාර් ලැබුවා ය.
24 කෝරාගේ පුත්‍රයෝ නම් අස්සීර්, එල්කානා සහ
අබියාසාප් ය. මොව්හු කෝරා ජාතිකයන්ගේ
පෙළපත් ය.
25 ආරොන්ගේ පුත් එලයොසර් පුතියෙල්ගේ දුවක
බිරිඳ කොට සරණ පාවාගත්තේ ය. ඈ ඔහුට දාව
පිනෙහාස් ලැබුවා ය. මොවුහු තමන්ගේ පෙළපත්
අනුව ලෙවී ජාතිකයන්ගේ පිය පෙළපත්වල
ප්‍රධානීහු ය.
26 "ඉශ්‍රායලේ ජනතාව කණ්ඩායම් වශයෙන් මිසර
දේශයෙන් පිටතට ගෙනෙන්නේ" කියා සමිඳාණන්
වහන්සේ කීවේ මේ ආරොන්ට සහ මෝසෙස්ට ය.
27 ඉශ්‍රායලේ ජනතාව මිසර දේශයෙන් පිටතට
ගෙනෙනු පිණිස මිසරයේ රජ වූ පාරාවෝට කතා
කළේත් එම මෝසෙස් සහ ආරොන් ය.

## මෝසෙස් නැවත කැඳවනු ලැබීම

28 සමිඳාණන් වහන්සේ මිසර දේශයේ දී
මෝසෙස්ට කතා කළ දවසේ 29 උන් වහන්සේ
ඔහුට වදාළේ, "මම සමිඳාණන් වහන්සේ ය. මා
නුඹට වදාළ සියල්ල මිසරයේ රජු වන පාරාවෝට
දන්වන්න" කියා ය. 30 එහෙත් මෝසෙස් සමිඳාණන්
වහන්සේට කීවේ, "බලන්න, මම කතාවෙහි
දක්ෂයෙක් නොවෙමි, එසේ නම් පාරාවෝ මට සවන්
දෙන්නේ කුමට දැ"යි කියා ය.
7 තවද සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට මෙසේ වදාළ සේක: "බලන්න, මම නුඹ
පාරාවෝ ඉදිරියෙහි දෙවි කෙනෙකු මෙන් කරමි.
නුඹේ සහෝදර වූ ආරොන් නුඹේ දිවැසිවරයා
වන්නේ ය. 2 මා නුඹට අණ කරන සියල්ල නුඹ
ඔහුට කිව යුතු ය. නුඹේ සහෝදර වන ආරොන් ද
පාරාවෝට කතා කොට, ඔහු ඉශ්‍රායලේ ජනයා
ඔහුගේ දේශයෙන් පිටත් කර යැවිය යුතු ය යි
කියන්න. 3 ක්‍රියා 7:36මම ද පාරාවෝගේ සිත දැඩි
කොට, මිසර දේශයෙහි මාගේ ලකුණු හා හාස්කම්
බහුල ව සිදු කරමි. 4 එහෙත්, පාරාවෝ නුඹට සවන්
නොදෙන්නේ ය. එවිට මම මිසරයෙහි මාගේ බාහු
බලය පා, එහි වාසීන්ට දරුණු දඬුවම් දී, මාගේ
සේනාවන් ද මාගේ සෙනඟ ද වන ඉශ්‍රායලේ
ජනයා මිසර දේශයෙන් පිටතට ගෙනෙන්නෙමි.
5 මිසරයට විරුද්ධ ව මාගේ හස්තය දිගු කොට
ඔවුන් අතුරින් ඉශ්‍රායලේ ජනයා පිටත ගෙනෙන විට
මා සමිඳාණන් වහන්සේ බව මිසර දේශ වාසීහු දැන
ගන්නෝ ය."
6 මෝසෙස් හා ආරොන් උන් වහන්සේ තමන්ට
අණ කළ පරිදි ඉටු කළහ. 7 ඔවුන් පාරාවෝ සමඟ
කතා කරන කාලයේ දී මෝසෙස්ගේ වයස අවුරුදු
අසූවකි; ආරොන්ට අවුරුදු අසූතුනකි.

## ආරොන්ගේ සැරයටියෙන් කළ හාස්කම්

8 තවද, සමිඳාණන් වහන්සේ මෝසෙස්ට හා
ආරොන්ට කතා කොට, 9 "පාරාවෝ නුඹ අමතා,
සාක්ෂි වශයෙන් හාස්කම් පෑමට කීවොත්, නුඹ
ආරොන්ට කතා කොට, 'ඔබේ සැරයටිය ගෙන එය

සර්පයකු වෙන ලෙස පාරාවෝ ඉදිරියෙහි බිම
දමන්න,’ කියා කිව යුතු ය”යි වදාළ සේක.
10 ඉන්පසු මෝසෙස් සහ ආරොන් ද පාරාවෝ වෙත
ගොස් සමිඳාණන් වහන්සේ අණ කළ ලෙස ඉටු
කළහ. ආරොන් තම සැරයටිය පාරාවෝ සහ
ඔහුගේ නිලධාරීන් ඉදිරියෙහි දැමූ විට එය
සර්පයකු විය. 11 එවිට පාරාවෝ,
ශාස්ත්‍රවන්තයන් හා අනවිනකාරයන් කැඳවී ය.
මිසරයේ ඒ ඉන්ද්‍රජාලිකයෝ ද තමන්ගේ ඇස්
බැන්දුම්වලින් එලෙසෙ ම කළහ. 12 ඔවුන් සැම
දෙනෙකු ම තම තමන්ගේ සැරයටි බිම දැමූ විට
ඒවා සර්පයෝ වූ හ. එහෙත් ආරොන්ගේ සැරයටිය
ඔවුන්ගේ සැරයටි ගිලදැමී ය. 13 සමිඳාණන්
වහන්සේ වදාළ ලෙස පාරාවෝගේ හිත දැඩි වූයෙන්,
ඔහු මෝසෙස් සහ ආරොන් කී දේ සැලකුවේ නැත.

### පළමු වන වසංගතය: වතුර ලේ වීම

14 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට,
“පාරාවෝගේ සිත දැඩි වී ඇත. ඔහු සෙනඟට පිට
වී යන්න අවසර නොදෙන්නේ ය. 15 උදය කාලයේ
පාරාවෝ ගඟට යන විට, නුඹ ද ගං ඉවුරේ ඔහු
පැමිණෙන තෙක් බලා සිටින්න. තවද, සර්පයකු වූ
සැරයටිය අතින් රැගෙන යන්න. 16 නුඹ ඔහුට කතා
කොට, හෙබ්‍රෙව්වරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේ මෙසේ කීමට ඔබ වෙත මා එවූ සේක.
එනම්, ‘මට පාළුකරයෙහි වැඳුම්පිදුම් කරන පිණිස
යන්න මාගේ සෙනඟට අවසර දෙන්න. එහෙත්
පුදුමයකි, මේ වන තෙක් ඔබ ඊට සවන් නුදුන්නෙහි
ය. 17 එළිද 16:4එබැවින් මෙන්න, සමිඳාණන්
වහන්සේගේ පණිවුඩය මේ ය: මා සමිඳාණන්
වහන්සේ බව ඔබ මේ ලකුණින් දැන ගන්නෙහි ය.
එනම්, බලන්න, ගඟේ දියට මා අතේ ඇති
සැරයටියෙන් ගසමි. එවිට එහි වතුර ලේ වන්නේ ය.
18 ගඟේ සිටින මසුන් මැරී ගඟෙන් දුගඳ හමනු
ඇත. එබැවින් එහි වතුර බීමට මිසර වාසීහු ඉතා
අප්‍රිය කරන්නෝ ය’ ”යි වදාළ සේක.
19 සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතමින්,
“ආරොන්ට මෙසේ කියන්න: ‘මිසරයේ ගංගා, ඇළ
දොළ, වැව් පොකුණු සියල්ල ම ලේවලට හැරෙන
පිණිස ඔබේ සැරයටිය අතට ගෙන ජලය මත එය
දිගු කරන්න.’ එවිට, මුළු මිසර දේශය පුරා ඇති ලී
බඳුන්වල මෙන් ම ගල් බඳුන්වල ද ලේ ඇති
වන්නේ ය”යි වදාළ සේක.
20 මෝසෙස් සහ ආරොන් සමිඳාණන් වහන්සේ
අණ කළ පරිදි කළහ. පාරාවෝ සහ ඔහුගේ
නිලධාරීන් ඉදිරිපිට ඔහු සැරයටියෙන් ගඟේ ජලයට
ගැසී ය. ගඟේ ජලය සියල්ල ද ලේවලට හැරිණි.
21 ගඟේ මාළු ද මැරිණි; ගඟෙන් දුගඳ හමන්නට
විය. මිසර දේශ වාසීන්ට එහි ජලය බීමට නොහැකි
විය. තවද, මුළු මිසර දේශයේ පුරා ම ලේ ඇති
විය. 22 මිසර දේශයේ ඉන්ද්‍රජාලිකයෝ ද
තමන්ගේ ඇස් බැන්දුම්වලින් එලෙසෙ කළහ.
පාරාවෝගේ හිත දැඩි වූයෙන්, සමිඳාණන් වහන්සේ
වදාළ ලෙස ඔහු ඔවුන් කී දේ සැලකුවේ නැත.
23 පාරාවෝ ද සිදු වූ දේ ගණනකට නොගත්තෙන්,
හැරී ආපසු තම මාලිගාවට ගියේ ය. 24 ගංගාවේ
ජලය බීමට ඔවුන්ට නොහැකි වූ නිසා මිසර දේශ
වාසීහු සැම දෙනෙ ම වතුර බීම සඳහා ගඟ අසල
වළවල් කැණූ හ.
25 තවද, සමිඳාණන් වහන්සේ මෙලෙසෙ ගඟේ
දියට ගැසූ පසු දවස් හතක් ගත විය.

### දෙ වන වසංගතය: මැඩි උවදුර

8 එවිට සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට, “පාරාවෝ වෙත ගොස්, ඔහු අමතා,
‘සමිඳාණන් වහන්සේගේ පණිවුඩය මේ ය: මට
වැඳුම්පිදුම් කරන පිණිස මාගේ සෙනඟට යන්න
අවසර දෙන්න. 2 ඔබ ඔවුන්ට යන්න අවසර
නුදුන්නොත් මෙන්න, මම ඔබේ මුළු රටට ම මැඩි
වසංගතයකින් පහර දෙමි. 3 එවිට නයිල් ගඟ
මැඩියන්ගෙන් පිරී ඉතිරී යන්නේ ය. මැඩියෝ එයින්
පිට වී ඔබේ මාලිගාවට ද ඔබේ යහන් ගබඩාවට ද
ඔබේ යහනට ද ඔබේ නිලධාරීන්ගේ නිවාසවලට ද
ඔබේ සෙනඟ වෙතට ද ඔබේ උදුන්වලට හා පිටි
බඳුන්වලට ද පනින්නෝ ය. 4 තවද, උන් ඔබේ
ඇඟටත්, ඔබේ ජනතාවගේ හා සියලු නිලධාරීන්ගේ
ඇඟටත් පනිනු ඇත’ කියා කියන්නැ”යි වදාළ සේක.
5 උන් වහන්සේ මෝසෙස්ට කතා කොට, “ ‘මිසර
දේශයෙහි මැඩියන් හටගන්න පිණිස එහි ගංගා,
ඇළ දොළ, පොකුණු මත ඔබේ සැරයටිය ගෙන අත
දිගු කරන්න’ කියා ආරොන්ට දන්වන්නැ”යි වදාළ
සේක. 6 ආරොන් මිසරයේ ජලය මත තම අත දිගු
කළ විට මැඩියෝ මතු වී මිසර දේශය වසාගත්හ.
7 ඉන්ද්‍රජාලිකයෝ ද තමන්ගේ ඇස් බැන්දුම් මඟින්
එලෙසෙ කර මිසර දේශයෙහි මැඩියන් හටගන්නට
සැලැස්වූ හ. 8 එවිට පාරාවෝ මෝසෙස් හා ආරොන්
කැඳවා, “මාගෙන් ද මාගේ සෙනඟගෙන් ද මැඩියන්
පහ කරන ලෙස සමිඳාණන් වහන්සේට යාච්ඤා
කරන්න. සමිඳාණන් වහන්සේට පුද පූජා ඔප්පු
කරන පිණිස මම සෙනඟට යන්න අවසර දෙමි”යි කී
ය. 9 එවිට මෝසෙස් පාරාවෝට කතා කොට,
“ඔබෙන් හා ඔබේ නිවසේවලින් මැඩියන් පහකොට
උන් ගංගාවේ පමණක් රඳවාලන පිණිස ඔබ ද
ඔබේ නිලධාරීන් හා සෙනඟ ද වෙනුවෙන් මා කවදා
යාච්ඤා කළ යුතු ද කියා මම ගෞරවපූර්වක ව
අයැදිමි”යි කීවේ ය. 10 ඔහු පිළිතුරු දෙමින්, “හෙට
ය”යි කී විට, “ඔබ කී ලෙස එසේ වනු ඇත. එවිට
අපේ දෙවියන් වහන්සේ හා සමාන වෙන කිසි
සමිඳාණන් වහන්සේ කෙනෙකු නැති බව ඔබ
දැනගන්නෙහි ය. 11 මැඩියෝ ඔබෙන් හා ඔබේ
නිවාසවලින් ද, ඔබේ නිලධාරීන්ගෙන් හා
සෙනඟගෙන් ද ඉවත ගොස් ගංගාවෙහි පමණක්
සිටිනු ඇතැ”යි කී ය. 12 ඉන්පසු මෝසෙස් හා
ආරොන් පාරාවෝ වෙතින් නික්ම ගියහ. මෝසෙස්,
පාරාවෝට පීඩා කිරීමට සැලැසූ මැඩියන් ගැන
සමිඳාණන් වහන්සේට යාච්ඤා කළේ ය.

13 මෝසෙස් ඉල්ලූ පරිදි උන් වහන්සේ ඉටු කළ
සේක. ගෙවල ද ගෙමිදුල්වල ද කෙත්වල ද සිටි
මැඩියෝ මැරුණාහ. 14 උන් එකතු කොට ගොඩගැසූ
කල මුළු රට ම දුගඳ විය. 15 එහෙත් සහනයක්
ලැබුණු බව පාරාවෝ දුටු විට, සමිඳාණන් වහන්සේ
කලින් කී ලෙස ම ඔහු තම සිත දැඩි කොට,
මෝසෙස් හා ආරොන් කී දේ සැලකුවේ නැත.

### තුන් වන වසංගතය: කිනිතුලු උවදුර

16 තවද, සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට, “ ‘නුඹේ සැරයටිය දිගු කොට පොළොවේ
දූවිල්ලට ගසන්න, එවිට මුළු මිසර දේශය පුරා ඇති
දූවිල්ල කිනිතුල්ලන් බවට හැරෙනු ඇත’ කියා
ආරොන්ට දන්වන්නැ”යි වදාළ සේක. 17 ඔව්හු එසේ
කළහ. ආරොන් සැරයටිය ගෙන අත දිගු කොට
එයින් පොළොවේ දූවිල්ලට ගැසූ විට ඒවා
මිනිසාගේ සහ මෘගයාගේ ඇඟේ වසන
කිනිතුල්ලන් බවට පත් විය. මුළු මිසර දේශය පුරා
පොළොවේ සියලු දූවිල්ල කිනිතුල්ලන් බවට පත්
විය. 18 එවිට ඉන්ද්‍රජාලිකයන් ද තමන්ගේ
ඇස්බැන්දුම් මඟින් කිනිතුල්ලන් හටගැන්වීමට වැර
දැරූ නමුත් ඔව්හු ඊට අපොහොසත් වූ හ. මෙලෙස
මිනිසා පිට හා මෘගයන් පිටත් කිනිතුල්ලෝ බෝ වූ
හ. 19 ලූක් 11:20ඉන්ද්‍රජාලිකයන් පාරාවෝට කතා
කොට, “මෙය දෙවියන් වහන්සේගේ ක්‍රියාවකි”යි
කී නමුත් සමිඳාණන් වහන්සේ වදාළ පරිදි ඔහු තම
සිත දැඩි කරගෙන ඔවුන් කී දේ සැලකුවේ නැත.

### හතර වන වසංගතය: මැසි උවදුර

20 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතාකොට,
“අලුයම නැඟිට, පාරාවෝ ගංගාව බලා එන
වේලාවේ දී ඔහු හමු වීමට ගොස්, ‘සමිඳාණන්
වහන්සේගේ පණිවුඩය මේ ය’යි කියන්න, ‘මට
වැඳුම්පිදුම් කරන පිණිස යන්නට මාගේ සෙනඟට
අවසර දෙන්න. 21 මාගේ සෙනඟට යන්න ඔබ
අවසර නොදෙන්නෙහි නම් බලන්න, මම මැසි රංචු
රංචු ඔබ පිට ද ඔබේ නිලධාරීන් හා ජනයා පිට ද
ගෙවලට ද එවන්නෙමි. එවිට මිසර වාසීන්ගේ
ගෙවල් ද ඔවුන් සිටින භූමිය ද මැසි රංචුවලින් පිරී
යනු ඇත. 22 එහෙත් එදින, මාගේ සෙනඟ පදිංචි වී
සිටින ගෝෂෙන් ප්‍රදේශය වෙන් කරමි. එහි නම්
මැසි රංචු නොසිටිනු ඇත. මා එසේ කරන්නේ, මිහි
පිට වැඩ සිටින සමිඳාණන් වහන්සේ මා බව ඔබ
දැනගන්නා පිණිස ය. 23 තවද, මාගේ සෙනඟ හා
ඔබේ සෙනඟ අතර වෙනසක් කරමි. මේ හාස්කම
හෙට සිදු වන්නේ ය’ ”යි වදාළ සේක. 24 සමිඳාණන්
වහන්සේ එලෙස ම කළ සේක. පාරාවෝගේ
මාලිගාවට ද ඔහුගේ නිලධාරීන්ගේ ගෙවලට ද මුළු
මිසර දේශය හැම තැනට ද මැස්සෝ විශාල රංචු
රංචු පිටින් පැමිණියහ. රට ද මැසි රංචු නිසා නාස්ති
විය.

25 එවිට පාරාවෝ මෝසෙස් හා ආරොන් කැඳවා,
“යන්න, නුඹලා මේ දේශයෙහි ම නුඹලාගේ
දෙවියන් වහන්සේට පුද පූජා ඔප්පු කරන්නැ”යි කී
ය. 26 මෝසෙස් පිළිතුරු දෙමින්, “එසේ කිරීම හරි
නැත. මන්ද, අපේ දෙවි සමිඳාණන් වහන්සේට අප
පූජා කරන සතුන් මිසර වාසීන්ට පිළිකුලක් වන
බැවිනි. හොඳයි, ඔවුන්ගේ ඇස් ඉදිරියෙහි ම ඔවුන්
පිළිකුලක් මෙන් සලකන පූජා අප ඔප්පු කළොත්
ඔවුන් අපට ගල් ගසන්නේ නැද් ද? 27 අපේ දෙවි
සමිඳාණන් වහන්සේ අපට අණ කළ පරිදි අපි, තුන්
දවසක දුර පාළුකරයට ගොස්, උන් වහන්සේට පුද
පූජා ඔප්පු කරන්නෙමු”යි කී ය. 28 එවිට පාරාවෝ
කතා කොට, “පාළුකරයේ දී නුඹලාගේ දෙවි
සමිඳාණන් වහන්සේට පුද පූජා ඔප්පු කරන පිණිස
නුඹලා බොහෝ දුර නොයන්නහු නම් මම නුඹලාට
යන්න අවසර දෙමි. මා වෙනුවෙන් ද යාච්ඤා
කරන්නැ”යි කීවේ ය. 29 මෝසෙස් ඊට උත්තර
දෙමින්, “මෙන්න, මා ඔබ වෙතින් ගිය කෙණෙහි ම,
හෙට පාරාවෝගෙන් ද නිලධාරීන්ගෙන් ද
සෙනඟගෙන් ද මැසි රංචු පලා යන ලෙස, මම
සමිඳාණන් වහන්සේට යාච්ඤා කරන්නෙමි. එහෙත්,
සමිඳාණන් වහන්සේට පුද පූජා ඔප්පු කරනු පිණිස
සෙනඟට යන්න අවසර නොදෙන ලෙස පාරාවෝ
කපටිකමින් තවදුරටත් ක්‍රියා නොකළ යුතු ය”යි
කීවේ ය. 30 මෝසෙස් පාරාවෝ වෙතින් ඉවතට
ගොස් සමිඳාණන් වහන්සේට යාච්ඤා කළේ ය.
31 උන් වහන්සේ ඔහු ඉල්ලූ ලෙස ඉටු කරමින්
පාරාවෝගෙන් ද ඔහුගේ නිලධාරීන්ගෙන් ද ඔහුගේ
සෙනඟගෙන් ද මැසි රංචු පහකළ සේක. එවිට
එකෙක් වත් ඉතිරි නොවී ය. 32 එහෙත්, පාරාවෝ
මේ වතාවේ ද තම සිත දැඩි කරගනිමින් සෙනඟට
යන්න අවසර නුදුන්නේ ය.

### පස් වන වසංගතය: ගවසම්පත් වැනසීම

9 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට,
“පාරාවෝ වෙත ගොස් ඔහු අමතා,
‘හෙබ්‍රෙව්වරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේගේ
පණිවුඩය මේ ය’යි කියන්න, ‘මා හට නමස්කාර
කරන පිණිස යන්නට මාගේ සෙනඟට අවසර
දෙන්න. 2 ඔබ ඔවුන්ට යන්න අවසර නොදී,
තවදුරටත් ඔවුන් වැළැක්වුවහොත් 3 මෙන්න, කෙතෙහි
සිටින ඔබේ ගවසම්පත් වන, අසුන්ට හා
කොටළුවන්ට ද, ඔටුවන්ට හා ගොනුන්ට ද,
බැටළුවන්ට ද, සමිඳාණන් වහන්සේගේ හස්තය
ඉතා බිහිසුණු වසංගතයකින් පහර දෙන්නේ ය.
4 එහෙත් සමිඳාණන් වහන්සේ වන මම ඉශ්‍රායලේ
ජනයාගේ ගවයන් හා මිසර වාසීන්ගේ ගවයන්
අතර වෙනසක් දක්වන්නෙමි. ඉශ්‍රායලේ ජනයා සතු
මුළු ගවසම්පතින් එක සතෙක් වත් නොමැරෙන්නේ
ය. 5 තවද, උන් වහන්සේ වේලාවක් ද නියම
කරමින්, ‘හෙට සමිඳාණන් වහන්සේ මේ දේ මේ
රටේ ඉටු කරනු ඇතැ’ ”යි වදාළ සේක. 6 පසුදින
උන් වහන්සේ එලෙස කළ සේක. එවිට මිසරයේ

ගවසම්පත මුළුමනින් ම වැනසිණි. එහෙත්,
ඉශ්රායලේ ජනයාගේ ගවසම්පතින් එකකේ වත්
නොමළේ ය. 7 පාරාවෝ පණිවුඩකාරයන් යැවූ විට
ඉශ්රායලේ ජනයාගේ ගවසම්පතින් එකකු වත්
නොමළ බව දිටී ය. එහෙත්, ඔහුගේ සිත දැඩි
වූයෙන් ඔහු සෙනඟට යන්න අවසර නුදුන්නේ ය.

### සය වන වසංගතය: ගඩු උවදුර

8 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට හා ආරොන්ට
කතා කොට, "උදුනින් අළු අහුරක් ගන්න. පාරාවෝ
බලා සිටිය දී මෝසෙස් ඒවා අහසට විසි කළ යුතු ය.
9 එවිට ඒවා මුළු මිසර දේශය පුරා සිහින් ධූලි වී,
මුළු මිසර දේශයේ සිටින මිනිසුන් හා මෘගයන් මත
වණ සහිත ගඩු ඇති කරන්නේ ය"යි වදාළ සේක.
10 එළිද 16:2ඔව්හු උදුනින් අළු ගෙන පාරාවෝ
ඉදිරිපිට සිට ගත්හ. එවිට මෝසෙස් අහස දෙසට
එය විසි කළ විට, එය මිනිසුන් හා මෘගයන් මත
වණ සහිත ගඩු ඇති කළේ ය. 11 එවිට ගඩු නිසා
ඉන්ද්රජාලිකයන්ට මෝසෙස් ඉදිරිපිට සිටින්න
නොහැකි විය. මන්ද, ඉන්ද්රජාලිකයන් හා මිසර
වාසීන් සියල්ලන් මත ගඩු හට ගැනිණි. 12 එහෙත්,
සමිඳාණන් වහන්සේ පාරාවෝගේ සිත දැඩි කළ
සේක. උන් වහන්සේ මෝසෙස්ට වදාළ පරිදි ඔහු
ඔවුන් කී දේ සැලකුවේ නැත.

### සත් වන වසංගතය: ගල් වර්ෂා උවදුර

13 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට,
"අලුයම නැඟිට පාරාවෝ ඉදිරියට ගොස් ඔහු අමතා,
'හෙබ්රෙව්වරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේගේ
පණිවුඩය මේ ය'යි කියන්න. එනම්, 'මා හට
නමස්කාර කරන පිණිස යන්නට මාගේ සෙනඟට
අවසර දෙන්න. 14 ඒ මන්ද, මම මේ වතාවේ ඔබ
පිට ද ඔබේ නිලධාරීන් හා සෙනඟ පිට ද වසංගත
සියල්ල ම එවන්නෙමි. එවිට මුළු මිහි පිට මා වැනි
අන් කෙනෙකු නැති බව ඔබ දැනගන්නෙහි ය.
15 මම අත දිගු කොට ඔබට ද ඔබේ සෙනඟට ද
ලෙඩ රෝගවලින් පහර දුනිම් නම් ඔබ පොළොවෙන්
තුරන් වී යන්නට ඉඩ තිබිණි. 16 රෝම 9:17එහෙත්,
ඔබට මාගේ බලපරාක්රමය පෙන්වන පිණිසත්,
මාගේ නාමය මුළු ලෝකය පුරා ප්රකාශ වන
පිණිසත් ඔබට ජීවත් වන්නට ඉඩ හැරියෙමි.
17 එහෙත්, ඔබ තවමත් මාගේ සෙනඟට විරුද්ධ ව
අහංකාරකම් පාමින්, ඔවුන්ට යන්න අවසර
නොදෙන්නෙහි ය. 18 බලන්න, හෙට මේ වේලාවට
පමණ, මිසරයේ ආරම්භයේ සිට අද දක්වා, එහි
නුවූ විරූ, ඉතා දරුණු ගල් වර්ෂාවක් මම
වස්වන්නෙමි. 19 එබැවින් දැන් ඉතින් පණිවුඩ යවා
කෙත්වල සිටින ගවසම්පතට හා නුඹ සතු සියල්ලට
ආරක්ෂා සලසන්න. ගෙට නොගෙනෙව්වාගෙන,
කෙත්වල සිටින සියලු මිනිසුන් හා සතුන් පිට ගල්
වැස්ස වැටේ. ඔව්හු නසින්නෝ ය' "යි වදාළ සේක.
20 පාරාවෝගේ නිලධාරීන් අතර සමිඳාණන්
වහන්සේගේ වචනයට බිය වූ සමහරෙක් තමන්ගේ
වහලුන් හා ගවසම්පත ගෙවලට ගත්හ. 21 එහෙත්,
සමිඳාණන් වහන්සේගේ වචනය නොතැකූ අය තම
වහලුන් හා ගවසම්පත කෙත්වල ම සිටින්නට
හැරියෝ ය.

22 එවිට සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට, "මුළු මිසර දේශය පුරා ගල් වර්ෂාව වැස,
මුළු මිසර දේශයෙහි සිටින මිනිසුන් හා මෘගයන් ද
කෙතෙහි සෑම පැළෑටි ද මත එය වැටෙන පිණිස,
ඔබේ අත අහස දෙසට දිගු කරන්නැ"යි වදාළ සේක.
23 ඔහු තම සැරයටිය අහස දෙසට දිගු කළ විට,
සමිඳාණන් වහන්සේ මේඝ ගර්ජනා ද, ගල් වර්ෂා ද
එවූ සේක. පොළොව මත ගිනි පතිත විය. මුළු
මිසර දේශයට ම උන් වහන්සේ ගල් වර්ෂාව
වැටෙන්නට සැලැසූ සේක. 24 එළිද 8:7;
16:21මෙලෙස ඉතා වේගවත් ලෙස ගල් වර්ෂා ද ගල්
වර්ෂා සමඟ විදුලි කෙටීම් ද විය. මෙවැන්නක් මුළු
මිසර දේශය පුරා එම රට ජාතියක් වූ දින සිට
කවදා වත් සිදු නොවිණි. 25 ගල් වර්ෂාව මුළු මිසර
දේශය පුරා කෙතේ සිටි සියලු මිනිසුන්ට හා
මෘගයන්ට පහර දුනි. තවද එය, කෙතෙහි වූ පැළෑටි
සියල්ලට ද පහර දෙමින් එහි වූ ගස් සියල්ල ද
බිඳදැමී ය. 26 එහෙත්, ඉශ්රායලේ ජනයා විසූ
ගෝෂෙන් දේශයෙහි පමණක් ගල් වර්ෂාව නො වී
ය.

27 එවිට පාරාවෝ පණිවුඩ යවා මෝසෙස් හා
ආරොන් කැඳවා, ඔවුන්ට කතා කොට, "මෙවර මම
පව් කළෙමි; සමිඳාණන් වහන්සේ කළ දේ හරි ය;
මාගේ සෙනඟත්, මාත් කළ දේ වැරදි ය. 28 අහස්
ගිගුරුම සහ ගල් වර්ෂාව නවත්වන ලෙස සමිඳාණන්
වහන්සේට යාච්ඤා කරන්න. මම ද නුඹලාට යන්න
අවසර දෙමි. නුඹලා තවත් මෙහි නැවතීම උවමනා
නැතැ"යි කී ය. 29 මෝසෙස් ඔහුට උත්තර දෙමින්,
"මම නුවරින් පිටත ගිය කෙණෙහි ම සමිඳාණන්
වහන්සේ වෙත මාගේ අත ඔසවමි. මිහිතලය
සමිඳාණන් වහන්සේට අයිති බව දැනගනු පිණිස,
අහස් ගිගුරුම් නවතිනු ඇත. ගල් වර්ෂා ද තවත් ඇති
නොවේ. 30 එහෙත්, ඔබත් ඔබේ නිලධාරීනුත් තව
ම දෙවි සමිඳාණන් වහන්සේට බිය නොවන බව
මම දනිමි"යි කීවේ ය.

31 එවකට යව පැසෙමින් තිබුණු නිසාත්, හණ
පීදෙමින් තිබුණු නිසාත් හණ සහ යව වැනසිණි.
32 එහෙත් තිරිඟු හා තණහාල් පමා වී පීදෙන බැවින්
ඒවා නොවැනසිණි.

33 මෝසෙස්, පාරාවෝ වෙතින් අහක් වී නුවරින්
පිටත ගොස් සමිඳාණන් වහන්සේ වෙත අත් එසවී
ය. මේඝ ගර්ජනා හා ගල් වර්ෂා නැවතිණි. වැස්ස ද
පොළොව මත නොවැටිණි. 34 වැස්සත්, ගල්
වර්ෂාවත්, මේඝ ගර්ජනාවත් නැවතුණු බව පාරාවෝ
දුටු කල ඔහු නැවත පව් කළේය, ඔහු ද නිලධාරීහු
ද තම සිත් දැඩි කොටගත්හ. 35 පාරාවෝගේ සිත
දැඩි විය. සමිඳාණන් වහන්සේ මෝසෙස්ට වදාළ
පරිදි ඔහු ඉශ්රායලේ ජනයාට යන්න අවසර
නුදුන්නේ ය.

### අට වන වසංගතය: පළඟැටි උවදුර

10 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට, “පාරාවෝ වෙත යන්න, මා ඔහුගේ
සිත ද ඔහුගේ නිලධාරීන්ගේ සිත් ද දැඩි කළේ
ඔවුන් මැද මාගේ මේ හාස්කම් පාන පිණිස ය.
2 ඇරත් මිසරයට මා සමච්චල් කළ සැටි ද ඔවුන්
මැද මා සිදු කළ හාස්කම් ද නුඹ නුඹේ පුතුන්ටත්,
පුතුන්ගේ පුතුන්ටත් කියන පිණිස ය. එවිට මා
සමිඳාණන් වහන්සේ බව නුඹලා සැම දැනගන්නහු
ය”යි වදාළ සේක.
3 මෝසෙස් හා ආරොන් පාරාවෝ වෙත පැමිණ
ඔහුට කතා කොට, “හෙබ්‍රෙව්වරුන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේගේ පණිවුඩය මේ ය; එනම්,
‘ඔබ කොපමණ කාලයක් මට යටත්වීම ප්‍රතික්ෂේප
කරන්නෙහි ද? මා හට වැඳුම්පිදුම් කරනු පිණිස
යන්නට මාගේ සෙනඟට අවසර දෙන්න. 4 මාගේ
සෙනඟට යන්න අවසර නුදුන්නොත්, මම හෙට
ඔබේ රටට පළඟැටියන් ගෙනෙන්නෙමි. 5 පොළොව
නොපෙනේ යන තරමට ම උන් පොළොවේ තලය
වසාගනු ඇත. ගල් වර්ෂාවෙන් බේරී ඔබට ඉතිරි වූ
සස්සෙ ද කෙතෙහි ඔබේ ප්‍රයෝජනය සඳහා
වැඩෙන සැම ගහක් ද උන් කා දමනු ඇත. 6 ඔබේ
මාලිගා ද ඔබේ නිලධාරීන්ගේ ගෙවල් ද මිසර වැසි
සියල්ලන්ගේ ගෙවල් ද උන්ගෙන් පිරී යන්නේ ය.
ඔබේ පියවරුන් වත්, පියවරුන්ගේ පියවරුන් වත්
ඔවුන් මෙරට පදිංචි වූ දින පටන් අද දක්වා
මෙවැන්නක් දකින්නට නැතැ’ ”යි කී හ. ඉන්පසු
ඔව්හු පාරාවෝ වෙතින් හැරී යන්න ගියෝ ය.
7 එවිට පාරාවෝගේ නිලධාරීහු ඔහු අමතමින්,
“මේ මිනිසා කොතෙරම් කාලයක් අපට හිරිහැර
කරන්න යන්නේ ද? ඔවුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේට වැඳුම්පිදුම් කරන පිණිස සෙනඟට යන්න
හරින්න, මිසරය වැනසී යන බව ඔබ නොදන්නෙහි
දැ”යි ඇසූ හ. 8 මෝසෙස් හා ආරොන් පාරාවෝ
වෙතට නැවත ගෙනෙනු ලැබූ හ. පාරාවෝ ඔවුන්ට
කතා කොට, “නුඹලාට යන්න පුළුවන, ගොස්
නුඹලාගේ දෙවි සමිඳාණන් වහන්සේට වැඳුම්පිදුම්
කරන්න. එහෙත්, යන අය කවුරු දැ”යි ඇසුවේ ය.
9 මෝසෙස් උත්තර දෙමින්, “අප විසින් සමිඳාණන්
වහන්සේට මංගල්‍යයක් පැවැත්විය යුතු නිසා, අපේ
බාලයන් සහ මහල්ලන් ද අපේ පුතුන් සහ දූවරුන් ද
අපේ එළු බැටළු සහ ගව පට්ටි ද සමඟ අපි
යන්නෙමු”යි කීවේ ය. 10 එවිට ඔහු ඔවුන් අමතා,
“නුඹලාට දෙවි පිහිට යි! එහෙත්, දරුදැරියන් හා
ස්ත්‍රීන් සමඟ යන්නට මම අවසර නො දෙමි.
නුඹලා නපුරක් කරන්න යන බව පෙනේ. 11 ඊට ඉඩ
නොදෙනු ඇත. දැන් ඉතින් නුඹලා පිරිමි පක්ෂය
ගොස් සමිඳාණන් වහන්සේට වැඳුම්පිදුම් කරන්න.
නුඹලාට උවමනා කළේ එය නොවේ ද” කියා තමා
වෙතින් ඔවුන් පන්නාදැමී ය.
12 එවිට සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට, “පළඟැටියන් එන පිණිස මිසර දේශය දෙසෙ
ඔබේ අත දිගු කරන්න. උන් මිසර දේශයට වැදී
රටේ ඇති සැම පැළෑටියක් ද ගල් වර්ෂාවෙන් බේරී
ඉතිරි වූ සියල්ල ද කාදමනු ඇතැ”යි වදාළ සේක.
13 මෝසෙස් ද මිසර දේශය දෙසෙ තම සැරයටිය
එසවී ය. එවිට සමිඳාණන් වහන්සේ එදින මුළු දිවා
රෑ දෙකෙහි මිසර දේශය පුරා පෙරදිගින් සුළඟක්
හමන්නට සැලැසූ සේක. පහන් වූ විට පෙරදිගින්
හැමූ සුළඟ පළඟැටියන් ගෙනාවේ ය. 14 එළිද
9:2-3උන් මුළු මිසර දේශයට වැදී මුළු රට පුරා පැතිර
ගියහ. එවැනි විශාල පළඟැටි රංචුවක් ඊට කලින්
නම් නො වී ය; මතු ද නොවෙනු ඇත. 15 උන් මුළු
පොළොවේ තලය ම වසාගත් බැවින් රට අඳුරු විය. උන්
මිහි පිට වූ පැළෑටි සියල්ල ද ගල් වර්ෂාවෙන්
බේරුණු ගස්වල ගෙඩි සියල්ල ද කාදැමූ හ. මෙලෙසෙ
මිසර දේශය පුරා ගසක අමු කොළයක් වත්,
කෙතෙක පැළෑටියක් වත් ඉතිරි නො වී ය.
16 එවිට පාරාවෝ මෝසෙස් හා ආරොන් වහා
කැඳවා, “නුඹලාගේ දෙවි සමිඳාණන් වහන්සේට ද,
නුඹලාට ද විරුද්ධ ව මම පව් කළෙමි. 17 දැන්
ඉතින් කරුණාකර, මේ අන්තිම වතාවට මාගේ
පාපයට කමා වී, මේ මාරක වසංගතය මගෙන්
ඉවත් කරන ලෙස නුඹලාගේ දෙවියන් වහන්සේට
යාච්ඤා කරන්නැ”යි කී ය. 18 මෝසෙස් ද පාරාවෝ
වෙතින් ගොස් සමිඳාණන් වහන්සේට යාච්ඤා
කළේ ය. 19 සමිඳාණන් වහන්සේ අපරදිගින්
වේගවත් සුළඟක් හමන්නට සැලැසූ සේක. එය
පළඟැටියන් ගසාගෙන ගොස් උන් රතු මුහුදට දැමී
ය. ඉන්පසු මිසර දේශය පුරා එක පළඟැටියෙකු වත්
ඉතිරි නො වී ය. 20 එහෙත්, සමිඳාණන් වහන්සේ
පාරාවෝගේ සිත දැඩි කළ සේක. පාරාවෝ
ඉශ්රායෙලේ ජනයාට යන්නට අවසර නුදුන්නේ ය.

### නව වන වසංගතය: ගන’දුරු උවදුර

21 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට,
“අහස දෙසට අත දිගු කරන්න. එවිට අන්ධකාරයක් -
අතගා බලන්න හැකි තරම් ඝනාන්ධකාරයක්, මිසර
දේශය වසාගන්නේ ය”යි වදාළ සේක. 22 ගීතා
105:28; එළිද 16:10මෝසෙස් ද අහස දෙසට තම අත
දිගු කළ විට තුන් දිනක් පුරා මුළු මිසර දේශයෙහි
ඝනාන්ධකාරයක් ඇති විය. 23 එවිට තුන් දිනක් පුරා
ඔවුන්ට එකිනෙකා නොපෙනේ ගොස් ඔව්හු සිටි තැන
ම නොසෙල්වී සිටියහ. එහෙත්, මුළු ඉශ්රායෙලේ
ජනතාවට තමන් විසූ තැන්වල ආලෝකය ඇති විය.
24 එවිට පාරාවෝ මෝසෙස් කැඳවා, “යන්න,
සමිඳාණන් වහන්සේට වැඳුම්පිදුම් කරන්න. ඔබේ
දරුදැරියන්ට හා ස්ත්‍රීන්ට පවා යෑමට අවසර දෙමි.
එළු බැටළු හා ගව පට්ටි පමණක් මෙහි
නවතාලන්නැ”යි කීවේ ය. 25 මෝසෙස් එවිට ඔහුට
උත්තර දෙමින්, “අප දෙවි සමිඳාණන් වහන්සේට පුද
පූජා කරන පිණිස ඔබ අපට යාග හා දවන පඬුරු ද
දිය යුතු ය. 26 එබැවින් අපගේ ගවසම්පත ද අප

සමඟ යා යුතු ය. එක සතකු වත් මෙහි ඉතුරු
නොකරනු ඇත. අප එහි යන තෙක් සමිඳාණන්
වහන්සේට කුමකින් වැඳුම්පිදුම් කළ යුතු ද කියා අපි
නොදනිමු”යි කී ය.
27 එහෙත්, සමිඳාණන් වහන්සේ පාරාවෝගේ සිත
දැඩි කළ සේක. පාරාවෝ ඔවුන්ට යන්න අවසර
නුදුන්නේ ය. 28 ඔහු මෝසෙස්ට කතා කොට,
“මෙතැනින් පලා යන්න; මින්පසු නම් මා ඉදිරියට
නොඑන්නට බලාගන්න, මා නුඹ දකින්නේ කවර
දිනක ද එදින නුඹ නසිනු ඇතැ”යි කී ය. 29 “ඔබ
කියන ලෙසෙ ම වේ වා! මින්පසු මම නම් ඔබේ
මුහුණ නොදකින්නෙමී”යි මෝසෙස් උත්තර දුන්නේ
ය.

### කුලුඳුලන් මැරීම

11 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අමතමින්,
“පාරාවෝ සහ මිසරය පිට මම තව එක
වසංගතයක් පමුණුවමි. ඉන්පසු ඔහු මෙතැනින්
නුඹලාට යන්න අවසර දෙනු ඇත. තවද, ඔහු
නුඹලාට යන්න අවසර දෙන විට ‘ඇත්තටම ම
මෙතැනින් නුඹලා සහමුලින් ම පන්නාදමනු ඇත.
2 සෑම පිරිමියකු ම තම අසල්වැසියාගෙන් ද, සෑම
ස්ත්‍රියක ම තම අසල්වැසියාගෙන් ද රන් රිදී
ආභරණ ඉල්ලාගන්න ලෙස දැන් සෙනඟට
දන්වන්නැ”යි වදාළ සේක. 3 සමිඳාණන් වහන්සේ
මිසර වැසියන්ගෙන් තම සෙනඟට ප්‍රසාදය ලබා දුන්
සේක. මෝසෙස් මිසර දේශයෙහි පාරාවෝගේ
නිලධාරීන් හා සෙනඟ ඉදිරියෙහි අතිශ්‍රේෂ්ඨයකු
විය.
4 එවිට මෝසෙස් පාරාවෝට කතා කොට,
“සමිඳාණන් වහන්සේගේ පණිවුඩය මේ ය: ‘මධ්‍යම
රාත්‍රිය පමණේ දී මම මිසර දේශය මැදින්
යන්නෙමි. 5 සිහසුන් අරා සිටින පාරාවෝගේ කුලුඳුල්
පුත්‍රයා පටන් ඇඹරුම් ගල පිටුපස සිටින
සේවිකාවගේ කුලුඳුලා දක්වා, මිසර දේශයේ සිටින
සියලු කුලුඳුලන් මැරෙනු ඇත. මෘගයන්ගේ
කුලුඳුලෝ ද මැරෙන්නෝ ය. 6 මිසර දේශය පුරා
මෙතෙක් නොවූ විරූ මතු ද නොවන මහා
අඳෝනාවක් ඇති වන්නේ ය. 7 එහෙත් ඉශ්‍රායෙලේ
ජනයා අතර මිනිසකුට වත්, මෘගයකුට වත්
විරුද්ධ ව බල්ලකු පවා බුරන්නේ නැත. සමිඳාණන්
වහන්සේ වන මා මිසර වැසියන් හා ඉශ්‍රායෙලේ
ජනයා අතර වෙනසක් ඇති කළ බව මේ
කාරණයෙන් නුඹලා දැනගන්නහු ය. 8 එවිට ඔබේ
මේ නිලධාරීහු සියලු දෙනා මා වෙත අවුත් මා
හමුවෙහි වැඳ වැටී, ‘නුඹ, නුඹේ පිරිවර සමඟ පලා
යනු’යි කියනු ඇත. ඉන්පසු මම නික්ම යන්නෙමී”යි
කී ය. මෙසේ කී පසු මෝසෙස් උදහසින් දිළිහමෙන්
පාරාවෝ වෙතින් නික්ම ගියේ ය.
9 සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතා, “මිසර
දේශයේ මාගේ හාස්කම් වැඩි වනු පිණිස පාරාවෝ
නුඹට සවන් නොදෙනු ඇතැ”යි වදාළ සේක.
10 මෝසෙස් හා ආරොන් පාරාවෝ ඉදිරියෙහි මේ
සියලු හාස්කම් පෑ හ. සමිඳාණන් වහන්සේ ද
පාරාවෝගේ සිත දැඩි කළ සේක. ඔහු ඉශ්‍රායෙලේ
ජනතාවට තම රටින් නික්ම යෑමට අවසර නුදුන්නේ
ය.

### පාස්කු මංගල්‍යය

12 ලෙවී 23:5; ගණන් 9:1-5; 28:16; ද්වි.නී.
16:1-2 සමිඳාණන් වහන්සේ මිසර දේශයේ දී
මෝසෙස් සහ ආරොන්ට කතා කොට මෙසේ වදාළ
සේක: 2 “මේ මාසය, හැම මාසවලට ම මුල් මාසය
විය යුතු ය; අවුරුද්දේ පළමු වන මාසය ද විය යුතු
ය. 3 නුඹලා මුළු ඉශ්‍රායෙලේ ජනතාව අමතා, මෙසේ
නිවේදනය කළ යුතු ය. ‘මේ මාසයේ දස වන දින,
හැම මිනිසකේ ම එක් ගෙදරකට බැටළු පැටවකු
බැගින් පවුලකට බැටළු පැටවකු සපයාගත යුතු ය.
4 යම් ගෙදරක වැසියන්ට එක බැටළු පැටවකු වැඩි
නම් ඔවුන්, අසල්වැසි ගෙදර අයගේ සංඛ්‍යාව අනුව,
ඊට හවුල් කරගත යුතු ය. බැටළු පැටවා අනුභව
කරන්නන්ගේ ගණන, ගිණිය යුත්තේ එක් එක්කෙනා
අනුභව කරන ප්‍රමාණය අනුව ය. 5 නුඹලා ගන්න
බැටළු පැටවා කැළැල් රහිත, අවුරුද්දක් වයසැති පිරිමි
සතකු විය යුතු ය. තවද, බැටළුවන් හෝ එළුවන්
හෝ අතරෙන් එවැනි එකකු තෝරාගත හැකි ය.
6 එම මාසයේ ම දහහතර වන දින දක්වා ඌ
තබාගෙන, එදින හවස රැස් වන මුළු ඉශ්‍රායෙලේ
ජනතාව ඌ මැරිය යුතු ය.
7 “ඉන්පසු උගේ ලෙයින් ටිකක් රැගෙන බැටළු
පැටවා අනුභව කරන අයගේ ගෙදර දොරේ උළුවහු
කණු දෙකේ ද උළුවස්සේ උඩ ලීයේ ද තැවරිය යුතු
ය. 8 එම රාත්‍රියේ දී උගේ මාංස අනුභව කළ යුතු
ය. එය අනුභව කළ යුත්තේ මඳ ගින්නේ පුළුස්සා,
නුමුහුන් රොටි හා තිත්ත පලා සමඟ ය. 9 ඉන්
කිසිවක් අමුවෙන් හෝ වතුරෙන් තම්බා හෝ නොකෑ
යුතු ය. උගේ හිස, කකුල්, බොකු හා මාංසය මඳ
ගින්නේ බදින්නට උවමනා ය. 10 උදය කාලය දක්වා
ඉන් කිසිවක් ඉතිරි නොකළ යුතු ය. උදය කාලය
දක්වා යමක් ඉතිරි වී නම්, එය ගින්නෙන්
පුළුස්සාදැමිය යුතු ය.
11 “තවද, නුඹ එය අනුභව කළ යුත්තේ මෙසේ
ය: ඉඟපටිය බැඳ, පාවහන් ලා, සැරයටිය ගෙන, එය
ලහි ලහියේ අනුභව කළ යුතු ය. මන්ද, එය
සමිඳාණන් වහන්සේ වන මා හට පවත්වන පාස්කුව
බැවිනි. 12 එදින රාත්‍රියේ මම මිසර දේශය මැදින්
ගොස්, එහි මිනිසුන්ගේ හා මෘගයන්ගේ කුලුඳුලන්ට
පහර දෙමි. තවද, මිසරයේ දේවදේවතාවුන්
සියල්ලන්ට දඬුවම් පමුණුවමි. මම සමිඳාණන්
වහන්සේ ය. 13 නුඹලා සිටින ගෙවල් මත තවරා
ඇති ලේ නුඹලා ඒවායේ සිටින බවට ලකුණක්
වන්නේ ය. මම ලේ දකින විට නුඹලා පසු කර
යන්නෙමි. මිසර දේශයට මා පහර දෙන විට, ඒ
මාරක දඬුවම නුඹලා වෙත නොපැමිණෙනු ඇත.
14 නික්ම 23:15; 34:18; ලෙවී 23:6-8; ගණන්
28:17-25; ද්වි.නී. 16:3-8මේ දවස නුඹලාට

අනුස්මරණ දිනයක් ලෙස ද සමිඳාණන් වහන්සේ
වන මා හට මංගලෝත්සව දිනයක් ලෙස ද
පැවැත්විය යුතු ය. තවද, මතු සියලු පරම්පරාවල ම
එය සදහට ම මංගල දිනයක් සේ පැවැත්වීමට
නියෝගයක් පැනවිය යුතු ය.”

## නුමුහුන් රොටි මංගල්‍යය

15 “සත් දිනක් නුඹලා නුමුහුන් රොටි අනුභව කළ
යුතු ය. පළමු වන දින නුඹලාගේ ගෙවලින් මුහුන්
ඉවත් කළ යුතු ය. පළමු වන දින සිට හත් වන දින
දක්වා, යමෙක් මුහුන් රොටි අනුභව කරන්නේ ද ඒ
තැනැත්තා ඉශ්‍රායලේ ජනයා වෙතින් නෙරපාදමනු
ලැබේ. 16 පළමු වන දිනයෙහි ද, හත් වන දිනයෙහි
ද ආගමික රැස්වීමක් පැවැත්විය යුතු ය. එම දිනවල
හැම දෙනා ම කෑම පිළියෙළ කිරීම හැර අන් කිසි
වැඩක් නොකළ යුතු ය. 17 තවද නුඹලා මේ
නුමුහුන් රොටි මංගල්‍යය පැවැත්විය යුත්තේ මා
නුඹලාගේ කණ්ඩායම් මිසර දේශයෙන් පිටතට
ගෙනාවේ මෙවෙනි දිනයක බැවිනි. එබැවින්
නුඹලාගේ හැම පරම්පරාවක් තුළ ම මේ දිනය
මංගල්‍යයක් මෙන් පැවැත්වීමට සදහට ම
නියෝගයක් පැනවිය යුතු ය. 18 පළමු වන මාසයේ
දහහතර වන දින හවස පටන්, විසිඑක් වන දින
හවස දක්වා නුඹලා නුමුහුන් රොටි අනුභව කළ යුතු
ය. 19 නුඹලාගේ ගෙවල දින හතක් ම මුහුන්
නොතිබිය යුතු ය. යමෙකු මුහුන් මුසු යමක් අනුභව
කළොත්, ඔහු විදේශිකයෙක් වේ වා,
ස්වදේශිකයෙක් වේ වා, ඔහු ඉශ්‍රායලේ ජනතාව
කෙරෙන් නෙරපාදමනු ලැබේ. 20 මුහුන් මුසු කිසිවක්
නුඹලා අනුභව නොකළ යුතු බැවින්, ගෙවල්
සියල්ලෙහි ම නුඹලා නුමුහුන් රොටි අනුභව කළ
යුතු ය.”

## පාස්කු මංගල්‍යය පිළිබඳ විධිවිධාන

21 එවිට මෝසෙස් ඉශ්‍රායලේ ජනතාවගේ ප්‍රජා
මූලිකයන් කැඳවා, ඔවුන්ට කතා කොට, “ඔබ ගොස්
ඔබේ පවුල්වලට ප්‍රමාණ වන බැටළු පැටවකු
බැගින් තෝරාගෙන, ඒ පාස්කු බැටළුවා මරන්න.
22 ඉන්පසු හිසොප් කිනිත්තක් ගෙන තලියේ ඇති
ලේවල එය ගල්වා, උළුවස්සේ උඩ ලීයේ හා දෙපස
කණු දෙකෙහි තලියේ ඇති ලේ තවරන්න. උදය වන
තෙක් ඔබගෙන් කිසිවකු තම ගෙයි දොරින් පිටතට
නො යා යුතු ය. 23 හෙබ්‍රෙ 11:28මන්ද, සමිඳාණන්
වහන්සේ මිසරයට පහර දීමට දේශය මැදින් යන
සේක. මෙසේ යද්දී උළුවස්සේ උඩ ලීයේ හා දෙපස
කණුවල ලේ උන් වහන්සේ දකින විට, එම දොර
පසු කොට ගොස් ඔබ මැරීමට, මාරක දූතයාට
ඔබගේ ගෙවලට ඇතුළු වීමට ඉඩ නොදෙන සේක.
24 තවද ඔබ, මේ පිළිවෙත, ඔබටත්, ඔබ දරුවන්ටත්
සදහට ම දුන් නියෝගයක් වශයෙන් පිළිපැදිය යුතු
ය. 25 සමිඳාණන් වහන්සේ පොරොන්දු වූ පරිදි, උන්
වහන්සේ ඔබට දෙන්නේ යන දේශයට ඔබ පැමිණි
විට, එහිදීත් මේ පිළිවෙත පැවැත්විය යුතු ය. 26 මේ
පිළිවෙතේ තේරුම කුමක් ද කියා ඔබේ දරුවන්
ඔබෙන් අසන විට 27 ‘මෙය නම්, සමිඳාණන්
වහන්සේගේ පාස්කු පූජාව ය. උන් වහන්සේ
මිසරයට පහර දෙන විට, උන් වහන්සේ මිසර
දේශයේ ඉශ්‍රායලේ ජනයාගේ ගෙවල් පසු කොට
ගොස් අපගේ ගෙවල් මිදූ සේකැ’යි කිව යුතු ය”යි
පැවසී ය. එවිට සෙනඟ ද හිස නමා වැන්දෝ ය.
28 ඉශ්‍රායලේ ජනයා ද පිටත් ව ගොස් සමිඳාණන්
වහන්සේ මෝසෙස්ට හා ආරොන්ට වදාළ පරිදි
කළහ.

## දස වන වසංගතය: කුලුඳුලන් මැරීම

29 නික්ම 4:22 ඉන්පසු මධ්‍යම රාත්‍රියේ දී
සමිඳාණන් වහන්සේ, සිහසුන් අරා සිටි පාරාවෝගේ
කුලුඳුලා පටන් සිරගෙයි සිටි සිරකරුවාගේ කුලුඳුලා
දක්වා, මිසර දේශයෙහි වසන කුලුඳුලන් සියල්ලන්ට
සහ මෘගයන්ගේ කුලුඳුලන්ට පහර දුන් සේක.
30 පාරාවෝ ද ඔහුගේ නිලධාරීහු ද මිසර වාසී
සියල්ලෝ ද රාත්‍රියෙහි අවදි වූ හ. මිසරයේ මහා
අඳෝනාවකි, මළ අයකු නැති ගෙයක් නො වී ය.
31 එවිට පාරාවෝ රාත්‍රියේ දී ම මෝසෙස් හා
ආරොන් කැඳවා, “නුඹලා සහ ඉශ්‍රායලේ ජනයා
නැඟිට, මාගේ සෙනඟ කෙරෙන් පලා ගොස්, නුඹලා
කී පරිදි සමිඳාණන් වහන්සේට නමස්කාර කරන්න.
32 තවද, නුඹලා කිව්වා පරිදි නුඹේ එළු බැටළු ගව
පට්ටි ද රැගෙන යන්න. මට ද ආශීර්වාද කරන්නැ”යි
කී ය. 33 “නැතහොත් අප හැම දෙන ම මැරෙන්නට
පුළුවනැ”යි කියමින්, මිසර වැසියෝ ඉශ්‍රායලේ
ජනයාට වහා රටින් පිට වන ලෙස බල කළහ.
34 එවිට සෙනඟ ඇනූ පිටි පිපෙන්න කලින් ගෙන,
තමන්ගේ පිටි අනන හට්ටි ද තම ඇඳුම්වල
ඔතාගෙන කරේ තබාගත්හ.
35 නික්ම 3:21-22 ඉශ්‍රායලේ ජනයා මෝසෙස් කී
ලෙස කරමින්, මිසර වැසියන්ගෙන් රන් රිදී ආභරණ
හා ඇඳුම් ඉල්ලාගත්හ. 36 සමිඳාණන් වහන්සේ
මිසර වැසියන්ගෙන් තම සෙනඟට අනුග්‍රහය ලබා
දුන් හෙයින් ඔව්හු ඉල්ලූ දේ දුන්හ. මෙලෙස
ඉශ්‍රායලේ ජනයා මිසර වැසියන්ගේ වස්තුව
කොල්ලකාගත්හ.

## ඉශ්‍රායලේ ජනයා නික්මයාම

37 ඉන්පසු ඉශ්‍රායලේ ජනයා රාමසෙස් නුවර සිට
සුක්කොත් දක්වා ගමන් කළහ. දරුවන් හා ස්ත්‍රීන්
හැර, පයින් ගිය පුරුෂයෝ ම හයලක්ෂයක් පමණ වූ
හ. 38 තවද, නා නා විධ විශාල සෙනඟක් ද ඔවුන්ට
එකතු වී ගමන්ගත්හ. එළු බැටළු හා ගව පට්ටි ද
සත්තු සිව්පාවෝ ද විශාල ගණනක් රංචු රංචු පිටින්
ගියහ. 39 ඔව්හු මිසර දේශයෙන් පිටතට ගෙනා,
ඇනූ නුමුහුන් පිටිවලින් රොටි පිළිස්සූ හ. මිසරයෙන්
ඔවුන් නෙරපාදැමූ විට පමා වීමට ඉඩක් නොතිබුණු
බැවින් මුහුන් දමා ඇනූ පිටි ඔවුන් සතු නො වී ය.
තවද, කිසි ආහාරයක් පිළියෙළ කරගැනීමට ද
ඔවුන්ට නොහැකි විය.

40 උත් 15:13; ගලා 3:17 ඉශ්රායලේ ජනයා මීසර
දේශයෙහි පදිංචි ව සිටි මුළු කාලය අවුරුදු හාරසිය
තිහක් විය. 41 මෙසේ අවුරුදු හාරසිය තිහක්
අවසාන වූ දිනයෙහි ම සමිඳාණන් වහන්සේගේ
සියලු සේනාවෝ මීසර දේශයෙන් නික්ම ගියෝ ය.
42 ඒ රාත්රියෙහි ඔවුන් මීසර දේශයෙන් පිටතට
ගෙනෙනු පිණිස සමිඳාණන් වහන්සේ අවදි ව සිටි
බැවින් සෑම පරම්පරාවක ම මුළු ඉශ්රායලේ ජනයා,
සමිඳාණන් වහන්සේගේ ගෞරවය පිණිස අවදි ව
සිට අනුස්මරණය කළ යුතු රාත්රිය මෙය වේ.

## පාස්කු මංගල්යය පිළිබඳ නියෝග

43 තවද, සමිඳාණන් වහන්සේ මෝසෙස්ට හා
ආරොන්ට කතා කොට මෙසේ වදාළ සේක:
“පාස්කුව පිළිබඳ නියෝග මේ ය. කිසි ම
විදේශිකයෙකු එයින් අනුභව නොකළ යුතු ය.
44 එහෙත්, නුඹ මිල දී ගත් වහලෙකු සිටී නම්, නුඹ
ඔහු චර්මඡේදනය කළ පසු ඔහුට එය අනුභව කළ
හැක. 45 එහෙත්, විදේශිකයෙකු හෝ කුලියට ගත්
වහලෙකු හෝ එය අනුභව නොකළ යුතු ය.
46 ගණන් 9:12; ජොහ 19:36තවද, මස්වලින් කිසිවක්
ගෙයින් පිටතට ගෙන නොගොස් එක ගෙදරක දී ම
එය අනුභව කළ යුතු ය. ඇරත් බැටළුවාගේ එක
ඇටයක් වත් නොකැඩිය යුතු ය. 47 තවද, මුළු
ඉශ්රායලේ ජනතාව ම පාස්කුව පැවැත්විය යුතු ය.
48 එහෙත්, නුඹ සමඟ වසන විදේශිකයෙකේ
සමිඳාණන් වහන්සේගේ නමින් පාස්කුව සිදු කිරීමට
කැමැත්තේ නම් ඔහු සතු සියලු පිරිමි චර්මඡේදනය
ලැබිය යුත්තෝ ය. එවිට නුඹ සමඟ එකතු වී ඔහුට
පාස්කුව පැවැත්විය හැකි ය. තවද, එවැන්නෙකු
ස්වදේශිකයෙකු මෙන් සැලකිය යුතු ය. එහෙත්,
අචර්මඡේදිත කෙනෙකේ නම් පාස්කුව අනුභව
නොකළ යුතු ය. 49 ස්වදේශිකයාටත් නුඹ සමඟ
වසන විදේශිකයාටත් එක ම නීතියක් බලපාන්නේ
ය.” 50 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට හා
ආරොන්ට අණ දුන් පරිදි මුළු ඉශ්රායලේ ජනයා
එලෙස ඉටු කළහ. 51 තවද, ඒ දවසේ දී ම
සමිඳාණන් වහන්සේ ඉශ්රායලේ ජනතාව ඔවුන්ගේ
සේනා අනුව මීසර දේශයෙන් පිටතට ගෙන ආ
සේක.

## කුලුඳුලන් කැප කිරීම

13 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට, 2 ගණන් 3:13; ලූක් 2:23“ඉශ්රායලේ
ජනයා අතර මවු කුසෙන් බිහි වන සියලු කුලුඳුලන්
මට කැප කරන්න; මනුෂ්යයන් අතර වේ වා,
මෘගයන් අතර වේ වා, එවැන්නන් මට අයිති ය”යි
වදාළ සේක.

## නුමුහුන් රොටි මංගල්යය

3 මෝසෙස් සෙනඟට කතා කොට මෙසේ කී ය:
“ඔබ, වහල්කමේ නිවාසය වූ මීසරයෙන් පිටතට
පැමිණි මේ දවස සිහි කරන්න. මන්ද, සමිඳාණන්
වහන්සේ සිය බාහු බලයෙන් ඔබ එතැනින් පිටතට
ගෙනා සේක. එබැවින් ඔබ මුහුන් රොටි නොකෑ
යුතු ය. 4 ඔබ ආබීබ් නම් මාසයේ මේ දවසෙහි
මීසරයෙන් නික්ම ආවාහු ය. 5 තවද, සමිඳාණන්
වහන්සේ ඔබට දෙන පිණිස ඔබේ පියවරුන්ට
දිවුරුම් දුන්, කිරෙන් හා මී පැණියෙන් ඉතිරෙන
දේශයක් වන කානානිවරුන්ගේ ද හිත්තීවරුන්ගේ
සහ අමෝරිවරුන්ගේ ද හිව්වරුන්ගේ සහ
ජබූසිවරුන්ගේ ද දේශයට උන් වහන්සේ ඔබ
පැමිණවූ කල මේ මාසයේ දී මේ පිළිවෙත
පවත්වන්න. 6 දවස් හතක් තුළ ඔබ නුමුහුන් රොටි
අනුභව කළ පසු හත් වන දින සමිඳාණන්
වහන්සේට මංගල්යයක් පැවැත්විය යුතු ය. 7 දවස්
හතක් ම නුමුහුන් රොටි අනුභව කළ යුතු ය. ඔබ
ළඟ මුහුන් රොටි නොතිබිය යුතු ය. තවද, මුළු
දේශයෙහි ම පවා මුහුන් නොතිබිය යුතු ය. 8 ඇරත්,
‘මා මෙසේ කරන්නේ, මා මීසර දේශයෙන් පිටතට
පැමිණි විට සමිඳාණන් වහන්සේ මට ඉටු කර දුන්
දේ නිසා යැ’යි ඔබ ඒ දවසේ දී ඔබේ පුතු හට
විස්තර කළ යුතු ය. 9 තවද, සමිඳාණන්
වහන්සේගේ මේ නීතිය ගැන නිතර ම කතා කරන
පිණිස, මේ පිළිවෙත ඔබට, ඔබ අත ලකුණක් මෙන්
ද, නළල මත සිහි වීමේ ලකුණක් මෙන් ද විය යුතු
ය. මන්ද, සමිඳාණන් වහන්සේ සිය බාහු බලය
පාමින් ඔබ මීසරයෙන් පිටත ගෙනා සේක.
10 එබැවින් මේ නියෝගය වසරින් වසර නියමිත
කාලයෙහි ඔබ පැවැත්විය යුතු ය.”

## කුලුඳුලන් කැප කිරීම පිළිබඳ විධිවිධාන

11 “සමිඳාණන් වහන්සේ ඔබටත්, ඔබේ
පියවරුන්ටත් දිවුරුම් දුන් පරිදි කානානිවරුන්ගේ
දේශයට ඔබ පමුණුවා, එය ඔබට දුන් කල,
12 නික්ම 34:19-20; ලූක් 2:23සියලු කුලුඳුල් පිරිමින්
සමිඳාණන් වහන්සේට කැප කළ යුතු ය. ඔබේ
මෘගයන්ගේ කුලුඳුල් පිරිමි පැටියන් සියල්ලන් ම උන්
වහන්සේට අයිති ය. 13 තවද, කොටළුවන්ගේ සියලු
කුලුඳුලන් බැටළු පැටවෙකු බැගින් දී මුදාගත යුතු ය.
ඔබ ඌ මුදා නොගන්නෙහි නම් උගේ බෙල්ල කැඩිය
යුතු ය. ඔබ ජනයා අතර සියලු කුලුඳුලන් ද මුදාගත
යුතු ය. 14 ‘මේ කුමක් ද’ කියා මතු දවස ඔබේ
පුත්රයා ඔබෙන් අසන විට ඔබ ද ඔහුට කතා
කොට, ‘සමිඳාණන් වහන්සේ සිය බාහු බලය පාමින්
වහල්කමේ නිවාසය වන මීසරයෙන් අප පිටතට
ගෙනා සේක. 15 පාරාවෝ මුරණ්ඩු ලෙස අපට
නික්ම යෑමට අවසර නුදුන් විට, සමිඳාණන් වහන්සේ
මීසර දේශයේ මිනිසුන්ගේ කුලුඳුලන් සියල්ලන් හා
මෘගයන්ගේ සියලු කුලුඳුලන් ද මරාදැමූ සේක.
එබැවින් මම, මවු කුසෙන් පළමුවෙන් බිහි වෙන
සියලු පිරිමි සතුන් උන් වහන්සේට පූජා කරමි.
එහෙත්, සියලු පිරිමි කුලුඳුල් දරුවන් මම
මුදාගන්නෙමි. 16 මේ පිළිවෙත ඔබේ අතෙහි
ලකුණක් මෙන් ද ලලාටයෙහි පටියක් මෙන් ද විය
යුතු ය. මන්ද, සමිඳාණන් වහන්සේ සිය බාහු බලය

පාමින් මිසරයනේ අප පිටතට ගනො හයෙිනැ'යි කිව
යුතු ය."

## ඉශ්රායලේ ජනයා නික්ම යාම

17 පාරාවෝ සනෙඟට යන්න අවසර දුන් විට,
පිලිස්තිවරුන්ගේ දේශය මැදින් වූ මාර්ගය ඉතා
කිට්ටු වූ නමුත් එය දිගේ දවේියන් වහන්සේ ඔවුන්
ගනෙ නොගිය සේක. මන්ද, 'සටන් කිරීමට වන බව
ඔවුන් දකින කල ඇතැම් විට ඔවුන් සිත වනෙස්
කරගනෙ මිසරයට ආපසු යත හැකි ය' කියා උන්
වහන්සේ සිතූ බැවිනි. 18 එහයෙින් උන් වහන්සේ
පාළුකරය ඔස්සේ වටවංගු මාර්ගයකින් රතු මුහුද
දසෙට ඔවුන් ගනෙ ගිය සේක. ඉශ්රායලේ සනෙඟ ද
සන්නාහ සන්නද්ධ ව මිසර දේශයනේ නික්ම ගියහ.
19 උත් 50:25; ජෝෂු 24:32තවද, ජෝසපේ
ඉශ්රායලේ ජනයා ප්රසිද්ධියේ දිවුරවා තිබුණ
ප්රකාර මෝසසේ තමා සමඟ ජෝසපේගේ ඇටකටු
ගනෙ ගියේ ය. මන්ද, "දවේියන් වහන්සේ ඔබට
සැබැවින් ම ආධාර කරන සේක. එවිට ඔබ
මතෙනින් මාගේ ඇටකටු රැගනෙ යා යුතු ය"යි
ජෝසපේ කියා තිබුණු බැවිනි.
20 ඔව්හු සුක්කොත් නම් ස්ථානයනේ නික්ම
පාළුකරයේ මායිමේ ඒතාම්හි කඳවුරු බැඳගත්හ.

## වලා ටැඹ හා ගිනි ටැඹ

21 සමිඳාණන් වහන්සේ දිවා කාලයේ දී ඔවුන්ට
මඟපනේවීමට වලා ටැඹකින් ද රාත්රි කාලයේ දී
ආලෝකය දීමට ගිනි ටැඹකින් ද ඔවුන්ට පරෙටුව
ගිය සේක. මලෙසෙ ඔවුන්ට දිවා රෑ දකේහි ම
ගමන් කරන්නට හැකි විය. 22 තවද, දවල් කාලයේ
දී වලා ටැඹ ද රාත්රි කාලයේ දී ගිනි ටැඹ ද සනෙඟ
ඉදිරියනේ පහ නො වී ය.

## රතු මුහුද තරණය

14 සමිඳාණන් වහන්සේ මෝසසේ අමතා,
2 "ඉශ්රායලේ ජනයාට කතා කොට, 'නුඹලා
ආපසු හැරී බාල්-ශපෙොන් ඉදිරිපස පිහිටි මිග්දෝල්
සහ මුහුදත් අතර, පී-හාහිරොත් නම් ස්ථානයට මූණ
ලා කඳවුරු බඳින්න; මුහුදට කිට්ටු ව එය ඉදිරිපිට
කඳවුරු බඳින්නැ'යි කියන්න. 3 'ඉශ්රායලේ ජනයා
රටේ ඔබමොබ යමින් ද පාළුකරයට මැදි ව සිටිමින්
ද ඇතැ'යි පාරාවෝ සිතනු ඇත. 4 මම පාරාවෝගේ
සිත දැඩි කරමි. ඔහු ඔවුන් ලුහුබැඳ එනු ඇත.
එහතේ, පාරාවෝ සහ ඔහුගේ සියලු හමුදාවන්
පරාජය කිරීමනේ මම ගෞරවය සලසා ගනිමි.
මයෙින් මා සමිඳාණන් වහන්සේ බව මිසර වාසීහු
දැනගන්නෝ ය"යි වදාළ සේක. ඉශ්රායලේ ජනතාව
එලසෙ ම කළහ.

## ඉශ්රායලේවරුන් ලුහුබැඳ යාම

5 සනෙඟ පලා ගිය බව මිසරයේ රජුට දන්වන
ලදී. එවිට ඔහු ද ඔහුගේ නිලධාරීහු ද ඔවුන් ගැන
තම සිත් වනෙස් කොට, "ඉශ්රායලේ ජනයා වහල්
සේවයනේ මුදා හැරීමනේ අප කළේ කුමන
ක්රියාවක් දැ"යි කියාගත්හ. 6 පාරාවෝ ඉන්පසු තම
යුද්ධ රථය සූදානම් කොට තම සනෙඟ ද එක්රැස්
කොට ගත්තේ ය. 7 තවද, ඔහුගේ විශේෂ යුද්ධ
රථ හයසියයක් ද, මිසරයේ සියලු ම යුද්ධ රථ ද
ඔහු සමඟ ගමන් ගත්තේ ය. ඒ සෑම රථයක ම යුද
සනෙවේියෝ සිටියහ. 8 සමිඳාණන් වහන්සේ
මිසරයේ රජු වන පාරාවෝගේ සිත දැඩි කළ සේක.
ඔහු ජයාන්විත ව රටින් පලා යන ඉශ්රායලේ ජනයා
ලුහුබැඳ ගියේ ය. 9 මිසර වාසීහු ඔවුන් ලුහුබැඳ
ගියහ. පාරාවෝගේ සියලු අසුන් ද යුද්ධ රථ ද
ඔහුගේ අසරුවන් ද හමුදාව ද සමඟ ඔවුන් ලුහුබැඳ
ගොස්, බාල්-ශපෙොන් නම් ස්ථානයට මූණ ලා පී-
හාහිරොත් නම් ස්ථානය අසල මුහුදුබඩ කඳවුරු බැඳ
සිටි ඔවුන්ට ළඟා වූ හ.
10 පාරාවෝ ළං වූ විට ඉශ්රායලේ ජනයා හිස්
ඔසවා බලා තමන් පසුපස මිසර වාසීන් එනු දැක,
මහත් සේ බිය වී සමිඳාණන් වහන්සේට මොරගැසූ
හ. 11 ඔව්හු මෝසසේට කතා කොට, "මේ
පාළුකරයේ මැරනේනට අප ගනොවේ මිසරයේ
මිනීවළවල් නැති නිසා ද? මිසරයනේ අප පිටත
ගනෙවුත් අපට මලෙසෙ කරන්නේ මන් ද? 12 'මිසර
වාසීන්ට වහල් මහෙවෙර කරන්නට අපට ඉඩ දුන
මැනවැ'යි ඔබට මිසරයේ දී කීවේ මේ නිසා නො
වේ ද? පාළුකරයේ මියයනවාට වඩා මිසර වාසීන්ට
වහල් මහෙවෙර කළා නම් හොඳ නො වේ දැ"යි
ඇසූ හ. 13 මෝසසේ සනෙඟට පිළිතුරු දමේින්, "බිය
නොවන්න, ස්ථිර ව සිටින්න, සමිඳාණන් වහන්සේ
අද ඔබ ගළවාලන පිණිස උන් වහන්සේ ඉටු කරන
දේ ඔබ දකින්නහු ය. අද ඔබ දකින මිසර වාසීන්
මින්පසු ඔබ කවදා වත් නොදකින්නහු ය. 14 උන්
වහන්සේ ඔබ උදසො සටන් කරන සේක. ඔබ
නිශ්චල ව සිටිය යුතු ය"යි කී ය.

## මුහුදු තරණය

15 සමිඳාණන් වහන්සේ මෝසසේට කතා කොට
මසෙේ වදාළ සේක: "නුඹ මට මොරගසන්නේ මන්
ද? ඉශ්රායලේ ජනයාට 'ඉදිරියට යන්නැ'යි කියන්න.
16 තවද, ඔවුන්ට මුහුද මැදින් වියළි බිම දිගේ යන්න
හැකි වන පරිදි ඔබ ද ඔබේ සැරයටිය ඔසවා, අත
මුහුද දසෙට දිගු කොට මුහුද දබෙෑ කරවන්න.
17 බලන්න, මම ද මිසර වාසීන්ගේ සිත් දැඩි කරමි.
ඔව්හු ද ඉශ්රායලේ ජනයා පසුපස යන්නෝ ය. එවිට
පාරාවෝ ද ඔහුගේ මුළු හමුදාව ද ඔහුගේ යුද්ධ
රථ ද ඔහුගේ අසරුවන් ද පරාජය කොට මම
කීර්තිය ලබන්නමේ. 18 මසෙේ මා පාරාවෝ ද
ඔහුගේ යුද්ධ රථ ද අසරුවන් ද ජයගනෙ කීර්තිය
ලැබූ පසු මා සමිඳාණන් වහන්සේ බව මිසර වාසීහු
දැනගන්නෝ ය."
19 ඉන්පසු ඉශ්රායලේ හමුදාවට පරෙටුවනේ ගිය
දවේ දූතයා ද තමා සිටි තැන වනෙස් කොට ඔවුන්
පසුපස ගියේ ය. ඔවුන් ඉදිරියේ තිබූ වලා ටැඹ
ඔවුන් පිටුපසට වී, 20 මිසර වාසීන්ගේ හමුදාව හා

ඉශ්රායලේවරුන්ගේ හමුදාව අතරට පැමිණියේ ය.
වලාකුළක් හා අඳුරක් ඇති විය, රාත්රිය
ගවේණි,එහතේ මුළු රාත්රියේ ම හමුදා දකෙ
එකිනකෙට ළඟා නාො වූ හ.
21 මෝසසේ තම අත මුහුද දසෙට දිගු කළෙේ ය.
එවිට සමිඳාණන් වහන්සේ ඒ මුළු රාත්රියේ ම
පරෙදිගින් හැමූ සැඩ සුළඟක් මඟින් මුහුදු ජලය
පසුබැස යාමට සලසා, මුහුද වියළි බිමකට හැරවෙු
සේක. මුහුදු ජලය ද දබෙෑ විය. 22 1 කොරි 10:1-2;
හබේර 11:29ඉශ්රායලේ ජනතාව වියළි බිම දිගේ
මුහුද මැදට ගියහ. ජලය දකුණු පසින් හා වම් පසින්
තාප්පයක් මනේ විය. 23 මිසර වැසියෝ ලුහුබැඳ
ගියහ; පාරාවෝගේ සියලු අසුන් ද රථ ද අසරුවන් ද
ඔවුන් පසුපස මුහුද මැදට ගියහ. 24 එවිට උදය
යාමයහෙි, සමිඳාණන් වහන්සේ ගිනි හා වලා ටැඹින්
මිසර වාසීන්ගේ හමුදා දසෙ බලා ඒ හමුදාවන්
සන්ත්රාසයට පත් කරවූ සේක. 25 උන් වහන්සේ ද
ඔවුන්ගේ රථ රෝද ක්රියා විරහිත කළ සේක. ඒවා
ඉදිරියට ගියේ ඉතා අමාරුවනේි. එවිට මිසර වාසීහු,
‘අපි ඉශ්රායලේවරුන් වතේින් පලා යමු, මන්ද,
සමිඳාණන් වහන්සේ අපට විරුද්ධ ව ඔවුන් උදසො
සටන් කරන සේකැ”යි කී හ. 26 උන් වහන්සේ
මෝසසේ අමතමින්, “මිසර වාසීන් පිට ද ඔවුන්ගේ
රථ හා අසරුවන් පිට ද ජලය ආපසු ගලන ලසෙ
මුහුද දසෙට නුඹේ අත දිගු කරන්නැ”යි වදාළ සේක.
27 ඔහු මුහුද දසෙට තම අත දිගු කළෙනේ පහන් වූ
විට ජලය ආපසු පරෙ තිබුණ මට්ටමට ම ගැලී ය.
මිසර වැසියෝ පලා යන්නට උත්සාහ කරන්නෝ මූද
මැදට ම දිවූ හ. සමිඳාණන් වහන්සේ ඔවුන් මුහුද
මැද හළොදැමූ සේක. 28 ඉශ්රායලේවරුන් ලුහුබැඳ
මුහුදට පැමිණි යුද්ධ රථ ද අසරුවෝ ද පාරාවෝගේ
මුළු හමුදාව ද ආපසු ගලා ආ ජලයට යට වූ හ.
ඔවුන්ගනේ එක් කනෙකේ වත් ඉතිරි නාො වී ය.
29 එහතේ, ඉශ්රායලේ ජනයා මුහුද මැද වියළි බිමින්
ගමන් කළහ. ඔවුන්ගේ දකුණු පසින් හා වම් පසින්
ජලය තාප්පයක් මනේ විය.
30 මසෙේ එදින සමිඳාණන් වහන්සේ මිසර වාසීන්
අතින් ඉශ්රායලේවරුන් ගළවාගත් සේක.
ඉශ්රායලේවරු ද මිසර වාසීන් මුහුදු වරෙළේ මැරී
සිටිනු දුටහ. 31 ඔව්හු සමිඳාණන් වහන්සේ මිසර
වාසීන්ට කළ ප්රබල ක්රියාව දුටහ. සනෙඟ
සමිඳාණන් වහන්සේට ගරුබිය පා, උන් වහන්සේ ද
උන් වහන්සේගේ සේවකයා වන මෝසසේ ද
කරෙහෙි විශ්වාසය තැබූ හ.

### මෝසසේගේ ජය ගීතය

15 එළිද 15:3 එවිට මෝසසේ සහ ඉශ්රායලේ
ජනයා සමිඳාණන් වහන්සේට මේ ගීතය
ගැයූ හ.
q2
15 සමිඳුන් හට මම ගී ගයමි, එතුමාණෝ තදෙ
මහිමනේ ජයගනෙ අසුන් හා අසරුවන් මූද මැද
හළෙූ සේක.
2 ගීතා 118:14; යසො 12:2 සමිඳාණෝ, මා සවිය
හා ගීතය වතේ;
q2 2 එතුමාණෝ මා විමුක්තිය වතේ;
q2 2 මාගේ දවේඳාණෝ ය.
q2 2 මා දවේතුමන් මම පසසමි.
q2 2 මා පියාගේ දවේඳුන් මහිමයට පමුණුවමි.
3 සමිඳාණෝ, රණ ශූර ය, එතුමන්ගේ නම හිමිසඳ
වේ.
4 එතුමාණෝ, පාරාවෝගේ රිය සනේ හා බළ ඇණි
මූද මැද හළෙූ සේක.
q2 4 උසස් ම සනේපතීහු ද රතු මූදට බිලි වූ හ.
5 ගැඹුරු සමුදුර ඔවුන් වසාගති;
q2 5 ගලක් විලස මූදු පත්ලට ඔව්හු කිඳා ගියහ.
6 සමිඳුනි, ඔබ දකුණත බල මහිමනේ උදාර ය.
q2 6 සමිඳුනි, ඔබ දකුණත හතුරන් කැබලි කරලී ය.
7 ඔබේ මහත් තජේෝමහිමයනේ ඔබ ඔබේ
හතුරන් සුණු විසුණු කරන සේක.
q2 7 ඔබේ උදහස විගසින් දැල් වී ඉපනැලි මනේ
ඔවුන් දවාලයි.
8 ඔබේ නැහැයේ හුස්මනේ ජලය ගාොඩ ගැසයෙි.
q2 8 දිය දහර වලේලක් මනේ කළෙින් සිටියි.
q2 8 මුහුදු ගැබේ ජල කඳ මිදිණි.
9 සතුරා මසෙේ උදන් අනයි:
q2 9 “මම ලුහුබැඳ යන්නමේ, ඔවුන් අල්ලාගන්නමේ,
කාොල්ලය බදෙන්නමේ, මා මනදොළ සපුරා
ගන්නමේ, මම කඩුව අදින්නමේ, මා අතින් ඔවුන්
වනසන්නමේ.”
10 ඔබ හුස්ම පිඹලූ සේක, මුහුද ඔවුන් වසාගති.
q2 10 ඔව්හු රුදුරු ජල කඳ තුළ ඊයම් මනේ කිඳා
ගියහ.
11 සමිඳුනි, දවේයන් අතර ඔබ හා සම අන් කවුරු
ද?
q2 11 ශුද්ධකමින් ප්රතාපවත්, බල විකුමනේ
භයංකර, අරුමපුදුම දේ කරවන ඔබ වැනි අය අන්
කවුරු ද?
12 ඔබ දකුණත දිගු කළ සේක, මිහිතලය ඔවුන්
ගිලගති.
13 ඔබ මිදූ ජනතාව කුළුණු බරින් ගනෙ ගිය සේක;
q2 13 බලය පාමින් ඔබ ශුද්ධ නිවසට ඔවුන්ට මඟ
පනේවූ සේක.
14 මේ ඇසූ ජනතාවෝ වවේලති;
q2 14 පිලිස්ති වැසියෝ විලිරුදාවනේ මනේ පළෙතේ;
15 ඒදාොම්හි අධිපතීහු බියපත් වතේ;
q2 15 මෝවබ් බලවත්හු වවේලති;
q2 15 සියලු කානානිය වැසියෝ දිරිය නැති කරගනිති.
16 භීතිය හා ත්රාසය ඔවුන් පිට ය;
q2 16 ඔබේ සනෙඟ එතරෙ වන තකේ, සමිඳුනි, ඔබ
මිල දී ගත් සනෙඟ එතරෙ යන තකේ, ඔබ තදෙ
බල විකුම් පෑ සේක.
q2 16 ඔව්හු ගස් ගල් මනේ නිසල ව සිටියහ.
17 සමිඳුනි, ඔබට උරුමය වන කඳු මුදුනට, සමිඳුනි,
ඔබේ වාසභවනය වන තැනට, ඔබ අතින් ඉදි කළ
ශුද්ධස්ථානයට, ඔබ ඔවුන් ගනෙ ගාොස්, පිහිටුවන
සේක.

18 සමිඳාණෝ, සදහට ම රජකම් කරන සේක.
19 පාරාවෝගේ අශ්වයෝ ද ඔහුගේ යුද්ධ රථ හා
අසරුවන් සමඟ මුහුදට ඇතුළු වූ හ. සමිඳාණන්
වහන්සේ ජලය ආපසු ඔවුන් පිට හැරවූ සේක.
එහෙත්, ඉශ්රායෙලේ ජනයා මුහුද මැදින් වියළි බිම
දිගේ ගමන් කළහ. 20 ආරොන්ගේ සොහොයුරිය
වන, මිරියම් දිවැසිවරිය කිකිණි බැඳි සිඟිති රබානක්
අතින් ගත්තා ය. වනිතාවෝ සියලු දෙනෙ ද කිකිණි
බැඳි රබන් පොඩි ලලෙවමින්, නටමින් ඇය පසුපස
ගමන්ගත්හ. 21 මිරියම් ඔවුන්ට පිළිතුරු වශයෙන්
මෙසේ ගායනා කළා ය:
q2 21 “සමිඳුන් හට ගී ගයන්න, එතුමාණෝ තදෙ
මහිමයෙනේ ජයගත් සේක;
q2 21 අසරුවන් හා අස් සෙනේ මූදට හෙළූ සේක.”

## කරදිය උල්පත

22 මෙසේ මෝසෙස් රතු මුහුදින් ඉශ්රායෙලේ ජනයා
ගෙනෙ ගිය පසු ඔව්හු ෂූර් නම් පාළුකරයට ඇතුළු වූ
හ. තදිනක් පාළුකරයේ ගමන් කළ නමුත් ඔවුන්ට
ජලය නොලැබිණි. 23 ඔවුන් මාරා නම් ස්ථානයට
පැමිණි නමුත් එහි ජලය කරදිය වූ බැවින් එය බීමට
නුපුළුවන් විය. ඒ ස්ථානයට මාරා යන නම දෙනෙ
ලද්දේ එබැවිනි. 24 එවිට සෙනඟ මෝසෙස්ට විරුද්ධ
ව කොඳුරමින්, “අප බොන්නේ මොනවා දැ”යි ඇසූ
හ. 25 මෝසෙස් සමිඳාණන් වහන්සේට අයැදුම් කළ
විට, උන් වහන්සේ ඔහුට ගසක් පෙන්නූ සේක. ඔහු
එය ජලයට දැම්මේ ය; ජලය මිහිරි විය.
25 තවද, උන් වහන්සේ එහි දී ඔවුන්ට
නියෝගයක් හා පණතක් දුන් සේක; එහි දී ඔවුන්
පරීක්ෂා කළ සේක. 26 උන් වහන්සේ ඔවුන්
අමතමින්, “නුඹේ දෙවි වන සමිඳාණන් වහන්සේගේ
හඬට නුඹ ඕනෑකමින් ඇහුම්කන් දී උන්
වහන්සේගේ ඇස් හමුයෙහි හරි ව තිබෙනෙ දේ
කොට, උන් වහන්සේගේ ආඥාවලට කන් දෙමින්
උන් වහන්සේගේ සියලු නියෝග රක්ෂා කරන්නෙහි
නම්, මිසර වාසීන් පිට මා පැමිණවූ ලෙඩ රෝග
එකක් වත් නුඹලා පිට නොපමුණුවමි. මන්ද,
නුඹලාට සුවය දෙනෙ සමිඳාණන් වහන්සේ මම ය”යි
වදාළ සේක.
27 ඉන්පසු ඔව්හු දිය උල්පත් දොළොසක් ද ඉඳි
ගස් හැත්තෑවක් ද තිබූ ඒලීම් නම් ස්ථානයට පැමිණ,
එහි දිය අසල කඳවුරු බැඳගත්හ.

## පාළුකරයේ දී ආහාර සැපයීම

16 මුළු ඉශ්රායෙලේ ජනතාව ඒලීම් නම්
ස්ථානයෙනේ ගමන් ඇරඹුවහු ය. ඔව්හු මිසර
දේශයෙනේ පිටත් වූ පසු දෙ වන මාසයේ පසළොස්
වන දින ඒලීම් සහ සීනයි අතරෙහි වූ සීන් නම්
පාළුකරයට පැමිණියෝ ය. 2 ඉශ්රායෙලේ ජනයා
මෝසෙස්ට හා ආරොන්ට විරුද්ධ ව පාළුකරයේ දී
මැසිවිලි කියන්නට වූ හ. 3 ඔව්හු ඔවුන්ට කතා
කොට, “මිසර දේශයේ දී සමිඳාණන් වහන්සේගේ
අතින් අපි මැරුණාමෙු නම් කෙතරම් යහපත් ද? එහි
දී අපට, මස් පිරුණු බඳුන් ළඟ වාඩි වී, ඇති තරම්
කෑම කන්න පුළුවන්කම තිබිණි. එහෙත්, ඔබ මේ
මුළු ජනතාව සාගින්නෙනේ මරාදැමීමට මේ
පාළුකරයට ගෙනොවහු ය”යි කී හ.
4 ජොහ 6:31 එවිට සමිඳාණන් වහන්සේ
මෝසෙස්ට කතා කොට, “මම නුඹලාට අහසින්
ආහාර වස්වමි. දිනපතා මිනිසුන් නික්ම ගොස්
එදිනට අවශ්ය කොටස එකතු කරගත යුතු ය.
මෙසේ ඔව්හු මාගේ නීතිය පිළිපදින්නෝ ද නැද්ද
කියා මට ඔවුන් පරීක්ෂා කළ හැක. 5 එහෙත්, හය
වන දවසේ දී, ඔවුන් දිනපතා එකතු කර ගන්නාක්
මෙනේ දෙගුණයක් ගෙනෙ, එය පිළියෙළ කළ යුතු ය”යි
වදාළ සේක. 6 මෝසෙස් හා ආරොන් මුළු
ඉශ්රායෙලේ ජනයාට කතා කොට, “ඔබ හැම මිසර
දේශයෙනේ පිටත ගෙනොවේ සමිඳාණන් වහන්සේ
බව අද සවස ඔබ දැනගන්නහු ය. 7 උදය කාලයේ
දී ඔබ සමිඳාණන් වහන්සේගේ මහිමාලංකාරය
දකින්නහු ය. මන්ද, ඔබ සමිඳාණන් වහන්සේට
විරුද්ධ ව කී මැසිවිලි උන් වහන්සේ ඇසූ සේක. ඔබ
මැසිවිලි කීවේ අපට විරුද්ධ ව නොවේ, අපි එතරම්
වැදගත් නොවමෙු”යි කී හ. 8 මෝසෙස් යළිත් කතා
කරමින්, “සමිඳාණන් වහන්සේ ඔබට සවස් කාලයේ
කෑමට මාංස ද, උදය කාලයේ ඇති තරම් රොටි ද
දෙනෙ සේක. එසේ වන්නේ සමිඳාණන් වහන්සේට
විරුද්ධ ව කී මැසිවිලි උන් වහන්සේ අසා ඇති
බැවිනි. සැබැවට ම අපි කවුරු ද? ඔබ මැසිවිලි කීවේ
අපට විරුද්ධ ව නොව සමිඳාණන් වහන්සේට විරුද්ධ
ව ය”යි කී ය.
9 ඉක්බිති මෝසෙස් ආරොන්ට කතා කොට, “මුළු
ඉශ්රායෙලේ ජනතාව අමතා, ‘සමිඳාණන් වහන්සේ
වෙත පැමිණෙනේන; උන් වහන්සේ නුඹලාගේ
මැසිවිලි ඇසූ සේක’ කියා කියන්නැ”යි පැවසී ය.
10 ආරොන් මුළු ඉශ්රායෙලේ ජනතාව අමතා කතා
කරන විට, ඔව්හු පාළුකරය දෙස බැලූ හ. පුදුමයකි,
වලාකුළක් මෙනේ සමිඳාණන් වහන්සේගේ
මහිමාලංකාරය දිස්විණි. 11 සමිඳාණන් වහන්සේ ද
මෝසෙස්ට කතා කොට, 12 “ඉශ්රායෙලේ ජනයාගේ
මැසිවිලි මට ඇසිණි, නුඹ ඔවුන් අමතමින්, ‘සවස
ඔබ මාංස කන්නහු ය. උදය ඔබට ඇති තරම් රොටි
ලැබෙනේනේ ය. මෙසේ නුඹලාගේ දෙවි සමිඳාණන්
වහන්සේ මා බව නුඹලා දැනගන්නහු ය’යි
කියන්නැ”යි පැවසූ සේක.
13 ඉන්පසු සවස් කාලයේ දී වටුවන් වර්ගයක්
අවුත් කඳවුර වසාගති. උදය කාලයේ දී කඳවුර
සිසාරා පිනි තට්ටුවක් විය. 14 පිනි වාෂ්ප වී ගිය පසු
පාළුකරයේ භූමිය මතුපිට සිහින් වූ, කුඩා වටකුරු
හිම වැනි දෙයෙක් තිබෙනු ඔව්හු දුටහ. 15 1 කොරි
10:3මයෙ දුටු ඉශ්රායෙලේ ජනයා එකිනෙකාට කතා
කරමින්, “මයෙ කුමක් දැ”යි විචාළාහ. මන්ද, ඒ
කුමක් ද කියා ඔවුන් නොදත් බැවිනි. මෝසෙස්
ඔවුන්ට පිළිතුරු දෙමින්, “මයෙ වනාහි සමිඳාණන්
වහන්සේ ඔබට අනුභව කිරීමට දුන් ආහාරය වේ.
16 සමිඳාණන් වහන්සේ අණ කළ පරිදි, සෑම
කෙනෙකු ම තම තමාට අවශ්ය ප්රමාණයට ඉන්

එකතු කරගත යුතු ය. ගයේ වැසියන්ගේ ගණන
අනුව එකිනකො ලීටර් දකෙ බැගින් ගත යුතු ය.
තවද, ඔබ සැම කනෙකුෙ ම තම කූඩාරමේ සිටින
අයටත් ගනෙ යා යුතු ය"යි කීවේ ය.
17 ඉශ්රායලේ ජනයා එලසෙ කරද්දී, සමහරකේ
අඩුවනේ ද සමහරකේ වැඩියනේ ද රුස් කරගත්හ.
18 2 කොරි 8:15ඔවුන් එය මැන්න විට වැඩියනේ
රුස් කරගත් අයට වැඩියක් නො වී ය, අඩුවනේ
රුස් කරගත් අයට අඩුවක් ද නො වී ය. එකිනකො
තම තමා කන ප්රමාණයට රුස් කරගනෙ තිබිණි.
19 මෝසසේ ඔවුන්ට කතා කොට, "උදය වන තකේ
ඉන් කිසිත් ඉතිරි නොකළ යුතු ය"යි කීවේ ය.
20 එහතේ, ඔව්හු මෝසසේට සවන් නොදුන්හ.
ඔවුන්ගනේ සමහරකේ පසු දින උදය වන තකේ ඉන්
කොටසක් ඉතුරු කළහ. එවිට එහි පණුවන් හටගනෙ
එයින් දුගඳ හමන්නට විය. මෝසසේ ඔවුන් සමඟ
කෝප විය. 21 ඔව්හු එකිනකො තම තමා කන
ප්රමාණය අනුව උදයනේ උදය එය රුස් කරගත්හ.
අව්ව තද වූ විට එය දිය වී ගියේ ය.
22 තවද, හය වන දවසේ දී ඔව්හු එකිනකොට
ලීටර් හතර බැගින් ආහාර දගුණයක් රුස්
කරගත්හ. ඉන්පසු ප්රජා මූලිකයෝ සියලු දනෙ
මෝසසේ වතෙ පැමිණ මයෙ සැළ කළහ. 23 නික්ම
20:8-11ඔහු ඔවුන් අමතමින්, "සමිඳාණන් වහන්සේ
අණ කරන දේ මේ ය. එනම්, 'හටෙ වනාහි නිවාඩු
දිනයකි, සමිඳාණන් වහන්සේට කැප කරන ලද
සබත් දිනයකි. එබැවින් පිළිස්සීමට අවශ්ය නම්,
පුළුස්සන්න, තැම්බීමට උවමනා යමක් නම්,
තම්බන්න. ඉතිරි වන දේ ඔබේ ප්රයෝජනයට
ගන්නා පිණිස හටෙ වනෙ තකේ පැත්තකට කර
තබාගන්නැ"යි කී ය. 24 ඔව්හු මෝසසේ කී පරිදි පසු
දා වන තකේ එය පැත්තකට කළ නමුත් එයින් දුගඳ
නොහැමී ය. එහි එක පණුවකේ වත් නො වී ය.
25 මෝසසේ කතා කොට, "ඒවා අද දින අනුභව
කරන්න, මන්ද, අද සමිඳාණන් වහන්සේට කැප කළ
නිවාඩු දිනය යි. අද ඒවා ඔබට කතෙහෙි සම්බ
නොවන්නේ ය. 26 දින හයක් ඔබ එය රුස් කරගත
යුතු ය. එහතේ, සබත් දින වන හත් වන දින ඒ
කිසිවක් නොතිබේ ය"යි කීවේ ය. 27 එහතේ, ජනයා
අතරින් සමහරකු හත් වන දින ද ඒවා රුස් කිරීමට
ගිය නමුත් ඒවායින් කිසිවක් සම්බ නො වී ය.
28 එවිට සමිඳාණන් වහන්සේ මෝසසේට කතා
කොට, "නුඹලා කොපමණ කාලයක් මාගේ ආඥා
සහ නීති පිළිපැදීම ප්රතික්ෂපේ කරන්නහු ද?
29 බලන්න, මම නුඹට සබත් දිනය දුන් බැවින් හය
වන දවසේ දී මම නුඹට දදෙවසක ආහාර දමේ.
සබත් දින නුඹලා සැම කනෙකේ ම තම තමා සිටින
තැන ම නැවතී සිටිය යුතු ය. කිසිවකු තම නිවසින්
පිටත නොයා යුතු ය"යි වදාළ සේක. 30 එබැවින්
සනෙඟ හත් වන දින නිවාඩු ගත්හ.
31 ගණන් 11:7-8 ඉශ්රායලේ ජනයා ඒ ආහාරයට
'මන්නා' යන නාමය තැබූ හ. එය කොත්තමල්ලි ඇට
තරම් ය, සුදු පාට ය, මී පැණි මිශ්ර තුනී රොටි
වර්ගයක් මනේ රසවත් ය. 32 මෝසසේ කතා කොට,
"සමිඳාණන් වහන්සේගේ ආඥාව මයෙ වේ: 'මා
මිසර දේශයනේ නුඹලා පිටතට ගනෙනෙ විට
පාළුකරයේ දී නුඹලා පෝෂ්ය කළ ආහාරය
නුඹලාගේ මතු පරම්පරාවල අය දකින පිණිස, ඔවුන්
සඳහා එයින් ලීටර් දකෙක් පුරවා තබාගන්නැ' "යි
කීවේ ය. 33 හබේරෙ 9:4ඉන්පසු මෝසසේ ආරොන්ට
කතා කොට, "බඳුනක් රැගනෙ මන්නාවලින් ලීටර්
දකෙක් එහි පුරවා ඔබේ මතු පරම්පරාවන් සඳහා
එය සමිඳාණන් වහන්සේ ඉදිරියහෙි තබන්නැ"යි කී
ය. 34 සමිඳාණන් වහන්සේ මෝසසේට අණ දුන්
ප්රකාර, ආරොන් එය ආරක්ෂා කරනු පිණිස ගිවිසුම්
කරඬුව ඉදිරිපිට තැබී ය. 35 ජෝෂු 5:12ඉශ්රායලේ
ජනයා මනුෂ්ය පථයකට පැමිණනෙ තකේ අවුරුදු
හතළිහක් මන්නා කෑ හ; එනම්, කානාන් දේශයේ
සීමාවලට පැමිණනෙ තකේ ම ඔව්හු මන්නා කෑ හ.
36 ඒ කාලයේ භාවිත කළ මිම්ම ලීටර් විස්සකට
සමාන ය.

## පර්වතයනේ නික්මුණු ජලය

(ගණන් 20:1-13)

17 ගණන් 20:2-13 තවද, මුළු ඉශ්රායලේ
ජනතාව සීන් නමැති පාළුකරයනේ නික්ම
සමිඳාණන් වහන්සේගේ අණ පරිදි කඳවුරින්
කඳවුරට ගොස් රෙපිඩීම් නම් ස්ථානයේ කඳවුරු
බැඳගත්හ. එහතේ, එහි සනෙඟට බීමට වතුර නො
වී ය. 2 එවිට ඔව්හු මෝසසේට අවලාද කියමින්,
"අපට බොන්න වතුර දනේනැ"යි ඉල්ලූ හ. මෝසසේ
ඔවුන්ට පිළිතුරු දමේන්, "ඔබ මට අවලාද කියන්නේ
ඇයි? ඔබ කුමක් නිසා සමිඳාණන් වහන්සේ පරීක්ෂා
කරන්නහු දැ"යි ඇසී ය. 3 සනෙඟ ද පිපාසයනේ
පළෙමේන් මෝසසේට විරුද්ධ ව කොඳුර කොඳුරා,
"ඔබ අප මිසරයනේ පිටතට ගනොවේ මන් ද? අප ද
අපේ දරුවන් ද අපේ ගවමහිෂයන් ද පිපාසයනේ
මරාදමන්නට දැ"යි විචාළහ. 4 මෝසසේ එවිට
සමිඳාණන් වහන්සේට මොරගසමින්, "මේ සනෙඟට
මා කුමක් කරන්න ද? ඔව්හු මට ගල් ගසන්නට
සැරසෙති"යි කීවේ ය. 5 එවිට සමිඳාණන් වහන්සේ
මෝසසේ අමතා, "ඔබ ඉශ්රායලේවරුන්ගේ ප්රජා
මූලිකයන් සමහරකු ද කැටුව සනෙඟට ඉදිරියනේ
යන්න. තවද, ඔබ ගංගාවේ දියට පහර දුන්
සැරයටිය ද ඔබ අත රැගනෙ යා යුතු ය. 6 බලන්න,
මම ද හොරබේහි පර්වතය මත ඔබ ඉදිරිපිට සිටිමි.
ඔබ පර්වතයට ගැසිය යුතු ය. එවිට සනෙඟට බීමට
ජලය එයින් ගලා එනු ඇතැ"යි වදාළ සේක.
මෝසසේ ඉශ්රායලේවරුන්ගේ ප්රජා මූලිකයන්
බලාගනෙ සිටිය දී එලසෙ කළෙේ ය. 7 ඉශ්රායලේ
ජනයා අවලාද කී නිසාත්, 'සමිඳාණන් වහන්සේ අප
අතර ඇද් ද? නැද් ද?' කියමින් ඔවුන් උන් වහන්සේ
පරීක්ෂා කළ නිසාත් ඒ ස්ථානයට ඔහු මස්සා සහ
මෙරිබා කියා නම් කළෙේ ය.

### අමලෙක්වරුන් සමඟ සටන

8 එවිට අමලෙක්වරු පැමිණ රෙපිඩීම් නම්
ස්ථානයේ දී ඉශ්රායෙල් ජනයා සමඟ සටන් කළහ.
9 මෝසෙස් ජෝෂුවාට කතා කොට, “අප උදෙසා ඔබ
මිනිසුන් තෝරාගෙන, නික්ම ගොස් හෙට
අමලෙක්වරුන් සමඟ සටන් කරන්න. මම දෙවියන්
වහන්සේ දුන් සැරයටිය මා අතට ගෙන කඳු මුදුනේ
සිටිමි”යි කීවේ ය. 10 ජෝෂුවා මෝසෙස් තමාට කී
පරිදි අමලෙක්වරුන් සමඟ සටන් කළේ ය.
මෝසෙස් සමඟ ආරොන් සහ හූර් යන දෙදෙනා කඳු
මුදුනට නැඟී ගියහ. 11 මෝසෙස් තමාගේ අත්
ඔසවාගෙන සිටි තෙක් ඉශ්රායෙල්වරුන්ට ජය අත්
විය. ඔහු තම අත් පහතට හෙළූ විට අමලෙක්වරු
ජයගත්හ. 12 එහෙත්, මෝසෙස්ගේ අත් විඩාවට
පත් වූ විට, ඔව්හු ගලක් ගෙන ඔහු පිටුපස
තැබූයෙන් ඔහු ද එය මත වාඩි විය. එවිට ආරොන්
සහ හූර් දෙපැත්තේ සිටගෙන ඔහුගේ අත්
උසුලාගෙන සිටියහ. මෙසේ ඔහුගේ අත්, හිරු බැස
යන තෙක් ම පහතට නොවැටී තිබිණි. 13 ජෝෂුවා,
අමලෙක් සහ ඔහුගේ සෙනඟ කඩු පහරින්
වනසාදැමී ය. 14 ද්වි.නී. 25:17-19; 1 සාමු 15:2-9එවිට
සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතමින්, “මෙය සිහි
වන පිණිස, “මම අමලෙක්වරුන් ගැන මතකයක්
නැති වන සේ මිහි පිටින් ඔවුන් සම්පූර්ණයෙන් ම
මකාදමමි’යි පොතක ලියා, එය ජෝෂුවාට ඇසෙන
පරිදි කියන්නැ”යි වදාළ සේක. 15 මෝසෙස්
පූජාසනයක් තනා ඊට සමිඳා-නිස්සී හෙවත්
සමිඳාණන් වහන්සේ මාගේ ධජය කියා නම් තැබී
ය. 16 මන්ද, ‘ඔබ සමිඳාණන් වහන්සේගේ ධජයට
අත ගසන්න, උන් වහන්සේ පරම්පරාවෙන්
පරම්පරාවට අමලෙක්වරුන් සමඟ සටන් කරන
සේකැ’යි උන් වහන්සේ වදාළ බැවිනි.

### ජෙත්රෝට මෝසෙස් හමු වීම

18 මෝසෙස්ගේ මාමණ්ඩී වන මිදියන්හි
පූජකවර ජෙත්රෝ, දෙවියන් වහන්සේ
මෝසෙස්ට හා ඔහුගේ ඉශ්රායෙල් සෙනඟට කළ
සියල්ල ද උන් වහන්සේ ඔවුන් මිසර දේශයෙන්
පිටතට ගෙන ආ අයුරු ද අසා තිබිණි. 2 නික්ම
2:21-22එබැවින් ඔහු මෝසෙස් පිටත්කර හැර සිටි
ශිප්පෝරා නම් ඔහුගේ බිරිඳ ද 3 ක්රියා 7:29ඇගේ
පුතුන් දෙදෙනා ද කැඳවාගෙන ආවේ ය. මොවුන්
එක් කෙනෙකුගේ නම ගේර්ෂොම් ය. එහි අර්ථය,
මෝසෙස් කී ලෙස ‘මම අමුතු රටක ආගන්තුකයකු
මෙන්, සිටියෙමි’ යනුයි. 4 අනික් පුත්රයාගේ නම
එලියේසර් ය. එහි අර්ථය, ඔහු කී ලෙස, ‘මාගේ
පියාගේ දෙවියන් වහන්සේ මාගේ ආධාරය වී
පාරාවෝගේ කඩුවෙන් මා මිදූ සේක’ යනුයි.
5 මෝසෙස්ගේ මාමණ්ඩී වන ජෙත්රෝ මෝසෙස්ගේ
බිරිඳ සහ පුතුන් ද රැගෙන, දෙවියන් වහන්සේගේ
කන්ද ළඟ පාළුකරයේ කඳවුරු බැඳ සිටි මෝසෙස්
වෙත පැමිණියේ ය. 6 ඔහු මෝසෙස් වෙත
පණිවුඩයක් යවමින්, “ඔබේ මාමණ්ඩී වන ජෙත්රෝ
නම් මම, ඔබේ බිරිඳ හා පුතුන් දෙදෙනා ද සමඟ
ඔබ හමු වීමට පැමිණ සිටිමි”යි සැළ කළේ ය.
7 මෝසෙස් තම මාමණ්ඩී හමු වීමට නික්ම ගොස්
ආචාර සමාචාර කොට ඔහු සිප ගත්තේ ය. තවද,
ඔවුන් එකිනෙකාගේ සුව දුක් විචාළ පසු, ඔව්හු
කූඩාරමට ඇතුළු වූ හ. 8 මෝසෙස් තම මාමණ්ඩීට
කතා කොට, සමිඳාණන් වහන්සේ ඉශ්රායෙල් ජනයා
උදෙසා පාරාවෝට සහ මිසර වැසියන්ට කළ දේවල්
ද මඟ දී ඔවුන්ට මූණ පාන්නට වූ සියලු අමාරුකම් ද
සමිඳාණන් වහන්සේ ඔවුන් ගැළවූ අයුරු ද දැන්වී ය.
9 සමිඳාණන් වහන්සේ ඉශ්රායෙල්වරුන් මිසර
වාසීන්ගේ අතින් මුදා, ඔවුන්ට උන් වහන්සේ කර
දුන් සියලු යහපත්කම් ගැන ජෙත්රෝ ප්රීති ප්රමෝද
විය. 10 ජෙත්රෝ කතා කොට, “මිසර වාසීන්ගේ
අතින් ද පාරාවෝගේ අතින් ද ඔබ මුදාලූ, මිසර
වාසීන්ගේ වහල් මෙහෙවරින් සෙනඟ මුදාලූ
සමිඳාණන් වහන්සේට ප්රශංසා වේ වා! 11 තවද,
සමිඳාණන් වහන්සේ සියලු දෙවිවරුන්ට වඩා
උත්තරීතර බව මම දැන් දනිමි. මන්ද, මිසර වාසීන්
ඉතා අහංකාර ලෙස ඉශ්රායෙල්වරුන්ට විරුද්ධ ව
ක්රියා කළ විට උන් වහන්සේ මෙය කළ සේකැ”යි
කී ය. 12 ඉන්පසු මෝසෙස්ගේ මාමණ්ඩී වන
ජෙත්රෝ සමිඳාණන් වහන්සේට ඔප්පු කරන පිණිස
දවන යාග පූජාවක් හා පුද පඬුරු ගෙනාවේ ය.
ආරොන් ද ඉශ්රායෙල්වරුන්ගේ ප්රජා මූලිකයන්
සියල්ලෝ ද මෝසෙස්ගේ මාමණ්ඩී සමඟ දෙවියන්
වහන්සේ ඉදිරියෙහි භෝජනයට සහභාගි වූ හ.

### විනිසකරුවන් පත් කිරීම

(ද්වි.නී. 1:9-18)

13 පසු දින මෝසෙස් සෙනඟ විනිශ්චය කරනු
සඳහා අසුන් ගත්තේ ය. සෙනඟ උදය සිට සවස
දක්වා ඔහු අවට සිටියහ. 14 තවද, සෙනඟ
සම්බන්ධයෙන් මෝසෙස් කරන්නට වූ සියල්ල දුටු
මෝසෙස්ගේ මාමණ්ඩී ඔහුට කතා කරමින්, “ඔබ
සෙනඟට මේ කරන්නේ කුමක් ද? ඔබ තනියම
අසුන් ගෙන සිටින්නේත්, මුළු සෙනඟ උදේ පටන්
සවස දක්වා ඔබ ළඟ සිටින්නේත් මන්දැ”යි විචාළේ
ය. 15 එවිට මෝසෙස් තම මාමණ්ඩීට පිළිතුරු
දෙමින්, “මා මෙසේ කරන්නේ, සෙනඟ දෙවියන්
වහන්සේගෙන් උපදෙස් ලබාගැනීම සඳහා මා වෙත
එන නිසා ය. 16 ඔවුන් අතර ප්රශ්නයක් ඇති වූ විට
ඔව්හු මා වෙත එති. මම ද ඔවුනොවුන් විනිශ්චය
කොට දෙවියන් වහන්සේගේ ආඥා සහ අණපණත්
ඔවුන්ට දන්වමි”යි කීවේ ය. 17 එවිට මෝසෙස්ගේ
මාමා ඔහුට කතා කොට, “ඔබ කරන දේ හරි නැත.
18 ඔබත්, ඔබ ළඟ සිටින මේ සෙනඟත් අතිශයින්
විඩාවට පත්වනු ඇත. මේ කටයුත්ත ඔබට බර වැඩි
ය. ඔබට එය තනියම ඉටු කිරීම නොහැක.
19 එබැවින් දැන් මා කියන දේට සවන් දෙන්න. මම
ඔබට දැනමුතුකමක් දෙමි. දෙවියන් වහන්සේ ඔබ
සමඟ වැඩ සිටින සේක. ඔබ දෙවියන් වහන්සේ
ඉදිරියෙහි නියෝජිතයකු වී, නඩුහබ උන් වහන්සේ

ඉදිරියට පමුණුවන්න. 20 ඔබ ඔවුන්ට ආඥා සහ
අණපණත් උගන්වමින් ඔවුන් හැසිරිය යුතු අන්දම හා
ඔවුන් ඉටු කළ යුතු දේ ද පනේවා දිය යුතු ය.
21 තවද, ඔබ මුළු සනෙඟ අතුරින් දේව භය ඇති,
සත්‍යවාදී, අල්ලස් නාගෙන්නා දක්ෂ මිනිසුන් තෝරා
ඔවුන් අතර සහශ්‍රාධිපතීන් ද ශතාධිපතීන් ද
පණසාධිපතීන් හා දශාධිපතීන් ද වශයනේ ඔවුන්
පත් කරන්න. 22 ඔවුන් සියලු අවස්ථාවන්හි දී
මිනිසුන් විනිශ්චය කළ යුතු ය. එහතේ, වැදගත්
ප්‍රශ්නයක් තිබේ නම් ඔවුන් ඔබ වතෙ එය ගනො
යුතු ය. එහතේ, සෑම සුළු කරුණක් ඔවුන් ම
විනිශ්චය කළ යුතුයි. එසේ කළහොත් ඔබට වඩාත්
පහසු වේ. ඔවුන් ද ඔබ සමඟ වගකීමේ බර
උසුලනු ඇත. 23 දවේියන් වහන්සේ ඔබට අණ
කරන ලසෙ ඔබ මයෙ කරන්නහෙි නම් ඔබ විඩාවට
පත් නාවෙනු ඇත. මේ සනෙඟට ද තම තමන්ගේ
ගවෙලට සමගි සාමදානයනේ යන්න පුළුවන් වේ
ය”යි කී ය.
24 මෝසසේ තම මාමණ්ඩි කී දේට සවන් දී ඔහු
කී සියල්ල ඉටු කළෙේ ය. 25 ඔහු ඉශ්‍රායලේවරුන්
සියලු දනො අතුරින් දක්ෂ මිනිසුන් තෝරා
සහශ්‍රාධිපතීන් ද ශතාධිපතීන් ද පණසාධිපතීන් හා
දශාධිපතීන් ද වශයනේ සනෙඟගේ නායකයන් ලසෙ
පත් කළෙේ ය. 26 ඔව්හු සියලු අවස්ථාවල දී
සනෙඟ විනිශ්චය කළහ. දුෂ්කර ප්‍රශ්න ඔවුන්
මෝසසේ වතෙ ගනො නමුත්, සෑම සුළු කරුණක් ම
ඔව්හු ම විනිශ්චය කළහ. 27 ඉන්පසු මෝසසේ තම
මාමණ්ඩිට යන්නට හැරියේ ය. ඔහු ද සිය රට බලා
ගියේ ය.

## සීනයි කන්ද මත දේව ආඥා

19 ඉශ්‍රායලේ ජනයා මිසර දේශයනේ නික්ම
ගොස් තෙ වන මස පළමු වන දින සීනයි
නම් පාළුකරයට පැමිණියහ. 2 ඔව්හු රපිඩීම් නම්
ස්ථානයනේ පිටත් ව සීනයි පාළුකරයට පැමිණ එහි
කඳවුරු බැඳගත්හ. එහි ඔවුන්ගේ කඳවුර පිහිටියේ
කන්ද ඉදිරිපිට ය.
3 මෝසසේ දවේියන් වහන්සේ හමු වීමට කන්දට
නැංගේ ය. එවිට සමිඳාණන් වහන්සේ කන්දේ සිට
ඔහුට හඬගසා, “නුඹ ජාකොබ්ගේ පළෙපත වන
ඉශ්‍රායලේ ජනයාට මසෙේ කිව යුතු ය: 4 ‘මා මිසර
වැසියන්ට කළ දේ ද, මා නුඹලා රාජාලියකුගේ
පියාපත් උඩ ගනෙනෙ මනේ මා වතෙ නුඹලා
උසුලාගනෙ පැමිණි අයුරු ද නුඹලා දුටුවහු ය.
5 ද්වි.නී. 4:20; 7:6; 14:2; 26:18; තීතස් 2:14 එබැවින්
දැන් ඉතින් නුඹලා සැබැවින් ම මාගේ හඬට කීකරු
වන්නහු නම්, මාගේ ගිවිසුම පිළිපදින්නහු නම්,
සියලු සනෙඟ අතුරින් නුඹලා මට ම අයිති සම්පත
වන්නහු ය.1 පේදු 2:9මන්ද, මුළු මහ පාොළවෙ මා
සතු ය. 6 එළිද 1:6; 5:10නුඹලා මට පූජක රාජ්‍යයක්
ද කැප වූ ජාතියක් ද වන්නහු ය’ ”යි වදාළ සේක.
7 ඉන්පසු මෝසසේ පැමිණ, සනෙඟගේ ප්‍රජා
මූලිකයන් කැඳවා සමිඳාණන් වහන්සේ ඔහුට අණ
කළ මේ සියලු දේ ඔවුන්ට දැන්වී ය. 8 එවිට මුළු
සනෙඟ ද එක්සත් ව පිළිතුරු දමෙින්, “සමිඳාණන්
වහන්සේ වදාළ සියල්ල අපි ඉටු කරන්නමෙු”යි කී
හ. ඉන්පසු මෝසසේ සනෙඟ කී දේ සමිඳාණන්
වහන්සේට සැළ කළෙේ ය.
9 නැවත සමිඳාණන් වහන්සේ මෝසසේට කතා
කාටෙ, “බලන්න, මා නුඹ සමඟ කතා කරන විට
සනෙඟට ඇසනෙ පිණිසත්, ඔවුන් නිතර ම නුඹ
විශ්වාස කරන පිණිසත් මම නුඹ වතෙ ඝන
වලාකුළක් මඟින් එන්නමෙි”යි වදාළ සේක.
මෝසසේ සනෙඟ දුන් පිළිතුර සමිඳාණන් වහන්සේට
දැන්වී ය.
10 සමිඳාණන් වහන්සේ මෝසසේට කතා කාටෙ,
“සනෙඟ වතෙ ගොස් අදත්, හටෙත් නමස්කාරය
පිණිස ඔවුන් සූදානම් කරන්න. ඔවුන් තම වස්ත්‍ර
සෝදා, 11 තුන් වන දවසට සූදානම් ව සිටිය යුතුයි.
තුන් වන දවසේ දී මුළු සනෙඟ බලාගනෙ සිටින විට
සමිඳාණන් වහන්සේ වන මම සීනයි කන්ද මත බැස
එන්නමෙි. 12 හබේ්‍රෙ 12:18-20නුඹ කන්ද වට කර
සනෙඟ මායිමේ සිටුවා, ‘කන්දට නාගෙනිඟ
හැටියටත්, කන්ද පාමුල ස්පර්ශ නාකෙරන හැටියටත්
පරසේසම් වන්නැ’යි ඔවුන්ට කියන්න. යමකෙු කන්ද
ස්පර්ශ කළහොත් ඔහු ඇත්තනේ ම මරනු ලැබේ.
13 එහතේ, ඒ තැනැත්තාට අත නාෙතබා, ඔහුට ගල්
ගසනු ලැබිය යුතුයි. නැත්නම් ඔහු ඊතලයකින් විදදැමිය
යුතුයි. මෘගයකු වුවත්, මනුෂ්‍යයකෙු වුවත් ජීවත්
නාවිය යුතු ය. හාරෙණෑව දීර්ඝ ස්වරයක් නංවන
විට ඔවුන් කන්ද වතෙ පැමිණිය යුතු ය”යි වදාළ
සේක.
14 මෝසසේ කන්දනේ බැස සනෙඟ වතෙ පැමිණ
නමස්කාරය සඳහා ඔවුන් සූදානම් කළෙේ ය. ඔව්හු
ද තමන් වස්ත්‍ර සෝදාගත්හ. 15 ඔහු සනෙඟට
කතා කරමින්, “තුන් වන දවසට සූදානම් වී සිටින්න;
ස්ත්‍රී සේවනයනේ වළකින්නැ”යි කීවේ ය.
16 එළිද 4:5 තුන් වන දවස උදා වූ විට කන්ද මත
මේඝ ගර්ජනා හා විදුලි කටෙීම් ද, ඝන වලාකුළක් ද,
තද හාරෙණෑ හඬක් ද විය. කඳවුරේ සිටි සියලු
සනෙඟ වවේලන්නට වූ හ. 17 ද්වි.නී. 4:11-12එවිට
මෝසසේ දවේියන් වහන්සේ හමු වන පිණිස
සනෙඟ කඳවුරින් පිටතට ගනොවේ ය. ඔව්හු කන්ද
පාමුල සිටගත්හ. 18 සමිඳාණන් වහන්සේ ගිනි
ජාලාවකින් කන්ද මත බැස වදාළ බැවින් එය
සම්පූර්ණයනේ ම දුමින් වැසී තිබිණි. එහි දුම,
උදුනක දුමක් මනේ නැංගේ ය. තවද, මුළු කන්ද ම
වේගවත් ලසෙ දදෙරන්නට විය. 19 හාරෙණෑ හඬ ද
දිගට ම නද දමෙින් එන්න එන්න වැඩි විය. මෝසසේ
කතා කළ විට දවේියන් වහන්සේ ගිගුරුම් හඬකින්
උත්තර දුන් සේක. 20 සමිඳාණන් වහන්සේ එවිට
සීනයි කඳු මුදුනට බැස වදාළ සේක. උන් වහන්සේ
මෝසසේ කඳු මුදුනට කැඳවූ බැවින්, ඔහු ද එහි
නැඟී ගියේ ය. 21 උන් වහන්සේ මෝසසේට කතා
කාටෙ, “නුඹ බැස ගොස් සමිඳාණන් වහන්සේ වන
මා බැලීමට මායිම් බිඳගනෙ නාඑෙන පිණිස
සනෙඟට අණ කරන්න. නැත්නම් බාහෙෝ දනෙකෙු

නසින්න පුළුවන. 22 සමිඳාණන් වහන්සේ වන මා
සමීපයට එන පූජකවරුන් ද පවිත්‍ර වීමේ
වත්පිළිවෙත් ඉටු කළ යුතු ය. නැත්නම් මම ඔවුන්ට
පහර දමේ"යි වදාළ සේක. 23 එවිට මෝසෙස්
සමිඳාණන් වහන්සේට කතා කොට, "සෙනඟට
සීනයි කන්දට නැඟිය නොහැකි ය. මන්ද, 'කන්ද වට
කර මායිම් සිටුවා එය ශුද්ධ භූමියක් ලෙස කැප
කරන්නැ'යි කියා ඔබ අපට අණ කළ බැවිනැ"යි
කීවේ ය. 24 උන් වහන්සේ ඔහු අමතමින්, "යන්න,
බැස ගොස්, නුඹ ද නුඹ සමඟ ආරොන් ද කැඳවා
ගෙන නැඟී එන්න. එහෙත් පූජකවරුන් ද සෙනඟ ද
සමිඳාණන් වහන්සේ වන මා වෙත නැඟී ඒමට
මායිම් නොබිඳිය යුතු ය. එසේ වුණොත් මම
ඔවුන්ට පහර දමේ"යි වදාළ සේක. 25 පසුව
මෝසෙස් ද සෙනඟ වෙත බැස ගොස් ඔවුන්ට
එලෙස දැන්වී ය.

### දස පණත
(ද්වි.නී. 5:1-21)

20 දෙවියන් වහන්සේ කතා කොට මේ සියලු
ආඥා වදාළ සේක: 2 "වහල්කමේ නිවාසය
වූ මිසර දේශයෙන් නුඹ පිටතට ගෙනා සමිඳාණන්
වහන්සේ මම ය.
3 "මා හැර අන් කිසි ම දෙවි කෙනෙකු නුඹට
නොසිටිය යුතු ය."
4 නික්ම 34:17; ලෙවී 19:4; 26:1; ද්වි.නී. 4:15-18;
27:15 "නුඹ සඳහා නෙළූ රූපයක් හෝ ඉහළ
අහසෙහි වත්, පහළ පොළොවෙහි වත්,
පොළොවෙන් යට ජලයෙහි වත් ඇති කිසි ම
වස්තුවකට සමාන දෙයක් හෝ සාදා නොගන්න.
5 නික්ම 34:6-7; ගණන් 14:18; ද්වි.නී. 7:9-10නුඹ
ඒවාට නමස්කාර නොකරන්න; ඒවාට නොවඳින්න.
මන්ද, නුඹේ දෙවි සමිඳාණන් වහන්සේ වන මා
ප්‍රතිවාදීන් නොඉවසන දෙවි කෙනෙකු වන බැවිනි.
මට වෛර කරන පියවරුන්ගේ පාපය නිසා තුන් වන,
සතර වන පරම්පරාව දක්වා ඔවුන්ගේ දරුවන්ට මම
දඬුවම් කරමි. 6 එහෙත්, මට ප්‍රේම කරමින් මාගේ
ආඥා පිළිපදින දහස් ගණන් අයට මම කරුණාව
දක්වමි.
7 ලෙවී 19:12 "නුඹ දෙවි සමිඳාණන් වහන්සේගේ
නාමය අගරු ලෙස භාවිතා නොකරව. යමෙක් ඒ
නාමය අගරු ලෙස භාවිතා කරන්නේ ද ඔහුට මම
දඬුවම් කරමි."
8 නික්ම 16:23-30; 31:12-14 "සබත් දවස ශුද්ධ
ලෙස පැවැත්වීමට සිතට ගන්න. 9 නික්ම 23:12;
31:15; 34:21; 35:2; ලෙවී 23:3 දවස් හයක් තුළ නුඹ
වෙහෙසෙ වී නුඹේ සියලු වැඩ කළ යුතු ය.
10 එහෙත්, හත් වන දවස නුඹේ දෙවි සමිඳාණන්
වහන්සේට කැප වූ සබත ය. එදින නුඹ වත්, නුඹේ
පුතු වත්, දුව වත්, නුඹේ සේවකයා වත්, සේවිකාව
වත්, නුඹේ සතකු වත්, නුඹේ වාසල් දොරටු සීමා
ඇතුළ සිටින අමුත්තකු වත් කිසි වැඩක් නොකළ
යුතු ය. 11 උත් 2:1-3; නික්ම 31:17මන්ද, සමිඳාණන්
වහන්සේ වන මම දින හයක් තුළ අහස හා
පොළොව ද, සමුද්‍රය ද, ඒවායේ ඇති සියල්ල ද
සාදා, සත් වන දවස නිවාඩු ගත්තමි. එබැවින් උන්
වහන්සේ සබත් දවසට ආශීර්වාද කොට එය විශුද්ධ
කළ සේක.
12 ද්වි.නී. 27:16; මතෙ 15:4; 19:19; මාක් 7:10;
10:19; ලූක් 18:20; එපී 6:2,3 "නුඹේ පියාට ද, මවට
ද ගෞරව කරව. එවිට නුඹේ දෙවි සමිඳාණන්
වහන්සේ නුඹට දෙන රටේ නුඹ බොහෝ කාලයක්
ජීවත් වන්නෙහි ය.
13 උත් 9:6; ලෙවී 24:17; මතෙ 5:21; 19:18; මාක්
10:19; ලූක් 18:20; රෝම 13:9; ජාකො 2:11 "මිනී
නොමරව.
14 ලෙවී 20:10; මතෙ 5:27; 19:18; මාක් 10:19; ලූක්
18:20; රෝම 13:9; ජාකො 2:11 "කාමමිථ්‍යාචාරය
නොකරව.
15 ලෙවී 19:11; මතෙ 19:18; මාක් 10:19; ලූක්
18:20; රෝම 13:9 "සොරකම් නොකරව.
16 නික්ම 23:1; මතෙ 19:18; මාක් 10:19; ලූක්
18:20 "නුඹේ අසල්වැසියාට විරුද්ධ ව බොරු සාක්ෂි
නොකියව.
17 රෝම 7:7; 13:9 "නුඹේ අසල්වැසියාගේ
ගෘහයට නුඹ ඇළුම් නොකරව. තවද, නුඹේ
අසල්වැසියාගේ භාර්යාවට හෝ ඔහුගේ සේවකයාට
හෝ සේවිකාවට හෝ ඔහුගේ ගවයාට හෝ
කොටළුවාට හෝ නුඹේ අසල්වැසියා සතු වෙනත්
කිසිවකට හෝ ඇළුම් නොකරව."

### සෙනඟ බිය වීම
(ද්වි.නී. 5:22-23)

18 හෙබ්‍රෙ 12:18-19 මුළු සෙනඟ මේඝ ගර්ජනා
හඬ සහ හොරණෑ ශබ්දය අසා, විදුලි කෙටීම් සහ
දුම් දමන කන්ද දැක බියෙන් වෙව්ලමින්, බොහෝ
ඈතින් සිටගත්හ. 19 එවිට ඔව්හු මෝසෙස්
අමතමින්, "ඔබ අප සමඟ කතා කරන්න; අපි
ඇහුම්කන් දෙන්නෙමු. එහෙත්, දෙවියන් වහන්සේ
අප සමඟ කතා නොකරන සේක් වා! මන්ද, එසේ
කළොත් අප මියයන්නට පුළුවනැ"යි කී හ. 20 ඔහු
සෙනඟට උත්තර දෙමින්, "බිය නොවන්න; දෙවියන්
වහන්සේ ඔබ පරීක්ෂා කරන පිණිසත්, ඔබ පව්
නොකරන ලෙස උන් වහන්සේ කෙරෙහි බිය
උපදවන පිණිසත් පැමිණි සේකැ"යි කී ය. 21 එහෙත්,
සෙනඟ ඈතින් ම සිටගත් කල මෝසෙස් දෙවියන්
වහන්සේ වැඩසිටි අඳුරු වලාකුළට සමීප විය.

### පූජාසනය පිළිබඳ නීති

22 සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතමින්
මෙසේ වදාළ සේක: "ඉශ්‍රායලේ ජනයාට නුඹ
මෙසේ කියන්න, 'මා ස්වර්ගයේ සිට නුඹලා සමඟ
කතා කළ බව නුඹලා දුටුවහු ය. 23 මා සමඟ
නමස්කාරය ලැබීමට නුඹලා රිදීයෙන් හෝ රනින්
හෝ දේවවරුන් නොසාදන්න.' 24 පස්වලින්
පූජාසනයක් මට තනා, එය මත නුඹලාගේ දවන
යාග පූජා ද සහභාගිකමේ පූජා ද නුඹලාගේ

බැටළුවන් ද ගවයන් ද පූජා කළ යුතු ය. තවද,
මාගේ නාමය සිහි කරනු ලබන සෑම ස්ථානයක දී ම
මම නුඹලා වෙත පැමිණ නුඹලාට ආශීර්වාද කරමි.
25 ද්වි.නී. 27:5-7; ජෝෂු 8:31එහෙත්, මා සඳහා
නුඹලා ගලින් පූජාසනයක් සාදන්නහු නම් නුඹලා එය
කැපූ ගලින් ඉදි නොකරන්න. මන්ද, මෙවලමකින්
නෙළන විට එය දූෂ්‍ය වන හෙයිනි. 26 තවද, නුඹලා
මාගේ පූජාසනය වෙත යන විට නුඹලාගේ නග්න
භාවය නොපෙනෙන පිණිස පඩිවලින් ඊට නොනැඟිය
යුතු ය.”

## වහලුන් පිළිබඳ නීති

21 “තවද, නුඹ පහත දක්වන නියෝග ද
සෙනඟ ඉදිරියෙහි තැබිය යුතු ය. 2 ලෙවී
25:39-46නුඹ හෙබ්‍රෙව් ජාතික දාසයකු මිලයට ගත්
විට, ඔහු අවුරුදු හයක් සේවය කොට, හත් වන
අවුරුද්දේ දී කිසි වන්දි ගෙවීමක් නොමැති ව ඔහුට
නිදහස් ව යන්නට ඉඩ දිය යුතු ය. 3 ඔහු තනියම
පැමිණියේ නම්, ඔහු තනියම පිට වී යා යුතු ය. ඔහු
විවාහ වී පැමිණියේ නම් ඔහුගේ බිරිඳ ද ඔහු
සමඟ පිට වී යා යුතු ය. 4 ඔහුගේ ස්වාමියා ඔහුට
භාර්යාවක පාවා දුන්නේ නම්, තවද ඈ ඔහුගෙන්
දරුදැරියන් ලැබුවා නම්, භාර්යාවත්, ඇගේ දරුවනුත්
ස්වාමියාට අයිති වනු ඇත. එබැවින් ඔහු තනියම
පිට වී යා යුතු ය. 5 එහෙත්, දාසයා, ‘මම මාගේ
ස්වාමියාට ද මාගේ භාර්යාවට ද මාගේ දරුවන්ට ද
ප්‍රේම කරමි. මට නිදහස උවමනා නැතැ’යි කියා
ප්‍රකාශ කරන්නේ නම්, 6 ඔහුගේ ස්වාමියා ඔහු
දෙවියන් වහන්සේ වෙතට ගෙන යා යුතු ය. දොර
හෝ උළුවහු කණුව හෝ ළඟට ඔහු ගෙන ගොස්,
ස්වාමියා ඔහුගේ කන උල් කටුවකින් විද්ද යුතුයි.
ඉන්පසු ඔහු සදහට ම ස්වාමියාට සේවය කළ යුතු
වේ.
7 “යම් මිනිසෙකු දාසියක ලෙස තම දුව
විකුණුවහොත් ඈ දාසයකු නිදහස ලබන පරිදි තම
නිදහස නොලබන්නී ය. 8 භාර්යාවක වශයෙන් තමා
පාවාගත් ස්වාමියාට ඈ ප්‍රිය මනාප නොවන්නී නම්,
ඈ ආපසු මිල දී ගැනීමට අවසර දිය යුතු ය. එහෙත්,
ඔහුට ඇය විදේශිකයකුට විකිණීමට බලයක්
නොමැත. මන්ද, එසේ කිරීම ඇයට කරන
අසාධාරණයක් බැවිනි. 9 ස්වාමියා ඇය තම පුතුට
දෙන්න අදහස් කරන්නේ නම්, ඔහු තම දූවරුන්ට
මෙන් ඇයට ද සංග්‍රහ කළ යුතු ය. 10 එහෙත්, ඔහු
අන් භාර්යාවක පාවාගන්නේ නම්, පළමු භාර්යාවට
දෙන ආහාර, වස්ත්‍ර, භාර්යාවක වශයෙන් ඈ
කෙරෙහි ඇති යුතුකම්, අඩු නොකළ යුතුයි.
11 එහෙත්, ඔහු ඇයට මේ තුන් වැදෑරුම් යුතුකම්
අඩු කරන්නේ නම් ඇයට නොමිලයේ පිට වී යාමට
අවසර දිය යුතු ය.”

## සාහසික ක්‍රියා පිළිබඳ නීති

12 ලෙවී 24:17 “යමෙක් මිනිසෙකුට පහර දී ඔහු
මරන්නේ නම් ඒ තැනැත්තා මරනු ලැබිය යුතු ම ය.
13 ගණන් 35:10-34; ද්වි.නී. 19:1-13; ජෝෂු
20:1-9එහෙත්, මැරීමේ අදහසක් නැති ව හදිසි
අනතුරකින් මරණය සිදු වී නම් ඒ තැනැත්තා පලා
යා යුතු ස්ථානයක් මම නුඹට නියම කරමි.
14 එහෙත් යම් මිනිසෙක් ඕනෑකමින් තම
අසල්වැසියා වෙත පැමිණ ඔහු ප්‍රයෝගයෙන්
මරන්නේ නම්, ඒ තැනැත්තා මරාදමන පිණිස මාගේ
පූජාසනය වෙතින් පවා ඔහු ගෙන යා හැකි ය.
15 “තම පියාට හෝ මවට හෝ පහර දෙන
තැනැත්තා මරනු ලැබිය යුතු ම ය. 16 ද්වි.නී.
24:7මිනිසෙකු බලයෙන් පැහැරගෙන, විකුණන හෝ
තමා ළඟ තබාගන්න හෝ තැනැත්තා මරනු ලැබිය
යුතුම ය. 17 ලෙවී 20:9; මතෙ 15:4; මාක් 7:10තම
පියාට හෝ මවට හෝ සාප කරන තැනැත්තා මරනු
ලැබිය යුතු ම ය. 18 මිනිසුන් දබර කොට ඔවුන්ගෙන්
එකෙකු අනෙකාට ගලකින් හෝ අත මිට මොලවා
හෝ පහර දුන් නමුත් ඔහු නොමැරී, ඇඳට වී සිට,
19 යළි නැඟිට, සැරයටියක වාරුවෙන් ගෙයින් පිටත
ඇවිදින්නේ නම්, එවිට පහර දුන් තැනැත්තාට
දඬුවම් නොදිය යුතු ය. එහෙත්, ඔහු අනිත්
තැනැත්තාගේ වැඩ නැති කාලය සඳහා වන්දියක්
ගෙවිය යුතු අතර, ඔහු සම්පූර්ණයෙන් ම සුව වන
තුරු බලාගත යුතු ය.
20 “යමෙකු තම දාසයාට හෝ දාසියට හෝ
කෝටුවකින් පහර දී එවැන්නකේ එතැන ම මළේ
නම්, ඒ තැනැත්තා දඬුවම් ලැබිය යුතු ම ය.
21 එහෙත්, එවැන්නකේ ජීවත් වන්නේ දවසක්
දෙකක් නම් එවිට ඔහුගේ ස්වාමියාට දඬුවම් කරනු
නොලැබේ. මන්ද, ඔහු ඒ තැනැත්තා මිල දී ගත්
හෙයිනි. 22 මිනිසුන් දබර කොට, ගැබ්ගත්
ස්ත්‍රියකට පහර දී, ඈ ගබ්සා වූ නමුත් ඇයට
අනතුරක් නුවූවත් ස්ත්‍රියගේ සැමියා ඉල්ලන
ප්‍රකාර ඒ තැනැත්තාට දඬුවම් දිය යුතු ම ය. තවද,
විනිසකරුවන්ගේ තීරණය පරිදි ඔහු වන්දි ද ගෙවිය
යුතුයි. 23 එහෙත්, අනතුරක් වුවහොත් පණට පණ
ද, 24 ලෙවී 24:19-20; ද්වි.නී. 19:21; මතෙ 5:38ඇසට
ඇස ද, දතට දත ද, අතට අත ද, පයට පය ද,
25 දැවීමට දැවීම ද, තුවාළයට තුවාළය ද, පහරට
පහර ද දිය යුතු ය.
26 “යමෙක් තම දාසයාගේ හෝ දාසියගේ හෝ
ඇසට පහර දී එය අන්ධ කරන්නේ නම් නැති වූ
ඇසට වන්දියක් වශයෙන් ඒ අය නිදහස් කර හැරිය
යුතු ය. 27 යමෙකු තම දාසයාගේ හෝ දාසියගේ
හෝ දත් ගැලවී යන්න ගැසුවහොත්, දතට වන්දියක්
වශයෙන් ඒ අය නිදහස් කර හැරිය යුතු ය.”

### දේපළ හිමිකරුවන්ගේ වගකීම

28 “ගොනෙක් පුරුෂයකුට හෝ ස්ත්‍රියකට හෝ
ඇන මරන්නේ නම්, ඒ ගොනාට ගල් ගසා මැරිය
යුතු ය. උගේ මස් ද නොකෑ යුතු ය. එහෙත්, ගොනා
අයිතිකරුට දඬුවම් කරනු නොලැබේ. 29 එහෙත්,
ගොනා කලින් පවා අනින්ට පුරුදු එකෙක් නම්, තවද
ඒ බව උගේ අයිතිකරුට දන්වා තිබුණ නමුත් ඔහු
ඌ කොටු කර නොතැබීම නිසා යම් පුරුෂයකු හෝ
ස්ත්‍රියක හෝ මැරුවේ නම් ගොනාට ගල් ගසා
මැරිය යුතු ය. උගේ අයිතිකරු ද මරනු ලැබිය යුතු
ය. 30 එහෙත්, ඔහු විසින් ගෙවිය යුතු වන්දිය නියම
කර තිබේ නම් තම පණ බේරාගැන්ම සඳහා ඔහුට
නියම කරන සියල්ල ඔහු ගෙවිය යුතු ය. 31 ගොනා
පිරිමි ළමයකුට හෝ ගැහැණු ළමයකුට හෝ ඇන
මැරුවහොත් මේ නියමය අනුව ම එය ද විසඳනු
ලැබිය යුතු ය. 32 ගොනා දාසයකුට හෝ දාසියකට
හෝ ඇන මැරුවහොත්, ඌ අයිතිකරු ඔවුන්ගේ
ස්වාමියාට රිදී කාසි තිහක් දිය යුතු අතර ගොනාට ද
ගල් ගසා මරාදැමිය යුතු ය.
33 “යමෙක් වළක වැස්ම හැර තබන්නේ නම්,
නොහොත් වළක් කැණ එය නොවසා තබන්නේ
නම්, ගවයකු හෝ කොටළුවකු හෝ ඊට
වැටුණහොත්, 34 වළ අයිතිකරු අලාභය ගෙවමින්
උන්ගේ අයිතිකරුට මුදල් දිය යුතු ය. එහෙත් මළ
සතා ඔහුට අයිති වේ. 35 යමකුගේ ගොනකු
වෙන අයකුගේ ගොනකුට ඇන මැරුවහොත්, පණ
පිටින් සිටින ගොනා විකුණා ඒ මුදල ඔවුන් තමන්
අතර බෙදාගත යුතු ය. මළ සතාගේ මස් ද
බෙදාගත යුතු ය. 36 එහෙත්, කලින් පවා ඒ ගොනා
අනින්න පුරුදු එකෙක් නම්, ඌ අයිතිකරු ගොනා
කොටු නොකර තැබුවේ නම්, ඔහු වන්දි වශයෙන්
ගොනා වෙනුවට ගොනකු දිය යුතුයි. එහෙත්, මළ
සතා ඔහුට අයිති වේ.”

### වන්දි ගෙවීම පිළිබඳ නීති

22 “යමෙක් ගොනකු හෝ බැටළුවකු හෝ
සොරකම් කොට ඌ මරන්නේ ද නැත්නම්
ඌ විකුණන්නේ ද එවිට ඔහු ගොනකු වෙනුවට
ගොනුන් පස්දෙනකු බැගින් ද, බැටළුවකු වෙනුවට
බැටළුවන් හතරදෙනකු බැගින් ද වන්දි ගෙවිය යුතු
ය. 2+EXO සොරාගත් සතා ඔහු ළඟ පණපිටින් ම සිට
සම්බ වුණොත් ඌ ගොනෙක් වේ වා, කොටළුවෙක්
වේ වා, බැටළුවෙක් වේ වා, ඔහු දගුණයක් ගෙවිය
යුතු ය. ඔහු සම්පූර්ණ වන්දිය ම ගෙවිය යුතු වේ.
එහෙත්, ඔහුට වත්කමක් නැත්නම් සොරකමේ
වටිනාකම ගෙවීමට ඔහු විකුණනු ලැබිය යුතු ය.
ගෙයක් බිඳින සොරකුට පහර දී ඔහු මළොත්,
පහර දුන් තැනැත්තා වරදකරුවෙක් නොවේ. එහෙත්,
ඉර උදා වූ පසු එය, කළේ නම් පහර දුන්
තැනැත්තා වරදකරුවෙකි.
5 “යමෙක් කුඹුරක හෝ මිදි වත්තක හෝ
තමාගේ මෘගයාට කන්න ඉඩ හරින්නේ නම්, එසේ
නැත්නම් ඌ ලිහා දමා තිබිය දී ඌ වෙන අයකුගේ
කෙතක කන්නේ නම්, ඔහු තමාගේ කුඹුරින් හා මිදි
වත්තෙන් ඉස්තරම් කොටසින් අලාභය ගෙවිය යුතු
ය.
6 “ගින්නක් හටගෙන, කටු පඳුරුවලට ඇවිළී
ගොයම් කොළ හෝ නොකැපූ ගොයම හෝ කුඹුර
හෝ එයින් දැවී ගියහොත් ගින්න ගැන වගකිවයුතු
තැනැත්තා සම්පූර්ණ අලාභය ගෙවිය යුතු ය.
7 “යමකු මුදල් හෝ බඩු හෝ ප්‍රවේසම පිණිස
වෙන කෙනෙකුට භාර දී, ඔහුගේ ගෙයින් ඒවා
සොරකම් කරනු ලැබ සොරා අසු වුවහොත් ඔහු
දගුණයක් අලාභය ගෙවිය යුතුයි. 8 සොරා අසු
නුවුවහොත්, ගෙහිමියා තම අසල්වැසියාගේ
බඩුවලට අත නොගැසූ බවට දෙවියන් වහන්සේ
ඉදිරියෙහි දිවුරුම් දිය යුතු ය.
9 “විශ්වාසය කඩ කිරීමක දී එය ගොනකු ගැන
හෝ කොටළුවකු ගැන හෝ බැටළුවකු ගැන හෝ
වස්ත්‍ර ගැන හෝ නැති වූ වෙනත් යමක් ගැන හෝ
වේ වා, වෙන අයෙක් එය ‘මගේ ය’යි කියා ගනී
නම් දෙපක්ෂයේ නඩුව දෙවියන් වහන්සේ වෙත
ගෙන යා යුතු ය. උන් වහන්සේ වරදකරු කියා
තීරණය කරන තැනැත්තා අනිත් පක්ෂයට
දගුණයක් ගෙවිය යුතු ය.
10 “යමකු අන් කෙනෙකුට කොටළුවකු හෝ
ගොනකු හෝ බැටළුවකු හෝ වෙනත් මෘගයකු
හෝ ප්‍රවේසම පිණිස භාර දුන් පසු, ඌ මැරුණොත්,
නැත්නම් ඌට තුවාළයක් වුණොත්, එසේත් නැත්නම්
කිසිවකුට නොපෙනී ඌ සොරා ගනු ලැබුවහොත්,
11 ඔහු තම අසල්වැසියාගේ දේපළ සොරා නොගත්
බවට සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි කරන
දිවුරුමකින් දෙදෙනා අතර එය තීරණය කරගත
යුතුයි. දේපළ හිමිකරු පාඩුව විඳදරාගත යුතු අතර
අසල්වැසියා ඊට අලාභය නොගෙවිය යුතු ය.
12 එහෙත්, ඔහුගේ මෘගයා සොරකම් කරනු
ලැබුවේ නම් ඔහු අසල්වැසියාට අලාභය ගෙවිය
යුතුයි. 13 ඌ වන මෘගයන් විසින් කැබලි කොට
ඉරාදමනු ලැබුවේ නම් සාක්ෂි පිණිස මළ සතාගේ
ඉතිරි කොටස් ගෙනා යුතුයි. එවිට කැබලි කළ
මෘගයාගේ අලාභය ඔහු නොගෙවන්නේ ය.
14 “යමකු අන් කෙනෙකුගෙන් මෘගයකු
ඉල්ලාගෙන අයිතිකාරයා ඌ ළඟ නොසිටිය දී ඌට
තුවාළ වුණොත් නැත්නම් ඌ මැරුණොත් ඔහු
අලාභය ගෙවිය යුතු ම ය. 15 එහෙත්, මෘගයාගේ
අයිතිකරු ළඟ සිටියේ නම් ඔහු අලාභය නොගෙවිය
යුතු ය. ඌ කුලියට ගත් මෘගයකු නම් ඔහු කුලී
මිල ගෙවිය යුතු ය.

### සදාචාර හා ආගමික නීති

16 ද්වි.නී. 22:28-29 “යමකු විවාහ ගිවිසුමක් කර
නැති කන්‍යාවක පොළඹවා ඈ සමඟ සයනය
කළොත් ඔහු දෑවැද්ද දී ඈ සමඟ විවාහ විය යුතු ය.

17 එහෙත්, ඇයගේ පියා ඔහුට ඇය විවාහ කර
දීමට කොහෙත් ම කැමැති නැත්නම් ඔහු
කන්‍යාවකට දිය යුතු මුදලට සම මුදලක් ගෙවිය
යුතුයි.
18 ද්වි.නී. 18:10-11 “කොඩිවිනකාර ස්ත්‍රියකට
ජීවත් වීමට ඉඩ නොදිය යුතු ය.
19 ලෙවී 18:23; 20:15-16; ද්වි.නී. 27:21 “මෘගයකු
සමඟ මෛථුනයෙහි යෙදෙන්නා මරණයට පත් කළ
යුතු ම ය.
20 ද්වි.නී. 17:2-7 “සමිඳාණන් වහන්සේ හැර අන්
දෙවිවරුන්ට පුද පූජා කරන තැනැත්තා මරණයට පත්
කළ යුතු ය.
21 නික්ම 23:9; ලෙවී 19:33-34; ද්වි.නී. 24:17-18;
27:19 “නුඹලා විදේශිකයකුට අයුත්තක් වත්
හිරිහැරයක් වත් නොකළ යුතු ය. මන්ද, නුඹලා
මිසර දේශයෙහි විදේශිකයන් ව සිටි හෙයිනි.
22 නුඹලා කණවැන්දුම් ස්ත්‍රියකට වත්, අනාථ
දරුවකුට වත් හිරිහැර නොකළ යුතු ය. 23 නුඹලා
ඔවුන්ට හිරිහැර කොට ඔවුන් මට මොරගැසුවොත්
මම සැබැවින් ම ඔවුන්ගේ මොරගැසීමට සවන්
දෙමි. 24 එවිට මගේ උදහස ඇවිළී, මම කඩුවෙන්
නුඹලා නසන්නෙමි. නුඹලාගේ භාර්යාවෝ
කණවැන්දුම් ස්ත්‍රීහු ද, නුඹලාගේ දරුවෝ අනාථ
දරුවෝ ද වන්නෝ ය.
25 ලෙවී 25:35-38; ද්වි.නී. 15:7-11; 23:19-20
“නුඹලා මගේ සෙනඟ අතර සිටින දිළින්දකුට මුදල්
ණයට දුන්නොත්, පොළියට මුදල් දෙන අය මෙන්
නොහැසිරිය යුතු ය. නුඹලා බලයෙන් පොළියක් ද
නොගත යුතු ය. 26 ද්වි.නී. 24:10-13නුඹ උගසක්
මෙන් යමකුගේ වස්ත්‍රය ගන්නෙහි නම් ඉර බැස
යාමට පෙර එය ඔහුට ආපසු දිය යුතු ය. 27 මන්ද,
ඔහුට ඇත්තේ ඒ පොරෝණය පමණක් බැවිනි. ඔහු
තමාගේ ඇඟට පොරොවාගන්නේ ඒ වස්ත්‍රය වේ.
නැත්නම් ඔහුට නිදාගන්න ඇත්තේ කුමක් ද? ඔහු
මට මොරගසන විට මා අනුකම්පා සහගත බැවින්
ඔහුට සවන් දෙමි.
28 ක්‍රියා 23:5 “නුඹ, නුඹලාගේ දෙවියන්
වහන්සේට පරිභව නොකළ යුතු ය. නුඹලා
සෙනඟගේ අධිපතියකුට ද සාප නොකළ යුතු ය.
29 “නුඹ, ධාන්‍යවලින් ද මිදිරසින් ද මට දිය යුතු
පඬුරු පුද කිරීමට පමා නොවිය යුතු ය. නුඹලාගේ
පුතුන් අතර කුලුඳුලා මට දිය යුතු වේ.
30 නුඹලාගේ ගවයන් හා බැටළුවන් සම්බන්ධයෙන්
ද එලෙස ම කළ යුතුයි. වහු පැටියා දින හතක් මවු
ළඟ සිටි පසු අට වන දින නුඹලා ඌ මට දිය යුතු
ය.
31 ලෙවී 17:15 “නුඹලා මට ම කැපවූ මනුෂ්‍යයන්
විය යුතුයි. තවද, කෙතේ වන මෘගයන් විසින් මරනු
ලැබූ සතුන්ගේ මස් නුඹලා නොකෑ යුතු ය. ඒවා
බල්ලන්ට දැමිය යුතු ය.”

## යුක්තිය ඉටු කිරීම

23 නික්ම 20:16; ලෙවී 19:11-12; ද්වි.නී. 5:20
“නුඹලා අසත්‍ය ප්‍රකාශයක් නොකළ යුතු ය.
බොරු සාක්ෂි දෙමින් වරදකරුවකුට උදව් නොකළ
යුතු ය. 2 නපුරක් කිරීමට වැඩි දෙනාගේ පැත්ත
නොගත යුතු ය. නඩුවක දී යුක්තියට පිටුපා වැඩි
දෙනාගේ පැත්ත ගෙන සාක්ෂි නොදිය යුතු ය.
3 ලෙවී 19:15නඩුවක දී යමකු දිළින්දකු වන නිසා
ම ඔහුගේ පැත්ත ගෙන ක්‍රියා නොකළ යුතු ය.
4 ද්වි.නී. 22:14 “නුඹේ සතුරාගේ ගවයා හෝ
කොටළුවා හෝ මංමුළා වී ඇවිදිනු දුටුවොත්, නුඹ
ඔහු වෙතට ඌ ආපසු ගෙන යා යුතු ය. 5 නුඹට
වෛර කරන්නාගේ කොටළුවා උගේ බඩු තොගය
යට වැටී සිටිනු නුඹ දුටුවොත්, ඌ සිටින මාර්ගයෙන්
අහක් වී නොගොස්, ඌට උපකාර කළ යුතු ම ය.
6 ලෙවී 19:15; ද්වි.නී. 16:19 “නුඹලා අතර වසන
දිළින්දකුගේ නඩුවක දී ඔහුට අසාධාරණ ලෙස
ක්‍රියා නොකළ යුතුයි. 7 බොරු පැමිණිලි කිරීමෙන්
වැළකිය යුතු ය. නිදොස්, දැහැමි තැනැත්තා
මරණයට පත් නොකළ යුතු ය. මන්ද, මම
වරදකරුවන් නිදොස් නොකරන්නෙමි. 8 අල්ලස්
නොගත යුතු ය. අල්ලස් වනාහි සාධාරණ ලෙස
සිතීමේ බුද්ධිය අඳුරු කොට නිවැරදිකරුවන්ගේ නඩු
අවනඩු කිරීමට පොළඹවන දෙයකි.
9 නික්ම 22:21; ලෙවී 19:33-34; ද්වි.නී. 24:17-18;
27:19 “විදේශිකයකුට පීඩා නොකරන්න. මන්ද,
නුඹලා මිසර දේශයෙහි විදේශී ව සිටි හෙයින්
විදේශිකයන් විඳින දේ දන්නහු ය.”

## සත් වන අවුරුදු විශ්‍රාමය සහ සබත් නිවාඩුව

10 ලෙවී 25:1-7 “අවුරුදු හයක් නුඹේ ඉඩම්
වගාකොට ඒවායේ අස්වැන්න නෙළාගත යුතු ය.
11 එහෙත් සත් වන අවුරුද්දේ දී ඒවා පුරන් ව
තිබෙන්නට හැර, ඒවායේ ඇති වන පලදාව නොගත
යුතු ය. එවිට නුඹේ සෙනඟ අතර සිටින දිළිඳුන්ට
ඒවා කන්න පුළුවන. ඔවුන් ඉතිරි කරන දේ වන
මෘගයන්ට කන්න පුළුවන. නුඹේ මිදි වතු හා ඔලීව
වතු සම්බන්ධයෙන් ද එලෙසෙ කළ යුතු ය. 12 නික්ම
20:9-11; 31:15; 34:21; 35:2; ලෙවී 23:3; ද්වි.නී.
5:13-14දින හයක් නුඹ වැඩ කොට, හත් වන දින
නුඹේ ගවයාට සහ කොටළුවාට විවේකය ලැබෙන
පිණිසත්, නුඹේ දාසියගේ පුතුට හා විදේශිකයාට
ශරීර ශක්තිය ලැබෙන පිණිසත් නුඹ විවේක ගත
යුතු ය. 13 මා නුඹට කී සියල්ලට නුඹේ අවධානය
යොමු කළ යුතු ය. අන් දෙවිවරුන්ගේ නාම සඳහන්
නොකරන්න. ඒවා කටින් වත් පිට නොකළ යුතු ය.”

## මහා මංගල්‍ය තුන

(නික්ම 34:18-26;ද්වි.නී. 16:1-17)

14 “අවුරුද්දකට තුන් වරක් මා උදෙසා මංගල්‍යයක්
පැවැත්විය යුතු ය. 15 නික්ම 12:14-20; ලෙවී 23:6-8;
ගණන් 28:17-25නුමුහුන් රොටි මංගල්‍යය පැවැත්විය

යුතු ය. මා අණ කළ පරිදි ආබීබ් මාසයේ නියමිත
කාලයේ දී දින හතක් නුමුහුන් රොටී අනුභව කළ
යුතු ය. මන්ද, නුඹලා මිසර දේශයෙන් නික්ම ආයේ
ඒ මාසයේ ය. එහෙත්, කිසිවෙකු හිස් අතින් මා
ඉදිරියට නොපැමිණිය යුතු ය. 16 ලෙවී
23:15-21,39-43; ගණන් 28:26-31තවද, නුඹ කෙතේ
වගා කළ ධාන්‍යවල නාඹුල් පල නෙළෙන විට අගස්
පල මංගල්‍යය පැවැත්විය යුතුයි. අවුරුද්ද අවසානයේ
දී වතුපිටිවලින් නුඹේ පලතුරු රැස් කරන විට
අස්වැන්නේ මංගල්‍යය සිදු කළ යුතු ය.
17 අවුරුද්දකට තුන් වරක් නුඹේ පිරිමින් සියලු දෙනෙ
සමිඳාණන් වහන්සේ වන මා ඉදිරියෙහි පෙනී සිටිය
යුතු යි.
18 “නුඹ මට පූජා කරන යාග පූජාවේ ලේ, මුහුන්
රොටී සමඟ ඔප්පු නොකළ යුතුයි. තවද, මට පූජා
කරන යාග පූජාවේ තෙලෙ ද උදය දක්වා ඉතිරි
නොකළ යුතු ය.
19 නික්ම 34:26; ද්වි.නී. 14:21; 26:2 “නුඹේ දෙවි
සමිඳාණන් වහන්සේ වන මාගේ ගෘහයට නුඹේ
ඉඩම්වලින් හොඳ ම නාඹුල් පල ගෙනා යුතු ය.
19 “එළු පැටවෙකු උගේ මවගේ කිරෙන් නොපිසිය
යුතු ය.”

### පොරොන්දු සහ උපදෙස්

20 “බලන්න, මාර්ගයේ දී නුඹලා ආරක්ෂා
කිරීමටත්, මා සූදානම් කළ ස්ථානයට නුඹලා ගෙනෙ
ඒමටත් නුඹලාට පෙරටුවෙන් මම දූතයෙකු
යවන්නෙමි. 21 ඔහුට ගෞරව කරන්න, ඔහුගේ
හඬට කීකරු වන්න. ඔහුට විරුද්ධ ව කැරලි
නොගසන්න. මාගේ නාමයෙන් ඔහු ක්‍රියා කරන
බැවින් ඔහු නුඹලාගේ වැරදි කමා නොකරන්නේ ය.
22 එහෙත්, නුඹලා ඔහුගේ හඬට කීකරු වී මා
කියන සියල්ල කරන්නහු නම් මම නුඹලාගේ
සතුරන්ට සතුරෙකේ ද නුඹේ විරුද්ධවාදීන්ට
විරුද්ධවාදියෙකේ ද වන්නෙමි. 23 මාගේ දූතයා
නුඹලාට පෙරටුව ගොස් අමෝරිවරුන්, හිත්තීවරුන්,
පෙරිස්සිවරුන්, කානානිවරුන්, හිවීවරුන් හා
ජබූසිවරුන් වෙතට නුඹලා පමුණුවන්නේ ය. මම ද
ඔවුන් වනසාලමි. 24 නුඹලා ඔවුන්ගේ දෙවිවරුන්ට
හිස නමා වැඳුම්පිදුම් නොකළ යුතු ය. ඔවුන් ක්‍රියා
කරන ලෙසෙ ක්‍රියා නොකළ යුතු ය. තවද, නුඹලා
ඔවුන්ගේ රූප සහමුලින් ම වනසා, ඔවුන්ගේ
ශිලාස්තම්භ කඩා බිඳදැමිය යුතු ය. 25 නුඹලාගේ
දෙවි සමිඳාණන් වහන්සේට නුඹලා වැඳුම්පිදුම් කළ
යුතු ය. මම ආහාර පාන දී නුඹලාට ආශීර්වාද
කරමින්, නුඹලා අතරින් ලෙඩ රෝග දුරු කරමි.
26 නුඹලාගේ දේශයේ කිසි ම ස්ත්‍රියක ගබ්සා
නොවනු ඇත; වඳ ස්ත්‍රියක නොවනු ඇත. මම
නුඹලාට දිගු කලක් ජීවත් වීමට ඉඩ දෙමි.
27 “මම නුඹලාට පෙරටුව භීතිය හට ගන්වා,
නුඹලාට මුණගැසෙනෙ සියලු සෙනඟ වියවුල්
කරවන්නෙමි, නුඹලාගේ සියලු සතුරන් නුඹලාට
පිටුපා දුවන්නට සලසමි. 28 නුඹලා වෙතින් හිවීවරුන්,
කානානිවරුන් හා හිත්තීවරුන් පන්නා දමන පිණිස
නුඹලාට පෙරටුව මම දෙබරුන් යවන්නෙමි. 29 එක
අවුරුද්දකින් මම ඔවුන් නුඹ වෙතින් පන්නා
නොදමන්නෙමි. මන්ද, එසේ කළහොත් රට පාළු වනු
ඇත; වන මෘගයන් ද වැඩි වීමෙන් නුඹලාට අවාසි
වනු ඇත. 30 නුඹලා වර්ධනය වී දේශය අයිති
කරගන්නා තෙක් මම ටිකින් ටික නුඹලා වෙතින්
ඔවුන් පන්නා දමන්නෙමි. 31 නුඹලාගේ දේශ
සීමාවන් රතු මුහුදේ සිට මධ්‍යධරණී මුහුද දක්වා ද
පාළුකරයේ සිට යුප්‍රටීස් ගඟ දක්වා ද විශාල
කරන්නෙමි. එම දේශයේ වැසියන් නුඹලා අතට
පාවා දෙන්නෙමි. නුඹලා ද නුඹලා වෙතින් ඔවුන්
පන්නා දමන්නහු ය. 32 නුඹලා ද ඔවුන් සමඟ හෝ
ඔවුන්ගේ දෙවිවරුන් සමඟ හෝ කිසි ගිවිසුමක්
නොකළ යුතු ය. 33 මට විරුද්ධ ව පව් කිරීමට ඔවුන්
නුඹලා නොපොළඹවන පිණිස නුඹලාගේ දේශයෙහි
ඔවුන් පදිංචි නොවිය යුතු ය. නුඹලා ඔවුන්ගේ
දෙවිවරුන්ට වැඳුම්පිදුම් කළහොත් එය නුඹලාට
මලපතක් වන්නේ ම ය.”

### ගිවිසුම ස්ථිර කිරීම

24 තවද, උන් වහන්සේ මෝසෙස්ට කතා
කොට, “නුඹ ද ආරොන් ද නාදාබ් ද අබීහු ද
ඉශ්රායලේවරුන්ගේ ප්‍රජා මූලිකයන්ගෙන්
හැත්තෑදෙනෙකු ද සමිඳාණන් වහන්සේ වන මා
වෙත කන්දට නැග, දුරින් සිට නමස්කාර කරන්න.
2 මෝසෙස් පමණක් මට ළං විය යුතු ය. සෙස්සෝ
ළං නොවිය යුත්තාහ. සෙනඟ ද කන්දට නොනැංග
යුතු ය”යි වදාළ සේක.
3 මෝසෙස් ද ඇවිත් සමිඳාණන් වහන්සේගේ
සියලු ආඥා හා නියෝග සෙනඟට දැන්වී ය. සියලු
සෙනඟ ද එක හඬින් උත්තර දෙමින්, “සමිඳාණන්
වහන්සේගේ ආඥා සියල්ල ම අපි ඉටු
කරන්නෙමු”යි කී හ. 4 ඉන්පසු ඔහු උන්
වහන්සේගේ ආඥා සියල්ල ම ලියා තැබී ය. පසු
දින අලුයම ඔහු නැඟිට, කන්ද පාමුල පූජාසනයක් ද
ඉශ්රායලේ ගෝත්‍ර දොළොස අනුව ශිලාස්තම්භ
දොළහක් ද ඉදි කළේ ය. 5 පසුව ඔහු ඉශ්රායලේ
ජනයා අතරෙන් තරුණයන් යැවී ය. ඔව්හු දවන යාග
පූජා හා ගවයන් මරා, සහභාගිකමේ පූජා ද
සමිඳාණන් වහන්සේට ඔප්පු කළහ. 6 මෝසෙස්
සතුන්ගේ ලෙයින් දෙකෙන් කොටසක් ගෙන එය
බඳුන්වල දැමී ය, ලෙයින් අඩක් පූජාසනය මත
ඉස්සේ ය. 7 පසුව ඔහු ගිවිසුම් පොත රැගෙන
සෙනඟට ඇසෙන ලෙස එය කියවී ය. ඔව්හු ද
පිළිතුරු දෙමින්, “සමිඳාණන් වහන්සේ වදාළ සියල්ල
අපි ඉටු කරන්නෙමු”යි කී හ. 8 මතෙ 26:28; මාක්
14:24; ලූක් 22:20; 1 කොරි 11:25; හෙබ්රෙ 9:19-20;
හෙබ්රෙ 10:29එවිට මෝසෙස් ලේ රැගෙන, සෙනඟ
මත ඉසිමින්, “මයෙ වනාහි සමිඳාණන් වහන්සේ
මකේ සියලු ආඥා ඔබට දෙමින්, ඔබ සමඟ කළ
ගිවිසුම ස්ථිර කරන ලේ ය”යි පැවසී ය.

9 මෝසෙස්, ආරොන්, නාදාබ් සහ අබිහු ද
ඉශ්රායලේවරුන් අතර මූලිකයන්ගෙන්
හැත්තෑදෙනෙක් ද කන්දට නැග,
10 ඉශ්රායලේවරුන්ගේ දෙවියන් වහන්සේ දර්ශනය
කළහ. උන් වහන්සේගේ සිරි පා යට නිල් අහස්
තලයේ කාන්තිය බඳු නීල මාණික්‍යමය පදික
වේදිකාවක් වැනි දයෙක් විය. 11 එහෙත්, උන්
වහන්සේ ඉශ්රායලේ ජනයා අතර මේ නායකයන්ට
අනතුරක් නොකළ සේක. ඔව්හු උන් වහන්සේ දුටු
පසු ආහාර පාන අනුභව කළහ.

## මෝසෙස් සීනයි කන්දට නැඟීම

12 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට,
"කන්දට නැග මා වෙත පැමිණ මෙහි නැවතී
සිටින්න. නුඹ සෙනඟට උගන්වන පිණිස මා ලියූ
ආඥා හා අණපණත් අඩංගු ගල් පුවරු මම නුඹට
දෙමි"යි වදාළ සේක. 13 මෝසෙස් නැඟිට තම
සේවක ජෝෂුවා සමඟ ශුද්ධ කන්දට නැංගේ ය.
14 තවද, ඔහු ප්රජා මූලිකයන් අමතමින්, "අප යළි
ඔබ වෙත පැමිණෙන තෙක් මෙහි බලා සිටින්න.
මෙන්න, ආරොන් ද හූර් ද ඔබ සමඟ සිටිති.
විසඳීමට ප්රශ්නයක් යමකුට ඇත්නම් ඔහු ඔවුන්
වෙත යා යුතු ය"යි කීවේ ය.
15 මෝසෙස් ඉන්පසු කන්දට නැංගේ ය. වලාකුළ
කන්ද වසාගත්තේ ය. 16 සීනයි කන්ද මත
සමිඳාණන් වහන්සේගේ මහිමාලංකාරය රැඳී
පැවතිණි. වලාකුළ ද දින හයක් එය වසාගති. හත්
වන දින උන් වහන්සේ වලාකුළ මැදින් මෝසෙස්ට
හඬගැසූ සේක. 17 ඉශ්රායලේ ජනයාගේ ඇස්
හමුවෙහි සමිඳාණන් වහන්සේගේ මහිමාලංකාරය
ඇවිලමෙන් නඟින ගිනි ජාලාවක් මෙන් දිස් විය.
18 ද්වි.නී. 9:9මෝසෙස් ද වලාකුළ මැදට ගොස්
කන්දට නැංගේ ය. ඔහු දවල් හතළිහක් හා රාත්රි
හතළිහක් කන්දෙහි සිටියේ ය.

## ශුද්ධස්ථානය සඳහා පඬුරු
(නික්ම 35:4-9)

25 සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතා,
මෙසේ වදාළ සේක: 2 "මට පඬුරක්
ගෙනෙන ලෙස ඉශ්රායලේ ජනයාට කියන්න. සිය
කැමැත්තෙන් ම දෙන සෑම දෙනාගෙන් ම නුඹ ඒ
පඬුරු ගත යුතු ය. 3 ඔවුන්ගෙන් ගත යුතු පඬුරු නම්
රන්, රිදී සහ ලෝකඩ ද, 4 නිල් පාට, දම් පාට සහ
තද රතු පාට නූල් ද, සිහින් හණ රෙදි හා එළු ලොම්
ද, 5 රතු සායම් පෙවූ බැටළු හම්, පදම් කළ හම් සහ
ෂිටිම් යන ලී ද, 6 පහන්වලට තෙල් ද, ආලේප
තෙලෙයට හා සුවඳ දුම් පූජාව සඳහා සුගන්ධ ද්රව්‍ය
ද, 7 ඒපොද් නම් ශුද්ධ වස්ත්රය සහ ළය වැස්ම
සඳහා නබමාණික්‍ය හා වෙනත් මැණික් ද යන
මේවා ය. 8 තවද, නුඹලා අතර වාසය කිරීම පිණිස
මට ඔවුන් ශුද්ධස්ථානයක් සෑදිය යුතු ය. 9 මා නුඹට
පෙන්වන සැලැස්ම අනුව මණ්ඩපය ද එහි සියලු
උපකරණ ද සෑදිය යුතු ය."

## ගිවිසුම් කරඬුව
(නික්ම 37:1-9)

10 "තවද, ඔවුන් ෂිටිම් ලීයෙන් සෙන්ටිමීටර් එකසිය
දහයක් දිග, සෙන්ටිමීටර් හැටහයක් පළල,
සෙන්ටිමීටර් හැටහයක් උස කරඬුව සෑදිය යුතු ය.
11 එහි ඇතුළත ද පිටත ද තනි රත්රනින් ආලේප
කොට, එය වටා රන් ලීස්තරයක් සෑදිය යුතුයි.
12 තවද, එය සඳහා රන් වළලු හතරක් වාත්තු
කොට, එක පැත්තකට වළලු දෙකෙක් ද අනික්
පැත්තට වළලු දෙකෙක් ද බැගින් එහි කකුල් හතරේ
ඒවා දැමිය යුතු ය. 13 ෂිටිම් ලීයෙන් පොලු සාදා ඒවා
රනින් ආලේප කොට 14 කරඬුව උසුලාගෙන යන
පිණිස එහි දෙපැත්තේ ඇති වළලු තුළට ඒ පොලු
දැමිය යුතු ය. 15 කරඬුවේ වළලු තුළ ම පොලු
තිබෙන්නට හැරිය යුතු ය. ඒවා එයින් ඉවත් නොකළ
යුතු ය. 16 පසුව මා නුඹට දෙන සාක්ෂි ගල් පුවරු
දෙක එම කරඬුවේ තැන්පත් කළ යුතු ය.
17 හෙබ්රෙ 9:5 "තවද, නුඹ සෙන්ටිමීටර් එකසිය
දහයක් දිග, සෙන්ටිමීටර් හැටහයක් පළල
කරුණාසනයක් තනි රත්රනින් සෑදිය යුතු ය.
18 කරුණාසනයේ දෙකෙළවරහෙි රනින් තළා සෑදූ
කෙරෙබ්වරුන් දෙදෙනෙකු වාත්තු කළ යුතු ය. 19 එක
කෙළවරක එක කෙරෙබ්වරයෙක් ද අනික් කෙළවරේ
අනික් කෙරෙබ්වරයා ද සිටින සේ කරුණාසනය සමඟ
එකක් වන සේ ඔවුන් සවිකර එහි දෙකෙළවරහෙි
තැබිය යුතු ය. 20 කෙරෙබ්වරුන්ගේ පියාපත් ද උඩට
විහිදී කරුණාසනයට ඉහළින් එය වසා සිටින සේ
තිබිය යුතු ය. ඔවුන් එකිනෙකා මුහුණට මුහුණ ලා
බලා සිටින්නාක් මෙන්, කරුණාසනය දෙසට ඔවුන්ගේ
මුහුණු ද හරවා තිබිය යුතු ය. 21 තවද, නුඹ කරඬුව
මත කරුණාසනය තබා, කරඬුව තුළ, මා නුඹට දෙන
සාක්ෂි ගල් පුවරු දෙක තැන්පත් කළ යුතු ය. 22 මම
ද එහි දී නුඹ හමුවෙමි. කරුණාසනයට ඉහළින්
ගිවිසුම් කරඬුව මත සිටින කෙරෙබ්වරුන් දෙදෙනා
මැදින්, ඉශ්රායලේ ජනයා සඳහා සියලු ආඥා මම
නුඹට දන්වන්නෙමි."

## පිදූ රොටි තබන මේසය
(නික්ම 37:10-16)

23 "තවද, ෂිටිම් ලීයෙන්, සෙන්ටිමීටර් අසූඅටක් දිග,
සෙන්ටිමීටර් හතළිස්හතරක් පළල, සෙන්ටිමීටර්
හැටහයක් උස මේසයක් සෑදිය යුතු ය. 24 එය තනි
රත්රනින් ආලේප කොට එය වටේට රන්
ලීස්තරයක් සෑදිය යුතු ය. 25 තවද, එය වටේට
මිලිමීටර් හැත්තෑපහක් පළල ඇති පටියක් සවි
කොට, එය වටා රන් ලීස්තරයක් සෑදිය යුතු වේ.
26 රන් වළලු සතරක් ද සාදා මේසයේ කකුල්
සතරේ කොන් සතරහෙි ඒවා දැමිය යුතු ය.
27 මේසය උසුලාගෙන යෑම සඳහා පොලු දමන
වළලු, පටිය ළඟ ම තිබිය යුතු යි. 28 පොලු ද ෂිටිම්
ලීයෙන් සාදා, රනින් ආලේප කළ යුතු ය. මේසය
මේවායේ ආධාරයෙන් උසුලාගෙන යා යුතු ය.

29 එහි තබන තැටි ද කුසලාන ද කණෝඩි ද පානීය
පූජා දැමීමට ගන්න පාත්‍ර ද තනි රත්‍රනින් සෑදිය
යුතු ය. 30 ලෙවී 24:5-8තවද, නුඹ නිතර ම පිදුම්
රොටි මා ඉදිරියෙහි මේසය උඩ තැබිය යුතු වේ.”

### පහන් රුක
(නික්ම 37:17-24)

31 “තවද, නුඹ තනි රත්‍රන් පහන් රුකක් සෑදිය
යුතු ය. එහි අඩිය ද කඳ ද තැළූ රනින් තැනිය යුතු
වේ. එහි මල් ද මල් කැකුළු ද මල් පෙති ද ඊට
පෑස්සූ එක වස්තුවක් විය යුතු ය. 32 පහන් රුකේ
එක පැත්තක අතු තුනක් ද අනික් පැත්තේ අතු
තුනක් ද බැගින් එහි පැතිවලින් අතු හයක් විහිදී යා
යුතු ය. 33 එක් අත්තක කොෆ්ටම්බා වැනි මල්
තුනක් ද මල් කැකුළු හා මල් පෙති ද අනික් පැත්තේ
කොෆ්ටම්බා වැනි මල් තුනක් ද මල් කැකුළු හා මල්
පෙති ද බැගින් පහන් රුකින් විහිදෙන අතු හයේ ම
එලෙස ම විය යුතු ය. 34 පහන් රුකෙහි ද
කොෆ්ටම්බා වැනි මල් හතරක් ද ඒවායේ මල්
කැකුළු හා මල් පෙති ද විය යුතු ය. 35 පහන්
රුකෙහි අතු දෙකෙක් යට එක මල් කැකුළක් ද තවත්
අතු දෙකෙක් යට එක මල් කැකුළක් ද අනික් අතු
දෙක යට මල් කැකුළක් ද බැගින් ඉන් විහිදී යන අතු
හයේ ම එසේ විය යුතු ය. 36 මල් කැකුළු සහ අතු
පහන් රුක සමඟ ඒකාබද්ධ ව තිබිය යුතු යි. සියල්ල
ම තැළූ තනි රනින් කළ කර්මාන්තයක් විය යුතු ය.
37 “නුඹ ද පහන් රුක සඳහා පහන් හතක් සාදා,
ඒවායේ එළිය ඉදිරියට වැටෙන සේ පහන්වල
ආලෝකය සකස් කළ යුතු ය. 38 පහන් කතුරු ද
ඒවායේ තැටි ද රනින් විය යුතු ය. 39 පහන් රුක
සහ සියලු බඳුන් තැනීම සඳහා තනි රන්
කිලෝග්‍රෑම් තිස්පහක් පාවිච්චි කළ යුතු ය.
40 ක්‍රියා 7:44; හෙබ්‍රෙ 8:5කන්දේ දී නුඹට පෙන්වූ
සැලැස්ම අනුව මේවා සෑදීමට වග බලාගත යුතු ය.”

### දේව මණ්ඩපය
(නික්ම 36:8-38)

26 “තවද, නුඹ නිල් පාට, දම් පාට සහ තද රතු
පාට නූල්වලින් ද සිහින් ව කටින ලද හණ
පිළියෙන් ද කළ තිර දහයකින් මණ්ඩපය සෑදිය යුතු
වේ. ඒවායේ කෙරුබ්වරුන්ගේ රූප ගෙත්තම් කොට
තිබිය යුතු වේ. 2 එක තිරයක දිග මීටර් දොළහක්
ද පළල මීටර් දෙකෙක් ද විය යුතු යි. ඒ තිර සියල්ල
ම එක ප්‍රමාණයට තිබිය යුතු වේ. 3 තිර පහක්,
එකටකෙ සම්බන්ධ කළ යුතු ය. අනිත් තිර පහ ද
එසේ ම ය. 4 මෙසේ සම්බන්ධ කළ තිරවල අන්තිම
තිරයේ එක වාටියක නිල් පාට පිළියෙන් ගාංචු සෑදිය
යුතු ය. අනික් තිරවල අන්තිම තිරයේ ද එලෙස කළ
යුතු වේ. 5 පළමු තිරයේ ගාංචු පණහක් සෑදිය යුතු
අතර, දෙවෙනුව යා කළ තිරවල වාටියේ ද පළමු
වැන්නේ ගාංචු හා එකිනෙකට මුහුණ ලා තිබෙන
අයුරින් ගාංචු පණහක් සෑදිය යුතු යි. 6 තවද නුඹ
රන් කොකු පණහක් සාදා, එක මණ්ඩපයක් වන
පරිදි ඒ කොකුවලින් තිර එකටකෙ සම්බන්ධ කළ
යුතු වේ.
7 “මණ්ඩපයට උඩින් කූඩාරමක් වන පිණිස එළු
ලොම්වලින් තිර එකොළහක් සෑදිය යුතු ය. 8 එක
තිරයක දිග මීටර් දහතුනක් ද පළල මීටර් දෙකෙක් ද
විය යුතු අතර, තිර එකොළහ ම එක ප්‍රමාණ විය
යුතු වේ. 9 තිර පහක් හා තිර හයක් වෙනෙ වෙනෙ ම
එකටකෙ සම්බන්ධ කොට, හය වන තිරය දෙකෙට
නමා මණ්ඩපයේ ඉස්සරහ කොටසේ එල්ලා
වැටෙන්නට සැලැස්විය යුතු ය. 10 සම්බන්ධ කළ තිර
පහේ අන්තිම තිරයේ වාටියේ ගාංචු පණහක් ද
අනික් තිරවල අන්තිම තිරයේ වාටියේ ගාංචු
පණහක් ද සෑදිය යුතු ය. 11 පසුව ලෝකඩ කොකු
පණහක් සාදා ඒ කොකු ගාංචුවලට අමුණා,
මණ්ඩපය එකක් වන සේ එකට සම්බන්ධ කළ යුතු
යි. 12 මණ්ඩපයේ තිරවලින් වැඩි මනත් ව ඉතිරි
වන තිර බාගය, මණ්ඩපයේ පිටුපසින් එල්ලී තිබිය
යුතු ය. 13 මණ්ඩපයේ තිරවල දිගින් දෙපැත්තේ
ඉතිරි වන සසේසනේ, එක පැත්තකින් සෙන්ටිමීටර්
පණහක් ද අනික් පැත්තෙන් සෙන්ටිමීටර් පණහක් ද
මණ්ඩපය වැසෙන පිණිස එල්ලෙන්නට හැරිය යුතු ය.
14 තවද, මණ්ඩපයට රතු සායම් පෙවූ බැටළු
හම්වලින් ආවරණයක් ද එය උඩ අතුරන පිණිස
සියුම් හම්වලින් ආවරණයක් ද සෑදිය යුතු වේ.
15 “තවද, මණ්ඩපය සඳහා ෂිටිම් ලීවලින් ලෑලි
ඉරා, ඒවා කෙළින් සිටුවිය යුතු ය. 16 එක ලෑල්ලක
දිග මීටර් හතරක් ද පළල සෙන්ටිමීටර් හැටහයක් ද
විය යුතු වේ. 17 එක ලෑල්ලකට ඒවා එකටකෙ යා
කිරීම පිණිස, කුඩිම්බි දෙකෙක් තිබිය යුතු ය.
මණ්ඩපයේ සෑම ලෑල්ලක් ම මෙසේ සකස් කළ යුතු
වේ. 18 මණ්ඩපයට ලෑලි ඉරා සාදන විට, දකුණු
දිශාවට මූණ ලා එහි දකුණු පැත්තට ලෑලි විස්සක්
සෑදිය යුතු ය. 19 පළමු වන ලෑල්ලේ කුඩිම්බි දෙක
දැමීමට තවු දෙකෙක් ද, දෙ වන ලෑල්ලේ කුඩිම්බි
දෙක දැමීමට තවු දෙකෙක් ද බැගින් ලෑලි විස්ස යට
රිදී තවු හතළිහක් සෑදිය යුතු වේ. 20 මණ්ඩපයේ
උතුරු දිශාවට ඇති අනික් පැත්තට ද ලෑලි විස්සක්
සෑදිය යුතු අතර, 21 එක එක ලෑල්ල යට තවු දෙක
බැගින් ඒවාට රිදී තවු හතළිහක් සෑදිය යුතු වේ.
22 බටහිර දිශාවට ඇති මණ්ඩපයේ පිටුපසට ලෑලි
හයක් සෑදිය යුතු ය. 23 මණ්ඩපයේ පිටුපස
කොන්වලට ලෑලි දෙකෙක් ද සෑදිය යුතු අතර, 24 මේ
ලෑලි ඒවායේ පහත කොටස්වල සිට මුදුනේ පළමු
වන වළල්ල දක්වා යා කළ යුතු ය. කොන් දෙකේ
තබන ලෑලි දෙකට ද එලෙස කළ යුතු ය. 25 මෙසේ
එක එක ලෑල්ලට තවු දෙක බැගින් රිදී තවු
දහසයක් සහිත ලෑලි අටක් ඇති වේ.
26 “තවද, මණ්ඩපයේ එක පැත්තක තිබෙන
ලෑලිවලට ෂිටිම් ලීවලින් හරස් පොලු පහක් ද සෑදිය
යුතු යි. 27 මණ්ඩපයේ අනික් පැත්තේ ලෑලිවලට
තව හරස් පොලු පහක් ද මණ්ඩපයේ පිටුපස,
එනම්, බටහිර අංශයේ ලෑලිවලට හරස් පොලු
පහක් ද සෑදිය යුතු යි. 28 ලෑලිවල මැදින් හරස් ලීය
එක කොනක සිට අනික් කොන දක්වා දිගට ම

තිබිය යුතු වේ. 29 තවද, ලෑලි රනින් ආලේප කොට
හරස් ලී දැමීමට රන් මුදු සාදා හරස් ලී ද රනින්
ආලේප කළ යුතු ය. 30 මෙසේ කන්දේ දී නුඹට
පෙන්වූ සැලැස්ම අනුව මණ්ඩපය ඉදි කළ යුතු වේ.”

## මණ්ඩපයේ තිරය

31 “නුඹ නිල් පාට, දම් පාට හා තද රතු පාට
ලොම්වලින් හා සිහින් ව කටින ලද හණ පිළියෙන්
තිරයක් සෑදිය යුතු ය. එහි ද කෙරුබ්වරුන්ගේ රූප
ගෙත්තම් කොට තිබිය යුතු වේ. 32 පසුව එය, රිදී
තවු හතරක් සවි කළ රන් කොකු සතරක් ඇති, රන්
ආලේප කළ, ෂිටීම් කණු සතරක එල්ලිය යුතු ය.
33 හෙබ්රෙ 6:19; 9:3-5තිරය කොකුවලට යටින්
එල්ලා, තිරයට පිටුපස ගිවිසුම් කරඬුව තැබිය යුතු
වේ. මෙලෙස තිරය, ශුද්ධස්ථානය,
අතිශුද්ධස්ථානයෙන් වෙන් කරනු ඇත. 34 තවද,
අතිශුද්ධස්ථානයේ ඇති ගිවිසුම් කරඬුව උඩ
කරුණාසනය තැබිය යුතු යි. 35 තිරයට පිටතින්
මේසය ද උතුරු පැත්තට තබා ඇති මේ මේසයට
මූණ ලා මණ්ඩපයේ දකුණු පැත්තට පහන් රුක ද
තැබිය යුතු ය. 36 මණ්ඩපයේ දොරටුවට නිල් පාට,
දම් පාට සහ තද රතු පාට නූල්වලින් ද සිහින් ව
කටින ලද හණවලින් ද මල්වැඩ දැමූ කඩතුරාවක්
සෑදිය යුතු යි. 37 මේ කඩතුරාව සඳහා ෂිටීම්
ලීවලින් කණු පහක් ගෙන ඒවා රනින් ආලේප කළ
යුතු යි. ඒවාට රන් කොකු තිබිය යුතු අතර ඒවා සවි
කිරීමට ලෝකඩයෙන් තවු පහක් ද වාත්තු කළ යුතු
වේ.”

## පූජාසනය
(නික්ම 38:1-7)

27 “ෂිටීම් ලීවලින් මීටර් දෙකෙයි දශම දෙකෙක්
දිග, මීටර් දෙකෙයි දශම දෙකෙක් පළල, මීටර්
එකයි දශම තුනක් උස, හතරැස් පූජාසනයක් සෑදිය
යුතු යි. 2 එය සමඟ ඒකාබද්ධ ව සිටින සේ එහි
කොන් හතරේ අං හතරක් සාදා ඒවා ලෝකඩයෙන්
වැසිය යුතු යි. 3 තවද, එහි තෙල් සහිත අළු දැමීමට
බඳුන් හා හැඳි ද තලි ද අඬු ද ගිනිකබල් ද සෑදිය
යුතු වේ. මේ උපකරණ සියල්ල ම ලෝකඩයෙන්
නිර්මාණය කළ යුතු ය. 4 ඊට දැලක අයුරින් ලෝකඩ
මැස්සක් සාදා, එහි හතර කොන්හි ලෝකඩ වළලු
හතරක් දැමිය යුතු ය. 5 එය ද පූජාසනයේ පහළ
සිට පූජාසනයේ මැද හරියට වෙන තෙක්,
පූජාසනයේ ගැටිය යට තැබිය යුතු යි. 6 පූජාසනයට
ෂිටීම් ලීයෙන් පොලු සාදා ඒවා ලෝකඩයෙන් වැසිය
යුතු අතර, 7 පූජාසනය උසුලාගෙන යන විට එහි
දෙපැත්තේ තිබෙන පිණිස ඒවා වළලු තුළින් දැමිය
යුතු වේ. 8 පූජාසනය තුළ කුහරයක් ඇති වන සේ
එය ලෑලිවලින් සෑදිය යුතු යි. නුඹට කන්දේ දී
පෙන්නූ ප්‍රකාර නුඹ ඒවා තැනිය යුතු වේ.”

## මණ්ඩපයේ මළුව
(නික්ම 38:9-20)

9 “නුඹ මණ්ඩපය සඳහා මළුව ද තැනිය යුතු යි.
දකුණු දෙසට මූණ ලා, මළුවේ දකුණු පැත්තට, එක
පැත්තක් මීටර් හතළිස්හතරක් දිග, සිහින් ව කටින
ලද හණ පිළියෙන් තිර සෑදිය යුතු යි. 10 ඒවායේ
කුළුණු සහ තවු විස්සක් ලෝකඩයෙන් ද කණුවල
වළලු සහ පොලු රිදියෙන් ද විය යුතු ය. 11 එලෙස
ම මණ්ඩපයේ උතුරු පැත්තට මීටර් හතළිස්හතරක්
දිග තිර සකස් කළ යුතු ය. ඒවායේ කණු විස්ස හා
තවු විස්ස ලෝකඩයෙන් ද කණුවල වළලු සහ
පොලු රිදියෙන් ද විය යුතු ය. 12 මණ්ඩපයේ බටහිර
පැත්තට මීටර් විසිදෙකෙක් පළල තිර ද ඒවාට කණු
දහයක් හා තවු දහයක් ද සෑදිය යුතු ය.
13 නැගෙනහිර දෙසටත් මළුවේ පළල මීටර්
විසිදෙකෙක් විය යුතු ය. 14 දොරටුව සඳහා එක
පැත්තකට මීටර් හයයි දශම හයක් වූ තිර ද ඒවාට
කණු තුනක් හා තවු තුනක් ද සෑදිය යුතු වේ.
15 අනික් පැත්තටත් මීටර් හයයි දශම හයක් වූ තිර
ද ඒවාට කණු තුනක් හා තවු තුනක් ද සෑදිය යුතු ය.
16 තවද, දොරටුව සඳහා නිල් පාට, දම් පාට, ලා රතු
සහ තද රතු පාට නූල්වලින් ද සිහින් ව කටින ලද
හණවලින් ද වැඩදමා ගෙතූ, මීටර් නවයක් දිග
තිරයක් විය යුතු ය. ඊට කණු හතරක් හා තවු
හතරක් ද තිබිය යුතු ය. 17 මළුව වටේට ඇති කණු
සියල්ල ම රිදී පොලුවලින් යා කළ යුතු ය. ඒවායේ
වළලු රිදියෙන් ද තවු ලෝකඩයෙන් ද තැනිය යුතු ය.
18 මළුවේ දිග මීටර් හතළිස්හතරක් ද පළල මීටර්
විසිදෙකෙක් ද උස මීටර් දෙකෙයි දශම දෙකෙක් ද විය
යුතු ය. එහි තිර සිහින් ව කටින ලද හණවලින් ද
ඒවායේ තවු ලෝකඩයෙන් ද සෑදිය යුතු වේ.
19 මණ්ඩපයේ සියලු සේවාවලට භාවිතා කරන
සියලු උපකරණ ද මණ්ඩපයේත්, මළුවේත් ඇති
කූඤ්ඤ සියල්ල ද ලෝකඩයෙන් විය යුතු ය.”

## පහන් දල්වන තෙල්
(ලෙවී 24:1-4)

20 “පහන නිතර ම දැල්වමෙන් පවතින පිණිස,
පහනට පිරිසිදු ඔලීව තෙල් ගෙනෙන්නට නුඹ
ඉශ්රායලේ ජනයාට අණ කළ යුතු ය. 21 තිරයට
පිටතින් ගිවිසුම් කරඬුව ඉදිරිපිට සම්මුඛ
මණ්ඩපයෙහි, උදය පටන් සවස දක්වා සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි දැල්වෙන පිණිස ආරොන් සහ
ඔහුගේ පුත්රයන්, මේ පහන තැබිය යුතු වේ. මෙය
ඉශ්රායලේ ජනයා හා ඔවුන්ගේ පෙළපත් සදහට ම
පිළිපැදිය යුතු නියෝගයක් වන්නේ ය.”

## පූජක ඇඳුම්
(නික්ම 39:1-21)

28 “මට පූජක නිලයෙහි සේවය කරන පිණිස
ඉශ්රායලේ ජනයා අතරින් නුඹේ සහෝදරයා
වන ආරොන් ද ඔහු සමඟ ඔහුගේ පුත්රයන් වන

නාදාබ් සහ අබිහු ද එලයොසර් සහ ඊතාමාර් ද
කැඳවන්න. 2 නුඹේ සහෝදරයා වන ආරොන් සඳහා
ගරුත්වය හා අලංකාරය ගෙන දෙන ශුද්ධ වස්ත්‍ර
සෑදිය යුතු ය. 3 ආරොන් මට පූජක සේවය කරන
පිණිස ඔහු කැප කිරීමට අවශ්‍ය වස්ත්‍ර සෑදීමට මා
විසින් විශේෂ හැකියාවකින් පූර්ණ කොට තිබෙන,
සියලු දක්ෂ ශිල්පීන් හට නුඹ අණ කළ යුතු ය.
4 ඔවුන් සෑදිය යුතු වස්ත්‍ර නම්: ළය වැස්ම, ඒපොද්
නම් සැට්ටය, ලෝගුව, මල් වැඩ දැමූ කබාය, මකුටය
සහ බඳපටිය වේ. නුඹේ සහෝදර ආරොන් සහ
ඔහුගේ පුත්‍රයන් මට පූජක සේවය කරන පිණිස
ඔවුන්ට ශුද්ධ වස්ත්‍ර සෑදිය යුතු යි. 5 මේ සඳහා
රත්රන් ද, නිල්, දම් සහ තද රතු පාට නූල් ද සිහින්
හණ ද ශිල්පීන් පාවිච්චි කළ යුතු ය.”
6 “ඒපොද් නම් සැට්ටය, රනින් ද නිල්, දම්, තද රතු
පාට නූල්වලින් ද වැඩ දමා විසිතුරු කර සිහින් ව
කටින ලද හණවලින් සෑදිය යුතු ය. 7 එහි
දකෙළෙවරේ සම්බන්ධ කරන උර පටි දකෙ සවි කළ
යුතු ය. 8 එහි මනා සේ ගොතන ලද බඳපටිය ද
සැට්ටය සමඟ එකට සම්බන්ධ ව, එය මනේ ම
රනින් ද නිල්, දම්, තද රතු පාට නූල්වලින් හා සිහින්
ව කටින ලද හණවලින් ද සෑදූ එකක් විය යුතු ය.
9 තවද, නුඹ නබමාණික්‍ය දකෙක් ගෙන ඉශ්රායලේ
ජනයාගේ නාම ඒවායේ කැටයම් කළ යුතු වේ.
10 ඔවුන් උපන් පිළිවළෙ අනුව නම් හයක් එක
ගලක ද අනික් නම් හය අනිත් ගලේ ද විය යුතු යි.
11 මැණික්කරුවකෙුගේ දස්කම් පාමින්, මුද්‍රා කටෙම
මනේ ඉශ්රායලේ ජනයාගේ නාම ගල් දකෙේ
කැටයම් කොට, ඒවා රන් කවෙණෙිවල බැඳිය යුතු
ය. 12 ඉශ්රායලේ ජනයා සිහි කිරීමේ ගල් මනේ, ඒ
ගල් දකෙ ඒපොද් නම් සැට්ටයේ උර පටියේ ඔබ්බා
තැබිය යුතු ය. මලෙසෙ ආරොන් සමිඳාණන්
වහන්සේ ඉදිරියට තම උරහිස් දකෙ මත සිහිවීමක්
මනේ ඔවුන්ගේ නාම උසුලාගනෙ යනු ඇත. 13 නුඹ
රන් කවෙණෙි දකෙක් ද 14 ගතෙූ රන් මාල දකෙක් ද
සාදා කවෙණෙි දකෙට ගතෙූ මාල සම්බන්ධ කළ යුතු
ය.
15 “තවද, ඒපොද් නම් සැට්ටයේ කලාවට සම වන
පරිදි විනිශ්චයේ ළය වැස්ම ද ගතේතම් කොට
සෑදිය යුතු ය. එය රනින් ද නිල්, දම් සහ තද රතු
පාට නූල්වලින් ද සිහින් ව කටින ලද හණවලින් ද
සෑදිය යුතු ය. 16 එය හතරැස් ව දපෙටක් විය යුතු
අතර, එහි දිග සනේටිමීටර් විසිදකෙක් ද පළල
සනේටිමීටර් විසිදකෙක් ද විය යුතු ය. 17 එය පිට
මැණික් ගල් පේළි හතරක් බැඳිය යුතු ය. පළමු වන
පේළිය ලෝහිතාංකයක් ද පුෂ්පරාගයක් ද
මරකතයක් ද 18 දෙ වන පේළිය පච්ච මාණික්‍යයක්
ද නීල මාණික්‍යයක් ද වජ්‍රයක් ද 19 තෙ වන
පේළිය පද්මරාගයක් ද වර්ණකාන්තියක් ද අඹතසේ
ගලක් ද 20 සතර වන පේළිය රන් කාන්තියක් ද
නබමාණික්‍ය ද සූර්යකාන්තියක් ද විය යුතු ය. ඒවා
ද රන් කවෙණෙි වල බහා තිබිය යුතු ය. 21 ඒ
ගල්වල ඉශ්රායලේ ජනයාගේ නම් තිබිය යුතු වේ.
මලෙසෙ නම් ඇති ගල් දොළහේ, මුද්‍රා කැටයම්
මනේ, එක් එක් ගලක ගෝත්‍ර දොළහේ නම් එක
එක බැගින් තිබිය යුතු ය. 22 ළය වැස්ම සඳහා ද
තනි රනින් එකට ගතෙූ මාල සෑදිය යුතු යි. 23 ළය
වැස්මට රන් මුදු දකෙක් සාදා ඒ රන් මුදු දකෙ ළය
වැස්මේ දකෙළෙවරේ දැමිය යුතු යි. 24 ගතෙූ රන්
මාල දකෙ ළය වැස්මේ දකෙළෙවරේ ඇති මුදු
දකෙේ ඇමිණිය යුතු වේ. 25 ගතෙූ මාල දකෙේ
අනිත් දකෙළෙවර ද රන් කවෙණෙි දකෙට අමුණා,
ඒවා ඒපොද් සැට්ටයේ උර පටි පිට ඉස්සරහින්
තැබිය යුතු යි. 26 රන් වළලු දකෙක් ද සාදා, ළය
වැස්මේ පහත වාටියේ දකෙළෙවරේ ඒපොද්
සැට්ටය දසෙට වන පරිදි ඒවා ඇතුළු පැත්තනේ සවි
කළ යුතු ය. 27 තවත් රන් වළලු දකෙක් සාදා,
ඒපොද් සැට්ටයට යටින් දපෙත්තේ උර පටි දකෙ
පිට, මූට්ටුව ළඟ ගතේතම් කළ බඳපටියට උඩින්
දැමිය යුතු ය. 28 ළය වැස්ම ඒපොද් සැට්ටයේ
වළලුවලට නිල් පැහැති පටියකින් බැන්ද පිණිසත්,
එය ඒපොද් සැට්ටයනේ බුරුල් නොවී පවතින
පිණිසත් එහි වළලු ඒපොද් සැට්ටයේ වළලුවලට
නිල් පැහැති පටියකින් බැන්ද යුතු ය. 29 ආරොන් ද
ශුද්ධස්ථානයට ඇතුළු වන විට, සමිඳාණන් වහන්සේ
වන මා ඉදිරියහෙි නිතර පවතින සිහි වීමක් වන
පිණිස තම ළය මත ඇති විනිශ්චයේ ළය වැස්මහෙි
ඉශ්රායලේ ජනයාගේ නාම දැරිය යුතු ය. 30 ගණන්
27:21; ද්වි.නී. 33:8; එස්රා 2:63; නහෙෙ
7:65විනිශ්චයේ ළය වැස්මහෙි උරිම් සහ තුම්මිම්
යන පස ඇට දැමිය යුතු වේ. මලෙසෙ ආරොන්
සමිඳාණන් වහන්සේ වන මා ඉදිරියට පැමිණනෙ විට
ඒවා ඔහුගේ ළය මත තිබනෙු ඇත. ඔහු ද
සමිඳාණන් වහන්සේ වන මා ඉදිරියහෙි නිතර ම
ඉශ්රායලේ ජනයා විනිශ්චය කිරීමේ උපකරණ තම
ළය මත දැරිය යුතු වේ.”

## සළුව
(නික්ම 39:22-31)

31 “ඒපොද් සැට්ටයේ සළුව සම්පූර්ණයනේ ම නිල්
පාටින් සෑදිය යුතු ය. 32 එහි මැද හිස දැමීමට
සිදුරක් තිබිය යුතු අතර මේ සිදුර නොඉරනෙ
පිණිස, හම් කබායක සිදුර මනේ එය වට වියන ලද
වාටියක් තිබිය යුතු යි. 33 එහි පහළ මුළු වාටිය
දිගේ ම, නිල්, දම් සහ තද රතු පැහැති දළෙම් ගඩේ
ද ඒවා අතරතුර වටෝට ම රනින් කළ මිණි ගඩේ ද
සෑදිය යුතු ය. 34 මසෙේ සළුවේ වාටිය දිගේ ම රන්
මිණි ගඩේයක් හා දළෙම් ගඩේයක් ද බැගින්
මාරුවනේ මාරුවට ඇති වේ. 35 ආරොන් පූජක
සේවය ඉටු කරන කල එය පැළඳිය යුතු ය. මලෙසෙ
ඔහු ශුද්ධස්ථානයහෙි සමිඳුන් වන මා ඉදිරියට
පැමිණනෙ විට ද එයින් පිටත එන විට ද කිංකිණි
නාදය ඇසනෙු ඇත; ඔහු ද නොමැරනේනේ ය.”
36 “නුඹ තනි රනින් තහඩුවක් සාදා, එය මත මුද්‍රා
කැටයමක් මනේ ‘සමිඳාණන් වහන්සේට කැප ය’
යන වචන කැටයම් කළ යුතු අතර 37 නිල් පටියකින්
එය මකුටයේ ඉදිරිපසට වළේිය යුතු යි. 38 එය
ආරොන්ගේ නළල මත විය යුතු වේ. මලෙසෙ

ඉශ්රායලේ ජනයා මට කැප කරන ශුද්ධ පඬුරුවල
යම් අඩුපාඩුවක් තිබේ නම්, ඒවා ගැන ඔහු වග
කියනු ඇත. පුද පඬුරු සමිඳාණන් වහන්සේ වන මට
ප්රසන්න වන පිණිස, ආරොන් නිතර ම එය තම
නළල මත පැළඳිය යුතු යි.”
39 “සිහින් හණ නූලින් සැදි කබාය ගෙතේතම්
කොට, මකුටය ද සිහින් හණ නූලින් සාදා, බඳපටිය
ද ගෙතේතම් කොට සැදිය යුතු ය.
40 “ආරොන්ගේ පුත්රයන්ට ද ගරුත්වය හා
අලංකාරය ගෙන දෙන කබා ද බඳපටි ද ශිරස්ක ද
සැදිය යුතු ය. 41 මේ ඇඳුම් නුඹේ සහෝදර
ආරොන්ට හා ඔහුගේ පුත්රයන්ට පළඳවා, ඔවුන්
පූජක පදවියේ මට ආවතේව කරන පිණිස, ඔවුන්
ආලේප කොට, ඔවුන්ට පූජකවරය දී ඔවුන් කැප
කළ යුතු ය. 42 ඔවුන්ගේ නග්නභාවය වසන පිණිස
හණ නූලින් ඉඟ සිට කලවය දක්වා කලිසම් සැදිය
යුතු යි. 43 ආරොන් සහ ඔහුගේ පුත්රයන් මරණයට
හේතු වන අපරාධයකට පත් නොවන පිණිස,
සම්මුඛ මණ්ඩපයට ඇතුළු වන විට හෝ
ශුද්ධස්ථානයේ පූජාසනයට පූජක සේවා කිරීමට
ළඟා වන විට හෝ ඒවා ඇඳගෙන සිටිය යුතු ය.
මෙය ඔහුටත්, ඔහුගෙන් පසු ඔහුගේ පරම්පරාවටත්
සදහට ම වලංගු නියෝගයකි.”

## ආරොන් සහ ඔහුගේ පුතුන් කැප කිරීම
(ලෙවී 8:1-36)

29 “ආරොන් සහ ඔහුගේ පුත්රයන් පූජක
පදවියෙහි මට සේවා කිරීමට කැප කිරීමේ දී
නුඹ පිළිපැදිය යුතු පිළිවෙත මෙය වේ. කැළලක්
නැති ගව නාම්බෙකු ද බැටළුවන් දදෙනෙකු ද
ගන්න. 2 නුමුහුන් රොටි ද තෙලින් බදින ලද හා
තෙල් ගාන ලද නුමුහුන් රොටි ද ගන්න. මේවා
සිහින් තිරිඟු පිටියෙන් සැදිය යුතු වේ. 3 නුඹ ඒවා
එක පැසක දමා, ඒ පැස ද ගව නාම්බා සහ
බැටළුවන් දෙනා ද ගෙනා යුතු ය.
4 “ආරොන් සහ ඔහුගේ පුත්රයන් ද සම්මුඛ
මණ්ඩපයේ දොරටුව ළඟට ගෙනවුත්, ඔවුන්ට
ස්නානය කිරීමට සලසන්න. 5 ඉන්පසු නුඹ වස්ත්ර
ගෙන, ආරොන්ට කබාය ද ඒපොද් සැට්ටයේ සළුව ද
ඒපොද් සැට්ටය ද ළය වැස්ම ද පළඳවා, ඒපොද්
සැට්ටයේ ගෙතේතම් කළ බඳපටිය ඔහුගේ ඉණ වටා
දැමිය යුතු ය. 6 ඔහුගේ සිරස මත මකුටය ද එය
මත ශුද්ධ කිරීටය ද පැළඳවිය යුතු ය. 7 පසුව
ආලේප තෙලෙය ගෙන ඔහුගේ සිරස මත වත්
කරමින්, ඔහු ආලේප කළ යුතු වේ.
8 “ඉන්පසු ඔහුගේ පුත්රයන් ද කැඳවා ඔවුන්ට
කබා හඳවා, 9 බඳපටි ඉණ වටා සවි කොට,
ආරොන් සහ ඔහුගේ පුත්රයන් මත හිස් වැසුම් සවි
කරන්න. මසේ කිරීමෙන් සදහට ම වලංගු
නියෝගයක් ලෙස පූජක නිල පදවිය ඔවුන්ගේ
වන්නේ ය. මේ අයුරින් නුඹ ආරොන් සහ ඔහුගේ
පුත්රයන්ට පූජකවරය දිය යුතු ය.”

## පඬුරු පුද කිරීම

10 “නුඹ සම්මුඛ මණ්ඩපය ඉදිරිපිටට ගව නාම්බා
ගෙනා පසු ආරොන් සහ ඔහුගේ පුත්රයන් උගේ
හිස මත ඔවුන්ගේ අත් තැබිය යුතු ය. 11 සම්මුඛ
මණ්ඩපයේ දොරටුව ළඟ සමිඳාණන් වහන්සේ වන
මා ඉදිරියෙහි නුඹ ඌ මැරිය යුතු ය. 12 පසුව, උගේ
ලේ ගෙන, නුඹ ඇඟිල්ලෙන් එය පූජාසනයේ අං මත
තවරා, ඉතුරු ලේ සියල්ල පූජාසනයේ පාමුල ළඟ
වත් කළ යුතු යි. 13 අතුණු වසා ඇති තෙල ද
අක්මාව පිට ඇති තෙල් පිඬ ද වකුගඩු දෙක හා
එහි ඇති තෙල ද ගෙන පූජාසනය මත පිළිස්සිය යුතු
ය. 14 එහෙත්, ගව නාම්බාගේ මස් ද උගේ හම හා
ගොම ද කඳවුරින් පිටත ගින්නෙන් පිළිස්සිය යුතු ය.
එය පාප නසන පූජාවකි.
15 “නුඹ එක බැටළුවෙකු ගෙනා පසු ආරොන් සහ
ඔහුගේ පුත්රයන් උගේ හිස මත ඔවුන්ගේ අත්
තැබිය යුතු ය. 16 පසුව ඌ මරා, උගේ ලේ ගෙන
පූජාසනයේ සෑම පැත්තට ම ඉසිය යුතු ය.
17 ඉන්පසු ඌ කැබලි කොට, උගේ අතුණු සහ
කකුල් සෝදා, ඒවා උගේ මස් කැබලි ද හිස ද
සමඟ තැබිය යුතු ය. 18 එපී 5:2; පිලිප් 4:18මසේ
කළ පසු බැටළුවා මුළුමනින් ම පූජාසනය මත
පිළිස්සිය යුතු වේ. එය මට පුද කරන දවන යාග
පූජාවකි. ගින්නෙන් දැවූ, එය සමිඳාණන් වහන්සේ
වන මා වෙත නඟින සුමිහිරි පූජාවකි.
19 “නුඹ අනික් බැටළුවා ද ගෙනා පසු ආරොන් සහ
ඔහුගේ පුත්රයන් උගේ හිස මත ඔවුන්ගේ අත්
තැබිය යුතු ය. 20 ඉන්පසු ඌ මරා උගේ ලේ ගෙන
ආරොන්ගේ දකුණු කන් පෙත්තෙහි ද ඔහුගේ
පුත්රයන්ගේ දකුණු කන් පෙතිවල ද ඔවුන්ගේ
දකුණත්වල මාපට ඇඟිලිවල ද දකුණු පාදවල මාපට
ඇඟිලිවල ද තවරා, ඉතිරි ලේ පූජාසනයේ හැම
පැත්තට ම ඉසිය යුතු ය. 21 පසුව පූජාසනය මත
ඇති ලෙයින් ටිකක් ද ආලේප තෙලෙයෙන් ටිකක් ද
ගෙන ආරොන් මත ද ඔහුගේ වස්ත්ර මත ද
ඔහුගේ පුත්රයන් මත ද ඔහුගේ පුත්රයන්ගේ
වස්ත්ර මත ද ඉසිය යුතු ය. මලෙසෙ ඔහු ද ඔහුගේ
වස්ත්ර ද ඔහුගේ පුත්රයන් හා ඔවුන්ගේ වස්ත්ර ද
ඔහු සමඟ කැප වනු ඇත.
22 “තවද, බැටළුවාගේ තෙල් ද එනම්, තෙල් සහිත
වල්ගය ද අතුණු වසා ඇති තෙල ද අක්මාව පිට
ඇති සිවිය ද වකුගඩු දෙක ද ඒවායේ තෙල ද
දකුණු ගාතය ද ගත යුතු ය. මන්ද, ඒ බැටළුවා කැප
කරන ලද්දකේ. 23 තවද, සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි නුමුහුන් රොටි ඇති පැසෙන් රොටියක් ද
තෙලින් බැදි රොටියක් ද තුනී රොටි පෙත්තක් ද
ගෙන, 24 මේ ආහාර සියල්ල ආරොන් හා ඔහුගේ
පුතුන්ගේ අත්වල තබා, සමිඳාණන් වහන්සේ වන
මා ඉදිරියෙහි පිළිගැන්වීමේ පිළිවෙත කරවා, ඒවා පුද
කිරීමට සැලැස්විය යුතු ය. 25 ඉන්පසු නුඹ ඔවුන්ගේ
අත්වලින් ඒවා ගෙන පූජාසනයේ දවන යාග පූජාවක්
මත සමිඳාණන් වහන්සේ වන මට සුවඳැති පූජාවක්

මනේ එය පිළිස්සිය යුතු ය. එය සමිඳාණන්
වහන්සේ වන මා වෙත නඟින ගින්නෙන් දැවූ
පූජාවකි. 26 නුඹ ද ආරොන්ට පූජකවරය දීම සඳහා
ගත් බැටළුවාගේ ළපැත්ත ගෙන සමිඳාණන්
වහන්සේ වන මා ඉදිරියෙහි පිළිගැන්වීමේ පිළිවෙත
කරමින් එය පුද කළ යුතු වේ. එය ඔබට හිමි
කොටස වන්නේ ය. 27 ආරොන්ට සහ ඔහුගේ
පුතුන්ට පූජකවරය දීම සඳහා ගත් බැටළුවාගේ
ළපැත්ත ද පුදන ලද උගේ ගාතය ද ගෙන,
පිළිගැන්වීමේ පිළිවෙත ඉටු කරමින් නුඹ ඒවා කැප
කළ යුතු ය. 28 සදහට ම වලංගු නියෝගයක් ලෙස,
ඉශ්රායලේ ජනයාගෙන් ගත යුතු, ආරොන්ට සහ
ඔහුගේ පුතුන්ට හිමි කොටස එය වනු ඇත. එය
වනේ කරන ලද කොටසකි: ඉශ්රායලේ ජනයා
තමන්ගේ සහභාගි වීමේ පූජාවල දී වනේ කළ
කොටසකි. එය ඔවුන් සමිඳාණන් වහන්සේ වන මට
පුද කරන විශේෂ පූජාව වනු ඇත.
29 "ආරොන්ගේ ශුද්ධ වස්ත්‍ර, ඔහුගෙන් පසු
ඔහුගේ පුත්‍රයන්ට හිමි වනු ඇත. ඔවුන් ඒවා පැළඳ
ආලේපනය හා පූජකවරය ලැබිය යුතු යි.
30 ආරොන්ගේ පුත්‍රයන් අතරින්, ඔහුගේ පූජක
පදවියට පත් වන තැනැත්තා ශුද්ධස්ථානයේ සේවා
කිරීම සඳහා සම්මුඛ මණ්ඩපයට ඇතුළු වන විට
සත් දවසක් මේ වස්ත්‍ර පැළඳිය යුතු ය."

## ශුද්ධ භෝජනය

31 "පූජකවරය දීම සඳහා පුද කළ බැටළුවා ගෙන,
පවිත්‍ර ස්ථානයක උගේ මාංසය පිසිය යුතු ය.
32 සම්මුඛ මණ්ඩපයේ දොරටුව ළඟ ආරොන් සහ
ඔහුගේ පුත්‍රයන් ද බැටළුවාගේ මස් සහ පැසේ
ඇති රොටි වැළඳිය යුතු ය. 33 ඔවුන් පූජකවරය
ලැබීමේ දී හා ඔවුන් කැප කිරීමේ දී, ඔවුන්ගේ
පාපවලට කමාව ලබාගැනීම සඳහා ගත් දේවල් ද
ඔවුන් වැළඳිය යුතු ය. එහතේ, ඒවා ශුද්ධ බැවින්,
ඔවුන් හැර වනෙ කිසිවකෙු ඒවා නොවැළඳිය යුතු ය.
34 පූජකවරය දීමේ දී ගත් මස්වලින් හා රොටිවලින්
කිසිවක් උදය දක්වා ඉතිරි වුවහොත්, එය ගින්නෙන්
පිළිස්සිය යුතු වේ. ඒවා ශුද්ධ බැවින් නොවැළඳිය
යුතු වේ.
35 "මා නුඹට අණ කළ සියල්ල ආරොන්ට සහ
ඔහුගේ පුත්‍රයන්ට ඉටු කළ යුතු ය. දවස් හතක්
තුළ නුඹ ඔවුන්ට පූජකවරය දීමේ පිළිවෙත ඉටු කළ
යුතු යි. 36 නුඹ දිනපතා ම පාප සඳහා ඒවාට සමාව
ලබාගැනීම පිණිස ගව නාම්බකෙු බැගින් පූජා කළ
යුතු ය. පව් කමාව සඳහා යාගයක් ඔප්පු කිරීමෙන්
නුඹ පූජාසනයේ පාප දුරු කරන්නෙහි ය. ඉන්පසු එය
විශුද්ධ කිරීම සඳහා ආලේප කළ යුතු ය. 37 දවස්
හතක් ම නුඹ පූජාසනයේ පව් දුරලීමේ වත්පිළිවෙත්
කොට එය විශුද්ධ කළ යුතු යි. එවිට එය අතිශුද්ධ
පූජාසනය වනු ඇත. එය ස්පර්ශ කරන සෑම
කනෙකෙු ම ශුද්ධ වනු ඇත."

## දෛනික යාග
(ගණන් 28:1-8)

38 "පූජාසනය මත නුඹ දිනපතා ම, නොකඩවා
පූජා කළ යුතු පඬුරු නම්, අවුරුද්දක් වයසැති බැටළු
පැටවුන් දදෙනෙකේ. 39 උදයට එකකෙු ද අනිකා
සවසට ද පූජා කළ යුතු ය. 40 එක බැටළු පැටවකෙු
සමඟ පිරිසිදු තලේ ලීටර් එකක් සමඟ ඇනූ සිහින්
පිටි කිලෝග්රෑම් එකක් ද පානීය පූජාවක් සඳහා
මිදිරස ලීටර් එකක් ද ඔප්පු කළ යුතු ය. 41 තවද,
සමිඳාණන් වහන්සේ වන මා වෙත නඟින, ගින්නෙන්
දැවූ සුමිහිරි පූජාවක් වනු පිණිස, අනික් බැටළුවා ද
සවස් කාලයේ දී, උදය ඔප්පු කළ පරිදි ධාන්‍ය
පූජාවක් හා පානීය පූජාවක් සමඟ ඔප්පු කළ යුතු ය.
42 මයෙ සමිඳාණන් වහන්සේ වන මා ඉදිරියෙහි
සම්මුඛ මණ්ඩපයේ දොරටුව අසල, නුඹේ සෑම
පළෙපතක් මඟින් ම නොකඩවා ඔප්පු කළ යුතු
දවන යාග පූජාවක් විය යුතු ය. එහි දී මම නුඹලා
හමු වමේ; නුඹලා සමඟ කතා කරමි. 43 එහි දී මම
ඉශ්රායලේ ජනයා හමු වමේ. එම ස්ථානය ද මාගේ
මහිමයෙන් විශුද්ධ කරනු ලැබේ. 44 මම සම්මුඛ
මණ්ඩපය හා පූජාසනය විශුද්ධ කරමි. ආරොන් සහ
ඔහුගේ පුතුන් මට පූජක පදවියෙහි සේවය කරනු
පිණිස විශුද්ධ කරමි. 45 මම ඉශ්රායලේ ජනයා අතර
වාසය කරමින් ඔවුන්ගේ දවේයන් වහන්සේ වමේ.
46 ඔව්හු ද තමන් අතර වාසය කරන පිණිස මිසර
දේශයෙන් පිටතට ගෙනා ඔවුන්ගේ දවේ සමිඳාණන්
වහන්සේ මා බව දැනගන්නෝ ය. මම ඔවුන්ගේ
දවේ සමිඳාණන් වහන්සේ වමේ."

## දුම් පුදන පූජාසනය
(නික්ම 37:25-28)

30 "නුඹ සුවඳ දුම් ඔප්පු කිරීමට ෂිටිම් ලීයෙන්
පූජාසනයක් තනන්න. 2 එහි දිග සෙන්ටිමීටර්
හතළිස්පහක් ද පළල සෙන්ටිමීටර් හතළිස්පහක් ද
උස සෙන්ටිමීටර් අනූවක් ද ඇති ව, හතරැස් ව එය
සෑදිය යුතු යි. එහි අං එය සමඟ ඒකකයක් විය යුතු
ය. 3 එහි මුදුන ද හතර පැත්ත ද අං ද රනින්
ආලේප කළ යුතු අතර එය වටේට රන් ලීස්තරයක්
ද සෑදිය යුතු ය. 4 එහි ලීස්තරය යට, දපෙැත්තේ
කොන් දකෙට කිට්ටු ව රන් වළලු දකෙක් ද සවි කළ
යුතු ය. පූජාසනය උසුලාගනෙ යෑම පිණිස ගන්න
පොලුවල ඒවා දමනු ඇත. 5 ඒ පොලු ද ෂිටිම්
ලීයෙන් සාදා රනින් ආලේප කළ යුතු ය. 6 ගිවිසුම්
කරඬුව වසා තිබනෙ කරුණාසනයට ඉස්සරහින්,
එනම්, ගිවිසුම් කරඬුව ඉදිරියට ඇති තිරය
ඉස්සරහින්, එය තැබිය යුතු ය. මා නුඹ හමු වන්නේ
එම ස්ථානයේ ය. 7 දිනපතා උදය ආරොන් පහන්
පිළියළෙ කොට, ඔහු එහි සුවඳ ද්‍රව්‍ය දැවිය යුතු ය.
8 සවස ඔහු පහන් දල්වන විට ද සුවඳ ද්‍රව්‍ය දැවිය
යුතු ය. නුඹේ සෑම පළෙපතක් මඟින් ම එය
නොකඩවා ඉටු කළ යුතු සුවඳ දුම් පූජාවක් විය යුතු
ය. 9 තවද, එය මත තහනම් වූ සුවඳ ද්‍රව්‍යයන්

හෝ දවන යාග පූජාවක් වත්, ධාන්‍ය පූජාවක් හෝ
පානීය පූජාවක් වත් ඔප්පු නොකළ යුතු ය.
10 අවුරුද්දකට වරක් ආරොන් එහි අං පිට පව්
කමාව ලබාගැනීමේ පිළිවෙත ඉටු කළ යුතු ය.
අවුරුද්දකට වරක් පාප කමාව ලබන පූජාවේ ලේ
ගෙන, පූජාසනය මත පව් කමාව ලැබීමේ පිළිවෙත
ඉටු කළ යුතු ය. එය නුඹේ සෑම පළපෙතක් මඟින්
ම ඉටු කළ යුතු ය. එය සමිඳාණන් වහන්සේ වන
මට කැප වූ අතිශුද්ධ පූජාසනයකි.”

## දේව මාලිගාව සඳහා බද්ද

11 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට,
මෙසේ වදාළ සේක: 12 “නුඹ ජන ලේඛනයක්
සඳහා ඉශ්රායලේ ජනයා සංගණනය කරන විට,
සංගණනය කරන අවස්ථාවේ දී ඔවුන් අතර
වංසගතයක් නොපැමිණෙන පිණිස සෑම කෙනෙකු ම
තම තමා වෙනුවෙන් මට මිදීමේ මුදලක් ගෙවිය යුතු
ය. 13 නික්ම 38:25-26; මතෙ 17:24සංගණනයට
ඇතුළු වෙන සෑම කෙනෙකේ ම ශුද්ධස්ථානයේ මිල
අනුව නියම මිල දිය යුතු ය. සමිඳාණන් වහන්සේ
වන මට පුදන පඬුර එය විය යුතු ය.
14 සංගණනයට ඇතුළත් වන සෑම කෙනෙකේ ම
එනම් අවුරුදු විස්සක් හා ඊට වැඩි වයසැති අය, මට
පඬුරක් දිය යුතු වේ. 15 නුඹ ඔවුන් වෙනුවට මිදීම
ලබාගැනීමේ මුදලක් වශයෙන් තම පඬුර සමිඳාණන්
වහන්සේ වන මට පුදන කල ධනවතා නියම මිලට
වැඩියෙන් හෝ දුප්පතා ඊට අඩුවෙන් හෝ නොදිය
යුතු ය. 16 නුඹ ද ඉශ්රායලේ ජනයා උදෙසා මිදීම
ලබාගැනීමේ මුදල් රැගෙන, සම්මුඛ මණ්ඩපයේ
සේවාවන් සඳහා එය වැය කළ යුතු ය. එය
සමිඳාණන් වහන්සේ වන මා ඉදිරියෙහි ඉශ්රායලේ
ජනයා සිහිවීමක් ද නුඹලා වෙනුවට පව් කමාවේ
මුදලක් ද වනු ඇත.”

## ලෝකඩ භාජන

17 සමිඳාණන් වහන්සේ නැවතත් මෝසෙස්ට කතා
කොට මෙසේ වදාළ සේක: 18 නික්ම 38:8“පවිත්‍ර
වීම පිණිස නුඹ ලෝකඩයෙන් භාජනයක් ද,
ලෝකඩයෙන් එහි අඩිය ද සාදන්න. එය සම්මුඛ
මණ්ඩපය සහ පූජාසනය අතර තබා ඊට වතුර දැමිය
යුතු යි. 19 ආරොන් සහ ඔහුගේ පුතුන් තමන්ගේ
අත් පා එයින් සේදිය යුතු ය. 20 ඔවුන් සම්මුඛ
මණ්ඩපයට ඇතුළු වන විට හෝ ගින්නෙන් දැවූ
දවන පඬුර සමිඳාණන් වහන්සේට ඔප්පු කරමින්,
සේවා කිරීම සඳහා පූජාසනය ළඟට කිට්ටු වන විට
හෝ ඔව්හු වතුරින් තමන් සෝදාගන්නෝ නම්
මරණයට පත් නො වන්නෝ ය. 21 මෙලෙස ඔවුන්
නොමැරෙන පිණිස තමන්ගේ අත් පා සෝදාගත යුතු
ය. මෙය ඔහු කෙරෙහි ද, ඔහුගේ පළපෙතින්
පැවතෙන සියල්ලන් කෙරෙහි ද සදහට ම වලංගු
නියෝගයකි.”

## ආලේප තෙලේ හා සුවඳ ද්‍රව්‍ය

22 නික්ම 37:29 සමිඳාණන් වහන්සේ යළි මෝසෙස්
අමතා මෙසේ වදාළ සේක: 23 “කිලෝග්රෑම් හයක
දියරු ගන්ධ රස ද ඉන් බාගයක් වන කිලෝග්රෑම්
තුනක සුවඳ කුරුඳු ද කිලෝග්රෑම් තුනක සුවඳ
උක්ගස් ද 24 ශුද්ධස්ථානයේ මිල අනුව කිලෝග්රෑම්
හයක තලිස් පතුරු ද යන අගනා සුවඳ ද්‍රව්‍ය ද
ඔලීව තෙලේ ලීටර් හතරක් ද ඔබ ගත යුතු ය.
25 ඉන්පසු සුවඳ ද්‍රව්‍ය සංයෝගකරුවෙකු කරන්නාක්
මෙන්, ඒවායින් ආලේපනය සඳහා ශුද්ධ තෙලෙයක්
වන තෙලේ සංයෝගයක් සෑදිය යුතු ය. එය ආලේප
කරනු පිණිස ශුද්ධ තෙලෙයක් වනු ඇත. 26 එයින්
සම්මුඛ මණ්ඩපය හා ගිවිසුම් කරඬුව ද 27 මේසය
හා එහි උපකරණ ද පහන් රුක හා එහි උපකරණ ද
සුවඳ දුම් පූජාසනය ද 28 දවන යාග පිදීමේ
පූජාසනය හා එහි උපකරණ ද වතුර භාජනය හා
එහි අඩිය ද ආලේප කළ යුතු ය. 29 මෙසේ ඒවා
ශුද්ධ වන පිණිස කැප කළ යුතු ය. ඒවා ස්පර්ශ වන
සෑම දෙයක් ද ශුද්ධ වනු ඇත. 30 ඉන්පසු නුඹ
ආරොන් සහ ඔහුගේ පුතුන් ආලේප කොට ඔවුන්
මට පූජක පදවියේ සේවා කරන පිණිස ඔවුන්ට
පූජකවරය ප්රදානය කළ යුතු ය. 31 ඉන්පසු නුඹ
ඉශ්රායලේ ජනයා අමතා, ‘ඔබේ පළපෙත් මේ
ආලේප තෙලෙය ශුද්ධ දෙයක් හැටියට සැලකිය යුතු
ය. 32 මනුෂ්‍ය ශරීරය පිට එය වත් නොකළ යුතු ය.
එකී සංයෝගය මෙන් අන් කිසිවක් ද නොසෑදිය යුතු
ය. එය ශුද්ධ ය. එය ඔබට ශුද්ධ දෙයක් විය යුතු ය.
33 යමෙක් ඊට සමාන අන් සංයෝගයක් සාදන්නේ ද
යමෙක් ඉන් මඳක් පූජකයෙකු නොවන්නකු මත
දමන්නේ ද ඔහු තම සෙනඟගෙන් නෙරපාදැමිය යුතු
ය’ කියා අණ කරන්න.”
34 නැවතත් සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට මෙසේ වදාළ සේක: “නුඹ සුවඳ ද්‍රව්‍ය වන
නාතාප් සහ ෂබෙලෙකේ ද බලේබනො සහ පිරිසිදු
තුවරලා ද සම බරට ගෙන, 35 සුවඳ ද්‍රව්‍ය
සංයෝගකරුවෙකු කරන්නාක් මෙන්, ඒවා ලුණුනේ
පදම් කොට ශුද්ධ සුගන්ධයක් සෑදිය යුතු ය.
36 තවද, නුඹ එයින් කොටසක් සුණු කොට, ඉනුත්,
කොටසක් මා නුඹ හමු වන සම්මුඛ මණ්ඩපයේ
ගිවිසුම් කරඬුව ඉදිරිපිට ඉසිය යුතු ය. නුඹ මෙය
අතිශුද්ධ දෙයක් ලෙස සැලකිය යුතු ය. 37 නුඹේ
ප්රයෝජනය සඳහා මේ සුගන්ධ සංයෝගයට සමාන
අනෙකක් නොසෑදිය යුතු ය. එය සමිඳාණන්
වහන්සේ වන මට කැප වූ දෙයක් හැටියට නුඹ
සැලකිය යුතු ය. 38 යමෙක් ඊට සමාන සුවඳැති
අනෙකක් සාදන්නේ ද ඔහු සිය සෙනඟගෙන්
නෙරපාදැමිය යුතු ය.”

### ශුද්ධස්ථානය ඉදි කිරීමට ශිල්පීන්
(නික්ම 35:30;36:1)

31 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට මෙසේ වදාළ සේක: 2 “බලන්න, මම
ජුදාගේ ගෝත්‍රයේ හූර්ගේ පුත්‍රයා වන උරීගේ
පුත් බෙශලලේ තෝරා ගතිමි. 3 තවද, මම ඔහු
දේවාත්මානුභාවයෙන් ද නන්වැදෑරුම් නිර්මාණ
ශිල්පය පිළිබඳ දක්ෂතාවෙන් ද හැකියාවෙන් ද
අවබෝධයෙන් ද පූර්ණ කළෙමි. 4 මා එසේ කළේ
ඔහුට කලාත්මක සැලසුම් පිළියෙළ කිරීමටත්, රන්
රිදී හා ලෝකඩයෙන් වැඩ කිරීමටත් 5 මැණික් ගල්
කැපීමටත්, ඒවා එබ්බවීමටත්, ලීයෙන් කැටයම් වැඩ
කිරීමටත්, නන්වැදෑරුම් නිර්මාණ ශිල්ප කිරීමටත්
හැකි වනු පිණිස ය. 6 තවද, මම ඔහුගේ සහායට
දාන්ගේ ගෝත්‍රයේ අහිසාමක්ගේ පුත්,
ඔහොලියාබ් පත් කළෙමි. ඇරත් මා නුඹට අණ
කළ සියල්ල ඔවුන් සාදන ලෙස දක්ෂ සියල්ලන්ට
විශිෂ්ට හැකියාව දුන්නෙමි. 7 නුඹට සෑදීමට අණ
කළ ඒවා නම් සම්මුඛ මණ්ඩපය, ගිවිසුම් කරඬුව,
එය මත ඇති කරුණාසනය, මණ්ඩපයේ සියලු බඩු
බාහිරාදිය, 8 මේසය සහ එහි බඩු බාහිරාදිය, ඝන
රන් පහන් රුක හා එහි සියලු උපකරණ, දුම්
පූජාසනය, 9 දවන යාග පූජාසනය හා එහි සියලු
බඩු බාහිරාදිය, වතුර භාජනය සහ එහි අඩිය,
10 විචිත්‍ර වස්ත්‍ර වන පූජක නිලයේ සේවා කිරීම
සඳහා පූජක ආරොන්ගේ ශුද්ධ වස්ත්‍ර සහ ඔහුගේ
පුත්‍රයන්ගේ වස්ත්‍ර, 11 ආලේප තෛලය සහ
ශුද්ධස්ථානය සඳහා සුවඳ දුම් වේ. මා නුඹට අණ
කළ සියල්ල අනුව ඒවා ඉටු කළ යුතු ය.”

### සබත් දිනය

12 නැවතත් සමිඳාණන් වහන්සේ මෝසෙස්
අමතමින්, 13 “නුඹ ඉශ්‍රායෙලේ ජනයාට මෙසේ
කියන්නැ”යි වදාළ සේක: “මාගේ සබත් දවස් නුඹලා
හොඳින් පිළිපැදිය යුතු යි. මන්ද, ඒවා වනාහි නුඹලා
ශුද්ධවන්ත කරවන, සමිඳාණන් වහන්සේ මා බව
නුඹලා දැනගනු පිණිස නුඹලාත්, මාත් අතර,
නුඹලාගේ පෙළපත් තුළ පිහිටුවන ලද ලකුණකි.
14 එබැවින් නුඹලා සබත් දිනය පිළිපැදිය යුතු ය. එය
නුඹලාට ශුද්ධ දිනයක් විය යුතු ය. එය කෙලෙසන
සෑම කෙනෙකේ මරණයට පත් කරනු ලැබිය යුතු වේ.
තවද, එම දවසේ වැඩ කරන සෑම කෙනෙකේ ම, සිය
සෙනඟ අතරින් නෙරපාදමනු ලැබිය යුතු ය.
15 නික්ම 20:8-11; 23:12; 34:21; 35:2; ලෙවී 23:3;
ද්වි.නී. 5:12-14දවස් හයක් තුළ වැඩ කළ හැක,
එහෙත් හත් වන දින, සමිඳාණන් වහන්සේ වන මට
වෙන් කළ නිවාඩුවේ සබත් දිනය යි. සබත් දින වැඩ
කරන සෑම කෙනෙකේ ම මරණයට පත් කරනු ලැබිය
යුතු වේ. 16 එබැවින් ඉශ්‍රායෙලේ ජනයා තමන්ගේ
පෙළපත් තුළ සදාතන ගිවිසුමක් හැටියට, සබත
පවත්වමින් එය පිළිපැදිය යුතු ය. 17 නික්ම 20:11එය
මාත්, ඉශ්‍රායෙලේ ජනයාත් අතර සදා පවතින
ලකුණකි. මන්ද, සමිඳාණන් වහන්සේ වන මම දින
හයක් තුළ අහස හා පොළොව ද සාදා, හත් වන
දින වැඩ නවතා, නිවාඩු ගත්තෙමි’ කියා කියන්න.”
18 උන් වහන්සේ සීනයි කන්ද මත මෝසෙස් සමඟ
කතා කොට නිම කළ පසු, දේව ඇඟිල්ලෙන් ලියන
ලද ගල් පුවරු වන ගිවිසුම් පුවරු දෙක ඔහුට දුන්
සේක.

### රන් වහු රූපය
(ද්වි.නී. 9:6-29)

32 ක්‍රියා 7:40 මෝසෙස් කන්දෙන් බැස ඒමට
ප්‍රමාද වන බව සෙනඟ දුටු විට, ඔව්හු
ආරොන් වට කර, රැස් වී ඔහුට කතා කොට,
“එන්න, අපට පෙරටුව යන පිණිස දෙවියකු සාදා
දෙන්න. මිසර දේශයෙන් අප පිටතට ගෙනා මේ
මෝසෙස් කියන මිනිසාට කුමක් වූයේ ද කියා අපි
නොදනිමු”යි කී හ. 2 ආරොන් ඔවුන්ට පිළිතුරු
දෙමින්, “ඔබේ භාර්යාවන්ගේ ද දරුදැරියන්ගේ ද
රන් කුණ්ඩලාභරණ ගලවා මා වෙත ගෙනෙන්නැ”යි
කී ය. 3 සෙනඟ සියල්ලෝ තම තමන්ගේ කන්වල
තිබූ රන් කුණ්ඩලාභරණ ගලවා ආරොන් වෙත
ගෙනාහ. 4 1 රාජා 12:28; ක්‍රියා 7:41ඔහු ඔවුන්ගේ
අතින් ඒවා ගෙන, උණු කොට, අච්චුවක වත් කර,
වස්සකුගේ රූපයක් වාත්තු කළේ ය. මේ දුටු
සෙනඟ, “ඉශ්‍රායෙලේ මේ අප මිසරයෙන් ගෙනාවා වූ
අපගේ දෙවියන් වහන්සේ ය”යි කීවෝ ය.
5 ආරොන් එය ඉදිරියේ පූජාසනයක් ඉදි කොට,
“හෙට, සමිඳාණන් වහන්සේගේ ගෞරවයට
පවත්වන මංගල්‍යයකි” කියා ප්‍රසිද්ධ කළේ ය. 6 1
කොරි 10:7සෙනඟ ද පසු දින අලුයම නැඟිට, දවන
යාග පූජා පුදා, සහභාගිකමේ පූජා ගෙනාහ. පසුව
ඔව්හු කන්න බොන්න වාඩි වී විනෝදයට ලකලැස්ති
වූ හ.

### මෝසෙස්ට උපදෙස් දීම

7 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට,
“යන්න, හනික කන්දෙන් බසින්න. නුඹ මිසර
දේශයෙන් පිටතට ගෙනා නුඹේ සෙනඟ තමන් ම
දූෂ්‍ය කරගෙන සිටිති. 8 මා ඔවුන්ට අණ කළ
මාර්ගයෙන් ඔව්හු ඉක්මනින් බැහැර ගියහ. ඔව්හු
වාත්තු කළ වස්සකු සාදාගෙන ඊට නමස්කාර
කරමින් ද පුද පූජා කරමින් ද, ‘ඉශ්‍රායෙල්වරුනි,
මිසර දේශයෙන් ඔබ පිටතට ගෙනා ඔබේ දෙවියෝ
මෙන්න’ කිය කියා සිටිති”යි වදාළ සේක.
9 තවදුරටත් උන් වහන්සේ මෝසෙස් අමතමින්,
“මේ සෙනඟ මුරණ්ඩු සෙනඟක් බව මට පෙනේ.
10 දැන් ඉතින්, මාගේ කෝපාග්නිය ඔවුන්ට විරුද්ධ
ව වේගවත් ව ඇවිළෙයි. මම ඔවුන් වනසාලන්නෙමි.
එහෙත්, මම නුඹෙන් මහත් ජාතියක් සාදන්නෙමි”යි
වදාළ සේක.
11 ගණන් 14:13-19 එහෙත්, මෝසෙස් තම දෙවි
සමිඳාණන් වහන්සේට කන්නලව් කරමින්, “ස්වාමීනි,
ඔබ මහත් බලය පාමින් ද ඔබේ බාහු බලයෙන් ද

මිසර දේශයනේ පිටතට ගනො ඔබේ සනෙඟට
විරුද්ධ ව ඔබේ උදහස වේගවත් ලසෙ අවුළන්නේ
මන් ද? 12 'දවෙියන් වහන්සේ ඔවුන් පිටතට
ගනොවේ දුෂ්ට අදහසකින්, කඳුකරයේ ඔවුන්
මරාදමා, මිහි පිටින් ඔවුන් තුරන් කිරීමට ය'යි කීමට
මිසර වාසීන්ට ඔබ ඉඩ තබන්නේ මන් ද? ඔබ මේ
ඇවිලනෙ කෝපාග්නිය නිවාගනෙ ඔබේ සනෙඟට
විරුද්ධ ව කරන්න යන මේ නපුර ගැන සිත වනෙස්
කරගනු මැනව. 13 උත් 17:8; 22:16-17ඔබේ
සේවකයන් වූ ආබ්රහම්, ඊසාක් සහ ඉශ්රායලේ සිහි
කළ මැනව. ඔබ ඔබේ නාමයනේ ම දිවුරමින්,
'අහසේ තරු මනේ නුඹේ පළෙපත මම වර්ධනය
කරන්නමේ. නුඹට පොරොන්දු වූ මේ දේශය මම
මුළුමනින් ම නුඹට දනේනමේ. තවද ඔව්හු එය
සදහට ම උරුම කරගන්නෝ ය'යි කියා ඔබ
නොවෙදාළ සේක් දැ"යි විචාළේ ය. 14 එවිට
සමිඳාණන් වහන්සේ තම සිත වනෙස් කොට සිය
සනෙඟට කරන්න අදහස් කළ නපුර අත් හළ සේක.

## නීතිය කටෙූ ගල් පුවරු කැඞීම

15 මෝසසේ හැරී කන්දනේ බැස එන විට සාක්ෂි
ගල් පුවරු දකෙ තම අතේ විය. ගල් පුවරු දකෙේ,
එක පැත්තක මනේ ම අනික් පැත්තේ ද ලියා
තිබිණි. 16 ඒ ගල් පුවරු දවෙියන් වහන්සේගේ
නිර්මාණයක් විය. ඒවායේ කටෙූ ලියවිල්ල ද
දවෙියන් වහන්සේගේ ම ලියවිල්ල විය.
17 සනෙඟගේ ඝෝෂාව ජෝෂුවාට ඇසුණු විට,
ඔහු මෝසසේ අමතා, "කඳවුරේ යුද්ධ ඝෝෂාවක්"යි
කීවේ ය. 18 එහතේ මෝසසේ පිළිතුරු දමේින්
මසෙේ කීවේ ය:
q2[18] "මට ඇසනෙ ඒ හඬ, ජය ගොසක් නො ම
වේ;
q2[18] පැරදුම් හඬක් ද නො ම වේ, එය ගී ගැයුමක්
පමණක් වේ."
19 ඔහු ද මසෙේ කියමින් කඳවුරට ළඟා වූ විට
වස්සා ද සනෙඟගේ නැටුම් ද දිටී ය. ඔහුගේ
කෝපාග්නිය ද එවිට වේගවත් ව ඇවිළී ගියනේ ඔහු
තම අත වූ ගල් පුවරු වීසි කොට, ඒවා කන්ද පාමුල
බිඳ දැමී ය. 20 පසුව ඔහු ඔවුන් සෑදූ වස්සා ගනෙ,
ගින්නනේ පුළුස්සා, කුඩු කුඩු කොට, එය ජලය මත
ඉස, ඒ ජලය ඉශ්රායලේ ජනයාට බොන්නට
සැලැස්විය. 21 මෝසසේ ද ආරොන් අමතමින්, "මේ
සනෙඟ ලවා මේ සා මහත් පාපයක් කරවීමට ඔවුන්
ඔබට කුමක් කළෙේ දැ"යි විචාළේ ය. 22 ආරොන්
පිළිතුරු දමේින්, "මාගේ ස්වාමීන්ගේ උදහස
වේගවත් ව නොඇවිළේ වා! මේ සනෙඟ නපුරට
කතෙරම් බර වී සිටින්නෝ දැ යි ඔබ දන්නහෙි ය.
23 ඔව්හු මට කතා කොට, 'අපට පරෙටුව යෑමට
දවෙියකෙු අපට සාදා දනේන. මිසර දේශයනේ අප
පිටතට ගනො ඒ මෝසසේ නම් මිනිසාට කුමක්
වූයේ දැ යි අපි නොදනිමු'යි කී හ. 24 මම ඔවුන්ට
පිළිතුරු දමේින්, 'රන් බඩු යමක් ඇත්තේ දැ'යි ඇසූ
විට ඔව්හු ද ඒවා ගලවා මට දුන්හ. මම ඒවා
ගින්නට වීසි කළෙමේ. එවිට මේ වස්සා නික්ම
ආයේ ය"යි කී ය.
25 තවද, සනෙඟ වියරු වැටී දඟලන බව මෝසසේ
දිටී ය. මන්ද, සනෙඟ සතුරන් හමුවේ අවඥාවට
පත් වන පිණිස ආරොන් ඔවුන්ට රූප වන්දනා
කිරීමට ඉඩ හැර තිබිණි. 26 එවිට මෝසසේ
කඳවුරේ දොරටුව ළඟ සිටගනෙ, "සමිඳාණන්
වහන්සේගේ පැත්ත ගන්නෝ මා වතෙට පැමිණතේ
වා!"යි හඬගෑවේ ය. ලවේිගේ සියලු පුත්රයෝ ඔහු
වතෙට රැස් වූ හ. 27 මෝසසේ ඔවුන් අමතමින්,
"ඉශ්රායලේවරුන්ගේ දවෙි සමිඳාණන් වහන්සේ
කතා කොට, 'සෑම කනෙකෙු ම තම කඩුව ගනෙ
දොරටුවනේ දොරටුවට කඳවුර හරහා යමින්, තම
සොහොයුරන් ද මිතුරන් ද අසල්වැසියන් ද
මරාදමන්න' කියා වදාරන සේකැ"යි පැවසී ය.
28 ලවේිගේ පුත්රයෝ මෝසසේ දුන් අණ පරිදි එය
ඉටු කළෙනේ, එදින සනෙඟ අතරින් තුන්දාහක්
පමණ වැනසුණා හ. 29 මෝසසේ ද කතා කොට,
"ඔබනේ එකිනකො තම තමාගේ පුත්රයා ද තම
තමාගේ සහෝදරයා ද මරාදමමින් පූජකවරුන් මනේ
සමිඳාණන් වහන්සේට අද ඔබ ම කැප කරගත්තහු
ය. එබැවින් අද දින සමිඳාණන් වහන්සේ ඔබට
ආශීර්වාදයක් දානය කළ සේකැ"යි කී ය.
30 පසු දින මෝසසේ සනෙඟ අමතමින්, "ඔබ
දරුණු පාප අපරාධයක් කළහු ය. දැන් මම සමිඳාණන්
වහන්සේ වතෙ කන්දට නගිමි. ඇතැම් විට ඔබට
පව් කමාව ලබා දනේන මට හැකි වන්නේ ය"යි කී
ය. 31 ඔහු ද සමිඳාණන් වහන්සේ වතෙ ආපසු
ගොස්, "අහෝ, මේ සනෙඟ දරුණු අපරාධයක්
කළෝ ය. ඔව්හු ඔවුන්ට ම රනින් දවෙියකෙු
සාදගත්හ. 32 ගීතා 69:29; එළිද 3:5දැන් ඉතින්
ඔවුන්ගේ පාපයට කමාව දුන මැනව; එසේ
නොදනෙ සේක් නම්, කරුණාකර ඔබ වහන්සේ
පොතනේ මාගේ නාමය මකාදමනු මැනව"යි ඉල්ලී
ය. 33 සමිඳාණන් වහන්සේ ද මෝසසේ අමතමින්,
"මට විරුද්ධ ව යමකේ පව් කළෙේ ද ඔහුගේ නම
මාගේ පොතින් මම මකාදමමි. 34 එබැවින් දැන්
යන්න, මා නුඹට කී ස්ථානයට සනෙඟ ගනෙ යන්න.
බලන්න, මාගේ දූතයා ද නුඹට පරෙටුව යනු ඇත.
එහතේ, මම, දඬුවම් දනෙ දවසේ දී, ඔවුන්ගේ
පාපයට දඬුවම් දමේ"යි වදාළ සේක.
35 වස්සා සෑදීමට සනෙඟ ආරොන්ට බල කළ
බැවින් සමිඳාණන් වහන්සේ ඔවුන් වතෙ
වසංගතයක් එවූ සේක.

## නික්ම යාමට අණ දීම

33 උත් 12:7; 26:3; 28:13 සමිඳාණන් වහන්සේ
මෝසසේට කතා කොට, "නුඹත්, නුඹ මිසර
දේශයනේ පිටතට ගනො සනෙඟත් මමෙ
ස්ථානයනේ නික්ම, 'මම නුඹලාගේ පළෙපතට
දමේ'යි කියා ආබ්රහම්ට, ඊසාක්ට හා ජාකොබ්ට
දිවුරා පොරොන්දු වූ දේශයට යන්න. 2 ඔබට
පරෙටුව මම දූතයකෙු යවමි. තවද, මම

කානානිවරුන්, අමෝරිවරුන්, හිත්තීවරුන්,
පෙරිස්සිවරුන්, හිව්වරුන් සහ ජබුසිවරුන්
පන්නාදමමි. 3 කිරෙන් සහ මී පැණියෙන් ඉතිරෙන
දේශයට යන්න. එහෙත්, නුඹ සමඟ මම නොයමි.
මන්ද, නුඹලා උඩඟු මුරණ්ඩු සෙනඟක් බැවින් මා
අතරමඟ දී නුඹලා වනසාලන්නට පිළිවනැ"යි වදාළ
සේක. 4 සෙනඟ ද මේ අසුබ ආරංචිය ඇසූ විට
වැලපෙන්නට වූ හ. කිසිවෙක් තම කනකර පැළඳ
නොගත්හ.
5 උන් වහන්සේ මෝසෙස් අමතා, "නුඹලා උඩඟු
මුරණ්ඩු සෙනඟකි. මම මොහොතකට වත් නුඹලා
අතරට පැමිණියොත් නුඹලා වනසාලමි. එබැවින් දැන්
නුඹලාගේ කනකර ආභරණ ගලවා දමන්න. එවිට
නුඹලාට කුමක් කළ යුතු ද කියා මම දන්නෙමි'යි
ඉශ්‍රායෙල් ජනයාට කියන්නැ"යි වදාරා තිබිණි.
6 ඉශ්‍රායෙල් ජනයා ද හොරෙබ් කන්දේ සිට
ඉදිරියට තම කනකර ආභරණ ගලවාගෙන ගියහ.
7 මෝසෙස් මණ්ඩපය රැගෙන කඳවුරෙන් පිටත,
ඊට ඈතින් එය පිහිටුවීමට පුරුදු ව සිටියේ ය. ඔහු
එයට සම්මුඛ මණ්ඩපය කියා නම් කෙළේ ය.
සමිඳාණන් වහන්සේගේ උපදෙස් ලබාගැනීමට ඕනෑ
වූ සෑම කෙනෙකු ම කඳවුරින් පිටත වූ සම්මුඛ
මණ්ඩපයට යා යුතු වීය. 8 තවද, මෝසෙස් සම්මුඛ
මණ්ඩපයට ඇතුළු වන පිණිස පිටතට ගිය කල,
සියල්ලෝ ම නැඟිට තම තමන්ගේ කූඩාරම් දොරටු
ළඟ සිටගෙන ඔහු සම්මුඛ මණ්ඩපයට ඇතුළු වන
තෙක් ඔහු දෙස බලා සිටියහ. 9 මෝසෙස් සම්මුඛ
මණ්ඩපයට ඇතුළු වූ විට ම වලා ටැඹ බැස, එහි
දොරටුව ළඟ සිටගති. සමිඳාණන් වහන්සේ
මෝසෙස් සමඟ කතා කළ සේක. 10 සියලු සෙනඟ
සම්මුඛ මණ්ඩපයේ දොර ළඟ වූ වලා ටැඹ දුටු විට
ඔව්හු නැඟිට තම තමන්ගේ කූඩාරම් දොරටු අසල
සිටගෙන නමස්කාර කළහ. 11 යමෙකු තම මිතුරා හා
සමඟ කතා කරනු මෙන් සමිඳාණන් වහන්සේ
මෝසෙස් සමඟ මුහුණට මුහුණ ලා කතා කළ
සේක. ඉන්පසු ඔහු කඳවුරට එන්නට ආපසු හැරුණ
නමුත් ඔහුගේ තරුණ සේවක නූන්ගේ පුත්,
ජෝෂුවා සම්මුඛ මණ්ඩපයෙන් නික්ම නොගියේ ය.

## මෝසෙස්ගේ ආයාචනය

12 මෝසෙස් සමිඳාණන් වහන්සේ අමතා, "බැලුව
මැනව, 'මේ සෙනඟ ගෙන යන්නැ'යි ඔබ මට කියන
නමුත් මා සමඟ යවන්නේ කවරෙක් ද කියා ඔබ
මට නොදැන්වූ සේක. තවද, 'මම නුඹ හොඳින්
හඳුනමි. මා ඉදිරියෙහි නුඹ ද අනුග්‍රහය ලැබුවෙහි
ය'යි කියා ඇත. 13 දැන් ඉතින් කරුණාකර, ඔබ
ඉදිරියෙහි මම අනුග්‍රහය ලැබුවෙමි නම්, මා ඔබ
හොඳින් දැනහැඳිනගෙන, ඔබේ අනුග්‍රහය
නොකඩවා ලබන පරිදි ඔබේ සැලසුම් දැන් මට
පෙන්වුව මැනව. මේ ජාතිය ද ඔබේ ම සෙනඟ බව
සිහි කළ මැනව"යි කී ය. 14 උන් වහන්සේ කතා
කොට, "මම නුඹ සමඟ ගොස්, නුඹට යහෙන්
විසීමට ඉඩ දෙන්නෙමි"යි වදාළ සේක. 15 එවිට ඔහු
උන් වහන්සේ අමතමින්, "ඔබ අප සමඟ නොඑන
සේක් නම්, මෙතැනින් නික්ම යාමට අපට ඉඩ
නොහැරිය මැනව. 16 ඔබේ සෙනඟත්, මමත් ඔබ
ඉදිරියෙහි අනුග්‍රහය ලැබූ බව අපි කෙසේ
දැනගනිමු ද? එය අප දැනගන්නේ ඔබ අප සමඟ
යෑමෙන් නො වේ ද? එවිට ඔබේ සෙනඟත්, මමත්
මිහි පිට සිටින සියලු සෙනඟට වඩා වරප්‍රසාද ලත්
අය වන්නෙමු"යි කීවේ ය. 17 උන් වහන්සේ ද
මෝසෙස්ට පිළිතුරු දෙමින්, "නුඹ ඉල්ලන මේ දේ ද
මම ඉටු කරමි. මන්ද, මා ඉදිරියෙහි නුඹ අනුග්‍රහය
ලැබුවෙහි ය. මම නුඹ හොඳින් හඳුනමි"යි වදාළ
සේක.

## මෝසෙස් කන්ද මත සිටීම

18 මෝසෙස් සමිඳාණන් වහන්සේට කතා කොට,
"ඔබේ මහිමාලංකාරය කරුණාකර මට පෙන්නුව
මැනව"යි ඉල්ලී ය. 19 රෝම 9:15උන් වහන්සේ
එවිට පිළිතුරු දෙමින්, "මම මාගේ ශෝභනාලංකාරය
නුඹට පෙරටුව යන්නට සලස්වමි. මම නුඹ ඉදිරියෙහි
'සමිඳාණන් වහන්සේ' වන මාගේ නාමය ප්‍රකාශ
කරන්නෙමි. කරුණාව පෑමට මා කැමැති තැනැත්තාට
මම කරුණාව පාමි, දයාව පෑමට කැමැති තැනැත්තාට
මම දයාව පාමි"යි වදාළ සේක. 20 නැවතත් උන්
වහන්සේ කතා කොට, "මාගේ මුහුණ දකින්න
නුඹට නුපුළුවන, මනුෂ්‍යයකුට මා දැක ජීවත්විය
නොහැකි ය"යි වදාළ සේක. 21 උන් වහන්සේ
තවදුරටත් කතා කරමින්, "මා සමීපයෙහි පර්වතයක්
ඇත. නුඹට එය මත සිටගත හැකි ය. 22 මාගේ
මහිමාලංකාරය නුඹ පසු කර යන විට මම නුඹ කඳු
විවරයක පිහිටුවා, නුඹ පසු කර යන තෙක්, මම
නුඹ අතින් වසාලන්නෙමි. 23 මා අත ඉවතට ගත්
විට, නුඹ මාගේ පිටුපස දකින්නෙහි ය. එහෙත්,
මාගේ මුහුණ නුඹ නොදකිනු ඇතැ"යි වදාළ සේක.

## දෙ වන වරටත් ගල් පුවරු සෑදීම

(ද්වි.නී. 10:1-5)

34 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට, "පළමු ඒවාට සමාන ගල් පුවරු
දෙකක් කපන්න. නුඹ බිඳ දැමූ පළමු ගල් පුවරුවල
තිබූ වචන මම ඒවායේ ලියන්නෙමි. 2 හෙට අලුයම්
වේලෙහි සූදානම් ව, සීනයි කන්දට නැඟ, කන්ද
මුදුනෙහි මා ඉදිරියෙහි පෙනී සිටින්න. 3 කිසි
මනුෂ්‍යයකු නුඹ සමඟ උඩට නො ආ යුතු ය.
කන්දේ කිසි තැනක කිසි මනුෂ්‍යයකු දක්නා
නොලැබිය යුතුයි. එළු බැටළු පට්ටි හෝ ගව පට්ටි
කිසිවක් හෝ කන්ද ඉදිරියෙහි තණ නො කෑ යුතු
ය"යි වදාළ සේක. 4 සමිඳාණන් වහන්සේ ඔහුට
වදාළ පරිදි මෝසෙස් පළමු ඒවාට සමාන ගල් පුවරු
දෙකක් කපා අලුයමින් නැඟිට සීනයි කන්දට නැංගේ
ය; ගල් පුවරු දෙක ද තම අතේ ගෙන ගියේ ය.
5 සමිඳාණන් වහන්සේ ද වලාකුළක ආකාරයෙන්
බැස, එහි ඔහු සමඟ සිටගෙන, 'සමිඳාණන්
වහන්සේ' යන ස්වකීය නාමය ප්‍රකාශ කළ සේක.

6 නික්ම 20:5-6; ගණන් 14:18; ද්වි.නී. 5:9-10;
7:9-10 උන් වහන්සේ ඔහු ඉදිරියෙනේ ගමන් කරමින්,
“මම සමිඳාණන් වහන්සේ ය. මම දයානුකම්පාවෙනේ
පූර්ණ, වහා නොකිපෙනෙ සුලු, මහා කාරුණික සහ
විශ්වාසදායී දවේියන් වහන්සේ ය; 7 මම දහස්
ගණනකට කරුණාව පාමින්, දුෂ්ටකමට ද නපුරට හා
පාපයට ද කමාව දනේනමේ. එහතේ වරදකරුවන්
නිදහස් නොකෙර, පියවරුන්ගේ පව් නිසා තුන් වන,
හතර වන දරු පරපුර දක්වා ඔවුන්ගේ දරු
මුණුබුරන්ට දඬුවම් කරන දවේියන් වහන්සේ මම
යැ”යි වදාළ සේක. 8 මෝසසේ ද වහා බිමට හිස
නමා නමස්කාර කළෙේ ය. 9 ඉන්පසු ඔහු කතා
කොට, “සමිඳුනි, ඔබ ඉදිරියෙහි මම අනුග්රහය ලබා
ඇත්තමේ නම්, මාගේ සමිඳුන් වන ඔබ අප සමඟ
වඩින ලසෙ මම අයැද සිටිමි. මේ සනෙඟ නම්
මුරණ්ඩු ය. අපේ දුෂ්ටකම හා පාප කමා කොට අප
ඔබේ ම උරුමය වශයනේ ගත මැනව”යි කී ය.

### ගිවිසුම අලුත් කිරීම

(නික්ම 23:14-19;ද්වි.නී. 7:1-5;16:1-17)

10 එවිට උන් වහන්සේ ඔහු අමතමින් මසෙේ
වදාළ සේක: “බලන්න, මම නුඹ සමඟ ගිවිසුමක්
පිහිටුවන්නමේ. මුළු මිහි පිට වේවා, කිසි ම ජාතියක්
අතර වේවා, කවදා වත් නොකළ අරුමපුදුම දේ මම
නුඹේ සනෙඟ ඉදිරියෙහි සිදු කරමි. එවිට සමිඳාණන්
වහන්සේ වන මට කරන්නට හැකි දේ නුඹ සමඟ
සිටින සියලු සනෙඟ දැනගනු ඇත. මන්ද, නුඹ මඟින්
මා කරන්න යන්නේ භයානක දයෙකි. 11 අද දින මා
නුඹට අණ කරන පණත් පිළිපදින්න. බලන්න, නුඹ
යන්න කලින් අමෝරිවරුන්, කානානිවරුන්,
හිත්තීවරුන්, පරෙිස්සිවරුන්, හිවීවරුන් හා ජබෙුසිවරුන්
මම පන්නාදමමි. 12 නුඹ යන දේශයේ වැසියන්
සමඟ ගිවිසුමක් නොකිරීමට බලාගන්න. මන්ද, එය
නුඹට මර උගුලක් වන්නට පුළුවන. 13 ද්වි.නී.
16:21තවද, නුඹ ඔවුන්ගේ පූජාසන වනසා
ශිලාස්තම්භ කුඩු කොට, අෂේරා නම් ශුද්ධස්ථාන
සිඳ හළෙිය යුතු යි.
14 “නුඹ අන් දවේියකුෙට නමස්කාර නොකළ යුතු
ය. මන්ද, සමිඳාණන් වහන්සේ වන මාගේ නාමය,
‘ප්රතිවාදීන් නොඉවසන උතුමාණෝ’ යනු බැවින් මම
ප්රතිවාදීන් නොඉවසන දවේ කනෙකේි. 15 එබැවින්
නුඹ දේශයේ වැසියන් සමඟ ගිවිසුමක් නොකළ
යුතු ය. මන්ද, ඔවුන් මට අවිශ්වාසවන්ත වී අන්
දවේිවරුන් වැළඳගනෙ පුද පූජා ඔප්පු කරන බැවින්,
නුඹ ද කැඳවූ කල, නුඹත් ඒ පිදේනිවලින් කන්න
පුළුවන. 16 ඇරත් නුඹේ පුතුන්ට ඔවුන්ගේ දූවරුන්
පාවා දී, ඔවුන්ගේ දූවරුන් මට අවිශ්වාසවන්ත වී අන්
දවේිවරුන් වැළඳගන්න කල නුඹලාගේ පුතුන් ද මට
අවිශ්වාසවන්ත වී අන් දවේිවරුන් වැළඳගන්න
පුළුවන.
17 නික්ම 20:4; ලවේ 19:4; ද්වි.නී. 5:8; 27:15
“වාත්තු කළ දවේ පිළිම සාදා නොගත යුතු ය.
18 නික්ම 12:14-20; ලවේ 23:6-8; ගණන් 28:16-25
“නුඹ නුමුහුන් රොටි මංගල්යය පැවැත්විය යුතු ය.
මා නුඹට අණ කළ පරිදි ආබිබ් නම් මාසයේ දී දින
හතක් නුමුහුන් රොටි අනුභව කළ යුතු ය. මන්ද,
නුඹ මිසර දේශයනේ පිටත ආවේ ඒ මාසයේ ය.
19 නික්ම 13:2සියලු කුලුඳුලෝ මට අයිති වති.
නුඹේ ගොවිපළේ ගවයන්ගේ හෝ බැටළුවන්ගේ
හෝ සෑම කුලුඳුල් පිරිමි සතකේ ම මට අයිති වේ.
20 නික්ම 13:13කුලුඳුල් කොටළුවකුෙ වනුෙවට බැටළු
පැටවකුෙ දී ඌ මුදාගත යුතු ය. නුඹ ඌ මුදා
නොගන්නහෙි නම්, උගේ බලේල කැඩිය යුතු ය.
තවද, සියලු ම කුලුඳුල් පිරිමි දරුවන් නුඹ මුදාගත
යුතු ය. කිසිවකුෙ හිස් අතින් මා ඉදිරියට නො ආ
යුතු ය.
21 නික්ම 20:9-10; 23:12; 31:15; 35:2; ලවේ 23:3;
ද්වි.නී. 5:13-14 “දවස් හයක් නුඹ වැඩ කර, හත් වන
දවසේ නිවාඩු ගත යුතු ය. සීසාන කාලයේ හෝ
අස්වැන්න නළෙන කාලයේ හෝ වුවද එදින නිවාඩු
ගත යුතු ය.
22 ලවේ 23:15-21,39-43; ගණන් 28:26-31 “තවද
නුඹ සති මංගල්යය ද තිරිඟු අස්වැන්නේ නාඹුල් පල
මංගල්යය ද අවුරුද්ද අවසානයේ දී පලතුරු රුැස්
කිරීමේ මංගල්යය ද පැවැත්විය යුතු ය.
23 “අවුරුද්දකට තුන් වරක් නුඹේ සියලු පිරිමින්,
ඉශ්රායලේවරුන්ගේ දවේ සමිඳාණන් වහන්සේ වන
මා ඉදිරියෙහි පනේී සිටිය යුතු ය. 24 නුඹේ රටට
නුඹ ඇතුළු වන්නට කල් තියා, මම ජාතීන්
නරෙපාදැමූ පසු නුඹේ දේශ සීමා විශාල කරන්නමේ.
අවුරුද්දකට තවෙරක් නුඹේ දවේ සමිඳාණන්
වහන්සේ වන මා ඉදිරියෙහි පනේී සිටින්න යන විට
කිසිවකේ නුඹේ දේශය යටත් කරගන්න උත්සාහ
නොකරන්නෝ ය.
25 නික්ම 12:10 “නුඹ මට පුද කරන යාගයේ ලයෙ
මුහුන් සමඟ ඔප්පු නොකළ යුතු ය. තවද පාස්කු
මංගල්යයේ යාගය ද උදය දක්වා නොතැබිය යුතු ය.
26 ද්වි.නී. 14:21; 26:2 “නුඹේ කතේවලින් ඉස්තරම්
නාඹුල් පල නුඹේ දවේ සමිඳාණන් වහන්සේ වන
මාගේ ගෘහයට ගනො යුතු ය.
26 “තවද එළු පැටියකුෙ උගේ මවගේ කිරහෙි
නොපිසිය යුතු ය.”
27 නැවතත් සමිඳාණන් වහන්සේ මෝසසේට කතා
කොට,
27 “නුඹ මේ වචන ලියාගන්න. මන්ද, මේ වචන
අනුව මා නුඹ සමඟ ද ඉශ්රායලේවරුන් සමඟ ද
ගිවිසුමක් පිහිටුවන හයෙිනි”යි වදාළ සේක.
28 මෝසසේ ද කන්ද මත සමිඳාණන් වහන්සේ
සමඟ දාවල් හතළිහක් හා රාත්රි හතළිහක් කිසිවක්
නොකා නොබී සිටියේ ය. ඔහු ගිවිසුමේ වචන වන
දස පණත ගල් පුවරුවල සටහන් කළෙේ ය.

### මෝසෙස් කන්දෙන් බැස ඒම

29 2 කොරි 3:7-16 මෝසෙස් සාක්ෂි ගල් පුවරු
දෙක තම අතේ තබාගෙන කන්දෙන් බැස්සේ ය.
එහෙත්, සමිඳාණන් වහන්සේ සමඟ කතා කිරීම
නිසා තම මුහුණ බැබළමින් තිබුණ බව ඔහු
කන්දෙන් බැස එන කල නොදැන සිටියේ ය.
30 ආරොන් සහ සියලු ඉශ්රායලේ ජනයා මෝසෙස්
දුටු විට, පුදුමයකි! ඔහුගේ මුහුණ බැබළමින්
තිබිණි. එවිහු ඔහු ළඟට එන්නට බිය වූ හ.
31 එහෙත්, මෝසෙස් ඔවුන් කැඳවූ කල ආරොන් සහ
ප්රජා මූලිකයන් සියලු දෙනෙ, ඔහු වෙත හැරී ආ විට
ඔහු ඔවුන් සමඟ කතා කළේ ය. 32 ඉන්පසු මුළු
ඉශ්රායලේ සෙනඟ ම ඔහු වෙත ළඟා වූයෙන් ඔහු
සමිඳාණන් වහන්සේ ඔහුට සීනයි කන්දේ දී වදාළ
ආඥා සියල්ල ඔවුන්ට දුන්නේ ය. 33 මෝසෙස් ඔවුන්
සමඟ කතා කොට නිම වූ පසු තම මුහුණ
වැස්මකින් වසාගත්තේ ය. 34 එහෙත්, ඔහු
සමිඳාණන් වහන්සේ සමඟ කතා කිරීමට උන්
වහන්සේගේ අභිමුඛයට ප්රවේශ වූ විට, ඉන්
පිටත එන තෙක් ඒ වැස්ම ඉවත් කොට තැබී ය.
ඔහු පිටතට පැමිණ තමාට අණ කළ සියල්ල
ඉශ්රායලේ සෙනඟට දැන්වීය. 35 ඉශ්රායලේ සෙනඟ
මෝසෙස්ගේ මුහුණ දෙස බැලූ කල ඔහුගේ මුහුණ
බැබළමින් තිබුණ බව දුටහ. ඔහු සමිඳාණන්
වහන්සේ සමඟ කතා කරන්න ආපසු යන තෙක්
තම මුහුණ වැස්මෙන් වසාගත්තේ ය.

### සබත් දින පිළිබඳ නියෝග

35 මෝසෙස් මුළු ඉශ්රායලේ ජනතාව කැඳවා,
ඔවුන්ට කතා කොට මෙසේ කීවේ ය: “ඔබ
විසින් කළ යුතු සමිඳාණන් වහන්සේ අණ කළ
කරුණු මේවා ය: 2 නික්ම 20:8-11; 23:12; 31:15;
34:21; ලෙවී 23:3; ද්වි.නී. 5:12-14‘දවස් හයක් තුළ
ඔබ වැඩ කළ යුතු ය. එහෙත්, හත් වන දින ඔබට
ශුද්ධ දිනයක් ද සමිඳාණන් වහන්සේට කැප කළ
සබත් නිවාඩුවක් ද විය යුතු ය. එදින වැඩ කරන
කවරකු නමුත් මරනු ලැබිය යුතු ය. 3 සබත් දවසේ
දී ඔබේ කිසි ම නිවාසයක ගින්නක් පවා නො
දැල්විය යුතු ය.’ ”

### ශුද්ධස්ථානයට පුදන පඬුරු
(නික්ම 25:1-9)

4 නැවතත් මෝසෙස් මුළු ඉශ්රායලේ ජනතාව
අමතමින් මෙසේ කීවේ ය: “සමිඳාණන් වහන්සේ
අණ කළ දේ මේ ය: 5 ඔබ සතු දෙයින් සමිඳාණන්
වහන්සේට පඬුරක් වෙන් කළ යුතු ය. එසේ කිරීමට
කැමැති සෑම කෙනෙකු ම තම පඬුර සමිඳාණන්
වහන්සේ වෙත ගෙන යුතු ය. එය රන්, රිදී,
ලෝකඩ ද 6 නිල් පාට, දම් පාට, රතු පාට නූල් ද
සිහින් ව කටින ලද හණ සහ එළු ලොම් ද 7 රතු
සායම් පොවූ බැටළු හම් හා පදම් කළ හම් ද ෂිටිම්
ලී ද 8 පහන්වලට තෙල් ද, ආලේප තෙලෙයට හා
සුවඳ දුම් සඳහා සුගන්ධ ද්රව්ය ද 9 ඒපොද් නම්
සැට්ටයේ සහ ළය වැස්මේ එබ්බවීමට නබමාණික්ය
හා වෙනත් මැණික් ද විය හැක.”

### මණ්ඩපය සඳහා උපකරණ
(නික්ම 39:32-43)

10 “ඔබ අතර සිටින සියලු දක්ෂ ශිල්පීන් පැමිණ,
සමිඳාණන් වහන්සේ අණ කළ සියල්ල සෑදිය යුතු ය.
11 එනම් මණ්ඩපය සහ එහි කූඩාරම, ඊට
ආවරණය, කොකු සහ ලෑලි, හරස් පොලු සහ කණු,
කවෙණි; 12 ගිවිසුම් කරඬුව සහ එය උසුලාගෙන
යෑමට පොලු, කරුණාසනය, එය වසන තිරය;
13 මේසය සහ එහි කකුල්, එහි උපකරණ සහ පුදන
රොටි 14 ආලෝකය දීමට පහන් රුක, එහි උපකරණ,
එහි පහන් හා ඒවා දැල්වීමට තෙල්; 15 දුම්
පූජාසනය හා එහි පොලු, ආලේප තෙලෙය, සුවඳ
දුම්, මණ්ඩපයට ඇතුළු වන දොරටුවේ කඩතුරාව;
16 දවන යාග පූජාව පුදන පූජාසනය, ඊට සම්බන්ධ
ලෝකඩ මේසය, එහි පොලු හා සියලු උපකරණ,
සේදීමට වතුර දමන භාජනය හා එහි අඩිය;
17 මළුවට තිර, එහි කණු, කවෙණි, මළුවේ
දොරටුවට කඩතුරාව; 18 මණ්ඩපයට හා මළුවට
කූඤ්ඤ හා ඒවායේ ලණු; 19 ශුද්ධස්ථානයේ සේවය
පිණිස නිල් වස්ත්ර, පූජක නිලයේ සේවාවට පූජක
ආරොන්ගේ ශුද්ධ වස්ත්ර හා ඔහුගේ පුතුන් හට
වස්ත්ර යන ඒවා සෑදිය යුතු ය.”

### සෙනඟ පඬුරු ගෙනෙ ඒම

20 ඉන්පසු මුළු ඉශ්රායලේ ජනතාව මෝසෙස්
වෙතින් නික්ම ගියහ. 21 තවද, එසේ දීමට සිය
කැමැත්තෙන් එකඟ වූ සෑම කෙනෙකේ ම සම්මුඛ
මණ්ඩපය සෑදීමට ද එහි සියලු සේවාවන් සඳහා ද
ශුද්ධ වස්ත්ර සඳහා ද සමිඳාණන් වහන්සේ වෙත
පඬුරු රැගෙන ආහ. 22 ස්ත්රීහු හා පුරුෂයෝ
පැමිණියහ. දීමට කැමැති සෑම දෙනා ම, හාරිච්චි,
කුණ්ඩලාභරණ, මුදු, මාල සහ නන්වැදෑරුම් රත්රන්
බඩු ගෙනොහ. මෙලෙසෙ සියල්ලෝ ම සමිඳාණන්
වහන්සේට කැප කළ රත්රන් බඩු රැගෙන
පැමිණියහ. 23 නිල් පාට, දම් පාට, රතු පාට නූල් ද
සිහින් ව කටින ලද හණ ද එළු ලොම් ද රතු සායම්
පොවූ බැටළු ලොම් ද පදම් කළ හම් ද ඇති සියලු
දෙනෙ ඒවා ගෙනොහ. 24 රිදී හෝ ලෝකඩ හෝ
දෙන්නට හැකි වූ සියල්ලෝ ම ඒවා සමිඳාණන්
වහන්සේ වෙත පඬුරු වශයෙන් ගෙනොහ. යම්
වැඩකට ගත හැකි ෂිටිම් ලී තිබූ සියල්ලෝ ද ඒවා
ගෙනොහ. 25 දක්ෂකම් ඇති කාන්තාවන් සියල්ලෝ ද
සිය අත්වලින් නූල් කටින්න පටන්ගෙනෙ, ඔවුන් විසින්
කටින ලද නිල් පාට, දම් පාට, රතු පාට නූල් ද
සිහින් හණපිළි ද ගෙනොහ. 26 දක්ෂ කාන්තාවන්
සියල්ලෝ ද තම හැකියාවන් අනුව එළු ලොම්
කටින්නට පටන්ගත්හ. 27 ඒපොද් නම් සැට්ටයේ හා
ළය වැස්මේ ඔබ්බනු සඳහා ප්රජා මූලිකයෝ
නබමාණික්ය හා වෙනත් මාණික්ය ද 28 පහනට

තලේ ද ආලේප තලෙය හා සුවඳ දුම් සඳහා
සුගන්ධ ද්‍රව්‍ය හා තලේ ද ගෙනාහ. 29 සමිඳාණන්
වහන්සේ මෝසෙස් මඟින් සෑදීමට අණ කළ
නන්වැදෑරුම් සේවාවන් සඳහා බඩු දීමට එකඟ වූ
ඉශ්‍රායලේ ජනයා අතර සිටි සෑම ස්ත්‍රියක් හා
පුරුෂයකේ ම සිය කැමැත්තනේ ම සමිඳාණන්
වහන්සේ වෙත තම පඬුරු ගෙනාහ.

### ශුද්ධස්ථානය සඳහා ශිල්පීහු
(නික්ම 31:1-11)

30 මෝසෙස් ඉශ්‍රායලේ ජනයාට කතා කොට
මෙසේ කීවේ ය: “බලන්න, සමිඳාණන් වහන්සේ
ජුදා ගෝත්‍රයේ හූර්ගේ පුත්‍රයා වන උරීගේ පුත්
බෙශලලේ තෝරාගත් සේක. 31 උන් වහන්සේ ඔහු
දේවාත්මානුභාවයනේ පුරවා, කෞශල්‍යය, හැකියාව
සහ අවබෝධය ඔහුට දානය කළ සේක. එසේ
කළෙේ නන්වැදෑරුම් කලාත්මක කෘතීන් සඳහාත්,
32 දක්ෂ කලාවන් නිපැයීමටත් ඒවායේ රනින් හා
රිදීයනේ හා ලෝකඩයනේ කැටයම් කිරීමටත්,
33 මැණික් ගල් කපා ඒවායේ එබ්බවීමටත්, ලීයනේ
කැටයම් වැඩ කිරීමටත්, වෙනත් නා නා විධ
කලාත්මක කෘතීන් සෑදීමටත් ය. 34 උන් වහන්සේ
ඔහුට ද දාන්ගේ ගෝත්‍රයේ අහිසාමක්ගේ පුත්
ඔහොලියාබ්ට ද කලා ශිල්පීන්ට ඉගැන්වීමේ වරය
දුන් සේක. 35 තවද, උන් වහන්සේ කැටයම්
ශිල්පීන්ගේ ද කලා ශිල්පීන්ගේ ද නිල් පාට, දම් පාට
සහ තද රතු පාට නූලින් සහ සිහින් ව කටින ලද
හණවලින් මල් වැඩ දමන්නන්ගේ ද වියන්නන්ගේ ද
නන්වැදෑරුම් කෘතීන් කිරීමට හැකියාව ඔවුන්ට දානය
කළ සේක. ඔවුන්ට සියලු ආකාර කලා වැඩ
කිරීමටත්, දක්ෂ ලෙස සැලැස්ම පිළියෙළ කිරීමටත්
පුළුවන් විය.

36 “තවද, සමිඳාණන් වහන්සේ බෙශලලේට
සහ ඔහොලියාබ්ට ද අනිකුත් කලා ශිල්පීන්ට
ද ශුද්ධස්ථානයේ සේවාවන් සඳහා වැඩ සියල්ල
පිළිබඳ අවබෝධය හා දක්ෂතාව දී ඇති බැවින්
ඔවුන් උන් වහන්සේ අණ කළ ලෙස සියල්ල ඉටු
කළ යුතු ය.”

### පඬුර ගෙන ඒම නතර කිරීම

2 බෙශලලේ හා ඔහොලියාබ් ද සමිඳාණන්
වහන්සේ කෞශල්‍යය දානය කළ වැඩ කිරීමට
කැමැත්ත පෑ දක්ෂ ශිල්පීන් සියල්ලන් ද වැඩට එන
ලෙස මෝසෙස් ඔවුන් කැඳවී ය. 3 ඉශ්‍රායලේ ජනයා
ශුද්ධස්ථානයේ වැඩ සඳහා, එය ඉදි කිරීමට ගෙනා
පඬුරු සියල්ල ඔව්හු මෝසෙස්ගනේ බාරගත්හ.
ඉශ්‍රායලේ ජනයා ද උදයක් උදයක් පාසා තම
තමන්ගේ පඬුරු ඔහු වෙත ගෙනෙන්නට වූ හ.
4 එවිට ශුද්ධස්ථානයේ වැඩවල යෙදී සිටි ශිල්පීන්
සියල්ලෝ ම තම තමන්ගේ වැඩ නවත්වා, මෝසෙස්
වෙත පැමිණ 5 ඔහුට කතා කොට, “සමිඳාණන්
වහන්සේ සෑදීමට අණ කළ වැඩය සඳහා උවමනාවට
වඩා දේවල් සෙනඟ ගෙනෙන්නාහ”යි කී හ.
6 මෝසෙස් ද එවිට අණක් දමේන්, “මින්පසු කිසි ම
පුරුෂයකේ හෝ ස්ත්‍රියක් හෝ ශුද්ධස්ථානයේ පඬුරු
පිණිස යමක් නොකෙරත් වා”යි යන ප්‍රකාශනයක්
මුළු කඳවුරු පුරා ප්‍රසිද්ධ කළෙේ ය. මෙලෙස
සෙනඟ පඬුරු ගෙන ඒමනේ වළක්වනු ලැබූ හ.
7 මන්ද, ගෙනෙන ලද බඩු බාහිරාදිය සියලු
කර්මාන්ත සාදා නිම කිරීමට ප්‍රමාණ වූවා පමණක්
නොව ඊට වැඩිමනක් ද විය.

### මණ්ඩපය සෑදීම
(නික්ම 26:1-37)

8 කම්කරුවන් අතර දක්ෂ ශිල්පීහු සියල්ලෝ ම
ශුද්ධස්ථානය සෑදූ හ. සිහින් ව කටින ලද හණවලින්
ද නිල් පාට, දම් පාට, තද රතු පාට නූල්වලින් ද තිර
දහයක් සාදන ලදු ව ඒවායේ කෙරුබ්වරුන්ගේ රූප
ගෙත්තම් කරන ලදී. 9 එක තිරයක දිග මීටර්
දොළොසක් ද පළල මීටර් දකෙක් ද විය. සියල්ල ම
එක ප්‍රමාණයට විය. 10 ඔහු තිර පහ බැගින් ගෙන
ඒවා වෙන වෙන ම එකට යා කළෙේ ය. 11 ඔහු
ඉන්පසු යා කළ තිරවල එක කොනෙක අන්තිම
තිරයේ වාටියේ නිල් පාට රදේවලින් මුදු සෑදී ය. යා
කළ අනිත් තිරවල, අන්තිම තිරයේ ද එලෙස ම
කළෙේ ය. 12 පසුව ඔහු එක තිර වාටියක මුදු
පණහක් ද ඒවා එකිනෙකට මුහුණ ලා සිටින ලෙස,
අනිත් තිරවල අන්තිම තිර වාටියේ මුදු පණහක් ද
සවි කළෙේ ය. 13 මෙසේ කළ පසු ඔහු රන් කොකු
පණහක් සාදා එක මණ්ඩපයක් වන පරිදි තිර
එකටකෙ කොකුවලින් සම්බන්ධ කළෙේ ය.
14 පසුව ඔහු මණ්ඩපය උඩින් කූඩාරම් ආවරණයක්
මෙන් දැමීමට එළු ලොමින් තිර එකොළහක් සෑදී ය.
15 එක එක තිරයේ දිග මීටර් දහතුනක් ද පළල
මීටර් දකෙක් ද විය. තිර එකොළහක් ම එක
ප්‍රමාණයට ද විය. 16 එවිට ඔහු තිර පහක් ද තිර
හයක් ද වෙනේ වෙනේ ව එකට යා කොට
17 පළමුවෙනේ යා කළ තිර පහේ අන්තිම තිරයේ
වාටියේ මුදු පණහක් ද අනිත් තිරවල අන්තිම
තිරයේ වාටියේ මුදු පණහක් ද සවි කළෙේ ය.
18 කූඩාරම් ආවරණය එකක් වන සේ ඔහු ලෝකඩ
කොකු පණහක් ද සෑදී ය. 19 මෙසේ සාදා රතු
සායම් පෙවූ බැටළු හම්වලින් කූඩාරමට ආවරණයක්
ද එය උඩ අතුරන පිණිස පදම් කළ සම් ආවරණයක්
ද සෑදී ය.
20 තවද, ඔහු මණ්ඩපයට ෂිටිම් ලීවලින් ලෑලි සාදා
ඒවා කළෙින් සිටුවිය. 21 එක ලෑල්ලක දිග මීටර්
හතරක් ද පළල සෙන්ටිමීටර් හැටහයක් ද විය.
22 එක එක ලෑල්ලක ඒවා එකටකෙ යා කිරීම පිණිස
කුඩිම්බි දකෙක් විය. මෙලෙස ඔහු මණ්ඩපයේ ලෑලි
සියල්ල ම සෑදී ය. 23 දකුණු දිශාවට මූණ ලා
මණ්ඩපයේ දකුණු පැත්තට ලෑලි විස්සක් සෑදී ය.
24 තවද, ඔහු එක ලෑල්ලක කුඩිම්බි දකෙ යට තවු
දකෙක් ද අනික් ලෑල්ලේ කුඩිම්බි දකෙ යට තවු
දකෙක් ද බැගින් ඔහු ලෑලි විස්සට රිදී තවු
හතළිහක් සෑදී ය. 25 මණ්ඩපයේ උතුරු පැත්තට ඔහු
ලෑලි විස්සක් ද 26 එක ලෑල්ලක් යට තවු දකෙ

බැගින් රිදී තවු හතළිහක් ද සෑදී ය. 27 මණ්ඩපයේ
පිටුපස බටහිර දිශාවට ලෑලි හයක් ද 28 එහි පිටුපස
කොන්වලට ලෑලි දෙකක් ද සෑදී ය. 29 මේ ලෑලි
ඒවායේ පහළ කොටස්වල සිට ඉහළ කොටසේ
පළමු වන වළල්ල දක්වා සම්බන්ධ කළ යුතු විය.
කොන් දෙකේ තබන ලෑලි දෙකට ද එලෙසම කළ යුතු
වේ. 30 මෙලෙස එක එක ලෑල්ලක තවු දෙක බැගින්
රිදී තවු දහසයක් සහිත ව ලෑලි අටක් ඇති වේ.
31 තවද, මණ්ඩපයේ එක පැත්තක තිබෙන
ලෑලිවලට ෂිටිම් ලීවලින් හරස් ලී පහක් සෑදිය යුතු
විය. 32 මණ්ඩපයේ අනික් පැත්තේ ලෑලිවලට තව
හරස් පොලු පහක් ද මණ්ඩපයේ බටහිර අංශයේ
ලෑලිවලට හරස් පොලු පහක් ද සෑදිය යුතු වේ.
33 ලෑලිවල මැදින් යන මැද හරස් ලීය එක කොනක
සිට අනිත් කොන දක්වා විහිදෙන ලෙස ඔහු එය
සෑදී ය. 34 ඔහු ලෑලි රනින් ආලේප කොට හරස් ලී
දැමීමට රන් මුදු ද සාදා, හරස් ලී ද රනින් ආලේප
කළේ ය.
35 ඉන්පසු ඔහු නිල් පාට, දම් පාට, තද රතු පාට
නූල්වලින් හා සිහින් ව කටින ලද හණපිළියෙන්
තිරයක් සාදා එහි කෙරුබ්වරුන්ගේ රූප ගෙත්තම්
කළේ ය. 36 මෙසේ කොට එය එල්ලීම සඳහා රිදී
තවු සතරක් සවි කළ රන් කොකු සතරක් ඇති රන්
ගෑ ෂිටිම් ලීයෙන් කණු සතරක් සෑදී ය. 37 පසුව ඔහු
මණ්ඩපයේ දොරටුවට, නිල් පාට, දම් පාට, තද රතු
පාට නූල්වලින් ද සිහින් ව කටින ලද හණවලින් ද
මල් වැඩ දැමූ කඩතුරාවක් ගෙතී ය. 38 මෙසේ
ගොතා ඔහු කොකු සවි කළ කණු පහක් සාදා,
ඒවායේ මුදුන් ද ඒවායේ පොලු ද රනින් ආලේප
කළේ ය. එහෙත් ඒවායේ තවු පහ ලෝකඩයෙන්
සාදන ලදී.

## ගිවිසුම් කරඬුව සෑදීම
(නික්ම 25:10-22)

37 බෙසලෙල් ද ෂිටිම් ලීයෙන් ගිවිසුම් කරඬුව
සෑදී ය. එහි දිග සෙන්ටිමීටර් එකසිය දහයක්
ද පළල සෙන්ටිමීටර් හැටහයක් ද උස සෙන්ටිමීටර්
හැටහයක් ද විය. 2 එහි ඇතුළත ද පිටත ද රන්
ආලේප කොට එය වටේට රන් ලීස්තරයක් සෑදී ය.
3 එය උසුලාගෙන යනු පිණිස එහි කොන් සතරට
රත්රන් වළලු සතරක් සාදා ඒවා එක පැත්තක දෙක
බැගින් දෙපැත්තේ සවි කළේ ය. 4 පසුව ඔහු ෂිටිම්
ලීයෙන් පොලු සාදා ඒවායේ ද රන් ගා, 5 කරඬුව
උසුලාගෙන යනු පිණිස කරඬුවේ දෙපැත්තේ මුදු
තුළින් ඒවා දැමී ය. 6 කරුණාසනය ද තනි රනින් සෑදී
ය. එහි දිග සෙන්ටිමීටර් එකසිය දහයක් ද පළල
සෙන්ටිමීටර් හැටහයක් ද විය. 7 තවද, ඔහු
කරුණාසනයේ දෙකෙළවරේ එක්කෙනා බැගින් සවි
කරනු පිණිස තළාපු රනින් කෙරුබ්වරුන් දෙදෙනෙකු
නිර්මාණ කළේ ය. 8 කරුණාසනය සමඟ ඒකාබද්ධ
ව පවතින ලෙස එක් කෙනෙකු එක් කොනක ද එක්
කෙනෙකු අනිත් කොනේ ද ඔහු ඔවුන් සෑදී ය.
9 කෙරුබ්වරුන්ගේ ද පියාපත් උඩට විහිදී,
කරුණාසනයට ඉහළින් එය වසා ගත්තාක් මෙන්
තිබිණි. තවද, ඔවුන් එකිනෙකා මුහුණට මුහුණ ලා
සිටින පරිදි කරුණාසනය දෙසට ඔවුන්ගේ මුහුණු
හැරී තිබිණි.

## මේසය සෑදීම
(නික්ම 25:23-30)

10 ෂිටිම් ලීයෙන් ඔහු මේසය ද සෑදී ය. එහි දිග
සෙන්ටිමීටර් අසූඅටක් ද පළල සෙන්ටිමීටර්
හතළිස්හතරක් ද උස සෙන්ටිමීටර් හැටහයක් ද විය.
11 එය ද රනින් ආලේප කොට එහි රනින්
ලීස්තරයක් ද ඔහු සෑදී ය. 12 එය වටේට මිලිමීටර්
හැත්තෑපහක් පළල පටියක් සවි කර, එය වටේ ද
රන් ලීස්තරයක් සෑදී ය. 13 පසුව රන් වළලු සතරක්
සාදා කකුල් සතරේ කොන් සතරේ ඒවා දැමී ය.
14 මේසය උසුලාගෙන යෑම සඳහා දමන පොලු
රිංගවන වළලු, පටිය ළඟ ම තිබිණි. 15 මේසය
උසුලාගෙන යෑම සඳහා පොලු ද ෂිටිම් ලීයෙන් සාදා
ඒවායේ ද රන් ආලේප කළේ ය. 16 එහි තබන
තැටි ද කුසලාන ද බුජම් ද පානීය පඬුරු දැමීමට
ගන්නා පාත්‍ර ද ඔහු තනි රනින් සෑදී ය.

## පහන් රුක සෑදීම
(නික්ම 25:31-40)

17 තවද, ඔහු පහන් රුක ද තනි රනින් සෑදුවේ ය.
එහි අඩිය ද කඳ ද තළාපු රනින් නිමවා, එහි මල් ද
මොට්ටු ද මල් පෙති ද එක වස්තුවක් වන සේ
සම්බන්ධ කළේ ය. 18 පහන් රුකේ එක පැත්තකින්
අතු තුනක් ද අනික් පැත්තෙන් අතු තුනක් ද බැගින්,
එහි පැතිවලින් අතු හයක් විහිදිණි. 19 එක අත්තක
කොට්ටම්බා වැනි මල් තුනක් ද මොට්ටු හා පෙති ද
අනික් අත්තේ කොට්ටම්බා වැනි මල් තුනක් ද
මොට්ටු හා පෙති ද බැගින් පහන් රුකින් විහිදෙන
අතු හයේ ම එලෙස කළේ ය. 20 පහන් රුක් කඳේ
කොට්ටම්බා වැනි මල් හතරක් ද ඒවායේ මොට්ටු ද
මල් පෙති ද තිබිණි. 21 පහන් රුකේ අතු දෙකෙක් යට
එක මල් මොට්ටුවක් ද තවත් අතු දෙකෙක් යට තව
මල් මොට්ටුවක් ද අනිත් අතු දෙක යට තව මල්
මොට්ටුවක් ද බැගින් ඉන් විහිදී ගිය අතු හයෙහි
එලෙස කළේ ය. 22 මොට්ටු සහ අතු, පහන් රුක
සමඟ ඒකාබද්ධ ව තිබිණි. සියල්ල ම තැළූ තනි
රනින් නිම කරන ලදී. 23 තවද, ඔහු ඊට පහන්
හතක් ද, පහන් තිර හා තැටි ද තනි රනින් සෑදී ය.
24 පහන් රුක හා එහි සියලු උපකරණ තනි රත්රන්
කිලෝග්රෑම් තිස්පහකින් සාදන ලදී.

## දුම් පූජාසනය සෑදීම
(නික්ම 30:1-5)

25 තවද, ඔහු ෂිටිම් ලීයෙන් දුම් පූජාසනයක් සෑදීය.
එය දිගින් සෙන්ටිමීටර් හතළිස්පහක් ද පළලින්
සෙන්ටිමීටර් හතළිස්පහක් ද උසින් සෙන්ටිමීටර්
අනූවක් ද වූ හතරැස් එකක් විය. එහි කොන්වල වූ
අං ද පූජාසනයට පාස්සා තිබිණි. 26 එහි මතුපිට ද
හතර පැත්ත ද අං ද තනි රනින් ආලේප කොට,

ඔහු එය වටේට රන් ලීස්තරයක් ද සෑදී ය. 27 තවද
එය උසුලාගෙන යන පිණිස පොලු රිංගවනු සඳහා
එහි දෙපැත්තේ දෙකෙළවරේ ලීස්තරය යට රන්
වළලු දෙකක් ඔහු සවි කළේ ය. 28 පොලු ද ඔහු
ෂිටිම් ලීයෙන් සාදා ඒවා රනින් ආලේප කළේ ය.

### ආලේප තෛලය සහ සුවඳ ද්‍රව්‍ය සෑදීම
(නික්ම 30:22-38)

29 තවද, සුවඳ ද්‍රව්‍ය සංයෝගකරුවකුගේ
ශාස්ත්‍රය අනුව ඔහු සුගන්ධ ද්‍රව්‍ය ගෙන ශුද්ධ
ආලේප තෛලය හා පිරිසිදු සුවඳ ද්‍රව්‍ය සංයෝගය
කළේ ය.නික්ම 30:22-38

### පූජාසනය සෑදීම
(නික්ම 27:1-8)

38 ඔහු ෂිටිම් ලීයෙන් දවන යාග පුදන
පූජාසනය සෑදී ය. එහි දිග මීටර් දෙකෙයි දශම
දෙකක් ද පළල මීටර් දෙකෙයි දශම දෙකක් ද උස
මීටර් එකයි දශම තුනක් ද වූ අතර එය
චතුරස්‍රාකාර විය. 2 එහි කොණ් හතරේ පිටතට
නෙරා ගිය අං හතර සාදා, පූජාසනය සමඟ
ඒකාබද්ධ වන සේ ඒවා පාස්සා ලෝකඩයෙන්
ආලේප කළේ ය. 3 ඉන්පසු එහි උපකරණ වන
බඳුන් හා ඉස්කෝප්ප හැඳි ද පාත්‍ර හා අඬු ද ගිනි
කබල් ද යන සියල්ල ලෝකඩයෙන් ම නිම කළේ
ය. 4 තවද, ඊට දැලක අයුරින් ලෝකඩයෙන් මැස්සක්
සාදා, පූජාසනයේ පහළ සිට එහි මැද හරියට වන
තරම්, එහි ගැටිය යට එය තැබී ය. 5 පසුව පොලු
රිංගවන පිණිස ලෝකඩ මැස්සේ හතර කොණේ
වළලු හතරක් යෙදී ය. 6 ෂිටිම් ලීයෙන් පොලු ද සාදා
ඒවා ලෝකඩයෙන් ආලේප කළේ ය. 7 ඉන්පසු
පූජාසනය උසුලාගෙන යෑමට එහි පැතිවල තිබූ වළලු
තුළින් පොලු දැමී ය. පූජාසනය තුළ ද කුහරයක්
ඇති වන සේ එය ලෑලිවලින් සෑදී ය.

### වතුර භාජන සෑදීම
(නික්ම 30:18)

8 නික්ම 30:18 ඉන්පසු ඔහු සම්මුඛ කූඩාරමට
ඇතුළු වන දොරටුව ළඟ සේවා කළ කාන්තාවන්ගේ
ලෝකඩ කැඩපත්වලින් වතුර භාජනය සහ එහි
ලෝකඩ අඩිය සෑදී ය.

### මණ්ඩපයේ මළුව සෑදීම
(නික්ම 27:9-19)

9 ඔහු මළුව ද තනා එහි දකුණු පැත්තට මුහුණ
දුන් දක්ෂිණ අංශයේ තිර සිහින් ව ගෙතූ හණවලින්
සෑදී ය. ඒවායේ දිග මීටර් හතළිස්හතරක් විය.
10 ඊට ලෝකඩයෙන් නිම කළ කුළුණු විස්සක් හා
තවු විස්සක් ද විය. කණුවල කොකු සහ පොලු
රිදීයෙන් සෑදිණි. 11 මළුවේ උතුරු පැත්තට ද මීටර්
හතළිස්හතරක් දිග තිර සාදන ලදී. ඒවාට කුළුණු
විස්සක් ද ලෝකඩ තවු විස්සක් ද වූ අතර
කුළුණුවල කොකු සහ පොලු රිදීයෙන් නිම විය.
12 එහි බටහිර පැත්තට ද මීටර් විසිදෙකෙක් දිග තිර
සෑදූ අතර ඒවාට කුළුණු දහයක් ද තවු දහයක් ද
සාදන ලදී. කුළුණුවල කොකු සහ ඒවායේ පොලු
රිදීයෙන් විය. 13 නැඟෙනහිර පැත්තට මුහුණ දුන්
නැඟෙනහිර අංශයේ තිරයේ දිග ද මීටර් විසිදෙකෙක්
විය. 14 දොරටුවේ එක පැත්තකට මීටර් හයයි දශම
හයක් දිග තිර විය. ඒවාට කුළුණු තුනක් හා තවු
තුනක් ද විය. 15 මළුවට ඇතුළු වන දොරටුවේ
අනික් පැත්තටත්, එලෙස ම තව දෙපැත්තකටත්
මීටර් හයයි දශම හයක් ද දිග තිර විය. ඒවාට
කුළුණු තුනක් හා තවු තුනක් ද විය. 16 තවද, මළුව
වටේට ම සෑදූ තිර සිහින් ව කටින ලද හණවලින්
විය. 17 කුළුණුවල තවු ලෝකඩයෙනුත් ඒවායේ
කොකු සහ පොලු ද ඒවායේ පේකඩ වැස්ම ද
රිදීයෙනුත් විය. මළුවේ කුළුණු සියල්ල රිදී
පොලුවලින් යා කරන ලදී. 18 මළුවට ඇතුළු වන
දොරටුවේ තිර ගෙත්තම් කොට මල් වැඩ දැමූ, නිල්
පාට, දම් පාට, තද රතු පාට නූල්වලින් ද සිහින් ව
කටින ලද හණවලින් ද විය. ඒවායේ දිග මීටර්
නවයකි, උස මීටර් දෙකෙකි. ඒවා මළුවේ තිර හා
සමාන විය. 19 ඒවාට කුළුණු හතරකි, ලෝකඩයෙන්
පොලු රිංගවන පිණිස ලෝකඩ මැස්සේ හතර සෑදූ
තවු හතරකි. ඒවායේ කොකු ද පේකඩ වැස්ම සහ
පොලු ද රිදීයෙන් විය. 20 තවද, මණ්ඩපයේ සහ
මළුව වටේට ම වූ කූඤ්ඤ සියල්ල ලෝකඩයෙන්
විය.

### ශුද්ධස්ථානය සෑදීමට ගත් ලෝහ

21 සාක්ෂි ගිවිසුම් කරඬුව තැබූ මණ්ඩපය සෑදීමට
ගත් ලෝහ වර්ගවල ප්‍රමාණය මෙසේ විය. මේ
ලැයිස්තුව මෝසෙස් විසින් අණ කරන ලදු ව,
ආරොන්ගේ පුත් ඊතාමාර් යටතේ වැඩ කළ
ලෙවීවරුන් විසින් පිළියෙළ කරන ලදී. 22 තවද,
සමිඳාණන් වහන්සේ මෝසෙස්ට සෑදීමට අණ කළ
සියල්ල, යූදාගේ ගෝත්‍රයේ හූර්ගේ පුත්‍රයා වන
ඌරීගේ පුත් බෙශෙලෙල් විසින් සාදන ලදී. 23 තවද,
ඔහු සමඟ දාන්ගේ ගෝත්‍රයේ අහිසාමක්ගේ පුත්‍ර
ඔහොලියාබ් ද විය. මොහු කැටයම් වැඩ
කරන්නෙකි, ගෙත්තම්කරුවෙකි, නිල් පාට, දම් පාට,
තද රතු පාට නූල් සහ සිහින් ව කටින ලද හණ
ගෙත්තම් කොට මල් වැඩ දමන්නෙකි.
24 සමිඳාණන් වහන්සේට කැප කළ,
ශුද්ධස්ථානයේ කර්මාන්ත සියල්ලට භාවිතා කළ
රත්‍රන්වල ප්‍රමාණය, කිලෝග්‍රෑම් දාහක් හා
ශුද්ධස්ථානයේ කිරුම් බර අනුව කිලෝග්‍රෑම්
තුන්දාස් හාරසිය තිහක් ද විය. 25 නික්ම
30:11-16ජන සංගණනය අනුව ලබාගත් රිදී
ප්‍රමාණය ශුද්ධස්ථානයේ කිරුම් බර අනුව
කිලෝග්‍රෑම් තුන්දාස් හාරසිය තිහක් විය. 26 මතෙ
17:24සංගණනයට ඇතුළත් වූ වයස අවුරුදු විස්සක්
හා ඊට වැඩි වූ සෑම කෙනෙකුගෙන් ම
ශුද්ධස්ථානයේ කිරුම් බර අනුව නියම මිල ගන්නා
ලදී. මෙසේ සංගණනයට ඇතුළත් වූ පිරිමි හයලක්ෂ

තුන්දාස් පන්සිය පණහක් වූ හ. 27 ශුද්ධස්ථානයේ
හා තිරවල තවු සඳහා, එනම් තවු එකකට
කිලෝග්රෑම් තිස්හතර බැගින් තවු සියයකට රිදී
කිලෝග්රෑම් තුන්දාස් හාරසිය තිහක් පාවිච්චි කරන
ලදී. 28 ඉතිරි වූ රිදී කිලෝග්රෑම් තිහ කුළුණුවල
කොකු සෑදීමටත්, කුළුණුවල පේකඩවල මුදුනේ
ගෑමටත්, ඒවායේ පොලුවලටත් භාවිතා කරන ලදී.
29 සමිඳාණන් වහන්සේට පිදූ ලෝකඩවල ප්රමාණය
කිලෝග්රෑම් දෙදාස් හාරසිය විසිපහක් විය. 30 එයින්
ඔහු සම්මුඛ මණ්ඩපයේ දොරටුවට තවු ද ලෝකඩ
පූජාසනය සහ ලෝකඩ මැස්ස ද පූජාසනයේ සියලු
උපකරණ ද 31 මළුව වටේට තිබූ තවු ද මළු
දොරටුවේ තවු ද මණ්ඩපයේ හා මළුව වටේ තිබූ
කූඤ්ඤ සියල්ල ද සෑදී ය.

## පූජක වස්ත්ර සෑදීම

(නික්ම 28:1-43)

39 තවද ඔව්හු නිල් පාට, දම් පාට, තද රතු
පාට නූල් ගෙන ශුද්ධස්ථානයේ සේවාවන්
සඳහා පූජක සේවා නිල ඇඳුම් සෑදූ හ. සමිඳාණන්
වහන්සේ මෝසෙස්ට අණ දුන් පරිදි ආරොන් සඳහා
ශුද්ධ වස්ත්ර සාදන ලදී.
2 ඔහු රනින් ද නිල් පාට, දම් පාට, තද රතු පාට
නූල්වලින් හා සිහින් ව කටින ලද හණවලින් ද
ඒපොද් නම් සැට්ටය සෑදී ය. 3 ඔව්හු රත්රන්, තුනී
තහඩුවලට තළා, රන් කෙඳි කපා, ඒවායින් නිල් පාට,
දම් පාට, තද රතු පාට නූල් ද සිහින් ව කටින ලද
හණ ද ගෙත්තම් කොට මල් වැඩ දැමූ හ. 4 ඉන්පසු
ඒපොද් නම් සැට්ටය සඳහා එය යා කිරීමට උර පටි
ද සාදන ලදු ව, එහි දෙකෙළවරට ඒවා සම්බන්ධ
කරන ලදී. 5 එය සමඟ ඒකාබද්ධ ව පවතින සේ,
එය හා සමාන වූ ගොතන ලද බඳපටිය ද
සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අණ දුන් පරිදි නිල්
පාට, දම් පාට, තද රතු පාට නූල්වලින් හා සිහින් ව
කටින ලද හණවලින් සාදන ලදී. 6 ඔව්හු
නඛමාණික්ය සාදා ඒවා රන් කෙවෙණිවලට එබ්බූ හ.
මුද්රා කැටයම් කලාව අනුව, ඉශ්රායෙල් ජනතාවගේ
නාම ඒවායේ කැටයම් කරන ලදී. 7 සමිඳාණන්
වහන්සේ මෝසෙස්ට අණ කළ පරිදි, ඉශ්රායෙල්
ජනයා පිළිබඳ සිහිවටනයක් වන පිණිස, ඔහු ඒවා
ඒපොද් නම් සැට්ටයේ උර පටිවල දැමී ය.
8 ඒපොද් සැට්ටය මෙන් ම, ළය වැස්ම ද ගෙත්තම්
කොට එහි මල් වැඩ දැමී ය. එය ද රනින් හා නිල්
පාට, දම් පාට, තද රතු පාට නූල්වලින් හා සිහින් ව
කටින ලද හණවලින් ද සාදන ලදී. 9 එය
චතුරස්රාකාර විය. දෙපටක් වන සේ එය සාදන ලදු
ව එහි දිග සෙන්ටිමීටර් විසිදෙකක් ද පළල
සෙන්ටිමීටර් විසිදෙකක් ද විය. 10 එය මතුපිට
මැණික් ගල් පේළි හතරක් බඳිනු ලැබී ය. පළමු වන
පේළිය ලෝහිතංකයක් ද පුෂ්පරාගයක් ද
මරකතයක් ද, 11 දෙ වන පේළිය පච්ච මාණික්යයක්
ද නීල මාණික්යයක් ද වජ්රයක් ද, 12 තෙ වන
පේළිය පද්මරාගයක් ද වර්ණ කාන්තියක් ද අඹතෙස්
ගලක් ද 13 සතර වන පේළිය රන් කාන්තියක් ද රතු
කැටයක් ද සූර්ය කාන්තියක් ද විය. ඒවා රන්
කෙවෙණිවල බහා තිබිණි. 14 මෙසේ ඉශ්රායෙල්
ජනයාගේ නාම අනුව ගල් දොළොසක් තිබිණි. මුද්රා
කැටයම් කලාව අනුව එක් එක් ගලක ගෝත්ර
දොළොසේ නාම එක එක බැගින් තිබිණි. 15 ළය
වැස්ම සඳහා තනි රනින් එකට ගෙතූ මාල සාදනු
ලැබී ය. 16 ඔව්හු රන් කෙවෙණි දෙකක් හා රන් මුදු
දෙකක් සාදා ළය වැස්මේ දෙකෙළවරේ ඒ මුදු දෙක
දැමූ හ. 17 ඔව්හු ගෙතූ රන් මාල දෙක ළය වැස්මේ
දෙකෙළවරේ වූ මුදු දෙකේ ඇමුණුවෝ ය. 18 ගෙතූ
මාල දෙකේ අනිත් දෙකෙළවරේ රන් කෙවෙණි
දෙකට අමුණා ඒවා ඒපොද් සැට්ටයේ උර පටි
ඉස්සරහින් තැබූ හ. 19 තවද, ඔව්හු රන් මුදු දෙකක්
ද සාදා, ළය වැස්මේ පහත වාටියේ දෙකෙළවරේ
ඒපොද් සැට්ටය දෙසට ඇතුළු පැත්තේ ඒවා සවි
කළහ. 20 ඔව්හු තවත් රන් මුදු දෙකක් සාදා ඒපොද්
සැට්ටයට යටින්, දෙපැත්තේ, එහි උර පටි දෙක පිට,
සන්ධිය ළඟ ගොතන ලද බඳපටියට උඩින් ඒවා දැමූ
හ. 21 තවද, සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අණ
කළ පරිදි, ළය වැස්ම, ඒපොද් සැට්ටයේ ගොතන
ලද බඳපටිය මත තිබෙන පිණිසත්, එය ඒපොද් නම්
සැට්ටයෙන් බුරුල් නොවී පවතින පිණිසත් එහි මුදු,
ඒපොද් සැට්ටයේ මුදුවලට නිල් පැහැති පටියකින්
බඳින ලදී.
22 ඉන්පසු ඔව්හු ඒපොද් සැට්ටයේ සළුව
මුළුමනින් ම නිල් පැහැති ලෝමවලින් සෑදූ හ.
23 එහි මැද හිස දැමීමට සිදුරක් තිබූ අතර, මේ
සිදුර නොඉරෙන පිණිස හම් කබායක සිදුර මෙන්
එය වටේට වියන ලද වාටියක් විය. 24 තවද, ඔව්හු
එහි පහළ වාටිය දිගේ ම නිල් පාට, දම් පාට, තද
රතු පාට නූල්වලින් ද සිහින් ව කටින ලද හණවලින්
ද දෙළෙම් ගෙඩි සෑදූ හ. 25 ඉන්පසු ඔව්හු තනි රනින්
මිණිගෙඩි සාදා, ඒ මිණිගෙඩි, සළුවේ පහළ වාටිය
දිගේ ම දෙළෙම් ගෙඩි අතර දැමූ හ. 26 මෙලෙස
සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අණ කළ පරිදි
පූජක සළුවේ වාටිය දිගේ ම රන් මිණිගෙඩියක් හා
දෙළෙම් ගෙඩියක් බැගින් මාරුවෙන් මාරුවට තිබිණි.
27 ඔව්හු ආරොන් සහ ඔහුගේ පුත්රයන් සඳහා
සිහින් ව කටින ලද හණවලින් කබා ද 28 මකුටයක්
සහ හිස් වැසුම් ද කලිසම් ද 29 සිහින් ව කටින ලද
හණවලින් හා නිල් පාට, දම් පාට, තද රතු පාට
නූල්වලින් ගොතන ලද බඳපටියක් ද සෑදූ හ. මේ
සියල්ල ම සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අණ කළ
පරිදි ඔව්හු ඉටු කළහ. 30 පසුව ඔව්හු තනි රනින්
කිරීටයේ තහඩුවක් සාදා එය මත මුද්රා කැටයම්
කලාව අනුව “සමිඳාණන් වහන්සේට කැප ය” යන
වචන කැටයම් කළහ. 31 ඉන්පසු සමිඳාණන්
වහන්සේ මෝසෙස්ට අණ කළ පරිදි ඔව්හු ඊට නිල්
පටියක් බැඳ එයින් එය මකුටයට වෙළහ.

## කර්මාන්ත සියල්ල සම්පූර්ණ කිරීම
(නික්ම 35:10-19)

32 මෙලෙසෙ ජනතාවගේ සම්මුඛ මණ්ඩපයේ වැඩ
සියල්ල නිම කරන ලදී. සමිඳාණන් වහන්සේ
මෝසෙස්ට අණ කළ පරිදි ම ඉශ්රායලේ ජනයා
සියල්ල කළහ. 33 ඉන්පසු ඔව්හු මෝසෙස් වෙත
මණ්ඩපය ද කූඩාරම හා එහි බඩු බාහිරාදිය සියල්ල
ද කොකු හා ලෑලි ද හරස් ලී හා කුළුණු ද ඒවායේ
තවු ද 34 රතු සායම් පෙවූ බැටළු හම් ද පදම් කළ
හම් ද කඩතුරාවේ තිරය ද 35 ගිවිසුම් කරඬුව හා
එහි පොලු ද කරුණාසනය ද 36 මේසය හා එහි
උපකරණ සියල්ල ද පිදුම් රොටි ද 37 තනි රන්
පහන් රුක හා එහි පහන් ද පිළිවෙළට තබන පහන්
හා එහි උපකරණ සියල්ල ද පහන දැල්වීමට තෙල ද
38 රන් පූජාසනය ද ආලේප තෙලෙය හා සුවඳ
ද්රව්ය ද මණ්ඩපයේ දොරටුවට කඩතුරාව ද
39 ලෝකඩ පූජාසනය ද එහි ලෝකඩ මැස්ස ද එහි
පොලු හා එහි සියලු උපකරණ ද වතුර භාජනය හා
එහි අඩිය ද 40 මළුවේ තිර හා කුළුණු ද ඒවායේ
තවු ද මළුවේ දොරටුවට සෑදූ කඩතුරාව ද එහි ලණු
හා කූඤ්ඤ ද මණ්ඩපයේ හා සම්මුඛ මණ්ඩපයේ
සේවාවන් සඳහා වූ උපකරණ සියල්ල ද
41 ශුද්ධස්ථානයේ සේවාව සඳහා සියුම් ව වියන ලද
සේවා පිළි ද පූජක නිලයේ සේවා කිරීමට අවශ්ය
වන පූජක ආරොන්ගේ ශුද්ධ වස්ත්ර හා ඔහුගේ
පුත්රයන්ගේ වස්ත්ර ද ගෙනොහ. 42 සමිඳාණන්
වහන්සේ මෝසෙස්ට අණ කළ පරිදි ම ඉශ්රායලේ
ජනයා සියල්ල ඉටු කළහ. 43 මෝසෙස් කර්මාන්ත
සියල්ල නැරඹූව විට සමිඳාණන් වහන්සේ අණ කළ
ප්රකාර ම ඔවුන් සියල්ල ම ඉටු කර තිබෙනෙ බව
දැක ඔහු ඔවුන්ට ආශීර්වාද කළේ ය.

## මණ්ඩපය ඉදි කොට කැප කිරීම

40 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට මෙසේ වදාළ සේක: 2 "පළමු වන
මාසයේ පළමු වන දින දී මණ්ඩපයේ සම්මුඛ
මණ්ඩපය සාදා, 3 එහි ගිවිසුම් කරඬුව තබා
තිරයකින් වැසිය යුතු ය. 4 මේසය ගෙනැවිත්, එය
මත පිළිවෙළට තැබිය යුතු දේවල් එය මත තබා,
පහන් රුක ද ගෙනැවිත්, එහි පහන් දැල්විය යුතු ය.
5 දුම් දවන රන් පූජාසනය ද ගිවිසුම් කරඬුව
ඉදිරිපිට තබා කූඩාරම් දොරටුවට කඩතුරාව දැමිය
යුතු ය. 6 ඉන්පසු සම්මුඛ මණ්ඩපයේ දොරටුව
ඉදිරිපිට දවන යාග පූජාසනය තැබිය යුතු වේ.
7 සම්මුඛ මණ්ඩපයත්, පූජාසනයත් අතර වතුර
භාජනය තබා ඊට වතුර පිරවිය යුතු ය. 8 වටේට
මළුව ද සකස් කොට මළුවේ දොරකඩ කඩතුරාව
එල්ලිය යුතු ය.
9 "ඉන්පසු ආලේප තෙලෙය ගෙන මණ්ඩපයත්,
එහි ඇති සියල්ලත් ආලේප කොට, එයත්, එහි
උපකරණ සියල්ලත් කැප කළ යුතු ය. මෙලෙසෙ එය
ශුද්ධ එකක් වනු ඇත. 10 දවන යාග පූජාසනය ද
එහි සියලු උපකරණ ද තෙලෙන් ආලේප කොට,
පූජාසනය කැප කළ යුතු වේ. මෙලෙසෙ එම
පූජාසනය අතිශුද්ධ එකක් වනු ඇත. 11 වතුර
භාජනයත්, එහි අඩියත් ආලේප කොට එය කැප
කළ යුතු වේ.
12 "ඉන්පසු ආරොන් ද ඔහුගේ පුත්රයන් ද සම්මුඛ
මණ්ඩපයේ දොරකඩට ගෙනැවිත් ඔවුන්ට ස්නානය
කරන්ට සැලැස්විය යුතු ය. 13 පසුව ආරොන් පූජක
නිලයේ මා හට සේවා කරනු පිණිස ඔහුට ශුද්ධ
වස්ත්ර හඳවා, ආලේප කොට, කැප කළ යුතු වේ.
14 මෙසේ කළ පසු ඔහුගේ පුත්රයන් ගෙනැවිත්
ඔවුන්ට කබා හඳවා 15 ඔවුන්ගේ පියා ආලේප කළ
ලෙසෙ, ඔවුන් ද මා හට පූජක නිලයේ සේවා කරනු
පිණිස ආලේප කළ යුතු ය. මෙසේ කිරීමෙනේ
ඔවුන්ගේ සෑම පරපුරක් තුළ ම ඔවුන් හට සදාතන
පූජකවරය දෙනු ඇත."
16 සමිඳාණන් වහන්සේ ඔහුට අණ කළ
ප්රකාරයට ම මෝසෙස් සියල්ල ඉටු කළේ ය.
17 මෙලෙසෙ ඔවුන් මිසර දේශයෙනේ නික්ම පැමිණි දෙ
වන අවුරුද්දේ පළමු වන මාසයේ පළමු වන දවසේ
දී මණ්ඩපය ඉදි කරන ලදී. 18 මෝසෙස් ද මණ්ඩපය
ඉදි කොට, එහි තවු සවි කර, ලෑලි ගසා, හරස් ලී
දමා, එහි කුළුණු කෙළෙන් කළේ ය. 19 සමිඳාණන්
වහන්සේ මෝසෙස්ට අණ කළ ලෙසෙ ඔහු මණ්ඩපය
මතුපිටින් කූඩාරම අතුරා ඊට උඩින් කූඩාරම්
ආවරණය තැබී ය. 20 පසුව ඔහු දස පණතේ ගල්
පුවරු කරඬුවට දමා ගිවිසුම් කරඬුවට පොලු යොදා,
එය මත කරුණාසනය තැබී ය. 21 ඉන්පසු ඔහු
සමිඳාණන් වහන්සේ අණ කළ පරිදි ගිවිසුම් කරඬුව
මණ්ඩපය තුළට ගෙනැවිත්, තිරය එල්ලා ගිවිසුම්
කරඬුව වසාදැමී ය.
22 මණ්ඩපයේ උතුරු පසට තිරයෙනේ පිටත ඔහු
සම්මුඛ මණ්ඩපය තුළ මේසය තැබී ය. 23 පසුව
සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අණ කළ පරිදි ඔහු
මේසය මත සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි පිදුම්
රොටි තැබී ය. 24 සම්මුඛ මණ්ඩපය තුළ මේසය
කෙළෙන් ම මණ්ඩපයේ දකුණු පසට ඔහු පහන් රුක
සිටුවා, 25 සමිඳාණන් වහන්සේ අණ කළ පරිදි උන්
වහන්සේ ඉදිරියෙහි පහන් දැල්විය. 26 සම්මුඛ
මණ්ඩපය තුළ තිරය ඉදිරිපිට රන් පූජාසනය තබා
27 උන් වහන්සේ මෝසෙස්ට අණ කළ පරිදි ඔහු එය
මත සුවඳ ද්රව්ය දැල්විය. 28 මණ්ඩපයේ දොරකඩ
කඩතුරාව ද එල්ලී ය. 29 පසුව මෝසෙස් සම්මුඛ
මණ්ඩපයේ දොරකඩ දවන යාග පූජාසනය තබා
එය මත උන් වහන්සේ අණ කළ පරිදි දවන යාග
පූජාව සහ ආහාර පූජාව පිදී ය. 30 සම්මුඛ
මණ්ඩපයත්, පූජාසනයත් අතර ඔහු වතුර භාජනය
තබා, පවිත්ර කරගන්නා පිණිස එහි වතුර වත්
කළේ ය. 31 මෝසෙස් සහ ආරොන් ද ආරොන්ගේ
පුත්රයෝ ද තම අත් පා එහි සෝදාගත්හ. 32 ඔව්හු
සම්මුඛ මණ්ඩපයට ඇතුළු වන විට හෝ පූජාසනයට
ළඟා වන විට හෝ සමිඳාණන් වහන්සේ මෝසෙස්ට
අණ කළ පරිදි තමන් සෝදාගත්හ. 33 ඉන්පසු ඔහු
සම්මුඛ මණ්ඩපය හා පූජාසනය වට කර මළුව තනා,

මළුවේ දොරකඩ කඩතුරාව එල්ලී ය. මෙලෙස
මෝසෙස් කර්මාන්ත සියල්ල නිම කළේ ය.

### මණ්ඩපය වසාගත් වලාකුළ

(නික්ම 9:15-23)

34 1 රාජා 8:10-11; යෙසා 6:4; එසකි 43:4-5; එළිද
15:8 එවිට වලාකුළක් බැස සම්මුඛ මණ්ඩපය
වසාගත්තේ ය. මණ්ඩපය සමිඳාණන් වහන්සේගේ
මහිමාලංකාරයෙන් පිරී ගියේ ය. 35 වලාකුළ
මණ්ඩපය වසාගෙන සිටි බැවිනුත්, සමිඳාණන්
වහන්සේගේ මහිමාලංකාරයෙන් එය පිරී ගිය
බැවිනුත් මෝසෙස්ට ඊට ඇතුළු වීමට නොහැකි විය.
36 ඉශ්රායෙලේ ජනයා කඳවුරින් කඳවුරට යන විට,
ඔවුන් පිටත් ව ගියේ වලාකුළ මණ්ඩපයෙන් ඔසවනු
ලැබූ විට පමණ ය. 37 එහෙත්, වලාකුළ ඔසවනු
නොලැබුවේ නම් එය ඔසවනු ලබන දින තෙක්
ඔව්හු නික්ම නොගියහ. 38 මුළු ඉශ්රායෙලේ සෙනඟ
කඳවුරින් කඳවුරට යන විට ඔවුන්ට පෙනෙන පරිදි
සම්මුඛ මණ්ඩපය මත, දවල් කාලයේ දී සමිඳාණන්
වහන්සේගේ වලාකුළ ද රාත්රි කාලයේ දී ගින්න ද
දෘශ්යමාන විය.

# ලෙවී ව්‍යවස්ථාව

### දවන යාග පූජා

1 සමිඳාණන් වහන්සේ මෝසෙස් කැඳවා,
සම්මුඛ මණ්ඩපයෙන් ඔහු අමතමින්,
2 “ඉශ්‍රායෙල් ජනයාට කතා කොට ඔවුන්ට මෙසේ
කියන්නැ”යි වදාළ සේක.
2 “නුඹලා අතරෙන් යමෙකු සමිඳාණන් වහන්සේට
පූජාවක් ගෙනෙන විට, ඒ සඳහා ගව පට්ටියෙන් හෝ
එළු බැටළු පට්ටියෙන් හෝ සතෙකු ගෙන ආ හැකි
ය. 3 ඔහුගේ පූජාව ගව පට්ටියෙන් ගත් දවන යාග
පූජාවක් නම්, ඔහු නොකැළැල් පිරිමි සතෙකු ඔප්පු
කළ යුතු ය. තවද, සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි
පිළිගනු ලබන පිණිස ඔහු සම්මුඛ මණ්ඩපයේ
දොරකඩ දී ඌ පිදිය යුතු ය. 4 ඔහු දවන යාග
පූජාව පිණිස ගත් සතාගේ හිස මත අත තැබිය යුතු
ය. එවිට ඔහුට පව් කමාව දීම සඳහා ඔහු
වෙනුවෙන් ඌ පිළිගනු ලැබේ. 5 ඔහු ඉන්පසු
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි සතා මැරිය යුතු ය.
එවිට ආරොන්ගේ පුත්‍රයන් වන පූජකයන් උගේ
ලේ ඔප්පු කොට, ඒ ලෙය සම්මුඛ මණ්ඩපයේ
දොරකඩ තිබෙන පූජාසනය පිට හාත්පස ම ඉසිය
යුතු ය. 6 පසුව ඔවුන් දවන යාග පූජාවට ගත් සතා
හම ගසා ඌ කෑලිවලට කැපිය යුතු ය. 7 පූජක
ආරොන්ගේ පුත්‍රයන් ද පූජාසනය මත ගිනි දල්වා,
ඒ ගිනි පිට පිළිවෙළින් දර තැබිය යුතු ය.
8 ආරොන්ගේ පුත්‍රයන් වන පූජකයන් පූජාසනය
මත ඇති ඒ ගිනි පිට, දර උඩ සතාගේ හිස, තෙල
ඇතුළු කොටස් පිළිවෙළින් තැබිය යුතු ය. 9 එහෙත්,
උගේ අතුණු ද කකුල් ද වතුරෙන් සෝදා, පූජකවරයා
ඒ සියල්ල පූජාසනය මත දැවිය යුතු ය. එවිට
ගින්නෙන් දවා පුදන ලද, මේ දවන යාග පූජාව
සමිඳාණන් වහන්සේ වෙත නඟින සුවඳවත් සුවඳක්
වනු ඇත.
10 “තවද, යමෙක් දවන යාගය සඳහා පට්ටියෙන්
ගත් බැටළුවෙකු හෝ එළුවෙකු හෝ පූජාව වශයෙන්
ගෙනෙන්නේ නම්, ඌ ද නොකැළැල් පිරිමි සතෙකු
විය යුතු ය. 11 පූජාසනයට උතුරු පැත්තේ සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි ඌ මැරිය යුතු ය. ආරොන්ගේ
පුත්‍රයන් වන පූජකයන් උගේ ලේ ගෙන පූජාසනය
පිට හාත්පසින් ඉසිය යුතු ය. 12 ඉන්පසු ඌ
කෑලිවලට කපා, පූජකවරයා උගේ කොටස් ද, හිස
හා තෙල ද පූජාසනය මත ඇති ගිනි උඩ, දර පිට
පිළිවෙළින් තැබිය යුතු ය. 13 උගේ අතුණු ද කකුල් ද
වතුරෙන් සෝදා, පූජකවරයා ඒ සියල්ල ගෙන
පූජාසනය මත දැවිය යුතු ය. ගින්නේ දවා පුදන ලද
මේ දවන යාග පූජාව සමිඳාණන් වහන්සේ වෙත
නඟින සුවඳවත් සුවඳක් වනු ඇත.
14 “සමිඳාණන් වහන්සේට ඔප්පු කරන දවන
යාගය පක්ෂියෙක් නම්, ඌ කොබෙයියෙකු හෝ
පරෙවි පැටියෙකු හෝ විය යුතු ය. 15 පූජකවරයා ද
ඌ පූජාසනයේ ඔප්පු කොට, උගේ බෙල්ල කඩා
පූජාසනය මත ඌ දැවිය යුතු ය. උගේ ලේ
පූජාසනයේ පැත්තකින් ගලා යන්නට හැරිය යුතු ය.
16 ඉන්පසු ඔහු උගේ ගොදුරු බොක්ක ද පිහාටු ද
පහ කොට, ඒවා පූජාසනයේ නැගෙනහිර පැත්තෙන්
වූ අළු දමන තැන දැමිය යුතු ය. 17 පසුව උගේ
අත්තටු සමඟ කෑලි දෙකකට වෙන් නොවන සේ ඌ
පළා, පූජාසනයේ ගිනි පිට ඇති දර උඩ තබා දැවිය
යුතු ය. ගින්නේ දවා පුදන ලද මේ දවන යාගය
සමිඳාණන් වහන්සේ වෙත නඟින සුවඳවත් සුවඳකි.”

### ධාන්‍ය පූජාව

2 “යමෙක් සමිඳාණන් වහන්සේට ධාන්‍ය
පූජාවක් ඔප්පු කරන්නේ නම්, ඔහුගේ පූජාව
සිහින් පිටිවලින් විය යුතු ය. තවද, එහි තෙල් වත්
කොට එය මත තුවරලා ද දැමිය යුතු ය. 2 පසුව
පූජකයන් වන ආරොන්ගේ පුතුන් වෙත ඔහු එය
ගෙනා යුතු ය. පූජකවරයා පිටිවලින් හා තෙලින්
අතලොස්සක් ද එහි ඇති තුවරලා සියල්ල ද ගෙන
පූජාසනය මත එය සිහිවීමේ කොටස වශයෙන්
දැවිය යුතු ය. ගින්නෙන් දවා පුදන ලද මේ පූජාව
සමිඳාණන් වහන්සේ වෙත නඟින සුවඳවත් සුවඳකි.
3 ධාන්‍ය පූජාවේ ඉතිරි කොටස ආරොන්ට සහ
ඔහුගේ පුත්‍රයන්ට අයිති වේ. එය සමිඳාණන්
වහන්සේට පිදූ දවන පූජාවලින් අතිශුද්ධ කොටස
වනු ඇත.
4 “නුඹ ඇනූ පිටි, උදුනේ පුළුස්සා ධාන්‍ය පූජාවක්
වශයෙන් ගෙනෙන්නෙහි නම්, එය සිහින් පිටි කලවම්
කළ, තෙල් මිශ්‍ර නුමුහුන් රොටි හෝ තෙල් ගෑ
නුමුහුන් තුනී රොටි හෝ විය යුතු ය.
5 “නුඹේ ධාන්‍ය පූජාව කබලක බදින ලද ඇනූ පිටි
නම්, එය නුමුහුන්, තෙල් මිශ්‍ර, සිහින් පිටිවලින් සෑදූ
රොටියක් විය යුතු ය. 6 එය කෑලි කොට කඩා එය
මත තෙල් වත් කළ යුතු ය. එය ධාන්‍ය පූජාවක් වනු
ඇත.
7 “නුඹේ පූජාව තාච්චියක පිළියෙළ කළ ධාන්‍ය
පූජාවක් නම් එය තෙල් මිශ්‍ර, සිහින් පිටිවලින් සෑදිය
යුතු ය. 8 නුඹ මේවායින් සූදානම් කළ ධාන්‍ය පූජාව
සමිඳාණන් වහන්සේ වෙත ගෙනවුත්, එය
පූජකවරයාට පිළිගැන්වූ විට ඔහු එය පූජාසනයට

ගෙනා යුතු ය. 9 පූජකවරයා ද එම ධාන්‍ය පූජාවෙන්
සිහිවීමේ කොටස ගෙන එය පූජාසනය මත දැවිය
යුතු ය. ගින්නෙන් දවා පිදූ එම පූජාව සමිඳාණන්
වහන්සේ වෙත නඟින ඉමිහිරි සුවඳකි. 10 ධාන්‍ය
පූජාවෙන් ඉතිරි කොටස ආරොන්ට සහ ඔහුගේ
පුත්‍රයන්ට අයිති ය. එය සමිඳාණන් වහන්සේට
ගින්නෙන් දවා පිදූ පූජාවලින් අතිශුද්ධ කොටස වේ.
11 “සමිඳාණන් වහන්සේ වෙත ගෙනෙන කිසි ම
ධාන්‍ය පූජාවක් මුහුන් දමා නොසෑදිය යුතු ය. නුඹ
සමිඳාණන් වහන්සේට ගින්නෙන් දවා පුදන කිසි ම
පූජාවක මුහුන් හෝ මී පැණි හෝ නොදැමිය යුතු ය.
12 මේවා නාඹුල් පල පූජාවක් ලෙස සමිඳාණන්
වහන්සේට පුද කළ හැකි වුව ද, එය සුමිහිරි
සුවඳක් මෙන් නැඟීමට පූජාසනය මත නොදැවිය
යුතු ය. 13 නුඹ ධාන්‍ය පූජාව වශයෙන් පුදන සෑම
පූජාවක් ම ලුණු දමා රසවත් කළ යුතු වේ. එසේ
කළ යුත්තේ, ලුණු, නුඹ ද සමිඳාණන් වහන්සේ ද
අතර ගිවිසුමේ ලකුණක් වනු පිණිස ය. නුඹේ සෑම
ධාන්‍ය පූජාවක් සමඟ ම ලුණු ද පුද කළ යුතු ය.
14 නුඹ නාඹුල් පලවලින් ධාන්‍ය පූජාව පුදන්නෙහි
නම්, එම පූජාව වශයෙන්, නුඹ ගින්නෙන් බදින ලද
අමු තිරිඟු කරල් හෝ එවැනි කරල්වලින් පොඩි
කරන ලද ධාන්‍ය හෝ ගත යුතු ය. 15 එය මත
තෙල් වත් කොට තුවරලා දැමිය යුතු ය. එවිට එය
ධාන්‍ය පූජාවක් වනු ඇත. 16 පොඩි කළ ධාන්‍යවලින්
කොටසක් ද තෙලින් කොටසක් ද එහි තුවරලා
සියල්ල සමඟ සිහිවීමේ කොටස වශයෙන්
පූජකවරයා විසින් දවනු ලැබිය යුතු ය. එය ද
ගින්නෙන් දවා සමිඳාණන් වහන්සේට පිදූ පූජාවකි.”

## සහභාගිකමේ පූජාව

3 “සහභාගිකමේ පූජාවක් වනු පිණිස
යමෙකුගේ පූජාව ගව පට්ටියෙන් ගන්නේ නම්,
එම සතා ගොනෙකු හෝ එළදෙනක වුවත්
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි පූජා කළ යුත්තේ
නොකැළැල් සතෙකු ය. 2 ඔහු පූජාව පිණිස ගත්
සතාගේ හිස පිට තම අත තබා සම්මුඛ මණ්ඩපයේ
දොරකඩ ළඟ දී ඌ මැරිය යුතු ය. ආරොන්ගේ
පුත්‍රයන් වන පූජකයන් උගේ ලේ පූජාසනය පිට
හාත්පස ම ඉසිය යුතු ය. 3 තවද, ඔහු
සහභාගිකමේ පූජාවෙන් පහත දක්වන කොටස්
ගින්නෙන් දවා සමිඳාණන් වහන්සේට ඔප්පු කළ යුතු
ය. ඒ කොටස් නම්, අතුණු වසා ඇති තෙල, අතුණු
පිට ඇති තෙල් සියල්ල, 4 වකුගඩු දෙක හා ඒවා
මත තුනටිය පෙදෙසෙහි තිබෙන තෙල සහ වකුගඩු
සමඟ අක්මාව පිට ඇති සිවිය ද වේ. 5 ආරොන්ගේ
පුත්‍රයන් ඒවා පූජාසනයේ ගින්න පිට ඇති දර උඩ
තබා, දවන යාගය සමඟ දැවිය යුතු ය. ගින්නෙන්
දවා පිදූ එම පූජාව සමිඳාණන් වහන්සේ වෙත
නඟින සුමිහිරි සුවඳකි.
6 “සමිඳාණන් වහන්සේට පුදන සහභාගිකමේ
පූජාව පිණිස යමෙක් තම පූජාව එළු බැටළු රැළෙන්
ගන්නේ නම්, ඔහු එය සඳහා නොකැළැල් පිරිමි
සතෙකු හෝ ගැහැණු සතෙකු හෝ ඔප්පු කළ යුතු
ය. 7 ඔහු පුදන පූජාව බැටළුවෙකු නම්, ඔහු ඒ සතා
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි පිදිය යුතු ය. 8 ඔහු
තම පූජාව පිණිස ගත් සතාගේ හිස පිට අත තබා,
සම්මුඛ මණ්ඩපය ඉදිරියෙහි ඌ මැරිය යුතු ය. පසුව
ආරොන්ගේ පුත්‍රයන් උගේ ලේ පූජාසනය පිට
හාත්පසින් ඉසිය යුතු ය. 9 තවද, ඔහු සහභාගිකමේ
පූජාවෙන් පහත දක්වන කොටස් ගින්නෙන් දවා
සමිඳාණන් වහන්සේට පුද කළ යුතු ය. ඒ කොටස්
නම්, උගේ තෙල, පිටකොන්ද ළඟින් කපාගත් මුළු
වල්ගය, අතුණු වසා ඇති තෙල්, අතුණු පිට ඇති
තෙල් සියල්ල, 10 වකුගඩු දෙක හා එය පිට තුනටිය
ළඟ තිබෙන තෙල සහ වකුගඩු සමඟ අක්මාව පිට
ඇති සිවිය ද වේ. 11 පූජකවරයා ඒවා පූජාසනය
මත දැවිය යුතු ය. මෙය ගින්නෙන් දවා සමිඳාණන්
වහන්සේට පුදන ආහාර පූජාවකි.
12 “යමෙකුගේ පූජාව එළුවෙකු නම්, ඔහු එය
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි පුද කළ යුතු ය.
13 ඔහු උගේ හිස මත අත තබා සම්මුඛ මණ්ඩපය
ඉදිරියෙහි ඌ මැරිය යුතු ය. පසුව ආරොන්ගේ
පුත්‍රයන් උගේ ලේ ගෙන පූජාසනය පිට හාත්පසින්
ඉසිය යුතු ය. 14 තවද, ඔහු එම පූජාවෙන් පහත
දක්වන කොටස් ගින්නෙන් දවා සමිඳාණන්
වහන්සේට ඔප්පු කළ යුතු ය. ඒ කොටස් නම්,
අතුණු වසා ඇති තෙල, අතුණු පිට ඇති තෙල්
සියල්ල, 15 වකුගඩු දෙක හා ඒවා පිට තුනටිය
පෙදෙසෙහි ඇති තෙල සහ වකුගඩු සමඟ අක්මාව
පිට ඇති සිවිය ද වේ. 16 පූජකවරයා ඒවා පූජාසනය
මත දැවිය යුතු ය. මේ වනාහි සමිඳාණන් වහන්සේ
වෙත සුමිහිරි සුවඳක් නැඟෙන පිණිස ගින්නෙන් දවා
පිදූ පූජාවකි. තෙල් සියල්ල සමිඳාණන් වහන්සේට
අයිති වේ. 17 නුඹ තෙල වත්, ලේ වත් කෑමට
නොගත යුතු ය. නුඹ වාසය කරන්නේ කොතැනක
වේවා, මෙය නුඹේ පෙළපත් තුළ සදහට ම වලංගු
නියෝගයකි.”

## පාප පූජා

4 සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතමින්,
2 “ඉශ්‍රායලේ ජනයාට මෙසේ කියන්නැ”යි
වදාළ සේක.
q22 “යමෙකු අදහස් නොකර, සමිඳාණන්
වහන්සේගේ ආඥාවකට විරුද්ධ ව පව් කොට,
තහනම් කළ දෙයක් කර යම් පණතක් කඩ
කරන්නට පුළුවන. එවිට ඔහු මෙලෙස කළ යුතු ය.”

## පූජකවරයා සඳහා පූජා

3 “ආලේප ලත් පූජකවරයා සෙනඟ පිට වරද
පමුණුවමින් පව් කෙළේ නම්, තමා කළ පාපය සඳහා
පාප පූජාවක් වශයෙන් නොකැළැල් ගොන් වස්සෙකු
සමිඳාණන් වහන්සේ වෙත ගෙනා යුතු ය. 4 ඔහු ද
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි සම්මුඛ මණ්ඩපයේ
දොරටුව ළඟට ඌ ගෙනවුත් උගේ හිස මත අත
තබා සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි ඌ මැරිය යුතු

ය. 5 පසුව ආලේප ලත් පූජකවරයා වස්සාගේ ලේ
මඳක් රැගෙන සම්මුඛ මණ්ඩපයට ගෙන ආ යුතු ය.
6 ඔහු ද තම ඇඟිල්ල ලේවල ගල්වා, සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි ශුද්ධස්ථානයේ තිරය මත හත්
වරක් එය ඉසිය යුතු ය. 7 ඉන්පසු ඔහු සම්මුඛ
මණ්ඩපය තුළ සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි ඇති
සුවඳ දුම් පූජාසනයේ අං මත එම ලෙයින් කොටසක්
දැමිය යුතු ය. පසුව වස්සාගේ ඉතිරි ලේ සියල්ල ම
සම්මුඛ මණ්ඩපයේ දොරකඩ ඇති දවන යාගය
පුදන පූජාසනයේ පාමුල වත් කළ යුතු ය.
8 “තවද, ඔහු පාප පූජාව සඳහා පිදූ වස්සාගේ
සියලු තෙල් එනම්, අතුණු වසා තිබූ තෙල හා අතුණු
පිට වූ තෙල සම්පූර්ණයෙන් ද 9 වකුගඩු දෙක හා
ඒවා මත තුනටිය පෙදෙසෙහි ඇති තෙල ද වකුගඩු
සමඟ අක්මාව පිට ඇති සිවිය ද අහකට ගත යුතු
ය. 10 සහභාගිකමේ පූජාවට පිදූ ගොනාගේ
කොටස් ඉවතට ගත් ලෙස, පූජකවරයා ඒවා ගෙන,
දවන යාගය පුදන පූජාසනයේ දැවිය යුතු ය.
11 ඉන්පසු ඔහු වස්සාගේ සම ද මස් සියල්ල ද හිස
ද කකුල් ද අතුණු සහ ගොම ද 12 යන කොටස්
සියල්ල ම කඳවුරෙන් පිටත අළු දමන පවිත්‍ර
ස්ථානයකට ගෙන ගොස්, දර පිට තබා ගින්නෙන්
දැවිය යුතු ය. මෙලෙස ඌ දැවිය යුත්තේ අළු දමන
ස්ථානයක ය.”

### මුළු ඉශ්රායලේ ජනතාව සඳහා පූජා

13 “මුළු ඉශ්රායලේ ජනතාව අදහස් නොකර ද,
සභාව නොදැනුවත්ව ද පව් කරමින්, තහනම් දෙයක්
කොට සමිඳාණන් වහන්සේගේ යම් කිසි පණතක්
කඩ කොට වැරදිකරුවන් වුවහොත්, 14 ඔවුන්
වැරදිකරුවන් වීමට හේතු වූ පාපය දැනගත් කල,
පාපය උදෙසා ජනතාව ගොන් වස්සෙකු පුද කොට,
සම්මුඛ මණ්ඩපය ඉදිරියට ඌ ගෙනා යුතු ය.
15 ප්‍රජා මූලිකයන් සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි
ඒ වස්සාගේ හිස පිට අත් තබා, සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි ඌ මැරිය යුතු ය. 16 ආලේප
ලත් පූජකවරයා ද වස්සාගේ ලේ මඳක් සම්මුඛ
මණ්ඩපයට ගෙනා යුතු ය. 17 පසුව ඔහු ලේවල
තම ඇඟිල්ල ගල්වා සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි
තිරය මත හත්වරක් ඉසිය යුතු ය. 18 ඔහු සම්මුඛ
මණ්ඩපය තුළ සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි ඇති
සුවඳ දුම් පූජාසනයේ අං මත ලෙයින් කොටසක්
දැමිය යුතු ය. පසුව වස්සාගේ ඉතිරි ලේ සියල්ල ම
සම්මුඛ මණ්ඩපයේ දොරකඩ ඇති දවන යාගය
පුදන පූජාසනයේ පාමුල වත් කළ යුතු ය. 19 ඔහු
උගේ තෙල ද සම්පූර්ණයෙන් ම රැගෙන, පූජාසනය
පිට එය දැවිය යුතු ය. 20 පාප පූජාව සඳහා පිදූ
වස්සාට කළ ලෙස ඔහු මේ වස්සාට ද කළ යුතු ය.
මෙසේ පූජකවරයා සෙනඟ උදෙසා පව් කමා කිරීමේ
පිළිවෙත ඉටු කළ විට, ඔවුන්ගේ පව් කමා කරනු
ලැබේ. 21 ඉන්පසු පූජකවරයා වස්සා කඳවුරෙන්
පිටතට ගෙන ගොස්, පළමු වස්සා දැවූ ලෙස මේ
වස්සා ද දැවිය යුතු ය. මෙය ජනතාව සඳහා පුදන
පාප පූජාවකි.”

### අධිපතියෙකු සඳහා පූජාව

22 “අධිපතියෙකු අදහස් නොකර පව් කරමින්, තම
දෙවි සමිඳාණන් වහන්සේගේ පණත්වලින් තහනම්
කළ දෙයෙක් කර, වැරදිකරුවෙකු වී, 23 තමා කළ
පාපය දන්වනු ලැබූ කල, ඔහු තම පූජාව පිණිස
එළුවන්ගෙන් නොකැළැල් පිරිමි සතෙකු ගෙනා යුතු
ය. 24 ඔහු ද එළුවාගේ හිස මත තම අත තබා,
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි දවන යාගයට ගත්
සතා මැරූ ස්ථානයෙහි ම ඌ මැරිය යුතු ය. මෙය
පාප පූජාවකි. 25 පසුව පූජකවරයා පාප පූජාවට පිදූ
සතාගේ ලෙයින් ටිකක් ඇඟිල්ලෙන් ගෙන දවන
යාගය පුදන පූජාසනයේ අං මත දැමිය යුතු ය.
ලෙයින් ඉතිරි කොටස දවන යාගය පුදන
පූජාසනයේ පාමුල වත් කළ යුතු ය. 26 ඉන්පසු ඔහු
සහභාගිකමේ පූජාවලට පිදූ සතුන්ගේ තෙලෙට කළ
ලෙසෙ, උගේ තෙල සම්පූර්ණයෙන් ම පූජාසනය මත
දැවිය යුතු ය. මෙසේ පූජකවරයා ඔහුගේ පාපයට
කමා කිරීමේ පිළිවෙත ඉටු කළ පසු එය ඔහුට කමා
කරනු ලැබේ.”

### අන් පුද්ගලයන් සඳහා පූජා

27 ගණන් 15:27-28 “සාමාන්‍ය කෙනෙකු අදහස්
නොකර පව් කරමින්, සමිඳාණන් වහන්සේගේ
පණතකින් තහනම් වූ දෙයක් කොට වැරදිකාරයෙකු
වී, 28 තමා කළ පාපය දන්වනු ලැබූ පසු, ඔහු තමා
කළ පාපය වෙනුවට නොකැළැල් එළුදෙනෙක පූජාව
වශයෙන් ගෙනා යුතු ය. 29 ඔහු ඒ සතාගේ හිස මත
අත තබා, දවන යාග පිදූ ස්ථානයෙහි ම ඌ මැරිය
යුතු ය. 30 ඉන්පසු පූජකවරයා උගේ ලෙයින් ටිකක්
තම ඇඟිල්ලෙන් ගෙන දවන යාග පුදන පූජාසනයේ
අං මත දැමිය යුතු ය. ඉතිරි ලේ සියල්ල පූජාසනයේ
පාමුල වත් කළ යුතු ය. 31 පසුව සහභාගිකමේ
පූජාවලින් තෙල ඉවතට ගත් ලෙස උගේ තෙල ද
ඉවතට ගෙන, සමිඳාණන් වහන්සේ වෙත නඟින
සුමිහිරි සුවඳක් මෙන් එය පූජාසනය මත දැවිය යුතු
ය. මෙසේ පූජකවරයා ඔහු වෙනුවෙන් පව් කමා
කිරීමේ පිළිවෙත ඉටු කළ විට, ඒවා ඔහුට කමා
කරනු ලැබේ. 32 තවද, ඔහු පාප පූජාව සඳහා
බැටළුවෙකු ගෙනෙන්නේ නම්, ඌ නොකැළැල්
බැටළුදෙනෙක විය යුතු ය. 33 ඔහු ඒ සතාගේ හිස
පිට අත තබා, පාප පූජාව සඳහා දවන යාග පූජාවට
ගත් සතා මැරූ ස්ථානයෙහි ම ඌ මැරිය යුතු ය.
34 පූජකවරයා ද උගේ ලෙයින් ටිකක් තම
ඇඟිල්ලෙන් ගෙන දවන යාගය පුදන පූජාසනයේ අං
මත දැමිය යුතු ය. ඉතිරි ලේ සියල්ල පූජාසනයේ
පාමුල වත් කළ යුතු ය. 35 පසුව ඔහු සහභාගිකමේ
පූජාවට ගත් බැටළුවාගෙන් තෙල අහකට ගත් ලෙස
උගේ තෙල් ද අහකට ගත යුතු ය. ඉන්පසු
සමිඳාණන් වහන්සේට ගින්නෙන් දවා පුදන පූජාවක්
මෙන් එය පූජාසනය මත දැවිය යුතු ය. මෙලෙස

පූජකවරයා ඔහු කළ පාපයන්ට කමා කිරීමේ
පිළිවෙත ඉටු කළ විට ඒවා ඔහුට කමා කරනු
ලැබේ."

## පාප පූජා අවශ්‍ය අවස්ථා

5 "යමෙක් සාක්ෂිකරුවෙකු වී සිටිය දී උසාවියේ
ප්‍රසිද්ධ දිවුරුම් වචන ඇසූ පසුත්, ඒ පිළිබඳ ව
තමා දුටු කරුණු හෝ දත් කරුණු හෝ
නොදන්වන්නේ නම්, ඔහු ඒ ගැන වගකිව යුතු ය.
2 යමෙකු නොදැනුවත්කමින් ආගමික පිළිවෙතේ අනුව
අපවිත්‍ර යයි සැලකෙන හීලෑ සතෙකුගේ, වන
සතෙකුගේ හෝ බඩගා යන අපවිත්‍ර සතෙකුගේ
මළකඳක් ස්පර්ශ කළොත්, ඔහු එය දැනගත් කල
අපවිත්‍ර වී වරදකරුවෙක් වන්නේ ය. 3 යමෙකු
නොදැනුවත්කමින් ආගමික පිළිවෙතේ අනුව
මනුෂ්‍යයෙකු කෙලෙසෙන යම්කිසි අපවිත්‍ර දෙයක්
ස්පර්ශ කළොත්, ඔහු එය දැනගත් කල
වරදකරුවෙක් වන්නේ ය. 4 යමෙකු
නොදැනුවත්කමින් හොඳක් හෝ නපුරක් හෝ
කරන්නට වචනයෙන් දිවුරා යමක් ගැන අනිසි ලෙස
භාරයක් වුවහොත්, ඔහු එය දැනගත් කල
වරදකරුවෙක් වන්නේ ය.
5 "ඉහත දැක්වූ කරුණුවලින් එකක් ගැන යමෙකු
වරදකරුවෙකු වූ කල ඔහු තමා කළ පාපය
උච්චාරණය කළ යුතු ය. 6 තවද, ඔහු තමා
වරදකරුවෙකු කළ පාපය වෙනුවට සමිඳාණන්
වහන්සේ වෙත වන්දි ගෙවීමේ පූජාවක් පිණිස
රැළෙන් ගැහැණු සතෙකු වන එළු පැටියෙකු හෝ
බැටළු පැටියෙකු හෝ ගෙනා යුතු ය. පූජකවරයා ද
ඔහු කළ පාපයට සමාව අයැදිනු ඇත.
7 "එළු පැටවියක හෝ බැටළු පැටවියක හෝ
ගෙනෙන්නට ඔහුට වත්කම නැත්නම්, ඔහු තමා කළ
පාපයට වන්දි ගෙවීමේ පූජාවක් වශයෙන් සමිඳාණන්
වහන්සේ වෙත කොබෙයියන් දදෙනෙකු හෝ
පරවී පැටවුන් දදෙනෙකු හෝ ගෙනා යුතු ය.
එකෙක් පාප පූජාවක් වශයෙනි, අනිකා දවන යාග
පූජාවක් වශයෙනි. 8 පූජකවරයා වෙත උන් ගෙනා
පසු ඔහු පළමුවෙන් පාප පූජාව ඔප්පු කරමින්, උගේ
බොටුව මිරිකා, හිස වෙන් නොකොට 9 උගේ
ලෙයින් ස්වල්පයක් පූජාසනයේ පැත්තට ඉසිය යුතු
ය. ඉතිරි ලේ පූජාසනයේ පාමුල වත් කළ යුතු ය.
මෙය පාප පූජාවකි. 10 දෙ වන සතා ද සිරිත් ප්‍රකාර
දවන යාග පූජාවක් මෙන් ඔප්පු කළ යුතු ය. මෙලෙස
ඒ තැනැත්තා කළ පාපයට පූජකවරයා කමාව
අයැදින කල, එය ඔහුට කමා කරනු ලැබේ.
11 "තවද, ඔහුට කොබෙයියන් දදෙනෙකු හෝ
පරවී පැටවුන් දදෙනෙකු හෝ ගෙනෙන්නට
වත්කම නැති නම්, ඔහු තමා කළ පාපය වෙනුවට
පාප පූජාවක් වශයෙන් සිහින් පිටි කිලෝග්‍රෑම්
එකක් ගෙනා යුතු ය. ඔහු එය මත තෙලේ හෝ
තුවරලා හෝ නොදැමිය යුතු ය. මන්ද, එය පාප
පූජාවකි. 12 ඔහු පූජකවරයා වෙත එය ගෙනා විට
පූජකවරයා එයින් අහුරක් ගෙන, සිහිවීමේ කොටස
වශයෙන් ගින්නෙන් දවා සමිඳාණන් වහන්සේට පුදන
පූජාවක් මෙන් එය පූජාසනයේ දැවිය යුතු ය. මෙය
පාප පූජාවකි. 13 මෙලෙස ඉහත දැක්වූ කරුණුවලින්
යමකට විරුද්ධ ව යමෙකු කළ පාපයට පූජකවරයා
පව් කමාව අයැදින කල එය ඔහුට කමා කරනු
ලැබේ. ධාන්‍ය පූජාවෙන් ඉතිරි වූ කොටස මෙන්,
මෙයින් ඉතිරි කොටස ද පූජකවරයාට අයිති ය."

## වන්දි ගෙවීමේ පූජාව

14 සමිඳාණන් වහන්සේ නැවතත් මෝසෙස්ට කතා
කොට මෙසේ වදාළ සේක: 15 "යමෙකු සමිඳාණන්
වහන්සේට දිය යුතු ශුද්ධ දේවල් නොදී,
නොදැනුවත්ව වැරැද්දක් කළොත්, ඒ වැරැද්ද
වෙනුවට ඔහු සමිඳාණන් වහන්සේ වෙත රැළෙන්
නොකැළැල් බැටළුවෙකු ගෙනා යුතු ය. වන්දි
ගෙවීමේ පූජාවක් සඳහා ඌ තක්සේරු කළ යුත්තේ,
ශුද්ධස්ථානයේ වලංගු කාසි අනුව රිදී කාසි මිලට
එකඟ ව ය; මෙය වන්දි ගෙවීමේ පූජාවකි. 16 ඔහු
ශුද්ධ දේ නොදීමෙන් කළ වංචාවට ගෙවිය යුතු
වන්දි ගෙවා, තව පහෙන් පංගුවක් ද ඊට එකතු
කොට පූජකවරයාට දිය යුතු ය. පූජකවරයා ද වන්දි
ගෙවීමේ බැටළුවා පුදමින්, ඒ තැනැත්තාගේ පාපයට
කමාව අයැදින කල ඔහුට කමා කරනු ලැබේ.
17 "මෙලෙස යමෙකු සමිඳාණන් වහන්සේගේ
ආඥාවලින් තහනම් කරන ලද යමක්
නොදැනුවත්කමින් හෝ කළොත්, ඔහු වරදකරුවෙකු
වේ, කළ වරද ගැන ඔහු වගකිව යුතු ය. 18 ඔහු
වන්දි ගෙවීමේ පූජාවට තක්සේරු කළ ලෙස රැළෙන්
එතරම් වටිනා, නොකැළැල් බැටළුවෙකු පූජකවරයා
වෙත ගෙනා යුතු ය. පූජකවරයා ද ඒ තැනැත්තා
නොදැනුවත්ව, අදහස් නොකර, කළ දෙයට කමාව
අයැදින කල එය ඔහුට කමා කරනු ලැබේ. 19 එය
සමිඳාණන් වහන්සේට විරුද්ධ ව කළ වැරැද්දට පුදන
වන්දි ගෙවීමේ පූජාවකි."
6 ගණන් 5:5-8 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට
කතා කොට මෙසේ වදාළ සේක: 2 "යමෙක්
තැන්පත් මුදලක් ගැන හෝ ප්‍රවේසමට
තබාගැනීමට දුන් දෙයක් ගැන හෝ යම් කෙනෙකු
සතු දෙයක් උදුරාගැනීමෙන් හෝ තම අසල්වැසියා
රැවටීමෙන් හෝ ඔහුට වංචා කිරීමෙන් හෝ පව්
කරමින් සමිඳාණන් වහන්සේට විරුද්ධ ව අපරාධයක්
කරන්නේ නම්, 3 තවද, නැති වූ දෙයක් සම්බ වූ පසු
ඒ ගැන බොරු කීමෙන් ද බොරුවට දිවීරීමෙන් ද
එවැනි කිසියම් කාරණාවකට අදාළ ව පව් කරන්නේ
නම්, 4 ඔහු මෙලෙස පව් කළ බැවින් වරදකරුවෙක්
වන්නේ ය. ඔහු උදුරාගත් දේ ද රැවටීමෙන් ගත් දේ
ද ප්‍රවේසමට තබා ගැන්මට දුන් දේ ද නැති වූ පසු
සොයා ගත් දේ ද 5 යමක් ගැන බොරුවට දිවුළ
සියල්ල ද ආපසු දිය යුතු ය. ඔහු ගත් දේ
සම්පූර්ණයෙන් ම දිය යුතු අතර, ඊට වැඩිමනත්
පහෙන් පංගුවක් එකතු කොට දිය යුතු ය. තවද,
ඔහු වරදකාරයා වූ දිනයේ දී ම එලෙස සියල්ල
අයිතිකරුට දිය යුතු ය. 6 ඔහු, සමිඳාණන්

වහන්සේට වන්දි ගෙවීමේ පූජාව වශයෙන්, රැළෙන්
නොකැළැල් බැටළුවකු ද පූජකවරයා වෙත ගෙනා
යුතු ය. ඌ තක්සේරු කළ යුත්තේ ගෙවිය යුතු
වන්දිය අනුව ය. 7 පූජකවරයා ද සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි ඔහුට පව් කමා කිරීමේ
පිළිවෙත ඉටු කළ යුතු ය. එවිට ඔහු කළ වරද
කුමක් වුව ද එය ඔහුට කමා කරනු ලැබේ.”

## දවන යාග පූජා

8 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට
මෙසේ වදාළ සේක: 9 “ආරොන්ට සහ ඔහුගේ
පුත්‍රයන්ට මෙසේ අණ කරන්න: දවන යාග පූජාව
පිළිබඳ නීතිය මෙය වේ; දවන යාග පූජාව මුළු
රාත්‍රියෙහි ම උදය දක්වා පූජාසනය මත ගින්න පිට
දැවෙමින් තිබිය යුතු ය. 10 පූජකවරයා හණ පිළි
කබාය හැඳගෙන, හණ කලිසමින් තම සිරුර
වසාගෙන පූජාසනය මත ගින්නෙන් දවන ලද දවන
යාග පූජාවේ අළු ගෙන පූජාසනයේ පැත්තකින්
දැමිය යුතු ය. 11 ඉන්පසු ඔහු තම වස්ත්‍ර ගලවා,
වෙන වස්ත්‍ර ලාගෙන කඳවුරෙන් පිටත පවිත්‍ර
ස්ථානයකට අළු ගෙන යා යුතු ය. 12 පූජාසනය මත
ගින්න නිවෙන්නට නොහැර එය දැල්වෙමින් ම තිබිය
යුතු ය. දිනපතා උදය පූජකවරයා එය මත දර දල්වා,
ඊට උඩින් පිළිවෙළට දවන යාග පූජාව තැබිය යුතු
ය. ඔහු සහභාගිකමේ පූජාවට ගත් සතාගේ තෙල
එහි දැවිය යුතු ය. 13 ගිනි ද පූජාසනය මත
නිවෙන්නට නොහැර නිතර ම දැල්වෙමින් තිබිය යුතු
ය.”

## ධාන්‍ය පූජා

14 “ධාන්‍ය පූජාව පිළිබඳ නීතිය මෙය ය:
ආරොන්ගේ පුත්‍රයන්ගෙන් කෙනෙකු පූජාසනය
ඉදිරියෙහි සමිඳාණන් වහන්සේට එය පුද කළ යුතු
ය. 15 ඔවුන්ගෙන් කෙනෙකු ධාන්‍ය පූජාවේ පිටිවලින්
අහුරක් ද එහි තෙලේ ද එය මත ඇති තුවරලා
සියල්ල ද ගෙන පූජාසනය මත සිහිවීමේ කොටස
දැවිය යුතු ය. එය සමිඳාණන් වහන්සේ වෙත නඟින
සුමිහිරි සුවඳකි. 16 ඉන්පසු එහි ඉතිරි කොටස
ආරොන් සහ ඔහුගේ පුත්‍රයන් සම්මුඛ මණ්ඩප
මළුවේ ශුද්ධ තැනක නුමුහුන් රොටී මෙන් සාදා
වැළඳිය යුතු ය. 17 තවද, එය පිසිය යුත්තේ මුහුන්
මිශ්‍ර නොකර ය. ගින්නෙන් දවා, මට පිදූ පූජාවෙන්
ඔවුන්ට හිමි කොටස මම ඔවුන්ට දෙමි. පාප පූජාව
හා වන්දි ගෙවීමේ පූජාව මෙන් එය අතිශුද්ධ ය.
18 තවද, ආරොන්ගේ පෙළෙපතින් පැවතෙන සියලු
පිරිමින්ට මෙය වැළඳිය හැකි ය. මෙය වනාහි
ගින්නෙන් දවා සමිඳාණන් වහන්සේට පිදූ පූජා
පිළිබඳ ඔබේ පෙළෙපත් තුළ සදහට ම වලංගු
නියෝගයකි. එය ස්පර්ශ කරන සෑම කෙනෙකු ම
ශුද්ධ වනු ඇත.”
19 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට
මෙසේ වදාළ සේක: 20 “ආරොන් සහ ඔහුගේ
පුත්‍රයන් ආලේප කරනු ලබන දිනයේ දී ඔවුන්
සමිඳාණන් වහන්සේට පිදිය යුතු පූජාව නම්, සිහින්
පිටි කිලෝග්‍රෑම් එකකි. එයින් භාගයක් උදය ද
අනිත් භාගය සවස ද නිරන්තර ධාන්‍ය පූජාවක්
වශයෙන් පිදිය යුතු ය. 21 තෙලේ මිශ්‍රකොට එය
තාච්චියක සූදානම් කළ යුතු ය. එය පිසුවාට පසු,
ධාන්‍ය පූජාව මෙන් පිසූ යාග පූජාවේ කැබලි
සමිඳාණන් වහන්සේට සුමිහිරි පූජාවක් ලෙස පිදිය
යුතු ය. 22 තවද, ආරොන්ගේ පුත්‍රයන් අතර
ආරොන් වෙනුවට ආලේප ලත් පූජකයා ද එය ඔප්පු
කළ යුතු ය. මෙය සදහට ම වලංගු නියෝගයකි.
එය සම්පූර්ණයෙන් ම දවා සමිඳාණන් වහන්සේට
පිදිය යුතු ය. 23 තවද, පූජකවරයකුගේ සියලු
ධාන්‍ය පූජා සම්පූර්ණයෙන් ම දැවිය යුතු ය. ඒවා
නොවැළඳිය යුතු ය.”

## පාප පූජා

24 සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතා,
25 “ආරොන්ට සහ ඔහුගේ පුත්‍රයන්ට කතා කොට
මෙසේ කියන්නැ”යි වදාළ සේක. “පාප පූජාව පිළිබඳ
නීතිය මේ ය: සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි දවන
යාග පූජාවේ සතා මරන ස්ථානයේ ම පාප පූජාවේ
සතා ද මැරිය යුතු ය. එය අතිශුද්ධ ය. 26 පාප
සඳහා එය පුදන පූජකවරයා එය වැළඳිය යුතු ය.
තවද, ඔහු එය වැළඳිය යුත්තේ, සම්මුඛ මණ්ඩප
මළුවේ ශුද්ධස්ථානයක ය. 27 එම සතාගේ මාංසයට
ස්පර්ශ වන සෑම දයෙක් ම ශුද්ධ වනු ඇත. එයින්
ලේ ස්වල්පයක් යම්කිසි වස්ත්‍රයක ගෑවුණොත්,
ගෑවුණු වස්ත්‍රය ශුද්ධස්ථානයක සේදිය යුතු ය.
28 යම්කිසි මැටි බඳුනක එය පිසිනු ලැබුවේ නම්,
එම බඳුන බිඳිය යුතු ය. එය පිසිනු ලැබුවේ ලෝකඩ
බඳුනක නම්, එම බඳුන මැද, වතුරෙන් සේදිය යුතු
ය. 29 පූජකවරුන් අතර සිටින සියලු පිරිමින්ට එයින්
වැළඳිය හැකි ය. එය අතිශුද්ධ ය. 30 එහෙත්,
ශුද්ධස්ථානයේ පව් කමා කිරීමේ පිළිවෙත සඳහා
සම්මුඛ මණ්ඩපය තුළට පාප පූජාව පිණිස පිදූ
සතාගේ ලේ ගෙනෙනු ලැබුවොත්, එම පූජාවෙන්
කිසිවක් නොවැළඳිය යුතු ය. එය ගින්නෙහි දැවිය
යුතු ය.”

## වන්දි ගෙවීමේ පූජා

7 “වන්දි ගෙවීමේ පූජාව පිළිබඳ නීතිය මේ ය:
එය අතිශුද්ධ දයෙකි. 2 දවන යාග පූජාව
පිණිස සතා මරන ස්ථානයේ දී වන්දි ගෙවීමේ පූජාව
පිණිස ගත් සතා ද මැරිය යුතු ය. පසුව උගේ ලේ
පූජාසනය පිට හාත්පසින් ඉසිය යුතු ය. 3 උගේ
තෙල සම්පූර්ණයෙන් ම ද එනම්, උගේ වල්ගය ද
අතුණු වසා ඇති තෙල ද 4 වකුගඩු දෙක ද ඒවා
මත තුනටිය ළඟ ඇති තෙල ද අක්මාව පිට සිවිය ද
වකුගඩු සමඟ ඉවතට ගත යුතු ය. 5 පූජකවරයා
ඒවා පූජාසනය මත ගින්නෙන් දවා සමිඳාණන්
වහන්සේට පුදන පූජාවක් මෙන් ඔප්පු කළ යුතු ය.
මෙය වන්දි ගෙවීමේ පූජාවකි. 6 පූජකවරුන් අතර
සිටින සෑම පිරිමියකුට ම ඉන් වැළඳිය හැකි ය. එය

වැළඳිය යුත්තේ ද ශුද්ධස්ථානයක ය. එය අතිශුද්ධ
දෙයෙකි.
7 “පාප පූජාවට වලංගු නීතිය වන්දි ගෙවීමේ
පූජාවට ද වලංගු වේ. පූජා ඔප්පු කරන
පූජකවරයාට ඒවා අයිති ය. 8 යමෙකුගේ දවන යාග
පූජාව පුදන පූජකවරයාට, ඔහු පිදූ සතාගේ හම
අයිති ය. 9 උදුනක පිසූ ධාන්‍ය පූජාව මුළුමනින් ද
කබලක හෝ තාච්චියක හෝ පිළියෙළ කළ සියල්ල
ද පිදූ පූජකවරයාට අයිති ය. 10 තෙලේ මිශ්‍ර සහ
අමිශ්‍ර ධාන්‍ය පූජා සියල්ල ම ආරොන්ගේ පුත්‍රයන්
සියලු දෙනා සම සේ බෙදාගත යුතු ය.”

## සහභාගිකමේ පූජා

11 “සමිඳාණන් වහන්සේට පිදිය යුතු
සහභාගිකමේ පූජා පිළිබඳ නීතිය මේ ය: 12 යමෙක්
ස්තුති දීමක් වශයෙන් එය පුදන්නේ නම්, ස්තුති
දීමේ පූජාවක් සමඟ තෙලේ මිශ්‍ර නුමුහුන් රොටි ද
තෙලේ ගෑ නුමුහුන් රොටි පති ද සිහින් පිටිවලින්
බදින ලද තෙලේ මිශ්‍ර රොටි ද පුද කළ යුතු ය.
13 තවද, රොටි සමඟ මුහුන් මිශ්‍ර රොටි ද තම
පූජාවට එකතු කොට සහභාගිකමේ පූජාව සමඟ
ස්තුති පූජාවක් වශයෙන් පුද කළ යුතු ය. 14 ඔහු
සෑම රොටි වර්ගවලින් ම එක් කොටසක් බැගින්
විශේෂ පඬුරක් වශයෙන් සමිඳාණන් වහන්සේට
පිදිය යුතු ය. එය සහභාගිකමේ පූජාවට පිදූ
සතාගේ ලේ ඉසින පූජකවරයාට අයිති ය. 15 ස්තුති
දීම සඳහා සහභාගිකමේ පූජාව වශයෙන් පුදන
සතාගේ මාංසය ඌ පුදන දවසේ දී ම වැළඳිය යුතු
ය. ඉන් කිසිවක් පසුදින උදය දක්වා නොතැබිය යුතු
ය.
16 “එහෙත්, පූජා කරන සතා පුදන්නේ භාරයක්
හෝ ස්වේච්ඡා පූජාවක් හෝ වශයෙන් නම්, ඔහු
එය පුදන දවසේ දී වැළඳිය යුතු ය. ඉන් ඉතිරි
කොටස පසුදින ද වළඳන්නට පුළුවන. 17 එහෙත්
ඌගේ මාංසයෙන් ඉතිරි වන කොටස තුන් වන
දවසේ දී ගින්නේ දැවිය යුතු ය. 18 එහෙත්, යමෙකු
සහභාගිකමේ පූජාව වශයෙන් පුදන සතාගේ
මාංසය තුන් වන දවසේ දී වැළඳුවහොත්, ඔහුගේ
පූජාව නොපිළිගනු ලැබේ. පූජාව පුදන තැනැත්තාට
එයින් වන ආනිශංසයක් නැත. එය පිළිකුලක් වනු
ඇත. එයින් වළඳන තැනැත්තා එය ගැන වගකිව යුතු
ය. 19 අපවිත්‍ර යමකට ස්පර්ශ වන ඒ මාංසය
නොවැළඳිය යුතු අතර එය ගින්නේ දැවිය යුතු ය.
19 “ඉතිරි මාංසය ආගමික චාරිත්‍ර අනුව පවිත්‍ර ව
සිටින සෑම කෙනෙකුට ම වැළඳිය හැක. 20 එහෙත්,
ආගමික චාරිත්‍ර අනුව අපවිත්‍ර යයි සැලකෙන
යමෙකු සහභාගිකමේ පූජාව වශයෙන් පිදූ සතාගේ
මාංසය කෑවහොත්, ඔහු තම සෙනඟ කෙරෙන්
නෙරපාදමනු ලැබේ. 21 තවද, යමෙකු
මනුෂ්‍යයෙකුගේ හෝ මෘගයෙකුගේ හෝ ආගමික
චාරිත්‍ර අනුව අපවිත්‍ර යයි සැලකෙන යමක් හෝ
පිළිකුල් අපවිත්‍ර දෙයක් හෝ ස්පර්ශ කොට,
සහභාගිකමේ පූජාවක් වශයෙන් සමිඳාණන්
වහන්සේට පුදන ලද සතකුගේ මාංස
වැළඳුවහොත්, ඔහු සිය සෙනඟ කෙරෙන්
නෙරපාදමනු ලැබේ.”
22 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අමතමින්,
23 “ඉශ්‍රායෙලේ ජනතාවට කතා කොට මෙසේ
කියන්න, ‘නුඹලා ගවයෙකුගේ හෝ බැටළුවෙකුගේ
හෝ එළුවෙකුගේ හෝ තෙල කෑමට නොගත යුතු
ය. 24 ස්වාභාවික ලෙස මැරුණු සතෙකුගේ හෝ වන
මෘගයෙකු විසින් ඉරාදමනු ලබන සතෙකුගේ හෝ
තෙල කිසි සේත් නොකෑ යුතු ය. එහෙත්, එය
යම්කිසි ප්‍රයෝජනයකට ගත හැකි ය. 25 මිනිසුන්
විසින් ගින්නෙන් දවා සමිඳාණන් වහන්සේට පුදන
ලද සතකුගේ තෙල යමෙක් කන්නේ ද, ඔහු සිය
සෙනඟ කෙරෙන් නෙරපාදමනු ලැබේ. 26 නුඹ වසන
කිසිම තැනක පක්ෂියෙකුගේ වේවා, මෘගයෙකුගේ
වේවා ලේ කෑමට නොගත යුතු ය.උත් 9:4; ලෙවී
17:10-14; 19:26; ද්වි.නී. 12:16,23; 15:23 27 යමෙක්
ලේ කෑමට ගන්නේ ද ඔහු සිය සෙනඟ කෙරෙන්
නෙරපාදමනු ලැබේ ය’ ”යි වදාළ සේක.

## පූජකවරයාගේ කොටස

28 නැවතත් සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අමතා,
29 “ඉශ්‍රායෙලේ ජනතාවට කතා කොට මෙසේ
කියන්නැ”යි වදාළ සේක. “යමෙක් සහභාගිකමේ
පූජාවක් සමිඳාණන් වහන්සේට ඔප්පු කරන්නේ ද,
ඔහු ඉන් කොටසක් දීමනාවක් වශයෙන් සමිඳාණන්
වහන්සේ වෙත ගෙනෙ යුතු ය. 30 ගින්නෙන් දවා
සමිඳාණන් වහන්සේට පුදන පූජාව ඔහු සිය අතින්
ම ගෙනෙ යුතු ය. ඔහු සතාගේ ළපැත්ත සමඟ තෙල
ද ගෙනවුත්, එයින් සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි
පිළිගැන්වීමේ පිළිවෙත ඉටු කළ යුතු ය.
31 පූජකවරයා පූජාසනය මත තෙල දැවිය යුතු ය.
සතාගේ ළපැත්ත ආරොන්ට සහ ඔහුගේ පුත්‍රයන්ට
අයිති වේ. 32 සහභාගිකමේ පූජාවේ විශේෂ
පඬුරක් වශයෙන් සතාගේ දකුණු ගාතය නුඹ
පූජකවරයාට දිය යුතු ය. 33 ආරොන්ගේ පුත්‍රයන්
අතරෙන් සහභාගිකමේ පූජාවේ සතාගේ ලේ සහ
තෙල පුදන තැනැත්තාට තම කොටස වශයෙන්
දකුණු ගාතය හිමි වේ. 34 මෙලෙසෙ මම ඉශ්‍රායෙලේ
ජනයාගේ සහභාගිකමේ පූජා පඬුරුවලින්
පිළිගැන්වීමේ පිළිවෙත කළ සතුන්ගේ ළපැත්ත සහ
විශේෂයෙන් පිදූ දකුණු ගාතය පූජක ආරොන්ට සහ
ඔහුගේ පුතුන්ට දෙමි. මෙය ඉශ්‍රායෙලේ ජනයා අතර
සදහට ම වලංගු නියෝගයකි.”
35 ආරොන් සහ ඔහුගේ පුත්‍රයන් පූජක නිල
තනතුරේ සමිඳාණන් වහන්සේට සේවය කරනු
පිණිස ඉදිරිපත් කොට, ඔවුන් ආලේප කළ දවසේ දී
ගින්නෙන් දවා සමිඳාණන් වහන්සේට පුදන
පූජාවලින් ඔවුන්ට හිමි කොටස මෙය වේ.
36 මෝසෙස් ඔවුන් ආලේප කරන දවසේ දී
ඉශ්‍රායෙලේ ජනයා ඔවුන්ට දිය යුතු ලෙස සමිඳාණන්
වහන්සේ ඔවුන්ට අණ කළ දේ මේ ය. තවද, මෙය
ඔවුන්ගේ පෙළපත් තුළ සදහට ම වලංගු

නියෝගයකි. 37 දවන යාග පූජාව හා ධාන්‍ය පූජාව
ද පාප පූජාව හා වන්දි ගෙවීමේ පූජාව ද ආලේප
කිරීමේ හා සහභාගිකමේ පූජාව ද පිළිබඳ නීතිය
මේ ය. 38 සීනයි පාළුකරයේ සීනයි කන්ද මත
සමිඳාණන් වහන්සේට පූජා පිදීමට ඉශ්‍රායලේ
ජනයාට මෝසෙස් නියම කළ දවසේ දී උන්
වහන්සේ ඔහුට අණ කළේ එසේ ය.

## පූජකවරයන් කැප කිරීම
(නික්ම 29:1-37)

8 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට,
2 “ආරොන් සහ ඔහු සමඟ ඔහුගේ පුත්‍රයන්
ද පූජක වස්ත්‍ර සහ ආලේප තෙලෙය ද පාප පූජාව
සඳහා වස්සකු ද බැටළුවන් දදෙනෙකු ද නුමුහුන්
රොටි පැස ද ගෙන 3 මුළු ජනතාව සම්මුඛ
මණ්ඩපයේ දොරටුව ළඟ රැස් කරවන්නැ”යි වදාළ
සේක.
4 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අණ කළ පරිදි
ඔහු ඉටු කළ විට, මුළු සභාව සම්මුඛ මණ්ඩපයේ
දොරටුව ළඟ රැස්වූ හ. 5 එවිට ඔහු ජනතාව
අමතමින්: “සමිඳාණන් වහන්සේ ඉටු කිරීමට අණ
කළ දේ මේ ය”යි කී ය. 6 ඉන්පසු ඔහු ආරොන්
සහ ඔහුගේ පුත්‍රයන් කැඳවා ඔවුන් නෑවුවේ ය.
7 පසුව මෝසෙස් ඔහුට කබාය හඳවා, ඉඟපටිය
බැඳ, සළුව පළඳවා, ඒපොද් නම් සැට්ටය ඔහු පිට
දමා, එම සැට්ටයේ ගෙත්තම් කළ පටියෙන් ඔහු
ඉණ වටකර බැඳ එය සවි කළේ ය. 8 ඉන්පසු ළය
වැස්ම ද ඔහුට පළඳවා එය තුළ ඌරිම් සහ තුම්මිම්
යන පස ඇට දැමී ය. 9 ඔහුගේ හිස මත මකුටය ද
ඊට උඩින් ඉදිරියෙන් රන් තහඩුව වන ශුද්ධ කිරීටය
ද සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අණ කළ පරිදි
තැබුවේ ය.
10 ඉන්පසු මෝසෙස් ආලේප තෙලෙය ගෙන
මණ්ඩපයත්, එය තුළ වූ සියල්ලත් ආලේප කොට
කැප කළේ ය. 11 ඔහු ඒ තෙලෙය පූජාසනය මත
හත්වරක් ඉස, පූජාසනය ද එහි සියලු උපකරණ ද
වතුර භාජන හා එහි අඩිය ද ආලේප කොට කැප
කළේ ය. 12 පසුව ඔහු ආලේප තෙලෙය
ආරොන්ගේ හිස මත වත් කොට ඔහු කැප කරමින්
ආලේප කළේ ය. 13 එවිට ඔහු ආරොන්ගේ
පුත්‍රයන් ද කැඳවා සමිඳාණන් වහන්සේ අණ කළ
පරිදි, ඔවුන්ට කබා හඳවා, ඉඟ පටි බැඳ හිස් වැසුම්
පැළඳවී ය.
14 ඔහු ද පාප පූජාවට පුදන වස්සා ගෙනා කල,
ආරොන් සහ ඔහුගේ පුත්‍රයෝ එම වස්සාගේ හිස
මත තම අත් තැබූ හ. 15 ඉන්පසු මෝසෙස් ඌ මරා,
උගේ ලේ ගෙන, තම ඇඟිල්ලෙන් පූජාසනය වටේට
තිබූ අං මත එය තවරා, පූජාසනයේ දොස්
පහකොට, එහි පාමුල ඉතිරි ලේ වත් කොට එය
මත පව් කමා කිරීමේ පිළිවෙත ඉටු කරමින් එය
කැප කළේ ය. 16 පසුව ඔහු සතාගේ අතුණු මත
තිබූ තෙලෙ සම්පූර්ණයෙන් ද අක්මාව වසා තිබූ සිවිය
ද වකුගඩු දෙක සමඟ ඒවායේ තෙලෙ ද ගෙන
පූජාසනය මත දැවී ය; 17 එහෙත්, සමිඳාණන්
වහන්සේ අණ කළ පරිදි ගවයාගේ ඉතිරි කොටස්
වන උගේ හම සහ මාංසය ද ගොම ද කඳවුරෙන්
පිටත ගින්නේ දැවී ය.
18 ඉන්පසු ඔහු දවන යාග පූජාව සඳහා බැටළුවා
ගෙනා විට ආරොන් සහ ඔහුගේ පුත්‍රයෝ උගේ
හිස මත තම අත් තැබූ හ. 19 මෝසෙස් ද ඌ මරා
උගේ ලේ පූජාසනය පිට හාත්පසින් ඉස්සේ ය.
20 ඉන්පසු ඔහු ඌ කෑලිවලට කපා, උගේ හිස ද
කෑලි සහ තෙලෙ ද ගින්නේ දැවී ය. 21 ඔහු සතාගේ
අතුණු හා කකුල් වතුරෙන් සෝදා සතා මුළුමනින් ම
පූජාසනය මත දැවී ය. එය වනාහි සමිඳාණන්
වහන්සේ මෝසෙස්ට අණ කළ පරිදි ගින්නෙන් දවා,
සමිඳාණන් වහන්සේට පුදන සුමිහිරි සුවඳක් සහිත
දවන යාග පූජාවකි.
22 පූජකයන් කැප කිරීමේ දී පුදන අනික් බැටළුවා
ගෙනා කල, උගේ හිස මත ආරොන් සහ ඔහුගේ
පුත්‍රයෝ තම අත් තැබූ හ. 23 මෝසෙස් ද ඌ මරා,
උගේ ලේ ගෙන, ආරොන්ගේ දකුණු කන්පෙත්තෙහි
ද දකුණතේ මාපටැඟිල්ලේ ද දකුණු පයේ
මාපටැඟිල්ලේ ද තැවරී ය. 24 පසුව ඔහු
ආරොන්ගේ පුත්‍රයන් කැඳවා ඔවුන්ගේ දකුණු කන්
පෙතිවල ද දකුණතේ මාපටැඟිලිවල ද දකුණු
පාදයේ මාපටැඟිලිවල ද ලේ තැවරී ය. ඉතිරි ලේ
පූජාසනය පිට හාත්පසින් ඉස්සේ ය.
25 ඉන්පසු ඔහු සතාගේ තෙලෙ ද එනම්, තර
වල්ගය ද අතුණු මත තිබූ තෙලෙ මුළුමනින් ම ද
අක්මාව පිට ඇති සිවිය ද වකුගඩු දෙක හා ඒවායේ
තෙලෙ ද දකුණු ගාතය ද ගත්තේ ය. 26 පසුව
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි තිබූ නුමුහුන් රොටි
පැසෙන් එක නුමුහුන් රොටියක් ද තෙලේ මිශ්‍ර
රොටියක් ද එක තුනී රොටි පෙත්තක් ද ගෙන ඔහු
ඒවා සතාගේ තෙලෙ හා දකුණු ගාතය මත තබා
27 මේ සියල්ල ම ආරොන්ගේ හා ඔහුගේ
පුතුන්ගේ අත්වලට දී සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි පිළිගැන්වීමේ පිළිවෙත ඉටු කරෙවේවේ ය.
28 මෙසේ කළ පසු, මෝසෙස් ඒවා ඔවුන්ගේ
අත්වලින් ගෙන පූජාසනයේ දවන යාග පූජාව මත
දැවී ය. එය වනාහි ගින්නෙන් දවා, සමිඳාණන්
වහන්සේට පුදන සුමිහිරි සුවඳැති කැප කිරීමේ
පූජාවකි. 29 ඉන්පසු මෝසෙස් සතාගේ ළපැත්ත
ගෙන සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි පිළිගැන්වීමේ
පිළිවෙත ඉටු කළේ ය. සමිඳාණන් වහන්සේ ඔහුට
අණ කළ පරිදි, එය වනාහි කැප කිරීමේ
බැටළුවාගෙන් මෝසෙස්ට හිමි කොටස වේ.
30 ඉන්පසු මෝසෙස් ආලේප තෙලෙයෙන් හා
පූජාසනය මත වූ ලයෙන් ස්වල්පයක් ගෙන ආරොන්
හා ඔහුගේ වස්ත්‍ර මත ද ඔහුගේ පුත්‍රයන් හා
ඔවුන්ගේ වස්ත්‍ර මත ද ඉස, ආරොන් සහ ඔහුගේ
වස්ත්‍ර ද ඔහුගේ පුත්‍රයන් හා ඔවුන්ගේ වස්ත්‍ර ද
කැප කළේ ය.
31 එවිට මෝසෙස් ආරොන්ට සහ ඔහුගේ පුතුන්ට
කතා කොට, මා අණ කළ පරිදි, “සම්මුඛ
මණ්ඩපයේ දොරකඩ ඒ මාංස තම්බා, ‘ආරොන් සහ
ඔහුගේ පුතුන් එය වැළඳිය යුතු ය’ කියා එහි දී කැප

කිරීමට ගත් පැසේ ඇති රොටි සමඟ වළඳන්න.
32 තවද, මස්වලින් හා රොටිවලින් ඉතිරි වන
කොටස ගින්නේ දැවිය යුතු ය. 33 කැප කිරීමේ දින
ගණන අවසාන වන තෙක්, දින හතක් ඔබ සම්මුඛ
මණ්ඩපයේ දොරටුවෙන් පිටතට නොයා යුතු ය. ඒ
සඳහා දින හතක් ගත වේ. 34 අප මෙදින කළ ලෙස
ඔබේ පාපවලට කමාව අයැදිනු පිණිස සමිඳාණන්
වහන්සේ මෙසේ කිරීමට අණ කළ සේක.
35 එබැවින් ඔබ දිවා රෑ, හත්දිනක් සම්මුඛ
මණ්ඩපයේ දොරටුව ළඟ සමිඳාණන් වහන්සේගේ
අණ පිළිපදිමින් නැවතී සිටිය යුතු ය. එලෙසෙ
නොකළොත්, ඔබ නසින්නහු ය. මක්නිසා ද උන්
වහන්සේ මට එසේ අණ කළ සේකැ”යි කීවේ ය.
36 මෙලෙසෙ ආරොන් සහ ඔහුගේ පුත්‍රයෝ
සමිඳාණන් වහන්සේ මෝසෙස් මඟින් අණ කළ
සියල්ල ඉටු කළහ.

## ආරොන් පූජා ඔප්පු කිරීම

9 අට වන දින මෝසෙස්, ආරොන් සහ ඔහුගේ
පුත්‍රයන් ද ඉශ්‍රායලේවරුන්ගේ ප්‍රජා
මූලිකයන් ද කැඳවී ය. 2 ඔහු ආරොන්ට කතා
කොට, “පාප පූජාවක් සඳහා නොකැළැල් ගොන්
වස්සකු ද දවන යාග පූජාවක් සඳහා නොකැළැල්
බැටළුවකු ද ගෙන සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි
ඔප්පු කරන්න. 3 තවද, ඔබ ඉශ්‍රායලේ ජනයාට
කතා කොට, ‘පාප පූජාවක් සඳහා නොකැළැල්
එළුවකු ද දවන යාග පූජාවක් සඳහා අවුරුද්දක්
වයසැති නොකැළැල් වස්සකු හා බැටළුවකු ද
4 සහභාගිකමේ පූජාවක් සඳහා ගවයකු හා
බැටළුවකු ද ගන්න. මේ සියල්ල ම තෙලේ මිශ්‍ර
ධාන්‍ය පූජාවක් සමඟ සමිඳාණන් වහන්සේට පිදිය
යුතු ය’යි කියන්න. ඒ මන්ද, අද සමිඳාණන් වහන්සේ
ඔබ හැමට දර්ශනය වන සේකැ”යි කීවේ ය.
5 මෝසෙස් අණ කළ දේ ඔව්හු සම්මුඛ මණ්ඩපය
ඉදිරිපිටට ගෙනා හ. මුළු ජනතාව ම ළං වී
සමිඳාණන් වහන්සේ ඉදිරිපිට සිටගත්හ. 6 එවිට
මෝසෙස් කතා කොට, “සමිඳාණන් වහන්සේගේ
මහිමාලංකාරය ඔබ ඉදිරියෙහි දර්ශනය වන පිණිස
කරන්නට උන් වහන්සේ ඔබට අණ කළ දේ මේ
ය”යි කී ය. 7 හෙබ්‍රෙ 7:27ඉන්පසු ඔහු ආරොන්
අමතා, “පූජාසනයට ළඟා වී, ඔබ උදෙසා ද සෙනඟ
උදෙසා ද පව් කමාව අයැදිමින් ඔබේ පාප පූජාව
සහ දවන යාග පූජාව පුදන්න. සමිඳාණන් වහන්සේ
අණ කළ පරිදි සෙනඟගේ පූජා පුදා ඔවුන් උදෙසා
පව් කමාව අයැදින්නැ”යි කීවේ ය.
8 ආරොන් ද එවිට පූජාසනයට ළඟා වී තමාගේ
පාප උදෙසා පාප පූජාවේ වස්සා මැරී ය.
9 ආරොන්ගේ පුත්‍රයන් ද වස්සාගේ ලෙයෙ ඔහු
වෙතෙ ගෙනා විට, ඔහු එහි තම ඇඟිල්ල ගල්වා
පූජාසනයේ අං පිට තවරා, ඉතිරි ලෙයෙ පූජාසනයේ
පාමුල වත් කළේ ය. 10 එහෙත්, පාප පූජාවට පිදූ
සතාගේ තෙලෙ ද වකුගඩු ද අක්මාව මත තිබූ සිවිය
ද සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අණ කළ පරිදි
ඔහු පූජාසනය මත දැවී ය. 11 එහෙත්, වස්සාගේ
මාංසය සහ හම කඳවුරෙන් පිටත ගින්නේ දැවී ය.
12 ඉන්පසු ආරොන් දවන යාග පූජාවේ සතා ද
මැරූ විට, ඔහුගේ පුත්‍රයන් ඔහුට උගේ ලේ දුන්
පසු, ඔහු ද පූජාසනය වටා හාත්පසින් එය ඉස්සේ
ය. 13 එවිට ඔවුන් දවන යාග පූජාව හිසත් ඇතුළු ව
කොටස් වශයෙන් දුන් කල, ඔහු ඒවා පූජාසනය මත
දැවී ය. 14 ඉන්පසු ඔහු ඒ සතාගේ අතුණු සහ
කකුල් සෝදා පූජාසනයේ දවන යාග පූජාව මත
ඒවා දැවී ය.
15 ඉක්බිති ඔහු සෙනඟගේ පූජා පිළිගන්වමින්,
සෙනඟගේ පාප පූජාව වන එළුවා ගෙනෙ, ඌ මරා,
කලින් කළ පාප පූජාව මෙන් එය පුද කළේ ය.
16 එවිට දවන යාග පූජාව ද ගෙනෙ, නියම පිළිවෙතෙ
අනුව ඔහු එය ද පුද කළේ ය. 17 ඉන්පසු ඔහු
ධාන්‍ය පූජාව පිළිගන්වමින් එයින් පුරා අහුරක්
රැගෙනෙ උදය කාලයේ පිදූ දවන යාග පූජාවට
අමතර ව එය පූජාසනය මත දැවී ය. 18 ලෙවී
3:1-11පසුව ඔහු සෙනඟ උදෙසා වූ සහභාගිකමේ
පූජාව වන ගවයා සහ බැටළුවා ද මැරී ය.
ආරොන්ගේ පුත්‍රයන් ඔහුට උන්ගේ ලේ පිළිගැන්වූ
විට ඔහු එය පූජාසනය පිට හාත්පසින් ඉස්සේ ය.
19 ගවයාගේ හා බැටළුවාගේ තෙලෙ ද එනම්, වල්ගා
ද අතුණු වැසි තෙලෙ ද වකුගඩු ද අක්මාව පිට ඇති
සිවිය ද ගෙනෙ 20 ඒ සියල්ල ළපැත්ත උඩ තබා
පූජාසනය මත ඒ තෙලෙ දැවී ය. 21 පසුව මෝසෙස්ට
අණ කළ පරිදි ඔහු ළපැත්ත සහ දකුණු ගාතය ගෙනෙ
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි පිළිගැන්වීමේ
පිළිවෙතෙ ඉටු කළේ ය.
22 ගණන් 6:22-26 ඉන්පසු ආරොන් සෙනඟ දෙසට
තම අත ඔසවා ඔවුන්ට ආශීර්වාද කොට පාප
පූජාව, දවන යාග පූජාව සහ සහභාගිකමේ පූජාව
පුදා එම ස්ථානයෙන් බැස ආවේ ය. 23 මෝසෙස් ද
ආරොන් ද සම්මුඛ මණ්ඩපයට ඇතුළු වී පිටතට
අවුත් සෙනඟට ආශීර්වාද කළහ. එවිට සමිඳාණන්
වහන්සේගේ මහිමාලංකාරය ද සියලු සෙනඟට
දර්ශනය විය. 24 සමිඳාණන් වහන්සේ ඉදිරියෙන්
ගින්නක් නික්ම පූජාසනය මත වූ දවන යාග පූජාව
සහ තෙලෙ දවා හැරියේ ය. මෙයෙ දුටු සියලු සෙනඟ
හඬ නඟා මුණින්තළා වැටුණා හ.

## නාදබ් සහ අබිහුගේ පාපය

10 ආරොන්ගේ පුත්‍රයන් වන නාදබ් සහ අබිහු
තම තමන්ගේ ධූම පාත්‍ර ගෙනෙ, ඒවායේ
ගිනි බහා, ඒවා මත සුවඳ ද්‍රව්‍ය දමා, සමිඳාණන්
වහන්සේ නියම නොකළ නීති විරෝධී ගිනි උන්
වහන්සේට පුද කළහ. 2 එවිට සමිඳාණන්
වහන්සේගෙන් ගින්නක් නික්ම, ඔවුන් දවා හැරියෙන්
ඔව්හු උන් වහන්සේ ඉදිරියෙහි මළහ. 3 එවිට
මෝසෙස් ආරොන්ට කතා කොට, “සමිඳාණන්
වහන්සේ වදාළ දේ මේ ය: ‘මට ළඟා වන්නන්
මඟින් මාගේ ශුද්ධ බව පාන්නෙමි. සියලු ජනතාව

අබිමුව මම මාගේ මහිමාලංකාරය දක්වන්නමේ’
”කීවේ ය. ආරොන් ද නිහඬ විය.
4 එවිට මෝසෙස්, ආරොන්ගේ බාප්පා වූ
උශ්ශියලේගේ පුත්‍රයන් වන මීෂායලේ සහ
එල්ශාපාන් කැඳවා, ඔවුන්ට කතා කොට, “මෙහි
අවුත්, ඔබේ සහෝදරයන් ශුද්ධස්ථානය ඉදිරිපිටින්
උසුලාගෙන ගොස් කඳවුරෙන් පිටත දමන්නැ”යි කී
ය. 5 එවිට ඔව්හු ළං වී, මෝසෙස් කී ලෙස
ඔවුන්ගේ වස්ත්‍ර පිටින් ම කඳවුරෙන් පිටතට ඔවුන්
ගෙන ගියහ.
6 ඉන්පසු මෝසෙස් ආරොන්ට ද ඔහුගේ පුත්‍රයන්
වන එලයාසර්ට සහ ඊතාමාර්ට ද කතා කොට,
“ඔබ කණගාටුව දැක්වීමට ඔබේ හිසකෙස් අවුල්
කර නොගන්න, ඔබේ වස්ත්‍ර ඉරා නොගන්න. ඔබ
එසේ කළොත් නසින්නහු ය, සමිඳාණන් වහන්සේ ද
මුළු ජනතාව සමඟ කිපෙන සේක. එහෙත්, ඔබේ
ඥාතීන් වන මුළු ඉශ්‍රායලේ ජනයා නම්, සමිඳාණන්
වහන්සේ එවන්නට සැලැසූ ගින්න ගැන වැළපිය යුතු
වේ. 7 ඔබ සම්මුඛ මණ්ඩපයේ දොරටුවෙන් පිටත
නොයා යුතු ය. මන්ද, සමිඳාණන් වහන්සේගේ
ආලේප තෛලය ඔබ පිට ඇති බැවින් ඔබ
මැරෙන්නට පුළුවනැ”යි කීවේ ය. ඔව්හු මෝසෙස් කී
ලෙස කළහ.

## පූජකවරුන් පිළිබඳ විනය නීති

8 සමිඳාණන් වහන්සේ ආරොන්ට කතා කොට,
9 “නුඹ සහ නුඹ සමඟ නුඹේ පුත්‍රයන් සම්මුඛ
මණ්ඩපයට ඇතුළු වන විට මුද්‍රික පානය හෝ මත්
පැන් හෝ පානය නොකරන්න. එසේ කළොත් නුඹ
මැරෙන්නට පුළුවන. මෙය නුඹේ පළපුරුත් තුළ
සදහට ම වලංගු නියෝගයකි. 10 නුඹ කැප කළ
දේවලින් අකැප දේ ද සම්මත පරිදි අපවිත්‍ර දෙයින්
පවිත්‍ර දේ ද වෙන් කළ යුතු ය. 11 තවද, සමිඳාණන්
වහන්සේ මෝසෙස් මඟින් ඉශ්‍රායලේ ජනයාට වදාළ
සියලු ම නීති නියෝග නුඹ ඔවුන්ට ඉගැන්විය යුතු
ය”යි වදාළ සේක.
12 ලෙවී 6:14-18 මෝසෙස් ආරොන්ට ද ඉතිරි ව
සිටි ඔහුගේ පුත්‍රයන් වන එලයාසර්ට හා
ඊතාමාර්ට ද කතා කොට, “සමිඳාණන් වහන්සේට
ගින්නේ දවා පිදූ පූජාවලින් ඉතිරි වූ ධාන්‍ය පූජාව
ගෙන, පූජාසනය ළඟ දී, මුහුන් නොදමා එය
වළඳන්න. එය අතිශුද්ධ ය. 13 එය ශුද්ධස්ථානයක
වැළඳිය යුතු ය. සමිඳාණන් වහන්සේට ගින්නේ දවා
පිදූ පූජාවලින් ඔබට හා ඔබේ පුත්‍රයන්ට හිමි
කොටස එය වේ. මට අණ කරන ලද්දේ එලෙස ය.
14 ලෙවී 7:30-34ඔබ ද ඔබේ පුත්‍රයන් හා දූවරුන් ද
පිළිගැන්වීමේ පිළිවෙතින් පිදූ ළපැත්ත හා
විශේෂයෙන් පිදූ ගාතය ශුද්ධස්ථානයක දී වැළඳිය
යුතු ය. මන්ද, ඒවා ඉශ්‍රායලේ ජනයාගේ
සහභාගිකමේ පූජාවලින් ඔබට හා ඔබේ පුතුන් හට
දුන් කොටස වේ. 15 තෙල ගින්නේ දවා ඔප්පු කරන
විට පිළිගැන්වීමේ පිළිවෙතින් පිදූ ළපැත්ත හා
විශේෂයෙන් පිදූ ගාතය ඔවුන් ගෙනා යුතු ය.
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි පිළිගැන්වීමේ
පිළිවෙතෙ ඉටු කළ පසු ඒවා ඔබටත්, ඔබ සමඟ
ඔබේ පුත්‍රයන්ටත් අයිති වේ. සමිඳාණන් වහන්සේ
අණ කළ පරිදි මෙය සදහට ම වලංගු
නියෝගයකි”යි කීවේ ය.
16 මෝසෙස් පාප පූජාව සඳහා පිදූ එළුවා ගැන
විමසූ විට, පුදුමයකි! ඌ දවා තිබිණි. එවිට ඔහු
ආරොන්ගේ පුත්‍රයන් අතර ජීවත් ව සිට එලයාසර්
සහ ඊතාමාර් සමඟ කිපී: 17 ලෙවී 6:24-26“ඔබ පාප
පූජාවට ගත් සතා ශුද්ධස්ථානයේ දී නොවැළඳුවේ
මන් ද? සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි පව් කමාවේ
පිළිවෙතෙ ඉටු කරමින්, ජනතාවගේ පාපවලට කමාව
දෙන පිණිස උන් වහන්සේ එය ඔබට දුන් සේක,
එය අතිශුද්ධ ය. 18 එහි ලේ ශුද්ධස්ථානය තුළට
ඔබ නොගෙනොවහු ය. මා අණ කළ පරිදි එය
ශුද්ධස්ථානය තුළ වැළඳිය යුතු ව තිබුණේ ය”යි
කීවේ ය.
19 එවිට ආරොන් ද මෝසෙස්ට උත්තර දෙමින්,
“බලන්න, මදෙන සෙනඟ තමන්ගේ පාප පූජාව සහ
දවන යාග පූජාව සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි
ඔප්පු කළ නමුත්, මට මෙයොකාර දේවල් සිදු වී ඇත.
හොඳයි, පාප පූජාව සඳහා පිදූ සතාගේ මාංසය මම
අද වැළඳුවමේ නම්, එය සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි ප්‍රසන්න දෙයක් වන්නට තිබුණේ දැ”යි
ඇසී ය. 20 මෙය ඇසූ විට මෝසෙස් සතුටු විය.

## පවිත්‍ර හා අපවිත්‍ර සතුන්

(ද්වි.නී. 14:3-21)

11 සමිඳාණන් වහන්සේ මෝසෙස් හා ආරොන්
අමතමින් ඔවුන්ට කතා කොට, 2 “ඉශ්‍රායලේ
ජනයාට මෙසේ කියන්නැ”යි වදාළ සේක. “මිහි පිට
සිටින සියලු මෘගයන් අතරෙන් නුඹලාට කන්නට
සුදුසු සත්තු නම් මොවුහු ය. 3 කුරය දෙකට බෙදී,
වෙන් ව තිබෙන, චමාරා කන මෘගයන් කෑමට සුදුසු
ය. 4 එහෙත්, චමාරා කන හෝ කුරය දෙකට බෙදී
ඇති හෝ පහත දක්වන මෘගයන් ඔබ නොකෑ යුතු
ය. එනම්, ඔටුවා චමාරා කන නමුත් උගේ කුර
දෙකට බෙදී නැත. ඌ අපවිත්‍ර සතෙකු ලෙස
සැලකිය යුතු ය. 5 පොළොවේ බෙනේ හාවා චමාරා
කන නමුත් උගේ කුර බෙදී නැත. ඌ අපවිත්‍ර ලෙස
සැලකිය යුතු ය. 6 හාවා චමාරා කන නමුත් උගේ
කුර බෙදී නැත. ඌ අපවිත්‍ර ලෙස සැලකිය යුතු ය.
7 ඌරාගේ කුරය බෙදී වෙන් ව තිබෙන නමුත් ඌ
චමාරා නොකයි. ඌ අපවිත්‍ර ලෙස සැලකිය යුතු ය.
8 ඉහත දැක්වූ සතුන්ගේ මස් නොකෑ යුතු ය.
උන්ගේ මළකුණු ස්පර්ශ නොකළ යුතු ය. උන්
අපවිත්‍ර ලෙස සැලකිය යුතු ය.
9 “තවද, ජලජ සතුන්ගෙන් පහත දක්වන සත්තු
නුඹලාට කන්නට සුදුසු ය. මුහුදු ජලයේ හෝ ගංගා
ජලයේ හෝ වසන වරල් සහ කොරපොතු සහිත
උන් නුඹලාට කෑමට සුදුසු ය. 10 එහෙත්, මුහුදු
ජලයේ හෝ ගංගා ජලයේ හෝ හැසිරෙන අනෙක්
ජලජ සතුන් අතර වරල් හා කොරපොතු රහිත උන්
නුඹලා පිළිකුල් කොට සැලකිය යුතු ය. 11 නුඹලා

උන් පිළිකුල් කොට, උන්ගේ මාංස නොකෑ යුතු ය.
තවද, නුඹලා උන්ගේ මළකුණු පවා පිළිකුල් කළ යුතු
ය. 12 නුඹලා වරල් හා කොරපොතු රහිත ජලජ
සතුන් පිළිකුල් කළ යුතු ය.
13 “තවද, පක්ෂීන් අතර නුඹලා පහත දක්වන
සතුන් පිළිකුල් කොට සැලකිය යුතු ය. නුඹලා උන්
නොකෑ යුතු ය; පිළිකුල් කළ යුතු ය. ඒ සත්තු නම්,
රාජාලියා, මහ ගිජු ලිහිණියා, මුදු උකුස්සා;
14 සාමාන්‍ය උකුස්සා, නා නා විධ කුරුළුගොයි; 15 නා
නා විධ කපුටුවෝ සියල්ල; 16 පැස්බරා, රෑ උකුස්සා,
මුදු ලිහිණියා, නා නා විධ වෙනත් උකුස්සෝ;
17 බස්සා, දියකාවා, බකමූණා; 18 උලමා,
කරවැල්කොකා, ගිජු ලිහිණියා; 19 මානකොකා, නා
නා විධ වෙනත් කොක්කු, හුපුවා සහ වවුලා වෙති.
20 “පියාපත් සහිත, පා හතරින් ඇවිදින සියලු
සතුන් නුඹලාට පිළිකුල් විය යුතු ය. 21 එහෙත්, පා
හතරින් බිම පැන පැන යන, දිග කකුල් ඇති පහත
දක්වන සත්තු නුඹලාට කෑමට සුදුසු ය. 22 එනම්, නා
නා විධ පළඟැටි ගිරව්, නා නා විධ රුහැයියන්, නා
නා විධ වාලුකා පළඟැටි ගිරව් කෑමට සුදුසු ය.
23 එහෙත්, පා හතරින් යන, පියාපත් සහිත අන්
සියලු සතුන් නුඹලාට පිළිකුල් විය යුතු ය.
24 “පහත දක්වන සතුන් නිසා නුඹලා අපවිත්‍ර
වන්නහු ය; උන්ගේ මළකුණු ස්පර්ශ කරන කවරෙක්
නමුත්, ඔහු සවස දක්වා අපවිත්‍ර වේ. 25 තවද,
යමෙකු උන්ගේ මළකුණු උසුලාගෙන ගියොත්, ඔහු
සිය වස්ත්‍ර සෝදාගත යුතු ය. ඔහු සවස දක්වා
අපවිත්‍ර වේ. 26 කුර ඇති නමුත් ඒවා නොබෙදේ
ඇති නම්, හෝ වමාරා නොකන හෝ සියලු
මෘගයන්ගේ මළකුණු අපවිත්‍ර ලෙස සැලකිය යුතු
ය. ඒවා ස්පර්ශ කරන සියල්ලෝ අපවිත්‍ර වෙති.
27 පා සතරින් ඇවිදින සියලු වර්ගවල සතුන් අතර
පතුල් තබා යන සතුන් අපවිත්‍ර ලෙස සැලකිය යුතු
ය. උන්ගේ මළකුණු ස්පර්ශ කරන සෑම කෙනෙක් ම
සවස දක්වා අපවිත්‍ර වේ. 28 යමෙකු උන්ගේ
මළකුණු උසුලාගෙන ගියොත්, ඔහු තම වස්ත්‍ර
සෝදාගත යුතු ය. ඔහු සවස දක්වා අපවිත්‍ර වේ.
නුඹලා උන් අපවිත්‍ර සතුන් ලෙස සැලකිය යුතු ය.
29 “බිම බඩගා යන සතුන් අතර පහත දක්වන
සතුන් අපවිත්‍ර ලෙස නුඹලා සැලකිය යුතු ය. උන්
නම්, නා නා විධ මුගටි, මීයෝ, ඉබ්බෝ;
30 හිකනැල්ලු, කටුස්සෝ, හූනෝ, ගොළුබෙල්ලෝ
සහ වැලි මීයෝ වෙති. 31 බඩගා යන සතුන් අතර
මොවුහු නුඹලාට අපවිත්‍ර ය. උන්ගේ මළකුණු
ස්පර්ශ කරන සෑම කෙනෙක් ම සවස දක්වා
අපවිත්‍ර වේ. 32 උන්ගේ මළකුණු යම් දෙයක් පිට
වැටුණොත්, එය ලී භාජනයක් වේ වා, වස්ත්‍රයක්
වේ වා, හමක් වේ වා, මල්ලක් වේ වා, භාවිතයට
ගන්න ඕනෑ ම බඳුනක් වේ වා ඒවා අපවිත්‍ර ලෙස
සැලකිය යුතු ය. ඒවා වතුරේ දැමිය යුතු අතර ඒවා
සවස දක්වා අපවිත්‍ර වේ. ඉන්පසු ඒවා පවිත්‍ර
ලෙස සැලකිය යුතු ය. 33 උන්ගේ මළකුණක් මැටි
බඳුනකට වැටුණොත්, එහි තිබෙන සියල්ල අපවිත්‍ර
වනු ඇත. එය ද බිඳ දැමිය යුතු ය. 34 කෑමට අවසර
ඇති යම් ආහාරයක් පිට එවැනි බඳුනකින් වතුර
වැටුණොත් ඒ ආහාර අපවිත්‍ර වනු ඇත. එවැනි
බඳුනකින් බොන සියලු බීම ද අපවිත්‍ර වන්නේ ය.
35 උන්ගේ මළකුණුවලින් කිසිවක් යම් දෙයක් පිට
වැටේ ද, එය උදුනක් වේ වා, වළං මැස්සක් වේ වා,
ඒවා කඩාදැමිය යුතු ය. ඒවා අපවිත්‍ර ය. නුඹලා ද
ඒවා අපවිත්‍ර ලෙස සැලකිය යුතු ය. 36 එහෙත්
උල්පත්, තටාක හා ජලය ඇති වෙනත් ස්ථාන ද
පවිත්‍ර යයි සැලකිය යුතු ය. එහෙත්, උන්ගේ
මළකුණු ස්පර්ශ වන අන් සියල්ල අපවිත්‍ර ය.
37 තවද, උන්ගේ මළකුණුවලින් යමක් බිත්තර වී
පිට වැටුණත් ඒවා පවිත්‍ර ය. 38 එහෙත්, ඒ බීජ පිට
වතුර වත් කළ පසු උන්ගේ මළකුණුවලින් කිසිවක්
ඒවා පිට වැටුණොත් ඒවා අපවිත්‍ර යයි සැලකිය යුතු
ය.
39 “නුඹලාට කෑමට අවසර ඇති යම් මෘගයෙකු මළ
පසු යමෙකු උගේ මළකුණ ස්පර්ශ කළොත්, සවස
දක්වා ඔහු අපවිත්‍ර ව සිටියි. 40 යමෙකු ඒ මළ
සතාගේ මස් කෑවොත්, ඔහු තම වස්ත්‍ර සෝදාගත
යුතු ය. ඔහු සවස දක්වා අපවිත්‍ර ව සිටියි. තවද,
යමෙකු උගේ මළකුණ උසුලාගෙන ගියොත්, ඔහු
තම වස්ත්‍ර සෝදාගත යුතු ය. ඔහු සවස දක්වා
අපවිත්‍ර ව සිටිනු ඇත.
41 “බිම බඩගා යන සියලු සත්තු පිළිකුල් ය. උන්
නොකෑ යුතු ය. 42 බඩගා යන සියලු සතුන්, පා
හතරෙන් ඇවිදින සියලු සතුන් හා බඩගා යන සතුන්
අතර බොහෝ පා ඇති සතුන් නුඹලා නොකෑ යුතු
ය. උන් පිළිකුල් කොට සැලකිය යුතු ය. 43 තවද,
නුඹලා බඩගා යන කොයි යම් සතෙක් වත් කෑමෙන්
පිළිකුල් නොවී, අපවිත්‍ර නොවී සිටිය යුතු ය.
උන්ගෙන් දූෂණය නොවිය යුතු ය. 44 ලෙවී 19:2; 1
පේදු 1:16මන්ද, මම නුඹලාගේ දෙවි සමිඳාණන්
වහන්සේ වෙමි. මා ශුද්ධ බැවින්, නුඹලා ද කැප වී
ශුද්ධ විය යුතු ය. එබැවින් නුඹලා බිම බඩගා යන
කොයි යම් සතෙකු වත් කෑමෙන් දූෂණය නොවිය
යුතු ය. 45 නුඹලාගේ දෙවියන් වහන්සේ වනු පිණිස,
නුඹලා පිටතට ගෙනා සමිඳාණන් වහන්සේ මම
වෙමි. මා ශුද්ධ බැවින්, නුඹලා ද ශුද්ධ විය යුතු ය.
46 “මෘගයන් හා පක්ෂීන් ද ජලයේ හැසිරෙන සියලු
ජලජ සතුන් හා බිම බඩගා යන සියලු සතුන් ද
පිළිබඳ ව වලංගු නීතිය මෙය වේ. 47 මෙහි අදහස
නම්, අපවිත්‍ර දේ හා පවිත්‍ර දේ පිළිබඳ ව ද
කෑමට සුදුසු හා නුසුදුසු මෘගයන් පිළිබඳ ව ද නුඹලා
වෙනසක් කළ යුතු බව ය.

## දරු උපතින් පසු වත්පිළිවෙත

12 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අමතා,
2 “ඉශ්‍රායෙල් ජනයාට කතා කොට මෙසේ
කියන්නැ”යි වදාළ සේක. “ස්ත්‍රියක ගැබ්ගෙන පිරිමි
දරුවකු ලැබුවොත්, ඈ ඔසප් ව සිටිය දිනවල දී
මෙන් ම හත් දවසක් අපවිත්‍ර ව සිටින්නී ය. 3 උත්
17:12; ලූක් 2:21අට වන දවසේ දී ඒ දරුවාගේ
චර්මාග්‍රය ඡේදනය කළ යුතු ය. 4 ඉන්පසු ඈ

සම්මත චාරිත්‍ර අනුව ඇගේ ලේ යාමනේ පවිත්‍ර
වීම පිණිස දවස් තිස්තුනක් සිටිය යුතු ය. ඇගේ
පවිත්‍ර වීමේ දවස් සම්පූර්ණ වන තකේ ඈ කිසි
ශුද්ධ දයෙක් ස්පර්ශ නොකළ යුතු ය. ශුද්ධස්ථානයට
ඇතුළු නොවිය යුතු ය. 5 එහෙත්, ඈ ගැහැණු
දරුවකු ලැබුවොත්, ඈ ඔසප් දිනවල දී මෙන් සති
දකෙක් අපවිත්‍ර ව සිටින්නී ය. ඉන්පසු ඈ සම්මත
චාරිත්‍ර අනුව ඇගේ ලේ යෑමනේ පවිත්‍ර වීම
පිණිස දවස් හැටහයක් සිටිය යුතු ය.
6 “පුතකු හෝ දුවක හෝ සඳහා ඇගේ පවිත්‍ර
වීමේ කාලය සම්පූර්ණ වූ පසු ඈ සම්මුඛ
මණ්ඩපයේ දොරකඩ පූජකවරයා වෙත දවන යාග
පූජාවක් සඳහා අවුරුද්දක් වයසැති බැටළුවකු ද පාප
පූජාවක් සඳහා පරවේ පැටියකු හෝ කොබෙයියකු
ද ගෙනෙ යුතු ය. 7 පූජකවරයා එය සමිඳාණන්
වහන්සේට පුදා ඇගේ පවිත්‍ර වීමේ පිළිවෙතෙ ඉටු
කරනු ඇත. පිරිමි දරුවකු හෝ ගැහැණු දරුවකු
හෝ ලැබූ පසු ස්ත්‍රියක ඉටු කළ යුතු පිළිවෙතෙ මයෙ
වේ. 8 ලූක් 2:24තවද, ඈට බැටළුවකු ගෙනෙන්නට
වත්කමක් නැති නම්, කොබෙයියන් දදෙනෙකු හෝ
පරවේ පැටවුන් දදෙනෙකු හෝ ගෙනෙ යුතු ය.
එකකේ දවන යාග පූජාව සඳහා ය, අනකො පාප
පූජාව සඳහා ය. පූජකවරයා ඈ උදසො මලෙසෙ
පවිත්‍ර වීමේ පිළිවෙතෙ ඉටු කළ විට ඈ පවිත්‍ර වනු
ඇත.”

## චර්ම රෝග පිළිබඳ නීති

13 තවද, සමිඳාණන් වහන්සේ මෝසසේට හා
ආරොන්ට කතා කොට මසෙේ වදාළ සේක:
2 “යමකුගේ ශරීරයේ හමේ බිබිලක් හෝ
තඩිස්සියක් හෝ පැල්ලමක් හෝ හටගෙන, එය
බෝවෙන චර්ම රෝගයක් වන්නට ඉඩ තිබේ නම්,
ඔහු පූජක ආරොන් වෙත හෝ පූජකයකු වන
ඔහුගේ පුතකු වෙත හෝ ගෙනෙ යුතු ය.
3 පූජකවරයා ද ඔහුගේ ශරීරයේ හමේ කුෂ්ඨය
සෝදිසි කළ යුතු ය. රෝගය ඇති ස්ථානයේ රෝම
සුදු පාට වී, කුෂ්ඨය හමේ ගැඹුරට ගොස් තිබේ
නම්, එය බෝවෙන චර්ම රෝගයක් වේ. පූජකවරයා
ද ඔහු සෝදිසි කළ පසු ඔහු අපවිත්‍ර ය කියා
ප්‍රකාශ කළ යුතු ය. 4 එහෙත්, හමේ පැල්ලම සුදු
පාට නමුත්, එය හමේ ගැඹුරට නොගොස් එහි
රෝම සුදු පාට වී නොතිබේ නම්, පූජකවරයා එම
කුෂ්ඨය ඇති තැනැත්තා දවස් හතක් වෙන් කොට
තැබිය යුතු ය. 5 හත් වන දින පූජකවරයා ඔහු
සෝදිසි කළ යුතු ය. කුෂ්ඨය එසේ ම ඇති ව, එය
පැතිරී නැත් නම්, ඔහු ඒ තැනැත්තා තව දවස් හතක්
වෙන් කොට තැබිය යුතු ය. 6 නැවත හත් වන දින
පූජකවරයා ඔහු සෝදිසි කළ යුතු ය. එවිට කුෂ්ඨය
මැල වී, එය හම පිට පැතිර නොගොස් තිබේ නම්,
පූජකවරයා ඔහු පවිත්‍ර ය කියා ප්‍රකාශ කළ යුතු
ය. එය තඩිස්සියක් පමණකි. ඔහු තම වස්ත්‍ර
සෝදාගත් පසු පවිත්‍ර වනු ඇත. 7 පූජකවරයා ඔහු
නැවත සෝදිසි කොට පවිත්‍ර යයි ප්‍රකාශ කළ පසු
තඩිස්සිය හමේ වඩා පැතිරී ගියහොත්, ඔහු
පූජකවරයා වෙත ඉදිරිපත් වී නැවත සෝදිසි කරවා
ගනු ලැබිය යුතු ය. 8 පූජකවරයා ඔහු මසෙේ
සෝදිසි කොට තඩිස්සිය හමේ පැතිර ගොස්
ඇත්නම්, ඔහු ඒ තැනැත්තා අපවිත්‍ර යයි ප්‍රකාශ
කළ යුතු ය. එය බෝවෙන චර්ම රෝගයක් වේ.
9 “යමකුට බෝවෙන චර්ම රෝගයක් ඇත්නම්,
ඔහු පූජකවරයා වෙත ගෙනෙ යුතු ය. 10 ඔහු ඒ
තැනැත්තා සෝදිසි කොට, හමේ බිබිල සුදු පාට
නම්, එහි රෝම සුදු පාට වී බිබිල ඔඩු දුවන
වණයක් වී ඇත්නම් 11 එය ඔහුගේ සිරුරේ හමේ වූ
කල්ගිය බෝවෙන චර්ම රෝගයක් බැවින් ඔහු ඒ
තැනැත්තා අපවිත්‍ර යයි ප්‍රකාශ කළ යුතු ය. තවද,
ඒ තැනැත්තා වෙන් කිරීම අනවශ්‍ය ය. මන්ද, ඔහු
දැනට ම අපවිත්‍ර ය. 12 තවද, බෝවෙන කුෂ්ඨ
රෝගය හම පුරා පැතිර ගොස් පූජකයාට පනෙනෙ
පරිදි එය ඔහුගේ හිස සිට පා දක්වා මුළු හම ම
වසා ඇත්නම්, 13 ඔහු ඒ තැනැත්තා යළි සෝදිසි කළ
යුතු ය. බෝවෙන චර්ම රෝගය ඔහුගේ මුළු ශරීරය
ම වසා ඇත්නම්, ඔහු ඒ තැනැත්තා පවිත්‍ර යයි
ප්‍රකාශ කළ යුතු ය. බෝවෙන චර්ම රෝගය
මුළුමනින් ම සුදු පාට වී ඇති බැවින් ඔහු පවිත්‍ර ය.
14 එහෙත්, ඔඩු දුවන වණ පනෙේ නම් ඔහු
අපවිත්‍ර ය. 15 පූජකවරයා ඒ වණ පරීක්ෂා කොට
ඔහු අපවිත්‍ර යයි ප්‍රකාශ කළ යුතු ය. ඔඩු දුවන
වණ අපවිත්‍ර ය. එය බෝවෙන චර්ම රෝගයකි.
16 ඒ ඔඩු දුවන වණ යළි වනෙසක් දක්වා සුදු පාටට
හැරුණොත්, ඔහු පූජකවරයා වෙත යළි පැමිණිය යුතු
ය. 17 ඔහු ඒ තැනැත්තා සෝදිසි කොට බෝවෙන
චර්ම රෝගය සුදු පාට වී ඇත්නම්, ඒ තැනැත්තා
පවිත්‍ර බව ප්‍රකාශ කළ යුතු ය. එවැන්නකේ
බෝවෙන චර්ම රෝගයනේ පවිත්‍ර ය.
18 “යමකුගේ ශරීරයේ හමේ ගඩ ගඩේයක් තිබී,
එය සුව වූ පසු 19 එම ගඩ ගඩේය තිබූ ස්ථානය සුදු
පාට වී ඉදිමී හෝ රතට හුරු පැල්ලමක් හෝ ඇති
වුවහොත්, එය පූජකවරයාට පනේවිය යුතු ය.
20 පූජකවරයා ද ඔහු සෝදිසි කළ පසු, එය හමේ
ගැඹුරට ගොස් එහි රෝම සුදු පාට වී ඇති බව
පනෙේ නම්, ඒ තැනැත්තා අපවිත්‍ර යයි ප්‍රකාශ
කළ යුතු ය. එය ගඩ ගඩේයකින් හට ගැනුණු චර්ම
රෝගයකි. 21 එහෙත්, පූජකවරයා ඔහු සෝදිසි කළ
පසු එහි සුදු පාට රෝම නැති බවත්, හමේ ගැඹුරට
ගොස් නැති බවත්, එය මැල වී තිබනෙ බවත්
පනෙේ නම්, ඔහු ඒ තැනැත්තා දවස් හතක් වෙන්
කොට තැබිය යුතු ය. 22 එය හම පුරා පැතිරී
ගියහොත්, පූජකවරයා ඔහු අපවිත්‍ර යයි ප්‍රකාශ
කළ යුතු ය. එය බෝවෙන චර්ම රෝගයකි.
23 එහෙත්, එම පැල්ලම පැතිරී නොගොස් එසේ ම
පවතී නම්, එය ගඩ ගඩේයේ කැළල ය. පූජකවරයා
ඔහු පවිත්‍ර යයි ප්‍රකාශ කළ යුතු ය.
24 “යමකුගේ ශරීරයේ හම ගින්නනේ පිළිස්සී, ඒ
පිළිස්සුණ ස්ථානයේ වණයේ, ලා රතු හෝ සුදු හෝ
පැල්ලමක් ඇති වුණොත්, 25 පූජකවරයා ඔහු
සෝදිසි කළ යුතු ය. පැල්ලමේ රෝම සුදු වී ඇති

බව ද හමේ ගැඹුරට ගොස් ඇති බව ද පෙනේ
නම්, එය පිළිස්සීමෙන් හට ගැනුණු බෝවෙන චර්ම
රෝගයකි. එබැවින් පූජකවරයා ඔහු අපවිත්‍ර යයි
ප්‍රකාශ කළ යුතු ය. එය බෝවෙන චර්ම රෝගයකි.
26 පූජකවරයා ඔහු සෝදිසි කොට, එම පැල්ලමේ
සුදු පාට රෝම නැති බවත්, එය හමේ ගැඹුරට
ගොස් නැති බවත්, එය මැල වී ඇති බවත් දකී නම්,
ඔහු ඒ තැනැත්තා දින හතක් වෙන් කොට තැබිය
යුතු ය. 27 හත් වන දින පූජකවරයා ඔහු සෝදිසි
කොට, එය හමේ පැතිරී ගොස් තිබේ නම්, ඒ
තැනැත්තා අපවිත්‍ර යයි ප්‍රකාශ කළ යුතු ය. එය
බෝවෙන චර්ම රෝගයකි. 28 එහෙත්, ඒ පැල්ලම
පැතිරී නොගොස් එලෙස ම පවතී නම්, එය මඳක්
මැල වී ඇති නම්, එය පිළිස්සීමෙන් හටගත්
ඉදිමීමකි. පූජකවරයා ඔහු පවිත්‍ර යයි ප්‍රකාශ කළ
යුතු ය. එය පිළිස්සීමෙන් හටගත් කැළලක් පමණි.
29 “පුරුෂයකුගේ හෝ ස්ත්‍රියකගේ හෝ හිසේ
හෝ නිකටේ හෝ වණයක් තිබේ නම්,
30 පූජකවරයා එම වණය සෝදිසි කළ යුතු ය. එය
හමේ ගැඹුරට ගොස් තිබෙන බවත්, එහි කහ
පාටට හුරු සිහින් රෝම ඇති බවත් පෙනේ නම්,
පූජකවරයා එවැනි අය අපවිත්‍ර යයි ප්‍රකාශ කළ
යුතු ය. එය දදයක් බැවින්, එය හිසේ හෝ නිකටේ
හෝ හටගන්න බෝවෙන චර්ම රෝගයකි.
31 පූජකවරයා ද එම දදය සෝදිසි කොට, එය හමේ
ගැඹුරට නොගොස් එහි කළු පාට රෝම නොතිබේ
නම්, ඔහු ඒ තැනැත්තා හත් දිනක් වෙන් කොට
තැබිය යුතු ය. 32 හත් වන දින දී පූජකවරයා ඒ
තැනැත්තා සෝදිසි කොට, දදය පැතිරී නොගොස්
එහි කහ පාටට හුරු රෝම නොතිබේ නම්, දදය
හමේ ගැඹුරට නොගොස් ඇත්නම්, 33 ඒ
තැනැත්තාට හිස බූගාගන්නට සැලැස්විය යුතු ය.
එහෙත්, දදය බූනොගෑ යුතු ය. තව හත් දිනක් ද
ඔහු වෙන් කොට තැබිය යුතු ය. 34 නැවත හත් වන
දින පූජකවරයා ඒ රෝගියා සෝදිසි කොට, දදය
හමේ නොපැතිරී, හමේ ගැඹුරට නොගොස්
ඇත්නම්, ඒ තැනැත්තා පවිත්‍ර යයි ප්‍රකාශ කළ යුතු
ය. රෝගියා ද තම වස්ත්‍ර සෝදාගත් පසු පවිත්‍ර
වේ. 35 එහෙත්, ඔහු සෝදාගත් පසු දදය වඩාත්
පැතිරී ගොස් තිබේ නම්, 36 පූජකවරයා ඔහු නැවත
සෝදිසි කොට දදය පැතිරී ගොස් ඇත්නම්, එහි කහ
පාටට හුරු රෝම නැති ව වේවා ඔහු අපවිත්‍ර
කෙනෙකු වනු ඇත. 37 එහෙත්, දදය එලෙසෙ
වෙනසක් නැති ව ද, එහි කළු පාට රෝම වැඩමෙන්
ද තිබේ නම්, දදය සුව වී ඇත. ඔහු පවිත්‍ර බැවින්
පූජකවරයා එලෙසෙ ප්‍රකාශ කළ යුතු වේ.
38 “යම් පුරුෂයකුගේ හෝ ස්ත්‍රියකගේ හෝ
ශරීරයේ හමේ සුදු පලු හටගතහොත්,
39 පූජකවරයා එවැන්නකු සෝදිසි කළ යුතු ය.
හමේ ඒ දදය සුදුමැලි ව තිබේ නම්, එය හමේ
හටගන්න ගෝමර වේ. එවැන්නකේ පවිත්‍ර
කෙනෙකි.
40 “යම් පුරුෂයකුගේ හිසකෙස් වැටුණොත් ඔහු
හිස මුඩු කෙනෙකි; ඔහු පවිත්‍ර ය. 41 තවද, ඔහුගේ
මුහුණට ඉහළින් හිසේ ඉස්සරහ කොටසේ
හිසකෙස් වැටී නළල මුඩු කෙනෙකු වුව ද ඔහු
පවිත්‍ර ය. 42 එහෙත්, ඒ මුඩු හිසහෙි හෝ මුඩු
නළලහෙි සුදුමැලි වණයක් හටගතහොත් එය
බෝවෙන චර්ම රෝගයකි. 43 පූජකවරයා ඔහු
සෝදිසි කළ විට මුඩු හිසහෙි හෝ මුඩු නළලහෙි
හෝ ඉදිමුම, හමේ හට ගන්න බෝවෙන චර්ම
රෝගයක් මෙන් මඳක් රතට හුරු නම්, 44 ඔහු හමේ
බෝවෙන රෝගයක් ඇති කෙනෙකි. ඔහු අපවිත්‍ර ය.
පූජකවරයා ඒ තැනැත්තාගේ හිසේ බෝවෙන චර්ම
රෝගයක් ඇති බැවින් ඔහු අපවිත්‍ර යයි ප්‍රකාශ
කළ යුතු ය. 45 බෝවෙන චර්ම රෝගියා ද තම
වස්ත්‍රය ඉරාගෙන, තම හිසකෙස් අවුල් කොටගෙන,
තම උඩු තොල වක්ත්‍ර පටියකින් වසාගෙන,
‘අපවිත්‍ර ය, අපවිත්‍ර ය’යි කෑගැසිය යුතු ය.
46 බෝවෙන චර්ම රෝගය ඇති මුළු කාලය තුළ ම
ඔහු කෙලෙසුණු, අපවිත්‍ර කෙනෙකි. ඔහු කඳවුරෙන්
පිටත හුදකලා ව විසිය යුතු ය.
47 “යම් රෙදි කඩක චර්ම රෝග ලකුණු
තිබුණොත්, එම රෙදි කඩ ලෝම වස්ත්‍රයක් හෝ
හණ වස්ත්‍රයක් හෝ වේවා, 48 හණ හෝ
ලෝමයෙන් හෝ වියූ ඇතිරිල්ලක් හෝ වේවා, හම්
පිළියක් හෝ හමින් සෑදූ යමක් හෝ වේවා, 49 එම
රෝග ලකුණු හම් පිළියේ හෝ වියූ වස්ත්‍රයේ හෝ
හමින් සෑදූ යමක හෝ වේවා, කොළ පාටට හෝ
රතු පාටට හෝ හුරු ව පෙනේ නම්, එය බෝවෙන
චර්ම රෝග ලකුණකි. ඒ රෙදිකඩ පූජකවරයාට
පෙන්වා 50 ඔහු එය සෝදිසි කළ පසු, දින හතක්
එය වෙන් කොට තැබිය යුතු ය. 51 ඔහු ද එහි
රෝගය හත් වන දින සෝදිසි කළ විට එය ඉහත කී
වස්ත්‍රයක එනම්, වියූ ඇතිරිල්ලක වේවා, හමින්
සෑදූ යමක වේවා පැතිරී ගොස් තිබේ නම්,
එවැන්නක් සැරෙන් බෝවෙන චර්ම රෝගයකි. එය
අපවිත්‍ර ය. 52 එබැවින් ඔහු එබඳු ඕනෑ ම පිළියක්,
හණ හෝ ලෝමයෙන් හෝ වියූ ඇතිරිල්ලක් හෝ
වේවා, හමින් සෑදූ යමක් හෝ වේවා, සැරෙන්
බෝවෙන චර්ම රෝගයක ලකුණු ඇති බැවින් ඒවා
ගින්නෙන් පුළුස්සා දැමිය යුතු ය. 53 එහෙත්,
පූජකවරයා එවැනි වස්ත්‍රයක් සෝදිසි කළ පසු එම
රෝගය, වියූ ඇතිරිල්ලක වේවා, හමින් සෑදූ යමක
වේවා, එය පැතිරී ගොස් නැත්නම්, 54 ඒවා
සෝදන්නට අණ කොට, තව හත් දිනක් ඒවා වෙන්
කොට තැබිය යුතු ය. 55 වස්ත්‍රය සේදූ පසු
පූජකවරයා එය සෝදිසි කොට බලන විට, රෝග
ලකුණුවල පාට වෙනස් නොවී, රෝගය පැතිරී
නොගොස් තිබෙන නමුත්, එය අපවිත්‍ර ය. එය
ගින්නේ පිළිස්සිය යුතු ය. මන්ද, රෝගය, වස්ත්‍රයේ
ඇතුළු පැත්තේ වේවා, පිට පැත්තේ වේවා, ඊට
තදින් කාවැදී ඇති බැවිනි. 56 වස්ත්‍රය සේදූ පසු
පූජකවරයා එය සෝදිසි කරන විට රෝග ලකුණු
මැල වී තිබෙන බව පෙනේ නම්, ඔහු ඒ කොටස
වස්ත්‍රයෙන් හෝ හම් පිළියෙන් හෝ වියූ

වස්ත්‍රයනේ හෝ ඉරා දැමිය යුතු ය. 57 ඉන්පසු පවා
එම රෝග ලකුණු වියූ ඇතිරිල්ලක හෝ හමින් සෑදූ
යමක හෝ පනෙේ නම්, ඒවා පැතිරී යන බෝවනෙ
චර්ම රෝගයක ලකුණු බැවින් එවැන්නක් ගින්නේ
පිළිස්සිය යුතු ය. 58 එහතේ, සෝදූ වස්ත්‍රයනේ, වියූ
ඇතිරිල්ලනේ හෝ හමින් සෑදූ යමකින් වේවා, රෝග
ලකුණු පහ වී ගොස් තිබේ නම්, එය දෙ වන
වරටත් සෝදූ පසු පවිත්‍ර වනු ඇත. 59 මයෙ වනාහි
ලෝම වස්ත්‍ර වේවා, වියූ හණ හෝ ලෝම හෝ
පිළි වේවා, හම් පිළි හෝ වේවා, ඒවායේ පවිත්‍ර
අපවිත්‍රතාව ප්‍රකාශ කිරීමට අදාළ වන නීතිය
වේ.”

## චර්ම රෝග සඳහා පුද පූජා

14 සමිඳාණන් වහන්සේ මෝසසේට කතා
කොට මසෙේ වදාළ සේක: 2 “බෝවනෙ
චර්ම රෝගියකු සුව වී තමා ශුද්ධ පවිත්‍ර වන
දවසේ දී ඔහු කරෙහි බලපාන නීතිය මයෙ වේ.
එනම්, ඔහු පූජකවරයා වතෙ ගනෙ ආ යුතු ය.මතෙ
8:4; මාක් 1:44; ලූක් 5:14; 17:14 3 පූජකවරයා ඔහු
කඳවුරනේ පිටතට කැඳවා ගනෙ ගොස් ඔහු සෝදිසි
කොට බෝවනෙ චර්ම රෝගය සුව වී ඇත්නම්,
4 පවිත්‍ර වීමේ පිළිවතෙ සඳහා පණපිටින් පවිත්‍ර
පක්ෂීන් දදෙනෙකු ද කිහිරි ගසින් ලී කෑල්ලක් ද දම්
පාට රදෙි කඩක් ද හිසොප් නම් පැළෑටියක් ද
ගනෙනේනට අණ කළ යුතු ය. 5 පසුව පිරිසිදු වතුර
දැමූ මැටි බඳුනක් තුළ, වතුරට උඩින් පක්ෂීන්
දදෙනොගනේ එකකු මැරීමට අණ කළ යුතු ය.
6 ඉන්පසු වතුරට උඩින් තබා මරන ලද පළමු
පක්ෂියාගේ ලේවල, පණපිටින් සිටින අනික් පක්ෂියා
ද කිහිරි ලී කෑල්ල ද දම් පාට රදෙි කඩ ද හිසොප්
පැළය ද ගිල්වා, 7 ඔහු බෝවනෙ චර්ම රෝගය තිබූ
තැනැත්තා මත හත්වරක් ලේ ඉස, ඔහු පවිත්‍ර යයි
ප්‍රකාශ කොට, පණපිටින් සිටින පක්ෂියාට
එළිමහනේ පියාඹා යෑමට ඉඩ හැරිය යුතු ය.
8 පවිත්‍ර විය යුතු තැනැත්තා ද තම වස්ත්‍ර
සෝදාගනෙ, හිස මුඩු කොට ස්නානය කළ යුතු ය.
මසෙේ කළ පසු ඔහු පවිත්‍ර වනු ඇත. ඔහු
කඳවුරට ඇතුළු වී හත් දිනක් තුළ තම කූඩාරමනේ
පිටත සිටිය යුතු වේ. 9 හත් වන දින දී ඔහු නැවත
තම හිස මුඩු කොට, රැවුල බාගනෙ ඇස් බැම ද
බූගාගනෙ තම වස්ත්‍ර ද සෝදා ස්නානය කළ යුතු
ය. එවිට ඔහු පවිත්‍ර වනු ඇත.
10 “අට වන දින ඔහු කැළැල් රහිත බැටළු වස්සන්
දදෙනෙකු ද කැළැල් රහිත අවුරුද්දක් වයසැති බැටළු
වැස්සියක ද තලේ මිශ්‍ර සිහින් පිටි කිලෝග්‍රෑම්
තුනක් ද තලේ ලීටර් එකකින් තුනනේ පංගුවක් ද
ධාන්‍ය පූජාවක් වශයනේ ගත යුතු ය. 11 ඉන්පසු
රෝගියාගේ පවිත්‍ර වීමේ පිළිවතෙ ඉටු කරන
පූජකවරයා රෝගියාත්, පරෙ කී පඬුරුත් සම්මුඛ
මණ්ඩපයේ දොරකඩ සමිඳාණන් වහන්සේ ඉදිරියට
ගනෙ යා යුතු ය. 12 එවිට පූජකවරයා බැටළු
වස්සකු ගනෙ ඔහු උදසො වන්දි ගවේමේ පූජාවක්
පිණිස තලේ ලීටර් එකකින් තුනනේ පංගුවක් සමඟ
ඌ පුද කරමින් සමිඳාණන් වහන්සේ ඉදිරියහෙි
පිළිගැන්වීමේ පිළිවතෙ ඉටු කොට පිළිගැන්විය යුතු
ය. 13 පසුව ඔහු පාප පූජාවට සහ දවන යාග
පූජාවට ගන්න සතුන් මරන ශුද්ධස්ථානයේ දී බැටළු
වස්සා මැරිය යුතු ය. පාප පූජාවේ සතා
පූජකවරයාට හිමි සේ ම වන්දි ගවේමේ පූජාවේ
සතා ද ඔහුට හිමි වේ. එය අතිශුද්ධ ය.
14 පූජකවරයා වන්දි ගවේමේ පූජාවේ සතාගේ
ලයෙින් ටිකක් ගනෙ පවිත්‍ර වීමේ පිළිවතෙ ලබන
තැනැත්තාගේ දකුණු කන් පතේතහෙි ද දකුණතේ
මාපටැඟිල්ලේ ද දකුණු පයේ මාපටැඟිල්ලේ ද
තැවරිය යුතු ය. 15 ඉන්පසු ඔහු තලේ ටිකක් ගනෙ
තම වමතේ අල්ලට වත් කර, 16 දකුණතේ ඇඟිල්ල
වමතේ අල්ලේ ඇති තලෙට දමා, එයින් සමිඳාණන්
වහන්සේ ඉදිරියහෙි හත්වරක් ඉසිය යුතු ය.
17 මසෙේ කොට ඔහු තම අතේ ඇති ඉතිරි තලෙින්
ටිකක් පවිත්‍ර වීමේ පිළිවතෙ ලබන්නාගේ දකුණු
කන් පතේතේ ද දකුණු මාපටැඟිල්ලේ ද දකුණු
පයේ මාපටැඟිල්ලේ ද වන්දි ගවේමේ පූජාවේ ලේ
මත ද දැමිය යුතු ය. 18 තම අතේ ඇති ඉතිරි තලෙ
පවිත්‍ර වීමේ පිළිවතෙ ලබන්නාගේ හිස මත වත්
කරමින් සමිඳාණන් වහන්සේ ඉදිරියහෙි ඔහු
වනෙුවනේ පවිත්‍ර වීමේ පිළිවතෙ ඉටු කළ යුතු ය.
19 “ඉන්පසු පූජකවරයා ද පාප පූජාව ඔප්පු කොට,
අපවිත්‍රකමින් පවිත්‍ර විය යුතු තැනැත්තා උදසො,
පවිත්‍ර වීමේ පිළිවතෙ ඉටු කළ පසු දවන යාග
පූජාවේ සතා මැරිය යුතු වේ. 20 පසුව දවන යාග
පූජාවත්, ධාන්‍ය පූජාවත් පූජාසනය මත පුද කොට
ඒ තැනැත්තා උදසො පවිත්‍ර වීමේ පිළිවතෙ ඉටු කළ
පසු ඔහු පවිත්‍ර වනු ඇත. 21 යමකුගේ දිළිඳුකම
නිසා වඩා යමක් ගනෙනේනට ඔහුට නොහැකි නම්,
ඔහු පූජකවරයා වතෙ ගනෙ ආ යුතු ඒ වන්දි
ගවේමේ පූජාව සඳහා එක බැටළු වස්සකු හා
ධාන්‍ය පූජාව සඳහා තලේ මිශ්‍ර සිහින් පිටිවලින්
කිලෝග්‍රෑම් එකක් ඇතුළු තව තලේ ලීටර් එකකින්
තුනනේ පංගුවක් ගනො යුතු ය. 22 තවද, ඔහුගේ
පුළුවන්කමේ හැටියට කොබෙයියන් ජෝඩුවක් හෝ
පරවේයින් ජෝඩුවක් හෝ ගනො යුතු ය. මින් එකක්
පාප පූජාවක් සඳහා ය, අනික දවන යාග පූජාවක්
සඳහා ය. 23 අට වන දින තමාගේ පවිත්‍ර වීම
සඳහා ඔහු මේ සියල්ල සම්මුඛ මණ්ඩපයේ
දොරකඩ සමිඳාණන් වහන්සේ ඉදිරියහෙි සිටින
පූජකවරයා වතෙ ගනො යුතු ය. 24 පසුව
පූජකවරයා වන්දි ගවේමේ පූජාව පිණිස සිටින
බැටළු පැටියා ද තලේ ලීටර් එකකින් තුනනේ
පංගුවක් ද සමිඳාණන් වහන්සේ ඉදිරියහෙි
පිළිගැන්වීමේ පූජාව ඔප්පු කරමින් පිළිගැන්වීමේ
පිළිවතෙ ඉටු කළ යුතු ය. 25 ඔහු වන්දි ගවේමේ
පූජාවේ බැටළුවා මරා, එයින් ලේ ටිකක් ගනෙ,
පවිත්‍ර වීම ලබන තැනැත්තාගේ දකුණු කන්
පතේතහෙි ද ඔහුගේ දකුණතේ මාපටැඟිල්ලේ ද
දකුණු පයේ මාපටැඟිල්ලේ ද තැවරිය යුතු වේ.
26 ඉන්පසු ඔහු තලේ ටිකක් තම වමතේ අල්ලට

වත් කොට, 27 දකුණතේ ඇඟිල්ලෙන් එම තෙලේ
ටිකක් ගෙන සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි
හත්වරක් ඉසිය යුතු ය. 28 තවද, ඔහු තම අතේ
තිබෙන තෙලින් ටිකක් ගෙන පවිත්‍ර වීම ලබන
තැනැත්තාගේ දකුණු කන් පෙත්තේ ද දකුණතේ
මාපටැඟිල්ලේ ද දකුණු පයේ මාපටැඟිල්ලේ ද
වන්දි ගෙවීමේ පූජාවේ ලේ මත ද දැමිය යුතු වේ.
29 පූජකවරයා තම අතේ ඇති ඉතිරි තෙලේ පවිත්‍ර
වීම ලබන තැනැත්තාගේ හිස මත වත් කරමින්, ඔහු
වෙනුවට සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි පවිත්‍ර
වීමේ පිළිවෙත ඉටු කළ යුතු ය. 30 පසුව ඔහුගේ
වත්කමේ හැටියට ගෙනා හැකි කොබෙයියෙකු හෝ
පරෙවියෙකු හෝ පුද කළ යුතු ය. 31 එකෙකු ඔප්පු
කළ යුත්තේ පාප පූජාවක් සඳහා ය; අනිකා ධාන්‍ය
පූජාවක් සමඟ ඔප්පු කළ යුත්තේ දවන යාග
පූජාවක් සඳහා ය; මෙලෙස පූජකවරයා සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි පවිත්‍ර වීම ලබන්නා වෙනුවට
පවිත්‍ර වීමේ පිළිවෙත ඉටු කළ යුතු ය. 32 පවිත්‍ර
වීම සඳහා ගත යුතු පඬුරු ගෙනෙන්නට නොහැකි,
බෝවෙන චර්ම රෝගියෙකු කෙරෙහි බලපාන නීතිය
මෙය වේ."

## නිවාසවල තිබිය හැකි රෝග ලකුණු

33 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට හා ආරොන්ට
කතා කොට මෙසේ වදාළ සේක: 34 "උරුම වශයෙන්
නුඹලාට දෙන්නට යන කානාන් දේශයට නුඹලා
පැමිණි විට, උරුම වන එම දේශයේ යම් ගෘහයක
ලාදුරු රෝගය බෝවෙන්නට මා සැලැස්සුවොත්,
35 එවිට ගෙහිමියා පූජකවරයා වෙත පැමිණ, 'මාගේ
ගෙදර ලාදුරු රෝගයෙහි ලකුණු ඇති සේ පෙනේ
යැ'යි කිව යුතු ය. 36 එවිට පූජකවරයා ඒ ලකුණු
පරීක්ෂා කිරීමට ගෙට ඇතුළු වන්නට පෙර ගෙයි
ඇති සියල්ල අපවිත්‍ර නොවනු පිණිස ඒ ගේ හිස්
කරන්නට අණ දිය යුතු ය. ඉන්පසු පූජකවරයා ගෙට
ඇතුල් වනු ඇත. 37 එසේ ඇතුළු වී ඒ ලකුණු
පරීක්ෂා කොට ගෙයි බිත්තියේ ඉරි ගැසී ඇති තැන්
කොළ පාටට හෝ රතට හෝ හුරුව, බිත්තියේ
යටට ම ගොස් තිබෙන බව පෙනේ නම්, 38 ඔහු
ගෙයින් නික්ම දොරින් පිටතට අවුත්, හත් දවසකට
ගෙය වසාදැමිය යුතු ය. 39 හත් වන දින දී ඔහු
පැමිණ පරීක්ෂා කොට ඒ ලකුණු ගෙයි බිත්තිවල
පැතිර ගොස් තිබේ නම්, 40 ඒ ලකුණු ඇති ගඩොල්
ගලවා, නගරයේ පිටත කසළ ගොඩකට දැමීමට
අණ කළ යුතු ය. 41 තවද, ගෙයි ඇතුළු බිත්ති සූරා,
සූරන ලද බදාම නගරයේ පිටත කසළ ගොඩකට
දමන ලෙස අණ කළ යුතු වේ. 42 ඉන්පසු වෙන
ගඩොල් ගෙන පළමු ගඩොල් තිබූ ස්ථානවලට දමා
තව බදාම ද රැගෙන ගෙය කපරාරු කළ යුතු ය.
43 "ගඩොල් අහකට ගෙන, ගෙය සූරා, එය කපරාරු
කළ පසු ඒ ලකුණු මතු වී, ඒවා ගෙයි පැතිරී
ගියහොත්, 44 පූජකවරයා යළි පැමිණි විට රෝගය
ගෙයි පැතිරී ගොස් තිබෙන බව පෙනේ නම්, එය
සැරෙන් පැතිරී යන බෝවෙන චර්ම රෝගයක් ය,
එය අපවිත්‍ර ය. 45 ඔහු ගෙය ද එහි ගඩොල් ද ලී
දඬු ද බදාම සම්පූර්ණයෙන් ද කඩාදමා නගරයෙන්
පිටත කසළ ගොඩකට ඒවා ගෙන යා යුතු ය.
46 තවද, යමෙකු ඒ ගේ වසා තිබෙන කාලය තුළ
එහි ඇතුළු වුවහොත්, ඔහු සවස දක්වා අපවිත්‍ර
යයි සලකනු ලැබේ. 47 යමෙකු එම ගෙයි
සැතපුණොත්, නැත්නම් ඒ ගෙය තුළ යමක් අනුභව
කළොත්, ඔහු තම වස්ත්‍ර සෝදා ගත යුතු ය.
48 "පූජකවරයා ගෙය ඇතුළට විත්, එය පරීක්ෂා
කොට ගෙය කපරාරු කළ පසු රෝග ලකුණු එහි
පැතිරී ගොස් නැත්නම්, රෝග ලකුණු සුව වී ඇති
බැවින් ඒ ගෙය පවිත්‍ර බව ප්‍රකාශ කළ යුතු ය.
49 ඔහු ගෙය පවිත්‍ර කරනු පිණිස පක්ෂීන්
දෙදෙනෙකු ද කිහිරි ලී කෑල්ලක් ද දම් පාට රෙදි
කඩක් ද හිසොප් පැළයක් ද ගෙනා යුතු ය.
50 පිරිසිදු වතුර ඇති මැටි බඳුනක උඩින් තබා එක
පක්ෂියෙකු මරා, 51 පිරිසිදු වතුරේ මැරූ පක්ෂියාගේ
ලේවල කිහිරි ලී කෑල්ල ද හිසොප් පැළය ද දම් පාට
රෙදි කඩ හා පණපිටින් සිටින පක්ෂියා ද දමා ඒ
ගෘහයට හත්වරක් ඉසිය යුතු ය. 52 මෙසේ ඔහු
පක්ෂියාගේ ලෙයින් ද පිරිසිදු වතුරෙන් ද පණපිටින්
සිටින පක්ෂියාගෙන් ද කිහිරි ලී කෑල්ලෙන් ද හිසොප්
පැළයෙන් හා දම් පාට රෙදි කඩින් ද ගේ පවිත්‍ර
කළ යුතු ය. 53 ඉන්පසු ඔහු පණපිටින් සිටින
පක්ෂියාට නගරයෙන් පිටත එළිමහනේ පියාඹා
යන්නට හැරිය යුතු ය. මෙලෙස ගෙය පවිත්‍ර වීමේ
පිළිවෙත ඉටු කළ විට එය පවිත්‍ර වනු ඇත.
54 "ඉහත දැක්වූයේ බෝවෙන චර්ම රෝග හා දද
පිළිබඳ ව ද 55 වස්ත්‍රයක සහ ගෙදරක බෝවෙන
චර්ම රෝග වැනි ලකුණු මතු වූ විට ද, 56 ඉදිමුමක්,
තඩිස්සියක් හා පැල්ලමක් පිළිබඳ ව ද ඒවා කෙරෙහි
බලපාන 57 අපවිත්‍ර දේ පවිත්‍ර දෙයින් වෙන්
කිරීමට උගැන්වීමට ඉවහල් වන නීති වේ."

## ශාරීරික අපවිත්‍රකම්

15 සමිඳාණන් වහන්සේ මෝසෙස් හා ආරොන්
අමතමින්, 2 "ඉශ්‍රායෙල් ජනයාට කතා කොට
ඔවුන්ට මෙසේ කියන්නැ"යි වදාළ සේක.
"යමෙකුගේ ශරීරයෙන් පුරුෂ ධාතු මෝචනය වේ
නම්, ඔහු අපවිත්‍ර කෙනෙකි. 3 ඔහුගේ ශරීරයෙන්
පුරුෂ ධාතු පිට වී ගියා වේවා, එය එහි රැඳී තිබුණා
වේවා, එවැන්නක් ඔහුට අපවිත්‍රකමක් ලෙස
සලකනු ඇත. 4 එවැන්නෙකු සයනය කරන හැම
යහනක් ම අපවිත්‍ර ය, වාඩි වන හැම අසුනක් ම
අපවිත්‍ර ය. 5 යමෙකු එවැන්නෙකුගේ යහන ස්පර්ශ
කළොත්, ඔහු තම ඇඳුම් සෝදාගෙන, ජලස්නානය
කළ යුතු ය. ඔහු සවස දක්වා අපවිත්‍ර යයි
සැලකෙනු ඇත. 6 එවැන්නෙකු වාඩි වූ අසුනක
යමෙකු වාඩි වුණොත්, මොහු තම ඇඳුම්
සෝදාගෙන, ජලස්නානය කළ යුතු ය. මොහු සවස
දක්වා අපවිත්‍ර යයි සැලකෙනු ඇත. 7 යමෙකු
එවැන්නෙකුගේ ඇඟ ස්පර්ශ කළොත්, ඔහු තම
ඇඳුම් සෝදාගෙන ජලස්නානය කළ යුතු ය. ඔහු

සවස දක්වා අපවිත්‍රය යයි සැලකෙනු ඇත.
8 එවැන්නකු පවිත්‍ර යයි සැලකෙන යමකුට කෙළ
ගැසුවොත්, ඔහු තම ඇඳුම් සෝදාගෙන ජලස්නානය
කළ යුතු ය. ඔහු සවස දක්වා අපවිත්‍ර යයි
සැලකෙනු ඇත. 9 එවැන්නකු නැඟී යන සෑදලය
අපවිත්‍ර ය. 10 එවැන්නකු වාඩිගත් ආසනයක්
යමකු ස්පර්ශ කළොත්, ඔහු සවස දක්වා අපවිත්‍ර
ය. යමකු එවැන්නකු වාඩිගත් යමක් උස්සාගෙන
ගියොත්, ඔහු තම ඇඳුම් සෝදාගෙන ජලස්නානය
කළ යුතු ය. ඔහු සවස දක්වා අපවිත්‍ර වනු ඇත.
11 මෝචනය ඇති කෙනෙකු වතුරෙන් අත්
නොසෝදා, වෙන කෙනෙකු ස්පර්ශ කළොත්, ඒ
තැනැත්තා තම ඇඳුම් සෝදාගෙන ජලස්නානය කළ
යුතු ය. ඔහු සවස දක්වා අපවිත්‍ර වනු ඇත.
12 එවැන්නකු මැටි බඳුනක් ස්පර්ශ කළොත්, එය
බිඳදැමිය යුතු ය. එසේ ම එවැන්නකු ස්පර්ශ කරන
සෑම ලී බඳුනක් ම වතුරෙන් සේදිය යුතු ය.
13 “අධික මෝචනය ඇති කෙනෙකු ඉන් සුව වූ
විට, හත් දිනක් ගත වූ පසු ඔහු තම ඇඳුම්
සෝදාගෙන, ගලා බසින පිරිසිදු වතුරෙන් ස්නානය
කළ විට පවිත්‍ර වනු ඇත. 14 අට වන දින ඔහු
කොබෙයියන් දෙදෙනෙකු හෝ පරෙවියන් දෙදෙනෙකු
හෝ ගෙන සම්මුඛ මණ්ඩපයේ දොරකඩ සමිඳාණන්
වහන්සේ වෙත පැමිණ ඒවා පූජකවරයාට දිය යුතු
ය. 15 පූජකවරයා එක පඬුරක් පාප පූජාවක් සඳහා
ද අනික දවන යාග පූජාවක් සඳහා ද ඔප්පු කළ යුතු
ය. මෙලෙස ඔහු ඔප්පු කරමින් ඒ තැනැත්තාගේ
මෝචනය උදෙසා පවිත්‍ර වීමේ පිළිවෙත සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි ඉටු කළ යුතු ය.
16 “යම් පුරුෂයකුට ධාතු මෝචනය ඇති
වුවහොත්, ඔහු ජලස්නානය කළ යුතු ය. ඔහු සවස
දක්වා අපවිත්‍ර වනු ඇත. 17 පුරුෂ ධාතු වැටුණු සෑම
වස්ත්‍රයක් ම, සෑම සම් පිළියක් ම වතුරෙන් සේදිය
යුතු ය. ඒවා සවස දක්වා අපවිත්‍ර වනු ඇත.
18 පුරුෂයකු ස්ත්‍රියක සමඟ සයනය කළ පසු,
දෙදෙනා ම ජලස්නානය කළ යුතු ය. සවස දක්වා
ඔවුන් අපවිත්‍ර වනු ඇත.
19 “යම්කිසි ස්ත්‍රියකට මාසික ඔසප් වීම වූ විට ඈ
හත් දිනක් අපවිත්‍ර වී සිටින්නී ය. යමකු ඈ ස්පර්ශ
කළොත්, ඔහු සවස දක්වා අපවිත්‍ර වේ. 20 ඇගේ
ඔසප් වීමේ කාලයේ දී ඈ සයනය කරන, වාඩි වන,
සෑම බඩුවක් ම අපවිත්‍ර වේ. 21 යමකු ඇගේ
යහන ස්පර්ශ කළොත්, ඔහු තම ඇඳුම් සෝදාගෙන
ජලස්නානය කළ යුතු වේ. ඔහු සවස දක්වා
අපවිත්‍ර වනු ඇත. 22 යමකු ඈ වාඩි වූ අසුනක්
ස්පර්ශ කළොත්, ඔහු තම ඇඳුම් සෝදාගෙන
ජලස්නානය කළ යුතු ය. ඔහු සවස දක්වා අපවිත්‍ර
වනු ඇත. 23 යමකු ඇගේ යහන වේවා, ඈ වාඩි වූ
ඕනෑ ම දයෙක් වේවා, ස්පර්ශ කළොත්, ඔහු සවස
දක්වා අපවිත්‍ර වනු ඇත. 24 ඒ කාලය තුළ දී යම්
පුරුෂයකු ඈ සමඟ සයනය කර ඇගේ
අපවිත්‍රතාවය ඔහු පිටට පැමිණියහොත්, ඔහු හත්
දිනක් අපවිත්‍ර වේ. ඔහු සයනය කරන යහන ද
අපවිත්‍ර වනු ඇත.
25 “යම්කිසි ස්ත්‍රියකගේ ඔසප් වීමේ නියමිත
කාලයෙන් පිට දින ගණනාවක් තුළ ද නියම
කාලයෙන් පසු ද පවා ලේ ගලා යාම වුවහොත්, ඒ
මුළු කාලය තුළ ම, ඇගේ ඔසප් වීමේ කාලයේ
මෙන් ම, ඈ අපවිත්‍ර වන්නී ය. 26 ඒ මුළු කාලය තුළ
ම, ඈ සයනය කරන සෑම යහනක් ම, වාඩි වන සෑම
අසුනක් ම, ඇගේ ඔසප් වීමේ කාලය තුළ දී මෙන්
අපවිත්‍ර වනු ඇත. 27 යමකේ ඒ බඩු භාණ්ඩ ස්පර්ශ
කරන්නේ ද ඔහු තම ඇඳුම් සෝදාගෙන ජලස්නානය
කළ යුතු ය. ඔහු සවස දක්වා අපවිත්‍ර වනු ඇත.
28 එහෙත්, ඇගේ ඒ ලේ ගලා යාම සුව වී හත්
දිනකට පසු, ඈ පවිත්‍ර වනු ඇත. 29 අට වන දින ඈ
කොබෙයියන් දෙදෙනෙකු හෝ පරෙවියන් දෙදෙනෙකු
හෝ ගෙන සම්මුඛ මණ්ඩපයේ දොරකඩ
පූජකවරයා වෙත ගෙනා යුතු ය. 30 පූජකවරයා එක
පූජාවක් පාප පූජාව පිණිස ද අනික් පූජාව දවන
යාග පූජාවක් පිණිස ද ඔප්පු කළ යුතු ය. මෙසේ
ඔහු ඇගේ ලේ ගලා යෑමෙන් පවිත්‍ර කිරීමේ
පිළිවෙත සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි ඉටු
කරන්නේ ය.
31 “මෙලෙස ඉශ්‍රායලේ ජනයා අතර ඇති මාගේ
මණ්ඩපය ඔවුන් කෙලෙසා, ඔවුන්ගේ අපවිත්‍රකම්
නිසා ඔවුන් නොමැරෙන පිණිස, නුඹ ඔවුන්ට මේ
අපවිත්‍රකම් ගැන උපදෙස් දිය යුතු ය.
32 “මේ දක්වන ලදුයේ, යමකුට මෝචනය ඇති
වන කල ද පුරුෂ ධාතු මෝචනය වීමෙන්
කෙලෙසෙන විට ද 33 ඔසප් වීමෙන් කාන්තාවන්
අපවිත්‍ර වන විට ද පුරුෂයකුට මෝචනය වන විට
ද ස්ත්‍රියකට ලේ ගලා යාම ඇති වන විට ද
අපවිත්‍ර යයි සැලකෙන, ස්ත්‍රියක සමඟ
සේවනයෙහි යෙදෙන කෙනෙකු පිළිබඳ ව ද වලංගු
නීති වේ.”

## වන්දි ගෙවීමෙනේ සමගිය

16 ආරොන්ගේ පුත්‍රයන් දෙදෙන සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි නීති විරෝධී ගිනි ඔප්පු
කොට මළ පසු, සමිඳාණන් වහන්සේ මෝසෙසේ
අමතා, 2 හෙබ්‍රෙ 6:19“නුඹ සහෝදර ආරොන්ට
මෙසේ කියන්නැ”යි වදාළ සේක. “නියමිත කාලයේ
දී පමණක් ඔහු තිරය පිටුපස තබා ඇති ගිවිසුම්
කරඬුව මත පිහිටි කරුණාසනය ඉදිරියේ
ශුද්ධස්ථානයට ඇතුළු විය යුතු ය. මයෙ කඩ
කළොත්, ඔහු මිය යනු ඇත. මන්ද, මම කරුණාසනය
මත වලාකුළක දර්ශනය වන්නමේ. 3 හෙබ්‍රෙ
9:7ඔහු ශුද්ධස්ථානයට ඇතුළු වන විට පාප පූජාවක්
සඳහා ගොන් වස්සකු ද දවන යාග පූජාවක් සඳහා
බැටළුවකු ද ගෙන ආ යුතු ය.
4 “ඔහු පූජක හණ කබාය හැඳ, හණ කලිසම්
ලාගෙන, හණ පටිය ඉණ වටා බැඳ, හණ මකුටයෙන්
සැරසී සිටිය යුතු ය. මේවා ශුද්ධ වස්ත්‍ර වන
බැවින්, ඒවා ලාගත යුත්තේ ජලස්නානය කළ පසුව
ය. 5 මුළු ඉශ්‍රායලේ ජනයා ඔහුට පාප පූජාවක්
සඳහා එළුවන් දෙදෙනෙකු ද දවන යාග පූජාවක්

සඳහා එක බැටළුවකු ද දිය යුතු ය. 6 ආරොන්
තමා උදෙසා පුදන පාප පූජාවේ ගොන් වස්සා ඔප්පු
කොට, තමා උදෙසාත්, තමාගේ ගෘහයේ වැසියන්
උදෙසාත් පව් කමා කිරීමේ පිළිවෙත ඉටු කළ යුතු ය.
7 ඔහු එළුවන් දදෙනා ගෙන සම්මුඛ මණ්ඩපයේ
දොරකඩ සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි
පිළිගැන්විය යුතු ය. 8 ඉන්පසු ඔහු සමිඳාණන්
වහන්සේට එකකු ද අශාශලේට හෙවත් කාන්තාර
යක්ෂයාට එකකු ද වශයෙන් තෝරාගැනීම සඳහා,
එළුවන් දදෙනාට දාදු දැමිය යුතු ය. 9 ආරොන්
සමිඳාණන් වහන්සේට පිදීමට දාදුව වැටුණ එළුවා
ගෙන, පාප පූජාවක් සඳහා ඌ පිදිය යුතු ය.
10 එහෙත්, අශාශලේට දීමට දාදු වැටුණු එළුවා,
පණපිටින් ම සමිඳාණන් වහන්සේට ඉදිරිපත් කොට,
පව් කමාව ලබාගැනීම සඳහා ඌට පාළුකරයට
යෑමට ඉඩ හැරිය යුතු ය.
11 “ඉන්පසු ආරොන් තමා උදෙසා පුදන පාප
පූජාවේ ගොන් වස්සා ගෙන තමා උදෙසා ද ගෙදර
වැසියන් උදෙසා ද පව් කමාවේ පිළිවෙත ඉටු කර ඌ
මැරිය යුතු ය. 12 ඔහු සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි පූජාසනයෙන් දැල්වෙන ගිනි අඟුරු ගෙන
දුම් බඳුනක් පුරවා, හොඳට කුඩු කළ සුවඳ ද්‍රව්‍ය
අහුරු දෙකක් ද ගෙන, තිරය පිටුපසට පැමිණ 13 උන්
වහන්සේ ඉදිරියෙහි සුවඳ දුම් වලාකුළකින් ගිවිසුම්
කරඬුව උඩ ඇති කරුණාසනය වැසෙන පිණිස ගිනි
අඟුරු මත සුවඳ ද්‍රව්‍ය දැමිය යුතු ය. මෙසේ
කළොත්, ඔහු මැරෙන්නේ නැත. 14 ඉන්පසු ඔහු
ගොන් වස්සාගේ ලෙයෙ ඇඟිල්ලෙන් ගෙන,
කරුණාසනයේ නැගෙනහිර පැත්තට ඉස, එහි
ඉස්සරහ පැත්තට ද හත්වරක් ඉසිය යුතු ය.
15 හෙබ්‍රෙ 9:12මෙසේ කළ පසු ඔහු සෙනඟ උදෙසා
ඇති පාප පූජාවේ එළුවා මරා, තිරය පිටුපසට උගේ
ලේ ගෙනැවිත්, ගොන් වස්සාගේ ලේ ගෙන කළ
පරිදි, කරුණාසනය උඩටත්, ඉස්සරහටත් ලේ ඉසිය
යුතු ය. 16 මෙසේ ඔහු ඉශ්‍රායෙලේ ජනයාගේ
අපවිත්‍රකම් හා ඔවුන්ගේ පාප අපරාධයන් නිසා
කළ යුතු ව ඇති ශුද්ධස්ථානයෙහි පව් කමා කිරීමේ
පිළිවෙත ඉටු කළ යුතු ය. තවද, ඔවුන්ගේ
අපවිත්‍රකම් මධ්‍යයේ පිහිටා ඇති සම්මුඛ
මණ්ඩපයට ද ඔහු එලෙසෙ කළ යුතු ය. 17 ආරොන්
පවිත්‍ර වීමේ පිළිවෙත ඉටු කරනු පිණිස
ශුද්ධස්ථානයට ඇතුළු වී, තමා උදෙසාත්, තමාගේ
ගෘහ වාසීන් උදෙසාත්, මුළු ඉශ්‍රායෙලේ ජනතාව
උදෙසාත් පව් කමා වීමේ පිළිවෙත ඉටු කර, පිටතට
එන තෙක් කිසිවකු සම්මුඛ මණ්ඩපයට ඇතුළු
නොවිය යුතු ය. 18 පසුව ඔහු සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි දවන යාග පුදන පූජාසනය වෙත ගොස්
එය උදෙසා පව් කමා කිරීමේ පිළිවෙත ඉටු කළ යුතු
ය. ඔහු ගොන් වස්සාගේ ලේ මඳක් ද එළුවාගේ
ලේ මඳක් ද ගෙන පූජාසනය වටේට ඇති අංවල
තැවරිය යුතු ය. 19 ඒවා මත සිය ඇඟිල්ලෙන්
හත්වරක් ලේ ඉසිමින්, ඒවා පවිත්‍ර කළ යුතු ය.
මෙලෙසෙ ඉශ්‍රායෙලේ ජනයාගේ අපවිත්‍රකමින් ඒවා
විශුද්ධ කළ යුතු ය.”

## එළුවා බිලි කොට දීම

20 “ආරොන් මෙසේ ශුද්ධස්ථානය ද සම්මුඛ
මණ්ඩපය ද පූජාසනය ද පිළිබඳ පව් කමා කිරීමේ
පිළිවෙත ඉටු කර හමාර කළ පසු, ඔහු පණපිටින්
සිටින එළුවා ගෙන ආ යුතු ය. 21 ඔහු උගේ හිස
මත අත් දෙක තබා ඉශ්‍රායෙලේ ජනයාගේ දුෂ්ටකම්
සහ නපුරුකම් වන සියලු පාප ඌ මත උච්චාරණය
කොට, ඒ සඳහා පත් කළ කෙනෙකුට බාර දී ඌ
පාළුකරයට ගෙන යන්නට හැරිය යුතු ය. 22 එළුවාට
ද ඔවුන්ගේ සියලු දුෂ්ටකම් දරාගෙන, ජන වාසයක්
නැති පාළුකරයට යන්නට හැරිය යුතු ය.
23 එසකි 44:19 “ඉන්පසු ආරොන් සම්මුඛ
මණ්ඩපයට ඇතුළු වී ශුද්ධස්ථානයට යන විට,
ලාගෙන සිටි හණ වස්ත්‍ර ලිහා ඒවා එහි තැබිය යුතු
ය. 24 මෙසේ තමා ශුද්ධස්ථානයෙහි ම ජලස්නානය
කොට, තමාගේ ඇඳුම් ලාගෙන, පිටතට අවුත් තමා
උදෙසා ද සෙනඟ උදෙසා ද තමාගේ දවන යාග
පූජාවත්, සෙනඟගේ දවන යාග පූජාවත් පව් කමා
කිරීමක් වශයෙන් ඔප්පු කළ යුතු ය. 25 පසුව පාප
පූජාවට ගත් සතාගේ තෙල පූජාසනය මත දැවිය
යුතු ය. 26 පාපයන් දරාගෙන අශාශලේ වෙත
පාළුකරයට ගිය එළුවා දක්කාගෙන ගිය තැනැත්තා ද
තම ඇඳුම් සෝදාගෙන, ජලස්නානය කොට කඳවුරට
පැමිණිය යුතු ය. 27 හෙබ්‍රෙ 13:11ශුද්ධස්ථානය
පිළිබඳ පව් කමා කිරීමේ පිළිවෙත ඉටු කිරීමට ලේ
ගෙනෙන ලද, පාප පූජාවට පිදූ ගොන් වස්සා සහ
එළුවා කඳවුරින් පිටතට ගෙනගොස්, උන්ගේ හම්,
මස්, අතුණු සහ ගොම ගින්නේ පිළිස්සිය යුතු ය.
28 එලෙසෙ පුළුස්සන්නා ද තම ඇඳුම් සෝදාගෙන,
ජලස්නානය කොට කඳවුරට පැමිණිය යුතු ය.”

## සමගි දිනය පැවැත්වීම

29 ලෙවී 23:26-32; ගණන් 29:7-11 “පහත දක්වන
නියෝගය නුඹලා කරෙහි සදහට ම වලංගු වේ:
එනම්, හත් වන මාසයේ දස වන දින ඉශ්‍රායෙලේ
ජනයා වන නුඹලා ද නුඹලා අතර වසන විදේශීන් ද
උපවාසයෙහි යෙදෙමින්, බර වැඩ කිරීමෙන් වැළකිය
යුතු ය. 30 එදින පූජකවරයා සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි නුඹලාගේ සියලු පාපවලින් නුඹලා පවිත්‍ර
කරනු පිණිස, පව් කමා කිරීමේ පිළිවෙත ඉටු කළ
යුතු ය. 31 එදින නුඹලාට මහා සබත් දිනයක් වනු
ඇත. එදින නුඹලා වැඩ නොකළ යුතු ය. නුඹලා
උපවාස කළ යුතු ය. මෙය සදහට ම වලංගු
නියෝගයකි. 32 තම පියා වෙනුවට පූජක නිලයේ
සේවා කරනු පිණිස පූජකවරය ලබමින් ආලේප
කරනු ලබන පූජකවරයා හණ පිළියෙන් සෑදූ ශුද්ධ
වස්ත්‍ර ලාගෙන පව් කමා කිරීමේ පිළිවෙත ඉටු කළ
යුතු ය. 33 මෙසේ ඔහු අතිශුද්ධස්ථානය, සම්මුඛ
මණ්ඩපය සහ පූජාසනය පිළිබඳ පව් කමා කිරීමේ
පිළිවෙත ද පූජකවරුන් හා මුළු සෙනඟගේ පව් කමා
කිරීමේ පිළිවෙත ද ඉටු කළ යුතු ය. 34 මෙය වනාහි
අවුරුද්දකට වරක් ඉශ්‍රායෙලේ ජනයාගේ සියලු පාප

කමා කිරීම පිණිස ඉටු කළ යුතු නුඹලා කෙරෙහි
සදහට ම වලංගු නියෝගයකි.”
34 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට වදාළ ලෙස
ඔහු ද ඒවා ඉටු කළේ ය.

## යාග පූජා සහ පඬුරු

17 සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතමින්,
2 “ආරොන්ට ද ඔහුගේ පුත්‍රයන්ට හා මුළු
ඉශ්‍රායලේ ජනයාට ද කතා කොට, ‘සමිඳාණන්
වහන්සේ මෙය අණ කළ සේක කියා පවසන්නැ’යි
මෙසේ වදාළ සේක. 3+LEV ‘ඉශ්‍රායලේ ජනයා
අතරෙන් යමෙක් ගොනෙකු හෝ බැටළු පැටවෙකු
හෝ එළුවෙකු හෝ සමිඳාණන් වහන්සේගේ
මණ්ඩපය ඉදිරියෙහි උන් වහන්සේට පූජා කිරීමට
සම්මුඛ මණ්ඩපයේ දොරකඩට නොගෙන, කඳවුර
ඇතුළත හෝ ඉන් පිටත හෝ ඌ මරන්නේ නම්,
ඔහු තමා වැගිරූ ලේ ගැන වගකිව යුතු ය. ඔහු ලේ
සිඳ හෙළූ බැවින් සිය සෙනඟ කෙරෙන් ඔහු
නෙරපාදැමිය යුතු ය. 5 මෙම නියෝගයේ තේරුම
නම්, ඉශ්‍රායලේ ජනයා යාග පූජා පිණිස එළිමහනේ
මරන්නට පුරුදු ව සිටිය සතුන් සමිඳාණන් වහන්සේ
වෙත රැගෙන යා යුතු බව ය. තවද, ඔවුන් එම
සතුන් සම්මුඛ මණ්ඩපයේ දොරකඩ සිටින
පූජකවරයා වෙත ගෙනවුත්, සහභාගිකමේ පූජා
වශයෙන් සමිඳාණන් වහන්සේට පිදීමට එහි දී උන්
මැරිය යුතු ය. 6 පූජකවරයා සම්මුඛ මණ්ඩපයේ
දොරකඩ සමිඳාණන් වහන්සේගේ පූජාසනය මත
ලේ ඉස, සතුන්ගේ ලේ සමිඳාණන් වහන්සේ වෙත
නඟින සුමිහිරි සුවඳක් මෙන් දැවිය යුතු ය. 7 තවද,
ඔවුන් යකුන් පසුපස ගොස් මට අවිශ්වාසවන්ත වී
ඔවුන් වැළඳගෙන ඔවුන්ට පුද කළ පරිදි මින්පසු
තවත් පූජා නොකළ යුතු ය. මෙය නුඹේ පෙළපත්
තුළ සදහට ම වලංගු නියෝගයකි.
8 ‘ඔබ ඔවුන්ට මෙසේ ද කියන්න, ඉශ්‍රායලේ
ජනයා අතර යමෙක් වේවා, ඔබ අතර වසන
විදේශිකයෙක් වේවා, දවන යාග පූජාවක් හෝ
පඬුරක් හෝ සමිඳාණන් වහන්සේට පුදන්නේ නම්,
9 සමිඳාණන් වහන්සේට ඔප්පු කරනු පිණිස ඔහු
සම්මුඛ මණ්ඩපයේ දොරකඩට එය ගෙනා යුතු ය.
එසේ නොකළොත්, ඔහු තම සෙනඟ කෙරෙන්
නෙරපාදමනු ලැබේ.
10 උත් 9:4; ලේවී 7:26-27; 19:26; ද්වි.නී. 12:16-23;
15:23 ‘ඉශ්‍රායලේ ජනයා අතරෙන් යමෙක් වේවා,
ඔවුන් අතර වසන විදේශිකයෙක් වේවා, ලේ සහිත
මාංස කෑමට ගතහොත්, එසේ කන තැනැත්තාට
විරුද්ධ ව මාගේ මුහුණ හරවා ගනිමින් ඔහු තම
සෙනඟ කෙරෙන් නෙරපාදමනු ලැබේ. 11 හෙබ්‍රෙ
9:22මන්ද, සත්ත්වයකුගේ ප්‍රාණය ඇත්තේ
ලේවල ය. නුඹලාගේ පාපවලට, පූජාසනය මත පව්
කමා කිරීමේ පිළිවෙත ඉටු කිරීමට මා නුඹලාට එය
දී ඇත. පව් කමා කිරීමේ පිළිවෙත ඉටු කරන්නේ
ලේ මඟිනි. 12 ඉශ්‍රායලේගේ ජනයා අතර යමෙකුට
වේවා, ඔවුන් අතර වසන විදේශිකයෙකුට වේවා,
ලේ කෑමට ගැනීම මා තහනම් කර ඇත්තේ ඒ නිසා
ය.
13 ‘ඉශ්‍රායලේ ජනයා අතර යමෙක් වේවා, ඔබ
අතර වසන විදේශිකයෙක් වේවා, කෑමට අවසර
ඇති මෘගයෙකු හෝ පක්ෂියෙකු හෝ දඩයම් කර
අල්ලා ගතහොත්, උගේ ලේ ගලා යන්නට හැර, එය
පස්වලින් වසාදැමිය යුතු ය. 14 මන්ද, සෑම
සත්ත්වයකුගේ ප්‍රාණය ඇත්තේ ලේවල ය.
එබැවින් මම ඉශ්‍රායලේ ජනයා අමතා, ‘ලේ සහිත
කිසි ම මාංසයක් අනුභව නොකළ යුතු ය. සෑම
සත්ත්වයකුගේ ප්‍රාණය රඳා ඇත්තේ එහි ඇති
ලේ පිට ය. යමෙක් එවැන්නක් කන්නේ ද ඔහු
නෙරපාදමනු ඇතැ’යි කීවෙමි.
15 ‘ඉශ්‍රායලේ ජාතිකයෙක් හෝ විදේශිකයෙක්
හෝ වේවා, ඉබේ ම මැරුණු හෝ වන සතුන් විසින්
මරාදමනු ලැබූ හෝ මෘගයකුගේ මාංස කෑවොත්,
ඔහු තම ඇඳුම් සෝදාගෙන ජලස්නානය කළ යුතු ය.
ඔහු සවස දක්වා අපවිත්‍ර ය. ඉන්පසු පවිත්‍ර යයි
සැලකෙනු ඇත. 16 ඔහු ඇඳුම් සෝදාගෙන
ජලස්නානය නොකළොත්, තමාගේ වරද ගැන
වගකිව යුතු ය.’ ”

## කාමයෙහි වරදවා හැසිරීම

18 සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතා,
2 “ඉශ්‍රායලේ ජනයාට කතා කොට ඔවුන්ට
මෙසේ කියන්නැ”යි වදාළ සේක. “මම නුඹලාගේ
දෙවි සමිඳාණන් වහන්සේ වෙමි. 3 නුඹලා වාසය
කළ මිසර දේශයෙහි වැසියන්ගේ ක්‍රියා නුඹලා
අනුගමනය නොකළ යුතු ය. තවද, මා නුඹලා
පමුණුවන්නට යන කානාන් දේශයේ වැසියන්ගේ
ක්‍රියා ද අනුගමනය නොකළ යුතු ය. ඔවුන්ගේ
නියෝගයන්ට ද කීකරු නොවිය යුතු ය. 4 නුඹලා
මාගේ විනිශ්චයයන් ඉටු කරමින්, නියෝග
පවත්වමින් ඒවාට කීකරු විය යුතු ය. මම වනාහි
නුඹලාගේ දෙවි සමිඳාණන් වහන්සේ වෙමි.
5 නෙහෙ 9:29; එසකි 18:9; 20:11-13; ලූක් 10:28;
රෝම 10:5; ගලා 3:12මාගේ නීති හා විනිශ්චයයන්
නුඹලා පිළිපැදිය යුතු ය. යමෙක් ඒවා ඉටු කරන්නේ
ද ඔහු ඒ මඟින් ජීවත් වනු ඇත. මම සමිඳාණන්
වහන්සේ වෙමි.
6 “නුඹලාගෙන් කිසිවෙකු කිට්ටු ඥාතියෙකුගේ
නිරුවත අනාවරණය නොකළ යුතු ය. මම සමිඳාණන්
වහන්සේ ය. 7 නුඹේ මවගේ නිරුවත අනාවරණය
කොට නුඹේ පියාට නින්දා නොකළ යුතු ය. ඈ
නුඹේ මව බැවින් ඇගේ නිරුවත අනාවරණය
නොකළ යුතු ය. 8 ලේවී 20:11; ද්වි.නී. 22:30;
27:20නුඹේ පියාගේ බිරිඳකගේ නිරුවත අනාවරණය
නොකළ යුතු ය. එසේ කිරීම නුඹේ පියාට කරන
නින්දාවකි. 9 ලේවී 20:17; ද්වි.නී. 27:22ගෙදර උපන්
හෝ අන් තැනක උපන් හෝ නුඹේ පියාගේ හෝ
මවගේ හෝ දුව වන නුඹේ සහෝදරියගේ නිරුවත
අනාවරණය නොකළ යුතු ය. 10 නුඹේ පුතකුට
උපන් හෝ දුවකට උපන් හෝ නුඹේ මිණිබිරියකගේ

නිරුවත අනාවරණය නොකළ යුතු ය. එය නුඹට ම
කරගන්න නින්දාවකි. 11 නුඹේ පියාට දාව උපන්,
ඔහුගේ වෙන කසාදයක දූව, නුඹේ සොහොයුරිය
වන බැවින්, ඇගේ නිරුවත අනාවරණය නොකළ
යුතු ය. 12 ලෙවී 20:19-20නුඹේ පියාගේ
සොහොයුරිය, නුඹේ පියාගේ කිට්ටු නෑයකු බැවින්
ඇගේ නිරුවත අනාවරණය නොකළ යුතු ය.
13 නුඹේ මවගේ සොහොයුරිය, නුඹේ මවගේ
කිට්ටු නෑයකු බැවින්, ඇගේ නිරුවත අනාවරණය
නොකළ යුතු ය. 14 නුඹේ පියාගේ සහෝදරයාගේ
බිරිඳ නුඹේ කුඩම්මා වන බැවින් ඇගේ නිරුවත
අනාවරණය නොකළ යුතු ය. 15 ලෙවී 20:12නුඹේ
ලේලි, නුඹේ පුතාගේ බිරිඳ වන බැවින්, ඇගේ
නිරුවත අනාවරණය නොකළ යුතු ය. 16 ලෙවී
20:21නුඹේ සහෝදරයාගේ බිරිඳගේ නිරුවත
අනාවරණය නොකළ යුතු ය. එය ඔහුට කරන
නින්දාවකි. 17 ලෙවී 20:14; ද්වි.නී. 27:23නුඹ යම්
ස්ත්‍රියකගේ නිරුවත අනාවරණය කළ පසු ඇගේ
දූවගේ හෝ ඇගේ මිණිබිරියගේ හෝ නිරුවත
අනාවරණය නොකළ යුතු ය. ඔවුන් කිට්ටු නෑයන්
වන බැවින් එසේ කිරීම දුෂ්ටකමකි. 18 නුඹේ
භාර්යාව ජීවත් ව සිටිය දී, ඇගේ සහෝදරිය තවත්
භාර්යාවක වශයෙන් පාවාගෙන ඇගේ නිරුවත
අනාවරණය නොකළ යුතු ය.
19 ලෙවී 20:18 "යම් ස්ත්‍රියකගේ ඔසප් වීමේ
කාලයේ දී ඇගේ නිරුවත අනාවරණය නොකළ යුතු
ය. 20 ලෙවී 20:10තවද, වෙනත් මිනිසකුගේ
භාර්යාවක සමඟ සයනය නොකරන්න. එසේ
කළොත්, ඔබ කෙලෙසෙනු ඇත. 21 ලෙවී
20:1-5නුඹේ දෙවියන් වහන්සේට අපහාස නොකළ
යුතු බැවින්, නුඹ කිසි ම දරුවකු මොලෙක් නම්
දෙවියාට පූජා නොකළ යුතු ය. මම සමිඳාණන්
වහන්සේ ය. 22 ලෙවී 20:13නුඹ ස්ත්‍රියක සමඟ
සයනය කරන අයුරින් ම පිරිමියකු සමඟ ද
නොහැසිරිය යුතු ය. මෙසේ කිරීම පිළිකුලකි.
23 නික්ම 22:19; ලෙවී 20:15-16; ද්වි.නී. 27:21නුඹ
හෝ කිසි ම ස්ත්‍රියක හෝ මෘගයකු සමඟ
මෛථුනයෙහි නොයෙදිය යුතු ය. එසේ කිරීම
අස්වාභාවික දූෂණයකි.
24 "මෙවැනි ක්‍රියා කිසිවකින් නුඹ කෙලෙසා
නොගන්න. මෙවැනි දේ කිරීමෙන් විජාතීහු තමන්
කෙලෙසාගත්හ. නුඹලා යන්නට කලින් මම ඔවුන් ඒ
රටින් පන්නාදමමි. 25 ඔව්හු එසේ හැසිර දේශය
කෙලෙසාගත්හ. එබැවින් මම ඔවුන්ගේ දුෂ්ටකමට
දඬුවම් දමේ. ඒ දේශය පවා තම වැසියන් නෙරපා
දමන්නේ ය. 26 එබැවින් නුඹලා මාගේ නීති ද
විනිශ්චයයන් ද පවත්වා මෙවැනි කිසි ම පිළිකුල්
ක්‍රියාවක් නොකටයුතු ය. නුඹලා අතරෙන් යමකු
හෝ නුඹලා අතර වසන ඕනෑ ම විදේශිකයකු හෝ
එවැන්නක් නොකළ යුතු ය. 27 නුඹලාට කලින් ඒ
දේශවාසීහු මේ සියලු පිළිකුල්කම් කළහ. එසේ
කිරීමෙන් දේශය දූෂ්‍ය විය. 28 නුඹලාට කලින් ඔවුන්
එසේ කර, දේශය එහි වැසියන් නෙරපාදැමී ය.
එලෙස ම නුඹලාත් දේශය කෙලෙසුවොත්, දේශය
නුඹලාත් නෙරපාදමනු ඇත. එබැවින් එලෙසෙ
නොකිරීමට වග බලාගත යුතු ය. 29 යමකු මෙවැනි
පිළිකුල්කම් කිසිවක් කළොත්, එවැන්නකු ඔවුන්ගේ
සෙනඟ අතරෙන් නෙරපාදමනු ලැබිය යුතු ය.
30 "එබැවින් නුඹලා මාගේ නියෝගයන් පිළිපැදිය
යුතු ය. නුඹලාට කලින් කරන ලද මෙකී පිළිකුල්
සිරිත්වලින් කිසිවක් නුඹලා නොකළ යුතු ය. එවිට
ඒවායින් නුඹලා කෙලෙසා නොගන්නහු ය. මම
නුඹලාගේ දෙවී සමිඳාණන් වහන්සේ වෙමි."

## සුචරිතය හා යුක්තිය පිළිබඳ නීති

19 සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතා,
2 ලෙවී 11:44-45; 1 පේදු 1:16මුළු ඉශ්රායලේ
ජනතාවට කතා කොට ඔවුන්ට කියන ලෙස මෙසේ
වදාළ සේක: "නුඹලාගේ දෙවී සමිඳාණන් වහන්සේ
වන මා ශුද්ධ බැවින් නුඹලා ද ශුද්ධ ව සිටිය යුතු ය.
3 නික්ම 20:8,12; ද්වි.නී. 5:12,16නුඹලා එකිනෙකා
තම තමාගේ පියාට හා මවට ගෞරව දැක්විය යුතු
ය. සබත් දවස පැවැත්විය යුතු ය. නුඹලාගේ දෙවී
සමිඳාණන් වහන්සේ මම වෙමි.
4 ලෙවී 26:1; නික්ම 20:23; 34:17; ද්වි.නී. 27:15
"බොරු දේව පිළිම වෙත නොහැරෙන්න; ලෝහයෙන්
වාත්තු කළ දේවවරුන් සාදා නොගන්න. නුඹලාගේ
දෙවී සමිඳාණන් වහන්සේ මම වෙමි.
5 "නුඹලා සමිඳාණන් වහන්සේට සහභාගිවීමේ
පූජාවක් ඔප්පු කරන්නහු නම්, නුඹලා පිළිගනු ලබනු
පිණිස එය නිසි ලෙස පුදන්න. 6 සතා මැරූ දවසේ ම
නැතහොත් පසු දින උගේ මස් අනුභව කළ යුතු ය.
තුන් වන දින දක්වා යමක් ඉතිරි වුවහොත්, එය
ගින්නේ දැවිය යුතු ය. 7 තුන් වන දින එයින් අනුභව
කිරීම පිළිකුලකි. එම පූජාව ද පිළිගනු නොලැබේ.
8 යමකු එයින් අනුභව කළොත්, සමිඳාණන්
වහන්සේට කැප කළ දේ කෙලෙසූ බැවින් තම
දුෂ්ටකම ගැන වගකිව යුතු ය. එවැන්නකේ තම
සෙනඟ අතරින් නෙරපාදමනු ලැබේ.
9 ලෙවී 23:22; ද්වි.නී. 24:19-22 "නුඹලාගේ
කෙත්වලින් අස්වැන්න නෙළන විට, කෙත්වල
මායිමේ තිබෙන අස්වැන්න සම්පූර්ණයෙන් ම කපා
නොගත යුතු ය. අස්වැන්න වරක් නෙළාගත් පසු
ඉතිරි වූ කරල් එකතු කර නොගන්න. 10 එලෙස ම
මිදි වත්තෙන් ඉතිරි වූ මිදි පල සියල්ල ම නෙළා
නොගන්න. තවද, මිදි වත්තේ වැටී තිබෙන මිදි පල
ද එකතු කර නොගත යුතු ය. ඒවා දුප්පතුන් සඳහා
ද විදේශිකයන් සඳහා ද ඉතුරු කළ යුතු ය.
නුඹලාගේ දෙවී සමිඳාණන් වහන්සේ මම වෙමි.
11 නික්ම 20:15,16; ද්වි.නී. 5:19,20 "නුඹලා
සොරකම් නොකළ යුතු ය. වංචා නොකළ යුතු ය.
කෙනෙකු අනෙකකුට බොරු නොකිව යුතු ය.
12 නික්ම 20:7; ද්වි.නී. 5:11; මතෙ 5:33තවද, නුඹලා
මාගේ නාමයෙන් බොරුවට නොදිවුළ යුතු ය.
දෙවියන් වහන්සේගේ නාමයට නුඹලා අපහාස
නොකළ යුතු ය. මම සමිඳාණන් වහන්සේ වෙමි.

13 ද්වි.නී. 24:14-15 “නුඹලා අසල්වැසියාගනේ අයුතු
ලසෙ වාසි නාගෙත යුතු ය. ඔහුගනේ කාලේලකෑම
යුතු නැත. කම්කරුවාගේ වේතනය ඔහුට නාදෙී
පසුදා උදේ වන තුරු එය නුඹලා ළඟ තබා නාගෙත
යුතු ය. 14 ද්වි.නී. 27:18බිහිරි කනෙකුෙට සාප
නාකෙළ යුතු ය. අන්ධ කනෙකු යන මඟ හරහා
අවහිරයක් නාතෙබිය යුතු ය. නුඹලාගේ දවේියන්
වහන්සේට ගරුබිය පෑ යුතු ය. මම සමිඳාණන්
වහන්සේ වමේ.
15 නික්ම 23:6-8; ද්වි.නී. 16:19 “නඩු තීන්දුවක් දනෙ
විට සාධාරණ ව සිටිය යුතු ය. දිළින්දාගේ පහත්
තත්ත්වය වත්, බලවතාගේ උසස් තත්ත්වය වත්
නාසෙලකා, සාධාරණ ලසෙ නුඹේ අසල්වැසියා
විනිශ්චය කළ යුතු ය. 16 සනෙඟ අතර ගතු
කලේාම් දාඩෙමින් ඔබමාබෙ නායො යුතු ය.
යමකු මරණයට තීන්දු විය හැකි නඩුවක දී, නුඹේ
සාක්ෂියනේ ඔහුගේ පණ බරේාගැනීමට ඉඩ තිබේ
නම්, එය කියා පෑ යුතු ය. මම සමිඳාණන් වහන්සේ
වමේ.
17 මතෙ 18:15 “නුඹේ සහෝදරයාට විරුද්ධ ව
හිතේ ක්රෝධය තබා නාගෙත යුතු ය.
අසල්වැසියාගේ වරදක් ඇත්නම්, නාසෙඟවා ඔහුට
කිව යුතු ය. එවිට ඔහු නිසා නුඹ පාපයට
නාවැටනෙු ඇත. 18 මතෙ 5:43; 19:19; 22:39; මාක්
12:31; ලූක් 10:27; රෝම 13:9; ගලා 5:14; ජාකො
2:8කනෙකුගනේ පළි නාගෙත යුතු ය. නුඹලාගේ
ජනයාට විරුද්ධ ව බද්ධ වරෛයක් තබා නාගෙත
යුතු ය. නුඹ නුඹට ප්රමේ කරන ලසෙ ම නුඹේ
අසල්වැසියාටත් ප්රමේ කළ යුතු ය. මම සමිඳාණන්
වහන්සේ වමේ.
19 ද්වි.නී. 22:9-11 “මාගේ නීති නුඹලා ඉටු කළ
යුතු ය. නුඹලාගේ ගවයන්ට වනෙ වර්ගයක සතුන්
සමඟ පට්ටි ගැසීමට ඉඩ නාදෙිය යුතු ය.
දවෙර්ගයක ධාන්ය බීජ නුඹලාගේ කතෙේ
නාවෙපිරිය යුතු ය. හණ සහ ලෝම මිශ්ර ව සාදන
ලද වස්ත්රයක් ද ඇඟලා නාගෙත යුතු ය.
20 “යමකු තම වහල් දාසිය යම් කනෙකුෙට
අනියම් බිරිඳ වශයනේ විකුණන්නට පාරොන්දු වූ
නමුත්, මේ තැනැත්තා ඈ සඳහා වන්දි මුදල
නාගෙවා ද, ඈ නිදහස නාලෙබා ද සිටිය දී ඇගේ
හිමියා ඈ සමඟ සයනය කළහාතේ, දදෙනො ම
මරණයට පත් නාකෙළ යුතු ය. එහතේ, ඈ තවමත්
ඔහුට අයිති බැවින් දදෙනොට ම දඬුවම් කළ යුතු ය.
21 ඔහු සම්මුඛ මණ්ඩපයේ දාරෙකඩ සමිඳාණන්
වහන්සේ වතෙ වන්දි ගවේමේ පූජාව වශයනේ
බැටළුවකු ගනො යුතු ය. 22 පූජකවරයා ඒ
තැනැත්තා කළ පාපය උදසො සමිඳාණන් වහන්සේ
ඉදිරියහෙි වන්දි ගවේමේ පූජාවේ බැටළුවා ඔප්පු
කරමින් ඔහු උදසො පව් කමාවේ පිළිවතෙ ඉටු කළ
යුතු ය. එවිට ඔහු කළ පාපය ඔහුට කමා කරනු
ලැබේ.
23 “නුඹලා දශේයට පැමිණ, ආහාර සඳහා විවිධ
ගස් වර්ග රෝපණය කළ පසු, පළමු අවුරුදු තුනේ දී
ඒවායේ පල කෑම තහනම් ලසෙ සැලකිය යුතු ය.
ඒවා අනුභව නාකෙළ යුතු ය. 24 සතර වන
අවුරුද්දේ දී ද ප්රශංසාවක් පිණිස මුළු පලදාව
සමිඳාණන් වහන්සේට කැප කළ යුතු ය. 25 එහතේ,
පස් වන අවුරුද්දේ එහි පලදාව නුඹලාට කන්නට
පුළුවන. මසෙේ කළහාතේ, එහි පලදාව ද වර්ධනය
වනු ඇත. මම නුඹලාගේ දවේ සමිඳාණන් වහන්සේ
වමේ.
26 උත් 9:4; ලවී 7:26-27; 17:10-14; ද්වි.නී.
12:16,23; 15:23; 18:10 “යමක ලේ තිබිය දී නුඹලා
එය කෑමට නාගෙත යුතු ය. නුඹලා අනවින සහ
නිමිති නාසෙලකිය යුතු ය. 27 ලවී 21:5; ද්වි.නී.
14:1නළලේ දකෙළෙවරේ හිසකසේ අක්බඹුරු
නාකෙළ යුතු ය. රැවුලේ අගිස් ද නාකෙපිය යුතු ය.
28 මළගිය ඇත්තන් නිසා නුඹලාගේ සිරුරහෙි
කැපුමක් නාකෙළ යුතු ය. ඇඟේ හමේ රූප කාටො
නාගෙත යුතුය. මම සමිඳාණන් වහන්සේ වමේ.
29 ද්වි.නී. 23:17 “නුඹේ දුව වසෙඟනක කාටෙ
අනාචාරයට දී ඇය දූෂණය නාකෙරන්න. එසේ
කළහාතේ, දශේය අනාචාරයනේ ද දුෂ්ටකමනේ ද පිරී
යනු ඇත. 30 ලවී 26:2මාගේ සබත් දවස් පවත්වා
ශුද්ධස්ථානයට ගරු කළ යුතු ය. මම සමිඳාණන්
වහන්සේ වමේ.
31 ද්වි.නී. 18:11; 1 සාමු 28:3; 2 රාජා 23:4; යසො
8:19 “නුඹලා නාකෙලෙසෙනෙ පිණිස ආත්ම
බන්ධනකාරයන්ගනේ ගුරුකම් ගන්න අය
නාතෙකන්න. මන්ත්රකාරයන් සායො නායෙන්න.
මම නුඹලාගේ දවේ සමිඳාණන් වහන්සේ වමේ.
32 “වයස්ගත ඇත්තන් ඉදිරියහෙි නැඟිට සිට,
මහල්ලන්ට ගරු කළ යුතු ය. නුඹලාගේ දවේියන්
වහන්සේට ගරුබිය පාන්න, මම සමිඳාණන්
වහන්සේ වමේ.
33 නික්ම 22:21; ද්වි.නී. 24:17-18; 27:19
“නුඹලාගේ දශේයහෙි වාසය කරන විදශේිකයකුෙට
නුඹලා හිංසා නාකෙළ යුතු ය. 34 නුඹලා අතර
වාසය කරන විදශේිකයා සැලකිය යුත්තේ, නුඹලා
අතර උපන් කනෙකු මනේ ය. නුඹලා නුඹලාට
ප්රමේ කරන ලසෙ ම ඔහුට ද ප්රමේ කළ යුතු ය.
මිසර දශේයේ දී නුඹලා විදශේිකයන් මනේ සිටි
බව සිහි කරන්න. නුඹලාගේ දවේ සමිඳාණන්
වහන්සේ මම වමේ.
35 ද්වි.නී. 25:13-16; හිතෝ 20:10; එසකි 45:10
“යමක දිග පළල, යමක බර, යමක ප්රමාණය
තීරණය කිරීමේ දී නුඹලා අසාධාරණ ව ක්රියා
නාකෙළ යුතු ය. 36 නුඹලා භාවිතා කළ යුත්තේ හරි
තරාදි ද හරි පඩි ද නියම ද්රව, ද්රව්ය මිම් ද ආදිය
ය. මිසර දශේයනේ නුඹලා පිටතට ගනො නුඹලාගේ
දවේ සමිඳාණන් වහන්සේ මම වමේ. 37 එබැවින්
නුඹලා මාගේ නීති ද සියලු විනිශ්චයයන් ද පිළිපැදිය
යුතු ය. මම සමිඳාණන් වහන්සේ වමේ.”

## අකීකරුකමට දඬුවම්

20 සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතමින්,
2 "නැවත ඉශ්‍රායලේ ජනයාට මෙසේ
කියන්නැ"යි වදාළ සේක: "ඉශ්‍රායලේ ජනයා
අතරෙන් යමෙකු හෝ ඉශ්‍රායලේ ජනයා අතර වසන
විදේශිකයෙකු හෝ තම දරුවෙකු මොලෙක් නම්
දේවතාවා හට බිලි කළොත්, සෙනඟ ඔහුට ගල්
ගසා ඔහු මරණයට පත් කළ යුතු ය. 3 එවැන්නෙකු
සිය දරුවා මොලෙක්ට බිලි දුන් නිසා ද මාගේ
ශුද්ධස්ථානය කෙලෙසූ නිසා ද මාගේ ශුද්ධ නාමය
ගැරහූ නිසා ද මම ඔහුට විරුද්ධ වී ඔහුගේ සෙනඟ
කෙරෙන් ඔහු නෙරපා දමමි. 4 දේශයේ ජනතාව
එවැන්නෙකු තම දරුවා මොලෙක්ට බිලි දුන් පසුත්
ඔහු නොමරා, යම් හයෙකින් එය නොසලකා
හැරියොත්, 5 මම එවැන්නෙකුට ද එවැන්නෙකුගේ
මුළු පවුලට ද මට අවිශ්වාසවන්ත වී මොලෙක්
වැළඳගෙන ඔහුට පුද පූජා පවත්වන සියලු දෙනාට ද
විරුද්ධ වී ඔවුන්ගේ සෙනඟ අතරෙන් ඔවුන් නෙරපා
දමමි. 6 තවද, යමෙකු මට අවිශ්වාසවන්ත වී ආත්ම
බන්ධනකාරයන්ගෙන් ගුරුකම් ගන්න අය හා
මන්ත්‍රකාරයන් පසුපස ගියොත්, මම එවැන්නෙකුට
විරුද්ධ වී ඔහුගේ සෙනඟ අතරෙන් ඔහු නෙරපා
දමමි. 7 එබැවින් නුඹලා දෙවියන් වහන්සේට කැප
වීමෙන් ශුද්ධ වන්න. නුඹලාගේ දෙවි සමිඳාණන්
වහන්සේ මම වෙමි. 8 මාගේ නීති රක්ෂා කරමින්
ඒවා ඉටු කළ යුතු ය. නුඹලා විශුද්ධ කරන
සමිඳාණන් වහන්සේ මම වෙමි.
9 නික්ම 21:17; මතෙ 15:4; මාක් 7:10 "එබැවින්
යමෙකු තම පියාට හෝ මවට හෝ සාප කළොත්,
ඔහු මරණයට පත් කරනු ලැබේ. ඔහු එවැන්නක්
කළ බැවින් ඔහුගේ මරණය ගැන ඔහු ම වගකිව
යුතු ය.
10 නික්ම 20:14; ලෙවී 18:20; ද්වි.නී. 5:18 "යමෙකු
වෙන කෙනෙකුගේ භාර්යාවක සමඟ පරදාර
සේවනය කළොත්, දෙදෙනා ම මරණයට පත් කළ
යුතුය. 11 ලෙවී 18:8; ද්වි.නී. 22:30; 27:20යමෙකු තම
පියාගේ භාර්යාවක සමඟ සයනය කළොත්, ඔහු
තම පියාට නින්දා කරනු ඇත; ඒ දෙදෙනා ම
මරණයට පත් කළ යුතු ය. තමන්ගේ මරණ ගැන ඒ
දෙදෙනා ම වගකිව යුතු ය. 12 ලෙවී 18:15යමෙකු
තම ලේලි සමඟ සයනය කළොත්, ඒ දෙදෙනා ම
මරණයට පත් කළ යුතු ය. ඔවුන් අස්වාභාවික
දයෙක් කළ බැවින් තමන්ගේ මරණ ගැන ඔවුන්
වගකිව යුතු ය. 13 ලෙවී 18:22යම් පුරුෂයෙකු
ස්ත්‍රියක සමඟ සයනය කරන ලෙස ම පිරිමියෙකු
සමඟ හැසුරුණොත්, ඔවුන් පිළිකුල් දෙයක් කරනු
ඇත. ඔවුන් මරණයට පත් කළ යුතු ය. ඔවුන්ගේ
මරණ ගැන ඔවුන් ම වගකිව යුතු ය. 14 ලෙවී 18:17;
ද්වි.නී. 27:23යම් මිනිසෙකු භාර්යාවක සහ ඇගේ
මව ද සරණ පාවාගතහොත් එය දුෂ්ටකමකි. ඒ
තිදෙන ම ගින්නෙන් පුළුස්සා මැරිය යුතු ය. මෙසේ
කළොත්, ඔබ අතර මෙබඳු දුෂ්ටකම් නොපවතිනු
ඇත. 15 නික්ම 22:19; ලෙවී 18:23; ද්වි.නී. 27:21යම්
මිනිසෙකු සතෙකු සමඟ මෛථුනයෙහි යෙදුණොත්,
ඔහු මරණයට පත් කළ යුතු ය. නුඹලා ඒ සතා ද
මැරිය යුතු ය. 16 යම් ස්ත්‍රියක සතෙකු සමඟ
මෛථුනයෙහි යෙදුණොත්, ඈ ද, ඒ සතා ද මරණයට
පත් කළ යුතු ය. ඔවුන්ගේ මරණ ගැන ඔවුන් ම
වගකිව යුතු ය.
17 ලෙවී 18:9; ද්වි.නී. 27:22 "යම් මිනිසෙකු තම
පියාගේ දුව හෝ තම මවගේ දුව වන තමාගේ
සහෝදරිය හෝ පාවාගෙන ඇගේ නිරුවත
අනාවරණය කළොත්, එය දුෂ්ටකමකි. ඔවුන්
ප්‍රසිද්ධියේ නින්දාවට පත් කර තම සෙනඟ
අතරෙන් නෙරපනු ලැබිය යුතු ය. ඔහු තම
සොහොයුරියට නින්දා කළ බැවින්, ඒ දුෂ්ටකම ගැන
වගකිව යුතු ය. 18 ලෙවී 18:19යම් මිනිසෙකු
ස්ත්‍රියක සමඟ ඇගේ ඔසප් වීමේ කාලයේ දී
සයනය කළොත්, ඇගේ ලේ ගැලීම දෙදෙනා ම
දකින බැවින්, දෙදෙනා ම ඔවුන්ගේ සෙනඟ අතරෙන්
නෙරපනු ලැබිය යුතු ය.
19 ලෙවී 18:12-14 "යමෙකු තම මවගේ
සොහොයුරියගේ හෝ තම පියාගේ
සොහොයුරියගේ හෝ නිරුවත අනාවරණය නොකළ
යුතු ය. මවෙන්නක්, තම කිට්ටු නෑයන්ට කරන
නින්දාවකි. ඔවුන් තමන්ගේ නපුරුකම ගැන වගකිව
යුතු ය. 20 යම් මිනිසෙකු තම පියාගේ
සහෝදරයෙකුගේ බිරිඳ සමඟ සයනය කළොත්,
එවැන්නක් ඔහුගේ පියාගේ සහෝදරයාට කරන
නින්දාවකි. ඔවුන් තමන්ගේ පාපය ගැන වගකිව යුතු
අතර, දෙදෙනා ම දරුවන් නොලැබ මැරෙනු ඇත.
21 ලෙවී 18:16යම් මිනිසෙකු තම සහෝදරයාගේ
බිරිඳ සරණ පාවාගතහොත් එය අපිරිසිදු ක්‍රියාවකි.
එවැන්නක් ඔහු තම සහෝදරයාට කරන නින්දාවකි.
ඔවුන් දෙදෙනා ම දරුවන් නොලැබ මැරෙනු ඇත.
22 "එබැවින් නුඹලා මාගේ සියලු නීති සහ සියලු
විනිශ්චයයන් පිළිපදිමින් ඒවා ඉටු කළ යුතු ය. එවිට
මා නුඹලා පදිංචි කරවීමට යන දේශය නුඹලා
නෙරපා නොදමනු ඇත. 23 තවද, නුඹලා යන්නට
කලින් මා පන්නාදමන විජාතීන්ගේ සිරිත්
නොපිළිපැදිය යුතු ය. ඔවුන් මෙවැනි දේවල් කළ
නිසා මම ඔවුන් පිළිකුල් කළෙමි. 24 තවද, කිරෙන්
සහ මී පැණියෙන් ඉතිරෙන ඔවුන්ගේ දේශය මම
නුඹලාට උරුම කොට දෙන බවටත්, එය නුඹලාට
හිමි කොට දෙන බවටත් පොරොන්දු වුණෙමි.
අවශේෂ ජාතීන්ගෙන් නුඹලා වෙන් කළ නුඹලාගේ
දෙවි සමිඳාණන් වහන්සේ මම වෙමි. 25 එබැවින්
පවිත්‍ර සතුන් හා අපවිත්‍ර සතුන් ද පවිත්‍ර පක්ෂීන්
හා අපවිත්‍ර පක්ෂීන් ද නුඹලා වෙන් කොට සැලකිය
යුතු ය. මා අපවිත්‍ර යයි වෙන් කළ සතුන්ගේ හෝ
පක්ෂීන්ගේ හෝ බඩගා යන සතුන්ගේ හෝ මාංස
අනුභව කොට නුඹලා මට පිළිකුල් නොවිය යුතු ය.
26 නුඹලා මට ශුද්ධ ව සිටිය යුතු ය. සමිඳාණන්
වහන්සේ වන මම ශුද්ධ ය. නුඹලා මට ම අයිති
වනු පිණිස අවශේෂ ජාතීන්ගෙන් මම නුඹලා වෙන්
කළෙමි.

27 "යම්කිසි ස්ත්‍රියක හෝ පුරුෂයෙකු හෝ ආත්ම
බන්ධනකාරයන්ගේ හෝ මන්ත්‍රකාරයන්ගේ හෝ
පිහිට සෙව්වොත්, ඔවුන්ට ගල් ගසා ඔවුන් මරණයට
පත් කළ යුතු ය. ඔවුන්ගේ මරණ ගැන ඔවුන් ම
වගකිව යුතු ය."

## පූජකවරුන්ගේ ශුද්ධවන්තකම

21 සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතා,
ආරොන්ගේ පුත්‍රයන් වන පූජකවරුන්ට කතා
කොට මෙසේ කියන ලෙස වදාළ සේක: "පහත
දක්වන අවස්ථාවල හැර කිසි ම පූජකයෙකු තම
සෙනඟගේ මළසිරුරක් සමීපයට යාමෙන්,
වත්පිළිවෙතේ අනුව අපවිත්‍ර නොවිය යුතු ය.
2 එහෙත්, ඔහුගේ නෑයන් වන තම මවගේ හා
පියාගේ ද තම පුතාගේ හා දුවගේ ද තම
සහෝදරයාගේ ද 3 අවිවාහක කන්‍යාවක වන තම
සහොදරියගේ ද අවමංගල්‍යයන්ට ඔහුට සහභාගි
විය හැක. 4 එහෙත්, විවාහක සහෝදරියකගේ
අවමංගල්‍යයකට සහභාගි වී ඔහු අපවිත්‍ර නොවිය
යුතු ය.
5 ලෙවී 19:27-28; ද්වි.නී. 14:1 "කිසි ම පූජකයෙකු
තම හිස මුඩු කොට නොගත යුතු ය. තම රැවුලේ
අගිස් කපා නොදැමිය යුතු ය. තමාගේ ශරීරයේ
කැපීමක් කර නොගත යුතු ය. 6 ඔවුන් දෙවියන්
වහන්සේට කැප වී සිටිය යුතු ය. ඔවුන්ගේ දෙවියන්
වහන්සේගේ නාමයට අපහාස නොකළ යුතු ය.
දෙවියන් වහන්සේගේ භෝජනය වන, සමිඳාණන්
වහන්සේට ගින්නෙන් දවා පුදන පූජා ද ඔවුන් ඔප්පු
කළ යුතු ය. එබැවින් ඔවුන් ශුද්ධ ව සිටිය යුතු ය.
7 ඔහු වෙසඟනක හෝ කන්‍යාවක නොවන
ස්ත්‍රියක හෝ සැමියා විසින් දික්කසාද කරන ලද
ස්ත්‍රියක හෝ සරණ පාවා නොගත යුතු ය. ඔහු
තම දෙවියන් වහන්සේට කැප වූ කෙනෙකි.
8 පූජකවරයා දෙවියන් වහන්සේට රොටි පුදන
බැවින් එවැන්නෙකු සමිඳාණන් වහන්සේට කැප
කරනු ලැබිය යුතු ය. ඔහු නුඹට ශුද්ධ කෙනෙකු විය
යුතු ය. මන්ද, ඔබව කැප කරන සමිඳාණන්
වහන්සේ වන මා ශුද්ධ කෙනෙකු වන බැවිනි. 9 යම්
පූජකයෙකුගේ දුවක වෙසඟනක මෙන් හැසුරුණොත්,
ඈ තම පියාට නින්දා කරයි. ඈ ගින්නෙන් පුළුස්සා
මැරිය යුතු ය.
10 "හිස මත ආලේප තෙලෙය වත් කරනු ලැබ,
පූජක වස්ත්‍ර ලාගැනීම සඳහා පූජකවරය ලත්
පූජකයන් අතර සිටින නායක පූජකයා තම හිසකෙස්
අවුල් කරනොගත යුතු ය. තම වස්ත්‍ර ඉරා නොගත
යුතු ය. 11 ඔහු කිසි මළසිරුරක් ළඟට නොයා යුතු
ය. තම පියාගේ වත්, මවගේ වත් අවමංගල්‍යයට
ගොස් අපවිත්‍ර නොවිය යුතු ය. 12 තවද, ඔහු
ශුද්ධස්ථානයෙන් පිට වී යාමෙන්, දේව
ශුද්ධස්ථානයට නින්දා නොකළ යුතු ය. පූජකවරයේ
දී ලත් දෙවියන් වහන්සේගේ ආලේප තෙලෙය ඔහු
මත ය. මම සමිඳාණන් වහන්සේ වෙමි.
13 පූජකයෙකු විවාහ විය යුතු කන්‍යාවක සමඟ ය.
14 ඔහු වැන්දඹුවක හෝ දික්කසාද ස්ත්‍රියක හෝ
දූෂණ වූ තැනැත්තියක හෝ වෙසඟනක ව සිටි
ස්ත්‍රියක හෝ සරණ පාවා නොගත යුතු ය. ඔහු
තමාගේ ම ඥාතීන් අතරෙන් කන්‍යාවක සරණ
පාවාගත යුතු ය. 15 මෙලෙසෙ තම සෙනඟ අතර
ඔහුගේ දරු පරපුර අපවිත්‍ර නොවෙනු ඇත. මම ඔහු
විශුද්ධ කරන සමිඳාණන් වහන්සේ වෙමි."
16 සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතා,
17 ආරොන්ට මෙසේ කියන ලෙස වදාළ සේක:
"පූජක පරපුරෙන් පැවතෙන කිසිවෙකුට ශාරීරික
කැළලක් තිබේ නම්, එවැන්නෙකු දෙවියන්
වහන්සේට රොටි පූජා කිරීමට ළඟා නොවිය යුතු ය.
18 කැළලක් තිබෙන කෙනෙකු හෝ අන්ධයෙකු හෝ
කොරෙකු හෝ මුක්කමෙකු හෝ අංග විකලයෙකු
හෝ 19 අත පය කැඩුණු කෙනෙකු හෝ 20 කුදෙකු
හෝ කුරු අයෙකු හෝ ඇස් රෝගයක් ඇති අයෙකු
හෝ චර්ම රෝග ඇති අයෙකු හෝ දද ඇති අයෙකු
හෝ තැළුණු අණ්ඩ ඇති අයෙකු හෝ පූජා කිරීමට
ළං නොවිය යුතු ය. 21 පූජක ආරොන්ගේ
පළෙපතින් පැවතෙන, කැළලක් ඇති කිසිවෙකු
සමිඳාණන් වහන්සේට ගින්නෙන් දවා පුදන පඬුරු
ඔප්පු කිරීමට ළඟා නොවිය යුතු ය. ඔහු තමාගේ
දෙවියන් වහන්සේට භෝජනය ඔප්පු කිරීමට ළඟා
නොවිය යුතු ය. මන්ද, එවැන්නෙකුට කැළලක් ඇති
බැවිනි. 22 එහෙත්, එවැන්නෙකුට අතිශුද්ධ ද ශුද්ධ ද
වන දේවලින් තම දෙවියන් වහන්සේට පුදන රොටි
වැළඳිය හැක. 23 ඔහුට කැළලක් ඇති බැවින් ඔහු
නොකළ යුත්තේ, තිරය කිට්ටුවට යෑම හෝ
පූජාසනයකට ළඟා වීම හෝ පමණකි. ඔහු මාගේ
ශුද්ධස්ථානය අපවිත්‍ර නොකළ යුතු ය. මන්ද, මම
ඒවා විශුද්ධ කරන සමිඳාණන් වහන්සේ වෙමි."
24 මෝසෙස් ආරොන්ට සහ ඔහුගේ පුතුන්ට ද මුළු
ඉශ්රායලේ ජනයාට ද එපවත් කී ය.

## පූජා පිදීම හා වැළඳීම

22 සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතා,
2 ආරොන්ට සහ ඔහුගේ පුත්‍රයන්ට මෙසේ
කියන ලෙස වදාළ සේක: "ඉශ්රායලේ ජනයා මට
පුදන පූජාවලින් මාගේ ශුද්ධ නාමයට නින්දා
නොවන ලෙස ඔවුන්ගේ ඒ ශුද්ධ පූජා ගෞරවයෙන්
සැලකිය යුතු ය. මම සමිඳාණන් වහන්සේ වෙමි.
ඔවුන්ට මෙසේ කියන්න: 3 නුඹේ පරපුරෙන්
පැවතෙන කිසිවෙකු, තමා අපවිත්‍ර යයි සැලකෙන
විට ඉශ්රායලේ ජනයා මට පුදන ශුද්ධ පූජා සමීපයට
ගියොත් ඔහු මා ඉදිරියෙන් නෙරපාදැමිය යුතු ය. මම
සමිඳාණන් වහන්සේ වෙමි.
4 "ආරොන්ගේ පළෙපතින් පැවතෙන යමෙකුට
බෝවෙන චර්ම රෝගය හෝ ධාතු මෝචනය හෝ
තිබේ නම්, ඔහු පවිත්‍ර වන තෙක් ශුද්ධ පූජාවලින්
නොවැළඳිය යුතු ය. 5 මළසිරුරක් නිසා අපවිත්‍ර වූ
යමක් ස්පර්ශ කරන කෙනෙක් හෝ ධාතු මෝචනය
ඇති කෙනෙක් හෝ අපවිත්‍ර බඩගා යන සතෙකු
වත්, යම් කිසි අපවිත්‍රකමක් ඇති මිනිසෙකු වත්

ස්පර්ශ කරන කෙනෙක් හෝ අපවිත්‍ර වන්නේ ය.
6 මෙසේ ස්පර්ශ කිරීමෙන් අපවිත්‍ර වූ පූජකයකු
සවස දක්වා අපවිත්‍ර යයි සැලකේ. ඔහු ජලස්නානය
කරන්නට පෙර ශුද්ධ පූජාවලින් කිසිවක් නොවැළඳිය
යුතු ය. 7 ඉර බැස ගිය පසු ඔහු පවිත්‍ර වනු ඇත.
ඉන්පසු ඔහුගේ ආහාර වන පූජා ඔහුට වැළඳිය
හැක. 8 ඉබේ ම මැරුණු හෝ වන මෘගයකු විසින්
මරන ලද හෝ සතකුගේ මස් ඔහු නොවැළඳිය
යුතු ය. එවැන්නකින් ඔහු අපවිත්‍ර වනු ඇත. මම
සමිඳාණන් වහන්සේ වෙමි.
9 “එබැවින් පූජකවරුන් සියලු දෙන මාගේ නියෝග
පිළිපැදිය යුතු ය. ඔවුන් ඒවා කඩ කළහොත්, ඒවා
ගැන වරදකරුවන් වන බැවින් ඔවුන් මරණයට පත්
කළ යුතු ය. ඔවුන් කැප කරන සමිඳාණන් වහන්සේ
මම වෙමි.
10 “පූජකයකු නොවන්නකු ශුද්ධ පඬුරු අනුභව
නොකළ යුතු ය. ඒ තැනැත්තා පූජකවරයා සමඟ
වසන ආගන්තුකයෙක් වේවා, කුලියට ගත් දාසයෙක්
වේවා, මෙවැන්නකු එවැනි ශුද්ධ පඬුරු අනුභව
නොකළ යුතු ය. 11 එහෙත්, පූජකවරයා මිල දී ගත්
වහල් අයට හෝ ඔහුගේ ගෘහයේ උපන් අයට හෝ
ඔහුගේ ආහාර අනුභව කළ හැක.
12 පූජකවරයාගේ දුවක් පූජකයකු නොවන
කෙනෙකුට විවාහ වී සිටී නම්, ඈ ද පුදන ශුද්ධ
පඬුරු අනුභව නොකළ යුතු ය. 13 එහෙත්, ඔහුගේ
දුව වැන්දඹුවක් නම්, දික්කසාද වී දරුවකු ද
නොලබා, පියාගේ නඩත්තු වීමට ඔහුගේ ගෘහයට
ආපසු ගියා නම්, ඇට ද පියාගේ ආහාර අනුභව කළ
හැක. එහෙත්, පූජක පවුලට අයිති නොවන
කෙනෙක් නම් එවැනි ආහාර අනුභව නොකළ යුතු
ය.
14 “පූජක පවුලට අයිති නොවන යමකු
නොදැනුවත් ව ශුද්ධ දෙයින් අනුභව කළහොත්, ඊට
අමතර ව තව පහෙන් කොටසක් එකතු කොට එය
පූජකවරයාට දිය යුතු ය. 15 මෙලෙස ඉශ්‍රායෙල්
ජනයා සමිඳාණන් වහන්සේට පුදන ශුද්ධ පඬුරු
අපවිත්‍ර නොකළ යුතු ය. 16 අවසර නොලත් අයට
ඒ ශුද්ධ පඬුරු අනුභව කිරීමට ඉඩ දීමෙන්, ඒ අය
දඬුවම් ලැබීමට සුදුසු වරදකරුවන් වනු ඇත. ඒවා
කැප කරන සමිඳාණන් වහන්සේ මම වෙමි.”
17 සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතා
18 ආරොන්ටත්, ඔහුගේ පුතුන්ටත්, මුළු ඉශ්‍රායෙල්
ජනයාටත් කියන ලෙස මෙසේ වදාළ සේක:
“ඉශ්‍රායෙල් ජනයා අතර යමෙක් වේවා, ඔවුන් අතර
වසන විදේශිකයෙක් වේවා, තමන්ගේ බාර හාර
ඉටු කරන පිණිස ද ස්වේච්ඡා පූජාවක් සඳහා ද
දවන යාග පූජාවක් සමිඳාණන් වහන්සේට ඔප්පු
කරන්නේ නම්, 19 ඒ සතා ගවයන්ගෙන් හෝ
බැටළුවන්ගෙන් හෝ එළුවන්ගෙන් හෝ තෝරාගන්නා
ලද කැළලක් නැති පිරිමි සතකු විය යුතු ය.
20 ද්වි.නී. 17:1යම් කිසි කැළලක් ඇති සතකු ඔප්පු
නොකළ යුතු ය. එසේ කළහොත්, එය බාරගනු
නොලැබේ. 21 යමකු බාරයක් ඉටු කිරීමට හෝ
ස්වේච්ඡා පූජාවක් සඳහා හෝ ගවයන්ගෙන් හෝ
බැටළුවන්ගෙන් හෝ සතකු සහභාගිකමේ පූජාවක්
වශයෙන් සමිඳාණන් වහන්සේට ඔප්පු කරන විට,
එය පිළිගනු ලබන්නේ ඒ සතා කැළැල් රහිත අංග
සම්පූර්ණ එකෙක් වේ නම් පමණ ය. 22 ඇස්
නොපෙනෙන හෝ අවයව කැඩුණු හෝ අබ්බාගාත
වූ හෝ වණ පිළිකා හා දද ඇති හෝ සතකු
පූජාසනය මත ගින්නෙන් දවා සමිඳාණන් වහන්සේට
පුදන පූජාවක් කොට ඔප්පු නොකළ යුතු ය.
23 එහෙත්, ස්වේච්ඡා පූජාවක් ලෙස අසාමාන්‍ය
අවයවයක් ඇති ගොනකු හෝ බැටළුවකු පුද කළ
හැකි ය. බාරයක් ඉටු කිරීම සඳහා නම් එවැන්නක්
පිළිගනු නොලැබේ. 24 තුවාළ වුණු හෝ තැළුණු
හෝ කැඩුණු හෝ කැපූ හෝ අණ්ඩ ඇති සතකු
සමිඳාණන් වහන්සේට ඔප්පු නොකළ යුතු ය.
මෙවැන්නක් කිරීමට නුඹේ රටේ අවසර නොදෙනු
ඇත.
25 “මෙවැනි සතකු නුඹ විදේශිකයකුගේ අතින්
වත් ගෙන, ආහාර පූජාවක් වශයෙන් සමිඳාණන්
වහන්සේට ඔප්පු නොකළ යුතු ය. එවැනි ශාරීරික
දෝෂ, කැළැල් වන බැවින් නුඹ උදෙසා උන්
නොපිළිගනු ලැබේ.”
26 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට
මෙසේ වදාළ සේක: 27 “වහු පැටියකු හෝ බැටළු
පැටියකු හෝ එළු පැටියකු හෝ උපන් විට, දවස්
හතක් යන තෙක් ඌ උගේ මවගෙන් ඉවතට
නොගත යුතු ය. අට වන දින පටන් සමිඳාණන්
වහන්සේට ගින්නෙන් දවා පුදන පූජාවක් ලෙස ඌ
පිළිගනු ඇත. 28 එළදෙනක සමඟ උගේ වස්සා ද
බැටළු දෙනක සමඟ උගේ පැටියා ද එක දින ම
නොමැරිය යුතු ය. 29 නුඹ සමිඳාණන් වහන්සේට
ස්තුති දීමේ පූජාවක් පුද කරන කල එය පිළිගත
හැකි වන පරිදි ඉටු කළ යුතු ය. 30 එය පුද කරන
දවසේ ම එය අනුභව කළ යුතු ය. පසු දින වන
තෙක් ඉන් කිසිවක් ඉතිරි නොකළ යුතු ය. මම
සමිඳාණන් වහන්සේ වෙමි.
31 “නුඹලා මාගේ ආඥා රකිමින් ඒවා පිළිපැදිය
යුතු ය. මම සමිඳාණන් වහන්සේ වෙමි. 32 නුඹලා
මාගේ ශුද්ධ නාමයට අපහාස නොකළ යුතු ය. මුළු
ඉශ්‍රායෙල් ජනයා මා විශුද්ධ ලෙස සැලකිය යුතු ය.
නුඹලා විශුද්ධ කරන සමිඳාණන් වහන්සේ මම
වෙමි. 33 නුඹලාගේ දෙවියන් වහන්සේ වන පිණිස
මම මිසර දේශයෙන් නුඹලා පිටතට ගෙනාවෙමි. මම
සමිඳාණන් වහන්සේ ය.”

## ආගමික මංගලෝත්සව

23 සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතා,
2 “ඉශ්‍රායෙල් ජනයාට කතා කොට මෙසේ
කියන්නැ”යි වදාළ සේක. “නමස්කාරය සඳහා
රැස්වීමක් පැවැත්විය යුතු සමිඳාණන් වහන්සේගේ
මංගල්‍ය පහත සඳහන් ඒවා ය කියා ප්‍රකාශ කළ
යුතු ය.”

### සබත් දවස

3 නික්ම 20:8-10; 23:12; 31:15; 34:21; 35:2; ද්වි.නී.
5:12-14 "දවස් හයක් වැඩ කළ යුතු ය. හත් වන දින
වන්දනාමාන පිණිස රුස්වීම් පවත්වන නිවාඩුවේ
සබත් දිනය ය. එදින කිසි ම වැඩක් නොකළ යුතු ය.
නුඹලා සියලු දෙනෙ කොතැනක වාසය කළත්, එදින
සමිඳාණන් වහන්සේට අයිති සබත් දින වේ.
4 තවද, ශුද්ධ නමස්කාරය සඳහා රුස්වීමක්
පැවැත්විය යුතු, පහත දක්වන සමිඳාණන්
වහන්සේගේ මංගල්‍ය, නියමිත කාලවල දී නුඹ
ප්‍රකාශ කළ යුතු ය."

### පාස්කුව සහ නුමුහුන් රොටි මංගල්‍යය
(ගණන් 28:15-25)

5 නික්ම 12:1-13; ද්වි.නී. 16:1-2 "සමිඳාණන්
වහන්සේගේ ගෞරවය පිණිස පවත්වන පාස්කුව
අරඹනුයේ පළමු වන මාසයේ දහහතර වන දින
සවස ය. 6 නික්ම 12:14-20; 23:15; 34:18; ද්වි.නී.
16:3-8එම මාසයේ ම පසළොස් වන දින සමිඳාණන්
වහන්සේගේ ගෞරවය පිණිස පවත්වන නුමුහුන්
රොටි මංගල්‍යයයි. දවස් හතක් නුඹලා නුමුහුන්
රොටි අනුභව කළ යුතු ය. 7 පළමු වන දින නුඹලා
ශුද්ධ නමස්කාරය සඳහා රුස්වීමක් පැවැත්විය යුතු
ය. එදින කිසි බර වැඩක් නොකළ යුතු ය. 8 දින
හතක් තුළ නුඹලා සමිඳාණන් වහන්සේට ගින්නෙන්
දවා පුදන ආහාර පූජා ඔප්පු කළ යුතු ය. හත් වන
දින ශුද්ධ නමස්කාරය සඳහා පවත්වන රුස්වීමකි.
එදින කිසි බර වැඩක් නොකළ යුතු ය."

### නාඹුල් පල මංගල්‍යය

9 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට
මෙසේ වදාළ සේක: 10 "ඉශ්රායෙලේ ජනයාට කතා
කොට මෙසේ කියන්න: 'මා නුඹලාට දෙන්නට යන
දේශයට නුඹලා පැමිණ, එහි අස්වැන්න නෙළාගත්
විට, අස්වැන්නෙන් පළමුවෙන් ම කපාගත් ගොයම්
මිටිය නුඹලා පූජකවරයා වෙත ගෙනා යුතු ය.
11 නුඹලා උදෙසා එය පිළිගනු ලබන ලෙස ඔහු
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි එය පිදිය යුතු ය.
ඔහු එය පිදිය යුත්තේ සබත් දවසට පසු දවසේ ය.
12 ධාන්‍ය පූජාව ඔප්පු කරන දින ම අවුරුද්දක්
වයසැති කැළැල් රහිත බැටළු පැටියෙකු දවන යාග
පූජාවක් වශයෙන් සමිඳාණන් වහන්සේට පිදිය යුතු
ය. 13 ඒ සමඟ ම තලෙන් මිශ්‍ර සිහින් පිටි
කිලෝග්රෑම් දෙකෙක් ධාන්‍ය පූජාවක් වශයෙන්
සමිඳාණන් වහන්සේ වෙත නඟින සුමිහිරි සුවඳක්
වන ලෙස ගින්නෙන් දවා උන් වහන්සේට පූජා කළ
යුතු ය. තවද, මුද්රික පානය ලීටර එකක් ගෙන එය
ද පානීය පූජාවක් ලෙස ඔප්පු කළ යුතු ය.
14 නුඹලාගේ නාඹුල් පල පඬුර දෙවියන් වහන්සේ
වෙත ගෙනෙන දින වන තෙක් නුඹලා අලුත් ධාන්‍ය
රොටි මෙන් සාදා හෝ අමුවෙන් හෝ විළඳ ලෙස
හෝ අනුභව නොකළ යුතු ය. නුඹලා කොතැනක
වාසය කළත්, නුඹලාගේ පරපුරේ තුළ මෙය සදහට
ම වලංගු නියෝගයකි."

### අස්වැන්න මංගල්‍යය
(ගණන් 28:16-31)

15 නික්ම 23:16; 34:22; ද්වි.නී. 16:9-12 "නුඹලා
පිළිගැන්වීමේ පිළිවෙතින් පළමුවෙන් කපාගත්
ගොයම් මිටිය පඬුරු ලෙස පුද කළ සබත් දිනට පසු
දින පටන් සම්පූර්ණ සබත් දින හතක් ගණන් කළ
යුතු ය. 16 හත් වන සබත් දිනට පසු පැමිණෙන
පණස් වන දිනේ දී නුඹලා නව ධාන්‍ය පූජාවක්
සමිඳාණන් වහන්සේට පිදිය යුතු ය. 17 එක් එක්
පවුල, සිහින් පිටි කිලෝග්රෑම් දෙකෙක් ගෙන මුහුන්
මිශ්‍ර කොට පුළුස්සන ලද රොටි දෙක බැගින්
පිළිගැන්වීමේ පිළිවෙත ඉටු කරනු පිණිස ගෙනා යුතු
ය. ඒවා සමිඳාණන් වහන්සේට පුදන නාඹුල් පල
වනු ඇත. 18 තවද, නුඹලා රොටි සමඟ අවුරුද්දක්
වයසැති බැටළු පැටවුන් හත් දෙනෙකු ද එක ගොන්
වස්සෙකු ද එළුවන් දදෙනෙකු ද ඔප්පු කළ යුතු ය.
ඒවා දවන යාග පූජාවක් ලෙස ධාන්‍ය පූජාව සහ
පානීය පූජාව සමඟ සමිඳාණන් වහන්සේට පිදිය
යුතු ය. මෙලෙසෙ ගින්නෙන් දවා පුදන පූජාව උන්
වහන්සේට සුමිහිරි සුවඳක් වනු ඇත. 19 ඉන්පසු
පාප පූජාවක් සඳහා එක එළු පැටියෙකු ද
සහභාගිකමේ පූජාවක් සඳහා අවුරුද්දක් වයසැති
බැටළු පැටවුන් දදෙනෙකු ද පුද කළ යුතු ය.
20 පූජකවරයා නාඹුල් පල වශයෙන් ගත් රොටි
සමඟ බැටළු පැටියන් දදෙනෙකු පිළිගැන්වීමේ
පිළිවෙත ඉටු කරමින් පුද කළ යුතු ය. උන්
වහන්සේට ශුද්ධ පඬුරු වන ඒවා පූජකවරයාට හිමි
වනු ඇත. 21 එදින නුඹලා ශුද්ධ නමස්කාරය පිණිස
රුස්වන ලෙස ද බර වැඩ නොකරන ලෙස ද
ප්‍රකාශ කළ යුතු ය. මෙය නුඹලාගේ පරපුරේ තුළ
නුඹලා කොතැනක විසුවත්, සදහට ම වලංගු
නියෝගයකි.
22 ලෙවී 19:9-10; ද්වි.නී. 24:19-22 "නුඹලාගේ
කෙතේවල අස්වැන්න නෙළන විට, කෙතේ මායිම්වල
තිබෙන ගොයම් සියල්ල ම නොකැපිය යුතු ය. ඉතිරි
වූ කරල් ඇහිලීමට කෙතට ආපසු නොයා යුතු ය.
ඒවා දුප්පතුන් හා විදේශිකයන් සඳහා නුඹලා ඉතිරි
කළ යුතු ය. නුඹලාගේ දෙවි සමිඳාණන් වහන්සේ
මම වෙමි."

### අලුත් අවුරුදු මංගල්‍යය
(ගණන් 29:1-6)

23 සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතා,
"ඉශ්රායෙලේ ජනයාට කතා කොට මෙසේ
කියන්නැ"යි වදාළ සේක. 24 "හත් වන මාසයේ
පළමු වන දින දී නුඹලා විශේෂ සබත් දවසක්
පැවැත්විය යුතු ය. හොරණෑ නද දෙන විට ශුද්ධ
නමස්කාරය සඳහා රුස්විය යුතු ය. 25 එදින නුඹලා
බර වැඩ නොකළ යුතු ය. එහෙත්, ආහාර පූජාවක්
ගින්නෙන් දවා ඔප්පු කළ යුතු ය."

### වන්දි ගෙවීමේ දිනය
(ගණන් 29:7-11)

26 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට මෙසේ වදාළ
සේක:ලෙවී 16:29-34 27 “හත් වන මාසයේ දස වන
දින පව් කමාව ලැබීමේ පිළිවෙත ඉටු කරන දිනයකි.
එදින නුඹලා ශුද්ධ නමස්කාරය සඳහා රැස්විය යුතු
ය. එදින උපවාස කර, ගින්නෙන් දවා ආහාර පූජාවක්
සමිඳාණන් වහන්සේට පිදිය යුතු ය. 28 එදින කිසි ම
වැඩක් නොකළ යුතු ය. එදින නුඹලා දෙවි
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි නුඹලා උදෙසා පව්
කමා කිරීමේ පිළිවෙත ඉටු කරන දිනයකි. 29 එදින
යමෙක් උපවාස නොකරන්නේ ද ඔහු තම සෙනඟ
අතරෙන් නෙරපාදමනු ලැබේ. 30 එදින යමෙක් වැඩ
කරන්නේ ද, ඔහු ද තම සෙනඟ අතරෙන් මරණයට
පත් කරනු ලබනු ඇත. 31 එදින කිසි වැඩක් නොකළ
යුතු ය. නුඹලා කොතැනක විසුවත් මෙය නුඹලාගේ
පෙළපත් තුළ සදහට ම වලංගු නියෝගයකි. 32 එදින
නුඹලා උපවාසය රකින මහා සබත් දවසක් විය යුතු
ය. නව වන දින සවස සිට පසු දින සවස දක්වා මේ
සබත් දිනය නුඹලා පැවැත්විය යුතු ය.”

### කූඩාරම් මංගල්‍යය
(ගණන් 29:12-40)

33 ද්වි.නී. 16:13-15 සමිඳාණන් වහන්සේ
මෝසෙස්ට කතා කොට, 34 “ඉශ්රායලේ ජනයාට
කතා කොට මෙසේ කියන්නැ”යි වදාළ සේක. “සත්
වන මාසයේ පසළොස් වන දින කූඩාරම් මංගල්‍යය
අරඹනු ලැබේ. එය හත් දිනක් පැවැත්විය යුතු ය.
35 පළමු වන දින ශුද්ධ වන්දනාමාන පිණිස රැස්වීම
පැවැත්විය යුතු ය. එදින නුඹලා බර වැඩ නොකළ
යුතු ය. 36 හත් දිනක් ම සමිඳාණන් වහන්සේට
ගින්නෙන් දවා ආහාර පූජාවක් ඔප්පු කළ යුතු ය.
අට වන දින ශුද්ධ නමස්කාරය සඳහා රැස්වීමක්
පවත්වා ගින්නෙහි දවා ආහාර පූජාවක් සමිඳාණන්
වහන්සේට ඔප්පු කළ යුතු ය. එදින ශුද්ධ
නමස්කාරය සඳහා ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වන
බැවින් කිසි බර වැඩක් නොකළ යුතු ය.
37 “ඒ ඒ දවසට නියමිත ලෙස කළ යුතු වූ,
සමිඳාණන් වහන්සේට ගින්නෙන් කරන පූජාවන්
නම්, දවන යාග පූජා, ධාන්‍ය පූජා, යාග පඬුරු සහ
පානීය පූජාවන් ය. මෙමෙ පූජා ඔප්පු කිරීම පිණිස
ශුද්ධ සභා රැස්වීම කැඳවා ප්‍රකාශ කළ යුතු ය.
38 මෙකී මංගල්‍ය, සමිඳාණන් වහන්සේගේ සබත්
දින, උන් වහන්සේට දෙන නුඹලාගේ පඬුරුවලට,
බාරවලට හා ස්වේච්ඡා පූජාවලට අමතර ව වේ.”

### මංගල්‍යයන් යළි සැමරීම

39 නික්ම 23:16; 34:22 “හත් වන මාසයේ
පසළොස් වන දින නුඹලා දේශයේ පලදාව
රැස්කරගත් පසු, හත් දිනක් ම සමිඳාණන්
වහන්සේට මංගල්‍ය පැවැත්විය යුතු ය. පළමු වන
දවස හා අට වන දවස විවේක ගත යුතු දින විය.
40 පළමු වන දවසේ දී නුඹලා ඉස්තරම් පලතුරු ද
තල් අතු ද කොළ පිරුණු අතු ද ගං තෙරෙන් ගත්
විලෝ ද ගෙන, නුඹලාගේ දෙවි සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි ප්‍රීති ප්‍රමෝද වමින් හත්
දිනක් මංගල්‍ය පැවැත්විය යුතු ය. 41 මෙලෙස
අවුරුද්දට හත් දිනක් තුළ සමිඳාණන් වහන්සේට
මංගල්‍ය පැවැත්විය යුතු ය. මෙය නුඹලාගේ
පෙළපත් තුළ සදහට ම වලංගු නියෝගයකි. නුඹලා
මේ මංගල්‍ය පැවැත්විය යුත්තේ හත් වන මාසයේ
දී ය. 42 හත් දිනක් ම නුඹලා පැල්පත්වල වාසය කළ
යුතු ය. ඉශ්රායලේ ජාතිකයන් සියලු දෙන මෙසේ
විසිය යුතු ය. 43 මෙලෙස මා ඉශ්රායලේ ජනයා
මිසර දේශයෙන් පිටතට ගෙනෙන විට මා ඔවුන්ට
පැල්පත්වල වාසය කිරීමට සැලැසූ බව නුඹලාගේ
අනාගත පරම්පරා දැනගන්නෝ ය. නුඹලාගේ දෙවි
සමිඳාණන් වහන්සේ මම ය.”
44 මෝසෙස් සමිඳාණන් වහන්සේගේ මංගල්‍ය
ඉශ්රායලේ ජනයාට ප්‍රකාශ කළේ ය.

### නිරතුරු දැල්වෙන පහන
(නික්ම 27:20-21)

24 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට මෙසේ වදාළ සේක: 2 “පහන් නිතර
ම දැල්වමින් පවතින පිණිස ඒවා සඳහා ඉස්තරම්,
පිරිසිදු ඔලීව තෙලේ ගෙනෙන්න ඉශ්රායලේ ජනයාට
අණ කරන්න. 3 සම්මුඛ මණ්ඩපයේ ගිවිසුම් කරඬුව
ඉදිරිපිට ඇති තිරයට පිටතින් ඒවා සවස සිට උදය
දක්වා සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි නිතර ම
දැල්වමින් තැබීමට ආරොන් වග බලාගත යුතු ය.
මෙය නුඹලාගේ පෙළපත තුළ සදහට ම වලංගු
නියෝගයකි. 4 තවද, ඔහු සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි නිතර ම තනි රන් පහන් රුක මත ඒවා
තැබීමට අණ කළ යුතු ය.”

### දෙවියන් වහන්සේට පුදන රොටි

5 නික්ම 25:30 “නුඹ සිහින් පිටි රැගෙන රොටි
දොළොසක් සාදන්න. එක රොටියක පිටි
කිලෝග්රෑම් එකක් විය යුතු ය. 6 පසුව සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි තනි රන් ගාන ලද මේසය උඩ,
එක පේළියකට හය බැගින් පේළි දෙකෙකට රොටි
තැබිය යුතු ය. 7 ඉන්පසු පේළි දෙකේ ම පිරිසිදු
තුවරලා දැමිය යුතු ය. මෙලෙස රොටි මත වැටෙන
තුවරලා සමිඳාණන් වහන්සේට ගින්නෙන් දවා පුද
කරන ආහාර පූජාවක් සිහිවීමේ ලකුණක් වනු ඇත.
8 සෑම සබත් දවසක ම මින් ඉදිරියට ඔහු සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි මේවා පිළිවෙළට තැබිය යුතු ය.
මෙලෙස ඉශ්රායලේ ජනයා උදෙසා ඒවා සදාතන
ගිවිසුමක් වනු ඇත. 9 මතෙ 12:4; මාක් 2:26; ලූක්
6:4මේ රොටි ආරොන්ට සහ ඔහුගේ පුත්රයන් හට
අයිති වනු ඇත. ඔවුන් ඒවා ශුද්ධස්ථානයක වැළඳිය
යුතු ය. මේවා පූජකවරුන් සඳහා සමිඳාණන්
වහන්සේට ගින්නෙන් දවා පුදන ආහාර පූජාවේ

අතිශුද්ධ කොටස් වේ. මෙසේ කිරීම සදහට ම
වලංගු නියෝගයකි.”

### දේවාපහාසයට දඬුවම්

10 තවද, මිසර වැසියකුට දාව ඉශ්රායලේ ජාතික
ස්ත්රියකගනේ උපන් එක්තරා මිනිසකේ, ඉශ්රායලේ
ජනයා අතර විය. මොහු කඳවුර තුළ දී ඉශ්රායලේ
වැසියකු සමඟ දබර කළේ ය. 11 ඒ
තැනැත්තාගේ මවගේ නම ෂලෙ‍ොමිත් ය. ඈ
දාන්ගේ ගෝත්රයේ දිබ්රීගේ දුව වූවා ය. ඒ
තැනැත්තා ද දබර කරන විට දවියන් වහන්සේගේ
නාමයට අපහාස කොට සාප කළෙනේ, සනෙඟ
මෝසසේ වතෙ ඔහු ගනොවෝ ය. 12 මසෙේ
ගනෙවුත්, සමිඳාණන් වහන්සේගේ තීරණය
දැනගන්න තකේ ඔව්හු ඔහු හිර අඩස්සි කළහ.
13 සමිඳාණන් වහන්සේ මෝසසේට කතා කොට
මසෙේ වදාළ සේක: 14 “සාප කළ තැනැත්තා
කඳවුරනේ පිටතට ගනෙන්නේ. ඔහු කී දේට කන්
දුන් සියල්ලන් ඔහුගේ හිස මත අත් තබා, මුළු
ජනතාව ම ඔහුට ගල් ගැසිය යුතු ය. 15 නුඹ ද
ඉශ්රායලේ ජනයාට කතා කොට මසෙේ කියන්න:
යමකු දවියන් වහන්සේට සාප කළොත්, ඔහු ඒ
පාපයේ දුර්විපාකය දැරිය යුතු ය. 16 ඔහු උන්
වහන්සේගේ නාමයට අපහාස කළ බැවින් මරණයට
පත් කළ යුතු ය. විදේශිකයකේ වේවා, දේශයේ
උපන් තැනැත්තකේ වේවා, ඔහු දවියන්
වහන්සේගේ නාමයට අපහාස කළොත්, මුළු
ජනතාව එවැන්නකුට ගල් ගසා ඔහු මරණයට පත්
කළ යුතු ය.
17 නික්ම 21:12 “යමකු මිනිසකු මැරුවොත්, ඔහු
ද මැරිය යුතු ය. 18 යමකු මෘගයකු මැරුවොත්,
මෘගයා වනෙුවට, වන්දි වශයනේ මෘගයකු ගවේය
යුතු ය.
19 “යමකු මිනිසකුට තුවාළයක් කළොත්,
ඔහුටත් එලසෙ ම කරනු ලැබේ. 20 නික්ම 21:23-25;
ද්වි.නී. 19:21; මතෙ 5:38ඇටකටුවට ඇටකටුව ය,
ඇසට ඇස ය, දතට දත ය. යමකු යමකුට තුවාළ
කළොත්, ඔහුටත් එලසෙ ම කරනු ලැබේ.
21 “යමකු මෘගයකු මැරුවොත්, ඔහු ඒ වනෙුවට
මෘගයකු දිය යුතු ය. යමකු මිනිසකු මැරුවොත්,
ඔහු ද මරනු ලැබේ.
22 ගණන් 15:16 “ඉශ්රායලේ ජනයා කරෙහෙි මනේ
ම ඔවුන් අතර වසන විදේශිකයන් කරෙහෙි ද එක
ම නීතියක් බල පාන්නේ ය. මන්ද මම වනාහි
නුඹලාගේ දවි සමිඳාණන් වහන්සේ වමි.”
23 මසෙේ මෝසසේ ඉශ්රයලේ ජනයාට කතා
කළේ ය. ඔහු කී ලසෙ ඔව්හු සාප කළ තැනැත්තා
කඳවුරනේ පිටතට ගනෙවුත් ඔහුට ගල් ගසා
මැරුවෝ ය. ඉශ්රායලේ ජනයා ද සමිඳාණන්
වහන්සේ මෝසසේට අණ කළ පරිදි ඉටු කළහ.

### සබත් වර්ෂය

(ද්වි.නී. 15:1-11)

25 නික්ම 23:10-11 සමිඳාණන් වහන්සේ සීනයි
කන්දේ දී මෝසසේට කතා කොට මසෙේ
වදාළ සේක: 2 “ඉශ්රායලේ ජනයාට කතා කොට
මයෙ කියන්න: මා නුඹලාට දනේනට යන දේශයට
පැමිණි කල, සමිඳාණන් වහන්සේගේ ගෞරවය
පිණිස එම දේශයට සබත් විවේකයක් දිය යුතු ය.
3 අවුරුදු හයක් තුළ නුඹලාට කතේ වැපිරිය හැකි ය;
මිදි වතුවල අතු පෑහිය හැකි ය; ඒවා කප්පාදු කොට
පල නලොගත හැකි ය. 4 එහතේ, හත් වන
අවුරුද්දේ දී සමිඳාණන් වහන්සේ උදසො දේශයට
ශුද්ධ සබත් විවේකයක් දිය යුතු ය. ඒ අවුරුද්දේ
නුඹලා නොවපුළ යුතු ය. මිදි වතුවල අතු නොපෑහිය
යුතු ය. 5 ඉබේ ම වැඩනෙ අස්වැන්න ද නළො
නොගත යුතු ය. අතු නොපාහින ලද මිදි වැල්වල
පල රුස් නොකළ යුතු ය. එය දේශයට ද දනෙ
අවුරුද්දක නිවාඩුවකි. 6 වගා නොකළ කතේ
වතුවලින් නුඹලාට ද නුඹලාගේ දැසිදසුන්ට ද
කුලීකරුවාට ද නුඹලා සමඟ සිටින විදේශිකයාට ද
7 නුඹේ ගවයන්ට ද ඉඩම්වල සිටින මෘගයන්ට ද
ආහාර ලැබනෙු ඇත. වගා නොකළ කතේ වතුවලින්
ඇති වන සියල්ල නුඹලාට කෑ හැකි ය.”

### ජුබිලි වර්ෂය

8 “අවුරුදු හතනේ හතට පැමිණනෙ සබත් වර්ෂ
හතක් හතනේ වැඩි කළ විට අවුරුදු හතළිස් නවයක්
ලැබනෙු ඇත. 9 එවිට හත් වන මාසයේ දහ වන
දින, එනම්, පව් කමා කිරීමේ පිළිවතෙ ඉටු කරන
දින, මුළු රට පුරා හොරණෑව රුව් පිළිරුව් දීමට
සැලැස්විය යුතු ය. 10 මලෙසෙ නුඹලා පණස් වන
අවුරුද්ද වනේ කොට මුළු දේශය පුරා එහි සිටින
සියල්ලන්ට නිදහස දීම ගැන ප්රකාශයක් කළ යුතු
ය. එම අවුරුද්ද ජුබිලියක් නිසා එකිනකො තම
තමාගේ උරුමයටත් තම තමාගේ පළෙපතටත්
නැවත පැමිණිය යුතු ය. 11 පණස් වන අවුරුද්ද
ජුබිලියක් බැවින් නුඹලා නොවැපිරිය යුතු ය. ඉබේ
ම වැවනෙ දේවලින් අස්වැන්න නළො නොගත යුතු
ය. අතු නොපාහින ලද මිදි වතුවලින් පලදාව රුස්
කොට නොගත යුතු ය. 12 එය ජුබිලියක් බැවින්,
එය නුඹලාට ශුද්ධ වර්ෂයක් විය යුතු ය. නුඹලා
වගා නොකළ කතේවලින් ලැබනෙ අස්වැන්න
නුඹලාට කන්නට පුළුවන.
13 “මිල දී ගත් බඩු මේ අවුරුද්දේ දී හිමිකරුට
ආපසු දිය යුතු ය. 14 එබැවින් නුඹලා තවත්
ඉශ්රායලේ ජාතිකයකුට යමක් විකුණන විට හෝ
ඔහුගනේ යමක් මිලට ගන්න විට හෝ ඔහු සමඟ
අසාධාරණ ලසෙ ක්රියා නොකළ යුතු ය.
15 ජුබිලියනේ පසු යමක් කනෙකුගනේ මිල දී
ගන්න විට, එහි වටිනාකම තක්සේරු කළ යුත්තේ
ඊළඟ ජුබිලිය දක්වා පලදාව ලබාගන්නට පුළුවන්
අවුරුදු ගණන අනුව ය. 16 අවුරුදු ගණන වැඩි නම්,

මිල වැඩි විය යුතු ය. අවුරුදු ගණන අඩු නම්, මිල
අඩු විය යුතු ය. මන්ද, විකුණනු ලබන්නේ අස්වනු
ගණන බැවිනි. 17 එබැවින් නුඹලා එකිනෙකාට වංචා
නොකළ යුතු ය. නුඹලාගේ දෙවියන් වහන්සේට
ගරුබිය පාන්න. මම නුඹලාගේ දෙවි සමිඳාණන්
වහන්සේ වෙමි.”

### සබත් වර්ෂ හා වගාව

18 “නුඹලා මාගේ නීති සහ විනිශ්චයයන්
පිළිපදිමින් ඒවා ඉටු කරන්න. එවිට නුඹලා දේශයේ
සුරැකි ව වසනු ඇත. 19 දේශය ද පලදාව උපදවන
විට නුඹලාට කන්නට උවමනා සෑම දේ දෙන්නේ ය.
නුඹලා එහි සුරැකි ව වසන්නහු ය. 20 හත් වන
අවුරුද්දේ දී වපුරන්නේ වත්, පලදාව එකතු
කරන්නේ වත් නැති බැවින් එම අවුරුද්දේ දී අපි
කුමක් කන්නමෝ ද කියා කෙනෙකුට ඇසිය හැකි ය.
21 හය වන අවුරුද්දේ දී තුන් අවුරුද්දක ආශීර්වාදය
ලැබෙන හැටියට මාගේ ආශීර්වාදය නුඹලා වෙත
පැමිණීමට මම අණ කරමි. 22 අට වන අවුරුද්දේ
නුඹලා වපුරන විට නව වන අවුරුද්ද දක්වා කලින්
ලැබූ පලදාව නුඹලාට අනුභව කළ හැකි ය. මෙසේ
ඒ අවුරුද්දේ අස්වැන්න නෙළෙන තෙක් නුඹලාට කෑමට
කලින් ලැබුණු පලදාව ප්‍රමාණවත් වේ.”

### ඉඩකඩම් ආපසු දීම

23 “දේශය අයිති මට බැවින් එය නිත්‍ය අයිතියක්
වන ලෙස නොවිකිණිය යුතු ය. මාගේ
ආගන්තුකයන් වන නුඹලා මා සමඟ කලක්
නේවාසික ව සිටින්නහු ය.
24 “ඉඩකඩම් විකුණන විට ඒවා ආපසු මිල දී
ගැනීමට මුල් හිමිකරුගේ අයිතිය පිළිගත යුතු ය.
25 යමෙකු දිළිඳු තත්ත්වයට පත් ව, ඔහුගේ
ඉඩකඩම් විකුණන්නට ඔහුට සිදු වී නම්, ඔහුගේ
කිට්ටු ම නෑයෙකු ඉදිරියට අවුත්, ඒ තැනැත්තා
විකුණූ ඉඩකඩම් ඔහුට මිල දී ආපසු ගත හැකි ය.
26 එහෙත්, යමෙකුට ඒවා මිල දී ගැනීමට කිට්ටු
නෑයෙකු නැති වුවත්, ඒ තැනැත්තා පසුව ධනවත් ව
මිල දී ගැනීමට සෑහෙන වත්කමක් ලබන්නට පුළුවන.
27 එවැනි අවස්ථාවක දී ඔහු විකුණූ දා සිට අවුරුදු
ගණන ගණන් කොට, ඊළඟ ජුබිලිය දක්වා තිබෙන
අවුරුදු ගණන අනුව, ඒවා මිල දී ගත් තැනැත්තාට
ආපසු ගෙවා තම ඉඩකඩම් ආපසු ලබා ගන්නේ ය.
28 එහෙත්, ඔහුට මිල දී ගන්නට නොහැකි නම්, එය
ජුබිලි වර්ෂය වන තෙක් ඊට මුදල් ගෙවූ තැනැත්තාට
අයිති ය. ජුබිලි වර්ෂයේ දී නැවත එය පළමු
අයිතිකාරයා සතු වන්නේ ය.
29 “යමෙකු පවුරකින් වට කළ නගරයක වූ
නිවාසයක් වික්කොත්, විකුණූ දින සිට සම්පූර්ණ
පළමු අවුරුද්ද තුළ දී ආපසු මුදල් ගෙවා එය ගත
හැකි ය. 30 එහෙත්, සම්පූර්ණ අවුරුද්ද ඇතුළත දී
ඔහු මුදල් ගෙවා ආපසු නොගතහොත්, එය මිල
ගෙවා ගත් තැනැත්තාටත්, ඔහුගේ පරපුරටත් සදහට
ම අයිති වේ. ජුබිලි වර්ෂයේ දී ද අයිතිය ආපසු මාරු
නොවෙනු ඇත. 31 එහෙත්, පවුරුවලින් වට නොවූ
ග්‍රාමවල ඇති නිවාස නම්, කෙත්වතු සමඟ ගණන්
ගත යුතු වේ. මුදල් ගෙවා ඒවා ආපසු ගත හැක,
ජුබිලි වර්ෂයේ දී ඒවායේ අයිතිය මාරු වනු ඇත.
32 එහෙත් ලෙවීවරුන්ට නම්, ඔවුන්ගේ නගරවල
පිහිටි නිවාස කැමැති වේලාවක මුදල් ගෙවා ආපසු
හිමි කරගත හැක. 33 ලෙවී කෙනෙකු විසින්
විකුණන ලද පවුරුවලින් වට වූ නගරයක ඇති
නිවාසයක් මුදල් ගෙවා ආපසු නොගතහොත්, ජුබිලි
වර්ෂයේ දී එය ආපසු ඔහුට දිය යුතු ය. මන්ද,
නගරවල පිහිටි ලෙවීවරුන්ගේ නිවාස, ඉශ්‍රායලේ
ජනයා අතර ඔවුන්ට සදහට ම අයිති වේ.
34 එහෙත්, ලෙවීවරුන්ගේ නගර වට කර ඇති තණ
බිම් නම්, කවරදා වත් නොවිකිණිය යුතු ය. ඒවා
ඔවුන්ට සදහට ම අයිති වනු ඇත.”

### දුප්පතුන්ට ණය මුදල් දීම

35 ද්වි.නී. 15:7-8 “යම් ඉශ්‍රායලේ ජාතිකයෙකු දිළිඳු
බවට පත් වී, තමා නඩත්තු කරගැන්මට නොහැකි
වේ නම්, ඔහුට නුඹලා සමඟ ජීවත් වීමට හැකි වන
ලෙස, නුඹලා විදේශිකයෙකුට හෝ ආගන්තුකයෙකුට
හෝ ආධාර කරන්නා සේ ඔහුට ද ආධාර කළ යුතු
ය. 36 ඔහුගෙනේ පොළියක් හෝ ලාභයක් හෝ
නොගත යුතු ය. නුඹලාගේ දෙවියන් වහන්සේට
ගරුබිය පාන්න. එවැන්නෙකුට නුඹලා සමඟ ජීවත්
වීමට ඉඩ හරින්න. 37 නික්ම 22:25; ද්වි.නී.
23:19-20නුඹලා ඔහුට පොළියට මුදල් නොදිය යුතු
ය. ලාභ අල්ලාගෙන ඔහුට ආහාර නොවිකිණිය යුතු
ය. 38 කානාන් දේශය නුඹලාට දෙනු පිණිසත්,
නුඹලාගේ දෙවියන් වහන්සේ වනු පිණිසත්, මිසර
දේශයෙනේ නුඹලා පිටතට ගෙනා නුඹලාගේ දෙවි
සමිඳාණන් වහන්සේ මම වෙමි.”

### වහලුන් මිදීම

39 නික්ම 21:2-6; ද්වි.නී. 15:12-18 “යම් ඉශ්‍රායලේ
ජාතිකයෙකු දිළිඳු බවට පත් වී, ඔහු තමා ම
නුඹලාට විකුණාගනු ලැබුවහොත්, වහලෙකු මෙන්
මෙහෙ කිරීමට ඔහුට බල නොකළ යුතු ය.
40 එහෙත්, කුලීකරුවෙකු මෙන් ද ආගන්තුකයෙකු
මෙන් ද ඔහුට නුඹලා සමඟ විසිය හැක. ජුබිලි
වර්ෂය දක්වා ඔහු නුඹලාට මෙහෙ කළ යුතු ය.
41 එවිට ඔහු ද ඔහුගේ දරුවන් ද නුඹලාගෙනේ පිට
වී, තමාගේ පවුලට හා පියාගේ උරුමයට ආපසු යනු
ඇත. 42 මා විසින් මිසර දේශයෙනේ පිටතට ගෙනෙන
ලද මාගේ මෙහෙකරුවෝ ඔව්හු ය. එබැවින් වහලුන්
මෙන් ඔවුන් නොවිකිණිය යුතු ය. 43 දැඩි ලෙස
ඔවුන් පාලනය නොකළ යුතු ය. නුඹලාගේ දෙවියන්
වහන්සේට නුඹලා ගරුබිය පෑ යුතු ය. 44 නුඹලාට
වහල් දැසිදසුන් අවශ්‍ය නම්, නුඹලා අවට සිටින
විජාතීන්ගෙනේ නුඹලා එවැන්නන් මිල දී ගත යුතු ය.
45 නුඹලා අතර වසන විදේශිකයන්ගේ දරුවන්
නුඹලාට මිල දී ගත හැක. නුඹලාගේ රටෙහි උපදින
මොවුන්නන් නුඹලාට උරුම වනු ඇත. 46 තවද,

නුඹලාගෙන් පසු නුඹලාගේ දරුවන්ට ද ඔවුන් උරුම
කොට හිමි කර දෙන්නට පුළුවන. ඔවුන් සදහට ම
නුඹලාගේ වහලුන් වනු ඇත. එහෙත්, නුඹලාගේ
ජාතිකයන් වන ඉශ්‍රායලේ ජනයා දැඩි ලෙස පාලනය
නොකළ යුතු ය.
47 “නුඹලා සමඟ සිටින තාවකාලික ව වසන්නෙකු
හෝ විදේශිකයෙකු හෝ පොහොසත් වන අතර,
ඉශ්‍රායලේ ජාතිකයෙකු දුගී බවට පත් වී, ඔහු
විදේශිකයෙකුට හෝ ආගන්තුකයෙකුට හෝ
විදේශිකයෙකුගේ පරපුරෙන් පැවතෙන යමෙකුට
හෝ තමා ම විකුණාගතහොත් 48 නුඹලාට ඔහු
ආපසු මිල දී ගත හැකි ය. ඔහුගේ සහෝදරයෙකුට
හෝ 49 ඔහුගේ මාමාට හෝ මාමාගේ පුතුට හෝ
තම පවුලේ කිට්ටු නෑයෙකුට හෝ මුදල් ගෙවා ඔහු
ආපසු ගත හැක. ඔහුට වත්කමක් තිබේ නම්, මුදල්
ගෙවා තමාට ම නිදහස ලබාගත හැකි ය. 50 ඔහු
තමා මිල දී ගත් තැනැත්තා සමඟ එකඟ වී, තමා ම
විකුණාගත් දින සිට ජුබිලි වර්ෂය දක්වා ඇති අවුරුදු
ගණන් කළ යුතු ය. පසුව ඔහුට නිදහස දීම සඳහා
ගෙවිය යුතු මිල නියම කළ යුත්තේ, කුලීකරුවෙකුට
ගෙවෙන වේතනය අනුව ය. 51 ජුබිලි වර්ෂය දක්වා
ඇති අවුරුදු ගණන බොහෝ නම්, ඒ අවුරුදු ගණන
අනුව මිල දී ගත් මුදලින් කොටසක් නිදහස දීමේ දී
ඔහුට ආපසු ගෙවිය යුතු ය. 52 අවුරුදු ගණන ස්වල්ප
නම්, ඒ අවුරුදු ගණන අනුව මුදලින් කොටසක් ආපසු
ගෙවිය යුතු ය. 53 තවද, ගෙවිය යුතු මුදල ගණන්
ගත යුත්තේ කුලීකරුවෙකුට අවුරුදුපතා ගෙවෙන
වේතනය අනුව ය, ඔහුගේ ස්වාමියා ද දැඩි ලෙස
ඔහු පාලනය නොකළ යුතු ය. 54 මේ කාලය
ඇතුළත දී ඔහු නිදහස ලබා නොගතහොත්, ජුබිලි
වර්ෂයේ දී ඔහුත්, ඔහුගේ දරුවනුත් නිදහස ලැබිය
යුතු ය. 55 මන්ද, ඉශ්‍රායලේ ජනයා මාගේ වහල්ලු
වන්නෝ ය. මා මිසර දේශයෙන් පිටතට ගෙනා
ඔව්හු මාගේ වහල්ලු ය. නුඹලාගේ දෙවි සමිඳාණන්
වහන්සේ මම වෙමි.”

## කීකරුකමේ ආශීර්වාදය
(ද්වි.නී. 7:12-24;28:1-14)

26 නික්ම 20:4; ලෙවී 19:4; ද්වි.නී. 5:8;
16:21-22; 27:1 “නුඹලාගේ දේශයෙහි
නුඹලාගේ වන්දනාව පිණිස දේව පිළිම හෝ
කැටයම් කළ ප්‍රතිමා හෝ ශිලාස්තම්භ හෝ නෙළූ
ගල් රූප හෝ නොසෑදිය යුතු ය. නුඹලාගේ දෙවි
සමිඳාණන් වහන්සේ මම වෙමි. 2 මාගේ සබත්
දිනයන් පවත්වා මාගේ ශුද්ධස්ථානයට ගරු කළ යුතු
ය. මම සමිඳාණන් වහන්සේ වෙමි.
3 ද්වි.නී. 11:13-15; 28:1-14 “මාගේ නීතිවලට
කීකරු වී, මාගේ ආඥා පිළිපැද්දොත්, 4 මම නියම
කාලයේ දී වැසි වස්වන්නෙමි. දේශය ද සරුසාර
අස්වැන්නක් නිපදවනු ඇත. කෙතේවල ගස් ද පලදාව
නිපදවන්නේ ය. 5 කමතේ ගොයම් පෑගීම මිදි පල
නෙළෙන කාලය දක්වා ද මිදි පල නෙළෙන කාලය
ධාන්‍ය වපුරන කාලය දක්වා ද දික්වනු ඇත.
නුඹලාට කෑමට උවමනා තරම් ආහාර ලැබෙනු ඇත.
නුඹලා ද සුරැකි ව නුඹලාගේ දේශයෙහි වසන්නහු
ය.
6 “නුඹලාගේ දේශයෙහි මම නුඹලාට සාමය
දෙන්නෙමි. නුඹලා ද කිසි බියක් සැකක් නැති ව
සැතපෙනු ඇත. රටින් චණ්ඩ මෘගයන් පන්නාදමමි.
නුඹලාගේ දේශයෙහි යුද්ධයක් ද සිදු නොවෙනු ඇත.
7 නුඹලා ද සතුරන් පන්නාදමන්නහු ය. නුඹලා
ඉදිරියෙහි ඔව්හු කඩුවෙන් පහර ලැබ වැටෙන්නෝ
ය. 8 නුඹලාගෙන් පස්දෙනෙකේ සියදෙනෙකු ද
සියදෙනෙකේ දසදහසක් ද ලුහුබැඳ යන්නෝ ය. නුඹලා
ඉදිරියෙහි ඔව්හු කඩුවෙන් පහර ලැබ වැටෙන්නෝ
ය. 9 මම ද නුඹලාට ආශීර්වාද කොට නුඹලා
සඵලවත් කොට, නුඹලා වර්ධනය කරන්නෙමි.
නුඹලා සමඟ මා කළ ගිවිසුම ඉටු කරන්නෙමි.
10 නුඹලා කලින් රැස් කළ අස්වැන්නෙන් අනුභව
කොට, නව අස්වැන්න පැමිණෙන විට පරණ
අස්වැන්නෙන් ඉතිරි වන කොටස නුඹලාට ඉවත්
කරන්නට සිදු වනු ඇත. 11 මම ද මාගේ මණ්ඩපය
නුඹලා අතර පිහිටුවමි. මම නුඹලා ඉවත
නොලන්නෙමි. 12 2 කොරි 6:16මම නුඹලා අතර
වාසය කොට, නුඹලාගේ දෙවියන් වහන්සේ
වන්නෙමි. නුඹලා මාගේ සෙනඟ වන්නහු ය.
13 නුඹලා මිසර වාසීන්ගේ වහලුන් නො වන පිණිස
මිසර දේශයෙන් නුඹලා පිටතට ගෙනා නුඹලාගේ
දෙවි සමිඳාණන් වහන්සේ මම වෙමි. නුඹලා
පාලනය කළ ඔවුන්ගේ බලය බිඳදමා, නුඹලාට හිස
ඔසවා යෑමට මම සැලැසුවෙමි.”

## අකීකරුකමට දඬුවම
(ද්වි.නී. 28:15-68)

14 ද්වි.නී. 28:15-68 “නුඹලා මට සවන් නො දී,
මෙකී සියලු ආඥා ඉටු නොකරන්නහු නම්, 15 මාගේ
ආඥාවලට අකීකරු ව, මාගේ ගිවිසුම කඩ කරන
පරිදි මාගේ නීති හෙළා දැක, මාගේ විනිශ්චය
ප්‍රතික්ෂේප කරන්නහු නම්, 16 මම ද නුඹලාට මේ
දේ කරමි. නුඹලා අන්ධ කරවන, ජරාවට පත්
කරවන මහත් ව්‍යසන වන භීතිය, අසාධ්‍ය ලෙඩ
රෝග හා උණ සන්නිපාත නුඹලා වෙත
පමුණුවන්නෙමි. නුඹලා බීජ වපුරන නමුත් ඒවා
නිෂ්ඵල වනු ඇත. නුඹලාගේ සතුරෝ ඒවා
කාදමන්නෝ ය. 17 මම නුඹලාට විරුද්ධ වන්නෙමි.
නුඹලාගේ සතුරන් ඉදිරියෙහි නුඹලා මරනු ලබන්නහු
ය. නුඹලාගේ සතුරෝ නුඹලා පාලනය කරන්නෝ ය.
කෙනෙකු නුඹලා ලුහුබැඳ නොයෙන විට පවා නුඹලා
පලා යන්නහු ය.
18 “මේ සියල්ලෙන් පසු පවා නුඹලා මට සවන්
නොදෙන්නහු නම්, මම නුඹලාගේ පාපවලට දඬුවම්
සත් ගුණයකින් වැඩි කරන්නෙමි. 19 නුඹලාගේ
අහංකාර බලය මම බිඳදමමි. අහස යකඩ මෙන් ද
පොළොව ලෝකඩ මෙන් ද වියළෙනු ඇත.
20 නුඹලාගේ ශ්‍රමය ද නිකරුණේ වැය වනු ඇත.
නුඹලාගේ ඉඩකඩම් අස්වැන්නක් නොදෙනු ඇත.
කෙතේවතුවල ගස් ද පලදාව නොදෙනු ඇත.

21 “ඉන්පසු පවා මට අකීකරු ව හැසිරමේන්, මට
සවන් නොදෙන්නහු නම්, නුඹලාගේ පව් නිසා
නුඹලාට තව සත් ගුණයකින් පීඩා පමුණුවන්නමේ.
22 මම නුඹලා අතරට චණ්ඩ මෘගයන් එවන්නමේ. ඒ
මෘගයෝ නුඹලාගේ දරුවන් මරා, ගවයන් වනසා,
නුඹලාගේ ජන සංඛ්‍යාව අඩු කරන්නෝ ය. එවිට
මාවත් ද පාළු වනු ඇත.
23 “මේ සියල්ල එවූ පසු පවා නුඹලා නොහැරී,
මට විරුද්ධ ව ක්‍රියා කරන්නහු නම්, 24 මම ද
නුඹලාට විරුද්ධ ව ක්‍රියා කොට නුඹලාගේ පාප
නිසා තවත් හත් ගුණයකින් දඬුවම් කරමි. 25 මාගේ
ගිවිසුම කඩ කළ නිසා දඬුවම් කරනු පිණිස
නුඹලාගේ රටට යුද්ධයක් පමුණුවනු ලැබේ. නුඹලා
නගරවල එක් රැස් වී සිටින විට මම නුඹලා අතරට
වසංගත පමුණුවන්නමේ. නුඹලාගේ සතුරන්ගේ
බලයට නුඹලා පාවා දෙනු ලබන්නහු ය. 26 මා
නුඹලාට ආහාර සපයන මාර්ග වැනසූ පසු, ස්ත්‍රීන්
දසදෙනෙකුට රොටි පුළුස්සනු සඳහා එක උදුනක්
ප්‍රමාණවත් වනු ඇත. නුඹලාගේ රොටි ඔවුන්
සලාක කොට කිරා දුන් පසු, නුඹලා ඒවා කන
නමුත්, නුඹලා සෑහීමට පත් නොවන්නහු ය.
27 “මේ සියල්ලට පසු පවා මට සවන් නො දී මට
විරුද්ධ ව ක්‍රියා කරන්නහු නම්, 28 මම ද
කෝපාවිෂ්ට ව නුඹලාගේ පාප නිසා නුඹලාට තව
හත් ගුණයකින් දරුණු ලෙස දඬුවම් කරමි.
29 කුසගිනි වාවාගනු නොහැකි ව, නුඹලාගේ
දරුදැරියන්ගේ මාංස නුඹලා කන්නහු ය. 30 මම ද
නුඹලාගේ ගිරිකුළු දේවාල වනසා දේව ප්‍රතිමා සිඳ
බිඳදමා, නුඹලාගේ මළකඳන් දේව පිළිමවල නටබුන්
මත ගොඩ ගසන්නමේ. මම ද නුඹලා පිළිකුල්
කරන්නමේ. 31 මම නුඹලාගේ නගර වනසා,
ශුද්ධස්ථාන පාළු කොට, නුඹලාගේ පූජාවන්හි මිහිරි
සුවඳ ආස්රාණය නොකරන්නමේ. 32 නුඹලාගේ රට
ද සහමුලින් ම පාළු කර හරින්නමේ. එහි පදිංචි වන
නුඹලාගේ සතුරන් එය දැක මවිත වනු ඇත.
33 නුඹලාට විරුද්ධ ව යුද්ධ ඇති කොට, මිසදිටුවන්
අතර නුඹලා විසුරුවා හරිමි. නුඹලාගේ රට පාළු වනු
ඇත, නගර වැනසෙනු ඇත.
34 “එවිට රට පාළු වී පවතින කාලය තුළ රටට
විවේකය ලැබෙනු ඇත. නුඹලා සතුරන්ගේ රටෙහි
වසන්නහු ය. එකල රටට විවේකය ලැබේ. රට එය
ගැන ප්‍රීති වනු ඇත. 35 නුඹලා එහි වාසය කරද්දී
ඊට සබත් විවේකයක් නුදුන් බැවින්, මලෙසෙ රට
පාළු ව පවතින කාලය තුළ දී එය විවේකය භුක්ති
විඳිනු ඇත.
36 “තවද, සතුරන්ගේ රටවල තවමත් පණපිටින්
සිටින අය වෙත මම දරුණු බියක් එවන්නමේ. ඔවුන්
ගසක කොළයක් සලෙවෙනෙ විට පවා පලා යනු ඇත.
බියට මනේ ඔව්හු පලා යන්නෝ ය. කිසිවකු ඔවුන්
ලුහුබැඳ නොයද්දී පවා ඔව්හු පලා ගොස්
වැටෙන්නෝ ය. 37 මලෙසෙ යුද්ධයක දී මනේ එකා
පිට එකා වැටෙන්නේ ය. සතුරන්ට මුහුණ දී
සිටින්නට ද නුඹලාට හැකි නොවෙනු ඇත. 38 මලෙසෙ
නුඹලා විජාතිකයන් මධ්‍යයේ වැනසෙන්නහු ය.
සතුරු රටවල් නුඹලා ගිලදමනු ඇත. 39 සතුරු රටවල
ජීවත් ව සිටින්නෝ තමන්ගේ දුෂ්ටකම් නිසා ද තම
පියවරුන්ගේ දුෂ්ටකම් නිසා ද ජරාවට පත්වන්නෝ
ය.
40 “එවිට ඔවුන් මට විරුද්ධ ව කළ ද්‍රෝහිකමනේ
වූ තමන්ගේ අයුතුකම් ද තම පියවරුන්ගේ අයුතුකම්
ද ඔවුන් මට විරුද්ධ ව හැසිරීම ද පිළිගත්තත්,
41 මම ඔවුන්ට විරුද්ධ ව ක්‍රියා කර ඔවුන්ගේ
සතුරන්ගේ දේශයට ඔවුන් පමුණුවන්නමේ. එකල්හි
වත් ඔවුන්ගේ දරදඬු සිත් යටහත් වී ඔව්හු
තමන්ගේ අයුතුකමේ දඬුවම පිළිගන්නෝ නම්,
42 උත් 17:7-8; 26:3-4; 28:13-14එවිට මම ජාකොබ්
සමඟ කළ ගිවිසුම ද ඊසාක් සමඟ කළ ගිවිසුම ද
ආබ්‍රහම් සමඟ කළ ගිවිසුම ද සිහි කරන්නමේ;
දීමට පොරොන්දු වූ දේශය ද සිහි කරන්නමේ.
43 සනෙඟ දේශය අත්හළ පසු, ජනශූන්‍ය ව තිබනෙ
හයින්, දේශයට සබත් විවේකය භුක්තිවිඳිය හැක.
ඔවුන් මාගේ අණපණත් හෙළා දැක, මාගේ
ව්‍යවස්ථාවන් පිළිකුල් කළ බැවින් ඔවුන් තමන්ගේ
දුෂ්ටකමට ලැබූ දඬුවම පිළිගත යුතු ය. 44 කසෙේ
වුව ද, ඔවුන්ගේ සතුරන්ගේ රටවල සිටින විට
ඔවුන් සහමුලින් ම වනසාලනු පිණිස ද මා සමඟ
පිහිටුවාගත් ගිවිසුම කඩ කිරීමට මඟ නොපෑදනෙ
ලසෙ ද මම ඔවුන් අත් නොහරිමි. මම ඔවුන්
පිළිකුල් නොකරමි. ඔවුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේ මම වමේ. 45 එහෙත්, ඔවුන්ගේ දෙවියන්
වහන්සේ වන පිණිස, විජාතීන් ඉදිරිපිට දී ම මිසර
දේශයනේ ඔවුන් පිටතට ගනො මම, ඔවුන්ගේ
මුතුන්මිත්තන් සමඟ පිහිටුවාගත් ගිවිසුම සිහි
කරන්නමේ. මම සමිඳාණන් වහන්සේ ය.”
46 සමිඳාණන් වහන්සේ මෝසෙස් මඟින් සීනයි
කන්ද මත, ඉශ්රායලේ ජනයා හා තමන් වහන්සේ
අතර පිහිටුවාගත් ව්‍යවස්ථා, අණපණත් සහ නීති
මේවා ය.

## පූදන පූජා පිළිබඳ නීති

27 සමිඳාණන් වහන්සේ මෝසසේට කතා
කොට, 2 “ඉශ්රායලේ ජනයා අමතා මයෙ
කියන්න”යි වදාළ සේක. “යමකු බාරයක් ඉටු
කරන පිණිස තමා ම සමිඳාණන් වහන්සේට කැප
කරගත් විට, ඔහු නිදහස් වීම සඳහා ගෙවිය යුතු
මුදල නියම කළ යුත්තේ පහත දක්වන පිළිවළෙට
ය.
3 “ඔහු අවුරුදු විස්සේ සිට හැට දක්වා වයසැති
පිරිමියකේ නම්, ගෙවිය යුතු මුදල ශුද්ධස්ථානයේ
මිලය අනුව රිදී කාසි පණහකි. 4 ස්ත්‍රියක් නම්,
ගෙවිය යුතු මුදල රිදී කාසි තිහක් වේ.
5 “අවුරුදු පහේ සිට විස්ස දක්වා වයසැති
පිරිමියකේ නම්, ගෙවිය යුතු මුදල රිදී කාසි විස්සකි.
ස්ත්‍රියක් නම්, රිදී කාසි දහයකි.
6 “මාසයේ සිට අවුරුදු පහ දක්වා වයසැති පිරිමි
ළමයකේ නම්, ගෙවිය යුතු මුදල රිදී කාසි පහකි.
ගැහැණු ළමයකේ නම්, රිදී කාසි තුනකි.

7 “අවුරුදු හැටට වැඩි වයසැති පිරිමියෙකු නම්,
ගෙවිය යුතු මුදල රිදී කාසි පසළොසකි. ස්ත්‍රියක්
නම්, රිදී කාසි දහයකි.
8 “භාරය වූ තැනැත්තා, නියම කළ මුදල ගෙවීමට
නොහැකි දුප්පතෙකු නම්, ඔහු පූජකවරයා ඉදිරියෙහි
පෙනී සිටිය යුතු ය. පූජකවරයා ද ඔහුගේ වත්කම
අනුව මුදලක් නියම කරනු ඇත.
9 “භාර වූ දේ සමිඳාණන් වහන්සේට පූජාවක්
ලෙස පිළිගත හැකි සතකු නම්, එලෙස උන්
වහන්සේට පුදන දේ කැප වූවක් විය යුතු ය.
10 ඔහු භාර වූ පසු හොඳ සතකුට නරක සතකු
හෝ නරක සතකුට හොඳ සතකු හෝ වශයෙන්
මාරු නොකළ යුතු ය. එසේ මාරු කළහොත්, සතුන්
දදෙනා ම සමිඳාණන් වහන්සේට කැප කළ වස්තු
වේ. 11 ඒ නිසා සමිඳාණන් වහන්සේට පූජාවක්
කොට, අපවිත්‍ර යයි සැලකෙන සතකු ගෙනෙවිත්
තිබේ නම්, ඒ තැනැත්තා ඌ පූජකවරයා වෙත
ගෙනා යුතු ය. 12 පූජකවරයා ද උගේ හොඳ නරක
හැටියට මිල නියම කළ පසු, ඒ මිල අවසාන
තීරණය වනු ඇත. 13 ඒ තැනැත්තා ඌ නිදහස්
කරගැනීමට කැමැති නම්, නියම කළ මිලට අමතර ව
තව එයින් පහෙන් පංගුවක් ඊට එකතු කළ යුතු ය.
14 “යම් මිනිසෙකු සමිඳාණන් වහන්සේට තම
නිවාසය කැප කළ විට, පූජකවරයා ද එහි හොඳ
නරක තත්ත්වයේ හැටියට එහි මිල තක්සේරු කළ
යුතු ය. පූජකවරයාගේ තක්සේරුව අවසාන තීරණය
වනු ඇත. 15 එය කැප කළ තැනැත්තා, ඒ නිවාසය
නිදහස් කරගැනීමට කැමැති නම්, එහි මිලට අමතර
ව එයින් පහෙන් පංගුවක් එකතු කළ යුතු ය. එවිට
නිවාසය ඔහුගේ වනු ඇත.
16 “යමෙකු තමාට ප්‍රවේණියෙන් හිමි
ඉඩකඩම්වලින් යමක් සමිඳාණන් වහන්සේට කැප
කරයි නම්, එය තක්සේරු කළ යුත්තේ එහි වැපිරිය
හැකි ප්‍රමාණය අනුව ය. බාර්ලි ඇටවලින්
කිලෝග්‍රෑම් විස්සක වටිනාකම රිදී කාසි දහයකි.
17 ඔහු තම ඉඩම ජුබිලි වර්ෂයේ දී කැප කරන්නේ
නම්, සම්පූර්ණ තක්සේරු මුදල වලංගු වේ.
18 එහෙත්, ඉන්පසු එය කැප කරයි නම්, පූජකවරයා
ඊළඟ ජුබිලි වර්ෂය දක්වා ඇති අවුරුදු ගණන්
කොට, අඩු මිලක් නියම කළ යුතු ය. 19 ඉඩම කැප
කළ තැනැත්තා එය නිදහස් කරගැනීමට කැමැති
නම්, නියම කළ මුදලට අමතර ව තව පහෙන්
පංගුවක් ඊට එකතු කළ යුතු ය. එවිට එය ඔහුගේ
වනු ඇත. 20 එය නිදහස් කර නොගෙන, ඔහු
යමෙකුට එය විකුණුවහොත්, එය ආපසු නිදහස්
කරගැනීමට නොහැකි වනු ඇත. 21 එවිට ඊළඟ
ජුබිලි වර්ෂයේ දී එය සමිඳාණන් වහන්සේට කැප
කළ ඉඩමක් ලෙස ශුද්ධ භූමියක් වනු ඇත. එය
පූජකවරයාට හිමි වේ.
22 “යමෙකු තමන්ට ප්‍රවේණියෙන් අයිති නො වූ
ඉඩමක් මිලයට ගෙන එය සමිඳාණන් වහන්සේට
කැප කළහොත්, 23 පූජකවරයා එහි වටිනාකම
තක්සේරු කළ යුත්තේ ජුබිලි වර්ෂය දක්වා ඇති
අවුරුදු ගණන අනුව ය. ඒ දින ම ඔහු මුදල ගෙවිය
යුතු ය. ඒ මුදල කැප වූ වස්තුවක් වනු ඇත.
24 ජුබිලි වර්ෂයේ දී ඒ ඉඩම පළමු හිමිකරුට හෝ
ඔහුගෙන් පැවත එන අයට හෝ හිමි වනු ඇත.
25 “සියලු තක්සේරු ගිණිය යුත්තේ ශුද්ධස්ථානයේ
මිලය අනුව ය. ගෙරා විස්සක් රිදී කාසි එකකි.
26 “සතකුගේ කුලුඳුල් පැටියා සමිඳාණන්
වහන්සේගේ ම බැවින්, උන් වහන්සේට කැප කළ
යුතු නොවේ. ඒ සතා වස්සෙකු හෝ බැටළු
පැටියෙකු හෝ වේවා, ඌ සමිඳාණන් වහන්සේගේ
ය. 27 එහෙත්, කුලුඳුල් සතා අපවිත්‍ර සතකු නම්,
තක්සේරු මුදල අනුව ඊට පහෙන් පංගුවක් එකතු
කොට ඌ මුදාගත යුතු ය. ඌ මුදා නොගන්නේ
නම්, යමෙකුට නියම මුදලට ඌ විකිණිය හැක.
28 ගණන් 18:14 “යමෙකු සම්පූර්ණ වශයෙන්
සමිඳාණන් වහන්සේට මිනිසෙකු හෝ සතකු හෝ
තමාට අයිති ඉඩමක් හෝ කැප කළහොත්, එය
විකිණිය නොහැක, ඒවා ආපසු නිදහස් කොට ගත
නොහැක. එවැන්නකේ හෝ එවැන්නක් හෝ
සමිඳාණන් වහන්සේට සහමුලින් ම ශුද්ධ වස්තුවකි.
29 සමිඳාණන් වහන්සේට සම්පූර්ණයෙන් ම කැප
කළ මිනිසෙකු ආපසු නිදහස් කරගත නොහැකි ය.
ඔහු මරණයට පත් කළ යුතු ම ය.
30 ගණන් 18:21; ද්වි.නී. 14:22-29 “කෙත්වතුවල
ධාන්‍යයෙන් හෝ ගස්වල පලදාවෙන් හෝ ඇති වන
භූමියේ මුළු අස්වැන්නෙන් දහයෙන් පංගුවක්
සමිඳාණන් වහන්සේට කැප වූවකි. එවැන්නක් උන්
වහන්සේට ශුද්ධ වස්තුවකි. 31 යමෙකු ඒ දහයෙන්
පංගුව නිදහස් කරගනු කැමැති නම්, එයින් පහෙන්
පංගුවක් ඊට අමතර ව එකතු කළ යුතු ය. 32 ගණන්
කරන පිණිස කවේට යටින් යන ගව පට්ටිවල හෝ
එළු බැටළු පට්ටිවල හෝ දහ වන සතා සමිඳාණන්
වහන්සේට කැප කළ යුතු ය. 33 ඌ හොඳ ද, නරක
ද කියා සොයන්නට හෝ ඌ මාරුකරන්නට හෝ
ඔහුට යුතු නැත. එසේ මාරු කළහොත්, පළමු සතුන්
දදෙනා ම සමිඳාණන් වහන්සේට කැප වනු ඇත.
උන් ආපසු නිදහස් කරගත නොහැක.”
34 සමිඳාණන් වහන්සේ සීනයි කන්දේ දී
ඉශ්‍රායෙලේ ජනයා උදෙසා මෝසෙස්ට දුන් ආඥා
මේවා ය.
io1 පරිච්ඡේද 1-9 සීනයි කන්දෙන් නික්ම යාමට
සූදානම් වීම.
io1 පරිච්ඡේද 10-21 සීනයි කන්දේ සිට මෝවබ්
දේශය දක්වා වූ සිද්ධීන් පිළිබඳ තොරතුරු.
io1 පරිච්ඡේද 22-32 මෝවබ් දේශයේ වූ කරුණු
පිළිබඳ විස්තරය.
io1 පරිච්ඡේද 33 මිසර දේශයේ පටන් මෝවබ්
දේශයට පැමිණීම දක්වා වූ ගමනේ විස්තරයේ
සාරාංශය.
io1 පරිච්ඡේද 34-36 ජෝර්දාන් ගඟෙන් එගොඩ
වීමට පෙර උපදෙස්.

# ගණන් කථාව

### හැඳින්වීම

ඉශ්රායලේවරුන් සීනයි කන්දනේ නික්ම අවුරුදු හතළිහක් තුළ පාළුකරය ඔස්සේ ගොස්, දවේයන් වහන්සේ ඔවුන්ට දීමට පොරොන්දු වූ දේශයේ පරෙදිග මායිමට පැමිණීමේ ගමන් විස්තරය මේ පොතහෙි අඩංගු වේ. මහෙි පරිච්ඡේද කීපයක සඳහන් වන ඉශ්රායලේ ජනතාවගේ ලේඛන සංගණන නිසා මේ පොතට ගණන් කථාව යයි කියනු ලැබේ. මහෙි ප්රධාන කොටස් පහක් ඇත.

මහෙි අඩංගු කරුණු:
පරිච්ඡේද 1-9 සීනයි කන්දනේ නික්ම යාමට සූදානම් වීම.
පරිච්ඡේද 10-21 සීනයි කන්දේ සිට මෝවබ් දේශය දක්වා වූ සිද්ධීන් පිළිබඳ තොරතුරු.
පරිච්ඡේද 22-32 මෝවබ් දේශයේ වූ කරුණු පිළිබඳ විස්තරය.
පරිච්ඡේද 33 මිසර දේශයේ පටන් මෝවබ් දේශයට පැමිණීම දක්වා වූ ගමනේ විස්තරයේ සාරාංශය.
පරිච්ඡේද 34-36 ජොර්දාන් ගඟනේ එගොඩ වීමට පරෙ උපදසේ.
පාළුකරය ඔස්සේ වූ ඉශ්රායලේවරුන්ගේ ගමන අධික දුක් කරදර සහිත එකක් විය. එබැවින් පාඨකයාට මහෙි හමු වනුයේ බොහෝ විට අධරෛයයට පත්, අවිශ්වාසවන්ත, කැරලිකාර දේව සැලසුම්වලට පිටුපා ගිය ජනතාවකි. මහෙි කැපී පනෙනෙ වැදගත් කරුණු දකෙකි. පළමු වැන්න නම් දවේයන් වහන්සේ සිය ජනතාවගේ දුබලකම හා අකීකරුකම නොතකා, ඔවුන් ඓතිහාසික වන්දනා ගමනකට සූදානම් කරමින්, මහත් සනෙහෙසකින් ඔවුන්ට මඟපනේවීම යි. දවෙැන්න නම් දවේයන් වහන්සේ හා ජනතාව කරෙහෙි, මෝසසේ තුමා දැක්වූ අචල භක්තිය හා ඇදහිල්ල යි.

### පළමු වන ජන ලේඛනය

1 ගණන් 26:1-51 ඉශ්රායලේ ජනයා මිසර
දේශයනේ පිටතට පැමිණි දවෙන අවුරුද්දේ,
දවෙන මාසයේ, පළමු වන දින දී සීනයි පාළුකරයේ
සම්මුඛ මණ්ඩපයේ දී සමිඳාණන් වහන්සේ
මෝසසේට කතා කොට මසෙේ වදාළ සේක: 2 “මුළු
ඉශ්රායලේ ජනතාව අතර සියලු පිරිමින්,
ඔවුනොවුන්ගේ පවුල් අනුව ද, පළෙපත් අනුව ද
වනේ වනේ ව ගණන් කිරීම පිණිස සංගණනයක්
පවත්වන්න. 3 එසේ ගිණිය යුත්තේ අවුරුදු විස්සක්
හා ඊට වඩා වයසැති, යුද්ධ හමුදාවේ සේවාව කළ
හැකි සියලු පිරිමින් ය. නුඹ සහ ආරොන්, ඔවුන්ගේ
සේනාංක අනුව ඔවුන් ගණන් කළ යුතු ය. 4 නුඹට
සහාය දීමට එක් එක් පළෙපතනේ ගෝත්රික
නායකයකු සිටිය යුතු ය. 5 මලෙසෙ නුඹට සහාය
දනේනෝ පහත දැක්වනෙ අය වතේ. එනම්:
රූබන්ගේ ගෝත්රයනේ ෂදෙවෙූර්ගේ පුත් එලිශූර් ය.
6 සිමියොන්ගේ ගෝත්රයනේ ශූරිෂද්දයිගේ පුත්
ෂලෙුමියලේ ය.
7 ජුදාගේ ගෝත්රයනේ අම්මිනාදාබ්ගේ පුත්
නාෂොන් ය.
8 ඉස්සාකර්ගේ ගෝත්රයනේ ශූවර්ගේ පුත්
නතෙනලේ ය.
9 සාබුලොන්ගේ ගෝත්රයනේ හේලොන්ගේ පුත්
එලියාබ් ය.
10 ජෝසපේගේ පුතුන් අතරනේ, එප්රායිම්ගේ
ගෝත්රයනේ අම්මිහුද්ගේ පුත් එලිෂාමා සහ
මනස්සේගේ ගෝත්රයනේ පදොශූර්ගේ පුත්
ගමාලියලේ ය.
11 බනේජමින්ගේ ගෝත්රයනේ ගිදයෙොනිගේ පුත්
අබීදන් ය.
12 දාන්ගේ ගෝත්රයනේ අම්මිෂද්දයිගේ පුත්
අහියේසරේ ය.
13 ආෂරේගේ ගෝත්රයනේ ඔක්රාන්ගේ පුත්
පගියලේ ය.
14 ගාද්ගේ ගෝත්රයනේ දවෙුයලේගේ පුත්
එලියාසාප් ය.
15 නප්තලීගේ ගෝත්රයනේ ඒනාන්ගේ පුත් අහිරා
ය.”
16 මකේ ගෝත්රික නායකයන් වන ඉශ්රායලේ
ජනයාගේ ප්රධානීහු, ජනතාව අතරනේ
තෝරාගන්නා ලදහ.
17 මෝසසේ සහ ආරොන්, නම් කරන ලද මේ
මිනිසුන් කැඳවා, 18 දවෙන මාසයේ පළමු වන දින
මුළු සනෙඟ රැස් කළහ. එවිට අවුරුදු විස්සක් හා ඊට
වඩා වයසැති සියල්ලන් ම තම තමන්ගේ පවුල්
අනුව ද, පළෙපත් අනුව ද ලියාපදිංචි කරන ලදුව,

වනේ වනේ වශයනේ ඔවුන්ගේ නාම, ලේඛනගත
කරන ලදී. 19 මලෙසෙ සමිඳාණන් වහන්සේ
මෝසසේට අණ කළ පරිදි, ඔහු සීනයි පාළුකරයේ දී
ජන සංගණනයක් පැවැත්වී ය.

### සංඛ්‍යා ලේඛන

20 අවුරුදු විස්සක් හා ඊට වඩා වයසැති, යුද්ධ
හමුදාවේ සේවාව කළ හැකි, ජාකොබ්ගේ
වැඩිමහල් පුත් රූබන්ගේ පරපුරට අයත් පිරිමින්ගේ
ගණන, ඔවුන්ගේ පවුල් හා පළෙපත් හැටියට
ලේඛනගත කරන ලදී. 21 ඒ සංඛ්‍යා ලේඛන අනුව
රූබන්ගේ ගෝත්‍රයට අයිති අය හතළිස් හයදාස්
පන්සියයක් වූ හ.
22 අවුරුදු විස්සක් හා ඊට වඩා වයසැති, යුද්ධ
හමුදාවේ සේවාව කළ හැකි, සිමියෝන්ගේ පරපුරට
අයත් පිරිමින්ගේ ගණන ඔවුන්ගේ පවුල් හා
පළෙපත් හැටියට ලේඛනගත කරන ලදී. 23 ඒ
සංඛ්‍යා ලේඛන අනුව ඔවුන්ගේ ගණන පණස්
නවදාස් තුන්සියයක් විය.
24 අවුරුදු විස්සක් හා ඊට වඩා වයසැති, යුද්ධ
හමුදාවේ සේවාව කළ හැකි, ගාද්ගේ පරපුරට
අයත් පිරිමින්ගේ ගණන ඔවුන්ගේ පවුල් හා
පළෙපත් හැටියට ලේඛනගත කරන ලදී. 25 ඒ
සංඛ්‍යා ලේඛන අනුව ඔවුන්ගේ ගණන හතළිස්
පන්දාස් හයසිය පණහක් විය.
26 අවුරුදු විස්සක් හා ඊට වඩා වයසැති, යුද්ධ
හමුදාවේ සේවාව කළ හැකි, ජුදාගේ පරපුරට අයත්
පිරිමින්ගේ ගණන ඔවුන්ගේ පවුල් හා පළෙපත්
හැටියට ලේඛනගත කරන ලදී. 27 ඒ සංඛ්‍යා
ලේඛන අනුව ඔවුන්ගේ ගණන හැත්තෑ හාරදාස්
හයසියයක් විය.
28 අවුරුදු විස්සක් හා ඊට වඩා වයසැති, යුද්ධ
හමුදාවේ සේවාව කළ හැකි, ඉස්සාකර්ගේ පරපුරට
අයත් පිරිමින්ගේ ගණන ඔවුන්ගේ පවුල් හා
පළෙපත් හැටියට ලේඛනගත කරන ලදී. 29 ඒ
සංඛ්‍යා ලේඛන අනුව ඔවුන්ගේ ගණන පණස්
හාරදාස් හාරසියයක් විය.
30 අවුරුදු විස්සක් හා ඊට වඩා වයසැති, යුද්ධ
හමුදාවේ සේවාව කළ හැකි, සාබුලොන්ගේ
පරපුරට අයත් පිරිමින්ගේ ගණන ඔවුන්ගේ පවුල්
හා පළෙපත් හැටියට ලේඛනගත කරන ලදී. 31 ඒ
සංඛ්‍යා ලේඛන අනුව ඔවුන්ගේ ගණන පණස්
හත්දාස් හාරසියයක් විය.
32 අවුරුදු විස්සක් හා ඊට වඩා වයසැති, යුද්ධ
හමුදාවේ සේවාව කළ හැකි, ජෝසපේගේ පුතුන්
අතරනේ එප්‍රායිම්ගේ ගෝත්‍රයට අයත් පිරිමින්ගේ
ගණන ඔවුන්ගේ පවුල් හා පළෙපත් හැටියට
ලේඛනගත කරන ලදී. 33 ඒ සංඛ්‍යා ලේඛන අනුව
ඔවුන්ගේ ගණන හතළිස්දාස් පන්සියයක් විය.
34 අවුරුදු විස්සක් හා ඊට වඩා වයසැති, යුද්ධ
හමුදාවේ සේවාව කළ හැකි, ජෝසපේගේ පුතුන්
අතරනේ මනස්සේගේ ගෝත්‍රයට අයත් පිරිමින්ගේ
ගණන ඔවුන්ගේ පවුල් හා පළෙපත් හැටියට
ලේඛනගත කරන ලදී. 35 ඒ සංඛ්‍යා ලේඛන අනුව
ඔවුන්ගේ ගණන තිස්දදොස් දසියයක් විය.
36 අවුරුදු විස්සක් හා ඊට වඩා වයසැති, යුද්ධ
හමුදාවේ සේවාව කළ හැකි, බනේජමින්ගේ
පරපුරට අයත් පිරිමින්ගේ ගණන ඔවුන්ගේ පවුල්
හා පළෙපත් හැටියට ලේඛනගත කරන ලදී. 37 ඒ
සංඛ්‍යා ලේඛන අනුව ඔවුන්ගේ ගණන තිස් පන්දාස්
හාරසියයක් විය.
38 අවුරුදු විස්සක් හා ඊට වඩා වයසැති, යුද්ධ
හමුදාවේ සේවාව කළ හැකි, දාන්ගේ පරපුරට
අයත් පිරිමින්ගේ ගණන ඔවුන්ගේ පවුල් හා
පළෙපත් හැටියට ලේඛනගත කරන ලදී. 39 ඒ
සංඛ්‍යා ලේඛන අනුව ඔවුන්ගේ ගණන හැට දදොස්
හත්සියයක් විය.
40 අවුරුදු විස්සක් හා ඊට වඩා වයසැති, යුද්ධ
හමුදාවේ සේවාව කළ හැකි, ආෂරේගේ පරපුරට
අයත් පිරිමින්ගේ ගණන ඔවුන්ගේ පවුල් හා
පළෙපත් හැටියට ලේඛනගත කරන ලදී. 41 ඒ
සංඛ්‍යා ලේඛන අනුව ඔවුන්ගේ ගණන හතළිස්
එක්දාස් පන්සියයක් විය.
42 අවුරුදු විස්සක් හා ඊට වඩා වයසැති, යුද්ධ
හමුදාවේ සේවාව කළ හැකි, නප්තලීගේ පරපුරට
අයත් පිරිමින්ගේ ගණන ඔවුන්ගේ පවුල් හා
පළෙපත් හැටියට ලේඛනගත කරන ලදී. 43 ඒ
සංඛ්‍යා ලේඛන අනුව ඔවුන්ගේ ගණන පණස්
තුන්දාස් හාරසියයක් විය.
44 මෝසසේ හා ආරොන් විසින් ද එක එක
පළෙපතට එක් එක්කනො බැගින් නියෝජනය කළ
ඉශ්‍රායලේ සනෙඟගේ නායකයන් දොළොස් දනො
විසින් ද මේ සියලු දනෙ ලියාපදිංචි කරන ලදහ.
45 මසෙේ අවුරුදු විස්සක් හා ඊට වඩා වයසැති,
යුද්ධ හමුදාවේ සේවාව කළ හැකි, මුළු ඉශ්‍රායලේ
ජනයා ඔවුන්ගේ පළෙපත් අනුව ලේඛනගත කරන
ලදුව, 46 ඔවුන්ගේ මුළු සංඛ්‍යාව හයලක්ෂ තුන්දාස්
පන්සිය පණස් දනෙකේ විය.

### ලෙවීවරුන්ගේ යුතුකම්

47 එහතේ, මොවුන් සමඟ ලෙවීවරු තමන්ගේ
පළෙපත් අනුව ලේඛනගත නොකරන ලදහ.
48 මන්ද, සමිඳාණන් වහන්සේ මෝසසේට කතා
කොට මසෙේ වදාරා තිබිණි: 49 “නුඹ ඉශ්‍රායලේ
ජනයා අතරනේ, ලෙවීගේ ගෝත්‍රයේ අය පමණක්
ලියාපදිංචි නොකළ යුතු ය; ඔවුන්ගේ සංගණනය
නොගත යුතු ය. 50 තවද, නුඹ ගිවිසුම් කරඬුව තබා
ඇති මණ්ඩපය ද එහි ඇති සියලු බඩුන් හා භාණ්ඩ
ද පිළිබඳ ව වගකීම ඔවුන්ට බාර දිය යුතු ය.
මණ්ඩපයත්, එහි ඇති බඩුන් සියල්ලත් උසුලාගනෙ
යා යුත්තෝ ඔව්හු ය. ඔවුන් එය තුළ පූජක සේවාව
ඉටු කරමින්, එය වටේට කඳවුරු බැඳිය යුතු ය.
51 මණ්ඩපය වනෙ තැනකට ගනෙ යා යුතු විට, එය
ගැලවිය යුත්තෝ ද වනෙ තැනක එය සවි කළ
යුත්තෝ ද ඔව්හු ය. අන් කිසිවකු ඊට ළං
වුවහොත් ඔහු මරණයට පත් කළ යුතු ය. 52 ඉතිරි

ඉශ්‍රායලේ ජනයා කඳවුර ළඟ කණ්ඩායම් වශයෙන්
එක් එක්කෙනා තම තමන්ගේ ධජය යට තම
තමන්ගේ කූඩාරම් ගැසිය යුතු ය. 53 ඉශ්‍රායලේ
ජනයා මත මාගේ උදහස නොපැමිණෙන පිණිස,
ගිවිසුම් කරඬුව ඇති මණ්ඩපය වටේට ලෙවීවරුන්
තමන්ගේ කූඩාරම් ගැසිය යුතු ය. මෙලෙස ඔවුන්
එය රැකවල් කළ යුතු වේ.” 54 සමිඳාණන් වහන්සේ
මෝසෙස්ට අණ දුන් පරිදි ඉශ්‍රායලේ ජනයා ද
සියල්ල ඉටු කළහ.

### ගෝත්‍ර අනුව කඳවුරු බැඳීම

2 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට හා
ආරොන්ට කතා කොට මෙසේ වදාළ සේක:
2 “ඉශ්‍රායලේ ජනයා අතර සෑම කෙනෙක් ම තම
පිය පෙළපත්හි ලකුණු අනුව, තම ගෝත්‍රයේ ධජය
සමීපයේ තම තමාගේ කූඩාරම ගැසිය යුතු වේ.
එහෙත්, ඒවා ගැසිය යුත්තේ සම්මුඛ මණ්ඩපය
ඉදිරියේ වටකරමින් ය.
3 පෙරදිග, ඉර උදා වන පැත්තේ ජුදාගේ කඳවුරේ
ධජයට අයත් සියල්ලන් කණ්ඩායම් වශයෙන්
කූඩාරම් ගැසිය යුතු ය. ජුදාගේ ගෝත්‍රයට අයිති
වූවන්ගේ අධිපතියා අම්මිනාදාබ්ගේ පුත් නාෂොන්
වනු ඇත. 4 ලියාපදිංචි කරන ලද ඔහුගේ හමුදාව ද
හැත්තෑ හාරදාස් හයසියයක් වනු ඇත.
5 ඊට යාබද ව ඉස්සාකර්ගේ ගෝත්‍රයට අයිති
වූවන් කූඩාරම් ගැසිය යුතු ය. ඔවුන්ගේ ප්‍රධානියා
ශූවර්ගේ පුත් නතනෙල් වනු ඇත. 6 ලියාපදිංචි
කළ ඔහුගේ හමුදාව පණස් හතරදාස් හාරසියයක්
වනු ඇත.
7 ඊළඟට සාබුලොන්ගේ ගෝත්‍රය විය යුතු ය.
එහි ප්‍රධානියා හේලොන්ගේ පුත් එලියාබ් වනු
ඇත. 8 ලියාපදිංචි කළ ඔහුගේ හමුදාව පණස්
හත්දාස් හාරසියයක් වනු ඇත.
9 ජුදාගේ කඳවුරේ මෙලෙස ලියාපදිංචි කළ
අයගේ මුළු ගණන එක්ලක්ෂ අසූහයදාස්
හාරසියයක් වේ. මොවුන් පළමුවෙනේ පිටත් ව යා
යුතු ය.
10 දකුණු දිශාවට රූබන්ගේ කඳවුරේ ධජයට අයිති
සියල්ලන් කණ්ඩායම් වශයෙන් කූඩාරම් ගැසිය යුතු
ය. තවද, මොහුගේ ගෝත්‍රයට අයිති වූවන්ගේ
ප්‍රධානියා ෂෙදෙයුර්ගේ පුත් එලිශූර් වනු ඇත.
11 ලියාපදිංචි කළ ඔහුගේ හමුදාව හතළිස් හයදාස්
පන්සියයක් වේ.
12 ඊට යාබද ව සිමියොන්ගේ ගෝත්‍රයට අයිති
වූවන් කූඩාරම් ගැසිය යුතු ය. මොවුන්ගේ
ප්‍රධානියා ශුරිෂද්දයිගේ පුත් ෂෙලුමියෙල් වනු ඇත.
13 ලියාපදිංචි කළ ඔහුගේ හමුදාව පණස් නවදාස්
තුන්සියයක් වේ.
14 ඊළඟට ගාද්ගේ ගෝත්‍රය විය යුතු ය.
මොවුන්ගේ ප්‍රධානියා රෙවුයෙල්ගේ පුත් එලියාසාප්
වනු ඇත. 15 ලියාපදිංචි කළ ඔහුගේ හමුදාව
හතළිස් පන්දාස් හයසිය පණහක් වේ.
16 මෙලෙස රූබන්ගේ කඳවුරේ ලියාපදිංචි කළ
අයගේ මුළු ගණන එක්ලක්ෂ පණස් එක්දාස්
හාරසිය පණහක් වේ. මොවුන් දෙවෙනු ව පිටත් ව
යා යුතු ය.
17 ඉන්පසු කඳවුර මැද සිටින ලෙවීවරුන්ගේ
හමුදාව සම්මුඛ මණ්ඩපය උසුලාගෙන ඉදිරියට යා
යුතු වේ. ඔවුන් ඉදිරියට යා යුත්තේ, කඳවුරු
බැඳගෙන තිබෙන පිළිවෙළට සෑම කෙනෙකු ම තම
තමාගේ ගෝත්‍රික ධජය සමීපයෙන් ය.
18 බටහිර දිශාවට එප්‍රායිම්ගේ කඳවුරේ ධජයට
අයත් සියල්ලන් කණ්ඩායම් වශයෙන් කූඩාරම් ගැසිය
යුතු ය. තවද, මොහුගේ ගෝත්‍රයට අයිති
වූවන්ගේ ප්‍රධානියා අම්මිහුද්ගේ පුත් එලිෂාමා වනු
ඇත. 19 ලියාපදිංචි කළ ඔහුගේ හමුදාව හතළිස්දාස්
පන්සියයක් වේ.
20 ඊට යාබද ව මනස්සේගේ ගෝත්‍රය විය යුතු
ය. මොවුන්ගේ ප්‍රධානියා පෙදොශූර්ගේ පුත්
ගමාලියෙල් වනු ඇත. 21 ලියාපදිංචි කළ මොහුගේ
හමුදාව තිස්දෙදාස් දෙසියයක් වේ.
22 ඊළඟට බෙන්ජමින්ගේ ගෝත්‍රය විය යුතු ය.
මොවුන්ගේ ප්‍රධානියා ගිදයෝනිගේ පුත් අබීදාන්
වනු ඇත. 23 ලියාපදිංචි කළ ඔහුගේ හමුදාව
තිස්පන්දාස් හාරසියයක් වේ.
24 මෙලෙස එප්‍රායිම්ගේ කඳවුරේ ලියාපදිංචි කළ
අයගේ මුළු ගණන එක්ලක්ෂ අටදාස් එකසියයක්
වේ. මොවුන් තුන්වනු ව පිටත් ව යා යුතු ය.
25 උතුරු දිශාවට දාන්ගේ කඳවුරේ ධජයට අයත්
සියල්ලන් කණ්ඩායම් වශයෙන් කූඩාරම් ගැසිය යුතු
ය. තවද, මොහුගේ ගෝත්‍රයට අයිති වූවන්ගේ
ප්‍රධානියා අම්මිෂද්දයිගේ පුත් අහියේසෙර් වනු
ඇත. 26 ලියාපදිංචි කළ ඔහුගේ හමුදාව හැට දෙදාස්
හත්සියයක් වේ.
27 ඊට යාබද ව ආෂෙර්ගේ ගෝත්‍රයට අයිති
වූවන් කූඩාරම් ගැසිය යුතු ය. මොවුන්ගේ
ප්‍රධානියා ඔක්රාන්ගේ පුත් පගියෙල් වනු ඇත.
28 ලියාපදිංචි කළ ඔහුගේ හමුදාව හතළිස් එක්දාස්
පන්සියයක් වේ.
29 ඊළඟට නප්තලීගේ ගෝත්‍රය විය යුතු ය.
මොවුන්ගේ ප්‍රධානියා ඒනාන්ගේ පුත් අහිරා වනු
ඇත. 30 ලියාපදිංචි කළ ඔහුගේ හමුදාව පණස්
තුන්දාස් හාරසියයක් වේ.
31 මෙලෙස දාන්ගේ කඳවුරේ ලියාපදිංචි කළ
අයගේ මුළු ගණන එක්ලක්ෂ පණස් හත්දාස්
හයසියයක් වේ. මොවුන් තම තමන්ගේ ධජ අනුව
අන්තිමට පිටත් ව යා යුතු ය.”
32 මෙලෙස කඳවුරුවලට අයත් සේනාංක සියල්ලේ
ම, පිය පෙළපත් අනුව ලියාපදිංචි කළ ඉශ්‍රායලේ
ජනයාගේ මුළු ගණන හයලක්ෂ තුන්දාස් පන්සිය
පණහක් විය. 33 එහෙත්, සමිඳාණන් වහන්සේ
මෝසෙස්ට අණ කළ ප්‍රකාර ඉශ්‍රායලේ ජනයා
අතර ලෙවීවරු ලියාපදිංචි නොකරන ලදහ.
34 උන් වහන්සේ මෝසෙස්ට අණ කළ සියල්ල
අනුව ඉශ්‍රායලේ ජනයා ද ඉටු කළහ. මෙලෙස
ඔව්හු තම පිය පෙළපත් අනුව, තම සේනාංකයේ

ධජය සමීපයෙහි කූඩාරම් ගසාගත්හ; ඒ පිළිවෙළෙට ම
නික්ම ගියහ.

## ආරොන්ගේ පූජක පෙළපත

3 සමිඳාණන් වහන්සේ සීනයි කන්ද මත
මෝසෙස් සමඟ කතා කළ කාලයේ දී, ඔහුගේ
සහ ආරොන්ගේ පවුල්වලට අයත් අය මොවුහු වූ
හ. 2 ගණන් 26:60ආරොන්ගේ පුත්‍රයන්ගේ නාම
වනාහි ඔහුගේ කුලුඳුලා වූ නාදාබ් සහ අබීහු,
එලෙයාසර් සහ ඊතාමාර් ය. 3 පූජක නිලයේ
සමිඳාණන් වහන්සේගේ සේවාවට කැප කරන
පිණිස ආරොන් ආලේප කළ ඔහුගේ පුත්‍රයෝ
මොවුහු වූ හ. 4 ලෙවී 10:1-2; ගණන් 26:61සීනයි
පාළුකරයේ දී නාදාබ් සහ අබීහු සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි අනියම් ගිනි ඔප්පු කළ විට
ඔව්හු මළහ. ඔවුන්ට දරුවෝ ද නො වූ හ. එබැවින්
එලෙයාසර් සහ ඊතාමාර්, තම පියා වන ආරොන්ගේ
ජීවිත කාලයේ දී පූජක නිලයේ සේවා ඉටු කළහ.

## ලෙවීවරුන්ගේ යුතුකම්

5 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට,
6 "ලෙවීගේ ගෝත්‍රයට අයිති වූවන්
කැඳවාගෙනවුත්, පූජක ආරොන්ට සේවය කරන
පිණිස ඔවුන් පත් කරන්න. 7 මණ්ඩපයේ
සේවාවන්ට අදාළ ව, සම්මුඛ මණ්ඩපය ඉදිරිපිට
ආරොන් සහ මුළු ජනතාව පිළිබඳ වගකීම් ඔවුන්
බාරගත යුතු ය. 8 ඔවුන් සම්මුඛ මණ්ඩපයට අයත්
බඩු භාණ්ඩ භාරගෙන, මණ්ඩපයේ සේවාවන්
පිළිබඳ ව ඉශ්‍රායෙලේ ජනයාගේ වගකීම් ඉටු කළ
යුතු ය. 9 නුඹ ලෙවීවරුන් ආරොන්ට සහ ඔහුගේ
පුත්‍රයන් හට කැප කොට භාර දිය යුතු ය. මෙසේ
ඉශ්‍රායෙලේ ජනයා අතරෙන් ඔවුන් භාර දෙනු ඇත.
10 එහෙත්, නුඹ ආරොන් සහ ඔහුගේ පුත්‍රයන්
පූජක නිලයේ සේවාවන් ඉටු කිරීම පිණිස පත් කළ
යුතු ය. අන් කිසිවකු ළං වුවහොත් ඔහු මරණයට
පත් කරනු ලැබේ ය"යි වදාළ සේක.
11 යළි සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කරමින්, 12 "මම ඉශ්‍රායෙලේ ජනයාගේ මවු
කුසයෙන් බිහි වන සියලු ම කුලුඳුලන් වෙනුවට
ඉශ්‍රායෙලේ ජනයා අතරෙන් ලෙවීවරුන් තෝරාගතිමි.
ඔවුන් මාගේ වනු ඇත. 13 නික්ම 13:2මන්ද, සියලු
කුලුඳුලෝ මට අයිති ය. මිසර දේශයේ සියලු
කුලුඳුලන් මැරූ දිනයේ දී, මම ඉශ්‍රායෙලේ ජනයා
අතර කුලුඳුල් දරුවන් හා කුලුඳුල් සතුන් මට ම කැප
කොටගතිමි. ඔවුන් මට අයිති වනු ඇත. මම
සමිඳාණන් වහන්සේ වෙමි"යි වදාළ සේක.

## ලෙවීවරුන්ගේ සංගණනය

14 නැවතත් සමිඳාණන් වහන්සේ සීනයි
පාළුකරයේ දී මෝසෙස්ට කතා කොට, 15 "ලෙවීගේ
ගෝත්‍රයට අයත්, මාසයක් හා ඊට වඩා වයසැති
සියලු පිරිමින් ඔවුන්ගේ පිය පෙළපත් හා පවුල්
අනුව ලියාපදිංචි කරන්නැ"යි වදාළ සේක.
16 මෝසෙස් ද උන් වහන්සේ අණ කළ පරිදි එය
ඉටු කෙළේ ය. 17 ලෙවීගේ පුත්‍රයෝ නම්
ගේර්ෂොන්, කොහාත් සහ මෙරාරී ය. 18 පවුල්
වශයෙන් ගේර්ෂොන්ගේ පුත්‍රයෝ නම් ලිබ්නි සහ
ෂිමෙයි ය. 19 පවුල් වශයෙන් කොහාත්ගේ පුත්‍රයෝ
නම් අම්රාම්, ඉශ්හාර්, හෙබ්රොන් සහ උස්සියෙල් ය.
20 පවුල් වශයෙන් මෙරාරීගේ පුත්‍රයෝ නම් මාලී
සහ මුෂී ය. තම පිය පෙළපත් අනුව ලෙවීවරුන්ගේ
පවුල් මේවා ය.
21 ගේර්ෂොන්ගේ පවුල්වලට අයිති වූවෝ
ලිබ්නිගේ සහ ෂිමෙයිගේ පවුල්වල අය වෙති.
22 ඔවුන් අතර ලියාපදිංචි කරන ලද, මාසයක් හා
ඊට වඩා වයසැති පිරිමින්ගේ මුළු ගණන හත්දාස්
පන්සියයක් විය. 23 මොවුන් මණ්ඩපයෙන් බටහිර
දිශාවට තමන්ගේ කූඩාරම් ගැසිය යුතු වේ.
24 තවද, මොවුන්ගේ ප්‍රධානියා, ලායෙලේගේ පුත්
එලියාසාප් ය. 25 මොවුන්ට සම්මුඛ මණ්ඩපයේ
පහත දක්වෙන කොටස් භාර විය. එනම්, මළුවේ තිර
ද, මණ්ඩපය ද, එහි වැස්ම ද කඩතුරාව ද 26 මළුවේ
තිර ද මණ්ඩපයට සම්බන්ධ පූජාසනය වටේට වූ
මළුවේ දොරටු දැමූ තිරය ද මේවා සම්බන්ධ සියලු
සේවාවන්ට අවශ්‍ය ලණු ද වේ.
27 කොහාත්ගේ පවුල්වලට අයිති වූවෝ නම්
අම්රාම්, ඉශ්හාර්, හෙබ්රොන් සහ උස්සියෙල්ගේ
පවුල්වල අය වෙති. 28 ඔවුන් අතර ලියාපදිංචි කළ,
මාසයක් හා ඊට වඩා වයසැති පිරිමින්ගේ මුළු
එකතුව අටදාස් හයසියයක් වේ. මොවුහු
ශුද්ධස්ථානයේ සේවය භාරගන්නෝ ය. 29 මොවුන්
මණ්ඩපයෙන් දකුණු දිශාවට තමන්ගේ කූඩාරම්
ගැසිය යුතු ය. 30 තවද, මොවුන්ගේ ප්‍රධානියා
උස්සියෙල්ගේ පුත් එලිශාපාන් ය. 31 මොවුන් හට
පහත දක්වෙන ඒවා භාර විය යුතු ය. එනම්, ගිවිසුම්
කරඬුව සහ මේසය ද, පහන් රුක ද පූජාසනය සහ
සේවාවට ගන්නා ශුද්ධස්ථානයේ සියලු බඩු භාණ්ඩ
ද, කඩතුරාව සහ මේවා සම්බන්ධ සේවාවන්
සියල්ල ද වේ.
32 පූජක ආරොන්ගේ පුත් එලෙයාසර්,
ලෙවීවරුන්ගේ ප්‍රධානියා වේ. ශුද්ධස්ථානයේ
සේවාවන් ඉටු කරන්නන් පිළිබඳ වගකීම ඔහු සතු
ය.
33 මෙරාරීගේ පවුල්වලට අයත් වූවෝ නම්, මාලී
සහ මුෂීගේ පවුල්වල අය වෙති. 34 ඔවුන් අතර
ලියාපදිංචි කළ මාසයක් හා ඊට වඩා වයසැති
පිරිමින්ගේ මුළු ගණන හයදාස් දෙසියයකි. 35 තවද,
මොවුන්ගේ ප්‍රධානියා අබීහයිල්ගේ පුත් ශුරියෙල්
ය. මොවුන් මණ්ඩපයෙන් උතුරු දිශාවට තමන්ගේ
කූඩාරම් ගැසිය යුතු ය. 36 මොවුන් හට පැවරෙන
වගකීම පහත දක්වෙන ඒවා පිළිබඳ ව ය. එනම්,
මණ්ඩපයේ ලෑලි ද හරස් පොලු ද කණු ද තවු ද
එහි සියලු භාණ්ඩ සහ මේවා සම්බන්ධ සේවාවන්ට
ගන්න සියල්ල ද 37 මළුව වටේට ඇති කණු ද
ඒවායේ තවු ද ඇබ සහ ලණු ද වේ.

38 මණ්ඩපයේ ඉදිරිපිට සිට එහි පෙරදිගට එනම්,
සම්මුඛ මණ්ඩපයෙනේ නැගෙනහිර අංශයට කූඩාරම්
ගැසිය යුත්තෝ නම් මෝසෙස්, ආරොන් සහ ඔහුගේ
පුත්‍රයෝ වෙති. මොවුන් ඉශ්‍රායෙලේ ජනයා උදෙසා
ශුද්ධස්ථානයේ පවත්වන මෙහෙයෙන් පිළිබඳ
වගකීම දැරිය යුතු ය. අන් කිසිවකු ළඟා වුවහොත්
ඔහු මරණයට පත් කරනු ලැබේ. 39 මෙලෙස
සමිඳාණන් වහන්සේ අණ කළ පරිදි මෝසෙස් සහ
ආරොන් විසින් ලියාපදිංචි කරන ලද, ලෙවීවරුන්ගේ
පවුල්වලට අයත්, මාසයක් හා ඊට වඩා වයසැති
සියලු පිරිමින්ගේ මුළු ගණන විසි දෙදහසක් විය.

## කුලුඳුල් දරුවන්ගේ සංගණනය

40 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට,
“ඉශ්‍රායෙලේ ජනයා අතරෙනේ මාසයකට හා ඊට වඩා
වයසැති සියලු කුලුඳුල් දරුවන්ගේ නම් අනුව ඔවුන්
ලියාපදිංචි කරන්න. 41 මම සමිඳාණන් වහන්සේ
වෙමි. ඉශ්‍රායෙලේ ජනයා අතර සියලු කුලුඳුලන්
වෙනුවට ලෙවීවරුන් පමණක් මට වෙන් කරන්න.
තවද, ඉශ්‍රායෙලේ ජනයාගේ සියලු කුලුඳුල් ගවයන්
වෙනුවට, ලෙවීවරුන්ගේ ගවයන් මට වෙන්
කරන්නැ”යි වදාළ සේක. 42 මෝසෙස් ද සමිඳාණන්
වහන්සේ අණ කළ පරිදි ඉශ්‍රායෙලේ ජනයා අතර
සියලු කුලුඳුලන් ලියාපදිංචි කළේ ය. 43 මෙලෙස
මාසයක් හා ඊට වඩා වයසැති වෙන් වෙන් ව
ලියාපදිංචි කරන ලද අයගේ මුළු එකතුව විසි දෙදොස්
දසිය හැත්තෑතුනක් විය.
44 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට,
45 “ඉශ්‍රායෙලේ ජනයා අතර සිටින සියලු කුලුඳුලන්
වෙනුවට, ලෙවීවරුන්ගේ කුලුඳුලන් ද, ඉශ්‍රායෙලේ
ජනයාගේ ගවයන් වෙනුවට ලෙවීවරුන්ගේ ගවයන් ද
මට වෙන් කරන්න. ලෙවීවරුන් මගේ වනු ඇත. මම
සමිඳාණන් වහන්සේ වෙමි. 46 ලෙවීවරුන්ගේ
කුලුඳුලන් සංඛ්‍යාවට වඩා වැඩි වූ
ඉශ්‍රායෙල්වරුන්ගේ කුලුඳුලන් දෙසිය හැත්තෑතුන්
දෙනා මුදාගැනීම පිණිස 47 නුඹ ලියාපදිංචි කළ ඒ
එක් එක්කෙනා වෙනුවට ශුද්ධස්ථානයේ සම්මත රිදී
කාසි මිල අනුව රිදී කාසි පහ බැගින් අය කළ යුතු
ය. රිදී කාසි එකක් ගේරා විස්සකට සමාන වේ.
48 තවද, නුඹ මෙලෙස වැඩිපුර සිටි අය මුදාගැනීමට
ආපසු ගෙවූ මුදල, ආරොන් සහ ඔහුගේ පුත්‍රයන්ට
දිය යුතු ය”යි වදාළ සේක. 49 මෝසෙස් ද
ලෙවීවරුන්ට වඩා ඉශ්‍රායෙලේ ජනයා අතර සිටි
කුලුඳුලන් ආපසු මුදාගැනීමට ගෙවූ මුදල ගත්තේ ය.
50 ශුද්ධස්ථානයේ සම්මත මිල අනුව, ගෙවූ මුදල රිදී
කාසි එක්දාස් තුන්සිය හැටපහක් විය. 51 සමිඳාණන්
වහන්සේ ඔහුට අණ කළ පරිදි, ඔහු එය ඉටු
කරමින් මුදාගැනීමට ගෙවූ මුදල ආරොන්ට සහ
ඔහුගේ පුත්‍රයන්ට දුන්නේ ය.

## කොහාත් ගෝත්‍රිකයන්ගේ යුතුකම්

4 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට සහ
ආරොන්ට කතා කොට මෙසේ වදාළ සේක:
2 “ලෙවීගේ පුතුන් අතරෙනේ කොහාත්ගේ පරපුරට
පැවතෙන්නන්ගේ පවුල් හා පිය පෙළෙපත් අනුව
සංගණනයක් ගන්න. 3 අවුරුදු තිහේ සිට පණහ
දක්වා වයසැති, හමුදාවේ සේවය කළ හැකි
සියල්ලන් සම්මුඛ මණ්ඩපයේ සේවය සඳහා
ලියාපදිංචි කරන්න. 4 සම්මුඛ මණ්ඩපය තුළ
මොවුන්ගේ සේවය නම්, එහි ඇති ශුද්ධ බඩු
භාණ්ඩ ගැන වගකීම ය.
5 “කඳවුරේ කූඩාරම් ගලවා ඉදිරියට යා යුතු
අවස්ථාව පැමිණි විට, ආරොන් සහ ඔහුගේ
පුත්‍රයන් විත් ගිවිසුම් කරඬුව ඉදිරිපිට ඇති තිරය
ගලවා, එයින් ගිවිසුම් කරඬුව වැසිය යුතු ය.
6 ඉන්පසු පදම් කළ සම් ආවරණය එය මත දමා,
මේ සියල්ල මත නිල් පාට රෙද්දක් ඇතිරිය යුතු ය.
මෙසේ කළ පසු එය උසුලාගෙන යන හරස් පොලු
ඊට දැමිය යුතු වේ.
7 “ඉන්පසු පිදුම් රොටි තබන මේසය මත නිල්වන්
රෙද්දක් අතුරා, ඒ පිට තැටි ද ධූම පාත්‍ර ද පිදීමේ
පාත්‍ර ද කෙණ්ඩි ද තැබිය යුතු ය. රොටි ද
නිරන්තරයෙනේ ඒ මත තිබෙන්නට හැරිය යුතු ය.
8 පසුව මේවා පිට දම් පාට රෙද්දක් අතුරා, පදම්
කළ සම් ආවරණයකින් ඒ සියල්ල වැසිය යුතු ය.
මෙසේ කළ පසු මෙය උසුලාගෙන යෑමට හරස්
පොලු දැමිය යුතු වේ.
9 “තවද, ඔවුන් නිල්වන් රෙදි කඩක් ගෙන, පහන්
රුක ද එහි සේවාවන්ට ගන්නා පහන් ද කතුරු ද
ඒවායේ තැටි ද තලේ බඳුන් ද වැසිය යුතු ය.
10 මෙසේ කළ පසු පදම් කළ සම් ආවරණයකින් ඒ
සියල්ල ඔතා මැස්ස පිට තැබිය යුතු වේ.
11 “ඉන්පසු රන් පූජාසනය මත නිල්වන් රෙදි කඩක්
අතුරා, පදම් කළ සම් ආවරණයකින් එය වසා,
උසුලාගෙන යන හරස් පොලු එහි දැමිය යුතු ය.
12 තවද, ශුද්ධස්ථානයේ සේවාවට භාවිත කෙරෙන
බඳුන් සියල්ල ගෙන, ඒවා නිල්වන් රෙදි කඩකින්
ඔතා, පදම් කළ සම් ආවරණයක් එය මත අතුරා,
මේ සියල්ල මැස්ස උඩ තැබිය යුතු ය.
13 පූජාසනයේ අළු ඉවත් කොට, එය මත දම් පාට
රෙදි කඩක් ඇතිරිය යුතු ය. 14 ඉන්පසු පූජාසනයේ
මෙහෙයට භාවිත කරන සියලු ම භාණ්ඩ වන ධූම
පාත්‍ර ද මස් කොකු ද හැඳි ද තලි ද එය මත තබා,
පදම් කළ සම් ආවරණයක් මේ සියල්ල පිට ඇතිරිය
යුතු ය. මෙසේ කළ පසු එය උසුලාගෙන යෑමට
හරස් පොලු එහි දැමිය යුතු වේ.
15 “මෙලෙස කඳවුර ගලවා ඉදිරියට යන
අවස්ථාවක, ආරොන් සහ ඔහුගේ පුතුන්
ශුද්ධස්ථානය හා එහි සියලු බඩු භාණ්ඩ වසා නිම
කළ පසු කොහාත්ගේ දරුපරපුර පැමිණ එය
උසුලාගෙන යා යුතු ය. එහෙත්, ඔවුන් ශුද්ධ වූ කිසි
ම භාණ්ඩයකට අත නොතැබිය යුතු ය. එසේ

කළොත් ඔවුන් මිය යනු ඇත. සම්මුඛ මණ්ඩපය
පිළිබඳ කොහාත්ගේ දරුපරපුරට පැවරෙන වගකීම
මෙය වේ.
16 “පූජක ආරොන්ගේ පුත්‍ර එලෙයාසර්ට පැවරෙන
වගකීම පහනට උවමනා තෙල් ද සුවඳ ද්‍රව්‍ය ද
දිනපතා පුදන ධාන්‍ය පූජාව සහ ආලේප තෛලය ද
බලාගැනීමත්, කූඩාරම මුළුමනින් ම ද ශුද්ධස්ථානයේ
ඇති සියල්ල හා එහි බඩු භාණ්ඩ ද බලාගැනීමත්
වනු ඇත.”
17 නැවතත් සමිඳාණන් වහන්සේ මෝසෙස්ට හා
ආරොන්ට කතා කොට, 18 “ලෙවීවරුන් අතරෙන්
කොහාත්ගේ ගෝත්‍රයේ දරුපරපුර පහ
නොකරන්න. 19 ඔවුන් අතිශුද්ධ බඩු භාණ්ඩවලට
ළඟා වන විට නොමැරී, ජීවත් වනු පිණිස ඔවුන්
ගැන කලින් කී පරිදි ක්‍රියා කරන්න. ආරොන් හා
ඔහුගේ පුත්‍රයන් ඇතුළු වී, කොහාත්ගේ
ගෝත්‍රයේ සෑම කෙනෙකුට ම පැවරෙන සේවාව
හා වගකීමට ඔවුන් පත් කළ යුතු ය. 20 එහෙත්,
ඔවුන් මොහොතකට වත් අතිශුද්ධ බඩු භාණ්ඩ
බැලීමට ඇතුළු නොවිය යුතු ය. එසේ බැලුවොත්
ඔවුන් මැරෙනු ඇතැ”යි වදාළ සේක.

## ගේර්ෂොන් ගෝත්‍රිකයන්ගේ යුතුකම්

21 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට
මෙසේ වදාළ සේක: 22 “ගේර්ෂොන්ගේ දරුපරපුරේ
සංගණනය ඔහුගේ පිය පෙළපත් සහ පවුල් අනුව
පවත්වන්න. 23 අවුරුදු තිහේ සිට පණහ දක්වා
වයසැති, හමුදාවේ සේවය කළ හැකි සියල්ලන්
සම්මුඛ මණ්ඩපයේ සේවය සඳහා ලියාපදිංචි
කරන්න. 24 මොවුන්ගේ සේවාව සහ වගකීම පහත
දක්වන ඒවා පිළිබඳ ව ය. 25 ඔවුන් මණ්ඩපයේ තිර
ද, තිරයෙන් ආවරණය වූ සම්මුඛ මණ්ඩපය ද, එහි
අභ්‍යන්තර ආවරණය ද, ඒ මත අතුරා ඇති පදම්
කළ සම් ආවරණය ද, සම්මුඛ මණ්ඩපයේ
දොරටුවේ කඩතුරාව ද, 26 මළුවේ තිර ද, මණ්ඩපය
සහ පූජාසනය වටේට ඇති මළුවේ දොරටුවට
යොදා තිබෙන කඩතුරාව ද, ඒවායේ ලණු ද,
ඒවායේ මෙහෙයට භාවිත කරන සියලු බඩු භාණ්ඩ
සහ අනිකුත් සියල්ල ද උසුලාගෙන යා යුතු ය.
27 ගේර්ෂොන්ගේ දරුපරපුරට පැවරෙන සේවාව
සහ වගකීම්, ආරොන් සහ ඔහුගේ පුත්‍රයන්
ඔවුන්ට භාර දෙන ලෙස ඉටු විය යුතු ය. එබැවින්
නුඹ ද ඔවුන්ට ඔවුන්ගේ වගකීම පැවරිය යුතු වේ.
28 ගේර්ෂොන්ගේ දරුපරපුරට සම්මුඛ මණ්ඩපය
පිළිබඳ ව පැවරෙන වගකීම ඉහත දැක්වෙන ඒවා ය.
තවද, පූජක ආරොන්ගේ පුත් ඊතාමාර් යටතේ
ඔවුන් ඒ වගකීම් ක්‍රියාත්මක කළ යුතු වේ.”

## මෙරොරී ගෝත්‍රිකයන්ගේ යුතුකම්

29 “නුඹ මෙරොරී දරුපරපුර ද ඔවුන්ගේ පවුල්, පිය
පෙළපත් අනුව ලියාපදිංචි කළ යුතු ය. 30 මෙලෙස
අවුරුදු තිහේ සිට පණහ දක්වා වයසැති, හමුදාවේ
සේවය කළ හැකි සියල්ලන් සම්මුඛ මණ්ඩපයේ
සේවය සඳහා ලියාපදිංචි කළ යුතු වේ. 31 සම්මුඛ
මණ්ඩපය පිළිබඳ ව මොවුන්ට පැවරෙන වගකීම්
පහත දක්වන ඒවා වනු ඇත. මොවුන් මණ්ඩපයේ
ලෑලි ද හරස් ලී ද කණු ද තවු ද 32 වටේට ඇති
මළුවේ කණු ද ඒවායේ තවු ද ඇබ ද ලණු ද සියලු
මෙහෙයයන්ට භාවිත කරන බඩු භාණ්ඩ සියල්ල ද
උසුලාගෙන යා යුතු ය. තවද, එක් එක්කෙනා
උසුලාගෙන යා යුතු බඩු භාණ්ඩ, නම් වශයෙන් වෙන්
කොට ඔවුන්ට භාර දිය යුතු වේ. 33 සම්මුඛ
මණ්ඩපයේ බඩු භාණ්ඩ පිළිබඳ මෙරොරීගේ
දරුපරපුරට පැවරෙන වගකීම් ඉහත දක්වන ලදී. මේ
සියල්ල ඔවුන් ඉටු කළ යුත්තේ පූජක ආරොන්ගේ
පුත් ඊතාමාර් යටතේ ය.”

## ලෙවීවරුන්ගේ සංගණනය

34 ඉන්පසු මෝසෙස්, ආරොන් සහ ප්‍රජා
මූලිකයෝ, කොහාත්ගේ දරුපරපුර ඔවුන්ගේ පවුල්
සහ පිය පෙළපත් අනුව ලියාපදිංචි කළහ. 35 සම්මුඛ
මණ්ඩපයේ සේවය සඳහා මෙසේ ලියාපදිංචි කරන
ලද්දෝ අවුරුදු තිහේ සිට පණහ දක්වා වයසැති,
හමුදාවේ සේවයට බැඳිය යුතු ඇත්තෝ ය. 36 පවුල්
අනුව මොවුන්ගේ මුළු ගණන දෙදාස් හත්සිය
පණහක් විය. 37 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට
දුන් අණ පරිදි, ඔහු සහ ආරොන් විසින්, සම්මුඛ
මණ්ඩපයේ සේවාව සඳහා කොහාත්ගේ දරුපරපුර
ලියාපදිංචි කරන ලදී. 38 තවද, ඔවුන්ගේ පවුල් සහ
පිය පෙළපත් අනුව, ගේර්ෂොන්ගේ දරුපරපුරට
අයත් 39 අවුරුදු තිහේ සිට පණහ දක්වා වයසැති,
හමුදාවේ සේවයට සුදුස්සෝ සම්මුඛ මණ්ඩපය තුළ
සේවාව සඳහා ලියාපදිංචි කරන ලදහ. 40 මේ
අයගේ මුළු ගණන දෙදාස් හයසිය තිහක් විය.
41 මෙලෙස සමිඳාණන් වහන්සේගේ අණ පරිදි
මෝසෙස් සහ ආරොන් විසින් ලියාපදිංචි කරන ලද
අය මොවුහු වූ හ.
42 පවුල් හා පිය පෙළපත් අනුව මෙරොරීගේ
දරුපරපුරේ අය ද ලියාපදිංචි කරන ලදහ. 43 අවුරුදු
තිහේ සිට පණහ දක්වා, හමුදාවේ සේවයට සුදුසු,
සම්මුඛ මණ්ඩපය තුළ සේවය සඳහා 44 මෙලෙස
ලියාපදිංචි කළ අයගේ මුළු ගණන තුන්දාස්
දෙසියයක් විය. 45 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට
අණ දුන් පරිදි, ඔහු සහ ආරොන් විසින් සම්මුඛ
මණ්ඩපයේ සේවය සඳහා මෙරොරීගේ දරුපරපුර
මෙසේ ලියාපදිංචි කරන ලදී.
46 මෙලෙස ලෙවීවරුන් සියලු දෙන ම පවුල් හා පිය
පෙළපත් අනුව, මෝසෙස්, ආරොන් සහ ඉශ්රායෙල්හි
ප්‍රජා මූලිකයන් විසින් ලියාපදිංචි කරන ලදහ.
47 අවුරුදු තිහේ සිට පණහ දක්වා වයසැති,
හමුදාවේ සේවයට සුදුසු අයට සම්මුඛ මණ්ඩපය
තුළ සේවාවේ වගකීම පැවරිය හැකි ය. 48 මේ
සියල්ලන්ගේ මුළු එකතුව අටදාස් පන්සිය අසූවක්
විය. 49 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අණ දුන්
පරිදි, සේවාව සහ වගකීම ඔවුන්ට පැවරීම පිණිස
ඔව්හු ගණන් කරන ලදහ. මෙසේ සමිඳාණන්

වහන්සේ මෝසෙස්ට අණ කළ පරිදි ඔව්හු
ලියාපදිංචි කරන ලදහ.

## අපවිත්‍ර වූවන් බැහැර කිරීම

5 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට,
2 "බෝවෙන සෑම චර්ම රෝගයක් ඇති සෑම
කෙනෙකු ම, ධාතු මෝචනය ඇති සෑම කෙනෙකු ම,
මෘත ශරීරයක් නිසා කෙලෙසුණ සෑම කෙනෙකු ම
කඳවුරින් පිටතට දැමිය යුතු ය කියා ඉශ්‍රායෙලේ
ජනයාට අණ කරන්න. 3 මා වාසය කරන කඳවුර
නොකෙලෙසන පිණිස මෙවන්නක් ඇති ස්ත්‍රී-පුරුෂ
දෙපක්ෂය ම කඳවුරින් පිටතට දැමිය යුතු ය"යි වදාළ
සේක. 4 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අණ කළ
පරිදි ඉශ්‍රායෙලේ ජනයා ද එලෙසෙ ඉටු කරමින්
එවැන්නන් කඳවුරින් පිටතට නෙරපාදැමූ හ.

## වන්දි ගෙවීම

5 ලෙවී 6:1-7 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට
කතා කොට, 6 "ඉශ්‍රායෙලේ ජනයාට මෙසේ කියන්න:
'සමිඳාණන් වහන්සේ කෙරෙහි විශ්වාසය කඩ කරන
යම් පාපයක්, යම් කිසි ස්ත්‍රියක හෝ පුරුෂයකු
හෝ කළොත් ඒ තැනැත්තා වරදකරුවකු වනු ඇත.
7 එවිට ඔවුන් කළ පාපය උච්චාරණය කළ යුතු ය.
ඉන්පසු මුළු වන්දිය වශයෙන්, කළ අලාභයට තව
පහෙන් පංගුවක් එකතු කර යම් කෙනෙකුට විරුද්ධ
ව වැරැද්දක් කළේ ද එය ඔහුට ගෙවිය යුතු ය.
8 එහෙත්, වන්දිය ගෙවීම සඳහා ඔහුට නෑයකු
නැත්නම්, එම වන්දිය පූජකවරයා විසින් ගනු පිණිස
සමිඳාණන් වහන්සේට ගෙවිය යුතු වේ. මේ වන්දිය
ඔහු උදෙසා පව් කමා කිරීමේ පිළිවෙත ඉටු කිරීමට
පුදන බැටළු වස්සාට අමතර ව ය. 9 තව ද,
ඉශ්‍රායෙලේ ජනයා සමිඳාණන් වහන්සේට පුදන සෑම
ශුද්ධ පඬුරක් ම, එය ඔවුන් දෙන පූජකවරයාට අයිති
වනු ඇත. 10 ඇරත් යමකු සමිඳාණන් වහන්සේට
කැප කරන සෑම දෙයක් ම, යමකු පූජකවරයාට
දෙන සෑම දෙයක් ම, ඔහුට හිමි වනු ඇතැ' "යි වදාළ
සේක.

## පතිවත නොරැකීමට දඬුවම්

11 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට
මෙසේ වදාළ සේක: 12 "ඉශ්‍රායෙලේ ජනයා අමතා
ඔවුන්ට මෙසේ කියන්න: 'යම් මිනිසකුගේ බිරිඳක
පිට වී ගොස්, තම සැමියාට විරුද්ධ ව වැරැද්දක්
කරමින් 13 අන් මිනිසකු සමඟ, සැමියා
නොදැනුවත්ව ම, රහසින් සයනය කොට, ඈ මෙසේ
දූෂණය වූ නමුත් ඈට විරුද්ධ ව සාක්ෂිකරුවකු
නැතුව ද වරද කරද්දී අසු නොවී ද සිටින්නට
පුළුවන. 14 සැමියා ද 'ඈ දූෂණය වූවා'ය කියා ඊර්ෂ්‍යා
සහගත ව, සැක සිතන්නට ද පුළුවන. ඈ දූෂණය
නොවී සිටිය දී පවා ඇගේ සැමියා ඇය ගැන ඊර්ෂ්‍යා
සහගත ව, සැක සිතන්නට ද පුළුවන. 15 මෙවැනි
අවස්ථාවක දී, ඇගේ සැමියා තම බිරිඳ පූජකවරයා
වෙත ගෙනා යුතු ය. ඈ උදෙසා පඬුරක් වන යව පිටි
කිලෝග්‍රෑම් එකක් රැගෙන ආ යුතු ය. එහෙත්,
පඬුර පිට තෙලේ හෝ තුවරලා හෝ නොදැමිය යුතු
ය. එසේ කළ යුත්තේ එය වැරැද්දක් එළිදරව් කරන
සිහි කිරීමේ පූජාවක් ද, ඊර්ෂ්‍යා දුරුකිරීමේ ධාන්‍ය
පූජාවක් ද වන බැවිනි.
16 'පූජකවරයා ඈ ළඟට කැඳවා සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි සිටුවිය යුතු ය. 17 ඉන්පසු ඔහු
මැටි බඳුනකට පිරිසිදු වතුර ස්වල්පයක් රැගෙන,
සම්මුඛ මණ්ඩපයේ පොළොවේ පස් ස්වල්පයක්
එහි දැමිය යුතු ය. 18 එවිට පූජකවරයා ඈ
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි සිටුවා, ඇගේ කෙස්
කළඹ ලිහා සැක දුරුකිරීමේ පූජාව වන සිහිකිරීමේ
පඬුර ඇගේ අත්වල තැබිය යුතු ය. එහෙත්, සාපය
සලසන තිත්ත වතුර ඔහු තමාගේ අතේ ම
තබාගත යුතු ය. 19 ඉන්පසු ඔහු ඈ දිවුරවමින් ඈට
මෙසේ කිව යුතු ය: 'ඔබේ පුරුෂයා යටතේ ඔබ
සිටිය දී, අන් මිනිසෙක් ඔබ සමඟ සයනය කොට,
ඔබ දූෂණය වීම සඳහා පිට වී නොගියා නම්, සාපය
සලසන මේ තිත්ත වතුරෙන් ඔබට නපුරක් නො
වේ වා! 20 එහෙත්, ඔබ ඔබේ පුරුෂයා මෙසේ සිටිය
දී දූෂණය වීම සඳහා පිට වී ගියා නම්, ඔබේ සැමියා
හැර අන් මිනිසෙක් ඔබ සමඟ සයනය කළොත්,
21 සමිඳාණන් වහන්සේ ඔබේ රහස් අවයව
බෙලහීන වීමට ද බඩ ඉදිමීමට ද සලස්වා ඔබට,
ඔබේ සෙනඟ අතර පිළිකුලක් හා සාපයක් කරන
සේක් වා! 22 සාපය ගෙන දෙන මේ වතුර ඔබේ
බඩට ඇතුළු වී, බඩ ඉදිමෙන්නටත්, රහස් අවයව
බෙලහීන වන්නටත් සලසන සේක් වා! එවිට ස්ත්‍රිය
ද: 'එසේ ම වේ වා, එසේ ම වේ වා!' කියා පිළිතුරු
දිය යුතු ය.
23 'පූජකවරයා මේ සාප, පොතක ලියා, ඒවා
තිත්ත වතුරෙන් සෝදා දැමිය යුතු ය. 24 ඉන්පසු
සාපය ගෙන දෙන මේ තිත්ත වතුර ඇගේ ශරීරගත
වී, වේදනා පමුණුවනු සඳහා, ඔහු එය ඈට බීමට
දිය යුතු වේ. 25 පසුව පූජකවරයා ස්ත්‍රියගේ අතින්
සැක දුරු කිරීමේ පූජාව ගෙන, සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි පිළිගැන්වීමේ පිළිවෙත ඉටු කොට,
පූජාසනය මත එය පුද කළ යුතු ය. 26 ඔහු
සිහිකිරීමේ පඬුරින් අහුරක් ගෙන, පූජාසනය මත
එය දවා, ඉන්පසු ස්ත්‍රියට වතුර බීමට සැලසිය යුතු
ය. 27 ඔහු ඈට වතුර බොන්නට සැලැසූ පසු, ඈ
දූෂණය වී ඇගේ සැමියාට විරුද්ධ ව වරදක් කර
ඇත්නම්, ඒ වතුර ඇගේ ශරීරගත වී, වේදනා
පමුණුවමින්, ඇගේ බඩ ඉදිමී, ඇගේ රහස් අවයව
බෙලහීන වනු ඇත. ඈ ද ඇගේ සෙනඟ අතර
සාපයක් වන්නී ය. 28 එහෙත්, ඈ දූෂණය නොවී
නිර්දෝෂ ව සිටී නම් ඈට නපුරක් නොවනු ඇත, ඈ
ද දරුවන් පිළිසිඳ ගන්නී ය.
29 'ශංකා පිළිබඳ නීති මෙය වේ. එනම්: යම්කිසි
බිරිඳක පිට වී ගොස් අන් මිනිසකු සමඟ දූෂණය වූ
විට ද 30 යම්කිසි සැමියකු තම බිරිඳ ගැන ශංකා
සහගත ව සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි ඇය
සිටුවන විට ද බලපාන නීතිය මෙය වේ. පූජකවරයා
ඈ පිළිබඳ ව මේ නීතිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක

කළ යුතු වේ. 31 එවිට සැමියා වරදින් නිදහස් වනු
ඇත, එහෙත්, ස්ත්‍රිය දඬුවම් ලැබිය යුතු ය.' "

### නාසරීයයන් සම්බන්ධ අණපනත්

6 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට
මෙසේ වදාළ සේක: 2 "ඉශ්‍රායලේ ජනයාට
කතා කොට මෙසේ කියන්න: 'යම් පුරුෂයකු හෝ
ස්ත්‍රියක හෝ විශේෂ භාරයක් වී සමිඳාණන්
වහන්සේට කැප වී වෙන් වන පිණිස
නාසරීයයකුගේ භාරයක් වූ විට 3 ලූක්
1:15එවැන්නකු මිදියුස ද මත්පැන් ද පානය නොකළ
යුතු ය. තවද, ඔහු මිදියුසේ කාඩි හෝ මත්පැනක
කාඩි හෝ මිදි ගෙඩිවලින් පෙරාගත් මත් වන බීමක්
හෝ පානය නොකළ යුතු ය. වියළි මිදි හෝ අමු මිදි
ගෙඩි හෝ නොකෑ යුතු ය. 4 කැප වූ මුළු කාලය
තුළ ම ඔහු මිදි වැලෙන් හෝ මිදි ගෙඩියේ මදයෙන්
හෝ ලෙල්ලෙන් හෝ සෑදූ කිසිවක් නොකෑ යුතු ය.
5 'තවද, සමිඳාණන් වහන්සේට තමන් කැප
කරගත් මුළු කාලය තුළ ම, එය අවසාන වෙන තෙක්
ම ඔහු තම හිස කෙස් නොකැපිය යුතු ය. ඒ
කාලයේ දී ඔහු ශුද්ධ කෙනෙකු වනු ඇත. තම
කේශ කලාපය ද වැඩීමට ඉඩ දිය යුතු ය. 6 මේ
කාලය තුළ දී ඔහු කිසි ම කෙනෙකුගේ මළකඳක්
සමීපයට නොපැමිණිය යුතු ය. 7 තම පියා හෝ මව
හෝ සහෝදරිය හෝ සහෝදරයා හෝ මියගිය විට
පවා, තමා අපවිත්‍ර නොවිය යුතු ය. මන්ද, ඔහු
දෙවියන් වහන්සේට කැපවීමේ ලකුණු තම හිස මත
දරන බැවිනි. 8 තමන් කැප වූ මුළු කාලය තුළ ම
ඔහු සමිඳාණන් වහන්සේට කැප වූ කෙනෙකි.
9 'තමන් ළඟින් සිටින යමෙකු හදිසියෙන්
මියගියොත්, ඔහු තමන් කැප කරගත් කේශ
කලාපය දූෂණය කරගත්තේ යයි සැලකෙනු ඇත.
එවිට ඔහු තමාගේ පවිත්‍ර වීමේ දිනය වන සත්
වන දින තම හිස බූගෑ යුතු ය. 10 අට වන දින ඔහු
කොබෙයියන් දදෙනෙකු හෝ පරෙවියන් දදෙනෙකු
හෝ සම්මුඛ මණ්ඩපයේ දොරකඩට පූජකවරයා
වෙත ගෙනා යුතු ය. 11 පූජකවරයා ඉන් එකෙකු පාප
පූජාවක් සඳහා ද, අනිකා දවන යාග පූජාවක් සඳහා
ද ඔප්පු කොට, මළකඳ නිසා වූ පාපයට, ඔහු උදෙසා
පව් කමාවේ පිළිවෙත ඉටු කර, එදින ම ඔහුගේ
කේශ කලාපය ඔහු යළි කැප කළ යුතු ය.
12 මෙලෙස තමන් කැප කරගත් කාලය සමිඳාණන්
වහන්සේට පූජා කළ පසු, ඔහු වන්දි ගෙවීමේ
පූජාවක් සඳහා අවුරුද්දක් වයසැති බැටළු පැටවෙකු
ගෙනා යුතු ය. එහෙත්, ඔහුගේ කැපවීම දූෂණය වූ
බැවින් කලින් කැප වූ කාලය වලංගු නොවනු ඇත.
13 ක්‍රියා 21:23-24 'තමන් කැප වූ කාලය අවසාන
වූ පසු, නාසරීයයකු සම්බන්ධ පහත දැක්වෙන නීති
වලංගු වේ. ඔහු සම්මුඛ මණ්ඩපයේ දොරකඩට
පැමිණ 14 නොකැළැල් අවුරුද්දක් වයසැති, පිරිමි
බැටළු පැටවෙකු දවන යාග පූජාවක් සඳහා ද,
කැළැල් නැති අවුරුද්දක් වයසැති බැටළු වැස්සියක
පාප පූජාවක් සඳහා ද, නොකැළැල් බැටළු වස්සෙකු
සහභාගිකමේ පූජාවක් සඳහා ද පඬුරු කොට ඔප්පු
කළ යුතු ය. 15 පසුව නුමුහුන් රොටී කූඩයක් ද,
තෙල් මිශ්‍ර කොට සිහින් පිටිවලින් සෑදූ රොටී ද,
තෙල් ගාන ලද නුමුහුන් තුනී රොටී පෙති ද රොටී
ධාන්‍ය පූජාවක් සහ පානීය පූජාවක් ද පිදිය යුතු ය.
16 'පූජකවරයා සමිඳාණන් වහන්සේ ඉදිරියට ඒවා
ගෙනවුත් ඔහුගේ පාප පූජාව සහ දවන යාග පූජාව
පුදනු ඇත. 17 ඉන්පසු ඔහු, සහභාගිකමේ පූජාවක්
වශයෙන් බැටළු වස්සා සහ නුමුහුන් රොටී කූඩය ද
ඔප්පු කළ යුතු ය. තවද, තම ධාන්‍ය පූජාව ද පානීය
පූජාව ද ඔප්පු කළ යුතු ය. 18 ඉන්පසු නාසරීයයා
සම්මුඛ මණ්ඩපයේ දොරකඩ තම කැපවීමේ
සංකේතය වන තමාගේ හිස බූගා, හිස කෙස්
රැගෙන, සහභාගිකමේ පූජාව යට තිබෙන ගින්නට
දැමිය යුතු ය.
19 'පූජකවරයා බැටළු වස්සාගේ තම්බන ලද
ගාතයත්, රොටී කූඩයෙන් එක නුමුහුන් රොටියකුත්,
එක නුමුහුන් තුනී රොටී පෙත්තකුත් රැගෙන,
නාසරීයයා තම හිස බූගාගත් පසු ඔහුගේ අත්හි
තැබිය යුතු ය. 20 මෙසේ පූජකවරයා සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි ඒවායින් පිළිගැන්වීමේ පිළිවෙත
ඉටු කරනු ඇත. පිළිගැන්වූ ළැපැත්තට හා පිදූ
ගාතයට අමතර ව, මෙය පූජකවරයාට හිමි වන
ශුද්ධ පඬුරකි. මින්පසු මිදියුස පානය කරන්නට
නාසරීයයාට අවසර ඇත. 21 භාරයක් වූ නාසරීයයන්
පිළිබඳ වලංගු නීතිය මෙය වේ. කැප වූ කාලය
සඳහා සමිඳාණන් වහන්සේට පිදිය යුතු පඬුර හැර,
ඊට අමතර වෙන යමක් ඔහු භාර වී නම්, ඔහු
කැප වූ කාල සීමාවෙන් පසු ඒ භාරය අකුරට ම
ඉෂ්ට කළ යුතු වේ.'

### පූජක ආශීර්වාදය

22 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට
මෙසේ වදාළ සේක: 23 "ආරොන් සහ ඔහුගේ
පුත්‍රයන් අමතා, 'නුඹලා ඉශ්‍රායලේ ජනයාට
ආශීර්වාද කරන විට මෙලෙස කිව යුතු වේ:
24 'සමිඳාණෝ ඔබට ආශීර්වාද කොට ඔබ
ආරක්ෂා කරන සේක්වා!
25 'සමිඳාණෝ ඔබ දෙස දයාවෙන් බලා ඔබට
කරුණා කරන සේක්වා!
26 'සමිඳාණෝ සිය නෙත් ඔබ කෙරෙහි යොමා
ඔබට සාමදානය දෙන සේක්වා!'
27 'ඔවුන් ඉශ්‍රායලේ ජනයා වෙනුවෙන් මාගේ
නාමය කියා අයැදිනවා ඇත. එවිට මම ද ඔවුනට
ආසිරි වස්වමි.' "

### ප්‍රජා මූලිකයන්ගේ පඬුරු

7 මෝසෙස් මණ්ඩපය සම්පූර්ණයෙන් ම ඉදි
කොට අවසාන කළ දවසේ, එය ආලේප
කොට කැප කළේ ය. එහි බඩු භාණ්ඩ වන
පූජාසනය ද බඳුන් සියල්ල ද ආලේප කොට කැප
කළේ ය. 2 එවිට පිය පෙළපත්හි ප්‍රධානීන් හා
ඉශ්‍රායලේ ජනයා අතර නායකයන් වන, ලියාපදිංචි

කිරීම මෙහෙයවූ ගෝත්‍ර මූලිකයෝ 3 සමිඳාණන්
වහන්සේ වෙත තමන්ගේ පඬුරු ගෙනාහ. ඒ පඬුරු
නම්, මූලිකයන් දදෙනෙකුට එක ගැලක් බැගින් ද,
එක එක මූලිකයාට එක ගොනෙකු බැගින් ද අඹරාව
ඇති ගැල් රථ හයක් සහ ගොනුන් දොළොස්දෙනෙකේ
වෙති. ඔව්හු මේවා මණ්ඩපය ඉදිරියට ගෙනාහ.
4 එවිට සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට, 5 “සම්මුඛ මණ්ඩපයේ සේවාව සඳහා
ඔවුන්ගෙන් මේවා භාරගන්න. තවද, ලෙවීවරුන් අතර
එක් එක්කෙනාට තමන් කළ යුතු සේවාව අනුව
ඔවුන්ට මේවා දිය යුතු ය”යි වදාළ සේක. 6 එවිට
මෝසෙස් ගැල් හා ගොනුන් භාරගෙන ලෙවීවරුන්ට
ඒවා දුන්නේ ය. 7 ගේර්ෂොන්ගේ දරුපරපුරට
ඔවුන්ගේ සේවාව අනුව ගැල් දෙකක් සහ ගොනුන්
හතරදෙනෙකු ද 8 පූජක ආරොන්ගේ පුත්‍ර
ඊතාමාර්ගේ පාලනය යටතේ, මෙරාරීගේ දරුපරපුරට
ඔවුන්ගේ සේවාව අනුව ගැල් හතරක් සහ ගොනුන්
අටදෙනෙකු ද දුනි. 9 එහෙත්, ශුද්ධස්ථානයේ
සේවාවන්ට අදාළ ව කොහාත්ගේ දරුපරපුරට පැවරී
තිබුණේ බඩු භාණ්ඩ කර පිට උසුලාගෙන යාම
බැවින් ඔවුන්ට ඔහු කිසිවක් නුදුන්නේ ය.
10 පූජාසනය ආලේප කොට එය කැප කරන
දවසේ දී ප්‍රජා මූලිකයෝ තම තමන්ගේ පඬුරු
පූජාසනය වෙත ඔප්පු කළහ. 11 එවිට සමිඳාණන්
වහන්සේ මෝසෙස් අමතා, “සෑම ප්‍රජා මූලිකයකු
ම තමාට නියම දවසේ දී තම පඬුරු පූජාසනය මත
කැප කිරීම සඳහා ගෙනෙ යුතු ය”යි වදාළ සේක.
12 පළමු වන දවසේ දී තම පඬුර පූජා කළේ
ජුදාගේ ගෝත්‍රයේ අම්මිනාදාබ්ගේ පුත් නාෂොන්
ය. 13 ඔහුගේ පඬුරු නම්, කිලෝග්‍රෑම් එකහමාරක්
බර ඇති රිදී බඳුනක් සහ ග්‍රෑම් අටසියයක් බර ඇති
රිදී තැටියක් විය. මේ දෙකෙ ම ධාන්‍ය පූජාවක් සඳහා
තෙලේ මිශ්‍ර සිහින් පිටිවලින් පිරී තිබිණි. 14 සුවඳ
ද්‍රව්‍ය පිරුණු ග්‍රෑම් එකසිය දහයක් බර එක රන්
පාත්‍රයක් ද 15 දවන යාග පූජාවක් සඳහා එක
ගොන් වස්සෙක්, එක බැටළු වස්සෙක් සහ අවුරුද්දක්
වයසැති බැටළු පැටියෙක් ද, 16 පාප පූජාවක් සඳහා
එක එළුවෙක් ද, 17 සහභාගිකමේ පූජාවක් සඳහා
ගොනුන් දදෙනෙක්, බැටළු වස්සන් පස්දෙනෙක්,
එළුවන් පස්දෙනෙක් සහ අවුරුද්දක් වයසැති බැටළු
පැටියන් පස්දෙනෙක් ද වූ හ. අම්මිනාදාබ්ගේ පුත්
නාෂොන්ගේ පඬුරු මේවා විය.
18 දෙ වන දවසේ දී ශූවර්ගේ පුත් නතෙනේල්
වන ඉස්සාකර්ගේ දරුපරපුරේ මූලිකයා තම පඬුරු
පිදී ය. 19 ඔහුගේ පඬුරු නම්, කිලෝග්‍රෑම්
එකහමාරක් බර ඇති රිදී බඳුනක් සහ ග්‍රෑම්
අටසියයක් බර ඇති රිදී තැටියක් විය. මේ දෙකෙ ම,
ධාන්‍ය පූජාවක් සඳහා තෙලේ මිශ්‍ර සිහින් පිටිවලින්
පිරී තිබිණි. 20 සුවඳ ද්‍රව්‍ය පිරුණු ග්‍රෑම් එකසිය
දහයක් බර එක රන් පාත්‍රයක් ද, 21 දවන යාග
පූජාවක් සඳහා එක ගොන් වස්සෙක්, එක බැටළු
වස්සෙක් සහ අවුරුද්දක් වයසැති බැටළු පැටියෙක් ද,
22 පාප පූජාවක් සඳහා එක එළුවෙක් ද,
23 සහභාගිකමේ පූජාවක් සඳහා ගොනුන්
දදෙනෙක්, බැටළු වස්සන් පස්දෙනෙක්, එළුවන්
පස්දෙනෙක් සහ අවුරුද්දක් වයසැති බැටළු පැටවුන්
පස්දෙනෙක් ද වූ හ. ශූවර්ගේ පුත් නතෙනේල්ගේ
පඬුරු මේවා විය.
24 තුන් වන දවසේ දී හේලෝන්ගේ පුත් එලියාබ්
වන සාබුලොන්ගේ දරුපරපුරේ මූලිකයා තම පඬුරු
පිදී ය. 25 ඔහුගේ පඬුරු නම්, කිලෝග්‍රෑම්
එකහමාරක් බර ඇති රිදී බඳුනක් සහ ග්‍රෑම්
අටසියයක් බර ඇති රිදී තැටියක් විය. මේ දෙකෙ ම,
ධාන්‍ය පූජාවක් සඳහා තෙලේ මිශ්‍ර සිහින් පිටිවලින්
පිරී තිබිණි. 26 සුවඳ ද්‍රව්‍ය පිරුණු ග්‍රෑම් එකසිය
දහයක් බර එක රන් පාත්‍රයක් ද, 27 දවන යාග
පූජාවක් සඳහා එක ගොන් වස්සෙක් සහ එක බැටළු
වස්සෙක් ද, අවුරුද්දක් වයසැති බැටළු පැටියෙක් ද
28 පාප පූජාවක් සඳහා එක එළුවෙක් ද,
29 සහභාගිකමේ පූජාවක් සඳහා ගොනුන්
දදෙනෙක්, බැටළු වස්සන් පස්දෙනෙක්, එළුවන්
පස්දෙනෙක් සහ අවුරුද්දක් වයසැති බැටළු පැටවුන්
පස්දෙනෙක් ද වූ හ. හේලෝන්ගේ පුත් එලියාබ්ගේ
පඬුරු මේවා විය.
30 සතර වන දවසේ දී ෂෙදෙවුර්ගේ පුත් එලිශූර්
වන රූබන්ගේ දරුපරපුරේ මූලිකයා තම පඬුරු පිදී
ය. 31 ඔහුගේ පඬුරු නම්, කිලෝග්‍රෑම් එකහමාරක්
බර ඇති රිදී බඳුනක් සහ ග්‍රෑම් අටසියයක් බර ඇති
රිදී තැටියක් විය. මේ දෙකෙ ම ධාන්‍ය පූජාවක් සඳහා
තෙලේ මිශ්‍ර සිහින් පිටිවලින් පිරී තිබිණි. 32 සුවඳ
ද්‍රව්‍ය පිරුණු ග්‍රෑම් එකසිය දහයක් බර එක් රන්
පාත්‍රයක් ද, 33 දවන යාග පූජාවක් සඳහා එක
ගොන් වස්සෙක් සහ එක බැටළු වස්සෙක් ද,
අවුරුද්දක් වයසැති බැටළු පැටියෙක් ද, 34 පාප
පූජාවක් සඳහා එක එළුවෙක් ද, 35 සහභාගිකමේ
පූජාවක් සඳහා ගොනුන් දදෙනෙක්, බැටළු වස්සන්
පස්දෙනෙක් සහ එළුවන් පස්දෙනෙක් ද, අවුරුද්දක්
වයසැති බැටළු පැටවුන් පස්දෙනෙක් ද වූ හ.
ෂෙදෙවුර්ගේ පුත් එලිශූර්ගේ පඬුරු මේවා විය.
36 පස් වන දවසේ දී ශූරිෂද්දයිගේ පුත්
ෂෙලුමියෙල් වන සිමියොන්ගේ දරුපරපුරේ මූලිකයා
තම පඬුරු පිදී ය. 37 ඔහුගේ පඬුරු නම්,
කිලෝග්‍රෑම් එකහමාරක් බර ඇති රිදී බඳුනක් සහ
ග්‍රෑම් අටසියයක් බර ඇති රිදී තැටියක් විය. මේ
දෙකෙ ම ධාන්‍ය පූජාවක් සඳහා තෙලේ මිශ්‍ර සිහින්
පිටිවලින් පිරී තිබිණි. 38 සුවඳ ද්‍රව්‍ය පිරුණු ග්‍රෑම්
එකසිය දහයක් බර එක රන් පාත්‍රයක් ද, 39 දවන
යාග පූජාවක් සඳහා එක ගොන් වස්සෙක් ද, එක
බැටළු වස්සෙක් සහ අවුරුද්දක් වයසැති බැටළු
පැටියෙක් ද, 40 පාප පූජාවක් සඳහා එක එළුවෙක් ද,
41 සහභාගිකමේ පූජාවක් සඳහා ගොනුන්
දදෙනෙක් ද, බැටළු වස්සන් පස්දෙනෙක් ද, එළුවන්
පස්දෙනෙක් සහ අවුරුද්දක් වයසැති බැටළු පැටවුන්
පස්දෙනෙක් ද වූ හ. ශූරිෂද්දයිගේ පුත්
ෂෙලුමියෙල්ගේ පඬුරු මේවා විය.
42 හය වන දවසේ දී දෙවුයෙල්ගේ පුත් එලියාසාප්
වන ගාද්ගේ දරුපරපුරේ මූලිකයා තම පඬුරු පිදී ය.
43 ඔහුගේ පඬුරු නම්, කිලෝග්‍රෑම් එකහමාරක් බර

ඇති රිදී බඳුනක් සහ ග්‍රෑම් අටසියයක් බර ඇති රිදී
තැටියක් විය. මේ දෙක ම ධාන්‍ය පූජාවක් සඳහා
තලේ මිශ්‍ර සිහින් පිටිවලින් පිරී තිබිණි. 44 සුවඳ
ද්‍රව්‍ය පිරුණු ග්‍රෑම් එකසිය දහයක් බර එක රන්
පාත්‍රයක් ද, 45 දවන යාග පූජාවක් සඳහා එක
ගොන් වස්සෙක්, එක බැටළු වස්සෙක් සහ අවුරුද්දක්
වයසැති බැටළු පැටියෙක් ද, 46 පාප පූජාවක් සඳහා
එක එළුවෙක් ද, 47 සහභාගිකමේ පූජාවක් සඳහා
ගොනුන් දදෙනෙක්, බැටළු වස්සන් පස්දෙනෙක්,
එළුවන් පස්දෙනෙක් සහ අවුරුද්දක් වයසැති බැටළු
පැටවුන් පස්දෙනෙක් ද වූ හ. දවුයෙලේගේ පුත්
එලියාසාප්ගේ පඬුරු මේවා විය.
48 සත් වන දවසේ දී අම්මීහුද්ගේ පුත් එලිෂාමා
වන එප්‍රායිම්ගේ දරුපරපුරේ මූලිකයා තම පඬුරු
පිදී ය. 49 ඔහුගේ පඬුරු නම්, කිලෝග්‍රෑම්
එකහමාරක් බර ඇති රිදී බඳුනක් සහ ග්‍රෑම්
අටසියයක් බර ඇති රිදී තැටියක් විය. මේ දෙක ම
ධාන්‍ය පූජාවක් සඳහා තලේ මිශ්‍ර සිහින් පිටිවලින්
පිරී තිබිණි. 50 සුවඳ ද්‍රව්‍ය පිරුණු ග්‍රෑම් එකසිය
දහයක් බර එක රන් පාත්‍රයක් ද, 51 දවන යාග
පූජාවක් සඳහා එක ගොන් වස්සෙක්, එක බැටළු
වස්සෙක් සහ අවුරුද්දක් වයසැති බැටළු පැටියෙක් ද,
52 පාප පූජාවක් සඳහා එක එළුවෙක් ද,
53 සහභාගිකමේ පූජාවක් සඳහා ගොනුන්
දදෙනෙක්, බැටළු වස්සන් පස්දෙනෙක්, එළුවන්
පස්දෙනෙක් සහ අවුරුද්දක් වයසැති බැටළු පැටවුන්
පස්දෙනෙක් ද වූ හ. අම්මීහුද්ගේ පුත් එලිෂාමාගේ
පඬුරු මේවා විය.
54 අට වන දවසේ දී පදොශූර්ගේ පුත් ගමාලියලේ
වන මනස්සේගේ දරුපරපුරේ මූලිකයා තම පඬුරු
පිදී ය. 55 ඔහුගේ පඬුරු නම්, කිලෝග්‍රෑම්
එකහමාරක් බර ඇති රිදී බඳුනක් සහ ග්‍රෑම්
අටසියයක් බර ඇති රිදී තැටියක් විය. මේ දෙක ම
ධාන්‍ය පූජාවක් සඳහා තලේ මිශ්‍ර හොඳ පිටිවලින්
පිරී තිබිණි. 56 සුවඳ ද්‍රව්‍ය පිරුණු ග්‍රෑම් එකසිය
දහයක් බර එක රන් පාත්‍රයක් ද, 57 දවන යාග
පූජාවක් සඳහා එක ගොන් වස්සෙක්, එක බැටළු
වස්සෙක් සහ අවුරුද්දක් වයසැති බැටළු පැටියෙක් ද,
58 පාප පූජාවක් සඳහා එක එළුවෙක් ද,
59 සහභාගිකමේ පූජාවක් සඳහා ගොනුන්
දදෙනෙක්, බැටළු වස්සන් පස්දෙනෙක්, එළුවන්
පස්දෙනෙක් සහ අවුරුද්දක් වයසැති බැටළු පැටවුන්
පස්දෙනෙක් ද වූ හ. පදොශූර්ගේ පුත්
ගමාලියලේගේ පඬුරු මේවා විය.
60 නව වන දවසේ දී ගිදයෙනිගේ පුත් අබීදාන්
වන බෙන්ජමින්ගේ දරුපරපුරේ මූලිකයා තම පඬුරු
පිදී ය. 61 ඔහුගේ පඬුරු නම්, කිලෝග්‍රෑම්
එකහමාරක් බර ඇති රිදී බඳුනක් සහ ග්‍රෑම්
අටසියයක් බර ඇති රිදී තැටියක් විය. මේ දෙක ම
ධාන්‍ය පූජාවක් සඳහා තලේ මිශ්‍ර සිහින් පිටිවලින්
පිරී තිබිණි. 62 සුවඳ ද්‍රව්‍ය පිරුණු ග්‍රෑම් එකසිය
දහයක් බර එක රන් පාත්‍රයක් ද, 63 දවන යාග
පූජාවක් සඳහා එක ගොන් වස්සෙක්, එක බැටළු
වස්සෙක් සහ අවුරුද්දක් වයසැති බැටළු පැටියෙක් ද,
64 පාප පූජාවක් සඳහා එක එළුවෙක් ද,
65 සහභාගිකමේ පූජාවක් සඳහා ගොනුන්
දදෙනෙක්, බැටළු වස්සන් පස්දෙනෙක්, එළුවන්
පස්දෙනෙක් සහ අවුරුද්දක් වයසැති බැටළු පැටවුන්
පස්දෙනෙක් ද වූ හ. ගිදයෙනිගේ පුත් අබීදාන්ගේ
පඬුරු මේවා විය.
66 දස වන දවසේ දී අම්මීෂද්දයිගේ පුත්
අහියේසර් වන දාන්ගේ දරුපරපුරේ මූලිකයා තම
පඬුරු පිදී ය. 67 ඔහුගේ පඬුරු නම් කිලෝග්‍රෑම්
එකහමාරක් බර ඇති රිදී බඳුනක් සහ ග්‍රෑම්
අටසියයක් බර ඇති රිදී තැටියක් විය. මේ දෙක ම
ධාන්‍ය පූජාවක් සඳහා තලේ මිශ්‍ර සිහින් පිටිවලින්
පිරී තිබිණි. 68 සුවඳ ද්‍රව්‍ය පිරුණු ග්‍රෑම් එකසිය
දහයක් බර එක රන් පාත්‍රයක් ද, 69 දවන යාග
පූජාවක් සඳහා එක ගොන් වස්සෙක්, එක බැටළු
වස්සෙක් සහ අවුරුද්දක් වයසැති බැටළු පැටියෙක් ද,
70 පාප පූජාවක් සඳහා එක එළුවෙක් ද,
71 සහභාගිකමේ පූජාවක් සඳහා ගොනුන්
දදෙනෙක්, බැටළු වස්සන් පස්දෙනෙක්, එළුවන්
පස්දෙනෙක් සහ අවුරුද්දක් වයසැති බැටළු පැටවුන්
පස්දෙනෙක් ද වූ හ. අම්මීෂද්දයිගේ පුත්
අහියේසර්ගේ පඬුරු මේවා විය.
72 එකොළොස් වන දවසේ දී ඔක්රාන්ගේ පුත්
පගියලේ වන ආෂෙර්ගේ දරුපරපුරේ මූලිකයා තම
පඬුරු පිදී ය. 73 ඔහුගේ පඬුරු නම් කිලෝග්‍රෑම්
එකහමාරක් බර ඇති රිදී බඳුනක් සහ ග්‍රෑම්
අටසියයක් බර ඇති රිදී තැටියක් විය. මේ දෙක ම
ධාන්‍ය පූජාවක් සඳහා තලේ මිශ්‍ර සිහින් පිටිවලින්
පිරී තිබිණි. 74 සුවඳ ද්‍රව්‍ය පිරුණු ග්‍රෑම් එකසිය
දහයක් බර එක රන් පාත්‍රයක් ද, 75 දවන යාග
පූජාවක් සඳහා එක ගොන් වස්සෙක්, එක බැටළු
වස්සෙක් සහ අවුරුද්දක් වයසැති බැටළු පැටියෙක් ද,
76 පාප පූජාවක් සඳහා එක එළුවෙක් ද,
77 සහභාගිකමේ පූජාවක් සඳහා ගොනුන්
දදෙනෙක්, බැටළු වස්සන් පස්දෙනෙක් එළුවන්
පස්දෙනෙක් සහ අවුරුද්දක් වයසැති බැටළු පැටවුන්
පස්දෙනෙක් ද වූ හ. ඔක්රාන්ගේ පුත් පගියලේගේ
පඬුරු මේවා විය.
78 දොළොස් වන දවසේ දී ඒනාන්ගේ පුත් අහිරා
වන නප්තලීගේ දරුපරපුරේ මූලිකයා තම පඬුරු පිදී
ය. 79 ඔහුගේ පඬුරු නම් කිලෝග්‍රෑම් එකහමාරක්
බර ඇති රිදී බඳුනක් සහ ග්‍රෑම් අටසියයක් බර ඇති
රිදී තැටියක් විය. මේ දෙක ම ධාන්‍ය පූජාවක් සඳහා
තලේ මිශ්‍ර සිහින් පිටිවලින් පිරී තිබිණි. 80 සුවඳ
ද්‍රව්‍ය පිරුණු ග්‍රෑම් එකසිය දහයක් බර එක රන්
පාත්‍රයක් ද, 81 දවන යාග පූජාවක් සඳහා එක
ගොන් වස්සෙක්, එක බැටළු වස්සෙක් සහ අවුරුද්දක්
වයසැති බැටළු පැටියෙක් ද, 82 පාප පූජාවක් සඳහා
එක එළුවෙක් ද, 83 සහභාගිකමේ පූජාවක් සඳහා
ගොනුන් දදෙනෙක්, බැටළු වස්සන් පස්දෙනෙක්,
එළුවන් පස්දෙනෙක් සහ අවුරුද්දක් වයසැති බැටළු
පැටවුන් පස්දෙනෙක් ද වූ හ. ඒනාන්ගේ පුත්
අහිරාගේ පඬුරු මේවා විය.

84 පූජාසනය ආලේප කොට කැප කරනු ලැබූ
දිනයෙහි ඉශ්රායලේහි මූලිකයන් විසින් ගෙනෙන ලද
බඩු භාණ්ඩ මේවා ය. එනම්, රිදී බඳුන් දොළසකි,
රිදී තැටි දොළසකි, රන් පාත්ර දොළසකි. 85 එක රිදී
බඳුනක බර කිලෝග්රෑම් එකහමාරක් ද, එක රිදී
තැටියක බර ග්රෑම් අටසියයක් ද වූයෙන් රිදී භාණ්ඩ
සියල්ලේ බර කිලෝග්රෑම් විසිහතයි දශම හයක්
විය. 86 තවද, ශුද්ධස්ථානයේ මිල අනුව, එක එකේ
බර ග්රෑම් එකසිය දහයක් වූ රන් පාත්ර දොළසකි.
මේ සියල්ලේ බර රිදී කාසි කිලෝග්රෑම් එකයි දශම
තුනයි දෙකක් විය. 87 දවන යාග පූජාව සඳහා
වස්සෝ දොළසකි, බැටළු වස්සෝ දොළසකි,
අවුරුද්දක් වයසැති බැටළු පැටවුන් දොළසකි. මේවා
සමඟ ධාන්ය පූජා ද පාප පූජා සඳහා එළුවෝ
දොළසක් ද වූ හ. 88 සහභාගිකමේ පූජාව සඳහා
ගොන් වස්සෝ විසිහතරකි, බැටළු වස්සෝ හැටකි,
එළුවෝ හැටකි, අවුරුද්දක් වයසැති බැටළු පැටවු
හැටකි. පූජාසනය ආලේප කොට කැප කළ දිනයෙහි
පුදන ලද්දේ ඉහත දැක්වූ ඒවා ය. 89 මෝසෙස්
සමිඳාණන් වහන්සේ සමඟ කතා කිරීමට සම්මුඛ
මණ්ඩපයට ඇතුළු වූ සැම විට ම, එහි ගිවිසුම්
කරඬුව මත කෙරුබ්වරුන් දෙදෙනා මැද තිබූ
කරුණාසනයෙන් නික්මුණු කට හඬක් ඔහුට ඇසිණි.
ඔහු උන් වහන්සේ සමඟ කතා කළේ ය.

### මණ්ඩපයේ පහන්

8 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට,
2 "ආරොන් අමතා ඔහුට මෙසේ කියන්න: 'නුඹ
පහන් දල්වන විට පහන් හතේ එළිය පහන් රුක
ඉස්සරහට වැටිය යුතු ය' "යි වදාළ සේක.
3 ආරොන් ද එසේ කරමින්, සමිඳාණන් වහන්සේ
මෝසෙස්ට අණ කළ පරිදි පහන්වල එළිය, පහන්
රුක ඉස්සරහට වැටෙන සේ ඒවා දැල්විය. 4 නික්ම
25:31-40; 37:17-24තවද, සමිඳාණන් වහන්සේ
මෝසෙස්ට පෙන්නූ සැලැස්ම අනුව, ඔහු විසින් එය
සාදා තිබිණි. එය තැළූ රනින් නිම කළ එකක් විය.
එය මුදුන සිට අඩිය දක්වා තැළූ රනින් සාදා තිබිණි.

### ලෙවීවරුන් පවිත්ර වීමේ වත්පිළිවෙත

5 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට
මෙසේ වදාළ සේක: 6 "ඉශ්රායලේ ජනයා අතරෙන්
ලෙවීවරුන් රැගෙන ඔවුන් පවිත්ර කරන්න. 7 ඔවුන්
පවිත්ර කිරීමේ වත්පිළිවෙත මෙලෙස කළ යුතු ය.
ඔවුන් මත පවිත්ර කිරීමේ වතුර ඉසින්න. ඉන්පසු
ඔවුන් තම මුළු ශරීරය බූගාගෙන, තමන්ගේ වස්ත්ර
සෝදා ගත යුතු ය. එවිට ඔවුන් පවිත්ර වනු ඇත.
8 ඉන්පසු ඔවුන් ගොන් වස්සකු ද, ධාන්ය පූජාවක්
සඳහා තෙලේ මිශ්ර සිහින් පිටි ද ගත යුතු ය. නුඹ
පාප පූජාවක් සඳහා තවත් ගොන් වස්සකු ගත යුතු
ය. 9 මෙසේ ඔවුන් ගත් පසු, සම්මුඛ මණ්ඩපය
ඉදිරිපිටට නුඹ ඔවුන් කැඳවිය යුතු ය. තවද, නුඹ මුළු
ඉශ්රායලේ ජනතාව ම එක්වන සේ කැඳවිය යුතු ය.
10 මෙසේ නුඹ ලෙවීවරුන් සමිඳාණන් වහන්සේ
ඉදිරියට ගෙන පසු ඉශ්රායලේ ජනතාව ඔවුන් මත
තම අත් තැබිය යුතු වේ. 11 ඉන්පසු ආරොන්
ඉශ්රායලේ ජනයාගේ විශේෂ පඬුරක් මෙන්
සමිඳාණන් වහන්සේගේ සේවය ඉටු කරන පිණිස,
ලෙවීවරුන් සමිඳාණන් වහන්සේට කැප කළ යුතු ය.
12 එවිට ලෙවීවරුන් ගොන් වස්සන්ගේ හිස් පිට
තමන්ගේ අත් තැබිය යුතු ය. ලෙවීවරුන්ගේ පව්
කමා කිරීමේ පිළිවෙත ඉටු කරන පිණිස, නුඹ එක
ගොන් වස්සකු පාප පූජාවක් සඳහා ද, අනිකා දවන
යාග පූජාවක් සඳහා ද සමිඳාණන් වහන්සේට ඔප්පු
කළ යුතු ය."
13 "නුඹ ලෙවීවරුන් විශේෂ පඬුරක් මෙන්
සමිඳාණන් වහන්සේට කැප කළ පසු ඔවුන් පිළිබඳ
වගකීම ආරොන්ට සහ ඔහුගේ පුතුන්ට පැවරිය යුතු
ය. 14 මෙසේ නුඹ ඉශ්රායලේ ජනයා අතරෙන්
ලෙවීවරුන් වෙන් කළ යුතු ය. ඔවුන් මගේ ම වනු
ඇත. 15 නුඹ ඔවුන් පවිත්ර කොට විශේෂ පඬුරක්
මෙන් කැප කළ පසු, සම්මුඛ මණ්ඩපයේ සේවාව
සඳහා ඔවුන්ට එහි ඇතුළු විය හැකි ය. 16 මුළු
ඉශ්රායලේ ජනයා අතර උපදින කුලුඳුලන් වෙනුවට
මම මට ම ඔවුන් තෝරාගතිමි. ඉශ්රායලේ ජනයා
අතරෙන් ඔව්හු මට මුළුමනින් ම කැප කරන ලද්දෝ
ය. 17 නික්ම 13:2මිසර දේශයෙහි සියලු කුලුඳුලන්
මරණයට පත් කළ දිනයෙහි ඉශ්රායලේ ජනයා අතර
සියලු කුලුඳුලන් මිනිසකේ හෝ සතකේ හෝ වේ
වා, මම මට ම කැප කොටගතිමි. 18 මෙලෙස
ඉශ්රායලේ ජනයා අතර කුලුඳුලන් සියලු දෙනා
වෙනුවට මම ලෙවීවරුන් තෝරාගතිමි. 19 ඉශ්රායලේ
ජනයා අතරෙන් තෝරාගත් ලෙවීවරුන් විශේෂ
දීමනාවක් මෙන් මම ආරොන්ට සහ ඔහුගේ පුතුන්
හට දුනිමි. ඔවුන් ඉශ්රායලේ ජනයා උදෙසා පව්
කමාවේ පිළිවෙත ඉටු කරමින්, සම්මුඛ මණ්ඩපය
තුළ ඔවුන් උදෙසා සේවාව ඉටු කළ යුතු ය. එවිට
ඉශ්රායලේ ජනයා ශුද්ධස්ථානයට සමීප වන විට
ඔවුන්ට විපත්තියක් නොවෙනු ඇත."
20 මෙලෙස ලෙවීවරුන් සම්බන්ධ ව සමිඳාණන්
වහන්සේ මෝසෙස්ට අණ කළ සියල්ල ම, ඔහු ද,
ආරොන් සහ මුළු ඉශ්රායලේ ජනතාව ද ඔවුන් වෙත
ඉටු කළහ. 21 ලෙවීවරු ද පවිත්ර වී, තම වස්ත්ර
සෝදාගත්හ. ආරොන් සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි ඔවුන් විශේෂ දීමනාවක් මෙන්
පිළිගැන්විය; ලෙවීවරුන් සම්බන්ධ පවිත්රවීමේ
වත්පිළිවෙත ද ඉටු කළේ ය. 22 ඉන්පසු ලෙවීවරු,
ආරොන් සහ ඔහුගේ පුත්රයන් යටතේ සම්මුඛ
මණ්ඩපය තුළ සේවාවන් ඉටු කිරීමට සූදුස්සෝ වූ
හ. මෙසේ සමිඳාණන් වහන්සේ ලෙවීවරුන් ගැන
මෝසෙස්ට අණ කළ ලෙස ඔව්හු ලෙවීවරුන්ට කළෝ
ය.
23 සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතා,
24 "පහත දක්වන දේ ද ලෙවීවරුන් සම්බන්ධ ය.
අවුරුදු විසි පහේ සිට ඊට වඩා වයසැති අය සම්මුඛ
මණ්ඩපය තුළ සේවාව ඉටු කළ යුතු ය. 25 වයස
අවුරුදු පණහක් වූ විට ඔවුන් එම සේවයෙන් අහක්
වී, ඉන් විශ්රාම ගත යුතු ය. 26 එහෙත්, ඔවුන්ට

සම්මුඛ මණ්ඩපයේ සේවාවෙහි නියුක්ත අනිකුත්
ලෙවීවරුන්ට සහාය විය හැකි ය. එහෙත්, ඔවුන් කිසි
සේවාවක් නම් නොකළ යුතු ය. ලෙවීවරුන්ගේ
වගකීම්වලට අදාළ ව නුඹ ක්‍රියා කළ යුත්තේ
ඉහත දැක්වූ අන්දමට ය”යි වදාළ සේක.

## පාස්කුව දෙ වන වරට පැවැත්වීම

9 නික්ම 12:1-13 ඉශ්‍රායලේ ජනයා මිසරයෙන්
නික්ම පැමිණි දෙ වන අවුරුද්දේ පළමු වන
මාසයේ දී, සමිඳාණන් වහන්සේ සීනයි පාළුකරයේ
දී මෝසෙස්ට කතා කොට, 2 “ඉශ්‍රායලේ ජනයා
පාස්කු මංගල්‍යය නියමිත කාලයේ දී පැවැත්විය යුතු
ය.
3 “මේ මාසයේ දහහතර වන දින සවස ඔවුන්
එය නියමිත වේලාවට ඊට සම්බන්ධ සියලු ම නීති
නියෝග අනුව සිදු කළ යුතු ය”යි වදාළ සේක.
4 එවිට මෝසෙස් ඉශ්‍රායලේ ජනයා අමතමින්,
“පාස්කු මංගල්‍යය පැවැත්විය යුතු ය”යි කී ය.
5 ඔව්හු සීනයි පාළුකරයේ දී, පළමු වන මාසයේ
දහහතර වන දින සවස පාස්කු මංගල්‍යය පැවැත් වූ
හ. සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අණ කළ
සියල්ල ලෙස ඉශ්‍රායලේවරු කළෝ ය.
6 මෘත ශරීරයක් ස්පර්ශ කිරීම නිසා අපවිත්‍ර වූ
මිනිසුන් සමහරෙක් එහි සිටියෝ ය. ඔවුන්ට එදින
පාස්කුව පැවැත්වීමට නොහැකි වූ බැවින්, ඔව්හු
එදින ම මෝසෙස් හා ආරොන් වෙතට පැමිණ
7 ඔවුන්ට කතා කොට, “මෘත ශරීරයක් ස්පර්ශ
කිරීම නිසා අපි අපවිත්‍ර වීමු. එබැවින් සෙසු
ඉශ්‍රායලේ ජනයා සමඟ නියමිත දිනයේ සමිඳාණන්
වහන්සේට පඬුරු පූජා කිරීම අපට තහනම් කර
ඇත්තේ මන් දැ”යි ඇසූ හ. 8 මෝසෙස් ඔවුන්ට
පිළිතුරු දෙමින්, “ඔබ සම්බන්ධ ව සමිඳාණන්
වහන්සේ කුමක් අණ කරන සේක් දැ යි මා
අසාගෙන එන තෙක් ඔබ මෙහි සිටින්නැ”යි කී ය.
9 එවිට සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතා
මෙසේ වදාළ සේක: 10 “ඉශ්‍රායලේ ජනයාට කතා
කොට මෙයෙ දන්වන්න: ‘නුඹලාගෙන් හෝ නුඹලාගේ
දරුපරපුරෙන් හෝ යමෙකු මෘත ශරීරයක් ස්පර්ශ
කිරීම නිසා අපවිත්‍ර වී සිටියත්, ඈත දුර ගමනක
යෙදී සිටියත්, සමිඳාණන් වහන්සේගේ ගෞරවය
පිණිස පාස්කුව පැවැත්විය යුතු ය. 11 දෙ වන
මාසයේ දහහතර වන දින සවස එය පවත්වා
නුමුහුන් රොටි හා තිත්ත පලා ද අනුභව කළ යුතු
ය. 12 නික්ම 12:46; ජොහ 19:36එයින් කිසිවක් උදය
දක්වා නොතිබිය යුතු ය. පාස්කු බැටළුවාගේ
ඇටයක් පවා නොකැඩිය යුතු ය. තවද, පාස්කුව
පිළිබඳ සියලු නියෝග අනුව එය පැවැත්විය යුතු ය.
13 එහෙත්, පවිත්‍ර කෙනෙක් හෝ දුර ගමනක්
නොගිය යම් මිනිසෙක් හෝ පාස්කුව
නොපවත්වන්නේ නම්, ඔහු නියම කාලයේ දී
සමිඳාණන් වහන්සේට තම පඬුර නොගෙනෙ බැවින්,
එවැන්නකු සිය සෙනඟ අතරෙන් නෙරපාදමනු ලැබිය
යුතු ය. ඔහු තම පාපය ගැන ද වගකිව යුතු වේ.
14 තවද, නුඹලා සමඟ කලකට වසන විදේශිකයෙක්
සමිඳාණන් වහන්සේගේ ගෞරවයට පාස්කුව
පැවැත්වීමට කැමැති නම්, ඔහු ද පාස්කුව පිළිබඳ
නියෝග පිළිපදිමින්, එහි සම්ප්‍රදායයන් අනුව එය
පැවැත්විය යුතු ය. විදේශිකයකුට වේ වා
ස්වදේශිකයකුට වේ වා වලංගු වනුයේ එක ම
නියෝගය වේ.’ ”

## මඟපෙන්වීමේ වලාකුළ
(නික්ම 40:34-38)

15 මණ්ඩපය ඉදි කළ දවසේ දී, වලාකුළක් විත්
සම්මුඛ මණ්ඩපය වසා ගත්තේ ය. සවස පටන් උදය
දක්වා ගින්න වැනි පෙනුමක් එහි තිබිණි. 16 නිතර ම
එලෙසෙ විය. දවල් කාලයේ දී මණ්ඩපය වලාකුළකින්
වැසිණි. රාත්‍රි කාලයේ දී එහි ගින්න වැනි පෙනුමක්
තිබිණි. 17 මණ්ඩපයෙන් වලාකුළ ඉවත් කරනු ලැබූ
සෑම විට ම ඉශ්‍රායලේ ජනයා ද යන්නට පිටත් වූ
හ. වලාකුළ යළි පහළ වූයේ යම් තැනක ද එතැන
ඉශ්‍රායලේ ජනයා තම තමන්ගේ කූඩාරම් ගැසූ හ.
18 මෙලෙසෙ ඔව්හු සමිඳාණන් වහන්සේගේ අණ
පරිදි යන්නට පිටත් වූ හ; සමිඳාණන් වහන්සේගේ
අණ පරිදි කූඩාරම් ගැසූ හ. වලාකුළ සම්මුඛ
මණ්ඩපය වසා සිටි මුළු කාලය තුළ ම ඔව්හු තම
තමන්ගේ කූඩාරම්වල පදිංචි වූ හ. 19 බොහෝ
දවසක් වලාකුළ මණ්ඩපය වසාගෙන සිටි විට ද
ඔව්හු සමිඳාණන් වහන්සේගේ අණට කීකරු ව
ඉදිරියට ගමන් නොකළහ. 20 මෙලෙසෙ වලාකුළ
මණ්ඩපය මත දින ස්වල්පයක් තිබූ විට සමිඳාණන්
වහන්සේගේ අණ පරිදි ඔව්හු තමන්ගේ
කූඩාරම්වල පදිංචි වූ හ. සමිඳාණන් වහන්සේගේ
අණ පරිදි ඔව්හු යන්නට ද පිටත් වූ හ. 21 සමහර
විට වලාකුළ සවස සිට උදය දක්වා එහි තිබී, උදය
කාලයේ දී ඉවත් කරනු ලැබී නම් ඔව්හු යන්නට වූ
හ. දවල් කාලයේ හෝ රාත්‍රි කාලයේ හෝ වේ වා,
වලාකුළ ඉවත් කරනු ලැබූ විට ඔව්හු යන්නට පිටත්
වූ හ. 22 දවස් දෙකෙක් හෝ මාසයක් හෝ අවුරුද්දක්
හෝ වලාකුළ මණ්ඩපය මත රැඳී තිබුණේ නම්,
ඉශ්‍රායලේ ජනයා පිටත් ව නොගොස්, තමන්ගේ
කූඩාරම්වල පදිංචි වූ හ. එය ඉවත් කරනු ලැබූ විට
ඔව්හු යන්නට පිටත් වූ හ; 23 සමිඳාණන්
වහන්සේගේ අණ පරිදි ඔව්හු කූඩාරම්වල පදිංචි වූ
හ. එලෙසෙ ම ඔව්හු යන්නට ද පිටත් වූ හ. උන්
වහන්සේ මෝසෙස් මඟින් අණ කළ පරිදි ඔව්හු උන්
වහන්සේගේ නියමයන් ඉටු කළහ.

## රිදී හොරණෑ

10 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට මෙසේ වදාළ සේක: 2 “තැළු රිදීයෙන්
හොරණෑ දෙකෙක් සාදන්න. මුළු ජනතාව කැඳවීම
සඳහාත්, කූඩාරම් ගැලවීම සඳහාත් ඒවා භාවිතා කළ
යුතු ය. 3 ඒවා පිඹින කල මුළු ඉශ්‍රායලේ ජනතාව
ම සම්මුඛ මණ්ඩපයේ දොරකඩ නුඹ වෙතට
රැස්විය යුතු ය. 4 එහෙත්, එක හොරණෑවක්

පමණක් පිඹින කල ඉශ්‍රායෙලේ ගෝත්‍රයන්හි
මූලිකයන් වන ප්‍රධානීන් පමණක් ඔබ වෙතට
රැස්විය යුතු ය. 5 හොරණෑව රණ හඬ නැඟුව විට
පූර්ව දිශාවේ පිහිටි කූඩාරම්වල අය පිටත් විය යුතු
ය. 6 හොරණෑව දෙ වන වරටත් රණ හඬ නැඟුව
විට දක්ෂිණ දිශාවේ කූඩාරම්වල අය පිටත් විය යුතු
ය. මෙලෙසෙ පිටත් වී යාම රණ හඬ අනුව විය යුතු
වේ. 7 එහෙත්, මුළු ජනතාව එක්රැස් කිරීමට නම්,
රණ හඬ නොනඟා හොරණෑව පිඹිය යුතු ය.
8 හොරණෑ පිඹිය යුත්තෝ ආරොන්ගේ පුත්‍රයන්
වන පූජකවරු ය.
8 පහත දක්වන මේ නීතිය නුඹලාගේ පෙළෙපත්
තුළ සදහට ම වලංගු විය යුතු වේ. 9 නුඹලාගේ
දේශයෙහි, නුඹලාට පීඩා කරන සතුරාට විරුද්ධ ව
නුඹලා සටන් කරන විට රණ හඬ නගින ලෙසෙ
හොරණෑ පිඹිය යුතු වේ. නුඹලාගේ දෙවියන් වන
සමිඳාණන් වහන්සේ එවිට නුඹලා සිහිපත් කොට
සතුරාගෙනේ නුඹලා මුදාගනු ලබන්නහු ය.
10 ප්‍රීතිදායක අවස්ථාවල දී, ප්‍රසිද්ධ මංගල්‍යවල දී
හා පෝය දින සිදුකරන උත්සවවල දී, දවන යාග
පූජා සහ සහභාගිකමේ පූජා පුදන විට හොරණෑ
පිඹිය යුතු වේ. එය මඟින් නුඹලාගේ දෙවියන්
වහන්සේ නුඹලාට සිහිපත් වනු ඇත. නුඹලාගේ
දෙවි සමිඳාණන් වහන්සේ මම වෙමි.”

## ගමන් යාමට අණ දීම

11 දෙ වන අවුරුද්දේ, දෙ වන මාසයේ විසි වන
දින දී, සම්මුඛ මණ්ඩපයට ඉහළින් වලාකුළ ඉවතට
ගන්නා ලදී. 12 එවිට ඉශ්‍රායෙලේ ජනයා සීනයි
පාළුකරයෙනේ නික්ම යන්නට පිටත් වූ හ. වලාකුළ
පාරාන් නම් පාළුකරයේ රැඳී නැවතිණි. 13 එවිට
මෝසෙස් මඟින් සමිඳාණන් වහන්සේ දුන් අණ පරිදි
ඔව්හු ඉදිරියට ගමන් ගත්හ.
14 පළමුකොට ජුදාගේ දරුපරපුර පදිංචි වූ
කඳවුරේ ධජය යටතේ සිටි සේනාංක පිළිවෙළෙට
ගමන් ගත්හ. ජුදාගේ සේනාංකයේ සෙනේපතියා
අම්මිනාදාබ්ගේ පුත් නාෂොන් විය. 15 ඉස්සාකර්ගේ
ගෝත්‍රයට අයත් වූවන්ගේ සේනාංකයේ
සෙනේපතියා ශූවර්ගේ පුත් නතෙනේල් විය.
16 සාබුලොන්ගේ ගෝත්‍රයට අයත් වූවන්ගේ
සේනාංකයේ සෙනේපතියා හේලොන්ගේ පුත්
එලියාබ් විය.
17 එවිට මණ්ඩපය බාන ලදින්, ගේර්ෂොන්ගේ හා
මෙරාරීගේ දරුපරපුර එය උසුලාගෙන පිටත් ව
ගියහ.
18 ඉන්පසු රූබන්ගේ කඳවුරේ ධජය යටතේ සිටි
සේනාංක පිළිවෙළෙට ගමන් ගත්හ. රූබන්ගේ
සේනාංකයේ සෙනේපතියා ෂදෙවූර්ගේ පුත් එලිශූර්
විය. 19 සිමියොන්ගේ ගෝත්‍රයට අයත් වූවන්ගේ
සේනාංකයේ සෙනේපතියා ශූරිෂද්දයිගේ පුත්
ෂලුමියෙලේ විය. 20 ගාද්ගේ ගෝත්‍රයට අයත්
වූවන්ගේ සේනාංකයේ සෙනේපතියා දවෙයෙලේගේ
පුත් එලියාසාප් විය.
21 එවිට කොහාත්ගේ දරුපරපුර ශුද්ධස්ථානයේ
පූජා භාණ්ඩ උසුලාගෙන නික්ම ගියහ. ඊළඟ
කඳවුරට ඔවුන් පැමිණෙන විට මණ්ඩපය යළි ඉදි
කොට තිබිණි.
22 ඉන්පසු එප්‍රායිම්ගේ දරුපරපුර පදිංචි වූ
කඳවුරේ ධජය යටතේ සිටි සේනාංක පිළිවෙළෙට
ගමන් ගත්හ. එප්‍රායිම්ගේ සේනාංකයේ
සෙනේපතියා අම්මිහුද්ගේ පුත් එලිෂාමා විය.
23 මනස්සේගේ ගෝත්‍රයට අයත් වූවන්ගේ
සේනාංකයේ සෙනේපතියා පදොශූර්ගේ පුත්
ගමාලියෙලේ විය. 24 බෙන්ජමින්ගේ ගෝත්‍රයට අයත්
වූවන්ගේ සේනාංකයේ සෙනේපතියා ගිදයෝනිගේ
පුත් අබිදාන් විය.
25 ඉන්පසු දාන්ගේ දරුපරපුර පදිංචි වූ කඳවුරේ
ධජය යටතේ සිටි සේනාංක කඳවුර පිටුපසින් යන
ආරක්ෂක භටයන් මෙනේ පිළිවෙළෙට ගමන් ගත්හ.
දාන්ගේ සේනාංකයේ සෙනේපතියා අම්මිෂද්දයිගේ
පුත් අහියෙසෙර් විය. 26 ආෂෙර්ගේ ගෝත්‍රයට
අයත් වූවන්ගේ සේනාංකයේ සෙනේපතියා
ඔක්රාන්ගේ පුත් පගියෙලේ විය. 27 නප්තලීගේ
ගෝත්‍රයට අයත් වූවන්ගේ සේනාංකයේ
සෙනේපතියා ඒනාන්ගේ පුත් අහිරා විය.
28 ඉශ්‍රායෙලේ ජනයා පෙරෙටුවට ගමන් කළ විට
ඔවුන්ගේ සේනාංක ගමන් කළ පිළිවෙළ මෙසේ විය.
29 මෝසෙස් තම මාමා වන මිදියන්හි
රවුයෙලේගේ පුත් හොබබ්ට කතා කොට, “ ‘මම
නුඹට දෙන්නෙමි’ කියා සමිඳාණන් වහන්සේ වදාළ
ස්ථානයට අපි පිටත් ව යන්නෙමු. සමිඳාණන්
වහන්සේ ඉශ්‍රායෙලේ ජනයාට ශුභසිද්ධිය සැලසීමට
පොරොන්දු වී ඇති බැවින්, ඔබ ද අප සමඟ එන්න;
අපි ඔබටත් ශුභසිද්ධිය සලසන්නෙමු”යි කී ය.
30 එහෙත්, ඔහු පිළිතුරු දෙමින්, “මම නම් නොඑමි.
මාගේ ම රටටත්, මාගේ ම නෑයන් වෙතටත් මම
පිටත් ව යන්නෙමි”යි කීවේ ය. 31 එවිට මෝසෙස්
කතා කොට, “ඔබ කරුණාකර අප අත්හැර
නොයන්න. පාළුකරයේ කොතැන අප කඳවුරු බැඳිය
යුතු ද කියා ඔබ දන්නවා ඇත. මෙලෙසෙ ඔබ අපට
ඇස් දෙකෙ මෙනේ වටිනා මාර්ගෝපදේශකයකු වනු
ඇත. 32 ඔබ අප සමඟ එන්නෙහි නම්, සමිඳාණන්
වහන්සේ අපට සලසන ශුභසිද්ධිය අපි ද ඔබට ම
සලසා දෙන්නෙමු”යි කීවේ ය.

## ජනයා නික්ම යාම

33 මෙසේ ඔව්හු සමිඳාණන් වහන්සේගේ
කන්දෙනේ නික්ම දවස් තුනක් ගමන් කළහ.
සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව ද ඔවුන්ට
කඳවුරු බැඳීමට සුදුසු ස්ථානයක් සොයනු පිණිස
ඔවුන්ට පෙරෙටුව, තුන් දිනක් ගමනෙහි යෙදිණි.
34 ඔවුන් නික්ම යන සෑම විට ම සමිඳාණන්
වහන්සේගේ වලාකුළ දවල් කාලයේ දී ඔවුන්ට
ඉහළින් තිබිණි.
35 ගීතා 68:1 ගිවිසුම් කරඬුව පිටත් ව යන සෑම
විට

q1 35 ම, මෝසෙස් මෙසේ යැදී ය:
q2 35 "සමිඳුනි, නැඟිටිනු මැනවි, ඔබ සතුරෝ විසිර
යත් වා!
q2 35 ඔබට වෛර කරන්නෝ ඔබෙන් පලා යත් වා!"
36 එය නැවතුණු සෑම විට ම ද, "ඉශ්‍රායලේ
ජනයාගේ පවුල් දස දහස් ගණන් වෙත, සමිඳුනි,
ඔබ යළි වැඩම කළ මැනව" කියා යැදී ය.

## සෙනඟ දොස් කීම

11 සෙනඟ දුක් ගැනවිලි ගැන කොඳුරන්නට
පටන්ගත් විට සමිඳාණන් වහන්සේ ඒවා
අසා, ඒවා ගැන අසතුටු වූයෙන්, උන් වහන්සේගේ
උදහස ඇවිළිණි. උන් වහන්සේ සෙනඟ අතරට
ගින්න එවූ විට, එය ඔවුන් දවා, කඳවුරේ එක
කොණක් වනසාලී ය. 2 එවිට සෙනඟ මෝසෙස්ට
මොරගෑ හ. ඔහු සමිඳාණන් වහන්සේ අයැදි කල,
ගින්න නිවී ගියේ ය. 3 උන් වහන්සේ එවූ ගින්න
ඔවුන් දවාලූ නිසා එම ස්ථානයට ඔහු තබේරා කියා
නම් තැබී ය.
4 ඉශ්‍රායලේ ජනයා අතර සිටි විදේශීහු කෑම
තණ්හාවට වසඟ වූ හ. ඉශ්‍රායලේ ජනයා පවා
හඬන්නට පටන්ගෙන, "අපට කෑමට මස් දෙන්නේ
කවුරු ද? 5 අප මිසර දේශයේ දී නොමිලේ කෑ මාලු
ද පිපිඤ්ඤා, කොමඩු, ලීක්ස්, රතු ලූනු හා සුදු ලූනු ද
අපට මතක ය. 6 දැන් නම් අපි හමේබත් වී සිටිමු.
අපේ ඇහැට පේන මන්නා ආහාරය හැර වෙන
කිසිවක් අපට නැතැ"යි කීවෝ ය.
7 නික්ම 16:31 මන්නා, කොත්තමල්ලි ඇට මෙන්
විය. එහි පැහැය සුවඳලාටු මෙන් විය. 8 සෙනඟ
ඔබමොබ ගොස් ඒවා රැස් කොට, ගලෙන් අඹරා
හෝ වංගෙඩියේ ලා කොටා හෝ බඳුන්වල පිළියෙළ
කොට රොටි සෑදූ හ. එහි පිරිසිදු තෙලින් බැදූ
රොටිවල මෙන් රහක් තිබිණි. 9 නික්ම
16:13-15රාත්‍රියේ දී කඳවුර මත පිණි වැටුණු විට,
එය සමඟ මන්නා වැටිණි.
10 සෙනඟ ද පවුල් වශයෙන්, තම තමන්ගේ
කූඩාරම් දොරකඩ සිට හඬනු මෝසෙස්ට ඇසිණි.
සමිඳාණන් වහන්සේගේ කෝපය ද ඉමහත් ලෙස
දැල්විණි. මෝසෙස් දුකට පත් විය.
11 ඔහු සමිඳාණන් වහන්සේට කතා කොට, "ඔබේ
සේවකයාට ඔබ පීඩා කරන්නේ මන් ද? ඔබට මා
අප්‍රසන්න වී ඇත්තේ කුමන හේතුවකින් ද? මේ
මුළු සෙනඟ ගැන වගකීම ඔබ මට පවරා
තිබෙන්නේ ඇයි? 12 මම මේ මුළු සෙනඟ පිළිසිඳ
නොගත්තෙමි. 'ඔවුන්ගේ පියවරුන්ට පොරොන්දු වූ
දේශයට, කිරි මවක කිරි බොන දරුවෙකු උසුලාගෙන
යන ලෙස, ඔවුන් ඔබේ තුරුල්ලේ රැගෙන යන්න'
කියා ඔබ මට කීමට ඇත්තෙන් ම ඔවුන් ජනිත
කළේ මම ද? 13 මේ මුළු සෙනඟට මා මස්
කොහෙන් සොයා ගෙනැවිත් කන්න දෙන්න ද? 'අපට
කන්නට මස් දෙන්නැ'යි කියා ඔව්හු මා ළඟ හඬමින්
සිටිති. 14 මුළු සෙනඟ ගැන වගකීම මට තනි ව
දැරීමට බැරි ය. 15 ඔබ මට මෙසේ කරන්නෙහි නම්,
කරුණාකර, මා මරාදමනු මැනවි. එවිට මගේ
කාලකණ්ණිකම මට ම නොපෙනේ යනු ඇතැ"යි
කීවේ ය.

## ප්‍රජා මූලිකයන් හැත්තෑදෙනෙකු තෝරා ගැනීම

16 එවිට, සමිඳාණන් වහන්සේ මෝසෙස්ට පිළිතුරු
දෙමින්, "නුඹ දන්නා පරිදි සෙනඟ අතර නායකයන්
හා නිලධාරීන් වන ඉශ්‍රායලේ සෙනඟගේ ප්‍රජා
මූලිකයන්ගෙන් හැත්තෑදෙනෙකු මා වෙත
කැඳවාගෙන එන්න. නුඹ සමඟ ඔවුන් ද පෙනී සිටින
පරිදි සම්මුඛ මණ්ඩපය වෙත ඔවුන් ගෙන එන්න.
17 මම බැසැවිත් නුඹ සමඟ එහි දී කතා කරන්නෙමි.
නුඹ මත ඇති ආත්මානුභාවයෙන් කොටසක් ගෙන
මම ඔවුන් පිට ද තබන්නෙමි. එවිට සෙනඟ පිළිබඳ
වගකීම නුඹ තනියම නො උසුලා ඔවුන් ද නුඹ
සමඟ එය උසුලනු ඇත. 18 සෙනඟට කතා කොට
මෙසේ කියන්න: එනම්, 'නුඹලා හෙට දවස සඳහා
පවිත්‍ර වන්න. නුඹලාට මස් කෑමට ලැබෙනු ඇත.'
'අපට කන්න මස් දෙන්නේ කවුරු ද? මිසරයේ දී නම්
අපට සැප තිබුණා නොවේ ද?' කියා නුඹලා
සමිඳාණන් වහන්සේගේ කනට ඇසෙන්නට හැඬුවහු
ය. එබැවින් උන් වහන්සේ නුඹලාට කෑමට මස් දෙන
සේක. නුඹලා එය කනු ඇත. 19 නුඹලා එය දවසක්,
දෙකෙක්, දවස් පහක්, දහයක්, විස්සක් හෝ නොව
20 මුළු මාසයක් ම නාහෙන් කටින් දාන තෙක්, එය
අප්‍රිය වන තෙක් කනු ඇත. මන්ද, ඔබ අතර සිටින
අය සමිඳාණන් වහන්සේ ප්‍රතික්ෂේප කොට, 'මිසර
දේශයෙන් අප පිටතට ගෙනාවේ මන් ද?' කිය කියා
හැඬූ නිසා"යි වදාළ සේක.
21 මෝසෙස් උන් වහන්සේ අමතා, "මා අවට සිටින
පාබල සෙනඟ හයදාහකි. 'මම ඔවුන්ට මුළු මාසයක්
ම කෑමට මස් දෙමි'යි ඔබ වදාරන සේක. 22 ඔවුන්
උදෙසා එළු බැටළු සහ ගව පට්ටි මැරුවොත්, ඔවුන්ට
සෑහේ ද? එසේ නැත්නම් මුහුදේ මසුන් සියල්ල
එකට එක්රැස් කළොත් ඔවුන්ට සෑහේ දැ"යි ඇසී ය.
23 එවිට සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට, "මාගේ බලයට සීමා තිබේ ද? මා කියන දේ
වන්නේ ද නොවන්නේ ද? කියා නුඹ දැන් දකිනු
ඇතැ"යි වදාළ සේක.
24 මෝසෙස් නික්ම ගොස් සමිඳාණන් වහන්සේ
වදාළ දේ සෙනඟට දන්වා, ප්‍රජා මූලිකයන්
හැත්තෑදෙනෙකු කැඳවා, කූඩාරම වටේට ඔවුන්
සිටවේවේ ය. 25 සමිඳාණන් වහන්සේ වලාකුළකින්
බැස, අවුත් මෝසෙස්ට කතා කොට, ඔහු මත වූ
ආත්මානුභාවයෙන් කොටසක් ගෙන මූලිකයන්
හැත්තෑදෙනාට දුන් සේක. ආත්මානුභාවය ඔවුන් මත
පහළ වූ විට, ඔව්හු මඳ වේලාවක් දිවැස් වැකි
කීමට පටන්ගත්හ.
26 එහෙත් මොවුන්ගෙන් දෙදෙනෙක් කඳවුරෙහි
නැවතී සිටියහ. එක් කෙනෙකුගේ නම එල්දාද් ය,
අනික් තැනැත්තා මේදාද් ය. මොවුහු සෙසන් අතර
ලේඛනගත වී තිබුණ නමුත් කූඩාරමට නොගියහ.
එහෙත්, ආත්මානුභාවය ඔවුන් මත ද පහළ වූයෙන්

කඳවුර තුළ ඔව්හු ද දිවැස් වැකි කී හ. 27 එවිට එක්
තරුණයෙක් දිව ගොස් එල්දාද් සහ මේදාද් කඳවුර
තුළ දිවැස් වැකි කියන බව මෝසෙස්ට සැළ කළේ
ය.
28 එවිට තරුණ වියේ පටන් මෝසෙස්ට සේවය
කළ නූන්ගේ පුත්, ජෝෂුවා කතා කොට, “මා පිය
මෝසෙස් තුමනි, ඔවුන් නවතාලන්නැ”යි ඉල්ලී ය.
29 මෝසෙස් ඔහුට කතා කොට, “ඔබ මාගේ
යහපතට ඊර්ෂ්‍යා කරන්නහෙි ද? දෙවිඳාණෝ උන්
වහන්සේගේ මුළු සෙනඟ දිවැසිවරුන් කර, ඔවුන්
හට සිය ආත්මානුභාවය දෙන සේක් නම් කතෙරම්
අනගි දැ”යි පිළිතුරු දුනි. 30 මෙසේ කියා මෝසෙස්
සහ ප්‍රජා මූලිකයෝ ආපසු කඳවුරට ගියහ.

### වටුවන් පැමිණීම

31 සමිඳාණන් වහන්සේ මුහුදින් සුළඟක් හමන්නට
සැලැසූ සේක. ඒ සුළඟ වටුවන් ගසාගෙන අවුත්
කඳවුර සමීපයෙහි ඔවුන් හළේ ය. කඳවුර වටේට
දවසක ගමනක් පමණ දුරට ද පොළොවෙන්
මීටරයක් පමණ ඉහළට ද ඔවුන් වැටී තිබිණි.
32 සෙනඟ එදින මුළු රූ සහ දවල් ද, ඊට පසු දින ද
වටුවන් එකතු කිරීමෙහි යෙදී සිටියහ. ඉතා අඩුවෙනේ
ම එකතු කරගත් තැනැත්තා ඒවායින් කිලෝග්‍රෑම්
දහසක් එකතු කරගත්තේ ය. ඉන්පසු ඔව්හු කඳවුර
වටේට ම උන් ඇතුරුවෝ ය. 33 ඔවුන් ඒ මස් කටට
ගෙන, එය විකන්නටත් පෙර සෙනඟට විරුද්ධ ව
සමිඳාණන් වහන්සේගේ උදහස ඇවිළී යෑමෙන්, උන්
වහන්සේ මහා වසංගතයකින් සෙනඟට පීඩා කළ
සේක. 34 තවද, එහි දී තෑදරකම් කළ සෙනඟ
වළලන ලද බැවින්, එම ස්ථානයට තෑදරකමේ
මිනීවළවල් යන අරුත ඇති කිබ්රොත්-හත්තාවා යන
නම තැබී ය.
35 සෙනඟ කිබ්රොත්-හත්තාවා යන ස්ථානයෙනේ
නික්ම, හශේරොත් දක්වා ගොස් එහි පදිංචි වූ හ.

### මිරියම්ට දඬුවම් දීම

12 මෝසෙස්, කුෂ් නම් දේශයෙනේ කුෂ් ජාතික
ස්ත්‍රියක සරණ පාවාගත් හයෙින් මිරියම්
සහ ආරොන් ඔහුට විරුද්ධ ව කතා කළහ.
2 “සමිඳාණන් වහන්සේ කතා කළේ මෝසෙස්
මඟින් පමණක් ද? උන් වහන්සේ අප මඟින් පවා
කතා නොකරන සේක් දැ”යි ඔව්හු කීවෝ ය.
සමිඳාණන් වහන්සේට එය ඇසිණි. 3 මිහි පිට සිටි
සියලු මිනිසුන් අතරෙනේ මෝසෙස් අතිනිහතමානී
කෙනෙක් විය.
4 සමිඳාණන් වහන්සේ හදිසියෙනේ මෝසෙස්ට,
ආරොන්ට සහ මිරියම්ට කතා කොට, “නුඹලා
තිදෙන සම්මුඛ මණ්ඩපයට නික්ම ආ යුතු ය”යි
වදාළ සේක. ඔව්හු ද එහි ගියහ. 5 උන් වහන්සේ
වලා ටැඹකින් බැස අවුත්, සම්මුඛ මණ්ඩපයේ
දොරකඩ වැඩ සිට, ආරොන් සහ මිරියම් කැඳවූ
සේක. ඔව්හු දෙදෙන පැමිණියහ. 6 එවිට උන්
වහන්සේ කතා කොට,

q2 6 “මා වදනට සවන් දෙන්නේ;
q2 6 දිවැසිවරු ඔබ අතර සිටිත් නම්, සමිඳුන් ඔවුන්ට
ප්‍රකාශ වනුයේ දර්ශනවලිනි;
q2 6 ඔවුන්ට කතා කරනුයේ සිහිනවලිනි:
7 හබේ‍රව 3:2 මා සේවක මෝසෙස් එසේ
නොවේ, ඔහුට මාගේ මුළු සෙනඟ භාර දී ඇත.
8 මම ඔහු සමඟ මුහුණට මුහුණ ලා කතා කරමි,
ගුප්ත වදනින් නොව, පැහැදිලි ව, කතා කරමි.
q2 8 ඔහු සමිඳුන්ගේ රූපය දකිනු ඇත.
q2 8 එබැවින් මාගේ සේවක මෝසෙස්ට විරුද්ධ ව
කතා කිරීමට නුඹලා එඩිතර වූයේ කෙසේ දැ’යි ඇසූ
සේක.
9 සමිඳාණන් වහන්සේගේ උදහස ඔවුන්ට විරුද්ධ
ව ඇවිළිණි. උන් වහන්සේ නික්ම ගිය සේක.
10 වලාකුළ මණ්ඩපයෙනේ ඉවත් විය. පුදුමයකි!
මිරියම්ට හිම මෙනේ සුදු කුෂ්ඨ රෝගයක් වැළඳී
තිබිණි. ආරොන් ඈ දෙස බැලූ විට ඈට කුෂ්ඨයක්
තිබෙන බව පෙනිණි. 11 එවිට ආරොන් මෝසෙස්ට
කතා කොට, “අහෝ ස්වාමීනි! අපගේ මෝඩකමින්
අප කළ පාපයේ වගකීම අප පිට පවරනු
නොමැනවි. 12 ඈ මවු කුසින් බිහි වන, මාංසයෙනේ
කොටසක් දිරා ගිය, මළ කෙනෙකු මෙනේ නො වේ
වා”යි කීවේ ය. 13 මෝසෙස් සමිඳාණන් වහන්සේට
මොරගසමින්, “මාගේ දෙවිඳුනි, ඈ වහා ම සුව
කරන ලෙස, මම ඔබගෙනේ අයැදිමි”යි කියා කෑගැසී
ය.
14 ඉන්පසු සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතා,
“ඇගේ පියා ඇගේ මූණට කෙළ ගැසී නම්, ඈ දින
හතක් තුළ ලජ්ජා නොවිය යුතු ද? එබැවින් දින
හතකට ඈ කඳවුරෙනේ නෙරපාදමනු ලැබිය යුතු ය.
ඉන්පසු ඇය කඳවුර තුළට බාර ගත හැකි ය”යි
වදාළ සේක.ගණන් 5:2-3 15 දින හතකට මිරියම්
කඳවුරෙනේ නෙරපාදමනු ලැබුවා ය. ඈ යළි පැමිණෙන
තෙක් සෙනඟ ද යන්නට පිටත් නො වූ හ.
16 ඉන්පසු සෙනඟ හශේරොත් නම් ස්ථානයෙනේ
නික්ම ගොස් පාරාන් නම් පාළුකරයේ කඳවුරු
බැඳගත්හ.

### චරපුරුෂයන් යැවීම
(ද්වි.නී. 1:19-33)

13 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට, 2 “මා ඉශ්‍රායලේ ජනයාට දෙන්නට
යන කානාන් දේශයට චරපුරුෂයන් යවන්න.
නුඹලාගේ පිය ගෝත්‍ර සෑම එකකින් ම එක්කෙනා
බැගින් ඔවුන් අතර මූලිකයන් වන අය යවන්නැ”යි
වදාළ සේක. 3 ඔහු ද සමිඳාණන් වහන්සේගේ
අණට කීකරු ව පාරාන් නම් පාළුකරයෙනේ ඔවුන් යැවී
ය. ඒ සියල්ලෝ ඉශ්‍රායලේ ජනයා අතර මූලිකයෝ
වූ හ.
4 මොවුන්ගේ නාමාවලිය මෙසේ ය: රූබන්ගේ
ගෝත්‍රයෙනේ සක්කූර්ගේ පුත් ෂම්මුවා ය.
5 සිමියොන්ගේ ගෝත්‍රයෙනේ හෝරීගේ පුත් ෂාපාත්
ය. 6 ජුදාගේ ගෝත්‍රයෙනේ ජෙපුන්නේගේ පුත්
කාලබේ ය. 7 ඉස්සාකර්ගේ ගෝත්‍රයෙනේ

ජෝසෙප්ගේ පුත් ඉගාල් ය. 8 එප්‍රායිම්ගේ
ගෝත්‍රයෙන් නූන්ගේ පුත් හෝෂෙයා ය.
9 බෙන්ජමින්ගේ ගෝත්‍රයෙන් රාපුගේ පුත් පල්තී
ය. 10 සාබුලෝන්ගේ ගෝත්‍රයෙන් සෝදිගේ පුත්
ගද්දියෙල් ය. 11 ජෝසෙප්ගේ ගෝත්‍රයෙන්, එනම්
මනස්සේගේ ගෝත්‍රයෙන් සුසිගේ පුත් ගද්දී ය.
12 දාන්ගේ ගෝත්‍රයෙන් ගමෙල්ලීගේ පුත්
අම්මියෙල් ය. 13 ආෂෙර්ගේ ගෝත්‍රයෙන්
මිකායෙල්ගේ පුත් සතූර් ය. 14 නප්තලීගේ
ගෝත්‍රයෙන් වොප්සීගේ පුත් නාබී ය. 15 ගාද්ගේ
ගෝත්‍රයෙන් මාකීගේ පුත් ගෙයුවෙල් ය.
16 ඉහත දැක්වූයේ මෝසෙස් කානාන් රටට යැවූ
චරපුරුෂයන්ගේ නාමාවලිය යි. තවද, ඔහු නූන්ගේ
පුත් හෝෂෙයාගේ නම වෙනස් කොට ඔහුට
ජෝෂුවා යි යන නම තැබී ය.
17 මෝසෙස් කානාන් දේශයට ඔවුන් චරපුරුෂයන්
සේ යවමින්, ඔවුන් අමතා, “දකුණු දිශාවට ගොස්,
ඉන්පසු කඳුකරයට යන්න. 18 කුමන විධියේ රටක්
ද? එහි වාසීන් බලසම්පන්න ද දුබල ද? එහි
ජනගහනය හිඟ ද බහුල ද? 19 ඔවුන් පදිංචි භූමිය
හොඳ ද නරක ද? ඔවුන් පදිංචි නුවර කුමන විධියේ
ද? ඔවුන් පදිංචි ව සිටින්නේ කූඩාරම්වල ද
බලකොටුවල ද? 20 ඒ රට සරු ද නිසරු ද? මූකලාන්
එහි ඇද්ද නැද් ද? යන වග සොයා බලන්න. තවද,
ධෛර්ය ගෙන, ඒ රටේ පලතුරුවලින් යමක්
ගෙනෙන්නැ”යි කීවේ ය. ඒ කාලය පළමු වරට මිදි
ගෙඩි නෙළෙන වාරය විය.
21 එවිට ඔව්හු උතුරට ගොස්, ශීන් නම්
පාළුකරයේ සිට හමාත් නම් දුර්ගයේ පිහිටි
රෙහොබ් දක්වා වූ රටෙහි ඔත්තු බැලූ හ. 22 ඉන්පසු
ඔව්හු දකුණට ගොස් හෙබ්‍රොන් නම් ස්ථානයට
පැමිණියහ. එහි අනාක්ගේ පරම්පරාවෙන් වූ අහීමන්,
ෂේෂයි සහ තල්මයි යන අයගේ ගෝත්‍රිකයෝ
සිටියහ. තවද, හෙබ්‍රොන් නුවර ගොඩනඟන ලද්දේ
මිසරයේ ශෝවන් නුවරට සත් අවුරුද්දකට
ප්‍රථමයෙනි. 23 ඉන්පසු ඔව්හු එෂ්කොල් මිටියාවතට
අවුත්, එහි දී මිදි පොකුරක් ඇති රිකිල්ලක්
කපාගෙන, එය හරස් ලීයක එල්ලා, දෙදෙනෙකේ එය
තබලාගෙන ආහ. ඔව්හු දෙළුම් සහ අත්තික්කා ද
ගෙනාවෝ ය. 24 එම ස්ථානයට එෂ්කොල් මිටියාවත
ය යි නම් කරන ලද්දේ ඉශ්‍රායෙල් ජනයා එහි දී
කපාගත් මිදි පොකුර නිසා ය.
25 දවස් හතළිහකට පසු ඔව්හු රටේ ඔත්තු බලා
ආපසු පැමිණියහ. 26 පාරාන් පාළුකරයේ කාදෙෂ් නම්
ස්ථානයේ සිටි මෝසෙස්, ආරොන් සහ මුළු
ඉශ්‍රායෙල් ජනතාව වෙත ඔව්හු පැමිණ, ඔවුන්
සියල්ලන්ට රටේ යථා තත්ත්වය වාර්තා කර, තමන්
ඒ රටින් ගෙනා පලතුරු පෙන්වූ හ. 27 ඔව්හු
මෝසෙස් අමතා, “ඔබ අප යැවූ දේශයට අපි
ගියෙමු. ඇත්තට ම ඒ නම් කිරෙන් හා මී පැණියෙන්
ඉතිරෙන රටකි. මෙන්න, එහි පලතුරු. 28 එහෙත්, ඒ
දේශවාසීහු බලසම්පන්න ය. ඔවුන්ගේ නගර
පවුරුවලින් වට කොට ඇත; ඒවා අති විශාල ය;
ඇරත් අපි එහි දී අනාක්ගේ දරුමුණුබුරන් ද දුටිමු,
29 අමලෙක්වරු රටේ දකුණු දිශාවේ වාසය කරති,
හිත්තීවරු සහ ජෙබුසිවරු, අමෝරිවරු කඳුකරයේ
වාසය කරති; කානානිවරු මුහුදුබඩ ද ජෝර්දාන් ගඟ
අසබඩ ද වාසය කරති”යි කී හ.
30 එවිට කාලබ්, මෝසෙස්ට විරුද්ධ ව මැසිවිලි කී
සෙනඟ නිහඬ කරමින්, “අපි වහා ම ගොස්, එය
හිමි කර ගනිමු. ඔවුන් පරාජය කිරීම පහසුවෙන් ම
කළ හැකි යැ”යි කී ය.
31 එහෙත්, ඔහු සමඟ ගිය සෙසු චරපුරුෂයෝ
කතා කරමින්, “සෙනඟ පරාජය කිරීමට තරම් අප
බලසම්පන්න නොවෙන්නට පුළුවන, ඔව්හු අපට වඩා
ශක්ති සම්පන්න ය”යි කී හ. 32 මෙලෙස ඔව්හු
තමන් ඔත්තු බැලූ රට ගැන අසත්‍ය වාර්තාවක්
ඉශ්‍රායෙල් ජනයාට දෙමින්, “අප ඔත්තු බැලීමට ගිය
රට නම්, වැසියන් කාදමන රටකි. එහි අප දුටු
මිනිසුන් සියල්ලෝ ම උස මහත මිනිස්සු ය. 33 උත්
6:4එහි දී, යෝධයන්ට නෑකම් කියන අනාක්ගෙන්
පැවතෙන යෝධ පරපුරක් අපි දුටිමු. ඔවුන් ඉදිරියෙහි
අප පළඟැටියන් මෙන් අපට ම පෙනුණේ ය. අප ද
ඔවුන්ටත් එලෙස ම පෙනෙන්නට ඇතැ”යි කී හ.

## සෙනඟ මැසිවිලි දෙඩීම

14 එදින රාත්‍රියේ මුළු සෙනඟ ම ශබ්ද නඟා
කෑගසමින් හඬන්නට වූ හ. 2 ඉශ්‍රායෙල්
ජනයා, මෝසෙස්ට හා ආරොන්ට විරුද්ධ ව මැසිවිලි
කී හ. මුළු ජනතාව ම ඔවුන්ට කතා කොට, “මිසර
දේශයේ අපි මැරී ගියෙමු නම් කොතරම් හොඳ ද!
එසේ නැත් නම් පාළුකරයේ මිය ගියෙමු නම්
කොතරම් හොඳ ද! 3 යුද්ධයෙන් අප නසාලන්නටත්,
අපේ අඹුදරුවන් බිලි කරන්නටත්, සමිඳාණන්
වහන්සේ මේ දේශයට අපව ගෙනාවේ ඇයි දැ”යි
කී හ. 4 ඉන්පසු ඔව්හු එකිනෙකොට කතා කොට,
“අපි නායකයෙකු තෝරාගෙන මිසර දේශයට යමු”යි
කතා කරගත් හ.
5 එවිට මෝසෙස් සහ ආරොන් මුළු ඉශ්‍රායෙල්
ජනතාව ම ඉදිරියෙහි මුණින්තලා වැටුණාහ. 6 රටේ
ඔත්තු සොයා ගියවුන් අතර නූන්ගේ පුත් ජෝෂුවා ද
ජෙපුන්නේගේ පුත් කාලබ් ද දුකින් තම වස්ත්‍ර
ඉරාගත්හ. 7 ඉන්පසු ඔව්හු මුළු ඉශ්‍රායෙල් ජනතාව
ම අමතා, “අප ඔත්තු සොයමින් ගිය රට ඉතා ම
සාරවත් රටකි. 8 සමිඳාණන් වහන්සේ අප ගැන
ප්‍රසන්න වන සේක් නම්, උන් වහන්සේ අප මේ
රටට පමුණුවා, එය අපට ලබා දෙන සේක. ඒ රට
කිරෙන් හා මී පැණියෙන් ඉතිරෙන රටකි. 9 හෙබ්‍රෙ
3:16සමිඳාණන් වහන්සේට විරුද්ධ ව පමණක් කැරලි
නොගසන්න. ඒ රට වාසීන්ට ද බිය නොවෙන්න.
මන්ද, අපි ඔවුන් ගොදුරු කොට ගන්නෙමු.
සමිඳාණන් වහන්සේ අප සමඟ වන බැවින් ඔවුන්ට
අරක්ගත් දෙවිවරුන් ඔවුන්ගෙන් ඉවත ගොස් ඇත.
ඔවුන්ට බිය නොවෙන්නැ”යි කීවෝ ය. 10 එහෙත්,
මුළු ජනතාව ගල් ගසා ඔවුන් මැරීමට ලකලෑස්ති වූ
හ. එවිට මුළු ඉශ්‍රායෙල් ජනයා ඉදිරියෙහි සම්මුඛ

මණ්ඩපය මත සමිඳාණන් වහන්සේගේ
මහිමාලංකාරය දර්ශනය විය.

## මෝසෙස් සෙනඟ උදෙසා අයැදීම

11 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට,
“මේ සෙනඟ කොපමණ කල් මා හෙළා දකින්නෝ
ද? ඔවුන් මැද මා කළ හාස්කම් දැක දැකත් ඔවුන්ට
මා කෙරෙහි විශ්වාසය තැබීමට තව කොපමණ කල්
ගතවේ ද? 12 මම වසංගතයකින් ඔවුන්ට පහර දී,
ඔවුන්ගේ උරුමය අහෝසි කරදමමි. ඔවුන්ට වඩා
බලසම්පන්න, විශාල ජාතියක් නුඹ මඟින් ඇති
කරන්නෙමි”යි වදාළ සේක.
13 නික්ම 32:11-14 එවිට මෝසෙස් සමිඳාණන්
වහන්සේට පිළිතුරු දෙමින්, “මහ බලපරාක්‍රමය
පාමින් මේ සෙනඟ මුදාගෙන පැමිණියේ ඔබ
වහන්සේ බව මිසර වැසියෝ දනිති. ඔවුන් මෙය
අසන විට, 14 එරට වැසියන්ට ද එය කියනු ඇත.
තවද, සමිඳාණන් වහන්සේ වන ඔබ මේ සෙනඟ
මැද වැඩ වසන බවත්, ඔබ ඔවුන්ට මුහුණට මුහුණ
ලා පෙනෙන බවත්, ඔබගේ ලකුණ වන වලාකුළ
ඔවුන්ට ඉහළින් රඳා සිටින බවත්, ඔබ ඔවුන්ට
පෙරටුව, දවල් කාලයේ දී වලා ටැඹක් මඟින් ද,
රාත්‍රි කාලයේ දී ගිනි ටැඹක් මඟින් ද වැඩම කරන
බවත් ඔවුන් අසා ඇත. 15 දැන් ඉතින්, ඔබ වහන්සේ
ඔවුන් සමූලඝාතනය කරන සේක් නම්, ඔබ
වහන්සේගේ කීර්තිය ගැන ඇසූ ජාතීහු කතා කොට,
16 ‘සමිඳාණන් වහන්සේ ඔවුන්ට දිවුරා පොරොන්දු
වූ දේශයට ඔවුන් ගෙනෙන්නට නොහැකි වූ බැවින්,
උන් වහන්සේ ඔවුන් පාළුකරයේ දී මරාදැමූ
සේකැ’යි කියන්නාහ. 17+NUM නික්ම 20:5-6; 34:6-7;
ද්වි.නී. 5:9-10; 7:9-10ඔබ වදාරා ඇති පරිදි,
සමිඳාණන් වහන්සේ වන ඔබ පහසුවෙනේ
නොකිපෙන සුලු ය, ඉමහත් සේ දයා පාන සේක,
අදමිටුකම් හා නපුරුකම් කමා කරන සේක,
වැරදිකරුට දඬුවම් නොකර නොහරින සේක,
පියවරුන්ගේ දමිටුකම් නිසා ඔවුන්ගේ දරු
මුණුබුරන්ට තුන් වන හතර වන පරම්පරාව දක්වා
දඬුවම් කරන සේක. එසේ පොරොන්දු වූ ලෙසෙ දැන්
කරුණාකර ඔබ වහන්සේගේ බලපරාක්‍රමය විදහා
පෑව මැනව. 19 එබැවින්, කරුණාකර, ඔබ
වහන්සේගේ ඉමහත් දයාව පෑම අනුව, මොවුන්
මිසරයෙනේ පැමිණි දින සිට අද දක්වා කමා කළ
ලෙසෙ, මේ සෙනඟට කමා කරනු මැනවැ”යි අයැදී ය.
20 සමිඳාණන් වහන්සේ පිළිතුරු දෙමින්, “නුඹේ
ඉල්ලීම පරිදි මම ඔවුන්ට කමා කළෙමි. 21 හබේරෙ
3:18එහෙත්, මාගේ නාමයෙනේ ද, මුළු ලෝකය
මාගේ මහිමාලංකාරයෙනේ පිරී පවතින තකේ ද මා
දිවුරා කියන්නේ මේ ය: 22 ‘ඒ මුළු සෙනඟ මාගේ
මහිමාලංකාරය හා මිසරයේ සහ පාළුකරයේ මා
කළ හාස්කම් දැක දැකත්, දස වාරයකට වඩා මා
පරීක්ෂා කොට, මා හඬට සවන් නුදුන් බැවින් 23 මා
ඔවුන්ගේ පියවරුන් හට දිවුරා පොරොන්දු වූ දේශය
ඔව්හු සත්තකට ම නොදකින්නෝ ය. ඔවුන් අතර
සිටින, මා හෙළා දුටු කිසිවකෙු ද එය නොදකිනු
ඇත. 24 ජෝෂු 14:9-12එහෙත් මාගේ සේවක
කාලබේට සසේසන්ට වඩා වනෙස් ආකල්පයක්
තිබුණු හයෙිනුත්, ඔහු මට සම්පූර්ණයනේ ම
පක්ෂපාත ව සිටි හයෙිනුත්, ඔහු ඇතුළු වූ රටට මම
ඔහු පමුණුවන්නමේි. ඔහුගේ පළෙපත ද එය හිමි
කරගනු ඇත.’ 25 දැනට එහි මිටියාවතේ
අමලකේවරු සහ කානානිවරු පදිංචි ව සිටිති.
එබැවින් හටෙ, ආපසු හැරී රතු මුහුදට යන
මාර්ගයනේ පාළුකරයට යන්නැ”යි වදාළ සේක.

## සෙනඟට දඬුවම් දීම

26 සමිඳාණන් වහන්සේ යළි මෝසෙස්ට සහ
ආරොන්ට කතා කොට, 27 “මට විරුද්ධ ව මැසිවිලි
කියන මේ නපුරු ජනතාව ගැන මම කොපමණ කල්
ඉවසම් ද? ඉශ්රායලේ ජනයා මට විරුද්ධ ව කී
මැසිවිලි මා අසා ඇත. 28 එබැවින් ඔබ ඔවුන් අමතා
මෙසේ කියන්න: ‘නුඹලා මාගේ කනට ඇසෙන සේ
කී ලෙසෙ මා නුඹලාට කරන බවට, මම දිවුරමි’යි
සමිඳාණන් වහන්සේ වදාරන සේක. 29 හබේරෙ
3:17ජන සංගණනයේ දී ලියාපදිංචි කළ, වයස අවුරුදු
විස්සක් හා ඊට වඩා වයසැති, මට විරුද්ධ ව මැසිවිලි
කී සියල්ලෝ ම මේ පාළුකරයේ ම නසිනු ඇත.
30 ජපෙුන්නේගේ පුත් කාලබේ හා නූන්ගේ පුත්
ජෝෂුවා හැර, අන් කිසිවකෙු මා ඔබ හැම පදිංචි
කරවීමට පොරොන්දු දුන් රටට කිසි සේත් ඇතුළු
නොවනු ඇත. 31 ‘මම ඔවුන් බිලි දනේනට
යන්නමේ’යි කියා නුඹ පැවසූ නුඹේ කුඩා දරුවන් නම්
මම එහි ඇතුළු කරන්නමේි. නුඹලා හෙළා දුටු ඒ
දේශය ඔවුන් භුක්ති විඳිනු ඇත. 32 එහෙත්, නුඹලා
මේ පාළුකරයේ ම නසින්නහු ය. 33 ක්රියා
7:36නුඹලාගේ දරුපරපුර අවුරුදු හතළිහක් තුළ මේ
පාළුකරයේ ඒ මේ අත යමින්, නුඹලාගේ මළකඳන්
පසට හැරනෙ තකේ, නුඹලාගේ අවිශ්වාසවන්තකම
නිසා දුක් විඳින්නහු ය. 34 නුඹලා ඒ රටේ ඔත්තු
සවෙූ කාලය දවස් හතළිහක් නොවේ ද? හැබැයි,
එක එක දවසකට, එක එක අවුරුද්ද බැගින් සලකා,
අවුරුදු හතළිහක් තුළ නුඹලාගේ දුෂ්ටකම්වලට වග
කියමින්, මාගේ පොරොන්දු කඩ කිරීමේ විපාකයේ
බරපතලකම කතෙරම් ද කියා දැනගන්නහු ය.
35 මෙය වදාළේ සමිඳාණන් වහන්සේ වන මම ය.
මට විරුද්ධ ව පරෙමුණු බැඳගත් මේ මුළු නපුරු
ජනතාවට ම මම සත්තකට ම දඬුවම් කරමි. මේ
පාළුකරයේ ම ඔවුන් නැති නාස්ති වී වැනසී යනු
ඇතැ”යි වදාළ සේක.
36 මලෙසෙ මෝසෙස් විසින් රටේ ඔත්තු බැලීමට
යවනු ලැබ, ආපසු පැමිණි චරපුරුෂයන් රට ගැන
බොරු ආරංචි සැළ කළ බැවින් මුළු ජනතාව ම
මෝසෙස්ට විරුද්ධ ව මැසිවිලි කී හ. 37 තවද,
මෙසේ රට ගැන බොරු ආරංචි සැළ කළ ඒ අය,
සමිඳාණන් වහන්සේ විසින් එවන ලද වසංගතයකින්
වැනසී ගියෝ ය. 38 එහෙත්, රට ගැන ඔත්තු බැලූ
චරපුරුෂයන් අතර නූන්ගේ පුත් ජෝෂුවා සහ

ජපුන්නේගේ පුත් කාලබ් පමණක් නොමැරී ඉතිරි
වූ හ.

## ඉශ්‍රායෙල්වරු පරාජය වීම

(ද්වි.නී. 1:41-46)

39 මෝසෙස් මේ සියල්ල මුළු ඉශ්‍රායෙල් ජනයාට
සැළ කළ විට සෙනඟ තදින් වැලපුණාහ. 40 ඔව්හු
පසු දින අලුයම නැඟිට, කඳුකර ප්‍රදේශයට යන්නට
සූදානම් වෙමින්, "මෙන්න, දැන් අපි සමිඳාණන්
වහන්සේ අපට පොරොන්දු වූ ස්ථානයට නැඟී යමු.
අපි පව් කළෙමු"යි කී හ. 41 එවිට මෝසෙස් පිළිතුරු
දෙමින්, "දැන් ඉතින් ඔබේ සමිඳාණන් වහන්සේගේ
ආඥා කඩ කරන්නේ මන් ද? ඔබේ වෑයම නිෂ්ඵල
වේ. 42 මෙලෙස නොයන්න, සමිඳාණන් වහන්සේ
ඔබ මැද වැඩ සිටින්නේ නැත. ඔබේ සතුරන් ඔබට
පහර දෙනු ඇත. 43 ඔබ, අමලකේවරුන්ට සහ
කානානිවරුන්ට මුහුණ දෙන විට යුද්ධයෙන් නසින්නහු
ය. ඔබ හැම සමිඳාණන් වහන්සේගෙන් ඉවත ගොස්
සිටින බැවින්, උන් වහන්සේ ඔබ හැම මැද නතර
නොවන සේකැ"යි කී ය. 44 එහෙත්, ඔව්හු
හිතුවක්කාරකමින් නැඟී කඳුකර ප්‍රදේශයේ මුදුනට
ගියහ. සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව වත්
මෝසෙස් වත් කඳවුරෙන් නික්ම නොගියේ ය.
45 එවිට කඳුකර ප්‍රදේශයෙහි විසූ අමලකේවරු ද
කානානිවරු ද බැස අවුත් ඔවුන්ට පහර දී හෝර්මා
නම් ස්ථානය දක්වා ඔවුන් ලුහුබැඳ ගියෝ ය.

## පුද පඬුරු පිළිබඳ නියෝග

15 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට මෙසේ වදාළ සේක: 2 "ඉශ්‍රායෙල්
ජනයාට කතා කොට මෙසේ කියන්න: 'මා නුඹලාට
දෙන්නට යන නුඹලාගේ වාස භූමිය වන රටට
පැමිණි කල 3 ගව පට්ටිවලින් හෝ එළු බැටළු
පට්ටිවලින් හෝ ගත් සතකු සමිඳාණන්
වහන්සේගේ මහිමයට ගින්නෙන් දවා, දවන යාග
පූජාවක් වශයෙන් හෝ බාරයක් ඔප්පු කිරීමක්
වශයෙන් හෝ ස්වේච්ඡා පූජාවක් වශයෙන් හෝ
මංගල දිනක දී පුදන පූජාවක් වශයෙන් හෝ
පුදන්නහු නම්, ඒවා සමිඳාණන් වහන්සේ වෙත
නඟින සුමිහිරි සුවඳක් වනු ඇත. 4 තවද, එවැන්නක්
සමිඳාණන් වහන්සේට පුදන තැනැත්තේ, තලේ
ලීටර් එකක් සමඟ ඇනූ පිටි කිලෝග්‍රෑම් දෙකෙක්
ධාන්‍ය පූජාවක් වශයෙන් ගෙනා යුතු ය. 5 නුඹලා
දවන යාග පූජාවක් වශයෙන් පුදන එක් එක් බැටළු
පැටියකු සමඟ, පානීය පූජාවක් වශයෙන් මිදියුස
ලීටර් එකක් ද පිදිය යුතු ය. 6 නුඹලා පුදන එක් එක්
බැටළු වස්සකු සමඟ ධාන්‍ය පූජාවක් වශයෙන්
තලේ ලීටර් එකහමාරක් ඇනූ සිහින් පිටි
කිලෝග්‍රෑම් දෙකෙක් ද පිදිය යුතු ය. 7 තවද, පානීය
පූජාවක් වශයෙන් මිදියුස ලීටර් එකහමාරක් පිදිය
යුතු ය. මේවා සමිඳාණන් වහන්සේ වෙත නඟින
සුමිහිරි සුවඳක් වනු ඇත. 8 දවන යාග පූජාවක්
වශයෙන් හෝ බාරයක් ඔප්පු කිරීමක් හෝ
සහභාගිකමේ පූජාවක් වශයෙන් හෝ ගොනෙකු
සමිඳාණන් වහන්සේට ඔප්පු කරන කල 9 ගොනා
සමඟ ආහාර පූජාවක් වශයෙන් තලේ ලීටර් දෙකෙක්
ඇනූ සිහින් පිටි කිලෝග්‍රෑම් තුනක් ද ගෙනා යුතු ය.
10 පානීය පූජාවක් වශයෙන් මිදියුස ලීටර් දෙකෙක් ද
ගෙනා යුතු ය. ගින්නෙන් දවා පිදූ මෙය සමිඳාණන්
වහන්සේ වෙත නඟින සුමිහිරි සුවඳකි. 11 පූජා
කරන එක් එක් ගොනෙකු ද බැටළු වස්සෙකු ද
බැටළු පැටියෙකු ද සඳහා මෙලෙස කළ යුතු ය.
12 නුඹලා පුදන සතුන්ගේ ගණන අනුව, එක එක
සතා සම්බන්ධයෙන් මෙලෙස ඉටු කළ යුතු ය.
13 'ස්වදේශිකයන් සියලු දෙනා ම, සුමිහිරි සුවඳක්
සහිත පඬුරක් ගින්නෙන් දවා, සමිඳාණන් වහන්සේට
ඔප්පු කරන විට, මේ අයුරින් සියල්ල ඉටු කළ යුතු
ය. 14 තවද, නුඹලා සමඟ කලකට වසන
විදේශිකයෙක් වේ වා, නිත්‍ය පදිංචිය ඇති කෙනෙක්
වේ වා, සුමිහිරි සුවඳක් සහිත පඬුරක් ගින්නෙන්
දවා සමිඳාණන් වහන්සේට ඔප්පු කරන විට, නුඹලා
කරන හැටියට ම ඔහුත් කළ යුතු ය. 15 ඉශ්‍රායෙල්
ජනයා වන නුඹලාටත්, නුඹලා සමඟ කලකට වසන
විදේශිකයන්ටත් ඉදිරියට සදහට ම එක ම
නියෝගයක් වලංගු වනු ඇත. සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි නුඹලා සහ විදේශිකයන් එක සමාන වනු
ඇත. 16 ලෙවී 24:22නුඹලාටත්, නුඹලා සමඟ
කලකට වසන විදේශිකයන්ටත් එක ම නීතියක් සහ
එක ම නියෝගයක් වලංගු වනු ඇත.' "
17 යළි සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට මෙසේ වදාළ සේක: 18 "ඉශ්‍රායෙල් ජනයා
අමතා මෙය කියන්න: 'මා නුඹලා ව ගෙනෙන රටට
නුඹලා පැමිණි පසු 19 ඒ රටේ නිපද වූ ආහාර
අනුභව කරන විට, ඉන් කොටසක් විශේෂ පඬුරු
පිණිස සමිඳාණන් වහන්සේ වන මා සඳහා වෙන්
කළ යුතු ය. 20 අස්වැන්න නෙළෙන විට සමිඳාණන්
වහන්සේට විශේෂ පඬුරක් ඔප්පු කරන ලෙස, පළමු
ධාන්‍යවලින් සෑදූ රොටියක් ද ඔප්පු කළ යුතු ය.
21 මෙලෙස පළමු ධාන්‍යවලින් සෑදූ රොටියක්,
නුඹලාගේ සෑම පරම්පරාවක් ම සමිඳාණන්
වහන්සේට විශේෂ පඬුරක් කොට පිදිය යුතු ය.
22 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට වදාළ මේ
සියලු ආඥා යම් කිසි අතපසු වීමකින් නුඹලා කඩ
කළොත් 23 එසේ නැත් නම්, උන් වහන්සේ ඒවා
අණ කළ දින පටන් ඉදිරියට මතු පරම්පරාවන්,
මෝසෙස් මඟින් දුන් ආඥා කඩ කළොත්, 24 එසේ
වූයේ ජනතාවට නොදැනුවත්කමින් නම්, මුළු
ජනතාව ම සමිඳාණන් වහන්සේ වෙත නඟින
සුමිහිරි සුවඳැති දවන යාග පූජාවක් වශයෙන් එක
ගොන් වස්සෙකු ඔප්පු කළ යුතු ය. එය සමඟ සිරිත්
පරිදි ධාන්‍ය පූජාවක් සහ පානීය පූජාවක් ද, පාප
පූජාවක් සඳහා එළුවෙකු ද ඔප්පු කළ යුතු ය. 25 මුළු
ඉශ්‍රායෙල් ජනතාව ම උදෙසා පූජකවරයා පව් කමා
කිරීමේ පිළිවෙත ඉටු කළ පසු ඔවුන්ගේ පව්
නොදැනුවත්කමින් වූ නිසා, ඔවුන්ට කමා කරනු ඇත.
එහෙත් ඒ නොදැනුවත්කම උදෙසා ගින්නෙන් දවා
පුදන පඬුරු සහ ඔවුන්ගේ පාප පූජා සමිඳාණන්

වහන්සේ වෙත ගෙනා යුතු ය. 26 මුළු සෙනඟගේ
නොදැනුවත්කමින් වූ නිසා මුළු ඉශ්‍රායලේ
ජනතාවගේ ද, ඔවුන් අතර වසන විදේශිකයන්ගේ
ද පව් කමා කරනු ලැබේ.
27 ලෙවී 4:27-31 ‘යමෙකු නොදැනුවත්කමින් පව්
කළොත්, එවැන්නෙකු පාප පූජාවක් සඳහා අවුරුද්දක්
වයසැති එළුදෙනෙක ගෙනා යුතු ය. 28 මෙලෙස
යමෙකු නොදැනුවත්කමින් සමිඳාණන් වහන්සේට
විරුද්ධ ව පව් කළොත් පූජකවරයා ඔහු වෙනුවෙනේ
පව් කමාවේ පිළිවෙතෙ ඉටු කළ පසු, ඔහුගේ පව්
කමා කරනු ලැබේ. 29 නොදැනුවත්කමින් වන පව්
පිළිබඳ ව මවුබිම උපන් ඉශ්‍රායලේ ජනයාටත්, ඔවුන්
අතර කලකට වසන විදෙශිකයන්ටත් එක ම
නීතියක් වලංගු වනු ඇත.
30 ‘ස්වදේශිකයෙක් හෝ විදේශිකයෙක් හෝ දැන
දැන නීතිය කඩ කරයි නම්, එවැන්නෙකු සමිඳාණන්
වහන්සේට විරුද්ධ ව දුෂ්ට අපරාධයක් කරන බැවින්
ඔහු සිය සෙනඟ අතරෙනේ නෙරපාදමනු ලැබේ.
31 ඔහු සමිඳාණන් වහන්සේගේ වචනය හෙළා දැක,
උන් වහන්සේගේ ආඥා කඩ කළ බැවින්,
එවැන්නෙකු සහමුලින් ම නෙරපාදමනු ඇත. ඔහුගේ
දුෂ්ටකම ගැන ඔහු ම වගකිව යුතු ය.’ “

## සබත කඩ කිරීමට දඬුවම

32 ඉශ්‍රායලේ ජනයා පාළුකරයේ සිටිය දී, සබත්
දින දර එකතු කළ මිනිසෙක් ඔවුන්ට සම්බ විය.
33 එවිට ඔව්හු මෝසෙස් සහ ආරොන් ඇතුළු
ජනතාව ඉදිරියට ඒ මිනිසා ගෙනාවෝ ය. 34 ඔහුට
කුමක් කළ යුතු ද කියා නියම ව නොතිබුණ හයෙින්,
ඔව්හු ඔහු සිර අඩස්සි කළහ. 35 සමිඳාණන්
වහන්සේ මෝසෙස්ට කතා කොට, “ඒ මිනිසා
මරණයට පත් කළ යුතු ය. මුළු ජනතාව ම ඔහු
කඳවුරෙනේ පිටතට ගෙන ගොස් ගල් ගසා මැරිය යුතු
ය”යි වදාළ සේක. 36 උන් වහන්සේ මෝසෙස්ට
වදාළ පරිදි මුළු ජනතාව ඔහු කඳවුරෙනේ පිටතට
ගෙන ගොස්, ඔහුට ගල් ගසා, මරාදැමූ හ.

## දාවලු පිළිබඳ නියෝග

37 සමිඳාණන් වහන්සේ යළි මෝසෙස්ට කතා
කොට මෙසේ වදාළ සේක: 38 ද්වි.නී.
22:12“ඉශ්‍රායලේ ජනයාට කතා කොට මෙසේ අණ
කරන්න. ‘ඔවුන්ගේ මතු පරම්පරාවල සැම කෙනෙක්
ම තම තමන්ගේ වස්ත්‍රවල වාටියේ දාවලු සෑදිය
යුතු ය. තවද, ඒ එක එක වාටියේ දාවල්ල පිට නිල්
පටියක් දැමිය යුතු ය. 39 නුඹලාට මේ දාවලු
පෙනෙන විට, සමිඳාණන් වහන්සේගේ ආඥා
සියල්ල සිහි කොට ඒවා පිළිපැදීමට සිතට ගත යුතු
ය. එවිට නුඹලා මට අවිශ්වාසවන්ත වී අන්
දෙවිවරුන් වැළඳගත් මෙනේ, නුඹලාගේ නෙතේ සිත්
ඇදී යන පරිදි එසේ නොකළ යුතු ය. 40 නුඹලා
මෙය සිහි කොට, මාගේ ආඥා සියල්ල ඉටු කරමින්,
නුඹලාගේ දෙවියන් වහන්සේට පමණක් කැප විය
යුතු ය. 41 දෙවි සමිඳාණන් වහන්සේ මම ය.
නුඹලාගේ දෙවියන් වන පිණිස මිසර දේශයෙනේ
නුඹලා පිටතට ගෙනා නුඹලාගේ දෙවි සමිඳාණන්
වහන්සේ මම ය.’ “

## කැරලිකරුවන්ට දඬුවම්

16 පුද් 11 ලෙවීගේ පුත්‍රයා කොහාත් ය;
ඔහුගේ පුත්‍රයා ඉශ්හාර් ය. ඔහුගේ පුත්‍රයා
වන කෝරා ද රුබෙන්වරුන්ගේ පුත්‍රයන් වන
එලියාබ්ගේ පුත්‍රයන් වන දාතාන් සහ අබිරාම් ද
පලෙතේගේ පුත් ඕන් ද 2 ඔවුන් සමඟ ඉශ්‍රායලේ
ජනයා අතර සභාව කැඳවන, ජනප්‍රිය, කීර්තිමත්
දසෙිය පණස්දෙනෙක් ද මෝසෙස්ට විරුද්ධ ව කැරලි
ගැසූ හ. 3 ඔව්හු මෝසෙස්ට හා ආරොන්ට විරුද්ධ ව
එක්රුස් වමෙින්, ඒ දදෙනොට කතා කොට, “ඔබ
දදෙනොගේ මහන්තත්වය පමණට වැඩි යි. මුළු
ජනතාවත්, එහි සැම දෙනෙකුත් සමිඳාණන්
වහන්සේට කැප වී නැද් ද? උන් වහන්සේ ඔවුන්
මැදත් වැඩ සිටින්නේ නැද් ද? එසේ නම්, නුඹලා
පමණක් සමිඳාණන් වහන්සේගේ ජනතාවට ඉහළින්
මහලොකුකම් පාන්නේ මන්ද”යි ඇසූ හ.
4 මෙය ඇසූ මෝසෙස් මුණින්තලා වැටිණි. 5 ඔහු
කෝරා ඇතුළු ඔහුගේ මුළු පිරිසට කතා කරමින්,
“හෙට උදෑසන අප අතරෙනේ සමිඳාණන් වහන්සේට
කැප වූ අය උන් වහන්සේ පෙන්වන සේක. උන්
වහන්සේට කැප වූ, උන් වහන්සේ තෝරාගත්
තැනැත්තාට උන් වහන්සේ සමීපයට එන්නට ද
සලසන සේක. 6 කෝරා සහ ඔහුගේ සගයෙනි,
මෙය කරන්න, ඔබ හැම ධූම පාත්‍ර ගෙන 7 හෙට
උදෑසන ඒවායේ ගිනි අඟුරු බහා, සුවඳ ද්‍රව්‍ය
දමන්න. එවිට සමිඳාණන් වහන්සේ තෝරාගත්, උන්
වහන්සේට කැප වූ තැනැත්තා කවරෙක් ද කියා
දැනගත හැක. ලෙවීගේ වංශයේ පුත්‍රයෙනි, ඔබ
හැමගේ මහන්තත්වය පමණට වැඩි”යි කීවේ ය.
8 මෝසෙස් තවදුරටත් කෝරාට කතා කරමින්,
“ලෙවීගේ වංශයේ පුත්‍රයෙනි, ඔබ සැම කරුණාකර
මට සවන් දෙන්න. 9 සමිඳාණන් වහන්සේගේ
මණ්ඩපයේ සේවය කරමින් තමන් වහන්සේ ළඟට
ඔබ හැම ළඟා කරගැනීමටත්, පූජකයන් වශයෙනේ
කටයුතු කරමින්, ඉශ්‍රායලේවරුන්ගේ දෙවියන්
වහන්සේ මුළු ඉශ්‍රායලේ ජනයා අතරෙනේ ඔබ හැම
වෙනේ කොට ගැනීම ඔබ සුළු කොට සලකන්නහු ද?
10 උන් වහන්සේ තමන් ළඟට ඔබත්, ලෙවීගේ
දරුපරපුර වන ඔබේ සහෝදරයන් සියලු දෙනාත්
ගෙනා සේක. ඔබ හැම දැන් පූජකවරයන්
සොයන්නහු ද? 11 එබැවින් ඔබත්, ඔබේ මුළු
පිරිසත් පෙරමුණු බැඳ ඇත්තේ සමිඳාණන්
වහන්සේට විරුද්ධ ව බව දැනගන්න. ආරොන්ට
විරුද්ධ ව මැසිවිලි කීමට තරම් ඔහු කවරෙක් දැ”යි
ඇසී ය.
12 ඉන්පසු මෝසෙස්, එලියාබ්ගේ පුත්‍රයන් වන
දාතාන් සහ අබිරාම් කැඳවූ විට, ඔව්හු පිළිතුරු
දමෙින්, “අපි නො එමු. 13 මේ පාළුකරයේ අප මරා
දමනු පිණිස, කිරෙනේ සහ මී පැණියෙනේ ඉතිරෙන

රටකින් අප පිටතට ගෙන ඒමනේ ඔබ කළේ සුළු
අපරාධයක් ද? දැන් ඔබට උවමනා වී ඇත්තේ අප
පාලනය කරන්නට ද? 14 ඇත්තට ම ඔබ නම් අපට
කිරි සහ මී පැණි ඉතිරෙන රටකට අප
නොගෙනොවෙහි ය. කෙත් සහ මිදි වතු අපට උරුම
කොට නුදුන්නෙහි ය. මේ මිනිසුන්ට යථා තත්ත්වය
නොපෙනේ ය කියා ඔබ හිතන්නෙහි ද? අපි නම්
නොඑන්නෙමු”යි කීවෝ ය.
15 මෝසෙස් ද එවිට තදින් රොස් වී සමිඳාණන්
වහන්සේ අමතමින්, “ඔබ ඔවුන්ගේ පඬුරු
නොපිළිගනු මැනවි. මම නම්, ඔවුන්ගෙන් කිසිවකුට
නපුරක් නොකෙළෙමි. ඔවුන්ගේ කොටළුවකු වත්
නොගතිමි”යි කී ය.
16 මෝසෙස් කෝරාට කතා කොට, “හෙට ඔබත්,
ඔබගේ මුළු පිරිසත් සමිඳාණන් වහන්සේ ඉදිරියට
ආ යුතු ය. ආරොන් ද එහි එනු ඇත. 17 තවද, සෑම
කෙනෙක් ම තම තමාගේ ධූම පාත්‍රය රැගෙන,
ඒවායේ සුවඳ ද්‍රව්‍ය දමා, සමිඳාණන් වහන්සේ
ඉදිරියට ඒ ධූම පාත්‍ර ද ගෙන ආ යුතු ය. මෙලෙස
එහි ධූම පාත්‍ර දෙසිය පණහක් වනු ඇත. ආරොන්
ද සිය ධූම පාත්‍රය ගෙන ආ යුතු ය”යි කී ය.
18 සියල්ලෝ ම තම තමන්ගේ ධූම පාත්‍ර රැගෙන
ඒවායේ ගිනි අඟුරු බහා, ඒ මත සුවඳ ද්‍රව්‍ය දමා,
මෝසෙස් සහ ආරොන් සමඟ සම්මුඛ මණ්ඩපයේ
දොරකඩ සිටගත්හ. 19 ඔවුන්ට මුණ ලා සිටින පරිදි,
කෝරා තම මුළු පිරිස සම්මුඛ මණ්ඩපයේ
දොරකඩට එක්රැස් කොට ගත්තේ ය. එවිට මුළු
ජනතාවට ම සමිඳාණන් වහන්සේගේ
මහිමාලංකාරය දර්ශනය විය. 20 උන් වහන්සේ
මෝසෙස්ට සහ ආරොන්ට කතා කොට,
21 “සැණකෙන් මා මොවුන් වනසාලන්නට යන
බැවින් මේ ජනතාවගෙන් අහකට යන්නැ”යි වදාළ
සේක.
22 ඔව්හු ද මුණින්තළා වැටී, “අහෝ දෙවිඳුනි!
සකල සත්ත්වයන්ට ජීවනය දෙන දෙවිඳුනි, එක
මිනිසකුගේ පාපයට, ඔබ මුළු ජනතාවට ම එරෙහි
ව රොස් වන සේක් දැ”යි ඇසූ හ.
23 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට උත්තර දෙමින්,
24 “මේ සෙනඟට කතා කොට: ‘කෝරාගේ ද
දාතාන්ගේ ද අබීරාම්ගේ ද කූඩාරම්වලින් අහකට
යන්න’ කියා කියන්නැ”යි වදාළ සේක.
25 මෝසෙස් නැඟිට ඉශ්‍රායලේ ජනයාගේ ප්‍රජා
මූලිකයන් සමඟ දාතාන් සහ අබීරාම් වෙත ගියේ ය.
26 මෙසේ ගොස්, ඔහු සෙනඟට කතා කොට,
“කරුණාකර මේ අදමිටුන්ගේ කූඩාරම්වලින් අහකට
යන්න. ඔවුන් සතු කිසිවකට අත නොතබන්න. එසේ
කළොත් ඔවුන්ගේ පාපයන් නිසා නුඹලාත් වැනසෙනු
ඇතැ”යි කීවේ ය. 27 එවිට ඔව්හු කෝරා, දාතාන්
සහ අබීරාම් යන අයගේ කූඩාරම්වලින් අහකට
ගියහ. දාතාන් සහ අබීරාම් පිටතට අවුත්, තමන්ගේ
භාර්යාවන්, පුත්‍රයන් සහ සිඟිත්තන් සමඟ තම
කූඩාරම්වල දොරකඩ සිටගත්හ. 28 මෝසෙස් කතා
කොට, “මේ කාරණා ඉටු කිරීමට සමිඳාණන්
වහන්සේ මා එවූ බව නුඹලා මෙයින් දැනගන්නහු
ය. මේවා කරන්නේ මාගේ ම බලයකින් නොවේ.
29 සියල්ලන්ට පොදු වූ මරණයට මේ මිනිසුන් පාත්‍ර
වී, පොදු ඉරණමට ලක් වූවොත්, සමිඳාණන්
වහන්සේ මා නො එවූ සේක. 30 එහෙත්, උන්
වහන්සේ අමුතු දෙයක් කරමින්, භූමියේ කට අයා
ඔවුන් ද ඔවුන් සතු සියල්ල ද ගිලගෙන පාතාලයට
ඔවුන් පණපිටින් වැටෙන්නට සැලැස්සුවොත්, මේ
මිනිසුන් උන් වහන්සේ ප්‍රතික්ෂේප කළ බව නුඹලා
දැනගත යුතු ය”යි කීවේ ය.
31 මේ වචන සියල්ල පවසා නිම වූ විගස, ඔවුන්
සිටගෙන උන් තැන පැළිණි. 32 භූමිය කට අයා
ගත්තේ ය. ඔවුනුත්, නිවාසත්, කෝරාගේ සියලු
පිරිසත්, සකල සම්පතත් භූමිය ගිලදැමී ය.
33 ඔව්හුත්, ඔවුන් සතු සියලු දෙනෙත් පණපිටින් ම
පාතාලයට කිඳා ගියෝ ය. මිහිතලය ඔවුන්
වසාගත්තා ය. සෙනඟ අතරෙන් ඔව්හු වැනසී ගියහ,
34 ඔවුන්ගේ මොරගැසීම ඇසූ, අවට සිටි ඉශ්‍රායලේ
ජනයා, “මෙහි සිටියොත් පොළොව අප ද
ගිලගන්නට පුළුවනැ”යි කියමින් එතැනින් පැන ගියහ.
35 ඉන්පසු සමිඳාණන් වහන්සේ එවූ ගින්නක් සුවඳ
දුම් පිදූ මිනිසුන් දෙසිය පණස්දෙන දවාදැමී ය.
36 එකල සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට, 37 “පූජක ආරොන්ගේ පුත් එලයෝසර්ට, ‘අළු
මැදින් ධූම පාත්‍ර ඉවතට ගෙන ගිනි අඟුරු අහකට
හළා දමන්නැ’යි කියන්න. මන්ද ඒවා ශුද්ධ ය.
38 සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි ඔවුන් ඒවායින්
පිදූ බැවින් ඒවා ශුද්ධ ය. එබැවින් හෘදය සාක්ෂියට
විරුද්ධ ව පව් කළ මේ අයගේ ධූම පාත්‍ර ගෙන,
පූජාසනය වැසීම සඳහා ඒවා පැතලි තහඩුවලට
තැළිය යුතු ය. ඒවා ඉශ්‍රායලේ ජනයාට ලකුණක්
වනු ඇතැ”යි වදාළ සේක. 39 පූජක එලයෝසර් දැවී
ගිය අය පිදූ ලෝකඩ ධූම පාත්‍ර රැගෙන, පූජාසනය
වැසීම සඳහා ඒවායින් පැතලි තහඩු සෑදී ය. 40 එසේ
කළේ ආරොන්ගේ වංශයට අයිති නැති අන්
කෙනෙකු සමිඳාණන් වහන්සේ ඉදිරියට සුවඳ දුම්
පිදීම සඳහා ළඟා නොවිය යුතු බව සිහිගැන්වීමේ
සිද්ධිය ඉශ්‍රායලේ ජනයාට අනුස්මරණයක් වීම
සඳහා ය. යමෙකු එසේ කළොත්, කෝරාට සහ
ඔහුගේ පිරිසට වූ දේ ඔහුටත් වනු ඇත. මේ
සියල්ල සමිඳාණන් වහන්සේ මෝසෙස් මඟින්
එලයෝසර්ට වදාළ පරිදි ඉටු විය.

## ආරොන්ගේ අයදුම

41 පසු දින මුළු ඉශ්‍රායලේ ජනතාව මෝසෙස්ට හා
ආරොන්ට විරුද්ධ ව මැසිවිලි දොඩමින්, “ඔබ දෙදෙනා
සමිඳාණන් වහන්සේගේ සෙනඟ මරාදැමුවහු ය”යි
කී හ. 42 ජනතාව මෝසෙස්ට හා ආරොන්ට විරුද්ධ
ව එක්රැස් වී සම්මුඛ මණ්ඩපය දෙස නෙත් යොමා
බැලූ හ. පුදුමයකි, වලාකුළකින් එය වැසී තිබිණි.
සමිඳාණන් වහන්සේගේ මහිමාලංකාරය ද දර්ශනය
විය. 43 මෝසෙස් සහ ආරොන් සම්මුඛ මණ්ඩපය
ඉදිරියට පැමිණියහ. 44 සමිඳාණන් වහන්සේ
මෝසෙස්ට කතා කරමින්, 45 “සැණකෙන් මම

මොවුන් වනසාලන්නට යමි. එබැවින් මගේ
ජනතාවගෙන් ඉවතට යන්නැ"යි වදාළ සේක. ඔව්හු
මුණින්තලා වැටුණාහ.
46 මෝසෙස් ආරොන්ට කතා කොට, "ඔබේ ධූම
පාත්‍රය ගෙන, පූජාසනයේ ගින්දර රැගෙන එහි
බහා, සුවඳ ද්‍රව්‍ය දමා, කඩිනමින් සෙනඟ අතරට
ගොස්, ඔවුන් උදෙසා පව් කමාවේ පිළිවෙත ඉටු
කරන්න. සමිඳාණන් වහන්සේ රොස් වී සිටින සේක.
වසංගතයක් බෝවේගෙන එන්නේ ය"යි පැවසී ය.
47 ආරොන් මෝසෙස් අණ කළ පරිදි ධූම පාත්‍රය
රැගෙන ජනතාව මැදට ගියේ ය. සෙනඟ අතර
වසංගතය පැතිරී යන බව දුටු විට, ඔහු සුවඳ ද්‍රව්‍ය
ධූම පාත්‍රයට දමා සෙනඟ උදෙසා පව් කමාවේ
පිළිවෙත ඉටු කළේ ය. 48 මෙසේ මළවුන් හා
ජීවතුන් මැද ඔහු සිටගත් කල වසංගතය නැවතිණි.
49 කෝරාගේ කැරලි ගැසීමෙන් නැසුණු අය හැරුණ
විට වසංගතයෙන් නැසුණු අයගේ ගණන
දහහතරදාස් හත්සියයක් විය. 50 වසංගතය පැතිරීම
නැවතුණු පසු, ආරොන් සම්මුඛ මණ්ඩපයේ
දොරකඩ සිටි මෝසෙස් වෙත ආපසු ගියේ ය.

## ආරොන්ගේ පූජකවරය ස්ථිර කිරීම

17 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට, 2 "ඉශ්‍රායලේ ජනයා අමතා ඔවුන්ගේ
පිය පෙළපත් අනුව, ගෝත්‍රවල මූලිකයන් එක්
එක්කෙනාගෙන් එක බැගින්, සැරයටි දොළසක්
ඔවුන්ගෙන් ගෙන නුඹ ඒවායේ එක් එක්කෙනාගේ
නම් සටහන් කරන්න. 3 ලෙවීගේ ගෝත්‍රය
වෙනුවෙන් ඇති සැරයටියේ ආරොන්ගේ නම
ලියන්න. පිය පෙළපත් අනුව එක ගෝත්‍ර
නායකයකුට එක සැරයටියක් බැගින් තිබිය යුතු ය.
4 සම්මුඛ මණ්ඩපයේ නුඹට මා හමු වන ගිවිසුම්
කරඬුව අබිමුව නුඹ ඒවා තැබිය යුතු ය. 5 මම
යමකු තෝරාගන්නෙමි ද ඔහුගේ සැරයටියෙහි දලු
ලියලන්නේ ය. නුඹට විරුද්ධ ව මැසිවිලි දොඩවන
ඉශ්‍රායලේ ජනයාගේ මැසිවිලි මා වෙත පැමිණීම
මම මෙයින් නවතාලන්නෙමි"යි වදාළ සේක.
6 මෝසෙස් මේ කරුණ ඉශ්‍රායලේ ජනයාට සැළ
කළ විට, ඔවුන්ගේ ගෝත්‍ර මූලිකයෝ, පිය පෙළපත්
අනුව එක එක ගෝත්‍රයට එක බැගින්, සැරයටි
දොළසක් ඔහුට දුන්නෝ ය. ආරොන්ගේ සැරයටිය ද
ඒවා අතර විය. 7 ඉන්පසු මෝසෙස් ගිවිසුම් කරඬුව
තැබූ සම්මුඛ මණ්ඩපය තුළ සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි ඒවා තැබී ය.
8 හෙබ්‍රෙ 9:4 පසු දින මෝසෙස් සම්මුඛ
මණ්ඩපයට ඇතුළු වූ විට පුදුමයකි, ලෙවීගේ
ගෝත්‍රය වෙනුවෙන් තිබූ ආරොන්ගේ සැරයටිය
ලියලා තිබිණි. එහි මොට්ටු හටගෙන මල් පිපී, ඉදුණු
කොට්ටම්බා ඇති විය. 9 මෝසෙස් සමිඳාණන්
වහන්සේ ඉදිරිපිටින් සැරයටි සියල්ල ඉශ්‍රායලේ
ජනයා වෙත පිටතට ගෙනාවේ ය. ඔව්හු ඒවා බලා,
තම තමන්ගේ සැරයටි ගත්තෝ ය. 10 සමිඳාණන්
වහන්සේ මෝසෙස්ට කතා කොට, "කැරලිකාරයන්
මට විරුද්ධ ව මැසිවිලි දෙඩීම නවත්වන්නේ නැත්
නම්, ඔවුන් නසින බවට සලකුණක් වශයෙන්
ආරොන්ගේ සැරයටිය සමිඳාණන් වහන්සේගේ
ගිවිසුම් කරඬුව ඉදිරියට යළි ගෙනෙන්නැ"යි වදාළ
සේක. 11 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අණ කළ
පරිදි ඔහු ඉටු කළේ ය.
12 ඉශ්‍රායලේ ජනයා මෝසෙස්ට කතා කොට,
"ඔන්න, අපි විනාශයි, අපි ඉවරයි, අපි සියල්ලෝ ම
නැතිනාස්ති වී ඉවරයි. 13 සමිඳාණන් වහන්සේගේ
කූඩාරමේ කිසි ම බඩුවක් ළඟට යන්නේ කවරෙක්
ද, ඔහුට මරණය නියත ය. අනේ! අපේ අවසානය
මෙය දැ"යි ඇසූ හ.

## පූජකයන්ගේ යුතුකම්

18 සමිඳාණන් වහන්සේ ආරොන්ට කතා කොට
මෙසේ වදාළ සේක: "නුඹ ද නුඹේ දරුවන් ද
නුඹේ පවුලේ අය ද ශුද්ධස්ථානයේ කෙරෙන වැරදි
පිළිබඳ ව වගකිව යුතු ය. නුඹේ පූජකවරයට විරුද්ධ
ව කෙරෙන වැරදි පිළිබඳ ව ද නුඹත්, නුඹේ
දරුවනුත් වගකිව යුතු ය. 2 නුඹ සමඟ සේවය
කරමින්, නුඹට උදව් උපකාර කිරීමට නුඹේ පිය
ගෝත්‍රය වන ලෙවීගේ ගෝත්‍රයට අයත් නුඹේ
සහෝදරයන් ද නුඹ කැඳවාගත යුතු ය. එහෙත්,
සම්මුඛ මණ්ඩපය ඉදිරිපිට නුඹත්, නුඹේ දරුවනුත්
පමණක් සේවය කළ යුතු ය. 3 නුඹ කෙරෙහි
තිබෙන වගකීම් ද සම්මුඛ මණ්ඩපයට අදාළ
ඔවුන්ගේ වගකීම් ද ඉටු කළ යුතු ය. එහෙත්, ඔවුන්
ශුද්ධස්ථානයේ සහ පූජාසනයේ බඩු භාණ්ඩවලට
කිට්ටු නොවිය යුතු ය. ඔවුන් එසේ කළොත්
ඔවුනුත්, නුඹත් මරණයට පත් කරනු ඇත. 4 ඔවුන්
නුඹට උදව් උපකාර වෙමින්, සම්මුඛ මණ්ඩපයේ
සේවාවන් පිළිබඳ වගකීම ඉටු කළ යුතු ය. එහෙත්,
අන් කෙනෙකු නුඹට උදව් නොකළ යුතු ය. 5 නුඹලා
ශුද්ධස්ථානය හා පූජාසනය පිළිබඳ වගකීම භාරගත
යුතු ය. එවිට ඉශ්‍රායලේ ජනයාට විරුද්ධ ව මින්මතු
මම රොස් නොවන්නෙමි. 6 මෙන්න, ඉශ්‍රායලේ
ජනයා අතරෙන් නුඹේ සහෝදරයන් වන ලෙවීවරුන්
තෝරාගෙන නුඹට තිළිණයක් වශයෙන් ඔවුන්
දුන්නේ මම ය. ඔවුන් මට කැප වී ඇති බැවින්,
සම්මුඛ මණ්ඩපයේ සේවය ඉටු කළ යුතු ය.
7 පූජාසනයට හා අතිශුද්ධස්ථානයට සම්බන්ධ පූජක
නිල සේවාවන් නුඹත්, නුඹේ පුත්‍රයනුත් ඉටු කළ
යුතු ය. මෙය නුඹලාගේ වගකීම ය. නුඹට මා පූජක
නිලය පැවරුයේ තිළිණයක් වශයෙනි. ශුද්ධ බඩු
භාණ්ඩ ළඟට අන් කෙනෙකු සමීප වුවහොත් ඔහු
මරා දමනු ලැබේ."

## පූජකවරුන්ගේ පඬුරු කොටස

8 සමිඳාණන් වහන්සේ ආරොන්ට කතා කොට
මෙසේ වදාළ සේක: "බලන්න, ඉශ්‍රායලේ ජනයා
පුදන පූජාවලින් විශේෂ කොටසක් නුඹට උරුම
කොට මම වෙන් කළෙමි. ඒවා සියල්ල ම මම
නුඹටත්, නුඹේ දරුවන්ටත් සදහට ම වලංගු

නියෝගයකින් ප්‍රදානය කරන්නෙමි. 9 ගින්නෙන්
නොදැවා පුදන අතිශුද්ධ පූජාවලින් නුඹලාට හිමි
කොටස මෙය වනු ඇත. ඔවුන් මට පූජා කරන සෑම
ධාන්‍ය පූජාවක් ම, පාප පූජාවක් ම, වන්දි ගෙවීමේ
පූජාවක් ම නුඹටත්, නුඹේ දරුවන්ටත් අතිශුද්ධ වනු
ඇත. 10 අතිශුද්ධස්ථානයක එය වැළඳිය යුතු ය. සෑම
පිරිමියකුට ද ඉන් වැළඳීමට අවසර ඇත. එය ශුද්ධ
දයෙක් සේ සැලකිය යුතු ය.
11 "ඉශ්‍රායලේ ජනයා පුදන පඬුරුවලින්
පිළිගැන්වීමේ පිළිවෙත ඉටු කළ පසු ඒවායින්
විශේෂ කොටසක් ද නුඹට හිමි වනු ඇත. මම ඒවා
නුඹටත්, නුඹේ දරුදැරියන්ටත් සදහට ම වලංගු
නියෝගයකින් දානය කොට ඇත්තෙමි. නුඹේ ගෙදර
පවිත්‍ර ව සිටින සෑම කෙනෙකුට ම ඉන් වැළඳිය
හැකි ය.
12 "ඔවුන් මට පුදන ඉතා අගනා තෙලේ ද ඉස්තරම්
මිදිපැන් ද හොඳ ම ධාන්‍ය සහ ඉතා වටිනා නැඹුල්
පල ද මම නුඹට දෙන්නෙමි. 13 පොළොවේ හටගත්,
සමිඳාණන් වහන්සේ වෙත ගෙනෙන පළමු අස්වැන්න
නුඹට අයිති වේ. ගෙදර පවිත්‍ර ව සිටින සෑම
කෙනෙකුට ම ඉන් වැළඳිය හැකි ය.
14 ලෙවී 27:28 "ඉශ්‍රායලේ ජනයා අතර කැප වූ
සෑම දයෙක් ම නුඹට අයිති වේ.
15 "ඔවුන් සමිඳාණන් වහන්සේට පුදන මිනිසුන්ගේ
හෝ මෘගයන්ගේ හෝ කුලුඳුලන් සියලු දෙනා නුඹට
අයිති වෙත්. එහෙත්, කුලුඳුල් පුතකේ නම් මුදාගත
යුතු වේ. එලෙස ම අපවිත්‍ර යයි සැලකෙන කුලුඳුල්
සතුන්ගේ පැටියන් ද මුදාගත යුතු ය. 16 මුදාගත
යුතු වූවන්ට මසක් ගිය පසු නුඹ ඔවුන් මුදාගත යුතු
ය. එසේ කිරීමේ දී නුඹේ නියමය හැටියට
ශුද්ධස්ථානයේ මිල අනුව, රිදී කාසි පහක් ගෙවිය
යුතු ය. රිදී කාසියක් නම් ගේරා විස්සකි. 17 එහෙත්,
එළදෙනෙකගේ හෝ බැටළු දෙනෙකගේ හෝ
එළුදෙනෙකගේ හෝ කුලුඳුල් පැටියකු මුදා නොගත
යුතු ය. උන් මට කැප ය. පූජාසනය මත උන්ගේ
ලේ ඉස උන්ගේ තෙල දැවිය යුතු ය. එය සමිඳාණන්
වහන්සේ වෙත නඟින සුමිහිරි සුවඳක් සහිත
ගින්නෙන් දවා පිදූ පූජාවක් වනු ඇත. 18 උන්ගේ මස්
ද ළපැත්ත සහ දකුණු ගාතය ද නුඹේ ය.
19 "ඉශ්‍රායලේ ජනයා සමිඳාණන් වහන්සේට පුදන
ශුද්ධ පඬුරුවල විශේෂ කොටස් සියල්ල ම මම
නුඹටත්, නුඹේ දරුදැරියන්ටත් සදහට ම වලංගු
නියෝගයකින් ප්‍රදානය කළෙමි. මෙය වනාහි
සමිඳාණන් වහන්සේ වන මම නුඹත්, නුඹේ
පළපෙතත් සමඟ ගිවිසගත් සදහට ම වලංගු වන
හවෙත් නොකැඩෙන ගිවිසුමක් ය."
20 සමිඳාණන් වහන්සේ නැවතත් ආරොන්ට කතා
කොට මෙසේ වදාළ සේක: "ඔවුන්ගේ දේශයෙහි
නුඹට උරුමයක් වශයෙන් හිමි වන ඉඩකඩම්
නොවනු ඇත. එහි කිසි ම කොටසක් නුඹට
නොපවරනු ඇත. ඉශ්‍රායලේ ජනයා අතර නුඹේ
කොටසත්, නුඹේ උරුමයත් මම වෙමි."

## ලෙවීවරුන්ගේ පඬුරු කොටස

21 ලෙවී 27:30-33; ද්වි.නී. 14:22-29 "තවද,
ඉශ්‍රායලේ ජනයා මට පුදන සෑම දයෙන් ම දසයෙන්
කොටස, මම උරුමයක් වශයෙන් ලෙවීගේ
දරුපරපුරට දිනිමි. එය ඔවුන්ට දෙනුයේ, සම්මුඛ
මණ්ඩපය තුළ ඔවුන් ඉටු කරන සේවාව සඳහා ය.
22 මින් ඉදිරියට ඉශ්‍රායලේ ජනතාව සම්මුඛ
මණ්ඩපයට ළඟා නොවිය යුතු ය. එසේ කළොත්,
ඔවුන් පව් කරන බැවින් මැරෙනු ඇත. 23 ලෙවීවරුන්
සම්මුඛ මණ්ඩපය තුළ සේවය කරමින්, එහි
සම්පූර්ණ වගකීම ඉසිලිය යුතු ය. මෙය ඔවුන්ගේ
පළපෙතට සදහට ම වලංගු නියෝගයකි. ඉශ්‍රායලේ
ජනයා අතර ඔවුන්ට උරුම වන ඉඩකඩම් නොවනු
ඇත. 24 මන්ද, ඉශ්‍රායලේ ජනයා මට පුදන විශේෂ
පඬුරුවලින් දසයෙන් කොටස මා ලෙවීවරුන්ට උරුම
කොට දී තිබේ. ඉශ්‍රායලේ ජනයා අතර කිසි
උරුමයක් ඔවුන්ට නොලැබෙන්නේ ය කියා මා
ඔවුන්ට කීවේ ඒ නිසා ය."

## දසයෙන් කොටස දීම

25 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට
මෙසේ වදාළ සේක: 26 "ලෙවීවරුන්ට කතා කොට
මෙය කියන්න: 'නුඹලාට උරුම කොට දුන් දසයෙන්
කොටස නුඹලා ඉශ්‍රායලේ ජනයාගෙන් ගන්න විට,
එයිනුත් දසයෙන් කොටසක් විශේෂ පඬුරක්
වශයෙන් සමිඳාණන් වහන්සේට පිදිය යුතු ය.
27 කමතේ ධාන්‍ය ප්‍රමාණයට නැතහොත් මිදි
පැසේ මිදිපැන්වල ප්‍රමාණයට නුඹේ විශේෂ පඬුරු
ද තක්සේරු කළ යුතු ය. 28 නුඹලා මෙලෙසෙ
ඉශ්‍රායලේ ජනයා අතින් ගන්න දසයෙන් කොටසින්
විශේෂ පඬුරක් සමිඳාණන් වහන්සේට පූජා කළ
යුතු ය. තවද, උන් වහන්සේගේ ඒ කොටස පූජක
ආරොන්ට දිය යුතු ය. 29 නුඹලා සමිඳාණන්
වහන්සේට පූජා කරන විශේෂ පඬුරු සියල්ලෙන්
ඉස්තරම් කොටස උන් වහන්සේට කැප කොට පිදිය
යුතු ය.' 30 තවද, නුඹ ලෙවීවරුන්ට මෙසේ කිව යුතු
ය: 'නුඹලා පඬුරුවලින් ඉස්තරම් කොටස සමිඳාණන්
වහන්සේට පූජා කළ පසු, ඉන් ඉතිරි කොටස,
කමතේ ඉතිරි ධාන්‍ය මෙන් ද, මිදිපැසේ ඉතිරි
මිදිපැන් මෙන් ද නුඹලාට අයිති වනු ඇත.
31 නුඹලාටත්, නුඹලාගේ ගෘහ වාසීන්ටත් එය
කැමැති තැනක දී වැළඳිය හැකි ය. සම්මුඛ මණ්ඩපය
තුළ නුඹලා ඉටු කරන සේවයට ලැබෙන ගෙවීල්ල
එය වේ. 32 නුඹලා ඉස්තරම් ම කොටස සමිඳාණන්
වහන්සේට පූජා කළහු නම්, එය වැළඳීමෙන් පාපයක්
නොවනු ඇත. තවද, නුඹලා ඉශ්‍රායලේ ජනයාගේ
ශුද්ධ පඬුරු නොකෙලෙසිය යුතු ය. ඒවා
කෙලෙසුවහොත් නසිනු ඇත.' "

### හෂ්මාවශේෂ පූජාව

19 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට සහ
ආරොන්ට කතා කොට මෙසේ වදාළ සේක:
2 “ස්වාමීන් වන මා පහත දක්වන ව්‍යවස්ථානුකූල
නීතිය පණවා ඇති බැවින් ඉශ්‍රායලේ ජනයාට කතා
කොට මෙයෙ කියන්න. ‘ඔවුන් ලප හෝ කැළැල් හෝ
නැති, වියගහ නොදැරූ රතු වැස්සියක නුඹ වෙත
ගෙනෙ යුතු ය. 3 නුඹ ඒ සතා පූජක එලෙයාසර්ට
භාර දිය යුතු ය. ඌ කඳවුරෙන් පිටත ගෙන ගිය පසු,
ඔහු ඉදිරියෙහි දී ම කෙනෙකු වැස්සිය මැරිය යුතු ය.
4 ඉන්පසු එලෙයාසර් තම ඇඟිල්ලෙන් උගේ ලේ
ටිකක් සම්මුඛ මණ්ඩපය දිශාවට හත් වරක් ඉසිය
යුතු ය. 5 තවද, ඔහු ඉදිරිපිට දී ම කෙනෙකු උගේ
හම, මාංසය, ලයෙ සහ ගොම පිළිස්සිය යුතු ය.
6 පූජකවරයා ම කිහිරි ගහෙන් දර කෑලි ද හිසොප්
නම් පැළ ද රතු රෙදි කඩක් ද ගෙන වැස්සී දැවෙන
ගින්න මැදට දැමිය යුතු ය. 7 ඉන්පසු පූජකවරයා
තම ඇඳුම් සෝදා, ජලස්නානය කොට, කඳවුර තුළට
ආ යුතු ය. එහෙත්, ඔහු හවස දක්වා අපවිත්‍ර යැයි
සැලකේ. 8 ඒ සතා ගින්නේ පිළිස්සූ තැනැත්තා ද
වතුරෙන් තම ඇඳුම් සෝදා ජලස්නානය කළ යුතු ය.
ඔහු ද හවස දක්වා අපවිත්‍ර යැයි සැලකේ.
9 හබේරෙ 9:13ඉන්පසු වත්පිළිවෙත් අනුව පවිත්‍ර
යැයි සැලකෙන මිනිසෙකු වැස්සීගේ අළු එකතු කර,
කඳවුරෙන් පිටත පවිත්‍ර තැනක තැබිය යුතු ය.
ඉශ්‍රායලේ ජනතාවට, තමන්ගේ පව්වලින් පවිත්‍ර
වීම සඳහා, අපවිත්‍රකම පහකරන ජලය පිළියෙළ
කිරීමට ඒ අළු ආරක්ෂා කොට තැබිය යුතු ය.
10 වැස්සීගේ අළු එකතු කළ තැනැත්තා ද තම ඇඳුම්
සෝදාගත යුතු ය. ඔහු ද හවස දක්වා අපවිත්‍ර යැයි
සැලකේ. මෙම නියෝගය ඉශ්‍රායලේ ජනයා සඳහා
ද ඔවුන් අතර කලකට වසන විදේශිකයන් සඳහා ද
සදහට ම වලංගු වනු ඇත.

### මළ සිරුරකින් වන අපවිත්‍රතා

11 “ ‘යමෙකුගේ මෘත ශරීරය ස්පර්ශ කරන
තැනැත්තා සත් දිනක් අපවිත්‍ර ව සිටියි. 12 ඔහු තුන්
වන දින හා සත් වන දින පවිත්‍ර වීමේ ජලයෙන්
තමා පවිත්‍ර කරගත් විට ඔහු පවිත්‍ර වනු ඇත.
එහෙත්, තුන් වන දින තමා පවිත්‍ර නොවුවොත් සත්
වන දින ඔහු පවිත්‍ර ය යි නොසැලකේ. 13 යමෙක්
යමෙකුගේ මෘත ශරීරයක් ස්පර්ශ කොට තමා
පවිත්‍ර කර නොගනී නම්, ඒ තැනැත්තා සමිඳාණන්
වහන්සේගේ කූඩාරම කෙලෙසෙනු ඇත. එවැන්නෙකු
ඉශ්‍රායලේ ජනයා වෙතින් නෙරපාදැමිය යුතු ය.
පවිත්‍ර වීමේ ජලය ඔහුට නොඉස්ස බැවින්, ඔහු
අපවිත්‍ර ය. අපවිත්‍රතාව ඔහුට තිබේ ය යි
සැලකෙනු ඇත.
14 “ ‘යමෙකු කූඩාරමක මළොත්, එවිට වලංගු
නීතිය මේ ය: කූඩාරමට ඇතුළු වන සියල්ලන් හා
එහි සිටින සියල්ලෝ හත් දිනකට අපවිත්‍ර ය.
15 වැස්මක් නැති ව, ඇර තිබූ භාජන සියල්ල
අපවිත්‍ර ය. 16 එලෙසෙ ම යමෙකු එළිමහනේ
කඩුවකින් මරාදැමූ කෙනෙකු හෝ මෘත ශරීරයක්
හෝ මිනිසකුගේ ඇටකටුවක් හෝ සොහොනක්
හෝ ස්පර්ශ කළොත් ඔහු දින හතකට අපවිත්‍ර ය.
17 “ ‘මෙලෙසෙ අපවිත්‍ර කෙනෙකු සඳහා, පාපයෙන්
පවිත්‍ර වීමට පිළිස්සූ වැස්සියගේ අළු ගෙන,
භාජනයකට දමා පිරිසිදු ජලය වත් කළ යුතු ය.
18 ඉන්පසු පවිත්‍ර යයි සැලකෙන යමෙකු, හිසොප්
කිනිත්තක් ගෙන, වතුරේ පොඟවා කූඩාරමට ද එහි
බඩුන් සියල්ලට ද එහි සිටි සියල්ලන්ට ද ඇටකටුවක්
හෝ මරණ ලද කෙනෙකු හෝ මෘත ශරීරයක් හෝ
සොහොනක් හෝ ස්පර්ශ කළ තැනැත්තාට ද ඉසිය
යුතු ය. 19 තුන් වන හා හත් වන දින පවිත්‍ර
තැනැත්තා අපවිත්‍ර තැනැත්තාට මෙසේ දිය ඉසිය
යුතු ය. හත් වන දින, ඔහු තමා ම පවිත්‍ර
කරගනිමින් නාගෙන, ඇඳුම් සෝදාගත් විට, ඒ දින
සවස පවිත්‍ර යයි සැලකෙනු ඇත.
20 “ ‘අපවිත්‍ර යමෙක් තමා ම පවිත්‍ර කර
නොගනී නම්, එවැන්නෙක් ජනතාව වෙතින්
නෙරපාදමනු ලැබේ. මන්ද, ඔහු සමිඳාණන්
වහන්සේගේ ශුද්ධස්ථානය කෙලෙසූ බැවිනි.
අපවිත්‍ර වීම පහකරන ජලය ඔහුට ඉස නැත. ඔහු
අපවිත්‍ර ය. 21 මෙයෙ නුඹලාට සදහට ම වලංගු
නියෝගයකි. අපවිත්‍ර වීම පහකරන ජලය ඉහින
තැනැත්තා තම ඇඳුම් සෝදාගත යුතු ය. ඒ ජලය
ස්පර්ශ කරන තැනැත්තා හවස දක්වා අපවිත්‍ර යයි
සැලකිය යුතු ය. 22 අපවිත්‍ර යමෙක් යමක් ස්පර්ශ
කරයි ද, ඒ දේ අපවිත්‍ර වනු ඇත. ඒ දේ ස්පර්ශ
කරන තැනැත්තා ද සවස දක්වා අපවිත්‍ර යයි
සැලකිය යුතු ය.’ ”

### පර්වතයෙන් වතුර ලැබීම

(නික්ම 17:1-7)

20 පළමු වන මාසයේ දී මුළු ඉශ්‍රායලේ
ජනතාව ශීන් නම් පාළුකරයට ඇතුළු වී
කාදෙෂ් නම් ස්ථානයේ නවාතැන් ගත්හ. එහි දී
මිරියම් මරණයට පත් වූයෙන්, ඈ භූමදාන කරේණි.
2 නික්ම 17:1-7 ජනතාවට එහි ජලය නොතිබුණු
බැවින් ඔව්හු මෝසෙස්ට හා ආරොන්ට විරුද්ධ ව
එක්රුස් වී 3 මෝසෙස්ට අභියෝග කරමින්,
“සමිඳාණන් වහන්සේ ඉදිරිපිට අපේ සොහොයුරන්
නැසුණු විට අපිත් නැසුණමෙු නම් කෙතරම් හොඳ ද?
4 ඔබ දදෙනෙ සමිඳාණන් වහන්සේගේ සෙනඟ මේ
පාළුකරයට ගෙනාවේ මන් ද? අපත් අපේ
ගවමහිෂයනුත් මරාදමන්නට ද? 5 ඔබ දදෙනෙ
මිසරයෙන් පිටතට අප ගෙනාවේ මන් ද? මේ
කාලකණ්ණි තැනට අප ගෙනෙන්නට ද? මෙතැන
ධාන්‍යයටත්, අත්තික්කාවලටත්, මිදිවලටත්, දෙළුම්
ගස්වලටත් තැනක් නොවේ. ඒ මිදිවාට බොන්නට
වතුරත් නැතැ”යි කී හ. 6 එවිට මෝසෙස් සහ
ආරොන් සෙනඟගෙන් ඉවත් ව, සම්මුඛ මණ්ඩපයේ
දොරකඩට ගොස් මුණින්තලා වැටුණාහ. සමිඳාණන්
වහන්සේගේ මහිමාලංකාරය ඔවුන්ට දර්ශනය විය.

7 සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතමින්,
8 “නුඹේ සැරයටිය ගෙන නුඹත්, නුඹේ සහෝදරයෝවූ
ආරොන්නුත් ජනතාවත් එකට රැස් කරන්න. එසේ රැස්
කොට, ඔවුන්ට පෙනෙන අර පර්වතයට අණ
කරන්න. ඉන් වතුර ගලා යනු ඇත. නුඹ පර්වතයෙන්
ගලා යන ඒ වතුර ඔවුන්ට දිය යුතු ය. මෙසේ
සෙනඟටත්, ඔවුන්ගේ සතුන්ටත් බොන්නට වතුර
ලැබෙනු ඇතැ”යි වදාළ සේක. 9 සමිඳාණන්
වහන්සේ මෝසෙස්ට අණ කළ පරිදි, ඔහු උන්
වහන්සේ ඉදිරිපිටින් සැරයටිය ගත්තේ ය.
10 ඔවුන් දදෙන පර්වතය ඉදිරිපිට ජනතාව
එක්රැස් කළහ. ඉන්පසු මෝසෙස් ඔවුන් අමතමින්,
“දැන් ඉතින්, කැරලිකරුවෙනි, මට සවන් දෙනු. මේ
පර්වතයෙන් වතුර ගලා එවන්නට දැ”යි ඇසී ය.
11 ඔහු අත ඔසවා, සැරයටියෙන් පර්වතයට දවරක්
ගැසී ය. මහා ජලධාරාවක් පිටාර ගැලී ය, ජනතාව
සහ ඔවුන්ගේ සත්තු එයින් බීවෝ ය.
12 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට හා ආරොන්ට
කතා කොට, “ඉශ්රායලේ ජනයා ඉදිරියෙහි මගේ
ශුද්ධ බල මහිමය පිළිගන්නා තරමට නුඹලා මා
කෙරෙහි විශ්වාසය නොතැබූ බැවින්, මා මේ
සෙනඟට දීමට පොරොන්දු වූ දේශයට නුඹලා ඔවුන්
ගෙන නොයන්නහු ය”යි වදාළ සේක.
13 ඉශ්රායලේ ජනයා සමිඳාණන් වහන්සේට විරුද්ධ
ව දොස් තැබූ බැවිනුත්, ඒ වතුර මඟින් උන්
වහන්සේ සිය ශුද්ධ බල මහිමය ඔවුන්ට ප්රකාශ
කළ බැවිනුත්, ඒ වතුර “මෙරිබාහි වතුර ය”යි නම්
කරනු ලැබී ය.

## ඉදිරි ගමනට බාධා

14 මෝසෙස් කාදෙෂ්හි සිට ඒදොම්හි රජතුමන්
වෙත දූතයන් යවමින් මෙසේ සැළ කළේ ය: “ඔබේ
සගයන් වන ඉශ්රායලේවරුන් මෙසේ දන්වනු ඇත.
අපට මුණපාන්නට වූ දුක් කරදර සියල්ල ම ඔබ
දන්නෙහි ය. 15 අපේ මුතුන්මිත්තන් මිසරයට ගිය
සැටිත්, දීර්ඝ කාලයක් අප එහි වාසය කළ සැටිත්,
මිසර වැසියන් අපට හා මුතුන්මිත්තන්ට පීඩා කළ
සැටිත් ඔබ දන්නෙහි ය. 16 අප සමිඳාණන්
වහන්සේට මොරගැසූ විට, උන් වහන්සේ අප හඬට
සවන් දී දූතයෙකු එවමින් මිසරයෙන් අප පිටතට
ගෙනා සේක. මෙන්න, දැන් අපි ඔබේ දේශ
සීමාවන්හි පිහිටි කාදෙෂ් නම් නුවර නැවතී සිටිමු.
17 කරුණාකර ඔබේ දේශය මැදින් ගමන් කිරීමට
අපට අවසර දෙනු මැනවි. කෙත් වතු හෝ මිදි වතු
හෝ මැදින් අපි නොයන්නෙමු. ඔබේ ළිංවලින් ජලය
ද අපි නොබොන්නෙමු. ඔබේ දේශ සීමා පසු කර
යන තෙක් දකුණතට හෝ වමතට හෝ නොහැරී
අපි රජ මාවත ඔස්සේ ම යන්නෙමු.”
18 එහෙත්, ඒදොම්හි රජ ඔවුන්ට කතා කොට,
“මාගේ දේශය මැදින් ඔබ හැමට ගමන් කිරීම
තහනම් ය. එසේ කළොත් මම ඔබ හැමට විරුද්ධ ව
යුද්ධ අරඹමි”යි කී ය.
19 ඉශ්රායලේ ජනයා ඔහුට යළි කතා කොට, “අපි
රජ මාවත දිගේ පමණක් යන්නෙමු. අප වත්, අපේ
ගවමහිෂයන් වත් ඔබට අයිති වතුර බීවොත් අපි
වන්දි ගෙවන්නෙමු. අපට ඕනෑ යන්තම් පයින් ගමන්
කිරීම පමණ ය”යි කී හ.
20 එහෙත් රජ තෙමේ, “ඔබ හැමට යාම තහනම්
ය”යි අණ කළේ ය. මෙසේ කී පසු ඒදොම්
වැසියෝ මහා බලය පාමින්, විශාල පිරිසක් රැගෙන
ඔවුන්ට විරුද්ධ ව පැමිණියා හ. 21 මෙසේ වූයේ
ඒදොම්හි රජු ඉශ්රායලේ ජනයාට තම දේශය මැදින්
යාමට අවසර නුදුන් බැවිනි. එබැවින් ඉශ්රායලේ
ජනයා එතැනින් වෙන අතකට හැරුණාහ.

## ආරොන්ගේ මරණය

22 මුළු ඉශ්රායලේ ජනතාව කාදෙෂ් නම්
ස්ථානයෙන් පිටත් ව හෝර් නම් කන්දට පැමිණියහ.
23 ඒදොම් දේශ සීමාවේ පිහිටි හෝර් නම් කන්ද
මත, සමිඳාණන් වහන්සේ මෝසෙස්ට සහ
ආරොන්ට කතා කොට, 24 “නුඹලා මාගේ අණට
විරුද්ධ ව, මෙරිබාහි ජලය සමීපයේ දී කැරලි ගැසූ
බැවින්, ඉශ්රායලේ ජනයාට මා දෙන්නට පොරොන්දු
වූ දේශයට ආරොන් ඇතුළු නොවන්නේ ය. ඔහු
මැරෙනු ඇත. 25 ආරොන් සහ ඔහු පුත් එලයොසර්
කැඳවාගෙන හෝර් කන්දට නගින්න. 26 ආරොන්ගේ
ඇඳුම් ගලවා, ඔහු පුත් එලයොසර්ට ඒවා පළඳවන්න.
ආරොන් එහි දී මරණයට පත් වනු ඇතැ”යි වදාළ
සේක. 27 සමිඳාණන් වහන්සේ අණ කළ පරිදි
මෝසෙස් ඉටු කළේ ය. මුළු ජනතාව බලාගෙන
සිටිය දී ඔව්හු හෝර් කන්දට නැංගාහ. 28 නික්ම
29:29; ගණන් 33:38; ද්වි.නී. 10:6ඉන්පසු මෝසෙස්
ආරොන්ගේ ඇඳුම් ගලවා ඔහු පුත් එලයොසර්ට
ඒවා පැළඳ වී ය. ආරොන් කඳු මුදුනේ දී මියගියේ
ය. ඉන්පසු මෝසෙස් සහ එලයොසර් කන්දෙන්
පහතට බැස ආහ. 29 මුළු ජනතාව ආරොන් මියගිය
බව දැනගත් විට, ඉශ්රායලේ වංශයේ සියල්ලෝ ම
දින තිහක් ආරොන් උදෙසා වැලපුණාහ.

## කානානිවරුන් පරාජය කිරීම

21 ගණන් 33:40 දකුණු දිශාවේ විසූ අරාද් නම්
කානානිය රජ අතාරිම් නම් මාර්ගය ඔස්සේ
ඉශ්රායලේවරුන් එන බව ඇසූ විට, ඔහු ඔවුන්
ආක්රමණය කර ඔවුන්ගෙන් සමහරකු
අල්ලාගත්තේ ය. 2 ඉශ්රායලේවරු සමිඳාණන්
වහන්සේට බාරයක් වමින්, “ඔබ මේ සෙනඟ අප
අතට පාවා දෙන සේක් නම්, අපි ඔවුන්ගේ නගර
සහමුලින් වනසාලන්නෙමු”යි කී හ. 3 උන් වහන්සේ
ඉශ්රායලේවරුන්ගේ ඉල්ලීමට සවන් දී කානානිවරුන්
ඔවුන්ට පාවා දුන් සේක. ඉශ්රායලේවරු ඔවුන් සහ
ඔවුන්ගේ නගර සහමුලින් වනසා ලූ හ. ඉන්පසු එම
ස්ථානය හෝර්මා කියා නම් කරන ලදී.

### ලෝකඩ සර්පයා

4 ද්වි.නී. 2:1 ඔව්හු හෝර් නම් කඳුකරයනේ නික්ම
රතු මුහුදට යන මාර්ගය ඔස්සේ ඒදොම් නම්
දේශය වටකර ගියහ. මසෙේ යන විට සනෙඟ
බොහෝ සේ අධෛර්යයට පත් වූ හ. 5 1 කොරි
10:9සනෙඟ දවේියන් වහන්සේට සහ මෝසසේට
විරුද්ධ ව කතා කරමින්, “මේ පාළුකරයේ අප
මැරෙන්නට ඇරීමට ඔබ අප මිසරයනේ පිටතට
ගනොවේ මන් ද? අපට කන්නත් නැත, බොන්නත්
නැත. අපට ලැබනෙ මේ සිල්ලර කෑම අපට දැන්
තිත්ත වී ඇතැ”යි පැවසූ හ. 6 එවිට සමිඳාණන්
වහන්සේ සනෙඟ මැදට විසකුරු සර්පයන් එවූ විට,
ඒ සර්පයෝ ඔවුන්ට දෂ්ට කළහ. ඉශ්රායලේ සනෙඟ
අතරේ බොහෝ දනෙකේ නැසී ගියහ. 7 එබැවින්
සනෙඟ මෝසසේ වතෙ පැමිණ, “අපි සමිඳාණන්
වහන්සේටත්, ඔබටත් විරුද්ධ ව කතා කිරීමනේ පව්
කළෙමු. මේ සර්පයන් අප මැදින් ඉවත් කරන ලසෙ
උන් වහන්සේට යාච්ඤා කරන්නැ”යි ඉල්ලූ හ.
මෝසසේ ද සනෙඟ උදසො යාච්ඤා කළේේ ය.
8 සමිඳාණන් වහන්සේ මෝසසේට කතා කොට,
“ලෝකඩ සර්පයකු සාදා රිටක් පිට තබන්න. දෂ්ට
කරනු ලැබූ යමකේ ඇද්ද, ඔහු එය දසෙ
බැලුවහොත්, සුව වනු ඇතැ”යි වදාළ සේක. 9 2
රාජා 18:4; ජොහ 3:14එවිට මෝසසේ ලෝකඩ
සර්පයකු සාදා ඌ රිටක් පිට තැබී ය. සර්පයකේ
යමකු දෂ්ට කළේේ ද ඒ තැනැත්තා ලෝකඩ
සර්පයා දසෙ බැලූ විට ඔහු සුවපත් විය.

### ඉදිරි ගමන්

10 ඉශ්රායලේ ජනයා ඉදිරියට ගොස් ඔබොත් නම්
ස්ථානයේ කඳවුරු බැඳගත්හ. 11 එතැනින් නික්ම
ඔව්හු පරෙදිග වූ මෝවබ් ප්රදේශයට ඉදිරියනේ
පිහිටි පාළුකරයේ ඉයේ-අබාරිම් නම් ස්ථානයේ
කඳවුරු බැඳගත්හ. 12 එතැනින් ද නික්ම ශරෙදේ නම්
මිටියාවතේ කඳවුරු බැඳගත්හ. 13 එතැනින් ද යළි
ඔව්හු පිටත් ව ගොස්, අමෝරිවරුන්ගේ දේශ සීමා
දක්වා ඇති පාළුකරයේ පිහිටි අර්ණොන් ගඟින්
එගොඩ කඳවුරු බැඳගත්හ. අර්ණොන් ගඟ පිහිටියේ
මෝවබ්වරුන්ගේ හා අමෝරිවරුන්ගේ රටවල් අතර
මෝවබ් දේශ සීමාවේ ය. 14 එබැවින් සමිඳුන්ගේ
සටන් ග්රන්ථයහෙි මසෙේ කියා තිබේ:
q214 “සුපා නම් පදෙසේහි වහබේ නුවර ය,
මිටියාවත් ය, අර්ණොන් නදිය ඇත,
15 ආර් නුවර හා මෝවබ් දේශ සීමා පැතිරී යන
මිටියාවත්හි බෑවුම් ය.”
16 එතැනින් ඔව්හු බයෙේර් නම් ස්ථානයට ගියහ.
‘සනෙඟ එක්රැස් කරන්න, මම ඔවුන්ට බොන්නට
වතුර දමේ’යි කියා සමිඳාණන් වහන්සේ මෝසසේට
වදාරා ඇත්තේ එහි ය.
17 එවිට ඉශ්රායලේ මේ ගීය ගැයූ හ.
q217 “එම්බා ළිඳ, දිය උනන්න.
q217 ඊට ගී ගයන්න.
18 කුමරුන් කැණි ළිඳ මේ ය, නායකයන් හෑරූ ළිඳ
මේ ය, ජයකොන්තයනේ කැණි ළිඳ මේ ය,
සැරයටියනේ හෑරූ ළිඳ මේ ය.”
18 ඔව්හු පාළුකරයනේ නික්ම මත්තානයට ද
19 එතැනින් නහලීයලෙට ද එතැනින් බාමොත්ට ද
20 එතැනින් කාන්තාරයට මුණ ලා පිහිටි පිස්ගා කඳු
ශිඛරයට පහතින් මෝවබ් දේශයේ මිටියාවතට ද
පැමිණියහ.

### රජුන් දදෙනෙකුගේ පරාජය

(ද්වි.නී. 2:26;ද්වි.නී. 3:11)

21 ඉශ්රායලේවරු අමෝරිවරුන්ගේ සීහොන් රජු
වතෙ දූතයන් යවමින්, 22 “ඔබේ දේශය මැදින්
යන්නට අපට අවසර දනෙු මැනව, ඔබේ කතේ
වතුවලට හෝ මිදි වතුවලට හෝ නොයන්නමු.
ළිංවලින් වතුර නොබොන්නමු. ඔබේ දේශ සීමා
පසු කරන තකේ රජ මාවත ඔස්සේ ම යන්නමු”යි
සැළ කළහ. 23 එහතේ, සීහොන් රජ, තම රට මැදින්
යන්නට ඉශ්රායලේවරුන්ට අවසර නුදුන්නේ ය. තවද,
ඔහු තම සියලු සනෙඟ රැස් කොට
ඉශ්රායලේවරුන්ට විරුද්ධ ව යුද අරඹා පාළුකරයේ
පිහිටි ජහශ් නම් ස්ථානයට ගොස්, ඔවුන්ට පහර
දුන්නේ ය. 24 ඉශ්රායලේවරු ද ඔවුන්ට විරුද්ධ ව
කඩුවනේ ප්රති ප්රහාර දී, අර්ණොන් නදියේ සිට
ජබ්බොක් දක්වා ද අම්මොන්වරුන්ගේ දේශ
සීමාවේ පිහිටි ජාශර් නම් ස්ථානය දක්වා ද රට
යටත් කරගත්හ. 25 ඉශ්රායලේවරු මසෙේ
අමෝරිවරුන්ගේ මේ නගර සියල්ල ම අල්ලාගත්හ.
ඉන්පසු ඔව්හු හෂේබොන් ඇතුළු ඊට යාබද සියලු
නගරවල පදිංචි වූ හ. 26 හෂේබොන් වනාහි
අමෝරිවරුන්ගේ, සීහොන් නම් රජතුමාගේ ප්රධාන
නගරය විය. ඔහු කලින් සිටි මෝවබ්හි රජුට විරුද්ධ
ව සටන් කොට අර්ණොන් නදිය දක්වා මුළු
ප්රදේශය ම අල්ලාගනෙ තිබුණේ ය.
27 එබැවින් කිව්හු මසෙේ ගැයූ හ:
q227 “හෂේබොන් වතෙ එන්න, සීහොන් නුවර ඉදි
කොට එය ලකලෑස්ති කරන්න.
28 ජරෙ 48:45-46 හෂේබොනින් නික්ම ගිය ගින්න,
සීහොන් නුවරින් නික්ම ගිය ගිනි දලුව, මෝවබ්හි
ආර් ද අර්ණොන් ගිරිකුළු නායකයන් ද දවාදැමී ය.
29 එම්බා මෝවබ්, තිට වන විපතක මහත!
q229 කමෙොෂ් වැසියනෙි, තපෙි විනාශ යි!
q229 දරුවන් කමෙොෂ් කරෙනේ පලා යාමටත්
දැරියන් අමෝරි රජු හට වහල්කමටත් පාවා දුනි.
30 හෂේබොන් සිට දීබොන් දක්වා, නාෂිම් සිට
මදෙබා අසල නෝපා දක්වා, ඔවුන්ගේ පළෙපත
වැනසී ඇත.”
31 මලෙසෙ ඉශ්රායලේවරු අමෝරිවරුන්ගේ
දේශයහෙි පදිංචි වූ හ. 32 මෝසසේ ජාශර් නුවරට
ඔත්තු බැලීමට දූතයන් යවා, ඊට යාබද නගර අල්ලා
ගනෙ ඒවායේ විසූ අමෝරිවරුන් පන්නා දැමී ය.
33 ඉන්පසු ඔව්හු හැරී බාෂාන් බලා ගියහ. එවිට
බාෂාන්හි රජු වූ ඕග් සහ ඔහුගේ මුළු සනෙඟ
ඉශ්රායලේවරුන්ට විරුද්ධ ව යුද අරඹා පහර දීමට

එද්රෙයි නම් ස්ථානයට ගියහ. 34 සමිඳාණන්
වහන්සේ මෝසෙස් අමතා, “රජුට බිය නොවන්න;
නුඹ අතට ඔහුත්, ඔහුගේ මුළු සෙනඟත්, රටත් මම
පාවාදමි. හෙෂ්බොන්හි සිටි අමෝරිවරුන්ගේ රජ වූ
සීහොන්ට නුඹ කළාක් මෙන්, ඔහුටත් දඬුවම් කළ
යුතු ය”යි වදාළ සේක. 35 එවිට ඉශ්රායෙල්වරු එම
රජුටත්, ඔහුගේ දරුවන්ටත්, ඔහුගේ සෙනඟටත්
පහර දී ඔවුන්ගෙන් කිසිවකු ඉතුරු නොකොට
මරාදැමූ හ. ඉන්පසු ඔව්හු එම දේශය අත්පත්
කරගත්හ.

## බාලාක් රජ බාලාම් කැඳවීම

22 ඉශ්රායෙල් ජනයා ඉදිරියට ගොස්
ජෙරිකෝවට මුණ ලා ජෝර්දාන් ගඟින්
එතෙර මෝවබ් මිටියාවතෙහි කඳවුරු බැඳගත්හ.
2 තවද, ශිප්පෝර්ගේ පුත් බාලාක් ඉශ්රායෙල්වරුන්
අමෝරිවරුන්ට කළ සියල්ල දිටී ය. 3 ඉශ්රායෙලේ
සෙනඟ බොහෝ වූ බැවින් මෝවබ්හි වැසියෝ
ඔවුන්ට අතිශයින් බියපත් වී ඔවුන් නිසා
කැළඹුණාහ. 4 මෝවබ්හි වැසියෝ මිදියන්හි
මූලිකයන්ට කතා කොට, “ගොනෙකු කෙතේ තණ
කොළ කා දමන්නාක් මෙන්, මේ පිරිස අප අවට
ඇති සියල්ල කාදමනු ඇතැ”යි කී හ. ඒ සමයෙහි
මෝවබ්වරුන්ගේ රජ ශිප්පෝර්ගේ පුත් බාලාක් විය.
5 2 පේදු 2:15-16; ජූද් 11මොහු අමවු නම් රටේ
යුප්රටීස් නදිය අසල වූ පෙතෝර් නම් නගරයේ විසූ
බෙයෝර්ගේ පුත් බාලාම් කැඳවීමට දූතයන් යවමින්,
ඔහුට මෙසේ දැන්වීය: “බලන්න, මිසරයෙන් පිටතට
පැමිණි සෙනඟක් මෙහි ඇත. ඔව්හු මගේ රට පුරා
පැතිරී, එය අල්ලාගැනීමට තර්ජනය කරති. 6 දැන්
ඉතින් කරුණාකර, ඔබ මෙහි පැමිණ, මා වෙනුවෙන්
ඔවුන්ට සාප කරන්න. එසේ කළොත් ඔවුන්ට පහර
දී මේ රටින් ඔවුන් පන්නාදැමීමට අපට පුළුවන් වනු
ඇත. මන්ද, ඔබ යමකුට ආසිරි පැතුවොත් ආසිරි
ලැබෙන බවත්, සාප කළොත් සාප ලැබෙන බවත්
මම දනිමි.”
7 එවිට මෝවබ්හි සහ මිදියන්හි ප්රජා මූලිකයෝ
පේන කීමට ගෙවිය යුතු මුදල් රැගෙන, බාලාම්
වෙත ගොස් බාලාක්ගේ පණිවුඩය සැළ කළහ.
8 ඔහු ඔවුන්ට පිළිතුරු දෙමින්, “අද රෑ මෙහි
නවතින්න. සමිඳාණන් වහන්සේ මට කියන ලෙස
මම යළි ඔබට දන්වන්නෙමි”යි කී ය. මෝවබ්හි
ප්රජා මූලිකයෝ ද බාලාම් සමඟ නවාතැන් ගත්හ.
9 දෙවියන් වහන්සේ බාලාම් වෙත පැමිණ, “නුඹ
සමඟ සිටින මේ මිනිස්සු කවුරු දැ”යි ඇසූ සේක.
10 බාලාම් උන් වහන්සේට පිළිතුරු දෙමින්,
“මෝවබ්හි රජ වූ ශිප්පෝර්ගේ පුත් බාලාක් මා
වෙත දූතයන් එවා, 11 ‘බලන්න, මිසරයෙන් පිටත් ව
මෙහි සෙනඟක් පැමිණ ඇත. ඔව්හු මාගේ රට පුරා
පැතිරී සිටිති. දැන් ඉතින් කරුණාකර, ඔබ මෙහි
පැමිණ මා වෙනුවෙන් ඔවුන්ට සාප කරන්න. එසේ
කළොත්, මට ඔවුන් පරාජය කොට, පන්නාදැමීමට
පුළුවන් වනු ඇතැ’යි කියා දන්වා තිබේ ය”යි පැවසී
ය.
12 එවිට දෙවියන් වහන්සේ බාලාම්ට කතා කොට,
“නුඹ ඔවුන් සමඟ නොයා යුතු ය. ඒ සෙනඟට සාප
නොකළ යුතු ය. මන්ද, ඒ සෙනඟ ආසිරි ලත්
සෙනඟක් ය”යි වදාළ සේක.
13 බාලාම් උදෑසන නැඟිට බාලාක්ගේ ප්රජා
මූලිකයන් අමතා, “ඔබේ රටට ආපසු යන්න, ඔබ
සමඟ මට යන්නට සමිඳාණන් වහන්සේ අවසර
නොදෙන සේකැ”යි කී ය. 14 ඔව්හු නැඟිට, බාලාක්
වෙත පැමිණ, “බාලාම් අප සමඟ එන්නට බැරි ය
කියන්නේ ය”යි සැළ කළහ.
15 එවිට බාලාක් කලින් යැවූ දූතයන්ට වඩා ගරුතර
නායකයන් බොහෝ දෙනෙකු නැවත යැවී ය.
16 ඔව්හු බාලාම් වෙත පැමිණ, “ශිප්පෝර්ගේ පුත්
බාලාක් මෙසේ කියනු ඇත: ‘කරුණාකර, මා වෙත
එන්නට බැහැ නොකියන්න. 17 මම ඔබට ගරු
සම්මාන ප්රදානය කරමි, ඔබ ඉල්ලන්නේ කුමක් ද,
ඒ දේ මම දෙමි. එබැවින් කරුණාකර, මෙහි පැමිණ,
මා වෙනුවෙන් මේ සෙනඟට සාප කරන්න’ කියා
ඉල්ලා සිටින්නේ ය”යි සැළ කළහ.
18 එවිට බාලාම්, බාලාක්ගේ දූතයන්ට පිළිතුරු
දෙමින්, “බාලාක් සිය රාජකීය මාලිගයේ රන් රිදී
සියල්ල මට දෙතත්, මාගේ දෙවි සමිඳාණන්
වහන්සේගේ වචනය ඉක්මවා, අබමල් රේණුවක
පමණ වත් දෙයක් මට කළ නොහැකි ය. 19 එබැවින්
කරුණාකර, මේ රාත්රියත් මෙහි ගත කරන්න,
සමිඳාණන් වහන්සේ ඊට වැඩි යමක් මට කියන
සේක් නම්, මම එය දැන ගන්නෙමි”යි සැළ කළේ
ය.
20 එදින රෑ දෙවියන් වහන්සේ බාලාම් වෙත
පැමිණ, ඔහුට කතා කොට, “නුඹ කැඳවීමට මේ
මිනිස්සු පැමිණියෝ නම්, ඔවුන් සමඟ යන්න.
එහෙත්, මා නුඹට දන්වන පණිවුඩය අනුව පමණක්
නුඹ කළ යුතු ය”යි වදාළ සේක. 21 බාලාම්
උදෑසනින් නැඟිට කොටළුවාට සෑදලය යොදා
මෝවබ්හි නායකයන් සමඟ ගියේ ය.

## බාලාම්ගේ කොටළුවා

22 බාලාම් මෙසේ ගිය බැවින් දෙවියන්
වහන්සේගේ උදහස ඇවිළිණි. ඔහු තම කොටළුවා
පිට නැඟී ගියේ ය. ඔහු සමඟ මෙහෙකරුවෝ
දෙදෙනෙක් ද වූ හ. එවිට සමිඳාණන් වහන්සේගේ
දූතයා ඔහුට අවහිර කරමින් පාර හරහා සිටගත්තේ
ය. 23 අතේ කඩුවක් ඇති, සමිඳාණන් වහන්සේගේ
දූතයා පාර හරහා සිටිනු දුටු විට, කොටළුවා පාරෙන්
ඉවත් ව කෙතට ගියේ ය. එහෙත් බාලාම්
කොටළුවා ආපසු පාරට හරවන පිණිස, ඌට පහර
දුන්නේ ය. 24 එවිට සමිඳාණන් වහන්සේගේ දූතයා,
දෙපැත්තේ තාප්ප ඇති, මිදි වතු මැදින් වූ පටු පාරක්
හරහා සිටගත්තේ ය. 25 කොටළුවා, සමිඳාණන්
වහන්සේගේ දූතයා දුටු විට, ඌ තාප්පය දෙසට
වැරෙන් තල්ලු වී ගිය නිසා බාලාම්ගේ පය

තාප්පයේ හැපී තුවාළ විය. එවිට ඔහු තවත් වරක්
ඌට තැළී ය. 26 ඉන්පසු සමිඳාණන් වහන්සේගේ
දූතයා ඉදිරියට ගොස් වමතට හෝ දකුණතට හෝ
හැරෙන්නට ඉඩ නැති ඉතා පටු පාරක සිටගත්තේ
ය. 27 මෙවර කොටළුවා සමිඳාණන් වහන්සේගේ
දූතයා දුටු විට, බාලාම් ඌ පිට සිටිය දී ම බිම
වැදහොත්තේ ය. ඔහු තදින් රොස් වී, කවේටනේ
ඌට පහර දෙන්නට විය. 28 එවිට සමිඳාණන්
වහන්සේ කොටළුවාට කතා කිරීමේ බලය දුන්
සේක. ඌ බාලාම්ට කතා කොට, "ඔබ මට තුන්
වතාවක් ම පහර දුන්නේ මා ඔබට කුමන වරදක්
කළ නිසා දැ"යි ඇසී ය.
29 බාලාම් ඌට කතා කොට, "මා නුඹට එසේ
කළේ නුඹ මට සරදම් කරන බැවිනි. මා අත
කඩුවක් තිබුණා නම් නුඹ මරාදමන එක සිකුරු ය"යි
කීවේ ය.
30 එවිට කොටළුවා බාලාම්ට කතා කොට, "මා
ඔබට අයිති වූ දින සිට අද දක්වා ඔබ නැඟී ගිය
ඔබේ කොටළුවා මම නොවෙමේ ද? මින් ඉහත කවදා
වත් මේ විදියට මම ඔබට සංග්‍රහ කළෙමේ දැ"යි
ඇසූ විට, ඔහු "නැතැ"යි පිළිතුරු දුනි.
31 එවිට සමිඳාණන් වහන්සේ ඔහුගේ ඇස් පැහැදූ
සේක. උන් වහන්සේගේ දූතයා අතේ කඩුවක් ඇති
ව පාර හරහා සිටිනු ඔහු දිටී ය. ඔහු ද හිස නමා
ආචාර කොට, මුණින්තලා වැටිණි. 32 සමිඳාණන්
වහන්සේගේ දූතයා ඔහු අමතමින්, "නුඹේ
කොටළුවාට නුඹ තුන් වතාවක් පහර දුන්නේ මන්
ද? නුඹ මේ ගමන නොයා යුතු බැවින්, නුඹට අවහිර
කිරීමට මම ආවෙමි. 33 කොටළුවා මා දැක
තුන්වරක් පාරෙන් ඉවතට ගියේ ය. ඌ එසේ
ඉවතට නොගියේ නම්, සත්තකින් ම නුඹ මරා දමා
ඒ සතාගේ පණ බේරාගන්නට මම හිතාගෙන
සිටියෙමි"යි කීවේ ය.
34 එවිට බාලාම් සමිඳාණන් වහන්සේගේ දූතයාට
කතා කොට, "මම පව් කළෙමි. ඔබ මට අවහිර
කරමින් පාර හරහා උන් බව මම නොදැන සිටියෙමි.
දැන් ඉතින් මගේ ගමනට ඔබ අකමැති නම්, මම
හැරී ආපසු යන්නෙමි"යි කීවේ ය.
35 එවිට උන් වහන්සේගේ දූතයා බාලාම්ට කතා
කොට, "මේ මිනිසුන් සමඟ යන්න. එහෙත්, මම
නුඹට දන්වන දේ පමණක් නුඹ කිව යුතු ය"යි
උත්තර දුනි. එවිට බාලාම් බාලාක්ගේ නායකයන්
සමඟ යන්නට ගියේ ය.

## බාලාක් රජ බාලාම් පිළිගැනීම

36 බාලාම් පැමිණි බව බාලාක් දැනගත් විට ඔහු
බාලාම් හමුවනු සඳහා මෝවබ් දේශ සීමාවේ
අර්නොන් ගං තෙරේ පිහිටි ආර් නම් නුවරට ගියේ
ය. 37 එවිට බාලාක්, බාලාම්ට කතා කොට, "ඔබ
කැඳවනු පිණිස, මම ඔබ වෙත ඉතා ඕනෑකමින්
දූතයන් නෑරියෙමි ද? මා වෙත නාවේ මන් ද? ඔබට
ගරු සම්මාන ප්‍රදානය කිරීමට මට නුපුළුවන් ය කියා
ඔබ සිතන්නෙහි දැ"යි විචාළේ ය.
38 එවිට බාලාම් උත්තර දෙමින්, "මෙන්න, මම
ඇවිත් සිටිමි. එහෙත්, යමක් කීමට මට ඇති බලය
කුමක් ද? දෙවියන් වහන්සේ මට කියන දේ
පමණක් මම ඔබට දන්වමි"යි සැළ කළේ ය.
39 ඉන්පසු ඔවුන් දදෙන ගමන් කොට, කිර්යත්-
හුශෝත් නම් නුවරට පැමිණියහ. 40 එහි දී බාලාක්
ගොනුන් සහ බැටළුවන් මරා, බාලාම් සහ ඔහු
සමඟ සිටි නායකයන් වෙත සතුන්ගේ කොටස් යැවී
ය. 41 පසු දින උදය බාලාක් බාලාම් කැඳවාගෙන
බාමොත්-බාල් නම් ගිරිකුළට ගියේ ය. එහි දී
ඉශ්රායලේ සෙනඟගෙන් කොටසක් බාලාම්ට
දකින්නට පුළුවන් විය.

## බාලාම්ගේ පළමු වන අනාවැකිය

23 බාලාම් බාලාක්ට කතා කොට, "මෙහි මට
පූජාසන හතක් තනා, ගොනුන් හත්දෙනෙකු
හා බැටළු වස්සන් හත්දෙනෙකු සපයා දෙන්නැ"යි කී
ය.
2 බාලාම් කී පරිදි බාලාක් කළ පසු, දදෙනා ම
එක එක පූජාසනය මත එක ගොනෙකු හා එක
බැටළු වස්සෙකු බැගින් පූජා කළහ. 3 ඉන්පසු
බාලාම්, බාලාක් අමතමින්, "ඔබ ඔබේ දවන යාග
පූජාව ළඟ සිටින්න. මම යන්නෙමි. ඇතැම් විට
සමිඳාණන් වහන්සේ මා හමුවීමට එනු ඇත. උන්
වහන්සේ මට යමක් වදාරන සේක් ද, මම එය
ඔබට දන්වන්නෙමි"යි පැවසී ය. මෙසේ පවසා, ඔහු
ගිරිකුළකට නැංගේ ය. 4 එහි දී දෙවියන් වහන්සේ
ඔහුට හමු වූ විට ඔහු උන් වහන්සේ අමතා, "මම
පූජාසන හතක් තනා ඒ එක එක මත ගොනෙකු හා
බැටළු වස්සෙකු බැගින් පූජා කළෙමි"යි කී ය.
5 උන් වහන්සේ ඔහුට කතා කොට, "නුඹ බාලාක්
වෙත ගොස්, ඔහුට මෙසේ සැළ කළ යුතු ය"යි
දැන්වූ සේක. 6 ඔහු ද බාලාක් වෙත ගිය විට,
බාලාක් සහ මෝවබ්හි නායකයන් ඔහුගේ දවන
යාග පූජාව ළඟ සිටිනු දිටී ය.
7 එවිට බාලාම් මේ අනාවැකිය කී ය:
q27 "මෝවබ්හි භූපති බාලාක් මා කැඳවූයේ, ආරාම්
රටිනි, පෙරදිග කඳුකරයෙනි, ඔහු මා ඇමතූයේ, '
එන්න,
q27 මා වෙනුවෙන් ඉශ්රායලේ ජනයාට සාප කරන්න.
q27 එන්න, ඉශ්රායලේ ජනයා හට දසේ කියන්න'
කියා ය.
8 දෙවිඳුන් සාප නොකළ අයට මම කෙසේ සාප
කරම් ද?
q28 සමිඳුන් දසේ නොකී අයට මම කෙසේ දසේ
කියම් ද?
9 ගිරිකුළුවලින් එපිට මට ඔවුන් පෙනේ, කඳු
හලේවලින් ඈත මට ඔවුන් දිස් වේ.
q29 ඔව්හු වෙනේ ව වසන සෙනඟක් වෙති.
q29 ජාතීන් අතර නොගැණෙන සෙනඟක් වෙති.
10 ධූලි වැනි ජාකොබ්ගේ පළෙපෙත ගිණිය හැක්කේ
කාට ද? ඉශ්රායලේ පරපුර ගිණීමට සමතා කවරකේ
ද?

q2 10 දැහැමියකු මෙන් මම මරණයට පත් වෙම් වා!
මා අවසානය ඔවුන්ගේ මෙන් ම වේ වා!”
11 එවිට බාලාක් බාලාම් අමතමින්, “ඔබ මට කළ
මේ හදිය කුමක් ද? මා ඔබ කැඳවූයේ මාගේ
සතුරන්ට සාප කිරීමට ය; එහෙත්, පුදුමයකි, ඔබ
කර ඇත්තේ ඔවුන්ට ආසිරි පැතීමකි”යි කී ය.
12 බාලාම් ඔහුට පිළිතුරු දෙමින්, සමිඳාණන්
වහන්සේ මට කියන දේ පමණක් කීමට මම වග
බලාගත යුතු නොවෙම් දැ”යි ඇසී ය.

## බාලාම්ගේ දෙ වන අනාවැකිය

13 බාලාක් බාලාම්ට කතා කොට, “ඔබ කරුණාකර,
මා සමඟ වෙන තැනකට එන්න. එහි දී ඔබට ඔවුන්
දකින්නට පුළුවන. එතැන සිට ඔවුන් සියල්ලන්
නොව, ඔවුන්ගෙන් කොටසක් ඔබට පෙනෙනු ඇත.
එතැන සිටගෙන මා වෙනුවෙන් ඔවුන්ට සාප
කරන්නැ”යි ඉල්ලී ය. 14 මෙසේ කියා පිස්ගා නම්
කඳු මුදුනෙහි ශොපිම් නම් කෙතට ඔහු ගෙනැවිත්,
එහි පූජාසන හතක් තනා එක එක පූජාසනය මත
ගොනෙකු හා බැටළු වස්සෙකු බැගින් පූජා කළේ
ය.
15 ඉන්පසු බාලාම් බාලාක්ට කතා කොට, “ඔබේ
දවන යාග පූජාව ළඟ ඔබ සිටින්න. මම අතනට
ගොස් සමිඳාණන් වහන්සේ හමුවෙමි”යි කී ය.
16 සමිඳාණන් වහන්සේ බාලාම්ට මුණ ගැසී, ඔහුට
කතා කොට, “නුඹ බාලාක් වෙත නැවත ගොස්
මෙසේ කියන්නැ”යි වදාළ සේක. 17 බාලාම් ඔහු
වෙත ගිය විට බාලාක් හා මෝවබ්හි නායකයන්
ඔහුගේ දවන යාග පූජාව ළඟ සිටිනු දිටී ය. බාලාක්
ද, “සමිඳාණන් වහන්සේ කුමක් කීවේ දැ”යි විචාළේ
ය. 18 එවිට බාලාම් මේ දිවැස් වැකිය පැවසී ය:
q2 18 “බාලාක්, අවදි ව ඇහුම්කන් දෙන්න;
q2 18 ශිප්පෝර්ගේ පුත්රය, මට සවන් දෙන්න;
19 දෙවිඳාණෝ බොරු කියන මිනිසකේ නොවෙති;
q2 19 පසුබට වන මිනිස් පුතකේ ද නොවෙති;
q2 19 එතුමාණෝ, තමන් කී දේ ඉටු නොකරන
සේක් ද?
q2 19 පොරොන්දු වූ දේ, නොදෙන සේක් ද?
20 බලන්න, මට පැවරුයේ ආසිරි පැතුමකි.
q2 20 උන් වහන්සේ පැතූ ආසිරි මට ආපසු නොගත
හැකි ය.
21 ජාකොබ් පළෙපතෙහි නපුරක් එතුමන්ට
නොපෙනේ.
q1 21 ඉශ්රායලේ පරපුරෙහි දූෂ්යකමක් එතුමාණෝ
නුදුටු සේක.
q2 21 දෙවි සමිඳාණෝ ඔවුන් සමඟ ය. එතුමාණන්
සිය රජු බව ඔව්හු පවසති.
22 දෙවිඳාණෝ ඉශ්රායලේවරුන් මිසරයෙන් ගෙනෙ
සේක.
q2 22 කුළු හරකාට උගේ අං යම් සේ ද දෙවිඳුන්
ඔවුන්ට එසේ ම වනු ඇත.
23 ජාකොබ්ට එරෙහි ව අනවින නැත.
q2 23 ඉශ්රායලේට එරෙහි ව පේන කීමක් ද නැත.
q2 23 ජාකොබ් පළෙපත, ඉශ්රායලේ පරපුර අමතා,
‘දෙවිඳුන් කළේ කුමක් ද’ කියා අසනු ඇත.
24 පුදුමයෙන් පුදුමයකි! සිහ දෙනෙක මෙන් සෙනඟ
නැඟිටිනු ඇත.
q2 24 සිහ රදකු මෙන් ගොදුර බලා පනිනු ඇත,
ගොදුර කන තුරු, මැරුවන්ගේ ලේ බොන තුරු, ඌ
ලගින්නේ නැත.”
25 එවිට බාලාක් බාලාම් අමතමින්, “ඔවුන්ට සාප
කිරීමට අකමැති නම්, යටත් පිරිසයේන් ඔවුන්ට
ආසිරි නොපතන්නැ”යි කී විට, 26 ඔහු උත්තර
දෙමින්, “සමිඳාණන් වහන්සේ කියන දේ මා කළ
යුතු බව මම ඔබට කලින් නොකීවෙම් දැ”යි ඇසී ය.

## බාලාම්ගේ තුන් වන අනාවැකිය

27 ඉන්පසු බාලාක් බාලාම්ට කතා කොට, “එන්න,
කරුණාකර, මම ඔබ වෙනත් තැනකට ගෙන යමි.
ඇතැම් විට එතැන සිටවත් මා වෙනුවෙන් මොවුන්ට
සාප කිරීමට දෙවියන් වහන්සේ ඔබට අවසර දෙනෙ
හැකි ය”යි කී ය. 28 මෙසේ කියා, ඔහු කාන්තාරය
ඉදිරිපිට වූ පයෙෝර් නම් කඳු මුදුනට බාලාම්
ගෙනාවේ ය. 29 ඔහු බාලාක්ට කතා කොට, “මෙහි
පූජාසන හතක් තනා, ගොනුන් හත්දෙනෙකු හා
බැටළු වස්සන් හත්දෙනෙකු සපයා දෙන්නැ”යි කී ය.
30 බාලාම් කී පරිදි බාලාක් කළ පසු, ඔහු එක එක
පූජාසනය මත ගොනෙකු හා බැටළු වස්සෙකු බැගින්
පූජා කළේ ය.

24 ඉශ්රායලේවරුන්ට ආශීර්වාද කිරීමට
සමිඳාණන් වහන්සේ කැමැති බව බාලාම්
දැනගත් විට, ඔහු කලින් කළාක් මෙන්, සුබ ලකුණු
බැලීමට නොගොස් පාළුකරය දෙසට හැරුණේ ය.
2 ඔහු හිස ඔසවා බැලූ විට, ඉශ්රායලේවරුන්
ඔවුන්ගේ ගෝත්ර අනුව කඳවුරු බැඳ සිටිනු දිටී ය.
දේවාත්මානුභාවය ඔහු මත විය. 3 එවිට ඔහු මේ
අනාවැකිය කී ය:
q2 3 “බයෙෝර්ගේ පුත්, බාලාම්ගේ පණිවුඩය මේ
ය.
q2 3 ඇස් පැහැදුණු මිනිසාගේ කියමන මේ ය.
4 දෙවි වදනට සවන් දුන්, සර්ව බලැති සමිඳුන්ගේ
දර්ශනය දුටු, ධ්යාන සුවයට සම වැදුණු, නෙත්
පැහැදී ඇති ඔහුගේ කියමන, මේ ය.
5 එම්බා ජාකොබ්!
q2 5 ඔබේ කූඩාරම් කෙතරම් මනහර ද?
q2 5 එම්බා ඉශ්රායලේ!
q2 5 ඔබේ කඳවුරු කෙතරම් ශෝභන ද?
6 ඒවා දුරට පැතිර විහිදෙන මිටියාවත් මෙනි,
ගඟබඩ උයන් මෙනි;
q2 6 සමිඳුන් රෝපණය කළ අගරු ගස් මෙනි;
q2 6 ගං තෙර කිහිරි ගස් මෙනි.
7 ඔවුන්ගේ බඳුන්හි ජලය උතුරා යයි;
q2 7 ඔවුන්ගේ පළෙපත මහ සමුදුර මෙනි, ඔවුන්ගේ
රජ, ආගග් රජුට වඩා උසස් වනු ඇත.
q2 7 ඔවුන්ගේ අණසක දසත පැතිර යනු ඇත.

8 දෙවිඳාණෝ ඉශ්‍රායෙල්වරුන් මිසරයෙන් ගෙනා
සේක.
q2 8 කුළු හරකාට උගේ අං යම් සේ ද, දෙවිඳුන්
ඔවුන්ට එසේ ම වනු ඇත.
q2 8 ඔවුන් තම හතුරු ජාතීන් කාදමනු ඇත, ඇටකටු
සිඳ බිඳ, ඊතල සුන්බුන් කරනු ඇත.
9 උත් 12:3; 49:9 සිහ රදෙකු මෙන්, සිහ දෙනක
මෙන්, ඉශ්‍රායෙල් ජනයා, හිස ඔසවා බිම වැතිරෙති.
q2 9 උන් අවදි කරන්නට සමතා කවරෙක් ද?
q2 9 ඔබට ආසිරි දෙන්නා ආසිරි ලද්දෙකි;
q2 9 ඔබට සාප දෙන්නා සාප ලද්දෙකි.”
10 එවිට බාලාක් බාලාම්ට විරුද්ධ ව තදින් රොස්
වී, අත් මිටමොළවා, ඔහු අමතමින්, “මා ඔබ
කැඳවූයේ මාගේ සතුරන්ට සාප කරන්නට ය.
එහෙත්, ඔබ කර ඇත්තේ තෙවරක් ම ඔවුන්ට ආසිරි
පැතීම යි. 11 එබැවින් දැන් ඉතින් ඔබේ ගෙදරට
වහා පලා යන්න. මා සිතාගෙන සිටියේ ඔබට
බොහෝ ගරු සම්මාන දීමට ය. එහෙත් සමිඳාණන්
වහන්සේ එසේ කිරීමෙන් මා වැළැක්වූ සේකැ”යි කී
ය.
12 එවිට බාලාම් පිළිතුරු දෙමින්, “මා වෙත ඔබ එවූ
දූතයන්ට කතා කොට, 13 “බාලාක් තම රාජ මාලිගය
පුරවා රන් රිදී මට දෙතත්, මා සිතන පරිදි හොඳ
හෝ නරක හෝ කිරීමට සමිඳාණන් වහන්සේගේ
අණ ඉක්මවා යන්නට බැරි බවත්, උන් වහන්සේ
කියන දේ පමණක් මා කතා කරන බවත් මම
නොකීවෙම් ද? 14 බලන්න, මම දැන් මගේ සෙනඟ
වෙත යමි. එහෙත්, මින් ඉදිරියට මේ සෙනඟ ඔබේ
සෙනඟට කරන දේ කල්තියා දන්වන්නට යමි”යි
කීවේ ය.

## බාලාම්ගේ අවසාන අනාවැකිය

15 ඉන්පසු බාලාම් මේ අන්තිම අනාවැකිය කී ය.
q2 15 “බෙයෝර්ගේ පුත්, බාලාම්ගේ පණිවුඩය මේ
ය, ඇස් පැහැදුණු මිනිසාගේ කියමන මේ ය.
16 දෙවි වදනට සවන් දුන්, මහෙසුරු පිළිබඳ
දැනගැන්ම ඇති, සර්ව බලැති සමිඳුන්ගේ දර්ශනය
දිටි, ධ්‍යාන සුවයට සම වැදුණු, නෙත් පැහැදී ඇති
ඔහුගේ කියමන, මේ ය.
17 මම එතුමන් දකිමි, එහෙත් දැන් නොවේ;
q2 17 මට එතුමන් පෙනේ, එහෙත් ළඟපාත නොවේ;
q2 17 ජාකොබ්ගේ පෙළපතින් තරුවක් පායනු ඇත;
q2 17 ඉශ්‍රායෙල් වංශයෙන් ජයකොන්තයක් මතු වනු
ඇත.
q2 17 එතුමන් මෝවබ් නායකයන්ට පහර දී, ඔද
වැඩි, සැහැසියන් වනසනු ඇත.
18 ඒදොම් පරාජිත රටක් වේ;
q2 18 සේයිර් ද පරාජිත රටක් වේ;
q2 18 ඉශ්‍රායෙල් රට ජයග්‍රාහී වනු ඇත.
19 ඉශ්‍රායෙල් ජනයා සතුරන් පරදා නගරයේ ඉතුරු
වන්නන් වනසාලන්නේ ය.”
20 එවිට බාලාම්, අමලෙක් දෙස බලා මේ
අනාවැකිය පැවසී ය:
q2 20 “ජාතීන් අතර ප්‍රබල ජාතිය අමලෙක් ය;
q2 20 එහෙත් ඔහුගේ අන්තිමය විනාශය වේ.”
21 ඔහු කේනිවරුන් දෙස බලා, මේ අනාවැකිය
පැවසී ය.
q1 21 “ඔබේ වාසභවනය ශක්තිමත් ය;
q2 21 ඔබේ කැදැල්ල පර්වතයක් මෙන් සුරැකි ව
ඇත.
22 එහෙත් කේනිවරුන් වැනසෙනු ඇත;
q2 22 අසිරියාව ඔබ හැම අල්ලාගනු ඇත.”
23 බාලාම් මේ අනාවැකිය ද පැවසී ය.
q2 23 “දිවයින් වැසියෝ උතුරු දිගට රැස් වෙති.
24 කිත්තිම් දිසාවෙන් නැව් එනු ඇත.
q2 24 අසිරියාවට, බබිලෝනියට පහර දෙනු ඇත.
q2 24 එහෙත්, ඔව්හු ද විනාශයට පැමිණෙති.”
25 ඉන්පසු බාලාම් නැඟිට සිය නිවසෙ බලා ආපසු
ගියේ ය.
q2 25 බාලාක් ද යන්නට ගියේ ය.

## ඉශ්‍රායෙල්වරුන්ගේ දුසිරිත්

25 ඉශ්‍රායෙල්වරු ෂිට්ටිම් නම් මිටියාවතෙහි
කඳවුරු බැඳගත්හ. ඔව්හු, මෝවබ්
කාන්තාවන් සමඟ අනාචාරයේ හැසිරෙන්නට
පටන්ගත්හ. 2 මේ ස්ත්‍රීන් තමන්ගේ දෙවි
දේවතාවන්ට පිදූ පුදපූජා සඳහා සෙනඟට ආරාධනය
කළ විට, ඔව්හු ගොස් ඒ පිදේනි වළඳා, ඒ දෙවි
දේවතාවන් ඉදිරියෙහි වැඳ වැටුණෝ ය. 3 මෙසේ
ඉශ්‍රායෙල්වරුන් පෙයෝර්හි බාල් නම් දෙවියාට කැප
වූ බැවින්, ඔවුන්ට විරුද්ධ ව සමිඳාණන්
වහන්සේගේ උදහස ඇවිළිණි. 4 උන් වහන්සේ
මෝසෙස් අමතා, “සෙනඟ අතර නායක සියල්ලන්
කැඳවන්න, සමිඳාණන් වහන්සේගේ උදහස
ඉශ්‍රායෙල් කෙරෙන් පහව් යන පිණිස, ප්‍රසිද්ධියේ
ඔවුන් එල්ලා මරන්නැ”යි වදාළ සේක. 5 එවිට
මෝසෙස් ඉශ්‍රායෙල්වරුන්ගේ නිලධාරීන් අමතා,
“පෙයෝර්හි බාල් නම් දෙවියාට කැප වූ තම
තමාගේ සියලු මිනිසුන් මරන්නැ”යි අණ කළේ ය.
6 එවිට, මෝසෙස් සහ මුළු ඉශ්‍රායෙල් ජනතාව ම
සම්මුඛ මණ්ඩපයේ දොරකඩ හඬ හඬා සිටිය දී,
ඔවුන්ට පෙනෙන්නට ම, එක් ඉශ්‍රායෙල් ජාතිකයෙක්
මිදියන් ජාතික ස්ත්‍රියක තම සොහොයුරන් වෙත
කැඳවාගෙන ආයේ ය. 7 එවිට පූජක ආරොන්ගේ
පුත් එලෙයාසර්ගේ පුත්‍රයා වන පිනෙහාස් මෙය දුටු
විට, තම සෙනඟ මැදින් නැඟිට, හෙල්ලයක් අතින්
ගෙන 8 ඒ ඉශ්‍රායෙල් ජාතිකයා පසුපස ගොස්
කූඩාරමට ඇතුළු වී, ඔහුගේ හා ඒ ස්ත්‍රියගේ බඩ
සිදුරු කරගෙන යන ලෙස දෙදෙනාට ම ඇන්නේ ය.
එවිට ඉශ්‍රායෙල් ජනයා අතර පැතිර ගිය වසංගතය
නැවතිණි. 9 ඒ දක්වා ඉන් මැරුණු ජනකාය විසිහතර
දාහක් වූ හ.
10 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට,
11 “පූජක ආරොන්ගේ පුත්, එලෙයාසර්ගේ පුත්‍රයා
වන පිනෙහාස් මගේ උදහස ඉශ්‍රායෙල් ජනයා වෙත
පැමිණීමෙන් වැළැක්වීය. ඔවුන් අතර ඔහු පමණක්

මට ඉතා ලැදි ව සිටි බැවින්, ඒ ලැදිකම නිසා ම, මම
ඉශ්රායලේ ජනයා වනසා නොදැමීමි. 12 එබැවින්
'සාම ගිවිසුම මම ඔහු සමඟ කරමි'යි ඔහුට
කියන්න. 13 සදාතන පූජකවරයගේ ගිවිසුමක්
වශයෙන් එය ඔහුටත්, ඔහුගෙන් පසු ඔහුගේ
පළපතටත් හිමි වනු ඇත. මා එසේ කළේ ඔහු
තම දෙවියන් වහන්සේට ලැදි ව, ඉශ්රායලේ ජනයාට
පව් කමාව සැලසූ හෙයිනි"යි වදාළ සේක.
14 මිදියන් ජාතික ස්ත්රී සමඟ මරණ ලද
ඉශ්රායලේ ජාතිකයාගේ නම සිම්රි ය. ඔහු
සිමියොන්ගේ පළපතට අයත් දෙටු කුලයක නායක
වූ සාලුගේ පුත්රයා ය. 15 මරණ ලද මිදියන් ජාතික
ස්ත්රිය කොස්බි ය. ඈ මිදියන්හි දෙටු කුලයක
සෙනඟට අධිපති නායකයකු වූ ශූර්ගේ දුව ය.
16 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට,
17 "මිදියන්වරුන්ට හිරිහැර කොට ඔවුන්
වනසාලන්න. 18 මන්ද, පයෝර් සම්බන්ධ
කාරණයේ දී ද, ඒ කරුණ නිසා වසංගත පැමිණි දින
මරණ ලද මිදියන් ජාතික නායකයාගේ දුව හා
ඔවුන්ගේ සහෝදරිය වන කොස්බි සම්බන්ධ
කාරණයේ දී ද, ඔවුන් තමන්ගේ කපටි මායම්වලින්
නුඹලාට හිරිහැර කර ඇති හෙයිනැ"යි වදාළ සේක.

### දෙ වන ජන සංගණනය

26 ගණන් 1:1-46 වසංගතයෙන් පසු සමිඳාණන්
වහන්සේ මෝසෙස්ට සහ පූජක ආරොන්ගේ
පුත් එලෙයාසර්ට කතා කොට, 2 "මුළු ඉශ්රායලේ
ජනතා අතර, ඔවුන්ගේ පළපත් අනුව, හමුදාවට
බැඳෙන්නට පුළුවන්, අවුරුදු විස්සක් හා ඊට වඩා
වයසැති සියල්ලන් සංගණනය කළ යුතු ය"යි වදාළ
සේක. 3 මෝසෙස් සහ පූජක එලෙයාසර් ජොර්දාන්
ගඟබඩ මෝවබ් මිටියාවතේ, ජෙරිකෝව අසල දී,
සෙනඟට කතා කොට, 4 "සමිඳාණන් වහන්සේ
මෝසෙස්ට සහ මිසර දේශයෙන් නික්ම ආ
ඉශ්රායලේ ජනයාට අණ කළ පරිදි අවුරුදු විස්සක්
හා ඊට වඩා වයසැති සියල්ලන්ගේ සංගණනය ගත
යුතු ය"යි කීහ.
5 ඔව්හු වනාහි ඉශ්රායලේවරුන්ගේ කුලදුල් පුත්
රූබන් ය; මොහුගේ පරපුර නම්, හනොක්ගෙන්
පැවතෙන හනොක් පවුල ය; පල්ලුගෙන් පැවතෙන
පල්ලු පවුල ය; 6 හෙශ්රොන්ගෙන් පැවතෙන
හෙශ්රොන් පවුල ය; කර්මීගෙන් පැවතෙන කර්මී
පවුල ය; 7 රූබන්ගේ පරපුරට අයත් පවුල් ඒවා ය.
ලියාපදිංචි කළ අයගේ මුළු ගණන හතළිස්තුන්දාස්
හත්සිය තිස්දෙනෙකේ ය. 8 පල්ලුගේ පුත්රයෝ නම්
එලියාබ් ය. 9 මොහුගේ පුත්රයෝ නම් නෙමුවෙලේ,
දාතාන් සහ අබිරාම් ය. දාතාන් සහ අබිරාම් නම්
සමිඳාණන් වහන්සේට විරුද්ධ ව කැරලිගැසූ
කෝරාගේ පිරිසට අයත්, මෝසෙස්ට හා ආරොන්ට
අභියෝග කළ, සෙනඟ අතර සුප්රසිද්ධ දෙදෙනා ය.
10 පොළොව පැළී ඔවුන් ගිලදැමී ය. ගින්නෙන්
දෙසිය පණස්දෙනෙකු වැනසී ගිය විට, ඔවුන් සමඟ
කෝරා සහ ඔහුගේ පිරිස ද මළහ. මෙසේ ඔව්හු
අනතුරු ඇඟවීමේ ලකුණක් වූ හ. 11 එහෙත්,
කෝරාගේ දරුපරපුර නොමළෝ ය.
12 පවුල් අනුව සිමියොන්ගේ දරුපරපුර නම්,
නෙමුවෙලේගෙන් පැවතෙන නෙමුවෙලේ පවුල ය;
ජාමින්ගෙන් පැවතෙන ජාමින් පවුල ය; ජාකීන්ගෙන්
පැවතෙන ජාකීන් පවුල ය; 13 ශෙරොගෙන් පැවතෙන
ශෙරො පවුල ය; ෂාවුල්ගෙන් පැවතෙන ෂාවුල් පවුල
ය. 14 සිමියොන්ගේ පරපුරට අයත් පවුල් ඒවා ය.
ඔවුන්ගේ මුළු ගණන විසි දෙදාස් දෙසීයයක් ය.
15 පවුල් අනුව ගාද්ගේ පරපුර නම්, ශෙපොන්ගෙන්
පැවතෙන ශෙපොන් පවුල ය; හග්ගීගෙන් පැවතෙන
හග්ගී පවුල ය; ෂූනීගෙන් පැවතෙන ෂූනී පවුල ය;
16 ඔශ්නිගෙන් පැවතෙන ඔශ්නි පවුල ය, ඒරීගෙන්
පැවතෙන ඒරී පවුල ය; 17 අරොද්ගෙන් පැවතෙන
අරොද් පවුල ය; අරේලිගෙන් පැවතෙන අරේලි
පවුල ය. 18 ගාද්ගේ පරපුරට අයත් පවුල් ඒවා ය.
ලියාපදිංචි කළ අයගේ මුළු ගණන හතළිස්දාස්
පන්සියයක් ය.
19 ජුදාගේ පුත්රයෝ, ඒර් සහ ඕනාන් ය, මේ
දෙදෙනා කානාන් දේශයෙහි මළහ. 20 පවුල් අනුව
ජුදාගේ පරපුර නම්, ෂේලාගෙන් පැවතෙන ෂේලා
පවුල ය; පෙරෙශ්ගෙන් පැවතෙන පෙරෙශ් පවුල ය;
ශෙරොගෙන් පැවතෙන ශෙරො පවුල ය; 21 පෙරෙශ්ගේ
පරපුර නම් හෙශ්රොන්ගෙන් පැවතෙන හෙශ්රොන්
පවුල ය; හාමුල්ගෙන් පැවතෙන හාමුල් පවුල ය.
22 ජුදාගේ පරපුරට අයත් පවුල් ඒවා ය. ලියාපදිංචි
කළ අයගේ මුළු ගණන හැත්තෑහයදාස් පන්සියයක්
ය.
23 පවුල් අනුව ඉස්සාකර්ගේ පරපුර නම්,
තෝලාගෙන් පැවතෙන තෝලා පවුල ය; පුවාගෙන්
පැවතෙන පුවා පවුල ය; 24 ජාෂුබ්ගෙන් පැවතෙන
ජාෂුබ් පවුල ය; ෂිම්රොන්ගෙන් පැවතෙන ෂිම්රොන්
පවුල ය. 25 ඉස්සාකර්ගේ පරපුරට අයත් පවුල් ඒවා
ය. ලියාපදිංචි කළ අයගේ මුළු ගණන හැටහතරදාස්
තුන්සියයක් ය.
26 පවුල් අනුව සාබුලොන්ගේ පරපුර නම්,
සෙරෙද්ගෙන් පැවතෙන සෙරෙද් පවුල ය;
ඒලොන්ගෙන් පැවතෙන ඒලොන් පවුල ය;
ජාලයෙලේගෙන් පැවතෙන ජාලයෙලේ පවුල ය.
27 සාබුලොන්ගේ පරපුරට අයත් පවුල් ඒවා ය.
ලියාපදිංචි කළ අයගේ මුළු ගණන හැටදාස්
පන්සියයක් ය.
28 පවුල් අනුව ජෝසෙප්ගේ පරපුර මනස්සේ සහ
එප්රායිම්ගෙන් ය. 29 මනස්සේගේ පරපුර නම්,
මාකීර් පවුල ය. මාකීර්ට දාව ගිලියද් උපන්නේ ය.
මොහුගෙන් පැවතෙන පවුල ගිලියද් පවුල ය.
30 ගිලියද්ගේ පරපුර නම්, ඊයෙසෙර්ගෙන් පැවතෙන
ඊයෙසෙර් පවුල ය; හේලෙක්ගෙන් පැවතෙන
හේලෙක් පවුල ය; 31 අශ්රීයලේගෙන් පැවතෙන
අශ්රීයලේ පවුල ය; ෂෙකෙම්ගෙන් පැවතෙන
ෂෙකෙම් පවුල ය; 32 ෂෙමීදාගෙන් පැවතෙන ෂෙමීදා
පවුල ය; හේපෙර්ගෙන් පැවතෙන හේපෙර් පවුල ය.
33 හෙපෙර්ගේ පුත් ශෙලොෆෙහාද්ට දූවරුන් මිස
පුත්රයෝ නොසිටියහ. ඒ දූවරු නම් මාලා, නෝවා,

හොග්ලා, මිල්කා සහ තිර්ශා ය. 34 මනස්සේගේ
පරපුරට අයත් පවුල් ඒවා ය. ලියාපදිංචි කළ අයගේ
මුළු ගණන පණස්දදොස් හත්සියයක් ය.
35 පවුල් අනුව එප්රායිම්ගේ පරපුර නම්,
ෂුතලොගනේ පැවතනෙ ෂුතලො පවුල ය;
බකෙරේගනේ පැවතනෙ බකෙරේ පවුල ය;
තහන්ගනේ පැවතනෙ තහන් පවුල ය.
36 ෂුතලොගේ පරපුර නම් එරාන්ගනේ පැවතනෙ
එරාන් පවුල ය. 37 එප්රායිම්ගේ පරපුරට අයත්
පවුල් ඒවා ය. ලියාපදිංචි කළ අයගේ මුළු ගණන
තිස්දදොස් පන්සියයක් ය. පවුල් අනුව ජෝසපේගේ
පරපුර මොවුහු ය.
38 පවුල් අනුව බනේජමින්ගේ පරපුර නම්,
බලොගනේ පැවතනෙ බලො පවුල ය; අෂ්බලේගනේ
පැවතනෙ අෂ්බලේ පවුල ය; අහිරාම්ගනේ පැවතනෙ
අහිරාම් පවුල ය; 39 ෂපුෙපාම්ගනේ පැවතනෙ
ෂපුෙපාම් පවුල ය, හුපාම්ගනේ පැවතනෙ හුපාම්
පවුල ය. 40 බලොගේ පරපුර ඔහුගේ පුත්රයන් වන
ආර්ද් සහ නාමාන් ය. ඒ පරපුර ආර්ද්ගනේ පැවතනෙ
ආර්ද් පවුල හා නාමාන්ගනේ පැවතනෙ නාමාන් පවුල
ය. 41 බනේජමින්ගේ පරපුරට අයත් පවුල් ඒවා ය.
ලියාපදිංචි කළ අයගේ මුළු ගණන සතළිස්පන්දාස්
හයසියයක් ය.
42 පවුල් අනුව දාන්ගේ පරපුර නම් ෂුහාම්ගනේ
පැවතනෙ ෂුහාම් පවුල ය. දාන්ගේ පරපුරට අයත්
පවුල එය වේ. 43 ෂුහාම්ගේ මුළු පරපුරේ
ලියාපදිංචි කළ අයගේ මුළු ගණන හැටහාරදහස්
හාරසියයක් ය.
44 පවුල් අනුව ආෂරේගේ පරපුර නම්, ඉම්නාගනේ
පැවතනෙ ඉම්නා පවුල ය; ඉෂ්වීගනේ පැවතනෙ
ඉෂ්වී පවුල ය; බරියාගනේ පැවතනෙ බරියා පවුල
ය; 45 බරියාගේ පරපුර නම්, හේබරේගනේ
පැවතනෙ හේබරේ පවුල ය. මල්කියලේගනේ
පැවතනෙ මල්කියලේ පවුල ය. 46 ආෂරේගේ දුව
සරො ය. 47 ආෂරේගේ පරපුරට අයත් පවුල් ඒවා ය.
ලියාපදිංචි කළ අයගේ මුළු ගණන පණස්තුන්දාස්
හාරසියයක් ය.
48 පවුල් අනුව නප්තලීගේ පරපුර නම්,
ජාශීල්ගනේ පැවතනෙ ජාශීල් පවුල ය; ගුණීගනේ
පැවතනෙ ගුණී පවුල ය, 49 ජේශරේගනේ පැවතනෙ
ජේශරේ පවුල ය; ෂිල්ලමේගනේ පැවතනෙ ෂිල්ලමේ
පවුල ය. 50 නප්තලීගේ පරපුරට අයත් පවුල් ඒවා
ය. ලියාපදිංචි කළ අයගේ මුළු ගණන
හතළිස්පන්දාස් හාරසියයක් ය.
51 ඉශ්රායලේ ජනයා අතරින් ලියාපදිංචි කළ
අයගේ මුළු ගණන හයලක්ෂ එක්දාස් හත්සිය
තිස්දනෙකේ.
52 ගණන් 34:13; ජෝෂු 14:1-2 සමිඳාණන්
වහන්සේ මෝසසේට කතා කොට, 53 "ලියාපදිංචි
කළ අයගේ ගණන හැටියට, මොවුන්ට මේ රට
උරුම කොට බදො දිය යුතු ය. 54 ගණනින් වැඩි
අයට උරුමය වශයනේ ලොකු කොටසක් ද, ගණනින්
අඩු අයට කුඩා කොටසක් ද දිය යුතු ය. මලෙසෙ
ලියාපදිංචි කළ සංඛ්යා ප්රමාණයට අනුව ඔවුන්ට
උරුමය බදො දිය යුතු වේ. 55 එහතේ, රට බදො
පංගු කිරීම කළ යුත්තේ දාදු දැමීමනේ.
ඔවුනොවුන්ගේ පිය පළෙපත්හි ගෝත්ර නාම අනුව
උරුමය හිමි විය යුතු ය. 56 මලෙසෙ ගණනින් වැඩි
අයටත්, අඩු අයටත් දාදු දැමීමනේ රට උරුම කර
දනෙු ලැබේ"යි වදාළ සේක.
57 ලියාපදිංචි කළ ලවේවරුන්ගේ ගණනට ඇතුළත්
වූ අය නම්, ගේර්ෂොන්ගනේ පැවතනෙ ගේර්ෂොන්
පවුල ය; කොහාත්ගනේ පැවතනෙ කොහාත් පවුල
ය; මරොරීගනේ පැවතනෙ මරොරී පවුල ය.
58 ලවේවරුන්ගේ සංඛ්යාවට ඇතුළත් වූ තවත් පවුල්
නම්, ලිබ්නිවරුන්ගේ පවුල ය; හබ්රොන්වරුන්ගේ
පවුල ය; මාලිවරුන්ගේ පවුල ය, මූෂිවරුන්ගේ පවුල
සහ කෝරාවරුන්ගේ පවුල ය. කොහාත්ට දාව
අම්රාම් උපන්නේ ය. 59 අම්රාම්ගේ බිරිඳ
ජොකබෙදේ ය. ඈ මිසරයේ දී ලවේට දාව උපන්
ඔහුගේ දුවකි. ඈ අම්රාම්ගනේ ආරොන් හා
මෝසසේ ද, ඔවුන්ගේ සොහොයුරිය මිරියම් ද
ලැබුවා ය. 60 ගණන් 3:2ආරොන්ට දාව නාදාබ් සහ
අබිහු ද, එලයොසර් සහ ඊතාමාර් ද උපන්හ.
61 ලවේ 10:1-2; ගණන් 3:4නාදාබ් සහ අබිහු
සමිඳාණන් වහන්සේ ඉදිරියහෙි අනියම් ගිනි ඔප්පු
කළ විට මළහ. 62 මාසයක් සහ ඊට වඩා වයසැති,
ලියාපදිංචි කළ මුළු පිරිමින්ගේ ගණන විසිතුන්දාහකි.
ඉශ්රායලේ ජනයා අතර ඔවුන්ට උරුම කොට යමක්
නුදුන් බැවින්, මොවුහු ඉශ්රායලේ ජනයාගේ
සංගණනයට ඇතුළත් නොකරන ලදහ.
63 මසේ ජෝර්දාන් ගඟබඩ ජරිකෝව අසල
මෝවබ් මිටියාවතහෙි මෝසසේ සහ පූජක
එලයොසර් විසින් ඉශ්රායලේ ජනයා ලියාපදිංචි කරන
ලදහ. 64 එහතේ, සීනයි පාළුකරයේ දී මෝසසේ සහ
පූජක ආරොන් ඉශ්රායලේ ජනයා ලියාපදිංචි කරන
විට සිටි අයගනේ එක් කනෙකේ වත්, මහෙි
නොසිටියේ ය. 65 ගණන් 14:26-35ඔවුන් පාළුකරයේ
ම මියයන බව සමිඳාණන් වහන්සේ කියා තිබිණි.
මලෙසෙ ජපෙුන්නේගේ පුත් කාලබේ ද, නූන්ගේ
පුත් ජෝෂුවා ද හැර ඔවුන්ගනේ කිසිවකේ ඔවුන්
අතර ඉතුරු නො වූ හ.

## දූවරුන්ගේ උරුම ගැන නීති

27 ඒ සමයහෙි ජෝසපේගේ පුත්රයා වන
මනස්සේගේ පරපුරනේ පැවති මාකීර්ගේ
පුත්රයා වන ගිලියද්ගේ පුත්ර වූ හේපරේගේ
පුත්රයා වන ශලෝපහොද්ගේ දූවරු නම් මාලා,
නෝවා, හොග්ලා, මිල්කා සහ තිර්ශා ය. 2 ඔව්හු
මෝසසේ ද පූජක එලයොසර් ද ප්රජා මූලිකයන් හා
මුළු ජනතාව ද ඉදිරිපිට සම්මුඛ මණ්ඩපයේ
දොරකඩ ළඟ සිටගනෙ, 3 "අපේ පියා පාළුකරයේ දී
මළේ ය. සමිඳාණන් වහන්සේට විරුද්ධ ව
කැරලිගැසූ කෝරාගේ පිරිසට ඔහු අයත් නො වී ය.
ඔහු මළේ තමාගේ පාපය නිසා ම ය. ඔහුට පුත්තු
නොසිටිය හ. 4 ඔහුට පුතකු නැති බැවින් අප
පියාගේ නම ඔහුගේ පරපුරනේ මැකී යා යුත්තේ

මන් ද? එබැවින් අප පියාගේ සහෝදරයන් අතරනේ
කොටසක් උරුම වශයෙනේ අපට දෙන්නැ"යි ඉල්ලූ හ.
5 මෝසෙස් ද ඔවුන්ගේ මේ කරුණ සමිඳාණන්
වහන්සේට ඉදිරිපත් කළේ ය. 6 එවිට සමිඳාණන්
වහන්සේ මෝසෙස්ට කතා කොට, 7 ගණන්
36:2"ශෙලොෆෙහාද්ගේ දූවරුන්ගේ ඉල්ලීම සාධාරණ
ය. නුඹ ඔවුන්ගේ පියාගේ සහෝදරයන්ට හිමි
කොටස ඔවුන්ට උරුම කොට දිය යුතු ය. මලෙසෙ
නුඹ ඔවුන්ගේ පියාගේ උරුමය ඔවුන්ට අයිති වීමට
සැලසිය යුතු ය. 8 නුඹ ද ඉශ්රායලේ ජනයා අමතා
මයෙ කියන්න: 'යම් මිනිසකු පුතකු නොලැබ
මියගියොත්, ඔහුගේ උරුමය ඔහුගේ දූවට අයිති
වීමට සැලසිය යුතු ය. 9 ඔහුට දූවක් නැති නම්, ඒ
උරුමය ඔහුගේ සහෝදරයන්ට දිය යුතු ය.
10 සහෝදරයෝ නැති නම්, ඔහුගේ පියාගේ
සහෝදරයන්ට නුඹ ඒ උරුමය දිය යුතු ය.
11 ඔහුගේ පියාට සහෝදරයන් ද නැති නම්
ඔහුගේ පියාගේ පවුලේ කිට්ටු ම නෑයකුට එය දිය
යුතු ය. ඒ නෑයාට එය සින්නක්කරේට අයිති වනු
ඇත. සමිඳාණන් වහන්සේ වන මම මෝසෙස් වන
නුඹට අණ කළ පරිදි මේ ය. ඉශ්රායලේ ජනයා
කරෙහෙි මයෙ සදහට ම වලංගු නීතියක් විය යුතු
ය"යි වදාළ සේක.

### මෝසෙස්ගේ පදවියට ජෝෂුවා පත්වීම
(ද්වි.නී. 31:1-8)

12 ද්වි.නී. 3:23-27; 32:48-52 සමිඳාණන් වහන්සේ
මෝසෙස්ට කතා කොට, "නුඹ මේ අබාරීම් කන්දට
නැඟ මා ඉශ්රායලේ ජනයාට දුන් දේශය නරඹන්න.
13 නුඹ එය නැරඹුව පසු නුඹේ සහෝදරයා වූ
ආරොන් මේ දිවියෙනේ පසු සිය ජනතාව හා එක්වූවා
සේ නුඹ ද මේ දිවියෙනේ පසු නුඹේ ජනතාව සමඟ
එක් වනු ඇත. 14 මන්ද, නුඹලා දදෙනෙ ශීන් නම්
පාළුකරයේ දී මගේ අණට විරුද්ධ ව කැරලි ගැසුවහු
ය. මරෙිබාහී දී මුළු ජනතාව මැසිවිලි කියද්දී නුඹලා
දදෙනෙ ඔවුන් ඉදිරියහෙි මාගේ බල මහිමය
පිළිගැනීමට අකමැති වූවාහු ය"යි වදාළ සේක.
(මරෙිබා වනාහි ශීන් පාළුකරයේ කාදේශ්හි ඇති
උල්පතකි.) 15 මෝසෙස් උන් වහන්සේට කතා
කොට, 16 "එසේ නම්, සව් සතට ජීවය දනෙ දවේ
සමිඳාණන් වහන්සේ සනෙඟ පාලනය කිරීමට
කනෙකෙු පත් කරන සේක් වා! 17 1 රාජා 22:17;
එසකි 34:5; මතෙ 9:36; මාක් 6:34එවිට සමිඳාණන්
වහන්සේගේ ජනතාව, එඬේරකෙු නැති බැටළු
රැළක් නොවනු පිණිස, ඒ තැනැත්තාට ඔවුන්
ඉදිරියහෙි යාමටත්, ඔවුන් පසුපස යාමටත්, ඔවුන්
පිටතට ගනෙ යාමටත්, ඇතුළට ආපසු ගනෙ ඒමටත්
හැකි වනු ඇතැ"යි කී ය.
18 නික්ම 24:13 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට
මසෙේ වදාළ සේක: "නූන්ගේ පුත්ර වූ, දක්ෂ
කනෙකෙු වන ජෝෂුවා කැඳවා, ඔහු මත නුඹේ අත්
තබන්න. 19 ඉන්පසු පූජක එලයොසර් සහ මුළු
ජනතාව ඉදිරිපිට ඔහු සිටුවා, ඔවුන් බලාගනෙ සිටිය
දී ඔහුට වගකීම පවරන්න. 20 මුළු ඉශ්රායලේ
ජනතාව ඔහුට කීකරු වන පිණිස නුඹේ ආණ්ඩු
බලයෙනේ කොටසක් ඔහුට දෙන්න. 21 නික්ම 28:30;
1 සාමු 14:41; 28:6ඔහු එලයොසර් පූජකවරයා
ඉදිරියහෙි පනේී සිටිය යුතු ය. මේ පූජකවරයා මා
ඉදිරියහෙි උරීම් කැට භාවිත කිරීමනේ ඔහු විමසනු
ඇත. මසෙේ පූජකවරයා විධාන කිරීමනේ ඔහුට ද
මුළු ඉශ්රායලේ ජනතාවට ද මඟපනේවනු ඇත."
22 සමිඳාණන් වහන්සේ වදාළ පරිදි මෝසෙස් ඉටු
කළේ ය. ඔහු ජෝෂුවා කැඳවා පූජක එලයොසර්
සහ මුළු ජනතාව ඉදිරියහෙි සිටුවා, 23 ද්වි.නී.
31:23ඔහු මත තම අත් තබා උන් වහන්සේ අණ
කළ පරිදි ඔහුට වගකීම පැවරී ය.

### පුද පූජා පිළිබඳ විධිවිධාන
(නික්ම 29:38-46)

28 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට මසෙේ වදාළ සේක: 2 "ඉශ්රායලේ
ජනයාට මසෙේ අණ කරන්න: 'සුවිහිරි සුවඳක් මනේ
මට ප්රසන්න, ගින්නනේ දවා මට පුදන ආහාර පඬුරු
නියමිත කාලයේ දී ඔප්පු කළ යුතු ය.' "

### දනෛික පඬුරු

3 "නුඹ ඔවුන්ට මයෙ කිව යුතු ය: ගින්නනේ දවා
සමිඳාණන් වහන්සේට පිදිය යුතු පඬුර නම්,
අවුරුද්දක් වයසැති කැළැල් නැති බැටළු පැටවුන්
දදෙනෙකේ. මයෙ දිනපතා ම දවන යාග පූජාවක්
මනේ ඔප්පු කළ යුතු ය. 4 එක බැටළු පැටවකු උදය
ද, අනිකා සවස ද ඔප්පු කළ යුතු ය. 5 සිහින් පිටි
කිලෝග්රෑම් එකක් ධාන්ය පූජාවක් වශයෙනේ ගනෙ,
ඊට ඉස්තරම් තලේ ලීටර් එකක් මිශ්ර කර එක එක
බැටළු පැටවා සමඟ ඔප්පු කළ යුතු වේ. 6 මයෙ
වනාහි සුවිහිරි සුවඳක් මනේ සමිඳාණන් වහන්සේට
ප්රසන්න, ගින්නනේ දවා සීනයි කන්දේ දී පිදීමට
නියම, සදහට ම වලංගු, දවන යාග පූජාවකි. 7 ඒ
බැටළු පැටවා සමඟ පානීය පූජාව වශයෙනේ,
ශුද්ධස්ථානය තුළ සමිඳාණන් වහන්සේගේ මහිමය
සඳහා, සැර මිදියුස ලීටර් එකක් වත් කොට පිදිය
යුතු ය. 8 අනික් බැටළු පැටවා සවස ඔප්පු කළ යුතු
ය. උදය පිදූ ධාන්ය පූජාව සහ පානීය පූජාව පරිදි
සමිඳාණන් වහන්සේ වතෙ නඟින සුවිහිරි සුවඳක්
මනේ, එය ගින්නනේ දවා ඔප්පු කළ යුතු ය."

### සබත් දින පඬුරු

9 "අවුරුද්දක් වයසැති කැළැල් නැති බැටළු පැටවුන්
දදෙනෙකු ද, ධාන්ය පූජාවක් වශයෙනේ සිහින් පිටි
කිලෝග්රෑම් දකෙකට තලේ මිශ්ර කර එය ද, පානීය
පූජාව ද, සබත් දින ඔප්පු කළ යුතු ය. 10 නිරන්තර
දවන යාග පූජාව සහ ඊට අදාළ පානීය පූජාවට
අමතර ව, ඒ ඒ සබත් දින පුද කළ යුතු දවන යාග
පූජාව මයෙ වේ."

### පොහෝ පඬුරු

11 “මාසය ආරම්භයේ දී නුඹලා සමිඳාණන්
වහන්සේට දවන යාග පූජාවක් ඔප්පු කළ යුතු වේ.
එය නම්, ගොන් වස්සන් දදෙනෙකේ ද, බැටළු
වස්සකේ සහ අවුරුද්දක් වයසැති කැළැල් නැති බැටළු
පැටවු හත්දනෙකේ ද වතේ. 12 එක එක ගොන්
වස්සකෙු සමඟ ධාන්‍ය පූජාවක් වශයනේ සිහින් පිටි
කිලෝග්‍රෑම් තුනක් සමඟ තලේ මිශ්‍ර කර, එක
එක බැටළු වස්සා සමඟ ධාන්‍ය පූජාවක් වශයනේ
සිහින් පිටි කිලෝග්‍රෑම් දකෙකට තලේ මිශ්‍ර කර,
13 එක එක බැටළු පැටවා සමඟ සිහින් පිටි
කිලෝග්‍රෑම් එකකට තලේ මිශ්‍ර කර, ඒවා ද ඔප්පු
කළ යුතු ය. මේවා සුමිහිරි සුවඳක් සේ සමිඳාණන්
වහන්සේ වතෙ නඟින ගින්නනේ දවා උන්
වහන්සේට පිදූ දවන යාග පූජාවකි. 14 පිදිය යුතු
පානීය පූජාව නම් එක එක ගොන් වස්සකෙු සමඟ
මිදියුස ලීටර් දකෙකි, බැටළු වස්සා සමඟ මිදියුස
ලීටර් එකහමාරකි, එක එක බැටළු පැටියා සමඟ
මිදියුස ලීටර් එකකි. අවුරුද්දේ සෑම මාසයක ම මේ
දවන යාග පූජාව පිදිය යුතු ය. 15 මේ නිරන්තර
දවන යාග පූජාව සහ පානීය පූජාවට අමතර ව,
පාප පූජාවක් වශයනේ එළුවකෙු ද සමිඳාණන්
වහන්සේට ඔප්පු කළ යුතු ය.”

### නුමුහුන් රොටි මංගල්‍ය දින පඬුරු
(ලෙවී 23:5-14)

16 නික්ම 12:1-13; ද්වි.නී. 16:1-2 “පළමු වන
මාසයේ දහහතර වන දින සමිඳාණන් වහන්සේගේ
පාස්කුව ය. 17 නික්ම 12:14-20; 23:15; 34:18; ද්වි.නී.
16:3-8ඒ මාසයේ පසළොස් වන දින මංගල්‍ය
පටන්ගනු ලැබේ. දින හතක් ම නුමුහුන් රොටි
අනුභව කළ යුතු ය. 18 පළමු වන දින ශුද්ධ
නමස්කාරය සඳහා රැස්වීමක් පැවැත්විය යුතු ය.
එදින කිසි ම බර වැඩක් නොකළ යුතු ය. 19 නුඹලා
සමිඳාණන් වහන්සේට ගින්නනේ දවා දවන යාග
පූජාවක් පිදිය යුතු ය. එය නම්, කැළැල් නැති ගොන්
වස්සන් දනේනකේ, එක බැටළු වස්සකේ සහ
අවුරුද්දක් වයසැති බැටළු පැටවු හත්දනෙකේ ද
වතේ. 20 ධාන්‍ය පූජාව වශයනේ තලේ මිශ්‍ර කළ
සිහින් පිටි ද පිදිය යුතු ය. ගොන් වස්සකෙු සඳහා
සිහින් පිටි කිලෝග්‍රෑම් තුනක් ද බැටළු වස්සකෙු
සඳහා පිටි කිලෝග්‍රෑම් දකෙක් ද, 21 එක එක
බැටළු පැටියකෙු සඳහා පිටි කිලෝග්‍රෑම් එකක් ද,
ඔප්පු කළ යුතු ය. 22 නුඹලා පව් කමාව ලබාගැනීම
සඳහා, පාප පූජාවක් වශයනේ එක එළුවකෙු ඔප්පු
කළ යුතු ය. 23 සෑම දින ම උදය පුදන දවන යාග
පූජාවට අමතර ව, නුඹලා මේවා පිදිය යුතු වේ.
24 මලෙසෙ දවස් හතක් තුළ හැම දා ම ඔප්පු කළ
යුතු ය. ගින්නනේ දවා පුදන මේ ධාන්‍ය පූජා සුමිහිරි
සුවඳක් සේ සමිඳාණන් වහන්සේට ප්‍රසන්න ය.
නිරන්තර දවන යාග පූජාවට හා ඊට අදාළ පානීය
පූජාවට අමතර ව එය ඔප්පු කළ යුතු ය. 25 හත්
වන දින නමස්කාරය සඳහා රැස්වීමක් පැවැත්විය
යුතු ය. එදින කිසි ම බර වැඩක් නොකළ යුතු වේ.”

### අස්වැන්න මංගල්‍ය දින පඬුරු
(ලෙවී 23:15-22)

26 නික්ම 23:16; 34:22; ද්වි.නී. 16:9-12 “සති
මංගල්‍යයේ දී, අස්වැන්න මංගල්‍යයේ පළමු වන
දින නුඹලා සමිඳාණන් වහන්සේට අලුත් ධාන්‍ය
පූජාව ඔප්පු කරන විට නමස්කාරය සඳහා රැස්වීමක්
පැවැත්විය යුතු ය. එදින කිසි ම බර වැඩක් නොකළ
යුතු වේ. 27 එහතේ, එදින සුමිහිරි සුවඳක් මනේ
සමිඳාණන් වහන්සේ වතෙ නඟින දවන යාග පූජාව
ඔප්පු කළ යුතු ය. එය නම් ගොන් වස්සන්
දනේනකේ ද, එක බැටළු වස්සකේ සහ අවුරුද්දක්
වයසැති බැටළු පැටවු හත්දනෙකේ ද වතේ.
28 මේවා සමඟ පිදිය යුතු තලේ ඇනූ ධාන්‍ය පූජා
නම්, එක එක ගොන් වස්සකෙු සමඟ සිහින් පිටි
කිලෝග්‍රෑම් තුනකි, එක බැටළු වස්සකෙු සමඟ පිටි
කිලෝග්‍රෑම් දකෙක් ද 29 එක එක බැටළු පැටවා
සමඟ පිටි කිලෝග්‍රෑම් එක බැගින් ද වේ.
30 නුඹලාට පව් කමාව ලබාගැනීම සඳහා එක
එළුවකෙු ද පිදිය යුතු ය. 31 නිරන්තර දවන යාග
පූජාවට ද කැළැල් නැති සතුන් විය යුතු ය. පුදන
ධාන්‍ය පූජාවට අමතර ව පානීය පූජාව ද ඉහත කී
පූජා ද ඔප්පු කළ යුතු ය.

### අලුත් අවුරුදු දින පඬුරු
(ලෙවී 23:22-25)

29 “හත් වන මාසයේ පළමු වන දින නුඹලා
නමස්කාරය පිණිස රැස්වීමක් පැවැත්විය යුතු
ය. එදින බර වැඩ නොකළ යුතු ය. එදින, හොරණෑ
පිඹීමේ දවසකි. 2 නුඹලා සුමිහිරි සුවඳක් සේ
සමිඳාණන් වහන්සේ වතෙ නඟින දවන යාග
පූජාවක් ඔප්පු කළ යුතු ය. ඒ පූජාව නම්, එක
ගොන් වස්සකේ ද, එක බැටළු වස්සකේ හා
අවුරුද්දක් වයසැති කැළැල් නැති බැටළු පැටවුන්
හත්දනෙකේ ද වතේ. 3 ඒවා සමඟ පුදන ධාන්‍ය පූජා
නම් තලේ ඇනූ සිහින් පිටි ය. එක ගොන් වස්සකෙු
සමඟ පිටි කිලෝග්‍රෑම් තුනක් ද එක බැටළු
වස්සකෙු සමඟ පිටි කිලෝග්‍රෑම් දකෙක් ද 4 එක
එක බැටළු පැටවා සමඟ පිටි කිලෝග්‍රෑම් එක
බැගින් ද ඔප්පු කළ යුතු ය. 5 තවද, ඔබට පව්
කමාව ලබාගැනීම සඳහා පාප පූජාවක් වශයනේ
එක එළුවකෙු පිදිය යුතු ය. 6 මේවා මේ පිළිවළෙට
පිදිය යුත්තේ මාසික දවන යාග පූජාවට ද ධාන්‍ය
පූජාවට ද දනෛික දවන යාග පූජාවට ද පානීය
පූජාවට ද අමතර ව ය. මේවා ගින්නනේ දවා පිදූ
විට සමිඳාණන් වහන්සේ වතෙ නඟින සුමිහිරි
සුවඳකි.

### පව් කමා දිනයේ පඬුරු
(ලෙවී 23:26-32)

7 ලෙවී 16:29-34 “හත් වන මාසයේ දහ වන දින
නමස්කාරය පිණිස රැස්වීමක් පැවැත්විය යුතු ය.
එදින උපවාස කර, කිසි වැඩක් නොකළ යුතු ය.
8 එහෙත් එදින නුඹලා සුමිහිරි සුවඳක් සේ
සමිඳාණන් වහන්සේ වෙත නඟින දවන යාග
පූජාවක් උන් වහන්සේට ඔප්පු කළ යුතු ය. ඒ පූජාව
නම්, කැළැල් නැති එක ගොන් වස්සෙකේ ද, එක
බැටළු වස්සෙකේ සහ අවුරුද්දක් වයසැති බැටළු පැටවු
හත්දෙනෙකේ ද වෙති. 9 ඒවා සමඟ පුදන ධාන්‍ය
පූජාව නම් තලේ ඇනූ සිහින් පිටි ය. ගොන් වස්සා
සමඟ පිටි කිලෝග්‍රෑම් තුනක් ද, බැටළු වස්සා
සමඟ පිටි කිලෝග්‍රෑම් දකෙක් ද, 10 එක එක
බැටළු පැටවා සමඟ පිටි කිලෝග්‍රෑම් එක බැගින් ද
ඔප්පු කළ යුතු ය. 11 පාප පූජාවට එක එළුවකු
පිදිය යුතු ය. මයෙ පව් කමාවේ පාප පූජාවට ද
නිරන්තර දවන යාග පූජාවට ද ධාන්‍ය පූජාවට ද
පානීය පූජාවට ද අමතර ව ය.”

### කූඩාරම් මංගල්‍ය දින පඬුරු
(ලෙවී 23:33-44)

12 නික්ම 23:16; 34:22; ද්වි.නී. 16:13-15 “හත් වන
මාසයේ පසළොස් වන දින නුඹලා නමස්කාරය
සඳහා රැස්වීමක් පැවැත්විය යුතු ය. එදින බර වැඩ
නොකළ යුතු ය. සමිඳාණන් වහන්සේගේ
ගෞරවයට දින හතක් ම මංගල්‍යය පැවැත්විය යුතු
ය. 13 තවද, සුමිහිරි සුවඳක් සේ සමිඳාණන්
වහන්සේ වෙත නඟින දවන යාග පූජාවක් ගින්නෙන්
දවා උන් වහන්සේට ඔප්පු කළ යුතු ය. ඒ පූජාව
නම්, කැළැල් නැති ගොන් වස්සන් දහතුන්දෙනෙකේ ද,
බැටළු වස්සන් දෙන්නෙකේ හා අවුරුද්දක් වයසැති
බැටළු පැටවුන් දහහතරදෙනෙක් ද වෙති. 14 ධාන්‍ය
පූජාව වශයෙන් තලේ ඇනූ සිහින් පිටි පිදිය යුතු ය.
එක එක ගොන් වස්සෙකු සමඟ පිටි කිලෝග්‍රෑම්
තුනක් ද, එක එක බැටළු වස්සෙකු සමඟ පිටි
කිලෝග්‍රෑම් දකෙක් ද 15 එක එක බැටළු පැටවා
සමඟ පිටි කිලෝග්‍රෑම් එක බැගින් ද ඔප්පු කළ
යුතු ය. 16 නිරන්තර දවන යාග පූජාවට ද පානීය
පූජාවට ද ධාන්‍ය පූජාවට ද අමතර ව, පාප පූජාව
සඳහා එළුවකු ද පිදිය යුතු ය.
17 “දෙ වන දවසේ දී ගොන් වස්සන්
දොළොස්දෙනෙකු ද බැටළු වස්සන් දදෙනෙකු ද
අවුරුද්දක් වයසැති කැළැල් නැති බැටළු පැටවුන්
දහහතරදෙනෙකු ද ඔප්පු කළ යුතු ය. 18 ගොන්
වස්සන්, බැටළු වස්සන් සහ බැටළු පැටවුන් සමඟ
පුදන ධාන්‍ය පූජාව සහ පානීය පූජා, නියෝග
ප්‍රකාර, ඔවුන්ගේ සංඛ්‍යාව අනුව ගණන් ගත යුතු
ය. 19 නිරන්තර දවන යාග පූජාවට ද ධාන්‍ය පූජාවට
හා පානීය පූජාවලට ද අමතර ව පාප පූජාව සඳහා
එක එළුවකු ඔප්පු කළ යුතු ය.
20 තුන් වන දවසේ දී ගොන් වස්සන්
එකළොස්දෙනෙකු ද බැටළු වස්සන් දදෙනෙකු ද
අවුරුද්දක් වයසැති කැළැල් රහිත බැටළු පැටවුන්
දහහතරදෙනෙකු ද ඔප්පු කළ යුතු ය. 21 ගොන්
වස්සන්, බැටළු වස්සන් සහ බැටළු පැටවුන් සමඟ
පුදන ධාන්‍ය පූජාව සහ පානීය පූජා නියෝග ප්‍රකාර
ඔවුන්ගේ සංඛ්‍යාව අනුව ගණන් ගත යුතු ය.
22 නිරන්තර දවන යාග පූජාවට ද ධාන්‍ය පූජාවට
හා පානීය පූජාවලට ද අමතර ව පාප පූජාව සඳහා
එක එළුවකු ඔප්පු කළ යුතු ය.
23 “සතර වන දවසේ දී ගොන් වස්සන් දහදෙනෙක්
ද බැටළු වස්සන් දදෙනෙකු ද අවුරුද්දක් වයසැති
කැළැල් නැති බැටළු පැටවුන් දහහතරදෙනෙකු ද
ඔප්පු කළ යුතු ය. 24 ගොන් වස්සන්, බැටළු වස්සන්
සහ බැටළු පැටවුන් සමඟ පුදන ධාන්‍ය පූජාව සහ
පානීය පූජා නියෝග ප්‍රකාර, ඔවුන්ගේ සංඛ්‍යාව
අනුව ගණන් ගත යුතු ය. 25 නිරන්තර දවන යාග
පූජාවට ද ධාන්‍ය පූජාවට හා පානීය පූජාවලට ද
අමතර ව පාප පූජාව සඳහා එක එළුවකු ඔප්පු
කළ යුතු ය.
26 “පස් වන දවසේ දී ගොන් වස්සන් නවදෙනෙකු ද
බැටළු වස්සන් දදෙනෙකු ද අවුරුද්දක් වයසැති
කැළැල් නැති බැටළු පැටවුන් දහහතරදෙනෙකු ද
ඔප්පු කළ යුතු ය. 27 ගොන් වස්සන්, බැටළු වස්සන්
සහ බැටළු පැටවුන් සමඟ පුදන ධාන්‍ය පූජාව සහ
පානීය පූජා, නියෝග ප්‍රකාර, ඔවුන්ගේ සංඛ්‍යාව
අනුව ගණන් ගත යුතු ය. 28 නිරන්තර දවන යාග
පූජාවට ද ධාන්‍ය පූජාවට සහ පානීය පූජාවලට ද
අමතර ව පාප පූජාව සඳහා එක එළුවකු ඔප්පු
කළ යුතු ය.
29 “හය වන දවසේ දී ගොන් වස්සන් අටදෙනෙකු
ද බැටළු වස්සන් දදෙනෙකු ද අවුරුද්දක් වයසැති
කැළැල් නැති බැටළු පැටවුන් දහහතරදෙනෙකු ද
ඔප්පු කළ යුතු ය. 30 ගොන් වස්සන්, බැටළු වස්සන්
සහ බැටළු පැටවුන් සමඟ පුදන ධාන්‍ය පූජාව සහ
පානීය පූජා, නියෝග ප්‍රකාර, ඔවුන්ගේ සංඛ්‍යාව
අනුව ගණන් ගත යුතු ය. 31 නිරන්තර දවන යාග
පූජාවට ද ධාන්‍ය පූජාවට හා පානීය පූජාවට ද
අමතර ව පාප පූජාව සඳහා එක එළුවකු ඔප්පු
කළ යුතු ය.
32 “හත් වන දවසේ දී ගොන් වස්සන් හත්දෙනෙකු
ද බැටළු වස්සන් දදෙනෙකු ද අවුරුද්දක් වයසැති
කැළැල් නැති බැටළු පැටවුන් දහහතරදෙනෙකු ද
ඔප්පු කළ යුතු ය. 33 ගොන් වස්සන්, බැටළු වස්සන්
සහ බැටළු පැටවුන් සමඟ පුදන ධාන්‍ය පූජාව සහ
පානීය පූජා, නියෝග ප්‍රකාර, ඔවුන්ගේ සංඛ්‍යා
අනුව ගණන් ගත යුතු ය. 34 නිරන්තර දවන යාග
පූජාවට ද ධාන්‍ය පූජාවට සහ පානීය පූජාවට ද
අමතර ව පාප පූජාව සඳහා එක එළුවකු ඔප්පු
කළ යුතු ය.
35 “අට වන දවසේ දී නමස්කාරය පිණිස ප්‍රසිද්ධ
රැස්වීමක් පැවැත්විය යුතු ය. එදින කිසි බර වැඩක්
නොකළ යුතු ය. 36 සුමිහිරි සුවඳක් සේ සමිඳාණන්
වහන්සේ වෙත නඟින, ගින්නෙන් දවා පිදූ දවන

යාග පූජාවක් උන් වහන්සේට ඔප්පු කළ යුතු ය. ඒ
පූජාව සඳහා එක ගොන් වස්සෙකු ද එක බැටළු
වස්සෙකු ද අවුරුද්දක් වයසැති කැළැල් නැති බැටළු
පැටවුන් හත්දෙනෙකු ද ගත යුතු ය. 37 ගොන්
වස්සා, බැටළු වස්සා සහ බැටළු පැටවුන් සමඟ පුදන
ධාන්‍ය පූජාව සහ පානීය පූජා නියෝග ප්‍රකාර,
ඔවුන්ගේ සංඛ්‍යාව අනුව ගණන් ගත යුතු ය.
38 නිරන්තර දවන යාග පූජාවට ද ධාන්‍ය පූජාවට
හා පානීය පූජාවට ද අමතර ව පාප පූජාව සඳහා
එක එළුවෙකු ද ඔප්පු කළ යුතු ය.
39 “නුඹලාගේ දවන යාග පූජාවලට ද ධාන්‍ය පූජා
සහ පානීය පූජාවලට ද සහභාගිකමේ පූජාවලට ද
අමතර ව මේවා නියමිත මංගල්‍ය දිනවල දී
සමිඳාණන් වහන්සේට ඔප්පු කළ යුතු ය. තවද,
මේවා පිදිය යුත්තේ බාරවලට පුදන පඬුරු හා
ස්වේච්ඡා පඬුරුවලටත් අමතර ව ය.” 40 සමිඳාණන්
වහන්සේ මෝසෙස්ට අණ කළ සියල්ල අනුව ඔහු
ඉශ්‍රායලේ ජනයාට දැන්වී ය.

## බාර පිළිබඳ නියෝග

30 මෝසෙස් ඉශ්‍රායලේ ජනයාගේ ගෝත්‍ර
මූලිකයන්ට කතා කොට මෙසේ කීවේ ය:
“සමිඳාණන් වහන්සේ අණ කළ දේ මෙය වේ:
2 ද්වි.නී. 23:21-23; මතෙ 5:33‘යම් පුරුෂයෙකු
සමිඳාණන් වහන්සේට බාරයක් වුවහොත්, නැත්නම්,
යම් කිසි දයෙකින් වැළකෙන හැටියට දිවුරුමක්
දුන්නොත්, ඔහු තම වචනය කඩ නොකළ යුතු ය.
තමා කී පරිදි සියල්ල ඉටු කළ යුතු ය.
3 ‘යම් කිසි තරුණ කාන්තාවක ඇගේ පියාගේ
ගෘහයේ සිටිය දී, සමිඳාණන් වහන්සේට බාරයක් වී
දිවුරුම් දුන් පසු, 4 ‘ඇගේ පියා, ඈ කළ බාරය සහ
ඈ යමකින් වැළකීමට ගත් පොරොන්දුව ගැන අසා
ඔහු නිහඬ වුවහොත්, ඈ එම බාර ද යමකින්
වැළකීමට ගත් පොරොන්දු ද සියල්ල ඉටු කළ යුතු
ය. 5 එහෙත්, ඇගේ පියා ඒවා ගැන දැනගත් පසු,
යම් දිනක ඒවා ඈට තහනම් කළොත්, ඈ කළ බාර
හා යමකින් වැළකීමට ඈ දුන් පොරොන්දු කිසිත් ඉටු
කිරීමට ඈ බැඳී නැත. ඇගේ පියා ඒවා ඈට තහනම්
කළ බැවින් සමිඳාණන් වහන්සේ ද ඈට කමා කරන
සේක.
6 ‘තවද ඈ බාර වී හෝ යමකින් වැළකීමට
පොරොන්දු දුන් පසු හෝ විවාහ වී 7 ඇගේ සැමියා
ඒවා ගැන ඇසූ දිනක නිහඬ වන්නේ නම් ඈ කළ
බාර හා දුන් පොරොන්දු සියල්ල ඉටු කළ යුතු ය.
8 එහෙත්, ඇගේ සැමියා එය අසා යම් දිනක ඈට
ඒවා තහනම් කළොත්, ඈ කළ බාර ද යමකින්
වැළකීමට දුන් පොරොන්දු ද කිසිවක් ඉටු කිරීමට ඈ
බැඳී නැත. සමිඳාණන් වහන්සේ ද ඈට කමා කරන
සේක.
9 ‘වැන්දඹුවක හෝ දික්කසාද වූ ස්ත්‍රියක හෝ
කළ බාර සහ දුන් පොරොන්දු සියල්ල ඔවුන් ඉටු
කළ යුතු ය.
10 ‘විවාහක ස්ත්‍රියක බාරයක් වී හෝ යමකින්
වැළකීමට පොරොන්දු දුන් පසු හෝ 11 ඇගේ
සැමියා ඒ ගැන අසා ඔහු නිහඬ ව සිටිමින් ඈට ඒවා
තහනම් නොකළේ නම්, ඈ කළ බාර සහ දුන්
පොරොන්දු සියල්ල ඉටු කළ යුතු ය. 12 එහෙත්,
ඇගේ සැමියා ඒවා ගැන ඇසූ යම් දිනක ඒවා
අවලංගු කළොත්, ඈ කළ බාර සහ දුන් පොරොන්දු
කිසිවක් ඉටු කිරීමට ඈ බැඳී නැත. ඇගේ සැමියා
ඒවා අවලංගු කළ බැවින්, සමිඳාණන් වහන්සේ ද
ඈට කමා කරන සේක. 13 විවාහක කාන්තාවක
කරන බාර සහ යමකින් වැළකීමට දෙන පොරොන්දු
වලංගු කිරීමට හෝ අවලංගු කිරීමට හෝ ඇගේ
සැමියා හට බලය පැවරේ. 14 එහෙත්, ඇගේ සැමියා
ඒවා ගැන දවසින් දවස නිහඬ ව සිටී නම්, ඈ කළ
බාර සහ දුන් පොරොන්දු සියල්ල වලංගු ය. ඔහු
ඒවා ගැන ඇසූ දින සිට ම නිහඬ ව සිටින බැවින්
ඔහු ඒවා අනුමත කළේ ය යි සැලකේ. 15 එහෙත්,
ඔහු ඒවා ගැන අසා කලක් ගිය පසු ඒවා අවලංගු
කළොත්, ඈට පැවරෙන වරද ගැන ඔහු වරදකරුවා
වනු ඇත.’ ”
16 සැමියා සහ බිරිඳ අතර ද පියා සහ තම ගෙදර
වසන තරුණ දුව අතර ද වලංගු වන, දෙවියන්
වහන්සේ මෝසෙස්ට වදාළ නියෝග මේවා ය.

## මිදියන්වරුන්ට විරුද්ධ ව සටන් කිරීම

31 සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතා,
2 “මිදියන්වරුන් ඉශ්‍රායලේ ජනයාට කළ දේ
නිසා ඔවුන්ට දඬුවම් දෙන්න. මේ දිවියෙන් පසු නුඹ,
නුඹේ සෙනෙඟ සමඟ එක් වනු ඇතැ’යි වදාළ සේක.
3 එවිට මෝසෙස් සෙනඟට කතා කොට,
“ඔබගෙන් සමහරෙකු යුද්ධයට සැරසී, මිදියන්වරුන්ට
විරුද්ධ ව ගොස්, ඔවුන් සමිඳාණන් වහන්සේට කළ
දේ නිසා ඔවුන්ට දඬුවම් දිය යුතු ය. 4 එක එක
ගෝත්‍රයෙන් දහස බැගින්, ඉශ්‍රායලේහි සියලු ම
ගෝත්‍රවලින් සෙනඟ යා යුතු ය”යි කී ය.
5 මෙලෙස එක එක ගෝත්‍රයෙන් දහස බැගින් මුළු
ඉශ්‍රායලේ ජනතාව අතරෙන් දොළොස්දාහක්
යුද්ධයට සන්නාහ සන්නද්ධ වූ හ. 6 මෝසෙස් මේ
සෙනඟ ද පූජක එලෙයාසර්ගේ පුත් පිනෙහාස් ද
ශුද්ධ භාජන සහ පිඹීමට හොරණෑ ද අතේ ඇති ව
ඔවුන් යුද්ධයට යැවූ හ. 7 සමිඳාණන් වහන්සේ
මෝසෙස්ට අණ කළ පරිදි ඔව්හු මිදියන්වරුන්ට
විරුද්ධ ව සටන් කොට සියලු පිරිමින් මරාදැමූ හ.
8 ඔවුන්ගෙන් මැරුම්කෑ අය අතර එවී, රකෙම්, ශූර්,
හූර් සහ රබෝ යන මිදියන් රජුන් පස්දෙනා ද වූ හ.
තවද, ඔව්හු බෙයෝර්ගේ පුත් බාලාම් ද කඩුවෙන්
මරාදැමූ හ.
9 ඉශ්‍රායලේ ජනයා මිදියන් ස්ත්‍රීන් සහ දරුදැරියන්
ද සිරබාරයට ගෙන ඔවුන්ගේ ගවමහිෂයන්, එළු
බැටළු පට්ටි සහ ධනසම්පත් සියල්ල පැහැරගත්හ.
10 තවද, ඔවුන් විසූ නගර හා කඳවුරු සියල්ල ද
ගිනිබත් කළහ. 11 එහෙත්, කොල්ලකාගත් සියල්ල ද
සිරබාරයට ගත් මිනිසුන් සහ පැහැරගත් සතුන් ද

තබාගත්හ. 12 ඉන්පසු ඔව්හු ජෝර්දාන් ගං තරේ
ජෙරිකෝව අසල මෝවබ් මිටියාවතේ කඳවුරේ සිටි
මෝසෙස් ද පූජක එලයෝසර් සහ මුළු ඉශ්‍රායලේ
ජනතාව ද වෙත සිරකරුවන් හා පැහැරගත්
කොල්ලය ද ගෙනෙහ.

## හමුදාව ආපසු පැමිණීම

13 එවිට මෝසෙස්, පූජක එලයෝසර් සහ
ජනතාවගේ නායකයෝ සියලු දෙනා ඔවුන් හමු වීමට
කඳවුරෙන් පිටත ගියහ. 14 එහෙත්, මෝසෙස්
සටනින් ආපසු පැමිණි හමුදාවේ නිලධාරීන්,
සහශ්‍රාධිපතීන් සහ ශතාධිපතීන් සමඟ කිපිණි.
15 මෝසෙස් ඔවුන්ට කතා කොට, “ඔබ හැම මේ
ස්ත්‍රීන් සියල්ලන් පණපිටින් ඉතුරු කළහු ද?
16 ගණන් 25:1-9බලන්න, පෙයෝර් නම් ස්ථානයේ
දී, බාලාම්ගේ උපදෙස් පිට ඉශ්‍රායලේ ජනයා
සමිඳාණන් වහන්සේට විරුද්ධ ව අපරාධ කළේ
මොවුන් නිසා ය. සමිඳාණන් වහන්සේගේ ජනතාව
අතර වසංගතයක් පැතිර ගියේත් ඒ නිසා ම ය.
17 දැන් ඉතින් කුඩාවූවන් අතර සියලු පිරිමි දරුවන් ද
මිනිසකු සමඟ සයනය කළ සෑම ස්ත්‍රියක ද
මරන්න. 18 එහෙත්, පුරුෂයින් හැඳින ඔවුන් සමඟ
සේවනයෙහි නොයෙදුණු ගැහැණු දරුවන් ඔබ හැම
සඳහා ඉතුරු කරගන්න. 19 තවද, යමකු මැරූ අය ද
මැරුම්කෑ කෙනෙකු ස්පර්ශ කළ අය ද හත් දිනක්
කඳවුරෙන් බැහැර සිටිය යුතු ය. තුන් වන දින සහ
සත් වන දින ඔබ ද සිරකරුවන් ද පවිත්‍ර විය යුතු
ය. 20 ඔබ හැමගේ වස්ත්‍ර ද සමින් සහ එළු
ලොමින් සහ ලීයෙන් සාදන ලද සියල්ල ද පවිත්‍ර
කළ යුතු ය”යි කීවේ ය.
21 පූජක එලයෝසර් ද යුද්ධ කළ මිනිසුන්
අමතමින්, “සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අණ
කළ නියෝගය මෙයෙ වේ. 22+NUM ‘ගින්නෙන් පිළිස්සී
නොයන රන්, රිදී, ලෝකඩ, යකඩ සහ ඊයම් වැනි
දේවල් ගින්නේ දවාගත් විට ඒවා පවිත්‍ර යයි
සැලකෙනු ඇත. එහෙත්, අපවිත්‍රකම පහකරන
ජලයෙනුත් ඒවා, පවිත්‍ර කළ යුතු ය. ගින්නෙන්
පිළිස්සී යන අනිකුත් ඒවා ජලයේ දමා ගත යුතු ය.
24 හත් වන දින ඔබේ ඇඳුම් සෝදාගත් පසු ඔබ
පවිත්‍ර වනු ඇත. ඉන්පසු ඔබට කඳවුරට ඇතුළු විය
හැකි ය’යි” කී ය.

## කොල්ලය බෙදාගැනීම

25 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට,
26 “නුඹ ද පූජක එලයෝසර් ද ජනතාවගේ
ප්‍රධානීන් ද අල්ලාගත් සිරකරුවන් සහ පැහැරගත්
සතුන් ද ගණන් කළ යුතු ය. 27 ඒ සියල්ල යුද වැදී
සටන් කළ අය සහ ඉතිරි අනිත් ජනයා අතර
දෙකොටසකට බෙදෙන්න. 28 තවද, සටන් කළ
භටයන්ට අයිති කොටසින්, මිනිසුන් පන්සියයකට
එක්කෙනා බැගිනුත් ගවයන්ගෙන් ද කොටළුවන්ගෙන්
ද එළු බැටළුවන්ගෙන් ද පන්සියයකට එකකු
බැගිනුත් සමිඳාණන් වහන්සේට දෙන බද්දක් මෙන්
වෙන් කරන්න. 29 ඔවුන්ගෙන් ගත් මේ කොටස
සමිඳාණන් වහන්සේට පුදන විශේෂ පඬුරක් මෙන්
පූජක එලයෝසර්ට දෙන්න. 30 සෙසු ඉශ්‍රායලේ
ජනයාට දුන් කොටසින් සිරකරුවන්ගෙන් පණහකට
එක්කෙනා බැගිනුත් ගව, කොටළු, එළු, බැටළු ආදී
නන්වැදෑරුම් සතුන්ගෙන් පණහකට එකකු බැගිනුත්
ගෙන සමිඳාණන් වහන්සේගේ මණ්ඩපය භාර ව
සිටින ලෙවීවරුන්ට දෙන්නැ”යි වදාළ සේක. 31 උන්
වහන්සේ වදාළ පරිදි මෝසෙස් සහ එලයෝසර් ඉටු
කළහ.
32 යුද්ධ භටයන් තමන්ට ම තබාගත් සතුන් හැරුණු
විට කොල්ලකෑ සතුන්ගේ ගණන බැටළුවන්
හයලක්ෂ හැත්තෑපන්දහසක් ද 33 ගවයන්
හැත්තෑදෙදහසක් ද 34 කොටළුවන් හැටඑක්දහසක් ද
විය. 35 තවද, පුරුෂයින් හැඳින ඔවුන් සමඟ
සේවනයෙහි නොයෙදුණු ගැහැණු දරුවෝ
තිස්දෙදහසක් වූ හ. 36 සටන් කළ භටයන්ගේ
දෙකෙන් කොටස බැටළුවන් තුන් ලක්ෂ තිස්හත්දහස්
පන්සියයක් වූ අතර 37 සමිඳාණන් වහන්සේට දුන්
බද්ද බැටළුවෝ හයසිය හැත්තෑපහක් වූ හ. 38 යුද්ධ
භටයන්ගේ කොටස ගවයන් තිස්හයදාහක් වූ අතර
සමිඳාණන් වහන්සේගේ බද්ද බැටළුවෝ
හැත්තෑදෙනෙක් වූ හ. 39 යුද්ධ භටයන්ගේ කොටස
කොටළුවන් තිස්දහස් පන්සියයක් වූ අතර,
සමිඳාණන් වහන්සේගේ බද්ද කොටළුවෝ
හැටඑකක් වූ හ. 40 යුද්ධ භටයන්ගේ කොටස
කන්‍යාවන් දහසයදහසක් වූ අතර සමිඳාණන්
වහන්සේගේ බද්ද කාන්තාවෝ තිස්දෙනෙක් වූ හ.
41 තවද මෝසෙස්, සමිඳාණන් වහන්සේ වදාළ පරිදි
උන් වහන්සේගේ පූජා පඬුර පූජක එලයෝසර්ට
දුන්නේ ය.
42 සටන් කළ යුද්ධ භටයන්ගෙන් ඉශ්‍රායලේ ජනයා
සඳහා මෝසෙස් වෙන් කළ දෙකෙන් කොටස
43 බැටළුවෝ තුන්ලක්ෂ තිස්හත්දාස් පන්සියයක් ද,
44 ගවයන් තිස්හයදහසක් ද 45 කොටළුවන් තිස්දාස්
පන්සියයක් ද 46 කන්‍යාවෝ දහසයදහසක් ද වූ හ.
47 ඉශ්‍රායලේ ජනයාට වූ මේ කොටසින් ද මෝසෙස්
සිරකරුවන් පණස්දෙනෙකුට එක්කෙනා බැගින් ද,
සතුන් පණස්දෙනෙකුට එකා බැගින් ද ගෙන,
සමිඳාණන් වහන්සේ අණ කළ පරිදි උන්
වහන්සේගේ මණ්ඩපය භාර ව සිටි ලෙවීවරුන්ට
දුන්නේ ය.
48 හමුදාවේ නිලධාරීහු ද සහශ්‍රාධිපතීහු සහ
ශතාධිපතීහු ද මෝසෙස් වෙත පැමිණ 49 ඔහුට
කතා කොට, “ඔබේ සේවකයන් වන අපි අපේ බල
ඇණිවල යුද්ධ භටයන් ගණන් කළෙමු. එක්
කෙනෙකේ වත් අඩු නැත. 50 එබැවින් සමිඳාණන්
වහන්සේ අපේ පණ බේරා දුන් බැවින්, අපි සෑම
කෙනෙකු ම ගත් ස්වර්ණාභරණ වන පාද මාලා ද
වළලු ද මුදු ද කුණ්ඩලාභරණ ද මාල ද උන්
වහන්සේට පූජා කරන පිණිස ගෙනාවෙමු”යි කී හ.
51 එවිට මෝසෙස් සහ පූජක එලයෝසර් රනින් කළ,
ඒ සියලු ආභරණ ගත්හ. 52 සහශ්‍රාධිපතීන් හා
ශතාධිපතීන් සමිඳාණන් වහන්සේට පිදූ මුළු රත්‍රන්

තෑගයේ බර කිලෝග්‍රෑම් දසයයක් විය.
53 එහෙත්, යුද්ධ භටයන් කොල්ලකෑ දේ ඔව්හු
තමන්ට ම තබාගත්හ. 54 මෙලෙස මෝසෙස් සහ
එලෙයාසර් සහශ්‍රාධිපතීන්ගෙන් සහ
ශතාධිපතීන්ගෙන් ගත් රන් රැගෙන ඒවා සම්මුඛ
මණ්ඩපය තුළ තැබූ හ. ඒවා ඉශ්‍රායලේ ජනයා හට
සමිඳාණන් වහන්සේගේ රැකවරණය සිහි ගන්වන
සංකේතයක් විය.

### ජෝර්දානින් එතෙර දේශය බෙදා දීම
(ද්වි.නී. 3:12-22)

32 රූබන්ගේ පෙළෙපතේ අයට සහ ගාද්ගේ
පෙළෙපතේ අයට ගවයෝ ඉතා විශාල
ගණනක් සිටියහ. ජාශර් දේශය සහ ගිලියද් දේශය
ගවයන්ට කෙතරම් සුදුසු ද කියා දුටු විට 2 ඔව්හු
මෝසෙස් ද පූජක එලෙයාසර් සහ ජනතාවගේ
නායකයන් ද වෙත අවුත්: 3 “අටාරොත්, දීබොන්,
ජාශර්, නිම්රා, හෙෂ්බොන්, එලෙයාලේ, සබාම්,
නබො සහ බියොන් යන නගර පිහිටා ඇති,
4 ඉශ්‍රායලේ ජනතාවට පදිංචි වීම සඳහා සමිඳාණන්
වහන්සේ පහර දුන් දේශය ගවයන්ට සුදුසු ය. තවද,
ඔබේ දාසයන් වන අපට ගවයෝ සිටිති. 5 එබැවින්
ඔබ අපට අනුග්‍රහය දක්වන්නහු නම්, මේ දේශය
ඔබේ දාසයන් වන අපට උරුම කොට දෙනු මැනවි.
අප ජෝර්දාන් නදියෙන් එතෙරට ගෙන නොයන්නැ”යි
කී හ.
6 එවිට මෝසෙස් ගාද්ගේ පරපුරේ අයට සහ
රූබන්ගේ පරපුරේ අයට මෙසේ කී ය: “ඔබ
හැමගේ අනෙක් සෙනඟ යුද්ධයට යන අතර ඔබ
හැම මෙහි නවතින්නට අරඅඳින්නහු ද? 7 සමිඳාණන්
වහන්සේ ඉශ්‍රායලේ ජනයාට දෙන්නට යන දේශයට
ඔවුන් නොයන ලෙස ඔවුන්ගේ සිත් අධෛර්ය
කරන්නේ මන් ද? 8 ගණන් 13:17-33රට බැලීමට මා
ඔබ හැමගේ පියවරුන් කාදෙෂ්-බර්නෙයේ සිට යැවූ
කල ඔවුන් කළේත් එයම යි. 9 ඔවුන් එෂ්කොල්
මිටියාවතට ගොස්, රට දුටු විට, ඉශ්‍රායලේ ජනයාට
සමිඳාණන් වහන්සේ දුන් දේශයට ඔවුන් නොයන
ලෙස ඔව්හු ඔවුන්ගේ සිත් අධෛර්ය කළහ.
10 ගණන් 14:26-35එවිට උන් වහන්සේගේ උදහස
ඇවිළී, 11 ‘මිසර දේශයෙන් නික්ම පැමිණි අවුරුදු
විස්සකට හා ඊට වැඩි වයසැති අය මට
සම්පූර්ණයෙන් ම අවනත නො වූ බැවින් ඔවුන්ගෙන්
කිසිවකු මා ආබ්‍රහම්ට, ඊසාක්ට සහ ජාකොබ්ට
පොරොන්දු වූ දේශය නොදකිනු ඇත. 12 එහෙත්,
කෙනෙසේසි ජාතික ජෙපුන්නේගේ පුත් කාලෙබ් සහ
නූන්ගේ පුත් ජෝෂුවා මට සම්පූර්ණයෙන් අවනත වූ
බැවින් ඔවුන් පමණක් ඒ දේශය දකිනු ඇත’ කියා
දිවුළ සේක. 13 මෙසේ උන් වහන්සේගේ උදහස
ඉශ්‍රායලේ ජනයාට විරුද්ධ ව ඇවිළී ගියෙන්
සමිඳාණන් වහන්සේට විරුද්ධ ව පව් කළ මුළු
පෙළෙපත ම නැසී වැනසී යන තෙක්, අවුරුදු හතළිහක්
පුරා ම ඔවුන්ට පාළුකරයේ මංමුළා වී යන්නට
සැලැසූ සේක. 14 බලන්න, සමිඳාණන් වහන්සේගේ
උදහස ඉශ්‍රායලේ ජනයා වෙත තවත් වැඩි කරවනු
පිණිස පාපිෂ්ඨ නව පරපුරක් වන ඔබ හැම ඔබේ
පියවරුන්ගේ හිලව්වට දැන් නැඟිට ඇත. 15 ඔබ
හැම උන් වහන්සේට අවනත නූණොත්, උන්
වහන්සේ යළි මේ සෙනඟ සියල්ලන් පාළුකරයේ
අත්හැරදමන සේක. ඔබ මොවුන් වනසාලන්නහු ය.”
16 එවිට ඔව්හු මෝසෙස්ට ළං වී, ඔහුට කතා
කොට, “අපි මෙහි අපේ බැටළුවන්ට ගාල් ද අපේ
කුඩා අයට නගර ද ඉදි කරන්නෙමු. 17 එහෙත්, අපි
ඉශ්‍රායලේ ජනයා ඔවුන්ට හිමි රටට පමුණුවන
තෙක්, ඔවුන්ට පෙරටුව සන්නාහ සන්නද්ධ ව ගොස්
සටන් කරන්නෙමු. අපගේ කුඩා අය පමණක්
දේශවාසීන්ගෙන් ඔවුන්ට උවදුරු නොපැමිණෙන ලෙස
පවුරු බැඳි නගරවල වසන්නෝ ය. 18 ඉශ්‍රායලේ
ජනයාගෙන් හැම කෙනෙකු ම තමාට හිමි උරුමය
ලබාගන්න තෙක් අපි අපේ ගෙවලට හැරී
නොඑන්නෙමු. 19 ජෝර්දාන් ගඟින් මෙගොඩ
පෙරදිග අපට උරුම වන බැවින්, ගඟින් එගොඩ සහ
ඉන් එහා ද කිසිවක් අපි ඔවුන් සමඟ උරුම කොට
නොගන්නෙමු”යි කී හ.
20 එවිට මෝසෙස් ඔවුන්ට කතා කොට, “ඔබ හැම
මෙය කරමින්, සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි
සටනට සන්නාහ සන්නද්ධ ව, 21 උන් වහන්සේ
සතුරන් පලවා හරින තෙක්, උන් වහන්සේගේ අණ
පරිදි, ජෝර්දානෙන් එගොඩ වී සටන් කොට, 22 රට
අල්ලා ගන්නහු නම්, ඉන්පසු ඔබ සියල්ලන්ට ආපසු
හැරී එන්නට අවසර ඇත. උන් වහන්සේ ඉදිරියෙහි
ද, ඉශ්‍රායලේ ජනයා ඉදිරියෙහි ද ඔබ නිදොස් වනු
ඇත. උන් වහන්සේගේ අණ පරිදි මේ රට ද ඔබට
උරුම වනු ඇත. 23 එහෙත්, ඔබ එලෙස
නොකරන්නහු නම්, සමිඳාණන් වහන්සේට විරුද්ධ ව
ඔබ හැම පව් කරන්නහු ය. ඔබේ පාපය ද ඔබ පිට
පැවරෙන බව දැනගන්න. 24 ඔබේ කුඩා අය සඳහා
නගර ද බැටළුවන් සඳහා ගාල් ද ඉදි කරන්න. ඔබ
පොරොන්දු වූ පරිදි සියල්ල ඉටු කරන්නැ”යි කී ය.
25 ගාද්ගේ පරපුරේ අය සහ රූබන්ගේ පරපුරේ අය
මෝසෙස්ට කතා කොට, “අපේ හිමිතුමා අණ කරන
ලෙස ඔබේ සේවක අපි ඉටු කරන්නෙමු. 26 අපේ
කුඩා අය ද භාර්යාවන් ද එළු බැටළු පට්ටි ද
ගවමහිෂ සියල්ලන් ද ගිලියද්හි නගරවල නවතිනු
ඇත. 27 එහෙත්, ඔබ කියන පරිදි ඔබ සේවක අපි
හැම කෙනෙක් ම සන්නාහ සන්නද්ධ ව, සමිඳාණන්
වහන්සේගේ අණ ලෙස සටනට සූදානම්
වන්නෙමු”යි කීවෝ ය.
28 ජෝෂු 1:12-15 මෙලෙස මෝසෙස් ඔවුන් පිළිබඳ
ව පූජක එලෙයාසර්ට ද නූන්ගේ පුත් ජෝෂුවාට හා
ඉශ්‍රායලේ ජනයාගේ ගෝත්‍රවල නායකයන්ට ද
විධාන කළේ ය. 29 ඔහු ඔවුන් අමතමින්, “ගාද්ගේ
පරපුරේ අය හා රූබන්ගේ පරපුරේ අය සමිඳාණන්
වහන්සේගේ අණ පරිදි සටනට සන්නාහ සන්නද්ධ
ව ඔබ සමඟ ජෝර්දාන් නදියෙන් එතෙරෙ ව, රට
අල්ලාගන්නෝ නම්, ඔබ හැම ඔවුන්ට ගිලියද්
දේශය උරුම කොට දිය යුතු ය. 30 එහෙත්, ඔව්හු
ඔබ සමඟ සන්නාහ සන්නද්ධ ව ගඟින් එගොඩ

නොවන්නෝ නම්, කානාන් දේශයේ දී ඔබ සමඟ
ඔව්හු උරුමය ලබන්නෝ ය”යි කී ය.
31 එවිට ගාද්ගේ පරපුරේ අය සමඟ රූබන්ගේ
පරපුරේ අය පිළිතුරු දමින්, “සමිඳාණන් වහන්සේ
ඔබේ සේවකයන් වන අපට දැන්වූ ලෙස අපි ඉටු
කරන්නෙමු. 32 ජොර්දාන් ගඟින් මෙගොඩ උරුමය
අපට අයිති වන පිණිස සමිඳාණන් වහන්සේගේ
අණ පරිදි අපි සන්නාහ සන්නද්ධ ව කානාන්
දේශයට යන්නෙමු”යි කී හ.
33 මෙලෙස මෝසෙස් ගාද්ගේ පරපුරටත්, රූබන්ගේ
පරපුරටත්; ජෝසෙප්ගේ පුත් මනස්සේගේ අර්ධ
ගෝත්‍රයටත්, අමෝරිවරුන්ගේ රජ වූ සීහොන්ගේ
රාජ්‍යය ද බාෂාන්හි රජ වූ ඕග්ගේ රාජ්‍යය ද යන
රටවල් සහ එහි දේශ සීමාවලින් ඇතුළු නගර සහ
ඒවායින් පිට නගර ද දුන්නේ ය. 34 ගාද්ගේ
පරපුරේ අය දීබොන්, අටාරොත් සහ අරෝයෙර්,
35 අත්‍රොත්-ෂෝපාන්, ජාසෙර් සහ ජොග්බෙහා,
36 බෙත්-නිම්රා සහ බෙත්-හාරන් යන පවුරු සහිත
නගර ද, බැටළුවන්ට ගාල් ද ඉදි කළහ. 37 රූබන්ගේ
පරපුරේ අය හෙෂ්බොන්, එලයොලේ සහ
කිරියතායිම් ද, 38 නම් වෙනස් කරන ලද නබෝ
සහ බාල්-මෙයොන් ද, සිබ්මා ද යන නගර ඉදි
කළහ. ඔව්හු තමන් ගොඩනැඟුවා වූ නගරවලට
අලුත් නාම ද තැබූ හ.
39 මනස්සේගේ පුත් මාකීර්ගේ පරපුරේ අය
ගිලියද් දේශයට ගොස් එය අල්ලාගෙන එහි සිටි
අමෝරිවරුන් පන්නාදැමූ හ. 40 මෝසෙස් එම දේශය
මනස්සේගේ පුත් මාකීර්ට දුන් පසු, ඔහු එහි විසී ය.
41 මනස්සේගේ පුත් ජායීර් ගොස්, එහි තිබූ සමහර
නගර අල්ලාගෙන ඒවාට හවොත්-ජායිර් කියා නම්
තැබී ය. 42 නොබා ගොස් කෙනෙත් සහ එහි ගම්
අල්ලාගෙන, තමාගේ නමින් ඊට නොබා යයි නම්
කළේ ය.

### මිසරයේ සිට මෝවබ් දක්වා ගමන් විස්තර

33 මෝසෙස්ගේ හා ආරොන්ගේ නායකත්වය
යටතේ මිසර දේශයෙන් නික්මුණු ඉශ්‍රායලේ
ජනයාගේ සහ ඔවුන්ගේ හමුදාවන්ගේ ගමන්
විස්තර මේවා ය. 2 සමිඳාණන් වහන්සේ අණ දුන්
පරිදි, මෝසෙස් ඔවුන් පිටත් වූ ස්ථාන අනුව ගමන්
විස්තර සටහන් කළේ ය. පිටත් වූ ස්ථාන අනුව
ඒවායේ විස්තර මෙසේ ය.
3 ඉශ්‍රායලේ ජනතාව පළමු වන මාසයේ
පසළොස් වන දින, පාස්කු දිනට පසු දින, මිසර
වැසියන් බල බලා සිටිය දී මහා උදාර ලීලාවෙන්
රාමසෙස් නම් නුවරින් පිටත් වූ හ. 4 එකල මිසර
වාසීහු සමිඳාණන් වහන්සේ මැරූ ඔවුන්ගේ
කුලුඳුලන් වළලමින් සිටියහ. මෙලෙස උන් වහන්සේ
ඔවුන්ගේ දෙවි දේවතාවන්ට ද දඬුවම් කළ සේක.
5 ඉශ්‍රායලේ ජනයා රාමසෙස් නුවරින් නික්ම
සුක්කොත්හි ද, 6 සුක්කොත් නුවරින් නික්ම
පාළුකරයේ අද්දර වූ ඒතාම්හි ද, 7 ඒතාම් නුවරින්
නික්ම බාල්-ශෙපොන් ඉදිරිපිට වූ පී-හාහිරොත් බලා
හැරී ගොස් මිග්දෝල් ඉදිරිපිට ද, 8 පී-හාහිරොත්
නම් නුවරින් නික්ම, මුහුද මැදින් පාළුකරයට ගොස්,
ඒතාම් නම් පාළුකරයේ තුන් දිනක් ගමන් කොට
මාරාහි ද කඳවුරු බැන්දහ. 9 මාරා නම් ස්ථානයෙන් ද
නික්ම, ඒලිම්ට පැමිණියහ. මෙහි දිය උල්පත්
දොළහක් ද තල්ගස් හැත්තෑවක් ද තිබිණි. එහි ද
ඔව්හු කඳවුරු බැඳ 10 ඉන් නික්ම රතු මුහුදුබඩ ද,
11 එතැනින් නික්ම සීන් නම් පාළුකරයේ ද,
12 එතැනින් නික්ම දොප්කාහි ද, 13 එතැනින් නික්ම
අලූෂ්හි ද කඳවුරු බැන්දහ. 14 එතැනින් නික්ම
සෙනඟට බීම සඳහා ජලය නොතිබුණු රෆිදිම්හි ද,
15 එතැනින් නික්ම සීනයි පාළුකරයේ ද කඳවුරු
බැන්දහ. 16 එතැනින් නික්ම කිබ්රොත්-හත්තාවාහි ද,
17 එතැනින් නික්ම හශේරොත්හි ද, 18 එතැනින්
නික්ම රිත්මාහි ද, 19 එතැනින් නික්ම රිම්මොන්-
පෙරෙශ්හි ද, 20 එතැනින් නික්ම ලිබ්නාහි ද,
21 එතැනින් නික්ම රිස්සාහි ද, 22 එතැනින් නික්ම
කෙහේලාතාහි ද, 23 එතැනින් නික්ම ෂෙපෙර්
කන්දෙහි ද, 24 එතැනින් නික්ම හරාදාහි ද,
25 එතැනින් නික්ම මක්හෙලොත්හි ද, 26 එතැනින්
නික්ම තාහත්හි ද, 27 එතැනින් නික්ම තරොහි ද,
28 එතැනින් නික්ම මිත්කාහි ද, 29 එතැනින් නික්ම
හෂ්මොන්හි ද, 30 එතැනින් නික්ම මොසේරොත්හි
ද, 31 එතැනින් නික්ම බෙනෙ-ජාකාන්හි ද,
32 එතැනින් නික්ම හෝර්-හග්ගිද්ගාද්හි ද,
33 එතැනින් නික්ම ජොට්බාතාහි ද, 34 එතැනින්
නික්ම අබ්රොනාහි ද, 35 එතැනින් නික්ම
එශියොන්-ගෙබෙර්හි ද, 36 එතැනින් නික්ම ශීන්
පාළුකරයෙහි එනම් කාදෙෂ්හි ද, 37 එතැනින් නික්ම
ඒදොම් දේශ සීමාවේ පිහිටි හෝර් කන්දෙහි ද
කඳවුරු බැඳගත්හ.
38 ගණන් 20:22-28; ද්වි.නී. 10:6; 32:50 ඉශ්‍රායලේ
ජනයා මිසර දේශයෙන් නික්ම ගිය හතළිස් වන
අවුරුද්දේ පස් වන මාසයේ පළමු වන දින
සමිඳාණන් වහන්සේගේ අණ පරිදි පූජක ආරොන්
හෝර් නම් කන්දට නැංග පසු, එහි දී මියගියේ ය.
39 ඔහු එහි මියයන විට ඔහුගේ වයස අවුරුදු
එකසිය විසිතුනකි.
40 ගණන් 21:1 කානාන් දේශයේ දකුණු දිශාවේ
විසූ කානානිය අරාද් නම් රජු හට ඉශ්‍රායලේ ජනයා
සැපත් වන බව සැළ විය.
41 ඔව්හු හෝර් කන්දෙන් නික්ම සල්මොනාහි ද,
42 එතැනින් නික්ම පූනොන්හි ද, 43 එතැනින් නික්ම
ඔබොතෙහි ද, 44 එතැනින් නික්ම මෝවබ් දේශ
සීමාවේ පිහිටි ඉයේ-ආබාරිම්හි ද, 45 එතැනින්
නික්ම දීබොන්-ගාද්හි ද, 46 එතැනින් නික්ම
අල්මොන්-දිබ්ලාතයිම්හි ද, 47 එතැනින් නික්ම
නබෝ ඉදිරිපිට අබාරිම් කඳු වැටියේ ද, 48 එතැනින්
නික්ම ජොර්දාන් ගං තරෙ වූ ජෙරිකෝ නුවර
මෝවබ් මිටියාවතේ ද කඳවුරු බැඳගත්හ.
49 මෙලෙස ඉශ්‍රායලේ ජනයා ජොර්දාන් ගං තරෙ
බෙත්-ජෙෂිමොත් පටන් ආබෙල්-ෂිත්තිම් දක්වා
මෝවබ් මිටියාවතෙහි කඳවුරු බැඳගත්හ.

### ජෝර්දානනේ එතරෙ වීමට පරෙ උපදසේ

50 ජෝර්දාන් ගං තරෙ පිහිටි ජෙරිකෝ නුවර අසල
මෝවබ් මිටියාවතේ දී සමිඳාණන් වහන්සේ
මෝසෙස්ට කතා කොට මසෙේ වදාළ සේක:
51 “ඉශ්රායලේ ජනයා අමතා මයෙ කියන්න; ‘නුඹලා
ජෝර්දාන් ගඟනේ එතරෙ වී, කානාන් දේශයට
සැපත් වූ විට 52 නුඹලාට ඉදිරියනේ එහි සිටින
දේශවාසී සියල්ලන් පලවා හැරිය යුතු ය. ඔවුන්
ගලින් නළෙ, ලෝහයනේ වාත්තු කළ පිළිම නසා
වනසා, ගිරිකුළු දේවාල නටබුන් කළ යුතු ය.
53 නුඹලා දේශය උරුම කොටගනෙ එහි පදිංචි විය
යුතු ය. මන්ද, ස්වාමීන් වන මා එය නුඹලාට දුන්
බැවිනි. 54 ගණන් 26:54-56තවද දාදු දමා, දේශය
නුඹලාගේ පළෙපත් අතර උරුම කොට බදොගත
යුතු ය. වැඩියනේ ඉන්න අයට වැඩියනේ ද, අඩුවනේ
ඉන්න අයට අඩුවනේ ද උරුමය දිය යුතු ය. දාදුව
අනුව යමකුෙට වැටනෙ ස්ථානය ඔහුට උරුම වනු
ඇත. නුඹලාගේ පිය පළෙපත්හි ගෝත්ර අනුව
නුඹලා දේශය උරුම කොට ගත යුතු වේ. 55 නුඹලා
දේශවාසී සියල්ලන් පලවා නොහැරියොත්, එහි
ඉතිරි වන අය නුඹලාගේ ඇහැට උලක් ද ඇලයට
කටුවක් ද වැනි මහා කරදරයක් වී නුඹලා වසන
දේශයේ දී ඔවුන් නුඹලාට හිරිහැර කරනු ඇත.
56 ඇරත්, නුඹලා මා කී ලසෙ නොකරන්නහු නම්,
මම ඔවුන්ට දනේනට යන දඬුවම් නුඹලාට
දනේනමේ.’ “

### දේශ සීමා පිහිටුවීම

34 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා
කොට මසෙේ වදාළ සේක: 2 “ඉශ්රායලේ
ජනයාට අණ දමේන් මයෙ කියන්න: ‘නුඹලාට
උරුමයක් වශයනේ හිමි වන කානාන් දේශයට
නුඹලා පැමිණි කල්හි, එහි දේශ සීමාවෝ පහත
දක්වන ඒවා ය. 3 දකුණු පැත්ත ශීන් නම්
පාළුකරයේ සිට ඒදමෝ දේශ සීමාව ඔස්සේ ය.
දකුණු මායිම මළ මුහුදේ දකුණු කොණට
නැගනෙහිරින් පටන්ගනු ඇත. 4 ඒ මායිම
අක්රබ්බීම්හි දුර්ගය පිහිටි දකුණු දිශාව සහ ශීන්
නම් පාළුකරය ඔස්සේ කාදෙෂ්-බර්නේය දක්වා දික්
වනු ඇත. එතැන සිට වයඹ දිශාවනේ පිහිටි හශර්-
අද්දාර් සහ අශ්මෝන් දක්වා එය වැටනෙු ඇත.
5 එතැන සිට මිසරයේ ගඟ දක්වා මායිම වැටී
මධ්යධරණි මුහුදනේ කළෙවර වනු ඇත.
6 ‘අපරදිග මායිම මධ්යධරණි මුහුද වේ. 7 උතුරු
මායිම මධ්යධරණි මුහුදේ සිට හෝර් කන්ද දක්වා ද
8 එතැන් සිට හමාත් දුර්ගය, ශදොද් සහ 9 ශිප්රෝන්
නම් ස්ථානය ඔස්සේ වැටී හශර්-ඒනාන් ළඟින් ද
කළෙවර වනු ඇත.
10 ‘පරෙදිග මායිම හශර්-ඒනානනේ ෂපොම් දක්වා
ද, 11 අයින් නම් ස්ථානයට නැගනෙහිරින් දකුණු
දිශාවේ පිහිටි හර්බලේ දක්වා ද, ගලීලය මුහුදේ
පරෙදිග වරෙළේ පිහිටි කඳු වැටිය දක්වා ද,
12 එතැනින් දකුණු දසෙට මළ මුහුදට වැටනෙ
ජෝර්දාන් ගඟ ඔස්සේ ද වැටනෙු ඇත. නුඹලාට
හිමි වන දේශයේ මායිම් මේවා වනු ඇත.’ “
13 ගණන් 26:52-56 ජෝෂුවා 14:1-5 තවද මෝසෙස්
ඉශ්රායලේ ජනයාට අණ කරමින් මසෙේ කීවේ ය:
“සමිඳාණන් වහන්සේ ඔබේ ගෝත්ර නවයට හා
අර්ධ ගෝත්රයට දනේනට අණ කළ, දාදු දමා ඔබ
උරුම කොට ගත යුතු දේශය මයෙ වේ. 14 පිය
පළෙපත් අනුව රූබන්ගේ පරපුරට අයිති අය සහ
ගාද්ගේ පරපුරට අයිති අය ඔවුන්ගේ උරුම කොටස
ලබාගනෙ ඇත. එලසෙ ම මනස්සේගේ අර්ධ
ගෝත්රයට ද ඔවුන්ගේ උරුම ලැබී තිබේ. 15 ඉහත
කී ගෝත්ර දකෙට සහ අර්ධ ගෝත්රයට හිරු නඟින
පරෙදිග පිහිටි ජෙරිකෝව අසල ජෝර්දාන් ගඟනේ
මගෙොඩ ඔවුන්ගේ උරුම කොටස ලැබී තිබේ.”

### දේශය බදේමේ වගකීම

16 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට
මසෙේ වදාළ සේක: 17 “නුඹලා අතර දේශය බදෙ
දීම ගැන වගකිවයුතු අය නම්, පූජක එලයොසර් සහ
නූන්ගේ පුත් ජෝෂුවා ය. 18 තවද, දේශය උරුම
කොට බදෙ දීම සඳහා එක එක ගෝත්රයට එක
එක නායකයකුෙ බැගින් තෝරාගත යුතු ය.
19 මොවුහු නම්, ජුදා ගෝත්රයනේ ජපෙුන්නේගේ
පුත් කාලබේ; 20 සිමියෝන්ගේ ගෝත්රයනේ
අම්මිහුද්ගේ පුත් ෂමෙුවලේ; 21 බනේජමින්ගේ
ගෝත්රයනේ කිස්ලෝන්ගේ පුත් එලිදාද්; 22 දාන්ගේ
පරපුරට අයත් ගෝත්රයනේ ජොග්ලිගේ පුත් වූ හා
නායකයකුෙ වූ බුක්කී; 23 ජෝසපේගේ පුත්රයන්
වන මනස්සේගේ පරපුරට අයත් ගෝත්රයනේ,
ඒෆොද්ගේ පුත් වූ හා නායකයකුෙ වූ හන්නීයලේ;
24 එප්රායිම්ගේ පරපුරට අයත් ගෝත්රයනේ,
ෂිප්තාන්ගේ පුත් වූ හා නායකයකුෙ වූ කමේුවලේ;
25 සාබුලෝන්ගේ පරපුරට අයත් ගෝත්රයනේ,
පර්නාක්ගේ පුත් වූ හා නායකයකුෙ වූ එලිශාපාන්;
26 ඉස්සාකර්ගේ පරපුරට අයත් ගෝත්රයනේ,
අශ්ශාන්ගේ පුත් වූ හා නායකයකුෙ වූ පල්තියලේ;
27 ආෂරේගේ පරපුරට අයත් ගෝත්රයනේ,
ෂලෙොමිගේ පුත් වූ හා නායකයකුෙ වූ අහිහුද්;
28 නප්තලීගේ පරපුරට අයත් ගෝත්රයනේ,
අම්මිහුද්ගේ පුත් වූ හා නායකයකුෙ වූ පදෙහලේ
යන අය ය.” 29 කානාන් දේශයේ දී ඉශ්රායලේ
ජනයාට උරුමය බදෙ දීමට සමිඳාණන් වහන්සේ
මොවුන්ට අණ කළ සේක.

### ලෙවීවරුන්ට නියම කළ නගර

35 ජෝෂුවා 21:1-42 තවද, සමිඳාණන් වහන්සේ
ජෝර්දාන් ගං තරෙ, ජෙරිකෝව අසල
මෝවබ් මිටියාවතේ දී මෝසෙස්ට මසෙේ වදාළ
සේක: 2 “ඉශ්රායලේ ජනයාට උරුම වන කොටසින්
ලෙවීවරුන්ට වාසය කිරීම පිණිස නගර දීමට ඔවුන්ට
අණ කරන්න. තවද, ඉශ්රායලේ ජනයා, නගර සිසාරා
ඇති තණ බිම් ද ඔවුන්ට දිය යුතු ය. 3 ඒ නගර

ඔවුන්ගේ වාසය පිණිසත්, තණ බිම් ගවමහිෂයන්
ඇතුළු මුළු ගොවිසම්පත සඳහාත් විය යුතු ය. 4 නුඹ
ලෙවීවරුන්ට දෙන නගර වටා ඇති තණ බිම්වල
ප්‍රමාණය නගර ප්‍රාකාරයේ සිට එය වටේට ම
මීටර් හාරසිය පණහක් විය යුතු ය. 5 නුවර මැදි
කොට නුවර වටේට ම පෙරදිගට මීටර් හාරසිය
පණහක් ද දකුණු දිගට මීටර් හාරසිය පණහක් ද
අපරදිගට මීටර් හාරසිය පණහක් ද උතුරු දිගට
මීටර් හාරසිය පණහක් ද මැනිය යුතු ය. මේ
නගරවලට යාබද තණ බිම් ඔවුන් සතු වේ.
6 ලෙවීවරුන්ට දෙන නගර අතර නගර හයක් අභය
භූමි නගර වශයෙන් දිය යුතු ය. කෙනෙකු තව
කෙනෙකු අදහස් නොකර මැරුවහොත්, එවිට ඔහුට
එම නගරයට පලා යත හැක. ඒවාට අමතර ව තව
නගර හතළිස්දෙකක් ද දිය යුතු ය. 7 මෙලෙස තණ
බිම් සහිත ව ඔවුන්ට දෙන නගරවල මුළු ගණන
හතළිස්අටක් වනු ඇත. 8 ඉශ්‍රායෙල් ජනයාගේ
උරුම කොටසින් නගර දෙන විට, වැඩියෙන් ඇති
අයට වැඩියෙන් ද, අඩුවෙන් ඇති අයට අඩුවෙන් ද
දිය යුතු ය. සෑම කෙනෙකු ම තම තමාට උරුම වන
කොටසේ ප්‍රමාණය අනුව ලෙවීවරුන්ට නගර දිය
යුතු වේ.”

## අභය භූමි නගර

(ද්වි.නී. 19:1-13;ජෝෂු 20:1-9)

9 ද්වි.නී. 19:2-4; ජෝෂු 20:1-9 සමිඳාණන් වහන්සේ
මෝසෙස්ට කතා කොට මෙසේ වදාළ සේක:
10 “ඉශ්‍රායෙල් ජනයා අමතා මෙය කියන්න: නුඹලා
ජෝර්දාන් නදියෙන් එතෙරට කානාන් දේශයට
පැමිණි විට, 11 නුඹලාගේ යහපතට, අභය භූමි
නගර නියම කළ යුතු ය. එවිට යමෙකු අදහස්
නොකර යමෙකු මැරුවහොත්, ඒ මිනීමරුවාට එවැනි
නගරයකට පලා යත හැක. 12 එවිට පළිගන්නාගෙන්
මිදී ඒ තැනැත්තාට පිහිට සොයා ඒ නගරවලට යත
හැක. ප්‍රසිද්ධ ලෙස විනිශ්චය කරන තුරු මිනීමරුවා
ලෙස සැලකෙන තැනැත්තා මරණයට පත් නොකළ
යුතු ය. 13 නුඹලාට දෙන නගරවලින් නගර හයක්
අභය භූමි මෙන් සැලකිය යුතු ය. 14 ජෝර්දාන්
නදියෙන් මෙගොඩ නගර තුනක් ද, කානාන්
දේශයේ නගර තුනක් ද අභය භූමි වශයෙන්
තෝරගත යුතු ය. 15 මේ නගර හය, ඉශ්‍රායෙල්
ජනයා සඳහා ද විදේශිකයන් සඳහා ද තාවකාලික ව
පදිංචි වූ අය සඳහා ද අභය භූමි වනු ඇත. එවිට
යමෙකු අදහස් නොකර යමෙකු මැරුවහොත්, ඔහුට
එහි පලා යත හැකි ය.
16 ‘යමෙකු වැරෙන් යකඩ ආයුධයකින් වෙනත්
අයෙකුට පහර දී මළහොත් ඔහු මිනීමැරීම ගැන
වරදකරුවෙකි. මිනීමරුවා මරණයට පත් කළ යුතු ය.
17 යමෙකු අනෙකකු මරන අදහසින් ගලකින් පහර
දී, ඔහු මළහොත් ඒ තැනැත්තා මිනීමැරීම ගැන
වරදකරුවෙකි. මිනීමරුවා මරණයට පත් කළ යුතු ය.
18 යමෙකු අනෙකකු මරන අදහසින් ඔහුට ලී
ආයුධයකින් ගසා ඔහු මැරුවොත්, ඔහු මිනීමැරීම
ගැන වරදකරුවෙකි. එවැන්නෙකු මරණයට පත් කළ
යුතු ය. 19 ඒ මැරීම ගැන පළිගන්න තැනැත්තා
මිනීමරුවා මරණයට පත් කිරීම ගැන වගකිව යුතු ය.
මිනීමරුවා සම්මුඛ වූ විට, ඔහු මරාදැමිය යුතු වේ.
20 ‘යමෙකු අනෙකකු මරන අදහසින්, වෛරයෙන්
ඔහු තල්ලු කොට හෝ රැක සිට ඔහු වෙත යමක්
වීසි කොට හෝ 21 සතුරුකමින් ඔහුට අතින් බැට දී
හෝ ඔහු මළහොත් එවැන්නෙකු මිනීමැරීම ගැන
වරදකරුවෙකු වන බැවින් ඔහු මරාදැමිය යුතු ය.
මරනු ලැබූ තැනැත්තාගේ කිට්ටු ම ඥාතියාට
මිනීමරුවා සම්මුඛ වූ විට ඔහු මරාදැමිය යුතු ය.
22 ‘සතුරුකමක් නොමැති ව යමෙකු අනෙකකු
හදිසියෙන් තල්ලු කොට හෝ රැක නොසිට යමක්
ඔහු වෙත වීසි කරමින් හෝ 23 ඔහු ඉන්න බව
නොදැන ගලක් ගසා හෝ ඔහු මළහොත්, එවැනි
අවස්ථාවක දී ඔහු සතුරුකම් නොපෙන්වූ බැවින් ද
ඔහුට නපුරක් කිරීමට නොසෙවූ බැවින් ද
24 ජනතාව මිනීමරුවා සහ මරනු ලැබූ තැනැත්තාගේ
කිට්ටු ඥාතියා අතර මෙලෙස විනිශ්චය කළ යුතු ය.
25 ජනතාව ඥාතියාගේ අතින් මිනීමරුවා
බේරාගෙන, මොහු පැන ගිය අභය භූමි නගරයට
ආපසු යැවිය යුතු ය. මොහු, ශුද්ධ තෙලින් තමා
ආලේප කළ නායක පූජකයාගේ මරණය දක්වා එහි
වසනු ඇත. 26 එහෙත්, යම් දිනක මිනීමරුවා තමා
පලා ගිය අභය භූමි නගරයේ සීමාවෙන් පිටතට
පැමිණි පසු, 27 එහි දී, මරාදැමූ තැනැත්තාගේ කිට්ටු
ඥාතියාට ඔහු සම්බවුණොත් මිනීමරුවා මරාදැමිය
හැකි ය. ඥාතියා ඒ මැරීම ගැන වරදකරුවෙකු
නොවනු ඇත. 28 මන්ද, මිනීමරුවා, නායක
පූජකයාගේ මරණය දක්වා තම අභය භූමි
නගරයෙහි සිටිය යුතු බැවිනි. ඔහුට තමාගේ
ගෙදරට යත හැක්කේ නායක පූජකයාගේ මරණයට
පසුව පමණකි. 29 නුඹලා වසන සෑම තැනක ම,
සෑම පෙළපතක් කෙරෙහි ම මේ නීති නියෝග
වලංගු වනු ඇත.
30 ද්වි.නී. 17:6; 19:15 ‘යමෙකු අනෙකකු
මැරුවහොත්, මිනීමරුවා සාක්ෂිකරුවන් කීප
දෙනෙකුගේ සාක්ෂි පිට මරණයට පත් කරනු ලැබේ.
එහෙත්, එලෙස මරණයට පත් කිරීමට පෙර එක
සාක්ෂිකරුවෙකුගේ සාක්ෂි පමණක් නොසෑහේ.
31 මිනීමැරීමක් සම්බන්ධ ව තීන්දු වූ වරදකරුවෙකු
මරණයට පත් කළ යුතු ය. එවැන්නෙකුගේ පණ
බේරාගැනීමට වන්දියක් නොගත යුතු ය. 32 අභය
භූමි නගරයට පලා ගිය තැනැත්තා වෙනුවෙන් නායක
පූජකයාගේ මරණයට කලින් ඔහුගේ රටට ම ආපසු
පැමිණීම සඳහා වන්දියක් නොගත යුතු ය. 33 නුඹලා
එලෙස කර, නුඹලා වසන රට නොකෙලෙසිය යුතු
ය. ලේ වැගිරීමෙන් රට කෙලෙසෙනු ඇත. මිනීමරුවා
මරණයට පත් කිරීමෙන් මිස, ඔහු විසින් වගුරුවන
ලද ලෙයින් තෙත් වූ රට පවිත්‍ර කිරීමට අන් මගක්
නැත. 34 එබැවින් නුඹලා වාසය කරන රට
නොකෙලෙසෙන්න. මම ද එහි වාසය කරමි.
ඉශ්‍රායෙල් ජනයා අතර වාසය කරන මම සමිඳාණන්
වහන්සේ වෙමි.’ “

## විවාහක කාන්තාවන්ගේ උරුමය

36 ජෝසෙප්ගේ පුතුන්ගේ පවුල්වලට අයත්
මනස්සේගේ පුත්, මාකීර්ගේ පුත්‍රයා වන
ගිලියද්ගේ පරපුරට අයත් පවුල්වල ප්‍රජා මූලිකයෝ
මෝසෙස් ද ඉශ්‍රායලේ ජනයාගේ ප්‍රජා මූලිකයන්
හා නායකයන් ද ඉදිරියට පැමිණ, 2 ගණන් 27:7"දාදු
දමා ඉශ්‍රායලේ ජනයාට රට උරුම කොට බෙදා දීමට
සමිඳාණන් වහන්සේ අප ස්වාමියා වන ඔබට අණ
කළ සේක. තවද අපගේ ඥාති වූ
ශෙලෝපහොද්ගේ උරුමය ඔහුගේ දූවරුන්ට දෙන
ලෙසෙ ද ඔබ සමිඳාණන් වහන්සේ අණ ලැබුවහු ය.
3 හොඳයි, ඔවුන් ඉශ්‍රායලේ ජනයාගේ ගෝත්‍රවල
පිරිමින්ගෙනේ කෙනෙකු හා විවාහ වූවොත්, එවිට
අපේ පියවරුන්ගේ උරුමයෙන් කොටසක් ගනු ලැබ,
ඔවුන් විවාහ වූ ගෝත්‍රයේ උරුමයට එය එකතු වනු
ඇත. මලෙසෙ දාදු දැමීමෙන් අප ලත් උරුමය අඩු
වනු ඇත. 4 තවද, ඉශ්‍රායලේ ජනයාගේ ජුබිලි
වර්ෂයේ දී ඔවුන්ගේ උරුමය ඔවුන් විවාහ වූ
අයගේ ගෝත්‍රයේ උරුමයට නිත්‍ය වශයෙන් එකතු
වීමෙන් ඔවුන්ගේ පියවරුන්ගේ ගෝත්‍රයට හිමි
උරුමය අඩු වී යනු ඇතැ"යි කීවෝ ය.
5 එවිට සමිඳාණන් වහන්සේ වදාළ පරිදි මෝසෙස්
ඉශ්‍රායලේ ජනයා අමතා මෙසේ කී ය:
6 "ශෙලෝපහොද්ගේ දූවරුන් ගැන සමිඳාණන්
වහන්සේ අණ කරන දේ මේ ය: 'ඔවුන් තමන්ට
කැමැති පරිදි තමන්ගේ ගෝත්‍රය තුළ ම පමණක්
විවාහ විය යුතු ය. 7 එවිට ඉශ්‍රායලේ ජනයාගේ
උරුමයේ කොටස් ගෝත්‍රයෙන් ගෝත්‍රයට නොයෙනු
ඇත. මන්ද, මෙසේ කිරීමෙන් ඉශ්‍රායලේ ජනයා
අතර සෑම කෙනෙකු ම තම තමාගේ පිය පළෙපත්
ගෝත්‍රයේ උරුමයට ම බැඳී සිටිනු ඇත.
8 'තවද, ඉශ්‍රායලේ ජනයා අතර උරුමයක් හිමි
සෑම දුවක ම තම පිය පළෙපත් ගෝත්‍රයේ
කෙනෙකු සමඟ විවාහ විය යුතු ය. එවිට ඉශ්‍රායලේ
ජනයා අතර සෑම කෙනෙකු ම තම පිය පළෙපත්
උරුමය භුක්ති විඳිනු ඇත. 9 උරුම කොටස්
ගෝත්‍රයෙන් ගෝත්‍රයට නොගොස් ඉශ්‍රායලේ
ජනයා අතර සෑම කෙනෙකු ම තම තමාගේ පිය
පළෙපත් ගෝත්‍රයේ උරුමයට ම බැඳී සිටිනු ඇත.' "
10 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අණ කළ පරිදි
ශෙලෝපහොද්ගේ දූවරු ද ඉටු කළහ. 11 ඒ දූවරු
වන මාලා, තිර්ශා, හොග්ලා, මිල්කා සහ නෝවා
තම පියාගේ සොහොයුරන්ගේ පුත්‍රයන් සමඟ
විවාහ වූ හ. 12 මොවුන් ජෝසෙප්ගේ පුත්
මනස්සේගේ පරපුරට අයත් පවුල්වල අය සමඟ
විවාහ වූ නිසා, ඔවුන්ගේ උරුම කොටස තම පිය
පළෙපත් ගෝත්‍රය තුළ ම පැවතුණි.
13 ජොර්දාන් ගං තරෙ, ජෙරිකෝ නුවර අසල
මෝවබ් මිටියාවතේ දී සමිඳාණන් වහන්සේ
මෝසෙස් මඟින් ඉශ්‍රායලේ ජනයාට දුන් ආඥා සහ
විනිශ්චයෝ මේවා ය.

# ද්විතීය නීති සංග්‍රහය

## හැඳින්වීම

1 ජෝර්දාන් ගඟින් මෙගොඩ පාළුකරයේ දී
මෝසෙස් සියලු ඉශ්රායෙලේ ජනයා අමතා කී
වචන මේ ය. මොවුන් සිටියේ සූප් නම් ස්ථානය
ඉදිරිපිට, පාරාන් ද තොපෙලේ ද ලාබාආන් ද
හශේරොත් සහ දී-සාහාබ් ද යන නගරවලට මැදි වූ
මිටියාවතහෙි ය. 2 හොරෙබ් සිට කාදෙෂ්-බර්නයේට
සේයිර් කඳුකර මාර්ගය ඔස්සේ ගමන් කිරීමට
එකොළොස් දවසක් ගත වේ. 3 සනෙඟට දැන්වීමට
සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අණ කළ සියල්ල,
ඔහු හතළිස් වන අවුරුද්දේ එකොළොස් වන
මාසයේ පළමු වන දින ඉශ්රායලේ ජනයාට කීවේ
ය. 4 ගණන් 21:21-35මයෙ වූයේ ඔහු හෙෂ්බොන්හි
වාසය කළ අමෝරිවරුන්ගේ රජ වූ සීහොන් ද
එද්රයෙ අසල අෂ්තාරොත්හි විසූ බාෂාන්හි රජ වූ
ඕග් ද පරාජය කළ පසු ය. 5 ජෝර්දාන් ගඟනේ
මගෙොඩ මෝවබ් දේශයේ දී මෝසෙස් දේව ආඥා
පහදා දීම මසෙේ ඇරඹී ය.
6 "අපේ දවේ සමිඳාණන් වහන්සේ හොරෙබ්
කන්දේ දී අපට මසෙේ කතා කළ සේක: 'නුඹලා
මේ කන්ද මත මතෙක් කල් විසුවා ඇත. 7 කඳවුර
ගලවා, ගමන අරඹා අමෝරිවරුන්ගේ කඳුකරයට ද
ඊට යාබද ව අසල්වැසියන් වසන මිටියාවතට සහ
කඳුකරයට ද තැනිතලාවට සහ දකුණු දිශාවට ද
මුහුදුබඩට හා කානානිවරුන්ගේ දේශයට ද
ලබෙනොන් රටට සහ මහා ගංගාව වන යුප්රටීස්
ගංගාව දක්වා ද යන්න. 8 බලන්න, මේ දේශය
නුඹලා ඉදිරියහෙි ඇත. සමිඳාණන් වහන්සේ
නුඹලාගේ ආදි පියවරුන් වූ ආබ්රහම්ට, ඊසාක්ට සහ
ජාකොබ්ට ද ඔවුන්ගනේ පසු ඔවුන්ගේ පළෙපතට ද
දනේනට පොරොන්දු වී දිවුළ දේශයට ඇතුළු වී එය
හිමි කරගන්න.' "

## ප්රධානීන් පත් කිරීම

(නික්ම 18:13-27)

9 "එකල මම ඔබට කතා කොට, 'ඔබ පිළිබඳ
වගකීම මට තනි ව දැරිය නොහැකි ය. 10 ඔබේ
දවේ සමිඳාණන් වහන්සේ ඔබ හැම වැඩි වර්ධනය
කළ සේක. පුදුමයකි! අද දින ඔබ හැම ගණනින්
අහසේ තරු හා සමාන ය. 11 ඔබේ පියවරුන්ගේ
දවේ සමිඳාණන් වහන්සේ ඔබ හැම තවත් දහස්
ගුණයකින් වැඩි වනේනට සලසා, උන් වහන්සේ
පොරොන්දු වූ ලසෙ ඔබට ආශීර්වාද කරන සේක.
12 ඔබ හැම පිළිබඳ වගකීම, කරදර හිරිහැර, වාද
විවාද මා තනි ව කසෙේ දරන්නට ද? 13 එබැවින්
නැණවත්, කාරණා කාරණා දන්න, අත්දැකීම් ඇති අය
ඔබගේ ගෝත්රවලින් තෝරාගන්න; ඔබ පාලනය
කරන පිණිස මම ඔවුන් පත් කරන්නමේ'යි කීවමේ.
14 ඔබ හැම ද මට පිළිතුරු දමේන්, 'ඔබ කී දේ අපට
වැඩදායක යැ'යි පැවසූ හ. 15 එවිට මම ඔබේ
ගෝත්ර නායකයන් අතර නැණවත්, කාරණා කාරණා
දන්න අයවලුන් ඔබ හැමගේ ප්රධානීන් වශයනේ
පත් කළෙමේ; සමහරකේ සහශ්රාධිපතීහු ද
සමහරකේ ශතාධිපතීහු ද සමහරකේ පණසාධිපතීහු
ද තවත් සමහරකේ දශාධිපතීහු ද වූ හ. තවද,
ගෝත්රයක් පාසා නිලධාරීන් ද පත් කළෙමේ.
16 "මම එකල ඔබේ විනිසකරුවන් අමතමින්,
'ඔබේ සනෙඟ අතර නඩු අසන ලසෙ ද යමකු සහ
ඔහුගේ අසල්වැසියා අතරත්, ඔහු සමඟ වසන
විදේශිකයා අතරත් යුක්තිය අනුව තීන්දුව දනේනට
ද 17 විනිශ්චය කරද්දී, මිනිසුන්ගේ තරාතිරම්
නොබලා, ලොකු කුඩා අයට එක සේ කන් දී,
තීන්දුව දවේයන් වහන්සේගනේ එන බැවින්
මිනිසුන්ට බිය නොවිය යුතු යයි ද දුෂ්කර නඩුවක්
ඇත්නම් මා එය අසන පිණිස මා වතෙ එය
ගනෙනේනට ඕනෑ බව ද කීවමේ. 18 මම ඔබ කළ
යුතු සියල්ල ගැන ඔබට උපදසේ දුනිමි.' "

## ඔත්තුකාරයන් යැවීම

(ගණන් 13:1-33)

19 "සමිඳාණන් වහන්සේ අපට වදාළ ලසෙ අපි ඉටු
කළෙමු. අපි හොරෙබ් කන්දනේ නික්ම
අමෝරිවරුන්ගේ කඳුකරයට යන මඟ ඔබ දුටු මහා,
රුදුරු පාළුකරය ඔස්සේ ගොස් කාදෙෂ්-බර්නයේ නම්
ස්ථානයට පැමිණියමෙු. 20 මම ද ඔබ අමතා, 'අපේ
දවේ සමිඳාණන් වහන්සේ අපට දනේනට යන
අමෝරිවරුන්ගේ කඳුකරයට ඔබ ආවහු ය.
21 මනේන, ඔබේ දවේ සමිඳාණන් වහන්සේ ඔබට
දනේනට යන දේශය ඔබ ඉදිරිපිට ඇත. ඔබේ
පියවරුන්ගේ දවේ සමිඳාණන් වහන්සේ ඔබට කී
පරිදි බිය නොවී, අධෛර්ය නොවී ගොස් එය උරුම
කරගන්නැ'යි ද කීවමේ.
22 "එවිට ඔබ සියල්ලෝ ම මා සමීපයට විත්, 'අප
කුමන මඟකින් යා යුතු ද අප පැමිණිය යුත්තේ
කුමන නගරවලට ද කියා වාර්තා කිරීමට, රට පිළිබඳ
ඔත්තු සොයා බලාගනු පිණිස අපට කලින් මිනිසුන්
යැවිය යුතු ය'යි කීවහු ය. 23 මම ද ඊට මුළු හිතින්
එකඟ වූයමේ. එක එක ගෝත්රයනේ එක්කනො
බැගින් මිනිසුන් දොළොස්දනෙකු තෝරාගතිමි.

24 ඔව්හු ද හැරී කඳුකරයට නැඟී, එෂ්කොල්
මිටියාවත දක්වා ගොස් එහි ඔත්තු බැලූ හ. 25 ඒ
රටේ පලතුරුවලින් ද සමහරක් අප වෙත ගෙනවුත්,
අපේ දෙවි සමිඳාණන් වහන්සේ අපට දෙන්නට යන
දේශය සාරවත් රටක් බව ද අපට සැළ කළ හ.
26 ද්වි.නී. 9:23; හබේරෙ 3:16 "එහෙත් ඔබ, ඔබේ
දෙවි සමිඳාණන් වහන්සේගේ අණට විරුද්ධ ව
කැරලි ගසමින් එහි යාමට කැමැත්ත නොදැක්වූ හ.
27 ඔබ ද කූඩාරම්වලට වී කොඳුරමින්, 'සමිඳාණන්
වහන්සේ අපට ද්වේෂ කරන බැවින්,
අමෝරිවරුන්ගේ බලයට අප පාවා දී අප මරනු
පිණිස මිසර දේශයෙන් අප පිටතට ගෙනා සේක.
28 අප එහි යා යුත්තේ මන් ද? එහි ගිය අය, ඒ
සෙනඟ අපට වඩා උස මහත සෙනඟක් බව ද,
ඔවුන්ගේ විශාල නගරවල ප්‍රාකාර අහස දක්වා
විහිදෙන බව ද, එහි දී අනාක්වරුන්ගේ පුතුන් වන
යෝධයන් දුටු බව ද කියමින් අපේ සිත්
අධෛර්යයට පත් කළ හ'යි කීවහු ය.
29 "මම එවිට ඔබ අමතමින්, 'තැති නොගන්න,
ඔවුන්ට බිය නොවන්න; 30 ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ ඔබ ඉදිරියෙහි යන සේක. මිසරයේ දී
ඔබ ඇස් ඉදිරියෙහි උන් වහන්සේ ඔබ වෙනුවෙන්
ඉෂ්ට කළ සියල්ල අනුව, උන් වහන්සේ ඔබ උදෙසා
සටන් කරන සේක. 31 ක්‍රියා 13:18තවද, පියකු
තම පුතුන් උසුලාගෙන යන්නාක් මෙන්, මේ ස්ථානය
දක්වා එන මුළු මාර්ගය ඔස්සේ ම ඔබේ දෙවි
සමිඳාණන් වහන්සේ පාළුකරයේ දී ඔබ උසුලාගෙන
පැමිණි අයුරු ඔබ දුටුවහු ය'යි කීවෙමි. 32 හබේරෙ
3:19එහෙත් මා කී දේ ගණන් නොගෙන, ඔබ, දෙවි
සමිඳාණන් වහන්සේ විශ්වාස නොකළහු ය.
33 කඳවුරු බැඳීම සඳහා ස්ථානයක් ඔබට සොයනු
පිණිස ඔබ ගිය මඟ උන් වහන්සේ ඔබට
පෙරටුවෙන් ගමන් කළ සේක. මෙලෙස උන්
වහන්සේ ඔබ යා යුතු මඟපෙන්වීම සඳහා රාත්‍රි
කාලයේ දී ගින්නක් මෙන් ද, දිවා කාලයේ දී
වලාකුළක් මෙන් ද ගමන් කළ සේක."

## ඉශ්‍රායලේවරුන්ට දඬුවම් දීම
(ගණන් 14:20-45)

34 හබේරෙ 3:18 "සමිඳාණන් වහන්සේ ඔබේ
මැසිවිලි අසා, උදහස් වී දිවුරමින්, 35 'මා ඔවුන්ගේ
පියවරුන්ට දෙන්නට දිවුරා පොරොන්දු වූ ඒ සාරවත්
රටට මේ දුෂ්ට පළෙපතට අයිති කිසි ම කෙනෙක්
ඇතුළු නොවන්නෝ ය. 36 එහෙත්, ජෆුන්නේගේ
පුත් කාලබ් පමණක් ඊට ඇතුළු වන්නේ ය;
ස්වාමීන් වන මට ඔහු සම්පූර්ණයෙන් අවනත වූ
බැවින් ඒ රටේ පස් පෑගූ ඔහුටත්, ඔහුගේ
දරුවන්ටත් මම එය දෙන්නෙමි'යි වදාළ සේක.
37 ඔබ හැම නිසා සමිඳාණන් වහන්සේ මා සමඟ ද
කිපී, 'ඔබත් එහි ඇතුළු නොවන්නෙහි ය; 38 එහෙත්
ඔබ සමඟ සිටින නූන්ගේ පුත් ජෝෂුවා එහි
ඇතුළුවන්නේ ය; ඔහු දිරි ගන්වන්න;
ඉශ්‍රායලේවරුන්ට එම දේශය උරුම කරගන්නට ඔහු
සලසනු ඇතැ'යි වදාළ සේක.
39 "තවදුරටත් උන් වහන්සේ කතා කරමින්,
'මොවුන් සතුරන්ට ගොදුරු වනු ඇතැ යි ඔබ සිතූ
සිඟිති දරුවන් ද, එකල හොඳ නරක නොදත් ඔබේ
දරුදැරියන් ද එහි ඇතුළු වනු ඇත. මා ඒ දේශය
ඔවුන්ට දුන් පසු එය ඔව්හු අයිති කරගන්නෝ ය.
40 එහෙත්, ඔබ හැම නැවත හැරී, රතු මුහුදට යන
පාර වැටී ඇති පාළුකරයට ගමන් කරන්නැ'යි වදාළ
සේක."

## ඉශ්‍රායලේවරුන් පරාජය කිරීම

41 "ඔබ පිළිතුරු දෙමින්, 'ඔව්, අපි සමිඳාණන්
වහන්සේට විරුද්ධ ව පව් කළෙමු. අපේ දෙවි
සමිඳාණන් වහන්සේ අපට අණ කළ පරිදි අපි ගොස්
සටන් කරන්නෙමු'යි කීවහු ය. ඉන්පසු ඔබ සියල්ලෝ
යුද්ධායුධ ගෙන සන්නාහ සන්නද්ධ වූ පසු කඳුකරයට
යෑමට පහසු ය කියා සිතුවහු ය.
42 "එවිට සමිඳාණන් වහන්සේ මට කතා කොට,
'ඔවුන්ට නොයන්නටත්, සටන් නොකරන්නටත්
කියන්න. මන්ද, මා ඔබ සමඟ වැඩ නොසිටින
බැවින් ඔබේ සතුරන් ඔබ පරාජය කරනු ඇතැ'යි
වදාළ සේක. 43 මම ද ඔබට එය සැළ කළෙමි.
එහෙත්, ඔබ ඊට කන් නොදී සමිඳාණන්
වහන්සේගේ අණට විරුද්ධ ව කැරලි ගසමින්
හිතුවක්කාරකමින් කඳුකරයට ගමන් කළහු ය.
44 එවිට කඳුකරයේ විසූ අමෝරිවරු මීමැසි රැළක්
සේ ඔබට විරුද්ධ ව පැමිණ, ඔබ ලුහුබැඳ ගොස්
සේයිර් දේශයේ හෝර්මා නම් ස්ථානයේ දී ඔබ
පරාජය කළෝ ය. 45 ඉන්පසු ඔබ ආපසු හැරී අවුත්
සමිඳාණන් වහන්සේ අබිමුව හැඬූ නමුත්, උන්
වහන්සේ ඔබේ ඉල්ලීම නොසලකා, ඔබට සවන්
නුදුන් සේක. 46 මෙලෙසෙ ඔබ සිතූ හැටියට ම
බොහෝ කාලයක් කාදෙෂ්හි වාසය කළහු ය."

## පාළුකරයේ ගත කළ කාලය

2 ගණන් 21:4 "ඉන්පසු සමිඳාණන් වහන්සේ
මට කී පරිදි, අපි හැරී රතු මුහුදට යන පාර
වැටී ඇති පාළුකරය ඔස්සේ ගමන් කළෙමු. සේයිර්
කඳුකරයෙහි අප බොහෝ කලක් සංචාරය කළ පසු
2 සමිඳාණන් වහන්සේ මට කතා කොට, 3 'නුඹලා
බොහෝ කලක් මේ කඳුකරයෙහි සංචාරය කළහු ය.
දැන් උතුරු දිශාවට හැරෙන්න. 4 උත් 36:8නුඹ ද
සෙනඟට අණ කරමින් මෙසේ කියන්න: ඔබේ
ඥාතීන් වූ ඒසව්ගේ පළෙපත පදිංචි වී සිටින සේයිර්
නම් දේශය ඔස්සේ ඔබ යා යුතු ය. ඔවුන් ඔබට
බිය වනු ඇත. එබැවින් ප්‍රවේසම් වන්න. 5 ඔවුන්
කුපිත නොකරන්න. ඔවුන්ගේ දේශයෙන්
අඟලක්වත් මම ඔබට නොදෙන්නෙමි. මන්ද, සේයිර්
කඳුකරය මා ඒසව් සන්තක කොට දුන් බැවිනි.
6 ඔබට කෑම පිණිස මුදල් ගෙවා ආහාර ද බීම
පිණිස මුදල් ගෙවා වතුර ද ඔවුන්ගෙන් ගත හැකි
ය'යි වදාළ සේක. 7 ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ ඔබ කළ සියල්ලෙහි දී ඔබට ආශීර්වාද
කළ සේක. මේ මහා පාළුකරය මැදින් ඔබ ගිය

ගමන උන් වහන්සේ දන්නා සේක. මේ අවුරුදු
හතළිහ ම උන් වහන්සේ ඔබ සමඟ වැඩ සිටිය
බැවින් ඔබට කිසි ම අග හිඟයක් නො වී ය.
8 “අපි ද අපගේ ඥාතීන් වූ ඒසව්ගේ පළෙපත
පදිංචි සේයිර් කඳුකරය පසු කොට, ඒලත් සහ
එශියොන්-ගබෙරේ නම් ස්ථානවලින් මිටියාවත
ඔස්සේ ගොස්, යළි හැරී මෝවබ්හි පාළුකරය මැදින්
ගියමු.
9 උත් 19:37 “සමිඳාණන් වහන්සේ මා අමතා,
‘මෝවබ්වරුන්ට හිරිහැර නොකරන්න, සටනට ඔවුන්
නොපොළඹවන්න. මා ආර් නම් දේශය ලොත්ගේ
පළෙපතට සතු කොට දනෙ බැවින්, ඔවුන්ගේ රටින්
කිසිවක් මම නුඹට අයිති කොට නොදනේනමේ’යි
වදාළ සේක.
10 “අනාක්වරුන් හා සමාන, බලසම්පන්න, ගණනින්
බොහෝ වූ, උස මහත සනෙඟක් වන ඒම්වරු පරෙ
කාලයේ දී එහි විසූ හ. 11 අනාක්වරුන් මනේ ඔව්හු
ද රපොයිම් යෝධයෝ යයි හඳුන්වනු ලැබූ හ.
එහතේ මෝවබ්වරුන් ඔවුන්ට කීවේ ඒම්වරු කියා ය.
12 සේයිර්හි පරෙ කල හෝරිවරු පදිංචි වූ හ.
සමිඳාණන් වහන්සේ ඉශ්රායලේවරුන්ට අයිති කොට
දුන් දේශයට, ඉශ්රායලේවරුන් කළ පරිදි, ඒසව්ගේ
පළෙපත ද හෝරිවරුන් පන්නා දමා, ඔවුන් වනසා,
එහි පදිංචි වූ හ.
13 “උන් වහන්සේ තවදුරටත් කතා කරමින්, ‘දැන්
නැඟිට, ශරෙදේ නම් නදියනේ එතරෙ වන්නැ’යි වදාළ
සේක. අපි ද එම නදියනේ එගොඩ වූයමු.
14 ගණන් 14:28-35කාදෙෂ්-බර්නේය නම් ස්ථානයනේ
නික්මුණු දා සිට ශරෙදේ නම් නදියනේ එගොඩ වන
තකේ ගත වූ කාලය අවුරුදු තිස්අටකි. සමිඳාණන්
වහන්සේ දිවුළ පරිදි ඒ කාලය තුළ ඒ පළෙපතට
අයත් මුළු හට හමුදාව නැසී ගියේ ය. 15 ඔවුන්
නැත්තට ම නැති වන තකේ හමුදාවනේ ඔවුන්
වනසාලීම පිණිස සමිඳාණන් වහන්සේ ඔවුන්ට
විරුද්ධ ව නැඟී සිටිය සේක.
16 “මලෙසෙ සනෙඟ අතරනේ මුළු හට හමුදාවේ
සියල්ලන් නැති නාස්ති වී වැනසී ගිය පසු,
17 සමිඳාණන් වහන්සේ මට කතා කොට, 18 ‘අද
නුඹ ආර් නම් පදෙසෙ ඔස්සේ මෝවබ් දේශය
මැදින් යා යුතු ය. 19 උත් 19:38නුඹ අම්මොන්ගේ
පරපුරට අයිති අයගේ දේශය සමීපයට පැමිණි කල
ඔවුන්ට හිරිහැර නොකරන්න, ඔවුන් කුපිත
නොකරන්න. මා ඔවුන්ගේ රට ලොත්ගේ පළෙපතට
අයිති කොට දී තිබනෙ බැවින් මම ඔවුන්ගේ රටින්
අඟලක්වත් නුඹට නොදනේනමේ’යි වදාළ සේක.
20 “එය ද රපොයිම්වරුන්ගේ රට මනේ ගණන්
ගැණිනි. පරෙ කාලවල දී රපොයිම් යෝධයෝ එහි
විසූ හ. අම්මොන්වරු ඔවුන්ට සම්සුම්මිවරු යයි නම්
කළහ. 21 අනාක්වරුන් මනේ ඔව්හු ද බලසම්පන්න,
ගණනින් බොහෝ වූ, උස මහත සනෙඟක් වූ හ.
එහතේ, සමිඳාණන් වහන්සේ ඔවුන් වනසා ලූ නිසා,
අම්මොන්වරු එම රට අල්ලාගනෙ එහි පදිංචි වූ හ.
22 සමිඳාණන් වහන්සේ හෝරිවරුන් වනසා,
සේයිර්හි පදිංචි වූ ඒසව්ගේ පළෙපතට කළ පරිදි,
මොවුන්ටත් කළ සේක. ඔවුන් රට අල්ලාගත් බැවින්
අද දක්වා එහි පදිංචි වී ඇත. 23 ක්රීට් දූපතේ සිට
පැමිණි වාසීහු ද, දකුණු දිග පිහිටි ගාසා දක්වා විසූ
අව්විවරුන් වනසා, එම රටේ පදිංචි වූ හ.
24 “සමිඳාණන් වහන්සේ තවදුරටත් කතා කරමින්,
‘නැඟිට, ගමන අරඹා, අර්ණොන් නදියනේ එතරෙ
වන්න. මනේන, හෙෂ්බොන්හි රජ වූ අමෝරි ජාතික
සීහොන් ද ඔහුගේ රට ද මම නුඹේ බලයට දුනිමි.
එය සතු කරගනු පිණිස සටන් අරඹා පහර දනේන.
25 මම අද දින මුළු පොළෙෝ තලයහෙි සිටින සියලු
ජාතීන් තුළ නුඹ නිසා තැති ගැන්ම සහ භීතිය ඇති
කරමි. නුඹ ගැන ඇසූ විට, ඔව්හු බියනේ ඇළලී
කැළඹනේනෝ ය’යි වදාළ සේක.”

### සීහොන් රජුගේ පරාජය
(ගණන් 21:21-30)

26 “මම ද කදෙමෝත් පාළුකරයේ සිට
හෙෂ්බොන්හි රජ වූ සීහොන් වතෙ සාමකාමී වචන
සහිත ව පණිවුඩකාරයන් යවමින්, 27 ‘ඔබේ දේශය
මැදින් මට යන්නට අවසර දුන මැනව. මම මහ
මාවත ඔස්සේ යමින් දකුණට හෝ වමට හෝ
නොහැරනේනමේ. 28 කන්නට ආහාර ද බොන්නට
වතුර ද මුදලට දුන මැනව. මම දේශය මැදින් පයින්
ම යමින්, 29 අපේ දවේ සමිඳාණන් වහන්සේ අපට
දනේනට යන රටට, ජෝර්දාන් ගඟනේ එතරෙ
වන්නමේ. සේයිර්හි පදිංචි ඒසව්ගේ පළෙපත ද
ආර්හි පදිංචි මෝවබ්වරු ද අපට එසේ යන්නට
අවසර දුන්නෝ ය’යි කීවමේ.
30 “එහතේ හෙෂ්බොන්හි රජ වූ සීහොන් අපට
දේශය මැදින් යන්නට අවසර නුදුන්නේ ය. එසේ
නුදුන්නේ ඔබේ දවේ සමිඳාණන් වහන්සේ ඔහු
ඔබේ බලයට පාවා දනෙු පිණිස, උන් වහන්සේ
ඔහුගේ සිත දැඩි ලසෙ මුරණ්ඩු කළ නිසා විය හැක.
31 “එවිට සමිඳාණන් වහන්සේ මා අමතා ‘මනේන,
සීහොන් රජු සහ ඔහුගේ දේශය මම නුඹට
දනේනට පටන්ගතිමි. එම දේශය අල්ලාගනෙ, උරුම
කරගන්නැ’යි වදාළ සේක. 32 සීහොන් ද ඔහුගේ
මුළු සනෙඟ ද අපට විරුද්ධ ව සටන් අරඹා යහශ්
නම් ස්ථානයට පැමිණියෝ ය. 33 දවේ සමිඳාණන්
වහන්සේ ඔහු අපට පාවා දුන් සේක. අපි ද ඔහුටත්,
ඔහුගේ දරුවන්ටත්, සියලු සනෙඟටත් පහර
දුන්නමු. 34 ඒ දවස්හි අපි ඔහුගේ සියලු නගර
අල්ලාගනෙ, ඒවා සියල්ලහෙි ම විසූ ස්ත්රී-පුරුෂ
දපෙක්ෂය ද සිඟිති දරුවන් ද සම්පූර්ණයනේ ම
වනසා දැම්මමු. ඔවුන්ගනේ එක් කනෙකෙු වත්
ඉතුරු නොකළෙමු. 35 අපගේ ම ප්රයෝජනයට අපි
ගවමහිෂයන් පැහැරගනෙ, අල්ලාගත් නගරවලින්
වස්තුව කොල්ලකෑවමු. 36 අර්ණොන් ගං තරෙ
පිහිටි අරෝයරේ පටන් ගිලියද් දක්වා ගඟ අද්දර වූ
නගරය ඇතුළු සියලු ම නුවරවල් අල්ලාගැනීමට
අපේ දවේ සමිඳාණන් වහන්සේ සැලැසූ සේක. අපට
අල්ලාගන්නට නොහැකි තරම් උස් වූ එක ම
නගරයක් වත් නො වී ය. 37 එහතේ, අම්මොන්ගේ
පළෙපත පදිංචි දේශයට වත්, ජබ්බොක් ගඟ

අසබඩ කිසි ම ස්ථානයකට වත්, කඳුකරයේ කිසි ම
නුවරකට වත්, අපේ දෙවි සමිඳාණන් වහන්සේ
තහනම් කළ කිසි ම තැනකට වත් අපි නොගියමු.”

### බාෂාන්හි රජුගේ පරාජය
(ගණන් 21:31-35)

3 “ඉන්පසු අපි එතැනින් හැරී බාෂාන් දක්වා වැටී
තිබූ මාර්ගය ඔස්සේ ගියමු. එවිට බාෂාන්හි
රජ වූ ඕග් ද ඔහුගේ මුළු සෙනඟ ද එද්‍රයි නම්
ස්ථානයේ දී අප සමඟ සටනට පැමිණියහ.
2 සමිඳාණන් වහන්සේ මා අමතා, ‘ඔහුට බිය
නොවන්න. ඔහුත්, ඔහුගේ මුළු සෙනඟත්, රටත්
නුඹේ බලයට මම පාවා දෙන්නෙමි. හෙෂ්බොන්හි
පදිංචි වූ අමෝරිවරුන්ගේ රජු වන සීහොන්ට නුඹ
කළ පරිදි, මොහුටත් කළ යුතු ය’යි වදාළ සේක.
3 “මෙලෙසෙ අපේ දෙවි සමිඳාණන් වහන්සේ
බාෂාන්හි රජ වූ ඕග් ද ඔහුගේ සියලු සෙනඟ ද
අපේ බලයට පාවා දුන් සේක. අපි ඔවුන්ගෙන් එක්
කෙනෙකු වත් ඉතුරු නොවන තුරු ඔවුන්ට පහර
දුනිමු. 4 තවද, එකල අපි ඔවුන්ගේ නගරවලින්
එකක් වත් නෑර, නගර සියල්ල ම අල්ලා ගතිමු.
එනම්, නගර හැටක් සහිත බාෂාන්හි රජකම් කළ
ඕග් රජුගේ රාජධානිය වූ, මුළු අර්ගොබ් පළාත ම
අල්ලා ගතිමු. 5 මේ නගර සියල්ල ම අගුල් දැමූ
වාසල් දොරටු සහිත උස් වූ ප්‍රාකාරවලින් සුරක්ෂිත
වී තිබිණි. තවද, ප්‍රාකාරවලින් වට නොවූ නගර
ගණනාවක් ද අල්ලා ගතිමු. 6 හෙෂ්බොන්හි රජු වූ
සීහොන්ට කළ ලෙසෙ අපි මේ නගර සෑම එකක ම
විසූ ස්ත්‍රී පුරුෂයන් ද සිඟිති දරුවන් ද නැත්තට ම
වනසා දැමීමු. 7 එහෙත්, ගවමහිෂයන් සියල්ලන් හා
නගරවලින් කොල්ලකෑ සම්පත අපේ ම
ප්‍රයෝජනයට තබාගත්තෙමු.
8 “තවද, අපි එකල අර්ණොන් ගංගාවේ සිට
හෙර්මොන් කන්ද දක්වා ජොර්දාන් ගඟින් මෙගොඩ
දේශය අමෝරිවරුන්ගේ රජවරුන් දදෙනාගෙන්
පැහැර ගත්තෙමු. 9 හෙර්මොන් කන්දට සීදොන්වරු
සිරියොන් කියා ද අමෝරිවරු සෙනීර් කියා ද කියති.
10 අපි බාෂාන්හි රජ වූ ඕග්ගේ රාජධානියට අයත්
මිටියාවතේ වූ සියලු නගර ද, සලකො සහ එද්‍රයි
යන නගර දක්වා මුළු ගිලියද් ප්‍රදේශය හා බාෂාන්
ප්‍රදේශය ද අල්ලා ගතිමු.
11 “ඉතුරු වූ රෙපොයිම් යෝධයන්ගෙන් එතෙක්
පණපිටින් සිටියේ බාෂාන්හි රජු වූ ඕග් පමණකි.
ඔහුගේ මිනිය තැබූ ඇඳ යකඩවලින් සෑදූ එකකි.
අම්මොන්වරුන්ගේ පෙළපතට අයත් නගරයක් වූ
රබ්බාහි එය අද දක්වා ඇත. සම්මත මිනුම අනුව
එහි දිග මීටර් හතරකි, පළල මීටර් දෙකෙකි.”

### ජොර්දානෙන් මෙගොඩ පදිංචි වූ ගෝත්‍ර
(ගණන් 32:1-42)

12 “අපි දේශය අයිති කරගත් විට, අර්ණොන් නදී
ගං තෙර වූ අරෝයෙර් සිට විහිදී ගිය කොටස ද
ගිලියද් කඳුකරයේ බාගයක් ද එහි නගර ද
රූබන්ගේ සහ ගාද්ගේ පෙළපත්වල අයට දුනිමු.
13 ගිලියද් දේශයෙන් ඉතිරි කොටස ද ඕග් රජුගේ
රාජධානිය වන මුළු බාෂාන් ප්‍රදේශය, එනම්, මුළු
අර්ගොබ් ප්‍රදේශය, මම මනස්සේගේ අර්ධ
ගෝත්‍රයට දුනිමි. මුළු බාෂාන් ප්‍රදේශය රෙපොයිම්
යෝධයන්ගේ දේශය යයි කියනු ලැබේ.
14 මනස්සේගේ පුත් ජයීර් නමැත්තා,
ගෙෂූර්වරුන්ගේ ද මාකාත්වරුන්ගේ ද සීමා දක්වා
සම්පූර්ණ අර්ගොබ් පළාත, එනම්, බාෂාන් පළාත
අල්ලාගෙන, ඊට තමාගේ ම නම දෙමින් හව්වොත්-
ජායීර් කියා නම් තැබී ය. අද දක්වා ඒ නම පවතී.
15 “ගිලියද් දේශය මම මාකීර්ට දුනිමි.
16 රූබන්ගේ සහ ගාද්ගේ පෙළපත්වලට මම ගිලියද්
සිට අර්ණොන් නදිය දක්වා වූ ප්‍රදේශය දුනිමි.
ගංගාවේ මැද එක සීමාවක් විය. අම්මොන්වරුන්ගේ
පෙළපතට අයත් දේශ සීමාව අසලින් ගලා ගිය
ජබ්බොක් ගඟ එක සීමාවක් විය. 17 කින්නරෙතේ
නම් ස්ථානයේ සිට පෙරෙදිගින් වූ පිස්ගා නම් කඳු
පාමුල පිහිටි මළ මුහුදේ වෙරළ අසබඩ වූ මිටියාවත
සහ ජොර්දාන් ගඟ තවත් සීමාවක් විය.
18 ජෝෂු 1:12-15 “මම එකල ඔබට කතා කොට,
‘ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබට අයිති
කරගැන්මට මෙරට දුන් සේක. එබැවින් සටනට යන
භටයන් සන්නාහ සන්නද්ධ වී, සෙසු ඉශ්‍රායලේ
ජනයාට පෙරටුවෙන් යා යුතු ය. 19 එහෙත්, ඔබේ
භාර්යාවන් ද සිඟිති දරුවන් ද මා දන්නා පරිදි ඔබ
සතු බහුල ව සිටින ගවමහිෂයන් ද මා ඔබට දුන්
නගරවල නැවතී සිටිය යුතු ය. 20 සමිඳාණන්
වහන්සේ ඔබට මෙන් ම, ඔබේ සෙසු ජනතාවට ද
විවේකය දෙන තෙක්, ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ ජොර්දානෙන් එතෙර ඔබට දුන් දේශය
ඔබ භටයන් අයිති කරගන්නා තෙක් ඔබ එලෙසෙ
නැවතී සිටිය යුතු ය. ඉන්පසු මා ඔබට දුන් දේශයට
සියල්ලන් ම හැරී ආ යුතු ය’යි කීවෙමි.
21 “එකල මම ජෝෂුවාට කතා කොට, ‘ඔබේ දෙවි
සමිඳාණන් වහන්සේ අන් රජුන් දදෙනාට කළ දේ
දෑසින් ම ඔබ දුටුවෙහි ය. ඔබ ආක්‍රමණය කරන
සියලු රාජධානිවලට උන් වහන්සේ එලෙසෙ කරන
සේක. 22 ඔබ ඔවුන්ට බිය නොවිය යුතු ය. ඔබේ
දෙවි සමිඳාණන් වහන්සේ ඔබ උදෙසා සටන් කරන
සේකැ’යි කීවෙමි.”

### පොරොන්දු දේශයට යන්නට මෝසෙස්ට අවසර නොදීම

23 ගණන් 27:12-14; ද්වි.නී. 32:48-52 “එවිට මම
සමිඳාණන් වහන්සේට බැගෑපත් ව යාච්ඤා කරමින්,
24 ‘මහෝත්තම දෙවි ස්වාමීනි, ඔබේ ශ්‍රේෂ්ඨත්වය
ද බාහු බලය ද ඔබේ සේවකයා හට පෙන්වීමට
ඔබ පටන්ගෙන තිබේ. ඔබ සේ දස්කම් හා විස්කම්
අනුව ක්‍රියා පෑමට සමත් අන් කවර දෙවි කෙනෙකේ
සගලොව හෝ නරලොව හෝ සිටිත් ද? 25 එබැවින්
ජොර්දාන් ගඟින් එගොඩ වී, එතෙර ඇති සරුසාර
රට ද දැකුම්කලු කඳුකරය ද ලෙබනොන් දේශය ද

දැකගැනීමට මට කරුණාකර අවසර දෙනු මැනව'යි
ඉල්ලීමි.
26 "එහෙත්, සමිඳාණන් වහන්සේ ඔබ නිසා මා
සමඟ කිපී, මා කී දේ'ට සවන් නුදුන් සේක. උන්
වහන්සේ මට කතා කොට, 'දැන් නුඹ කතා කළා
ඇති, මේ කරුණ මින්පසු මට සඳහන් නොකරන්න.
27 පිස්ගා කඳු ශිඛරයට නැඟ, පරෙ අපර දදිග ද
උතුර හා දකුණ ද හිස ඔසවා බලා මැනවින්
නරඹන්න. ජෝර්දාන් ගඟින් ඔබ එතරෙ නොවනු
ඇත. 28 ජෝෂුවාට වගකීම පවරා ඔහු ධෛර්යවත්
කර ශක්ති සම්පන්න කරන්න. ඔහු මේ සෙනඟට
පෙරටුවෙනේ ගොස්, ඔබ දකින දේශය ඔවුන්ට උරුම
කරගැනීමට සලසනු ඇතැ'යි වදාළ සේක.
29 "එවිට අපි බෙත්-පයෝර් නම් නගරය ඉදිරිපිට
වූ මිටියාවතෙහි පදිංචි වී සිටියෙමු."

### ඉශ්‍රායලේවරුන්ට උපදෙස් දීම

4 මෝසෙස් ඉශ්‍රායලේවරුන්ට කතා කොට
මෙසේ කී ය: "ඔබේ පියවරුන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේ ඔබට දෙන්නට යන දේශයට
ඇතුළු වී, එය අයිති කරගෙන, එහි ජීවත් වන
පිණිස, ඔබ විසින් ඉටු කළ යුතු, මා ඔබට උගන්වන
නීති හා නියෝගයන්ට, ඉශ්‍රායලේවරුනි, දැන් ඉතින්
සවන් දෙන්න. 2 එළිද 22:18-19මා ඔබට අණ කළ
ඔබේ දෙවි සමිඳාණන් වහන්සේගේ නීති හා
නියෝගවලට අමතර වචනයක් එකතු නොකර,
ඒවායින් කිසිවක් අඩු නොකර, ඔබ ඒවා පිළිපැදිය
යුතු ය. 3 ගණන් 25:1-9බාල්-පයෝර්හි සිද්ධියට
අදාළ ව සමිඳාණන් වහන්සේ කළ දේ ඔබේ දෑසින්
ම ඔබ දුටුවහු ය. පයෝර්හි දී බාල් නම් දෙවියා
අනුගාමී වූ සියල්ලන් ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ ඔබ අතරෙන් වනසා ලූ සේක. 4 එහෙත්,
ඔබගේ දෙවි සමිඳාණන් වහන්සේ'ට පක්ෂපාත ව
සිටි ඔබ සියල්ලෝ අද පණපිටින් සිටින්නහු ය.
5 "මාගේ දෙවි සමිඳාණන් වහන්සේ මට අණ කළ
පරිදි මම ඔබ හට නීති හා නියෝග ඉගැන්වීමි. ඔබ
අයිති කරගන්නට යන රටට ඔබ ගිය පසු ඒවා
පිළිපැදිය යුතු ය. 6 ඒවා ආරක්ෂා කරමින් පිළිපදින්න.
මෙසේ කිරීමෙන් සෙසු ජාතීන් ඉදිරියෙහි ඔබේ
පැණවත්කමත්, නැණවත්කමත් කැපී පෙනෙනු ඇත.
මේ නීති සියල්ල ගැන ඔවුන්ට සැළ වන විට, 'මේ
ශ්‍රේෂ්ඨ ජාතියට අයිති සෙනඟ කෙතරම් පැණවත්
ද නැණවත් ද' කියා ඔවුන් විස්මපත් වනු ඇත.
7 "අපේ දෙවි සමිඳාණන් වහන්සේගෙන් අප
අයැදින සියල්ලෙහි දී, උන් වහන්සේ අපට ළං ව
සිටින්නාක් මෙන් වෙන කිනම් ශ්‍රේෂ්ඨ ජාතියකට
දෙවි කෙනෙක් ළං ව සිටින්නේ ද? 8 මා අද දින ඔබ
ඉදිරියෙහි තැබූ මේ සියලු නීති මෙන් සාධාරණ නීති
හා නියෝග වෙන කිනම් ශ්‍රේෂ්ඨ ජාතියක් සතු ව
පවතී ද? 9 පරෙස්සම් වන්න! ඔබේ ඇසින් ඔබ දුටු
දේවල් අමතක නොවන පිණිසත්, දිවි ඇති තාක්
ඒවා ඔබේ සිතින් පහ වී නොයන පිණිසත්, ඒවා
මැනවින් සලකා බලන්න. ඒවා ඔබේ දරුවන්ටත්,
දරුවන්ගේ දරුවන්ටත් කියා දෙන්න. 10 එසේ
ඉගැන්විය යුතු කරුණු නම් ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ අබිමුව හොරෙබ් කඳු මුදුනේ ඔබ සිටි
දින ගැන ය. එදින උන් වහන්සේ මට කතා කොට,
'සෙනඟ රැස් කරන්න. මාගේ වචන මම ඔවුන් හට
ඇසෙන්නට සලස්වමි. එවිට ඔවුන් මිහි පිට දිවි ඇති
තාක් මට ගරුබිය දැක්වීමට ඉගෙන ගනු ඇත. එසේ
කිරීමට ඔවුන්ගේ දරුවන්ට ද උගන්වනු ඇතැ'යි
වදාළ සේක.
11 නික්ම 19:16-18; හෙබ්‍රෙ 12:18-19 "ඔබ කඳු
පාමුලට වීත් සිටගත්තහු ය. කන්ද ගිනිගෙන
ඇවිලමින්, ඒ ගින්න අහස් කුසට බුර බුරා නැංගේ
ය. අඳුරු වලා පටල නිසා කන්ද සනාන්ධකාරයෙන්
වැසිණි. 12 සමිඳාණන් වහන්සේ ගින්න මැද වැඩ
සිට ඔබට කතා කළ සේක. ඔබ කටහඬක් ඇසූ
නමුත් රූපයක් නුදුටුවහු ය. ඔබට ඇසුණේ කටහඬ
පමණ ය. 13 නික්ම 31:18; 34:28; ද්වි.නී. 9:10ඔබට
පිළිපැදීමට උන් වහන්සේ නියම කළ උන්
වහන්සේගේ ගිවිසුම වන දස පණත ඔබ හට
ප්‍රකාශ කළ සේක; ගල් පුවරු දෙකෙක ඒවා ලියා දුන්
සේක. 14 නික්ම 21:1තවද, ඔබ අයිති කරගැනීමට
යන දේශයේ දී ඔබ පිළිපැදිය යුතු නීති හා නියෝග
මා ඔබට උගන්වන පිණිස සමිඳාණන් වහන්සේ මට
අණ කළ සේක."

### රූප වන්දනාව ගැන අනතුරු ඇඟවීම

15 "එබැවින් ඔබ හැම සුපරීක්ෂාකාරී ව සිටිය යුතු
ය. සමිඳාණන් වහන්සේ ගිනි මැද සිට හොරෙබ්
කන්ද මුදුනේ දී ඔබ හැම අමතූ විට ඔබ කිසි
රූපාකාරයක් නුදුටුවහු ය. 16 නික්ම 20:4; ලෙවී 26:1;
ද්වි.නී. 5:8; 27:15එබැවින් ඔබ පවට නොවැටෙන
පිණිස කිසි ම නළෙ පිළිමයක් වත්, ස්ත්‍රියකට හෝ
පුරුෂයකුට හෝ සමාන කිසි ම රූපයක් වත්,
17 රෝම 1:23මිහි පිට සිටින සතකුට හෝ අහස්
කුස පියාඹන පක්ෂියකුට හෝ සමාන රූපයක් වත්,
18 පොළොවේ බඩගා යන උරගයකුට හෝ
ජලයෙහි හැසිරෙන මත්ස්‍යයකුට හෝ සමාන
රූපයක් වත් නොසෑදිය යුතු ය. 19 ඔබ අහස දෙසෙ
හිස ඔසවා, එහි ඇති ඉර, හඳ, තාරකා සහ සියලු
ආකාශ වස්තු දකින විට ඒවාට වන්දනා නමස්කාර
කිරීමට ඇදී නොයන්න. ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ ඒවා දී ඇත්තේ මිහි පිට සෙසු සියලු
ජාතීන් සඳහා ය. 20 නික්ම 19:5; ද්වි.නී. 7:6; 14:2;
26:18; තීතස් 2:14; 1 පේදු 2:9එහෙත්, ඔබ ගැන
කිව යුතු දේ නම්, යකඩ ගිනි උදුනක් වැනි
මිසරයෙන් සමිඳාණන් වහන්සේ ඔබ පිටතට
ගෙනාවේ, ඔබ හැම අද දින සිටින්නාක් මෙන් උන්
වහන්සේගේ ම උරුමය වූ සෙනඟක් වනු පිණිස ය.
21 ගණන් 20:12 "තවද, උන් වහන්සේ ඔබ නිසා
මා සමඟ කිපී ජෝර්දාන් ගඟෙන් මට එතරෙ
වීමටත්, ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබට
උරුම කොට දෙන්නට යන සරුසාර දේශයට මට
ඇතුළු වීමටත් ඉඩ නොදෙන බවට දිවුළ සේක.

22 මට ජොර්දාන් ගඟනේ එතරෙ වන්නට ඉඩ
නොලැබෙන්නේ ය, මරෙට මැරෙන්නට මට සිදු වේ.
එහෙත්, ඔබ නම් ගඟනේ එතරෙ වී ඒ සරුසාර රට
අයිති කරගන්නහු ය. 23 ඔබේ දවේ සමිඳාණන්
වහන්සේ ඔබ සමඟ කරගත් ගිවිසුම අමතක
නොකරන ලසෙටත්, උන් වහන්සේ ඔබට තහනම්
කළ නළෙ පිළිමයක් හෝ වනෙ කිසිවකට සමාන
රූපයක් හෝ නොසාදන ලසෙටත් ප්‍රවසේම් වන්න.
24 හබේරෙ 12:29මන්ද, ඔබේ දවේ සමිඳාණන්
වහන්සේ ගින්නකි, ප්‍රතිවාදීන් නොඉවසන දවේ
කනෙකේ.
25 “ඔබ දරුවන් ද දරුවන්ගේ දරුවන් ද ලබා,
බොහෝ කාලයක් එම රටහෙි විසූ පසු, නළෙ පිළිම
හෝ යම්කිසි රූපයක් හෝ සාදා පවට වැටමේන් ඔබ
දවේ සමිඳාණන් වහන්සේ ඉදිරියහෙි නපුර කොට
උන් වහන්සේ කුපිත කළහොත් 26 මම එදින ඔබට
විරුද්ධ ව සාක්ෂියක් වශයනේ අහසත්, පොළොවත්
කැඳවා ඔබ අයිති කරගන්නට යන ජොර්දාන්
ගඟනේ එතරෙ රටින් ඔබ හැම සහමුලින් ම
වනසාලන හැටියට දිවුරා කියමි. එම රටහෙි ඔබ
වැඩි කල් ජීවත් නොවනු ඇත. ඔබ සහමුලින් ම
වැනසනෙු ඇත. 27 ද්වි.නී. 28:36සමිඳාණන් වහන්සේ
ඔසෙු ජාතීන් අතරහෙි ඔබ හැම විසුරුවා දමන
සේක. උන් වහන්සේ ඔබ ගනෙ යන විජාතීන්
අතරහෙි ඔබ ගණනින් ඉතා ස්වල්ප දනෙකෙු
වශයනේ ඉතිරි වන්නාහු ය. 28 එහි දී ඔබ හැම
ලීයනේ සහ ගලින් නළෙ මිනිස් අත්කම්වල ප්‍රතිඵල
වන, කිසිත් නොදකින, නොවළඳන, ගඳ සුවඳ
නොදැනනෙ, දවේ දවේතාවන්ට වැඳුම්පිදුම්
කරන්නහු ය. 29 ජරෙ 29:13එහෙත්, එහි දී ඔබේ
මුළු හෘදයනේ ද මුළු සිතින් ද ඔබ දවේ සමිඳාණන්
වහන්සේ සොයා ගියොත් උන් වහන්සේ ඔබට
සම්බ වනු ඇත. 30 දුක් කරදර ඔබට පැමිණනෙ විට,
අවසානයේ දී වත් ඔබ, දවේ සමිඳාණන් වහන්සේ
වතෙ හැරී, උන් වහන්සගේේ හඬට අවනත
වන්නහු නම්, 31 උන් වහන්සේ දයාවන්ත දවේ
කනෙකෙු බැවින්, ඔබ අත් නොහරින සේක; ඔබ
නොවනසන සේක; උන් වහන්සේ ඔබේ පියවරුන්
හට දිවුරා පොරොන්දු වූ ගිවිසුම අමතක නොකරන
සේක.
32 “තවද, දවේයන් වහන්සේ මිහි පිට මිනිසා මැවූ
දා සිට මේ දක්වා ගවේගිය දීර්ඝ කාලය තුළ වේවා,
අහසේ එක් කොණක සිට අනික් කොණ දක්වා
වේවා, මයොකාර මහා දයෙක් සිදු වූ බවක් හෝ
එවැන්නක් ගැන ඇසූ බවක් හෝ දැනගන්නට තිබේ
ද? 33 ගින්න මැද සිට කතා කළ දවේයන් වහන්සේට
ඔබ සවන් දුන්නාක් මනේ කිසියම් සනෙඟක් උන්
වහන්සගේේ හඬට සවන් දී ජීවත් ව සිටිත් ද?
34 ඔබ බලා සිටිය දී ම මිසරයේ දී ඔබේ දවේ
සමිඳාණන් වහන්සේ ඔබට කළ සියල්ල අනුව වනෙ
කිසියම් දවේ කනෙකේ, අභියෝග දක්වා, හාස්කම්
සහ අරුමපුදුම දේ පා, යුද්ධයනේ ද, බාහු බලයනේ
හා දිගු කළ හස්තයනේ ද මහා බියජනක දේ කර,
එක් ජාතියක් තවත් ජාතියක් මධ්‍යයනේ
තෝරාගන්නට වැඩිය සේක් ද? 35 මාක් 12:32මේ
දේ පමණක් පනේවන ලද්දේ සමිඳාණන් වහන්සේ
ම දවේයන් වහන්සේ බවත්, උන් වහන්සේ හැර අන්
දවේ කනෙකෙු නැති බවත් ඔබ දැනගන්නා පිණිස ය.
36 උන් වහන්සේ ඔබට උපදසේ දනෙු සඳහා සිය
හඬ ස්වර්ගයනේ ඇසනේනට සැලැසූ සේක; මිහි පිට
තම මහා ගින්න ඔබට දැක්වූ සේක. ගින්න මැද සිට
උන් වහන්සගේේ කට හඬ ඔබට ඇසිණි. 37 ඔබේ
පියවරුන්ට උන් වහන්සේ ප්‍රමේ කළ නිසා,
ඔවුන්ගනේ පැවත ආ පළෙපත තෝරාගනෙ මහා
බලය පා මිසර දශේයනේ උන් වහන්සේ ම ඔවුන්
ගනො සේක. 38 අද ඔබට අයිති වී තිබනෙ හැටියට
ඔබ ගනෙවීත් ඔබට උරුම කොට, ඒ රට දනෙ
පිණිස ඔබට වඩා ගණනින් විශාල බලවත් ජාතීන්,
ඔබට පරෙටුවනේ පන්නාදැමූ සේක. 39 එබැවින්
සමිඳාණන් වහන්සේ ඉහළ ස්වර්ගයහෙිත්, පහළ
මිහි පිටත් වැඩ වසන දවේයන් වහන්සේ බවත්, උන්
වහන්සේ හැර අන් දවේ කනෙකෙු නැති බවත්
මදෙින වටහාගනෙ තරයේ සිතින් මනෙහෙි කරන්න.
40 ඔබට ද ඔබනේ පසු ඔබේ පළෙපතට ද
ශුභසිද්ධිය සැලසනෙු පිණිසත්, දවේ සමිඳාණන්
වහන්සේ ඔබ හට සදහට ම දානය කරන
දශේයහෙි ඔබ දිගායු වළඳන පිණිසත් මා ඔබට අද
දින අණ කරන උන් වහන්සගේේ නීති සහ නියෝග
ඔබ පිළිපැදිය යුතු ය.”

## අභය භූමි

41 ජෝෂු 20:8-9 ඉන්පසු මෝසසේ ජොර්දාන්
ගඟනේ මගෙොඩ, නැගනෙහිර දිශාවට නගර තුනක්
වනේ කළේ ය. 42 යමකෙු, කලින් වරෙයක්
නොදැක්වූ කනෙකෙු අදහස් නොකර මැරුවොත්,
එවිට මේ මිනීමරුවා හට මකේ නගරවලින් එකකට
පලා ගොස් ජීවත් විය හැකි ය. 43 මලෙසෙ
රූබන්ගේ ගෝත්‍රය සඳහා පාළුකරයහෙි තැනිතලා
භූමියහෙි පිහිටි බශෙරේ නගරය ද ගාද්ගේ
ගෝත්‍රය සඳහා ගිලියද් දශේයේ රාමොත් නගරය
ද මනස්සගේේ ගෝත්‍රය සඳහා බාෂාන්
ප්‍රදශේයේ ගෝලාන් නගරය ද ඇති විය.

## දවේ නීතිය හැඳින්වීම

44 මෝසසේ ඉශ්‍රායලේ ජනයාට දුන් නීතිය මයෙ
වේ. 45 ඉශ්‍රායලේ ජනයා මිසර දශේයනේ නික්ම
ආ පසු මෝසසේ දුන් ශික්ෂා පද ද, නීති හා නියෝග
ද, අණපණත් ද මේවා ය. 46 මෝසසේ සහ
ඉශ්‍රායලේ ජනයා එකල සිටියේ ඔවුන්
හෙශ්බොන්හි පදිංචි ව සිටි අමෝරිවරුන්ගේ රජු
වන සීහොන්ගේ දශේයේ, බෙත්-පයෙෝර් නම්
ස්ථානය ඉදිරිපිට වූ මිටියාවතහෙි, ජොර්දාන් ගඟනේ
මගෙොඩ ය. 47 ඔව්හු බාෂාන්හි රජු වූ ඕග්ගේ
දශේය ද අයිති කරගත්හ. මේ දදෙනො ජොර්දාන්
ගඟනේ මගෙොඩ නැගනෙහිර දසෙ පදිංචි වූ
අමෝරිවරුන්ගේ රජවරු ය. 48 ඔවුන් අයිති කරගත්
දශේය අර්ණොන් ගං තරෙ පිහිටි අරොයරේ සිට

හරේමොන් හෙවත් සිරියොන් කන්ද දක්වා විහිදිණි.
49 තවද, එම දේශයට ජෝර්දාන් ගඟින් නැගෙනහිර
මගෙොඩ පිහිටි තැනිතලාවේ සිට මළ මුහුද දක්වා
ද, පිස්ගා කන්ද පාමුල දක්වා ද ප්‍රදේශය අයිති
විය.

### දස පණත
(නික්ම 20:1-17)

5 මෝසෙස් මුළු ඉශ්‍රායෙල් ජනයා කැඳවා
ඔවුන්ට මෙසේ කී ය: “ඉශ්‍රායෙල්වරුනි, මෙදින
මා ඔබට කියන්නට යන නීති හා නියෝගවලට
සවන් දෙන්න. ඔබ ඒවා ඉගෙනගෙන, ආරක්ෂා
කරමින් පිළිපැදිය යුතු ය. 2 අපේ දෙවි සමිඳාණන්
වහන්සේ හොරෙබ් කන්දේ දී අප සමඟ ගිවිසුමක්
කළ සේක. 3 උන් වහන්සේ මේ ගිවිසුම කළේ,
අපේ පියවරුන් සමඟ නොව අද දින ජීවත් ව සිටින
අප සියල්ලන් ද සමඟ ය. 4 සමිඳාණන් වහන්සේ
ගින්න මැද සිට කන්දේ දී මුහුණට මුහුණ ලා ඔබ
සමඟ කතා කළ සේක. 5 උන් වහන්සේ වදාළ දේ
ඔබට දැන්වීමට මම එකල සමිඳාණන් වහන්සේටත්,
ඔබටත් අතර සිටියෙමි. ගින්න නිසා බිය වූයෙන් ඔබ
කන්දට නොනැංගහු ය.
5 “උන් වහන්සේ මෙසේ වදාළ සේක: 6 ‘මම
වනාහි, වහල්කමේ නිවාසය වූ මිසර දේශයෙන් නුඹ
පිටතට ගෙනා සමිඳාණන් වහන්සේ වෙමි.
7 ‘මා හැර අන් කිසි ම දෙවි කෙනෙකු නුඹට
නොවිය යුතු ය.
8 ලෙවී 26:1; ද්වි.නී. 4:15-18; 27:15 ‘නුඹ සඳහා
නෙළූ රූපයක් හෝ ඉහළ අහසෙහි වත්, පහළ
පොළොවෙහි වත්, පොළොවෙන් යට ජලයෙහි වත්
ඇති කිසි ම වස්තුවකට සමාන දෙයක් හෝ නුඹ
සාදා නොගන්න. 9 නික්ම 34:6-7; ගණන් 14:18;
ද්වි.නී. 7:9-10නුඹ ඒවාට නමස්කාර නොකරන්න;
වැඳුම්පිදුම් නොකරන්න. මන්ද, නුඹේ දෙවි
සමිඳාණන් වහන්සේ වන මම ප්‍රතිවාදීන්
නොඉවසන දෙවි කෙනෙකුන් වන බැවිනි. මට වෛර
කරන පියවරුන්ගේ පාපය නිසා තුන් වන, සතර වන
පරම්පරාව දක්වා ඔවුන්ගේ දරුවන්ට මම දඬුවම්
කරමි. 10 එහෙත්, මට ප්‍රේම කරමින්, මාගේ ආඥා
පිළිපදින දහස් ගණන් අයට මම කරුණාව දක්වමි.
11 ලෙවී 19:12 ‘නුඹේ දෙවි සමිඳාණන්
වහන්සේගේ නාමය අගරු ලෙස භාවිත
නොකරන්න. යමෙක් ඒ නාමය අගරු ලෙස භාවිත
කරන්නේ ද ඔහුට උන් වහන්සේ දඬුවම් කරන
සේක.
12 නික්ම 16:23-30; 31:12-14 ‘දෙවි සමිඳාණන්
වහන්සේ නුඹට අණ කළ පරිදි සබත් දවස ශුද්ධ
ලෙස පැවැත්විය යුතු ය.
13 නික්ම 23:12; 31:15; 34:21; 35:2; ලෙවී 23:3
‘දවස් හයක් තුළ නුඹ වෙහෙසෙ වී නුඹේ සියලු වැඩ
කරන්න. 14 එහෙත්, හත් වන දවස නුඹේ දෙවි
සමිඳාණන් වහන්සේට කැප වූ සබත ය. එදින නුඹ
වත්, නුඹේ පුතා වත්, දුව වත්, නුඹේ සේවකයා
වත්, සේවිකාව වත්, නුඹේ ගවයා වත්, කොටළුවා
වත්, ගවමහිෂයන් වත්, නුඹේ වාසල් දොරටු සීමා
තුළ සිටින ආගන්තුකයා වත් කිසි වැඩක් නොකළ
යුතු ය. එවිට නුඹට මෙන් ම නුඹේ සේවක
සේවිකාවන්ට ද නිවාඩු ගත හැකි ය. 15 නුඹ මිසර
දේශයේ දී වහලෙකු මෙන් සිටි බවත්, දෙවි
සමිඳාණන් වහන්සේ සිය බාහු බලයෙන් හා දිගු කළ
හස්තයෙන් නුඹ පිටතට ගෙනා බවත් සිහි කළ යුතු
ය. සබත් දවස ශුද්ධ ලෙස පැවැත්වීමට දෙවි
සමිඳාණන් වහන්සේ අණ කළේ එබැවින් ය.
16 ද්වි.නී. 27:16; මතෙ 15:4; 19:19; මාක් 7:10;
10:19; ලූක් 18:20; එපී 6:2,3 ‘දෙවි සමිඳාණන්
වහන්සේ නුඹට අණ කළ පරිදි නුඹේ පියාට ද මවට
ද ගෞරව කරන්න. එවිට දෙවි සමිඳාණන් වහන්සේ
නුඹට දෙන දේශයෙහි නුඹ චිරාත් කාලයක් ජීවත්
වන්නෙහි ය; නුඹට සෙත සැලසෙනු ඇත.
17 උත් 9:6; ලෙවී 24:17; මතෙ 5:21; 19:18; මාක්
10:19; ලූක් 18:20; රෝම 13:9; ජාකො 2:11 ‘මිනී
නොමරන්න.
18 ලෙවී 20:10; මතෙ 5:27; 19:18; මාක් 10:19; ලූක්
18:20; රෝම 13:9; ජාකො 2:11 ‘කාමමිථ්‍යාචාරය
නොකරන්න.
19 ලෙවී 19:11; මතෙ 19:18; මාක් 10:19; ලූක්
18:20; රෝම 13:9 ‘සොරකම් නොකරන්න.
20 නික්ම 23:1; මතෙ 19:18; මාක් 10:19; ලූක්
18:20 ‘නුඹේ අසල්වැසියාට විරුද්ධ ව බොරු සාක්ෂි
නොකියන්න.
21 රෝම 7:7; 13:9 ‘නුඹේ අසල්වැසියාගේ
භාර්යාවට ඇලුම් නොකරන්න. නුඹේ
අසල්වැසියාගේ ගෘහයට හෝ ඔහුගේ කෙතට හෝ
ඔහුගේ සේවක සේවිකාවන්ට හෝ ඔහුගේ
ගවයාට හෝ කොටළුවාට හෝ අසල්වැසියා සතු
කිසිවකට හෝ තණ්හා නොකරන්න.’
22 හෙබ්‍රෙ 12:18-19 “කන්දේ දී ගින්න ද වලා
පටලය ද ඝනාන්ධකාරය ද මැද වැඩ සිට මුළු
ජනතාව අමතා, මහා හඬකින් සමිඳාණන් වහන්සේ
වදාළ වචන මේවා ය. ඒවාට අමතර ව කිසිවක්
එකතු නොකොට, ගල් පුවරු දෙකෙක උන් වහන්සේ
ඒවා ලියා මට භාර දුන් සේක.”

### කීකරු වීමට සෙනඟ පොරොන්දු වීම
(නික්ම 20:18-21)

23 “කන්ද ගින්නෙන් දැවෙමින් තිබිය දී, අඳුර මැදින්
ඔබට කටහඬ ඇසුණු විට, ඔබේ ගෝත්‍රවල
ප්‍රධානීන් සියල්ලෝ ද ප්‍රජා මූලිකයෝ ද මා
සමීපයට පැමිණ, 24 ‘පුදුමයකි! අපේ දෙවි සමිඳාණන්
වහන්සේ සිය තේජශ්‍රීය සහ ශ්‍රේෂ්ඨත්වය අපට
පෙන්වා වදාළ සේක. ගින්න මැදින් අපි උන්
වහන්සේගේ කටහඬට සවන් දුනිමු. දෙවියන්
වහන්සේ මිනිසා සමඟ කතා කළ පසු පවා ඔහුට
ජීවත් විය හැකි බව අද අපි දුටිමු. 25 එහෙත්, අප
යළි මරණයට මුහුණ දිය යුත්තේ මන් ද? මේ මහා
ගින්න අප දවාලන්නට පුළුවන. අපේ දෙවි
සමිඳාණන් වහන්සේගේ හඬට අප තවදුරටත් සවන්
දුන්නොත් අපට මරණය නියත ය. 26 ගින්න මැදින්

කතා කළ ජීවමාන දෙවියන් වහන්සේගේ කඩහඬට
අප සවන් දුන්නාක් මෙන් සවන් දී, ජීවත් ව සිටින
මිනිසෙක් තවත් සිටී ද? 27 එබැවින් ඔබ ළං වී අප
දෙවි සමිඳාණන් වහන්සේ වදාරන සියල්ලට සවන්
දෙන්න. ඉන්පසු උන් වහන්සේ ඔබට වදාළ සියල්ල
අපට දන්වන්න, අපි ඒවා අසා, ඉටු කරන්නෙමු'යි කී
හ.
28 "ඔබ මට කතා කළ විට, ඔබේ කටහඬ
සමිඳාණන් වහන්සේට ඇසිණි. එවිට උන් වහන්සේ
මා අමතා මට මෙසේ වදාළ සේක: 'මේ සෙනඟ
ඔබට කී දේ මට ඇසිණි. ඔවුන් කී සියල්ල හොඳින්
කියා ඇත, 29 මට ගරුබිය දැක්වීමටත්, ඔවුන්ටත්,
ඔවුන්ගේ පෙළපත්වලටත් සදහට ම ශුභසිද්ධිය
සලසන පිණිස මාගේ අණපණත් නිරතුරුව
පිළිපැදීමටත් තුඩු දෙන සිතක් ඔවුන් තුළ මෙලෙස
ඇත්නම් කෙතරම් වාසනාවක් ද! 30 ඔවුන් වෙත
ගොස් ඔවුන්ගේ කූඩාරම් තුළට යන්නට කියන්න.
31 එහෙත්, නුඹ මෙහි මා ළඟ සිටින්න. මා ඔවුන්ට
අයිති කොට දෙන්නට යන දේශයෙහි ඔවුන්
පිළිපදින පිණිස ඔවුන්ට ඔබ උගැන්විය යුතු සියලු
අණපණත් ද, නීති හා නියෝගයන් ද මම ඔබට
දන්වන්නෙමි.'
32 "එබැවින් ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ
ඔබට අණ කළ පරිදි ඔබ හැම පිළිපැදිය යුතු ය. ඒ
කිසිවකට ඔබ අකීකරු නොවිය යුතු ය. 33 ඔබට දිවි
ඇති තාක් ශුභසිද්ධිය වන පිණිසත්, ඔබ අයිති
කරගන්නට යන දේශයෙහි චිරාත් කාලයක් ජීවත්
වන පිණිසත්, දෙවි සමිඳාණන් වහන්සේ ඔබට අණ
කරන සියල්ලට කීකරු ව ජීවත් විය යුතු ය."

## ශ්‍රේෂ්ඨතම ආඥාව

6 "ඔබ අයිති කරගන්නට යන දේශයෙහි
පිළිපැදිය යුතු, දෙවි සමිඳාණන් වහන්සේ ඔබට
ඉගැන්වීමට අණ කළ, අණපණත් ද නීති හා නියෝග
ද මේවා ය. 2 ඔබට දිවි ඇති තාක්, ඔබත්, ඔබේ
පුත්‍රයාත්, පුත්‍රයාගේ පුත්‍රයාත්, දෙවි සමිඳාණන්
වහන්සේට ගරුබිය පාමින්, මා ඔබට අණ කළ උන්
වහන්සේගේ සියලු ම නියෝග සහ අණපණත්
රක්ෂා කළ යුතු ය. එසේ කළොත්, ඔබ චිරාත්
කාලයක් ජීවත් වනු ඇත. 3 එබැවින්
ඉශ්‍රායෙල්වරුනි, සවන් දී ඒවා පිළිපදින්න. එසේ
කළොත්, ඔබේ පියවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේ ඔබට පොරොන්දු වූ පරිදි කිරෙන් හා මී
පැණියෙන් ඉතිරෙන දේශයෙහි ඔබට ශුභසිද්ධිය
සැලසෙනු ඇත; ගණනින් ඔබ බහුල ව වර්ධනය වනු
ඇත.
4 මාක් 12:29 "ඉශ්‍රායෙල්වරුනි, සවන් දෙන්න,
අපේ සමිඳාණන් වහන්සේ ම පමණක් දෙවියන්
වහන්සේ වන සේක. 5 මතෙ 22:37; මාක් 12:30;
ලූක් 10:27දෙවි සමිඳාණන් වහන්සේට ඔබේ මුළු
හෘදයෙන් ද ඔබේ මුළු ආත්මයෙන් ද ඔබේ මුළු
වීර්යයෙන් ද ප්‍රේම කළ යුතු ය. 6 ද්වි.නී.
11:18-20අද දින මා ඔබට දෙන මේ අණපණත්
සිතේ ධාරණය කරගත යුතු ය. 7 ඔබේ දරුදැරියන්ට
ඒවා ඉගැන්විය යුතු ය. ඔබ ගෙදර සිටින විට ද,
පාරේ යන එන විට ද, සැතපෙන විට ද, අවදි වන
විට ද ඒවා ගැන ඔවුන්ට කතා කළ යුතු ය. 8 අතේ
ලකුණක් වනු පිණිස ද, නළල මත පටියක් වන
පිණිස ද ඒවා බැඳ ගන්න. 9 ගෙදර උළුවහුවල සහ
දොරටුවේ ඒවා ලියා තබන්න."

## අකීකරු නොවීමට උපදෙස්

10 උත් 12:7; 26:3; 28:13 "දෙවි සමිඳාණන්
වහන්සේ ඔබේ පියවරුන් වූ ආබ්‍රහම්ට, ඊසාක්ට
සහ ජාකොබ්ට දෙන්නට දිවුරා පොරොන්දු වූ
දේශයට ඔබ ගෙනා පසු උන් වහන්සේ ඔබ ඉදි
නොකළ, විශාල දියුණු නගර ඔබට දානය කරන
සේක. 11 ඔබ නොපිරවූ, හොඳ හොඳ දේවලින්
පිරුණු ගෙවල් ද, ඔබ නොකැණූ ළිං ද, ඔබ නොවැවූ
මිදි උයන් සහ ඔලීව ගස් ද එහි වනු ඇත. ඔබ ඒවා
භුක්ති විඳ තෘප්තිමත් වූ පසු 12 වහල්කමේ
නිවාසය වූ මිසර දේශයෙන් ඔබ පිටතට ගෙනා
සමිඳාණන් වහන්සේ අමතක නොකරන්නට
වගබලාගන්න. 13 මතෙ 4:10; ලූක් 4:8ඔබේ දෙවි
සමිඳාණන් වහන්සේට පමණක් ගරුබිය පෑ යුතු ය.
උන් වහන්සේට පමණක් වැඳුම්පිදුම් කළ යුතු ය.
උන් වහන්සේගේ නාමයෙන් පමණක් දිවුරුම් දිය
යුතු ය. 14 ඔබ අවට සිටින සෙනඟගේ අනිකුත් දෙවි
දේවතාවන්ට ඔබ නමස්කාර නොකළ යුතු ය.
15 ඔබ එලෙස කළොත්, ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ ප්‍රතිවාදීන් නොඉවසන දෙවි කෙනෙකු
බැවින්, උන් වහන්සේගේ කෝපය ඔබට විරුද්ධ ව
ඇවිළී උන් වහන්සේ ඔබ මිහිතලයෙන්
වනසාලන්නට පුළුවන.
16 නික්ම 17:1-7; මතෙ 4:7; ලූක් 4:12 "මස්සා නම්
ස්ථානයේ දී ඔබ දෙවි සමිඳාණන් වහන්සේ පරීක්ෂා
කළාක් මෙන් උන් වහන්සේ පරීක්ෂා නොකරන්න.
17 ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබට අණ කළ
උන් වහන්සේගේ අණපණත් ද ශික්ෂා පද ද නීති
හා නියෝග ද උනන්දුවෙන් පිළිපැදිය යුතු ය.
18 ඔබට සෙත සැලසෙන ලෙස සමිඳාණන් වහන්සේ
කියන පරිදි සාධාරණ වූ ද, යහපත් වූ ද දේ
කරන්න. එවිට උන් වහන්සේ ඔබේ පියවරුන්ට
පොරොන්දු වූ සරුසාර රටට ඔබ ඇතුල් වී එය අයිති
කරගැනීමට ද, 19 උන් වහන්සේ වදාළ පරිදි සතුරන්
පන්නා දැමීමට ද ඔබට හැකි වනු ඇත.
20 "මතු කාලයක දී ඔබේ පුතු ඔබ අමතමින්,
'අපේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබට අණ දුන්
ශික්ෂා පදවල ද නීති හා නියෝගවල ද තේරුම
කුමක් දැ'යි ඇසුවොත්, 21 ඔබ ඔහුට පිළිතුරු දෙමින්
මෙසේ කිව යුතු ය: 'මිසරයේ දී අපි පාරාවෝ
රජුගේ වහලුන් මෙන් සිටියෙමු. එහෙත්, සමිඳාණන්
වහන්සේ තම බාහු බලය පාමින් මිසරයෙන් අප
ගෙනා සේක. 22 තවද, උන් වහන්සේ අප බලා
සිටිය දී ම මිසර දේශයට, එනම් පාරාවෝ රජු හා
ඔහුගේ ගෙවැසියන් හට අති බියජනක හාස්කම්

සහ අරුමපුදුම දේ පමුණුවා 23 උන් වහන්සේ අපේ
පියවරුන්ට දිවුරා පොරොන්දු වූ රට අපට දීම සඳහා
එහි අප ඇතුල් කිරීමට, මිසරයෙන් පිටතට අප
ගෙනා සේක. 24 තවද, අපට නිරතුරු සතෙ සලසන
පිණිස මේ නියෝග සියල්ල පිළිපැදීමටත්, දෙවි
සමිඳාණන් වහන්සේට ගරුබිය පෑමටත් අපට අණ
කළ සේක. එසේ කළොත්, අද දවසේ මෙන් උන්
වහන්සේ අප පණපිටින් රකින සේක. 25 අපේ දෙවි
සමිඳාණන් වහන්සේ අපට අණ කළ පරිදි මේ
අණපණත් සියල්ල අප ඉටු කළොත් එය අපට යුතු
මාර්ගය වනු ඇතැ'යි කිව යුතු ය."

### සමිඳුන්ගේ විශේෂ ජනතාව

(නික්ම 34:11-16)

7 ක්‍රියා 13:19 ඔබ අයිති කරගන්නට යන
දේශයට "දෙවි සමිඳාණන් වහන්සේ ඔබ
පැමිණවූ කල, ඔබ ඉදිරියට යන විට ඔබට වඩා
ගණනින් විශාල, බලවත් ජාතීන් හතක් වන
හිත්තීවරුන් සහ ගිර්ගාෂිවරුන් ද, අමෝරිවරුන් සහ
කානානිවරුන් ද, පෙරෙසේසිවරුන් සහ හිවීවරුන් ද,
ජබූසිවරුන් ද උන් වහන්සේ පලවා හරින සේක.
2 උන් වහන්සේ ඔබට ඔවුන් පාවා දුන් පසු ඔබ
ඔවුන්ට පහර දී සහමුලින් ම ඔවුන් වැනසිය යුතු ය.
ඔවුන් සමඟ ගිවිසුමක් ඇති කර නොගත යුතු ය.
ඔවුන්ට දයාවක් නොපෙන්විය යුතු ය. 3 ඔවුන් සමඟ
සරණබන්ධන ඇති කර නොගත යුතු ය. ඔබේ
දූවරුන් ඔවුන්ගේ පුත්‍රයන් හට විවාහ කර නොදිය
යුතු ය. ඔවුන්ගේ දූවරුන් ඔබේ පුත්‍රයන් හට
ආවාහ කර නොගත යුතු ය. 4 එසේ කළොත්, අන්
දෙවි දේවතාවන් හට වැඳුම්පිදුම් කරනු පිණිස, මා
අනුගමනය කිරීමෙන් ඔව්හු ඔබේ පුත්‍රයන්
වළක්වන්නෝ ය. එවිට සමිඳාණන් වහන්සේගේ
කෝපය ඔබට විරුද්ධ ව ඇවිළී, උන් වහන්සේ විගස
ඔබ වනසාලනු ඇත. 5 ද්වි.නී. 12:3ඔබ ඔවුන්ට
මලෙසෙ කළ යුතු ය. ඔවුන්ගේ පූජාසන කඩාදමා,
රූපස්තම්භ බිඳදමා, අෂේරා කප් කණු කපාදමා,
නළෙ දේව රූප ගින්නේ දැවිය යුතු ය. 6 නික්ම 19:5;
ද්වි.නී. 4:20; 14:2; 26:18; තීතස් 2:14; 1 පේදු
2:9මසෙේ කළ යුත්තේ, ඔබ වනාහි දෙවි සමිඳාණන්
වහන්සේට කැප වූ ශුද්ධ සෙනඟක් වන බැවිනි.
පොළෝ තලයෙහි සිටින සියලු සෙනඟ අතරෙන්
තමන් වහන්සේට ම විශේෂ වූ සෙනඟක් මෙන් උන්
වහන්සේ ඔබ තෝරාගත් සේක.
7 "සමිඳාණන් වහන්සේ ඔබට ප්‍රේම කළේත්,
ඔබ තෝරාගත්තේත්, අන් සෙනඟකට වඩා ඔබ
ගණනින් බහුල වූ නිසා නොවේ. ඔබ වනාහි සියලු
සෙනඟ අතරෙන් ඉතා ම කුඩා ජනතාවකි. 8 එහෙත්,
සමිඳාණන් වහන්සේ ඔබට ප්‍රේම කළ බැවිනුත්,
ඔබේ පියවරුන්ට උන් වහන්සේ දිවුළ පොරොන්දුව
ඉටු කිරීමට කැමැති වූ බැවිනුත්, උන් වහන්සේ සිය
බාහු බලය පෙන්වා, ඔබ මුදාගෙන අවුත්, මිසර රජ
වූ පාරාවෝ ඔබ බැඳ සිටි වහල්කමේ බැම්මවලින්
ඔබ ගළවා ලූ සේක. 9 නික්ම 20:5-6; 34:6-7; ගණන්
14:18; ද්වි.නී. 5:9-10 එබැවින් ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ පමණක් දෙවියන් වහන්සේ බවත්, උන්
වහන්සේ විශ්වාසවන්ත දෙවි කෙනෙකු බවත්
දැනගන්න. උන් වහන්සේට කරුණාව පාමින්, උන්
වහන්සේගේ අණපණත් පිළිපදින අයට පරම්පරා
දහසක් දක්වා උන් වහන්සේත් ගිවිසුම ඉටු කරමින්
ස්ථිර ප්‍රේමය දක්වන සේක. 10 උන් වහන්සේට
වෛර කරන්නන් වනසාලමින්, ඔවුන්ගේ මුහුණ
ඉදිරිපිට ම ඔවුන්ට විපාක දෙන සේක. උන්
වහන්සේට වෛර කරන්නන්ට මුහුණ ඉදිරිපිට දී ම
විපාක දීමට උන් වහන්සේ ප්‍රමාද නොවන සේක.
11 එබැවින් මා ඔබට අද දින නියම කරන අණපණත්
ද, නීති හා නියෝග ද ආරක්ෂා කරමින් ඔබ ඒවා
පිළිපැදිය යුතු ය."

### කීකරු වීමේ ආශීර්වාද

(ද්වි.නී. 28:1-14)

12 ද්වි.නී. 11:13-17 "ඔබ මේ නියෝගයන්ට සවන්
දී, ඒවා ආරක්ෂා කොට, පිළිපදින්නහු නම්, දෙවි
සමිඳාණන් වහන්සේ ඔබේ පියවරුන්ට දිවුළ ගිවිසුම
ඉටු කරන සේක. ඔවුන්ට පෙන්වූ කරුණාව ඔබටත්
පෙන්වන සේක. 13 තවද උන් වහන්සේ ඔබේ
පියවරුන්ට දෙන්නට දිවුළ දේශයේ දී, ඔබට ප්‍රේම
කොට, ආසිරි දී, වැඩි වර්ධනය කරන සේක. ඔබට
ලැබෙන දරු පරපුරට ද රටේ පලදාවට ද ධාන්‍යවලට
ද මිදියුසට හා තලේවලට ද ආසිරි දෙන සේක.
ඔබේ ගවමහිෂයන් ද බැටළු පට්ටි ද ගණනින් බහුල
කරන සේක. 14 සියලු මනුෂ්‍යයන්ට වඩා ඔබ ආසිරි
ලබනු ඇත. ඔබ අතර ස්ත්‍රී පුරුෂයන් හෝ
ගවමහිෂයන් හෝ වඳ නොවනු ඇත. 15 සමිඳාණන්
වහන්සේ ඔබ අතරෙන් සියලු ලෙඩ දුක් දුරු කරනු
ඇත. ඔබ දන්නා වූ, මිසරයේ තිබුණ, කිසි භයානක
රෝගයක් ඔබ වෙත නොපැමිණෙනු ඇත. ඔබට
වෛර කරන්නන් මත ඒවා උන් වහන්සේ එවන
සේක. 16 ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබට
පාවා දෙන සියලු සෙනඟ වනසා දැමිය යුතු ය. ඔබ
ඔවුන්ට කිසි ම අනුකම්පාවක් නොදැක්විය යුතු ය.
ඔවුන්ගේ දෙවිවරුන්ට වැඳුම්පිදුම් නොකළ යුතු ය.
එසේ කළොත්, එය ඔබට මලපතක් වනු ඇත.
17 " 'මේ ජාතීහු අපට වඩා බහුල ය. අප ඔවුන්
පන්නා දමන්නේ කෙසේ දැ'යි ඔබට සිතෙන විට
18 ඔවුන්ට බිය නොවන්න. ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ පාරාවෝ රජුට හා මුළු මිසරයට කළ
දේවල් ද, 19 ඔබේ ම ඇසින් ඔබ දුටු භයානක
විසංගත ද, හාස්කම් හා අරුමපුදුම දේ ද හොඳින්
සිහි කරන්න. දෙවි සමිඳාණන් වහන්සේ ඔබ
මුදාලීමට යෙදූ බාහු බලය ද, දිගු කළ හස්තය ද
සිහි කරන්න. ඔබ බිය වන්නේ යම් සෙනඟකට ද
ඔවුන් සියල්ලන්ට ම උන් වහන්සේ පරෙ සේ ම
කරන සේක. 20 ඔබෙන් ගැළවී, සැඟවුණු අය
වනසාලන තෙක්, දෙවි සමිඳාණන් වහන්සේ ඔවුන්
වෙත දෙබෙරුන් එවන සේක. 21 ඔබ ඔවුන්ට බිය
නොවිය යුතු ය. ඔබ අතර වැඩ සිටින ඔබේ දෙවි
සමිඳාණන් වහන්සේ බලවත්, බිය උපදවන දෙවි
කෙනෙකු වන සේක. 22 ඔබ ඉදිරියට යන විට,

ඔබගේ දෙවි සමිඳාණන් වහන්සේ ටිකින් ටික, ඒ
ජාතීන් නෙරපා දමනු ඇත. ඔබ ඔවුන් එක වර ම
වනසාලිය යුතු නොවේ. මන්ද, එසේ කළොත් වන
මෘගයෝ ඔබට විරුද්ධ ව වැඩි වන්නෝ ය. 23 ඔබගේ
දෙවි සමිඳාණන් වහන්සේ ඔබට ඔවුන් පාවා දෙනු
ඇත. ඔවුන් නැත්තට ම නැති වන තෙක් මහා
විපත්ති පමුණුවා ඔවුන් වනසාලන සේක. 24 උන්
වහන්සේ ඔවුන්ගේ රජවරුන් ඔබගේ බලයට පාවා
දෙනු ඇත. ඔබ ද ඔවුන්ගේ නම මිහි පිටින් මකා
දැමිය යුතු ය. ඔබ ඔවුන් වනසාලන විට කිසිවකුට
ඔබට විරුද්ධ ව නැඟී සිටින්නට නොහැකි වනු ඇත.
25 ඔබ ඔවුන්ගේ දෙවි දේවතාවන්ගේ නෙළූ පිළිම
ගින්නෙන් පුළුස්සා දැමිය යුතු ය. ඒ පිළිම මත ඇති
රිදීවලට හෝ රන්වලට හෝ ආසා නොකළ යුතු ය.
ඔබගේ ප්‍රයෝජනයට ඒවා නොගත යුතු ය. එසේ
කළොත් ඒවා ඔබට මලපතක් විය හැකි ය. මේ
සියල්ල ඔබගේ දෙවි සමිඳාණන් වහන්සේට පිළිකුල්
ය. 26 මෙවැනි පිළිකුල් දේ ඔබගේ ගෙදරට ද නොගත
යුතු ය. එසේ කළොත්, ඔබත් ඒවා හා සමාන සාප
ලත් දෙයක් වනු ඇත. ඒ පිළිම සාප ලත් ඒවා බැවින්
ඔබ ඒවා සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කොට
හෙළා දැකිය යුතු ය.”

### ඔබට හිමි වන සාර භූමිය

8 “සමිඳාණන් වහන්සේ ඔබගේ පියවරුන්ට දිවුරා
පොරොන්දු වූ දේශයට ඔබ ඇතුළු වී එහි ඔබ
ජීවත් වී, ගණනින් වැඩි වී, එය අයිති කරගනු පිණිස
මා අද දින ඔබට නියම කරන සියලු අණපණත් ඔබ
රක්ෂා කරමින් පිළිපැදිය යුතු ය. 2 තවද, ඔබගේ දෙවි
සමිඳාණන් වහන්සේගේ අණපණත් ඔබ
පිළිපදින්නහු ද නැද්ද කියා ඔබගේ සිත දැනගනු
පිණිස, මේ හතළිස් අවුරුද්ද තුළ පාළුකරය ඔස්සේ
ඔබ යටහත් බවට පමුණුවා, සෝදිසි කරමින් උන්
වහන්සේ ඔබ ගෙන ගිය දීර්ඝ ගමන සිහි කරන්න.
3 මතෙ 4:4; ලූක් 4:4උන් වහන්සේ ඔබ යටහත්
බවට පමුණුවා සාගින්නෙන් යන්නට හැරිය සේක.
ඉන්පසු ඔබ වත්, ඔබගේ පියවරුන් වත් නොදත්
‘මන්නා’ නමැති කෑමෙන් ඔබ පෝෂණය කළ සේක.
උන් වහන්සේ මෙසේ කළේ මිනිසා ජීවත් වන්නේ
කෑමෙන් පමණක් නොව සමිඳාණන් වහන්සේගේ
මුවින් නික්මෙන සියලු වචනවලින් බව ඔබට
උගන්වනු පිණිස ය. 4 ඒ අවුරුදු සතළිස තුළ ඔබ ඇඳ
සිටි ඇඳුම් පරණ නො වී ය, ඔබගේ පාද ඉදිමුණේ
නැත. 5 පියකු තම පුතා හික්මවන්නා සේ ඔබගේ
දෙවි සමිඳාණන් වහන්සේ ද ඔබ හික්මවන බව ඔබ
මෙනෙහි කළ යුතු ය. 6 එබැවින් ඔබගේ දෙවි
සමිඳාණන් වහන්සේගේ අණපණත් පිළිපදිමින් උන්
වහන්සේගේ මාර්ගයෙහි යමින් ගරුබිය පෑ යුතු ය.
7 ඔබගේ දෙවි සමිඳාණන් වහන්සේ සරුසාර රටකට
ඔබ ගෙනෙන සේක. ඒ වනාහි දිය ඇළවලින් ද,
මිටියාවතින් සහ කඳුකරයෙන් පැන නගින දිය
උල්පතින් සහ පොකුණුවලින් ද ගහණ වූ රටකි.
8 එය තිරිඟු සහ යව ද, මිදි ද අත්තික්කා හා දෙළුම්
ද, ඔලීව ද, තලේ හා මී පැණි ද ඇති රටකි.
9 හිඟයක් නැතිව කෑමට ආහාර ද, ඔබට අවශ්‍ය
සියල්ල ද ඇති රටකි. එහි පර්වතවල යබොර ඇත,
එහි කඳුවැටියෙන් තඹ කැණගන්නට පුළුවන. 10 ඔබ
ආහාර අනුභව කර තෘප්තිමත් වූ පසු, ඔබගේ දෙවි
සමිඳාණන් වහන්සේ ඔබට දුන් සරුසාර රට උදෙසා
උන් වහන්සේට ස්තුති පිදිය යුතු ය.”

### සමිඳාණන් වහන්සේ අමතක නොකිරීම

11 හොසි 13:5-6 “මම අද දින ඔබට අණ කරන
ඔබගේ දෙවි සමිඳාණන් වහන්සේගේ අණපණත් ද
නීති හා නියෝග ද නොපිළිපැදීමෙන් උන් වහන්සේ
අමතක නොකරන ලෙස වගබලාගන්න. 12 ඔබ
ආහාර අනුභව කර තෘප්තිමත් වී, හොඳ ගෙවල්
තනා, ඒවායේ පදිංචි වූ පසු ද, 13 ඔබගේ ගව පට්ටි
සහ එළු බැටළු පට්ටි ගණනින් බහුල වී, රන් රිදී
වැඩි වී, ඔබ සතු සියල්ල වර්ධනය වූ පසු ද 14 ඔබ
හිස උදුම්මා නොගෙන, වහල්කමේ නිවාසය වන
මිසර දේශයෙන් ඔබ පිටතට ගෙන ඔබගේ දෙවි
සමිඳාණන් වහන්සේ අමතක නොකරන්න.
15 විසකුරු සර්පයන්ගෙන් හා ගෝනුස්සන්ගෙන්
ගහණ වූ මහා භයානක පාළුකරය ඔස්සේ උන්
වහන්සේ ඔබ ගෙන ගිය සේක. නියඟය පැවති,
වතුර නැති ස්ථානවල දී කළුගල් පර්වතයෙන් ඔබට
වතුර ලබා දුන් සේක. 16 පාළුකරයේ දී ඔබගේ
පියවරුන් පවා නොදත්, ‘මන්නා’ නමැති ආහාරයකින්
උන් වහන්සේ ඔබ පෝෂණය කළ සේක. උන්
වහන්සේ එසේ කළේ ඔබ යටහත් බවට පමුණුවා,
ඔබ සෝදිසි කොට, අන්තිමේ දී ඔබට සෙත සලසනු
සඳහා ය. 17 ‘මා මේ ධන සම්පත උපයාගත්තේ
මගේ ම බල පුළුවන්කමින් සහ සවි ශක්තියෙන්
ය’යි ඔබ නොකීමට වගබලාගන්න. 18 ඔබට ධන
සම්පත උපයාගැනීමට බල පුළුවන්කම දෙනුයේ
ඔබගේ දෙවි සමිඳාණන් වහන්සේ බව ඔබ සිහිපත්
කළ යුතු ය. උන් වහන්සේ එසේ කරන්නේ, අද
පවතින පරිදි උන් වහන්සේ ඔබගේ පියවරුන්ට දිවුරුම්
දුන් ගිවිසුම ඉටු කරන පිණිස ය. 19 ඔබ දෙවි
සමිඳාණන් වහන්සේ අමතක කොට, අන් දෙවි
දේවතාවන් පසුපස යමින් ඔවුන්ට වැඳුම්පිදුම් හා
නමස්කාර කළොත්, ඔබ ඇත්තට ම නැසීවැනසී යන
බව මම අද සහතික කොට කියමි. 20 ඔබගේ දෙවි
සමිඳාණන් වහන්සේගේ හඬට ඔබ කීකරු නො වූ
වොත්, සමිඳාණන් වහන්සේ ඔබගේ ඇස් ඉදිරිපිට දී
ම ජාතීන් විනාශ කළාක් මෙන්, ඔබ ද විනාශ කරන
සේක.”

### සමිඳුන්ගේ පොරොන්දුව

9 “ඉශ්‍රායෙල්වරුනි, සවන් දෙන්න. ඔබ අද දින
ජොර්දාන් ගඟින් එතෙර වී යා යුතු ය. ඔබ යා
යුත්තේ, ගණනින් ඔබට වඩා විශාල වූ ද
බලසම්පන්න වූ ද ජාතීන්ගේ රටවල් හා අහස් කුස
දක්වා නගින පවුරුවලින් වට වූ විශාල නගර
ආක්‍රමණය කරනු පිණිස ය. 2 ඒවායේ ඇත්තේ,

අනාක්වරුන්ගේ පෙළපතට අයිති ගණනින් විශාල
සෙනඟකි. ඔව්හු ඉතා උස මහත මිනිස්සු ය. ඔවුන්
ගැන ඔබ දන්නහු ය. 'අනාක්ගේ සෙනඟට විරුද්ධ ව
නැඟිට සිටින්නට හැක්කේ කාට දැ'යි යන කීම ද
ඔබ අසා ඇත. 3 එබැවින් අද දින ඔබ මෙය
වටහාගත යුතු ය. ඔබට පෙරටුවෙන් වඩින තැනැන්
වහන්සේ ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ය. බුර
බුරා නඟින ගින්නකින් මෙන් උන් වහන්සේ ඔවුන්
වනසාලනු ඇත. ඔබ බලා සිටිය දී ම උන් වහන්සේ
ඔවුන්ගේ බලය බිඳිනු ඇත. එවිට උන් වහන්සේ
වදාළ පරිදි ඔබ ඔවුන් පන්නාදමා, විගස වනසාදමනු
ඇත.
4 "ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ඔවුන් නෙරපා
දැමූ පසු, 'සමිඳාණන් වහන්සේ මේ රට මට අයිති
කර දීමට මා ගෙනාවේ මාගේ දැහැමිකම නිසා ය'යි
නොසිතන්න. එසේ නොව ඔබ ඉදිරියට යන විට
උන් වහන්සේ ඔවුන් පන්නා දැමුවේ මේ ජාතීන්ගේ
දුෂ්ටකම නිසා ය. 5 ඔවුන්ගේ රට ඔබ අයිති
කරගන්නට යනුයේ ඔබේ දැහැමිකම නිසා වත්,
ඔබේ සිත්හි අවංකකම නිසා වත්, නො වේ. එසේ
නොව, ඔබ යන විට ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ ඔවුන් පන්නා දමනුයේ මේ ජාතීන්ගේ
දුෂ්ටකම නිසා ය. මෙසේ කිරීමෙන් ඔබේ පියවරුන්
වන ආබ්‍රහම්ට, ඊසාක්ට සහ ජාකොබ්ට සමිඳාණන්
වහන්සේ දිවුළ වචනය ඉටු කරන සේක. 6 එබැවින්
ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ මේ සාර භූමිය
ඔබට අයිති කර දෙනුයේ ඔබේ දැහැමිකම නිසා
නොවන බව තේරුම්ගන්න. මන්ද, ඔබ වනාහි
මුරණ්ඩු සෙනඟකි."

### සෙනඟ කැරලි ගැසීම

7 "පාළුකරයේ දී ඔබ දෙවි සමිඳාණන් වහන්සේ
කුපිත කළ අන්දම අමතක නොකොට සිතේ
තබාගන්න. මිසර දේශයෙන් පිටත් වූ දා සිට
මෙතැනට එන තෙක් ම ඔබ සමිඳාණන් වහන්සේට
විරුද්ධ ව කැරලි ගැසුවහු ය. 8 හොරෙබ් කන්දේ දී
පවා ඔබ උන් වහන්සේ කුපිත කළහු ය. එවිට ඔබ
වනසාලන තරමට පවා උන් වහන්සේ ඔබ සමඟ
කිපුණ සේක. 9 නික්ම 24:18සමිඳාණන් වහන්සේ
ඔබ සමඟ පිහිටවූ ගිවිසුම සටහන් කළ ගල් පුවරු
ලබාගැනීම සඳහා මම කන්දට නැඟ එහි දවල්
සතළිසක් සහ රාත්‍රි සතළිසක් නැවතී සිටියෙමි.
එකල මම කිසිත් නොකා නොබී සිටියෙමි. 10 එවිට
දෙවියන් වහන්සේගේ ඇඟිල්ලෙන් ලියන ලද ගල්
පුවරු දෙක සමිඳාණන් වහන්සේ මට භාර දුන්
සේක. ජනතාව රැස් කළ දිනයෙහි ගින්න මැද සිට
සමිඳාණන් වහන්සේ කන්දේ දී ඔබ සමඟ කතා
කළ සියල්ල ම එහි සටහන් කර තිබිණි. 11 තවද,
දවල් සතළිසක් සහ රාත්‍රි සතළිසක් ගෙවී ගිය පසු
සමිඳාණන් වහන්සේ ගිවිසුම ලියා තිබූ ගල් පුවරු
දෙක මට දුන් සේක.
12 "එවිට සමිඳාණන් වහන්සේ මට කතා කොට,
'නැඟිට, ඉක්මනට කන්දෙන් බැස යන්න. නුඹ මිසර
දේශයෙන් පිටතට ගෙනා නුඹේ සෙනඟ තමන් ම
දූෂ්‍ය කරගෙන ඇත. මා ඔවුන්ට අණ කළ
මාර්ගයෙන් ඔවුන් විගස අන් අතකට හැරී ගොස්,
තමන්ට ම වාත්තු කළ පිළිමයක් සාදාගෙන ඇතැ'යි
වදාළ සේක.
13 "උන් වහන්සේ තවදුරටත් මට කතා කොට,
'මම මේ සෙනඟ දැන අඳුනමි. ඔවුන් මුරණ්ඩු
සෙනඟක් බව මට පෙනේ. 14 මිහි පිටින් ඔවුන්ගේ
නම මකා දමා, ඔවුන් වනසාලනු පිණිස මට ඉඩ
හරින්න. එහෙත්, මම නුඹගෙන්, ඔවුන්ට වඩා
බලසම්පන්න, ගණනින් විශාල ජාතියක් පිහිටුවමි'යි
වදාළ සේක.
15 "මම ද ආපසු හැරී කන්දෙන් බැස ආවෙමි. කන්ද
ගින්නෙන් දැවී දැවී තිබිණි. ගිවිසුමේ ගල් පුවරු දෙක
ද මා දෑතෙහි විය. 16 මම ද බලන විට, ඔබේ දෙවි
සමිඳාණන් වහන්සේට විරුද්ධ ව ඔබ පව් කර
තිබෙන බවත්, ඔබට ම වාත්තු කළ පිළිමයක්
තනාගෙන තිබෙන බවත් දිටිමි. සමිඳාණන් වහන්සේ
ඔබට අණ කළ මාර්ගයෙන් ඔබ විගස අන් අතකට
හැරී තිබිණි. 17 ඔබේ ඇස් ඉදිරියෙහි ම, මම ගල්
පුවරු දෙක ගෙන, දෑතින් ම විසිකොට බිඳ දැම්මෙමි.
18 එවිට මම කලින් කළාක් මෙන්, සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි දවල් සතළිසක් සහ රාත්‍රි
සතළිසක් මුණින්තළා වැඳ වැටී කිසිත් නොකා නොබී
සිටියෙමි. මා එසේ කළේ ඔබ බොහෝ සේ පව්
කොට, උන් වහන්සේ ඉදිරියෙහි දුෂ්ට ලෙස
හැසිරෙමින්, උන් වහන්සේ කුපිත කළ බැවිනි.
19 හෙබ්‍රෙව් 12:21ඔබ වනසාලනු පිණිස උන්
වහන්සේ උදහස් වීම ගැනත්, ඔබ කෙරෙහි වූ තද
අප්‍රසන්න ගතිය සහ කෝප වීම ගැනත් මම බිය
වුණෙමි. එහෙත්, සමිඳාණන් වහන්සේ ඒ අවස්ථාවේ
දී පවා මට සවන්දුන් සේක. 20 සමිඳාණන් වහන්සේ
ආරොන් ද විනාශ කරන පිණිස ඔහුට විරුද්ධ ව ඉතා
උදහස් ව සිටි සේක. මම ඒ අවස්ථාවේ දී ඔහු
උදෙසාත් යාච්ඤා කළෙමි. 21 මම ද ඔබේ පාපිෂ්ට
දේ වන ඔබ සෑදූ වස්සා ගෙන, ගින්නෙන් දවා
පුළුස්සා, කොටා, දූවිලි හා සමාන කුඩක් වන තෙක්
ඌ හොඳට අඹරා, ඒ දූවිලි කන්දෙන් ගලා ගිය දිය
පාරට දැමීමි.
22 නික්ම 17:7; ගණන් 11:3,34 "තවද, ඔබ
තාබෙරා, මස්සා සහ කිබ්‍රොත්-හත්තාවා යන
ස්ථානවල දී සමිඳාණන් වහන්සේ කුපිත කළහු ය.
23 ගණන් 13:25—14:38; ද්වි.නී. 1:21,26; හෙබ්‍රෙව්
3:16සමිඳාණන් වහන්සේ කාදෙෂ්-බර්නේය නම්
ස්ථානයෙන් ඔබ යවමින්, 'මා නුඹට දුන් දේශයට
ඇතුල් වී, එය අයිති කරගත යුතු ය' කියා කී විට,
ඔබේ දෙවි සමිඳාණන් වහන්සේගේ අණට විරුද්ධ ව
ඔබ කැරලි ගසා, උන් වහන්සේ අවිශ්වාස කොට,
උන් වහන්සේගේ හඬට සවන් නුදුන්නහු ය. 24 මා
ඔබ දැනගත් දා සිට ම ඔබ සමිඳාණන් වහන්සේට
විරුද්ධ ව කැරලි ගැසුවහු ය.

25 “ ‘සමිඳාණන් වහන්සේ වන මම ඔබ වනසමි’යි
වදාළ බැවින් මම උන් වහන්සේ ඉදිරියෙහි දාවල්
සතළිසක් සහ රාත්‍රි සතළිසක් මුණින්තලා වැටී
සිටියෙමි. 26 මම ද සමිඳාණන් වහන්සේට යාච්ඤා
කරමින්, ‘මහෝත්තම දෙවි ස්වාමීන් වහන්ස, ඔබ
බාහු බලය පාමින් මිසරයෙන් පිටතට ගෙනෙ, ඔබේ
බලසම්පන්න භාවය පෙන්වා ඔබ මුදාගත්, ඔබේ
උරුමයත්, සෙනඟත් විනාශ නොකළ මැනව.
27 ඔබේ දාසයන් වන ආබ්‍රහම් ද ඊසාක් ද
යාකොබ් ද සිහි කළ මැනව. මේ සෙනඟගේ
මුරණ්ඩුකම හෝ ඔවුන්ගේ දුෂ්ටකම හෝ පාප හෝ
ඔබ නොසැලකුව මැනව. 28 එසේ නැත්නම්,
සමිඳාණන් වහන්සේ වන ඔබ ඔවුන්ට පොරොන්දු
වූ දේශයට ඔවුන් ගෙන යෑමට ඔබට නොහැකි වූ
නිසාත්, ඔබ ඔවුන්ට වෛර කළ නිසාත්, ඔවුන් මරා
දමනු පිණිස මේ පාළුකරයට ගෙනා සේකැ යි, මිසර
වාසීන් කියනු ඇත. 29 මේ සෙනඟ වනාහි, ඔබ මහා
බලය පාමින් ඔබේ දිගු කළ හස්තයෙන් ඔබ මිසර
දේශයෙන් පිටතට ගෙනා ඔබේ උරුමය සහ ඔබේ
ම සෙනඟ ය’යි කීවෙමි.”

### මෝසෙස් යළි ආඥා ලබාගැනීම

(නික්ම 34:1-10)

10 “එකල සමිඳාණන් වහන්සේ මට කතා
කොට, ‘කලින් තිබුණු ගල් පුවරු මෙන් ගල්
පුවරු දෙකක් කපාගෙන මා වෙත කන්ද මුදුනට අවුත්
ලීයෙන් කරඬුවක් සාදන්න, 2 නුඹ බිඳ දැමූ පළමු
පුවරුවල තිබූ වචන මේ පුවරුවල නැවත මම
ලියන්නෙමි. නුඹ ඒවා කරඬුව තුළ දැමිය යුතු ය’යි
වදාළ සේක.
3 “මම ද ෂිටිම් ලීයෙන් කරඬුවක් සාදා, කලින් තිබූ
පුවරු හා සමාන ගල් පුවරු දෙකක් කපාගෙන ඒ
පුවරු දෙක අතට ගෙන කන්දට නැංගෙමි. 4 එවිට
උන් වහන්සේ රැස්වීම පැවැත්වූ දින ගින්න මැද සිට
කන්දේ දී ඔබට සමිඳාණන් වහන්සේ වදාළ දස
පණත කලින් ලියූ පරිදි ගල් පුවරු මත ලියූ සේක.
මෙසේ ලියා මට දුන් පසු 5 මම ආපසු හැරී,
කන්දෙන් බැස අවුත් මා සෑදූ කරඬුව තුළ ඒවා
දැමුවෙමි. උන් වහන්සේ මට අණ කළ පරිදි ඒවා අද
දක්වා එහි ඇත.
6 ගණන් 20:28; 33:38 “ඉශ්‍රායලයේ ජනයා බෙනේ-
ජාකන් නම් ස්ථානයේ සෙනඟට අයිති ළිං තිබූ
තැනින් නික්ම මොසේරා දක්වා ගමන් ගත්හ. එහි දී
ආරොන් මරණයට පත් වූයෙන් එහිම භූමදාන කරන
ලදී. ඔහු වෙනුවට ඔහුගේ පුත් එලයාසර් පූජක
නිලයේ සේවය කළේ ය. 7 එතැනින් ඔව්හු
ගුද්ගොදා නම් ස්ථානයට ද මෙතැනින් ජලය බහුල
ව තිබූ ජොත්බාතා නම් රටට ද පිටත් ව ගියහ.
8 ගණන් 3:5-8එකල සමිඳාණන් වහන්සේ තමන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව උසුලාගෙන යනු
සඳහා ද උන් වහන්සේ ඉදිරියෙහි සේවය කිරීමට ද
සිය නාමයෙන් ආශීර්වාදය පැවසීමට ද අද දක්වා ම
පැවත එන පරිදි ලෙවීගේ ගෝත්‍රයේ ජනයා පත්
කළ සේක. 9 එබැවින් ලෙවීගේ ගෝත්‍රයේ ජනයාට
ඔහුගේ සහෝදරයන්ගේ ගෝත්‍රවල අයට මෙන්
රටින් කොටසක් උරුම වී නැත. ඔබේ දෙවි
සමිඳාණන් වහන්සේ පොරොන්දු වූ ලෙස ඔවුන්ගේ
උරුම කොටස සමිඳාණන් වහන්සේ ම වන සේක.
10 නික්ම 34:28 “මම පළමුවෙන් කළාක් මෙන් දවල්
සතළිසක් සහ රාත්‍රි සතළිසක් කන්ද මත නැවතී
සිටියෙමි. එවිට පවා උන් වහන්සේ මට සවන් දී ඔබ
විනාශ නොකිරීමට එකඟ වූ සේක. 11 උන්
වහන්සේ මා අමතා, ‘නුඹේ පියවරුන්ට දෙන්නට
දිවුළ දේශයට ඇතුළු වී එය අයිති කරගනු පිණිස,
නැඟිට සෙනඟට පෙරටුවෙන් යන්නැ’යි වදාළ සේක.”

### කීකරු වීමට දේව අණ

12 “දැන් ඉතින් ඉශ්‍රායලයේ ජනයෙනි, දෙවි
සමිඳාණන් වහන්සේට ඔබෙන් උවමනා වී ඇත්තේ
කුමක් ද? උවමනා වී ඇත්තේ දෙවි සමිඳාණන්
වහන්සේට ගරුබිය පෑමත්, උන් වහන්සේගේ සියලු
මාර්ගවල යෑමත්, උන් වහන්සේට ප්‍රේම කිරීමත්,
ඔබේ මුළු හෘදයෙන් ද ඔබේ මුළු සිතින් ද උන්
වහන්සේට වැඳුම්පිදුම් කිරීමත්, 13 මා අද දින ඔබේ
ශුභසිද්ධිය තකා ඔබට අණ කරන උන් වහන්සේගේ
අණපණත්, නීති හා නියෝග පිළිපැදීමත් ය.
14 බලන්න, ස්වර්ගයත්, ස්වර්ගයෙහි ස්වර්ගයත්,
පොළොවත්, එහි ඇති සියල්ලත් අයිති ඔබේ දෙවි
සමිඳාණන් වහන්සේට ය. 15 එහෙත්, උන් වහන්සේ
ඔබේ පියවරුන්ට ඉමහත් ප්‍රේමයක් දක්වමින්
ඔවුන්ගෙන් පසු, අද පවතින පරිදි, ඔවුන්ගේ
පළපත වන ඔබ ද අන් සියලු ජාතීන් අතරින්
තෝරාගත් සේක. 16 එබැවින් ඔබේ සිත් සතන්හි
පාප මල කපා හැර, මින්පසු මුරණ්ඩු නොවන්න.
17 ක්‍රියා 10:34; රෝම 2:11; ගලා 2:6; එපී 6:9; 1
තිමෝ 6:15; එළිද 17:14; 19:16ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ දේවාතිදේව ය. ස්වාමිවරුන්ගේ
සමිඳාණන් වහන්සේ ය. උන් වහන්සේ මහා
බලසම්පන්න, බිය උපදවන සුලු, මිනිසුන්ගේ
තරාතිරම් නොබලන, අල්ලස් නොගන්න දෙවියන්
වහන්සේ ය. 18 උන් වහන්සේ අනාථ වූවන්ට සහ
වැන්දඹුවන්ට යුක්තිය ඉටු කරන සේක.
ආගන්තුකයන් හට කෑම, ඇඳීම දෙමින් ප්‍රේමය
දක්වන සේක. 19 බැවින්, ඔබ ද මිසර දේශයෙහි
ආගන්තුකයන් ව සිටි බැවින්, මොවුන්ට ප්‍රේමය
දක්වන්න. 20 ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට
පමණක් ඔබ ගරුබිය දක්වමින් උන් වහන්සේට
පමණක් වැඳුම්පිදුම් කළ යුතු ය. උන් වහන්සේට
පමණක් ඇළුම් ව සිටිය යුතු ය. උන් වහන්සේගේ
නාමයෙන් පමණක් දිවුරුම් දිය යුතු ය. 21 ඔබ
ප්‍රශංසා කළ යුත්තේ, බල බලා සිටිය දී ම මේ
මහා භයානක දේවල් ඔබ උදෙසා ඉටු කළ, ඔබේ
දෙවියන් වහන්සේට ය. 22 උත් 15:5; 22:17;
46:27ඔබේ පියවරුන් මිසර දේශයට යන විට
සිටියේ හැත්තෑදෙනෙකි. එහෙත්, දැන් නම් ඔබේ
දෙවි සමිඳාණන් වහන්සේ අහසේ තරු මෙන්
ගණනින් ඔබ වැඩි වර්ධනය කර ඇත.”

### සමිඳාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය

11 “ඔබ දෙවී සමිඳාණන් වහන්සේට ප්‍රේම
කොට, නිතර ම උන් වහන්සේගේ
අනුශාසනා ද නීති නියෝග සහ අණපණත් ද
පිළිපැදිය යුතු ය. 2 අද දින මයෙ දැනගන්න. මා කතා
කරන්නේ ඒවා නොදත් ඔබේ දරුවන් සමඟ නොව
ඔබ සමඟ ය. ඔබේ දරුවෝ වනාහි, ඔබේ දෙවී
සමිඳාණන් වහන්සේ එවූ දඬුවම් ද, උන්
වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය සහ බාහු බලය ද, දිගු
කළ හස්තය ද, 3 නික්ම 7:8—12:13මිසරයේ රජ වූ
පාරාවෝට සහ ඔහුගේ මුළු රටටත්, මිසරය මැද
කළ හාස්කම් සහ ප්‍රබල ක්‍රියා ද, 4 නික්ම
14:28මිසරයේ හමුදාවටත් ඔවුන්ගේ අශ්වයන්ට සහ
රථවලටත් උන් වහන්සේ කළ දේ ද, ඔවුන් ඔබ
ලුහුබැඳ යද්දී රතු මුහුදේ වතුර ඔවුන් මත ගලා
යෑමට සලස්වා ඔවුන් සහමුලින් ම වැනසූ අන්දම ද,
5 ඔබ මේ ස්ථානයට එන තෙක් පාළුකරයේ දී උන්
වහන්සේ ඔබට කළ දේ ද, 6 ගණන්
16:31-32රූබන්ගේ පුත් එලියාබ්ගේ පුත්‍රයා වන
දාතාන්ට සහ අබීරාම්ට කළ දේ ද, මුළු ඉශ්‍රායලේ
ජනයා මැද පොළොව විවර වී ඔවුන් ද ඔවුන්ගේ
ගවෙසියන් ද කූඩාරම් ද ඔවුන් සතු සියලු සම්පත ද
ගිලගත් ආකාරය ද නුදුටුවහු ය. 7 එහෙත්,
සමිඳාණන් වහන්සේ කළ සියලු ප්‍රබල ක්‍රියා ඔබේ
දෙනෙතින් ඔබ දුටුවහු ය.”

### පොරොන්දු දේශයේ ආශීර්වාද

8 “එබැවින් මා ඔබට අද දින නියම කරන සියලු
අණපණත් ඔබ පිළිපැදිය යුතු ය. එසේ කළොත්,
ඔබ ශක්තිමත් වී, හිමි කරගන්නට යන දේශයට
ඇතුළු වී එය අයිති කරගනු ඇත. 9 සමිඳාණන්
වහන්සේ ඔබේ පියවරුන්ටත්, ඔවුන්ගේ පළෙපතටත්
දෙන්නට පොරොන්දු වූ කිරෙන් සහ මී පැණියෙන්
ඉතිරෙන ඒ දේශයෙහි ඔබට චිරාත් කාලයක් ජීවත්
වීමට හැකි වනු ඇත. 10 ඔබ අයිති කරගන්නට යන
දේශය ඔබ නික්ම පැමිණි මිසර දේශය මෙන්
නොවේ. මිසරයේ නම් වැපුරුවායින් පසු, එළවළු
වත්තකට මෙන් ජල රෝදයක් පෑගීමෙන් ජලය
සැපයීම කළ යුතුව තිබුණි. 11 එහෙත්, ඔබ අයිති
කරගන්නට යන රට, අහසින් වහින වැහි වතුර උරා
බොන කඳුවැටිවලින් හා නිම්නවලින් යුත් එකකි.
12 එය ඔබේ දෙවී සමිඳාණන් වහන්සේ සලකන
රටකි, අවුරුද්දේ මුල සිට අග දක්වා උන්
වහන්සේගේ බැල්ම නිතර ම ඒ රට කෙරෙහි යොමු
ව පවතී.
13 ලෙවී 26:3-5; ද්වි.නී. 7:12-16; 28:1-14 “අද දින
මා ඔබට නියම කරන අණපණත්වලට ඔබ
උනන්දුවෙන් සවන් දී, ඔබේ දෙවී සමිඳාණන්
වහන්සේට ප්‍රේම කොට, ඔබේ මුළු හෘදයෙන් ද,
ඔබේ මුළු ආත්මයෙන් ද උන් වහන්සේට වැඳුම්පිදුම්
කරන්නහු නම්, 14 ඔබේ දේශයට නියම කාලය වන
සරත් කාලයේ දී සහ වසන්තයේ දී වැසි වස්වනු
ඇත. එවිට ඔබට ඔබේ ධනධාන්‍ය ද මිදිපල ද තෙලේ
ද එකතු කරගත හැකි ය. 15 ඔබේ ගවමහිෂයන්
සඳහා කෙතේවල තණ වැවෙන්නට ද සලස්වනු ඇත.
ඔබට කෑම කා තෘප්තිමත් වීමට හැකි වනු ඇත.
16 එහෙත්, අන් මඟක ගොස්, අන් දෙවී
දේවතාවන්ට වැඳුම්පිදුම් හා නමස්කාර කරන සේ
නොරැවටෙන්නට වගබලාගන්න. 17 ඔබ එසේ
නොකළොත්, ඔබට විරුද්ධ ව සමිඳාණන්
වහන්සේගේ උදහස ඇවිලෙනු ඇත. වැසි නොවස්නා
පිණිස ද, පොළොවෙන් පලදාව ඇති නොවන පිණිස
ද උන් වහන්සේ අහසේ වැහි කවුළු වසා දමන
සේක. එවිට උන් වහන්සේ ඔබට දෙන සාර
භූමියෙහි ඔබ විගස මියයනු ඇත.
18 ද්වි.නී. 6:6-9 “එබැවින් ඔබ හැම මාගේ මේ
වචන ඔබේ හදවතෙහි ද සිතෙහි ද තැන්පත්
කරගත යුතු ය. ඔබේ අත්වල ලකුණක් මෙන් ද
ඔබගේ නළල මත පටි මෙන් ද ඒවා බැඳගත යුතු
ය. 19 ඒවා ඔබේ දරුදැරියන්ට ඉගැන්විය යුතු ය. ඔබ
ගෙදර සිටින විට ද, පාරේ යන එන විට ද,
සැතපෙන විට හා අවදි වන විට ද ඒවා ගැන කතා
කළ යුතු ය. 20 ඒවා ඔබේ ගෙදර උළුවහුවල ද
දොරටුවේ ද සටහන් කළ යුතු ය. 21 එසේ කළොත්,
සමිඳාණන් වහන්සේ ඔබේ පියවරුන්ට දෙන්නට
පොරොන්දු වූ දේශයෙහි ඔබේ ආයු කාලයත් ඔබේ
දරුදැරියන්ගේ ආයු කාලයත් මිහි පිට ඉර හඳ
පවතින තාක් දික් වන්නේ ය.
22 “මා ඔබට නියම කරන මේ සියලු අණපණත්
ඔබ උනන්දුවෙන් ආරක්ෂා කොට, ඒවා පිළිපදිමින්,
ඔබේ දෙවී සමිඳාණන් වහන්සේට ප්‍රේමය දක්වා
උන් වහන්සේගේ සියලු මාර්ගවල යමින්, උන්
වහන්සේට ඇලුම් ව සිටින්නහු නම්, 23 උන්
වහන්සේ ඔබට පෙරටුවෙන් මේ සියලු ජාතීන්
පන්නාදමන සේක. ඔබ ද ඔබට වඩා ගණනින්
විශාල, බලසම්පන්න ජාතීන්ට අයත් රටවල් අයිති
කරගන්නහු ය. 24 ජෝෂු 1:3-5ඔබ පස් පාගන හැම
තැනක් ම ඔබට අයිති වනු ඇත. පාළුකරයේ සිට
ලෙබනොන් දේශය දක්වා ද, යුප්‍රටීස් ගංගාවේ සිට
මධ්‍යධරණි මුහුද දක්වා ද දේශය ඔබේ වන්නේ ය.
25 ඔබට විරුද්ධ ව කිසිවකුට නැඟිට සිටීමට හැකි
නොවනු ඇත. ඔබේ දෙවී සමිඳාණන් වහන්සේ
ඔබට වදාළ ලෙසෙ ඔබ පස් පාගන සෑම රටක් පිට ම
ඔබ ගැන භීතිය සහ සන්ත්‍රාසය එවනු ඇත.
26 “මෙන්න, මම අද දින ඔබට තෝරා ගැනීමට
ආශීර්වාදයක් ද සාපයක් ද ඔබ ඉදිරියෙහි තබමි.
27 මම අද දින ඔබට නියම කරන ඔබේ දෙවී
සමිඳාණන් වහන්සේගේ අණපණත්වලට ඔබ කීකරු
වන්නහු නම්, එය ආශීර්වාදයක් වන්නේ ය. 28 දෙවී
සමිඳාණන් වහන්සේගේ අණපණත්වලට අකීකරු වී,
මා අද දින නියම කරන මාර්ගයෙන් අන් අතකට
හැරී, ඔබ නාඳුනන අන් දෙවිදේවතාවන් පසුපස
යන්නහු නම්, එය සාපයක් වන්නේ ය. 29 ද්වි.නී.
27:11-14; ජෝෂු 8:33-35ඔබ අයිති කරගන්නට යන
දේශයට දෙවී සමිඳාණන් වහන්සේ ඔබ ගෙනො කල,
ගෙරිසිම් කන්ද මත ආශීර්වාදය ද ඒබාල් කන්ද මත

සාපය ද ප්‍රකාශ කළ යුතු ය. 30 මේ කඳු දෙක,
ජෝර්දාන් ගඟින් එතෙර, බටහිරට පිහිටි
කානානිවරුන් වසන මිටියාවතෙහි ගිල්ගාල් නගරය
අසල මෝරෙහ්ගේ ආලෝන අරඹ ළඟ පිහිටා තිබේ.
31 දෙවි සමිඳාණන් වහන්සේ ඔබට දෙන දේශයට
ඔබ ඇතුළු වී එය අයිති කරගන්නා පිණිස ඔබ
ජෝර්දාන් ගඟෙන් එතෙර වන්නහු ය. ඔබ ද එය
අයිති කරගෙන එහි පදිංචි වන්නහු ය. 32 මා අද දින
ඔබ ඉදිරියෙහි තබන සියලු නීති හා නියෝග ඔබ
ආරක්ෂා කරමින් පිළිපැදිය යුතු ය.”

### වන්දනාව සඳහා එක ස්ථානයක්

12 “ඔබේ පියවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේ ඔබට අයිති කරගැනීමට දෙන
දේශයෙහි දී දිවි ඇති තාක් ඔබ ආරක්ෂා කළ යුතු
නීති හා නියෝග මේවා ය. 2 ඔබ යටත් කරගන්න
ජාතීන් තමන්ගේ දෙවිදේවතාවන්ට වැඳුම්පිදුම් කළ
උස් කඳු මත ද, කඳු හෙලේ මත ද, සෑම අතුපතර
ඇති ගසක් යට ද වූ සියලු වන්දනා ස්ථාන සහමුලින්
ම වනසා 3 ද්වි.නී. 7:5ඔවුන්ගේ පූජාසන කඩාදමා,
රූපස්තම්භ බිඳදමා, අෂේරා කප් කණු ගින්නෙන්
පිළිස්සිය යුතු ය. ඔවුන්ගේ දෙවිදේවතාවන්ගේ
නෙළූ පිළිම ද සිඳදමා, එම ස්ථානවලින් ඔවුන්ගේ
නාම මකාදැමිය යුතු ය.
4 “එහෙත් ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට ඔබ
එලෙස වැඳුම්පිදුම් කළ යුතු නොවේ. 5 ඔබේ
ගෝත්‍ර සියල්ල අතරෙන්, තමන් වහන්සේගේ
නාමය පිහිටුවනු සඳහා ද වාසස්ථානය වනු පිණිස ද
ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ තෝරාගන්න
ස්ථානය ඔබ සොයා යා යුතු ය. 6 එම ස්ථානයට
ඔබේ දවන යාග පූජා ද විශේෂ පඬුරු ද දසයෙන්
කොටස ද දෑතින් පුදන විශේෂ පූජා ද බාර ද
ස්වේච්ඡා පූජා ද ගව පට්ටිවල හා එළු පට්ටිවල
කුලුඳුල් සතුන් ද ඔබ ගෙනා යුතු ය. 7 එහි දී ඔබ ද
ඔබේ ගෙවැසියන් ද දෙවි සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි ආහාර අනුභව කොට ඔබ හැම උන්
වහන්සේගේ ආශීර්වාදයට පාත්‍ර වී ඔබ කළ
සියල්ල ගැන ප්‍රීති ප්‍රමෝද විය යුතු ය.
8 “අද දක්වා අපේ සෑම කෙනෙකු ම නමස්කාර
කර ඇත්තේ තම තමාට කැමැති අයුරින් ය. එහෙත්,
මින්පසු එලෙස නොකළ යුතු ය. 9 මන්ද, ඔබ තව ම
ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ දෙන්නට යන
උරුමයටත්, වාසස්ථානයටත් නොපැමිණියහු ය.
10 ඔබ ජෝර්දාන් ගඟෙන් එතෙර වී, ඔබේ දෙවි
සමිඳාණන් වහන්සේ ඔබට උරුම කොට දෙන
දේශයෙහි පදිංචි වී, ඔබට එහි සුරැකි ව වසන සේ
ඔබ වටකර සිටින සියලු සතුරන්ගෙන් රැකවරණය
ඔබ ලබාගත් පසු 11 තමන් වහන්සේගේ නාමය
එහි පිහිටුවනු පිණිස උන් වහන්සේ යම්කිසි
ස්ථානයක් තෝරාගන්න සේක. ඔබේ දවන යාග
පූජා ද විශේෂ පූජා ද, දසයෙන් කොටස ද දෑතින්
පුදන විශේෂ පඬුරු ද සමිඳාණන් වහන්සේට කළ
විශේෂ බාර ද යන සියල්ල ඔබ එතැනට ගෙනා යුතු
ය. 12 එවිට ඔබේ සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි
ඔබ ද ඔබේ දරුදැරියන් ද ඔබේ දැසිදසුන් ද ඔබේ
වාසල් දොරටු ඇතුළත සිටින ලෙවීවරුන් ද ප්‍රීති
ප්‍රමෝද විය යුතු ය. ලෙවීවරුන්ට වනාහි ඔබ සමඟ
උරුමයක් හෝ රටින් කොටසක් හෝ අයිති නොවනු
ඇත. 13 ඔබ කැමැති කැමැති තැන්වල දවන යාග
පූජා නොපිදීමට වගබලාගන්න. 14 සමිඳාණන්
වහන්සේ ඔබේ ගෝත්‍ර අතරෙන් එක ගෝත්‍රයක්
වසන පෙදෙසෙක යම් ස්ථානයක් තෝරාගන්න සේක්
ද, එහි දී ඔබේ දවන යාග පූජා පිදිය යුතු ය. මා
ඔබට අණ කරන සියල්ල එහි දී පමණක් කළ යුතු
ය.
15 “එහෙත් ඔබේ වාසල් දොරටු ඇතුළත, ඔබේ
දෙවි සමිඳාණන් වහන්සේ ආසිරි වශයෙන් ඔබට
දෙන පරිදි, ඔබ කැමැති ලෙස සතුන් මරා ඔබට මස්
අනුභව කළ හැකි ය. ඔබ මුව මස් සහ ගෝන මස්
අනුභව කරන්නාක් මෙන් වත්පිළිවෙතේ අනුව, පවිත්‍ර
අයට මෙන් අපවිත්‍ර අයටත් ඒවා අනුභව කළ හැකි
ය. 16 උත් 9:4; ලෙවී 7:26-27; 17:10-14; 19:26;
ද්වි.නී. 15:23එහෙත්, ඔබ සතුන්ගේ ලේ කෑමට ගත
යුතු නොවේ. බීම වතුර වත් කරන්නාක් මෙන් එය
බිමට වත් කළ යුතු ය. 17 වාසල් දොරටු තුළ
ධනධාන්‍යවලින් හෝ මිදියුසවලින් හෝ තෙලේවලින්
හෝ දසයෙන් කොටස නොකෑ යුතු ය. තවද, එහි දී
ගව පට්ටිවල වත්, එළු බැටළු පට්ටිවල වත් කුලුඳුල්
සතුන් හෝ ඔබ පොරොන්දු වූ බාරවලින් යමක්
හෝ ස්වේච්ඡා පූජා හෝ දෑතින් පුදන විශේෂ පඬුරු
හෝ නොකෑ යුතු ය. 18 ඔබ ද ඔබේ දරුදැරියන් ද
දැසිදසුන් ද ඔබේ වාසල් දොරටු ඇතුළත සිටින
ලෙවීවරුන් ද ඒවා වැළඳිය යුත්තේ ඔබේ දෙවි
සමිඳාණන් වහන්සේ තෝරා, නියම කරන
ස්ථානයෙහි උන් වහන්සේ ඉදිරියෙහි ය. තවද, ඔබ
අතින් පුදන සියල්ල ගැන ද උන් වහන්සේ ඉදිරියෙහි
ප්‍රීති ප්‍රමෝද විය යුතු ය. 19 ඔබේ දේශයෙහි
ඔබට දිවි ඇති තාක්, ලෙවීවරුන් අත් නොහැරීමට
වගබලාගන්න.
20 “දෙවි සමිඳාණන් වහන්සේ ඔබට පොරොන්දු වූ
පරිදි, උන් වහන්සේ ඔබේ දේශ සීමා විශාල කළ
කල්හි, ඔබට මස් කෑමට දැඩි ආශාවක් ඇති
වුවහොත්, ඔබ කැමැති පරිදි ඔබට මස් කෑ හැකි ය.
21 දෙවි සමිඳාණන් වහන්සේ තම නාමය පිහිටුවීම
සඳහා තෝරාගත් ස්ථානය දුර නම්, මා ඔබට අණ
කළ පරිදි උන් වහන්සේ දුන් ගව පට්ටිවලින් සහ
එළු බැටළු පට්ටිවලින් ඔබ කැමැති පරිදි සතුන් මරා,
වාසල් දොරටු ඇතුළත ඔබට අනුභව කළ හැකි ය.
22 මුව මස් සහ ගෝන මස් කන්නාක් මෙන්
වත්පිළිවෙතේ අනුව, පවිත්‍ර වූ හෝ අපවිත්‍ර වූ හෝ
ඕනෑ ම කෙනෙකුට ඒ මස් කෑ හැකි ය. 23 ලෙවී
17:10-14එහෙත් ලේ කෑමෙන් නම් පරෙස්සම් විය
යුතු ය. මන්ද, ලේ ප්‍රාණය වන බැවින්, මස් සමඟ
ලේ අනුභව නොකළ යුතු ය. 24 එය අනුභව
නොකර වතුර මෙන් බිම වත් කළ යුතු ය. 25 ඔබ
ලේ කෑමට නොගෙන සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි යුතු දේ කරන බැවින් ඔබටත්, ඔබෙන්

පසු ඔබේ දරු පරපුරටත් සෙත සැලසෙනු ඇත.
26 ඔබ සතු ශුද්ධ දේවල් සහ බාර පමණක් රැගෙන
සමිඳාණන් වහන්සේ තෝරා නියම කරන ස්ථානයට
යා යුතු ය. 27 තවද, ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේගේ පූජාසනය මත දවන යාග පූජා ද
එනම්, දේව පූජාසනය මත ලේ වගුරුවා මාංස
අනුභව කළ යුතු අනිකුත් පූජා ද ඔප්පු කළ යුතු ය.
ඔබේ යාග පූජාවල ලේ ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේගේ පූජාසනය පිට වත් කළ යුතු ය.
මාංසය ඔබට අනුභව කරන්නට පුළුවන. 28 මා
ඔබට අණ කරන මේ සියල්ලට සවන් දී ඒවා
පිළිපදින්න. මෙලෙස ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි ඔබ දැහැමි දේ හා කළ යුතු
දේ කරන බැවින් ඔබටත්, ඔබෙන් පසු ඔබේ දරු
පරපුරටත් සදහට ම සෙත සැලසෙනු ඇත.”

### රූප වන්දනාවට විරුද්ධ ව අවවාද

29 “ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබ අයිති
කරගන්නට යන දේශයෙහි ජාතීන් වනසාදැමූ කල්හි
ඔබ ඔවුන් පන්නාදමා, ඔවුන්ගේ දේශයෙහි පදිංචි වූ
කල 30 ඔබට කලින් විනාශ වී ගිය ඔවුන් පසුපස
යෑමට නොරැවටෙන ලෙස හොඳින් වගබලාගන්න.
තවද, මේ ජාතීන් ඔවුන්ගේ දේවදේවතාවන්ට
වැඳුම්පිදුම් කළේ කෙසේ ද ‘මමත් එසේ කරමි’
කියා ඔවුන්ගේ දේවදේවතාවන් ගැන විස්තර
නොසොයන්න. ඔබ එසේ කළොත්, ඔබත් ඔවුන්
මෙන් වනු ඇත. 31 ඔබ නම්, ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේට එලෙස නොකළ යුතු ය. සමිඳාණන්
වහන්සේ වෛර කරන සෑම පිළිකුල් දෙයක් ම ඔවුන්
තමන්ගේ දේවදේවතාවන් සම්බන්ධයෙන් කර ඇත.
ඔව්හු තමන්ගේ දේවදේවතාවන් සඳහා ඔවුන්ගේ
දරුදැරියන් පවා ගින්නේ පිළිස්සූ හ.
32 ද්වි.නී. 4:2; එළිද 22:18-19 “මා අණ කරන සෑම
දෙයක් ම ඔබ ආරක්ෂා කොට පිළිපදින්න. ඒවාට
අමතර ව යමක් එකතු නොකළ යුතු ය. ඒවායින්
යමක් අඩු නොකළ යුතු ය.

13 “ඔබ අතර දිවැසිවරයකු හෝ ස්වප්න
තෝරන්නකු හෝ පහළ වී, ඔබට
හාස්කමක් හෝ අරුමපුදුම දෙයක් හෝ පාන්නට
යෝජනා කොට, 2 ඔහු කී අයුරින් ඒ හාස්කම් හෝ
අරුමපුදුම දේ හෝ සිදු වී ඔබ නොහඳුනන අන්
දේවදේවතාවන් පසුපස ගොස්, ‘අපි ඔවුන්ට
වැඳුම්පිදුම් කරමු’යි කීවොත්, 3 එවැනි
දිවැසිවරයකුගේ හෝ ස්වප්න තෝරන්නකුගේ
හෝ කීම්වලට ඔබ සවන් නොදිය යුතු ය. මෙවැනි
දේවලින් ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට ඔබේ
මුළු හෘදයෙන් සහ ඔබේ මුළු සිතින් ප්‍රේම
කරන්නහු දැ යි උන් වහන්සේ ඔබ පරීක්ෂා කරන
සේක. 4 ඔබ හැම, දෙවි සමිඳාණන් වහන්සේ අනුව
ගොස්, ගරුබිය දක්වා, උන් වහන්සේගේ ආඥා
ආරක්ෂා කොට, හඬට කීකරු වී උන් වහන්සේට
වැඳුම්පිදුම් කොට, ඇළුම් ව සිටිය යුතු ය. 5 ඒ
දිවැසිවරයා හෝ ස්වප්න තෝරන්නා හෝ මරණයට
පත් කළ යුතු ය. මන්ද, මිසර දේශයෙන් ඔබ පිටතට
ගෙන, වහල්කමේ නිවාසයෙන් ඔබ මුදාගත්, ඔබේ
දෙවි සමිඳාණන් වහන්සේගෙන් ඔබ ඈත් කිරීමට
ඔහු වැරවැයම් කළ බැවිනි. ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ ඔබට අණ කළ මාර්ගයෙන් ඔබ ඉවත්
කිරීමට ඔහු වෑයම් කළ බැවින් ඔබ අතරෙන් එවැනි
නපුරක් පහකොට දැමිය යුතු ය.
6+DEU “එක මවකගෙන් උපන් ඔබේ සහෝදරයා
හෝ ඔබේ පුතා හෝ දුව හෝ ඔබ ප්‍රේම කරන
ඔබේ බිරිඳ හෝ ඔබට පණ මෙන් සිටින ඔබේ
මිතුරා හෝ රහසින් ඔබ පොළඹවමින් ඔබ වත්
ඔබේ පියවරුන් වත් නොදත්, ඔබ අවට ඉතා
කිට්ටුවෙන් හෝ බොහෝ දුරින් හෝ ලෝකයේ එක්
කෙළවරක සිට අනික් කෙළවර දක්වා හෝ සිටි
ජනතාවන්ගේ ‘දේවදේවතාවන්ට වැඳුම්පිදුම් කිරීමට
යමු’යි කීවොත්, 8 ඔබ එවැන්නකුට සවන් දී, එකඟ
නොවිය යුතු ය. ඔහුට කිසි අනුකම්පාවක්
නොදක්වා, ඔහු ඉතුරු නොකර, ඔහුගේ වරද
නොසඟවා, 9 මරාදැමිය යුතු ම ය. ඔහු මරාදමනු
පිණිස පළමුවෙන් ඔබ ද ඉන්පසු සෙනඟ ද තම
තමන්ගේ අත්වලින් ගල් ගැසිය යුතු ය.
10 වහල්කමේ නිවාසය වන මිසර දේශයෙන් ඔබ
පිටතට ගෙන ඔබේ දෙවි සමිඳාණන් වහන්සේගෙන්
ඔබ ඉවත් කිරීමට එවැන්නකු වෑයම් කළ බැවින්
ඔහුට ගල් ගසා මරාදැමිය යුතු ය. 11 මුළු ඉශ්‍රායලේ
ජනයා මේ දේ ගැන ඇසූ කල, ඔවුන් බිය වී ඔබ
අතර මෙවැනි දුෂ්ටකමක් මින්පසු නොකරනු ඇත.
12 “ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබට පදිංචි
වීමට දුන් යම්කිසි නගරයක 13 ඔබ අතර වසන,
අධම මිනිසුන් කීප දෙනෙක් පිටත් ව ගොස් ඒ
නගරවාසීන් අමතා, ‘ඔබ නොදත් දේවදේවතාවන්ට
වැඳුම්පිදුම් කිරීමට යමු’යි කියා ඔවුන් නොමඟ
හැරිය බව ඔබට අසන්නට ලැබුණොත්, 14 ඔබ ඒ
ගැන විමසා සොයා බලා, හොඳින් තතු දැනගෙන,
මෙබඳු පිළිකුල් දෙයක් ඔබ අතර ඇත්තට ම කිසි
සැකයක් නැතුව ම සිදු වී යයි ඒත්තු ගියහොත්,
15 ඒ නගර වැසි සියල්ලන්ට ම කඩුවෙන් පහර දී
සහමුලින් ම වනසාලිය යුතු ය. තවද, එහි ඇති
සියල්ලන්ට ද ගවමහිෂයන්ට ද කඩුවෙන් පහර දී
සහමුලින් වනසාදැමිය යුතු ය. 16 ඉන්පසු එහි ධන
සම්පත වීදිය මැදට රැස්කොට, ඒ නගරය ද ඒ ධන
සම්පත් සියල්ල ද ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ
උදෙසා ගින්නෙන් පුළුස්සාදැමිය යුතු ය. ඒ නුවර
නැවත ඉදි නොකළ යුතු අතර එය නටබුන් ගොඩක්
ලෙස ම, සදහට ම තිබෙන්නට හැරිය යුතු ය.
17 විනාශයට කැප කළ දෙයින් කිසිවක් ඔබ අත
ඉතිරි කර නොගත යුතු ය. එවිට සමිඳාණන්
වහන්සේ ඔබේ පියවරුන්ට දිවුරා පොරොන්දු වූ
ලෙස සිය දැඩි කෝපය සන්සිඳුවාගෙන ඔබ වෙත
දයානුකම්පාව දක්වා උන් වහන්සේ ඔබ ගණනින්
වර්ධනය කරන සේක. 18 එසේ කරන්නේ ඔබේ
දෙවි සමිඳාණන් වහන්සේගේ හඬට සවන් දී, මා
ඔබට අද නියම කරන උන් වහන්සේගේ ආඥා

සියල්ල ආරක්ෂා කොට, උන් වහන්සේ අබිමුව
දැහැමි දේ කළහොත් පමණක් ය.”

### තහනම් අවමඟුල් වත්පිළිවෙත්

14 ලෙවී 19:28; 21:5 “ඔබ දෙවි සමිඳාණන්
වහන්සේගේ දරුවෝ ය. මළවුන් නිසා ඔබ
ශරීරය කපා නොගත යුතු ය. ඔබේ නළලට ඉහළින්
කෙස් රොද කපා නොගත යුතු ය. 2 නික්ම 19:5-6;
ද්වි.නී. 4:20; 7:6; 26:18; තීතස් 2:14; 1 පේදු 2:9ඔබ
දෙවි සමිඳාණන් වහන්සේට කැප වූ සෙනඟකි. මිහි
පිට සියලු ජාතීන් අතරෙන් සමිඳාණන් වහන්සේ සතු
විශේෂ සෙනඟක් වන පිණිස උන් වහන්සේ ඔබ
තෝරාගත් සේක.”

### පවිත්‍ර සහ අපවිත්‍ර සතුන්
(ලෙවී 11:1-47)

3 “ඔබ කිසි පිළිකුල් දෙයක් නොකෑ යුතු ය.
4 ඔබට කන්නට අවසර ඇති සත්තු නම් ගවයා,
බැටළුවා, එළුවා, 5 ගෝනා, තිත්මුවා, වැලිමුවා, වල්
එළුවා, ඕලුමුවා, කුරංගයා සහ වාතමෘගයා යන
මොවුහු ය. 6 සතුන් අතර කුරය බෙදී වෙන් ව
තිබෙන වමාරා කන සෑම සතෙකු ම කෑමට ඔබට
අවසර ඇත. 7 එහෙත්, වමාරා කන සතුන් අතරෙන්
හෝ කුර බෙදී වෙන් වී ඇති සතුන් අතරෙන් හෝ
කෑමට අවසර නැති සත්තු නම් ඔටුවා, හාවා සහ
බෙන් හාවා ය. මොවුන් වමාරා කන නමුත් උන්ගේ
කුර බෙදී නැත. එබැවින් මොවුන් අපවිත්‍ර සතුන්
මෙන් සැලකිය යුතු ය. 8 ඌරා, කුරය බෙදී ඇති
සතෙකු නමුත් ඌ වමාරා නොකන බැවින් අපවිත්‍ර
සතෙකු මෙන් සැලකිය යුතු ය. උන්ගේ මස් නොකෑ
යුතු අතර, උන්ගේ මළකුණු ද ස්පර්ශ නොකළ යුතු
ය.
9 “සියලු ජලජ සතුන් අතරෙන් වරල් සහ
කොරපොතු ඇති සතුන් කන්නට පුළුවන. 10 වරල්
සහ කොරපොතු නැති සතුන් නොකෑ යුතු ය. ඔවුන්
අපවිත්‍ර සේ සැලකිය යුතු ය.
11 “සියලු පවිත්‍ර පක්ෂීන් ඔබට කන්නට අවසර
ඇත. 12 කෑමට අවසර නැති පක්ෂීහු නම් රාජාලියා,
මහ ගිජුලිහිණියා, 13 ගුරුළා, කුරුළුගොයා, ඒ ඒ
වර්ගයේ උකුස්සෝ 14 ඒ ඒ වර්ගයේ සියලු කපුටෝ
15 පැස්බරා, මුහුදු ලිහිණියා, 16 බස්සා, බකමූණා,
උලමා, 17 දිය කාවා, 18 ඒ ඒ වර්ගයේ කොක්කු,
හුපුවා සහ වවුලා යන මොවුහු ය.
19 “පියාඹන කුඩා සත්තු අපවිත්‍ර ය. උන් කෑමට
අවසර නැත. 20 එහෙත් සියලු ම පවිත්‍ර පක්ෂීන්
කන්නට අවසර ඇත.
21 නික්ම 23:19; 34:26 “ඉබේ ම මැරුණ
සතෙකුගේ මස් කිසිවෙකු නොකෑ යුතු ය. ඔබේ
වාසල් දොරටු ඇතුළත සිටින ආගන්තුකයෙකුට ඒ
සතා දිය යුතු ය. නැත්නම් විදේශිකයෙකුට ඌ
විකිණිය යුතු ය. ඔබ ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේට කැප කරන ලද සෙනඟකි.
21 “එළු පැටියෙකු උගේ මවගේ කිරෙන්
නොතැම්බිය යුතු ය.”

### දසයෙන් කොටස පිළිබඳ නීති

22 ලෙවී 27:30-33; ගණන් 18:21 “අවුරුදුපතා ඔබේ
කෙතෙන් ලැබෙන පලදාවෙන් දසයෙන් කොටස ඔබ
දිය යුතු ය. 23 ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ තම
නාමය පිහිටුවනු සඳහා තෝරාගත් ස්ථානයේ දී උන්
වහන්සේ ඉදිරියෙහි ඔබේ ධනධාන්‍යයෙන්, මිදියුසින්
සහ තෙල්වලින් දසයෙන් කොටස ද, ගව පට්ටිවල
සහ එළු බැටළු පට්ටිවල කුලුඳුල් සතුන් ද අනුභව
කළ යුතු ය. මෙසේ කිරීමෙන් ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේට ගරුබිය පෑමට ඔබ ඉගෙනෙගනු ඇත.
24 ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබට ආශීර්වාද
කළ පසු සිය නාමය පිහිටුවනු සඳහා උන් වහන්සේ
තෝරාගත් ස්ථානය ඔබෙන් බොහෝ දුර නම්,
දසයෙන් කොටස ඔබට උසුලාගෙන යෑමට නොහැකි
වන තරමට දුර වැඩි නම්, 25 ඔබ එය විකුණා මුදල්
කොට, ඒ මුදල අතේ රුගෙන උන් වහන්සේ
තෝරාගත් ස්ථානයට යා යුතු ය. 26 ඉන්පසු ඒ මුදල
වැය කොට ඔබ කැමැති පරිදි ඕනෑ ම දෙයක් එනම්,
ගවයන් හෝ බැටළුවන් හෝ මිදියුස හෝ මත්පැන්
හෝ ඔබ කැමැති දෙයක් ගෙන දෙවි සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි ඔබ ද ඔබේ ගෙවැසියන් ද ඒවා
අනුභව කර ප්‍රීති ප්‍රමෝද විය යුතු ය. 27 තවද,
ඔබ ඔබේ වාසල් දොරටු ඇතුළත සිටින ලෙවීවරුන්
අමතක නොකළ යුතු ය. ඔබට මෙන් ඔවුන්ට රටින්
කොටසක් හෝ උරුමයක් හෝ නැත.
28 “සෑම තුන් අවුරුද්දක් අවසානයේ දී ඔබ ඒ තෙ
වන අවුරුද්දේ ලැබූ අස්වැන්නෙන් දසයෙන් කොටස
ගෙනැවිත් වාසල් දොරටු ඇතුළත තැබිය යුතු ය.
29 එවිට වාසල් දොරටු ඇතුළත සිටින ඔබට මෙන්
රටින් කොටසක් හෝ උරුමයක් හෝ නැති
ලෙවීවරුන් ද ආගන්තුකයන් ද අනාථ වූවන් ද
වැන්දඹුවන් ද විත් ඒවා අනුභව කොට තෘප්තිමත්
වනු ඇත. මෙසේ කළොත්, ඔබේ සියලු වැඩ
කටයුතුවල දී ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ
ඔබට ආශීර්වාද කරන සේක.”

### ණය බරින් මිදීමේ වර්ෂය
(ලෙවී 25:1-7)

15 “සෑම සත් අවුරුද්දක් අවසානයේ දී ඔබ ණය
බරින් නිදහසක් දිය යුතු ය. 2 ණයෙන්
නිදහස දීම මෙලෙසෙ විය යුතු ය. තම අසල්වැසියාට
ණයට දෙන සෑම කෙනෙකු ම, ඒ තැනැත්තාට
ණයෙන් නිදහස දිය යුතු වේ. තම අසල්වැසියාගෙන්
හෝ මොහුගේ සොහොයුරාගෙන් හෝ ඔහු එය
බලෙන් නොගත යුතු ය. මන්ද, මෙය වනාහි
සමිඳාණන් වහන්සේ දානය කරන නිදහසකි.
3 විදේශිකයෙකුගෙන් නම්, එය එකතු කරගත හැකි
ය. එහෙත්, ඔබේ ම සහෝදරයෙකුට නම්, ණයෙන්
නිදහස දිය යුතු ය.

4 “කෙසේ වුවත් ඔබ අතර දිළින්දන් නොසිටිය යුතු
ය. ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබට උරුම
කොට හිමි කරදෙන දේශයෙහි උන් වහන්සේ ඔබ
හට ඉමහත් ලෙස ආශීර්වාද කරන සේක. 5 උන්
වහන්සේ එසේ කරන්නේ මා ඔබට අද දින නියම
කරන උන් වහන්සේගේ හඬට සාවධානයෙන් සවන්
දී, මේ සියලු අණපණත් ඔබ ආරක්ෂා කොට ඒවා
පිළිපැද්දොත් පමණක් ය. 6 දෙවි සමිඳාණන්
වහන්සේ ඔබට පොරොන්දු වූ ලෙස ඔබට
ආශීර්වාද කරන නිසා ඔබ බොහෝ ජාතීන්ට මුදල්
ණයට දෙන්නෙහු ය. එහෙත්, ඔබ නම් මුදල් ණයට
ඉල්ලා නොගත යුතු ය. ඔබ බොහෝ ජාතීන්
පාලනය කරන්නෙහු ය. එහෙත්, ඔව්හු ඔබ පාලනය
නොකරන්නෝ ය.
7 ලෙවී 25:35 “දෙවි සමිඳාණන් වහන්සේ ඔබට
දෙන දේශයෙහි, ඔබේ වාසල් දොරටු ඇතුළත ඔබේ
සහෝදරයන් අතර යම් දිළින්දෙක් සිටී නම්, ඔබේ
සිත දැඩි කර නොගෙන, ඒ දිළින්දාට උදව් උපකාර
කිරීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය. 8 ඔහු කෙරෙහි
ත්‍යාගශීලී ව ඔහුගේ අඟහිඟකමට සෑහෙන පමණ
අවශ්‍ය දේ සැපයිය යුතු ය. 9 ‘ණයෙන් මිදෙන
අවුරුද්ද වන හත් වන අවුරුද්ද ආසන්න ය’යි යන
දුෂ්ට හිතකට ඉඩ නොදෙන්න. ඔබේ දිළිඳු
සහෝදරයා දෙස නපුරු ඇසකින් බලා, ඔහුට කිසිත්
නුදුන් පසු ඔහු ඔබට විරුද්ධ ව සමිඳාණන්
වහන්සේට මොරගැසුවොත්, එය ඔබට පාපයක් වනු
ඇත. 10 සිතේ කණගාටුවක් නැතිව, දෙන දේ ඔබ
ඔහුට දිය යුතු ය; ඔබ එලෙස කරන්නෙහු නම්, ඔබේ
දෙවි සමිඳාණන් වහන්සේ ඔබේ සියලු වැඩ
කටයුතුවලදීත්, ඔබ අත තබන සියල්ලෙහිදීත් ඔබට
ආශීර්වාද කරන සේක. 11 මතෙ 26:11; මාක් 14:7;
ජොහ 12:8දිළින්දෝ කවරදාත් දේශයෙහි සිටින්නෝ
ය. එබැවින් රටෙහි සිටින දිළින්දා සහ අඟහිඟකම්
ඇති ඔබේ සහෝදරයන් කෙරෙහි ත්‍යාගශීලී වන
ලෙස මම ඔබට අණ කරමි.”

### වහලුන් පිළිබඳ නීති හා නියෝග
(නික්ම 21:1-11)

12 ලෙවී 25:39-46 “ඔබේ සහෝදර හෙබ්‍රෙව්
මිනිසෙකු හෝ හෙබ්‍රෙව් ස්ත්‍රියක හෝ ඔබට
විකුණනු ලැබ, එවැන්නෙකු සාවුරුද්දක් ඔබට සේවය
කළ පසු හත් වන අවුරුද්දේ දී ඔහුට නිදහස ලබා
යන්නට ඉඩ දිය යුතු ය. 13 එවැන්නෙකු නිදහස් කර
හරින විට, හිස් අතින් යන්නට ඉඩ නොදෙන්න.
14 ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබට
ශුභසිද්ධිය සලසා දුන් පරිදි ඔබේ එළු
බැටළුවන්ගෙන් ද කමතින් ද මිදි පැසෙන් ද නොමසුරු
ලෙස එවැන්නෙකුට දිය යුතු ය. 15 මිසර දේශයේ
ඔබ වහලුන් ව සිටි බව ද, ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ ඔබ ගැළවූ බව ද සිහි කළ යුතු ය.
මවෙන්නක් අද දින මා ඔබට අණ කරනුයේ
එබැවින් ය.
16 “එහෙත් එවැන්නෙකු ඔබ සමඟ යහෙනේ සිටි
බැවින්, ඔබට කතා කොට, ‘මා ඔබටත්, ඔබේ
ගෘහයටත් කැමැති බැවින් ඔබනේ වනේ ව යාමට
කැමැති නැත’ කියා කීවොත් 17 විදින කටුවක් ගෙන,
ඔහුගේ කන දොරට තද කර එය විදිය යුතු ය.
ඉන්පසු ඔහු සදහට ම ඔබේ සේවකයා වනු ඇත.
ඔබේ දාසියට ද එලෙසෙ කළ යුතු ය. 18 දාසයෙකු
නිදහස් කර යන්නට හරින විට ඔහු කෙරෙහි
අමනාපයක් නොදක්වන්න. මන්ද, ඔහු සාවුරුද්දක්
ඔබට සේවය කිරීම නිසා ඔහුගේ අගය
කුලීකරුවකුගේ අගය මෙන් දගුණයක් වන බැවිනි.
මලෙසෙ ඔබ ඉටු කළොත් ඔබේ වැඩ කටයුතු
සියල්ලෙහි දී දෙවි සමිඳාණන් වහන්සේ ඔබට
ආශීර්වාද කරන සේක.”

### කුලුඳුල් ගවයන් සහ බැටළුවන්

19 නික්ම 13:12 “ගවයන්ගේ සහ එළු
බැටළුවන්ගේ කුලුඳුල් පිරිමි සතුන් සියල්ලන් ම
ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට කැප කළ යුතු ය.
කුලුඳුල් ගොන් වස්සෙකුගෙන් වැඩ නොගත යුතු ය,
කුලුඳුල් බැටළුවන්ගේ ලොම් නොකැපිය යුතු ය.
20 ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ තෝරාගන්න
ස්ථානයේ දී අවුරුද්දක් පාසා ඔබත්, ඔබේ
ගවෙසියනුත් උන් වහන්සේ අබිමුව උගේ මස් කෑ
යුතු ය. 21 සතාගේ කැළලක් තිබේ නම්, ඌ කොර
නම්, අන්ධ නම්, අන්කිසි නරක කැළලක් තිබේ නම්,
ඒ සතා ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට පූජා
නොකළ යුතු ය. 22 මුව මස් සහ ගෝන මස්
කන්නාක් මෙන් ඔබේ වාසල් දොරටු ඇතුළත දී
පවිත්‍ර වූ ද අපවිත්‍ර වූ ද සෑම කෙනෙකුට ම උගේ
මස් කෑ හැකි ය. 23 උත් 9:4; ලෙවී 7:26-27;
17:10-14; 19:26; ද්වි.නී. 12:16,23එහෙත් උගේ ලේ
නොගත යුතු ය. වතුර වත් කරන්නාක් මෙන් උගේ
ලේ බිමට වත් කළ යුතු ය.”

### පාස්කු මංගල්‍යය
(නික්ම 2:1-20)

16 නික්ම 12:1-20; ලෙවී 23:5-8; ගණන්
28:16-25 “ආබිබ් මාසය අනුස්මරණය කර
ඔබේ දෙවි සමිඳාණන් වහන්සේගේ ගෞරවය
පිණිස පාස්කු මංගල්‍යය පවත්වන්න. මන්ද, ආබිබ්
මාසයේ දී එක් රාත්‍රියක උන් වහන්සේ මිසර
දේශයෙන් ඔබ පිටතට ගෙනා බැවිනි. 2 එබැවින්
ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ තම නාමය
පිහිටුවන්නට තෝරාගන්න ස්ථානයේ දී එළු
බැටළුවන්ගෙන් සහ ගවයන්ගෙන් පාස්කු යාගය පිදිය
යුතු ය. 3 ඔබ එය සමඟ මුහුන් මිශ්‍ර රොටි නොකෑ
යුතු ය. දින හතක් ම ඔබ දුක්ගැහැට සිහිපත් වන
රොටි එනම්, නුමුහුන් රොටි කෑ යුතු ය. මන්ද, ඔබ
මිසර දේශයෙන් පිටතට ලහි ලහියේ පැමිණි දින
කැවේ නුමුහුන් රොටි ය. ඔබ මිසර දේශයෙන්
පිටතට පැමිණි දින ඔබට දිවි ඇති තාක් සිහිපත්
වනු පිණිස එලෙසෙ කළ යුතු ය. 4 දින හතක් ඔබේ

මුළු දේශය තුළ ම කිසිවකු ළඟ මුහුන් රොටී තබා
නොගත යුතු ය. පළමු වන දින හවස ඔබ පූජා කළ
මස්වලින් කිසිවක් උදය දක්වා තබා නොගත යුතු ය.
5 “දෙවි සමිඳාණන් වහන්සේ ඔබට දෙන හැම
නගරයක දී ම ඔබ පාස්කු යාගය පූජා නොකළ යුතු
ය. 6 මිසර දේශයෙන් ඔබ නික්ම ආ කාලයේ දී,
සවස ඉර බැස යන විට ඔබ පාස්කු යාගය පිදිය
යුත්තේ, උන් වහන්සේ සිය නාමය පිහිටුවනු සඳහා
තෝරාගත් ස්ථානයෙහි ය. 7 ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ තෝරාගත් ස්ථානයේ දී ඔබ එය පුළුස්සා
අනුභව කර, උදය කාලයේ ආපසු හැරී ඔබේ
කූඩාරම්වලට යා යුතු ය. 8 දින හයක් ඔබ නුමුහුන්
රොටී කෑ යුතු ය. හත් වන දින දෙවි සමිඳාණන්
වහන්සේගේ මහිමය පිණිස ප්‍රසිද්ධ රැස්වීමක්
පවත්වා එදින වැඩ නොකළ යුතු ය.”

### අස්වැන්න මංගල්‍යය
(නික්ම 34:22;ලෙවී 23:15-21)

9 ලෙවී 23:15-21; ගණන් 28:26-31 “සති හතක්
ගණන් කරගන්න. ධාන්‍ය නෙළීමට දෑකැත්ත යොදන
දින පටන් ඒ සති හත ගණන් කරන්න පටන්ගන්න.
10 ඉන්පසු දෙවි සමිඳාණන් වහන්සේ ඔබට
ආශීර්වාද කර තිබෙන සැටියට, ඔබ උන් වහන්සේට
ස්වේච්ඡා පූජා පඬුරක් පුදා උන් වහන්සේගේ
ගෞරවය පිණිස අස්වැන්න මංගල්‍යය පැවැත්විය
යුතු ය. 11 මෙසේ කළ පසු දෙවි සමිඳාණන්
වහන්සේ තම නාමය පිහිටුවීමට තෝරාගත්
ස්ථානයේ දී උන් වහන්සේ ඉදිරියෙහි, ඔබ ද ඔබේ
පුතා සහ දුව ද ඔබේ දැසිදසුන් ද ඔබේ වාසල්
දොරටු ඇතුළත සිටින ලෙවීවරුන් ද ඔබ සමඟ සිටින
විදේශීන් ද අනාථයන් සහ වැන්දඹුවන් ද ප්‍රීති
ප්‍රමෝද විය යුතු ය. 12 මිසරයේ ඔබ වහලකු
මෙන් සිටි බව සිහි කොට, මේ නීති නොකඩා
පිළිපැදිය යුතු ය.”

### කූඩාරම් මංගල්‍යය
(ලෙවී 23:33-43)

13 ලෙවී 23:33-36,39-43; ගණන් 29:12-38 “ඔබේ
ධනධාන්‍ය සහ මිදි ඔබ එකතු කළායින් පසු, දින
හතක් ඔබ කූඩාරම් මංගල්‍යය පැවැත්විය යුතු ය.
14 මෙසේ පවත්වන ඒ මංගල්‍යයේ දී ඔබ ද ඔබේ
පුතා ද දුව ද ඔබේ දැසිදසුන් ද ලෙවීවරුන් ද ඔබේ
වාසල් දොරටු ඇතුළත සිටින විදේශීන් ද අනාථයන්
සහ වැන්දඹුවන් ද ප්‍රීති ප්‍රමෝද විය යුතු ය.
15 ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ තෝරාගත්
ස්ථානයේ දී උන් වහන්සේගේ ගෞරවය පිණිස
ඔබ ඒ මංගල්‍යය දින හතක් පැවැත්විය යුතු ය. සරු
අස්වැන්නක් දීමෙන් ද ඔබේ සියලු වැඩ කටයුතු
සඵල කිරීමෙන් ද උන් වහන්සේ ඔබට ආශීර්වාද
කළ බැවින් ඔබ ප්‍රීති ප්‍රමෝද විය යුතු ය.
16 “දෙවි සමිඳාණන් වහන්සේ තෝරාගත්
ස්ථානයේ දී අවුරුද්දකට තුන්වරක් ඔබේ සියලු
පිරිමින් උන් වහන්සේ ඉදිරියට විත් පෙනී සිටිය යුතු
ය. ඒ තුන් වාරය නම් නුමුහුන් රොටී මංගල්‍යය,
අස්වැන්න මංගල්‍යය සහ කූඩාරම් මංගල්‍යය වේ.
තවද උන් වහන්සේ ඉදිරියෙහි හිස් අතින් පෙනී
නොසිටිය යුතු ය. 17 දෙවි සමිඳාණන් වහන්සේ
ඔබට ආශීර්වාද කර තිබෙන පරිදි තම තමාගේ
පුළුවන්කමේ හැටියට පඬුරක් පිදිය යුතු ය.”

### නඩු විසඳීම

18 “දෙවි සමිඳාණන් වහන්සේ ඔබට දෙන සෑම
නගරයක් තුළ ම, ගෝත්‍රයක් ගෝත්‍රයක් පාසා
විනිශ්චයකාරයන් සහ නිලධාරීන් පත් කළ යුතු ය.
ඔවුන් ද සාධාරණ ලෙස සෙනඟ විනිශ්චය කළ යුතු
ය. 19 නික්ම 23:6-8; ලෙවී 19:15ඔවුන් අසාධාරණ
ලෙස විනිශ්චය නොකළ යුතු ය. ඔවුන් මිනිසුන්ගේ
තරාතිරම් නොබැලිය යුතු ය. අල්ලස් නොගත යුතු
ය. අල්ලස් ගැනීමෙන් පැණවතුන්ගේ නෙත් අඳුරු
වේ; දමිටුන්ගේ වචන පවා නොපිටට පෙරළේ.
20 යුක්තිය, යුක්තිය පමණක් ම, අනුගමනය කළ
යුතු ය. මෙසේ කළොත්, ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ ඔබට දෙන දේශය උරුම කරගෙන ඔබට
එහි ජීවත් විය හැකි ය.
21 නික්ම 34:13 “දෙවි සමිඳාණන් වහන්සේට
පූජාසනයක් ඉදි කරන කල, ඒ අසල ලීයෙන් කළ
රූපස්තම්භයක් සිටුවිය යුතු නොවේ. 22 ලෙවී
26:1අෂේරා කප් කණුවක් ද එහි ඉදි නොකළ යුතු
ය. මෙසේ කිරීම දෙවි සමිඳාණන් වහන්සේට
පිළිකුලකි.

17 “කැළලක් හෝ විරූපී ලකුණක් හෝ ඇති
ගොනෙකු හෝ බැටළුවකු හෝ දෙවි
සමිඳාණන් වහන්සේට පූජා නොකළ යුතු ය.
එවැන්නක් උන් වහන්සේට පිළිකුලකි. 2 දෙවි
සමිඳාණන් වහන්සේ ඔබට දෙන නගරයක ඔබ
අතරෙන් යම්කිසි පුරුෂයකු හෝ ස්ත්‍රියක හෝ උන්
වහන්සේගේ ගිවිසුම කඩකොට, උන් වහන්සේ
අබිමුව දුෂ්ටකම් කරමින්, 3 නික්ම 22:20උන්
වහන්සේ තහනම් කළ දේවදේවතාවන්ට හෝ ඉරට
හෝ හඳට හෝ අන්කිසි ආකාශ වස්තුවකට හෝ
වැඳුම්පිදුම් හා නමස්කාර කරන්නට පුළුවන.
4 එවැන්නක් දැනගන්නට ලැබුණොත්, ඔබ ඒ ගැන
හොඳාකාර විභාග කළ යුතු ය. ඉශ්රායලේ ජනයා
අතර එවැනි පිළිකුලක් සිදුවූ බව නිසැක ව සත්‍ය
ලෙස පෙනී ගියොත් 5 ඒ දුෂ්ටකම කළ පුරුෂයා හෝ
ස්ත්‍රිය හෝ වාසල් දොරකඩට රැගෙන විත්, ඔහුට
හෝ ඇට හෝ ගල් ගසා මරාදැමිය යුතු ය. 6 ගණන්
35:30; ද්වි.නී. 19:15; මතෙ 18:16; 2 කොරි 13:1; 1
තිමෝ 5:19; හෙබ්‍රෙ 10:28සාක්ෂිකාරයන්
දදෙනෙකුගේ හෝ තුන් දෙනෙකුගේ හෝ කීම පිට
මරණයට සුදුසු තැනැත්තා මරනු ලැබිය යුතු ය.
එහෙත් එක සාක්ෂිකරුවකුගේ කීම පිට
එවැන්නකු මරනු නොලැබිය යුතු ය. 7 1 කොරි
5:13ඔහු මරනු සඳහා පළමුවෙන් සාක්ෂිකරුවන් ද
ඉන්පසු සියලු සෙනඟ ද තම තමන්ගේ අත්වලින්

ඔහුට ගල් ගැසිය යුතු ය. මේ අයුරින් ඔබ ඒ
දුෂ්ටකම ඔබ අතරෙන් පහකළ යුතු ය.
8 “ඔබේ නගරය තුළ විවාදයට භාජනය වූ
නොයෙක් විදියේ මිනීමැරීම් ද පැමිණිලි ද පහර දීම්
ද පිළිබඳ ව තීරණයක් දීම ඉතා දුෂ්කර නම්, දෙවි
සමිඳාණන් වහන්සේ තෝරාගත් ස්ථානයට ඔබ
ගොස් 9 ලෙවී පූජකයන් සහ එකල පත් ව සිටින
විනිසකරු වෙත පැමිණ එය විසඳාගත යුතු ය. ඔව්හු
ඔබට නඩු තීන්දුව දෙන්නෝ ය. 10 සමිඳාණන්
වහන්සේ තෝරාගත් ස්ථානයෙහි ඔවුන් දෙන තීන්දුව
අනුව ඔබ ක්‍රියා කළ යුතු ය. ඔවුන් ඔබට දන්වන
පරිදි ඔබ සියල්ල පිළිපැදිය යුතු ය. 11 ඔවුන් ඔබට
දෙන උපදෙස් සහ ඔබට දන්වන නඩු තීන්දුව අනුව
ක්‍රියා කළ යුතු ය. ඔවුන් ඔබට දෙන තීන්දුව අකුරට
ම පිළිපැදිය යුතු ය. 12 දෙවි සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි සේවා කරන පූජක තැනට වත්
විනිසකරුට වත් කීකරු නොවී හිතුවක්කාර ලෙස
හැසිරෙන්නා මරනු ලැබිය යුතු ය. මේ අයුරින්
ඉශ්‍රායෙල් ජනයා අතරෙන් දුෂ්ටකම පහකළ යුතු
වේ. 13 එවිට සියලු සෙනඟ මේ ගැන අසා, බිය වී
තවත් හිතුවක්කාරකම් නොකරනු ඇත.”

## රාජ පදවිය පිළිබඳ උපදෙස්

14 1 සාමු 8:5 “දෙවි සමිඳාණන් වහන්සේ ඔබට
දෙන දේශයට ඔබ පැමිණ, එය අයිති කොට, එහි
පදිංචි වූවායින් පසු, ‘මා අවට සිටින සියලු ජාතීන්
මෙන්, මා කෙරෙහි රජෙකු පත් කරගනිමි’යි ඔබ
කියන්නට පුළුවන. 15 දෙවි සමිඳාණන් වහන්සේ
තෝරන තැනැත්තා ඔබේ රජු වශයෙන් පත් කිරීමට
ඔබ තරයේ සිතට ගත යුතු ය. ඔබේ ජාතියෙන්
කෙනෙකු රජු වශයෙන් පත්කළ යුතු ය. ඔබේ
ජාතියට අයිති නැති විදේශිකයෙකු ඔබේ රජු
වශයෙන් පත් නොකළ යුතු ය. 16 1 රාජා 10:28; 2
වංශා 1:16; 9:28රජු සිය ප්‍රයෝජනයට බොහෝ
අශ්වයන් සපයා නොගත යුතු ය. බොහෝ අශ්වයන්
සපයාගැනීම සඳහා සෙනඟ ද මිසරයට නොයැවිය
යුතු ය. මන්ද, ‘ඔබ හැම ඒ මාර්ගයෙන් ආපසු
නොයා යුතු ය’යි සමිඳාණන් වහන්සේ වදාළ සේක.
17 1 රාජා 10:14-22,27; 11:1-8; 2 වංශා 1:15;
9:27තවද, ඔහු තම සිත මුළා ව නොයන පිණිස
බොහෝ භාර්යාවන් ද පාවා නොගත යුතු ය. තම
වාසියට බොහෝ රන් රිදී ද සපයා නොගත යුතු ය.
18 ඔහු රාජකීය සිංහාසනය අරා හිඳින කල,
ලෙවීවරුන් වන පූජකවරුන්ගේ පොතේ හැටියට මේ
ව්‍යවස්ථාවෙන් පිටපතක් ලියාගෙන තමා ළඟ
තබාගත යුතු ය. 19 මෙසේ ඔහු එය තමා ළඟ
තබාගෙන, මුළු ජීවිත කාලය තුළ ම එය කියවිය
යුතු ය. එසේ කියවීමෙන් ඔහු තම දෙවි සමිඳාණන්
වහන්සේට ගරුබිය පෑමට ද නීති හා නියෝගවල
අඩංගු සියල්ල ආරක්ෂා කරමින් ඒවා පිළිපැදීමට ද
ඉගෙන ගන්නේ ය; 20 මෙලෙස සිය සහෝදරයන්ට
ඉහළින් තමා ගැන උඩඟු නොවන්නේ ය. ඉශ්‍රායෙල්
ජනයා මැද සිහසුන අරා ඔහුත්, ඔහුගේ දරුපරපුරත්
චිරාත් කාලයක් ජීවත් වන පරිදි අණපණත්වලට
කීකරු ව ඒවා අකුරට ම ඉටු කරන්නේ ය.”

## පූජකවරුන්ට හිමි කොටස

18 “ලෙවීවරුන් වන පූජකවරුන්ට සහ ලෙවීගේ
ගෝත්‍රයට අයිති සියල්ලන්ට ම
ඉශ්‍රායෙල්වරුන් සමඟ රටින් කොටසක් හෝ
උරුමයක් හෝ නොලැබේ. සමිඳාණන් වහන්සේට
පුදන පඬුරු සහ උන් වහන්සේට හිමි කොටස ඔවුන්
වැළඳිය යුතු ය. 2 ගණන් 18:20එබැවින් ඔවුන්ගේ
සහෝදර ජනතාව සමඟ ඔවුන්ට උරුමයක් නොවනු
ඇත. සමිඳාණන් වහන්සේ ඔවුන්ට වදාළ පරිදි උන්
වහන්සේ ම ඔවුන්ගේ උරුමය වනු ඇත.
3 “සෙනඟ, ගොනෙකු හෝ බැටළුවෙකු හෝ පූජා
වශයෙන් පුද කළ විට, පූජකවරයාට ඒ අයගෙන් හිමි
වන කොටස මෙය වේ. එනම්, ඔවුන් පූජකවරයාට
සතාගේ ඉස්සරහ ගාතය ද හකු දෙක ද ආමාශය ද
දිය යුතු ය. 4 තවද ඔබ ධාන්‍ය අස්වැන්නෙත්, මිදියුස
සහ තෙල්වලත්, මුල් කොටස ද බැටළුවන්ගෙන්
මුලින් ම කපාගන්න ලෝම ද ඔහුට දිය යුතු ය.
5 ඔබේ සියලු ම ගෝත්‍රවලින්, දෙවි සමිඳාණන්
වහන්සේට සදහට ම සේවය කරනු පිණිස
පූජකවරුන් සහ ඔවුන්ගේ පරපුර තෝරාගත් සේක.
6 “මුළු ඉශ්‍රායෙල් ජනතාව වසන නගරවලින්, යම්
ලෙවීවරයෙකු, තමා පදිංචි ව සිටි ස්ථානයෙන් නික්ම,
ඉතා දැඩි ආශාවකින් සමිඳාණන් වහන්සේ
තෝරාගන්න ස්ථානයට පැමිණියොත්, 7 සමිඳාණන්
වහන්සේ අබිමුව සෙසු සහෝදර ලෙවීවරුන්
කරන්නාක් මෙන් ඔහු ද තම දෙවි සමිඳාණන්
වහන්සේට සේවය කළ යුතු ය. 8 තම පිය උරුමය
විකිණීමෙන් ලැබෙන ආදායමට අමතර ව සෙසු
පූජකවරුන්ට මෙන් ඔහුටත් වැළඳීමට සම කොටසක්
දිය යුතු ය.”

## මිසදිටු චාරිත්‍රවලින් වැළකීම

9 “දෙවි සමිඳාණන් වහන්සේ ඔබට දෙන රටට ඔබ
පැමිණිවිට, ඒ ජාතීන්ගේ පිළිකුල් චාරිත්‍ර අනුගමනය
නොකිරීමට පරෙස්සම් විය යුතු ය. 10 ලෙවී 19:26;
නික්ම 22:18තම පුත්‍රයා හෝ දුව හෝ ගින්නෙන්
දවා පූජා කරන්නෙකු වත්, පේන කියන්නෙකු වත්,
නැකත් බලන්නෙකු වත්, ශාස්ත්‍රකාරයෙකු වත්,
කෙඩිවිනකාරයෙකු වත්, 11 ලෙවී 19:31හූනියම්
කරන්නෙකු වත්, ආත්ම බන්ධනකාරයන්ගෙන්
ගුරුකම්ගන්නෙකු වත්, මන්ත්‍රකාරයෙකු වත්,
යක්බැන්දුම්කාරයෙකු වත් ඔබ අතර නොසිටිය යුතු
ය. 12 මෙවැනි දේවල් කරන සියල්ලෝ සමිඳාණන්
වහන්සේට පිළිකුලකි. ඔවුන්ගේ මේ පිළිකුල් ක්‍රියා
නිසා දෙවි සමිඳාණන් වහන්සේ ඔබ යන්නට කලින්
ඔවුන් පන්නා හරින සේක. 13 මතෙ 5:48දෙවි
සමිඳාණන් වහන්සේට ඔබ සම්පූර්ණයෙන් ම
විශ්වාසවන්ත ව සිටිය යුතු ය.”

### දිවැසිවරයන් එවීමේ පොරොන්දුව

14 එවිට මෝසෙස් මෙසේ කීවේ ය: “ඔබ පලවා
හරින්න යන මේ ජාතීහු නැකත් බලන්නන්ට ද
පේන කියන්නන්ට ද සවන් දුන්හ. එහෙත් ඔබට
නම්, ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ එවැනි
දේවලට ඉඩ නොදෙන සේක. 15 ක්‍රියා 3:22;
7:37දෙවි සමිඳාණන් වහන්සේ ඔබ අතරෙන් ද ඔබේ
සහෝදර ජනතාව අතරෙන් ද මා හා සමාන
දිවැසිවරයකු පත් කරන සේක. ඔබ ඔහුට සවන්
දිය යුතු ය. 16 හොරෙබ් කන්ද ළඟ ජනතාව රැස් වූ
දින, දෙවි සමිඳාණන් වහන්සේට යාච්ඤා කරමින්,
‘අපේ දෙවි සමිඳාණන් වහන්සේගේ කටහඬ අපට
යළි ඇසෙන්න ඉඩ නොතබනු මැනවි; අප මිය
නොයන ලෙස මේ මහා ගින්න ද අපට තවත්
පෙනෙන්න ඉඩ නොදෙනු මැනව’යි ඉල්ලූවහු ය.
17 සමිඳාණන් වහන්සේ මට කතා කොට ‘ඔවුන් කී
දේ නැණවත් ය. 18 නුඹේ සහෝදර ජනතාව
අතරෙන් නුඹ හා සමාන දිවැසිවරයකු තෝරා පත්
කොට, ඔහු කිය යුතු දේ ඔහුට කියා දෙන්නෙමි.
ඔහුට මා අණ කරන සියල්ල, ඔවුන්ට ඔහු දන්වනු
ඇත. 19 ක්‍රියා 3:23යමකේ මාගේ නාමයෙන් ඔහු
කියන දේට සවන් නොදෙන්නේ නම්, මම
එවැන්නකුට දඬුවම් කරමි. 20 එහෙත්, මාගේ
නාමයෙන් දිවැස් වැකි කීමට ඉදිරිපත් වන
දිවැසිවරයා, මා අණ නොකළ දෙයක් කීමට හිතට
ගතහොත් හෝ අන් දේවතාවන්ගේ නාමයෙන් කතා
කළහොත් හෝ ඒ තැනැත්තා මරනු ලැබේ.’
21 “ ‘සමිඳාණන් වහන්සේ නොවදාළ දිවැස්
වැකියක් තිබේ නම්, අපි ඒ ගැන කෙසේ
දැනගන්නෙමු දැ’යි ඔබ සිතන්න පුළුවන.
22 දිවැසිවරයකු සමිඳාණන් වහන්සේගේ නාමයෙන්
කතා කිරීමට ඉදිරිපත් වූ නමුත්, ඔහු කී දේ සිදු
නොවේ නම්, ඉටු නොවේ නම්, ඒ කරුණ
සමිඳාණන් වහන්සේ නොවදාළ එකකි. එය
දිවැසිවරයා තම හිතුවක්කාරකමින් කී කරුණකි.
එවැන්නකුට ඔබ බිය නොවිය යුතු ය.”

### අභය භූමි නගර

(ගණන් 35:9-28;ජෝෂුවා 20:1-5)

19 ජෝෂුවා 20:1-9 “දෙවි සමිඳාණන් වහන්සේ
ඔබට දෙන දේශයෙහි උන් වහන්සේ
ජනතාව වනසාදැමූ විට, ඔබ ඒවා අයිති කොටගෙන,
ඒවායේ නගර සහ ගෙවල පදිංචි වූ පසු, 2 ඔබ
උරුම කොටගත් ඒ දේශයේ නගර තුනක් වෙන් කළ
යුතු ය. 3 දෙවි සමිඳාණන් වහන්සේ ඔබට දෙන එම
දේශය කොටස් තුනකට බෙදා, ඕනෑ ම
මිනීමරුවකුට ඒවාට පලා යනු සඳහා මඟක්
පිළියෙළ කළ යුතු ය. 4 ඒවාට පලා ගොස් පණ
බේරාගත හැක්කේ පහත දක්වන අන්දමට
කෙනෙකු අතින් මරණයක් වූ විට ය. කලින්
වෛරයක් නොමැති ව, අදහස් නොකර යමකු
මැරුවොත් ඔහුට එලෙස පලා යත හැකි ය.
5 නිදසුනක් නම් මෙය වේ: යමකු තව කෙනෙකු
සමඟ ලී කැපීමට වනයට ගොස්, ගසක් කපනු
පිණිස අත ඔසවා පොරොවෙන් පහර දෙන විට,
පොරෝ තලය මිටෙන් ගැලවී අනිත් තැනැත්තාගේ
ඇඟට වැදී ඔහු මළහොත්, ගස කැපූ තැනැත්තාට ඒ
නගරවලින් එකකට පලා ගොස් පණ බේරා ගත
හැකි ය. 6 පලා යාමට ඇත්තේ එක නගරයක් නම්,
එය බොහෝ දුර වී නම්, පළිගැනීමේ අයිතිය හිමි,
මරන ලද තැනැත්තාගේ ලේ නෑයකුට, තමා දැඩි
කෝපයෙන් සිටිය දී මැරූ තැනැත්තා ලුහුබැඳ ගොස්,
ඔහු අල්ලාගෙන, මරා දමන්නට හැකි වේ. එහෙත්,
එවැන්නකු කලින් වෛර බැඳ නොසිටි බැවින්, ඒ
තැනැත්තා මරාදැමීම යුතු නොවේ. 7 එබැවින් ඔබේ
ප්‍රයෝජනයට නගර තුනක් වෙන් කළ යුතු යයි මම
අණ කරමි.
8 “උන් වහන්සේ ඔබේ පියවරුන්ට දිවුරුම් දුන්
ප්‍රකාර ඔබේ දේශ සීමා පළල් කොට, උන්
වහන්සේ ඔවුන්ට පොරොන්දු වූ පරිදි මේ මුළු රට
ම ඔබට දානය කරන සේක. 9 එසේ කරන්නේ, මා
ඔබට අද දින දෙන අණපණත් සියල්ලට ඔබ අවනත
වී ඒවා පිළිපැද, ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට
ප්‍රේම කරමින්, උන් වහන්සේට සදහට ම කීකරු
වන්නහු නම් පමණකි. ඉන්පසු පෙර කී අභය භූමි
නගර තුනට අමතර ව තව තුනක් එකතු කළ යුතු
ය. 10 එවිට දෙවි සමිඳාණන් වහන්සේ ඔබට උරුම
කොට දෙන ඒ ඔබේ දේශයෙහි ඔබ නිදොස් ලේ
නොවගුරන්නහු ය.
11 “එහෙත් යමකු අනෙකකුට වෛර බැඳ, ඔහු
එන තෙක් රැක සිට, ඔහුට විරුද්ධ ව නැඟිට,
මැරෙන්නට පහර දී, ඒ නගරවලින් එකකට පලා
ගියොත්, 12 නගරයේ ප්‍රජා මූලිකයන්, මිනිසුන් යවා
ඔහු ගෙන්වාගෙන, ඔහු මරාදමන පිණිස, මිනීමැරීම
ගැන පළිගන්න තැනැත්තාට ඔහු පාවා දිය යුතු ය.
13 ඔබ ඔහුට අනුකම්පා නොදක්වා, ඉශ්රායෙල්
ජනයා අතරෙන් නිදොස් ලේ හැළීම පිළිබඳ වරදකරු
නෙරපාදැමිය යුතු ය. එවිට ඔබට ශුභසිද්ධිය
සැලසෙන්නේ ය.”

### පුරාණ වතු මායිම්

14 ද්වි.නී. 27:17 “දෙවි සමිඳාණන් වහන්සේ ඔබට
හිමි කරගන්නට දෙන දේශයෙහි ඔබට උරුම වන
වතුපිටිවල, පුරාණයේ පටන් පිහිටුවා ඇති, ඔබේ
අසල්වැසියාගේ වතු මායිම් ඉවත් නොකළ යුතු ය.”

### සාක්ෂිකරුවන් පිළිබඳ නීතිය

15 ගණන් 35:30; ද්වි.නී. 17:6; මතෙ 18:16; ජොහ
19:31; 2 කොරි 13:1; 1 තිමෝ 5:19; හෙබ්‍රෙ 10:28
“යමකු කළ අපරාධයක් හෝ වරදක් හෝ ගැන
තීන්දු කිරීමට එක සාක්ෂිකරුවකු ප්‍රමාණ නොවේ.
සාක්ෂිකරුවන් දෙදෙනෙකුගේ හෝ තුන්දෙනෙකුගේ
හෝ වචනය පිට යම් කරුණක් තීරණය කළ යුතු
වේ. 16 යමකුට විරුද්ධ ව බොරු වරද තැබීමට
බොරු සාක්ෂිකරුවකු ඉදිරිපත් වුවහොත්, 17 ඒ

නඩුවට සම්බන්ධ දෙදෙනා ම සමිඳාණන් වහන්සේ
ඉදිරියට, එනම්, එකල නිල දරන පූජකවරුන් සහ
විනිශ්චයකරුවන් ඉදිරියට, පැමිණිය යුතු ය.
18 විනිශ්චයකරුවන් නඩුව හොඳින් විභාග කළ පසු,
සාක්ෂිකරු බොරු සාක්ෂිකරුවකු බවත්, තම
සහෝදරයාට විරුද්ධ ව ඔහු බොරු සාක්කි දුන්
බවත් පෙනී යන්නේ නම්, 19 සාක්ෂිකරු විත්තිකරුට
කරන්නට අදහස් කළ දෙය, සාක්ෂිකරු හට ම දිය
යුතු ය. මෙලෙස ඔබ, ඔබ අතරෙන් මෙවැනි
නපුරුකම් පහකළ යුතු ය. 20 සෙසු අය ද මේ ගැන
අසා, බිය වී, මෙවැනි නපුරුකම් ඔබ අතර තවදුරටත්
නොකරන්නෝ ය. 21 නික්ම 21:23-35; ලෙවී
24:19-20; මතෙ 5:38කිසි ම අනුකම්පාවක්
නොදක්වන්න; හිලව් වශයෙන් පණට පණ ද ඇසට
ඇස ද දතට දත ද අතට අත ද පයට පය ද දිය යුතු
ය.”

## යුද්ධ නීති

20 “ඔබ ඔබේ සතුරන්ට විරුද්ධ ව සටනට
ගොස්, අශ්වයන් සහ රථ ද ඔබට වඩා
ගණනින් විශාල සේනාවක් ද දකින විට, ඔවුන්ට බිය
නොවන්න. ඔබ මිසර දේශයෙන් පිටතට ගෙන
ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබ සමඟ වැඩ
සිටින සේක. 2 ඔබ සටනට ළං වන කල පූජකවරයා
සේනාව වෙත පැමිණ, 3 ඔවුන් අමතමින්,
‘ඉශ්රායලේ ජනයෙනි, සවන් දෙන්න; අද දින ඔබේ
සතුරන්ට විරුද්ධ ව ඔබ සටනට යන්නහු ය. සිත්
අධෛර්ය කර නොගන්න; බිය නොවන්න, කලබල
නොවන්න; සතුරන් නිසා තැති නොගන්න. 4 ඔබ
ගළවාගැනීමට ඔබ වෙනුවෙන් සතුරන්ට විරුද්ධ ව
සටන් කරන පිණිස ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ
ඔබ සමඟ වඩින සේකැ’යි කිව යුතු ය.
5 “එවිට නිලධාරීන් සේනාව අමතා මෙසේ කිව
යුතු ය: ‘අලුත් ගෙයක් තැනූ නමුත්, එහි ගෙවැදීමේ
උත්සවය නොකළ යමෙක් මෙහි සිටී ද? එවැන්නෙක්
ආපසු ගෙදර යා යුතු ය. මන්ද, ඔහු සටනේ දී
මියගියොත්, අන් කෙනෙකු ඒ උත්සවය සිදු කරනු
ඇත. 6 මිදි වත්තක් වවා එහි පලදාව භුක්ති
නොවිඳි යමෙක් මෙහි සිටී ද? එවැන්නෙක් ආපසු
ගෙදර යා යුතු ය. මන්ද, ඔහු සටනේ දී මියගියොත්
අන් කෙනෙක් එහි පලදාව භුක්ති විඳින්නට පුළුවන.
7 කාන්තාවක හා විවාහ ගිවිසගත් නමුත් ඈ සරණ
පාවා නොගත් යමෙක් සිටී ද? එවැන්නෙක් ආපසු
ගෙදර යා යුතු ය. මන්ද, ඔහු සටනේ දී මියගියොත්
අන් කෙනෙකු ඇය සරණ පාවාගන්නට පුළුවන.
8 “නිලධාරීන් තවදුරටත් සේනාව අමතමින්, ‘බිය
වන, අධෛර්ය වන යමෙක් මෙහි සිටී ද?
එවැන්නෙක් ආපසු ගෙදර යා යුතු ය. එවිට ඔහුගේ
සිත මෙන් සෙසු සහෝදර ජනතාවගේ සිත් ද
අධෛර්යට පත් නොවෙනු ඇතැ’යි කිව යුතු ය.
9 නිලධාරීන් සෙනඟට කතා කොට නිම වූ පසු,
සේනාවන් මෙහෙයවනු සඳහා සේනාධිපතීන් පත්
කරනු ලැබිය යුතු ය.
10 “යම් නුවරකට විරුද්ධ ව සටන් කිරීම ළඟා වන
විට, ඊට සාම යෝජනාවක් ඉදිරිපත් කරන්න. 11 ඒ
නුවර වාසීහු ද සාමදානයට කැමැති ව, එහි දොරටු
විවෘත කරත් නම්, එහි සිටින සියල්ලන් ම වහලුන්
මෙන් ඔබට වහල් සේවය ඉටු කළ යුතු ය.
12 එහෙත්, ඔව්හු සාමදානයට කැමැති නොවී, ඔබට
විරුද්ධ ව සටන් කරත් නම් ඔබ ඒ නුවර වටලෑ යුතු
ය. 13 දෙවි සමිඳාණන් වහන්සේ එය ඔබේ බලයට
පාවා දුන් පසු, ඔබ එහි සිටින සියලු පිරිමින්
කඩුවෙන් මරාදැමිය යුතු ය. 14 එහෙත්, කාන්තාවන්
ද කුඩා දරුවන් ද ගවමහිෂයන් ද ඒ නුවරින්
කොල්ලකාගත් මුළු වස්තුව ද ඔබේ ප්‍රයෝජනයට
තබාගත හැකි ය. දෙවි සමිඳාණන් වහන්සේ ඔබට
දුන් ඔබේ සතුරන්ගේ කොල්ලකාගත් වස්තුව ඔබට
භුක්ති විඳිය හැකි ය. 15 ඔබට යාබද ව වසන
ජාතීන්ට අයිති නො වූ, ඔබෙන් බොහෝ දුරස්තර ව
පිහිටි නගර සියල්ලට ම ඔබ මෙලෙස කළ යුතු ය.
16 “දෙවි සමිඳාණන් වහන්සේ ඔබට උරුම කොට
දෙන නගරවල සෙනඟගෙන් කිසිවකුට පණපිටින්
සිටින්නට ඉඩ නොහැරිය යුතු ය. 17 දෙවි සමිඳාණන්
වහන්සේ ඔබට අණ දුන් ප්‍රකාර හිත්තීවරුන් ද
අමෝරිවරුන් ද කානානිවරුන් ද පෙරෙසිවරුන් ද
හිව්වරුන් ද ජෙබුසිවරුන් ද යන සියල්ලන් සහමුලින්
ම වනසාලිය යුතු ය. 18 ඔබ එසේ කළ යුත්තේ,
ඔවුන් තමන්ගේ දේවදේවතාවන් ඉදිරියෙහි කරන
පිළිකුල් ක්‍රියාවන් ඔබට නුගන්වන පිණිසත්, ඔබේ
දෙවි සමිඳාණන් වහන්සේට විරුද්ධ ව පව් නොකරන
පිණිසත් ය.
19 “යම් නුවරක් අල්ලාගැනීම සඳහා සටනක යෙදී,
බොහෝ කාලයක් එය වටලාගෙන සිටින විට, එහි
ඇති ගස් කොළන් පොරොවකින් වැනසිය යුතු
නොවේ. ඒවායින් ඔබට කන්නට පුළුවන. ඒවා
නොකැපිය යුතු ය; නගරයක් වැටලීමේ දී එහි ඇති
ගස් කොළන්, ඔබේ සතුරන් නොවන බව සැලකිය
යුතු ය. 20 පල නොදරන යම් ගසක් වේ නම්, ඔබට
එය කපා වනසාදැමිය හැකි ය. ඒවා පාවිච්චි කරමින්,
ඔබට විරුද්ධ ව සටන් කරන නගරය යටත් වන තුරු
එය වැටලීම සඳහා පවුරු පදනම් සෑදිය හැකි ය.”

## නොවිසඳූ මිනීමැරුම්

21 “දෙවි සමිඳාණන් වහන්සේ ඔබට අයිති
කරගැනීමට දෙන දේශයෙහි යම් එළිමහන්
තැනක මරාදමනු ලැබූ යමෙකු සම්බ වුණොත්, ඔහු
මැරූ තැනැත්තා නොදන්නේ නම්, 2 එවිට ප්‍රජා
මූලිකයන් සහ විනිශ්චයකරුවන් පැමිණ, මළසිරුර
ඇති තැන සිට අවට තිබෙන නගරවලට ඇති දුර
මැනිය යුතු ය. 3 ඉන්පසු මළසිරුරට කිට්ටු ම
නගරයේ ප්‍රජා මූලිකයන් වැඩ කිරීමට නොගත්,
වියගස නොදැරූ එළ නැම්බියක ගෙන, 4 කිසිවක්
නොවපුළ, රෝපණය නොකළ, දිය ගලා යන
මිටියාවතකට ගොස්, එම ස්ථානයේ දී ඇගේ ගෙල
සිඳදැමිය යුතු ය. 5 එවිට ලෙවීගේ පුත්‍රයන් වන
පූජකවරුන් එහි ආ යුතු ය. දෙවි සමිඳාණන්

වහන්සේට සේවය කිරීමටත්, උන් වහන්සේගේ
නාමයෙන් ආසිරි දීමටත් උන් වහන්සේ
තෝරාගත්තෝ ඔව්හු ය. සෑම වාද විවාද සහ
අඬදබර ඔවුන්ගේ තීන්දුවෙන් තේරුම් බේරුම්
කරගත යුතු වේ. 6 ඉන්පසු, මරන ලද තැනැත්තාට
ඉතා කිට්ටු නගරයේ ප්‍රජා මූලිකයන්, දිය ගලා යන
ස්ථානයේ ගලෙ සිඳින ලද එළ නැම්බියගේ හිස මත
තමන්ගේ අත් සෝදාගත යුතු ය. 7 තවද, ඔවුන්
මෙසේ කිව යුතු ය: ‘අපි මේ ලේ නොවැගුරුවමු.
අපි එය නුදුටිමු. 8 ස්වාමීනි, ඔබ මුදාගත් ඔබේ
ඉශ්‍රායලේ සෙනඟට අනුකම්පාව දක්වන සේක් වා!
මේ නිදොස් ලේ ඔවුන්ගේ වගකීමට නොපවරන
සේක් වා!’ එවිට එම මිනීමැරීම පිළිබඳ වරද ඔබේ
සෙනඟ වන ඉශ්‍රායලේ ජනතාවට කමා කරනු
ලැබේ. 9 මෙලෙසෙ ඔබ සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි යුතු දේ කිරීමෙන්, නිදොස් ලේ වැගිරීම
පිළිබඳ වරද ඔබ අතරෙන් පහකළ යුතු ය.”

### යුද්ධයෙන් අල්ලාගත් කාන්තාවන්

10 “ඔබ ඔබේ සතුරන්ට විරුද්ධ ව සටනට ගිය විට
ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබට පාවා දී,
ඔවුන් වහල්කමට අල්ලාගත් පසු, 11 ඔවුන් අතර
ඔබ කැමැති, රුවැති කාන්තාවක දැක, ඇය ඔබේ
බිරිඳ කරගන්නට කැමැති නම්, 12 ඇය ගෙදර
ගෙනැවිත්, ඇගේ හිස බූගෑ යුතු ය. ඇගේ
නියපොතු කැපිය යුතු ය. 13 ඇය ද වහල්කමේ
ඇඳුම් මාරු කොට, ඔබේ ගෙදර නැවතී, ඇගේ
දෙමාපියන් සඳහා සම්පූර්ණ මාසයක් වැලපිය යුතු
ය. ඉන්පසු ඔබ ඇය සමඟ හැසිර, ඇගේ ස්වාමි
පුරුෂයා විය හැකි ය. ඇය ද ඔබේ බිරිඳ වන්නී ය.
14 එහෙත්, කාලයක් ගිය පසු ඔබ ඇයට කැමැති
නැත්නම්, ඈට කැමැති තැනකට යන්න ඉඩ හැරිය
යුතු වේ. එහෙත් ඔබ ඇය බිරිඳ කොට තබාගත්
බැවින් වහලියක මෙන් සලකා, මුදලට විකිණිය යුතු
නොවේ.”

### කුලුඳුලාගේ උරුමය

15 “යම් පුරුෂයකුට භාර්යාවෝ දෙදෙනෙක් සිටිත්
නම්, ඔහු එක් කෙනෙකුට ප්‍රේම කරන්නටත්,
අනෙක් තැනැත්තීට ප්‍රේම නොකරන්නටත් පුළුවන.
එහෙත්, ප්‍රේමය ලැබූ හා නොලැබූ භාර්යාවන්
දෙදෙනා ඔහුගෙන් දරුවන් ලබන විට, ප්‍රේමය
නොලැබූ තැනැත්තියගේ දරුවා කුලුඳුලා වේ නම්,
16 එවැනි අවස්ථාවක දී, ඒ පුරුෂයා තමා සන්තක
වස්තුව තම දරුවන්ට උරුම කොට දෙන කල,
කුලුඳුලා සිටින, තමා ප්‍රේම නොකළ භාර්යාවගේ
පුත්‍රයා වෙනුවට තමා ප්‍රේම කළ භාර්යාවගේ
පුත්‍රයා කුලුඳුලා මෙන් නියම නොකළ යුතු ය.
17 තමා ප්‍රේම නොකළ තැනැත්තීගේ පුත්‍රයාට
තමා සතු වස්තුවෙන් කොටස් දෙකක් දී, ඔහු
කුලුඳුලා මෙන් පිළිගත යුතු වේ. මන්ද, ඒ කුලුඳුලා
ඔහුගේ පුරුෂ ශක්තියේ නාඹුල් පලය වේ. එබැවින්
කුලුඳුල් බවේ අයිතිය ඔහුගේ ය.”

### අකීකරු දරුවා

18 “දෙමාපියන් හට කීකරු නොවන, දඬුවම් දුන්
කල පවා ඔවුන්ට ඇහුම්කන් නොදෙන, හිතුවක්කාර,
කැරලිකාර පුතෙක් යමකුට සිටී නම්, 19 ඔවුන් ඔහු
අල්ලාගෙන වාසල් දොරකඩ සිටින තම නගරයේ
ප්‍රජා මූලිකයන් වෙත ඔහු ගෙනා යුතු ය. 20 මෙසේ
ගෙනැවිත්, ඔවුන් නගර ප්‍රජා මූලිකයන්ට කතා
කොට, ‘මොහු හිතුවක්කාර, කැරලිකාර දරුවෙකි.
මොහු අපට කීකරු වන්නේ නැත. මොහු
බේබද්දෙකි, නාස්තිකාරයෙකි’යි කිය යුතු ය. 21 එවිට
නගරයේ සියලු ම මිනිස්සු ඔහුට ගල් ගසා මරණයට
පත් කරන්නෝ ය. මෙලෙසෙ ඔබ අතරෙන් නපුර
පහකළ යුතු වේ. මුළු ඉශ්‍රායලේ ජනතාව මෙය
ගැන ඇසූ විට බිය වනු ඇත.”

### විවිධ නීති හා නියෝග

22 “යමෙකු මරණ දඬුවමට සුදුසු අපරාධයක්
කොට ගසක එල්ලා මරනු ලැබුවහොත් 23 ගලා
3:13මුළු රුය ම ඔහුගේ මළකඳ ගසේ තිබෙන්නට
නෑර, කෙසේ නමුත් එදින ම එය භූමදාන කළ යුතු
ය. එල්ලා මරන ලද තැනැත්තා, දේව සාපයට පාත්‍ර
වූ කෙනෙකි. මෙසේ කිරීමෙන් දෙවි සමිඳාණන්
වහන්සේ ඔබට උරුම කොට දෙන දේශය දූෂ්‍ය
නොවන්නේ ය.

22 නික්ම 23:4-5 “ඔබේ සහෝදරයාට අයිති
ගොනෙකු හෝ බැටළුවෙකු හෝ මංමුළා ව
ගොස් සිටිනු දැක, ඌ ගැන සලකා බලා, ඔබේ
සහෝදරයා වෙත ඌ ආපසු ගෙනා යුතු ය. 2 එහෙත්,
ඔබේ සහෝදරයා අසලක නොසිටී නම්, නොහොත්
ඔබ ඔහු නොදන්නෙහි නම්, ඔහු ඌ සොයා එන
තුරු ඔබ ඌ ගෙදර ගෙන යා යුතු ය. ඔහු ඌ සොයා
ආ විට ඒ සතා ඔහුට ආපසු භාර දිය යුතු ය.
3 ඔබේ සහෝදරයාට අයිති ව තිබී, නැති වූ, පසුව
ඔබ සොයාගත් ඔහුගේ කොටළුවෙකු හෝ ඔහුගේ
වස්ත්‍ර හෝ අන් හැම දෙයක් හෝ සම්බන්ධයෙන් ද
ඔබ මගනෑර එලෙසෙ ම සලකා බලා ක්‍රියා කළ යුතු
ය.

4 “ඔබේ සහෝදරයාගේ කොටළුවා හෝ ගොනා
හෝ පාරේ වැටී සිටිනු ඔබ දුටුවහොත්, අහක
බලාගෙන නොගොස් ඌ නැගිටුවාලීමට ආධාර කළ
යුතු ය.

5 “කාන්තාවක පුරුෂයකුගේ ඇඳුම් ඇඟ ලා
නොගත යුතු ය. පුරුෂයකු ස්ත්‍රියකගේ ඇඳුම ඇඟ
ලා නොගත යුතු ය. එලෙසෙ කරන සියල්ලන් ඔබේ
දෙවි සමිඳාණන් වහන්සේට පිළිකුලකි.

6 “ඔබ පාරේ යන විට, ගසක හෝ බිම හෝ ඇති,
පැටවුන් හෝ බිත්තර හෝ සහිත, කුරුලු කූඩුවක්
දුටහොත්, තවද කිරිල්ලී පැටවුන් හෝ බිත්තර හෝ
මත සිටින්නී නම්, ඔබ පැටවුන් සමඟ කිරිල්ලී
නොගත යුතු ය. 7 කිරිල්ලී ගිය පසු පැටවුන් ඔබට
ගත හැකි ය. මෙලෙසෙ කළහොත් ඔබට සෙත සැලසේ;
ඔබේ ආයු දික් වන්නේ ය.

8 “ඔබ අලුත් ගයෙක් ඉදි කරන විට, වහලනේ
යමකෙු ලිස්සා නාොවැටනෙ සේ වහල වටේට ම
බිත්තියක් තැනිය යුතු ය. යමකෙු එයින් ලිස්සා වැටී
මැරුණාොත්, ඒ මරණය පිළිබඳ වගකීම ඔබේ
ගෘහයේ අය පිට නාොපැවරේ.
9 ලෙවී 19:19 “ඔබේ මිදි වත්තේ බීජ දවෙර්ගයක්
වැපිරිය යුතු නාොවේ. එසේ කළාොත් ඔබ වපුළ
බීජවල පලදාවත්, මිදි පලදාවත් ශුද්ධස්ථානයට
අයිතිවන්නේ ය.
10 “කතෙක් හෑම සඳහා ගාොනකෙු සහ
කාොටළුවකෙු එකට බැඳිය යුතු නාොවේ.
11 “ලාෝම සහ හණ වැනි දවෙර්ගයක ද්‍රව්‍ය මිශ්‍ර
ඇඳුම් ඇඟ ලා නාොගත යුතු ය.
12 ගණන් 15:37-41 “ඔබ ඇඟ ලා ගන්න ඇඳුම්වල
කාොන් සතරේ දාවලු සාදාගත යුතු ය.”

## කන්‍යාභාවය නැති වීම පිළිබඳ වගකීම

13 “යම් පුරුෂයකෙු බිරිඳක පාවාගනෙ ඈ සමඟ
සේවනයහෙි යදේී, කලකට පසු ඈට අකමැති වී,
14 ඈට විරුද්ධ ව බාොරු චාෝදනා ඉදිරිපත් කාොට,
ඇගේ නමට නිගා කරමින්, ‘මම මේ කාන්තාව
සරණ පාවා ගතිමි; ඈ වතෙ පිවිසුණු කල්හි ඈ
කන්‍යාවක් නාොවූයේ ය’යි කිවහාොත්,
15 තරුණියගේ දමෝපියන් ඈ ගනෙ නගර වාසල්
දාොරටුවේ සිටින ප්‍රජා මූලිකයන් වතෙ තරුණියගේ
කන්‍යාභාවය දක්වන සලකුණු රැගනෙ යා යුතු ය.
16 තරුණියගේ පියා ප්‍රජා මූලිකයන්ට කතා කාොට,
‘මම මගේ දුව මේ පුරුෂයාට බිරිඳ කාොට පාවා
දුනිමි. එහතේ, ඔහු ඇයට අකමැති වී, 17 බාොරු
චාෝදනා ඉදිරිපත් කරමින්, මගේ දුව කන්‍යාවක්
නාො වූවා යයි කියයි. එහතේ මනේන, මාගේ දුවගේ
කන්‍යාභාවයේ සලකුණු’යි කියා, ප්‍රජා මූලිකයන්
ඉදිරියහෙි, රදෙි කඩ දිග ඇරිය යුතු වේ. 18 එවිට
නගරයේ ප්‍රජා මූලිකයන් ඒ පුරුෂයා ගනෙ ඔහුට
පහර දිය යුතු ය. 19 තවද, ඔහුට රිදී කාසි සියයක්
දඩ ගසා ඒවා ඒ තරුණියගේ පියාට දිය යුතු ය.
මසෙේ කළ යුත්තේ ඉශ්‍රායලේ ජාතික කන්‍යාවක
පිට ඔහු නරක නාමය පැවරූ බැවිනි. ඇය ඔහුගේ
බිරිඳ වන්නී ය. දිවි ඇති තාක් ඔහුට ඇය
පන්නාදැමිය නාොහැකි ය.
20 “එහතේ, තරුණියගේ කන්‍යාභාවයේ සලකුණු
නැති බවට ඉදිරිපත් කළ චාෝදනාව ඇත්තක් නම්,
21 ඔවුන් ඇගේ පියාගේ ගෘහයේ දාොරකඩට ඇය
ගනො පසු, නුවර මිනිසුන් ඇයට ගල් ගසා මරණයට
පත් කළ යුතු ය. එසේ කළ යුත්තේ, ඇගේ පියාගේ
ගෘහයේ දී ඈ වසෙඟනක ලසෙ හැසිරමේින්,
ඉශ්‍රායලේ ජනයා අතර නින්දිත දයෙක් කළ බැවිනි.
මලෙසෙ ඔබ අතරනේ නපුර පහකළ යුතු වේ.
22 “යම් පුරුෂයකෙු අන් විවාහක කාන්තාවක සමඟ
සයනය කළහාොත්, එම පුරුෂයාත් කාන්තාවත්
දදෙනෙ ම මරණයට පත් කළ යුතු ය. මලෙසෙ ඔබ
අතරනේ නපුර පහකළ යුතු වේ.
23 “යම් මිනිසකෙු, අන් පුරුෂයකෙුට විවාහ ගිවිසුම්
බස් දුන් කන්‍යාවක සමඟ නගරය තුළ දී හමු වී
ඇය සමඟ සයනය කළහාොත්, 24 ඔබ ඔවුන්
දදෙනො ඒ නගරයේ වාසල් දාොරකඩට ගනෙවුත්
ගල් ගසා මරණයට පත් කළ යුතු ය. තරුණිය මැරිය
යුත්තේ නගරය තුළ දී ඈට එය වූ බැවින්, කෑ ගසා
බේරනේනට ඇයට ඉඩ ප්‍රස්තාව තිබූ නිසා ය.
පුරුෂයා මැරිය යුත්තේ, ඔහු තම අසල්වැසියාගේ
බිරිඳට අගෞරව කළ බැවිනි. මලෙසෙ ඔබ අතරනේ
නපුර පහකළ යුතු වේ.
25 “යම් මිනිසකෙු අන් පුරුෂයකෙුට විවාහ ගිවිසුම්
බස් දුන් තරුණියක එළිමහනේ දී මුණගැසී, ඔහු
බලහත්කාරකමින් ඇය දූෂණය කළහාොත්, ඒ
පුරුෂයා පමණක් මරණයට පත් කළ යුතු ය.
26 තරුණියට නම්, කිසිවක් නාොකළ යුතු ය. ඈ
මරණයට සුදුසු අපරාධයක් නාොකළ බැවිනි. මේ
කාරණය, යමකෙු තම අසල්වැසියාට විරුද්ධ ව
නැඟිට, ඔහු මරා දැමීමට සමාන වේ. 27 මන්ද,
විවාහ ගිවිසුම් බස් දුන් තරුණිය ඔහුට මුණගැසුණේ
කතෙක දී ය. ඈ කෑගැසූ නමුත් ඇය මුදාගැනීමට
කිසිවකෙු නාොසිටි බැවිනි.
28 නික්ම 22:16-17 “යම් මිනිසකෙු අන් පුරුෂයකෙුට
විවාහ ගිවිසුම් බස් නුදුන් තරුණ කන්‍යාවක
බලහත්කාරකමින් දූෂණය කාොට හසුවුවහාොත්,
29 ඔහු ඒ තරුණියගේ පියාට රිදී කාසි පණහක් දිය
යුතු ය. ඇය ඔහුගේ බිරිඳ වන්නී ය. ඔහු ඇයට
අගෞරව කළ බැවින් දිවි ඇති තාක් ඇය නරෙපා
නාොදැමිය යුතු ය.
30 ලෙවී 18:8; 20:11; ද්වි.නී. 27:20 “යම් පුරුෂයකෙු
තම පියාගේ බිරිඳ සරණ පාවාගනෙ ඒ පියාට නින්දා
කළ යුතු නාොවේ.”

## සමිඳුන්ගේ සභාවට නාොයා යුතු අය

23 “අණ්ඩය තුවාළ වූ හෝ රහසඟ කපන ලද
හෝ කනෙකෙු සමිඳාණන් වහන්සේගේ
සභාවට නාොයා යුතු ය. 2 අවජාතක යමකෙු ද
සමිඳාණන් වහන්සේගේ සභාවට නාොයා යුතු ය.
එවැන්නකෙුගනේ පැවතනෙ අය දස වන පරම්පරාව
දක්වා ම සමිඳාණන් වහන්සේගේ සභාවට නාොයා
යුතු ය.
3 නහෙෙ 13:1-2 “අම්මාොනිය ජාතිකයකෙු වත්,
මාෝවබ් ජාතිකයකෙු වත්, මාොවුන්ගනේ පැවත එන
අය වත්, දස වන පරම්පරාවේ දී වත් සමිඳාණන්
වහන්සේගේ සභාවට නාොයා යුතු ය. 4 ගණන්
22:1-6ඔවුන් නාොයා යුත්තේ, ඔබ මිසර දේශයනේ
නික්ම එන විට, මාර්ගයේ දී ඔබට ඔවුන් ආහාර
පාන නුදුන් නිසාත්, ඔවුන් ඔබට විරුද්ධ ව සාප කරනු
සඳහා මසොපාතාමියේ පතෝර් නගරයේ
බයෝර්ගේ පුත් බාලාම් කුලියට ගත් නිසාත් ය.
5 ගණන් 23:7—24:9එහතේ, දවේ සමිඳාණන්
වහන්සේ බාලාම්ට ඇහුම්කන් නුදුන් සේක. උන්
වහන්සේ ඔබට ප්‍රමේ කළ බැවින්, ඒ සාපය
ආශීර්වාදයකට හැරවූ සේක. 6 ඔබ දිවි ඇති තාක්

ඔවුන්ගේ සෞභාග්‍යය සහ ශුභසිද්ධිය සඳහා
කිසිවක් නොකළ යුතු ය.
7 “ඒදොම් ජාතිකයකු, ඔබේ සහෝදරයකු
බැවින්, ඒදොම් ජාතිකයකු හෙළා නොදැකිය යුතු
ය. මිසර දේශයේ විදේශිකයකු මෙන් ඔබ විසූ
බැවින් මිසර ජාතිකයකු හෙළා නොදැකිය යුතු ය.
8 තුන් වන පරම්පරාවේ දී ඔවුන්ට ලැබෙන දරුවන්
හට සමිඳාණන් වහන්සේගේ සභාවට යා හැකි ය.”

## කඳවුරු පවිත්‍ර ව තබාගැනීම

9 “ඔබේ සතුරන්ට විරුද්ධ ව සටනට එළඹෙන විට,
කඳවුරු තුළ හැම නපුරු ක්‍රියාවකින් වැළකී සිටිය
යුතු ය. 10 රාත්‍රියේ ධාතු මෝචනයෙන් අපවිත්‍ර
වුණු යමෙකු කඳවුරෙන් පිටතට ගොස් ඊට
නොපැමිණිය යුතු ය. 11 සවස් කාලයේ දී ඔහු
ජලයෙන් තමා සෝදාගත් පසු, ඉර බැස ගිය විට
කඳවුර තුළට ඔහු ආපසු පැමිණිය යුතු ය.
12 “මලපහ කිරීම සඳහා කඳවුරෙන් පිටත
ස්ථානයක් තිබිය යුතු ය. 13 ඔබේ බඩු භාණ්ඩ
අතරේ හාරන හැන්දක් විය යුතු ය. මලපහ කිරීමට
උවමනා වූ විට හාරන හැන්දෙන් වළක් හාරා, ඊට
මලපහ කර, ආපසු හැරී, එය වසාදැමිය යුතු ය.
14 ඔබ ගළවාගැනීමටත්, ඔබේ සතුරන් පරාජය
කිරීමටත් ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ කඳවුර
මැද වැඩ සිටින සේක. එබැවින් කඳවුර පවිත්‍ර ව
තබාගත යුතු ය. එහි අපවිත්‍ර යමක් උන් වහන්සේ
දුටුවොත් උන් වහන්සේ ඔබෙන් අහක් ව යන
සේක.”

## වෙනත් විවිධ නීති හා නියෝග

15 “තම ස්වාමියාගෙන් ගැළවී ඔබ වෙත පැමිණි
වහලෙකු ඔබ යළි ස්වාමියා හට පාවා නොදිය යුතු
ය. 16 නගරය තුළ ඔහු කැමැති පරිදි, තෝරාගන්න
ස්ථානයක ඔබ සමඟ වාසය කරනු ඇත. ඔබ ඔහුට
පීඩා නොකළ යුතු ය.
17 ලෙවී 19:29 “ඉශ්‍රායලේවරුන්ගේ දූවරුන් අතර
දේවාල වෙසඟනක හෝ ඉශ්‍රායලේ පුත්‍රයන් අතර
දේවාල සල්ලාලයෙකු හෝ නොසිටිය යුතු ය.
18 එවැනි අයගේ කුලිය වශයෙන් ගත් මිලමුදල් ද
ඔබේ බාර ඔප්පු කිරීම සඳහා දෙවි සමිඳාණන්
වහන්සේගේ ගෘහයට නොගෙනෙ යුතු ය. මේ
දෙවර්ගයේ ම මුදල් ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේට පිළිකුලකි.
19 නික්ම 22:25; ලෙවී 25:36-37; ද්වි.නී. 15:7-11
“ඔබේ සහෝදරයාට පොළියට කිසිවක් ණයට දිය
යුතු නොවේ. පොළී ගැනීම සඳහා මුදල් හෝ කෑම
බීම හෝ අන් කිසිවක් හෝ දීම නොකළ යුතු ය.
20 විදේශිකයකුට පොළියට යමක් ණයට දිය හැක.
එහෙත්, ඔබේ සහෝදර ජනතාවට එලෙස දිය යුතු
නොවේ. මේවා ඔබ පිළිපැද්දොත්, ඔබ අයිති
කරගන්නට යන දේශයෙහි ඔබේ සියලු වැඩ
කටයුතුවල දී දෙවි සමිඳාණන් වහන්සේ ඔබට ආසිරි
දෙන සේක.
21 ගණන් 30:1-16; මතෙ 5:33 “ඔබේ දෙවි
සමිඳාණන් වහන්සේට ඔබ බාරයක් පොරොන්දු වූ
විට, එය ඉටු කිරීමට පමා නොවිය යුතු ය. උන්
වහන්සේ එය ඔබෙන් බලාපොරොත්තු වීම සහතික
ය. එසේ නොකළොත් එය ඔබට පාපයකි.
22 බාරයක් නොවීම ඔබට පාපයක් නොවේ. 23 ඔබ
වචනයෙන් පොරොන්දු වූ දේ ඉටු කළ යුතු ය. ඔබ
වචනයෙන් පොරොන්දු වූ ස්වේච්ඡා පූජාව, දෙවි
සමිඳාණන් වහන්සේට පොරොන්දු වූ ලෙසට ඉටු
කළ යුතු ය.
24 “ඔබේ අසල්වැසියාගේ මිදි වත්තට ඔබ ඇතුළු
වුවහොත් ඔබට කැමැති පරිදි ඇති තරමට එහි
මිදිපල කත හැකි ය. එහෙත්, ඒවා මල්ලක දමා
නොගත යුතු ය. 25 ඔබේ අසල්වැසියාගේ ධාන්‍ය
කෙතෙකට ඇතුළු වූ කල්හි ද එහි කරල් ඔබට අතින්
කඩාගත හැකි ය. එහෙත්, ඒ ගොයමට දෑකැත්තක්
නොපෙවිය යුතු ය.”

## දික්කසාද වීම සහ යළි විවාහ වීම

24 මතෙ 5:31; 19:7; මාක් 10:4 “යම් පුරුෂයෙකු
කාන්තාවක පාවාගත් පසු, ඇගේ යම්කිසි
නොහොබිනාකමක් නිසා ඈට අකමැති වුවහොත්,
දික්කසාද පත්‍රයක් ලියා, ඇය අතට දී, තම ගෙදරින්
ඇය පිට කළ යුතු ය. 2 එම ගෙදරින් පිටතට ගිය
පසු, ඈට වෙන පුරුෂයෙකුගේ බිරිඳක විය හැකි ය.
3 මේ සැමියා ද ඇයට අකමැති වුවහොත් දික්කසාද
පත්‍රයක් ලියා, ඇය අතට දී, සිය ගෙදරින් ඇය පිට
කළ යුතු ය. ඇය සරණ පාවාගත් මේ සැමියා
මියගියොත්, 4 ඇය දූෂ්‍ය වී සිටින හෙයින්, ඇය පිට
කළ පළමු ස්වාමි පුරුෂයාට තම බිරිඳ කොට ඇය
පාවාගත නොහැකි ය. මෙසේ කිරීම සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි පිළිකුලකි. මෙසේ කර ඔබේ
දෙවි සමිඳාණන් වහන්සේ ඔබට උරුම කොට දෙන
දේශයෙහි ජනතාව පිට වරද නොපැවරිය යුතු ය.

## විවිධ නීති හා නියෝග

5 “යම් පුරුෂයෙකු අලුතෙන් බිරිඳක පාවාගත් පසු,
ඔහු යුද්ධයට පිටත් ව නොයා යුතු ය. වෙනත්
රාජකාරි සම්බන්ධ වගකීමක් ඔහුට නොපැවරිය යුතු
ය. අවුරුද්දක් ඔහු ගෙදර නැවතී සිට තමා පාවාගත්
බිරිඳ සතුටු කළ යුතු ය.”
6 “කිසිවෙකු සකේකුවක් හෝ ඇඹරුම් ගලක් හෝ
උකස වශයෙන් නොගත යුතු ය. එසේ කිරීම
යමෙකුගේ ජීවිතය උකසට ගන්නාක් මෙනි.
7 නික්ම 21:16 “යමෙකු ඉශ්‍රායලේ ජනයා අතර
කෙනෙකු පැහැරගෙන ඔහු වහලෙකු කළොත් හෝ
ඔහු විකුණුවොත් හෝ එවැනි සොරෙකු මරාදැමිය
යුතු ය. මෙලෙස ඔබ අතරෙන් නපුර පහකළ යුතු ය.
8 ලෙවී 13:1—14:54 “බෝවෙන චර්ම රෝගයක්
සම්බන්ධයෙන් ලෙවී ජාතික පූජකවරුන් ඔබට
උගන්වන සියල්ල හරියාකාර ඉටු කිරීමට සැලකිල්ල
දැක්විය යුතු ය. මා ඔවුන්ට අණ දුන් ප්‍රකාර ඔබ
ඒවා පිළිපැදීමට වගබලාගත යුතු ය. 9 ගණන්

12:10ඔබ මිසර දේශයෙන් නික්ම ආ පසු අතරමඟ දී
දෙවි සමිඳාණන් වහන්සේ මිරියම් නම් කාන්තාවට
කළ දේ සිහි කරන්න.
10 නික්ම 22:26-27 “ඔබේ සහෝදරයාට යමක්
ණයට දුන් පසු, ඒ වෙනුවට උකසක් ගැනීම සඳහා
ඔහුගේ ගෙදරට ඇතුළු නොවිය යුතු ය. 11 ඔබ
පිටත සිටින විට ඔබ යමක් ණයට දුන් තැනැත්තා
උකස රැගෙන එත් ඔබට දෙනු ඇත. 12 යමෙක් දිළිඳු
නම්, ඔහු ඔබට උකසට දුන් වස්ත්‍රය රෑ කාලයේ
තබා නොගත යුතු ය. 13 කෙසේ හෝ වේවා, ඔහුට
එම වස්ත්‍රය පොරවාගෙන නිදාගැනීමට හැකි වනු
පිණිස ඉර බැස යන විට එම උකස් වස්ත්‍රය ඔහුට
භාර දිය යුතු ය. එවිට ඔහු ඔබට ආසිරි දෙනු ඇත.
ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි එය
ධර්මිෂ්ඨ ක්‍රියාවක් වන්නේ ය.
14 ලෙවී 19:13 “ඔබේ සහෝදර ජනතාවගෙන් හෝ
ඔබේ දේශයේ නගරවල විදේශීන්ගෙන් හෝ දිළිඳු,
අසරණ කුලීකරුවෙකුට පීඩා නොකළ යුතු ය. 15 ඉර
බැස යාමට පෙර ඔහුගේ දවසේ කුලිය ඔහුට
ගෙවිය යුතු ය. ඔහු දිළිඳු නිසා, ඔහු ඒ කුලිය
බලාපොරොත්තුවෙන් සිටියි. එසේ නොගෙවුවහොත්
ඔහු සමිඳාණන් වහන්සේට මොරගසනු ඇත, එය
ඔබට පාපයක් වන්නේ ය.
16 2 රාජා 14:6; 2 වංශා 25:4; එසකි 18:20
“දරුවන්ගේ වැරදිවලට ඔවුන්ගේ පියවරුන් ද
පියවරුන්ගේ වැරදිවලට ඔවුන්ගේ දරුවන් ද
මරණයට පත් නොකළ යුතු ය. හැම කෙනෙක් ම
තම තමාගේ ම අපරාධවලට මරණයට පත් කරනු
ලැබේ.
17 නික්ම 23:9; ලෙවී 19:33-34; ද්වි.නී. 27:19
“විදේශිකයන්ගේ ද අනාථයන්ගේ ද අයිතිවාසිකම්
පැහැර නොගත යුතු ය. වැන්දඹුවකගේ වස්ත්‍ර ද
උකසට නොගත යුතු ය.
18 “ඔබ මිසර දේශයේ වහලෙකු ව සිටි බවත්,
ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබ මුදාගත් බවත්
සිහි කළ යුතු ය. මා ඔබට මේ දේවල් අණ
කරන්නේ එබැවින් ය.
19 ලෙවී 19:9-10; 23:22 “ඔබ කෙතේ අස්වැන්න
නෙළාගත් පසු, ගොයම් මිටියක් අමතක වුණොත්
එය ගැනීමට ආපසු නොයන්න. එය විදේශිකයන්ට ද
අනාථයන්ට ද වැන්දඹුවන්ට ද අයිති විය යුතු ය. ඔබ
මෙසේ කළොත්, ඔබේ සියලු වැඩපලවල දී දෙවි
සමිඳාණන් වහන්සේ ඔබට ආශීර්වාද කරන සේක.
20 ඔලීව ගස්වලින් පල නෙළන විට ද ඉතුරු වන
ගෙඩි සොයාගෙන ආපසු නොයන්න. එය
විදේශිකයන්ට ද අනාථයන්ට ද වැන්දඹුවන්ට ද
අයිති විය යුතු ය. 21 මිදි වත්තේ මිදි එකතු
කරගන්න විට ද ඉතිරි වන ඒවා නැවත කපා
නොගන්න. ඒවා විදේශිකයන්ට ද අනාථයන්ට ද
වැන්දඹුවන්ට ද අයිති විය යුතු ය. 22 මිසර දේශයේ
දී ඔබ වහලුන් ව සිටි බව සිහි කරන්න. මේ දේවල්
මා ඔබට අණ කරන්නේ එබැවින් ය.

25 “මිනිසුන් අතර ආරාවුලක් හටගෙන,
උසාවියට ගිය විට, විනිශ්චයකරුවන් ආරාවුල්
විසඳමින්, නිවැරදිකරු නිදොස් කොට, වරදකරුට
දඬුවම් දිය යුතු ය. 2 වරදකරු පහර ලැබීමට සුදුසු
නම්, විනිශ්චයකරු ඔහු බිම බාවා, වරදේ
බරපතලකම හැටියට, තමා ඉදිරිපිට දී නියමිත පහර
ගණන ඔහුට දෙන්නට සැලැස්විය යුතු ය. 3 2 කොරි
11:24ඔහුට කස පහර සතළිසක් දෙන හැක. ඊට
වඩා නොදිය යුතු ය. ඊට වැඩි ගණනක් දුන්නොත්,
ඔබ ඔබේ සහෝදරයාට ප්‍රසිද්ධියේ අවමානයක්
කරන්නෙහි ය.
4 1 කොරි 9:9; 1 තිමෝ 5:18 “ගොයම් පාගන
ගවයාගේ කට නොබැඳිය යුතු ය.”

### මියගිය සහෝදරයා කෙරෙහි යුතුකම

5 මතෙ 22:24; මාක් 12:19; ලූක් 20:28 “එකට
වාසය කරන සහෝදරයන් අතරෙන් එක් කෙනෙකු
පුතෙකු නැතුව මළොත්, මියගිය තැනැත්තාගේ බිරිඳ,
පිට පවුලක කෙනෙකු සමඟ විවාහ නොවිය යුතු ය.
ඇගේ සැමියාගේ සහෝදරයා ඇය සරණ පාවාගෙන,
ඇය වෙත පිවිස, සැමියාගේ සහෝදරයෙකු විසින් ඈ
කෙරෙහි කළ යුතු යුතුකම ඔහු ඉටු කළ යුතු ය.
6 තවද, මියගිය සහෝදරයාගේ නම ඉශ්‍රායලේ
ජනයා අතර නොමැකී පවතින පිණිස ඈට උපදින
කුලුඳුලා මියගිය සහෝදරයාගේ නම ගත යුතු ය.
7 රූත් 4:7-8එහෙත්, ඒ තැනැත්තා මියගිය තම
සහෝදරයාගේ බිරිඳ පාවා ගන්නට අකමැති නම්, ඈ
වාසල් දොරකඩ සිටින ප්‍රජා මූලිකයන් වෙත ගොස්,
‘මාගේ සැමියාගේ සහෝදරයා, ඔහුගේ මියගිය
සහෝදරයාට ඉශ්‍රායලේ ජනයා අතර නාමයක්
රඳවාගැනීම ප්‍රතික්ෂේප කරයි. මාගේ සැමියාගේ
සහෝදරයාට පැවරෙන යුතුකම් ඔහු ඉටු කරන්නේ
නැතැ’යි කිව යුතු ය. 8 එවිට නුවර ප්‍රජා මූලිකයන්
ඔහු කැඳවා, ඔහුට කතා කළ යුතු ය. ‘මම ඇය
සරණ පාවාගන්නට අකමැත්තෙමි’යි ඔහු තදින් කියා
සිටින්නේ නම්, 9 ඔහුගේ සහෝදරයාගේ බිරිඳ
ප්‍රජා මූලිකයන් බලා සිටිය දී ම ඔහු වෙත පැමිණ
ඔහුගේ පාදයෙන් සෙරෙප්පුවක් ගලවා, ඔහුගේ
මුහුණට කෙළ ගසා, ‘තම සහෝදරයාට පෙළපතක්
ඇති නොකරන මිනිසාට මෙසේ කළ යුතු ය’යි කිව
යුතු ය. 10 ‘සෙරෙප්පුව ගලවන ලද තැනැත්තාගේ
පවුල’ කියා ඉශ්‍රායලේ ජනතාව අතර ඔහුගේ පවුල
නම් කළ යුතු වේ.”

### නීති හා නියෝග

11 “මිනිසුන් දෙදෙනෙකු තමන් අතර දබර කරන
කල එක් කෙනෙකුගේ බිරිඳ, තම සැමියාට පහර
දෙන අනික් තැනැත්තාගෙන් ඔහු බේරාගැනීමට ළං
වී අත දිගු කොට ඒ තැනැත්තාගේ රහසඟ
ඇල්ලුවොත්, 12 ඇගේ අත කපාදැමිය යුතු ය. ඔබ
ඇයට අනුකම්පා නොකළ යුතු ය.

13 ලෙවී 19:35-36 “බර එකක් සහ සැහැල්ලු එකක්
වශයෙන් විවිධ හොර කිරුම් පඩි ඔබේ මල්ලේ
තබා නොගත යුතු ය. 14 ලොකු එකක් සහ කුඩා
එකක් වශයෙන් විවිධ හොර මිම් ඔබේ ගෙදර තබා
නොගත යුතු ය. 15 හරි කිරුම් පඩි ද හරි මනින මිම්
ද ඔබ ළඟ තබාගත යුතු ය. මෙසේ කළහොත්, දෙවි
සමිඳාණන් වහන්සේ ඔබට දෙන දේශයේ දී ඔබට
දීර්ඝායුෂ ලැබෙන්නේ ය. 16 මෙවැනි වංචනික
දේවල් සහ අසාධාරණ දේවල් කරන්නෝ සමිඳාණන්
වහන්සේට පිළිකුලකි.”

### අමලකේවරුන් ඝාතනය කිරීම

17 නික්ම 17:8-14; 1 සාමු 15:2-9 “මිසර දේශයෙන්
ඔබ නික්ම එන විට මාර්ගයේ දී අමලකේවරුන්
ඔබට කළ දේ සිහි කරන්න. 18 ඔවුන් දෙවියන්
වහන්සේට ගරුබිය නොපෙනේවූ බැවින්, මාර්ගයේ දී
ඔවුන් ඔබට හමු වී, ඔබ ක්ලාන්ත ව වෙහෙසෙ
මහන්සි වී සිටිය දී, ඔබට පිටුපසින් පැමිණ දුබල
අයට ඔවුන් පහර දුන් හැටි සිහි කරන්න. 19 එබැවින්
දෙවි සමිඳාණන් වහන්සේ ඔබට උරුමයක් වශයෙන්
අයිති කර දෙන්නට යන දේශයෙහි ඔබ අවට්න්
සිටින සියලු සතුරන්ගෙන් ඔබට විවේකය දුන් පසු
අමලකේවරුන් සිහි කිරීම පවා මිහි පිට්න් මකාදැමිය
යුතු ය. මෙය අමතක නොකරන්න.”

### නාඹුල් පල

26 “ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ උරුමයක්
වශයෙන් ඔබට අයිති කර දෙන්නට යන
දේශයට ඔබ පැමිණ, එහි පදිංචි වූ පසු, 2 නික්ම
23:19උන් වහන්සේ දුන් දේශයෙහි පොළොවේ සෑම
පලදාවකින් නාඹුල් පල ගෙන, ඒවා පැසක දමා උන්
වහන්සේ සිය නාමය පිහිටුවීමට තෝරාගන්න
ස්ථානයට යා යුතු ය. 3 ඔබ එකල සිටින පූජකවරයා
වෙත ගොස් මෙසේ කිව යුතු ය: ‘අපට දෙනු සඳහා
සමිඳාණන් වහන්සේ අපේ පියවරුන්ට පොරොන්දු වූ
රටට මා පැමිණි බව මම අද දින දෙවි සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි ප්‍රකාශ කරමි.’ 4 පූජකවරයා ද
පැස ඔබේ අතින් ගෙන දෙවි සමිඳාණන්
වහන්සේගේ පූජාසනය ඉදිරිපිට එය තැබිය යුතු ය.
5 “ඉන්පසු ඔබ දෙවි සමිඳාණන් වහන්සේ ඉදිරිපිට
මෙසේ කිව යුතු ය: ‘මාගේ ආදි පියා තැනින් තැන
සංචාරය කළ අරමීය ජාතිකයෙකි. ඔහු කුඩා පිරිසක්
කැටුව මිසරයට ගොස්, එහි කලකට පදිංචි වී මහත්
බලසම්පන්න, ගණනින් විශාල ජාතියක් විය.
6 මිසරවාසීහු ද නපුරු ලෙසෙ ක්‍රියා කරමින්, අපට
හිංසා පීඩා කොට අප දැඩි වහල්කමට පත් කළහ.
7 අපේ ආදි පියවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේට අප මොරගැසූ විට සමිඳාණන් වහන්සේ
අපට සවන් දී අපේ දුක් කරදර ද හිංසා පීඩා ද
වෙහෙසෙ මහන්සි ද දෙසෙ බැලූ සේක. 8 සමිඳාණන්
වහන්සේ සිය හස්තය දිගු කොට, බාහු බලය පා,
බියජනක අරුමපුදුම දේවලින් සහ හාස්කම්වලින්
මිසර දේශයෙන් අප පිටතට ගෙනා සේක. 9 උන්
වහන්සේ අප මෙහි ගෙනවුත්, කිරෙන් සහ මී
පැණියෙන් ඉතිරෙන මේ දේශය අපට දුන් සේක.
10 සමිඳුනි, දැන් බලනු මැනව; ඔබ මට දුන්
දේශයේ නාඹුල් පල මම ගෙනැවිත් සිටිමි.’ මෙසේ
කියා දෙවි සමිඳාණන් ඉදිරියෙහි එය තබා උන්
වහන්සේට නමස්කාර කළ යුතු ය. 11 දෙවි
සමිඳාණන් වහන්සේ ඔබටත්, ඔබේ පවුලටත් දානය
කළ සියලු යහපත් දේවල් ගැන ඔබත්, ලෙවීවරුත්,
ඔබ සමඟ වසන විදේශිකයනුත් ප්‍රීති ප්‍රමෝද විය
යුතු ය.
12 ද්වි.නී. 14:28-29 “දසයෙන් කොටස දෙන අවුරුද්ද
වන තුන් වන අවුරුද්දේ දී, ඔබේ අස්වනු සියල්ලෙන්
දසයෙන් කොටස වෙන් කොට, ලෙවීවරයා ද
විදේශිකයා ද අනාථයා ද වැන්දඹුව ද ඔබේ නගරය
තුළ එය අනුභව කොට තෘප්තිමත් වූ පසු 13 දෙවි
සමිඳාණන් වහන්සේට මෙසේ කිව යුතු ය: ‘ඔබ මට
දුන් සියලු ආඥා ප්‍රකාර, කැප කළ දේ සියල්ල මම
ගෙදරින් ගෙනවුත්, ලෙවීවරයාට ද විදේශිකයාට ද
අනාථයාට ද වැන්දඹුවට ද දුනිමි. ඔබේ ආඥා මම
කඩ නොකළෙමි. ඒවා අමතක නොකළෙමි. 14 මා
වැලපෙන සමයේ ද මම එයින් කිසිවක් නොකෑවෙමි.
අපවිත්‍ර ව සිටි විට එයින් කිසිවක් ඉවත්
නොකළෙමි. එයින් කිසිවක් මළවුන්ට ඔප්පු
නොකළෙමි. මම මාගේ දෙවි සමිඳාණන්
වහන්සේට කීකරු වී, ඔබ වහන්සේ මට අණ කළ
සියල්ල ප්‍රකාර කළෙමි. 15 ඔබේ ශුද්ධස්ථානය
වන ස්වර්ගයේ සිට බලා, ඔබේ සෙනඟ වන
ඉශ්‍රායලේ ජනතාවට ද ඔබ අපේ පියවරුන්ට දිවුළ
ප්‍රකාර, අපට දුන්, කිරෙන් හා මී පැණියෙන්
ඉතිරෙන මේ දේශයට ද ආශීර්වාද කරනු මැනව.’ “

### සමිඳුන්ගේ ම සෙනඟ

16 “මෙදින දෙවි සමිඳාණන් වහන්සේ මේ නීති හා
නියෝග පිළිපැදීමට ඔබට අණ කරන සේක.
එබැවින් ඔබ, ඔබේ මුළු හෘදයෙන් ද ඔබේ මුළු
සිතින් ද ඒවාට අවනත වී පිළිපැදිය යුතු ය. 17 ඔබ,
සමිඳාණන් වහන්සේ ඔබේ දෙවියන් වහන්සේ බව
අද පිළිගෙන, දෙවි මඟ යාමටත්, උන් වහන්සේගේ
නීති, නියෝග සහ අණපණත් පිළිපැදීමටත්, උන්
වහන්සේට කීකරුවීමටත් පොරොන්දු විය යුතු ය.
18 නික්ම 19:5; ද්වි.නී. 4:20; 7:6; 14:2; තීතස් 2:14; 1
පේදු 2:9ඔබ උන් වහන්සේගේ අණපණත් සියල්ල
පිළිපදින්නහු නම්, උන් වහන්සේ පොරොන්දු වූ
ප්‍රකාර, ඔබ තමන් වහන්සේගේ විශේෂ සෙනඟක්
මෙන් අද දින පිළිගන්න බව ප්‍රකාශ කරන සේක.
19 තවද, දෙවි සමිඳාණන් වහන්සේ වදාළ ප්‍රකාර,
ඔබ උන් වහන්සේට කැප වූ ජනතාවක් වන පිණිස,
තමන් මැවූ අන් සියලු ජාතීන්ට වඩා කීර්තියෙන් ද
මහිමයෙන් ද ගෞරවයෙන් ද ඔබ උසස් කරන
සේක.”

### දේව ආඥා ගල් කණුවල කටේම

27 මෝසෙස් ඉශ්‍රායලේ ජනතාවගේ ප්‍රජා
මූලිකයන් කැටුව සෙනඟට මෙසේ කී ය: “අද
දින මා ඔබට නියම කළ සියලු අණපණත්
පිළිපදින්න. 2 ජෝෂු 8:30-32ජෝර්දාන් ගඟනේ
එතරෙ වී, දෙවි සමිඳාණන් වහන්සේ ඔබට දෙන්න
යන දේශයට ඔබ ගිය පසු, විශාල ගල් කණු සිටුවා,
ඒවාට හුණු බදාමක් ගෑ යුතු ය. 3 මෙසේ දෙවි
සමිඳාණන් වහන්සේ ඔබේ පියවරුන්ට පොරොන්දු
වූ ප්‍රකාර, උන් වහන්සේ ඔබට දෙන්න යන, කිරෙන්
සහ මී පැණියෙන් ඉතිරෙන දේශයට එතරෙ වී,
ඇතුළු වූ පසු මේ ආඥාව මුළුමනින් ම ඒ ගල්වල
කටේය යුතු ය. 4 ජෝර්දාන් ගඟින් එතරෙ වූ පසු මා
ඔබට අණ කරන, හුණු බදාම යෙදූ ඒ ගල් කණු
සිටුවිය යුත්තේ ඒබාල් කන්දේ ය. 5 නික්ම
20:25එහි දී දෙවි සමිඳාණන් වහන්සේට, ගලින්
පූජාසනයක් ගොඩනැඟිය යුතු ය. එහෙත්, කිසි ම
යකඩ ආයුධයක් ඒ ගල්වලට නොතැබිය යුතු ය.
6 දෙවි සමිඳාණන් වහන්සේගේ පූජාසනය නොකැපූ
ගලින් ඉදි කළ යුතු ය. උන් වහන්සේගේ මහිමයට
ඒ පූජාසනය මත දවන යාග පූජා ඔප්පු කළ යුතු ය.
7 සහභාගිකමේ පූජා ද එහි ඔප්පු කොට, ඒවා එහි
අනුභව කොට, දෙවි සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි
ප්‍රීති ප්‍රමෝද විය යුතු ය. 8 තවද, ඒ ගල් කණු
මත මේ ආඥාව සම්පූර්ණයෙන් ම පැහැදිලි ව
කටේය යුතු ය.”
9 නැවතත් මෝසෙස් සහ ලෙවී පූජකවරු
ඉශ්‍රායලේ ජනතාව අමතමින්, “ඉශ්‍රායලේ ජනයෙනි,
සාවධානයෙන් සවන් දෙන්න. අද දින ඔබ හැම දෙවි
සමිඳාණන් වහන්සේගේ සෙනඟ වූවහු ය.
10 එබැවින් ඔබ හැම දෙවි සමිඳාණන් වහන්සේට
කීකරු වී මා මෙදින නියම කරන උන් වහන්සේගේ
ආඥා ද නීති නියෝග ද ඉටු කළ යුතු ය”යි කී හ.

### අකීකරුකමේ පල විපාක

11 එදින ම මෝසෙස් සෙනඟට අණ කරමින්
මෙසේ කී ය: 12 ද්වි.නී. 11:29; ජෝෂු
8:33-35“ජෝර්දාන් ගඟනේ එතරෙ වූ පසු, ගෙරිසීම්
කන්ද මත, සෙනඟට ආශීර්වාද කරන පිණිස
සිමියොන් ද ලෙවී ද ජුදා ද ඉස්සාකර් ද ජෝසෙප්
සහ බෙන්ජමින් ද යන අයගේ ගෝත්‍ර සිටිය යුතු
ය. 13 ඒබාල් කන්ද මත සෙනඟට සාප කරන පිණිස,
රූබන් සහ ගාද් ද ආෂෙර් සහ සාබුලොන් ද දාන් සහ
නප්තලී ද යන අයගේ ගෝත්‍ර සිටිය යුතු ය.
14 ඉන්පසු ලෙවීවරු, මුළු ඉශ්‍රායලේ ජනතාව
අමතමින්, හඬ නඟා මෙසේ කිව යුතු ය:
15 නික්ම 20:4; 34:17; ලෙවී 19:4; 26:1; ද්වි.නී.
4:15-18; 5:8 ‘සමිඳාණන් වහන්සේට පිළිකුලක් වන
ශිල්පියකුගේ හස්ත කර්මාන්තයක් ද වන නළේ
රූපයක් හෝ වාත්තු පිළිමයක් හෝ සාදා එය
රහසින් තබාගන්න මිනිසාට සාප වේ වා!’ මුළු
සෙනඟ පිළිතුරු දෙමින්, ‘ආමෙන්’ කිව යුතු ය.
16 නික්ම 20:12; ද්වි.නී. 5:16 ‘තම මවට හෝ
පියාට හෝ අගෞරව කරන්නාට සාප වේ වා!’ මුළු
සෙනඟ ‘ආමෙන්’ කිව යුතු ය.
17 ද්වි.නී. 19:14 ‘තම අසල්වැසියාගේ ඉඩමේ
මායිම් ඉවත් කරන්නාට සාප වේ වා!’ මුළු සෙනඟ
‘ආමෙන්’ කිව යුතු ය.
18 ලෙවී 19:14 ‘අන්ධයා මංමුළා කරවන්නාට සාප
වේ වා!’ මුළු සෙනඟ ‘ආමෙන්’ කිව යුතු ය.
19 නික්ම 22:21; 23:9; ලෙවී 19:33-34; ද්වි.නී.
24:17-18 ‘විදේශිකයාගේ ද අනාථයාගේ ද
වැන්දඹුවන්ගේ ද අයිතිවාසිකම් හළො දමන්නාට
සාප වේ වා!’ මුළු සෙනඟ ‘ආමෙන්’ කිව යුතු ය.
20 ලෙවී 18:8; 20:11; ද්වි.නී. 22:30 ‘තම පියාගේ
බිරිඳ සමඟ සයනය කොට, පියාට නින්දා කරන්නාට
සාප වේ වා!’ මුළු සෙනඟ ‘ආමෙන්’ කිව යුතු ය.
21 නික්ම 22:19; ලෙවී 18:23; 20:15 ‘යම්කිසි
මෘගයකු සමඟ ලිංගික සම්බන්ධකම් ඇති
කරගන්නාට සාප වේ වා!’ මුළු සෙනඟ ‘ආමෙන්’ කිව
යුතු ය.
22 ලෙවී 18:9; 20:17 ‘තම සහෝදරියක් හෝ තම
පියාගේ දුව හෝ තම මවගේ දුව හෝ සමඟ
සයනය කරන්නාට සාප වේ වා!’ මුළු සෙනඟ
‘ආමෙන්’ කිව යුතු ය.
23 ලෙවී 18:17; 20:14 ‘තම නැන්දම්මා සමඟ
සයනය කරන්නාට සාප වේ වා!’ මුළු සෙනඟ
‘ආමෙන්’ කිව යුතු ය.
24 ‘තම අසල්වැසියා රහසින් මරා දමන්නාට සාප
වේවා!’ මුළු සෙනඟ ‘ආමෙන්’ කිව යුතු ය.
25 ‘නිර්දෝෂී යමකු මරනු පිණිස අල්ලස් ගන්නාට
සාප වේ වා!’ මුළු සෙනඟ ‘ආමෙන්’ කිව යුතු ය.
26 ගලා 3:10 ‘මේ නීතිය පිණිස එය සම්පූර්ණයෙන්
අනුමත නොකරන්නාට සාප වේ වා!’ මුළු සෙනඟ
‘ආමෙන්’ කිව යුතු ය.

### කීකරුකමේ ආශීර්වාද

(ලෙවී 26:3-13;ද්වි.නී. 7:12-24)

28 ද්වි.නී. 11:13-17 “මා අද දින ඔබට නියම
කරන අණපණත් සියල්ල පිළිපදින පිණිස
ඔබේ දෙවි සමිඳාණන් වහන්සේගේ හඬට ඔබ
කීකරු වන්නහු නම්, උන් වහන්සේ මිහි පිට සියලු
ජාතීන්ට වඩා ඔබ උසස් කරන සේක. 2 උන්
වහන්සේගේ හඬට කීකරු වන්නහු නම්, පහත
දැක්වෙන ආශීර්වාද සියල්ල ඔබ පිට පැමිණ ඔබ
සමඟ වන්නේ ය.
3 “ඔබේ නගරයේ දී ඔබ ආශීර්වාද ලද්දෝ
වන්නහු ය. ඔබේ කෙතේවතුවල දී ඔබ ආශීර්වාද
ලද්දෝ වන්නහු ය.
4 “ඔබේ දරුසම්පතට ද භවභෝගසම්පතට ද
ගවයන්ගේ සහ එළු බැටළුවන්ගේ බෝ වීමට ද
ආශීර්වාද ලැබෙන්නේ ය.
5 “ඔබේ පැසට ද පිටි අනන බඳුනට ද ආශීර්වාද
ලැබෙන්නේ ය.
6 “ඔබ ඇතුළට එන විට ද පිටතට යන විට ද උන්
වහන්සේ ඔබට ආශීර්වාද කරන සේක.

7 “ඔබට විරුද්ධ ව නැඟිටින ඔබේ සතුරන්, ඔබ
ඉදිරියෙහි පරාජය වීමට සමිඳාණන් වහන්සේ
සලසන සේක. ඔව්හු ඔබට විරුද්ධ ව එක මඟකින්
අවුත් හත් මඟකින් ඔබෙන් පලා යන්නෝ ය.
8 “ඔබේ ගබඩාවලට ද ඔබේ සියලු
වැඩකටයුතුවලට ද සමිඳාණන් වහන්සේ ආශීර්වාද
කරන සේක. දෙවි සමිඳාණන් වහන්සේ ඔබට දෙන
දේශයෙහි ඔබට ආශීර්වාද කරන සේක.
9 “ඔබ උන් වහන්සේගේ ආඥා පිළිපැද දෙවි මඟ
යන්නහු නම්, දෙවි සමිඳාණන් වහන්සේ දිවුළ
ප්‍රකාර ඔබ උන් වහන්සේට කැප වූ සෙනඟක්
කරගන්නා සේක. 10 උන් වහන්සේගේ නාමය ඔබ
දරන බව දුටු විට, මිහි පිට සියලු ජාතීහු ඔබට බිය
වන්නෝ ය. 11 සමිඳාණන් වහන්සේ ඔබට දෙනු
පිණිස ඔබේ පියවරුන්ට දිවුළ දේශයේ දී උන්
වහන්සේ ඔබට දරුසම්පත ද ගවසම්පත ද
භවභෝගසම්පත ද බහුල ව දානය කරන සේක.
12 උන් වහන්සේ තම ඉසුරු බර අහස් ගබඩා විවෘත
කොට, නිසි කලට කෙත්වතුවලට වැසි වස්වන
සේක. ඔබ කරන වැඩකටයුතු සියල්ලට ආශීර්වාද
කරන සේක. ඔබ බොහෝ ජාතීන්ට ණයට දෙන්නහු
ය; ණයට ඉල්ලා නොගන්නහු ය. 13 මා අද දින
ඔබට අණ කරන දෙවි සමිඳාණන් වහන්සේගේ
ආඥාවලට කීකරු වී, ඔබ ඒවා පිළිපදින්නහු නම්,
සමිඳාණන් වහන්සේ ඔබ අන්තිමයන් නොකොට,
ප්‍රධානීන් කරන සේක; පහත් නොකොට උසස්
කරන සේක. 14 මා ඔබට මෙදින නියම කරන
දේවල් ඔබ අකුරට ම පිළිපැදිය යුතු ය. අන්
දෙවිදේවතාවන්ට වැඳුම්පිදුම් නොකළ යුතු ය.”

### අකීකරුකමේ දුර්විපාක
(ලෙවී 26:14-46)

15 “මා අද දින ඔබට නියම කරන දෙවි සමිඳාණන්
වහන්සේගේ ආඥා ද නීති හා නියෝගයන් ද
පිළිපදිනු සඳහා උන් වහන්සේගේ හඬට කීකරු
නොවන්නහු නම්, පහත දක්වන සාප සියල්ල ද ඔබ
වෙත පැමිණ, ඔබ සමඟ පවතින්නේ ය.
16 “ඔබේ නගරවල දී ඔබ සාප ලද්දෝ වන්නහු ය.
ඔබේ ග්‍රාමයේ දී සාප ලද්දෝ වන්නහු ය.
17 “ඔබේ පැසට ද පිටි අනන බඳුනට ද සාප
ලැබෙන්නේ ය.
18 “ඔබේ දරුසම්පතට ද භවභෝගසම්පතට ද
ගවසම්පතට හා එළු බැටළු පැටවුන්ට ද සාප
ලැබෙන්නේ ය.
19 “ඔබ එන විට ද යන විට ද සාප ලද්දෝ
වන්නහු ය.
20 “ඔබේ නපුරු ක්‍රියාවලින් ඔබ සමිඳාණන්
වහන්සේ අත්හළ නිසා උන් වහන්සේ ඔබ නාස්ති
වී, විගස වැනසී යන තෙක් ඔබටත් ඔබේ
වැඩකටයුතු සියල්ලටත් සාපය ද වියවුල් ද තර්ජන ද
පමුණුවන සේක. 21 ඔබ අයිති කරගන්නට යන
දේශයෙන් ඔබ නැති කරදමන තෙක් උන් වහන්සේ
වංසගත පිට වසංගත ඔබට පමුණුවන සේක.
22 සමිඳාණන් වහන්සේ ක්ෂය රෝගය සහ උණ ද
ඉදිමුම සහ උණසන්නිපාතය ද ඔබට වැළඳෙන්න
සලස්වා පීඩා කරන සේක. ඔබේ පලදාවන්
නියඟයෙන් ද කොළ රෝගයෙන් සහ හතු
රෝගයෙන් ද වනසාලන සේක. ඔබ නාස්ති වී යන
තෙක් ඒවා ඔබ ලුහුබැඳ එනු ඇත. 23 ඉහළින් ඇති
අහස පිත්තල මෙන් වියළී ගොස් වැසි නොවසිනු
ඇත. පහළින් ඇති පොළොව යකඩ මෙන් දැඩි වෙනු
ඇත. 24 ඔබ වැනසී යන තෙක් උන් වහන්සේ
දේශය පුරා වැසි, වැලි කුණාටු හා දූවිලි බවට පත්
කර අහසින් හමන්නට සලසන සේක.
25 “සමිඳාණන් වහන්සේ ඔබේ සතුරන් ඉදිරියෙහි
ඔබ පරාජය වන්නට සලසන සේක. ඔබ ඔවුන්ට
විරුද්ධ ව එක මඟකින් අවුත් හත් මඟකින් පලා
යන්නහු ය. මිහි පිට සියලු රාජධානීන්හි වැසියන්ට
ඔබ ගොරතර භීතියක් වන්නහු ය. 26 ඔබේ
මළකඳන් අහසේ පක්ෂීන්ටත්, පොළොවේ
මෘගයන්ටත් ගොදුරු වන්නේ ය. උන් බියගන්වා
එළවාදැමීමට කිසිවකු නොවෙනු ඇත. 27 සුව විය
නොහැකි ලෙසෙ සමිඳාණන් වහන්සේ ඔබට මිසරයේ
වූ ගඩු රෝග ද පිළිකා ද වණ ද කුෂ්ඨ සහ හෝරි ද
වැළඳෙන්නට සලසන සේක. 28 උන් වහන්සේ ඔබ
උමතු බවට පමුණුවා, ඔබේ ඇස් අන්ධ කොට, ඔබ
අවුල් වියවුල් කරන සේක. 29 අන්ධයා අඳුරේ
අතපතගාමින් යන්නාක් මෙන් ඔබ ද ඉර මුදුන්
වේලාවෙහි අතපතගාමින් යන්නහු ය. ඔබ ගන්න
පියවර සාර්ථක නොවන්නේ ය. ඔබ නිතර ම
පීඩාවටත්, කොල්ලයටත් පාත්‍ර වන නමුත්,
කිසිවකේ ඔබ ගළවානොගන්නේ ය.
30 “ඔබ බිරිඳකට විවාහ ගිවිසුම් බස් දෙන නමුත්,
වෙනත් මිනිසකු ඇය සමඟ සයනය කරනු ඇත.
ඔබ ගෙයක් ගොඩනඟන නමුත්, එහි ඔබ පදිංචි
නොවෙනු ඇත. ඔබ මිදි වත්තක් වවන නමුත්, එහි
පල එකතු නොකරනු ඇත. 31 ඔබ බලා සිටිය දී
ඔබේ ගොනා මරනු ලබන නමුත්, ඔබ උගේ මස්
නොකන්නහු ය. ඔබ බලා සිටිය දී ඔබේ කොටළුවා
බලහත්කාරයෙන් පැහැරගනු ලබන්නේ ය; ඔබට
ආපසු ඌ නොලැබෙනු ඇත. ඔබේ බැටළුවෝ
සතුරන් විසින් පැහැරගනු ලබන්නෝ ය. ඔබට උදව්
දීමට කිසිවකේ නොවන්නේ ය. 32 ඔබේ දරුදැරියෝ
අන් ජනතාවකට පාවා දෙනු ලබන්නෝ ය, ඔවුන්ගේ
පැමිණීම ගැන දවස පුරා ඔබ ආසාවෙන් බල බලා
සිටීමෙන් ඔබේ ඇස් අඳුරු වනු ඇත, ඒ ගැන ඔබට
කිසිවක් කළ නොහැකි වන්නේ ය. 33 ඔබේ ශ්‍රමය
සහ වතුපිටිවල පලදාව ඔබ නොහඳුනන ජාතියක්
භුක්ති විඳින්නේ ය. ඔබ නිතර ම පීඩා කරනු ලැබ,
තැළී පොඩි වී යන්නහු ය. 34 ඔබ දකින මේ දේවල්
නිසා ඔබ උමතු වන්නහු ය. 35 සමිඳාණන් වහන්සේ
ඔබේ යටි පතුල සිට හිස් මුදුන දක්වා සුව විය
නොහැකි වණ ද දණහිස්වලත්, පාදවලත් දරුණු ගඩු
ද හටගන්නට සලසන සේක.
36 “සමිඳාණන් වහන්සේ ඔබත්, ඔබ පත්
කරගන්න රජුත් ඔබ හෝ ඔබේ පියවරුන් හෝ
නොදත් ජාතියක් වෙත ගෙන යන සේක. එහි දී ඔබ
ලීයෙන් සහ ගලින් තැනූ අන් දෙවිදේවතාවන්ට

වැඳුම්පිදුම් කරන්නහු ය. 37 උන් වහන්සේ ඔබ
පමුණුවන සියලු ජාතීන් අතර ඔබ ඔවුන්ගේ
මවිතයට හේතු වනු ඇත. ඔව්හු ඔබ සමච්චලයට ද
උපහාසයට ද ලක් කරන්නෝ ය.
38 “ඔබ කෙතට බොහෝ බීජ ගෙන යන නමුත්,
අස්වැන්න ස්වල්ප වනු ඇත. මන්ද, පළඟැටියෝ ඒවා
කාදමන්නෝ ය. 39 ඔබ මිදිවතු වවා සශ්‍රීක කරන
නමුත්, මිදි පල නෙළාගෙන මිදියුස පානය
නොකරන්නහු ය. පණුවෝ ඒවා කාදමන්නෝ ය.
40 ඔබේ දේශය පුරා ඔලීව ගස් තිබෙන නමුත්,
ආලේප කරගැනීමට ඔලීව තෙල් බිඳක් වත් ඔබට
ගත හැකි නොවන්නේ ය. එසේ වන්නේ ඔලීව
ගෙඩි වැටී යන බැවිනි. 41 ඔබට දරුදැරියන් ලැබෙන
නමුත්, ඔවුන් වහල්කමට යන බැවින් ඔව්හු ඔබට
අයිති නොවන්නෝ ය. 42 ඔබේ රටේ ගස්කොළන්
සහ පලදාව සියල්ල පළඟැටියෝ කාදමන්නෝ ය.
43 “ඔබ අතර සිටින විදේශිකයෝ වැඩිවැඩියෙන්
උසස් වන්නෝ ය. ඔබ වැඩිවැඩියෙන් පහත් වන්නහු
ය. 44 ඔහු ඔබට ණයට දෙනවා මිස ඔබ ඔහුට
ණයට නොදෙන්නෙහු ය. ඔහු ප්‍රධානියා වනු ඇත.
ඔබ අන්තිමයා වන්නහු ය.
45 “දෙවි සමිඳාණන් වහන්සේ ඔබට අණ කළ
ආඥා නීති හා නියෝගවලට, ඔබ අකීකරු වී ඒවා
නොපිළිපැදි බැවින් ඔබ වැනසී යන තෙක් මේ සාප
සියල්ල ම ඔබ පිට පැමිණ, ඔබ ලුහුබැඳ ගොස් ඔබ
අසු කරගන්නේ ය. 46 ඒවා ඔබටත්, ඔබේ
පරපුරටත් සදහට ම ලකුණක් සහ අරුමපුදුම දෙයක්
වනු ඇත. 47 සියලු සම්පතින් සමෘද්ධ ව සිටිය දී
දෙවි සමිඳාණන් වහන්සේට ඔබ ප්‍රීතියෙන් ද සතුටු
සිතින් ද සේවය නොකළ බැවින් 48 උන් වහන්සේ
ඔබට විරුද්ධ ව එවන සතුරන්ට සාපිපාසයෙන් ද
කයට වතක් නැති ව ද අගහිඟකමින් ද ඔබ සේවය
කරන්නහු ය. ඔබ වැනසී යන තෙක් ඔව්හු ඔබේ
කරපිට දරුණු වියගසක් තබන්නෝ ය. 49 ඔබට
නොතේරෙන භාෂාවක් කතා කරන ජාතියක්,
පොළොවේ බොහෝ දුරස්තර රටක සිට
රාජාලියකු පියාඹා එන වේගයෙන් ඔබට විරුද්ධ ව
පැමිණීමට සමිඳාණන් වහන්සේ සලසන සේක.
50 ඒ ජාතියට අයත් වුවෝ, රුදුරු මුහුණකින් යුක්ත
වූ ද මහල්ලන්ට ගරුසරු නොකරන්නා වූ ද
තරුණයන්ට අනුකම්පා නොදක්වන්නා වූ ද ඇත්තෝ
වෙති. 51 ඔව්හු ඔබ වැනසී යන තුරු ඔබේ
ගොවිසම්පත ද ගෙවතුවල පලදාව ද කාදමන්නෝ
ය. ඔබට ධනධාන්‍ය හෝ මිදියුස හෝ තෙල් හෝ
එළු බැටළු පැටවුන් හෝ ගව පට්ටි හෝ ඉතිරි
නොකරන්නෝ ය. 52 ඔබ විශ්වාස තැබූ, උස, ශක්ති
සම්පන්න රට පුරා ඇති ප්‍රාකාර බිඳ වැටෙන තුරු
සතුරෝ ඔබේ නගර වටලන්නෝ ය. දෙවි සමිඳාණන්
වහන්සේ ඔබට දුන් රට පුරා තිබෙන ඔබේ නගර
සියල්ල ම ඔව්හු වටලන්නෝ ය.
53 “මෙසේ සතුරන් ඔබේ නගර සියල්ල වටලා,
ඔබට අවහිර කිරීමෙන් වන දරුණු පීඩාවේ දී දෙවි
සමිඳාණන් වහන්සේ ඔබට දුන්, ඔබ ජනිත කළ
ඔබේ දරුදැරියන්ගේ මාංසය ඔබ කන්නහු ය. 54 ඔබ
අතර සිටින ශිෂ්ට සම්පන්න, විනීත ගතිපැවතුම් ඇති
මිනිසා පවා, තම සොහොයුරා දෙස ද තම
ප්‍රේමවන්ත බිරිඳ දෙස ද ඉතිරි ව සිටින අනෙක්
දරුදැරියන් දෙස ද අකාරුණික ලෙස බැල්ම
හෙළන්නේ ය. 55 ඔහු තමා කන තම දරුදැරියන්ගේ
මාංසයෙන් කොටසක් කිසිවකුට දීමට අකමැති
වන්නේ ය. ඔහු එසේ කරන්නේ සතුරන් ඔබේ
නගර සියල්ල වටලා, ඔබට අවහිර කිරීමෙන් වන
දරුණු පීඩාවේ දී ඔබට කන්න දෙයක් ඉතිරි නොවන
බැවිනි. 56 ඔබ අතර සිටින ශිෂ්ට සම්පන්න, විනීත
ගතිපැවතුම් ඇති, සුමුදු සිව්මැලි ගතිය නිසා තම පය
බිම තැබීමටවත් වුවමනාවක් නොතිබුණු ස්ත්‍රිය
පවා, තම ප්‍රේමවන්ත සැමියා දෙස ද දරුදැරියන්
දෙස ද අකාරුණික බැල්ම හෙළන්නී ය. 57 2 රාජා
6:28-29; විලාප 4:10සතුරන් ඔබේ නගර සියල්ල
වටලා ඔබට අවහිර කිරීමෙන් වන දරුණු පීඩාවේ දී
ඇයට කන්න යමක් නැති ව, ඇය අලුත ලැබූ දරුවා
වැදෑමහත් සමඟ ම රහසින් කන්නී ය.
58 “මේ පොතේ ලියා ඇති නීති සියල්ලට අවනත
වී නොපිළිපදින්නහු නම්, දෙවි සමිඳාණන් වහන්සේ
යන බියජනක, ශ්‍රී නාමයට ගරුබිය දක්වන පිණිස,
59 සමිඳාණන් වහන්සේ ඔබටත්, ඔබේ පෙළපතටත්
පුදුමාකාර, භයානක, කල් පවතින වසංගත හා කල්
පවතින දරුණු ලෙඩරෝග පමුණුවන සේක. 60 තවද,
උන් වහන්සේ මිසර දේශයේ වූ බියකරු ලෙඩරෝග
සියල්ල ඔබ පිට යළි පමුණුවන සේක. ඒවා ඔබෙන්
තුරන් නොවන්නේ ය. 61 මේ නීති සංග්‍රහයේ ලියා
නැති ලෙඩරෝග සහ වසංගත සියල්ල ම උන්
වහන්සේ ඔබ වනසාලන තෙක් ඔබ පිට පමුණුවන
සේක. 62 ඔබ ගණනින් අහසේ තරු මෙන් වැඩි
වුවත්, දෙවි සමිඳාණන් වහන්සේගේ හඬට අකීකරු
වූ බැවින් ගණනින් ස්වල්පයක් මෙන් ඉතිරි වන්නහු
ය. 63 ඔබට ශුභසිද්ධිය සැලසීමටත්, ඔබ වැඩි
වර්ධනය කිරීමටත් සමිඳාණන් වහන්සේ ප්‍රීති
ප්‍රමෝද වූවාක් සේ, ඔබ වනසාලීමටත්, නැත්තටම
නැතිකිරීමටත් උන් වහන්සේ ප්‍රීති ප්‍රමෝද වන
සේක. ඔබ අයිති කරගන්නට යන රටින් උන්
වහන්සේ ඔබ සම්පූර්ණයෙන් පිටමං කරදමන
සේක.
64 “පොළොවේ එක් කොණක සිට අනික් කොණ
දක්වා ජාති ජාතීන් අතරෙහි උන් වහන්සේ ඔබ
විසුරුවා හරින සේක. එවිට ඔබ හෝ ඔබේ
පියවරුන් හෝ නොදත්, ලීයෙන් සහ ගලින් නෙළූ අන්
දෙවිදේවතාවන්ට ඔබ වැඳුම්පිදුම් කරන්නහු ය.
65 මෙකී ජාතීන් අතර ඔබට කිසි පහසුවක්
නොවන්නේ ය. ඔබේ පයට විවේකයක් නොවනු
ඇත. එහි දී සමිඳාණන් වහන්සේ ඔබේ හද කම්පා
කරන සේක; නෙත අඳුරු කරන සේක; සිත දුක්
ගන්වන සේක. 66 ඔබේ ජීවිතය ගැන ඔබට සැක
පහළ වනු ඇත. දිවා රෑ බියට පත් වමින් ජීවිතය
ගැන අවිශ්වාසයක් වනු ඇත. 67 ඔබේ හදවත
බියෙන් ගැහි ගැහී පුදුමාකාර දේවල් දකින විට, උදය
කාලයේ, ‘අනේ! හවස් වුණා නම් කෙතරම් හොඳ ද’
කියාත්, හවස් කාලයේ දී ‘අනේ! උදය වුණා නම්

කෙතරම් හොඳ ද' කියාත් ඔබ කියන්නහු ය. 68 ඔබ
මිසර දේශය නැවත නොදකින්නෙහි යයි මා කී
නමුත් සමිඳාණන් වහන්සේ ගොඩින් සහ මුහුදින්
ඔබ මිසර දේශයට නැවත යවන සේක. එහි දී ඔබ
වහල් දැසිදසුන් මෙන් ඔබේ සතුරන්ට විකුණනු
ලබන්නහු ය. එහෙත් කිසිවෙකු ඔබ මිලට නොගනු
ඇත."

### මෝවබ්හි දී කළ ගිවිසුම සිහි කිරීම

29 සමිඳාණන් වහන්සේ ඉශ්‍රායෙලේ ජනයා
සමඟ හොරෙබ් කන්දේ දී කළ ගිවිසුමට
අමතර ව, උන් වහන්සේ මෝවබ් දේශයෙහි දී
ඔවුන් සමඟ කරන ලෙස මෝසෙස්ට අණ කළ
ගිවිසුමේ වචන මේවා ය.
2 මෝසෙස් මුළු ඉශ්‍රායෙලේ සෙනඟ කැඳවා ඔවුන්
අමතා මෙසේ කී ය: "සමිඳාණන් වහන්සේ මිසර
දේශයෙහි ඔබේ ඇස් ඉදිරියෙහි දී පාරාවෝ රජුටත්,
ඔහුගේ සියලු නිලධාරීන්ටත්, මුළු රටටත් කළ
3 බිහිසුණු පීඩා ද හාස්කම් සහ ප්‍රබල ක්‍රියා ද
ඔබ දුටුවහු ය. 4 එහෙත්, ඒවා තේරුම්ගැනීමට සිත්
ද දැකීමට නෙත් ද ඇසීමට කන් ද සමිඳාණන්
වහන්සේ අද දක්වා ඔබට නුදුන් සේක.
5 සමිඳාණන් වහන්සේ ඔබට පාළුකරයේ දී හතළිස්
අවුරුද්දක් මඟ පෙන්වූ සේක. ඔබ ඇඟ ලා ගත්
ඇඳුම් පරණ නො වී ය. පය ලා ගත් වහන් පරණ
නො වී ය. 6 සමිඳාණන් වහන්සේ වන මා ඔබේ
දෙවියන් වහන්සේ බව දැනගන්නා පිණිස ඔබ රොටි
කෑවේ වත් මිදිරස හෝ මත්පැන් පානය කළේ වත්
නැත. 7 ගණන් 21:21-35ඔබ මෙතැනට පැමිණි විට
හෙෂ්බොන්හි රජ වූ සීහොන් ද බාෂාන්හි රජ වූ ඕග්
ද අපට විරුද්ධ ව සටනට පැමිණි නමුත්, අපි ඔවුන්ට
පහර දුනිමු. 8 ගණන් 32:33අපි ඔවුන්ගේ රට
අල්ලාගෙන රූබන්ගේ පෙළපතටත්, ගාද්ගේ
පෙළපතටත්, මනස්සේගේ අර්ධ ගෝත්‍රයටත් ඒ
රට උරුම කොට දුනිමු. 9 එබැවින් ඔබ කරන සියල්ල
සඵල වන පිණිස මේ ගිවිසුමේ වචන ආරක්ෂා
කොට ඒවා පිළිපදින්න.
10 "අද දින ඔබේ ගෝත්‍රවල නායකයෝ ද ප්‍රජා
මූලිකයෝ ද නිලධාරීහු ද වන ඉශ්‍රායෙල්වරුන්ගේ
මුළු පිරිමි පක්ෂය ද 11 ඔබේ කුඩා දරුවෝ ද
භාර්යාවෝ ද දර පළන්නා පටන් වතුර අදින්නා
දක්වා ඔබේ කඳවුරේ සිටින විදේශිකයෝ ද දෙවි
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි සිටින්නෝ ය. 12 ඔබ
එසේ සිටින්නේ, ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ
අද ඔබ සමඟ කරන දිවුරුම් ගිවිසුමට ඔබ ඇතුළු
වන පිණිස ය. 13 එවිට උන් වහන්සේ ඔබට වදාළ
පරිදි, ඔබේ පියවරුන් වූ ආබ්‍රහම්ට, ඊසාක්ට සහ
ජාකොබ්ට දිවුළ පරිදි අද දින උන් වහන්සේ ඔබ
තමන්ට ම වෙන් කොටගත් සෙනඟක් කර, ඔබේ
දෙවියන් වහන්සේ වන සේක. 14 උන් වහන්සේ
මේ දිවුරුම් ගිවිසුම කරන්නේ ඔබ සමඟ පමණක්
නොවේ. 15 අද දින දෙවි සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි මෙහි සිටින ඔබ සමඟත්, අද දින මෙහි
නැති අය සමඟත් උන් වහන්සේ ගිවිසුම කරන
සේක.
16 "මිසර දේශයේ අප වාසය කළ සැටිත්, අප පසු
කර ආ ජාතීන් මැදින් අපි කෙසේ ආවමෝ ද කියාත්
ඔබ දන්නහු ය. 17 ඔවුන්ගේ පිළිකුල් ක්‍රියා ද ඔවුන්
අතර වූ ලීයෙන්, ගලින්, රිදී සහ රත්රනින් නෙළූ
පිළිම ද ඔබ දුටුවහු ය. 18 හෙබ්‍රෙ 12:15මෙදින අප
දෙවියන් වහන්සේ අත්හැර දමා මේ ජාතීන්ගේ
දෙවිදේවතාවන් වෙත ගොස්, ඔවුන්ට වැඳුම්පිදුම්
කරනු සඳහා සිත වෙනස් කරගත් ස්ත්‍රියක හෝ
පුරුෂයෙකු ද පවුලක් හෝ ගෝත්‍රයක් ද ඔබ අතර
නොසිටින හැටියටත්, තිත්ත වහ ගෙඩි හටගන්වන
ගහක මුලක් ඔබ අතර නොවෙන හැටියටත්
ප්‍රවේසම් විය යුතු ය. 19 එබඳු කෙනෙකු මේ
දිවුරුමේ වචන අසන විට, 'මා සිත මුරණ්ඩුකමින්
හැසිරෙන නමුත්, මට සකල ශුභසිද්ධිය සැලසේ
වා'යි කියාගනිමින් තමන් සිත සනසා ගත්තත්, හොඳ
නරක දෙපක්ෂය ම විනාශය කරා යනු ඇත.
20 සමිඳාණන් වහන්සේ ඔහුට කමා නොකරන
සේක, උන් වහන්සේගේ උදහස ද කෝපය ද ඔහුට
විරුද්ධ ව ඇවිළෙන්නේ ය. මේ පොතේ ලියන ලද
සාප සියල්ල ඔහු පිට වැටෙන්නේ ය. තවද, උන්
වහන්සේ ඔහුගේ නම මිහි පිටින් මකාදමන සේක.
21 මේ නීති සංග්‍රහය ලියන ලද ගිවිසුමට සම්බන්ධ
සාප සියල්ල අනුව සමිඳාණන් වහන්සේ ඔහු විපතට
හෙළෙනු පිණිස සියලු ම ඉශ්‍රායෙලේ ගෝත්‍රවලින්
ඔහු වනසාලන සේක.
22 "මෙසේ ඔබට පසු එන ඔබේ දරු පරම්පරා සහ
දුර රටකින් පැමිණෙන විදේශිකයා, සමිඳාණන්
වහන්සේ ඒ රටට එවූ වසංගත සහ ලෙඩරෝග ද
දකින්නෝ ය. 23 උත් 19:24-25උන් වහන්සේ වනසා
දැමූ සොදොම් සහ ගොමෝරා, අද්මා සහ
ශෙබොයිම් යන නගරවල මෙන්, ඒ මුළු රටෙහි කිසි
වැපිරීමක් වත්, පලා ජාතියක් වත්, තණකොළ ගහක්
පවා හටගැනීමක් වත් නැති ව, ගෙන්දගම් සහ
ලුණුවලින් ඒ රට පිරී දැවමෙන් තිබෙනු ඇත.
24 සියලු ජාතීහු මේවා දැක, 'සමිඳාණන් වහන්සේ
මේ රටට මෙසේ කළේ මන් ද? මෙතරම් දරුණු
උදහසකට හේතුව කුමක් දැ'යි අසන්නෝ ය.
25 එවිට මිනිස්සු පිළිතුරු දෙමින් මෙසේ කියන්නෝ
ය: 'මොවුන්ගේ පියවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේ ඔවුන් මිසර දේශයෙන් පිටතට ගෙනා විට
ඔවුන් සමඟ කළ ගිවිසුම ඔව්හු අත්හැර ගොස්,
26 ඔවුන් නොදත්, උන් වහන්සේ ඔවුන්ට නුදුන්, අන්
දෙවිදේවතාවන්ට වන්දනා නමස්කාර කළෝ ය.
27 එබැවින් මේ පොතේ ලියා ඇති සාප සියල්ල ඒ
රටට පමුණුවන තරම් ඊට විරුද්ධ ව උන්
වහන්සේගේ කෝපය ඇවිළිණි. 28 සමිඳාණන්
වහන්සේ කෝපයෙන් සහ උදහසින් ද දැඩි
ක්‍රෝධයෙන් ද ඇවිළී ඔවුන්ගේ මවු බිමින් ඔවුන්
මුලින් උදුරා, අද සිටින පරිදි වෙනත් රටකට ඔවුන්
පලවා දැමූ සේක.'

29 “අබිරහස් දේ අපේ දෙවි සමිඳාණන් වහන්සේට
අයිති ය. එහෙත්, මේ නීතියේ කරුණු අපටත්, අපේ
දරුවන්ටත්, ප්‍රකාශ කර ඇත්තේ අප ඒවා සදහට ම
පිළිපදින පිණිස ය.”

## කීකරුකමේ ආශීර්වාදය

30 “මා ඔබට තෝරාගන්නට දුන් ආශීර්වාද සහ
සාප යන මේ සියල්ල ඔබ වෙත පැමිණි විට,
දෙවි සමිඳාණන් වහන්සේ විසින් ඔබ පන්නාදමනු
ලැබූ සියලු ජාතීන් අතර ඒවා සිහි කොට 2 ඔබත්,
ඔබේ දරුමුණුබුරොත් තම තමන්ගේ මුළු හෘදයෙන්
සහ මුළු සිතින් සමිඳාණන් වහන්සේ වෙත ආපසු
හැරී, මා ඔබට අද නියම කරන සියල්ල අනුව ඔබ
උන් වහන්සේගේ හඬට කීකරු වන්නහු නම්, 3 උන්
වහන්සේ ඔබට අනුකම්පාව දක්වා ඔබේ වහල්කම
පහකොට, උන් වහන්සේ පැමිණ, විසුරුවනු ලැබූ
සියලු ජාතීන් අතරෙන් ඔබ හැම එක්රැස් කරගන්නා
සේක. 4 පොළොවේ බොහෝ දුර පෙදෙසට ඔබ
පන්නාදමනු ලැබ සිටියත්, උන් වහන්සේ ඔබ සොයා
එතැනට පැමිණ ඔබ ගෙන එන සේක. 5 තවද,
ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබේ පියවරුන්ට
හිමි වූ දේශයට ඔබ ගෙනා පසු ඔබ එය අයිති
කරගන්නහු ය. උන් වහන්සේ ඔබේ ආදි පියවරුන්ට
වඩා ඔබට සෙත සලසා, ඔබේ ජන සංඛ්‍යාව
ගණනින් වර්ධනය කරන සේක. 6 ඔබ ඒ රට පදිංචි
ව ජීවත් වෙමින් ඔබේ මුළු හෘදයෙන් ද ඔබේ මුළු
සිතින් ද ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට ප්‍රේම
කරන පිණිස උන් වහන්සේ ඔබේ සිතෙන් ද ඔබේ
දරුමුණුබුරන්ගේ සිත්වලින් ද පාප මල කපා හරින
සේක. 7 තවද, දෙවි සමිඳාණන් වහන්සේ ඔබට
පීඩා කළ ඔබේ සතුරන් පිට ද ඔබට වෛර කළ අය
පිට ද මේ සාප සියල්ල වැටෙන්නට සලසන සේක.
8 ඔබ යළි පැමිණ සමිඳාණන් වහන්සේගේ හඬට
කීකරු ව, මා ඔබට අද පණවන උන් වහන්සේගේ
ආඥා සියල්ල පිළිපදින්නහු ය. 9 දෙවි සමිඳාණන්
වහන්සේ ඔබ කරන සියලු වැඩකටයුතු ද බහුල ව
සඵලවත් කරන සේක. ඔබට සෙත සලසමින්, ඔබේ
දරුසම්පත ද ගවසම්පත ද භවභෝග ද වර්ධනය
කරන සේක. උන් වහන්සේ ඔබේ පියවරුන් ගැන
ප්‍රීති ප්‍රමෝද වූවාක් මෙන් ම ඔබට සෙත සලසන
පිණිස ඔබ ගැන ද නැවත ප්‍රීති ප්‍රමෝද වන
සේක. 10 එසේ වන්නේ, මේ නීති සංග්‍රහයේ ලියා
ඇති දෙවි සමිඳාණන් වහන්සේගේ ආඥා ද නීති හා
නියෝග ද පිළිපදින පිණිස, ඔබ උන් වහන්සේගේ
හඬට කීකරු වුණොත්, ඔබේ මුළු හෘදයෙන් සහ
ඔබේ මුළු සිතින් උන් වහන්සේ වෙත හැරී ආවොත්
පමණකි.
11 “මා ඔබට අද නියම කරන මේ පණත දුෂ්කර
එකක් වත්, ඉටු කරන්නට අපහසු එකක් වත්
නොවේ. 12 රෝම 10:6-8එය ඇත්තේ අහසෙහි
නොවේ; එබැවින් එය අසා, ඉටු කරන පිණිස අප
වෙත ගෙන එන්නට කවරෙක් අහසට නඟින්නේ ද
කියා කිසිවකුට කිව නොහැකි ය. 13 එය ඇත්තේ
මුහුදින් එතෙර ද නොවේ; එබැවින් එය අසා ඉටු
කරන පිණිස අප වෙත ගෙන එන්නට කවරෙක්
මුහුද තරණය කරන්නේ ද කියා කිසිවකුට කිව
නොහැකි ය. 14 එහෙත්, ඒ වචනය ඔබ ඉටු කරන
පිණිස එය ඔබට ඉතා ළං ව, ඔබේ තොල් මත ද
ඔබේ සිතෙහි ද ඇත්තේ ය.”

## ජීවනය හා මරණය

15 “බලන්න, මම අද ඔබ ඉදිරියෙහි ජීවනය සහ
සැපත ද මරණය සහ විපත ද තැබීමි. 16 ඔබේ දෙවි
සමිඳාණන් වහන්සේ ඔබට මෙදින දෙන පණත් ඔබ
අනුගමනය කරන්නහු නම්, ඔබ ඒ රටේ පදිංචි
වෙමින්, වැඩී වර්ධනය වී ජීවත් වන්නහු ය. ඔබේ
දෙවි සමිඳාණන් වහන්සේට ඔබ ප්‍රේම කරමින්
දෙවි මඟ හැසිරෙමින්, උන් වහන්සේගේ ආඥා ද
නීති හා නියෝග ද ව්‍යවස්ථා ද පිළිපදින්නහු නම්,
ඔබ අයිති කරගන්නට යන දේශයෙහි දෙවි
සමිඳාණන් වහන්සේ ඔබට ආශීර්වාද කරන සේක.
17 එහෙත්, ඔබ අකීකරු වී ඔබේ සිත අන් අතකට
හැරී ගොස් අනිකුත් දෙවිදේවතාවන්ට වන්දනා
නමස්කාර කිරීමට ඔබේ සිත ඇදී ගියොත්, 18 ඔබ
නැත්තට ම විනාශ වන බවත්, ජොර්දාන් ගඟෙන්
එතෙර වී ඔබ අයිති කරගන්නට යන දේශයෙහි ඔබ
බොහෝ කල් ජීවත් නොවන බවත් මම අද
ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරමි. 19 මා ඔබ ඉදිරියෙහි
ජීවනය හෝ මරණය ද ආශීර්වාදය හෝ සාපය ද
අද තැබූ බවට, ඔබට විරුද්ධ ව සාක්ෂි දරන පිණිස
අහසත්, පොළොවත් කැඳවමි. එබැවින් ඔබත්, ඔබේ
පරපුරත් ජීවත් වන පිණිස ජීවනය තෝරාගන්න.
20 උත් 12:7; 26:3; 28:13දෙවි සමිඳාණන් වහන්සේ
ඔබේ පියවරුන් වන ආබ්‍රහම්ට, ඊසාක්ට සහ
ජාකොබ්ට දෙන්න දිවුළ දේශයෙහි ඔබ පදිංචි වන
පිණිස උන් වහන්සේට ප්‍රේම කොට, උන්
වහන්සේගේ හඬට කීකරු වී උන් වහන්සේට ඇලුම්
ව සිටිය යුතු ය. එසේ කිරීමෙන් චිරාත් කාලයක් ඔබ
ඒ රටේ ජීවත් වන්නහු ය.”

## ජෝෂුවා පත් කිරීම

31 මෝසෙස් ගොස් ඉශ්‍රායෙල්වරුන් සියලු
දෙනාට මේ පුවත කීවේ ය. 2 ගණන්
20:12ඔහු ඔවුන් අමතමින් මෙසේ පැවසී ය: “මට අද
වයස අවුරුදු එකසිය විස්සකි. මට තවත් රිසි පරිදි
යන්න එන්න බැරි ය. ‘ඔබ ජොර්දාන් ගඟෙන් එතෙර
නොවනු ඇතැ’යි සමිඳාණන් වහන්සේ ද මට වදාළ
සේක. 3 ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබට
පෙරටුවෙන් එතෙර වී, ඔබට ඉදිරියෙන් සිටින ජාතීන්
වනසාලන සේක. ඔබ ඔවුන්ගේ දේශ අයිති
කරගන්නහු ය. සමිඳාණන් වහන්සේ වදාළ ප්‍රකාර,
ඔබට පෙරටුවෙන් ජෝෂුවා යනු ඇත. 4 ගණන්
21:21-35සමිඳාණන් වහන්සේ වනසා ලූ
අමෝරිවරුන්ගේ රජුන් වන සීහොන්ට සහ ඕග්ට ද
ඔවුන්ගේ දේශයට ද කළ ලෙස, උන් වහන්සේ
ඔවුන්ටත් කරන සේක. 5 සමිඳාණන් වහන්සේ

මොවුන් ඔබට පාවා දුන් කල, මා නියම කළ සියලු
අණපණත් අනුව ඔබ ඔවුන්ට කළ යුතු ය.
6 ශක්තිමත් ව ධෛර්ය සම්පන්න ව සිටින්න; බිය
නොවී, තැති නොගෙන ඉන්න; ඔබ සමඟ යන්නේ
ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ය. උන් වහන්සේ
ඔබ අතරමං නොකරන සේක. ඔබ අත් නොහරින
සේක.”
7 ඉන්පසු මෝසෙස් ජෝෂුවා කැඳවා මුළු
ඉශ්‍රායලේ ජනතාව බලා සිටිය දී ඔහුට කතා
කොට, “ශක්තිමත් ව ධෛර්ය සම්පන්න ව සිටින්න.
සමිඳාණන් වහන්සේ ඔබේ පියවරුන්ට දෙන්නට
දිවුළ දේශයට මේ සෙනඟ සමඟ ඔබ යා යුතු ය.
ඔබ ඔවුන්ට එරට උරුම කර දිය යුතු ය. 8 ජෝෂු
1:5; හෙබ්‍රෙ 13:5ඔබට පෙරටුවෙන් යන්නේ
සමිඳාණන් වහන්සේ ය. උන් වහන්සේ ඔබ සමඟ
වැඩ සිටින සේක. ඔබ අතරමං නොකරන සේක.
ඔබ අත් නොහරින සේක. බිය නොවන්න;
නොකැළඹෙන්නැ”යි කීවේ ය.

## සත් වසරකට වරක් කිව යුතු නීතිය

9 මෝසෙස් මේ නීතිය ලියා සමිඳාණන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව උසුලාගෙන ගිය
ලෙවීගේ වංශයේ පූජකයන්ට ද ඉශ්‍රායලේ
ජනතාවගේ ප්‍රජා මූලිකයන්ට ද භාර දුන්නේ ය.
10 ද්වි.නී. 15:12; 16:13-15තවද, මෝසෙස් ඔවුන්ට
මෙසේ අණ කරමින්, “සෑම සත් අවුරුද්දක් කෙළෙවර
දී, මිදීමේ අවුරුද්ද පැමිණි විට, 11 කූඩාරම්
මංගල්‍යයේ දී දෙවි සමිඳාණන් වහන්සේ තෝරා
නියම කරන ස්ථානයට, උන් වහන්සේ අබිමුවට මුළු
ඉශ්‍රායලේ ජනතාව ආ විට, ඔවුන් සියල්ලන්ට
ඇසෙන පරිදි ඔබ මේ නීතිය කියවිය යුතු ය.
12 ස්ත්‍රීන් සහ පුරුෂයන් ද දරුදැරියන් ද ඔබේ
නගරවල සිටින විදේශිකයන් ද එක්රැස් කොට,
ඔවුන් මේ නීතිය අසා දැනගෙන දෙවි සමිඳාණන්
වහන්සේට ගරුබිය පෑමටත්, මේ නීතියේ අඩංගු
කරුණු සියල්ල පිළිපැදීමටත් ඔවුන්ට එය කියවිය යුතු
ය. 13 එවිට ඔබ ජෝර්දාන් ගඟෙන් එතෙරේ වී අයිති
කරගන්නට යන දේශයෙහි ඔබට දිවි ඇති තාක්,
ඔබෙන් පැවත එන කිසිවක් නොදත් අය එය අසා,
දෙවි සමිඳාණන් වහන්සේට ගරුබිය පෑමට ඉගෙන
ගන්නෝ ය”යි කී ය.

## මෝසෙස්ට දුන් අවසාන උපදෙස්

14 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට,
“බලන්න, නුඹ මැරෙන කාලය දැන් ආසන්න ය.
ජෝෂුවා කැඳවා, මා ඔහුට වගකීම භාර දෙන පිණිස
නුඹලා දෙදෙන සම්මුඛ මණ්ඩපයෙහි පෙනී
සිටින්නැ”යි වදාළ සේක. මෝසෙස් සහ ජෝෂුවා
ගොස් සම්මුඛ මණ්ඩපයෙහි පෙනී සිටියෝ ය.
15 සමිඳාණන් වහන්සේ ද මණ්ඩපයෙහි වලා ටැඹක්
මඟින් දර්ශනය වූ සේක. එහි දොරටුවට ඉහළින්
වලා ටැඹ පිහිටා තිබිණි.

16 සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට
මෙසේ වදාළ සේක: “බලන්න, නුඹේ පියවරුන්
කළුරිය කළ පරිදි නුඹත් කළුරිය කරන්නට දැන්
ආසන්න ව සිටින්නෙහි ය. නුඹේ මරණින් පසු මේ
සෙනඟ මට අවිශ්වාසවන්ත ව ඔවුන් පදිංචි වන
රටෙහි විදේශිකයන්ගේ දෙවිදේවතාවන් වැළඳගෙන,
මා අත්හැර, ඔවුන් සමඟ කළ මාගේ ගිවිසුම කඩ
කරන්නෝ ය. 17 එදින මාගේ උදහස ඔවුන්ට විරුද්ධ
ව ඇවිළී, මා ඔවුන් අත්හැර, මම ඔවුන්ගෙන් මාගේ
මුහුණ සඟවා ගන්නෙමි. ඔවුන් පිට පැමිණෙන මහා
විපත්ති සහ දුක් කරදරවලින් ඔව්හු වැනසී යන්නෝ
ය. එවිට එදින ඔව්හු කතා කොට, ‘මේ විපත්ති අප
පිට පැමිණ තිබෙන්නේ අපේ දෙවියන් වහන්සේ අප
අතරේ නැති නිසා නොවේ දැ’යි කියන්නෝ ය.
18 ඔවුන් අන් දෙවිදේවතාවන් වෙත හැරී ගොස්,
කළ සියලු නපුරුකම් නිසා මම එදින සත්තකට ම
මාගේ මුහුණ ඔවුන්ගෙන් සඟවාගන්නෙමි.
19 එබැවින් දැන් මේ ගීතය ලියා ඉශ්‍රායලේ ජනයාට
ඉගැන්විය යුතු ය. මේ ගීතය ඉශ්‍රායලේ ජනයාට
විරුද්ධ ව මා වෙනුවෙන් සාක්ෂියක් වනු පිණිස එය
ඔවුන්ට කටපාඩම් කරවන්න. 20 මා ඔවුන්ගේ
පියවරුන්ට දිවුළ කිරෙන් හා මී පැණියෙන් ඉතිරෙන
දේශයට ඔවුන් ගෙනා පසු, ඔවුන් කා බී, තෘප්තිමත්
වී, තර වූ පසු, ඔව්හු අන් දෙවිදේවතාවන් වෙත
හැරී ගොස්, ඔවුන්ට වැඳ පුදා, මා කුපිත කොට
මාගේ ගිවිසුම් කඩ කරන්නෝ ය. 21 ඔවුන් පිට
බොහෝ විපත්ති හා දුක්කරදර පැමිණෙන විට,
ඔවුන්ගේ දරුමුණුබුරන්ට එම ගීතය අමතක නොවන
බැවින් එය සාක්ෂිකරුවකු මෙන් ඔවුන්ට විරුද්ධ ව
සාක්ෂි දෙනු ඇත. මන්ද, මා දිවුළ දේශයට ඔවුන්
ගෙනෙන්නට කලින්, දැනට ම මම ඔවුන්ගේ සිතුම්
පැතුම් දනිමි.”
22 එබැවින් මෝසෙස් එදින ඒ ගීතය ලියා
ඉශ්‍රායලේ ජනයාට ඉගැන්වී ය. 23 ගණන් 27:23;
ජෝෂු 1:6සමිඳාණන් වහන්සේ නූන්ගේ පුත්
ජෝෂුවාට කතා කරමින්, “ශක්තිමත් ව, ධෛර්ය
සම්පන්න වන්න. මා ඔවුන්ට දිවුළ දේශයට ඔබ
ඉශ්‍රායලේ ජනතාව ගෙන යන්නෙහි ය. මම ඔබ
සමඟ සිටිමි”යි වදාළ සේක.
24 එවිට මෝසෙස් මේ නීතියේ අඩංගු කරුණු
සියල්ල ම කෙළෙවර වන තෙක් පොතක ලීවේ ය.
25 ඉන්පසු ඔහු සමිඳාණන් වහන්සේගේ ගිවිසුම්
කරඬුව උසුලන ලෙවීවරුන්ට අණ කරමින් මෙසේ
කීවේ ය: 26 “මේ නීති සංග්‍රහය රැගෙන, ඔබට
විරුද්ධ ව සාක්ෂියක් වන පිණිස, එය දෙවි
සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව ළඟ
තබන්න. 27 මම ඔබේ කැරලිකාරකමත්,
මුරණ්ඩුකමත් දනිමි. මා අද ජීවත් ව සිටිය දී ම
සමිඳාණන් වහන්සේට විරුද්ධ ව ඔබ
කැරලිගසන්නහු නම්, මාගේ මරණයෙන් පසු
කොපමණ වැඩියෙන් එසේ නොකරන්නහු ද?
28 ඔබේ ගෝත්‍රවල ප්‍රජා මූලිකයන් ද නිලධාරීන්
ද අසාගෙන සිටින විට මේ කරුණු කියා, ඔවුන්ට
විරුද්ධ ව සාක්ෂි දීමට අහසත් පොළොවත් කැඳවනු

පිණිස, ඔවුන් සියල්ලන් මා වෙතට රැස් කරන්න.
29 මාගේ මරණින් පසු ඔබ හැම සම්පූර්ණයෙන් ම
දූෂ්‍ය වී මා නියම කළ මාර්ගයෙන් ඉවතට යන බව
මම දනිමි. සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි දුෂ්ටකම්
කර, ඔබේ ක්‍රියාවලින් උන් වහන්සේගේ කෝපය
අවුස්සන බැවින් මතු කාලයේ දී ඔබ පිට මහා
දුර්භාග්‍ය පැමිණෙනු ඇත.” 30 ඉන්පසු මෝසෙස් මුළු
ඉශ්‍රායෙලේ ජනතාවට ඇසෙන පරිදි මේ ගීතයේ
වචන, නිමවන තෙක් පැවසී ය.

### මෝසෙස්ගේ ගීතය

32 “එම්බා, අහස් තලය! මා කියන දේට සවන් දෙන්න.
q2
32 එම්බා, මිහිතලය!
q2
32 මා වදනට ඇහුම්කන් දෙන්න.
2 මා සික පද වැහි බිඳු මෙන්, මා කථනය පිනි
බිඳු මෙන්, ළා පැළ මත වැසි පොද මෙන්, ළා තණ
මත මල් වැසි මෙන් වැටේ.
3 හිමි සඳ නම මම පවසමි.
q2 3 එතුමන්ගේ මහිමය ඔබ ගයන්න.
4 එතුමාණෝ පර්වතයාණෝ ය.
q2 4 එතුමන්ගේ ක්‍රියා පරිපූර්ණ ය;
q2 4 එතුමන්ගේ මාර්ග සාධාරණ ය.
q2 4 එතුමාණෝ අයුතුකමින් තොර ව වසන විශ්වාසී
දෙවි කෙනෙකි.
q2 4 දැහැමි ව හා අවංක ව ද සිටින සේක.
5 එහෙත් එතුමන්ගේ සෙනඟ, දූෂ්‍ය වී ඇත;
q2 5 දෙවි දරුකම ඔවුන්ට නැත;
q2 5 වංක, අදමිටු පරපුරක් වී ඇත.
6 අහෝ, මෝඩ අනුවණ ජනයෙනි!
q2 6 සමිඳුන්ට සලකන්නේ මෙලෙසෙ ද?
q2 6 නුඹලා මවා, උපදවා ජාතියක් සේ පිහිටවූ
පියාණෝ, එතුමණෝ නොවෙතේ ද?
7 පැරණි යුග සිහි කරන්න.
q2 7 පරෙ පරපුර සලකා බලන්න.
q2 7 පියාගෙන් අසන්න;
q2 7 ඔහු නුඹලාට කියා දෙනු ඇත.
q2 7 ප්‍රජා මූලිකයන්ගෙන් විමසන්න;
q2 7 ඔවුන් නුඹලාට දන්වනු ඇත.
8 ක්‍රියා 17:26 මහෝත්තමයාණෝ ජාති ජාතීන් හට
රට රාජ්‍ය බෙදා දුන් විට, මිනිසුන් ජාතීන් වශයෙන්
බෙදා වෙන් කරන විට, මුර දේවතාවන්ගේ ගණනේ
හැටියට, ඔවුන්ගේ සීමා නියම කළ සේක.
9 සමිඳුන්ගේ කොටස එතුමන් සෙනඟ ය, සිය
උරුමය ජාකොබ් පෙළපත ය.
10 කාන්තාර රටක දී, බියකරු පාළුකරයේ දී, ඔවුන්
හමු වී, එතුමාණෝ, තම දෙනෙත මෙන් ඔවුන්
රැකබලා ඔවුන්ට උපදෙස් දී, මඟපෙන්වූ සේක.
11 එසේ කළේ, රාජාලියා සිය කැදැල්ල අවුස්සා,
පැටවුන්ට පහළින් පියාඹා, පියාපත් විහිදුවා, ඒ මත
උන් දරා, උන් ගෙන යන්නාක් මෙනි.
12 ඔවුන්ට මඟපෙන්වූයේ සමිඳාණන් පමණකි;
q2 12 අන් දෙවියෙක් එතුමන් සමඟ නොවී ය.
13 එතුමාණෝ මිහි පිට ගිරිකුළු මත ඔවුන් ගෙන
ගිය සේක.
q2 13 ගොඩ මඬ අස්වැන්නෙන් ඔවුන් පෝෂණය කළ
සේක.
13 පර්වතයෙන් මී පැණි ද ගිනිගලෙන් තලේ ද
ඔවුන්ට පෙවූ සේක.
14 දී කිරෙන් හා බැටළු කිරෙන්, බාෂාන්හි එළු බැටළු
තලෙන්, හොඳ ම තිරිඟු පිටිවලින්, පැසුණු ඉස්තරම්
මිදියුසින්, ඔවුන් පෝෂණය කළ සේක.
15 ජාකොබ්ගේ පෙළෙපත කා බී සෑහීමට පත් වූ හ.
q2 15 ඉශ්‍රායෙලේ සෙනඟ තර වී කැරලි ගැසූ හ.
q2 15 තර වී, තරබාරු වී, ස්ථූල වූ හ.
q2 15 තමන් මැවූ දෙවිඳුන් අතහැර, විමුක්ති
පර්වතයාණන් වන එතුමන් සුළු කොට සැලකූ හ.
16 අන් දෙවිදේවතාවන්ට වැඳ පුදා,
q2 16 නුරුස්සන ලෙසෙ උන් වහන්සේ පෙළෙඹවූහ.
q2 16 පිළිකුල් ක්‍රියා කොට, එතුමන් උදහස් කළහ.
17 1 කොරි 10:20 දෙවිඳුන් නොවෙන, ඔවුන්
නොහඳුනන, අලුතින් පැමිණි නව දෙවිවරුන් වන
ඔවුන්ගේ පියවරුන් ගරුබිය නොපෑ යකුන් හට ඔව්හු
පූජා කළහ.
18 ඔබට දිවි දුන් පර්වතයාණන්, ඔබ නොසැලකුවෙහු
ය.
q2 18 ඔබ මැවූ දෙවි තුමාණන්, ඔබ අමතක කළහු
ය.
19 සමිඳාණෝ එය දැක, ඔවුන්ගේ දූ පුතුන් එතුමන්
කුපිත කළ නිසා, ඔවුන් පිළිකුල් කළ සේක.
20 එතුමාණෝ මෙසේ වදාළ සේක:
q2 20 මම ඔවුන්ගෙන් මුහුණ සඟවාගනිමි.
q2 20 ඔවුන්ගේ ඉරණම කුමක් දැ යි බලමි.
q2 20 ඔව්හු කපටි පෙළෙපතකි;
q2 20 අවිශ්වාසී පරපුරකි.
21 රෝම 10:19; 1 කොරි 10:22 බොරු දෙවිවරුන්
නිසා ඔව්හු මා කුපිත කළහ.
q2 21 එවැනි නිසරු දෙයින් මා උදහස් කළහ.
q2 21 එබැවින් වැදගැම්මක් නැති ජාතියක් ලවා මම
ඔවුන් කුපිත කරවමි.
q2 21 අනුවණ සෙනඟක් ලවා මම ඔවුන් උදහස්
කරවමි.
22 මාගේ කෝපයෙන් ගින්නක් ඇවිළී, පාතාල
ලෝකයේ ගැඹුර තෙක් ගොස් දැවී, මිහිතලය
අස්වැන්න සමඟ ගිනිබත් වනු ඇත.
q2 22 කඳුවල පදනම් ද දැවෙනු ඇත.
23 මම ඔවුන් පිට විපත් ගොඩ ගසමි.
q2 23 ඊ සැරයෙන් ඔවුන් විද දමමි.
24 ඔවුන් සාගින්නෙන් දැවෙනු ඇත.
q2 24 දැඩි උණකට, දරුණු වංසගතයට බිලි වනු ඇත.
q2 24 ඔවුන් ඉරාදැමීමට වන සතුන් එවමි.
q2 24 සර්ප විසෙන් ඔවුන් වනසාදමමි.
25 වීදිවල යුද්ධය ඇති වයේ;
q2 25 ගෙවල භීතිය ඇති වයේ.
q2 25 තරුණ තරුණියෝ නැසී යති;

q2[25] කිරි දරුවෝ ද මහල්ලෝ ද වැනසී යති.
26 ඔවුන් දස දසෙ විසුරුවා හැර, ඔවුන්ගේ නම
මිනිසුන් අතරනේ මකාදමමි.
q2[26] මයෙ මාගේ තීරණය වේ.
27 'අපි ජයගත්තේ අපේ අතිනි.
q2[27] මයෙ කළෙේ සමිඳාණන් නොවෙ, අපි ම ය'යි
සතුරන් වරදවා කියා මා උදහසට පත් නොකරනු
වස්, මම එසේ නොකළෙමේ.
q1[28] ඉශ්‍රායලේවරු නැණනුවණ මදි ජාතියකි;
q2[28] ප්‍රඥා හීන සනෙඟකි.
29 ඔවුන්ට නැණනුවණ තිබිණි නම්, ඔව්හු නැණවත්
වූවෝ නම්, අනාගතය ගැන මනෙහෙි කළෝ නම්,
කතෙරම් හොඳ ද?
30 ඔවුන්ගේ පර්වතයාණෝ, ඔවුන් නොවිකිණ
සේක් නම්, සමිඳාණෝ, ඔවුන් පාවා නුදුන් සේක්
නම්, එක් කනෙකේ දහසක් ද දනේනකේ දස දහසක්
ද පලවා හරින්නේ කසෙේ ද?
31 අප සතුරන්ගේ දවේවරු, අපේ දවේඳුන් හා සම
නොවතෙි යි සතුරෝ දනිති.
32 සතුරන්ගේ මිදි වැල සොදොමෙහි මිදි වැලනේ ය;
q2[32] ගොමෝරාහි වතුපිටිවල මිදි වැලනේ ය.
q2[32] ඒවායේ මිදි පල විස ය;
q2[32] ඒවායේ මිදි වලු තිත්ත ය.
33 ඔවුන්ගේ මිදියුස සර්ප විස වැනි ය,
පොළඟාගේ සැර විස වැනි ය.
34 ඉශ්‍රායලේ ජනයා මට අනගි නොවේ ද?
q2[34] මාගේ ගබඩාවල සම්පත් මනේ ඔවුන් තැන්පත්
කොට නැද් ද?
q1[35] රෝම 12:19; හබේ‍රෙ 10:30 ඔවුන් වැරදි
පියවරක් ගන්න විට පළිගැනීම හා ප්‍රතිඵල දීම
මාගේ ය.
q2[35] ඔවුන්ගේ විපත්ති දවස ළඟ ය;
q2[35] ඔවුන්ගේ ඉරණම වහා පැමිණේ.
36 ගීතා 135:14 තම ජනයාගේ බලය නැති වූ බව,
දාසයා ද නිර්දාසයා ද නැති බව, සමිඳාණෝ දැක;
q2[36] සිය සනෙඟට යුක්තිය ඉටු කරන සේක;
q2[36] ඔවුන්ට අනුකම්පා කරන සේක.
37 එතුමාණෝ මසෙේ අසන සේක:
q2[37] 'ඔවුන් විශ්වාසය තැබූ පර්වතය වන
දවේදේවතාවෝ කොහේ ද?
38 යාග පඬුරුවල තලෙ වැළඳූ, පානීය පූජාවල
මිදියුස පානය කළ, ඔවුන්ගේ දවේදේවතාවෝ
කොතැන ද?'
q2[38] ඔව්හු නැඟිට සිට උපකාර කරත් වා!
q2[38] රැකවරණය සලසත් වා!
39 බලන්න, මම, මම පමණක්, දවේයන් වහන්සේ
වමේ.
q2[39] මා හැර අන් දවේ කනෙකේ නැත.
q2[39] දිවි දනේනතේ, දිවි නසන්නතේ මම ය.
q2[39] තුවාළ කරන්නතේ, සුව කරන්නතේ මම ය, මා
අතින් යමකු ගළවන්නට හැකි කිසිවකේ නැත.
40 අහසට මා අත ඔසවා දිවුරා කියමි, මා සදහට
ම ජීවත් ව සිටින්නාක් මනේ,
41 මා දිළිසනෙ කඩුව මුවහත් කොට, මම යුක්තිය
ඉටු කරමි.
q2[41] සතුරන්ට දඬුවම් දමේ;
q2[41] මට වරෙ කරන අයට දුර්විපාක දමේ.
42 මැරුම් කෑ අයගේ ද අල්ලාගත් අයගේ ද
ලයෙින්, මාගේ ඊගස් පොඟවමි;
q2[42] දිගු කසේ ඇති නායකයන්ගේ මාංසය මාගේ
කඩුවට ගොදුරු වන්නේ ය.
43 රෝම 15:10; එළිද 19:2 එම්බා ජනයනෙි!
q2[43] දවේ සනෙඟ ගැන ප්‍රීති වන්න.
q2[43] එතුමාණෝ සිය සනෙඟගේ මරණයට
පළිගන්න සේක;
q2[43] සතුරන්ට දඬුවම් දනෙ සේක;
q2[43] එහතේ, සිය සනෙඟගේ දේශයට අනුකම්පා
කරන සේක."
44 මෝසසේ ද නූන්ගේ පුත් ජෝෂුවා සමඟ අවුත්
මේ ගීතයේ වචන සියල්ල ම සනෙඟට ඇසනෙ
පරිදි හඬ නගා කී ය.

### මෝසසේගේ අවසාන උපදසේ

45 මෝසසේ මේ කරුණු සියල්ල ඉශ්‍රායලේවරුන්ට
කියා නිම කළ පසු, 46 ඔහු ඔවුන්ට කතා කොට,
"අද දින මා ඔබ අතර සාක්ෂි දුන් මේ කරුණු
සියල්ල කරෙහෙි සිත් යොමු කරන්න. මේ
ව්‍යවස්ථාවේ කරුණු සියල්ල ම පිළිපදින ලසෙ ඔබේ
දරුදැරියන්ට නියම කරන්න. 47 මයෙ ඔබේ ජීවය
වන හයෙින් එය වටිනා දයෙකි. ජොර්දාන් ගඟනේ
එතරෙ වී අයිති කරගන්නට යන දේශයහෙි මේ දේ
පිළිපදින්නහු නම් ඔබ චිරාත් කාලයක් ජීවත් වන්නහු
ය"යි කීවේ ය.
48 ගණන් 27:12-14; ද්වි.නී. 3:23-27 ඒ දවසේ දී ම
සමිඳාණන් වහන්සේ මෝසසේ අමතමින්,
49 "ජරෙකෝ නුවරට ඉදිරියනේ මෝවබ් දේශයහෙි
ඇති අබාරීම් කඳු වැටියේ පිහිටි නබෝ නම්
කන්දට නැඟී මා ඉශ්‍රායලේ ජනයාට අයිති කර
දනේනට යන කානාන් දේශය නරඹන්න. 50 නුඹේ
සොහොයුරු ආරොන් හෝර් කන්දේ දී මරණයට
පත් වී, පවුලේ සුසාන භූමියේ තැන්පත් කරනු
ලැබුවාක් මනේ, නුඹ ද නඟින්නට යන කන්දේ දී
මරණයට පත් වී පවුලේ සුසාන භූමියේ තැන්පත්
කරනු ලැබිය යුතු ය. 51 මන්ද, ශීන් නම් පාළුකරයේ
කාදෙෂ්හි මරිබා නම් උල්පත ළඟ දී ඉශ්‍රායලේ
ජනයා අතර නුඹලා මට විරුද්ධ ව පව් කොට, මට
හිමි ගෞරවය නුදුන් නිසා ය. 52 නුඹ දුර තියා
දේශය නරඹන්න. එහතේ, මා ඉශ්‍රායලේ ජනයාට
දනෙ දේශයට නුඹ ඇතුළු නොවන්නහෙි ය"යි වදාළ
සේක.

### ඉශ්‍රායලේ ගෝත්‍රවලට ආශීර්වාද කිරීම

33 දවේයන් වහන්සේට කැප වූ මනුෂ්‍යයකේ වූ
මෝසසේ තම මරණයට පරෙ ඉශ්‍රායලේ
ජනයාට ආශීර්වාද කරමින් මසෙේ පැවසී ය:

2 “සමිඳාණෝ සීනයි කන්දෙන් සිට වැඩිය සේක.
සේයිර් පෙදෙසෙන් සිට ඔවුන්ට උදා වූ සේක.
q2[2] පාරාන් කන්දෙන් සිට බැබළුණු සේක.
q2[2] දස දහසක් දේව දූතයන් ඇති ව පැමිණි සේක.
q2[2] දකුණත ගිනි දැල්ලක් සමඟ වැඩිය සේක.
3 එතුමාණෝ සිය සෙනඟට සැබැවින් ම ප්‍රේම
කරන සේක, සියලු සැදැහැවත්හු එතුමන් අතහි ය;
q2[3] ඔව්හු, ඔබේ පාමුල හිඳ ඔබේ වචන
පිළිගන්නෝ ය;
4 යාකොබ්ගේ පෙළපතට උරුම කොට දුන්
මෝසෙස් පැනවූ ව්‍යවස්ථා පිළිගන්නෝ ය.
5 ඉශ්‍රායලිත්වරුන්ගේ ගෝත්‍ර ද ජන නායකයන් ද
එක්රැස් වූ විට දෙවිඳාණෝ ඔවුන්ගේ රජ වූ සේක.
6 “රූබන්ගේ පෙළපත කුඩා වුවත්, එය නොනැසී
පවතී වා!”
7 ජුදාගේ පෙළපත ගැන මෙසේ කී ය:
q2[7] “සමිඳුනි, ජුදාගේ හඬට සවන් දුන මැනව.
q2[7] සසෙසු සෙනඟ වෙත ඔවුන් ගෙන ගිය මැනව.
q2[7] ඔවුන් වෙනුවට සටන් කළ මැනව.
q2[7] සතුරන්ට විරුද්ධ ව ඔවුන්ට සහාය වුව මැනව.”
8 නික්ම 17:7; 28:30; ගණන් 20:13 ලෙවීගේ
පෙළපත ගැන මෙසේ කී ය:
q2[8] “මස්සා, නම් ස්ථානයේ දී ඔබ පරීක්ෂා කළ,
මෙරිබාහි උල්පත් ළඟ ඔබ සමඟ විවාද කළ
සැදැහැවතුන්ට, ඌරිම් සහ තුම්මීම් දානය කළ
මැනව.
9 ඔව්හු සිය දෙමාපියන් අමතා, ‘අපි ඔබ නුදුටිමු’යි
කී හ;
q2[9] සිය සහෝදරයන් නොපිළිගත්හ;
q2[9] සිය දරුදැරියන් නොදත්හ;
q2[9] ඔව්හු ඔබ වදන් රැක ඔබ ගිවිසුම ඉටු කළහ.
10 ඔව්හු යාකොබ්ගේ පෙළපතට නියෝග ද,
ඉශ්‍රායලේ ජනතාවට ව්‍යවස්ථාව ද උගන්වති;
q2[10] ඔබ අබියස සුවඳ දුම් අල්ලති;
q2[10] පුදසුන් මත දවන යාග පුදති.
11 සමිඳුනි, ඔවුන්ගේ ශක්තියට ආසිරි දුන මැනව.
q2[11] ඔවුන්ගේ අත්කම් පිළිගත මැනව.
q2[11] ඔවුන්ට එරෙහි ව නැඟිටින්නන් ඔවුන්ගේ
විරුද්ධවාදීන් යළිත් නොනැඟිටින ලෙස ඔවුන්ගේ
තුනටියට පහර දුන මැනව.”
12 බෙන්ජමින්ගේ පෙළපත ගැන මෙසේ කී ය:
q2[12] “එම්බා සමිඳුන්ගේ පෙම්වත!
q2[12] එතුමන් කෙරෙහි ඔවුන් සුරැකි ව වසනු ඇත.
q2[12] දවස පුරා සමිඳාණන් ඔහුට රැකවරණය දෙනු
ඇත.
q2[12] එතුමන්ගේ රැකවරණය තුළ ඔහු වසනු ඇත.”
13 ජෝසෙප්ගේ පෙළපත ගැන මෙසේ කී ය:
q2[13] “සමිඳාණෝ ඔවුන්ගේ රටට ආසිරි වස්වනු
සේක් වා!
q2[13] අහසින් වැටෙන පිනි බිඳු සම්පත ද පොළොව
යට ඇති අගනා සම්පත ද
14 හිරු රැසින් උපදින ප්‍රණීත පල ද සඳ සමඟ
උපදින වටිනා අස්වැන්න ද
15 පැරණි උස කඳුකරයේ අගනා දේ ද සදාතන
හලේවල වටිනා වස්තු ද
16 ගොඩ මඩ සරුසාර අස්වැන්න ද පඳුරේ සිට
කතා කළ තැනැන් වහන්සේගේ ප්‍රසාදය ද යන
සියලු ආසිරි ජෝසෙප්ගේ පෙළපත පිට පහළ වේ
වා!
q2[16] සිය සහෝදරයන් අතර රජ කුමරු ඔහුගේ
පරපුර පිට පහළ වේ වා!
17 ඔවුන්ගේ මහිමය, ගව කුලුඳුලාගේ මහිමය
මෙනි ය;
q2[17] ඒ බලය, කුළු හරකාගේ අං මෙනි ය.
q2[17] ඒ බලයෙනි පොළොවේ කෙළවරට ඔහු, ජනයා
නෙරපාදමයි.
q2[17] එප්‍රායිම්ගේ පරපුරෙහි දස දහස ද
මනස්සේගේ පරපුරෙහි දහස් ගණන ද මගේ ජනයා
වෙති.”
18 සාබුලොන්ගේ පෙළපත ගැන මෙසේ කී ය:
q2[18] “එම්බා සාබුලොන්!
q2[18] ඔබ පිටත යන විට ප්‍රීති වන්න.
q2[18] එම්බා ඉස්සාකර්!
q2[18] ඔබේ කූඩාරම් තුළ සිටින විට ප්‍රීති වන්න.
19 ඔව්හු කන්දට සෙනඟ කැඳවති, දැහැමි පූජා එහි
පුදති.
q2[19] සමුදුරේ ඇති සම්පත ද වෙරළෙහි සැඟවුණු
නිධානය ද ඔව්හු ඇදගනිති.”
20 ගාද්ගේ පෙළපත ගැන මෙසේ කී ය:
q2[20] “ගාද් දේශය පුළුල් කරන හිමි හට ආසිරි වේ
වා!
q2[20] ගාද් සිංහදෙනක මෙනි නිදා සිටියි.
q2[20] සතුරන්ගේ බාහුව හා හිස් මුදුන ඉරාදමයි.
21 දේශයේ හොඳ ම කොටස ගාද් තමාට ම
ගත්තේ ය.
q2[21] නායකයාට හිමි පංගුව ඔහුට ම හිමි විය.
q2[21] සෙනඟගේ ප්‍රධානීන් වෙතට පැමිණ
ඉශ්‍රායලේ ජනයා සමඟ සමිඳාණන්ගේ යුක්තිය ද
එතුමන්ගේ අණපණත් ද ඔව්හු ඉටු කළෝ ය.”
22 දාන්ගේ පෙළපත ගැන මෙසේ කී ය:
q2[22] “දාන්, බාෂාන් සිට පැන එන්නෙකි;
q2[22] සිංහ පොව්වෙකි.”
23 නප්තලීගේ පෙළපත ගැන මෙසේ කී ය:
q2[23] “එම්බා නප්තලී!
q2[23] ප්‍රසාදයෙනි සෑහීමට පත්, සමිඳුන්ගේ
ආසිරියෙනි පිරිපුන් ඔබ, අපර දිග ද දකුණු දිග ද
හිමි කරගන්න.”
24 ආෂෙර්ගේ පෙළපත ගැන මෙසේ කී ය:
q2[24] “හැමට වඩා ආෂෙර්ට ආසිරි වේ වා!
q2[24] තම සහෝදරයන් අතර ප්‍රියමනාප වේ වා!
q2[24] සිය පා, තෙලෙහි ගල්වා ගනී වා!
25 ඔබ දොරටු අගුල් යකඩ සහ ලෝකඩින් වේ වා!
q2[25] දිවි ඇති තාක් බලයෙනි වෙසේ වා!
26 ඉශ්‍රායලේ දෙවිඳුන්ට සම අන් කෙනෙක් නැත.
q2[26] එතුමාණෝ ඔබට සහාය වනු වස් අහස පීරා
වලාකුළු අරා තෙද මහිමයෙනි වඩිනා සේක.
27 සදාතන දෙවිඳාණෝ ඔබේ සරණය වේ!

q2 27 එතුමන් සදාතන බාහු බලය ඔබ ආධාරය වේ.
q2 27 එතුමාණෝ ඔබ ඉදිරියෙන් සතුරන් පලවා
හරින සේක.
q2 27 'ඔව්හු වැනසෙත් වා!'යි අණ දෙන සේක.
28 ඉශ්‍රායලේ ජනයා සුරැකි ව වසනු ඇත.
q2 28 ජාකොබ්ගේ පළෙපත ධාන්‍ය ද කෙත් හා
මිදියුස ද ඇති සරුසාර රටක වසනු ඇත.
q2 28 අහස් තලය පිනි බිඳු වස්වනු ඇත.
29 එම්බා ඉශ්‍රායලේ ජනයෙනි, ඔබේ වාසනාවක
මහත!
q2 29 සමිඳු මිදූ සෙනඟකි, ඔබ. ඔබ හා සමාන
කිසිවකේ නැත.
q2 29 ඔබට ආධාර වන පලිහ, ඔබට ජයසිරි දෙන
කඩුව, සමිඳාණෝ ය.
q2 29 ඔබේ සතුරෝ වැටී කමාව ඉල්ලා එන්නෝ ය.
q2 29 ඔබ ඔවුන්ගේ ගිරිකුළු දේවාල පයින් පාගා
පොඩි කරදමන්නහු ය."

### මෝසෙස්ගේ මරණය

34 ඉක්බිති මෝසෙස් මෝවබ් නම් මිටියාවතින්,
නෙබෝ නම් කඳුකරයට ගොස්, ජෙරිකෝ
නගරයට ඉදිරියෙන් පිහිටි පිස්ගා කඳු මුදුනට
නැංගේ ය. එහි දී සමිඳාණන් වහන්සේ ඔහුට දාන්
නගරය දක්වා විහිදුණු මුළු ගිලියද් දේශය ද
2 නප්තලීගේ මුළු දේශය ද එප්‍රායිම්ගේ සහ
මනස්සේගේ දේශයෙන් ද මධ්‍යධරණි මුහුද දක්වා
පිහිටි ජුදාගේ මුළු දේශය ද 3 දකුණු දිග ද ඉඳි ගස්
නගරය යන අර්ථය ඇති ජෙරිකෝව පිහිටි
මිටියාවතේ සිට ශෝවර් දක්වා තිබෙන තැනිතලාව
ද පෙන්වූ සේක. 4 උත් 12:7; 26:3; 28:13ඉන්පසු
සමිඳාණන් වහන්සේ ඔහුට කතා කොට, " 'නුඹේ
ගෝත්‍රයට දෙන්නෙමි'යි කියා ආබ්‍රහම් ද ඊසාක්
සහ ජාකොබ්ට ද දිවුළ දේශය මේ ය. දේශය
නුඹේ දෙනෙතින් දකින්නට සැලැස්වීමි. එහෙත්, නුඹ
ඊට ඇතුළු නොවන්නෙහි ය"යි වදාළ සේක.
5 මෙසේ සමිඳාණන් වහන්සේගේ සේවක
මෝසෙස්, උන් වහන්සේ වදාළ පරිදි මෝවබ්
දේශයේ දී මියගියේ ය. 6 උන් වහන්සේ බෙත්-
පයෙයෝර් නම් නගරයට ඉදිරියෙන් වූ මෝවබ්
දේශයෙහි තැනිතලාවක ඔහු භූමදාන කළ සේක.
කිසිවකේ අද දක්වා ඔහුගේ සොහොන් පළ
නොදනිති. 7 මෝසෙස් මියයන විට ඔහුට වයස
අවුරුදු එකසිය විස්සකි. ඔහුගේ ඇස් පෙනීම හොඳට
තිබිණි. ශරීර ශක්තිය ද අඩු නො වී ය.
8 ඉශ්‍රායලේ ජනතාව මෝවබ් මිටියාවතේ මෝසෙස්
ගැන දවස් තිහක් හඬා වැලපුණෝ ය. හඬා
වැලපෙන කාලය ද අවමංගල්‍යයේ වත්පිළිවෙත්
කාලය ද නිම විය.
9 මෝසෙස්, නූන්ගේ පුත් ජෝෂුවා පිට තම අත්
තැබූ බැවින්, ඔහු ප්‍රඥානුභාවයෙන් පූර්ණ වූයේ ය.
ඉශ්‍රායලේ ජනතාව ද ඔහුට කීකරු වී සමිඳාණන්
වහන්සේ මෝසෙස්ට අණ කළ ලෙස කළෝ ය.
10 නික්ම 33:11 සමිඳාණන් වහන්සේ මුහුණට
මුහුණ ලා ඇඳිනගත් මෝසෙස්ට සමාන
දිවැසිවරයකේ ඉන්පසු ඉශ්‍රායලේවරුන් අතර තවත්
නො වී ය. 11 සමිඳාණන් වහන්සේ විසින් යවනු
ලැබ, මිසර දේශයෙහි පාරාවෝ ද ඔහුගේ සියලු
නිලධාරීන් ද මුළු සෙනඟ ද ඉදිරියෙහි හාස්කම් සහ
අරුමපුදුම දේ කළ ඔහුට සමාන අන් දිවැසිවරයකේ
නො වී ය. 12 මුළු ඉශ්‍රායලේ ජනතාව බලා සිටිය දී
සිය බාහු බලයෙන් මහත් ත්‍රාසජනක දේවල් ද කළ
ඔහුට සමාන අන් දිවැසිවරයකේ නො වී ය.

# ජෝෂු

### කානාන් දේශය අත්කර ගැනීමට සූදානම

1 සමිඳාණන් වහන්සේගේ සේවක වූ
මෝසෙස්ගේ මරණයෙන් පසු, ඔහුගේ සහකාර
වූ නූන්ගේ පුත් ජෝෂුවාට උන් වහන්සේ කතා
කොට, මෙසේ වදාළ සේක: 2 “මාගේ සේවක වූ
මෝසෙස් මළේ ය. දැන් ඉතින් නුඹත්, මේ මුළු
සෙනඟත් නැඟිට, ඔවුන්ට එනම්, ඉශ්රායලේ
ජනතාවට මා දෙන්නට යන දේශයට ජෝර්දාන්
ගඟින් එගොඩ වී යන්න. 3 ද්වි.නී. 11:24-25මා
මෝසෙස්ට දැන්වූ පරිදි නුඹලා පා තබන සෑම
ස්ථානයක් ම මම නුඹලාට දෙමි. 4 පාළුකරය හා මේ
ලෙබනොන් දේශය පටන් මහා ගංගාව වන
යුප්රටීස් ගංගාව දක්වා ඇති, හිත්තීවරුන්ගේ මුළු
රට ද අපරදිග මහ මුහුද දක්වා ද නුඹලාගේ දේශ
සීමා වනු ඇත. 5 ද්වි.නී. 31:6,8; හෙබ්රෙ 13:5දිවි
ඇති තාක් නුඹලාට විරුද්ධ ව කිසිවකුට නැඟී
සිටින්නට නොහැකි වන්නේ ය. මම මෝසෙස් සමඟ
සිටියාක් මෙන් නුඹ සමඟත් සිටින්නෙමි. මම නුඹ
කෙරෙන් අහක් ව යන්නේ වත්, නුඹ අත්හරින්නේ
වත් නැත. 6 ද්වි.නී. 31:6-7,23ශක්තිමත් ව ද
ධෛර්යවත් ව ද සිටින්න. මන්ද, මේ සෙනඟට දෙන
හැටියට මා ඔවුන්ගේ පියවරුන්ට දිවුළ දේශය නුඹ
ඔවුන්ට උරුම කොට දෙන්නෙහි ය. 7 මාගේ සේවක
වූ මෝසෙස් අණ කළ සියලු නීති අනුව ක්රියා
කිරීමට බලාගන්නා ලෙස ශක්තිමත් ව ද ධෛර්යවත්
ව ද සිටින්න. නුඹ යන යන සෑම තැන දී ම නුඹට
ශුභසිද්ධ වන පිණිස එම නීතිය අකුරට ම
පිළිපදින්න. 8 මේ නීති සංග්රහය නුඹ නිතර ම
කියවිය යුතු ය. එහි ලියා තිබෙන සියල්ල අනුව
ක්රියා කරන පිණිස ඒ ගැන දිවා රෑ දෙකේහි භාවනා
කළ යුතු ය. එවිට නුඹ කරන දේ සඵල වී නුඹට
ශුභසිද්ධිය සැලසෙනු ඇත. 9 ශක්තිමත් ව,
ධෛර්යවත් ව සිටීමට ද බිය නොවීමට ද
නොකැළඹීමට ද මා නුඹට අණ කළා නොවේ ද?
මන්ද, නුඹ යන සෑම තැනක ම නුඹේ දෙවි
සමිඳාණන් වහන්සේ නුඹ සමඟ වැඩසිටින සේක.”
10 එවිට ජෝෂුවා සෙනඟගේ නිලධාරීන් අමතා,
11 “ඔබ කඳවුර මැදින් ගොස් සෙනඟට කතා කොට,
‘දෙවි සමිඳාණන් වහන්සේ උරුමය වශයෙන් ඔබට
දෙන දේශය හිමි කරගැනීමට තව දවස් තුනකින්
ඔබ හැම මේ ජෝර්දාන් ගඟින් එතෙරෙ යන හෙයින්
ඒ සඳහා කෑම සූදානම් කරගන්න’ කියා අණ
කරන්නැ”යි කීවේ ය.
12 ගණන් 32:28-32; ද්වි.නී. 3:18-20; ජෝෂු 22:1-6
ඉන්පසු ජෝෂුවා රූබන්වරුන්ට ද ගාද්වරුන්ට ද
මනස්සේගේ අර්ධ ගෝත්රයට ද කතා කොට,
13 “සමිඳාණන් වහන්සේගේ සේවක මෝසෙස් ඔබ
හැමට අණ කරමින් කී දේ, එනම්, ‘දෙවි සමිඳාණන්
වහන්සේ ඔබ හැමට විවේක ස්ථානයක් සඳහා මේ
දේශය දෙන සේක’ යන්න සිහිකරන්න. 14 මෝසෙස්
ජෝර්දාන් ගඟින් මෙගොඩ ඔබට දී තිබෙන
දේශයෙහි ඔබේ භාර්යාවන් ද කුඩා දරුවන් ද
ගවමහිෂයන් ද පදිංචි වනු ඇත. එහෙත්, ඔබ අතර
සියලු බලසම්පන්න පුරුෂයන් සන්නාහ සන්නද්ධ ව
ඔබේ සහෝදරයන්ට පෙරටුව යමින් ඔවුන්ට උපකාර
කරනු ඇත. 15 දෙවි සමිඳාණන් වහන්සේ ඔබට
මෙන් ඔබේ සහෝදරයන්ට විවේකය දෙන තෙක් ද
උන් වහන්සේ ඔවුන්ට දෙන දේශය අයිති කරගන්න
තෙක් ද ඔබ එලෙස ඔවුන්ට උපකාර කළ යුතු ය.
ඉන්පසු සමිඳාණන් වහන්සේගේ සේවක මෝසෙස්
ජෝර්දාන් ගඟින් එහා පෙරෙදිග දිශාවෙහි ඔබ හැමට
දුන්, ඔබට අයිති වන දේශයට හැරී අවුත් එය
භුක්ති විඳීමට පටන්ගන්නෝ ය”යි කීවේ ය.
16 එවිට ඔව්හු ජෝෂුවාට පිළිතුරු දෙමින්, “ඔබ
අපට අණ කළ සියල්ල ම අපි කරන්නෙමු; ඔබ අප
යවන කොතැනට වුව ද අපි යන්නෙමු. 17 සියල්ලේ
දී අප මෝසෙස්ට කීකරු වූ ලෙස ඔබටත් කීකරු
වන්නෙමු. දෙවි සමිඳාණන් වහන්සේ මෝසෙස්
සමඟ වැඩ සිටියාක් මෙන් ඔබ සමඟ ද වැඩ සිටින
සේක් වා! 18 යමෙක් ඔබේ අණපණත්වලට විරුද්ධ
ව කැරලි ගසමින්, ඔබ ඔහුට අණ කරන සියල්ලේ දී
ඔබට අකීකරු වුවහොත්, ඔහු මරණයට පත් කළ යුතු
වන්නේ ය. ඔබ ශක්තිමත් ව ද ධෛර්යවත් ව ද
සිටින්නැ”යි කීවෝ ය.

### ජෙරිකෝවට ඔත්තුකාරයන් යැවීම

2 හෙබ්රෙ 11:31; ජාකො 2:25 නූන්ගේ පුත්
ජෝෂුවා ෂිට්ටිම් නම් ස්ථානයේ සිට මිනිසුන්
දෙදෙනෙකු ඔත්තු බැලීමට රහසින් පිටත් කර යවමින්,
“ඔබ දෙදෙනා විශේෂයෙන් ගොස් ජෙරිකෝ
ප්රදේශය පරීක්ෂා කර බලන්නැ”යි කීවේ ය. ඔව්හු
ගොස් රාහාබ් නම් වෙසඟනකගේ ගෙදරට පැමිණ
එහි නවාතැන් ගත්හ. 2 එවිට, “දේශයෙහි ඔත්තු
බලන පිණිස ඉශ්රායලේ ජනයාගෙන් කීප දෙනෙක්
අද රෑ මෙහි ඇවිත් සිටිති”යි ජෙරිකෝවේ රජුට සැළ
විය. 3 මේ දේ ඇසූ ජෙරිකෝවේ රජ, රාහාබ් වෙත
පණිවුඩයක් යවමින්, “ඔබ වෙත පැමිණ ඔබේ ගෙට
ඇතුළු වී සිටින මිනිසුන් පිටතට ගෙනෙන්න. මන්ද,

ඔවුන් පැමිණ සිටින්නේ මුළු දේශයේ ඔත්තු බලන
පිණිස ය"යි දැන්වී ය.
4 ස්ත්‍රිය ද ඒ මිනිසුන් දදෙනා කැඳවාගෙන ගොස්
ඔවුන් සඟවා තැබුවා ය. ඈ පණිවුඩකාරයන්ට කතා
කොට, "මිනිසුන් මා වෙත පැමිණි බව ඇත්තකි.
එහෙත්, ඔවුන් ආවේ කොහෙන් ද කියා මම
නොදනිමි. 5 ඇරත්, කළුවර වැටී වාසල් දොරටුව
වසන වේලාව පැමිණෙද්දී ඒ මිනිස්සු පිටත් ව ගියෝ
ය. ඔවුන් කොහේ ගියා දැ යි මම නොදනිමි.
ඉක්මනින් ඔවුන් ලුහුබැඳ යන්න. තවම ඔවුන්
අල්ලාගන්නට හැකි වන්නේ ය"යි පැවසුවා ය.
6 රාහාබ් ඒ මිනිසුන් දදෙනා ගෙයි පියස්ස උඩට
ගෙන ගොස්, එහි අහුරා තිබුණ හණ දඬු යට ඔවුන්
සඟවා තැබුවා ය. 7 රාජ සේවකයෝ ජෝර්දාන්
ගඟට යන පාර දිගේ තොටුපළවල් දක්වා ඔවුන්
ලුහුබැඳ ගියෝ ය. ඔවුන් නගරයෙන් පිට වූ වහා ම
වාසල් දොරටුව වසන ලද්දේ ය.

## රාහාබ් සහ ඔත්තුකාරයන් අතර ගිවිසුම

8 ඒ මිනිසුන් දදෙනා නිදාගන්නට පෙර ඈ
පියස්සේ සිටි ඔවුන් වෙත අවුත්, 9 ඔවුන්ට මෙසේ
කීවා ය: "සමිඳාණන් වහන්සේ මේ දේශය ඔබට දී
තිබෙන බව ද ඔබ නිසා අප අතර භීතිය පැතිරී
ගොස් තිබෙන බව ද සියලු දේශ වාසීන් ඔබේ
පැමිණීම හේතුකොටගෙන මහත් සේ තැතිගෙන
සිටින බව ද මම දනිමි. 10 නික්ම 14:21; ගණන්
21:21-35ඔබ මිසර දේශයෙන් පිටතට එන කල,
සමිඳාණන් වහන්සේ ඔබ ඉදිරියෙහි රතු මුහුද වේළී
යන්නට සැලැස්සූ හැටි ද ජෝර්දාන් ගඟින් එතෙර සිටි
අමෝරිවරුන්ගේ රජුන් දදෙනා වන සීහොන්ට සහ
ඕග්ට ඔබ කළ දයෙ, එනම්, ඔවුන් සහමුලින් විනාශ
කළ හැටි ද අප අසා ඇත 11 මේ කරුණු ඇසූ
කණෙහි ම අපි අධෛර්ය වී අතිශයෙන්
කලකිරුණෙමු. ඔබට විරුද්ධ ව නැඟී සිටින්නට අප
කිසිවකුට ධෛර්යයක් නො වී ය. මන්ද, ඔබේ දෙවි
සමිඳාණන් වහන්සේ ඉහළ අහසෙහිත්, පහළ
පොළොවෙහිත් දෙවියන් වහන්සේ වන බැවිනි.
12 ඉතින් මා ඔබට කරුණාව පෙන්වූ බැවින්, දැන් ඔබ
මාගේ පියාගේ පවුලට කරුණාව පෙන්වන බවට
සමිඳාණන් වහන්සේගේ නාමයෙන් දිවුරා ඒ බවට
මට සහතිකයක් දෙන්න. 13 මාගේ පියා ද මව ද
සහෝදර සහෝදරියන් ද ඔවුන්ගේ සියලු පවුල් ද
ආරක්ෂා කොට, අපේ ජීවිත මරණින් බේරාගන්න."
14 එවිට ඒ මිනිස්සු ඈට පිළිතුරු දෙමින්, "අපේ
මේ රහස ඔබ එළිදරව් නොකළොත්, ඔබ
වෙනුවෙන් දිවි පුදන්නට අපි සූදානම් ය. සමිඳාණන්
වහන්සේ මේ දේශය අපට දුන් කල, අපි ඔබ
කෙරෙහි කරුණාවෙන් ද හිතවත්කමෙන් ද ක්‍රියා
කරන්නෙමු"යි කීවෝ ය.
15 රාහාබ්ගේ ගෙය නගරයේ පවුර පිට තිබුණේ
ය; ඈ ද පවුර පිට වාසය කළා ය. එබැවින් ඈ
කඹයකින් ඒ මිනිසුන් දදෙනා කවුළුවෙන් බැස්සුවා
ය. 16 ඈ ඔවුන්ට කතා කොට, "ලුහුබැඳ ගිය අයට
ඔබ අසු නොවෙන පිණිස කඳුකරයට පලා යන්න.
ඔවුන් ආපසු හැරී එන තුරු එහි තුන් දවසක් සැඟවී
සිටින්න. ඉන්පසු ඔබේ ගමන යන්නැ"යි කීවා ය.
17 ඒ මිනිස්සු ද ඈට පිළිතුරු දෙමින් මෙසේ කී හ:
"ඔබ අපෙන් ගත් දිවුරුම අපි ඉටු කරන්නෙමු.
18 එසේ කරන්නට නම්, අප මේ දේශයට ආ කල
මේ රතු නූල් පටිය ඔබ අප බැස්සවූ කවුළුවේ බැඳ
තබා, ඔබේ පියා ද මව ද සහෝදරයන් ද පියාගේ
ගෙයි වැසි සියල්ලන් ද ඔබ සමඟ නිවසෙට එක්රැස්
කරගන්න. 19 කිසිවකු ඔබේ ගෙදරින් පිට වී වීදියට
ගොස් මරණයට පත් වුවහොත් වරද ඔහුගේ ම ය;
ඒ ගැන අපි නිදොස් ය. ඔබ සමඟ ගෙදර සිටින
යමකුට අනතුරක් සිදු වුවහොත් ඔහුගේ මරණය
ගැන අප වගකිවයුතු වන්නේ ය. 20 එහෙත්, ඔබ
අපේ මේ රහස් එළිදරව් කළොත්, ඔබ අප ලවා
දිවුරුම් ගත් දිවුරුමෙන් අපි නිදහස් වන්නෙමු."
21 රාහාබ් පිළිතුරු දෙමින්, "ඔබ කී ලෙසෙ ම වේ
වා"යි ඔවුන් පිටත් කර යැව්වා ය. ඔව්හු ද පිටත් ව
ගියෝ ය. එවිට ඈ රතු පටිය කවුළුවේ බැන්දා ය.
22 ඒ මිනිසුන් දදෙනා පිටත් වී ගොස් කඳුකරයට
පැමිණ, ඔවුන් ලුහුබැඳ ගිය අය ආපසු හැරී එන තුරු
තුන් දවසක් එහි නැවතී සිටියෝ ය. ලුහුබැඳ ගිය
අය ඒ මිනිසුන් සෑම තැන ම සෙවූ නමුත් ඔවුන්
සම්බවුණේ නැත. 23 එවිට ඒ මිනිසුන් දදෙනා
ආපසු හැරී, කඳුකරයෙන් බැස, ගඟෙන් එතෙරෙ වී,
නූන්ගේ පුත් ජෝෂුවා වෙත පැමිණ තමන්ට සිදු වූ
සියල්ල ඔහුට දැන්වූ හ. 24 ඔව්හු ජෝෂුවාට කතා
කොට, "සැබැවින් ම සමිඳාණන් වහන්සේ මේ මුළු
දේශය අප අතට පාවා දී තිබේ. දේශයේ වැසියන්
සියල්ලෝ ම අප කෙරෙහි භීතියෙන් සිටිති"යි කීවෝ
ය.

## ජෝර්දාන් ගඟින් එතෙරෙ වීම

3 ජෝෂුවා අලුයම නැඟිට, මුළු ඉශ්රායලේ
ජනතාව සමඟ ෂිට්ටිම් නම් ස්ථානයෙන් නික්ම,
ජෝර්දාන් ගඟබඩට පැමිණ, ඉන් එතෙරෙ වීමට පෙර
කඳවුරු බැන්දේ ය. 2 තුන් දවසකට පසු නිලධාරීහු
කඳවුරු මැදින් ගොස්, 3 සෙනඟට කතා කොට, "දෙවි
සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව ද ලෙවී
පූජකයන් එය උසුලාගෙන යනවා ද ඔබ දකින කල,
ඔබ සිටින ස්ථානවලින් පිටත් ව ඒ පසුපස්සේ
යන්න. 4 ඔබ මේ මාර්ගයෙන් කවදාවත් නොගිය
බැවින්, යා යුතු මාර්ගය එවිට ඔබ දැනගන්නහු ය.
එහෙත්, ඔබ ගිවිසුම් කරඬුවට ළං වී නොයා යුතු ය.
එය හා ඔබ අතරේ කිලෝමීටරයක් පමණ දුර තිබිය
යුතු ය"යි කීවේ ය.
5 ජෝෂුවා සෙනඟට කතා කොට, "සමිඳාණන්
වහන්සේ හෙට ඔබ අතරේ පුදුම දේ කරන්නට යන
බැවින් පවිත්‍ර වන්නැ"යි කී ය. 6 ඉන්පසු ඔහු
පූජකවරුන් අමතමින්, "ගිවිසුම් කරඬුව රැගෙන
සෙනඟට පෙරටුවෙන් යන්නැ"යි කීවේ ය. එවිට
ඔව්හු එය රැගෙන සෙනඟට පෙරටුව ගියහ.

7 සමිඳාණන් වහන්සේ ජෝෂුවාට මෙසේ වදාළ
සේක: “මා මෝසෙස් සමඟ වැඩ සිටියාක් මෙන් නුඹ
සමඟ ද වැඩ සිටින බව සියලු ඉශ්රායෙල්වරුන්
දැනගනු පිණිස ඔවුන්ගේ ඇස් ඉදිරියෙහි නුඹ උසස්
කිරීමට ද අද දවසේ මම පටන් ගන්නෙමි. 8 නුඹ
ගිවිසුම් කරඬුව උසුලාගෙන යන පූජකවරුන්ට කතා
කොට, ‘ඔබ හැම ජෝර්දාන් ගඟේ දිය අද්දරට
පැමිණි විට එහි නැවතී සිටින්න’ කියා අණ කරන්න.”
9 එවිට ජෝෂුවා ඉශ්රායෙලේ ජනයා අමතමින්,
“මෙහි පැමිණ ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ
වදාළ දේට සවන් දෙන්නැ”යි කීවේ ය. 10 ඔහු
තවදුරටත් මෙසේ කීවේ ය: “ජීවමාන දෙවියන්
වහන්සේ ඔබ අතර සිටින බවත්, උන් වහන්සේ
නොඅනුමානව ම ඔබ ඉදිරියෙන් කානානිවරුන් සහ
හිත්තීවරුන් ද හිව්වරුන් සහ පෙරෙස්සිවරුන් ද
ගිර්ගාෂිවරුන් සහ අමෝරිවරුන් ද ජෙබුසිවරුන් ද
පන්නා දමන බවත් ඔබ මෙයින් දැනගන්නහු ය.
11 බලන්න, මුළු පොළොවට අධිපති වන සමිඳාණන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව ඔබ පෙරටුවෙනේ
ජෝර්දාන් ගඟට වැඩම කරනු ඇත. 12 එබැවින් දැන්
එක එක ගෝත්රයෙන් එක්කෙනා බැගින් ඉශ්රායෙලේ
ගෝත්රවලින් පිරිමින් දොළොස්දෙනෙකු
තෝරාගන්න. 13 මුළු පොළොවට අධිපති වන
සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව උසුලාගෙන
යන පූජකවරුන් ජෝර්දාන් ගඟේ දියෙහි පා තැබූ
කෙණෙහි ම ඉහළින් ගලා බසින ජලය නතර වී
ගොඩගැහී සිටිනු ඇත.”
14 සෙනඟ ජෝර්දාන් ගඟින් එතෙරට යන්නට
තමන්ගේ කූඩාරම්වලින් නික්ම ගිය විට, ගිවිසුම්
කරඬුව උසුලාගෙන යන පූජකවරු සෙනඟට
පෙරටුවෙනේ ගියෝ ය. 15 ගිවිසුම් කරඬුව උසුලාගෙන
ගිය පූජකවරු ජෝර්දාන් ගඟට පැමිණ දියෙහි පා
තැබූ හ. අස්වැන්න නෙළන මුළු කාලය තුළ දී
ජෝර්දාන් ගඟේ දිය ඉවුරු තළා උතුරා යයි. 16 ඔවුන්
පා තැබූ වහා ම ඉහළින් බැස එන දිය නැවතී, ඉතා
දුරට, ශාරතාන් ඉදිරිපිට තිබෙන නුවර වන ආදාම්
දක්වා ගොඩගැසුණේ ය. අරබා මිටියාවතෙහි පිහිටි
ලුණු මුහුදට බැස යන දිය සම්පූර්ණයෙන් ම වෙනේ වී
ගියේ ය. සෙනඟ ජෙරිකෝවට මූණ ලා ගඟින්
එතෙර වූ හ. 17 ජෝර්දාන් ගඟෙන් එතෙර
වනතෙක්, ඉශ්රායෙල්වරුන් සියලු දෙනා වියළි බිම
පිට ගමන් කළ අතර සමිඳාණන් වහන්සේගේ
ගිවිසුම් කරඬුව ගෙන ගිය පූජකවරු ජෝර්දාන් ගඟ
මැද වියළි බිම පිට සිටගෙන සිටියෝ ය.

## සිහිවටන ගල් දොළොස

4 මුළු ඉශ්රායෙලේ ජාතිය ජෝර්දාන් ගඟින්
එතෙර වී නිම වූ කල සමිඳාණන් වහන්සේ
ජෝෂුවාට කතා කොට, 2 “නුඹ එක එක
ගෝත්රයෙන් එක් කෙනෙකු බැගින් සෙනඟ අතරෙන්
දොළොස්දෙනෙකු තෝරාගෙන, ඔවුන් අමතා, 3 ‘ඔබ
හැම ජෝර්දාන් ගඟේ මැද පූජකවරුන් පා තබා සිටි
තැනින් ගල් දොළොසක් රැගෙන, එතෙර ගෙන
ගොස්, ඒවා ඔබ හැම අද රෑ නවාතැන් ගන්නා
ස්ථානයෙහි තබන්න’ කියා අණ කරන්නැ”යි වදාළ
සේක.
4 එවිට ජෝෂුවා ඉශ්රායෙල්වරුන් අතරෙන් එක
එක ගෝත්රයෙන් එක් කෙනෙකු බැගින් තෝරාගත්
දොළොස්දෙනා කැඳවා, 5 ඔවුන් අමතා, “දෙවි
සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුවට
පෙරටුවෙනේ ඔබ ජෝර්දාන් ගඟට ගොස් ඉශ්රායෙලේ
ජනයාගේ ගෝත්ර අනුව එක්කෙනා ගලක් බැගින්
රැගෙන කරේ ගෙන යන්න. 6 මෙසේ කරන්නේ,
ඒවා ඔබ අතරේ සිහිවටනයක් වන පිණිස ය. ‘මේ
ගල් තිබෙන්නේ කුමට දැ’යි මතු කාලයේ දී ඔබේ
දරුවන් අසන විට, 7 ඔබ ඔවුන්ට කතා කොට,
‘සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව ඉදිරියෙහි
ජෝර්දාන් ගඟෙහි දිය බෙදී ගියේ ය; ඒ කරඬුව
ගඟ හරහා වැඩමවාගෙන යන විට, ගඟේ දිය බෙදී
ගිය නිසා, මේ ගල් ඉශ්රායෙලේ ජනතාවට සදාකාල
සිහිවටනයක් වන්නේ ය’යි කිව යුතු ය”යි දැන්වී ය.
8 ඉශ්රායෙලේ ජනතාව ජෝෂුවාගේ අණ පරිදි
කළහ. සමිඳාණන් වහන්සේ ජෝෂුවාට වදාළ ලෙස
ඉශ්රායෙලේ ජනයාගේ ගෝත්රවල ගණන හැටියට,
ජෝර්දාන් ගඟ මැදින් ගල් දොළොසක් රැගෙන,
තමන් සමඟ මෙතෙරට ගෙනැවිත් ඔවුන් නැවතුන
ස්ථානයේ තැන්පත් කළහ. 9 ජෝර්දාන් ගඟ මැද
ගිවිසුම් කරඬුව ගෙන ගිය පූජකවරුන් පය ගැසූ
ස්ථානයෙහි ද ජෝෂුවා ගල් දොළොසක් තැබී ය.
ඒවා අද දක්වා එහි තිබේ. 10 මෝසෙස් ජෝෂුවාට
අණ කළ පරිදි සෙනඟට දැන්වීම සඳහා සමිඳාණන්
වහන්සේ ජෝෂුවාට නියම කළ සියලු දේ කියා නිම
වන තෙක්, ගිවිසුම් කරඬුව ගෙන ගිය පූජකවරු
ජෝර්දාන් ගඟ මැද නැවතී සිටියෝ ය. සෙනඟ
ඉක්මන් කර එතෙරට ගියෝ ය.

## ගිල්ගාලයට පැමිණීම

11 මුළු සෙනඟ ඉක්මන් ව එතෙර වී නිම වූ කල,
සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව සහ
පූජකවරු සෙනඟට පෙරටුවෙනේ ගියෝ ය.
12 රූබන්ගේ පළෙපත ද ගාද්ගේ පළෙපත ද
මනස්සේගේ අර්ධ ගෝත්රය ද සන්නාහ සන්නද්ධ
ව, මෝසෙස් ඔවුන්ට කී ප්රකාර, ඉශ්රායෙල්වරුන්ට
පෙරටුව එතෙර වූ හ. 13 යුද්ධයට සැරසුණු
සතළිස්දහසක් පමණ අය සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි මෙතෙර පිහිටි ජෙරිකෝවේ
මිටියාවත්වලට යුද්ධය සඳහා පැමිණියෝ ය. 14 ඒ
දවසේ දී සකල ඉශ්රායෙලේ ජනතාවගේ ඇස්
හමුයෙහි සමිඳාණන් වහන්සේ ජෝෂුවා උසස් කළ
සේක. ඔව්හු මෝසෙස්ට ගෞරව කළාක් මෙන්
ජෝෂුවාට ද ඔහුගේ මුළු ජීවිත කාලයෙහි ගෞරව
දැක්වූවෝ ය.
15 එවිට සමිඳාණන් වහන්සේ ජෝෂුවාට කතා
කොට, 16 “ගිවිසුම් කරඬුව ගෙන ගිය පූජකවරුන්ට
ජෝර්දාන් ගඟින් නැඟී පිටතට එන ලෙස
කියන්නැ”යි වදාළ සේක. 17 එබැවින් ඔහු

පූජකවරුන්ට අණ කරමින්, “ජෝර්දාන් ගඟින් නැඟී
පිටතට එන්නැ”යි කීවේ ය. 18 සමිඳාණන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව ගෙන ගිය පූජකවරුන්
ජෝර්දාන් ගඟින් ගොඩට අවුත්, තමන්ගේ පාද
ගොඩබිම තැබූ කෙණෙහි ම ගඟේ දිය ආපසු ගලා
ඇවිත් පෙර ලෙස ගං ඉවුරු තළා ගලා ගියේ ය.
19 මෙලෙස සෙනඟ පළමු වන මාසයේ දස වන
දින ජෝර්දාන් ගඟින් ගොඩට අවුත්, ජෙරිකෝවට
නැඟෙනහිර දිශාවෙහි ගිල්ගාල් නම් ස්ථානයෙහි
කඳවුරු බැඳගත්තෝ ය. 20 ඔවුන් ජෝර්දාන් ගඟින්
ගත් ඒ ගල් දොළොස ජෝෂුවා ගිල්ගාල්හි එක උඩ
එක තබා 21 ඉශ්‍රායලේ ජනයා අමතමින්, “ ‘මේ
ගල් පිළිවෙළට තබා තිබෙන්නේ කුමට දැ’යි මතු
කාලයෙහි දී ඔබේ දරු පරපුර ඔවුන්ගේ
පියවරුන්ගෙන් අසන විට 22 ඔබ ඔවුන්ට පිළිතුරු
දෙමින් මෙසේ කියන්න, ‘ඉශ්‍රායලේවරු වියළි බිම
දිගේ මේ ජෝර්දාන් ගඟෙන් එතෙරෙ වී ආවෝ ය.
23 ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ අප රතු
මුහුදෙන් එතෙර වන තුරු එහි දිය, අප බලාගෙන
සිටිය දී ම, හින්දවා දැමුවාක් මෙන්, උන් වහන්සේ
ජෝර්දාන් ගඟේ දිය ද අප බලාගෙන සිටිය දී
හින්දවා දැමූ සේක. 24 උන් වහන්සේ එසේ කළේ,
මිහි පිට සියල්ලන් සමිඳාණන් වහන්සේගේ හස්තය
බලවත් බව දැනගනු පිණිසත්, ඔවුන් දෙවි
සමිඳාණන් වහන්සේට සදහට ම ගරුබිය දක්වනු
පිණිසත් ය’ කියා දැන්විය යුතු ය”යි කීවේ ය.
5 ඉශ්‍රායලේ ජනයා එතෙර වන තුරු සමිඳාණන්
වහන්සේ ඔවුන් පැමිණෙන්නට කලින්
ජෝර්දාන් ගඟේ දිය හිඳී යන්නට සැලැසූ බව,
ජෝර්දාන් ගඟින් එතෙර බස්නාහිර සිටි
අමෝරිවරුන්ගේ සියලු රජවරුන් ද මධ්‍යධරණී
මුහුදුබඩ විසූ කානානිවරුන්ගේ සියලු රජවරුන් ද
ඇසූ කල, ඔව්හු ඉශ්‍රායලේ ජනයා නිසා තැති ගෙන
අධෛර්යයට පත් වූහ.

## චර්මඡේදනය සහ පාස්කුව පැවැත්වීම

2 එකල සමිඳාණන් වහන්සේ ජෝෂුවාට කතා
කොට, “ගිනි ගලින් පිහියා සාදා, ඉශ්‍රායලේ ජනයා
තවත් වරක් චර්මඡේදනය කරන්නැ”යි වදාළ සේක.
3 එවිට ජෝෂුවා ගිනි ගලින් පිහියා සාදා,
චර්මඡේදන-කන්ද නම් ස්ථානයේ දී ඉශ්‍රායලේවරුන්
චර්මඡේදනය කළේ ය. 4 ජෝෂුවා චර්මඡේදනය
කළේ මේ කරුණ නිසා ය: මිසර දේශයෙන් පිටත්
ව පැමිණි සියලු හට සෙනඟ වූ පිරිමි, මිසරයෙන්
නික්ම ආ පසු, මඟ දී පාළුකරයේ මියගියහ.
5 නික්ම ආ සියලු සෙනඟ චර්මඡේදනය ලබා සිටිය
නමුත්, මිසරයෙන් එන කල, මඟ දී පාළුකරයෙහි
උපන් සෙනඟ චර්මඡේදනය නොලැබූ හ. 6 ගණන්
14:28-35ඉශ්‍රායලේ ජනයා සතළිස් අවුරුද්දක්
මුළුල්ලේ පාළුකරයෙහි ගමන් කළෝ ය. ඒ කාලය
තුළ දී මිසරයෙන් පිටත් ව ආ සියලු හට සෙනඟ
සමිඳාණන් වහන්සේගේ හඬට කීකරු නොවූ බැවින්
මියගියහ. මෙසේ වූයේ, අපට දෙන හැටියට
සමිඳාණන් වහන්සේ ඔවුන්ගේ පියවරුන්ට දිවුරුම්
දුන්, කිරෙන් හා මීපැණියෙන් ඉතිරෙන දේශය
දකින්නට ඔවුන්ට ඉඩ නොදෙන ලෙස උන් වහන්සේ
දිවුළ නිසා ය. 7 උන් වහන්සේ ඒ පියවරුන් වෙනුවට
ඔවුන්ගෙන් පැවත ආ දරු පරපුරක් ඇති කළ සේක.
පාළුකරය මැදින් ගමන් කරද්දී චර්මඡේදනය
නොකරනු ලැබූ බැවින් ඔව්හු අචර්මඡේදිතයෝ වූ
හ. ජෝෂුවා මොවුන් චර්මඡේදනය කළේ ය.
8 මුළු සෙනඟ චර්මඡේදනය කර නිම වූ කල,
ඔව්හු සුව වන තුරු කඳවුරේ නැවතී සිටියෝ ය.
9 එවිට සමිඳාණන් වහන්සේ ජෝෂුවාට කතා
කොට, “මම අද නුඹලා කෙරෙන් මිසරයේ
වහල්කමෙන් ලත් අපකීර්තිය ඉවත් කළෙමි”යි
වදාළ සේක. ඒ නිසා ඒ ස්ථානයට ගිල්ගාල් යයි
කියනු ලැබේ ය.
10 නික්ම 12:1-13 ඉශ්‍රායලේ ජනයා ගිල්ගාල්හි
කඳවුරු බැඳ, මාසයේ දස සතර වන දින සවස
ජෙරිකෝවේ මිටියාවතේ දී පාස්කු මංගල්‍යය
පැවැත්වූ හ. 11 පාස්කුවට පසු දින ඔව්හු දේශයේ
ධාන්‍යවලින් සෑදූ නුමුහුන් රොටි හා විළඳ අනුභව
කළෝ ය. 12 නික්ම 16:35ඔවුන් දේශයේ
ධාන්‍යයෙන් අනුභව කළ දාට පසු දින, මන්නා
ආහාරය වැටීම නැවතිණි. ඉශ්‍රායලේ ජනයාට ඊට
පසු මන්නා නොලැබුණ හයෙන් ඔව්හු ඒ අවුරුද්දේ
පටන් කානාන් දේශයේ භවභෝග අනුභව කළෝ
ය.

## ජෝෂුවා සහ ස්වර්ගික අධිපතියා

13 ජෝෂුවා ජෙරිකෝ නුවර ළඟ සිටිය දී, තම හිස
ඔසවා බැලූ විට, තමා ඉදිරිපිට කොපුවෙන් ඇදගත්
කඩුවක් ඇති මිනිසෙකු සිටිනු දුටුවේ ය. ජෝෂුවා
ඔහු සමීපයට ගොස්, “ඔබ අපේ පැත්තට ද
නැතහොත් අපේ විරුද්ධ කාරයන්ගේ පැත්තට දැ”යි
විචාළේ ය.
14 ඔහු පිළිතුරු දෙමින්, ‘එසේ නොවේ; සමිඳාණන්
වහන්සේගේ සේනාවේ අධිපතියා ව මම දැන්
ආවෙමි”යි කීවේ ය. එවිට ජෝෂුවා මුණින්තළා වී
ඔහුට නමස්කාර කරමින්, “ස්වාමීන් වහන්ස ඔබේ
මෙහෙකරුවාට කුමක් වදාරන සේක් දැ”යි ඇසී ය.
15 සමිඳාණන් වහන්සේගේ සේනාවේ අධිපතියා
ජෝෂුවාට කතා කොට, “නුඹ සිටින තැන ශුද්ධ
භූමියක් නිසා නුඹේ පාවහන් ගලවන්නැ”යි කීවේ ය.
ජෝෂුවා ද එසේ කළේ ය.

## ජෙරිකෝව අත්පත් කරගැනීම

6 ජෙරිකෝව ඉශ්‍රායලේ ජනයාගෙන් ආරක්ෂා
කරගනු පිණිස එය අගුල් දමා වසා තිබුණේ
ය. කිසිවෙකු පිටතට ගියේ වත්, ඇතුළතට ආවේ
වත් නැත. 2 සමිඳාණන් වහන්සේ ජෝෂුවාට කතා
කොට, “සවන් දෙන්න, ජෙරිකෝව ද එහි රජු ද
බලවත් යුද්ධ හටයන් ද නුඹේ අතට මම පාවා
දෙන්නෙමි. 3 යුද්ධ හටයන් වන නුඹලා සියල්ලන්
දවසකට එක වරක් බැගින් හය දවසක් මුළුල්ලේ

නුවර වටේට යා යුතු ය. 4 පූජකවරුන් සත්දෙනෙකු
බැටළු අං හොරණෑ සතක් රැගෙන ගිවිසුම් කරඬුවට
පෙරටුවෙනේ යා යුතු ය. සත් වන දවසේ දී සත්වරක්
නුවර වටේට ගමන් කරන්න; පූජකවරු ද හොරණෑ
පිඹිත් වා! 5 තවද, ඔවුන් බැටළු අං හොරණෑවෙනේ
බොහෝ වේලාවක් ශබ්ද පවත්වන විට, ඒ
හොරණෑ ශබ්දය නුඹලාට ඇසුණු කල, සකල ජනයා
මහත් ඔල්වර හඬක් නඟත් වා! එවිට නුවර පවුර
ඇද වැටෙන්නේ ය. සෙනඟ ද එකිනෙකා කෙළින් ම
නුවර ඉදිරියට යන්නෝ යැ"යි වදාළ සේක. 6 එවිට
නූන්ගේ පුත් ජෝෂුවා පූජකයන් කැඳවා ඔවුන්
අමතා, "ගිවිසුම් කරඬුව ඔසවාගන්න, පූජකවරුන්
සත්දෙනෙක් සමිඳාණන් වහන්සේගේ ගිවිසුම්
කරඬුව ඉදිරිපිට බැටළු අං හොරණෑ සතක් ගෙන
යත් වා!"යි කීවේ ය. 7 ඔහු සෙනඟටත් කතා කොට,
"ඉදිරිපත් වී නුවර වටේට යන්න, ආයුධ ගත්
පුරුෂයෝ සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුවට
ඉදිරියෙනේ යත් වා!"යි කීවේ ය.
8 ජෝෂුවා සෙනඟට කතා කොට නිම වූ කල,
පූජකවරු සත්දෙනා බැටළු අං හොරණෑ සතක් ගෙන,
සමිඳාණන් වහන්සේ ඉදිරිපිට යමින් හොරණෑ
පිම්බෝ ය. සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
ඔවුන්ට පස්සෙනේ ගෙනයනු ලැබී ය. 9 සන්නාහ
සන්නද්ධ වූ භටයෝ හොරණෑ පිඹින පූජකවරුන්ට
පෙරටුවෙනේ ගියෝ ය. පූජකයන් හොරණෑ පිඹිමින්
යද්දී සෙසු අය ගිවිසුම් කරඬුවට පස්සෙනේ ගියෝ ය.
10 ජෝෂුවා සෙනඟට අණ කරමින්, "ඔල්වර හඬ
නඟන්නට මා ඔබ හැමට කියන දවස දක්වා ඔබ
හැම ඔල්වර හඬ නොනැඟිය යුතු ය. ඔබ හැමගේ
කට හඬ ඇසෙන්නට වත්, ඔබේ කටින් කිසිවක්
නික්මෙන්නට වත් නොදිය යුතු ය. මා අණ කළ විට
ඔල්වර හඬ නැඟිය යුතු ය"යි කීවේ ය. 11 මෙසේ
ජෝෂුවා සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
නුවර වටේට එක වරක් කර උඩ තබාගෙන යනු
ලැබීමට සැලැස්වී ය. එය ගෙන ගිය ඔව්හු කඳවුරට
ආපසු අවුත් රාත්‍රිය එහි ගත කළෝ ය.
12 පසු දින අලුයම ජෝෂුවා අවදි විය; පූජකවරු ද
සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
ඔසවාගත්තෝ ය. 13 පූජකවරු සත්දෙනා සමිඳාණන්
වහන්සේගේ ගිවිසුම් කරඬුවට පෙරටුවෙනේ බැටළු
අං හොරණෑ සත රැගෙන නොනැවතී හොරණෑ
පිඹිමින් ගියෝ ය. සන්නාහ සන්නද්ධ ව සිටි අය
ඔවුන්ට පෙරටුවෙනේ ගියෝ ය; පූජකයන් හොරණෑ
පිඹිමින් යද්දී, සෙසු අය සමිඳාණන් වහන්සේගේ
ගිවිසුම් කරඬුවට පස්සෙනේ ගියෝ ය. 14 මෙසේ දෙ
වන දවසේ දී නුවර වටේට එක වරක් ගොස් ඔව්හු
ආපසු කඳවුරට ආවෝ ය. හය දවසක් ඔව්හු එසේ
කළෝ ය.
15 සත් වන දින අලුයම් වේලේ ඔව්හු නැඟිට එම
ආකාරයෙනේ ම සත්වරක් නුවර වටේට ගියෝ ය.
ඔව්හු එදින පමණක් සත්වරක් නුවර වටේ ගමන්
කළෝ ය. 16 සත් වන වර පූජකවරුන් හොරණෑ
පිම්බ කල ජෝෂුවා, "ඔල්වර හඬ නඟන්න; මන්ද,
සමිඳාණන් වහන්සේ ඔබ හැමට නුවර දී තිබේ.
17 නුවර හා එහි ඇති සියල්ල සමිඳාණන් වහන්සේ
උදෙසා සහමුලින් ම විනාශයට නියම වන්නේ ය.
රාහාබ් නම් වේශ්‍යා ස්ත්‍රිය, අප යැවූ
පණිවුඩකාරයන් සඟවා තැබූ බැවින් ඈ ද ඈ සමඟ
ගෙදර සිටින සියල්ලෝ ද පමණක් විනාශ
නොවෙන්නෝ ය. 18 විනාශයට වෙනේ කළ දෙයින් ඔබ
වැළකී සිටිය යුතු ය: නැතහොත් වෙනේ කළ පසු කැප
වූ දෙයින් යමක් ඔබ ගත්තොත්, ඔබ ඉශ්‍රායලේ
කඳවුර පිට විනාශයක් පැමිණෙන්නට සලස්වා එය
කලඹනු ඇත. 19 රන් රිදී සියල්ල ද ලෝකඩ සහ
යකඩ බඩු ද සමිඳාණන් වහන්සේට කැප ය. ඒවා
සමිඳාණන් වහන්සේගේ ගබඩාවෙහි තැබිය යුතු
ය"යි කීවේ ය.
20 හෙබ්‍රෙ 11:30 එසේ පූජකවරු හොරණෑ
පිම්බෝ ය; සෙනඟ ඔල්වර හඬ නැඟුවෝ ය:
සෙනඟ හොරණෑ ශබ්දය අසා, මහා හඬකින් ඔල්වර
හඬ පැවැත්වූවෝ ය. පවුර ඇද වැටිණි; සෙනඟ ද
එකිනෙකා කෙළින් ම ඉදිරියට ගොස් නුවර
අල්ලාගත්තෝ ය. 21 ඔව්හු පුරුෂයන් හා ස්ත්‍රීන් ද
බාලයන් හා මහල්ලන් ද ගවයන් ද බැටළුවන් ද
කොටළුවන් ද යන නුවර සිටි සියල්ලන් කඩු පහරින්
සහමුලින් ම විනාශ කරදැම්මෝ ය.
22 ඔත්තු බලන පිණිස දේශයට ගිය මිනිසුන්
දෙදෙනාට ජෝෂුවා කතා කොට, "වේශ්‍යා
ස්ත්‍රියගේ ගෙදරට ගොස්, ඔබ ඈට දිවුළ ලෙස ඒ
ස්ත්‍රිය සහ ඈට අයිති සියල්ලන් පිටතට
ගෙනෙන්නැ"යි කීවේ ය. 23 ඔත්තුකාරයන් වූ ඒ
තරුණයෝ ඇතුළට ගොස් රාහාබ් ද ඇගේ පියා ද
මව් ද සහෝදරයන් ද ඈට අයිති සියල්ලන් ද ඇගේ
සියලු නෑයන් ද පිටතට ගෙනවුත්
ඉශ්‍රායලේවරුන්ගේ කඳවුරෙනේ පිටත නතර කළෝ
ය. 24 ඉන්පසු ඔව්හු නුවර හා එහි තිබුණ සියල්ල
ගින්නෙනේ පුළුස්සා දැමුවෝ ය. රන් රිදී ද ලෝකඩ හා
යකඩ බඩු ද ඔව්හු සමිඳාණන් වහන්සේගේ
ගෘහයෙහි ගබඩාවෙහි තැන්පත් කළෝ ය.
25 හෙබ්‍රෙ 11:31ජෙරිකෝව සෝදිසි කරන්නට
ජෝෂුවා යැවූ ඔත්තුකාරයන්, රාහාබ් නම් වෙසඟන
විසින් සඟවනු ලැබූ බැවින් ජෝෂුවා ඈට සහ ඇගේ
පියාගේ පවුලට ද ඈට අයිති සියල්ලන්ට ද ජීවත්
වන්නට ඉඩ හැරියේ ය. ඈ ඉශ්‍රායලේවරුන් අතරෙහි
අද දක්වා වාසය කරන්නී ය.
26 1 රාජා 16:34 එවිට ජෝෂුවා දිවුරමින්, "යමෙක්
මේ ජෙරිකෝ නුවර ගොඩනඟන්නට උත්සාහ
කරන්නේ නම්, ඔහු සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි
සාප ලද්දෙක් වේ වා! ඔහු අත්තිවාරම් තබන විට
ඔහුගේ කුලුඳුලා ද, එහි දොරටු තබන විට ඔහුගේ
බාල පුත්‍රයා ද නැති වනු ඇතැ"යි ඔවුන්ට කීවේ ය.
27 මෙසේ සමිඳාණන් වහන්සේ ජෝෂුවා සමඟ
වැඩ සිටි සේක; ඔහුගේ කීර්තිය දේශය මුළුල්ලෙහි
පතළ විය.

### ආකාන්ගේ පාපය

7 විනාශයට වෙන් කළ දෙයින් කිසිවක්
නොගන්න ලෙස සමිඳාණන් වහන්සේ දුන්
ආඥාව ඉශ්‍රායලේ සෙනඟ කඩ කළෝ ය. මන්ද,
ආකාන් කැප වූ දෙයින් කොටසක් ගත්තේ ය. ඔහු
වනාහි ජුදා ගෝත්‍රයට අයිති සෙරාගේ පුත්
ශබ්දිගේ පුත්‍රයා වන කර්මීගේ පුත්‍රයා ය. ඒ නිසා
සමිඳාණන් වහන්සේගේ උදහස ඉශ්‍රායලේවරුන්ට
විරුද්ධ ව ඇවිළුණේ ය.
2 ජෝෂුවා ජෙරිකෝවේ සිට බෙතෙල්ට
නැගෙනහිරින් බෙතාවෙන්ට ආසන්න වූ ආයි නගරයට
මිනිසුන් යවමින්, "ඔබ පිටත් ව ගොස් දේශය
සෝදිසි කරගෙන එන්නැ"යි ඔවුන්ට කීවේ ය. ඒ
මිනිස්සු පිටත් ව ගොස් ආයි නගරය ගැන ඔත්තු
බැලුවෝ ය. 3 ඉන්පසු ඔව්හු ජෝෂුවා වෙත පෙරළා
පැමිණ ඔහුට කතා කොට, "සෙනඟ සියලු දෙනා
නොයෙත්වා, දෙතුන් දහසක් පමණ සෙනඟ ගොස්
ආයි නගරයට පහර දෙත්වා. ඒ නගරයේ සිටින්නේ
ස්වල්ප දෙනෙකු නිසා, සකල ජනයා එහි යැවීමෙන්
ඔවුන් වෙහෙසට පත් කරන්නට වුවමනාවක් නැතැ"යි
කී හ. 4 එකී ලෙස සෙනඟගෙන් තුන්දහසක් පමණ
එහි ගියෝ ය. එහෙත්, ඔව්හු ආයි නුවර මිනිසුන්ට
බියෙන් පලා ගියෝ ය. 5 ආයි නුවර වැසියෝ
ඔවුන්ගෙන් තිස්දෙනෙකු පමණ මැරුවෝ ය. ඔව්හු
නුවර දොරටුවේ සිට ෂබොරීම් දක්වා ඔවුන්
ලුහුබැඳවා ගොස් කඳු බෑවුමේ දී ඔවුන්ට පහර
දුන්නෝ ය. එවිට ඉශ්‍රායලේවරු අධෛර්යයට පත් වී
භීතියෙන් ඇලළී ගියෝ ය.
6 ජෝෂුවා ශෝකයෙන් තමාගේ වස්ත්‍ර ඉරාගෙන
ඉශ්‍රායලේවරුන්ගේ ප්‍රජා මූලිකයන් සමඟ
සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව ඉදිරියෙහි
සවස් වන තෙක් මුණින්තළා වැටී සිටියේ ය. ඔව්හු
තමන්ගේ හිස් පිට ධූලි දමාගත්තෝ ය. 7 ජෝෂුවා
කතා කොට, "මහෝත්තම දෙවි ස්වාමීන් වහන්ස,
අප විනාශ කරන පිණිස අමෝරිවරුන් අතට අප
පාවා දීමට ඔබ මේ සෙනඟ ජෝර්දානෙන්
මෙගොඩට පැමිණෙව්වේ කුමක් නිසා ද? අනේ! අපි
ජෝර්දාන් ගඟින් එගොඩ වාසය කරන්නට සතුටු
වුණාමෙ නම් කොපමණ හොඳ ද? 8 අහෝ
සමිඳාණන් වහන්ස! ඉශ්‍රායලේවරුන් සිය සතුරන්ට
පිටුපා පලා ගිය පසු මම කුමක් කියම් ද?
9 කානානිවරුන් ද දේශයේ සියලු වැසියන් ද ඒ අසා
අප වටලා අපගේ නාමය පොළොවෙන් මකාදමනු
ඇත. එවිට ඔබේ ගරු නාමය රැකීමට ඔබ කුමක්
කරන සේක් දැ"යි ඇසී ය.
10 සමිඳාණන් වහන්සේ ජෝෂුවාට මෙසේ පිළිතුරු
දුන් සේක: "නැඟිටින්න; නුඹ කුමක් නිසා මෙසේ
මුණින් වැතිරී සිටින්නෙහි ද? 11 ඉශ්‍රායලේවරුන් පව්
කර ඇත; එසේ ය, මා ඔවුන්ට අණ කළ මාගේ
ගිවිසුම ඔවුන් කඩ කර තිබේ. ඔවුන් මට කැප
කරන ලද දෙයින් රැගෙන සොරකම් කර, ඒවා
සඟවා, ඒවා තමන්ගේ ම බඩු අතරේ තබා තිබේ.
12 ඉශ්‍රායලේ සෙනඟට තමන්ගේ සතුරන්ට
මුහුණපෑමට නොහැකි වූයේ ඒ නිසා ය. සාපයට අසු
වූ බැවින් ඔව්හු තමන්ගේ සතුරන්ට පිටුපාති. ඒ
කැප කරන ලද දේ නුඹලා කරෙන් විනාශ කර
නොදැමුවොත් මම තවත් නුඹලා සමඟ
නොසිටින්නෙමි. 13 නුඹ නැඟිට සෙනඟ පවිත්‍ර
කරන්න; ඔවුන්ට කතා කොට, 'ඔබ හෙට පවිත්‍ර
වන්න. මන්ද, ඉශ්‍රායලේවරුනි, ඔබ අතරේ කැප
කරන ලද දෙයක් ඇත; කැප කරන ලද ඒ දේ ඔබ
අතරෙන් පහකරන තුරු ඔබේ සතුරන්ට මූණ
දෙන්නට ඔබට නොහැකි වන්නේ යයි
ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ
වදාරන සේක. 14 ඒ නිසා හෙට ඔබ හැම ඒ ඒ
ගෝත්‍ර වශයෙන් පැමිණෙන්න. සමිඳාණන් වහන්සේ
තෝරාගන්න ගෝත්‍රය පළෙපත් වශයෙන් ඉදිරියට
පැමිණෙන්නෝ ය. සමිඳාණන් වහන්සේ තෝරාගන්න
පළෙපත ද පවුල් වශයෙන් පැමිණෙන්නෝ ය.
සමිඳාණන් වහන්සේ තෝරාගන්න පවුල එකිනෙකා
වශයෙන් පැමිණෙන්නේ ය. 15 කැප කරන ලද දෙය
ගත් තැනැත්තා මෙසේ අසු වූ කල්හි ඔහු සමිඳාණන්
වහන්සේගේ ගිවිසුම කඩ කළ නිසාත්, ඉශ්‍රායලේහි
දුෂ්ටකමක් කළ නිසාත් ඔහු හා ඔහු සන්තක සියල්ල
ගින්නෙන් පුළුස්සා දැමිය යුතු ය'යි ඔවුන්ට කියන්න."
16 ජෝෂුවා අලුයම නැඟිට ඉශ්‍රායලේවරුන්
ඔවුන්ගේ ගෝත්‍ර වශයෙන් ඉදිරියට ගෙන්වාගත්තේ
ය. ජුදා ගෝත්‍රය අසු විය. 17 ඔහු ජුදා ගෝත්‍රය
ඉදිරියට ගෙන්වූ විට ශෙරාවරුන්ගේ පවුල අසු විය.
ශෙරාගේ පවුල එක එක පළෙපත වශයෙන් ඉදිරියට
ගෙන්වූ විට ශබ්දිගේ පළෙපත අසු විය. 18 ඔහුගේ
පළෙපත එකිනෙකා වශයෙන් ඉදිරියට ගෙන්වූ විට
ජුදා ගෝත්‍රයට අයිති ශෙරාගේ පුත් ශබ්දිගේ
පුත්‍රයා වන කර්මීගේ පුත් වූ ආකාන් අසු විය.
19 ජෝෂුවා ආකාන්ට කතා කොට, "මාගේ පුත්‍රය,
ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේට
ගෞරවය දී උන් වහන්සේට ඇත්ත කියා, ඔබ කළ
වරද මාගෙන් නොසඟවා, මට දන්වන්නැ"යි කීවේ
ය.
20 ආකාන් පිළිතුරු දෙමින්, "සැබැවින් මම
ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේට
විරුද්ධ ව පව් කළෙමි. මා කළ දෙය මෙයෙ යි:
21 කොල්ලය අතරේ ශෝභන බබිලෝනීය සළුවක්
ද රිදී කාසි දෙසීයයක් ද රිදී කාසි පණසක් බර ඇති
රන් පොල්ලක් ද දැක, මම ඒවාට ආසා වී ඒවා
ගත්තෙමි; ඒවා මාගේ කූඩාරම මැද පොළොව යට
සඟවා තිබේ. ඊට යටින් රිදී තිබේ ය"යි කීවේ ය.
22 එවිට ජෝෂුවා පණිවුඩකාරයන් යැව්වේ ය.
ඔව්හු කූඩාරමට දිව ගොස් ඒවා ද ඒවා යට රිදී ද
ආකාන්ගේ කූඩාරමේ සඟවා තිබුණු බව
සොයාගත්තෝ ය. 23 ඔව්හු කූඩාරම මැදින් ඒවා
ගෙන ගොස් ජෝෂුවා වෙත ද මුළු ඉශ්‍රායලේ
සෙනඟ වෙත ද ගෙනවුත් සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි තැබූ හ. 24 එවිට ජෝෂුවා සහ ඔහු සමඟ
සියලු ඉශ්‍රායලේවරු ශෙරාගේ පුත් ආකාන් ද රිදී ද
සළුව ද රන් පොල්ල ද ඔහුගේ දරුදැරියන් ද

ඔහුගේ ගවයන් ද කොටළුවන් ද බැටළුවන් ද
ඔහුගේ කූඩාරම ද ඔහු සන්තක සියල්ල ද රැගෙන
ආකෝර් මිටියාවතට ගෙන ගියෝ ය. 25 ජෝෂුවා
කතා කොට, “ඔබ අප පිට මේ විපත්තිය
පැමිණෙව්වේ මන් ද? සමිඳාණන් වහන්සේ අද ඔබ
පිට විපත්තිය පමුණුවන සේකැ”යි කීවේ ය. එවිට
සියලු ඉශ්‍රායෙල්වරු ඔහුට ගල් ගැසූ හ. ඔව්හු
ඔවුන්ට ගල් ගසා ගින්නෙන් පුළුස්සාදැමුවෝ ය.
26 තවද, ඔව්හු මහ ගල් ගොඩක් ඔහු පිට ගොඩ
ගැසූ හ. එය අද දක්වා තිබේ. ඒ ස්ථානයට ආකෝර්
මිටියාවත යයි අද දක්වා කියන්නේ ඒ නිසා ය.
ඉන්පසු සමිඳාණන් වහන්සේගේ උදහස සංසිඳුණේ
ය.

## ආයි නගරය අල්ලාගැනීම

8 සමිඳාණන් වහන්සේ ජෝෂුවාට කතා කොට,
“බිය නොවන්න, නොකැළඹෙන්න. මුළු යුද්ධ
සේනාව නුඹ සමඟ රැගෙන ආයි නගරයට යන්න.
මම ආයි රජු හා ඔහුගේ සෙනඟත්, ඔහුගේ
නගරයත්, ඔහුගේ රටත් නුඹ අතට පාවා දෙන්නෙමි.
2 නුඹ ජෙරිකෝවටත් එහි රජුටත් කළාක් මෙන් ආයි
නගරයටත්, එහි රජුටත් කරන්න. එහි වස්තුව හා
ගවයන් නුඹලාට කොල්ලයක් වශයෙන් ගන්න.
නගරයට එහායින් රහසේ රැක සිටින සේනාවක්
සූදානම් කර තබන්නැ”යි වදාළ සේක.
3 මෙසේ ජෝෂුවා සහ මුළු යුද්ධ සේනාව ආයි
නගරයට යන පිණිස සැරසුණෝ ය. ජෝෂුවා
බලසම්පන්න හේවායන් තිස්දහසක් තෝරාගෙන
රාත්‍රියේ ඔවුන් යැව්වේ ය. 4 ඔවුන්ට ඔහු මෙසේ
අණ කෙළේ ය: “බලන්න, ඔබ හැම නගරයට
එහායින් සැඟවී සිටින්න; නගරයෙන් වැඩි දුර
නොගොස්, සියල්ලන් ම සූදානම් වී සිටිය යුතු ය.
5 මා සමඟ සිටින සියලු සෙනඟ ද මම ද නගරය
දෙසට ගමන් කරන්නෙමු. එවිට ඔවුන් පළමු වතාවේ
මෙන් අපට විරුද්ධ ව පහර දීමට ආ කල්හි අපි
ඔවුන් ඉදිරියෙන් පලා යන්නෙමු. 6 ‘පළමු වතාවේ
මෙන් ඔව්හු අප ඉදිරියෙන් පලා යන්නෝ ය’යි
කියමින්, අප ඔවුන් නගරයෙන් ඈත් කරගන්න තුරු
ඔවුන් අප ලුහුබැඳ එනු ඇත. මෙසේ අපි ඔවුන්
ඉදිරියෙන් පලා යන්නෙමු. 7 එවිට ඔබ හැම සැඟවී
සිටින තැනින් පිටතට අවුත් නගරය අල්ලාගන්න.
මන්ද, ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ එය ඔබ
අතට පාවා දෙන සේක. 8 ඔබ හැම නගරය
අල්ලාගත් විට එයට ගිනි තබන්න. සමිඳාණන්
වහන්සේ වදාළ ලෙස ම කරන්න. මා ඔබ හැමට
දෙන අණ මෙසේ වේ.” 9 මෙසේ ජෝෂුවා ඔවුන්
යැව්වේ ය; ඔව්හු ගොස් ආයි නගරයට
බස්නාහිරෙන් බෙතෙල්ටත් ආයිටත් අතර සැඟවී
සිටියෝ ය. ජෝෂුවා සෙනඟ සමඟ ඒ රාත්‍රිය ගත
කෙළේ ය.
10 ජෝෂුවා අලුයම නැඟිට, සෙනඟ රැස්කර ඔවුන්
ගණන් කොට, ඉශ්‍රායෙල් ප්‍රජා මූලිකයන් සමඟ
සෙනඟට පෙරටුවෙන් ආයි නගරයට ගියේ ය. 11 මුළු
සෙනඟ, එනම්, ඔහු සමඟ සිටි හේවායෝ නගරය
ඉදිරිපිටට ගමන් කර ආයි නගරයට උතුරෙන් කඳවුරු
බැඳගත්තෝ ය. ඔවුන්ටත්, ආයි නගරයටත් අතරේ
මිටියාවතක් තිබුණේ ය. 12 ජෝෂුවා පන්දහසක්
පමණ මිනිසුන් රැගෙන ඔවුන් ආයිට බස්නාහිරෙන්
බෙතෙල්ටත්, ආයිටත් අතරේ රහසේ සඟවා
තැබුවේ ය. 13 එසේ නගරයට උතුරෙන් සිටි මහ
හමුදාව ද නගරයට බස්නාහිරෙන් රහසේ සඟවා
සිටි අය ද යන සෙනඟ, මෙසේ නතර කළ පසු
ජෝෂුවා ඒ රාත්‍රියේ මිටියාවතට ගියේ ය. 14 ආයි
රජු එය දුටු කල ඔහු සහ නගර වැසියන් වන
ඔහුගේ මුළු සෙනඟත් කඩිනමින් අලුයම නැඟිට,
ඉශ්‍රායෙල්වරුන්ට විරුද්ධ ව සටන් කරන පිණිස
බෑවුමට ඉදිරියේ පිහිටි අරබා සමභූමියට පිටත් ව
ගියෝ ය. එහෙත්, නගරයට එහායින් තමාට විරුද්ධ
ව සමූහයක් සැඟවී සිටින බව ඔහු නොදැන සිටියේ
ය. 15 ජෝෂුවා ද සියලු ඉශ්‍රායෙල්වරු ද තමන්
පැරදුණාක් මෙන් පෙනේවා පාළුකරයට යන
මාර්ගයෙහි පලා ගියෝ ය. 16 ඔවුන් පස්සේ ලුහුබැඳ
යන පිණිස ආයි නගරයේ සිටි මුළු සෙනඟ රැස්
කරගන්නා ලදහ. ඔව්හු ජෝෂුවා පස්සේ එළවාගෙන
ගොස් නගරයෙන් ඈත් වූවෝ ය. 17 ඉශ්‍රායෙල්වරුන්
ලුහුබැඳ යන පිණිස පිටතට නොගිය එක මිනිසෙක්
වත් ආයි නගරයේ වත්, බෙතෙල් නගරයේ වත්
ඉතිරි ව නොසිටියේ ය. නගරය නොවසා සියල්ල
අත්හැර ඔව්හු ඉශ්‍රායෙල්වරුන් ලුහුබැඳ ගියෝ ය.

## ආයි නගරයේ විනාශය

18 සමිඳාණන් වහන්සේ ජෝෂුවාට කතා කොට,
“නුඹේ අතේ තිබෙන හෙල්ලය ආයි දෙසට එල්ල
කරන්න. මන්ද, මම ඒ නගරය නුඹ අතට පාවා
දෙන්නෙමි”යි වදාළ සේක. ජෝෂුවා තමාගේ අතේ
තිබුණු හෙල්ලය නගරය දෙසට එල්ල කෙළේ ය.
19 එවිට සැඟවී සිටි හමුදාව තමන් සිටි තැනින්
වහාම නැඟිට, ජෝෂුවා අත දිගු කළ කෙණෙහි ම
දිව අවුත්, නගරයට වැද, එය අල්ලාගෙන ඉක්මනින්
එයට ගිනිලෑවෝ ය. 20 ආයි නගරයේ මිනිසුන් ආපසු
හැරී බැලූ කල, නගරයේ දුම අහසට නඟින බව
ඔව්හු දුටුවෝ ය. එවිට ඒ අතට වත්, මේ අතට වත්
පලා යාමට ඔවුන්ට පුළුවන්කමක් නොතිබුණේ ය.
පාළුකරය දෙසට පලා ගිය සෙනඟ තමන් ලුහුබැඳ ආ
අය දෙසට හැරුණෝ ය. 21 ජෝෂුවා සහ සියලු
ඉශ්‍රායෙල්වරු, සැඟවී සිටි හමුදාව නගරය
අල්ලාගත් බවත්, නගරයේ දුම නැඟෙන බවත් දැක,
හැරී අවුත් ආයි නගරයේ මිනිසුන් මැරුවෝ ය.
22 සෙසු අය ද ඔවුන්ට විරුද්ධ ව නගරයෙන් නික්ම
ආවෝ ය. මෙසේ ඒ පැත්තෙනුත්, මේ පැත්තෙනුත්
ඉශ්‍රායෙල්වරුන්ට මැදි වූ ආයි සෙනඟගෙන් එක්
කෙනෙකු වත් ගැළවී ඉතුරුවන්නට නොහැර
ඉශ්‍රායෙල්වරු ඔවුන්ට පහර දුන්නෝ ය. 23 ඔව්හු
ආයි රජු පණපිටින් අල්ලා ජෝෂුවා වෙත ගෙනාවෝ
ය.

24 ඉශ්‍රායලේවරුන් තමන් ලුහුබැඳ ආ සියලු
වැසියන් පාළුකරයේ දී වනසා නිම කළ පසු ද
මෙසේ ආයි වැසියන් සියල්ලන් ම එකකු වත් ඉතුරු
නොවන සේ කඩුවෙන් විනාශ කරනු ලැබූ පසු ද
සියලු ඉශ්‍රායලේවරු ආයි නගරයට හැරී ගොස් එහි
සිටි අය ද කඩුවෙන් මරා දැමුවෝ ය. 25 ඒ දවසේ දී
මරුමුවට පත් වූ ආයි නගර වැසි සියලු ස්ත්‍රී
පුරුෂයන්ගේ ගණන දොළොස්දහසක් විය. 26 මන්ද,
ජෝෂුවා හෙල්ලය එල්ල කර ආයි නගරයෙහි සියලු
වැසියන් මුළුමනින් ම විනාශ කරදමන තුරු, තමාගේ
අත පහතට නොදැම්මේ ය. 27 එහෙත්, ගවයන් ද ඒ
නගරයේ වස්තුව ද සමිඳාණන් වහන්සේ ජෝෂුවාට
අණ කළ පරිදි, ඉශ්‍රායලේවරු තමන්ට කොල්ලයක්
කොට ගත්තෝ ය. 28 මෙසේ ජෝෂුවා ආයි
නගරයට ගිනි ලා, එය සදහට ම පවතින නටබුන්
ගොඩක් කළේ ය. එය අද දක්වා පවතී. 29 ඔව්හු
ආයි රජු සවස දක්වා ගසක එල්ලා තැබුවෝ ය; ඉර
බසින වේලාවේ ජෝෂුවාගේ අණ පිට ඔහුගේ
මළකඳ ගසින් බා, නගරයට පිවිසෙන දොරකඩ ළඟ
හෙළා, ඒ පිට මහ ගල් ගොඩක් ගැසුවෝ ය. එය අද
දවස දක්වා තිබේ.

### ව්‍යවස්ථාව කියවනු ලැබීම

30 ද්වි.නී. 27:2-8 එවිට ජෝෂුවා ඒබාල් කන්දෙහි
ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේට
පූජාසනයක් ගොඩනැඟුවේ ය. 31 නික්ම 20:25ඔහු
මෙසේ කළේ, සමිඳාණන් වහන්සේගේ සේවක
මෝසෙස් ඉශ්‍රායලේ සෙනඟට අණ කළ ලෙස,
මෝසෙස්ගේ ව්‍යවස්ථා පොතේ ලියා තිබෙන පරිදි,
‘කිසිවකු විසින් යකඩ ආයුධයකින් නොකපන ලද
පියවි ගල්වලින් ය.’ ඔව්හු ඒ පූජාසනය පිට
සමිඳාණන් වහන්සේට දවන යාග පූජා ද
සහභාගිකමේ පූජා ද ඔප්පු කළෝ ය. 32 ජෝෂුවා
එහි දී ඒ ගල් පිට මෝසෙස්ගේ ව්‍යවස්ථාවේ
පිටපතක් ලිව්වේ ය. ඔහු එය ඉශ්‍රායලේ ජනයා
ඉදිරියෙහි ඉටු කළේ ය. 33 ද්වි.නී. 11:29;
27:11-14සියලු ඉශ්‍රායලේවරු ද ඔවුන්ගේ ප්‍රජා
මූලිකයෝ ද නිලධාරීහු ද විනිශ්චයකාරයෝ ද
ස්වදේශිකයෝ ද එසේ ම විදේශිකයෝ ද
සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව ඉසුලූ ලෙවී
පූජකවරුන් ඉදිරියෙහි ගිවිසුම් කරඬුව දෙපසෙහි
සිටියෝ ය. ඔවුන්ගෙන් දකෙනේ කොටසක් ගෙරිසීම්
කන්ද ඉදිරිපිට ද සෙසු දකෙනේ කොටස ඒබාල්
කන්ද ඉදිරියෙහි ද සිටියෝ ය. මෙසේ කළේ, පළමු
කොට ඉශ්‍රායලේ සෙනඟට ආශීර්වාද කළ යුතු ය
කියා සමිඳාණන් වහන්සේගේ සේවක මෝසෙස්
අණ කළ පරිදි ය. 34 ඉන්පසු ව්‍යවස්ථා පොතේ ලියා
තිබෙන පරිදි ආශීර්වාදයත්, සාපයත් යන
ව්‍යවස්ථාවේ සියලු වචන ඔහු කියෙව්වේ ය.
35 ජෝෂුවා, ස්ත්‍රීන් ද බාලයන් ද ඔවුන් අතරේ
හැසුරුණු විදේශීන් ද ඇතුළු වූ ඉශ්‍රායලේ සභාව
ඉදිරියෙහි මෝසෙස් අණ කළ සියල්ලෙන් නොකියවූ
එක ද වචනයක් වත් නො වී ය.

### ගිබියොන්වරුන් සමඟ ගිවිසුම

9 ජෝර්දානෙන් මෙගොඩ කඳු රටෙහි ද පහත
රටෙහි ද මධ්‍යධරණි මුහුද අසබඩ මුළුල්ලෙහි
ලෙබනොන් දක්වා ද විසූ හිත්තීවරුන්ගේ ද
අමෝරිවරුන්ගේ ද කානානිවරුන්ගේ ද
පෙරෙස්සිවරුන්ගේ ද හිව්වරුන්ගේ ද ජෙබුසිවරුන්ගේ
ද සියලු රජවරුන් ඒ ගැන ඇසූ කල, 2 ඔව්හු එක්
සිත් ව ජෝෂුවා හා ඉශ්‍රායලේවරුන්ට විරුද්ධ ව
යුද්ධ කරන පිණිස එක්රැස් වූවෝ ය.
3 එහෙත්, ගිබියොන් වැසියන් ජෝෂුවා
ජෙරිකෝවටත්, ආයි නගරයටත් කළ දේ ඇසූ විට,
4 ඔව්හු ජෝෂුවා රැවටීමට උපායක් යොදාගත්තෝ
ය. ඔව්හු සූදානම් කරගත් ආහාර ද පරණ ගෝණි ද
පැළී පිළියම් කළ පරණ හම් මුද්‍රික පාන භාජන ද
තමන්ගේ කොටළුවන් පිට පටවා ගත්තෝ ය.
5 අණ්ඩ දැමූ, ගෙවී ගිය පාවහන් පය ලාගෙන,
පරණ වස්ත්‍ර ඇඳගත්තෝ ය; ඔවුන් කෑමට ගත්
රොටි සියල්ල ද වේළී, පුස් බැඳී තිබුණේ ය.
6 මෙසේ ඔව්හු ගිල්ගාල්හි කඳවුරේ සිටි ජෝෂුවා
වෙත ගොස්, ඔහුටත්, ඉශ්‍රායලේ සෙනඟටත් කතා
කොට, “අපි දුර රටකින් ආවමෝ; එබැවින් අප සමඟ
ගිවිසුමක් කළ මැනවැ”යි කීවෝ ය.
7 නික්ම 23:32; 34:12; ද්වි.නී. 7:2 එහෙත්,
ඉශ්‍රායලේ සෙනඟ ඔවුන්ට පිළිතුරු දෙමින්, “ඔබ අප
අසල වාසය කරනු වන්නට පුළුවන. එසේ නම් අප
ඔබ සමඟ ගිවිසුමක් කරගන්නේ කෙසේ දැ”යි
හිව්වරුන්ගෙන් ඇසූ හ.
8 ඔව්හු ජෝෂුවාට කතා කරමින්, “අපි ඔබ
වහන්සේගේ දාසයෝ වමු”යි ඔහුට කී හ. ජෝෂුවා
ද, “ඔබ කවරහු ද? කොතැනින් ආවහු දැ”යි
ඔවුන්ගෙන් ඇසුවේ ය.
9 ඔව්හු පිළිතුරු දෙමින් මෙසේ කී හ: “ඔබේ
දාසයන් වන අපි ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ
ගැන අසා බොහෝ දුර රටකින් ආවමෝ. උන්
වහන්සේගේ කීර්තිය ද උන් වහන්සේ මිසරයේ
කළ සියල්ල ද 10 ගණන් 21:21-35ජෝර්දාන් ගඟින්
එගොඩ විසූ අමෝරිවරුන්ගේ රජවරුන් දෙදෙනා වන
හෙෂ්බොන්හි රජ වූ සීහොන්ටත්, අෂ්ටාරොත්හි විසූ
බාෂාන්හි රජ වූ ඕග්ටත් කළ සියල්ල ද අපි ඇසීමු.
11 එබැවින් අපේ ප්‍රජා මූලිකයෝ ද අපේ රට වැසි
සියල්ලෝ ද අපට කතා කොට, ‘ඔබේ ගමනට
ආහාර රැගෙන, ඔවුන් හමු වන්නට ගොස් ඔවුන්ට
කතා කොට, අපි ඔබ හැමගේ දාසයෝ වමු. අප
සමඟ ගිවිසුමක් කළ මැනව යි ඔවුන්ට කියන්නැ’යි
අපට කී හ. 12 ඔබ හැම වෙත එන්නට අප පිටත් වූ
දවසේ දී අපේ ආහාර පිණිස ගත් මේ රොටි අපේ
ගෙවලින් අප ගත්තේ උණු උණු ව තිබෙද්දී ය;
එහෙත්, දැන් ඒවා වියළී, පුස් බැඳී තිබේ. 13 මේ
මුද්‍රික පාන හම් භාජන අප පුරවාගත් විට ඒවා
අලුත් ව තිබිණි; දැන් ඒවා පැළී තිබේ. මේ අපේ
වස්ත්‍ර ද පාවහන් ද ගමන ඉතා දීර්ඝ නිසා පරණ වී
තිබේ.”

14 ඉශ්‍රායලේ සෙනඟගේ ප්‍රධානීහු සමිඳාණන්
වහන්සේගේ අවවාද නොවිචාරා ඔවුන්ගේ ආහාර
කෑවෝ ය. 15 ජෝෂුවා ඔවුන් සමඟ සාමය ඇති
කරගෙන, ඔවුන්ට ජීවත් වන්නට ඉඩ දෙන හැටියට
ඔවුන් සමඟ ගිවිසුමක් කළේ ය. ඉශ්‍රායලේ
ජනයන්ගේ ප්‍රජා මූලිකයෝ ද ඔවුන්ට දිවුරුම්
දුන්නෝ ය.
16 ඉශ්‍රායලේවරුන් ඔවුන් සමඟ ගිවිසුමක් කර
තුන් දවසකට පසු ඔවුන් තමන්ගේ අසල්වාසීන්
බවත්, තමන් අතරෙහි වාසය කරන බවත් ඔවුන්ට
ආරංචි වුණේ ය. 17 ඉශ්‍රායලේ සෙනඟ ගමන්
කොට තුන් දවසකට පසු ඔවුන්ගේ නගරවලට
පැමිණියෝ ය. ඒ නගර නම්: ගිබියෝන්, කෆීරා,
බයේරොත්, කිරියත්-ජයාරීම් යන මේවා ය.
18 ප්‍රජා මූලිකයෝ ඉශ්‍රායලේවරුන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේගේ නමින් ඔවුන්ට දිවුරුම් දී
තිබුණ නිසා ඔවුන්ට පහර නොදුන්නෝ ය. සියලු
සෙනඟ ප්‍රජා මූලිකයන්ට විරුද්ධ ව දොස් පැවරුවෝ
ය.
19 එහෙත්, සියලු ප්‍රජා මූලිකයෝ කතා කොට,
"අපි ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේගේ නාමයෙන් ඔවුන්ට දිවුරුම් දුනිමු;
එබැවින් ඔවුන්ට අත ගසන්නට අපට නොහැකි ය.
20 අප ඔවුන්ට මෙසේ කළ යුතු ය: ඔවුන්ට ජීවත්
වීමට අපි ඉඩ හරිමු. එසේ නොකළොත්, අප
ඔවුන්ට දුන් දිවුරුම නිසා උදහස අප පිටට පැමිණෙනු
ඇත. 21 ඔවුන් ජීවත් වුණා වේ. ඔවුන්ගේ අධිපතීන්
කී පරිදි ඔව්හු අපට දර කපන්නෝ ද දිය අදින්නෝ
ද වන්නෝ ය"යි කීවෝ ය.
22 ජෝෂුවා ගිබියෝන්වරුන් කැඳවා, "ඔබ අප
අතරේ වාසය කරද්දී, 'අපි ඔබට බොහෝ දුරින්
සිටිමු' කියා ඔබ අප රැවටුවේ මන් ද? 23 මෙසේ
කළ නිසා ඔබ සාප ලද්දහු ය. ඔබ අතරෙන්
සමහරෙකු මාගේ දෙවියන් වහන්සේගේ ගෘහයට
දර කපන්නන් ද දිය අදින්නන් ද වශයෙන් සෑම
කල්හි ම ඔබ සපයනු ඇතැ"යි කීවේ ය.
24 ඔව්හු ජෝෂුවාට පිළිතුරු දෙමින්, "මුළු දේශය
ඔබ හැමට දෙන්නටත්, ඔබ හැම ඉදිරියෙන් දේශයේ
සියලු වැසියන් විනාශ කරදමන්නටත්, ඔබ දෙවි
සමිඳාණන් වහන්සේ තමන්ගේ මෙහෙකරු
මෝසෙස්ට අණ කළ බව අපට දැනගන්නට ලැබුණ
බැවින්, ඔබ විසින් මරනු ලබනු ඇත යන බියෙන් අපි
මෙසේ කළෙමු. 25 අහෝ! අපි දැන් ඔබ අතේ ය:
ඔබට හරි යයි ද සාධාරණ යයි ද දැනෙන හැටියට
අපට කළ මැනවැ"යි කී හ. 26 ජෝෂුවා ඔවුන්ට
එලෙස කර, ඉශ්‍රායලේ සෙනඟ විසින් ඔවුන් මරා
නොදමන ලෙස ඔවුන්ගේ අතින් ඔවුන්
ගළවාගත්තේ ය. 27 ජෝෂුවා ඒ දවසේ, ඔවුන් තම
සෙනඟටත්, සමිඳාණන් වහන්සේගේ පූජාසනයටත්
දර කපන්නන් ද දිය අදින්නන් ද කළේ ය.
සමිඳාණන් වහන්සේ සිය පූජාසනය සඳහා
තෝරාගන්න ස්ථානයේ දී ඔව්හු අද දක්වා ම එසේ
කරති.

## ගිබියෝන්හි දී ලත් ජය

10 ජෝෂුවා ජෙරිකෝවටත්, එහි රජුටත් කළාක්
මෙන් ආයිටත් එහි රජුටත් කර, ආයි නගරය
අල්ලාගෙන එය සහමුලින් ම විනාශ කළ බවත්,
ගිබියොන් වැසියන් ඉශ්‍රායලේවරුන් සමඟ සාමදාන
වී ඔවුන් අතරේ සිටින බවත්, ජෙරුසලමේ රජ වූ
අදෝනි-ශෙදෙකේට ආරංචි විය. 2 ගිබියොන් රාජකීය
නගරයක් මෙන් විශාල නගරයක් ව තිබුණ නිසා ද
එය ආයි නගරයටත් වඩා විශාල නිසා ද එහි
වැසියන් සියලු දෙනා බලසම්පන්න නිසා ද ජෙරුසලම්
වැසියෝ බියපත් වූවෝ ය. 3 එබැවින් ජෙරුසලමේ
රජ වූ අදෝනි-ශෙදෙකේ, හෙබ්‍රෝන්හි රජ වූ
හෝහාම්ට ද ජර්මුත්හි රජ වූ පීරාම්ට ද ලාකීෂ්හි
රජ වූ ජපියාට ද එග්ලොන්හි රජ වූ දබීර්ට ද
පණිවුඩ යවමින්, 4 "ගිබියෝන්වරුන් ජෝෂුවා ද
ඉශ්‍රායලේ සෙනඟ ද සමඟ සාමදාන වී ඇති නිසා
ගිබියොන්ට පහර දෙන පිණිස මට හවුල් වී උපකාර
කරන්නැ"යි කී ය. 5 එබැවින් අමෝරිවරුන්ගේ
රජවරුන් පස්දෙන, එනම්, ජෙරුසලමේ රජ ද
හෙබ්‍රොන් රජ ද ජර්මුත්හි රජ ද ලාකීෂ්හි රජ ද
එග්ලොන්හි රජ ද එකතු වී, ඔව්හු ද ඔවුන්ගේ
සියලු සේනාවෝ ද ගොස්, ගිබියොන් ඉදිරියෙහි
කඳවුරු බැඳ, ඊට විරුද්ධ ව යුද්ධ කළෝ ය.
6 එවිට ගිබියෝන්හි සෙනඟ කතා කොට, "ඔබේ
දාසයන් අත් නොහළ මැනව; අප වෙත ඉක්මනින්
අවුත්, අප ගළවා අපට උපකාර කළ මැනව. මන්ද,
කඳුකරයේ වසන අමෝරිවරුන්ගේ සියලු රජවරු
අපට විරුද්ධ ව එකතු වී සිටිති"යි ගිල්ගාල්හි
කඳවුරේ සිටි ජෝෂුවාට දන්වා යැවූ හ:
7 එවිට ජෝෂුවා මුළු යුද්ධ හමුදාව ද බලසම්පන්න
වීරයන් ද සමඟ ගිල්ගාල් කරෙන් නැඟී ගියේ ය.
8 සමිඳාණන් වහන්සේ ජෝෂුවාට කතා කොට,
"ඔවුන්ට බිය නොවන්න; මන්ද, මා ඔවුන් නුඹ අතට
පාවා දී ඇත; ඔවුන්ගෙන් කිසිවකුට වත් නුඹට
විරුද්ධ ව නැඟිට නොසිටිය හැකි ය"යි වදාළ සේක.
9 ජෝෂුවා ගිල්ගාල් සිට රාත්‍රිය මුළුල්ලේ ගමන්
කොට හදිස්සියෙන් ඔවුන් කරා පැමිණියේ ය.
10 සමිඳාණන් වහන්සේ ඉශ්‍රායලේවරුන් ඉදිරියෙහි
ඔවුන් තැතිගැන්වූ සේක. ඉශ්‍රායලේවරු ගිබියොන්
ළඟ දී ඔවුන් වනසා, බෙත්-හෝරොන්ට යන
මාර්ගයෙහි ඔවුන් ලුහුබැඳ ගොස් අශේකා සහ
මක්කේදා දක්වා ඔවුන්ට පහර දුන්නෝ ය. 11 තවද,
ඔවුන් ඉශ්‍රායලේවරුන් ඉදිරියෙන් පලා යද්දී, අශේකා
දක්වා බෙත්-හෝරොන් පල්ලමේ දී සමිඳාණන්
වහන්සේ අහසෙන් විශාල ගල් ඔවුන් පිට හෙළූ
සේක; එයින් ඔව්හු මැරුණෝ ය. ගල් වර්ෂාවෙන්
නැසුණු අය, ඉශ්‍රායලේවරුන් කඩුවෙන් මැරූ අයට
වඩා බොහෝ වූ හ.
12 සමිඳාණන් වහන්සේ අමෝරිවරුන් ඉශ්‍රායලේ
සෙනඟට පාවා දුන් ඒ දවසේ දී ජෝෂුවා සමිඳාණන්
වහන්සේට කතා කොට, මුළු ඉශ්‍රායලේවරුන්ගේ
ඇස් හමුයෙහි මෙසේ කීවේ ය:

q212 “එම්බා සූර්යය!
q212 ගිබියොන්ට ඉහළින් නොසෙලී වී සිටින්න;
q212 එම්බා චන්ද්‍රය!
q212 අයාලොන් මිටියාවත ඉහළින් එසේ ම
සිටින්න.”
13 2 සාමු 1:18 එවිට සෙනඟ තමන්ගේ
සතුරන්ගෙන් පළිගන්න තුරු සූර්යයා නැවතී සිටියේ
ය; චන්ද්‍රයා ද නැවතුණේ ය. මෙපොවත් ජාෂාර්ගේ
පොතේ ලියා තිබෙනු නොවේ ද? සූර්යයා සම්පූර්ණ
දවසක් පමණ බැස යාමට ඉක්මන් නොවී අහස මැද
සිටියේ ය. 14 සමිඳාණන් වහන්සේ මිනිසකුගේ
හඬට සවන් දුන් එබඳු දවසක් මීට පෙර වත්, ඊට
පසු වත් නො වී ය; මන්ද, සමිඳාණන් වහන්සේ
ඉශ්‍රායලේ සෙනඟ උදෙසා සටන් කළ සේක.
15 ඉන්පසු ජෝෂුවා ද සියලු ඉශ්‍රායලේ සෙනඟ ද
ගිල්ගාල්හි කඳවුරට පෙරළා ගියෝ ය.

## මක්කේදාහි ගුහාවේ සිටි රජවරුන් පස්දෙනා

16 රජවරු පස්දෙනා පලා ගොස් මක්කේදාහි
ගුහාවේ සැඟවුණා හ. 17 “රජවරු පස්දෙනා
මක්කේදාහි ගුහාවේ සැඟවී සිටිනු සම්බ වූ හ”යි
ජෝෂුවාට දන්වන ලද්දේ ය. 18 එවිට ජෝෂුවා කතා
කරමින්, “ඔබ ගුහාවේ කටට ලොකු ගල් පෙරළා
තබා ඔවුන් මුර කරන්නට මිනිසුන් තබන්න.
19 එහෙත්, ඔබ නැවතී නොසිටින්න; ඔබේ සතුරන්
ලුහුබැඳ ගොස් පිටුපසින් සිටින්නන්ට පහර දෙන්න;
ඔවුන්ගේ නගරවලට ඇතුළු වීමට ඔවුන්ට ඉඩ
නොදෙන්න. මන්ද, ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ
ඔවුන් ඔබ අතට පාවා දී තිබේ ය”යි කීවේ ය.
20 ජෝෂුවා සහ ඉශ්‍රායලේ සෙනඟ ඔවුන්
සමූලඝාතනය කර නිම කළෝ ය. ඔවුන්ගෙන් ඉතිරි
අය පවුරු ඇති නගරවලට ඇතුළු වූ හ. 21 ඉන්පසු
ජෝෂුවාගේ සෙනඟ මක්කේදාහි කඳවුරට ජෝෂුවා
වෙත සුව සේ හැරී ආවෝ ය. ඉශ්‍රායලේ
සෙනඟගෙන් කිසිවකුට විරුද්ධ ව කවරකේ වත්
කිසිවක් නොකීවෝ ය.
22 එවිට ජෝෂුවා කතා කොට, “ගුහාවේ කට ඇර
ඒ රජුන් පස්දෙනා ගුහාවෙන් මා ළඟට ගෙනෙන්නැ”යි
කී ය. 23 ඔව්හු එසේ කොට, ඒ රජවරුන් පස්දෙනා
එනම්, ජෙරුසලමේ රජ ද හෙබ්රොන්හි රජ ද
ජර්මුත්හි රජ ද ලාකීෂ්හි රජ ද එග්ලොන්හි රජ ද
ගුහාවෙන් ඔහු වෙත ගෙනාවෝ ය. 24 ඔවුන් ඒ
රජුන් ජෝෂුවා වෙත ගෙනා කල, ජෝෂුවා සියලු
ඉශ්‍රායලේ මිනිසුන් කැඳවා, තමා සමඟ ගිය යුද්ධ
භටයන්ගේ අධිපතීන්ට කතා කොට, “ළං වී ඔබේ
පාද මේ රජුන්ගේ ගෙලෙ මත තබන්නැ”යි කීවේ ය.
ඔව්හු ළං ව තමන්ගේ පාද ඔවුන්ගේ ගෙලෙ මත
තැබුවෝ ය. 25 ජෝෂුවා ඔවුන්ට කතා කොට, “බිය
නොවී නොකැළඹී සිටින්න; ශක්තිමත් ව ධෛර්යවත්
ව සිටින්න; මන්ද, ඔබට විරුද්ධ ව යුද්ධ කරන ඔබේ
සියලු සතුරන්ට සමිඳාණන් වහන්සේ මෙසේ කරන
සේකැ”යි කීවේ ය. 26 ඉන්පසු ජෝෂුවා ඔවුන්ට
පහර දී ඔවුන් මරා ගස් පහක එල්ලුවේ ය. ඔව්හු
ඔවුන් සවස දක්වා ගස්වල එල්ලා තැබුවෝ ය.
27 ඉර බසින විට ජෝෂුවාගේ අණ පිට ඔව්හු ඔවුන්
ගස්වලින් බා ඔවුන් සැඟවී සිටි ගුහාවේ දමා, මහ
ගල් ඒ ගුහා කටෙහි තැබුවෝ ය. ඒ ගල් අද දක්වා
ම පවතී.

## මක්කේදා යනාදී තැන් අල්ලාගැනීම

28 ඒ දවසේ ජෝෂුවා මක්කේදා නගරය
අල්ලාගෙන, එයටත්, එහි රජුටත් කඩුවෙන් පහර දී,
එක ද කෙනෙකු වත් ඉතිරි නොකර, එහි සිටි සියලු
දෙනා ද මුළුමනින් ම විනාශ කරදමා, ජෙරිකෝවේ
රජුට කළාක් මෙන් මක්කේදාහි රජුටත් කළේ ය.
29 ඉක්බිති ජෝෂුවා මක්කේදා සිට සියලු
ඉශ්‍රායලේවරුන් සමඟ ලිබ්නා නගරයට ගොස් ඒ
නගරයට විරුද්ධ ව යුද්ධ කළේ ය. 30 සමිඳාණන්
වහන්සේ ඒ නගරයත්, එහි රජුත්
ඉශ්‍රායලේවරුන්ගේ අතට පාවා දුන් සේක. ජෝෂුවා
එහි සිටි එක් කෙනෙකු වත් ඉතිරි නොකොට ඒ
නගරයටත්, ඒ නගරයේ විසූ සියලු දෙනාටත්
කඩුවෙන් පහර දී ජෙරිකෝවේ රජුට කළාක් මෙන්
ලිබ්නාහි රජුටත් කළේ ය.
31 ජෝෂුවා සියලු ඉශ්‍රායලේවරුන් සමඟ ලිබ්නාහි
සිට ලාකීෂ් නගරයට ගොස්, එය ඉදිරිපිට කඳවුරු
බැඳ ඊට විරුද්ධ ව යුද්ධ කළේ ය. 32 සමිඳාණන්
වහන්සේ ලාකීෂ් නගරය ද ඉශ්‍රායලේවරුන්ගේ
අතට පාවා දුන් සේක. ජෝෂුවා දෙ වන දවසේ දී
එය අල්ලාගෙන ලිබ්නාට කළාක් මෙන් එහි සිටි
සියලු දෙනාටත් කඩුවෙන් පහර දුන්නේ ය. 33 එවිට
ගෙසෙර්හි රජ වූ හොරාම් ලාකීෂ් නගරයට උපකාර
කරන පිණිස පැමිණියේ ය. ජෝෂුවා, එක් කෙනෙකු
වත් ඉතිරි නොවන තුරු ඔහුටත්, ඔහුගේ
සෙනඟටත් පහර දුන්නේ ය.
34 ජෝෂුවා ඉශ්‍රායලේවරුන් සමඟ ලාකීෂ්හි සිට
එග්ලොන් නගරයට ගොස් එය වටලා කඳවුරු බැඳ
එයට විරුද්ධ ව යුද්ධ කළේ ය. 35 ඔව්හු ඒ දවසේ
දී ම එය අල්ලාගෙන, එයට කඩුවෙන් පහර දී ලාකීෂ්
නගරයට කළාක් මෙන් එහි සිටි සියලු දෙනා ඒ
දවසේ දී මුළුමනින් විනාශ කරදැමුවෝ ය.
36 ජෝෂුවා සියලු ඉශ්‍රායලේවරුන් සමඟ
එග්ලොන් සිට හෙබ්රොන් නගරයට ගොස් ඊට
විරුද්ධ ව යුද්ධ කොට, 37 එය අල්ලාගෙන එයටත්,
එහි රජුටත්, ඊට අයිති සියලු නගරවලටත්, එහි විසූ
සියලු දෙනාටත් කඩුවෙන් පහර දී, එග්ලොන්
නගරයට කළාක් මෙන් එක් කෙනෙකු වත් ඉතිරි
නොකර, එය ද එහි සිටි සියලු දෙනා ද මුළුමනින් ම
විනාශ කරදැමුවේ ය.
38 ජෝෂුවා සියලු ඉශ්‍රායලේවරුන් සමඟ දබීර්
නගරයට හැරී අවුත්, එයට විරුද්ධ ව යුද්ධ කොට,
39 එය සහ එහි රජු ද එයට අයිති සියලු නගර ද
අල්ලාගෙන, කඩුවෙන් පහර දී, එක් කෙනෙකු වත්
ඉතිරි නොකර එහි සිටි සියලු දෙනාත් මුළුමනින්
විනාශ කරදැමුවේ ය. ඔහු හෙබ්රොන්ට කළාක්

මනේ ද ලිබ්නාටත් එහි රජුටත් කළාක් මනේ ද
දබේර්ටත් එහි රජුටත් කළෙේ ය.
40 මසෙේ ජෝෂුවා මුළු දේශයට, එනම් කඳු රටට
හා දකුණු දේශයට ද පහත රටට හා කඳු
බෑවුම්වලට ද එහි සියලු රජුන්ට ද පහර දී, එක්
කනෙකු වත් ඉතිරි නොකොට ඉශ්රායලේවරුන්ගේ
දවේ සමිඳාණන් වහන්සේ අණ කළ ලසෙ පණ ඇති
සියල්ලන් ම මුළුමනින් ම සිඳදැමුවේ ය. 41 කාදෙෂ්-
බර්නේය පටන් ගාසා දක්වා ද මුළු ගෝෂනේ ඇතුළු
ව ගිබියොන් දක්වා ද ජෝෂුවා සියල්ලන්ට පහර
දුන්නේ ය. 42 ඉශ්රායලේවරුන්ගේ දවේ සමිඳාණන්
වහන්සේ ඉශ්රායලේවරුන් උදසො සටන් කළ බැවින්,
ජෝෂුවා ඒ සියලු රජවරුන් ද ඔවුන්ගේ දේශයන් ද
එක විට ම අල්ලාගත්තේ ය. 43 ඉක්බිති ජෝෂුවා ද
ඔහු සමඟ සියලු ඉශ්රායලේවරු ද ගිල්ගාල්හි
කඳවුරට පරෙළා ආවෝ ය.

## උතුරු දේශය අත්කරගැනීම

11 හාශොරේහි රජ වූ ජාබීන් මේ සියලු දේ ඇසූ
විට, මාදොන්හි රජ වූ ජෝබාබ්ට ද
ෂිම්රොන්හි රජුට ද ආක්ෂාප්හි රජුට ද 2 උතුරු
දිශාවේ කඳු රටේ සහ කින්නරෙතෝට දකුණනේ
තිබනෙ අරබා සමභූමියහෙි පහත රටේත්,
බස්නාහිරනේ තිබනෙ දෝර් කඳුකරයහෙිත් සිටි
රජවරුන්ට ද පණිවුඩයක් යැව්වේ ය. 3 තවද,
නැගනෙහිරනේ සහ බස්නාහිරනෙුත් විසූ
කානානිවරුන්ට ද අමෝරිවරුන්ට ද හිත්තීවරුන්ට ද
පරෙිස්සිවරුන්ට ද කඳු රටේ විසූ ජබෙුසිවරුන්ට ද
මිශ්පා දේශයහෙි හරෙමොන්ට පහළින් විසූ
හිව්වරුන්ට ද පණිවුඩ යැව්වේ ය. 4 එවිට ඔව්හු
මුහුදු වරෙළේ වැලි මනේ ඉතා විශාල ජන
සංඛ්යාවක් වන තමන්ගේ සියලු සේනාවන් සමඟ
පැමිණියෝ ය. ඔව්හු අශ්වයන් සහ රථ වාහන ඉතා
මහත් ගණනාවක් ඇති ව පිටත් ව ආවෝ ය.
5 මකේී සියලු රජවරුන් තම බලඇණි එක්රුැස්
කොට, ඉශ්රායලේවරුන්ට විරුද්ධ ව යුද්ධ කරන
පිණිස මරෙොම්හි ජලය ඇති ස්ථානය ළඟ එක් ව
කඳවුරු බැඳගත්තෝ ය.
6 සමිඳාණන් වහන්සේ ජෝෂුවාට කතා කොට,
“ඔවුන් ගැන බිය නොවන්න: මන්ද, ඔවුන් මැරුම්
කන පිණිස හටෙ මේ වලේාවට ඔවුන්
ඉශ්රායලේවරුන්ගේ අතට පාවා දනේනමේ; ඔවුන්ට
අයත් අශ්වයන්ගේ කුදි කපා ඔවුන්ගේ රථ
ගින්නනේ පුළුස්සාදමන්නැ”යි වදාළ සේක. 7 එවිට
ජෝෂුවා මුළු යුද්ධ සේනාව සමඟ මරෙොම්හි ජලය
ඇති ස්ථානය ළඟ සිටි ඔවුන්ට විරුද්ධ ව හදිස්සියේ
අවුත් ඔවුන් මැදට කඩා පැන්නේ ය. 8 සමිඳාණන්
වහන්සේ ඉශ්රායලේවරුන්ගේ අතට ඔවුන් පාවා දුන්
සේක. ඉශ්රායලේවරු ඔවුන් මහ සීදනෝ දක්වා ද
මිස්රපෙොත්-මායිම් දක්වා ද නැගනෙහිර තිබනෙ
මිශ්පාහි මිටියාවත දක්වා ද එළවාගනෙ ගොස්
ඔවුන්ගනේ එක් කනෙකු වත් ඉතිරි නොවන තුරු
ඔවුන්ට පහර දුන්නෝ ය. 9 ජෝෂුවා, සමිඳාණන්
වහන්සේ තමාට වදාළ ලසෙ ඔවුන්ට කර, ඔවුන්ගේ
අශ්වයන්ගේ කුදි කපා ඔවුන්ගේ රථ ගින්නනේ
පුළුස්සාදැමුවේ ය.
10 ඒ අවස්ථාවේ දී ජෝෂුවා පරෙළා අවුත්
හාශොරේ නගරය අල්ලාගනෙ එහි රජුට කඩුවනේ
පහර දුන්නේ ය. හාශොරේ වනාහි ඉහත දී ඒ සියලු
රාජ්යවල ප්රධාන නගරය ව තිබුණේ ය.
11 ඉශ්රායලේවරු එහි විසූ සියලු දනොට කඩුවනේ
පහර දී ඔවුන් මුළුමනින් ම විනාශ කරදැමුවෝ ය.
පණ ඇති කිසිවකේ එහි ඉතිරි නොවූ හ. ජෝෂුවා
හාශොරේ නගරය ගින්නනේ පුළුස්සාදැමුවේ ය.
12 ජෝෂුවා මේ සියලු රජවරුන්ගේ නගර ද එහි
සියලු රජවරුන් ද අල්ලාගනෙ, සමිඳාණන්
වහන්සේගේ මහෙකෙරු මෝසසේ අණ කළ ලසෙ
කඩුවනේ ඔවුන්ට පහර දී, ඔවුන් මරා දැමුවේ ය.
13 හලේ පිට පිහිටා තිබුණු සියලු නගරවලින්,
හාශොරේ හැර, අන් එකක් වත් ඉශ්රායලේවරු
පුළුස්සා නොදැමුවෝ ය. ජෝෂුවා හාශොරේ පමණක්
පුළුස්සාදැමුවේ ය. 14 ඒ නගරවල වටිනා වස්තුව ද
ගවයන් ද ඉශ්රායලේ ජනයා කොල්ලකාගනෙ
තබාගත්තෝ ය. සියලු මිනිසුන් විනාශ වන තුරු
ඔව්හු ඔවුන්ට කඩුවනේ පහර දුන්නෝ ය; කිසිවකෙු
පණපිටින් ඉතුරු නොකළෝ ය. 15 සමිඳාණන්
වහන්සේ තමන්ගේ සේවක මෝසසේට අණ කළ
ලසෙ, මෝසසේ ජෝෂුවාට අණ කළෙේ ය. ජෝෂුවා
ඒ අනුව ක්රියා කළෙේ ය. සමිඳාණන් වහන්සේ
මෝසසේට අණ කළ සියල්ලනේ කිසිවක් වත්
ජෝෂුවා ඉටු නොකර නොහැරියේ ය.

## ජෝෂුවා මුළු දේශය ම අත්කරගැනීම

16 ජෝෂුවා ඒ මුළු දේශය අත්කරගත්තේ ය.
එනම්, කඳු රට ද මුළු දකුණු දිශාව ද මුළු ගෝෂනේ
රට ද අරබා සමභූමිය ද ඉශ්රායලේ කඳු රට ද ඒ
අසල පහත රට ද 17 සේයිර්ට යන මාර්ගයහෙි
හලක් කන්ද පටන් හරෙමොන් කන්දට පහළ
ලබෙනොන් මිටියාවතේ තිබනෙ බාල්-ගාද් දක්වා මුළු
දේශය ද අත්කරගනෙ, එහි රජවරුන් ද අල්ලාගනෙ
ඔවුන්ට පහර දී මැරුවේ ය. 18 එහි සියලු රජවරුන්
සමඟ ජෝෂුවා බොහෝ කල් යුද්ධ කළෙේ ය.
19 හිව්වරුන් විසූ ගිබියොන් නගරය හැර අන් කිසි
නගරයක් ඉශ්රායලේවරුන් සමඟ සාමදාන නො වී
ය. සසෙු නගර සියල්ල ම ඔව්හු යුද්ධයනේ
අල්ලාගත්තෝ ය. 20 ද්වි.නී. 7:16ඉශ්රායලේවරුන්
සමඟ සටනට එළඹීමට ඔවුන්ගේ සිත් දැඩි කිරීම
සමිඳාණන් වහන්සේ ම අදහස් කළ දයෙකි. මසෙේ
කළෙේ, ඔවුන් කිසි දයාවක් නොලබා සහමුලින් ම
විනාශකර දමනු ලබන පිණිස ය. මේ වනාහි
සමිඳාණන් වහන්සේ මෝසසේට අණ කළ දේ ය.
21 ඒ කාලයහෙි ජෝෂුවා අවුත් කඳු රටින් ද
හබේරොන් කරෙනේ ද දබේර් කරෙනේ ද අනාබ්
කරෙනේ ද මුළු ජුදා කඳු රටනේ ද මුළු ඉශ්රායලේ
කඳු රටනේ ද ආනාක් නම් යෝධයන් නැතිකර
දැමුවේ ය. ජෝෂුවා ඔවුන්ගේ නගර සමඟ ඔවුන්

මුළුමනින් ම විනාශ කරදැමුවේ ය. 22 ඉශ්රායලේ
ජනයාගේ දේශයෙහි අනාක්වරු එක් කෙනෙකේ වත්
ඉතිරි නොවූ හ. ගාසාහි ද ගාත්හි ද අෂ්දෝදෙහි ද
පමණක් ඔව්හු ඉතිරි ව සිටියෝ ය.
23 මෙසේ සමිඳාණන් වහන්සේ මෝසෙස්ට වදාළ
සියල්ල ලෙසෙ ජෝෂුවා මුළු දේශය අල්ලාගෙන,
ඉශ්රායලේවරුන්ගේ ගෝත්ර අනුව එය කොටස්වලට
බෙදා, ඔවුන්ට උරුම කොට දුන්නේ ය. ඉන්පසු
යුද්ධයෙන් තොර ව සාමය ඇති විය.

### මෝසෙස් පරාජය කළ රජවරුන්

12 ගණන් 21:21-35; ද්වි.නී. 2:26—3:11
නැගෙනහිරට ජෝර්දානයේ එගොඩ
අර්ණෝන් ඔය පටන් හෙර්මොන් කන්ද දක්වා ද මුළු
නැගෙනහිර අරබා සමභූමියට ද ඉශ්රායලේ සෙනඟ
පහර දී හිමි කරගත්තෝ ය. ඒ දේශයේ රජවරු
මොවුහු ය. 2 හෙෂ්බොන්හි විසූ අමෝරිවරුන්ගේ
රජ වූ සීහොන් ය. ඔහු අර්ණෝන් ඔය අද්දර
තිබෙනෙ අරෝයෙරේ පටන් ද මිටියාවත මැද තිබෙනෙ
නුවර පටන් ද අම්මොන් වැසියන්ගේ සීමාව වන
ජබ්බොක් ඔය දක්වා ගිලියද් අර්ධයක් කරෙහි ද
3 නැගෙනහිරට කින්නරෙතේ මුහුද දක්වාත්, බෙත්-
ජෙෂිමොත්ට යන මාර්ගයෙහි පිස්ගා පාමුලට පහළින්
දකුණු දිශාවට තිබෙනෙ ලුණු මුහුද වන අරබා
සමභූමියෙහි මුහුද දක්වාත් නැගෙනහිරට තිබෙනෙ
අරබා සමභූමිය කරෙහි ද ආණ්ඩු කළේ ය.
4 රෙෆායිම් යන යෝධයන්ගෙනේ ඉතිරි ව සිටි
බාෂාන්හි රජ වූ ඕග්ගේ පළාතටත් ඔව්හු පහර දී
එය හිමි කරගත්තෝ ය. ඕග් වූකලී අෂ්ටාරොත්හිත්,
එද්රයෙහිත් වාසය කළේ ය. 5 ඔහු හෙර්මොන්
කන්ද ද සල්කා ද ගෙෂුර්වරුන්ගේ සහ
මයකාත්වරුන්ගේ සීමා දක්වා මුළු බාෂාන් ද
හෙෂ්බොන්හි රජ වූ සීහොන්ගේ සීමාව දක්වා ද
ගිලියද් අර්ධයක් ද කරෙහි ආණ්ඩු කළේ ය.
සමිඳාණන් වහන්සේගේ මෙහෙකරු මෝසෙස් ද
ඉශ්රායලේ සෙනඟ ද ඔවුන්ට පහර දුන්නෝ ය.
6 ගණන් 32:33; ද්වි.නී. 3:12 සමිඳාණන්
වහන්සේගේ මෙහෙකරු වූ මෝසෙස් ඒ රට
රූබන්වරුන්ටත්, ගාද්වරුන්ටත්, මනස්සෙගේ අර්ධ
ගෝත්රයටත් උරුම කොට දුන්නේ ය.

### ජෝෂුවා පරාජය කළ රජවරුන්

7 බස්නාහිරට ජෝර්දානයේ මෙගොඩ ලෙබනොන්
මිටියාවතේ තිබෙනෙ බාල්-ගාද් පටන් සේයිර්ට නඟින
මාර්ගයෙහි හලක් කන්ද දක්වා වූ දේශයට ජෝෂුවා
සහ ඉශ්රායලේ සෙනඟ පහර දුන්නෝ ය. ජෝෂුවා
ඉශ්රායලේවරුන්ගේ ගෝත්ර අනුව ඒ දේශය
කොටස් කර බෙදා ඔවුන්ට හිමිකර දුන්නේ ය.
8 මේ දේශය කඳු රටෙහි ද පහත රටෙහි ද අරබා
සමභූමියෙහි ද කඳු බෑවුම් ළඟ ද කාන්තාරයෙහි ද
දකුණු දිශාවෙහි ද වාසය කළ හිත්තීවරුන්ටත්,
අමෝරිවරුන්ටත්, කානානිවරුන්ටත්, පෙරෙස්සිවරුන්ටත්,
හිව්වරුන්ටත්, ජෙබුසිවරුන්ටත් අයිති ව තිබිණි.
9 පරාජය කරන ලද රජවරු මොවුහු ය. ජෙරිකෝවේ
රජ; බෙතෙලේ අසල ආයිහි රජ; 10 ජෙරුසලමේ රජ;
හෙබ්රොන්හි රජ; 11 ජර්මූත්හි රජ; ලාකීෂ්හි රජ;
12 එග්ලොන්හි රජ; ගෙෂෙරේහි රජ; 13 දබීර්හි රජ;
ගෙඩෙරේහි රජ; 14 හොර්මාහි රජ; අරාද්හි රජ;
15 ලිබ්නාහි රජ; අදුල්ලාහි රජ; 16 මක්කේදාහි රජ;
බෙතෙලේහි රජ; 17 තප්පුවාහි රජ; හේපෙරේහි රජ;
18 අපෙක්හි රජ; ලෂ්-ෂාරොන්හි රජ; 19 මාදොන්හි
රජ; හාශොරේහි රජ; 20 ෂිම්රොන්-මෙරොන්හි රජ;
අක්ෂාෆ්හි රජ; 21 තයනාක්හි රජ; මගිද්දෝහි රජ;
22 කදෙෂ්හි රජ; කර්මලේට අයිති ජොක්නෙයාම්හි
රජ; 23 දෝර් කඳුකරයේ දෝර්හි රජ; ගිල්ගාල්හි විසූ
ගොයිම්හි රජ හා 24 තිර්සාහි රජ ය. සියලු රජවරු
තිස්එක්දෙනෙක් වූ හ.

### යටත් කරගැනීමට ඇති තවත් ප්රදේශ

13 ජෝෂුවා මහලු ව, වයෝවෘද්ධ ව සිටියේ ය.
සමිඳාණන් වහන්සේ ඔහුට කතා කොට
මෙසේ වදාළ සේක: “නුඹ මහලු ව, වයෝවෘද්ධ ව
සිටින්නෙහි ය; හිමි කරගැනීමට දේශයෙනේ විශාල
කොටසක් තව ම ඉතිරි ව තිබේ. 2 ඉතිරි ව තිබෙනෙ
ප්රදේශ නම් මේවා ය. පිලිස්තිවරුන්ගේ සියලු
ප්රදේශ හා ගෙෂුර්වරුන්ගේ සියලු ප්රදේශ වේ.
එනම්, මිසරයට නැගෙනහිරනේ තිබෙනෙ ෂිහොර් සිට
උතුරේ එක්රොන් දක්වා කානානිවරුන්ගේ පළාත්
වශයෙනේ ගැණෙනෙ ප්රදේශ ය.
3 “ඒ ප්රදේශයේ ගාසාවේ ද අෂ්දෝදෙහි ද
අෂ්කලෝන්හි ද ගාත්හි ද එක්රොන්හි ද
පිලිස්තිවරුන්ගේ අධිපතීහු පස්දෙනා විසූ හ. තවද,
අව්විම් පළාත ද එයට අයිති ය. 4 දකුණු දිශාවේ ද
සීදොන්වරුන්ට අයිති වූ මෙයාරාහි පටන් අපෙක්
දක්වා අමෝරිවරුන්ගේ සීමාව තෙක්
කානානිවරුන්ගේ මුළු දේශයත්, 5 ගෙබල්වරුන්ගේ
දේශයත්, නැගෙනහිරට හෙර්මොන් කන්ද පහළින්
තිබෙනෙ බාල්-ගාද් පටන් හමාත්ට ඇතුළු වන තැන
දක්වා මුළු ලෙබනොන් ප්රදේශයත් ය. 6 ගණන්
33:54ලෙබනොන් පටන් මිස්රෙපොත්-මායිම් දක්වා
කඳු රටේ සියලු වැසියන් වන සියලු සීදොන්වරුන්
මම ඉශ්රායලේ ජනයා ඉදිරියෙනේ පන්නාදමන්නෙමි.
මා නුඹට අණ කළ හැටියට පස ඇට දමා ඒ
ප්රදේශය ඉශ්රායලේවරුන්ට උරුමයක් වශයෙනේ
බෙදා දෙන්න. 7 එබැවින් දැන් මේ දේශය ද ගෝත්ර
නවයටත්, මනස්සෙගේ අර්ධ ගෝත්රයටත් බෙදා
දෙන්න.”

### ජෝර්දානයේ නැගෙනහිර ගෝත්රවල උරුමය

8 ගණන් 32:33; ද්වි.නී. 3:12 මනස්සෙගේ සෙසු
අර්ධ ගෝත්රයටත්, රූබන්වරුන්ටත්, ගාද්වරුන්ටත්
සමිඳාණන් වහන්සේගේ මෙහෙකරු මෝසෙස්
ජෝර්දානයේ නැගෙනහිර ප්රදේශය උරුම කොට
දුන්නේ ය. 9 ඒ ප්රදේශය අර්ණෝන් ඔය අද්දර
තිබෙනෙ අරෝයෙරේ පටන් ද මිටියාවත මැද තිබෙනෙ
නුවර පටන් ද දීබොන් දක්වා තිබෙනෙ මෙදෙබාහි මුළු

සමභූමිය දක්වා පැතිර තිබිණි. 10 ඒ ප්‍රදේශයට
හෙෂ්බොන්හි රජකම් කළ අමෝරිවරුන්ගේ රජ වූ
සීහොන්ට, අම්මොන්වරුන්ගේ සීමාව දක්වා අයිති ව
තිබුණු සියලු නගර ද 11 ගිලියද් ද ගෙෂූර්වරුන්ගේත්,
මයකාත්වරුන්ගේත් පළාත ද මුළු හර්මොන්
කඳුකරය ද 12 තවද, අෂ්ටාරොත්හිත්, එද්රයෙහිත්
රජකම් කළ බාෂාන්හි ඕග් රජුගේ රාජ්‍යය ද
සලකා දක්වා ඇතුළත් ය. ඕග් රෆායිම්
යෝධයන්ගෙන් ඉතිරි ව සිටි කෙනෙකි. මෝසෙස්
ඔවුන්ට පහර දී ඔවුන් පන්නාදැමුවේ ය. 13 එසේ වී
නමුත්, ඉශ්‍රායෙල් සෙනඟ ගෙෂූර්වරුන් ද
මයකාත්වරුන් ද පන්නා නොදැමුවෝ ය. ගෙෂූර්වරු ද
මයකාත්වරු ද අද දක්වා ඉශ්‍රායෙල්වරුන් අතරෙහි
වාසය කරති.
14 ද්වි.නී. 18:1 මෝසෙස් ලෙවී ගෝත්‍රයට පමණක්
කිසි උරුමයක් නුදුන්නේ ය. ඔහු ඔවුන්ට කී පරිදි,
ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේට
ගින්නෙන් ඔප්පු කරන පූජා ඔවුන්ගේ උරුමය වීය.

## රූබන් ගෝත්‍රයට දුන් ප්‍රදේශ

15 මෝසෙස් රූබන්වරුන්ගේ ගෝත්‍රයට ඔවුන්ගේ
පවුල්වල හැටියට උරුමයක් දී තිබුණේ ය.
16 ඔවුන්ගේ පළාත නම්, අර්ණොන් ඔය අද්දර
තිබෙන අරෝයෙර් පටන් ද මිටියාවත මැද තිබෙන
නුවර පටන් ද මෙදේබා ළඟ තිබෙන මුළු තැනිතලා ද
17 හෙෂ්බොන් හා ඊට අයිති තැනිතලාවේ තිබෙන
සියලු නගර වන දීබොන් ද බමොත්-බාල් ද බෙත්-
බාල්මෙයොන් ද 18 ජාහශ් ද කෙදේමොත් ද මෙෆාත්
ද 19 කිරියාතයිම් ද සිබ්මා ද මිටියාවතේ කන්දෙහි
තිබෙන ශෙරෙත්-ෂහර් ද 20 බෙත්-පයෝර් ද
පිස්ගාහි කඳු බෑවුම් ද බෙත්-ජෙසිමොත් ද
21 තැනිතලාවේ සියලු නගර ද හෙෂ්බොන්හි රජකම්
කළ අමෝරිවරුන්ගේ රජ වූ සීහොන්ගේ මුළු
රාජ්‍යය ද යන මේවා ය. සීහොන් රජුට සහ
දේශයේ වාසය කළ ඔහුගේ අමාත්‍යයන් ව සිටි
මිදියන්හි අධිපතීන් වන එවීටත්, රකෙමේටත්,
ශුර්ටත්, හුර්ටත්, රබොටත් මෝසෙස් පහර දුන්නේ
ය. 22 ඉශ්‍රායෙල් සෙනඟ විසින් කඩුවෙන් මරන
ලද්දවුන් අතරේ බයෝර්ගේ පුත් බාලාම් නම්
පේන කියන්නා ද විය. 23 රූබන් ගෝත්‍රයේ දේශ
සීමාවේ මායිම ජෝර්දාන් ගඟ විය. මේවා වනාහි
රූබන් ගෝත්‍රයේ පවුල්වලට උරුම කර දුන් නගර
හා ගම් ය.

## ගාද්වරුන්ගේ ගෝත්‍රයට දුන් ප්‍රදේශ

24 මෝසෙස් ගාද්වරුන්ගේ ගෝත්‍රයට ඔවුන්ගේ
පවුල්වල හැටියට උරුමයක් දී තිබුණේ ය.
25 ඔවුන්ගේ පළාත ජාශරේ ද ගිලියද්හි සියලු නගර
ද රබ්බා ඉදිරිපිට තිබෙන අරෝයෙර් දක්වා
අම්මොන්වරුන්ගේ රටෙන් දෙකෙන් කොටස ද
26 හෙෂ්බොන් පටන් රාමත්-මිශ්පේ සහ බෙතෝනිම්
දක්වාත් මහනයිම් පටන් දබීර් සීමාව දක්වාත්
තිබෙන පළාත් ද 27 හෙෂ්බොන්හි රජ වූ
සීහොන්ගේ රාජ්‍යයෙන් ඉතිරි කොට්ඨාශය වන
මිටියාවතේ තිබෙන බෙත්-හාරාම් ද බෙත්-නිම්රා ද
සුක්කොත් ද ශාපොන් ද නැඟෙනහිරට ජෝර්දානෙන්
එගොඩ කින්නරෙත් මුහුදේ කෙළවර දක්වාත්
ජෝර්දාන් සහ සීමාව ද යන මේ ය. 28 මේවා
වනාහි ගාද් ගෝත්‍රයේ පවුල්වලට උරුම කර දෙන
ලද නගර හා ගම් ය.

## මනස්සේ අර්ධ ගෝත්‍රයට දුන් ප්‍රදේශ

29 මෝසෙස් මනස්සේ අර්ධ ගෝත්‍රයටත්
ඔවුන්ගේ පවුල්වල හැටියට උරුමයක් දුන්නේ ය.
30 ඔවුන්ගේ පළාත නම්, මහනයිම් පටන් මුළු
බාෂාන් වන බාෂාන්හි රජ වූ ඕග් රජුගේ මුළු
රාජ්‍යයත් බාෂාන්හි තිබෙන ජායිර්ගේ සියලු නගර
එනම්, නගර හැටකුත් ය. 31 ගිලියද් දේශයෙන්
අර්ධයක් ද බාෂාන්හි තිබෙන ඕග් රජුගේ රාජ්‍යයේ
නගර වන අෂ්ටාරොත් ද එද්රයි ද මනස්සේගේ
පුත් මාකීර්ගේ පුත්‍රයන්ට එනම්, මාකීර්ගේ
පුත්‍රයන්ගෙන් දෙකෙන් කොටසකට තමන්ගේ
පවුල්වල හැටියට උරුම ලැබුණේ ය.
32 මෝසෙස් විසින් ජෝර්දානෙන් එගොඩ,
ජෙරිකෝවට නැඟෙනහිරෙන් තිබූ මෝවබ්
තැනිතලාවල දී උරුම වශයෙන් බෙදා දෙන ලද
කොටස් ඉහත කී ඒවා ය. 33 ගණන් 18:20; ද්වි.නී.
18:2මෝසෙස් ලෙවී ගෝත්‍රයට පමණක් කිසි
උරුමයක් නුදුන්නේ ය. ඔහු ඔවුන්ට කී පරිදි,
ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ
ඔවුන්ගේ උරුමය වූ සේක.

## කානාන් දේශය ආදූ දා බෙදීම

14 ඉශ්‍රායෙල් සෙනඟට කානාන් දේශයෙන්
ලැබූ උරුම කොටස් මේවා ය. පූජක
එලයාසර් ද නූන්ගේ පුත් ජෝෂුවා ද ඉශ්‍රායෙල්
ජනයාගේ ගෝත්‍රවල පවුල් ප්‍රධානීහු ද ඒවා
ඔවුන්ට බෙදා දුන්නෝ ය. 2 ගණන් 26:52-56;
34:13සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අණ කළ පරිදි
ගෝත්‍ර නවයටත්, අර්ධ ගෝත්‍රයටත් ආදූ දැම්මෙන්
ඔවුන්ගේ උරුම ලැබුණේ ය. 3 ගණන් 32:33;
34:14-15; ද්වි.නී. 3:12-17ගෝත්‍ර දෙකටත් අර්ධ
ගෝත්‍රයටත් මෝසෙස් ජෝර්දානෙන් එගොඩ
ඔවුන්ගේ උරුමය දී තිබිණි. එහෙත්, ලෙවීවරුන්ට
ඔවුන් අතරේ උරුමයක් නොදුන්නේ ය.
4 ජෝසෙප්ගේ පරපුර මනස්සේ සහ එප්‍රායිම් යන
ගෝත්‍ර දෙකට බෙදෙන ලද්දේ ය. ලෙවීවරුන්ට
දේශයෙන් කිසි කොටසක් නොලැබුණේ ය. ඒ
වෙනුවට ජීවත් වන පිණිස නගර ද ඔවුන්ගේ ගව
පට්ටි සහ එළු බැටළු පට්ටි සඳහා තණ බිම් ද දෙන
ලද්දේ ය. 5 ඉශ්‍රායෙල් ජනයා සමිඳාණන් වහන්සේ
මෝසෙස්ට අණ කළ පරිදි කරමින් දේශය බෙදුවෝ
ය.

## කාලබේ වංශයට හෙබ්රෝන් දීම

6 ගණන් 14:30 එවිට ජුදා ගෝත්රය ගිල්ගාල්හි
සිටි ජෝෂුවා වෙත ආවෝ ය. කෙනිස්සියේ
වැසියකු වූ ජෙපුන්නේගේ පුත් කාලබේ ජෝෂුවා
අමතා මෙසේ කීවේ ය: “දෙවියන් වහන්සේට කැප
වූ මනුෂ්යයකු වූ මෝසෙස්ට සමිඳාණන් වහන්සේ
කාදෙෂ්-බර්නේයේ දී මා ගැනත්, ඔබ ගැනත් වදාළ
කාරණය ඔබ දන්නෙහි ය. 7 ගණන් 13:1-30දේශයේ
ඔත්තු බලන පිණිස සමිඳාණන් වහන්සේගේ
මෙහෙකරු වූ මෝසෙස් කාදෙෂ්-බර්නේයේ සිට මා
එවූ කල මම සතළිස් අවුරුද්දක් වයස් ව සිටියෙමි.
මම ද පෙරළා අවුත් සත්ය වාර්තාවක් ඔහුට
දුන්නෙමි. 8 එහෙත්, මා සමඟ ගිය සහෝදරයෝ
සෙනඟ තැති ගැන්නුවෝ ය. එසේ වුව ද, මම
සම්පූර්ණ ලෙසෙ මාගේ දෙවි සමිඳාණන් වහන්සේට
කීකරු වුණෙමි. 9 ගණන් 14:24මෝසෙස් ඒ දවසේ දී
දිවුරුම් දෙමින්, ‘ඔබ සම්පූර්ණ ලෙසෙ මාගේ
සමිඳාණන් වහන්සේට කීකරු වූ නිසා සැබැවින් ම
ඔබ පය තැබූ දේශය ඔබටත්, ඔබේ දරුවන්ටත්
සදාකාල උරුමයක් වන පිණිස වන්නේ ය’යි කීවේ
ය. 10 දැන් බලන්න, සමිඳාණන් වහන්සේ මෝසෙස්ට
මේ දේ වදාළ දවස සිට අද දක්වා සතළිස්පස්
අවුරුද්දක් ගත වී ඇත. ඒ වූකලී ඉශ්රායලේ සෙනඟ
පාළුකරය මැදින් ගමන් කළ කාලය ය. අද වන තුරු
සමිඳාණන් වහන්සේ මා ජීවත් කොට රක්ෂා කළ
සේක. අද මම අසූපස් අවුරුද්දක් වයස් ව සිටිමි.
11 මෝසෙස් මා පිටත් කර යැවූ දවසේ මෙන් ම
අදත් මම ශක්තිමත් ව සිටිමි. යුද්ධ කරන්නටත්
කොයි දේ කරන්නටත් ඒ කාලයේ තිබුණාක් මෙන්
ම දැනුත් මට ශක්තිය තිබේ. 12 සමිඳාණන්
වහන්සේ ඒ දවසේ දී සඳහන් කළ මේ කඳුකර
පළාත මට දුන මැනවි. එහි අනාක්වරුන් සිටින බව ද
පවුරු ඇති මහ නගර තිබෙන බව ද ඔබට ඒ දවසේ
දී අපි කීවෙමු. සමිඳාණන් වහන්සේ වදාළ පරිදි
සමහර විට උන් වහන්සේ මා සමඟ සිටිනු ඇත.
එවිට මම ඔවුන් පන්නාදමමි.
13 ජෝෂුවා ජෙපුන්නේගේ පුත් කාලබේට
ආශීර්වාද කොට, ඔහුට හෙබ්රෝන් නුවර උරුම
කොට දුන්නේ ය. 14 එබැවින් කෙනෙසේසියේ
වැසියකු වූ ජෙපුන්නේගේ පුත් කාලබේ සම්පූර්ණ
ලෙසෙ ඉශ්රායලේවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේට කීකරු වූ නිසා හෙබ්රෝන් අද දවස
දක්වා ඔහුගේ උරුමය ව තිබේ. 15 මීට පළමුවෙනේ
හෙබ්රෝන් නගරයේ නම කිරියත්-අර්බා ය. අර්බා
වනාහි අනාක්වරුන් අතර සිටි ඉතා ශ්රේෂ්ඨ
තැනැත්තා ය. යුද්ධයෙනේ තොර ව රටේ සාමදානය
ඇති විය.

## ජුදා ගෝත්රයට දුන් ප්රදේශ

15 ජුදා ගෝත්රයට ඔවුන්ගේ පවුල් ගණන
අනුව ලැබුණු කොටස, දකුණෙහි ඒදොම්
සීමාව වන ශීන් පාළුකරයේ දකුණු සීමාන්තය දක්වා
ම පිහිටා තිබිණි. 2 ඔවුන්ගේ දකුණු සීමාන්තය මළ
මුහුදේ කෙළවර වන, දකුණට හැරී තිබෙනෙ වරාය
පටන්, 3 අක්රාබිම්හි නැඟුමට දකුණෙනේ වැටී ශීන්
දක්වා ගොස්, කාදෙෂ්-බර්නේයට දකුණෙනේ නැඟී
හෙෂ්රෝන්ට ගොස්, අද්දාර්ට නැඟී කර්කා දෙසට
හැරී ගොස්, 4 අශ්මොන්ට පැමිණ, මිසරයේ ඔය
දක්වාත් තිබිණි. ඒ සීමාව මුහුද ළඟ කෙළවර විය.
මෙයෙ ජුදා ගෝත්රයේ දකුණු සීමාව විය.
5 නැගෙනෙහිර සීමාව ජෝර්දාන් ගඟේ මෝය
දක්වා වන මළ මුහුද ය. උතුරු පැත්තේ සීමාව
ජෝර්දාන් ගඟේ කෙළවරහි වන මුහුදේ වරාය සිට
ය. 6 මේ සීමාව බෙත්-හොග්ලාට නැඟී, බෙත්-
අරබාට උතුරෙනේ ගොස් රූබන්ගේ පුත් බොහන්ගේ
ගල ළඟට නැඟී, 7 ආකොරේ මිටියාවතෙනේ දබීර්ට
නැඟී, ඔයට දකුණෙනේ තිබෙනෙ අදුම්මිම්හි නැඟුම
ඉදිරිපිට තිබෙනෙ ගිල්ගාල් දෙසට උතුරට හැරී ගොස්,
එතැනින් ඒන්-ෂෙමෙෂ්හි ජල ළඟට ගොස්, ඒන්-
රොගෙලේ ළඟ කෙළවර වුණේ ය. 8 එතැනින් සීමාව
ජෙබුසිවරුන් වාසය කළ ජෙරුසලමට දකුණු
පැත්තෙනේ හින්නොම්ගේ පුත්රයන්ගේ මිටියාවත
මැදින් නැඟී ගොස්, හින්නොම්ගේ මිටියාවත
ඉදිරිපිට බස්නාහිරෙනේ ද රෙපොයිම්වරුන්ගේ
මිටියාවතට උතුරෙනේ තිබෙනෙ කන්ද මුදුන දක්වා වැටී
තිබිණි. 9 සීමාව කන්ද මුදුනේ සිට නෙප්තොවාහි
දිය උල්පතට එතැනින් එප්රොන් කන්දේ නගර
දක්වා වැටී ගියේ ය. එතැනින් කිරියත්-ජෙයාරීම් වන
බාලාට ගොස්, 10 බාලා සිට බස්නාහිරට හැරී
සේයිර් කන්දට ද එතැනින් කෙසාලොන් වන
ජෙයාරීම් කන්දට උතුරු පැත්තෙනේ ද ගොස් බෙත්-
ෂෙමෙෂ්ට බැස තිම්නා දක්වා විය. 11 එතැනින්
සීමාව එක්රොන්ට උතුරු පැත්තෙනේ ගොස් ෂික්-
කරොන්ට වැටී එතැනින් බාලා කන්දට ගොස්
ජබ්නයෙලේට වැටී, මධ්යධරණී මුහුද ළඟ කෙළවර
වුණේ ය. 12 බස්නාහිර සීමාව මධ්යධරණී මුහුදත්
එහි වෙරළත් ය. ජුදා ගෝත්රයේ පවුල්වලට දී
තිබුණ ප්රදේශය වටේට වූ සීමාව මෙයෙ විය.

## කාලබේ හෙබ්රෝන් අල්ලාගැනීම

(විනි 1:11-15)

13 විනි 1:20 සමිඳාණන් වහන්සේ තමාට අණ කළ
පරිදි ජෝෂුවා ජෙපුන්නේගේ පුත් කාලබේට ජුදා
ජනයා අතර කොටසක් දුන්නේ ය. එය හෙබ්රෝන්
නම් වූ කිරියත්-අර්බා ය. අර්බා අනාක්වරුන්ගේ පියා
ය. 14 කාලබේ, අනාක්ගෙනේ පැවත ආ ෂේෂයි ද
අහීමාන් ද තල්මයි ද යන අනාක්ගේ පුත්රයන්
තුන්දෙනා එතැනින් පන්නා දැමුවේ ය. 15 එතැනින්
ඔහු දබීර් වැසියන්ට විරුද්ධ ව ගියේ ය. කලින්
දබීර්ට කිරියත්-සේපෙරේ යන නම තිබුණේ ය.
16 කාලබේ කතා කොට, “කිරියත්-සේපෙරේට පහර දී
එය අල්ලාගන්න තැනැත්තාට මාගේ දුව වන අක්සා
භාර්යාව වශයෙනේ පාවා දෙන්නෙමි”යි කීවේ ය.
17 කාලබේගේ සහෝදරයා වන කෙනෙස්ගේ පුත්
ඔත්නියලේ එය අල්ලාගත්තේ ය. කාලබේ තමාගේ
දුව වන අක්සා ඔහුට භාර්යාව වශයෙනේ පාවා

දුන්නේ ය. 18 ඈ ඔත්නියෙල් වෙත පැමිණි කල
ඇගේ පියාගෙන් කෙතක් ඉල්ලන ලෙස ඔහු ඈට
පෙරැත්ත කළේ ය. ඈ කාලෙබ් වෙත ගොස්
කොටළුවා පිටින් බැස්ස විට, “ඔබට ඕනෑ කුමක්
දැ”යි කාලෙබ් ඇසී ය. 19 ඈ පිළිතුරු දමින්, “මට
වරයක් දුන මැනවි; ඔබ වියළි රටක් වන නෙගෙබ්
රට මට දී තිබෙන බැවින් දිය උල්පත් ද මට දුන
මැනව”යි කීවා ය. එවිට ඔහු ඉහළ උල්පත් ද පහළ
උල්පත් ද ඈට දුන්නේ ය.

## ජුදා රටේ නගර

20 ජුදා ජනයාගේ ගෝත්‍රයට ඔවුන්ගේ පවුල්
ගණන අනුව ලැබුණ උරුමය මේ ය. 21 දකුණු
දිශාවෙහි ඒදොම්හි සීමාව දක්වා ජුදා ජනයාගේ
ගෝත්‍රයට තිබුණු ඉතා දුර වූ නගර නම්:
කබ්ශයෙල් ද ඒදෙර් ද ජාගුර් ද 22 කීනා ද දිමෝනා
ද අදාදා ද 23 කදෙෂ් ද හාශෝර් ද ඉත්නාන් ද
24 ශීප් ද තෙලෙම් ද බයොලොත් ද 25 හාශෝර්-
හදත්තා ද කෙරියොත්-හෙශ්රොන් වන හාශෝර් ද
26 ආමාම් ද ෂෙමා ද මෝලාදා ද 27 හශර්ගද්දා ද
හෙෂ්මොන් ද බෙත්-පලෙත් ද 28 හෂර්-ෂුවාල් ද
බයෙර්-ෂෙබා ද බිස්යෝතියා ද 29 බාලා ද ඉයිම් ද
එශෙම් ද 30 එල්තෝලද් ද කසීල් ද හොර්මා ද
31 ශික්ලග් ද මද්මන්නා ද සන්සන්නා ද
32 ලබොයොත් ද ෂිල්හිම් ද ආයින් ද රිම්මොන් ද
යන මේවා ය. ගම් සහිත ව සියලු නගර විසිනවයක්
ය.
33 තැනිතලා රටෙහි තිබුණු ඒවා නම්: එෂ්තායොල්
ද ශෝරා ද අෂ්නා ද 34 ශානොවා ද ඒන්-ගන්නීම් ද
තප්පුවා ද ඒනාම් ද 35 ජර්මූත් ද අදුල්ලාම් ද
සෝකෝ ද අශේකා ද 36 ෂයරයිම් ද අදීතයිම් ද
ගදේරා ද ගදේරෝතයිම් ද යන නගර දහසතර
සහ ඒවායේ ගම් ද යන මේවා ය.
37 ශෙනාන් ද හදාෂා ද මිග්දල්-ගාද් ද 38 දිල්යාන් ද
මිශ්පේ ද ජොක්තයෙල් ද 39 ලාකීෂ් ද බොශ්කාත්
ද එග්ලොන් ද 40 කබ්බොන් ද ලාමාම් ද කිත්ලීෂ් ද
41 ගදේරොත් ද බෙත්-දාගොන් ද නාමා ද
මක්කේදා ද යන නගර දහසය සහ ඒවායේ ගම් ද
යන මේවා ය.
42 ලිබ්නා ද ඒතෙර් ද ආෂාන් ද 43 ඉප්තා ද අෂ්නා
ද නේශීබ් ද 44 කයෙලා ද අක්ශීබ් ද මරේෂා ද යන
නගර නවය සහ ඒවායේ ගම් ද යන මේවා ය.
45 එක්රොන් ද ඊට අයිති නගර සහ ගම් ද යන
මේවා ය. 46 එක්රොන් පටන් බස්නාහිරට
මධ්‍යධරණි මුහුද දක්වා අෂ්දොද් ළඟ තිබෙන සියලු
නගර සහ ඒවායේ ගම් ය.
47 අෂ්දොද් ද ඊට අයිති නගර සහ ගම් ද යන
මේවා ය. මිසරයේ ඔය සහ මධ්‍යධරණි මුහුදත්
එහි අසබඩත් දක්වා ගාසා ද ඊට අයිති නගර සහ
ගම් ද යන මේවා ය.
48 කඳු රටේ තිබුණු ඒවා නම්: ෂාමීර් ද ජත්තීර් ද
සෝකෝ ද 49 දන්නා ද දබීර් වන කිරියත්-සන්නා ද
50 අනාබ් ද එෂ්තමෝ ද ආනිම් ද 51 ගෝෂෙන් ද
හෝලොන් ද ගිලෝ ද යන නගර එකොළහ සහ
ඒවායේ ගම් ද යන මේවා ය.
52 අරාබ් ද දූමා ද එෂාන් ද 53 ජානීම් ද බෙත්-
තප්පුවා ද අපේකා ද 54 හුම්තා ද හෙබ්රොන් නම්
වූ කිරියත්-අර්බා ද ශීයෝර් ද යන නගර නවය ද
ඒවායේ ගම් ද යන මේවා ය.
55 මායොන් ද කර්මෙල් ද ශිප් ද ජුතා ද
56 ජශ්රයෙල් ද ජොක්දෙයාම් ද ශානොවා ද
57 කායින් ද ගිබයා ද තිම්නා ද යන නගර දසය
සහ ඒවායේ ගම් ද යන මේවා ය.
58 හල්හුල් ද බෙත්-ශූර් ද ගදෝර් ද 59 මාරාත් ද
බෙත්-අනොත් ද එල්තෙකොන් ද යන නගර හය
සහ ඒවායේ ගම් ද යන මේවා ය.
60 කිරියත්-ජයොරිම් වන කිරියත්-බාල් ද රබ්බා ද
යන නගර දෙක සහ ඒවායේ ගම් ය.
61 පාළුකරයේ තිබුණ ඒවා නම්: බෙත්-අරබා ද
මිද්දීන් ද සකොකා ද 62 නිබ්ෂාන් ද ලුණු නුවර ද
ඒන්-ගෙදී ද යන නගර හය සහ ඒවායේ ගම් ය.
63 වීරා 1:21; 2 සාමු 5:6; 1 වංශා 11:4 එහෙත්,
ජෙරුසලමේ වාසය කළ ජබුසිවරුන් පන්නාදමන්නට
ජුදා ජනයාට නොහැකි විය. අද දවස දක්වා
ජබුසිවරු ජුදා ජනයා සමඟ ජෙරුසලමෙහි වාසය
කරති.

## එප්‍රායිම් ගෝත්‍රයට දුන් ප්‍රදේශය

16 ජෝසෙප්ගේ පරපුරට පැවරුණු කොටසේ
සීමාව නැගෙනහිර පාළුකරය ළඟ තිබෙන
ජෙරිකෝවේ ගඟ ළඟ ජෙරිකෝව ඉදිරිපිට තිබෙන
ජොර්දානේ පටන් ජෙරිකෝවෙන් කඳු රට මැදින්
බෙතෙල්ට නැඟී ගොස් 2 බෙතෙල් සිට ලූස්ට ගොස්,
අර්කිවරුන්ගේ සීමාවේ අතාරෝත්ට පැමිණ
3 එතැනින් බස්නාහිරට ජප්ලේතිවරුන්ගේ සීමාවටත්
පහළ බෙත්-හෝරොන් සීමාවටත්, ගෙශෙරේටත් බැස
ගොස්, මධ්‍යධරණි මුහුද ළඟ කෙළවර වුණේ ය.
4 මනස්සේ සහ එප්‍රායිම් යන ජෝසෙප්ගේ
පුත්‍රයෝ මෙසේ තමන්ගේ උරුමය ලැබූ හ.
5 එප්‍රායිම් පෙළෙපතේ සීමාව ඔවුන්ගේ පවුල්
ගණන අනුව මෙසේ විය. නැගෙනහිරට ඔවුන්ගේ
උරුමයේ සීමාව අතාරොත්-අද්දාර් පටන් ඉහළ බෙත්-
හෝරොන් දක්වා ය; 6 උතුරු සීමාව මික්මතොත් සිට
මධ්‍යධරණි මුහුදට විය. එතැනින් සීමාව
නැගෙනහිරට හැරී තානත්-ශීලෝ ළඟට ගොස්,
ජනෝවාට නැගෙනහිරින් එය පසු කර වැටී තිබිණි.
7 ජනෝවාවෙන් අතාරෝත්ටත්, නාරාටත් බැස
ජෙරිකෝවට පැමිණ ජොර්දාන දක්වා වැටී තිබිණි.
8 තප්පුවා සිට සීමාව බස්නාහිර දසෙ කානා ඔයට
ගොස් මධ්‍යධරණි මුහුද ළඟ කෙළවර වුණේ ය.
එප්‍රායිම් ගෝත්‍රයට ඔවුන්ගේ පවුල් ගණන අනුව
තිබුණු උරුමය වනාහි 9 එය සහ මනස්සේගේ
ගෝත්‍රයේ උරුමය තුළ එප්‍රායිම් ගෝත්‍රයට වෙන්
කරන්නට යෙදුණු ඒවායේ සියලු නගර හා ගම් ද
වේ. 10 වීරා 1:29ඔව්හු ගෙශෙරේහි වාසය කළ
කානානිවරුන් පන්නා නොදැමුවෝ ය. එහෙත්,

කානානිවරු අද දක්වා එප්‍රායිම්වරුන් අතරේ වාසය
කරමින් වහලුන් ලෙස වහල් වැඩට යටත් ව සිටිති.

## මනස්සේගේ ගෝත්‍රයට දුන් ප්‍රදේශය

17 ජෝසෙප්ගේ කුලුඳුලා වූ මනස්සේගේ
ගෝත්‍රයට ලැබුණු කොටස මේ ය.
මනස්සේගේ කුලුඳුලා වූ ගිලියද්ගේ පිය වූ මාකීර්
යුද්ධ භටයකු බැවින් ඔහුට ගිලියද් ද බාෂාන් ද
ලැබුණේ ය. 2 මනස්සේගේ අනික් පුත්‍රයන් වන
අබීයෙසෙර්ගේ පරපුරට ද හේලෙක්ගේ පරපුරට ද
අශ්‍රීයෙල්ගේ පරපුරට ද ෂෙකෙම්ගේ පරපුරට ද
හේපෙර්ගේ පරපුරට ද ෂෙමීදාගේ පරපුරට ද
ඔවුන්ගේ පවුල් ගණන අනුව කොටස් ලැබුණේ ය.
තමන්ගේ පවුල් ගණන අනුව ජෝසෙප්ගේ පුත්
මනස්සේගේ පිරිමි දරුවෝ මොවුහු ය. 3 එහෙත්,
මනස්සේගේ පුත්‍රයා වන මාකීර්ගේ පුත්‍ර වූ
ගිලියද්ගේ පුත් වන හෙපෙර්ගේ පුත්‍ර වූ
ශෙලොෆෙහාද්ට දූවරුන් මිස පුත්‍රයෝ නුවූ හ.
ඔහුගේ දූවරුන්ගේ නාම මාලා, නෝවා, හොග්ලා,
මිල්කා සහ තිර්ශා ය. 4 ගණන් 27:1-7ඔව්හු පූජක
එලෙයාසර් ද නූන්ගේ පුත් ජෝෂුවා ද ප්‍රජා
මූලිකයන් ද ඉදිරියට අවුත්, “සමිඳාණන් වහන්සේ
අපේ සහෝදරයන් අතරේ අපට උරුමයක් බෙදා
දෙන්නට මෝසෙස්ට අණ කළ සේකැ”යි කීවෝ ය.
එබැවින් ඔහු සමිඳාණන් වහන්සේගේ ආඥාව ලෙස
ඔවුන්ගේ පියාගේ සහෝදරයන් අතරෙහි ඔවුන්ට
උරුමයක් දුන්නේ ය. 5 ජොර්දානෙන් එගොඩ තිබෙන
ගිලියද් ද බාෂාන් ද හැර, මනස්සේට කොටස්
දසයක් පැවරුණේ ය. 6 මන්ද, මනස්සේගේ දූවරුන්ට
ඔහුගේ පුත්‍රයන් අතරෙහි උරුමයක් ලැබුණු හයෙනි.
මනස්සේගේ අනික් පුත්‍රයන්ට ගිලියද් දේශය හිමි
වුණේ ය.
7 මනස්සේගේ දේශ සීමාව ආෂෙර් පටන් ෂෙකෙම්
ඉදිරියෙහි තිබෙන මික්මතොත් දක්වා විය; එතැනින්
සීමාව දකුණට ඒන්-තප්පුවාහි වාසීන්ගේ දේශය
දක්වා විය. 8 තප්පුවා රට මනස්සේට අයිති විය.
එහෙත්, මනස්සේගේ සීමාවේ තිබුණු තප්පුවා
එප්‍රායිම් ගෝත්‍රයට අයිති වුණේ ය. 9 එතැනින්
සීමාව කානා ඔයට දකුණෙනේ ඔය ළඟට බැස්සේ ය.
මේ නගර මනස්සේගේ නගර අතරේ එප්‍රායිම්ට
හිමි විය. මනස්සේගේ සීමාව ඔයට උතුරෙන් වැටී
මධ්‍යධරණී මුහුද ළඟ කෙළවර වුණේ ය. 10 දකුණු
පැත්ත එප්‍රායිම්ට ද උතුරු පැත්ත මනස්සේට ද
අයිති ය; ඔහුගේ තවත් සීමාවක් මධ්‍යධරණී මුහුද
ය; ඒවාට උතුරෙන් ආෂෙර්ගේ දේශයත්,
නැගෙනහිරෙන් ඉස්සාකර්ගේ දේශයත් යාව තිබේ.
11 තවද, ඉස්සාකර්හි සහ ආෂෙර්හි බෙත්-ෂයොන්
සහ ඊට අයිති නගර ද ඉබ්ලයොම් සහ ඊට අයිති
නගර ද දෝර් වැසියන් සහ ඔවුන්ට අයිති නගර ද
ඒන්-දෝර් වැසියන් සහ ඔවුන්ට අයිති නගර ද
තයනාක් වැසියන් සහ ඔවුන්ට අයිති නගර ද
මගිද්දෝ වැසියන් සහ ඔවුන්ට අයිති නගර ද යන
උස් ප්‍රදේශ තුන මනස්සේට ලැබුණේ ය. 12 වීරා
1:27-28එහෙත්, මනස්සේගේ පුත්‍රයන්ට ඒ නගර
වැසියන් පන්නාදමන්නට නොහැකි විය; එබැවින්
කානානිවරු ඒ රටේ තමන්ගේ විසීම තහවුරු
කරගත්තෝ ය. 13 ඉශ්‍රායෙලේ ජනයා ශක්තිමත් වූ
කල ඔව්හු කානානිවරුන් වහල් වැඩට පත් කළෝ ය;
එහෙත්, ඔවුන් සහමුලින් පන්නා නොදැමූ හ.
14 ජෝසෙප්ගේ පරපුරේ අය ජෝෂුවාට කතා
කොට, “සමිඳාණන් වහන්සේ මේ දක්වා අපට
ආශීර්වාද කළ බැවින් අප විශාල සෙනඟක් ව සිටිය
දී ඔබ එක කොටසක් ද එක පංගුවක් ද පමණක්
අපට උරුම කොට දුන්නේ මන්දැ”යි ඇසූ හ.
15 ජෝෂුවා පිළිතුරු දෙමින්, “ඔබ හැම මහා
සෙනඟක් නම්, එප්‍රායිම් කඳු රට ඔබට මදි බැවින්
වනාන්තරයට ගොස් එහි පෙරිස්සිවරුන්ගේ ද
රෆායිම්වරුන්ගේ ද රටෙන් කොටසක් එළි
කරගන්නැ”යි ඔවුන්ට කීවේ ය.
16 ජෝසෙප්ගේ පරපුරේ අය කතා කොට, “කඳු
රට අපට මදි ය. මිටියාවත් රටෙහි, එනම්, බෙත්-
ෂයොන්හි ද ඊට අයිති නගරවල ද ජෙශ්‍රෙයෙලේ
මිටියාවතෙහි ද වාසය කරන සියලු කානානිවරුන්ට
යකඩ රථ තිබේ ය”යි කීවෝ ය.
17 ජෝෂුවා එප්‍රායිම් ද මනස්සේ ද යන
ජෝසෙප්ගේ පරපුරට කතා කොට, “ඔබ හැම මහා
සෙනඟක් ය; ඔබට බොහෝ බලය ඇත්තේ ය. ඔබ
හැමට ලැබෙන්නේ එක කොටසක් පමණක් නොවේ
ය. 18 කඳු රටත් ඔබට අයිති වන්නේ ය. එය
වනාන්තරයක් වුවත් ඔබ එය කපා එළි කරගන්න.
එවිට අන්තිම සීමාව දක්වා ම එය ඔබට වන්නේ ය.
කානානිවරුන්ට යකඩ රථ තිබෙන නුමුත්, ඔවුන්
ශක්තිමත් ව සිටින නුමුත්, ඔබ ඔවුන් පන්නාදමනු
ඇතැ”යි කීවේ ය.

## ඉතිරි කොටස බෙදීම

18 ඉශ්‍රායෙලේ ජනයාගේ මුළු සභාව ෂිලෝහි
රැස් ව සම්මුඛ මණ්ඩපය එහි ඉදි කළෝ ය.
මුළු දේශය දැන් ඔවුන්ට යටත් ව තිබුණේ ය.
2 තමන්ගේ උරුමය නොලැබූ ගෝත්‍ර සතක්
ඉශ්‍රායෙලේ ජනයන් අතරේ ඉතිරි ව සිටියෝ ය.
3 ජෝෂුවා ඔවුන්ට කතා කොට, “ඔබ හැමගේ
පියවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබට දී
තිබෙන දේශය හිමි කරගැනීමට යන්නට ඔබ
කොපමණ කල් ප්‍රමාද වන්නහු ද? 4 ඔබ උදෙසා
එක එක ගෝත්‍රයෙන් මනුෂ්‍යයන් තුන්දෙනෙකු
බැගින් පත් කරන්න. මම ඔවුන් යවන්නෙමි; ඔව්හු
පිටත් ව දේශයෙහි ඔබමොබ ගමන් කොට
තමන්ගේ උරුමවලට සුදුසු ලෙස ඒවා සටහන්
කරගෙන මා වෙත එන්නෝ ය. 5 ඔව්හු ඒක සත්
කොටසකට බෙදෙන්නෝ ය. ජුදා දකුණු දිග තමාගේ
සීමාව තුළ සිටී වා; ජෝසෙප්ගේ පරපුර උතුරු දිග
තිබෙන තමන්ගේ සීමාව තුළ සිටී වා. 6 ඔබ හැම
දේශය සත් කොටසකට බෙදා, එහි භූමි සටහනක්
මා ළඟට ගෙනෙන්න. මම අපේ දෙවි සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි ඔබ හැම වෙනුවට මෙහි දී පස

ඇට දමන්නමේ. 7 මන්ද, ලෙවීවරුන්ට ඔබ අතරෙහි
කොටසක් නැත; ඔවුන්ගේ උරුමය වනාහි සමිඳාණන්
වහන්සේගේ පූජක තනතුර ය. ගාද්ටත්, රූබන්ටත්,
මනස්සේගේ අර්ධ ගෝත්‍රයටත් සමිඳාණන්
වහන්සේගේ මෙහෙකරු මෝසෙස් ඔවුන්ට දුන්
ඔවුන්ගේ උරුමය නැගෙනහිරට ජෝර්දානයේ
එගොඩ ලැබී තිබේ ය”යි කීවේ ය.
8 ඒ මනුෂ්‍යයෝ පිටත් ව ගියෝ ය. ජෝෂුවා
දේශයේ භූමි සටහනක් ගැනීමට පිටත් ව යන අයට
අණ කරමින්, “ඔබ ගොස් ඒ දේශයෙහි ඇවිද එහි
භූමි සටහන් කරගෙන මා ළඟට හැරී එන්න; මම
මෙහි ෂිලෝහි දී සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි ඔබ
උදෙසා පස ඇට දමන්නමේ”යි කීවේ ය. 9 ඒ
මනුෂ්‍යයෝ දේශයෙහි ඇවිද, එය කොටස් හතකට
බෙදා, නගරයෙන් නගරයට පොතක සටහන්
කරගෙන ෂිලෝහි කඳවුරේ සිටි ජෝෂුවා ළඟට
ආවෝ ය. 10 ජෝෂුවා ඔවුන් උදෙසා ෂිලෝහි දී
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි පස ඇට දමා එහි දී
ඉශ්‍රායෙලේ ජනයාගේ කොට්ඨාශවල හැටියට දේශය
බෙදා දුන්නේ ය.

## බෙන්ජමින් ගෝත්‍රයට දුන් ප්‍රදේශය

11 බෙන්ජමින් පරපුරේ කොටස ඔවුන්ගේ පවුල්
ගණන අනුව වැටුණේ ය. ඔවුන්ගේ කොටසේ
පළාත ජුදාගේ පරපුරටත්, ජෝසෙප්ගේ පරපුරටත්
අතරේ නියම වුණේ ය. 12 උතුරු පැත්තෙහි
ඔවුන්ගේ සීමාව ජෝර්දානයේ පටන්ගෙන
ජෙරිකෝවට උතුරු පැත්තෙන් නැඟී, කඳු රට මැදින්
බස්නාහිරට ගොස්, බෙතාවෙන්හි පාළුකරය ළඟ දී
කෙළවර වුණේ ය. 13 එතැනින් සීමාව බෙතෙලේ නම්
වූ ලූස්ට ගොස්, දකුණු පැත්තෙන් ලූස් පසු කර,
පහළ බෙත්-හෝරොන්ට දකුණෙන් තිබෙන කන්දෙන්
අටාරොත්-අද්දාර් දක්වා වැටී තිබුණේ ය.
14 එතැනින් සීමාව බෙත්-හෝරොන් ඉදිරිපිට ඊට
දකුණෙන් තිබෙන කන්දෙන් දකුණට බස්නාහිර
පැත්තට හැරී ගොස්, ජුදාගේ පරපුරට අයිති
නගරයක් වූ කිරියත්-ජයොරීම් වන කිරියත්-බාල්හි
කෙළවර වුණේ ය. බස්නාහිර පැත්ත මේ ය.
15 දකුණු පැත්ත කිරියත්-ජයොරීම්හි කෙළවර සිට
පටන්ගෙන ඒ සීමාව බස්නාහිර දෙසෙ නෙප්තෝවාහි
දිය උල්පත දක්වා විය. 16 එතැනින් සීමාව
හින්නොම්ගේ පරපුරට අයිති මිටියාවත ඉදිරිපිට
රෙපායිම්වරුන්ගේ මිටියාවතෙහි උතුරට තිබෙන
කන්දේ කෙළවරට බැස, එතැනින් ජෙබුසිවරුන්ට
දකුණු පැත්තෙන් තිබෙන හින්නොම්ගේ මිටියාවතට
බැස, එතැනින් ඒන්-රෝගලේ දක්වා විය. 17 එය
උතුරෙන් ගොස් ඒන්-ෂෙමෙෂ්ටත්, එතැනින්
අදුම්මිම්හි නැඟුම ඉදිරිපිට තිබෙන ගලීලොත්ටත්
පැමිණ, එතැනින් රූබන්ගේ පුත් බොහන්ගේ ගල
දක්වා විය. 18 එතැනින් අරබා සමභූමිය ඉදිරිපිට
උතුරු පැත්තෙන් ගොස් අරබා සමභූමියට බැස,
19 එතැනින් සීමාව උතුරු පැත්තෙන් බෙත්-හොග්ලාට
ගොස්, ජෝර්දානේ දකුණු කෙළවරේ තිබෙන මළ
මුහුදේ උතුරු වරායෙහි කෙළවර වුණේ ය. දකුණු
සීමාව මේ ය. 20 එහි නැගෙනහිර පැත්තෙන් සීමාව
නම් ජෝර්දාන ය. බෙන්ජමින් පරපුරේ පවුල් ගණන
අනුව ඔවුන් වටකර සීමා හැටියට, ඔවුන්ගේ උරුමය
මේ ය.
21 බෙන්ජමින් පරපුරේ ඔවුන්ගේ පවුල් ගණන
අනුව ලැබුණ නගර නම්: ජෙරිකෝව ද බෙත්-
හොග්ලා ද ඒමෙක්-කෙශිශ් ද 22 බෙත්-අරබා ද
ශෙමොරයිම් ද බෙතෙලේ ද 23 අව්වීම් ද පාරා ද ඔෆ්රා
ද 24 කෙපෙර්-අම්මෝනී ද ඔෆ්නී ද ගෙබෝ ද යන
නගර දොළොස සහ ඒවායේ ගම් ය. 25 ගිබියොන්
ද රාමා ද බයෙරෝත් ද 26 මිශ්පේ ද කෙපීරා ද
මෝශා ද 27 රකෙමේ ද ඉර්පයෙලේ ද තරලා ද
28 ශේලා ද එලපේ ද ජෙරුසලම වන ජෙබුසීය ද
ගිබයො ද කිරියත් ද යන නගර දහසතර සහ ඒවා
යාබද ගම් ය. බෙන්ජමින් පරපුරේ පවුල් ගණන
අනුව ඔවුන්ගේ උරුමය මේ ය.

## සිමියොන් ගෝත්‍රයට දුන් ප්‍රදේශ

19 දෙ වන කොටස සිමියොන්ට, එනම්,
සිමියොන්ගේ පරපුරේ ඔවුන්ගේ පවුල්
ගණන අනුව වැටුණේ ය. ඔවුන්ගේ උරුමය ජුදා
පරපුරේ උරුමය ඇතුළත තිබුණේ ය. 2 1 වංශා
4:28-33ඔවුන්ගේ උරුමය නම්: බයෙර්-ෂෙබා හෙවත්
ෂෙබා ද මෝලාදා ද 3 හශර්-ෂුවාල් ද බාලා ද එශෙම්
ද 4 එල්තෝලද් ද බෙතුල් ද හෝර්මා ද 5 ශික්ලග් ද
බෙත්-මර්කාබොත් ද හශර්-සුසා ද 6 බෙත්-
ලබොයොත් ද ෂාරුහෙන් ද යන නගර දහතුන සහ
ඒවා යාබද ගම් ය.
7 අයින් ද රිම්මොන් ද ඒතෙර් ද ආෂාන් ද යන මේ
නගර සතර සහ ඒවායේ ගම් ය. 8 දකුණේ පිහිටි
රාමා වන බාලත්-බයෙරේ දක්වා ඒ නගර වටකර
තිබෙන ගම් සියල්ලත් ය. සිමියොන් පරපුරේ පවුල්
ගණන අනුව ඔවුන්ගේ ගෝත්‍රයේ උරුමය මේ ය.
9 සිමියොන් පරපුරේ උරුමය ජුදාගේ පරපුරේ
කොට්ඨාශයෙන් ගන්නට යෙදුණේ ය. මන්ද, ජුදා
පරපුරේ කොටස ඔවුන්ට පමණට වඩා විශාල ව
තිබුණේ ය. එබැවින් ඔවුන්ගේ උරුමය ඇතුළත
සිමියොන් පරපුරට උරුමයක් තිබුණේ ය.

## සාබුලොන් ගෝත්‍රයට දුන් ප්‍රදේශ

10 තුන් වන කොටස සාබුලොන් පරපුරේ
ඔවුන්ගේ පවුල් ගණන අනුව වැටුණේ ය. ඔවුන්ගේ
උරුමයේ සීමාව සාරීද් දක්වා විය. 11 ඔවුන්ගේ
සීමාව බස්නාහිර දෙසෙ මරාලාට නැඟී, දබ්බෂෙත්ට
ද ජොක්නෙයොම් ඉදිරියෙහි තිබෙන ඔය ළඟට ද
පැමිණියේ ය. 12 සාරීද්හි සිට සීමාව නැගෙනහිරට
හැරී කිස්ලොත්-තාබෝර් දක්වා ගොස්, එතැනින්
දාබරෙත්ට ද ජාපීයාට ද නැඟී ගියේ ය; 13 එතැනින්
නැගෙනහිර දෙසෙ ගත්-හේපෙරේට ද එත්-කාශීන්ට ද
පැමිණ, නයො දෙසට පිහිටා තිබෙන රිම්මොන්
දක්වා විය. 14 සීමාව ඊට වටකරින් උතුරට හැරී
හන්නාතොන්ට ගොස්, ඉප්තා-යෙලේ මිටියාවත ළඟ

කෙළවර වුණේ ය. 15 කට්ටාත් ද නහලාල් ද
ෂිම්රොන් ද ඉදලා ද බෙත්ලෙහෙමේ ද යනාදී නගර
දොළොසක් ද ඒවා යාබද ගම් ද තිබුණේ ය.
16 සාබුලොන්ගේ පරපුරේ පවුල් ගණන අනුව
ඔවුන්ගේ උරුමය මකේ නගර සහ ඒවායේ ගම් ය.

## ඉස්සාකර් ගෝත්‍රයට දුන් ප්‍රදේශ

17 සතර වන කොටස ඉස්සාකර්ට එනම්, ඉස්සාකර්
පරපුරේ ඔවුන්ගේ පවුල් ගණන අනුව වැටුණේ ය.
18 ඔවුන්ගේ පළාතට ජශේරයෙලේ ද කසුල්ලොත්
ද ෂූනමේ ද 19 හපාරයිම් ද ෂියොන් ද අනාහරාත් ද
20 රබ්බිත් ද කිෂියොන් ද එබශේ ද 21 රමෙතේ ද
ඒන්-ගන්නීම් ද ඒන්-හද්දා ද බෙත්-පශේශ් ද දක්වා
විය. 22 සීමාව තාබෝරේ ද ෂහශුමා ද බෙත්-ෂමෙෂේ
ද දක්වා විය. ඔවුන්ගේ සීමාව ජෝර්දාන ළඟ
කෙළවර වුණේ ය. නගර දහසයක් ද ඒවා යාබද
ගම් ද තිබුණේ ය. 23 ඉස්සාකර් පරපුරේ පවුල්
ගණන අනුව ඔවුන්ගේ ගෝත්‍රයේ උරුමය මකේ
නගර සහ ඒවායේ ගම් ය.

## ආෂෙර් ගෝත්‍රයට දුන් ප්‍රදේශ

24 පස් වන කොටස ආෂෙර් පරපුරේ ඔවුන්ගේ
පවුල් ගණන අනුව වැටුණේ ය. 25 ඔවුන්ගේ සීමාව
හලේකත් ද හලී ද බෙටෙනේ ද අක්ෂාප් ද
26 අල්ලම්මලෙකේ ද අමාද් ද මිෂාල් ද යන මේවා
ය. බස්නාහිරට සීමාව කර්මලේටත් ෂිහෝර්-
ලිබ්නාත්ටත් පැමිණියේ ය. 27 එතැනින් නැගෙනහිරට
හැරී බෙත්-දාගොන්ට ගොස්, සාබුලොන්ටත් බෙත්-
ඒමකේට සහ නයියෙලේට උතුරනේ තිබෙනෙ ඉප්තා-
යලේ මිටියාවතටත් පැමිණ, වමතට තිබෙනෙ කාබුල්
ද 28 ඒබ්රොන් ද රහොබ් ද හම්මොන් ද කානා ද
මහ සීදොන් ද දක්වා විය. 29 එතැනින් සීමාව රාමාට
හැරී, පවුරු ඇති නගර වූ තීර්ට පැමිණ, හෝස්
දසෙට හැරී අක්ෂිබ් පළාතේ පටන් ගොස්
මධ්‍යධරණී මුහුද ළඟ කෙළවර වුණේ ය. 30 උම්මා
ද අපකේ ද රහොබ් ද අඩංගු ය: නගර විසිදෙකක්
සහ ඒවා යාබද ගම් ද තිබුණේ ය. 31 ආෂෙර්
පරපුරේ පවුල් ගණන අනුව ඔවුන්ගේ ගෝත්‍රයේ
උරුමය මකේ නගර සහ ඒවායේ ගම් ය.

## නප්තලී ගෝත්‍රයට දුන් ප්‍රදේශ

32 සය වන කොටස නප්තලී පරපුරට එසේ ය,
නප්තලීගේ පරපුරට, ඔවුන්ගේ පවුල් ගණන අනුව
වැටුණේ ය. 33 ඔවුන්ගේ සීමාව හලෙප්හි සිට
ශානන්නිම්හි තිබුණ ආලෝන වෘක්ෂය පටන් අදාමි-
නගෙබේ ද ජබ්නයෙලේ ද ලක්කුම් ද දක්වා ගොස්,
ජෝර්දාන ළඟ කෙළවර වුණේ ය. 34 එතැනින්
සීමාව බස්නාහිරට හැරී අස්නොත්-තාබෝර් දසෙට
ගොස්, එතැනින් හුකොක්ට පැමිණ, දකුණනේ
සාබුලොන් ද බස්නාහිරනේ ආෂෙර් ද නැගෙනහිරනේ
ජෝර්දානේ ජුදා ද දක්වා විය. 35 පවුරු සහිත නගර
නම්: ශිද්දිම් ද ශේර් ද හම්මත් ද රක්කත් ද
කින්නරෙත් ද 36 අදාමා ද රාමා ද හාශෝර් ද
37 කදෙෂේ ද එද්රයෙයි ද ඒන්-හාශෝර් ද 38 ඉරොන්
ද මිග්දල්-යලේ ද හෝරෙමේ ද බෙත්-අනාත් ද බෙත්-
ෂමෙෂේ ද යන මේවා ය. නගර දහ නවයක් සහ
ඒවායේ ගම් ද තිබුණේ ය. 39 නප්තලීගේ පවුල්
ගණන අනුව ඔවුන්ගේ ගෝත්‍රයේ උරුමය මකේ
නගර සහ ඒවායේ ගම් ය.

## දාන් ගෝත්‍රයට දුන් ප්‍රදේශ

40 සත් වන කොටස දාන් පරපුරේ ඔවුන්ගේ පවුල්
ගණන අනුව වැටුණේ ය. 41 ඔවුන්ගේ උරුමයේ
පළාත නම්, ශෝරා ද එෂ්තායොල් ද ඊර්-ෂමෙෂේ ද
42 ෂාලබ්බින් ද ආයාලොන් ද ඉත්ලා ද 43 ඒලොන් ද
තිම්නා ද එක්රොන් ද 44 එල්තකෙේ ද
ගිබ්බතොන් ද බාලාත් ද ජහුද් ද 45 බෙනේ-
බරෙක් ද ගත්-රිම්මොන් ද 46 මේ-ජර්කොන් ද
ජොප්පාව ඉදිරිපිට තිබෙනෙ පළාත ඇතුළු ව
රක්කොන් ද යන මේවා ය. 47 විනි. 18:27-29දාන්
පරපුරේ පළාත ඔවුන්ට අහිමි වූ නිසා, ඔව්හු ගොස්
ලෙෂෙමේට විරුද්ධ ව යුද්ධ කොට ඒවා අල්ලාගෙන,
ඊට කඩුවනේ පහර දී එය හිමි කරගෙන, එහි වාසය
කොට, ඔවුන්ගේ පිය වූ දාන්ගේ නම ප්‍රකාර
ලෙෂෙමේට දාන් යන නම තැබුවෝ ය. 48 දාන්
පරපුරේ පවුල් ගණන අනුව ඔවුන්ගේ ගෝත්‍රයේ
උරුමය මකේ නගර සහ ඒවායේ ගම් ය.
49 මසේ උරුම පිණිස සීමා වශයනේ දේශය
බෙදා දී නිම කොට ඉශ්‍රායලේ ජනයා නූන්ගේ පුත්
ජෝෂුවාට තමන් අතරහේ උරුමයක් දුන්නෝ ය.
50 ඔහු ඉල්ලූ නුවර වන එප්‍රායිම් කඳු රටහෙි
තිබෙනෙ තිම්නාත්-සරෝ ඔව්හු සමිඳාණන්
වහන්සේගේ ආඥාව ප්‍රකාර ඔහුට දුන්නෝ ය. ඔහු
ඒ නුවර ගොඩනඟා එහි වාසය කළේ ය.
51 පූජක එලයොසර් ද නූන්ගේ පුත් ජෝෂුවා ද
ඉශ්‍රායලේ ජනයාගේ ගෝත්‍රවල පිය පළෙපත්
ප්‍රජා මූලිකයන් ද ෂිලෝහි දී සම්මුඛ මණ්ඩපයේ
දොරකඩ සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි බෙදා දුන්
උරුම මේවා ය. මසේ ඔව්හු දේශය බෙදා නිම
කළෝ ය.

## අභය භූමි නගර

20 ගණන් 35:6-32; ද්වි.නී. 4:41-43; 19:1-13
සමිඳාණන් වහන්සේ ජෝෂුවාට කතා කොට,
2 "ඉශ්‍රායලේ ජනයාට මසේ කියන්නැ"යි වදාළ
සේක. "මෝසසේ ලවා මා නුඹලාට ප්‍රකාශ කළ
පරිදි අභය භූමි නගර තෝරාගන්න. 3 යම් මිනිසකු
අදහස් නොකර හෝ වැරදීමකින් හෝ යමකු
මැරුවොත් ඔහුට ඒ අභය භූමියට ගොස් පළිගන්නට
සොයන්නාගනේ ආරක්ෂා විය හැකි ය. 4 ඔහු ඒ
නගරවලින් එකකට පලා ගොස් නගර දොරකඩ සිට
ඒ නගරයේ ප්‍රජා මූලිකයන් ඉදිරියෙහි සිදු වූ
කාරණය කියා සිටින්නේ ය. ඔවුන් ඔහු නගරයට
පිළිගෙන තමන් සමඟ වාසය කරන පිණිස ඔහුට
ස්ථානයක් දිය යුතු ය. 5 මැරීම ගැන පළිගන්නට
සොයන මිනිසා ඔහු ලුහුබැඳ ආවොත්, ඔහු අතට

මිනී මැරූ තැනැත්තා පාවා නොදිය යුතු ය. මන්ද,
ඔහු තමාගේ අසල්වැසියා මැරුවේ පෙර තිබූ
වෛරයක් නිසා නොව අත්වැරැද්දක් නිසා ය. 6 ඔහු
විනිශ්චය පිණිස සභාව ඉදිරියෙහි සිටින තුරු ද
එවකට සිටින උත්තම පූජකයා නසින තුරු ද ඒ
නගරයේ වසන්නේ ය. ඉන්පසු මිනී මැරූ
තැනැත්තාට තමා අත්හැර ගිය තමාගේ නගරයටත්,
තමාගේ ම ගෙදරටත් හැරී යා හැකි ය.
7 මෙසේ ඔව්හු නප්තලී කඳු රටේ තිබෙන
ගලීලයෙහි කෙදෙෂ් ද එප්‍රායිම් කඳු රටේ ෂෙකෙම්
ද ජුදා කඳු රටේ හෙබ්‍රොන් වන කිරියත්-අර්බා ද
වෙන් කොට තැබුවෝ ය. 8 ජෙරිකෝවට
නැගෙනහිරෙන් ජෝර්දානෙන් එගොඩ රූබන්
ගෝත්‍රයෙන් උස් සමභූමියේ පාළුකරයේ තිබෙන
බෙශෙර් ද ගාද් ගෝත්‍රයෙන් ගිලියද්හි තිබෙන
රාමොත් ද මනස්සේ ගෝත්‍රයෙන් බාෂාන්හි තිබෙන
ගෝලාන් ද ඔව්හු වෙන් කොට තැබුවෝ ය.
9 වැරදීමකින් මිනී මරන කවුරු නමුත්, සභාව
ඉදිරියෙහි පෙනී සිටින්නට ප්‍රථම මිනී මැරීම ගැන
පළිගන්නට සොයන්නාගේ අතින් මැරුම් නොකෙනු
පිණිස පලා ගොස් සිටීමට සියලු ඉශ්‍රායෙලේ සෙනඟ
ද ඔවුන් අතරේ සිටින විදේශිකයන් ද උදෙසා නියම
කරන ලද අභය භූමි නගර මේවා ය.

## ලෙවීවරුන්ගේ නගර

21 එවිට ලෙවීවරුන්ගේ පවුල්වල ප්‍රධානීහු
එලෙයාසර් නම් පූජකයා ද නූන්ගේ පුත්
ජෝෂුවා ද ඉශ්‍රායෙලේ ගෝත්‍රයන්ගේ පවුල්වල
ප්‍රධානීන් ද වෙත පැමිණ, 2 ගණන් 35:1-8කානාන්
දේශයෙහි ෂිලෝහි දී ඔවුන්ට කතා කොට, “වාසය
කිරීමට නගර ද අපේ සිවුපාවුන්ට ඒ නගර අවට
තණ බිම් ද දෙන්නට කියා සමිඳාණන් වහන්සේ
මෝසෙස් ලවා ආඥා කෙරෙව්වූ සේකැ”යි කීවෝ ය.
3 ඉශ්‍රායෙලේ ජනයා සමිඳාණන් වහන්සේගේ ආඥා
ලෙස තමන්ගේ උරුමයෙන් මේ නගර ද ඒවා අවට
තණ බිම් ද ලෙවීවරුන්ට දුන්නෝ ය.
4 පස ඇට දැමීමෙන් කොහොත්වරුන්ගේ
ගෝත්‍රවලට නගර නියම කරන ලදී. පූජක
ආරොන්ගෙන් පැවත ආ ලෙවීවරුන්ට ජුදා
ගෝත්‍රයෙන් ද සිමියොන් ගෝත්‍රයෙන් ද
බෙන්ජමින් ගෝත්‍රයෙන් ද නගර දහතුනක් පස ඇට
දැමීමෙන් ලැබුණේ ය. 5 කොහොත්වරුන්ගේ සෙසු
ගෝත්‍රවලට එප්‍රායිම් ගෝත්‍රයෙන් ද දාන්
ගෝත්‍රයෙන් ද මනස්සේගේ අර්ධ ගෝත්‍රයෙන් ද
නගර දහයක් පස ඇට දැමීමෙන් ලැබුණේ ය.
6 ගේර්ෂොන්වරුන්ගේ ගෝත්‍රවලට ඉස්සාකර්
ගෝත්‍රයෙන් ද ආෂෙර් ගෝත්‍රයෙන් ද නප්තලී
ගෝත්‍රයෙන් ද බාෂාන්හි මනස්සේගේ අර්ධ
ගෝත්‍රයෙන් ද නගර දහතුනක් පස ඇට දැමීමෙන්
ලැබුණේ ය.
7 මෙරාරීවරුන්ගේ ගෝත්‍රවලට රූබන්
ගෝත්‍රයෙන් ද ගාද් ගෝත්‍රයෙන් ද සාබුලොන්
ගෝත්‍රයෙන් ද නගර දොළොසක් ලැබුණේ ය.
8 ඒ නගර සහ ඒවා අවට තණ බිම් ඉශ්‍රායෙලේ
ජනයා, සමිඳාණන් වහන්සේ මෝසෙස් මඟින් අණ
කළ ලෙස, පස ඇට දැමීමෙන් ලෙවීවරුන්ට දුන්නෝ
ය.
9 ජුදා ගෝත්‍රයෙන් ද සිමියොන් ගෝත්‍රයෙන් ද
මෙහි නම් සඳහන් කරන නගර දෙනු ලැබුවේ
10 ලෙවී ගෝත්‍රයේ වූ කොහොත්වරුන්ගේ
පවුල්වලට අයිති ආරොන්ගේ පුත්‍රයන්ට ය. මන්ද,
පළමු වන පස ඇට ලැබුණේ ඔවුන්ට ය. 11 ජුදා කඳු
රටේ තිබෙන හෙබ්‍රොන් නම් කිරියත්-අර්බා ද ඒ
අවට තිබෙන තණ බිම් ද ඔවුන්ට දෙන ලදී. අර්බා
වනාහි ආනාක්ගේ පියා ය. 12 එහෙත්, නගරයේ
කෙත් ද එහි ගම් ද ජෙපුන්නේගේ පුත් කාලෙබ්ට දී
තිබුණේ ය.
13 ඉශ්‍රායෙලේවරු පූජක ආරොන්ගේ පුත්‍රයන්ට,
මිනී මරන අයට අභය භූමි නගරයක් වූ හෙබ්‍රොන්
හා ඒ අවට තණ බිම් ද ලිබ්නා සහ ඒ අවට තණ
බිම් ද 14 ජත්තීර් සහ ඒ අවට තණ බිම් ද
එෂ්තමෝවා සහ ඒ අවට තණ බිම් ද
15 හෝලොන් සහ ඒ අවට තණ බිම් ද දෙබීර් සහ
ඒ අවට තණ බිම් ද 16 අයින් සහ ඒ අවට තණ බිම්
ද ජුතා සහ ඒ අවට තණ බිම් ද බෙත්-ෂෙමෙෂ් සහ
ඒ අවට තණ බිම් ද යන ඒ නගර නවය ඒ ගෝත්‍ර
දෙකෙන් දුන්නෝ ය. 17 බෙන්ජමින් ගෝත්‍රයෙන්
ගිබියොන් සහ ඒ අවට තණ බිම් ද ගෙබා සහ ඒ
අවට තණ බිම් ද 18 අනාතොත් සහ ඒ අවට තණ
බිම් ද අල්මොන් සහ ඒ අවට තණ බිම් ද යන
නගර සතරත් දුන්නෝ ය. 19 පූජක ආරොන්ගේ
පුත්‍රයන්ගේ සියලු නගර සහ ඒ අවට තණ බිම්
ඇතුළු ව නගර දහතුනක් ය.
20 ලෙවීවරුන් වන කොහොත්ගේ සෙසු
ගෝත්‍රයන්ගේ පවුල්වලට ඔවුන්ගේ කොටසේ
නගර එප්‍රායිම් ගෝත්‍රයෙන් ලැබුණේ ය. 21 මිනී
මරන අය උදෙසා නියම කළ අභය භූමි නගරයක් වූ
ෂෙකෙම් සහ ඒ අවට තණ බිම් ද ගෙශෙර් සහ ඒ
අවට තණ බිම් ද 22 කිබ්සයිම් සහ ඒ අවට තණ
බිම් ද බෙත්-හෝරොන් සහ ඒ අවට තණ බිම් ද
යන නගර සතර ඔවුන්ට දුන්නෝ ය. 23 දාන්
ගෝත්‍රයෙන් එල්තෙකේ සහ ඒ අවට තණ බිම් ද
ගිබ්බෙතොන් සහ ඒ අවට තණ බිම් ද
24 අයාලෝන් සහ ඒ අවට තණ බිම් ද ගැත්-
රිම්මොන් සහ ඒ අවට තණ බිම් ද යන නගර
සතරත් දුන්නෝ ය. 25 මනස්සේගේ අර්ධ
ගෝත්‍රයෙන් තයනාක් සහ ඒ අවට තණ බිම් ද
ගැත්-රිම්මොන් සහ ඒ අවට තණ බිම් ද වන නගර
දෙක දුන්නෝ ය. 26 කොහොත්ගේ අනික්
ගෝත්‍රයන්ගේ පවුල්වලට ලැබුණ සියලු නගර
වනාහි ඒ අවට තණ බිම් ද ඇතුළු ව නගර දහසයක්
ය.
27 ලෙවීවරුන්ගේ ගෝත්‍රයට අයිති
ගේර්ෂොන්ගේ ගෝත්‍රයට මනස්සේගේ අර්ධ
ගෝත්‍රයෙන් දුන්නේ, මිනී මරන අය උදෙසා නියම
කළ අභය භූමි නගරයක් වූ බාෂාන්හි තිබෙන
ගෝලාන් සහ ඒ අවට තණ බිම් ද බෙ-ජෙෂ්තරො

සහ ඒ අවට තණ බිම් ද යන නගර දෙකෙ ය.
28 ඉස්සාකර්ගේ ගෝත්‍රයෙනේ කිෂියෝන් සහ ඒ
අවට තණ බිම් ද දාබරෙත් සහ ඒ අවට තණ බිම් ද
29 ජර්මුත් සහ ඒ අවට තණ බිම් ද ඒන්-ගන්නීම්
සහ ඒ අවට තණ බිම් ද යන නගර සතරත් දුන්නෝ
ය. 30 ආෂෙර්ගේ ගෝත්‍රයෙනේ මිෂාල් සහ ඒ අවට
තණ බිම් ද අබ්දෝන් සහ ඒ අවට තණ බිම් ද
31 හෙල්කත් සහ ඒ අවට තණ බිම් ද රෙහොබ් සහ
ඒ අවට තණ බිම් ද යන නගර සතරත් දුන්නෝ ය.
32 නප්තලීගේ ගෝත්‍රයෙනේ මිනී මරන අය උදසො
නියම කළ අභය භූමි නුවරක් වූ ගලීලයෙහි තිබෙනෙ
කෙදෙෂ් සහ ඒ අවට තණ බිම් ද හම්මොත්-දෝර්
සහ ඒ අවට තණ බිම් ද කර්තාන් සහ ඒ අවට තණ
බිම් ද යන නගර තුනත් දුන්නෝ ය.
33 ගේර්ෂෝන්වරුන්ට ඔවුන්ගේ පවුල් ගණන අනුව
ලැබුණ සියලු නගර සහ ඒ අවට තණ බිම් ද ඇතුළු
ව නගර දහතුනක් ය.
34 අනික් ලෙවීවරුන් වන මෙරාරිගේ
ගෝත්‍රයන්ගේ පවුල්වලට සාබුලෝන් ගෝත්‍රයෙනේ
ජොක්නෙයොම් සහ ඒ අවට තණ බිම් ද 35 දිම්නා
සහ ඒ අවට තණ බිම් ද නහලාල් සහ ඒ අවට තණ
බිම් ද යන නගර සතර දුන්නෝ ය. 36 රූබන්
ගෝත්‍රයෙනේ බෙසෙර් සහ ඒ අවට තණ බිම් ද
ජාහශ් සහ ඒ අවට තණ බිම් ද 37 කෙදෙමොත් සහ
ඒ අවට තණ බිම් ද මේපාත් සහ ඒ අවට තණ බිම්
ද යන නගර සතරත් දුන්නෝ ය. 38 ගාද්ගේ
ගෝත්‍රයෙනේ මිනී මරන අය උදසො නියම කළ අභය
භූමි නගරයක් වූ ගිලියද්හි තිබෙනෙ රාමොත් සහ ඒ
අවට තණ බිම් ද මහනයිම් සහ ඒ අවට තණ බිම්
ද 39 හෙෂ්බෝන් සහ ඒ අවට තණ බිම් ද ජාසෙර්
සහ ඒ අවට තණ බිම් ද යන නගර සතරත් දුන්නෝ
ය. 40 මේ සියල්ල ලෙවීවරුන්ගේ අනික් පවුල් වන
මෙරාරිගේ ගෝත්‍රයට ඔවුන්ගේ පවුල් ගණන අනුව
ලැබුණ නගර ය. ඔවුන්ගේ කොටස නගර
දොළොසක් ය.
41 ඉශ්රායලේ වංශයේ උරුමය තුළ තිබුණ
ලෙවීවරුන්ගේ සියලු නගර වනාහි ඒවායේ තණ බිම්
ඇතුළු ව නගර සතළිස්අටක් ය. 42 මේ නගරවලින්
එක එක නුවර වට කර තණ බිම් තිබුණේ ය. ඒ
සියලු නගර එකාකාර ව තිබුණේ ය.
43 මෙසේ ඉශ්රායලේවරුන්ගේ පියවරුන්ට දෙනෙ
ලෙසෙ සමිඳාණන් වහන්සේ දිවුළ මුළු දේශය උන්
වහන්සේ ඔවුන්ට දුන් සේක. ඔව්හු එය හිමි
කරගෙන එහි විසුවෝ ය. 44 සමිඳාණන් වහන්සේ
ඔවුන්ගේ පියවරුන්ට දිවුළ සියල්ල ලෙසෙ හාත්පසින්
උන් වහන්සේ ඔවුන්ට රට පුරා සාමය දුන් සේක.
ඔවුන්ගේ සියලු සතුරන්ගෙනේ කිසිවකුටෙ ඔවුන්ට
විරුද්ධ ව සිටින්නට නොහැකි විය. සමිඳාණන්
වහන්සේ ඔවුන්ගේ සියලු සතුරන් ඔවුන් අතට පාවා
දුන් සේක. 45 සමිඳාණන් වහන්සේ ඉශ්රායලේ
වංශයට දුන් යහපත් පොරොන්දු එකක් වත් කඩ
නො වී ය; සියල්ල ම ඉෂ්ට වුණේ ය.

### ජෝර්දාන් ගඟ ළඟ පූජාසනය

22 ජෝෂුවා රූබන්වරුන් ද ගාද්වරුන් ද
මනස්සේගේ අර්ධ ගෝත්‍රය ද කැඳවා
2 ගණන් 32:20-32; ජෝෂු 1:12-15ඔවුන්ට මෙසේ
කීවේ ය: "සමිඳාණන් වහන්සේගේ සේවක වූ
මෝසෙස් ඔබ හැමට අණ කළ සියල්ල ඔබ
පිළිපැද්දහු ය; මා ඔබට අණ කළ සියල්ලට ඔබ
කීකරු වූවහු ය. 3 ඔබ අද දවස දක්වා මෙපමණ
දීර්ඝ කාලයක් තුළ ඔබේ සහෝදරයන් අත්නෑර සිට
ඔබේ දෙවි සමිඳාණන් වහන්සේගේ ආඥාවේ
බාරය රක්ෂා කළහු ය. 4 දැන් ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ ඔබේ සහෝදරයන්ට වදාළ ප්‍රකාරයට
විවේක සුවය දී ඇත. දැන් ඉතින් ඔබ හැරී
සමිඳාණන් වහන්සේගේ මෙහෙකරු වූ මෝසෙස්
විසින් ජෝර්දානනේ එගොඩ ඔබට දෙනෙ ලද උරුම
දේශයෙහි ඔබේ නිවාසවලට යන්න. 5 සමිඳාණන්
වහන්සේගේ මෙහෙකරු වූ මෝසෙස් ඔබට අණ
කළ අණපණත් හා ව්‍යවස්ථාව මැනවින්
පවත්වන්නට ද ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට
ප්‍රේම කොට, උන් වහන්සේගේ සියලු මාර්ගවල
ගමන් කරන්නට ද උන් වහන්සේගේ ආඥා
පවත්වන්නට ද උන් වහන්සේට ඇළුම් ව සිට ඔබේ
මුළු හෘදයෙනේ ද ඔබේ මුළු ආත්මයෙනේ ද උන්
වහන්සේට වැඳුම්පිදුම් කරන්නට ද වගබලාගන්න."
6 මෙසේ කියා ජෝෂුවා ඔවුන්ට ආශීර්වාද කොට
ඔවුන්ට යන්නට අවසර දුන්නේ ය. ඔව්හු ද
තමන්ගේ නිවාසවලට ගියෝ ය. 7 මනස්සේගේ
ගෝත්‍රයෙනේ අර්ධයකට මෝසෙස් බාෂාන්හි
ප්‍රදේශයක් දී තිබුණේ ය. අනික් අර්ධයට ඔවුන්ගේ
සහෝදරයන් අතරෙහි බස්නාහිරට ජෝර්දාන්
ගඟනේ මෙගොඩ ප්‍රදේශයක් ජෝෂුවා දුන්නේ ය.
තවද, ජෝෂුවා ඔවුන්ගේ, නිවාසවලට ඔවුන් යවන
කල ඔවුන්ට ආශීර්වාද කරමින්, 8 "ඔබ බොහෝ
ධනය ද සිව්පාවුන් ඉතා මහා ගණනක් ද රිදී ද රන්
ද ලෝකඩ ද යකඩ ද බොහෝ වස්ත්‍ර ද ඇති ව
ඔබේ නිවාසවලට ගොස්, ඔබේ සතුරන්ගෙනේ ගත්
කොල්ලය ඔබේ සහෝදරයන් සමඟ බෙදා
ගන්නැ"යි ඔවුන්ට කීවේ ය.
9 එවිට රූබන් ගෝත්‍රයේ සෙනඟ ද ගාද්
ගෝත්‍රයේ සෙනඟ ද මනස්සේගේ අර්ධ
ගෝත්‍රයේ සෙනඟ ද සමිඳාණන් වහන්සේ
මෝසෙස් ලවා අණ කළ ලෙසෙ තමන් ලබාගෙනෙ සිටි
තමන්ගේ උරුම දේශය වන ගිලියද් දේශයට යන
පිණිස කානාන් දේශයේ තිබෙනෙ ෂීලෝහි සිට
ඉශ්රායලේ සෙනඟ කෙරෙනේ වෙනේ වී පිටත් ව ගියෝ
ය.
10 කානාන් දේශයේ තිබෙනෙ ජෝර්දාන් ගඟ
අසබඩ පළාතට ඔවුන් පැමිණිවිට රූබන් ගෝත්‍රයේ
සෙනඟ ද ගාද් ගෝත්‍රයේ සෙනඟ ද මනස්සේගේ
අර්ධ ගෝත්‍රයේ සෙනඟ ද මනා පෙනුමක් ඇති
විශාල පූජාසනයක් ගොඩනැඟුවහු ය. 11 එවිට,
රූබන් ගෝත්‍රයේ සෙනඟ ද ගාද් ගෝත්‍රයේ

සෙනඟ ද මනස්සේගේ අර්ධ ගෝත්‍රයේ සෙනඟ ද
කානාන් දේශයේ ඉදිරිපිට ඉශ්‍රායලේ සෙනඟ වාසය
කළ පැත්තෙහි ජෝර්දාන් ගඟ අසබඩ පළාතේ
පූජාසනයක් ගොඩනඟා තිබේ යයි ඉශ්‍රායලේ
සෙනඟට ආරංචි විය. 12 ඉශ්‍රායලේ සෙනඟ ඒ බව
ඇසූ කල ඔවුන්ට විරුද්ධ ව යුද්ධයට යන පිණිස මුළු
ඉශ්‍රායලේ ජනතාව ෂීලෝහි රැස් වුණෝ ය.
13 ඉශ්‍රායලේ ජනයා ගිලියද් දේශයේ සිටි රූබන්
ගෝත්‍රයේ සෙනඟ ගාද් ගෝත්‍රයේ සෙනඟ ද
මනස්සේගේ අර්ධ ගෝත්‍රයේ සෙනඟ ද වෙත
එලයෝසර්ගේ පුත් පිනෙහාස් ද 14 ඔවුන් සමඟ
සියලු ඉශ්‍රායලේ ගෝත්‍රවලින් එක එක
ගෝත්‍රයේ අධිපති ව සිටි අධිපතීන් දසදෙනෙකු ද
යැවුවෝ ය. ඔව්හු එකිනෙකා ඉශ්‍රායලේ ගෝත්‍ර
අතරෙහි තම තමන්ගේ පිය පෙළපත්වලට
ප්‍රධානියන් ව සිටියෝ ය. 15 ඔව්හු අවුත් ගිලියද්
දේශයෙහි රූබන්ගේ ගෝත්‍රයේ සෙනඟට ද ගාද්
ගෝත්‍රයේ සෙනඟට ද මනස්සේගේ අර්ධ
ගෝත්‍රයේ සෙනඟට ද මෙසේ කී හ: 16 ද්වි.නී.
12:13-14“සමිඳාණන් වහන්සේගේ මුළු සෙනඟ
මෙසේ කියති, ‘ඔබ අද දවසේ සමිඳාණන්
වහන්සේට විරුද්ධ ව කැරලි ගසමින් පූජාසනයක්
ගොඩනඟා ගැනීමෙන් අද ඔබ සමිඳාණන් වහන්සේ
වෙතින් වෙන් වී ගොස් ඉශ්‍රායලේවරුන්ගේ දෙවියන්
වහන්සේට විරුද්ධ ව කළ මේ අපරාධය කුමක් ද?
17 ගණන් 25:1-9පයෝර්හි දී කරන ලද අපරාධය
මතක නැද් ද? සමිඳාණන් වහන්සේගේ සෙනඟ
පිටට වසංගතයක් පැමිණි හැටි සිහි කරන්න. ඒ
අපරාධයෙන් අප තවමත් නිදහස් වී නැත.
18 එහෙත්, ඔබ අද සමිඳාණන් වහන්සේ වෙතින්
අහක් ව යන්නහු ද? මෙසේ ඔබ අද සමිඳාණන්
වහන්සේට විරුද්ධ ව කැරලි ගසන හෙයින් හෙට
උන් වහන්සේ මුළු ඉශ්‍රායලේ සෙනඟ කෙරෙහි
උදහස් වනු ඇත. 19 ඔබේ උරුම දේශය අපවිත්‍ර
නම්, සමිඳාණන් වහන්සේගේ මණ්ඩපය පිහිටා
තිබෙන උන් වහන්සේගේ උරුම දේශයට එතෙර වී
අවුත් අප අතරේ ප්‍රදේශයක් ලබාගන්න. අපේ
දෙවි සමිඳාණන් වහන්සේගේ පූජාසනය හැර, ඔබට
වෙන පූජාසනයක් ගොඩනැඟීමෙන් සමිඳාණන්
වහන්සේටත්, අපටත් විරුද්ධ ව කැරලි නොගසන්න.
20 ජෝෂු 7:1-26ශෙරාගේ පුත් ආකාන් කැප වූ දෙය
සම්බන්ධ අපරාධය කළ නිසා මුළු ඉශ්‍රායලේ
සෙනඟ පිටට උදහස පැමිණියේ නැද් ද? ඒ
මිනිසාගේ අපරාධය නිසා විනාශයට පත් වුණේ ඔහු
පමණක් නොවේ.’ “
21 රූබන් ගෝත්‍රයේ සෙනඟ ද ගාද් ගෝත්‍රයේ
සෙනඟ ද මනස්සේගේ අර්ධ ගෝත්‍රයේ සෙනඟ ද
ඉශ්‍රායලේවරුන්ගේ පවුල්වල පිය පෙළපත්
ප්‍රධානීන්ට මෙසේ පිළිතුරු දුන්නෝ ය:
22 “දේවාතිදේව සමිඳාණන් වහන්ස, දේවාතිදේව
සමිඳාණන් වහන්ස, උන් වහන්සේ ම දන්නා සේක.
ඉශ්‍රායලේ ජනයා ද දැනගත යුතු ය. අපි කැරලි
ගසා සමිඳාණන් වහන්සේට විරුද්ධ ව ද්‍රෝහිකම්
කළෙමු නම්, අද අප ඉතිරි නොකළ මැනව. 23 අප
උන් වහන්සේට අකීකරු වී දවන යාග පූජා හෝ
ධාන්‍ය පූජා හෝ සහභාගිකමේ පූජා හෝ ඔප්පු
කරන පිණිස ඒ පූජාසනය තැනුවා නම්, සමිඳාණන්
වහන්සේ ම අපට දඬුවම් කරන සේක් වා! 24 අප
එසේ කළේ බියෙනි. එනම්, මතු කාලයක දී ඔබේ
දරු පරපුර අපේ දරු පරපුරට කතා කොට,
‘ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේට
ඔබේ ඇති සම්බන්ධකම කිමෙක් ද, කියාත්,
25 රූබන් දරුවෙනි! ගාද් දරුවෙනි! ඔබත් අපත් අතරේ
සමිඳාණන් වහන්සේ ජෝර්දාන් ගඟ සීමා කොට
තබා තිබෙන නිසා සමිඳාණන් වහන්සේ සමඟ ඔබට
කිසි සම්බන්ධකමක් නැතැ’යි කියාත්, උන්
වහන්සේට නමස්කාර කිරීමෙන් ඔබේ දරු පරපුර
අපේ දරු පරපුර වළක්වනු ඇතැ යි යන බියෙනි.
26 එබැවින් අපට පූජාසනයක් ගොඩනැඟීමට, ‘අපි
සූදානම් වෙමු’යි අප කියා ගත්තේ දවන යාග පූජා
වත් යාග පඬුරු වත් ඔප්පු කිරීමට නොව, 27 අපේ
දවන යාග පූජාවලිනුත්, අපේ යාග පඬුරුවලිනුත්,
සහභාගිකමේ පූජාවලිනුත් සමිඳාණන් වහන්සේට
වැඳුම්පිඳුම් උන් වහන්සේ ඉදිරියෙහි ඉටු කිරීම යුතු
බවට, අප සහ ඔබ ද අපට පසුව අපේ දරු පරපුර ද
අතරේ එය සාක්ෂියක් වන පිණිසත්, සමිඳාණන්
වහන්සේ සමඟ ඔබට සම්බන්ධකමක් නැතැ යි මතු
කාලයේ ඔබේ දරු පරපුර විසින් අපේ දරු පරපුරට
වත් කියනු නොලබන පිණිසත් ය. 28 එහෙයින්
ඔවුන් අපට වත්, අපේ දරු පරපුරට වත් මතු
කාලයේ එසේ කීවොත්, ‘දවන යාග පූජා හෝ යාග
පඬුරු හෝ ඔප්පු කිරීමට නොව අප සමඟ හා ඔබ
සමඟ සාක්ෂියක් වන පිණිස අපේ පියවරුන් තැනූ
සමිඳාණන් වහන්සේගේ පූජාසනයේ ආදර්ශය
බලන්න’ කියා අපට කියන්නට පුළුවන් යයි අපි
සිතුවෙමු. 29 අපේ දෙවි සමිඳාණන් වහන්සේගේ
මණ්ඩපය ඉදිරියෙහි තිබෙන උන් වහන්සේගේ
පූජාසනය හැර, දවන යාග පූජා හෝ ධාන්‍ය පූජා
හෝ යාග පඬුරු හෝ ඔප්පු කිරීමට වෙන
පූජාසනයක් ගොඩනැඟීමෙන් සමිඳාණන් වහන්සේට
විරුද්ධ ව කැරලි ගසා අද උන් වහන්සේ වෙතින්
අහක් ව යාම කිසිසේත් අපේ අදහස නො වී ය.”
30 එවිට රූබන් ගෝත්‍රයේ සෙනඟ ද ගාද්
ගෝත්‍රයේ සෙනඟ ද මනස්සේගේ ගෝත්‍රයේ
සෙනඟ ද විසින් කියන ලද වචන පූජක වූ පිනෙහාස්
ද ඔහු සමඟ සිටි ඉශ්‍රායලේ ගෝත්‍රවල පෙළපත්
ප්‍රධානීන් ද ඇසූ කල ඔව්හු ඊට බොහෝ සේ
සතුටු වූ හ. 31 පූජක එලයෝසර්ගේ පුත් පිනෙහාස්
රූබන්වරුන්ටත්, ගාද්වරුන්ටත්, මනස්සේවරුන්ටත්
කතා කොට, “ඔබ හැම සමිඳාණන් වහන්සේට
විරුද්ධ ව ද්‍රෝහිකම් නොකළ නිසා සමිඳාණන්
වහන්සේ අප සමඟ වැඩවසන බව අපි අද
දැනගතිමු. මෙසේ ඔබ ඉශ්‍රායලේ සෙනඟ
සමිඳාණන් වහන්සේගේ අතින් බේරාගත්තහු ය”යි
කීවේ ය.
32 එවිට පූජක එලයෝසර්ගේ පුත් පිනෙහාස් ද
අධිපතීහු ද රූබන්වරුන් හා ගාද්වරුන් කෙරෙන්
ගිලියද් දේශයේ සිට කානාන් දේශයෙහි ඉශ්‍රායලේ

සෙනඟ වෙත හැරී අවුත් ඔවුන්ට ඒ පුවත සැළ
කළෝ ය. 33 ඒ පුවත ගැන ඉශ්රායලේවරු සතුටු වූ
හ. එබැවින්, රූබන්වරුන් ද ගාද්වරුන් ද වාසය කළ
දේශය විනාශ කරන පිණිස ඔවුන්ට විරුද්ධ ව
යුද්ධයට යාම ගැන ඉශ්රායලේ සෙනඟ තවත් කතා
නොකොට දෙවියන් වහන්සේට ප්රශංසා කළෝ ය.
34 රූබන්වරු ද ගාද්වරු ද 'සමිඳාණන් වහන්සේ
දෙවියන් වහන්සේ බවට එය අප අතර සාක්ෂියක්
වන්නේ ය' කියා ඒ පූජාසනයට ඒද් හවෙත් සාක්ෂිය
යන නාමය තැබූ හ.

### විශ්වාස ව සිටීමට අවවාද

23 සමිඳාණන් වහන්සේ ඉශ්රායලේවරුන් වට
කර සිටි ඔවුන්ගේ සියලු සතුරන්ගෙන්
ඔවුන්ට ආරක්ෂාව දී බොහෝ කලක් ගත වූ පසු,
ජෝෂුවා මහලු ව, වයෝවෘද්ධ ව සිටියේ ය. 2 ඔහු
සියලු ඉශ්රායලේවරුන් එනම්, ඔවුන්ගේ ප්රජා
මූලිකයන් ද ප්රධානීන් ද විනිශ්චයකාරයන් ද
නිලධාරීන් ද කැඳවා, ඔවුන්ට මෙසේ කීවේ ය: "මම
මහලු ව, වයෝවෘද්ධ ව සිටිමි. 3 ඔබ හැමගේ දෙවි
සමිඳාණන් වහන්සේ ඔබ උදෙසා මේ සියලු
විජාතීන්ට කළ සියල්ල ඔබ දුටුවහු ය; ඔබ උදෙසා
යුද්ධ කළේ, ඔබ හැමගේ දෙවි සමිඳාණන්
වහන්සේ ම ය. 4 ඉතිරි ව සිටින විජාතීන්ගේ ද මා
විසින් සිඳ දමනු ලැබූ සියලු විජාතීන්ගේ ද දේශය,
ජොර්දාන් ගඟ පටන් බස්නාහිර මධ්යධරණී මුහුද
දක්වා ඔබේ ගෝත්රවලට උරුමයක් කොට පස ඇට
දමා මම ඔබට බෙදා දුනිමි. 5 ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ ම ඔබ ඉදිරියෙන් ඔවුන් එළවාදමා ඔබ
ඉදිරියෙන් ඔවුන් පන්නාදමනු ඇත. ඔබ හැම ද ඔබේ
දෙවි සමිඳාණන් වහන්සේ පොරොන්දු වූ හැටියට
ඔවුන්ගේ දේශය හිමි කර ගනු ඇත. 6 එබැවින්,
මෝසෙස්ගේ ව්යවස්ථා පොතේ ලියා තිබෙන
සියල්ල අකුරට ම පිළිපැදීමට තරයේ ම අධිෂ්ඨාන
කරගන්න. 7 එසේ කර ඔබ අතරේ ඉතිරි ව සිටින
මේ ජාතීන් සමඟ නොගැවසී, ඔවුන්ගේ
දෙවිවරුන්ගේ නම් සඳහන් නොකර, ඔවුන්ගේ
නාමයෙන් නොදිවුරා, ඔවුන්ට වැඳුම්පිදුම් හා
නමස්කාර නොකරන්නට වග බලාගන්න. 8 ඔබ මේ
දක්වා කර ඇති පරිදි ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේට ම විශ්වාසවන්ත ව සිටින්න. 9 මන්ද,
සමිඳාණන් වහන්සේ ඉතා විශාල වූ විජාතීන් ඔබ
ඉදිරියෙන් පන්නාදැමූ සේක. ඒ නිසා ඔබට විරුද්ධ ව
සිටින්නට අද දවස දක්වා කිසිවකුට පුළුවන් වුණේ
නැත. 10 ද්වි.නී. 3:22; 32:30ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ ඔබට පොරොන්දු වූ පරිදි ඔබ උදෙසා
යුද්ධ කරන්නේ උන් වහන්සේ ය; එබැවින් ඔබෙන්
එක් කෙනෙක් දහසක්දෙනා පන්නා දමන්නේ ය.
11 එහෙයින් ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට
ප්රේම කරන්නට තරයේ ම අධිෂ්ඨාන කරගන්න.
12 ඔබ යම් හයෙකින් ඒ අධිෂ්ඨානය නොසලකා,
ඔබ සමඟ ඉතිරි ව සිටින මේ විජාතීන්ට ඇලුම් වී,
ඔවුන් සමඟ විවාහ වමෙින්, ඔබ ඔවුන් අතරෙහි ද
ඔවුන් ඔබ අතරෙහි ද ගැවසුණොත්, 13 ඔබේ දෙවි
සමිඳාණන් වහන්සේ ඔබ ඉදිරියෙන් මේ ජාතීන්
මින්පසු පන්නා නොදමන බවත්, ඔබේ දෙවි
සමිඳාණන් වහන්සේ ඔබට දී තිබෙන මේ යහපත්
දේශය මතුපිටින් ඔබ විනාශ වී යන තුරු, ඔවුන්
ඔබට මලපතක් ද උගුලක් ද ඔබේ ඇළපත්වලට
පහර දෙන කසයක් ද ඔබේ ඇස්වලට කටු ද මෙන්
වන බවත් සහතික ලෙස දැනගන්න.
14 "බලන්න, දැන් මුළු ලොවේ හැම මිනිසකුට ම
සිදු වන්නට යන දේ මටත් සිදු වනු ඇත. ඔබ
හැමගේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබට
පොරොන්දු වූ සියලු යහපත් දේවලින් එක දයෙක්
වත් අතපසු නුවූ බව ඔබේ මුළු හෘදයෙන් ද
ආත්මයෙන් ද දන්නහු ය. එක පොරොන්දුවක් වත්
නොකැඩී සියල්ල ම ඔබට ඉෂ්ට වුණේ ය. 15 තවද,
ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ කළ සියලු
පොරොන්දු ඔබට ඉෂ්ට කර දුන්නාක් මෙන් ම, ඔබට
දී තිබෙන මේ යහපත් දේශය මතුපිටින් ඔබ විනාශ
වී යන තුරු සියලු නපුරු දේ ඔබ පිටට පමුණුවන්නට
උන් වහන්සේට පුළුවන. 16 ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ ඔබට අණ කළ උන් වහන්සේගේ ගිවිසුම
ඔබ කඩ කළහොත්, අන් දෙවිවරුන්ට වැඳුම්පිදුම් කර
ඔවුන්ට නමස්කාර කළහොත්, උන් වහන්සේගේ
උදහස ඔබට විරුද්ධ ව ඇවිළී ඔබට දී තිබෙන
යහපත් දේශය මතුපිටින් ඔබ විගසින් නැති
කරදමනු ඇත."

### ජෝෂුවාගේ අවසාන අනුශාසනා

24 ඉන්පසු ජෝෂුවා සියලු ඉශ්රායලේ
ගෝත්රයන් ෂකෙමේට රැස් කරවා,
ඉශ්රායලේවරුන්ගේ ප්රජා මූලිකයන් ද ප්රධානීන් ද
විනිශ්චයකාරයන් ද නිලධාරීන් ද කැඳවී ය. ඔව්හු
දෙවියන් වහන්සේ ඉදිරියෙහි පෙනී සිටියෝ ය.
2 උත් 11:27ජෝෂුවා මුළු සෙනඟට මෙසේ කීවේ ය:
"ඉශ්රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ
මෙසේ වදාරන සේක: 'යටගිය දවස ආබ්රහම්ගේ ද
නාහෝර්ගේ ද පිය වූ තේරා වැනි, නුඹලාගේ
පියවරු යුප්රටීස් ගඟෙන් එතරෙ වාසය කරමින් අන්
දෙවිවරුන්ට වැඳුම්පිදුම් කළෝ ය. 3 උත් 12:1-9;
21:1-3මම ඒ ගංගාව එතරෙින් නුඹලාගේ පිය වූ
ආබ්රහම් කැඳවාගෙන කානාන් දේශය මුළුල්ලෙහි
ගෙන ගොස්, ඔහුගේ වංශය වැඩි කළෙමි. මම
ඔහුට ඊසාක් දුනිමි. 4 උත් 25:24-26; 36:8; 46:1-7;
ද්වි.නී. 2:5ඊසාක්ට ජාකොබ් ද ඒසව් ද දුනිමි. ඒසව්ට
සේයිර් කඳුකරය උරුමයක් කොට දුනිමි. ජාකොබ් ද
ඔහුගේ පුත්රයෝ ද මිසරයට ගියෝ ය. 5 නික්ම
3:1—12:42මම මෝසෙස් සහ ආරොන් යවමින් මිසර
දේශය පිට වසංගත පැමිණවේවමේ. නුඹලා ඒ ගැන
හොඳාකාර ව දන්නහු ය. ඉන්පසු නුඹලා මිසර
දේශයෙන් පිටතට ගෙනොවමේ. 6 නික්ම 14:1-31මා
නුඹලාගේ පියවරුන් මිසර දේශයෙන් පිටතට ගෙනො
විට නුඹලා රතු මුහුද දක්වා ආවහු ය. මිසරවරු රථ
සහ අසරුවන් ඇති ව නුඹලාගේ පියවරුන් ලුහුබැඳ

රතු මුහුද දක්වා ගියහ. 7 ඔවුන් මට මොරගැසූ කල
මම නුඹලාටත්, මිසරවරුන්ටත් අතරේ අන්ධකාරයක්
ඇති කර මුහුද ඔවුන් පිටට පමුණුවා ඔවුන් මුහුදුබත්
කළෙමි. මා මිසරයේ දී කළ දේ නුඹලාගේ
ඇස්වලින් ම නුඹලා දුටුවහු ය. නුඹලා කාන්තාරයේ
බොහෝ කාලයක් වාසය කළහු ය.
8 ගණන් 21:21-35 ‘තවද, මම නුඹලා ජෝර්දානින්
එතරෙ වාසය කළ අමෝරිවරුන්ගේ දේශයට
ගෙනාවෙමි. ඔව්හු නුඹලාට විරුද්ධ ව යුද්ධ කළහ.
මම ඔවුන් නුඹලා අතට පාවා දුනිමි. නුඹලා
ඔවුන්ගේ දේශය හිමි කර ගත්තහු ය. මම ඔවුන්
නුඹලා ඉදිරියෙනේ විනාශ කරදැමීමි. 9 ගණන්
22:1—24:25එකල ශිප්පෝර්ගේ පුත් මෝවබ්හි රජ
වූ බාලාක් ඉදිරිපත් වී ඉශ්රායලේවරුන්ට විරුද්ධ ව
යුද්ධ කර, නුඹලාට සාප කරන පිණිස බයෝර්ගේ
පුත් බාලාම්ට අඬගසා යැව්වේ ය. 10 එහෙත්, මා
බාලාම්ට සවන් දීමට නොකැමැති වූ බැවින් ඔහු
නුඹලාට ආශීර්වාද කළේ ය. මෙසේ මම ඔවුන්ගේ
අතින් නුඹලා ගැළවීමි. 11 ජෝෂු 3:14-17;
6:1-21නුඹලා ජෝර්දානින් එගොඩ වී ජෙරිකෝවට
පැමිණියහු ය. ජෙරිකෝවේ වැසියෝ ද අමෝරිවරු ද
පෙරිස්සිවරු ද කානානිවරු ද හිත්තීවරු ද ගිර්ගාෂිවරු
ද හිව්වරු ද ජෙබුසිවරු ද නුඹලාට විරුද්ධ ව සටන්
කළෝ ය. මම ඔවුන් නුඹලා අතට පාවා දුනිමි.
12 නික්ම 23:28; ද්වි.නී. 7:20මම නුඹලාට පෙරටුව
දබෙරුන් යැවීමි. ඒ දබෙරු අමෝරිවරුන්ගේ රජුන්
දදෙනා නුඹලා ඉදිරියෙනේ පලවාදැමූ හ. එසේ
වුණේ, නුඹලාගේ කඩුවෙනේ වත්, දුන්නෙනේ වත්
නොවේ. 13 ද්වි.නී. 6:10-11මෙසේ නුඹලා වෙහෙසෙ
නොවී ලබාගත් දේශයක් ද නුඹලා ම ගොඩ
නොනැඟුව නගර ද නුඹලාට දුනිමි; නුඹලා එහි
වාසය කරන්නහු ය. නුඹලා නොවැවූ මිදි වතුවලින්
ද ඔලීව වතුවලින් ද පලදාව කන්නහු ය.’
14 “එබැවින් ඔබ හැම දෙවියන් වහන්සේට ගරුබිය
පා, අවංක ව ද විශ්වාසී ව ද උන් වහන්සේට
වැඳුම්පිදුම් කරන්න. ඔබේ පියවරුන් ගංගාවෙනේ
එතරෙ දීත්, මිසරයේ දීත් වැඳුම්පිදුම් කළ දෙවිවරුන්
පහකර දමා, සමිඳාණන් වහන්සේට වැඳුම්පිදුම්
කරන්න. 15 සමිඳාණන් වහන්සේට වැඳුම්පිදුම්
කිරීමට ඔබ සතුටු නැත් නම්, ඔබ වැඳුම්පිදුම්
කරන්නට කැමැති කවරකුට ද කියා අදම තීරණය
කරගන්න. ගඟින් එගොඩ සිටි ඔබේ පියවරුන්
වැඳුම්පිදුම් කළ දෙවිවරුන්ට හෝ ඔබ වාසය කරන
දේශයේ සිටින අමෝරිවරුන්ගේ දෙවිවරුන්ට හෝ
වැඳුම්පිදුම් කරන්නට තීරණය කරගන්න. එහෙත් අපි,
එනම්, මාගේ පවුල ද, මම ද සමිඳාණන් වහන්සේට
වැඳුම්පිදුම් කරන්නෙමු.”
16 සෙනඟ පිළිතුරු දෙමින්, “අන් දෙවිවරුන්ට
වැඳුම්පිදුම් කරන පිණිස කවරදාවත් අපි සමිඳාණන්
වහන්සේ අත් නොහරින්නෙමු. 17 මන්ද, අප සහ
අපේ පියවරුන් මිසර දේශය නමැති වහල්කමේ
නිවාසයෙනේ පිටතට ගෙනාවේත්, අපේ ඇස් ඉදිරියේ
මහත් හාස්කම් කළේත්, අපේ මුළු මාර්ගයේ දී ද
අප පසු කර ආ මුළු සෙනඟ අතරේ දී ද අප
ආරක්ෂා කළේත්, අපේ දෙවි සමිඳාණන් වහන්සේ
ම ය. 18 සමිඳාණන් වහන්සේ සියලු මනුෂ්‍ය
වර්ගයන් ද දේශයේ සිටි අමෝරිවරුන් ද අප
ඉදිරියෙනේ එළවා දැමූ සේක. එබැවින් අපිත්
සමිඳාණන් වහන්සේට වැඳුම්පිදුම් කරන්නෙමු. මන්ද,
උන් වහන්සේ අපේ දෙවියන් වහන්සේ ය”යි කීවෝ
ය.
19 ජෝෂුවා සෙනඟට කතා කොට, “සමිඳාණන්
වහන්සේට වැඳුම්පිදුම් කරන්නට ඔබට නොහැකි ය.
මන්ද, උන් වහන්සේ ශුද්ධ දෙවි කෙනෙකි;
ප්‍රතිවාදීන් නොඉවසන දෙවි කෙනෙකි. එබැවින් උන්
වහන්සේ ඔබේ අපරාධ ද පාප ද කමා නොකරන
සේක. 20 ඉතින් ඔබ සමිඳාණන් වහන්සේ අත්හැර
අන් දෙවිවරුන්ට වැඳුම්පිදුම් කරන්නහු නම්, උන්
වහන්සේ ඔබට කලින් යහපත කළ නමුත්, දැන්
ඔබට විරුද්ධ වී ඔබට විපත්ති පමුණුවා ඔබ විනාශ
කරන සේකැ”යි කීවේ ය.
21 සෙනඟ ද පිළිතුරු දෙමින්, “නැත. අප වැඳුම්පිදුම්
කරන්නේ සමිඳාණන් වහන්සේට ම ය”යි ජෝෂුවාට
කීවෝ ය.
22 ජෝෂුවා කතා කරමින්, “සමිඳාණන් වහන්සේට
වැඳුම්පිදුම් කිරීමට ඔබ උන් වහන්සේ තෝරාගත්
බවට ඔබට විරුද්ධ ව ඔබ ම සාක්ෂිකාරයෝ ය”යි
සෙනඟට කීවේ ය. ඔව්හු පිළිතුරු දෙමින්, “අපි
සාක්ෂිකාරයෝ වෙමු”යි කීවෝ ය.
23 “එසේ වී නම් ඔබ අතරෙහි ඇති අන් දෙවිවරුන්
පහකර දමා, ඉශ්රායලේවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේ වෙත ඔබේ සිත් යොමු කරන්නැ”යි
ජෝෂුවා ඔවුන්ට කීවේ ය. 24 “අපි අපේ දෙවි
සමිඳාණන් වහන්සේට වැඳ පුදා උන් වහන්සේගේ
හඬට සවන් දෙන්නෙමු”යි සෙනඟ ද, ජෝෂුවාට
පිළිතුරු දුන්නෝ ය.
25 මෙසේ ජෝෂුවා ඒ දවසේ ෂකෙමේහි දී සෙනඟ
සමඟ ගිවිසුමක් කර, ඔවුන්ට පණතක් ද
නියෝගයක් ද නියම කළේ ය.
26 ජෝෂුවා මේ වචන දෙවියන් වහන්සේගේ
ව්‍යවස්ථා පොතේ ලියා, විශාල ගලක් රැගෙන එය
සමිඳාණන් වහන්සේගේ ශුද්ධස්ථානයේ තිබුණ
ආලෝන ගස යට පිහිටුවා, 27 මුළු සෙනඟ අමතා,
“මේ ගල අපට සාක්ෂියක් පිණිස තිබේ. මන්ද,
සමිඳාණන් වහන්සේ අපට වදාළ සියලු වචන ඒ
ගලට ඇසුණේ ය. එබැවින් ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ ප්‍රතික්ෂේප නොකරන පිණිස ඒ ගල
ඔබට සාක්ෂියක් වන්නේ ය”යි කීවේ ය. 28 ඉන්පසු
ජෝෂුවා මුළු සෙනඟ තම තමන්ගේ උරුම
ප්‍රදේශවලට යැව්වේ ය.

### ජෝෂුවාගේ සහ එලයෝසර්ගේ මරණ

29 මේ සිද්ධීන්ගෙනේ පසු සමිඳාණන් වහන්සේගේ
මෙහෙකරු නූන්ගේ පුත් ජෝෂුවා එකසිය දස
අවුරුද්දක් ආයු වළඳා මියගියේ ය. 30 ජෝෂු
19:49-50ඔව්හු එප්‍රායිම් කඳු රටේ ගායෂ් කන්දට
උතුරෙනේ තිබෙන තිම්නාත්-සෙරා නම් වූ ඔහුගේ

උරුම පළාතෙහි ඔහු තැන්පත් කළහ.
31 ඉශ්රායලේවරු ජෝෂුවා සිටි මුළු කාලයේ දී ද
ඔහුට පසුව ජීවත් ව සිටි, සමිඳාණන් වහන්සේ
ඉශ්රායලේවරුන් උදෙසා කළ උන් වහන්සේගේ සියලු
ක්රියා දැනගෙන සිටි ප්රජා මූලිකයන් ජීවත් ව සිටි
මුළු කාලයේ දී ද සමිඳාණන් වහන්සේට වැඳුම්පිදුම්
කළෝ ය.
32 උත් 33:19; 50:24-25; නික්ම 13:19; ජොහ 4:5;
ක්රියා 7:16 තව ද, ඉශ්රායලේ ජනයා මිසරයෙන්
ගෙනා ජෝසෙප්ගේ ඇටකටු ෂෙකෙම්හි, ජාකොබ්
විසින් ෂෙකෙම්ගේ පියා වූ හමෝර්ගේ
පුත්රයන්ගෙන් රිදී මිල සියයකට ගන්නා ලද බිම්
කොටසෙහි තැන්පත් කළෝ ය. එය ජෝසෙප්ගේ
පරපුරට උරුමයක් විය. 33 ආරොන්ගේ පුත්
එලයෝසර් ද මියගියේ ය. ඔව්හු, ඔහුගේ පුත්
පිනෙහාස්ට එප්රායිම් කඳු රටෙහි දෙන ලද ගිබියා
නගරයේ ඔහු තැන්පත් කළෝ ය.

# වීරාවලිය

### ජුදාගේ සහ සිමියොන්ගේ ගෝත්‍රවල ජයග්‍රහණ

1 ජෝෂුවාගේ මරණයෙන් පසු ඉශ්‍රායලේ
ජනයා, “කානානිවරුන්ට විරුද්ධ ව යුද්ධ කරන
පිණිස පළමු කොට අප අතරෙන් යා යුතු ගෝත්‍රය
කුමක් දැ”යි සමිඳාණන් වහන්සේගෙන් ඇසූ හ.
2 සමිඳාණන් වහන්සේ පිළිතුරු දමෙන්, “ජුදාගේ
ගෝත්‍රය පළමු කොට යා යුතු ය; මම ඔවුන්ගේ
අතට දේශය දිනිමි”යි වදාළ සේක.
3 ජුදාගේ ගෝත්‍රය සිමියොන් නම් තම සහෝදර
ගෝත්‍රයට කතා කොට, “අප කානානිවරුන්ට විරුද්ධ
ව යුද්ධ කරන පිණිස අපට හිමි උරුම කොටසට
ඔබත් අප සමඟ එන්න; අපිත් ඔබේ උරුම කොටසට
ඔබ සමඟ එන්නමෝ”යි කී හ. මෙසේ සිමියොන්ගේ
ගෝත්‍රය ජුදාගේ ගෝත්‍රය සමඟ ගියහ. 4 ජුදා
ගෝත්‍රය එසේ නැඟී ගිය කල, සමිඳාණන්
වහන්සේ කානානිවරුන් ද පෙරිස්සිවරුන් ද ඔවුන්ගේ
අතට පාවා දුන් සේක. ඔව්හු බෙශෙක්හි දී මිනිසුන්
දසදහසකට පහර දුන්නෝ ය. 5 බෙශෙක්හි දී
අදොනි-බෙශෙක් ඔවුන්ට හමු විය. ඔව්හු ඔහුට
විරුද්ධ ව යුද්ධ කොට කානානිවරුන්ටත්,
පෙරිස්සිවරුන්ටත් පහර දුන්නෝ ය. 6 එහෙත්,
අදොනි-බෙශෙක් පලා ගියේ ය. ඔව්හු ඔහු លුහුබැඳ
ගොස්, ඔහු අල්ලාගෙන ඔහුගේ අත්පාවල
මාපටැඟිලි කපාදැමූ හ. 7 අදොනි-බෙශෙක් කතා
කොට, “අත්පාවල මාපටැඟිලි කපාදමන ලද රජවරු
සැත්තෑදෙනෙක් මාගේ මේසයෙන් වැටෙන කෑම
ඇහිඳ ගත්තෝ ය; මා ඔවුන්ට කළ ලෙස දෙවියන්
වහන්සේ මට ප්‍රතිවිපාක දුන් සේකැ”යි කීවේ ය.
ඔව්හු ඔහු ජෙරුසලමට ගෙන ගියෝ ය. ඔහු එහි දී
මළේ ය.

### ජෙරුසලම සහ හෙබ්‍රොන් අත්කරගැනීම

8 ජුදා සෙනඟ ජෙරුසලමට විරුද්ධ ව යුද්ධ කොට,
එය අල්ලාගෙන, ඊට කඩුවෙන් පහර දී නුවර ගිනි
ලෑවෝ ය. 9 ඉන්පසු ජුදා සෙනඟ කඳු රටේ ද දකුණු
දිශාවේ ද පහත රටේ ද විසූ කානානිවරුන්ට විරුද්ධ
ව යුද්ධ කරන්නට බැස ගියෝ ය. 10 එසේ ජුදා
සෙනඟ කලින් කිරියත්-අර්බා යන නම තිබූ
හෙබ්‍රොන්හි වාසය කළ කානානිවරුන්ට විරුද්ධ ව
ගොස්, ෂේෂයිට ද අහීමාන්ට ද තල්මයිට ද පහර
දුන්නෝ ය.

### ඔත්නියෙල් දබීර් නගරය අල්ලාගැනීම

11 ඔව්හු එතැනින් දබීර් වැසියන්ට විරුද්ධ ව
ගියෝ ය. කලින් දබීර්ට තිබුණු නම කිරියත්-
සේපෙර් ය. 12 කාලෙබ් කතා කොට, “කිරියත්-
සේපෙර්ට පහර දී එය අල්ලාගන්න තැනැත්තාට
මාගේ දුව වන අක්සා බිරිඳ කොට පාවා
දෙන්නෙමි”යි කීවේ ය. 13 කාලෙබ්ගේ බාල
සහෝදරයා වන කෙනෙස්ගේ පුත් ඔත්නියෙල් එය
අල්ලාගත්තේ ය. කාලෙබ් තමාගේ දුව වන අක්සා
ඔහුට බිරිඳ කොට විවාහ කර දුන්නේ ය. 14 ඈ ඔහු
වෙත පැමිණි කල ඇගේ පියාගෙන් කෙතෙක්
ඉල්ලන්නට ඔහු ඈට පෙරැත්ත කළේ ය. ඈ
කොටළුවා පිටින් බැස්සා ය. එවිට කාලෙබ් ඈට කතා
කොට, “ඔබට ඕනෑ කුමක් දැ”යි ඇගෙන් ඇසී ය.
15 ඈ ද, “මට වරයක් දුන මැනවි. ඔබ වියළි
පෙදෙසෙක් වන දකුණු දිශාව මට දී තිබෙන බැවින්
දිය උල්පත් ද මට දුන මැනවැ”යි කීවා ය. එවිට
කාලෙබ් ඉහළ උල්පත් ද පහළ උල්පත් ද ඈට
දුන්නේ ය.

### බෙන්ජමින්ගේ සහ ජුදාගේ ගෝත්‍රවල ජයග්‍රහණ

16 කේනීය ජාතිකයෙකු වූ මෝසෙස්ගේ
මාමණ්ඩියගේ පරම්පරාව ජුදා සෙනඟ සමඟ ඉඳි
ගස් නම් නුවර සිට අවුත්, අරාද්ට දකුණෙන් තිබෙන
ජුදා පාළුකරයට ගොස් අමලෙක්වරුන් සමඟ වාසය
කළෝ ය. 17 ජුදා සෙනඟ තමන් සහෝදර සිමියොන්
සෙනඟ සමඟ ගොස්, ශෙපෙත්හි විසූ කානානිවරුන්ට
පහර දී ඒ නගරය සහමුලින් ම විනාශ කර දැමුවෝ
ය. එබැවින් ඒ නගරයට හෝර්මා යන නම තබන
ලදී. 18 ජුදා සෙනඟ ගාසා, අෂ්කෙලොන් සහ
එක්‍රොන් යන නගර ද ඒවාට අයත් පළාත් ද
අල්ලාගත්හ. 19 සමිඳාණන් වහන්සේ ජුදා සෙනඟ
සමඟ සිටි සේක; ඔව්හු ද කඳු රටේ වැසියන්
පන්නා දැමූ හ. එහෙත්, මිටියාවතේ වැසියන්ට යකඩ
රථ තිබුණ බැවින් ඔවුන් පන්නා දමන්නට ඔවුන්ට
නොහැකි විය. 20 ජෝෂු 15:13-14මෝසෙස් කී ලෙස
ඔව්හු කාලෙබ්ට හෙබ්‍රොන් නගරය දුන්නෝ ය. ඔහු
එතැනින් අනාක්ගේ පුත්‍රයන් තිදෙනා පන්නා දැමී ය.
21 ජෝෂු 15:63; 2 සාමු 5:6; 1 වංශා
11:4බෙන්ජමින්ගේ ගෝත්‍රයේ මිනිස්සු ජෙරුසලමේ
විසූ ජෙබුසිවරුන් පන්නා නොදැමූ හ. ජෙබුසිවරු අද
දවස දක්වා බෙන්ජමින් ගෝත්‍රයේ සෙනඟ සමඟ
ජෙරුසලමේ වාසය කරති.

## ජෝසෙප්ගේ ගෝත්‍ර බෙතෙල් අල්ලාගැනීම

22 ජෝසෙප්ගේ ගෝත්‍ර බෙතෙල්ට විරුද්ධ ව
ගියෝ ය. සමිඳාණන් වහන්සේ ඔවුන් සමඟ සිටි
සේක. 23 ජෝසෙප්ගේ ගෝත්‍ර බෙතෙල් ගැන
ඔත්තු සොයන පිණිස චර පුරුෂයන් යැව්වෝ ය.
කලින් ඒ නගරයේ නම ලූස් ය. 24 ඒ චර පුරුෂයෝ
මිනිසෙකු නගරයෙන් එනු දැක, "නගරයට ඇතුළු වන
මාර්ගය අපට පෙන්වන්න, එවිට අපි ඔබට කරුණාව
දක්වන්නෙමු"යි කීවෝ ය. 25 නගරයට ඇතුළු වන
මාර්ගය ඔහු ඔවුන්ට පෙන්නුවේ ය. ඔව්හු නගරයට
කඩුවෙන් පහර දුන්නෝ ය. එහෙත්, ඔව්හු ඒ
මිනිසාත්, ඔහුගේ මුළු පවුලත් බේරා හැරියෝ ය.
26 ඒ මිනිසා හිත්තීවරුන්ගේ දේශයට ගොස්, එහි
නගරයක් ගොඩනඟා, ඊට ලූස් යන නාමය තැබුවේ
ය. අද දවස දක්වා එහි නම එය ම ය.

## මනස්සේගේ සහ එප්‍රායිම්ගේ ගෝත්‍රවල ජයග්‍රහණ

27 ජෝෂු 17:11-13 මනස්සේගේ ගෝත්‍රයේ
සෙනඟ බෙත්-ෂයොන් හා ඊට අයිති නගරවල
වැසියන් වත්, තයනාක් හා ඊට අයිති නගරවල
වැසියන් වත්, දෝර් සහ ඊට අයිති නගරවල වැසියන්
වත්, ඉබ්ලයොම් හා ඊට අයිති නගරවල වැසියන්
වත්, මගිද්දෝ හා ඊට අයිති නගරවල වැසියන් වත්
පන්නා නොදැමුවෝ ය. කානානිවරු ඒ රටේ ම වාසය
කළෝ ය. 28 ඉශ්‍රායලේවරුන් බලවත් වූ කල ඔව්හු
කානානිවරුන් බර වැඩට යෙදෙව්වෝ ය. එහෙත්
ඔවුන් සහමුලින් ම පන්නා නොදැමුවෝ ය.
29 ජෝෂු 16:10 එප්‍රායිම්ගේ ගෝත්‍රයේ සෙනඟ
ගෙශෙරේහි විසූ කානානිවරුන් පන්නා නොදැමුවෝ ය.
කානානිවරු ඔවුන් අතර වාසය කළෝ ය.

## සෙසු ගෝත්‍රවල ජයග්‍රහණ

30 සාබුලොන්ගේ ගෝත්‍රයේ සෙනඟ කිත්‍රොන්
වැසියන් ද නහලොල් වැසියන් ද පන්නා නොදැමුවෝ
ය. කානානිවරු ඔවුන් අතර වාසය කරමින් බර වැඩට
යටත් වූ හ.
31 ආෂෙර් ගෝත්‍රයේ වැසියෝ අක්කෝහිත්,
සීදොන්හිත්, අහ්ලාබ්හිත්, අක්ශිබ්හිත්, හෙල්බාහිත්,
අපෙක්හිත්, රෙහොබ්හිත් වැසියන් පන්නා
නොදැමුවෝ ය. 32 ආෂෙර්වරු ඒ දේශවාසී වූ
කානානිවරුන් සමඟ වාසය කළෝ ය. ඔව්හු ඔවුන්
පන්නා නොදැමුවෝ ය.
33 නප්තලී ගෝත්‍රයේ සෙනඟ බෙත්-ෂෙමෙෂ්හි
වැසියන් වත්, බෙත්-අනාත්හි වැසියන් වත් පන්නා
නොදමා, රටේ වැසියන් වූ කානානිවරුන් අතරේ
වාසය කළෝ ය. එසේ වුවත්, බෙත්-ෂෙමෙෂ්හි ද
බෙත්-අනාත්හි ද වැසියෝ බර වැඩ පිණිස ඔවුන්ට
යටත් වුණෝ ය.
34 අමෝරිවරු දාන්ගේ ගෝත්‍රයේ සෙනඟට
මිටියාවතට බසින්නට නොදී කඳු රටට ඔවුන්
නෙරපා හැරියෝ ය. 35 අමෝරිවරු හෙරෙස් කන්දේ
ද අයාලෝන්හි ද ෂාල්බිම්හි ද වාසය කළෝ ය.
එසේ වුවත්, ජෝසෙප්ගේ ගෝත්‍ර බලවත් වූ පසු
අමෝරිවරු බර වැඩට යටත් වුණෝ ය.
36 අමෝරිවරුන්ගේ දේශ සීමාව අක්‍රබ්බිම්
නැඟුමේ පටන් පර්වතයේ ඉහළට පිහිටියේ ය.

## බෝකිම්හි දේව දූතයා

2 සමිඳාණන් වහන්සේගේ දූතයා ගිල්ගාල්හි
සිට බෝකිම්ට අවුත් ඉශ්‍රායලේවරුන්ට මෙසේ
කීවේ ය: "මම නුඹලා මිසරයෙන් පිටතට පමුණුවා,
නුඹලාගේ පියවරුන්ට පොරොන්දු වූ දේශයට
නුඹලා ගෙනාවෙමි. 'නුඹලා සමඟ මාගේ ගිවිසුම
කිසි කලක කඩ නොකරන්නෙමි'යි කීවෙමි. 2 නික්ම
34:12-13; ද්වි.නී. 7:2-5'එසේ ම මේ දේශයේ
වැසියන් සමඟ කිසි ගිවිසුමක් නොකොට, ඔවුන්ගේ
පූජාසන කඩා දමන්නැ'යි ද කීවෙමි. එහෙත්, නුඹලා
මාගේ හඬට සවන් නුදුන්නහු ය. නුඹලා මෙසේ
කළේ මන් ද? 3 එබැවින් මම නුඹලා ඉදිරියෙන්
ඔවුන් පන්නා නොදමන්නෙමි; ඔව්හු නුඹලාගේ
සතුරෝ වන්නෝ ය; ඔවුන්ගේ දෙවි දේවතාවෝ
නුඹලාට මලපතක් මෙන් වන්නෝ ය." 4 සමිඳාණන්
වහන්සේගේ දූතයා සකල ඉශ්‍රායලේ ජනයාට මේ
වචන කී විට ඔව්හු ශබ්ද නඟා හැඬුවෝ ය.
5 ඔව්හු ඒ ස්ථානයට බෝකිම් යැයි නම් තබා එහි දී
සමිඳාණන් වහන්සේට පූජා ඔප්පු කළෝ ය.

## ජෝෂුවාගේ මරණය

6 ජෝෂුවා සෙනඟ පිටත් කර යැවූ කල,
ඉශ්‍රායලේ සෙනඟ දේශය හිමි කරගනු පිණිස තම
තමන්ට නියම උරුම ප්‍රදේශවලට ගියෝ ය.
7 ඉශ්‍රායලේ සෙනඟ ජෝෂුවා ජීවත් ව සිටි මුළු
කාලය තුළ දී ද, ජෝෂුවාට පසුව ජීවත් ව සිටි,
සමිඳාණන් වහන්සේ ඉශ්‍රායලේ උදෙසා කළ, උන්
වහන්සේගේ සකල බලවත් ක්‍රියා දුටු, ප්‍රජා
මූලිකයන් ජීවත් ව සිටි කාලය තුළ දී ද සමිඳාණන්
වහන්සේට වැඳුම්පිදුම් කළෝ ය. 8 සමිඳාණන්
වහන්සේගේ සේවක නූන්ගේ පුත් ජෝෂුවා එකසිය
දස අවුරුද්දක් ආයු වළඳා මියගියේ ය. 9 ජෝෂු
19:49-50ඔව්හු එප්‍රායිම් කඳු රටේ ගායෂ් කන්දට
උතුරෙන් තිබෙන තිම්නාත්-හෙරෙස් නම් ඔහුගේ
උරුම පළාතෙහි දී ඔහු තැන්පත් කළෝ ය. 10 ඒ මුළු
පරම්පරාව ද මියගොස් ඔවුන්ගේ පියවරුන්ගේ
සුසාන භූමියේ තැන්පත් කරනු ලැබූ හ. ඔවුන්ට පසු
නැඟී ආ පරම්පරාව සමිඳාණන් වහන්සේ වත්,
ඉශ්‍රායලේ උදෙසා උන් වහන්සේ කළ ක්‍රියා වත්
නොදත්තෝ ය.

## දේව නමස්කාරය ප්‍රතික්ෂේප කිරීම

11 ඉශ්‍රායලේ ජනයා සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි නපුරු දේ කර බාල් දේවතාවන්ට
වැඳුම්පිදුම් කළහ. 12 ඔව්හු තමන්ගේ පියවරුන්
මිසර දේශයෙන් පිටතට ගෙනා තමන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේ අතහැර, අන් දෙවිවරුන් එනම්,

තමන් අවට සිටි මනුෂ්‍ය ජාතීන්ගේ දෙවිවරුන් අනුව
ගොස් ඔවුන්ට නමස්කාර කළෝ ය. එසේ කිරීමෙන්
ඔව්හු සමිඳාණන් වහන්සේ කෝප කළෝ ය.
13 ඔව්හු සමිඳාණන් වහන්සේ අත්හැර බාල්
දේවතාවාටත්, අෂ්ටාරෝත් දේවතාවියටත්
වැඳුම්පිදුම් කළෝ ය. 14 සමිඳාණන් වහන්සේගේ
උදහස ඉශ්රායෙල්වරුන්ට විරුද්ධ ව ඇවිළී, උන්
වහන්සේ ඔවුන් කොල්ලකාරයන් අතට පාවා දුන්
සේක. ඔව්හු ද ඔවුන්ගෙන් කොල්ලකෑවෝ ය.
තමන්ගේ සතුරන්ට විරුද්ධ ව සිටින්නට තවත්
ඔවුන්ට නොහැකි වන ලෙස උන් වහන්සේ ඔවුන්
වට කර සිටි සතුරන්ගේ අතට ඔවුන් පාවා දුන්
සේක. 15 සමිඳාණන් වහන්සේ කී ප්රකාරයටත්,
ඔවුන්ට දිවුළ හැටියටත් ඔවුන් යුද්ධයට ගිය හැම
අවස්ථාවක දී ම උන් වහන්සේගේ හස්තය ඔවුන්ට
විරුද්ධ ව තිබුණේ ය. ඔව්හු ද තද අමාරුවට පත්
වුණෝ ය.

## විනිශ්චයකාරයන් නියම කිරීම

16 එවිට ඉශ්රායෙල් සෙනඟ කොල්ලකෑ අයගෙන්
ඔවුන් ගළවාගන්න පිණිස සමිඳාණන් වහන්සේ විනිශ්චය
නායකයන් පත් කළ සේක. 17 එහෙත්, ඔව්හු ඒ විනිශ්චය
නායකයන්ට වත් සවන් නොදී උන් වහන්සේට
අවිශ්වාසවන්ත වී අන් දෙවිවරුන් වැළඳගෙන ඔවුන්ට
නමස්කාර කළෝ ය. සමිඳාණන් වහන්සේගේ
ආඥාවලට කීකරු ව සිටි ඔවුන්ගේ පියවරුන් මෙන්
ඔව්හු ක්රියා නොකොට, ඔවුන් ගිය මාර්ගයෙන්
වහා ම ඉවත් ව ගියෝ ය. 18 සමිඳාණන් වහන්සේ
ඔවුන්ට විනිශ්චය නායකයන් පත් කර දුන් විට උන්
වහන්සේ විනිශ්චය නායකයන් සමඟ සිට, ඔවුන්ගේ මුළු
ජීවිත කාලය තුළ ඉශ්රායෙල්වරුන් සතුරන්ගේ අතින්
ගැළවූ සේක. ඔවුන්ට පීඩා කළාවූ ද ඔවුන් පෙළෙඩි
කළාවූ ද අය කරණකොටගෙන හටගත් ඔවුන්ගේ
කඳෙරිගෑම නිසා සමිඳාණන් වහන්සේ ඔවුන්ට
අනුකම්පා කළ සේක. 19 එහෙත්, විනිශ්චය පුරුෂයකු
මැරුණු කල, ඔව්හු හැරී අන් දෙවිවරුන් අනුව ගොස්,
ඔවුන්ට වැඳුම්පිදුම් හා නමස්කාර කරමින්, තමන්ගේ
පියවරුන්ටත් වඩා දූෂ්‍යකම් කළහ. ඔව්හු ඔවුන්ගේ
ක්රියාවලින් වත්, මුරණ්ඩුකම්වලින් වත් කිසිවක්
අත්නෑරියෝ ය. 20 සමිඳාණන් වහන්සේගේ උදහස
ඉශ්රායෙල්වරුන්ට විරුද්ධ ව ඇවිළුණේ ය. එවිට උන්
වහන්සේ මෙසේ වදාළ සේක: “මේ ජාතිය මාගේ
හඬට සවන් නොදී, මා ඔවුන්ගේ පියවරුන්ට අණ
කළ මාගේ ගිවිසුම කඩ කළ බැවින්, 21 මම
ජෝෂුවා නසින විට ඉතිරි ව සිටි ජාතීන්ගෙන් එක්
කෙනෙකු වත් ඉශ්රායෙල් ජනයා ඉදිරියෙන් මින්පසු
පන්නා නොදමන්නෙමි. 22 මෙසේ කරන්නේ,
ඔවුන්ගේ පියවරුන් මාගේ මාර්ගය රක්ෂා කළ පරිදි,
ඔව්හු ද ඒ මාර්ගයේ හැසිරෙන ලෙස එය රක්ෂා
කරත් ද නැද්ද යනු ඒ ජාතීන් කරණකොටගෙන
ඉශ්රායෙල් ජනයා සෝදිසිකර බලන පිණිස ය.”
23 එබැවින් සමිඳාණන් වහන්සේ ඒ ජාතීන් ජෝෂුවා
අතට පාවා නොදී, ඔවුන් ඉක්මනින් පන්නා නොදමා
එහි විසීමට ඉඩ දුන් සේක.

## පරාජය නොවූ ජාතීහු

3 කානාන්හි ඇති වූ සියලු යුද්ධ සම්බන්ධයෙන්
අත්දැකීමක් නොලැබූ සකල ඉශ්රායෙල්වරු
සෝදිසි කරන පිණිස සමිඳාණන් වහන්සේ ඉතිරි
කළ ජාතීහු මොවුහු ය. 2 උන් වහන්සේ එසේ
කළේ, ඉශ්රායෙල් ජනයාගේ පරම්පරාවලින් මීට
පෙර යුද්ධ කරන්නට දැනගෙන නොසිටිය අයට එය
ඉගැන්වීමට ය. 3 ඒ ජාතීහු නම්, පිලිස්තිවරුන්ගේ
අධිපතිවරු පස්දෙනාත්, කානානිවරු සියලුදෙනාත්,
සීදොන්වරුත්, බාල්-හර්මොන් කන්දේ පටන්
හමාත්ට ඇතුළු වන තැන දක්වා ලබෙනොන්
කඳුකරයේ වාසය කළ හිව්වරුත් වෙති. 4 ඔවුන්
ඉතිරි කළේ, සමිඳාණන් වහන්සේ මෝසෙස් ලවා
ඉශ්රායෙල්වරුන්ගේ පියවරුන්ට අණ කර වදාළ උන්
වහන්සේගේ ආඥාවලට ඔව්හු කීකරු වෙත් දැ යි ඒ
ජාතීන් කරණකොටගෙන ඉශ්රායෙල්වරුන් සෝදිසි
කරන පිණිස ය. 5 ඉශ්රායෙල් සෙනඟ කානානිවරුන්
ද හිත්තිවරුන් ද අමෝරිවරුන් ද පෙරිස්සිවරුන් ද
හිව්වරුන් ද ජෙබුසිවරුන් ද අතරෙහි වාසය කළහ.
6 ඔව්හු ඔවුන්ගේ දූවරුන් සරණ පාවාගෙන,
තමන්ගේ දූවරුන් ඔවුන්ගේ පුත්රයන්ට දී ඔවුන්ගේ
දෙවිවරුන්ට වැඳුම්පිදුම් කළෝ ය.

## ඔත්නියෙල්

7 ඉශ්රායෙල් සෙනඟ සමිඳාණන් වහන්සේට විරුද්ධ
ව පව් කළෝ ය. ඔව්හු තමන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේ අමතක කොට බාල් දේවතාවුන්ටත්,
අෂේරේ දේවතාවියටත් වැඳුම්පිදුම් කළහ. 8 එබැවින්
සමිඳාණන් වහන්සේගේ උදහස ඉශ්රායෙල්
සෙනඟට විරුද්ධ ව ඇවිළ, මෙසොපොතේමියේ රජ
වූ කුෂාන්-රිෂාතයිම් අතට උන් වහන්සේ ඔවුන් පාවා
දුන් සේක. ඉශ්රායෙල් සෙනඟ කුෂාන්-රිෂාතයිම්ට
අට අවුරුද්දක් මෙහෙවර කළහ. 9 ඉශ්රායෙල් සෙනඟ
සමිඳාණන් වහන්සේට මොරගැසූ කල සමිඳාණන්
වහන්සේ ඉශ්රායෙල් සෙනඟට ගැළවුම්කාරයෙකු
එවා වදාළ සේක. ඔහු වූ කලී කාලෙබ්ගේ බාල
සහෝදරයා වන කෙනෙස්ගේ පුත් ඔත්නියෙල් ය.
10 සමිඳාණන් වහන්සේගේ ආත්මානුභාවය ඔහු
කෙරෙහි පැමිණියෙන්, ඔහු ඉශ්රායෙල්වරුන්ගේ විනිශ්චය
පුරුෂයා වී යුද්ධයට පිටත් ව ගියේ ය. සමිඳාණන්
වහන්සේ මෙසොපොතේමියේ රජ වූ කුෂාන්-
රිෂාතයිම් ඔහු අතට පාවා දුන් සේක. ඔහු කුෂාන්-
රිෂාතයිම් පරදවා ජය ගත්තේ ය. 11 එවිට හතළිස්
අවුරුද්දක් දේශයේ සාමය පැවතුණේ ය. ඉන්පසු
කෙනෙස්ගේ පුත් ඔත්නියෙල් මැරුණේ ය.

## ඒහුද්

12 ඉශ්රායෙල් සෙනඟ යළිත් සමිඳාණන්
වහන්සේට විරුද්ධ ව පව් කළෝ ය. ඔවුන්
සමිඳාණන් වහන්සේට විරුද්ධ ව පව් කළ නිසා උන්

වහන්සේ ඔවුන්ට විරුද්ධ ව මෝවබ්හි රජ වූ
එග්ලොන් බලවත් කළ සේක. 13 ඔහු අම්මොන්
සහ අමලෙක් සෙනඟ රැස් කරවාගෙන ගොස්
ඉශ්රායෙල්වරුන්ට පහර දී, ඉඳි ගස් නුවර ද හිමි
කරගත්තේ ය. 14 ඉශ්රායෙලේ සෙනඟ මෝවබ්හි රජ
වූ එග්ලොන්ට දහඅට අවුරුද්දක් මෙහෙවර කළෝ ය.
15 එහෙත්, ඉශ්රායෙලේ සෙනඟ සමිඳාණන්
වහන්සේට මොරගැසූ කල සමිඳාණන් වහන්සේ
ගැළවුම්කාරයෙකු ඔවුන්ට එවා වදාළ සේක. ඔහු වූ
කලී බෙන්ජමින්ගේ ගෝත්රයට අයිති ගේරාගේ
පුත් ඒහුද් ය. ඔහු වමත හුරු මිනිසෙකු විය.
ඉශ්රායෙලේ සෙනඟ මෝවබ්හි රජ වූ එග්ලොන්ට
ඒහුද් අත කප්පම් යැවූ හ. 16 ඔහු රියනක් දිග
දෙමුවහත් කඩුවක් සාදාගෙන එය තමාගේ දකුණු
කලවයෙහි ඇඳුම් යට බැඳගෙන ගොස්
17 මෝවබ්ගේ රජ වූ එග්ලොන්ට ඒ කප්පම
පිරිනැමී ය. එග්ලොන් වනාහි ඉතා තර මිනිසෙකි.
18 ඒහුද් කප්පම පිරිනමා නිම වූ කල කප්පම ගෙන
ගිය මිනිසුන් පිටත් කර හැරියේ ය. 19 එහෙත්, ඔහු
ගිල්ගාල් ළඟ කැපූ ගල් තිබෙන තැන සිට හැරී
ගොස්, "රජතුමනි, ඔබට කියන්න රහස් පණිවුඩයක්
මට ඇතැ"යි කීවේ ය. රජ තෙමේ, "නිශ්ශබ්දවන්න"
කියා, ඔහු වෙත සිටි සේවකයන් ඔහු කරෙන්
පිටතට ඇරියේ ය.
20 ඒහුද් රජතුමා වෙත පැමිණියේ ය. ඔහු
තමාගේ උඩුමහල් තලහෙි තනියම ඉඳගෙන සිටියේ
ය. ඒහුද් ඔහු අමතා, "ඔබට දෙවියන් වහන්සේගේ
පණිවුඩයක් දන්වන්න මට ඇතැ"යි කී ය. ඔහු
හුනස්නෙන් නැඟිට්ටේ ය. 21 ඒහුද් තමාගේ වමත
දිගු කොට දකුණු කලවයෙන් කඩුව ඇදගෙන රජුගේ
බඩට ඇන්නේ ය. 22 තලය සමඟ මිටත් බඩ
ඇතුළට ගියේ ය. රජුගේ බඩෙන් ඒහුද් කඩුව ඇද
නොගත් නිසා, තලය මාංසයෙන් වැසී ගොස්
පිටුපසින් එළියට නෙරා ආයේ ය. 23 ඒහුද් පිටත
ශාලාවට ගොස්, උඩුමහලේ දොරවල් වසා තබා,
අගුලු දමා ගියේ ය. 24 ඔහු පිටත් ව ගිය කල
රජුගේ මෙහෙකරුවෝ අවුත් බැලූ හ. ඔව්හු
උඩුමහලේ දොරවල් අගුලු දමා තිබෙනවා දැක, රජ
තෙමේ, 'උඩුමහල් තලයේ රහස් කාමරයේ
ශරීරකෘත්යය කරනු ඇතැ'යි සිතූ හ. 25 ඔව්හු
තුෂ්ණිම්භූත ව බලා සිටියෝ ය. ඔහු උඩුමහලෙහි
දොරවල් නොහැරිය බැවින්, ඔව්හු යතුර ගෙන ඒවා
ඇරිය කල, ඔවුන්ගේ ස්වාමියා බිම වැටී, මැරී සිටිනු
දුටුවෝ ය.
26 ඔවුන් ප්රමාදවමින් සිටිය දී, ඒහුද් කැපූ ගල්
ඇති ස්ථානය පසු කර සෙයිරාට ගැළවී ගියේ ය.
27 ඔහු අවුත් එප්රායිම් කඳු රටේ දී හොරණෑවක්
පිම්බේ ය. එවිට ඉශ්රායෙලේ ජනයා ඔහු සමඟ කඳු
රටෙන් බැස ගියෝ ය. ඔහු ඔවුන්ට පෙරටුවෙන්
ගොස්, 28 ඔවුන්ට කතා කොට, "මා පස්සේ එන්න;
මන්ද, සමිඳාණන් වහන්සේ ඔබේ සතුරන් වන
මෝවබ්වරුන් ඔබේ අතට පාවා දී ඇතැ"යි කීවේ ය.
ඔව්හු ඔහු පස්සේ ගොස්, මෝවබ් ළඟ තිබෙන
ජෝර්දාන්හි තොටුපොළවල් අල්ලාගෙන කිසිවකුට
එයින් එගොඩ වන්නට ඉඩ නොදුන්නෝ ය. 29 ඔව්හු
ඒ අවස්ථාවේ දී මෝවබ්වරුන් දසදහසක් පමණ
මැරුවෝ ය. ඒ මෝවබ්වරු සියලු දෙන
ශක්තිසම්පන්න බලවන්ත අය වූ හ. ඔවුන්ගෙන් එක්
කෙනෙකු වත් ගැළවුණේ නැත. 30 ඒ දවසේ දී
මෝවබ්වරු ඉශ්රායෙල්වරුන් විසින් යටත් කරනු ලැබූ
හ. ඉන්පසු අසූ අවුරුද්දක් තුළ දේශයේ සාමය
පැවැතුණේ ය.

### ෂම්ගර්

31 ඒහුද්ට පසුව පැමිණියේ අනාත්ගේ පුත් ෂම්ගර්
ය. ඔහු පිලිස්තිවරුන්ගෙන් මිනිසුන් හයසියයක් හරක්
අංකුසයකින් මැරී ය. ඔහු ද ඉශ්රායෙලේ ගැළවුවේ
ය.

### දෙබෝරා සහ බාරාක්

4 ඒහුද්ගේ මරණයෙන් පසු ඉශ්රායෙලේ ජනයා
යළිත් සමිඳාණන් වහන්සේට විරුද්ධ ව පව්
කළෝ ය. 2 සමිඳාණන් වහන්සේ ද හාශෝර්හි
රජකම් කළ කානාන්හි රජ වූ ජාබින් අතට ඔවුන්
පාවා දුන් සේක. ඔහුගේ සේනාවේ අධිපතියාගේ
නම සීසෙරා ය. ඔහු හරොෂෙත්-ගොයිම් වැසියෙකි.
3 ඔහුට යකඩ රථ නවසියයක් තිබිණි. ඔහු
ඉශ්රායෙලේ සෙනඟට විසි අවුරුද්දක් තුළ බලවත්
ලෙස පීඩා කළේ ය. එබැවින් ඉශ්රායෙලේ සෙනඟ
සමිඳාණන් වහන්සේට මොරගැසුවෝ ය.
4 ඒ කාලයෙහි ඉශ්රායෙල්වරුන් විනිශ්චය කළේ,
ලප්පිදොත්ගේ බිරිඳ වූ දිවැසිවරියක වූ දෙබෝරා
තොමෝ ය. 5 එප්රායිම් කඳු රටේ රාමාටත්,
බෙතෙල්ටත් අතර තිබෙන දෙබෝරාගේ ඉඳි ගස යට
අසුන් ගැනීම ඇගේ සිරිත විය. ඉශ්රායෙලේ සෙනඟ
විනිශ්චය ලබන පිණිස ඈ වෙත පැමිණියෝ ය. 6 ඈ
කෙදෙෂ්-නප්තලීයෙන් අබිනොවම්ගේ පුත් බාරාක්
කැඳවා ඔහු අමතා, "ඉශ්රායෙලේ දෙවි සමිඳාණන්
වහන්සේ ඔබට මෙසේ අණ කර ඇත: 'නුඹ ගොස්
නප්තලීගේ ගෝත්රයෙන් ද සාබුලොන්ගේ
ගෝත්රයෙන් ද මිනිසුන් දසදහසක් රැස්කරගෙන
තාබෝර් කන්දට යන්න; 7 මම ජාබින්ගේ සේනාවේ
අධිපති සීසෙරා ද ඔහුගේ රථ ද ඔහුගේ හමුදාව ද
කීෂොන් ඔය ළඟ නුඹ වෙත රැස් කර ඔහු නුඹේ
අතට පාවා දෙන්නෙමි' "යි කීවා ය.
8 බාරාක් ඈට පිළිතුරු දෙමින්, "ඔබ මා සමඟ
යන්නෙහි නම් මමත් යන්නෙමි; ඔබ මා සමඟ
නොයන්නෙහි නම් මමත් නොයන්නෙමි"යි කී ය.
9 ඈ පිළිතුරු දෙමින්, "සැබැවින් මම ඔබ සමඟ
යන්නෙමි. එසේ වී නමුත්, ඔබ යන ගමන ඔබේ
ගෞරවය පිණිස නොවන්නේ ය. මන්ද, සමිඳාණන්
වහන්සේ ස්ත්රියකගේ අතට සීසෙරා පාවා දෙනු
ඇතැ"යි කීවා ය. එවිට දෙබෝරා තොමෝ බාරාක්
සමඟ කෙදෙෂ්ට ගියා ය. 10 බාරාක් සාබුලොන්වරුන්
ද නප්තලීවරුන් ද කෙදෙෂ්ට කැඳවා ගත්තේ ය;
මිනිස්සු දසදහසක් ඔහු කැටුව ගියෝ ය. දෙබෝරාත්
ඔහු සමඟ ගියා ය.

11 එකල කේනීය ජාතික හෙබෙර්, මෝසෙස්ගේ
මාමණ්ඩි වන හොබාබ්ගේ පුත්‍රයන් වූ
කේනිවරුන්ගෙන් වෙන් වී කෙදෙෂ් ළඟ තිබෙන
ශයනන්නීම්හි ආලෝන වෘක්ෂය ළඟ තමාගේ
කූඩාරම පිහිටුවාගෙන සිටියේ ය.
12 එවිට, අබීනොවම්ගේ පුත් බාරාක් තාබෝර්
කන්දට ගිය බව සීසෙරාට දන්වන ලද්දේ ය.
13 සීසෙරා තමාගේ සියලු රථ එනම්, යකඩ රථ
නවසියයක් ද තමා සමඟ සිටි මුළු සෙනඟ ද
හරොෂෙත්-ගොයිම් සිට කීෂොන් ඔය ළඟට
කැඳවාගත්තේ ය.
14 එවිට දෙබෝරා බාරාක් අමතා, “නැගිටින්න,
මන්ද, සමිඳාණන් වහන්සේ සීසෙරා ඔබ අතට පාවා
දෙන දවස මේ ය: සමිඳාණන් වහන්සේ ඔබට
පෙරටුව යන සේකැ”යි කීවා ය. එහෙයින්, බාරාක් ද
ඔහු අනුව මිනිස්සු දසදහසක් ද තාබෝර් කන්දෙන්
බැස ගියෝ ය. 15 එවිට සමිඳාණන් වහන්සේ
සීසෙරා හා ඔහුගේ සියලු රථ ද ඔහුගේ මුළු
සේනාව ද බාරාක් ඉදිරියෙහි කඩුව ලලෙවා, ඔවුන්
කලඹා විසුරුවාදැමූ සේක. සීසෙරා තමන්ගේ
රථයෙන් බැස පයින් පලා ගියේ ය. 16 එහෙත්,
බාරාක් රථ හා සේනාව පසුපස හරොෂෙත්-ගොයිම්
දක්වා ලුහුබැඳ ගියේ ය. සීසෙරාගේ මුළු සේනාව
කඩුවෙන් මරනු ලැබූ හ. එක් කෙනෙකු වත් ඉතුරු
නො වී ය.
17 එහෙත්, හාශෝර්හි රජ වූ ජාබීන් හා කේනීය
ජාතික හෙබෙර්ගේ වංශය අතරේ සාමය තිබුණු
බැවින්, සීසෙරා කේනීය ජාතික හෙබෙර්ගේ භාර්යාව
වූ ජායෙල්ගේ කූඩාරමට පයින් පලා ගියේ ය.
18 ජායෙල්, සීසෙරාගේ පෙරමඟට ගොස්, “මාගේ
ස්වාමීනි, ඇතුළට අව මැනව; බිය නොවී මා ළඟට
ඇතුළට අව මැනවැ”යි කීවා ය. ඔහු ඈ සමඟ
කූඩාරමට ගියේ ය, ඈ පලස් රෙද්දකින් ඔහු වැසුවා
ය. 19 ඔහු ද, “කරුණාකර වතුර ටිකක් බොන්නට
දෙන්න, මට පිපාසා යැ”යි කීවේ ය. ඈ කිරි
භාජනයක් ඇර ඔහුට බොන්නට දී ඔහු යළිත් වසා
තැබුවා ය. 20 ඔහු ඈට කතා කොට, “ඔබ කූඩාරමේ
දොරකඩ ළඟ සිට, යම් කෙනෙකු අවුත්, ‘මෙහි කවුරු
වත් සිටින්නේ දැ’යි ඇසුවොත්, ‘නැතැ’යි කියන්නැ”යි
ඈට කීවේ ය.
21 සීසෙරා බොහෝ තෙහෙට්ටු වී සිටි බැවින් තද
නින්දට වැටී සිටියේ ය. එවිට හෙබෙර්ගේ බිරිඳ වූ
ජායෙල් කූඩාරමේ ඇණය හා අතකොලුවක් රැගෙන
නිශ්ශබ්ද ව ඔහු ළඟට ගොස් ඔහුගේ නළල්
කළෙවරට ඒ ඇණය පොළොවට යන තෙක් ගසා
හිස පසාරු කළා ය. මෙසේ ඔහු මළේ ය. 22 බාරාක්
සීසෙරා ලුහුබැඳ ආ කල, ජායෙල් ඔහුගේ පෙරමඟට
ගොස්, “එන්න, ඔබ සොයන මිනිසා පෙන්වමි”යි
ඔහුට කීවා ය. ඔහු ඈ සමඟ ඇතුළට ගිය කල,
සීසෙරා වැටී මැරී සිටිනවාත්, ඇණය ඔහුගේ නළල
පසාරු කර ඇති බවත් දුටුවේ ය.
23 මෙසේ දෙවියන් වහන්සේ ඒ දවසේ දී
කානානිය රජ වූ ජාබීන් ඉශ්රායෙලේ සෙනඟ
ඉදිරියෙහි යටත් කළ සේක. 24 කානාන්හි රජ වූ
ජාබීන් සහමුලින් ම විනාශ කර දමන තුරු
ඉශ්රායෙලේ සෙනඟ ඔහුට විරුද්ධ ව වඩ වඩා
බලවත් ලෙස පහර දුන්නෝ ය.

## දෙබෝරාගේ සහ බාරාක්ගේ ගීය

5 ඒ දවසේ දී දෙබෝරා ද අබීනොවම්ගේ පුත්
බාරාක් ද මෙසේ ගී ගැයූ හ:
2 “අධිපතීන් ඉශ්රායෙල්හි මූලික ව ගිය බැවින්,
සෙනඟ සිය කැමැත්තෙන් ඉදිරියට ආ බැවින්, සමිඳුන්
හට දවේ ගී පැසසුම්.
3 රජ දරුවෙනි අසන්න;
q2 3 අධිපතියෙනි කන් දෙන්න;
q2 3 සමිඳුන් හට මම ගී ගයමි.
q2 3 ඉශ්රායෙල්හි දවේ සමිඳුන් හට පැසසුම් දෙමි.
4 සමිඳුනි, ඔබ සේයිර් සිට නික්ම ගිය කල, ඒදොම්
සිට නැඟී ආ විට දරණි දදෙරා ගියේ ය;
q2 4 ගුවනින් වැසි වැස්සේ ය;
q2 4 මේඝයෙන් වතුර වැස්සුණේ ය.
5 නික්ම 19:18 සීනයි කන්දේ සමිඳුන් ඉදිරියේ,
ඉශ්රායෙල්ගේ දවේ සමිඳුන් හමුයේ කඳු කම්පා වී
ගියේ ය.
6 අනාත්ගේ පුත් ෂම්ගර්ගේ කාලයේ දී, ජායෙල්
සිටි අවදියේ මහ මාවත්වල තවලම් නොගියේ ය.
q2 6 මගීහු අතුරු මාර්ගවලින් ගියහ.
7 දෙබෝරා නම් මා නැඟී එන තෙක්, ඉශ්රායෙල්ට
මා මවක වන තෙක් ඉශ්රායෙල්හි ප්‍රධානීහු
කොහෙත් ම නොසිටියෝ ය.
8 ඔවුන් අමුතු දෙවිවරුන් තෝරාගත් කල, දොරටු
කරා යුද්ධය පැමිණියේ ය.
q1 8 ඉශ්රායෙල්හි සතළිස්දහසක් අතරේ පලිහක්
වත්, හෙල්ලයක් වත් දකින්නට ලැබුණේ ද?
9 සෙනඟ අතරෙන් සිය කැමැත්තෙන් ම, ඉදිරියට ආ
සෙනෙවියන් කෙරේ මාගේ සිත ඇලුම් වේ.
q2 9 සමිඳුන් හට ගී පසස් දවේ.
10 සුදු කොටළුවන් පිට නැඟී එන ඔබත්, බුමුතුරුණු
පිට හිඳින ඔබත්, මඟ යන ඔබ හැම දෙනොත් එය
ප්‍රකාශ කරන්න.
11 ළිං වටේ රැස් ව ජය හඬ නඟන සෙනඟ,
සමිඳුන්ගේ ජය ශ්‍රී සමරති.
q2 11 සෙනඟගේ විජය ශ්‍රී ඔව්හු පසසති.
q1 11 එවිට සමිඳුන්ගේ සෙනඟ සිය නගරවලින්
ගමන් කළහ.
12 පිබිදෙන්න, දෙබෝරා පිබිදෙන්න, පිබිදෙන්න,
පිබිදෙන්න, ගීයක් ගයන්න, නැගිටින්න;
q2 12 අබීනොවම් පුත් බාරාක්, නැගිටින්න;
q2 12 වාලට ගත් අය ගෙනෙයන්න.
13 ඉශ්රායෙලේ සෙනඟ එකල දොරටු කරා ගමන්
ගත්හ.
q2 13 සමිඳුන්ගේ සෙනඟ වීරයන් ලෙස එතුමන්
වෙනුවෙන් සටනට ආහ.
14 ඔව්හු එප්‍රායිම් සිට මිටියාවතට ආහ,
බෙන්ජමින් ගෝත්‍රයේ සෙනඟ ඔවුන්ට එක් වූ හ:

q2 14 මාකීර් කරෙනේ සනෙවේයෝ ද සාබුලාොන්
කරෙනේ නිල යෂ්ටිය දරන්නෝ ද නිලධාරීහු ද
පැමිණිය හ.
15 ඉස්සාකර් ගෝත්‍රයේ අධිපතීහු ද දබෙොරා
සමඟ ආහ, ඉස්සාකර් සමඟ බාරාක් ද පැමිණියේ
ය.
q2 15 ඔහු පසුපස ඔව්හු මිටියාවතට වේගයෙන් දිවූ
හ.
q2 15 එහෙත්, රූබන්ගේ ගෝත්‍රය භේද භින්න වී
දගෙඩියාවෙනේ පසු වූ හ.
16 එඬේරුන්ගේ නළා හඬ අසන පිණිස බැටළු
පට්ටි අතරේ ඔව්හු කුමට සිටියෝ ද?
q2 16 රූබන් ගෝත්‍රය භේද භින්න වී දගෙඩියාවෙනේ
පසු වූ හ.
17 ගිලියද් ගෝත්‍රය ජෝර්දානෙනේ එතරෙ ද දාන්
ගෝත්‍රය තණ බිම් අතර ද නතර වී වාසය කළහ:
q2 17 ආෂෙර් ගෝත්‍රය මුහුදු වරෙළේ ඔවුන්ගේ
තොටුපොළවල් අතරේ සුව සේ වාසය කළෝ ය.
18 සාබුලාොන් ගෝත්‍රයේ සෙනඟ මරණයට මුහුණ
පෑ හ;
q2 18 නප්තලී ගෝත්‍රය ද රණ බිමට බට හ.
19 තයනාක්හි මගිද්දෝ ජලය ළඟ රජවරු යුද්ධ
කළහ;
q2 19 කානානිය රජවරුන් යුද්ධ කළ නමුත් මුදල්
කොල්ලයක් ඔවුන්ට නොලැබුණේ ය.
20 තාරකාවෝ අහසේ සිට යුද්ධ කළෝ ය;
q2 20 සිසරොට විරුද්ධ ව සිය කක්ෂයේ සිට යුද්ධ
කළෝ ය.
21 කීෂොන් ගංගාව, ඒ පැරණි ගංගාව ඔවුන්
ගසාගෙන ගියා ය.
q2 21 සවි ශක්තියෙනේ මම ඉදිරිය ම බලා ගමන්
කරමි.
22 එවිට පොළොව මත අඩි තළ තළා, අශ්වයෝ
පැන පැන ගියහ.
23 'සමිඳුන්ගේ උදව්වට සතුරන්ට විරෝධය පා
ඉදිරියට නා බැවින් මෙරොස්හි වැසියන්ට සාප
වේවා'යි සමිඳුන්ගේ දූතයා කී ය.
24 කේනීය හබෙර්ගේ බිරිඳ වන ජායලේ අන්
කතුන්ට වඩා ආසිරි ලද්දියක් වන්නී ය.
25 සිසරො වතුර ඉල්ලී ය, ඈ කිරි දුන්නා ය;
q2 25 අගනා තැටියක වඬෙරු දා ඔහුට ගෙනවුත්
දුන්නා ය.
26 ඈ සිය වමතින් ඇණයක් ද දකුණතින් කම්කරු
අතකොලුවක් ද රැගෙන අතකොලුවෙනේ සිසරොට
හිස සිදුරු වන්නට ගැසුවා ය.
q2 26 ඔහුගේ නළල සිදුරු කොට එය පොඩි කර
දැම්මා ය.
27 ඇගේ පාමුල ඔහු කිඳා වැටුණේ ය, ඇද
වැටුණේ ය, දිගා වුණේ ය.
q2 27 ඇගේ පාමුල ඔහු කිඳා වැටුණේ ය, ඇද
වැටුණේ ය.
q2 27 කිඳා වැටුණු තැන ම ඔහු නැසුණේ ය.
28 සිසරොගේ මවු කවුළුව තුළින්, ගරාදි අතරනේ
එබී බැලුවා ය.
q2 28 'රථය මෙතෙක් කල් පමා වන්නේත්, රථයේ
අශ්වයන් සුසංගු වන්නේත් මන්දැ'යි සිතුවා ය.
29 ඇගේ නැණවත් කුලඟනෝ ඈට පිළිතුරු දුන්නෝ
ය.
q2 29 එය ඈ තමා හට ම මෙසේ කියාගත්තා ය:
30 'ඔවුන් කොල්ලය සොයනු ඇත.
q2 30 තමන් අතරේ බෙදා ගැනීමට, එකිනකොට
තරුණියන් එක් කෙනෙකු හෝ දෙදෙනෙකු ද
සිසරොට නානා වර්ණ වස්ත්‍රයක්, වයිවර්ණ
ගෙත්තම් වස්ත්‍රයක් ද මාගේ ගලෙ වටා දැමීමට
ගෙත්කම් කළ සළුවක් හෝ දකෙක් ද ඔවුන් රැගෙන
එනු ඇත.'
31 සමිඳුනි, ඔබේ සතුරෝ, මලෙසෙ විනාශ වෙත්
වා!
q2 31 එහෙත්, ඔබට ප්‍රේම කරන්නෝ වීකුමෙනේ
නැඟී එන හිරු මෙනේ වෙත් වා!"
31 හතළිස් වසරක් මුළුල්ලේ දේශයේ සාමය ඇති
විය.

## මිදියන්වරුන්ගෙනේ වූ පීඩා

6 ඉශ්රායලේ සෙනඟ සමිඳාණන් වහන්සේට
විරුද්ධ ව පව් කළෝ ය. ඒ නිසා සමිඳාණන්
වහන්සේ මිදියන්වරුන් අතට ඔවුන් සත් අවුරුද්දකට
පාවා දුන් සේක. 2 මිදියන්වරු ඉශ්රායලේවරුන්ට වඩා
බලසම්පන්න වූ හ. මිදියන්වරුන්ගෙනේ බේරෙනෙ
පිණිස ඉශ්රායලේ සෙනඟ කඳුවිවරවල ගුහා ද
කොටු ද පාවිච්චි කළහ. 3 ඉශ්රායලේවරුන් බීජ
වැපුරූ හැම විට ම මිදියන්වරු ද අමලකේවරු ද
පරෙදිග වැසියෝ ද ඔවුන්ට පහර දනේනට
පැමිණියෝ ය. 4 ඔව්හු ඒ ප්‍රදේශයේ කඳවුරු බැඳ,
ගාසා දොරටු දක්වා පොළොවේ භවභෝග නාස්ති
කළෝ ය. ඔව්හු ආහාර වත්, එළු බැටළුවන් වත්,
ගවයන් වත්, කොටළුවන් වත් ඉශ්රායලේවරුන්ට
ඉතිරි නොකළෝ ය. 5 ඔව්හු තමන්ගේ ගවයන් ද
කූඩාරම් ද ඇතිව පැමිණියෝ ය; ඔව්හු ද ඔවුන්ගේ
ඔටුවෝ ද ගණන් කළ නොහැකි විශාල පළඟැටියන්
සංඛ්‍යාවක් මෙනේ අවුත් දේශය විනාශ කරන පිණිස
එයට ඇතුළු වුණෝ ය. 6 මිදියන්වරුන් නිසා
ඉශ්රායලේවරු ඉතා දුඃඛිත තත්ත්වයකට පත් වුණෝ
ය. එවිට ඉශ්රායලේවරු සමිඳාණන් වහන්සේට
මොරගැසුවෝ ය.
7 මිදියන්වරුන් නිසා ඉශ්රායලේ සෙනඟ සමිඳාණන්
වහන්සේට මොරගැසූ කල, 8 උන් වහන්සේ
දිවැසිවරයකු ඉශ්රායලේ ජනයා වෙත එවූ සේක.
ඔහු ඔවුන් අමතා, "ඉශ්රායලේගේ දෙවි සමිඳාණන්
වහන්සේ මෙසේ කියන සේකැ"යි කී ය. "මම
නුඹලා මිසරයෙනේ පිටතට ගෙනවුත්, වහල්කමේ
නිවාසයෙනේ පිටතට පැමිණෙවුවෙමි. 9 මිසරවරුන්ගේ
අතින් ද නුඹලාට පීඩා කළ සියල්ලන්ගේ අතින් ද
නුඹලා නිදහස් කර, නුඹලා ඉදිරියෙනේ ඔවුන් පන්නා
දමා ඔවුන්ගේ දේශය නුඹලාට දිනිමි. 10 මම
නුඹලාගේ දෙවි සමිඳාණන් වහන්සේ ය කියා ද,
නුඹලා වාසය කළ දේශයේ සිටි අමෝරිවරුන්ගේ

දෙවිවරුන්ට ගරුබුහුමන් නොදක්වන්න කියා ද මම
නුඹලාට කීවෙමි. එහෙත්, නුඹලා මාගේ හඬට
සවන් නොදුන්නාහු ය."

## ගිඩියොන් කැඳවනු ලැබීම

11 සමිඳාණන් වහන්සේගේ දූතයා පැමිණ
අබියෙශේරිය ජෝවාෂ්ට අයත් ඔප්රාහි තිබෙන
ආලෝන අරඹ යට හිඳ ගත්තේ ය. ජෝවාෂ්ගේ පුත්
ගිඩියොන් මිදියන්වරුන්ගෙන් තිරිඟු සඟවාගන්න
පිණිස ඒවා මුද්රික යන්ත්රයෙහි මඬිමින් සිටියේ ය.
12 සමිඳාණන් වහන්සේගේ දූතයා ඔහුට පෙනී,
"ධෛර්යවත්, බලවත් මනුෂ්යය, සමිඳාණන්
වහන්සේ ඔබ සමඟ සිටින සේකැ"යි කී ය.
13 ගිඩියොන් ඔහුට කතා කරමින්, "අහෝ මාගේ
ස්වාමීනි, සමිඳාණන් වහන්සේ අප සමඟ සිටින
සේක් නම්, මේ සියල්ල අපට සිදු වී තිබෙන්නේ
කුමක්නිසා ද? 'සමිඳාණන් වහන්සේ අප මිසරයෙන්
ගෙනා සේකැ'යි කියමින් අපේ පියවරුන් අපට මතක්
කර දුන් උන් වහන්සේගේ සියලු පුදුම ක්රියා
කොහේ ද? දැන් නම්, සමිඳාණන් වහන්සේ අප
අත්හැරදමා, මිදියන්වරුන් අතට අප පාවා දී ඇතැ"යි
කීවේ ය.
14 සමිඳාණන් වහන්සේ ඔහු දෙස බලා, "නුඹට
ඇති බලසම්පන්නකම මෙහෙයවා, මිදියන්වරුන්
අතින් ඉශ්රායෙල්වරුන් ගළවන්න. නුඹ යවන්නේ මම
ය"යි වදාළ සේක.
15 ගිඩියොන් උන් වහන්සේට පිළිතුරු දෙමින්,
"අහෝ, ස්වාමීනි, මා ඉශ්රායෙල්වරුන් ගළවාගන්නේ
කෙසේ ද? බලන්න, මාගේ පවුල මනස්සේ
ගෝත්රයෙහි ඇති ඉතා දුබල පවුල ය; මම ද ඒ
පවුලේ ඉතා ම සුළු තැනැත්තා වෙමි"යි කීවේ ය.
16 සමිඳාණන් වහන්සේ ද, "සැබැවින් මම නුඹ
සමඟ සිටින්නෙමි. නුඹ එක් කෙනෙකුට පහර
දෙන්නාක් මෙන් මිදියන්වරුන්ට පහර දෙන්නෙහි යැ"යි
ඔහුට වදාළ සේක.
17 ඔහු උන් වහන්සේට පිළිතුරු දෙමින්, "ඔබ
වහන්සේ ඉදිරියෙහි මට ප්රසාදය ලැබී තිබේ නම්,
ඔබ මා සමඟ කතා කරන බවට ලකුණක් මට
පෙන්වුව මැනව. 18 ඔබ වෙත මාගේ පූජාව
ගෙනවුත් එය ඔබ ඉදිරියේ තබන තෙක් මෙතැනින්
නොගිය මැනවැ"යි කී ය. උන් වහන්සේ ද, "නුඹ
පෙරළා එන තුරු මම නැවතී සිටින්නෙමි"යි වදාළ
සේක.
19 ගිඩියොන් ඇතුළට ගොස්, එළු පැටවෙකු ද
කිලෝග්රෑම් දහයක් පමණ පිටිවලින් මුහුන් නොදැමූ
රොටි ද සූදානම් කොට, පෙට්ටියක මස් දමා,
භාජනයක සොදි වත්කොට, ආලෝන ගස යටට
ගෙන උන් වහන්සේට ඔප්පු කළේ ය. 20 දෙවියන්
වහන්සේගේ දූතයා, "මස් සහ මුහුන් නොදැමූ
රොටි ගෙන මේ ගල පිට තබා සොදි වත්
කරන්නැ"යි ඔහුට කී ය. ඔහු එසේ කළේ ය.
21 එවිට සමිඳාණන් වහන්සේගේ දූතයා තමාගේ
අතේ තිබූ සැරයටියේ අග දිගු කොට මස්වලටත්,
මුහුන් නොදැමූ රොටිවලටත් තට්ටු කළේ ය. එවිට
පර්වතයෙන් ගිනි මතු වී මස් ද මුහුන් නොදැමූ
රොටි ද දවා දැමී ය: සමිඳාණන් වහන්සේගේ දූතයා
ඔහු ඉදිරියෙන් නොපෙනී ගියේ ය.
22 ගිඩියොන් දුටුවේ, සමිඳාණන් වහන්සේගේ
දූතයා බව ඔහුට පෙනී ගිය විට, "මහෝත්තම දෙවි
සමිඳාණන් වහන්ස, මම සමිඳාණන් වහන්සේගේ
දූතයා මුහුණට මුහුණ ලා දිටිමි"යි කී ය.
23 සමිඳාණන් වහන්සේ, "නුඹට සාමදානය වේ වා!
බිය නොවන්න; නුඹ නසින්නේ නැතැ"යි ඔහුට වදාළ
සේක. 24 එවිට ගිඩියොන් එහි සමිඳාණන්
වහන්සේට පූජාසනයක් ගොඩනඟා, 'සමිඳාණන්
වහන්සේ සාමදානය ය' යන අර්ථය ඇති 'යාවේ-
ෂාලොම්' යන නාමය ඊට තැබුවේ ය. එය අද දවස
දක්වා අබියෙශේරීයවරුන්ට අයිති ඔප්රාහි තිබේ.

## බාල් දෙවියාගේ පූජාසන කඩා දැමීම

25 එදා ම රාත්රියේ සමිඳාණන් වහන්සේ
ගිඩියොන්ට කතා කොට, "නුඹේ පියාට අයිති
ගොනා එනම්, සත් අවුරුදු වයස් ඇති දෙ වන
ගොනා ගෙන ගොස්, නුඹේ පියාට අයිති බාල්
දෙවියාගේ පූජාසනය කඩා දමා, ඒ ළඟ තිබෙන
අෂේරා කප් කණු කපා දමන්න. 26 මේ බලකොටුව
මුදුනේ නුඹේ දෙවි සමිඳාණන් වහන්සේට
පූජාසනයක් නිසි පිළිවෙළට සාදා, ගොනා ගෙන, නුඹ
කපා දමන අෂේරා කප් ලීවලින් දවන යාග
පූජාවක් කොට ඔප්පු කරන්නැ"යි වදාළ සේක.
27 එවිට ගිඩියොන් සිය වැඩකාරයන්ගෙන්
දසදෙනෙකු කැඳවාගෙන, සමිඳාණන් වහන්සේ ඔහුට
වදාළ ලෙසෙ කළේ ය. ඔහු තමාගේ පියාගේ
ගෙවැසියන් නිසාත්, නගර වැසියන් නිසාත් එය
දවාලේ කරන්නට බිය වී රාත්රියේ කළේ ය.
28 නගර වැසියෝ අලුයම අවදි වූ විට, බාල්ගේ
පූජාසනය කඩා තිබෙන බවත්, ඒ ළඟ තිබුණු
අෂේරා කප් කණු කපා, ගොඩනඟා තිබුණු
පූජාසනය මත ගොනා පූජා කර තිබුණු බවත්
දුටුවෝ ය. 29 මෙයෙ කළේ කවරෙක් දැ යි
එකිනෙකාගෙන් අසා විමසූ කල, "ජෝවාෂ්ගේ පුත්
ගිඩියොන් එය කළේ යැ"යි ඔවුන්ට කියන ලද්දේ
ය. 30 එවිට නගර වැසියෝ ජෝවාෂ්ට කතා කොට,
"ඔබේ පුතා බාල් දෙවියාගේ පූජාසනය කඩා දැමූ
නිසා ද ඒ ළඟ තිබුණු අෂේරා කප් කණු කැපූ නිසා
ද ඔහු මරන පිණිස පිටතට ගෙනෙන්නැ"යි කීවෝ ය.
31 ජෝවාෂ් ද ඔහුට විරුද්ධ ව සිටි සියලු දෙනාට
කතා කොට, "ඔබ බාල් උදෙසා කරුණු කියන්නහු ද,
නොහොත් ඔහු ගළවාගන්නට උත්සාහ කරන්නහු ද?
බාල් උදෙසා කරුණු කියන්නට කැමැති තැනැත්තේ
එළි වන්නට පෙර මරනු ලැබේ වා. බාල් දෙවි
කෙනෙක් නම්, ඔහුගේ පූජාසනය යමෙකු කඩා දමා
තිබෙන නිසා ඔහු ම තමා උදෙසා කරුණු කියා වා"යි
කීවේ ය. 32 "බාල්ගේ පූජාසනය කඩා දැමූ නිසා
බාල් ම තමා උදෙසා කරුණු කියා වා"යි ඒ දවසේ දී
කියූ ජෝවාෂ් 'බාල් ම තමාගේ ම විත්තිකාරයා ය'

යන අර්ථය ඇති ජරුබ්බාල් යන නම ගිඩියොන්ට
තැබුවේ ය.
33 එවිට සියලු මිදියන්වරු ද අමලකේවරු ද පෙරදිග
වැසියෝ ද එකට රැස් ව ජොර්දාන් ගඟෙන්
මෙගොඩට අවුත්, ජෙශ්‍රයෙලේ මිටියාවතෙහි කඳවුරු
බැඳගත්තෝ ය. 34 සමිඳාණන් වහන්සේගේ
ආත්මානුභාවය ගිඩියොන් කෙරෙහි පහළ වූයේ ය;
ඔහු හොරණෑව පිම්බේ ය; එවිට අබියෙශේරියවරු
ඔහු ළඟට රැස් වූ හ. 35 ඔහු මනස්සේ ගෝත්‍රය
මුළුල්ලෙහි පණිවුඩකාරයන් යැවී ය; ඔව්හු ද ඔහු
ළඟට රැස් වූ හ. ඔහු ආෂෙර්වරුන් ද
සාබුලොන්වරුන් ද නප්තලීවරුන් ද වෙතටත්
පණිවුඩකාරයන් යැවී ය. ඔව්හු ද ඔහු හමු වන
පිණිස පැමිණියෝ ය.
36 ගිඩියොන් දෙවියන් වහන්සේට කතා කොට,
"ඔබ වහන්සේ වදාළ ලෙස මා ලවා ඉශ්‍රායලේ
ජාතිය ගළවන සේක් නම්, 37 මෙන්න මම, බැටළු
ලොම් මිටියක් කමතේ තබන්නෙමි; මුළු බිම වියළී
තිබියදී, ලොම් මිටිය පිට පමණක් පිනි තිබුණොත්,
ඔබ වහන්සේ වදාළ ලෙස මා ලවා ඉශ්‍රායලේ
ජාතිය ගළවන බව එයින් මම දැනගන්නෙමි"යි
කීවේ ය. 38 එය එසේ ම සිදු විය. ඔහු පසු දා
අලුයම නැඟිට බඳුනක් පිරෙනෙ තරමට වතුර ලොම්
මිටියෙන් මිරිකා හැරියේ ය. 39 යළිත් ගිඩියොන්
දෙවියන් වහන්සේට කතා කොට, "ඔබ
වහන්සේගේ උදහස මට විරුද්ධ ව නොඇවිළේ වා!
තව එක වරක් කතා කරන්නට මට අවසර දුන
මැනව. ලොම් මිටියෙන් තව එක් වතාවක් පමණක්
මට අත්හදා බලන්නට අවසර ලැබේ වා. මුළු බිම
පිට පිනි තිබියදී ලොම් මිටිය පමණක් වියළී තිබේ
වා"යි කී ය. 40 දෙවියන් වහන්සේ ඒ රාත්‍රියේ
එසේ කළ සේක. මුළු බිම පිට පිනි තිබියදී ලොම්
මිටිය පමණක් වියළී තිබුණේ ය.

## හමුදාව තෝරාගැනීම

7 ජරුබ්බාල් නම් ගිඩියොන් ද ඔහු සමඟ සිටි
සියලු සෙනඟ ද අලුයම් වේලෙහි නැඟිට
හාරොද්හි උල්පත ළඟ කඳවුරු බැඳගත්තෝ ය.
ඔවුන්ට උතුරෙන් මිදියන්වරුන්ගේ කඳවුරු
මොරේගේ කන්ද ළඟ මිටියාවතෙහි තිබුණේ ය.
2 එවිට සමිඳාණන් වහන්සේ ගිඩියොන්ට කතා
කොට, "මිදියන්වරුන් නුඹ අතට පාවා දීමට නුඹ
සමඟ සිටින සෙනඟගේ ගණන වැඩි ය, මා එසේ
කළොත්, 'අපේ ශක්තියෙන් ම අපි ගැළවුණෙමු'යි
ඉශ්‍රායලේ සෙනඟ මට ගෞරවය නොදී අහංකාර
වනු ඇත. 3 ද්වි.නී. 20:8එබැවින්, 'භය ද තැතිගැනීම
ද ඇති අය ගිලියද් කන්දේ සිට හැරී යත් වා'යි
ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන්නැ"යි වදාළ සේක. එවිට
සෙනඟගෙන් විසිදෙදහසක් හැරී ගියෝ ය. දසදහසක්
ඉතිරි ව සිටියෝ ය.
4 සමිඳාණන් වහන්සේ ගිඩියොන්ට කතා කොට,
"සෙනඟගේ ගණන තවමත් වැඩි ය. ඔවුන් වතුර
සමීපයට ගෙන එන්න, එහි දී මම ඔවුන් වෙනේ
කොට ඔබට තෝරා දෙන්නෙමි. 'මොහු නුඹ සමඟ
යා යුතු ය'යි මම යමකු ගැන නුඹට කියන්නෙමි ද
ඔහු යන්නේ ය. 'මොහු නුඹ සමඟ නොයා යුතු ය'යි
මම යමකු ගැන නුඹට කියන්නෙමි ද ඔහු
නොයන්නේ යැ"යි වදාළ සේක. 5 ගිඩියොන් සෙනඟ
වතුර ළඟට ගෙනොවේ ය. සමිඳාණන් වහන්සේ
ගිඩියොන්ට කතා කොට, "බල්ලකු ලෙවකා බොන
ලෙසෙ තමන්ගේ දිවෙන් ලෙවකා වතුර බොන හැම
දෙනෙ ද වතුර බොන්නට දණ ගසන හැම දෙනෙ ද
වෙනෙ වෙනෙ ම සිටුවන්නැ"යි වදාළ සේක.
6 තමන්ගේ අතට වතුර ගෙනෙ ලෙවකා බිව් අය
තුන්සියයක් වූ හ; සෙසු සියල්ලෝ වතුර බොන
පිණිස දණ ගැසුවෝ ය. 7 සමිඳාණන් වහන්සේ ද,
"ලෙවකා වතුර බීවාවූ මිනිස්සු තුන්සියය ලවා නුඹලා
ගළවා මිදියන්වරුන් නුඹේ අතට පාවා දෙන්නෙමි.
සෙසු සියල්ලෝ තම තමන්ගේ නිවෙස්වලට යත්
වා"යි ගිඩියොන්ට වදාළ සේක. 8 ගිඩියොන් ඒ
මිනිසුන් තුන්සියය නවත්වාගෙනෙ සෙසු සියලු
ඉශ්‍රායලේවරුන් තම තමන්ගේ කූඩාරම්වලට
යන්නට හැරියේ ය. ඔවුන්ගේ කෑම භාජනත්,
හොරණෑත් ඔහු තබා ගත්තේ ය. මිදියන්වරුන්ගේ
කඳවුර ඔහුට පහළින් මිටියාවතේ තිබුණේ ය.

## මිදියන්වරුන් පරාජය කිරීම

9 එදා රෑ සමිඳාණන් වහන්සේ ගිඩියොන්ට කතා
කොට, "නැඟිට කඳවුරට පහර දෙන්න; මම ඔවුන්
නුඹේ අතට පාවා දෙන්නෙමි. 10 එහෙත්, නුඹ පහර
දෙන්නට භය නම්, නුඹේ මෙහෙකරුවා වන පූරා
සමඟ කඳවුරට බැස යන්න. 11 එවිට ඔවුන් කියන
දේ නුඹට ඇසෙනෙ විට කඳවුරට පහර දෙන්නට නුඹ
ධෛර්යවත් වන්නෙහි ය"යි වදාළ සේක. එවිට
ගිඩියොන් තම මෙහෙකෙරු පූරා සමඟ කඳවුරේ මුර
පොළේ අවි ගත් මිනිසුන් වෙත බැස ගියේ ය.
12 මිදියන්වරු ද අමලකේවරු ද පෙරදිග සියලු
වැසියෝ ද පළඟැටි සමූහයක් මෙන් විශාල ගණනක්
මිටියාවතේ පැතිර සිටියෝ ය. ඔවුන්ගේ ඔටුවෝ ද
මුහුදු වෙරළේ වැලි මෙන් ගණන් කළ නොහැකි
විශාල ගණනක් වූ හ.
13 ගිඩියොන් එතැනට පැමිණි විට එක් මිනිසෙක්
තවත් මිනිසකුට තමා දුටු සිහිනයක් ගැන කියමින්,
"මම සිහිනයක් දිටිමි. යව රොටියක් මිදියන්වරුන්ගේ
කඳවුරට පෙරළීගෙනෙ අවුත් කූඩාරම දක්වා පැමිණ,
එයට හැපී, එය ඊට පහර දී, එය පෙරළා දමා
තිබෙනු දිටිමි"යි කීවේ ය.
14 අනෙක් තැනැත්තා පිළිතුරු දෙමින්, "මෙය
ඉශ්‍රායලේ වැසියකු වන ජෝවාෂ්ගේ පුත්
ගිඩියොන්ගේ කඩුව මිස අනෙකක් නොවේ. ඔහු
අතට දෙවියන් වහන්සේ මිදියන්වරුන් ද සියලු
සේනාව ද පාවා දී තිබේ යැ"යි කීවේ ය.
15 මෙසේ කියන ලද සිහිනය ද එහි තේරුම ද
ගිඩියොන් ඇසූ විට, ඔහු නමස්කාර කොට, ආපසු
ඉශ්‍රායලේ කඳවුරට ගොස්, "නැඟිටින්න; මන්ද,
සමිඳාණන් වහන්සේ මිදියන් සේනාව ඔබ අතට

පාවා දුන් සේකැ"යි කීවේ ය. 16 ඔහු ඒ මිනිසුන්
තුන්සියදෙනා කණ්ඩායම් තුනකට බෙදා ඔවුන්
සියල්ලන් අතට හොරණෑ ද ඇතුළේ පන්දම් ඇති
හිස් කළගෙඩි ද දී, 17 ඔවුන්ට කතා කොට, "මා
කරන හැටි බලා එයාකාර ව කරන්න. මා කඳවුර
අද්දරට පැමිණි විට මා කරන හැටියට ඔබත්
කරන්න. 18 මාත්, මා සමඟ සිටින සියලු දෙනාත්
හොරණෑ පිඹින විට, ඔබත් මුළු කඳවුර වට කරමින්
හොරණෑ පිඹිමින්, 'සමිඳාණන් වහන්සේ සහ
ගිඩියොන් උදෙසා ය' කියා මොරගසන්නැ"යි කීවේ
ය.
19 මෙසේ මධ්‍යම රාත්‍රියේ, මුර මාරු කළ මුල්
අවස්ථාවේ දී ම ගිඩියොන් ද ඔහු සමඟ සිටි
මිනිස්සු සියදෙනා ද කඳවුර අද්දරට පැමිණ හොරණෑ
පිඹ, තමන්ගේ අත්වල තිබූ කළගෙඩි බින්දෝ ය.
20 කණ්ඩායම් තුන ම හොරණෑ පිඹ, කළගෙඩි බිඳ
දමා, වමතින් පන්දම් ද පිඹින පිණිස දකුණතින්
හොරණෑ ද රැගෙන, "සමිඳාණන් වහන්සේගේ ද
ගිඩියොන්ගේ ද කඩුව යැ"යි මොරගැසුවෝ ය.
21 ඔව්හු සියල්ලෝ ම කඳවුර වටේ එකිනෙකා තම
තමන්ගේ ස්ථානයේ සිටියෝ ය. මුළු සේනාව ද
කෑගසමින් පලා ගියෝ ය. 22 ඔව්හු හොරණෑ
තුන්සියය පිම්බෝ ය. එවිට සමිඳාණන් වහන්සේ
කඳවුරේ සිටි අය එකිනෙකා තම තමාගේ කඩුවෙන්
අනෙකාට පහර දෙන්නට සැලැස්සූ සේක. සේනාව ද
ශෙරේරා දෙසට බෙත්-ෂිට්ටා දක්වා ද ටබ්බාත් ළඟ
තිබෙන ආබෙල්-මෙහෝලාහි සීමාව දක්වා ද පලා
ගියෝ ය.
23 නප්තලී ගෝත්‍රයෙන් ද ආෂෙර් ගෝත්‍රයෙන් ද
මුළු මනස්සේ ගෝත්‍රයෙන් ද ඉශ්‍රායෙල් සෙනඟ
රැස් ව මිදියන්වරුන් පස්සේ එළවාගෙන ගියෝ ය.
24 ගිඩියොන් එප්‍රායිම් කඳු රට මුළුල්ලේ ම
පණිවුඩකාරයන් යවා, "මිදියන්වරුන්ට විරුද්ධ ව
අවුත්, ඔවුන් එන්නට පළමුවෙන් බෙත්-බාරා දක්වා
ජොර්දාන් ගඟේ තොටුපොළවල් අල්ලාගන්නැ"යි
කියා යැවී ය. එවිට එප්‍රායිම්හි සියලු මිනිස්සු රැස් ව
බෙත්-බාරා දක්වා ජොර්දාන් තොටුපොළවල්
අල්ලාගත්තෝ ය. 25 ඔව්හු මිදියන්වරුන්ගේ
අධිපතීන් දෙදෙනා වන ඔරෙබ් ද ශීබ් ද අල්ලාගෙන,
ඔරෙබ් නම් පර්වතය ළඟ දී ඔරෙබ් ද ශීබ්හි ඇති
මිදි යන්ත්‍රය ළඟ දී ශීබ් ද මරාදමා, මිදියන්වරුන්
පස්සේ එළවාගෙන ගියෝ ය. ඔව්හු ඔරෙබ්ගේ ද
ශීබ්ගේ ද හිස් දෙක ජොර්දානෙන් එතෙර සිටි
ගිඩියොන් වෙත ගෙනාවෝ ය.

## මිදියන්වරුන්ගේ අන්ත පරාජය

8 එප්‍රායිම් වැසියෝ ගිඩියොන්ට කතා කොට,
"ඔබ මිදියන්වරුන්ට විරුද්ධ ව යුද්ධ කරන්නට
යන කල අපට අඬ නොගසා මෙසේ කළේ
මන්දැ"යි ඔහුට තද ලෙස දොස් පැවරූ හ.
2 ඔහු පිළිතුරු දෙමින්, "ඔබ හැම කළ දේට සමාන
කළ විට මා කළ දේ කුමක් ද? එප්‍රායිම් ගෝත්‍රයට
අයත් ඔබ කළ සුළු දේ අබියෙශෙර් නම් මාගේ
ගෝත්‍රය කළ සියල්ලට වඩා වටිනවා නොවේ ද?
3 ගීතා 83:11ඔබ අතට දෙවියන් වහන්සේ මිදියන්හි
අධිපතීන් වන ඔරෙබ් ද ශීබ් ද පාවා දුන් සේක. ඔබ
කළ දේට සමාන ව මට කරන්නට හැකි වූයේ
කිමෙක් දැ"යි ඔවුන්ගෙන් ඇසී ය. ඔහු එසේ කී කල
ඔහු කෙරෙහි තිබුණ ඔවුන්ගේ කෝපය සංසිඳුණේ
ය.
4 ගිඩියොන් සහ ඔහුගේ මිනිස්සු තුන්සියදෙනා
ජොර්දාන් ගඟ ළඟට පැමිණ එයින් එතෙරේ වූ හ.
ඔව්හු අධික වෙහෙසෙට පත් වී සිටිය නමුත්, එතකේ
සතුරන් ලුහුබැඳ ගියෝ ය. 5 ගිඩියොන් සුක්කොත්හි
මිනිසුන්ට කතා කොට, "මා කැටුව යන මිනිසුන්
අධික වෙහෙසෙට පත් ව සිටින බැවින් ඔවුන්ට රොටි
දුන මැනව; මම මිදියන්හි රජවරුන් වන ශෙබා ද
ශල්මුන්නා ද ලුහුබැඳ යමි"යි කීවේ ය.
6 සුක්කොත්හි අධිපතීහු, "අප විසින් ඔබේ
සේනාවට කෑම දෙනු ලබන පිණිස ශෙබා ද
ශල්මුන්නා ද දැන් ඔබේ අතට අසු වී සිටිත් දැ"යි
ඇසූ හ.
7 "සමිඳාණන් වහන්සේ ශෙබා ද ශල්මුන්නා ද මා
අතට පාවා දුන් විට මම ඔබ හැමගේ මාංසය
වනයේ කටුවලින් ද ගොකටුවලින් ද ඉරා
දමන්නෙමි"යි ගිඩියොන් ඔවුන්ට කීවේ ය.
8 ගිඩියොන් එතැනින් පෙනුයෙල්ට ගොස් එහි
වැසියන්ගෙන් ද එසේ ම ඉල්ලුවේ ය. ඔව්හු ද
සුක්කොත්හි වැසියන් උත්තර දුන් ලෙස ම ඔහුට
උත්තර දුන්නෝ ය. 9 ඔහු පෙනුයෙල්හි මිනිසුන්ට
කතා කොට, "මම ජයාන්විත ව ආපසු ආ විට මේ
බලකොටුව බිඳ දමන්නෙමි"යි කී ය.
10 ශෙබා ද ශල්මුන්නා ද පසළොස්දහසක්
දෙනාගෙන් සමන්විත වූ ඔවුන්ගේ සේනාව සමඟ
කර්කෝර්හි සිටියෝ ය. පූර්ව දිශාවේ වැසියන්ගෙන්
ඉතිරි වූයේ මේ අය පමණකි. මන්ද, යුද්ධයේ දී
එකසිය විසිදහසක් දෙනා නැසුණෝ ය. 11 ගිඩියොන්
නොබාට ද ජොග්බෙහාට ද පෙරෙදිගින්, කූඩාරම්වල
වාසය කරන්නන්ගේ පාරෙන් ගොස්, සේනාව
පරීක්ෂාකාරී ව නොසිටිය දී ඔවුන්ට පහර දුන්නේ
ය. 12 ශෙබා ද ශල්මුන්නා ද පලා ගියෝ ය. ඔහු
ඔවුන් පසුපස ලුහුබැඳ ගොස් මිදියන් රජ වන ශෙබා
ද ශල්මුන්නා ද අල්ලාගත්තේ ය. ඔහු මුළු සේනාව
ද භයගන්වා විසුරුවා හැරියේ ය.
13 ඉන්පසු ජෝවාෂ්ගේ පුත් ගිඩියොන් හෙරෙසේ
දුර්ගමාර්ගයෙන් ගමන් කර අවුත්, 14 සුක්කොත්හි
තරුණයකු අල්ලාගෙන ඔහුගෙන් තොරතුරු විචාළේ
ය. ඔහු සැත්තෑසත්දෙනෙකුන් වන සුක්කොත්හි
අධිපතීන් ද ප්‍රජා මූලිකයන් ද ගැන විස්තර ලියා
දුන්නේ ය. 15 ගිඩියොන් සුක්කොත්හි වැසියන් ළඟට
අවුත්, ඔවුන්ට කතා කොට, "ඔබ මට සරදම් කළ
අවස්ථාව සිහි කරන්න. 'වෙහෙස වූ ඔබේ මිනිසුන්ට,
අප විසින් කෑම දෙනු ලබන පිණිස ශෙබා ද
ශල්මුන්නා ද ඔබේ අතට අසු ව සිටිත් දැ'යි ඔබ
කීවහු ය. ඒ ශෙබා ද ශල්මුන්නා ද මෙන්න,
බලන්නැ"යි කී ය. 16 ඔහු නගරයේ ප්‍රජා මූලිකයන්
අල්ලා වනයේ කටු ගස් ද ගොකටු ද රැගෙන එයින්

සුක්කොත්හි මිනිසුන් මට්ටු කළේ ය. 17 ඔහු
පෙනුයෙල්හි බලකොටුව ද කඩා දමා නගරයේ
වැසියන් මැරුවේ ය.
18 එවිට ගිඩියොන් ශබොට හා ශල්මුන්නාට කතා
කොට, “ඔබ තාබෝර්හි මැරූ අය කොයි ආකාර
මිනිස්සු දැ”යි ඇසුවේ ය. ඔව්හු පිළිතුරු දෙමින්, “ඒ
අය ඔබ වාගේ ය. එකිනෙකා පෙනීමෙන් රාජ
කුමාරයන්ට සමාන ය”යි කීවෝ ය.
19 ගිඩියොන් ද, “ඔව්හු මාගේ සහෝදරයෝ ය,
මාගේ මෑණියන්ගේ පුත්‍රයෝ ය. ඔබ ඔවුන්
නොමැරුවහු නම්, මමත් ඔබ නොමරමි යි ජීවමාන
සමිඳාණන් වහන්සේගේ නාමයෙන් දිවුරා කියමි”යි
කීවේ ය. 20 ඔහු තමාගේ කුලුඳුල් පුත් ජෙතෙරේට,
“නැඟිට ඔවුන් මරන්නැ”යි කී ය. එහෙත්, ඒ තරුණයා
බිය වී කඩුව නොඇද සිටියේ ය. මන්ද, ඔහු ඒ තාක්
තරුණයෙකු ව සිටි බැවිනි.
21 එවිට ශබො ද ශල්මුන්නා ද කතා කොට, “ඔබ
ම නැඟිට අප මරන්න. මන්ද, ලොකු මිනිසෙකු කළ
යුතු දේ ලොකු මිනිසෙකු ම කළ යුතු ය”යි කීවෝ
ය. ගිඩියොන් නැඟිට ශබො ද ශල්මුන්නා ද මරා,
ඔවුන්ගේ ඔටුවන්ගේ කරේ තිබුණු අඩ සඳාකාර
ආභරණ ගත්තේ ය.

## ගිඩියොන් සෑදූ රන් ඒපොද් පිළිමය

22 ඉශ්‍රායෙල් ජනයා ගිඩියොන්ට කතා කොට,
“ඔබ ද ඔබේ පුත්‍රයා ද ඔබේ පුත්‍රයාගේ පුත්‍රයා
ද අප කෙරෙහි ආණ්ඩු කළ යුතු ය. මන්ද, ඔබ
මිදියන්වරුන්ගේ අතින් අප ගළවා ගත්තෙහි යැ”යි කී
හ.
23 ගිඩියොන් පිළිතුරු දෙමින්, “මම ඔබ කෙරෙහි
ආණ්ඩු නොකරන්නෙමි; මාගේ පුත්‍රයා වත් ඔබ
කෙරෙහි ආණ්ඩු නොකරන්නේ ය; සමිඳාණන්
වහන්සේ ඔබ කෙරෙහි ආණ්ඩු කරන සේකැ”යි
කීවේ ය. 24 ගිඩියොන් තවදුරටත් කතා කරමින්,
“මම ඔබ හැමගෙන් ඉල්ලීමක් කරමි. ඔබ එකිනෙකා
කොල්ලකෑ කුණ්ඩලාභරණ මට දෙන්නැ”යි කීවේ ය.
ඔහු එසේ කීවේ, සතුරන් ඉෂ්මායෙල්වරුන් බැවින්
ඔවුන්ට රන් කුණ්ඩලාභරණ තිබුණු නිසා ය.
25 ඔව්හු, “අපි ඒවා කැමැත්තෙන් ම දෙමු”යි
පිළිතුරු දී වස්ත්‍රයක් අතුරා එක් එක්කෙනා
කොල්ලකෑ කුණ්ඩලාභරණ එහි දැමුවෝ ය.
26 මිදියන්හි රජුු පැළඳ සිටි අඩ සඳ වැනි ආභරණ ද
කර්ණාභරණ ද රත් නිල් වස්ත්‍ර ද ඔවුන්ගේ
ඔටුවන්ගේ කර වටා තිබුණු මාල ද හැර ඔහු ඉල්ලා
ගත් රන් කුණ්ඩලාභරණවල බර රන් කිලෝග්‍රෑම්
විස්සක් පමණ විය. 27 ගිඩියොන් එයින් පිළිමයක්
සාදා එය තමාගේ නගරය වූ ඔප්රාහි පිහිටවූවේ
ය. ඉශ්‍රායෙල්වරු සියලු දෙනා සමිඳාණන් වහන්සේට
අවිශ්වාසවන්ත වී ඒ පිළිමය වැළඳගත්හ. එය
ගිඩියොන්ටත්, ඔහුගේ පවුලටත් මලපතක් මෙන්
විය.

## ගිඩියොන්ගේ මරණය

28 මෙසේ මිදියන්වරු ඉශ්‍රායෙල් සෙනඟ විසින්
යටත් කරනු ලැබූ හ: ඉන්පසු ඔවුන්ට බලය පාන්නට
නොහැකි විය. ගිඩියොන්ගේ පාලන කාලයේ දී
දේශයේ සතළිස් අවුරුද්දක් සාමය පැවතුණේ ය.
29 ජෝවාෂ්ගේ පුත් ජෙරුබ්බාල් හෙවත් ගිඩියොන්
තමාගේ ම ගෙදරට ගොස් එහි වාසය කළේ ය.
30 ගිඩියොන්ට දාව උපන් පුත්‍රයෝ හැත්තෑදෙනෙක්
වූ හ. එසේ වූයේ, ඔහුට බොහෝ භාර්යාවන් සිටි
බැවිනි. 31 ෂෙකෙම්හි ඔහුට උපභාර්යාවක් ද සිටියා
ය. ඇගෙන් ඔහුට පුත්‍රයෙක් ලැබුණේ ය. ඔහු ඔහුට
අබිමෙලෙක් යන නම තැබී ය. 32 ජෝවාෂ්ගේ පුත්
ගිඩියොන් දීර්ඝායු වළඳා මියගොස්, අබියෙශ්‍රීවරුන්ට
අයත් ඔප්රාහි තමාගේ පියා වූ ජෝවාෂ්ගේ
සොහොන් ගෙහි තැන්පත් කරනු ලැබුවේ ය.
33 ගිඩියොන් මියගිය පසු ඉශ්‍රායෙල් ජනයා යළිත්
වහා ම සමිඳාණන් වහන්සේට අවිශ්වාසවන්ත වී
බාල් දේවතාවා වැළඳ ගෙන ඔහුට නමස්කාර
කරන්නට පටන්ගෙන බාල්-බෙරීත් තමන්ට දෙවි ලෙස
තබා ගත්තෝ ය. 34 ඔවුන් වට කර සිටි සියලු
සතුරන්ගේ අත්වලින් ඔවුන් ගළවා ගත් ඔවුන්ගේ
දෙවි සමිඳාණන් වහන්සේ ඔව්හු අමතක කළෝ ය.
35 එපමණක් නොව, ජෙරුබ්බාල් හෙවත් ගිඩියොන්
ඉශ්‍රායෙල් ජනයාට කළ සියලු යහපත් දේට ඔබින
ලෙස ඔහුගේ පවුලට ඔව්හු කළෙහිගුණ ද
නොදැක්වූ හ.

## අබිමෙලෙක්ගේ කැරලි ගැසීම

9 ජෙරුබ්බාල්ගේ පුත් අබිමෙලෙක් ෂෙකෙම්හි
සිටි තමාගේ මවගේ සහෝදරයන් ළඟට
ගොස්, ඔවුන්ටත්, තමාගේ මවගේ පිය වංශයේ
මුළු පවුලටත් කතා කොට, 2 “ෂෙකෙම්හි සියලු
වැසියන්ගෙන් මෙසේ ප්‍රශ්න කරන්න, ‘ඔබට වඩා
හොඳ සේ පෙනෙන්නේ කුමක් ද? ජෙරුබ්බාල්ගේ
සියලු පුත්‍රයන් එනම්, සැත්තෑදෙනෙකු ඔබ කෙරෙහි
අධිපතිකම් කිරීම ද නැතහොත් එක් කෙනෙකු
අධිපතිකම් කිරීම ද?’ මා වනාහි ඔබේ ම ලේ
නෑයෙකු බවත් සිහි කරන්නැ”යි කීවේ ය. 3 ඔහුගේ
මවගේ සහෝදරයෝ ඔහු වෙනුවෙන් ෂෙකෙම්හි
සියලු වැසියන් සමඟ මේ කරුණු ගැන කතා කළහ.
ඔව්හු අබිමෙලෙක් අනුගමනය කරන්නට තීරණය
කරගත්හ. ඔවුන් එසේ කළේ, ඔහු ඔවුන්ගේ ම
ඥාතියෙකු වන බැවිනි. 4 තවද, ඔව්හු බාල්-
බෙරීත්ගේ දේවාලයෙන් රිදී මිල සැත්තෑවක් ඔහුට
දුන්නෝ ය. එයින් අබිමෙලෙක් තමා කැටුව යන
පිණිස කමකට නැති චණ්ඩි මිනිසුන් කුලියට ගත්තේ
ය. 5 ඔහු ඔප්රාහි තමාගේ පියාගේ ගෙදරට ගොස්
ජෙරුබ්බාල්ගේ පුත්‍රයන් වන තමාගේ ම
සහෝදරයන් සැත්තෑදෙනා එක ගලක් මත මැරුවේ
ය. එහෙත්, ජෙරුබ්බාල්ගේ බාල ම පුත්‍රයා වන
ජෝතාම් සැඟ වී සිටි බැවින් නොමැරී බේරුණේ ය.
6 ඉන්පසු ෂෙකෙම්හි සියලු වැසියෝ ද මිල්ලෝහි

සියලු වැසියෝ ද එක් ව ගොස් ෂකෙමේහි තිබුණු
කණුව අසල ආලෝන වෘක්ෂය ළඟ දී අබීමලෙක්
රජකමට පත් කළෝ ය.

### ජෝතාම්ගේ උපමාව

7 මේ කරුණ ගැන ජෝතාම්ට දැන්වූ විට ඔහු
ගොස් ගරිසීම් කන්ද පිට සිට මොරගසමින් මෙසේ
කීවේ ය: “ෂකෙමේහි වැසියෙනි, දෙවියන් වහන්සේ
ඔබට සවන් දෙන පිණිස, ඔබ මට සවන් දෙන්න.
8 එක් කලෙක වෘක්ෂයෝ තමන් කෙරෙහි රජකු
පත් කරගන්නට ගිය හ. ඒ වෘක්ෂයෝ, ‘ඔබ අප
කෙරෙහි රජ වුණ මැනවැ’යි ඔලීව වෘක්ෂයට කී හ.
9 ඔලීව ගස ඒ වෘක්ෂයන්ට පිළිතුරු දෙමින්, ‘දෙවියන්
වහන්සේට ද මනුෂ්‍යයන්ට ද ගෞරව කරන්නට
පාවිච්චි කරන මාගේ තෙල් අත්හැර ඔබ කෙරෙහි
රජ කරන පිණිස යාම මට යුතු දැ’යි ඇසී ය.
10 එවිට වෘක්ෂයෝ, ‘ඔබ අවුත් අප කෙරෙහි රජ
වුණ මැනවැ’යි අත්තික්කා ගසට කී හ. 11 අත්තික්කා
ගස ඒ වෘක්ෂයන්ට පිළිතුරු දෙමින්, ‘ඔබ කෙරෙහි
රජ කරන පිණිස, මාගේ හොඳ එල ද එහි මිහිර ද
අත්හැරීම යුතු දැ’යි ඇසී ය. 12 එවිට වෘක්ෂයෝ,
‘ඔබ අවුත් අප කෙරෙහි රජ වුණ මැනවැ’යි මිදි
වැලට කී හ. 13 මිදි වැල පිළිතුරු දෙමින්, ‘ඔබ
කෙරෙහි රජකම් කරන පිණිස, මා දෙවිවරුන් සහ
මනුෂ්‍යයන් ප්‍රීති කරවන මාගේ මිදියුස අත්හැරීම
යුතු දැ’යි ඇසී ය. 14 එවිට සියලු වෘක්ෂයෝ, ‘ඔබ
අවුත් අප කෙරෙහි රජ වුණ මැනවැ’යි කටුඇඹිල්ල
ගසට කී හ. 15 කටුඇඹිල්ල ගස පිළිතුරු දෙමින්, ‘ඔබ
සැබෑවට ම ඔබ කෙරෙහි රජකු කොට මා
පත්කරගන්නහු නම්, අවුත් මාගේ සෙවණෙහි
රැකවරණය ලබා සිටින්න. එසේ නොකළොත්,
කටුඇඹිල්ල ගසෙන් ගින්නක් නික්ම ලෙබනොන්හි
කිහිරි ගස් දවාලන්නේ යැ’යි වෘක්ෂයන්ට කීවේ ය.
16 “දැන් ඉතින් ෂකෙමේ වැසියෙනි, ඔබ හැම සැබෑ
ලෙස ද අවංක ලෙස ද ක්‍රියා කොට අබීමලෙක්
රජකමට පත් කළහු ද? ජෙරුබ්බාල්ගේ ක්‍රියාවලට
ඔබින ලෙස ඔහුටත්, ඔහුගේ පවුලේ අයටත් යුතු
දේ කළහු ද? 17 මාගේ පියා තමාගේ ජීවිතය
නොතකා ඔබ උදෙසා යුද්ධ කර මිදියන්වරුන්ගේ
අත්වලින් ඔබ ගැළවුවේ ය. 18 එහෙත්, ඔබ අද
මාගේ පියාගේ වංශයට විරුද්ධ ව නැඟී සිට
ඔවුන්ගේ පුත්‍රයන් සැත්තෑදෙනෙකු එක ගල පිට
මරා, ඔහුගේ දාසියගේ පුත්‍ර අබීමලෙක් ඔබේ
ඥාතියකු වන බැවින් ඔහු ෂකෙමේහි වැසියන්
කෙරෙහි රජකමට පත් කළහු ය. 19 ඔබ මෙසේ අද
දවසේ ජෙරුබ්බාල්ට සහ ඔහුගේ පවුලට සැබෑ ලෙස
ද අවංක ලෙස ද ක්‍රියා කළහු නම්, අබීමලෙක්
ගැන ප්‍රීති වන්න; ඔහුත් ඔබ ගැන ප්‍රීති වේ වා.
20 එසේ නැත්නම්, අබීමලෙක්ගෙන් ගිනි නික්ම
ෂකෙමේ වැසියන් ද මිල්ලෝ වංශය ද දවා දමා වා!
ෂකෙමේ වැසියන්ගෙන් ද මිල්ලෝ වංශයෙන් ද ගිනි
නික්ම අබීමලෙක් දවා දමා වා!” 21 එවිට ජෝතාම්
තමාගේ සහෝදර අබීමලෙක්ට බියෙන් බයෙර්ට
පලා ගොස් එහි විසුවේ ය.

### අබීමලෙක්ගේ නැඟීම හා වැටීම

22 අබීමලෙක් ඉශ්රායලේහි අවුරුදු තුනක් රජකම්
කළේ ය. 23 ඉන්පසු අබීමලෙක් සහ ෂකෙමේ
වැසියන් අතරේ විරුද්ධවාදිකමක් දෙවියන් වහන්සේ
ඇති කළ සේක. ෂකෙමේ වැසියෝ අබීමලෙක්ට
විරුද්ධ ව ද්‍රෝහිකම් කළෝ ය. 24 මෙසේ වූයේ,
ජෙරුබ්බාල්ගේ පුත්‍රයන් සැත්තෑදෙනාට කරන ලද
අයුක්තියේත්, ඔවුන්ගේ ලේ වැගිරීමේත්
ප්‍රතිවිපාකය ඔවුන් මැරූ ඔවුන්ගේ සහෝදරයා වන
අබීමලෙක් පිටත්, ඔහුගේ සහෝදරයන් මැරීමට
අනුබල දුන් ෂකෙමේ වැසියන් පිටත් පැමිණෙන
පිණිස ය. 25 ෂකෙමේ වැසියෝ ඔහුට විරුද්ධ ව කඳු
මුදුන්වල මිනිසුන් රහසින් සිටවේවෝ ය. ඔව්හු ඒ
මාර්ගයෙහි ඔවුන් ළඟින් යන සියල්ලන්ගෙන්
කොල්ලකෑවෝ ය. එපවත් අබීමලෙක්ට දන්වන
ලද්දේ ය.
26 තවද, ඒබෙද්ගේ පුත් ගයල් සිය සහෝදරයන්
සමඟ ෂකෙමේට පැමිණියේ ය. ෂකෙමේ වැසියෝ
ඔහු කෙරෙහි විශ්වාසය තැබූ හ. 27 ඔව්හු
කෙතේවලට ගොස් තමන්ගේ මිදිවතුවලින් පල
නෙළා, මැඩගෙන, මංගල්‍ය පවත්වමින්, තමන්ගේ
දෙවියන්ගේ දේවාලයට ඇතුළු වී, කා බී
අබීමලෙක්ට දෙස් තැබුවෝ ය. 28 ඒබෙද්ගේ පුත්
ගයල් කතා කොට, “අප විසින් අබීමලෙක්ට සේවය
කරනු ලැබීමට ඔහු කවරෙක් ද? ෂකෙමේ වැසියෝ
කවුරු ද? අබීමලෙක් ජෙරුබ්බාල්ගේ පුත්‍රයා
නොවේ ද? ඔහුගේ අධිපතියා ශබුල් නොවේ ද?
අප ඔහුට සේවය කරන්නේ කුමට ද? ඔබේ
ගෝත්‍රය පිහිටවූ, ඔබේ පියා වූ හාමොර්ට
පක්ෂපාත ව සිටින්න. එසේ නම්, අප ඔබට සේවය
කළ යුත්තේ මන් ද? 29 අහෝ! මේ මිනිස්සු මා
යටතේ සිටිත් නම්, මම අබීමලෙක්ට පහර
දෙන්නෙමි. ‘ඔබේ සේනාව තර කරගෙන සටන්
කරන පිණිස පිටතට එන්නැ’යි අබීමලෙක්ට
කියන්නෙමි”යි කීවේ ය.
30 නගරයේ අධිපතියා වන ශබුල් ඒබෙද්ගේ පුත්
ගයල්ගේ වචන ඇසූ කල ඔහුගේ කෝපය
ඇවුළුණේ ය. 31 ඔහු රහසින් පණිවුඩකාරයන්
අබීමලෙක් වෙත යවා, “බලන්න, ඒබෙද්ගේ පුත්
ගයල් ද ඔහුගේ ඥාතීහු ද ෂකෙමේට අවුත් සිටිති.
ඔව්හු ඔබට විරුද්ධ ව නගරවැසියන් පොළඹවති.
32 එබැවින් ඔබ සහ ඔබ සමඟ සිටින සෙනඟ
රාත්‍රියේ පිටත් වී, කෙතේ සැඟවී සිට 33 ඉර උදා
වූ වහා ම නැඟිට, නුවර ආක්‍රමණය කරන්න. එවිට
ඔහු ද ඔහු සමඟ සිටින සෙනඟ ද ඔබට විරුද්ධ ව
පිටතට ආ කල්හි ප්‍රස්තාවෝචිත ලෙස ඔවුන්ට කළ
යුතු දේ කරන්නැ”යි කියන්නට කීවේ ය.
34 අබීමලෙක් ද ඔහු සමඟ සිටි මුළු සෙනඟ ද
රාත්‍රියේ පිටත් ව අවුත් කණ්ඩායම් හතරකට බෙදී
ෂකෙමේට පහර දෙන්නට රැකබලා සිටියෝ ය.

35 ඒබෙද්ගේ පුත් ගයල් ද පිටතට ගොස් නුවරට
ඇතුළු වන දොරකඩ සිටියේ ය. අබිමෙලෙක් ද ඔහු
සමඟ සිටි සෙනඟ ද සැඟවී සිටි තැනින් නැඟිට
ආවෝ ය. 36 ගයල් සෙනඟ දැක, “අන්න, සෙනඟක්
කඳු මුදුන්වලින් එති”යි ශබුල්ට කීවේ ය. ශබුල් ද,
“සෙනඟ මෙන් ඔබට පෙනෙන්නේ කඳුවල ඇති
සෙවණැලි යැ”යි ඔහුට කීවේ ය.
37 ගයල් නැවත කතා කොට, “අන්න, රටේ
සෙනඟ ද උස් පළාතෙන් බැස එති; තවත්
කණ්ඩායමක් මයොනෙනීම්හි ආලෝන අරඹට යන
මාර්ගයෙන් බැස එති”යි කී ය.
38 එවිට ශබුල් ඔහුට පිළිතුරු දෙමින්, “ ‘අප විසින්
සේවය කරනු ලැබීමට අබිමෙලෙක් කවරෙක් දැ’යි
කීවාවූ ඔබේ කට දැන් කොහේ ද? මේ ඔබ විසින්
හෙළා දකින ලද මිනිස්සු නොවෙත් ද? ඉතින් දැන්
ඔබ ඔවුන්ට විරුද්ධ ව ගොස් සටන් කරන්නැ”යි
කීවේ ය. 39 එවිට ගයල් ෂෙකෙම් වැසියන්ට
පෙරටුව ගොස් අබිමෙලෙක්ට විරුද්ධ ව සටන්
කළේ ය. 40 අබිමෙලෙක් ඔහු එළවාගෙන ගියේ ය.
ගයල් ද අබිමෙලෙක් ඉදිරියෙන් පලා ගියේ ය. නුවර
දොරකඩට පැමිණෙන තුරු බොහෝ දෙනෙක් මැරුම්
කා වැටුණෝ ය. 41 අබිමෙලෙක් අරුමාහි වාසය
කළේ ය. ශබුල් වනාහි ගයල්ට ද ඔහුගේ
ඥාතීන්ට ද ෂෙකෙම්හි වාසය කරන්නට ඉඩ නොදී
ඔවුන් නෙරපා දැමුවේ ය.
42 පසු දින ෂෙකෙම් වැසියෝ පිටතට ගියෝ ය. ඒ
බව අබිමෙලෙක්ට දන්වන ලද්දේ ය. 43 ඔහු සෙනඟ
කැඳවා කණ්ඩායම් තුනකට බෙදා පිටත සැඟවී
සිටියේ ය. සෙනඟ නුවරින් පිටතට එන බව ඔහු දුටු
විට, ඔහු ඔවුන්ට විරුද්ධ ව නැඟී අවුත් ඔවුන්ට
පහර දුන්නේ ය. 44 අබිමෙලෙක් ද ඔහු සමඟ වූ
කණ්ඩායම ද ඉදිරියට දිව ගොස් නුවරට ඇතුළු වන
දොරකඩ සිටියෝ ය. කණ්ඩායම් දෙකෙක් පිටත සිටි
සියල්ලන් වෙත දිව ගොස් ඔවුන්ට පහර දුන්නෝ ය.
45 අබිමෙලෙක් ඒ දවස මුළුල්ලෙහි ෂෙකෙම් නුවරට
විරුද්ධ ව සටන් කොට, එය අල්ලාගෙන, එහි
සෙනඟ මරා, නුවර බිඳ හෙළා එහි ලුණු වැපුරුවේ
ය.
46 ෂෙකෙම්හි කොටුවේ සිටි සියලු දෙනා ඒ අසා,
බෙරිත් නම් දෙවියාගේ දේවාලයේ කොතට ඇතුළු
වුණෝ ය. 47 ෂෙකෙම්හි කොටුවේ මිනිසුන් සියලු
දෙනා එක්රැස් ව සිටින බව අබිමෙලෙක්ට දන්වන
ලද්දේ ය. 48 අබිමෙලෙක් ද ඔහු සමඟ සිටි සියලු
සෙනඟ ද ශල්මොන් කන්දට නැඟී ගියෝ ය.
අබිමෙලෙක් සිය අතින් පොරොවක් ගෙන, ගසකින්
අත්තක් කපා, එය ඔසවා ඔහුගේ කරපිට තබාගෙන,
තමා සමඟ සිටි සෙනඟට කතා කොට, “මා කරනවා
ඔබ දුටු දේ ම ඔබත් ඉක්මනින් කරන්නැ”යි කීවේ
ය. 49 එවිට සියලු දෙනා එකිනෙකා අත්තක් බැගින්
කපාගෙන, අබිමෙලෙක් පසුපස්සේ ගොස්, ඒවා
කොත ළඟ තබා, මිනිසුන් ඇතුළේ සිටිද්දී කොත
ගිනි ලෑවෝ ය. මෙසේ ෂෙකෙම් කොටුවේ සිටි
දහසක් පමණ ස්ත්‍රී-පුරුෂ සියලු දෙනා මියගියහ.
50 ඉක්බිති අබිමෙලෙක් තේබේශ්ට ගොස්, එය
වටලා, එය අල්ලාගත්තේ ය. 51 ඒ නුවර තුළ
ශක්තිමත් බලකොටුවක් තිබුණේ ය. ස්ත්‍රී-පුරුෂ
සියලු දෙනා ද නුවර වැසි සියල්ලෝ ද එයට පලා
ගොස් දොර වසාගෙන, කොටුවේ පියස්ස මුදුනට
නැඟී සිටියෝ ය. 52 අබිමෙලෙක් කොටුව ළඟට
අවුත්, ඊට විරුද්ධ ව සටන් කොට කොටුවේ දොර
පුළුස්සා දමන පිණිස එය ළඟට ගියේ ය. 53 2 සාමු
11:21එවිට එක්තරා ස්ත්‍රියක් අබිමෙලෙක්ගේ හිස
පිටට ඇඹරුම් ගලක් හෙළා ඔහුගේ හිස් කබල
පොඩි කළා ය. 54 අබිමෙලෙක් සිය ආයුධ රැගත්
තරුණයා ඉක්මනින් කැඳවා, “ ‘ස්ත්‍රියක් ඔහු මැරුවා
ය’යි මිනිසුන් මා ගැන නොකියන පිණිස ඔබේ කඩුව
ඇද මා මරන්නැ”යි කී ය. තරුණයා ඔහුට ඇන්නේ
ය. ඔහු මළේ ය. 55 ඉශ්රායලේ සෙනඟ අබිමෙලෙක්
මළ බව දැක සියල්ලෝ ම තම තමන්ගේ ගෙවලට
ගියෝ ය.
56 දෙවියන් වහන්සේ, අබිමෙලෙක් තම
සහෝදරයන් සැත්තෑදෙනා මැරීමෙන් තමාගේ පියාට
කළ දුෂ්ටකමට ප්‍රතිවිපාක දුන් සේක. 57 ෂෙකෙම්හි
මිනිසුන්ගේ දුෂ්ටකමේ ප්‍රතිවිපාකය දෙවියන්
වහන්සේ ඔවුන් පිට පැමිණෙවූ සේක. මෙසේ
ජෙරුබ්බාල්ගේ පුත් ජෝතාම් කළ සාපය ඉෂ්ට විය.

## තෝලා සහ ජායීර්

10 අබිමෙලෙක්ට පසුව ඉස්සාකර් වැසියෙකු වූ
දෝදෝගේ පුත්‍රයා වූ පුවාගේ පුත් තෝලා
ඉශ්රායලේවරුන් ගළවන්නට ඉදිරිපත් වුණේ ය. ඔහු
එප්‍රායිම් කඳු රටේ වූ ෂාමීර්හි වාසය කළේ ය.
2 ඔහු විසිතුන් අවුරුද්දක් වීරයකු මෙන් ඉශ්රායලේ
පාලනය කොට, නැසී, ෂාමීර්හි තැන්පත් කරනු ලැබී
ය.
3 ඔහුට පසු ගිලියද් වැසියෙකු වූ ජායීර් ඉදිරිපත් වී
විසි දෑවුරුද්දක් වීරයකු මෙන් ඉශ්රායලේ පාලනය
කළේ ය. 4 ඔහුට පුත්‍රයෝ තිස්දෙනෙක් සිටියෝ
ය. ඔවුන් එකිනෙකොට නැඟී යාම පිණිස කොටළුවෝ
තිස්දෙනෙක් වූවෝ ය. ඔවුන්ට ගිලියද් දේශයෙහි
නගර තිහක් ද තිබුණේ ය. ඒවාට හවොත්-ජායීර්
කියා අද දවස දක්වා කියනු ලැබේ. 5 ජායීර් ද නැසී
කාමොන්හි තැන්පත් කරනු ලැබී ය.

## ඉශ්රායලේවරුන්ට පීඩා කිරීම

6 ඉශ්රායලේ ජනයා නැවතත් සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි පව් කොට, බාල් දේවතාවන්ටත්,
අෂ්ටාරොත් දේවතාවීටත්, සිරියාවේ දෙවිවරුන්ටත්,
සීදොන්හි දෙවිවරුන්ටත්, මෝවබ්හි දෙවිවරුන්ටත්,
අම්මොන්වරුන්ගේ දෙවිවරුන්ටත්, පිලිස්තිවරුන්ගේ
දෙවිවරුන්ටත් වැඳුම්පිදුම් කළෝ ය; සමිඳාණන්
වහන්සේට වැඳුම්පිදුම් නොකොට උන් වහන්සේ
අත් හැරියෝ ය. 7 සමිඳාණන් වහන්සේගේ උදහස
ඉශ්රායලේ සෙනඟට විරුද්ධ ව ඇවිළී, උන් වහන්සේ
ඔවුන් පිලිස්තිවරුන්ගේ අතට ද අම්මොන්වරුන්ගේ
අතට ද පාවා දුන් සේක. 8 ඔවුන් ඒ අවුරුද්දේ පටන්

දසඅට අවුරුද්දක් ජෝර්දානනේ එගොඩ ගිලියද්හි
තිබනෙ අමෝරිවරුන්ගේ දේශයේ සිටි සියලු
ඉශ්රායලේ ජනයාට පීඩා කොට ඔවුන් මැඬලූවෝ ය.
9 තවද, අම්මොන්හි සනෙඟ ජුදා ගෝත්රයටත්,
බනේජමින් ගෝත්රයටත්, එප්රායිම් ගෝත්රයටත්
විරුද්ධ ව යුද්ධ කරන පිණිස ජෝර්දානනේ
මගෙොඩට ආවෝ ය. මසෙේ ඉශ්රායලේ සනෙඟ
බරපතල අමාරුවකට පත් වූ හ.
10 එවිට ඉශ්රායලේ සනෙඟ සමිඳාණන් වහන්සේට
මොරගසා, "අපි අපේ දවේියන් වහන්සේ අත්හැර
බාල් දේවතාවන්ට වැඳුම්පිදුම් කිරීමනේ ඔබ
වහන්සේට විරුද්ධ ව පව් කළෙමු"යි කීවෝ ය.
11 සමිඳාණන් වහන්සේ ඉශ්රායලේ සනෙඟට
පිළිතුරු දමේින්, "මිසරවරුන්ගනේ ද අමෝරිවරුන්ගනේ
ද අම්මොන්වරුන්ගනේ ද පිලිස්තිවරුන්ගනේ ද මම
නුඹලා ගළවා නොගතිම් ද? 12 සීදොන්වරුන් සහ
අමලකේවරුන් ද මායොන්වරුන් ද නුඹලාට පීඩා කළ
විට, නුඹලා මට මොරගැසූ කල්හි ඔවුන්ගේ අතිනුත්
මම නුඹලා ගැළවවූෙමේ. 13 එහතේ, නුඹලා මා
අත්හැර අන් දවේිවරුන්ට වැඳුම්පිදුම් කළහු ය.
එබැවින් දැන් මම නුඹලා නොගළවන්නමේ.
14 නුඹලා තෝරාගත් දවේිවරුන් කරා ගොස් ඔවුන්ට
මොරගසන්න. ඔව්හු නුඹලාගේ විපත්ති කාලයේ දී
නුඹලා ගළවත්වා"යි වදාළ සේක.
15 ඉශ්රායලේ ජනයා සමිඳාණන් වහන්සේට කතා
කොට, "අපි පව් කළෙමු. ඔබ වහන්සේට සුදුසු
යැයි පනෙනෙ දයෙක් අපට කළ මැනව. එහතේ, මේ
වතාවේ අප ගැළවවූ මැනවැ"යි කීවෝ ය. 16 එවිට
ඔව්හු අන් දවේිවරුන් තමන් කරෙනේ පහ කර දමා,
සමිඳාණන් වහන්සේට වැඳුම්පිදුම් කළෝ ය. උන්
වහන්සේ ඉශ්රායලේවරුන්ගේ කාලකණ්ණිකම ගැන
ශෝක වූ සේක.
17 එකල අම්මොන් ජනයා රුස් ව ගිලියද්හි කඳවුරු
බැඳගත්තෝ ය. ඉශ්රායලේ ජනයා රුස් වී මිශ්පාහි
කඳවුරු බැඳගත්තෝ ය. 18 එවිට සනෙඟ හා
ගිලියද්හි අධිපතියෝ එකිනකොට කතා කරමින්,
"අම්මොන් සනෙඟට විරුද්ධ ව සටන් කරන්නට
පටන්ගන්න මිනිසා කවරකේ ද? ඔහු ගිලියද්හි සියලු
වැසියන් කරෙහෙි ප්රධානියා කරන්නමු"යි කී හ.

## ජෙප්තාගේ පාලන කොන්දේසි

11 ගිලියද් වැසියකුෙ වූ ජෙප්තා බලසම්පන්න
හෝවායකේ විය. ඔහු වශේයා ස්ත්රියකගේ
පුත්රයකේ. ඔහුගේ පියාගේ නම ගිලියද් ය.
2 ගිලියද්ගේ භාර්යාව ඔහුට දාව පුත්රයන් ලැබූවා
ය. ඔහුගේ භාර්යාවගේ පුත්රයන් වැඩී වයසට
පැමිණි කල, ඔව්හු ජෙප්තාට කතා කොට, "ඔබ අන්
ස්ත්රියකගේ පුතකුෙ බැවින්, අපේ පියාගේ ගදෙර
උරුමකරුවකේ නොවන්නහෙි ය" කියා එළවාදැමූවෝ
ය. 3 එවිට ජෙප්තා තමාගේ සහෝදරයන් ඉදිරියනේ
පලා ගොස් ටෝබ් දේශයේ වාසය කළෙේ ය.
කමකට නැති මිනිස්සු ජෙප්තාට එකතු වී ඔහු
කැටුව ගියෝ ය.
4 කලකට පසු අම්මොන්වරු ඉශ්රායලේවරුන්ට
විරුද්ධ ව යුද්ධ කළෝ ය. 5 අම්මොන්වරුන්
ඉශ්රායලේවරුන්ට විරුද්ධ ව යුද්ධ කරන විට, ගිලියද්
දේශයේ ප්රජා මූලිකයෝ ටෝබ් දේශයනේ ජෙප්තා
කැඳවාගනෙ එන්නට ගොස්, 6 ඔහුට කතා කොට,
"අප අම්මොන්වරුන්ට විරුද්ධ ව යුද්ධ කරන පිණිස
අපේ අධිපතියා වන්නට පැමිණනේනැ"යි ඉල්ලා
සිටියෝ ය.
7 ජෙප්තා පිළිතුරු දමේින්, "ඔබ මා කරෙහෙි වරෙ
බැඳ, මාගේ පියාගේ ගදෙරින් මා පන්නා දැමූවා
නොවේ ද? දැන් ඔබේ විපතේ දී කුමක් නිසා මා
ළඟට ආවහු දැ"යි ඔවුන්ගනේ ඇසුවේ ය.
8 එවිට ගිලියද් දේශයේ ප්රජා මූලිකයෝ පිළිතුරු
දමේින්, "අප දැන් යළිත් ඔබ ළඟට ආවේ, ඔබ අප
සමඟ ගොස්, අම්මොන්වරුන්ට විරුද්ධ ව යුද්ධ කර,
ගිලියද් වැසියන් වන අප සියල්ලන්ට ප්රධානියා වන
පිණිස යැ"යි ජෙප්තාට කී හ.
9 ජෙප්තා ඔවුන්ට කතා කොට, "අම්මොන්වරුන්ට
විරුද්ධ ව යුද්ධ කරන පිණිස ඔබ මා යළිත් කැඳවා
ගනෙ ගිය විට, සමිඳාණන් වහන්සේ ඔවුන් මා අතට
පාවා දුන්නොත්, මම ඔබේ ප්රධානියා වන්නමේ
දැ"යි ඇසුවේ ය.
10 එවිට ඔව්හු පිළිතුරු දමේින්, "සමිඳාණන්
වහන්සේ අප අතරේ සාක්ෂි දනෙ සේක. සැබැවින්
ම ඔබේ වචනය ලසෙ ම කරන්නමු"යි ජෙප්තාට කී
හ. 11 එවිට ජෙප්තා ගිලියද්හි ප්රජා මූලිකයන්
සමඟ නික්ම ගියේ ය. සනෙඟ ඔහු තමන්ගේ
ප්රධානියා ද අධිපතියා ද කරගත්හ. ජෙප්තා
මිශ්පාහි දී ඔහුගේ සියලු කොන්දේසි සමිඳාණන්
වහන්සේ ඉදිරියහෙි කීවේ ය.

## ජෙප්තා සහ අම්මොන්වරුන්ගේ රජ

12 ජෙප්තා අම්මොන්වරුන්ගේ රජු වතෙ
පණිවුඩකාරයන් යවා, "ඔබ මාගේ දේශයට විරුද්ධ
ව යුද්ධ කරන පිණිස පැමිණියේ, මා සහ ඔබ
අතරේ ඇති කුමන ආරාවුලක් නිසා දැ"යි ඇසුවේ ය.
13 අම්මොන්වරුන්ගේ රජ ජෙප්තාගේ
පණිවුඩකාරයන්ට පිළිතුරු දමේින්, "මා එසේ කළෙේ,
ඉශ්රායලේ ජනයා මිසර දේශයනේ ආ කල
අර්නොන් පටන් ජබ්බොක් හා ජෝර්දාන් දක්වා
මාගේ දේශය පැහැරගත් නිසා ය; එහයෙින්, දැන් ඒ
රටවල් සාමදානයනේ ආපසු දනේනැ"යි කීවේ ය.
14 ජෙප්තා අම්මොන්වරුන්ගේ රජු වතෙ
පණිවුඩකාරයන් යැව්වේ ය. 15 "ජෙප්තා මසෙේ
කියන්නේ යැ"යි ඔව්හු කී හ: "ඉශ්රායලේවරුන්
මෝවබ් දේශය වත්, අම්මොන්වරුන්ගේ දේශය වත්
පැහැරගත්තේ නැත. 16 එහතේ, ඉශ්රායලේවරුන්
මිසර දේශයනේ ආ කල ඔව්හු රතු මුහුද දක්වා
පාළුකරයේ ගමන් කර කාදෂේට පැමිණියෝ ය.
17 ගණන් 20:14-21එවිට ඉශ්රායලේවරු ඒදොම් රජු
වතෙ පණිවුඩකාරයන් යවා, 'ඔබේ දේශය මැදින්
යන්නට අපට අවසර ලැබේවා'යි කී හ. එහතේ,
ඒදොම් රජු එයට සවන් නොදුන්නේ ය. මෝවබ් රජු

වතෙටත් එසේ ම පණිවුඩකාරයෝ යවනු ලැබූ හ.
ඔහු ද ඒ ඉල්ලීමට කැමැති නො වී ය. ඉශ්රායලේවරු
කාදෙෂ්හි නැවතී සිටියෝ ය. 18 ගණන් 21:4ඉන්පසු
ඔව්හු පාළුකරය මැදින් ගමන් කොට ඒදොම්
දේශයත්, මෝවබ් දේශයත් වටකරින් ගොස්,
මෝවබ් දේශයේ නැගෙනහිරින් අවුත්, මෝවබ්
සීමාව ඇතුළතට නොපැමිණ, අර්ණොන් ඔයෙනේ
එගොඩ කූඩාරම් පිහිටුවාගත්තෝ ය. මන්ද,
අර්ණොන් ඔය මෝවබ් සීමාව වූ බැවිනි. 19 ගණන්
21:21-24එවිට ඉශ්රායලේවරු හෙෂ්බොන්හි රජු වන
අමෝරිවරුන්ගේ රජ වූ සීහොන් වෙත
පණිවුඩකාරයන් යවා, 'ඔබේ දේශය මැදින් අපේ ම
දේශයට යන්නට අපට අවසර දුන මැනවැ"යි කී හ.
20 එහෙත්, සීහොන් රජ තමාගේ දේශය මැදින්
ඉශ්රායලේවරුන් යාම ගැන සැක කර, තමාගේ මුළු
සෙනඟ රැස් කොට, ජහශ්හි කඳවුරු බැඳ,
ඉශ්රායලේවරුන්ට විරුද්ධ ව යුද්ධ කළෙේ ය.
21 ඉශ්රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ
සීහොන් රජු සහ ඔහුගේ මුළු සෙනඟ
ඉශ්රායලේවරුන් අතට පාවා දුන් සේක.
ඉශ්රායලේවරු ඔවුන්ට පහර දී ඒ දේශවාසී වූ
අමෝරිවරුන්ගේ මුළු රට හිමි කරගත්තෝ ය.
22 "ඔව්හු අර්ණොන් පටන් ජබ්බොක් දක්වා ද
පාළුකරයේ පටන් ජොර්දාන් දක්වා ද
අමෝරිවරුන්ගේ මුළු දේශය හිමි කරගත්තෝ ය.
23 මෙසේ ඉශ්රායලේවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේ තමන්ගේ සෙනඟ වන ඉශ්රායලේවරුන්
ඉදිරියෙනේ අමෝරිවරුන් පන්නා දමා තිබිය දී, ඔබ
ඔවුන්ගේ රට හිමි කරගන්නට අදහස් කරන්නෙහි ද?
24 ඔබේ දෙවි වන කමෝෂ් ඔබට හිමි කරගැනීමට
දුන් දේ ඔබට හිමි කරගත හැකි ය. එලෙස ම අපේ
දෙවි සමිඳාණන් වහන්සේ අප ඉදිරියෙනේ පන්නා දැමූ
සියල්ලන්ගේ රට අපිත් හිමි කරගනිමු. 25 ගණන්
22:1-6ශිප්පොර්ගේ පුත් මෝවබ්හි රජ වූ බාලාක්ට
වඩා ඔබ කොයි අයුරකින් වත් උතුම් ද? ඔහු
ඉශ්රායලේවරුන් සමඟ කවරදා වත් ආරාවුල් කළෙේ
ද? ඔවුන්ට විරුද්ධ ව කවරදා වත් යුද්ධ කළෙේ ද?
26 ඉශ්රායලේවරුන් වනාහි හෙෂ්බොන් හා ඊට අයිති
නගරවල ද අරෝයෙරේ හා ඊට අයිති නගරවල ද
අර්ණොන් අසබඩ තිබෙන සියලු නගරවල ද අවුරුදු
තුන්සියයක් වාසය කරද්දී ඔබ ඒ කාලය අතරතුරේ
දී ඒවා ගළවා නොගත්තේ මන් ද? 27 එබැවින් මම
ඔබට විරුද්ධ ව වරදක් නොකළෙමි. එසේ වුව ද
මට විරුද්ධ ව යුද්ධ කිරීමෙනේ ඔබ මට අයුත්තක්
කරන්නෙහි ය. විනිශ්චයකාරයාණන් වන සමිඳාණන්
වහන්සේ ඉශ්රායලේවරුන් හා අම්මොනේවරුන්
අතරේ අද විනිශ්චය කරන සේක් වා." 28 එසේ
වුවත්, අම්මොනේවරුන්ගේ රජ, තමාට ජෙප්තා එවූ
පණිවුඩයට සවන් නුදුන්නේ ය.

### ජෙප්තාගේ දුව පිළිබඳ බාරය

29 සමිඳාණන් වහන්සේගේ ආත්මානුභාවය
ජෙප්තා කෙරෙහි පහළ විය. ඔහු ගිලියද් සහ
මනස්සේ මැදින් ගොස් ගිලියද්හි මිශ්පාට පැමිණ
එතැන් සිට අම්මොනේවරුන් වෙත ගියේ ය.
30 ජෙප්තා සමිඳාණන් වහන්සේට බාරයක් වමින්,
"ඔබ වහන්සේ සැබැවින් අම්මොනේවරුන් මා අතට
පාවා දෙන සේක් නම්, 31 මා සාමදානයෙනේ
අම්මොනේවරුන් වෙතින් හැරී එන කල, මා හමු වන
පිණිස මාගේ ගෙයින් පිටත් ව එන කවරෙකු වුවත්,
ඔහු සමිඳාණන් වහන්සේට අයිති වන්නේ ය; මම
ඔහු දවන යාග පූජාවක් කොට ඔප්පු කරන්නෙමි"යි
කීවේ ය.
32 මෙසේ ජෙප්තා අම්මොනේවරුන්ට විරුද්ධ ව යුද්ධ
කරන පිණිස ඔවුන් කරා ගියේ ය. සමිඳාණන්
වහන්සේ ද ඔහු අතට ඔවුන් පාවා දුන් සේක.
33 ඔහු නගර විස්සකින් සමන්විත අරෝයෙරේ පටන්
මින්නිත්ට පැමිණෙන තැන දක්වා ද ආබලේ-කෙරොමිම්
දක්වා ද ඔවුන්ට පහර දී ඉමහත් ඝාතනයක් කළෙේ
ය. මෙසේ අම්මොනේවරු ඉශ්රායලේවරුන් විසින්
යටත් කරනු ලැබූ හ.
34 ජෙප්තා මිශ්පාහි තමාගේ ගෙදරට එන විට,
ඔහුගේ දුව රබන් ගසමින් ද නටමින් ද ඔහුගේ
පෙරමඟට ආවා ය. ඈ වූ කලී ඔහුගේ එක ම දරුවා
ය. ඈ හැර ඔහුට පුතකේ වත්, දුවක් වත් නො වූ හ.
35 ගණන් 30:2ඔහු ඇය දුටු විට, තමාගේ වස්ත්ර
ඉරාගෙන, "අහෝ මාගේ දියණියෙනි! ඔබ මා
ඉමහත් දුකට පත් කළෙහි ය. ඔබ මාගේ දුක්
වේදනාවට හේතු වූයේ මන් ද? මා එසේ
කියන්නේ, මම සමිඳාණන් වහන්සේට මාගේ මුවින්
පොරොන්දුවක් වූ බැවිනි. එය වෙනස් කළ නොහැකි
ය"යි කී ය.
36 ඈ ද පිළිතුරු දෙමින්, "මාගේ පියාණෙනි, ඔබේ
මුවින් ඔබ සමිඳාණන් වහන්සේට පොරොන්දුවක්
වුණෙහි නම්, ඔබ දුන් පොරොන්දුව ලෙසෙ මට
කරන්න; ඔබේ සතුරන් වන අම්මොනේවරුන්ගෙනේ
ඔබ උදෙසා උන් වහන්සේ පළිගත් සේකැ"යි කීවා
ය. 37 තවදුරටත් ඈ පියාට කතා කොට, "මෙසේ මට
අවසර ලැබේ වා. මා ද මාගේ යෙහෙළියන් ද ගොස්
කඳුවල ඇවිද, මාගේ කන්යාභාවය ගැන
වැලපෙනේනට මට දෙමසක් කල් දුන මැනවැ"යි කීවා
ය. 38 ඔහු ද ඈට, "යන්නැ"යි කියා ඈ දෙමසකට
පිටත් කර යැව්වේ ය. ඈ ඇගේ යෙහෙළියන් සමඟ
කඳුකරයට ගොස් ඇගේ කන්යාභාවය ගැන
වැලපුණා ය. 39 දෙමස ගෙවී ගිය කල ඈ ඇගේ
පියා වෙත හැරී ආවා ය. එවිට ඔහු තමා කළ බාරය
අනුව ඈට කළෙේ ය. ඈ කන්යාවක් ව සිටියා ය.
මෙය ඉශ්රායලේවරුන් අතරේ ඇති වූ සිරිතකි.
40 එනම්, ගිලියද්හි ජෙප්තාගේ දුව සිහි කිරීම පිණිස
අවුරුද්දකට සතර දවසක් බැගින් ඉශ්රායලේ දූවරුන්
ගෙදෙරින් පිටත් ව යාම අවුරුදු පතා පවත්වන
ඔවුන්ගේ සිරිතක් ය.

## එප්‍රායිම්වරුන් සමඟ සටන

12 එප්‍රායිම් වැසියෝ රැස් වී, උතුරු දිශාවට
එතරෙ වී ගොස් ජප්තාට කතා කොට, “ඔබ
සමඟ යන පිණිස අපට ආරාධනා නොකොට, ඔබ
අම්මොන්වරුන්ට විරුද්ධ ව යුද්ධ කරන්නට එගොඩට
ගියේ මන් ද? අපි ඔබේ නිවසෙ ඔබත් ඇතුළු ව
ගින්නනේ පුළුස්සා දමන්නමෝ”යි කී හ.
2 ජප්තා ඔවුන්ට කතා කොට, “මාගේ සෙනඟත්,
මමත් අම්මොන්වරුන්ට විරුද්ධ ව තදබල ආරාවුලක
යෙදී සිටියෙමු. මා ඔබට අඬගැසූ නමුත්, ඔවුන්ගේ
අතින් ඔබ මා නොගැළවෙව්වහු ය. 3 ඔබ මා
නොගැළවූ බව දුටු විට මම මාගේ ජීවිතය
නොතකා, අම්මොන්වරුන්ට විරුද්ධ ව එගොඩට
ගියෙමි. සමිඳාණන් වහන්සේ ඔවුන් මා අතට පාවා
දුන් සේක. ඉතින් ඔබ හැම මට විරුද්ධ ව සටන්
කරන්නට අද දවසේ මා වෙත ආවේ කුමක් නිසා
දැ”යි කීවේ ය. 4 එවිට ජප්තා ගිලියද්හි සියලු
මිනිසුන් රැස් කරවාගෙන එප්‍රායිම්ට විරුද්ධ ව යුද්ධ
කළේ ය. එසේ කළේ, “එප්‍රායිම්වරුන් හා
මනස්සේවරුන් අතර වසන ගිලියද්වරුනි, ඔබ
එප්‍රායිම් කරෙනේ පලා ගිය අය යැ”යි
එප්‍රායිම්වරුන් කී බැවිනි. 5 ගිලියද්වරු එප්‍රායිම්ට
යන ජොර්දාන් තොටුපොළවල් අල්ලාගත්තෝ ය.
පලාගිය එප්‍රායිම්වරුන්ගෙනේ යමකු අවුත්, “මට
එගොඩ වන්නට අවසර දෙන්නැ”යි කී කල, ගිලියද්
සෙනඟ, “ඔබ එප්‍රායිම් වැසියෙක් දැ”යි ඔහුගෙනේ
අසති. ඔහු “නැතැ”යි කීවොත්, 6 “ ‘ෂිබ්බොලෙත්’
කියා කියාපන්නැ”යි ඔව්හු ඔහුට කියති. ඔහුට එය
හරියට උච්චාරණය නොකළ හැකි ව, ‘සිබ්බොලෙත්’
කියා කීවොත්, ඔව්හු ඔහු අල්ලා ජොර්දාන්
තොටුපොළවල් ළඟ මරති. ඒ අයුරින්
එප්‍රායිම්වරුන්ගෙනේ සතළිස්දෙදහසක් මැරුම්කෑවෝ
ය. 7 ජප්තා සය අවුරුද්දක් ඉශ්‍රායලේ රට පාලනය
කළේ ය. ඉන්පසු ගිලියද් වැසියකු වූ ජප්තා
මියගියේ ය. ගිලියද්හි ඔහුගේ ම නගරයක ඔහු
තැන්පත් කරන ලද්දේ ය.

## ඉබ්ශාන්, ඒලොන් සහ අබ්දොන්

8 ජප්තාට පසුව බෙත්ලෙහෙමේහි ඉබ්ශාන්
ඉශ්‍රායලේ රට පාලනය කළේ ය. 9 ඔහුට
පුත්‍රයෝ තිස්දෙනෙක් ද දූවරු තිස්දෙනෙක් ද
සිටියෝ ය. ඔහු දූවරුන් තිස්දෙනා ඔහුගේ වංශයෙනේ
පිටත අයට සරණපාවා දී, ඔහුගේ පුත්‍රයන්ට
පිටතින් කාන්තාවන් තිස්දෙනෙකු ගෙනාවේ ය. ඔහු
සත් අවුරුද්දක් ඉශ්‍රායලේ රට පාලනය කළේ ය.
10 ඉබ්ශාන් මියගිය පසු බෙත්ලෙහෙමේහි තැන්පත්
කරන ලද්දේ ය.
11 ඔහුට පසුව සාබුලොන් වැසියකු වූ ඒලොන්
ඉශ්‍රායලේ පාලනය කළේ ය. ඔහු දස අවුරුද්දක්
ඉශ්‍රායලේ පාලනය කළේ ය. 12 සාබුලොන්
වැසියකු වූ ඒලොන් මියගිය පසු සාබුලොන් රටේ
තිබෙන අයාලෝන්හි තැන්පත් කරන ලද්දේ ය.
13 ඔහුට පසුව පිරාතෝනි වැසියකු වූ
හිල්ලෙල්ගේ පුත් අබ්දොන් ඉශ්‍රායලේ රට පාලනය
කළේ ය. 14 ඔහුට පුත්‍රයෝ සතළිස්දෙනෙක් ද
මුණුබුරෝ තිස්දෙනෙක් ද සිටියෝ ය. ඔවුන්
එක්තනකොට නැඟී යන පිණිස කොටළුවෝ
හැත්තෑදෙනෙක් වූ හ. ඔහු අට අවුරුද්දක් ඉශ්‍රායලේ
රට පාලනය කළේ ය. 15 පිරාතෝනි වැසියකු වූ
හිල්ලෙල්ගේ පුත් අබ්දොන් ද මියගොස් එප්‍රායිම්හි
අමලෙක්වරුන්ගේ කඳුකරයේ පිරාතෝන්හි තැන්පත්
කරන ලද්දේ ය.

## සම්සොන්ගේ උපත

13 ඉශ්‍රායලේ සෙනඟ නැවතත් සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි පව් කළෝ ය. සමිඳාණන්
වහන්සේ ඔවුන් පිලිස්තිවරුන්ගේ අතට සතළිස්
අවුරුද්දකට පාවා දුන් සේක.
2 දාන්ගේ වංශයට අයිති ශෝරාහි එක්තරා
මිනිසෙක් සිටියේ ය. ඔහුගේ නම මානෝවා ය.
ඔහුගේ භාර්යාව වඳ වූ බැවින් දරුවන් නොලැබ
සිටියා ය. 3 සමිඳාණන් වහන්සේගේ දූතයා ඒ
ස්ත්‍රියට පෙනී මෙසේ කීවේ ය: “නුඹ වඳ ව දරුවන්
නොලැබ සිටින්නෙහි ය. එහෙත්, නුඹ පිළිසිඳගෙන
පුත්‍රයකු ලබන්නෙහි ය. 4 ඒ නිසා දැන් ඉතින්
මුද්‍රික පානය වත්, සැර බීම වත් නොබී, අපවිත්‍ර
දයෙක් නොකා සිටින හැටියට වගබලාගන්න.
5 ගණන් 6:1-5මන්ද, නුඹ පිළිසිඳගෙන පුත්‍රයකු
ලබන්නෙහි ය. දැළි පිහියකින් ඔහුගේ කෙස්
නොකැපිය යුතු ය. මන්ද, දරුවා ගර්භයේ පටන්
දෙවියන් වහන්සේට කැප කරන ලද නාසරීයයකු
විය යුතු බැවිනි. ඔහු පිලිස්තිවරුන්ගේ අතින්
ඉශ්‍රායලේවරුන් ගළවා ගන්නේ ය.”
6 එවිට ඒ ස්ත්‍රිය ඇගේ පුරුෂයා වෙත අවුත්
මෙසේ කීවා ය: “දෙවියන් වහන්සේට කැප වූ
මනුෂ්‍යයෙක් මා ළඟට ආවේ ය. ඔහුගේ පෙනීම
දේව දූතයකුගේ පෙනීම හා සමාන ව ඉතා
ප්‍රතාපවත් ව තිබුණේ ය. ඔහු කොතැනින් ආවේ ද
කියා මම නොඇසීමි. ඔහු තමාගේ නම මට
දැන්වූයේ නැත. 7 එහෙත්, ඔහු මට කතා කොට,
‘බලන්න, නුඹ පිළිසිඳගෙන පුත්‍රයකු ලබන්නෙහි ය;
ඒ නිසා දැන් ඉතින් මුද්‍රික පානය වත්, සැර බීම වත්
නොබී, අපවිත්‍ර කිසි දයෙක් නොකා සිටින්න. මන්ද,
ඒ දරුවා ගර්භයේ පටන් මැරෙන දවස දක්වා
දෙවියන් වහන්සේට කැප කරන ලද නාසරීයයකු
විය යුතු ය’යි කීවේ ය.”
8 එවිට මානෝවා සමිඳාණන් වහන්සේට
කන්නලව් කරමින්, “අහෝ, සමිඳුනි, ඔබ විසින් එවන
ලද දෙවියන් වහන්සේට කැප වූ මනුෂ්‍යයා නැවත
අප ළඟට අවුත්, උපදින්නට යන දරුවාට අප විසින්
කරනු ලැබිය යුතු දේ ඉගැන්වූව මැනවැ”යි කීවේ ය.
9 දෙවියන් වහන්සේ මානෝවාගේ කන්නලව්වට
ඇහුම්කන් දුන් සේක. දේව දූතයා ඒ ස්ත්‍රිය
කෙතේ සිටිය දී යළිත් ඈ ළඟට පැමිණියේ ය.
එහෙත්, ඇගේ පුරුෂයා වන මානෝවා ඈ ළඟ

නොසිටියේ ය. 10 ස්ත්‍රිය ඉක්මනින් දුව ගොස්,
“මෙන්න, එදා මා ළඟට ආ මනුෂ්‍යයා මට දැන්
පෙනුණේ යැ”යි ඇගේ පුරුෂයාට දැන්වූවා ය.
11 මානෝවා නැඟිට සිය භාර්යාව කැටුව ගොස්, ඒ
මනුෂ්‍යයා ළඟට පැමිණ, “මේ ස්ත්‍රියට කතා කළ
මනුෂ්‍යයා ඔබ දැ”යි ඔහුගෙන් ඇසී ය. ඔහු ද, “ඔව්,
මම යැ”යි පිළිතුරු දුන්නේ ය.
12 එවිට මානෝවා කතා කොට, “ඔබ කී දේ ඉටු
වූ විට, දරුවා හැසිරිය යුත්තේ කෙසේ ද? ඔහු කළ
යුත්තේ කුමක් දැ”යි ඇසුවේ ය.
13 සමිඳාණන් වහන්සේගේ දූතයා මානෝවාට
කතා කොට, “මා ස්ත්‍රියට කී සියල්ල කිරීමට ඈ
වගබලාගනී වා. 14 මුද්‍රික වැලෙන් උපදින කිසිවක්
නොකා, මුද්‍රික පානය වත් සුරා බීම වත් නොබී,
අපවිත්‍ර කිසිවක් නොකා සිටීවා. මා විසින් ඈට අණ
කරන ලද සියල්ල ඈ කළ යුතු යැ”යි කී ය.
15 මානෝවා සමිඳාණන් වහන්සේගේ දූතයාට
කතා කොට, “අප විසින් ඔබට එළු පැටවකු උයා
පිළියෙළ කරනු ලබන තුරු, ඔබ නවත්වාගන්නට
අපට අවසර ලැබේවා”යි කීවේ ය. 16 සමිඳාණන්
වහන්සේගේ දූතයා, “නුඹ මා නවත්වාගන්න නමුත්,
නුඹේ කෑමෙන් නොකන්නෙමි; එහෙත්, නුඹ දවන
යාග පූජාවක් පිළියෙළ කරන්නහි නම්, ඒ නුඹ
විසින් සමිඳාණන් වහන්සේට ඔප්පු කරනු ලැබිය
යුතු යැ”යි මානෝවාට කීවේ ය. ඔහු සමිඳාණන්
වහන්සේගේ දූතයා බව මානෝවා නොදැන සිටියේ
ය.
17 මානෝවා ද, “ඔබ කී ලෙස සිද්ධ වූ කල අප
ඔබට ගෞරව කරන පිණිස ඔබේ නාමය කිමෙක්
දැ”යි සමිඳාණන් වහන්සේගේ දූතයාගෙන් ඇසුවේ
ය.
18 උත් 32:29 සමිඳාණන් වහන්සේගේ දූතයා
පිළිතුරු දෙමින්, “නුඹ මාගේ නාමය ගැන
විචාරන්නේ මන් ද? එය අබිරහසකැ”යි කීවේ ය.
19 එවිට මානෝවා එළු පැටවාත්, ආහාර පූජාවත්
ගෙනවුත්, අරුමපුදුම දේ කරන සමිඳාණන්
වහන්සේට පර්වතය මත පූජා කළේ ය. 20 ගිනි
ජාලාව පූජාසනයෙන් අහස දෙසෙ නඟින අතර,
සමිඳාණන් වහන්සේගේ දූතයා ගිනි ජාලාවෙහි නැඟී
ගියේ ය. මානෝවා ද ඔහුගේ භාර්යාව ද බලාගෙන
සිටියෝ ය. එවිට ඔව්හු මුණින්තළා වැටුණෝ ය.
21 ඉන්පසු සමිඳාණන් වහන්සේගේ දූතයා
මානෝවාට වත්, ඔහුගේ භාර්යාවට වත්
නොපෙනුණේ ය. එවිට මානෝවා ඔහු සමිඳාණන්
වහන්සේගේ දූතයා බව දැන ගත්තේ ය.
22 මානෝවා කතා කොට, “අප දෙවියන් වහන්සේ
දුටු නිසා ඒකාන්තයෙන් නසින්නෙමු”යි තම භාර්යාවට
කීවේ ය.
23 එහෙත්, ඔහුගේ භාර්යාව, “සමිඳාණන්
වහන්සේ අප නසන්නට කැමැති සේක් නම්, උන්
වහන්සේ අපේ අතින් දවන යාග පූජාවක් හා
ආහාර පූජාවක් පිළිගන්නේ වත්, උන් වහන්සේ මේ
සියල්ල අපට පෙන්වන්නේ වත්, මේ කාලයේ දී
අපට මෙබඳු දේවල් දන්වන්නේ වත් නැතැ”යි ඔහුට
කීවා ය.
24 ඒ ස්ත්‍රිය පුත්‍රයකු ලැබූ පසු ඈ ඔහුට
සැම්සන් යන නම තැබුවා ය. දරුවා වැඩුණේ ය.
සමිඳාණන් වහන්සේ ඔහුට ආශීර්වාද කළ සේක.
25 සැම්සන් ශොරාටත් එෂ්තායොල්ටත් අතරෙහි වූ
දාන්ගේ කඳවුරේ සිටිය දී, සමිඳාණන් වහන්සේගේ
ආත්මානුභාවය ඔහු ක්‍රියාවේ පොළඹවන්නට
පටන්ගත්තේ ය.

### සැම්සන් කාන්තාවකට පෙමේ බැඳීම

14 සැම්සන් තිම්නා නගරයට ගියේ ය. එහි දී
ඔහු පිලිස්ති ජාතික එක් කාන්තාවක දුටුවේ
ය. 2 ඔහු අවුත් තම පියාටත් මවටත් කතා කොට,
“පිලිස්තිවරුන්ගේ දූවරුන්ගෙන් එක් කාන්තාවක
තිම්නාහි දී මම දිටිමි. ඈ මාගේ බිරිඳ කරගන්න
පිණිස මට ඈ ලබාදෙන්නැ”යි කීවේ ය.
3 එවිට ඔහුගේ මවුපියෝ ඔහුට කතා කොට,
“ඔබ අචර්මඡේදිත පිලිස්තිවරුන්ගෙන් බිරිඳක
ගන්නට යන්නේ, ඔබේ ඥාතීන්ගේ දූවරුන් අතරේ
වත්, අපේ සෙනඟ අතරේ වත් කාන්තාවක නැති
නිසා දැ”යි ඔහුගෙන් ඇසූ හ. එහෙත් සැම්සන්, “ඒ
කාන්තාව මට ලබා දෙන්න, මම ඈට කැමැත්තෙමි”යි
තම පියාට කීවේ ය.
4 මේ කටයුත්ත සම්බන්ධයෙන් ක්‍රියා කළේ,
සමිඳාණන් වහන්සේ බව ඔහුගේ දෙමවුපියෝ
නොදැන සිටියෝ ය. මන්ද, සමිඳාණන් වහන්සේ
පිලිස්තිවරුන්ට විරුද්ධ ව සටන් කිරීමට අවස්ථාවක්
සොයමින් සිටි සේක. ඒ කාලයේ දී පිලිස්තිවරු
ඉශ්‍රායලේවරුන් පාලනය කළෝ ය.
5 සැම්සන් ඔහුගේ මවුපියන් සමඟ තිම්නා
නගරයට පිටත් ව ගියේ ය. තිම්නාහි මිදිවතුවලට
පැමිණි කල, සිංහ නාම්බකු ඔහුට ගොරවනවා
ඇසුණේ ය. 6 එවිට සමිඳාණන් වහන්සේගේ
ආත්මානුභාවය බලවත් ලෙස ඔහු කෙරෙහි
පැමිණියේ ය. සැම්සන් තමාගේ අතේ කිසිදු
අවියක් නැති ව, එළු පැටවකු ඉරා දමන ලෙස ඌ
ඉරා දැමුවේ ය. එහෙත්, ඔහු කළ දේ ඔහුගේ
පියාට වත්, මවට වත් ඔහු දැන්නුවේ නැත.
7 ඉන්පසු ඔහු ගොස් ඒ කාන්තාව සමඟ කතා
කළේ ය. ඈ ඔහුට බොහෝ ප්‍රියමනාප වූවා ය.

### සැම්සන්ගේ ප්‍රහේලිකාව

8 ස්වල්ප දවසකට පසු සැම්සන් ඈ සරණ
පාවාගන්නට ආපසු යද්දී සිංහයාගේ මළකුණ බලන
පිණිස ඉවතට හැරී ගියේ ය. ඔහු බැලූ කල
සිංහයාගේ ශරීරයේ මී මැසි රංචුවක් ද මී පැණි ද
තිබිණි. 9 ඔහු මී පැණි අතින් ගෙන, කකා ගොස්,
ඔහුගේ මවුපියන් ළඟට පැමිණ ඔවුන්ටත් දුන්නේ
ය. ඔව්හු කෑවෝ ය. එහෙත්, ඒ මී පැණි සිංහයාගේ
මළකුණෙන් ගත් බව ඔහු ඔවුන්ට කීවේ නැත.

10 ඔහුගේ පියා ඒ කාන්තාව සිටි තැනට ආවේ ය.
සම්සොන් එහි දී මංගල්‍යයක් පිළියෙළ කළේ ය.
මෙය තරුණයන් අතරේ පැවති සිරිතක් විය.
11 පිලිස්තිවරු සම්සොන් දුටු විට ඔහු සමඟ සිටින
පිණිස යහළුවන් තිස්දෙනෙකු ගෙනාවෝ ය.
12 සම්සොන් කතා කොට, “මම දැන් ඔබ හැමට
ප්‍රහේලිකාවක් කියමි. මංගල්‍ය දවස් සත ඇතුළත
දී ඔබ එය විසඳා මට කීවොත්, මම ඔබ හැමට
සිහින් සළු තිහක් ද ඇඳුම් කට්ටල තිහක් ද
දෙන්නෙමි. 13 එය විසඳා මට කියන්නට ඔබට බැරි
වුණොත්, ඔබ සිහින් සළු තිහක් ද ඇඳුම් කට්ටල
තිහක් ද මට දිය යුතු යැ”යි කීවේ ය. ඔව්හු, “අපට
ඇසෙන්නට ඔබේ ප්‍රහේලිකාව කියන්නැ”යි ඔහුට
කීවෝ ය.
14 ඔහු මෙසේ කී ය.
q2 14 “කන්නා කෙරෙන් කෑමකි;
q2 14 බලවතාගෙන් මිහිරකි.”
14 ඒ ප්‍රහේලිකාව තුන් දවසකින් විසඳා කියන්නට
ඔවුන්ට නුපුළුවන් විය.
15 සතර වන දවසේ ඔව්හු සම්සොන්ගේ බිරිඳට
කතා කොට, “ප්‍රහේලිකාව අපට කියා දෙන්නට
ඔබේ පුරුෂයා වාටුවෙන් පොළඹවන්න. එසේ
නොකළොත්, ඔබත්, ඔබේ පියාගේ ගෙයත් ගිනිබත්
කරන්නෙමු. ඔබ හැම අප කැඳෙව්වේ අප දිළිඳුන්
කරන්න නොවේ දැ”යි ඇසුවෝ ය.
16 සම්සොන්ගේ බිරිඳ ඔහුගේ ගෙලෙ බදාගෙන
අඬමින්, “ඔබ මට ද්වේෂ කරනවා මිස මට ආදරේ
කරන්නේ නැත. මාගේ මිතුරන්ට ඔබ
ප්‍රහේලිකාවක් කී නමුත්, ඒක මට තෝරා දුන්නේ
නැතැ”යි කීවා ය. ඔහු පිළිතුරු දෙමින්, “බලන්න, මම
මාගේ පියාට වත්, මාගේ මවට වත් ඒ ගැන
නොකීවෙමි. ඔබට කියන්නේ කෙසේ දැ”යි ඈට
කීවේ ය. 17 ඔවුන්ගේ මංගල්‍ය පැවති සත් දවස
මුළුල්ලේ ම ඈ ඔහුගේ ගෙලෙ බදාගෙන හැඬුවා ය.
ඈ ඔහුට පෙරෙත්ත කළ බැවින් ඔහු සත් වන දවසේ
දී තේරුම ඈට කී ය. ඈ ද ඇගේ රට වැසියන්ට ඒ
තේරුම කීවා ය. 18 සත් වන දවසේ දී ඉර බසින්නට
පෙර නුවර වැසියෝ ඔහුට කතා කොට මෙසේ කී
හ:
q2 18 “මී පැණිවලට වඩා මිහිරක් ඇද් ද?
q2 18 සිංහයකුට වඩා බලවතෙක් ඇද් ද?”
q2 18 සම්සොන් ඔවුන්ට මෙසේ පිළිතුරු දුන්නේ ය:
q2 18 “ඔබ මාගේ නැම්බිය මඟින් සීසෑවේ නැත්නම්,
මාගේ ප්‍රහේලිකාව දැනගන්නට නොහැකි වන්නේ
ය.”
19 එවිට සමිඳාණන් වහන්සේගේ ආත්මානුභාවය
බලවත් ලෙස ඔහු කෙරේ පැමිණියේ ය. ඔහු
අෂ්කෙලෝනට ගොස්, එහි මිනිසුන් තිස්දෙනෙකු
මරා, ඔවුන්ගෙන් කොල්ලකාගෙන ප්‍රහේලිකාව
තෝරා දුන් අයට ඇඳුම් කට්ටල දුන්නේ ය. ඔහු
ඉමහත් කෝපයෙන් ඇවිළී තමාගේ පියාගේ ගෙදරට
ගියේ ය. 20 සම්සොන්ගේ බිරිඳ, ඔහු යහළුවා
කොටගත් ඔහුගේ මිතුරාට දෙන ලද්දී ය.

## හිවලුන් සහ පන්දම්

15 ස්වල්ප දවසකට පසු තිරිඟු කපන කාලයේ
දී සම්සොන් එළු පැටවකු රැගෙන තමාගේ
බිරිඳ බලන්නට ගියේ ය. “මාගේ බිරිඳ වෙත ඇතුළු
ගෙට මම යමි”යි ඔහු ඇගේ පියාට කීවේ ය.
එහෙත්, ඇගේ පියා ඔහුට යන්නට ඉඩ නොදී,
2 “සැබැවින් ම ඔබ ඈට මුළුමනින් ම වෛර වුණෙහි
යැ යි මා සිතා, මම ඈ ඔබේ මිතුරාට දුනිමි. ඇගේ
බාල සහෝදරී ඈට වඩා සුරූපී ය. ඈ වෙනුවට මෑ
පාවාගන්නැ”යි සම්සොන්ට කීවේ ය.
3 සම්සොන් පිළිතුරු දෙමින්, “මේ වතාවේ දී මා
පිලිස්තිවරුන්ට කරන දේ සම්බන්ධයෙන් මම වගකීම
භාර නොගනිමි”යි කීවේ ය. 4 එසේ කියා සම්සොන්
ගොස්, හිවලුන් තුන්සියයක් අල්ලාගෙන, හුළු අතු ද
ගෙන, උන්ගේ වල්ගා දෙකෙක් එකට බැඳ, ඒ දෙකෙ
මැද හුළු අත්තක් බැගින් තැබුවේ ය. 5 ඉන්පසු ඔහු
ඒ හුළු අතුවලට ගිනි තියා පිලිස්තිවරුන්ගේ ගොයම්
අතරට උන් යන්නට හැරියේ ය. කැපූ ගොයම් ද
නොකැපූ ගොයම් ද ඔලීව වතු ද එයින් දාලා ගියේ
ය. 6 එවිට පිලිස්තිවරු, “මේ දේ කළේ කවුරු දැ”යි
ඇසුවෝ ය. “තිම්නියයාගේ බෑණා වන සම්සොන් ය;
ඔහු සම්සොන්ගේ බිරිඳ ඔහුගේ මිතුරාට දුන් නිසා
සම්සොන් මෙසේ කළේ යැ”යි මිනිස්සු පිළිතුරු
දුන්නෝ ය. එවිට පිලිස්තිවරු අවුත් ඒ ස්ත්‍රිය ද
ඇගේ පියා ද ගින්නෙන් දවා දැමුවෝ ය.
7 සම්සොන් ඔවුන්ට කතා කොට, “ඉදින් මේ
අන්දමින් ඔබ ක්‍රියා කරන්නහු නම්, සැබැවින්
ඔබෙන් පළිගන්නෙමි; ඉන්පසු නවතින්නෙමි”යි කීවේ
ය. 8 සම්සොන් ඔවුන්ට ගිය ගිය අතේ පහර දී
ඉමහත් ඝාතනයක් කළේ ය. ඉන්පසු ඔහු ගොස්
ඒතාම් පර්වතයේ ගුහාවේ නැවතී සිටියේ ය.

## පිලිස්තිවරුන් පරාජය කිරීම

9 එකල පිලිස්තිවරු පිටත් ව ගොස් ජුදාහි කඳවුරු
බැඳගෙන ලෙහි නගරයට පහර දුන්නෝ ය. 10 ජුදා
වැසියෝ, “කුමක් නිසා ඔබ අපට විරුද්ධ ව ආවහු
දැ”යි ඇසුවෝ ය. ඔව්හු පිළිතුරු දෙමින්, “අප ආවේ,
සම්සොන් අත්අඩංගුවට ගෙන ඔහු අපට කළ
හැටියට ඔහුටත් කරනු පිණිස යැ”යි කීවෝ ය.
11 එවිට ජුදා සෙනඟගෙන් තුන්දහසක් ඒතාම්
පර්වතයේ ගුහාව ළඟට ගොස් සම්සොන්ට කතා
කොට, “පිලිස්තිවරුන් අප කෙරෙහි ආණ්ඩු කරන
බව ඔබ දන්නේ නැද් ද? එසේ නම්, ඔබ අපට කර
තිබෙන මේ දේ කුමක් දැ”යි ඇසුවෝ ය. “ඔවුන් මට
කළ ලෙස ම මමත් ඔවුන්ට කළෙමි”යි ඔහු ඔවුන්ට
කී ය.
12 ඔව්හු ද, “ඔබ බැඳ පිලිස්තිවරුන්ට පාවා දෙන
පිණිස අපි ආවෙමු”යි ඔහුට කී හ. සම්සොන් පිළිතුරු
දෙමින්, “ඔබ ම මා නොමරන හැටියට දිවුරුම්
දෙන්නැ”යි ඔවුන්ට කීවේ ය.

13 ඔව්හු ද, “ඔබ බැඳ ඔවුන් අතට පාවා දෙනවා
මිස සැබැවින් අපි ඔබ නොමරන්නෙමු”යි ඔහුට කියා,
අලුත් කඹ දෙකෙකින් ඔහු බැඳ පර්වතයෙන්
ගෙනාවෝ ය.
14 ඔහු ලෙහි නගරයට පැමිණි කල පිලිස්තිවරු
ඔහු දැක ඔල්වර හඬ නැඟුවෝ ය. සමිඳාණන්ගේ
ආත්මානුභාවය බලවත් ලෙස සම්සොන් කෙරෙහි
පැමිණියේ ය. ඔහුගේ අත් බැඳ තිබුණු කඹ
ගින්නෙන් දැවී ගිය හණ මෙන් විය. ඔහුගේ
අත්වලින් බැඳුම් ද ලිහී වැටුණේ ය. 15 ඔහු
කොටළුවකුගේ අලුත් හකු ඇටයක් දැක අත දිගු
කොට එය ගෙන, එයින් මිනිසුන් දහස්දෙනෙකු මැරී
ය. 16 එවිට සම්සොන් මෙසේ කී ය:
q2 16 “කොටළු හකු ඇටයකින්, කොටළුවන් මෙන්
ඔවුන් මැරීමි;
q2 16 කොටළු හකු ඇටයකින්, මිනිසුන් දහසක්
මැරීමි.”
17 ඔහු මෙසේ කී පසු තමාගේ අතෙන් හකු ඇටේ
වීසි කොට, ‘හකු ඇට හෙළ’ යන අර්ථය ඇති රාමත්-
ලෙහි යන නම එතැනට තැබී ය.
18 එවිට ඔහු ඉතා පිපාසිත ව, සමිඳාණන්
වහන්සේට යාච්ඤා කොට, “ඔබේ මෙහෙකරුවා
ලවා ඔබ ම මේ මහා ගැළවීම දුන් සේක; දැන් මම
පිපාසාවෙන් නැසී අචර්මඡේදිතයන්ගේ අතට අසු
වන්නෙම් දැ”යි කීවේ ය. 19 එවිට දෙවියන් වහන්සේ
පොළොවෙහි වළක් විවර කළ සේක. ඒ වළ
ලෙහියෙහි ඇත. එයින් වතුර නික්මුණේ ය.
සම්සොන් එයින් බී ශක්තිය ලැබ ප්‍රාණවත් විය.
එබැවින් ඒ ස්ථානයට ‘හඬගැසූ අයගේ උල්පත’ යන
අර්ථය ඇති එන්-හක්-කෝරේ යන නම තබන ලදී.
එය අද දවස දක්වා ලෙහිය නගරයේ දක්නට තිබේ.
20 පිලිස්තිවරුන් සිටි කාලයේ දී විසි අවුරුද්දක්
සම්සොන් ඉශ්‍රායෙල්වරුන් පාලනය කළේ ය.

### සම්සොන් ගාසාහි කළ දේ

16 සම්සොන් ගාසා නගරයට ගොස් එහි
වෙසඟනක දැක ඈ වෙත ගියේ ය.
2 “සම්සොන් මෙහි අවුත් සිටී ය”යි ගාසා වැසියන්ට
දන්වන ලද්දේ ය. එවිට ඔව්හු සම්සොන් වට කොට
ඔහු අල්ලන පිණිස නුවර දොරටුව ළඟ රාත්‍රිය
මුළුල්ලෙහි රැක සිටියෝ ය. “පහන් වනතුරු අපි
සිටිමු. එවිට අපි ඔහු මරන්නෙමු”යි රාත්‍රිය
මුළුල්ලෙහි නිශ්චල ව සිටියෝ ය. 3 සම්සොන්
මධ්‍යම රාත්‍රිය දක්වා නිදා හිඳ, රෑ මැදියම් වේලේ
නැඟිට, නුවර දොරටුවේ දොරවල් ද උළුවහු කණු
දෙකෙ ද අගුල් ආදිය ද සමඟ උගුලා කර පිට
තබාගෙන හෙබ්‍රොන් ඉදිරිපිට තිබෙන කන්ද මුදුනට
ගියේ ය.

### සම්සොන් සහ දලීලා

4 ඉන්පසු සම්සොන් සෝරෙක් නම් මිටියාවතේ
සිටි දලීලා නම් ස්ත්‍රියකට ප්‍රේම කළේ ය.
5 පිලිස්තිවරුන්ගේ අධිපතීහු ඈ ළඟට අවුත් ඈට
කතා කොට, “ඔබ ඔහු වාටුවෙන් පොළඹවා ඔහුගේ
යෝධ ශක්තිය තිබෙන්නේ කොතැන්හි ද කියාත්,
අප ඔහුට පීඩා කිරීමට ඔහු බැඳ තබන පිණිස ඔහු
දමනය කරන්නට පුළුවන් කෙසේ ද කියාත්
දැනගන්න. එවිට අපි එක් එක්කෙනා රිදී එක්දහස්
එකසියයක් බැගින් ඔබට දෙන්නෙමු”යි කීවෝ ය.
6 දලීලා සම්සොන්ට කතා කොට, “ඔබේ යෝධ
ශක්තිය තිබෙන්නේ කොතැන ද කියාත්, ඔබ දමනය
කරන පිණිස ඔබ බඳින්නට පුළුවන් කුමකින් ද
කියාත් මට කරුණාකර කියන්නැ”යි කීවා ය.
7 සම්සොන් පිළිතුරු දෙමින්, “නොවේළුණු අලුත් දුනු
ලණු සතකින් මා බැන්දොත්, මා බල හීන වී
සාමාන්‍ය මිනිසකු මෙන් වනු ඇතැ”යි ඈට කී ය.
8 එවිට පිලිස්තිවරුන්ගේ අධිපතීහු නොවේළුණු අලුත්
දුනු ලණු සතක් ඈට ගෙනවුත් දුන්හ. ඈ එයින් ඔහු
බැන්දා ය. 9 මිනිස්සු ගෙයි ඇතුළු කාමරයක සැඟවී
බලාගෙන සිටියෝ ය. ඈ කතා කොට, “සම්සොන්,
පිලිස්තිවරු ඔබ අල්ලන්න එති”යි ඔහුට කෑ ගසා
කීවා ය. එවිට ඔහු, හණ නූලක් ගින්න වැදුණු විට ම
කැඩෙන්නාක් මෙන් ඒ දුනු ලණු කඩා දැමුවේ ය.
එබැවින් ඔව්හු ඔහුගේ යෝධ ශක්තියේ රහස
නොදත්හ.
10 දලීලා යළිත් සම්සොන්ට කතා කොට, “ඔබ මා
රවටා බොරු කීවෙහි ය; දැන්වත් ඔබ බඳින්න
පුළුවන් කුමකින් ද කියා මට කියන්නැ”යි කීවා ය.
11 ඔහු පිළිතුරු දෙමින්, “කිසි වැඩකට පාවිච්චි
නොකළ අලුත් කඹවලින් මා බැන්දොත්, මා බල
හීන වී සාමාන්‍ය මිනිසකු මෙන් වනු ඇතැ”යි ඈට
කීවේ ය.
12 එවිට දලීලා අලුත් කඹ ගෙන ඔහු බැඳ,
“සම්සොන්, පිලිස්තිවරු ඔබ අල්ලන්නට එති”යි ඔහුට
කෑ ගසා කීවා ය. මිනිස්සු ද ඇතුළු ගෙයි සැඟවී බලා
සිටියෝ ය. ඔහු තමාගේ අත් බැඳ තිබූ කඹ නූල්
පොටක් මෙන් කඩා දැමුවේ ය.
13 එවිට දලීලා සම්සොන්ට කතා කොට, “ඔබ
මේ වන තෙක් මා රවටා මට බොරු කීවෙහි ය. දැන්
ඉතින් ඔබ බැඳ තබන්නට පුළුවන් කුමකින් දැ යි
කියන්නැ”යි කීවා ය. ඔහු පිළිතුරු දෙමින්, “ඔබ
මාගේ හිසේ කෙස් රොදවල් සත රෙදි වියමන
සමඟ යන්ත්‍රයට ගොතා ඇබයකින් එය තද
කළොත්, මා සාමාන්‍ය මිනිසකු මෙන් බල හීන වනු
ඇතැ”යි කී ය.
14 දලීලා ඔහු නින්දට පමුණුවා, ඔහුගේ කෙස්
රොදවල් සත ගෙන, රෙදි වියමනත් සමඟ ඒවා
ගොතා, ඇබයකින් තද කර, “සම්සොන්, පිලිස්තිවරු
ඔබ අල්ලන්නට එති”යි කෑ ගැසුවා ය. එහෙත් ඔහු
පිබිද, ඔහුගේ හිස කෙස් ද රෙදි වියන යන්ත්‍රය ද
ඇබය ද අහකට ඇදගත්තේ ය.
15 එවිට ඈ, “ඔබේ සිත මට බැඳී නැති විට ඔබ
මට ප්‍රේම කරනවා කියා කියන්නේ කෙසේ ද? ඔබ
දැන් මා තුන්වරක් රැවටුවෙහි ය. ඔබේ යෝධ
ශක්තිය තිබෙන තැන මට නොකීවෙහි යැ”යි ඔහුට
කීවා ය. 16 ඉන්පසු ඈ සෑම දා ම ඇගේ ඉල්ලීමෙන්
ඔහුට පෙරෙත්ත කළා ය. ඒ නිසා මැරෙන තරමට

ඔහුගේ ජීවිතය ඔහුට එපා විය. 17 එබැවින් ඔහු
රහස ඈට දන්වමින් ඈට මෙසේ කීවේ ය: “මා මවු
කුස පටන් දෙවියන් වහන්සේට කැප වූ
නාසරීයයෙකු බැවින් දැළි පිහියක් මාගේ හිසට ළං
නොකරන ලද්දේ ය. මාගේ හිස බූගෑවොත්, මාගේ
යෝධ ශක්තිය මාගෙන් නැති වී යන්නේ ය. මා ද
බල හීන වී සාමාන්‍ය මිනිසෙකු මෙන් වනු ඇතැ”යි
කීවේ ය.
18 සම්සොන් තමාගේ සිතේ තිබුණු සම්පූර්ණ
රහස ඈට කී බව දලීලා දැන, පිලිස්තිවරුන්ගේ
අධිපතීන් කැඳවමින්, “මේ වතාවේ දී එන්න; මන්ද,
ඔහු තමාගේ සිතේ තිබෙන සම්පූර්ණ රහස මට
කියා තිබේ ය”යි දන්වා යැව්වා ය: එවිට
පිලිස්තිවරුන්ගේ අධිපතීහු මුදල් රැගෙන ඈ ළඟට
ආහ. 19 ඈ තමාගේ උකුල පිට ඔහු නිදි කරවා,
මිනිසෙකු කැඳවා, ඔහුගේ හිසේ කෙස් රොදවල්
සත කපා දමා, ඔහු පුබුදුවන්නට ඔහුට ගැසූ නමුත්,
ඔහුගේ ශක්තිය ඔහුගෙන් පහ ව ගොස් තිබුණේ
ය. 20 ඈ ද, “සම්සොන්, පිලිස්තිවරු ඔබ අල්ලන්නට
එති”යි කීවා ය. එවිට සම්සොන් නින්දෙන් පිබිද,
සමිඳාණන් වහන්සේ තමා කෙරෙන් අහක් ව ගිය
බව නොදැන, වෙන වතාවල දී මෙන් පිටතට ගොස්
බැඳුම්වලින් නිදහස් වන්නෙමි”යි සිතුවේ ය.
21 එහෙත්, පිලිස්තිවරු ඔහු අල්ලාගෙන, ඔහුගේ ඇස්
උගුලාදමා, ගාසා නගරයට ගෙන ගොස්, ලෝකඩ
දම්වැල්වලින් ඔහු බැන්දෝ ය. 22 ඔහු හිරගෙයි
ධාන්‍ය ඇඹරීමට යොදවන ලදී. එසේ වුවත්, ඔහුගේ
හිස කෙස් කපා දමනු ලැබූ පසු, යළිත් ඒවා
වැඩෙන්නට පටන්ගත්තේ ය.

## සම්සොන්ගේ මරණය

23 පිලිස්තිවරුන්ගේ අධිපතීහු තමන්ගේ දෙවි වන
දාගොන්ට මහා පූජාවක් ඔප්පු කරන්නටත්, ප්‍රීති
වන්නටත් රැස් වූ හ. “අපේ දෙවියෝ අපේ සතුරා වූ
සම්සොන් අප අතට පාවා දුන්නාහ”යි ඔව්හු කීවෝ
ය. 24 සෙනඟ සම්සොන් දුටු කල, ඔවුන්ගේ
දෙවියන්ට ප්‍රශංසා කළෝ ය. “අපේ දෙවියෝ අපේ
දේශය නාස්ති කළ, බොහෝ දෙනෙකු මරා දැමූ,
අපේ සතුරා අපේ අතට පාවා දුන්නාහ”යි කී හ.
25 ඔවුන් ප්‍රීතියෙන් පිනා ගිය කල, “අප විනෝද
කරන පිණිස සම්සොන් අඬගසාගෙන එන්න” කියා
ඔව්හු හිරගෙයින් ඔහු ගෙන්වා ගත්තෝ ය. ඔහු
ඔවුන් ඉදිරියෙහි ක්‍රීඩා කළේ ය. ඔව්හු කුළුණු
අතරේ ඔහු සිටවූවෝ ය. 26 සම්සොන් තමාගේ
අත අල්ලාගෙන සිටි තරුණයාට කතා කොට, “මේ
ගෘහය පිහිටා තිබෙන කුළුණුවලට මා හාන්සි වන
පිණිස ඒවාට අත ගසා බලන්නට මට ඉඩ දෙන්නැ”යි
කීවේ ය. 27 ඒ ගෘහය ස්ත්‍රී පුරුෂයන්ගෙන් පිරී
තිබුණේ ය. පිලිස්තිවරුන්ගේ සියලු අධිපතියෝ ද
එහි සිටියෝ ය. පියස්ස උඩ ස්ත්‍රී පුරුෂයෝ
තුන්දහසක් පමණ සම්සොන්ගේ විනෝද ක්‍රීඩා
නරඹමින් සිටියෝ ය.

28 සම්සොන් සමිඳාණන් වහන්සේට යාච්ඤා
කොට, “අනේ, දෙවි සමිඳාණන් වහන්ස, මා සිහි
කළ මැනව. අනේ සමිඳුනි, මාගේ ඇස් දෙක උගුලා
දැමූ නිසා, පිලිස්තිවරුන්ගෙන් එක වරට ම පළිගන්න
පිණිස මේ වතාවේ පමණක් මා බලවත් කළ
මැනවැ”යි කීවේ ය. 29 එවිට සම්සොන් ගෘහය
පිහිටා තිබුණු මැද කුළුණු දෙක, එකක් දකුණතින් ද
එකක් වමතින් ද අල්ලා තමාගේ මුළු ශක්තිය
යොදා, 30 පිලිස්තිවරුන් සමඟ මමත් නසිම්වා”යි
කියා තමාගේ මුළු ශක්තියෙන් ඉදිරියට නැඹුරු වූයේ
ය. එවිට ගෘහය, අධිපතීන් සහ එහි සිටි සියලු
සෙනඟ පිට කඩාවැටුණේ ය. මෙසේ ඔහු ජීවත් ව
සිටිය දී මැරූ අයට වඩා ඔහුගේ මරණයේ දී මැරූ
අයගේ ගණන වැඩි විය.
31 එවිට ඔහුගේ සහෝදරයෝ ද ඔහුගේ පියාගේ
මුළු පවුල ද ගොස් ඔහු ගෙනවුත්, ශෝරා ද
එෂ්තායොල් ද අතරේ තිබෙන ඔහුගේ පිය වූ
මානෝවාගේ සොහොනේ පොළොවේ තැන්පත් කළෝ
ය. සම්සොන් විසි අවුරුද්දක් ඉශ්‍රායලේවරුන්
පාලනය කළේ ය.

## මීකාගේ දේවාලය

17 එප්‍රායිම් කඳු රටේ මීකා නම් මිනිසෙක්
සිටියේ ය. 2 ඔහු සිය මවට කතා කොට,
“ඔබේ රිදී කාසි එක්දහස් එකසියය සොරකම් කරනු
ලැබූ විට, ඔබ සොරා පිට සාපයක් තැබුවෙහි ය. ඔබ
සාප කරනවා මට ඇසිණි. බලන්න, ඒ කාසි මා ළඟ
ඇත. ඒවා ගත්තේ මම ය”යි කීවේ ය. ඔහුගේ මව,
“මාගේ පුත්‍රය, සමිඳාණන් වහන්සේ ඔබට
ආශීර්වාද කරන සේක්වා”යි කීවා ය. 3 ඔහු තමාගේ
මවට රිදී කාසි එක්දහස් එකසියය නැවත දුන්නේ ය.
එවිට ඔහුගේ මවු කතා කොට, “කැපූ රූපයක් ද
වාත්තු පිළිමයක් ද සෑදීමට මම මේ රිදී මාගේ ම
අතින් මාගේ පුත්‍රයා වෙනුවෙන් සමිඳාණන්
වහන්සේට සැබැවින් ම කැප කළෙමි. දැන් ඒවා
මම නැවත ඔබට දෙමි”යි කීවා ය. 4 ඔහු ඒ මුදල
නැවත ඔහුගේ මවට දුන් කල, ඔහුගේ මව රිදී
කාසි දෙසීයයක් රැගෙන කම්කරුවෙකුට දුන්නා ය.
ඔහු එයින් කැපූ රූපයක් ද වාත්තු පිළිමයක් ද
සෑදුවේ ය. ඒවා මීකාගේ ගෙයි තිබුණේ ය.
5 මීකා නම් මේ මිනිසාට දේවාලයක් තිබුණේ ය.
ඔහු ඒපොද් සැට්ටයක් ද තෙරෙපීම් රූප ද සාදා තමාට
පූජකයෙකු ව සිටින පිණිස තමාගේ පුත්‍රයෙකු පත්
කළේ ය. 6 විනි 21:25ඒ කාලයේ දී ඉශ්‍රායලේහි
රජ කෙනෙක් නොසිටියේ ය. එක් එක්කෙනා තම
තමාට රිසි දේ කළේ ය.
7 ජුදා පළෙපතට අයිති වූ ජුදයේ බෙත්ලෙහෙමේ
සිට පැමිණි එක්තරා ලෙවීය තරුණයෙක් සිටියේ ය.
ඔහු එහි ටික කලකට වාසය කළ කෙනෙකි. 8 ඒ
මිනිසා විසීමට තැනක් සොයන පිණිස ජුදයේ
බෙත්ලෙහෙමෙන් පිටත් ව ගොස්, ගමන් කරනුයේ,
එප්‍රායිම් කඳු රටේ මීකාගේ ගෙදරට පැමිණියේ ය.
9 “ඔබ කොතැනින් ආවෙහි දැ”යි මීකා ඔහුගෙන්

ඇසී ය. ඔහු ද, “මම ජුදයේ බෙත්ලෙහෙමේ
ලෙවීවරයකේම්; මට විසීමට තැනක් සොයා යමි”යි
පිළිතුරු දුන්නේ ය.
10 එවිට මීකා, “මා සමඟ වාසය කර, මට පිය
කෙනෙකු ද පූජකයෙකු ද වන්න; මම ඔබට අවුරුදු
පතා රිදී කාසි දසයක් හා ඇඳුම් කුට්ටමක් ද කෑම ද
දෙන්නෙමි”යි ඔහුට කීවේ ය. 11 එවිට ලෙවීවරයා
ඇතුළු වී මීකා සමඟ වාසය කරන්නට සතුටු විය.
ඔහු වනාහි මීකාට තමාගේ පුත්‍රයන්ගෙන් එක්
කෙනෙකු මෙන් විය. 12 මීකා ඒ ලෙවීවරයා පූජකයා
වශයෙන් පත් කළේ ය. ලෙවීවරයා ඔහුගේ ගෙයි
විසී ය. 13 මීකා කතා කරමින්, “ලෙවීවරයෙකු මට
පූජකකමට සිටින නිසා සමිඳාණන් වහන්සේ මට
යහපත කරන සේකැ යි දැන් දනිමි”යි කී ය.

## දාන්වරු ලායිෂ්හි ඔත්තු බැලීම

18 ඒ කාලයේ ඉශ්‍රායලේහි රජ කෙනෙක්
නොසිටියේ ය. තවද, ඒ දවස්වල දී දාන්
ගෝත්‍රය තමන්ට වාසය කිරීම පිණිස ප්‍රදේශයක්
සෙව්වෝ ය. එසේ කළේ, ඒ දවසේ ඒ වන තෙක්
ඉශ්‍රායලේ ගෝත්‍ර අතරේ ඔවුන්ට උරුමයක් ලැබී
නොතිබුණ නිසා ය. 2 දාන් වැසියෝ දේශයෙහි
ඔත්තු බලන පිණිස, තමන්ගේ සියලු සෙනඟ
අතරෙන් තමන්ගේ ම පෙළපතේ වික්‍රමාන්විත
මිනිසුන් පස්දෙනෙකු තෝරාගෙන, ශෝරා ද
එෂ්තායොල් ද සිට යවමින්, “ඔබ ගොස් දේශයෙහි
ඔත්තු බලන්නැ”යි ඔවුන්ට කීවෝ ය. ඔව්හු එප්‍රායිම්
කඳු රටේ මීකාගේ ගෙට අවුත් එහි නවාතැන්
ගත්තෝ ය. 3 ඔව්හු මීකාගේ නිවසෙ ළඟ සිටිය දී,
ලෙවීවරයා වන තරුණයාගේ කටහඬ ඇඳින, එහි
ගොස් ඔහුට කතා කොට, “ඔබ මෙහි ගෙනාවේ
කවරෙක් ද? මෙතැන ඔබ කරන්නේ කුමක් ද? මෙහි
ඔබේ වගකීම කුමක් දැ”යි ඇසුවෝ ය.
4 “මීකා මට මේ මේ දේ කර ඇත. මා ඔහුගේ
පූජකයා ව සිටින පිණිස ඔහු මට වැටුපක්
ගෙවන්නේ යැ”යි ඔහු ඔවුන්ට කීවේ ය.
5 ඔව්හු ඔහුට කතා කොට, “අප යන මේ ගමන
සඵල වේ ද කියා අප දැනගන්න පිණිස දෙවියන්
වහන්සේගෙන් විමසන්නැ”යි කී හ.
6 “ශාන්ති සිතින් යන්න. ඔබ යන ගමන සමිඳාණන්
වහන්සේගේ ආරක්ෂාව යටතේ තිබේ යැ”යි
පූජකයා ඔවුන්ට කීවේ ය.
7 එවිට ඒ පස්දෙනා පිටත් ව ගොස්, ලායිෂ්ට
පැමිණ, එහි සිටින සෙනඟ ආරක්ෂා සහිත ව,
සීදොන් වැසියන් හා සමාන ව සාමකාමී ව ද නිශ්චල
ව ද වාසය කරන බව දුටුවෝ ය. ඔවුන්ට කිසි
අඟහිඟයක් තිබුණේ නැත. ඔව්හු සීදොන්වරුන්ගෙන්
ඈත් ව වාසය කළහ. අරමීයයන් සමඟ ඔවුන්ට කිසි
ගනුදෙනුවක් නො වී ය. 8 ඉන්පසු ඔව්හු ශෝරාහි ද
එෂ්තායොල්හි ද සිටි තමන්ගේ සහෝදරයන් වෙත
පෙරළා ආවෝ ය. ඔවුන්ගේ සහෝදරයෝ ඔවුන්ට
කතා කොට, “ඔබ සොයාගත් තොරතුරු මොනවා
දැ”යි ඇසුවෝ ය. 9 ඔව්හු පිළිතුරු දෙමින්, “අපි පිටත්
වී ගොස් ඔවුන්ට පහර දෙමු. මන්ද, ඒ රට ඉතා
යහපත් බව අපි දුටිමු. කිසිත් නොකර මෙහි
සිටින්නේ මන් ද? ඒ රටට ඇතුළු වී එය හිමි
කරගන්න පිණිස යන්නට මැළි නොවෙන්න. 10 ඔබ
ගිය විට, ආරක්ෂා රහිත සෙනඟක් කරා ඔබ
පැමිණෙන්නෙහු ය. ඒ රට විශාල ය. දෙවියන්
වහන්සේ ඔබ අතට ඒ රට දී තිබේ. එය
පොළොවේ තිබෙන කිසි දෙයෙකින් හිඟයක් නැති
ස්ථානයකැ”යි කී හ.

## මීකාගේ දේව රූප සොරා ගැනීම

11 එවිට එතැනින් දාන්ගේ පෙළපතේ සෙනඟ
හයසියයක් සන්නාහ සන්නද්ධ ව ශෝරා ද
එෂ්තායොල් ද සිට පිටත් ව ගියෝ ය. 12 ඔව්හු
ජුදයේ තිබෙන කිරියත්-ජයොරීම්හි කඳවුරු
බැඳගත්තෝ ය. ඒ නිසා ඒ ස්ථානයට අද දක්වා
දාන්ගේ කඳවුර යන අර්ථය ඇති මහනේ-දාන් ය යි
කියති. එය පිහිටා තිබෙන්නේ කිරියත්-ජයොරීම්ට
බටහිරෙන් ය. 13 ඔව්හු එතැනින් එප්‍රායිම් කඳු රටට
ගොස් මීකාගේ නිවසෙ ළඟට පැමිණියෝ ය.
14 එවිට ලායිෂ් රටට ඔත්තු බලන්න ගිය පස්දෙනා
තමන්ගේ සහෝදරයන්ට කතා කොට, “මේ ගෙවල
ඒපොද් සැට්ටයක් ද තරෙපීම් රූප ද කැපූ රූපයක් ද
වාත්තු පිළිමයක් ද තිබෙන බව ඔබ දන්නෙහු ද?
ඉතින් දැන් ඔබ කළ යුතු දේ කල්පනා කරන්නැ”යි
කී හ. 15 එබැවින් ඔව්හු හැරී ගොස්, තරුණ
ලෙවීවරයා සිටි මීකාගේ නිවසෙට පැමිණ ඔහුගේ
සැප පහසු විචාළෝ ය. 16 සන්නාහ සන්නද්ධ ව සිටි
දාන්වරුන් වන ඒ මිනිස්සු හයසියදෙනා දොරකඩ
ළඟ සිටියෝ ය. 17 රටේ ඔත්තු බලන පිණිස ගිය
පස්දෙනා නැඟී ගොස් නිවසෙට ඇතුළු ව කැපූ රූපය
ද ඒපොද් සැට්ටය ද තරෙපීම් රූපය ද වාත්තු පිළිමය
ද ගත්තෝ ය. පූජකයා සහ සන්නාහ සන්නද්ධ
හයසියදෙනා දොරකඩ ළඟ සිටියෝ ය.
18 ඔවුන් මීකාගේ ගෙට ඇතුළු ව කැපූ රූපය ද
ඒපොද් සැට්ටය ද තරෙපීම් රූපය ද වාත්තු පිළිමය ද
පිටතට ගෙනෙ විට, පූජකයා, “ඔබ කුමක් කරන්නෙහු
දැ”යි ඔවුන්ගෙන් ඇසී ය.
19 ඔව්හු පිළිතුරු දෙමින්, “නිශ්ශබ්ද ව අතින් කට
වසාගෙන අප සමඟ ගොස්, අපට පියෙකු ද
පූජකයෙකු ද වන්න. එක මිනිසෙකුගේ පවුලකට
පූජකයෙකු වීමට වඩා ඉශ්‍රායලේ ගෝත්‍රයකටත්,
පෙළපතකටත් පූජකයෙකු වීම හොඳ නොවේ දැ”යි
ඇසූ හ. 20 එවිට පූජකයාගේ සිත සතුටු ව ඔහු
ඒපොද් සැට්ටය ද තරෙපීම් රූපය ද වාත්තු රූපය ද
රැගෙන සෙනඟ අතරට ගියේ ය.
21 මෙසේ ඔව්හු ආපසු හැරී බාලයන් ද
ගවමහිෂයන් ද බඩු ද පෙරටු කොටගෙන ගියෝ ය.
22 ඔවුන් මීකාගේ නිවසෙන් ඈතට ගිය කල,
මීකාගේ නිවසෙ අසල නිවසේවල මිනිස්සු එක්රුස්
ව දාන්වරුන් පසුපස ගොස්, ඔවුන්ට ළං ව
මොරගැසුවෝ ය. 23 ඔව්හු හැරී බලා, “මිනිසුන් රැස්

කර ගෙන එන්නට ඔබට සිදු වී තිබෙන්නේ කුමක්
දැ"යි මීකාගෙන් ඇසූහ.
24 ඔහු පිළිතුරු දෙමින්, "මා සෑදූ දේවතාවන් ද
මාගේ පූජකයා ද ඔබ ගෙන යන්නහු ය. මට තවත්
ඉතිරි ව තිබෙන්නේ කිමෙක් ද? 'ඔබට සිදු වී
තිබෙන්නේ කුමක් දැ'යි ඔබ මාගෙන් අසන්නේ
කෙසේ දැ"යි ඇසී ය.
25 දාන්වරු ඔහුට පිළිතුරු දෙමින්, "තවත් කතා
නොකරන්න, කතා කළොත්, රෞද්‍ර මිනිසුන් ඔබ
වෙත එන්නට පුළුවන. එවිට ඔබේ ජීවිතය ද ඔබේ
ගෙයි වැසියන්ගේ ජීවිත ද හානි වනු ඇතැ"යි කියා
යන්නට ගියෝ ය. 26 ඔවුන් තමාට වඩා බලවත් බව
මීකා දැක ආපසු හැරී තමාගේ ගෙදරට ගියේ ය.

## ලායිෂ් නගරයේ විනාශය

27 ඔව්හු මීකා සාදා තිබුණු දේ රැගෙන, ඔහු
සමඟ සිටි පූජකයා කැටුව ගොස්, සාමකාමී ව ද
සුරක්ෂිත ව ද සිටි ලායිෂ්හි සෙනඟ වෙත පැමිණ,
කඩුවෙන් ඔවුන්ට පහර දී නුවර ගිනි ලෑවෝ ය.
28 ඒ නුවර සීදොන් නුවරින් ඈත් ව තිබුණ නිසා ද
කිසිවකු සමඟ ඔවුන්ගේ ගනුදෙනුවක් නොවූ නිසා
ද ඔවුන් ගළවන්නට කිසිවෙක් නො වූ හ. ඒ නුවර
බෙත්-රෙහොබ්හි පිහිටි මිටියාවතේ තිබුණේ ය.
ඔව්හු ඒ නුවර ගොඩනඟා එහි වාසය කළෝ ය.
29 ඉශ්‍රායලේට දාව උපන් තමන්ගේ පියා වූ
දාන්ගේ නාමය අනුව ඔව්හු ඒ නගරයට දාන් යන
නාමය තැබුවෝ ය. කලින් ඒ නගරයේ නම ලායිෂ්
ය. 30 දාන්වරු වාත්තු රූපය පිහිටුවා ගත්තෝ ය.
මෝසෙස්ගේ පුත්‍රයා වන ගේර්ෂොම්ගේ පුත්
ජොනාතන් ද ඔහුගේ පුත්‍රයෝ ද රට වැසියන්
වහල්කමට ගෙනෙනු ලැබූ දවස දක්වා දාන්
ගෝත්‍රයට පූජකයෝ වූවෝ ය. 31 මීකා විසින්
සාදන ලද වාත්තු රූපය ඔව්හු පිහිටුවාගත්හ.
දෙවියන් වහන්සේගේ මණ්ඩපය ෂීලෝහි තිබුණ
තාක් කල් එය එහි තිබුණේ ය.

## ගිබියා වැසියන්ගේ දුෂ්ටකම්

19 ඉශ්‍රායලේහි රජ කෙනෙකු නොසිටි කාලයේ
දී එප්‍රායිම් කඳු රටේ එහා පැත්තේ
ලෙවීවරයෙක් වාසය කළේ ය. ඔහු ජුදයේ
බෙත්ලෙහෙමෙන් උපභාර්යාවක සරණ පාවාගත්තේ
ය. 2 ඔහුගේ උපභාර්යාව ඔහුට විරුද්ධ ව
වේශ්‍යාකම් කොට, ඔහු අත්හැර ජුදයේ
බෙත්ලෙහෙමේ ඇගේ පියාගේ ගෙදරට ගොස් එහි
හාර මාසයක් සිටියා ය. 3 ඇගේ පුරුෂයා
කරුණාවෙන් කතා කර ඈ නැවත ගෙනෙනු පිණිස
තම වැඩකාරයා ද කොටළුවන් දදෙනෙකු ද සමඟ
ඈ කරා ගියේ ය. ඈ තමාගේ පියාගේ ගෙදරට ඔහු
කැඳවාගෙන ආවා ය. තරුණියගේ පියා ඔහු දුටු විට
ඔහු හමුවීමට ප්‍රීතියෙන් ආවේ ය. 4 ඔහුගේ මාමා
වන තරුණියගේ පියා ඔහු නවත්වා ගත්තේ ය. ඔහු
තුන් දවසක් ඔහු සමඟ විසී ය. එලෙස ඔව්හු කමින්
බොමින් එහි නැවතී සිටියෝ ය. 5 සතර වන දින
අලුයම ඔහු නැඟිට පිටත් වී යන්නට සූදානම් විය.
තරුණියගේ පියා කතා කොට, "කෑම ටිකක් කා
ඔබේ සිත සනසාගෙන පසුව ඔබට යන්නට
පුළුවනැ"යි තම බෑණාට කීවේ ය.
6 මෙසේ ඔව්හු දදෙනෙ හිඳගෙන එක් ව ආහාර
පාන ගත්හ. තවද, තරුණියගේ පියා ඒ මිනිසාට
කතා කොට, "අනේ, අද රාත්‍රියේත් කරුණාකර
නවතින්න; එසේ නැවතී සොම්නස් වන්නැ"යි ඒ
මිනිසාට කීවේ ය.
7 ඒ මිනිසා යන්නට සැරසුණු විට, ඔහුගේ මාමා
පෙරෙත්ත කළෙන් ඔහු නැවතුණේ ය. 8 පස් වන දා
අලුයම ඔහු යන්නට සැරසුණ විට, තරුණියගේ පියා
ඔහුට කතා කොට, "අනේ ඔබේ සිත සනසාගන්න,
සවස් වන තෙක් නවතින්නැ"යි කීවේ ය. එබැවින්
ඔව්හු දදෙනෙ කෑම කෑහ.
9 ඒ මිනිසා ද ඔහුගේ උපභාර්යාව ද වැඩකාරයා ද
යන්නට සැරසුණ විට ඔහුගේ මාමා වන තරුණියගේ
පියා ඔහුට කතා කොට, "දැන් සවස් වේගෙන එයි.
අනේ, රාත්‍රියේ නැවතී සිටින්න. ඉර බැස යන්නට
ළඟ ය. රාත්‍රියේ මෙහි සිට ඔබේ සිත සතුටු
කරගෙන හෙට ඔබේ ගමනට වේලාසනින් නැඟිට
ගෙදර යන්නට පිටත් වන්නැ"යි කීවේ ය.
10 එහෙත්, ඒ මිනිසා ඒ රාත්‍රියේ නවතින්නට
නොකැමැති ව නැඟිට, සෑදල දැමූ කොටළුවන්
දදෙනෙකු ද තමාගේ උපභාර්යාව ද රැගෙන ගොස්,
ජබූස්, එනම්, ජෙරුසලම ඉදිරිපිටට පැමිණියේ ය.
11 ඔවුන් ජබූස් නගරයට ළං වන විට බොහෝ
සවස් වී තිබුණේ ය. එවිට වැඩකාරයා, "අපි ගොස්
ජබූසිවරුන්ගේ මේ නගරයට ඇතුළු වී එහි
නවාතැන් ගනිමු"යි තමාගේ ස්වාමියාට කී ය.
12 ඔහුගේ ස්වාමියා පිළිතුරු දෙමින්, "ඉශ්‍රායලේ
පුත්‍රයන්ට අයිති නැති අන්‍යයන්ගේ නුවරකට
නොගොස් ගිබියාවට යමු"යි ඔහුට කීවේ ය.
13 තවද, ඔහු කතා කොට, "ගිබියාවෙහි හෝ රාමාහි
හෝ නවතින පිණිස ඒ ස්ථානවලින් එකකට ළඟා
වමු"යි තමාගේ වැඩ-කාරයාට කීවේ ය. 14 මෙසේ
ඔව්හු තවදුරටත් ගමන් කොට, බෙන්ජමින්ට අයිති
ගිබියා පෙදෙසට ළඟා වන විට ඉර බැස ගියේ ය.
15 ඔව්හු ගිබියාවෙහි නවාතැන් ගන්න පිණිස ඒ
දෙසට හැරී ගියෝ ය. ලෙවීවරයා ඇතුළු වී නුවර
වීදියේ හිඳගත්තේ ය. මන්ද, කිසිවෙක් නවාතැන්
දීමට ඔවුන් ගෙදරට කැඳවා නොගත්හ.
16 ඒ වේලේ මහලු මිනිසෙක් කෙතේ වැඩ කර
සවස් වූයෙන් ආවේ ය. ඒ මිනිසා කඳු රටේ
මිනිසෙකි. ඔහු ගිබියාවෙහි වාසය කළේ ය.
එහෙත්, එහි වැසියෝ බෙන්ජමින්වරු ය. 17 ඒ
මහල්ලා තම හිස ඔසවා නුවර වීදියේ හුන් ඒ
මඟියා දැක, "ඔබ කොතැනට යන්නෙහි ද? කොතැන
සිට එන්නෙහි දැ"යි ඇසී ය.
18 ඔහු පිළිතුරු දෙමින්, "අපි ජුදයේ
බෙත්ලෙහෙමේ සිට එප්‍රායිම්හි කඳු රටෙහි එහා
කෙළවරට යමු. මම එහි වැසියෙක්මි. මම ජුදයේ
බෙත්ලෙහෙමට ගියෙමි. මම දැන් ගෙදර යමි.
කිසිවෙකු මට මෙහි දී නවාතැන් දෙන්නේ නැත.

19 අපගේ කොටළුවන්ට පිදුරුත්, කෑමත් තිබේ. මට
සහ මාගේ උපභාර්යාවට ද මාගේ වැඩකාරයාට ද
රොටිත්, මුද්‍රික පානයත් තිබේ. කිසි දෙයකින් අපට
අඩුපාඩුවක් නැතැ”යි ඔහුට කීවේ ය.
20 මහලු මිනිසා කතා කරමින්, “මාගේ ගෙදරට
මම ඔබ පිළිගනිමි. ඔබේ සියලු ඕනෑකම් මම සපයා
දෙමි. වීදියේ නම් නොසිටින්නැ”යි ඔහුට කීවේ ය.
21 එවිට ඒ මහලු මිනිසා ඔවුන් තමාගේ ගෙදරට
කැඳවාගෙන ගොස්, කොටළුවන්ට කන්නට දුන්නේ
ය. ඔව්හු ද තමන්ගේ පාද සෝදාගෙන ආහාර පාන
අනුභව කළහ.
22 උත් 19:5-8 ඔවුන් සතුටින් කල් යවන අතර, ඒ
නගරයේ දුර්ජනයන් ව සිටි සමහර මිනිස්සු ඒ
ගෙදර වට කර සිට, දොරට ගසමින්, ගෘහ මූලිකයා
වන මහලු මිනිසාට කතා කොට, “ඔබේ ගෙදරට
පැමිණ සිටින මිනිසා සමඟ කම් සැප විඳින්නට ඔහු
පිටතට ගෙනෙන්නැ”යි කීවෝ ය.
23 එවිට ගෘහ මූලිකයා වන මහලු මිනිසා පිටතට
ගොස්, ඔවුන්ට කතා කොට, “අනේ සහෝදරයෙනි,
එසේ නොවේ වා! එපමණ දූෂ්‍යකම් නොකරන්න. ඒ
මිනිසා මාගේ ගෙට පැමිණ සිටිය දී ඔය නින්දිතකම්
නොකරන්න. 24 මෙන්න, මෙහි මාගේ කන්‍යා දුවත්,
ඒ මිනිසාගේ උපභාර්යාවත් සිටිති, මම දැන් ඔවුන්
පිටතට ගෙනෙමි. ඔවුන් වසඟ කරගෙන ඔබ කැමැති
දෙයක් ඔවුන්ට කරන්න. එහෙත්, මේ මිනිසාට ඒ
නින්දිතකම නොකරන්නැ”යි කීවේ ය. 25 එහෙත්, ඒ
මිනිස්සු ඔහුට ඇහුම්කන් නුදුන්නෝ ය. එබැවින් ඒ
ලෙවීවරයා ඔහුගේ උපභාර්යාව අල්ලාගෙන ඔවුන්
වෙත පැමිණවූයේ ය. ඔව්හු ඈ සමඟ
බලහත්කාරයෙන් එක් වී අලුයම දක්වා මුළු
රාත්‍රියේ ම ඈ දූෂණය කොට, පහන් වන විට ඈ
යන්නට හැරියෝ ය.
26 එවිට ඒ ස්ත්‍රිය අලුයම් වේලේ අවුත්, ඇගේ
ස්වාමියා සිටි ඒ මිනිසාගේ ගෙයි දොරකඩ වැටී එළි
වන තෙක් සිටියා ය. 27 ඇගේ ස්වාමියා අලුයම
නැඟිට ගෙයි දොරවල් ඇර තමාගේ ගමන යන්නට
එළියට ගියේ ය. එවිට ඔහුගේ උපභාර්යාව වන
ස්ත්‍රිය ගෙයි දොරකඩ වැටී සිටියා ය. ඇගේ අත්
එළිපත්ත උඩ තිබුණේ ය. 28 ඔහු ඈට කතා කොට,
“නැඟිටින්න, අපි යමු”යි කී ය. එහෙත්, උත්තරයක්
ලැබුණේ නැත. එවිට ඔහු ඈ ඔසවා කොටළුවා පිට
තබාගෙන, සිය නිවෙස බලා ගියේ ය. 29 1 සාමු
11:7ඔහු තමාගේ නිවෙසට පැමිණි කල පිහියක්
ගෙන, තමාගේ උපභාර්යාවගේ සිරුර ඇට සමඟ
කොටස් දොළොසකට කපා, ඉශ්‍රායලේවරුන්ගේ
සියලු පළාත්වලට යැව්වේ ය. 30 ඒ දුටු සියල්ලෝ,
“ඉශ්‍රායලේ ජනයා මිසර දේශයෙන් ආ දා පටන් අද
දක්වා මෙබඳු දෙයක් සිදු වුණේ වත්, දකින්නට
ලැබුණේ වත් නැත. මේ ගැන සිතට ගෙන, සාකච්ඡා
කොට තීරණයකට පැමිණෙන්නැ”යි කීවෝ ය.

### ඉශ්‍රායලේවරුන් යුද්ධයට සැරසීම

20 එවිට දාන් සිට බෙයර්-ෂෙබා දක්වා ද ගිලියද්
දේශයේ ද සිටි සියලු ඉශ්‍රායලේ සෙනඟ
පිටත් ව අවුත් එක් කෙනෙකු මෙන් සමිඳාණන්
වහන්සේ වෙත මිශ්පාහි රැස් වුණාහ. 2 දෙවියන්
වහන්සේගේ සෙනඟගේ මේ රැස්වීමට
ඉශ්‍රායලේහි සියලු ගෝත්‍රවල ප්‍රධානීහු පැමිණ
සිටියහ. කඩු රැගත් පාබල සේනාව හාරලක්ෂයක් වූ
හ. 3 ඉශ්‍රායලේවරුන් මිශ්පාට ගිය බව
බෙන්ජමින්වරුන්ට සැළ විය. “මේ දුෂ්ටකම සිදු
වුණේ කෙසේ ද කියා කියන්නැ”යි ඉශ්‍රායලේවරු
ඇසුවෝ ය.
4 එවිට මරනු ලැබූ ස්ත්‍රියගේ ස්වාමිපුරුෂයා වන
ලෙවීවරයා උත්තර දෙමින්, “මාගේ උපභාර්යාවත්,
මමත් නවාතැන් ගන්නට බෙන්ජමින්වරුන්ට අයිති
ගිබියාවට පැමිණියෙමු. 5 එවිට ගිබියා වැසියෝ මට
විරුද්ධ ව පැමිණ, මා සිටි නිවෙස රාත්‍රියේ
වටලාගත්තෝ ය. ඔව්හු මා මරන්නට සිතුවෝ ය.
එහෙත්, මාගේ උපභාර්යාව මැරෙන ලෙස ඈට
බලහත්කාරකම් කළෝ ය. 6 එවිට මම මාගේ
උපභාර්යාවගේ සිරුර ගෙන, එය කොටස්වලට කපා,
ඉශ්‍රායලේවරුන්ට අයිති සියලු පළාත්වලට ඇරියෙමි.
එසේ කළේ, ඔවුන් ඉශ්‍රායලේහි දුෂ්ටකමක් ද
නින්දිතකමක් ද කළ බැවිනි. 7 ඉශ්‍රායලේ ජනයෙනි,
ඔබ සියලු දෙනා මෙහි රැස් ව සිටින්නහු ය. මේ
කාරණා ගැන සාකච්ඡා කර, දැන් ම මෙහි දී
තීරණයක් ගන්නැ”යි කීවේ ය.
8 එවිට මුළු සෙනඟ එකා මෙන් නැඟිට, කතා
කොට, “අපෙන් කිසිවෙක් තමාගේ කූඩාරමට
නොයන්නේ ය. කිසිවෙක් තමාගේ ගෙදරට
නොයන්නේ ය. 9 අප දැන් ගිබියාවට කරන දෙය
මෙය යි. අපි පස ඇට දමා ගිබියාවට පහර දෙන
සෙනඟ තෝරා ගනිමු. 10 සියලු ඉශ්‍රායලේ
ගෝත්‍රවලින් මිනිසුන් සියයකින් දසදෙනෙකු ද
දහසකින් සියයක් ද දසදහසකින් දහසක් ද බැගින්
තෝරා ගනිමු. ඔව්හු බෙන්ජමින්ට අයිති මිනිසුන්
විසින් ඉශ්‍රායලේහි කරන ලද නින්දිතකම
ප්‍රකාරයට ඔවුන්ට පහර දෙන්නට යන හමුදාවට
කෑම ගෙනෙන්නෝ ය”යි කී හ. 11 එකී ලෙස සියලු
ඉශ්‍රායලේ ගෝත්‍ර එකා මෙන් එකට බැඳී ඒ නුවරට
විරුද්ධ ව රැස් වූවෝ ය.
12 ඉශ්‍රායලේ ගෝත්‍රවල සෙනඟ බෙන්ජමින්
ගෝත්‍රයේ සෑම තැන්වලට පණිවුඩකාරයන් යවමින්,
“ඔබ අතරේ කර තිබෙන මේ දුෂ්ටකම කුමක් ද?
13 ඉතින් අප ගිබියාවෙහි සිටින ඒ දුර්ජනයන් මරා,
ඉශ්‍රායලේවරුන් කෙරෙන් නපුර පහකර දමන පිණිස,
ඔවුන් අපට පාවා දෙන්නැ”යි කීවෝ ය. එහෙත්,
බෙන්ජමින්වරු තමන්ගේ සහෝදර
ඉශ්‍රායලේවරුන්ගේ හඬට සවන් දෙන්නට කැමැති
නො වූ හ. 14 බෙන්ජමින්වරු ඉශ්‍රායලේවරුන්ට
විරුද්ධ ව යුද්ධ කරන්නට යන පිණිස නගරවලින්
පිටත් ව ගිබියාවට එක්රැස් වූ හ. 15 ගිබියාවෙහි

වැසියන්ගෙන් තෝරාගත් මිනිසුන් සත්සියයක් හැර,
නගරවලින් රැස් වූ කඩු රැගත් බෙන්ජමින්වරු
විසිහයදහසක් ඒ දවසේ දී ගණන් කරනු ලැබූ හ.
16 මේ මුළු සෙනඟ අතර තෝරාගත් වමත හුරු
මිනිස්සු සත්සියයක් වූ හ. ඔව්හු සියල්ලෝ ම කෙස්
ගසක් පමණ වත් නොවරදා ගල් පටියකින් ගල්
විදින්නට දක්ෂ අය ය. 17 බෙන්ජමින්වරුන් හැර, කඩු
රැගත් ඉශ්රායලේවරු සාරලක්ෂයක් ගණන් කරනු
ලැබූ හ. ඔව්හු පලපුරුදු යුද්ධ භටයෝ ය.

## බෙන්ජමින්වරුන්ට විරුද්ධ සටන

18 ඉශ්රායලේ සෙනඟ පිටත් ව බෙතෙල්ට ගොස්,
“බෙන්ජමින් සෙනඟට විරුද්ධ ව යුද්ධ කරන පිණිස
අපෙන් පළමුවෙන් යා යුත්තෝ කවුරු දැ”යි දෙවියන්
වහන්සේගෙන් විචාළෝ ය. “ජුදාවරුන් පළමු ව යා
යුතු ය”යි සමිඳාණන් වහන්සේ වදාළ සේක.
19 ඉශ්රායලේ සෙනඟ උදේ නැඟිට ගිබියා ඉදිරිපිට
කඳවුරු බැඳගත්තෝ ය. 20 ඉශ්රායලේ සෙනඟ
බෙන්ජමින්වරුන්ට විරුද්ධ ව යුද්ධයට ගොස්, ගිබියා
ළඟ ඔවුන්ට විරුද්ධ ව සටන සඳහා පිළිවෙළින් සැරසී
සිටියෝ ය. 21 එවිට බෙන්ජමින්වරු ගිබියාවෙන්
පිටත් ව අවුත්, ඒ දවසේ ඉශ්රායලේවරුන්ගේ
මිනිසුන් විසිදෙදහසක් විනාශ කර, බිම හෙළා
දැමුවෝ ය. 22 ඉශ්රායලේවරු ධෛර්ය වඩා, තමන්
පළමු වන දවසෙහි පිළිවෙළින් සිටි ස්ථානයෙහි යළිත්
යුද්ධය පිණිස සැරසී සිටියෝ ය. 23 තවද,
ඉශ්රායලේවරු ගොස්, සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි සවස් වන තෙක් හඬා, “අපේ
සහෝදරයන් වන බෙන්ජමින්වරුන්ට විරුද්ධ ව අප
නැවත සටනට යා යුතු දැ”යි සමිඳාණන්
වහන්සේගෙන් ඇසූ හ. “ඔවුන්ට විරුද්ධ ව යන්නැ”යි
සමිඳාණන් වහන්සේ වදාළ සේක.
24 ඉශ්රායලේ සෙනඟ දෙ වන දින
බෙන්ජමින්වරුන්ට විරුද්ධ ව ඔවුන්ට ළඟා වූ හ.
25 එවිට බෙන්ජමින්වරු දෙ වන දා ඔවුන්ට විරුද්ධ ව
ගිබියාවෙන් පිටතට අවුත්, යළිත්
ඉශ්රායලේවරුන්ගෙන් මිනිසුන් දහඅටදහසක් විනාශ
කර බිම හෙළුවෝ ය. මේ සියල්ලෝ කඩු
හරඹයෙහි දක්ෂ අය වූ හ. 26 එකල සියලු
ඉශ්රායලේවරු ද සකල ජනයා ද ගොස් බෙතෙල්ට
පැමිණ, එහි දී සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි
හඬමින් සිට, එදා සවස් වන තෙක් නිරාහාර ව සිට,
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි සහභාගිකමේ පූජා
ද දවන යාග පූජා ද ඔප්පු කළෝ ය. 27 ඒ දවස්වල
දී සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
බෙතෙල්හි තිබුණ බැවින් ඔව්හු සමිඳාණන්
වහන්සේගෙන් ප්රශ්නයක් ඇසූ හ. 28 ආරොන්ගේ
පුත්රයා වන එලයාසර්ගේ පුත් පිනෙහාස් ඒ
දවස්වල දී ඒ ගිවිසුම් කරඬුව භාර ව සිටියේ ය.
ඉශ්රායලේවරු කතා කොට, “අප සහෝදරයන් වන
බෙන්ජමින්වරුන්ට විරුද්ධ ව අප නැවතත් යුද්ධයට
යා යුතු ද නැතහොත් නතර විය යුතු දැ”යි
සමිඳාණන් වහන්සේගෙන් ඇසූ හ. සමිඳාණන්
වහන්සේ පිළිතුරු දෙමින්, “යන්න, මන්ද, හෙට ඔවුන්
නුඹලා අතට පාවා දෙන්නෙමි”යි වදාළ සේක.
29 ඉශ්රායලේවරු ද ගිබියාව වටකර මිනිසුන්
සඟවා තැබුවෝ ය.
30 තුන් වන දා ඉශ්රායලේවරු බෙන්ජමින්වරුන්ට
විරුද්ධ ව ගොස්, වෙන වතාවල දී මෙන් ගිබියාව
ළඟ සැරසී සිටගත්හ. 31 බෙන්ජමින්වරු
ඉශ්රායලේවරුන්ට විරුද්ධ ව පිටතට අවුත්, නුවරින්
ඈත් වී, වෙන වතාවල දී මෙන් සෙනඟට පහර
දෙන්නට පටන්ගෙන බෙතෙල්ටත්, ගිබියාවටත් යන
මාර්ග දෙකේ දී ඉශ්රායලේ මිනිසුන් තිස්දෙනෙකු
පමණ මැරූ හ. 32 “පළමු වන වතාවේ දී මෙන්
ඔවුන් අප ඉදිරියෙහි පරාජය වනු ඇතැ”යි
බෙන්ජමින්වරු කී හ. එහෙත් ඉශ්රායලේවරු, “අපි
පලා ගොස් ඔවුන් නුවරින් ඈත් කොට, මාවත්වලට
පමුණුවා ගනිමු”යි කීවෝ ය. 33 එවිට සියලු
ඉශ්රායලේවරු තමන් සිටි තැනින් නැඟිට ගොස්
බාල්-තාමාර්හි පිළිවෙළින් සිට ගත්තෝ ය. සැඟවී
බලා සිටි ඉශ්රායලේවරු ද තමන්ගේ ස්ථානය වූ
ගිබියාවෙහි පිට්ටනියෙන් නික්ම ආවෝ ය. 34 සියලු
ඉශ්රායලේවරුන්ගෙන් තෝරාගත් මිනිසුන් දසදහසක්
ගිබියාව ඉදිරිපිටට ආහ. සටන ඉතා බලවත් විය.
එහෙත්, බෙන්ජමින්වරු ඔවුන්ට විපත්තිය ආසන්න ව
තිබුණු බව නොදැන සිටියහ. 35 සමිඳාණන්
වහන්සේ ඉශ්රායලේවරුන් ඉදිරියෙහි
බෙන්ජමින්වරුන් පරාජය කරවූ සේක. ඉශ්රායලේ
සෙනඟ ඒ දවසේ දී බෙන්ජමින්වරුන්ගෙන් මිනිසුන්
විසිපන්දහස් එකසියයක් විනාශ කළෝ ය. මේ සියලු
දෙනා කඩු හරඹයෙහි දක්ෂ අය වූ හ.

## ඉශ්රායලේවරුන් ජයගත් ආකාරය

36 තමන් පරාජය වන බව බෙන්ජමින්වරුන්ට පෙනී
ගියේ ය. ඉශ්රායලේවරු වනාහි තමන් ගිබියාවෙහි
සඟවා තැබූ මිනිසුන් කෙරෙහි විශ්වාස කළ බැවින්,
බෙන්ජමින්වරුන් ඉදිරියෙන් පසු බැස ගියහ.
37 සැඟවී සිටි මිනිස්සු ද ඉක්මනින් ගිබියාවට විරුද්ධ
ව වේගයෙන් පැතිර ගොස් මුළු නගරයට කඩුවෙන්
පහර දුන්නෝ ය. 38 ඉශ්රායලේවරුන් ද සැඟවී සිටි
අය ද අතර නියම කර තිබුණ ලකුණ නම්, නුවරින්
මහත් දුම් කඳක් නැංවීම ය. 39 එය දුටු විට
ඉශ්රායලේවරු සටනේ දී ආපසු හැරුණෝ ය.
බෙන්ජමින්වරු ඉශ්රායලේවරුන්ට පහර දෙන්නට
පටන්ගෙන, ඔවුන්ගෙන් තිස්දෙනෙකු පමණ මරා,
“පළමු වන සටනේ දී මෙන් ම ඔවුන් සත්තකින්
අපට පරාජය වනු ඇතැ”යි කීවෝ ය. 40 එහෙත්,
ලකුණක් වන ඒ දුම් කඳ නගරයෙන් පටන් ගත්තේ
ය. බෙන්ජමින්වරු ආපසු හැරී බැලූ කල නගරයේ
හැම තැනින් ම දුම් අහසට නඟිනු දුටුවෝ ය.
41 ඉශ්රායලේ සෙනඟ ද ආපසු හැරුණෝ ය. එවිට
බෙන්ජමින්වරු විපත්තිය තමන් පිට පැමිණ තිබෙන
බව දැක කැළඹී, 42 ඉශ්රායලේවරුන් ඉදිරියෙන්
කාන්තාරයට යන මාර්ගයේ හැරී ගියෝ ය. එහෙත්,
සටන ඔවුන් පසුපස්සේ බලවත් ව පැවතුණේ ය.

නගරවලින් පිටතට ආ තැනැත්තෝ මැදි ව සිටි අය
විනාශ කළෝ ය. 43 ඔව්හු බෙන්ජමින්වරුන් හැම
අතින් ම වට කරගෙන නැගෙනහිර ගිබියාවට
පැමිණෙන තුරු ඔවුන් ලුහුබැඳ ගොස්, ඔවුන්
නතරවුණ තැනේ දී ඔවුන් පාගා දැමුවෝ ය.
44 මෙසේ බෙන්ජමින්වරුන්ගෙන් මිනිස්සු
දහඅටදහසක් මැරුම්කෑහ. ඔව්හු සියල්ලෝ
බලසම්පන්න මනුෂ්‍යයෝ වූ හ.
45 සෙසු අය කාන්තාරයේ තිබෙන රිම්මොන්
පර්වතයට පලා ගියෝ ය. ඔවුන්ගෙන් පන්දහසක්
මාවත්වල දී මරනු ලැබූ හ. ඉශ්රායලේවරු සෙසු අය
ගිදෝම් දක්වා ලුහුබැඳ ගොස් ඔවුන්ගෙන්
දෙදහසක්දෙනා මැරුවෝ ය. 46 මෙසේ
බෙන්ජමින්වරුන්ගෙන් ඒ දවසේ දී මැරුම්කෑ, කඩු
හරඹහි දක්ෂ මනුෂ්‍යයෝ විසිපන්දහසක් වූ හ.
ඔව්හු සියල්ලෝ බලසම්පන්න මනුෂ්‍යයෝ වූ හ.
47 එහෙත්, මිනිස්සු හයසියයක් හැරී කාන්තාරයේ
තිබෙන රිම්මොන් පර්වතයට පලා ගොස්, රිම්මොන්
පර්වතයේ හාර මාසයක් සිටියෝ ය.
48 ඉශ්රායලේවරු නැවත බෙන්ජමින්වරුන් වෙත
අවුත්, නගරයේ මිනිසුන්ට ද සතුන්ට ද තමන්ට
සම්බ වූ සියල්ලන්ට ද කඩුවෙන් පහර දුන්නෝ ය.
ඔව්හු ඒ ප්‍රදේශයේ සියලු නගර ගිනි ලෑවෝ ය.

## බෙන්ජමින්වරුන්ට භාර්යාවන් සපයා දීම

21 "අපෙන් කිසිවෙක් තමාගේ දුවක බෙන්ජමින්
ගෝත්‍රයේ මිනිසෙකුට භාර්යාව වශයෙන්
නොදෙන්නේ ය"යි ඉශ්රායලේ සෙනඟ මිශ්පාහි දී
දිවුරා තිබුණේ ය. 2 සෙනඟ බෙතෙලේට පැමිණ එහි
සවස් වන තෙක් දෙවියන් වහන්සේ ඉදිරියෙහි හිඳ,
මහත් ශෝකයකින් ශබ්ද නගා ඇඬුවෝ ය.
3 "ඉශ්රායලේවරුන්ගේ දෙවි සමිඳුනි, අද
ඉශ්රායලේවරුන්ගෙන් එක ගෝත්‍රයක් අඩු වී යන
හැටියට මේ දේ ඉශ්රායලේහි සිදු වුණේ කුමක්
නිසා දැ"යි ඔව්හු ඇසුවෝ ය.
4 පසු දා සෙනඟ අලුයම නැඟිට පූජාසනයක්
ගොඩනඟා දවන යාග පූජා ද සහභාගිකමේ පූජා ද
ඔප්පු කළෝ ය. 5 ඉශ්රායලේ සෙනඟ කතා කොට,
"සියලු ඉශ්රායලේ ගෝත්‍රවලින් සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි මේ රැස්වීමට නොපැමිණි අය
කවුරු දැ"යි ඇසූ හ. ඔවුන් එසේ ඇසුවේ, මිශ්පාහි
සමිඳාණන් වහන්සේ වෙත නොයෙන අය මැරිය යුතු
ම ය කියා ඔවුන් තදබල දිවුරුමක් කළ බැවිනි.
6 ඉශ්රායලේවරු තමන්ගේ සහෝදරයන් වන
බෙන්ජමින්වරුන් ගැන අනුකම්පා කර, "මේ දවසේ දී
ඉශ්රායලේවරුන්ගෙන් එක ගෝත්‍රයක් නැති වී ඇත.
7 ඔවුන්ගෙන් ඉතිරි ව සිටින්නන්ට භාර්යාවන්
ලැබෙන පිණිස අපි කුමක් කරමු ද? අපේ දූවරුන්
ඔවුන්ට භාර්යාවන් වශයෙන් නොදෙන හැටියට
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි අපි දිවුළෙමු"යි
කීවෝ ය.
8 තවදුරටත් ඔව්හු කතා කරමින්, "ඉශ්රායලේ
ගෝත්‍රවලින් මිශ්පාහි සමිඳාණන් වහන්සේ ඉදිරියට
නොපැමිණියේ කවුරු දැ"යි ඇසූ හ. ජාබෙෂ්-ගිලියද්හි
සිට කිසිවෙකු රැස්වීමට සහභාගි වන පිණිස
කඳවුරට නොපැමිණි බව දැනගත්තෝ ය. 9 සෙනඟ
ගණන් කර බැලූ විට ජාබෙෂ්-ගිලියද් වැසියන්ගෙන්
කිසිවෙකු වත් එහි නැති බව පෙනී ගියේ ය.
10 එබැවින් එහි රැස් වූ බලසම්පන්න මිනිසුන්ගෙන්
දොළොස්දහසක් එතැනට යවමින්, ඔවුන් මරන්නට
අණ කරමින්, "ඔබ හැම ගොස් ස්ත්‍රීන් ද බාලයන් ද
ඇතුළු ව ජාබෙෂ්-ගිලියද්හි වැසියන්ට කඩුවෙන් පහර
දෙන්න. 11 ඔබ කළ යුතු දේ නම්, සියලු පුරුෂයන් ද
පුරුෂයන් සමඟ සේවනයෙහි යෙදුණ සියලු ස්ත්‍රීන්
ද මුළුමනින් ම විනාශ කර දැමීම ය"යි කීවෝ ය.
12 පුරුෂයන් හැඳින ඔවුන් සමඟ සේවනයෙහි
නොයෙදුණු කන්‍යාවන් හාරසියයක් ජාබෙෂ්-ගිලියද්
වැසියන් අතරේ ඔවුන්ට සම්බ වී කානාන් දේශයේ
ෂීලෝහි තිබුණු කඳවුරට ඔවුන් ගෙනාවෝ ය.
13 එවිට රිම්මොන් පර්වතයේ බෙන්ජමින්වරුන්
සමඟ කතා කොට ඔවුන්ට සාමදානය ප්‍රකාශ
කරන පිණිස, ඒ සභාව මිනිසුන් යැව්වා ය. 14 එකල
බෙන්ජමින්වරු හැරී ආවෝ ය. ඉශ්රායලේවරු ජාබෙෂ්-
ගිලියද්හි ස්ත්‍රීන්ගෙන් ඉතුරු කළ කාන්තාවන්
ඔවුන්ට දුන්නෝ ය. එහෙත්, කාන්තාවෝ සෑහෙන
ගණනක් නොසිටියහ.
15 සමිඳාණන් වහන්සේ ඉශ්රායලේ ගෝත්‍ර
අතරෙහි බිඳීමක් ඇති කළ නිසා, සෙනඟ
බෙන්ජමින්වරුන් ගැන ශෝක වූ හ. 16 එවිට ප්‍රජා
මූලිකයෝ කතා කොට, "බෙන්ජමින්වරුන් අතර
ස්ත්‍රීන් විනාශ කරනු ලැබූ බැවින්, ඉතිරි ව සිටින
අයට භාර්යාවන් ලැබෙන පිණිස කුමක් කරමු ද?
17 ඉශ්රායලේවරුන් අතරෙන් ගෝත්‍රයක්
නොමැකෙන ලෙස බෙන්ජමින් ගෝත්‍රයෙන් ගැළවී
සිටින්නන්ට උරුමයක් තිබිය යුතු ය. 18 එහෙත්, අපේ
දූවරුන්ගෙන් ඔවුන්ට භාර්යාවන් දෙන්නට බැරි ය.
මන්ද, 'බෙන්ජමින් ගෝත්‍රයේ මිනිසෙකුට
භාර්යාවක දෙන තැනැත්තාට සාප වේ වා'යි කියා
ඉශ්රායලේවරුන් දිවුරා තිබේ ය"යි කීවෝ ය.
19 තවද, ඔව්හු කතා කොට, "බෙතෙලේට උතුරෙන්
ද බෙතෙලේ සිට ෂෙකෙමේට යන මාවතට
නැගෙනහිරෙන් ද ලබෝනාට දකුණෙන් ද තිබෙන
ෂීලෝහි දී අවුරුදු පතා සමිඳාණන් වහන්සේට
මංගල්‍යයක් පවත්වන්නේ යැ"යි පවසා,
20 බෙන්ජමින්වරුන්ට අණ කරමින් මෙසේ කීවෝ ය;
"ඔබ ගොස් මිදිවතුවල සැඟවී සිට, 21 ෂීලෝහි
දූවරුන් නටන්නට පිටතට ආවොත්, ඔබ මිදිවතුවලින්
නික්ම අවුත්, එකිනෙකා ෂීලෝහි දූවරුන්ගෙන් තම
තමාට භාර්යාවක බැගින් අල්ලාගෙන බෙන්ජමින්
රටට යන්න. 22 ඉතින් ඔවුන්ගේ පියවරුන් හෝ
සහෝදරයන් හෝ අප ඉදිරියෙහි පැමිණිලි කරන්නට
පැමිණි විට, අපි ඔවුන්ට කතා කොට, 'කරුණාවෙන්
ඔවුන් අපට දුන මැනව. මන්ද, අපි යුද්ධයේ දී එක
එකාට භාර්යාවක ඉතිරි නොකළෙමු. ඔබවත්

ඔවුන්ට භාර්යාවන් දුන්නේ නැත. ඔබ දුන්නහු නම්
වරදකරුවෝ වන්නහු ය'යි කියන්නමු."
23 බෙන්ජමින්වරු එසේ කර, නටන්නට ආ
තරුණියන්ගෙන් තමන්ගේ ගණන ලෙස තමන්ට
භාර්යාවන් අල්ලාගෙන තමන්ගේ උරුම ප්‍රදේශයට
හැරී ගොස්, නගර ගොඩනඟා එහි විසුවෝ ය.
24 එකල ඉශ්‍රායෙල්වරු සියලු දෙනා තමන්ගේ
ගෝත්‍රය ද පවුල ද කරා ගියෝ ය. එතැනින් ඔව්හු
එකිනෙකා තම තමාගේ උරුම ප්‍රදේශයට ගියෝ ය.
25 විනි 17:6 ඒ දවස්වල දී ඉශ්‍රායෙල්හි රජ
කෙනෙක් නොසිටියේ ය. එකිනෙකා තම තමා රිසි
දේ කළේ ය.

# රූත්

## නයෝමී සහ රූත්

1 වීර පුරුෂයන් ඉශ්‍රායලේ රට පාලනය කරන
සමයේ දී ඒ රටේ සාගතයක් ඇති විය.
එහෙයින්, ජුදා දේශයේ බෙත්ලෙහෙමේ එක්තරා
මිනිසෙක් මෝවබ් දේශයෙහි ටික කලක් පදිංචි
වීමට තම බිරිඳ ද පුතුන් දෙදෙනා ද කැටුව එහි
ගියේ ය. 2 ඔහුගේ නම එලිමලෙක් ය; ඔහුගේ
බිරිඳ නයෝමී ය; ඔහුගේ පුත්තු දෙදෙනා මාලොන්
සහ කිලියොන් ය. ඔව්හු ජුදා දේශයේ
බෙත්ලෙහෙමේ එප්‍රාතා වංශයට අයිති අය ය.
ඔව්හු මෝවබ් දේශයට ගොස් එහි පදිංචි වූ හ.
3 එහි දී නයෝමීගේ ස්වාමි පුරුෂයා වූ එලිමලෙක්
මළේ ය. නයෝමීට ඉතිරි වූයේ, පුත්තු දෙදෙනා
පමණි. 4 ඔව්හු දෙදෙනා ඕර්පා සහ රූත් නම්
මෝවබ් ජාතික තරුණියන් දෙදෙනෙකු සරණ
පාවාගෙන එහි දස වසක් පමණ ජීවත් වූ හ.
5 ඉන්පසු මාලොන් ද කිලියොන් ද මළහ. එවිට
පුතුන් දෙදෙනා ද ස්වාමි පුරුෂයා ද නැති වූයෙන්
නයෝමී තනි වූවා ය.

## නයෝමී රූත් සමඟ බෙත්ලෙහෙමට පැමිණීම

6 ඉශ්‍රායලේ දේශයේ අස්වැන්න සරු කිරීමෙන්
තම සෙනඟට සමිඳාණන් වහන්සේ පිහිට වූ බව
නයෝමීට ආරංචි විය. එහෙයින්, ඈ මෝවබ් දේශය
අත්හැර තම ලේලීන් දෙදෙනා සමඟ එහි යෑමට
සූදානම් වූවා ය. 7 ඈ ද ඈ සමඟ ලේලීන් දෙදෙනා ද
ඔවුන් සිටි දේශය අත්හැර ජුදා දේශය බලා ආපසු
ගමන්ගත්හ. 8 නයෝමී ලේලීන් දෙදෙනා අමතා
මෙසේ කීවා ය: "ආපසු ගෙදර ගොස් ඔබ
එකිනෙකාගේ මවුන් සමඟ නවතින්න. මටත්,
මළගිය අයටත් ඔබ හොඳින් සැලකුවාක් මෙන්,
සමිඳාණන් වහන්සේ ඔබටත් හොඳින් සලකන
සේක් වා! 9 තවද, ඔබ දෙදෙනා නැවත පවුල් වී
සුරැකි ව සිටීමට සමිඳාණන් වහන්සේ ඔබට පිහිට
වන සේක් වා!" මෙසේ කියා නයෝමී ඔවුන්
දෙදෙනා සිඹ ඔවුන්ගෙන් සමුගත්තා ය. එහෙත්,
ලේලීන් දෙදෙනා හඬා වැලපෙමින්, 10 "අනේ, එසේ
කළ නොහැකි ය. ඔබ සමඟ ඔබේ සෙනඟ වෙත
අපි එන්නෙමු"යි කී හ.
11 එවිට නයෝමී උත්තර දෙමින් මෙසේ කීවා ය:
"මාගේ දූවරුනි, ඔබ ආපසු යන්නට ම ඕනෑ ය. මා
සමඟ එන්නේ කුමක් බලාපොරොත්තුවෙන් ද?
ඔබට පුරුෂයන් වශයෙන් දීමට තවත් පුතුන් මාගේ
කුසෙන් දැරීමට මට පුළුවන් ද? 12 මාගේ දූවරුනි,
ආපසු ගෙදර යන්න. නැවතත් විවාහයක් කරගැනීමට
මට දැන් වයස වැඩි යි. මා විවාහ වීමට අදහස්
කළත්, එසේ නැති නම්, මා අද ම විවාහ වී පුතුන්
ලැබුවත්, 13 ඔවුන් නියම වයසට පැමිණෙන තෙක්
බලා සිටින්නට ඔබට හැකි ද? ඒ
බලාපොරොත්තුවෙන් අන් කෙනෙකු හා විවාහ
නොවී සිටීමට ඔබට පුළුවන් ද? මාගේ දූවරුනි, මෙය
කරන්නට බැරි දෙයකි. සමිඳාණන් වහන්සේ මට
විරුද්ධ වී සිටින බැවින් මාගේ දුක ඔබේ දුකට වඩා
දැඩි ය."
14 ඔව්හු නැවතත් හඬා වැලපෙන්නට පටන්ගත්හ.
ඕර්පා තම නැන්දම්මා සිඹ සමුගෙන තමාගේ
නෑදෑයින් වෙත ගියා ය. එහෙත්, රූත් තම
නැන්දම්මාට ඇළුම්කමින් බැඳී සිටියා ය. 15 එවිට
නයෝමී රූත්ට මෙලෙස කීවා ය: "බලන්න, ඔබේ
නෑනා තම නෑදෑහිතවතුන් වෙත ද තම කුල දෙවියා
වෙත ද ආපසු ගියා ය. ඔබත් ඈ සමඟ යන්න."
16 එහෙත්, රූත් උත්තර දෙමින් මෙසේ කීවා ය:
"මට ඔබ අත්හැර යන්නට වත්, ඔබ සමඟ
නොඑන්නට වත් පෙරැත්ත නොකරන්න. ඔබ යන
ඕනෑ ම තැනකට මමත් යමි. ඔබ ජීවත් වන ඕනෑ ම
තැනක මමත් ජීවත් වෙමි. ඔබේ සෙනඟ මාගේ
සෙනඟ ය. ඔබේ දෙවියෝ මාගේ දෙවියෝ ය.
17 ඔබ මැරෙන තැන ම මමත් මැරෙන්නෙමි, එතැන
ම වළලනු ලබමි. මරණය හැර ඔබෙන් මා වෙන් කළ
හැකි වෙන කිසිවක් නැත; තිබුණොත්, සමිඳාණන්
වහන්සේ මට ඉතා දරුණු ලෙස දඬුවම් කරන සේක්
වා!"
18 තමා සමඟ යෑමට රූත් අධිෂ්ඨාන කරගෙන
තිබෙන බව නයෝමීට හැඟුණෙන් ඈ ඒ ගැන තවත්
කතා නොකළා ය.
19 බෙත්ලෙහෙමට ම පැමිණෙන තෙක් ඔව්හු
දෙදෙනා මෙසේ ගමන් කළහ. ඔවුන් එහි පැමිණි විට
මුළු නගරය කලබල විය. එහි ස්ත්‍රීහු, "මේ නයෝමී
නොවේ දැ"යි ඇසූ හ.
20 ඈ උත්තර දෙමින් මෙසේ කීවා ය: "මට
වාසනාවන්තී යන අර්ථය ඇති නයෝමී යයි තවත්
නොකියන්න; කාලකණ්ණි යන අර්ථය ඇති මාරා යයි
කියන්න. මන්ද, සර්ව පරාක්‍රමයාණන් මට තදබල
ලෙස දඬුවම් කර ඇත. 21 මා මෙයින් පිට වී යන
විට සියලු දෙයින් පරිපූර්ණ වී සිටියෙමි. එහෙත්,
සමිඳාණන් වහන්සේ හිස් අතින් මා ආපසු ගෙනවුත්
තිබේ. සමිඳාණන් වහන්සේ මට විරුද්ධ වී සර්ව
පරාක්‍රමයාණන් මට පීඩා කර තිබිය දී මට
වාසනාවන්තී යැයි කියන්නේ මන් ද?"

22 මෙසේ නයෝමී තම ලේලි වන මෝවබ් ජාතික
රූත් සමඟ මෝවබ් දේශයෙන් ආපසු පැමිණියා ය.
ඔවුන් බෙත්ලෙහෙමට පැමිණියේ, බාර්ලි අස්වැන්න
රැස් කරන්නට පටන්ගත් කාලයේ දී ය.

### රූත් බෝවස්ගේ කෙතෙහි කරල් ඇහිදීම

2 නයෝමීට බෝවස් නමින් ධනවත් නෑයෙක්
සිටියේ ය. ඔහු ඇගේ පුරුෂයා ව සිටි
එලිමලෙක්ගේ පළෙපතට අයත් කෙනෙකි. 2 ලෙවී
19:9-10; ද්වි.නී. 24:19මෝවබ් ජාතික රූත් නයෝමීට
කතා කොට, “අස්වැන්න එකතු කරන අයගෙන් මඟ
හැරෙන කරල් එකතු කරගැනීමට ඉඩ දෙන
මිනිසකු පසුපස යන්නට මට අවසර දෙන්නැ”යි
කීවා ය. නයෝමී උත්තර දෙමින්, “හොඳයි, යන්න
දුව” කියා ඇයට අවසර දුන්නා ය.
3 මෙසේ රූත් කෙතට ගොස් එහි වැඩකරන්නන්
පසුපස යමින් කරල් අහුලාගත්තා ය. වාසනාවකට
මෙන් ඇ පැමිණියේ, එලිමලෙක්ගේ පළෙපතේ
කෙනෙකු වූ බෝවස්ට අයිති කෙතට ය.
4 කෙත අයිතිකාර බෝවස් ම බෙත්ලෙහෙමේ සිට
එහි පැමිණියේ ය. “සමිඳාණන් වහන්සේ ඔබ සමඟ
වේ වා!”යි කියමින් ඔහු ගොයම් කපන්නන්ට ආචාර
කළේ ය. ඔව්හු ද, “ඔබටත් දෙවි සමිඳාණන්
වහන්සේ ආශීර්වාද කරන සේක් වා!”යි පිළිතුරු
දුන්හ.
5 බෝවස් ගොයම් කපන්නන් භාර ව සිටි තම
සේවකයා අමතා, “අර තරුණිය කාගේ කවුදැ”යි ඇසී
ය.
6 සේවකයා උත්තර දෙමින් මෙසේ කී ය: “ඒ
මෝවබ් දේශයෙන් නයෝමී සමඟ ආ මෝවබ්
ජාතික තරුණිය ය. 7 ‘ගොයම් කපන්නන් පස්සේ
ගොසින් කරල් අහුලාගන්න දැ’යි ඇ මාගෙන් ඇසුවා
ය. ඇ අලුයම සිට මේ වන තකේ විවේක නොගෙන
කරල් අහුලමින් සිටින්නී ය.”
8 එවිට බෝවස් රූත්ට මෙසේ කී ය: “මාගේ
දියණිය, මට ඇහුම්කන් දෙන්න, මේ කෙතෙහි හැර
වෙන කිසි තැනක කරල් අහුලන්නට නොයන්න.
මෙහි නැවතී මාගේ සේවිකාවන් සමඟ වැඩ
කරන්න. 9 ඔවුන් අස්වැන්න එකතු කරගන්නේ
කොහේ දැ යි බලාගෙන ඔවුන් පස්සෙන් යන්න.
ඔබට කිසි හිරිහැරයක් නොකිරීමට මම මාගේ
සේවකයන්ට අණ කළෙමි. ඔබට පිපාසය ඇති
වූවොත්, ගොස් ඔවුන් පුරවා තබා තිබෙන වතුර
භාජනවලින් බොන්න.”
10 රූත් බෝවස්ගේ පාමුල මුණින්තළා වැඳ වැටී,
“විදේශික ගැහැණියක වන මා දෙස ඇස් හෙළා ඔබ
මට මෙපමණ කරුණාවන්ත වන්නේ මන්දැ”යි ඇසුවා
ය.
11 බෝවස් මෙසේ පිළිතුරු දුන්නේ ය: “ඔබේ
ස්වාමි පුරුෂයාගේ මරණින් පසු ඔබේ නැන්දම්මාට
ඔබ සලකා තිබෙන අන්දම ගැන සියලු කාරණා මම
දැනගතිමි. ඔබේ දෙමාපියන් ද මව්බිම ද හැර දමා
නන්නාඳුනන සෙනඟක් මැදට ඔබ පැමිණි ආකාරය
ගැන සියලු කාරණා මම දනිමි. 12 ඔබ කළ යහපතට
සමිඳාණන් වහන්සේ ඔබට සෙත සලසන සේක් වා;
ඉශ්රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේගේ
රැකවරණය සොයා පැමිණි ඔබට උන් වහන්සේ
ආශීර්වාද කරන සේක් වා!”
13 එවිට රූත් උත්තර දෙමින්, “ස්වාමීනි, ඔබ මට
බොහෝ කරුණාවන්ත ය. ඔබේ සේවිකාවන්ගෙන්
එක් අයකුට වත් සමානකමක් නැති සේවිකාවක
වන මට කරුණාවන්ත ලෙස කතා කිරීමෙන් ඔබ මා
ධෛර්යවත් කර ඇතැ”යි කීවා ය.
14 කෑම කන වේලාවේ දී බෝවස් රූත් අමතා,
“මෙහි අවුත් රොටි කැබැල්ලක් ඇඹුල් මිදියුසේ
පොඟවා කන්නැ”යි කී ය. රූත් ද ගොයම් කපන අය
සමඟ එකට වාඩිවුණා ය. බෝවස් විළඳ ස්වල්පයක්
ඇයට ළං කළේ ය. ඇ සෑහෙන පමණ කෑ පසු එහි
තවත් ඉතිරි විය.
15 ඇ නැවතත් කරල් අහුලාගන්නට යෑමට නැඟිටි
විට, බෝවස් තම සේවකයන් හට මෙසේ අණ
කළේ ය: “ගොයම් මිටි බැඳ තිබෙන තැන්වල
වුවත් කරල් අහුලාගන්නට ඇයට ඉඩ හරින්න. ඇයට
අවහිර නොකරන්න. 16 ගොයම් මිටිවලින් ද කරල්
ටිකක් ඇද දමා ඇයට අහුලාගන්නට ඉඩ දෙන්න.
ඇට දොස් නොකියන්න.”
17 මෙසේ හවස් වනතුරු රූත් කෙතෙහි කරල්
ඇහුලුවා ය. ඇ අහුලාගත් කරල්වලින් ධාන්‍ය සූරා
ගත්විට එය කිලෝග්රෑම් දහයක් පමණ විය. 18 ඇ
එය රැගෙන නගරයට ගිය විට තමා කොපමණ
ධාන්‍ය ප්රමාණයක් එකතු කරගත්තා දැ යි ඇගේ
නැන්දම්මා දුටුවා ය. රූත් ඉතුරු කර ගෙනා ආහාර
කොටස ද ඇයට දුන්නා ය. 19 නයෝමී ඇයට කතා
කරමින්, “ඔබ අද කරල් ඇහුලුවේ කොහේ ද? ඔබ
වැඩ කළේ කාගේ කෙතෙක ද? ඔබ ගැන සැලකූ
මිනිසාට ආශීර්වාද වේ වා!”යි කීවා ය. එවිට රූත්
කාගේ කෙතෙක තමා එදා වැඩ කළා දැ යි දන්වමින්,
“මා අද වැඩ කළේ, බෝවස් නම් මිනිසකුගේ
කෙතෙක යැ”යි කීවා ය.
20 ලෙවී 25:25 එවිට නයෝමී ලේලිට කතා
කරමින්, “ජීවමාන අයටත්, දැනට මිය ගොස් සිටින
අයටත් වූ පොරොන්දු ඉටු කරන සමිඳාණන්
වහන්සේ ඔහුට ආශීර්වාද කරන සේක් වා! ඒ
මිනිසා අපේ නෑයෙකි. අපේ ඇවැස්ස නෑයෙකි”යි
කීවා ය.
21 එවිට රූත් කතා කරමින්, “එපමණක් නොව,
‘ගොයම් කපා හමාර වනතෙක් සේවකයන් සමඟ
වැඩ කරන්නැ’යි ඔහු මට කීවේ යැ”යි නැන්දම්මාට
කීවා ය.
22 නයෝමී රූත් අමතා, “ඔව් දුව, වෙන
මිනිසකුගේ කෙතකට ඔබ ගියොත් ඔබට හිරිහැර
ලබන්නට සිදු වේ. ඒ නිසා ඔහුගේ සේවකයන්
සමඟ ම ඔබ වැඩ කරනවා නම් වඩා හොඳ ය”යි
කීවා ය. 23 මෙසේ රූත් බෝවස්ගේ සේවකයන්
සමඟ වැඩ කරමින් සියලු බාර්ලි සහ තිරිඟු
අස්වැන්න රැස් කර හමාර වන තකේ කරල් ඇහුලුවා

ය. ඇය තම නැන්දම්මා සමඟ දිගට ම ජීවත් වූවා
ය.

## බෝවස් රූත්ට කරුණාව දැක්වීම

3 එවිට රූත්ගේ නැන්දම්මා වන නයෝමි ඈ
අමතා මෙසේ පැවසුවා ය: “මාගේ දුව, ඔබේ
ශුභසිද්ධිය සඳහා ඔබට කටයුත්තක් කර දීම මාගේ
යුතුකම නොවේ ද? 2 ඔබ සමඟ සිටි
සේවිකාවන්ගේ ස්වාමියා වන බෝවස් අපේ කිට්ටු
නෑයකේ නොවේ ද? අද රෑ ඔහු කමතේ දී බාර්ලි
ගොයම් පොළන්නේ ය. 3 ඒ නිසා දැන් ඇඟපත
සෝදාගෙන, සුවඳ විලවුන් ටිකක් ගල්වාගෙන, හොඳ
ම ඇඳුම්වලින් සැරසී ඔහු සිටින කමතට යන්න. ඔහු
කා බී ඉවර වන තකේ ඔබ එහි සිටින බව ඔහුට
දැනගන්නට ඉඩ නාරින්න. 4 ඔහු නිදියන්නට
සැරසෙන විට නිදියන තැන මැනවින් බලාගෙන,
ඇතුළට ගොස් ඔහුගේ පා වසා තිබෙන
පොරෝනාව ඉවත් කොට, එහි නිදාගන්න. එසේ
කළ පසු කුමක් කළ යුතු දැ යි ඔහු ඔබට කියා දෙනු
ඇත.”
5 “ඔබ කී සියල්ලක් ම කරන්නමේ”යි රූත්
නයෝමිට පිළිතුරු දුන්නා ය.
6 මෙසේ රූත් කමතට ගොස් සිය නැන්දම්මා
තමාට කී ලෙස සියල්ල කළා ය. 7 බෝවස් කා බී
ඉවර වී සතුටු සොම්නසින් සිටියේ ය. ඔහු ගොස්
බාර්ලි ගොඩගසා තිබුණ තැන අසලින් නිදාගැනීමට
වැතිරුණේ ය. රූත් හමේහිට ගොස් ඔහුගේ පා වසා
තිබුණ පොරෝනාව ඉවත් කොට නිදාගත්තා ය.
8 ඔහු මධ්‍යම රාත්‍රියේ හදිසියේ අවදි වී හැරී
බැලූවිට තම පාද ළඟ ස්ත්‍රියක නිදාගෙන සිටිනු
දැක, 9 “ඔබ කවුදැ”යි ඇසී ය. රූත් පිළිතුරු දමේන්,
“මම ඔබේ සේවිකාව වන රූත් ය. ඔබ අපේ
ඇවැස්ස නෑයකෙු නිසා ඔබ මා බිරිඳ කොට
පාවාගත මැනවැ”යි කීවා ය.
10 “මාගේ දියණියෙනි, සමිඳාණන් වහන්සේ ඔබට
ආශීර්වාද කරන සේක් වා!”යි ඔහු උත්තර දී
තවදුරටත් මෙසේ කී ය: “ඔබ පවුලට ඇති
පක්ෂපාතකම, ඔබේ නැන්දම්මාට කළ දේවලින්
පනෙුණාටත් වඩා දැන් ඔබ කරන මේ ක්‍රියාවනේ
පනෙේ. මන්ද, ඔබ පොහොසත් හෝ දුප්පත් හෝ
තරුණයකෙු පස්සේ ගියේ නැත. 11 දැන් ඔබ
කිසිවකට බිය වන්න උවමනා නැත. ඔබ සිල්වත්
ස්ත්‍රියක බව නගරයේ හැම දනෙකේ ම දනිති. ඔබ
ඉල්ලන කුමන දයෙක් වුවත් කරන්න මම සූදානම් ය.
12 රූත් 2:20මා ඔබේ ඇවැස්ස නෑයකෙු බව ඇත්තයි.
එහතේ, මට වඩා කිට්ටු තවත් ඇවැස්ස නෑයකේ
ඔබට ඇත. 13 පහන් වන තුරු මෙහි සිටින්න. උදේ
ඒ මිනිසා ඔබ රැකබලාගැනීමේ වගකීම භාරගන්නට
සතුටු වුවහොත් මැනවි. ඊට ඔහු අකමැති
වුවහොත්, මා එම වගකීම භාර ගන්න බවට
ජීවමාන දවේයන් වහන්සේගේ නාමයනේ දිවුරා
කියමි.”
14 මෙසේ ඈ අලුයම වන තකේ ඔහුගේ පය
අද්දර සැතපී සිට එකිනකො හැඳින ගැනීමට හැකි
වන්නට පරෙ අවදි වූවා ය. මන්ද, ‘ඈ කමතට ආ
බව කිසිවකෙු දැන නොගත යුතු ය’යි බෝවස් කී
බැවිනි.
15 එවිට බෝවස් කතා කොට, “ඔබ ඇඳගෙන
තිබෙන උතුරු සළුව මෙහි ගෙනවුත් දිග හරින්නැ”යි
කී ය. ඈ එසේ කළ විට ඔහු බාර්ලි කිලෝග්‍රෑම්
විස්සක් එහි බහා එය ඔසවා ගැනීමට ඈට උපකාර
කළේ ය. ඈ පරෙළා නගරයට පැමිණියා ය. 16 සිය
නැන්දම්මා සිටි තැනට පැමිණි විට, “දුව, තොරතුරු
කෙසේ දැ”යි නැන්දම්මා විචාළා ය. බෝවස් තමාට
සැලකූ අන්දම ගැන සියලු තොරතුරු ඈ සැළ කළා ය.
17 ඔබ වතෙ හිස් අතින් මා නොපැමිණිය යුතු යයි
ඔහු මේ බාර්ලි කිලෝග්‍රෑම් විස්ස මට දුන්නේ යැ
යි කීවා ය.
18 එවිට නයෝමි “මාගේ දුව, ඊළඟට සිදු වන දේ
දැනගන්න තකේ ඉවසා සිටින්න. මන්ද, කාරණාව අද
ම තීන්දු කරගන්න තකේ බෝවස්ට ඉස්පහසුවක්
නැතිවිය හැකි යැ”යි කීවා ය.

## බෝවස් රූත් පළෙවහට ගැනීම

4 බෝවස් නුවර දොරටුව ළඟට ගොස් එහි
හිඳගත්තේ ය. නොබෝ වේලාවකින්, ඔහු
කලින් සඳහන් කළ එලිමලෙකේගේ කිට්ටු නෑයා
එතැනට පැමිණියේ ය. බෝවස් ඔහුගේ නම කියා
අමතමින්, “මිත්‍රය, මෙහි අවුත් වාඩිවන්නැ”යි ඔහුට
කී ය. ඔහු එහි ගොස් වාඩි විය. 2 එවිට බෝවස්
ප්‍රජා මූලිකයන් දසදනෙකෙු කැඳවාගෙන, “මෙහි
වාඩි ගන්නැ”යි ඔවුන්ටත් කී ය. 3 ඉක්බිති ඔහු කිට්ටු
ම නෑයාට කතා කොට මෙසේ කී ය: “දැන් නයෝමි
මෝවබ් දේශයනේ ආපසු පැමිණ සිටින බැවින් අපේ
නෑයා වූ එලිමලෙකේට අයිති ව තිබුණ කුඹුර
විකිණීමට අදහස් කර ඇත. 4 ඒ බව ඔබට
දන්වන්නටත්, මෙසේ කියන්නටත් මම සිතුවමේ.
ඔබට එය උවමනා නම්, මෙහි සිටින තැනැත්තන් හා
අපේ සනෙඟගේ මමෙ ප්‍රජා මූලිකයන් ඉදිරියේ
ඔබ එය මුදාගන්න. එය ඔබට උවමනා නැත්නම්,
මට ඒ බව කියන්න. මන්ද, එය මුදාගැනීමේ
අයිතිවාසිකම තිබනේනේ පළමු ව ඔබට ය; ඊට පසු
ව මට ය. මම එය මුදාගනිමි.”
5 බෝවස් තවදුරටත් කතා කරමින්, “නයෝමිගනේ
එය මිලයට ගන්න දවසේ දී, මෝවබ් ජාතික
වැන්දඹුව වන රූත් ද ඔබ පළෙවහ කොට ගත යුතු
ය. එසේ කළ යුත්තේ ඇගේ මියගිය පුරුෂයාගේ
කුඹුර එම පවුලට ම උරුම වන පිණිස ය”යි ද කී ය.
6 එයට ඇවැස්ස නෑයා උත්තර දමේන්, “කාරණය
එසේ නම්, මම කුඹුර මිලයට ගැනීමට මාගේ
අයිතිවාසිකම යොදවන්නේ නැත. එසේ කළොත්
මාගේ උරුමයන් නැති වන්නට ඉඩ තිබේ. කුඹුර
මිලේට ගැනීමට මට ඇති අයිතිවාසිකම ඔබට ම
භාර කරමි. මට එය උවමනා නැතැ”යි කී ය.

7 ද්වි.නී. 25:9 යම්කිසි විටක ඉඩකඩම් මුදාගැනීමේ
දී හෝ හුවමාරු කිරීමේ දී හෝ ඉශ්රායලේ රටේ
මිනිසුන් අතරේ පැවති ස්ථිර කිරීමේ සිරිත මෙසේ
ය: විකුණන්නා පාවහන ගලවා මිලයට ගන්නාට
දයි. ඉශ්රායලේහි පැවති ගනුදනුව සහතික
කිරීමේ පිළිවෙළ මෙය විය.
8 එහයින් ඒ ඥාතියා, "ඔබ ම මිලයට
ගන්නැ"යි බෝවස්ට කියා, තම පාවහන ගලවා
බෝවස්ට දුන්නේ ය. 9 එවිට එතැන සිටි ප්රජා
මූලිකයන්ට සහ අනිකුත් අයට බෝවස් මෙසේ කී
ය: "එලිමලෙක්ටත්, කිලියොන් සහ මාලොන්ටත්
අයිති ව තිබුණු සියල්ල නයෝමීගෙන් අද මා මිලයට
ගත් බවට ඔබ හැම සාක්ෂිකාරයෝ ය. 10 ද්වි.නී.
25:5-6තවද, මළ මිනිසාගේ පවුලට කුඹුර උරුම වන
පිණිස මාලොන්ගේ වැන්දඹුව වන මෝවබ් ජාතික
රූත් මාගේ භාර්යාව වශයෙන් ද ගන්නෙමි. මෙසේ
කිරීමෙන් ඔහුගේ නාමය ඔහුගේ සහෝදර අතරේ ද
ඔහු උපන් නගරයේ ද අමතක නොවී පවතිනු ඇත.
මේ බවට ඔබ හැම අද දින සාක්ෂිකාරයෝ වන්නහු
ය."
11 උත් 29:31 "ඔව්, අපි සාක්ෂිකාරයෝ ය"යි එතැන
සිටි සහෝදර කී හ. ප්රජා මූලිකයෝ මෙසේ කී හ:
"ඔබේ ගෙදරට පැමිණෙන මේ ස්ත්රිය, ඉශ්රායලේ
වංශය ගොඩනැඟුව රාකලේ සහ ලයා මෙන් වේ
වා! ඔබ එප්රාතාහි බලවත් වේ වා! බෙත්ලෙහෙමේහි
කීර්තිමත් වේ වා! 12 උත් 38:27-30සමිඳාණන්
වහන්සේ මේ කාන්තාවගෙන් ඔබට දෙන දරුවන්
කරණකොටගෙන ඔබේ පවුල ජුදාගේ ද තාමාර්ගේ
ද පුත් පෙරෙශ්ගේ වංශය මෙන් වේ වා!"
13 මෙසේ බෝවස් සිය භාර්යාව ලෙස රූත්
පළෙවහට ගත්තේ ය. ඔහු ඈ සමඟ එක් වූ විට
සමිඳාණන් වහන්සේ ඇය පිළිසිඳ ගැනීමට සැලැසූ
සේක. ඈ පුතකු ලැබුවා ය. 14 ස්ත්රීහු නයෝමිට
කතා කොට, "සමිඳාණන් වහන්සේට ප්රශංසා වේ
වා! ඔබ රැකබලාගැනීමට උන් වහන්සේ ඔබට
පුතකු දී තිබේ. ඒ දරුවා ඉශ්රායලේහි ප්රසිද්ධ වේ
වා! 15 ඔහු ඔබට නව ජීවනයක් ලබා දී ඔබේ මහලු
කාලයේ දී ඔබට ආරක්ෂාව සලසනු ඇත. මන්ද,
ඔබට ආදරය කරන, පුතුන් හත්දෙනකුට වඩා ඔබට
වැඩදායක වන ඔබේ ලේලී ඒ දරුවා ලබා ඇතැ"යි
කීවෝ ය. 16 නයෝමි ඒ දරුවා වඩාගෙන ළයෙහි
හොවා රැකබලාගත්තා ය.
17 අසල්වැසි ස්ත්රීහු, "නයෝමිට පුතකු උපන්නේ
යැ"යි කියමින්, ඔහුට ඕබෙද් යන නම තැබූ හ. ඔහු
දාවිත්ගේ පියා වූ ජෙස්සේගේ පියා විය.

### දාවිත් රජුගේ පෙළපත

18 පෙරෙශ්ගේ පෙළපත මේ ය: පෙරෙශ්
හෙශ්රොන්ගේ පියා ය. 19 හෙශ්රොන් රාම්ගේ ද
රාම් අම්මිනාදාබ්ගේ ද 20 අම්මිනාදාබ් නාෂොන්ගේ
ද නාෂොන් සල්මොන්ගේ ද 21 සල්මොන්
බෝවස්ගේ ද බෝවස් ඕබෙද්ගේ ද 22 ඕබෙද්
ජෙස්සේගේ ද ජෙස්සේ දාවිත්ගේ ද පියා විය.

# 1 සාමුවලේ

## එල්කානා සහ ඔහුගේ පවුල

1 එප්‍රායිම් කඳු රටේ රාමාතයිම්-ශෝපීම්හි
එල්කානා නම් මිනිසෙක් විය. ඔහු
ජෙරොහාම්ගේ පුත්‍රයා ය; එප්‍රායිම්යයෙකු වූ
ශුප්ගේ ගෝත්‍රයේ තොහුගේ පවුලට අයත්
එලීහුගේ මුණුබුරා ය. 2 එල්කානාට භාර්යාවෝ
දදෙනෙක් සිටියහ. එක් තැනැත්තියකගේ නම
හන්නා ය; අනික් තැනැත්තියගේ නම පනින්නා ය.
පනින්නාට දරුවෝ සිටියහ; එහෙත්, හන්නාට
දරුවෝ නොසිටියහ. 3 එල්කානා ෂිලෝහි දී සියලු
බලැති සමිඳාණන් වහන්සේට නමස්කාර කරන්නත්,
පූජා කරන්නත් අවුරුදු පතා ඔහුගේ නගරයෙන්
නික්ම ගියේ ය. එහි සමිඳාණන් වහන්සේගේ
පූජකයන් වූ හොප්නි සහ පිනහොස් යන ඒලීගේ
පුත්‍රයෝ දදෙනා සිටියහ. 4 එල්කානා පූජා කරන
හැම අවස්ථාවේ දී ම සිය බිරිඳ වූ පනින්නාටත්,
ඇගේ සියලු දූ දරුවන්ටත් කොටසක් දුන්නේ ය.
5 එහෙත්, ඔහු හන්නාට දකොටසක් දුන්නේ ය.
එසේ කළේ, ඔහු හන්නාට බොහෝ ප්‍රේම කළ
බැවිනි. එහෙත්, සමිඳාණන් වහන්සේ ඇගේ ගර්භය
පියවා තිබිණි. 6 සමිඳාණන් වහන්සේ ඇගේ ගර්භය
පියවා තිබුණු බැවින්, ඇගේ විරුද්ධකාරී ඈ කෝප
කරවන පිණිස ඇට නින්දා කළා ය. 7 එල්කානා
අවුරුදු පතා සමිඳාණන් වහන්සේගේ මාලිගාවට ගිය
අවස්ථාවල දී පනින්නා හන්නා කෝප කළා ය. ඒ
නිසා හන්නා කෑම නොකා හඬමින් සිටියා ය. 8 එවිට
ඇගේ පුරුෂයා වන එල්කානා ඇට කතා කොට,
"හන්නා, ඔබ අඬන්නේ මන් ද? නොකා සිටින්නේ
මන් ද? ඔබ සෝදුකින් සිටින්නේ මන් ද? පුත්‍රයන්
දසදෙනෙකුට වඩා මා ඔබට අගේ නැද්ද"යි කී ය.

## හන්නා සහ ඒලී

9 වරක් ෂිලෝහි දී ඔවුන් කා බී හමාර වූ පසු
හන්නා නැඟිට සිටියා ය. ඒලී නම් පූජකයා
සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ උළුවහු කණුව
ළඟ තිබුණු සිය ආසනයේ හිඳගෙන සිටියේ ය.
10 හන්නාගේ සිත ශෝකයෙන් පිරී තිබිණි. ඈ
සමිඳාණන් වහන්සේට යාච්ඤා කරමින් අඬ අඬා
සිටියා ය. 11 ගණන් 6:5ඈ භාරයක් වෙමින්, "සියලු
බලැති සමිඳාණන් වහන්ස, ඔබේ මෙහෙකාරී වන
මාගේ දුක දසෙ හොඳින් බලා, මා සිහි කර, මා
අමතක නොකර, මට පිරිමි දරුවෙකු දෙන සේක්
නම්, මම ඔහුගේ මුළු ජීවිත කාලය ම ඔබට කැප
කරන්නෙමි; ඔහුගේ හිසට කවදාවත් දැළි පිහියක්
නොතබන්නෙමි"යි කීවා ය.
12 හන්නා සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි බොහෝ
වේලා යාච්ඤා කරන අතර ඒලී ඇගේ මුඛය දෙස
බලා සිටියේ ය. 13 හන්නා නිශ්ශබ්ද ව යාච්ඤා
කළා ය. ඇගේ තොල් පමණක් සෙලවුණ නමුත්,
ඇගේ කටහඬ ඇසුණේ නැත. ඒ නිසා ඈ බීමත් වී
සිටිති යි ඒලී සිතුවේ ය. 14 ඒලී කතා කොට, "ඔබ
කොපමණ කල් වෙරි වී සිටින්නෙහි ද? වෙරි මත
ඔබෙන් පහ වන තුරු ඉවතට යන්නැ"යි කී ය.
15 හන්නා උත්තර දෙමින්, "මාගේ ස්වාමීනි, එසේ
නොවේ; මුද්‍රික පානය වත් සුර බීමක් වත් මම
නොබීවෙමි. මම ශෝක සිතක් ඇති ස්ත්‍රියක්මි.
සමිඳාණන් වහන්සේට යාච්ඤා කරමින් මාගේ දුක්
ගැනවිලි උන් වහන්සේ ඉදිරියෙහි වැගිර වූයෙමි.
16 ඔබේ මෙහෙකාරී කමකට නැති ස්ත්‍රියකැ යි
නොසිතන්න. මා මේ ආකාරයෙන් යාච්ඤා කරමින්
සිටියේ මාගේ දුකේ හා සිත් වේදනාවේ වැඩිකම
නිසා ය"යි කීවා ය.
17 එවිට ඒලී පිළිතුරු දෙමින්, "ශාන්ති සිතින් යන්න;
ඉශ්‍රායලේවරුන්ගේ දෙවියන් වහන්සේගෙන් ඔබ
කළ ඉල්ලීම උන් වහන්සේ ඔබට ඉෂ්ට කර දෙන
සේක්වා"යි කීවේ ය. 18 ඈ ද, "ඔබේ දාසීට ඔබ
ඉදිරියෙහි කරුණාව ලැබේ වා"යි කියා එතැනින්
පිටත් ව ගොස් කෑම කෑවා ය. ඉන්පසු ඇගේ මුහුණ
ද මළානික ව නොතිබිණි.

## සාමුවලේගේ උපත සහ කැප කිරීම

19 පසු දින අලුයම එල්කානා සහ ඔහුගේ පවුල
නැඟිට, සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි නමස්කාර
කොට, හැරී ගොස් රාමාහි තමන්ගේ ගෙදරට ගියෝ
ය. එල්කානා සිය බිරිඳ වන හන්නා සමඟ එක් විය.
සමිඳාණන් වහන්සේ ද ඇය සිහි කළ සේක. 20 ඈ
පිළිසිඳගෙන නියම කාලයේ දී පුත්‍රයෙකු ලැබුවා ය.
ඈ ඔහුට සාමුවලේ යන නාමය තැබුවා ය. "එසේ
කළේ, මා සමිඳාණන් වහන්සේගෙන් ඔහු
ඉල්ලාගත් බැවිනැ"යි ඈ කීවා ය.
21 එල්කානා සහ ඔහුගේ මුළු පවුල අවුරුදුපතා
කරන පූජාවත්, තමාගේ භාරයත් සමිඳාණන්
වහන්සේට ඔප්පු කරන පිණිස ෂිලෝවට නික්ම
ගියහ. 22 එහෙත්, හන්නා ගියේ නැත. මන්ද, "ළමයා
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි හැම කල්හි ම
නැවතී සිටින පිණිස කිරි වැරූ පසු ඔහු ගෙන යන
තුරු මම නොයෙමි"යි ඈ ඇගේ පුරුෂයාට කීවා ය.

23 ඇගේ පුරුෂයා වන එල්කානා ඇට පිළිතුරු
දෙමින්, “ඔබට හොඳ යයි සිතෙන දේ කරන්න;
දරුවා කිරි වරන තුරු නැවතී සිටින්න. සමිඳාණන්
වහන්සේ තමන්ගේ පොරොන්දුව ඉෂ්ට කරන
සේක් වා”යි කීවේ ය. මෙසේ හන්නා නැවතී සිට
සිය පුතා කිරි වරන තුරු ඔහුට කිරි දුන්නා ය.
24 දරුවා කිරි වැරූ පසු, හන්නා තුන් අවුරුදු
වස්සෙකු ද පිටි කිලෝග්‍රෑම් දහයක් ද මිදියුස
බඳුනක් ද අරගෙන දරුවා ගෙන ගොස් ෂිලෝහි
තිබුණු සමිඳාණන් වහන්සේගේ මාලිගාවට
පැමිණුණා ය. එකල ඔහු කුඩා දරුවෙකු ව සිටියේ
ය. 25 ඔව්හු ගොන් වස්සා මරා දරුවා ඒලී ළඟට
ගෙනාහ. 26 ඈ ඒලී අමතා, “අනේ ස්වාමීනි, මට
සමා වන්න. වරක් ඔබ ළඟ සමිඳාණන් වහන්සේට
යාච්ඤා කරමින් සිටි ස්ත්‍රිය මා බව මම දිවුරා
කියමි. 27 මේ දරුවා දෙන ලෙස මම යාච්ඤා
කළෙමි. සමිඳාණන් වහන්සේ ද මා උන්
වහන්සේගෙන් ඉල්ලූ මේ ඉල්ලීම මට ඉටු කළ
සේක. 28 එබැවින් මම ද ඔහු සමිඳාණන්
වහන්සේට දෙන්නෙමි. ඔහු ජීවත් ව සිටින තෙක්
සමිඳාණන් වහන්සේට කැප ය”යි කීවා ය. ඔව්හු
එහි දී සමිඳාණන් වහන්සේට නමස්කාර කළහ.

## හන්නාගේ යාච්ඤාව

2 ලූක් 1:46-55 හන්නා යාච්ඤා කරමින් මෙසේ
කීවා ය:
q2
2 “මා සිත සමිඳුන් කෙරෙහි ප්‍රීතිමත් වේ;
q2
2 මාගේ සවිය සමිඳුන් කෙරෙහි උසස් වී තිබේ.
q2
2 මාගේ මුවින් මා සතුරන්ට මම සරදම් කරමි;
q2
2 ඔබ මා ගැළවූ නිසා මම ප්‍රීති වෙමි.
2 සමිඳුන් මෙන් සුවිශුද්ධ අන් කෙනෙක් නැත;
q2 2 ඔබ හැර අන් දෙවි කෙනෙක් ඇත්තේ ම නැත;
q2 2 අපේ දෙවිඳුන්ට සම වන සරණක් නැත.
3 උඩඟු ලෙස පුරසාරම් නොදොඩන්න;
q2 3 අහංකාර දෙඩුම් ඔබේ මුඛවලින් නොනික්මේ
වා!
q2 3 මන්ද, සමිඳු සියල්ල දන්නා වූ දෙවි කෙනෙකි;
q2 3 මිනිසුන්ගේ සියලු ක්‍රියා විනිශ්චය කරන
කෙනෙකි.
4 බලවතුන්ගේ බලය දුබල වී ඇත.
q2 4 දුබලයෝ බලවත් වී ඇත.
5 කා බී තර වී සිටි අය කුලී වැඩ කරති;
q2 5 සාගින්නෙන් පෙළී සිටි අයට සාගින්නක් තවත්
නැත.
q2 5 වඳ ස්ත්‍රියට දරුවන් සත්දෙනෙක් ඇත.
q2 5 බොහෝ දරුවන් ලැබූ ස්ත්‍රියට දැන් එකෙක්
වත් නැත.
6 මරණය සමිඳුන්ගෙන් ය, ජීවිතය ද සමිඳුන්ගෙන්
ය;
q2 6 පාතාලයට ගෙන යන්නේත්, එයින් ගෙන
එන්නේත් සමිඳාණෝ ය.
7 සමිඳාණෝ දිළිඳුකම ද පොහොසත්කම ද ඇති
කරන සේක;
q2 7 පහත්කම ද උසස්කම ද ගෙන දෙන සේක.
8 අධිපතීන් සමඟ හිඳුවන පිණිසත්, මහිමාසන
උරුම කර දෙන පිණිසත්, එතුමාණෝ දුප්පතා
ධූලියෙන් නැඟුටුවන සේක;
q2 8 දිළින්දා කසළ ගොඩින් ඔසවන සේක.
q2 8 පොළොවේ පදනම් සමිඳාණන්ගේ ය;
q2 8 එතුමාණෝ ඒවා පිට ලොව පිහිටවූ සේක.
9 එතුමාණෝ තම සුදනන්ගේ දිවි රක්නා සේක;
q2 9 එහෙත්, දුදනෝ අඳුරෙහි වැනසෙන්නෝ ය.
q2 9 සිය සවියෙන් පමණක් කිසිවෙක් ජය
නොගන්නේ ය.
10 සමිඳුන්ගේ සතුරෝ සුණු විසුණු කරනු ලබති;
q2 10 අතිඋසස් දෙවිඳාණෝ අහසෙන් ගිගුරුම් දෙන
සේක.
q2 10 සමිඳාණෝ මුළු පොළෝ තලය විනිශ්චය කරන
සේක;
q2 10 එතුමාණෝ සිය රජුට බලය දෙන සේක.
q2 10 තමන් තෝරාගත් රජුට ජය අත් කර දෙන
සේක.”
11 එල්කානා රාමාහි තමාගේ ගෙදරට ගියේ ය.
එහෙත්, දරුවා නතර වී ඒලී පූජකයා යටතේ
සමිඳාණන් වහන්සේට සේවය කළේ ය.

## ඒලීගේ පුත්‍රයෝ

12 ඒලීගේ පුත්‍රයෝ දුර්ජනයෝ වූ හ. ඔවුන්
සමිඳාණන් වහන්සේ ගැන කිසිත් සැලකුවේ නැත.
13 ඒ පූජකයන් සෙනඟ සමඟ හැසුරුණු අන්දම
මෙසේ ය: යම් කෙනෙකු පූජාවක් ඔප්පු කරන කල,
මස් උයන අතර, පූජකයාගේ වැඩකාරයා දැති තුනක්
ඇති මස් කොක්කක් රැගෙන අවුත්, 14 හට්ටියේ
හෝ සැළියේ හෝ කල්දේරමේ හෝ ඇතිළියේ
හෝ දමන්නේ ය; එවිට කොක්කට අසු වූ සියල්ල
පූජකයා තමාට ම ගන්නේ ය. ෂිලෝ නගරයට
පැමිණි සියලු ඉශ්‍රායලේවරුන්ට ඔව්හු මෙසේ කළහ.
15 ඒ හැර, තෙල දැවී යන්නටත් පෙර පූජකයාගේ
වැඩකාරයා අවුත්, පූජා ඔප්පු කරන මිනිසාට කතා
කොට, “පූජක තුමාට පුළුස්සන්නට මස් දෙන්න;
මන්ද, එතුමා අමු මස් මිස පිසූ මස් ඔබෙන්
නොපිළිගන්නේ ය”යි කී ය.
16 ඒ මිනිසා ඔහුට පිළිතුරු දෙමින්, “තෙල දැවී ගිය
පසු කැමැති තරම් ගන්නැ”යි ඔහුට කීවොත්,
වැඩකාරයා පිළිතුරු දෙමින්, “එසේ නොව, ඔබ දැන්
ම දෙන්නට ඕනෑ ය; නැත්නම් බලහත්කාරයෙන්
ගන්නෙමි”යි කියනු ඇත.
17 ඒලීගේ පුත්‍රයන් සමිඳාණන් වහන්සේගේ
පූජාව සුළු කොට සැලකූ බැවින් ඔවුන්ගේ පාපය
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි ඉතා බරපතල විය.

## සාමුවෙලේ ෂීලෝහි සිටීම

18 ළමා වියෙහි සිටි සාමුවෙලේ හණ ඒපොද්
සැට්ටයක් ඇඳගෙන, සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි
සේවය කරමින් සිටියේ ය. 19 ඔහුගේ මව සිය
පුරුෂයා සමඟ වාර්ෂික පූජාව ඔප්පු කරන පිණිස
අවුරුද්දක් පාසා අවුරුද්දක් ෂීලෝ නගරයට යන කල
සාමුවෙලේට කුඩා ඇඳුමක් සාදාගෙන ගියා ය. 20 ඒ
අවස්ථාවල දී ඒලී එල්කානාටත්, ඔහුගේ
භාර්යාවටත් ආශීර්වාද කරමින්, "ඔබ දෙපළ
සමිඳාණන් වහන්සේට දුන් දීමනාව වෙනුවට
සමිඳාණන් වහන්සේ ඔබට මේ ස්ත්‍රියගෙන් දරු
පරපුරක් දෙන සේක් වා"යි කීවේ ය. ඉන්පසු ඔව්හු
සිය ගෙදරට ගියෝ ය.
21 සමිඳාණන් වහන්සේ හන්නාට කරුණා කළ
සේක. ඈ පිළිසිඳගෙන පුත්‍රයන් තුන්දෙනෙකු ද
දූවරුන් දෙදෙනෙකු ද ලැබුවා ය. සාමුවෙලේ නම් ළමයා
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි වැඩිණි.

## ඒලී සහ ඔහුගේ පුත්‍රයෝ

22 ඒලී ඉතා මහලු ව සිටියේ ය. තමාගේ
පුත්‍රයන් සියලු ඉශ්‍රායලේවරුන්ට කළ සියල්ල
ගැනත්, සම්මුඛ මණ්ඩපයේ දොරකඩ සේවය කළ
ස්ත්‍රීන් සමඟ ඔවුන් සයනය කරන බවත් ඔහුට
ආරංචි විය. 23 ඒලී සිය පුතුන්ට කතා කොට, "ඔබ
මෙයාකාර දේවල් කරන්නේ කුමක් නිසා ද? ඔබේ
නපුරු ක්‍රියා ගැන මේ හැම දෙනාගෙන් ම මට
අසන්නට ලැබේ. 24 මාගේ පුත්‍රයෙනි, එසේ
නොකරන්න. මන්ද, සමිඳාණන් වහන්සේගේ සෙනඟ
අතරේ පැතිරී යන මේ දූසමාන ආරංචිය හොඳ
නැත. 25 මිනිසෙකුට විරුද්ධ ව මිනිසෙකු පව්
කළොත්, ඒ සම්බන්ධයෙන් දෙවියන් වහන්සේට
මැදහත් විය හැකි ය. එහෙත්, සමිඳාණන් වහන්සේට
විරුද්ධ ව මිනිසෙකු පව් කළොත්, ඔහු වෙනුවට
මැදහත් විය හැක්කේ කවරෙකුට දැ"යි කීවේ ය.
එහෙත්, ඔව්හු තම පියාගේ බසට සවන්
නොදුන්නෝ ය. මන්ද, සමිඳාණන් වහන්සේ ඔවුන්
නසන්නට තීරණය කර තිබුණු බැවිනි.
26 ලූක් 2:52 සාමුවෙලේ කාය ශක්තියෙන් ද
සමිඳාණන් වහන්සේගෙන් හා මනුෂ්‍යයන්ගෙන්
ප්‍රසාදය ලබමින් ද වැඩුණේ ය.

## ඒලීගේ පවුලට විරුද්ධ ප්‍රකාශනයක්

27 දෙවියන් වහන්සේට කැප වූ මනුෂ්‍යයෙක් ඒලී
වෙත අවුත්, "සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන
සේකැ"යි කීවේ ය: "නුඹේ පියා ද ඔහුගේ වංශය ද
මිසරයෙහි පාරාවෝගේ ගෙදර වහල් ව සිටිය දී මම
ඔවුන්ට ප්‍රකාශ නොවීම් ද? 28 නික්ම 28:1-4; ලෙවී
7:35-36පූජාසනය මත පූජා ඔප්පු කරන පිණිස ද
සුවඳ දුම් ඔප්පු කරන පිණිස ද මා ඉදිරියෙහි දාදු
කරඬුව දරන පිණිස ද මාගේ පූජකයන් ලෙස සියලු
ඉශ්‍රායලේ ගෝත්‍රවලින් මම ඒ වංශය තෝරා
නොගතිම් ද? ඉශ්‍රායලේවරුන් විසින් ඔප්පු කරන
ලද සියලු දවන යාග පූජා මම නුඹේ පියාගේ
වංශයට නුදුනිම් ද? 29 එසේ නම්, මාගේ
වාසස්ථානයේ ඔප්පු කරන්නට මා අණ කර තිබෙන
මාගේ යාගයටත්, මාගේ පූජාවටත් නුඹ අගෞරව
කරන්නේත්, මාගේ සෙනඟ වන ඉශ්‍රායලේවරුන්ගේ
සියලු පූජාවල ඉතා හොඳ කොටස්වලින් නුඹේ
පුත්‍රයන් තර කරගන්න පිණිස නුඹ මට වඩා නුඹේ
පුත්‍රයන්ට ගෞරව කරන්නේත් මන් ද? 30 එබැවින්
ඉශ්‍රායලේවරුන්ගේ දෙවි ස්වාමීන් වන මම මෙසේ
කියමි: නුඹේ වංශයත්, නුඹේ පියාගේ වංශයත් මා
ඉදිරියෙහි සදහට ම සේවය කරනු ඇත. එහෙත්,
දැන් ස්වාමීන් වන මම එය මාගෙන් දුරු වේ වා යි
කියමි. මන්ද, මට ගෞරව කරන්නන්ට මම ගෞරව
කරමි. මා හෙළා දකින්නන් නින්දාවට
පමුණුවන්නෙමි. 31 නුඹේ වංශයෙන් ද නුඹේ
පියාගේ වංශයෙන් ද කිසිවෙකු මහලු වියට
නොපැමිණෙන ලෙස නුඹේ ද නුඹේ පියාගේ ද
බලය මා බිඳදමන බව සිතට ගන්න.
32 ඉශ්‍රායලේවරුන්ට මා දෙන ආශීර්වාද සියල්ල
කෙරෙහි නුඹ ඊර්ෂ්‍යාවෙන් බලා කැළඹෙන්නෙහි ය.
නුඹේ වංශයෙන් කිසිවෙක් දීර්ඝායු වළඳන්නේ නැත.
33 එසේ වුවත් මට පූජකයෙකු ලෙස සේවය කරන
පිණිස නුඹේ පරපුරෙන් එක් කෙනෙකු මම ඉතිරි
කරගනිමි. එහෙත්, ඔහු අන්ධ වන්නේ ය; ඔහුගේ
සියලු බලාපොරොත්තු නැති වී යන්නේ ය. නුඹේ
වංශයෙන් පැවතෙන සියල්ලන් කඩු පහරින් මැරෙනු
ඇත. 34 1 සාමු 4:11නුඹේ පුත්‍රයන් දෙදෙනා වන
හොප්නි සහ පිනෙහාස් එක දවසේ මැරුණ විට, මා
කියන දේ සැබෑ බවට එය ලකුණක් වන්නේ ය.
35 මට පක්ෂපාත ව සිටින, මා කැමැති, මා කියන
හැම දේ කරන පූජකයෙකු මම තෝරාගන්නෙමි.
ඔහුට දරු පරපුරක් සලසා දී මාගේ අභිෂේක ලත්
රජ්ජුරුවන් ඉදිරියෙහි නිරන්තරයෙන් සේවය කිරීමට
ඔහු පත් කරමි. 36 තවද, නුඹේ වංශයෙන් ඉතුරු
වන හැම දෙනා රිදී කාසියක් ද රොටියක් ද
ලබාගන්න පිණිස රජු වෙත පැමිණ ඔහු ඉදිරියේ
වැඳ වැටී, අනේ රොටි කෑල්ලක් කන පිණිස පූජක
තනතුරට මා පත් කළ මැනවැ'යි කියනු ඇත."

## සාමුවෙලේ කැඳවනු ලැබීම

3 ළමා වියේ සිටි සාමුවෙලේ ඒලී යටතේ
සමිඳාණන් වහන්සේට සේවය කළේ ය. ඒ
කාලයේ දී සමිඳාණන් වහන්සේගෙන් පැමිණුණ
පණිවුඩ දුර්ලභ විය; දර්ශන ද විරල විය. 2 දැන්
ඒලීගේ ඇස් හරියාකාර නොපෙනෙන තරමට
අඳුරුවන්නට පටන්ගෙන තිබුණේ ය. දිනක් ඔහු සිය
කාමරයෙහි සැතපෙමින් සිටියේ ය. 3 සාමුවෙලේ ද
දෙවියන් වහන්සේගේ ගිවිසුම් කරඬුව තිබුණු
සමිඳාණන් වහන්සේගේ ශුද්ධස්ථානයෙහි නිදාගෙන
සිටියේ ය. එහි පහන එතෙක් දැල්වෙමින් තිබුණේ
ය. 4 එවිට සමිඳාණන් වහන්සේ සාමුවෙලේට අඬගැසූ
සේක. ඔහු ද, "මම මෙහි ය"යි කී ය. 5 එසේ කියා,
ඒලී ළඟට දිව ගොස්, "ඔබ මට අඬගැසුවෙහි ය.

මම මෙහි ය"යි කීවේ ය. ඒලී ද, "මම අඬ
නොගැසීමි; නැවත නිදාගන්නැ"යි කීවේ ය. ඔහු
ගොස් නිදාගත්තේ ය.
6 සමිඳාණන් වහන්සේ නැවතත්, "සාමුවෙලේ" කියා
අඬගැසූ සේක. සාමුවෙලේ නැඟිට ඒලී ළඟට ගොස්,
"ඇත්තට ම ඔබ මට අඬගැසුවෙහි ය; මෙන්න, මම
මෙහි ය"යි කී ය. එහෙත්, ඒලී පිළිතුරු දෙමින්,
"මාගේ පුත්‍රය, මම අඬ නොගැසීමි, නැවතත්
නිදාගන්නැ"යි කීවේ ය. 7 සාමුවෙලේ ඒ වන තුරු
සමිඳාණන් වහන්සේ දැන සිටියේ නැත. ඒ වන තුරු
සමිඳාණන් වහන්සේගේ වචන ඔහුට එළිදරව් නො
වී ය.
8 සමිඳාණන් වහන්සේ යළිත් තුන් වන වරටත්
සාමුවෙලේට අඬගැසූ සේක. ඔහු නැඟිට ඒලී ළඟට
ගොස්, "ඔබ මට කතා කෙළෙහි ය. මෙන්න, මම
මෙහි ය"යි කී ය. එවිට, සමිඳාණන් වහන්සේ
ළමයාට අඬගසන බව ඒලී තේරුම් ගත්තේ ය.
9 එබැවින් ඒලී සාමුවෙලේට කතා කොට, "ඔබ ගොස්
නිදාගන්න. ඔබට නැවත අඬගැසුවොත්, 'සමිඳාණන්
වහන්ස, කතා කළ මැනව; ඔබ වහන්සේගේ
මෙහෙකරුවා සවන් දී සිටිනවා'යි කියන්නැ"යි කීවේ
ය. සාමුවෙලේ ගොස් තමාගේ යහනේ නිදාගත්තේ
ය.
10 එවිට සමිඳාණන් වහන්සේ වැඩම කර, පළමු
වතාවල දී මෙන්, "සාමුවෙලේ, සාමුවෙලේ," කියා
අඬගැසූ සේක. සාමුවෙලේ පිළිතුරු දෙමින්, "කතා කළ
මැනව; ඔබ වහන්සේගේ මෙහෙකරුවා සවන් දී
සිටිනවා ය"යි කීවේ ය.
11 සමිඳාණන් වහන්සේ සාමුවෙලේට කතා කොට
මෙසේ වදාළ සේක: "මෙන්න, මම ඉශ්‍රායෙල්වරුන්ට
විරුද්ධ ව කරන්නට යන දේ; ඒ ගැන අසන
සියල්ලන්ගේ කන් දෙකෙ ලලෙ දෙන්නේ ය. 12 මා
ඒලීගේ වංශය ගැන කී සියල්ල ම, මුල පටන් අග
දක්වා, ඒ දවසේ දී ඒලීට විරුද්ධ ව ඉෂ්ට
කරන්නෙමි. 13 ඒලීගේ පුත්‍රයන් තමන් පිට සාපයක්
පමුණුවා ගන්න බව ඔහු දැනගෙන සිටිය දී, ඔවුන්
නොවැළැක්වීමේ අපරාධය නිසා මම ඔහුගේ
වංශයට සෑම කල්හි ම දඬුවම් කරන්නෙමි යි මම
ඔහුට දැන්වීමි. 14 එබැවින් ඒලීගේ වංශයේ
අපරාධය කිසි යම් පූජාවකින් වත්, පඬුරකින් වත්
පහකළ නොහැකි බව මා දිවුරා ඇත."
15 සාමුවෙලේ පහන් වන තුරු නිදා හිඳ, සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ දොරවල් ඇරියේ ය.
එහෙත්, සාමුවෙලේ තමා දුටු දර්ශනය ඒලීට දන්වන්න
බිය ව සිටියේ ය. 16 එවිට ඒලී, "සාමුවෙලේ, මාගේ
පුත්‍රය," කියා සාමුවෙලේ ඇමතුවේ ය. ඔහු ද, "මම
මෙහි ය"යි පිළිතුරු දුන්නේ ය.
17 එවිට ඒලී, "සමිඳාණන් වහන්සේ ඔබට කී දේ
කුමක් ද? ඒක මාගෙන් නොසඟවන්න. උන්
වහන්සේ ඔබට වදාළ සියලු දේ කිසිවක් මාගෙන්
නොසඟවා ඔබ මට නොකියන්නෙහි නම්, දෙවියන්
වහන්සේ ඔබට ඉතා තද ලෙස දඬුවම් කරන සේක්
වා"යි කීවේ ය. 18 එවිට සාමුවෙලේ කිසිවක්
නොසඟවා සියල්ල ම ඔහුට කීවේ ය. ඒ ඇසූ ඒලී,
"උන් වහන්සේ සමිඳාණන් වහන්සේ ය; උන්
වහන්සේ යහපත් ය; උන් වහන්සේට යහපත් යැයි
සිතෙන දේ කරන සේක් වා"යි පැවසී ය.
19 සාමුවෙලේ වැඩුණේ ය. සමිඳාණන් වහන්සේ
ඔහු සමඟ සිට ඔහු කී හැම දෙයක් ම එකක් වත්
නැර ඉෂ්ට කළ සේක. 20 සාමුවෙලේ සමිඳාණන්
වහන්සේගේ දිවැසිවරයකු වශයෙන් ස්ථිර කරන
ලද බව, උතුරේ සිට දකුණ දක්වා සිටි සියලු
ඉශ්‍රායෙල්වරු දැනගත්තෝ ය. 21 සමිඳාණන්
වහන්සේ ශිලෝහි දී සාමුවෙලේට ප්‍රකාශ වූ සේක.
එහි දී නැවත නැවත ප්‍රකාශ වී ඔහු සමඟ කතා
කළ සේක.

## ගිවිසුම් කරඬුව පැහැරගැනීම

4 සාමුවෙලේ කතා කළ විට ඉශ්‍රායෙලේ ජනතාව
ඔහුගේ වචන පිළිගත්හ. එකල ඉශ්‍රායෙල්වරු
පිලිස්තිවරුන්ට විරුද්ධ ව යුද්ධ කරන්නට පිටත් ව
ගොස්, එබෙනේ-එශරේ ළඟ කඳවුරු බැඳගත්හ.
2 පිලිස්තිවරු අපෙක්හි කඳවුරු බැඳගත්හ.
පිලිස්තිවරුන් ඉශ්‍රායෙල්වරුන්ට විරුද්ධ ව සටනට
සැරසී, දරුණු ලෙස සටන් කළ පසු ඉශ්‍රායෙල්වරු
පිලිස්තිවරුන්ට පරාජය වූ හ. ඔව්හු යුද්ධ භූමියේ
සේනාවෙන් මිනිසුන් හාරදාහක් පමණ මැරූහ.
3 ඉශ්‍රායෙල්වරුන් කඳවුරට ආපසු ආ කල,
ඉශ්‍රායෙල්හි ප්‍රජා මූලිකයෝ කතා කොට, "අද අප
පරාජය කරන්නට සමිඳාණන් වහන්සේ
පිලිස්තිවරුන්ට ඉඩ දුන්නේ මන් ද? සමිඳාණන්
වහන්සේ අප අතරට පැමිණ අපේ සතුරන්ගේ
අතින් අප ගළවන පිණිස උන් වහන්සේගේ ගිවිසුම්
කරඬුව ශිලෝවෙන් ගෙනේවා ගනිමු"යි කී හ. 4 නික්ම
25:22ඒ කී ලෙස ඔව්හු ශිලෝ නගරයට මිනිසුන්
යවා, කෙරුබ්වරුන් අතර පිහිටි සිහසුන මත
වැඩහිඳින සියලු බලැති සමිඳාණන් වහන්සේගේ
ගිවිසුම් කරඬුව ගෙනේවා ගත්හ. හොප්නි සහ
පිනෙහාස් යන ඒලීගේ පුත්‍රයෝ දෙදෙන දෙවියන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව සමඟ පැමිණියහ.
5 සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
කඳවුරට ගෙනෙනු ලැබූ කල මුළු ඉශ්‍රායෙලේ ජනතාව
පොළොව පුරා දෝංකාර දෙන මහත් ඝෝෂාවකින්
මොරහඬ නැඟුවහු ය. 6 පිලිස්තිවරු ඒ
මොරගැසීමේ ශබ්දය අසා, "හෙබ්‍රෙව්වරුන්ගේ
කඳවුරේ ඇසෙන මේ මහා ඝෝෂාව කුමක් දැ"යි
ඇසූ හ. සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
කඳවුරට ගෙනා බව ඔව්හු දැන ගත්හ. 7 ඒ නිසා
පිලිස්තිවරු බිය වූ හ. මන්ද, "දෙවියන් වහන්සේ
කඳවුරට වැඩිය සේකැ"යි ඔව්හු කී හ. තවද, ඔව්හු
කතා කොට, "අපට වන විපතක මහත! මන්ද,
මෙබඳු දෙයක් මීට පෙර නො වී ය. 8 අනේ, අපට
වන විපතක මහත! මේ බලසම්පන්න දෙවිවරුන්ගේ
අතින් අප ගළවාගන්නෝ කවුරු ද? මේ දෙවිවරු
වනාහි කාන්තාරයේ මිසරවරුන්ට සියලු ආකාර
වසංගතවලින් පහර දුන් දෙවිවරු ය. 9 පිලිස්තිවරුනි,
ධෛර්ය සම්පන්න වී වීර පුරුෂයන් මෙන් සටන්

කරන්න. එසේ නොකළොත් ඔවුන් අපේ වහලුන්
වූවාක් මෙන් අපි හෙබ්‍රෙව්වරුන්ගේ වහල්ලු
වන්නෙමු. ඒ නිසා වීර පුරුෂයන් මෙන් සටන්
කරන්නැ"යි කී හ.
10 එවිට පිලිස්තිවරු සටන් කළහ. ඉශ්‍රායලේවරු
පැරදී එක එකා තම තමාගේ කූඩාරම්වලට පලා
ගියෝ ය. ඉමහත් ඝාතනයක් ඇති විය. ඉශ්‍රායලේ
භේවායෝ තිස්දාහක් මරනු ලැබූ හ. 11 දෙවියන්
වහන්සේගේ ගිවිසුම් කරඬුවත් ඔවුන් අතට අසු
විණි. ඒලීගේ පුත්‍රයන් දෙදෙනා වන හොප්නි සහ
පිනෙහාස් ද මැරුම්කෑහ.

### ඒලීගේ මරණය

12 බෙන්ජමින්ගේ ගෝත්‍රයෙන් මිනිසෙක් යුද්ධ
භූමියෙන් දුව ගොස් එම දවසේ ම ෂීලෝ නගරයට
පැමිණියේ ය. ඔහු ඇඳුම් ඉරාගෙන, හිසේ පස්
දමාගෙන සිටියේ ය. 13 ඔහු එන විට ඒලී පාර අද්දර
තිබුණ තමාගේ ආසනයෙහි ඉඳගෙන බලා සිටියේ
ය. මන්ද, දෙවියන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
ගැන ඔහුගේ සිත බොහෝ සේ තැති ගෙන තිබිණි.
ඒ මිනිසා නගරයට අවුත් ආරංචිය කී කල නුවර
වැසි සියල්ලෝ මොරහඬ දුන්හ. 14 ඒලී
මොරගැසීමේ ශබ්දය අසා, "අර කෝලාහල ශබ්දය
කිමෙක් දැ"යි ඇසී ය. ඒ මිනිසා ඉක්මනින් අවුත්
ඒලීට ආරංචිය සැළ කළේ ය. 15 ඒලී වනාහි
අනූඅට අවුරුද්දක් වයස් ව සිටියේ ය; ඔහුගේ ඇස්
නොපෙනෙන තරමට අඳුරුව තිබුණේ ය. 16 ඒ
මිනිසා කතා කොට, "යුද්ධ භූමියේ සිට ආ
තැනැත්තා මම ය; එතැන සිට මෙතෙනට අද මම
දුවගෙන ආවෙමි"යි ඒලීට කීවේ ය. ඒලී ද, "මාගේ
පුත්‍රය, එහි සිදුවුණේ කිමෙක් දැ"යි ඇසී ය.
17 පණිවුඩකාරයා උත්තර දෙමින් "ඉශ්‍රායලේවරු
පිලිස්තිවරුන් ඉදිරියෙන් පලා ගියහ. සෙනඟ අතරේ
ඉමහත් ඝාතනයක් ඇති විය; ඔබේ පුත්‍රයන්
දෙදෙනා වන හොප්නි ද පිනෙහාස් ද මළහ. දෙවියන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව ද පැහැර ගනු ලැබී
ය"යි කීවේ ය.
18 ඔහු දෙවියන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
ගැන සඳහන් කළ විට, ඒලී හුනස්නෙන් දොරටුව
සමීපයෙහි පස්සට වැටී බෙල්ල කැඩී මළේ ය. මන්ද,
ඔහු මහලු තරබාරු මිනිසෙකු වූ බැවිනි. ඔහු සතළිස්
අවුරුද්දක් ඉශ්‍රායලේවරුන් පාලනය කළේ ය.

### පිනේහාස්ගේ වැන්දඹුවගේ මරණය

19 ඒලීගේ ලේලී යන පිනේහාස්ගේ බිරිඳ
ගැබ්ගෙන දරුවකු ලබන්නට ආසන්න ව සිටියා ය.
දෙවියන් වහන්සේගේ ගිවිසුම් කරඬුව සතුරන්
අතට අසු වූ බවත්, ඇගේ මාමණ්ඩිය ද ස්වාමි
පුරුෂයා ද මැරුණ බවත් ඈ ඇසූ කල, ප්‍රසව
වේදනාව හටගෙන ඈ නැඹුරු වී දරුවා බිහි කළා ය.
20 ඈ මැරෙන වේලාවේ ඈ ළඟ සිටි ස්ත්‍රීහු කතා
කොට, "බිය නොවන්න; ඔබ පුත්‍රයෙකු ලැබුවෙහි
යැ"යි කීවෝ ය. එහෙත්, ඈ පිළිතුරු දුන්නේ වත්, ඒ
ගැන සැලකුවේ වත් නැත. 21 දෙවියන් වහන්සේගේ
ගිවිසුම් කරඬුව සතුරන් අතට අසු වූ නිසා ද ඇගේ
මාමාත්, ස්වාමි පුරුෂයාත් මළ නිසා ද ඈ, "ඉශ්‍රායලේ
කෙරෙන් තේජස පහ ව ගියේ ය" කියා දරුවාට
'ඊකාබොද්' යන නම තැබුවා ය. 22 දෙවියන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව සතුරන් අතට අසු වූ
භයෙන්, "ඉශ්‍රායලේ කෙරෙන් තේජස පහ ව ගියේ
ය"යි ඈ කීවා ය.

### ගිවිසුම් කරඬුව නිසා වූ පීඩා

5 පිලිස්තිවරු දෙවියන් වහන්සේගේ ගිවිසුම්
කරඬුව රැගෙන එබෙන්-එෂෙර්හි සිට අෂ්දොද්
නගරයට එය ගෙනාවෝ ය. 2 ඔව්හු දෙවියන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව, රැගෙන දාගොන්
දෙවියාගේ දේවාලයට ගෙන ගොස් දාගොන් ළඟ
තැබූ හ. 3 පසු දා අලුයම අෂ්දොද්හි වැසියන් අවදි
වූ විට, සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
ඉදිරිපිට දාගොන් මුණින්තළා වී තිබෙනවා ඔව්හු
දුටුහ. ඔව්හු දාගොන් රැගෙන නැවත ඔහු කලින්
තිබූ ස්ථානයෙහි ම තැබූ හ. 4 ඔව්හු පසු දා අලුයම
අවදි වූ විටත් සමිඳාණන් වහන්සේගේ ගිවිසුම්
කරඬුව ළඟ යළිත් දාගොන් මුණින්තළා වී බිම
සිටිනවා දුටුහ; දාගොන්ගේ හිස ද අත් දෙක ද වෙන්
වී එළිපත්ත උඩ තිබෙනවා දුටුහ; ඉතිරි ව තිබුණේ
කඳ පමණක් ය. 5 අද දවස දක්වා ම දාගොන්ගේ
පූජකයන් ද දාගොන්ගේ දේවාලයට ඇතුළු වන අය
ද අෂ්දොද්හි තිබෙන දාගොන්ගේ දේවාලයේ
එළිපත්ත නොපාගන්නේ එබැවිනි.
6 එකල සමිඳාණන් වහන්සේ සිය බාහු බලයෙන්
අෂ්දොද් වැසියන්ට තදින් පහර දුන් සේක. උන්
වහන්සේ අෂ්දොද්හි වැසියන්ටත්, එහි දිසාවල
වැසියන්ටත් භයානක ගඩු හටගැන්වීමෙන් පහර දුන්
සේක. 7 අෂ්දොද් වැසියෝ සිදු වූ දේ දැක,
"ඉශ්‍රායලේහි දෙවියන් වහන්සේගේ ගිවිසුම්
කරඬුව අප ළඟ නොතිබිය යුතු ය; මන්ද, උන්
වහන්සේ සිය බාහු බලයෙන් අපටත්, අපේ දෙවියා
වන දාගොන්ටත් තදින් දඬුවම් කරන සේකැ"යි කී
හ. 8 එබැවින් ඔව්හු පණිවුඩ යවා, පිලිස්තිවරුන්ගේ
අධිපතීන් පස්දෙනා තමන් ළඟට රැස් කර,
"ඉශ්‍රායලේ දෙවියන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
ගැන අප කුමක් කළ යුතු දැ"යි විමසූ හ. ඔව්හු
පිළිතුරු දෙමින්, "ඉශ්‍රායලේ දෙවියන් වහන්සේගේ
ගිවිසුම් කරඬුව ගාත් නගරයට ගෙන යන්නැ"යි කී
හ. ඒ කී ලෙස ඔව්හු ඉශ්‍රායලේ දෙවියන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව එහි ගෙන ගියහ.
9 ඔවුන් එය ගෙන ගිය විට, සමිඳාණන් වහන්සේ
සිය බාහු බලය පා ඒ නගරයට දඬුවම් කොට එහි
ඉමහත් කැළඹීමක් ඇති වන්නට සැලැසූ සේක. උන්
වහන්සේ නුවර වැසි ලොකු කුඩා සියල්ලන් පිට
භයානක ගඩු හටගන්වා ඔවුන්ට පහර දුන් සේක.
10 එවිට ඔව්හු දෙවියන් වහන්සේගේ ගිවිසුම්
කරඬුව එක්රොන් නගරයට යැව්වෝ ය. දෙවියන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව එක්රොන් නගරයට

පැමිණි කල එහි වැසියෝ, “අප ද අපගේ සෙනඟ ද
නසන්නට ඉශ්රායලේ දෙවියන් වහන්සේගේ ගිවිසුම්
කරඬුව අප ළඟට ගෙනවුත් ඇතැ”යි කියමින්
මොරගැසූ හ. 11 එබැවින් ඔව්හු පණිවුඩ යවා,
පිලිස්තිවරුන්ගේ සියලු අධිපතීන් රැස් කරවා,
“ඉශ්රායලේ දෙවියන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
අප හා අපගේ සෙනඟ විනාශ නොකරන පිණිස එය
ස්වකීය ස්ථානයට ආපසු යවන්නැ”යි කී හ. එසේ
කීවේ, නගරය මුළුල්ලේ මාරක කැළඹීමක් හටගත්
නිසා ය; දෙවියන් වහන්සේගේ බාහු බලයෙන් එයට
තදින් පහර වැදුණේ ය. 12 නොමළ අය ගඩුවලින්
පීඩා වින්දෝ ය; නගර වැසියන්ගේ විලාපය ද අහස
දක්වා නැඟුණේ ය.

## ගිවිසුම් කරඬුව ආපසු බාර දීම

6 සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
පිලිස්තිවරුන්ගේ රටෙහි හත් මාසයක් තිබිණි.
2 පිලිස්තිවරු පූජකයන් ද පේන කියන්නන් ද කැඳවා,
“සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
සම්බන්ධයෙන් අප කුමක් කළ යුතු ද? එය ස්වකීය
ස්ථානයට කුමන දෙයක් සමඟ යැවිය යුතු ද කියා
අපට දන්වන්නැ”යි කී හ.
3 ඔව්හු පිළිතුරු දෙමින්, “ඔබ, ඉශ්රායලේවරුන්ගේ
දෙවියන් වහන්සේගේ ගිවිසුම් කරඬුව ආපසු
යවන්නහු නම්, එය හිස් අතින් නැර, ඔබගේ පව්
වෙනුවෙන් වන්දි පූජාවක් උන් වහන්සේට යවන්න.
එවිට ඔබ සුව වන්නහු ය. උන් වහන්සේගේ බාහු
බලයෙන් කෙරෙන පීඩා ඔබ කෙරෙන් පහ ව
නොයන්නේ කුමක් නිසා ද කියා ඔබට දැනගන්නට
ලැබෙනු ඇතැ”යි කීවෝ ය.
4 “අප කුමන වන්දි පූජාවක් ගෙවිය යුතු දැ”යි
ඔව්හු ඇසූ හ. පූජකවරු හා පේන කියන්නෝ පිළිතුරු
දෙමින්, “පිලිස්තිවරුන්ගේ අධිපතීන්ගේ ගණන අනුව
රනින් කළ ගඩු රූප පහකුත්, රනින් කළ මීයන්
පස්දෙනකුත් ය. මන්ද, ඔබ සියල්ලන් හා ඔබගේ
අධිපතීන් කෙරෙහි පැමිණුණේ එක ම පීඩාවක් ය.
5 එබැවින් ගඩු රූප ද රට නාස්ති කරන මී රූප ද
සාදා ඉශ්රායලේවරුන්ගේ දෙවියන් වහන්සේට
ගෞරව දෙන්න. එසේ කළොත්, සමහර විට උන්
වහන්සේ ස්වකීය බාහු බලයන් ඔබ කෙරෙන් ද
ඔබගේ දෙවිවරුන් කෙරෙන් ද ඔබගේ දේශය කෙරෙන්
ද ඉවත් කරනු ඇත. 6 මිසරවරුන් හා පාරාවෝ
ඔවුන්ගේ සිත් දැඩි කරගත් ලෙස ඔබත් සිත් දැඩි
කරගන්නේ කුමට ද? උන් වහන්සේ ඔවුන්
මෝඩයන් කළ විට ඔවුන් සෙනඟට යන්නට අවකාශ
දුන්නා නොවේ ද? ඉශ්රයලේවරුන් පිටත් ව ගියා
නොවේ ද? 7 දැන් ඉතින් අලුත් ගැලක් සාදාගෙන
වියගහ නොදැරූ කිරි එළදෙනුන් දෙදෙනෙකු ගෙන
ගැලට බැඳ, උන්ගේ වස්සන් උන් වෙතින් වෙන් කර
ගාලේ නවත්වන්න. 8 ඉන්පසු සමිඳාණන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව ගෙන ගැල මත තබා,
වන්දි පූජාව පිණිස උන් වහන්සේට දෙන රන්
භාණ්ඩ එහි පැත්තක කුඩා කරඬුවක තබා ගැල යන
දෙසෙක යන්නට එයට ඉඩ හැර බලා සිටින්න.
9 ඉතින්, එය සිය දේශ සීමාවට යන මාර්ගයේ
බෙත්-ෂෙමෙෂ්ට ගියොත්, මේ මහත් විපත්තිය අපට
සිදු කළේ උන් වහන්සේ බව එයින් පෙනෙයි; එසේ
නැත්නම්, අපට පහර දුන්නේ උන් වහන්සේ නොවෙ,
එය ඉබේ ම අපට පැමිණි දෙයක් බව අපට
පෙනෙනු ඇතැ”යි කීවෝ ය.
10 ඔව්හු එලෙස කරමින්, කිරි එළදෙනුන්
දෙදෙනෙකු ගෙන ගැලට බැඳ, උන්ගේ වස්සන් ගාල්
කොට තබා, 11 සමිඳාණන් වහන්සේගේ ගිවිසුම්
කරඬුව ද රන් මී රූප සහ ගඩු රූප දැමූ කුඩා
කරඬුව ද ගැලෙහි තැබූ හ. 12 එළදෙන්නු බෙත්-
ෂෙමෙෂ්ට යන මාර්ගයේ ගියෝ ය; දකුණට වත්,
වමට වත් නොහැරී තපුල්ලමින් එම මාවත දිගේ ම
ගියෝ ය; පිලිස්තිවරුන්ගේ අධිපතියෝ ද බෙත්-
ෂෙමෙෂ්හි සීමාව දක්වා උන් පසුපස ගියහ.
13 බෙත්-ෂෙමෙෂ්හි මිනිස්සු මිටියාවතේ තිරිඟු
කපමින් සිටියෝ ය. ඔව්හු හිස ඔසවා බලා, ගිවිසුම්
කරඬුව දැක ප්රීතියෙන් පිනා ගියහ. 14 ගැල ද
බෙත්-ෂෙමෙෂ්හි ජෝෂුවාගේ කෙතට පැමිණ එහි
නැවතුණේ ය. එහි ලොකු ගලක් තිබුණේ ය.
සෙනඟ ගැලේ ලී පළා, එළදෙනුන් සමිඳාණන්
වහන්සේට දවන යාග පූජාවක් කොට ඔප්පු කළෝ
ය. 15 ලෙවීවරු සමිඳාණන් වහන්සේගේ ගිවිසුම්
කරඬුව ද රන් භාණ්ඩ දමා තිබුණු කරඬුව ද ගෙන,
මහ ගල මත තැබූහ. බෙත්-ෂෙමෙෂ් වැසියෝ ඒ
දවසේ දී සමිඳාණන් වහන්සේට දවන යාග පූජා
ඔප්පු කොට, පඬුරු ද පිදුවෝ ය. 16 පිලිස්තිවරුන්ගේ
අධිපතීහු පස්දෙන ඒ දැක එදා ම එක්රොන්ට හැරී
ගියහ.
17 පිලිස්තිවරු වන්දි පූජාවක් වශයෙන්, අෂ්දොද්
උදෙසා ද ගාසා උදෙසා ද අෂ්කෙලොන් උදෙසා ද
ගාත් උදෙසා ද එක්රොන් උදෙසා ද එක එක බැගින්
රනින් කළ ගඩු යැවූහ. තවද, ඔව්හු පිලිස්තිවරුන්ගේ
අධිපතීන් පස්දෙනා විසින් පාලනය කරන ලද නගර
වෙනුවෙන් එකකට එක රූපයක් බැගින් රනින් කළ මී
රූප යැවූහ. 18 ඒ නගරවලට පවුරු සහිත නගර ද
පිටිසර ගම් ද ඇතුළත් ය. ඔවුන් සමිඳාණන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව තැබූ බෙත්-ෂෙමෙෂ්හි
ජෝෂුවාගේ කෙතෙහි විශාල ගල, මේ සිද්ධිය
සම්බන්ධයෙන් සාක්ෂියක් වශයෙන් අද දක්වා ම
තිබේ.
19 බෙත්-ෂෙමෙෂ්හි මනුෂ්යයන් සමිඳාණන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව ඇර බැලූ නිසා, උන්
වහන්සේ සෙනඟගෙන් සැත්තෑදෙනෙකුට පහර දුන්
සේක. සමිඳාණන් වහන්සේ සෙනඟ අතරෙහි මේ
සා මහත් ඝාතනයක් කළ බැවින් සෙනඟ වැලපුණෝ
ය.

## කිරියත්-ජෙයාරීම්හි ගිවිසුම් කරඬුව තැබීම

20 බෙත්-ෂෙමෙෂ්හි මනුෂ්යයෝ කතා කොට,
“සමිඳාණන් වහන්සේ වන ශුද්ධ දෙවියන් වහන්සේ
ඉදිරියෙහි සිටින්නට පුළුවන් කවරකුට ද? උන්

වහන්සේ අප වෙතින් බැහැර කරන පිණිස ගිවිසුම්
කරඬුව කොතැනට යැවිය හැකි දැ”යි ඇසුවෝ ය.
21 ඔව්හු කිරියත්-යෙයාරීම්හි වැසියන් වෙත දූතයන්
අත පණිවුඩයක් යවමින්, “පිලිස්තිවරුන් සමිඳාණන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව ආපසු එවා තිබේ;
අවුත් එය ගෙන යන්නැ”යි කී හ.
7 2 සාමු 6:2-4; 1 වංශා 13:5-7 කිරියත්-යෙයාරීම්
වැසියෝ අවුත්, සමිඳාණන් වහන්සේගේ
ගිවිසුම් කරඬුව රැගෙන, කන්ද පිට පිහිටි
අබීනාදාබ්ගේ ගෙට ගෙන ගොස්, සමිඳාණන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව රක්ෂා කරන පිණිස
එලයාසර් භාරකරු ලෙස පත් කළහ.

## සාමුවෙල් විනිශ්චයකාරයා වීම

2 සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
කිරියත්-යෙයාරීම්හි තැන්පත් කළ දා පටන් දීර්ඝ
කාලයක් එනම්, විසි අවුරුද්දක්, ගත විය. මේ කාලය
තුළ දී මුළු ඉශ්‍රායෙල් ජනයා සමිඳාණන්
වහන්සේගේ උපකාරය සොයා මොරගැසූ හ.
3 සාමුවෙල් මුළු ඉශ්‍රායෙල් ජනයා අමතා, “ඔබ
හැම මුළු සිතින් ඔබේ සමිඳාණන් වහන්සේ වෙත
හැරී එන්නහු නම්, ඔබ අතරෙන් අන්‍ය දෙවිවරුන් ද
අෂ්ටාරෝත් දේවතාවිය ද පහ කරදමා, ඔබේ සිත්
සමිඳාණන් වහන්සේ දෙසට ම යොමු කොට උන්
වහන්සේට පමණක් වැඳුම්පිදුම් කරන්න. උන්
වහන්සේ ද පිලිස්තිවරුන්ගේ අතින් ඔබ ගළවාගනු
ඇතැ”යි කීවේ ය. 4 එවිට ඉශ්‍රායෙල් ජනයා බාල්
දේවතාවන් ද අෂ්ටාරෝත් ද පහ කරදමා සමිඳාණන්
වහන්සේට පමණක් වැඳුම්පිදුම් කළහ.
5 එවිට සාමුවෙල් කතා කොට, “මා ඔබ උදෙසා
සමිඳාණන් වහන්සේට යාච්ඤා කරන පිණිස සියලු
ඉශ්‍රායෙල්වරුන් මිශ්පා නගරයට රැස් කරන්නැ”යි
කීවේ ය. 6 ඔව්හු මිශ්පා නගරයට රැස් වී වතුර ඇද
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි පූජාවක් වශයෙන්
වත් කොට, ඒ දවසේ නිරාහාර ව සිට, “අපි
සමිඳාණන් වහන්සේට විරුද්ධ ව පව් කළෙමු”යි
එහි දී කී හ. සාමුවෙල් මිශ්පාහි පදිංචි වී සිට
ඉශ්‍රායෙල් ජනයා විනිශ්චය කළේ ය.
7 ඉශ්‍රායෙල් ජනයා මිශ්පා නගරයට රැස් ව සිටින
බව පිලිස්තිවරුන් ඇසූ කල ඔවුන්ගේ අධිපතීහු
ඉශ්‍රායෙල්වරුන්ට විරුද්ධ ව නැඟී ආහ. ඉශ්‍රායෙල්
ජනයා ඒ අසා පිලිස්තිවරුන්ට බිය වූ හ. 8 එවිට
ඔව්හු සාමුවෙල්ට කතා කොට, “අපේ දෙවි
සමිඳාණන් වහන්සේ පිලිස්තිවරුන්ගේ අතින් අප
ගළවන පිණිස අප උදෙසා නොනැවතී ම යාච්ඤා
කළ මැනවැ”යි කී හ. 9 සාමුවෙල් කිරි බොන බැටළු
පැටවකු රැගෙන සමිඳාණන් වහන්සේට දවන යාග
පූජාවක් කොට ඔප්පු කර ඉශ්‍රායෙල්වරුන් උදෙසා
සමිඳාණන් වහන්සේට යාච්ඤා කළේ ය;
සමිඳාණන් වහන්සේ ඔහුට උත්තර දුන් සේක.
10 සාමුවෙල් දවන යාග පූජාව ඔප්පු කරන වේලේ
ම පිලිස්තිවරු ඉශ්‍රායෙල්වරුන්ට විරුද්ධ ව සටනට ළං
වූ හ. එහෙත්, සමිඳාණන් වහන්සේ ඒ දවසේ දී
පිලිස්තිවරුන්ට විරුද්ධ ව මහ හඬින් ගිගුරුම් දී ඔවුන්
වියවුලට පත් කළ සේක. ඔව්හු ඉශ්‍රායෙල්වරුන්
කෙරෙන් පලා ගියහ. 11 ඉශ්‍රායෙල් ජනයා මිශ්පා
නුවරින් නික්ම, පිලිස්තිවරුන් ලුහුබැඳ ගොස්, බෙත්-
කාර්ට පැමිණෙන තුරු ඔවුන්ට පහර දුන්හ.
12 එවිට සාමුවෙල් ගලක් ගෙන මිශ්පා නගරයටත්,
ෂේන් නගරයටත් අතරේ තබා, “මෙතෙක් දක්වා
සමිඳාණන් වහන්සේ අපට පිහිට වූ සේකැ”යි
කියමින් ඊට ‘එබෙන්-එසෙරේ ය’යි නම තැබුවේ ය.
13 මෙසේ පිලිස්තිවරු පරාජය වී ඉශ්‍රායෙල්
දේශයේ සීමාවට ඇතුළු නොවූ හ. සාමුවෙල්ගේ
මුළු ජීවිත කාලය තුළ සමිඳාණන් වහන්සේගේ බාහු
බලය පිලිස්තිවරුන්ට විරුද්ධ ව පැවතුණේ ය.
14 පිලිස්තිවරුන් විසින් එක්‍රොන් සිට ගාත් දක්වා
ඉශ්‍රායෙල්වරුන්ගෙන් ගන්නා ලද නගර ආපසු
ඉශ්‍රායෙල්වරුන්ට දෙන ලද්දේ ය. ඉශ්‍රායෙල්වරු
සියලු දේශ සීමාවන් පිලිස්තිවරුන්ගේ අතින්
මුදාගත්හ. ඉශ්‍රායෙල්වරුන් හා අමෝරිවරුන් අතර
සාමදානය ද පැවතිණි.
15 සාමුවෙල් ජීවිතාන්තය දක්වා ඉශ්‍රායෙල්වරුන්
විනිශ්චය කළේ ය. 16 ඔහු වසරක් පාසා වසරක්
බෙතෙල්ටත්, ගිල්ගාල්ටත්, මිශ්පාටත් පිළිවෙළින්
ගොස් ඒ ඒ ස්ථානවල දී ඉශ්‍රායෙල්වරුන් විනිශ්චය
කළේ ය. 17 ඉන්පසු ඔහු රාමා නගරයට ගියේ ය.
මන්ද, ඔහුගේ ගෙය තිබුණේ එහි බැවිනි. එහි දී ද
ඔහු ඉශ්‍රායෙල්වරුන් විනිශ්චය කළේ ය. තවද,
ඔහු එහි සමිඳාණන් වහන්සේට පූජාසනයක්
ගොඩනැඟුවේ ය.

## සෙනඟ රජකු ඉල්ලීම

8 සාමුවෙල් මහලු වයසට පත් වූ කල ඔහු
තමාගේ පුත්‍රයන් ඉශ්‍රායෙල්වරුන්ගේ
විනිශ්චයකාරයන් වශයෙන් පත් කළේ ය.
2 ඔහුගේ කුලුඳුල් පුත්‍රයාගේ නම ජෝවෙල් ය;
දෙවැන්නාගේ නම අබීයා ය. ඔව්හු බෙයෙර්-ෂෙබාහි
විනිශ්චයකාරයෝ වූ හ. 3 එහෙත්, සාමුවෙල්ගේ
පුත්‍රයෝ ඔහුගේ අඩි පාරේ නොගොස්, වස්තු
තණ්හාවෙන් අල්ලස් ගෙන, යුක්තියට පිටුපා ක්‍රියා
කළහ.
4 එවිට ඉශ්‍රායෙල්වරුන්ගේ සියලු ප්‍රජා මූලිකයෝ
එක් රැස් වී රාමාහි සිටි සාමුවෙල් වෙත අවුත්,
5 ද්වි.නී. 17:14ඔහුට කතා කොට, “ඔබ මහලු ව
සිටින්නෙහි ය, ඔබේ පුත්‍රයෝ ඔබේ අඩි පාරෙහි
ගමන් නොකරති. ඉතින් අන් ජාතීන්ට මෙන් අප
පාලනය කරන පිණිස අපටත් රජ කෙනෙකු පත් කළ
මැනවැ”යි කී හ. 6 “අප පාලනය කරන පිණිස අපට
රජ කෙනෙකු දුන මැනවැ”යි කී කීම ගැන සාමුවෙල්
අසතුටු වී සමිඳාණන් වහන්සේට යාච්ඤා කළේ ය.
7 සමිඳාණන් වහන්සේ ඔහුට කතා කොට, “සෙනඟ
නුඹට කී සියල්ල ගැන ඔවුන්ගේ හඬට සවන්
දෙන්න. ඔවුන් ප්‍රතික්ෂේප කර ඇත්තේ නුඹ
නොවේ, ඔවුන් ප්‍රතික්ෂේප කර ඇත්තේ මා ය.
මන්ද, මා ඔවුන් කෙරෙහි රජකම් කිරීමෙන් වළක්වන

පිණිස 8 මා ඔවුන් මිසර දේශයෙන් ගෙනා දා පටන්
අද දවස දක්වා ඔව්හු මා අත්හැර අන් දෙවිවරුන්ට
වැඳුම්පිදුම් කළෝ ය. ඔව්හු සෑම කල්හි ම මට කළ
දේ දැන් නුඹටත් කරති. 9 දැන් ඉතින් ඔවුන්ගේ
හඬට ඇහුම්කන් දෙන්න. එසේ වී නමුත්, ඔවුන්
කෙරෙහි රජකම් කරන රජු ඔවුන් සම්බන්ධයෙන්
ක්‍රියා කරන අන්දම ගැන ඔවුන්ට විස්තර කර
දෙන්නැ"යි වදාළ සේක.
10 එවිට සාමුවලේ තමාගෙන් රජකෙනෙකු ඉල්ලා සිටි
සෙනඟට සමිඳාණන් වහන්සේ වදාළ සියලු දේ
කීවේ ය. 11 ඔහු ඔවුන්ට මෙසේ කීවේ ය: "ඔබ
කෙරෙහි රජකම් කරන රජ මෙවැන්නෙකු වන්නේ ය.
ඔහු ඔබේ පුත්‍රයන් ගෙන තමාගේ රියැදුරන් හා
අසරුවන් වශයෙන් ද තමාගේ රථවලට පෙරටුව
දුවන පිණිස ද පත් කරගන්නේ ය. 12 ඔහු ඔවුන්
සහශ්‍රාධිපතීන් ද පණසාධිපතීන් ද වශයෙන් පත්
කරගන්නේ ය; සමහරුන් තමාගේ බිම් හාන්නට ද
තමාගේ ගොයම් කපන්නට ද තමාගේ යුද්ධ
ආයුධත්, රථායුධත් සාදන්නට ද පත් කරගන්නේ ය.
13 ඔහු ඔබේ දූවරුන් සුවඳ ද්‍රව්‍ය සාදන පිණිස ද
කෑම පිසින පිණිස ද රොටි පුළුස්සන පිණිස ද
ගන්නේ ය. 14 ඔහු ඔබේ කෙත් ද මිදි වතු ද ඔලීව
වතු අතරෙන් ඉතා හොඳ ඒවා ද රැගෙන තමාගේ
නිලධාරීන්ට දෙන්නේ ය. 15 ඔබේ ධාන්‍යවලින් ද
මුද්‍රික ඵලයෙන් ද දසයෙන් කොටසක් ගෙන
තමාගේ රජ වාසලේ නිලධාරීන්ටත්, සෙසු
නිලධාරීන්ටත් දෙන්නේ ය. 16 ඔබේ දාස දාසීන් ද
ඔබේ හොඳ ම ගවයන් ද කොටළුවන් ද තමාගේ
වැඩට පත් කරගන්නේ ය. 17 ඔහු ඔබේ
බැටළුවන්ගෙන් දසයෙන් කොටසක් ගන්නේ ය; ඔබ
ඔහුගේ වහල්ලු වන්නහු ය. 18 ඒ කාලය පැමිණි විට
ඔබ ම තෝරාගත් ඔබේ රජු ගැන ඔබ දැඩි ලෙස
පැමිණිලි කරනු ඇත. එහෙත්, සමිඳාණන් වහන්සේ
ඒ දවසේ දී ඔබට උත්තර නොදෙන සේක."
19 එහෙත්, සෙනඟ සාමුවලේ කී දේට සවන්
නොදී, "නැත. අපටත් රජ කෙනෙකු ඕනෑ ම ය.
20 එවිට අප විනිශ්චය කරන, අපට පෙරටුව ගොස්
අපේ යුද්ධවල දී සටන් කරන රජ කෙනෙකේ අපට
ඇත. අපිත් අන් ජාතීන් මෙන් වන්නෙමු"යි කී හ.
21 සාමුවලේ සෙනඟගේ සියලු වචන අසා, ඒවා
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි කීවේ ය.
22 සමිඳාණන් වහන්සේ පිළිතුරු දෙමින්, "ඔවුන්ගේ
හඬට සවන් දී, ඔවුන්ට රජකෙනෙකු පත් කරන්නැ"යි
සාමුවලේට වදාළ සේක. සාමුවලේ ද ඉශ්‍රායලේ
සෙනඟගේ සියලු දෙනාට කතා කොට, "තම
තමන්ගේ නිවාසවලට යන්නැ"යි කීවේ ය.

### සාමුවලේ සහ සාවුල් හමු වීම

9 බෙන්ජමින්ගේ ගෝත්‍රයට අයත් කිෂ් නම්
මිනිසෙකේ සිටියේ ය. ඔහු වූ කලී මහා
ධනවතෙකේ. ඔහු අබීයලේගේ පුත්‍රයා ය;
ශෙරෝර්ගේ මුණුබුරා ය; අපියාගේ වංශයට අයත්
බෙකෝරත්ගේ පවුලේ කෙනෙකේ. 2 ඔහුට සාවුල්
නම් කඩවසම් පෙනුමක් ඇති තරුණ පුත්‍රයෙකේ
සිටියේ ය. ඔහුට වඩා පෙනුමක් ඇති කෙනෙකේ
ඉශ්‍රායලේවරුන් අතර සිටියේ නැත. ඔහු අන් හැමට
වඩා උස කෙනෙකේ විය.
3 දිනක් සාවුල්ගේ පිය වූ කිෂ්ගේ කොටළුවෝ
නැති වුණෝ ය. කිෂ් තම පුත් සාවුල්ට කතා කොට,
"ඔබ වැඩකාරයන්ගෙන් එක් කෙනෙකු අඬගසා ගෙන
පිටත් ව ගොස් කොටළුවන් සොයන්නැ"යි කීවේ ය.
4 ඔහු එප්‍රායිම් කඳුකරයෙහි සිට ෂාලීෂා රට දක්වා
ඇවිද්ද නමුත්, කොටළුවන් සම්බ වුණේ නැත. ඔවුන්
ෂාලීම් රටේත් ඇවිද්ද නමුත්, කොටළුවන් එහි ද
නොවූ බැවින්, ඔව්හු බෙන්ජමින්ගේ රටෙහි ද
ඇවිද්දෝ ය. එහෙත්, ඔවුන්ට උන් සම්බ වුණේ නැත.
5 ඔව්හු ශූප් රටට පැමිණි කල, සාවුල් තමා සමඟ
සිටි සිය වැඩකාරයාට කතා කොට, "අපි ආපසු හැරී
යමු; නැත්නම්, මාගේ පියා කොටළුවන් ගැන
කල්පනාව අත්හැර අප ගැන ශෝක වනු ඇතැ"යි
කීවේ ය.
6 සේවකයා ඔහුට පිළිතුරු දෙමින්, "දෙවියන්
වහන්සේට කැප වූ මනුෂ්‍යයෙකේ මේ නගරයේ
සිටියි; ඔහු ගරු කටයුතු කෙනෙකේ; ඔහු කියන
සියල්ල නොවරදවා ඉෂ්ට වන්නේ ය. අපි ඔහු වෙත
යමු; සමහර විට, අප යා යුත්තේ කොහේ දැ යි
ඔහු අපට දන්වනු ඇතැ"යි කීවේ ය.
7 එවිට සාවුල් වැඩකාරයාට කතා කොට, "අපි
යන්නෙමු නම්, ඒ මිනිසාට කුමක් ගෙන යමු ද? අපේ
භාජනවල තිබුණු කෑම දැන් ඉවර ය; දෙවියන්
වහන්සේගේ මනුෂ්‍යයාට ගෙන යන්නට කිසි
තෑග්ගක් නැත. අප ළඟ කුමක් තිබේ දැ"යි ඇසුවේ
ය.
8 වැඩකාරයා යළිත් සාවුල්ට පිළිතුරු දෙමින්, "මා
අතේ කුඩා රිදී කාසියක් තිබේ. අප යා යුතු මාර්ගය
දන්වන පිණිස එය දෙවියන් වහන්සේගේ
මනුෂ්‍යයාට දෙන්නෙමි"යි කීවේ ය.
9+1SA පෙර කාලයේ දී ඉශ්‍රායලේහි මිනිසෙකේ
දෙවියන් වහන්සේගෙන් යම් කරුණක් විමසන්නට
යන විට, "දිවැස් ඇත්තා ළඟට යමු"යි කියන්නේ ය.
දැන් දිවැසිවරයා යයි කියන තැනැත්තා පෙර කාලයේ
දී අනාගතවක්තෘ යයි කියනු ලැබී ය. එවිට සාවුල්
කතා කොට, "ඔබේ යෝජනාව හොඳයි; එන්න, අපි
යමු"යි තම වැඩකාරයාට කීවේ ය. මෙසේ ඔව්හු
දෙවියන් වහන්සේට කැප වූ මනුෂ්‍යයා සිටි නුවරට
ගියෝ ය. 11 ඔව්හු කන්ද නඟිමින් නුවරට යන කල,
වතුර අදින පිණිස නුවරින් පිටතට එන තරුණියන්
ඔවුන්ට සම්බ වී, "අනාගතවක්තෘ මෙහි ඉන්නවා
දැ"යි ඔවුන්ගෙන් විමසුවෝ ය.
12 ඔව්හු උත්තර දෙමින්, "ඔව්, ඔහු ඉන්නවා;
බලන්න, ඔහු ඔබ ඉදිරියෙහි ය. ඉක්මන් කරන්න,
මන්ද, කඳු මත පූජාස්ථානයෙහි අද සෙනඟ පූජාවක්
පවත්වන බැවින් ඔහු අද නුවරට අවුත් සිටියි.
13 ඔබ නුවරට ඇතුළු වූ වහා ම කෑම කන පිණිස
කඳු මත පූජාස්ථානයට ඇතුළු වීමට මත්තෙන් ඔහු
සම්බ වනු ඇත. මන්ද, ඔහු පූජාවට ආශීර්වාද කරන
බැවින් ඔහු එන තුරු සෙනඟ කන්නේ නැත. කැඳවන

ලද්දන් කෑම කන්නේ ඉන්පසු ය. ඒ නිසා යන්න; මේ
වේලාවට ඔහු ඔබට සම්බ වනු ඇතැ”යි කීවෝ ය.
14 ඔවුන් නුවරට ගොස්, නුවර ඇතුළට පිවිසදේදී
සාමුවලේ කඳු මත පූජාස්ථානයට යන පිණිස ඔවුන්
දසෙට පිටත් වී ආවේ ය.
15 සාවුල් පැමිණනේනට දවසකට පරෙ, සමිඳාණන්
වහන්සේ සාමුවලේට කතා කොට, 16 “මම හටෙ
මේ වේලාවට පමණ බනේජමින්ගේ රටනේ
මිනිසකු නුඹ ළඟට එවන්නමේ; ඔහු මාගේ සනෙඟ
වන ඉශ්‍රායලේ කරෙහෙි අධිපතියා කොට අභිෂේක
කරන්න; ඔහු පිලිස්තිවරුන්ගේ අතින් මාගේ සනෙඟ
ගළවන්නේ ය. මාගේ සනෙඟගේ මොරගැසීම මා
වතෙ පැමිණි හයින් මම ඔවුන් දසෙ බැලුවමේ”යි
දන්වා තිබුණේ ය.
17 සාමුවලේ, සාවුල් දුටු විට, සමිඳාණන් වහන්සේ
සාමුවලේට කතා කොට, “මනේන, මා නුඹට කී
මිනිසා! මොහු මාගේ සනෙඟ පාලනය කරන්නේ
ය”යි වදාළ සේක. 18 එවිට සාවුල් දොරටුව ළඟ
සාමුවලේ වතෙ ගොස්, “අනාවැකි කියන්නාගේ ගයෙ
තිබනේනේ කොතැන ද කියා මට දන්වන්නැ”යි කී
ය.
19 සාමුවලේ ද සාවුල්ට පිළිතුරු දමේන්, “අනාවැකි
කියන්නා මම ය; මට පරෙටුව කඳු මත
පූජාස්ථානයට ඔබ දපෙළ ම යන්න. මන්ද, ඔබ ද මා
සමඟ ආහාර වැළඳිය යුතු ය. හටෙ උදේ ඔබ
යන්නට අරින්නමේ; ඔබේ සිතේ තිබනෙ සියල්ල ද
ඔබට දන්වන්නමේ. 20 තුන් දවසකට පරෙ නැති වූ
ඔබේ කොටළුවන් ගැන කරදර නොවන්න. උන්
සම්බ වී ඇත. ඉශ්‍රායලේ ජනයා අතිශයනේ
අපේක්ෂා කරන්නේ කවරකේ ද? ඔබ උදසොත්,
ඔබේ පියාගේ මුළු පවුල උදසොත් නොවේ දැ”යි
කීවේ ය.
21 සාවුල් පිළිතුරු දමේන්, “මම ඉශ්‍රායලේ
ගෝත්‍රවලින් ඉතා කුඩා එකක් ව තිබනෙ
බනේජමින් ගෝත්‍රයට අයත් කනෙකේ නොවමේ ද?
බනේජමින්ගේ සියලු පවුල්වලින් මාගේ පවුල ඉතා
සුළු එක නොවේ ද? එසේ නම්, ඔබ මලෙසෙ මට
කතා කරන්නේ මන්දැ”යි ඇසුවේ ය.
22 එවිට සාමුවලේ, සාවුල් සහ ඔහුගේ වැඩකාරයා
කැඳවාගනෙ, කෑම ශාලාවට ඇතුළු වී, ගණනින්
තිහක් පමණ වූ ආරාධිතයන් අතරේ ප්‍රධාන
ස්ථානයහෙි ඔවුන්ට අසුන් දුන්නේ ය. 23 සාමුවලේ
අරක්කැමියාට කතා කොට, “මම ඔබට ‘වනේ කර
තබන්නැ’යි දුන් කොටස මහෙි ගනෙනේනැ”යි කීවේ
ය. 24 අරක්කැමියා ගාතය ද ඒ පිට තිබුණු දේ ද
ගනෙවුත් සාවුල් ඉදිරිපිට තැබුවේ ය. සාමුවලේ කතා
කොට, “මනේන, ඔබ උදසො තැබූ කොටස. එය
වළඳන්න. මා ආරාධනා කළ සනෙඟ සමඟ එය මේ
මොහොතේ දී වළඳන පිණිස ඔබ උදසො මම එය
වනේ කොට තැබුවමේ”යි කීවේ ය. මසෙේ සාවුල්
එදා සාමුවලේ සමඟ ආහාර වැළඳුවේ ය. 25 ඔවුන්
කඳු මත පූජාස්ථානයනේ බැස නගරයට ආ කල,
ඔව්හු පියස්ස උඩ සාවුල්ට යහනක් සකස් කර
දුන්නෝ ය. සාවුල් එහි නිදාගත්තේ ය.
26 පහන් වන වේලාවේ දී සාමුවලේ පියස්ස උඩ
සිටි සාවුල්ට අඬගසා, “නැඟිටින්න, මම ඔබ පිටත්
කර යවමි”යි කීවේ ය. සාවුල් නැඟිට්ටේ ය. ඔහු
සහ සාමුවලේ එකට වීදියට ගියේ ය.

## සාවුල් අභිෂේක කරනු ලැබීම

27 ඔවුන් නුවර සීමාවට පැමිණි විට සාමුවලේ
සාවුල්ට කතා කොට, “අපට පරෙටුව ඔබේ
වැඩකාරයාට යන්න කියන්න. මා ඔබට දවේියන්
වහන්සේගේ වචනය දන්වන පිණිස දැන් මහෙි
මොහොතක් නවතින්නැ”යි කීවේ ය. වැඩකාරයා
පරෙටුවනේ ගියේ ය.
10 එවිට සාමුවලේ තලේ කුලාව රැගනෙ
සාවුල්ගේ හිසේ වත් කොට, ඔහු සිඹ
මසෙේ කීවේ ය: “සමිඳාණන් වහන්සේ ඉශ්‍රායලේ
සනෙඟ කරෙහෙි අධිපතියා කොට ඔබ අභිෂේක
කරන සේක. ඔබ සනෙඟ පාලනය කොට ඔවුන්
සියලු සතුරන්ගනේ ගළවාගන්නහෙි ය. සමිඳාණන්
වහන්සේ තමන් තෝරා ගත් සනෙඟගේ අධිපතියා
වශයනේ ඔබ පත් කළ බවට සාක්ෂිය මයෙ වන්නේ
ය: 2 ඔබ අද මා ළඟින් පිටත් ව යන විට,
බනේජමින්ගේ දේශ සීමාවේ ශලේශාහි තිබනෙ
රාකලේගේ සොහොන් පළ ළඟ දී මිනිසුන්
දදෙනෙකේ ඔබට සම්බවන්නෝ ය. ඔවුන් ඔබට
කතා කොට, ඔබ සොයන්නට ගිය කොටළුවන්
සම්බ වූ බවත්, ඔබේ පියා කොටළුවන් ගැන නොව
ඔබ ගැන කරදර වන බවත්, ‘මාගේ පුත්‍රයා ගැන
මම කුමක් කරම් දැ’යි කිය කියා සිටින බවත් ඔබට
කියනු ඇත. 3 එවිට ඔබ එතැනින් තව දුර ගොස්
තාබෝරේහි ආලෝන ගස ළඟට පැමිණනේනහෙි ය.
එතැන දී දවේියන් වහන්සේට පූජා කරන පිණිස
බතෙලේට යන මිනිසුන් තිදනෙකේ ඔබට
සම්බවන්නෝ ය. ඔවුන්ගනේ එක් කනෙකේ
එළුපැටියන් තුන් දනෙකු ද එක් කනෙකේ රොටි
තුනක් ද එක් කනෙකේ මුද්‍රිකපාන භාජනයක් ද
රැගනෙ යන්නෝ ය. 4 ඔවුන් ඔබට ආචාර කොට
රොටි දකෙක් ඔබට දනෙවා ඇත. ඒවා ඔවුන් අතින්
පිළිගන්න. 5 ඉන්පසු ඔබ පිලිස්තිවරුන්ගේ මුර
හමුදාව සිටින ගිබියාහි ඇති දවේියන් වහන්සේගේ
කන්දට පැමිණනේනහෙි ය. ඔබ එහි නුවරට ඇතුළු
වන විට දිවැසිවරු කණ්ඩායමක් තමන්ට පරෙටුව
වීණාවක් ද රබානක් ද නළාවක් ද කුඩා වීණාවක් ද
ඇති ව ධර්ම වාක්‍ය පවසමින්, නටමින් ද ඝෝෂා
කරමින් ද ගිරිකුළුවලින් බැස එනු ඔබට
සම්බවන්නේ ය. 6 එවිට සමිඳාණන් වහන්සේගේ
ආත්මානුභාවය ඔබ කරෙහෙි බලවත් ලසෙ ආරූඪ
වනු ඇත. ඔබ ද ඔවුන් සමඟ ධර්ම වාක්‍ය
පවසන්නහෙි ය. ඔබ අමුතු ම මිනිසකේ වන්නහෙි ය.
7 මේ ලකුණු ඔබට පැමිණි කල ප්‍රස්තාවෝචිත ව
ක්‍රියා කරන්න. මන්ද, දවේියන් වහන්සේ ඔබ සමඟ
සිටින සේක. 8 ඔබ මට පරෙටුව ගිල්ගාල්ට යන්න.
මම දවන යාග පූජා ඔප්පු කරන පිණිසත්, ශාන්ති
පූජාවල යාගයන් පූජා කරන පිණිසත් ඔබ ළඟට

එන්නමේ. මා ඔබ ළඟට අවුත්, ඔබ කළ යුතු දේ
ඔබට දන්වන තුරු සත් දවසක් බලා සිටින්න.”
9 මෙසේ කී පසු සාවුල්, සාමුවෙලේ වෙතින් යන්නට
හැරුණ විට දෙවියන් වහන්සේ ඔහුට අමුතු සිතක්
දුන් සේක. සාමුවෙලේ කී සියලු දේ ඒ දවසේ දී ම
සිදු විය. 10 සාවුල් සහ ඔහුගේ සේවකයා හලෙ
ළඟට පැමිණි කල, දිවැසිවර කණ්ඩායමක් සාවුල්ට
හමු විය. දෙවියන් වහන්සේගේ ආත්මානුභාවය
ඔහුට ආරූඪ විය. එවිට ඔහු, ඔවුන් සමඟ ධර්ම
වාක්‍ය පැවසුවේ ය. 11 කලින් සාවුල් හැඳින සිටි
හැම දෙනා ම, ඔහු දිවැසිවරුන් සමඟ ධර්ම වාක්‍ය
පවසනවා දුටු කල, ඔවුනොවුන් අතරේ කතා
කරමින්, “කිෂ්ගේ පුත්‍රයාට කුමක් වී ඇද් ද?
සාවුලුත් දිවැසිවරයකු වී සිටී දැ”යි කී හ. 12 1 සාමු
19:23-24එතැන සිටි කෙනෙක් පිළිතුරු දෙමින්, “මේ
මිනිසුන්ගේ පියවරුත් දිවැසිවරු දැ”යි ඇසුවේ ය.
“සාවුලුත් දිවැසිවරුන් අතරේ සිටී දැ”යි යන කීම ඇති
වූයේ මෙලෙසෙ ය. 13 ඔහු ධර්ම වාක්‍ය පවසා නිම
වූ කල කඳු මත පූජාස්ථානයට ගියේ ය.
14 සාවුල්ගේ බාප්පා කතා කොට, “ඔබ කොතැනට
ගියහු දැ”යි සාවුල්ගෙන් ද වැඩකාරයාගෙන් ද
ඇසුවේ ය. “අපි කොටළුවන් සොයන්නට ගියෙමු.
උන් නැති බව දුටු විට අපි සාමුවෙලේ ළඟට ගියෙමු”යි
සාවුල් පිළිතුරු දුන්නේ ය.
15 “සාමුවෙලේ ඔබට කුමක් කීවේ ද කියා මට
කියන්නැ”යි සාවුල්ගේ බාප්පා කී ය.
16 සාවුල් පිළිතුරු දෙමින්, “කොටළුවන් සම්බ වූ
බව ඔහු පැහැදිලි ලෙසෙ දැන්නුවේ ය”යි තම
බාප්පාට කීවේ ය. එහෙත්, රජකම ගැන සාමුවෙලේ
කී කාරණය ඔහුට දැන්නුවේ නැත.

## සාවුල් රජු වශයෙන් පිළිගැනීම

17 සාමුවෙලේ සමිඳාණන් වහන්සේ වෙත මිශ්පා
නගරයට සෙනඟ රැස් කරවී ය. 18 ඔහු ඉශ්රායෙලේ
සෙනඟ අමතා මෙසේ කීවේ ය: “ඉශ්රයෙලේගේ
දෙවි සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
‘මම ඉශ්රායෙලේ සෙනඟ වන නුඹලා මිසරයෙන්
ගෙනවුත් මිසරවරුන්ගේ අතින් ද නුඹලාට පීඩා කළ
සියලු රාජ්‍යයන්ගේ බලයෙන් ද නුඹලා ගළවාගතිමි.
19 එහෙත්, නුඹලාගේ සියලු විපත්තිවලින් ද
පීඩාවලින් ද නුඹලා ගැළවූ නුඹලාගේ දෙවි
සමිඳාණන් වහන්සේ වන මා නුඹලා අද එපා කර,
නුඹලාට රජ කෙනෙකු පත් කරන ලෙසෙ මාගෙන්
ඉල්ලන්නහු ය. එබැවින් දැන් නුඹලා ගෝත්‍ර
වශයෙන් ද පවුල් වශයෙන් ද ස්වාමීන් වන මා
ඉදිරියේ රැස් වන්න.’ ”
20 මෙසේ සාමුවෙලේ මුළු ඉශ්රායෙලේ ජනතාව එක
එක ගෝත්‍රය වශයෙන් ඉදිරිපත් කළෙේ ය.
සමිඳාණන් වහන්සේ බෙන්ජමින්ගේ ගෝත්‍රය
තෝරාගත් සේක. 21 ඉන්පසු සාමුවෙලේ
බෙන්ජමින්ගේ ගෝත්‍රයේ අය පවුල් වශයෙන්
ඉදිරිපත් කළෙේ ය. ඒවායින් මට්රීගේ පවුල
තෝරාගන්නා ලද්දේ ය. ඒ පවුලෙන් කිෂ්ගේ පුත්
සාවුල් තෝරාගන්න ලද්දේ ය. එහෙත්, ඔවුන් සාවුල්
කොහේ දැ යි සෙව්වූ නමුත්, ඔහු සොයාගත
නොහැකි විය. 22 එබැවින් ඔව්හු, “ඒ මිනිසා මෙහි
ඇවිත් සිටී දැ”යි යළිත් සමිඳාණන් වහන්සේගෙන්
ඇසුවෝ ය. සමිඳාණන් වහන්සේ පිළිතුරු දෙමින්,
“ඔහු භාණ්ඩ අතරේ සැඟවී සිටී”යි වදාළ සේක.
23 ඔව්හු දුව ගොස් සාවුල් එතැනින් ගෙනාවෝ ය.
ඔහු සෙනඟ අතරේ සිටි කල, අන් හැමට වඩා උස
කෙනෙක් විය. 24 සාමුවෙලේ මුළු සෙනඟට කතා
කොට, “මෙන්න, සමිඳාණන් වහන්සේ තෝරාගත්
තැනැත්තා, ඔහුට සමාන අන් කිසිවකු සෙනඟ
අතරේ නැති බව ඔබට නොපෙනේ දැ”යි කී ය.
එවිට සියලු ජනයා, “මහ රජතුමා සැරදේ වා!” කියා
මොරගැසූ හ.
25 සාමුවෙලේ රජකමේ යුතුකම් සෙනඟට විස්තර
කර දී, ඒවා පොතක සටහන් කර සමිඳාණන්
වහන්සේ ඉදිරියේ තැබුවේ ය. ඉන්පසු සාමුවෙලේ
සෙනඟ විසුරුවා හැර ඔවුන් සිය ගෙවලට පිටත් කර
යැවුවේ ය. 26 සාවුල් ද ගිබියාහි තිබූ සිය ගෙදරට
ගියේ ය. දෙවියන් වහන්සේ විසින් සිත් ප්‍රබෝධ
කරන ලද සේනාවක් ද ඔහු සමඟ ගියෝ ය.
27 එහෙත්, සමහර දුර්ජනයන් කතා කොට, “මේ
මිනිහා අප ගළවන්නේ කොහොම දැ”යි සාවුල් සුළු
කොට සිතා ඔහුට කිසි තෑග්ගක් ගෙනාවේ නැත.

## සාවුල් රජ අම්මොනිවරුන් පරාජය කිරීම

11 මසකට පමණ පසු අම්මොනිවරයකු වූ
නාහාෂ් රජ ගිලියද් පෙදෙසෙහි තිබූ ජාබෙෂ්
නගරයට විරුද්ධ ව පැමිණ එය වටලෑවේ ය.
ජාබෙෂ්හි මනුෂ්‍යයෝ කතා කොට, “අප සමඟ
ගිවිසුමක් කළ මැනව, එවිට අපි ඔබට යටත්
වන්නමු”යි නාහාෂ්ට කීවෝ ය.
2 අම්මොනිය නාහාෂ් ද පිළිතුරු දෙමින්, “ඔබ
සියල්ලන්ගේ දකුණු ඇස් උගුලා දමා, එයින්
ඉශ්රායෙල්වරුන් පිට නින්දාවක් පමුණුවන්නට මට
ඉඩ දුන්නොත් පමණක් ඔබ සමඟ ගිවිසුමක්
කරගන්නමේ”යි ඔවුන්ට කීවේ ය.
3 ජාබෙෂ්හි ප්‍රජා මූලිකයෝ පිළිතුරු දෙමින්, “අප
ඉශ්රායෙල්හි සියලු පළාත්වලට පණිවුඩකාරයන්
යවන පිණිස අපට සත් දවසක් කල් දුන මැනව;
අපට පිහිට වන්නට කිසිවකේ නැත්නම්, අපි ඔබට
යටත් වන්නමු”යි කීවෝ ය.
4 එකල පණිවුඩකාරයෝ සාවුල් සිටි ගිබියාට
පැමිණ ඒ කාරණය සෙනඟ ඉදිරියෙහි ප්‍රකාශ
කළෝ ය. ඒ ඇසූ මුළු සෙනඟ ශබ්ද නඟා හැඬූ හ.
5 ඒ අවස්ථාවේ දී සාවුල් කෙතේ සිට හරකුන්
දක්කාගෙන එමින් සිටියේ ය. “සෙනඟ අඬන්නේ
කුමන කාරණයක් නිසා දැ”යි ඔහු විමසුවේ ය. ඔව්හු
ජාබෙෂ් සිට පැමිණි පණිවුඩකාරයන් කී දේ ඔහුට
දැන්වූවෝ ය. 6 සාවුල් මේ වචන ඇසූ විට දෙවියන්
වහන්සේගේ ආත්මානුභාවය ඔහු කෙරෙහි පිහිටිණි.
ඔහු අතිශයෙන් කෝපාවිෂ්ට වුණේ ය. 7 එවිට ඔහු
ගොන් බානක් ගෙන උන් කැබලිවලට කපා, “සාවුල්

ද සාමුවෙලේ ද කැටුව යුද්ධයට යමකේ නොයෙනු ඇද්ද
ඔහුගේ හරකුන්ට මෙසේ ම කරනු ලැබේ ය” කියා
ඒ කැබලි පණිවුඩකාරයන් අත ඉශ්රායලේවරුන්ගේ
සියලු පළාත්වලට යැවී ය. එවිට සෙනඟ පිට
සමිඳාණන් වහන්සේ කෙරෙහි භීතියක් පහළ වී
ඔව්හු සියලු දෙනා එක් කෙනෙකු මෙන් පිටත් ව
ආවෝ ය. 8 සාවුල් ඔවුන් බෙශෙක් නගරයෙහි
එක්රැස් කළේ ය. ඉශ්රායලේවරු තුන් ලක්ෂයක් ද
ජුදාවරු තිස් දහසක් ද එහි සිටියෝ ය. 9 ඔව්හු
පණිවුඩකාරයන්ට කතා කොට, “ ‘හෙට මද්දහනට
පෙර ගිලියද්හි ජාබෙෂ් නගරය මුදනු ලබනු ඇතැ’යි
ජාබෙෂ්-ගිලියද් මනුෂ්‍යයන්ට කියන්නැ”යි කීවෝ ය.
පණිවුඩකාරයෝ ගොස් ජාබෙෂ්හි සෙනඟට එපවත්
දැන්නුවෝ ය; ඔව්හු ද ප්‍රීතියෙන් පිනා ගියෝ ය.
10 එබැවින් ජාබෙෂ්හි සෙනඟ, “හෙට අපි ඔබට
යටත් වන්නෙමු, එවිට ඔබ කැමැති ඕනෑ ම දෙයක්
අපට කරන්නට පුළුවනැ”යි නාහාෂ්ට කීවෝ ය.
11 පසු දා සාවුල් සෙනඟ කණ්ඩායම් තුනකට
බෙදුවේ ය; ඔව්හු එළි වන යාමයෙහි
අම්මොනිවරුන්ගේ කඳවුර මැදට කඩා පැන ඉර
මුදුන් වේලාව දක්වා ඔවුන්ට පහර දුන්නෝ ය.
දෙදෙනෙකු එක තැනක නොසිටින ලෙස ඉතිරි වූ අය
විසුරුවනු ලැබූ හ.
12 එවිට සෙනඟ සාමුවෙලේට කතා කොට, “සාවුල්
අපේ රජු නොවිය යුතුය යි කී සෙනඟ කවුරු ද? ඒ
අය අපට භාර දෙන්න; අපි ඔවුන් මරන්නෙමු”යි
කීවෝ ය.
13 එවිට සාවුල් සෙනඟ අමතා, “අද දවසේ දී
සමිඳාණන් වහන්සේ ඉශ්රායලේ ගළවාගත් නිසා
කිසිවෙකු මේ දවසේ දී මරණයට පත් නොකළ යුතු
ය”යි කීවේ ය. 14 එවිට සාමුවෙලේ සෙනඟට කතා
කොට, “එන්න, අපි ගිල්ගාල්ට ගොස් එහි දී සාවුල්
රජකමෙහි නැවත ස්ථිර කරමු’යි කීවේ ය.
15 සෙනඟ සියලු දෙනා ගිල්ගාල්ට ගොස් එහි දී
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි සාවුල් රාජ පදවියේ
පිහිටුවා උන් වහන්සේට සහභාගිකමේ පූජා ඔප්පු
කළෝ ය. සාවුල් ද ඉශ්රායලේ සෙනඟ ද අතිශයෙන්
ප්‍රීති ප්‍රමෝද වූ හ.

### සාමුවෙලේගේ අවසාන කතාව

12 සාමුවෙලේ මුළු ඉශ්රායලේ සෙනඟට මෙසේ
කීවේ ය; “මෙන්න, ඔබ හැම මාගෙන් ඉල්ලූ
සියලු දේට මම සවන් දී ඔබ කෙරෙහි රජකු පත්
කළෙමි. 2 දැන් ඒ රජතුමා ඔබ හැමගේ නායකයා
ය. මම නම් මහලු ය, මාගේ හිසකෙස් පැහී තිබේ.
මාගේ පුත්‍රයෝත් ඔබ සමඟ සිටිති. මම බාල
වියෙහි පටන් අද දක්වා ඔබේ නායකයා වී සිටියෙමි.
3 මෙන්න, මම මෙහි සිටිමි. මා යම් වරදක් කර
තිබේ නම්, සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි ද උන්
වහන්සේ තෝරාගත් රජ්ජුරුවන් ඉදිරියෙහි ද දැන්
මට විරුද්ධ ව පැමිණිලි කරන්න. මම කවරකුගේ
හරකා ගතිම් ද? කවරකුගේ කොටළුවා ගතිම් ද?
කවරකුට අයුත්තක් කළෙම් ද? කවරකුට පීඩා
කළෙම් ද? කවරකුගෙන් අල්ලසක් ගතිම් ද?
මේවා ගැන මම වරදකාරයෙක් නම්, මා ගත් දේ
ආපසු දෙන්නෙමි.”
4 සෙනඟ පිළිතුරු දෙමින්, “ඔබ අපට අයුක්තියක්
කළේ වත්, පීඩා කළේ වත්, කිසිවකුගේ අතින්
කිසිවක් ගත්තේ වත් නැතැ”යි කීවෝ ය.
5 සාමුවෙලේ පිළිතුරු දෙමින්, “ඔබ හැම මා අත
වරදක් නැති බවට සමිඳාණන් වහන්සේ ද උන්
වහන්සේ තෝරාගත් රජතුමා ද ඉදිරියෙහි අද
දවසේ සාක්ෂිකාරයන් ව සිටින්නහු ය”යි කීවේ ය.
ඔව්හු පිළිතුරු දෙමින්, “සමිඳාණන් වහන්සේ අපේ
සාක්ෂිකාරයාණෝ ය”යි කී හ.
6 නික්ම 6:26 සාමුවෙලේ තවදුරටත් සෙනඟට කතා
කරමින් මෙසේ කීවේ ය: “මෝසෙස් සහ ආරොන්
තෝරාගත්තේත්, මිසරයෙන් ඔබේ පියවරුන්
ගෙනාවේත් සමිඳාණන් වහන්සේ ය. 7 එබැවින්
ඔබටත්, ඔබේ පියවරුන්ටත් සමිඳාණන් වහන්සේ
කළ සියලු බලවත් ක්‍රියා ගැන මා සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි ඔබට මතක් කර දෙන පිණිස
නිශ්චල ව සිටින්න. 8 නික්ම 2:23ජාකොබ් මිසරයට
පැමිණි පසු ඔබේ පියවරුන් සමිඳාණන් වහන්සේට
මොරගැසූ විට, සමිඳාණන් වහන්සේ මෝසෙස් ද
ආරොන් ද යවා ඔබේ පියවරුන් මිසරයෙන් ගෙනේවා
මේ දේශයෙහි වාසය කෙරෙවේ සේක. 9 වීරා 3:12;
4:2; 13:1එහෙත්, ඔව්හු තමන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේ අමතක කළෝ ය. එවිට උන් වහන්සේ
හාශෝර්හි සේනාධිපතියා වූ සිසෙරා අතටත්,
පිලිස්තිවරුන් අතටත්, මෝවබ්හි රජු අතටත් ඔවුන්
පාවා දුන් සේක. ඔව්හු ද ඔවුන්ට විරුද්ධ ව යුද්ධ
කළෝ ය. 10 වීරා 10:10-15එවිට ඔව්හු සමිඳාණන්
වහන්සේට මොරගසමින්, ‘අපි සමිඳාණන් වහන්සේ
අත් හැර බාල් දේවතාවන්ටත්, අෂ්ටාරොත්
දේවතාවියටත් වැඳුම්පිදුම් කිරීමෙන් පව් කළෙමු.
එහෙත්, අපේ සතුරන් අතින් අප ගැළවුව මැනව.
අපි ඔබ වහන්සේට වැඳුම්පිදුම් කරන්නෙමු’යි කීවෝ
ය. 11 වීරා 4:6; 7:1; 11:29; 1 සාමු 3:20එවිට
සමිඳාණන් වහන්සේ ජෙරුබ්බාල් ද බාරාක් ද ජෙප්තා
ද සාමුවෙලේ ද එවා වටකර සිටි ඔබේ සතුරන්ගේ
අතින් ඔබ ගැළවූ සේක. එවිට ඔබ සුරක්ෂිත ව
වාසය කළහු ය. 12 1 සාමු 8:19එහෙත්,
අම්මොන්වරුන්ගේ රජ වූ නාහාෂ් ඔබට විරුද්ධ ව
එන බව ඔබ දුටු කල ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ ඔබේ රජ ව සිටි නමුත්, ඔබ කතා
කරමින්, ‘එසේ නොවේ, අප කෙරෙහි රජ කරන
පිණිස අපට රජ කෙනෙක් ඕනෑ ය’යි කීවහු ය.
13 “මෙන්න, ඔබ තෝරාගත්, ඔබ ඉල්ලූ රජතුමා
දෙස බලන්න. සමිඳාණන් වහන්සේ ඔබ කෙරෙහි
රජ කෙනෙකු පත් කළ සේක. 14 ඔබ සමිඳාණන්
වහන්සේගේ අණට විරුද්ධ ව කැරලි නොගසා, උන්
වහන්සේට බිය ව වැඳුම්පිදුම් කොට, උන්
වහන්සේගේ හඬට කීකරු ව සිටින්නහු නම්, ඔබ
කෙරෙහි රජකම් කරන රජුත්, ඔබ හැමත් ඔබේ
දෙවි සමිඳාණන් වහන්සේ අනුව යන්නහු නම්, ඔබට
ශුභසිද්ධ වේ. 15 එහෙත්, ඔබ හැම සමිඳාණන්

වහන්සේගේ හඬට කීකරු නොවී, උන්
වහන්සේගේ අණට විරුද්ධ ව කැරලි ගසන්නහු නම්,
උන් වහන්සේ ඔබේ රජතුමාටත්, ඔබටත් විරුද්ධ ව
සිටින සේක. 16 එබැවින් නිශ්චල ව සිට සමිඳාණන්
වහන්සේ ඔබේ ඇස් හමුයෙහි කරන්නට යන මේ
මහත් දේ බලන්න. 17 දැන් තිරිඟු කපන කාලය
නොවේ ද? එහෙත්, අහස් ගර්ජනාවක් ද වර්ෂාව ද
එවන ලෙස මම සමිඳාණන් වහන්සේට යාච්ඤා
කරන්නෙමි. ඒ ඉටු වූ කල රජෙකු ඉල්ලීමෙන් ඔබ
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි කළ දුෂ්ටකම ඔබ
තේරුම් ගන්නවා ඇත.”
18 මෙසේ කී පසු සාමුවෙල් සමිඳාණන් වහන්සේට
යාච්ඤා කළේ ය. එදින සමිඳාණන් වහන්සේ අහස්
ගර්ජනාව ද වර්ෂාව ද එවූ සේක. එවිට මුළු සෙනඟ
සමිඳාණන් වහන්සේටත්, සාමුවෙල්ටත්, අතිශයෙන්
බිය වූ හ. 19 ඔව්හු සාමුවෙල් අමතා, “අප
නොනසින පිණිස ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට
ඔබේ මෙහෙකරුවන් උදෙසා යාච්ඤා කළ මැනව;
මන්ද, රජෙකු ඉල්ලීමේ වරද අපේ අනික් සියලු
පාපවලට අප එකතු කර ඇතැ”යි කී හ.
20 එවිට සාමුවෙල් ඔවුන්ට මෙසේ කීවේ ය: “බිය
නොවන්න. ඔබ හැම ඇත්තෙන් ම මේ සියලු වැරදි
කළහු ය. එහෙත්, සමිඳාණන් වහන්සේ අනුව යාම
අත් නොහැර ඔබේ මුළු සිතින් සමිඳාණන්
වහන්සේට වැඳුම්පිදුම් කරන්න. 21 බොරු දෙවිවරුන්
අනුව නොයන්න. ඔවුන් බොරු දෙවිවරුන් වන
බැවින්, ඔබට පිහිටවන්නට වත්, ඔබ ගළවන්නට
වත් ඔවුන්ට නොහැකි ය. 22 සමිඳාණන් වහන්සේ
ඔබ තමන් වහන්සේගේ ම සෙනඟ කරගන්නට
ප්‍රසන්න ව සිටින බැවින්, තමන්ගේ උදාර නාමය
නිසා තමන්ගේ ම සෙනඟ අත් නොහරින සේක.
23 ඇරත් මා ඔබ උදෙසා යාච්ඤා නොකර සිටීමේ
පාපයෙන් සමිඳාණන් වහන්සේ මා වළක්වන සේක්
වා, තවද, මම යහ මඟ ඔබට උගන්වන්නෙමි.
24 සමිඳාණන් වහන්සේට ගරුබිය ඇතිව, ඔබේ මුළු
සිතින් උන් වහන්සේට සැබෑ ලෙස වැඳුම්පිදුම්
කරන්න. සමිඳාණන් වහන්සේ ඔබ උදෙසා
කොපමණ මහත් දේ කර ඇත් දැ යි සිහි කරන්න.
25 එහෙත්, ඔබ තවදුරටත් නපුරුකම් කරන්නහු නම්,
ඔබ ද ඔබේ රජු ද විනාශ වනු ඇත.”

## පිලිස්තිවරුන් සමඟ යුද්ධ කිරීම

13 සාවුල් රජකමට පැමිණි විට වයස අවුරුදු
තිහක්පමණ විය. ඔහු ඉශ්රායලේවරුන්
කරෙහි දැවුරුද්දක් රජකම් කළේ ය.
2 සාවුල් ඉශ්රායලේවරුන්ගෙන් මිනිසුන් තුන්දාහක්
තෝරාගත්තේ ය; ඔවුන්ගෙන් දෙදහක් සාවුල් සමඟ
මික්මාෂ්හි ද බෙතෙල් කඳුකරයේ ද සිටියෝ ය;
දාහක් බෙන්ජමින්ගේ ගෝත්‍රයට අයත් පෙදෙසෙ වන
ගිබ්යාහි සිටි ජොනතන් සමඟ සිටියෝ ය. ඔහු
සෙනඟගෙන් ඉතිරි අය එකිනෙකා තම තමාගේ
කූඩාරමට යන්නට හැරියේ ය.
3 ජොනතන් ගබොයෙහි සිටි පිලිස්තිවරුන්ගේ මුර
හමුදාවට පහර දුන්නේ ය. එපවත් පිලිස්තිවරුන්ට
ආරංචි විය. එවිට සාවුල් කතා කොට, හෙබ්රෙව්වරු
අසත් වා”යි දේශය මුළුල්ලෙහි හොරණෑ පිඹින්නට
සැලැස්සුවේ ය. 4 සාවුල් පිලිස්තිවරුන්ගේ මුර
හමුදාවට පහර දුන් බවත්, පිලිස්තිවරුන්
ඉශ්රායලේවරුන් පිළිකුල් කළ බවත් සියලු
ඉශ්රායලේවරුන්ට සැළ විය. සෙනඟ ද ගිල්ගාල්හි
සිටි සාවුල් වෙත රැස් වූවෝ ය.
5 පිලිස්තිවරු ඉශ්රායලේවරුන් සමඟ යුද්ධ කරන
පිණිස රථ තිස්දහසක් ද අසරුවන් හයදහසක් ද මුහුදු
වෙරළේ වැලි මෙන් ගණන් කළ නොහැකි විශාල
සෙනඟක් ද ඇතිව රැස් වී අවුත්, බෙතොවෙන්ට
නැගෙනහිරෙන් මික්මාෂ්හි කඳවුරු බැඳගත්තෝ ය.
6 එවිට ඉශ්රායලේවරු තමන් අනතුරට භාජන වී සිටි
බව දුටුවෝ ය. ඔව්හු අවදානම් තත්ත්වයක සිටියෝ
ය. එවිට සෙනඟ ගුහාවල ද වළවල ද පර්වතවල ද
පතල්වල ද ළිංවල ද සැඟවුණෝ ය. 7 සමහරෙක්
ගාද් දේශයටත්, ගිලියද් දේශයටත් ජොර්දානින්
එගොඩ වී ගියෝ ය. එහෙත්, සාවුල් ඒ වන තුරු
ගිල්ගාල්හි සිටියේ ය. සෙනඟ සියලු දෙන වෙව්ලමින්
ඔහු පසුපස ගියෝ ය.

## සාවුල් රජ එපා කරනු ලැබීම

8 1 සාමු 10:8 සාමුවෙල් නියම කළ පරිදි ඔහු එන
තුරු සාවුල් සත් දවසක් බලා සිටියේ ය. එහෙත්,
සාමුවෙල් ගිල්ගාල්ට නොපැමිණියේ ය. සෙනඟ ද
ඔහු වෙතින් විසිර ගියෝ ය. 9 එබැවින් සාවුල් ඔවුන්
අමතා, “දවන යාග පූජාව හා සහභාගිකමේ පූජා මා
ළඟට ගෙනෙන්නැ”යි කීවේ ය. සාවුල් දවන යාග
පූජා ඔප්පු කළේ ය. 10 ඔහු දවන යාග පූජාව
ඔප්පු කර නිම කළ හැටියේ ම සාමුවෙල් පැමිණියේ
ය. සාවුල් ද ඔහුට ආචාර කරන පිණිස ඔහුගේ
පෙරමඟට ගියේ ය. 11 සාමුවෙල් ඔහු අමතා, “ඔබ
කුමක් කළෙහි දැ”යි ඇසී ය. සාවුල් පිළිතුරු දෙමින්,
“සෙනඟ මා අත්හැර යන බව මම දිටිමි; ඔබ එනවා
යයි කී දවසේ දී නොපැමිණියෙහි ය; පිලිස්තිවරුන්
මික්මාෂ්හි රැස් ව සිටින බවත් මම දිටිමි.
12 ගිල්ගාල්හි දී පිලිස්තිවරුන් මට පහර දෙන්නට
යන නමුත් දෙවියන් වහන්සේගේ හිත දිනාගැනීමට
මා උත්සාහ නොකළා යයි මම සිතුවෙමි. ඒ නිසා
පූජාව ඔප්පු කළ යුතු බව මට හැඟුණේ ය”යි කීවේ
ය.
13 එවිට සාමුවෙල් සාවුල්ට මෙසේ කීයේ ය: “ඔබ
අනුවණ ලෙස ක්‍රියා කළෙහි ය. දෙවි සමිඳාණන්
වහන්සේ ඔබට අණ කළ උන් වහන්සේගේ ආඥා
ඔබ රක්ෂා කළේ නැත. ඔබ ඒවා රක්ෂා කළෙහි
නම්, සමිඳාණන් වහන්සේ ඔබේ පරම්පරාවට
ඉශ්රායලේ කරෙහි සදහට ම රජකම් කරන්නට
සලස්වන සේක. 14 ක්‍රියා 13:22එහෙත්, දැන් ඔබේ
රජකම පවතින්නේ නැත. සමිඳාණන් වහන්සේ
ඔබට අණ කළ දේ ඔබ රක්ෂා නොකළ බැවින් උන්
වහන්සේ තමන්ගේ සිතට එකඟ වන මිනිසෙකු

තෝරාගෙන තමන්ගේ සෙනඟ කෙරෙහි ඔහු
නායකයා වන පිණිස නියම කර ඇතැ"යි කීවේ ය.

### සටනට සූදානම් වීම

15 සාමුවෙල් පිටත් වී ගිල්ගාලෙන් බෙන්ජමින්ගේ
පෙදෙසෙහි ගිබියාට ගියේ ය. සාවුල් තමා සමඟ සිටි
මිනිසුන් ගණන් කළේ ය. ඔව්හු හයසියයක් පමණ
වූ හ. 16 සාවුල් ද ඔහු පුත් ජොනතන් ද ඔවුන්
සමඟ සිටි සෙනඟ ද බෙන්ජමින්ගේ පෙදෙසෙහි
ගෙබාහි නැවතී සිටියෝ ය. එහෙත්, පිලිස්තිවරු
මික්මාෂ්හි කඳවුරු බැඳගත්තෝ ය.
17 පිලිස්තිවරුන්ගේ කඳවුරෙන් ආක්‍රමණිකයෝ
කණ්ඩායම් තුනකට බෙදී නික්ම ආවෝ ය. එක
කණ්ඩායමක් ෂුවාල් රටේ ඔප්රාට යන මාර්ගයෙන්
ගියේ ය. 18 එක කණ්ඩායමක් බෙත්-හොරොන්ට යන
දිශාවට ගියේ ය. අනෙක් කණ්ඩායම පාළුකරයට
සහ ශෙබොයිම් මිටියාවතට ඉහළින් තිබෙන දේශ
සීමා දෙසට ගියේ ය.
19 හෙබ්‍රෙව්වරුන් කඩු ද හෙල්ල ද සාදා ගැනීම
වැළැක්වීමට පිලිස්තිවරුන් අධිෂ්ඨාන කරගෙන සිටි
නිසා මුළු ඉශ්රායෙල් දේශයෙහි කම්මල්කාරයෙකු
සොයා ගන්නට බැරි විය. 20 ඉශ්රායෙල්වරු සියලු
දෙනා තම තමන්ගේ හීවැල ද දෑකැත්ත ද පොරොව
ද උදැල්ල ද මුවහත් කරන පිණිස පිලිස්තිවරුන්
ළඟට ගියෝ ය. 21 එහෙත්, උදලු ද දෑකැති ද හීවැල්
ද පොරෝ ද මුවහත් කිරීමට රිදී කාසියකින් තුනෙන්
දෙකක් ද කෙවිටි හරිගස්සන්නට රිදී කාසියකින්
තුනෙන් එකක් ද ඔව්හු අය කළෝ ය. 22 එබැවින්
යුද්ධ දවසේ දී සාවුල්ටත්, ඔහුගේ පුත්
ජොනතන්ටත් මිස ඒ දෙදෙනා සමඟ සිටි
සෙනඟගෙන් කිසිවෙකු අතේ කඩුවක් වත්,
හෙල්ලයක් වත් තිබුණේ නැත.
23 පිලිස්තිවරුන්ගේ මුර හමුදාව මික්-මාෂ්හි කඳු
පාරට ගියෝ ය.

### ජොනතන්ගේ ජයග්‍රහණය

14 එක් දවසක් සාවුල්ගේ පුත් ජොනතන්
තමාගේ ආයුධ රැගත් තරුණයාට කතා
කොට, "එන්න, අර පැත්තේ සිටින පිලිස්තිවරුන්ගේ
මුර හමුදාව ළඟට යමු"යි කීවේ ය. ජොනතන් ඒ
බව තම පියාට දැන්නුවේ නැත. 2 සාවුල් ගිබියාවට
යාබද ව පිහිටි මිග්රොන්හි තිබුණ දෙළුම් ගස යට
කඳවුරු බැඳගෙන සිටියේ ය. ඔහු සමඟ හයසියයක්
පමණ සෙනඟ සිටියෝ ය. 3 ෂිලෝහි සමිඳාණන්
වහන්සේගේ පූජකයා ව සිටි ඒලීගේ පුත්
පිනෙහාස්ගේ පුත්රයා වන ඊකාබොද්ගේ සහෝදර
වූ අහිතුබ්ගේ පුත්රයා වන අහියා ඒපොද් සැට්ටයක්
ඇඳගෙන එහි සිටියේ ය. ජොනතන් ගිය බව
සෙනඟ නොදත්හ.
4 පිලිස්තිවරුන්ගේ මුර හමුදාව ළඟට ජොනතන්
යන්නට උත්සාහ කළ කඳුපාරවල් අතරේ, එක
පැත්තක ගිරිකුළක් ද අනික් පැත්තේ තවත්
ගිරිකුළක් ද විය. එකක නම බෝශෙශ් ය, අනිකේ
නම සෙනේ ය. 5 එක ගිරිකුළක් උතුරට මික්මාෂ්
ඉදිරිපිට ද අනික දකුණු දෙසට ගෙබා ඉදිරිපිට ද උස්
ව පිහිටියේ ය.
6 ජොනතන් තමාගේ ආයුධ රැගත් තරුණයාට
කතා කොට, "එන්න, අපි අර අචර්මඡේදිත
නීචයන්ගේ මුර හමුදාව ළඟට යමු. සමහර විට
සමිඳාණන් වහන්සේ අප උදෙසා ක්රියා කරනු ඇත.
මන්ද, බොහෝ දෙනෙකු කරණකොටගෙන හෝ
ස්වල්ප දෙනෙකු කරණකොටගෙන හෝ අප
ගළවන්නට සමිඳාණන් වහන්සේට බැරිකමක්
නැතැ"යි කීවේ ය.
7 ආයුධ රැගත් තරුණයා පිළිතුරු දෙමින්, "ඔබ
අදහස් කරන සියල්ල කරන්න. අපි එහි යමු. ඔබ
කැමැති ඕනෑ ම දෙයක් කරන්නට මම කැමැති
වෙමි"යි ඔහුට කීවේ ය.
8 එවිට ජොනතන් කතා කරමින්, "අපි මනුෂ්යයන්
ළඟට ගොස් ඔවුන්ට පෙනෙන්නට සිටිමු. 9 ඔවුන්
අප ළඟට එන තෙක් අපට නතර වී සිටින්නට යයි
කීවොත්, ඔවුන් අප ළඟට එන තෙක් අපි මේ
ස්ථානයෙහි ම නැවතී සිටිමු. 10 ඔවුන් ළඟට එන්නැ
යි අපට කීවොත්, අපි ඔවුන් වෙත නැඟී යමු.
සමිඳාණන් වහන්සේ ඔවුන් අප අතට පාවා දී
තිබෙන බවට එය ලකුණකි."
11 ඔව්හු දෙදෙන ගොස් පිලිස්තිවරුන්ගේ මුර
හමුදාවට පෙනෙන්නට සිටියෝ ය. පිලිස්තිවරු කතා
කරමින්, "අන්න, හෙබ්‍රෙව්වරු සැඟවී සිටින
ගුහාවලින් පිටතට එමින් සිටිති"යි කීවෝ ය. 12 මුර
හමුදාවේ මිනිස්සු ජොනතන්ටත්, ඔහුගේ ආයුධ
රැගත් තරුණයාටත් කතා කොට, "අප ළඟට
පැමිණෙන්න. ඔබට යම් කාරණයක් කියන්නට අපට
ඇතැ"යි කීවෝ ය. එවිට ජොනතන් තමාගේ ආයුධ
රැගත් තරුණයාට කතා කොට, "මා පස්සේ එන්න,
සමිඳාණන් වහන්සේ ඔවුන් ඉශ්රායෙල්වරුන්ගේ
අතට පාවා දී තිබේ ය"යි කීවේ ය. 13 ජොනතන් ද
ඔහු පස්සෙන් ඔහුගේ ආයුධ රැගත් තරුණයා ද
සතර ගාතයෙන් නැඟී ගියෝ ය. ඔව්හු ජොනතන්
ඉදිරියෙහි පැරදී වැටුණෝ ය. ආයුධ රැගත් තරුණයා
ද ජොනතන් පස්සේ ගොස් ඔවුන් මරා දැමුවේ ය.
14 ජොනතන් ද ඔහුගේ ආයුධ රැගත් තරුණයා ද
මෙසේ ප්රථම වරට මැරුවේ, අක්කර භාගයක
පමණ බිම් පෙදෙසෙක සිටි මිනිසුන් විසිදෙනෙකු
පමණ ය. 15 කඳවුරේ ද එළිමහනේ ද සිටි සෙනඟ
අතරේ මහත් තැතිගැනීමක් ඇති විය. මුර
හමුදාවත්, ආක්‍රමණකාරයෝත් වෙවුලුවෝ ය.
පොළොව කම්පා විය. මෙසේ ඉතා මහත්
සන්ත්රාසයක් ඇති විය.

### පිලිස්තිවරුන්ගේ පරාජය

16 බෙන්ජමින්ගේ දේශයෙහි ගිබියාහි සිටි
සාවුල්ගේ රැකවල්ලු පිලිස්තිවරුන් වියවුල් වී
ඔබමොබ විසිර යනු දුටුවෝ ය. 17 එවිට සාවුල්
තමා ළඟ සිටි සෙනඟට කතා කොට, "අප කරෙන්
කොපමණ දෙනෙක් ගියෝ දැ යි ගණන් කර

බලන්නැ"යි කීවේ ය. ඔව්හු ගණන් කර බැලූ විට
ජොනතන් ද ඔහුගේ ආයුධ රැගත් තරුණයා ද එහි
නොසිටි බව දැනගත්තෝ ය. 18 එවිට සාවුල් අහියා
නම් පූජකයාට කතා කොට, "ඒපොද් සැට්ටය මෙහි
ගෙනෙන්නැ"යි කීවේ ය. ඒ අවස්ථාවේ දී ඒපොද්
සැට්ටය ඉශ්රායලේ ජනයාට ඉදිරියෙන් උසුලාගෙන
ගියේ ඔහු ය. 19 සාවුල් පූජකයාට කතා කරන ඒ
අවස්ථාවේ දී පිලිස්තිවරුන්ගේ කඳවුරේ ඇති වූ
අවුල් වියවුල් එන්න එන්න වැඩි විය. "ඔබේ අත
අහකට ගන්නැ"යි සාවුල් පූජකයාට කී ය. 20 එවිට
සාවුල් ද ඔහු සමඟ සිටි මුළු සෙනඟ ද යුද්ධය
සඳහා පැමිණියෝ ය. පිලිස්තිවරුන් අතරේ මහත්
වියවුලක් තිබුණ බව ඔව්හු දුටුවෝ ය. එක එක
මිනිසා තම තමාගේ කඩුවෙන් තම තමා ළඟ සිටි
තැනැත්තාට පහර දුන්නේ ය. 21 ඊට පෙර
පිලිස්තිවරුන් සමඟ සිටියාවූ ද ඔවුන් සමඟ කඳවුරට
ගියාවූ ද හබ්රෙව්වරු, සාවුල් හා ජොනතන් සමඟ
සිටි ඉශ්රායලේවරුන් වෙත හැරී ආවෝ ය. 22 එසේ
ම එප්රායිම් කඳු රටේ සැඟවී සිටි සියලු ඉශ්රායලේ
ජනයා පිලිස්තිවරුන් පලා යන බව අසා, ඔවුන්ට
පහර දෙමින් වේගයෙන් ඔවුන් ලුහුබැඳ ගියෝ ය.
23 මෙසේ සමිඳාණන් වහන්සේ ඒ දවසේ දී
ඉශ්රායලේවරුන් ගැළවූ සේක. යුද්ධය ද බෙත්-
ආවෙන් ඉක්මවා පැතුරුණේ ය.

### ජොනතන්ට සිදු වූ ඇබැද්දිය

24 ඒ දවසේ දී ඉශ්රායලේ සෙනඟ ආහාර නැති ව
දුර්වල ව සිටියෝ ය. එසේ වූයේ "මා විසින් මාගේ
සතුරන්ගෙන් පළිගනු ලබන තුරු, සවස වනතෙක්,
කිසි කෑමක් කන මනුෂ්යයාට සාප වේවා"යි
සෙනඟගෙන් සාවුල් දිවුරුම් ගත් බැවිනි. එබැවින්
සෙනඟගෙන් කිසිවකු කෑම කෑවේ නැත. 25 ඔවුන්
සියලු දෙනා වනයට පැමිණි විට එහි හැම තැන ම
බිම මී පැණි සම්බ විය. 26 මී පැණි වැගිරෙනවා දුටු
නමුත්, ඔවුන් දී තිබුණ දිවුරුම ගැන බිය වූ බැවින්
කිසිවකු එයින් තමාගේ කටට බිඳක් වත් ගත්තේ
නැත. 27 එහෙත්, තම පියා සෙනඟගෙන් දිවුරුමක්
ගෙන තිබෙන බව ජොනතන් දැන සිටියේ නැත. ඒ
නිසා ඔහු තමාගේ අතේ තිබුණ සැරයටිය දිගු
කොට එහි අග මී වදයක ගල්වා ඒවා අරගෙන
කටට ගත්තේ ය. එයින් ඔහුට අමුතු ශක්තියක්
ලැබුණේ ය. 28 එවිට සෙනඟගෙන් එක් කෙනෙක්
කතා කොට, "ඔබේ පියා අද කෑම කන මනුෂ්යයාට
සාප වේවා යි කියා කෑම නොකන හැටියට
සෙනඟගෙන් දිවුරුමක් ගත්තේ ය. ඒ නිසා සෙනඟ
විඩාවට පත් වී සිටිති"යි කීවේ ය.
29 එවිට ජොනතන් පිළිතුරු දෙමින්, "මාගේ පියා
ජාතියට කොතරම් අවැඩක් කර තිබේ ද? මේ මී
පැණි ටික කෑමෙන් මට අමුතු ශක්තියක් ලැබුණු
හැටි බලන්න. 30 ඉදින් තමන්ගේ සතුරන්ගෙන්
කොල්ලකාගත් කෑම රිසි සේ අද කෑවා නම්, තවත්
කොපමණ හොඳ ද? එසේ කළා නම්,
පිලිස්තිවරුන්ගෙන් තවත් බොහෝ දෙනෙකු විනාශ
කරන්නට ඉඩ තිබිණි"යි කීවේ ය.
31 ඒ දවසේ දී ඉශ්රායලේවරු මික්මාෂ් පටන්
අයාලෝන් දක්වා පිලිස්තිවරුන්ට පහර දුන්නෝ ය.
සෙනඟ බොහෝ සේ විඩාවට පත් වී සිටියෝ ය.
32 සෙනඟ කොල්ලය පිට කඩා පැන, බැටළුවන් ද
හරකුන් ද වස්සන් ද අරගෙන බිම දමා මරා, ලේ
පිටින් ම කෑවෝ ය. 33 උත් 9:4; ලෙවී 7:26-27;
17:10-14; 19:26; ද්වි.නී. 12:16,23; 15:23එවිට,
"සෙනඟ ලේ පිටින් ම කෑම කෑමෙන් සමිඳාණන්
වහන්සේට විරුද්ධ ව පව් කරති"යි සාවුල්ට දන්වන
ලද්දේ ය. ඔහු ද පිළිතුරු දෙමින් "ඔබ ද්රෝහි ලෙසෙ
ක්රියා කළහු ය. මා ළඟට මහ ගලක් පෙරළාගෙන
එන්නැ"යි කීවේ ය. 34 සාවුල් තවදුරටත් කතා
කරමින්, "ඔබ සෙනඟ අතරට ගොස්, ලේ සමඟ
කෑමෙන් සමිඳාණන් වහන්සේට විරුද්ධ ව පව්
නොකර ඔබ එකිනෙකා තම තමාගේ හරකා ද
බැටළුවා ද මා ළඟට ගෙනවුත් මෙහි දී මරා
කන්නැ"යි කියන්නට අණ කළේ ය. සෙනඟ සියලු
දෙනා තම තමාගේ හරකා රාත්රියෙහි ගෙනවුත් එහි
දී මැරුවෝ ය. 35 සාවුල් එහි සමිඳාණන් වහන්සේට
පූජාසනයක් ගොඩනැඟුවේ ය. එය ඔහු විසින්
ගොඩනැඟුණු පළමු වන පූජාසනය ය.
36 සාවුල් සෙනඟ අමතා, "අපි අද රාත්රියේ
පිලිස්තිවරුන් ලුහුබැඳ ගොස් ඔවුන්ගෙන් එක්
කෙනෙකු වත් ඉතුරු නොකර, පහන් වන තෙක් මුළු
රෑ ඔවුන්ගෙන් කොල්ලකාගනිමු"යි කීවේ ය. ඔව්හු ද
පිළිතුරු දෙමින්, "ඔබට යහපතැ යි පෙනෙන කොයි
දෙයක් වුව ද කළ මැනවැ"යි කීවෝ ය. එවිට
පූජකයා, "අපි මෙහි දෙවියන් වහන්සේ වෙත ළං
වමු"යි කීවේ ය.
37 සාවුල් ද, "මා පිලිස්තිවරුන්ට විරුද්ධ ව යන්නට
ඕනෑ ද? ඔබ වහන්සේ ඔවුන් ඉශ්රායලේ අතට පාවා
දෙන සේක් දැ"යි දෙවියන් වහන්සේගෙන් විචාළේ
ය. එහෙත්, උන් වහන්සේ එදා ඔහුට උත්තර
නොදුන් සේක. 38 එවිට සාවුල් කතා කොට,
"සෙනඟගේ සියලු ප්රධානියෙනි, මෙහි රැස් ව අද
මේ පාප සිදු වුණේ කුමන හේතුවක් නිසා දැ යි
සෝදිසි කර බලන්න. 39 වරදකරු මාගේ පුත්
ජොනතන් වුව ද, ඉශ්රායලේ ගළවන ජීවමාන
සමිඳාණන් වහන්සේගේ නමින් මම දිවුරා, ඔහු වුව
ද මරණයට පත් කරන්නෙමි"යි කීවේ ය. එහෙත්,
මුළු සෙනඟ අතරෙන් කිසිවකු ඔහුට උත්තර
දුන්නේ නැත.
40 එවිට ඔහු, "ඔබ සියලු දෙනා එක පැත්තක
සිටින්න. මම ද මාගේ පුත් ජොනතන් ද අනික්
පැත්තෙහි සිටින්නෙමු"යි සියලු ඉශ්රායලේවරුන්ට
කීවේ ය. "ඔබට යහපත් යයි පෙනෙන දෙයක් කළ
මැනවැ"යි සෙනඟ සාවුල්ට කීවෝ ය.
41 ගණන් 27:21; 1 සාමු 28:6 සාවුල් යාච්ඤා
කරමින්, "ඉශ්රායලේහි දෙවී සමිඳාණන් වහන්ස, ඔබ
වහන්සේගේ මෙහෙකරු වන මට අද ඔබ පිළිතුරු
නුදුන්නේ මන් ද? ඉශ්රායලේහි දෙවී සමිඳුනි, වරද
මා අත හෝ මාගේ පුත් ජොනතන් අත හෝ වේ

නම්, උරීම් කැටයේ ආදූව දැම්මනේ පනේවා දනේන.
වරද ඔබ වහන්සේගේ ඉශ්රායලේ සනෙඟ අතේ
නම්, තුම්මීම් කැටයේ ආදූව දැම්මනේ පනේවා
දනේනැ"යි සමිඳාණන් වහන්සේට කීවේ ය. ආදූ දැමූ
විට සාවුල් සහ ජොනතන් වරදකරුවන් බව පනේණි.
සනෙඟ වරදින් නිදහස් වුණෝ ය. 42 එවිට සාවුල්
කතා කරමින්, "මා සහ මාගේ පුත් ජොනතන්
අතරනේ වරදකරු කවරකේ දැ යි බලන පිණිස ආදූ
දමන්නැ"යි කී ය. එසේ කළ විට ජොනතන් වරදකරු
බව පනේණි. 43 "ඔබ කළේ කුමක් ද කියා මට
කියන්නැ"යි සාවුල් ජොනතන්ට කීවේ ය. ජොනතන්
පිළිතුරු දමේින්, "මාගේ අතේ තිබුණ සැරයටියේ
අගින් මී පැණි ටිකක් ගනෙ මා කෑ බව සැබෑ ය. ඒ
නිසා මනේන, මම මැරනේනට සූදානම් ය"යි කීවේ
ය.
44 සාවුල් පිළිතුරු දමේින්, "ජොනතන් ඔබ
නසින්නට ම ඕනෑ ය; නැත්නම් දවේියන් වහන්සේ
ඊට වැඩියනෙුත් මට දඬුවම් කරන සේක්වා"යි කීයේ
ය.
45 එවිට සනෙඟ සාවුල්ට කතා කොට,
"ඉශ්රායලේට මේ මහත් ජයග්රහණය ලබා දුන්
ජොනතන් නසින්නට ඕනෑ ද? එසේ නොවේ වා.
ඔහුගේ හිසනේ කෙසේශයක් වත් බිම නොවැටිය යුතු
යයි ජීවමාන සමිඳාණන් වහන්සේගේ නාමයනේ
දිවුරා කියමු. මන්ද, ඔහු දවේියන් වහන්සේ සමඟ
අද දවසේ ක්රියා කළේ ය"යි කීවෝ ය. මසේ
ජොනතන් නොනසින ලසෙ සනෙඟ ඔහු
බේරාගත්තෝ ය.
46 එවිට සාවුල් පිලිස්තිවරුන් ලුහුබැඳ නොගොස්
හැරී ආවේ ය. පිලිස්තිවරු ඔවුන්ගේ ප්රදේශයට
යන්නට ගියෝ ය.

## සාවුල්ගේ රජ කාලය

47 සාවුල් ඉශ්රායලේවරුන් කරෙහි රජ කමට පත්
කරනු ලැබූ පසු අවට සිටි තමාගේ සියලු සතුරන්
වන මෝවබ්වරුන්ටත්, අම්මොන්වරුන්ටත්,
ඒදොම්වරුන්ටත්, ශෝබාහි රජුන්ටත්,
පිලිස්තිවරුන්ටත් විරුද්ධ ව යුද්ධ කළේ ය. ඔහු ගිය
ගිය තැන ජය ගත්තේ ය. 48 ඔහු වික්රමාන්විත
ක්රියා කරමින් අමලකේවරුන්ට පහර දී
ඉශ්රායලේවරුන්ව කොල්ලකන අයගේ අත්වලින්
ඔවුන් ගළවා ගත්තේ ය.
49 සාවුල්ගේ පුත්රයෝ නම්: ජොනතන් ද ඉෂ්වී ද
මල්කීෂුවා ද යන මොවුහු ය. ඔහුගේ දූවරුන්
දදෙනොගේ නම් මේවා ය: වැඩිමහල් දූවගේ නම
මේරබ් ය, බාල දූවගේ නම මීකල් ය. 50 සාවුල්ගේ
භාර්යාවගේ නම අහිනොවම් ය. ඈ අහීමයාශ්ගේ
දූව ය. ඔහුගේ සේනාපතියාගේ නම අබ්නේර් ය.
ඔහු සාවුල්ගේ බාප්පා වන නේර්ගේ පුත්රයා ය.
51 සාවුල්ගේ පිය වූ කිෂ් සහ අබ්නේර්ගේ පිය වූ
නේර් අබියලේගේ පුත්රයෝ ය.
52 සාවුල්ගේ මුළු ජීවිත කාලයේ දී ම
පිලිස්තිවරුන්ට විරුද්ධ ව දරුණු යුද්ධ පැවතුණේ ය.
සාවුල් වනාහි යම් බලසම්පන්න මනුෂ්යයකු හෝ
වික්රමාන්විත මනුෂ්යයකු හෝ දුටු විට ඔහු රාජ
සේවය සඳහා පත් කරගත්තේ ය.

## අමලකේවරුන්ට විරුද්ධ ව සටන

15 1 සාමු 10:1 සාමුවලේ සාවුල්ට කතා කොට
මසේ කීවේ ය: "සමිඳාණන් වහන්සේ
තමන්ගේ සනෙඟ වන ඉශ්රායලේවරුන් කරෙහි
ඔබ රජ කොට අභිෂේක කරන පිණිස මා එවූ
සේක. එබැවින් දැන් සමිඳාණන් වහන්සේ වදාරන
දේට සවන් දනේන. 2 නික්ම 17:8-14; ද්වි.නී.
25:17-19සියලු බලැති සමිඳාණන් වහන්සේ මසේ
වදාරන සේක: 'ඉශ්රයලේ සනෙඟ මිසර දේශයනේ
එන කල, මාර්ගයේ දී අමලකේවරුන් ඔවුන්ට විරුද්ධ
ව ක්රියා කළ නිසා මම ඔවුන්ට දඬුවම් කරමි.
3 දැන් නුඹ අමලකේවරුන්ට පහර දී ඔවුන් ඉතිරි
නොකොට, ඔවුන් සතු සියල්ල සහමුලින් ම
විනාශකර දමා, පුරුෂයන් හා ස්ත්රීන් ද බාලයන් හා
කිරි දරුවන් ද ගවයන් හා බැටළුවන් ද ඔටුවන් හා
කොටළුවන් ද මරා දමන්න.' "
4 සාවුල් සනෙඟ එකතු කරගනෙ තලොයිම්හි දී
ඔවුන් ගණන් කළේ ය. පාබළ සනෙඟ දලෙක්ෂයක්
ද ජුදාවනේ භෝවායෝ දස දහසක් ද සිටියෝ ය.
5 සාවුල් අමලකේවරුන්ගේ නුවරට පැමිණ
මිටියාවතේ සැඟවී රැක සිටියේ ය. 6 තවද, සාවුල්
කේනිවරුන්ට කතා කොට, "මා විසින් අමලකේවරුන්
සමඟ ඔබ විනාශ නොකරනු ලබන පිණිස ඔවුන්
කරෙනේ අහක් ව යන්න. මන්ද, ඉශ්රායලේවරුන්
මිසරයනේ එද්දී ඔබ ඔවුන් සියල්ලන්ට කරුණා කළ
නිසා ය"යි ඔවුන්ට කීවේ ය. එබැවින් කේනිවරු
අමලකේවරුන් අතරනේ අහක් ව ගියෝ ය.
7 සාවුල් ද හවීලා පටන් මිසරයට පරෙදිගින් පිහිටා
තිබනෙ ෂූර් දක්වා අමලකේවරුන්ට පහර දුන්නේ ය.
8 ඔහු අමලකේවරුන්ගේ රජ වූ ආගග් පණපිටින්
අල්ලාගනෙ, සියලු සනෙඟ කඩුවනේ ගසා දමා
සහමුලින් ම විනාශ කර දැමුවේ ය. 9 එහතේ,
සාවුල් සහ සනෙඟ ආගග් ද බැටළුවන් හා
ගවයන්ගනෙුත්, තර සතුන්ගනෙුත් ඉතා හොඳ සතුන්
ද බැටළු පැටවුන් ද ප්රයෝජනවත් දේ සියල්ල ද
විනාශ නොකර ඉතිරි කරගත්තෝ ය.
ප්රයෝජනයක් නැති, නොවටින සියල්ල ම ඔව්හු
විනාශ කර දැම්මෝ ය.

## සාවුල් රජකමින් පහකරනු ලැබීම

10 සමිඳාණන් වහන්සේ සාමුවලේට කතා කොට,
11 "මම සාවුල් රජකමට පත් කිරීම ගැන තැවමේ;
මන්ද, ඔහු මාගේ ආඥා නොපවත්වා මා කියන දේ
ඉටු නොකර මා වතේින් අහක් ව ගොස් ඇතැ"යි
වදාළ සේක. සාමුවලේ උදහස් වී රාත්රිය මුළුල්ලේ
සමිඳාණන් වහන්සේට යාච්ඤා කළේ ය.
12 සාමුවලේ සාවුල් හමු වන පිණිස පසු දින උදේ ම

නැඟිට ගියේ ය. “සාවුල් කර්මලේ කන්දට පැමිණ
එහි තමාගේ නමින් ජයස්ථම්භයක් පිහිටුවා
එතැනින් පිටත් වී ගිල්ගාල් බලා නික්ම ගියේ ය”යි
සාමුවලේට දන්වන ලද්දේ ය. 13 සාමුවලේ සාවුල්
වෙත පැමිණෙන කල සාවුල් ඔහු අමතා, “සමිඳාණන්
වහන්සේ ඔබට ආශීර්වාද කරන සේක්වා; මම
සමිඳාණන් වහන්සේ වදාළ දේ ඉෂ්ට කළෙමි”යි කී
ය.
14 සාමුවලේ පිළිතුරු දෙමින්, “එසේ නම්, මට
ඇසෙන මේ බැටළු හඬත්, මට ඇසෙන ගවයින්ගේ
හඬත් කිමෙක් දැ”යි ඇසුවේ ය.
15 සාවුල් පිළිතුරු දෙමින්, “මාගේ සෙනඟ
අමලකේවරුන්ගෙන් උන් ගෙනාවෝ ය. මන්ද, ඔබේ
දෙවි සමිඳාණන් වහන්සේට පූජා කරන පිණිස
සෙනඟ බැටළුවන්ගෙන් ද ගොනුන්ගෙන් ද ඉතා
හොඳ සතුන් ඉතිරි කරගත්තෝ ය. සෙසු සතුන් අපි
සහමුලින් ම විනාශ කර දැමුවෙමු”යි කීවේ ය.
16 එවිට සාමුවලේ, “නවතින්න, මේ රාත්‍රියේ
සමිඳාණන් වහන්සේ මට වදාළ කාරණය ඔබට
දන්වමි”යි සාවුල්ට කීවේ ය. “කිව මැනවැ”යි සාවුල්
කී ය.
17 එවිට සාමුවලේ මෙසේ පිළිතුරු දුන්නේ ය: “ඔබ
සුළු කෙනෙකු යි ඔබ ම සිතූ නමුත්, ඔබ ඉශ්රායලේ
ගෝත්‍ර කෙරෙහි නායකයා කරනු ලැබුවා නොවේ
ද? සමිඳාණන් වහන්සේ ඉශ්රායලේවරුන් කෙරෙහි
රජකමට ඔබ අභිෂේක කළ සේක. 18 සමිඳාණන්
වහන්සේ ඔබ පිටත් කර යවමින්, ‘පව්කාරයන් වන
අමලකේවරුන් විනාශ කරදමා ඔවුන් නැති වී යන
තුරු ඔවුන්ට විරුද්ධ ව යුද්ධ කරන්නැ’යි ඔබට වදාළ
සේක. 19 එහෙත්, සමිඳාණන් වහන්සේගේ අණට
කීකරු නොවී කොල්ලය පිට කඩා පැන, සමිඳාණන්
වහන්සේගේ ඇස් හමුවෙහි වැරදි සහිත දේ කළේ
මක්නිසා දැ”යි ඇසී ය.
20 සාවුල් පිළිතුරු දෙමින්, “නැත, මම සමිඳාණන්
වහන්සේගේ හඬට කීකරු ව, සමිඳාණන් වහන්සේ
මා යැවූ ගමන ගොස් අමලකේවරුන්ගේ රජ වූ
ආගග් ගෙනාවෙමි; අමලකේවරුන් ද සහමුලින් ම
විනාශ කරදැමීමි. 21 එහෙත්, සෙනඟ විනාශ කළ
යුතුව තිබූ දේවලින් ඉස්තරම් කොටස වන
බැටළුවන් ද ගවයන් ද කොල්ලය අතරෙන් රැගෙන
ගිල්ගාල්හි දී ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට පූජා
කරන පිණිස ගෙනාවෝ ය”යි සාමුවලේට කීවේ ය.
22 සාමුවලේ පිළිතුරු දෙමින්, “හිමි තුමන්ට වඩා
ප්‍රසන්න වන්නේ කුමක් ද? එතුමන්ගේ හඬට
කීකරු වීම ද නැතහොත් දවන පූජා හා යාග පූජා ද?
පූජාවට වඩා කීකරු වීම හොඳ ම ය. බැටළු තලේ
පිදීමට වඩා අවනත වීම හොඳ ය. 23 මන්ද,
කැරලිකාරකම අනාවැකි කිරීමේ පාපයට සමාන ය.
මුරණ්ඩුකම රූප ඇදහීමට සමාන ය. ඔබ සමිඳාණන්
වහන්සේගේ වචනය ප්‍රතික්ෂේප කළ නිසා උන්
වහන්සේ ඔබ රජකමෙන් ඉවත් කළ සේකැ”යි
කීවේ ය.
24 සාවුල් සාමුවලේට පිළිතුරු දෙමින්, “මම පව්
කළෙමි. මන්ද, මම සෙනඟට බිය වී ඔවුන්ගේ
හඬට කීකරු වූ බැවින් සමිඳාණන් වහන්සේගේ
ආඥාව ද ඔබේ වචන ද කඩ කළෙමි. 25 එහෙත්,
දැන් ඔබ මාගේ පාපයට කමා වී සමිඳාණන්
වහන්සේට මා නමස්කාර කරන පිණිස මා සමඟ
අව මැනවැ”යි කීවේ ය.
26 සාමුවලේ පිළිතුරු දෙමින්, “මම ඔබ සමඟ ආපසු
නොඑමි. මන්ද, ඔබ සමිඳාණන් වහන්සේගේ
වචනය ප්‍රතික්ෂේප කළෙහි ය; සමිඳාණන්
වහන්සේ ද ඉශ්රායලේවරුන් කෙරෙහි රජකමින් ඔබ
පහකළ සේකැ”යි සාවුල්ට කීවේ ය.
27 1 සාමු 28:17; 1 රාජා 11:30-31 සාමුවලේ
යන්නට හැරෙන විට සාවුල් ඔහුගේ සළුවේ
කළෙවර අල්ලාගත්තේ ය. එවිට ඒ සළුව ඉරුණේ ය.
28 සාමුවලේ ඔහුට කතා කරමින්, “සමිඳාණන්
වහන්සේ අද ඉශ්රායලේ රාජ්‍යය ඔබගෙන් ගෙන ඉරා
ඔබට වඩා යහපත් ඔබේ අසල්වැසියකුට දී තිබේ.
29 ඉශ්රායලේහි පරාක්‍රමයාණෝ බොරු නොකියන
සේක. අධිෂ්ඨාන කරගත් දේ වෙනස් නොකරන
සේක. උන් වහන්සේ මනුෂ්‍යයකු නොවන බැවින්
සිතූ දේ වෙනස් නොකරන සේකැ”යි කීවේ ය.
30 එවිට සාවුල් පිළිතුරු දෙමින්, “මම පව් කළෙමි;
එහෙත්, දැනට මාගේ සෙනඟගේ ප්‍රජා මූලිකයන් ද
ඉශ්රායලේවරුන් ද ඉදිරියෙහි මට ගෞරවය දී, මා
විසින් ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට නමස්කාර
කරනු ලබන පිණිස මා සමඟ අව මැනව”යි කීවේ
ය. 31 එවිට සාමුවලේ සාවුල් සමඟ ගියේ ය. සාවුල්
ද සමිඳාණන් වහන්සේට නමස්කාර කළේ ය.
32 එවිට සාමුවලේ කතා කොට, “අමලකේවරුන්ගේ
රජ වූ ආගග් මා ළඟට ගෙනෙන්නැ”යි කීවේ ය.
ආගග් ද, ‘මරණයට පත් වීම කෙතරම් භයානක
දෙයක් ද’ කියා සිතමින් භයෙන් වෙවුල වෙවුලා
සාමුවලේ වෙත ආවේ ය. 33 සාමුවලේ ද කතා
කොට, “ඔබේ කඩුව, ස්ත්‍රීන් දරුවන් නැති අය
කළාක් මෙන් ඔබේ මවත් ස්ත්‍රීන් අතරෙහි දරුවන්
නැති කෙනෙකේ වන්නී ය”යි කියා ගිල්ගාල්හි දී
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි ආගග් කැබලි කොට
කපා දැමුවේ ය.
34 ඉක්බිති සාමුවලේ රාමා නගරයට ගියේ ය;
සාවුල් ද ගිබියාහි තිබුණ තමාගේ ගෙදරට ගියේ ය.
35 ඉන්පසු සාමුවලේ ජීවිතාන්තය දක්වා තවත්
සාවුල් දුටුවේ නැත. එහෙත්, සාමුවලේ සාවුල් ගැන
ශෝක විය. සමිඳාණන් වහන්සේ සාවුල්
ඉශ්රායලේවරුන් කෙරෙහි රජකමට පත් කළ බැවින්
තැවුණු සේක.

### දාවිත් රාජ පදවියට අභිෂේක කරනු ලැබීම

16 සමිඳාණන් වහන්සේ සාමුවලේට කතා
කොට, “නුඹ කොපමණ කල් සාවුල් ගැන
ශෝක වන්නෙහි ද, මම ඔහු ඉශ්රායලේවරුන්
කෙරෙහි රජකම් කිරීමෙන් පහ කළෙමි. දැන් නුඹ
තලේ කුලාව පුරවාගෙන බෙත්ලෙහෙමෙහි සිටින

ජෙස්සේ නම් තැනැත්තා වෙත යන්න. මන්ද, ඔහුගේ
පුත්‍රයන් අතරෙන් රජකු මම තෝරාගත්තෙමි"යි
වදාළ සේක.
2 සාමුවෙල් පිළිතුරු දෙමින්, "මා එසේ කරන්නේ
කොහොමෙ ද? එය සාවුල්ට සැළ වුණොත් ඔහු මා
මරනු ඇතැ"යි කී ය. සමිඳාණන් වහන්සේ ද පිළිතුරු
දෙමින්, "නුඹ වැස්සියක ගෙන 'සමිඳාණන්
වහන්සේට පූජා කරන පිණිස ආවෙමි'යි කියන්න.
3 ජෙස්සේ ද ඒ පූජාවට කැඳවන්න. එවිට නුඹ විසින්
කරනු ලැබිය යුතු දේ මම නුඹට පෙන්වන්නෙමි. මා
නුඹට කියන තැනැත්තා රජු වශයෙන් නුඹ අභිෂේක
කළ යුතු ය"යි වදාළ සේක.
4 සාමුවෙල් සමිඳාණන් වහන්සේ වදාළ දේ
කරමින්, බෙත්ලෙහෙමෙට පැමිණියේ ය. එවිට
නගරයේ ප්‍රජා මූලිකයෝ වෙවුලමින් ඔහු හමු
වන්නට අවුත්, "ඔබ එන්නේ සාමදානයෙන් දැ"යි ඇසූ
හ.
5 සාමුවෙල් පිළිතුරු දෙමින්, "සාමදානයෙන් ය;
සමිඳාණන් වහන්සේට පූජා කරන්නට ආවෙමි; ඔබ
හැම පවිත්‍ර වී මා සමඟ පූජාවට එන්නැ"යි කීවේ
ය. සාමුවෙල්, ජෙස්සේ ද ඔහුගේ පුත්‍රයන් ද
පවිත්‍ර කොට පූජාවට කැඳවෙව්වේ ය.
6 ඔවුන් පැමිණි කල සාමුවෙල් එලියාබ් දෙස බලා,
"සැබැවින් ම සමිඳාණන් වහන්සේගේ අභිෂේක ලත්
තැනැත්තේ උන් වහන්සේ ඉදිරියෙහි සිටී"යි තමන්ට
ම කියාගත්තේ ය. 7 එහෙත්, සමිඳාණන් වහන්සේ
සාමුවෙල්ට කතා කොට, "ඔහුගේ පෙනීම දෙස වත්,
ශරීරයේ උස මහත දෙස වත් නොබලන්න; මන්ද,
මම ඔහු ප්‍රතික්ෂේප කළෙමි. සමිඳාණන්
වහන්සේ මිනිසා බලන්නාක් මෙන් නොබලන සේක.
මිනිසා බලන්නේ බාහිර පෙනීම දෙස ය. එහෙත්,
සමිඳාණන් වහන්සේ බලන්නේ සිත දෙස ය"යි වදාළ
සේක.
8 එවිට ජෙස්සේ අබිනාදාබ්ට හඬගසා සාමුවෙල්
ඉදිරිපිටට එන්නට සැලැස්වී ය. "මොහු වත්
සමිඳාණන් වහන්සේ තෝරා නොගත් සේකැ"යි
සාමුවෙල් කී ය. 9 එවිට ජෙස්සේ ෂම්මා ඔහු
ඉදිරිපිටින් එන්නට සැලැස්වීය. "මොහු වත්
සමිඳාණන් වහන්සේ තෝරා නොගත් සේකැ"යි
සාමුවෙල් කී ය. 10 මෙසේ ජෙස්සේ තමාගේ
පුත්‍රයන්ගෙන් සත්දෙනෙකු සාමුවෙල් ඉදිරිපිටට
එන්නට සැලැස්සුවේ ය. සාමුවෙල් ද, "මොවුන් එක්
කෙනෙකු වත් සමිඳාණන් වහන්සේ තෝරා නොගත්
සේකැ"යි ජෙස්සේට කී ය. 11 එසේ කියා සාමුවෙල්,
"ඔබේ පුත්‍රයෝ හැම දෙනා ම මෙහි සිටිත් දැ"යි
ජෙස්සේගෙන් ඇසී ය. ජෙස්සේ පිළිතුරු දෙමින්, "තව
ඉතිරි ව සිටින්නේ බාලයා ය; ඔහු බැටළුවන්
බලාගෙන සිටිනවා ය"යි කී ය. සාමුවෙල් ද,
"පණිවුඩකාරයකු යවා ඔහු මෙහි ගෙන්වන්න. ඔහු
මෙහි එන තුරු අපි පූජාව ඔප්පු නොකරන්නෙමු"යි
ජෙස්සේට කී ය. 12 එවිට ජෙස්සේ
පණිවුඩකාරයකු යවා ඔහු ගෙන්වී ය. ඔහු රතු
පැහැයක් ද කඩවසම් පෙනුමක් ද දීප්තිමත් නෙත්
යුවලක් ද ඇති කෙනෙකි, සමිඳාණන් වහන්සේ කතා
කරමින්, "නැඟිට මොහු අභිෂේක කරන්න; මොහු ඒ
තැනැත්තා ය"යි වදාළ සේක. 13 එවිට සාමුවෙල්
තෙල් කුලාව රැගෙන ඒ තැනැත්තා ඔහුගේ
සහෝදරයන් ඉදිරියෙහි අභිෂේක කළේ ය. එදින
පටන් සමිඳාණන් වහන්සේගේ ආත්මානුභාවය
දාවිත් කෙරෙහි පිහිටිණි. සාමුවෙල් නැඟිට ආපසු
රාමා නගරයට ගියේ ය.

## දාවිත්ගේ වීණා වාදනය

14 සමිඳාණන් වහන්සේගේ ආත්මානුභාවය සාවුල්
කෙරෙන් පහ ව ගියේ ය. සමිඳාණන් වහන්සේ එවූ
දුෂ්ටාත්මයක් ඔහු කැළඹුවේ ය. 15 සාවුල්ගේ
සේවකයෝ ඔහුට කතා කොට, "දෙවියන් වහන්සේ
එවූ දුෂ්ටාත්මයක් ඔබ කළඹන්නේ ය. 16 ඒ නිසා
දක්ෂ වීණාකාරයකු සොයන පිණිස අපේ
ස්වාමීන්ගේ සේවකයන් වන අපට අණ කළ මැනව.
එවිට දෙවියන් වහන්සේ එවන දුෂ්ටාත්මය ඔබට
ආවේශ වූ කල, ඔබට සුව සහනය ලැබෙන පිණිස
ඔහු වාදනය කරනු ඇතැ"යි කීවෝ ය.
17 සාවුල් කතා කොට, "හොඳට වාදනය කරන
මිනිසකු සොයා ඔහු මා වෙත ගෙනෙන්නැ"යි
සේවකයන්ට කීවේ ය.
18 එවිට සේවකයන්ගෙන් එක් කෙනෙක් පිළිතුරු
දෙමින්, "දක්ෂ වාදකයකු වන පුත්‍රයෙක්
බෙත්ලෙහෙමේ වසන ජෙස්සේට සිටියි. ඔහු නිර්භීත
කෙනෙකි; දක්ෂ භටයෙකි; කතාවෙහි දක්ෂ ය;
රූපසම්පන්න ය. සමිඳාණන් වහන්සේ ඔහු සමඟ
සිටින සේකැ"යි කීවේ ය.
19 එවිට සාවුල් ජෙස්සේ වෙත පණිවුඩකාරයන්
යවමින්, "බැටළුවන් සමඟ සිටින ඔබේ පුත්‍රයා වන
දාවිත් මා ළඟට එවන්නැ"යි කියා යැවී ය. 20 එවිට
ජෙස්සේ රොටී ද මිදියුස භාජනයක් ද කොටළුවකු
පිට පටවා එළු පැටවකු සමඟ ඒවා තමාගේ පුත්
දාවිත් අත සාවුල්ට යැව්වේ ය. 21 දාවිත් සාවුල්
වෙත අවුත්, ඔහුගේ සේවයට බැඳුණේ ය. සාවුල්
ඔහුට ඉතා ප්‍රේම කළේ ය. ඔහු සාවුල්ගේ ආයුධ
රැගෙන යන්නා විය. 22 සාවුල් ජෙස්සේට
පණිවුඩයක් යවමින්, "දාවිත් මට ප්‍රිය මනාප නිසා
ඔහු මා සමඟ සිටියාවේ"යි කියා ඇරියේ ය.
23 එතැන් පටන් දෙවියන් වහන්සේ සාවුල්ට
දුෂ්ටාත්මයක් ආවේශ කළ විට දාවිත් වීණාව
රැගෙන වාදනය කළේ ය. එයින් සාවුල්ට සුව
සහනය ලැබී දුෂ්ටාත්මය ඔහුගෙන් පහ ව ගියේ ය.

## ගොලියත් ඉශ්‍රායලේවරුන්ට අභියෝග කිරීම

17 පිලිස්තිවරු ජුදාහි නගරයක් වන සෝකෝ
නම් ස්ථානයට යුද්ධය පිණිස රැස් වූ හ.
ඔව්හු සෝකෝ නගරයටත්, අසේකා නගරයටත්
අතරේ එපෙස්-දම්මීම්හි කඳවුරු බැඳගත්හ. 2 සාවුල්
ද ඉශ්‍රායලේ ජනයා ද එක් රැස් ව ඒලා මිටියාවතේ
කඳවුරු බැඳගෙන පිලිස්තිවරුන්ට විරුද්ධ ව යුද්ධය
සඳහා සැරසී සිටියහ. 3 පිලිස්තිවරු එක පැත්තක
තිබුණ කන්දේ ද ඉශ්‍රායලේවරු අනික් පැත්තේ

තිබුණ කන්දේ ද සිටියහ. ඒ කඳු දෙකට අතරේ
මිටියාවතක් තිබිණි.
4 ගාත් නගරයෙහි වැසියෙකු වූ ගොලියත් නම්
මල්ලවයෙක් පිලිස්තිවරුන්ගේ කඳවුරෙන් ඉදිරිපත් ව
ආවේ ය. ඔහු මීටර් තුනක් පමණ උස ය. 5 ඔහුගේ
හිසේ ලෝකඩ තොප්පියක් තිබිණි; ඔහු ලෝහ
යුද්ධ ඇඳුමක් පැළඳගෙන සිටියේ ය. එය
කිලෝග්‍රෑම් පණස්හතක් පමණ බර ය. 6 ඔහුගේ
පාදවල ලෝකඩ වැසුම් තිබිණි. ඔහුගේ උරහිස මත
කුඩා ලෝකඩ හෙල්ලයක් එල්ලාගෙන සිටියේ ය.
7 ඔහුගේ මහා හෙල්ලයේ මිට, වියන යන්ත්‍රයක
දණ්ඩකට සමාන ය; එහි තලය කිලෝග්‍රෑම් හතක්
පමණ බර ය. ඔහුගේ පලිහ ගෙන යන්නා ඔහුට
පෙරටුවෙන් ගියේ ය. 8 ගොලියත් නැඟිට ඉශ්‍රායෙලේ
සෙනඟට මොරගසා, "ඔබ යුද්ධ කරන පිණිස සැරසී
සිටින්නේ කුමට ද? මම පිලිස්තියයෙක් නොවෙම් ද?
ඔබ සාවුල්ගේ දාසයෝ නොවන්නහු ද? මා සමඟ
සටන් කරන පිණිස ඔබ අතරෙන් එක මිනිසෙකු
තෝරාගන්න. 9 මා සමඟ සටන් කොට මා මරන්නට
ඔහුට පුළුවන් වුණොත්, අපි ඔබේ මෙහෙකරුවෝ
වන්නෙමු. එහෙත්, මා ඔහුගෙන් ජය ගෙන ඔහු
මැරුවොත්, ඔබ අපේ මෙහෙකරුවන් ව අපට සේවය
කරන්නට ඕනෑ ය"යි කීවේ ය. 10 තවදුරටත් ඒ
පිලිස්තියයා කතා කරමින්, "මම ඉශ්‍රායෙලේ
සේනාවට අද දවසේ අභියෝග කරමි. මා සමඟ
සටන් කරන්නට මිනිසෙකු තෝරා ඉදිරිපත්
කරන්නැ"යි කීවේ ය. 11 සාවුල් ද සියලු ඉශ්‍රායෙලේ
ජනයා ද පිලිස්තියයාගේ ඒ වචන අසා තැතිගෙන
බොහෝ සෙයින් බියපත් වූ හ.

### දාවිත් සාවුල්ගේ කඳවුරට පැමිණීම

12 දාවිත් ජුදයේ බෙත්ලෙහෙමෙහි ජෙස්සේ නම් වූ
එප්‍රාතියයාගේ පුත්‍රයා ය; ජෙස්සේට පුත්‍රයෝ
අටදෙනෙක් වූ හ. සාවුල් රජ ව සිටි කාලයේ
ජෙස්සේ දුබල මහලු මනුෂ්‍යයෙක් විය.
13 ජෙස්සේගේ වැඩිමහල් පුත්‍රයෝ තුන් දෙනා
සාවුල් අනුව යුද්ධයට ගියහ. යුද්ධයට ගිය ඔහුගේ
පුත්‍රයන් තිදෙනාගේ නාම මෙසේ ය; කුලුඳුලා
එලියාබ් ය, දෙවෙනියා අබිනාදාබ් ය. තුන්වැනියා
ෂම්මා ය. 14 දාවිත් සියල්ලන්ට ම බාලයා ය.
වැඩිමහල් තිදෙනා සාවුල් සමඟ නැවතී සිටියහ.
15 දාවිත් වනාහි බෙත්ලෙහෙමෙහි තමාගේ බැටළුවන්
බලා ගන්න පිණිස සාවුල් වෙතින් ඔබමොබ ගියේ
ය.
16 ගොලියත් හතළිස් දවසක් මුළුල්ලේ උදයේත්,
සවසත් ඉදිරියට අවුත් අභියෝග කළේ ය.
17 දිනක් ජෙස්සේ තම පුත් දාවිත්ට කතා කොට,
"මේ විළඳවලින් කිලෝග්‍රෑම් දහයක් ද මේ රොටි
දසය ද රැගෙන කඳවුරේ සිටින ඔබේ සහෝදරයන්
ළඟට ඉක්මනින් ගොස් ඒවා ඔවුන්ට දෙන්න;
18 ඔවුන්ගේ සහශ්‍රාධිපතියාට මේ කේජු ගෙඩි
දසය ද ගෙන ගොස් දී ඔබේ සහෝදරයන්ගේ සැප
සනීප කොහොමෙ ද කියා බලා ඔවුන්ගේ තොරතුරු
දැනගෙන ආපසු එන්නැ"යි කීවේ ය.
19 ඒ අවස්ථාවේ දී සාවුල් ද දාවිත්ගේ
සහෝදරයෝ ද ඉශ්‍රායෙලේ සෙනඟ සියලු දෙනා ද
ඒලා නම් මිටියාවතේ පිලිස්තිවරුන් සමඟ සටන්
කරමින් සිටියහ.
20 දාවිත් අලුයම නැඟිට, බැටළු පාලකයෙකුට
බැටළුවන් භාර දී, ජෙස්සේ තමාට අණ කළ ලෙස
ආහාර රැගෙන ගොස් කඳවුර තිබුණ ස්ථානයට
පැමිණියේ ය. ඒ අවස්ථාවේ දී සේනාව රණ බිමට
යමින් ඔල්වර හඬ නඟමින් සිටියහ.
21 ඉශ්‍රායෙලේවරුන්ගේ සේනාව ද පිලිස්තිවරුන්ගේ
සේනාව ද එක එකාට විරුද්ධ ව මුහුණට මුහුණ ලා
යුද්ධයට සැරසී සිටියහ. 22 දාවිත් තමා ගෙනා
දේවල් බඩු ප්‍රවේසම් කරන්නා අතට දී, සේනාව
ළඟට දිව ගොස් තමාගේ සහෝදරයන්ට ආචාර
කළේ ය. 23 ඔහු ඔවුන් සමඟ කතා කරන කල,
ගාත්හි ගොලියත් නම් පිලිස්තිය මල්ලවයා
පිලිස්තිවරුන්ගේ හමුදාවෙන් පිටත් ව අවුත් කලින්
මෙන් අභියෝග කළේ ය. දාවිත්ට එය ඇසිණි.
24 ඉශ්‍රායෙලේ සෙනඟ සියලු දෙනා ඒ මිනිසා දුටු විට
බොහෝ සෙයින් බිය වී ඔහු ඉදිරියෙන් පලා ගියහ.
25 ඉශ්‍රායෙලේ සෙනඟ කතා කොට, "ඉදිරියට එන
අර මිනිසා දෙස බලන්න. ඉශ්‍රායෙලේවරුන්ට ඔහු
කරන අභියෝගය අසන්න. යම් මිනිසෙකු ඔහු
මැරුවොත්, රජතුමා ඔහුට බොහෝ වස්තුව දී ඔහු
ධනවතෙකු කොට, තමාගේ දුව ඔහුට සරණපාවා දී,
ඉශ්‍රායෙලෙහි ඔහුගේ පියාගේ පවුල අයබදුවලින්
නිදහස් කරනු ඇතැ"යි කී හ.
26 දාවිත් තමා ළඟ සිටි මිනිසුන්ට කතා කොට,
"මේ පිලිස්තියයා මරා දමා ඉශ්‍රායෙලේවරුන් කෙරෙන්
නින්දාව පහකරන මිනිසාට කුමක් දෙන්නේ ද?
ජීවමාන දෙවියන් වහන්සේගේ සේනාවලට
අභියෝග කරන මේ අචර්මඡේදිත පිලිස්තියයා
කවරෙක් දැ"යි ඇසී ය. 27 සෙනඟ ද පෙර සේ
පිළිතුරු දෙමින් ඒ මිනිසා මරන තැනැත්තාට දෙන දේ
ද කී හ.
28 දාවිත් මිනිසුන්ට කතා කරන කල ඔහුගේ
වැඩිමහල් සහෝදරයා වන එලියාබ් අසාගෙන
සිටියේ ය. එවිට එලියාබ් දාවිත් කෙරේ කෝප වී,
"ඔබ ආවේ කුමකට ද? පාළුකරයේ සිටින ඒ
බැටළුවන් ස්වල්ප දෙනා ඔබ කාට භාර දී ආවෙහි ද?
කපටි දඟකාර කොලුවා! ඔබ මෙහි ආවේ යුද්ධය
බලන පිණිස ය"යි කීවේ ය.
29 දාවිත් පිළිතුරු දෙමින්, "මම දැන් කුමක් කළෙම්
ද? ප්‍රශ්නයක් ඇසුවා පමණක් නොවේ දැ"යි කියා,
30 ඔහු වෙතින් අනිකෙකු දෙසට හැරී ගොස් ඒ
ප්‍රශ්නය ම ඇසුවේ ය. මිනිස්සු පළමු කී ලෙසට ම
ඔහුට යළිත් උත්තර දුන්හ. 31 දාවිත් කී වචන ඇසූ
සමහර මිනිස්සු සාවුල්ට එපවත් සැළ කළහ. සාවුල්
ද ඔහු කැඳෙව්වේ ය. 32 දාවිත් සාවුල්ට කතා
කොට, "රජතුමනි, කිසිවෙකු මේ පිලිස්තියයාට බිය
නොවිය යුතු යි. ඔබේ මෙහෙකරුවා වන මම ගොස්
මේ පිලිස්තියයා සමඟ සටන් කරමි"යි කී ය.

33 සාවුල් පිළිතුරු දමේන්, "මේ පිලිස්තියයාට විරුද්ධ
ව ගොස් ඔහු සමඟ සටන් කරන්නට ඔබට බැරි ය.
මන්ද, ඔබ කොලු ගැටයකේ. එහතේ, ඔහු තරුණ
වයසේ පටන් හ්වොයකෙු ව සිටින්නකෙු"යි දාවිත්ට
කී ය.
34 දාවිත් පිළිතුරු දමේන් සාවුල්ට මසෙේ කී ය:
"ඔබේ මහෙකෙරුවා වන මා, මාගේ පියාගේ
බැටළුවන් බලාගනෙ සිටිය දී සිංහයකෙු හෝ
වලසකෙු හෝ අවුත් රැළනේ බැටළුවකෙු ගත්තහොත්,
35 මම ඌ පස්සේ ගොස්, ඌට පහර දී ඌගේ
කටින් බැටළුවා ගළවාගන්නමේ. ඌ මට කඩාපැන්න
විට මම ඌ බලේලනේ අල්ලා ඌට පහර දී
මරන්නමේ. 36 ඔබේ මහෙකෙරුවා වන මම සිංහයන්
ද වලසුන් ද මරා ඇත්තමේ. ජීවමාන දවේයන්
වහන්සේගේ සේනාවලට නින්දා කළ මේ
අචර්මඡේදිත පිලිස්තියයාටත් එසේ කරමි,
37 සිංහයාගේ නිය පහරින් ද වලසාගේ නිය පහරින්
ද මා ගැළවූ සමිඳාණන් වහන්සේ මේ
පිලිස්තියයාගේ අතිනුත් මා ගළවන සේක." සාවුල්
කතා කොට, "යන්න. සමිඳාණන් වහන්සේ ඔබ
සමඟ සිටින සේක් වා!"යි දාවිත්ට කී ය.
38 තවද, සාවුල් තමාගේ ඇඳුම් දාවිත්ට අඳවා,
ඔහුගේ හිසේ ලෝකඩ තොප්පියක් දමා, යුද්ධ
ඇඳුමක් ඔහුට පැළඳවූවේ ය. 39 දාවිත් ඒ ඇඳුමේ
සාවුල්ගේ කඩුව බැඳගනෙ ඇවිදින්නට උත්සාහ
කළේ ය. එහතේ, ඔහුට නුපුළුවන් විය. මන්ද, ඔහු
ඒවා පැළඳ පුරුදු නැති නිසා ය. එවිට දාවිත් සාවුල්ට
කතා කොට, "මට මේවා ඇඳ පුරුදු නැති බැවින්
මේවා ඇඳගනෙ යන්නට බැරි ය"යි කියා ඒවා ගලවා
දමා, 40 තමාගේ සැරයටිය අතින් ගනෙ, දොළනේ
සිනිඳු ගල් පහක් තෝරාගනෙ, තමා ළඟ තිබුණ
පසුම්බියක් වන එඬේර මල්ලේ ඒවා දමාගනෙ,
අතින් ගල් පටිය රැගනෙ පිලිස්තියයා දසෙට යන්නට
ගියේ ය.

### දාවිත් ගොලියත් පරාජය කිරීම

41 පිලිස්තියයා පිටත් ව අවුත් දාවිත් දසෙට ගමන්
කළේ ය. පලිහ ගනෙ යන්නා ඔහුට පරෙටුව ආවේ
ය. 42 පිලිස්තියයා දාවිත් දුටු විට ඔහුට ගැරහුම්
කළේ ය. මන්ද, ඔහු රතු පැහැයක් ද කඩවසම්
පනෙුමක් ද ඇති තරුණයකෙු වූ බැවිනි.
43 පිලිස්තියයා දාවිත්ට කතා කොට, "තෝ සැරයටිය
රැගනෙ මා ළඟට එන්නේ මා බල්ලකෙු යි සිතා ද"
කියා, තමාගේ දවේයන්ගේ නාමයනේ දාවිත්ට දසේ
කීවේ ය. 44 ඔහු තවදුරටත් කතා කරමින්, "මා
ළඟට වර, මම තාගේ මස් ආකාශයේ පක්ෂීන්ටත්,
වනයේ මෘගයන්ටත් දනේනමේ"යි දාවිත්ට කීවේ ය.
45 එවිට දාවිත් පිළිතුරු දමේන්, "තෝ කඩුවක් ද
හලේලයක් ද කුන්තයක් ද රැගනෙ මා ළඟට
එන්නහෙි ය. මම වනාහි තා නින්දා කළ ඉශ්රායලේ
හමුදාවල සියලු බලැති දවේ සමිඳාණන්
වහන්සේගේ නාමයනේ තා ළඟට එමි. 46 අද දින
සමිඳාණන් වහන්සේ තා මා අතට පාවා දනෙ සේක;
මම තට ගසා, තාගේ හිස කපා දමා,
පිලිස්තිවරුන්ගේ මළකඳන් අද දවසේ ආකාශයේ
පක්ෂීන්ට ද පොළොවේ වන මෘගයන්ට ද
දනේනමේ. මසෙේ ඉශ්රායලේ කරෙහෙි දවේ
කනෙකෙුන් සිටින බව පොළොවේ සියල්ලන් ම
දැනගනු ඇත. 47 ජය ගැනීමට සමිඳාණන්
වහන්සේට කඩුවක් වත්, හලේලයක් වත් වුවමනා
නැති බව මුළු සමූහයා දැනගනු ඇත. සටන
සමිඳාණන් වහන්සේගේ ය; උන් වහන්සේ ද ඔබ
අප අතට පාවා දනෙ සේකැ"යි පිලිස්තියයාට කී ය.
48 පිලිස්තියයා යළිත් දාවිත්ට විරුද්ධ ව ගමන්
කළේ ය. දාවිත් විගසින් පිලිස්තියයාට විරුද්ධ ව
සේනාව දසෙට දුව ගොස්, 49 මල්ලේ අත දමා
එයින් ගලක් ගනෙ, එය ගල් පටියනේ විද්දේ ය. ඒ
ගල පිලිස්තියයාගේ නළලට වැදී නළල ඇතුළට කා
වැදුණේ ය. පිලිස්තියයා මුණින්තළා බිමට වැටිණි.
50 2 සාමු 21:19මසෙේ දාවිත් කඩුවක් නැති ව ගල්
පටියනේ ද ගලනේ ද පිලිස්තියයාගනේ ජයගනෙ,
ඔහුට පහර දී, ඔහු මැරුවේ ය. 51 එවිට දාවිත් දුව
ගොස් පිලිස්තියයා ළඟ සිට ඔහුගේ කඩුව
කොපුවනේ ඇද, එයින් ඔහුගේ හිස ගසා දමා ඔහු
මැරුවේ ය. පිලිස්තිවරු තමන්ගේ යෝධයා මළ බව
දැක පලා ගියෝ ය. 52 ඉශ්රායලේ සනෙඟ ද ජුදා
සනෙඟ ද නැඟිට, ඔල්වර හඬ පවත්වා පිලිස්තිවරුන්
ලුහුබැඳ ගායිට පැමිණනෙ තැන දක්වාත් ඒක්රොන්හි
දොරටුව දක්වාත් ගියහ. ෂාරයිම්ට යන මාර්ගය
දිගට ගාත් දක්වා ද ඒක්රොන් දක්වා ද පිලිස්තිවරු
මැරුම් කා වැටුණා හ. 53 ඉශ්රායලේ ජනයා
පිලිස්තිවරුන් ලුහුබැඳ එලවා දමා, හැරී අවුත්
ඔවුන්ගේ කඳවුරු කොල්ලකාගත්තෝ ය. 54 දාවිත්
පිලිස්තියයාගේ හිස රැගනෙ ජරෙුසලමට පැමිණියේ
ය; ඔහුගේ ආයුධ තමාගේ කූඩාරමේ තබාගත්තේ
ය.

### සාවුල් දාවිත් පිළිගැනීම

55 දාවිත් පිලිස්තිවරුන්ට විරුද්ධ ව පිටත් ව යන
බව සාවුල් දැක, සේනාවේ අධිපතියා වන
අබ්නේර්ට කතා කොට, "අබ්නේර්, මේ කොලු
ගැටයා කාගේ පුත්රයා දැ"යි ඇසී ය. අබ්නේර්
පිළිතුරු දමේන්, "රජතුමනි, ඔබේ නාමයනේ දිවුරා
කියමි. මම ඒ ගැන කිසිත් නොදනිමි"යි කී ය.
56 රජතුමා ද, "මේ කොලු ගැටයා කාගේ පුත්රයා
ද කියා සොයා බලන්නැ"යි කීවේ ය.
57 දාවිත් පිලිස්තියයා මරා දමා ආපසු හැරී එන
කල අබ්නේර් ඔහු කැඳවාගනෙ සාවුල් ඉදිරියට
ගියේ ය. පිලිස්තියයාගේ හිස දාවිත්ගේ අතේ
තිබිණි. 58 සාවුල් ඔහු අමතා, "තරුණය, ඔබ කාගේ
පුත්රයා දැ"යි ඇසී ය. දාවිත් පිළිතුරු දමේන්, "මම
ඔබේ මහෙකෙරු වන, බතේලහෙමේහි සිටින
ජසේසේගේ පුත්රයකේ වමේ"යි කීවේ ය.

### දාවිත් සහ ජොනතන්ගේ මිත්‍රකම

18 දාවිත් සාවුල්ට කතා කොට නිම වූ කල
ජොනතන්ගේ සිත දාවිත් දසෙට තදින් ඇදී
ගොස්, ජොනතන් සිය පණට මෙන් දාවිත්ට ප්‍රේම
කළේ ය. 2 ඒ දවසේ පටන් සාවුල්, දාවිත් තමා
සමඟ නවතාගෙන ඔහුගේ පියාගේ ගෙදරට යන්නට
ඔහුට ඉඩ නුදුන්නේ ය. 3 ජොනතන් සිය පණට
මෙන් දාවිත්ට ප්‍රේම කළ බැවින් ඔහු සහ දාවිත්
ගිවිසුමක් කරගත්හ. 4 ජොනතන් තමාගේ සළුව
ගලවා ඒ සමඟ ඔහුගේ කඩුවත්, දුන්නත්,
ඉඟපටියත් ඇතුළු ව තමාගේ යුද්ධ ඇඳුම ද දාවිත්ට
දුන්නේ ය. 5 සාවුල් විසින් දාවිත් යවනු ලැබූ හැම
කාර්යයක දී ම ඔහු ජයගත්තේ ය. සාවුල් ඔහු
භේවායන් කෙරෙහි ප්‍රධානියා කළේ ය. මුළු
සෙනඟ ද සාවුල්ගේ සේවකයෝ ද ඊට ප්‍රසන්න වූ
හ.

### සාවුල් දාවිත්ට ඊර්ෂ්‍යා කිරීම

6 දාවිත් පිලිස්තියයා මරා පෙරළා එන විට,
ඉශ්රායලේහි සියලු නගරවලින් කාන්තාවෝ නික්ම
ගායනා කරමින් ද නටමින් ද රබන් ගසමින් ද ප්‍රීති
හඬ නඟමින් ද අත්තාලම් ගසමින් ද සාවුල් රජු හමු
වීමට ආහ. 7 1 සාමු 21:11; 29:5කාන්තාවෝ නට
නටා ගී ගයමින්,
q27 "මැරී සාවුල් දහස් ගණනක්, මැරී දාවිත් දස
දහස් ගණනක් ය"යි
7 කී හ. 8 සාවුල් මේ කීමට අප්‍රසන්න ව ඉතා
කෝප වී, " 'දාවිත් දස දහස් ගණන් මැරුවේ ය'යි
ඔව්හු කියති; 'සාවුල් දහස් ගණන් පමණක් මැරුවේ
ය'යි කියති. දැන් ඔහුට ලැබෙන්නට ඉතිරි ව ඇත්තේ
රජකම පමණකැ"යි කීවේ ය. 9 එදා පටන් සාවුල්
දාවිත් දෙස බැලුවේ ඊර්ෂ්‍යා සහගත ඇසිණි.
10 පසු දා දෙවියන් වහන්සේගෙන් දුෂ්ටාත්මයක්
සාවුල්ට ආවේශ විය. ඔහු නිවසෙ ඇතුළේ පිස්සකු
මෙන් දඩෙව්වේ ය. දාවිත් පෙරෙ ලෙසෙ වීණාව
වාදනය කරන විට සාවුල්ගේ අතේ හෙල්ලයක්
තිබිණි. 11 "මම දාවිත් බිත්තියට ම ඇණ තබමි"යි
සිතා ඔහු හෙල්ලය දාවිත් දෙසට දෙවරක් විසි
කළේ ය. දාවිත් අහකට පැන බේරුණේ ය.
12 සමිඳාණන් වහන්සේ දාවිත් සමඟ වැඩ සිටි
නිසාත්, සාවුල්ගෙන් පහ ව වැඩිය නිසාත් සාවුල්
දාවිත්ට බිය විය. 13 ඒ නිසා සාවුල් තමා වෙතින්
දාවිත් අහක් කොට, ඔහු සහශ්‍රාධිපතියකු කළේ
ය. දාවිත් මූලිකත්වය දරා සෙනඟ කැටුව සටනට
ගියේ ය. 14 සමිඳාණන් වහන්සේ ඔහු සමඟ වැඩ
සිටි නිසා ඔහු කළ හැම දේ සාර්ථක විය. 15 දාවිත්
ජයගන්න බව සාවුල් දැක වඩ වඩා ඔහුට බිය විය.
16 එහෙත්, මුළු ඉශ්රායලේ ජනයා ද ජුදා වැසියෝ ද
දාවිත් ජයග්‍රාහී මූලිකයකු වූ බැවින් ඔහුට ප්‍රේම
කළහ.

### දාවිත් සාවුල්ගේ දුව සරණපාවා ගැනීම

17 සාවුල් දාවිත්ට කතා කොට, "මෙන්න, මාගේ
වැඩිමහල් දුව වන මේරබ් ඔබට භාර්යාව කොට
දෙන්නෙමි. ඔබ මා උදෙසා වික්‍රමාන්විත ව
සමිඳාණන් වහන්සේගේ යුද්ධවල සටන් කරන්නැ"යි
කීවේ ය. සාවුල් එසේ කීවේ, 'දාවිත් ඔහුගේ අතින්
නොව පිලිස්තිවරුන්ගේ අතින් මරනු ලැබිය යුතු ය'යි
අදහස් කළ බැවිනි.
18 දාවිත් සාවුල්ට පිළිතුරු දෙමින්, "රජතුමාණන්ට
බෑණා වන්නට මම කවරෙක් ද? ඉශ්රායලේහි සිටින
මාගේ පියාගේ වංශයටත්, මාගේ ඥාතීන්ටත් ඇති
වැදගත්කම කුමක් දැ"යි ඇසුවේ ය. 19 එහෙත්,
සාවුල්ගේ දුව වන මේරබ් දාවිත්ට පාවා දෙන්නට
නියි කාලය පැමිණි විට, ඈ මෙහොලාතියේ
වැසියකු වන අද්‍රියෙල්ට භාර්යාව කොට දෙන ලද්දී
ය.
20 ඒ අතරතුරේ දී සාවුල්ගේ දුව මීකල් දාවිත්ට
ආදරේ වූවා ය. ඒ බව සාවුල්ට දන්වන ලද්දේ ය.
සාවුල් ඒ ගැන ප්‍රීති විය. 21 එවිට සාවුල්, "මම
මීකල් දාවිත්ට දෙන්නෙමි. ඈ උගුලක් අටවා
පිලිස්තිවරුන් ලවා ඔහු මරවනු ඇතැ"යි අදහස්
කරගෙන, දෙ වන වතාවටත් දාවිත්ට කතා කොට,
"ඔබ අද මාගේ බෑණා වන්නට ඕනෑ ය"යි කීවේ ය.
22 සාවුල් තමාගේ සේවකයන්ට අණ කරමින්,
"දාවිත් සමඟ රහසින් කතා කොට, රජ්ජුරුවෝ ඔබ
කෙරෙහි ප්‍රිය මනාප ය. එතුමන්ගේ සියලු
සේවකයෝ ද ඔබට කැමැති ය; එබැවින්
රජ්ජුරුවන්ගේ බෑණා වන්න කියා කියන්නැ"යි කී ය.
23 සාවුල්ගේ සේවකයෝ එපවත් දාවිත්ට සැළ
කළහ. දාවිත් පිළිතුරු දෙමින්, "මම නම් වැදගැම්මක්
නැති දිළිඳු කෙනෙක්මි. ඉතින් රජ්ජුරුවන්ගේ බෑණා
වීම සුළුපටු දෙයක් නොවන බව ඔබට පෙනෙනු
ඇතැ"යි කීවේ ය.
24 සාවුල්ගේ සේවකයෝ දාවිත් කී දේ ඔහුට
දැන්නූ හ. 25 එවිට සාවුල් සේවකයන්ට අණ
කරමින්, "රජ්ජුරුවන්ගේ සතුරන්ගෙන් පළිගන්න
පිණිස පිලිස්තිවරුන් සිය දෙනෙකුගේ චර්මාග්‍ර මිස
රජ්ජුරුවන්ට අන් කිසි දායාදයක් වුවමනා නැත කියා
දාවිත්ට කියන්නැ"යි කී ය. සාවුල් පිලිස්තිවරුන්ගේ
අතින් දාවිත් මරවන්නට අදහස් කළේ මේ අයුරින්
ය. 26 ඔහුගේ සේවකයන් මේ බව දාවිත්ට දැන්වූ
කල දාවිත්, සාවුල් රජුගේ බෑණා වන්නට සතුටු විය.
නියමිත කාලය ගත වන්නට පෙරෙ, 27 දාවිත් ඔහුගේ
සෙනඟ සමඟ නික්ම ගොස්, පිලිස්තිවරුන්ගෙන්
මිනිසුන් දෙසියයක් මැරී ය. දාවිත් ඔවුන්ගේ
චර්මාග්‍ර ගෙන ගොස්, ඔහු රජුගේ බෑණා වීමේ
අයිතිය ලබන පිණිස ඒවා රජු ඉදිරියෙහි ගණන්
කොට තැබුවේ ය. එවිට සාවුල් තමාගේ දුව මීකල්
ඔහුට භාර්යාව කොට පාවා දුන්නේ ය.
28 සමිඳාණන් වහන්සේ දාවිත් සමඟ සිටින බවත්,
මුළු ඉශ්රායලේ ජනයා ඔහුට ප්‍රිය බවත් සාවුල්ට
හැඟී ගියේ ය. 29 ඒ නිසා සාවුල් වඩ වඩාත් දාවිත්ට

භය වුණාේ ය. සාවුල් ජීවිතාන්තය දක්වා ම දාවිත්ට
වරෙ කළෙේ ය.
30 පිලිස්තිවරුන්ගෙ අධිපතීහු වරින් වර සටනට
පැමිණියහ. ඔවුන් පැමිණි සෑම අවස්ථාවක දී ම
දාවිත් සාවුල්ගෙ සියලු සේවකයන්ට වඩා උසස්
ලසෙ ජය ගත්තේ ය. ඒ නිසා ඔහු ඉතා කීර්තිමත්
කනෙකේ විය.

### සාවුල් දාවිත් මරන්නට උත්සාහ කිරීම

19 දාවිත් මරන ලසෙ සාවුල් තම පුත්
ජොනතන්ටත්, තමාගෙ සියලු සේවකයන්ටත්
කීවේ ය. එහතේ, සාවුල්ගෙ පුත් ජොනතන් දාවිත්ට
බොහෝ සේ ප්‍රමේ කළෙේ ය. 2 ඔහු දාවිත්ට
කතා කොට, “මාගෙ පියා වන සාවුල් ඔබ මරන්නට
සොයන්නේ ය. ඒ නිසා හටෙ උදෙ ප්‍රවේසම් වී
රහසේ සැඟවී සිටින්න. 3 ඔබ සිටින කතෙහෙි
මාගෙ පියා ළඟට පැමිණ ඔබ ගැන මාගෙ පියා
සමඟ කතා කරන්නමේ. ඔබට දන්වන්න යම්
කරුණක් ඇත්නම් මම ඔබට දන්වන්නමේ”යි දාවිත්ට
කීවේ ය.
4 ජොනතන් තම පිය සාවුල්ට දාවිත්ගෙ ගුණ
වර්ණනා කරමින් මසෙේ කී ය: “පිය රජතුමනේ,
ඔබෙ සේවකයා වන දාවිත්ට විරුද්ධ ව පව්
නොකරන්න. මන්ද, ඔහු ඔබට විරුද්ධ ව පව් කළෙේ
නැත. ඇරත් ඔහු කළ හැම ක්‍රියාවක් ම ඔබට ඉතා
ප්‍රයොජනවත් විය. 5 ඔහු සිය දිවිත් නොතකා
ගොස් අර පිලිස්තියයා මැරුවේ ය. එයින් සමිඳාණන්
වහන්සේ සියලු ඉශ්‍රායලේවරුන්ට විශිෂ්ට
ජයග්‍රහණයක් අත් කර දුන් සේක. ඔබ එය දැක
ප්‍රීති වූයහෙි ය. එබැවින් නිකරුණේ දාවිත් මරා
නිදොස් ලෙ වැගිරීමනේ ඔබ පව් කරන්නට
හදන්නේ මන් ද?”
6 සාවුල් ජොනතන්ගෙ බසට ඇහුම්කන් දී, ඔහු
දාවිත් නොමරන බව සමිඳාණන් වහන්සේගෙ
නාමයනේ දිවුරා කීවේ ය. 7 ජොනතන් දාවිත්ට
අඬගසා ඒ සියල්ල ඔහුට දන්වා, සාවුල් ළඟට ඔහු
කැඳවාගනෙ ගියේ ය. දාවිත් ද පරෙ ලසෙ සාවුල්
ඉදිරියහෙි සේවය කළෙේ ය.
8 නැවතත් යුද්ධයක් ඇති විය. දාවිත් පිටත් ව
ගොස් පිලිස්තිවරුන්ට විරුද්ධ ව යුද්ධ කොට ඔවුන්
අතරෙ මහා විනාශයක් කළෙේ ය. ඔව්හු ද ඔහු
ඉදිරියනේ පලා ගියහ.
9 දිනක් සාවුල් තමාගෙ හලේලය අතෙ තබාගනෙ
නිවසෙේ හිඳින අතර සමිඳාණන් වහන්සේ එවූ
දුෂ්ටාත්මයක් ඔහුට ආවේශ විය. දාවිත් තමාගෙ
වීණාව වාදනය කරමින් සිටියේ ය. 10 දාවිත්
බිත්තියට ඇණ තබන අදහසින් සාවුල් හලේලයනේ
දාවිත්ට අනින්නට උත්සාහ කළෙේ ය. එහතේ, දාවිත්
සාවුල් ඉදිරියනේ අහකට පැන්නේ ය; හලේලය
බිත්තියට වැදුණාේ ය. දාවිත් පලා ගොස් පණ
බේරාගත්තේ ය.
11 ගීතා 59 එදා රෑ සාවුල්, දාවිත්ගෙ නිවසෙ මුර
තියා පසු දින උදෙ ඔහු මරන පිණිස සේවකයන්
සමහර දනෙකෙු යැවී ය. මීකල් ඒ ගැන දාවිත්ට
දන්වමින්, “අද රාත්‍රියෙ ඔබෙ පණ බේරා
නොගත්තහොත්, හටෙ ඔබ මරනු ලබනු ඇතැ”යි
ඔහුට කීවා ය. 12 මීකල් ද දාවිත් කවුළුවනේ පහළට
බැස්සුවා ය. එවිට ඔහු ද පලා ගොස් ගැළවුණාේ ය.
13 මීකල් තරෙපීම් රූපය රැගනෙ ඇඳෙ තබා, ඒකෙ
හිසට එළු ලොම් කොට්ටයක් තබා, එය රදෙිවලින්
වැසුවා ය. 14 දාවිත් අල්ලාගනෙ යන්නට සාවුල් එවූ
සේවකයන් පැමිණි කල, “ඔහු ලඩේන් ය”යි ඈ කීවා
ය. 15 ඔවුන්ගෙ ඇසින් දාවිත් බලන පිණිස සාවුල්
නැවතත් සේවකයන් යවා, ඔහු මරා දැමීම පිණිස,
“ඇඳ පිටින් ඔහු මා වතෙ ගනෙනේනැ”යි කීවේ ය.
16 ඒ සේවකයෝ ගෙ ඇතුළට ගිය කල, හිසට තබා
තිබුණ එළු ලොම් කොට්ටය සමඟ තරෙපීම් රූපය
ඇඳෙ තිබනෙ බව දුටුහ. 17 සාවුල් මීකල්ට කතා
කොට, “ඔබ මසෙේ මා රවටා, මාගෙ සතුරාට
ගැළවී යන්නට ඉඩ හැරියෙ මන්දැ”යි ඇසී ය. මීකල්
උත්තර දමේින්, “ ‘ඔබ මට බේරී යන්නට උදව්
නොකළහොත් මම ඔබ මරන්නමේ’යි ඔහු මට කී
නිසා ය”යි කීවා ය.
18 දාවිත් ගැළවී පලා ගොස් රාමාහි සිටි සාමුවලේ
වතෙ පැමිණ, සාවුල් තමාට කළ සියල්ල දැන්නුවේ
ය. එවිට දාවිත් සහ සාමුවලේ නායොත්ට ගොස්
එහි විසූ හ. 19 “දාවිත් රාමායෙ නායොත්හි
සිටින්නේ ය”යි සාවුල්ට දන්වන ලද්දේ ය. 20 දාවිත්
අල්ලාගනෙ එන පිණිස සාවුල් මිනිසුන් යැවී ය. ඔවුන්
එහි පැමිණි කල්හි, දිවැස් වැකි පවසමින් සිටි
දිවැසිවරුන් මණ්ඩලය ද සාමුවලේ ඔවුන්ගෙ මූලිකයා
ව ද සිටින බව දුටු විට, දවේයන් වහන්සේගෙ
ආත්මානුභාවය සාවුල් එවූ මිනිසුන් කරෙහෙි
පැමුණුණාේ ය. ඔව්හු ද දිවැස් වැකි පැවසුවෝ ය.
21 ඒ බව සාවුල්ට දැන්වූ කල, ඔහු වනෙ
සේවකයන් යැවී ය. ඔව්හු ද දිවැස් වැකි පැවසූ හ.
සාවුල් නැවතත් තුන් වන වර සේවකයන් යැවී ය;
ඔව්හු ද දිවැස් වැකි පැවසූ හ. 22 එවිට සාවුල් ද
රාමාට ගොස් සේකුහි තිබනෙ මහ ළිඳ ළඟට
පැමිණ, “සාමුවලේ සහ දාවිත් මතෙැන සිටිත් දැ”යි
ඇසී ය. “අන්න, ඔව්හු රාමායෙ නායොත්හි සිටිති”යි
කනෙකේ ඔහුට කීවේ ය. 23 සාවුල් රාමායෙ
නායොත්ට ගියේ ය. ඔහු මසෙේ යන අතර දවේයන්
වහන්සේගෙ ආත්මානුභාවය ඔහු කරෙහෙි ද පහළ
විය. ඔහු රාමායෙ නායොත්ට පැමිණනෙ තුරු දිවැස්
වැකි පවස පවසා ගියේ ය. 24 1 සාමු 10:11-12ඔහු
තමාගෙ ඇඳුම් ගලවා දමා, සාමුවලේ ඉදිරියහෙි
දිවැස් වැකි පවසා, ඒ මුළු දවාලේත්, ඒ මුළු
රාත්‍රියේත් නග්න ව වැටී සිටියේ ය. “සාවුලුත්
දිවැසිවරයන් අතරෙ දැ”යි යන කීම ඇති වූයේ
මසෙේ ය.

## ජොනතන් දාවිත් ආරක්ෂා කිරීම

20 දාවිත් රාමායේ වූ නායොත්හි සිට පලා
ගොස් ජොනතන් ළඟට පැමිණ, “ඔබේ
පියාණන් මා මරන්නට සොයන්නේ මා කුමක් කළ
නිසා ද? මාගේ අපරාධය කිමෙක් ද? ඔහුට විරුද්ධ ව
මා කළ පාපය කුමක් දැ”යි ඇසුවේ ය.
2 ජොනතන් පිළිතුරු දෙමින්, “එවැන්නක් සිද්ධ
නොවේ වා! ඔබ නොනසින්නහි ය. මාගේ පියා
මට නොදන්වා ලොකු හෝ කුඩා හෝ කිසි දෙයක්
නොකරන්නේ ය. එබැවින් මාගේ පියා මේ කාරණය
මාගෙන් සඟවන්න වුවමනාවක් තිබේ ද? ‘මාගේ
පියා ඔබ මරන්නට ඉන්නේ ය’ යන කීමේ සත්‍යයක්
නැතැ”යි කීවේ ය.
3 දාවිත් පිළිතුරු දෙමින්, “ඔබ මට ප්‍රේම කරන
බව පියා හොඳාකාරයෙන් දන්නේ ය. ඒ නිසා ඔබේ
සිත නොරිදවන පිණිස ඔහු මට කරන්න යන දෙය
ඔබෙන් සඟවා ඇත. සැබැවින් ම මාත්, මරණයත්
අතරේ ඇත්තේ එක මොහොතක් පමණ යයි
සමිඳාණන් වහන්සේගේ නාමයෙන් ද ඔබේ
නාමයෙන් ද ඔබට දිවුරා කියමි”යි කීවේ ය.
4 ජොනතන් ද, “ඔබ කැමැති කොයි දෙයක් වුවත්
ඔබ උදෙසා කරන්නෙමි”යි කී ය.
5 ගණන් 28:11 දාවිත් ජොනතන් අමතා මෙසේ
කීවේ ය: “හෙට අමාවක බැවින් මා නොවරදවා ම
රජ්ජුරුවන් සමඟ කෑම වැළඳිය යුතු ව තිබේ.
එහෙත්, තුන් වන දා සවස වන තුරු කෙතේ සැඟවී
සිටින්නට මට යන්නට ඉඩ දෙන්න. 6 ඉදින් මා
කොහේ ද කියා ඔබේ පියා ඇසුවොත්, ‘ඔහු
තමාගේ නුවර වන බෙත්ලෙහෙමේ සිටින මුළු පවුල
උදෙසා අවුරුදු පතා පූජා ඔප්පු කරන බැවින්, එහි
ගොස් එන්නට උදක්ම මාගෙන් අවසර ඉල්ලා
සිටියේ ය’යි කියන්න. 7 ඉතින් ඔහු, ‘හොඳයි’
කීවොත්, ඔබේ මෙහෙකරු වන මට අනතුරක්
නොවන බව එයින් පෙනෙනු ඇත. එහෙත්, ඔහු
කිපුණොත්, ඔහු මට නපුරක් කරන්නට අදහස්
කරගෙන සිටින බව එයින් පෙනෙනු ඇත. 8 ඒ නිසා
කරුණා කොට ඔබේ මෙහෙකරුවා වන මට මේ
උපකාරය කර මා සමඟ ඔබේ සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි ඔබ කළ ගිවිසුම පවත්වන්න. එහෙත්, මා
අතේ වරදක් ඇත්නම්, ඔබ ම මා මරන්න. ඔබේ
පියා වෙත මා ගෙනයන්නේ කුමට ද?”
9 ජොනතන් ඊට පිළිතුරු දෙමින්, “ඔබට එසේ
නොවේ වා! ඔබට නපුරක් කරන්නට මාගේ පියා
අදහස් කර සිටින බව මා ඇත්තට ම දන්නවා නම්,
මා එය ඔබට දන්වන්නේ නැද්දැ”යි කී ය.
10 එවිට, දාවිත්, “ඔබේ පියාණන් ඔබට උදහසින්
උත්තර දුන්නොත් ඒ බව මට දන්වන්නේ කවරෙක්
දැ”යි ජොනතන්ගෙන් ඇසී ය.
11 ජොනතන් ද, “එන්න අපි කෙතට යමු”යි දාවිත්ට
කී ය. ඔවුන් දෙදෙන ම කෙතට ගියහ. 12 ජොනතන්
දාවිත් අමතා මෙසේ කීවේ ය: “ඉශ්‍රායෙල්වරුන්ගේ
දෙවි සමිඳාණන් වහන්සේ අපේ සාක්ෂිකාරයාණෝ
වන සේක් වා! හෙට හෝ අනිද්දා හෝ මේ
වේලාවට පමණ මාගේ පියාගේ අදහස මා සොයා
දැනගත් පසු, දාවිත්ට හොඳක් වන්නට තිබේ නම්,
ඒ බව දන්වන පිණිස මම ඔබ වෙත පණිවුඩයක්
එවන්නෙමි. 13 මාගේ පියා ඔබට නපුරක් කරන්නට
අදහස් කර ඇත්නම්, ඔබ සාමදානයෙන් යන පිණිස
මා ඒ බව ඔබට දන්වා ඔබ පිටත් කර
නොහැරියොත්, සමිඳාණන් වහන්සේ ඉතා දරුණු
ලෙස මට දඬුවම් කරන සේක් වා! සමිඳාණන්
වහන්සේ මාගේ පියා සමඟ වැඩ සිටියාක් මෙන්
ඔබ සමඟත් වැඩ සිටින සේක. 14 මා ජීවත් ව
සිටිනවා නම්, මා නොනසින පිණිස සමිඳාණන්
වහන්සේගේ දයා ප්‍රේමය මට දක්වන්න. 15 2 සාමු
9:1මා මැරුණොත්, මාගේ පවුලේ ඥාතීන් කෙරෙහි
ඔබේ කරුණාව කවදාවත් පහ නොකරන්න. එසේ
ය, සමිඳාණන් වහන්සේ දාවිත්ගේ සතුරන්
එකිනෙකා මිහි පිටින් සිඳ දැමූ පසුත්, 16 ඔබත් මාත්
අතර කළ ගිවිසුම නොකැඩී පවතී වා. එය කඩ
කරනු ලැබුවොත්, සමිඳාණන් වහන්සේ ඔබට
දඬුවම් කරන සේක.”
17 මෙසේ කී පසු දාවිත් තමාට ප්‍රේම කරන
බවට ජොනතන් යළිත් ඔහුගෙන් දිවුරුම් ගත්තේ ය.
එසේ කළේ, ජොනතන් සිය පණට මෙන් දාවිත්ට
ප්‍රේම කළ නිසා ය. 18 ඉන්පසු ජොනතන් දාවිත්ට
මෙසේ කීවේ ය: “හෙට අමාවක් දවස ය; ඔබේ
ආසනය හිස් ව තිබුණොත්, ඔබ එහි නැති බව
පෙනෙන්නේ ය. 19 අනිද්දා ඔබේ නොපැමිණීම වඩා
හොඳට කැපී පෙනෙනු ඇත. ඒ නිසා ඔබ කලින්
සැඟවී සිටි ස්ථානයට ගොස් එහි ඇති ගල් ගොඩ
පිටුපස්සේ සැඟවී සිටින්න. 20 එවිට මම
ඉලක්කයකට විදින්නාක් මෙන් එහි පැත්තකට ඊගස්
තුනක් විදින්නෙමි. 21 ඉන්පසු ඊගස් සොයාගෙන එන
පිණිස මාගේ සේවකයා යවන්නෙමි. මා සේවකයා
අමතා ‘බලන්න, ඊගස් ඇත්තේ ඔබට මේ පැත්තෙනේ
ය; ඒවා ගන්නැ’යි කීවොත්, එයින් අදහස් කරන්නේ
ඔබට අනතුරක් නැති බව ය. එබැවින් ඔබට පිට වී
ආ හැකි ය. ඔබ කිසි අනතුරකට නොවැටෙන බවට
සමිඳාණන් වහන්සේගේ නාමයෙන් මම දිවුරා කියමි.
22 එහෙත්, සේවකයා අමතා, ‘ඊගස් ඇත්තේ ඔබට
එහා පැත්තෙනේ ය’යි කීවොත් පලා යන්න. මන්ද,
සමිඳාණන් වහන්සේ ඔබ පිටත් කර යවන සේක.
23 ඔබත් මාත් අතර කළ ගිවිසුම පිළිබඳ ව නම් එය
සදහට ම පවතින බවට සමිඳාණන් වහන්සේ වග
බලාගන්න සේක.”
24 ඔවුන් කතා කරගත් ලෙස දාවිත් කෙතෙහි
සැඟවුණේ ය. අමාවක දවස පැමිණි විට රජතුමා
කෑම කන්නට හිඳගත්තේ ය. 25 වෙනෙ දා මෙන් ඔහු
බිත්තිය ළඟ තමාගේ ආසනයෙහි හිඳගත්තේ ය.
ජොනතන් රජු ඉදිරියෙන් ද අබ්නේර් රජුගේ
පැත්තකින් ද හිඳගත්හ. දාවිත්ගේ අසුන හිස් ව
තිබිණි. 26 එහෙත්, සාවුල් ඒ දවසේ දී කිසිවක්
කීවේ නැත. මන්ද, ‘යම් දෙයක් සිදු වීම
හේතුකොටගෙන ඔහු කිසි සේ පවිත්‍ර නැතැ’යි
කල්පනා කළ බැවිනි. 27 අමාවකට පසු දිනත්, දෙ

වන දිනත් දාවිත්ගේ අසුන හිස් ව තිබිණි. සාවුල්
තම පුත් ජොනතන්ට කතා කොට, “ජෙසේසේගේ
පුත්‍රයා ඊයේත් අදත් කෑමට නාවේ මන්දැ”යි
ඇසුවේ ය.
28 ජොනතන් පිළිතුරු දෙමින් මෙසේ කීවේ ය:
“දාවිත් බෙත්ලෙහෙමෙට යන පිණිස බැගෑපත් ව
මාගෙන් අවසර ඉල්ලමින්, 29 ‘මට යන්න අවසර දුන
මැනව; මන්ද, ඒ නුවර අපේ පවුලේ පූජාවක්
ඇත්තේ ය; මාගේ සහෝදරයා ද එහි එන්න මට
අණ කළේ ය; එබැවින් ඔබේ ඇස් හමුවෙහි මට
කරුණාව ලැබී ඇත්නම්, මාගේ සහෝදරයන් දකින
පිණිස මට අවසර ලැබේවා’යි අයැද සිටියේ ය. ඔහු
රජ්ජුරුවන්ගේ මේසයට නාවේ ඒ නිසා ය.”
30 එවිට සාවුල්ගේ කෝපය ජොනතන්ට විරුද්ධ ව
ඇවිළ, “හිතුවක්කාර, අනාචාර ස්ත්‍රියකගේ පුත්‍රය,
ඔබ ඔබට ලජ්ජාවත්, ඔබේ මෑණියන්ට ලජ්ජාව හා
අගෞරවයත් පැමිණෙන ලෙස ජෙසේසේගේ පුත්‍රයා
කෙරෙහි ඇලුම් ව සිටින බව මා දන්නේ නැද් ද?
31 ජෙසේසේගේ පුත්‍රයා මිහි පිට ජීවත් ව සිටින තුරු
ඔබ වත්, ඔබේ රජකම වත් ආරක්ෂා සහිත නැත.
එබැවින් දැන් මිනිසුන් යවා ඔහු මා වෙත
ගෙන්වන්න; සැබැවින් ඔහු මරනු ලබන්නේ ය”යි
කීවේ ය.
32 ජොනතන් තම පිය සාවුල්ට උත්තර දෙමින්,
“ඔහු මැරිය යුත්තේ මන් ද? ඔහු කළ වරද කුමක්
දැ”යි ඇසී ය.
33 එවිට සාවුල් ඔහුට අනින පිණිස ඔහු දෙසට
හෙල්ලය වීසි කළේ ය. තම පියා දාවිත් මරන්නට
නියම කරගෙන සිටින බව එයින් ජොනතන්
තේරුම්ගත්තේ ය. 34 ජොනතන් කෝපයෙන්
දිළිහෙමින් මේසයෙන් නැඟිට ගොස් අමාවක දෙ
වන දින වන එදා කෑම නොකා සිටියේ ය. තමාගේ
පියා දාවිත්ට අගෞරව කළ බැවින් ඔහු දාවිත් ගැන
ශෝක වුණේ ය. 35 පසු දින උදෑසන ජොනතන්
දාවිත් සමඟ නියම කරගත් වේලාවේ දී කුඩා
ළමයකු සමඟ කෙතට ගියේ ය. 36 ඔහු ළමයාට
කතා කොට, “ඔබ දුව ගොස් මා විදින ඊගස්
සොයාගෙන එන්නැ”යි කියා ළමයා දුවද්දී ඔහුට
එහායින් ඊගසක් විද්දේ ය. 37 ජොනතන් ඊගස විද්ද
තැනට ළමයා පැමුණුණ කල ජොනතන් ළමයාට
මොරගසා, “ඊගස ඔබට එහායින් තිබෙනවා නොවේ
දැ”යි කීවේ ය. 38 යළිත් ජොනතන් ළමයාට
මොරගසා, “කඩිසර වී ඉක්මන් වන්න; ප්‍රමාද
වන්නට එපා”යි කී ය. ළමයා ද ඊගස අහුලාගෙන
තමාගේ ස්වාමියා ළඟට ආවේ ය. 39 ඒ සිද්ධියේ
තේරුම කුමක් දැ යි ළමයා දැන නොගත්තේ ය.
ජොනතන් හා දාවිත් පමණක් එය දැනගෙන සිටියහ.
40 ජොනතන් තමාගේ ආයුධ ළමයාට දී, “ඒවා
නුවරට ගෙන යන්නැ”යි ඔහුට කීවේ ය.
41 ළමයා ගිය පසු දාවිත් ගල් ගොඩ පිටුපසින්
නික්ම අවුත් මුණින්තළා වී තුන්වරක් වැන්දේ ය.
දාවිත් සහ ජොනතන් එකිනෙකා සිඹගෙන කඳුළු
වගුරුවා ඇඬූ හ. දාවිත්ගේ ශෝකය ජොනතන්ගේ
ශෝකයට වඩා අධික විය. 42 ජොනතන් දාවිත්ට
කතා කොට, “ඔබ ද මා ද ඔබේ පරම්පරාව ද
මාගේ පරම්පරාව ද අප දෙදෙනා අතරේ කරගත්
ගිවිසුම සදහට ම පවතින ලෙස සමිඳාණන්
වහන්සේ සහතික කරන සේකැ”යි කී ය. එවිට
දාවිත් නැඟිට පිටත් ව ගියේ ය. ජොනතන් ආපසු
නුවරට ගියේ ය.

### දාවිත් සාවුල් වෙතින් පලා යෑම

21 මතෙ 12:3-4; මාක් 2:25-26; ලූක් 6:3 දාවිත්
නොබ්හි අහිමෙලෙක් නම් පූජකයා වෙත
පැමිණියේ ය. අහිමෙලෙක් දාවිත් සමුවන්නට
වෙවුලමින් අවුත්, “කිසිවකු ඔබ සමඟ නැතිව ඔබ
මෙහි තනියම ආවේ මන්දැ”යි ඔහුගෙන් ඇසුවේ ය.
2 දාවිත් පිළිතුරු දෙමින්, “රජ්ජුරුවන්ගේ
කටයුත්තක් සඳහා මම මෙහි ආවෙමි. එතුමා මා
එවුවේ මන්දැ යි කිසිවකු දැන නොගන්න ලෙස
වගබලා ගන්නැ යි මට අණ කළේ ය. මිනිසුන්
සම්බන්ධයෙන් නම්, මා නියම කළ ස්ථානයක මා
හමු වන්නැ යි මම ඔවුන්ට කීවෙමි. 3 දැන් ඔබ ළඟ
තිබෙන්නේ මොනවා ද? මට රොටි පහක් හෝ
වෙනෙ තිබෙන දෙයක් හෝ දුන මැනවැ”යි
අහිමෙලෙක් නම් පූජකයාට කීවේ ය.
4 පූජක තෙමේ දාවිත්ට පිළිතුරු දෙමින්, “ශුද්ධ රොටි
මිස වෙනෙ රොටි මා ළඟ නැත: සේවකයෝ ස්ත්‍රී
සේවනයෙන් වැළකී සිටියෝ නම්, ඒවා දෙන්නට
පුළුවනැ”යි කීවේ ය.
5 දාවිත් ඔහුට පිළිතුරු දෙමින්, “සැබැවින් ම අපි
යම් ව්‍යාපාරයකට එළඹෙන විට ස්ත්‍රීහු අපෙන්
වෙන් ව සිටිති. සාමාන්‍ය ව්‍යාපාරයක වුව ද
සේවකයන්ගේ ශරීරය ශුද්ධ ව තිබෙන්නේ ය.
එසේ නම්, ඊට වඩා කොපමණ වැඩියෙන් අද
ඔවුන්ගේ ශරීරය ශුද්ධ නොවන්නේ දැ”යි ඔහුට
කීවේ ය.
6 ලෙවී 24:5-9 එවිට සමිඳාණන් වහන්සේ
ඉදිරියෙන් අහකට ගන්න ලද පිදුම් රොටි මිස වෙනෙ
රොටි එහි නොතිබුණ බැවින් පූජකයා ශුද්ධ රොටි
ඔහුට දුන්නේ ය. ඒවා අහකට ගන්න ලද්දේ, එම
දවසේ දී ම ඒවා වෙනුවට උණු රොටි තබන පිණිස
ය.
7 තවද, ඒ දවසේ දී සාවුල්ගේ වැඩකාරයන්ගෙන්
එක් කෙනෙකු වූ ඔහුගේ එඬේරුන්ගේ ප්‍රධානියා
වන දොවෙගේ නම් ඒදොම් වැසියකු වන මිනිසෙක්
ආගමික යුතුකමක් ඉටු කරන පිණිස එහි නැවතී
සිටියේ ය.
8 දාවිත් අහිමෙලෙක්ට කතා කොට, “මට දෙන්නට
ඔබ ළඟ හෙල්ලයක් හෝ කඩුවක් හෝ තිබේ ද?
රජ්ජුරුවන්ගේ අණ පරිදි නොපමා ව පිටත්වන්නට
සිදු වුණ බැවින් කඩුවක් වත්, ආයුධයක් වත් මම
නොගෙනාවෙමි”යි කීවේ ය.
9 1 සාමු 17:51 පූජක තෙමේ පිළිතුරු දෙමින්, “ඔබ
ඒලා මිටියාවතේ දී මැරූ පිලිස්තියයා වූ
ගොලියත්ගේ කඩුව මා ළඟ ඇත. එය රෙද්දකින්
ඔතා ඒපොද් සැට්ටයට එහායින් තබා තිබේ. ඒක

ගන්නට කැමැති නම් අරගන්න. ඒක මිස අන්
කඩුවක් නැතැ"යි කීවේ ය. දාවිත් පිළිතුරු දමේන්,
"ඊට සමාන අන් කඩුවක් නැත, ඒක මට දනේනැ"යි
කීවේ ය.
10 දාවිත් පිටත් වී සාවුල්ට බියනේ ඒ දවසේ පලා
ගොස් ගාත්හි රජ වූ ආකීෂ් වතෙ පැමිණියේ ය.
11 1 සාමු 18:7; 29:5ආකීෂ්ගේ සේවකයෝ රජු
අමතා, "මොහු සිය දේශයහෙි රජ වූ දාවිත් නොවේ
ද?
අ2¹¹ 'මැරී සාවුල්, දහස් ගණනක් මැරී දාවිත් දස
දහස් ගණනක් යැ'යි
11 කියමින් ස්ත්‍රීන් නටමින් එකිනකොට ගී කීවේ
මොහු ගැන නොවේ දැ"යි කීවෝ ය. 12 ගීතා
56දාවිත් ඒ වචන සිතට ගනෙ ගාත්හි රජ වූ ආකීෂ්ට
බොහෝ සේ බිය විය. 13 ගීතා 34ඒ නිසා ඔහු
ඔවුන් ඉදිරියහෙි ඔල්මාද වූවකෙු මනේ හැසිරිණි;
ඔවුන් ඔහු දමනය කරන්නට උත්සාහ කරන විට
ඔහු පිස්සකෙු මනේ ක්‍රියා කළේ ය; වාසල් දොර
පහුරු ගෑවේ ය; තමාගේ කළෙ රුවුල දිගේ
වැගිරනේන හැරියේ ය. 14 එවිට ආකීෂ් තමාගේ
සේවකයන්ට කතා කොට, "මේ මිනිසා පිස්සකෙු
බව ඔබට පනෙනේනේ නැද් ද? ඔබ ඔහු මා ළඟට
ගනොවේ කුමට ද? 15 මා ඉදිරියහෙි පිස්සු විකාර
කරන්නට මොහු ගනොවේ පිස්සන් මට හිඟ නිසා
ද? මොහු මාගේ ගටෙ එන්නට යුතු දැ"යි කීවේ ය.

22 ගීතා 57; 142 දාවිත් ගාත් රටින් ගැළවී
ගොස්, අදුල්ලාම්හි ගුහාවට පැමිණියේ ය.
ඔහුගේ සහෝදරයෝ ද ඔහුගේ පියාගේ පවුලේ
සියල්ලෝ ද ඒ අසා එහි ඔහු වතෙ ගියෝ ය.
2 විපතට පත් වූ සියල්ලෝ ද ණයතුරුස් ඇති
සියල්ලෝ ද අසහනයට පත් වූ සියල්ලෝ ද ඔහු
වතෙ රුස් වූ හ. දාවිත් ඔවුන්ගේ අධිපතියා විය.
මසෙේ ඔහු සමඟ හාරසියයක් පමණ මනුෂ්‍යයෝ
සිටියහ.
3 දාවිත් එතැනින් මෝවබ්හි මිශ්පාට ගොස්,
මෝවබ් රජුට කතා කොට, "දවේයන් වහන්සේ මට
කරන්නට යන්නේ කුමක් දැ යි මා දැනගන්න තුරු
මාගේ මවුපියන්ට ඔබ වතෙ අවුත් සිටින්නට අවසර
ලැබේ වා"යි කී ය. 4 ඔහු මෝවබ් රජු වතෙ ඔවුන්
කැඳවාගනෙ ගියේ ය. දාවිත් ගුහාවහෙි සැඟවී සිටි
මුළු කාලය තුළ ඔව්හු රජු සමඟ වාසය කළහ.

### දොවගේ පූජකයන් මරා දැමීම

5 ගාද් නම් දිවැසිවරයා දාවිත් වතෙ පැමිණ ඔහු
අමතා, "ගුහාවහෙි නොසිට ජුදා රටට පිටත් ව
එන්නැ"යි කීවේ ය. එවිට දාවිත් පිටත් ව හරෙතේ
වනයට පැමිණියේ ය.
6 දාවිත් සහ ඔහු සමඟ වූ මිනිසුන් සිටින ස්ථානය
එළිදරව් වූ බව සාවුල්ට සැළ විය. සාවුල් ඒ
වේලාවේ තමාගේ හලේලය අතේ ඇති ව
ගිබියාවේ රාමාහි තිබුණු එශලේ ගස යට ඉඳගනෙ
සිටියේ ය. ඔහුගේ සියලු සේවකයෝ ඔහු පිරිවරා
සිටියහ. 7 සාවුල් තමා ළඟ සිටි සේවකයන්ට කතා
කොට, "බනේජමින්වරුනි, සවන් දනේන; දාවිත් නම්
ජසේසේගේ පුත්‍රයා ඔබ හැමට කතේ ද මිදි වතු ද
දනෙු ඇතැ යි ඔබ සිතන්නහු ද? ඔහු ඔබ සියල්ලන්
සහශ්‍රාධිපතීන් ද ශතාධිපතීන් ද කරනු ඇතැ යි ඔබ
සිතන්නහු ද? 8 එසේ නොවේ නම්, ඔබ සියල්ලන්
මට විරුද්ධ ව කුමන්ත්‍රණය කරගනෙ සිටින්නේ මන්
ද? මාගේ පුත්‍රයා, දාවිත් සමඟ ගිවිසුමක් කර ගත්
බව ඔබ අතරනේ කිසිවකෙු මට කීවේ නැත.
කිසිවකෙු මා ගැන සලකන්නේත් නැත. මාගේ ම
සේවකයකෙු වන දාවිත් දැන් මා මරන්නට
අවස්ථාවක් සොයමින් සිටින බවත්, මාගේ පුත්‍රයා
ඔහුට අනුබල දනෙ බවත් කිසිවකෙු මට කියා
නැතැ"යි කීවේ ය.
9 ගීතා 52 ඒ අවස්ථාවේ දී සාවුල්ගේ
මහෙකෙරුවන්ගේ ප්‍රධානියා ව සිටි ඒදොම්හි
දොවගේ පිළිතුරු දමේන්, "දාවිත් නොබ්හි සිටින
අහිතුබ්ගේ පුත් වූ අහිමලෙකේ වතෙ පැමිණනෙු මම
දිටිමි. 10 දාවිත් කළ යුත්තේ කුමක් දැ යි
අහිමලෙකේ සමිඳාණන් වහන්සේගනේ විමසා ඔහුට
ආහාර දී, පිලිස්තිවරයා වූ ගොලියත්ගේ කඩුවත්
ඔහුට දුන්නේ ය"යි කීවේ ය.
11 එවිට රජ තමෙේ අහිතුබ්ගේ පුත්‍ර වූ
අහිමලෙකේ නම් පූජකයාට ද නොබ්හි සිටි ඔහුගේ
ඥාති පූජකයන් සියල්ලන්ට ද අඬගස්වා පණිවුඩයක්
යැව්වේ ය. ඔව්හු සියල්ලෝ රජු වතෙ පැමිණියහ.
12 එවිට සාවුල්, "අහිතුබ්ගේ පුත්‍රය, අසන්නැ"යි කී
ය. ඔහු, "මාගේ ස්වාමිනි මම මහෙි ය"යි පිළිතුරු
දුන්නේ ය.
13 සාවුල් ඔහු අමතා, "ඔබ ද ජසේසේගේ පුත්‍රයා
වන දාවිත් ද මට විරුද්ධ ව කුමන්ත්‍රණය කළේ
මක්නිසා ද? ඔබ ඔහුට ආහාර ද කඩුවක් ද දුන්නහෙි
ය. ඔහු උදසො දවේයන් වහන්සේගනේ විමසුවේ
මන් ද? දැන් ඔහු මට විරුද්ධ ව හැරී අවස්ථාවක්
එන තුරු බලා සිටින්නේ ය"යි කීවේ ය.
14 එවිට අහිමලෙකේ පිළිතුරු දමේන්,
"රජ්ජුරුවන්ගේ බෑණා වන ඔබේ මන්ත්‍රණ සභාවට
ඇතුළත් වන රාජ සභාවේ සියල්ලන් විසින් ගරු
කොට සලකනු ලබන දාවිත් මනේ ඔබේ
මහෙකෙරුවන් අතරනේ විශ්වාස ව සිටින්නේ
කවරකේ ද? 15 මා ඔහු උදසො දවේයන්
වහන්සේගනේ විමසන්න පටන්ගත්තේ මේ දවසේ
පමණක් ද? කොහෙතේ ම නැත. රජ්ජුරුවෝ තමාගේ
මහෙකෙරු වූ මා කරෙහෙි වත්, මාගේ ඥාතීන්
කිසිවකෙු කරෙහෙි වත් වරද නොතබත් වා. මන්ද,
ඔබේ මහෙකෙරුවා මේ කැරලි ගැසීම ගැන කිසිවක්
නොදන්නේ ය"යි කීවේ ය.
16 රජතුමා කතා කරමින්, "අහිමලෙකේ, ඔබ ද
ඔබේ සියලු ඥාතීන් ද සැබැවින් ම මරණයට පත්
කළ යුතු ය"යි කීවේ ය. 17 එසේ කියා රජතුමා තමා
ළඟ සිටි මුරකාරයන්ට කතා කොට, "ඔබ ළං වී
සමිඳාණන් වහන්සේගේ පූජකයන් මරාදමන්න.
මන්ද, ඔව්හු දාවිත් සමඟ එකතු ව සිටිති. ඔහු පලා
යන බව දැනගනෙත් ඔවුන් මට එය එළිදරව් කළේ
නැතැ"යි කීවේ ය. එහතේ, රජුගේ සේවකයෝ

සමිඳාණන් වහන්සේගේ පූජකයන්ට පහර දනේනට
තමන්ගේ අත් ඔසවන්නට නොකැමති වූ හ.
18 එබැවින් රජ, “ඔබ ළං වී පූජකයන්ට පහර
දනේනැ”යි දොවෙගේට කීවේ ය. ඒදොමීය දොවෙගේ
ළං වී පූජකයන්ට පහර දී සිහින් හණ රෙදි ඒපොද්
සැට්ට ඇඳ සිටි අසූපස්දනෙකු ඒ දවසේ දී මැරුවේ
ය. 19 ඔහු පූජකයන්ගේ නුවර වන නොබ්ටත් එනම්,
එහි සිටි පුරුෂයන්ට හා ස්ත්‍රීන්ටත්, බාලයන්ට හා
කිරි දරුවන්ටත්, ගවයන්ටත්, කොටළුවන්ටත්,
බැටළුවන්ටත් කඩුවනේ පහර දුන්නේ ය.
20 එහතේ, අහිතුබ්ගේ පුත්‍රයා වන
අහිමලෙකේගේ පුත්‍රයන්ගනේ එක් කනෙකු වූ
අබියාතර් දාවිත් වතෙ පලා ගියේ ය. 21 සාවුල්
සමිඳාණන් වහන්සේගේ පූජකයන් මැරූ බව
අබියාතර් දාවිත්ට දැන්නුවේ ය. 22 දාවිත් ඔහු
අමතා, “ඒදොමීය දොවෙගේ එහි සිටිය බැවින් ඔහු
සාවුල්ට නිසැකින් ම දන්වන බව මම ඒ දවසේ දී
දැනගත්තමේ. ඔබේ ඥාතීන්ගේ මරණයට හේතු
වූයේ මම ය. 23 ඔබ මා ළඟ සිටින්න, බිය
නොවන්න; මා මරන්න සොයන්නා ඔබත් මරන්න
සොයන්නේ ය. එහතේ, ඔබ මා ළඟ සුරක්ෂිත ව
සිටින්නහෙි ය”යි අබියාතර්ට කීවේ ය.

## දාවිත් කයිලා නගරය ගළවාගැනීම

23 “පිලිස්තිවරු කයිලා නගරයට විරුද්ධ ව
යුද්ධ කරමින් කමත්වලින් ධාන්‍ය
කොල්ලකන්නෝ ය”යි දාවිත්ට දන්වන ලදී.
2 එබැවින්, “මා ගොස් මේ පිලිස්තිවරුන්ට පහර
දනේන දැ”යි දාවිත් සමිඳාණන් වහන්සේගනේ
විමසුවේ ය. සමිඳාණන් වහන්සේ පිළිතුරු දමේන්,
“නුඹ ගොස් පිලිස්තිවරුන්ට පහර දී කයිලා නගරය
ගළවාගන්නැ”යි දාවිත්ට වදාළ සේක.
3 එහතේ, දාවිත්ගේ සනෙඟ ඔහුට කතා කොට,
“අපි මහෙි ජුදාහි වුව ද බියනේ සිටිමු;
පිලිස්තිවරුන්ගේ හමුදාවට විරුද්ධ ව අපි කයිලා
නගරයට ගියොත් ඊට වඩා කොපමණ වැඩියනේ
බිය නොවන්නමෙු දැ”යි කී හ. 4 එවිට දාවිත්
නැවතත් සමිඳාණන් වහන්සේගනේ විමසුවේ ය.
සමිඳාණන් වහන්සේ ඔහුට පිළිතුරු දමේන්, “නැගිට
කයිලා නගරයට යන්න; මම නුඹ අතට
පිලිස්තිවරුන් පාවා දනේනමේ”යි වදාළ සේක.
5 එවිට දාවිත් ද ඔහුගේ සනෙඟ ද කයිලා
නගරයට ගොස් පිලිස්තිවරුන් සමඟ යුද්ධ කොට,
ඔවුන්ගේ සිවුපාවුන් පැහැරගනෙ, ඔවුන් අන්ත
පරාජයට පමුණුවා කයිලාහි වැසියන් ගළවාගත්තේ
ය.
6 අහිමලෙකේගේ පුත් අබියාතර් කයිලාහි දාවිත්
ළඟට පලා ආ කල ඔහු තමාගේ අතේ ඒපොද්
සැට්ටයක් ඇති ව ආයේ ය.
7 දාවිත් කයිලාට ආ බව සාවුල්ට දන්වන ලද්දේ
ය. සාවුල් කතා කරමින්, “දවේයන් වහන්සේ දාවිත්
මා අතට පාවා දී ඇත. මන්ද, ඔහු වාසල් දොරවල් ද
අගුල් ද ඇති නුවරකට ඇතුළු වීමනේ අසු වී සිටී”යි
කීවේ ය. 8 දාවිත් සහ ඔහුගේ සනෙඟ වටලනු
පිණිස සාවුල් කයිලා නගරයට යන්නට සියලු
සනෙඟ යුද්ධය සඳහා කැඳවේවේ ය.
9 තමාට අනතුරු කරන්නට සාවුල් උපා යොදන බව
දාවිත් දැන ගත් විට, “ඒපොද් සැට්ටය මහෙි
ගනෙන්නේනැ”යි ඔහු පූජක අබියාතර්ට කීවේ ය.
10 එවිට දාවිත් මසෙේ පැවසුවේ ය:
“ඉශ්‍රායලේවරුන්ගේ දවේ සමිඳාණන් වහන්ස, සාවුල්
මා නිසා කයිලා නගරය විනාශ කරන පිණිස
එන්නට සැරසනෙ බව ඔබේ මහෙකෙරු වන මට
සැබැවින් සැළ වී තිබේ. 11 කයිලාහි ජනයා සාවුල්
අතට මා පාවා දනෙවා ඇද් ද? ඔබේ මහෙකෙරු වන
මට සැළ වී තිබනෙ ලසෙ සාවුල් එනවා ඇද් ද?
ඉශ්‍රායලේවරුන්ගේ දවේ සමිඳාණන් වහන්ස, ඔබේ
මහෙකෙරුට දැන්වුව මැනව.” සමිඳාණන් වහන්සේ
පිළිතුරු දමේන්, “සාවුල් එන්නේ ය”යි වදාළ සේක.
12 එවිට දාවිත්, “කයිලාහි ජනයා මා සහ මාගේ
සනෙඟ සාවුල් අතට පාවා දනෙවා ඇද් දැ”යි ඇසී ය.
සමිඳාණන් වහන්සේ පිළිතුරු දමේන්, “එසේ ය,
ඔවුන් පාවා දනෙු ඇතැ”යි වදාළ සේක.
13 එවිට දාවිත් හයසියයක් පමණ ඔහුගේ සනෙඟ
ද රුගනෙ කයිලා නගරයනේ පිටත් වී තමන්ට යා
හැකි ඒ ඒ තැන්වලට ගියහ. දාවිත් කයිලා
නගරයනේ ගැළවී ගිය බව සාවුල්ට දන්වන ලද්දේ
ය. එවිට ඔහු තමාගේ ගමන නතර කළෙේ ය.

## දාවිත් පාළුකරයේ සැඟවී සිටීම

14 ශිප් පාළුකරය අසබඩ තිබූ කඳුකරයහෙි දාවිත්
සැඟවී සිටියේ ය. සාවුල් හැමදා ම ඔහු සවෙුවේ ය.
එහතේ, දවේයන් වහන්සේ සාවුල් අතට ඔහු පාවා
නුදුන් සේක.
15 සාවුල් තමා මරන්නට පිටත් ව ආ නිසා දාවිත්
බිය පත් ව සිටියේ ය. එකල දාවිත් ශිප් කඳු රටේ
තිබුණ හොරෙෂ්හි සිටියේ ය. 16 එවිට සාවුල්ගේ
පුත් ජොනතන් හොරෙෂ්හි සිටි දාවිත් වතෙ අවුත්
දවේයන් වහන්සේගේ ආරක්ෂාව ඔහු වතෙ ඇතැ යි
කියමින් ඔහු ධරෛයවත් කළෙේ ය. 17 ජොනතන්
ඔහුට කතා කරමින්, “බිය නොවන්න; මන්ද, මාගේ
පියා වන සාවුල්ගේ අතට ඔබ අසුවන්නේ නැත;
ඉශ්‍රායලේවරුන් කරෙහෙි රජ වන්නට ඉන්නේ ඔබ
ය; මම ද ඔබට දවෙනියා වන්නමේ; මාගේ පියා
වන සාවුල් ද ඒ බව දන්නේ ය”යි ඔහුට කීවේ ය.
18 1 සාමු 18:3ඔවුන් දදෙනො සමිඳාණන් වහන්සේ
ඉදිරියහෙි ගිවිසුමක් කරගත්හ. දාවිත් හොරෙෂ්හි
නැවතී සිටියේ ය; ජොනතන් තමාගේ ගදෙරට
ගියේ ය.
19 ගීතා 54 එවිට ශිප් වැසියෝ ගිබියාවහෙි සිටි
සාවුල් ළඟට අවුත්, “දාවිත් අපේ ප්‍රදශේයේ
පාළුකරයට දකුණනේ තිබනෙ හකීලා නම් කැළෑවේ
සැඟවී සිටී; 20 ඒ නිසා රජතුමනෙි, එනු මැනව;
ඔබේ සිතහෙි ඇති මුළු කැමැත්ත ලසෙ අව මැනව;
රජ්ජුරුවන් අතට දාවිත් අල්ලා දීම අපේ වැඩක් ය”යි
කීවෝ ය.

21 සාවුල් පිළිතුරු දෙමින් මෙසේ කීවේ ය: “ඔබ
මට අනුකම්පා කළ නිසා සමිඳාණන් වහන්සේ ඔබට
ආශීර්වාද කරන සේක් වා! 22 ඉතින් ඔබ ගොස්
තවදුරටත් සෝදිසි කර, ඔහු ගැවසෙන ඔහුගේ
ස්ථානයත්, එහි ඔහු සිටිනු දුටුවේ කවරෙක් ද
කියාත් බලා දැනගන්න. මන්ද, ඔහු උපා යෙදීමට අති
දක්ෂ බව මට දැනගන්නට ලැබී තිබේ. 23 ඒ නිසා
ඔහු සැඟවී සිටින සියලු රහස් තැන් බලා නිසැක ව
ම දැනගෙන මා ළඟට නැවත එන්න. එවිට මම ඔබ
සමඟ ගොස් ඔහු රටේ සිටිනවා නම්, ජුදාහි සිටින
සියලු ගෝත්‍රයන් එකින් එක විමසා බලා ඔහු
සොයාගන්නෙමි.”
24 ශිප් වැසියෝ පිටත් ව සාවුල්ට පළමුවෙන් සිය
නගරයට ගියහ. එහෙත්, දාවිත් සහ ඔහුගේ සෙනඟ
පාළුකරයට දකුණු දිගින් අරබා සම භූමියෙහි තිබෙන
මායොන් පාළුකරයෙහි සිටියහ. 25 සාවුල් ද ඔහුගේ
සෙනඟ ද ඔහු සොයන පිණිස ගියහ. ඒ බව දාවිත්ට
දන්වනු ලැබූ බැවින් ඔහු පර්වතයට බැස අවුත්
මායොන් පාළුකරයෙහි සිටියේ ය. සාවුල් ඒ බව අසා
දාවිත් ලුහුබැඳ මායොන් පාළුකරයට ගියේ ය.
26 සාවුල් සහ ඔහුගේ සෙනඟ කන්දේ එක
පැත්තකින් ද දාවිත් සහ ඔහුගේ සෙනඟ කන්දේ
අනික් පැත්තෙන් ද ගියහ. සාවුල් සහ ඔහුගේ
සෙනඟ, දාවිත් සහ ඔහුගේ සෙනඟ අල්ලාගන්න
පිණිස වට කළ නිසා, දාවිත් සාවුල්ට බියෙන් ගැළවී
යන්නට ඉක්මන් කෙළේ ය. 27 ඒ අතරතුරේ දී
සාවුල් වෙත පණිවුඩකාරයෙක් පැමිණ, “ඉක්මනින්
ආපසු අව මැනව; පිලිස්තිවරු අප රට ආක්‍රමණය
කරති”යි කීවේ ය. 28 එබැවින් සාවුල් දාවිත් ලුහුබැඳ
යෑම අත්හැර පෙරළා පැමිණ පිලිස්තිවරුන්ට විරුද්ධ
ව සටනට ගියේ ය. ඒ නිසා ඔව්හු ඒ ස්ථානයට
වෙන් කිරීමේ පර්වතය යන අරුත ඇති සෙලෙ-හම්මා-
ලකොත් යන නම තැබූහ. 29 දාවිත් එතැනින්
නික්ම ගොස් එන්ගෙදි බලකොටුවල සැඟවී සිටියේ
ය.

## දාවිත් සාවුල් ගැළවීම

24 සාවුල් පිලිස්තිවරුන් ලුහුබැඳ ගොස් ආපසු
හැරී ආ කල, “දාවිත් එන්ගෙදියේ පාළුකරයේ
සිටී ය”යි ඔහුට දන්වන ලද්දේ ය. 2 එවිට සාවුල්
සියලු ඉශ්‍රායෙල්වරුන්ගෙන් තෝරාගත් මිනිසුන්
තුන්දහසක් රැගෙන වල් එළුවන් ගැවසෙන
පර්වතයේ නැගෙනහිරෙන් දාවිත් සහ ඔහුගේ
සෙනඟ සොයන්නට ගියේ ය. 3 ගීතා 57; 142සාවුල්
මාර්ගයෙහි තිබුණ බැටළු ගාලකට පැමිණ
ශරීරකෘත්‍යය සඳහා එහි තිබුණු ගුහාවකට ඇතුළු
විය. දාවිත් ද ඔහුගේ සෙනඟ ද ගුහාවේ අහු මුලු
වල සිටියෝ ය. 4 දාවිත්ගේ සෙනඟ කතා කොට,
“මෙන්න, හරි අවස්ථාව පැමිණ තිබේ. සමිඳාණන්
වහන්සේ පොරොන්දු වූ ලෙස ඔබේ සතුරා ඔබේ
අතට පාවා දී ඇත. ඔබ කැමැති දෙයක් ඔහුට
කරන්නට ඔබට හැකි ය”යි කී හ. එවිට දාවිත්
නැඟිට සාවුල්ගේ සළුවේ කොන රහසින් කපා
ගත්තේ ය. 5 සාවුල්ගේ සළුවේ කොන කපාගත්
බැවින් පසුව දාවිත්ගේ සිත ඔහුට දොස් තැබුවේ ය.
6 1 සාමු 26:11ඔහු සිය සෙනඟට කතා කොට,
“සමිඳාණන් වහන්සේගේ අභිෂේක ලත් තැනැත්තා
වන මාගේ ස්වාමියාට විරුද්ධ ව අත් ඔසවා
අනතුරක් කිරීමෙන් සමිඳාණන් වහන්සේ මා
වළක්වන සේක්වා; මන්ද, ඔහු සමිඳාණන්
වහන්සේගේ අභිෂේක ලත් තැනැත්තා ය”යි කීවේ
ය. 7 මෙසේ සාවුල්ට අනතුරක් කරන ලෙස දාවිත්
තමාගේ සෙනඟට ඉඩ නැර මේ වචනවලින් ඔවුන්
වළක්වා ගත්තේ ය. සාවුල් ගුහාවෙන් පිටත් ව
ගියේ ය.
8 ඉන්පසු දාවිත් නැඟිට ගුහාවෙන් පිටතට ගොස්,
“මාගේ ස්වාමීනි, රජ්ජුරුවන් වහන්සැ”යි හඬගැසුවේ
ය. සාවුල් පස්සට හැරී බැලූ කල, දාවිත් මුණින්තළා
වී වැඳ, 9 සාවුල්ට මෙසේ කීවේ ය: “ ‘දාවිත් ඔබට
අනතුරු කරන්නට සොයන්නේ ය’යි කියන
මිනිසුන්ගේ වචනවලට ඔබ සවන් දෙන්නේ මන් ද?
10 සමිඳාණන් වහන්සේ අද ගුහාවේ දී ඔබ මා
අතට පාවා දුන් බව ඔබේ ඇස්වලින් ම මේ දවසේ
දී පෙනෙනු ඇත. සමහරු ඔබ මරන්නට කියා මට කී
හ. එහෙත්, මම ඔබට කරුණා කෙළෙමි. මන්ද,
‘මාගේ ස්වාමියා සමිඳාණන් වහන්සේගේ අභිෂේක
ලත් තැනැත්තා බැවින් ඔහුට විරුද්ධ ව මාගේ අත
ඔසවන්නේ නැතැ’යි මම කීමි. 11 තවද, මාගේ
පියාණෙනි, මේ බලන්න, ඔබේ සළුවේ කොන
මාගේ අතේ තිබෙන බව බැලුව මැනව. මා ඔබ
නොමරා, ඔබේ සළුවේ කොන කපාගත් බව බලා,
මා අත නපුරක් වත්, අපරාධයක් වත් නැති බව ද,
මා ඔබට විරුද්ධ ව පව් නොකළ බව ද දැනගත
මැනව. එසේ වුව ද මාගේ ප්‍රාණය නසන්නට ඔබ
මා ලුහුබැඳ එන්නෙහි ය. 12 සමිඳාණන් වහන්සේ
ඔබ හා මා අතරේ විනිශ්චය කොට, මට විරුද්ධ ව
ඔබ ක්‍රියා කර ඇති බැවින්, ඔබට දඬුවම් කරන
සේක්වා. මම නම් ඔබට කිසිම අනතුරක් නොකරමි.
13 පැරණි ආප්තෝපදේශයේ හැටියට දුෂ්ටයාගෙන්
දුෂ්ටකම නික්මෙයි. එහෙත්, මම ඔබට දුෂ්ටකමක්
නොකරන්නෙමි. 14 1 සාමු 26:20ඉශ්‍රායෙල්වරුන්ගේ
රජතුමා කවරෙකු ලුහුබැඳ එන්නේ ද? මළ බල්ලෙකු
පස්සේ ද? බලුමැක්කෙකු පස්සේ ද? 15 සමිඳාණන්
වහන්සේ විනිශ්චයකාරයාණන් වී මාගේ පැමිණිල්ල
අසා ඔබත් මාත් අතරේ විනිශ්චය කර, ඔබේ අතින්
මා ගළවන සේක් වා!”
16 දාවිත් මේ වචන සාවුල්ට කියා නිම කළ පසු
සාවුල් කතා කොට, “දාවිත්, මාගේ පුත්‍රය, ඔය
ඔබේ හඬ ද?” කියා ශබ්ද නඟා හැඬුවේ ය. 17 ඔහු
දාවිත්ට කතා කොට මෙසේ කීවේ ය: “ඔබ මට
වඩා දැහැමි ය. මන්ද, මා ඔබට නපුර කළ නමුත්,
ඔබ මට යහපත කෙළෙහි ය. 18 සමිඳාණන්
වහන්සේ ඔබ අතට මා පාවා දුන් විට පවා, ඔබ මා
නොමරා, මට යහපත කළ බව අද ඔබ මට පෙන්වා
දුන්නෙහි ය. 19 මිනිසෙකුට සිය සතුරා අසු වුණොත්,
ඔහුට සුව සේ යන්නට ඉඩ හරියි ද? එබැවින් ඔබ
අද දවසේ මට කළ මේ දේ නිසා සමිඳාණන්

වහන්සේ ඔබට යහපත් විපාකයක් දෙන සේක් වා!
20 සැබැවින් ම ඔබ රජ වන බවත්,
ඉශ්රායලේවරුන්ගේ රාජාධිපත්‍යය ඔබ අතේ ස්ථිර
ව පවතින බවත් මම දනිමි. 21 ඒ නිසා මට පසුව
එන මාගේ වංශය ඔබ විසින් සිඳ දමනු නොලබන
ලෙසත්, මාගේ පිය වංශයෙන් මාගේ නාමය නැති
කර නොදමනු ලබන ලෙසත් සමිඳාණන්
වහන්සේගේ නාමයෙන් දිවුරුම් දෙන්න." 22 දාවිත්
සාවුල්ට දිවුරුම් දුන්නේ ය. ඉක්බිති සාවුල් ගෙදර
ගියේ ය; දාවිත් ද ඔහුගේ සෙනඟ ද ඔවුන් සැඟවී
සිටි ස්ථානයට ගියහ.

## දාවිත් සහ නාබල්

25 සාමුවලේ මියගියේ ය; සියලු ඉශ්රායලේවරු
රැස් ව ඔහු ගැන වැළපී, රාමාහි තිබුණ
ඔහුගේ නිවාසයෙහි ඔහු තැන්පත් කළහ.
25 ඉන්පසු දාවිත් පිටත් ව මායොන් පාළුකරයට
බැස ගියේ ය. 2 සිය ධන සම්පත කර්මලේහි
ඇති මිනිසෙක් මායොන්හි සිටියේ ය. ඔහු
ධනකුවේරයෙකි; ඔහුට බැටළුවෝ තුන්දහසක් ද
එළුවෝ දහසක් ද සිටියෝ ය. ඔහු කර්මලේහි තම
බැටළුවන්ගේ ලොම් කප්පමින් සිටියේ ය. 3 ඒ
මිනිසාගේ නම නාබල් ය; ඔහුගේ බිරිඳගේ නම
අබීගායිල් ය. ඒ ස්ත්‍රිය බුද්ධිමත් රූමත් කාන්තාවක්
වූවා ය. එහෙත්, ඇගේ පුරුෂයා තිරිසන් ගති ඇති
නපුරු කෙනෙක් විය. ඔහු කාලබ්ගේ වංශයේ
කෙනෙකි. 4 නාබල් තම බැටළුවන්ගේ ලොම්
කප්පන බව කාන්තාරයේ දී දාවිත්ට සැළ විය.
5 දාවිත් තරුණයන් දසදෙනෙකු යවමින් ඔවුන්ට
මෙසේ කීවේ ය: "ඔබ කර්මලේ කන්දට ගොස්,
නාබල් වෙත පැමිණ මාගේ නාමයෙන් ඔහුට ආචාර
කරන්න. 6 ඔහුට ආචාර කරමින් 'අපි ශුභ පැතීමට
ඔබ වෙත එවනු ලැබීමු. ඔබේ පවුලට සාමදානය
වේ වා! ඔබට ඇති සියල්ලටත් සාමදානය වේ වා!
7 ඔබට බැටළු ලොම් කපන්නන් සිටින බව ඇසීමු.
ඔබේ බැටළු එඬේරු අප සමඟ සිටියහ; අප ඔවුන්ට
හිංසා කළේ වත්, ඔවුන් කර්මලේහි සිටි මුළු කාලය
තුළ දී ඔවුන්ට අයිති කිසිවක් නැති වුණේ වත් නැත.
8 ඒ ඔබේ සේවකයන්ගෙන් ඔබ විමසුවොත් ඔවුන්
ඒ බව ඔබට කියනු ඇත. ඒ නිසා අපට ඔබ
ඉදිරියෙහි කරුණාව ලැබේ වා! මන්ද, අපි මංගල
අවස්ථාවකට එළඹ සිටිමු. මෙහෙකරුවන්ටත්, ඔබේ
පුත් දාවිත්ටත් ඔබට පුළුවන් දෙයක් දෙන ලෙස
ඉල්ලමු'යි කියන්න."
9 මෙසේ කී පසු දාවිත්ගේ තරුණයෝ පිටත් ව
ගොස්, ඔහු කී පණිවුඩය ඔහුගේ නාමයෙන්
නාබල්ට සැළ කර එහි නතර වූ හ. 10 නාබල්
දාවිත්ගේ මෙහෙකරුවන්ට පිළිතුරු දෙමින්, "දාවිත්
කවරෙක් ද? ජෙස්සේගේ පුත්‍රයා කවරෙක් ද? මේ
කාලයේ තම තමන්ගේ ස්වාමිවරුන් වෙතින් පලා
යන මෙහෙකරුවෝ බොහෝ වෙති. 11 එසේ වී නම්,
මා මාගේ රොටි ද වතුර ද මාගේ බැටළු ලොම්
කපන්නන් උදෙසා මා මැරූ සතුන්ගේ මස් ද රැගෙන,
කොතැනින් ආවා ද කියා මා නොදන්න මිනිසුන්ට
දෙන්නට දැ"යි ඇසුවේ ය.
12 එවිට දාවිත්ගේ තරුණයන් හැරී ගොස් දාවිත්
වෙත පැමිණ නාබල් කී දේ ඔහුට සැළ කළහ.
13 එවිට දාවිත්, "ඔබ එකිනෙකා තම තමාගේ කඩුව
ගන්නැ"යි තමාගේ තරුණයන්ට කී ය. ඔව්හු හැම
දෙන ම තම තමන්ගේ කඩු ගත්හ. දාවිත් ද
තමාගේ කඩුව ගත්තේ ය. මිනිස්සු හාරසියයක්
පමණ දාවිත් අනුව ගියෝ ය; දෙසියයක් භාණ්ඩ ළඟ
නැවතී සිටියහ.

## අබීගායිල්ට දාවිත් මුණගැසීම

14 නාබල්ගේ මෙහෙකරුවන්ගෙන් එක් කෙනෙක්
ඔහුගේ බිරිඳ වූ අබීගායිල්ට මෙසේ කීවේ ය: "අප
ස්වාමියාට ආචාර කරන පිණිස දාවිත් කාන්තාරයේ
සිට පණිවුඩකාරයන් එව්වේ ය. එහෙත්, ඔහු
ඔවුන්ට බැණ වැදුණේ ය. 15 ඒ තරුණයෝ නම් ඉතා
හොඳින් අපට සැලකුවෝ ය. අපි කෙත්වල සිටිය දී
ඔවුන් සමඟ ගැවසුණ මුළු කාලයේ දී අපට
අනතුරක් වුණේ වත්, අපගෙන් කිසිවක් නැති වුණේ
වත් නැත. 16 අප බැටළුවන් බලාගනිමින් ඔවුන්
සමඟ සිටි මුළු කාලයේ, ඔව්හු රෑ දවල් දෙකේහි
අපට උපකාරයක් මෙන් සිටියහ. 17 ඒ නිසා දැන් ඔබ
ඒ කරුණු දැනගෙන කුමක් කටයුතු දැ යි කල්පනා
කළ මැනව. මන්ද, අපේ ස්වාමියාටත්, ඔහුගේ මුළු
පවුලටත් විරුද්ධ ව අනතුරක් කිරීමට නියම කර
ඇත. අපේ ස්වාමියා කොතරම් දුර්ජනයෙක් ද
කීවොත්, ඔහු සමඟ කිසිවෙකුට කතා කරන්නට
නොහැකි ය."
18 එවිට අබීගායිල් කඩිනමින්, රොටි දෙසියයක් ද
මිදියුස බඳුන් දෙකක් ද කෑමට පිළියෙළ කළ
බැටළුවන් පස්දෙනෙකු ද විලඳ නැළි පහක් ද වියළි
මුද්රික පල පොකුරු සියයක් ද අත්තික්කා කැටි
දෙසියයක් ද රැගෙන, ඒවා කොටළුවන් පිට
පැටවුවා ය. 19 එසේ කර ඈ වැඩකාරයන් අමතා,
"ඔබ මට පෙරටුව යන්න. මම ඔබ පස්සෙන්
එන්නෙමි"යි කීවා ය. ඒ ගැන කිසිවක් ඈ සිය
පුරුෂයාට කීවේ නැත.
20 ඈ කොටළුවා පිට නැඟී කඳු ගැටයකින් බැස
යද්දී හදිසියේ දාවිත් ද ඔහුගේ සෙනඟ ද ඈ
ඉදිරියට බැස ආවෝ ය. ඈ ද ඔවුන්ට මුණගැසුණා
ය. 21 දාවිත් මෙසේ ඉටාගෙන සිටියේ ය: "සැබැවින්
පාළුකරයේ දී මේ මිනිසාට අයිති සියල්ල මම
ආරක්ෂා කළෙමි. කිසිවක් නැති නොවන ලෙස
මොහු සන්තක සියල්ල මා ආරක්ෂා කිරීම නිෂ්ඵල
ය. එසේ වුව ද මා මොහුට කළ යහපතට ඔහු මට
අයහපතක් කර ඇත. 22 මා මොහුගේ සියලු
පිරිමින්ගෙන් එක් කෙනෙකු වත් ඉතිරි නොවන සේ
හෙට එළි වන්නට පෙර මරා නොදැම්මොත් දෙවියන්
වහන්සේ මට ඉතා දරුණු ලෙස දඬුවම් කරන සේක්
වා."

23 අබිගායිල් දාවිත් දුටු විට ඉක්මනින් කොටළුවා
පිටින් බැස දාවිත් ඉදිරියෙහි මුණින්තළා වැඳ වැටුණා
ය. 24 ඈ ඔහුගේ පාමුල වැටී මෙසේ කීවා ය:
“මාගේ ස්වාමීනි, ඒ අපරාධය මා පිට, මා පිට ම
වේ වා; ඔබට කතා කරන්නට ඔබේ මෙහෙකාරියට
අවසර ලැබේ වා. ඔබේ මෙහෙකාරියගේ වචන ඇසුව
මැනව. 25 මාගේ ස්වාමීනි, නාබල් නම් ඒ දුර්ජන
මිනිසා ගැන නොසැලකුව මැනව. ඔහුගේ නාමය
යම් සේ ද, ඔහුගේ ගතියත් එසේ ම ය; ඔහුගේ
නම නාබල් ය. එහි තේරුම අනුව ඔහු තිරිසනෙකි;
මාගේ ස්වාමීන් වන ඔබ විසින් එවන ලද තරුණයන්
ඔබේ මෙහෙකාරී වන මම නුදුටිමි. 26 දැන් මාගේ
ස්වාමීනි, ලේ වැගිරීමේ අපරාධයෙන් ද ඔබේ ම
අතින් පළිගැනීමෙන් ද සමිඳාණන් වහන්සේ ඔබ
වැළැක්වූ සේකැ යි සමිඳාණන් වහන්සේගේ
නාමයෙන් ද ඔබේ නාමයෙන් ද දිවුරා කියමි.
එබැවින් ඔබේ සතුරෝ ද මාගේ ස්වාමියා වන
ඔබට අන්තරා කරන්නට සොයන්නෝ ද නාබල් මෙන්
තිරිසන්නු වෙත් වා. 27 ඉතින් ඔබේ මෙහෙකාරී වන
මා විසින් මාගේ ස්වාමියා වන ඔබට ගෙනෙන ලද
මේ තෑග්ග මාගේ ස්වාමියා වන ඔබ පස්සේ යන
තරුණයන්ට දුන මැනව. 28 ඔබේ මෙහෙකාරියගේ
වරදට කමා වුණ මැනව. මාගේ ස්වාමියා වන ඔබ
සමිඳාණන් වහන්සේගේ යුද්ධ කරන බැවින්
සමිඳාණන් වහන්සේ මාගේ ස්වාමියා වන ඔබට
ස්ථිර වංශයක් නංගවා දෙන සේක් ම ය. ඔබ ජීවත්
ව සිටින මුළු කාලයේ දී ඔබ අත කිසි නපුරක් දකිනු
නොලබන්නේ ය. 29 ඔබ ලුහුබැඳ අවුත් ඔබේ
ප්‍රාණය හානි කරන්නට යම් මිනිසෙකු තැත්
කළොත්, කෙනෙකු ඔහුගේ වටිනා වස්තුව ආරක්ෂා
කරන සේ ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ මාගේ
ස්වාමියා වන ඔබේ ප්‍රාණය ආරක්ෂා කරන සේක.
උන් වහන්සේ ඔබේ සතුරන්, ගල් පටියකින් විදින
ගල් සේ විසි කරදමන සේක් වා! 30 සමිඳාණන්
වහන්සේ මාගේ ස්වාමියා වන ඔබ ගැන වදාළ
සියලු යහපත්කම් ඉෂ්ට කර, ඔබ ඉශ්රායෙල්වරුන්
කෙරෙහි අධිපතියා වශයෙන් පත් කළ කල්හි
31 මාගේ ස්වාමියා වන ඔබ නිකරුණේ ලේ
වැගිරවේවහෙි ය කියා වත්, තමා අතින් පළිගත්තේ
ය කියා වත් ඒ ගැන ඔබට සිත් වේදනාවක් වත්,
ශෝකයක් වත් නොවෙනු ඇත. තවද, සමිඳාණන්
වහන්සේ මාගේ ස්වාමියා වන ඔබට ආශීර්වාද කළ
කල්හි ඔබේ මෙහෙකාරී වන මා සිහි කළ මැනව.”
32 දාවිත් අබිගායිල්ට මෙසේ පිළිතුරු දුන්නේ ය:
“මා සම්බ වන පිණිස අද දවසේ ඔබ එවා වදාළ
ඉශ්රායෙල්වරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේට
ප්‍රශංසා වේ වා! 33 ඔබේ දැනුමැතිකමට ද ස්තුති
වේ වා! ලේ වගුරුවා මාගේ අතින් පළිගැනීමෙන් අද
දවසේ මා වැළකූ ඔබට ආශීර්වාද වේ වා! 34 ඔබට
හිංසා කිරීමෙන් ඉශ්රායෙල්වරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේ මා වැළකූ සේක. ඔබ කඩිනමින් මා සම්බ
වන්නට නාවා නම්, නාබල්ට අයිති එක පිරිමියෙකේ
වත් හෙට එළි වන විට ඉතුරු නොවන්නේ යයි උන්
වහන්සේගේ නාමයෙන් දිවුරා කියමි.” 35 මෙසේ
කියා දාවිත් අබිගායිල් තමාට ගෙනෝ දේවල් ඇගේ
අතින් පිළිගෙන, “ඔබේ ගෙදරට ශාන්ති සිතින්
යන්න; මම ඔබේ හඬට සවන් දී ඔබ කී දේ
පිළිගතිමි”යි කීවේ ය.
36 අබිගායිල් නාබල් වෙත පැමිණියා ය. එවිට රාජ
මංගල්‍යයක් මෙන් ඔහු තම ගෙදර මංගල්‍යයක්
පවත්වමින් සිටියේ ය. නාබල් හොඳට ම මත් වී සිටි
බැවින් ඔහු ප්‍රීති ලීලාවෙන් සිටියේ ය. එබැවින් පසු
දා එළි වන තුරු ඈ ඔහුට කිසිවක් දැන්නුවේ නැත.
37 පසු දා නාබල්ගේ වෙරි සිඳුණ කල ඈ ඔහුට
සියලු දේ සැළ කළා ය. එවිට ඔහු හදිස්සි
ආබාධයකින් දරදඬු විය. 38 ඊට දස දවසකට පමණ
පසු සමිඳාණන් වහන්සේ නාබල්ට පහර දුන් සේක;
ඔහු මළේ ය.
39 නාබල් මළ බව දාවිත් අසා, “නාබල් අතින් මට
වූ නින්දාව ගැන යුක්තිය ඉටු කළ, තමන්
වහන්සේගේ මෙහෙකරුවා නපුරෙන් වැළකූ
සමිඳාණන් වහන්සේට ප්‍රශංසා වේ වා! සමිඳාණන්
වහන්සේ නාබල්ගේ නපුරුකම් ඔහුගේ ම හිස පිටට
හැරවූ සේකැ”යි කී ය.
39 දාවිත් අබිගායිල් සරණපාවා ගන්න අදහසින් ඒ
ගැන ඈ සමඟ කතා කරගන්නට පණිවුඩකාරයන්
යැව්වේ ය. 40 දාවිත්ගේ සේවකයෝ කර්මෙලේ
කන්දෙහි අබිගායිල් වෙත පැමිණ ඈට කතා කරමින්,
“දාවිත් ඔබ සරණපාවා ගැනීමේ අදහසින් ඔබ
කැඳවාගෙන එන පිණිස ඔබ වෙත අප එව්වේ ය”යි
කී හ.
41 අබිගායිල් නැඟිට මුණින්තළා වී, “එතුමාගේ
දාසි වන මම එතුමාගේ සේවකයන්ගේ පාද
සේදීමට සූදානම් ය”යි කීවා ය. 42 එවිට අබිගායිල්
කඩිනමින් කොටළුවකු පිට නැඟී පිටත්වුණා ය.
ඇගේ තරුණියෝ පස්දෙනෙකේ ද ඈ සමඟ ගියහ.
එසේ ඈ දාවිත්ගේ පණිවුඩකාරයන් කැටුව ගොස්
ඔහුගේ භාර්යාව වූවා ය.
43 දාවිත් ජශ්රේයෙලේහි අහිනොවම් ද
සරණපාවාගෙන සිටියේ ය. ඈ ද අබිගායිල් ද යන
දෙදෙනෝ ම ඔහුට භාර්යාවෝ වූ හ. 44 2 සාමු
3:14-16සාවුල් විසින් දාවිත්ගේ බිරිඳ ව සිටි මීකල්
නම් තමාගේ දුව ගල්ලිම්හි විසූ ලායිෂ්ගේ පුත්
පල්තීට භාර්යාව කොට දෙන ලද්දී ය.

## දාවිත් යළිත් සාවුල් ගැළවීම

26 ගීතා 54 ශිප්වරු ගිබියාවේ සිටි සාවුල් වෙත
පැමිණ, “දාවිත් මරුකතර ඉදිරියේ හකීලා
හලෙේ සැඟවී සිටින්නේ ය”යි දැන්නූ හ. 2 එවිට
සාවුල් පිටත් වී, ඉශ්රායෙල් දේශයෙන් තෝරාගත්
තුන්දහසක් පිරිවරා ශිප් පාළුකරයෙහි දාවිත් සොයන
පිණිස එතැනට ගියේ ය. 3 සාවුල් පාළුකරය ඉදිරිපිට
මාර්ගය ළඟ තිබෙන හකීලා හලෙේ කූඩාරම්
ගසාගත්තේ ය. දාවිත් පාළුකරයේ සිටියේ ය. සාවුල්
තමා සොයමින් පාළුකරයට ඇවිත් සිටින බව
දාවිත්ට දැනගන්නට ලැබිණි, 4 ඔහු ඔත්තුකාරයන්
යවා සාවුල් ඇත්තට ම ඇවිත් සිටින බව

දැනගත්තේ ය. 5 එවිට දාවිත් පිටත් වී සාවුල්
කූඩාරම් ගසාගෙන සිටි ස්ථානයට අවුත්, සාවුල් ද
ඔහුගේ සේනාපතියා වූ නේර්ගේ පුත් අබ්නේර් ද
නිදා උන් ස්ථානය දුටුවේ ය. සාවුල් කඳවුර ඇතුළේ
වැදහොත්තේ ය; සේනාව ඔහු වට කර කූඩාරම්
ගසාගෙන සිටියහ.
6 එවිට දාවිත් හිත්තීය අහිමලෙක්ටත් ශෙරුයාගේ
පුත් ජෝවාබ්ගේ සහෝදර වූ අබීෂයිටත් කතා
කොට, “මා සමඟ සාවුල් ළඟට කඳවුරට යන්නේ
කවරෙක් දැ”යි ඇසී ය. “මම ඔබ සමඟ යමි”යි
අබීෂයි පිළිතුරු දුන්නේ ය.
7 මෙසේ දාවිත් ද අබීෂයි ද රාත්‍රියෙහි සාවුල්ගේ
කඳවුරට පිවිස, සාවුල් තමාගේ හෙල්ලය තම හිස
ළඟ බිම සිටුවා කඳවුර මැද නිදාගෙන සිටිනු දුටුවෝ
ය. අබ්නේර් සහ සේනාව ඔහු වටකර නිදා උන්හ.
8 එවිට අබීෂයි දාවිත්ට කතා කොට, “දෙවියන්
වහන්සේ අද ඔබේ සතුරා ඔබ අතට පාවා දුන්
සේක. එබැවින් දැන් එක පහරකින් හෙල්ලයෙන්
ඔහු බිමට ම ඇණ දමන්නට මට අවසර දුන මැනව;
ඔහුට පහර දෙකක් ගසන්නට වුවමනා නැතැ”යි
දාවිත්ට කීවේ ය.
9 දාවිත් පිළිතුරු දෙමින්, “ඔහු නොනසන්න;
සමිඳාණන් වහන්සේගේ අභිෂේක ලත් තැනැත්තාට
විරුද්ධ ව සිය අත ඔසවා නිදොස් ව සිටින්නට හැකි
කාට දැ”යි අබීෂයිට කීවේ ය. 10 තවදුරටත් ඔහු
කතා කරමින්, සමිඳාණන් වහන්සේගේ නාමයෙන්
දිවුරා මෙසේ කී ය: “ඔහු මැරෙන්නට නියම දවස
පැමිණි විට හෝ ඔහු යුද්ධයට ගොස් නසින විට
හෝ සමිඳාණන් වහන්සේ ම ඔහුට පහර දෙන
සේක; 11 1 සාමු 24:6මාගේ අත සමිඳාණන්
වහන්සේගේ අභිෂේක ලත් තැනැත්තාට විරුද්ධ ව
එසවීමෙන් උන් වහන්සේ මා වළක්වන සේක් වා!
ඔහුගේ හිස ළඟ තිබෙන හෙල්ලයත්, වතුර
භාජනයත් අරගෙන අපි යමු.” 12 මෙසේ දාවිත්
සාවුල්ගේ හිස ළඟ තිබුණ හෙල්ලයත්, වතුර
භාජනයත් ගෙන පිට වී ගියේ ය. එය කිසිවකු
දුටුවේ වත්, දැනගත්තේ වත් නැත. කිසිවකු
පිබිදුණේත් නැත; සමිඳාණන් වහන්සේ බර
නින්දකට සියලු දෙනා පත්කර තිබුණ බැවින් ඔව්හු
සියල්ලෝ ම නිදාගෙන සිටියහ.
13 එවිට දාවිත් අනික් පැත්තට ගොස් කන්ද
මුදුනේ දුරින් සිටියේ ය. දෙගොල්ල අතරේ මහා
පරතරයක් විය. 14 ඉන්පසු දාවිත් සාවුල්ගේ
සේනාවටත්, නේර්ගේ පුත් අබ්නේර්ටත් මොරගසා,
“අබ්නේර්, මට පිළිතුරු දෙන්නේ නැ”යි කී ය. අබ්නේර් ද
පිළිතුරු දෙමින්, “රජ්ජුරුවන්ට අඬගසන ඔබ කවරෙක්
දැ”යි ඇසුවේ ය.
15 දාවිත් පිළිතුරු දෙමින් මෙසේ කී ය; “ඔබ
මිනිසෙක් නොවේ ද? ඉශ්රායලේහි ඔබ හා සමාන
අන් කෙනෙක් සිටී ද? එසේ නම් ඔබේ ස්වාමියා වන
රජ්ජුරුවන් ඔබ රැක බලා නොගත්තේ මන් ද?
ඔබේ ස්වාමීන් වන රජ්ජුරුවන් නසන පිණිස
සේනාවෙන් කෙනෙක් ඇතුළු විය. 16 ඔබේ යුතුකම
ඔබ නොකෙළෙහි ය. ඔබ හැම දෙන සමිඳාණන්
වහන්සේගේ අභිෂේක ලත් තැනැත්තා වන ඔබ
හැමගේ ස්වාමියා රැක බලා නොගත් නිසා ජීවමාන
සමිඳාණන් වහන්සේගේ නාමයෙන් දිවුරා කියමි, ඔබ
හැම මරණයට සුදුස්සෝ ය. රජ්ජුරුවන්ගේ හිස ළඟ
තිබුණු හෙල්ලයත්, වතුර භාජනයත් දැන් කොහේ ද
කියා බලන්න.”
17 දාවිත්, මෙසේ කී පසු සාවුල් දාවිත්ගේ කට
හඬ හැඳිනගෙන, “මාගේ පුත, ඔය ඔබේ කට හඬ
දැ”යි ඇසී ය. දාවිත් පිළිතුරු දෙමින් මෙසේ කී ය:
“මාගේ ස්වාමීන් වන රජතුමනි, ඒ මාගේ කට හඬ
ය. 18 මාගේ ස්වාමියා තමාගේ මෙහෙකරුවා
ලුහුබැඳ එන්නේ මක්නිසා ද? මා කළේ කුමක් ද?
මා කළ අපරාධය කුමක් ද? 19 මාගේ ස්වාමීන් වන
රජතුමනි, ඔබේ මෙහෙකරුවා වන මාගේ
වචනවලට සවන් දෙන්න. ඔබ තුමා මට විරුද්ධ ව
පෙළඹවූයේ සමිඳාණන් වහන්සේ නම්, උන් වහන්සේ
පූජාවක් පිළිගන්න සේක් වා! එහෙත්, ඔබ තුමා
පෙළඹවූයේ මනුෂ්‍යයෝ නම්, ඔව්හු සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි සාපලද්දෝ වෙත් වා. මන්ද, ඒ
මිනිස්සු, ‘ඔබ ගොස් අන් දෙවිවරුන්ට නමස්කාර
කරන්න’ කියා මට දැන් සමිඳාණන් වහන්සේගේ
උරුමයට හිමිකමක් නැති වන හැටියට මා පන්නාදැමූ
හ. 20 සමිඳාණන් වහන්සේ ඉදිරියෙන් දුරු ව
විදේශිකයකු මෙන් මාගේ ලේ බිම හැළෙන්නට
ඉඩ නුදුන මැනව. කඳුවල වටුවකු පස්සේ එළවා
යන්නකු මෙන් මා වැනි බල්ලැක්කකු මැරීමට
ඉශ්රායලේහි රජතුමා පිටත් ව එන්නේ කුමට ද?”
21 එවිට සාවුල් පිළිතුරු දෙමින්, “මම පව් කළෙමි;
මාගේ පුත් දාවිත්, හැරී එන්න. අද දවසේ ඔබ
මාගේ ප්‍රාණය ගරු කොට සැලකූ නිසා ඔබට තවත්
මම හිංසා නොකරමි. මම මෝඩයකු මෙන් හැසිර,
බොහෝ සේ මුළා වීමි”යි කීවේ ය.
22 දාවිත් පිළිතුරු දෙමින් මෙසේ කී ය:
“රජ්ජුරුවන්ගේ හෙල්ලය මෙන්න. තරුණයන්-ගෙන්
එක් කෙනෙක් මෙහි ඇවිත් ඒක ගෙන ගියා වේ.
23 සමිඳාණන් වහන්සේ එක එක තැනැත්තාට තම
තමාගේ දැහැමිකම හා විශ්වාසවන්තකම ලෙස
විපාක දෙන සේක් වා! සමිඳාණන් වහන්සේ අද ඔබ
මා අතට පාවා දුන් නමුත්, මම සමිඳාණන්
වහන්සේගේ අභිෂේක ලත් තැනැත්තාට විරුද්ධ ව
අත ඔසවන්නට කැමැති නොවීමි. 24 ඉතින් අද
දවසේ ඔබේ ප්‍රාණය මා ගරු කොට සැලකුවාක්
මෙන් මාගේ ප්‍රාණය ද සමිඳාණන් වහන්සේගේ
ඇස් හමුවෙහි දී ගරු කොට සලකනු ලැබේවා. උන්
වහන්සේ සියලු විපත්තිවලින් මා ගළවන සේක් වා!”
25 එවිට සාවුල් කතා කොට, “දාවිත්, මාගේ
පුත්‍රය, ඔබට ආශීර්වාද වේ වා! ඔබ ඉමහත් දේ
කරන්නෙහි ය; ඒකාන්තයෙන් ම ජය ගන්නෙහි ය”යි
දාවිත්ට කී ය. ඉන්පසු දාවිත් යන්නට ගියේ ය;
සාවුල් ද සිය නිවසෙට හැරී ගියේ ය.

## දාවිත් පිලිස්තිවරුන් අතරේ විසීම

27 දාවිත්ගේ සිතහෙි මෙවැනි කල්පනාවක් ඇති
විය: “යම් දවසක සාවුල් අතින් මට මරණය
පැමිණෙන්නේ ය. පිලිස්තිවරුන්ගේ දේශයට ගැළවී
යාම මිස වෙන හොඳ විධියක් මට නැත. එවිට
සාවුල් මුළු ඉශ්රායලේ දේශය පුරා තවදුරටත් මා
සොයා යෑමෙන් මත්තට වළකිනු ඇත. මෙසේ
ඔහුගේ අතින් ගැළවී යෑමට මට පුළුවන් වන්නේ
ය.” 2 මෙසේ සිතූ පසු දාවිත් ද ඔහු සමඟ සිටි
මිනිස්සු හත්සියය ද පිටත් වී මායොක්ගේ පුත්
ගාත්හි රජ වූ ආකීෂ් වෙත ගියහ. 3 දාවිත් සහ
ඔහුගේ සෙනඟ ද ඔවුනොවුන්ගේ පවුල් ද දාවිත්
සමඟ ඔහුගේ භාර්යාවන් දදෙනා වන
ජශ්රෙයෙලේය අහිනොවම් සහ නාබල්ගේ භාර්යාව
ව සිටි කර්මලේය අබීගායිල් ද ආකීෂ් රජු සමඟ
ගාත්හි විසූ හ. 4 දාවිත් ගාත්ට පලා ගිය බව
සාවුල්ට දන්වන ලද්දේ ය. එබැවින් ඔහු තවත්
දාවිත් නොසෙව්වේ ය.
5 දාවිත් ආකීෂ් රජුට කතා කොට, “ඔබේ ඇස්
හමුවෙහි මට කරුණාව ලැබී තිබේ නම්, මට වාසය
කිරීමට පිටිසර නුවරක යම් ස්ථානයක් ලැබේවා.
ඔබේ මෙහෙකරුවා ඔබ සමඟ රජ නුවර වාසය
කරන්නේ කුමට දැ”යි කීවේ ය. 6 ආකීෂ් රජු ද ඒ
දවසේ දී ශික්ලග් නුවර දාවිත්ට දුන්නේ ය. ඒ නිසා
ශික්ලග් නුවර අද දක්වා ජුදාහි රජවරුන්ට අයිති ය.
7 දාවිත් පිලිස්තිවරුන්ගේ රටේ විසූ මුළු කාලය එක්
අවුරුදු හාර මාසයකි.
8 දාවිත් ද ඔහුගේ සෙනඟ ද පිටත් ව
ගෂූර්වරුන්ට ද ගිර්ශිවරුන්ට ද අමලකේවරුන්ට ද
විරුද්ධ ආක්රමණයේ දී කොල්ලකෑමට ගියෝ ය. ඒ
ජාතීහු ෂූර්ට යන මාවත දක්වා ද මිසර දේශය
දක්වා ද යන ප්රදේශයේ පරෙ සිට වාසය කළහ.
9 දාවිත් පුරුෂයකු වත්, ස්ත්රියක වත් ඉතිරි
නොකර ඒ ප්රදේශයේ සියල්ලන් මරා දමා,
බැටළුවන් ද ගවයන් ද කොටළුවන් ද ඔටුවන් ද
වස්ත්ර ද පැහැරගෙන හැරී ආකීෂ් රජු වෙත
පැමිණියේ ය. 10 “අද ඔබ කොයි පළාතට විරුද්ධ ව
කොල්ලකෑම සඳහා ගියහු දැ”යි ආකීෂ් රජ ඇසුවේ
ය. දාවිත් පිළිතුරු දෙමින්, “ජුදාහි දකුණු දිශාවට ද
ජෙරොමයෙලේවරුන්ගේ දේශයේ දකුණු දිශාවට ද
කේනිවරුන්ගේ දේශයේ දකුණු දිශාවට ද විරුද්ධ ව
ගියෙමු”යි කී ය. 11 ගාත් නුවරට ගෙනෙන පිණිස
දාවිත් පුරුෂයකු වත්, ස්ත්රියක වත් ඉතුරු කළේ
නැත. මන්ද, “දාවිත් මේ මේ ආකාර දේ කළේ ය
කියා ඔවුන් අපට විරුද්ධ ව කරුණු දන්වන්නට
පුළුවනැ”යි ඔහු සිතූ බැවිනි. දාවිත් පිලිස්තිවරුන්ගේ
රටේ විසූ මුළු කාලය තුළ ක්රියා කළේ මේ
ආකාරයෙනි. 12 ආකීෂ් දාවිත් කෙරෙහි විශ්වාසය
තබා, “ඔහු තමාගේ ම සෙනඟ වන
ඉශ්රායලේවරුන්ගේ පිළිකුල මුළුමනින් ම තමා පිට
පමුණුවාගෙන ඇති බැවින් ඔහු සෑම කල්හි ම
මාගේ මෙහෙකරුවා වනු ඇතැ”යි සිතාගත්තේ ය.

## මන්ත්රකාරියගේ ගුරුකම් ගැනීම

28 ඒ දවස්වල දී පිලිස්තිවරු ඉශ්රායලේවරුන්ට
විරුද්ධ ව සටන් කරන පිණිස තමන්ගේ
සේනා යුද්ධය සඳහා රුස් කළහ. ආකීෂ් දාවිත්ට
කතා කොට, “ඔබ සහ ඔබේ සෙනඟ මාගේ
හමුදාව කැටුව සටනට යා යුතු බව ඔබට දන්වා
ඇතැ”යි කීවේ ය. 2 දාවිත් පිළිතුරු දෙමින්, “එසේ
නම් ඔබේ මෙහෙකරුවා කරන දයෙ ඔබ දැනගනු
ඇතැ”යි ආකීෂ්ට කී ය. ආකීෂ් පිළිතුරු දෙමින්,
“හොඳයි, මාගේ ජීවිතාන්තය දක්වා ඔබ මාගේ
ආරක්ෂක භටයා කොට පත් කරමි”යි දාවිත්ට කී ය.
3 ලෙවී 20:27; ද්වි.නී. 18:10-11; 1 සාමු 25:1 මේ
කාලයේ දී සාමුවලේ මියගොස් තිබිණි. සියලු
ඉශ්රායලේවරු ඔහු ගැන වැලපී, ඔහුගේ ම නුවර වූ
රාමාහි ඔහු තැන්පත් කළහ. සාවුල්
ආත්මබන්ධනකාරයන් ද අනාවිනකාරයන් ද
දේශයෙන් පහ කර තිබිණි.
4 පිලිස්තිවරු එක්රුස් වී අවුත්, ෂූනමේහි කඳවුරු
බැඳගත්තෝ ය. සාවුල් ද සියලු ඉශ්රායලේවරුන් රුස්
කළේ ය. ඔව්හු ගිල්බෝවාහි කඳවුරු බැඳගත්හ.
5 සාවුල් පිලිස්තිවරුන්ගේ සේනාව දුටු විට බිය විය;
ඔහුගේ සිත ද බොහෝ සේ කම්පිත විය. 6 ගණන්
27:21සාවුල් සමිඳාණන් වහන්සේගෙන් කරුණු විමසූ
කල, උන් වහන්සේ ස්වප්නවලින් වත්, උරිම් පස
ඇටවලින් වත්, දිවැසිවරුන් ලවා වත් ඔහුට පිළිතුරු
නුදුන් සේක. 7 එවිට සාවුල් සිය සේවකයන්ට කතා
කොට, “ආත්මබන්ධනකාරියක මට සොයා දෙන්න;
මම ඈ වෙත ගොස් ඇගෙන් කරුණු විචාරන්නෙමි”යි
කී ය. ඔහුගේ සේවකයෝ ද “ආත්මබන්ධනකාරියක්
ඒන්දොරේහි සිටිනවා ය”යි කී හ.
8 සාවුල් අමුතු වස්ත්ර ඇඳ, වෙස්වළාගෙන මිනිසුන්
දදෙනෙකු සමඟ ගොස්, රාත්රියේ ඒ ස්ත්රිය වෙත
පැමිණ, ඈට කතා කොට, “ආත්මබන්ධනයෙන් මට
පේන කියා, මා ඔබට නම් කරන ආත්මය
කැඳවන්නැ”යි කීවේ ය.
9 ස්ත්රිය පිළිතුරු දෙමින්, “සාවුල් කළ දයෙ, එනම්,
ඔහු ආත්මබන්ධනකාරයන් ද අනාවිනකාරයන් ද
දේශයෙන් පහකළ හැටි ඔබ දන්නහෙි ය. එසේ
නම්, මා නසන පිණිස මාගේ ප්රාණයට මලපතක්
තබන්නේ මන්දැ”යි ඔහුගෙන් ඇසුවා ය.
10 සාවුල් පිළිතුරු දෙමින්, “ජීවමාන සමිඳාණන්
වහන්සේගේ නාමයෙන් මේ කාරණය නිසා ඔබට
කිසි දඬුවමක් නොවනු ඇතැ යි දිවුරා කියමි”යි ඈට
කී ය.
11 එවිට ස්ත්රිය, “මම ඔබට කවරකු කැඳවා දෙම්
දැ”යි ඇසුවා ය. “සාමුවලේ මට කැඳවා දෙන්නැ”යි
සාවුල් ඈට කී ය.
12 ඒ ස්ත්රිය සාමුවලේ දුටු කල මහ හඬින්
කෑගැසුවා ය. ඈ සාවුල්ට කතා කොට, “ඔබ මා
රැවටුවේ මන් ද? ඔබ නම් සාවුල් ය”යි ඔහුට කීවා
ය.

13 රජ ද, “බිය නොවන්නැ”යි කියා, “ඔබට
පෙනෙන්නේ කුමක් දැ”යි ඇසුවේ ය. “අවතාරයක්
පොළොවෙන් නැඟී එනවා”යි ස්ත්‍රිය සාවුල්ට කීවා
ය.
14 “ඔහුගේ හැටි කොහොම ද”යි ඔහු ඇගෙන්
ඇසුවේ ය. ඈ පිළිතුරු දෙමින්, “මහලු මිනිසෙක් නැඟී
එන්නේ ය; ඔහු සළුවක් පොරවාගෙන සිටින්නේ
ය”යි කීවා ය. ඒ සාමුවෙල් බව සාවුල්ට දැනී ඔහු
මුණින්තලා වී වැන්දේ ය.
15 එවිට සාමුවෙල් කතා කොට, “මා ආපසු
කැඳවීමෙන් ඔබ මට කරදර කළේ මන්දැ”යි
සාවුල්ගෙන් ඇසී ය. සාවුල් පිළිතුරු දෙමින්, “මම තද
අමාරුවකට පත් ව සිටිමි; පිලිස්තිවරු මට විරුද්ධ ව
යුද්ධ කරති; දෙවියන් වහන්සේ මා කෙරෙන් අහක්
ව ගිය සේක; උන් වහන්සේ දැන් දිවැසිවරුන් ලවා
වත්, ස්වප්නවලින් වත් මට පිළිතුරු දෙන්නේ නැත.
එබැවින් මා කළ යුතු දේ ඔබ මට දන්වන පිණිස
ඔබට අඬ ගැස්වීමි”යි කීවේ ය.
16 එවිට සාමුවෙල් පිළිතුරු දෙමින් මෙසේ කීවේ ය:
“සමිඳාණන් වහන්සේ ඔබ කෙරෙන් අහක් වී ඔබට
විරුද්ධ ව සිටිද්දී ඔබ මාගෙන් අසන්නේ කුමක් නිසා
ද? 17 1 සාමු 15:28සමිඳාණන් වහන්සේ මා ලවා
ප්‍රකාශ කරවූ හැටියට ඉෂ්ට කළ සේක. සමිඳාණන්
වහන්සේ ඔබ අතින් රජකම පැහැරගෙන ඔබේ
අසල්වැසියා වන දාවිත්ට දුන් සේක. 18 1 සාමු
15:3-9උන් වහන්සේගේ බලවත් උදහස අනුව
අමලකේවරුන්ට කළ යුතු දේ නොකර, උන්
වහන්සේගේ හඬට කීකරු නොවූ බැවින් උන්
වහන්සේ අද දවසේ මේ දෙය කළ සේක. 19 ඒ
හැර සමිඳාණන් වහන්සේ පිලිස්තිවරුන් අතට ඔබ
සමඟ ඉශ්රායලේවරුන් පාවා දෙන සේක. හෙට ඔබ
සහ ඔබේ පුත්‍රයන් මා සමඟ සිටිනු ඇත.
සමිඳාණන් වහන්සේ ඉශ්රායලේවරුන්ගේ හමුදාවත්
පිලිස්තිවරුන්ගේ අතට පාවා දෙන සේක.”
20 එවිට සාවුල් එකණෙහි ම බිම වැතිර සාමුවෙල්
කී දේ නිසා අතිශයෙන් බියට පත් විය. ඔහු එදා මුළු
දවාලෙහි වත්, රාත්‍රියෙහි වත් කෑම නොකෑ නිසා
දුර්වල ව සිටියේ ය. 21 ඒ ස්ත්‍රිය සාවුල් ළඟට
අවුත්, ඔහු බොහෝ සේ කැළඹී සිටින බව දැක,
ඔහුට කතා කොට, “ඔබේ දාසී වන මම ඔබේ
හඬට කීකරු ව මාගේ ජීවිතය නොසලකා ඔබ මට
කී දේ කළෙමි. 22 ඒ නිසා දැන් ඔබේ දාසී කියන
දේ අසා ඔබ ඉදිරියෙහි කෑම තබන්නට මට අවසර
දී, ඔබ මාර්ගයෙහි යන කල ඔබට ශක්තිය ඇති වන
පිණිස කෑම කනු මැනවැ”යි කීවා ය.
23 එහෙත්, සාවුල් අකමැති ව, “මම නොකමි”යි කී
ය. කෙසේ වෙතත් ඔහුගේ සේවකයෝ ද ඒ ස්ත්‍රිය
ද ඔහුට පෙරැත්ත කළ නිසා ඔහු ඔවුන්ගේ කීමට
ඇහුම්කන් දී බිමින් නැඟිට ඇඳේ හිඳගත්තේ ය.
24 තර කරන ලද වස්සෙක් ඒ ස්ත්‍රියට ගෙදර
සිටියේ ය. ඈ කඩිනමින් ඌ මරා, පිටි අරගෙන අනා,
මුහුන් නොදැමූ රොටි පුළුස්සා, 25 ඒවා සාවුල් ද
ඔහුගේ සේවකයන් ද ඉදිරියෙහි තැබුවා ය. ඔව්හු
කෑම කා, නැඟිට ඒ රාත්‍රියේ ම පිටත් ව ගියහ.

## පිලිස්තිවරුන් දාවිත් නෙරපා දැමීම

29 පිලිස්තිවරු ඔවුන්ගේ සියලු හමුදාවන්
අපෙක් නම් ස්ථානයට රැස් කළහ.
ඉශ්රායලේවරු ජෙශ්රයෙලෙහි උල්පත ළඟ කඳවුරු
බැඳගත්හ. 2 පිලිස්තිවරුන්ගේ අධිපතීහු සිය දහස්
ගණන් වශයෙන් ආහ. දාවිත් ද ඔහුගේ සෙනඟ ද
ආකීෂ් සමඟ ඔවුන්ට පස්සෙන් ආහ. 3 එවිට
පිලිස්තිවරුන්ගේ අධිපතීහු, “මේ හෙබ්‍රෙව්වරුන්
මෙහි කුමක් කරත් දැ”යි ඇසූ හ. එවිට ආකීෂ්
පිලිස්තිවරුන්ගේ අධිපතීන්ට කතා කොට, “මේ
තැනැත්තා ඉශ්රායලේවරුන්ගේ රජ වන සාවුල්ගේ
සේවකයකු ව සිටි දාවිත් ය. මොහු දැන් කලක
සිට, අවුරුදු ගණනක සිට මා සමඟ සිටියි; ඔහු මට
එකතු වූ දා පටන් අද දක්වා ඔහු අතේ කිසි වරදක්
මට දකින්නට ලැබුණේ නැතැ”යි කී ය.
4 එහෙත්, පිලිස්තිවරුන්ගේ අධිපතීහු ඔහු කෙරෙහි
කෝප වී ඔහුට කතා කොට, “ඒ මිනිසා ඔබ නියම
කළ ස්ථානයට ආපසු යන පිණිස ඔහු පිටත් කර
හරින්න; ඔහු අප සමඟ යුද්ධයට යෑම සුදුසු නැත.
සමහර විට සටන් බිමේ දී ඔහු අපට විරුද්ධ ව
හැරෙන්නට බැරි කමක් නැත. මේ සෙනඟගේ හිස
ගසා දැමීමෙන් මිස අන් කවර මඟකින් ඔහුට සිය
ස්වාමියාගේ සිත දිනාගත හැකි ද? 5 1 සාමු 18:7;
21:11මේ අර දාවිත් නොවේ ද?
q25 ‘මැරී සාවුල් දහස් ගණනක් මැරී දාවිත් දස දහස්
ගණනක්’
5 කියමින් කාන්තාවන් නටමින් එකිනෙකොට ගී කීවේ
මොහු ගැන නොවේ දැ”යි කී හ.
6 එවිට ආකීෂ් දාවිත් කැඳවා ඔහුට කතා කොට,
“ජීවමාන සමිඳාණන් වහන්සේගේ නාමයෙන් ම, ඔබ
අවංක ව ම හැසුරුණු බව මම දිවුරා කියමි. ඔබ මා
සමඟ අවුත් මේ යුද්ධයේ දී සටන් කරන්නෙහි නම්
මම කැමැත්තෙමි. ඔබ මා ළඟට ආ දා පටන් අද
දක්වා ඔබ අත කිසි වරදක් මට දක්නට ලැබුණේ
නැත; එසේ වුවත් අධිපතීන් ඔබට කැමැති නැත.
7 එබැවින් පිලිස්තිවරුන්ගේ අධිපතීන් අප්‍රසන්න
නොවන පිණිස දැන් සුව සේ ආපසු යන්නැ”යි කීවේ
ය.
8 දාවිත් පිළිතුරු දෙමින්, “මම කුමක් කළෙමේ ද?
මා අවුත් මාගේ ස්වාමීන් වන රජ්ජුරුවන්ගේ
සතුරන්ට විරුද්ධ ව සටන් කරන්නට මට බැරි වන
විධියට මා ඔබ ඉදිරියට පැමිණි දා පටන් අද දවස
දක්වා ඔබේ මෙහෙකරුවා වන මා අත ඔබට සම්බ
වූ වරද කුමක් දැ”යි ආකීෂ්ගෙන් ඇසුවේ ය.
9 ආකීෂ් පිළිතුරු දෙමින්, “මට පෙනෙන හැටියට
දෙවියන් වහන්සේගේ දූතයකු මෙන් ඔබ නිදොස්
බව මම දනිමි. එහෙත්, පිලිස්තිවරුන්ගේ අධිපතීහු,
‘ඔබ අප කැටුව යුද්ධයට නොආ යුතු ය’යි කී හ.
10 එබැවින් ඔබ සමඟ පැමිණි ඔබේ ස්වාමියාගේ
සේවකයන් සමඟ අලුයම නැඟිට එළිය වැටෙද්දී ම
පිටත් ව යන්නැ”යි දාවිත්ට කීවේ ය. 11 මෙසේ
දාවිත් ද ඔහුගේ සෙනඟ ද පිලිස්තිවරුන්ගේ

දේශයනේ හැරී යන පිණිස අලුයම පිටත් වුණෝ ය.
පිලිස්තිවරු ද ජෙශ්රයෙලෙයට ගියහ.

### අමලකේවරුන්ට විරුද්ධ ව යුද්ධය

30 දාවිත් සහ ඔහුගේ සනෙඟ තුන් වන දා
ශික්ලග් නගරයට පැමිණියහ. ඊට පරෙ
අමලකේවරු දකුණු දිශාවටත්, ශික්ලග්ටත් විරුද්ධ ව
අවුත්, ශික්ලග්ට පහර දී ඒ නගරය ගින්නනේ
දවාදමා, 2 එහි සිටින ස්ත්රීන් ද ලොකු කුඩා
සියල්ලන් ද වහල්කමට ගනෙ, කිසිවකු නොමරා
ඔවුන් අල්ලාගනෙ පිටත් ව ගියහ. 3 දාවිත් ද
ඔහුගේ සනෙඟ ද නුවරට පැමිණි කල, එය ගිනි ලා
තිබනෙ බවත්, ඔවුන්ගේ භාර්යාවන් ද දරුදැරියන් ද
වහල්කමට ගනෙ යන ලද බවත් දුටු හ. 4 එවිට
දාවිත් ද ඔහු සමඟ සිටි සනෙඟ ද ඔවුන්ට තවත්
හඬන්නට ශක්තිය නැති වන තුරු ම ශබ්ද නඟා
ඇඬූ හ. 5 1 සාමු 25:42-43දාවිත්ගේ භාර්යාවන්
දදෙනො වන ජෙශ්රයෙලේය අහිනොවම් ද
කර්මලේය නාබල්ගේ භාර්යාව ව සිටි අබිගායිල් ද
වහල්කමට ගනෙයනු ලැබූ හ.
6 දාවිත් දැන් තද අමාරුවකට පත් විය. මන්ද,
සනෙඟ සියලු දනොගේ සිත් තම තමන්ගේ
දරුදැරියන් ගැන ශෝක වූ බැවින් ඔව්හු දාවිත්ට ගල්
ගසන්නට තර්ජනය කළහ. එහතේ, දාවිත් සිය දවේ
සමිඳාණන් වහන්සේ කරෙහෙි තම ශක්තිය
උපදවාගත්තේ ය. 7 1 සාමු 22:20-23දාවිත්
අහිමලෙකේගේ පුත් වූ අබියාතර් පූජකයා අමතා:
"ඒපොද් සැට්ටය මා ළඟට ගනෙනේනැ"යි කී ය.
අබියාතර් ඒපොද් සැට්ටය දාවිත් ළඟට ගනොවේ ය.
8 දාවිත් සමිඳාණන් වහන්සේගනේ විචාරමින්, "මම
මේ හමුදාව ලුහුබැඳ ගියොත්, ඔවුන් කරා
පැමිණෙනේනට මට පුළුවන් වේ දැ"යි ඇසුවේ ය. උන්
වහන්සේ ඔහුට පිළිතුරු දමේින්, "ලුහුබැඳ යන්න;
මන්ද, නුඹ සැබැවින් ම ඔවුන් කරා පැමිණ
නොවරදවා සිරකරුවන් සියලු දනො ම නැවත
ලබාගනු ඇතැ"යි වදාළ සේක.
9 එවිට දාවිත් ද ඔහු සමඟ සිටි සනෙඟ
හයසියදනො ද පිටත් ව ගියහ. ඔව්හු බසෙොර් ඔය
ළඟට පැමිණි විට සමහරකේ එහි නැවතුණහ.
10 එහතේ, දාවිත් සහ සනෙඟ හාරසියදනෙකේ
ලුහුබැඳ ගියහ. බසෙොර් ඔයනේ යාමට බැරි තරම්
වහෙසෙ ව සිටි මිනිසුන් දසියයක් නතර වූ හ.
11 දාවිත්ගේ සනෙඟට නුවරනේ පිටත දී මිසර
වැසියකේ සම්බ විය. ඔව්හු ඒ මිනිසා දාවිත් ළඟට
ගනෙවුත්, කන්නට රොටි ද බොන්නට වතුර ද ඔහුට
දුන්හ. 12 තවද, ඔව්හු අත්තික්කා කැටියකින්
කැබැල්ලක් ද මුද්රික පල පොකුරු දකෙක් ද ඔහුට
දුන්හ. ඔහු කෑ පසු ප්රාණවත් විය. මන්ද, ඔහු දවල්
තුනකුත් රෑ තුනකුත් කෑම කැවේ වත්, වතුර බීවේ
වත් නැතුව සිටිය බැවිනි. 13 දාවිත් ඔහු අමතා, "ඔබ
කාට අයිති ද? කොතැනින් ආයේ දැ"යි ඇසී ය. ඔහු
පිළිතුරු දමේින්, "මම අමලෙකේ මනුෂ්යයකුගේ
වහලකෙු ව සිටින මිසර ජාතික තරුණයකේ ය; තුන්
දවසකට පරෙ මට අසනීප වූ බැවින් මාගේ ස්වාමියා
මා අත්හැර දමා ගියේ ය. 14 අපි කරෙතේිවරුන්ගේ
දකුණු දිශාවටත්, ජුදාට අයිති දකුණු පළාතටත්,
කාලබේගේ දකුණු දිශාවටත් විරුද්ධ ව යුද්ධ
කළෙමු; ශික්ලග් නුවර ගිනිබත් කළෙමු"යි කී ය.
15 "ඒ හමුදාව ළඟට යන්නට ඔබ මට මඟ
පනේවන්නෙහි දැ"යි දාවිත් ඔහුගනේ ඇසී ය. ඔහු ද,
"මා නොමරන හැටියටත්, මාගේ ස්වාමියා අතට
පාවා නොදනෙ හැටියටත් දවේයන් වහන්සේගේ
නාමයනේ ඔබ මට දිවුරුම් දුන්නොත් මම ඒ හමුදාව
ළඟට පැමිණෙනේනට ඔබට මඟපනේවමි"යි කී ය.
16 ඔහු දාවිත් ඒ ස්ථානයට පැමිණෙවේවේ ය. එවිට
ඔවුන් පිලිස්තිවරුන්ගේ දේශයනෙුත්, ජුදා
දේශයනෙුත් ගත් ඉමහත් කොල්ලය කමින්,
බොමින්, නටමින් සෑම තැන ම විසිරී සිටියහ.
17 දාවිත් ඇඳිරි වේලේ පටන් පසු දින සවස දක්වා
ඔවුන්ට පහර දුන්නේ ය. ඔටුවන් පිට නැඟී පලා
ගිය තරුණයන් හාරසියයක් හැර ඔවුන්ගනේ වනෙ
කිසිවකේ ගැළවුණේ නැත. 18 මසේ දාවිත්
අමලකේවරුන් ගනෙ ගිය සියල්ලන් ද තමාගේ
භාර්යාවන් දදෙනො ද ගළවාගත්තේ ය. 19 ලොකු
කුඩා සියල්ලන්ගනේ ද දරුදැරියන්ගනේ ද කිසිවකු
වත්, කොල්ලය වත්, ඔවුන් ගත් කිසිවක් වත් අඩු
නැතිව සියල්ල ම දාවිත් නැවත ගනොවේ ය.
20 සියලු එළු බැටළුවන් ද ගවයන් ද දාවිත් ගත්තේ
ය. ඔහුගේ සනෙඟ උන් අනික් සිවුපාවුන්ට
පරෙටුවනේ දක්කමින්, "මයෙ දාවිත්ට අයිති
කොල්ලය ය"යි කී හ.
21 දාවිත් සමඟ යන්නට බැරි තරම් වහෙසෙ වී
සිටි, බසෙොර් ඔය ළඟ නතර කරන ලද මිනිසුන්
දසියය ළඟට දාවිත් පැමිණි විට, ඔව්හු දාවිත් සහ
ඔහු සමඟ සිටි සනෙඟගේ පරෙමඟට පැමිණියහ.
දාවිත් සනෙඟ ළඟට ආ කල ඔව්හු ආචාර කළහ.
22 එවිට දාවිත් සමඟ ගිය සනෙඟ අතරනේ නපුරු,
දුදන මිනිසුන් සියලු දනො කතා කොට, "අප සමඟ
නොගිය මිනිසුන්ට අප ගළවා ගත් කොල්ලයනේ
කිසිවක් නොදමෙු. ඔවුන් එකිනකොට තම තමන්ගේ
භාර්යාවන් ද දරුදැරියන් ද රැගනෙ යන්නට පමණක්
දමෙු"යි කී හ.
23 එවිට දාවිත් මසේ කී ය: "මාගේ
සහෝදරයනෙි, සමිඳාණන් වහන්සේ අපට දුන්
දේවල් ගැන එසේ නොකරන්න. උන් වහන්සේ අප
ආරක්ෂා කර, අපට විරුද්ධ ව පැමිණි හමුදාව අප
අතට පාවා දුන් සේක. 24 ඔබ කියන දේට සවන්
දනේනේ කවරකේ ද? සියලු දනො ම එක හා සමාන
ව බදොගත යුතු ය; යුද්ධයට යන අයගේ
කොටසත්, බඩු ළඟ නැවතී සිටින අයගේ කොටසත්
එක හා සමාන විය යුතු ය." 25 එදා දාවිත් කී දේ,
පණතක් හා නියෝගයක් හැටියට නියම කළෙේ ය.
එදා පටන් අද දක්වා ඉශ්රායලේ ජනයා විසින් එය
පිළිපදිනු ලැබේ.
26 දාවිත් ශික්ලග් නුවරට පැමිණි විට තමාගේ
මිත්රයන් වන ජුදාහි ප්රජා මූලිකයන්ට කොල්ලයනේ
කොටසක් යවමින්, "මනේන, සමිඳාණන්

වහන්සේගේ සතුරාගනේ ගත් කොල්ලයෙන් ඔබට
තෑගි ය”යි කියා යැවී ය. 27 එසේ යැව්වේ,
බෙතෙලේහි ද දකුණු රාමොත්හි ද යත්තීර්හි ද
28 අරෝයෙර්හි ද සිප්මෝත්හි ද එෂ්තමෝවාහි ද
29 රාකාල්හි ද ජෙරොමයෙලේවරුන්ගේ නුවරවල ද
කේනිවරුන්ගේ නුවරවල ද 30 හොර්මාහි ද
බෝර්-ආෂාන්හි ද අතාක්හි ද 31 හෙබ්රොන්හි ද
දාවිත් සහ ඔහුගේ සෙනඟ ගැවසුණ සියලු තැන්හි
ද සිටි ප්‍රජා මූලිකයන් වෙත ය.

### සාවුල්ගේ මරණය

(1 වංශා 10:1-12)

31
පිලිස්තිවරු ඉශ්‍රායලේවරුන්ට විරුද්ධ ව යුද්ධ
කළහ. එවිට ඉශ්‍රායලේ සෙනඟ පිලිස්තිවරුන්
වෙතින් පලා ගොස් ගිල්බෝවා කන්දේ දී මැරුම් කා
වැටුණෝ ය. 2 පිලිස්තිවරු සාවුල් ද ඔහුගේ
පුත්‍රයන් ද ලුහුබැඳ ගොස් සාවුල්ගේ පුත්‍රයන් වන
ජොනතන් ද අබීනාදාබ් ද මල්කිෂුවා ද මැරූ හ.
3 සටන සාවුල්ට විරුද්ධ ව බලවත් විය; දුනුවායෝ
ඔහුටත් ළං වූ හ. ඔහු දුනුවායන්ගෙන් තදින් තුවාළ
ලැබුවේ ය. 4 එවිට සාවුල් තම ආයුධ රැගෙන
යන්නාට කතා කොට, “අර අචර්මඡේදිතයන් ඇවිත්
මට ඇන අවනම්බු නොකරන පිණිස කඩුව ඇද මට
අනින්නැ”යි කී ය. එහෙත්, ඔහුගේ ආයුධ
ගෙනෙයන්නා එසේ කිරීමට කැමැති නො වී ය. මන්ද,
ඔහු ඉතා බිය ව සිටියේ ය. එවිට සාවුල් තමාගේ
කඩුව රැගෙන එය පිට වැටී මැරුණේ ය. 5 සාවුල්
මැරුණ බව ඔහුගේ ආයුධ ගෙනෙයන්නා දුටු විට ඔහු
ද තමාගේ කඩුව පිට වැටී සාවුල් සමඟ මළේ ය.
6 මෙසේ සාවුල් ද ඔහුගේ පුත්‍රයන් තිදෙනා ද
ඔහුගේ ආයුධ ගෙනෙයන්නා ද ඔහුගේ සියලු සෙනඟ
ද ඒ දවසේ දී එක විට ම මරණයට පත් වූ හ.
7 ඉශ්‍රායලේ සෙනඟ පලා ගිය බවත්, සාවුල් ද
ඔහුගේ පුත්‍රයන් ද මැරුණු බවත් මිටියාවතට මේ
පැත්තේ ද ජොර්දානෙන් එගොඩ ද සිටි ඉශ්‍රායලේ
සෙනඟ දුටු විට ඔව්හු නගර අත්හැර පලා ගියහ.
පිලිස්තිවරු අවුත් ඒ නගරවල වාසය කළහ.
8 පසු දා පිලිස්තිවරුන් මරන ලද අයගේ යුද්ධායුධ
පැහැර ගැනීමට ආ කල සාවුල් ද ඔහුගේ පුත්‍රයන්
තුන්දෙනා ද ගිල්බෝවා කන්දේ වැටී සිටිනු ඔවුන්ට
සම්බ විය. 9 ඔව්හු සාවුල්ගේ හිස කපා දමා
ඔහුගේ ආයුධ ගලවා, එපවත් තමන්ගේ
දේවාලවලත්, සෙනඟ අතරේත් ප්‍රකාශ කරන
පිණිස පිලිස්තිවරුන්ගේ දේශය මුළුල්ලෙහි
පණිවුඩකාරයන් යැවූ හ. 10 ඔව්හු සාවුල්ගේ ආයුධ
අෂ්ටාරොත්ගේ දේවාලයෙහි තැබූ හ; ඔහුගේ
ශරීරය බෙතේෂාන් නගරයේ පවුරට සවි කොට
තැබූහ.
11 පිලිස්තිවරුන් සාවුල්ට කළ දේ ගැන ජාබෙෂ්-
ගිලියද් වැසියන් ඇසූ කල, 12 ඔවුන් අතරෙන් සියලු
නිර්භීත මනුෂ්‍යයෝ නැඟිට මුළු රෑ බෙතේෂාන්ට
ගමන් කොට පවුරෙන් සාවුල්ගේ මළකඳ ද ඔහුගේ
පුත්‍රයන්ගේ මළකඳන් ද ජාබෙෂ්ට ගෙනෙ අවුත් එහි
දී ඒවා ආදාහන කළහ. 13 ඉන්පසු ඔව්හු ඔවුන්ගේ
ඇටකටු රැගෙන ජාබෙෂ්හි ඒෂලේ ගස යට වළලා
සත් දවසක් උපවාස කළහ.

# 2 සාමුවලේ

## සාවුල්ගේ මරණය දාවිත්ට සැළ වීම

1 සාවුල්ගේ මරණයෙන් පසු දාවිත්
අමලකේවරුන් නසා, පෙරළා අවුත් දදෙවසක්
ශික්ලග්හි නැවතී සිටියේ ය. 2 තුන් වන දවසේ දී
මිනිසෙක් තමාගේ ඇඳුම් ඉරාගෙන, හිසේ පස්
දමාගෙන සාවුල්ගේ කඳවුරෙන් නික්ම ආවේ ය. ඔහු
දාවිත් ළඟට පැමිණි විට බිම වැටී වැන්දේ ය.
3 “ඔබ කොතැනින් ආවෙහි දැ”යි දාවිත් ඔහුගෙන්
ඇසී ය. ඔහු ද, “මම ඉශ්රායලේ කඳවුරෙන් ගැළවී
ආවෙමේ”යි ඔහුට පිළිතුරු දුන්නේ ය.
4 එවිට දාවිත්, “එහි සිදු වූයේ කිමෙක් දැ යි මට
කියන්නැ”යි ඔහුට කීවේ ය. ඔහු පිළිතුරු දෙමින්,
“සෙනඟ යුද්ධයෙන් පලා ගියහ; ඔවුන්ගෙන් බොහෝ
දෙනෙක් මැරී වැටුණෝ ය; සාවුල් ද ඔහුගේ පුත්
ජොනතන් ද මැරුණෝ ය”යි කීවේ ය.
5 එකල දාවිත් මෙපවත් සැළ කළ ඒ තරුණයාගෙන්,
“සාවුල් හා ඔහුගේ පුත් ජොනතන් මළ බව ඔබ
දන්නේ කොහොමො දැ”යි ඇසී ය.
6 1 සාමු 31:1-6; 1 වංශා 10:1-6 එපවත් ඔහුට සැළ
කළ තරුණයා ඔහුට කතා කොට, “මම ගිල්බෝවා
කන්දට අහම්බෙන් පැමිණියෙමි. ඒ වේලාවේ දී
සාවුල් තමාගේ හෙල්ලයට හේත්තු වී සිටියේ ය;
රථ හා අසරුවෝ ඔහු පසුපස වේගයෙන් එළවාගෙන
ආහ. 7 ඔහු පස්සට හැරී මා දැක මට අඬගැසී ය.
‘මම මෙහි ය’යි මම උත්තර දිනිමි. 8 ‘ඔබ කවුදැ’යි
ඔහු මාගෙන් ඇසී ය. ‘මම අමලකේ ජාතිකයෙකිමි’යි
ඔහුට පිළිතුරු දිනිමි. 9 ඔහු මට කතා කොට, ‘මා
ළඟ සිට මා මරන්න. මන්ද, මට තවමත් පණ
තිබුණත් මම බොහෝ වේදනාවෙන් පසු වමේ’යි කී
ය. 10 එවිට මම ඔහු ළඟ සිට ඔහු මැරුවෙමි. මා
එසේ කළේ, ඔහු වැටුණු වහා ම ජීවත් නොවන
බව සහතික ලෙසෙ මා දැන සිටි බැවිනි. මම ඔහුගේ
හිස මත තිබුණු කිරීටය ද අතේ දමා තිබුණු වළල්ල
ද රැගෙන මෙහි මාගේ ස්වාමියා ළඟට
ගෙනොවමේ”යි කීවේ ය.
11 එවිට දාවිත් ශෝකයෙන් පිරී තමාගේ වස්ත්ර
ඇද ඉරා දැමුවේ ය. ඔහු සමඟ සිටි සියලු සෙනඟ ද
එසේ කළහ. 12 ඔව්හු සාවුල් ද ඔහුගේ පුත්
ජොනතන් ද සමිඳාණන් වහන්සේගේ සෙනඟ ද
ඉශ්රායලේ වංශය ද යුද්ධයේ දී මැරුම් කෑ බැවින්
ඔවුන් ගැන හඬා වැලපමෙන් හවස දක්වා නිරාහාර
ව සිටියහ.
13 දාවිත් තමාට ඒ සිද්ධිය සැළ කළ තරුණයාට
කතා කොට, “ඔබ කොහේ කෙනෙක් දැ”යි ඇසී ය.
“මම විදේශිකයකු වන අමලකේ ජාතිකයකුගේ
පුතෙක් වමේ”යි ඔහු පිළිතුරු දුන්නේ ය.
14 දාවිත් ද, “සමිඳාණන් වහන්සේගේ අභිෂේක
ලත් තැනැත්තා නැසීමට භය නැති ව ඔබේ අත
එසවේවේ කෙසේ දැ”යි ඔහුට කියා,
15 තරුණයන්ගෙන් එක් කෙනෙකුට අඬ ගසා, “ඔබ
ගොස් ඔහුට පහර දෙන්නැ”යි කී ය. ඔහු ද පහර දී
ඒ තරුණයා මැරුවේ ය. 16 දාවිත් කතා කරමින්,
“මේ ලේ වැගිරීමේ වරදට වගකිව යුත්තේ ඔබ ම
ය. මන්ද, ‘මම සමිඳාණන් වහන්සේගේ අභිෂේක
ලත් තැනැත්තා මැරුවමේ’යි කීමෙන් ඔබ ඔබේ ම
කටින් ඔබට විරුද්ධ ව සාක්ෂි දුන්නෙහි ය”යි කීවේ
ය.

## දාවිත්ගේ විලාප ගීය

17 සාවුල් හා ඔහුගේ පුත් ජොනතන් ගැන මේ
විලාප ගීය ගයමින් දාවිත් වැලපිණි. 18 ජෝෂු
10:13ඒ ගීය ජුදා ජනයාට උගන්වන්නටත් නියම
කළේ ය. එය ජාෂාර්ගේ පොතේ සඳහන් වී ඇත.
19 “අහෝ, ඉශ්රායලේ දේශය!
q219 ඔබේ තේජස ගිරිකුළු මුදුනෙහි අතුරුදන් වී
ඇත.
q219 අහෝ!
q219 බලවතුන් වැටුණු හැටි!
20 ඒ ගැන ගාත්හි නොකියන්න;
q220 අෂ්කලෝනේ වීදිවල පළ නොකරන්න;
q220 එසේ කළොත්, පිලිස්තිවරුන්ගේ දූවරුන් ප්රීති
වනු ඇත;
q220 විජාතිකයන්ගේ දූවරුන් ජය ඝෝෂා නඟනු
ඇත.
21 එම්බා ගිල්බෝවා කඳු හලේ!
q221 තොප පිට පිනි වත්, වැසි වත් නොවැටේ වා!
q221 එහි කෙත්වතු පාළු වී යේ වා!
q221 මන්ද, බලවතුන්ගේ පලිහ කෙලෙසී ඇත.
q221 සාවුල්ගේ පලිහ තලෙින් ආලේප නොකර
ඇත.
22 එහෙත්, මරන ලද්දවුන්ගේ ලයින් ද
සබෙළුන්ගේ තලෙින් ද එය ආලේප කර ඇත.
q222 ජොනතන්ගේ දුන්න මාරක අවියක් විය.
q222 සාවුල්ගේ කඩුව ද ජයෙන් තොර ව හැරී
නාවේ ය.
23 සාවුල් හා ජොනතන් ජීවත් ව සිටිය දී
සනෙහෙසින් හා සතුටින් බැඳී සිටියහ.

q2 23 ජීවිතයේ දී හෝ මරණයේ දී හෝ ඔවුහු වෙන් නො වූ හ.
q2 23 ඔවුහු රාජාලීන්ට වඩා වේගවත් වූ හ;
q2 23 සිංහයන්ට වඩා බලවත් වූ හ.
24 ඉශ්රායලේ දූවරුනි, පියකරු රතු වස්ත්ර ඔබට
පැළඳවූ, ඔබේ වස්ත්ර රන් ආභරණවලින් සැරසූ
සාවුල් ගැන හඬන්න.
25 අහෝ, බලවතුන් රණ බිම මැද දී වැටුණු හැටි!
q2 25 අහෝ ජොනතන්!
q2 25 ගිරිකුළු මුදුනෙහි ඔබ මැරුම් කෑවෙහි ය.
26 මාගේ සහෝදරයා වූ ජොනතන්, ඔබ ගැන
මම වියෝ දුකින් පසු වෙමි.
q2 26 ඔබ මට ඉතා පියකරු ව සිටියෙහි ය.
q2 26 මා කෙරෙහි වූ ඔබේ ආදරය පුදුම ය;
q2 26 වනිතාවකගේ ආදරයට වඩා මහත් ය.
27 අහෝ, බලවතුන් වැටුණු හැටි!
q2 27 යුද්ධ ආයුධත් විනාශ වුණ හැටි!

## දාවිත් ජුදාහි රජ වීම

2 ඉන්පසු දාවිත්, “මා ජුදාහි නගරයකට යන්නට
දැ”යි සමිඳාණන් වහන්සේගෙන් විමසුවේ ය.
“යන්නැ”යි සමිඳාණන් වහන්සේ වදාළ සේක. “මා
කොයි නගරයට යන්නට දැ”යි දාවිත් ඇසුවේ ය.
“හෙබ්රොන් නගරයට ය”යි උන් වහන්සේ වදාළ
සේක. 2 1 සාමු 25:42-43එවිට දාවිත් ද ඔහුගේ
භාර්යාවන් දෙදෙනා වන ජෙශ්රයෙලේය අහිනොවම්
ද කර්මලේය නාබල්ගේ බිරිඳ ව සිටි අබීගායිල් ද
එහි ගියහ. 3 දාවිත් තමා සමඟ සිටි තමාගේ
මිනිසුන් ඔවුන් එකිනෙකාගේ ගෙයි වැසියන් සමඟ
කැඳවාගෙන ආයේ ය. ඔව්හු හෙබ්රොන් නගරවල
වාසය කළහ. 4 1 සාමු 31:11-13තවද, ජුදාහි සෙනඟ
අවුත් එහි දී දාවිත් ජුදා වංශයේ රජු වශයෙන්
අභිෂේක කළහ.
4 “සාවුල් තැන්පත් කරනු ලැබුවේ ජාබෙෂ්-ගිලියද්
මිනිසුන් විසින් ය”යි දාවිත්ට දන්වන ලද්දේ ය.
5 දාවිත් ජාබෙෂ්-ගිලියද් මිනිසුන් වෙත පණිවුඩයක්
යවමින් මෙසේ කීවේ ය: “ඔබේ ස්වාමියා වූ
සාවුල්ට ඔබ පක්ෂපාත ව සිට ඔහු තැන්පත් කළ
බැවින් සමිඳාණන් වහන්සේගෙන් ඔබට ආශීර්වාද
ලැබේ වා! 6 දැන් සමිඳාණන් වහන්සේ ඔබට
කරුණාවත්, විශ්වාසවන්තකමත් පෙන්වන සේක් වා!
ඔබ මේ දේ කළ නිසා මමත් එසේ ම ඔබට
යහපත කරන්නෙමි. 7 එබැවින් ඔබේ අත් බලවත්
වේ වා! වික්රමාන්විත ව සිටින්න. මන්ද, ඔබේ
ස්වාමි වූ සාවුල් මිය ගිය නමුත්, ජුදා වංශය
කෙරෙහි රජු වශයෙන් ඔව්හු මා අභිෂේක කළහ.”
8 තවද, නේර්ගේ පුත්, සාවුල්ගේ සේනාපති වූ
අබ්නේර් සාවුල්ගේ පුත් ඊෂ්-බොෂෙත් කැඳවාගෙන
මහනයිම්ට ගොස්, 9 ගිලියද්වරුන්, අෂූර්වරුන්,
ජෙශ්රයෙලේවරුන්, එෆ්රායිම්වරුන්, බෙන්ජමින්වරුන්
සහ සියලු ඉශ්රායලේවරුන් කෙරෙහි ඔහු රජකමට
පත් කළේ ය. 10 සාවුල්ගේ පුත් ඊෂ්-බොෂෙත්
ඉශ්රායලේහි රජකම් කරන්නට පටන් ගන්න කල
ඔහු අවුරුදු සතළිසක් වයස් ව සිටියේ ය. ඔහු
දෑවුරුද්දක් රජකම් කළේ ය. එහෙත්, ජුදා වංශය
පමණක් දාවිත්ට පක්ෂපාත වුණේ ය. 11 දාවිත්
හෙබ්රොන්හි ජුදා වංශයට රජ ව සිටි කාලය සත්
අවුරුදු හය මාසයක් ය.

## ඉශ්රායලේ හා ජුදා අතරේ යුද්ධය

12 නේර්ගේ පුත් අබ්නේර් ද සාවුල්ගේ පුත් ඊෂ්-
බොෂෙත්ගේ සේවකයෝ ද මහනයිම් සිට පිටත් ව
ගිබියොන් නගරයට ගියහ. 13 ශෙරුයාගේ පුත්
ජෝවාබ් ද දාවිත්ගේ සේවකයෝ ද පිටත් ව ගොස්
ගිබියොන් පොකුණ ළඟ දී මුණගැසී, එක පක්ෂයක්
පොකුණේ එක පැත්තක ද අනෙක් පක්ෂය
පොකුණේ අනෙක් පැත්තේ ද නැවතුණාහ.
14 “තරුණයෝ නැඟිට අප ඉදිරියෙහි ක්රීඩා කරත්
වා”යි අබ්නේර් ජෝවාබ්ට කී ය. ජෝවාබ් ද, “ඔව්හු
එසේ කරත් වා”යි කීවේ ය.
15 එවිට සාවුල්ගේ පුත් ඊෂ්-බොෂෙත්ට අයිති
බෙන්ජමින්වරුන්ගෙන් ගණන් වශයෙන් දොළොස්
දෙනෙක් ද දාවිත්ගේ සේවකයන්ගෙන් දොළොස්
දෙනෙක් ද නැඟිට ගියහ. 16 එවිට ඔව්හු එකිනෙකා
තම තමාගේ විරුද්ධකාරයාගේ හිස අල්ලා, කඩුවෙන්
ළපැත්තට ඇන එකට වැටුණෝ ය. එබැවින්
ගිබියොන් ළඟ තිබෙන ඒ ස්ථානයට මුවහත් පිහියා
කෙත යන අර්ථය ඇති හලේකත්-හශ්ශුරිම් යන නම
තබන ලද්දේ ය.
17 ඒ දවසේ දී බලවත් සටනක් ඇති විය. අබ්නේර්
ද ඉශ්රායලේ සෙනඟ ද දාවිත්ගේ සේවකයන්ට
පැරදුණෝ ය. 18 ශෙරුයාගේ පුත්රයන් තිදෙනා වන
ජෝවාබ්, අබීෂයි සහ අසාහලේ එහි සිටියහ.
අසාහලේට වනයේ මුවකුට මෙන් වේගයෙන්
දිවීමේ ශූරතාව තිබුණේ ය. 19 අසාහලේ, අබ්නේර්
ලුහුබැඳ යනුයේ, දකුණට වත්, වමට වත් නොහැරී
අබ්නේර් පස්සේ ගියේ ය. 20 එවිට අබ්නේර්
පස්සට හැරී, “ඔබ අසාහලේ දැ”යි ඇසී ය. “එසේ
ය”යි ඔහු කී ය.
21 අබ්නේර්, “ඔබ දකුණට හෝ වමට හෝ හැරී,
තරුණයන්ගෙන් එක් කෙනෙකු අල්ලාගෙන, ඔහුගේ
ආයුධ පැහැරගන්නැ”යි ඔහුට කී ය. එහෙත්,
අසාහලේ ඔහු වෙතින් අහක් ව යන්නට කැමැති
නො වී ය. 22 නැවතත් අබ්නේර්, “මා වෙතින් අහක්
ව යන්න. මා ඔබට ගසා බිම හෙළන්නේ කුමට ද?
එසේ කළොත්, මා ඔබේ සහෝදර වන ජෝවාබ්ට
මුහුණ දෙන්නේ කොහොම දැ”යි අසාහලේට කී ය.
23 එහෙත්, ඔහු අහක් ව යන්නට අකමැති විය.
එබැවින් අබ්නේර් හෙල්ල මිටේ අගින් ඔහුගේ
බඩට ඇන්නේ ය. ඇන්න හෙල්ලය ඔහුගේ පිට
පසාරු කරගෙන එළියට ආවේ ය. ඔහු එතැන ම
වැටී මළේ ය. තවද, අසාහලේ වැටී මැරුණු
ස්ථානයට ආ විට සියල්ලෝ ම නතර වූ හ.
24 එහෙත්, ජෝවාබ් සහ අබීෂයි, අබ්නේර්
ලුහුබැඳ ගොස් ඉර බැස ගිය විට ගිබියොන්
පාළුකරයට යන මාර්ගයෙහි ගීයා ඉදිරිපිට තිබෙන

අම්මා හලෙට පැමිණියහ. 25 බෙන්ජමින්වරු අබ්නේර්
වෙත රැස් වී එක කණ්ඩායමක් ව හලෙක් මුදුනේ
නැවතී සිටියහ. 26 එවිට අබ්නේර් ජෝවාබ්ට
අඬගසා, “මේ ඝාතනය සදහට ම කළ යුතු ද? එයින්
අවසානයේ දී උග්‍ර දුක හටගන්න බව ඔබ
නොදන්නෙහි ද? එසේ වී නම්, තමන්ගේ
සහෝදරයන් ලුහුබැඳ යාමෙන් හැරී එන්නට කියා
අණ නොකර ඔබ කොපමණ කල් සිටින්නෙහි දැ”යි
ඇසී ය.
27 ජෝවාබ් කතා කරමින්, “සැබැවින් ම ඔබ කතා
නොකළෙහි නම්, සෙනඟ තමන්ගේ සහෝදරයන්
උදේ වනතෙක් ලුහුබැඳ යන්නට ඉඩ තිබිණි යයි
ජීවමාන දෙවියන් වහන්සේගේ නාමයෙන් මම දිවුරා
කියමි”යි කීවේ ය. 28 එවිට ජෝවාබ් හොරණෑව
පිම්බේ ය; මුළු සෙනඟ ද නැවතුණාහ. ඔවුන් තවත්
ඉශ්‍රායෙල්වරුන් පසුපස ලුහුබැඳ ගියේ වත්, යුද්ධ
කළේ වත් නැත.
29 අබ්නේර් සහ ඔහුගේ සෙනඟ ඒ රාත්‍රිය
මුළුල්ලෙහි අරබා සමභූමිය මැදින් ගොස් ජෝර්දානින්
එගොඩ ව, මුළු උදේ වරුවේ ගමන් කොට
මහනයිම් නගරයට පැමිණියහ.
30 ජෝවාබ්, අබ්නේර් ලුහුබැඳ යාමෙන් හැරී අවුත්
මුළු ජනයා රැස් කළේ ය. එවිට දාවිත්ගේ
සේවකයන්ගෙන් මිනිසුන් දහනවදෙනෙකු ද
අසාහෙල් ද නැති බව පෙනී ගියේ ය. 31 එහෙත්,
දාවිත්ගේ සේවකයෝ බෙන්ජමින්වරුන්ගෙන් ද
අබ්නේර්ගේ මිනිසුන්ගෙන් ද තුන්සිය හැටදෙනෙකුට
පහර දී මැරූ හ. 32 ඔව්හු අසාහෙල් රැගෙන
බෙත්ලෙහෙමෙහි තිබුණ ඔහුගේ පියාගේ සොහොන්
ගෙයි තැන්පත් කළෝ ය. ජෝවාබ් ද ඔහුගේ
සෙනඟ ද මුළු රාත්‍රියේ ගමන් කර එළි වන විට
හෙබ්‍රොන් නගරයට පැමිණියහ.

## දාවිත් රජුගේ පවුල

3 සාවුල්ගේ වංශයත්, දාවිත්ගේ වංශයත්
අතරේ බොහෝ කල් යුද්ධ පැවතුණේ ය.
දාවිත් වනාහි වඩ වඩා බලවත් වන අතර,
සාවුල්ගේ වංශය වඩ වඩා බල හීන වේගෙන ගියේ
ය.
2 හෙබ්‍රොන්හි දාවිත්ට පුත්‍රයෝ උපන්නාහ.
ඔහුගේ කුලුඳුලා නම්, ජෙශ්‍රෙයෙලේය
අහිනොවම්ගෙන් උපන් අම්නොන් ය; 3 දෙවැනියා
කර්මෙලේය නාබල්ගේ බිරිඳ ව සිටි අබීගායිල්ගෙන්
උපන් කිලයොබ් ය; තුන්වැනියා ගෙෂූර්හි රජ වූ
තල්මයිගේ දුව වන මයකාගේ පුත් අබ්සලොම් ය;
4 සතරවැනියා හග්ගිත්ගේ පුත් අදොනියා ය;
පස්වැනියා අබිටල්ගේ පුත් ෂෙෆටියා ය; 5 සවැනියා
දාවිත්ගේ බිරිඳ වන එග්ලාගෙන් උපන් ඉත්‍රෙයාම්
ය. මොවුහු හෙබ්‍රොන්හි දී දාවිත්ට උපන්නාහ.

## අබ්නේර් දාවිත්ට එකතු වීම

6 සාවුල්ගේ වංශය ද දාවිත්ගේ වංශය ද අතරේ
යුද්ධය පැවතෙද්දී, අබ්නේර් සාවුල්ගේ වංශයෙහි
එන්න එන්න බලවත් විය.
7 ආයාගේ දුව වන රිශ්පා නම් උපභාර්යාවක්
සාවුල්ට සිටියා ය. “ඔබ මාගේ පියාගේ උපභාර්යාව
සමඟ සයනය කළේ මන්දැ”යි ඊෂ්-බොෂෙත්
අබ්නේර්ගෙන් ඇසී ය. 8 එවිට අබ්නේර්, ඊෂ්-
බොෂෙත්ගේ ප්‍රශ්නය ගැන ඉතා කෝප වී, “මම
ජුදාට දාස වූ නරි බල්ලෙක් ද? මම දාවිත්ගේ අතට
ඔබ අසු කරනොදී, අද දක්වා ඔබේ පියා වන
සාවුල්ගේ වංශයටත්, ඔහුගේ සහෝදරයන්ටත්,
ඔහුගේ මිත්‍රයන්ටත් කරුණාව පෙන්නුවෙමි. එහෙත්,
අද ඔබ මේ ස්ත්‍රිය සම්බන්ධයෙන් මට දොස්
නඟන්නෙහි ය. 9 1 සාමු 15:28සමිඳාණන් වහන්සේ
දාවිත්ට දිවුළ ලෙස, මම ඔහුට නොකළෙමේ නම්,
දෙවියන් වහන්සේ අබ්නේර්ට ඉතා තදින් දඬුවම්
කරන සේක් වා! 10 එසේ කළ යුත්තේ, රජකම
සාවුල්ගේ වංශයෙන් පහකර, දාවිත්ගේ සිංහාසනය
දාන් පටන් බයෙර්-ෂෙබා දක්වා ඉශ්‍රායෙල්වරුන් ද
ජුදාවරුන් ද කෙරෙහි පිහිටුවන පිණිස ය”යි කීවේ ය.
11 ඊෂ්-බොෂෙත් අබ්නේර්ට බිය වූ බැවින් එක
වචනයකින් වත් උත්තර දෙන්නට ඔහුට නොහැකි
විය.
12 එකල අබ්නේර්, දාවිත් වෙත පණිවුඩකාරයන්
යවා, “දේශය අයිති කවරකුට ද? මා සමඟ ඔබේ
ගිවිසුම කරගන්න. එවිට සියලු ඉශ්‍රායෙල්වරුන් ඔබ
වෙත හරවා ගන්න පිණිස මාගේ සහාය ඔබට
දෙන්නෙමි”යි කීවේ ය.
13 දාවිත් පිළිතුරු දෙමින්, “යහපත, මම ඔබ සමඟ
ගිවිසුමක් කරන්නෙමි. හැබැයි, ඔබ එක දෙයක් කළ
යුතු ය; එනම්, ඔබ මා බලන්නට එන විට පළමු
කොට සාවුල්ගේ දුව වන මීකල් කැඳවාගෙන ආ
යුතු ය; එසේ නොකළොත්, මාගේ මුහුණ
නොදකින්නෙහි ය”යි කී ය. 14 1 සාමු 18:27එවිට
දාවිත් සාවුල්ගේ පුත්‍ර ඊෂ්-බොෂෙත් වෙත
පණිවුඩකාරයන් යවා, “පිලිස්තිවරුන් සියදෙනෙකුගේ
චර්මාග්‍ර දී මා ලබාගත් මාගේ බිරිඳ වන මීකල්
මට දෙන්නැ”යි කියන්නට කීවේ ය. 15 ඊෂ්-බොෂෙත්
මිනිසුන් යවා, ඇගේ පුරුෂයා වන, ලායිෂ්ගේ පුත්
පල්තියෙල් වෙතින් ඈ ගෙන්වා ගත්තේ ය. 16 ඇගේ
පුරුෂයා බහුරීම් නගරය දක්වා ඈ පස්සේ අඬ අඬා
ගියේ ය. එවිට “හැරී යන්නැ”යි අබ්නේර් ඔහුට කී
ය. ඔහු හැරී ගියේ ය.
17 අබ්නේර් ඉශ්‍රායෙල් ප්‍රජා මූලිකයන් සමඟ
කතා කොට, “දාවිත් ඔබ හැමගේ රජු වන පිණිස
ඔබ පසු ගිය කාලයෙහි දී ඔහු සෙව්වහු ය. 18 දැන්
එසේ කරන්න. මන්ද, ‘මාගේ සෙනඟ වන
ඉශ්‍රායෙල්, පිලිස්තිවරුන්ගේ අතින් ද ඔවුන්ගේ
සියලු සතුරන්ගේ අතින් ද මාගේ මෙහෙකරු වන
දාවිත් ලවා මම ගළවාගනිමි’යි සමිඳාණන් වහන්සේ
දාවිත් ගැන වදාරා තිබේ ය”යි පැවසී ය. 19 අබ්නේර්

බෙන්ජමින්වරුන් සමඟ කතා කළේ ය. ඉන්පසු
අබ්නේර් ඉශ්‍රායලේවරුන් ද මුළු බෙන්ජමින් වංශය
ද කළ යුතු යයි සම්මත කරගත් සියල්ල
හෙබ්රොන්හි සිටි දාවිත්ට කියන පිණිස ගියේ ය.
20 මෙසේ අබ්නේර් ද ඔහු සමඟ මිනිස්සු
විසිදෙනෙක් ද හෙබ්රොන්හි සිටි දාවිත් ළඟට
පැමිණියෝ ය. දාවිත් අබ්නේර්ටත්, ඔහු සමඟ සිටි
මිනිසුන්ටත් භෝජන සංග්‍රහයක් පිළියෙළ කළේ
ය. 21 අබ්නේර් දාවිත්ට කතා කොට, “මම පිටත් ව
ගොස්, සියලු ඉශ්‍රායලේවරුන් මාගේ ස්වාමීන් වන
රජ්ජුරුවන් සමඟ ගිවිසුමක් කරන පිණිස ඔවුන් ඔබ
වෙත රැස් කරගෙන එන්නෙමි; මෙසේ ඔබේ සිත්
ගන්න සියල්ලන් කෙරෙහි ඔබ රජකම් කරනු ඇතැ”යි
කීවේ ය. දාවිත් අබ්නේර්ට යන්නට අවසර දුන් විට
ඔහු සාමදානයෙන් ගියේ ය.

## අබ්නේර් මරනු ලැබීම

22 ඒ අවස්ථාවේ දී ම දාවිත්ගේ සේවකයෝ ද
ජෝවාබ් ද කොල්ලකෑම පිණිස ගොස් බොහෝ
වස්තුව ලබාගෙන පෙරළා ආහ. ඒ වේලාවේ
අබ්නේර් හෙබ්රොන්හි දාවිත් සමඟ නොසිටියේ ය.
මන්ද, දාවිත් ඔහුට යන්නට අවසර දුන් බැවින් ඔහු
සාමදානයෙන් ගොස් තිබිණි. 23 එහෙත්, ජෝවාබ්
සහ ඔහු සමඟ සිටි මුළු සේනාව පැමිණි විට,
“නේර්ගේ පුත් අබ්නේර් රජු ළඟට ආවේ ය; රජු
ඔහුට අවසර දුන්නේ ය; ඔහු සාමදානයෙන් ගියේ
ය”යි කී හ. 24 එවිට ජෝවාබ් රජතුමා ළඟට අවුත්,
“ඔබ කළේ කුමක් ද? අබ්නේර් ඔබ ළඟට ආවේ
ය; දැන් ඔහු පිට වී ගොස් ඇත; ඔබ එසේ ඔහුට
යන්නට අවසර දුන්නේ මන් ද? 25 නේර්ගේ පුත්
අබ්නේර් ඔබ රවටා, ඔබේ යාම් ඊම් ද ඔබ කරන
සියල්ල ද දැනගන්න පිණිස ආවේ ය; ඔබ එය
දන්නෙහි දැ”යි ඇසී ය.
26 ජෝවාබ් දාවිත් වෙතින් පිටතට අවුත් අබ්නේර්
පසුපස පණිවුඩකාරයන් යැවී ය; ඔව්හු සිරාගේ ළිඳ
ළඟ සිට අබ්නේර් නැවත කැඳවාගෙන ආහ. එහෙත්,
දාවිත් එය නොදත්තේ ය. 27 අබ්නේර් හෙබ්රොන්
නගරයට පෙරළා ආ කල, ජෝවාබ් ඔහු සමඟ
රහසින් කතා කරන පිණිස දොරටුවේ පැත්තකට
ඔහු කැඳවාගෙන ගොස් ඔහුගේ බඩට ඇන්නේ ය.
අබ්නේර් මැරුණේ ය. එසේ කළේ, අබ්නේර්
ජෝවාබ්ගේ සහෝදරයා වූ අසාහෙල් මැරූ නිසා ය.
28 ඉන්පසු දාවිත් ඒ ගැන අසා, “මමත්, මාගේ
රාජ්‍යයත් නේර්ගේ පුත් අබ්නේර්ගේ ලේ වැගිරීම
ගැන සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි දී සදහට ම
නිදොස් ය. 29 ඒ වරද ජෝවාබ්ටත්, ඔහුගේ පියාගේ
මුළු වංශයටත් පඩිසන් දේ වා! ජෝවාබ්ගේ
වංශයෙහි ප්‍රමේහ රෝගයක් ඇති කෙනෙකු හෝ
කුෂ්ඨ රෝගියෙකු හෝ හැරමිටි වාරුවෙන් යන
කෙනෙකු හෝ කඩුවෙන් වැටෙන කෙනෙකු හෝ
කෑම හිඟ වූ කෙනෙකු හෝ නොසිටින කාලයක් කිසි
කලෙක නොවේ වා!”යි කීවේ ය. 30 අබ්නේර්
ගිබියොන්හි සටනේ දී, ජෝවාබ්ගේ සහ අබිෂයිගේ
සහෝදර අසාහෙල් මැරූ නිසා, මෙසේ ඔව්හු
අබ්නේර් මරාදැමූහ.
31 දාවිත් ජෝවාබ්ටත්, ඔහු සමඟ සිටි මුළු
සෙනඟටත් කතා කොට, “දුකින් ඔබේ ඇඳුම්
ඉරාගෙන, ගෝණි රෙදි හැඳ, අබ්නේර්ගේ මෘත
දේහයට පෙරටුවෙන් වැලපෙමින් යන්නැ”යි කී ය.
දාවිත් රජ ද මිනී දෙණ පස්සේ ගියේ ය. 32 ඔව්හු
අබ්නේර් හෙබ්රොන්හි තැන්පත් කළහ. රජ ශබ්ද
නගා අබ්නේර්ගේ සොහොන් පොළේ දී හැඬී ය.
මුළු සෙනඟත් හැඬූ හ. 33 රජ අබ්නේර් ගැන විලාප
ගීයක් ගයමින් මෙසේ කීවේ ය:
q2 33 “කාලකණ්ණියෙකු මැරෙන සේ අබ්නේර් මිය
යා යුතු ද?
q2 33 ඔබේ අත් නොබැඳින ලද්දේ ය;
34 ඔබේ පාදවල විලංගු නොදමන ලද්දේ ය.
q2 34 දුෂ්ටයන් අතින් මිනිසෙකු මැරුම් කන සේ ඔබ
මැරුම් කෑවෙහි ය.”
34 මුළු සෙනඟ යළිත් ඔහු ගැන හඬා වැලපුණෝ ය.
35 එය දවල් කාලය වූ බැවින් දාවිත්ට කෑම
කන්නට පෙරැත්ත කරන පිණිස මුළු සෙනඟ ආහ.
එහෙත් දාවිත්, “මා රොටී වත්, වෙන කිසි දෙයක්
වත් ඉර බැස යන තෙක් කටට ගත්තොත්, දෙවියන්
වහන්සේ මට දරුණු ලෙස දඬුවම් කරන සේක්
වා!”යි කියමින් දිවුළේ ය. 36 මුළු සෙනඟ ඒ බව
දැනගෙන එය අනුමත කළහ; එසේ ම රජ්ජුරුවන්
කළ සියල්ල ගැන සතුටු වූ හ. 37 මෙසේ නේර්ගේ
පුත් අබ්නේර් මැරීම රජ්ජුරුවන්ගේ කැමැත්ත නොවූ
බව මුළු සෙනඟ ද සියලු ඉශ්‍රායලේවරු ද ඒ දවසේ
දැනගත්හ. 38 රජතුමා තමන්ගේ නිලධාරීන්ට කතා
කොට, අද දවසේ ඉශ්‍රායලේහි අධිපතියෙකු ද
උත්තමයෙකු ද මියගිය බව ඔබ හැම දන්නේ නැද්
ද? 39 මා රජු වශයෙන් අභිෂේක ලැබූ නමුත්, අද
මම දුර්වල ව සිටිමි; ශෙරුයාගේ පුත්‍රයන් වන මේ
මනුෂ්‍යයෝ මට වඩා බලවත් ය; නපුර කරන්නාට
ඔහුගේ නපුරුකම ලෙස සමිඳාණන් වහන්සේ විපාක
දෙන සේක් වා”යි කීවේ ය.

## ඊෂ්-බෝෂෙත් මරනු ලැබීම

4 අබ්නේර් හෙබ්රොන්හි දී මැරුණු බව
සාවුල්ගේ පුත් ඊෂ්-බෝෂෙත්ට සැළ වූ විට ඔහු
අධෛර්යයට පත් විය; සියලු ඉශ්‍රායලේ ජනයා ද
කැළඹුණහ. 2 සාවුල්ගේ පුත්‍රයාට කඩා වදින යුද
කණ්ඩායම් භාර අධිපතියන් දෙදෙනෙක් සිටියහ; එක්
කෙනෙකුගේ නම බානා ය; අනික් අයගේ නම
රේකාබ් ය. මොවුහු බෙන්ජමින් ගෝත්‍රයට අයිති
බෙයෙරොතිය රිම්මොන්ගේ පුත්‍රයෝ ය. මන්ද,
බෙයෙරොත් ද බෙන්ජමින් වංශයට ඇතුළත් කර
තිබිණි. 3 බෙයෙරොතිවරු ගිත්තායිම් නගරයට පලා
ගොස් අද දක්වා එහි විදේශිකයන් වී සිටිති.
4 2 සාමු 9:3 සාවුල්ගේ පුත් ජොනතන්ට දෙපා
කොර වූ පුත්‍රයෙක් සිටියේ ය. ජෙශ්‍රෙයෙල්හි සිටි
සාවුල් හා ජොනතන් ගැන ආරංචි ලැබුණු කල ඔහු
පස් හැවිරිදි ළමයෙකු ව සිටියේ ය. ඔහුගේ කිරි මව

ඔහු වඩාගෙන පලා ගියා ය. ඈ කඩිනම් කර පලා
යන අතර ඔහු වැටී කොර වුණේ ය. ඔහුගේ නම
මෆිබොෂෙත් ය.
5 තවද, බයෙරොතිය රිම්මොන්ගේ පුත්‍රයන් වූ
රේකාබ් ද බානා ද ගොස් දවල් ග්‍රීෂ්ම වේලාව
පමණේ දී ඊෂ්-බොෂෙත්ගේ ගෙට ඇතුළු වූ හ. ඉර
මුදුන් වේලාව නිසා ඔහු සැතපී සිටියේ ය. 6 ඒ
අවස්ථාවේ දී තිරිඟු පොළෙමින් සිටි දොරටුපාලී
නිදිබර වී නිදා වැටුණා ය. එවිට රේකාබ් ද ඔහුගේ
සහෝදර වූ බානා ද ඇතුළට පිවිසියහ. 7 ඔව්හු
ගෙට ඇතුළු වී ඊෂ්-බොෂෙත් ඔහුගේ නිදන
කාමරයේ යහනේ නිදා සිටිය දී ඔහුට පහර දී ඔහු
මරා, ඔහුගේ හිස කපා දමා, එය රැගෙන මුළු රැයේ
ම අරබා සමභූමිය පාරෙන් ගියාහ. 8 ඔව්හු
හෙබ්‍රොන්හි සිටි දාවිත් වෙත ඊෂ්-බොෂෙත්ගේ හිස
ගෙනවුත්, රජුට කතා කොට, “ඔබ මරන්නට සෙවූ,
ඔබට සතුරු වූ, සාවුල්ගේ පුත්‍රයා වන ඊෂ්-
බොෂෙත්ගේ හිස මෙන්න; මෙසේ සමිඳාණන්
වහන්සේ මාගේ ස්වාමීන් වන රජ්ජුරුවන් උදෙසා අද
සාවුල්ගෙන් ද ඔහුගේ වංශයෙන් ද පළිගත්
සේකැ”යි කී හ.
9 දාවිත් ද බයෙරොත්හි රිම්මොන්ගේ පුත්‍රයන්
වන රේකාබ්ටත්, ඔහුගේ සහෝදර බානාටත්
පිළිතුරු දෙමින්, “සියලු විපත්තිවලින් මාගේ ප්‍රාණය
ගළවාගත් ජීවමාන සමිඳාණන් වහන්සේගේ
නාමයෙන් මම දිවුරා මෙසේ කියමි: 10 2 සාමු
1:1-16යහපත් ආරංචියක් ගෙනෙමි යි සිතාගෙන එක්
කෙනෙක්, ‘සාවුල් මැරුණේ ය’යි මට දැන්වූ විට මම
ඔහු අල්ලා ශික්ලග්හි දී මරා දැමුවෙමි. ඔහු ගෙනෝ
ආරංචියට මා විසින් දෙන ලද ප්‍රතිවිපාකය එය වේ.
11 තමාගේ ගෙයි, තමාගේ යහනේ සිටිය දී, දැහැමි
මිනිසකු මරාදැමූ දුෂ්ට මිනිසුන්ට ඊට කොපමණ
වැඩියෙන් එසේ කරන්නට යුතු ද? එබැවින් ඔහුගේ
ලේ වැගිරීමේ වරදට ඔබෙන් පළි ගෙන ඔබ දැන්
මිහි පිටින් පහ කරදැමීම මට යුතු නොවේ දැ”යි
ඇසුවේ ය. 12 දාවිත් තමාගේ තරුණයන්ට අණ
දුන්නේ ය; ඔව්හු ඔවුන් මරා, ඔවුන්ගේ අත් පා
කපාදමා හෙබ්‍රොන්හි පොකුණ ළඟ එල්ලා තැබූ හ.
එහෙත්, ඔව්හු ඊෂ්-බොෂෙත්ගේ හිස රැගෙන
හෙබ්‍රොන්හි තිබුණු අබ්නේර්ගේ සොහොනේ
තැන්පත් කළහ.

## දාවිත් ඉශ්‍රායලේහි රජකමට පත් වීම

(1 වංශා 11:1-9;14:1-7)

5 එකල සියලු ඉශ්‍රායලේ ගෝත්‍රයෝ
හෙබ්‍රොන්හි සිටි දාවිත් වෙත අවුත්, “අපි
ඔබේ ම ලේ නෑයෝ වෙමු. 2 පසු ගිය කාලයේ දී,
සාවුල් අපේ රජ ව සිටි කාලයෙහි ඉශ්‍රායලේවරුන්
සටනට ගෙන ගියේත්, ඔවුන් ආපසු ගෙනාවේත් ඔබ
ම ය. සමිඳාණන් වහන්සේ ඔබට කතා කොට, ‘නුඹ
මාගේ ඉශ්‍රායලේ සෙනඟ පාලනය කරමින්,
ඉශ්‍රායලේ කෙරෙහි අධිපතියා වන්නෙහි ය’යි වදාළ
සේකැ”යි කීවෝ ය. 3 මෙසේ ඉශ්‍රායලේහි සියලු
ප්‍රජා මූලිකයෝ හෙබ්‍රොන්හි සිටි රජ්ජුරුවන් වෙත
පැමිණියෝ ය. දාවිත් රජු හෙබ්‍රොන්හි දී සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි ඔවුන් සමඟ ගිවිසුමක් කළේ
ය. ඔව්හු දාවිත් ඉශ්‍රායලේවරුන්ගේ රජු වශයෙන්
අභිෂේක කළෝ ය. 4 1 රාජා 2:11; 1 වංශා 3:4;
29:27දාවිත් රජකමට පත් වුණ විට ඔහුගේ වයස
අවුරුදු තිහකි. ඔහු සතළිස් අවුරුද්දක් රජකම් කළේ
ය. 5 ඔහු හෙබ්‍රොන්හි ජුදාවේවරුන් කෙරෙහි රජකම්
කළේ සත් අවුරුදු හය මාසයකි; ජෙරුසලමේ ඔහු
සියලු ඉශ්‍රායලේවරුන් ද ජුදාවේවරුන් ද කෙරෙහි
රජකම් කළේ තිස්තුන් අවුරුද්දකි.

## ජෙරුසලම අත්පත් කරගැනීම

6 ජෝෂු 15:63; විනි 1:21 රජු ද ඔහුගේ සෙනඟ ද
රටේ වැසියන් වූ ජෙබුසිවරුන්ට විරුද්ධ ව
ජෙරුසලමට ගියෝ ය. ඔව්හු ද, “දාවිත්ට මෙහි
ඇතුළු වන්නට බැරි ය”යි කියමින් දාවිත්ට කතා
කොට, “ඔබ මෙහි ඇතුළු නොවන්නෙහි ය. අන්ධයන්
හා කොරුන් ඔබ පහකරදමනු ඇතැ”යි කීවෝ ය.
7 එසේ වුව ද, දාවිත් සියොන් බලකොටුව
අල්ලාගත්තේ ය; එය දාවිත්ගේ නුවර විය.
8 ඒ දවසේ දාවිත් කතා කොට, “ජෙබුසිවරුන්ට
පහර දෙන සියල්ලෝ ම දිය අගල තුළින් ගොස් මා
ද්වේෂ කරන මේ කොරුන්ටත්, අන්ධයන්ටත් පහර
දෙත් වා”යි කී ය. ‘අන්ධයන් ද කොරුන් ද දේව
මාලිගාවට ඇතුළු නොවිය යුතු ය’ යන කීම ඇති
වූයේ මේ නිසා ය.
9 දාවිත් බලකොටුවේ වාසය කළේ ය. එය
දාවිත්ගේ නුවර යයි නම් කරන ලදී. දාවිත් මිල්ලෝ
පටන් වටකරින් ද ඇතුළතින් ද නගර ගොඩනැඟුවේ
ය. 10 කල් යත් යත් දාවිත් බලවත් විය. එසේ
වූයේ, සියලු බලැති දෙවි සමිඳාණන් වහන්සේ ඔහු
සමඟ සිටි බැවිනි.
11 තවද, තීර්හි රජ වූ හීරාම් තමේ
පණිවුඩකාරයන් ද කිහිරි ලී ද වඩුවන් ද ගල් වඩුවන්
ද දාවිත් වෙත එව්වේ ය. ඔව්හු දාවිත්ට මාලිගාවක්
ගොඩනැඟුවෝ ය. 12 තමා ඉශ්‍රායලේවරුන්ගේ රජු
වශයෙන් සමිඳාණන් වහන්සේ විසින් පත් කරනු
ලැබූ බවත්, උන් වහන්සේගේ සෙනඟ වන
ඉශ්‍රායලේ උදෙසා තමාගේ රාජ්‍යය උසස් කරනු
ලැබූ බවත් දාවිත් දැනගත්තේ ය.
13 දාවිත් හෙබ්‍රොන්හි සිට පැමිණි පසු තවත්
උපභාර්යාවන් ද භාර්යාවන් ද ජෙරුසලමෙන්
පාවාගත්තේ ය. තව පුත්‍රයෝ ද දූවරු ද දාවිත්ට
දාව උපන්නෝ ය. 14 ජෙරුසලමෙහි දී දාවිත්ට උපන්
අයගේ නම් මේ ය: ෂම්මුවා, ෂෝබාබ්, නාතාන්,
සලමොන්; 15 ඉබ්හාර්, එලිෂූවා, නෙපෙග්, ජාපියා;
16 එලිෂාමා, එලියාදා සහ එලිපලෙත් ය.

## දාවිත් රජ පිලිස්තිවරුන්ට පහර දීම

(1 වංශා 14:8-17)

17 දාවිත් ඉශ්‍රායලේවරුන්ගේ රජු වශයෙන්
අභිෂේක කරනු ලැබූ බව පිලිස්තිවරුන් ඇසූ කල
ඔව්හු සියල්ලෝ ම දාවිත් සොයා ආවෝ ය. දාවිත් ඒ

අසා බලකොටුවට බැස ගියේ ය. 18 පිලිස්තිවරු
අවුත් රපොවරුන්ගේ මිටියාවතේ පැතිර සිටියෝ ය.
19 දාවිත් සමිඳාණන් වහන්සේගෙන් විචාරමින්, “මා
පිලිස්තිවරුන්ට විරුද්ධ ව යන්න ද? ඔබ වහන්සේ
ඔවුන් මාගේ අතට පාවා දෙන සේක් දැ”යි ඇසුවේ
ය. සමිඳාණන් වහන්සේ පිළිතුරු දෙමින්, “යන්න, මම
සැබැවින් පිලිස්තිවරුන් නුඹ අතට පාවා දෙමි”යි
දාවිත්ට වදාළ සේක.
20 දාවිත් බාල්-පෙරාශීම් නගරයට අවුත්, එහි දී
ඔවුන්ට පහර දී, “ගඟක් ඉවුරු තළා යන්නා සේ
සමිඳාණන් වහන්සේ මා ඉදිරියේ මාගේ සතුරන් බිඳ
දැමූ සේකැ”යි කීවේ ය. එබැවින් ඔහු ඒ ස්ථානයට
භංගස්ථානය යන අරුත ඇති බාල්-පෙරාශීම් යන නම
තැබී ය. 21 ඔව්හු තමන්ගේ දේව රූප එහි දමා
ගියෝ ය. දාවිත් ද ඔහුගේ සෙනඟ ද ඒවා රැගෙන
ගියෝ ය.
22 පිලිස්තිවරු යළිත් පැමිණ රපොවරුන්ගේ
මිටියාවතේ පැතිර සිටියෝ ය. 23 දාවිත් සමිඳාණන්
වහන්සේගෙන් විචාළ කල්හි උන් වහන්සේ කතා
කරමින්, “නුඹ ඉස්සරහට නොයන්න; වටකරින්
ඔවුන්ට පිටුපසින් ගොස් ඇඹිල්ල ගස්වලට ඉදිරිපිටින්
ඔවුන් ළඟට පැමිණෙන්න. 24 තවද, ඇඹිල්ල ගස්
මුදුන්වල අඩි තබා යන ශබ්දයක් නුඹට ඇසෙන කල
කඩිසර වන්න. මන්ද, ඒ වේලාවේ දී සමිඳාණන්
වහන්සේ පිලිස්තිවරුන්ගේ සේනාවට පහර දෙන
පිණිස නුඹට පෙරටුව යන සේකැ”යි වදාළ සේක.
25 දාවිත් සමිඳාණන් වහන්සේ අණ කළ පරිදි කර,
ගෙබොහි සිට ගෙශෙරේට පැමිණෙන තෙක්
පිලිස්තිවරුන්ට පහර දුන්නේ ය.

### ගිවිසුම් කරඬුව ජෙරුසලමට ගෙන ඒම

(1 වංශා 13:1-14;15:25;16:6,43)

6 ඉශ්‍රායෙල්වරුන්ගෙන් තෝරාගත් සියල්ලන්
වන මිනිසුන් තිස්දහසක් දාවිත් නැවත රැස්
කළේ ය. 2 නික්ම 25:22දාවිත් නැඟිට තමා සමඟ
සිටි මුළු සෙනඟ කැටුව යනුයේ, කෙරුබ්වරුන් පිට
සිහසුන් අරා සිටින සියලු බලැති සමිඳාණන්
වහන්සේගේ නාමය දරන දෙවියන් වහන්සේගේ
ගිවිසුම් කරඬුව ගෙනෙන පිණිස ජුදාහි බායාලේට
ගියේ ය. 3 1 සාමු 7:1-2ඔව්හු හලෙ මත පිහිටා
තිබුණු අබිනාදාබ්ගේ ගෙයින් දෙවියන් වහන්සේගේ
ගිවිසුම් කරඬුව අලුත් රථයක තබා ගෙනාවෝ ය.
අබිනාදාබ්ගේ පුත්‍රයන් වන උශ්ශා ද අහියෝ ද
අලුත් රථය දක්කාගෙන ගියෝ ය. 4 ඔව්හු හලෙ
මත තිබුණ අබිනාදාබ්ගේ ගෙයින් දෙවියන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව ගෙන රථයේ
තබාගෙන ගෙනාවෝ ය; ඒ ඉදිරියෙන් අහියෝ ගමන්
කළේ ය. 5 දාවිත් සහ මුළු ඉශ්‍රායෙල් වංශය
සියලු ආකාර තූර්ය භාණ්ඩවලින් ද කුඩා වීණාවලින්
ද කයිතාලම්වලින් ද වීණාවලින් ද රබන්වලින් ද
අත්තලවලින් ද නාද කරමින් සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි මහ හඬින් ගයමින් නැටුවෝ ය.
6 ඔවුන් නාකොන්ගේ කමතට පැමිණි විට හරකුන්
දැඟලූ බැවින්, උශ්ශා දෙවියන් වහන්සේගේ ගිවිසුම්
කරඬුවට අත දිගු කොට එය ඇල්ලුවේ ය. 7 එවිට
සමිඳාණන් වහන්සේගේ උදහස උශ්ශාට විරුද්ධ ව
ඇවිළිණි. දෙවියන් වහන්සේ ඒ වරද නිසා එහි දී
ඔහුට පහර දුන් සේක. ඔහු දෙවියන් වහන්සේගේ
ගිවිසුම් කරඬුව ළඟ මැරුණේ ය. 8 සමිඳාණන්
වහන්සේ උශ්ශාට පහර දුන් බැවින්, දාවිත්
ශෝකයට පත් වී ඒ ස්ථානයට උශ්ශා ප්‍රහාරය යන
අරුත ඇති පෙරෙශ්-උශ්ශා යන නම තැබුවේ ය. ඒ
නාමය අද දක්වා පවතී.
9 ඒ දවසේ දී දාවිත් සමිඳාණන් වහන්සේට භය
ව, “සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව මා
ළඟට එන්නේ කෙසේ දැ”යි කීවේ ය. 10 එබැවින්
දාවිත් සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
දාවිත්ගේ නුවරට ගෙනෙන්නට අකමැති ව, එය
අහකට හරවා ගිත්තීය ඕබෙද්-ඒදොම්ගේ නිවසෙට
ගෙන ගියේ ය. 11 1 වංශා 26:4-5සමිඳාණන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව ගිත්තීය ඕබෙද්-
ඒදොම්ගේ නිවසේ තුන් මාසයක් තිබුණේ ය.
සමිඳාණන් වහන්සේ ඕබෙද්-ඒදොම්ටත්, ඔහුගේ මුළු
පවුලටත් ආශීර්වාද කළ සේක.
12 දෙවියන් වහන්සේගේ ගිවිසුම් කරඬුව නිසා
සමිඳාණන් වහන්සේ ඕබෙද්-ඒදොම්ටත්, ඔහුට අයිති
සියල්ලටත් ආශීර්වාද කරන සේකැ යි දාවිත්ට
දන්වන ලද්දේ ය. එවිට දාවිත් ගොස් දෙවියන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව ඕබෙද්-ඒදොම්ගේ
නිවසෙන් දාවිත්ගේ නුවරට ප්‍රීති සහගත ව
ගෙනාවේ ය. 13 තවද, සමිඳාණන් වහන්සේගේ
ගිවිසුම් කරඬුව උසුලන්නන් අඩි හයක් ගිය කල
දාවිත් ගොනෙකු ද වස්සෙකු ද පූජා කළේ ය.
14 දාවිත් හණ ඒපොද් සැට්ටයක් හැඳගෙන
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි මුළු ශක්තියෙන්
නැටුවේ ය. 15 මෙසේ දාවිත් සහ මුළු ඉශ්‍රායෙල්
වංශය ඔල්වර ශබ්දයත්, හොරණෑ ශබ්දයත් ඇති ව
සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව ගෙනාහ.
16 සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
දාවිත්ගේ නුවරට පැමිණි කල සාවුල්ගේ දූව වන
මීකල් කවුළුවෙන් බලා, සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි දාවිත් රජ උඩ පනිමින් නටනු දැක ඇගේ
සිතින් ඔහු හෙළා දැක්කා ය. 17 ඔව්හු සමිඳාණන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව ඇතුළට ගෙනවුත්,
දාවිත් ඊට පිහිටුවා තිබුණු කූඩාරම මධ්‍යයෙහි ඊට
නියම ස්ථානයෙහි, එය තැබූ හ. දාවිත් සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි දවන යාග පූජා සහ
සහභාගිකමේ පූජා ඔප්පු කළේ ය. 18 දාවිත් දවන
යාග පූජා ද සහභාගිකමේ පූජා ද ඔප්පු කර නිම
කළ පසු සර්ව පරාක්‍රම සමිඳාණන් වහන්සේගේ
නාමයෙන් සෙනඟට ආශීර්වාද කළේ ය. 19 1 වංශා
16:43තවද, ඔහු මුළු සෙනඟට එනම්, ඉශ්‍රායෙල්
සමූහයාගෙන් එක එක පුරුෂයාට හා ස්ත්‍රියට
රොටියකුත්, මස් කැබැල්ලකුත්, වියළි මුද්‍රික
කැටියකුත් දුන්නේ ය. එවිට මුළු සෙනඟ තම
තමන්ගේ නිවසේවලට යන්නට ගියහ.

20 දාවිත් ද තමන්ගේ ගෙවෙසියන්ට ආශීර්වාද
කරන පිණිස හැරී ගියේ ය. සාවුල්ගේ දුව වන
මීකල් දාවිත්ගේ පෙරමඟට අවුත් කතා කොට,
“කමකට නැති කෙනෙකු විලි ලජ්ජා නැති ව
තමාගේ ඇඳුම් ගලවා දමන්නා සේ අද සිය
මෙහෙකරුවන්ගේ දාසීන් ඉදිරියෙහි තමාගේ ඇඳුම්
ගලවා දැමූ ඉශ්රායලේ රජතුමා අද තේජවන්ත වී
සිටින හැටි පුදුම ය”යි කීවා ය.
21 දාවිත් මීකල්ට කතා කොට, “එසේ කරන
ලද්දේ, සිය සෙනඟ වන ඉශ්රායලේ කෙරෙහි
අධිපතියා කොට පත් කරන පිණිස ඔබේ පියාත්,
ඔහුගේ මුළු වංශයත් පහ කොට මා තෝරාගත්
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි ය. ඒ නිසා මම
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි නටන්නෙමි. 22 මම
ඊටත් වඩා නීච ව මාගේ ම ඇස් හමුයෙහි පහත්
වන්නෙමි, එහෙත්, ඔබ කී දාසීන්ගෙන් නම් ගෞරව
ලබන්නෙමි”යි කීවේ ය.
23 එබැවින් සාවුල්ගේ දුව වන මීකල්ට මැරෙන
තුරු දරුවකු නොලැබුණේ ය.

## නාතාන්ගෙන් දාවිත් රජුට පණිවුඩයක්
(1 වංශා 17:1-15)

7 දාවිත් රජුගේ සියලු සතුරන්ගෙන් සමිඳාණන්
වහන්සේ ඔහුට හැම අතින් ම නිදහස දුන්
පසු, ඔහු සිය නිවසෙහි වාසය කළේ ය. 2 එසේ
සිටින අතර රජතුමා නාතාන් නම් දිවැසිවරයාට කතා
කොට, “මෙන්න, මම දැන් කිහිරි ගයෙක වසමි;
එහෙත්, දෙවියන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
කූඩාරමක් ඇතුළේ තිබේ ය”යි කීවේ ය.
3 එවිට නාතාන් පිළිතුරු දෙමින්, “ඔබ ගොස් ඔබේ
සිතේ තිබෙන සියල්ල කරන්න; මන්ද, සමිඳාණන්
වහන්සේ ඔබ සමඟ වැඩ සිටින සේකැ”යි රජුට
කීවේ ය.
4 තවද, එම රාත්රියේ සමිඳාණන් වහන්සේගේ
පණිවුඩය නාතාන් වෙත පැමිණියේ ය. 5 උන්
වහන්සේ මෙසේ වදාළ සේක: “නුඹ ගොස්,
සමිඳාණන් වහන්සේ මෙසේ කියන සේකැ යි මගේ
මෙහෙකරු වන දාවිත්ට කියන්න: 6 ‘මාගේ
වාසස්ථානය සඳහා මට මාලිගාවක් ගොඩනඟන්නට
යන්නේ නුඹ ද? මම ඉශ්රායලේ සෙනඟ මිසරයෙන්
ගෙනා දවසේ පටන් අද දක්වා ගෘහයක වාසය
නොකොට කූඩාරමක ද මණ්ඩපයක ද වාසය
කළෙමි. 7 මාගේ සෙනඟ වන ඉශ්රායලේ පාලනය
කරන පිණිස මා අණ දුන් වීර පුරුෂයන්ගෙන්, ‘නුඹලා
මට කිහිරි ලීවලින් ගෘහයක් ගොඩනොනැඟුවේ
මන්දැ’යි සියලු ඉශ්රායලේ සෙනඟ හැසුරුණ කිනම්
ස්ථානයක දී ඇසුවෙම් ද?
8 “එබැවින්, මාගේ මෙහෙකරු දාවිත්ට මෙසේ
කියන්නැ යි සියලු බලැති සමිඳාණන් වහන්සේ
මෙසේ වදාරන සේක. මාගේ සෙනඟ වන
ඉශ්රායලේ කෙරෙහි අධිපතියා වන පිණිස තණ
බිමෙන් ද බැටළුවන් පස්සේ යාමෙන් ද මම නුඹ
කැඳවාගතිමි. 9 නුඹ ගිය හැමතැන්හි ම මම නුඹ
සමඟ සිට, නුඹේ සතුරන් නුඹ ඉදිරියෙන්
සිඳදැමුවෙමි. මිහි පිට සිටින උත්තමයන්ගේ නාමය
මෙන් උසස් නාමයක් නුඹට සලසා දෙන්නෙමි.
10 මාගේ සෙනඟ වන ඉශ්රායලේ ඔවුන්ට ම හිමි
ස්ථානයෙහි වාසය කරමින්, තවත් බැහැර කරනු
නොලබන ලෙස මම ඔවුන්ට ස්ථානයක් නියම
කොට ඔවුන් ස්ථිර කොට පිහිටුවන්නෙමි. දුෂ්ටයෝ
පෙර කළා සේ තවත් ඔවුන්ට හිරිහැර
නොකරන්නාහ. 11 එසේ කරන්නේ, මා ඉශ්රායලේ
කෙරෙහි වීර පුරුෂයන් පත් කළ කාලයේ දී මෙන් ය.
නුඹේ සියලු සතුරන්ගෙන් නිදහස ලැබෙන්නට
සලස්වන්නෙමි. ඇරත්, සමිඳාණන් වහන්සේ නුඹට
වංශයක් උපදවා දෙන බව සමිඳාණන් වහන්සේ ම
නුඹට දන්වන සේක. 12 ගීතා 89:3-4; 132:11; ජොහ
7:42; ක්රියා 2:30නුඹේ ආයු කාලය සම්පූර්ණ වී
නුඹේ පියවරුන් සමඟ සැතපුණ කල්හි, මම නුඹෙන්
පැවත එන නුඹේ ම දරුවකු නුඹට පසු ව රජකමට
නංවා ඔහුගේ රාජ්යයෙහි ඔහු ස්ථිර කරන්නෙමි.
13 ඔහු ම මාගේ නාමයට මාලිගාවක්
ගොඩනඟන්නේ ය. ඔහුගේ රාජ්යයේ සිංහාසනය ද
සදහට ම ස්ථිර කරන්නෙමි. 14 ගීතා 89:26-27; 2
කොරි 6:18; හෙබ්රෙ 1:5මම ඔහුට පියකු වන්නෙමි;
ඔහු මට පුත්රයකු වන්නේ ය. ඔහු අයුතුකම්
කළොත් මම පියකු මෙන් ඔහුට ඉපලෙන් දඬුවම්
කරන්නෙමි; මිනිසුන් පහර දෙන සේ ඔහුට පහර
දෙන්නෙමි. 15 එහෙත්, නුඹේ මාර්ගයෙන් මා විසින්
අහක් කරන ලද සාවුල්ගෙන් මාගේ ස්ථිර ප්රේමය
පහ කළ ලෙස ඒ රජුගෙන් එය පහ නොකරන්නෙමි.
16 ගීතා 89:36-37නුඹේ වංශය ද රාජශ්රීය ද මා
ඉදිරියෙහි සදහට ම ස්ථිර කරනු ලබන්නේ ය. නුඹේ
සිංහාසනය සදහට ම පිහිටුවනු ලබන්නේ ය.”
17 මේ සියලු වචනවල හැටියටත්, මේ මුළු
දර්ශනයේ හැටියටත් නාතාන් දාවිත්ට දැන්වීය.

## දාවිත් රජුගේ ස්තුති දීමේ යාච්ඤාව
(1 වංශා 17:16-27)

18 එවිට දාවිත් රජ ඇතුළට ගොස් සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි හිඳගෙන, මෙසේ යැදී ය: “දෙවි
ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ මෙපමණ දුර මා
ගෙන ඒමට තරම් මම කවරෙක් ද? මාගේ වංශය
කුමක් ද? 19 එහෙත්, දෙවි ස්වාමීන් වහන්ස, මේ
දේ වුව ද, ඔබ ඇස් හමුයෙහි සුළු දෙයකි. මතු
බොහෝ කලකට පවතින ඔබේ මෙහෙකරුවාගේ
වංශය ගැනත් ඔබ වහන්සේ කතා කළ සේක. දෙවි
ස්වාමීන් වහන්ස, මතු පරම්පරා ද මට පෙන්වා ඇත.
20 දාවිත් ඔබ වහන්සේට තවත් කුමක් කියන්න ද?
දෙවි ස්වාමීන් වහන්ස, ඔබ නම් ඔබේ මෙහෙකරුවා
දන්නා සේක. 21 ඔබ මේ සියලු උසස් දේ කොට
ඔබේ මෙහෙකරුවාට එය දැන්වූයේ ඔබේ
පොරොන්දුව නිසා ය. ඔබේ සිතට එකඟ ලෙස ය.
22 එබැවින් දෙවි ස්වාමීන් වහන්ස, ඔබ උතුම් ව
සිටින සේක. ඔබ වහන්සේට සමාන කෙනෙකු ගැන
අප කන්වලින් කවදාවත් අසා නැත; ඔබ හැර වෙන
කිසි දෙවි කෙනෙක් ද නැත. 23 ද්වි.නී. 4:34මිහි පිට
කුමන ජාතියක් ඔබේ සෙනඟ වන ඉශ්රායලේට

සමාන ද? දෙවි ස්වාමීන් වහන්ස, තමන් සෙනඟ වන
පිණිස දෙවියන් වහන්සේ විසින් වහල්කමින්
මුදාගන්න ලද තවත් ජාතියක් ඇද් ද? ඔබ වහන්සේ
කීර්තිය දිනාගන්න පිණිස උදාර වූ, භයානක වූ දේ
කර දුන් තවත් ජාතියක් ඇද් ද? අන්‍ය ජාතීන් ද
පන්නා දමා, ඔවුන්ගේ දෙවිවරුන් ද පන්නා දමා,
මිසර දේශයෙන් තමන් වහන්සේ උදෙසා මුදාගත්
ජාතියට සමාන අන් ජාතියක් ඇද් ද? 24 මෙසේ
ඔබේ සෙනඟ වන ඉශ්‍රායෙලේ, සදහට ම ඔබට
සෙනඟක් වශයෙන් ස්ථිර කරගෙන, සමිඳුනි ඔබ ම
ඔවුන්ගේ දෙවියන් වහන්සේ ව සිටින සේක.
25 “ඉතින් දෙවි ස්වාමීන් වහන්ස, ඔබේ
මෙහෙකරුවා හා ඔහුගේ වංශය ගැනත් ඔබ වදාළ
වචන සදහට ම ස්ථිර කොට, ඔබ වදාළ ලෙස කළ
මැනව. 26 ‘ඉශ්‍රායෙලේ කෙරෙහි දෙවියන් වහන්සේ
ව සිටින්නේ සියලු බලැති සමිඳාණන් වහන්සේ ය’යි
කියනු ලැබීමෙන් ඔබේ නාමය සදහට පසසනු
ලැබේ වා! ඔබේ මෙහෙකරු වන දාවිත්ගේ වංශය ද
ඔබ ඉදිරියෙහි ස්ථිර ව තිබේ. 27 මන්ද,
ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවි වන සියලු බලැති
සමිඳාණන් වහන්ස, ඔබ කතා කොට, ‘මම නුඹට
වංශයක් සාදා දෙන්නෙමි’යි ඔබේ මෙහෙකරුවාට
එළිදරව් කළ සේක. එබැවින් මේ යාච්ඤාව ඔබට
ඔප්පු කරන්නට ඔබේ මෙහෙකරුවා ධෛර්ය ගත්තේ
ය.
28 “ඉතින් දෙවි ස්වාමීන් වහන්ස, ඔබ ම දෙවියන්
වහන්සේ ය, ඔබේ වචනය සැබෑ ම ය, ඔබ ද ඔබේ
මෙහෙකරුවාට මේ යහපත් දේ පොරොන්දු වූ
සේක. 29 එබැවින් ඔබේ මෙහෙකරුවාගේ වංශය
ඔබ ඉදිරියෙහි සදහට ම පවතින පිණිස ඊට
ආශීර්වාද කරන්නට ඔබ කැමැති වන සේක් වා!
මන්ද, දෙවි ස්වාමීන් වහන්ස, ඔබ එසේ වදාළ
සේක. ඔබේ ආශීර්වාදය මඟින් ඔබේ
මෙහෙකරුවාගේ වංශය සදහට ම ආශීර්වාද කරනු
ලැබේ වා!”

## දාවිත් රජුගේ යුද්ධ ව්‍යාපාර
(1 වංශා 18:1-17)

8 ඉන්පසු දාවිත් පිලිස්තිවරුන්ට පහර දී ඔවුන්
යටත් කරගෙන, අගනුවර පාලනය
පිලිස්තිවරුන් අතින් පැහැර ගත්තේ ය.
2 ඔහු මෝවබ්වරුන්ටත් පහර දී, ඔවුන්ට බිම දිගා
වන්නට සලස්වා ලණුවකින් මැන්නේ ය. මරණයට
පත් කිරීමට පේළි දෙකක් ද ඉතුරු කරන පිණිස එක
සම්පූර්ණ පේළියක් ද මැන වෙන් කළේ ය. මෙසේ
මෝවබ්වරු දාවිත්ට මෙහෙකරුවන් වී කප්පම් ගෙවූ
හ.
3 තවද, රෙහොබ්ගේ පුත්‍රයා ද ශෝබාහි රජු ද
වන හදද්-එශෙර් යුප්‍රටීස් ගංගාව ළඟ තමාගේ
බලය නැවත පිහිටුවන්නට යද්දී දාවිත් ඔහුටත් පහර
දී, 4 අසරුවන් එක්දහස් හත්සියයක් ද පාබළ සෙනඟ
විසිදහසක් ද ඔහුගෙන් අල්ලාගෙන, එයින් රථ
සියයකට අසුන් ඉතිරි කරගෙන අනික් සියලු
අශ්වයන්ගේ කුඳිකපා අබලන් කළේ ය.
5 දමස්කයෙහි සිරියන්වරු ශෝබාහි රජ වූ හදද්-
එශෙර්ට උපකාර කරන්නට ආහ. එවිට දාවිත්
සිරියන්වරුන්ගෙන් මිනිසුන් විසිදෙදහසක් මැරුවේ ය.
6 සිරිය දමස්කයේ මුරකාර හමුදා තැබුවේ ය.
සිරියන්වරු ද දාවිත්ට මෙහෙකරුවන් වී කප්පම් ගෙවූ
හ. දාවිත් ගිය ගිය තැන සමිඳාණන් වහන්සේ ඔහුට
ජය අත් කර දුන් සේක. 7 දාවිත් හදද්-එශෙර්ගේ
සේවකයන්ට තිබුණු රන් පළිස් රැගෙන ජෙරුසලමට
ගෙනාවේ ය. 8 බෙටා ද බෙරොතයි ද යන හදද්-
එශෙර්ගේ නගරවලින් දාවිත් රජ ලෝකඩ බොහෝ
සෙයින් ගත්තේ ය.
9 දාවිත්, හදද්-එශෙර්ගේ මුළු සේනාවට පහර දුන්
බව හමාත්හි රජු වන තොයි ඇසූ විට, දාවිත් එසේ
හදද්-එශෙර්ට විරුද්ධ ව සටන් කොට ඔහුට පහර
දුන් නිසා දාවිත්ට ආචාර කරන්නටත්, 10 ඔහුට
ආශීර්වාද කරන්නටත් ඔහු වෙත තමාගේ පුත්
ජෝරාම් යැව්වේ ය. මන්ද, හදද්-එශෙර් හා තොයි
අතරේ යුද්ධ පැවතුණේ ය. ජෝරාම් රන් බඩු ද රිදී
බඩු ද ලෝකඩ බඩු ද ගෙනාවේ ය. 11 මේවා ද
දාවිත් රජු යටත් කරගත් සියලු ජාතීන්ගෙන් ගත් රන්
රිදී ද ඔහු සමිඳාණන් වහන්සේට කැප කළේ ය.
12 ඔහු ඒ රන් රිදී ගත්තේ, ඒදොම්වරුන්ගෙන් ද
මෝවබ්වරුන්ගෙන් ද අම්මෝන්වරුන්ගෙන් ද
පිලිස්තිවරුන්ගෙන් ද අමලෙක්වරුන්ගෙන් ද
රෙහොබ්ගේ පුත් ශෝබාහි රජ වූ හදද්-එශෙර්ගෙන්
ද ගත් කොල්ලයෙන් වේ.
13 ගීතා 60 දාවිත් ලුණු මිටියාවතෙහි
ඒදොම්වරුන්ගෙන් දහඅට දාහකට පහර දී, හැරී ආ
කල ඔහු කීර්තියට පත් විය. 14 ඔහු ඒදොම්හි හැම
තැන ම මුරකාර හමුදා තැබුවේ ය. සියලු ඒදොම්වරු
දාවිත්ට මෙහෙකරුවෝ වූ හ. දාවිත් ගිය ගිය තැන්හි
සමිඳාණන් වහන්සේ ඔහුට ජය අත් කර දුන් සේක.
15 දාවිත් මුළු ඉශ්‍රායෙලේ කෙරෙහි රජකම් කරමින්
තමාගේ මුළු සෙනඟට විනිශ්චය හා යුක්තිය ඉෂ්ට
කළේ ය. 16 ශෙරුයාගේ පුත් ජෝවාබ් සේනාපතියා
ව සිටියේ ය. අහිලුද්ගේ පුත් ජෙහෝෂාපාට්
වාර්තාකරුවා ව සිටියේ ය. 17 අහිතුබ්ගේ පුත්
සාදොක් හා අබියාතර්ගේ පුත් අහිමෙලෙක්
පූජකයන් ව සිටියහ. සෙරායා ලේකම් ව සිටියේ ය.
18 ජෙහෝයාදාගේ පුත් බෙනායා කෙරේතිවරුන් ද
පෙලෙතිවරුන් ද කෙරෙහි අධිපතියා ව සිටියේ ය.
දාවිත්ගේ පුත්‍රයෝ පූජකවරුන් ව සිටියහ.

## දාවිත් රජ සහ මෙපිබොෂෙත්

9 1 සාමු 20:15-17 දාවිත් කතා කොට,
“සාවුල්ගේ වංශයෙන් යමෙක් තව ඉතුරු ව සිටී
ද? සිටිනවා නම්, මම ජොනතන් නිසා ඔහුට
කරුණාව පෙන්වන්නෙමි”යි කීවේ ය.
2 සාවුල්ගේ වංශයට අයිති ශීබා නම්
මෙහෙකරුවෙක් විය. ඔවුන් ඔහු දාවිත් ළඟට
කැඳවාගෙන ආ කල, “ඔබ ශීබා දැ”යි රජ ඇසී ය.
ඔහු ද, “ඔබේ මෙහෙකරුවා වන මම ශීබා ය”යි
කීවේ ය.

3 2 සාමු 4:4 රජ ද, "සාවුල්ගේ වංශයනේ තවත්
කිසිවකේ ඉතිරි ව ඇද් ද? ඉතිරි ව ඇත්නම්, මම
ඔහුට දවේයන් වහන්සේගේ කරුණාව
පනේවන්නමේ"යි කීවේ ය. ශීබා පිළිතුරු දමේන්,
"ජොනාතන්ගේ පුත්‍රයකේ තව ම සිටියි; ඔහු කොර
වූ කනෙකෙු"යි රජුට කී ය.
4 එවිට, "ඔහු කොතැන ද"යි රජ ඔහුගනේ ඇසී
ය. ශීබා පිළිතුරු දමේන්, "ඔහු ලෝ-දබොර්හි
අම්මියලේගේ පුත් මාකීර්ගේ ගදෙර සිටී ය"යි රජුට
කී ය. 5 එවිට දාවිත් රජ පණිවුඩ යවා, ලෝ-
දබොර්හි අම්මියලේගේ පුත් මාකීර්ගේ ගදෙරින් ඔහු
ගනේවූයේ ය.
6 සාවුල්ගේ පුත්‍රයා වන ජොනාතන්ගේ පුත්
මපෙිබොෂතේ දාවිත් වතෙ අවුත් මුණින්තළා වී
වැන්දේ ය. දාවිත් ද, "මපෙිබොෂතේ" කියා ඔහු
ඇමතුවේ ය. "ඔබේ මහෙකෙරුවා මහෙි ය"යි ඔහු
කී ය.
7 දාවිත් කතා කොට, "බය නොවන්න; සැබැවට ම
ඔබේ පියා වූ ජොනාතන් නිසා මම ඔබට කරුණාව
පනේවා, ඔබේ පියා වූ සාවුල්ගේ ගම් බිම් ඔබට
නැවත දනේනමේ. ඔබ නිතර ම මා සමඟ එකට
වාඩි වී කෑම කන්නහෙි ය"යි ඔහුට කී ය.
8 ඔහු වැඳ කතා කොට, "මා වැනි බලු කුණකට
සැලකීමට ඔබේ මහෙකෙරුවා කවරකේ දැ"යි ඇසී
ය.
9 එවිට රජු සාවුල්ගේ වැඩකාරයා වන ශීබාට
හඬගසා, "සාවුල්ටත්, ඔහුගේ මුළු වංශයටත් අයිති
ව තිබුණු සියල්ල ඔබේ ස්වාමියාගේ පුත්‍රයාට
දනේනමේ. 10 එබැවින් ඔබේ ස්වාමියාගේ පුත්‍රයාට
කෑම කන්නට ලැබනෙ පිණිස ඔබ සහ ඔබේ
පුත්‍රයෝ ද ඔබේ වැඩකාරයෝ ද ඔහු උදසො බිම්
වගා කොට එහි අස්වැන්න රැස් කරගන්න. එහතේ,
ඔබේ ස්වාමියාගේ පුත් මපෙිබොෂතේ මාගේ
මේසයේ කෑම කනු ඇතැ"යි කීවේ ය. ශීබාට
පුත්‍රයෝ පසළොස්දනෙකේ හා වැඩකාරයෝ
විසිදනෙකේ සිටියහ.
11 එවිට ශීබා කතා කරමින්, "මාගේ ස්වාමීන් වන
රජ්ජුරුවන් තමන්ගේ වැඩකරුවාට අණ කරන
සියල්ල ලසෙ ඔබේ මහෙකෙරුවා කරන්නේ ය"යි
රජුට කීවේ ය. මපෙිබොෂතේ වනාහි රාජ
පුත්‍රයන්ගනේ එක් කනෙකෙු මනේ රජු සමඟ එකට
වාඩි වී කෑම කෑවේ ය. 12 මපෙිබොෂතේට මීකා
නම් බාල පුත්‍රයකේ සිටියේ ය. ශීබාගේ ගවෙසි
සියල්ලෝ මපෙිබොෂතේගේ වැඩකාරයන් ව සිටියහ.
13 මලෙසෙ මපෙිබොෂතේ ජරෙුසලමේ විසී ය.
මන්ද, ඔහු රජු සමඟ එකට වාඩි වී නිතර ම කෑම
කෑවේ ය. ඔහුගේ දපෙය ම කොර වී තිබිණි.

### අම්මොන් සහ සිරියාව සමඟ යුද්ධ කිරීම
(1 වංශා 19:1-19)

10 ඉන්පසු අම්මොන්වරුන්ගේ රජ මියගියේ ය.
ඔහුගේ පුත් හානුන් ඔහු වනෙුවට රජ වුණේ
ය. 2 දාවිත් කතා කරමින්, "හානුන්ගේ පිය වූ නාහෂ්
මට කරුණාව පනේවූ ලසෙ මම හානුන්ට කරුණාව
පනේවන්නමේ"යි ඔහුගේ පියාගේ මරණය ගැන ඔහු
සනසන පිණිස තමාගේ සේවකයන් අත පණිවුඩයක්
යැවී ය. දාවිත්ගේ මහෙකෙරුවෝ අම්මොන්වරුන්ගේ
දේශයට පැමිණියහ. 3 එහතේ, අම්මොන්වරුන්ගේ
අධිපතීහු තමන්ගේ ස්වාමීන් වන හානුන්ට කතා
කොට, "දාවිත් ඔබ වතෙ සැනසිලිකාරයන් එවූ නිසා
ඔහු ඔබේ පියාණන්ට ගෞරව කරන්නේ යයි ඔබ
සිතන්නහෙි ද? දාවිත් තමාගේ සේවකයන් ඔබ
වතෙ එවා ඇත්තේ, නගර සෝදිසි කර ඔත්තු බලා
එය විනාශ කරන අදහසින් නොවේ දැ"යි කී හ.
4 එබැවින් හානුන් දාවිත්ගේ සේවකයන් අල්ලා
ඔවුන්ගේ රැවුලනේ බාගයක් බූ ගා, තට්ටම් දක්වා
ඔවුන්ගේ ඇඳුම් මැදින් කපා දමා ඔවුන් යන්නට
හැරියේ ය. 5 ඒ බව දාවිත්ට දැන්වූ කල ඔහු ඔවුන්
සම්බ වන පිණිස මිනිසුන් යැවී ය. මන්ද, ඒ මිනිස්සු
බොහෝ සයෙින් ලජ්ජාවට පැමිණ සිටියහ. "ඔබේ
රැවුල් වැඩනෙ කල් ජරෙිකෝවේ නැවතී සිට පසුව
හැරී එන්නැ"යි රජ කියා යැවී ය.
6 තවද, අම්මොන්වරු තමන් දාවිත් රජුට සතුරු වූ
බව දැක, පණිවුඩකාරයන් යවා, බතේ-රහෙොබ්හි
සිරියන්වරුන්ගනෙුත්, ශෝබාහි සිරියන්වරුන්ගනෙුත්
පාබළ සනෙඟ විසිදහසක් ද මිනිසුන් දහසක් සමඟ
මයකාහි රජු ද ටෝබ්හි මිනිසුන් දොළොස්දහසක් ද
කුලියට ගත්හ. 7 දාවිත් ඒ අසා, ජෝවාබ් හා
බලවන්තයන් වන මුළු සේනාව යැවී ය.
8 අම්මොන්වරු පිටතට අවුත්, දොරටුව ළඟ යුද්ධය
සඳහා පළෙගැසී සිටියහ. ශෝබාහි ද රහෙොබ්හි ද
සිරියන්වරුත්, ටෝබ්හි ද මයකාහි ද මිනිස්සුත්
එළිමහනේ භූමියහෙි වනෙ වනෙ ම සිටගත්හ.
9 පරෙටුවනේ ද පිටු පසින් ද සටන තමාට විරුද්ධ
ව යොමු ව තිබනෙ බව ජෝවාබ් දැක, සියලු
බලවන්ත ඉශ්රායලේවරුන් අතරනේ කොටසක්
තෝරාගනෙ සිරියන්වරුන්ට විරුද්ධ ව සිටුවා, 10 සසෙු
සනෙඟ අම්මොන්වරුන්ට විරුද්ධ ව සිටුවන පිණිස
ඔහු තමාගේ සහෝදර අබීෂයි අතට භාර දී,
11 ඔහුට කතා කොට, "සිරියන්වරුන් මට වඩා
බලවන්ත වූවොත් ඔබ මට උපකාර කරන්න;
අම්මොන්වරුන් ඔබට වඩා බලවන්ත වූවොත් මම
අවුත් ඔබට උපකාර කරන්නමේ. 12 අපේ සනෙඟ
උදසොත්, අපේ දවේයන් වහන්සේගේ නගර
උදසොත් ධරෛයවත් වී සිටින්න; ස්ථිර ව සිටින්න;
සමිඳාණන් වහන්සේගේ කැමැත්ත ඉෂ්ට වේවා"යි
කී ය.
13 මසෙේ ජෝවාබ් ද ඔහු සමඟ සිටි සනෙඟ ද
සිරියන්වරුන්ට විරුද්ධ ව සටනට ළං වූ හ. එවිට
ඔව්හු ජෝවාබ් ඉදිරියනේ පලා ගියහ.
14 සිරියන්වරුන් පලා ගිය බව අම්මොන්වරුන් දැක,
ඔව්හු අබීෂයි ඉදිරියනේ පලා ගොස් නගරයට ඇතුල්
වූ හ. එවිට ජෝවාබ් අම්මොන්වරුන්ට විරුද්ධ ව
යුද්ධ කොට ජරෙුසලමට පරෙළා ආවේ ය.
15 සිරියන්වරු තමන් ඉශ්රායලේවරුන් ඉදිරියහෙි
පරාජය වූ බව දැක එක්රැස් වූ හ. 16 හදද්-එෂරේ ද
යුප්රටීස් ගංගාවට එගොඩින් සිටි සිරියන්වරුන්
ගනේවාගත්තේ ය. ඔව්හු ඔවුන්ට පරෙටු ව හදද්-

එශරේගේ සේනාපතියා වූ ෂෝබා සමඟ හේලාම්
නගරයට පැමිණියහ. 17 එපවත් දාවිත් රජුට දැන්වූ
කල ඔහු සියලු ඉශ්රායලේවරුන් රුස් කරගනෙ,
ජෝර්දානින් එගොඩ වී හේලාම් නගරයට ගියේ ය.
18 සිරියන්වරුන් ද දාවිත් රජුට විරුද්ධ ව යුද්ධයට
සැරසී ඔහු සමඟ සටන් කළ විට ඔව්හු ඉශ්රායලේ
ඉදිරියනේ පලා ගියහ. දාවිත් සිරියන්වරුන්ගේ
රියැදුරන් හත්සියයක් ද අසරුවන් සතළිස්දහසක් ද
මරා, ඔවුන්ගේ සනේපති ෂෝබාටත් පහර දුන්නේ
ය. ඔහු එතැන ම මළේ ය. 19 එවිට හදද්-එශරේගේ
සේවකයන් වන සියලු රජවරු තමන් ඉශ්රායලේවරුන්
ඉදිරියහෙි පරාජය වූ බව දැක, ඉශ්රායලේවරුන්
සමඟ සාමදාන ගිවිසගනෙ ඔවුන්ට සේවය කළහ.
මසෙේ සිරියන්වරු අම්මොන්වරුන්ට තවත් උපකාර
කරන්නට බිය වූ හ.

### දාවිත් රජු සහ බැත්-ෂබො

11 1 වංශා 20:1 ඒ අවුරුද්දේ වසන්ත සමයේ
රජවරුන් යුද්ධයට යන කාලයේ දී, දාවිත් රජ,
ජෝවාබ් ද ඔහු සමඟ තමාගේ සේවකයන් ද
ඉශ්රායලේ හමුදාව ද යුද බිමට යැවී ය. ඔව්හු
අම්මොන්වරුන් ඝාතනය කොට රබ්බා නගරය වැටලූ
හ. එහතේ, දාවිත් ජරෙුසලමේ නැවතී සිටියේ ය.
2 දිනක් සවස් වේලේ දාවිත් තමාගේ යහනින්
නැඟිට ගොස්, රජ මාලිගාවේ පියස්ස උඩ සක්මන්
කළෙේ ය. එවිට ස්ත්රියක ස්නානය කරනු ඔහු
පියස්සේ සිට දිටී ය. ඒ ස්ත්රිය ඉතා රූමත් වූවා ය.
3 දාවිත් පණිවුඩ යවා ස්ත්රිය ගැන විභාග කරවී ය.
එක් කනෙකේ කතා කොට, “ඈ එලියාම්ගේ දුව
වන, හිත්තීය ජාතික උරියාගේ බිරිඳ වන බැත්-ෂබො
නොවේ දැ”යි කී ය. 4 දාවිත් පණිවුඩකාරයන් යවා
ඈ ගනේවාගත්තේ ය. ඈ ඔහු ළඟට ආවා ය. ඔහු
ඈ සමඟ සේවනයහෙි යදෙිණි; ඒ අවස්ථාවේ දී ඈ
තමාගේ අපවිත්රකමින් පිරිසිදු වූවා පමණකි. ඈ සිය
ගදෙරට පරෙළා ගියා ය. 5 ඈ ගැබ්ගනෙ, “මම
ගැබ්ගනෙ සිටිමි”යි දාවිත්ට දන්වා යැවුවා ය.
6 එවිට දාවිත්, “හිත්තීය උරියා මා ළඟට
එවන්නැ”යි ජෝවාබ්ට කියා යැවී ය. ජෝවාබ්, දාවිත්
ළඟට උරියා යැවී ය. 7 උරියා ඔහු ළඟට ආ කල
දාවිත් ඔහුගනේ ජෝවාබ්ගේ ද සනෙඟගේ ද සැප
සනීප ගැනත්, යුද්ධය සිදු වේගනෙ යන ආකාරයත්
විචාළේ ය. 8 ඉන්පසු දාවිත්, “ඔබ ගදෙර ගොස්
විවේකී ව සිටින්නැ”යි උරියාට කීවේ ය. උරියා රජ
මාලිගාවනේ පිටත් ව ගියේ ය. ඔහු ගිය පසු
රජුගනේ ත්යාගයක් ඔහු වතෙ යවන ලදී. 9 එහතේ,
උරියා සිය ගදෙරට නොගොස්, තමාගේ ස්වාමියාගේ
මහෙකෙරුවන් සමඟ රජ මාලිගාවේ දොරකඩ
නිදාගත්තේ ය. 10 “උරියා තමාගේ ගදෙරට
නොගියේ ය”යි දාවිත්ට දන්වනු ලැබූ කල, දාවිත්
උරියාට කතා කොට, “ඔබ ගමනක් ගොස් ආවා
නොවේ ද? ඔබ ගදෙර නොගියේ මන්දැ”යි ඇසුවේ
ය.

11 උරියා දාවිත්ට කතා කොට, “ගිවිසුම් කරඬුව
කූඩාරමක ඇත; ඉශ්රායලේවරු ද ජුදාවේවරු ද
කූඩාරම්වල සිටිති; මාගේ ස්වාමීන් වන ජෝවාබ් ද
මාගේ ස්වාමියාගේ සේවකයෝ ද එළිමහනේ
කඳවුරු බැඳගනෙ සිටිති. එසේ නම්, කා, බී ප්රීති
වන්නටත්, මාගේ බිරිඳ සමඟ සයනය කරන්නටත්
මා මාගේ ගදෙරට යන්නේ කසෙේ ද? මම සැබෑ
ලසෙ එවැන්නක් නොකරමි යි ජීවමාන දවේයන්
වහන්සේගේ නාමයනේ ද ඔබේ නාමයනේ ද දිවුරා
කියමි”යි පැවසී ය.
12 එවිට දාවිත් පිළිතුරු දමේින්, “අදත් මහෙි
සිටින්න, හටෙ ඔබ යන්නට හරින්නමේ”යි උරියාට
කීවේ ය. එසේ උරියා එදත්, පසු දිනත් ජරෙුසලමේ
සිටියේ ය. 13 පසු දින දී දාවිත් ඔහු කැඳවා, ඔහුට
කන්නටත්, බොන්නටත් දී ඔහු වරෙිමත් කළෙේ ය.
ඔහු සවස තමාගේ ස්වාමියාගේ මහෙකෙරුවන්
සමඟ තමාගේ ඇඳේ නිදන පිණිස ගියේ ය. එහතේ
සිය ගදෙරට නොගියේ ය.
14 පසු දින උදේ දාවිත් ජෝවාබ්ට ලියුමක් ලියා
එය උරියා අතේ යැවී ය. 15 ඔහු ඒ ලියුමේ, “සටන
ඉතා බලවත් ව තිබනෙ තැනක උරියා සිටුවා, පහර
ලැබ නසින පිණිස ඔහු අත්හැර අහක් වන්නැ”යි
ලියා යැවී ය. 16 ජෝවාබ් නුවර වටලා සිටිය දී
වීරවන්ත මිනිසුන් සිටින බව ඔහු දැන සිටි
ස්ථානයේ උරියා සිටවෙුවේ ය. 17 නගර වැසියෝ
පිටතට අවුත් ජෝවාබ් සමඟ යුද්ධ කළහ. එවිට
සනෙඟගනේ එනම්, දාවිත්ගේ සේවකයන්ගනේ
සමහරකේ මැරී වැටුණ හ. හිත්තීය උරියා ද මැරුම්
කෑවේ ය.
18 එවිට ජෝවාබ් යුද්ධය ගැන සියලු කාරණා
දාවිත්ට දන්වා යැවී ය. 19 ඔහු පණිවුඩකාරයාට කතා
කොට, “ඔබ යුද්ධය ගැන සියලු කාරණා රජුට කියා
නිම වූ කල, 20 රජු කෝප වී, ‘ඔබ සටන් කරන
පිණිස නගරයට එපමණ ළං වූයේ මන් ද? ඔවුන්
පවුරේ සිට දුන්නනේ විදින බව දන්නේ නැද් ද?
21 විනි 9:53ජරෙුබ්බෙෂෙතේගේ පුත් අබිමලෙකේ
මරන ලද්දේ කවරකෙු විසින් ද? තේබේශ්හි දී
ස්ත්රියක පවුරේ සිට ඔහු පිට ඇඹරුම් ගලක උඩ
පළුව හළො ඔහු මැරුවා නොවේ ද? ඔබ එපමණ
පවුරට ළං වුණේ මන්දැ’යි ඔබට කීවොත්, ‘ඔබේ
සේවකයා වන හිත්තීය උරියා ද මළේ ය’යි
දන්වන්නැ”යි ඔහුට අණ කළෙේ ය.
22 මසෙේ පණිවුඩකාරයා ගොස්, ජෝවාබ් තමා
අත කියා යැවූ සියල්ල දාවිත්ට දැන්වී ය.
23 පණිවුඩකාරයා දාවිත්ට කතා කොට, “ඒ මිනිසුන්
අපට විරුද්ධ ව බලවත් වී අප සමඟ සටන් කරන
පිණිස පිටතට ආ විට අපිත් ඔවුන්ට විරුද්ධ ව
දොරටුව දක්වා ගියමෙු. 24 එවිට දුනුවායෝ පවුරේ
සිට ඔබේ සේවකයන්ට විද්දෝ ය. රජ්ජුරුවන්ගේ
සේවකයන් සමහරකේ මළහ. ඔබේ සේවක
හිත්තීය ජාතික උරියාත් මළේ ය”යි කී ය.
25 එවිට දාවිත් පණිවුඩකාරයාට කතා කොට, “ඔබ
ජෝවාබ්ට මසෙේ කියන්න: ‘මේ කාරණය ගැන
කණගාටු නොවන්න. මන්ද, කඩුව කවරකෙු

නසන්නේ දැ යි කාට කිව හැකි ද? නගරයට තවත්
දරුණු ලෙස පහර දී එය බිඳ හෙළන්න' කියා ඔහුට
ධෛර්ය දෙන්නැ"යි කී ය.
26 උරියාගේ බිරිඳ තමාගේ සැමියා වන උරියා
මැරුණ බව අසා, ඔහු ගැන වැලපුණා ය.
27 වැලපීමේ කාලය නිම වූ විට දාවිත් තමාගේ
නිවසෙට ඈ ගෙන්වා ගත්තේ ය. ඔහු ඈ සරණ
පාවාගත්තේ ය. ඈ දාවිත්ට දාව පුත්‍රයකු ලැබුවා
ය. එහෙත්, දාවිත් කළ ක්‍රියාව ගැන සමිඳාණන්
වහන්සේ ඉතා අප්‍රසන්න වූ සේක.

## නාතාන්ගේ උපමාව

12 ගීතා 51 සමිඳාණන් වහන්සේ දාවිත් වෙත
නාතාන් යැවූ සේක. ඔහු දාවිත් ළඟට අවුත්
මෙසේ කී ය: "එක් නුවරක මනුෂ්‍යයෝ දෙදෙනෙක්
සිටියහ. එක් කෙනෙක් ධනවතෙකි; අනික් තැනැත්තා
දිළින්දෙකි. 2 ධනවතාට බැටළු හා ගව පට්ටි ඉතා
විශාල ගණනක් තිබිණි. 3 එහෙත්, තමා මිලට ගෙන
ඇති කළ එක කුඩා බැටළු පැටියකු හැර වෙන
කිසිවක් දිළින්දාට නො වී ය. ඒ බැටළු වැස්සිය ඔහු
සමඟ ද ඔහුගේ දරුවන් සමඟ ද වැඩෙමින්, ඔහුගේ
කෑමවලින් කමින් ද ඔහුගේ කුසලානෙන් බොමින් ද
ඇති දැඩි වූවා ය. ඔහු ඒ බැටළු වැස්සී සිය ළයෙහි
හොවාගත්තේ ය. ඒ වැස්සී ඔහුට දුවක මෙන් වූවා
ය. 4 "දිනක් ධනවතාගේ ගෙදරට ගමනක් යන
කෙනෙක් ආවේ ය. ධනවතා තමාගේ ගෙදරට ආ
මඟියාට කෑම පිළියෙළ කරන පිණිස සතකු
තමාගේ බැටළුවන්ගෙන් වත්, ගවයන්ගෙන් වත්
ගන්නට අකමැති වී දිළින්දාගේ බැටළු වැස්සිය
අරගෙන තමාගේ ගෙදරට ආ මිනිසාට කෑමක්
පිළියෙළ කළේ ය."
5 ඒ ඇසූ දාවිත්ගේ කෝපය ඒ මිනිසාට විරුද්ධ ව
තදින් ඇවිළී, ඔහු නාතාන්ට කතා කොට, "මේ දේ
කළ මිනිසා මැරුම් කෑ යුතු ය කියා ජීවමාන
සමිඳාණන් වහන්සේගේ නාමයෙන් දිවුරා කියමි.
6 ඔහු මේ ක්‍රියාව කළ බැවින් ද අනුකම්පාව
නොදැක්වූ බැවින් ද ඒ බැටළු වැස්සී වෙනුවට
සතරදෙනෙකු දිය යුතු ය"යි කී ය.
7 එවිට නාතාන් දාවිත්ට මෙසේ කීවේ ය: "ඒ
මිනිසා ඔබ තමයි; එබැවින් ඉශ්‍රායලේවරුන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක: 'මම
නුඹ ඉශ්‍රායලේවරුන්ගේ රජු වශයෙන් අභිෂේක
කර, මම ම නුඹ සාවුල් අතින් ගළවා ගතිමි. 8 මම
නුඹේ ස්වාමියාගේ වංශය ද ඔහුගේ භාර්යාවන් ද
නුඹට ම දිනිමි. ඉශ්‍රායලේ හා ජුදා වංශයත් නුඹට
දිනිමි. මෙය නුඹට ප්‍රමාණවත් නොවෙන්නේ නම්,
මෙවැනි තවත් දේ මම නුඹට දෙන්නෙමි. 9 නුඹ
සමිඳාණන් වහන්සේගේ ඇස් හමුයෙහි නපුරු දේ
කිරීමෙන් උන් වහන්සේගේ වචනය සුළු කොට
සිතුවේ කුමක් නිසා ද? නුඹ හිත්තීය ජාතික උරියා
කඩුවෙන් නසා, ඔහුගේ බිරිඳ නුඹේ බිරිඳ වශයෙන්
ගත්තෙහි ය. නුඹ අම්මෝන්වරුන් ලවා ඔහු කඩුවෙන්
මැරෙව්වෙහි ය. 10 ඉතින් මා සුළු කොට සිතා,
හිත්තීය ජාතික උරියාගේ බිරිඳ නුඹේ බිරිඳ
වශයෙන් ගත් බැවින් කඩු පහර කිසි කලක නුඹේ
වංශයෙන් පහ නොවෙන්නේ ය.' 11 සමිඳාණන්
වහන්සේ මෙසේ වදාරන සේක: 'මම නුඹට විරුද්ධ
ව නුඹේ ම පවුලෙන් විපත්තිය උපදවා, නුඹේ ඇස්
ඉදිරියෙහි නුඹේ භාර්යාවන් රැගෙන නුඹේ
අසල්වැසියකුට දෙන්නෙමි. ඔහු එළිමහනෙහි නුඹේ
භාර්යාවන් සමඟ සේවනයේ යෙදෙන්නේ ය. 12 නුඹ
කළ දේ නුඹ කළේ රහසින් ය; එහෙත්, මම මේ
දේ සියලු ඉශ්‍රායලේවරුන්ට පෙනෙන ලෙස දවල්
කාලයේ කරන්නට සලස්වන්නෙමි.'
13 එවිට දාවිත් පිළිතුරු දෙමින්, "මම සමිඳාණන්
වහන්සේට විරුද්ධ ව පව් කළෙමි"යි නාතාන්ට කී
ය. නාතාන් ද කතා කරමින්, "සමිඳාණන් වහන්සේ
ඔබේ පාපයට ක්ෂමාව දුන් සේක; ඔබ
නොනසින්නෙහි ය; 14 එහෙත්, ඔබේ මේ ක්‍රියාව
හේතුකොටගෙන සමිඳාණන් වහන්සේට අපහාස
කළ බැවින් ඔබට දාව උපදින දරුවා මැරෙන්නේ ම
ය"යි දාවිත්ට කී ය. 15 ඉන්පසු නාතාන් සිය ගෙදරට
ගියේ ය.

## දරුවාගේ මරණය හා සලමොන්ගේ උපත

15 දාවිත්ගෙන් උරියාගේ බිරිඳ ලැබූ දරුවා
රෝගයකින් පෙළෙන්නට සමිඳාණන් වහන්සේ
සැලැසූ සේක. ළදරුවා ඉතා රෝගාතුර විය.
16 එබැවින් ළදරුවා ගැන දාවිත් දෙවියන් වහන්සේට
කන්නලව් කළේ ය. දාවිත් නිරාහාර ව සිට, ගෙට
ඇතුල් වී බිම වැතිර මුළු රෑ ගත කළේ ය. 17 ඔහු
බිමෙන් නැඟුටුවන්නට ඔහුගේ ගෙදර වැඩිහිටියෝ
ඔහු ළඟ සිටියහ. එහෙත්, ඔහු නැඟිටින්නට කැමැති
නො වී ය. ඔවුන් සමඟ කෑම කෑවේ වත් නැත.
18 සත් වන දා දරුවා මැරුණේ ය.
18 දාවිත්ගේ සේවකයෝ දරුවා මැරුණු බව ඔහුට
දන්වන්න බිය වූ හ. මන්ද, "දරුවා ජීවත් ව සිටිය දී
අප ඔහුට කතා කළ විට ඔහු අපේ හඬට සවන්
දුන්නේ නැත. ඉතින් දරුවා මැරුණ බව ඔහුට
කීවොත් සමහර විට ඔහු තමාට යම් අනතුරක්
කරගන්නට බැරි නැතැ"යි ඔව්හු සිතූ හ.
19 එහෙත්, දාවිත් තමාගේ මෙහෙකරුවන් රහසින්
කතා කරනු දැක, දරුවා මළ බව තේරුම්ගෙන,
"ළදරුවා මැරුණේ දැ"යි මෙහෙකරුවන්ගෙන් ඇසී ය.
ඔව්හු ද, "ළදරුවා මැරුණේ ය"යි කී හ.
20 එවිට දාවිත් බිමෙන් නැඟිට ස්නානය කොට,
තලේ ගාගෙන, තමාගේ වස්ත්‍ර මාරු කර,
සමිඳාණන් වහන්සේගේ මාලිගාවට ඇතුළු වී
නමස්කාර කොට, ඉන්පසු සිය නිවසෙට ආවේ ය.
තවද, ඔහු තමා ඉදිරියෙහි කෑම තබන්න කියා, කෑම
කෑවේ ය. 21 එවිට ඔහුගේ සේවකයෝ ඔහුට කතා
කොට, "ඔබ කළ මේ දේ කුමක් ද? ළදරුවා ජීවත්
ව සිටිය දී ඔබ ඔහු නිසා නිරාහාර ව ඇඬුවෙහි ය.
එහෙත්, ළදරුවා මැරුණු විට ඔබ නැඟිට කෑම
කෑවෙහි ය"යි කී හ.

22 දාවිත් පිළිතුරු දෙමින්, “ළදරුවා ජීවත් ව සිටිය
විට මම නිරාහාර ව සිට ඇඬුවෙමි. මා එසේ
කළේ, ‘දරුවා ජීවත් වන ලෙස සමිඳාණන් වහන්සේ
මට කරුණා කරන සේක් ද, නොකරන සේක් ද
කියා කවුරු දනිත් දැ’යි මා සිතූ බැවිනි. 23 එහෙත්,
දැන් ඔහු මළ පසු කුමට නිරාහාර ව සිටිම් ද? ඔහු
නැවත ගෙනෙන්වාගන්නට පුළුවන් ද? මා ඔහු ළඟට
යනවා මිස, ඔහු මා ළඟට එන්නේ නැතැ”යි කී ය.
24 ඉන්පසු දාවිත් තමාගේ බිරිඳ වන බැත්-ෂෙබා
සනසා, ඈ ළඟට පැමිණ, ඈ සමඟ සයනය කළේ
ය. ඈ පුතකු ලැබුවා ය. සලමොන් යන නම දාවිත්
ඔහුට තැබුවේ ය. සමිඳාණන් වහන්සේ දරුවාට
ප්‍රේම කළ සේක. 25 ඒ බව උන් වහන්සේ
දිවැසිවර නාතාන් අත දන්වා හැර, සමිඳාණන්
වහන්සේ කී පරිදි, ඔහුට ‘සමිඳුන් ප්‍රේම කළ
තැනැත්තා’ යන අර්ථය ඇති ‘ජෙදීදියා’ යන නම තැබී
ය.

## රබ්බා නගරය අල්ලාගැනීම
(1 වංශා 20:1-3)

26 ජෝවාබ් අම්මොන්වරුන්ට අයිති රබ්බා
නගරයට විරුද්ධ ව යුද්ධ කොට රාජධානිය
අල්ලාගත්තේ ය. 27 ජෝවාබ් දාවිත් රජු වෙත
පණිවුඩකාරයන් යවමින්, “රබ්බා නගරයට විරුද්ධ ව
යුද්ධ කළෙමි; ජලය සපයන ඒ රාජධානිය ද
අල්ලාගතිමි. 28 එබැවින් මා විසින් ඒ නගරය
අල්ලාගැනීමෙන් ඊට මාගේ නාමය නොලැබෙන
පිණිස, ඔබ ඉතිරි සේනාව රැස් කරගෙන නගරයට
විරුද්ධ ව කඳවුරු බැඳ එය අල්ලාගත මැනවැ”යි
කියන්නට නියම කළේ ය. 29 දාවිත් වනාහි, මුළු
සේනාව රැස් කරගෙන, රබ්බා නගරයට ගොස්, ඊට
විරුද්ධ ව සටන් කොට එය අල්ලාගත්තේ ය. 30 ඔහු
මිල්කොම් රජුගේ ඔටුන්න ඔහුගේ හිසෙන් ගත්තේ
ය. එහි බර, රන් කිලෝග්‍රෑම් තිස්පහක් විය. එහි
අනර්ඝ මැණික් ගලක් අල්ලා තිබිණි. එය දාවිත්ගේ
හිසේ තබන ලද්දේ ය. ඔහු ඒ නුවරින් කොල්ලකෑ
බොහෝ දේ ගෙනාවේ ය. 31 ඔහු එහි සිටි සෙනඟ
පිටතට ගෙනවා, කියත්වලින් ද යකඩ ගල් කටුවලින්
ද යකඩ පොරෝවලින් ද වැඩ කරන්නටත්, ගඩොල්
උඳුන්වල වැඩ කරන්නටත් ඔවුන් යෙදෙව්වේ ය. ඔහු
අම්මොන්වරුන්ගේ සියලු නගරවලට මෙසේ කළේ
ය. ඉන්පසු දාවිත් රජ සහ මුළු සේනාව ජෙරුසලමට
පෙරළා ආහ.

## අම්නොන් සහ තාමාර්

13 ඉන්පසු මෙසේ සිදු විය. දාවිත්ගේ පුත්
අබ්සලොම්ට තාමාර් නම් රුවැති සහෝදරියක්
සිටියා ය. දාවිත්ගේ පුත් අම්නොන් ඈට ප්‍රේම
කළේ ය. 2 අම්නොන් තමාගේ සහෝදරී වූ
තාමාර්ට ප්‍රේම කළ නිසා අසනීප වන තරම් සිත්
වේදනාවෙන් සිටී ය. ඈ කන්‍යාවක වන බැවින් ඈට
කිසිවක් කිරීම දුෂ්කර බව අම්නොන්ට පෙනුණේ ය.
3 දාවිත්ගේ සහෝදරයා වන ෂිමෙයාගේ පුත්
ජොනාදාබ් නම් මිත්‍රයෙක් අම්නොන්ට සිටියේ ය.
ජොනාදාබ් උපායේ ඉතා දක්ෂ මිනිසෙකි. 4 ඔහු
අම්නොන්ට කතා කොට, “රාජ පුත්‍රය, ඔබ දවසින්
දවස මෙසේ කෘශවන්නේ මන් ද? මට කියන්නේ
නැද්දැ”යි ඇසී ය. එවිට අම්නොන්, “මාගේ සහෝදර
අබ්සලොම්ගේ සහෝදරිය වන තාමාර්ට මම ආලය
කරමි”යි ඔහුට කී ය.
5 ජොනාදාබ් ද පිළිතුරු දෙමින්, “ඔබ ලෙඩින්
සිටින්නා සේ ඔබේ යහනේ වැතිර සිට, ඔබේ
පියාණන් ඔබ බලන්නට ආ කල, ඔහුට කතා කොට,
‘මාගේ සහෝදරී වන තාමාර් මා වෙත අවුත් මට
කෑම දෙන්නටත්, මට පෙනෙන ලෙස කෑම පිළියෙළ
කරන්නටත්, ඇගේ අතින් එය කන්නටත් අවසර දුන
මැනවැ’යි ඔහුට කියන්නැ”යි කීවේ ය. 6 මෙසේ
අම්නොන් ලෙඩින් සිටින්නා සේ වැතිර සිටියේ ය.
රජු අම්නොන් බලන්නට ආ කල, “මාගේ සහෝදරී
වන තාමාර්ගේ අතින් ම මට කන්නට පුළුවන් වන
පිණිස ඈ අවුත් මා ඇස් ඉදිරියේ ම රොටි දෙකක්
සාදන්නට ඈට අවසර දුන මැනවැ”යි කී ය.
7 එවිට දාවිත් පණිවුඩයක් යවමින්, “ඔබේ
සහෝදර අම්නොන්ගේ නිවසට ගොස්, ඔහුට කෑම
සාදා දෙන්නැ”යි ගෙදර සිටි තාමාර්ට කියා යැවී ය.
8 එවිට තාමාර් තමාගේ සහෝදර අම්නොන්ගේ
ගෙට ගියා ය. ඔහු නිදා සිටියේ ය. ඈ පිටි රැගෙන
අනා, ඔහුගේ ඇස් ඉදිරියෙහි දී රොටි සාදා, පුළුස්සා,
9 ඇතිලිය ගෙනවුත් ඔහු ඉදිරියෙහි ඒවා බෙදා දුන්නා
ය. එහෙත්, ඔහු කන්නට අකමැති විය. අම්නොන්,
“හැම දෙනා ම මා වෙතින් පිටතට යන්නැ”යි කී ය.
එවිට සියලු දෙනා ම ඔහු වෙතින් පිටතට ගියහ.
10 අම්නොන් කතා කරමින්, “මා ඔබේ අතින් කන
පිණිස, කෑම ඇතුළු ගෙට ගෙනෙන්නැ”යි තාමාර්ට
කීවේ ය. තාමාර් ඈ සෑදූ රොටි ගෙන ඇතුල් ගෙයි
සිටි ඇගේ සහෝදර අම්නොන් ළඟට ගෙන ගියා ය.
11 ඒවා ඔහුට කවන්නට ළඟට ගෙන ගිය විට ඔහු
ඈ අල්ලා, “මාගේ සහෝදරිය, ඇවිත් මා සමඟ
සයනය කරන්නැ”යි ඈට කී ය.
12 එවිට ඈ කතා කොට, “මාගේ සහෝදරය,
එසේ නොවේවා. මට අවනම්බු නොකරන්න;
ඉශ්‍රායෙලෙහි එබඳු දෙයක් කරන්නට යුතු නැත; මේ
නින්දිතකම නොකරන්න; 13 එසේ කළොත්, මා
මාගේ නින්දාව සඟවාගන්නේ කෙසේ ද? ඔබත්
ඉශ්‍රායෙලෙහි නින්දිතයන්ගෙන් එක් කෙනෙකු මෙන්
වන්නෙහි ය. ඒ නිසා රජ්ජුරුවන්ට කතා කරන්න; ඔහු
මා ඔබට නො දී සිටින්නේ නැතැ”යි කීවා ය.
14 එහෙත්, ඔහු ඇගේ කීමට සවන් නො දී, ඈට
වඩා ශක්තිමත් බැවින් බලහත්කාරකමින් ඈ දූෂණය
කළේ ය.
15 එවිට අම්නොන් ඈට බොහෝ සේ වෛර
කළේ ය. ඔහුට ඇති වූ ඒ වෛරය කලින් ඔහු ඈට
තිබුණ ආලයට වඩා බලවත් විය. “නැඟිට
පලයන්නැ”යි අම්නොන් ඈට කී ය.
16 ඈ කතා කොට, “එසේ නොකරන්න; මා
යන්නට හැරීම ඔබ මට කළ අනික් නපුරට වඩා
මහත් ය”යි කීවා ය. එහෙත්, ඔහු ඈට සවන් නො දී,

17 තමාට සේවය කළ වැඩකාරයාට අඬගසා, “මේ
ස්ත්‍රිය මා වෙතින් පිටතට හැර, දොර අගුල
ලාපන්නැ”යි කී ය. 18 ඈ අත් දිග ඇඳුමක් ඇඳ සිටියා
ය. රජුගේ කන්‍යා දූවරුන් එබඳු ඇඳුම් ඇඳීම සිරිතකි.
ඔහුගේ වැඩකාරයා ඈ පිටතට ඇර, දොර අගුල්
දැමුවේ ය. 19 එවිට තාමාර් තමාගේ හිසේ අළු
දමාගෙන, ඇඳ සිටි දිග අත් ඇති ඇඳුම ඉරාගෙන,
හිසේ අත තබාගෙන කෑගසමින් ගියා ය.
20 ඇගේ සහෝදර අබ්සලොම් ඈට කතා කොට,
“ඔබේ සහෝදර අම්නොන් ඔබ සමඟ සිටියේ ද?
ඉතින් මාගේ සහෝදරිය, නිශ්ශබ්ද ව සිටින්න. ඔහු
ඔබේ සහෝදරයා ය. මේ කාරණය සිතට
නොගන්නැ”යි ඈට කීවේ ය. තාමාර් ඇගේ සහෝදර
අබ්සලොම්ගේ ගෙදර අසරණ භාවයෙන් විසුවා ය.
21 දාවිත් මේ සියලු දේ අසා ඉතා උදහස් විය.
22 එහෙත්, අබ්සලොම් අම්නොන්ට විරුද්ධ ව ගුණ
වත්, අගුණ වත් නොකීවේ ය. එසේ නොකීවේ,
තමාගේ සහෝදරී වන තාමාර්ට අම්නොන් අවනම්බු
කළ නිසා අබ්සලොම් ඔහුට වෛර බැන්ද බැවිනි.

### අම්නොන්ගේ මරණය

23 මීට දෑවුරුද්දකට පසු, එප්‍රායිම්ට නුදුරු වූ බාල්-
හාශෝර්හි අබ්සලොම්ට බැටළු ලොම් කපන්නෝ වූ
හ. අබ්සලොම් රජුගේ සියලු පුත්‍රයන් කැඳෙව්වේ
ය. 24 ඔහු රජු වෙත අවුත් කතා කොට, “ඔබේ
මෙහෙකරුවාට බැටළු ලොම් කපන්නෝ සිටිති; ඉතින්
රජු ද තමන්ගේ සේවකයන් ද ඔබේ මෙහෙකරුවා
සමඟ අව මැනවැ”යි කී ය.
25 රජ ද පිළිතුරු දෙමින්, “නැත, මාගේ පුත්‍රය, අපි
සියල්ලෝ ම නොඑන්නෙමු; ආවොත් ඔබට බරක්
වනු ඇතැ”යි අබ්සලොම්ට කී ය. අබ්සලොම්
පෙරෙත්ත කළ නමුත්, රජ යන්නට කැමැති නොවී,
ඔහුට ආශීර්වාද කොට පිටත් කර හැරියේ ය.
26 එකල අබ්සලොම්, “එසේ නම්, මාගේ සහෝදර
අම්නොන්ට අප සමඟ යන්නට අවසර ලැබේවා”යි
කී ය. “ඔහු ඔබ සමඟ යන්නේ කුමට දැ”යි රජු ඇසී
ය. 27 එහෙත්, අබ්සලොම් ඔහුට පෙරෙත්ත කළෙන්,
අම්නොන්ට ද රජුගේ සියලු පුත්‍රයන්ට ද ඔහු
සමඟ යන්නට ඉඩ දුන්නේ ය.
28 අබ්සලොම් තමාගේ වැඩකාරයන්ට අණ
කරමින්, “අම්නොන් මුද්‍රික පානය බී විනෝද සිතින්
සිටින කල, ‘අම්නොන්ට පහර දෙන්නැ’යි මා ඔබට
කී විට, ඔහු මරාදමන්න; බිය නොවන්න; ඔබට අණ
කරන්නේ මම නොවෙමේ ද? ධෛර්යවත් ව ද
බලසම්පන්න ව ද සිටින්නැ”යි කී ය.
29 අබ්සලොම්ගේ වැඩකාරයෝ අබ්සලොම් අණ
කළ ලෙස අම්නොන්ට කළහ. එවිට රජුගේ සියලු
පුත්‍රයෝ නැඟිට තම තමන්ගේ අශ්වතරයන් පිට
නැඟී පලා ගියහ.
30 ඔවුන් මාර්ගයේ යද්දී, “රජුගේ සියලු පුත්‍රයෝ
අබ්සලොම් විසින් මරන ලද්දෝ ය; එක් කෙනෙක්
වත් ඉතුරු වී නැතැ”යි දාවිත්ට සැළ විය. 31 එවිට රජ
නැඟිට සෝවෙන් තමාගේ වස්ත්‍ර ඉරාගෙන, බිම
වැතිරුණේ ය; ඔහුගේ සියලු සේවකයෝ ද
තමන්ගේ වස්ත්‍ර ඉරාගෙන ළඟ සිටියහ.
32 දාවිත්ගේ සහෝදරයා වන ෂිමයාගේ පුත්
ජොනාදාබ් කතා කොට, “රජුගේ පුත්‍රයන් වන ඒ
තරුණයන් සියල්ලන් ම ඔව්හු මැරුවෝ යයි මාගේ
ස්වාමියා නොසිතා වා; මැරුණේ අම්නොන් පමණයි.
මන්ද, අබ්සලොම්ගේ සහෝදරී වන තාමාර්
අම්නොන් විසින් කෙලෙසුණු දා පටන්, අබ්සලොම්
එසේ කිරීමට අධිෂ්ඨාන කරගෙන සිටියේ ය. 33 ඒ
නිසා සියලු රාජ කුමාරයෝ මළෝ යයි මාගේ
ස්වාමීන් වන රජ්ජුරුවන් සිතට නොගත මැනව.
මැරුණේ අම්නොන් පමණකි”යි කීවේ ය.
34 අබ්සලොම් පලා ගියේ ය. රැකවලේ සිටි
තරුණයා හිස ඔසවා බැලූ විට, විශාල සෙනඟක්
කන්දේ පැත්තකින් හොරොනායිම් මාර්ගයේ එනවා
දුටුවේ ය. 35 ජොනාදාබ් රජුට කතා කොට, “අන්න,
රාජ කුමාරයෝ එති. ඔබේ මෙහෙකරුවා කී ලෙස ම
සිද්ධ වී තිබේ ය”යි කීවේ ය. 36 තවද, ඔහු කතා
කර නිම වූ කෙණෙහි ම රාජ කුමාරයෝ අවුත් ශබ්ද
නඟා ඇඬූ හ. රජ ද ඔහුගේ සියලු සේවකයෝ ද
ශබ්ද නඟා ඇඬූ හ.
37 2 සාමු 3:3 අබ්සලොම් ගෙෂූර්හි රජ වූ
අම්මිහුද්ගේ පුත් තල්මයි වෙත පලා ගියේ ය. දාවිත්
තමාගේ පුත්‍රයා ගැන හැම දින ම බොහෝ
කාලයක් තුළ වැලපිණි. 38 මෙසේ අබ්සලොම්
ගෙෂූර්ට පලා ගොස් එහි තුන් අවුරුද්දක් සිටියේ ය.
39 අම්නොන්ගේ මරණයෙන් පසු දාවිත් සැනසීමට
පත් ව සිටි බැවින්, අබ්සලොම් කෙරෙහි ඔහුගේ
සිත ඇදී ගියේ ය.

### අබ්සලොම් දාවිත් රජ සමඟ සාමදාන වීම

14 දාවිත් රජුගේ සිත අබ්සලොම් කෙරෙහි
ඇලුම් ව තිබෙන බව ශෙරූයාගේ පුත්
ජෝවාබ්ට පෙනී ගියේ ය. 2 එවිට තෙකෝවායෙන්
කපටි ස්ත්‍රියක ගෙන්වාගෙන ඈට කතා කොට,
“ඔබ වැලපෙන්නියක මෙන් වැලපීමේ වස්ත්‍ර හැඳ,
තෙල් නොගා, මියගිය කෙනෙකු ගැන බොහෝ කල්
වැලපෙන ස්ත්‍රියක මෙන් වී, 3 රජු ළඟට ගොස්,
මෙසේ කියන්නැ”යි කීවේ ය. ජෝවාබ්, ඈ විසින්
කියනු ලැබිය යුතු දේ ඈට කියා දිනි.
4 තෙකෝවාවේ ස්ත්‍රිය රජු ළඟට ගොස්,
මුණින්තළා වී වැඳ, “අනේ දේවයන් වහන්ස, පිහිට
වුව මැනවැ”යි කීවා ය.
5 රජු කතා කොට, “ඔබට කුමක් වලො දැ”යි
ඇගෙන් ඇසූ විට, ඈ පිළිතුරු දෙමින්, “මම සැබැවින්
ම වැන්දඹුවක්මි. මාගේ පුරුෂයා මැරුණේ ය.
6 ඔබේ දාසීට පුත්‍රයෝ දෙදෙනෙක් සිටියහ. ඒ
දෙදෙනා පිටත දී දබර කරගත්හ. ඔවුන්
නවත්වන්නට කිසිවෙකු නොසිටි නිසා, එක් කෙනෙක්
අනෙකා ගසා ඔහු මැරුවේ ය. 7 ඉතින් දැන් පවුලේ
සියල්ලෝ ඔබේ දාසියට විරුද්ධ ව නැඟිට, ‘සිය
සහෝදරයා මැරූ මිනිසා එසේ කළ බැවින් අප ඔහු
මරා දමන පිණිස අපට භාර දෙන්න. මෙසේ අපි

උරුමකරුවාත් විනාශ කරමු'යි කියති. මයොකාරයනේ
මාගේ පුරුෂයාට මිහි පිට නාමයක් වත්, දරුවකු
වත් නොපවතින ලසෙ, ඔවුන් මට ඉතිරි ව තිබනෙ
ගිනි අඟුර නිවනු ඇතැ"යි කීවා ය.
8 රජ ද කතා කරමින්, "ඔබ ගදෙර යන්න. මම
ඔබේ පැමිණිල්ල ගැන බේරුමක් කරන්නමේ"යි
කීවේ ය.
9 තකෙෝවාහි ස්ත්‍රිය කතා කරමින්, "මාගේ
ස්වාමීන් වන රජතුමනි, ඒ දෝෂය මා පිටත්, මාගේ
වංශය පිටත් වේවා; රජු ද රජුගේ සිංහාසනය ද ඒ
ගැන නිර්දෝෂ වේවා"යි කීවා ය.
10 රජු ද, "ඔබට විරුද්ධ ව කතා කරන අය මා
ළඟට ගනෙන්න. එවිට ඔහු තවත් ඔබට අත
නොගසන්නේ ය"යි කී ය.
11 එවිට ඈ, "ලේවලට පළිගන්න සිටින මිනිසා
තවත් අය විනාශ නොකරන පිණිස ද ඔහු මාගේ
පුත්‍රයා නැති නොකරන පිණිස ද රජතුමනි, ඔබේ
දවේ සමිඳාණන් වහන්සේගනේ අයදින්නැ"යි කීවා ය.
රජ ද, "ඔබේ පුත්‍රයාගේ හිසකසෙක් වත් බිම
නොවැටනේනේ යයි ජීවමාන සමිඳාණන්
වහන්සේගේ නාමයනේ මම දිවුරා කියමි"යි කී ය.
12 එවිට ස්ත්‍රිය, "මාගේ ස්වාමීන් වන රජ්ජුරුවන්ට
වචනයක් කියන්නට ඔබේ දාසීට අවසර ලැබේවා"යි
කීවා ය. "කියන්නැ"යි ඔහු කී ය.
13 ස්ත්‍රිය ද මසෙේ කීවා ය: "එසේ වී නම්, ඔබ
දවේයන් වහන්සේගේ සනෙඟට විරුද්ධ ව එබඳු
දයෙක් කරන්නට කල්පනා කළෙේ මන් ද? ඔබ
පන්නා දැමූ ඔබේ පුත්‍රයාට ආපසු එන්නට ඉඩ දී
නැත. එබැවින් ඔබ කී දයෙින් ම ඔබ වරදකරුවකේ
වන්නහෙි ය. 14 මන්ද, බිම වැගුරුණු වතුර එකතු
කරගන්නට බැරි ලසෙ අප මැරනේනට ම ඕනෑ ය;
දවේයන් වහන්සේ වුව ද, මළ මිනිසකුෙට නැවත
පණ නොදනෙ සේක. එහතේ, පිටුවහල් කළ
මිනිසකු ආපසු ගනෙ ඒමට මඟක් රජ්ජුරුවන්ට
සොයාගත හැකි ය. 15 "එබැවින් දැන් මාගේ
ස්වාමීන් වන රජ්ජුරුවන්ට මේ කාරණය කියන්නට
මා පැමිණ සිටින්නේ, සනෙඟ මා බිය ගැන්වූ නිසා
ය. එබැවින්, මම රජ්ජුරුවන්ට කතා කරමි; සමහර
විට රජ්ජුරුවන් වහන්සේ තම දාසියගේ ඉල්ලීම
ඉෂ්ට කරනු වන්නට පුළුවන. 16 මන්ද, දවේයන්
වහන්සේගේ උරුමයනේ මාත්, මාගේ පුත්‍රයාත් එක
වර ම නැති කර දමන්නට හදන මිනිසාගේ අතින්
තමන්ගේ දාසිය ගළවාගන්නට රජ්ජුරුවන් සවන්
දනෙු ඇතැ යි මම සිතුවමේ. 17 2 සාමු 19:27එබැවින්
මාගේ ස්වාමීන් වන රජ්ජුරුවන්ගේ වචනයනේ
සැනසීම ලැබේ වා'යි ඔබේ දාසී කීවා ය. මන්ද,
යහපත හා අයහපත විමසීමේ දී මාගේ ස්වාමීන්
වන රජ්ජුරුවෝ දවේයන් වහන්සේගේ දූතයකුෙට
සමාන ය. එබැවින් ඔබේ දවේ සමිඳාණන් වහන්සේ
ඔබ සමඟ සිටින සේක් වා!"
18 එවිට රජ පිළිතුරු දමේින්, "මා ඔබනේ අසන
දයෙ මාගනේ නොසඟවන්නැ"යි ස්ත්‍රියට කීවේ ය.
ස්ත්‍රිය ද, "මාගේ ස්වාමීන් වන රජ්ජුරුවෝ කතා
කරත්වා"යි කීවා ය.
19 රජ ද, "මේ සියල්ල සම්බන්ධ ව ජෝවාබ් ඔබට
අනුබල දී ඇද්දැ"යි ඇසී ය. ස්ත්‍රිය පිළිතුරු දමේින්,
"මාගේ ස්වාමීන් වන රජ්ජුරුවනි, මාගේ ස්වාමීන්
වන රජ්ජුරුවන් කී සියල්ල මඟ හැර දකුණට වත්,
වමට වත් යන්නට කිසිවකුෙට නොහැකි බව ඔබේ
නාමයනේ මම දිවුරා කියමි. එසේ ය, ඔබේ සේවක
වන ජෝවාබ් ම මට අණ කර ඔහු ම මේ සියලු
වචන ඔබේ දාසීගේ කටට දුන්නේ ය. 20 ඔබේ
සේවකයා වන ජෝවාබ් මසෙේ කළෙේ, ඒ කාරණය
අන් මඟකට හරවන පිණිස ය. එහතේ, මිහි පිට
සියල්ල දැනගැනීමට මාගේ ස්වාමීන් වන
රජ්ජුරුවන්ගේ ප්‍රඥාව දවේයන් වහන්සේගේ
දූතයකුගේ ප්‍රඥාව හා සමාන ය"යි කීවා ය.
21 එවිට රජ ජෝවාබ්ට කතා කොට, "මනේන,
ඔබේ ඉල්ලීම ඉටු කර දමේි. ඔබ ගොස් තරුණ
අබ්සලොම් කැඳවාගනෙ එන්නැ"යි කී ය.
22 ජෝවාබ් මුණින්තළා වී වැඳ රජුට ස්තුති කොට,
"රජ්ජුරුවන් තමන්ගේ මහෙකෙරුවාගේ ඉල්ලීම ඉෂ්ට
කළ නිසා, රජතුමනි, ඔබ ඉදිරියහෙි කරුණාව ලැබී
තිබනෙ බව ඔබේ මහෙකෙරුවා දැන් දන්නේ ය"යි
කී ය. 23 මසෙේ ජෝවාබ් පිටත් ව ගෂූර් නගරයට
ගොස්, අබ්සලොම් ජරෙුසලමට කැඳවාගනෙ ආවේ
ය. 24 රජ ද, "ඔහු තමාගේ ම ගදෙරට යේවා; ඔහු
මා ඉදිරියට නොපැමිණිය යුතු ය"යි කී ය. එබැවින්
අබ්සලොම් තමාගේ ගදෙරට හැරී ගියේ ය. ඔහු
රජ්ජුරුවන් ඉදිරියට නොපැමිණියේ ය.
25 අබ්සලොම් මනේ රූප ශෝභාව ගැන ප්‍රශංසා
කටයුතු කනෙකේ මුළු ඉශ්‍රායලේහි නොසිටියේ ය.
පතුල පටන් හිස් මුදුන දක්වා ඔහුට කිසි කැළලක්
නො වී ය. 26 ඔහු තමාගේ හිස කසේ අවුරුද්දනේ
අවුරුද්දට කැපුවේ ය. එසේ කළෙේ, ඔහුගේ කේශ
කලාපය ඔහුට බර ව තිබුණ නිසා ය. ඔහු හිස
කසේ කැපූ විට එය කිරා බැලුවේ ය. ඒවායේ බර
සම්මත රාජකීය මිම්ම අනුව කිලෝග්‍රෑම් දකෙක්
විය. 27 අබ්සලොම්ට පුත්‍රයෝ තුන්දනෙකේ ද එක
දුවක් ද උපන්නාහ. දුවගේ නම තාමාර් ය. ඈ
ශෝභන පනේමක් ඇති කාන්තාවක් වූවා ය.
28 අබ්සලොම් රජු ඉදිරියට නොපැමිණ දෑවුරුද්දක්
ම ජරෙුසලමේ වාසය කළෙේ ය. 29 එවිට
අබ්සලොම්, ජෝවාබ් රජු ළඟට යවන පිණිස, ඔහුට
අඬගසා යැවී ය. එහතේ, ඔහු එන්නට කැමැති නො
වී ය. ඔහු යළිත් දවෙන වර ද කියා යැවී ය.
එහතේ, ඔහු එන්නට කැමැති නො වී ය. 30 එබැවින්
තමාගේ වැඩකාරයන්ට කතා කොට, "බලන්න,
ජෝවාබ්ගේ කතෙ මාගේ කතෙට යාබද ව තිබේ.
එහි ඔහුට යව ගොයම් තිබේ. ඔබ ගොස් ඒවාට
ගිනි තියන්නැ"යි කී ය. අබ්සලොම්ගේ
මහෙකෙරුවෝ ඒ කතෙට ගිනි තැබූහ.
31 එවිට ජෝවාබ් නැඟිට අබ්සලොම්ගේ ගදෙරට
අවුත්, "ඔබේ මහෙකෙරුවන් අවුත් මාගේ කතෙට
ගිනි තැබුවේ මන්දැ"යි ඔහුගනේ ඇසී ය.
32 අබ්සලොම් කතා කොට, "මහෙි පැමිණනේනැ යි
ඔබට පණිවුඩ එව්වේ, 'මම ගෂූර් සිට ආවේ කුමට
ද? මේ වන තුරුත් එහි සිටියමේ නම් හොඳ ය' කියා

දන්වා ඔබ රජු වෙත යවන පිණිස ය. ඉතින් මට
රජුගේ මුහුණ දකින්නට ලැබේවා. මා තුළ
අපරාධයක් ඇත්නම්, ඔහු මා මැරුවා වේ”යි කී ය.
33 ජෝවාබ් රජු ළඟට අවුත් එපවත් ඔහුට දැන්වී
ය. ඔහු අබ්සලෝම් කැඳවූ කල හෙතෙමේ රජු ළඟට
අවුත්, රජු ඉදිරියෙහි මුණින්තළා වී වැන්දේ ය. රජ ද
අබ්සලෝම් සිඹගත්තේ ය.

### අබ්සලෝම් කැරලි ගැසීම

15 අබ්සලෝම් රථයක් ද අශ්වයන් ද තමාට
පෙරටුවෙන් දුවන්නට මිනිසුන් පණස්දෙනෙකු
ද සූදානම් කර ගත්තේ ය. 2 තවද, අබ්සලෝම්
අලුයම නැඟිට දොරටුවට යන මාර්ගය අයිනේ
සිටිමින්, විනිශ්චය පිණිස නඩුවක් ඇති යම් මිනිසෙකු
පැමිණි විට, ඔහුට අඬගසා, “ඔබ කුමන නගරයට
අයිති දැ”යි ඔහුගෙන් ඇසී ය. ඔහු ද, “ඔබේ
මෙහෙකරුවා අසවල් ඉශ්‍රායලේ ගෝත්‍රයට අයිති
ය”යි කී විට, 3 අබ්සලෝම් ඔහු අමතා, “බලන්න,
ඔබේ පැමිණිල්ල හොඳ ය. සාධාරණ ය. එහෙත්,
ඔබේ ඒ පැමිණිල්ල අසන පිණිස රජු විසින් පත්
කරන ලද කෙනෙක් නැතැ”යි කීවේ ය. 4 ඇරත්,
“දේශයේ විනිශ්චයකාරයා වශයෙන් මම පත් කරනු
ලබම් නම්, නඩුවක් හෝ පැමිණිල්ලක් හෝ ඇති
කෙනෙකු මා වෙත ආ කල්හි මම ඔහුට යුක්තිය ඉටු
කර දෙන්නෙමි”යි ද අබ්සලෝම් කී ය. 5 යමෙකු
ඔහුට වඳින්නට ළං වූ කල ඔහු තමාගේ අත දිගු
කොට ඔහු අල්ලා සිඹගත්තේ ය. 6 විනිශ්චය පිණිස
රජු ළඟට පැමිණි සියලු ඉශ්‍රායලේවරුන්ට
අබ්සලෝම් මෙලෙසෙ කර ඔවුන්ගේ සිත් දිනාගත්තේ
ය.
7 තවද, සතර අවුරුද්දකට පසු අබ්සලෝම්, රජුට
කතා කොට, “මා සමිඳාණන් වහන්සේට වුණ බාරය
හෙබ්‍රොන්හි දී ඉෂ්ට කරන පිණිස මට යන්නට
අවසර දුන මැනව. 8 මන්ද, ඔබේ මෙහෙකරුවා
සිරියේ ගෙෂූර්හි සිටිය දී, ‘සමිඳාණන් වහන්සේ
සැබැවින් ම මා නැවත ජෙරුසලමට පමුණුවන්නට
යෙදුණොත්, මම සමිඳාණන් වහන්සේට සේවය
කරන්නෙමි’යි බාරයක් වුණාමි”යි කී ය.
9 “සාමදානයෙන් යන්නැ”යි රජ ඔහුට කී ය. ඔහු
නැඟිට හෙබ්‍රොන් නගරයට ගියේ ය. 10 එහෙත්,
අබ්සලෝම් ඉශ්‍රායලේ ගෝත්‍රයන් අතරෙහි
ඔත්තුකාරයන් යවා, “ඔබට හොරණෑ ශබ්දය ඇසුණ
කණෙහි ම, ‘අබ්සලෝම් හෙබ්‍රොන්හි රජ වී සිටී
ය’යි කියන්නැ”යි දන්වන්නට කී ය. 11 තවද, කැඳවන
ලද මිනිස්සු දෙසියයක් අබ්සලෝම් සමඟ
ජෙරුසලමට ගියහ. ඔව්හු කිසිවක් නොදැන, අවංක
සිතින් ගියහ. 12 අබ්සලෝම් පූජා ඔප්පු කරන අතර
දාවිත්ගේ මන්ත්‍රීවරයෙකු ද ගිලෝන් වැසියෙකු ද
වන අහිතොපෙල් ඔහුගේ නගරය වූ ගිලෝයෙන්
ගෙන්වා ගත්තේ ය. මෙසේ කුමන්ත්‍රණය බලවත්
වී සෙනඟ වඩ වඩා අබ්සලෝම්ට එකතු වූ හ.

### දාවිත් රජ පලා යෑම

13 පණිවුඩකාරයෙකු දාවිත් කරා පැමිණ,
“ඉශ්‍රායලේ මිනිසුන්ගේ සිත් අබ්සලෝම් දෙසට ඇදී
ගොස් ඇතැ”යි කී ය.
14 එවිට දාවිත් ජෙරුසලමේ තමා සමඟ සිටි
තමාගේ සියලු සේවකයන්ට කතා කොට, “අපි
පිටත් ව පලා යමු. නැතහොත් අපෙන් කිසිවකු
අබ්සලෝම්ගෙන් බේරෙන්නේ නැත. ඔහු වහා ම
අප කරා පැමිණ, අප පිට අනතුරු පමුණුවා, කඩුවෙන්
නගරයට පහර නොදෙන පිණිස පිට වී යන්නට
ඉක්මන් කරන්නැ”යි කී ය.
15 රජුගේ සේවකයෝ රජුට කතා කොට, “අපේ
ස්වාමීන් වන රජ්ජුරුවන් නියම කරන කවර දෙයක්
වුව ද කරන්නට ඔබේ සේවකයෝ සැරසී සිටිති”යි
කී හ. 16 එවිට රජ ද ඔහු අනුව ඔහුගේ ගෙයි වැසි
සියල්ලෝ ද පිටත් ව ගියහ. රජ තමේ රාජ
මාලිගාව බලාගැනීමට උපභාර්යාවන් දසදෙනෙකු
නතර කොට පලා ගියේ ය.
17 මෙසේ රජ ද ඔහු සමඟ සියලු සෙනඟ ද පිටත්
ව ගොස්, නගර සීමාවේ අන්තිම ගෙදර නැවතුණාහ.
18 ඔහුගේ සියලු සේවකයෝ ඔහු ළඟ සිටියහ.
සියලු කෙරෙතිවරු ද සියලු පෙලෙතිවරු ද ගාත්හි සිට
ඔහු අනුව ආ ගිත්තීය ජාතික මිනිස්සු හයසියයක් ද
ඔහුට පෙරටු ව ගියහ. 19 එවිට රජ ගිත්තීය ජාතික
ඉත්තයිට කතා කොට, “ඔබත් අප සමඟ එන්නේ
මන් ද? හැරී ගොස් අලුත් රජු සමඟ සිටින්න. මන්ද,
ඔබ විදේශිකයෙකු ය; ඔබේ රටෙන් පිට වූ
කෙනෙකු ය; 20 ඊයේ පැමිණි ඔබට අද අප සමඟ
ඔබමොබ යන්නට සැලැස්විය යුතු ද? මම වනාහි
මට යා හැකි කොතැනට වුව ද යමි. ඔබ හැරී ඔබේ
සහෝදරයන් කැඳවාගෙන යන්න. කරුණාවත්,
සැබෑකමත් ඔබ සමඟ වේවා”යි කී ය.
21 ඉත්තයි රජුට උත්තර දෙමින්, “මාගේ ස්වාමීන්
වන රජ්ජුරුවන් සිටින්නේ යම් තැනක ද, එතැන ම
මැරෙන්නට හෝ ජීවත් වන්නට හෝ ඔබේ
මෙහෙකරුවා සිටින්නේ යයි ජීවමාන සමිඳාණන්
වහන්සේගේ නාමයෙන් ද ඔබේ නාමයෙන් ද දිවුරා
කියමි”යි කී ය.
22 දාවිත් ද, “ගොස් එගොඩ වන්නැ”යි ඉත්තයිට
කී ය. එවිට ගිත්තීය ජාතික ඉත්තයි ද ඔහුගේ සියලු
මිනිස්සු ද ඔහුගේ පිරිවර ද එගොඩ වූ හ. 23 මුළු
සෙනඟ යද්දී දේශයේ සෑම තැන ම මිනිස්සු මහා
හඬින් ඇඬූ හ. රජු කිද්‍රොන් නම් ඔයෙන් එගොඩ
වූ පසු සියලු සෙනඟ ද පාළුකරය බලා යන මාර්ගය
දිගේ ගියහ.
24 ශාදොක් ද ඔහු සමඟ සියලු ලෙවීවරු ද
දෙවියන් වහන්සේගේ ගිවිසුම් කරඬුව රැගෙන
පැමිණියහ. මුළු ජනතාව නගරයෙන් අවුත් නිම වන
තුරු ඔව්හු දෙවියන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
අබියාතර් ළඟ බිම තැබූ හ. 25 රජ ශාදොක්ට කතා
කොට, “දෙවියන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
යළිත් නගරයට ගෙන යන්න. සමිඳාණන්

වහන්සේගේ ඇස් හමුයෙහි මට කරුණාව
ලැබුණොත්, උන් වහන්සේ යළිත් මා ගෙනවුත්
ගිවිසුම් කරඬුවත්, එය තබා තිබෙන ස්ථානයත් මට
පෙන්වනු ඇත. 26 එහෙත්, 'නුඹ කෙරෙහි මම
ප්‍රසන්න නොවෙමි'යි උන් වහන්සේ වදාරන සේක්
නම්, මම මෙහි ය; උන් වහන්සේ කැමැති ලෙස මට
කරන සේක් වා"යි කී ය. 27 රජ පූජක වූ ශාදොක්ට
තවදුරටත් කතා කොට, "හොඳින් බලන්න. ඔබේ
පුත් අහීමයාශ් ද අබ්යාතර්ගේ පුත් ජොනතන් ද
යන ඔබේ පුත්‍රයන් දදෙනා සමඟ ඔබ ද අබ්යාතර්
ද සාමදානයෙන් නගරයට පෙරළා යන්න. 28 මන්ද,
මට දන්වන්නට ඔබෙන් ආරංචි ලැබෙන තුරු මම
පාළුකරයේ සමහුම්වල නවතින්නෙමි"යි කී ය.
29 එවිට ශාදොක් ද අබ්යාතර් ද දෙවියන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව නැවත ජෙරුසලමට
ගෙන ගොස් එහි නැවතී සිටියහ.
30 දාවිත් අඬ අඬා, හිස වසාගෙන, පාවහන් නැති
ව, ඔලීව කන්දට නඟින පාරේ ගියේ ය. ඔහු සමඟ
සිටි සියලු සෙනඟ ද තම තමන්ගේ හිස් වසාගෙන,
අඬමින් නැඟී ගියහ. 31 අහිතොපෙල් කුමන්ත්‍රණ
කාරයන් අතරේ අබ්සලොම් සමඟ සිටින බව
දාවිත්ට දන්වන ලද්දේ ය. එවිට දාවිත්, "අහෝ
සමිඳුනි, අහිතොපෙල්ගේ මන්ත්‍රණය අනුවණකමක්
බවට හැරවුව මැනවැ"යි කී ය.
32 තවද, දෙවියන් වහන්සේට නමස්කාර කරන
ස්ථානය වන කන්ද මුදුනට දාවිත් පැමිණි විට,
අර්කීය ජාතික හූෂයි තමාගේ උතුරු සළුව ඉරාගෙන,
හිස පිට පස් දමාගෙන ඔහුගේ පෙරමඟට ආයේ ය.
33 දාවිත් ඔහුට මෙසේ කී ය: "ඔබ මා සමඟ
ගියොත් ඔබ මට බරක් වන්නෙහි ය. 34 එහෙත්,
ඔබ නගරයට හැරී ගොස්, අබ්සලොම්ට කතා කර,
'රජතුමනි, මම ඔබේ සේවකයා වෙමි; පළමු ව
ඔබේ පියාගේ සේවකයකු ව සිටි ලෙස ම දැන්
ඔබේ සේවකයෙක් වෙමි'යි කියන්නෙහි නම්, මා
උදෙසා අහිතොපෙල්ගේ මන්ත්‍රණය නිෂ්ඵල
කරන්නට ඔබට පුළුවන් වන්නේ ය. 35 පූජකයන්
වන ශාදොක් හා අබ්යාතර් ඔබ සමඟ එහි සිටිනවා
නොවේ ද? එබැවින් රජ ගෙදරින් අසන්නට ලැබෙන
කවර දෙයක් වුව ද, ඔබ පූජකයන් වන ශාදොක්ටත්,
අබ්යාතර්ටත් දන්වන්න. 36 ඔවුන්ගේ පුත්‍රයන්
දදෙනා වන ශාදොක්ගේ පුත් අහීමයාශ් හා
අබ්යාතර්ගේ පුත් ජොනතන් ද එහි ඔවුන් සමඟ
සිටිති. ඔබ හැම දැනගන්න සියලු දේ ඔවුන් අත මට
කියා එවන්නැ"යි කී ය.
37 මෙසේ දාවිත්ගේ මිත්‍ර වූ හූෂයි නුවරට
පිවිසෙද්දී අබ්සලොම් ද ජෙරුසලමට ඇතුළු විය.

## ශීබාගේ හිතවත්කම

16 2 සාමු 9:9-10 දාවිත් කඳු මුදුනෙන් මඳක්
ඔබ්බට ගිය විට, මෙපිබොෂෙත්ගේ
වැඩකාරයා වන ශීබා, ඇඳුම් දැමූ කොටළුවන්
දදෙනෙකු ද උන් පිට පටවන ලද රොටි දෙසියයක්
ද වියළි මිදි පල පොකුරු සියයක් ද වනෙන් පලතුරු
වලු සියයක් ද මුද්‍රික පාන භාජනයක් ද ඇති ව
ඔහුගේ පෙරමඟට ආවේ ය. 2 "මේවා මොනවාට
දැ"යි රජ ශීබාගෙන් ඇසී ය. ශීබා ද, "කොටළුවන්,
රජ්ජුරුවන්ගේ පවුලේ අයට නැඟී යන පිණිස ය;
රොටි හා පලතුරු තරුණයන්ට කන්නටත්, මුද්‍රික
පානය පාළුකරයේ දී වෙහෙසෙන්නන්ට බොන්නටත්
ය"යි පිළිතුරු දුන්නේ ය.
3 2 සාමු 19:26-27 එවිට රජ, "ඔබේ ස්වාමියාගේ
පුත්‍රයා කොහේ දැ"යි ඇසුවේ ය. ශීබා පිළිතුරු
දෙමින්, "බලන්න, ඔහු ජෙරුසලමේ නැවතී සිටියි;
මන්ද, 'ඉශ්‍රායලේ වංශය අද මාගේ පියාගේ
රාජ්‍යය මට දෙනු ඇත' කියා ඔහු කීවේ ය"යි රජුට
පිළිතුරු දුන්නේ ය.
4 එවිට රජ, "බලන්න, මෙපිබොෂෙත්ට අයිති
සියල්ල ඔබට අයිති වේවා"යි ශීබාට පැවසී ය. ශීබා
ද, "මාගේ ස්වාමීන් වන රජතුමනි, මාගේ ගරු
බුහුමන් පිළිගත මැනව; ඔබ ඉදිරියෙහි මට කරුණාව
ලැබේවා"යි කී ය.

## ෂිමයි දාවිත් රජුට සාප කිරීම

5 දාවිත් බහුරීම් නගරයට පැමිණි කල, සාවුල්ගේ
කුල පරම්පරාවට අයිති වූ ගේරාගේ පුත් ෂිමයි
නම් මිනිසෙක් එතැනින් පිටත් වී, දෙස් කිය කියා
යමින්, 6 දාවිත්ටත්, දාවිත් රජුගේ සියලු
සේවකයන්ටත් ගල් ගැසී ය. සියලු සෙනඟ ද සියලු
බලවන්තයෝ ද දාවිත්ගේ දකුණු පසෙහි ද වම්
පසෙහි ද සිටියෝ ය. 7 ෂිමයි දෙස් තබමින්,
"මිනීමරුව, දුර්ජනය, පලා යව, පලා යව. 8 සාවුල්
වෙනුවට රජ වූ ඔබ පිට, සමිඳාණන් වහන්සේ
සාවුල්ගේ පවුලේ සියල්ලන්ගේ ලේ වැගිරීමේ
දුර්විපාකය පමුණුවා, ඔබේ පුත් අබ්සලොම්ට
රජකම භාර දුන් සේක. ඔන්න, ඔබ විපත්තියට අසු
වී සිටින්නෙහි ය. මන්ද, ඔබ මිනීමරුවෙක් ය"යි රජුට
කී ය.
9 එවිට ශරුයාගේ පුත් අබීෂයි කතා කොට,
"මෙවැනි බලු කුණක්, මාගේ ස්වාමීන් වන
රජ්ජුරුවන්ට දෙස් කියන්නේ මන් ද? ගොස් ඔහුගේ
හිස ගසා දමන්නට මට අවසර ලැබේවා"යි කී ය.
10 රජ ද පිළිතුරු දෙමින්, "ශරුයාගේ පුත්‍රයෙනි,
මෙය මට වත්, ඔබට වත් අයිති වැඩක් නොවේ.
ඔහු දෙස් කීවා වේ! 'දාවිත්ට දෙස් කියාපන්නැ'යි
ඔහුට කීවේ සමිඳාණන් වහන්සේ නම්, 'ඔබ මෙසේ
කළේ මන්දැ'යි කියන්නට පුළුවන් කවරෙකුට දැ"යි
ඇසී ය. 11 තවද, දාවිත් රජ අබීෂයිටත්, තමාගේ
සියලු සේවකයන්ටත් කතා කොට, "බලන්න, මට
දාව උපන් මාගේ ම පුත්‍රයා මා නසන්නට
සොයන්නේ නම්, ඊට කොපමණ වැඩියෙන් මේ
බෙන්ජමින් ජාතිකයාට දැන් එසේ කරන්නට බැරි ද?
ඔහු නිකම් සිටියා වේ, දෙස් කීවා වේ; මන්ද,
එලෙසෙ කරන්නට සමිඳාණන් වහන්සේ වදාළ සේක.
12 සමහර විට මට කරන ලද අයුක්තිය දෙස
සමිඳාණන් වහන්සේ බලා, අද දවසේ ඔහුගේ දෙස්
කීම වෙනුවට මට යහපත කරනු ඇතැ"යි කී ය.

13 මසෙේ දාවිත් හා ඔහුගේ මිනිසුන් මාර්ගයෙේ
යද්දී, ෂිමයි ඔහුට ඉදිරිපිටින් කන්දෙේ පැත්තකින්
යනුයෙේ, දසේ කියමින් ද ඔහුට ගල් ගසමින් ද පස්
විසි කරමින් ද ගියෙේ ය. 14 රජ ද තමා ළඟ සිටි
සියලු සනෙඟ ද වහෙසෙ ව ජොර්දාන් ගඟ ළඟට
අවුත් එහි විඩා සංසිඳුවා ගත්තෝ ය.

### අහිතොපලේ අබ්සලොම්ට අවවාද කිරීම

15 අබ්සලොම් ද ඉශ්රායලේ ජාතික සියලු සනෙඟ
ද ඔහු සමඟ අහිතොපලේ ද ජරෙුසලමට ආවෝ ය.
16 තවද, දාවිත්ගේ මිතුරා වන අර්කීය ජාතික හූෂයි
අබ්සලොම් ළඟට පැමිණි විට, "රජු සැරදෙේ වා!,
සැරදෙේ වා!"යි කීවෙේ ය.
17 අබ්සලොම් ද, "ඔබෙේ මිතුරා කරෙහෙි ඇති
ඔබෙේ කරුණාව කුමක් ද? ඔබෙේ මිතුරා සමඟ
නොගියෙේ මන්දැ"යි හූෂයිගනෙේ ඇසී ය.
18 හූෂයි ද, "එසෙේ නොවෙේ; සමිඳාණන් වහන්සෙේ
ද මෙේ සනෙඟ ද සියලු ඉශ්රායලේ මනුෂ්යයන් ද
විසින් තෝරාගන්නා ලද තැනැත්තාට එකතු ව මම
ඔහු සමඟ සිටිමි. 19 ඇරත්, මා සෙේවය කළ යුත්තෙේ
කවරකුෙට ද? ඔහුගෙේ පුත්රයාට නොවෙේ ද? මම
ඔබගෙේ පියාණන් ඉදිරියෙහි සෙේවය කළ පරිදි, ඔබට
සෙේවය කරන්නමෙි"යි අබ්සලොම්ට කීවෙේ ය.
20 එවිට අබ්සලොම් අහිතොපලේට කතා කොට,
"අප කුමක් කටයුතු දැ යි සම්මන්ත්රණය කොට
කියන්නැ"යි කීවෙේ ය.
21 අහිතොපලේ අබ්සලොම්ට පිළිතුරු දමෙින්,
"ඔබෙේ පියාණන්ගෙේ ගදෙර ප්රවෙේසම් කරන පිණිස
සිටුවා ගිය ඔහුගෙේ උපභාර්යාවන් වතෙ පිවිසනේන;
එවිට සියලු ඉශ්රායලේවරු ඔබෙේ පියාණන්ට ඔබ
පිළිකුලක් ව සිටින බව අසන්නෝ ය. එකල්හි ඔබ
සමඟ සිටින සියල්ලෝ ශක්තිසම්පන්න වන්නෝ
ය"යි කී ය. 22 2 සාමු 12:11-12මසෙේ ඔව්හු ගයෙ
උඩ අබ්සලොම්ට කූඩාරමක් සැදුවෝ ය. අබ්සලොම්
ද සියලු ඉශ්රායලේවරුන් ඉදිරියෙහි තමාගෙේ පියාගෙේ
උපභාර්යාවන් වතෙ පිවිසුණෙේ ය.
23 ඒ කාලයෙේ දී මිනිසකු දවෙියන් වහන්සෙේගෙේ
පණිවුඩය සොයන ලසෙ, ඔව්හු අහිතොපලේගෙේ
අවවාදය සවේවෝ ය. අහිතොපලේගෙේ අවවාදය
දාවිත් හා අබ්සලොම් සැලකුවෙේ එයාකාරයනේ ය.

### අබ්සලොම් නොමඟ යැවීම

17 අහිතොපලේ අබ්සලොම්ට කතා කොට,
'මිනිසුන් දොළොස්දහසක් තෝරාගනෙ, අද
රාත්රියෙේ පිටත් ව, දාවිත් පස්සෙේ ලුහුබැඳ යන්නට
මට අවසර ලැබෙේවා. 2 ඔහු වහෙසෙ ව අධරෛය ව
සිටිය දී මම ඔහුට විරුද්ධ ව ගොස් ඔහු බිය
ගන්වන්නමෙි. එවිට ඔහු සමඟ සිටින මුළු සනෙඟ
පලා යනු ඇත. මම රජුට පමණක් පහර දමෙි.
3 මනාලියක සිය සැමියා වතෙ ගනෙනෙු ලබන පරිදි
මම මුළු සනෙඟ ඔබ වතෙ හරවා ගනෙනෙන්නමෙි.
ඔබ සොයන්නෙේ එක් කනෙකුෙ මරන්නට ය; සසෙුෙ
අය සුරැකී ව සිටිනු ඇතැ"යි කීවෙේ ය. 4 අබ්සලොම්
ද මුළු ඉශ්රායලේහි සියලු ප්රජා මූලිකයෝ ද ඒ
කීමට ප්රසන්න වූ හ.
5 එවිට අබ්සලොම්, "දැන් අර්කීය ජාතික හූෂයිටත්
අඬගසන්න; ඔහු කියන දෙේත් අසමු"යි කීවෙේ ය.
6 හූෂයි අබ්සලොම් වතෙ ආ කල්හි අබ්සලොම්
ඔහුට කතා කොට, අහිතොපලේ කී සියල්ල ඔහුට
කියා, "අහිතොපලේගෙේ කීම ලසෙ අපි කරමු ද?
එසෙේ නැත්නම් ඔබ සිතන්නෙේ කුමක් දැ"යි ඇසී ය.

### හූෂයිගෙේ අවවාදය

7 හූෂයි අබ්සලොම්ට කතා කොට, "අහිතොපලේ
මෙේ වතාවෙේ දී දුන් අවවාදය නම් හොඳ නැතැ"යි
කීවෙේ ය. 8 හූෂයි තවදුරටත් කතා කරමින් මසෙේ
කීවෙේ ය: "ඔබෙේ පියා හා ඔහුගෙේ මිනිසුන්
බලවන්තයන් බවත්, වනයෙේ පැටවුන් නැති වූ
වැලහින්නක මනේ කෝප වී සිටින බවත් ඔබ
දන්නෙහි ය. ඔබෙේ පියා යුද්ධයෙහි දක්ෂයකෙි. ඔහු
රාත්රියෙේ සනෙඟ සමඟ නවතින්නෙේ නැත. 9 දැන්
වුව ද ඔහු ගුහාවක හෝ වනෙ තැනක හෝ සැඟවී
ඇත. තවද, මුල් පහර දීමෙේ දී ඔවුන්ගනේ සමහර
දනෙකුෙ මිය ගිය විට එය අසන කවුරුන් නමුත්,
'අබ්සලොම් අනුව යන සනෙඟ අතරෙහි මහා
ඝාතනයක් සිදු වී තිබෙේ ය'යි කියනු ඇත. 10 එවිට
සිංහයකුගෙේ සිත මනේ සිතක් ඇති බලවතා පවා
සහමුලින් ම මලානික වනු ඇත. මන්ද, ඔබෙේ පියා
බලවන්තයකුෙ බවත්, ඔහු සමඟ සිටින අය
වික්රමාන්විත මිනිසුන් බවත් සියලු ඉශ්රායලේවරු
දනිති. 11 ඒ නිසා මා ඔබට දනෙ අවවාදය නම් මයෙ
යි. දාන් පටන් බයෙර්-ෂබෝ දක්වා, සිටින, ගණනින්
මුහුදු වරළෙෙේ වැලි මනේ විශාල සංඛ්යාවක් වන
සියලු ඉශ්රායලේවරුන් ඔබ වතෙ රැස් වන තකෝ
සිට, ඔබ ම පෞද්ගලික ලසෙ සටනට යන්න.
12 එසෙේ ඔහු යම් ස්ථානයක සිටින්නෙේ ද, අපි
එතැනට පැමිණ, මිහි පිට පිනි වැටනෙ පරිදි ඔහු
කරා පැමිණනේනමු. එවිට ඔහු වත්, ඔහු සමඟ
සිටින මිනිසුන්ගනේ එකකෙු වත් ඉතිරි නොවන්නෝ
ය. 13 ඔහු යම් හයෙකින් නගරයකට ඇතුල් වී
සිටියොත්, සියලු ඉශ්රායලේවරුන් ඒ නගරයට කඹ
ගනෙවුත් එහි බොරළු කැටයක් වත් ඉතුරු නොවන
තුරු අපි ඒ නගරය ගඟට ම ඇද දමන්නමු."
14 අබ්සලොම් ද සියලු ඉශ්රායලේ සනෙඟ ද,
"අහිතොපලේගෙේ අවවාදයට වඩා අර්කීය ජාතික
හූෂයිගෙේ අවවාදය හොඳ ය"යි කී හ. සමිඳාණන්
වහන්සෙේ අබ්සලොම් පිට විනාශය පමුණුවන පිණිස,
අහිතොපලේගෙේ හොඳ අවවාදය නිෂ්ප්රභා
කරන්නට නියම කර තිබුණෙේ ය.

### දාවිත් රජ ගැළවී පලා යාම

15 එකල පූජකයන් වන ශාදොක්ටත්, අබියාතර්ටත්
හූෂයි කතා කොට, "අහිතොපලේ මෙේ මෙේ විධියට
අබ්සලොම්ටත්, ඉශ්රායලේහි ප්රජා මූලිකයන්ටත්
අවවාද දුන්නෙේ ය. මම මෙේ මෙේ විධියට අවවාද
දිනිමි. 16 එබැවින් දැන් ඉක්මනින් පණිවුඩයක් යවා,

'රජු ද මුළු සෙනඟ ද නැති නොවෙන පිණිස, අද
රාත්‍රියේ පාළුකරයේ සමභූමිවල නොනැවතී,
කොහොම නමුත් එගොඩ විය යුතු ය'යි දාවිත් රජුට
දන්වන්නැ"යි කීවේ ය.
17 ජොනාතන් හා අහීමයාශ් ඒන්රොගලේ ස්ථානය
ළඟ සිටියෝ ය. වැඩකාරියක් ගොස් සිරිතක්
වශයෙන් ඔවුන්ට ආරංචි දැන්වූවා ය. ඔව්හු ගොස්
එපවත් රජ්ජුරුවන්ට දැන්වූවෝ ය. මෙසේ කරන
ලද්දේ ඒ දදෙනා තමන්ගේ නගරය ඇතුළට
පිවිසෙනු කිසිවකු නොදකින පිණිස ය. 18 එසේ
වුව ද, තරුණයෙක් ඔවුන් දැක අබ්සලොම්ට දැන්වී
ය. එවිට ඔවුන් දදෙනා වහා ගොස්, බහුරීම්හි වසන
මිනිසෙකුගේ ගෙදරට පැමිණියෝ ය. ඔහුගේ
ගමිදුලේ ළිඳක් තිබුණේ ය. ඔව්හු එයට බැස්සෝ
ය. 19 ස්ත්‍රිය ද වැස්මක් ගෙන එය ළිං කටේ එළා,
ඒ පිට ධාන්‍ය වනා තැබුවා ය. එසේ කළේ,
කිසිවකු එහි ළිඳක් ඇති බව දැන නොගන්න පිණිස
ය. 20 අබ්සලොම්ගේ සේවකයෝ ස්ත්‍රිය වෙත ඒ
ගෙදරට අවුත්, "අහීමයාශ් හා ජොනාතන් කොතැන
දැ"යි ඇසූ හ. ඒ ස්ත්‍රී පිළිතුරු දෙමින්, "ඔව්හු වතුර
ඇළෙනේ එගොඩ වූවෝ ය"යි කීවා ය. ඒ මනුෂ්‍යයෝ
ඔවුන් සොයා සම්බ නොවූ බැවින් ජෙරුසලමට
පෙරළා ගියෝ ය.
21 ඔවුන් ගිය පසු, ජොනාතන් හා අහීමයාශ් ළිඳනේ
ගොඩට විත්, දාවිත් රජු වෙත ගොස්, එපවත්
දන්වමින්, "ඔබට විරුද්ධ ව අහිතොපෙලේ මෙසේ
අවවාද කළ නිසා පිටත් වී ඉක්මනින් ඇළෙනේ
එගොඩ වුව මැනවැ"යි ඔහුට කී හ. 22 එවිට දාවිත්
ද ඔහු සමඟ සිටි සියලු සෙනඟ ද පිටත් ව
ජොර්දාන් ගඟනේ එගොඩ වූ හ. එළි වන විට
ඔවුන්ගෙනේ එක් කෙනෙක් වත් ජොර්දානනේ
එගොඩට නොගොස් ඉතිරි ව සිටියේ නැත.
23 තමාගේ අවවාදය ලෙසෙ නොකරන ලද බව
අහිතොපෙලේ දැක, තමාගේ කොටළුවා සූදානම්
කොට, පිටත් ව සිය නගරයේ තිබුණ ඔහුගේ
ගෙදරට ගොස්, පවුලේ කටයුතු ගැන විධි විධාන
යොදා එල්ලී මැරුණේ ය. ඔහු තම පියාගේ
සොහොනේ ගයේ තැන්පත් කරනු ලැබී ය.

## දාවිත් රජ මහනයිම් නගරයට පිවිසීම

24 දාවිත් රජ මහනයිම් නගරයට පැමිණියේ ය.
අබ්සලොම් ද ඔහු සමඟ සිටි සියලු ඉශ්රායලේ
සෙනඟ ද ජොර්දාන් ගඟනේ එගොඩට ගියෝ ය.
25 තවද, අබ්සලොම් ජෝවාබ් වෙනුවට අමාසා
සේනාපතියා වශයෙනේ පත් කළේ ය. අමාසා වූකලී
ඉෂ්මායලේ ජාතික ඉත්‍රාගේ පුත්‍රයා ය. ඉත්‍රාගේ
බිරිඳ නාහාෂ්ගේ දුව වන අබීගායිල් ය. තවද, ඇ
ජෝවාබ්ගේ මව වන ශෙරුයාගේ සහෝදරී ය.
26 ඉශ්රායලේවරු ද අබ්සලොම් ද ගිලියද් රටහි
කඳවුරු බැඳගත්තෝ ය.
27 දාවිත් රජු මහනයිම් නගරයට පැමිණි විට
අම්මොන්වරුන්ට අයිති රබ්බාහි නාහාෂ්ගේ පුත්
ෂෝබී ද ලෝ-දබොර්හි අම්මීයලේගේ පුත් මාකීර් ද
රොගෙලීම්හි ගිලියද් ජාතික බර්සිල්ලයි ද 28 යහන්,
තළි, මැටි භාජන, කෑමට තිරිඟු, යව පිටි, විලඳ, මෑ,
කොල්ලු ඇට, බැදපු මුං, 29 මී පැණි, කේජු,
බැටළුවන් සහ එළ දීකිරි යන මේවා දාවිත්ටත්, ඔහු
සමඟ සිටි සෙනඟටත් ගෙනාවෝ ය. ඔවුන් එසේ
කළේ, "සෙනඟ පාළුකරයේ බඩගිනි ව, වෙහෙසෙ
ව, පිපාසිත ව සිටිති"යි දැන සිටි බැවිනි.

## අබ්සලොම්ගේ පරාජය හා මරණය

18 දාවිත් තමා සමඟ සිටි සෙනඟ ගණන්
කොට, ඔවුන් කෙරෙහි සහශ්‍රාධිපතීන් හා
ශතාධිපතීන් පත් කළේ ය. 2 තවද, දාවිත්
සෙනඟගෙනේ තුනෙනේ කොටසක් ජෝවාබ් යටතේ ද
තුනෙනේ කොටසක් ශෙරුයාගේ පුත් ජෝවාබ්ගේ
සහෝදර අබීෂයි යටතේ ද තුනෙනේ කොටසක්
ගිත්තීය ඉත්තයි යටතේ ද පිටත් කර හැරියේ ය.
"මමත් ඔබ සමඟ යමි"යි දාවිත් රජ සෙනඟට කී ය.
3 එහෙත්, සෙනඟ කතා කරමින්, "ඔබ නොයා යුතු
ය; මන්ද, අප පලා ගියත් ඔවුන් අප සලකන්නේ
නැත; අපෙනේ දෙකෙනේ කොටසක් මැරුණත් අප ගැන
සලකන්නේ නැත; එහෙත්, ඔබ අපෙනේ දසදහසක්
දෙනෙකු හා සමාන ය. එබැවින් අපට උපකාර
කරන්නට සූදානම් ව ඔබ නගරයේ සිටියොත්
මැනවැ"යි කීවෝ ය.
4 "ඔබ යහපතැ යි සිතන දේ මම කරමි"යි රජ
ඔවුන්ට කී ය. රජු දොරටුවේ පැත්තකින් සිටිය දී
සියලු සෙනඟ සියය සියය බැගින් ද දහස දහස
බැගින් ද පිටත් ව ගියෝ ය. 5 රජ ජෝවාබ්ට ද
අබීෂයිට ද ඉත්තයිට ද කතා කොට, "මා නිසා ඒ
තරුණ අබ්සලොම්ට කරුණාවෙනේ සලකන්නැ"යි අණ
කළේ ය. රජ අබ්සලොම් ගැන සියලු අධිපතීන්ට
එසේ අණ කළ විට මුළු සෙනඟට එය ඇසුණේ ය.
6 මෙසේ සෙනඟ ඉශ්රායලේවරුන්ට විරුද්ධ ව
පිටත් ව ගියෝ ය. සටන එප්‍රායිම් වනයේ දී සිදු
විය. 7 එතැන දී ඉශ්රායලේ සෙනඟ දාවිත්ගේ
සේවකයන්ට පරාජය වූවෝ ය. එදා මහා ඝාතනයක්
සිදු වී මිනිස්සු විසිදහසක් මළහ. 8 යුද්ධය රට
මුළුල්ලේ පැතිර ගොස්, එදා කඩුවෙනේ විනාශ වූ
ගණනට වඩා විශාල සෙනඟක් වනයෙනේ විනාශ වූ
හ.
9 අබ්සලොම් තම අශ්වතරයා පිට නැඟී යද්දී,
දාවිත්ගේ සේවකයන්ට මුණ ගැසුණේ ය.
අශ්වතරයා මහත් ආලෝන ගසක විශාල අතු යටින්
යද්දී ඔහුගේ හිස ආලෝන ගසේ අතුවල හිර වී,
ඔහු අහසටත්, පොළොවටත් අතරේ එල්ලී සිටියේ ය.
ඔහු නැඟී සිටි අශ්වතරයා යන්නට ගියේ ය.
10 එක්තරා මිනිසෙක් ඒ දැක, ජෝවාබ්ට ඒ බව
දන්වමින්, "අබ්සලොම් ආලෝන ගසක එල්ලී සිටිනු
දිටිමි"යි කීවේ ය.
11 ජෝවාබ් එපවත් තමාට කී මිනිසාට කතා
කොට, "ඔබ ඔහු දුටුවෙහි ද? එසේ නම් ඔහු එතැන
ම මරා බිමට නොදැමුවේ මන් ද? ඔබ එසේ

කළෙහෙි නම්, රිදී දසයක් ද ඉඟ පටියක් ද මා ඔබට
දෙන්නට තිබුණා ය"යි කීවේ ය.
12 ඒ මිනිසා පිළිතුරු දෙමින්, "මාගේ අත්වල ඔබ
රිදී කාසි දහසක් තැබුවත්, රජුගේ පුත්‍රයාට විරුද්ධ
ව මාගේ අත මා ඔසවන්නේ නැත. මන්ද, 'කිසිවකු
තරුණ අබ්සලොම්ට අත නොගසන ලෙස වග
බලාගන්න' කියා අප අසාගෙන සිටිය දී රජ්ජුරුවෝ
ඔබටත්, අබිෂයිටත්, ඉත්තයිටත් අණ කළහ.
13 එසේ හයින් මම ඔහුගේ ජීවිතයට විරුද්ධ ව
ද්‍රෝහිකම් කළෙමේ නම්, ඔබ ම මට විරුද්ධ ව
සිටිනු ඇත; මන්ද, කිසි දෙයක් රජුගෙන් සැඟවී
නැතැ"යි කී ය.
14 එවිට ජෝවාබ්, "මට මෙසේ ඔබ සමඟ පමා
වෙමින් සිටිය නොහැක" කියා, හෙල්ල තුනක් අතින්
ගෙන, අබ්සලොම් ආලෝන ගසේ පණපිටින් එල්ලී
සිටිද්දී ම, ඔහුගේ හදවතට ඇන්නේ ය.
15 ජෝවාබ්ගේ ආයුධ රැගත්, මෙහෙකරුවෝ
දසදෙනෙක් වටකරින් සිට අබ්සලොම්ට පහර දී ඔහු
මැරුවෝ ය.
16 ජෝවාබ් හොරණෑව පිම්බේ ය. එවිට සෙනඟ
ඉශ්‍රායලේවරුන් ලුහුබැඳ යෑම අත්හැර පෙරළා
ආවෝ ය. එසේ කළේ, ජෝවාබ් සෙනඟ නැවැත්වූ
බැවිනි. 17 ඔව්හු අබ්සලොම් රැගෙන වනයේ තිබුණ
මහ වළක හෙළා ඔහු පිට ඉතා මහත් ගල් ගොඩක්
නැඟුවෝ ය. සියලු ඉශ්‍රායලේවරු ද තම තමන්ගේ
කූඩාරම්වලට පලාගියෝ ය.
18 අබ්සලොම් ජීවත් ව සිටිය දී, "මාගේ නාමය
සිහිපත් කරවන්නට මට පුත්‍රයෙක් නැතැ"යි රජුගේ
මිටියාවතේ තිබෙන කණුව තමා සිහි වීම උදෙසා
පිහිටුවා, ඊට තමාගේ නම තැබුවේ ය. අද දක්වා
ඊට 'අබ්සලොම් ටැඹ' යයි කියනු ලැබේ.

## දාවිත් රජ අබ්සලොම් ගැන ශෝක වීම

19 එවිට සාදොක්ගේ පුත් අහිමයාශ් කතා කොට,
"සමිඳාණන් වහන්සේ රජ්ජුරුවන් උදෙසා ඔහුගේ
සතුරන්ගෙන් පළිගත් බව රජුට දන්වන පිණිස
දුවන්නට මට අවසර ලැබේවා"යි කීවේ ය.
20 ජෝවාබ් ද, "අද ඔබ ආරංචි ගෙන නොයන්න.
වෙන දවසක ඔබට ආරංචි ගෙන ගිය හැකි ය. අද
රජුගේ පුත්‍රයා මැරුණු නිසා අද ම ආරංචිය ගෙන
නොයන්නැ"යි ඔහුට කීවේ ය. 21 එවිට ජෝවාබ්,
"ඔබ ගොස් දුටු දේ රජුට දන්වන්නැ"යි කූෂීය
ජාතිකයාට කීවේ ය. ඔහු ජෝවාබ්ට වැඳ දිව්වේ ය.
22 එවිට සාදොක්ගේ පුත් අහිමයාශ් යළිත්
ජෝවාබ්ට කතා කොට, "කොහොම නමුත්, මටත් ඒ
කූෂීය ජාතිකයා පස්සේ දුවන්නට අවසර දුන
මැනවැ"යි කීවේ ය. ජෝවාබ් ද, "මාගේ පුත්‍රය, ඔබ
දුවන්නේ මන් ද? ඔබ ගෙනයන ආරංචියට ඔබට
විපාකයක් ලැබෙන්නේ නැතැ"යි කීවේ ය.
23 එහෙත් ඔහු, "කුමක් වෙතත් මම දුවමි"යි කීවේ
ය. ජෝවාබ් ද, "එසේ නම් දුවන්නැ"යි ඔහුට කීවේ
ය. එවිට අහිමයාශ් සමභූමියේ මාවතින් දුව ගොස්
කූෂීය ජාතිකයා පසු කර ගියේ ය.
24 දාවිත් වාසල් දොරටු දෙක අතර වාඩි වී සිටියේ
ය. මුරකාරයා පවුරේ දොරටුව උඩ තිබුණ පියස්සට
ගියේ ය. ඔහු හිස ඔසවා බැලූ විට, මිනිසෙකු
තනියම දුවගෙන එනු දුටුවේ ය. 25 මුරකාරයා
මොරගසා එපවත් රජුට කී ය. රජ කතා කොට,
"ඔහු තනියම එන්නේ නම්, ආරංචි ගෙනෙන්නේ
ය"යි කී ය. ඔහු ඉක්මනට අවුත් ළං විය.
26 මුරකාරයා තව මිනිසෙකු දුව එනු දැක, දොරටු
පාලයාට අඬගසා, "තව මිනිසෙක් තනියම දුව
එන්නේ ය"යි කී ය. එවිට රජ, "ඔහුත් ආරංචි
ගෙනෙන්නේ ය"යි කී ය.
27 මුරකාරයා ද පළමු වන මිනිසාගේ දිවීම
සාදොක්ගේ පුත් අහිමයාශ්ගේ දිවීම හා සමාන බව
මට පෙනේ ය"යි කීවේ ය. රජ ද, "ඔහු යහපත්
මිනිසෙකි. යහපත් ආරංචි ඇතිව එන්නේ ය"යි කී ය.
28 අහිමයාශ් මොරගසා, "සියල්ල යහපතැ"යි රජුට
කියා මුණින්තළා වී වැඳ කතා කොට, "මාගේ
රජ්ජුරුවන්ට විරුද්ධ ව තමන්ගේ අත් එසවූ මිනිසුන්
පාවා දුන් ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට
ප්‍රශංසා වේ වා"යි කීවේ ය.
29 "තරුණ අබ්සලොම් සුව සේ සිටින්නේ දැ"යි රජ
ඇසී ය. එවිට අහිමයාශ් පිළිතුරු දෙමින්, "ජෝවාබ්
විසින් රජ්ජුරුවන්ගේ මෙහෙකරුවාත්, ඔබේ
මෙහෙකරු වන මාත් එවනු ලබන විට මහා
කෝලාහලයක් දිටිමි; එහෙත්, එය කිමෙක් දැ යි
නොදන්නෙමි"යි පිළිතුරු දුන්නේ ය.
30 රජ ද, "පැත්තකට වී මෙහි සිටින්නැ"යි ඔහුට කී
ය. ඔහු පැත්තකට වී සිටියේ ය.
31 එවිට කූෂීය ජාතිකයා ආවේ ය. ඔහු කතා
කොට, "මාගේ ස්වාමීන් වන රජ්ජුරුවන්ට ආරංචි
තිබේ. මන්ද, ඔබට විරුද්ධ ව නැඟී ආ
සියල්ලන්ගෙන් සමිඳාණන් වහන්සේ අද ඔබ උදෙසා
පළිගත් සේකැ"යි කීවේ ය.
32 එවිට රජ, "තරුණ අබ්සලොම් සුව සේ සිටී
දැ"යි කූෂීය ජාතිකයාගෙන් ඇසී ය. කූෂීය ජාතිකයා
ද, "මාගේ ස්වාමීන් වන රජ්ජුරුවන්ගේ සතුරෝ ද
ඔබට අනතුරු කරන්නට ඔබට විරුද්ධ ව නැඟී සිටින
සියල්ලෝ ද ඒ තරුණයා මෙන් වේත්වා"යි උත්තර
දුන්නේ ය.
33 එවිට රජ අතිශයෙන් කම්පා වී දොරටුවට
ඉහළින් තිබුණු උඩුමහලට ගොස් ඇඬුවේ ය. ඔහු
අඬ අඬා, "අනේ! මාගේ පුත් අබ්සලොම්, මාගේ
පුත්‍රය, මාගේ පුත් අබ්සලොම්! ඔබ වෙනුවට මා
මැරුණා නම් යහපත; අහෝ අබ්සලොම්, මාගේ
පුත්‍රය, මාගේ පුත්‍රය"යි කීවේ ය.

## ජෝවාබ් දාවිත් රජුට අවවාද දීම

19 රජ අබ්සලොම් ගැන අඬා වැලපෙන්නේය
කියා ජෝවාබ්ට දන්වන ලද්දේ ය. 2 රජ සිය
පුත්‍රයා ගැන ශෝක වන්නේ යයි එදින ම මුළු
ජනයාට සැළ වුණ බැවින් ඒ දවසේ ඇති වූ ජය ගීය
විලාප ගීයකට හැරිණි. 3 මන්ද, යුද්ධයේ දී පලා යන
සෙනඟක් ලජ්ජා සහගත ව රහසින් එන සේ ඒ

දවසේ දී සෙනඟ රහසින් නගරයට ඇතුළු වුණෝ ය.
4 රජ තමාගේ මුහුණ වසාගෙන, “අනේ! මාගේ පුත්
අබ්සලොම්, අනේ! අබ්සලොම් මාගේ පුත්‍රය,
මාගේ පුත්‍රය!” කියා මහා හඬින් හැඬී ය.
5 ජෝවාබ් රජු වෙත ගෙට ඇතුල් වී කතා කොට,
“අද දවසේ දී ඔබේ ජීවිතයත්, ඔබේ පුත්‍රයන්ගේ
හා දූවරුන්ගේ ජීවිතත්, ඔබේ භාර්යාවන්ගේ
ජීවිතත්, ඔබේ උපභාර්යාවන්ගේ ජීවිතත්, ගැළවේ
ඔබේ සියලු සේවකයන් අද ඔබ ලජ්ජාවට
පැමිණෙව්වහි ය. 6 එසේ වූයේ, ඔබට වෛර
කරන්නන්ට ඔබ ප්‍රේම කරන නිසාත්, ඔබට ප්‍රේම
කරන්නන්ට ඔබ වෛර කරන නිසාත් ය.
අධිපතීන්ගෙන් වත්, සේවකයන්ගෙන් වත් ඔබට
කමක් නැති බව අද ඔබ පෙන්නුවහි ය. අබ්සලොම්
ඉතිරි ව අපි සියල්ලෝ ම මැරුණමු නම්, ඔබ ඉතා
ප්‍රසන්න වන බව අද මට පැහැදිලි විය. 7 එබැවින්
දැන් නැඟිට, පිටතට ගොස් ඔබේ සේවකයන්ට
කරුණාවෙන් කතා කළ මැනව. ඔබ පිටතට
නොගියොත්, ඔබ සමඟ කිසිවකු නොසිටින බවට
සමිඳාණන් වහන්සේගේ නාමයෙන් දිවුරා කියමි.
එසේ වූවොත්, ඔබේ බාල වයසේ පටන් අද දක්වා
ඔබට සිදු වූ සියලු අන්තරාවලට වඩා එය ඔබට
දරුණු වනු ඇතැ”යි කී ය. 8 එවිට රජ නැඟිට
දොරටුව ළඟ හිඳ ගත්තේ ය. “රජ දොරටුව ළඟ
හිඳගෙන සිටින්නේ ය”යි මුළු සෙනඟට දන්වන
ලද්දේ ය. මුළු සෙනඟ ද රජු ඉදිරියට පැමිණියෝ ය.

## දාවිත් රජ ජෙරුසලමට හැරී ඒම

8 ඉශ්‍රායලේවරු තම තමන්ගේ කූඩාරම්වලට පලා
ගොස් සිටියෝ ය. 9 සියලු ඉශ්‍රායලේ ගෝත්‍රවල
සෙනඟ විවාද කරමින්, “රජ්ජුරුවෝ අපේ සතුරන්
අතින් අප මුදා, පිලිස්තිවරුන්ගේ අතින් ද අප
ගළවාගත්හ. එහෙත්, දැන් ඔහු අබ්සලොම් නිසා
රටින් පලා ගොස් ඇත. 10 අප විසින් අප කෙරෙහි
අභිෂේක කරන ලද අබ්සලොම් දැන් යුද්ධයේ දී
මැරුණේ ය. ඒ නිසා රජ්ජුරුවන් නැවත ගෙනේවීම
ගැන ඔබ හැම කිසිවක් නොකියා සිටින්නේ මන්දැ”යි
ඇසූ හ.
11 එවිට දාවිත් රජ පූජක වන ශාදොක්ටත්,
අබියාතර්ටත් මෙසේ කියා යැවී ය. “ඔබ ජුදාහි
ප්‍රජා මූලිකයන්ට කතා කොට, ‘ඉශ්‍රායලේ සෙනඟ
කියමින් සිටි දේ රජ්ජුරුවන්ට සැළ විය. එබැවින්
රජ්ජුරුවන් සිය නිවසෙට ගෙනේවන පිණිස ඔබ
අන්තිමයන් වන්නේ මන්දැ’යි අසන්න. 12 ‘ඔබ හැම
මාගේ සහෝදරයෝ ය; මාගේ ලේ නෑයෝ ය;
එබැවින් රජ්ජුරුවන් නැවත ගෙනේවා ගන්නට ඔබ
අන්තිමයන් වන්නේ මන්දැ’යි අසන්න. 13 තවද,
අමාසාට කතා කොට, ‘ඔබ මාගේ ලේ නෑයෙක්
නොවේ ද? අද සිට ජෝවාබ් වෙනුවට මම නුඹ
සේනාපතියා වශයෙන් පත් කරමි. එසේ
නොකළොත් දෙවියන් වහන්සේ මට දරුණු ලෙස
දඬුවම් කරන සේක්වා’යි කියන්නැ”යි කියා යැව්වේ
ය. 14 මෙසේ දාවිත් සියලු ජුදා මිනිසුන්ගේ සිත් එක්
කෙනෙකුගේ සිත මෙන් දිනාගත්තේ ය. සෙනඟ
කතා කරමින්, “ඔබේ සියලු සේවකයන් සමඟ හැරී
අව මැනව”යි කියා යැව්වෝ ය. 15 එවිට රජ හැරී
ජොර්දාන් ළඟට පැමිණියේ ය. ජුදා වාසීන් ද
ජොර්දාන් ගඟෙන් මෙගොඩට රජු කැඳවාගෙන එන
පිණිස රජුගේ පෙරමඟට යන්නට ගිල්ගාල් නගරයට
පැමිණියෝ ය.
16 2 සාමු 16:5-13 එකල බහුරීම් වැසියකු වූ
බෙන්ජමින් ගෝත්‍රයට අයිති ගේරාගේ පුත් ෂිමයි
කඩිනමින් ජුදා මිනිසුන් සමඟ දාවිත් රජුගේ
පෙරමඟට බැස ආවේ ය. 17 ඔහු සමඟ බෙන්ජමින්
ගෝත්‍රයේ මිනිස්සු දහසක් ද සාවුල්ගේ වංශයේ
සේවකයකු වූ ශීබා ද ඔහුගේ පුත්‍රයෝ
පසළොස්දෙනා ද ඔහුගේ වැඩකාරයෝ විසිදෙනා ද
සිටියෝ ය. ඔව්හු රජු බලා සිටිය දී ජොර්දාන් මැදින්
ගියෝ ය.

## දාවිත් රජ ෂිමයිට කරුණාව දැක්වීම

18 රජු ද ඔහුගේ ගෙයිවැසි සියල්ලන් ද මෙගොඩට
ගෙනෙන පිණිසත්, රජුගේ කැමැත්තක් කරන
පිණිසත්, පාරුවක් ගඟින් එගොඩට ගියේ ය.
ගේරාගේ පුත් ෂිමයි ජොර්දාන් ගඟෙන් එගොඩ වූ
කල, 19 රජු ඉදිරියෙහි වැටී, කතා කොට, “රජතුමනි,
ඔබතුමා ජෙරුසලම අත්හැර ගිය දවසේ දී ඔබේ
දාසයා හිතුවක්කාරකමින් කළ දේ සිහි නොකළ
මැනව; එය මට විරුද්ධ දයෙක් ලෙස නොසැලකුව
මැනව; එය සිතට නොගත මැනව. 20 මන්ද, ඔබේ
දාසයා වන මා පව් කළ බව මම දනිමි. එබැවින්
ජෝසෙප්ගේ මුළු වංශය අතරෙන්, මාගේ ස්වාමීන්
වන රජ්ජුරුවන්ගේ පෙරමඟට බැස එන්නට මම
පළමු කොට ආවෙමි”යි කී ය.
21 එහෙත්, ශෙරුයාගේ පුත් අබිෂයි පිළිතුරු දෙමින්,
“ෂිමයි සමිඳාණන් වහන්සේගේ අභිෂේක ලත්
තැනැත්තාට දෙස් කී බැවින් ඔහු මරනු ලැබිය යුතු
නොවේ දැ”යි ඇසී ය.
22 දාවිත් පිළිතුරු දෙමින්, “ශෙරුයාගේ පුත්‍රයෙනි,
ඔබ හැම අද මට එදිරි වීමට ඔබත් මාත් අතර
තිබෙන සම්බන්ධකම කුමක් ද? අද
ඉශ්‍රායලේවරුන්ගෙන් කිසිවකු මරණයට පත් කිරීම
යුතු ද? අද මා ඉශ්‍රායලේ කෙරෙහි රජු ව සිටින බව
මම නොදනිම් දැ”යි කී ය. 23 තවද, “ඔබ
නොනසින්නෙහි ය”යි රජ ෂිමයිට කියා දිවුළේ ය.

## මෙපිබොෂෙත් දාවිත් රජුට ආචාර කිරීම

24 2 සාමු 9:1-13; 16:1-4 සාවුල්ගේ පුත්
මෙපිබොෂෙත් දාවිත්ගේ පෙරමඟට ආවේ ය. ඔහු
රජු ගිය දා සිට සාමදානයෙන් ආපසු පැමිණි දවස
දක්වා තමාගේ පාද සේදුවේ වත්, රැවුල සකස්
කරගත්තේ වත්, ඇඳුම් සේදුවේ වත් නැත.
25 තවද, ඔහු රජු සම්බ වන්නට ජෙරුසලමට ආ කල
රජ කතා කොට, “මෙපිබොෂෙත් ඔබ මා සමඟ
නොගියේ මන්දැ”යි ඔහුගෙන් ඇසී ය.

26 එවිට ඔහු මෙසේ පිළිතුරු දුන්නේ ය: "මාගේ
ස්වාමීන් වන රජතුමනි, මාගේ වැඩකාරයා මා
රැවටුවේ ය. මන්ද, ඔබ මෙහෙකරුවා කොර බැවින්,
'කොටළුවකු සූදානම් කරගෙන ඌ පිට නැඟී,
රජ්ජුරුවන් සමඟ යමි'යි ඔබේ මෙහෙකරුවා වන මම
කීවෙමි. 27 මාගේ වැඩකාරයා මාගේ ස්වාමීන් වන
රජුට ඔබේ මෙහෙකරුවා වන මා ගැන කේලාම් කී
ය. එහෙත්, මාගේ ස්වාමීන් වන රජතුමා දෙවියන්
වහන්සේගේ දූතයකු වැනි ය. ඔබට යහපත යයි
පෙනෙන දේ කළ මැනව. 28 මන්ද, මාගේ පියාගේ
මුළු වංශය මාගේ ස්වාමීන් වන රජු ඉදිරියෙහි
මරණයට සුදුස්සෝ වූ හ. එසේ වී නමුත්, ඔබේ ම
කෑම මේසයෙන් එකට කෑම කන අය අතරෙහි ඔබ,
ඔබේ මෙහෙකරුවා වන මට තැනක් දුන්නේ ය. ඒ
නිසා රජ්ජුරුවන්ට තවත් කන්නලව් කරන්නට මට
අයිතියක් ඇද්ද"යි කී ය.
29 රජ පිළිතුරු දෙමින්, "ඔබේ කාරණාව ගැන
තවත් කතා කරන්නේ කුමට ද? ඔබ ශීබා සමඟ
දේශය බෙදාගන්න ලෙස මම තීරණය කරමි"යි
ඔහුට කී ය.
30 මෙපිබොෂෙත් පිළිතුරු දෙමින්, "මාගේ ස්වාමීන්
වන රජ්ජුරුවන් තමාගේ ගෙදරට සාමදානයෙන් ආ
බැවින්, සියල්ල ම වුව ද ශීබා ගත්තා වේ ය"යි
රජුට කීවේ ය.

## දාවිත් රජ බර්සිල්ලයිට කරුණාව පෑම

31 2 සාමු 17:27-29 තවද, ගිලියද් වැසියකු වූ
බර්සිල්ලයි, රොගේලිම් සිට අවුත්, ජොර්දාන්
ගඟෙන් මෙගොඩට රජු ගෙනෙන පිණිස ඔහු සමඟ
ජොර්දානෙන් මෙගොඩට ආයේ ය. 32 බර්සිල්ලයි
අසූ අවුරුද්දක් වයස් වූ මහලු කෙනෙකු ව සිටියේ ය.
ඔහු රජු මහනයිම්හි සිටි කල ඔහුට කන බොන දේ
සපයා දුන්නේ ය. ඔහු ඉතා පොහොසත්
මනුෂ්‍යයෙකි ය. 33 රජ ද, "මා සමඟ යන්නට එන්න;
ජෙරුසලමෙහි දී මම ඔබට ආහාර පාන සපයා
දෙන්නෙමි"යි බර්සිල්ලයිට කී ය.
34 බර්සිල්ලයි පිළිතුරු දෙමින් මෙසේ කීවේ ය:
"රජ්ජුරුවන් සමඟ ජෙරුසලමට යන්නට මාගේ
ජීවිතයේ තවත් ඉතිරි වී ඇති අවුරුදු ගණන
කොපමණ ද? 35 මම දැනට අසූ අවුරුද්දක් වයස්
ගත ව සිටිමි. හොඳ නරක දෙක අතර වෙනස මට
දැනේ ද? ඔබේ මෙහෙකරු වන මට කන බොන
දේවල රස දැනේ ද? ගායක ගායිකාවන්ගේ මිහිරි
කට හඬ අසන්නට පුළුවන් ද? එබැවින් රජුගේ
මෙහෙකරුවා වන මා, මාගේ ස්වාමීන් වන
රජ්ජුරුවන්ට තවත් බරක් වන්නේ කුමට ද? 36 ඔබේ
මෙහෙකරුවා වන මම ජොර්දාන් ගඟෙන් එගොඩ
ටික දුරක් යන්නෙමි. රජ්ජුරුවන් එබඳු විපාකයක් මට
දෙන්නේ කුමට ද? 37 මාගේ ම නගරයේ මාගේ
පියාණන්ගේත් මාගේ මෑණියන්ගේත් සොහොන්
පොළ ළඟ මැරෙන පිණිස ඔබේ මෙහෙකරුවාට හැරී
යන්නට අවසර ලැබේවා. එහෙත්, ඔබේ
මෙහෙකරුවා වන කිම්හාම් මාගේ ස්වාමීන් වන
රජ්ජුරුවන් සමඟ එගොඩ ගියා වේ. ඔබට යහපත
යයි පෙනෙන හැටියට ඔහුට කළ මැනව."
38 රජ පිළිතුරු දෙමින්, "කිම්හාම් මා සමඟ එගොඩ
වනු ඇත. ඔබ යහපත් යයි සිතන කවර දෙයක් වුව
ද මම ඔහු උදෙසා කරමි. ඔබ මාගෙන් ඉල්ලන
සියල්ලත් මම ඔබට ඉටු කර දෙන්නෙමි"යි කීවේ ය.
39 මුළු සෙනඟ ජොර්දානෙන් මෙගොඩ පැමිණියෝ
ය. රජ ද මෙගොඩට පැමිණියේ ය. රජ තෙමේ
බර්සිල්ලයි සිඹගෙන ඔහුට ආශීර්වාද කළේ ය.
ඔහු තමාගේ ගෙදරට පෙරළා ගියේ ය.
40 මෙසේ රජ මෙගොඩ වී ගිල්ගාල්ට පැමිණියේ
ය. කිම්හාම් ද ඔහු සමඟ ගියේ ය. මුළු ජුදා සෙනඟ
ද ඉශ්‍රායෙලේ සෙනඟගෙන් දෙකෙන් කොටසක් ද රජු
මෙගොඩට කැඳවාගෙන ආහ. 41 එවිට සියලු
ඉශ්‍රායෙලේ සෙනඟ රජු ළඟට පැමිණ රජුට කතා
කොට, "අප සහෝදරයන් වන ජුදා සෙනඟ ඔබ
රහසින් අඬගසාගෙන, රජු ද ඔහුගේ ගෙයි වැසියන්
ද ඔහු සමඟ දාවිත්ගේ සියලු මිනිසුන් ද ජොර්දාන්
ගඟෙන් මෙගොඩට ගෙනාවේ මන්ද"යි ඇසුවෝ ය.
42 සියලු ජුදා සෙනඟ ඉශ්‍රායෙලේ සෙනඟට පිළිතුරු
දෙමින්, "රජ්ජුරුවන් අපේ කිට්ටු නෑයෙකු නිසා ය;
ඔබ හැම මේ කාරණය ගැන කෝප වන්නේ මන් ද?
රජුගේ වියදමෙන් අපි කිසිවක් කෑවෙමු ද,
නැතහොත් ඔහු කිසි තෑග්ගක් අපට දුන්නේ දැ"යි
ඇසුවෝ ය.
43 ඉශ්‍රායෙලේ සෙනඟ ජුදා සෙනඟට පිළිතුරු
දෙමින්, "රජුගෙන් දස කොටසක් අපට තිබේ. දාවිත්
රජුගෙනුත් ඔබට වඩා අයිතිකම් අපට ඇත්තේ ය.
ඔබ අප සුළු කොට සිතුවේ මන් ද? රජු යළිත්
ගෙනෙන්නට පළමුකොට කතා කළේ අපි නොවෙමු
දැ"යි කී හ. එහෙත්, ඉශ්‍රායෙලේ සෙනඟගේ
වචනවලට වඩා ජුදා සෙනඟගේ වචන වේගවත්
විය.

## ෂෙබාගේ කැරලි ගැසීම

20 1 රාජා 12:16; 2 වංශා 10:16 බෙන්ජමින්
ජාතිකයෙකු වන බික්රිගේ පුත් ෂෙබා නම්
දුර්ජන මිනිසෙක් එහි සිටියේ ය. ඔහු හොරණෑව
පිඹ, මොරගසා,
q2
20 "දාවිත් සමඟ ගනුදෙනු අපට නැත,
ජෙස්සේගේ පුත්‍රයාගෙන් කිසි උරුමයක් අපට
නැත;
q2
20 ඉශ්‍රායෙලේවරුනි, එකිනෙකා තම තමාගේ
කූඩාරම්වලට යේවා"යි
20 කී ය. 2 එවිට සියලු ඉශ්‍රායෙලේ ජනයා දාවිත්
අත්හැර, බික්රිගේ පුත් ෂෙබා පසුපස ගියෝ
ය. එහෙත්, ජොර්දාන් පටන් ජෙරුසලම දක්වා ම
ජුදාහි සෙනඟ තමන්ගේ රජුට පක්ෂපාත ව සිටියෝ
ය.

3 2 සාමු 16:22 දාවිත් ජෙරුසලමෙහි රජ මැඳුරට
පැමුණුණ විට, එය බලාගැනීමට ඔහු තබා ගිය
උපභාර්යාවන් දසදෙනා රැගෙන, ඔවුන් රැකවල්
යටතේ තබා ඔවුන්ගේ වුවමනාවන් සපයා දුන්නේ
ය. එහෙත්, ඔහු ඔවුන් සමඟ එක් නො වී ය.
මෙසේ ඔව්හු මැරෙන දවස දක්වා ම සිරගත ව
වැන්දඹුවන් මෙන් සිටියෝ ය.
4 රජ අමාසාට කතා කොට, “තුන් දවසකින් ජුදා
සෙනඟ කැඳවා, ඔවුන් සමඟ ඔබත් මා ඉදිරියේ
පෙනී සිටින්නැ”යි කී ය. 5 මෙසේ අමාසා ජුදා
සෙනඟ කැඳවන්නට ගිය නමුත්, ඔහුට නියම කළ
කාලයට වඩා ප්‍රමාද විය. 6 දාවිත් අබිෂයිට කතා
කොට, “අබ්සලොම්ට වඩා බික්රිගේ පුත් ෂෙබා
අපට අනතුරු කරනු ඇත. ඔහු පවුරු ඇති නගර අත්
කරගෙන අපෙන් ගැළවී නොයන පිණිස, ඔබේ
ස්වාමියාගේ සේවකයන් කැඳවාගෙන ඔහු ලුහුබැඳ
යන්නැ”යි කී ය. 7 එවිට ජෝවාබ්ගේ සෙනඟ ද
කරෙතේවරු ද පලෙතේවරු ද සියලු බලවන්තයෝ ද
ඔහු පසුපස පිටත් වී ගියහ. බික්රිගේ පුත් ෂෙබා
ලුහුබැඳ යන පිණිස ඔව්හු ජෙරුසලමෙන් නික්ම
ගියහ. 8 ඔවුන් ගිබියොන්හි තිබෙන මහගල ළඟ
සිටිය දී අමාසා ඔවුන් ඉදිරියට පැමිණියේ ය.
ජෝවාබ් තමාගේ යුද්ධ ඇඳුම් ඇඳ ඊට උඩින් ඉඟ
පටියක් බැඳගෙන සිටියේ ය. එහි කොපුවේ කඩුවක්
දමා තිබිණි. ඔහු පිටතට යද්දී කඩුව වැටිණි.
9 ජෝවාබ් අමාසාට කතා කොට, “මාගේ
සහෝදරය, ඔබ සුව සේ සිටින්නෙහි දැ”යි ඔහුට
කියමින් ඔහු සිඹගන්නට ඔහුගේ රැවුල දකුණතින්
අල්ලාගත්තේ ය. 10 එහෙත්, අමාසා ජෝවාබ්ගේ
අතේ තිබුණු කඩුව ගැන නොසැලකුවේ ය. ජෝවාබ්
එයින් ඔහුගේ බඩට ඇන්නේ ය. ඔහුගේ අතුණු
බිමට ඇද හැළුණේ ය. දෙ වන වරට පහර දීම
අවශ්‍ය නො වී ය. මෙසේ අමාසා මළේ ය. ජෝවාබ්
ද ඔහුගේ සහෝදර වූ අබිෂයි ද බික්රිගේ පුත්
ෂෙබා ලුහුබැඳ ගියහ.
11 ජෝවාබ්ගේ සේවකයන්ගෙන් එක් කෙනෙක්
අමාසා ළඟ සිට, “ජෝවාබ්ට හිතවත්, දාවිත්ට
පක්ෂපාත කවුරු නමුත් ජෝවාබ් අනුව යත්වා”යි කී
ය. 12 අමාසා වනාහි මහ මාවත මැද තමාගේ ලේ
විලේ පෙරළෙමින් සිටියේ ය. ඒ නිසා හැම කෙනෙකු
ම නවතින බව ඒ මිනිසාට පෙනී ගියේ ය.
අමාසාගේ සිරුර ළඟින් එන සියල්ලන් මෙසේ
නවතින බව ඔහු දුටු කල්හි, ඔහු එය මාවතෙන්
කෙතට ගෙන ගොස් ඒ පිට රෙද්දක් හෙළුවේ ය.
13 අමාසාගේ මළකඳ මාවතින් ඉවත් කළ පසු, මුළු
සෙනඟ බික්රිගේ පුත් ෂෙබා ලුහුබඳින පිණිස
ජෝවාබ් පසුපස ගියහ.
14 ෂෙබා සියලු ඉශ්‍රායලයේ ගෝත්‍ර මැදින් ගොස්
ආබලේ-බෙත්-මයකා නගරයට පැමුණුණේ ය.
බේරීවරු රැස් වී ඔහු පස්සේ ගියෝ ය. 15 ඔව්හු
අවුත් ආබලේ-බෙත්-මයකා නගරය වටලාගෙන එය
ඉදිරිපිට ගොඩැල්ලක් නැඟුවෝ ය. එය පවුර
ඉදිරිපිට තිබිණි. ජෝවාබ් සමඟ සිටි මුළු සෙනඟ ද
පවුර හෙළා දමන්නට ඊට පහර දුන්හ. 16 එවිට
නැණවත් ස්ත්‍රියක් නගරයේ සිට මොරගසා,
“මෙන්න, සවන් දෙන්න, සවන් දෙන්න; මා ජෝවාබ්
සමඟ කතා කරන පිණිස, ඔහුට මෙහි එන්නට කියා
කිව මැනව”යි කීවා ය. 17 ඔහු ඈ ළඟට ආ කල ඒ
ස්ත්‍රිය, “ඔබ ජෝවාබ් ද” කියා ඇසුවා ය. ඔහු ද,
“එසේ ය”යි උත්තර දුන්නේ ය. එවිට ඈ, “ඔබේ
මෙහෙකාරී කියන දේට සවන් දුන මැනව”යි ඔහුට
කීවා ය. ඔහු ද, “මම සවන් දෙමි”යි කී ය.
18 එවිට ඈ කතා කොට, “පුරාණ කාලයේ දී
‘දැනුමැතිකම් ලැබීමට ආබලේට යන්නැ’යි කීමක්
තිබිණි. ඒ අනුව පැරැන්නෝ ප්‍රශ්න විසඳාගත්හ.
19 අපේ නගරය, ඉශ්‍රායලයේහි ඇති ඉතා සාමකාමී,
විශ්වාසදායී නගරයක් බව ප්‍රසිද්ධ ය. ඉශ්‍රායලයේහි
මවු බිමක් වැනි නගරයක් විනාශ කරන්නට ඔබ
උත්සාහ කරන්නෙහි ය. සමිඳාණන් වහන්සේගේ
උරුමය ඔබ නාස්ති කරන්නේ කුමක් නිසා දැ”යි
ඇසුවා ය.
20 ජෝවාබ් පිළිතුරු දෙමින්, “නගරය නැති නාස්ති
කිරීම ගැන අදහසක් මට කොහෙත් ම නැත.
21 එසේ කීම අසත්‍යයකි. බික්රිගේ පුත් ෂෙබා නම්
එප්‍රායිම් කඳු රටේ මිනිසෙකු දාවිත් රජ්ජුරුවන්ට
විරුද්ධ ව කැරලි ගසා ඇත. ඔහු පමණක් පාවා
දෙන්න. එවිට මම නගරයෙන් අහක් ව යන්නෙමි”යි
කී ය. ඒ ස්ත්‍රිය ද, “ඔහුගේ හිස පවුර උඩින් ඔබ
වෙත විසි කරනු ලබන්නේ ය”යි ජෝවාබ්ට කීවා ය.
22 එවිට ඒ ස්ත්‍රිය නගරයට ගොස් ඥානවන්ත
ලෙසෙ සෙනඟට කතා කළා ය. සෙනඟ ද බික්රිගේ
පුත් ෂෙබාගේ හිස ගසා ජෝවාබ් වෙත විසි කළෝ
ය. ජෝවාබ් හොරණෑව පිම්බේ ය. එවිට ඔව්හු
නගරයෙන් පිට වී තම තමන්ගේ කූඩාරම්වලට
ගියහ. ජෝවාබ් ද ජෙරුසලමෙහි රජු වෙත හැරී
ආවේ ය.
23 ජෝවාබ් මුළු ඉශ්‍රායලයේ සේනාවට අධිපතියා
ය. ජෙහෝයාදාගේ පුත් බෙනායා කරෙතේවරුන්ටත්,
පලෙතේවරුන්ටත් අධිපතියා ය. 24 අදොරාම් බැල
මෙහෙවර භාර ව සිටියේ ය. අහිලූද්ගේ පුත්
ජෙහෝෂාපාට් වාර්තාකරු ය. 25 ෂෙවා වනාහි
ලේකම් ය. ශාදොක් හා අබියාතර් පූජකයෝ ය.
26 ජායිර්හි ඊරාත් දාවිත්ගේ පූජකයා ය.

## සාවුල්ගේ පරපුර මරනු ලැබීම

21 දාවිත් රජුගේ දවස, තුන් අවුරුද්දක්
මුළුල්ලේ ම සාගතයක් ඇති විය. ඒ ගැන
දාවිත් සමිඳාණන් වහන්සේගෙන් විමසූ විට උන්
වහන්සේ පිළිතුරු දෙමින්, “සාගතයට හේතුව, සාවුල්
සහ ඔහුගේ පවුලේ අය මිනීමරුවන් නිසාත්, සාවුල්
ගිබියොන්වරුන් මැරූ නිසාත් ය”යි වදාළ සේක.
2 ජෝෂු 9:3-15ගිබියොන්වරු ඉශ්‍රායලයේ ජාතිකයන්
නොව, අමෝරිවරුන්ගෙන් ඉතිරි ව සිටි
කොට්ඨාශයකි. ඉශ්‍රායලයේ සෙනඟ ඔවුන්
නොමරන්නට දිවුරුම් දී තිබුණු නමුත්, සාවුල්
ඉශ්‍රායලයේ සෙනඟටත්, ජුදා සෙනඟටත් ඇති
තමාගේ උද්යෝගය නිසා ඔවුන් මරන්නට සවේවේ

ය. 3 දාවිත් රජ ගිබියොන්වරුන් කැඳවා ඔවුන්ට කතා
කොට, “ඔබ උදෙසා මම කුමක් කරම් ද? ඔබ
සමිඳාණන් වහන්සේගේ සෙනඟට ආශීර්වාද කරන
පිණිස මා වන්දි ගෙවීමක් වශයෙන් කුමක් කළ යුතු
දැ”යි ඔවුන්ගෙන් ඇසී ය.
4 ගිබියොන්වරු පිළිතුරු දෙමින්, “සාවුල්ට සහ
ඔහුගේ පවුලට විරුද්ධ ව ඇති අපගේ ආරාවුල් රන්
රිදීවලින් බේරිය නොහැකි ය; තවද, ඉශ්රායලේහි
කිසිවකු මැරීමට අපට වුවමනාවක් නැතැ”යි කී හ.
ඔහු ද, “ඔබ කියන දෙයක් මම ඔබට කර දෙමි”යි
කී ය.
5 ඔව්හු රජුට කතා කොට, “ඉශ්රායලේහි කිසි ම
තැනක අපට ජීවත් වන්නට නොහැකි වන ලෙස
සාවුල් අප නැතිනාස්ති කරන්නට සවේවේ ය.
6 ඔහුගේ පුත්රයන්ගෙන් සත්දෙනෙකුන් අපට පාවා
දුන මැනව. අපි ද සමිඳාණන් වහන්සේ විසින්
තෝරාගනු ලැබූ සාවුල් සිටි ගිබියාහි සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි ඔවුන් එල්ලා තබන්නෙමු”යි කී
හ. එවිට රජ “මම ඔවුන් පාවා දෙන්නෙමි”යි කී ය.
7 1 සාමු 20:15-17; 2 සාමු 9:1-7 එහෙත්, දාවිත්
සහ සාවුල්ගේ පුත් ජොනතන් තම තමන් අතර
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි කරන ලද දිවුරුම
නිසා රජ සාවුල්ගේ පුත්ර වන ජොනතන්ගේ පුත්
මෙපිබොෂෙත් ඉතුරු කළේ ය. 8 1 සාමු 18:19එසේ
වුව ද, ඔහු අයාගේ දුව වූ රිශ්පා සාවුල්ට දාව ලැබූ
අර්මෝනි සහ මෙපිබොෂෙත් යන පුත්රයන් දෙදෙනෙ
ද සාවුල්ගේ දුව වූ මීකල් මෙහොලාතිය
බර්සිල්ලයිගේ පුත් අද්රියෙල්ට දාව ලැබූ පුත්රයන්
පස්දෙනා ද ගෙනෙ, 9 ගිබියොන්වරුන් අතට පාවා
දුන්නේ ය. ඔව්හු සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි
කන්දේ ඔවුන් එල්ලා දැමුවෝ ය. මෙසේ ඒ
සත්දෙනා එක විට ම වැනසුණෝ ය. ඔවුන් මරනු
ලැබුවේ යව කපන්නට පටන්ගන්න කාලයේ මුල් ම
දවස්වල දී ය.
10 එවිට අයාගේ දුව වූ රිශ්පා ගෝණි රෙදි
අරගෙන ගොස් පර්වතය පිට අතුරා ඉඳගෙන,
ගොයම් කපන කාලය පටන්ගැන්මේ සිට අහසින්
වැසි වසින තෙක් දවල් ආකාශයේ පක්ෂීන්ට වත්, රෑ
වනයේ මෘගයන්ට වත් ඒ මළකඳන් ළඟට
පැමිණෙන්නට ඉඩ නොදී සිටියා ය.
11 අයාගේ දුව වූ, සාවුල්ගේ උපභාර්යාව වූ රිශ්පා
කළ දෙය දාවිත්ට දන්වන ලද්දේ ය. 12 1 සාමු
31:8-13එවිට ඔහු ගොස්, ජාබේෂ්-ගිලියද්
වැසියන්ගෙන් සාවුල්ගේ ද ඔහුගේ පුත්
ජොනතන්ගේ ද ඇටකටු අරගත්තේ ය. ඔවුන් ඒ
ඇටකටු බෙතේෂාන්හි ප්රසිද්ධ චතුරශ්රයෙන්
සොරාගෙන ගොස් තිබිණි. සාවුල් ගිල්බෝවා
කන්දේ දී මරනු ලැබූ දවසේ දී පිලිස්තිවරුන් ඔහුගේ
ද ජොනතන්ගේ ද සිරුරු එල්ලුවේ ඒ චතුරශ්රයෙහි
ය. 13 දාවිත් ගොස් සාවුල්ගේ ඇටකටු සහ ඔහුගේ
පුත් ජොනතන්ගේ ඇටකටු එතැනින් ගෙනාවේ ය.
එල්ලා දමන ලද තැනැත්තන්ගේ ඇටකටුත් ඔව්හු
එකතු කළෝ ය. 14 සාවුල්ගේ ද ඔහුගේ පුත්
ජොනතන්ගේ ද ඇටකටු බෙන්ජමින් රටේ ශේලාහි
තිබෙන සාවුල්ගේ පිය වූ කිෂ්ගේ සොහොනේ ගෙයි
තැන්පත් කොට රජු විසින් අණ කරන ලද සියල්ල
ඔව්හු කළෝ ය. ඉන්පසු දේශය වෙනුවෙන් කරන
ලද කන්නලව්වට දෙවියන් වහන්සේ සවන් දුන්
සේක.

### පිලිස්තීය යෝධයන් සමඟ සටන්

(1 වංශා 20:4-8)

15 ඉශ්රායලේවරුන්ට විරුද්ධ ව පිලිස්තිවරු යළිත්
යුද්ධයක් කළහ. දාවිත් තමාගේ සේවකයන් සමඟ
ගොස් පිලිස්තිවරුන්ට විරුද්ධ ව සටන් කළේ ය.
දාවිත් විඩාවට පත් විය. 16 එවිට රපොයිම් නම්
යෝධයන්ගෙන් පැවත ආ කෙනෙකු වන ඉෂ්බි-
බෙනොබ්, දාවිත් මරන්නට සිතා ගත්තේ ය. ඔහුගේ
ලෝකඩ හෙල්ලයේ බර කිලෝග්රෑම් තුනහමාරක්
ය. ඔහු අලුත් කඩුවක් ද ඉණේ බැඳගෙන සිටියේ
ය. 17 1 රාජා 11:36; ගීතා 132:17එහෙත්, ශෙරූයාගේ
පුත් අබිෂයි රජුට සහාය වී පිලිස්තියයාට පහර දී
ඔහු මැරුවේ ය. එවිට දාවිත්ගේ සෙනඟ,
“ඉශ්රායලේවරුන්ගේ පහන වැනි බලාපොරොත්තුව
වන ඔබ, නොනිවෙන පිණිස තවත් අප සමඟ
යුද්ධයට නොයා යුතු ය”යි දිවුරුම් දී දාවිත්ට කියා
සිටියෝ ය.
18 ඉන්පසු නැවතත් පිලිස්තිවරුන් සමඟ ගෝබ්හි
යුද්ධයක් විය. එවිට හුෂාතිය සිබ්බකෙයි,
යෝධයාගේ පුත්රයන්ගෙන් එක් කෙනෙකු වූ සප්
මැරුවේ ය.
19 නැවතත් පිලිස්තිවරුන් සමඟ ගෝබ්හි යුද්ධයක්
විය; බෙත්ලෙහෙමීය ජාරේ-ඔරගීම්ගේ පුත්ර වූ
එල්හානාන් ගිත්තීය ගොලියත්ගේ සහෝදරයා
මැරුවේ ය. ඔහුගේ හෙල්ලයේ මිට වියන
යන්ත්රයක දණ්ඩක් හා සමාන ය.
20 නැවතත් ගාත්හි යුද්ධයක් විය; එහි බොහෝ
උස මහත මනුෂ්යයෙක් සිටියේ ය. ඔහුගේ
අත්වලත්, පාවලත් හය හය බැගින් ඇඟිලි
විසිසතරක් තිබිණි. ඔහුත් යෝධයාට දාව උපන්
කෙනෙකි. 21 ඔහු ඉශ්රායලේවරුන්ට අභියෝග කළ
කල, දාවිත්ගේ සහෝදරයා වන ෂිමෙයිගේ පුත්ර වූ
ජොනතන් ඔහු මැරී ය.
22 ඒ සතරදෙනා ගාත්හි දී යෝධයාට දාව
උපන්නෝ ය. ඔව්හු දාවිත් අතින් ද ඔහුගේ
සේවකයන් අතින් ද මැරුම්කෑවෝ ය.

### දාවිත් රජුගේ මිදීමේ ගීය

(ගීතා 18)

22 සමිඳාණන් වහන්සේ දාවිත්ගේ සියලු
සතුරන් අතින් ද සාවුල් අතින් ද ඔහු මුදාගත්
කල ඔහු සමිඳාණන් වහන්සේට ගැයූ ගීයේ වචන
මෙසේ ය:
2 සමිඳාණෝ මාගේ පර්වතය ය, මාගේ
බලකොටුව ය, මාගේ මිදුම්කාරයාණෝ ය.
3 මාගේ පර්වතය වන දෙවිඳාණෝ ය;
q23 මම එතුමාණන් සරණ කරගනිමි.

q2[3] එතුමාණෝ මාගේ පලිහ ය;
q2[3] මාගේ ගැළවීමේ බලය ය;
q2[3] මාගේ බලකොටුව ය;
q2[3] මාගේ රක්ෂස්ථානය ය;
q2[3] මාගේ විමුක්තිදායකයාණෝ ය;
q2[3] ඔබ බලහත්කාරකමනේ මා ගළවන සේක.
4 සියලු පැසසුම්වලට හිමිකම් ඇති සමිඳුන් මම
අයැද සිටිමි.
q2[4] මසේ මාගේ සතුරන්ගනේ මම ගැළවනේනමේ.
5 මන්ද, මරණය නමැති තරංගයෝ මා වට කළහ.
q2[5] අධර්මය නමැති ජලධාරාවෝ මා බියගැන්වූ හ.
6 පාතාලයේ රුහැන් මා වළො ගති, මරණයේ
මලපත් මට අටවා තිබිණි.
7 මාගේ විපතේ දී මම සමිඳුන් යැදීමි.
q2[7] එසේ ය, මාගේ දවේඳුන්ට මොරගැසීමි.
q2[7] එතුමාණෝ සිය මාලිගාවේ සිට මාගේ හඬට
සවන් දුන් සේක.
q2[7] මා යැදුම් එතුමන් වතෙ නැඟිණි.
8 එවිට පොළොව සලෙවී කම්පා විය;
q2[8] සග පදනම් ද වවුෙළා සලෙවිණි.
q2[8] මන්ද, එතුමාණෝ උදහස් වූ සේක.
9 එතුමාණන්ගේ නාස් පුඬුවලින් දුමක් නැඟිණි.
q2[9] එතුමන්ගේ මුවින් වනසන ගින්නක් නික්මිණි,
එයින් ගිනි අඟුරු ඇවිළිණි.
10 එතුමාණෝ අහස නමා බැස වැඩිය සේක,
එතුමන්ගේ පා යට ගන'ඳුර වී ය.
11 එතුමාණෝ කරුේබ්වරයකුෙ අරා පියාසර කළ
සේක.
q2[11] එසේ ය, එතුමාණෝ සුළං පියාපත් පිට පියාඹා
වැඩිය සේක.
12 එතුමාණෝ අඳුර සිය ආවරණය කරගත් සේක.
q2[12] ඝන වැහි වලා සිය මණ්ඩපය කරගත් සේක.
13 එතුමාණන් ඉදිරියෙහි වූ දීප්තියනේ ගිනි අඟුරු
දැල්වී ගියේ ය.
14 සමිඳාණෝ අහසේ සිට ගිගුරුම් දුන් සේක:
q2[14] මහෝත්තමයාණෝ සිය හඬ නිකුත් කළ
සේක.
15 එතුමාණෝ සිය ඊගස් විද ඔවුන් විසුරුවා හළ
සේක;
q2[15] විදුලිය එවා ඔවුන් පරාජය කළ සේක.
16 එකල සමිඳුන්ගේ තරවටුවනේ ද එතුමන්ගේ
නාසයනේ නික්මුණ වාත වගේයනේ ද සමුද්‍ර පත්ල
එළි පහෙළෙි විය;
q2[16] පොළොවේ පදනම් ද දිස් විය.
17 එතුමාණෝ උඩින් අත පොවා මා අල්ලාගත්
සේක;
q2[17] ගැඹුරු දිය පාරින් මා ඇදගත් සේක.
18 මාගේ බලවත් සතුරන්ගනේ ද මට වරෙ
කළවුන්ගනේ ද එතුමාණෝ මා මුදා ගත් සේක.
q2[18] මන්ද, ඔව්හු මට වඩා බලවත් වූ හ.
19 මාගේ විපත්ති දවසේ දී ඔව්හු මට විරුද්ධ ව
නැඟී ආහ.
q2[19] එහතේ, සමිඳාණෝ මාගේ පිහිට වූ සේක.
20 එතුමාණෝ අවහිර නැති තැනකට මා ගනො
සේක, මා කරෙහෙි ප්‍රසන්න වූ බැවින් මා මිදූ
සේක.
21 සමිඳාණෝ මාගේ දැහැමිකම අනුව මට විපාක
දුන් සේක.
q2[21] මාගේ නිදොස්කම අනුව මට ප්‍රතිඵල දුන්
සේක.
22 මන්ද, මම සමිඳු මඟ හැසුරුණමේ, මාගේ
දවේඳුන් කරෙනේ දුෂ්ට ලසෙ අහක් ව නොගියමේ.
23 එතුමන්ගේ සියලු නියෝග මා ඉදිරියෙහි විය.
q2[23] එතුමන්ගේ පණත්වලින් ඉවත් ව නොගියමේ.
24 මම එතුමන් ඉදිරියෙහි නිදොස් ව සිටියමේ;
q2[24] පවින් වැළකී සිටියමේ.
25 එබැවින් සමිඳාණෝ මාගේ දැහැමිකම අනුව ද
එතුමන්ගේ ඇස් හමුයෙහි මාගේ පිරිසිදුකම අනුව ද
මට ප්‍රතිඵල දුන් සේක.
26 කරුණාවන්ත අයට ඔබ කරුණාවන්ත ය.
q2[26] නිදොස් අයට ඔබ නිදොස් ය.
27 පිරිසිදු අයට ඔබ පිරිසිදු ය.
q2[27] හිතුවක්කාර අයට ඔබ විරුද්ධ ය.
28 ඔබ පීඩිත සනෙඟ ගළවන සේක.
q2[28] එහතේ, උඩඟු වූවන් පහත් කරන පිණිස ඔබේ
ඇස් ඔවුන් දසෙ යොමා තිබේ.
29 මන්ද, සමිඳුනි, ඔබ මාගේ පහන ය, සමිඳාණෝ
මාගේ අඳුර එළිය කරන සේක.
30 ඔබේ පිහිටනේ මට හමුදාවක් වැනසිය හැකි ය.
q2[30] ඔබේ පිහිටනේ පවුරු උඩින් පැන්න හැකි ය.
31 මේ දවේඳුන්ගේ මාර්ගය පරිපූර්ණ ය;
q2[31] සමිඳුන්ගේ වචන නිර්මල ය.
q2[31] තමන් සරණ යන අයට එතුමාණෝ පලිහක්
වන සේක.
32 මන්ද, සමිඳුන් මිස දවේ වන්නේ කවරකේ ද?
q2[32] අපේ දවේඳුන් මිස පර්වතයක් වන්නේ
කවරකේ ද?
33 මේ දවේ තුමාණෝ මාගේ බලකොටුව ය;
q2[33] එතුමාණෝ මාගේ මාර්ගය නිදොස් කරන
සේක.
34 හබේරු 3:19 එතුමාණෝ මාගේ පාද මුව
දනෙුන්ගේ පාද මනේ කරන සේක.
q2[34] කඳු මුදුන්හි මා සුරක්ෂිත ව තබන සේක.
35 මාගේ බාහුවනේ ලෝකඩ දුන්නක් නමන්න
පුළුවන් වන පිණිස එතුමාණෝ මාගේ දෑත සටනට
පුහුණු කරන සේක.
36 ඔබේ ගැළවීම නමැති පලිහ ඔබ මට දුන් සේක.
q2[36] ඔබේ පිහිට මා උසස් කළ සේක.
37 ඔබ මාගේ දපො යට මාගේ අඩි පාර පළල් කළ
සේක.
q2[37] මාගේ පාද නොලිස්සුවේ ය.
38 මම මාගේ සතුරන් ලුහුබැඳ ගොස් ඔවුන් විනාශ
කළෙමේ.
q2[38] මම ඔවුන් වනසන තුරු හැරී නායමේ.
39 නැඟිටින්න බැරි වන ලසෙ මම ඔවුන්ට පහර දී
ඔවුන් වැනසුවමේ.

q2[39] එසේ ය, ඔවුහු වැටී මාගේ පාදවලට යට වූ හ.
40 මන්ද, ඔබ සටන් පිණිස ශක්තියෙන් මාගේ ඉඟටිය සවිමත් කරන සේක.
q2[40] මට විරුද්ධ ව නැඟුණ අය ඔබ මා ඉදිරියෙහි අවනත කරවූ සේක.
41 ඔබ මාගේ සතුරන්ට පසු බැස යන්න සැලැසූ සේක.
q2[41] මට ද්වේෂ කරන්නන් මම විනාශ කරමි.
42 ඔවුන් බැලූ නමුත්, ඔවුන් ගළවන්න කිසිවකේ නො වූ හ.
q2[42] සමිඳුන්ට මොරගැසූ නමුත් එතුමාණෝ උත්තර නුදුන් සේක.
43 එකල මම පොළොවෙහි ධූලි මෙන් ඔවුන් සුණු විසුණු කළෙමි.
q2[43] වීථිවල මඩ මෙන් ඔවුන් පාගා දැමුවෙමි.
44 කැරලිකාර සෙනඟගෙන් ඔබ මා මිදූ සේක;
q2[44] ජාතීන්ට ප්‍රධානියා වන පිණිස මා රක්ෂා කළ සේක;
q2[44] මා නොහඳුනන සෙනඟක් මට මෙහෙ කරති.
45 විදේශීහු බැගෑපත් ව මාගේ පිහිට පතා එන්නෝ ය.
q2[45] මා ගැන ඇසූ කණෙහි ම ඔවුහු මට කීකරු වෙති.
46 විදේශීහු මලානික වී තමන් සැඟවී උන් හිටි තැන්වලින් වවුළමින් පිටත එති.
47 සමිඳාණෝ ජීවමාන ය;
q2[47] මාගේ පර්වතයාණන්ට ප්‍රශංසා වේ වා!
q2[47] මාගේ ගැළවීමේ පර්වතය වන දෙවිඳාණෝ උසස් වන සේක් වා!
48 එතුමාණෝ, මා උදෙසා සතුරන්ගෙන් පළිගන්න, ජාතීන් මට යටත් කර දෙන,
49 මාගේ සතුරන්ගෙන් මා මුදාගන්න දෙවියන් වහන්සේ ය.
q2[49] එසේ ය, මට විරුද්ධ ව නැඟී සිටින්නාට වඩා ඔබ මා උසස් කරන සේක;
q2[49] සැහැසි මිනිසුන්ගෙන් මා ගළවන සේක.
50 රෝම 15:9 එබැවින් සමිඳුනි, විජාතීන් අතරේ ඔබට ස්තුති කරන්නෙමි;
q2[50] ඔබේ නාමයට ප්‍රශංසා ගී ගයන්නෙමි.
51 උන් වහන්සේ තමන් රජු හට ඉමහත් ජය අත් කර දෙන සේක.
q2[51] තමන්ගේ අභිෂේක ලත් තැනැත්තා වන දාවිත්ටත්, ඔහුගේ වංශයටත් සදහට කරුණාව පෙන්වන සේක.

## දාවිත් රජුගේ අවසාන වචන

23 දාවිත්ගේ අවසාන වචන මෙසේ ය.
q2
23 ජෙස්සේගේ පුත්‍රයා ද උසස් කරනු ලැබූ මනුෂ්‍යයා ද ජාකොබ්ගේ දෙවියන් වහන්සේගේ අභිෂේක ලත් තැනැත්තා ද ඉශ්‍රායලේ ජාතියේ මිහිරි ගායකයා ද වන දාවිත් මෙසේ කියයි:
2 "සමිඳුන්ගේ ආත්මය මා මඟින් කතා කරන්නේ ය.
q2[2] එතුමන්ගේ වචනය මාගේ දිවේ තිබුණේ ය.
3 ඉශ්‍රායලේවරුන්ගේ දෙවිඳාණෝ කතා කළ සේක.
q2[3] ඉශ්‍රායලේවරුන්ගේ පර්වතයාණෝ මට මෙසේ වදාළ සේක:
q2[3] මිනිසුන් යුක්තියෙන් පාලනය කරන, දේව ගරු බිය ඇති ව ආණ්ඩු කරන තැනැත්තේ වූකලී,
4 වැස්සෙන් පසු, වලාකුළු නැති උදයක දී, පොළොවේ තණ දීප්තිමත් කරන අලුයම හිරු උදා වන කල ඇති එළිය වැනි ය.
5 සැබැවින් මාගේ වංශය දෙවිඳුන් ඉදිරියෙහි එසේ ම නොපෙවතින්නේ ද?
q2[5] මන්ද, සියල්ල නියම ලෙස ස්ථිර කර තිබෙන සදාකාල ගිවිසුමක් එතුමාණෝ මා සමඟ කළ සේක.
q2[5] මාගේ මුළු ගැළවීමත්, මට රිසි සියල්ලත් එතුමාණෝ සඵල වන්නට නොසලසන සේක් ද?
6 එහෙත්, සියලු දුදනෝ අතින් ඇල්ලිය නොහැකි, අහක දමනු ලබන කටු ගස් හා සමාන ය.
7 ඒවා අල්ලන මිනිසා යකඩ අවියක් හෝ හෙල්ල මිටක් හෝ රැගෙන සිටිය යුතු ය;
q2[7] ඒවා මුළුමනින් ගින්නෙන් දවා ලනු ඇත."

## දාවිත් රජුගේ වීරයෝ

(1 වංශා 11:10-41)

8 දාවිත් රජුට සිටි වීරයන්ගේ නාම මේවා ය: අධිපතීන්ට ප්‍රධාන වූ තාකමොනිය ජොෂෙබේ-බෂ්ෂෙබෙතේ ය; අධිපතීන් තුන්දෙනාගේ ප්‍රධානියා වූ ඔහු එක් වතාවක දී අටසියදෙනෙකුට විරුද්ධ ව තමාගේ හෙල්ලය ලෙළෙවා ඔවුන් මැරුවේ ය.
9 ඊළඟට අහෝහිය දෝදෝගේ පුත් එලයාසර් ය; ඔහු පිලිස්තිවරුන් යුද්ධයට රැස් ව සිටිය දී, ඉශ්‍රායලේ සෙනඟ පසු බැස ගිය විට, ඒ ස්ථානයෙහි දාවිත් රජු සමඟ සිට ඔවුන්ට අභියෝග කළ බලවන්තයන් තුන්දෙනාගෙන් දෙවෙන්නා ය. 10 ඔහු නැඟිට තමාගේ අත හිරි වැටී, අත කඩුවට ඇළෙන තුරු පිලිස්තිවරුන්ට පහර දුන්නේ ය. සමිඳාණන් වහන්සේ එදා ඉමහත් ජයක් සලසා දුන් සේක. සෙනඟ ද කොල්ලය ගන්නට පමණක් ඔහු පස්සේ ගියහ.
11 ඊළඟට, හාරාරීය අගීගේ පුත් ෂම්මා ය. පිලිස්තිවරු කොල්ලු පිරී තිබුණු ලෙහි නම් බිම් කොටසක එක්රැස් ව සිටියෝ ය; සෙනඟ ද පිලිස්තිවරුන් ඉදිරියෙන් පලා ගියහ. 12 එහෙත්, ඔහු බිම් කොටස මැද සිට එය බේරාගෙන පිලිස්තිවරුන් මැරුවේ ය. සමිඳාණන් වහන්සේ ඉමහත් ජයක් සලසා දුන් සේක.
13 ප්‍රධාන තිස්දෙනාගෙන් තුන්දෙනෙකේ ගොයම් කපන කාලයේ දී දාවිත් සිටි අදුල්ලම් ගුහාවට ගියහ. පිලිස්තිවරුන්ගේ හමුදාව රෙපායිම් මිටියාවතෙහි කඳවුරු බැඳගෙන සිටියහ. 14 දාවිත් එවකට බලකොටුවෙහි සිටියේ ය. පිලිස්තිවරුන්ගේ හමුදාව එවකට බෙත්ලෙහෙමේහි සිටියහ. 15 දාවිත්,

තද පිපාසාවක් ඇති ව, “අනේ, බෙත්ලෙහෙමේ
දොරටුව ළඟ තිබෙන ළිඳේ වතුර ටිකක් කවුරුත්
ගෙනවුත් මට බොන්නට දෙන්නේ නම් යහපතැ”යි
කීවේ ය. 16 එවිට ඒ වීරයන් තිදෙනා
පිලිස්තිවරුන්ගේ කඳවුර මැදින් කඩා බිඳගෙන
ගොස්, බෙත්ලෙහෙමේ දොරටුව ළඟ තිබෙන ළිඳෙන්
වතුර ඇද දාවිත් වෙත ගෙනාහ. එහෙත්, ඔහු එය
නොබී, සමිඳාණන් වහන්සේට පානීය පූජාවක් ඔප්පු
කොට, 17 “සමිඳාණන් වහන්ස, මයෙ බීමනේ මා
වැළැක්වුව මැනව. මේ වනාහි, සිය දිවි නොතකා
ඉදිරියට ගිය මිනිසුන්ගේ ලේ ය”යි කී ය. ඒ නිසා
ඔහු ඒ වතුර නොබීවේ ය. ඒ වීරයන්ගේ බලවත්
ක්‍රියා එසේ ය.
18 ශෙරුයාගේ පුත් ජෝවාබ්ගේ සහෝදර වූ
අබිෂයි තුන්දෙනාගේ ප්‍රධානියා විය. ඔහු සිය
හෙල්ලය තුන්සියදෙනෙකුට විරුද්ධ ව ලෙළෙවා ඔවුන්
මරා තුන්දෙනා අතරේ නම ගිය කෙනෙකේ විය.
19 තුන්දෙනා අතරෙන් ඔහු ඉතා කීර්තිමත් තැනැත්තා
වමේන්, ඔවුන්ගේ ප්‍රධානියා විය. එසේ වුවත්, ඔහු
පළමු වන තිදෙනා තරම් කීර්තිමත් නො වී ය.
20 බොහෝ වීර ක්‍රියා කළ, කබ්ශයෙලේ
ජාතිකයකු වූ ජෙහෝයාදාගේ පුත් බෙනායා
මෝවබ්හි අරියලේගේ පුත්‍රයන් දදෙනා මැරුවේ ය.
හිම වැටෙන දවසක දී ඔහු ගොස් වළක් ඇතුළෙහි
වූ සිංහයකු මැරුවේ ය. 21 ඔහු එඩිතර පෙනුමක්
ඇති මිසර ජාතිකයකු මැරුවේ ය. ඒ මිසර
ජාතිකයාගේ අතේ හෙල්ලයක් තිබිණි; එහෙත්, ඔහු
පොල්ලක් ඇතුව මිසර ජාතිකයා ළඟට ගොස්
ඔහුගේ අතින් හෙල්ලය උදුරාගෙන ඔහුගේ ම
හෙල්ලයෙන් ඔහු මරා දැමී ය.
22 ජෙහෝයාදාගේ පුත් බෙනායා මේ දේවල්
කොට වීරයන් තුන්දෙනා අතර කීර්තියක් ලැබී ය.
23 ඔහු සෙසු තිස්දෙනාට වඩා කීර්තිමත් කෙනෙකේ
විය; එහෙත්, පළමු වන තිදෙනා තරම් කීර්තිමත්
නො වී ය. දාවිත් රජ ඔහු තමාගේ මුර
භේවායන්ගේ අධිපතියා කළේ ය.
24 ජෝවාබ්ගේ සහෝදර වූ අසාහෙලේ
තිස්දෙනාගෙන් එක් කෙනෙකේ ය. තවත් අයගේ නම්
මෙසේ ය: බෙත්ලෙහෙමේහි දෝදෝගේ පුත්
එල්හානාන් ය; 25 හරොදිය ෂම්මා ය; 26 හරොදිය
එලිකා ය; පල්තිය හෙලෙශේ ය; තකෝයිය
ඉක්කෙෂ්ගේ පුත් ඊරා ය; 27 අනාතෝතිය
අබියෙශෙරේ ය; හුෂාතිය මබුන්නයි ය; 28 අහෝහිය
ශල්මොන් ය; නටෝෆාතිය මහරයි ය;
29 නටෝෆාතිය බානාගේ පුත් හෙලෙබේ ය;
බෙන්ජමින් ගෝත්‍රයේ ගිබියාහි රිබයිගේ පුත්
ඉත්තයි ය; 30 පීරාතෝනිය බෙනායා ය; ගායෂ්හි
මිටියාවතේ හිද්දයි ය; 31 අර්බාතිය අබි-යල්බොන්
ය; බර්හුමීය අශ්මාවෙතේ ය; 32 ෂාල්බොනිය එලියාබා
ය; ජාෂෙන්ගේ පුත්‍රයන්ගෙන් ජොනතන් ය;
33 හරාරිය ෂම්මා ය; අරාරිය ෂරාර්ගේ පුත් අහියාම්
ය; 34 මයකාතිය ජාතිකයාගේ පුත් වන අහස්බයිගේ
පුත් එලිපලෙතේ ය; ගිලොනිය අහිතොපෙලේගේ පුත්
එලියාම් ය; 35 කර්මලේය හෙශ්රෙයි ය; අර්බිය
පයරයි ය; 36 ශෝබාහි නාතාන්ගේ පුත් ඉගාල් ය;
ගාදිය බානි ය; 37 අම්මොනිය ශෙලෙකේ ය;
ශෙරුයාගේ පුත් ජෝවාබ්ගේ ආයුධ ගෙනයන්නා වන
බයෙරෝතිය නහරයි ය; 38 ඉත්රීය ඊරා ය; ඉත්රීය
ගාරබේ ය; 39 හිත්තීය උරියා ය; ඒ සියල්ලෝ
තිස්හත්දෙනෙකි.

## දාවිත් රජ සංගණනය ගැනීම

(1 වංශා 21:1-27)

24 සමිඳාණන් වහන්සේගේ උදහස යළිත්
ඉශ්‍රායලේ සෙනඟට විරුද්ධ ව ඇවිළිණි. උන්
වහන්සේ ඔවුන්ට විරුද්ධ ව දාවිත් පොළඹවමින්,
“නුඹ ගොස්, ඉශ්‍රායලේවරුන් ද ජුදයේවරුන් ද ගණන්
කරන්නැ”යි ඔහුට වදාළ සේක. 2 රජ තමේ
ජෝවාබ්ට ද තමා සමඟ සිටි සේනාපතීන්ට ද කතා
කොට, “සෙනඟගේ ගණන මා දැනගන්න පිණිස,
ඔබ දාන් පටන් බයෙර්-ෂෙබා දක්වා සියලු ඉශ්‍රායලේ
ගෝත්‍ර අතරේ ඇවිද සෙනඟ ගණන් කරන්නැ”යි කී
ය.
3 ජෝවාබ්, රජුට කතා කොට, “දැන් සිටින ගණන
කොපමණ වුවත් ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ
සෙනඟ ඊට වඩා සිය ගුණයක් වැඩි කරන සේක්
වා! මාගේ ස්වාමීන් වන රජ්ජුරුවන්ට එය සියැසින්
දකින්නටත් ලැබේ වා! එහෙත්, මාගේ ස්වාමීන් වන
රජ්ජුරුවන් මේ ගැන ප්‍රිය වන්නේ කුමට දැ”යි ඇසී
ය. 4 එහෙත්, ජෝවාබ් හා සේනාපතීන් කී දේ
රජතුමා නොසලකා සිය නියමය ස්ථිර කළේ ය.
ජෝවාබ් ද සේනාපතීහු ද ඉශ්‍රායලේ සෙනඟ
ගණන් කරන පිණිස රජු ඉදිරියෙන් පිටත් ව ගියහ.
5 ඔව්හු ජොර්දාන් ගඟෙන් එගොඩට ගොස්
අරෝයෙර්හි ගාද් සිට ද මිටියාවත මැද තිබෙන
නගරය සිට ද සෙනඟ ගණන් කරන්නට පටන්ගෙන,
ජාසේර් දෙසට ද ගමන් කළහ. 6 එතැනින් ඔව්හු
ගිලියද්ටත්, හිත්තීවරුන්ගේ දේශයෙහි වූ කාදෙෂ්ටත්
පැමිණියහ. ඉන්පසු දාන්යාන්ටත්, වටකරින් ගොස්
සීදොන් දෙසටත් ගමන් කළහ. 7 එතැනින් පවුරු ඇති
තීර්ටත්, හිව්වරුන්ගේ ද කානානිවරුන්ගේ ද සියලු
නගරවලටත් පැමිණ, ජුදාහි දකුණු දිශාවේ බයෙර්-
ෂෙබා දක්වා ගියහ. 8 මෙලෙසෙ ඔව්හු මුළු දේශයෙහි
සැරිසරා නව මාස විසි දවසකට පසු ජෙරුසලමට
ආපසු පැමිණියහ. 9 ජෝවාබ් ගණන් කළ
සෙනඟගේ මුළු ගණන රජුට දැන්වී ය. අවි ආයුධ
දැරීමට දක්ෂ මිනිසුන්ගේ ගණන ඉශ්‍රායලේහි
අටලක්ෂයක් ද ජුදාහි පන්ලක්ෂයක් ද වූ හ.

## දාවිත් රජ දඬුවමක් තෝරාගැනීම

10 දාවිත් සෙනඟ ගණන් කළ පසු ඔහුගේ සිත
ඔහුට දොස් තැබී ය. දාවිත් සමිඳාණන් වහන්සේට
කතා කොට, “මම මේ දේ කිරීමෙන් බොහෝ
සයෙන් පව් කළෙමි. දැන් සමිඳුනි ඔබේ
මෙහෙකරුවාගේ අපරාධ පහ කළ මැනව; මන්ද, මම
බොහෝ අනුවණ ලෙස ක්‍රියා කළෙමි”යි කී ය.

11 දාවිත් පසු දින උදේ අවදි වූ විට දාවිත්ගේ
දිව්‍යසිව්වරයා වන ගාද් වෙත සමිඳාණන්
වහන්සේගෙන් මේ පණිවුඩය පැමිණියේ ය: “නුඹ
ගොස් දාවිත්ට මෙසේ කියන්න: 12 ‘මම කරුණු
තුනක් නුඹ ඉදිරියෙහි තබමි; නුඹ පිට පමුණුවන
පිණිස එයින් එකක් තෝරාගන්නැ’යි කී ය. 13 ගාද්
දාවිත් ළඟට අවුත් ඔහුට එපවත් දන්වමින්, “ඔබ
කැමැති කොයි එකට ද? ඔබේ දේශයට සත්
අවුරුද්දක් සාගතය පැමිණීමට ද? නොහොත් තුන්
මාසයක් ඔබේ සතුරන් ඔබ පසුපස ලුහුබැඳ එද්දී
ඔබ ඔවුන් ඉදිරියෙන් පලා යෑමට ද, නොහොත්
ඔබේ දේශයෙහි තුන් දවසකට වසංගතයක් ඇති
වීමට ද? දැන් ඉතින් මා එවූ තැනැන් වහන්සේට
කබෙඳු උත්තරයක් මා දිය යුතු දැ යි කල්පනා කර
බලන්නැ”යි කී ය.
14 දාවිත් පිළිතුරු දමේන්, “මම මහත් අමාරුවකට
වැටී සිටිමි. ඉතින් සමිඳාණන් වහන්සේගේ අතට
අපි භාර වන්නමෙු. මන්ද, උන් වහන්සේගේ
අනුකම්පාව ඉමහත් ය. මිනිසුන්ගේ අතට මම අසු
නොවමේවා”යි ගාද්ට කී ය. 15 මෙසේ සමිඳාණන්
වහන්සේ උදය පටන් නියම වේලාව දක්වා
ඉශ්රායලේ දේශය පිට වසංගතයක් එවූ සේක.
එයින් දාන් පටන් බයෙර්-ෂබො දක්වා සනෙඟගනේ
මිනිස්සු සැත්තෑ දහසක් මැරුණෝ ය. 16 දේව දූතයා
ජරේුසලම විනාශ කරන්නට තමාගේ අත ඒ දසෙට
දිගු කළ විට, සමිඳාණන් වහන්සේ විපත ගැන තැවී
සනෙඟ අතරේ විනාශ සිදු කරන දූතයාට කතා
කොට, “ඉතින් ඇති, නුඹේ අත ඉවත් කර ගන්නැ”යි
වදාළ සේක. සමිඳාණන් වහන්සේගේ දූතයා ඒ
අවස්ථාවේ දී ජබෙුසිය අරව්නාගේ කමත ළඟ
සිටියේ ය.
17 දාවිත් ද සනෙඟට පහර දනෙ දූතයා, දැක,
සමිඳාණන් වහන්සේට කතා කොට, “මම පව්
කළෙමේ. මම අපරාධ කළෙමේ. එහතේ, මේ
බැටළුවෝ කුමක් කළෝ ද? අනේ ඔබේ අත මා
පිටත්, මාගේ පවුල පිටත් පැමිණේ වා”යි කී ය.
18 එදින ගාද් දාවිත් ළඟට අවුත්, “ඔබ ගොස්
ජබෙුසිය අරව්නාගේ කමතේ සමිඳාණන් වහන්සේට
පූජාසනයක් ගොඩනඟන්නැ”යි ඔහුට කී ය. 19 දාවිත්
සමිඳාණන් වහන්සේ අණ කළ ලසෙ ගාද්ගේ කීමේ
හැටියට නැඟිට ගියේ ය. 20 අරව්නා බැලූ විට රජු ද
ඔහුගේ සේවකයන් ද තමා වතෙ එනු දැක පිටතට
අවුත්, මුණින්තළා වී රජුට වැඳ, 21 “මාගේ ස්වාමීන්
වන රජතුමා, තමාගේ මහෙකෙරුවා ළඟට ආවේ
කුමක් පිණිස දැ”යි ඇසී ය. “වංසගතය සනෙඟගනේ
පහ වන පිණිස සමිඳාණන් වහන්සේට පූජාසනයක්
ගොඩනැඟීම සඳහා කමත ඔබනේ මිලට ගැනීමට
ය”යි දාවිත් පිළිතුරු දිනි.
22 අරව්නා ද, “මාගේ ස්වාමීන් වන රජතුමා, එය
ගනෙ ඔබ කැමැති දයෙක් පූජා කරනු මැනව.
මනේන, දවන යාග පූජාවට ගවයෝ සිටිති. දර
පිණිස මඩින යන්ත්‍ර ද ගවයන්ගේ වියගස් ද තිබේ.
23 රජතුමනි, අරව්නා වන මම මේ සියල්ල
රජතුමාට දනේනමේ”යි දාවිත්ට කී ය. තවදුරටත්
අරව්නා කතා කොට, “ඔබේ දවේ සමිඳාණන්
වහන්සේ ඔබ පිළිගන්න සේක් වා”යි රජුට කී ය.
24 රජ ද, “එසේ නොව, මිලේට එය ඔබනේ
ගනිමි, මට වියදමක් නැති ව මාගේ දවේ සමිඳාණන්
වහන්සේට දවන යාග පූජා ඔප්පු නොකරමි”යි
අරව්නාට කී ය. එසේ දාවිත් කමත ද ගවයන් ද රිදී
කාසි පණසකට ගත්තේ ය. 25 එහි දාවිත් සමිඳාණන්
වහන්සේට පූජාසනයක් ගොඩනඟා දවන යාග පූජා
ද සහභාගිකමේ පූජා ද ඔප්පු කළෙේ ය. එවිට
සමිඳාණන් වහන්සේ දේශය ගැන කළ කන්නලව්ව
පිළිගත් සේක. ඉශ්රායලේ දේශයේ වසංගතය පහ
ව ගියේ ය.

io1 (1) දාවිත් රජුගේ ඇවෑමනේ පසු ඔහු පුත්
සලමොන් රජ වීම.
io1 (2) සලමොන් රජුගේ රාජ්‍ය පාලනය සහ
ඔහුගේ වික්‍රමාන්විත ක්‍රියා-විශේෂයනේ සඳහන්
කළ යුත්තේ, ඔහු ජරේුසලමේ දේව මාලිගාව
ගොඩනැඟීමයි.
io1 (3) රාජ්‍යය උතුර, දකුණ කියා කොටස් දකෙකට
කැඩී යාම සහ ක්‍රි.පූ. නව වන ශත වර්ෂයේ මැද
භාගය දක්වා රාජ වංශ කතා.
io1 පරිච්ඡේද 1:1; 2:12 දාවිත් රජුගේ පාලනයේ
අවසාන කාලය.
io1 පරිච්ඡේද 2:13-46 සලමොන් රජ වීම.
io1 පරිච්ඡේද 3:1; 11:43 සලමොන් රජුගේ පාලන
සමය.
io1 (අ) පරිච්ඡේද 3:1; 4:34 මුල් කාලය.
io1 (ආ) පරිච්ඡේද 5:1; 8:66 දේව මාලිගාව
ගොඩනැඟීම.
io1 (ඉ) පරිච්ඡේද 9:1; 11:43 අවසාන කාලය.
io1 පරිච්ඡේද 12:1; 22:53 රාජ්‍යය බදේී යාම.
io1 (අ) පරිච්ඡේද 12:1; 14:20 උතුරු කොටසේ
වංශයන් කැරලි ගැසීම.
io1 (ආ) පරිච්ඡේද 14:21; 16:34 ජුදාහි සහ
ඉශ්රායලේහි රජවරු.
io1 (ඉ) පරිච්ඡේද 17:1; 19:21 එලියා දිව්‍යසිව්වරයා.
io1 (ඊ) පරිච්ඡේද 20:1; 22:40 ඉශ්රායලේහි ආහබ්
රජ.
io1 (උ) පරිච්ඡේද 22:41-53 ජුදාහි ජහෙෝෂාපාට්
සහ ඉශ්රායලේහි අහසියා නමැති රජවරු.

# 1 රාජාවලියේ

### හැඳින්වීම

සාමුවෙල්ගේ පළමු වන පොතෙන් අරඹන ලද ඉශ්රායලේ රජ පෙළපතේ ඉතිහාසය මෙහි වැඩිදුරටත් විස්තර කොට ඇත. මෙම පොත කොටස් තුනකට බෙදිය හැකි ය.
(1) දාවිත් රජුගේ ඇවෑමෙන් පසු ඔහු පුත් සලමොන් රජ වීම.
(2) සලමොන් රජුගේ රාජ්‍ය පාලනය සහ ඔහුගේ වික්රමාන්විත ක්රියා-විශේෂයෙන් සඳහන් කළ යුත්තේ, ඔහු ජෙරුසලමේ දේව මාලිගාව ගොඩනැඟීමයි.
(3) රාජ්‍යය උතුර, දකුණ කියා කොටස් දෙකකට කැඩී යාම සහ ක්රි.පූ. නව වන ශත වර්ෂයේ මැද භාගය දක්වා රාජ වංශ කතා.
රාජාවලියේ පොත් දෙකේ ම පාලකයන් විනිශ්චය කොට ඇත්තේ, ඔවුන් දෙවියන් වහන්සේට දක්වන පක්ෂපාතකම අනුව ය. ජාතික සමෘද්ධිය මකේ පක්ෂපාතකම මත රඳා පවතින අතර, රූප වන්දනාව සහ දෙවියන් වහන්සේට අකීකරු වීම ජාතික විපතට මඟ පාදයි. රූප වන්දනාවට නොනැමෙන ලෙසත්, දෙවියන් වහන්සේට කීකරු වන ලෙසත් උන් වහන්සේ වෙනුවෙන් කතා කළ දිවැසිවරයන් ප්රකාශ කර ඇති බව මේ පොතේ සඳහන් වී ඇත. මොවුන් අතරෙන් විශේෂයෙන් කැපී පෙනෙන්නේ එලියා දිවැසිවරයා ය.
මෙහි අඩංගු කරුණු:
පරිච්ඡේද 1:1; 2:12 දාවිත් රජුගේ පාලනයේ අවසාන කාලය.
පරිච්ඡේද 2:13-46 සලමොන් රජ වීම.
පරිච්ඡේද 3:1; 11:43 සලමොන් රජුගේ පාලන සමය.
(අ) පරිච්ඡේද 3:1; 4:34 මුල් කාලය.
(ආ) පරිච්ඡේද 5:1; 8:66 දේව මාලිගාව ගොඩනැඟීම.
(ඉ) පරිච්ඡේද 9:1; 11:43 අවසාන කාලය.
පරිච්ඡේද 12:1; 22:53 රාජ්‍යය බෙදී යාම.
(අ) පරිච්ඡේද 12:1; 14:20 උතුරු කොටසේ වංශයන් කැරලි ගැසීම.
(ආ) පරිච්ඡේද 14:21; 16:34 ජුදාහි සහ ඉශ්රායලේහි රජවරු.
(ඉ) පරිච්ඡේද 17:1; 19:21 එලියා දිවැසිවරයා.
(ඊ) පරිච්ඡේද 20:1; 22:40 ඉශ්රායලේහි ආහබ් රජ.
(උ) පරිච්ඡේද 22:41-53 ජුදාහි ජෙහෝෂාපාට් සහ ඉශ්රායලේහි අහසියා නමැති රජවරු.

### දාවිත් රජුගේ මහලු කාලය

1 දාවිත් රජු මහලු ව වයස්ගත ව සිටි කල
කම්බිලිවලින් වසනු ලැබූ නමුත්, ඔහුට උණුසුම
ලැබුණේ නැත. 2 එබැවින් ඔහුගේ සේවකයෝ
ඔහුට කතා කොට, “ස්වාමීන් වන රජතුමනේ, ඔබ
ඉදිරියෙහි සිටීමටත්, ඔබට සාත්තු සප්පායම් කරමින්
ඔබට උණුසුම ලැබෙන පිණිස ඔබේ ළයෙහි
සැතපීමටත් සුදුසු තරුණ කාන්තාවක සොයා
දෙන්නට අපට අවසර දුන මැනවැ”යි කී හ. 3 ඔව්හු
රුවැති තරුණියක මුළු ඉශ්රායලේ දේශ සීමා තුළ
සොයා, ෂූනම්මීය අබීෂග් නම් තරුණිය සම්බ වී ඈ
රජු ළඟට ගෙනාවෝ ය. 4 තරුණිය ඉතා රූමත් වූවා
ය. ඈ රජුට සාත්තු සප්පායම් කොට, ඔහුට
ආවතේව කළ නමුත්, රජ ඈ සමඟ එක් නො වී
ය.

### අදොනියා සිහසුනට උරුමකම් කීම

5 2 සාමු 3:4 එකල හග්ගිත්ගේ පුත් අදොනියා,
“මම රජ වමේ”යි තමා ම උසස් කරගෙන රථ ද
අසරුවන් ද තමාට පෙරටුවෙන් දුවන පිණිස මිනිසුන්
පණස්දෙනෙකු ද සපයාගත්තේ ය. 6 “ඔබ මසේ
කළේ මන්දැ”යි ඔහුගේ පියා ඔහුට කවදාවත්
තරවටු කළේ නැත. අදොනියා කඩවසම් පෙනුමක්
ඇති මිනිසෙකි. මොහු අබ්සලොම්ට පසු ව උපන්නේ
ය. 7 ඔහු ශෙරුයාගේ පුත් ජෝවාබ් සහ අබ්යාතර්
නමැති පූජකවරයා සමඟ සම්මන්ත්රණය කළේ ය.
මොවුහු ද අදොනියාට පක්ෂ වී ඔහුට උපකාර
කළෝ ය. 8 එහෙත්, ශාදොක් පූජකවරයා ද

ජෙහෝයාදාගේ පුත් බෙනායා ද දිවැසිවර නාතාන් ද
ෂිමයි සහ රේයි යන අය ද දාවිත්ගේ ආරක්ෂක
පිරිස ද අදොනියා සමඟ නො වූ හ.
9 අදොනියා ඒන්-රොගලේ නම් ස්ථානය ළඟ
තිබෙන සොහෙලෙත් නම් නාග පර්වතය අසල
බැටළුවන් ද හරකුන් ද තර වස්සන් ද මරා, රාජ
කුමාරයන් වන ස්වකීය සහෝදරයන් ද රජුගේ
සේවකයන් වන ජුදා ගෝත්‍රයේ සියලු මිනිසුන් ද
කැඳවී ය. 10 එහෙත්, ඔහු දිවැසිවර නාතාන් ද
බෙනායා ද ආරක්ෂක පිරිස ද ස්වකීය සහෝදර
සලමොන් ද කැඳවේවේ නැත.

### සලමොන් රජ වීම

11 2 සාමු 12:24 එවිට නාතාන් සලමොන්ගේ මව
වන බැත්-ෂෙබාට කතා කොට, “අපේ ස්වාමීන් වන
දාවිත් රජ නොදැනුවත් ව හග්ගිත්ගේ පුත්
අදොනියා රජ වී සිටින බව ඔබට සැළ නොවී ද?
12 එබැවින් දැන් එන්න, ඔබේ ජීවිතයත්, ඔබ පුත්
සලමොන්ගේ ජීවිතයත් ඔබ ආරක්ෂා කරගන්න
පිණිස ඔබට දැනුමැතිකමක් දීමට මට අවසර
දෙන්න. 13 ඔබ ගොස් දාවිත් රජු ළඟට පැමිණ, ඔහු
අමතා, ‘මාගේ ස්වාමීන් වන රජතුමනේ, සැබැවින් ම
ඔබ පුත් සලමොන් මට පසු ව රජ වී ඔහු මාගේ
සිහසුන අරා හිඳගන්නේ ය, කියා ඔබේ දාසී හට
ඔබ දිවුරුම් දුන්නා නොවේ ද? එසේ නම්, අදොනියා
රජ වී සිටින්නේ මන්ද’යි ඔහුගෙන් අසන්න. 14 ඔබ
එහි රජතුමා සමඟ කතා කරන විට මම ද ඔබට
පසු ව පැමිණ ඔබේ වචන ස්ථිර කරන්නමේ”යි
කීවේ ය.
15 බැත්-ෂෙබා සයනාගාරයේ සිටි රජතුමා ළඟට
ගියා ය. රජ තමෙ ඉතා මහලු ව සිටියේ ය.
ෂූනම්මිය අබීෂග් නම් තරුණිය රජතුමාට ආවතේව
කරමින් සිටියා ය. 16 බැත්-ෂෙබා නැමී රජුට ආචාර
කළා ය. රජතුමා, “ඔබට කුමක් උවමනා දැ”යි ඇසූ
විට, 17 ඈ එතුමාට පිළිතුරු දෙමින්, “මාගේ ස්වාමීනි,
ඔබේ දෙවි සමිඳාණන් වහන්සේගේ නාමයෙන්
ඔබේ දාසී හට ඔබ දිවුරමින්, ‘සැබැවින් ම ඔබේ
පුත් සලමොන් මට පසු ව රජ වී මාගේ සිහසුන
අරා හිඳගන්නේ ය’යි කීවෙහි ය. 18 එහෙත්, දැන්
අදොනියා කුමරු රජ වී සිටියි. මාගේ ස්වාමීන් වන
රජතුමනේ, ඔබ එය නොදන්නෙහි ය. 19 තවද, ඔහු
හරකුන් ද තර වස්සන් ද බැටළුවන් ද බොහෝ
ගණනක් මරා, රජ කුමරුන් සියලු දෙනා ද පූජක
අබියාතර් ද සේනාපති ජෝවාබ් ද කැඳවේවේ ය.
එහෙත්, ඔහු ඔබ සේවකයා වන සලමොන්
කැඳවේවේ නැත. 20 ඉතින්, මාගේ ස්වාමීන් වන
රජතුමනේ, ඔබට පසු ව මාගේ ස්වාමීන් වන
රජතුමාගේ සිහසුන අරා හිඳගත යුත්තේ කවරකේ
දැ යි ඔබ ඉශ්‍රායලේවරුන්ට දැන්විය යුතු ය කියා
ඔව්හු සියල්ලෝ බලා සිටිති. 21 එසේ නොකළොත්,
මාගේ ස්වාමීන් වන රජතුමා මියගිය පසු මා ද
මාගේ පුත්‍ර සලමොන් ද වරදකාරයන් වනු ඇතැ”යි
කීවා ය.
22 තවද, ඈ මෙසේ රජු සමඟ කතා කරද්දී ම
දිවැසිවර නාතාන් ඇතුළට පැමිණියේ ය.
23 “දිවැසිවර නාතාන් පැමිණ සිටී”යි රජතුමාට දැන්වූ
කල ඔහු රජු ඉදිරියට අවුත් මුණින්තළා වී රජුට
වැන්දේ ය. 24 නාතාන් කතා කොට, “මාගේ
ස්වාමීන් වන රජතුමනේ, ‘අදොනියා කුමරු මට පසු
ව රජ වී මාගේ සිහසුන අරා හිඳගත යුතු ය’යි ඔබ
කීවෙහි ද? 25 මන්ද, ඔහු අද ගොස් හරකුන් ද තර
වස්සන් ද බැටළුවන් ද බොහෝ ගණනක් මරා, රජ
කුමරුන් සියලු දෙනා ද ඔබේ හමුදා සෙන්පති
ජෝවාබ් ද පූජක අබියාතර් ද කැඳවේවේ ය. ඔව්හු
ඔහු ඉදිරියෙහි ආහාර පාන වළඳා, ‘අදොනියා රජු
සැරදේ’ කියා කියති. 26 එහෙත්, ඔහු ඔබේ
මෙහෙකරු වන මා ද පූජක ශාදොක් ද
ජෙහෝයාදාගේ පුත් බෙනායා ද ඔබේ මෙහෙකරු වූ
සලමොන් ද කැඳවේවේ නැත. 27 මාගේ ස්වාමීන්
වන රජතුමාට පසු ඔබ සිහසුන අරා හිඳගත
යුත්තේ කවරකේ ද කියා ඔබේ මෙහෙකරුවන්ට
නොදන්වා ඔබ මේ දේ කළෙහි දැ”යි ඇසුවේ ය.

### සලමොන්ගේ රාජාභිෂේකය

28 එවිට දාවිත් රජ උත්තර දෙමින්, “බැත්-ෂෙබා මා
වෙත කැඳවාගෙන එන්නැ”යි කීවේ ය. ඈ රජු වෙත
පැමිණ රජු ඉදිරියෙහි සිටියා ය. 29 එවිට රජ තමෙ
කතා කොට, “සියලු විපත්තිවලින් මාගේ ප්‍රාණය
මිදූ ජීවමාන සමිඳාණන් වහන්සේගේ නාමයෙන්,
30 ‘ඔබේ පුත් සලමොන් මට පසු ව රජ වී මා
වෙනුවට මාගේ සිහසුන අරා හිඳින්නේ ය’යි
ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේගේ
නාමයෙන් මා ඔබට දිවුරුම් දුන් ලෙසෙ සැබැවින් ම අද
දවසේ කරමි”යි දිවුළේ ය.
31 එවිට බැත්-ෂෙබා මුණින්තළා වී රජුට වැඳ,
“දාවිත් රජතුමා සදහට ම ජීවත් වේ වා!”යි කීවා ය.
32 තවද, දාවිත් රජු, “ශාදොක් පූජකවරයාත්,
නාතාන් දිවැසිවරයාත්, ජෙහෝයාදාගේ පුත්
බෙනායාත් මා ළඟට කැඳවාගෙන එන්නැ”යි කී විට,
ඔව්හු රජතුමා ඉදිරියට ආවෝ ය. 33 රජ තමෙ
ඔවුන් අමතා, “ඔබේ ස්වාමීන්ගේ නිලධාරීන්
කැඳවාගෙන, මා පුත් සලමොන් මාගේ ම කොටළුවා
පිට නංවාගෙන ගීහොන් නමැති දිය උල්පත් ළඟට
යන්න. 34 එහි දී ශාදොක් පූජකවරයා සහ නාතාන්
දිවැසිවරයා ඔහු ඉශ්‍රායලේවරුන් කෙරෙහි රජ කොට
අභිෂේක කරත් වා. ඔබ ද හොරණෑව පිඹ
‘සලමොන් රජ තමෙ සැරදේ වා’යි කියන්න.
35 ඉන්පසු ඔහුට පිටුපසින් ඔබ ආ යුතු ය. ඔහු ද
අවුත් මාගේ සිහසුන අරා හිඳගත යුතු ය. ඔහු මා
වෙනුවට රජ වනු ඇත. ඔහු ඉශ්‍රායලේවරුන් ද
ජුදාවරුන් ද කෙරෙහි අධිපතියා කොට පත්
කළෙමේ”යි කීවේ ය.
36 එවිට ජෙහෝයාදාගේ පුත් බෙනායා රජුට
උත්තර දෙමින්, “එසේ ම වේ වා! මාගේ ස්වාමීන්
වන රජතුමන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ එසේ
වදාරන සේක් වා! 37 සමිඳාණන් වහන්සේ මාගේ

ස්වාමීන් වන රජතුමන් සමඟ වැඩසිටින ලෙසෙ ම
සලමොන් සමඟත් වැඩසිට ඔහුගේ සිහසුන මාගේ
ස්වාමීන් වන දාවිත් රජතුමන්ගේ සිහසුනටත් වඩා
උසස් කරන සේක් වා!"යි කීවේ ය.
38 මෙසේ ශාදොක් පූජකවරයා ද නාතාන්
දිවැසිවරයා ද ජෙහෝයාදාගේ පුත් බෙනායා ද
කෙරෙතිවරු ද පෙලෙතිවරු ද ගොස්, දාවිත් රජුගේ
කොටළුවා පිට සලමොන් නංවාගෙන ගීහොන් නම්
ස්ථානයට පැමිණියහ. 39 ශාදොක් පූජකවරයා
මණ්ඩපයෙන් තෙල් කුලාව රැගෙන ගොස් සලමොන්
අභිෂේක කළේ ය. එවිට ඔව්හු හොරණෑව
පිම්බෝ ය. මුළු සෙනඟ ද, "සලමොන් රජු සැරදේ
වා"යි කීවෝ ය. 40 මුළු සෙනඟ ඔහු පසුපස ගොස්
නළා පිඹ, පොළොව පැළෙන තරම් වූ ඔවුන්ගේ
ශබ්දයෙන් ඉමහත් ප්‍රීතියකින් ප්‍රීති ප්‍රමෝද වූ හ.

## අදොනියා බියපත් වීම

41 එවිට අදොනියා ද ඔහු සමඟ සිටි සියලු
අමුත්තන් ද ආහාර අනුභව කොට අවසාන වනවාත්
සමඟ ම ඔවුන්ට ඒ ශබ්දය ඇසිණි. ජෝවාබ්
හොරණෑ ශබ්දය අසා, "නගරය දෙවෙනත් කරන මේ
ඝෝෂාව කුමක් නිසා දැ"යි පිළිවිසී ය. 42 ඔහු කතා
කරද්දී ම අබියාතර් පූජකවරයාගේ පුත් ජොනතන්
පැමිණියේ ය. එවිට අදොනියා ඔහුට කතා කොට,
"ඇතුළට එන්න, ඔබ අවංක මිනිසෙකි, ඔබ සුබ
ආරංචි ගෙනෙනු ඇතැ"යි කීවේ ය.
43 ජොනතන් උත්තර දෙමින්, "නැත, අපේ ස්වාමීන්
වන දාවිත් රජ තෙමෙ සැබැවින් ම සලමොන් කුමරු
රජකමට පත් කළේ ය. 44 තවද, රජ තෙමෙ ඔහු
සමඟ ශාදොක් පූජකවරයා ද නාතාන් දිවැසිවරයා ද
ජෙහෝයාදාගේ පුත් බෙනායා ද කෙරෙතිවරුන් ද
පෙලෙතිවරුන් ද යැව්වේ ය. ඔව්හු ඔහුට රජුගේ
කොටළුවා පිට නැඟී යාමට සැලැස්සූ හ. 45 ඇරත්,
ශාදොක් පූජකවරයා ද නාතාන් දිවැසිවරයා ද
ගීහොන් නම් ස්ථානයේ දී ඔහු රජු වශයෙන්
අභිෂේක කළෝ ය. ඉන්පසු ඔව්හු එතැනින් පිටත් ව
අවුත් ප්‍රීති ප්‍රමෝද වූ හ. ඝෝෂාවෙන් නුවර රැව්
පිළිරැව් දිනි. ඔබ සැමට ඇසුණු ඝෝෂාව ඒක ය.
46 තවද, සලමොන් රජ සිංහාසනය අරා හිඳින්නේ
ය. 47 ඇරත්, රාජ නිලධාරීහු අපේ ස්වාමීන් වන
දාවිත් රජු හට ආශීර්වාද කරන්නට පැමිණ, 'දෙවියන්
වහන්සේ සලමොන්ගේ නාමය ඔබේ නාමයට වඩා
උසස් කර, ඔහුගේ සිංහාසනය ඔබේ සිංහාසනයට
වඩා සෞභාග්‍යවත් කරන සේක් වා!'යි කීවෝ ය.
රජ තෙමෙ ද යහනේ සිට නැමී ආචාර කළේ ය.
48 තවදුරටත් රජ තෙමෙ කතා කරමින්, 'මාගේ
ඇස්වලින් දකින හැටියට අද මාගේ සිංහාසනයෙහි
හිඳගැනීමට කෙනෙකු දුන් ඉශ්රායෙල්වරුන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේට ප්‍රශංසා වේ වා!'කියා කීවේ
ය"යි අදොනියාට සැළ කළේ ය.
49 එවිට අදොනියා සමඟ සිටි අමුත්තෝ සියල්ලෝ
ම බියපත් වී, නැඟිට එකිනෙකා තමතමන් කැමැති
දෙසට යන්නට ගියෝ ය. 50 අදොනියා ද සලමොන්
රජතුමාට බිය වී, නැඟිට ගොස් පූජාසනයේ
කොන්වලින් නරො ගිය අං අල්ලාගත්තේ ය.
51 තවද, " 'සලමොන් රජු තම මෙහෙකෙරුවා
කඩුවෙන් නොමරන ලෙසෙ අද මට දිවුරුම් දිය යුතු
ය'යි කියමින්, අදොනියා පූජාසනයේ කොන්වලින්
නරො ගිය අං අල්ලාගෙන සිටී"යයි සලමොන්
රජතුමාට දන්වන ලදී.
52 සලමොන් රජ තෙමෙ ද, "ඔහු විශ්වාස
මනුෂ්‍යයෙකු බව මට පෙනේ නම්, ඔහුගේ කෙස්
ගහක් වත් බිම නොවැටෙන්නේ ය. එහෙත්, ඔහු
දුෂ්ට කෙනෙකු බව පෙනේ නම්, ඔහු නසින්නේ
ය"යි කීවේ ය. 53 එවිට සලමොන් රජ මිනිසුන් යවා
ඔහු පූජාසනය ළඟින් ගෙනේවී ය. අදොනියා ද අවුත්
නැමී රජතුමාට වැන්දේ ය. රජ තෙමෙ ඔහුට කතා
කොට, "ඔබේ ගෙදරට යන්නැ"යි කීවේ ය.

## දාවිත් රජුගේ අන්තිම අවවාදය සහ මරණය

2 දාවිත් රජතුමා නසින කාලය ආසන්න විය.
ඔහු ස්වකීය පුත් සලමොන්ට මෙසේ අණ
කළේ ය. 2 "කොයිකාටත් පොදු අන්තිම ගමන මම
යමි. එබැවින් ඔබ ශක්තිමත් වී, වීරයෙකු මෙන්
ක්‍රියා කරන්න. 3 ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේගේ නියමයන් ඉටු කරමින්, දෙවි මඟ
ගමන් කරන්න. ඔබ කරන සියල්ලේ දී ද ඔබ යන
සෑම තැන්වල දී ද ඔබට ශුභසිද්ධිය සැලසෙන පිණිස
මෝසෙස්ගේ නීති සංග්‍රහයේ සටහන් පරිදි උන්
වහන්සේගේ ආඥා හා පණත් ද විනිශ්චයයන් හා
ශික්ෂා පද ද පිළිපදින්න. 4 ඔබ එසේ කළොත්,
සමිඳාණන් වහන්සේ මට වදාළ පරිදි, 'ඔබේ
දරුදැරියෝ තම තමන්ගේ මුළු හෘදයෙන් ද මුළු
සිතින් ද මා ඉදිරියෙහි සත්‍යවාදී ව හැසිරෙන ලෙසෙ
තමන්ගේ ජීවන මාර්ගය ගැන බලාගන්නෝ නම්,
ඉශ්රායෙල්වරුන්ගේ සිංහාසනය අරා හිඳීමට ඔබට
කෙනෙකේ නැති ව නොයන්නේ ය.'
5 2 සාමු 3:27; 20:10 "තවද, ශරූයාගේ පුත්
ජෝවාබ් විසින් මට කරනු ලැබූ දේ එනම්,
ඉශ්රායෙලේ හමුදාවල සෙනෙපතීන් දදෙනො වූ
නේර්ගේ පුත් අබ්නේර්ටත්, ජෙතෙර්ගේ පුත්
අමාසාටත් කළ දේ ඔබ දන්නෙහි ය. ඔහු ඔවුන්
මරා, සාමය ඇති කාලයේ දී යුද්ධ ලේ වගුරුවා
මාගේ ඉඟපටියෙහිත්, මාගේ පා වහන්වලත් යුද්ධ
ලේ තැවරුවේ ය. 6 එබැවින් ඔබ ස්ථානෝචිත
ප්‍රඥාව ඇතිව ක්‍රියා කරමින් ඔහුට මහලු වයසේ
දී සැනසිල්ලෙන් මැරෙන්න ඉඩ නොදෙන්න.
7 2 සාමු 17:27-29 "එහෙත්, ගිලියද් ජාතික
බර්ශිල්ලයිගේ පුත්‍රයන් හට කරුණාව පෙන්වා,
ඔවුන්ට ඔබේ මේසයෙන් ආහාර පාන අනුභව
කරන්නට අවසර දෙන්න. මන්ද, ඔබේ සහෝදර වූ
අබ්සලොම්ගෙන් මා පලා ගිය විට ඔව්හු එලෙසෙ මා
ළඟට පැමිණියෝ ය.
8 2 සාමු 16:5-13; 19:16-23 "තවද, බහුරිම් නම්
නගරයේ බෙන්ජමින්ගේ ගෝත්‍රයේ ගේරාගේ පුත්
ෂිමයි ඔබ ළඟ සිටියි. මා මහනයිම් නම් ස්ථානයට

ගිය දවසේ දී ඔහු මට ඉතා තදින් සාප කළේ ය.
එහෙත්, ඔහු ජෝර්දාන් ගඟ අසල මා හමු වූ විට,
මම ද, 'ඔබ කඩුවෙන් නොමරන්නෙමි'යි සමිඳාණන්
වහන්සේගේ නමින් දිවුළෙමි. 9 එහෙත්, ඔහුට
දඬුවම් නොකර නාරින්න; ඔබ පැණවත් මිනිසෙකු
බැවින් ඔහුට කළ යුතු දේ කුමක් දැ යි ඔබ
දන්නෙහි ය. ඔහුගේ මහලු වයසේ දී ලේ වගුරුවා
මැරෙන්නේ සලස්වන්න."
10 මෙසේ කී පසු දාවිත් රජ මියගියේ ය. ඔහුගේ
නගරයේ ඔහු භූමදාන කරන ලදී. 11 2 සාමු 5:4-5; 1
වංශා 3:4දාවිත් රජ තමෙ ඉශ්රායලේවරුන් කෙරෙහි
රජකම් කළ කාලය අවුරුදු හතළිහකි. ඔහු
හෙබ්රොන් නගරයේ හත් අවුරුද්දක් ද ජෙරුසලමෙහි
තිස්තුන් අවුරුද්දක් ද රජකම් කළේ ය. 12 1 වංශා
29:23සලමොන් ද තම පිය දාවිත් රජුගේ සිංහාසනය
අරා හිඳගත්තේ ය. ඔහුගේ රාජ්‍යය ද ස්ථිර ලෙස
පිහිටුවන ලදී.

## අදොනියාගේ මරණය

13 එකල හග්ගිත්ගේ පුත් අදොනියා සලමොන්ගේ
මව වන බැත්-ෂෙබා ළඟට ආයේ ය. "ඔබ එන්නේ
සාමදානයෙන් දැ"යි ඈ ඇසූ විට, ඔහු "සාමදානයෙන්
ය"යි උත්තර දුන්නේ ය. 14 තවද ඔහු, "ඔබට
කාරණයක් කියන්න මට තිබේ ය"යි කී විට, ඈ ද,
"කියන්නැ"යි කීවා ය.
15 එවිට ඔහු කතා කරමින්, "රාජ්‍යය මට
ලැබෙන්නට තිබුණු බවත්, මා රජකම් කරනු ඇත
කියා සියලු ඉශ්රායලේවරුන් මා ගැන බලා සිටි බවත්
ඔබ දන්නෙහි ය. එහෙත්, රජකම වෙනස් වී මාගේ
සහෝදරයාට එය අත් විය. මන්ද, එය ඔහුට
සමිඳාණන් වහන්සේගෙන් ලැබුණු බැවිනි. 16 ඉතින්
මම එක දෙයක් ඔබෙන් ඉල්ලමි. එය ප්රතික්ෂේප
නොකරන්නැ"යි කීවේ ය. ඈ ද, "එය කියන්නැ"යි
ඔහුට කීවා ය.
17 1 රාජා 1:3-4 ඔහු ද, "ෂූනම්මීය අබීෂග් නම්
කාන්තාව මට බිරිඳ කොට දෙන ලෙස සලමොන් රජු
හට කරුණාකර කතා කළ මැනව. රජ තමෙ ඔබේ
ඉල්ලීම ඉෂ්ට නොකර නොසිටින්නේ ය"යි කීවේ ය.
18 බැත්-ෂෙබා ද, "හොඳයි, ඔබ උදෙසා මම ඔහුට
කතා කරන්නෙමි"යි උත්තර දුන්නා ය.
19 එබැවින් බැත්-ෂෙබා අදොනියා උදෙසා සලමොන්
රජුට කතා කරන්නට ඔහු ළඟට ගිය විට, රජ තමෙ
ද ඈ හමු වීමට නැඟිට, ඈට ආචාර කර තම
සිංහාසනය අරා හිඳගත්තේ ය. රජුගේ මවටත්
ආසනයක් තබන්නට සැලැස්සුවේ ය. ඈ ඔහුගේ
දකුණෙනේ හිඳගත්තා ය. 20 එවිට ඈ, "මම එක සුළු
ඉල්ලීමක් ඔබෙන් ඉල්ලමි. එය නොදී නොසිටිය
මැනව"යි කී විට, රජ ද, "මාගේ මෑණියනි,
ඉල්ලන්න. මම එය ඔබට නොදී සිටින්නේ නැතැ"යි
ඈට කීවේ ය.
21 එවිට ඈ, "ෂූනම්මීය අබීෂග් ඔබේ සහෝදරයා
වන අදොනියාට බිරිඳ කොට දෙනු ලැබේ වා!"යි
කීවා ය.
22 සලමොන් උත්තර දෙමින්, "ඔබ අදොනියා
උදෙසා ෂූනම්මීය අබීෂග් නම් කාන්තාව ඉල්ලන්නේ
මන් ද? රජකමත් ඔහු උදෙසා ඉල්ලන්න. මන්ද, ඔහු
මාගේ වැඩිමහල් සහෝදරයා ය. පූජක අබියාතර්
සහ ශෙරූයාගේ පුත් ජෝවාබ් ද ඔහුගේ පැත්ත
ගෙන තිබෙන්නේ ය"යි තම මවට කීවේ ය. 23 එවිට
සලමොන් රජ ජීවමාන සමිඳාණන් වහන්සේගේ
නාමයෙන් දිවුරමින්, "අදොනියා පැවසූ මේ වචන
නිසා ඔහු මරණ පත් නොවන්නේ නම්, දෙවියන්
වහන්සේ මට දැඩි ලෙස දඬුවම් දෙන සේක් වා!
24 මා රජකමෙහි පිහිටවූ, මාගේ පියා වන
දාවිත්ගේ සිංහාසනය අරා මා අසුන් ගැන්වූ, තමන්
වහන්සේ පොරොන්දු වූ ලෙස මට වංශයක් උපදවා
දුන් ජීවමාන සමිඳාණන් වහන්සේගේ නාමයෙන්
අදොනියා අද දවසෙහි මරනු ලබනු ඇත කියා
දිවුරමි"යි කීවේ ය.
25 මෙසේ කියා සලමොන් රජ ජෙහෝයාදාගේ
පුත් බෙනායා යැවී ය. ඔහු අදොනියාට පහර දී
මැරුවේ ය.

## අබියාතර්ගේ සහ ජෝවාබ්ගේ ඉරණම

26 1 සාමු 22:20-23; 2 සාමු 15:24 තවද, සලමොන්
රජ අබියාතර් පූජකයාට කතා කොට, "අනාතොත්හි
තිබෙන ඔබේ ම ඉඩමට යන්න. ඔබ මරණයට
සුදුස්සෙකි. එහෙත්, ඔබ මාගේ පිය වූ දාවිත් රජු
ඉදිරියෙහි දෙවී සමිඳාණන් වහන්සේගේ ගිවිසුම්
කරඬුව ඉසුලූ බැවින් ද මාගේ පියා දැරූ සියලු
දුක්වල දී ඔබත් දුක් වින්ද බැවින් ද මේ වතාවේ
මම ඔබ නොමරමි"යි කී ය. 27 1 සාමු
2:27-36මෙසේ කියා ෂිලෝහි දී ඒලීගේ වංශය ගැන
සමිඳාණන් වහන්සේ වදාළ වචනය සම්පූර්ණ වන
ලෙසේ, සලමොන් උන් වහන්සේගේ පූජක ධුරයෙන්
අබියාතර් පහකළේ ය.
28 ඒ ආරංචිය ජෝවාබ්ට සැළ විය. මන්ද, ජෝවාබ්
අබ්සලොම් අනුව නොගිය නමුත්, අදොනියා අනුව
ගිය බැවින්, ඔහු සමිඳාණන් වහන්සේගේ
මණ්ඩපයට පලා ගොස් පූජාසනයේ කොන්වලින්
නෙරා ගිය අං අල්ලාගත්තේ ය. 29 ජෝවාබ්
සමිඳාණන් වහන්සේගේ මණ්ඩපයට පලා ගිය බව
ද ඔහු පූජාසනය ළඟ සිටින්නේ ය කියා ද සලමොන්
රජුට දන්වන ලදී. ඔහු ද ජෝවාබ් වෙත පණිවුඩයක්
යවමින්, "ඔබ කුමක් නිසා පූජාසනයට පලා ගියේ
දැ"යි ඇසූ විට, "මම ඔබට බියෙන් සමිඳාණන්
වහන්සේ වෙත පලා ගියෙමි"යි ජෝවාබ් උත්තර
දුන්නේ ය. එවිට රජ තමෙ, "ඔබ ගොස් ඔහු
මරන්නැ"යි ජෙහෝයාදාගේ පුත් බෙනායා යැවී ය.
30 බෙනායා සමිඳාණන් වහන්සේගේ මණ්ඩපයට
ඇතුළු වී, "පිටතට එන්න කියා රජ තමෙ කියන්නේ
ය"යි ඔහුට කී ය. "මම නො එමි, මම මෙතැන ම
නසින්නෙමි"යි ඔහු කී විට, බෙනායා ගොස්, ජෝවාබ්
එලෙස පිළිතුරු දුන්නේ යයි රජුට කීවේ ය.

31 එවිට රජ බෙනායාට කතා කොට, “ඔහු කී
ලෙස ඔහුට පහර දී මරා භූමදාන කරන්න. එසේ
කිරීමෙන් ජෝවාබ් නිකරුණේ වගුළ ලේ මා කෙරෙන්
ද මාගේ පියාගේ වංශයෙන් ද ඔබ පහකරනු ඇත.
32 ඔහු තමාට වඩා ධර්මිෂ්ඨ, වඩා යහපත් මිනිසුන්
දදෙනෙකු එනම්, නේර්ගේ පුත් ඉශ්රායලේ
සේනාවට අධිපති අබ්නේර්ට ද ජෙතෙර්ගේ පුත්
ජුදා සේනාවට අධිපති අමාසාට ද පහර දී, මාගේ
පිය වූ දාවිත් රජතුමාට නොදැනුවත් ව ඔවුන්
කඩුවෙන් මරාදැමූ බැවින්, සමිඳාණන් වහන්සේ
ඔහුගේ ලේ ඔහුගේ ම හිස පිට මෙසේ ආපසු
පමුණුවනු ඇත. 33 ඔවුන්ගේ ලේ ජෝවාබ්ගේ හිස
පිට ද ඔහුගේ පෙළෙපතේ අයගේ හිස් පිට ද සදහට
ම ආපසු පැමිණෙන්නේ ය. එහෙත්, දාවිත් රජ හට ද
ඔහුගේ පෙළෙපතට ද ඔහුගේ රාජ වංශයට ද
සිංහාසනයට ද සමිඳාණන් වහන්සේගෙන් සදහට ම
සාමදානය වන්නේ ය”යි කීවේ ය.
34 එවිට ජෙහෝයාදාගේ පුත් බෙනායා ගොස්
ඔහුට පහර දී, ඔහු මරාදැමූ පසු පාළුකරයෙහි
තිබුණු ඔහුගේ ම ගෙයි ඔහු භූමදාන කරනු ලැබී ය.
35 ඉන්පසු රජ තමෙ ඔහු වෙනුවට සේනාවේ
අධිපති කොට ජෙහෝයාදාගේ පුත් බෙනායා ද
අබ්යාතර් වෙනුවට පූජක ශාදොක් ද පත් කළේ ය.

### ෂිමයිගේ මරණය

36 තවද, රජ තමෙ ෂිමයිට පණිවුඩයක් යවා ඔහු
කැඳවා, “ඔබ ජෙරුසලමෙහි ගෙයක් සාදාගෙන එහි
වාසය කරන්න. එතැනින් කොතැනට වත් නොයන්න.
37 ඔබ පිටතට ගොස් කිද්රොන් ඔයෙන් එතෙර වන
දවසේ දී ඔබ නසිනවා ම ඇතැ යි දැනගන්න. ඇරත්,
ඔබේ මරණය සම්බන්ධ ව ඔබ ම වැරදිකරු වනු
ඇතැ”යි ඔහුට කීවේ ය.
38 ෂිමයි ද, “ඒ කීම යහපත, මා ස්වාමීන් වන
රජතුමා කී ලෙස ම ඔබේ මෙහෙකරුවා කම
කරන්නේ ය”යි රජුට කීවේ ය. එසේ ෂිමයි
ජෙරුසලමෙහි බොහෝ කාලයක් විසුවේ ය.
39 එහෙත්, තුන් අවුරුද්දකට පසු ෂිමයිගේ
වහල්ලු දදෙනෙකේ ගාත් නම් ස්ථානයෙහි රජු වන
මයකාගේ පුත් ආකීෂ් වෙත පලා ගියෝ ය. එවිට,
“ඔබේ වහල්ලු ගාත්හි සිටිති”යි ෂිමයිට දන්වන
ලදී. 40 ෂිමයි නැඟිට තම කොටළුවාට සෑදලය
යොදා තම වහලුන් සොයන්නට ගාත්හි ආකීෂ් වෙත
ගියේ ය. මෙසේ ෂිමයි ගොස් ගාත්හි සිටි තම
වහලුන් ගෙනාවේ ය. 41 ෂිමයි ජෙරුසලමෙන් ගාත්
නුවරට ගොස් ආපසු ආ බව සලමොන් රජු හට
දන්වන ලදී. 42 එවිට ඔහු ෂිමයි වෙත පණිවුඩයක්
යවා ඔහු කැඳවා, ඔහුට කතා කොට, “ ‘ඔබ
කොහේ නමුත් පිටතට ගිය දවසේ දී නසිනවා ම
ඇතැ යි දැනගන්න’ කියා, මා ඔබට සහතික කොට
ඔබ සමිඳාණන් වහන්සේගේ නම කියා දිවුරවූවා
නොවේ ද? ඔබ ද, ‘මා ඇසූ කීම යහපතැ’යි මට
කීවෙහි ය. 43 ඉතින්, ඔබ සමිඳාණන් වහන්සේගේ
නම කියා කළ දිවුරුමත්, මා ඔබට අණ කළ
නියෝගයත් රක්ෂා නොකළේ මන්දැ”යි ඔහුගෙන්
ඇසී ය. 44 තවදුරටත් රජ තමෙ ෂිමයිට කතා
කරමින්, “ඔබ මාගේ පිය වූ දාවිත්ට කළ සියලු
දුෂ්ටකම් ඔබ ඉතා හොඳින් දන්නෙහි ය. එබැවින්,
සමිඳාණන් වහන්සේ ඔබේ හිස පිට ඔබේ දුෂ්ටකම
ආපසු හරවන සේක. 45 එහෙත්, සලමොන් රජ
තමෙ ආශීර්වාද ලබන්නේ ය. දාවිත් රජුගේ
සිංහාසනය සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි සදහට
ම පිහිටුවනු ලබන්නේ ය”යි කීවේ ය.
46 මෙසේ රජ තමෙ ජෙහෝයාදාගේ පුත්
බෙනායාට අණ කළ පසු, ඔහු පිටතට ගොස්
ෂිමයිට පහර දී මැරුවේ ය. රජකම සලමොන් අත
ස්ථිර විය.

### ප්රඥාව සඳහා සලමොන් රජුගේ යාච්ඤාව
(2 වංශා 1:3-12)

3 තවද, සලමොන් රජු මිසරයේ රජු වන
පාරාවෝගේ දුව සරණ පාවාගෙන, පාරාවෝ
සමඟ ගිවිසුමක් කරගත්තේ ය. ස්වකීය මාලිගයත්,
සමිඳාණන් වහන්සේගේ මන්දිරය හා ජෙරුසලම
වටකර පවුරත් ගොඩනඟා නිම කරන තුරු, ඔහු ඇය
දාවිත් රජුගේ නුවරට ගෙනාවේ ය. 2 ඒ කාලය වන
තුරු සමිඳාණන් වහන්සේගේ නාමයට කිසි
මන්දිරයක් ගොඩනඟා නොතිබුණු බැවින් සෙනඟ
ගිරිකුළුවල පූජා ඔප්පු කළෝ ය. 3 සලමොන් තම
පිය වූ දාවිත්ගේ නියෝග ලෙස හැසිර සමිඳාණන්
වහන්සේට ප්රේම කළේ ය. තවද, ඔහු කඳු මත
පූජාස්ථානවල පූජා සහ සුවඳ දුම් ඔප්පු කළේ ය.
4 ගිබියොන් ප්රධාන කඳු මත පූජාස්ථාන වූ බැවින්
පූජා ඔප්පු කරන පිණිස රජ එතැනට ගියේ ය.
සලමොන් ඒ පූජාසනය පිට දවන යාග පූජා දහසක්
පුද කළේ ය. 5 ගිබියොන්හි දී සමිඳාණන් වහන්සේ
රාත්රියේ ස්වප්නයකින් සලමොන්ට දර්ශනය වූ
සේක. තවද, දෙවියන් වහන්සේ කතා කොට, “මා
නුඹට දිය යුතු දයෙ ඉල්ලන්නැ”යි වදාළ සේක.
6 සලමොන් කතා කොට, “ඔබේ දාසයා වූ මාගේ
පිය වූ දාවිත් ඔබ ඉදිරියෙහි සත්යවාදී ව ද
ධර්මිෂ්ඨකමින් ද ඔබ සමඟ සිතේ අවංකකමින් ද
හැසුරුණු පරිද්දෙන් ඔබ ඔහුට මහා කරුණාවක්
පෙන්වූ සේක. තවද, අද තිබෙන හැටියට ඔහුගේ
සිංහාසනය අරා හිඳින්න ඔහුට පුත්රයකු දීමෙන්
මේ මහා කරුණාව නොනවත්වා පෙන්වූ සේක.
7 දැනුදු මාගේ දෙවි සමිඳුනි, ඔබ මාගේ පිය වූ
දාවිත් වෙනුවට ඔබේ දාසයා රජ කොට පත් කළ
සේක. මම ළා බාල කෙනෙක්මි, රට පාලනයේ
දක්ෂකමක් මට නැත. 8 ගණන් කළ නොහැකි
අසංඛ්ය සමූහයක් වන ඔබ විසින් තෝරාගනු ලැබූ
ඔබේ සෙනඟ මැද ඔබේ දාසයා සිටියි. 9 එබැවින්
ඔබේ මේ සෙනඟ විනිශ්චය කරන පිණිස, හොඳ
නරක දැනගන්න පුළුවන් වන ලෙස ඥානවන්ත
සිතක් ඔබේ දාසයාට දුන මැනව, මන්ද, ඔබේ මේ
මහා සෙනඟ විනිශ්චය කරන්න කවරකුට පුළුවන්
දැ”යි කීවේ ය.

10 සලමොන් මේ දේ ඉල්ලූ නිසා සමිඳාණන්
වහන්සේ ඊට ප්‍රසන්න වූ සේක. 11 දෙවියන්
වහන්සේ කතා කොට, “නුඹ දීර්ඝායුෂ ඉල්ලන්නේ
වත් ධන සම්පත් ඉල්ලන්නේ වත්, නුඹේ සතුරන්ගේ
ජීවිතය ඉල්ලන්නේ වත් නැති ව විනිශ්චය
තේරුම්ගැනීමට ඥානය ඉල්ලූ බැවින්, 12 බලන්න,
මම නුඹේ ඉල්ලීම ලෙසෙ ඉටු කරමි. නුඹට සමාන
කෙනෙකු නුඹට පළමුවෙනේ සිටියේ වත්, නුඹට පසු
ව සිටින්නේ වත් නැති වන ලෙසෙ තියුණු නැණනුවණ
නුඹට දෙමි. 13 ඇරත්, නුඹේ මුළු කාලයේ දී
රජවරුන් අතරේ නුඹට සමාන කෙනෙකු නොවන
ලෙසෙ ධනය ද ගෞරවය ද යන නුඹ නොඉල්ලූ දේත්
නුඹට දෙමි. 14 තවද, නුඹේ පිය වූ දාවිත් හැසුරුණ
පරිදි නුඹ මාගේ ආඥා ද පණත් ද රක්ෂා කරමින්
මාගේ මාර්ගවල හැසිරෙන්නෙහි නම්, නුඹේ ආයුෂ
ද වැඩිකරන්නෙමි”යි ඔහුට වදාළ සේක.
15 සලමොන් පිබිද දෙවියන් වහන්සේ ස්වප්නයක්
මඟින් කතා කළ බව දැන ගත්තේ ය. ඔහු
ජෙරුසලමට අවුත් සමිඳාණන් වහන්සේගේ ගිවිසුම්
කරඬුව ඉදිරියෙහි සිට දවන යාග පූජා ද
සහභාගිකමේ පූජා ද ඔප්පු කළේ ය. තමාගේ
සියලු සේවකයන්ට මංගල්‍යයක් ද පිළියෙළ කොට
දුන්නේ ය.

### නඩුවක් විසඳීම

16 එකල වේශ්‍යා ස්ත්‍රීහු දෙදෙනෙකේ රජු ළඟට
අවුත් ඔහු ඉදිරියෙහි සිටියෝ ය. 17 එක ස්ත්‍රියක්
කතා කොට, “අනේ, රජතුමනේ, මේ ස්ත්‍රීත්, මමත්
එක ගෙයක වාසය කළෙමු. ඒ ගෙදර ම ඈ සමඟ
සිටිය දී මම දරුවෙකු ලැබුවෙමි. 18 තවද, මා දරුවා
ලබා තුන් දිනකට පසු මේ ස්ත්‍රී ද දරුවෙකු ලැබුවා
ය. අපි එකට සිටියෙමු. ගෙයි අප දෙදෙනා හැර
කිසිවෙකු අප සමඟ එහි සිටියේ නැත. 19 මේ
ස්ත්‍රියගේ දරුවා රාත්‍රියේ දී ඇගේ ඇඟට යට
වීමෙනේ මළේ ය. 20 ඈ මධ්‍යම රාත්‍රියෙහි නැඟිට,
ඔබේ මෙහෙකාරී නිදාගෙන සිටිය දී, මාගේ පුත්‍රයා
මා ළඟින් රැගෙන ඇගේ ළයෙහි තබාගෙන, ඇගේ
මළ දරුවා මාගේ ළයෙහි තැබුවා ය. 21 උදය මාගේ
දරුවාට කිරි දෙන්න නැඟුටුණු විට ඔහු මැරී උන් බව
දිටිමි. එහෙත්, මා උදේ ඔහු දෙස හොඳින් බැලූ විට
මා ලැබූ පුත්‍රයා නොවන බව දැනගතිමි”යි කීවා ය.
22 අනික් ස්ත්‍රී ද, “එසේ නොවෙ, ජීවත් ව සිටින
පුත්‍රයා මාගේ ය; මළ පුත්‍රයා ඔබේ ය”යි කීවා ය.
මැය ද, “නැත, මළ පුත්‍රයා ඔබේ ය; ජීවත් ව සිටින
පුත්‍රයා මාගේ ය”යි කීවා ය. මෙසේ ඔව්හු දෙදෙනා
රජු ඉදිරියෙහි විවාද කළෝ ය.
23 එවිට රජ කතා කොට, “එක් තැනැත්තියක්,
‘මේ ජීවත් ව සිටින පුත්‍රයා මාගේ ය; මළ පුත්‍රයා
ඔබේ ය’ කියාත්, අනික් තැනැත්තිය, ‘නැත, මළ
පුත්‍රයා ඔබේ ය, ජීවත් ව සිටින පුත්‍රයා මාගේ ය’
කියාත් කියති. 24 කඩුවක් මෙහි ගෙනෙන්නැ”යි
කීවේ ය. රජු ඉදිරියට කඩුවක් ගෙනෙන ලදී.
25 එවිට රජ කතා කොට, “ජීවත් ව සිටින දරුවා
දෙකට කපා බාගයක් එක් තැනැත්තියකටත්,
බාගයක් අනික් තැනැත්තියටත් දෙන්නැ”යි කීවේ ය.
26 එවිට ජීවත් ව සිටින දරුවාගේ මවගේ හෘදය
ඇගේ පුත්‍රයා කෙරෙහි අනුකම්පාවෙනේ දැවී ගිය
බැවින්, ඈ රජුට කතා කොට, “අනේ, මාගේ
ස්වාමීනි, ජීවත් ව සිටින දරුවා ඇට දෙන්න, මරන්න
නම් එපා යැ”යි කීවා ය. එහෙත්, අනික් තැනැත්තී,
“ඒ දරුවා මට වත්, ඔබට වත් නොවේ වා, ඔහු
දෙකට කපන්නැ”යි කීවා ය.
27 එවිට රජ උත්තර දෙමින්, “ජීවත් ව සිටින දරුවා
මරන්නට එපා, අර තැනැත්තියට දෙන්න. ඈ ඔහුගේ
මව ය”යි කීවේ ය.
28 රජු විසින් කරන ලද විනිශ්චය සියලු
ඉශ්‍රායලේවරු අසා, යුක්තිය විසඳීමට දෙවියන්
වහන්සේගේ ප්‍රඥාව ඔහු තුළ තිබෙන බව දැක
රජු කෙරෙහි බිය වූවෝ ය.

### රජුගේ නිලධාරීහු

4 සලමොන් රජ සියලු ඉශ්‍රායලේවරුන්ට රජ ව
සිටියේ ය. 2 ඔහුගේ උසස් නිලධාරීහු මොවුහු
ය. ශාදොක්ගේ පුත් අශරියා පූජකයා ය; 3 ෂිෂාගේ
පුත්‍රයන් වන එලිහොරෙපේ සහ අහියා ලේකම්වරු
ය; අහිලුද්ගේ පුත් ජෙහෝෂාපාට් වාර්තාකරු ය;
4 ජෙහෝයාදාගේ පුත් බෙනායා සේනාපතියා ය;
ශාදොක් සහ අබියාතර් පූජකවරු ය; 5 නාතාන්ගේ
පුත් අශරියා ප්‍රාදේශිය ආණ්ඩුකාරයන්ගේ පාලකයා
ය; නාතාන්ගේ පුත් පූජක සාබුද් රාජකීය
පුරෝහිතයා ව සිටියේ ය. 6 අහිෂාර් වනාහි රජ
ගෙදර ප්‍රධානියා ය. අබ්දාගේ පුත් අදොනිරාම්
රාජකාරියේ මූලාදෑනියා ය.
7 රජුටත්, ඔහුගේ ගෘහවාසීන්ටත් ආහාර සපයන
පිණිස සලමොන් රජ නිලධාරීන් දොළොස්දෙනෙකු
සියලු ඉශ්‍රායලේවරුන් කෙරෙහි පත් කළේ ය.
එකිනෙකා අවුරුද්දකට මාසයක් බැගින් එසේ ආහාර
සපයා දුන්නෝ ය. 8 ඔවුන්ගේ නාම මේ ය;
එප්‍රායිම් කඳුකරයේ විසූ බෙනේ-හුර් ය; 9 මාකශ්,
ෂායාල්බිම්, බෙතේ-ෂෙමෙෂ් සහ ඒලොන්-බෙතේ-හානාන්
යන නගරවල විසූ බෙනේ-දෙකෙරේ ය; 10 අරුබ්බෝත්හි
බෙනේ-හෙසෙදේ ය; මොහුට සෝකෝව නුවර සහ මුළු
හේපෙරේ රට ද පැවරිණි. 11 දෝර් නම් මුළු කඳුකර
පෙදෙසෙහි විසූ බෙනේ-අබීනාදාබ් ය. ඔහුගේ භාර්යාව
සලමොන්ගේ දුව වන තාපත් ය.
12 අහිලූද්ගේ පුත් බානාට තයනාක් සහ මෙගිද්දෝ
යන නගර ද ශාරතොන් නගරය අසල ජෙශ්රෙයෙලේ
නම් නගරයට දකුණින් පිහිටි මුළු බෙතේ-ෂයොන්
පෙදෙස ද පැවරිණි. ඒ පෙදෙස බෙතේ-ෂයොන් පටන්
ආබලේ-මෙහෝලා දක්වා ද ජොක්මෙයාම් නගරයට
එහා සීමා දක්වා ද විහිදී තිබේ. 13 රාමොත්-
ගිලියද්හි සිටි බෙනේ-ගබෙර් ය; ගිලියද්හි සිටි
මනස්සේගේ පුත් ජායීර්ගේ නගර ද පවුරු ද
ලෝකඩ අගුල් ද ඇති මහා නගර හැටක් සහිත
බාෂාන් නම් පෙදෙසෙහි අර්ගොබ් පළාත ඔහුට
පැවරිණි. 14 මහනයිම් නගරයේ විසූ ඉද්දෝගේ පුත්

අහිනාදාබ් ය. 15 නප්තලීගේ පදෙසෙහි විසූ
අහීමයාශ් ය; ඔහු ද සලමොන් රජුගේ දුව වන
බාසමෙත් භාර්යාව කොට පාවාගෙන තිබිණි.
16 ආෂරේ පදෙසෙහි බයොලොත් නගරයේ විසූ
හූෂයිගේ පුත් බානා ය. 17 ඉස්සාකර්ගේ පදෙසෙහි
විසූ පරුවාගේ පුත්‍ර වන ජෙහෝෂාපාට් ය.
18 බෙන්ජමින්ගේ පදෙසෙහි විසූ ඒලාගේ පුත්
ෂිමයි ය. 19 අමෝරිවරුන්ගේ රජ වූ සීහොන්ගේ ද
බාෂාන්හි රජ වූ ඕග්ගේ ද දේශය වූ ගිලියද්
දේශයෙහි විසූ උරීගේ පුත් ගබෙර් ය. ඒ
දේශයෙහි සිටියේ එක නිලධාරියෙක් පමණ ය.

### සලමොන් රජුගේ යසඉසුරු

20 ජුදාවරු ද ඉශ්රායලේවරු ද මුහුදු වෙරළේ වැලි
මෙන් ගණනින් අධික ව සිටියෝ ය. ඔව්හු
කමින්බොමින් ප්‍රීතිවමින් පසු වූ හ. 21 උත් 15:18;
2 වංශා 9:26සලමොන් රජ වනාහි යුප්‍රටීස්
ගංගාවේ පටන් පිලිස්තිවරුන්ගේ දේශය සහ
මිසරයේ දේශ සීමාව දක්වා සියලු රාජ්‍යයන් ආණ්ඩු
කළේ ය. ඔව්හු කප්පම් ගෙනවුත් දී සලමොන්
රජුගේ මුළු කාලය තුළ ඔහුට සේවය කළෝ ය.
22 දවසකට සලමොන් රජුගේ ආහාර මෙසේ ය.
සිහින් පිටි ලීටර් පන්දහසකි. වෙනෙ පිටි ලීටර්
දසදහසකි. 23 මුවන් ද තිත් මුවන් ද තරු මුවන් ද
තර කළ පක්ෂීන් ද හැර, තර හරක් දසදෙනෙකි,
කතේ හරක් විසිදෙනෙකි, බැටළුවෝ සියයකි.
24 ඔහු තිප්සා පටන් ගාසා දක්වා ම යුප්‍රටීස්
ගංගාවනේ මෙගොඩ තිබෙන මුළු දේශය ද මේ
ගංගාවනේ මෙගොඩ විසූ සියලු රජුන් ද පාලනය
කළේ ය. ඔහු අවට සෑම දිශාවල සාමය පැවතිණි.
25 මොහුගේ මුළු කාලය තුළ දාන් පටන් බයෙර්-
ෂෙබා දක්වා ජුදාවරු ද ඉශ්රායලේවරු ද එකිනෙකා
තම තමාගේ මිදි වතු හා අත්තික්කා වතුවල අයිතිය
භුක්ති විඳිමින් සුව සේ වාසය කළෝ ය.
26 1 රාජා 10:26; 2 වංශා 1:14; 9:25 සලමොන්
රජුගේ රථවලට ගාල් සතළිස්දහසක අශ්වයෝ
සිටියෝ ය; අසරුවෝ දොළොස්දහසක් ද සිටියෝ ය.
27 ඒ නිලධාරීහු එකිනෙකා තම තමාට නියම
මාසයේ දී සලමොන් රජුට ද ඔහුගේ කෑම
මේසයට පැමිණි සියල්ලන්ට ද කිසිවක් අඩු වන්න
ඉඩ නැර ආහාර සපයා දුන්නෝ ය. 28 ඔව්හු
එකිනෙකා තම තමාට නියම වී තිබුණු ලෙසෙ රථ
අදින අසුන්ටත්, බර අදින සතුන්ටත් යව සහ පිදුරු
නියම ස්ථානයට ගෙනොවෝ ය.
29 දෙවියන් වහන්සේ ඉමහත් ප්‍රඥාවත්,
විචක්ෂණ බුද්ධියත්, මුහුදු වෙරළේ වැලි මෙන්
පෘථුල ඥානයත් සලමොන් රජු හට දුන් සේක.
30 මොහුගේ ප්‍රඥාව පෙරදිග රටවල සියලු
ජනතාවගේ ප්‍රඥාවත්, මිසරවැසියන්ගේ සියලු
ප්‍රඥාවත් ඉක්මවා ගියේ ය. 31 ගීතා 89මන්ද, ඔහු
සියලු මිනිසුන්ට ද එස්රාහීය ජාතික ඒතාන්ට ද
මාහොල් නමැත්තාගේ පුත්‍රයන් වන හේමාන්ට ද
කල්කොල්ට ද දර්දාට ද වඩා ප්‍රඥාවන්ත ව සිටියේ
ය. ඔහුගේ කීර්තිය අවට සිටි සියලු ජාතීන් අතරේ
පතළ වී ගියේ ය. 32 හිතෝ 1:1; 10:1; 25:1; ප්‍රේම
1:1ඔහු උපදේශ වාක්‍ය තුන්දහසක් කීවේ ය.
ඔහුගේ ගීතිකා එක්දාස් පහකි. 33 ඔහු ලෙබනොන්
දේශයෙහි තිබෙන කිහිරි ගහ පටන් බිත්තියේ
හටගන්න හිසොප් ගහ දක්වා වෘක්ෂලතා ගැන
කතා කළේ ය. ඔහු මෘගයන් ද පක්ෂීන් ද උරගයන්
ද මත්ස්‍යයන් ද ගැනත් කතා කළේ ය. 34 විවිධ
ජාතීහු සලමොන්ගේ ප්‍රඥාව ඇසීමට පැමිණියෝ
ය. ඔහුගේ ප්‍රඥාව ගැන ඇසූ පොළොවේ
භූපතීන්ගෙන් ඔහු තෑගිබෝග ලැබුවේ ය.

### දේව මාළිගාව සාදන්න සූදානම

(2 වංශා 2:1-18)

5 සලමොන් ඔහුගේ පිය රජුට පසු ව රජු
වශයෙන් අභිෂේක කරනු ලැබූ බව තීර්හි රජ
වූ හීරාම් අසා තමාගේ තානාපතීන් ඔහු වෙත
එව්වේ ය. මන්ද, හීරාම් නිතර ම දාවිත් රජුගේ
හිතමිතුරෙක් විය. 2 සලමොන් රජ ද හීරාම් වෙත
පණිවුඩයක් යවමින්, 3 “සමිඳාණන් වහන්සේ මාගේ
පිය වූ දාවිත්ගේ සතුරන් පරාජය කරන තෙක්
හාත්පසින් තිබුණු යුද්ධ නිසා ඔහුගේ දෙවි
සමිඳාණන් වහන්සේගේ නාමයට මාළිගාවක්
ගොඩනඟන්නට ඔහුට බැරි වූ බව ඔබ දන්නෙහි ය.
4 එහෙත්, දැන් මාගේ දෙවි සමිඳාණන් වහන්සේ
හැම අතින් ම මට විවේකය දී තිබේ. එදිරිකාරයෙක්
වත්, විපත්ති ගැන බියක් වත් මට නැත. 5 2 සාමු
7:12-13; 1 වංශා 17:11-12සමිඳාණන් වහන්සේ
මාගේ පිය වූ දාවිත්ට කතා කොට, ‘නුඹ වෙනුවට
නුඹේ සිංහාසනය පිට මා තබන නුඹේ පුත්‍රයා
මාගේ නාමයට මාළිගාවක් ගොඩනඟනු ඇතැ’යි
වදාළ හැටියට මාගේ දෙවි සමිඳාණන් වහන්සේගේ
නාමයට ගෘහයක් ගොඩනඟන්නට මම අදහස්
කරමි. 6 එබැවින් ලෙබනොන් දේශයෙන් කිහිරි ගස්
කපා මට දෙන්න අණ කළ මැනව. මාගේ
වැඩකාරයෝ ඔබේ වැඩකාරයන් සමඟ සිටින්නෝ
ය. ඔබේ වැඩකාරයන්ගේ කුලී ඔබ කියන
ප්‍රකාරයට ඔබට දෙන්නෙමි. මන්ද, සීදොන්
නගරවාසීන් මෙන් ලී කපන්න දන්න අය අප අතර
නැති බව ඔබ දන්නෙහි ය”යි කියා යැවී ය.
7 හීරාම් රජ සලමොන්ගේ වචනය අසා ඉතා ප්‍රීති
වී, “ඒ ශ්‍රේෂ්ඨ ජාතිය ආණ්ඩු කරන පිණිස
ප්‍රඥාවන්ත පුත්‍රයකු දාවිත්ට දුන් සමිඳාණන්
වහන්සේට අද ප්‍රශංසා වේ වා!”යි කීවේ ය.
8 තවද, ඔහු සලමොන් වෙත පණිවුඩයක් යවමින්,
“ඔබ මට කියා එවූ කාරණය ඇසීමි. කිහිරි ලී ගැන ද
දේවදාර ලී ගැන ද ඔබේ මුළු කැමැත්ත ඉෂ්ට
කරන්නෙමි. 9 මාගේ වැඩකාරයෝ ලෙබනොන්
දේශයේ සිට මුහුද ළඟට ඒවා ගෙන එන්නෝ ය.
මම ඒවා එක් කොට, පහුරු බඳවා ඔබ මට කියා
එවන තැනකට මුහුදෙන් එවන්නෙමි. තවද, ඔබ ඒවා
භාරගැනීම පිණිස එහි දී ඒවා ලිහන්න
සලස්වන්නෙමි. ඔබ වනාහි මාගේ ගයේ වැසියන්ට

ආහාර දීමනේ මාගේ කැමැත්ත ඉෂ්ට කරන්නෙහි
ය"යි කියා එව්වේ ය.
10 මෙසේ හීරාම් රජ සලමොන්ගේ මුළු කැමැත්ත
ලෙසෙ කිහිරි ලී ද දේවදාර ලී ද ඔහුට දුන්නේ ය.
11 සලමොන් ද හීරාම්ගේ ගෙයි වැසියන්ට ආහාර
පිණිස තිරිඟු මෙට්රික් ටොන් දෙදහසක් ද පිරිසිදු
තෙල් ලීටර් ලක්ෂ හතරක් ද ඔහුට දුන්නේ ය.
සලමොන් අවුරුදුපතා මෙසේ හීරාම්ට දුන්නේ ය.
12 සමිඳාණන් වහන්සේ සලමොන්ට පොරොන්දු වූ
ලෙසෙ ඔහුට ප්‍රඥාව දුන් සේක; හීරාම් සහ
සලමොන් අතරේ සාමදානය පැවතුණේ ය. තවද,
ඔව්හු දෙදෙනා එක් ව ගිවිසුමක් කර ගත්තෝ ය.
13 සලමොන් රජ සියලු ඉශ්‍රායෙල්වරුන් අතරෙන්
රාජකාරියට මිනිසුන් බඳවාගත්තේ ය. එසේ
බඳවාගත් මිනිස්සු තිස්දහසකි. 14 1 රාජා 12:18ඔහු
මාසයකට දසදහසක් බැගින් මාරුවෙන් මාරුවට ඔවුන්
ලෙබනොන් දේශයට යැවී ය. ඔව්හු එක මාසයක්
ලෙබනොන්හි ද දෙමාසයක් ගෙදර ද සිටියෝ ය.
අදොනිරාම් වනාහි රාජකාරියේ නිලධාරියා විය.
15 කඳුවල ගල් කැපීමට අසූදහසක් ද ඒ ගල්
උසුලාගෙන යෑමට හැත්තෑදහසක් ද සෙනඟ
සලමොන්ට සිටියෝ ය. 16 ඒ හැර වැඩ බලාගත්තා
වූ, වැඩ කළ සෙනඟ පාලනය කළා වූ සලමොන්ගේ
ප්‍රධාන නිලධාරීන්ගේ ගණන තුන්දහස් තුන්සියයක්
විය. 17 කැපූ ගල්වලින් මාලිගාවේ අත්තිවාරම දමන
පිණිස රජුගේ ආඥාව පිට විශාල වූ ද අනර්ඝ වූ ද
ගල් ගෙනාවෝ ය. 18 සලමොන්ගේ වඩුවෝ ද
හීරාම්ගේ වඩුවෝ ද ගෙබලිවරු නම් ජනයා ද ඒවා
කැපුවෝ ය. මෙසේ දේව මාලිගාව තැනීමට ඔව්හු
ලී දඬු ද ගල් ද සූදානම් කළෝ ය.

## දේව මාලිගාව සෑදීම

6 තවද, ඉශ්‍රායෙල් ජනයා මිසර දේශයෙන්
පිටත් ව ආපසු පැමිණ හාරසිය අසූ වන
අවුරුද්දේ එනම්, ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි සලමොන්
රජකම් කිරීමට පටන්ගෙන සතර වන අවුරුද්දේ දෙ
වන මාසය වූ ශිව් මාසයේ දී ඔහු සමිඳාණන්
වහන්සේගේ මාලිගාව ගොඩනඟන්නට
පටන්ගත්තේ ය. 2 ඔහු සමිඳාණන් වහන්සේට
ගොඩනැඟුවාවූ මාලිගාවේ දිග මීටර් විසිහතකි.
පළල මීටර් නවයකි. උස මීටර් දහතුනයි දශම
පහකි. 3 මාලිගාවේ ඉදිරියෙන් වූ ප්‍රවේශ ශාලාවේ
දිග මාලිගාවේ පළල හැටියට ම මීටර් නවයක් ව ද
එහි පළල මාලිගාව ඉදිරිපිට මීටර් හතරයි දශම
පහක් ව ද තිබුණේ ය. 4 ඔහු මාලිගාවට ගරාදි
සවිකරන ලද කවුළු සෑදුවේ ය. 5 ඔහු මාලිගාවත්,
දිව්‍ය-වාක්‍යස්ථානයත් වටකර මාලිගාවේ බිත්ති
වටේට, ඒවාට යා කර උඩුමහල් ගොඩනැඟී ය.
6 උඩුමහලේ පහත ම තට්ටුවේ පළල මීටර් දෙකයි
දශම දෙකකි. මැද එකේ පළල මීටර් දෙකයි දශම
හතකි; තුන් වන එකේ පළල මීටර් තුනයි දශම
එකකි. මාලිගාවේ බිත්තිවලට බාල්ක ඇතුළු
නොකරන පිණිස පිටින් වටේට ම මාලිගාවේ
බිත්තිවල තැනින් තැන පටු කළ කපොලු සෑදුවේ ය.
7 නියම කළ ප්‍රමාණයට ගල්වළෙහි දී කැපූ
ගල්වලින් මාලිගාව ගොඩනැඟුව බැවින් මාලිගාව
ගොඩනැඟීමේ දී මිටියක වත්, පොරොවක වත්, වෙන
කිසි යකඩ ආයුධයක වත් ශබ්දයක් නොඇසිණි.
8 මැද මහලට දොර ගෘහයේ දකුණු පැත්තෙන්
විය. මැද මහලටත්, මැද මහලෙන් තුන් වන
මහලටත් නඟින්නට දඟර සෝපාන මාලාවක් සාදා
තිබුණේ ය. 9 මෙසේ ඔහු මාලිගාව තනා නිම
කළේ ය. ඔහු මාලිගාව කිහිරි දැවවලින් ද
ලෑලිවලින් ද වැසුවේ ය. 10 ඔහු මුළු මාලිගාවට යා
කර මීටර් නවයක් බැගින් උස ඇති මහල් තල
ගොඩනැඟුවේ ය. ඒවා කිහිරි ලීවලින් මාලිගාවට
සවි කරන ලද්දේ ය.
11 සමිඳාණන් වහන්සේ සලමොන්ට කතා කොට,
12 "නුඹ ගොඩනඟන මේ ගෘහය ගැන මම මෙය
කියමි: නුඹ මාගේ නීති අනුව හැසිර, මාගේ
නියෝග ඉෂ්ට කර, මාගේ පණත් පවත්වමින්, ඒ
ප්‍රකාර හැසිරෙන්නෙහි නම්, නුඹේ පිය වූ දාවිත්ට
මා කී මාගේ වචනය නුඹට ඉෂ්ට කරන්නෙමි.
13 තවද, මාගේ සෙනඟ වන ඉශ්‍රායෙල් අත් නෑර
ඉශ්‍රායෙල් ජනයා අතරෙහි වාසය කරන්නෙමි"යි
වදාළ සේක.
14 මෙසේ සලමොන් දේව මාලිගාව ගොඩනඟා
නිම කළේ ය.

## දේව මාලිගාවේ ඇතුළත පිළියෙළ කිරීම

(2 වංශා 3:8-14)

15 ඔහු මාලිගාවේ බිත්තිවල ඇතුළතින් කිහිරි ලෑලි
ඇල්ලුවේ ය. මාලිගාවේ බිම පටන් පියස්සේ පැති
දක්වා ඇතුළතින් දේවදාර ලීවලින් වැසුවේ ය.
16 නික්ම 26:33-34ඔහු මාලිගාවේ ඇතුළේ අන්තිම
කොටසෙන් මීටර් නවයක් දිගට බිම සිට සීලිම
දක්වා කිහිරි ලෑලි අල්ලා, වෙන් කොට ඒ ඇතුළු
කොටස දිව්‍ය-වාක්‍යස්ථානයක් වූ අතිශුද්ධස්ථානය
කොට සෑදුවේ ය. 17 ඊට ඉදිරියෙන් වූ මාලිගාවේ
ඉතුරු කොටස මීටර් දහඅටක් දික් විය.
18 මාලිගාවේ ඇතුළත කැකිරි වැල් ද පිපුණු මල් ද
කැටයම් කළ කිහිරි ලීවලින් වසා තිබුණු බැවින්, මුළු
මාලිගාව ම කිහිරි ලීයෙන් විය. කිසි ගලක්
පෙනෙන්නට නොතිබිණි.
19 ඔහු සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
තැබීමට ඇතුළතින් මාලිගාව තුළ දිව්‍ය-
වාක්‍යස්ථානයක් පිළියෙළ කළේ ය. 20 ඇතුළතින්
දිව්‍ය-වාක්‍යස්ථානයේ දිග මීටර් නවයකි; පළල මීටර්
නවයකි; උස මීටර් නවයකි. ඔහු එහි පෙරූ රන්
ගල්වා පූජාසනය කිහිරි ලීවලින් වැසුවේ ය.
21 මෙසේ සලමොන් මාලිගාවේ ඇතුළත පෙරූ රන්
ආලේප කොට රන් දම්වැල් දිව්‍ය-වාක්‍යස්ථානයේ
ඉස්සරහ පැත්තෙහි ඇද, ඒවායෙහි ද රන් ආලේප
කළේ ය. 22 නික්ම 30:1-3මුළු මාලිගාව
සම්පූර්ණයෙන් නිම වන තෙක් රන් ගැල්වී ය. දිව්‍ය-

වාක්‍යස්ථානය තුළ වූ පූජාසනයෙහි ද සම්පූර්ණයෙන්
ම රන් ආලේප කළේ ය.
23 නික්ම 25:18-20 ඔහු දිව්‍ය-වාක්‍යස්ථානයෙහි
ඇතුළේ ඔලීව ලීවලින් මීටර් හතරයි දශම හතර
බැගින් උස ඇති කෙරුබ්වරුන්ගේ රූප දෙකක් සාදා
තැබී ය. 24 එක කෙරුබ්වරයකුගේ රූපයක එක
පියාපතක් මීටර් දෙකයි දශම දෙකක් ය.
කෙරුබ්වරයාගේ රූපයේ අනික් පියාපත මීටර් දෙකයි
දශම දෙකක් ය; එක් පියාපතක කෙළවර පටන්
අනික් පියාපතේ කෙළවර දක්වා මීටර් හතරයි දශම
හතරකි. 25 අනික් කෙරුබ්වරයාගේ රූපයත් මීටර්
හතරයි දශම හතරකි, කෙරුබ්වරුන්ගේ රූප දෙක ම
එක මිම්මට ද එක හැඩේට ද විය. 26 එක
කෙරුබ්වරයකුගේ රූපයක උස මීටර් හතරයි දශම
හතරකි. අනික් කෙරුබ්වරයාගේ රූපයත් එසේ ම ය.
27 ඔහු ඒ කෙරුබ්වරුන්ගේ රූප ඇතුළු ගෘහය තුළ
පිහිටවූවේ ය. එක කෙරුබ්වරයකුගේ රූපයක
පියාපතක් එක බිත්තියකට වදින හැටියටත්, අනික්
කෙරුබ්වරයාගේ රූපයේ පියාපතක් අනික් බිත්තියට
වදින හැටියටත්, ඒවායේ පියාපත් ඇතුළු ගෘහය මැද
එකිනෙකට වදින හැටියටත් ඒවායේ පියාපත්
විහිදුවා තබන ලද්දේ ය. 28 ඔහු කෙරුබ්වරුන්ගේ
රූප රනින් ආලේප කළේ ය.
29 වටකර ඇතුළෙනුත්, පිටිනුත් මාලිගාවේ සියලු
බිත්තිවල ඔහු කෙරුබ් රූප ද තාල වර්ගයේ ගස් ද
පිපුණු මල් ද කොටා කැටයම් වැඩ කළේ ය.
30 ඔහු මාලිගාවේ ඇතුළත හා පිටත බිම රන්
ආලේප කළේ ය.
31 දිව්‍ය-වාක්‍යස්ථානයේ දොරකඩ ඔලීව ලීවලින්
ඔහු දොරවල් සෑදුවේ ය. උළුවස්සේ ඉහළ පඩිය ද
උළුවහු කණු ද බිත්තියෙන් පහෙන් කොටසක් විය.
32 ඔලීව ලීවලින් සෑදූ ඒ දොරවල් දෙකේ ඔහු
කෙරුබ්වරුන්ගේ රූප ද තල් ගස් ද පිපුණු මල් ද
කැටයම් කර, රන් ආලේප කර, කෙරුබ්වරුන්ගේ රූප
හා තල් ගස් පිටත් රන් ගෑවේ ය. 33 එසේ ම ඔහු
මාලිගාවේ දොරකඩටත් ඔලීව ලීවලින් උළුවහු කණු
සෑදුවේ ය. ඊට බිත්තියෙන් හතරෙන් කොටසක්
ගියේ ය. 34 මාලිගාවේ දොරකඩට දේවදාර ලීවලින්
දොරවල් දෙකක් ද සෑදුවේ ය. එක දොරකට
අකුළන දේවදාර පියන් දෙකක් ද අනික් දොරට
අකුළන දේවදාර පියන් දෙකක් ද විය. 35 ඔහු
ඒවායේ කෙරුබ්වරුන්ගේ රූප ද තල් ගස් ද පිපුණු
මල් ද කපා, ඒ කැටයම් පිට සම ලෙස රත්රන්
ගෑවේ ය.
36 ඇතුළු මළුව කැපූ ගල් පේළි තුනකින් ද කිහිරි
දැව පේළියකින් ද සෑදුවේ ය.
37 සතර වන අවුරුද්දේ ශිව් මාසයේ දී සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ අත්තිවාරම් දමන ලදී.
38 එකොළොස් වන අවුරුද්දේ අට වන මාසය වන
බූල් මාසයේ දී මාලිගාව එහි සියලු කොටස් ඇතුළු
ව අඳින ලද සම්පූර්ණ සැලැස්ම අනුව නිම කරන
ලදී. මෙසේ ඔහු සත් අවුරුද්දක් එය ගොඩනැඟීමෙහි
යෙදී සිටියේ ය.

## සලමොන් රජුගේ මාලිගාව

7 සලමොන් රජ තමා සඳහා මාලිගාවක්
ගොඩනඟා, මුළු මාලිගාව දහතුන් අවුරුද්දකින්
අවසාන කළේ ය.
2 ඔහු ලෙබනොන් ආරණ්‍යය නම් ශාලාව ද
ගොඩනැඟී ය. කිහිරි කණු පේළි සතරක් ද ඒ කණු
පිට කිහිරි බාල්ක ද ඇති ව එය සාදන ලද්දේ ය.
එහි දිග මීටර් හතළිස්හතරකි. පළල මීටර්
විසිදෙකකි, උස මීටර් දහතුනයි දශම පහකි.
3 පේළියට පහළොව බැගින් කණු සතළිස්පහක් වූ
ශාලාවේ සීලිම කිහිරි ලීවලින් වසා තිබුණේ ය.
4 ජනේල තට්ටු තුනක් තිබුණේ ය. කවුළුවක්
ඉදිරිපිට කවුළුවක් වශයෙන් තට්ටු තුනක ඒවා
තිබුණේ ය. 5 සියලු දොරකඩවල් ද උළුවහු ද
ජනේලවලට කළෙන් සතරැස් ව තිබුණේ ය.
කවුළුවක් ඉදිරිපිට කවුළුවක් වශයෙන් තට්ටු තුනක
ඒවා විය.
6 ඔහු මීටර් විසිදෙකෙක් දිග ද මීටර් දහතුනයි දශම
පහක් පළල ද ඇති කුළුණු ශාලාවක් සෑදුවේ ය.
ඒවා ඉදිරිපිට කුළුණු ද ලොකු බාල්ක ද සහිත තවත්
ශාලාවක් ද සෑදී ය.
7 විනිශ්චය කරන පිණිස සිංහාසන ශාලාව වන
අධිකරණ ශාලාවක් ඔහු සෑදුවේ ය. එය බිම පටන්
උඩ තට්ටුව දක්වා කිහිරි ලීවලින් වසන ලදී.
8 1 රාජා 3:1 ඔහුට වාසය කිරීම සඳහා ශාලාවට
එහා පැත්තෙන් අනික් මළුවේ ඔහුගේ මාලිගාව ඊට
සමාන ව සාදන ලදී. ඒ ශාලාවට සමාන වූ නිවසෙක්
සලමොන් තමා භාර්යාව කොට පාවාගත්
පාරාවෝගේ දුවටත් සෑදුවේ ය.
9 මේ සියල්ල ම කියතෙන් ඉරා කැපූ ගල්වල
මිම්වල හැටියට ඇතුළෙනුත්, පිටිනුත් අත්තිවාරමේ
පටන් පියස්සේ පහත කෙළවර දක්වා ද පිටත සිට
මහ මළුව දක්වා ද වටිනා ගල්වලින් නිම කරන
ලද්දේ ය. 10 වටිනා විශාල ගල්වලින් එනම්, මීටර්
හතරක් වූ ගල්වලින් ද මීටර් තුනහමාරක් වූ
ගල්වලින් ද අත්තිවාරම දමා තිබුණේ ය. 11 ඒවා
පිට කැපූ ගල්වල මිම්වල හැටියට වටිනා ගල් ද
කිහිරි ලී ද තිබිණි. 12 වටකර තිබුණ මහ මළුව
කැපූ ගල් පේළි තුනකින් ද කිහිරි දැව පේළියකින් ද
සාදන ලද්දේ ය. සමිඳාණන් වහන්සේගේ
මාලිගාවේ ඇතුළු මළුවත්, මාලිගාවේ ශාලාවත්
එලෙස ම විය.

## දේව මාලිගාවේ ලෝකඩ බඩු

13 සලමොන් රජ පණිවුඩයක් යවා තීර් නගරයේ
සිට හීරාම් නමැත්තකු ගෙන්වා ගත්තේ ය. 14 ඔහු
නප්තලීගේ ගෝත්‍රයේ වැන්දඹු ස්ත්‍රියකගේ
පුත්‍රයෙකි. ඔහුගේ පියා තීර් වැසියකු වූ
ලෝකුරුවෙකේ ය. ඔහු සියලු ආකාර ලෝකඩ වැඩ
කිරීමට ප්‍රඥාවෙන් ද තේරුමෙන් ද දක්ෂකමින් ද
පූර්ණ ව සිටියේ ය. ඔහු සලමොන් රජු වෙත
පැමිණ ඔහුගේ සියලු වැඩ කළේ ය.

### ලෝකඩ කුළුණු
(2 වංශා 3:15-17)

15 ඔහු ලෝකඩ කුළුණු දෙකක් වාත්තු කළේ ය.
එක එක කුළුණේ උස මීටර් අටකි. එක එක
කුළුණේ වට ප්‍රමාණය මීටර් පහයි දශම තුනකි.
16 කුළුණු මුදුන් පිට තබන්නට ඔහු ලෝකඩ පේකඩ
දෙකක් වාත්තු කර සෑදී ය. එක එක පේකඩයේ උස
මීටර් දෙකයි දශම දෙකකි. 17 කුළුණු මුදුන් පිට
තිබුණු පේකඩවලට දැල් වැඩ ද දම්වැල් මාලා වැඩ
ද තිබිණි. එක එක පේකඩයට ඒවා සතක් බැගින්
තිබිණි. 18 කුළුණු මුදුන් පිට තිබුණු පේකඩ වසන
පිණිස එක එක පේකඩයේ දැල් වැඩ පිට වටේට ම
ඔහු දෙළුම් ගෙඩි පේළි දෙකක් සෑදුවේ ය.
19 ශාලාවේ කුළුණු මුදුන් පිට තිබුණු පේකඩවල
මානෙලේ මල් වැඩ මීටර් එකයි දශම අටක් සාදා
තිබිණි. 20 කුළුණු දෙකේ පේකඩවල දැල්
කර්මාන්තයට උඩින්, මැද වටය ළඟ එක එක
පේකඩය වටකර දෙළුම් දෙසියයක් පේළිවල තිබිණි.
21 ඔහු දේව මාළිගාවේ ශාලාව ඉදිරිපිට ඒ කුළුණු
පිහිටුවා දකුණු කුළුණට ජාකීන් යන නම ද වම්
කුළුණට බෝවස් යන නම ද තැබුවේ ය. 22 කුළුණු
මුදුන්වල මානෙලේ මල් වැඩ තිබිණි. මෙසේ
කුළුණුවල වැඩ නිම කරන ලද්දේ ය.

### ලෝකඩ වතුර පොකුණ
(2 වංශා 4:2-5)

23 ඔහු වටකුරු වතුර පොකුණක් වාත්තු කර
සෑදුවේ ය. එය ගැට්යේ එක පැත්තක සිට අනික්
පැත්ත දක්වා මීටර් හතරයි දශම දෙකකි. එහි උස
මීටර් දෙකයි දශම දෙකකි. වට ප්‍රමාණය මීටර්
දහතුනයි දශම දෙකකි. 24 එහි ගැට්යට යටින් එය
වටකර කැකිරි ගෙඩි දසයක් තිබිණි. එය වාත්තු
කරන විට, වාත්තු කළ දෙපේළියක කැකිරි ගෙඩි
වතුර පොකුණ වටේට ම තිබිණි. 25 වතුර පොකුණ
ගව රූප දොළොසක් පිට තබා තිබිණි. තුනක් උතුරු
දෙසට ද තුනක් බස්නාහිර දෙසට ද තුනක් දකුණු
දෙසට ද තුනක් නැගෙනහිර දෙසට ද හැරී තිබිණි.
වතුර පොකුණ ඒ රූපවලට උඩින් ඒවා පිට තබා
තිබිණි. රූපවල පිටුපස කොටස් සියල්ල ම ඇතුළට
විය. 26 එහි ඝනකම මිලිමීටර් හැත්තෑපහකි. එහි
ගැට්ය පාත්‍රයක ගැට්ය මෙන් මානෙලේ මලක් ලෙසෙ
සාදන ලද්දේ ය. එහි ජල ප්‍රමාණය ලීටර්
හතළිස්දහසක් පමණ විය.

### ලෝකඩ රථ

27 ඔහු රථ දසයක් ලෝකඩින් සෑදී ය. එක එක
රථයේ දිග මීටර් එකයි දශම අටකි. පළල මීටර්
එකයි දශම අටකි. උස මීටර් එකයි දශම තුනකි.
28 මෙකී රථ මෙලෙසෙ සාදන ලදී. ඒවා පනේල
ආකාර ව තිබිණි; පනේල සන්ධිවලට අතරේ තිබිණි.
29 එසේ සන්ධිවලට අතරේ පනේල පිට සිංහ රූප ද
ගව රූප ද කෙරුබ් රූප ද විය. සන්ධි පිටත් ඉහළ
පැත්ත එසේ ම තිබිණි. සිංහයන්ටත්, ගවයන්ටත්
යටින් එල්ලෙන මාලා කර්ම තිබිණි. 30 එක එක
රථයට ලෝකඩ රෝද සතරක් ද ලෝකඩ අලවංගු ද
විය. ඒවායේ සතර කොනේ ආධාර කණු ද මෝවට
උඩින් සෝදන භාජනය ද විය. මේ ආධාර කණු එක
එක පැත්තේ මාලා ඇති ව වාත්තු කළ ඒවා විය.
31 පේකඩය ඇතුළතේ, ඉහළත් සෝදන භාජනයේ
කට හරහා සෙන්ටිමීටර් හතළිස්පහක් විය. රථයක
මෙන් වැඩ ඇති ව එහි කට වටකුරු ව සෙන්ටිමීටර්
හැටහයක් උස ව තිබිණි. එහි කට පිට කැටයම් වැඩ
තිබිණි. එහෙත්, ඒවායේ පනේල වටකුරු ව නොව
සතරැස් ව තිබිණි. 32 රෝද සතර පනේලවලට
යටින් තිබිණි. රෝදවල අලවංගු රථවලට යා කර
තිබිණි. එක එක රෝදයේ උස සෙන්ටිමීටර්
හැටහයක් ය. 33 රෝදවල වැඩ රථ රෝදයක වැඩට
සමාන ය. ඒවායේ අලවංගු ද වක් අතු ද ගරාදි ද
බොස් ගෙඩි ද සියල්ල ම වාත්තු කරන ලදී. 34 එක
එක රථයේ කොණේ සතර ම රථයට යා කරන ලද
ආධාර සතරක් විය. 35 රථයේ මුදුන සෙන්ටිමීටර්
විසිදෙකක් උසට වටකුරු කර තිබිණි. රථයේ
මුදුනෙහි තිබුණු ලීස්තර ද පනේල ද ඊට ම
සම්බන්ධ කර සාදා තිබිණි. 36 ඔහු එහි ලීස්තරවල
ලෑලිවල ද එහි පනේලවල ද ඒ ඒ ඉඩ ප්‍රමාණයට
කෙරුබ් රූප ද සිංහ රූප ද තල් ගස් ද කැටයම්
කළේ ය. වටේට මාලා ද තිබිණි.
37 මේ අයුරින් ඔහු රථ දසය සෑදී ය. ඒ සියල්ලට
තිබුණේ එක ම වාත්තුවත්, එක ම මිම්මත්, එක ම
හැඩයත් ය.
38 නික්ම 30:17-21 තවද, සේදීම පිණිස ලෝකඩ
භාජන දසයක් ඔහු සෑදුවේ ය. එක එක භාජනයේ
වතුර ප්‍රමාණය ලීටර් අටසියයක් බැගින් විය. එක
එක භාජනය මීටර් එකයි දශම අටක් පළල ය. රථ
දසයෙනේ එක එක රථය පිට භාජනයක් බැගින්
තිබිණි. 39 ඔහු රථ පහක් මාළිගාවට දකුණු
පැත්තෙනේ ද පහක් වම් පැත්තෙනේ ද තැබුවේ ය.
ඔහු වතුර පොකුණ මාළිගාවට දකුණු පැත්තෙනේ
නැගෙනහිර දිශාවටත්, දකුණු දිශාවටත් අතරේ
තැබුවේ ය.

### දේව මාළිගාවේ බඩුවල ලැයිස්තුව
(2 වංශා 4:11;5:1)

40 තවද, හීරාම් තමේ සෝදන භාජන ද හැඳි ද
තැටි ද සෑදී ය. මෙසේ හීරාම් සමිඳාණන්
වහන්සේගේ මාළිගාව සඳහා සලමොන් රජු උදෙසා
කළ සියලු වැඩ නිම කළේ ය. 41 එනම්, කුළුණු
දෙකක් ද කුළුණු මුදුන් පිට තිබුණු පේකඩවල
ගෝල දෙකෙ ද ඒ ගෝල දෙකෙ වැසීමට දැල් වැඩ
දෙකෙ ද 42 කුළුණු පිට තිබුණු පේකඩවල ගෝල
දෙකෙ වැසීමට එක එක දැල වටේට දෙළුම්
දෙපේළියක් බැගින් දැල් වැඩ දෙකට දෙළුම්
හාරසියයක් ද 43 රථ දසය ද රථ පිට වූ භාජන
දසය ද 44 වතුර පොකුණක් ද වතුර පොකුණ යට
තිබුණු ගව රූප දොළොස ද 45 හැළි ද හැඳි ද තැටි
ද යන මේවා ය. හීරාම් සමිඳාණන් වහන්සේගේ

මාලිගාව උදෙසා සලමොන් රජුට සෑදූ මේ සියලු බඩු
ඔප දැමූ ලෝකඩින් විය. 46 රජ ජෝර්දාන්
මිටියාවතෙහි සුක්කොත් හා ශාරතෙත් අතරේ
තිබෙන මැටි භූමියෙහි ඒවා වාත්තු කරවී ය. 47 ඒ
සියලු බඩු ඉතා විශාල ගණනක් වූ බැවින් සලමොන්
රජ ඒවා කිරුවේ නැත. ලෝකඩවල බර ද
දැනගත්තේ නැත.
48 නික්ම 25:23-30; 30:1-3 සලමොන් රජ
සමිඳාණන් වහන්සේගේ මාලිගාවෙහි සියලු බඩු
එනම්, රන් පූජාසනය ද පිදීමේ පූප තැබීමට රන්
මේසය ද 49 නික්ම 25:31-40දිව්‍ය-වාක්‍යස්ථානය
ඉදිරිපිට දකුණු පැත්තෙන් හා වම් පැත්තෙන් පහක්
බැගින් තැබීමට තනි රනින් පහන් රුක් ද මල් ද
පහන් ද අඬු ද 50 තනි රනින් කළ බඳුන් ද පහන්
කතුරු ද තැටි ද පාත්‍ර ද ධූම පාත්‍ර ද ඇතුළු මැදුර
වන අතිශුද්ධස්ථානයේ දොරවලටත්, මාලිගාවේ
දොරවලටත් රන් සරණේරු ද සෑදවූවේ ය.
51 2 සාමු 8:11; 1 වංශා 18:11 මෙලෙස සලමොන්
රජ සමිඳාණන් වහන්සේගේ මාලිගාව උදෙසා
කරවන ලද වැඩ සියල්ල නිම විය. මොහු තමාගේ
පිය වූ දාවිත් විසින් කැප කරන ලද දේ වන රිදී හා
රන් ද භාණ්ඩ ද ඇතුළට ගෙනවුත් සමිඳාණන්ගේ
මාලිගාවේ ගබඩාවල තැබුවේ ය.

### දේව මාලිගාවට ගිවිසුම් කරඬුව ගෙන ඒම

(2 වංශා 5:2-6-2)

8 2 සාමු 6:12-16; 1 වංශා 15:25-29 එවිට
සලමොන් රජ දාවිත්ගේ නුවර වූ සියොන්හි
සිට සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
ගෙනෙන පිණිස ඉශ්‍රායලේවරුන්ගේ ප්‍රජා මූලිකයන්
ද ඉශ්‍රායලේ ජනයාගේ පිය පෙළපත්වල අධිපතීන්
වූ ගෝත්‍රවල සියලු ප්‍රධානීන් ද තමන් වෙත
ජෙරුසලමට රැස් කළේ ය. 2 ලෙවී 23:34සියලු
ඉශ්‍රායලේවරු සත් වන මාසය වන ඒතානිම් මාසයේ
මංගල්‍යයේ දී සලමොන් රජු වෙත රැස් වූවෝ ය.
3 ඉශ්‍රායලේවරුන්ගේ සියලු ප්‍රජා මූලිකයන් පැමිණි
කල පූජකවරු ගිවිසුම් කරඬුව උසුලාගත්හ. 4 තවද,
ඔව්හු කරඬුව ද සම්මුඛ මණ්ඩපය ද මණ්ඩපයෙහි
තිබුණු සියලු ශුද්ධ බඩු ද ගෙනාවෝ ය. මෙලෙස
පූජකවරු සහ ලෙවීවරු ඒවා ගෙනොහ. 5 සලමොන්
රජ ද ඔහු වෙත රැස් ව සිටි මුළු ඉශ්‍රායලේ සභාව
ද ගණන් කරන්නට බැරි තරම් විශාල ගණනක්
බැටළුවන් සහ ගවයන් පූජා කරමින් ගිවිසුම් කරඬුව
ඉදිරියෙහි සිටියෝ ය. 6 පූජකවරු සමිඳාණන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව අතිශුද්ධස්ථානය වන
දේව මාලිගාවේ දිව්‍ය-වාක්‍යස්ථානයට ගෙනවුත්
කෙරුබ්වරුන්ගේ පියාපත් යට ඊට නිසි තැන එය
තැබූ හ. 7 මන්ද, කරඬුව තබන ලද ස්ථානයට උඩින්
විහිදී තිබූ කෙරුබ්වරුන්ගේ පියාපත්වලට කරඬුවත්,
එහි පොලුත් උඩින් වැසී තිබුණේ ය. 8 ඒ පොලුවල
අගිස් දිව්‍ය-වාක්‍යස්ථානයට ඉදිරියෙහි වූ
ශුද්ධස්ථානයට පෙනෙන තරම් දිගට තිබිණි. එහෙත්,
ඒවා පිටතට පෙනුණේ නැත. ඒවා අද දක්වා ම එහි
තිබේ. 9 ද්වි.නී. 10:5ඉශ්‍රායලේ ජනයා මිසර
දේශයෙන් පැමිණි පසු, සමිඳාණන් වහන්සේ ඔවුන්
සමඟ ගිවිසුමක් කළ විට මෝසෙස් විසින් හොරෙබ්
කන්දේ දී තබන ලද ගල්පුවරු දෙක මිස, ගිවිසුම්
කරඬුවේ වෙන කිසිවක් නොතිබිණි.
10 නික්ම 40:34-35 පූජකවරුන් ශුද්ධස්ථානයෙන්
පිටතට ආ කල සමිඳාණන් වහන්සේගේ මාලිගාව
වලාපටලයෙන් පිරිණි. 11 වලාපටලය නිසා
පූජකවරුන්ට සේවය කිරීම පිණිස සිටින්න නොහැකි
විය. සමිඳාණන් වහන්සේගේ මහිමාලංකාරයෙන්
උන් වහන්සේගේ මාලිගාව පිරී තිබිණි. 12 ගීතා
18:11; 97:2එවිට සලමොන් කතා කොට මෙසේ
කීවේ ය:
q212 “සමිඳුනි, ඔබ අහස් තලයෙහි සූර්යයා තැබූ
සේක;
q212 එහෙත්, විසීමට අඳුරු වලාකුළු තෝරාගත්
සේක.
13 මම ඔබ උදෙසා වාසභවනයක්, ඔබට සදා
විසීමට තැනක් ඉදි කළෙමි.”

### ජනතාව ඇමතීම

(2 වංශා 6:3-11)

14 රජ තෙම මුළු ඉශ්‍රායලේ සභාව නැඟිට සිටිය
දී, මුහුණ හරවා ඔවුන්ට ආශීර්වාද කරමින් මෙසේ
කී ය: 15 “ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේට ප්‍රශංසා වේ වා! මන්ද, උන් වහන්සේ
ස්වකීය මුඛයෙන් මාගේ පිය වූ දාවිත්ට කතා
කරමින්, 16 2 සාමු 7:4-11; 1 වංශා 17:3-10‘මාගේ
සෙනඟ වන ඉශ්‍රායලේ ජනයා මා මිසරයෙන් ගෙනා
දවසේ පටන් මාගේ නාමයට මාලිගාවක්
ගොඩනඟන පිණිස සියලු ඉශ්‍රායලේ ගෝත්‍රවලින්
කිසි නගරයක් තෝරා නොගෙන, මාගේ සෙනඟ
වන ඉශ්‍රායලේවරුන් පාලනය කිරීමට දාවිත් තෝරා
ගතිමි’යි පවසා ස්වකීය හස්තයෙන් එය ඉෂ්ට කළ
සේක.
17 2 සාමු 7:1-3; 1 වංශා 17:1-2
“ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේගේ
නාමයට මාලිගාවක් ගොඩනැඟීමට අදහසක් මාගේ
පිය වූ දාවිත්ගේ සිතේ තිබිණි. 18 එහෙත්,
සමිඳාණන් වහන්සේ මාගේ පිය වූ දාවිත්ට කතා
කොට, ‘මාගේ නාමයට මාලිගාවක් ගොඩනඟන්නට
නුඹේ සිතේ තිබූ අදහස හොඳ එකකි. 19 2 සාමු
7:12-13; 1 වංශා 17:11-12එසේ වී නමුත්, නුඹ ඒ
මාලිගාව ගොඩනඟන්නේ නැත; නුඹට දාව ඉපදෙන
නුඹේ පුත්‍රයා ම මාගේ නාමයට මාලිගාවක්
ගොඩනඟන්නේ ය’යි වදාළ සේක.
20 “සමිඳාණන් වහන්සේ තමන් වදාළ වචනය
ඉෂ්ට කළ සේක. මන්ද, උන් වහන්සේ වදාළ
හැටියට මම මාගේ පිය වූ දාවිත් වෙනුවෙන් පත් වී
ඉශ්‍රායලේවරුන්ගේ සිංහාසනයේ හිඳ,
ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේගේ
නාමයට මාලිගාවක් ගොඩනැඟුවෙමි. 21 තවද,
සමිඳාණන් වහන්සේ අපේ පියවරුන් මිසර
දේශයෙන් ගෙනා කල ඔවුන් සමඟ කළ ගිවිසුම

තබා තිබෙන කරඬුවට එහි ස්ථානයක් නියම
කළෙමි."

### සලමොන් රජුගේ යාච්ඤාව

(2 වංශා 6:12-42)

22 ඉන්පසු සලමොන් රජ තමෙ මුළු ඉශ්‍රායලේ
සභාව ඉදිරියෙහි සමිඳාණන් වහන්සේගේ පූජාසනය
ඉදිරිපිට සිට, ස්වර්ගය දෙසට තම අත් විදහා මෙසේ
කී ය: 23 "ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්ස, ඉහළ ස්වර්ගයෙහි වත්, පහළ පොළොවෙහි
වත් ඔබට සමාන දෙවි කෙනෙක් ඇත්තේ නැත. ඔබ
වනාහි ඔබ ඉදිරියෙහි තමන්ගේ මුළු සිතින් කීකරු
වන ඔබේ මෙහෙකරුවන් සමඟ ගිවිසුමත්,
කරුණාවත් පවත්වන සේක. 24 ඔබේ මෙහෙකරු වූ
මාගේ පිය දාවිත්ට ඔබ පොරොන්දු වූ දේ ඔහුට
ඉෂ්ට කර දුන් සේක. එසේ ය, ඔබ ස්වකීය
මුඛයෙන් එය වදාරා අද දවසේ තිබෙන ප්‍රකාරයට
ස්වකීය හස්තයෙන් එය ඉෂ්ට කළ සේක. 25 1 රාජා
2:4එබැවින් ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්ස, ඔබේ මෙහෙකරු වූ මාගේ පිය දාවිත්ට
ඔබ කතා කොට, 'නුඹ මා ඉදිරියෙහි හැසුරුණු පරිදි
නුඹේ දරුවෝ ද තමන්ගේ මාර්ගය ගැන ප්‍රවේසම්
වන්නෝ නම්, ඉශ්‍රායලේවරුන්ගේ සිංහාසනයෙහි
හිඳීමට මා ඉදිරියෙහි නුඹට කෙනෙක් නැතුව
නොයන්නේ ය' කියා ඔබ වදාළ කාරණය ඔහුට
ඉෂ්ට කර දුන මැනව, 26 එබැවින්
ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්ස, ඔබේ
මෙහෙකරු වූ මාගේ පිය දාවිත්ට වදාළ ඔබේ
වචනය මෙසේ ස්ථිර වේ වා!
27 2 වංශා 2:6 "එහෙත්, දෙවියන් වහන්සේ
සැබැවින් ම පොළොවෙහි වැඩ වසන සේක් ද?
ස්වර්ගය ද ඉහළ ම ස්වර්ගය ද ඔබ වහන්සේට ඉඩ
මදි ය; එසේ නම්, මා ගොඩනැඟුවාවූ මේ මාලිගාව
ඊට වඩා කොපමණ නොසෑහේ ද? 28 එහෙත්,
මාගේ දෙවි සමිඳාණන් වහන්ස, ඔබේ
මෙහෙකරුවාගේ යාච්ඤාව ද කන්නලව්ව ද සලකා
අද ඔබ ඉදිරියෙහි ඔබේ මෙහෙකරුවා ඔප්පු කරන
ඉල්ලීම හා යාච්ඤාව ඇසුව මැනව. 29 ද්වි.නී.
12:11'මාගේ නාමය එහි වන්නේ ය' කියා ඔබ යම්
ස්ථානයක් ගැන වදාළ සේක් ද, ඒ ස්ථානය වන මේ
මාලිගාව දෙස ඔබේ දෙනෙත් දිවා රෑ දෙක්හි යොමු
වී තිබේ වා! ඔබේ මෙහෙකරුවා මේ ස්ථානය
දෙසට හැරී ඔප්පු කරන යාච්ඤාව ඇසුව මැනව.
30 ඔබේ මෙහෙකරුවා ද ඔබේ ඉශ්‍රායලේ සෙනඟ
ද මේ ස්ථානය දෙසට හැරී ඔප්පු කරන ඔවුන්ගේ
කන්නලව්ව ඇසුව මැනව. එසේ ය, ස්වකීය
වාසස්ථානය වන ස්වර්ගයෙහි සිට ඇසුව මැනව,
අසා කමා වුව මැනව.
31 "යමෙකු තම අසල්වැසියාට විරුද්ධ ව වරදක්
කොට ඔහු දිවුරවන පිණිස දිවුරුමක් ඔහුට පවරා,
ඔහු අවුත් මේ මාලිගාවේ ඔබේ පූජාසනය ඉදිරිපිට
දිවුළොත්, 32 ඔබ ස්වර්ගයෙහි සිට එය අසා
වදාරමින් ක්‍රියා කළ මැනව; ඔබේ මෙහෙකරුවන්
විනිශ්චය කළ මැනව; වරදකරුවාට නිසි විපාකය
අනුව ඔහුට දඬුවම් දුන මැනව; නිවැරදිකරුවාට
ඔහුගේ නිදොස්කම අනුව ඔහුට විපාක දුන මැනව.
33 "ඔබේ සෙනඟ වන ඉශ්‍රායලේවරුන් ඔබට
විරුද්ධ ව පව් කළ බැවින් සතුරා ඉදිරියෙහි ඔවුන්
පරාජය වූ කල, ඔව්හු දෙවෙනු ඔබ වෙත හැරී ඔබේ
නාමය ප්‍රකාශ කර, මේ මාලිගාවේ දී ඔබට
යාච්ඤා කර කන්නලව් කළොත්, 34 ඔබ ස්වර්ගයේ
සිට එය අසා, ඔවුන්ගේ පාපයට කමා වී, ඔවුන්ගේ
පියවරුන්ට ඔබ දුන් දේශයට ඔවුන් නැවත
පැමිණවුව මැනව.
35 "ඔවුන් ඔබට විරුද්ධ ව පව් කළ බැවින් අහස
පිය වී වර්ෂාව නැති වී යන විට, ඔබ මෙසේ
ඔවුන්ට දඬුවම් කරන හයෙන් ඔවුන් මේ ස්ථානය
දෙසට හැරී යාච්ඤා කොට ඔබේ නාමය ප්‍රකාශ
කර තමන්ගේ පාපය අත් හැරියොත්, 36 ඔබ
ස්වර්ගයේ සිට එය අසා, ඔවුන් යා යුතු යහපත්
මාර්ගය ඔවුන්ට පන්නා දුන් කල, ඔබේ
මෙහෙකරුවන්ගේත්, ඔබේ සෙනඟ වන
ඉශ්‍රායලේවරුන්ගේත් පාපයට කමා වී, උරුමයක්
කොට ඔබේ සෙනඟට ඔබ දී තිබෙන ඔබේ
දේශයට වර්ෂාව දුන මැනව.
37 "දේශයෙහි සාගතයක් හෝ වසංගතයක් හෝ
ගොයම් වියළී යාම හෝ ගොයම් රෝගය හෝ
පළඟැටියන් හෝ දළඹුවන් හෝ ඇති වූ විට ද
ඔවුන්ගේ දේශයේ නගරවල ඔවුන් සිටින විට
ඔවුන්ගේ සතුරන් ඔවුන් වැටලූ අවස්ථාවක දී,
යම්කිසි පීඩාවක් හෝ රෝගයක් හෝ ඇති වූ විට ද
38 යම් මනුෂ්‍යයෙකු හෝ ඔබේ මුළු සෙනඟ වන
ඉශ්‍රායලේවරුන් හෝ තමන්ගේ සිත්වල සෝ දුක
තේරුම් ගෙන, මේ මාලිගාව දෙසට තමන්ගේ අත්
විදහාගෙන යම් යාච්ඤාවක් හෝ කන්නලව්වක් හෝ
ඔප්පු කළොත්, 39 ඔබේ වාසස්ථානය වන
ස්වර්ගයෙහි සිට එය අසා කමා වුව මැනව. සෑම
මනුෂ්‍යයෙකුගේ ම සිත් ඔබ පමණක් දන්න සේක;
ඔබ එකිනකොට ඔවුනොවුන්ට සුදුසු පරිදි ඉෂ්ට කර
දුන මැනව. 40 එවිට ඔබ අපේ පියවරුන්ට දුන්
දේශය මතුපිට ඔවුන් ජීවත් වන මුළු කාලයේ දී
ඔව්හු ඔබ කෙරෙහි ගරුබිය ඇති ව සිටින්නෝ ය.
41 "තවද, ඔබේ සෙනඟ වන ඉශ්‍රායලේ
ජාතිකයෙකු නොවෙන යම් විදේශිකයෙකු ඔබේ
උතුම් නාමය ද ප්‍රබල බාහුව හා දිගු කළ හස්තය ද
ගැන අසනු ඇත. 42 එසේ ඔබේ නාමය නිසා දුර
දේශයකින් පැමිණි විදේශිකයෙකු මේ මාලිගාව
දෙසට හැරී යාච්ඤා කළොත්, 43 ඔබේ සෙනඟ වන
ඉශ්‍රායලේවරුන් මෙන් මිහි පිට සියලු සෙනඟ ඔබේ
නාමය ඇඳිනගෙන ඔබ කෙරෙහි ගරුබිය පාන පිණිස
ද මා ගොඩනැඟුවාවූ මේ මාලිගාවට ඔබේ නාමය
තබා තිබෙන බව දැනගන්න පිණිස ද ඔබේ
වාසස්ථානය වන ස්වර්ගයෙහි සිට අසා විදේශිකයා
ඔබට කරන මුළු කන්නලව්ව ලෙස ඔහුට ඉටු කළ
මැනව.
44 "ඔබේ සෙනඟ තම සතුරන්ට විරුද්ධ ව යුද්ධ
කරන්නට ඔබ ඔවුන් යවන කොයි මාර්ගයෙන් වුවත්
ගොස්, ඔබ තෝරාගත් නගරය ද ඔබේ නාමයට මා

විසින් ගොඩනඟන ලද මාලිගාව ද දෙසට හැරී
සමිඳාණන් වහන්සේට යාච්ඤා කළොත්, 45 ඔබ
ස්වර්ගයේ සිට ඔවුන්ගේ යාච්ඤාව හා කන්නලව්ව
අසා ඔවුන්ට යුක්තිය ඉටු කළ මැනව.
46 "පව් නොකරන මනුෂ්‍යයෙක් නැත. එබැවින්
ඔවුන් ඔබට විරුද්ධ ව පව් කරන්නටත්, ඔබ ඔවුන්
කෙරෙහි උදහස් වී ඔවුන්ගේ සතුරන්ට ඔවුන් පාවා
දෙන්නටත්, ඔවුන් වහල්කමට ගන්න අය දුර හෝ
ළඟ හෝ ඇති සතුරන්ගේ දේශයට ඔවුන්
ගෙනයන්නටත් පුළුවන. 47 එවිට ඔවුන් වහලුන්
කොට ගෙනයනු ලැබූ දේශයේ දී ඔවුන් එය සිතට
ගෙන පසුතැවී සිත් හරවා ගෙන, ඔවුන් වහල්කමට
ගත් අයගේ දේශයේ දී ඔබට කන්නලව් කොට,
'අපි පව් කළෙමු; හිතුවක්කාරකමින් ද දුෂ්ටකමින් ද
ක්‍රියා කළෙමු'යි කියමින්, 48 ඔවුන් වහල්කමට
ගත් ඔවුන්ගේ සතුරන්ගේ දේශයේ දී තමන්ගේ
මුළු හෘදයෙන් ද මුළු සිතින් ද ඔබ දෙසට හැරී, ඔබ
ඔවුන්ගේ පියවරුන්ට දුන් ඔවුන්ගේ දේශය ද ඔබ
තෝරාගත් නගරය ද ඔබේ නාමයට මා
ගොඩනැඟුවාවූ මාලිගාව ද දෙස බලා, ඔබට
යාච්ඤා කළොත්, 49 ඔබේ වාසස්ථානය වන
ස්වර්ගයේ සිට ඔබ ඔවුන්ගේ යාච්ඤාව හා
කන්නලව්ව අසා ඔවුන්ට යුක්තිය ඉටු කළ මැනව.
50 ඔබට විරුද්ධ ව පව් කළ ඔබේ සෙනඟට ඔබට
විරුද්ධ ව කළ ඔවුන්ගේ සියලු අපරාධවලට කමා වී,
ඔවුන් වහල්කමට ගත් අය විසින් ඔවුන්ට අනුකම්පා
කරනු ලබන හැටියට ඔවුන්ට ඒ අයගෙන්
අනුකම්පාව ලබා දුන මැනව. 51 මන්ද, ඔව්හු ඔබ
විසින් මිසර දේශය වන යකඩ උදුනෙන් පිටතට
ගෙනෙන ලද ඔබේ සෙනඟත්, ඔබේ උරුමයත් ය.
52 "ඔබේ මෙහෙකරුවාගේ ද ඔබේ ඉශ්‍රායලේ
සෙනඟගේ ද කන්නලව්ව දෙස ඔබේ කන් යොමු
කළ මැනව. ඔවුන් ඔබෙන් ඉල්ලන සියල්ල ගැන
ඔවුන්ට ඇහුම්කන් දුන මැනව. 53 මන්ද, දෙවි
ස්වාමීන් වහන්ස, ඔබ අපේ පියවරුන් මිසරයෙන්
ගෙනා විට ඔබේ මෙහෙකරු වූ මෝසෙස් ලවා කතා
කරවූ ප්‍රකාරයට, ඔබට උරුමයක් කොට ඔබ ම මිහි
පිට සියලු මනුෂ්‍ය වර්ගයන්ගෙන් ඔවුන් වෙන්
කරගත් සේක."

## අවසාන යාච්ඤාව

54 සලමොන් රජ තමෙ සමිඳාණන් වහන්සේට මේ
මුළු යාච්ඤාව හා කන්නලව්ව ඔප්පු කර නිම කළ
විට, ඔහු උන් වහන්සේගේ පූජාසනය ඉදිරිපිට
ස්වර්ගය දෙසට තම අත් විදහාගෙන, දණ ගසා සිටි
තැනින් නැඟිට්ටේ ය. 55 තවද, ඔහු සිටගෙන මහත්
හඬින් ඉශ්‍රායලේවරුන්ගේ සභාවට ආශීර්වාද
කරමින් මෙසේ කී ය: 56 ද්වි.නී. 12:10; ජෝෂු
21:44-45"තමන් වහන්සේ පොරොන්දු වූ සියල්ල
හැටියට තමන් සෙනඟ වන ඉශ්‍රායලේවරුන්ට සාමය
දුන් සමිඳාණන් වහන්සේට ප්‍රශංසා වේ වා! උන්
වහන්සේ සිය මෙහෙකරු වූ මෝසෙස් ලවා
පොරොන්දු වූ සියලු යහපත් දේවලින් එක
පොරොන්දුවක් වත් හිස් නොවී ය. 57 අපේ දෙවි
සමිඳාණන් වහන්සේ අපේ පියවරුන් සමඟ වැඩ සිටි
ලෙස ම අප සමඟත් වැඩ සිටින සේක් වා! උන්
වහන්සේ අප අත් නොහරින සේක් වා! අප බැහැර
නොදමන සේක් වා! 58 එසේ උන් වහන්සේගේ
සියලු මාර්ගවල හැසිරෙන්නටත්, උන් වහන්සේ අපේ
පියවරුන්ට අණ කළ උන් වහන්සේගේ ආඥා ද
පණත් ද විනිශ්චයයන් ද පවත්වන්නටත් උන්
වහන්සේ අපේ සිත් තමන් වෙත නමාගන්න සේක්
වා! 59 තමන්ගේ මෙහෙකරුවාටත්, තම සෙනඟ වන
ඉශ්‍රායලේවරුන්ටත් දවසින් දවස වුවමනා වන ලෙස
යුක්තිය ඉෂ්ට කිරීමට සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි මා ඔප්පු කළ මේ කන්නලව්වේ වචන
දිවා රෑ දෙකෙහි අපේ දෙවි සමිඳාණන් වහන්සේ
සමීපයෙහි පවතී වා! 60 එවිට සමිඳාණන් වහන්සේ
දෙවියන් වහන්සේ බවත්, වෙන දෙවි කෙනෙකු නැති
බවත් මිහි පිට සියලු ජාතීහු දැනගන්නෝ ය.
61 එබැවින් උන් වහන්සේගේ පණත්වල හැසිර, උන්
වහන්සේගේ ආඥා පවත්වන හැටියට ඔබේ සිත්
අද දවසේ මෙන් දෙවි සමිඳාණන් වහන්සේ වෙත
මුළුමනින් ම යොමු වී පවතී වා!"

## දේව මාලිගාව කැප කිරීම

(2 වංශා 7:4-10)

62 රජ ද ඔහු සමඟ සියලු ඉශ්‍රායලේවරු ද
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි පූජා ඔප්පු කළෝ ය.
63 සලමොන් රජ සමිඳාණන් වහන්සේට ඔප්පු කළ
සහභාගිකමේ පූජා සඳහා ගොනුන් විසිදෙදහසක්
හා බැටළුවන් එක්ලක්ෂ විසිදහසක් පුද කළේ ය.
මෙසේ රජ ද සියලු ඉශ්‍රායලේ ජනයා ද සමිඳාණන්
වහන්සේගේ මාලිගාව කැප කළෝ ය. 64 එම
දවසේ රජ තමෙ සමිඳාණන් වහන්සේගේ මාලිගාව
ඉදිරිපිට තිබෙන මළුවේ ඇතුළු කොටස විශුද්ධ
කළේ ය. මන්ද, ඔහු දවන යාග පූජාව ද ආහාර
පූජාව ද සහභාගිකමේ පූජාවල තෙල් ද එහි ඔප්පු
කළ බැවිනි. එසේ කළේ, සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි තිබෙන ලෝකඩ පූජාසනය දවන යාග
පූජාව ද ආහාර පූජාව ද සහභාගිකමේ පූජාවල
තෙල් ද දැරීමට ඉඩ මදි වූ නිසා ය.
65 මෙසේ ඒ කාලයෙහි හමාත් නම් දුර්ගයට ඇතුළු
වන තැන පටන් මිසරයේ නයිල් ගඟ දක්වා
පළාත්වලින් පැමිණි විශාල පිරිසක් වන, සලමොන්
ඇතුළු සියලු ඉශ්‍රායලේවරු අප දෙවි සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි සත්දවසක් මංගල්‍ය පැවැත්වූ
හ. 66 අට වන දින ඔහු සෙනඟ යන්නට හැරියේ ය.
ඔව්හු රජුට ප්‍රශංසා කර, සමිඳාණන් වහන්සේ තම
මෙහෙකරු දාවිත්ටත්, තම සෙනඟ වන
ඉශ්‍රායලේවරුන්ටත් කළ සියලු යහපත ගැන
ප්‍රීතිමත් ව, සතුටු සිතින් තම ගෙවලට ගියෝ ය.

### දෙවියන් වහන්සේ සලමොන්ට යළි දර්ශනය වීම
(2 වංශා 7:11-22)

9 සලමොන් සමිඳාණන් වහන්සේගේ මාලිගාව
ද රාජ මාලිගාව ද ගොඩනඟා, තම ආසාව
පරිදි සාදන්නට කැමැති වූ සියල්ලත් සාදා නිම කළ
විට, 2 1 රාජා 3:5; 2 වංශා 1:7සමිඳාණන් වහන්සේ
ගිබ්යොන්හි දී ඔහුට දර්ශනය වූ ලෙස ම දෙ වන
වරටත් ඔහුට දර්ශනය වූ සේක. 3 උන් වහන්සේ
ඔහුට කතා කොට මෙසේ වදාළ සේක: "නුඹ මා
ඉදිරියෙහි ඔප්පු කළ නුඹේ යාච්ඤාවත්,
කන්නලව්වත් මම ඇසුවෙමි. නුඹ ගොඩනැඟුවාවූ
මේ මාලිගාවෙහි මාගේ නාමය සදහට ම පවතින
පිණිස එය විශුද්ධ කළෙමි. මාගේ නෙත ද සිත ද
නිරන්තරයෙන් මෙයෙට යොමු වී තිබෙන්නේ ය.
4 ඉතින්, නුඹේ පිය වූ දාවිත් හැසුරුණු පරිදි නුඹ මා
ඉදිරියෙහි සෘජු සිතක් ඇති ව ද අවංක ව ද
හැසිරෙමින්, මා නුඹට අණ කළ සියල්ල ප්‍රකාරයට
ඉටු කර, මාගේ පණත් ද විනිශ්චයයන් ද
පිළිපදින්නෙහි නම්, 5 1 රාජා 2:4ඉශ්‍රායලේ
සිංහාසනයෙහි හිඳින්නට නුඹට කෙනෙකේ නැති ව
යන්නේ නැත කියා මා නුඹේ පිය දාවිත්ට
පොරොන්දු වූ හැටියට, ඉශ්‍රායලේවරුන් කෙරෙහි
නුඹේ රාජ්‍යයේ සිංහාසනය සදහට ම ස්ථිර
කරන්නෙමි. 6 එහෙත්, නුඹලා ද නුඹලාගේ දරුවන් ද
මා වෙතින් ඉවත් ව ගොස්, මා විසින් නුඹලා
ඉදිරියෙහි තබන ලද මාගේ ආඥා හා පණත්
නොපවත්වා අන් දෙවිවරුන් වෙත ගොස්, ඔවුන්ට
වැඳුම්පිදුම් කර නමස්කාර කළොත්, 7 මම
ඉශ්‍රායලේවරුන්ට දුන් දේශයෙන් ඔවුන්
නෙරපාදමන්නෙමි. මාගේ නාමය සඳහා මා විශුද්ධ
කළ මේ මාලිගාවත් මාගේ ඇස් හමුයෙන් පහකර
දමන්නෙමි. ඉශ්‍රායලේවරුන් ද සියලු ජාතීන් අතර
සමච්චලයක් හා උපහාසයක් වනු ඇත. 8 2 රාජා
25:9; 2 වංශා 36:19මේ මාලිගාවේ නටබුන් ගොඩ
ළඟින් යන සියල්ලන් විස්මයට පත් ව, කවටකම්
කර, 'සමිඳාණන් වහන්සේ මේ දේශයටත්, මේ
මාලිගාවටත් මෙසේ කළේ මන්දැ'යි අසනු ඇත.
9 එවිට මිනිස්සු උත්තර දෙමින්, 'ඔවුන් තමන්ගේ
පියවරුන් මිසර දේශයෙන් ගෙනා තමන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේ අත්හැර, අන් දෙවිවරුන්ට
ඇලුම් ව, ඔවුන්ට නමස්කාර කොට, වැඳුම්පිදුම් කළ
නිසා සමිඳාණන් වහන්සේ මේ සියලු විපත් ඔවුන්
පිට පැමිණවූ සේකැ'යි කියන්නෝ ය."

### හීරාම් රජු සමඟ ගිවිසුම
(2 වංශා 8:1-2)

10 සලමොන් රජ සමිඳාණන් වහන්සේගේ
මාලිගාව සහ රජ මාලිගාව යන මාලිගා දෙක
ගොඩනැඟීමට ගත කළ විසි අවුරුද්දට පසු, 11 ඔහු
රිසි පරිදි ඔහුට කිහිරි ලී ද දේවදාර ලී ද රත්රන් ද
සපයා දුන් තීර්හි හීරාම් රජු හට ගලීල දේශයෙහි
නගර විස්සක් දුන්නේ ය. 12 හීරාම් ද සලමොන්
තමාට දුන් නගර බලන්නට තීර්හි සිට ඇවිත් ඒවා
ගැන සතුටු නොවී, 13 "මාගේ සහෝදරය, ඔබ මට
දුන් මේ නගර මොනවා දැ"යි කියා ඒවාට 'කාබුල්
රට ය'යි නම් තැබුවේ ය. ඒ නම අද දක්වා ම
පවතී. 14 හීරාම් රන් කිලෝග්රෑම් හාරදාහක් රජුට
එවී ය.

### මාලිගාව සඳහා රාජකාරි වැඩ ගැනීම
(2 වංශා 8:3-18)

15 සලමොන් රජු රාජකාරියට මිනිසුන් ගත්තේ,
සමිඳාණන් වහන්සේගේ මාලිගාව ද තම මාලිගාව ද
මිල්ලෝ නම් ස්ථානය ද ජෙරුසලමේ පවුර ද
හාශෝර්, මගිද්දෝ සහ ගෙශෙර් යන නගර ද
ගොඩනැඟීම සඳහා ය. 16 මිසරයේ රජ වූ පාරාවෝ
අවුත් ගෙශෙර් නම් නගරය අල්ලාගෙන, එය ගිනිබත්
කොට, ඒ නගරයේ විසූ කානානිවරුන් මරා එය
සලමොන් රජුගේ බිරිඳ වන තම දුවට දායාදයක්
කොට දී තිබිණි. 17 සලමොන් රජ ගෙශෙර් ද පහළ
බෙත්-හොරොන් ද 18 බාලාත් ද රට තුළ වූ
පාළුකරයෙහි තාමාර් ද 19 තමන් සතු සියලු ගබඩා-
නගර ද රථවලට නගර ද අසරුවන්ට නගර ද
ජෙරුසලමෙහිත්, ලෙබනොන්හිත්, තමාගේ රජයට
අඩංගු වූ මුළු දේශයෙහිත් තමන් රිසි පරිදි
ගොඩනඟනු කැමැති සියල්ල ද ගොඩනැඟුවේ ය.
20 ඉශ්‍රායලේවරුන් අතින් විනාශ නොවූ,
ඉශ්‍රායලේවරුන්ට මුළුමනින් ම විනාශ කර දමන්නට
බැරි වූ අමෝරිවරුන්ගෙන් ද හිත්තීවරුන්ගෙන් ද
පෙරිස්සිවරුන්ගෙන් ද හිව්වරුන්ගෙන් ද
ජෙබුසිවරුන්ගෙන් ද ඉතිරි වූ සියලු ජාතීන්ට පසු ව,
21 දේශයෙහි ඉතිරි ව සිටි ඔවුන්ගේ ජනයාගෙන්
සලමොන් රජ අද දවස දක්වා රාජකාරියට වහලුන්
ගණනාවක් ගත්තේ ය. 22 එහෙත්, සලමොන්
ඉශ්‍රායලේ ජනයා අතරෙන් කිසිවකු වහලකු
කොට නොගත්තේ ය. ඔව්හු වනාහි යුද්ධ භටයන්
ව, ඔහුගේ සේවකයන් ව, අධිපතියන් ව,
සෙනෙපතියන් ව, ඔහුගේ රථ කෙරෙහි ද අසරුවන්
කෙරෙහි ද ප්‍රධානියන් ව සිටියෝ ය.
23 සලමොන්ගේ වැඩ බලාගත්, වැඩ කළ සෙනඟ
පාලනය කළ ප්‍රධාන නිලධාරීහු පන්සිය
පණස්දෙනෙකේ වූ හ. 24 පාරාවෝගේ දුව දාවිත්ගේ
නුවර සිට සලමොන් විසින් ඇය උදෙසා ගොඩනඟන
ලද ඇගේ මාලිගාවට පැමිණියා ය. ඉන්පසු ඔහු
මිල්ලෝ නම් ස්ථානය ගොඩනැඟී ය.
25 නික්ම 23:17; 34:23; ද්වි.නී. 16:16 සලමොන්
තමා සමිඳාණන් වහන්සේට ගොඩනැඟුවාවූ
පූජාසනය පිට අවුරුද්දට තුන්වරක් දවන යාග පූජා
හා සහභාගිකමේ පූජා ද උන් වහන්සේ ඉදිරියෙහි
තිබුණු පූජාසනය පිට සුවඳ දුම් ද ඔප්පු කළේ ය.
මෙසේ ඔහු මාලිගාව සාදා නිම කළේ ය.
26 සලමොන් රජ ඒදොම් දේශයෙහි රතු මුහුද
අද්දර ඒලෝත් ළඟ පිහිටි එශියොන්-ගෙබෙර්හි නැව්
කණ්ඩායමක් සෑදවී ය. 27 හීරාම් රජ ද මුහුදේ තතු
දන්න නාවිකයන් වන තම සේවකයන් සලමොන්ගේ
සේවකයන් සමඟ ඒ නැව්වල යැවී ය. 28 ඔව්හු

ඕෆීර් නම් දේශයට ගොස් එතැනින් රන්
කිලෝග්රෑම් දාහතරදාහක් සලමොන් රජු වෙත
ගෙනෙහ.

### ෂෙබාහි රැජිනගේ පැමිණීම

(2 වංශා 9:1-12)

10 මතෙ 12:42; ලූක් 11:31 ෂෙබාහි රැජින
සමිඳාණන් වහන්සේගේ නාමයේ හේතුවෙනේ
සලමොන් රජු ලත් කීර්තිය ගැන අසා දුෂ්කර
ප්රශ්නවලින් ඔහු පිරික්සන පිණිස පැමිණියා ය.
2 ඕතොමෝ ඉතා විශාල පිරිවරක් ද සුවඳ ද්රව්ය
සහ රත්රන් රාශියක් ද මැණික් ගල් පටවන ලද
ඔටුවන් ද ඇති ව ජෙරුසලමට සැපත් වූවා ය. ඇය
සලමොන් වෙත ගොස් තම සිතේ තිබූ සියල්ල ගැන
ඔහු සමඟ කතා කළා ය. 3 සලමොන් ද ඇගේ
සියලු ප්රශ්න ඇට විසඳා කී ය. ඇට තේරා දිය
නොහැකි වූ කිසි ප්රශ්නයක් රජුට නො වී ය;
කිසිවක් ඔහුගෙනේ සැඟවී තිබුණේ නැත. 4 ෂෙබාහි
රැජින සලමොන්ගේ මහා ප්රඥා මහිමය ද ඔහු
ගොඩනැඟුවාවූ මාලිගාව ද 5 ඔහුගේ මේසයේ
ආහාර ද ඔහුගේ නිලධාරීන් අසුන් ගන්නා ආකාරය
ද ඔහුගේ මෙහෙකරුවන් සේවයෙහි නිරත වන
අන්දම ද සේවකයන් ලා සිටි අනගි ඇඳුම් ද ඔහුගේ
කුසලාන දරන්නන් ද ඔහු විසින් සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ පුද කරන ලද පූජා ද දුටු
කල තුෂ්ණිම්භූත වූවා ය. 6 එවිට ඈ රජුට කතා
කොට, “මාගේ දේශයේ දී ඔබේ ක්රියා හා ඔබේ
ප්රඥාව ගැන මා ඇසූ ආරංචි සැබෑ ය. 7 එහෙත්,
මම අවුත් මාගේ ඇසින් දකින තෙක් ඒ වචන
විශ්වාස නොකෙළෙමි. සැබැවින් ම අඩක් වත් මට
නොකියන ලද්දේ ය. ඔබේ ප්රඥා මහිමයත්,
සෞභාග්යයත් මා ඇසූ කීර්තියේ ප්රමාණයටත් වඩා
උසස් ව තිබේ. 8 ඔබේභාර්යාවෝ වාසනාවන්තියෝ
ය. නිතර ම ඔබ ඉදිරියෙහි ඔබේ ප්රඥාව අසන
මේ ඔබේ සේවකයෝ වාසනාවන්තයෝ ය.
9 ඉශ්රායලේවරුන්ගේ සිංහාසනය පිට ඔබ පත්
කරන පිණිස ඔබ කෙරෙහි ප්රසන්න වූ ඔබේ දෙවි
සමිඳාණන් වහන්සේට ප්රශංසා වේ වා! සමිඳාණන්
වහන්සේ සැම කල්හි ම ඉශ්රායලේවරුන්ට ප්රේම
කළ බැවින් විනිශ්චයත්, යුක්තියත් ඉෂ්ට කරන්නට
උන් වහන්සේ ඔබ රජ කොට පත් කළ සේකැ”යි
කීවා ය.
10 තවද, ඈ රන් කිලෝග්රෑම් හාරදහසක් ද සුවඳ
ද්රව්ය මහත් රාශියක් ද මැණික් ගල් ද රජුට දුන්නා
ය. ෂෙබාහි රැජින සලමොන් රජුට දුන් ඒ සුවඳ
ද්රව්ය හා සමාන කළ හැකි සුවඳ ද්රව්ය තවත්
නොලැබුණේ ය.
11 ඕෆීර් දේශයේ සිට රත්රන් ගෙනෙ හීරාම්ගේ
නැව්වලින් හඳුන් ලී මහත් රාශියක් හා මැණික් ගල්
ඕෆීර් දේශයෙනේ ගෙනෙනෙ ලදී. 12 රජ ඒ හඳුන්
ලීවලින් සමිඳාණන් වහන්සේගේ මාලිගාවටත්, රජ
මාලිගාවටත් ගරාදි වැටවල් සහ ගායකයන්ට වීණා ද
කුඩා වීණා ද සෑදවී ය. ඒ ආකාර හඳුන් ලී අද දවස
දක්වා තවත් ගෙනොවේ වත්, දකින්න ලැබුණේ වත්
නැත.
13 සලමොන් රජ ස්වකීය රාජකීය
ත්යාගිවන්තකමනේ ෂෙබාහි රැජිනට දුන් දේවල්
හැර ඈ හිතූ පැතූ සියල්ලත් ඇයට දුන්නේ ය.
ඉක්බිති ඇය සහ ඇගේ සේවක පිරිස සිය රට බලා
හැරී ගියෝ ය.

### රජුගේ යසඉසුරු

(2 වංශා 9:13-29)

14 සලමොන් රජුට අවුරුද්දකට ලැබුණු රන්වල බර
කිලෝග්රෑම් තුන්දාහකි. 15 මෙයෙ ලැබුණේ, බඩු
හුවමාරු කරගන්නන්ගෙනේ ද වෙළෙඳුන්ගේ
වෙළෙඳාමෙනේ ද අරාබියේ සියලු රජවරුන්ගෙනේ ද
දේශයේ ආණ්ඩුකාරයන්ගෙනේ ද ලැබුණු රන්වලට
අමතරව ය.
16 සලමොන් රජ තමෙ තැළූ රන් පලිස් දසෙයයක්
සෑදී ය. එක එක පලිහ සෑදීමට තැළූ රන්
කිලෝග්රෑම් හතක් යොදන ලදී. 17 ඔහු කුඩා පලිස්
තුන්සියයකුත් තැළූ රනින් සෑදුවේ ය. එක එක කුඩා
පලිහ සෑදීමට රන් කිලෝග්රෑම් තුනක් යොදන ලදී.
රජ තමෙ ලබෙනොන් ආරණ්යය නම් ශාලාවේ ඒවා
තැබී ය.
18 තවද, රජ ඇත් දත්වලින් මහා සිංහාසනයක්
සාදා තනිකර රනින් එය වැසී ය. 19 සිංහාසනයට
පඩි හයක් තිබිණි. සිංහාසනයේ මුදුනට පිටුපසින්
ගවහිස් සාදා තිබිණි. වාඩි වන ආසනය දපෙත්තේ
අත්ඇඳි සහ අත්ඇඳි ළඟ සිටගත් සිංහ රූප දකෙක් ද
විය. 20 පඩි හය පිට දපෙත්තේ සිටගත් සිංහ රූප
දොළොසක් විය. එයාකාර සිංහාසනයක් කිනම්
රාජ්යයක වත් නොතිබිණි.
21 සලමොන් රජුගේ පාන පාත්ර සියල්ල ම රනින්
විය. ලබෙනොන් ආරණ්ය ශාලාවේ සියලු භාජනත්
තනි රනින් විය. කිසිවක් රිදීයනේ නො වී ය. රිදී
වනාහි සලමොන් රජුගේ කාලයේ දී අගය කොට
නොසලකන ලදී. 22 මන්ද, මුහුදු යාත්රා කරන
හීරාම්ගේ නැව් කණ්ඩායම සමඟ වෙළෙඳ නැව්
කණ්ඩායමක් රජුට විය. ඒ වෙළෙඳ නැව්වලින් රන් ද
රිදී ද ඇත් දත් ද වඳුරන් හා රිළවුන් ද තුන්
අවුරුද්දකට වරක් ගෙනොවේ ය.
23 මෙසේ සලමොන් රජ ධනසම්පතින් හා
ප්රඥාවනේ මිහි පිට සියලු රජුන්ට වඩා ශ්රේෂ්ඨ ව
සිටියේ ය. 24 දෙවියන් වහන්සේ සලමොන්ගේ
සිතේ නිදන් කළ ඔහුගේ ප්රඥාව අසන පිණිස
සකල දේශවාසීහු ඔහු වෙත පැමිණියෝ ය.
25 ඔව්හු අවුරුද්දනේ අවුරුද්ද තම තමන්ගේ තෑගි
වන රිදී භාජන, රන් භාජන, වස්ත්ර, යුද්ධායුධ, සුවඳ
ද්රව්ය, අශ්වයන් හා කොටළුවන් ගෙනොවෝ ය.
26 1 රාජා 4:26 සලමොන් රජ අශ්ව රථ සහ
අසරුවන් ද එකතු කරගත්තේ ය. ඔහුට අශ්ව රථ
එක්දහස් හාරසියයක් තිබිණි. අසරුවෝ
දොළොස්දහසක් සිටියෝ ය. රජ ඒවා රථ සඳහා
සෑදූ නගරවල ද තමා ළඟ ජෙරුසලමේ ද තැබී ය.
27 ද්වි.නී. 17:17තවද, රජ ජෙරුසලමෙහි වූ රිදී ගල්

මනේ ද, කිහිරි ගස්, මීටියාවතයේ වූ අත්තික්කා ගස්
මනේ ද, ගණනින් වැඩි වන්නට සැලැස්වී ය.
28 ද්වි.නී. 17:16සලමොන්ට සිටි අශ්වයෝ මීසරයනේ
ගනෙන ලද්දෝ ය. රජුගේ වළෙනේදෝ උන් මීසර
දේශයනේ නියම මිලකට ලබාගත්හ. 29 අශ්ව
රථයක් රිදී කාසි හයසියයකටත්, අශ්වයකු එකසිය
පණහකටත් මීසර දේශයනේ ගනෙවුත් විකුණන්නට
යදෙනි. රජුගේ වළෙනේදෝ හිත්තීවරුන්ගේ සියලු
රජුන්ටත්, සිරියාවේ රජුන්ටත් එලසෙ ම ගනෙවුත්
දුන්නෝ ය.

## සලමොන් රජු පාපයට වැටීම

11 ද්වි.නී. 17:17 සලමොන් රජ බොහෝ
විජාතික ස්ත්‍රීන්ට ඇනම්, පාරාවෝගේ දුව
ඇතුළු මෝවබ්වරුන්ගේ ද අම්මොන්වරුන්ගේ ද
ඒදෝම්වරුන්ගේ ද සීදොන්වරුන්ගේ ද
හිත්තීවරුන්ගේ ද කාන්තාවන් වන බොහෝ විජාතික
ස්ත්‍රීන්ට ඇළුම් ව සිටියේ ය. 2 නික්ම 34:16; ද්වි.නී.
7:3-4'සැබැවින් ම ඔවුන් නුඹලාගේ සිත් ඔවුන්ගේ
දවේවරුන් වතෙ හරවන බැවින් නුඹලා ඔවුන් අතරට
නොයා යුතු ය; ඔවුන්ට නුඹලා අතරට එන්නට ඉඩ
නොදිය යුතු ය'යි සමිඳාණන් වහන්සේ ඉශ්‍රායලේ
ජනයාට යම් යම් ජාතීන් ගැන වදාළ සේක් ද, ඒ ඒ
ජාතීන්ට සලමොන් රජ ස්නේහයනේ ඇළුම් වූයේ ය.
3 ඔහුට රාජකීය, වංශවත්, භාර්යාවෝ සත්සියයක්
හා උපභාර්යාවෝ තුන්සියයක් සිටියෝ ය. ඒ
භාර්යාවෝ ඔහුගේ සිත නොමඟ යැවූ හ. 4 එසේ
ය, සලමොන් මහලු වූ කල ඒ භාර්යාවෝ ඔහුගේ
සිත අන් දවේවරුන් වතෙ හැරවූවෝ ය. ඔහුගේ
සිත තමාගේ පිය දාවිත්ගේ සිත මනේ තමාගේ
දවේ සමිඳාණන් වහන්සේ කරෙහි විශ්වාසී ව
නොතිබුණේ ය. 5 මන්ද, සලමොන් සීදොන්වරුන්ගේ
දේවතාවිය වූ අෂ්ටාරොත් හා අම්මොන්වරුන්ගේ
පිළිකුල සහිත මිල්කොම් අනුව ගොස්, 6 සමිඳාණන්
වහන්සේගේ ඇස් හමුයහෙි නපුරු දේ කළෙේ ය.
ඔහු තමාගේ පිය දාවිත් මනේ සමිඳාණන් වහන්සේ
අනුව මුළු සිතින් ගමන් කළෙේ නැත. 7 එකල
සලමොන් ජරේුසලම ඉදිරියහෙි වූ කන්ද මත
මෝවබ්වරුන්ගේ පිළිකුල් කටයුතු කමෙොෂ්
දේවතාවාටත්, අම්මොන්වරුන්ගේ පිළිකුල් කටයුතු
මොලකේ දේවතාවාටත් ගිරිකුළු දේවාලයක්
ගොඩනැඟී ය. 8 තම තමන්ගේ දවේවරුන්ට සුවඳ
දුම් සහ පූජා ඔප්පු කළ තමාගේ සියලු විජාතික
භාර්යාවන්ටත් ඔහු එසේ ම සාදා දුන්නේ ය.
9 මෙසේ සලමොන් තමාට දවෙරක් දර්ශනය වූ
ඉශ්‍රායලේවරුන්ගේ දවේ සමිඳාණන් වහන්සේ
කරෙනේ තම සිත අහක් කරගත් බැවින් සමිඳාණන්
වහන්සේ ඔහු සමඟ උදහස් වූ සේක. 10 අන්
දවේවරුන් පසුපස නොයෙන ලසෙ තමාට අණ කළ
සමිඳාණන් වහන්සේ ඔහුට අණ කළ දේට ඔහු
කීකරු වූයේ නැත. 11 එබැවින් සමිඳාණන් වහන්සේ
සලමොන්ට කතා කොට, "නුඹ මාගේ ගිවිසුම ද මා
නුඹට අණ කළ මාගේ ආඥා ද නොපෙවත්වා මෙසේ
කළ බැවින් සැබැවින් ම රාජ්‍යය නුඹනේ උදුරා නුඹේ
මහෙකෙරුවාට දනේනමේ. 12 එහතේ, නුඹේ පිය
දාවිත් නිසා මම නුඹේ කාලයේ දී එය නොකොට,
නුඹේ පුත්‍රයාගේ අතින් එය පැහැර ගන්නමේ.
13 තවද, මුළු රාජ්‍යය පැහැර නොගනෙ මාගේ
මහෙකෙරු වූ දාවිත් නිසාත්, මා තෝරාගත්
ජරේුසලම නිසාත් නුඹේ පුත්‍රයාට එක ගෝත්‍රයක්
දනේනමේ"යි වදාළ සේක.

## රජුගේ විරුද්ධවාදීහු

14 සමිඳාණන් වහන්සේ සලමොන් රජු හට
විරුද්ධකාරයකු කොට ඒදෝම් ජාතික හදද් නම්
තැනැත්තා එවූ සේක. ඔහු ඒදෝම් රාජ වංශයේ
කනෙකෙි. 15 දාවිත් ඒදෝමෙහි සිටිය දී ඒදෝමෙහි
සියලු පිරිමින් මරාදැමූ පසු, මැරුම්කෑ තැනැත්තන්
භූමදාන කරන පිණිස සනේපති ජෝවාබ් ගිය කල
මසේ විය. 16 එනම්, ජෝවාබ් හා සියලු
ඉශ්‍රායලේවරු ඒදෝමෙහි සියලු පිරිමින් මරා දමන
තුරු එහි හය මාසයක් නැවතී සිටියෝ ය. 17 එහතේ,
හදද් සහ ඔහු සමඟ ඔහුගේ පියාගේ
සේවකයන්ගනේ ඒදෝමෙහි සමහර මනුෂ්‍යයෝ
මීසරයට යන පිණිස පලා ගියෝ ය. මකෙල හදද්
කුඩා ළමයකෙි. 18 ඔව්හු මිදියන් දේශයනේ පිටත් ව
පාරාන් දේශයට පැමිණ, පාරාන් දේශයනේ මිනිසුන්
කැඳවාගනෙ, මීසරයේ රජ වූ පාරාවෝ වතෙ
මීසරයට ගියෝ ය. රජ තමෙ ඔහුට වාසස්ථානයක්
දී, ආහාර පාන නියම කොට, ගම්බිම් ද දුන්නේ ය.
19 පාරාවෝ හදද් කරෙහෙි ඉතා ප්‍රසන්න ව සිටි
බැවින් තම බිරිඳගේ සහෝදරී වන තාපනෙසේ
රැජිනගේ සහෝදරී ඔහුට බිරිඳ කොට දුන්නේ ය.
20 තාපනෙසේ රැජිනගේ සහෝදරී ඔහුගනේ
ගනුෙබත් නම් පුත්‍රයා ලැබුවා ය. තාපනෙසේ
පාරාවෝගේ මාලිගාවේ දී ඔහු ඇතිදැඩි කළා ය.
ගනුෙබත් පාරාවෝගේ මාලිගාවහෙි පාරාවෝගේ
පුත්‍රයන් අතර ජීවත් විය.
21 දාවිත් රජු මියගිය බවත්, ජෝවාබ් සනේපති
මළ බවත් හදද් මීසරයේ දී අසා, "මාගේ රටට
යන්නට මා හැරිය මැනව"යි පාරාවෝට කී ය.
22 එවිට පාරාවෝ ඔහුට කතා කොට, "ඔබේ රටට
යන්න හදන්නේ මා ළඟ ඔබට මොන හිඟයක් නිසා
දැ"යි ඇසී ය. "හිඟයක් නැත, එහතේ, කසෙේ වුව ද
මට යන්නට අවසර දුන මැනව"යි ඔහු උත්තර දිනි.
23 දවේයන් වහන්සේ ඔහුට තවත් විරුද්ධකාරයකු
එවූ සේක. එනම්, තම ස්වාමීන් වූ ශෝබායේ රජ වූ
හදද්-එශරේ වතෙින් පලා ගිය එලියාදාගේ පුත්‍ර වූ
රශෙොන් ය. 24 දාවිත් ශෝබායේ මිනිසුන් මරාදමන
කල ඔහු තමා ළඟට මිනිසුන් කීප දනෙකු රැස්
කරගනෙ මංකොල්ලකාර හමුදාවක අධිපතියා විය.
ඔව්හු දමස්කයට ගොස් එහි වාසය කරමින්
දමස්කයහෙි රජකම් කළෝ ය. 25 හදද් කළ අනතුර
හැර සලමොන්ගේ මුළු කාලයේ දී ම ඔහු
ඉශ්‍රායලේවරුන්ට සතුරකු ව සිට, ඉශ්‍රායලේවරුන්
පිළිකුල් කොට ඒදෝමේරටේ රජකම් කළෙේ ය.

### දෙවියන් වහන්සේ ජෙරොබෝවම්ට දුන් පොරොන්දුව

26 ශෙරේදායේ එප්‍රායිම් ජාතිකයෙකු වූ
නබොත්ගේ පුත්‍ර වූ ද සලමොන්ගේ සේවකයෙකු
වූ ද ජෙරොබෝවම්, රජුට විරුද්ධ ව කැරලි ගැසී ය.
වැන්දඹු ස්ත්‍රියක ව සිටි ඔහුගේ මවගේ නම
ශෙරූවා ය. 27 ඔහු රජුට විරුද්ධ ව කැරලි ගැසුවේ
මෙලෙසෙ ය: සලමොන් මිල්ලෝ ගොඩනඟමින් ද තම
පිය දාවිත්ගේ නුවර ප්‍රාකාරයේකැඩුම්බිඳුම්
ප්‍රතිසංස්කරණය කරමින් ද සිටියේ ය.
28 ජෙරොබෝවම් බලසම්පන්න මනුෂ්‍යයෙකි.
සලමොන් ඒ තරුණයා කඩිසර කෙනෙකු බව දැක
ජෝසෙප්ගේ ගෝත්‍රයට නියම වූ වහල් වැඩ
සියල්ල කෙරෙහි ඔහු පත් කළේ ය. 29 ඒ කාලයේ
දී ජෙරොබෝවම් ජෙරුසලමෙන් පිටතට යන කල,
අලුත් සළුවක් පොරවාගෙන සිටි ශිලෝහි අහියා නම්
දිවැසිවරයාට ඔහු මඟ දී සම්බ විය. ඒ දෙදෙනා
පමණක් කෙතෙහි සිටියෝ ය. 30 අහියා තමා ඇඳ
සිටි අලුත් සළුව ගෙන කැලි දොළොසකට ඉරා,
31 ජෙරොබෝවම්ට කතා කොට මෙසේ කී ය: “ඔබ
කැලි දහයක් ගන්න, මන්ද, ඉශ්‍රායලේවරුන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක, ‘මම
සලමොන්ගේ රාජ්‍යය පැහැරගෙන ඔබට ගෝත්‍ර
දසයක් දෙන්නෙමි. 32 එක ගෝත්‍රයක් මාගේ
මෙහෙකරු දාවිත් නිසාත්, ඉශ්‍රායලේවරුන්ගේ සියලු
ගෝත්‍රවලින් මා විසින් තෝරාගන්න ලද නුවර වන
ජෙරුසලම නිසාත් ඔහුට වන්නේ ය. 33 මා මෙසේ
කරන්නේ, සලමොන් ඔහුගේ පිය වූ දාවිත් මෙන්
මාගේ ඇස් හමුවෙහි හරි දේ ද මාගේ පණත් ද
විනිශ්චයයන් ද ඉෂ්ට නොකරමින්, මාගේ මාර්ගවල
නොහැසිර, මා අත්හැර සීදොන්වරුන්ගේ දේවතාවිය
වූ අෂ්ටාරොත්ට ද මෝවබ්වරුන්ගේ දේවතාවා වූ
කෙමොෂ්ට ද අම්මොන්වරුන්ගේ දේවතාවා වූ
මිල්කොම්ට ද නමස්කාර කළ නිසා ය. 34 එහෙත්,
මම මුළු රාජ්‍යය ඔහුගේ අතින් නොගෙන මා විසින්
තෝරාගන්න ලද, මාගේ ආඥා හා පණත් රක්ෂා
කළ, මාගේ මෙහෙකරු වූ දාවිත් නිසා ඔහුගේ මුළු
ජීවිත කාලය තුළ අධිපති ව සිටින්න ඔහුට ඉඩ
හරින්නෙමි. 35 එහෙත්, ඔහුගේ පුත්‍රයා අතින්
රාජ්‍යය ගෙන ගෝත්‍ර දහයක් ඔබට දෙන්නෙමි.
36 මාගේ නාමය තබන්නට මා විසින් තෝරාගන්න
ලද නගරය වන ජෙරුසලමේ මාගේ මෙහෙකරු වූ
දාවිත්ගේ වංශයෙන් පැවතෙන්නෙකු මා ඉදිරියෙහි
සිටින පිණිස මම ඔහුගේ පුත්‍රයාට එක
ගෝත්‍රයක් දෙන්නෙමි. 37 නුඹ කැමැති සියල්ල
කෙරෙහි නුඹ රජකම් කරමින් ඉශ්‍රායලේවරුන්ගේ
රජ වන පිණිස නුඹ පිළිගන්නෙමි. 38 මාගේ
මෙහෙකරු වූ දාවිත් කළ පරිදි නුඹ මාගේ ආඥා හා
පණත් රක්ෂා කරමින්, මා නුඹට අණ කරන
සියල්ලට ඇහුම්කන් දී, මාගේ මාර්ගවල හැසිර
මාගේ ඇස් හමුයෙහි හරි දේ කරන්නෙහි නම්, මම
නුඹ සමඟ සිට දාවිත්ට ස්ථිර වූ පෙළපතක්
ගොඩනඟා දුන් ලෙසෙ නුඹටත් ගොඩනඟා දී
ඉශ්‍රායලේවරුන් නුඹට භාර දෙන්නෙමි. 39 මෙලෙසෙ
සලමොන්ගේ පාපය නිසා දාවිත්ගේ වංශයට පීඩා
කරන්නෙමි. එහෙත්, එය සදහට ම නොවෙනු ඇත.’ ”
40 මේ නිසා සලමොන් ජෙරොබෝවම් මරන්නට
සෙවී ය. එහෙත්, ජෙරොබෝවම් පිටත් වී මිසරයේ
රජු වූ ෂීෂක් වෙතෙ මිසරයට පලා ගොස්
සලමොන්ගේ මරණය දක්වා එහි සිටියේ ය.

### සලමොන් රජුගේ මරණය
(2 වංශා 9:29-31)

41 සලමොන්ගේ ජීවිතයේ සෙසු කරුණු ද ඔහු
කළ සියල්ල ද ඔහුගේ ප්‍රඥාව ගැන ද
සලමොන්ගේ ක්‍රියා සඳහන් ඉතිහාස ග්‍රන්ථයේ
ලියා නොතිබේ ද? 42 සලමොන් ජෙරුසලමේ මුළු
ඉශ්‍රායලේ දේශයෙහි රජකම් කළ කාලය සතළිස්
අවුරුද්දකි. 43 ඔහු මරණයට පත් වූ පසු තම පිය
දාවිත්ගේ නුවර භූමදාන කරන ලදී. ඔහුගේ පුත් වූ
රෙහොබෝවම් ඔහු වෙනුවට රජ විය.

### රෙහොබෝවම් රජුගේ අනුවණ තීරණය
(2 වංශා 10:1-19)

12 රෙහොබෝවම් ෂෙකෙමේ නම් ස්ථානයට
ගියේ ය. මන්ද, ඔහු රජ කොට පත් කරන
පිණිස සියලු ඉශ්‍රායලේවරුන් ෂෙකෙමේට පැමිණි
බැවිනි. 2 තවද, සලමොන් රජු කෙරෙන් පලා ගොස්
මිසර දේශයෙහි වාසය කළ නබොත්ගේ පුත්
ජෙරොබෝවම් මිසරයෙහි සිටිය දී ම ඒ බව ඔහුට
සැළ විය. 3 මිනිස්සු පණිවුඩයක් යවා ඔහු
ගෙන්වාගත්හ. 4 ජෙරොබෝවම් හා මුළු ඉශ්‍රායලේ
සභාව පැමිණ, රෙහොබෝවම්ට කතා කොට, “ඔබේ
පියාණෝ අප පිට බර වියගහක් තැබූ හ. එබැවින්
ඔබේ පියාණන් පැවරූ දුෂ්කර සේවය ද ඔහු අප පිට
තැබූ බර වියගහ ද සැහැල්ලු කළ මැනව. එවිට අපි
ඔබට සේවය කරන්නෙමු”යි කීවෝ ය.
5 “ඔබ ගොස් තුන් දවසකින් මා ළඟට නැවත
එන්නැ”යි ඔහු ඔවුන්ට කී විට සෙනඟ පිටත් ව
ගියහ.
6 රෙහොබෝවම් රජ තම පිය සලමොන් ජීවත් ව
සිටිය දී ඔහුට උපදෙස් දුන් ප්‍රජා මූලිකයන් සමඟ
මන්ත්‍රණය කරමින්, “මේ සෙනඟට උත්තර දෙන
පිණිස ඔබ මට දෙන දැනුමැතිකම කුමක් දැ”යි ඇසී
ය.
7 ඔව්හු ද පිළිතුරු දෙමින්, “ඔබ අද මේ සෙනඟට
සේවකයෙකු වී, ඔවුන්ට සේවය කොට, ප්‍රිය
වචනයෙන් ඔවුන්ට කතා කරමින් උත්තර දෙන්නෙහි
නම්, ඔවුන් සෑම කල්හි ඔබේ සේවකයන් වනු
ඇතැ”යි කී හ.
8 එහෙත්, ප්‍රජා මූලිකයන් ඔහුට දුන් දැනුමැතිකම
ඔහු අත්හැර, තමා සමඟ වැඩුණු තමන්ට උපදේශ
දුන් තරුණයන් සමඟ මන්ත්‍රණය කරමින්, 9 ඔවුන්ට
කතා කොට, “ ‘ඔබේ පියාණන් අප පිට තැබූ
වියගහ සැහැල්ලු කළ මැනව’යි මට කී සෙනඟට මා

උත්තර දෙන පිණිස ඔබ මන්ත්‍රණය කර කියන්නේ
කුමක් දැ"යි ඔවුන්ගෙන් ඇසී ය.
10 ඔහු සමඟ වැඩුණු තරුණයෝ ඔහුට කතා
කොට, " 'ඔබේ පියාණෝ අප පිට බර වියගහක්
තැබූ හ. එහෙත්, ඔබ එය අපට සැහැල්ලු කළ
මැනව'යි ඔබට කී මේ සෙනඟට ඔබ මෙසේ කිව
යුතු ය: 'මාගේ පියාණන්ගේ තුනටියට වඩා මාගේ
සුළැඟිල්ල ලොකු ය. 11 එසේ ය, මාගේ පියාණෝ
ඔබ පිට බර වියගහක් තැබූ හ. මම වනාහි ඔබේ
වියගහ තව වඩා බර කරන්නෙමි. මාගේ පියාණෝ,
සාමාන්‍ය කසවලින් ඔබට දඬුවම් කළහ. මම කටු
කසවලින් ඔබට දඬුවම් කරන්නෙමි'යි ඔවුන්ට
දැන්විය යුතු ය"යි කී හ.
12 'තුන් වන දින නැවත මා ළඟට එන්න' කියා රජු
නියම කළ හැටියට ජෙරොබෝවම් හා මුළු සෙනඟ
තුන් වන දින රෙහොබෝවම් ළඟට පැමිණියහ.
13 රජ ද ප්‍රජා මූලිකයන් ඔහුට දුන් දැනුමැතිකම
අත්හැර, 14 සෙනඟට තදින් උත්තර දෙමින්,
තරුණයන්ගේ දැනුමැතිකමේ හැටියට ඔවුන්ට කතා
කොට, "මාගේ පියාණෝ ඔබ පිට බර වියගහක්
තැබූ හ. එහෙත්, මම ඔබේ වියගහ තව වඩා බර
කරන්නෙමි. මාගේ පියාණෝ සාමාන්‍ය කසවලින්
ඔබට දඬුවම් කළහ. මම වනාහි කටු කසවලින්
දඬුවම් කරන්නෙමි"යි කී ය. 15 මෙසේ රජ සෙනඟට
ඇහුම්කන් නුදුන්නේ ය. මන්ද, සමිඳාණන් වහන්සේ
ෂිලෝහි අහියා ලවා නබොත්ගේ පුත්‍ර වූ
ජෙරොබෝවම්ට දෙන ලද තමන්ගේ පණිවුඩය ඉෂ්ට
කරන පිණිස ඒ කරුණු එලෙස උන් වහන්සේගෙනේ
විය.
16 2 සාමු 20:1 සියලු ඉශ්‍රායලේවරු රජු තමන්ට
ඇහුම්කන් නුදුන් බව දුටු කල, රජුට උත්තර දෙමින්,
"දාවිත්ගෙනේ අපට ඇති කොටස කුමක් ද?
q2 16 ජෙස්සේගේ පුතුගෙනේ අපට උරුමයක් නැත.
q2 16 ඉශ්‍රායලේවරුනි, ඔබේ ගවෙලට යන්න.
q2 16 ඉතින් දාවිත් රජතුමනේ, ඔබ ඔබේ ම
ගෝත්‍රය බලාගන්නැ"යි කියා තම තමන්ගේ
ගවෙලට ගියෝ ය.
17 එහෙත්, ජුදා නගරවල විසූ ඉශ්‍රායලේ ජනයා
කරෙහි රෙහොබෝවම් රජකම් කළේ ය.
18 එවිට රෙහොබෝවම් රජ රාජකාරියේ
නිලධාරියා වන අදොරාම් යැවී ය. සියලු
ඉශ්‍රායලේවරු ඔහුට ගල් ගසා ඔහු මරණයට පත්
කළෝ ය. එසේ වූ විට රෙහොබෝවම් රජ
ජෙරුසලමට පලා යන පිණිස ඉක්මනින් රථයට
නැඟුණේ ය. 19 මෙසේ අද දක්වා තිබෙන පරිදි
ඉශ්‍රායලේවරු දාවිත්ගේ වංශයට විරුද්ධ ව කැරලි
ගසන්න වූ හ.

## රාජ්‍යය බෙදී යාම

(2 වංශා 11:1-4)

20 ජෙරොබෝවම් නැවත පැමිණි බව සියලු
ඉශ්‍රායලේවරු අසා, සභාවට ඔහු ගෙන්වාගෙන,
සියලු ඉශ්‍රායලේවරුන් කරෙහි ඔහු රජ කොට පත්
කළෝ ය. ජුදා ගෝත්‍රය මිස දාවිත්ගේ වංශයට
පක්ෂපාත වූ වෙන කිසිවෙක් නො වූ හ.
21 සලමොන්ගේ පුත්‍ර වන රෙහොබෝවම්
ජෙරුසලමට පැමිණි විට, ඉශ්‍රායලේ වංශයට විරුද්ධ
ව යුද්ධ කොට, තමාට රාජ්‍යය නැවත දිනාගනු
පිණිස, මුළු ජුදා ගෝත්‍රයෙන් හා බෙන්ජමින්
ගෝත්‍රයෙන් යුද්ධ භටයන් එක්ලක්ෂ අසූදහසක්
රැස් කළේ ය. 22 එහෙත්, දෙවියන් වහන්සේගේ
පණිවුඩය උන් වහන්සේට කැප වූ මනුෂ්‍යයා වන
ෂෙමායා වෙත පැමිණ, 23 "නුඹ සලමොන්ගේ පුත්‍ර
ජුදාහි රජ වන රෙහොබෝවම්ටත්, මුළු ජුදා
ගෝත්‍රයටත් බෙන්ජමින් ගෝත්‍රයටත්, ඉතිරි,
සෙනඟටත් කතා කොට මෙසේ කියන්න,
24 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
ඉශ්‍රායලේ ජනයා වන නුඹලාගේ සහෝදරයන්ට
විරුද්ධ ව යුද්ධ නොකරන්න. එක් එක්කෙනා තම
තමාගේ ගෙදරට හැරී යන්න. මන්ද, මේ කාරණය
පැමුණුණේ සමිඳාණන් වහන්සේ වන මගෙනේ යැ"යි
දැන්වී ය. මෙසේ ඔව්හු සමිඳාණන් වහන්සේගේ
පණිවුඩයට ඇහුම්කන් දී උන් වහන්සේගේ
පණිවුඩය ලෙස හැරී ගියෝ ය.

## ජෙරොබෝවම් රජ දෙවියන් වහන්සේගෙන් ඈත් වීම

25 ජෙරොබෝවම් එප්‍රායිම් කඳු රටෙහි ෂෙකෙමේ
ගොඩනඟා එහි වාසය කළේ ය. ඔහු එතැනින්
ගොස් පෙනුයෙලේ නගරය ශක්තිමත් කළේ ය.
26 තවද, ජෙරොබෝවම් කල්පනා කරමින්, 'දැන්
තිබෙන තත්ත්වය අනුව මේ රාජ්‍යයේ සෙනඟ
දාවිත්ගේ වංශයට හැරී යනු ඇත. 27 මේ සෙනඟ
ජෙරුසලමේ තිබෙන සමිඳාණන් වහන්සේගේ
මාලිගාවට පූජා ඔප්පු කරන්න ගියොත්, මේ
සෙනඟගේ සිත් තම ස්වාමීන් වූ ජුදාවරුන්ගේ රජ
වන රෙහොබෝවම් වෙත ඇදී යන්නේ ය, එවිට
ඔවුන් මා මරාදමා ජුදාහි රජ වන රෙහොබෝවම්
වෙත හැරී යනු ඇතැ'යි සිතී ය.
28 නික්ම 32:4 මෙසේ රජ කල්පනා කොට රන්
වස්සන් දෙන්නෙකු සාදා සෙනඟට කතා කොට, "පූජා
කිරීම පිණිස ඔබ ජෙරුසලමට මෙතෙක් කල් ගියා
ඇති. ඉශ්‍රායලේවරුනි, මිසර දේශයෙන් ඔබ ගෙනා
ඔබේ දෙවිවරු මේ ය"යි ඔවුන්ට කී ය. 29 ඔහු
එකකු බෙතෙලේහි සිටුවා අනිකා දාන්හි තැබී ය.
30 මෙසේ කිරීම පාපයක් විය. මන්ද, මිනිස්සු ඒ
ඉදිරියෙහි වඳින පිණිස දාන් දක්වා ගියෝ ය.
31 තවද, ඔහු ගිරිකුළු දේවාල සාදා, ලෙවීගේ
වංශයට අයත් නුවූ අය මුළු සෙනඟ අතරෙන්
පූජකයන් වශයෙන් පත් කළේ ය.
32 ලෙවී 23:33-34 ජුදාහි පවත්වන මංගල්‍යය මෙන්
ජෙරොබෝවම් අට වන මාසයේ පසළොස් වන දින
මංගල්‍යයක් නියම කොට පූජාසනය පිට පූජා ඔප්පු
කළේ ය. ඔහු බෙතෙලේහිදීත් එසේ ම කරමින් තමා
සෑදූ වස්සන්ට පූජා කළේ ය. ඔහු තමා සෑදූ ගිරිකුළු
දේවාලවල පූජකයන් බෙතෙලේහි සිටවූවේ ය.
33 ඔහු බෙතෙලේහි සෑදූ පූජාසනයට තමා ම නියම

කරගත් මාසය වන අට වන මාසයේ පසළොස් වන
දින ගොස්, ඉශ්‍රායලේ ජනයාට මංගල්‍යයක් නියම
කොට, සුවඳ දුම් ඔප්පු කරන පිණිස පූජාසනය වෙත
ගියේ ය.

### බෙතෙලේහි වැඳුම්පිදුම් හෙළා දැකීම

13 ජෙරොබෝවම් සුවඳ පූජා
ඔප්පුකරමින්පූජාසනය ළඟ සිටිද්දී දෙවියන්
වහන්සේට කැප වූ මනුෂ්‍යයෙක්, සමිඳාණන්
වහන්සේගේ ආඥාව පිට ජුදා සිට බෙතෙලේ
නගරයට පැමිණ, 2 2 රාජා 23:15-16උන්
වහන්සේගේ ආඥාව පිට පූජාසනයට විරුද්ධ ව
ප්‍රසිද්ධියේ චෝදනා කරමින්, "එම්බා පූජාසනය,
පූජාසනය, සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන
සේක: 'ජොසියා නම් පුත්‍රයෙක් දාවිත්ගේ වංශයට
ඉපිද, කඳු මත පූජාස්ථානවල සුවඳ පූජා ඔප්පු කරන
පූජකයන් මේ පූජාසනය පිට පූජා කරන්නේ ය;
මිනීඇට ද තා පිට දවනු ලබන්නේ ය' "යි පැවසී ය.
3 ඔහු එම දවසේ ලකුණක් දෙමින්, "සමිඳාණන්
වහන්සේ වදාළ ලකුණ නම්, 'පූජාසනය පැළී එය
පිට තිබෙන අළු විසිරී වැටීම ය' "යි කී ය.
4 දෙවියන් වහන්සේට කැප වූ මනුෂ්‍යයා
බෙතෙලේහි පූජාසනයට විරුද්ධ ව ප්‍රසිද්ධියේ
චෝදනා කරමින් කී වචන ජෙරොබෝවම් රජු ඇසූ
විට, ඔහු පූජාසනය වෙතින් තමාගේ අත දිගු කර,
"ඔහු අල්ලාගනිව් ය"යි කීවේ ය. ඔහුට විරුද්ධ ව
රජතුමා දිගු කළ තමාගේ අත, ආපසු නමා ගන්න
බැරි ලෙස කොර විය. 5 තවද, දෙවියන් වහන්සේට
කැප වූ මනුෂ්‍යයා සමිඳාණන් වහන්සේගේ අණ
පරිදි, දුන් ලකුණ හැටියට පූජාසනය පැළී, අළු
පූජාසනයෙන් විසිරී වැටිණි. 6 රජ තෙමෙ දෙවියන්
වහන්සේට කැප වූ මනුෂ්‍යයාට කතා කොට,
"මාගේ අත සුව වන පිණිස ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේට කන්නලව් කර මා උදෙසා යාච්ඤා
කරන්නැ"යි කී ය. ඒ මනුෂ්‍යයා ද සමිඳාණන්
වහන්සේට කන්නලව් කළ විට රජුගේ අත සුව වී
පෙර තිබුණාක් මෙන් විය. 7 රජ ද, "මා සමඟ
ගෙදරට පැමිණ විඩා හැරගන්න; ඔබට තුටු පඬුරක්
දෙමි"යි ඒ මනුෂ්‍යයාට කීවේ ය.
8 එවිට ඒ මනුෂ්‍යයා, "ඔබේ ගයෙන් දෙකෙනේ
පංගුවක් මට දෙතොත් මම ඔබ සමඟ එහි නොයෙමි.
මේ ස්ථානයේ දී මා කිසිවක් කන්නේ වත්, වතුර
බොන්නේ වත් නැත. 9 මන්ද, සමිඳාණන්
වහන්සේගේ පණිවුඩයෙන් මට මෙසේ අණ කොට,
'නුඹ කිසිවක් කන්න වත්, වතුර බොන්න වත්, ආ
මගින් හැරී යන්න වත් එපා ය'කියා මට දන්වන
ලද්දේ ය"යි රජුට කී ය. 10 මෙසේ ඔහු බෙතෙලේ
නගරයට පැමිණි මාර්ගයෙන් නැවත නොගොස්
වෙනෙ මාර්ගයකින් ගියේ ය.

### අකීකරු දිවැසිවරයාගේ අවසානය

11 බෙතෙලේහි මහලු දිවැසිවරයෙක් වාසය කළේ
ය. ඔහුගේ එක් පුත්‍රයෙක් අවුත් දෙවියන්
වහන්සේට කැප වූ මනුෂ්‍යයා එදා බෙතෙලේහි දී කළ
සියලු ක්‍රියා ඔහුට දැන්වී ය. ඒ මනුෂ්‍යයා විසින්
රජුට කියන ලද වචන ද ඔව්හු තම පියාට කී හ.
12 ඔවුන්ගේ පියා ද, "ඔහු කොයි මගින් ගියේ
දැ"යි තම පුත්‍රයන්ගෙන් ඇසී ය. ජුදාහි සිට පැමිණි
දෙවියන් වහන්සේට කැප වූ ඒ මනුෂ්‍යයා ගිය
මාර්ගය ඔහුගේ පුත්‍රයන් විසින් දක්නා ලද්දේ ය.
13 "මට යෑමට සෑදලය යොදා කොටළුවා සූදානම්
කර දෙන්නැ"යි ඔහු තම පුත්‍රයන්ට කී ය. ඔවුන්
කොටළුවාගේ සෑදලය යොදා ඌ සූදානම් කර ඔහුට
දුන් විට, ඔහු ඌ පිට නැඟී, 14 දෙවියන් වහන්සේට
කැප වූ ඒ මනුෂ්‍යයා පසුපස ගොස්, ඔහු ආලෝන
ගසක් යට වාඩි වී සිටිනු දැක, "ජුදා සිට පැමිණි
දෙවියන් වහන්සේට කැප වූ මනුෂ්‍යයා ඔබ දැ"යි
ඔහුගෙන් ඇසී ය. "ඒ මම ය"යි ඔහු කී විට,
15 "මා සමඟ ගෙදර අවුත් කෑම කන්නැ"යි ඔහුට
කී ය.
16 ඔහු ද පිළිතුරු දෙමින්, "ඔබ සමඟ හැරී එන්න
වත්, ඔබේ ගෙදරට ඇතුළු වන්න වත් මට
නොපිළිවන. මේ ස්ථානයේ දී ඔබ සමඟ කෑම
නොකමි, වතුර ද නොබොමි. 17 මන්ද, 'නුඹ එහිදී
කෑම කන්න වත්, වතුර බොන්න වත්, නුඹ යන
මාර්ගයෙන් හැරී එන්න වත් එපා ය' කියා සමිඳාණන්
වහන්සේගේ පණිවුඩයෙන් මට කියන ලද්දේ ය"යි
සැළ කළේ ය.
18 එවිට ඔහු, "මමත් ඔබ මෙන් ම
දිවැසිවරයෙක්මි, දේව දූතයෙක් සමිඳාණන්
වහන්සේගේ වචනයෙන් මට කතා කොට, 'ඔහු
කෑම කන පිණිසත්, වතුර බොන පිණිසත් ඔබේ
ගෙදරට කැඳවාගෙන එන්න' කියා දැන්වී ය"යි පැවසී
ය. ඔහු ඒ තැනැත්තාට මෙසේ කීවේ බොරුවකි.
19 එවිට ඔහු මේ තැනැත්තා සමඟ ආපසු ගොස්
ඔහුගේ ගෙදර කෑම කා වතුර බීවේ ය. 20 ඔවුන්
මෙසේ හිඳින කල ඒ තැනැත්තා ආපසු කැඳවාගෙන
ආ දිවැසිවරයා වෙත සමිඳාණන් වහන්සේගේ
පණිවුඩය පැමුණුණේ ය. 21 ජුදාහි සිට පැමිණි
දෙවියන් වහන්සේට කැප වූ ඒ මනුෂ්‍යයාට ඔහු
කතා කොට, "සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන
සේක: 'නුඹ සමිඳාණන් වහන්සේගේ පණිවුඩයට
අකීකරු වී, නුඹේ දෙවි සමිඳාණන් වහන්සේ නුඹට
අණ කළ ආඥාව රක්ෂා නොකොට, 22 හැරී අවුත්,
යම් ස්ථානයක දී කෑම කන්න වත්, වතුර බොන්න
වත් එපා යයි නුඹට වදාළ සේක් ද, ඒ ස්ථානයෙහි දී
නුඹ කෑම කා, වතුර බිව් නිසා, නුඹේ මළකඳ නුඹේ
පියවරුන්ගේ සොහොනේ ගටෙ නොපැමිණෙන්නේ ය'
"යි කී ය.
23 තවද, ඔහු ආහාර පාන වැළඳූ පසු ඔහු විසින්
ආපසු කැඳවාගෙන එන ලද දිවැසිවරයාට යෑම සඳහා
කොටළුවාට සෑදලය යොදන ලදී. 24 ඔහු පිටත් ව

ගිය පසු මාර්ගයේ දී සිංහයෙක් ඔහුට සම්බ වී ඔහු
මැරුවේ ය. ඔහුගේ මළකඳ මාර්ගයෙහි දමනු ලැබූ
විට කොටළුවා සහ සිංහයා ඒ ළඟ සිටියෝ ය. 25 ඒ
ළඟින් ගිය මනුෂ්‍යයෝ මළකඳ මාර්ගයෙහි වැටී
තිබෙන බව ද සිංහයා මළකඳ ළඟ සිටින බව ද දැක
මහලු දිවැසිවරයා විසූ නගරයට අවුත් ඒ බව කී හ.
26 මාර්ගයෙන් ඔහු කැඳවාගත් දිවැසිවරයා එපවත්
අසා, “ඒ වනාහි සමිඳාණන් වහන්සේගේ
පණිවුඩයට අකීකරු වූ දෙවියන් වහන්සේට කැප වූ
මනුෂ්‍යයා ය. එබැවින් සමිඳාණන් වහන්සේ ඔහුට
දුන් පණිවුඩය ලෙසෙ උන් වහන්සේ ඔහු සිංහයාට
පාවා දුන් සේක. ඌ ඔහු ඉරා මරා දැමී ය”යි කී ය.
27 තවද, ඔහු “කොටළුවාට සෑදලය යොදන්නැ”යි
තම පුත්‍රයන්ට කියා, ඔවුන් එලෙසෙ කළ පසු ඔහු
ගියේ ය. 28 එවිට මළකඳ මාර්ගයෙහි වැටී
තිබෙනවාත්, කොටළුවා හා සිංහයා ද මළකඳ ළඟ
සිටිනවාත් ඔහුට සම්බ විය. සිංහයා මළකඳ කා
තිබුණේ වත්, කොටළුවා ඉරා දමා තිබුණේ වත්
නැත. 29 ඒ මහලු දිවැසිවරයා ද දෙවියන් වහන්සේට
කැප වූ මනුෂ්‍යයා ගැන වැලපී, ඔහු තැන්පත් කරන
පිණිස ඔහුගේ මළකඳ ඔසවා කොටළුවා පිට තබා,
සිය නගරයට ගෙන ගොස්, 30 තමාගේ ම
සොහොනේ ගයේ තැබී ය. ඔහු ද, “අහෝ, මාගේ
සහෝදරය” කියා ඔහු ගැන වැලපුණේ ය. 31 තවද,
ඒ මහලු දිවැසිවරයා ඔහු තැන්පත් කළ පසු තමාගේ
පුත්‍රයන්ට කතා කොට, “මා මැරුණ විට දෙවියන්
වහන්සේට කැප වූ ඒ මනුෂ්‍යයා තැන්පත් කරන ලද
සොහොනේ ගයේ මාත් තැන්පත් කරන්න; ඔහුගේ
ඇටකටු ළඟ මාගේ ඇටකටු ද තබන්න. 32 මන්ද,
ඔහු බෙතෙල්හි පූජාසනයටත්, සමාරියේ නගරවල
කඳු මත පූජාස්ථානවලටත් විරුද්ධ ව සමිඳාණන්
වහන්සේගේ ආඥාව පරිදි කී පණිවුඩය ඉෂ්ට වනු
සිකුරු ය”යි කී ය.
33 මේ සිද්ධියට පසු ව වුව ද, ජෙරොබෝවම්
තමාගේ නපුරු මාර්ගයෙන් නොහැරී, නැවතත් සියලු
මිනිසුන්ගෙන් ගිරිකුළු දේවාලවලට පූජකයන් පත්
කළේ ය. කැමැති වූ කොයි අය නමුත්, ගිරිකුළු
දේවාලවල පූජකයන් වීමට ඔහු කැප කළේ ය.
34 මේ කරුණ වූකලී ජෙරොබෝවම්ගේ වංශය
පහකොට මිහි පිටින් විනාශ කිරීමට ඔවුන් කෙරෙහි
පාපයක් විය.

### ජෙරොබෝවම් රජුගේ පුත්‍රයාගේ මරණය

14 ඒ කාලයෙහි ජෙරොබෝවම්ගේ පුත් අබියා
රෝගාතුර විය. 2 ජෙරොබෝවම් තම බිරිඳට
කතා කොට, “ඔබ ජෙරොබෝවම්ගේ බිරිඳ බව
නොදැනෙන හැටියට කරුණාකර, වෙසේ වළාගෙන
පිටත් වී ෂිලෝ නම් ස්ථානයට යන්න. ‘ඔබ මේ
සෙනඟ කෙරෙහි රජ වන්නේ ය’යි මා ගැන කී
අහියා දිවැසිවරයා එහි සිටියි. 3 ඔබේ අතින් රොටී
දසයක් ද රස කැවිලි ද මීපැණි භාජනයක් ද රැගෙන
ඔහු ළඟට යන්න. ළමයාට කුමක් වේ ද කියා ඔහු
ඔබට දන්වනු ඇතැ”යි පැවසී ය.

4 ජෙරොබෝවම්ගේ බිරිඳ එලෙසෙ කොට පිටත් වී,
ෂිලෝ නම් ස්ථානයට ගොස් අහියාගේ ගෙදරට
පැමිණියා ය. මහලුකම නිසා අහියාගේ ඇස්
නොපෙනෙන තරමට අඳුරු වී තිබිණි. 5 එහෙත්,
සමිඳාණන් වහන්සේ අහියාට කතා කොට, “බලන්න,
ජෙරොබෝවම්ගේ බිරිඳ රෝගාතුර වී සිටින ඇගේ
පුත්‍රයා ගැන නුඹෙන් විචාරන්න එන්නී ය. ඇට මේ
අයුරින් කතා කරන්න. ඇය එන විට අන්
තැනැත්තියක මෙන් පෙනේවනු ඇතැ”යි වදාළ සේක.
6 දොරකඩින් ඇතුළු වන ඇගේ අඩි ශබ්දය අහියාට
ඇසුණු විට ඔහු කතා කොට, “ජෙරොබෝවම්ගේ
බිරිඳ ඇතුළට එන්න. ඔබ අන් තැනැත්තියක මෙන්
පෙනේවන්නේ කුමට ද? කණගාටුදායක ආරංචි
දැන්වීමට මට තිබේ. 7 ‘ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේකැ’යි ඔබ
ගොස් ජෙරොබෝවම්ට කියන්න: ‘මම සෙනඟ
අතරෙන් නුඹ උසස්කර, මාගේ සෙනඟ වන
ඉශ්‍රායෙල්වරුන්ගේ අධිපතියා කොට පත්කර,
8 දාවිත්ගේ වංශයෙන් රාජ්‍යය උදුරා නුඹට දිනිමි.
එහෙත්, නුඹ වනාහි මාගේ ආඥා පිළිපැද, මාගේ
ඇස් හමුවෙහි හරි දේ පමණක් කරමින් තමාගේ
මුළු හෘදයෙන් මා අනුව පැමිණි, මාගේ මෙහෙකරු
දාවිත් මෙන් නොසිට, 9 නුඹට පළමුවෙන් සිටි
සියල්ලන්ට වඩා නපුරුකම් කරමින්, මා කෝප කරන
හැටියට අන් දෙවිවරුන් ද වාත්තු පිළිම ද සාදාගෙන
මට පිටුපෑවෙහි ය. 10 1 රාජා 15:29එබැවින් මම
ජෙරොබෝවම්ගේ වංශය පිට විපත්ති පමුණුවා
ජෙරොබෝවම්ගේ සියලු පිරිමින් වන
ඉශ්‍රායෙල්වරුන් අතරෙහි දාසයන් වූත්, නිර්දාසයන්
වූත් සියල්ලන් නරෙපා, නිමාවට කුණු අතුගාදමන
ලෙසෙ, ජෙරොබෝවම්ගේ වංශය සහමුලින් ම
අතුගාදමන්නෙමි. 11 නගරයේ දී මැරෙන
ජෙරොබෝවම්ට අයිති අය බල්ලෝ කන්නෝ ය.
පිටත දී මැරෙන අය ආකාශයේ පක්ෂීහු කන්නෝ
ය.’ එසේ වන්නේ, සමිඳාණන් වහන්සේ එය වදාළ
බැවිනි.
12 “එබැවින් ඔබ පිටත් ව ඔබේ ගෙදරට යන්න.
නගරය තුළට ඔබ පා තබන විට ළමයා මැරෙනු
ඇත. 13 සියලු ඉශ්‍රායෙල්වරු ඔහු ගැන වැලපී ඔහු
භූමදාන කරන්නෝ ය. මන්ද, ජෙරොබෝවම්ගේ
වංශය අතරෙන් ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේ යහපත් යමක් ඔහු තුළ ඇති බැවින්
ජෙරොබෝවම්ගේ වංශයෙන් ඔහු පමණක් නියම
විධියට භූමදාන කරනු ලබන්නේ ය. 14 ඇරත් ඒ
දවසේ දී ජෙරොබෝවම්ගේ වංශය නරෙපා දැමීමට
සමිඳාණන් වහන්සේ ඉශ්‍රායෙලේ කෙරෙහි රජකු
නැඟුටුවාලන සේක. මුලින් සිදු වන දේ මේ ය.
ඉන්පසු කුමක් වේ ද? 15 ඉශ්‍රායෙල්වරුන් තමන්ට
අෂේරා කප් කණු සාදාගෙන සමිඳාණන් වහන්සේ
කෝප කළ බැවින්, බට ගහක් වතුරේ සලවෙන
ලෙසෙ සලෙවීමට උන් වහන්සේ ඔවුන්ට පහර දී,
ඔවුන්ගේ පියවරුන්ට දුන් මේ සශ්‍රීක දේශයෙන්
ඔවුන් පහකර, යුප්‍රටීස් ගංගාවෙන් එතරෙට ඔවුන්
විසුරුවාදමන සේක. 16 ජෙරොබෝවම් පව් කළ නිසා

ද ඉශ්‍රායලේවරුන්ට කරන්න සැලැස්සූ පාප නිසා ද
උන් වහන්සේ ඉශ්‍රායලේවරුන් අත්හැරදමන
සේකැ”යි කී ය.
17 ඉන්පසු ජරොබෝවම්ගේ බිරිඳ පිටත් ව ගොස්
තිර්ශා නම් නගරයට පැමිණියා ය. ඈ ගෙයි එළිපත්ත
ළඟට එන විට ම ළමයා මළේ ය. 18 සමිඳාණන්
වහන්සේ සිය මෙහෙකරු වන දිවැසිවර අහියා ලවා
වදාළ පණිවුඩයේ හැටියට සියලු ඉශ්‍රායලේවරු ඔහු
තැන්පත් කොට ඔහු ගැන වැලපුණෝ ය.
19 ජරොබෝවම් පිළිබඳ ඉතිරි කරුණු වන ඔහු
කළ යුද්ධ ද ඔහු රජකම් කළ හැටි ද ඉශ්‍රායලේ
රජවරුන්ගේ පුරාවෘත්ත ග්‍රන්ථයේ වාර්තා කර
තිබේ. 20 ජරොබෝවම් රජකම් කළ කාලය
විසිදෑවුරුද්දකි. ඔහු මරණයට පත් වූ පසු ඔහුගේ
පුත් නාදාබ් ඔහු වෙනුවට රජ විය.

### රෙහොබෝවම් රජුගේ රාජ්‍ය පාලනය

(2 වංශා 11:5;12:15)

21 සලමොන්ගේ පුත් රෙහොබෝවම් ජුදාහි
රජකමට පත් විය. රෙහොබෝවම් රජකමට පත්
වන කල සතළිස් එක් අවුරුද්දක් වයස් ව සිටියේ ය.
සමිඳාණන් වහන්සේ සිය නාමය තැබීමට සියලු
ඉශ්‍රායලේ ගෝත්‍රවලින් තෝරාගත් නගරය වූ
ජෙරුසලමෙහි ඔහු දහහත් අවුරුද්දක් රජකම් කළේ
ය. අම්මොනිය ජාතික ස්ත්‍රියක වන ඔහුගේ
මවගේ නම නාමා ය.
22 ජුදාවරු ද සමිඳාණන් වහන්සේගේ ඇස්
හමුයෙහි නපුරු දේ කොට තමන් කළ පාපවලින්
තමන්ගේ පියවරුන් කළ සියල්ලට වඩා උන්
වහන්සේ කෝප කළෝ ය. 23 2 රාජා 17:9-10ඔව්හු
කඳු මත පූජාස්ථාන ගොඩනඟා, සියලු උස් හලේ
පිට ද විශාල අතුපතර ඇති සියලු ගස් යට ද පිළිම
සහ අෂේරා කප් කණු ඉදි කළෝ ය. 24 ද්වි.නී.
23:17සල්ලාලකම් කළ පිරිමි පවා කඳු මත
පූජාස්ථානවල වූ හ. ඉශ්‍රායලේ ජනයා යන්න කලින්
සමිඳාණන් වහන්සේ පන්නාදැමූ ජාතීන්ගේ සියලු
පිළිකුල් ක්‍රියා ඔව්හු අනුගමනය කළෝ ය.
25 2 වංශා 12:2-8 තවද, රෙහොබෝවම් රජුගේ
පස් වන අවුරුද්දේ දී මිසරයේ රජ වූ ෂීෂක්
ජෙරුසලමට පහර දී, 26 1 රාජා 10:16-17; 2 වංශා
9:15-16සමිඳාණන් වහන්සේගේ මාලිගාවෙහි වස්තු
ද රජ මාලිගාවෙහි වස්තු ද රැගෙන ගියේ ය.
සලමොන් විසින් සාදවනු ලැබ තිබුණු සියලු රන්
පලිස් ඇතුළු සියල්ල ම රැගෙන ඔහු යන්න ගියේ ය.
27 රෙහොබෝවම් රජ ඒ වෙනුවට ලෝකඩ පලිස්
සාදා රජ මාලිගාවේ දොරටුවල රැකවල් කළ මුර
භටයන්ගේ අධිපතීන් අතට භාර දුන්නේ ය.
28 රජතුමා සමිඳාණන් වහන්සේගේ මාලිගාවට එන
සියලු ප්‍රස්තාවන්හි දී මුර භටයෝ ඒවා උසුලාගෙන
අවුත් නැවත මුරගෙට ගෙන ගියෝ ය.
29 රෙහොබෝවම් පිළිබඳ ඉතිරි කරුණු ද ඔහු කළ
සියල්ල ද රජුන්ගේ පුරාවෘත්ත ග්‍රන්ථයේ වාර්තා
කර තිබෙනු නොවේ ද? 30 රෙහොබෝවම් සහ
ජරොබෝවම් අතර නිතර ම යුද්ධ පැවතිණි.
31 රෙහොබෝවම් මියගිය පසු තමාගේ පිය වූ
දාවිත්ගේ නුවර රජ පරපුරේ සුසාන භූමියේ
තැන්පත් කරනු ලැබී ය. අම්මොනිය ජාතික
ස්ත්‍රියක වූ ඔහුගේ මවගේ නම නාමා ය. ඉන්පසු
ඔහුගේ පුත් අබියාම් ඔහු වෙනුවට රජ විය.

### අබියාම් ජුදාහි රජකම් කිරීම

(2 වංශා 13:1;14:1)

15 නබොත්ගේ පුත් ජරොබෝවම් රජුගේ
දහඅට වන අවුරුද්දේ දී අබියාම් ජුදා
දේශයෙහි රජ වී, 2 තුන් අවුරුද්දක් ජෙරුසලමේ
රජකම් කළේ ය. ඔහුගේ මවගේ නම මයකා ය.
ඈ අබ්සලොම්ගේ දුවකි. 3 තමාගේ පියා පෙර කළ
සියලු පාප ඔහු කළේ ය. ඔහුගේ සිත ද ඔහුගේ
පිය වූ දාවිත්ගේ සිත මෙන් තම දෙවි සමිඳාණන්
වහන්සේ කෙරෙහි විශ්වාසී ව නොතිබුණේ ය. 4 1
රාජා 11:36එහෙත්, දාවිත් නිසා ඔහුගේ දෙවි
සමිඳාණන් වහන්සේ ඔහුට පසු ව ඔහුගේ පුත්‍රයා
නැඟිටුවීමෙන් ද ජෙරුසලම ආරක්ෂා කිරීමෙන් ද
ජෙරුසලමට පහනක් වැනි පුත්‍රයකු ඔහුට දුන්
සේක. 5 2 සාමු 11:1-27 මන්ද, හිත්තීය ජාතික
උරියාගේ කරුණු ගැන මිස, සමිඳාණන් වහන්සේ
දාවිත්ට අණ කළ කිසි දයෙකින් ඔහු තමාගේ
ජීවිතයේ මුළු කාලයේ දී වෙන් වී නොගොස් උන්
වහන්සේගේ ඇස් හමුවෙහි හරි දේ ම කළේ ය.
6 2 වංශා 13:3-21රෙහොබෝවම් සහ ජරොබෝවම්
අතර ඔහුගේ මුළු ජීවිත කාලයේ දී යුද්ධ තිබිණි.
7 අබියාම් පිළිබඳ ඉතිරි කරුණු ද ඔහු කළ සියල්ල ද
ජුදා රජුන්ගේ පුරාවෘත්ත ග්‍රන්ථයේ වාර්තා කර
තිබෙනු නොවේ ද? අබියාම් සහ ජරොබෝවම්
අතර යුද්ධ පැවතිණි.
8 අබියාම් මරණයට පත් වූ පසු සෙනඟ දාවිත්ගේ
නුවර ඔහු භූමදාන කළෝ ය. ඉන්පසු ඔහුගේ පුත්
ආසා ඔහු වෙනුවට රජ විය.

### ආසා රජ වීම

(2 වංශා 15:16;16:6)

9 ඉශ්‍රායලේවරුන්ගේ රජ වූ ජරොබෝවම්ගේ
විසි වන අවුරුද්දේ ආසා ජුදා දේශයෙහි රජ විය.
10 මොහු ජෙරුසලමෙහි සතළිස්එක් අවුරුද්දක්
රජකම් කළේ ය. ඔහුගේ මවගේ නම මයකා ය.
ඈ අබ්සලොම්ගේ දුවකි. 11 ආසා තමාගේ පිය වූ
දාවිත් කළ ලෙස සමිඳාණන් වහන්සේගේ ඇස්
හමුයෙහි හරි දේ කළේ ය. 12 2 වංශා 15:8-15ඔහු
සල්ලාලයන් දේශයෙන් පහකොට, තමාගේ පියවරුන්
සෑදූ සියලු දේව රූප අහක් කරදැමී ය. 13 සිය මව
වන මයකා අෂේරා කප් කණුවක් පිණිස පිළිකුල්
රූපයක් සෑදූ බැවින්, ඔහු ඈ මව් බිසෝකමෙන් අහක්
කර, ඒ රූපය කපාදමා, කිද්‍රොන් ඔය ළඟ දී එය
පුළුස්සා දැමී ය. 14 එහෙත්, කඳු මත පූජාස්ථාන පහ
නොකරන ලද්දේ ය. එසේ වී නමුත්, ආසාගේ සිත
ඔහුගේ මුළු ජීවිත කාලයේ දී සමිඳාණන් වහන්සේ
කෙරෙහි සම්පූර්ණයෙන් විශ්වාසී ව තිබිණි. 15 ඔහු

තමාගේ පියා විසින් ද තමා විසින් ද කැප කරන ලද
රන් රිදී සහ බඩු බාහිරාදිය සමිඳාණන් වහන්සේගේ
මාලිගාව ඇතුළට ගෙනවුත් එහි තැන්පත් කළේ ය.
16 ආසා සහ ඉශ්රායලේවරුන්ගේ රජ වූ බාෂා
අතර ඔවුන්ගේ මුළු කාලයේ දී යුද්ධ පැවතිණි.
17 ඉශ්රායලේවරුන්ගේ රජ වූ බාෂා ජුදාට විරුද්ධ ව
ගොස්, ජුදාහි රජ වූ ආසා වෙතින් පිටත යන්න හෝ
ඔහු වෙත ඇතුළට එන්න හෝ කිසිවකුට ඉඩ
නොදෙන පිණිස, රාමා නම් නගරය ශක්තිමත්
කළේ ය. 18 එවිට ආසා සමිඳාණන් වහන්සේගේ
මාලිගාවේ ගබඩාවල ඉතිරි ව තිබූ රන් රිදී සියල්ල
ද රජ මාලිගාවේ තිබූ වස්තුව ද ගෙන තමාගේ
සේවකයන් අතට භාර දී, දමස්කයෙහි විසූ සිරියාවේ
රජ වූ හෙශියොන්ගේ පුත්රයා වන තබ්රිමොන්ගේ
පුත් බෙන්-හදද්ට ඒවා යවමින්, 19 "මා සහ ඔබ
අතරේ ද මාගේ සහ ඔබේ පියා අතරේ ද
ගිවිසුමක් තිබේ. මෙන්න, රන් රිදී තෑග්ගක් ඔබට
එවමි. ඉශ්රායලේ රජ වන බාෂා මා වෙතින් අහක් ව
යන පිණිස, ඔබ අවුත් ඔහු සමඟ කර තිබෙන
ඔබේ ගිවිසුම කඩ කළ මැනව"යි කියා හැරී ය.
20 එවිට බෙන්-හදද්, ආසා රජුට ඇහුම්කන් දී,
තමාගේ සේනාපතීන් ඉශ්රායලේවරුන්ගේ නගරවලට
විරුද්ධ ව යවා ඊයොන් ද දාන් සහ ආබලේ-බෙත්-
මයකා ද යන නගරවලටත්, මුළු නප්තලී ප්රදේශය
ඇතුළු මුළු කින්නරෝත් පළාතටත් පහර දුන්නේ ය.
21 බාෂා ඒ අසා රාමා නගරය ශක්තිමත් කිරීම
නවත්වා, තිර්ශාහි වාසය කළේ ය. 22 එවිට ආසා
රජ කිසිවකු අත්නෑර සියලු ජුදාවරුන් කැඳවා, රාමා
ශක්තිමත් කිරීමට බාෂා විසින් ගන්නා ලද ගල් හා ලී
ද ඔවුන් ලවා ගෙන්වාගෙන, ඒවායින් බෙන්යමින්ගේ
දේශයෙහි ගබෝ හා මිශ්පා යන නගර ශක්තිමත්
කළේ ය.
23 ආසා පිළිබඳ ඉතිරි කරුණු ද ඔහුගේ සියලු
බලවන්තකම් ද ඔහු කළ සියල්ල ද ඔහු
ගොඩනැඟුවාවූ නගර ද ජුදාහි රජුන්ගේ පුරාවෘත්ත
ග්රන්ථයේ වාර්තා කර තිබෙනු නොවේ ද? එහෙත්,
ඔහුගේ මහලු වයසේ දී, ඔහුගේ පාදවල වූ
රෝගයකින් ඔහු දුක් වින්දේ ය. 24 ආසා මරණයට
පත් වූ පසු තමාගේ පිය වූ දාවිත්ගේ නුවර
තමාගේ පියවරුන් ළඟ භූමදාන කරනු ලැබී ය.
ඔහුගේ පුත්ර වූ ජෙහෝෂාපාට් ඔහු වෙනුවට රජ
විය.

## නාදාබ් ඉශ්රායලේ හි රජකම් කිරීම

25 ජෙරොබෝවම්ගේ පුත් නාදාබ් ජුදාහි රජ වූ
ආසාගේ දෙ වන අවුරුද්දේ දී ඉශ්රායලේ දේශයෙහි
රජ වී දෑවුරුද්දක් රජකම් කළේ ය. 26 ඔහු
සමිඳාණන් වහන්සේගේ ඇස් හමුවෙහි නපුරු දේ
කොට, තම පියාගේ අඩි පාරේ ගමන් කරමින්, තම
පියා ඉශ්රායලේවරුන්ට කරන්න සැලැස්සූ පාප ද
කළේ ය. 27 තවද, ඉස්සාකර් වංශයේ අහියාගේ
පුත් බාෂා, නාදාබ්ට විරුද්ධ ව කුමන්ත්රණ කොට,
නාදාබ් සහ සියලු ඉශ්රායලේවරුන් පිලිස්තිවරුන්ට
අයිති ගිබ්බෙතොන් නගරය වටලා සිටි අතර එහි දී
ඔහුට පහර දුන්නේ ය. 28 ජුදාහි රජ වූ ආසාගේ
තුන් වන අවුරුද්දේ දී බාෂා තමෙමේ නාදාබ් මරා ඔහු
වෙනුවට රජ විය. 29 1 රාජා 14:10තවද, ඔහු රජ වූ
වහා ම ජෙරොබෝවම්ගේ මුළු වංශය නැසුවේ ය.
විනාශ නොකර පණපිටින් කිසිවකු ඔහු
ජෙරොබෝවම්ට ඉතිරි නොකළේ ය. 30 එසේ
වුණේ, ඉශ්රායලේවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේ උදහස් කරන ලෙස, ජෙරොබෝවම් විසින්
කළා වූ ද, ඔහු ඉශ්රායලේවරුන්ට කරන්න
සැලැස්සුවා වූ ද පව් නිසා, සමිඳාණන් වහන්සේ
ස්වකීය දාසයා වූ ෂිලෝහි අහියා ලවා කියවූ උන්
වහන්සේගේ පණිවුඩය හැටියට ය.
31 නාදාබ් පිළිබඳ ඉතිරි කරුණු ද ඔහු කළ සියල්ල
ද ඉශ්රායලේ රජුන්ගේ පුරාවෘත්ත ග්රන්ථයේ
වාර්තා කර තිබෙනු නොවේ ද? 32 ආසා සහ
ඉශ්රායලේවරුන්ගේ රජ වූ බාෂා අතර ඔවුන්ගේ මුළු
ජීවිත කාලය තුළ ම යුද්ධ පැවතිණි.

## බාෂා ඉශ්රායලේවරුන්ගේ රජ වීම

33 ජුදාහි ආසාගේ තුන් වන අවුරුද්දේ දී අහියාගේ
පුත්ර වූ බාෂා තිර්ශාහි සියලු ඉශ්රායලේවරුන්ගේ
රජ වී විසිහතර අවුරුද්දක් රජකම් කළේ ය.
34 ඔහු සමිඳාණන් වහන්සේගේ ඇස් හමුවෙහි
නපුරු දේ කර ජෙරොබෝවම්ගේ අඩි පාරේ යමින්
ඉශ්රායලේවරුන් පව් කරන්න සැලැස්සූ පාපය ද
කළේ ය.
16 එවිට සමිඳාණන් වහන්සේගේ පණිවුඩය
බාෂාට විරුද්ධ ව හනානීගේ පුත් ජේහු වෙත
පැමිණියේ ය. 2 එය මෙසේ ය: "කිසි වටිනාකමක්
නැති නුඹ උසස් කර, මම මාගේ සෙනඟ වන
ඉශ්රායලේවරුන්ගේ අධිපතියා කොට පත් කළෙමි.
එහෙත්, නුඹ ජෙරොබෝවම්ගේ මාර්ගයෙහි
හැසිරමින්, තමන්ගේ පාපවලින් මා කෝප කරවන
හැටියට මාගේ සෙනඟ වන ඉශ්රායලේවරුන්ට පව්
කරන්නට සැලැස්වූයෙහි ය. 3 එබැවින් මම, බාෂා
සහ ඔහුගේ වංශය සහමුලින් ම වනසාදමා, නුඹේ
වංශය නෙබාත්ගේ පුත් වූ ජෙරොබෝවම්ගේ
වංශය මෙන් වන්නට සලස්වන්නෙමි. 4 බාෂාට අයිති,
නගරයේ දී මැරෙණ අය බල්ලෝ කන්නෝ ය. පිටත
දී මැරෙණ ඔහුට අයිති අය ආකාශයේ පක්ෂීහු
කන්නෝ ය."
5 බාෂා පිළිබඳ ඉතිරි කරුණු ද ඔහු කළ දේවල් ද
ඔහුගේ බලවන්තකම් ද ඉශ්රායලේ රජුන්ගේ
පුරාවෘත්ත ග්රන්ථයේ වාර්තා කර තිබෙනු නොවේ
ද? 6 බාෂා මරණයට පත් වූ පසු තිර්ශාහි භූමදාන
කරන ලදී. ඔහුගේ පුත් ඒලා ඔහු වෙනුවට රජ විය.
7 තවද, හනානීගේ පුත් දිවැසිවර ජේහු අතින්
සමිඳාණන් වහන්සේගේ පණිවුඩය බාෂාටත්,
ඔහුගේ වංශයටත් විරුද්ධ ව පැමිණියේ ය. එසේ
වූයේ, ඔහු ජෙරොබෝ-වම්ගේ වංශයට සමාන වන
හැටියට තමාගේ ක්රියාවලින් සමිඳාණන් වහන්සේ
කෝප කරවමින් උන් වහන්සේගේ ඇස් හමුයෙහි

කළ සියලු නපුරුකම් නිසාත්, ඔහු ඒ වංශය නැසූ
නිසාත් ය.

## ඒලා ඉශ්රායලේවරුන්ගේ රජ වීම

8 ජුදාහි රජ වූ ආසාගේ විසිහය වන අවුරුද්දේ දී
බාෂාගේ පුත් ඒලා ඉශ්රායලේවරුන්ගේ රජ වී
තිර්ශාහි දෑවුරුද්දක් රජකම් කළේ ය. 9 ඔහුගේ
අශ්ව රථ සේනාවනේ දකෙනේ කොටසකට අධිපති
ව සිටි ඔහුගේ සේවක වන සිම්රී ඔහුට විරුද්ධ ව
කුමන්ත්රණ කොට, තිර්ශාහි මාලිගාවේ ප්රධානියා
වන අර්ශාගේ නිවසේ ඔහු බීමත් ව සිටින විට,
10 එහි ඇතුළු වී ජුදාහි රජ වන ආසාගේ විසිහත්
වන අවුරුද්දේ දී ඔහුට පහර දී, ඔහු මරා ඔහු
වනෙුවට රජ විය.
11 මසේ ඔහු රජ වී ස්වකීය සිංහාසනය පිට
හිඳගත් වහාම බාෂාගේ නෑයන්ගනේ වත්,
මිත්රයන්ගනේ වත්, කිසි පිරිමියකු ඉතුරු නොකොට
ඔහුගේ වංශයේ සියල්ලන් මරාදැම්මේ ය.
12 මසේ සිම්රී, බාෂාගේ මුළු වංශය විනාශ
කළේ, බාෂා ද ඔහුගේ පුත් ඒලා ද තමන්ගේ
නිරර්ථක දේව රූපවලින් ඉශ්රායලේවරුන්ගේ දවේ
සමිඳාණන් වහන්සේ කෝප කරවමින් ඔවුන් විසින්
කරන ලද, 13 ඉශ්රායලේවරුන්ට කිරීමට සලස්වන
ලද ඔවුන්ගේ සියලු පාප නිසා උන් වහන්සේ
දිවැසිවර ජේහු ලවා බාෂාට විරුද්ධ ව දනෙ ලද
තමන් වහන්සේගේ පණිවුඩය හැටියට ය. 14 ඒලා
පිළිබඳ ඉතිරි කරුණු ද ඔහු කළ සියල්ල ද
ඉශ්රායලේ රජුන්ගේ පුරාවෘත්ත ග්රන්ථයේ වාර්තා
කර තිබනෙු නොවේ ද?

## සිම්රී ඉශ්රායලේවරුන්ගේ රජ වීම

15 ජුදාහි රජ වන ආසාගේ විසිහත් වන අවුරුද්දේ
දී සිම්රී තිර්ශාහි සත් දවසක් රජකම් කළේ ය.
එවිට සනෙඟ පිලිස්තිවරුන්ට අයිති ගිබ්බතොන්
නගරය වටලා කඳවුරු බැඳගනෙ සිටියෝ ය.
16 'සිම්රී කුමන්ත්රණ කොට රජුටත් පහර දුන්නේ
ය' කියා කඳවුරු බැඳගනෙ සිටි සනෙඟ ඇසූ විට,
සියලු ඉශ්රායලේවරු ඔවුන්ගේ සේනාපති වූ ඔම්රී ඒ
දවසේ කඳවුරේ දී ඉශ්රායලේවරුන්ගේ රජ ලසෙ
පත් කළෝ ය. 17 ඔම්රී ද ඔහු සමඟ සියලු
ඉශ්රායලේවරු ද ගිබ්බතොන් නගරයේ සිට ගොස්
තිර්ශා වටලා ගත්තෝ ය. 18 තවද, නගරය
අල්ලාගත් බව සිම්රී දුටු විට ඔහු රජ මාලිගාවේ
බලකොටුවට ඇතුළු වී රජ මාලිගාවට ගිනි ලා ගනෙ
මළේ ය. 19 එසේ වුණේ, ඔහු සමිඳාණන්
වහන්සේගේ ඇස් හමුයෙහි නපුරු දේ කරමින්,
ජරොබෝවම්ගේ මාර්ගයෙහි ද ඉශ්රායලේවරුන්ට
පව් කරන්නට සලස්වන ලසෙ ඔහු කළ පාපයේ
හැටියට ද හැසිරමේන් ඔහු කළ පාප නිසා ය.
20 සිම්රී පිළිබඳ ඉතිරි කරුණු ද ඔහු කළ ද්රෝහිකම්
ද ඉශ්රායලේ රජුන්ගේ පුරාවෘත්ත ග්රන්ථයේ
වාර්තා කර තිබනෙු නොවේ ද?

21 එකල ඉශ්රායලේ සනෙඟ දපෙක්ෂයකට බදේී
සනෙඟගනේ දකෙනේ කොටසක් ගීනත්ගේ පුත්
තිබ්නී රාජ ධුරයට පත් කරගැනීමට ඔහුට එකතු වූ
හ. අනකේ කොටස ඔම්රීට එකතු වූ හ. 22 එහතේ,
ඔම්රීට එකතු වුණ සනෙඟ ගීනත්ගේ පුත් තිබ්නීට
එකතු වූ සනෙඟ පරාජය කළෝ ය. මසේ තිබ්නී
මළේ ය. ඔම්රී රජ විය.

## ඔම්රී ඉශ්රායලේවරුන්ගේ රජ වීම

23 ජුදාහි රජ වූ ආසාගේ තිස්එක් වන අවුරුද්දේ දී
ඔම්රී ඉශ්රායලේවරුන්ගේ රජ වී දොළොස් අවුරුද්දක්
රජකම් කළේ ය. තිර්ශාහි ඔහු අවුරුදු හයක්
රජකම් කළේ ය. 24 ඔහු සමාරිය කන්ද රිදී කාසි
හයදහසකට ෂමෙරේගනේ මිලේට ගනෙ කන්දහෙි
නගරයක් ගොඩනඟා, තමා ගොඩනැඟුවාවූ
නගරයට කන්ද අයිතිකරු වූ ෂමෙරේගේ නාමය
අනුව සමාරිය යන නම තැබී ය. 25 ඔම්රී සමිඳාණන්
වහන්සේගේ ඇස් හමුයෙහි නපුරු දේ කොට තමාට
පළමුවනේ සිටි සියල්ලන්ට ම වඩා දුෂ්ට ලසෙ ක්රියා
කළේ ය. 26 මන්ද, ඔහු නබොත්ගේ පුත්
ජරොබෝවම්ගේ සියලු මාර්ගවල ද තමාගේ
නිරර්ථක දේව රූපවලින් ඉශ්රායලේවරුන්ගේ දවේ
සමිඳාණන් වහන්සේ කෝප කරවන ලසෙ
ඉශ්රායලේවරුන්ට කරන්නට සැලැස්සූ ඔහුගේ පාප
හැටියට ද පව් කළේ ය. 27 ඔම්රී කළ අනික්
ක්රියා ද ඔහු කළ බලවන්තකම් ද ඉශ්රායලේ
රජුන්ගේ පුරාවෘත්ත ග්රන්ථයේ වාර්තා කර තිබනෙු
නොවේ ද? 28 ඔම්රී මරණයට පත් වූ විට
සමාරියහෙි භූමිදාන කරනු ලැබී ය. ඔහුගේ පුත්
ආහබ් ඔහු වනෙුවට රජ විය.

## ආහබ් රජකමට පැමිණීම

29 ජුදාහි රජ වූ ආසාගේ තිස්අට වන අවුරුද්දේ දී
ඔම්රීගේ පුත් ආහබ් ඉශ්රායලේවරුන්ගේ රජ වී
සමාරියේ විසිදෑවුරුද්දක් ඉශ්රායලේවරුන් පාලනය
කළේ ය. 30 ඔම්රීගේ පුත් ආහබ් ද තමාට
පළමුවනේ සිටි සෑම දනොට වඩා සමිඳාණන්
වහන්සේගේ ඇස් හමුයෙහි නපුරු දේ කළේ ය.
31 තවද, ඔහු නබොත්ගේ පුත් ජරොබෝවම්ගේ
පාප මාර්ගයෙහි හැසුරුණා පමණක් නොව,
සීදොන්වරුන්ගේ රජ වූ එත්බාල්ගේ දූව වන
ජශෙබෙලේ බිරිඳ කොට පාවාගත්තේ ය. ඇරත්,
ඔහු ගොස් බාල් දේවතාවාට වැඳුම්පිදුම් කරමින්
නමස්කාර කළේ ය. 32 ඔහු සමාරියේ
ගොඩනැඟුවාවූ බාල් දේවතාවාගේ දේවාලයහෙි
බාල්ට පූජාසනයක් ද අෂේරා කප් කණු ද සෑදී ය.
33 ආහබ් තමෙ තමාට පළමුවනේ සිටි සියලු
ඉශ්රායලේ රජුන්ටත් වඩා ඉශ්රායලේවරුන්ගේ දවේ
සමිඳාණන් වහන්සේ කෝප කරවන ක්රියා කළේ
ය. 34 ජෝෂු 6:26ඔහුගේ කාලයේ දී බතෙලේහි
හීයලේ නම් තැනැත්තා විසින් ජරිකෝව
ගොඩනඟන ලදී. සමිඳාණන් වහන්සේ නූන්ගේ පුත්
ජෝෂුවා ලවා දනෙ ලද උන් වහන්සේගේ පණිවුඩය

ලසෙ, ඔහු එහි අත්තිවාරම් දමන විට ඔහුගේ
කුළුඳුලා වන අබිරාම් ද ඔහු එහි දොරටු පිහිටුවන
විට ඔහුගේ බාල පුත් සගුබ් ද නැසුණෝ ය.

### එලියා සහ නියඟය

17 ජාකො 5:17 ගිලියද්හි විසූවන්ගනේ
කනෙකු වන තිෂ්බි නම් ස්ථානයනේ වූ
එලියා, ආහබ්ට කතා කොට, "මාගේ අණ ප්‍රකාර
මිස මේ අවුරුදුවල පිනි වත්, වැසි වත් ඇති
නොවන්නේ යයි මා වැඳුම්පිදුම් කරන
ඉශ්‍රායලේවරුන්ගේ ජීවමාන දවේ සමිඳාණන්
වහන්සේගේ නාමයනේ දිවුරමි"යි කීවේ ය.
2 සමිඳාණන් වහන්සේගේ පණිවුඩය ඔහු වෙත
පැමිණ, 3 "මතෙනින් පිටත් ව, පරෙදිගට ගොස්
ජෝර්දාන් ගඟට නැගනෙහිරින් තිබනෙ කරෙත් නම්
ඔය ළඟ සැඟවී සිටින්න. 4 ඒ ඔයනේ නුඹට
බොන්න පුළුවන. එහි දී නුඹට කෑම දනේනට
කපුටුවන්ට මම අණ කළෙමි"යි කීවේ ය.
5 ඔහු ගොස් සමිඳාණන් වහන්සේ වදාළ ලසෙ
කළේ ය. ඔහු ජෝර්දාන් ගඟට නැගනෙහිරින්
තිබනෙ කරෙත් ඔය ළඟ වාසය කළේ ය.
6 කපුටුවෝ උදය කාලයේ රොටි සහ මස් ද සවස්
කාලයේ රොටි සහ මස් ද ගනොවෝ ය. 7 ඔහු ද
ඔයනේ වතුර බීවේ ය. එහතේ, දශේයට වැස්ස
නැති නිසා කලකට පසු ඔය සිඳී ගියේ ය.
8 එවිට සමිඳාණන් වහන්සේගේ පණිවුඩය ඔහු
වෙත පැමිණ, 9 ලූක් 4:25-26"නුඹ පිටත් වී සීදොන්
අසල පිහිටි ශාරපෙත් නම් නගරයට ගොස් එහි
වාසය කරන්න. නුඹට ආහාර දීමට එහි සිටින
වැන්දඹු ස්ත්‍රියකට අණ කළෙමි"යි කීවේ ය.
10 එහයෙින් ඔහු පිටත් ව ශාරපෙත් නගරයට ගොස්
වාසල් දොරටුවට පැමිණි කල, වැන්දඹු ස්ත්‍රියක
එහි දර අහුලනු දැක, ඇට අඬගසා, "කරුණාකර, මට
බොන්න භාජනයකට වතුර ටිකක් ගනෙනේනැ"යි
කීවේ ය. 11 ඇය එය ගනෙනේනට යන අතර ඔහු
ඇට අඬගසා, "කරුණාකර, ඔබේ අතින් රොටි
කැල්ලකුත් මට ගනෙන්නැ"යි කීවේ ය.
12 එවිට ඈ කතා කොට, "බඳුනක පිටි මිටකුත්,
කුලාවක තලේ ටිකකුත් මිස මා ළඟ රොටි නැත.
ඒවා සාදාගන්නට දර කෑලි දකෙක් අහුලමි. මටත්,
මාගේ පුත්‍රයාටත් තිබනෙ ඒ අන්තිම කෑම වලේ
අනුභව කළ පසු නහින්නමෙු යි ඔබේ ජීවමාන දවේ
සමිඳාණන් වහන්සේගේ නාමයනේ දිවුරමි"යි කීවා
ය.
13 එලියා ඇට කතා කොට, "බිය නොවෙන්න,
ගොස් ඔබ කී හැටියට කරන්න. එහතේ, පළමුකොට
එයින් මට කුඩා රොටියක් සාදා මා ළඟට
ගනෙනේන; පසු ව ඔබටත්, ඔබේ පුත්‍රයාටත්
සාදාගන්න. 14 මන්ද, දවේ සමිඳාණන් වහන්සේ
මසෙේ වදාරන සේක:
q214 'සමිඳාණන් මිහි පිට වැස්ස එවන දවස දක්වා
පිටි බඳුන ඉවර වන්නේ නැත;
q214 තලේ කුලාව අඩු වන්නේ නැත' "යි කීවේ ය.
15 ඈ ගොස් එලියා කී හැටියට කළා ය. එසේ ඈ
ද ඔහු ද ඇගේ ගයෙි වැසියෝ ද බොහෝ දවස්
ඒවා අනුභව කළෝ ය. 16 සමිඳාණන් වහන්සේ
එලියා ලවා දනෙ ලද උන් වහන්සේගේ පණිවුඩය
ප්‍රකාර පිටි බඳුන හිස් නොවී ය; තලේ කුලාව අඩු
නොවී ය.

### වැන්දඹුවගේ පුතු හට නැවත ජීවිතය දීම

17 ඉක්බිති ගදෙර ස්වාමි දූ වූ ඒ ස්ත්‍රියගේ
පුත්‍රයා රෝගාතුර විය. ඔහුගේ රෝගය කොපමණ
බලවත් වී ද යත්, ඔහුගේ හුස්මගැනීම නතර විය.
18 එවිට ඈ එලියාට කතා කොට, "දවේයන්
වහන්සේට කැප වූ මනුෂ්‍යය, ඔබ සමඟ මට ඇති
ආරාවුල කුමක් ද? මාගේ පාපය සිහි කරවන්නටත්,
මාගේ පුත්‍රයා මරන්නටත් මා ළඟට ඔබ ආයහෙි
ද"යි ඔහුගනේ ඇසුවා ය. 19 ඔහු ද පිළිතුරු දමෙින්,
"ඔබේ පුත්‍රයා මට දනේනැ"යි ඇට කියා ඇගේ
තුරුල්ලනේ ඔහු රැගනෙ, තමා විසූ උඩු මහලට ගනෙ
ගොස් තමාගේ ම ඇඳහෙි ඔහු තැබුවේ ය. 20 තවද,
ඔහු සමිඳාණන් වහන්සේට යාච්ඤා කරමින්, "මාගේ
දවේ සමිඳාණන් වහන්සේ, මට නවාතැන් දුන්
වැන්දඹුවගේ පුතා නැසීමනේ ඔබ ඇයට විපත්
පැමිණවූ සේක් ද" කියා, 21 2 රාජා 4:34-35තුන්වරක්
ළමයා පිට දිගා වී සමිඳාණන් වහන්සේට යාච්ඤා
කොට, "මාගේ දවේ සමිඳාණන් වහන්සේ, මේ
ළමයාගේ ප්‍රාණය නැවත ඔහු තුළට පැමිණවේවා
මැනවැ"යි කීවේ ය. 22 සමිඳාණන් වහන්සේ
එලියාගේ හඬට සවන් දුන් සේක. ළමයාගේ
ප්‍රාණය නැවත ඔහු තුළට පැමිණ ඔහු ජීවත් වුණේ
ය. 23 එලියා ළමයා රැගනෙ උඩු මහලින් ගටෙ
ගනෙවුත් ඔහුගේ මවට දී, "මනේන, ඔබේ පුතා
ජීවත් ව සිටී"යයි කීවේ ය. 24 ස්ත්‍රිය ද කතා
කරමින්, "ඔබ දවේයන් වහන්සේට කැප වූ
මනුෂ්‍යයකෙු බව ද, ඔබේ මුඛයහෙි තිබනෙ
සමිඳාණන් වහන්සේගේ පණිවුඩය සැබෑ බව ද
දනිමි"යි එලියාට කීවා ය.

### එලියා සහ ඔබදියා හමුවීම

18 බොහෝ කාලයකට පසු තුන් වන අවුරුද්දේ
දී සමිඳාණන් වහන්සේගේ පණිවුඩය එලියා
වෙත පැමිණ, "නුඹ ගොස් ආහබ් ඉදිරියහෙි පනේී
සිටින්න. මම පොළොව පිට වැස්ස එවන්නමෙි"යි
කීවේ ය. 2 එලියා ආහබ් ඉදිරියහෙි පනේී සිටින්නට
ගියේ ය. සාගතය සමාරියහෙි බලවත් ව තිබිණි.
3 ආහබ් ගදෙර ප්‍රධානියා වන ඔබදියාට අඬ
ගැසුවේ ය. ඔබදියා වනාහි සමිඳාණන් වහන්සේට
බොහෝ සයෙින් ගරුබිය ඇති කනෙකේි. 4 මන්ද,
ජසෙබෙලේ සමිඳාණන් වහන්සේගේ දිවැසිවරුන්
මරාදැමූ කල්හි, ඔබදියා දිවැසිවරුන් සියදනෙකෙු
රැගනෙ ගොස්, පණස පණස බැගින් ඔවුන් ගුහාවල
සඟවා ආහාර සහ වතුර දී, ඔවුන් පෝෂ්‍ය කළේ
ය. 5 ආහබ් ඔබදියාට කතා කොට, "දශේයහෙි
සියලු දිය උල්පත් හා ඔයවල් ළඟට යන්න; සියලු

සිවුපාවුන් නැති වන්න නොදී අශ්වයන් හා
කොටළුවන් පණපිටින් රක්ෂා කරගන්න පිණිස
සමහර විට අපට තෘණ සම්බ වේ ය”යි කීවේ ය.
6 මෙසේ මුළු දේශය පරීක්ෂා කරන පිණිස ඔවුන්
එය බෙදාගෙන ආහබ් එක මාර්ගයකින් වෙන ම
ගියේ ය; ඔබදියා වෙනේ ව වෙන මාර්ගයකින් වෙන
ම ගියේ ය.
7 ඔබදියා යන විට එලියා ඔහුට සම්බ වී ය.
ඔබදියා ඔහු හැඳිනගෙන මුණින්තළා වී, “මාගේ
ස්වාමීන් වන එලියා ඔබ දැ”යි ඇසී ය.
8 ඔහු පිළිතුරු දෙමින්, “ඒ මම ය, ‘එලියා මෙහි සිටී
ය’යි ඔබ ගොස් ඔබේ ස්වාමියාට කියන්නැ”යි ඔහුට
කී ය.
9 එවිට ඔහු මෙසේ කීවේ ය: “ඔබේ මෙහෙකරු
වන මා මරන පිණිස ආහබ්ගේ අතට පාවා දීමට
මම මොන පාපයක් කළෙමේ ද? 10 ඔබ සොයන
පිණිස මාගේ ස්වාමියා මිනිසුන් නොහැරිය ජාතියක්
වත්, රාජ්‍යයක් වත් නැතැ යි ඔබේ ජීවමාන දෙවී
සමිඳාණන් වහන්සේගේ නාමයනේ දිවුරමි. ‘ඔහු
මෙහි නැත’ කියා ඔවුන් කී කල, ඔබ ඔවුන්ට සම්බ
නොවූ බවට ඔහු ඒ රාජ්‍යවලිනුත්, ජාතීන්ගෙනුත්
දිවුරුම් ගත්තේ ය. 11 එහෙත්, ‘එලියා මෙහි සිටිනු
ඇතැ යි ගොස් ඔබේ ස්වාමියාට දන්වන්නැ’යි ඔබ
කියන්නෙහි ය. 12 තවද, මා ඔබ වෙතින් අහක් ව
ගිය වහාම දේවාත්මභාවය මා නොදන්න තැනකට
ඔබ ගෙනයනු ඇත. මා ගොස් ආහබ්ට කී කල,
ඔහුට ඔබ සම්බ නොවෙන නිසා මා මරනු ඇත.
එහෙත්, ඔබේ මෙහෙකරු වන මම, බාල වයසේ
පටන් සමිඳාණන් වහන්සේ කෙරෙහි ගරුබිය පාමින්
සිටියෙමි. 13 ජෙසෙබෙලේ සමිඳාණන් වහන්සේගේ
දිවැසිවරුන් මරාදමන කල, මා කළ දේ එනම්, උන්
වහන්සේගේ දිවැසිවරුන්ගෙන් සියදෙනෙකු පණස
පණස බැගින් ගුහාවල සඟවා ආහාර පාන දී ඔවුන්
පෝෂ්‍ය කළ හැටි මාගේ ස්වාමියාට නොකියන
ලද්දේ ද? 14 දැනුත්, ‘එලියා මෙහි සිටින්නේ ය කියා
ඔබ ගොස් ඔබේ ස්වාමියාට දන්වන්නැ’යි ඔබ
කියන්නෙහි ය. ඔහු මා මරනු ඇත.”
15 එලියා පිළිතුරු දෙමින්, “මම ඒකාන්තයෙන් ඔහු
ඉදිරියෙහි පෙනී සිටින්නෙමි යි මා වැඳුම්පිදුම් කරන
සියලු බලැති ජීවමාන සමිඳාණන් වහන්සේගේ
නාමයෙන් දිවුරමි”යි කීවේ ය.

### එලියා සහ ආහබ් රජු හමුවීම

16 එවිට ඔබදියා, ආහබ් රජු සම්බ වන්නට ගොස්
ඒ බව ඔහුට දැන්වී ය. ආහබ් එලියා සම්බ වන්නට
ගියේ ය. 17 තවද, ආහබ් රජ එලියා දුටු විට, ඔහුට
කතා කොට, “ඉශ්‍රායලේ ජනයා කළඹන තැනැත්තේ
ඔබ දැ”යි ඔහුගෙන් ඇසී ය.
18 ඔහු උත්තර දෙමින්, “මා නොව ඔබ සහ ඔබේ
පියාගේ වංශය සමිඳාණන් වහන්සේගේ ආඥා
අත්හැර, බාල් දේවතාවා පසුපස ගිය කාරණය නිසා
ඔබ හැම ඉශ්‍රායලේ ජනයා කැළඹුවහු ය. 19 ඉතින්,
දැන් පණිවුඩ යවා සියලු ඉශ්‍රායලේවරුන් ද බාල්ගේ
දිවැසිවරුන් හාරසිය පණහ ද ජෙසෙබෙලේගේ
මේසයේ වාඩි වී ආහාර වළඳන අෂේරා
දේවතාවියගේ දිවැසිවරුන් හාරසියදෙනා ද මා වෙත
කර්මලේ කන්දට රැස් කරන්නැ”යි කී ය.
20 එවිට ආහබ් මුළු ඉශ්‍රායලේ ජනයා අතරට
පණිවුඩ යවා දිවැසිවරුන් කර්මලේ කන්දට රැස් කරවී
ය.

### කර්මලේ කන්ද මත පූජාව

21 එවිට එලියා මුළු සෙනඟ ළඟට අවුත් කතා
කොට, “තීරණයක් නොගෙන දෙගිඩියාවෙන් ඔබ
කොපමණ කල් සිටින්නහු ද? සමිඳාණන් වහන්සේ
දෙවියන් වහන්සේ නම්, උන් වහන්සේ අනුව යන්න.
බාල් දේවතාවා දෙවියන් වහන්සේ නම්, ඔහු අනුව
යන්නැ”යි කීවේ ය. එහෙත්, සෙනඟ ඔහුට කිසි
උත්තරයක් දුන්නේ නැත. 22 එවිට එලියා සෙනඟට
කතා කොට, “සමිඳාණන් වහන්සේගේ
දිවැසිවරයකු ව, ඉතිරි ව සිටින්නේ මම පමණකි.
එහෙත්, බාල් දේවතාවාගේ දිවැසිවරු හාරසිය
පණස්දෙනෙක් සිටිති. 23 එබැවින් අපට ගොනුන්
දෙදෙනෙකු දෙත් වා! ඔව්හු එක ගොනෙකු
තෝරාගෙන කැලිවලට කපා, දර පිට තබා යටින්
ගිනි නොතබත් වා! මමත් අනික් ගොනා පිළියෙළ
කොට දර පිට තබා, යටින් ගිනි නොතබන්නෙමි.
24 ඔබ හැම ඔබේ දෙවියන්ගේ නාමය කියා යාච්ඤා
කරන්න. මමත් සමිඳාණන් වහන්සේගේ නාමය කියා
යාච්ඤා කරන්නෙමි. එවිට ගිනි එවීමෙන් උත්තර
දෙන දෙවියන් වහන්සේ ම සැබෑ දෙවියන් වහන්සේ
වන සේක් වා!”යි කීවේ ය. මුළු සෙනඟ උත්තර
දෙමින්, “ඒ කීම යහපතැ”යි කීවෝ ය.
25 එලියා බාල් දේවතාවාගේ දිවැසිවරුන්ට කතා
කොට, “ඔබ හැම බොහෝ දෙනෙකු හයෙන්,
පළමුකොට ගොනෙකු තෝරාගෙන පිළියෙළ කර,
ඔබේ දෙවියන්ගේ නාමය කියා යාච්ඤා කරන්න.
එහෙත්, යටින් ගිනි නොතබන්නැ”යි කීවේ ය.
26 ඔව්හු තමන්ට ලැබුණු ගොනා රැගෙන පිළියෙළ
කොට, උදය පටන් ඉර මුදුන් වේලාව දක්වා බාල්
දේවතාවාගේ නාමයෙන් යාච්ඤා කරමින්, “අහෝ
බාල් දේවතාවෙනි” කියා කෑ ගසමින්, සාදා තිබුණු
පූජාසනය වටේට නට නටා ඇවිද්දෝ ය. එහෙත්,
කිසි හඬක් වත්, උත්තර දුන් කිසිවකේ වත් නො වූ
හ.
27 ඉර මුදුන් වේලාවේ එලියා ඔවුන්ට කවටකම්
කරමින්, “ශබ්ද නඟා මොරගසන්න, මන්ද, ඔහු
දෙවියෙකි. ඔහු කල්පනා කරමින් හෝ බැහැර
ගොසින් හෝ ගමනක් යමින් හෝ ඇත. සමහර විට
ඔහු නිදාගෙන සිටියි. ඒ නිසා පුබුදු වන්න උවමනා
ය”යි කීවේ ය. 28 ඔව්හු මහත් හඬින් මොරගසා
තමන්ගේ සිරිත අනුව ලේ ඇඟේ ගලා යන තුරු
පිහිවලිනුත්, හෙල්ලවලිනුත් තමන්ගේ ශරීර
කපාගත්හ. 29 මද්දහන පසු වී සවස යාගය ඔප්පු
කරන වේලාව දක්වා ඔව්හු ඔල්මාදයෙන්
දොඩවමින් බෙරිහන් දුන්හ. එහෙත්, කිසි හඬක් වත්

උත්තර දුන් කිසිවකේ වත්, සැලකූ කනෙකේ වත්
නොවූ හ.
30 එවිට එලියා, “මා ළඟට එන්නැ”යි සෙනඟට කී
ය. මුළු සෙනඟ ඔහු ළඟට ආවෝ ය. ඔහු වනාහි
කඩා දමා තිබූ සමිඳාණන් වහන්සේගේ පූජාසනය
යළි සාදා, 31 උත් 32:28; 35:10‘නුඹේ නාමය
ඉශ්රායලේ වන්නේ ය’ යන සමිඳාණන් වහන්සේගේ
පණිවුඩය ලැබූ යාකොබ්ගේ පුත්රයන්ගේ
ගෝත්රවල ගණන ලෙස ගල් දොළොසක් රැගෙන
32 උන් වහන්සේගේ නාමයෙන් පූජාසනයක්
ගොඩනැඟී ය. ඉන්පසු ඒ පූජාසනය වටේට වතුර
ලීටර් දහහතරක් පමණ අල්ලන තරම් වූ අගලක්
කපා, 33 දර පිළිවෙළින් තබා, ගොනා කැබලි කොට
කපා දර පිට තැබී ය. තවද, “වතුර සැළි සතරක්
පුරවා දවන යාග පූජාව පිටත්, දර පිටත්
වත්කරන්නැ”යි ඔහු කීවේ ය. 34 දෙ වන වරත්,
“එසේ ම කරන්නැ”යි ඔහු කී විට ඔව්හු දෙ වන
වරත් එසේ කළෝ ය. තුන් වන වරත්, “එසේ ම
කරන්නැ”යි ඔහු කී විට, ඔව්හු තුන් වන වරත් එසේ
කළෝ ය. 35 වතුර පූජාසනය වටේට ගලා ගොස්,
අගල ද වතුරෙන් පිරුණේ ය.
36 සවස යාගය ඔප්පු කරන වේලාවේ දිවැසිවර
එලියා ළං වී කතා කොට, “ආබ්රහම්ගේ ද
ඊසාක්ගේ ද ඉශ්රායලේගේ ද දෙවි සමිඳාණන්
වහන්ස ඔබ ඉශ්රායලේ හි දෙවියන් වහන්සේ බව ද
මා ඔබේ සේවකයා බව ද මා මේ දෙය කළේ,
ඔබේ වචනය ලෙස බව ද අද ඔවුන්ට දැනගන්නට
ලැබේ වා! 37 සමිඳාණන් වහන්ස මට උත්තර දුන
මැනව. ස්වාමීන් වන ඔබ දෙවියන් වහන්සේ බවත්,
මේ සෙනඟගේ සිත් නැවත හරවාගත්තේ ඔබ ම
බවත් මොවුන් දැනගන්න පිණිස මට උත්තර දුන
මැනව”යි කී ය.
38 එවිට සමිඳාණන් වහන්සේ වෙතින් ගිනි බැස
පූජාවත්, දරත්, ගලුත්, ධූලිත් දවා අගලේ වතුරත්
වියළවා දැමී ය. 39 මුළු සෙනඟ එය දැක මුණින්තළා
වැටී, “සමිඳාණන් වහන්සේ ම දෙවියන් වහන්සේ ය;
සමිඳාණන් වහන්සේ ම දෙවියන් වහන්සේ ය”යි
කීවෝ ය.
40 එලියා ඔවුන්ට කතා කොට, “බාල්ගේ
දිවැසිවරුන්ගෙන් එක් කෙනෙකුට වත් ගැළවී යන්න
නොදී ඔවුන් අල්ලාගන්නැ”යි කී ය. ඔවුන් අල්ලාගත්
පසු, එලියා ඔවුන් කීෂොන් ඔය ළඟට ගෙන ගොස්
එහි දී ඔවුන් මැරී ය.

### නියඟය කෙළෙවර වීම

41 එලියා ආහබ්ට කතා කොට, “හැරී ගොස්
කන්න, බොන්න. මන්ද, මහා වර්ෂා හඬක් ඇසේ
ය”යි කීවේ ය. 42 යාකොබ් 5:18ආහබ් කන බොන
පිණිස හැරී ගියේ ය. එලියා කර්මෙල් කන්ද මුදුනට
නැඟී, බිම වැටී දණහිස් දෙකෙ අතරේ මුහුණ
තබාගෙන, 43 “ඔබ ගොස් මුහුද දෙසෙ බලන්නැ”යි
තම වැඩකාරයාට කී ය. ඔහු ගොස් බලා අවුත්,
“කිසිවක් නැතැ”යි කී විට, “නැවත සත්වරක්
යන්නැ”යි ඔහු කීවේ ය. 44 සත් වන වර ඔහු කතා
කොට, “මිනිසකුගේ අතක් වැනි කුඩා වලාකුළක්
මුහුදින් නැඟී එන්නේ ය”යි කීවේ ය. ඔහු ද, “
‘වැස්ස ඔබ නොවළක්වන පිණිස ඔබේ රථය
සූදානම් කරගෙන ගිය මැනව’ කියා ඔබ ගොස්
ආහබ්ට කියන්නැ”යි දැන්වී ය.
45 ඉක්බිති මඳ වේලාවකින් අහස වලාකුළුවලින් ද
සුළඟින් ද අඳුරු විය. මහත් වැස්සක් ද ඇති විය.
ආහබ් රථයට නැඟී ජෙශ්රයෙලේ නම් නගරයට
ගියේ ය. 46 සමිඳාණන් වහන්සේගේ බලය එලියා
පිට පැමිණි නිසා, ඔහු සිය ඉඟටිය වටා වූ වස්ත්රය
අල්ලාගෙන ආහබ්ට පෙරටු ව ජෙශ්රයෙලේ නගරයට
ඇතුළු වන තැන දක්වා දිවී ය.

### එලියා හොරෙබ් කන්දට යෑම

19 එලියා කළ සියල්ලත්, ඔහු සියලු දිවැසිවරුන්
කඩුවෙන් මරාදැමූ බවත් ආහබ් ජෙසෙබෙල්ට
දැන්වී ය. 2 එවිට ජෙසෙබෙල් කතා කොට, “මා
හෙට මේ වේලාවට පමණ ඔබේ ප්රාණය ඒ
දිවැසිවරුන්ගෙන් එක් කෙනෙකුගේ ප්රාණය මෙන්
වන්නට සැලැස්සුවේ නැත්නම්, දෙවිවරු මා ඉතා
දරුණු ලෙස මරාදමත් වා”යි පණිවුඩකාරයකු අත
එලියාට කියා ඇරියා ය. 3 ඔහු ඒ අසා බිය වී තම
පණ ගළවාගැනීමට පලා ගියේ ය. මෙසේ ගොස්
ඔහු ජුදාට අයිති බයෙර්-ෂෙබා නම් ස්ථානයට පැමිණ
තම වැඩකාරයා එහි නවතින්නට හැර, 4 ජෝනා
4:3තමා ම මුළු දවසක ගමන් ප්රමාණය නිමවමින්
පාළුකරයට පිවිස රෝතමේ නම් ගසක් යට වාඩි වී,
තමා මැරෙන ලෙස ඉල්ලමින් “සමිඳාණන් වහන්ස,
ඉතින් ඇත, දැන් මාගේ ප්රාණය ගත මැනව. මන්ද,
මාගේ පියවරුන්ට වඩා මම උතුම් නොවෙමි”යි කී ය.
5 මෙසේ කියා ඔහු ඒ රෝතමේ ගස යට වැතිර
නිදාගත්තේ ය. එවිට දේව දූතයෙක් ඔහුට අතගසා,
“නැඟිට කන්නැ”යි කී හයින්, 6 ඔහු බැලූ විට තම
හිස ළඟ අඟුරු පිට පිළිස්සූ රොටියක් හා වතුර
භාජනයක් තිබෙනු දැක කා බී නැවත වැතුරුණේ ය.
7 තවද, සමිඳාණන් වහන්සේගේ දූතයා දෙ වන වර
අවුත්, ඔහුට අතගසා, “නැඟිට කන්න, ගමන නුඹට
දුර වැඩි වන්න පුළුවනැ”යි කීවේ ය. 8 ඔහු නැඟිට
කා බී, ඒ ආහාරයේ සවි ශක්තියෙන් දවල් සතළිසක්
හා රෑ සතළිසක් ගමන් කර දෙවියන් වහන්සේගේ
කන්ද වන හොරෙබ් ළඟට පැමිණියේ ය.
9 පසු ව ඔහු එහි ගුහාවකට ඇතුළු වී නවාතැන්
ගත්තේ ය. සමිඳාණන් වහන්සේගේ පණිවුඩය ද
ඔහු වෙත පැමිණියේ ය. උන් වහන්සේ ඔහුට කතා
කොට, “එලියා, නුඹ මෙහි කුමක් කරන්නෙහි දැ”යි
ඔහුගෙන් ඇසූ සේක.
10 රෝම 11:3 ඔහු පිළිතුරු දෙමින්, “මම සියලු
බලැති දෙවි සමිඳාණන් වහන්සේ උදෙසා බොහෝ
උද්යෝගයෙන් සේවය කළෙමි. කුමක්හයින් ද,
ඉශ්රායලේ ජනයා ඔබේ ගිවිසුම අත්හැර, ඔබේ
පූජාසන කඩාදමා, ඔබේ දිවැසිවරුන් ද කඩුවෙන්
මැරුවෝ ය. ඉතුරු ව සිටින්නේ මම පමණක් ය.

ඔව්හු මාගේ ප්‍රාණයත් නැති කරන්න සොයති”යි කී
ය.
11 උන් වහන්සේ කතා කොට, “පිටතට අවුත්
කන්ද උඩ සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි
සිටින්නැ”යි වදාළ සේක. එවිට සමිඳාණන් වහන්සේ
ඒ ළඟින් ගිය සේක. උන් වහන්සේට පෙරටුවෙනේ
මහා බලවත් හුළඟක් කඳු දෙදරවා, පර්වත බිඳගෙන
ගියේ ය. එහෙත්, සමිඳාණන් වහන්සේ සුළඟෙහි
නොවූ සේක. සුළඟට පසු පොළෝ කම්පාවක් විය.
එහෙත්, සමිඳාණන් වහන්සේ පොළෝ කම්පාවෙහි
නොවූ සේක. 12 පොළෝ කම්පාවට පසු ගින්නක්
විය. එහෙත්, සමිඳාණන් වහන්සේ ගින්නෙහි නොවූ
සේක. ගින්නට පසු මඳ පවනක හඬක් විය.
13 එලියා ඒ අසා තමාගේ මුහුණ සළුවෙනේ
වසාගෙන පිටතට ගොස් ගුහාවේ දොරකඩ සිටියේ
ය. එවිට හඬක් ඔහු වෙත පැමිණ, “එලියා නුඹ
මෙහි කුමක් කරන්නෙහි දැ”යි ඇසී ය.
14 ඔහු ද, “මම සියලු බලැති දෙවි සමිඳාණන්
වහන්සේ උදෙසා බොහෝ උද්‍යෝගයෙනේ සේවය
කළෙමි. මන්ද, ඉශ්‍රායලේ ජනයා ඔබේ ගිවිසුම
අත්හැර, ඔබේ පූජාසන කඩාදමා, ඔබේ දිවැසිවරුන්
කඩුවෙනේ මැරුවෝ ය. ඉතුරු ව සිටින්නේ මම
පමණකි. ඔව්හු මාගේ ප්‍රාණයත් නැති කරන්නට
සොයති”යි කීවේ ය.
15 2 රාජා 8:7-13 සමිඳාණන් වහන්සේ ඔහුට කතා
කොට, “යන්න, දමස්කයේ පාළුකර මාර්ගයෙනේ ම
ආපසු යන්න. ගොස් හසායලේ සිරියාවේ රජකමට
ආලේප කරන්න. 16 2 රාජා 9:1-6නිම්ෂිගේ පුත්
ජේහු ඉශ්‍රායලේවරුන්ගේ රජු වශයෙනේ ආලේප
කරන්න. ආබලේ මෙහොලාහී ෂාපාත්ගේ පුත් එලිෂා
නුඹ වෙනුවට දිවැසිවරයකු ලෙස ආලේප කරන්න.
17 හසායලේගේ කඩුවෙනේ ගැළවෙනෙ අය ජේහු
විසින් මරනු ලබත්. ජේහුගේ කඩුවෙනේ ගැළවෙනෙ
අය එලිෂා විසින් මරනු ලබත්. 18 රෝම 11:4එසේ
වුවත්, බාල් දේවතාවාට නොනැමූ දණ ඇති, ඔහු
සිප නොගත් මුඛ ඇති සත්දහස්දෙනෙකු
ඉශ්‍රායලේවරුන් අතරෙහි ඉතුරු කරගන්නෙමි”යි
වදාළ සේක.

### එලිෂා කැඳවනු ලැබීම

19 මෙසේ එලියා එතැනින් ගිය විට ෂාපාත්ගේ පුත්
එලිෂා ඔහුට සම්බ විය. එලිෂා ගවයන් දොළොස්
බානක් පිටුපස හාමින් සිටියේ ය. දොළොස් වන
බාන සමඟ එලිෂා සිටිනු ඔහු දිටී ය. එලියා ඔහු
ළඟට ගොස් සිය සළුව ඔහු පිට හෙළී ය. 20 එවිට
ඔහු ගවයන් අත්හැර එලියා පසුපස දුව ගොස්,
“මාගේ පියාණන් හා මෑණියන් සිඹ එන්නට මට
අවසර ලැබේ වා! ඉන්පසු ඔබ පසුපස එන්නෙමි”යි
කීවේ ය. ඔහු ද කතා කොට, “හැරී යන්න; මම ඔබ
නොවළක්වමි”යි ඔහුට කීවේ ය.
21 එවිට එලියා වෙතින් එලිෂා හැරී ගොස් ගවයන්
බාන රැගෙන මරා, ගවයන්ගේ වියදඬු දර වශයෙනේ
පාවිච්චි කර, උන්ගේ මස් තම්බා, මිනිසුන්ට දුන්නේ
ය. ඔව්හු ද එය කෑවෝ ය. පසු ව එලිෂා නැඟිට
එලියා පසුපස ගොස් ඔහුට සේවය කළේ ය.

### සිරියාව වටලෑම

20 සිරියාවේ රජ වන බෙනේ-හදද් සිය මුළු
සේනාව රැස් කොට, තවත් රජවරුන්
තිස්දෙදෙනෙකු ද අශ්වයන් ද අශ්වරථ ද සමඟ අවුත්
සමාරිය වටලා ඊට විරුද්ධ ව යුද්ධ කළේ ය. 2 ඔහු
නගරයේ සිටි ඉශ්‍රායලේ රජ වන ආහබ් වෙත
පණිවුඩකාරයන් යවමින්, 3 “ඔබේ රන් රිදී සහ
භාර්යාවන් ද දරුවන්ගෙනේ ඉතා ප්‍රසන්න අය ද මට
පාවා දිය යුතු ය”යි ඔහුට දන්වා යැවී ය.
4 ඉශ්‍රායලේ රජ ද, “මාගේ ස්වාමීන් වන
රජතුමනි, ඔබේ කීම ප්‍රකාර මමත්, මට ඇති
සියල්ලත් ඔබට අයත් වමු”යි උත්තර දුන්නේ ය.
5 පණිවුඩකාරයෝ නැවත අවුත් කතා කොට,
“ඔබේ රන් රිදී ද ඔබේ අඹු දරුවන් ද ඔබ මට
දෙන්නේ ඕනෑ යයි ඔබට කියා එවීමි. 6 ඇරත් හෙට
මේ වේලාවට පමණ මාගේ සේවකයන් ඔබ ළඟට
එවන්නෙමි. ඔවුන් ඔබේත්, ඔබේ සේවකයන්ගේත්
ගෙවල් සෝදිසි කර, ඔබට ප්‍රසන්න වන සියල්ල ම
ඔවුන්ගේ අතට ගෙන එනු ඇත කියා බෙනේ-හදද්
කියන්නේ ය”යි සැළ කළහ.
7 එවිට ඉශ්‍රායලේ රජ දේශයේ සියලු ප්‍රජා
මූලිකයන් කැඳවා, “මේ මිනිසා නපුරක් කරන්න
සොයන හැටි කල්පනා කර බලන්න, ඔහු මාගේ
භාර්යාවන් ද මාගේ දරුවන් ද මාගේ රන් රිදී ද
මාගෙනේ ඉල්ලා එවූ විට, දෙන්නට බැරිය කියා මම
නොකීවෙමි”යි දැන්වී ය.
8 සියලු ප්‍රජා මූලිකයෝ ද මුළු සෙනඟ ද කතා
කොට, “ඔබ ඇහුම්කන් නුදුන මැනව; ඊට එකඟ
නූණ මැනව”යි ඔහුට කී හ.
9 එබැවින් ඔහු බෙනේ-හදද්ගේ පණිවුඩකාරයන්ට
කතා කොට, “ඔබ පළමුවෙනේ ඔබේ මෙහෙකෙරුවා
අත කියා එවූ සියල්ල ම කරන්නෙමි, එහෙත්, මේ
දේ මට කරන්නට බැරිය කියා මාගේ ස්වාමීන් වන
රජතුමා හට දන්වන්නැ”යි කී ය. පණිවුඩකාරයෝ ද
පිටත් ව ගොස් ඔහුට එම උත්තරය දැන් වූ හ.
10 බෙනේ-හදද් ද කතා කොට, “සමාරියේ දූවිලි මා
පසුපස එන සියල්ලන්ගෙනේ එක එකාට මිට මිට
බැගින් ගන්න වත් මදිවන තරම් විශාල සෙනඟක්
නාවොත්, දෙවිවරු මට ඉතා දරුණු ලෙස දඬුවම්
කරත් වා”යි ඔහුට දන්වා ඇරියේ ය.
11 ඉශ්‍රායලේ රජ පිළිතුරු දෙමින්, “උදම් ඇනිය
යුත්තේ යුද්ධායුධ පළඳන්නා නොව ඒවා ගලවන්නා
ය කියා ඔහුට දන්වන්නැ”යි කීවේ ය.
12 රජුන් සමඟ කූඩාරම්වල මත්පැන් පානය
කරමින් සිටි බෙනේ-හදද් ඒ කීම ඇසූ විට, “සටනට
සැරසෙන්නැ”යි සිය සේවකයන්ට කීවේ ය. ඔව්හු ද
නගරයට විරුද්ධ ව සැරසී සිටගත්හ.

## ඉශ්රායලේවරුන්ට ජයග්රහණය

13 එවිට දිවැසිවර කනෙකේ ඉශ්රායලේ හි රජ වන
ආහබ් ළඟට අවුත් කතා කොට, “මේ මුළු මහා
සේනාව ඔබ දුටුවෙහි ද? ‘මා සමිඳාණන් වහන්සේ
බව ඔබ දැනගන්න පිණිස මම අද ඔවුන් ඔබ අතට
පාවා දමේ’යි සමිඳාණන් වහන්සේ වදාරන සේකැ”යි
පැවසී ය.
14 ආහබ්, “කවරකෙුගේ මාර්ගයනේ දැ”යි ඇසූ
විට, ඔහු උත්තර දමේන්, “ජනපදවල අධිපතීන්ගේ
තරුණ භටයන් ලවා ය කියා සමිඳාණන් වහන්සේ
වදාරන සේකැ”යි දැන්වී ය. එවිට ආහබ්, “සටන
පටන් ගන්නේ කවරකේ දැ”යි ඇසූ විට ඔහු ද, “ඔබ
ය”යි උත්තර දුන්නේ ය.
15 ඉන්පසු ආහබ් ජනපදවල අධිපතීන්ගේ
සේවකයන් රැස් කළෙේ ය. ඔව්හු
දසෙියතිස්දදෙනෙකේ වූ හ. ඔවුන්ට පසු ව ඔහු මුළු
සනෙඟ වන සියලු ඉශ්රායලේ ජනයා ද රැස් කළෙේ
ය. ඔව්හු සත්දහසක් වූ හ.
16 ඉර මුදුන් වලේෙ ඔව්හු පිටතට ගියෝ ය.
එහතේ, බනේ-හදද් වනාහි තමාට උපකාර කරන
රජවරුන් තිස්දනො සමඟ මත් වන තරමට මිදියුස
පානය කරමින් කූඩාරම්වල සිටියේ ය. 17 ජනපදවල
අධිපතීන්ගේ සේවකයෝ පළමුවනේ පිටතට ගියෝ
ය. බනේ-හදද් සොයා බැලූ විට, “මිනිසුන් සමහරකේ
සමාරියනේ පිටතට ආවෝ යැ”යි දන්වන ලදී. 18 ඔහු
ද කතා කොට, “ඔව්හු සාමදානය පිණිස පැමිණියෝ
නම්, පණපිටින් අල්ලාගන්න. යුද්ධය පිණිස
පැමිණියෝ නම්, එසේ වුණත්, පණපිටින්
අල්ලාගන්නැ”යි කීවේ ය.
19 මසෙේ ජනපදවල අධිපතීන්ගේ සේවකයෝ ද
ඔවුන් අනුව ගිය සේනාව ද නගරයනේ පිටතට
ගොස් 20 එකිනකො එක මිනිසකෙු බැගින් මැරූ හ.
එවිට සිරියාවේ වැසියෝ පලා ගියහ. ඉශ්රායලේවරු
ද ඔවුන් ලුහුබැඳ ගියහ. සිරියාවේ රජ වන බනේ-
හදද් අසකෙු පිට නැඟී සිය අශ්වාරෝහක පිරිසක්
සමඟ ගැළවී ගියේ ය. 21 ඉශ්රායලේ රජ පිටතට
ගොස් අශ්වයන්ට ද අශ්ව රථවලට ද පහර දී
සිරියාවේ වැසියන් හොඳට ම පරාජය කළෙේ ය.

## විවේක කාලයක්

22 දිවැසිවරයා ඉශ්රායලේ රජු වතෙ පැමිණ, “ලබන
වසන්ත කාලයේ දී සිරියාවේ රජ ඔබට විරුද්ධ ව
එනු ඇත. එබැවින් ඔබ ශක්තිමත් වී කුමක් කළ යුතු
ද කියා කල්පනා කර බලන්නැ”යි කී ය. 23 තවද,
සිරියාවේ රජුගේ සේවකයෝ ඔහුට කතා කොට,
“ඔවුන්ගේ දවේියෝ කඳුවල දවේ කනෙකේ. එබැවින්
ඔව්හු අපට වඩා බලවත් වූවෝ ය. එහතේ, සම
භූමියෙහි අපි ඔවුන්ට විරුද්ධ ව සටන් කරමු නම්,
අපි සැබැවින් ම ඔවුන් පරාජය කරන්නමෙු.
24 මලෙසෙ කළ යුතු ය. රජවරුන් තම තමන්ගේ
ස්ථානවලින් ඉවත් කොට, ඔවුන් වනෙුවට
සේනාපතීන් සිටුවා, 25 නැති වූ ඔබේ සේනාව හා
සමාන සේනාවක් ද අශ්වයන් හා සමාන අශ්වයන් ද
අශ්ව රථ හා සමාන අශ්ව රථ ද ගණන් කරගත
මැනව. එවිට අපි සම භූමියෙහි ඔවුන්ට විරුද්ධ ව
සටන් කරන්නමෙු නම්, අපි සැබැවින් ම ඔවුන්
පරාජය කරන්නමෙු”යි කී හ. ඔහු ද ඔවුන්ගේ හඬට
ඇහුම්කන් දී එසේ කළෙේ ය.

## ජයග්රහණය ලැබීම

26 ඊට පසු පැමිණි වසන්ත කාලයේ දී බනේ-හදද්
සිරියාවේ වැසියන් රැස් කොට ඉශ්රායලේවරුන්ට
විරුද්ධ ව සටනට අපකේ නම් ස්ථානයට ගියේ ය.
27 ඉශ්රායලේ ජනයා ද රැස් කරනු ලැබ, සන්නාහ
සන්නද්ධ වී ඔවුන්ට විරුද්ධ ව ගියහ. ඉශ්රායලේ
ජනයා කුඩා එළු පට්ටි දකෙකට සමාන ව ඔවුන්
ඉදිරියේ කඳවුරු බැඳ සිටියහ. එහතේ, සිරියාවේ
වැසියන්ගනේ දේශය පිරී තිබිණි.
28 දවේියන් වහන්සේට කැප වූ මනුෂ්යයා ළං වී
ඉශ්රායලේ රජුට කතා කොට, “ ‘සමිඳාණන්
වහන්සේ කඳුවල දවේ කනෙකෙු මිස, මිටියාවතේ
දවේ කනෙකේ නොවන සේකැ’යි සිරියාවේ වැසියන්
කී නිසා, ‘මා සමිඳාණන් වහන්සේ බව නුඹලා
දැනගන්න පිණිස මේ මුළු මහා සමූහය නුඹ අතට
පාවා දනේනමේ”යි සමිඳාණන් වහන්සේ වදාරන
සේකැ”යි පැවසී ය.
29 තවද, එක් සනෙඟක් අනික් සනෙඟට ඉදිරියනේ
සත් දවසක් කඳවුරු බැඳ සිටියෝ ය. සත් වන දින
යුද්ධය ඇරඹිණි. ඉශ්රායලේ ජනයා සිරියාවේ
වැසියන්ගේ පාබල සේනාවනේ ලක්ෂයක් එක
දවසක දී මැරූ හ. 30 ඉතිරි අය අපකේ නම් නගරය
තුළට පලා ගියහ. එහි දී ඉතිරි ව සිටි
විසිහත්දහසක් මනුෂ්යයන් පිට පවුරු වැටිණි.
30 බනේ-හදද් පලා ගොස් නගරයට පැමිණ ඇතුළු
ගයෙකට ගියේ ය. 31 එවිට ඔහුගේ සේවකයෝ
ඔහුට කතා කොට, “ඉශ්රායලේ වංශයේ රජවරුන්
කරුණාවන්ත රජවරුන් බව අප අසා ඇත. ඉතින්,
අපේ ඉඟටිවල ගෝණි රදෙි බැඳගනෙ, හිස් මත
ලණු දමාගනෙ, ඉශ්රායලේ රජු ළඟට යන්නට අපට
අවසර දනෙු මැනව, සමහර විට ඔහු ඔබේ ප්රාණය
ආරක්ෂා කරනු ඇතැ”යි කී හ. 32 එවිට ඔව්හු
තමන්ගේ ඉඟටිවල ගෝණි රදෙි බැඳගනෙ, හිස් මත
ලණු දමාගනෙ, ඉශ්රායලේ රජු ළඟට පැමිණ, “ඔබේ
මහෙකෙරු වන බනේ-හදද්, ‘මාගේ ප්රාණය ආරක්ෂා
කළ මැනව’යි කියන්නේ ය”යි සැළ කළහ. එවිට
ආහබ් කතා කොට, “ඔහු තව ම ජීවත් ව සිටී ද?
ඔහු මාගේ සහෝදරයා ය”යි කීවේ ය.
33 ඒ මනුෂ්යයො ද රජු කී වචනය හොඳ ලකුණක්
කොට සලකා, එය වහා පිළිගනෙ, “ඔහු ඔබේ
සහෝදරවන බනේ-හදද් ය”යි කීවෝ ය. ඔහු ද කතා
කොට, “ඔබ ගොස් ඔහු කැඳවාගනෙ එන්නැ”යි කී
ය. එකල බනේ-හදද් ඔහු වතෙ පැමිණියේ ය. රජ ද
ඔහු රථයට නංවාගත්තේ ය. 34 බනේ-හදද් ද කතා
කරමින්, “මාගේ පියාණන් විසින් ඔබේ
පියාණන්ගනේ ගන්න ලද නගර ආපසු දනේනමේ.

මාගේ පියාණන් සමාරියෙහි වළෙඳෙ පොළවල් සෑදූ
ලෙස ඔබට ද දමස්කයෙහි සාදාගන්න පුළුවනැ"යි
කීවේ ය. ආහබ් ද කතා කොට, "මම ද මේ ගිවිසුම
පිට ඔබ යන්න හරිමි"යි ඔහු සමඟ ගිවිසුමක් කර
ඔහු යන්නට හැරියේ ය.

### ආහබ් රජුගේ ප්‍රතිපත්ති හළො දැකීම

35 දිවැසිවරුන්ගේ කණ්ඩායමනේ එක්තරා මිනිසකේ
සමිඳාණන් වහන්සේගේ අණ පරිදි තමාගේ
සහකාරයාට කතා කොට, "මට ගසන්නැ"යි කී ය.
එහතේ, ඒ මිනිසා ඔහුට ගසන්න අකමැති විය. 36 1
රාජා 13:24එවිට ඔහු, "ඔබ සමිඳාණන් වහන්සේගේ
අණට කීකරු නොවූ නිසා මා ළඟින් අහක් ව ගිය
කණෙහෙි ම සිංහයකේ ඔබ මරන්නේ ය"යි කීවේ
ය. ඔහු අහක් ව ගිය කණෙහෙි ම සිංහයකේ ඔහුට
සම්බ වී ඔහු මැරුවේ ය.
37 තවත් මිනිසකෙු ඔහුට සම්බ වී, "මට
ගසාපන්නැ"යි ඔහු කීවේ ය. ඒ මිනිසා ඔහුට ගසා,
එසේ ගැසීමනේ තුවාළ කළෙේ ය. 38 එවිට
දිවැසිවරයා පිටත් ව තමාගේ හිස්වැස්මනේ ඇස්
බැඳගනෙ, වසේමාරු කරගනෙ, රජු එනතකේ මඟ
බලා සිටියේ ය. 39 රජු ඒ ළඟින් යන කල ඔහු රජුට
මොරගසා, "ඔබේ මහෙකෙරු වන මම සටන්
මධ්‍යයට ගියෙමි. එවිට එක් මිනිසකේ තවත්
මිනිසකෙු මා ළඟට ගනෙවුත් කතා කොට, 'මේ
මිනිසා බලාගන්න. ඔහු යම් අන්දමකින් ගැළවී
ගියොත්, ඔහුගේ ප්‍රාණය වනෙුවට ඔබේ ප්‍රාණය
දනේනට වේ. නැතහොත් රිදී කාසි තුන්දාහක්
ගවේය යුතු ය'යි කීවේ ය. 40 එහතේ, ඔබේ
මහෙකෙරුවා නොයෙකේ කටයුතු කරන අතර ඔහු
සැඟවී ගියේ ය"යි කීවේ ය. ඉශ්රායලේ රජ, "ඔබේ
තීන්දුව එසේ ම වන්නේ ය. ඔබ ම ඒක තීන්දු
කළෙහෙි ය"යි කීවේ ය.
41 එවිට ඔහු වහා ම හිස්වැස්ම තමාගේ
ඇස්වලින් ඉවත් කළෙේ ය. එවිට ඔහු දිවැසිවරයකෙු
බව ඉශ්රායලේ රජ හැඳිනගත්තේ ය. 42 ඔහු රජුට
කතා කොට, "සමිඳාණන් වහන්සේ මසෙේ වදාරන
සේක: 'මා විසින් මරණයට නියම කරන ලද මිනිසා
නුඹ නිදහස් කර හැරිය බැවින් ඔහුගේ ප්‍රාණය
වනෙුවට නුඹේ ප්‍රාණය ද ඔහුගේ සනෙඟ වනෙුවට
නුඹේ සනෙඟ ද දනේන වේ යැ' "යි කීවේ ය.
43 ඉශ්රායලේ රජ ශෝකයනේ ද කෝපයනේ ද යළි
සමාරියට පැමිණියේ ය.

### නාබොත්ගේ මිදි වත්ත

21 ඉන්පසු මසෙේ සිදු විය. සමාරියේ රජු වන
ආහබ්ගේ මාලිගාවට සමීපව ජශේරයෙලේ
නගරයේ නාබොත්ට මිදි වත්තක් තිබිණි. 2 ආහබ්
නාබොත්ට කතා කොට, "ඔබේ මිදි වත්ත මාගේ
ගටෙ සමීපව තිබනෙ නිසා එය මට එළවලු වත්තක්
පිණිස දනේන; ඒ වනෙුවට ඊට වඩා හොඳ මිදි
වත්තක් ඔබට දනේනමෙි. එසේ නැත්නම්, ඔබ
කැමැති නම්, එහි වටිනා මිල ඔබට දනේනමෙි"යි කී
ය.
3 "මාගේ පියවරුන්ගේ උරුමය ඔබට දීමනේ
සමිඳාණන් වහන්සේ මා වළක්වන සේක් වා"යි
නාබොත් ආහබ්ට කී ය.
4 එසේ ජශේරයෙලේය නාබොත් කතා කොට,
"මාගේ පියවරුන්ගේ උරුමය ඔබට නොදමෙි"යි කී ඒ
වචනය නිසා ආහබ් ශෝක වී කෝපයනේ තමාගේ
ගටෙ ගොස් ඇඳේ වැතිර, මුහුණ අහකට
හරවාගනෙ, කෑම නොකා සිටියේ ය. 5 එවිට
ඔහුගේ භාර්යාව වන ජශෙබලේ ඔහු ළඟට අවුත්,
"ඔබ සිත අප්‍රසන්න ව තිබනේනේත්, ඔබ කෑම
නොකා සිටින්නේත් මක්නිසා දැ"යි ඔහුගනේ ඇසුවා
ය.
6 ඔහු ද, "මම ජශේරයෙලේය නාබොත්ට කතා
කොට, 'ඔබේ මිදි වත්ත මට මිලටේ දනේන; එසේ
නැත්නම්, ඔබ කැමැති නම්, මම එය වනෙුවට ඔබට
මිදිවත්තක් දනේනමෙි'යි ඔහුට කීවමෙි. එහතේ, ඔහු
මට උත්තර දමෙින්, 'මාගේ මිදි වත්ත ඔබට
නොදනේනමෙි'යි කීවේ යැ"යි ඇට කී ය.
7 ඔහුගේ භාර්යාව වන ජශෙබලේ කතා කොට,
"දැන් රට පාලනය කරන රජ ඔබ නොවන්නහෙි ද?
නැඟිට කෑම කා ඔබේ සිත ප්‍රීති කරගන්න. මම
ජශේරයෙලේය නාබොත්ගේ මිදි වත්ත ඔබට ලබා
දනේනමෙි"යි ඔහුට කීවා ය.

### නාබොත් මරණයට පත් කිරීම

8 ඈ ආහබ්ගේ නමින් ලියුම් ලියා ඔහුගේ
මුද්‍රාවනේ මුද්‍රා කොට, නාබොත් සමඟ ඔහුගේ
නුවර විසූ ප්‍රජා මූලිකයන්ටත්, ප්‍රභූවරුන්ටත් ඒ
ලියුම් යැව්වා ය. 9 ඈ ලියුම්වල මසෙේ ලීවා ය:
"ඔබ හැම උපවාසයක් ප්‍රකාශ කොට, නාබොත්
සනෙඟ ඉදිරියහෙි මුල් තැන සිටුවා ඔහු ඉදිරිපිට
තක්කඩියන් දදෙනෙකෙු සිටුවන්න. 10 ඔව්හු ඔහුට
විරුද්ධ ව චෝදනා කරමින්, 'ඔබ දවේයන්
වහන්සේටත්, රජුටත් සාප කළෙහෙි ය'යි කියත් වා.
පසු ව ඔහු පිටතට ගනෙ ගොස් ගල් ගසා මරන්න."
11 ඔහුගේ නගරවැසියන් වන ඒ නගරයේ විසූ
ප්‍රජා මූලිකයෝ ද ප්‍රභූවරු ද ජශෙබලේ තමන්ට
යැවූ ලියුම්වල ලියා තිබුණු ප්‍රකාරයට කළෝ ය.
12 ඔව්හු උපවාසයක් ප්‍රකාශ කොට, නාබොත්
සනෙඟ ඉදිරිපිට මුල් තැනක සිටවේවෝ ය.
13 තක්කඩියන් දදෙනෙකේ පැමිණ ඔහු ඉදිරියහෙි
වාඩි වී, "නාබොත් දවේයන් වහන්සේටත්, රජුටත්
සාප කළෙේ ය"යි සනෙඟ ඉදිරියේ නාබොත්ට
විරුද්ධ ව චෝදනා කළෝ ය. එවිට ඔව්හු ඔහු
නගරයනේ පිටතට ගනෙ ගොස් ගල් ගසා මරා,
14 "නාබොත් ගල් ගසනු ලැබ මළේ ය"යි
ජශෙබලේට කියා යැවූවෝ ය.
15 තවද, නාබොත් ගල් ගසනු ලැබ මියගිය බව
ජශෙබලේ ඇසූ විට, ඈ ආහබ්ට කතා කොට,
"ජශේරයෙලේය නාබොත් ඔබට විකුණන්නට
අකමැති වූ ඔහුගේ මිදි වත්ත ඔබ ගොස් හිමි

කරගන්න. මන්ද නාබොත් ජීවත් ව නැත. මියගොස්
ඇතැ”යි කීවා ය. 16 නාබොත් මළ බව ආහබ් ඇසූ
විට, ඔහු ජශ්රෙයෙලේය නාබොත්ගේ මිදි වත්ත
අයිති කරගන්න පිණිස එහි යන්න පිටත් වුණේ ය.

## ආහබ් රජුට දඬුවම් නියම කිරීම

17 තවද, සමිඳාණන් වහන්සේගේ පණිවුඩය
තිෂ්බීය එලියා වෙත පැමිණ, 18 “නුඹ පිටත් ව
සමාරියේ වසන ඉශ්රායලේ රජු වන ආහබ් රජු
හමුවන්න යන්න. ඔහු නාබොත්ගේ මිදි වත්ත අයිති
කරගන්න එහි ගොස් සිටියි. 19 1 රාජා 22:38නුඹ
ඔහුට කතා කොට, ‘නුඹ ඒ වත්ත මිනී මරා අයිති
කරගත්තෙහි දැ යි සමිඳාණන් වහන්සේ වදාරන
සේකැ’යි කියන්න. තවද, ‘බල්ලෝ යම් තැනක දී
නාබොත්ගේ ලේ ලෙවකෑවෝ ද එතැන්හි දී බල්ලෝ
නුඹේ ලේ එසේ ය, නුඹේ ම ලේත් ලෙවකන්නෝ
යයි සමිඳාණන් වහන්සේ වදාරන සේකැ’යි ඔහුට
දන්වන්නැ”යි කී ය.
20 ආහබ් ද කතා කොට, “අහෝ මාගේ හතුර,
ඔබ මා සොයාගත්තෙහි දැ”යි එලියාට කී ය. ඔහු
උත්තර දමින්, “මම නුඹ සොයාගතිමි. මක්නිසා ද,
නුඹ සමිඳාණන් වහන්සේගේ ඇස් හමුවෙහි නපුරු
දේ කරන්න නුඹ ම භාර වී සිටින්නෙහි ය.
21 බලන්න ‘මම නුඹ පිට විපත පමුණුවා නුඹ
සහමුලින් ම අහකට නරෙපාදමා, නුඹේ පවුලට
අයත් සියලු පිරිමින්, ඉශ්රායලේවරුන් අතරෙහි
දාසයන් වුවත්, නිර්දාසයන් වුවත්, මරා දමා, 22 නුඹ
මා කෝප කරවමින් ඉශ්රායලේවරුන්ට පව් කරන්නට
සලස්වමින් කළ ක්රියාව නිසා, නුඹේ වංශය
නබොත්ගේ පුත් ජරොබෝවම්ගේ වංශය මෙන් ද
අහියාගේ පුත් බාෂාගේ වංශය මෙන් ද
කරන්නමේ’යි සමිඳාණන් වහන්සේ වදාරන සේක.
23 2 රාජා 9:36උන් වහන්සේ ජෙශෙබෙලේ ගැන ද
කතා කොට, ‘ජශ්රෙයෙලේ නගරයේ පවුර ළඟ දී
බල්ලෝ ජෙශෙබෙලේ කන්නෝ ය. 24 ආහබ්ගේ
වංශයෙන් නුවර තුළ දී මැරෙන අය බල්ලෝ
කන්නෝ ය. පිටත දී මැරෙන අය පක්ෂීහු කන්නෝ
ය’යි වදාළ සේකැ”යි කීවේ ය.
25 සැබැවින් ම තම භාර්යාව වන ජෙශෙබෙලේ
විසින් පොළඹවනු ලැබ සමිඳාණන් වහන්සේගේ
ඇස් හමුයෙහි නපුරු දේ කරන්න භාර වූ ආහබ්ට
සමාන කිසිවෙකේ නොසිටියේ ය. 26 සමිඳාණන්
වහන්සේගේ ඉශ්රායලේ ජනයා ඉදිරියෙහි
පන්නාදැමූ අමෝරිවරුන් කළ සියල්ල ලෙසෙ ඔහු දේව
රූප පසුපස ගොස් ඉතා පිළිකුල් ක්රියා කළේ ය.

## ආහබ් රජ පසුතැවී සිත හරවා ගැනීම

27 ආහබ් ඒ වචන ඇසූ විට ශෝකයෙන් තම ඇඳුම්
ඉරාගෙන, ඇඟේ හමට ගෑවෙන පරිදි ගෝණි රෙදි
දමාගෙන, නිරාහාර ව ගෝණි රෙදි පිට නිදාගනිමින්
කලකිරුණ ස්වභාවයකින් හැසුරුණේ ය.
28 එකල්හි සමිඳාණන් වහන්සේගේ වචනය
තිෂ්බීහි එලියා වෙත පැමිණ, 29 “ආහබ් මා
ඉදිරියෙහි යටත් වූ අයුරු නුඹ දුටුවෙහි ද? ඔහු මා
ඉදිරියෙහි යටත් වූ බැවින් ඒ විපත ඔහුගේ කාලයේ
දී නොව, ඔහුගේ පුත්රයාගේ කාලයේ දී ඔහුගේ
වංශය පිට පමුණුවන්නමේ”යි කී ය.

## ආහබ් රජ සටනට සූදානම් වීම

(2 වංශා 18:2-27)

22 සිරියාවේ වැසියන් හා ඉශ්රායලේවරුන් අතර
තුන් අවුරුද්දක් සාමය පැවතිණි. 2 තුන් වන
අවුරුද්දේ ජුදාහි රජ වන ජෙහෝෂාපාට් ඉශ්රායලේ
රජු ළඟට පැමිණියේ ය.
3 ඉශ්රායලේ රජ තමාගේ සේවකයන්ට කතා
කොට, “රාමොත්-ගිලියද් අපට අයිති බව ඔබ
දන්නහු ද? දැනගෙනෙත්, අප එය සිරියාවේ රජු අතින්
උදුරාගැනීමට කිසිවක් නොකර සිටිනු නොවේ දැ”යි
කීවේ ය. 4 ඔහු ජෙහෝෂාපාට්ට කතා කොට,
“යුද්ධයට මා සමඟ රාමොත්-ගිලියද්ට යන්නෙහි
දැ”යි ඇසී ය. ජෙහෝෂාපාට් ද, “මාත් ඔබ මෙන් ම,
මාගේ සෙනඟත් ඔබේ සෙනඟ මෙන් ම, මාගේ
අශ්වයොත් ඔබේ අශ්වයන් මෙන් ම සූදානම් ය”යි
ඉශ්රායලේ රජුට කීවේ ය.

## ජයග්රහණය ගැන දිවැස් වැකි කීම

5 තවද, ජෙහෝෂාපාට් කතා කොට, “පළමුවෙන්
සමිඳාණන් වහන්සේගේ වචනය විභාග කළ
මැනව”යි ඉශ්රායලේ රජුට කී ය.
6 එවිට ඉශ්රායලේ රජ දිවැසිවරුන් වන හාරසියයක්
පමණ මිනිසුන් රැස් කොට, “මම රාමොත්-ගිලියද්ට
විරුද්ධ ව යුද්ධයට යම් ද නොයම් දැ”යි ඔවුන්ගෙන්
ඇසී ය. ඔව්හු කතා කොට, “ගිය මැනව, මන්ද,
සමිඳාණන් වහන්සේ එය රජු අතට පාවා දෙනෙ
සේකැ”යි කීවෝ ය.
7 එහෙත්, ජෙහෝෂාපාට්, “අප විසින් විචාරනු
ලබන පිණිස සමිඳාණන් වහන්සේගේ තව
දිවැසිවරයකේ මෙහි නැද්දැ”යි ඇසී ය.
8 ඉශ්රායලේ රජ ද, “සමිඳාණන් වහන්සේගෙන්
විචාරන පිණිස ඉම්ලාගේ පුත් මීකායා නම් තව
කෙනෙකේ සිටියි. එහෙත්, ඔහු මා ගැන දිවැස්
වැකියෙන් නරකක් මිස යහපතක් නොකියන නිසා
මම ඔහුට වෛර වෙමි”යි ජෙහෝෂාපාට්ට කීවේ ය.
ජෙහෝෂාපාට් ද, “රජතුමා එසේ නොකියාවා”යි
කීවේ ය.
9 එකල ඉශ්රායලේ රජ ඇමතියකුට අඬගසා,
“ඉම්ලාගේ පුත් මීකායා ඉක්මනින් ගෙනෙන්වන්නැ”යි
සැළ කළේ ය.
10 ඉශ්රායලේ රජ ද ජුදාහි රජ වන ජෙහෝෂාපාට්
ද රාජකීය වස්ත්ර පැළඳගෙන, සමාරියේ වාසල්
දොරටුවෙන් පිටත එළිමහන් තැනක තම තමන්ගේ
සිංහාසනවල වාඩි වී සිටියෝ ය. සියලු දිවැසිවරු
ඔවුන් ඉදිරිපිට දිවැස් වැකි කී හ. 11 තවද,
කෙනානාගේ පුත් ශෙදෙකියා යකඩ අං සාදාගෙන,

“ඔබ සිරියාවේ වැසියන් නැති කරන තුරු මේවායින්
ඔවුන්ට අනිනු ඇත කියා සමිඳාණන් වහන්සේ
වදාරන සේකැ”යි පැවසී ය. 12 දිවැසිවරු සියල්ලෝ
එලෙස ම දිවැස් වැකි කියමින්, “රාමොත්-ගිලියද්ට
ගොස් ජය ගත මැනව. මන්ද, සමිඳාණන් වහන්සේ
එය රජු අතට පාවා දෙන සේකැ”යි කී හ.

## පරාජය ගැන දිවැස් කීම

13 මීකායා කැඳවාගෙන එන්න ගිය පණිවුඩකාරයා
ඔහුට කතා කොට, “බලන්න, දිවැසිවරුන්ගේ වචන
එක ලෙස රජුට ප්‍රසන්න දේ පවසයි. ඔබේ
වචනයත් ඔවුන්ගෙන් කෙනෙකුගේ වචනය මෙන්
කල්තියා ජය අත්වනු පිණිස කියන්නැ”යි දැන්වී ය.
14 මීකායා ද කතා කොට, “ජීවමාන සමිඳාණන්
වහන්සේගේ නාමයෙන් මා දිවුරා කියන්නේ, උන්
වහන්සේ මට කියන දේ ය”යි පැවසී ය.
15 ඔහු රජු ළඟට ආ කල රජු ඔහුට කතා කොට,
“මීකායා, අපි රාමොත්-ගිලියද්ට විරුද්ධ ව යුද්ධයට
යමු ද නොයමු දැ”යි ඔහුගෙන් ඇසී ය. ඔහු ද,
“ගොස් ජය ගත මැනව, සමිඳාණන් වහන්සේ එය
රජු අතට පාවා දෙන සේකැ”යි උත්තර දුන්නේ ය.
16 රජ ද කතා කොට, “සමිඳාණන් වහන්සේගේ
නාමයෙන් සැබෑව මිස වෙන කිසිවක් මට නොකියන
හැටියට මම කී වරක් ඔබ දිවුරවම් දැ”යි ඔහුගෙන්
ඇසී ය.
17 ගණන් 27:17; මතෙ 9:36; මාක් 6:34 එවිට ඔහු
කතා කොට,
q217 “සියලු ඉශ්රායෙල්වරුන් එඬේරෙකු නැති
බැටළුවන් මෙන් කඳුවල විසිර සිටිනු මම දිටිමි.
q217 තවද, සමිඳාණෝ මෙසේ වදාරන සේක;
q217 ‘මොවුන්ට ස්වාමියෙකු නැත, එක එකා තම
තමාගේ ගෙදරට සාමදානයෙන් හැරී යත් වා!’ “යි
17 කීවේ ය.
18 ඉශ්රායෙල්ලේ රජ ද, “ඔහු මා ගැන දිවැසි
වැකියෙන් නරකක් මිස යහපතක් කියන්නේ නැත
කියා මම ඔබට නොකීයෙම් දැ”යි ජෙහෝෂාපාට්ට කී
ය.
19 ජෝබ් 1:6; යෙසා 6:1 මීකායා කතා කොට,
“එබැවින් ඔබ සමිඳාණන් වහන්සේගේ වචනය
ඇසුව මැනව. සමිඳාණන් වහන්සේ තම
සිංහාසනයේ වැඩ හිඳිනු ද, මුළු ස්වර්ග සේනාව උන්
වහන්සේ ළඟ උන් වහන්සේගේ දකුණු පැත්තේ ද
වම් පැත්තේ ද සිටිනු ද මම දිටිමි. 20 සමිඳාණන්
වහන්සේ කතා කොට, ‘ආහබ්, රාමොත්-ගිලියද්ට
ගොස් එහි දී මරණයට පත් වන පිණිස එහි යෑමට
ඔහු පොළඹවන්නේ කවරෙක් දැ’යි ඇසූ සේක. එක්
කෙනෙක් මේ ආකාරයට ද තව කෙනෙක් ඒ
ආකාරයට ද උත්තර දුන්නෝ ය. 21 එකල ආත්මයක්
නික්ම විත් සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි සිට, ‘මම
ඔහු පොළඹවන්නෙමි’යි කීවේ ය. 22 සමිඳාණන්
වහන්සේ, ‘කුමකින් දැ’යි ඔහුගෙන් ඇසූ විට, ඔහු,
‘මම ගොස් ඔහුගේ සියලු දිවැසිවරයන්ගේ මුඛවල
මුසා දොඩන ආත්මයක් වන්නෙමි’යි කී ය. උන්
වහන්සේ ද, ‘නුඹ ඔහු පොළඹවා ජයගනු ඇත.
ගොස් එසේ කරන්නැ’යි වදාළ සේක.
23 “එබැවින් සමිඳාණන් වහන්සේ ඔබේ මේ සියලු
දිවැසිවරයන්ගේ මුඛවල මුසා දොඩන ආත්මයක්
තැබූ සැටි බලන්න. තවද, සමිඳාණන් වහන්සේ
ඔබට නපුරක් වන බව වදාළ සේකැ”යි පැවසී ය.
24 එවිට කෙනානාගේ පුත් ශෙදෙකියා ළං වී
මීකායාගේ කම්මුලට ගසා, “සමිඳාණන්
වහන්සේගේ ආත්මය ඔබට කතා කරන්නට මා
කෙරෙන් ගියේ කොයි මාර්ගයෙන් දැ”යි ඇසී ය.
25 මීකායා ද, “ඔබ සැඟවෙන පිණිස ඇතුළු
ගෙයකට යන දවසේ එය දැනගන්නෙහි ය”යි කීවේ
ය.
26 ඉශ්රායෙල්ලේ රජ, “ඔබ මීකායා රැගෙන නුවර
අධිපතියා වන ආමොන් ද රජුගේ පුත් ජෝවාෂ් ද
ළඟට ගෙන ගොස් කතා කොට, 27 ‘ඔබ මොහු
හිරගෙහි ලා මා සාමදානයෙන් එන තුරු මොහුට
රොටි සහ වතුර හැර කිසිවක් නොදිය යුතු යයි රජ
කියන්නේ ය’ කියා දන්වන්නැ”යි කී ය.
28 මීකායා ද, “ඔබ ඇත්තටම සාමදානයෙන් හැරී
ආවොත් සමිඳාණන් වහන්සේ මා ලවා කතා
කරෙව්වේ නැත. ජනයිනි, ඔබ සියල්ලන් ම
අසන්නැ”යි කීවේ ය.

## ආහබ් රජුගේ මරණය

(2 වංශා 18:28-34)

29 මෙසේ ඉශ්රායෙල්ලේ රජ ද ජුදාහි රජ වන
ජෙහෝෂාපාට් ද රාමොත්-ගිලියද්ට ගියෝ ය.
30 ඉශ්රායෙල්ලේ රජ ජෙහෝෂාපාට්ට කතා කොට,
“මම වෙස් වළාගෙන යුද්ධයට පැමිණෙමි. එහෙත්,
ඔබ ඔබේ ම වස්ත්‍ර පැළඳගත මැනවැ”යි කීවේ ය.
එසේ ඉශ්රායෙල්ලේ රජ වෙස් වළාගෙන යුද්ධයට ගියේ
ය.
31 සිරියාවේ රජු තමාගේ රථාධිපතීන්
තිස්දෙනොට කතා කොට, “ඔබ ඉශ්රායෙල්ලේ රජුට
විරුද්ධ ව මිස ලොකු කුඩා වෙන කිසිවකුට විරුද්ධ
ව සටන් නොකරන්නැ”යි අණ කර තිබිණි. 32 තවද,
රථාධිපතීහු ජෙහෝෂාපාට් දුටු කල, “මොහු
ඉශ්රායෙල්ලේ රජ ම ය”කියා ඔහුට විරුද්ධ ව සටන්
කරන්නට හැරුණෝ ය. එවිට ජෙහෝෂාපාට්
මොරගැසී ය. 33 ඒ ඉශ්රායෙල්ලේ රජු නොවන බව
දැක රථාධිපතීහු ඔහු වෙතින් හැරී ගියෝ ය.
34 එහෙත්, එක් මනුෂ්‍යයෙක් අහම්බෙන් දුන්න
තැත්කවා ඉශ්රායෙල්ලේ රජුගේ සන්නාහයේ සන්ධි
අතරෙන් ඔහුට විද්දේ ය. එවිට ඔහු රියැදුරාට කතා
කොට, “ඔබ ආපසු හැරී මා යුද්ධයෙන් පිටතට
ගෙනයන්න, මට බොහෝ තුවාළ ය”යි කී ය.
35 ඒ දවසේ යුද්ධය තදබල විය. රජතුමා
සිරියන්වරුන්ට ඉදිරිපිටින්, ආධාර ඇති ව රථයේ
කළෙන් සිටුවනු ලැබ සවස මළේ ය. තුවාළයෙන්
රථයේ පතුලට ලේ ගලාගෙන ගියේ ය. 36 එක එක
මනුෂ්‍යයා තම තමාගේ නුවරටත්, රටටත් යේ වා යි
කියා ඉර බහින වේලාවේ කඳවුර පුරා ප්‍රසිද්ධියක්
කරන ලදී.

37 මෙසේ රජ මරණයට පත් වූ පසු ඔහු සමාරියට
ගෙන ගොස්, සමාරියේ තැන්පත් කරන ලදී.
38 තවද, ඔව්හු සමාරියේ පොකුණෙනේ රථය සේදූ
හ. සමිඳාණන් වහන්සේ වදාළ වචනය හැටියට
බල්ලෝ ඔහුගේ ලේ ලෙවකෑහ. වේශ්‍යාවෝ එහි
ස්නානය කළහ.
39 ආහබ්ගේ සෙසු ක්‍රියා ද ඔහු කළ සියල්ල ද
ඔහු සෑදූ ඇත් දත් ගයෙ ද ගොඩනැඟුවාවූ සියලු
නගරවල් ද ඉශ්‍රායලේ රජුන්ගේ පුරාවෘත්ත
ග්‍රන්ථයේ වාර්තා කර තිබෙනු නොවේ ද?
40 මෙසේ ආහබ් මියගියේ ය. ඔහුගේ පුත් අහසියා
ඔහු වෙනුවට රජ විය.

### ජෙහෝෂාපාට් ජුදා දේශයේ රජ වීම

(2 වංශා 20:31;21:1)

41 ඉශ්‍රායලේ රජ වන ආහබ්ගේ සතර වන
අවුරුද්දේ දී ආසාගේ පුත් ජෙහෝෂාපාට් තමෙ
ජුදාහි රජ විය. 42 ජෙහෝෂාපාට් රජ වන කල
අවුරුදු තිස්පහක් වයස් ව සිටියේ ය. ඔහු
ජෙරුසලමේ විසිපස් අවුරුද්දක් රජකම් කළේ ය.
ඔහුගේ මවගේ නම අශුබා ය. ඈ ෂිල්හිගේ දුව ය.
43 ඔහු තම පිය වූ ආසාගේ අඩි පාරේ ගමන්
කරමින්, එයින් අහක් නොවී සමිඳාණන්
වහන්සේගේ ඇස් හමුයෙහි හරි දේ කළේ ය.
එහෙත් කඳු මත පූජාස්ථාන පහ නොකරන ලදී.
එවකටත් සෙනඟ පූජා ද සුවඳ දුම් ද කඳු මත
පූජාස්ථානවල ඔප්පු කළහ. 44 ජෙහෝෂාපාට්
ඉශ්‍රායලේ රජු සමඟ සාමදාන විය.
45 ජෙහෝෂාපාට්ගේ සෙසු ක්‍රියා ද ඔහු පෙන්වූ
දස්කම් ද කළ යුද්ධ ද ජුදා රජුන්ගේ පුරාවෘත්ත
ග්‍රන්ථයේ වාර්තා කර තිබෙනු නොවේ ද?
46 තමාගේ පිය වූ ආසාගේ කාලයෙහි ඉතුරු වූ
දේවාල සල්ලාලයන් ඔහු රටින් නෙරපොදැමී ය.
47 එකල ඒදොමෙහි රජෙක් නො වී ය. යුව රජෙක්
රජකම් කළේ ය.
48 ජෙහෝෂාපාට් රත්රන් ගෙනෙන පිණිස ඕෆීර්
නගරයට යෑමට තර්ෂීෂ් නැව් සෑදී ය. එහෙත්, ඒවා
එහි ගියේ නැත. මන්ද, ඒ නැව් එෂියොන් ගෙබෙර්
නම් ස්ථානයෙහි දී විනාශ වූ බැවිනි. 49 එකල
ආහබ්ගේ පුත් අහසියා, “මාගේ සේවකයෝ ඔබේ
සේවකයන් සමඟ නැව්වල යාත්‍රා කරත් වා”යි
ජෙහෝෂාපාට්ට කීවේ ය. එහෙත්, ජෙහෝෂාපාට්
එකඟ වූයේ නැත. 50 ජෙහෝෂාපාට් තමාගේ
පියවරුන් මෙන් මියගොස් තම පිය වූ දාවිත්ගේ
නුවර තම පියවරුන් ළඟ තැන්පත් කරන ලදී.
ඔහුගේ පුත් ජෙහෝරාම් ඔහු වෙනුවට රජ විය.

### අහසියා ඉශ්‍රායලේ කරෙහෙි රජ වීම

51 ජුදාහි රජ වූ ජෙහෝෂාපාට්ගේ දසසත් වන
අවුරුද්දේ දී ආහබ්ගේ පුත් අහසියා ඉශ්‍රායලේ
කරෙහෙි සමාරියේ රජ වී දෑවුරුද්දක් ඉශ්‍රායලේවරුන්
පාලනය කළේ ය. 52 ඔහු සමිඳාණන් වහන්සේගේ
ඇස් හමුයෙහි නපුරු දේ කොට, තමාගේ පියාගේ ද
තමාගේ මවගේ ද අඩි පාරේ ද ඉශ්‍රායලේවරුන්ට
පව් කරන්නට සැලැස්සූ නබොත්ගේ පුත්
ජෙරොබෝවම්ගේ අඩි පාරේ ද ගමන් කළේ ය.
53 ඔහු බාල් දේවතාවාට සේවය කර ඔහුට
වැඳුම්පිදුම් කරමින් තමාගේ පියා කළ ප්‍රකාරයට ම
ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ
කෝප කළේ ය.

# 2 රාජාවලියේ

### අහසියා රජුගේ මරණය ගැන එලියා කලින් දැන්වීම

1 ආහබ් රජු මියගිය පසු මෝවබ්වරු
ඉශ්රායලේවරුන්ට විරුද්ධ ව කැරලි ගැසූ හ.
2 තවද, අහසියා සමාරියෙහි තමාගේ උඩු මහලේ
සඳලුතලයෙනේ වැටී රෝගාතුර විය. "ඔබ ගොස් මම
මේ රෝගයෙනේ සුව වන්නමේ දැ යි එක්රෝන්හි
දවේ වන බාල්-ශබූබ්ගෙනේ විචාරන්නැ"යි ඔහු
පණිවුඩකාරයන් යැවී ය. 3 එහතේ, සමිඳාණන්
වහන්සේගේ දූතයා තිෂ්බී ජාතික දිවැසිවර එලියාට
කතා කොට, "නැඟිට සමාරියේ රජුගේ
පණිවුඩකාරයන්ගේ පෙරමඟට ගොස්, 'ඔබ
එක්රෝන්හි දවේ වන බාල්-ශබූබ්ගෙනේ විචාරන්නට
යන්නේ, ඉශ්රායලේහි දවේ කෙනෙකුන් නැති නිසා
ද? 4 එබැවින්, නුඹ නැඟී සිටින ඇඳෙනේ නොබැස
සැබැවින් ම මැරනේනෙහි ය'යි සමිඳාණන් වහන්සේ
වදාරන සේක කියා ඔවුන්ට දන්වන්නැ"යි කී ය.
එලියා පිටත් ව ගියේ ය.
5 එවිට පණිවුඩකාරයෝ රජු ළඟට හැරී ආ හ.
"ඔබ හැරී ආවේ කුමක් නිසා දැ"යි ඔහු ඔවුන්ගෙනේ
ඇසී ය.
6 ඔව්හු කතා කොට, "මනුෂ්යයකේ අපේ
පෙරමඟට අවුත්, 'ඔබ හැම එවූ රජු ළඟට හැරී
ගොස්, ඔබ එක්රෝන්හි දවේ වන බාල්-ශබූබ්ගෙනේ
විචාරන්නට යවන්නේ ඉශ්රායලේහි දවේ කෙනෙකුන්
නැති නිසා ද? එබැවින්, ඔබ සිටින ඇඳෙනේ නොබැස
සැබැවින් ම මැරනේනෙහි යයි සමිඳාණන් වහන්සේ
වදාරන සේක කියා ඔහුට කියන්නැ'යි අපට සැළ
කළේ ය"යි කී හ.
7 "ඔබේ පෙරමඟට අවුත් මේ වචන ඔබට කී
මනුෂ්යයා කෙබඳු කෙනෙකේ දැ"යි ඔහු ඔවුන්ගෙනේ
ඇසී ය. 8 මතෙ 3:4; මාක් 1:6ඔව්හු ඔහුට උත්තර
දමේන්, "ඔහු ලෝම වස්ත්රයක් හැඳ, ඉඟටියෙහි
සම් පටියක් බැඳගත් මනුෂ්යයකේ ය"යි කී හ. ඔහු,
"ඒ තිෂ්බී ජාතික එලියා ය"යි කී ය.

### අහසෙනේ ගිනි එවීම

9 එවිට රජ පණසාධිපතියකු ඔහුගේ පණස්දෙනා
සමඟ එලියා වතෙ යැවී ය. ඔහු කන්ද මුදුනේ
හිඳගෙන සිටි එලියා ළඟට ගොස්, "දවේයන්
වහන්සේට කැප වූ මනුෂ්යය, බැස එන්න කියා රජ
කියන්නේ ය"යි ඔහුට දැන්වී ය.
10 ලූක් 9:54 එලියා පණසාධිපතියාට උත්තර
දමේන්, "මම දවේයන් වහන්සේට කැප වූ
මනුෂ්යයකේ නම්, අහසින් ගිනි බැස ඔබ ද ඔබේ
පණස්දෙනා ද දවාදමා වා"යි කී ය. එවිට අහසින්
ගිනි බැස ඔහු ද ඔහුගේ පණස්දෙනා ද දවාදැමී ය.
11 රජ නැවත තවත් පණසාධිපතියකු ඔහුගේ
පණස්දෙනා සමඟ ඔහු ළඟට යැවී ය. ඔහු කතා
කොට, "දවේයන් වහන්සේට කැප වූ මනුෂ්යය,
ඉක්මනින් බැස එන්න කියා රජ කියන්නේ ය"යි
ඔහුට කී ය.
12 එලියා උත්තර දමේන්, "මම දවේයන් වහන්සේට
කැප වූ මනුෂ්යයකේ නම්, අහසින් ගිනි බැස ඔබ ද
ඔබේ පණස්දෙනා ද දවාදමා වා"යි ඔවුන්ට කී ය.
එවිට අහසින් ගිනි බැස ඔහු ද ඔහුගේ පණස්දෙනා
ද දවාදැමී ය.
13 රජ නැවතත් තුන් වන වර පණසාධිපතියකු
ඔහුගේ පණස්දෙනා සමඟ යැවී ය. පණස්දෙනාට
අධිපති වූ තුන්වැනියා ද නැඟී ගොස් එලියා
ඉදිරියෙහි දණින් වැටී යාච්ඤා කරමින්, "දවේයන්
වහන්සේට කැප වූ මනුෂ්යය, මාගේ ප්රාණයට ද
ඔබේ මෙහෙකරුවන් වන මේ පණස්දෙනාගේ
ප්රාණවලට ද හානියක් නොකළ මැනව. 14 බැලුව
මැනව, අහසින් ගිනි බැස පළමු පණසාධිපතීන්
දදෙනො ද ඔවුන්ගේ පිරිස් ද දවාදැමුවේ ය. එහතේ,
දැන් මාගේ ප්රාණයට හානියක් නොකළ මැනව"යි
ඔහුට කීවේ ය.
15 එවිට සමිඳාණන් වහන්සේගේ දූතයා කතා
කොට, "බිය නොවී ඔහු සමඟ යන්නැ"යි එලියාට කී
ය. ඔහු නැඟිට ඔහු සමඟ රජු ළඟට බැස ගියේ ය.
16 ඔහු කතා කොට, "නුඹ එක්රෝන්හි දවේ වන
බාල්-ශබූබ්ගෙනේ විචාරන්නට පණිවුඩකාරයන්
යැව්වේ, දේව වාක්යයෙනේ විචාරන්නට
ඉශ්රායලේවරුන්ගේ දවේ කෙනෙකුන් නැති නිසා ද?
එබැවින් නුඹ සිටින ඇඳෙනේ නොබැස සැබැවින් ම
මැරනේනෙහි යයි සමිඳාණන් වහන්සේ වදාරන
සේකැ"යි ඔහුට කී ය.
17 මෙසේ එලියා පැවසූ සමිඳාණන් වහන්සේගේ
වචනය ලෙසෙ ඔහු මළේ ය. ඔහුට පුත්රයකු
නොසිටි බැවින් ඔහු වෙනුවට ජෝරාම්, ජුදාහි රජ වූ
ජෙහෝෂාපාට්ගේ පුත් වන ජෙහෝරාම්ගේ දෙ වන
අවුරුද්දේ දී රජ විය.
18 අහසියා කළ අනකේ ක්රියා ඉශ්රායලේ
රජුන්ගේ පුරාවෘත්ත ග්රන්ථයේ වාර්තා කර තිබනේ
නොවේ ද?

## එලියා ස්වර්ගයට ගෙනයනු ලැබීම

2 තවද, සමිඳාණන් වහන්සේ එලියා සුළි
සුළඟකින් ස්වර්ගයට ගන්නට කැමැති වූ
අවස්ථාවේ දී එලියා, එලිෂා සමඟ ගිල්ගාල්
නගරයෙන් පිටත් ව ගියේ ය. 2 එලියා කතා කොට,
"සමිඳාණන් වහන්සේ මා පමණක් බෙතෙලේ
නගරයට යවන නිසා මෙහි නවතින්නැ"යි එලිෂාට කී
ය.
2 එලිෂා උත්තර දෙමින්, "ජීවමාන සමිඳාණන්
වහන්සේගේ නාමයෙන් ද ජීවමාන ඔබගේ නාමයෙන්
ද මම ඔබ අත් නොහරිමි"යි දිවිරී ය. මෙසේ ඔව්හු
බෙතෙලේ නගරයට බැස ගියෝ ය.
3 බෙතෙලේහි සිටි දිවැසිවරුන්ගේ කණ්ඩායමේ අය
එලිෂා ළඟට අවුත්, "සමිඳාණන් වහන්සේ අද ඔබගේ
ස්වාමියා ඔබ කරෙනේ ගන්න බව දන්නෙහි දැ"යි
ඔහුගෙන් ඇසූ හ. ඔහු උත්තර දෙමින්, "එසේ ය,
මම දනිමි; නිශ්ශබ්ද වන්නැ"යි කී ය.
4 එලියා, ඔහුට කතා කොට, "එලිෂා, මෙහි
නවතින්න; මන්ද, සමිඳාණන් වහන්සේ මා
ජෙරිකෝවට යවන සේකැ"යි කීවේ ය. ඔහු ද,
"ජීවමාන සමිඳාණන් වහන්සේගේ නාමයෙන් ද
ජීවමාන ඔබගේ නාමයෙන් ද මම ඔබ අත්
නොහරිමි"යි දිවිරී ය. මෙසේ ඔව්හු ජෙරිකෝවට ආ
හ.
5 ජෙරිකෝවෙහි සිටි දිවැසිවරුන්ගේ කණ්ඩායමේ
අය එලිෂා ළඟට අවුත්, "සමිඳාණන් වහන්සේ අද
ඔබගේ ස්වාමියා ඔබ කරෙනේ ගන්න බව දන්නෙහි
දැ"යි ඔහුගෙන් ඇසූ හ. ඔහු ද, "එසේ ය, මම දනිමි,
නිශ්ශබ්ද වන්නැ"යි උත්තර දිනි.
6 එලියා ද කතා කොට, "සමිඳාණන් වහන්සේ මා
ජොර්දානට යවන නිසා මෙහි නවතින්නැ"යි ඔහුට කී
ය.
6 ඔහු උත්තර දෙමින්, "ජීවමාන සමිඳාණන්
වහන්සේගේ නාමයෙන් ද ජීවමාන ඔබගේ නාමයෙන්
ද මම ඔබ අත් නොහරිමි"යි දිවිරී ය. එවිට ඒ
දෙදෙනා ම යන්න ගියහ.
7 දිවැසිවරුන්ගේ කණ්ඩායමේ පණස්දෙනෙක්
ගොස්, ඔවුන් ඉදිරිපිට දුරින් සිටියෝ ය. ඒ දෙදෙනා
ද ජොර්දානය ළඟ සිටියෝ ය. 8 එවිට එලියා
තමාගේ උතුරු සළුව රැගෙන, අකුළා වතුරට ගැසී ය.
වතුර දෑතට බෙදී ගියේ ය. ඒ දෙදෙනා වියළි බිම
පිට එගොඩ වූ හ. 9 ද්වි.නී. 21:17තවද, ඔවුන්
එගොඩ වූ කල එලියා කතා කොට, "ඔබ වෙතින්
මා ගන්න පළමුවෙනේ ඔබට මාගෙනේ ඕනෑ දයෙක්
ඉල්ලන්නැ"යි එලිෂාට කී ය, එලිෂා පිළිතුරු දෙමින්,
"ඔබට තිබෙන ආත්මානුභාවය මෙනේ දගුණයක් මා
කරෙහි පැමිණේ වා"යි කී ය.
10 ඔහු ද, "ඔබ අමාරු දයෙක් ඉල්ලුවෙහි ය.
එහෙත්, ඔබ වෙතින් මා ගන්න විට ඔබ මා
දුටුවොත් ඔබට එසේ වන්නේ ය; නැතහොත්, එසේ
නොවන්නේ යැ"යි කී ය.
11 තවද, ඔවුන් කතා කරමින් යද්දී, ගිනි අශ්ව
රථයක් ද ගිනි අශ්වයෝ ද පැනී ඔවුන් දෙදෙනා
වෙනේ කළෝ ය. එලියා සුළි සුළඟකින් ස්වර්ගයට
නැඟී ගියේ ය. 12 2 රාජා 13:14එලිෂා ඒ දැක,
"ඉශ්රායලේහි රථ සහ අසරුවන් වැනි බලසම්පන්න
මාගේ පියාණෙනි, මාගේ පියාණෙනි"යි කී ය. ඔහු
තවත් එලියා නුදුටුවේ ය.
13 එවිට ඔහු තමාගේ වස්ත්ර අල්ලා දෙකට ඉරා,
එලියාගෙනේ වැටුණු ඔහුගේ සළුව රැගෙන හැරී
ආවේ ය. 14 ඉන්පසු එලිෂා ජොර්දානය අද්දර සිට,
එලියාගෙනේ වැටුණු ඔහුගේ සළුව රැගෙන,
"එලියාගේ දෙවි සමිඳාණන් වහන්සේ කොතැන ද,"
කියා වතුරට ගැසී ය. ඔහුත් වතුරට ගැසූ විට එය
දෑතට බෙදී ගියේ ය. එලිෂා එගොඩ විය. 15 ඔහුට
ඉදිරියෙනේ ජෙරිකෝවේ සිටි දිවැසිවර කණ්ඩායම
ඔහු දැක, "එලියාට තිබුණු ආත්මානුභාව එලිෂා
කරෙහි පිහිටා තිබේ ය"යි කියමින් ඔහුගේ
පෙරමඟට ගොස්, බිමට නැමී ඔහුට වැන්දෝ ය.
16 ඔව්හු එලිෂාට කතා කොට, "මෙහි ඔබගේ
මෙහෙකරුවන් අතරේ ශක්තිමත් මනුෂ්යයෝ
පණස්දෙනෙක් සිටිති. ඔව්හු ගොස් ඔබගේ ස්වාමියා
සොයත් වා. සමහර විට සමිඳාණන් වහන්සේගේ
ආත්මානුභාවය ඔහු ගෙන ගොස් යම්කිසි කන්දක්
පිට වත්, යම්කිසි මිටියාවතක වත් දමන්නට ඇතැ"යි
ඔහුට කී හ.
17 ඔහු ද, "කිසි කෙනෙකු නොයවන්නැ"යි කී ය.
එහෙත්, ඔහු ලජ්ජාවට පත්වන තුරු ම ඔවුන් ඔහුට
කරදර කළ බැවින්, "යවන්නැ"යි ඔහු කී ය. එවිට
ඔව්හු මනුෂ්යයන් පණස්දෙනෙකු යැවූ හ. ඔව්හු තුන්
දවසක් සෙව්වෝ නමුත් ඔහු හමු නොවී ය. 18 ඉන්පසු
ඔව්හු ජෙරිකෝවේ නැවතී සිටි එලිෂා ළඟට හැරී ආ
හ. ඔහු ද, "නොයන්නැ යි මා ඔබට කීවා නොවේ
දැ"යි ඔවුන්ගෙන් ඇසී ය.

## එලිෂා කළ හාස්කම්

19 ඒ නුවර වැසියෝ එලිෂාට කතා කොට,
"මෙන්න, මාගේ ස්වාමියාට පෙනෙන හැටියට මේ
නුවර පිහිටා තිබෙන ස්ථානය ප්රසන්න ය. එහෙත්,
වතුර අපවිත්ර ය. එයින් ගබ්සා ඇති වන්නේ ය"යි
කී හ.
20 ඔහු ද කතා කොට, "අලුත් සැළියක් මා ළඟට
ගෙනවුත් එහි ලුණු දමන්නැ"යි කී ය. ඔව්හු ද එය
ඔහු ළඟට ගෙනාවෝ ය. 21 ඔහු වතුර උල්පත
ළඟට ගොස් එහි ලුණු දමා, " 'මේ වතුර පිරිසිදු
කළෙමි'යි කියාත්, 'මින්පසු එයින් මරණය වත්,
ගබ්සාවීම වත් නොවන්නේ ය' කියාත් සමිඳාණන්
වහන්සේ වදාරන සේකැ"යි කීවේ ය. 22 මෙසේ
එලිෂා කී වචනය ලෙසෙ ඒ වතුර අද දක්වා පිරිසිදු ව
පවතී.
23 ඔහු එතැනින් බෙතෙලේ නගරයට ගියේ ය. ඔහු
පාරේ යද්දී පුංචි ළමයි නුවරින් පිටත් ව අවුත් ඔහුට
කවටකම් කරමින්, "පලා යව, තට්ටයා, පලා යව
තට්ටයා" යයි කීවෝ ය.

24 ඔහු පස්සට හැරී ඔවුන් දැක සමිඳාණන්
වහන්සේගේ නාමයෙන් ඔවුන්ට සාප කෙළේ ය,
එවිට වැළහින්නන් දදෙනෙකේ කැලෑවෙන් අවුත් ඒ
ළමයින්ගෙන් සතළිස්දදෙනෙකු ඉරා දැමූ හ.
25 ඔහු එතැනින් කර්මලේ කන්දට ගොස් එතැනින්
සමාරියට හැරී ආවේ ය.

### ජෝරාම් රජුගේ පාලන සමය

3 ආහබ්ගේ පුත් ජෝරාම් ජුදාහි රජු වන
ජෙහෝෂාපාට්ගේ දහඅට වන අවුරුද්දේ දී
සමාරියෙහි ඉශ්රායලේවරුන්ගේ රජ වී දොළොස්
අවුරුද්දක් රජකම් කෙළේ ය. 2 ඔහු සමිඳාණන්
වහන්සේගේ ඇස් හමුයෙහි නපුරු දේ කෙළේ ය.
එහෙත්, ඔහු තමාගේ පියා ද මවු ද මෙන් නපුරු
නො වී ය. මන්ද, ඔහු තමාගේ පියා සෑදූ බාල්ගේ
රූපස්තම්භ පහකෙළේ ය. 3 එසේ වුවත්, ඔහු
ඉශ්රායලේවරුන්ට පව් කරන්නට සැලැසූ නබොත්ගේ
පුත් ජෙරොබෝවම්ගේ පාපවලින් අහක් නොවී ඒවා
දිගට ම කරගෙන ගියේ ය.

### මෝවබ්වරුන්ට විරුද්ධ ව සටන් කිරීම

4 මෝවබ්හි රජු වූ මෙෂා බැටළු හිමියෙකු ව
සිටියේ ය. ඔහු ඉශ්රායලේ රජුට එක්ලක්ෂයක්
බැටළු පැටවුන්ගේ ද එක්ලක්ෂයක් බැටළුවන්ගේ ද
ලෝම කප්පම් දෙන සිරිතක් තිබිණි. 5 එහෙත්,
ආහබ් මියගිය කල මෝවබ්හි රජ ඉශ්රායලේ රජුට
විරුද්ධ ව කැරලි ගැසී ය. 6 ජෝරාම් රජ ද ඒ
කාලයේ සමාරියෙන් පිටත් ව ගොස් සියලු
ඉශ්රායලේවරුන් රැස් කෙළේ ය. 7 තවද, ඔහු ගොස්
ජුදාහි රජු වන ජෙහෝෂාපාට් වෙත පණිවුඩයක්
යවමින්, "මෝවබ්හි රජ මට විරුද්ධ ව කැරලි ගැසී
ය. ඔබ මා සමඟ මෝවබ්වරුන්ට විරුද්ධ ව යුද්ධයට
යන්නෙහි දැ"යි අසා ඇරියේ ය. ඔහු ද, "යන්නෙමි.
මම ඔබ මෙන් සූදානම් ය. මාගේ සෙනඟත් ඔබේ
සෙනඟ මෙන් ද, මාගේ අශ්වයෝත් ඔබේ අශ්වයන්
මෙන් ද සූදානම් ය"යි කී ය. 8 ඔහු කතා කොට,
"අපි කුමන පාරකින් යමු දැ"යි ඇසී ය. "ඒදොම්
පාළුකරයේ පාරෙන් ය"යි ඔහු උත්තර දුන්නේ ය.
9 මෙසේ ඉශ්රායලේහි රජ ද ඒදොම්හි රජ ද
ජුදාහි රජ ද පිටත් ව ගියහ. ඔවුන් සත් දවසක්
වැරදි මඟකින් යද්දී සේනාවටත්, ඔවුන් සමඟ ගිය
සිව්පාවුන්ටත් වතුර නැති විය. 10 එවිට ඉශ්රායලේ
රජ, "අහෝ! සමිඳාණන් වහන්සේ මේ රජුන්
තුන්දෙනා වන අප, මෝවබ් රජුගේ අතට පාවා
දෙන්නට ගෙනෙවූ සේකැ"යි කී ය.

### එලිෂාගෙන් විභාග කිරීම

11 ජුදා රජු වන ජෙහෝෂාපාට් කතා කොට, "අප
විසින් සමිඳාණන් වහන්සේගෙන් විචාරනු ලබන
පිණිස උන් වහන්සේගේ දිවැසිවරයෙකේ මෙහි
නැද්දැ"යි ඇසී ය.

11 එවිට ඉශ්රායලේ රජුගේ සේවකයෙකේ උත්තර
දමමින්, "එලියාගේ අත්වලට වතුර වත් කළ,
ශාපාත්ගේ පුත් එලිෂා මෙහි සිටී ය"යි කී ය.
12 ජෙහෝෂාපාට් කතා කොට, "ඔහු සමිඳාණන්
වහන්සේගේ පණිවුඩය පවත්වන්නේ ය"යි කී ය.
මෙසේ ඉශ්රායලේ රජ ද ජෙහෝෂාපාට් ද ඒදොම්හි
රජ ද ඔහු ළඟට ගියහ.
13 එලිෂා ඉශ්රායලේ රජුට කතා කොට, "මා සමඟ
ඔබට ඇති ගනුදෙනුව කුමක් ද? ඔබේ පියාගේ
දිවැසිවරුන් ළඟටත්, ඔබේ මවුගේ දිවැසිවරුන්
ළඟටත් ගිය මැනැවැ"යි කී ය. ඉශ්රායලේ රජ ද,
"එසේ නොවේ වා. මන්ද, සමිඳාණන් වහන්සේ
මෝවබ්වරුන් අතට පාවා දෙන පිණිස මේ රජුන්
තුන්දෙනා වන අප ගෙනෙවූ සේකැ"යි ඔහුට කී ය.
14 එලිෂා කතා කොට, "මා සේවය කරන සර්ව
පරාක්රම ජීවමාන සමිඳාණන් වහන්සේගේ
නාමයෙන් සැබැවින් ම ජුදාහි ජෙහෝෂාපාට් රජු
මෙහි සිටින කාරණය නිසා මිස නැත්නම්, මා ඔබ
දෙස බලන්නේ වත්, ඔබ ගණන් ගන්නේ වත්
නැතැ"යි දිවුරා, 15 "දැන් ඉතින් වීණා වාදකයෙකු මා
ළඟට ගෙනෙන්නැ"යි කී ය.
15 වීණා වාදකයා වාදනය කරද්දී සමිඳාණන්
වහන්සේගේ බලය එලිෂා පිට පැමිණියේ ය.
16 ඔහු කතා කොට, "සමිඳාණන් වහන්සේ මෙසේ
වදාරන සේක: 'මේ වියළි ගඟේ පතුල පුරා ම
අගල් කපන්න. 17 මන්ද, නුඹලා හුළඟ වත්, වැස්ස
වත් නොදකින නමුත් නුඹලාටත්, නුඹලාගේ
සිවුපාවුන්ටත්, නුඹලාගේ මෑගයන්ටත් බීමට මේ
ගඟ පතුල වතුරෙන් පිරෙනු ඇත.' 18 මෙය
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි සුළු දයෙකි. උන්
වහන්සේ මෝවබ්වරුන් ද ඔබ අතට පාවා දෙන
සේක. 19 ඔබ පවුරු ඇති සියලු නගර ද සියලු
අලංකාර නගර ද වනසා, සියලු හොඳ ගස් කපාදමා,
සියලු දිය උල්පත් වසා සියලු සාරවත් කෙතේ වතු ගල්
දමා වනසන්නහු ය"යි කීවේ ය. 20 පසු දා උදය
පූජාව ඔප්පු කරන වේලාව පමණේ දී ඒදොම්
දිශාවෙන් වතුර අවුත් එයින් රට පිරී ගියේ ය.

### මෝවබ්වරුන් පරාජය කිරීම

21 තමන්ට විරුද්ධ ව යුද්ධ කරන්නට රජුන් පැමිණි
බව ඇසූ විට, සියලු මෝවබ්වරු, යුද්ධායුධ
පළඳින්නට පුළුවන් වයසේ සිට ඊට වැඩි වයස් වූ
සියල්ලෝ රැස් වී දේශ සීමාව ළඟ සිටියෝ ය.
22 ඔවුන් අලුයම නැඟිට් කල ඒ වතුර පිට හිරු රැස්
වැටිණි. මෝවබ්වරු තමන් ඉදිරිපිට තිබූ වතුර
ලේමෙන් රතු ව තිබෙනු දැක, 23 "මේ නම් ලේ ය;
සැබැවින් ම රජවරු විනාශ වූ හ. ඔවුන් එකිනෙකා
මරාගන්නට ඇත. ඉතින්, මෝවබ්වරුනි, කොල්ලය
ගැනීමට එන්නැ"යි කී හ.
24 ඔවුන් ඉශ්රායලේ කඳවුරට පැමිණි විට
ඉශ්රායලේවරු නැඟිට මෝවබ්වරුන් තමන් ඉදිරියෙන්
පලා යන තුරු ඔවුන්ට පහර දී ඔවුන්ගේ රටටත්
ගොස් මෝවබ්වරුන්ට පහර දුන්හ. 25 ඔව්හු නගර

වනසා, රටේ හොඳ සියලු කතේවතුවලට එකිනකො
ගලක් බැගින් දමා ඒවා පුරවා, සියලු දිය උල්පත්
වසා, සියලු හොඳ ගස් කපාදැමූ හ. ඉතිරි වූයේ,
කීර්හරසෙතේ නුවර පමණකි. ගල්පට්වලින් විදින්නෝ
එය වටලා ඊට පහර දුන්හ.
26 මෝවබ් රජ සටන ඉතා වේගයනේ තමාට
විරුද්ධ ව යන බව දැක, සේනාව මැදින් බිඳගනෙ
ඒදොම් රජු කරා යන පිණිස කඩු ගත් මනුෂ්‍යයන්
හත්සියයක් රැගනෙ ආවේ ය. එහතේ, ඔවුන්ට
යන්නට නුපුළුවන් විය. 27 එකල ඔහු තමා වනුෙවට
රජ වන්නට සිටි තමාගේ කුලුඳුල් පුත්‍රයා රැගනෙ
දවන යාග පූජාවක් කොට පවුර පිට පුද කළෙේ ය.
ඉමහත් උදහසක් ඉශ්‍රායලේවරුන් පිට පැමිණිණි.
එවිට ඉශ්‍රායලේවරු ඔහු වතෙින් අහක් වී තමන්ගේ
දේශයට හැරී ගියෝ ය.

### වැන්දඹුවගේ තලේ කුළාව

4 දිවැසිවර කණ්ඩායමේ අයගේ
භාර්යාවන්ගනේ එක්තරා ස්ත්‍රියක් එලිෂාට
මොරගසා, "ඔබේ මෙහෙකෙරු වූ මාගේ පුරුෂයා
මළේ ය. ඔබේ මෙහෙකෙරුවා සමිඳාණන් වහන්සේ
කෙරෙහි ගරුබිය ඇති ව සිටි බව දන්නෙහි ය. ණය
හිමියා මාගේ දරුවන් දදෙනො තමාට දාසයන් කොට
ගන්න අවුත් සිටී ය"යි කීවා ය. 2 එලිෂා කතා
කොට, "මම ඔබට කුමක් කරම් ද? ගදෙර ඔබට
තිබනේනේ මොනවා දැ යි මට කියන්නැ"යි ඈට කී
ය. "තලේ කුළාවක් මිස ගදෙර වනෙ කිසිවක් ඔබේ
දාසියට නැතැ"යි ඈ කීවා ය.
3 එවිට ඔහු කතා කොට, "ඔබ පිටතට ගොස්
ඔබේ සියලු අසල්වැසියන්ගනේ භාජන එනම්, හිස්
භාජන බොහොමයක් ඉල්ලාගන්න. 4 ඔබත්, ඔබේ
පුත්‍රයනුත් ගදෙරට ඇතුළු වී දොර වසාගනෙ, ඒ
සියලු භාජනවල තලේ වත් කොට, පිරුණු ඒවා
පැත්තක තබන්නැ"යි කීවේ ය.
5 ඈ ද ඔහු වතෙින් ගොස්, ඈත්, ඇගේ
පුත්‍රයෝත් ගදෙරට ඇතුළු වී දොර වසාගත්හ.
ඔව්හු ඈ ළඟට භාජන ගනෙවෝ ය. ඈ තලේ වත්
කළා ය. 6 භාජන පිරුණු කල ඈ, "තවත් භාජනයක්
මට ගනෙන්නේ"යි ඇගේ පුත්‍රයාට කීවා ය. "තවත්
භාජනයක් නැතැ"යි ඔහු ඈට කී ය. 7 තලේ ගලා
යෑම ද නැවතිණි. එවිට ඈ අවුත් දවේයන්
වහන්සේට කැප වූ මනුෂ්‍යයාට එපවත් දැන්වූවා ය.
ඔහු ද, "ඔබ ගොස් තලේ විකුණා ණය ගවෝ ඉතිරි
මුදලනේ ඔබත්, ඔබේ පුත්‍රයනුත් රක්ෂා වන්නැ"යි
කීවේ ය.

### ෂුනම්මිය ස්ත්‍රියට එලිෂාගනේ ත්‍යාගයක්

8 එක් දවසක් එලිෂා ෂුනමේ නම් දේශයට ගියේ
ය. එහි සිටි ධනවත් ස්ත්‍රියක් කෑම කන්න ඔහුට
පරෙැත්ත කළා ය. මසෙේ ඔහු යන එන සෑම විට ම
කෑම කන පිණිස එහි නැවතිණි. 9 ඈ ඇගේ
පුරුෂයාට කතා කොට, "නිතර ම අප ළඟින් යන
එන මොහු දවේයන් වහන්සේට කැප වූ බැතිමත්
මනුෂ්‍යයකෙු බව මට පනෙයි. 10 අපි බිත්ති ඇති
කුඩා උඩුමහලක් සාදා, ඇඳකුත්, මේසයකුත්,
පුටුවකුත්, පහනකුත් එහි තබමු. එවිට ඔහු අප
ළඟට ආ කල එහි සිටින්න පුළුවනැ"යි කීවා ය.
11 එක් දවසක් ඔහු එහි පැමිණ උඩුමහලට ගොස්
නිදාගත්තේ ය. 12 තවද, ඔහු, "ෂුනම්මිය ජාතික
ස්ත්‍රියට අඬගසන්නැ"යි තම වැඩකාරයා වන
ගහේසිට කී ය. ඔහු ඈට අඬගැසූ විට ඈය ඔහු
ඉදිරියට ආවා ය. 13 එලිෂා ද කතා කොට, "මේ
සියලු සත්කාර කිරීමට ඔබ බොහෝ සේ මහන්සි වූ
බැවින් ඔබ උදසො කුමක් කළ යුතු ද? රජුට හෝ
සේනාපතියාට හෝ ඔබ වනුෙවට කතා කරනවාට
කැමැති ද? කියා ඇගනේ අසන්නැ"යි ගහේසීට කී ය.
ඈ ද, "මාගේ ම සනෙඟ අතරේ මම වාසය කරමි"යි
උත්තර දුන්නා ය.
14 "එසේ වී නම් ඈ උදසො කරන්න තිබනේනේ
කිමකේ දැ"යි ඔහු ඇසී ය.
14 ගහේසී කතා කොට, "ඈට පුත්‍රයකේ නැත,
ඇගේ පුරුෂයාත් මහලු ය"යි කීවේ ය.
15 "ඈට අඬගසන්නැ"යි ඔහු කී ය. ඔහු ඈට
අඬගැසූ කල ඈ දොරකඩ ළඟට ආවා ය. 16 උත්
18:14එවිට ඔහු කතා කොට, "ලබන අවුරුද්දේ මේ
කාලය පැමිණි විට ඔබ පුත්‍රයකු අතට ගන්නෙහි
ය"යි කී ය. ඈ ද, "නැත, මාගේ ස්වාමීන් වන
දවේයන් වහන්සේට කැප වූ මනුෂ්‍යය, ඔබේ දාසීට
බොරු කියන්නට එපා ය"යි කීවා ය.
17 ඒ ස්ත්‍රිය ගර්භණී ව එලිෂා ඈට කී හැටියට
ඊළඟ අවුරුද්දේ ඒ කාලය පැමිණි විට පුත්‍රයකු
ලැබුවා ය.

### ෂුනම්මිය ස්ත්‍රියගේ පුත්‍රයා මියයෑම

18 ඒ ළමයා වැඩුණු කල එක් දවසක් ගොයම්
කපන්නන් අතරේ සිටි තම පියා ළඟට ගියේ ය.
19 එවිට ඔහු, "අනේ! මාගේ ඔළුව කකියනවා ය;
මාගේ ඔළුව කකියනවා ය"යි තම පියාට කී ය. පියා
ද, "ඔහුගේ මවු ළඟට ඔහු ගනෙයන්නැ"යි තමාගේ
වැඩකාරයාට කීවේ ය. 20 වැඩකාරයා ඔහු රැගනෙ
ඔහුගේ මවු ළඟට ගනෙ ගියේ ය. ඔහු ඉර මුදුන්
වේලාව දක්වා ඇගේ උකුලේ හිඳ මළේ ය.
21 එවිට ඈ නැඟිට ගොස්, දවේයන් වහන්සේට කැප
වූ මනුෂ්‍යයාගේ ඇඳේ ඔහු බාවා, දොර වසා
පිටතට ගියා ය. 22 තවද, ඈ තමාගේ පුරුෂයාට
අඬගසා, "දවේයන් වහන්සේට කැප වූ මනුෂ්‍යයා
ළඟට හනික ගොස් එන පිණිස, වැඩකාරයකෙුත්,
කොටළු දනෙකුත් මට එවන්නැ"යි කීවා ය.
23 ඔහු ද, "ඔබ අද ඔහු ළඟට යන්නේ කුමට ද?
අද අමාවක වත්, සබත් දිනය වත් නොවේ ය"යි කී
ය. 24 ඈ, "ඒකට කමක් නැත" කියා කොටළු දනෙ
සූදානම් කරගනෙ ඇගේ වැඩකාරයාට කතා කොට,
"කොටළු දනෙ දක්කාගනෙ යන්න; මා ඔබට කියන
තකේ දැක්කීමේ වේගය අඩු නොකරන්නැ"යි කීවා
ය. 25 මසෙේ ඈ ගොස් කර්මලේ කන්දේ සිටි

දෙවියන් වහන්සේට කැප වූ මනුෂ්‍යයා ළඟට
පැමිණියා ය.
25 තවද, දෙවියන් වහන්සේට කැප වූ මනුෂ්‍යයා
ඈ දුර දී දැක තමාගේ මෙහෙකෙරු වන ගෙහෝසීට
කතා කොට, "අන්න, අර ෂූනම්මිය ස්ත්‍රිය එන්නී ය.
26 දැන් ම ඇගේ පෙරමඟට දිව ගොස්, 'ඔබ සුව
සේ ද? ඔබේ පුරුෂයා සුව සේ ද? ළමයා සුව සේ
දැ'යි ඇගෙන් අසන්නැ"යි කී ය.
26 "සුව සේ ය"යි ඈ ද උත්තර දුන්නා ය. 27 ඈ
වනාහි කන්දේ සිටි දෙවියන් වහන්සේට කැප වූ
මනුෂ්‍යයා ළඟට පැමිණ ඔහුගේ පාද අල්ලාගත්තා
ය. එවිට ගෙහෝසී ඈ අහක් කරනු පිණිස ළං විය.
එහෙත්, දෙවියන් වහන්සේට කැප වූ මනුෂ්‍යයා
කතා කොට, "ඈට කරදර නොකරන්න; ඇගේ සිත
ශෝකී ව ඇත. සමිඳාණන් වහන්සේ එය මට
නොදන්වා මාගෙන් සැඟ වූ සේකැ"යි කී ය.
28 එවිට ඈ කතා කොට, "මාගේ ස්වාමීන්ගෙන්
මම පුත්‍රයකු ඉල්ලුවෙමේ ද? මා රවටන්න එපා කියා
මම නොකීයෙමේ දැ"යි ඇසුවා ය.
29 එවිට ඔහු ගෙහෝසීට කතා කොට, "ඉඟටිය
බැඳගෙන මාගේ සැරයටිය අතින් රැගෙන යන්න.
යමකු ඔබට සම්බවුණත් ඔහුට ආචාර කරන්නේ
වත්, යමකු ඔබට ආචාර කළත් ඔහුට උත්තර
දෙන්නේ වත් නැති ව ගොස් මාගේ සැරයටිය ළමයා
පිට තබන්නැ"යි කී ය.
30 එහෙත්, ළමයාගේ මවු, "ජීවමාන සමිඳාණන්
වහන්සේගේ නාමයෙන් ද ජීවමාන ඔබේ නාමයෙන්
ද මම ඔබ අත්හැර නොයෙමි"යි දිවුරා කීවා ය. එවිට
ඔහු පිටත් වී ඈ පසුපස ගියේ ය.

### එලිෂා ළමයාට නැවත පණ දීම

31 ගෙහෝසී ඔවුන්ට පෙරටුවෙන් ගොස් සැරයටිය
ළමයා පිට තැබී ය. එහෙත්, කිසි හඬක් වත්,
පිළිතුරක් වත් නො වී ය. එබැවින් ගෙහෝසී ඔහුගේ
පෙරමඟට හැරී අවුත්, "ළමයා පිබිදුණේ නැතැ"යි
ඔහුට දැන්නුවේ ය. 32 එලිෂා ඒ ගෙදරට පැමිණි විට
ළමයා මැරී තමාගේ ඇඳේ බාවා තිබෙනු දිටී ය.
33 එවිට ඔහු ඇතුළු වී ඔවුන් දෙදෙනා සිටිද්දී දොර
වසාගෙන සමිඳාණන් වහන්සේට යාච්ඤා කළේ ය.
34 1 රාජා 17:21තවද, ඔහු ඇඳට නැඟී, ළමයා පිට
වැතිර, තමාගේ කට ඔහුගේ කට පිට ද තමාගේ
ඇස් ඔහුගේ ඇස් පිට ද තමාගේ අත් ඔහුගේ අත්
පිට ද තබා ළමයා පිට දිගා විණි. ළමයාගේ මාංසය
ද උණුසුම් විය. 35 එවිට ඔහු හැරී අවුත් ගෙයි එහා
මෙහා ඇවිද, නැවත ඇඳට නැඟී ගොස් ඔහු පිට
පෙර ලෙස ම සත් වරක් දිගාවුණේ ය. එවිට ළමයා
කිඹිහුම් ඇර ඇස් ඇරියේ ය. 36 ඔහු ගෙහෝසී
කැඳවා, "ඒ ෂූනම්මිය ස්ත්‍රියට අඬගසන්නැ"යි කී ය.
ඔහු ඈට අඬගැසී ය. ඈ ඔහු ළඟට ආ කල, "ඔබේ
පුත්‍රයා ගන්නැ"යි ඔහු කී ය. 37 ඈ ද ඇතුළු වී
ඔහුගේ පාමුල වැටී, බිමට නැමී වැඳ, ඇගේ පුත්‍රයා
රැගෙන ගියා ය.

### තවත් හාස්කම් දෙකෙක්

38 එලිෂා ගිල්ගාල් නුවරට නැවත ගොස් සිටිය දී
දේශයෙහි දුර්භික්ෂයක් තිබිණි. දිවැසිවරු කණ්ඩායම
ඔහු ඉදිරියෙහි වාඩි වී උන්නෝ ය. ඔහු තමාගේ
මෙහෙකෙරුවා අමතා, "ලොකු සැළිය ලිපේ තබා
දිවැසිවරයන්ට කෑම පිසින්නැ"යි කී ය. 39 එක්
කෙනෙක් පලා එකතු කරන්නට කෙතට ගොස්, වල්
කැකිරි වැලක් සම්බ වී, එයින් ගෙඩි කඩා ගෙන
තමාගේ ඔඩොක්කුව පුරවාගෙන අවුත්, ඒවා කැලි
කොට කපා කෑම සැළියේ දැමී ය. එහෙත්, ඔව්හු,
"ඒ මොනවා දැ"යි නොදත්හ. 40 තවද, ඔව්හු ඒවා
මිනිසුන්ට කන පිණිස බෙදා දුන්නෝ ය. එහෙත්,
ඔව්හු ඒ කෑම කන්න පටන්ගත් විට ම මොරගසා,
"දෙවියන් වහන්සේට කැප වූ මනුෂ්‍යය, සැළියේ විස
තිබේ ය"යි කී හ. 41 ඔවුන්ට ඒවා කන්න නොහැකි
විය. ඔහු ද, "එසේ වී නම් පිටි ටිකක් ගෙනෙන්නැ"යි
ඒවා සැළියෙහි දමා, "කන පිණිස සෙනඟට වත් කර
දෙන්නැ"යි කී ය. එවිට සැළියෙහි කිසි විසක් නො වී
ය.
42 තවද, බාල්-ෂාලිෂාහි සිට මනුෂ්‍යයෙකේ ප්‍රථම
අස්වැන්නෙන් යව රොටි විස්සක් ද අලුත් ගොයම්
කරල් ද තමාගේ මල්ලේ දමාගෙන දෙවියන්
වහන්සේට කැප වූ මනුෂ්‍යයා වෙත ගෙනාවේ ය.
ඔහු ද, "සෙනඟට කන්න දෙන්නැ"යි කී ය.
43 ඔහුගේ මෙහෙකෙරුවා, "කිමෙක් ද? මේවා
මනුෂ්‍යයන් සියයක් ඉදිරියෙහි තබන්න දැ"යි ඇසී ය.
43 එහෙත් ඔහු, "ඒවා සෙනඟට කන්න දෙන්න;
මන්ද, ඔවුන් අනුභව කොට ඉතිරි කරනු ඇත කියා
සමිඳාණන් වහන්සේ වදාරන සේකැ"යි පැවසී ය.
44 එවිට ඔහු ඒවා ඔවුන් ඉදිරියෙහි තැබී ය. ඔව්හු
එයින් අනුභව කොට සමිඳාණන් වහන්සේ වදාළ
ලෙසෙ ඉතිරි කළෝ ය.

### නාමන්ගේ කුෂ්ඨය සුව කිරීම

5 ලූක් 4:27 සිරියාවේ රජුගේ සේනාපතියා වූ
නාමන් තමාගේ ස්වාමියා වෙත උත්තමයකු ව
ගරුබුහුමන් ලැබූ මනුෂ්‍යයකු ව සිටියේ ය. මන්ද,
ඔහු කරණකොටගෙන සමිඳාණන් වහන්සේ
සිරියන්වරුන්ට ජය දී තිබිණි. ඔහු බලසම්පන්න
කෙනෙකු වූ නමුත් කුෂ්ඨ රෝගියෙකේ විය.
2 සිරියන්වරුන්ගේ එක්තරා ආක්‍රමණයක දී ඔවුන්
ඉශ්‍රායලේ දේශයෙන් කුඩා දැරියක අල්ලාගෙන
අවුත් තිබිණි. ඈ නාමන්ගේ භාර්යාවට සේවය කළා
ය. 3 ඈ වනාහි ඇගේ ස්වාමිදුවට කතා කොට,
"මාගේ ස්වාමියා සමාරියේ දිවැසිවරයා ඉදිරියෙහි
පෙනී සිටියොත් හොඳ ය; එවිට ඔහුගේ කුෂ්ඨය
සුව කරනු ඇතැ"යි කීවා ය. 4 එවිට නාමන් ගොස්
ඉශ්‍රායලේ දේශයෙන් ආ දැරිය කී දේ එලෙසෙ ම
කියා තමාගේ ස්වාමියාට දැන්වී ය. 5 සිරියාවේ රජ
ද, "ඉතින් ඔබ එහි යන්න; මම ඉශ්‍රායලේ රජුට
ලියුමක් හරින්නෙමේ"යි කී ය.

5 ඔහු ද රිදී කාසි තිස්දාහකුත්, රන් කාසි
හයදාහකුත්, ඇඳුම් කුට්ටම් දසයකුත් රැගෙන පිටත්
ව ගියේ ය.
6 ඔහු ඒ ලියුම ඉශ්රායලේ රජු වෙත ගෙනාවේ ය.
"මේ ලියුම ඔබට ලැබුණු විට නාමන් නම් මාගේ
සේවකයාගේ කුෂ්ඨය සුව කරන පිණිස ඔහු ඔබ
ළඟට එවමි"යි එහි ලියා තිබිණි.
7 ඉශ්රායලේ රජ ලියුම කියවා, පුදුම වී තමාගේ
ඇඳුම් ඉරාගෙන, "මනුෂ්යයකුගේ කුෂ්ඨය සුව
කරන්නට කියා මොහු මට ලියා එවන්නේ යමකු
මරන්නත්, ජීවත් කරන්නත් මා දෙවියන් වහන්සේ
කියා සිතාගෙන ද? මොහු මට විරුද්ධ ව දබරයකට
කාරණයක් සොයන හැටි කල්පනා කර බලන්නැ"යි
කී ය.
8 ඉශ්රායලේ රජු තමාගේ ඇඳුම් ඉරාගත් බව
දෙවියන් වහන්සේට කැප වූ මනුෂ්යයා වන එලිෂා
අසා, "ඔබ කුමක් නිසා ඔබේ ඇඳුම් ඉරාගන්නෙහි ද?
ඔහු මා ළඟට ආවා වේ. එවිට ඔහු ඉශ්රායලේහි
දිවැසිවර කෙනෙකු සිටින බව දැනගන්නේ ය"යි
රජුට කියා යැවී ය.
9 මෙසේ නාමන් තමාගේ අශ්වයන් ද රථ ද ඇති
ව අවුත් එලිෂාගේ ගෙයි දොරකඩ ළඟ සිටියේ ය.
10 එලිෂා කතා කොට, "ඔබ ගොස් ජෝර්දාන්
ගඟෙහි සත් වරක් නාන්න; එවිට ඔබේ කුෂ්ඨය සුව
වී ඔබේ ශරීරය නැවත පවිත්ර වන්නේ ය"යි
පණිවුඩකාරයකු අත කියා යැවී ය. 11 එහෙත්,
නාමන් කෝප වී යන්නට ගියේ ය. ඔහු කතා
කොට, "ඔහු පිටතට මා ළඟට අවුත් සිටගෙන,
තමාගේ දෙවි සමිඳාණන් වහන්සේගේ නාමය කියා
යාච්ඤා කර, කුෂ්ඨය මත්තෙහි තමාගේ අත වනා
රෝගියා සුව කරනු ඇතැ යි මම සිතුවෙමි.
12 දමස්කයෙහි ගංගා වන අබානා සහ පර්පර්
ඉශ්රායලේ දේශයේ සියලු ගංගා ජලයට වඩා හොඳ
නොවේ ද? ඒවායේ ස්නානය කොට පවිත්රවන්න
මට බැරි දැ"යි ඇසී ය. මෙසේ ඔහු කෝපයෙන් හැරී
ගියේ ය.
13 ඔහුගේ සේවකයෝ ළඟට අවුත් ඔහුට කතා
කොට, "මාගේ පියාණෙනි, දිවැසිවරයා මහා දෙයෙක්
කරන්න ඔබට කීවේ නම් ඔබ කරන්නේ නැද් ද?
එසේ වී නම්, 'ස්නානය කොට පවිත්ර වන්නැ'යි ඔහු
ඔබට කී කල එය කරන්න බැරි දැ"යි ඇසූ හ.
14 එවිට ඔහු බැස ගොස් දෙවියන් වහන්සේට කැප
වූ මනුෂ්යයාගේ කීම ලෙස ජෝර්දාන් ගඟෙහි සත්
වරක් ගිලී ස්නානය කළේ ය. ඔහුගේ ශරීරය ද
කුඩා ළමයකුගේ ශරීරය මෙන් පවිත්ර විය.
15 එවිට ඔහු තමාගේ මුළු පිරිවර සමඟ දෙවියන්
වහන්සේට කැප වූ මනුෂ්යයා ළඟට හැරී අවුත්, ඔහු
ඉදිරියේ සිට කතා කොට, "ඉතින් ඉශ්රායලේහි
සිටින දෙවියන් වහන්සේ මිස මුළු පොළොවේ වෙන
දෙවි කෙනෙකුන් නැති බව දැන් මම දනිමි. එබැවින්
දැන් ඔබේ මෙහෙකරුවාගෙන් තෑගි පිළිගත
මැනවැ"යි කී ය.
16 ඔහු ද කතා කරමින්, "මා සේවය කරන
ජීවමාන සමිඳාණන් වහන්සේගේ නාමයෙන් මම
කිසිවක් නොපිළිගනිමි"යි දිවුරමින් කීවේ ය.
16 එවිට ඔහු එය පිළිගන්න හැටියට ඔහුට
පෙරෙත්ත කළේ ය. එහෙත්, ඔහු අකමැති විය.
17 එවිට නාමන්, "එසේ නැත්නම්, කොටළුවන්
දෙන්නකුට ගෙන යත හැකි බරට පස් වත් ඔබේ
මෙහෙකරුවාට ලැබේ වා. මන්ද, මින් මතු ඔබේ
මෙහෙකරුවා සමිඳාණන් වහන්සේට මිස වෙන
දෙවිවරුන්ට දවන යාග පූජාවක් වත්, යාගයක් වත්
ඔප්පු කරන්නේ නැත. 18 මේ කාරණය ගැන
සමිඳාණන් වහන්සේ ඔබේ මෙහෙකරුවාට කමා වන
සේක් වා! එනම්, මාගේ ස්වාමියා, රිම්මොන්ගේ
දේවාලයෙහි වඳින්නට මාගේ අතේ හේත්තු වී එහි
යන විට මාත් රිම්මොන්ගේ දේවාලයෙහි දී
වැන්දොත්, එසේ වඳින විට සමිඳාණන් වහන්සේ ඒ
කාරණය ගැන ඔබේ මෙහෙකරුවාට කමා වන සේක්
වා"යි කී ය. 19 එලිෂා ද, "සාමදානයෙන් යන්නැ"යි
ඔහුට කී ය. එවිට ඔහු එලිෂා වෙතින් වෙන් ව ටික
දුරක් ගියේ ය.

## ගෙහාසීට දඬුවම් දීම

20 එකල දෙවියන් වහන්සේට කැප වූ මනුෂ්යයා
වන එලිෂාගේ වැඩකාර ගෙහාසී කල්පනා කොට,
"බලන්න, මාගේ ස්වාමියා මේ සිරියන් ජාතික
නාමන් ගෙනා දේවල් ඔහුගේ අතින් නොපිළිගෙන
නිකම් යන්න හැරියේ ය. ජීවමාන සමිඳාණන්
වහන්සේගේ නාමයෙන් මම ඔහු පස්සේ දිව ගොස්
ඔහුගෙන් යමක් ලබාගනිමි"යි දිවිරී ය. 21 මෙසේ
ගෙහාසී නාමන් පසුපස ගියේ ය. නාමන් තමා
පසුපස කෙනෙකු දුවගෙන එනු දැක ඔහු සම්බවන්න
රථයෙන් බැස, "යම් කරදරයක් ඇත්දැ"යි ඇසී ය.
22 ඔහු ද, "කරදරයක් නැත. දිවැසිවර
කණ්ඩායමෙන් තරුණයෝ දෙදෙනෙක් එප්රායිම් කඳු
රටේ සිට මේ දැන් මා වෙත ආවෝ ය. ඔවුන්ට රිදී
කාසි තුන්දාහකුත්, ඇඳුම් කුට්ටම් දෙකෙකුත් දුන
මැනවැ යි කියන්නට මාගේ ස්වාමියා මා එවුවේ
ය"යි කීවේ ය.
23 නාමන් ද කතා කොට, "ඔබ රිදී කාසි හයදාහක්
ගන්නට සතුටු වන්නැ"යි ඔහුට පෙරෙත්ත කර, රිදී
කාසි හයදාහක් මලු දෙකෙක බැඳ, ඇඳුම් කුට්ටම්
දෙකෙකුත් තමාගේ වැඩකාරයන් දෙදෙනෙකු පිට
තැබුවේ ය. ඔව්හු ඔහුට පෙරටුවෙන් ඒවා
උසුලාගෙන ගියෝ ය. 24 හලෙ ළඟට පැමිණි විට
ඔහු ඔවුන් අතින් ඒවා රැගෙන ගෙයි තබා, ඒ
මනුෂ්යයන් යන්න හැරියේ ය. ඔව්හු ද යන්නට
ගියෝ ය.
25 ඔහු වනාහි ඇතුළු වී තමාගේ ස්වාමියා
ඉදිරියේ සිටියේ ය. එලිෂා කතා කොට, "ගෙහාසී
ඔබ කොහේ ගොස් ආවෙහි දැ"යි ඔහුගෙන් ඇසී ය.
"ඔබේ මෙහෙකරුවා කොහේවත් ගියේ නැතැ"යි
ඔහු කී ය.

26 එලිෂා කතා කරොට, “ඒ මනුෂ්‍යයා තමාගේ
රථයෙන් බැස ඔබ සම්බවන්න හැරී ආ විට මාගේ
ආත්මානුභාවය ඔබ සමඟ ගියේ නැද් ද? මේ මුදල්
පිළිගන්නත්, ඇඳුම් ද ඔලීව වතු ද මිදි වතු ද
බැටළුවන් ද ගවයන් ද දාස දාසීන් ද පිළිගන්නත්
අවස්ථාවක් ද? 27 එබැවින් නාමන්ගේ කුෂ්ඨය
ඔබටත්, ඔබේ වංශයටත් නිරතුරු ම වැළඳනේනේ
ය”යි ඔහුට කී ය.
27 එවිට ඔහු හිම මෙන් කුෂ්ඨයක් ඇති ව
ඔහුගෙන් ඉවත් ව ගියේ ය.

### නැති වූ පොරොවේ තලය සොයාගැනීම

6 දිවැසිවරු කණ්ඩායම එලිෂාට කතා කොට,
“බැලුව මැනව, අප ඔබ ඉදිරියෙහි වසන මේ
ස්ථානය අපට ඉඩ මදි ය. 2 ජෝර්දානය ළඟට
ගොස්, එතැනින් එක් එක්කෙනා ලීයක් බැගින්
රැගෙන අපේ වාසයට එහි ස්ථානයක් සාදාගන්න
අපට අවසර ලැබේ වා”යි කී හ. “යන්නැ”යි ඔහු
පිළිතුරු දිනි.
3 එක් කෙනෙකේ, “ඔබ ද, ඔබේ මෙහෙකරුවන්
සමඟ යන්න සතුටු වුව මැනවැ”යි කී ය. “මම යමි”යි
ඔහු ඔවුන් සමඟ ගියේ ය. 4 ඔව්හු ජෝර්දානය
ළඟට පැමිණ ගස් කැපූ හ. 5 එක් කෙනෙකු ලීයක්
කපද්දී පොරොවේ තලය වතුරේ වැටිණි. ඔහු, “අනේ
මාගේ ස්වාමීනි, ඒක ඉල්ලාගත් එකකැ”යි කෑගසා කී
ය.
6 එවිට දෙවියන් වහන්සේට කැප වූ මනුෂ්‍යයා
කතා කොට, “එය වැටුණේ කොහේ දැ”යි ඇසී ය.
6 ඔහු ඒ ස්ථානය ඔහුට පෙන්නූ විට ඔහු දණ්ඩක්
කපා එහි දැමී ය. එවිට යකඩය පා විය. 7 ඔහු ද
කතා කොට, “ඒක ගන්නැ”යි කී විට ඔහු අත දිගු
කර එය ගත්තේ ය.

### සිරියන් රාජ්‍යය පරාජය කිරීම

8 සිරියාවේ රජ ඉශ්‍රායලේවරුන්ට විරුද්ධ ව යුද්ධ
කරන විට තමාගේ සේවකයන් සමඟ මන්ත්‍රණය
කරමින්, “අසවල්, අසවල් තැන මාගේ කඳවුරු විය
යුතු ය”යි කී ය. 9 දෙවියන් වහන්සේට කැප වූ
මනුෂ්‍යයා ද, “සිරියන්වරුන් අසවල් තැනට බැස එන
නිසා ඒ ළඟින් නොයෙන හැටියට බලාගත මැනව”යි
ඉශ්‍රායලේ රජුට දන්වමින් අනතුරු ඇඟවී ය.
10 දෙවියන් වහන්සේට කැප වූ මනුෂ්‍යයා දැනුම් දුන්
ස්ථානයට ඉශ්‍රායලේ රජ මිනිසුන් යැවී ය. ඔහු ද
රජුට අනතුරු ඇඟ වූ බැවින් රජ ද පරීක්ෂාකාරී ව
සිටියේ ය. එසේ වූයේ වරක් දෙවරක් නොව,
බොහෝ වාරයක් ය.
11 මේ කාරණය ගැන සිරියාවේ රජුගේ සිත
කැළඹී ඔහු තමාගේ සේවකයන් කැඳවා, “අපෙන්
ඉශ්‍රායලේ රජුගේ පක්ෂයට සිටින්නේ කවරකේ ද
කියා ඔබ මට දන්වන්නේ නැද් දැ?”යි ඇසී ය.
12 ඔහුගේ සේවකයන්ගෙන් එක් කෙනෙකේ කතා
කොට, “මාගේ ස්වාමීන් වන රජතුමනි, එසේ
නොවේ. ඔබේ යහන් ගබඩාවේ දී ඔබ කියන
වචන ඉශ්‍රායලේහි දිවැසිවරයා වන එලිෂා,
ඉශ්‍රායලේ රජුට දන්වන්නේ ය”යි කීවේ ය.
13 එවිට ඔහු කතා කොට, “මා විසින් ඔහු
අල්ලාගනු ලබන පිණිස ඔහු කොතැන ද කියා ඔබ
ගොස් බලන්නැ”යි කී ය.
13 “ඔහු දොතාන්හි සිටින්නේ ය”යි ඔහුට දන්වන
ලදී. 14 එබැවින් ඔහු අශ්වයන් ද රථ ද විශාල
හමුදාවක් ද එහි යැවී ය. ඔව්හු රාත්‍රියේ අවුත්
නුවර වටලාගත්තෝ ය. 15 එලිෂාගේ සේවකයා
අලුයම නැඟිට පිටතට ගිය කල හමුදාවක්, අශ්වයන්
හා රථ ඇති ව නුවර වටේට සිටිනු දුටුවේ ය. එවිට
ඔහු, “අහෝ! ස්වාමීනි, අපි කුමක් කරමු දැ”යි
ඔහුගෙන් ඇසී ය.
16 ඔහු ද කතා කොට, “බිය නොවන්න. මන්ද,
ඔවුන් සමඟ සිටින අයට වඩා අප සමඟ සිටින අය
බොහෝ ය”යි කීවේ ය. 17 එවිට එලිෂා යාච්ඤා
කොට, “සමිඳාණන් වහන්ස, ඔහුට පෙනෙන පිණිස
ඔහුගේ ඇස් පැහැදුව මැනවැ”යි කී ය. සමිඳාණන්
වහන්සේ සේවකයාගේ ඇස් පැහැදූ සේක. එවිට
එලිෂා වටේට ගිනි අශ්වයන්ගෙන් ද ගිනි රථවලින් ද
කන්ද පිරී තිබෙන බව ඔහු දුටුවේ ය.
18 ඔවුන් එලිෂා ළඟට ගිය කල ඔහු, “මේ සෙනඟ
අන්ධ කළ මැනවැ”යි සමිඳාණන් වහන්සේට යාච්ඤා
කළේ ය. උන් වහන්සේ එලිෂාගේ ඉල්ලීම ලෙසෙ
ඔවුන් අන්ධ කළ සේක. 19 එවිට එලිෂා ඔවුන්ට
කතා කොට, “ඒ පාර මෙය නොවේ. ඒ නුවරත්
මෙය නොවේ. මා පසුපස එන්න, ඔබ සොයන
මනුෂ්‍යයා ළඟට මම ඔබ ගෙනයන්නමේ”යි ඔවුන්
සමාරියට ගෙන ගියේ ය.
20 තවද ඔවුන් සමාරියට පැමිණි විට එලිෂා කතා
කොට, “සමිඳාණන් වහන්ස, පෙනෙන පිණිස
මොවුන්ගේ ඇස් පැහැදුව මැනවැ”යි කී ය.
සමිඳාණන් වහන්සේ ඔවුන්ගේ ඇස් පැහැදූ සේක.
ඔව්හු බැලූ විට තමන් සමාරිය මැද සිටින බව
දුටුවෝ ය.
21 ඉශ්‍රායලේ රජු ඔවුන් දැක, “මාගේ පියාණනි,
ඔවුන්ට පහර දමේ ද? පහර දමේ දැ”යි එලිෂාගෙන්
ඇසී ය.
22 ඔහු, “ඔබ ඔවුන්ට පහර නොදිය යුතු ය. ඔබේ
කඩුවෙන් ද ඔබේ දුන්නෙන් ද අල්ලාගත්
තැනැත්තන්ට ඔබ පහර දෙන්නෙහි ද? ඔවුන් කා බී
තමන්ගේ ස්වාමියා ළඟට යන පිණිස ඔවුන්ට කෑම
ද වතුර ද දෙන්නැ”යි කී ය. 23 ඔහු ඔවුන්ට මහා
භෝජන සංග්‍රහයක් පිළියෙළ කළේ ය. ඔවුන්
ආහාර පාන අනුභව කළ පසු ඔහු ඔවුන් පිටත් කර
හැරියේ ය. ඔව්හු ද තමන්ගේ ස්වාමියා ළඟට
ගියෝ ය. සිරියාවේ ආක්‍රමණය සඳහා යෙදෙන
කණ්ඩායම් තවත් ඉශ්‍රායලේ රටට නාවෝ ය.

### සමාරිය වටලෑම

24 ඉන්පසු සිරියාවේ රජ වන බෙන්-හදද් තමාගේ
මුළු සේනාව රැස් කරගෙන විත් සමාරිය
වටලාගත්තේ ය. මහා සාගතයක් සමාරියෙහි විය.

25 කොටළු හිසක් රිදී කාසි අසූවකටත්, වල්ලුණු
ග්රෑම් දසෙයියක් රිදී කාසි පහකටත් විකිණෙන
තකේ ඔව්හු සමාරිය වටලාගනෙ සිටියෝ ය.
26 ඉශ්රායලේ රජු පවුර පිට යන කල ස්ත්රියක්
කතා කොට, “මාගේ ස්වාමීන් වන රජතුමනි, පිහිට
වුව මැනවැ”යි මොරගැසුවා ය.
27 ඔහු උත්තර දමේන්, “සමිඳාණන් වහන්සේ ඔබට
පිහිට නොවන සේක් නම්, මම කුමකින් ඔබට පිහිට
වමේ ද? මට තිරිඟු වත් මිදි වත් ඇද් දැ?”යි කියා,
28 “ඔබට කුමක් වී තිබේ දැ”යි ඇගනේ ඇසී ය.
28 ඈ ද පිළිතුරු දමේන්, “ ‘ඔබේ පුත්රයා අද අපට
කන්න දනේන. මාගේ පුත්රයා හටෙ අපි කන්නමෙු’යි
මේ ස්ත්රිය මට කීවා ය. 29 ද්වි.නී. 28:57; විලාප
4:10එසේ අපි මාගේ පුතා උයා කෑවමෙු. පසු දින
‘ඔබේ පුත්රයා අපට කන්න දියන්නැ’යි ඈට කීවමේ.
එහතේ ඈ ඇගේ පුත්රයා සඟවාගනෙ සිටියා ය”
කීවා ය.
30 එකල රජ පවුර පිට යමින් සිටියේ ය. ඔහු
වනාහි ස්ත්රියගේ වචනය අසා මවිත වී තමාගේ
ඇඳුම් ඉරාගත්තේ ය. සනෙඟ ද ඔහු දසෙ බලා ඔහු
ඇඟ යටට ගෝණි රෙදි ඇඳ තිබනු දුටුවෝ ය.
31 එවිට ඔහු, “ශාපාත්ගේ පුත් එලිෂාගේ හිස අද
නොසිඳ තිබනේනට හැරියොත් දවේයන් වහන්සේ
මට ඉතා තදින් දඬුවම් කරන සේක් වා”යි කී ය.

### සහනය ගැන කල්තියා දැන්වීම

32 එලිෂා ප්රජා මූලිකයන් සමඟ තමාගේ ගදෙර
වාඩි වී සිටියේ ය. එවිට රජ තමා වතෙින්
මනුෂ්යයකු යැවී ය. එහතේ, පණිවුඩකාරයා ඔහු
ළඟට එන්න පළමුවනේ එලිෂා ප්රජා මූලිකයන්ට
කතා කොට, “අර මිනීමරුවාගේ පුතා මාගේ හිස
කපාදමන්න කනෙකු එවූ බව ඔබට පනෙේ ද? ඔබ
බලා සිට පණිවුඩකාරයා ආ විට, ඔහුට ඇතුළු වන්න
ඉඩ නොදී, දොර වසා එය තද කරගනෙ සිටින්න.
ඔහුට පස්සනේ එන ඔහුගේ ස්වාමියාගේ අඩි
ශබ්දය ඇසනේනේ නැද් දැ?”යි ඇසී ය. 33 ඔහු ඔවුන්
සමඟ කතා කරද්දී ම පණිවුඩකාරයා ඔහු ළඟට
ආවේ ය. රජ කතා කොට, “මේ නපුර සමිඳාණන්
වහන්සගේනේ ය; සමිඳාණන් වහන්සේ ගැන මා
තවත් බලාපොරොත්තු වන්නේ කුමට දැ”යි ඇසී ය.

7 එවිට එලිෂා කතා කොට, “සමිඳාණන්
වහන්සගේ පණිවුඩය අසන්න. ‘හටෙ මේ
වලේාවට පමණ රිදී කාසියකට සිහින් පිටි
කිලෝග්රෑම් තුනක් ද, රිදී කාසියකට යව
කිලෝග්රෑම් හයක් ද සමාරියහෙි දොරටුවහෙි
විකිණනෙු ඇත’ කියා සමිඳාණන් වහන්සේ වදාරන
සේකැ”යි කී ය.
2 එවිට තම අතට රජු හේත්තු වී සිටි නිලධාරියා
දවේයන් වහන්සේට කැප වූ මනුෂ්යයාට උත්තර
දමේන්, “සමිඳාණන් වහන්සේ අහසේ කවුළු සාදා
වැසි එව්වත් මයෙ සිදු විය හැකි දැ”යි කී ය. “එය
ඔබේ ඇස්වලින් දකින්නහෙි ය. එහතේ, එයින්
නොකන්නහෙි ය”යි ඔහු පැවසී ය.

### සිරියන් හමුදාව කඳවුර අත්හැර යාම

3 කුෂ්ඨ රෝගීහු සතර දනෙකේ වාසල් දොරකඩ
සිටියෝ ය. ඔව්හු එකිනකොට කතා කොට, “අපි
නහින තුරු කුමට මහෙි සිටිමු ද? 4 අපි නුවරට
ඇතුළුවමෙු යි කීවත් නුවර තුළ සාගතය තිබනෙ
නිසා අප එහි නසිනු ඇත. මහෙි සිටියත් නසිනු ඇත.
එබැවින් දැන් එන්න, අපි සිරියන්වරුන්ගේ සේනාවට
එකතුවමෙු. ඔවුන් අප ආරක්ෂා කළොත් අපි
ජීවත්වන්නමෙු. ඔවුන් අප මැරුවොත් අපට මරණය
පමණක් සිදු වනු ඇතැ”යි කී හ. 5 එසේ ඔව්හු
සිරියන්වරුන්ගේ කඳවුරට යන පිණිස ඇඳිරි වගේනෙ
එන වලේහෙිම පිටත් වූ හ. එහතේ, ඔව්හු
සිරියන්වරුන්ගේ කඳවුරේ සීමාවට පැමිණනෙ විට
එහි කිසිවකු නැති බව දුටුවෝ ය. 6 මන්ද,
සමිඳාණන් වහන්සේ රථ ඝෝෂාවක් ද අශ්ව
ඝෝෂාවක් ද යන මහා සේනාවක ඝෝෂාවක්
සිරියන්වරුන්ගේ සේනාවට ඇසනේන සැලැසූ සේක.
ඔව්හු එකිනකොට කතා කොට, “ඉශ්රායලේ රජ
හිත්තීවරුන්ගේ ද මිසරවරුන්ගේ ද රජුන් අපට
විරුද්ධ ව කුලියට ගනේවාගත්තේ ය” කියා 7 නැඟිට
රෑ කාලයේ පලා ගියහ. ඔව්හු තමන්ගේ කූඩාරම් ද
අශ්වයන් ද කොටළුවන් ද ඇතුළු ව කඳවුර තිබුණු
හැටියට ම අත්හැර තමන්ගේ ප්රාණය ගළවා
ගන්නට පලා ගියහ.
8 ඒ කුෂ්ඨ රෝගීන් කඳවුරේ සීමාවට පැමිණි විට,
ඔව්හු එක් කූඩාරමකට ඇතුළු වී කා බී, එතැනින්
රන් රිදී වස්ත්ර රැගනෙ ගොස්, සඟවා තබා, නැවත
හැරී අවුත්, වනෙ කූඩාරමකට ඇතුළු වී, එතැනිනුත්
ඒවා රැගනෙ ගොස් සඟවා තැබූ හ.

### වටලෑමේ අවසානය

9 එවිට කුෂ්ඨ රෝගීහු සතරදනෙ එකිනකොට
කතා කොට, “අප කරන දේ හරි නැත. අද දවස
හොඳ ආරංචි ඇති දවසක් ව තිබදේදී අපි නිශ්ශබ්ද
ව සිටිමු. උදය එළි වන තුරු ප්රමාද වුණොත් අපට
වරද පැමිණයෙි. ඒ නිසා එන්න, අපි රජ ගදෙරට
මපෙවත් දන්වමු”යි කී හ. 10 මසෙේ ඔව්හු අවුත්
නුවර දොරටු පාලකයන්ට හඬගසා කතා කොට,
“අපි සිරියන්වරුන්ගේ කඳවුරට ගියමෙු. එහි කිසි
මනුෂ්යයකේ වත්, මනුෂ්ය හඬක් වත් නැත. බඳින
ලද අශ්වයෝත්, කොටළුවෝත් සිටිති. කූඩාරම් ද
තිබුණු හැටියට ම තිබේ ය”යි ඔවුන්ට දැන්නූ හ.
11 දොරටු පාලකයෝ හඬගසා රජ ගදෙර
වැසියන්ට එපවත් දැන්නූ හ. 12 රජ තමෙේ
රාත්රියේ නැඟිට, තමාගේ සවේකයන්ට කතා
කොට, “ඉතින් සිරියන්වරුන් අපට කර තිබනෙ
කාරණය ඔබට දන්වමි. අපට කුසගිනි ඇති බව
ඔව්හු දනිති. එබැවින් අප නුවරින් පිටත ආ කල
ඔව්හු අප පණපිටින් අල්ලා, නුවරට ඇතුළු වන්නට
සිතාගනෙ පිටත සැඟවී ඉන්න කඳවුර අත්හැර
ගියෝ ය”යි කීවේ ය.

13 සේවකයන්ගෙනේ එක් කෙනෙකේ උත්තර දමේන්,
“නුවර ඉතිරි ව සිටින අශ්වයන්ගෙනේ පස්දෙනෙකු
රැගෙනෙ කඳවුර බැලීම සඳහා මනුෂ්යයන් යවමු.
මෙහි ඉතිරි ව සිටින මුළු ඉශ්රායලේ සමූහය මෙනේ
ඔවුන් ද මැරෙනු ඇතැ”යි කී ය. 14 ඔව්හු අශ්වයන්
යෙදූ රථ දෙකෙක් ගත්තෝ ය. “එහි ගොස් බලන්න”
කියා රජ සිරියන් සේනාව පස්සේ ඔවුන් යැවී ය.
15 ඔව්හු ඔවුන් පස්සේ ජෝර්දාන් ගඟ දක්වා ගියහ.
සිරියන්වරුන් ඉක්මනින් පලා යද්දී විසිකළ
වස්ත්රවලින් හා භාජනවලින් මාවත දිගට ම පිරී
තිබිණි. පණිවුඩකාරයෝ හැරී අවුත් රජුට එපවත්
දැන්නුවෝ ය. 16 සෙනෙඟ ගොස් සිරියන්වරුන්ගේ
කඳවුර කොල්ලකෑ හ. මෙසේ සමිඳාණන් වහන්සේ
වදාළ ලෙසෙ රිදී කාසි එකකට සිහින් පිටි
කිලෝග්රෑම් තුනක් ද රිදී කාසි එකකට යව
කිලෝග්රෑම් හයක් ද විකුණන්නට යෙදුණේ ය.
17 තමාගේ අත පිට රජු හේත්තු වී සිටි අධිපතියා
රජු විසින් දොරටුව බලාගැනීමට පත් කරන ලද්දේ
ය. ඔහු දොරටුවේ දී සෙනෙඟට පෑගී මැරුණේ ය.
මෙසේ රජු දවියන් වහන්සේට කැප වූ මනුෂ්යයා
ළඟට ගිය විට ඔහු කී ලෙසෙ සිද්ධ විය. 18 “යව
කිලෝග්රෑම් හයක් රිදී කාසියකට ද සිහින් පිටි
කිලෝග්රෑම් තුනක් රිදී කාසියකට ද හටෙ මේ
වේලාවට පමණ සමාරියෙහි දොරටුවෙහි විකිණෙනු
ඇතැ”යි දවියන් වහන්සේට කැප වූ මනුෂ්යයා රජුට
කතා කර කී විට, 19 ඒ අධිපතියා ඔහුට උත්තර
දමේන්, “බලන්න, සමිඳාණන් වහන්සේ අහසේ
කවුළු සාදා වැසි එව්වත් එබඳු දයෙක් සිදු විය හැකි
දැ”යි කීවේ ය. එලිෂා කතා කොට, “ඔබ එය ඔබේ
ඇස්වලින් දකින්නෙහි ය. එහෙත්, එයින්
නොකන්නෙහි ය”යි කී ය. 20 එසේ ම සිදු විය. ඔහු
දොරටුවේ දී සෙනෙඟට පෑගී මළේ ය.

### ෂූනම්මිය ස්ත්රිය ආපසු පැමිණීම

8 2 රාජා 4:8-37 තවද, එලිෂා විසින් නැවත පණ
දෙනෙ ලද ළමයාගේ මවුට ඔහු කතා කොට,
“ඔබේ ගවෙසියන් සමඟ ඔබ පිටත් ව ගොස් ඔබට
නැවතී සිටින්න පුළුවන් තැනක සිටින්න. මන්ද,
සමිඳාණන් වහන්සේ සාගතයක් නියම කර තිබේ.
එය සත් අවුරුද්දක් දේශයෙහි පවතිනු ඇතැ”යි කී ය.
2 ඒ ස්ත්රී දවියන් වහන්සේට කැප වූ
මනුෂ්යයාගේ වචනය ලෙසෙ කරමින් ඇගේ
ගවෙසියන් සමඟ පිටත් ව ගොස් පිලිස්තිවරුන්ගේ
දේශයෙහි සත් අවුරුද්දක් සිටියා ය.
3 සත් අවුරුද්ද කළෙවර දී ඒ ස්ත්රී
පිලිස්තිවරුන්ගේ දේශයෙනේ හැරී ආවා ය. තවද, ඈ
ඇගේ ගයෙ සහ ඉඩම ගැන රජුට පැමිණිල්ලක්
කිරීමට පිටත් ව ආවා ය. 4 එකල්හි රජ, “එලිෂා කළ
සියලු පුදුම දේවල් මට කියන්නැ”යි දවියන්
වහන්සේට කැප වූ මනුෂ්යයාගේ වැඩකාර ගෙහොසී
සමඟ කතා කරමින් සිටියේ ය. 5 ඔහු විසින් මළ
කෙනෙකු ජීවත් කරනු ලැබූ සැටි රජුට කියන විට ම
බලන්න, එසේ ඔහු විසින් නැවත පණ දෙනෙ ලද
ළමයාගේ මවු තමාගේ ගයෙ සහ ඉඩම ගැන රජුට
පැමිණිලි කරමින් සිටියා ය. ගෙහොසී කතා කොට,
“මාගේ ස්වාමීන් වන රජතුමනි, මේ සිටින්නේ ඒ
ස්ත්රිය ය; මේ සිටින්නේ එලිෂා විසින් නැවත පණ
දෙනෙ ලද ඇගේ පුත්රයා ය”යි කී ය. 6 රජු ද
ස්ත්රියගෙනේ ඇසූ විට ඈ ඔහුට සියල්ල කීවා ය.
තවද, රජ තමේ ඈ ගැන එක්තරා මූලාදෑනියකුට
නියම කොට, “ඈට අයිති වූ සියල්ල ද ඈ දේශය
අත්හැර ගිය දා පටන් මේ වන තුරු ඇගේ ඉඩමෙනේ
හටගත් සියලු පල ද ඈට ලබා දනේනැ”යි කී ය.

### එලිෂා සහ දමස්කයේ හසායලේ

7 එලිෂා දමස්කයට පැමිණියේ ය. එකල්හි
සිරියාවේ බනේ-හදද් රජ ලඩේන් සිටියේ ය. එවිට,
“දවියන් වහන්සේට කැප වූ මනුෂ්යයා මෙහි ආවේ
ය”යි ඔහුට දන්වන ලදී. 8 රජ හසායලේට කතා
කොට, “ඔබ තෑග්ගක් රැගෙනෙ දවියන් වහන්සේට
කැප වූ මනුෂ්යයා සම්මුඛවන්න ගොස්, ‘මේ
ලඩෙනේ මම සුව වමේ දැ’යි ඔහු ලවා සමිඳාණන්
වහන්සේගෙනේ විචාරන්නැ”යි කීවේ ය. 9 එවිට
හසායලේ තෑග්ගක් ගෙනෙ දමස්කයේ නන් වැදෑරුම්
ඉස්තරම් හොඳ දේවල් ඔටුවන් සතළිස්දෙනෙකු පිට
පටවාගෙනෙ ඔහු වෙතෙ පැමිණ, ඔහු ඉදිරියෙහි සිට, “
‘මේ ලඩෙනේ මම සුව වන්නමේ ද’ කියා විචාරන්නට
ඔබේ පුත් සිරියාවේ රජු වන බනේ-හදද් මා ඔබ
ළඟට එව්වේ ය”යි කී ය.
10 එලිෂා ද උත්තර දමේන්, “ඔබ ගොස්, ‘සැබැවින්
ඔබ සුව වන්නෙහි ය’යි ඔහුට කියන්න. එහෙත්, ඔහු
සැබැවින් නසින බව සමිඳාණන් වහන්සේ මට
පනේවා තිබේ ය”යි ඔහුට කී ය. 11 තවද,
සංවේගයට පත් වන තුරු ම දවියන් වහන්සේට
කැප වූ මනුෂ්යයා ඔහු දෙසෙ බලා සිට පසු ව
ඇඬුවේ ය. 12 එවිට හසායලේ, “මාගේ ස්වාමියා
අඬන්නේ කුමක් නිසා දැ”යි ඇසී ය. ඔහු උත්තර
දමේන්, “ඔබ ඉශ්රායලේ ජනයාට කරන්න යන නපුර
මා දන්න නිසා ය. ඔබ ඔවුන්ගේ බලකොටු ගිනිලා,
ඔවුන්ගේ යෞවනයන් කඩුවෙනේ නසා, ඔවුන්ගේ
දරුවන් බිම ගසා මරා, ඔවුන්ගේ ගර්භණීන්
දපෙළුකර දමන්නෙහි ය”යි කී ය.
13 1 රාජා 19:15 හසායලේ ද කතා කොට,
“බල්ලකු වැනි ඔබේ මෙහෙකරු මා ඒ බරපතල දේ
කරන්නට ඔහු කවරකේ දැ”යි ඇසී ය. එලිෂා කතා
කොට, “ඔබ සිරියාවේ රජ වන බව සමිඳාණන්
වහන්සේ මට පනේවා තිබේ ය”යි කී ය.
14 ඔහු එලිෂා වෙතනේ ගොස් තමාගේ ස්වාමියා
ළඟට පැමිණි විට, “එලිෂා ඔබට කීවේ කුමක් දැ”යි
ඔහුගෙනේ ඇසුවේ ය. “සැබැවින් ම ඔබ සුව වනු
ඇත කියා මට කීයේ යැ”යි ඔහු පැවසී ය.
15 පසු දා ඔහු දළ රෙද්දක් ගෙනෙ වතුරේ පොඟවා
ඔහුගේ මුහුණ පිට එළා තැබී ය. එයින් ඔහු
මැරුණේ ය.
15 හසායලේ ඔහු වෙනුවට රජ විය.

### ජෙහෝරාම් රජුගේ පාලන සමය
(2 වංශා 21:1-20)

16 ඉශ්‍රායලේවරුන්ගේ රජ වූ ආහබ්ගේ පුත්
ජෝරාම්ගේ පස් වන අවුරුද්දේ ජෙහෝෂාපාට් ජුදාහි
රජ ව සිටිද්දී ජුදාහි රජ වූ ජෙහෝෂාපාට්ගේ පුත්
ජෙහෝරාම් රජ විය. 17 ඔහු තිස්දෑවුරුදු වයසේ දී
රජ වී ජෙරුසලමේ අට අවුරුද්දක් රජකම් කළේ ය.
18 ආහබ්ගේ වංශය කළ පරිදි ඔහු ඉශ්‍රායලේ
රජුන්ගේ අඩි පාරේ ගමන් කළේ ය. මන්ද, ඔහු
ආහබ්ගේ දුව සරණ පාවාගෙන සමිඳාණන්
වහන්සේගේ ඇස් හමුයෙහි නපුරු දේ කළේ ය.
19 1 රාජා 11:36එසේ වී නමුත්, සමිඳාණන්
වහන්සේ තමන්ගේ මෙහෙකරු වූ දාවිත්ට ඔහුගේ
පළෙපතින් එන කෙනෙකු නොනිවෙනෙ පහනක් මෙන්
රට පාලනය කරන බවට පොරොන්දු වූ ලෙස ඔහු
නිසා ජුදා රාජ්‍යය නැති කරන්නට අකමැති වූ සේක.
20 උත් 27:40 ඔහුගේ කාලයේ දී ඒදොම්වරු
කැරලි ගසා, ජුදාගේ පාලනය යටතෙන් අහක් ව
තමන්ට රජකු පත් කරගත්හ. 21 එවිට ජෝරාම්
තමාගේ සියලු රථ රැගෙන ශායීර් නම් ස්ථානයට
ගොස්, රෑ කාලයේ නැඟිට තමා වටකරගෙන සිටි
ඒදොම්වරුන්ටත්, රථාධිපතීන්ටත් පහර දුන්නේ ය.
එකල සෙනඟ තමන්ගේ කූඩාරම්වලට පලා ගියහ.
22 මෙසේ ඒදොම්වරුන් අද දක්වා ජුදාවරුන්ගේ
රාජ්‍ය පාලනය ඉවත දමා තිබේ. එම කාලයේ දී
ලිබ්නාවරු ද කැරලි ගැසූ හ.
23 ජෙහෝරාම්ගේ අනික් ක්‍රියා ද ඔහු කළ
සියල්ල ද ජුදා රජුන්ගේ පුරාවෘත්ත ග්‍රන්ථයේ
වාර්තා කර තිබෙනු නොවේ ද? 24 ජෙහෝරාම්
මියගිය පසු තමාගේ පියවරුන් සමඟ දාවිත්ගේ
නුවර තැන්පත් කරනු ලැබී ය. ඔහුගේ පුත් අහසියා
ඔහු වෙනුවට රජ විය.

### අහසියා රජුගේ පාලන සමය
(2 වංශා 22:1-6)

25 ඉශ්‍රායලේ රජු වූ ආහබ්ගේ පුත් ජෝරාම්ගේ
දොළොස් වන අවුරුද්දේ දී ජුදාහි රජු වන
ජෙහෝරාම්ගේ පුත් අහසියා රජ විය. 26 අහසියා
විසිදෑවුරුදු වයසේ දී රජ වී ජෙරුසලමේ අවුරුද්දක්
රජකම් කළේ ය. ඔහුගේ මවුගේ නම අතලියා ය.
ඈ ඉශ්‍රායලේ රජු වූ ඔම්රිගේ දුවක් ය. 27 ඔහු
ආහබ්ගේ වංශය ගිය මාර්ගයේ ගමන් කරමින්
ආහබ්ගේ වංශය කළ ලෙස සමිඳාණන්
වහන්සේගේ ඇස් හමුයෙහි නපුරු දේ කළේ ය.
විවාහයෙන් ඔහු ආහබ්ගේ පවුලට බෑණා විය.
28 ඔහු ආහබ්ගේ පුත් ජෝරාම් සමඟ සිරියාවේ
රජු වූ හසායලේට විරුද්ධ ව රාමොත්-ගිලියද්හි යුද්ධ
කරන්නට ගියේ ය. සිරියන්වරු ජෝරාම්ට තුවාළ
කළෝ ය. 29 ජෝරාම් රජ තමා සිරියාවේ රජු වන
හසායලේට විරුද්ධ ව යුද්ධ කරද්දී රාමාහි දී
සිරියන්වරුන් ඔහුට කළ තුවාළ ජෙශ්රයෙලේහි සුව
කරගන්න පිණිස හැරී ආවේ ය. ජුදාහි රජු වූ
ජෙහෝරාම්ගේ පුත් අහසියා ද ආහබ්ගේ පුත්
ජෝරාම් රෝගාතුර ව සිටි නිසා ඔහු බලන්නට
ජෙශ්රයෙලේට ගියේ ය.

### ජේහූ අභිෂේක කරනු ලැබීම

9 දිවැසිවර එලිෂා දිවැසිවර කණ්ඩායමනේ
කෙනෙකුට අඬගසා, “ඔබ ඉඟටිය බැඳගෙන,
මේ තලේ කුළාව අතින් රැගෙන රාමොත්-ගිලියද්ට
යන්න. 2 ඔබ එහි පැමිණි කල නිම්ෂීගේ පුත්‍රයා
වන ජෙහෝෂාපාට්ගේ පුත් ජේහූ සොයාගෙන,
ඔහුගේ සහෝදරයන් අතරෙන් ඔහු කැඳවාගෙන
ඇතුළු කාමරයකට ගොස්, 3 තලේ කුළාව රැගෙන
ඔහුගේ හිසේ වත්කොට, ‘මම නුඹ
ඉශ්‍රායලේවරුන්ගේ රජු ලෙස අභිෂේක කළෙමි යි
සමිඳාණන් වහන්සේ වදාරන සේකැ’යි කී පසු, දොර
හැර ප්‍රමාද නොවී යන්නැ”යි කී ය.
4 මෙසේ ඒ තරුණ දිවැසිවරයා රාමොත්-ගිලියද්ට
ගියේ ය. 5 ඔහු ඇතුළු වන විට සේනාපතියෝ වාඩි
වී සිටියහ. එවිට ඔහු, “සේනාපතිතුමනි, ඔබට
වචනයක් කියන්න මට තිබේ ය”යි කී ය. “අප
සියල්ලන්ගෙන් කවරකුට දැ”යි ජේහූ ඇසී ය.
“සේනාපතිතුමනි, ඔබට ය”යි ඔහු කී ය. 6 1 රාජා
19:16ඔහු නැඟිට කාමරය ඇතුළට ගිය විට ඒ
තරුණයා ඔහුගේ හිසේ තලේ වත් කොට,
“ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ
මෙසේ වදාරන සේක: ‘සමිඳාණන් වහන්සේගේ
සෙනඟ වන ඉශ්‍රායලේවරුන්ගේ රජු ලෙස ඔබ
අභිෂේක කළෙමි. 7 මාගේ මෙහෙකරුවන් වූ
දිවැසිවරුන් මැරීම ගැන ද සමිඳාණන් වහන්සේගේ
සියලු මෙහෙකරුවන් මැරීම ගැන ද මා
ජෙශෙබෙලේගෙන් පළිගන්න පිණිස නුඹේ ස්වාමීන් වූ
ආහබ්ගේ වංශයට පහර දෙන්න. 8 ආහබ්ගේ මුළු
වංශය විනාශ වන්නේ ය. ඉශ්‍රායලේවරුන් අතරේ
දාසයන් ද නිර්දාසයන් ද වන ආහබ්ගේ සියලු
පිරිමින් මරාදමා, 9 ආහබ්ගේ වංශය නබොත්ගේ
පුත් ජෙරොබෝවම්ගේ වංශය මෙන් ද අහියාගේ
පුත් බාෂාගේ වංශය මෙන් ද වන්නට
සලස්වන්නෙමි. 10 1 රාජා 21:23බල්ලෝ
ජෙශ්රයෙලේ නම් බිම් කොටසේ දී ජෙශෙබෙලේ
කන්නෝ ය. ඈ භූමදාන කරන්නට කිසිවෙක්
නොසිටින්නේ ය.’ ”යි ඔහුට කියා දොර ඇර ඔහු
යන්න ගියේ ය.
11 එකල ජේහූ තම ස්වාමියාගේ සේවකයන්
වෙත ආවේ ය. එක් කෙනෙක් කතා කොට, “සියල්ල
හොඳින් තේරුණා ද? ඒ පිස්සා ඔබ ළඟට ආවේ
කුමක්නිසා දැ”යි ඔහුගෙන් ඇසී ය. ඔහු ද, “ඒ
මනුෂ්‍යයාත්, ඔහුගේ කතාවත් ඔබ දන්නවා නොවේ
දැ”යි ඔවුන්ට කී ය. 12 “අපි එය නොදනිමු. අපට එය
කියන්නැ”යි ඔව්හු කී හ. ඔහු කතා කොට, “ ‘මම
ඉශ්‍රායලේවරුන්ගේ රජු ලෙස නුඹ අභිෂේක
කළෙමි යි සමිඳාණන් වහන්සේ වදාරන සේකැ’යි
මේ හැටියට මට කීවේ ය”යි දැන්වී ය.

13 එවිට ඔව්හු ඉක්මන් ව එකිනකො තම තමාගේ
වස්ත්‍රය රැගනෙ ඔහුට යටින් ඒවා පඩි පළෙ මත
එළා හාොරණෑ පිඹ, "ජේහු දැන් රජ යැ"යි කී හ.

## ජේහු රජ බලය උදුරාගැනීමට සූදානම් වීම

14 මසෙේ නිම්ෂිගේ පුත් ජහෙෝෂාපාට්ගේ පුත්‍ර
වන ජේහු, ජෝරාම්ට විරුද්ධ ව කුමන්ත්‍රණය
කළෙේ ය. එකල ජෝරාම් ද සියලු ඉශ්‍රායලේ
සනෙඟ ද සිරියාවේ රජ වූ හසායලේට විරුද්ධ ව
රාමොත්-ගිලියද් මුර කරමින් සිටියහ. 15 එහතේ,
ජෝරාම් රජ තමා සිරියාවේ රජු වන හසායලේට
විරුද්ධ ව යුද්ධ කරන අතර සිරියන්වරුන් විසින්
තමාට කරන ලද තුවාළ සුව කරගන්න පිණිස
ජශ්රෙයෙලේට හැරී අවුත් සිටියේ ය. තවද, ජේහු
කතා කාොට, "ඔබ කැමැති නම් ජශ්රෙයෙලේට
ගාොස් දන්වන පිණිස නුවරින් කාට වත් ගැළවී යන්න
ඉඩ නාොදනේනැ"යි කියා 16 රථයට නැඟ
ජශ්රෙයෙලේට ගියේ ය. කුමක් නිසා ද ජෝරාම් එහි
ඔත්පල ව සිටියේ ය. ජුදාහි රජ වූ අහසියා ද
ජෝරාම් බලන්නට එහි අවුත් සිටියේ ය.
17 ජශ්රෙයෙලේහි කාොටුව උඩ සිටි මුරකාරයා
ජේහුගේ හමුදාව එනු දැක, "හමුදාවක් මට පනෙේ
ය"යි කී ය. ජෝරාම් ද, "ඔබ අසරුවකෙුට අඬගසා
'ඔබ එන්නේ සාමදානයනේ දැ'යි අසන්නට ඔවුන්ගේ
පරෙමඟට යවන්නැ"යි කී ය.
18 මසෙේ එක් කනෙකේ අශ්වයකෙු පිට නැඟී
ඔහුගේ පරෙමඟට ගාොස්, " 'ඔබ එන්නේ
සාමදානයනේ දැ'යි රජ අසන්නේ ය"යි කී ය. ජේහු
ද, "සාමදානයනේ; ඔබට ඇති වැඩය කුමක් ද? හැරී
මා පස්සනේ එන්නැ"යි කී ය. මුරකාරයා කතා කාොට,
"පණිවුඩකාරයා ඔවුන් ළඟට පැමිණි නමුත් ආපසු
නාොඑන්නේ ය"යි කී ය. 19 එවිට ඔහු දෙ වන
අසරුවකෙු යැවී ය. ඔහු ද ඔවුන් ළඟට අවුත්, " 'ඔබ
එන්නේ සාමදානයනේ ද' කියා රජ අසන්නේ ය"යි කී
ය. ජේහු ද, "සාමදානයනේ; ඔබට ඇති වැඩය කුමක්
ද? හැරී මා පස්සනේ එන්නැ"යි කී ය.
20 මුරකාරයා ද, "ඔහු ඔවුන් ළඟට පැමිණි නමුත්
නැවත නාොඑන්නේ ය. රථය පදවන්නා එය
පදවන්නේ නම්, නිම්ෂිගේ පුත් ජේහුගේ
මහෙයෙවීම මනේ ය. කුමක් නිසා ද ඔහු උමතුවනේ
මනේ පදවන්නේ ය"යි දැන්නුවේ ය.
21 ජෝරාම් ද කතා කාොට, "රථය සූදානම්
කරන්නැ"යි කී ය. ඔව්හු ඔහුගේ රථය සූදානම්
කළාෝ ය. ඉශ්‍රායලේ රජ වූ ජෝරාම් ද ජුදාහි රජ වූ
අහසියා ද තම තමාගේ රථයට නැඟී පිටත් වී
ජේහුගේ පරෙමඟට ගාොස්, ජශ්රෙයෙලේය
නාබාොත්ගේ බිම් කාොටසේ දී ඔහුට සම්මුඛ වූ හ.

## ජෝරාම් රජුගේ මරණය

22 ජෝරාම්, ජේහු දුටු විට, "ජේහු, ඔබ එන්නේ
සාමදානයනේ දැ"යි ඇසී ය. ඔහු උත්තර දමේන්,
"ඔබේ මව වන ජශෙබෙලේගේ වශේයාකම් ද
ඇගේ මායම් ද මපෙමණ තිබිය දී මාොන
සාමදානයක් දැ"යි ඇසී ය. 23 එවිට ජෝරාම් හැරී
පලා යමින්, "අහාෝ අහසියා, මයෙ ද්‍රෝහිකමකි"
කියා අහසියාට කී ය. 24 එහතේ, ජේහු මුළු
ශක්තියනේ දුන්න ඇද ජෝරාම්ගේ පිට මැදට විද්දේ
ය. ඊ ගහ ඔහුගේ හෘදය පසා කරගනෙ පිට විය.
ඔහු රථයහෙි ඇද වැටුණේ ය. 25 එවිට ජේහු
තමාගේ ආරක්ෂක භටයා වන බිද්කර්ට කතා
කාොට, "ඔහු රැගනෙ ජශ්රෙයෙලේය නාබාොත්ගේ
කතෙට දමන්න, මන්ද, මාත්, ඔබත් එක් ව ඔහුගේ
පිය වූ ආහබ් පස්සනේ අසුන් පිට ගිය විට
සමිඳාණන් වහන්සේ ඔහුට විරුද්ධ ව දුන් තීන්දුව
සිහි කරන්න. 26 1 රාජා 21:19එනම්, සැබැවින්
නාබාොත්ගේ ද ඔහුගේ පුත්‍රයන්ගේ ද ලේ ඊයේ
දුටුවමේ යි සමිඳාණන් වහන්සේ වදාරන සේක.
තවද, මම මේ කතෙේ දී ඔබට විපාක දනේනමේ යි
සමිඳාණන් වහන්සේ වදාරන සේක. එබැවින් ඔහු
රැගනෙ සමිඳාණන් වහන්සේ වදාළ ලසෙ මේ
කතෙහෙි දමන්නැ"යි කී ය.

## අහසියා රජුගේ මරණය

27 ජුදාහි රජු වන අහසියා ඒ දැක බතේ-හගාක්
නම් පාර දිගේ පලා ගියේ ය. ජේහු ඔහු លුහුබැඳ
ගාොස්, "ඔහුටත් පහර දනේනැ"යි කී ය. එසේ ඔව්හු
ඉබ්ලියාම් ළඟ ගූර් නම් බෑවුමේ දී ඔහු රථයේ
සිටින විට ඔහුට පහර දුන්හ. ඔහු මගේිද්දාෝ
මීටියාවතට පලා ගාොස් එහි දී මළේ ය. 28 ඔහුගේ
සේවකයාෝ ඔහු රථයකින් ජරෙුසලමට ගනෙ ගාොස්
දාවිත්ගේ නුවර ඔහුගේ පියවරුන් සමඟ ඔහුගේ
සාොහාොන් ගයෙි තැන්පත් කළහ.
29 ආහබ්ගේ පුත් ජෝරාම්ගේ එකාොළාොස් වන
අවුරුද්දේ දී අහසියා ජුදා දශේයේ රජ විය.

## ජශෙබෙලේගේ මරණය

30 ජේහු ජශ්රෙයෙලේට ආ කල ජශෙබෙලේ ඒ
අසා, ඇගේ ඇස්වල අඳුන් ගා, හිස සරසාගනෙ
කවුළුවනේ බැලුවා ය. 31 ජේහු දාොරටුවනේ ඇතුළු
වන විට ඈ කතා කාොට, "ස්වකීය ස්වාමියා මැරූ
සිම්රි, ඔබ එන්නේ සාමදානයනේ දැ"යි ඇසුවා ය.
32 ඔහු කවුළුව දසෙ බලා, "මාගේ පක්ෂයට
සිටින්නේ කවරකේ දැ"යි ඇසී ය. එවිට නපුංසකයන්
දදෙනෙකේ ඔහු දසෙ බැලුවාෝ ය. 33 "ඈ පහළට
හළෙන්නැ"යි ඔහු කී ය. ඔව්හු ඈ පහළට හළෙවාෝ
ය. ඇගේ ලේවලින් මඳක් බිත්තියේත්, අශ්වයන්
පිටත් ඉසිණි. 34 ඔහු ඇය පාගාගනෙ අසුපිටින් ගියේ
ය. ඔහු ඇතුළු වී, කා බී, "ඒ සාපලත් ස්ත්‍රිය
රජකෙුගේ දූවක නිසා සලකා බලා ඈ තැන්පත්
කරන්නැ"යි කී ය. 35 ඔව්හු ඈ තැන්පත් කරන්නට
ගිය විට ඇගේ හිස් කබල ද පාද ද දෑත ද මිස
ඇගනේ වනෙ කිසිවක් සම්බ නාොවී, 36 1 රාජා
21:23හැරී ගාොස් ඔහුට දැන්නූ හ. ඔහු කතා කාොට,
"මේ සමිඳාණන් වහන්සේ තමන්ගේ මහෙකෙරු වූ
තිෂ්බී ජාතික එලියා ලවා කියවූෙ වචනය ය:
'ජශ්රෙයෙලේ පදෙසෙේ දී බල්ලාෝ ජශෙබෙලේගේ

මාංස කන්නෝ ය. 37 මේ ජෙශෙබෙලේ යයි කියන්න
බැරි වන ලෙස ජෙශෙබෙලේගේ මළකඳ ජෙශ්රෙයෙලේ
පෙදෙසෙහි පොළොව මතුපිට කසළ මෙන් වන්නේ
ය. කියා වදාළ සේකැ' "යි කීවේ ය.

## රජ පවුල මරාදැමීම

10 ආහබ්ගේ පුත්රයන් සැත්තෑදෙනෙක්
සමාරියේ සිටියහ. ජේහු ලියුම් ලියා
සමාරියේ සිටි ජෙශ්රෙයෙලේහි අධිපතීන් වන ප්රජා
මූලිකයන්ට ද ආහබ්ගේ දරුවන් ඇතිදැඩි කළ
භාරකාරයන්ට ද යැවී ය. 2 එහි ලියා තිබුණේ,
"ඔබේ ස්වාමියාගේ පුත්රයන් ඔබ ළඟ සිටින
නිසාත්, රථ සහ අශ්වයන් ද පවුරු ඇති නුවරක් ද
යුද්ධායුධ ද තිබෙන නිසාත් මේ ලියුම ඔබට ලැබුණු
වහා ම 3 ඔබේ ස්වාමියාගේ පුත්රයන්ගෙන් ඉතා
හොඳ සුදුසු තැනැත්තා තෝරාගෙන, ඔහුගේ
පියාගේ සිංහාසනයේ හිඳුවා ඔබේ ස්වාමියාගේ
වංශය උදෙසා සටන් කරන්න" යනු යි.
4 එහෙත්, ඔව්හු අතිශයින් බිය ව කතා කොට,
"බලන්න, ඒ රජවරුන් දදෙනොට ඔහු ඉදිරිපිට
සිටින්නට නුපුළුවන් විය. එසේ නම්, අපි කෙසේ
සිටිමු දැ"යි ඇසුවෝ ය. 5 එවිට මාලිගාවේ
ප්රධානියා ද නගරාධිපතියා ද ප්රජා මූලිකයෝ ද
රාජ කුමාරයන් ඇතිදැඩි කළ අය ද ජේහු වෙත
පණිවුඩයක් යවමින්, "අපි ඔබේ මෙහෙකරුවෝ ය,
ඔබ අපට අණ කරන සියල්ල කරන්නෙමු; කිසිවකු
රජ කර නොගන්නෙමු. ඔබට යහපත් ව පෙනෙන
හැටියට කළ මැනවැ"යි කී හ.
6 එවිට ඔහු දෙ වන වර ඔවුන්ට ලියුමක් ලියා,
"ඔබ මාගේ පක්ෂයට සිට, මාගේ හඬට ඇහුම්කන්
දෙන්නහු නම්, ඔබේ ස්වාමියාගේ පුත්රයන්ගේ හිස්
රැගෙන හෙට මේ වේලාවට මා වෙත ජෙශ්රෙයෙලේ
නගරයට එන්නැ"යි කියා හැරියේ ය.
6 රජුගේ පුත්රයන් හැත්තෑදෙනා වනාහි ඔවුන්
ඇතිදැඩි කළ නුවර ප්රධානීන් වෙත සිටියෝ ය.
7 තවද, ඒ ලියුම ඔවුන්ට ලැබුණු කල ඔව්හු රජුගේ
පුත්රයන් අල්ලා, හැත්තෑදෙනෙකු වූ ඔවුන් මරා,
ඔවුන්ගේ හිස් පැස්වල දමා ජෙශ්රෙයෙලේහි ඔහු
වෙත යැවුවෝ ය.
8 එවිට පණිවුඩකාරයෙක් අවුත්, "රජුගේ
පුත්රයන්ගේ හිස් ගෙනවුත් තිබේ ය"යි ඔහුට දැන්වී
ය. "හෙට වන තුරු ඒවා ගොඩවල් දෙකක් කොට
දොරටුව ළඟ තබන්නැ"යි ඔහු කී ය. 9 පසු දා
උදෑසන ඔහු පිටතට ගොස් සිටගෙන, මුළු සෙනඟට
කතා කොට, "ඔබ නිර්දෝෂ ය. මම මාගේ
ස්වාමියාට විරුද්ධ ව කුමන්ත්රණය කොට ඔහු
මැරීමි. එහෙත්, මොවුන් සියල්ලන් මැරුවේ කවරෙක්
ද? 10 එබැවින් සමිඳාණන් වහන්සේ ආහබ්ගේ
වංශයට විරුද්ධ ව වදාළ තමන්ගේ වචනයෙන්
කිසිවක් නිෂ්ඵල නොවන බව දැනගන්න. සමිඳාණන්
වහන්සේ තමන්ගේ මෙහෙකරු වූ එලියා ලවා
කියවූ දේ ඉෂ්ට කළ සේකැ"යි කී ය. 11 හොසී
1:4මෙසේ ජේහු ජෙශ්රෙයෙලේහි ආහබ්ගේ
වංශයෙන් ඉතිරි ව සිටි සියල්ලන් ද ඔහුගේ සියලු
ප්රධානීන් ද ඔහුගේ කිට්ටු හිතවතුන් ද ඔහුගේ
පූජකයන් ද එක් කෙනෙකු වත් ඉතිරි නොකර මැරවී
ය.

## ජුදාහි කුමරුන් මරාදැමීම

12 ජේහු නැඟිට සමාරියට යන්න පිටත් විය. ඔහු
මඟ දී එඬේරුන්ගේ බෙත්-එකදේ නම් ස්ථානයට ළං
ව සිටිය දී, 13 ජුදාහි රජු වන අහසියාගේ
සහෝදරයන් ඔහුට සම්බ වී, "ඔබ කවරහු දැ"යි ඇසී
ය. "අපි අහසියාගේ සහෝදරයෝ ය. රජුගේ
පුත්රයන්ටත්, බිසවගේ පුත්රයන්ටත් ආචාර කරන්න
යමු"යි ඔව්හු කී හ. 14 ඔහු ද, "ඔවුන් පණපිටින්
අල්ලාගන්නැ"යි කී ය. ඔව්හු ඔවුන් පණපිටින්
අල්ලාගෙන මිනිසුන් සතළිස්දදෙනෙකු වන ඔවුන්
බෙත්-එකදේ නම් ළිඳ ළඟ දී මැරූ හ. ඔවුන්ගෙන්
එක් කෙනෙකු වත් ඔහු ඉතිරි කළේ නැත.

## ජේහු රජ සහ ජෙහෝනාදාබ්

15 ඔහු එතැනින් ගිය විට ඔහුගේ පෙරමඟට ආ
රේකාබ්ගේ පුත් ජෙහෝනාදාබ් සම්බ වී ඔහුට
ආචාර කොට, "මාගේ සිත ඔබේ සිත කෙරේ
අවංක ව තිබෙන්නාක් මෙන් ඔබේ සිතත් අවංක
දැ"යි ඇසුවේ ය. ජෙහෝනාදාබ්, "එසේ ය"යි කී විට,
"එසේ නම් මට ඔබේ අත දෙන්නැ"යි ඔහු කීවේ ය.
ඔහු තමාගේ අත ඔහුට දුන්නේ ය. 16 එවිට ජේහු
තමාගේ රථයට ඔහු නංවාගෙන, කතා කොට,
"සමිඳාණන් වහන්සේ උදෙසා වන මාගේ උද්යෝගය
බලන්නට මා සමඟ එන්නැ"යි කී ය. මෙසේ ඔව්හු
ස්වකීය රථයෙහි ඔහු නංවාගෙන ගියෝ ය. 17 ඔව්හු
සමාරියට ආ කල සමිඳාණන් වහන්සේ එලියා ලවා
කී වචනය ලෙසෙ සමාරියෙහි ආහබ්ගේ පවුලේ ඉතිරි
ව සිටි සියල්ලන් ඔහුගේ වංශය විනාශ වන තුරු
මරාදැමූ හ.

## බාල් දේවියා අදහන්නන් මරාදැමීම

18 තවද, ජේහු මුළු සෙනෙඟ රැස් කර, ඔවුන්ට
කතා කොට, "ආහබ් බාල් දේවියාට ස්වල්ප වශයෙන්
සේවය කළේ ය. එහෙත්, ජේහු ඔහුට බොහෝ
සෙයින් සේවය කරන්නේ ය. 19 එබැවින් බාල්ගේ
සියලු දිවැසිවරුන් ද ඔහු අදහන සියල්ලන් ද සියලු
පූජකයන් ද එක් කෙනෙකු වත් නෑර මා වෙත
කැඳවාගෙන එන්න. මන්ද, බාල්ට මහා පූජාවක්
ඔප්පු කරන්නට මට වුවමනා වී තිබේ. නොඑන
සියල්ලෝ ම මරණයට පත් වන්නෝයැ"යි කී ය.
එහෙත්, ජේහු බාල් අදහන්නන් නැති කරන පිණිස
ප්රයෝගයෙන් එසේ කළේ ය. 20 තවද, ජේහු,
"බාල් උදෙසා පවත්වන නමස්කාරයට සියලු දෙනෙ
රැස්වීම පිණිස නියම කරන්නැ"යි කී ය. ඔව්හු එසේ
ප්රසිද්ධ කළහ. 21 එසේ ජේහු ඉශ්රායෙලේ රට
මුළුල්ලේ ම පණිවුඩ යැවූ විට බාල්ගේ
සේවකයන්ගෙන් එක් කෙනෙකු වත් නැවත් නොසිට,
සියල්ලෝ ම බාල්ගේ දේවාලයට ඇතුළු වූ හ.

බාල්ගේ දේවාලය එක් කළෙවරක පටන් අනෙක්
කළෙවර දක්වා පිරී ගියේ ය. 22 ඔහු වස්ත්‍ර
ගබඩාවේ මුලාදෑනියාට කතා කොට, “බාල් අදහන
සියල්ලන්ට වස්ත්‍ර ගෙනෙන්නැ”යි කීවේ ය. ඔහු ද
වස්ත්‍ර ගෙනාවේ ය. 23 ජේහු ද රේකාබ්ගේ පුත්
ජෙහෝනාදාබ් ද බාල්ගේ දේවාලයට ගොස්, “බාල්
අදහන සියල්ලන් මිස, මෙහි ඔබ සමඟ සමිඳාණන්
වහන්සේගේ සේවකයන් කිසිවකු නොසිටින ලෙසෙ
සොයා බලන්නැ”යි බාල් අදහන්නන්ට කී ය.
24 ඔව්හු යාග ද දවන පූජා ද ඔප්පු කරන්නට
ඇතුළට ගියහ. එවිට ජේහු මිනිසුන් අසූ දෙනෙකු
පිටත සිටුවා, “මා විසින් ඔබ අතට අසු කර දෙනු
ලබන මිනිසුන්ගෙන් කිසිවකු ගැළවී ගියොත්, ඔහු
යන්නට අරින අයගේ ප්‍රාණය ඔහුගේ ප්‍රාණය
වෙනුවට දෙන්න වේ ය”යි කියා තිබිණි.
25 තවද, ජේහු දවන යාග පූජාව පුදා නිම කළ
කණෙහි ම මුරකාරයන්ටත්, ඔවුන්ගේ
මුලාදෑනීන්ටත් කතා කොට, “ඇතුළට ගොස් කාට
වත් පිටතට එන්න නෑර ඔවුන් මරන්නැ”යි කී ය.
එසේ මුරකාරයෝ ද මුලාදෑනීහු ද කඩුවෙන් ඔවුන්
මරා පිටතට දමා, බාල්ගේ දේවාලයේ මළුව
දක්වාත් ගියෝ ය. 26 තවද, ඔව්හු බාල්ගේ
දේවාලයේ ශිලාස්තම්භය පිටතට ගෙනවුත්
පුළුස්සාදමා, 27 බාල්ගේ පූජාසනයත් බාල්ගේ
දේවාලයත් බිඳ දමා අද දක්වා තිබෙන හැටියට එය
වැසිකිළියක් කළහ.

### ජේහු රජුගේ පාලනය

28 මෙසේ ජේහු ඉශ්‍රායලේවරුන් අතරෙන් බාල්
නැති කරදැමී ය. 29 1 රාජා 12:28-30එසේ නමුත්,
බෙතෙලේහි ද දාන්හි ද තිබූ රන් වස්සන්
කරණකොටගෙන ඉශ්‍රායලේවරුන්ට පව් කරන්නට
සැලැසූ නබාත්ගේ පුත් ජෙරොබෝවම්ගේ
පාපවලින් ජේහු ඉවත් නො වී ය. 30 සමිඳාණන්
වහන්සේ ජේහුට කතා කොට, “නුඹ මාගේ ඇස්
හමුයෙහි හරි දේ කිරීමෙන් යුතු ලෙස ක්‍රියා කොට,
මාගේ සිතේ තිබුණ සියල්ල ප්‍රකාර ආහබ්ගේ
වංශයට කළ බැවින්, නුඹේ පුත්‍රයෝ සතර වන
පරම්පරාව දක්වා ඉශ්‍රායලේ සිංහාසනයෙහි හිඳ
ගන්නෝ ය”යි වදාළ සේක. 31 එහෙත්, ජේහු
තමාගේ මුළු සිතින් ඉශ්‍රායලේවරුන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේගේ ව්‍යවස්ථාව ප්‍රකාර
හැසිරෙන්නට ප්‍රවේසම් නො වී ය.
ඉශ්‍රායලේවරුන්ට පව් කරන්නට සැලැසූ
ජෙරොබෝවම්ගේ පාපවලින් ඔහු ඉවත් නො වී ය.
32 එකල්හි සමිඳාණන් වහන්සේ ඉශ්‍රායලේ
දේශයේ ප්‍රමාණය කුඩා කරන්නට පටන්ගත්
සේක. 33 හසායලේ ජෝර්දාන්ට නැගෙනහිරින්
තිබෙන ඉශ්‍රායලේවරුන්ගේ සියලු පළාත් වූ
අර්ණොන් මිටියාවත ළඟ වූ අරෝයෙර් පටන්
තිබෙන මුළු ගිලියද් දේශයෙහිත් බාෂාන්හිත් වීසූ
ගාද්වරුන්ටත්, රූබන්වරුන්ටත්, මනස්සේවරුන්ටත්
පහර දුන්නේ ය.
34 ජේහුගේ අනෙක් ක්‍රියා ද ඔහු කළ සියල්ල ද
ඔහුගේ සියලු බලවත්කම් ද ඉශ්‍රායලේ රජුන්ගේ
පුරාවෘත්ත ග්‍රන්ථයේ වාර්තා කර තිබෙනු නොවේ
ද? 35 ජේහු මියගිය පසු සමාරියෙහි තැන්පත් කරනු
ලැබී ය. ඔහුගේ පුත් ජෙහෝවාහාස් ඔහු වෙනුවට
රජ වීය. 36 ජේහු සමාරියෙහි ඉශ්‍රායලේවරුන්
පාලනය කළ කාලය විසිඅට අවුරුද්දකි.

### අතලියා රැජිනගේ පාලනය
(2 වංශා 22:10;23:15)

11 අහසියාගේ මව වූ අතලියා ඇගේ පුත්‍රයා
මළ බව දැක නැඟිට මුළු රාජ වංශය විනාශ
කළා ය. 2 එහෙත්, ජෝරාම් රජුගේ දූ වූ අහසියාගේ
සහෝදරී වූ ජෙහෝෂෙබා නොමෝ මරනු ලැබූ
රජුගේ පුත්‍රයන් අතරෙන් අහසියාගේ පුත් ජෝවාෂ්
රැගෙන ඔහුගේ කිරි මව සමඟ යහන් ගෙයි
රහසිගත ව තැබුවා ය. ඔහු මරනු නොලබන ලෙසෙ
අතලියාගෙන් ඔහු සඟවන ලදී. 3 ඔහු සමිඳාණන්
වහන්සේගේ මාලිගාවෙහි ඈ සමඟ අවුරුදු හයක්
සැඟවී සිටියේ ය. අතලියා දේශයෙහි රජකම් කළා
ය.
4 සත් වන අවුරුද්දේ දී ජෙහෝයාදා පණිවුඩ යවා
ආරක්ෂක භටයන්ගේ ද රජ මාලිගාවේ
මුරකාරයන්ගේ ද ශතාධිපතීන් ගෙන්වා සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ දී තමා ළඟට
පමුණුවාගෙන ඔවුන් සමඟ ගිවිසුමක් කොට,
සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ දී ඔවුන්ගෙන්
දිවුරුම් ගෙන, රජුගේ පුත්‍රයා ඔවුන්ට පෙන්වා කතා
කොට, 5 “ඔබ කරන්නට ඕනෑ දේ මේ ය: සබත්
දවසේ දී ඇතුළු වන ඔබෙන් තුනෙන් කොටසක් රජ
ගෙදර මුරට සිට, 6 තුනෙන් කොටසක් සූර්
දොරටුවේ ද, තුනෙන් කොටසක් මුරකාරයන්ට
එපිටින් තිබෙන දොරටුවේ ද සිටින්න. මෙසේ
මාලිගාව මුරකර ආරක්ෂා කරන්න. 7 ඔබෙන්
කොටස් දෙකෙක් වන සබත් දවසේ දී පිටත යන
සියල්ලන් ම රජු ළඟ සමිඳාණන් වහන්සේගේ
මාලිගාවෙහි මුරකරන්න. 8 ඔබ එක් එක්කෙනා තම
තමාගේ ආයුධ අතින් ගෙන රජු වටකර සිට පෙළෙ
කඩාගෙන ඒමට වෑයම් කරන තැනැත්තා මරන්න ආ
යුතු ය. රජු යන එන විට ඔබ ඔහු සමඟ සිටින්නැ”යි
ඔවුන්ට අණ කළේ ය.
9 ශතාධිපතියෝ ජෙහෝයාදා පූජකයා අණ කළ
සියල්ල ලෙසෙ කරමින්, එකිනෙකා තම තමාගේ
මිනිසුන් එනම්, සබත් දවසේ දී ඇතුළු වන
තැනැත්තන් සබත් දවසේ දී පිටත යන තැනැත්තන්
ද සමඟ කැඳවාගෙන ජෙහෝයාදා පූජකයා ළඟට
ආවෝ ය. 10 පූජකයා සමිඳාණන් වහන්සේගේ
මාලිගාවෙහි තිබූ දාවිත් රජුගේ හෙල්ල හා පලිස්
ශතාධිපතීන්ට දුන්නේ ය. 11 මුරකාරයෝ එක්
එක්කෙනා තම තමාගේ අතින් ආයුධ රැගෙන
මාලිගාවේ දකුණු පැත්තේ පටන් වම් පැත්ත දක්වා
පූජාසනයත්, මාලිගාවත් ළඟ රජු වටකර සිටියහ.
12 එවිට ඔහු රජුගේ පුත්‍රයා පිටතට ගෙනවුත්,
ඔහුගේ හිස පිට ඔටුන්න තබා ව්‍යවස්ථාව ඔහුට

දුන්නෝ ය. ඔව්හු රජකමට ඔහු අභිෂේක කොට
අත්පොළසන් දී, “රජතුමා සැරදේ වා”යි කීවෝ ය.
13 අතලියා තොමෝ මුරකාරයන්ගේත්,
සෙනඟගේත් ඝෝෂාව අසා සමිඳාණන් වහන්සේගේ
මාලිගාවෙහි සිටි සෙනඟ ළඟට ආවා ය. 14 2 රාජා
23:3ඈ බැලූ විට සිරිත් ප්‍රකාර රජු කණුව ළඟ
සිටින බව ද රජු ළඟ අධිපතීන් ද නළාකාරයන් ද
සිටින බව ද දේශයේ මුළු සෙනඟ ප්‍රීතියෙන්
හොරණෑ පිඹින බව ද දැක හිත් වේදනාවෙන් ඇගේ
ඇඳුම් ඉරාගෙන, “ද්‍රෝහිකමකි, ද්‍රෝහිකමකි” කියා
මොරගැසුවා ය.
15 එවිට ජෙහෝයාදා පූජකයා සේනාවේ
ප්‍රධානීන් වන ශතාධිපතීන්ට කතා කොට, “ඇය මුර
භටයන් අතරෙන් පිටතට ගෙන යන්න. ඈ පස්සේ
යමෙකු ආවොත් ඔහු කඩුවෙන් මරන්නැ”යි අණ
කළේ ය. මන්ද, “සමිඳාණන් වහන්සේගේ
මාලිගාවේ දී ඈ මරනු නොලැබේ වා”යි පූජකයා කී
ය. 16 මෙසේ ඔව්හු ඈට යන්නට ඉඩ හැරියෝ ය.
ඈ රජ ගෙදරට අශ්වයන් ඇතුළු වන මාර්ගයෙන්
ගෙන ගිය විට එහි දී මරනු ලැබුවා ය.

### ජෙහෝයාදාගේ ප්‍රතිසංස්කරණ
(2 වංශා 23:16-21)

17 සමිඳාණන් වහන්සේගේ සෙනඟ ව සිටින
හැටියට සමිඳාණන් වහන්සේ සහ රජු ද සෙනඟ ද
අතර ජෙහෝයාදා තෙමේ ගිවිසුමක් කළේ ය;
එසේ ම රජු ද සෙනඟ ද අතරේත් ගිවිසුමක්
කළේ ය; 18 දේශයේ මුළු සෙනඟ බාල්ගේ
දේවාලයට ගොස් එය කඩා ඔහුගේ පූජාසනය ද
රූප ද මුළුමනින් බිඳදමා, පූජාසනය ඉදිරියෙහි දී
බාල්ගේ පූජකයා වූ මත්තාන් මැරුවෝ ය.
18 පූජක තෙමේ සමිඳාණන් වහන්සේගේ
මාලිගාවට මුලාදෑනීන් පත් කළේ ය. 19 තවද, ඔහු
ශතාධිපතීන් ද ආරක්ෂක භටයන් ද මුරකාරයන් ද
දේශයේ මුළු සෙනඟ ද පිරිවරා සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ සිට රජු ගෙන ගොස්,
මුරකාරයන්ගේ දොරටු මාර්ගයෙන් රජ ගෙදරට
පැමිණියේ ය. එවිට ඔහු රජවරුන්ගේ සිංහාසනයෙහි
වාඩි විය. 20 මෙසේ දේශයේ මුළු සෙනඟ ප්‍රීති වූ
හ. නුවර ද සාමකාමී ව තිබිණි. 21 ඔව්හු අතලියා
රජ ගෙදර දී කඩුවෙන් මැරූ හ.

### ජෙහෝවාෂ් රජුගේ රාජ්‍ය කාලය
(2 වංශා 24:1-16)

12 ජෙහෝවාෂ් රජ වන විට අවුරුදු සතක් වයස්
ව සිටියේ ය. ජේහුගේ සත් වන අවුරුද්දේ දී
ජෙහෝවාෂ් රජ වී ජෙරුසලමේ සතළිස් අවුරුද්දක්
රජකම් කළේ ය. ඔහුගේ මවුගේ නම ශිබියා ය.
ඈ බයෙර්-ෂෙබාහි කෙනෙකි. 2 ජෙහෝවාෂ් වනාහි
ජෙහෝයාදා පූජකයා විසින් තමාට දැනුමැතිකම් දෙන
ලද කාලය මුළුල්ලෙහි සමිඳාණන් වහන්සේගේ ඇස්
හමුයෙහි හරි දේ කළේ ය. 3 එහෙත්, කඳු මත
පූජාස්ථාන පහ නොකරන ලදී. ඒ කාලයේත් සෙනඟ
කඳු මත පූජාස්ථානවල පූජා ඔප්පු කොට සුවඳ දුම්
පිදූ හ.
4 නික්ම 30:11-16 ජෙහෝවාෂ් පූජකයන්ට කතා
කොට, “සමිඳාණන් වහන්සේගේ මාලිගාවට
ගෙනෙන ලද කැප කළ දේවල මිල සියල්ල ද එනම්,
එක් එක්කෙනා ගෙවිය යුතු මුදල් ද එක් එක්කෙනා
තම තමාගේ කැමැත්තෙන් සමිඳාණන් වහන්සේගේ
මාලිගාවට ගෙනෙන යාග පූජා මුදල් ද, 5 පූජකයෝ
තම තමන් සේවය කළ අයගෙන් ද
අඳුනන්නවුන්ගෙන් ද ගනිත් වා, ඔව්හු ද මාලිගාවේ
වුවමනා පරිදි කැඩුම්බිඳුම් ප්‍රතිසංස්කරණය කරත්
වා”යි කී ය.
6 එහෙත්, පූජකයන් විසින් ජෙහෝවාෂ් රජුගේ
විසිතුන් වන අවුරුද්ද දක්වා මාලිගාවේ කැඩුම්බිඳුම්
ප්‍රතිසංස්කරණය නොකරන ලදී. 7 එවිට
ජෙහෝවාෂ් රජ, පූජක වූ ජෙහෝයාදාටත්, අනික්
පූජකයන්ටත් හඬගසා, “ඔබ මාලිගාවේ කැඩුම්බිඳුම්
ප්‍රතිසංස්කරණය නොකරන්නේ මන් ද? ඉතින් ඔබ
සේවය කරන අයගෙන් තවත් මුදල් නොගෙන ඒවා
කැඩුම්බිඳුම් ප්‍රතිසංස්කරණය කරන්න භාර
දෙන්නැ”යි කී ය. 8 පූජකයෝ සෙනඟගෙන් තවත්
මුදල් නොගන්නටත්, මාලිගාවේ කැඩුම්බිඳුම්
ප්‍රතිසංස්කරණය නොකරන්නටත් එකඟ වූ හ.
9 එහෙත්, පූජක වූ ජෙහෝයාදා පෙට්ටියක් ගෙන
පියනේ සිදුරක් සාදා සමිඳාණන් වහන්සේගේ
මාලිගාවට එන මාර්ගයේ දකුණු පැත්තේ පූජාසනය
ළඟ එය තැබී ය. තවද, සමිඳාණන් වහන්සේගේ
මාලිගාවට ගෙනා මුදල් සියල්ල ම දොරටු පාලකයන්
වන පූජකයෝ එහි දැමූ හ. 10 පෙට්ටියේ බොහෝ
මුදල් තිබෙන බව දුටු විට රජුගේ ලේකම් ද නායක
පූජකයා ද අවුත්, සමිඳාණන් වහන්සේගේ
මාලිගාවෙහි තිබූ ඒ මුදල් ගණන් කරමින් පසුම්බිවල
දමා බැන්දෝ ය. 11 ගණන් කළ ඒ මුදල් සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ වැඩ කළාවූ ද කරෙව්වා
වූ ද තැනැත්තන් අතට දුන්නෝ ය. ඔව්හු සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ වැඩ කළ වඩුවන්ටත්,
ගොඩනඟන්නන්ටත්, 12 පෙදරේරුවන්ටත්, ගල්
කපන්නන්ටත් ඒ මාලිගාවේ කැඩුම්බිඳුම්
ප්‍රතිසංස්කරණය කිරීමට ලී සහ කැපූ ගල් මිලයට
ගන්න පිණිසත්, මාලිගාව අලුත්වැඩියා කිරීමට ඕනෑ
කළ සියල්ල පිණිසත් ඒ මුදල් දුන්නෝ ය. 13 එයින්,
සමිඳාණන් වහන්සේගේ මාලිගාව සඳහා රිදී
කුසලාන් ද පහන් කතුරු ද තළි ද හොරණෑ ද යම්
රන් භාජන හෝ රිදී භාජන ද නොසාදා, 14 ඒ මුදල්
වැඩ කළ තැනැත්තන්ට දී එයින් සමිඳාණන්
වහන්සේගේ මාලිගාව අලුත් වැඩියා කරවූ හ. 15 2
රාජා 22:7තවද, වැඩ කරන්නන්ට දෙන්න මිල භාර
දෙනු ලැබූ මිනිසුන් විශ්වාස ලෙස කටයුතු කළ
බැවින් ඔවුන්ගෙන් ගණන් තැබීමක් නොගන්න ලදී.
16 ලෙවී 7:7අපරාධ පූජා සහ පාප පූජා උදෙසා දුන්
මිල සමිඳාණන් වහන්සේගේ මාලිගාවට ගෙනෙන
ලදී. ඒ මිල පූජකයන්ට අයිති විය.

17 එකල සිරියාවේ රජ වන හසායෙල් අවුත් ගාත්
නගරයට විරුද්ධ ව යුද්ධ කොට එය අල්ලාගෙන,
ජෙරුසලමටත් විරුද්ධ ව පහර දෙන්නට තීරණය
කරගත්තේ ය. 18 එවිට ජුදාහි රජ වන ජෙහෝවාෂ්
තමාගේ පියවරුන් ද ජෙහෝෂාපාට් ද ජෙහෝරාම් ද
අහසියා ද යන ජුදාහි රජවරුන් විසින් කැප කරන ලද
සියලු ම පඬුරු ද තමාගේ ම පඬුරු ද සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ ගබඩාවලත්, රජ මැදුරේත්
තිබූ සියලු රන් ද රැගෙන සිරියාවේ රජු වන
හසායෙල්ට යැවී ය. එවිට ඔහු ජෙරුසලමෙන් ඉවත්
ව යන්නට ගියේ ය.
19 ජෝවාෂ්ගේ අනෙක් ක්‍රියා ද ඔහු කළ සියල්ල
ද ජුදාහි රජුන්ගේ පුරාවෘත්ත ග්‍රන්ථයේ වාර්තා
කර තිබෙනු නොවේ ද?
20 ඔහුගේ සේවකයෝ නැඟිට කුමන්ත්‍රණය
කොට, සිල්ලාට යන මාර්ගයෙහි තිබෙන මිල්ලෝහි
නිවාසයේ දී ජෙහෝවාෂ් මරාදැමූ හ. 21 ඔහුගේ
සේවකයන් වන ෂිමයෝත්ගේ පුත් ජෝශාකාර් ද
ෂොමෙරේගේ පුත් ජෙහෝශාබාද් ද ඔහුට පහර දී
මැරුවෝ ය. ඔව්හු ඔහු දාවිත්ගේ නුවර තමාගේ
පියවරුන් ළඟ තැන්පත් කළෝ ය. ඔහුගේ පුත්
අමශියා ඔහු වෙනුවට රජ විය.

## ජෙහෝවාහාස් රජුගේ රාජ්‍ය කාලය

13 අහසියාගේ පුත් ජුදාහි රජ වූ ජෝවාෂ්ගේ
විසිතුන් වන අවුරුද්දේ ජේහුගේ පුත්
ජෙහෝවාහාස් සමාරියේ ඉශ්‍රායෙල්වරුන්ගේ රජ වී
දහහත් අවුරුද්දක් රජකම් කළේ ය. 2 ඔහු
සමිඳාණන් වහන්සේගේ ඇස් හමුයෙහි නපුරු දේ
කරමින් ඉශ්‍රායෙල්වරුන්ට පව් කිරීමට සැලැසූ
නෙබාත්ගේ පුත් ජෙරොබෝවම්ගේ පාපවලින් ඉවත්
නොවී සිටියේ ය. 3 සමිඳාණන් වහන්සේගේ උදහස
ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි ඇවිළී ඒ කාලය මුළුල්ලෙහි
උන් වහන්සේ සිරියාවේ රජු වන හසායෙල් අතටත්,
හසායෙල්ගේ පුත් බෙනේ-හදද් අතටත් ඔවුන් පාවා
දුන් සේක. 4 එහෙත්, ජෙහෝවාහාස් සමිඳාණන්
වහන්සේට කන්නලව් කළ විට, සමිඳාණන් වහන්සේ
ඔහුට ඇහුම්කන් දුන් සේක. මන්ද, සිරියාවේ රජ
ඉශ්‍රායෙල්වරුන්ට පීඩා කරන විට ඔවුන්ට පැමිණි
පීඩාව සමිඳාණන් වහන්සේ දුටු සේක. 5 තවද,
සමිඳාණන් වහන්සේ ඉශ්‍රායෙල්වරුන්
සිරියන්වරුන්ගේ පාලන බලයෙන් නිදහස් වන ලෙසෙ
ඔවුන්ට ගැළවුම්කාරයකු දුන් සේක. ඉශ්‍රායෙලේ
ජනයා පෙර ලෙස තමන්ගේ කූඩාරම්වල වාසය
කළෝ ය. 6 එසේ වී නමුත්, ඔව්හු ඉශ්‍රායෙල්වරුන්ට
පව් කරන්නට සැලැසූ ජෙරොබෝවම්ගේ වංශයේ
පාපවලින් ඉවත් නොවී ඒවායෙහි හැසුරුණෝ ය.
අෂේරා කප් කණු ද ඒ වන තෙක් සමාරියෙහි
තිබිණි.
7 සිරියාවේ රජු ජෙහෝවාහාස්ගේ සේනාවෙන්
ඔහුට ඉතිරි කළේ, අසරුවන් පණසක් ද රථ දසයක්
ද පාබල සෙනඟ දසදහසක් ද පමණකි. මන්ද, ඔහු
ඔවුන් විනාශ කොට, ඔවුන් පයින් පාගාදමා දූවිලි
මෙන් කළේ ය.
8 ජෙහෝවාහාස්ගේ අනික් ක්‍රියා ද ඔහු කළ
සියල්ල ද ඔහුගේ වික්‍රම ද ඉශ්‍රායෙලේ රජුන්ගේ
පුරාවෘත්ත ග්‍රන්ථයේ වාර්තා කර තිබෙනු නොවේ
ද? 9 ජෙහෝවාහාස් ද මියගිය පසු සමාරියෙහි
තැන්පත් කරනු ලැබී ය. ඔහුගේ පුත් ජෝවාෂ් ඔහු
වෙනුවට රජ විය.

## ජෝවාෂ් රජුගේ රාජ්‍ය කාලය

10 ජුදාහි රජ ජෝවාෂ්ගේ තිස්හත් වන අවුරුද්දේ
දී ජෙහෝවාහාස්ගේ පුත් ජෙහෝවාෂ් සමාරියේ
ඉශ්‍රායෙල්වරුන්ගේ රජ වී අවුරුදු දහසයක් රජකම්
කළේ ය. 11 ඔහු සමිඳාණන් වහන්සේගේ ඇස්
හමුයෙහි නපුරු දේ කොට, ඉශ්‍රායෙල්වරුන් පාපයට
පෙළඹවූ නෙබාත්ගේ පුත් ජෙරොබෝවම්ගේ සියලු
පාපවලින් ඉවත් නොවී ඒවායේ හැසුරුණේ ය.
12 ජෝවාෂ්ගේ අනික් ක්‍රියා ද ඔහු කළ සියල්ල ද
ඔහුගේ බලවන්තකම් වන ජුදාහි රජ වූ අමශියාට
විරුද්ධ ව යුද්ධ කළ හැටි ද ඉශ්‍රායෙලේ රජුන්ගේ
පුරාවෘත්ත ග්‍රන්ථයේ වාර්තා කර තිබෙනු නොවේ
ද? 13 ජෝවාෂ් ද මියගියේ ය. ජෙරොබෝවම් ඔහු
වෙනුවට රජ විය. ජෝවාෂ් සමාරියෙහි ඉශ්‍රායෙලේ
රජුන් සමඟ තැන්පත් කරනු ලැබී ය.

## එලිෂාගේ මරණය

14 2 රාජා 2:12 තමා මරණයට පත් කරන රෝගය
එලිෂාට වැළඳුණ විට, ඉශ්‍රායෙලේ රජු වන ජෝවාෂ්
ඔහු වෙත ගොස් ඔහු ළඟ සිටගෙන අඬා, "මාගේ
පියාණෙනි, ඉශ්‍රායෙල්වරුන්ගේ රථ සහ ඔවුන්ගේ
අසරුවන් මෙන් බලවත් මාගේ පියාණෙනි"යි කී ය.
15 එලිෂා ද, "දුන්නක් හා ඊගස් ගන්නැ"යි ඔහුට කී
ය. ඔහු දුන්න සහ ඊගස් ගත්තේ ය. 16 එලිෂා
"ඔබේ අත දුන්න පිට තබන්නැ"යි ඉශ්‍රායෙලේ රජුට
කී ය. ඔහු තම අත තැබී ය. එවිට එලිෂා තමාගේ
අත් රජුගේ අත් පිට තබා, 17 "නැගෙනහිර කවුළුව
අරින්නැ"යි කී ය. ඔහු එය ඇරිය පසු, "දුන්නෙන්
විදින්නැ"යි එලිෂා කී ය. ඔහු ද විද්දේ ය. එවිට
එලිෂා, "ඒ සමිඳාණන් වහන්සේගේ ජය ඊගස ය,
එනම්, සිරියන්වරුන්ගෙන් ජය ගැනීමේ ඊගස ය. ඔබ
සිරියන්වරුන් නැති කරන තුරු, අපෙක්හි දී ඔවුන්ට
පහර දෙන්නෙහි ය"යි කී ය.
18 ඔහු ද, "ඊගස් ගන්නැ"යි කී ය. ඔහු ඒවා ගත්
විට, "ඒවා බිම ගසන්නැ"යි ඔහු ඉශ්‍රායෙලේ රජුට කී
ය. ඔහු තුන් වරක් ඒවා බිම ගසා නැවතුණේ ය.
19 එවිට දෙවියන් වහන්සේට කැප වූ මනුෂ්‍යයා ඔහු
කෙරෙහි උදහස් වී, "ඔබ ඒවා පස් වරක් හෝ හය
වරක් හෝ ගසන්නට යුතු ව තිබිණි. එසේ කළේ
වී නම්, ඔබ සිරියන්වරුන් විනාශ වන තුරු ඔවුන්ට
පහර දෙනු ඇත. එහෙත්, දැන් ඔබ තුන් වරක්
පමණක් සිරියන්වරුන්ට පහර දෙන්නෙහි ය"යි කී ය.

20 එලීෂා මියගොස් තැන්පත් කරනු ලැබී ය. ඊළඟ
අවුරුද්දේ මෝවබ්වරුන්ගේ හමුදා දේශයට ඇතුළු වූ
හ. 21 මිනිසුන් මිනියක් වළලන්නට යන විට
හමුදාවක් දැක එලීෂාගේ සොහොන් ගයේ ඒ මිනිය
දැමූ හ. ඒ මිනිය එලීෂාගේ ඇටවල තැවරුණු
හැටියේ ම පණ ලැබ නැඟිට සිටියේ ය.

## සිරියන්වරුන්ගේ පරාජය

22 සිරියාවේ රජ වූ හසායෙල් ජෙහෝවාහාස්ගේ
මුළු කාලයෙහි ඉශ්රායෙල්වරුන්ට පීඩා කළේ ය.
23 එහෙත්, සමිඳාණන් වහන්සේ ආබ්රහම් ද ඊසාක්
ද ජාකොබ් ද සමඟ කළ තමන්ගේ ගිවිසුම නිසා
ඔවුන්ට කරුණා කොට ඔවුන් කෙරෙහි අනුකම්පා
කොට ඔවුන් සැලකූ සේක. උන් වහන්සේ ඔවුන්
නැති කරන්නට අකමැති ව ඒ වන තුරු ඔවුන් තමන්
ඉදිරියෙන් ඉවත නොදැමූ සිටි සේක.
24 සිරියාවේ රජ වූ හසායෙල් මළේ ය. ඔහුගේ
පුත් බෙන්-හදද් ඔහු වෙනුවට රජ විය.
25 ජෙහෝවාහාස්ගේ පුත් ජෙහෝවාෂ් තමාගේ පිය
වූ ජෙහෝවාහාස් අතින්, හසායෙල් විසින් යුද්ධ
කොට අල්ලා ගනු ලැබූ නගර ඔහුගේ පුත්රයා වූ
බෙන්-හදද් අතින් නැවත අල්ලාගත්තේ ය. ජෝවාෂ්
තුන් වරක් ඔහුට පහර දී ඉශ්රායෙල් නගර ආපසු
අල්ලාගත්තේ ය.

## අමශියාගේ රාජ්ය පාලනය

(2 වංශා 25:1-24)

14 ඉශ්රායෙල් රජු වන ජෙහෝවාහාස්ගේ පුත්
ජෙහෝවාෂ්ගේ දෙ වන අවුරුද්දේ දී ජුදාහි
රජ වූ ජෙහෝවාෂ්ගේ පුත් අමශියා රජ විය.
2 විසිපස් අවුරුදු වයසේ දී ඔහු රජ වී ජෙරුසලමෙහි
විසිනව අවුරුද්දක් රජකම් කළේ ය. ඔහුගේ
මවුගේ නම ජෙහෝයද්දින් ය. ඈ ජෙරුසලමේ
ස්ත්රියකි. 3 අමශියා සමිඳාණන් වහන්සේගේ ඇස්
හමුයෙහි හරි දේ කළේ ය. එහෙත්, ඔහු තමාගේ
පිය වූ දාවිත් මෙන් නො වී ය. තම පිය වූ ජෝවාෂ්
කළ සියල්ල ලෙසෙ ඔහු කළේ ය. 4 එසේ වී නමුත්,
ගිරිකුළු දේවාල ඉවත් නොකරන ලදී. ඒ වන තෙක්
සෙනඟ ගිරිකුළු දේවාලවල පූජා කොට සුවඳ ද්රව්ය
පිදූ හ.
5 තවද, රජකම ඔහු අතේ ස්ථිර වූ කෙණෙහි ම
ඔහු තමාගේ පිය රජු මැරූ තමාගේ නිලධාරීන් මැරී
ය. 6 ද්වි.නී. 24:16එහෙත්, 'දරුවන් නිසා පියවරු වත්,
පියවරුන් නිසා දරුවෝ වත් මරනු නොලැබත් වා, එක්
එක්කෙනා තම තමාගේ ම පාපය නිසා මරනු ලැබේ
වා'යි සමිඳාණන් වහන්සේ අණ කර වදාළ පරිදි,
මෝසෙස්ගේ ව්යවස්ථා පොතේ ලියා තිබෙන ලෙසෙ,
ඔහු ඒ මිනීමරුවන්ගේ දරුවන් නොමැරී ය.
7 ඔහු 'ලුණු' මිටියාවතේ දී ඒදොම්වරුන් දසදහසක්
මරා, යුද්ධ කොට සේලා අල්ලාගෙන, අද දක්වා
තිබෙන හැටියට ඊට ජොක්තයෙල් යන නම තැබී
ය.

8 එකල අමශියා දූතයන් යවමින්, "එන්න, අපි
දෙදෙන මුණගැසමු" කියා ජේහුගේ පුත්
ජෙහෝවාහාස්ගේ පුත්ර ඉශ්රායෙල් රජු වන
ජෙහෝවාෂ්ට කියා යැවී ය. 9 ඉශ්රායෙල් රජ වන
ජෙහෝවාෂ් උත්තර දෙමින්, " 'ඔබේ දුව මාගේ
පුතාට භාර්යාව කොට දෙන්න' කියා ලෙබනොන්හි
වූ කටු පඳුර වැනි සුළු තැනැත්තා ලෙබනොන්හි වූ
කිහිරි ගස වැනි උතුම් තැනැත්තාට කියා යැවී ය.
එහෙත්, ලෙබනොන්හි වන මෘගයෙක් ඒ ළඟින් යන
විට කටු පඳුර පාගාදැමුවේ ය. 10 ඔබ හිස
උදුම්වාගෙන ඒදොම්වරුන්ට පහර දුන් බව සැබෑ ය.
ඔබේ සිත ද උඩඟු වී තිබේ. ඒ ගෞරවය ඔබට
සෑහේ. දැන් ඉතින් ගෙදර නවතින්න. ඔබ ද ඔබ
සමඟ ජුදාවරුන් ද වැටෙන ලෙසෙ ඔබ අන්තරායට
මැදි වන්නේ මන්දැ"යි ජුදාහි රජු වන අමශියාට කියා
යැවී ය.
11 එහෙත්, අමශියා ඇහුම්කන් දුන්නේ නැත. ඒ
නිසා ඉශ්රායෙල් රජ වන ජෙහෝවාෂ් පහර දෙන්න
ගියේ ය. ඔහු ද ජුදාහි රජ වන අමශියා ද ජුදාට
අයිති බෙත්-ෂෙමෙෂ්හි දී එකිනෙකොට මුණගැසුණෝ
ය. 12 ජුදාවරු ඉශ්රායෙල්වරුන්ට පරාජය වී සියල්ලෝ
ම තම තමන්ගේ කූඩාරම්වලට පලා ගියහ.
13 ඉශ්රායෙල් රජ වන ජෙහෝවාෂ් අහසියාගේ පුත්
ජෙහෝවාෂ්ගේ පුත්රයා වන ජුදාහි රජ වන අමශියා
බෙත්-ෂෙමෙෂ්හි දී අල්ලාගෙන ජෙරුසලමට අවුත්,
එෆ්රායිම් දොරටුවේ සිට කොනේ දොරටුව දක්වා
ජෙරුසලමේ පවුරෙන් මීටර් දෙසියයක් බිඳදමා,
14 සමිඳාණන් වහන්සේගේ මාලිගාවෙහිත්, රජ
මැදුරේ ගබඩාවලත් තිබූ රන් රිදී සියල්ල ද භාජන
සියල්ල ද ඇපකාරයන් ද රැගෙන ආපසු හැරී
සමාරියට ගියේ ය.
15 ජෙහෝවාෂ් කළ අනික් ක්රියා ද ඔහුගේ
වික්රම ද ඔහු ජුදාහි රජ වූ අමශියාට විරුද්ධ ව
යුද්ධ කළ හැටි ද ඉශ්රායෙල් රජුන්ගේ පුරාවෘත්ත
ග්රන්ථයේ වාර්තා කර තිබෙනු නොවේ ද?
16 ජෙහෝවාෂ් ද මියගිය පසු සමාරියෙහි ඉශ්රායෙල්
රජුන් ළඟ තැන්පත් කරනු ලැබී ය. ඔහුගේ පුත්
ජෙරොබෝවම් ඔහු වෙනුවට රජ විය.

## අමශියාගේ අවසානය

(2 වංශා 25:25-28)

17 ජෙහෝවාහාස්ගේ පුත් ඉශ්රායෙල් රජ වූ
ජෙහෝවාෂ්ගේ මරණයෙන් පසු ජෝවාෂ්ගේ පුත්
ජුදයේ රජ වන අමශියා අවුරුදු පහළොවක් ජීවත්
විය. 18 අමශියාගේ අනෙක් ක්රියා ජුදා රජුන්ගේ
පුරාවෘත්ත ග්රන්ථයේ වාර්තා කර තිබෙනු නොවේ
ද?
19 මිනිසුන් ඔහුට විරුද්ධ ව ජෙරුසලමෙහි
කුමන්ත්රණයක් කළහ. ඔහු ලාකීෂ් නම් ස්ථානයට
පලා ගියේ ය. එහෙත්, ඔව්හු ඔහු පස්සේ ලාකීෂ්ට
මිනිසුන් යවා එහි දී ඔහු මරා 20 අශ්වයන් පිට තබා
ගෙනවුත්, ජෙරුසලමෙහි දාවිත්ගේ නුවර ඔහුගේ
පියවරුන් ළඟ තැන්පත් කළෝ ය. 21 එකල ජුදාහි
මුළු සෙනඟ දහසය අවුරුදු වයස් ව සිටි උස්සියා

කැඳවාගෙන ඔහුගේ පියා වූ අමශියා වෙනුවට
රජකමට පත් කළෝ ය. 22 රජු මියගිය පසු ඔහු
ඒලත් ගොඩනඟා එය ජුදා රටට නැවත අයිති
කරගත්තේ ය.

### දෙ වන ජරොබෝවම්ගේ රාජ්‍ය කාලය

23 ජුදාහි රජ වූ ජෝවාෂ්ගේ පුත් අමශියාගේ
පසළොස් වන අවුරුද්දේ දී ඉශ්‍රායලේ රජ වූ
ජෝවාෂ්ගේ පුත් ජරොබෝවම් සමාරියෙහි රජ වී
සතළිස්එක් අවුරුද්දක් රජකම් කළේ ය. 24 ඔහු
සමිඳාණන් වහන්සේගේ ඇස් හමුයෙහි නපුරු දේ
කළේ ය. ඉශ්‍රායලේවරුන් පාපයට පෙළඹවූ
නබොත්ගේ පුත් ජරොබෝවම්ගේ සියලු පාපවලින්
ඔහු අහක් නො වී ය. 25 ජෝනා
1:1ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ
තමන්ගේ මෙහෙකරු වූ, ගාත්-හපෙරේහි දිවැසිවර
අමිත්තයිගේ පුත් ජෝනා ලවා කියවූ වචනය ලෙස
හමාත් දුර්ගයට ඇතුල් වන තැන පටන් අරබා
සමභූමියේ මුහුද දක්වා ඉශ්‍රායලේවරුන්ගේ දේශ
සීමාව ඔහු නැවත ලබාගත්තේ ය.
26 මන්ද, ඉශ්‍රායලේවරුන්ගේ පීඩිතකම ඉතා
බරපතල බවත්, දාසයන් ද නිර්දාසයන් ද නැති වී
ගිය බවත්, ඉශ්‍රායලේවරුන්ට උපකාර කරන්නට
කිසිකෙනෙකු නැති බවත් සමිඳාණන් වහන්සේ දුටු
සේක. 27 තවද, ඉශ්‍රායලේ යන නාමය මිහි පිටින්
මකා දමන බව සමිඳාණන් වහන්සේ නොවදාළ
සේක. එබැවින් උන් වහන්සේ ජෝවාෂ්ගේ පුත්
ජරොබෝවම් ලවා ඔවුන් මුදාගත් සේක.
28 ජරොබෝවම්ගේ අනික් ක්‍රියාත්, ඔහු කළ
සියල්ලත්, ඔහුගේ වික්‍රම එනම්, ඔහු යුද්ධ කළ
හැටිත්, ජුදාට අයිති ව තිබූ දමස්කය ද හමාත් ද
ඔහු නැවත ඉශ්‍රායලේවරුන්ට ලබාගත් හැටිත්
ඉශ්‍රායලේ රජුන්ගේ පුරාවෘත්ත ග්‍රන්ථයේ වාර්තා
කර තිබෙනු නොවේ ද? 29 ජරොබෝවම් ද
මියගියේ ය. ඔහුගේ පුත් සකෙරියා ඔහු වෙනුවට
රජ විය.

### උශ්ශියාගේ රාජ්‍ය කාලය

(2 වංශා 26:1-23)

15 ඉශ්‍රායලේ රජු වන ජරොබෝවම්ගේ
විසිහත් වන අවුරුද්දේ දී ජුදාහි රජු වන
අමශියාගේ පුත් උශ්ශියා රජ විය. 2 දහසය අවුරුදු
වයසේ දී ඔහු රජ වී ජෙරුසලමේ පණස්දෑවුරුද්දක්
රජකම් කළේ ය. ඔහුගේ මවුගේ නම ජකොලියා
ය. ඈ ජෙරුසලමේ ස්ත්‍රියකි. 3 තමාගේ පිය වූ
අමශියා කළ සියල්ල ලෙස ඔහු සමිඳාණන්
වහන්සේගේ ඇස් හමුයෙහි හරි දේ කළේ ය.
4 එසේ වුවත්, දේවාල පහ නොකරන ලද්දේ ය. ඒ
වන තෙක් සෙනඟ දේවාලවල පූජා කොට සුවඳ
ද්‍රව්‍ය පිදූ හ.
5 සමිඳාණන් වහන්සේ රජුට පහර දුන් සේක. ඔහු
මැරෙන දවස දක්වා කුෂ්ඨ රෝගියෙකු ව, වෙනෙ ම
ගෙයක වාසය කළේ ය. රජුගේ පුත් ජෝතාම් රජ
ගෙදර ප්‍රධානියා ව සිට දේශයේ සෙනඟ පාලනය
කළේ ය.
6 උශ්ශියාගේ අනික් ක්‍රියා ද ඔහු කළ සියල්ල ද
ජුදාහි රජුන්ගේ පුරාවෘත්ත ග්‍රන්ථයේ වාර්තා කර
තිබෙනු නොවේ ද? 7 යෙසා 6:1ඔහු මියගිය පසු
දාවිත්ගේ නුවර ඔහුගේ පියවරුන් ළඟ ඔහු තැන්පත්
කරනු ලැබී ය. ඔහුගේ පුත් ජෝතාම් ඔහු වෙනුවට
රජ විය.

### ශකෙරියාගේ රාජ්‍ය කාලය

8 ජුදාහි රජ වූ උශ්ශියාගේ තිස්අට වන අවුරුද්දේ
දී ජරොබෝවම්ගේ පුත් ශකෙරියා සමාරියේ
ඉශ්‍රායලේහි හය මාසයක් රජකම් කළේ ය. 9 ඔහු
තමාගේ පියවරුන් කළ පරිදි සමිඳාණන්
වහන්සේගේ ඇස් හමුයෙහි නපුරු දේ කළේ ය.
ඔහු ඉශ්‍රායලේවරුන් පාපයට පෙළඹුවාවූ
නබොත්ගේ පුත් ජරොබෝවම්ගේ පාපවලින් ඉවත්
නො වී ය. 10 ජාබෙශ්ගේ පුත් ෂල්ලුම් ඔහුට විරුද්ධ
ව කුමන්ත්‍රණය කොට සෙනඟ ඉදිරියේ ඔහුට
පහර දී මරා, ඔහු වෙනුවට රජ විය.
11 ශකෙරියාගේ අනෙක් ක්‍රියා ඉශ්‍රායලේ
රජුන්ගේ පුරවෘත්ත ග්‍රන්ථයේ වාර්තා කර තිබේ.
12 2 රාජා 10:30මෙයෙ වනාහි ‘නුඹේ පුත්‍රයෝ සතර
වන පරම්පරාව දක්වා ඉශ්‍රායලේ සිංහාසනයෙහි
හිඳින්නෝ ය”යි සමිඳාණන් වහන්සේ ජේහුට වදාළ
වචනය වේ. එය එලෙසෙ ම සිදු විය.

### ෂල්ලුම්ගේ රාජ්‍ය කාලය

13 ජාබෙෂේගේ පුත් ෂල්ලුම් ජුදාහි රජ වන
උශ්ශියාගේ තිස්නව වන අවුරුද්දේ දී රජ වී මාසයක්
සමාරියෙහි රජකම් කළේ ය.
14 එවිට ගාදීගේ පුත් මෙනෙහමේ තිර්ශා සිට පිටත්
වී සමාරියට අවුත් ජාබෙශ්ගේ පුත් ෂල්ලුම්ට
සමාරියේ දී පහර දී ඔහු මරා, ඔහු වෙනුවට රජ
විය. 15 ෂල්ලුම්ගේ අනෙක් ක්‍රියා ද ඔහු කළ
කුමන්ත්‍රණය ද ඉශ්‍රායලේ රජුන්ගේ පුරාවෘත්ත
ග්‍රන්ථයේ වාර්තා කර තිබේ. 16 එකල මෙනෙහමේ
තිප්සාටත්, එහි සිටි සියල්ලන්ටත්, තිර්ශා පටන් එහි
පළාත්වලටත් පහර දුන්නේ ය. ඔවුන් ඔහුට නුවර
දොරටු නොහැරිය බැවින් ඔහු ඔවුන්ට පහර දී එහි
සිටි සියලු ගර්භණීන් දපෙළු කරදැමී ය.

### මෙනෙහමේගේ රාජ්‍ය කාලය

17 ජුදාහි රජ වූ උශ්ශියාගේ තිස්නව වන අවුරුද්දේ
දී ගාදීගේ පුත් මෙනෙහමේ ඉශ්‍රායලේවරුන්ගේ රජ
වී සමාරියේ දස අවුරුද්දක් රජකම් කළේ ය.
18 ඔහු සමිඳාණන් වහන්සේගේ ඇස් හමුයෙහි
නපුරු දේ කළේ ය. ඉශ්‍රායලේවරුන් පාපයට
පෙළඹුවාවූ නබොත්ගේ පුත් ජරොබෝවම්ගේ
පාපවලින් ඔහු තමාගේ සියලු දවස්වල ඉවත් නොවී
සිටියේ ය. 19 අසිරියාවේ රජ වූ පූල් දේශය
ආක්‍රමණය කළේ ය. මෙනෙහමේ ද රාජ බලය
තමා අතේ තහවුරු කරගැනීමට, පූල් තමාට උදව්

වන පිණිස රිදී කිලෝග්‍රෑම් තිස්හතරදහසක් ඔහුට
දුන්නේ ය. 20 මෙනෙහමේ තමේ අසිරියාවේ රජුට
දුනෙ පිණිස එක් එක්කෙනොගනේ රිදී කාසි පණහක්
බැගින් ඉශ්‍රායලේහි සියලු පොහොසත්
බලවතුන්ගනේ අය කළේ ය. එවිට අසිරියාවේ රජ
දේශයේ නොනැවතී හැරී ගියේ ය.
21 මෙනෙහමේ අනකේ ක්‍රියා ද ඔහු කළ සියල්ල ද
ඉශ්‍රායලේ රජුන්ගේ පුරාවෘත්ත ග්‍රන්ථයේ වාර්තා
කර තිබනේ නොවේ ද? 22 මෙනෙහමේ ද මියගිය
පසු ඔහුගේ පුත් පකෙහියා ඔහු වනුවෙට රජ වීය.

### පකෙහියාගේ රාජ්‍ය කාලය

23 ජුදාහි රජ වූ උශ්ශියාගේ පණස් වන අවුරුද්දේ
දී මෙනෙහමේගේ පුත් පකෙහියා සමාරියේ
ඉශ්‍රායලේවරුන්ගේ රජ වී දෑවුරුද්දක් රජකම් කළේ
ය. 24 ඔහු සමිඳාණන් වහන්සේගේ ඇස් හමුයෙහි
නපුරු දේ කළේ ය. ඉශ්‍රායලේවරුන් පාපයට
පළෙඹුවාවූ නබොත්ගේ පුත් ජරොබෝවම්ගේ
පාපවලින් ඔහු ඉවත් නො වී ය. 25 ඔහුගේ අශ්ව
රථාධිපතියා වන රමෙලියාගේ පුත් පකො, ඔහුට
විරුද්ධ ව කුමන්ත්‍රණය කොට ගිලියද්වරුන්ගේ
පුත්‍රයන්ගනේ මිනිසුන් පණස්දනෙකුත් කැඳවාගනෙ
අවුත්, සමාරියෙහි රජවාසලේ බලකොටුවේ දී ඔහු
මරා ඔහු වනුවෙට රජ වීය.
26 පකෙහියාගේ අනික් ක්‍රියා ද ඔහු කළ සියල්ල
ද ඉශ්‍රායලේ රජුන්ගේ පුරාවෘත්ත ග්‍රන්ථයේ
වාර්තා කර තිබේ.

### පකොගේ රාජ්‍ය කාලය

27 ජුදාහි රජු වන උශ්ශියාගේ පණස් දෙ වන
අවුරුද්දේ දී රමෙලියාගේ පුත් පකො සමාරියෙහි
ඉශ්‍රායලේවරුන්ගේ රජ වී විසි අවුරුද්දක් රජකම්
කළේ ය. 28 ඔහු සමිඳාණන් වහන්සේගේ ඇස්
හමුයෙහි නපුරු දේ කළේ ය. ඉශ්‍රායලේවරුන්
පාපයට පළෙඹුවාවූ නබොත්ගේ පුත්
ජරොබෝවම්ගේ පාපවලින් ඔහු ඉවත් නො වී ය.
29 ඉශ්‍රායලේ රජු වන පකොගේ කාලයේ දී
අසිරියාවේ රජු වන තිග්ලත්-පිලසෙරේ අවුත් ඊයොන්
ද ආබලේ-බෙත්-මයකා ද ජනෝවා ද කදෙෂ් ද
හාශෝර් ද ගිලියද් ද ගලීලය ද, එනම් මුළු නප්තලී
දේශය ද අල්ලාගනෙ දේශවාසීන් අසිරියාවට ගනෙ
ගියේ ය.
30 උශ්ශියාගේ පුත් ජෝතාම්ගේ විසි වන
අවුරුද්දේ දී ඒලාගේ පුත් හෝෂයො රමෙලියාගේ
පුත් පකොට විරුද්ධ ව කුමන්ත්‍රණය කොට, ඔහුට
පහර දී මරා ඔහු වනුවෙට රජ වීය. 31 පකොගේ
අනික් ක්‍රියා ද ඔහු කළ සියල්ල ද ඉශ්‍රායලේ
රජුන්ගේ පුරාවෘත්ත ග්‍රන්ථයේ වාර්තා කර තිබේ.

### ජෝතාම්ගේ රාජ්‍ය කාලය

(2 වංශා 27:1-9)

32 රමෙලියාගේ පුත් ඉශ්‍රායලේහි රජු වන
පකොගේ දෙ වන අවුරුද්දේ දී ජුදාහි රජ වූ
උශ්ශියාගේ පුත් ජෝතාම් රජ වීය. 33 විසිපස් අවුරුදු
වයසේ දී ඔහු රජ වී ජරුසෙලමේ දහසය අවුරුද්දක්
රජකම් කළේ ය. ඔහුගේ මවුගේ නම ජරූෂා ය.
ඈ ශාදොක්ගේ දූවකි. 34 ජෝතාම් සමිඳාණන්
වහන්සේගේ ඇස් හමුයෙහි හරි දේ කරමින්
තමාගේ පියා වූ උශ්ශියා කළ සියල්ල ලසෙ කළේ
ය. 35 එහතේ, ගිරිකුළු දේවාල පහ නොකරන
ලද්දේ ය. ඒ වන තකේ සනෙඟ ගිරිකුළු දේවාලවල
සුවඳ ද්‍රව්‍ය පිදූ හ. සමිඳාණන් වහන්සේගේ
මාලිගාවේ ඉහළ දොරටුව ගොඩනැඟුවේ ඔහු ය.
36 ජෝතාම්ගේ අනකේ ක්‍රියා ද ඔහු කළ සියල්ල
ද ජුදා රජුන්ගේ පුරාවෘත්ත ග්‍රන්ථයේ වාර්තා කර
තිබනේ නොවේ ද? 37 ඒ දවස්වල දී සමිඳාණන්
වහන්සේ සිරියාවේ රජ වූ රශේන් ද රමෙලියාගේ
පුත් පකො ද ජුදාට විරුද්ධ ව සටනට යවන්න
පටන්ගත් සේක. 38 ජෝතාම් මියගිය පසු තමාගේ
පිය වූ දාවිත්ගේ නුවර තමාගේ පියවරුන් ළඟ
තැන්පත් කරනු ලැබී ය. ඔහුගේ පුත් ආහාස් ඔහු
වනුවෙට රජ වීය.

### ආහාස්ගේ රාජ්‍ය කාලය

(2 වංශා 28:1-27)

16 රමෙලියාගේ පුත් පකොගේ දහහත් වන
අවුරුද්දේ දී ජුදාහි රජ වූ ජෝතාම්ගේ පුත්
ආහාස් රජ වීය. 2 ආහාස් විසි අවුරුදු වයසේ දී රජ
වී ජරුසෙලමේ දහසය අවුරුද්දක් රජකම් කළේ ය.
ඔහු තමාගේ පිය වූ දාවිත් මනේ නොව තමාගේ
දවේ සමිඳාණන් වහන්සේගේ ඇස් හමුයෙහි හරි
දේ නොකර, 3 ද්වි.නී. 12:31ඉශ්‍රායලේ රජුන්ගේ
මාර්ගයෙහි ගමන්කර සමිඳාණන් වහන්සේ
ඉශ්‍රායලේ පුත්‍රයන් ඉදිරියනේ පහකරදැමූ
විජාතීන්ගේ පිළිකුල් සිරිත් ලසෙ තමාගේ පුත්‍රයා
ගිනි මැදින් යවා පූජා කළේ ය. 4 ඔහු ගිරිකුළු
දේවාලවලත්, හලේ පිටත්, සියලු අතු පතර ඇති
ගස් යටත් පූජා ඔප්පු කොට සුවඳ ද්‍රව්‍ය පිදී ය.
5 යසො 7:1 එකල සිරියාවේ රජ වන රශේන් ද
රමෙලියාගේ පුත් ඉශ්‍රායලේ රජ වන පකො ද යුද්ධ
කරන පිණිස ජරුසෙලමට අවුත් ආහාස් වැටලූ නමුත්,
ඔහු පරදවන්නට අපොහොසත් වූ හ. 6 ඒ කාලයේ
දී සිරියාවේ රජ වන රශේන්, ඒලත් දේශය නැවත
සිරියාවට ලබාගනෙ ජුදාවරුන් ඒලත් කරෙනේ
පහකරදැමී ය. සිරියන්වරු ඒලත්ට අවුත් අද වන තුරු
එහි වසති. 7 එකල ආහාස් අසිරියාවේ රජ වන
තිග්ලත්-පිලසෙරේ වතෙ දූතයන් යවා, “මම ඔබේ
මහෙකෙරුවා ය; ඔබේ පුත්‍රයා ය. ඔබ අවුත් මට
විරුද්ධ ව නැඟිට සිටින සිරියාවේ රජුන්ගේ අතිනුත්,
ඉශ්‍රායලේ රජුන්ගේ අතිනුත් මා ගැළවුව මැනව”යි
කියා යැවී ය. 8 තවද, ආහාස් සමිඳාණන්

වහන්සේගේ මාලිගාවෙහිත්, රජ ගෙදර ගබඩාවලත්
තිබුණු රන් රිදී රැගෙන අසිරියාවේ රජුට තෑග්ගක්
වශයෙන් යැවී ය. 9 අසිරියාවේ රජ ඔහුට ඇහුම්කන්
දී දමස්කයට විරුද්ධ ව ගොස් එය අල්ලාගෙන එහි
වැසියන් වහලුන් කොට කීර්ට ගෙන ගියේ ය. ඔහු
රශීන් ද මැරවී ය.
10 ආහාස් රජ අසිරියාවේ රජ වන තිග්ලත්-
පිලෙසෙර් සම්බ වන්න දමස්කයට ගොස් දමස්කයේ
තිබුණු පූජාසනය දැක, පූජාසනයේ සියලු වැඩවල
හරි සැලැස්මක් ද එහි දිග පළල ආදිය ද උරියා
පූජකයාට එවී ය. 11 උරියා පූජක තමේ පූජාසනය
ගොඩනැඟුවේ ය. ආහාස් රජ දමස්කයෙන් එවූ
සියල්ලේ හැටියට උරියා පූජක තමේ ආහාස් රජ
දමස්කයෙන් එන්නට පෙර එය සෑදුවේ ය. 12 රජ
දමස්කයෙන් අවුත්, ඒ පූජාසනය දැක, ඊට ළං ව ඒ
මත පූජා කළේ ය. 13 ඔහු තමාගේ දවන යාග
පූජාවත්, ආහාර පූජාවත් පුදා, තමාගේ පානීය පූජාව
වත් කොට තමාගේ සහභාගිකමේ පූජාවල ලේ
පූජාසනය මත ඉස්සේ ය. 14 නික්ම 27:1-2; 2 වංශා
4:1සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි තිබූ ලෝකඩ
පූජාසනය වූ කලී මාලිගාව ඉදිරියෙන් එනම්,
තමාගේ පූජාසනයටත් සමිඳාණන් වහන්සේගේ
මාලිගාවටත් අතරෙන් අහක් කොට තමාගේ
පූජාසනයට උතුරු පැත්තේ එය තැබීණි. 15 ආහාස්
රජ පූජකයා වූ උරියාට අණ කරමින්, “උදේ දවන
යාග පූජාවත්, සවස ආහාර පූජාවත්, රජුගේ යාග
පූජාවත්, ඔහුගේ ආහාර පූජාවත්, දේශයේ මුළු
සෙනඟගේ දවන යාග පූජාවත්, සවස ඔවුන්ගේ
ආහාර පූජාවත්, ඔවුන්ගේ පානීය පූජාවලුත් මහා
පූජාසනය මත දවා, දවන යාග පූජාවේ සියලු ලේත්,
පූජාවේ සියලු ලේත් එය මත ඉසින්න. ලෝකඩ
පූජාසනය වනාහි මාගේ පේන කීම පිණිස වන්නේ
ය”යි කී ය. 16 ආහාස් රජු අණ කළ සියල්ල පූජක
වන උරියා ඉටු කළේ ය.
17 1 රාජා 7:23-39; 2 වංශා 4:2-6 තවද, ආහාස් රජ
අසිරියාවේ රජු නිසා මැසිවල පනේල කපාදමා ඒවා
උඩ තිබූ භාජනය අහක් කළේ ය. ලෝකඩ බඳුන
යට තිබූ ගව රූප අටෙන් ලෝකඩ බඳුන බස්වා ගල්
ඇල්ලූ බිමක තැබී ය. 18 සබත් දවසේ යාම පිණිස
මාලිගාවෙහි සාදා තිබුණ ඇතුළු මාර්ගය ද රජුට
ඇතුළු වීමට තිබුණ බාහිර ස්ථානය ද ඔහු
සමිඳාණන් වහන්සේගේ මාලිගාව දසෙට හරවා
තැබී ය.
19 ආහාස් කළ අනෙකේ ක්‍රියා ජුදාහි රජුන්ගේ
පුරාවෘත්ත ග්‍රන්ථයේ වාර්තා කර තිබෙනු නොවේ
ද? 20 යෙසා 14:28ආහාස් මියගිය පසු දාවිත්ගේ
නුවර තමාගේ පියවරුන් ළඟ තැන්පත් කරනු ලැබී
ය. ඔහුගේ පුත් හසෙකියා ඔහු වෙනුවට රජ විය.

## හෝෂෙයාගේ රාජ්‍ය පාලනය

17 ජුදාහි රජ වූ ආහාස්ගේ දොළොස් වන
අවුරුද්දේ දී ඒලාගේ පුත් හෝෂෙයා
සමාරියෙහි ඉශ්‍රායලේවරුන්ගේ රජ වී නව අවුරුද්දක්
රජකම් කළේ ය. 2 ඔහු සමිඳාණන් වහන්සේගේ
ඇස් හමුයෙහි නපුරු දේ කළේ ය. එහෙත්, තමාට
පළමුවෙන් සිටි ඉශ්‍රායලේ රජවරුන් මෙන් නොවී ය.
3 අසිරියාවේ රජ වූ ෂල්මනසෙර් ඔහුට විරුද්ධ ව
ආයේ ය. හෝෂෙයා ඔහුට මෙහෙකරු වී කප්පම්
දුන්නේ ය. 4 එහෙත්, හෝෂෙයා මිසරයේ සෝ නම්
රජු ළඟට දූතයන් යැවූ නිසාත්, අවුරුදුපතා කළ
සැටියට අසිරියාවේ රජුට කප්පම් ගෙනවුත් නුදුන්
නිසාත් ඔහු කුමන්ත්‍රණය කළ බව අසිරියාවේ රජ
දැන ගෙන ඔහුට විලංගු ලා හිර අඩස්සි කළේ ය.

## සමාරියේ වැටීම

5 එවිට අසිරියාවේ රජ දේශය මුළුල්ලෙහි ගොස්
සමාරියට පැමිණ, තුන් අවුරුද්දක් එය වටලාගෙන
සිටියේ ය. 6 තවද, හෝෂෙයාගේ නව වන අවුරුද්දේ
අසිරියාවේ රජ සමාරිය අල්ලාගෙන ඉශ්‍රායලේවරුන්
අසිරියාවට ගෙන ගොස් හලාහි ද ගෝෂාන් ගංගාව
වන හාබෝර් ළඟ ද මේදවරුන්ගේ නුවරවල ද
පදිංචි කරවී ය.
7 එසේ වූයේ, ඉශ්‍රායලේ ජනයා පාරාවෝ රජුගේ
බලයෙන් නිදහස් කොට මිසර දේශයෙන් ගෙනා
තමන්ගේ දෙවි සමිඳාණන් වහන්සේට විරුද්ධ ව පව්
කරමින් වෙන දෙවිවරුන්ට බිය ව, 8 සමිඳාණන්
වහන්සේ ඉශ්‍රායලේ ජනයා ඉදිරියෙන් පන්නාදැමූ
විජාතීන්ගේ සම්ප්‍රදායයන් අනුව ද හැසුරුණු නිසා
ය. 9 තවද, ඉශ්‍රායලේ ජනයා තමන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේට විරුද්ධ ව අයුතු දේවල්
රහසින් කරමින්, මුරකාරයන්ගේ කොටු පටන් පවුරු
ඇති නගර දක්වා තමන්ගේ හැම නගරයක ගිරිකුළු
දේවාල සාදාගෙන, 10 1 රාජා 14:23උස් වූ සියලු
හලේ පිට ද සියලු අතු පතර ඇති විශාල ගස් යට ද
රූපස්තම්භ සහ අෂේරා කප් කණු පිහිටුවාගෙන,
11 ඔවුන් ඉදිරියෙන් සමිඳාණන් වහන්සේ ගෙන ගිය
විජාතීන් කළ පරිදි ඒ සියලු ගිරිකුළු දේවාලවල සුවඳ
දුම් ඔප්පු කළෝ ය. සමිඳාණන් වහන්සේ උදහස්
කරන අන්දමේ නපුරු දේවල් ද කළෝ ය.
12 ‘රූපවලට වැඳුම්පිදුම් නොකරන්නැ’යි සමිඳාණන්
වහන්සේ ඔවුන්ට වදාළ නමුත් ඔව්හු ඒ දේ කළෝ
ය.
13 එහෙත්, සමිඳාණන් වහන්සේ තමන්ගේ සියලු
දිවැසිවරුන් ද දර්ශකයන් ද ලවා ඉශ්‍රායලේවරුන්ටත්,
ජුදාවරුන්ටත් අවවාද කරමින්, “නුඹලාගේ නපුරු
මාර්ගවලින් ඉවත් වී, නුඹලාගේ පියවරුන්ට මා අණ
කළ, මාගේ සේවකයන් වන දිවැසිවරුන් අත
නුඹලාට එවූ මාගේ මුළු ව්‍යවස්ථාව අනුව මාගේ
ආඥා පවත්වන්නැ”යි වදාළ සේක. 14 එහෙත්, ඔව්හු
සවන් නො දී, තමන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ
නොඇදහූ ඔවුන්ගේ පියවරුන් මුරණ්ඩු වූ ලෙසෙ
තමන්ගේ මුරණ්ඩුකම් වැඩිකරගෙන, 15 උන්
වහන්සේගේ පණත් ද ඔවුන්ගේ පියවරුන් සමඟ
කළ උන් වහන්සේගේ ගිවිසුම ද ඔවුන්ට උන්
වහන්සේ දුන් උන් වහන්සේගේ අවවාද ද එපා කර,
වැදගැම්මක් නැති නිෂ්ඵල රූපවලට නමස්කාර

කොට, වැදගැම්මක් නැති අය මෙන් ඔවුන් වටකර
සිටි විජාතීන් මෙන් නොකරන හැටියට සමිඳාණන්
වහන්සේ ඔවුන්ට අණ කළ නමුත්, ඒ විජාතීන්ගේ
සම්ප්‍රදායයන් අනුව හැසුරුණෝ ය. 16 1 රාජා
12:28ඔව්හු තමන්ගේ දෙවි සමිඳාණන් වහන්සේගේ
සියලු ආඥා අත්හැර, වාත්තු කළ පිළිම වන වස්සන්
දෙදෙනෙකු ද අෂේරා කප් කණු ද සාදා ගෙන
ආකාශ වස්තූන් සියල්ලට නමස්කාර කරමින්, බාල්
දෙවියාට සේවය කළෝ ය. 17 ද්වි.නී. 18:10ඔව්හු
තමන්ගේ පුත්‍රයන් ද දූවරුන් ද ගිනි මැදින් යවා
පූජා කළෝ ය. පේන කීම ද ශාස්ත්‍ර බැලීම ද
භාවිතා කළෝ ය. ඔව්හු සමිඳාණන් වහන්සේ
උදහස් කරවන ලෙස උන් වහන්සේගේ ඇස්
හමුයෙහි නපුරු දේ කිරීමට ද භාර වූ හ. 18 ඒ නිසා
සමිඳාණන් වහන්සේ ඉශ්රායලේවරුන් කෙරෙහි ඉතා
උදහස් වී තමන්ගේ ඇස් හමුයෙන් ඔවුන් පහකළ
සේක. ඉතිරි වූයේ ජුදා ගෝත්‍රය පමණකි.
19 ජුදාවරුත් තමන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේගේ ආඥා රක්ෂා නොකොට,
ඉශ්රායලේවරුන් සාදාගත් පණත් ලෙස හැසුරුණෝ ය.
20 සමිඳාණන් වහන්සේ ද මුළු ඉශ්රායලේ වංශය
අත්හැර ඔවුන්ට පීඩා කොට ඔවුන් තමන්ගේ ඇස්
හමුයෙන් ඉවත්කර දමන තුරු කොල්ලකාරයන්ගේ
අතට ඔවුන් පාවා දුන් සේක. 21 එසේ වූයේ, උන්
වහන්සේ ඉශ්රායලේවරුන් දාවිත්ගේ වංශයෙන්
වෙන් කළ බැවින් ඔව්හු නබොත්ගේ පුත්
ජෙරොබෝවම් රජ කොට පත් කරගත්තෝ ය.
ජෙරොබෝවම් සමිඳාණන් වහන්සේ වෙතින්
ඉශ්රායලේවරුන් බැහැර කොට ඔවුන් බරපතල
පාපයන්ට පෙළඹී ය. 22 මෙසේ සමිඳාණන් වහන්සේ
තමන්ගේ සියලු මෙහෙකරුවන් දිවැසිවරුන් ලවා
කියවූ ලෙස ඉශ්රායලේ ජනයා තමන්ගේ ඇස්
හමුයෙන් පහකරන තෙක්, ඔව්හු ජෙරොබෝවම් කළ
සියලු ම පාපවලින් ඉවත් නොවී, ඒවායෙහි
හැසුරුණෝ ය. 23 මෙසේ ඉශ්රායලේවරු තමන්ගේ
දේශයෙන් අසිරියාවට ගෙනයන ලදුව අද දක්වා එහි
සිටිති.

### සමාරීය ජාතියේ පටන්ගැන්ම

24 අසිරියාවේ රජ බබිලෝනියෙන් ද කුතාවෙන් ද
අව්වායෙන් ද හමාතෙන් ද සපර්වයිමෙන් ද මිනිසුන්
ගෙනවුත්, ඉශ්රායලේ ජනයා වෙනුවට සමාරියේ
නගරවල පදිංචි කරවී ය. ඔව්හු සමාරිය හිමි
කරගෙන එහි නගරවල වාසය කළෝ ය. 25 ඔව්හු
එහි වාසය කරන්න පටන්ගන්න කල සමිඳාණන්
වහන්සේ කෙරෙහි ගරුබිය ඇති ව නොසිටියෝ ය.
එබැවින් සමිඳාණන් වහන්සේ ඔවුන් අතරට
සිංහයන් යැවූ සේක. ඒ සත්තු ඔවුන්ගෙන් සමහර
දෙනෙකුන් මැරූ හ. 26 එබැවින් ඔව්හු අසිරියාවේ
රජුට කතා කොට, “ඔබ ගෙනවුත් සමාරියේ
නුවරවල පදිංචි කරවූ ජාතීහු ඒ දේශයේ දෙවියන්
නමදින අන්දම නොදනිති. ඒ නිසා උන් වහන්සේ
ඔවුන් අතරට සිංහයන් එවූ සේක. ඔවුන් දේශයේ
දෙවියන් නමදින අන්දම නොදන්න නිසා සිංහයෝ
ඔවුන් මරති”යි කී හ. 27 එවිට අසිරියාවේ රජ අණ
කරමින්, “ඔබ එතැනින් ගෙනෙ පූජකයන්ගෙන් එක්
කෙනෙකු එහි කැඳවාගෙන යන්න. ඔහු ගොස් එහි
වාසය කරමින් ඒ දේශයේ දෙවියන් නමදින අන්දම
ඔවුන්ට උගන්වා දේ වා”යි කී ය. 28 මෙසේ ඔවුන්
සමාරියෙන් ගෙන ගිය පූජකයන්ගෙන් එක් කෙනෙක්
අවුත් බෙතෙල්හි වාසය කොට, සමිඳාණන් වහන්සේ
කෙරෙහි ගරුබිය පෑ යුතු අන්දම ඔවුන්ට ඉගැන්වී ය.
29 එසේ වුවත්, ඒ ජාතීහු තම තමන්ගේ දෙවිවරුන්
සාදාගෙන, ඒ ජාතීන් විසූ නගරවල තිබූ ගිරිකුළු
දේවාලවල ඒවා තැබූ හ. 30 එසේ බබිලෝනියේ
මිනිස්සු සුක්කොත්-බෙනොත් ද කුත්හි මිනිස්සු
නේර්ගල් ද හමාත්හි මිනිස්සු අෂිමා ද 31 අව්විවරු
නිබ්හාස් ද තර්තාක් ද යන දෙවිවරුන් සෑදුවෝ ය.
සපර්විවරු ද සපර්වයිමේ දෙවිවරුන් වන
අද්‍රම්මලෙක්ට සහ අනම්මලෙක්ට පූජා කරනු
සඳහා තමන්ගේ දරුවන් ගින්නෙන් දැවූ හ. 32 ඔව්හු
සමිඳාණන් වහන්සේ කෙරෙහි ගරුබිය පවත්වමින්
ගිරිකුළු දේවාලවල ඔවුන් උදෙසා පූජා කරන පිණිස
තමන් අතරෙන් ගිරිකුළු දේවාලවල පූජකයන් පත්
කරගත්හ. 33 ඔව්හු සමිඳාණන් වහන්සේ කෙරෙහි
ගරුබිය ඇති ව තමන් අත්හැර පැමිණි ඒ
විජාතීන්ගේ වත්පිළිවෙත් අනුව තමන්ගේ
දෙවිවරුන්ට සේවය කළෝ ය.
34 උත් 32:28; 35:10 අද දක්වා ඔව්හු පැරණි
විධිවිධාන ලෙස කරති. ඔව්හු සමිඳාණන් වහන්සේ
කෙරෙහි ගරුබිය ඇති ව නොසිටියහ, උන්
වහන්සේගේ නියෝග ද පණත් ද ලෙස නොකළහ.
සමිඳාණන් වහන්සේ ඉශ්රායලේ යන නම තැබූ
ජාකොබ්ගේ දරු පරපුරට අණ කළ උන්
වහන්සේගේ ව්‍යවස්ථාවේ ද ආඥාවේ ද හැටියට
නොකළහ. 35 නික්ම 20:5; ද්වි.නී. 5:9සමිඳාණන්
වහන්සේ ඉශ්රායලේ ජනයා සමඟ ගිවිසුමක්
කරමින්, “අන් දෙවිවරුන් කෙරෙහි ගරුබිය නොදක්වා
ඔවුන්ට නමස්කාර නොකොට, සේවය නොකොට,
පූජා නොකොට, 36 ද්වි.නී. 6:13මහා බාහු බලයෙන්
මිසර දේශයෙන් නුඹලා ගෙනෙ සමිඳාණන් වහන්සේ
කෙරෙහි ගරුබිය පවත්වා, උන් වහන්සේට ම
නමස්කාර කොට උන් වහන්සේට ම පූජා කරන්න.
37 අන් දෙවිවරුන් කෙරෙහි ගරුබිය නොපවත්වා, උන්
වහන්සේ ලියා දුන් නියෝග ද පණත් ද ව්‍යවස්ථා ද
ආඥා ද සෑම කල්හි ම පවත්වන්නට බලාගන්න.
38 මා නුඹලා සමඟ කළ ගිවිසුම මතක නැති
නොකරන්න. වෙන දෙවිවරුන් කෙරෙහි ගරුබිය
නොපවත්වා, 39 නුඹලාගේ දෙවි සමිඳාණන්
වහන්සේ කෙරෙහි ගරුබිය ඇති ව සිටින්න. උන්
වහන්සේ නුඹලාගේ සියලු සතුරන් අතින් නුඹලා
ගළවනු ඇතැ”යි වදාළ සේක. 40 එසේ වී නමුත්,
ඔව්හු සවන් නො දී තමන්ගේ පැරණි විධිවිධාන
ලෙසෙ කළහ.
41 මෙසේ මේ විජාතීහු සමිඳාණන් වහන්සේ
කෙරෙහි ගරුබිය පවත්වමින් තමන්ගේ රූපවලට
සේවය කළහ. එලෙසම ඔවුන්ගේ දරුවෝ ද

දරුවන්ගේ දරුවෝ ද තමන්ගේ පියවරුන් කළ
හැටියට අද දක්වා කරති.

### හසෙකියාගේ රාජ්‍ය පාලනයේ පටන්ගැන්ම
(2 වංශා 29:1-2;31:1)

18 ඒලාගේ පුත් ඉශ්රායලේ රජු වන
හෝෂෙයාගේ තුන් වන අවුරුද්දේ දී ජුදාහි
රජ වූ ආහාස්ගේ පුත් හසෙකියා රජ විය. 2 විසිපස්
අවුරුදු වයසේ දී ඔහු රජ වී විසිනව අවුරුද්දක්
ජෙරුසලමේ රජකම් කළේ ය. ඔහුගේ මවගේ නම
අබී ය. ඈ සකරියාගේ දුවකි.
3 ඔහුගේ පිය වූ දාවිත් කළ සියල්ල ලෙස ඔහු
සමිඳාණන් වහන්සේගේ ඇස් හමුයෙහි හරි දේ
කළේ ය. 4 ගණන් 21:9ඔහු ගිරිකුළු දේවාල
පහකර, රූපස්තම්භ කඩා, අෂේරා කප් කණු
කපාදමා, මෝසෙස් විසින් සාදන ලද ලෝකඩ
සර්පයා ද කැබැලි කොට දැමී ය. ඒ දවස් දක්වා
ඉශ්රායලේ ජනයා ඊට සුවඳ දුම් ඔප්පු කළහ. ඔහු
ඊට නෙහුෂ්තාන් යයි නම තැබී ය. 5 ඔහු
ඉශ්රායලේවරුන්ගේ සමිඳාණන් වහන්සේ කෙරෙහි
විශ්වාස කළේ ය. ඔහුට සමාන කිසිවෙක් ඔහුට
පසු වත්, ඔහුට පෙර වත් ජුදාහි සියලු රජුන් අතරේ
නොසිටියේ ය. 6 ඔහු සමිඳාණන් වහන්සේට ඇළුම්
ව සිට උන් වහන්සේ අනුව යාම අත් නොහැර,
සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අණ කළ උන්
වහන්සේගේ ආඥා රක්ෂා කළේ ය. 7 සමිඳාණන්
වහන්සේ ද ඔහු සමඟ සිටි සේක. ඔහු ගිය තැන
සමෘද්ධ විය. ඔහු අසිරියාවේ රජුට විරුද්ධ ව කැරලි
ගසා, ඔහුට සේවය නොකොට සිටියේ ය. 8 ගාසා
සහ එහි සීමාවන් දක්වා ද මුරකොටුව පටන් පවුරු
සහිත නගරය දක්වා ද පිලිස්තිවරුන්ට පහර දුන්නේ
ඔහු ය.

### සමාරියේ වැටීම සිහි කිරීමක්

9 ඒලාගේ පුත් ඉශ්රායලේ රජ වූ හෝෂෙයාගේ
සත් වන අවුරුද්ද වන හසෙකියා රජුගේ සතර වන
අවුරුද්දේ දී අසිරියාවේ රජ වූ ෂල්මනසෙරේ
සමාරියට විරුද්ධ ව අවුත් එය වටලාගෙන, 10 තුන්
අවුරුද්දකට පසු එය අල්ලාගත්තේ ය. ඉශ්රායලේ
රජු වන හෝෂෙයාගේ නව වන අවුරුද්ද වන
හසෙකියාගේ හය වන අවුරුද්දේ දී සමාරිය
අල්ලාගන්න ලද්දේ ය. 11 අසිරියාවේ රජ ද
ඉශ්රායලේවරුන් අසිරියාවට ගෙන ගොස් හලාහි ද
ගෝෂාන්හි ගංගාව වන හාබෝර් ළඟ ද
මේදවරුන්ගේ නගරවල ද පදිංචි කරවී ය.
12 මෙසේ සිද්ධ වූයේ, ඔවුන් තම දෙවි සමිඳාණන්
වහන්සේගේ හඬට කීකරු නොවී උන් වහන්සේගේ
ගිවිසුම වන, සමිඳාණන් වහන්සේගේ මෙහෙකරු වූ
මෝසෙස් අණ කළ සියල්ල කඩ කළ නිසා ය. ඔව්හු
ඒවා අසන්නට වත්, කරන්නට වත් නොකැමැති වූ
හ.

### සනෙකරේබ් රජුගේ ආක්‍රමණය
(2 වංශා 32:1-19;යෙසා 36:1-22)

13 හසෙකියා රජුගේ දහහතර වන අවුරුද්දේ දී
අසිරියාවේ රජ වූ සනෙකරේබ් ජුදාහි රජවරුන්ගේ
නගරවලට විරුද්ධ ව අවුත් ඒවා අල්ලාගත්තේ ය.
14 එවිට ජුදාහි රජු වන හසෙකියා, “මම වරද
කළෙමි; මා වෙතින් හැරී ගිය මැනව. ඔබ මට
පවරන හැම දෙයක් ම භාර ගනිමි”යි ලාකීෂ්හි සිටි
අසිරියාවේ රජුට කියා යැවී ය. අසිරියාවේ රජ ද රිදී
කිලෝග්රෑම් දසදහසක් ද රන් කිලෝග්රෑම් දහසක්
ද දෙන්නට ජුදාහි රජ වූ හසෙකියාට නියම කළේ
ය. 15 හසෙකියා සමිඳාණන් වහන්සේගේ
මාලිගාවෙහිත්, රජ ගෙදර ගබඩාවලත් තිබූ රිදී
සියල්ල ඔහුට දුන්නේ ය. 16 ඒ කාලයෙහි හසෙකියා
සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ දොරටුවලින් ද
ජුදාහි රජ වූ හසෙකියා රනින් වැසූ කුළුණුවලින් ද
රන් ඉවත් කරගෙන ඒවා අසිරියාවේ රජුට දුන්නේ
ය.

### තානාපති සේවයක්

17 එහෙත්, අසිරියාවේ රජ ලාකීෂ්හි සිට තර්තාන්
ද රබ්-සාරිස් ද රබ්-ෂාකේ ද යන නිලධාරීන් විශාල
සේනාවක් සමඟ හසෙකියා රජු වෙත ජෙරුසලමට
යැවී ය. ඔව්හු අවුත් ජෙරුසලමට පැමිණියහ. තවද,
ඔව්හු රජකයන්ගේ පිට්ටනියේ මාවත තිබෙන ඉහළ
පොකුණේ කාණුව ළඟ සිට රජු කැඳවූ හ. 18 එවිට,
රජ ගෙදර ප්රධානියා වූ හිල්කියාගේ පුත් එලියාකිම්
ද ෂෙබ්නා ලේකම් ද වාර්තාකරුවා වන ආසාප්ගේ
පුත් ජෝවා ද පිටත් ව ඔවුන් ළඟට ගියෝ ය.
19 එවිට රබ්-ෂාකේ ඔවුන්ට කතා කොට,
“අසිරියාවේ රජු වන මහා රජතුමාණෝ මෙසේ
කියන්නාහ: ‘ඔබ කුමක් කෙරෙහි විශ්වාසය
තබන්නහු ද? 20 යුද බලය හා ශූරතාව වනුවට හිස්
දඬුවම් සෑහේ යයි ඔබ සිතන්නෙහි ද? එහෙත්, ඒවා
හිස් වචන වේ. ඉතින් ඔබ මට විරුද්ධ ව කැරලි
ගැසුවේ කවරකු කෙරෙහි විශ්වාස කරගෙන ද?
21 මෙන්න, ඔබ විශ්වාස කරන්නේ ඒ තැළුණ බට
දණ්ඩ වන මිසරය කෙරෙහි ය. යමකු ඊට බර
වුණොත් එය ඔහුගේ අතට ඇනී හිල් වෙයි.
මිසරයේ රජු වන පාරාවෝ කෙරෙහි විශ්වාස කරන
සියල්ලන්ට ඔහු එලෙසෙ කරන්නේ ය.
22 ‘එහෙත්, අපේ දෙවි සමිඳාණන් වහන්සේ
කෙරෙහි විශ්වාස කරමු යයි ඔබ හැම සමහර විට
මට කියනු ඇත. එහෙත්, ඔබ හැම ජෙරුසලමෙහි
මේ පූජාසනය ඉදිරියෙහි නමස්කාර කළ යුතු යයි
ජුදාවරුන්ටත්, ජෙරුසලමේ වැසියන්ටත් කියා
හසෙකියා උන් වහන්සේගේ කඳු මත පූජාස්ථාන ද
පූජාසන ද පහකර දැමුවා නොවේ ද? 23 ඉතින්
අශ්වයන් පිට නැඟී යන්නට අසරුවන් සොයන්නට
ඔබට පුළුවන් නම්, ඔබ අසිරිය රජු වන මාගේ
ස්වාමියාට ඇප දුන්නොත්, මම ඔබට අශ්වයන්
දදෙහසක් දෙන්නෙමි. 24 එසේ ඔබට බැරි නම්, ඔබ

මාගේ ස්වාමීහුගේ සුළු සේවකයන්ගෙන් එක
මුලාදෑනියකු වුවත් එලවාදමන්නේ කෙසේ ද?
අශ්ව රථ ද අසරුවන් ද ගැන මිසරය කෙරෙහි
විශ්වාසය තබා සිටින්නහු ද? 25 මා දැන් මේ
ස්ථානය විනාශ කරන්නට ඊට විරුද්ධ ව ආවේ
සමිඳාණන් වහන්සේ නැතිව ද? මේ දේශයට විරුද්ධ
ව ගොස් එය විනාශ කරන්නැ යි සමිඳාණන්
වහන්සේ මට වදාළ සේක' කියා ඔබ හැම
හෙසෙකියාට කියන්නැ"යි කී ය.
26 එකල හිල්කියාගේ පුත් එලියාකිම් ද ෂෙබ්නා ද
ජෝවා ද රබ්-ෂාකේට කතා කොට, "පවුර පිට සිටින
සෙනඟට ඇසෙන්නට ජුදවේ භාෂාවෙන් අපට කතා
නොකොට, ඔබේ මෙහෙකරුවන් වන අපට සිරියන්
භාෂාව තේරෙන නිසා ඒ භාෂාවෙන් කතා කළ
මැනවැ"යි කී හ.
27 එහෙත්, රබ්-ෂාකේ ඔවුන්ට උත්තර දෙමින්,
"මාගේ ස්වාමියා මේ වචන කියන්නට මා එවුවේ,
ඔබේ ස්වාමියා හා ඔබ ළඟට ද? නොහොත් පවුර
පිට සිටින මනුෂ්‍යයන් ඔබ සමඟ තමන්ගේ අශූචි
කන පිණිසත්, තමන්ගේ මුත්‍රා බොන පිණිසත්
ඔවුන් ළඟට නොවේ දැ"යි කී ය.
28 එවිට රබ්-ෂාකේ සිටගෙන ජුදවේ භාෂාවෙන්
මහා ශබ්දයකින් මොරගසා මෙසේ කීවේ ය:
"අසිරියාවේ රජු වන මහා රජතුමාගේ වචන
අසන්න. 29 ඔබ රවටන්න හෙසෙකියාට ඉඩ
නොදෙන්න. මාගේ අතින් ඔබ ගළවන්නට ඔහුට
බැරි ය. 30 සමිඳාණන් වහන්සේ සැබැවින් ම අප
ගළවන සේක කියා ද මේ නුවර අසිරියාවෙහි රජු
අතට අසුවන්නේ නැත කියා ද සමිඳාණන් වහන්සේ
කෙරෙහි ඔබ විශ්වාස කරවන්නටත් ඉඩ නාරින්න.
31 හෙසෙකියාට ඇහුම්කන් නොදෙන්න. කුමක් හෙයින්
ද අසිරියාවේ රජ මෙසේ කියයි: 'මා හා සමඟ
සාමදානයකට පැමිණ මා වෙත එන්න. එවිට මම
අවුත් ඔබේ දේශයට සමාන වන ධාන්‍ය හා මුද්‍රික
පානය ඇති, කෑම ද මිදි වතු ද ඇති, ඔලීව තෙලේ ද
මී පැණි ද ඇති දේශයකට ඔබ ගෙනයන තුරු,
32 ඔබ එකිනෙකොට තම තමාගේ මුද්‍රික වැලෙන් ද
තම තමාගේ අත්තික්කා ගසෙන් ද කන්නටත්, තම
තමාගේ ළිඳේ වතුර බොන්නටත් පුළුවන. මෙසේ
ඔබ නොනැසී ජීවත් වන්නහු ය. සමිඳාණන්
වහන්සේ අප ගළවාගන්න සේක කියා හෙසෙකියා
ඔබ පොළඹවන කල ඔහුට සවන් නොදෙන්න.
33 විජාතීන්ගේ දෙවිවරු තම තමන්ගේ දේශ
අසිරියාවේ රජුගේ අතින් කිසි සේත් ගළවාගත්තෝ
ද? 34 හමාත්හි ද අර්පාද්හි ද දෙවිවරු කොයි ද?
සෙපර්වයිම්හි ද හේනාහි ද ඉව්වාහි ද දෙවිවරු
කොහි ද? ඔව්හු සමාරිය මාගේ අතින්
ගළවාගත්තෝ ද? 35 සමිඳාණන් වහන්සේ ජෙරුසලම
මාගේ අතින් ගළවාගන්න සේක කියා සිතන්නට
පුළුවන් වන ලෙස, දේශවල සියලු දෙවිවරුන්
අතරෙන් තමන්ගේ දේශ මාගේ අතින් ගළවා
ගත්තේ කොයි දෙවිවරු දැ'යි අසන්නේ ය."
36 එහෙත්, සෙනඟ ඔහුට කිසි උත්තරයක් නොදී
නිශ්ශබ්ද ව සිටියෝ ය. මන්ද, "ඔහුට උත්තර දෙන්න
එපා ය"යි රජුගේ ආඥාවක් පනවා තිබිණි. 37 එවිට
රජ ගෙදර ප්‍රධානියන් වන හිල්කියාගේ පුත්
එලියාකිම් නම් ගෘහාධිපතියා ද ෂෙබ්නා ලේකම් ද
වාර්තාකරු වන ආසාප්ගේ පුත් ජෝවා ද දුකින්
තමන්ගේ ඇඳුම් ඉරාගෙන හෙසෙකියා ළඟට අවුත්
රබ්-ෂාකේගේ වචන ඔහුට දැන්වූ හ.

### යෙසායාට කළ අයැදුම

(යෙසා 37:1-7)

19 හෙසෙකියා රජ ඒ අසා දුකින් තම ඇඳුම්
ඉරාගෙන, ගෝණි රෙදි පොරවාගෙන
සමිඳාණන් වහන්සේගේ මාලිගාවට ඇතුළු විය.
2 තවද, ඔහු රජ ගෙදර ප්‍රධානියා වන එලියාකිම්ට
ද ෂෙබ්නා ලේකම්ට ද පූජකයන්ගේ මූලිකයන්ට ද
ගෝණි රෙදි හඳවා ආමොස්ගේ පුත් යෙසායා
දිවැසිවරයා ළඟට යැවී ය. 3 ඔව්හු ඔහුට කතා
කොට, "හෙසෙකියා මෙසේ කියන්නේ ය: 'අද දවස
දුක ද තරවටුව ද අපහාසය ද ඇති දවසකි. මන්ද,
ළදරුවන් බිහි වන්නට ළං ව සිටින නමුත්, ප්‍රසූත
කරන්නට ශක්තිය නැත. 4 ජීවමාන දෙවියන්
වහන්සේට අපහාස කරන්නට අසිරියාවේ රජු එවූ
ඔහුගේ සේවක වන රබ්-ෂාකේගේ සියලු වචන
සමහර විට ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ අසා,
ඒ ඇසූ වචනවලට උන් වහන්සේ දඬුවම් කරන
සේක. එබැවින් තව ම ඉතිරි ව සිටින්නන් උදෙසා
යාච්ඤා ඔප්පු කරන්න' කියා පවසන්නැ"යි කී හ.
5 මෙසේ කියා හෙසෙකියා රජුගේ මෙහෙකරුවෝ
යෙසායා ළඟට පැමිණිය හ. 6 යෙසායා ඔවුන්ට කතා
කොට, "සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
'ඔබට ඇසුණු අසිරියාවේ රජුගේ සේවකයන් විසින්
මට අපහාස කොට කියන ලද වචනවලට බිය
නොවන්න. 7 ඔහු ආරංචියක් අසා තමාගේ දේශයට
හැරී යන ලෙස මම ඔහුගේ සිතට අදහසක් දමා,
ඔහුගේ දේශයේ දී ඔහු කඩුවෙන් මැරී වැටෙන්නට
සලස්වන්නෙමි'යි කියා ඔබේ ස්වාමියාට දන්වන්නැ"යි
කී ය.

### අසිරියන්වරු යළි තර්ජනය කිරීම

(යෙසා 37:8-20)

8 අසිරියාවේ රජු ලාකීෂ්හි සිට පිටත් ව ගිය බව
රබ්-ෂාකේ අසා, ඔහු හැරී ගිය විට, රජු ලිබ්නාට
විරුද්ධ ව යුද්ධ කරන බව දැනගත්තේ ය. 9 "කුෂ්හි
රජු වන තිර්හාකා රජ ඔබට විරුද්ධ ව යුද්ධ
කරන්නට එන්නේ යැ"යි ඔහුට සැළ විය. එවිට ඔහු
හෙසෙකියා ළඟට නැවත දූතයන් එවා, 10 "ඔබ ජුදාහි
රජු වන හෙසෙකියාට මෙසේ කියන්න: අසිරියාවේ
රජු අතට ජෙරුසලම අසු නොවන්නේ ය කියා ඔබ
විශ්වාස කරන ඔබේ දෙවියන් වහන්සේට
නොරැවටෙන්න. 11 මෙන්න, අසිරියාවේ රජවරුන්
සියලු දේශවලට කළ දේ එනම්, ඒවා විනාශ
කරදැමූ බව ඔබ අසා තිබේ. එසේ නම්, ඔබ

ගැළවනු ඇද් ද? 12 මාගේ පියවරුන් නැති කළ
ගෝෂාන් ද හාරාන් ද රෙෂෙපේ ද තලෙස්සාර්හි සිටි
ඒදනේ ජාතිකයන් ද යන ජාතීන්ගේ දේවවරු ඔවුන්
ගළවා ගත්තෝ ද? 13 හමාත්හි රජ ද අර්පාද්හි රජ
ද සෙපර්වයිම් නුවරත්, හේනාහිත්, ඉව්වාහිත් රජ ද
කොතැන දැ”යි ඇසී ය.
14 හසෙකියා පණිවුඩකාරයන් අතින් ලියුම ගෙන
කියවා, සමිඳාණන් වහන්සේගේ මාලිගාවට ගොස්,
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි එය විදහා පා,
15 නික්ම 25:22උන් වහන්සේ ඉදිරියෙහි යාච්ඤා
කරමින්, “කෙරුබ්වරුන් අතර වැඩ වසන
ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ,
පොළොවේ සියලු රාජ්‍යයන් කෙරෙහි ඔබ ම, ඔබ
පමණක් ම, දෙවියන් වහන්සේ ය; ඔබ අහසත්,
පොළොවත් මැවූ සේක. 16 සමිඳාණන් වහන්ස,
ඔබේ කන යොමු කොට ඇසුව මැනව; සමිඳාණන්
වහන්ස, ඔබේ ඇස් ඇර බැලුව මැනව; ජීවමාන
දෙවියන් වහන්සේට අපහාස කරන පිණිස
සනෙකෙරිබ් කියා එවූ වචන ඇසුව මැනව;
17 සමිඳාණන් වහන්ස, අසිරියාවේ රජවරුන් ජාතීන් ද
ඔවුන්ගේ දේශ ද පාළු කොට, 18 ඔවුන්ගේ
දේවවරුන් ගින්නෙහි හෙළුවා සැබෑ ය. මන්ද, ඒවා
දේවවරුන් නොව මනුෂ්‍යයන්ගේ හස්ත කර්මාන්ත
වන ලී සහ ගල් ය. ඒ නිසා ඔව්හු ඒවා විනාශ
කළහ. 19 එබැවින් අපේ දෙවියන් වහන්ස, ඔබ ම,
ඔබ පමණක් ම, ස්වාමීන් වන දෙවියන් වහන්සේ
බව පොළොවේ සියලු රාජ්‍ය දැනගන්න පිණිස
ඔහුගේ අතින් අප ගැළවේව මැනව”යි කී ය.

### යසායා මැදහත්වීම
(යසා 37:21-38)

20 එවිට ආමොස්ගේ පුත් යසායා හසෙකියාට
මෙසේ කියා යැවී ය: “ඉශ්‍රායලේවරුන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
අසිරියාවේ රජු වන සනෙකෙරිබ් ගැන ඔබ මට කළ
යාච්ඤාව මම ඇසීමි. 21 ඔහු ගැන සමිඳාණන්
වහන්සේ කියන පණිවුඩය මේ ය: සියොන් පුරඟන
නුඹ සුළු කොට සලකන්නී ය; නුඹට කවටකම්
කරන්නී ය; ජෙරුසලම්හි දුව හිස වන වනා, නුඹට
උසුළු-විසුළු කරන්නී ය. 22 නුඹ නින්දා කළෙහේත්,
අපහාස කළෙහේත් කවරකුටු ද? නුඹ
මොරගැසුවෙහේත්, නුඹ රවා බැලුවෙහේත් කවරකුටු
විරුද්ධ ව ද? ඉශ්‍රායලේවරුන්ගේ ශුද්ධ තැනැන්
වහන්සේට විරුද්ධ ව ය. 23 නුඹේ දූතයන් ලවා නුඹ
සමිඳාණන් වහන්සේට නින්දා කරවා කතා කොට,
මාගේ රථ සමූහය හා සමඟ මම කඳු මුදුනට
එනම්, ලෙබනොන්හි ඈත ප්‍රදේශවලට නැඟුණෙමි.
එහි උස් වූ කිහිරි ගස් ද අනර්ඝ දේවදාර ගස් ද
කපාදමා, එහි දුරස්තර නිවාසවලටත්, උයනක් වැනි
එහි වනයටත් ඇතුළු වන්නෙමි. 24 මම ළිං හාරා
අන්‍ය දේශවල වතුර බීවෙමි, මම මිසරයේ සියලු
ගංගා පිට ඇවිද ඒවා හින්දවන්නෙමි යි කීවෙහි ය.

25 “මම බොහෝ කාලයක සිට එය අභිප්‍රාය කර
පෙරෙ සිට ම එය නියම කළ බව නුඹ ඇසුවේ නැද්
ද? දැන් නුඹ පවුරු ඇති නගර නාස්ති කොට,
ජරාවාස ගොඩවල් කරන හැටියට එය ඉෂ්ට
කළෙමි. 26 එබැවින් ඒවායේ වැසියෝ බලහීන ව
සිටියහ. ඔව්හු කැළඹී වියවුලට පත් වූ හ. ඔව්හු
කෙතේ තෘණ ද අමු පල ද පියසි උඩ තණ කොළ ද
වැඩෙන්න පළමුවෙන් වියළුණු ගොයම් ද මෙන් වූ හ.
27 “එහෙත්, මම නුඹේ හිඳීම ද නුඹේ යාම ඊම ද
මට විරුද්ධ ව තිබෙන නුඹේ කැරලිකාරකම ද දනිමි.
28 මට විරුද්ධ ව තිබෙන නුඹේ කැරලිකාරකම නිසා
ද නුඹේ අහංකාරය මාගේ කන්වලට පැමිණි නිසා ද
නුඹේ නාසයේ මාගේ වළල්ලත්, නුඹේ කටේ
මාගේ කටකලියාවත් දමා නුඹ ආ මාර්ගයෙන් නුඹ
හරවා යවන්නෙමි.
29 “මෙය නුඹට ලකුණක් වන්නේ ය. එනම්, මේ
අවුරුද්දේ ඉබේ ම හටගන්න ධාන්‍ය සහ දෙ වන
අවුරුද්දේ එයින් හටගන්න ඒවාත් නුඹලා කනු ඇත.
තුන් වන අවුරුද්දේ නුඹලා අස්වැන්න වපුරා
කපාගන්න. මිදි වතුත් වවා ඒවායේ පල කන්න.
30 ජුදා වංශයෙන් ගැළවී ඉතිරි කුඩා පිරිස නැවත
ගසක් මෙන් යටට මුල් ඇද ඉහළින් පල දරනු ඇත.
31 මන්ද, ඉතිරි කුඩා පිරිස ජෙරුසලමෙන් ද මිදුණු
පිරිස සියොන් කන්දෙන් ද නික්මෙනු ඇත. සමිඳාණන්
වහන්සේ මෙය කිරීමට අධිෂ්ඨාන කළ සේක.
32 “එබැවින් සමිඳාණන් වහන්සේ අසිරියාවේ රජු
ගැන මෙසේ කියන සේක: ‘අසිරියාවේ රජ මේ
නගරයට ඇතුළුවන්නේ වත්, ඊගහක් ඊට විදින්නේ
වත්, ඉදිරි පිටට පලිහක් රැගෙන එන්නේ වත්, ඊට
විරුද්ධ ව ගොඩැල්ලක් නඟන්නේ වත්, නැත. 33 ඔහු
මේ නුවර තුළට නෑවිත් තමා ආ මඟින් හැරී
යන්නේ ය. සමිඳාණන් වහන්සේ වන මම මෙසේ
වදාරමි. 34 මක්නිසා ද, මා නිසාත්, මාගේ මෙහෙකෙරු
වූ දාවිත් නිසාත් මේ නුවර ගළවන්න මම එය
රැකගන්නෙමි.’ ”

### අසිරියන්වරුන්ගේ විනාශය

35 ඒ රාත්‍රියේ සමිඳාණන් වහන්සේගේ දූතයා
පිටත් ව ගොස් අසිරියන්වරුන්ගේ කඳවුරෙහි
එක්ලක්ෂ අසූපන්දහසකට පහර දුන්නේ ය. මිනිසුන්
අලුයම නැඟිට බලන විට, ඒ සියල්ලෝ මැරී සිටියහ.
36 එවිට අසිරියාවේ රජු වන සනෙකෙරිබ් පිටත් ව
ගොස් නිනිවෙහි වාසය කළේ ය. 37 තවද, ඔහු
තමාගේ දෙවි නිස්රොක්ගේ ගෘහයෙහි නමස්කාර
කරද්දී ඔහුගේ පුත්‍රයන් වන අද්‍රම්මලෙක් ද
ෂරෙෂෙර් ද ඔහු කඩුවෙන් මරා අරාරාත් දේශයට
පලා ගියහ. ඔහුගේ පුත් ඒසර්-හද්දොන් ඔහු
වෙනුවට රජ විය.

### හසෙකියා රජුගේ රෝගය සහ සුවය
(යසෝ 38:1-8-21-22;2 වංශා 32:24-26)

20 ඒ කාලයේ දී හසෙකියා රෝගී ව
මරණාසන්න විය. ආමොස්ගේ පුත් යසෝයා
දිවැසිවරයා ඔහු ළඟට අවුත්, “නුඹේ කටයුතු
පිළියෙළ කර තබන්න. මන්ද, නුඹ මැරෙන්නෙහි ය.
ජීවත් නොවන්නෙහි ය කියා සමිඳාණන් වහන්සේ
කියන සේකැ”යි ඔහුට කී ය.
2 එවිට ඔහු තමාගේ මුහුණ බිත්තිය දෙසට
හරවාගෙන සමිඳාණන් වහන්සේට යාච්ඤා කරමින්,
3 “අහෝ, සමිඳුනි, මා සැබෑකමිනුත්, සම්පූර්ණ
සිතකිනුත් ඔබ ඉදිරියෙහි හැසිර ඔබේ ඇස් හමුයෙහි
හරි දේ කළ බව සිහි කළ මැනව”යි අතිශයින්
හැඬුවේ ය.
4 යසෝයා මළුව දක්වා යන්නට පළමුවෙනේ
සමිඳාණන් වහන්සේගේ වචනය ඔහු වෙත පැමිණ
කියනුයේ, 5 “නුඹ හැරී ගොස් මාගේ සෙනඟගේ
අධිපතියා වන හසෙකියාට මෙසේ කියන්න: ‘නුඹේ
පියා වූ දාවිත්ගේ දෙවි සමිඳාණන් වහන්සේ මෙසේ
වදාරන සේක: මම නුඹේ යාච්ඤාව ඇසීමි, නුඹේ
කඳුළු දිටිමි. බලන්න, මම නුඹ සුවපත් කරන්නෙමි.
තුන් වන දින නුඹ සමිඳාණන් වහන්සේගේ
මාලිගාවට යන්නෙහි ය. 6 නුඹේ වයසට පහළොස්
අවුරුද්දක් එකතු කරන්නෙමි. මම අසිරියාවේ රජුගේ
අතින් නුඹ සහ මේ නුවර ගළවා මා නිසාත්, මාගේ
මෙහෙකෙරු වූ දාවිත් නිසාත්, මේ නුවර
රැකගන්නෙමි’ කියා කියන්නැ”යි පැවසී ය.
7 එවිට යසෝයා, “අත්තික්කා පැලැස්තරයක්
ගෙනෙන්නේ”යි කී ය. ඔව්හු එය ගෙනවුත් එය වණය
පිට තැබුවෝ ය. එවිට රජ සුවපත් විය. 8 හසෙකියා
යසෝයාට කතා කොට, “සමිඳාණන් වහන්සේ මා
සුවපත් කරන බවටත්, තුන් වන දා මා සමිඳාණන්
වහන්සේගේ මාලිගාවට යන බවටත් ලකුණ
කිමෙක් දැ”යි ඇසී ය.
9 යසෝයා කතා කොට, “සමිඳාණන් වහන්සේ
වදාළ දේ කරන බවට සමිඳාණන් වහන්සේගෙනේ
ඔබට ලැබෙනෙ ලකුණ මේ ය: එනම්, පඩි පෙළේ
ඡායාව අංශක දසයක් ඉස්සරහට යනවාට හෝ
පස්සට හැරී එනවාට හෝ කැමැති දැ”යි ඇසී ය.
10 හසෙකියා ද, “ඡායාව අංශක දසයක් ඉස්සරහට
යන එක සුළු දෙයෙකි, එසේ නොව ඡායාව අංශක
දසයක් පස්සට හැරී ඒ වා”යි කී ය.
11 එවිට දිවැසිවර යසෝයා සමිඳාණන් වහන්සේට
යාච්ඤා කළෙේ ය. උන් වහන්සේ ආහාස්ගේ පඩි
පෙළේ ඡායාව බැස ගිය තැනින් අංශක දසයක්
පස්සට පැමිණවූ සේක.

### තානාපතීන් පැමිණීම
(යසෝ 39:1-8)

12 ඒ කාලයේ දී බලදාන්ගේ පුත් බබිලෝනියේ
රජු වන මෙරොදක්-බලදාන් හසෙකියා රෝගී ව සිටි
බවත්, ඔහු සුවය ලැබූ බවත් අසා ලියුම් ද තෑග්ගක්
ද ඔහු වෙත යැවී ය. 13 හසෙකියා ඔවුන්ට
ඇහුම්කන් දී තමාගේ මුළු සම්පත් ගබඩාව ද එහි
තිබූ රන් රිදී ද සුවඳ ද්‍රව්‍ය ද අනර්ඝ තෙල් ද
තමාගේ මුළු යුද්ධායුධ ගබඩා ද තමාගේ ගබඩාවල
තිබුණු සියල්ල ද ඔවුන්ට පෙන්වී ය. තමාගේ ගෙදර
වත්, මුළු රාජ්‍යයෙහි වත් හසෙකියා ඔවුන්ට
නොපෙන්නූ කිසිවක් නො වී ය. 14 එවිට දිවැසිවර
යසෝයා හසෙකියා රජු ළඟට අවුත්, “ඒ මනුෂ්‍යයෝ
කුමක් කීවෝ ද? ඔව්හු කොතැනින් ඔබ වෙත
ආවෝ දැ”යි ඔහුගෙනේ ඇසී ය.
14 හසෙකියා උත්තර දෙමින්, “ඔව්හු දුර රටක් වන
බබිලෝනියේ සිට ආවෝ ය”යි කී ය.
15 එවිට ඔහු, “ඔව්හු ඔබේ ගෙයි කුමක් දුටුවෝ
දැ”යි ඇසී ය. “මාගේ ගෙයි තිබෙනෙ සියල්ල ඔව්හු
දුටුවෝ ය. මාගේ වස්තු අතරෙහි මා විසින්
නොපෙන්වන ලද කිසිවක් නැතැ”යි හසෙකියා කී ය.
16 එවිට යසෝයා හසෙකියාට කතා කොට,
“සමිඳාණන් වහන්සේගේ වචනය අසන්න: 17 2
රාජා 24:13; 2 වංශා 36:10‘බලන්න, නුඹේ ගෙයි
තිබෙනෙ සියල්ලත්, නුඹේ පියවරුන් අද දක්වා රුස්
කර තිබූ දේවලුත් කිසිවක් ඉතිරි නොකොට
බබිලෝනියට ගෙනෙ යන දවස් පැමිණෙන්නේ ය.
18 2 රාජා 24:14-15; දානි 1:1-7නුඹ තුළින් නික්මෙනෙ
නුඹට දාව උපදින නුඹේ පුත්‍රයන්ගෙනේ සමහරෙකේ
බබිලෝනියේ රජුගේ මාලිගාවෙහි නපුංසකයන් වන
පිණිස ගනු ලබන්නෝ ය’ කියා සමිඳාණන් වහන්සේ
වදාරන සේකැ”යි කීවේ ය.
19 එවිට හසෙකියා, “ඔබ කී සමිඳාණන්ගේ වචනය
යහපත් ය”යි යසෝයාට කී ය. තවද, ඔහු
“සාමදානයත්, ආරක්ෂාවත් මාගේ ජීවිත කාලයේ දී
ඇත්නම් හොඳ නොවේ දැ”යි යසෝයාට කී ය.

### හසෙකියා රජුගේ අවසානය
(2 වංශා 32:32-33)

20 හසෙකියාගේ අනෙකේ ක්‍රියා ද ඔහුගේ සියලු
බලවන්තකම් ද ඔහු පොකුණ සහ ජල කාණුවත්
සාදා නුවරට වතුර ගෙනො හැටි ද ජුදාහි රජුන්ගේ
පුරාවෘත්ත ග්‍රන්ථයේ වාර්තා කර තිබෙනූ නොවේ
ද? 21 හසෙකියා මියගියේ ය. ඔහුගේ පුත් මනස්සේ
ඔහු වෙනුවට රජ විය.

### මනස්සේගේ රාජ්‍ය පාලනය
(2 වංශා 33:1-20)

21 මනස්සේ දොළොස් අවුරුදු වයසේ දී රජ වී
පණස්පස් අවුරුද්දක් ජෙරුසලමෙහි රජකම්
කළෙේ ය. ඔහුගේ මවුගේ නම හෙප්සිබා ය.
2 ජෙරෙ 15:4සමිඳාණන් වහන්සේ ඉශ්‍රායලේ ජනයා
ඉදිරියෙනේ පන්නා දැමූ විජාතීන්ගේ පිළිකුල් ක්‍රියා
ලෙසෙ ඔහු සමිඳාණන් වහන්සේගේ ඇස් හමුයෙහි
නපුරු දේ කළෙේ ය. 3 තමාගේ පිය වූ හසෙකියා
නැති කළ ගිරිකුළු දේවාල ඔහු නැවත ගොඩනඟා,
බාල් දෙවියාට පූජාසන තනා, ඉශ්‍රායලේහි රජ වූ
ආහාබ් සෑදූ පරිදි අෂේරා කප් කණු ද සෑදුවේ ය.

ඔහු ආකාශ වස්තූන් සියල්ලට නමස්කාර කරමින්
ඒවාට සේවය කළේ ය. 4 2 සාමු 7:13තවද,
‘මාගේ නාමය ජෙරුසලමෙහි තබන්නෙමි’යි
සමිඳාණන් වහන්සේ යම් මාලිගාවක් ගැන වදාළ
සේක් ද ඒ මාලිගාවෙහි ඔහු පූජාසන ගොඩනැඟුවේ
ය. 5 සමිඳාණන් වහන්සේගේ මාලිගාවෙහි මළු
දෙකෙහි මුළු ආකාශ වස්තූන්ටත් පූජාසන
ගොඩනැඟුවේ ය. 6 ඔහු තමාගේ පුත්‍රයා ගිනි
මැදින් යවා පූජා කළේ ය. මායම් හා ශාස්ත්‍ර
බැලීම් ද භාවිතා කරමින් ආත්මබන්ධනකාරයන් ද
අනවිනකාරයන් ද පත් කළේ ය. ඔහු සමිඳාණන්
වහන්සේ කෝප කරවන හැටියට උන් වහන්සේගේ
ඇස් හමුයෙහි බොහෝ නපුරු දේ කළේ ය. 7 1
රාජා 9:3-5; 2 වංශා 7:12-18තමා සෑදූ අෂේරා කප්
කණු හා රූප ඔහු සමිඳාණන් වහන්සේගේ
මාලිගාවෙහි තැබී ය. ඒ මාලිගාව ගැන සමිඳාණන්
වහන්සේ දාවිත්ටත්, ඔහුගේ පුත් සලමොන්ටත්
කතා කොට, “මේ මාලිගාවෙහි ද මා විසින් සියලු
ඉශ්රායලේ ගෝත්‍රවලින් තෝරාගනු ලැබූ
ජෙරුසලමේ ද මාගේ නාමය සදහට ම තබන්නෙමි.
8 මා විසින් ඉශ්රායලේවරුන්ට අණ කරන ලද සියල්ල
ප්‍රකාරයට ද මාගේ සේවක මෝසෙස් ඔවුන්ට අණ
කළ මුළු ව්‍යවස්ථාවේ ප්‍රකාරයට ද කරන්නට ඔවුන්
බලාගත්තොත්, ඔවුන්ගේ පියවරුන්ට මා විසින් දෙන
ලද දේශයෙන් ඔවුන්ගේ පාද තවත් මුළා ව යන්නට
නොසලස්වන්නෙමි”යි වදාළ සේක. 9 එහෙත්, ඔව්හු
ඇහුම්කන් නුදුන්නෝ ය. සමිඳාණන් වහන්සේ
ඉශ්රායලේ ජනයා ඉදිරියෙන් විනාශ කළා වූ
විජාතීන්ට වඩා නපුරුකම් කරන ලෙස මනස්සේ
ඔවුන් මුළා කළේ ය.
10 සමිඳාණන් වහන්සේ තමන් මෙහෙකරු වන
දිවැසිවරුන් ලවා කතා කරවා, 11 “ජුදාහි රජ වන
මනස්සේ මේ පිළිකුල්කම් කරමින්, ඔහුට පළමුවෙනි
සිටි අමෝරිවරුන් කළ සියල්ලට වඩා නපුරුකම්
කොට ජුදාවරුන් ද තමාගේ දේව රූපවලින් පාපයට
පෙළඹවූ නිසා, 12 ඉශ්රායලේවරුන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
‘බලන්න, අසන සියල්ලන්ගේ කන් දෙක රත් වන
තරම් මම ජෙරුසලම සහ ජුදාවරුන් පිට විපත්ති
පමුණුවන්නෙමි. 13 තවද, සමාරිය මැන්න ලණුව ද
ආහාබ්ගේ වංශයේ ලඹකැටය ද ජෙරුසලම් නුවර
පිට අල්ලා, මනුෂ්‍යයකු තැටියක් පිසදමා, පිසදැමූ
පසු එය මුණින් පෙරළා තබන පරිදි ජෙරුසලම
පිසදමා, 14 මම මාගේ උරුමයෙන් ඉතිරි කුඩා පිරිස
අත්හැරදමා ඔවුන් තමන්ගේ සියලු සතුරන්ට
ගොදුරක් ද කොල්ලයක් ද වන පිණිස ඔවුන්ගේ
සතුරන් අතට පාවා දෙන්නෙමි. 15 මන්ද, ඔවුන්ගේ
පියවරුන් මිසරයෙන් පිටත් ව ආ දවස පටන් අද
දවස දක්වා ම ඔව්හු මාගේ ඇස් හමුයෙහි නපුරු
දේ කොට මා කෝප කළෝ ය’ කියා වදාරන
සේකැ”යි කියවූ සේක.
16 තවද, සමිඳාණන් වහන්සේගේ ඇස් හමුයෙහි
නපුරු දේ කරන ලෙස, එසේ, ජුදා ගෝත්‍රය පාපයට
පෙළඹවීමෙන් ඔහු විසින් කරන ලද පාපය හැර, ඔහු
ජෙරුසලමෙහි එක් කෙළවරක පටන් අනික් කෙළවර
දක්වා පිරෙන තෙක් නිදොස් ලේ බොහෝ කොට
වැගිරවී ය. 17 මනස්සේගේ අනෙක් ක්‍රියා ද ඔහු
කළ සියල්ල ද ඔහු කළ පාපය ද ගැන ජුදා රජුන්ගේ
පුරාවෘත්ත ග්‍රන්ථයේ වාර්තා කර තිබෙනු නොවේ
ද? 18 මනස්සේ මියගිය පසු තමාගේ ගෙට අයිති
උයන වන උස්සාගේ උයනෙහි තැන්පත් කරනු
ලැබුවේ ය. ඔහුගේ පුත් ආමොන් ඔහු වෙනුවට රජ
විය.

## ආමොන්ගේ රාජ්‍ය කාලය

(2 වංශා 33:21-25)

19 ආමොන් විසි අවුරුදු වයසේ දී රජ වී දෑවුරුද්දක්
ජෙරුසලමෙහි රජකම් කළේ ය. ඔහුගේ මවගේ
නම මෙෂුල්ලෙමෙත් ය. ඈ ජොත්බාහි හාරුස්ගේ
දුවකි. 20 ආමොන් තමාගේ පියා වූ මනස්සේ කළ
ලෙස සමිඳාණන් වහන්සේගේ ඇස් හමුයෙහි නපුරු
දේ කොට, 21 තම පියාගේ අඩි පාරේ යමින්,
තමාගේ පියා වැඳුම්පිදුම් කළ දේව රූපවලට
වැඳුම්පිදුම් කරමින් ඒවාට නමස්කාර කළේ ය.
22 ඔහු සමිඳාණන් වහන්සේගේ මාර්ගයෙහි
නොහැසිර තමාගේ පියවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේ අත් හැරියේ ය.
23 ආමොන් රජුගේ සේවකයෝ ඔහුට විරුද්ධ ව
කුමන්ත්‍රණය කොට ඔහුගේ ගෙදර දී ඔහු මැරූ හ.
24 එහෙත්, දේශයේ සෙනඟ, ආමොන් රජුට විරුද්ධ
ව කුමන්ත්‍රණය කළ සියල්ලන් මරා ඔහුගේ පුත්
ජොෂියා ඔහු වෙනුවට රජකමට පත් කළහ.
25 ආමොන් කළ අනෙක් ක්‍රියා ජුදා රජුන්ගේ
පුරාවෘත්ත ග්‍රන්ථයේ වාර්තා කර තිබෙනු නොවේ
ද? 26 උස්සාගේ උයනේ තිබූ ඔහුගේ පියාගේ
සොහොන්ගෙයි ඔහු තැන්පත් කරනු ලැබුවේ ය.
ඔහුගේ පුත් ජොෂියා ඔහු වෙනුවට රජ විය.

## ජොෂියාගේ රාජ්‍ය කාලය

(2 වංශා 34:1-2)

22 ජෙරෙ 3:6 ජොෂියා අට අවුරුදු වයසේ දී රජ
වී තිස්එක් අවුරුද්දක් ජෙරුසලමෙහි රජකම්
කළේ ය. ඔහුගේ මවුගේ නම ජෙදීදා ය. ඈ
බොස්කාත්හි අදායාගේ දුවකි. 2 ජොෂියා සමිඳාණන්
වහන්සේගේ ඇස් හමුයෙහි හරි දේ කොට, ආඥා
අකුරට ම පිළිපැද තම පිය වූ දාවිත්ගේ මුළු
මාර්ගයෙහි ගමන් කළේ ය.

## ව්‍යවස්ථා ග්‍රන්ථය සොයාගැනීම

(2 වංශා 34:8-28)

3 ජොෂියා රජ තමාගේ දහඅට වන අවුරුද්දේ දී
මෙෂුල්ලාම්ගේ පුත්‍රයා වන අශලියාගේ පුත් ෂාපාන්
ලේකම් සමිඳාණන් වහන්සේගේ මාලිගාවට යවමින්
කතා කොට, 4 “ඔබ නායක පූජකයා වන හිල්කියා
වෙත ගොස්, සමිඳාණන් වහන්සේගේ මාලිගාවට
ගෙනෙන ලද, දොරටු පාලකයන් සෙනඟගෙන් එකතු
කරගත් මුදල් භාර දෙන ලෙස ඔහුට දන්වන්න.

5 ඒවා සමිඳාණන් වහන්සේගේ මාලිගාවෙහි වැඩ
කරවීමට පත් ව සිටින තැනැත්තන් අතට දිය යුතු ය.
ඔව්හු ද සමිඳාණන් වහන්සේගේ මාලිගාවෙහි
කැඩුම්-බිඳුම් ප්‍රතිසංස්කරණය කිරීමට
කර්මාන්තකාරයන් වන 6 වඩුවන්ටත්,
ගංඩනඟන්නන්ටත්, පදෙරේරුවන්ටත් මාලිගාව
අලුත්වැඩියා කිරීමට ලී සහ කැපූ ගල් ද මිලයට
ගැනීම පිණිස ඒවා දිය යුතු ය”යි කී හ. 7 2 රාජා
12:15එසේ වී නමුත්, ඔවුන් විශ්වාස ලෙස කටයුතු
කළ බැවින් ඔවුන් අතට දුන් මුදල ගැන ඔවුන්ගෙන්
අය වැය වාර්තාවක් නොගන්න ලදී.
8 නායක පූජක වන හිල්කියා ලේකම් වන
ෂාපාන්ට කතා කොට, “ව්‍යවස්ථා පොත සමිඳාණන්
වහන්සේගේ මාලිගාවෙහි මට සම්බ විය” කියා
පොත ෂාපාන්ට දුන්නේ ය; ඔහු එය කියවී ය.
9 ලේකම් වන ෂාපාන් තමෙ රජු ළඟට හැරී අවුත්,
“මාලිගාවෙහි තිබූ මුදල් ඔබේ සේවකයෝ රැගෙන
සමිඳාණන් වහන්සේගේ මාලිගාවෙහි වැඩ කරවීමට
පත් ව සිටින්නන් අතට දුන්නෝ ය”යි රජුට කී ය.
10 ලේකම් වන ෂාපාන් කතා කොට, “පූජක වන
හිල්කියා පොතක් මට දුන්නේ ය”යි රජුට දන්වා එය
රජු ඉදිරියෙහි කියවී ය.
11 රජු ඒ ව්‍යවස්ථා පොතේ වචන ඇසූ කල පුදුම
වී, තමාගේ ඇඳුම් ඉරාගෙන, 12 පූජක හිල්කියාටත්,
ෂාපාන්ගේ පුත් අහිකාම්ටත්, මීකායාගේ පුත්
අක්බෝර්ටත්, ලේකම් වන ෂාපාන්ටත්, රජුගේ
සේවකයා වන අසායාටත් අණ කොට, 13 “ඔබ
ගොස් මේ සම්බ වූ පොතේ වචන මා උදෙසාත්,
සෙනඟ උදෙසාත්, සියලු ජුදාවරුන් උදෙසාත්
සමිඳාණන් වහන්සේගෙන් විචාරන්න. මන්ද, අප
ගැන ලියා තිබෙන සියල්ලේ ප්‍රකාරයට කරන ලෙස
අපේ පියවරුන් මේ පොතේ වචනවලට ඇහුම්කන්
නුදුන් නිසා අප කෙරෙහි ඇවිළ තිබෙන සමිඳාණන්
වහන්සේගේ උදහස ඉමහත් ය”යි කී ය.

## දිවැසිවරියකගෙන් විමසීම

14 එවිට පූජක හිල්කියා ද අහිකාම් ද අක්බෝර් ද
ෂාපාන් ද අසායා ද හර්හස්ගේ පුත්‍රයා වන
තික්වාගේ පුත් වස්ත්‍ර භාරකාරයා වන ෂල්ලුම්ගේ
භාර්යාව වන හුල්දා නම් දිවැසිවරිය ළඟට ගොස්
ඈට කතා කළෝ ය. ඈ ජෙරුසලමේ තම නගරයෙහි
වාසය කළා ය. 15 ඈ ඔවුන් අමතා, “ඉශ්‍රායලේහි
දෙවි සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
‘ඔබ මා වෙත එවූ මනුෂ්‍යයාට සමිඳාණන් වහන්සේ
මෙසේ වදාරන සේකැ යි කියන්න. 16 මම මේ
ස්ථානය පිටත්, මෙහි වැසියන් පිටත් ජුදාහි රජු
විසින් කියවුණු පොතේ සියලු වචනවල හැටියට
විපත් පමුණුවන්නෙමි. 17 ඔවුන් මා අත්හැර ඔවුන්
කළ සියලු ක්‍රියාවලින් මා කෝප කරවන ලෙස
වෙනෙ දෙවිවරුන්ට සුවඳ දුම් ඔප්පු කළ බැවින්,
මාගේ උදහස මේ ස්ථානයට විරුද්ධ ව ඇවිළෙන්නේ
ය. එය නිවෙන්නේ නැත. 18 එහෙත්, සමිඳාණන්
වහන්සේගෙන් විචාරන පිණිස නුඹලා එවූ ජුදාහි
රජුට මෙසේ කියන්න, නුඹ ඇසූ වචන ගැන
ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ
මෙසේ වදාරන සේක: 19 මේ ස්ථානය පාළු වී ඊට
සාප වේ වා! කියා මා මේ ස්ථානයටත්, මෙහි
වැසියන්ටත් විරුද්ධ ව කියා තිබෙන කාරණා නුඹ
ඇසූ විට නුඹේ සිත මෘදු වී, නුඹ සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි යටහත් වී, දුකින් නුඹේ ඇඳුම්
ඉරාගෙන මා ඉදිරියෙහි හැඬූ නිසා, මමත් නුඹට
ඇහුම්කන් දුන්නෙමි. 20 එබැවින් නුඹේ පියවරුන්
ළඟට නුඹ පමුණුවන්නෙමි. මා විසින් මේ ස්ථානයට
පමුණුවනු ලබන සියලු ම විපත්ති නුඹේ ඇස්වලින්
නොදැක, නුඹේ සොහොනට නුඹ සාමදානයෙන්
පැමිණෙන්නෙහි ය’යි කියා වදාරන සේකැ”යි කීවා ය.
ඔව්හු හැරී අවුත් රජුට එය සැළ කළෝ ය.

## ගිවිසුම ප්‍රතිස්ථාපනය කිරීම

(2 වංශා 34:3-7-29-33)

23 එවිට රජ තමෙ ජුදාහි ද ජෙරුසලමෙහි ද
සියලු ප්‍රජා මූලිකයන් තමා ළඟට රැස්
කරවාගෙන, 2 ජුදාහි සියලු වැසියන් ද ජෙරුසලමේ
සියලු වැසියන් ද පූජකයන් ද දිවැසිවරයන් ද ලොකු
කුඩා සියලු සෙනඟ ද සමඟ සමිඳාණන්
වහන්සේගේ මාලිගාවට ගොස් උන් වහන්සේගේ
මාලිගාවෙහි සම්බ වූ ගිවිසුම් පොතේ සියලු වචන
ඔවුන් අසාගෙන සිටිද්දී කියවී ය. 3 තවද, රජ කුළුණ
ළඟ සිට, ඒ පොතේ ලියා තිබූ ඒ ගිවිසුමේ වචන
ඉෂ්ට කරන පිණිස සමිඳාණන් වහන්සේ අනුව යන
ලෙසත්, උන් වහන්සේගේ ආඥා ද ශික්ෂා ද පණත්
ද මුළු හෘදයෙන් හා මුළු සිතින් පිළිපදින ලෙසත් උන්
වහන්සේ ඉදිරියෙහි ගිවිසුමක් කරගත්තේ ය. මුළු
සෙනඟ ද ගිවිසුමට එකඟ වූ හ.

## ජුදාහි නවෝදය

4 2 රාජා 21:3; 2 වංශා 33:3 එවිට බාල් දෙවියාත්,
අෂේරා දේවතාවියත්, ආකාශ වස්තූන් සියල්ලත්
නමදින පිණිස සාදා තිබුණ සියලු භාජන සමිඳාණන්
වහන්සේගේ මාලිගාවෙන් පිටතට ගෙනෙ යන පිණිස
නායක පූජක හිල්කියාටත්, දෙ වන පංතියේ
පූජකයන්ටත්, දොරටු පාලකයන්ටත් රජ අණ කළේ
ය. ඔහු ජෙරුසලමෙන් පිටත කිද්‍රොන් මිටියාවතේ
ඒවා පුළුස්සාදමා, ඒවායේ අළු බෙතෙලේ නගරයට
ගෙනොවේ ය. 5 ජුදාහි නගරවල ද ජෙරුසලම වටකර
ද තිබූ කඳු මත පූජාස්ථානවල සුවඳ දුම් ඔප්පු කරන
පිණිස ජුදාහි රජුන් විසින් පත් කරන ලද කපුවන් ද
බාල්ට සහ ඉර සඳටත්, ග්‍රහ තාරකාවලට සහ
ආකාශ වස්තූන් සියල්ලටත් සුවඳ දුම් ඔප්පු කළ
කපුවන් ද ඔහු පහකළේ ය. 6 ඔහු අෂේරා කප්
කණුව සමිඳාණන් වහන්සේගේ මාලිගාවෙන් ඉවත්
කොට ජෙරුසලමෙන් පිට කිද්‍රොන් ඔයට ගෙනෙ
ගොස්, කිද්‍රොන් ඔය ළඟ පුළුස්සාදමා කුඩු කර, ඒ
කුඩු පොදු සෙනෙගගේ සොහොන් බිමෙහි විසුරුවා
දැමී ය. 7 සමිඳාණන් වහන්සේගේ මාලිගාව ළඟ

තිබූ අෂේරා කප් කණුවලට තිර වියූ ස්ත්‍රීන් විසූ
සල්ලාලයන්ගේ ගවෙලුත් ඔහු බිඳ දැමී ය.
8 තවද, ඔහු ජුදාහි නගරවලින් සියලු පූජකයන්
කැඳවාගෙන, ගබා පටන් බයෙර්-ෂබා දක්වා
පූජකයන් විසින් සුවඳ දුම් ඔප්පු කරන ලද කඳු මත
පූජාස්ථාන දූෂ්‍ය කළේ ය. දොරටු ළඟ තිබූ කඳු
මත පූජාස්ථාන ද නුවර අධිපතියා වූ ජෝෂුවාගේ
දොරටුව වන නුවර දොරටුවට වම් පැත්තෙහි තිබුණ
කඳු මත පූජාස්ථාන ද කඩා දැමී ය. 9 එසේ වී
නමුත්, කඳු මත පූජාස්ථානවල පූජකයෝ තමන්ගේ
සහෝදරයන් සමඟ මුහුන් නොදැමූ රොටි කෑ හ.
එහෙත්, ඔව්හු ජෙරුසලමෙහි සමිඳාණන්
වහන්සේගේ පූජාසනය ළඟට නාවෝ ය.
10 ලෙවී 18:21; ජෙරෙ 7:31; 19:1-6; 32:35 කිසිවෙකු
තමාගේ පුත්‍රයකු වත්, දුවක වත් මොලෙක්
දෙවියාට ගින්නෙන් කැප නොකරන පිණිස ඔහු
හින්නොම් පුත්‍රයන්ගේ මිටියාවතෙහි තිබුණ
තොපෙත් නම් ගිනි උදුන දූෂ්‍ය කළේ ය. 11 ජුදාහි
රජුන් හිරු දෙවියාට කැප කළ අශ්වයන් ඔහු
සමිඳාණන් වහන්සේගේ මාලිගාවට ඇතුළු වන
තැනින් ඉවත් කළේ ය. ඒවා උප නගරයෙහි සිටි
ඇමතියා වන නාතාන්-මලෙකේගේ කාමරය අසල
මළුවේ තබා තිබුණි. ඔහු හිරු දෙවියාගේ රථය ද
ගින්නෙන් පුළුස්සා දැමී ය. 12 2 රාජා 21:5; 2 වංශා
33:5ඔහු ආහාස්ගේ උඩුමහලේ පියස්ස උඩ තිබූ
ජුදාහි රජවරුන් සෑදූ පූජාසන ද සමිඳාණන්
වහන්සේගේ මිදුල් දෙකෙහි මනස්සේ විසින් සාදන
ලද පූජාසනය ද කඩා, එතනින් හළාදමා ඒවායේ
කුඩු කිද්‍රොන් ඔයට විසි කළේ ය. 13 1 රාජා
11:7තවද, රජ තමෙ ජෙරුසලම ඉදිරිපිට ඔලීව
කන්දට දකුණෙන් තිබූ සීදොන්වරුන්ගේ පිළිකුල වූ
අෂ්ටාරොත්ටත්, මෝවබ්වරුන්ගේ පිළිකුල වූ
කමොෂ්ටත්, අම්මොන්වරුන්ගේ පිළිකුල වූ
මිල්කොම්ටත් ඉශ්රායලේ රජ වූ සලමොන් විසින්
ගොඩනැඟුණු ගිරිකුළු දේවාල දූෂ්‍ය කළේ ය.
14 ඔහු රූප හා කුළුණු බිඳ, අෂේරා කප් කණු
කපාදමා, ඒවා තිබූ තැන් මිනීඇටවලින් පිරවේවේ ය.
15 1 රාජා 12:33 තවද, බෙතෙල්හි තිබූ පූජාසනය ද
ඉශ්රායලේවරුන් පාපයට පළෙඹවූ නබොත්ගේ පුත්
ජෙරොබෝවම් සෑදූ ගිරිකුළු දේවාල ද වන එහි
පූජාසනයත්, ගිරි මුදුනත් ඔහු කඩාදමා, ඒ දේවාලය
පුළුස්සාදමා කුඩු කර, අෂේරා කප් කණුව ද
පුළුස්සාදැමී ය. 16 1 රාජා 13:2ජෝෂියා එහි කන්දේ
තිබූ සොහොන් ගවෙල් දැක, මේ කාරණා
ප්‍රකාශකළ සමිඳාණන් වහන්සේගේ වචනය
ප්‍රකාර ඒවා පූජාසනය පිට පුළුස්සා එය දූෂ්‍ය
කළේ ය. 17 1 රාජා 13:30-32තවද, ඔහු කතා
කොට, "මට පනෙනෙ අර සොහොන් කොත, කුමක්
දැ"යි ඇසී ය.
17 නගර වාසීහු උත්තර දමේන්, "එය ජුදා සිට
අවුත් බෙතෙල්හි පූජාසනයට විරුද්ධ ව ඔබ කළ මේ
දේවල් කලින් ප්‍රකාශ කළ දෙවියන් වහන්සේට
කැප වූ මනුෂ්‍යයාගේ සොහොන් කොත ය"යි කී හ.
18 රජ ද කතා කරමින්, "සොහොනට කිසිවක්
නොකරන්න. කිසිවකේ ඔහුගේ ඇටකටුවලට අත
නොගසන්නැ"යි කී ය.
18 මසෙේ ඔව්හු ඔහුගේ ඇටකටු ද සමාරියෙනේ
පැමිණි දිවැසිවරයාගේ ඇටකටු ද එලසෙ ම
තිබනේනට හැරියෝ ය.
19 සමාරියේ නගරවල තිබූ සමිඳාණන් වහන්සේ
කෝප කරවන ලසෙ ඉශ්රායලේ රජුන් විසින් සාදන
ලද ගිරිකුළු දේවාල ජෝෂියා පහකොට, බෙතෙල්හි
දී කළ සියලු ක්‍රියා ප්‍රකාර ඒවාටත් කළේ ය.
20 එහි සිටි ගිරිකුළු දේවාලවල සියලු පූජකයන් ද
පූජාසන පිට මරා, ඒවා පිට මිනීඇට පුළුස්සා ඔහු
ජෙරුසලමට හැරී ආවේ ය.

## පාස්කු මංගල්‍යය පැවැත්වීම

(2 වංශා 35:1-19)

21 තවද, ජෝෂියා රජ කතා කොට, "මේ ගිවිසුම්
පොතේ ලියා තිබනෙ ප්‍රකාර ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේට පාස්කුව පවත්වන්නැ"යි මුළු සනෙඟට
අණ කළේ ය. 22 ඉශ්රායලේවරුන් පාලනය කළ වීර
පුරුෂයන්ගේ දවස්වල පටන් ඉශ්රායලේ රජුන්ගේ ද
ජුදා රජුන්ගේ ද මුළු කාලයෙහි සැබැවින් ම එබඳු
පාස්කුවක් නොපවත්වන ලදී. 23 ඒ පාස්කුව
සමිඳාණන් වහන්සේ උදසො ජෙරුසලමේ පවත්වන
ලද්දේ ජෝෂියා රජුගේ දහඅට වන අවුරුද්දේ දී ය.
24 තවද, සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ දී
පූජක වන හිල්කියාට සම්බ වූ පොතේ ලියා තිබුණු
ව්‍යවස්ථාවේ වචන ඉෂ්ට කරන පිණිස ජෝෂියා
ආත්මබන්ධනකාරයන් ද අනාවිනකාරයන් ද දේවතා
රූප ද පිළිම ද ජුදා දේශයෙහිත්, ජෙරුසලමෙහිත්
දක්නා ලද අනකේ සියලු පිළිකුල් දේවල් ද
පහකරදැමී ය. 25 මෝසසේගේ මුළු ව්‍යවස්ථාව
ලසෙ තමාගේ මුළු හෘදයනේ ද තමාගේ මුළු සිතින්
ද තමාගේ මුළු වීර්යයනේ ද සමිඳාණන් වහන්සේ
වතෙ හැරුණු ඔහු හා සමාන රජකේ ඔහුට
පළමුවනේ වත්, ඔහුට පසු ව වත් නොසිටියේ ය.
26 එසේ වී නමුත්, මනස්සේ විසින් සමිඳාණන්
වහන්සේ කෝප කරවන ලද සියලු කාරණා නිසා
ජුදාට විරුද්ධ ව ඇවිළී තිබූ උන් වහන්සේගේ
ඉමහත් උදහසේ බලවත්කම උන් වහන්සේ පහකර
නොගත් සේක. 27 සමිඳාණන් වහන්සේ කතා
කොට, "මා ඉශ්රායලේ පහකරදැමූ ලසෙ ජුදාත්
මාගේ ඇස් හමුයනේ පහ කරදමා, මා තෝරාගත්
මේ නුවර වන ජෙරුසලම ද මාගේ නාමය එහි
පවතින්නේ යයි මා කී මාලිගාව ද
අත්හැරදමන්නමේ"යි වදාළ සේක.

## ජෝෂියා රජුගේ මරණය

(2 වංශා 35:20;36:1)

28 ජෝෂියාගේ අනකේ ක්‍රියා ද ඔහු කළ සියල්ල
ද ජුදා රජුන්ගේ පුරාවෘත්ත ග්‍රන්ථයේ වාර්තා කර
තිබනෙු නොවේ ද? 29 ඔහුගේ දවස්වල දී මිසරයේ
රජ වූ පාරාවෝ - නකෙෝ අසිරියාවේ රජුගේ

සහායට යුප්‍රටීස් ගංගාව ළඟට ගියේ ය. එවිට
ජොෂියා රජ ඔහුට විරුද්ධ ව සටනට ගියේ ය.
මිසරයේ රජ ද මගිද්දෝහි දී ජොෂියා දුටු විට ඔහු
මැරී ය. 30 ඔහුගේ සේවකයෝ මළාවූ ජොෂියා රජ
රථයකින් මගිද්දෝ සිට ජෙරුසලමට ගෙනවුත්
ඔහුගේ ම සොහොනේගයි ඔහු තැන්පත් කළෝ ය.
එවිට දේශයේ සෙනඟ ජොෂියාගේ පුත්
ජෙහෝවාහාස් කැඳවාගෙන අභිෂේක කොට
ඔහුගේ පියා වෙනුවට ඔහු රජකමට පත් කළහ.

### ජෙහෝවාහාස්ගේ රාජ්‍ය කාලය
(2 වංශා 36:2-4)

31 ජෙහෝවාහාස් විසිතුන් හැවිරිදි වයසේ දී රජ
වී, තුන් මසක් ජෙරුසලමහි රජකම් කළේ ය.
ඔහුගේ මවුගේ නම හමුතල් ය. ඈ ලිබ්නාහි
ජෙරමියාගේ දුවකි. 32 ඔහුගේ පියවරුන් කළ
සියල්ල ලෙස ඔහු සමිඳාණන් වහන්සේගේ ඇස්
හමුයෙහි නපුරු දේ කළේ ය. 33 එවිට ඔහු
ජෙරුසලමහි රජකම් නොකරන පිණිස පාරාවෝ-
නෙකෝ හමාත් දේශයේ රිබ්ලාහි දී ඔහු සිර
අඩස්සි කොට, රිදී කිලෝග්‍රෑම් තුන්දාස්
හාරසියයකුත්, රන් කිලෝග්‍රෑම් තිස්හතරකුත්
දේශයට දඩ ගැසී ය. 34 ජෙරෙ 22:11-12තවද,
පාරාවෝ-නෙකෝ තමේ ජොෂියා රජුගේ පුත්
එලියාකිම් ඔහුගේ පිය වූ ජොෂියා වෙනුවට
රජකමට පත් කොට, ඔහුගේ නාමය ජෙහෝයාකිම්
ය කියා වෙනස් කළේ ය. එහෙත්, ඔහු
ජෙහෝවාහාස් රැගෙන මිසරයට ගියේ ය. එහි දී
ඔහු මළේ ය.

### ජෙහෝයාකිම්ගේ රාජ්‍ය පාලනය
(2 වංශා 36:5-8)

35 ජෙහෝයාකිම් ඒ රිදී ද රන් ද පාරාවෝට
දුන්නේ ය. එහෙත්, පාරාවෝගේ නීතිය ප්‍රකාර ඒ
මුදල් දෙන පිණිස ඔහු දේශයට ගණන නියම
කොට, පාරාවෝ-නෙකෝට දීමට එකිනෙකොට නියම
කළ හැටියට ඒ රිදී ද රන් ද දේශයේ සෙනඟගෙනේ
අය කළේ ය.
36 ජෙරෙ 22:18-19; 26:1-6; 35:1-19 ජෙහෝයාකිම්
විසිපස් අවුරුදු වයසේ දී රජ වී එකොළොස්
අවුරුද්දක් ජෙරුසලමහි රජකම් කළේ ය. ඔහුගේ
මවගේ නම ශෙබීදා ය. ඈ රුමාහි පදායාගේ දුවකි.
37 ඔහු තමාගේ පියවරුන් කළ සියල්ල ලෙස
සමිඳාණන් වහන්සේගේ ඇස් හමුයෙහි නපුරු දේ
කළේ ය.

24 ජෙරෙ 25:1-38; දානි 1:1-2 ඔහුගේ දවස්වල දී
බබීලෝනියේ රජ වූ නබෙකද්නෙශර් පැමිණ,
ජුදා දේශය ආක්‍රමණය කළ පසු, ජෙහෝයාකිම්
තුන් අවුරුද්දක් ඔහුට සේවය කොට පසු ව ඔහුට
විරුද්ධ ව කැරලි ගැසී ය. 2 සමිඳාණන් වහන්සේ
කල්දිවරුන්ගේ හමුදාවන් ද සිරියන්වරුන්ගේ
හමුදාවන් ද මෝවබ්වරුන්ගේ හමුදාවන් ද
අම්මොන්වරුන්ගේ හමුදාවන් ද ඔහුට විරුද්ධ ව එවූ
සේක. තමන්ගේ මෙහෙකරු වූ දිවැසිවරුන් ලවා
සමිඳාණන් වහන්සේ කියවූ වචනයේ හැටියට ජුදා
නැති කරන පිණිස ඊට විරුද්ධ ව උන් වහන්සේ
ඔවුන් එවූ සේක. 3 ජුදාවරුන් තමන්ගේ ඇස්
හමුයෙන් පහකරන පිණිස සමිඳාණන් වහන්සේගේ
ආඥාවෙන් මයෙ ඔවුන් පිට පැමිණියේ ය. මයෙ සිදු
වූයේ, මනස්සේගේ පාප වන ඔහු කළ සියල්ල
නිසාත්, 4 ඔහු වැගිරවූ නිදොස් ලේ නිසාත් ය.
මන්ද, ඔහු වැගිරවූ නිදොස් අයගේ ලේ ජෙරුසලම
පුරා ගලා ගියේ ය. ඔහුට කමා වන්නට සමිඳාණන්
වහන්සේට නොහැකි විය.
5 ජෙහෝයාකිම්ගේ අනික් ක්‍රියා ද ඔහු කළ
සියල්ල ද ජුදා රජුන්ගේ පුරාවෘත්ත ග්‍රන්ථයේ
වාර්තා කර තිබෙනු නොවේ ද? 6 ජෙහෝයාකිම්
මියගියේ ය. ඔහුගේ පුත් ජෙහෝයාකින් ඔහු
වෙනුවට රජ විය. 7 බබීලෝනියේ රජ නයිල් ගංගාව
පටන් යුප්‍රටීස් ගංගාව දක්වා මිසර රජුට අයිති
සියල්ල ගත් නිසා, මිසරයේ රජ තවත් තම
දේශයෙන් පිටතට ආවේ නැත.

### ජෙහෝයාකින්ගේ රාජ්‍ය කාලය
(2 වංශා 36:9-10)

8 ජෙහෝයාකින් දහඅට අවුරුදු වයසේ දී රජ වී
තුන් මසක් ජෙරුසලමහි රජකම් කළේ ය. ඔහුගේ
මවගේ නම නෙහෂ්තා ය. ඈ ජෙරුසලමේ
එල්නාතාන්ගේ දුවකි. 9 ඔහු තමාගේ පියා කළ
සියල්ල ලෙස සමිඳාණන් වහන්සේගේ ඇස්
හමුයෙහි නපුරු දේ කළේ ය.

### පළමු වන වරට විප්‍රවාසයට ගෙන යෑම

10 ඒ කාලයෙහි බබීලෝනියේ රජ වූ
නබෙකද්නෙශර්ගේ හමුදා ජෙරුසලමට විරුද්ධ ව
පැමිණ නුවර වටලූ හ. 11 ස්වකීය හමුදා නුවර
වටලා සිටිය දී බබීලෝනියේ රජ වූ නබෙකද්නෙශර්
ද එතැනට පැමිණියේ ය. 12 ජෙරෙ 22:24-30; 24:1-10;
29:1-2එවිට ජුදාහි රජ වූ ජෙහෝයාකින් ද ඔහුගේ
මෑණියෝ ද රාජ සේවකයෝ ද අධිපතියෝ ද
ඇමතියෝ ද නුවරින් පිටත සිටි බබීලෝනියේ රජුට
යටත් වූ හ. බබීලෝනියේ රජ තමේ තමා
රජකමට පත් වී අට වන අවුරුද්දේ දී ඒ නගරය
අල්ලාගත්තේ ය.
13 ඔහු සමිඳාණන් වහන්සේ වදාළ ලෙස
සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ වස්තු සියල්ල ද
රජ ගෙයි වස්තු ද එතැනින් පිටතට ගෙන යනුයේ,
ඉශ්‍රායලේ රජ වූ සලමොන් සමිඳාණන්
වහන්සේගේ මාලිගාවෙහි සාදා තිබුණු සියලු රන්
භාජන කැබලි කොට කැපී ය. 14 ඔහු ජෙරුසලම්
වැසියන් ද සියලු අධිපතීන් ද සියලු යුද්ධ භටයන් ද
වන දසදහස්දෙනෙකු සහ සියලු ශිල්පීන් ද ආචාරීන්
ද විප්‍රවාසයට ගෙන ගියේ ය. දේශයේ ඉතා
දුප්පතුන් මිස කිසිවකේ ඉතිරි නොවූ හ.

15 එසකි 17:12 ඔහු ජෙහෝයාකින් බබිලෝනියට
ගෙන ගියේ ය. රජුගේ මෑණියන් ද රජුගේ
භාර්යාවන් ද ඔහුගේ ඇමතියන් ද දේශයේ
බලවන්තයන් ද ඔහු පිටිවහල්කමට රැගෙන
ජෙරුසලමේ සිට බබිලෝනියට ගෙන ගියේ ය.
16 සත්දහසක් වූ සියලු යුද්ධ භටයන් ද ශිල්පීන් සහ
ආචාරීන් දහසක් ද වන යුද්ධ කරන සියලු
බලවන්තයෝ බබිලෝනියේ රජු විසින් විප්‍රවාසයට
බබිලෝනියට ගෙන යන ලදහ.
17 ජෙරෙ 37:1; එසකි 17:13 බබිලෝනියේ රජ ද
ඔහුගේ බාප්පා වන මත්තනියා ඔහු වෙනුවට
රජකමට පත් කොට ඔහුගේ නම ශෙදෙකියා යයි
වෙනස් කළේ ය.

### ශෙදෙකියාගේ රාජ්‍ය කාලය
(2 වංශා 36:11-12;ජෙරෙ 52:1-3)

18 ජෙරෙ 27:1-22; 28:1-17 ශෙදෙකියා විසිඑක් අවුරුදු
වයසේ දී රජ වී එකොළොස් අවුරුද්දක්
ජෙරුසලමෙහි රජකම් කළේ ය. ඔහුගේ මවුගේ
නම හමුතල් ය. ඈ ලිබ්නාහි ජෙරෙමියාගේ දුවක් ය.
19 ඔහු ජෙහෝයාකිම් කළ සියල්ල ලෙසෙ සමිඳාණන්
වහන්සේගේ ඇස් හමුයෙහි නපුරු දේ කළේ ය.
20 එසකි 17:15මන්ද, සමිඳාණන් වහන්සේ ඔවුන්
තමන් ඉදිරියෙන් පහකරදමන තරමට උන්
වහන්සේගේ උදහස නිසා ජෙරුසලමටත්, ජුදාටත්
මෙසේ සිද්ධ විය.

### ජෙරුසලමේ වැටීම
(2 වංශා 36:13-21;ජෙරෙ 52:3-11)

25 ජෙරෙ 21:1-10; 34:1-5; එසකි 24:2 ශෙදෙකියා
රජකමට පත් වී නව වන අවුරුද්දේ දහ වන
මාසයේ දහ වන දා බබිලෝනියේ රජු වන
නබුකද්නෙශර් තමාගේ මුළු සේනාව සමඟ
ජෙරුසලමට විරුද්ධ ව අවුත් ඊට විරුද්ධ ව කඳවුරු
බැඳ, එය වටා බලකොටු ගොඩනැඟුවේ ය.
2 මෙසේ ශෙදෙකියා රජුගේ එකොළොස් වන
අවුරුද්ද දක්වා නුවර වටලා තිබිණි. 3 සතර වන
මාසයේ නව වන දා දේශයේ සෙනඟට කෑම නැති
වන තරමට සාගතය නුවර තුළ බලවත් විය.
4 එසකි 33:21එකල නුවර සතුරන්ට අසු වී
කල්දිවරුන් වටකර සිටිය දී, සියලු යුද්ධ භටයෝ රජ
උයන ළඟ පවුරු දෙකෙ අතරේ තිබෙන දොරටුවෙන්
රාත්‍රියේ පලා ගියහ. රජ අරබා සමභූමි පාරෙන්
පලා ගියේ ය. 5 එහෙත්, කල්දිවරුන්ගේ සේනාව
රජු පසුපස්සේ එළවාගෙන ගොස්, ජෙරිකෝවේ
සමභූමිවල දී ඔහු කිට්ටු කර ආවෝ ය. ඔහුගේ මුළු
සේනාව ද ඔහු වෙතින් විසිර ගියහ. 6 ඔව්හු රජු
අල්ලාගෙන රිබ්ලා නුවර සිටි බබිලෝනියේ රජු
ළඟට ගෙන ගියහ. එවිට රජ ඔහු ගැන තීන්දුව
දුන්නේ ය. 7 එසකි 12:13ඔව්හු ශෙදෙකියාගේ
පුත්‍රයන් ඔහුගේ ඇස් හමුයෙහි මරා, ඔහුගේ ඇස්
අන්ධ කොට, ඔහුට විලංගු දමා බබිලෝනියට ගෙන
ගියෝ ය.

### ජෙරුසලම විනාශ කිරීම
(ජෙරෙ 52:12-33)

8 බබිලෝනියේ රජු වන නබුකද්නෙශර් රජුගේ
දහනව වන අවුරුද්දේ පස් වන මාසයේ සත් වන දා
බබිලෝනියේ රජුගේ සේවකයෙකු වූ රැකවලුන්ගේ
අධිපති වූ නබුසරදාන් ජෙරුසලමට අවුත්, 9 1 රාජා
9:8සමිඳාණන් වහන්සේගේ මාලිගාව ද රජගෙය ද
ජෙරුසලමේ සියලු ගෙවල් ද ගිනිබත් කළේ ය.
ලොකු ගෙවල් සියල්ල ම ඔහු ගින්නෙන් දවාදැමී ය.
10 රැකවලුන්ගේ අධිපතියා සමඟ සිටි
කල්දිවරුන්ගේ මුළු සේනාව ජෙරුසලමේ පවුරු
හාත්පසින් ම බිඳ දැමූ හ. 11 සෙනඟගෙන් නගරයේ
ඉතිරි ව සිටි අය ද සැඟවී ගොස් බබිලෝනියේ
රජුගේ පක්ෂයට වූ අය ද සමූහයාගෙන් අනික් අය
ද රැකවලුන්ගේ අධිපති වූ නබුසරදාන් තමෙ‍්‍ර
අල්ලාගෙන ගියේ ය. 12 එහෙත්, මිදි වතු
වවන්නටත්, ගොවිතැන් කරන්නටත් රැකවලුන්ගේ
අධිපතියා දේශයේ ඉතා දිළිඳුන්ගෙන් සමහරෙකු
ඉතිරි කොට ගියේ ය.
13 1 රාජා 7:15-26; 2 වංශා 3:15-17; 4:2-5 තවද,
කල්දිවරු සමිඳාණන් වහන්සේගේ මාලිගාවෙහි තිබූ
ලෝකඩ කණු ද මැසි ද එහි තිබූ ලෝකඩ බඳුන් ද
කඩාගෙන ඒවායේ ලෝකඩ බබිලෝනියට ගෙන
ගියහ. 14 1 රාජා 7:45; 2 වංශා 4:16ඇතිලි ද හැඳි ද
පහන් කතුරු ද පාත්‍ර ද මෙහෙයෙට පාවිච්චි කළ
ලෝකඩ බඩු සියල්ල ද ඔව්හු ගත්හ. 15 ගිනි කබල්
ද තාලි ද රන් බඩුවල රන් ද රිදී බඩුවල රිදී ද
රැකවලුන්ගේ අධිපතියා විසින් ගන්නා ලදී.
16 සලමොන් විසින් සමිඳාණන් වහන්සේගේ
මාලිගාවට සාදන ලද කුළුණු දෙකෙත්, ලෝකඩ
බඳුනේ මැසිත් යන සියලු බඩුවල ලෝකඩවල බර
මනින්නට බැරි තරමට තිබිණි. 17 එක කුළුණේ උස
මීටර් අටකි. එහි පිට ලෝකඩ පෝකඩයක් විය.
පෝකඩයේ උස මීටර් එකයි දශම තුනකි. පෝකඩය
පිට වටකරින් දැල් වැඩක් සහ දෙළුම් ගෙඩිත් තිබිණි.
ඒ සියල්ල ලෝකඩින් විය. දෙ වන කුළුණ පිටත්
එයාකාර ව දැල් වැඩ තිබිණි.

### ජුදාහි වැසියන් විප්‍රවාසගත වීම
(ජෙරෙ 52:24-27)

18 රැකවලුන්ගේ අධිපතියා නායක පූජකයා වූ
සෙරොයා ද දෙ වන පූජකයා වූ ශෙපෙනියා ද දොරටු
පාලකයන් තුන් දෙනා ද අල්ලාගත්තේ ය. 19 ඔහු
යුද්ධ භටයන්ගේ අධිපතියෙකු වූ ඇමතියෙකු ද රජු
ඉදිරියෙහි සිටි මනුෂ්‍යයන්ගෙන් නුවර සිටි
පස්දෙනෙකු ද දේශයේ සෙනඟ යුද්ධයට රැස්කළ
සේනාපතියාගේ ලේකම් ද නුවර සිටි සම්භාවනීය
අය හැටදෙනෙකු ද අල්ලාගත්තේ ය. 20 එවිට
රැකවලුන්ගේ අධිපතියා වූ නබුසරදාන් ඔවුන්
බබිලෝනියේ රජු වෙත රිබ්ලා නගරයට ගෙන
ගියේ ය. 21 බබිලෝනියේ රජ හමාත් රටේ රිබ්ලාහි
දී ඔවුන්ට පහර දී ඔවුන් මරාදැමී ය.

21 මෙසේ ජුදාවරු තමන්ගේ ප්‍රවේණි භූමියෙන්
විප්‍රවාසයට ගෙන යන ලදහ.

### අධිපතියකු පත් කිරීම
(ජරෙ 40:7-9;41:1-3)

22 ජරෙ 40:7-9 ඔහු ජුදා දේශයෙහි ඉතිරි ව සිටි,
බබිලෝනියේ රජ වූ නබුකද්නෙශර් ඉතිරි කර ගිය
සෙනඟගේ අධිපතියා කොට ෂාපාන්ගේ පුත්‍රයා
වන අහිකාම්ගේ පුත් ගෙදලියා පත් කළේ ය.
23 බබිලෝනියේ රජු ගෙදලියා ආණ්ඩුකාරයා කොට
පත් කළ බව සේනාවල සියලු අධිපතීන් ද ඔවුන්ගේ
මිනිසුන් ද ඇසූ විට ඔව්හු එනම්, නතනියාගේ පුත්
ඉෂ්මායෙලේ ද කාරියාගේ පුත් ජෝහානාන් ද
නටෝපාතිය තන්හුමෙත්ගේ පුත් සෙරායා ද
මයකාති-යයාගේ පුත් ජාශනියා ද ඔවුන්ගේ මිනිසුන්
ද මිශ්පා නගරයෙහි සිටි ගෙදලියා වෙත ආ හ.
24 ගෙදලියා ඔවුන්ටත්, ඔවුන්ගේ මිනිසුන්ටත් දිවුරුම්
දී කතා කොට, "කල්දිවරුන්ගේ සේවකයන්ට බිය
නොවී දේශයෙහි වාසය කොට බබිලෝනියේ රජුට
සේවය කරන්න. එවිට ඔබට ශුභසිද්ධ වන්නේ ය"යි
කී ය.
25 ජරෙ 41:1-3 එහෙත්, සත් වන මාසයේ දී රාජ
වංශයේ එලිෂාමාගේ පුත්‍රයා වන නතනියාගේ
පුත් ඉෂ්මායෙලේ මනුෂ්‍යයන් දසදෙනෙකුත් සමඟ
අවුත් ගෙදලියාටත්, මිශ්පාහි ඔහු සමඟ සිටි
ජුදෙව්වරුන්ටත්, කල්දිවරුන්ටත් පහර දී මරාදැමී ය.
26 ජරෙ 43:5-7එවිට ලොකු කුඩා සියලු දෙනා ද
සේනාවන්ගේ අධිපතීහු ද කල්දිවරුන්ට බිය වී
මිසරයට පලා ගියෝ ය.

### ජෙහෝයාකින් රජ සිරගෙයින් මිදීම
(ජරෙ 52:31-34)

27 ජුදාහි රජ වූ ජෙහෝයාකින් බබිලෝනියට
ගෙනයනු ලැබ, තිස්හත් වන අවුරුද්දේ දොළොස්
වන මාසයේ විසිහත් වන දා බබිලෝනියේ රජ වූ
එවිල්මෙරොදක් තමා රජකමට පත් වූ අවුරුද්දේ දී
ජුදාහි ජෙහෝයාකින්ට සමාව දී, හිරගෙයින් ඔහු
නිදහස් කර, 28 ඔහුට කරුණාව පනේවා,
බබිලෝනියෙහි ඔහු සමඟ සිටි රජුන්ගේ රාජ
බලයට වඩා උසස් රාජ බලයක් ඔහුට දුන්නේ ය.
29 ඔහුගේ හිරඇඳුම් ද මාරු කළේ ය. තවද, ඔහු
තමාගේ ජීවිතයේ ඉතිරි කාලයේ නිතර ම රජු
ඉදිරියෙහි ආහාර වැළඳුවේ ය. 30 ඔහුගේ ආහාර
කොටස ද නියම ලෙස දවස්පතා ම ඔහුගේ මුළු
ජීවිත කාලය තුළ ම රජු වෙතින් ඔහුට දෙන ලද්දේ
ය.

# 1 වංශාවලියේ

## ආදම් පටන් ආබ්‍රහම් දක්වා පළෙපත
(උත් 5:1-32;10:1-32;11:10-26)

1 ආදම්, සතේ, ඒනොෂ්; 2 කේනාන්, මහලලලේ,
ජරදේ, 3 ඒනොක්, මතූසලෝ, ලාමකේ;
4 නෝවාගේ පුත්‍රයෝ නම්: ෂමේ, හාම් සහ ජපතේ
ය.
5 ජපතේගේ පුත්‍රයෝ නම්: ගොමරේ, මාගොග්,
මාදයි, ජාවාන්, තුබල්, මෂෙකේ සහ තීරස් ය.
6 ගොමරේගේ පුත්‍රයෝ නම්: අෂ්-කනෙස්, රිපත්
සහ තොගර්මා ය. 7 ජාවාන්ගේ පුත්‍රයෝ නම්:
එලිෂා, තර්ෂිෂ්, කිත්තිම් සහ රොදානිවරු ය.
8 හාම්ගේ පුත්‍රයෝ නම්: කුෂ්, මිශ්‍රයිම්, පූට් සහ
කානාන් ය. 9 කුෂ්ගේ පුත්‍රයෝ නම්: ෂබො, හවීලා,
සබ්තා, රාමා සහ සබ්තකො ය. රාමාගේ පුත්‍රයෝ
නම්: ෂබො සහ දදොන් ය. 10 කුෂ්ට දාව නිම්රොද්
උපන්නේ ය; ඔහු පොළොවේ බලවන්තයකු
වන්නට පටන් ගත්තේ ය. 11 මිශ්‍රයිම්ට දාව
ලූදිම්වරු ද අනාමිම්වරු ද ලහොබීම්වරු ද
නප්තුහිම්වරු ද 12 පත්‍රුසිම්වරු ද කස්ලුහිම්වරු ද
ක්‍රීට්වරු ද උපන්නෝ ය. පිලිස්තිවරුන් පැවත ආයේ
ඔවුන්ගනේ ය. 13 කානාන්ට දාව තමාගේ කුලුඳුලා වූ
සීදොන් සහ හතේ ද; 14 ජබුසිවරු ද අමෝරිවරු ද
ගිර්ගාෂිවරු ද; 15 හිවීවරු ද අර්කිවරු ද සීනිවරු ද;
16 ආර්වාදිවරු ද ශමොරිවරු ද හමාතිවරු ද උපන්නෝ
ය.
17 ෂමේගේ පුත්‍රයෝ නම්: ඒලාම්, අෂූර්,
අර්පක්ෂද්, ලූද්, අරාම්, ඌශ්, හුල්, ගතෙරේ සහ
මෂෙකේ ය. 18 අර්පක්ෂද්ට දාව ෂේලා උපන්නේ ය;
ෂේලාට දාව ඒබරේ උපන්නේ ය. 19 ඒබරේට
පුත්‍රයෝ දදෙනෙකේ උපන්නෝ ය. එක්
කනෙකුගේ නම පලෙගේ ය. මන්ද, ඔහුගේ
කාලයේ පොළෝ තලය බදෙන්නට යදුණේ ය.
ඔහුගේ සහෝදරයාගේ නම ජොක්තන් ය.
20 ජොක්තන්ට දාව අල්මෝදාද් ද ෂලෙපේ ද
හසර්මාවතේ ද ජරො ද; 21 හදොරාම් ද ඌසාල් ද
දික්ලා ද; 22 ඒබාල් ද අබීමායලේ ද ෂබො ද;
23 ඕපීර් ද හවීලා ද ජෝබාබ් ද උපන්නෝ ය. මේ
සියල්ලෝ ජොක්තන්ගේ පුත්‍රයෝ ය.
24 ෂමේ, අර්පක්ෂද්, ෂේලා; 25 ඒබරේ, පලෙගේ,
රයූෙ; 26 සරූෙග්, නාහෝර්, තේරා සහ 27 ආබ්‍රම්
හවෙත් ආබ්‍රහම් ය.

## ආබ්‍රහම් පටන් ජාකොබ් දක්වා පළෙපත
(උත් 25:12-16;36:1-43)

28 ආබ්‍රහම්ගේ පුත්‍රයෝ නම්: ඊසාක් සහ
ඉෂ්මායලේ ය. 29 ඔවුන්ගේ පරම්පරා මේ ය:
ඉෂ්මායලේගේ කුලුඳුලා වූ නබොයොත්, ඊළඟට
කේදාර්, අද්බයෙලේ, මිබ්සාම්; 30 මිෂ්මා, දූමා,
මස්සා; හදද්, තේමා, 31 ජතූර්, නාපීෂ් සහ
කේදමො ය. මොවුහු ඉෂ්මායලේගේ පුත්‍රයෝ ය.
32 ආබ්‍රහම්ගේ උපභාර්යාව වූ කතූරාගේ
පුත්‍රයෝ මොවුහු ය: ඈ ශිම්රාන්, ජොක්ෂාන්,
මදොන්, මිදියාන්, ඉෂ්බාක් සහ ෂූවා ලැබුවා ය.
ජොක්ෂාන්ගේ පුත්‍රයෝ නම්: ෂබො සහ දදොන් ය.
33 මිදියාන්ගේ පුත්‍රයෝ නම්: ඒපා, ඒපරේ,
හනොක්, අබීදා සහ එල්දායා ය. මේ සියල්ලෝ
කතූරාගේ පුත්‍රයෝ ය.
34 ආබ්‍රහම්ට දාව ඊසාක් උපන්නේ ය. ඊසාක්ගේ
පුත්‍රයෝ නම්: ඒසව් සහ ඉශ්‍රායලේ ය.
35 ඒසව්ගේ පුත්‍රයෝ නම්: එලිපස්, රවූෙයලේ,
ජවූෙෂ්, ජලාම් සහ කෝරා ය. 36 එලිපස්ගේ
පුත්‍රයෝ නම්: තේමාන්, ඕමාර්, ශපෝ, ගායිතාම්,
කනෙස්, තිම්නා සහ අමලකේ ය. 37 රවූෙයලේගේ
පුත්‍රයෝ නම්: නහත්, සරො, ෂම්මා සහ මිස්සා ය.
38 සේයිර්ගේ පුත්‍රයෝ නම්: ලෝතාන්, ෂෝබාල්,
ශිබයෙොන්, අනා, දීෂොන්, එශරේ සහ දීෂාන් ය.
39 ලෝතාන්ගේ පුත්‍රයෝ නම්: හෝරී සහ හෝමාම්
ය. තිම්නා ලෝතාන්ගේ සහෝදරී ය. 40 ෂෝබාල්ගේ
පුත්‍රයෝ නම්: අල්වාන්, මානහත්, ඒබාල්, ෂපෝ සහ
ඕනාම් ය. ශිබයෙොන්ගේ පුත්‍රයෝ නම්: ආයා සහ
අනා ය. 41 අනාගේ පුත්‍රයා දීෂොන් ය. දීෂොන්ගේ
පුත්‍රයෝ නම්: හම්රාන්, එෂ්බාන්, ඉත්රාන් සහ
කරොන් ය. 42 එශරේගේ පුත්‍රයෝ නම්: බිල්හන්,
සයවාන් සහ ජාකන් ය. දීෂාන්ගේ පුත්‍රයෝ නම්:
ඌශ් සහ අරාන් ය.
43 ඉශ්‍රායලේ ජනයා කරෙහෙි කිසි රජකු රජකම්
කරන්න පළමුවනේ ඒදොම් රටේ රජකම් කළ රජවරු
මොවුහු ය. බයෙෝර්ගේ පුත් බලෝ ය; ඔහුගේ
නුවර නම් දින්හාබා ය. 44 බලෝ මළ පසු බොශ්‍රාහි
සරොගේ පුත් ජෝබාබ් ඔහු වනුෙවට රජකම්
කළෙේ ය. 45 ජෝබාබ් මළ පසු තේමානිවරුන්ගේ
රටේ හුෂාම් ඔහු වනුෙවට රජකම් කළෙේ ය.
46 හුෂාම් මළ පසු මෝවබ් රටේ දී මිදියන්ට පහර
දුන් බදෙද්ගේ පුත් හදද් ඔහු වනුෙවට රජකම්
කළෙේ ය. ඔහුගේ නුවරේ නම අවීත් ය. 47 හදද්
මළ පසු මස්රේකාහි ෂම්ලා ඔහු වනුෙවට රජකම්

කළේ ය. 48 ෂම්ලා මළ පසු යුප්රටීස් ගංගාව ළඟ
තිබුණු රෙහොබොත්හි ෂාවුල් ඔහු වෙනුවට රජකම්
කළේ ය. 49 ෂාවුල් මළ පසු අක්බෝර්ගේ පුත්
බාල්-හනන් ඔහු වෙනුවට රජකම් කළේ ය.
50 බාල්-හනන් මළ පසු හදද් ඔහු වෙනුවට රජකම්
කළේ ය. ඔහුගේ නුවරේ නම පායී ය. ඔහුගේ
භාර්යාවගේ නම මෙහෙතොබෙල් ය. ඈ මෙසාහාබ්ගේ
දුව වූ මත්රේද්ගේ දුව ය.
51 හදද් මියගියේ ය. ඒදොම්හි අධිපතිවරු නම්:
තිම්නා, අල්වා, ජෙතේත්; 52 ඔහොලිබාමා, ඒලා,
පීනොන්; 53 කෙනෙස්, තේමාන්, මිබ්සාර්;
54 මග්දීයෙල් සහ ඊරාම් ය. මොවුහු ඒදොම්හි
අධිපතියෝ ය.

2 ඉශ්රායෙල්ගේ පුත්රයෝ නම්: රූබන්,
සිමියොන්, ලෙවී සහ යූදා ය; ඉස්සාකර් සහ
සාබුලොන් ය; 2 දාන්, ජෝසෙප් සහ බෙන්ජමින් ය;
නප්තලී, ගාද් සහ ආෂෙර් ය.

### යූදා ගෝත්රය

3 යූදාගේ පුත්රයෝ නම්: ඒර්, ඕනාන් සහ ෂේලා
ය. මේ තුන්දෙනා කානානිය බැත්-ෂූවාගෙන් ඔහුට
දාව උපන්නෝ ය. යූදාගේ කුලුඳුලා වූ ඒර්
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි දුෂ්ට ව සිටි බැවින්
උන් වහන්සේ ඔහු නැසූ සේක. 4 ඔහුගේ ලේලිය
වූ තාමාර් ඔහුට දාව පෙරෙශ් ද ශෙරා ද ලැබුවා ය.
යූදාට පුත්රයෝ පස්දෙනෙක් සිටියෝ ය.
5 පෙරෙශ්ගේ පුත්රයෝ නම්: හෙශ්රොන් සහ
හාමුල් ය. 6 ශෙරාගේ පුත්රයෝ නම්: සිම්රී, ඒතාන්,
හේමන්, කල්කොල් සහ දාරා ය. ඒ සියල්ලෝ
පස්දෙනෙක් ය. 7 ජෙෂු 7:1කර්මීගේ පුත්රයා නම්:
කැප වූ දේ ගැන අපරාධයක් කර ඉශ්රායෙල්
කැළඹුවා වූ ආකාර් ය.
8 අශරියා ඒතාන්ගේ පුත්රයෙක් ය.
9 හෙශ්රොන්ට උපන් ඔහුගේ පුත්රයෝ නම්:
ජෙරොමයෙල්, රාම් සහ කලෙබයි ය.
10 රාම්ට දාව අම්මිනාදාබ් උපන්නේ ය;
අම්මිනාදාබ්ට දාව යූදාගේ පුත්රයන්ට අධිපති වූ
නාෂොන් උපන්නේ ය. 11 නාෂොන්ට දාව සල්මාද
සල්මාට දාව බෝවස් ද උපන්නෝ ය; 12 බෝවස්ට
දාව ඕබෙද් ද ඕබෙද්ට දාව ජෙස්සේ ද උපන්නෝ ය;
13 ජෙස්සේට දාව ඔහුගේ කුලුඳුලා වූ එලියාබ් ද,
දෙවෙනියා වූ අබිනාදාබ් ද, තුන්වැනියා වූ ෂිමයා ද;
14 සතරවැනියා වූ නෙතනෙල් ද, පස්වැනියා වූ රද්දයි
ද; 15 හයවැනියා වූ ඔශෙම් ද, සත්වැනියා වූ දාවිත් ද
උපන්නෝ ය. 16 මොවුන්ගේ සහෝදරියෝ නම්:
ශරුයා සහ අබිගායිල් ය. ශරුයාගේ පුත්රයෝ
නම්: අබිෂයි ද ජෝවාබ් ද අසාහෙල් ද යන
තුන්දෙනා ය. 17 අබිගායිල් අමාසා ලැබුවා ය.
අමාසාගේ පියා නම්, ඉෂ්මායෙලීය ජෙතෙර් ය.
18 හෙශ්රොන්ගේ පුත් කාලෙබ්ට දාව ඔහුගේ
භාර්යාව වූ අශුබාගෙන් ජෙරියොත් උපන්නා ය. ඈට
පුත්රයෝ උපන්නෝ ය. ඔව්හු නම්: ජේෂෙර්,
ෂෝබාබ් සහ අර්දොන් ය. 19 අශුබා මියගිය පසු
කාලෙබ් එප්රාතා පාවාගත්තේ ය. ඈ ඔහුගෙන් හූර්
ලැබුවා ය. 20 හූර්ට දාව උරී උපන්නේ ය; උරීට දාව
බෙශෙලෙල් උපන්නේ ය.
21 පසු ව හෙශ්රොන් තමා හැට අවුරුදු වයස් වූ
කල, ගිලියද් හට පියා වූ මාකීර්ගේ දුව පාවාගෙන
ඈ හා එක් විය. ඈය ඔහුගෙන් සගුබ් ලැබුවා ය.
22 සගුබ්ට දාව ජායිර් උපන්නේ ය; ඔහුට ගිලියද්
දේශයෙහි නගර විසිතුනක් තිබුණේ ය.
23 ගෂූර්වරු ද සිරියන්වරු ද ජායිර්හි නගර සහ
කෙනෙත් ද ඊට අයිති ගම් ඇතුළු ව නගර සැටක් ද
ඔවුන්ගෙන් අල්ලාගත්තෝ ය. මේ සියල්ලෝ
ගිලියද්ගේ පිය වූ මාකීර්ගේ පුත්රයෝ ය.
24 හෙශ්රොන් කාලෙබ්එප්රාතාහි දී මියගිය පසු
හෙශ්රොන්ගේ භාර්යාව වූ අබියා තෙකෝවා
වැසියන්ගේ මුල් පියා වන අෂ්හූර් ලැබුවා ය.
25 හෙශ්රොන්ගේ කුලුඳුලා වූ ජෙරොමයෙල්ගේ
පුත්රයෝ නම්: කුලුඳුලා වූ රාම්, බූනා, ඔරෙන්,
ඔශෙම් සහ අහියා ය. 26 ජෙරොමයෙල්ට අටාරා නම්
වෙනෙ භාර්යාවක් වූවා ය. ඈ ඕනාම්ගේ මව ය.
27 ජෙරොමයෙල්ගේ කුලුඳුලා වූ රාම්ගේ පුත්රයෝ
නම්: මයශ්, ජාමීන් සහ ඒකෙර් ය. 28 ඕනාම්ගේ
පුත්රයෝ නම්: ෂම්මයි සහ ජාදා ය. ෂම්මයිගේ
පුත්රයෝ නම්: නාදාබ් සහ අබිෂූර් ය.
29 අබිෂූර්ගේ භාර්යාවගේ නම අබිහයිල් ය; ඈ
ආබාන් සහ මෝලිද් ඔහුගෙන් ලැබුවා ය.
30 නාදාබ්ගේ පුත්රයෝ නම්: සලෙද් සහ අප්පයිම්
ය. සලෙද් දරුවන් නොලැබ මියගියේ ය.
31 අප්පයිම්ගේ පුත්රයා නම්: ඉෂී ය. ඉෂීගේ
පුත්රයා නම් ෂේෂාන් ය. ෂේෂාන්ගේ පුත්රයා නම්
ආලයි ය.
32 ෂම්මයිගේ සහෝදර වූ ජාදාගේ පුත්රයෝ නම්:
ජෙතෙර් සහ ජොනතන් ය. ජෙතෙර් දරුවන් නොලැබ
මියගියේ ය. 33 ජොනතන්ගේ පුත්රයෝ නම්:
පෙලෙත් සහ සාසා ය. මොවුහු ජෙරොමයෙල්ගේ
පුත්රයෝ ය.
34 ෂේෂාන්ට දූවරුන් මිස පුත්රයෝ නොසිටියෝ ය.
ෂේෂාන්ට මිසර වැසියෙකු වූ ජර්හා නම්
වැඩකාරයෙක් සිටියේ ය. 35 ෂේෂාන් තමාගේ
වැඩකාරයා වූ ජර්හාට තමාගේ දුව භාර්යාව කොට
දුන්නේ ය. ඈ ඔහුට දාව අත්තයි ලැබුවා ය.
36 අත්තයිට දාව නාතාන් උපන්නේ ය; නාතාන්ට
දාව සාබාද් උපන්නේ ය; 37 සාබාද්ට දාව එප්ලාල්
උපන්නේ ය; එප්ලාල්ට දාව ඕබෙද් උපන්නේ ය;
38 ඕබෙද්ට දාව ජේහූ උපන්නේ ය; ජේහූට දාව
අශරියා උපන්නේ ය; 39 අශරියාට දාව හෙලෙශ්
උපන්නේ ය; හෙලෙශ්ට දාව එලයොසා උපන්නේ ය;
40 එලයොසාට දාව සිස්මයි උපන්නේ ය; සිස්මයිට
දාව ෂල්ලුම් උපන්නේ ය; 41 ෂල්ලුම්ට දාව ජෙකමියා
උපන්නේ ය; ජෙකමියාට දාව එලිෂාමා උපන්නේ ය.
42 ජෙරොමයෙල්ගේ සහෝදර වූ කාලෙබ්ගේ
පුත්රයෝ නම්: ඔහුගේ කුලුඳුලා වූ, සීප්ගේ පියා වූ
මේෂා සහ හෙබ්රොන්ගේ පියා වූ මරේෂාගේ
පුත්රයෝත් ය. 43 හෙබ්රොන්ගේ පුත්රයෝ නම්:
කෝරා, තප්පුවා, රෙකෙම් සහ ෂෙමා ය. 44 ෂෙමාට

දාව ජාරේකයොම්ගේ පියා වූ රහම් උපන්නේ ය;
රකෙමේට දාව ෂම්මයි උපන්නේ ය. 45 මායොන්
ෂම්මයිගේ පුත්‍රයා ය; මායොන් බෙත්-ශූර්ගේ පියා
ය.
46 කාලබ්ගේ උපභාර්යාව වූ ඒපා හාරාන් ද
මෝශා ද ගාසසේ ද ලැබුවා ය. හාරාන්ට දාව
ගාසසේ උපන්නේ ය.
47 ජාදයිගේ පුත්‍රයෝ නම්: රගෙමේ, ජෝතාම්,
ගේෂාම්, පලෙටේ, ඒපා සහ ෂයප් ය.
48 කාලබ්ගේ උපභාර්යාව වූ මයකා ෂබෙරේ සහ
තිර්හනා ලැබුවා ය. 49 ඈ මද්මන්නාගේ පියා වූ
ෂයප් ද මක්බේනාගේ සහ ගිබයොගේ පියා වූ
ෂවො ද ලැබුවා ය. කාලබ්ගේ දූව අක්සා ය.
50 මොවුහු කාලබ්ගේ පුත්‍රයෝ ය. එප්රාතාගේ
කුලුඳුලා වූ බනේහූර් ය; කිරියත්-ජයොරීම්ගේ පියා වූ
ෂෝබාල්; 51 බෙත්ලෙහෙමේගේ පියා වූ සල්මා සහ
බෙත්ගාදරේගේ පියා වූ හාරෙපේ ය.
52 කිරියත්-ජයොරීම්ගේ පියා වූ ෂෝබාල්ට
පුත්‍රයෝ සිටියෝ ය. එනම්; හාරොවේ සහ
මනුෙහොත්වරුන්ගනේ දකෙනේ කොටසක් ය.
53 කිරියත්-ජයොරීම්ගේ පවුල් නම්: ඉත්රියවරු,
පූතිවරු, ෂුමාතිවරු සහ මිෂ්රායිවරු ය; මොවුන්ගනේ
ශොරාතිවරු ද එෂ්තායෝලිවරු ද පැවත ආවෝ ය.
54 සල්මාගේ පුත්‍රයෝ නම්: බෙත්ලෙහෙමේවරු,
නටෝපාතිවරු, අටාරොත්බෙත්-ජෝවාබ්වරු,
මානහතිවරුන්ගනේ දකෙනේ කොටසක් සහ
ශොරියවරුත් ය.
55 ජාබශේහි විසූ ලියන්නන්ගේ පවුල් නම්:
තිරාතිවරු, ෂිමියාතිවරු සහ සුකාතිවරු ය. මොවුහු
රේකාබ්ගේ වංශයේ පියා වූ හම්මත්ගනේ පැවත ආ
කේනිවරු ය.
3 හබ්රොන්හි දී දාවිත්ට උපන් ඔහුගේ
පුත්‍රයෝ මොවුහු ය. කුලුඳුලා ජශ්රෙයෙලේය
අහිනොවම්ගනේ උපන් අම්නොන් ය. දවෙනියා
කර්මලේය අබීගායිල්ගනේ උපන් දානියලේ ය;
2 තුන්වැනියා ගෂූෙර්හි රජ වන තල්මයිගේ දූව වූ
මයකාගේ පුත්‍ර වූ අබ්සලොමේ ය; හතරවැනියා
හග්ගිත්ගේ පුත්‍ර වූ අදොනියා ය; 3 පස්වැනියා
අබිටල්ගනේ උපන් ෂෙපටියා ය; හයවැනියා ඔහුගේ
භාර්යාව වූ එග්ලාගනේ උපන් ඉත්රයොම් ය; 4 2
සාමු 5:4-5; 1 රාජා 2:11; 1 වංශා 29:27හය දනෙකේ
හබ්රොන්හි දී ඔහුට උපන්නෝ ය. එහි ඔහු සත්
අවුරුදු හය මාසයක් ද ජරූෙසලමහෙි තිස්තුන්
අවුරුද්දක් ද රජකම් කළේ ය. 5 2 සාමු
11:3ජරූෙසලමේ දී ඔහුට දාව උපන් අය මොවුහු ය:
ෂිමයො, ෂෝබාබ්, නාතාන් සහ සලමොන් ය. මේ
සතර දනො අම්මියලේගේ දූව වූ බැත්-ෂුවාගනේ
උපන්නෝ ය.
6 ඉබ්හාර්, එලිෂමා, එලිපලෙතේ; 7 නොගා,
නපෙගේ, ජාපියා; 8 එලිෂාමා, එල්යාදා, එලිපලෙතේ
යන නව දනොත් ය. 9 උපභාර්යාවන්ගේ පුත්‍රයන්
ඇතුළු ව මොවුහු සියල්ලෝ දාවිත්ගේ පුත්‍රයෝ ය.
තාමාර් මොවුන්ගේ සහෝදරී ය.
10 සලමොන්ගේ පුත්‍රයා රහෙොබෝවම් ය.
ඔහුගේ පුත්‍රයා අබියා ය; ඔහුගේ පුත්‍රයා ආසා ය;
ඔහුගේ පුත්‍රයා ජහෙෝෂාපාට් ය; 11 ඔහුගේ
පුත්‍රයා ජෝරාම් ය; ඔහුගේ පුත්‍රයා අහසියා ය;
ඔහුගේ පුත්‍රයා ජෝවාෂ් ය; 12 ඔහුගේ පුත්‍රයා
අමශියා ය; ඔහුගේ පුත්‍රයා අසරියා ය; ඔහුගේ
පුත්‍රයා ජෝතාම් ය; 13 ඔහුගේ පුත්‍රයා ආහාස් ය;
ඔහුගේ පුත්‍රයා හසෙකියා ය; ඔහුගේ පුත්‍රයා
මනස්සේ ය; 14 ඔහුගේ පුත්‍රයා ආමොන් ය;
ඔහුගේ පුත්‍රයා ජොෂියා ය. 15 ජොෂියාගේ
පුත්‍රයෝ නම්: කුලුඳුලා වූ ජොහානාන් ය; දවෙනියා
ජහෙෝයාකිම් ය; තුන්වැනියා ශදෙකෙියා ය;
හතරවැනියා ෂල්ලුම් ය. 16 ජහෙෝයාකිම්ගේ
පුත්‍රයෝ නම්: ඔහුගේ පුත් ජකොෙනියා සහ
ඔහුගේ පුත් ශදෙකෙියා ය.
17 හිරකාරයකෙු වූ ජකොෙනියාගේ පුත්‍රයෝ නම්:
18 ඔහුගේ පුත් ෂයෙල්තියලේ සහ මල්කිරාම්,
පදොයා, ෂනෙශ්ශර්, ජකෙමියා, හෝෂාමා සහ
නදෙබියා ය. 19 පදොයාගේ පුත්‍රයෝ නම්:
සරූෙබ්බාබලේ සහ ෂිමයි ය. සරූෙබ්බාබලේගේ
පුත්‍රයෝ නම්: මෂූෙල්ලාම් සහ හනනියා ය;
ඔවුන්ගේ සහෝදරී ෂලෙොමිත් ය. 20 හෂුබා,
ඔහලේ, බරෙකෙියා, හසදියා, ජුෂබ්-හසෙදේ යන
පස්දනොත් ය.
21 හනනියාගේ පුත්‍රයෝ නම්: පලෙටියා සහ
ජෂොයා ය. රපොයාගේ පුත්‍රයෝ ය; අර්ණන්ගේ
පුත්‍රයෝ ය; ඔබදියාගේ පුත්‍රයෝ ය; ෂකෙනියාගේ
පුත්‍රයෝ ය. 22 ෂකෙනියාගේ පුත්‍රයෝ නම්:
ෂමොයා ද ෂමොයාගේ පුත්‍රයන් වූ හට්ටූෂ්, ඉගාල්,
බාරියා, නයෙරියා, ෂාපාත් යන හයදනො ය.
23 නයෙරියාගේ පුත්‍රයෝ නම්: එලියෝයේනයි,
හිස්කියා, අශ්රිකාම් යන තුන්දනො ය.
24 එලියෝයේනයිගේ පුත්‍රයෝ නම්: හෝදවියා,
එලියාෂිබ්, පලොයා, අක්කුබ්, ජොහානාන්, දලොයා,
අනානී යන සත්දනො ය.
4 ජුදාගේ පුත්‍රයෝ නම්: පරෙශේ, හශේරොන්,
කර්මී, හූර් සහ ෂෝබාල් ය. 2 ෂෝබාල්ගේ
පුත්‍ර වූ රයොයාට දාව ජහත් උපන්නේ ය; ජහත්ට
දාව අහුමයි සහ ලාහද් උපන්නෝ ය. මොවුහු
ශොරාතිවරුන්ගේ පවුල් ය.
3 ඒතාම්ගේ පියාගනේ උපන් අය නම්:
ජශේරයෙලේ, ඉෂ්මා සහ ඉඩ්බාෂ් ය. ඔවුන්ගේ
සහෝදරීගේ නම හශ්ශලෙලේපොනී ය.
4 ගදෙෝර්ගේ පියා වූ පනෙුවේල් ය; හූෂාගේ පියා
වූ එශරේ ය. මොවුහු එප්රාතාගේ කුලුඳුලා වූ බෙත්-
ලෙහෙමේගේ පියා වූ හූර්ගේ පුත්‍රයෝ ය.
5 තකෝවා වැසියන්ගේ පියා වූ අෂ්හූර්ට
හලෙයො සහ නයරා යන භාර්යාවෝ දදෙනෙකේ වූ
හ. 6 නයරා ඔහුගනේ අහුස්සාම් ද හේපරේ ද
තේමනෙි ද හාහෂ්තාරි ද ලැබුවා ය. නයරාගේ
පුත්‍රයෝ මොවුහු ය. 7 හලෙයොගේ පුත්‍රයෝ නම්:
ශරෙතේ, ඉශ්හාර් සහ එත්නන් ය.
8 කොෂ්ට දාව ආනුබ් ද ශොබේබා ද හාරුම්ගේ
පුත් අහර්හලේගේ පවුල් ද උපන්නෝ ය.

9 ජාබශේ තමාගේ සහෝදරයන්ට වඩා ගෞරව
ලැබුවේ ය. ඔහුගේ මව, “මම වේදනාවෙන් ඔහු
ලැබුවෙමි”යි කියා ඔහුට ජාබශේ යන නම තැබුවා ය.
10 ජාබශේ ඉශ්‍රායලේවරුන්ගේ දෙවියන් වහන්සේට
යාච්ඤා කොට, “අහෝ, ඔබ මට ආශීර්වාද කර,
මාගේ සීමාව විශාල කර, ඔබේ අතින් මට පිහිට වී,
මට දුක් නූපදින ලෙස විපතෙන් මා ආරක්ෂා කළ
මැනව”යි කීවේ ය. දෙවියන් වහන්සේ ද ඔහුගේ
ඉල්ලීම ඉෂ්ට කළ සේක.
11 ෂුහාගේ සහෝදර වූ කලෙබ්ට දාව මෙහීර්
උපන්නේ ය. ඔහු එෂ්තොන්ගේ පියා ය.
12 එෂ්තොන්ට දාව බෙත්-රාපා ද පසේයා ද ඊර්-
නාහාෂ්ගේ පියා වූ තෙහින්නා ද උපන්නෝ ය.
මොවුහු රේකාහී මනුෂ්‍යයෝ ය.
13 කෙනස්ගේ පුත්‍රයෝ නම්: ඔත්නියෙල් සහ
සෙරායා ය. ඔත්නියෙල්ගේ පුත්‍රයෝ හතත් සහ
මෙයෝනොතයි ය. 14 මෙයෝනොතයිට දාව ඔෆ්රා
උපන්නේ ය. සෙරායාට දාව ගෙ-හරාෂිවරුන්ගේ පිය
වූ ජෝවාබ් උපන්නේ ය. ඔව්හු ශිල්පීහු ය.
15 ජෙපුන්නේගේ පුත් කාලබ්ගේ පුත්‍රයෝ නම්:
ඊරු, ඒලා සහ නයම් ය. ඒලාගේ පුත්‍රයා කෙනස් ය.
16 ජෙහෙල්ලෙලේල්ගේ පුත්‍රයෝ නම්: ශීෆ්, ශීෆා,
තිරියා සහ අසරේල් ය.
17 එස්‍රාගේ පුත්‍රයෝ නම්: ජෙතෙරේ, මෙරේද්,
ඒපෙර් සහ ජාලොන් ය. මෙරේද් පාරාවෝගේ දුව වූ
පාරාවෝගේ දුව වූ බිතියාගේ පුත්‍රයෝ මොවුහු ය.
ඈ මිරියම් ද ෂම්මයි ද එෂ්තෙමෝවාගේ පියා වූ
ඉෂ්බා ද ලැබුවා ය. 18 ඔහුගේ ජුදෙව් භාර්යාව
ගෙදෝර්ගේ පියා වූ ජෙරෙද් ද සෝකෝගේ පියා වූ
හෙබෙර් ද සානෝවාගේ පියා වූ ජෙකුතියෙල් ද
ලැබුවා ය.
19 කෙයිලාගේ පියා වන නහම්ගේ සහෝදරී වූ,
හෝදියාගේ භාර්යාවගේ පුත්‍රයෝ නම්: ගර්මී සහ
මයකාතිය එෂ්තෙමෝවා ය.
20 ෂිමොන්ගේ පුත්‍රයෝ නම්: අම්නොන්, රින්නා,
බෙන්-හානාන් සහ තීලොන් ය. ඉෂිගේ පුත්‍රයෝ
නම්: සෝහෙත් සහ බෙන්-සෝහෙත් ය.
21 ජුදාගේ පුත්‍ර වූ ෂේලාගේ පුත්‍රයෝ නම්:
ලේකාගේ පියා වූ ඒර් ද මරේෂාගේ පියා වූ ලයදා
ද අෂ්බයාගේ වංශය වන සිහින් හණ රෙදි
වියන්නන්ගේ වංශයේ පවුල් ද; 22 ජෝකිම් ද
කොසේබාහි මනුෂ්‍යයෝ ද මෝවබ්වරුන්ගෙන්
භාර්යාවන් සරණ පාවාගත් ජෝවාෂ් සහ සාරාෆ් ද
ජාෂුබි-ලෙහෙම් ද යන මොවුහු ය. මේවා පැරණි
කරුණු ය. 23 මොවුහු කුම්භකාරයන් ව නෙතායිම්හි
ද ගෙදෙරාහි ද විසුවෝ ය. මොවුහු රජුගේ
වැඩකරන පිණිස එහි ඔහු සමඟ වාසය කළෝ ය.

### සිමියොන්ගේ ගෝත්‍රය

24 සිමියොන්ගේ පුත්‍රයෝ නම්: නමූවෙල්, ජාමීන්,
ජාරීබ්, සෙරා සහ ෂාවුල් ය. 25 ඔහුගේ පුත්‍රයා
ෂල්ලුම් ය; ඔහුගේ පුත්‍රයා මිබ්සාම් ය; ඔහුගේ
පුත්‍රයා මිෂ්මා ය. 26 මිෂ්මාගේ පුත්‍රයෝ නම්:
ඔහුගේ පුත් හම්මුවෙල් ය; ඔහුගේ පුත්‍ර වූ
සක්කූර් ය; ඔහුගේ පුත්‍ර වූ ෂිමෙයි ය. 27 ෂිමෙයිට
පුත්‍රයෝ දහසයදෙනෙක් ද, දූවරු හයදෙනෙක් ද
සිටියෝ ය. එහෙත්, ඔහුගේ සහෝදරයන්ට බොහෝ
දරුවෝ නොසිටියෝ ය. ඔවුන්ගේ මුළු වංශය ජුදා
පුත්‍රයන් මෙන් වැඩි නො වී ය.
28 ජෝෂු 19:2-8 ඔව්හු බෙයෙර්-ෂෙබාහි ද
මොලාදාහි ද හශර්-ෂුවාල්හි ද; 29 බිල්හාහි ද
එසෙම්හි ද තෝලාද්හි ද; 30 බෙතුයෙල්හි ද
හෝර්මාහි ද සික්ලග්හි ද; 31 බෙත්-මර්කාබොත්හි ද
හශර්-සුසීම්හි ද බෙත්-බිරියෙහි ද ෂයරම්හි ද
විසුවෝ ය. දාවිත් රජකමට පැමිණෙන තුරු මේවා
ඔවුන්ගේ නගර ව තිබුණේ ය. 32 ඔවුන්ගේ ගම්:
ඒතාම්, අයින්, රිම්මොන්, තොකෙන්, ආෂාන් යන
නගර පහක් සහ 33 බාල් දක්වා එම නගර වටේට
තිබුණු සියලු ගම් ද වේ. ඔවුන්ගේ වාසස්ථාන ද
ඔවුන්ගේ පෙළපත් ලේඛන ද මේවා ය.
34 මෙෂෝබාබ් ද ජම්ලෙක් ද අමශියාගේ පුත්
ජෝෂා ද; 35 ජෝවෙල් ද අසියෙල්ගේ පුත්‍රයා වන
සෙරායාගේ පුත් ජෝෂිබියාගේ පුත්‍රයා වන ජේහු
ද; 36 එලියෝයේනයි ද ජාකොබා ද ජෙෂෝහායා ද
ආසායා ද අදීයෙල් ද ජෙසීමියෙල් ද බෙනායා ද;
37 ෂමායාගේ පුත්‍රයා වන ෂිම්රීගේ පුත්‍ර වූ
ජෙදායාගේ පුත්‍රයා වන අල්ලොන්ගේ පුත්‍ර වූ
ෂිෆීගේ පුත්‍රයා වන සීසා ද යන 38 නම් වශයෙන්
සඳහන් කළ මොවුහු තමන්ගේ පවුල්වල
අධිපතියෝ වූ හ. ඔවුන්ගේ පිය පෙළපත් ද
බොහෝ සයෙන් වර්ධනය විය. 39 ඔව්හු තමන්ගේ
එළු බැටළු රැළවලට තණ බිම් සොයමින්
මිටියාවතේ නැගෙනහිර අතට ගෙදෝර්ට ඇතුල් වන
තැන දක්වා ගියෝ ය. 40 හොඳ සරු තණ බිම්
ඔවුන්ට සම්බ විය. දේශය ද දැනට ම විශාල ව,
නිශ්චල ව, සාමදාන සහිත ව තිබුණේ ය. මන්ද,
පළමුවෙන් එහි වාසය කළ අය හාම්ගෙන් පැවත
ආවෝ ය.
41 නම් වශයෙන් ලියන ලද මොවුහු ජුදාහි රජ වූ
හෙසෙකියාගේ කාලයේ දී අවුත් එහි සම්බවුණ
මෙයුනිවරුන්ටත්, ඔවුන්ගේ කූඩාරම්වලටත් පහර දී,
අද දක්වා තිබෙන හැටියට ඔවුන් මුළුමනින් ම
නැතිකර දමා ඔවුන් වෙනුවට එහි වාසය කළෝ ය.
මන්ද, ඔවුන්ගේ එළු බැටළු රැළවල්වලට එහි තණ
බිම් තිබුණේ ය. 42 සිමියොන්ගේ පුත්‍රයන් වන
ඔවුන්ගෙන් සමහර දෙනෙක් එනම්, මනුෂ්‍යයන්
පන්සියයක් ඉෂිගේ පුත්‍ර වූ පෙලෙටියා ද නයෙරියා ද
රෙෆායා ද උශ්ශීයෙල් ද ප්‍රධානකමට තබා ගෙන
සේයිර් කන්දට ගොස්, 43 ගැළවී ඉතුරු ව සිටි
අමලෙක්වරුන්ට පහර දුන්නෝ ය. අද දක්වාත් ඔව්හු
එහි වාසය කරති.

### රූබන්ගේ ගෝත්‍රය

5 උත් 35:22; 49:3-4 ඉශ්‍රායලේගේ කුලුඳුලා වූ
රූබන්ගේ පුත්‍රයෝ මොවුහු ය. ඔහු කුලුඳුලා
ව සිටි නමුත්, තම පියාගේ උපභාර්යාවන් සමඟ

සේවනයෙහි යෙදුණු නිසා, ඔහුගේ කුලුඳුල්කම
ඉශ්රායලේගේ පුත් ජෝසෙප්ගේ පුත්‍රයන්ට දෙන
ලද්දේ ය; කුලුඳුල්කමේ හැටියට පෙළපත ගණන්
නොගන්නා ලද්දේ ය. 2 උත් 49:8-10ජුදා වනාහි
තමාගේ සහෝදරයන් අතරේ බලවත් වුණේ ය.
ඔහුගෙන් අධිපතියා පැවත ආයේ ය. එහෙත්,
කුලුඳුල්කම ජෝසෙප්ට අයිති ය. 3 ඉශ්රායලේගේ
කුලුඳුලා වූ රූබන්ගේ පුත්‍රයෝ නම්: හනොක්,
පල්ලු, හෙශ්රොන් සහ කර්මී ය.
4 ජෝවෙලේගේ පුත්‍රයෝ නම්: ඔහුගේ පුත්‍රයා
ෂෙමායා ය; ඔහුගේ පුත්‍රයා ගොග් ය; ඔහුගේ
පුත්‍රයා ෂිමයි ය; 5 ඔහුගේ පුත්‍රයා මීකා ය;
ඔහුගේ පුත්‍රයා රයායා ය; ඔහුගේ පුත්‍රයා බාල්
ය; 6 2 රාජා 15:29ඔහුගේ පුත්‍රයා බයේරා ය; ඔහු
අසිරියාවේ රජ වූ තිල්ගත්-පිලසෙරේ විසින්
වහල්කමට ගෙනයනු ලැබුවේ ය. ඔහු
රූබන්වරුන්ගේ අධිපතියා ය.
7 තමන්ගේ පරම්පරා ලේඛනයෙහි ලියා තිබෙන
තමන්ගේ පවුල් අනුව ඔහුගේ සහෝදරයෝ නම්:
ප්‍රධානියා වූ ජෙයීයෙලේ සහ ශකරියා ය,
8 ජෝවෙලේගේ පුත්‍ර වූ ෂෙමාගේ පුත්‍රයා වන
ආශාශ්ගේ පුත් බෙලා ය. ඔහු අරෝයෙර්හි ද
නෙබෝ සහ බාල්-මෙයොන් දක්වා ද වාසය කළේ
ය. 9 නැගෙනහිරට ඔව්හු යුප්‍රටීස් ගංගාවේ පටන්
පාළුකරයට ඇතුළු වන තැන දක්වා වාසය කළෝ ය.
මන්ද, ඔවුන්ගේ සිවුපාවෝ ගිලියද් දේශයෙහි බහුල
ව සිටියෝ ය.
10 ඔව්හු සාවුල්ගේ දවස්වල දී හග්රීවරුන් සමඟ
යුද්ධ කොට ඔවුන් නැතිකර, ගිලියද්ට
නැගෙනහිරෙන් තිබෙන දේශය මුළුල්ලෙහි ඔවුන්ගේ
කූඩාරම්වල වාසය කළෝ ය.

## ගාද්ගේ ගෝත්‍රය

11 ගාද්ගේ පුත්‍රයෝ ඔවුන්ට ඉදිරිපිටින් බාෂාන්
දේශයේ සලකො දක්වා වාසය කළෝ ය. 12 ඔව්හු
නම්: ප්‍රධානියා වූ ජෝවෙලේ, දෙවෙනියා වූ ෂාපාම්,
ජානයි සහ ෂාපාත් ය. ඔව්හු බාෂාන්හි සිටියෝ ය.
13 තමන්ගේ පිය වංශ ප්‍රකාරයට ඔවුන්ගේ
සහෝදරයෝ නම්: මීකායෙලේ ද මෙෂුල්ලාම් ද ෂෙබා
ද ජෝරයි ද ජාකාන් ද ෂිය ද ඒබෙර් ද යන සත්දෙනා
ය. 14 මොවුහු බූශ්ගේ පුත්‍රයා වන ජාඩෝගේ පුත්
ජෙෂිෂයිගේ පුත්‍රයා වන මීකායෙලේගේ පුත්
ගිලියද්ගේ පුත්‍රයා වන ජාරොවාගේ පුත් හූරීගේ
පුත්‍රයා වන අබීහයිල්ගේ පුත්‍රයෝ ය. 15 ගූනීගේ
පුත් අබ්දියෙලේගේ පුත්‍රයා වන අහී ඔවුන්ගේ පිය
වංශවල ප්‍රධානියා ය. 16 ඔව්හු ගිලියද්හි ද
බාෂාන්හි ද එහි නුවරවල ද ෂාරොන්හි සියලු තණ
බිම්වල ද තමන්ගේ සීමා දක්වා වාසය කළෝ ය.
17 මේ සියල්ලෝ ම ජුදාහි රජ වූ ජෝතාම්ගේ
දවස්වල දී ද ඉශ්රායලේ රජ වූ ජෙරොබෝවම්ගේ
දවස්වල දී ද පෙළපත් වශයෙන් ලියවුණෝ ය.

## ජොර්දානෙන් එගොඩ ගෝත්‍ර

18 රූබන්වරුන්ගෙන් ද ගාද්වරුන්ගෙන් ද
මනස්සේගේ අර්ධ ගෝත්‍රයෙන් ද පලිහත්, කඩුවත්
පාවිච්චි කරන දුන්නෙන් විදින යුද්ධයට දක්ෂ
වික්‍රමාන්විත මනුෂ්‍යයෝ හතළිස්හාරදාස් හත්සිය
හැටක් වූවෝ ය. ඔව්හු යුද්ධයට යන්න පුළුවන් අය
වෙති. 19 ඔව්හු හග්රීවරුන් ද ජටූර් ද නාෆීෂ් ද
නෝදාබ් ද සමඟ යුද්ධ කළෝ ය. 20 ඒ අයට විරුද්ධ
ව ඔවුන්ට පිහිට ලැබුණු බැවින් හග්රීවරු ද ඔවුන්
සමඟ සිටි සියල්ලෝ ද ඔවුන් අතට පාවා දෙන
ලද්දෝ ය. මන්ද, සටනේ දී ඔව්හු දෙවියන්
වහන්සේට යාච්ඤා කළෝ ය. ඔවුන් උන් වහන්සේ
කෙරෙහි විශ්වාස කළ බැවින් උන් වහන්සේ ඔවුන්ට
ඇහුම්කන් දුන් සේක. 21 ඔව්හු ඔවුන්ගේ සිව්පාවුන්
වන ඔවුන්ගේ ඔටුවන් පණස්දහසක් ද බැටළුවන්
දලක්ෂ පණස්දහසක් ද කොටළුවන් දෙදහසක් ද
මිනිසුන් ලක්ෂයක් ද අල්ලාගෙන ගියෝ ය. 22 යුද්ධය
දෙවියන් වහන්සේ කෙරෙන් වූ නිසා බොහෝ
දෙනෙක් ම මැරුම්කා වැටුණෝ ය. වහල්කමට ගෙන
යාම දක්වා ඔව්හු මොවුන්ගේ දේශයෙහි වාසය
කළෝ ය.
23 මනස්සේගේ අර්ධ ගෝත්‍රයේ ජනයා බාෂාන්
පටන් බාල්-හෙර්මොන් ද සෙනීර් ද හෙර්මොන් කන්ද
ද දක්වා දේශයෙහි වාසය කළෝ ය. ඔව්හු ගණනින්
වැඩි වූවෝ ය. 24 ඔවුන්ගේ පිය වංශවල
ප්‍රධානියෝ මොවුහු ය: ඒපෙර්, ඉෂී, එලියෙලේ,
අශ්රියෙලේ, ජෙරමියා, හෝදවියා සහ ජාදියෙලේ ය.
ඔව්හු බලවන්තයන් ව, කීර්තිමත් මනුෂ්‍යයන් ව,
තමන්ගේ පිය වංශවල ප්‍රධානියන් ව සිටියෝ ය.
25 එහෙත්, ඔව්හු තමන්ගේ පියවරුන්ගේ දෙවියන්
වහන්සේට අවිශ්වාසවන්ත වී උන් වහන්සේ ඔවුන්
ඉදිරියෙන් විනාශ කළ රට වැසියන්ගේ දෙවිවරුන්
වැළඳ ගත්තෝ ය. 26 2 රාජා 15:19,29;
17:6ඉශ්රායලේවරුන්ගේ දෙවියන් වහන්සේ ද
අසිරියාවේ රජ වූ පූල්ගේ සිතත් අසිරියාවේ රජ වූ
තිල්ගත්-පිලසෙරේගේ සිතත් පොළඹවා, ඔවුන්
එනම්, රූබන්වරුන් ද ගාද්වරුන් ද මනස්සේගේ අර්ධ
ගෝත්‍රය ද ගෙන ගොස්, හලාටත්, හාබෝර්ටත්,
හාරාටත්, ගෝෂාන්හි ගංගාව ළඟටත් පැමිණෙවූ
සේක. ඔව්හු අද දක්වා එහි සිටිති.

## ලෙවීගේ ගෝත්‍රය

6 ලෙවීගේ පුත්‍රයෝ නම්: ගේර්ෂොම්,
කොහාත් සහ මෙරාරී ය.
2 කොහාත්ගේ පුත්‍රයෝ නම්: අම්රාම්, ඉශ්හාර්,
හෙබ්රොන් සහ උශ්ශියෙලේ ය.
3 අම්රාම්ගේ දරුවෝ නම්: ආරොන්, මෝසෙස් සහ
මිරියම් ය. ආරොන්ගේ පුත්‍රයෝ නම්: නාදාබ්,
අබීහු, එලයොසර් සහ ඊතාමාර් ය.
4 එලයොසර්ට දාව පිනෙහාස් ද පිනෙහාස්ට දාව
අබීෂුවා ද; 5 අබීෂුවාට දාව බුක්කී ද; බුක්කීට දාව
උශ්ශි ද 6 උශ්ශිට දාව සෙරෙහියා ද සෙරෙහියාට දාව

මරොයාතොත් ද; 7 මරොයාතොත්ට දාව අමරියා ද
අමරියාට දාව අහිතුබ් ද; 8 අහිතුබ්ට දාව ශාදාොක් ද
ශාදාොක්ට දාව අහීමයාශ් ද; 9 අහීමයාශ්ට දාව
අශරියා ද අශරියාට දාව ජොහානාන් ද;
10 ජොහානාන්ට දාව අශරියා ද උපන්නෝ ය.
සලමොන් ජෙරුසලමේ ගොඩනැඟුවාවූ මාලිගාවෙහි
පූජක තනතුරේ කටයුතු ඉෂ්ට කළේ ඔහු ය.
11 අශරියාට දාව අමරියා ද අමරියාට දාව අහීතුබ් ද;
12 අහීතුබ්ට දාව ශාදාොක් ද ශාදාොක්ට දාව ෂල්ලුම්
ද; 13 ෂල්ලුම්ට දාව හිල්කියා ද හිල්කියාට දාව
අශරියා ද; 14 අශරියාට දාව සරොයා ද සරොයාට
දාව ජෙහෝශාදාක් ද උපන්නෝ ය. 15 සමිඳාණන්
වහන්සේ නබුකද්නෙශර් අතින් ජුදාවරුන් ද
ජෙරුසලමේ වැසියන් ද වහල්කමට හරින විට
ජෙහෝශාදාක් ද ගියේ ය.
16 නික්ම 6:15-19 ලෙවීගේ පුත්‍රයෝ නම්:
ගේර්ෂොම්, කොහාත් සහ මෙරාරී ය.
17 ගේර්ෂොම්ගේ පුත්‍රයන්ගේ නාම නම්: ලිබ්නි
සහ ෂිමයි ය. 18 කොහාත්ගේ පුත්‍රයෝ නම්:
අම්රාම්, ඉශ්හාර්, හබ්රොන් සහ උශ්ශියලේ ය.
19 මෙරාරීගේ පුත්‍රයෝ නම්: මාලී සහ මුෂී ය.
ලෙවීවරුන්ගේ පවුල් ඔවුන්ගේ පියවරුන්ගේ වංශ
ප්‍රකාරයට මෙසේ ය: 20 ගේර්ෂොම්ගේ පුත්‍රයා
ලිබ්නි ය; ඔහුගේ පුත්‍රයා ජහත් ය; ඔහුගේ
පුත්‍රයා සිම්මා ය; 21 ඔහුගේ පුත්‍රයා ජෝවා ය;
ඔහුගේ පුත්‍රයා ඉද්දෝ ය; ඔහුගේ පුත්‍රයා ශෙරා
ය; ඔහුගේ පුත්‍රයා ජෙයොතෙරයි ය.
22 කොහාත්ගේ පුත්‍රයා නම්: අම්මීනාදාබ් ය;
ඔහුගේ පුත්‍රයා කෝරා ය; ඔහුගේ පුත්‍රයා අස්සීර්
ය; 23 ඔහුගේ පුත්‍රයා එල්කානා ය; ඔහුගේ
පුත්‍රයා එබ්යාසාප් ය; ඔහුගේ පුත්‍රයා අස්සීර් ය;
24 ඔහුගේ පුත්‍රයා තහත් ය; ඔහුගේ පුත්‍රයා
උරියලේ ය; ඔහුගේ පුත්‍රයා උශ්ශියා ය; ඔහුගේ
පුත්‍රයා ෂාවුල් ය.
25 එල්කානාගේ පුත්‍රයෝ නම්: අමාසයි සහ
අහීමොත් ය. 26 ඔහුගේ පුත්‍රයා එල්කානා ය;
ඔහුගේ පුත්‍රයා එල්කානා-ශෝපෙයි ය; ඔහුගේ
පුත්‍රයා නහත් ය; 27 ඔහුගේ පුත්‍රයා එලියාබ් ය;
ඔහුගේ පුත්‍රයා ජෙරොහාම් ය; ඔහුගේ පුත්‍රයා
එල්කානා ය.
28 සාමුවෙලේගේ පුත්‍රයෝ නම්: කුලුඳුලා වූ
ජෝවෙලේ සහ දෙවෙනියා වූ අබියා ය.
29 මෙරාරීගේ පුත්‍රයා නම්: මාලී ය, ඔහුගේ
පුත්‍රයා ලිබ්නි ය; ඔහුගේ පුත්‍රයා ෂිමයි ය;
30 ඔහුගේ පුත්‍රයා උශ්ශා ය; ඔහුගේ පුත්‍රයා
ෂිමයො ය; ඔහුගේ පුත්‍රයා හග්ගියා ය; ඔහුගේ
පුත්‍රයා අසායා ය.

### මාලිගාවේ ගායකයෝ

31 ගිවිසුම් කරඬුව පිහිටවූ විට සමිඳාණන්
වහන්සේගේ මාලිගාවෙහි ගීතිකා මෙහෙයට දාවිත්
විසින් පත් කරනු ලැබුවෝ මොවුහු ය. 32 සලමොන්
ජෙරුසලමෙහි සමිඳාණන් වහන්සේගේ මාලිගාව
ගොඩනඟන තුරු ඔව්හු සම්මුඛ මණ්ඩපය ඉදිරිපිට
ගීතිකා මෙහෙයෙ පවත්වමින් තමන්ගේ පන්ති
පරිද්දනේ තමන්ගේ තනතුරෙහි යෙදී සිටියෝ ය.
33 එසේ සිටි අය සහ ඔවුන්ගේ පුත්‍රයෝ
මොවුහු ය: කොහාත් පරපුරනේ ගායනාකාර හේමන්
ය. ඔහු ජෝවෙලේගේ පුත්‍රයා ය; ඔහු සාමුවෙලේගේ
පුත්‍රයා ය; 34 ඔහු එල්කානාගේ පුත්‍රයා ය; ඔහු
ජෙරොහාම්ගේ පුත්‍රයා ය; ඔහු එලියෙලේගේ
පුත්‍රයා ය; ඔහු තෝවාගේ පුත්‍රයා ය; 35 ඔහු
ශුප්ගේ පුත්‍රයා ය; ඔහු එල්කානාගේ පුත්‍රයා ය;
ඔහු මහත්ගේ පුත්‍රයා ය; ඔහු අමාසයිගේ පුත්‍රයා
ය; 36 ඔහු එල්කානාගේ පුත්‍රයා ය; ඔහු
ජෝවෙලේගේ පුත්‍රයා ය; ඔහු අශරියාගේ පුත්‍රයා
ය; ඔහු ශෙපෙනියාගේ පුත්‍රයා ය; 37 ඔහු තාහත්ගේ
පුත්‍රයා ය; ඔහු අස්සීර්ගේ පුත්‍රයා ය; ඔහු
එබ්යාසාප්ගේ පුත්‍රයා ය; ඔහු කෝරාගේ පුත්‍රයා
ය; 38 ඔහු ඉශ්හාර්ගේ පුත්‍රයා ය; ඔහු
කොහාත්ගේ පුත්‍රයා ය; ඔහු ලෙවීගේ පුත්‍රයා ය;
ඔහු ඉශ්රායලේගේ පුත්‍රයා ය.
39 ඔහුට දකුණනේ සිටියේ ඔහුගේ සහෝදර
ආසාප් ය. ආසාප් බෙරෙකියාගේ පුත්‍රයා ය; ඔහු
ෂිමයොගේ පුත්‍රයා ය; 40 ඔහු මිකායලේගේ
පුත්‍රයා ය; ඔහු බයසයොගේ පුත්‍රයා ය; ඔහු
මල්කියාගේ පුත්‍රයා ය; 41 ඔහු එත්නිගේ පුත්‍රයා
ය; ඔහු ශෙරොගේ පුත්‍රයා ය; ඔහු අදායාගේ
පුත්‍රයා ය; 42 ඔහු ඒතාන්ගේ පුත්‍රයා ය; ඔහු
සිම්මාගේ පුත්‍රයා ය; ඔහු ෂීමයිගේ පුත්‍රයා ය;
43 ඔහු ජහත්ගේ පුත්‍රයා ය; ඔහු ගේර්ෂොම්ගේ
පුත්‍රයා ය; ඔහු ලෙවීගේ පුත්‍රයා ය.
44 ඔවුන්ගේ සහෝදරයන් වන මෙරාරීගේ
පුත්‍රයෝ වමනේ සිටියෝ ය. එනම්: ඒතාන් ය. ඔහු
කිෂිගේ පුත්‍රයා ය; ඔහු අබ්දීගේ පුත්‍රයා ය; ඔහු
මල්ලූක්ගේ පුත්‍රයා ය; 45 ඔහු හෂබියාගේ පුත්‍රයා
ය; ඔහු අමශියාගේ පුත්‍රයා ය; ඔහු හිල්කියාගේ
පුත්‍රයා ය; 46 ඔහු අම්ශීගේ පුත්‍රයා ය; ඔහු
බානීගේ පුත්‍රයා ය; ඔහු ෂමෙරේගේ පුත්‍රයා ය;
47 ඔහු මාලීගේ පුත්‍රයා ය; ඔහු මුෂීගේ පුත්‍රයා ය;
ඔහු මෙරාරීගේ පුත්‍රයා ය; ඔහු ලෙවීගේ පුත්‍රයා
ය. 48 ඔවුන්ගේ සහෝදරයන් වූ ලෙවීවරු දෙවියන්
වහන්සේගේ මාලිගාව වන මණ්ඩපයේ මුළු
මෙහෙයට පත් වී සිටියෝ ය.

### ආරොන්ගේ පුත්‍රයෝ

49 එහෙත්, ආරොන් ද ඔහුගේ පුත්‍රයෝ ද
දෙවියන් වහන්සේගේ මෙහෙකරු වූ මෝසෙස් විසින්
අණ කරන ලද සියල්ල ලෙසෙ දවන යාග පූජා පුදන
පූජාසනයත්, දුම් පූජාසනයත් පිට ඔප්පු කරන්නට ද
අතිශුද්ධස්ථානයේ මුළු මෙහෙයෙ කරන්නට ද
ඉශ්රායලේවරුන්ගේ පව් උදෙසා සහභාගිවීමේ පූජා
ඔප්පු කරන්නට ද නියම වී සිටියෝ ය.
50 ආරොන්ගේ පුත්‍රයෝ මොවුහු ය: ඔහුගේ
පුත්‍රයා එලයොසර් ය; ඔහුගේ පුත්‍රයා ෆිනෙහාස්
ය; ඔහුගේ පුත්‍රයා අබිෂූවා ය; 51 ඔහුගේ පුත්‍රයා

බුක්කී ය; ඔහුගේ පුත්‍රයා උශ්ශි ය; ඔහුගේ
පුත්‍රයා ශරෙහියා ය; 52 ඔහුගේ පුත්‍රයා
මෙරායොත් ය; ඔහුගේ පුත්‍රයා අමරියා ය; ඔහුගේ
පුත්‍රයා අහිතුබ් ය; 53 ඔහුගේ පුත්‍රයා ශාදොක් ය;
ඔහුගේ පුත්‍රයා අහීමයාශ් ය.

## ලෙවීවරුන්ගේ නගර

54 කොහාත්වරුන්ගේ පවුල් අතරෙන් ආරොන්ගේ
පුත්‍රයන්ගේ වාසස්ථාන ඔවුන්ගේ සීමා තුළෙහි වූ
ඔවුන්ගේ කඳවුරුවල හැටියට මේවා ය. මන්ද, පස
ඇටය වැටුණේ ඔවුන්ට ය. 55 ජුදා දේශයෙහි වූ
හෙබ්රොන් සහ ඒ වටකරින් වූ එහි තණ බිම් ද
ඔවුන්ට දෙන ලද්දේ ය. 56 එහෙත්, නුවර කෙතේ ද
එහි ගම් ද ජෙපුන්නේගේ පුත් කාලෙබ්ට දෙන
ලද්දේ ය. 57 ආරක්ෂා නගරයක් වූ හෙබ්රොන් ද
ලිබ්නා සහ එහි තණ බිම් ද ජත්තීර් ද එෂ්තමොව
සහ එහි තණ බිම් ද; 58 හිලේන් සහ එහි තණ බිම්
ද දෙබීර් සහ එහි තණ බිම් ද; 59 ආෂාන් සහ එහි
තණ බිම් ද බෙත්-ෂෙමෙෂ් සහ එහි තණ බිම් ද;
60 බෙන්ජමින් ගෝත්‍රයෙන් ගෙබා සහ එහි තණ
බිම් ද අල්ලෙමෙත් සහ එහි තණ බිම් ද අනාතොත්
සහ එහි තණ බිම් ද ආරොන්ගේ පුත්‍රයන්ට දෙන
ලද්දේ ය. ඔවුන්ගේ මුළු පවුල් ප්‍රකාරයට ඔවුන්ගේ
සියලු නගර දහතුනක් ය. 61 කොහාත්ගේ
පුත්‍රයන්ට මනස්සේගේ අර්ධ ගෝත්‍රයෙන් ද නගර
දහයක් පස ඇට දැමීමෙන් ලැබුණේ ය.
62 ගේර්ෂොම්ගේ පුත්‍රයන්ට තමන්ගේ පවුල්
ප්‍රකාරයට ඉස්සාකර් ගෝත්‍රයෙන් ද ආෂෙර්
ගෝත්‍රයෙන් ද නප්තලී ගෝත්‍රයෙන් ද බාෂාන්හි
සිටි මනස්සේගේ අර්ධ ගෝත්‍රයෙන් ද නගර
දහතුනක් ලැබුණේ ය. 63 මෙරාරීගේ පුත්‍රයන්ට
ඔවුන්ගේ පවුල් ප්‍රකාරයට රූබන් ගෝත්‍රයෙන් ද
ගාද් ගෝත්‍රයෙන් ද සාබුලොන් ගෝත්‍රයෙන් ද
නගර දොළොසක් පස ඇට දැමීමෙන් ලැබුණේ ය.
64 ඉශ්රායෙල් පුත්‍රයෝ මේ නගර සහ ඒවායේ
තණ බිම් ද ලෙවීවරුන්ට දුන්නෝ ය. 65 ජුදා
පුත්‍රයන්ගේ ගෝත්‍රයෙන් ද සිමියොන් පුත්‍රයන්ගේ
ගෝත්‍රයෙන් ද බෙන්ජමින් පුත්‍රයන්ගේ
ගෝත්‍රයෙන් ද නම් වශයෙන් කියන ලද මේ නගර
ඔව්හු පස ඇට දමා දුන්නෝ ය.
66 කොහාත්ගේ පුත්‍රයන්ගේ අනික් පවුල්වලට
ඔවුන්ගේ සීමා තුළෙහි වූ නගර එප්‍රායිම්ගේ
ගෝත්‍රයෙන් ලැබුණේ ය. 67 මෙසේ එප්‍රායිම් කඳු
රටේ තිබෙන ආරක්ෂා නගරයක් වූ ෂෙකෙම් සහ
එහි තණ බිම් ද ගෙශෙර් සහ එහි තණ බිම් ද;
68 ජොක්මෙයාම් සහ එහි තණ බිම් ද බෙත්-
හෝරොන් සහ එහි තණ බිම් ද; 69 අයාලෝන් සහ
එහි තණ බිම් ද; ගැත්-රිම්මෝන් සහ එහි තණ බිම්
ද; 70 මනස්සේගේ අර්ධ ගෝත්‍රයෙන් ආනේර් සහ
එහි තණ බිම් ද බිලෙයාම් සහ එහි තණ බිම් ද
කොහාත් පුත්‍රයන්ගේ අනික් පවුල්වලට දෙන
ලද්දේ ය.

71 ගේර්ෂොම්ගේ පුත්‍රයන්ට මනස්සේගේ අර්ධ
ගෝත්‍රය යන පවුලෙන් බාෂාන්හි ගෝලාන් සහ එහි
තණ බිම් ද අෂ්ටාරොත් සහ එහි තණ බිම් ද;
72 ඉස්සාකර් ගෝත්‍රයෙන් කෙදෙෂ් සහ එහි තණ
බිම් ද දාබෙරත් සහ එහි තණ බිම් ද; 73 රාමොත්
සහ එහි තණ බිම් ද ආනේම් සහ එහි තණ බිම් ද;
74 ආෂෙර් ගෝත්‍රයෙන් මාෂාල් සහ එහි තණ බිම්
ද අබ්දොන් සහ එහි තණ බිම් ද; 75 හුකොක් සහ
එහි තණ බිම් ද රෙහොබ් සහ එහි තණ බිම් ද;
76 නප්තලීගේ ගෝත්‍රයෙන් ගලීලයේ කෙදෙෂ්
සහ එහි තණ බිම් ද හම්මෝන් සහ එහි තණ බිම්
ද කිරියාතයිම් සහ එහි තණ බිම් ද ලැබුණේ ය.
77 මෙරාරීගේ අනික් පුත්‍රයන්ට සාබුලොන්
ගෝත්‍රයෙන් රිම්මොන් සහ එහි තණ බිම් ද
තාබෝර් සහ එහි තණ බිම් ද;
78 ජෙරිකෝව ළඟ ජොර්දානෙන් එගොඩ
ජොර්දානට නැගෙනහිරෙන් රූබන් ගෝත්‍රයෙන්
පාළුකරයෙහි තිබෙන බෙශෙර් සහ එහි තණ බිම් ද
ජහශා සහ එහි තණ බිම් ද; 79 කෙදෙමොත් සහ
එහි තණ බිම් ද මේපයත් සහ එහි තණ බිම් ද;
80 ගාද් ගෝත්‍රයෙන් ගිලියද්හි රාමොත් සහ එහි
තණ බිම් ද මහනයිම් සහ එහි තණ බිම් ද
81 හෙෂ්බොන් සහ එහි තණ බිම් ද ජාශෙර් සහ එහි
තණ බිම් ද ලැබුණේ ය.

## ඉස්සාකර්ගේ ගෝත්‍රය

7 ඉස්සාකර්ගේ පුත්‍රයෝ නම්: තෝලා, පුවා,
ජාෂුබ්, ශිම්රොන් යන සතරදෙනා ය.
2 තෝලාගේ පුත්‍රයෝ නම්: උශ්ශි, රෙපායා,
ජෙරීයෙල්, ජාමයි, ඉබ්සාම් සහ ෂමුවෙල් ය; ඔව්හු
තෝලාට අයිති තමන්ගේ පිය වංශවල ප්‍රධානියන්
ව, තමන්ගේ පෙළපත්වල බලවන්ත මනුෂ්‍යයෝ වූ
හ. දාවිත්ගේ කාලයේ දී ඔවුන්ගේ ගණන
විසිදෙදහස් හයසියයක් විය.
3 උශ්ශිගේ පුත්‍රයෝ නම්: ඉස්රායා සහ
ඉස්රායාගේ පුත්‍රයන් වූ මීකායෙල් ද ඔබදියා ද
ජෝවෙල් ද ඉෂ්ෂියා ද යන පස්දෙනා ය. ඒ සියල්ලෝ
ප්‍රධාන මනුෂ්‍යයෝ ය. 4 ඔවුන් සමඟ තමන්ගේ
පරම්පරා වශයෙන් ද තමන්ගේ පිය වංශවල
ප්‍රකාරයට ද ගණනින් තිස්හයදහසක් වූ යුද්ධ
හමුදාවල් සිටියෝ ය. ඔවුන්ට බොහෝ භාර්යාවෝ
සහ පුත්‍රයෝ වූ හ.
5 සියලු ඉස්සාකර් පවුල් අතරෙහි බලවන්ත
මනුෂ්‍යයන් ව සිටි ඔවුන්ගේ සහෝදරයෝ,
සියල්ලන්ගේ ලේඛනයේ හැටියට අසූහත්දහසක් වූ
හ.

## බෙන්ජමින්ගේ ගෝත්‍රය

6 බෙන්ජමින්ගේ පුත්‍රයෝ නම්: බෙලා, බෙකෙර්,
ජෙදීයයෙල් යන තුන්දෙනා ය.
7 බෙලාගේ පුත්‍රයෝ නම්: එශ්බොන්, උශ්ශිය,
උශ්ශියෙල්, ජෙරිමොත්, ඊරී යන පස්දෙනා ය. ඔව්හු
තමන්ගේ පිය වංශවල ප්‍රධානියන් ව, බලවන්ත

මනුෂ්‍යයන් ව සිටියෝ ය. ඔව්හු පළෙපත් වශයනේ
ගණන් කරන ලදුව විසිදදොස් තිස්හතරදනෙකේ වූ
හ.
8 බකෙරේගේ පුත්‍රයෝ නම්: ශමේරා, ජෝවාෂ්,
එලියසෙර්, එලියෝයේනෙයි, ඔම්රී, ජරේමෝත්, අබියා,
අනාතෝත් සහ ආලමෙතේ ය. මේ සියල්ලෝ
බකෙරේගේ පුත්‍රයෝ ය. 9 ඔවුන්ගේ පළෙපත්
වශයනේ තමන්ගේ පරම්පරා හැටියට, තමන්ගේ
පිය වංශවල ප්‍රධානියන් ව සිටි බලවන්ත
මනුෂ්‍යයෝ විසිදාස් දසෙියයක් ය.
10 ජදේියයලේගේ පුත්‍රයා නම්: බිල්හන් ය.
බිල්හන්ගේ පුත්‍රයෝ නම්: ජවෙුෂ්, බනේජමින්,
ඒහුද්, කනෙනා, ශේතාන්, තර්ෂිෂ් සහ අහිෂාහර් ය.
11 මේ සියල්ලෝ තමන්ගේ පිය වංශවල
ප්‍රකාරයට ජදේියයලේගේ පුත්‍රයන් ව, සේනා
වශයනේ යුද්ධයට යන්නට පුළුවන් වූ බලවන්ත
මනුෂ්‍යයන් ව සිටියෝ ය. ඔව්හු දහහත්දාස්
දසෙියදනෙකේ වූ හ. 12 ෂුප්පීම් ද හුප්පීම් ද ඊර්ගේ
පුත්‍රයෝ ය. හුෂිම් අහරේගේ පුත්‍රයකේ ය.

## නප්තලීගේ ගෝත්‍රය

13 නප්තලීගේ පුත්‍රයෝ නම්: බිල්හාගේ පුත්‍රයන්
වූ ජාශීයලේ, ගුනී, ජේශරේ සහ ෂල්ලුම් ය.

## මනස්සේගේ ගෝත්‍රය

14 මනස්සේගේ පුත්‍රයෝ: මනස්සේට අරමේය
උපභාර්යාවගනේ පුතුන් දදෙනෙකේ ලැබී ය. ඔව්හු
අශ්‍රීයලේ හා මාකීර් ය. මාකීර්, ගිලියද්ගේ පියා විය.
15 මාකීර් හුප්පීම් සහ ෂුප්පීම්ගේ සහෝදරී වූ
මයකා භාර්යාව කොට පාවාගත්තේ ය.
දවෙනියාගේ නම ශලෙොපෙහාද් ය.
ශලෙොපෙහාද්ට දූවරු සිටියෝ ය.
16 මාකීර්ගේ භාර්යාව වූ මයකා පුත්‍රයකු ලබා
ඔහුට පරෙෂේ යන නම තැබුවා ය. ඔහුගේ
සහෝදරයාගේ නම ෂරෙෂේ ය. ඔහුගේ පුත්‍රයෝ
නම්: ඌලාම් සහ රාකමේ ය. 17 ඌලාම්ගේ පුත්‍රයා
බදොන් ය. මොවුහු මනස්සේගේ පුත්‍රයා වන
මාකීර්ගේ පුත් ගිලියද්ගේ පුත්‍රයෝ ය.
18 ඔහුගේ සහෝදරී වූ හම්මොලකෙතේ ඊෂ්හොද්
සහ අබියේශරේ ද මාලා ද ලැබුවා ය. 19 ෂමේදාගේ
පුත්‍රයෝ නම්: අහයොන්, ෂකෙමේ, ලික්හි සහ
අනියාම් ය.

## එප්‍රායිම්ගේ ගෝත්‍රය

20 එප්‍රායිම්ගේ පුත්‍රයා ෂුතලො ය. ඔහුගේ
පුත්‍රයා බරෙදේ ය. ඔහුගේ පුත්‍රයා තාහත් ය.
ඔහුගේ පුත්‍රයා එලියාදා ය. 21 ඔහුගේ පුත්‍රයා
තාහත් ය; ඔහුගේ පුත්‍රයා සාබාද් ය; ඔහුගේ
පුත්‍රයා ෂුතලො ය. ඒ හැර එශරේ සහ එලයොද් ය.
මොවුන් දේශයේ උපන් ගාත්හි මනුෂ්‍යයන්ගේ
සිව්පාවුන් සොරකම් කරන්න බැස ආ බැවින් ඒ
මනුෂ්‍යයෝ මොවුන් මැරුවෝ ය. 22 මොවුන්ගේ පිය
වූ එප්‍රායිම් ද බොහෝ දවස් වැළපුණේ ය. ඔහුගේ
සහෝදරයෝ ඔහු සනසන්නට ආවෝ ය. 23 ඔහු
තමාගේ භාර්යාව කරා පැමිණි කල ඈ පිළිසිඳගනෙ
පුත්‍රයකු ලැබුවා ය. තමාගේ පවුලට විපත්තිය
පැමිණි නිසා ඔහු ඔහුට බරෙියා යන නම තැබී ය.
24 එප්‍රායිම්ගේ දූව ෂයෙරෝ ය. ඈ පහළ සහ
ඉහළ බතේ-හෝරොනේහි නගර ද උශ්ශේන්-ෂයෙරෝ
ද ගොඩනැඟුවා ය.
25 ඔහුගේ පුත්‍රයා රපො ය; රපොගේ පුත්‍රයා
රෂෙපේ ය; රෂෙපේගේ පුත්‍රයා තලො ය; ඔහුගේ
පුත්‍රයා තහන් ය; 26 ඔහුගේ පුත්‍රයා ලාදාන් ය;
ඔහුගේ පුත්‍රයා අම්මීහුද් ය; ඔහුගේ පුත්‍රයා
එලිෂාමා ය; 27 ඔහුගේ පුත්‍රයා නූන් ය; ඔහුගේ
පුත්‍රයා ජෝෂුවා ය.
28 ඔවුන්ගේ උරුම වාසස්ථාන නම්: බතෙලේ සහ
එහි ගම් ද නැගනෙහිරට නයරාන් ද බස්නාහිරට
ගශෙරේ සහ එහි ගම් ද අස්සා සහ එහි ගම් ද
දක්වා ෂකෙමේ සහ එහි ගම් ද විය.
29 මනස්සේගේ ජනයාගේ සීමා දිගට බතේ-
ෂයොන් සහ එහි ගම් ද තයනාක් සහ එහි ගම් ද
මගෙිද්දෝ සහ එහි ගම් ද දෝර් සහ එහි ගම් ද
යන මේවා ය. මේවායෙහි ඉශ්‍රායලේගේ පුත්
ජෝසපේගේ පුත්‍රයෝ වාසය කළෝ ය.

## ආෂරේගේ ගෝත්‍රය

30 ආෂරේගේ පුත්‍රයෝ නම්: ඉම්නා, ඉෂ්වා, ඉෂ්වී,
බරෙියා සහ ඔවුන්ගේ සහෝදරී වූ සරෝ ය.
31 බරෙියාගේ පුත්‍රයෝ නම්: හබෙරේ සහ
මල්කියලේ ය. ඔහු බිර්ශායිත්ගේ පියා ය.
32 හබෙරේට දාව ජප්ලතේ ද ෂෝමරේ ද හෝතාම්
ද ඔවුන්ගේ සහෝදරී වූ ෂූවා ද උපන්නෝ ය.
33 ජප්ලතේගේ පුත්‍රයෝ නම්: පාසක්, බිම්හාල්
සහ අෂ්වාත් ය. මොවුහු ජප්ලතේගේ පුත්‍රයෝ ය.
34 ෂමෙරේගේ පුත්‍රයෝ නම්: අහි, රොක්ගා,
ජහෙුබ්බා සහ අරාම් ය.
35 ඔහුගේ සහෝදර වූ හේලමේගේ පුත්‍රයෝ
නම්: ශෝපා, ඉම්නා, ෂලෙසේ සහ අමාල් ය.
36 ශෝපාගේ පුත්‍රයෝ නම්: සුවා, හර්නපෙරේ,
ෂූවාල්, බේරී, ඉම්රා; 37 බශෙරේ, හෝඩ්, ෂම්මා,
ෂිල්ෂා, ඉත්රාන් සහ බයෙේරා ය.
38 ජතෙරේගේ පුත්‍රයෝ නම්: ජපෙුන්නේ, පිස්පා
සහ අරා ය. 39 උල්ලාගේ පුත්‍රයෝ නම්: ආරක්,
හන්නියලේ සහ රිසියා ය.
40 මේ සියල්ලෝ ආෂරේගේ පුත්‍රයෝ ය. ඔව්හු
තමන්ගේ පිය වංශවල ප්‍රධානියන් ව උතුම් වූ
බලවන්ත මනුෂ්‍යයන් ව; ප්‍රධාන අධිපතියන් ව
සිටියෝ ය. පළෙපත් හැටියට යුද්ධ සේවයට ගණන්
ගන්නා ලද්දෝ විසිහයදහසක් ය.

## බනේජමින්ගේ ගෝත්‍රය

8 බනේජමින්ට දාව ඔහුගේ කුලුඳුලා වූ බලො ද
දවෙනියා වූ අෂ්බලේ ද තුන්වැනියා වූ අහරා ද
2 සතරවැනියා වූ නෝහා ද පස්වැනියා වූ රාපා ද
උපන්නෝ ය. 3 බලොට පුත්‍රයෝ සිටියෝ ය. එනම්:

අද්දාර්, ගේරා, අබීහුද්, 4 අබීෂුවා, නාමාන්, අහෝවා,
5 ගේරා, ෂෙෆුපාන් සහ හූරාම් ය.
6 ඒහුද්ගේ පුත්‍රයෝ ගබොහි වැසියන්ගේ පිය
වංශවල ප්‍රධානියෝ ය. මොවුහු මානහත්හි
විප්‍රවාසයට ගෙන යන ලදහ. 7 මොවුහු නම්
නාමාන්, අහියා සහ ගේරා ය. ඔව්හු විප්‍රවාසයට
ගෙන යන ලද්දේ ගේරා විසිනි. මොහුට දාව උස්සා
ද අහිහුද් ද උපන්නෝ ය.
8 ෂහරයිම් ඔහුගේ භාර්යාවන් වූ හුෂිම් ද, බයරා
ද අත්හැරියේ ය. 9 ඉන්පසු ඔහුට මෝවබ් රටේ දී
ඔහුගේ භාර්යාව වූ හෝඩෙෂ්ගෙනේ පුත්‍රයන්
ලැබිණි. ඔව්හු නම්, ජෝබාබ්, ශිබියා, මේෂා,
මල්කාම්, 10 ජෙවුශ්, ෂාකියා හා මිර්මා ය. මොවුහු
ඔහුගේ පිය වංශවල ප්‍රධානියන් ව සිටියෝ ය.
11 හුෂිම්ගෙනේ අබිතුබ් සහ එල්පයල් උපන්නෝ ය.
12 එල්පයල්ගේ පුත්‍රයෝ නම්: ඒබරේ, මිෂාම් සහ
ෂමෙඩේ ය. ෂමෙඩේ ඕනෝ ද ලොද් ද එහි ගම් ද
ගොඩනැඟුවේ ය. 13 බරියා සහ ෂමා
අයාලෝන්හි වැසියන්ගේ පිය වංශවල ප්‍රධානියෝ
වූ හ. ඔව්හු ගාත්හි වැසියන් පන්නා දැමූ හ.
14 අහියෝ ද ෂාෂාක් ද ජෙරේමොත් ද; 15 සබෙදියා
ද ආරාද් ද එදෙර් ද, 16 මිකායලේ ද ඉෂ්පා ද ජෝහා
ද බරියාගේ පුත්‍රයෝ ය.
17 සබෙදියා ද මෂුල්ලාම් ද හිස්කී ද හබෙරේ ද,
18 ඉෂ්මරෙයි ද ඉස්ලියා ද ජෝබාබ් ද එල්පයල්ගේ
පුත්‍රයෝ ය.
19 ජාකීම් ද ශික්රී ද ශබ්දී ද, 20 එලියේනයි ද
ශිල්ලතෙයි ද එලියලේ ද,
21 අදායා ද බරායා ද ෂිම්රාත් ද ෂිමයිගේ
පුත්‍රයෝ ය.
22 ඉෂ්පාන් ද ඒබරේ ද එලියලේ ද, 23 අබ්දෝන් ද
ශික්රී ද හානාන් ද, 24 හනනියා ද ඒලාම් ද
අන්තොතියා ද, 25 ඉප්දයා ද පනූයෙලේ ද
ෂාෂාක්ගේ පුත්‍රයෝ ය.
26 ෂම්ෂරෙයි ද ෂහෙරියා ද අතලියා ද,
27 ජාරෙෂියා ද එලියා ද ශික්රී ද ජෙරොහාම්ගේ
පුත්‍රයෝ ය. 28 මොවුහු තමන්ගේ පරම්පරාවලින්
පිය පෙළපත්වල මූලික ප්‍රධානියන් ව සිටියෝ ය.
මොවුහු ජෙරුසලමෙහි විසුවෝ ය.
29 ගිබියොන්ගේ පිය වූ ජෙයියෙලේ ගිබියොන්හි
විසුවේ ය, ඔහුගේ භාර්යාවගේ නම මයකා ය.
30 ඔහුගේ කුලුඳුල් පුත්‍රයා අබ්දෝන් ය; අනික්
පුත්‍රයෝ ශූර්, කිෂ්, බාල්, නාදාබ්, 31 ගෙදෝර්,
අහියෝ සහ සකෙරේ ය. 32 මික්ලොත්ට දාව
ෂිමයා උපන්නේ ය. ඔව්හු ද තමන්ගේ
සහෝදරයන් සමඟ තමන්ගේ සහෝදරයන්
ඉදිරිපිටින් ජෙරුසලමෙහි වාසය කළෝ ය.
33 නේර්ට දාව කිෂ් ද කිෂ්ට දාව සාවුල් ද සාවුල්ට
දාව ජොනතන් ද මල්කි-ෂුවා ද අබිනාදාබ් ද එෂ්බාල්
ද උපන්නෝ ය. 34 මෙරිබ්-බාල් ජොනතන්ගේ
පුත්‍රයා ය. මෙරිබ්-බාල්ට දාව මීකා උපන්නේ ය.
35 මීකාගේ පුත්‍රයෝ නම්: පීතොන්, මලෙක්,
තාරයා සහ ආහාස් ය. 36 ආහාස්ට දාව
ජෙහෝවද්දා ද ජෙහෝවද්දාට දාව අල්ලෙමෙත් ද
අශ්මාවෙත් ද සිම්රී ද උපන්නෝ ය. සිම්රීට දාව
මෝශා ද 37 මෝශාට දාව බිනයා ද උපන්නෝ ය.
ඔහුගේ පුත්‍රයා රාපා ය. ඔහුගේ පුත්‍රයා එලයොසා
ය. ඔහුගේ පුත්‍රයා ආශලේ ය.
38 ආශලේට පුත්‍රයෝ හයදෙනෙක් සිටියෝ ය.
ඔවුන්ගේ නම් මේවා ය: අශ්රිකාම්, බොකරු,
ඉෂ්මායලේ, ෂයෙරියා, ඔබදියා සහ හානාන් ය. මේ
සියල්ලෝ ආශලේගේ පුත්‍රයෝ ය. 39 ඔහුගේ
සහෝදර වූ එෂෙක්ගේ පුත්‍රයෝ නම්: ඔහුගේ
කුලුඳුලා වූ ඌලාම් ය. දෙවෙනියා වූ ජෙවුෂ් ය;
තුන්වැනියා වූ එලිපලෙත් ය.
40 ඌලාම්ගේ පුත්‍රයෝ බලවන්ත මනුෂ්‍යයන් ව,
දුනුකාරයන් ව සිටියෝ ය. ඔවුන්ට පුත්‍රයෝ ද
පුත්‍රයන්ගේ පුත්‍රයෝ ද බොහෝ දෙනෙක් එනම්,
එකසියපණහක් සිටියෝ ය. මේ සියල්ලෝ
බෙන්ජමින්ගේ පුත්‍රයෝ ය.

## ජෙරුසලමේ පවුල්වල ප්‍රධානියෝ

9 මෙසේ සියලු ඉශ්රායලේවරු පෙළපත්
වශයෙන් ලියවුණෝ ය. ඒවා ඉශ්රායලේ
රජවරුන්ගේ පොතේ ලියා තිබේ. ජුදාවරු තමන්ගේ
ද්‍රෝහිකම් නිසා බබිලෝනියට ගෙන යන ලද්දෝ ය.
2 එස්රා 2:27; නහෙම 7:73ආපසු අවුත් තමන්ගේ
උරුම කොටස්වල ද නගරවල ද වාසය කළ අය නම්:
ඉශ්රායලේවරුන්ගේ පූජකයෝත්, ලෙවීවරුත්, දේව
මාලිගාවේ මෙහෙකරුවන් වන නතිනීම්වරුත් ය.
3 ජුදා ගෝත්‍රයෙනුත්, බෙන්ජමින් ගෝත්‍රයෙනුත්,
එප්‍රායිම් සහ මනස්සේ ගෝත්‍රයෙනුත්
ජෙරුසලමෙහි වාසය කළ අය නම්:
4 ජුදාගේ පුත්‍රයා වන පෙරෙශ්ගේ පුත්‍රයන්ගෙනේ
බානිගේ පුත් ඉම්රිගේ පුත්‍රයා වන ඔම්රීගේ පුත්
අම්මිහුද්ගේ පුත්‍රයා වන ඌතයි ය.
5 ශිලෝනිවරුන්ගෙනේ කුලුඳුලා වූ අසායා සහ ඔහුගේ
පුත්‍රයෝ ය. 6 ශෙරාගේ පුත්‍රයන්ගෙනේ ජෙවුයෙලේ
සහ ඔවුන්ගේ සහෝදරයෝ හයසිය අනූදෙනෙක් ය.
7 බෙන්ජමින් ගෝත්‍රයෙනුත් හස්සෙනුවාගේ
පුත්‍රයා වන හෝදවියාගේ පුත් මෂුල්ලාම්ගේ
පුත්‍රයා වන සල්ලු ද 8 ජෙරොහාම්ගේ පුත්
ඉබ්නයා ද මික්රිගේ පුත්‍රයා වන උස්සිගේ පුත්
ඒලා ද ඉබ්නියාගේ පුත්‍රයා වන රෙවුයෙලේගේ පුත්
ෂෙපටියාගේ පුත්‍රයා වන මෂුල්ලාම් ද;
9 ඔවුන්ගේ පරම්පරාවල හැටියට ඔවුන්ගේ
සහෝදරයෝ නවසිය පණස්හයදෙනෙක් ද යන අය
ය. මේ සියලු මනුෂ්‍යයෝ තම තමන්ගේ පිය වංශ
ලසෙ පිය වංශවල ප්‍රධානියෝ වූ හ.

## ජෙරුසලමේ සිටි පූජකයෝ

10 පූජකයන්ගෙනේ ජදොයා ද ජෙහෝයාරිබ් ද
ජාකීන් ද; 11 දෙවියන් වහන්සේගේ මාලිගාවට
අධිපතියා වූ අහිතුබ්ගේ පුත්‍රයා වන
මෙරායොත්ගේ පුත් ශාදොක්ගේ පුත්‍රයා වන
මෂුල්ලාම්ගේ පුත් හිල්කියාගේ පුත්‍රයා වන
අශරියා ද; 12 මල්කියාගේ පුත්‍රයා වන පෂ්හූර්ගේ

පුත් ජරෙොහාම්ගේ පුත්‍රයා වන අදායා ද
ඉම්මේර්ගේ පුත් මෂිල්ලේමීත්ගේ පුත්‍රයා වන
මෂුල්ලාම්ගේ පුත් ජාසේරාගේ පුත්‍රයා වන
අදීයලේගේ පුත් මයසයි ද;
13 තමන්ගේ පිය වංශවල ප්‍රධානියන් වූ දෙවියන්
වහන්සේගේ මාලිගාවේ මෙහෙයේ කටයුතු කිරීමට
ඉතා සමර්ථ වූ ඔවුන්ගේ සහෝදරයන් වන එක්දාස්
සත්සිය හැටදනෙකේ ද යන අය වතේ.

## ජෙරුසලමේ වාසය කළ ලෙවීවරු

14 ලෙවීවරු නම්: මෙරොරීගේ පුත්‍රයන්ගෙනේ
හෂබියාගේ පුත්‍රයා වන අශ්රිකාම්ගේ පුත්
හෂ්ෂුබ්ගේ පුත්‍රයා වන ෂමොයා ය; 15 බක්බක්කර්,
හරෙෂ්, ගාලාල් සහ ආසාප්ගේ පුත් ශික්රීගේ
පුත්‍රයා වන මීකාගේ පුත් මත්තනියා ය;
16 ජෙදූතුන්ගේ පුත්‍රයා වන ගාලාල්ගේ පුත්
ෂමෙයියාගේ පුත්‍රයා වන ඔබදියා ය;
නටොෆාතිවරුන්ගේ ගම්වල විසූ එල්කානාගේ
පුත්‍රයා වන ආසාගේ පුත් බෙරෙකියා ය.
17 දොරටු පාලකයන් වූ ෂල්ලූම්, අක්කුබ්,
ටල්මොන්, අහිමාන් සහ ඔවුන්ගේ සහෝදරයෝත්
ය. ෂල්ලූම් ප්‍රධානියා ය. 18 මේ දක්වා මොවුහු
ලෙවීගේ පුත්‍රයන්ගේ කඳවුරු උදෙසා නැගෙනහිරට
තිබෙන රජුගේ දොරටුවේ දොරටු පාලකයෝ වූ හ.
19 කෝරාගේ පුත් එබියාසාප්ගේ පුත්‍රයා වන
කෝරේගේ පුත් වූ ෂල්ලූම් ද ඔහුගේ පිය වංශයට
අයිති ඔහුගේ සහෝදරයන් වන කොරෙහිවරු ද
සේවයේ කටයුතුවලට පත් වී සහ මණ්ඩප
දොරටුවල රැකවල්ලු වූ හ. ඔවුන්ගේ පියවරු
සමිඳාණන් වහන්සේගේ කඳවුරට ඇතුල් වන තැන
රැකවලුන් ලෙස සිටියෝ ය. 20 එලෙයාසර්ගේ පුත්
පීනෙහාස් පළමු ව ඔවුන් කෙරෙහි අධිපතියා ව
සිටියේ ය. සමිඳාණන් වහන්සේ ඔහු සමඟ සිටි
සේක.
21 මෙෂෙලෙමියාගේ පුත් ශකරියා සම්මුඛ
මණ්ඩපයේ දොරකඩ දොරටු පාලකයා ව සිටියේ ය.
22 දොරකඩවල දොරටු පාලකයන් කොට
තෝරාගන්න ලද ඒ සියල්ලෝ දෙසිය
දොළොස්දෙනෙකේ ය. ඔවුන්ගේ ගම්වල හැටියට
ඔව්හු ලියාපදිංචි වූ හ. දාවිත් සහ දිවැසිවරයා වූ
සාමුවෙලේ ද ඔවුන්ගේ නිලවලට ඔවුන් පත් කළෝ
ය. 23 ඔව්හු ද ඔවුන්ගේ පුත්‍රයෝ ද ගෘහ
මණ්ඩපය වන සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ
දොරටු මාරුවනේ මාරුවට මුර කළහ. 24 නැගෙනහිර
ද බස්නාහිර ද උතුර ද දකුණ ද යන සතර පැතිවල
දොරටු පාලකයෝ සිටියෝ ය. 25 ඔවුන්ගේ ගම්වල
සිටි ඔවුන්ගේ සහෝදරයෝ ද සත් දවසකට වරක්
ඔවුන් සමඟ මාරුවනේ මාරුවට ආවෝ ය. 26 මන්ද,
ඒ ලෙවීවරුන් වන ප්‍රධාන දොරටු පාලකයන්
සතරදෙනා නියම නිලයෙහි සිට දෙවියන්
වහන්සේගේ මාලිගාවෙහි ඇතුළු ගවෙල් ද
ගබඩාවල් ද බලාගත්හ. 27 දෙවියන් වහන්සේගේ
මාලිගාව රැකවල් කිරීම ඔවුන්ගේ යුතුකම ව තිබුණු
නිසා ඔව්හු ඒ මාලිගාව වටකර නැවතී සිටියෝ ය.
උදයනේ උදය එහි දොරවල් ඇරීම ඔවුන්ගේ බාරේ
තිබුණේ ය.
28 ලෙවීවරුන්ගෙනේ සමහරකේ මෙහෙයෙට අයිති
භාජන බලාගත්හ. මන්ද, ඒවා ඇතුළට ගන්නටත්,
පිටතට ගන්නටත් යෙදුණේ ගණන් කළ පසු ව ය.
29 ඔවුන්ගෙනේ සමහරකේ බඩු බාහිරාදිය ද
ශුද්ධස්ථානයේ සියලු භාජන ද සිහින් පිටි ද මුද්රික
පානය ද තලේ ද තුවරලා ද සුවඳ ද්‍රව්‍ය ද
බලාගන්නට පත් කරන ලද්දෝ ය. 30 පූජකයන්ගේ
පුත්‍රයන්ගෙනේ සමහරකේ සුවඳ ද්‍රව්‍යවලින්
තලෙලය සෑදුවෝ ය.
31 ලෙවීවරුන් අතරනේ කොරෙහි ෂල්ලූම්ගේ
කුලුඳුලා වූ මත්තිතියා ඇතිළිවල පිසූ දේ
බලාගැනීමට පත් ව සිටියේ ය. 32 ඔවුන්ගේ
සහෝදරයන් වන කොහාත්වරුන්ගේ පුත්‍රයන්ගෙනේ
සමහරකේ එක එක සබත් දවසේ පිදීමේ රොටි
සූදානම් කිරීමට පත් ව සිටියෝ ය.
33 මොවුහු ගීතිකාකාරයන් ව ලෙවීවරුන්ගේ පිය
වංශවල ප්‍රධානියන් ව ඇතුළු ගවෙල වාසය කළෝ
ය. රෑ දාවල් සේවයේ යෙදී සිටි නිසා මොවුහු අනික්
මෙහෙයෙන්වලින් නිදහස් ව සිටියෝ ය.
34 මොවුහු තමන්ගේ පරම්පරාවල ලෙවීවරුන්ගේ
පිය වංශවල ප්‍රධානියන් ව ජෙරුසලමෙහි වාසය
කළෝ ය.

## සාවුල් රජුගේ පෙළපත
(1 වංශා 8:29-38)

35 ගිබියොන්ගේ පියා වූ ජෙයීයලේ ගිබියොන්හි
විසුවේ ය. ඔහුගේ භාර්යාවගේ නම මයකා ය.
36 ඔහුගේ කුලුඳුල් පුත්‍රයා අබ්දොන් ය; අනික්
පුත්‍රයෝ ශූර්, කිෂ්, බාල්, නේර්, නාදාබ්,
37 ගදෙෝර්, අහියෝ, ශකෙරියා සහ මික්ලොත් ය.
38 මික්ලොත්ට දාව ෂිමයොම් උපන්නේ ය. මොවුහු
තමන්ගේ සහෝදරයන් සමඟ තමන්ගේ
සහෝදරයන් ඉදිරිපිට ජෙරුසලමෙහි වාසය කළෝ ය.
39 නේර්ට දාව කිෂ් ද කිෂ්ට දාව සාවුල් ද සාවුල්ට
දාව ජොනතන් ද මල්කී-ෂුවා ද අබිනාදාබ් ද එෂ්බාල්
ද උපන්නෝ ය. 40 මෙරිබ්-බාල් ජොනතන්ගේ
පුත්‍රයා ය. මෙරිබ්-බාල්ට දාව මීකා උපන්නේ ය.
41 මීකාගේ පුත්‍රයෝ නම්: පීතොන්, මෙලෙකේ,
තාරයො සහ ආහාස් ය. 42 ආහාස්ට දාව ජයිරා
උපන්නේ ය. ජයිරාට දාව අල්ලමෙතේ ද අශ්මාවතේ
ද සිම්රි ද උපන්නෝ ය. සිම්රිට දාව මෝශා ද,
43 මෝශාට දාව බිනයො ද උපන්නෝ ය. ඔහුගේ
පුත්‍රයා රෙපොයා ය; ඔහුගේ පුත්‍රයා එලියාසා ය;
ඔහුගේ පුත්‍රයා ආශලේ ය.
44 ආශලේට පුත්‍රයෝ හයදෙනෙකේ සිටියෝ ය.
ඔවුන්ගේ නාම නම්: අශ්රීකාම්, බොකෙරු,
ඉෂ්මායලේ, ෂයෙරියා, ඔබදියා සහ හානාන් ය.
ආශලේගේ පුත්‍රයෝ මොවුහු ය.

## සාවුල් රජුගේ මරණය
(1 සාමු 31:1-13)

10 පිලිස්තිවරු ඉශ්රායෙල්වරුන්ට විරුද්ධව යුද්ධ
කළෝ ය. ඉශ්රායෙල්වරු පිලිස්තිවරුන්
ඉදිරියෙන් පලා ගොස් ගිල්බෝවා කන්දේ මැරී
වැටුණෝ ය. 2 පිලිස්තිවරු සාවුල් ද ඔහුගේ
පුත්රයන් ද ලුහුබැඳ එළවාගෙන ගොස් සාවුල්ගේ
පුත් ජොනාතන් ද අබිනාදාබ් ද මල්කී-ෂුවා ද මැරූ හ.
3 සටන සාවුල්ට විරුද්ධ ව තදබල විය. ඔහු
දුනුවායන්ට අසු වී දුනුවායන් විසින් තුවාළ කරනු
ලැබී ය. 4 එවිට සාවුල් තමාගේ ආයුධ ගෙනයන්නාට
කතා කොට, “අර අචර්මඡේදිතයන් අවුත්, මට
අවමන් නොකරන පිණිස ඔබේ කඩුව ඇද මට
අනින්නැ”යි කී ය. එහෙත්, ඔහුගේ ආයුධ
ගෙනයන්නා ඊට කැමැති වූයේ නැත. ඔහු එසේ
කරන්නට බොහෝ සෙයින් බිය විය. එබැවින් සාවුල්
තමාගේ කඩුව ගෙන තෙමේ ම එය පිට වැටුණේ
ය. 5 සාවුල් මැරුණ බව ඔහුගේ ආයුධ ගෙනයන්නා
දැක, ඔහුත් තමාගේ කඩුව පිට වැටී මළේ ය.
6 මෙසේ සාවුල් ද ඔහුගේ පුත්රයෝ තුන්දෙනා ද
මළෝ ය. ඔහුගේ පවුලේ සියල්ලෝ එක විට
මැරුණෝ ය. 7 ඉශ්රායෙල් මිනිසුන් පලා ගිය බවත්,
සාවුල් සහ ඔහුගේ පුත්රයන් මැරුණු බවත්
මිටියාවතෙහි සිටි සියලු ඉශ්රායෙල් මනුෂ්යයෝ දැක
තමන්ගේ නගර අත්හැර පලා ගියහ. පිලිස්තිවරු
අවුත් එහි වාසය කළෝ ය.
8 තවද, පසු දා පිලිස්තිවරු මැරුම්කෑවුන්ගෙන්
කොල්ලය ගන්නට පැමිණි කල, සාවුල් ද ඔහුගේ
පුත්රයන් ද ගිල්බෝවා කන්දේ වැටී සිටිනු දුටුවෝ
ය. 9 ඔව්හු ඔහුගේ ඇඳුම් ගලවා, ඔහුගේ හිසත්
ආයුධත් රැගෙන, තමන්ගේ දේවාල වලත්
සෙනඟටත් ප්රකාශ කරන පිණිස පිලිස්තිවරුන්ගේ
දේශය මුළුල්ලෙහි ඒවා යැවූ හ. 10 ඔහුගේ ආයුධ
ඔව්හු තමන්ගේ දෙවියන්ගේ ගෘහයෙහි තබා
ඔහුගේ හිස දාගොන්ගේ ගෘහයෙහි එල්ලා තැබූ හ.
11 ජාබේෂ්-ගිලියද්හි සියල්ලන් පිලිස්තිවරුන් සාවුල්ට
කළ සියල්ල ඇසූ විට, 12 සියලු නිර්භීත මනුෂ්යයෝ
පිටත් ව ගොස්, සාවුල්ගේ ශරීරය ද ඔහුගේ
පුත්රයන්ගේ ශරීර ද රැගෙන ජාබේෂ්ට අවුත්,
ඔවුන්ගේ ඇටකටු ජාබේෂ්හි ආලෝන ගස යට
වළලා සත් දවසක් නිරාහාර ව සිටියහ.
13 ලෙවී 19:31; 20:6; 1 සාමු 13:8-14; 15:1-24;
28:7-8 සමිඳාණන් වහන්සේගේ වචනය රක්ෂා
නොකිරීමෙන් උන් වහන්සේට විරුද්ධ ව කළ වරද
නිසාත්, උන් වහන්සේගෙන් නොවිචාරා
ආත්මබන්ධනකාරියකගෙන් කරුණු අසා විචාළ නිසාත්
සාවුල් මෙසේ නැසුණේ ය. 14 ඒ නිසා උන්
වහන්සේ ඔහු නසා, රජකම අහක් කොට
ජෙස්සේගේ පුත් දාවිත්ට එය දුන් සේක.

## දාවිත්ගේ අභිෂේකය
(2 සාමු 5:1-10)

11 එකල සියලු ඉශ්රායෙල්වරු හෙබ්රොන්හි
සිටි දාවිත් වෙත රැස් වී කතා කොට,
“බලන්න අපි ඔබේ ම ලේ නෑයෝ වමු. 2 පසුගිය
කාලවල සාවුල් රජ ව සිටිය දී පවා, ඉශ්රායෙල්වරුන්
යුද්ධයට ගෙන ගියේ ද ආපසු ගෙනාවේ ද ඔබ ය.
ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ කතා කොට, ‘නුඹ
මාගේ සෙනඟ වන ඉශ්රායෙල්වරුන් පාලනය
කරන්නෙහි ය, නුඹ මාගේ සෙනඟ වන
ඉශ්රායෙල්වරුන්ගේ අධිපතියා වන්නෙහි ය’ කියා
ඔබට වදාළ සේකැ”යි කීවෝ ය. 3 මෙලෙස
ඉශ්රායෙල්හි සියලු ප්රජා මූලිකයෝ හෙබ්රොන්හි
සිටි රජු වෙත පැමිණියා හ. දාවිත් ද හෙබ්රොන්හි දී
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි ඔවුන් සමඟ
ගිවිසුමක් කළේ ය. ඔව්හු සමිඳාණන් වහන්සේ
සාමුවෙල් ලවා කියවූ වචනය ලෙස දාවිත්
ඉශ්රායෙල්වරුන්ගේ රජ කොට අභිෂේක කළෝ ය.

## ජෙරුසලම රාජධානිය කරගැනීම

4 ජෝෂු 15:63; වීරා 1:21 පසු ව දාවිත් ද සියලු
ඉශ්රායෙල්වරු ද ජෙබුස නම් වූ ජෙරුසලමට විරුද්ධ
ව ගියෝ ය. දේශ වාසී වූ ජෙබුසිවරු එහි සිටියෝ
ය. 5 ජෙබුසිවරු කතා කොට, “ඔබ මෙහි ඇතුල්
නොවන්නෙහි ය”යි දාවිත්ට කීවෝ ය. එහෙත්, දාවිත්
සියොන් බලකොටුව අල්ලාගත්තේ ය. එය
දාවිත්ගේ නුවර විය. 6 දාවිත් කතා කොට, “මුලින්
ම ජෙබුසිවරයකුට පහර දෙන කවරකු නමුත්, ඔහු
ප්රධානියා ද අධිපතියා ද වන්නේ ය”යි කීවේ ය.
ශෙරුයාගේ පුත් ජෝවාබ් මුලින් ම නැඟිට ගොස්
ප්රධානියා වුණේ ය. 7 දාවිත් බලකොටුවෙහි වාසය
කළේ ය. ඒ නිසා ඊට දාවිත්ගේ නුවර යයි නම්
කළේ ය. 8 ඔහු මිල්ලෝ නම් ස්ථානයෙන් පටන්
ගෙන ඊට ආසන්න ප්රදේශය ම වටකර නුවර
ගොඩනැඟුවේ ය. ජෝවාබ් නුවර ඉතිරි කොටස
අලුත්වැඩියා කළේ ය. 9 දාවිත් වඩ වඩා උසස්
වූයේ ය. සර්ව පරාක්රම සමිඳාණන් වහන්සේ ඔහු
සමඟ වැඩ සිටි සේක.

## දාවිත් රජුගේ දක්ෂ යුද්ධ භටයෝ
(2 සාමු 23:8-39)

10 ඉශ්රායෙල් වංශය ගැන සමිඳාණන් වහන්සේ
වදාළ වචනය ප්රකාරයට, දාවිත් රජකමට පත්
කරන පිණිස, සියලු ඉශ්රායෙල්වරුන් සමඟ ඔහු
රජකමට පත් කිරීම ගැන ඔහුට උපකාර කළ
ප්රධාන බලවන්තයෝ මොවුහු ය.
11 දාවිත්ට සිටි බලවන්තයන්ගේ නාමාවලිය මේ
ය: හක්මෝනි ජාතිකයකුගේ පුත්රයා වන
තිස්දෙනාගෙන් ප්රධානියා වූ ජාෂොබෙයොම් ය. ඔහු
එක් වතාවක දී තුන්සියදෙනෙකුට විරුද්ධ ව තමාගේ
හෙල්ලය ඔසවා ඔවුන් මැරී ය. 12 ඊළඟට අහෝහිය
ජාතික දෝදෝගේ පුත් එලයොසර් ය. ඔහු

බලවන්තයන් තුන්දෙනාගෙන් එක් කෙනෙක් ය.
13 පිලිස්තිවරුන් යුද්ධයට සැරසී සිටි පැස්-දම්මිම් නම්
ස්ථානයෙහි යව රැස්කොට තිබුණු කෙතක ඔහු
දාවිත් සමඟ සිටියේ ය. සෙනඟ පිලිස්තිවරුන්
ඉදිරියෙන් පලා ගියෝ ය. 14 ඔව්හු ඒ කෙත මැද සිට
එය ආරක්ෂා කරගෙන පිලිස්තිවරුන් මැරුවෝ ය.
සමිඳාණන් වහන්සේ මහා ජයක් ලබා දී ඔවුන්
ගැළවූ සේක.
15 ප්‍රධාන තිස්දෙනාගෙන් තුන්දෙනෙක් අදුල්ලම්
ගුහාවේ නැවතී සිටි දාවිත්ට එකතු වන පිණිස
පර්වතයට ගියෝ ය. පිලිස්තිවරුන්ගේ හමුදාව
රෙපාවරුන්ගේ මිටියාවතෙහි කඳවුරු බැඳගෙන
සිටියෝ ය. 16 දාවිත් එවකට බලකොටුවෙහි සිටියේ
ය. පිලිස්තිවරුන්ගේ මුර සේනාව එවකට
බෙත්ලෙහෙමෙහි සිටියෝ ය. 17 දාවිත් තද
ආසාවෙන් සුසුම්ලමින්, “අනේ, බෙත්ලෙහෙමේ
දොරටුව ළඟ තිබෙන ළිඳෙන් කෙනෙකු මට
බොන්නට වතුර ගෙනවුත් දුන්නොත් කොපමණ
හොඳ ද” කියා කීවේ ය. 18 එවිට තුන්දෙනා
පිලිස්තිවරුන්ගේ හමුදාව මැදින් බිඳගෙන ගොස්,
බෙත්ලෙහෙමේ දොරටුව සමීපයෙහි වූ ළිඳෙන් වතුර
ඇද දාවිත් වෙත ගෙනා හ. එහෙත්, දාවිත් එය
බොන්නට අකමැති ව, ඒවා සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි පූජාවක් ලෙස වත් කොට, 19 “මේ දේ
කිරීමෙන් මාගේ දෙවියන් වහන්සේ මා වළක්වන
සේක් වා! තමන්ගේ ජීවිතයට විය හැකි අන්තරාය
නොසලකා ගිය මේ මනුෂ්‍යයන්ගේ ලේ මා
බොන්න ද? මන්ද, ඔව්හු තමන්ගේ ජීවිත ගැන
නොතකා මේවා ගෙනා හ”යි කී ය. එහෙයින් ඔහු ඒ
වතුර බොන්න අකමැති විය. බලවන්තයෝ
තුන්දෙනා මේ දේ කළෝ ය.
20 ජෝවාබ්ගේ සහෝදර වූ අබීෂයි තිස්දෙනාගෙන්
ප්‍රධානියා ව සිටියේ ය. ඔහු තමාගේ හෙල්ලය
තුන්සියදෙනෙකුට විරුද්ධ ව ඔසවා, ඔවුන් මරා,
තිස්දෙනා අතරේ කීර්තිය ලැබී ය. 21 තිස්දෙනාට
වඩා ප්‍රසිද්ධ වූයෙන් ඔහු ඔවුන්ගේ අධිපතියා විය.
එසේ වී නමුත්, ඔහු පළමු වන තුන්දෙනා තරම්
ප්‍රසිද්ධියට නොපැමිණියේ ය.
22 බොහෝ වීර ක්‍රියා කළ කබ්ශෙයෙල්හි
වික්‍රමාන්විත මනුෂ්‍යයෙකුගේ පුත් ජෙහෝයාදාගේ
පුත්‍රයා වන බෙනායා මෝවබ්හි ශ්‍රේෂ්ඨ සෙබළුන්
දෙදෙනා මැරුවේ ය. ඔහු හිම වැටෙන දවසක දී
වළකට බැස ගොස් එහි ඇතුළේ සිටි සිංහයෙකු
මැරුවේ ය. 23 ඔහු මීටර් දෙකක් පමණ උස තරබාරු
මනුෂ්‍යයෙකු වූ මිසර ජාතිකයෙකුත් මැරී ය.
මිසරයාගේ අතේ වියන යන්ත්‍රයක දණ්ඩක් වැනි
හෙල්ලයක් තිබුණේ ය. ඔහු පොල්ලක් ඇති ව මිසර
ජාතිකයා ළඟට ගොස්, ඔහුගේ අතින් හෙල්ලය
උදුරා, ඔහුගේ ම හෙල්ලයෙන් ඔහු මරා දැමුවේ ය.
24 ජෙහෝයාදාගේ පුත් බෙනායා මේ වීර ක්‍රියා
කොට බලවන්තයන් තිස්දෙනා අතරේ කීර්තිය ලැබී
ය. 25 ඔහු ඒ තිස්දෙනාට වඩා ප්‍රසිද්ධ කෙනෙක්
විය. ඒ නමුත්, ඔහු පළමු වන තුන්දෙනාගේ ගණනට
පැමිණියේ නැත. දාවිත් තමාගේ ආරක්ෂක මුර
හමුදාව කෙරෙහි ඔහු පත් කළේ ය.
26 සේනාවල බලවන්තයෝ නම්: ජෝවාබ්ගේ
සහෝදරයා වූ අසාහෙල් ය; බෙත්ලෙහෙමේ
දෝදෝගේ පුත් එල්හානාන් ය; 27 හරෝරීය
ෂම්මොත් ය; පෙලෝනීය හෙලෙශ් ය; 28 තෙකෝයිය
ඉක්කෙෂ්ගේ පුත් ඊරා ය; අනතෝතිය අබීයෙශෙර්
ය; 29 හුෂාතිය සිබ්බෙකයි ය; අහෝහිය ඉලයි ය;
30 නෙටෝපාතිය මහරයි ය; නෙටෝපාතිය බානාගේ
පුත් හේලෙද් ය.
31 බෙන්ජමින් ගෝත්‍රයේ ගිබියාහි රීබයිගේ පුත්
ඊතයි ය; පීරාතෝනිය බෙනායා ය; 32 ගායෂ් ඔයවල
හූරයි ය; අර්බාතිය අබීයෙල් ය; 33 බහරුමිය
අශ්මාවෙත් ය; ෂාල්බොනිය එලියාබා ය;
34 ගිසොනිය හාෂෙම්ගේ පුත්‍රයෝ ය; හරාරීය
ෂාගේගේ පුත් ජොනතන් ය; 35 හරාරීය සාකාර්ගේ
පුත් අහියාම් ය; ඌර්ගේ පුත් එලිපාල් ය;
36 මෙකේරාතිය හේපෙර් ය; පෙලෝනීය අහියා ය;
37 කර්මෙලිය හෙශ්රෝ ය; එශ්බයිගේ පුත් නයරයි
ය; 38 නාතාන්ගේ සහෝදර වූ ජෝවෙල් ය;
හග්රීගේ පුත් මිබ්හාර් ය; 39 අම්මොනිය ශෙලෙක්
ය; ශෙරුයාගේ පුත් ජෝවාබ්ගේ ආයුධ ගෙනයන්නා
වන බෙරොතිය නහරයි ය; 40 ඉත්‍රීය ඊරා ය;
ඉත්‍රීය ගාරෙබ් ය; 41 හිත්තීය උරියා ය; ආලයිගේ
පුත් සාබාද් ය; 42 රූබන්වරුන්ගේ ප්‍රධානියා ව සිටි
රූබන් ගෝත්‍රයේ ෂීශාගේ පුත් අදීනා ය. ඔහු සමඟ
තිස්දෙනෙක් සිටියෝ ය. 43 මයකාගේ පුත් හානාන්
ය; මිත්නිය ජොෂාපාට් ය; 44 අෂ්තෙරාතිය උශ්ශියා
ය; අරෝයේරිය හෝතාම්ගේ පුත්‍රයන් වූ ෂාමා සහ
ජෙයීයෙල් ය. 45 ෂිම්රීගේ පුත් ජෙදීයයෙල් සහ
ඔහුගේ සහෝදර වූ තිශිය ජෝහා ය; 46 මහවිය
එලීයෙල් ය; එල්නයම්ගේ පුත්‍රයන් වූ ජෙරෙබයි සහ
ජෝෂාවියා ය; මෝවබ් ජාතික ඉත්මා ය; 47 එලියෙල්
ය; ඕබෙද් ය; මෙසොබාය වූ ජයසීයෙල් ය.

## දාවිත් රජුට පක්ෂ බලවන්තයෝ

12 කිෂ්ගේ පුත් සාවුල් නිසා දාවිත් සැඟවී
ශික්ලග්හි සිටිය දී ඔහු ළඟට පැමිණි
මනුෂ්‍යයෝ මොවුහු ය. මොවුහු යුද්ධයේ දී ඔහුට
උපකාර වූ බලවන්තයන්ගේ ගණනට අයිති වූ හ.
2 ඔව්හු දකුණතින් ද වමතින් ද ගල්විසි කරන්නත්,
දුන්නෙන් ඊ ගස් විදින්නත් පුරුදු දුනුවායන් ව,
බෙන්ජමින්ගේ වංශයට අයිති වූ සාවුල්ගේ
සහෝදරයන් ව සිටියෝ ය. 3 එනම්, ප්‍රධානියා වූ
අහියේසෙර් සහ ජෝවාෂ් ය. ඔව්හු ගිබියාහි
ෂෙමායාගේ පුත්‍රයෝ ය. අශ්මාවෙත්ගේ පුත්‍රයන්
වූ ජෙසීයෙල් සහ පෙලෙට් ය; බෙරාකා ය;
අනතෝතිය ජේහු ය. 4 බලවන්තයන් තිස්දෙනාගෙන්
එක් කෙනෙකු ව, තිස්දෙනාගේ ප්‍රධානියා ව සිටි
ගිබියොන්හි ඉෂ්මයියා ය; ජෙරෙමියා ය; ජහසියෙල් ය;
ජෝහානාන් ය; ගෙදේරාතිය ජොසාබාද් ය;
5 එල්යුශයි ය; ජෙරිමොත් ය; බෙයාලියා ය; ෂෙමරියා
ය; හරුපිය ෂෙපතියා ය; 6 එල්කානා සහ ඉෂ්ෂියා ද

අශරියලේ ද ජෝවශෙරේ ද ජෂොබෙයාම් ද යන
කොරාවරු ය. 7 ගදෙෝර්හි ජෙරොහාම්ගේ පුත්‍රයන්
වූ ජොයේලා සහ සබෙදියා ය.

### ගාද් ගෝත්‍රයනේ දාවිත් රජුට පක්ෂ බලවන්තයෝ

8 ගාද්වරුන්ගනෙුත් බලවන්ත මනුෂ්‍යයෝ වනේ ව
ගොස් දාවිත් වෙත පාළුකරයේ බලකොටුවට එක්
වූවෝ ය. ඔව්හු යුද්ධයට පුහුණු වූ, පලිහත්
හලේලයත් දරන්න සමර්ථ වූ, සිංහ මුහුණු වැනි
මුහුණු ඇති වේගවත්කමින් කඳුවල තිත් මුවන්ට
සමාන වූ මනුෂ්‍යයෝ ය. 9 ප්‍රධානියා එශරේ ය;
දවෙනියා ඔබදියා ය; තුන්වැනියා එලියාබ් ය;
10 සතරවැනියා මිෂ්මන්නා ය; පස්වැනියා ජෙරමෙියා
ය; 11 හයවැනියා අත්තයි ය; හත්වැනියා එලියලේ ය;
12 අටවැනියා ජෝහානාන් ය; නවවැනියා එල්ශාබාද්
ය; 13 දසවැනියා ජෙරමෙියා ය; එකොළොස්වැනියා
මක්බන්නයි ය.
14 ගාද්ගේ පුත්‍රයන් වූ මොවුහු සේනාවට
මුලාදෑනියන් ව සිටියෝ ය. මොවුන්ගනේ කුඩා
තැනැත්තා සියයකටත්, ලොකු තැනැත්තා දහසකටත්
සනේපතියෝ වූ හ. 15 මොවුහු පළමු වන මාසයේ,
ජොර්දාන් ගඟේ වතුර එහි සියලු ඉවුරු තළා ගලා
තිබිය දී, එගොඩ වී නැගනෙහිරටත් බස්නාහිරටත්
මිටියාවත්වල වාසය කළ සියල්ලන් එළවා දැමූහ.
16 බනේජමින්ගේ ද ජුදාගේ ද සනෙඟගනෙුත්
සමහරකේ දාවිත් වෙත බලකොටුවට ආවෝ ය.
17 දාවිත් ඔවුන් සම්බ වන්න පිටතට ගොස්, ඔවුන්ට
කතා කොට, “ඔබ හැම මට උපකාර කරන්න
සාමදානයනේ මා ළඟට ආවහු නම්, මාගේ සිත ඔබ
කරෙහේ ඇළුම් වන්නේ ය. එහෙත්, මා අත වරදක්
නැති ව තිබදේදී, මාගේ එදිරිකාරයන්ට මා පාවා
දනෙ පිණිස ආවහු නම්, අපේ පියවරුන්ගේ දවෙියන්
වහන්සේ එය බලා යුක්තිය ඉටු කරන සෙක් වා!”යි
කීවේ ය.
18 එවිට තිස්දනොගේ ප්‍රධානියා වූ අමාසයි පිට
ආත්මයක් ආවේශ වී ඔහු කතා කරමින්, “දාවිත්
රජතුමනේි, අපි ඔබේ පක්ෂයට ද ජෙසේසේගේ
පුත්‍රය, අපි ඔබ සමඟ ද සිටින්නමෙු. සාමදානය,
සාමදානය ම ඔබට වේ වා! ඔබට උපකාර
කරන්නන්ටත් සාමදානය වේ වා! මන්ද, ඔබේ
දවෙියන් වහන්සේ ඔබට උපකාර කරන සෙකැ”යි
කීවේ ය. එවිට දාවිත් ඔවුන් පිළිගනෙ ඔවුන්
හමුදාවේ ප්‍රධානීන් කළෙේ ය.

### මනස්සේගේ ගෝත්‍රයනේ බලවන්තයෝ

19 තවද දාවිත්, පිලිස්තිවරුන් සමඟ සාවුල්ට විරුද්ධ
ව සටනට ගිය විට මනස්සේවරුන්ගනේ සමහරකේ ද
ඔහුට එකතු වුණෝ ය. එහෙත්, ඔව්හු
පිලිස්තිවරුන්ට උපකාර නොකළෝ ය. මන්ද,
පිලිස්තිවරුන්ගේ අධිපතීහු මන්ත්‍රණය කොට, “ඔහු
අප අන්තරායට පමුණුවන ලසෙ තම ස්වාමියා වූ
සාවුල්ට එකතුවනු ඇතැ”යි ඔහු යන්න හැරියෝ ය.
20 එසේ ඔහු ශික්ලග් නම් ස්ථානයට යද්දී
මනස්සේවරුන්ගනේ සහශ්‍රාධිපතියන් වූ අද්නා ද
ජොශාබාද් ද ජදේියයලේ ද මිකායලේ ද ජෝශාබාද් ද
එලීහු ද ශිල්ලතෙයි ද ඔහුට එකතු වූ හ. 21 ඔව්හු
කොල්ලකාර හමුදාවට විරුද්ධ ව දාවිත්ට උපකාර
කළෝ ය. මන්ද, ඔව්හු සියල්ලෝ ම බලවන්තයන් ව
ද සේනාවේ අධිපතියන් ව ද සිටියෝ ය. 22 එසේ
දවෙියන් වහන්සේගේ සේනාව වැනි මහත්
සේනාවක් වන තකේ දාවිත්ට උපකාර කරන පිණිස
මිනිස්සු දවසින් දවස ඔහු ළඟට පැමිණියහ.

### හබේ්‍රොනේහි දී දාවිත්ගේ යුද්ධ භටයෝ

23 සමිඳාණන් වහන්සේගේ වචනය ප්‍රකාරයට
සාවුල්ගේ රජකම දාවිත්ට හරවා දනෙ පිණිස
යුද්ධයට සන්නද්ධ ව දාවිත් වෙත හබේ්‍රොනේට
පැමිණි මනුෂ්‍යයන්ගේ ගණන මසේ ය: 24 ජුදා
ගෝත්‍රයනේ පලිහ ද හලේලය ද දරන, යුද්ධයට
සන්නද්ධ වූ හයදාස් අටසිය දනෙකේ ය.
25 සිමියොනේගේ ගෝත්‍රයනේ යුද්ධයට බලවන්ත
මනුෂ්‍යයෝ හත්දාස් එකසියයක් ය. 26 ලවේිගේ
ගෝත්‍රයනේ හාරදාස් හයසියයක් ය. 27 ආරොනේගේ
වංශයේ අධිපතියා වූ ජෙහෝයාදා සහ ඔහු සමඟ
තුන්දාස් හත්සියයක් ය. 28 බලවන්ත යෞවනයකෙු
වූ ශාදොක් සහ ඔහුගේ පිය වංශයේ අධිපතිවරු
විසිදදෙනෙකේ ය. 29 සාවුල්ගේ සහෝදරයන් වූ
බනේජමින්ගේ ගෝත්‍රයනේ තුන්දහසක් ය.
ඔවුන්ගනේ වැඩි කොටස මේ වන තුරු සාවුල්ගේ
වංශයට පක්ෂ ව සිටියෝ ය. 30 එප්‍රායිම්ගේ
ගෝත්‍රයනේ බලවන්තයන් ව, තමන්ගේ පිය
වංශවල කීර්තිමත් මනුෂ්‍යයන් ව සිටි විසිදාස්
අටසියදනෙකේ ය. 31 දාවිත් රජකමට පත් කිරීමට
එන පිණිස මනස්සේගේ අර්ධ ගෝත්‍රයනේ නම්
සඳහන් කරනු ලැබූ දහඅටදාහක් ය.
32 ඉශ්‍රායලේවරුන් විසින් කරනු ලැබිය යුතු දේ
කිමකේ දැ යි දැනනෙ හැටියට සටනට පිවිසනෙ
වකවානු තේරුම් ඇති ඉස්සාකර්ගේ ගෝත්‍රවල
ප්‍රධානියෝ දසියදනෙකේ ය; ඔවුන්ගේ සියලු
සහෝදරයෝ ද ඔවුන්ගේ අණට යටත් ව සිටියෝ
ය. 33 සාබුලොනේවරුන්ගනේ සියලු ආකාර යුද්ධායුධ
ඇති ව, යුද්ධ පිළිවළෙට පැමිණ තිර සිත් ඇති ව
පිළිවළෙින් සිටින්න පුළුවන් වූ අය පණස්දහසක් ය.
34 නප්තලීවරුන්ගනේ අධිපතිවරු දහසක් සහ ඔවුන්
සමඟ පලිහ ද හලේලය ද ඇති අය තිස්හත්දහසක්
ය. 35 දාන්වරුන්ගනේ සටනට සැරසී පැමිණනෙ අය
විසිඅටදාස් හයසියයක් ය. 36 ආෂරේවරුන්ගනේ
සටනට ගොස් සටනට සැරසී සිටින්න පුළුවන් අය
සතළිස්දහසක් ය. 37 ජොර්දානනේ එගොඩ
රූබන්වරුන්ගනේ ද ගාද්වරුන්ගනේ ද මනස්සේගේ
අර්ධ ගෝත්‍රයනේ ද සටනට සියලු ආකාර යුද්ධායුධ
ඇති අය එක්ලක්ෂ විසිදහසක් ය.
38 යුද්ධ පිළිවළෙට පැමිණනේන පුළුවන් වූ මේ
සියලු යුද්ධ භටයෝ සියලු ඉශ්‍රායලේවරුන් පාලනය
කිරීම සඳහා දාවිත් රජකමට පත් කිරීමට සම්පූර්ණ
සිතින් හබේ්‍රොනේට ආවෝ ය. අනික් සියලු

ඉශ්‍රායෙල්වරුත් දාවිත් රජකමට පත් කිරීමට එක්
සිත් ව සිටියෝ ය. 39 ඔව්හු ආහාර පාන වළඳමින්
දාවිත් ළඟ තුන්දවසක් සිටියෝ ය. මන්ද, ඔවුන්ගේ
සහෝදරයන් ඔවුන්ට එසේ පිළියෙළ කර තිබිණි.
40 තවද, ඉස්සාකර්ගේ ද සාබුලොන්ගේ ද
නප්තලීගේ ද දේශ දක්වා ඔවුන් අසල සිටි අය
කොටළුවන් ද ඔටුවන් ද අශ්වතරයන් ද ගොනුන් ද
පිට රොටි සහ පිටි කෑමත්, වියළි අත්තික්කා කැටි
සහ මිදි පොකුරුත්, මුද්‍රික පානයත්, තෙලුත්,
ගොනුන් සහ බැටළුවනුත් බොහෝ සෙයින් ගෙන
ආවෝ ය. මන්ද, ඉශ්‍රායෙල්වරුන් අතරෙහි ප්‍රීතිය
ඇති වූයේ ය.

### ගිවිසුම් කරඬුව කිරියත්-ජෙයාරීම් සිට ගෙන ඒම

(2 සාමු 6:1-11)

13 දාවිත් සහශ්‍රාධිපතින් ද ශතාධිපතින් ද
සියලු නායකයන් ද සමඟ මන්ත්‍රණය
කරමින්, 2 මුළු ඉශ්‍රායෙල් සභාවට කතා කොට,
"ඔබ හැමට මා කියන දේ හොඳ ය කියා පෙනේ
නම්, අපේ දෙවි සමිඳාණන් වහන්සේත් ඊට කැමැති
වන සේක් නම්, මුළු ඉශ්‍රායෙල් දේශයෙහි ඉතිරි ව
සිටින අපේ සහෝදරයන්ට ද ඔවුන් සමඟ තමන්ගේ
ගම් බිම් සහිත නගරවල සිටින පූජකයන්ට ද
ලෙවීවරුන්ට ද අප ළඟට රැස්වන්න කියා සෑම
දිශාවලට දන්වා යවා, 3 අපේ දෙවියන් වහන්සේගේ
ගිවිසුම් කරඬුව අප වෙත නැවත ගෙනෙමු. මන්ද,
සාවුල්ගේ කාලයේ දී අපි එය ගැන
නොසැලකුවෙමු"යි කීවේ ය. 4 මුළු සෙනඟගේ ඇස්
හමුයෙහි එය කළ යුතු දෙයක් ලෙස පෙනුණු නිසා,
එසේ කරන්න කැමැති බව මුළු සභාව කියා සිටියා
ය.
5 1 සාමු 7:1-2 ඒ නිසා, දාවිත් දෙවියන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව කිරියත්-ජෙයාරීම් සිට
ගෙනෙන පිණිස මිසරයේ ෂිහෝර් ඔය පටන්
හමාත්ට ඇතුළු වන තැන දක්වා සිටි සියලු
ඉශ්‍රායෙල්වරුන් රැස් කෙළේ ය. 6 නික්ම
25:22කෙරුබ්වරුන් අතරේ වැඩ සිටින සමිඳාණන්
වහන්සේගේ නාමය තබා තිබෙන දෙවියන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව ජුදාට අයිති බාලා
නම් වූ කිරියත්-ජෙයාරීම් සිට ගෙනෙන පිණිස දාවිත්
සහ සියලු ඉශ්‍රායෙල්වරු ද එහි ගියෝ ය. 7 ඔව්හු
දෙවියන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
අබිනාදාබ්ගේ ගෙයින් අලුත් රථයක තබා ගෙනාවෝ
ය. උශ්ශා ද අහියෝ ද ගැල දැක්කුවෝ ය. 8 දාවිත්
සහ සියලු ඉශ්‍රායෙල්වරු වීණා ද කුඩා වීණා ද රබන්
ද නළා ද ඇති ව දෙවියන් වහන්සේ ඉදිරියෙහි මුළු
ශක්තියෙන් ගී ගයා නැටූ හ.
9 කීදොන්ගේ කමතට ආ කල රථයේ බැඳ සිටි
හරක් දැඟලූ බැවින් ගිවිසුම් කරඬුව අල්ලන්න
උශ්ශා තමාගේ අත දිගු කෙළේ ය. 10 එවිට
සමිඳාණන් වහන්සේගේ උදහස උශ්ශාට විරුද්ධ ව
ඇවිළුණේ ය. ඔහු ගිවිසුම් කරඬුවට තමාගේ අත
දිගු කළ බැවින් උන් වහන්සේ ඔහුට පහර දුන්
සේක. ඔහු එහි දී දෙවියන් වහන්සේ ඉදිරියෙහි
මළේ ය. 11 සමිඳාණන් වහන්සේ උශ්ශාට දුන් හදිසි
පහර නිසා දාවිත් අප්‍රසන්න විය. ඔහු ඒ ස්ථානයට
උශ්ශා ප්‍රහාරය යන අර්ථය ඇති පෙරෙෂ්-උශ්ශා
යන නාමය තැබී ය. ඒ නාමය අද දක්වා ඊට තිබේ.
12 ඒ දවසේ දී දාවිත් දෙවියන් වහන්සේට භය වී,
"දෙවියන් වහන්සේගේ ගිවිසුම් කරඬුව මා ළඟට
කෙසේ ගෙනෙම් දැ"යි කීවේ ය. 13 ඒ නිසා දාවිත්
ගිවිසුම් කරඬුව තමා වෙත දාවිත්ගේ නුවරට
නොගෙන, අන් අතකට හරවා, එය හිත්තීය ජාතික
ඕබෙද්-ඒදොම්ගේ ගෙට ගෙන ගියේ ය. 14 1 වංශා
26:4-5එසේ දෙවියන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
ඕබෙද්-ඒදොම්ගේ පවුල සමඟ ඔවුන්ගේ ගෙයි තුන්
මාසයක් තිබිණි. සමිඳාණන් වහන්සේ ඕබෙද්-
ඒදොම්ගේ ගෙදෙරටත්, ඔහු සන්තක සියල්ලටත්
ආශීර්වාද කළ සේක.

### දාවිත් රජ ජෙරුසලමේ නැවතී සිටීම

(2 සාමු 5:11-16)

14 තීර්හි රජ වූ හීරාම් දාවිත්ට මාලිගාවක්
ගොඩනැඟීම පිණිස ඔහු වෙත
පණිවුඩකාරයන් ද කිහිරි ලී ද ගල් වඩුවන් ද වඩුවන්
ද එවී ය. 2 දාවිත් ද තමා ඉශ්‍රායෙල්වරුන්ගේ රජ
කොට සමිඳාණන් වහන්සේ විසින් ස්ථිර කරන ලද
බව දැනගත්තේ ය. මන්ද, උන් වහන්සේගේ
සෙනඟ වන ඉශ්‍රායෙල්වරුන් උදෙසා ඔහුගේ රාජ්‍යය
සමෘද්ධිමත් වී තිබුණේ ය.
3 දාවිත් ජෙරුසලමේ දී තවත් භාර්යාවන්
පාවාගත්තේ ය. දාවිත්ට දාව තව පුත්‍රයෝත්,
දූවරුත් උපන්නෝ ය. 4 ජෙරුසලමේ දී ඔහුට උපන්
පුත්‍රයන්ගේ නාම මෙසේ ය: ෂම්මුවා, ෂෝබාබ්,
නාතාන් සහ සලමොන්; 5 ඉබ්හාර්, එලිෂූවා සහ
එල්පෙලෙත්; 6 නොගා, නෙපෙග් සහ ජපියා,
7 එලිෂාමා, බෙයෙලියාදා සහ එලීපෙලෙත් ය.

### පිලිස්තිවරුන් පරාජය කිරීම

(2 සාමු 5:17-25)

8 දාවිත් මුළු ඉශ්‍රායෙල් ජාතිය කෙරෙහි රජ කොට
අභිෂේක කරනු ලැබූ බව පිලිස්තිවරුන් ඇසූ කල,
ඔව්හු සියල්ලෝ ම දාවිත් සොයා ආවෝ ය. දාවිත් ඒ
අසා ඔවුන්ට විරුද්ධ ව පිටත් ව ගියේ ය.
9 පිලිස්තිවරු අවුත් රෙපායිම් මිටියාවතෙහි පැතිර
ගොස් එය කොල්ලකෑවෝ ය. 10 දාවිත් කතා
කොට, "මා පිලිස්තිවරුන්ට විරුද්ධ ව යන්න ද? ඔබ
වහන්සේ ඔවුන් මා අතට පාවා දෙන සේක් ද?"
කියා දෙවියන් වහන්සේගෙන් පිළිවිසී ය. සමිඳාණන්
වහන්සේ පිළිතුරු දෙමින්, "යන්න, මම ඔවුන් නුඹේ
අතට පාවා දෙමි"යි ඔහුට වදාළ සේක.
11 ඔව්හු බාල්-පෙරාශීම්ට ආවෝ ය. දාවිත් එහි දී
ඔවුන්ට පහර දී, කතා කරමින්, "දෙවියන් වහන්සේ
මා අතින් මාගේ සතුරන් ජලගැල්මක් මෙන් විසුරුවා
හැරිය සේකැ"යි කීවේ ය. ඒ නිසා ඒ ස්ථානයට
බාල්-පෙරාශීම් යන නම තැබී ය. 12 ඔව්හු තමන්ගේ
දේව රූප එහි අත්හැර ගියෝ ය. එකල දාවිත් දුන්

ආඥාව ලෙස ඒවා ගින්නෙන් පුළුස්සා දමන ලද්දේ
ය.
13 නැවතත් පිලිස්තිවරු මිටියාවතෙහි පැතිර ගොස්
එය කොල්ලකෑවෝ ය. 14 දාවිත් නැවත දෙවියන්
වහන්සේගෙන් විචාළේ ය. දෙවියන් වහන්සේ ද
උත්තර දෙමින්, “නුඹ ඔවුන් පස්සේ නොගොස්,
ඔවුන් වටෙන් හැරී වටකරින් ගොස්, ඇඹිල්ල
ගස්වලට ඉදිරිපිටින් ඔවුන් සමඟ සටනට යන්න.
15 තවද, ඇඹිල්ල ගස් මුදුන්වල අඩි ශබ්දයක් නුඹට
ඇසෙන විට සටනට පිටත් ව යන්න. මන්ද, එවිට
දෙවියන් වහන්සේ පිලිස්තිවරුන්ගේ සේනාවට පහර
දෙන්න නුඹට පෙරටුවෙන් පිටත් ව යන සේකැ”යි
ඔහුට වදාළ සේක. 16 දාවිත් දෙවියන් වහන්සේ
අණ කළ ලෙස කළේ ය. ඔව්හු ගිබියොන් සිට
ගෙසෙර් දක්වා පිලිස්තිවරුන්ගේ සේනාවට පහර
දුන්නෝ ය. 17 දාවිත්ගේ කීර්තිය සියලු රටවල පතළ
වී ගියේ ය. සමිඳාණන් වහන්සේ සියලු ජාතීන් තුළ
ඔහු කෙරෙහි භයක් ඇති කළ සේක.

### ගිවිසුම් කරඬුව ජෙරුසලමට ගෙන ඒම

15 දාවිත් තමා උදෙසා ම දාවිත්ගේ නුවර
ගොඩනැගිලි සාදාගත්තේ ය. ඔහු දෙවියන්
වහන්සේගේ ගිවිසුම් කරඬුවට ස්ථානයක් පිළියෙළ
කොට ඊට කූඩාරමක් පිහිටෙව්වේ ය. 2 ද්වි.නී.
10:8එවිට දාවිත් කතා කොට, “දෙවියන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව ගෙනයන්නටත්, හැම
කල්හි ම උන් වහන්සේට සේවය කරන්නටත්
සමිඳාණන් වහන්සේ ලෙවීවරුන් තෝරාගත් නිසා උන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව ගෙනයන්නට ඔවුන්ට
මිස වෙන කාට වත් යුතු නැතැ”යි කීවේ ය. 3 දාවිත්
තමා සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුවට
පිළියෙළ කළ ස්ථානයට එය ගෙනෙන පිණිස සියලු
ඉශ්‍රායෙල්වරුන් ජෙරුසලමට රැස් කළේ ය.
4 දාවිත්, ආරොන්ගේ පුත්‍රයන් ද ලෙවීවරුන් ද රැස්
කළේ ය. 5 එසේ රැස් කරන ලද ගණන නම්,
කොහාත්ගේ පුත්‍රයන්ගේ ප්‍රධානියා වූ උරියෙල්
සහ ඔහුගේ සහෝදරයෝ එකසිය විසිදෙනෙක් ය.
6 මෙරාරීගේ ගෝත්‍රයෙන් ප්‍රධානියා වූ අසායා සහ
ඔහුගේ සහෝදරයෝ දෙසිය විසිදෙනෙක් ය.
7 ගේර්ෂොම්ගේ ගෝත්‍රයෙන් ප්‍රධානියා වූ
ජෝවෙල් සහ ඔහුගේ සහෝදරයෝ එකසිය
තිස්දෙනෙක් ය. 8 එලිශාපාන්ගේ ගෝත්‍රයෙන්
ප්‍රධානියා වූ ෂෙමායා සහ ඔහුගේ සහෝදරයෝ
දෙසියදෙනෙක් ය. 9 හෙබ්‍රොන්ගේ ගෝත්‍රයෙන්
ප්‍රධානියා වූ එලීයෙල් සහ ඔහුගේ සහෝදරයෝ
අසූදෙනෙක් ය. 10 උශ්ශියෙල්ගේ ගෝත්‍රයෙන්
ප්‍රධානියා වූ අම්මීනාදාබ් සහ ඔහුගේ සහෝදරයෝ
එකසිය දොළොස්දෙනෙක් ය.
11 දාවිත් පූජකයන් වූ සාදොක්ට සහ අබියාතර්ට ද
ලෙවීවරුන් වූ උරියෙල්, ආසායා, ජෝවෙල්, ෂෙමායා,
එලීයෙල් සහ අම්මීනාදාබ්ට ද අඬගසා ඔවුන්ට කතා
කොට, 12 “ඔබ හැම ලෙවීවරුන්ගේ පිය වංශවල
ප්‍රධානියෝ ය. ඔබත් ඔබේ සහෝදරයනුත් පවිත්‍ර
වී, ඉශ්‍රායෙල්ගේ දෙවි සමිඳාණන් වහන්සේගේ
ගිවිසුම් කරඬුව මා විසින් ඊට පිළියෙළ කරනු ලැබ
තිබෙන ස්ථානයට ගෙනෙන්න. 13 පළමු වතාවේ දී
එය ගෙනා අය ඔබ හැම නොවූ බැවින් අපේ දෙවි
සමිඳාණන් වහන්සේ අපට පහර දුන් සේක. මන්ද,
නියෝගය ලෙස අපි උන් වහන්සේ නොසෙව්වෙමු”යි
කීවේ ය.
14 පූජකයෝ ද ලෙවීවරු ද ඉශ්‍රායෙල්ගේ දෙවි
සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව ගෙනෙන
පිණිස පවිත්‍ර වූණෝ ය. 15 නික්ම 25:14සමිඳාණන්
වහන්සේගේ වචනය ප්‍රකාර, මෝසෙස් විසින් අණ
කරනු ලැබූ ලෙස, ලෙවීගේ පුත්‍රයෝ දෙවියන්
වහන්සේගේ ගිවිසුම් කරඬුවේ පොලු තමන්ගේ
කරපිට තබාගෙන එය ගෙන ගියෝ ය.
16 තවද, දාවිත් කුඩා වීණා ද මහා වීණා ද අත්තල්
ද යන තූර්ය භාණ්ඩවලින් ගායනා කරමින් ප්‍රීති
හඬ පැවැත්වීමට තමන්ගේ සහෝදරයන් වූ
ගායකයන් නියම කරන ලෙස ලෙවීවරුන්ගේ
ප්‍රධානීන්ට කීවේ ය. 17 මෙසේ ලෙවීවරු
ජෝවෙල්ගේ පුත් හේමන් ද ඔහුගේ
සහෝදරයන්ගෙන් බෙරෙකියාගේ පුත් ආසාප් ද
තමන්ගේ සහෝදරයන් වූ මෙරාරීගේ පුත්‍රයන්ගෙන්
කූෂායාගේ පුත් ඒතාන් ද 18 ඔවුන් සමඟ දොරටු
පාලකයන් කොට තමන්ගේ බාල සහෝදරයන් වන
ශෙකරියා ද බෙනේ ද ජයසීයෙල් ද ෂෙමීරාමොත් ද
ජයියෙල් ද උන්නී ද එලියාබ් ද බෙනායා ද
මයසේයා ද මත්තිතියා ද එලීපලෙහු ද මික්නේයා
ද ඕබෙද්-ඒදොම් ද ජයියෙල් ද පත් කළෝ ය.
19 හේමාන් ද ආසාප් ද ඒතාන් ද යන
ගායනාකාරයෝ ලෝකඩ අත්තල්වලින් ශබ්ද
කිරීමටත්, 20 ශෙකරියා ද අශීයෙල් ද ෂෙමීරාමොත් ද
ජෙහියෙල් ද උන්නී ද එලියාබ් ද මයසේයා ද
බෙනායා ද යන මොවුහු අලමොත් නම් කුඩා
වීණාවලින් සිහින් ශබ්ද පැවැත්වීමටත්; 21 මත්තිතියා
ද එලීපලෙහු ද මික්නේයා ද ඕබෙද්-ඒදොම් ද
ජයියෙල් ද අශශියා ද ෂෙමිනිත් නම් මහා
වීණාවලින් උච්චස්වර මහා ශබ්ද පැවැත්වීමටත්
නියම කළෝ ය.
22 කෙනෙනියා ගායනා කිරීම ගැන ලෙවීවරුන්ගේ
ප්‍රධානියා ව සිටියේ ය. ඔහු ඊට දක්ෂ ව සිටි
බැවින් ගායනා කරන්නන්ට එය ඉගැන්නුවේ ය.
23 බෙරෙකියා ද එල්කානා ද ගිවිසුම් කරඬුව උදෙසා
දොරටු පාලකයන් ව සිටියෝ ය. 24 පූජකයන් වූ
ෂෙබෙනියා ද ජෝෂාපාට් ද නෙතනෙල් ද අමාසයි ද
ශෙකරියා ද බෙනායා ද එලියෙසෙර් ද දෙවියන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව පෙරටුවෙන් නළා
පිම්බෝ ය. ඕබෙද්-ඒදොම් ද ජෙහියා ද ගිවිසුම්
කරඬුව උදෙසා දොරටු පාලකයන් ව සිටියෝ ය.
25 මෙසේ දාවිත් හා සියලු ඉශ්‍රායෙල්වරුන්ගේ
ප්‍රජා මූලිකයෝ ද සහශ්‍රාධිපතීහු ද සමිඳාණන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව ඕබෙද්-ඒදොම්ගේ
ගෙදරින් ගෙනෙන පිණිස ප්‍රීතියෙන් ගියෝ ය.
26 තවද, සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
ගෙන යන ලෙවීවරුන්ට දෙවියන් වහන්සේ පිහිට වන

බැවින් ඔව්හු ගොන් හත්දෙනෙකු ද බැටළුවන්
හත්දෙනෙකු ද පූජා කළෝ ය. 27 දාවිත් ද ගිවිසුම්
කරඬුව උසුලාගත් සියලු ලෙවීවරු ද ගායකයෝ ද
ගායකයන් අතරේ ගායනා කිරීමට ප්‍රධානියා ව සිටි
කෙනෙනියා ද සිහින් හණ සළු ඇඳගෙන සිටියහ.
දාවිත් හණ ඒපොද් සැට්ටයක් පැළඳගෙන සිටියේ ය.
28 මෙසේ සියලු ඉශ්රායලේවරු ඔල්වර හඬත්,
හොරණෑ ශබ්දයත් ඇති ව, නළාවලිනුත්,
අත්තල්වලිනුත්, වීණාවලිනුත්, මහා වීණාවලිනුත්
ශබ්ද පවත්වමින් සමිඳාණන් වහන්සේගේ ගිවිසුම්
කරඬුව ගෙනාවෝ ය.
29 සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
දාවිත්ගේ නුවරට පැමිණෙන විට, සාවුල්ගේ දුව වූ
මීකල් කවුළුවෙන් බලා දාවිත් රජ ප්‍රීතියෙන්
ප්‍රමුදිත ව නටනු දැක, ඈ සිතින් ඔහු හෙළා දැක්කා
ය.

16 ඔවුහු දෙවියන් වහන්සේගේ ගිවිසුම්
කරඬුව ගෙනෙවුත්, දාවිත් ඒ සඳහා පිහිටුවා
තිබුණු කූඩාරම තුළ එය තබා, දවන යාග පූජාවල් ද
සහභාගිකමේ පූජාවල් ද දෙවියන් වහන්සේ
ඉදිරියෙහි ඔප්පු කළෝ ය. 2 දාවිත් දවන යාග පූජාව
ද සහභාගිකමේ පූජා ද ඔප්පු කර නිම වූ විට,
සමිඳාණන් වහන්සේගේ නාමයෙන් සෙනඟට
ආශීර්වාද කළේ ය. 3 තවද, ඔහු ඉශ්රායලේවරුන්
සියල්ලන්ගෙන් එක එක පුරුෂයාටත්, ස්ත්‍රියටත්
රොටියක් ද මස් කෑල්ලක් ද වියළි මුද්රික පල
කැටියක් ද බැගින් දුන්නේ ය.

## ගිවිසුම් කරඬුව ලෙවීවරුන්ට බාර දීම

4 තවද, සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
ඉදිරියෙහි සේවය කිරීමටත්, ඉශ්රායලේවරුන්ගේ
දෙවි සමිඳාණන් වහන්සේ වර්ණනා කිරීමටත්, උන්
වහන්සේට ස්තුති ප්‍රශංසා කිරීමටත් ඔහු
ලෙවීවරුන්ගෙන් සමහරකු නියම කළේ ය. 5 ඒ
අයගේ ප්‍රධානියා ආසාප් ය. ඔහු ළඟට ශකරියා,
ජයීයලේ, ෂමීරාමොත්, ජහීයලේ, මත්තිතියා,
එලියාබ්, බෙනායා, ඕබදේ-ඒදොම් සහ ජයීයලේ ය.
මොවුහු වීණාවලින් ද මහා වීණාවලින් ද ගායනා
කළහ. එහෙත්, ආසාප් අත්තල්වලින් ශබ්ද පැවැත්වී
ය. 6 පූජකයන් වූ බෙනායා ද ජහසියලේ ද දෙවියන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව ඉදිරියෙහි නිතර ම
නළා පිම්බෝ ය.
7 දාවිත් ආසාප් ද ඔහුගේ සහෝදරයන් ද ලවා
සමිඳාණන් වහන්සේට ස්තුති කරවීමට පළමුවෙනේ
නියම කළේ ඒ දවසේ දී ය.

## ප්‍රශංසා ගීයක්

(ගීතා 105:1-15;96:1-13;106:1,47-48)

8 සමිඳුන්ට තුති පුදන්න;
q2 8 එතුමන් නම කියා අයැදින්න;
q2 8 ජාතීන් අතරේ එතුමන්ගේ ක්‍රියා පළ කරන්න.
9 එතුමන්ට ගී ගයන්න;
q2 9 එතුමන්ට පසස් ගී ගයන්න;
q2 9 එතුමන්ගේ පුදුම ක්‍රියා මෙනෙහි කරන්න.
10 එතුමන්ගේ ශුද්ධ නාමය ගැන උදම් අනන්න.
q2 10 සමිඳුන් සොයන්නන්ගේ සිත් ප්‍රීති ප්‍රමුදිත
වේ වා!
11 සමිඳුන් ද එතුමන්ගේ බලය ද සොයා බලන්න;
q2 11 එතුමන්ගේ හමු වීම නිතර ම සොයන්න.
12 එතුමන්ගේ මෙහෙකෙරු වන ඉශ්රායලේ
වංශයෙනි, එතුමන් විසින් තෝරාගනු ලැබූ
තැනැත්තන් වන ජාකොබ් දරුවෙනි,
13 එතුමන් කළ පුදුම ක්‍රියා ද එතුමන්ගේ
ආශ්චර්යයන් ද එතුමන් දුන් විනිශ්චයයන් ද සිහි
කරන්න.
14 එතුමාණෝ අපේ දෙවි සමිඳාණෝ ය.
q2 14 එතුමන්ගේ ආණ්ඩු බලය මුළු පොළොවෙහි
තිබේ.
15 එතුමන්ගේ ගිවිසුම සදහටත්, එතුමන් අණ කළ
වචනය පරම්පරා දහසක් දක්වාත් සිහි කරන්න.
16 උත් 12:7; 26:3 ඒ ගිවිසුම එතුමාණෝ ආබ්රහම්
සමඟ කළ සේක;
q2 16 ඊසාක්ට ද දිවුරුම් දුන් සේක.
17 උත් 28:13 එතුමාණෝ එය ජාකොබ්ට පණතක්
ද ඉශ්රායලේට සදාකාල ගිවිසුමක් ද කොට ස්ථිර
කරමින්,
18 “නුඹලාගේ උරුම කොටස කොට කානාන්
දේශය නුඹලාට දෙන්නෙමි.
19 නුඹලා ගණනින් ස්වල්ප දෙනෙකු වී, ඉතා
ස්වල්ප දෙනෙකු වී එහි විදේශීන් වී සිටින්නහු ය”යි
වදාළ සේක.
20 ඔව්හු, ජාතියකින් ජාතියකට ද රාජ්යයකින්
රාජ්යයකට ද ගියෝ ය.
21 උත් 20:3-7 ඔවුන්ට තාඩන පීඩන කරන්න කිසි
ම මිනිසකුට එතුමාණෝ ඉඩ නුදුන් සේක.
q2 21 එසේ ය, එතුමාණෝ ඔවුන් නිසා රජුන්ට
තරවටු කොට,
22 “මාගේ අබිසෙස් ලත් අයට අත නොගසන්න;
q2 22 මාගේ දිවැසිවරුන්ට අනතුරු නොකරන්නැ”යි
වදාළ සේක.
23 පොළෝ වැසි සියල්ලෙනි, සමිඳුන්ට ගී ගයන්න.
q2 23 එතුමන්ගෙන් ලැබෙන ගැළවීම දිනෙන් දින
ප්‍රකාශ කරන්න.
24 ජාතීන් අතරෙහි එතුමන්ගේ මහිමය ද සියලු
ජාතීන් අතරෙහි එතුමන්ගේ ක්‍රියා ද පතළ කරන්න.
25 මන්ද, සමිඳාණෝ උතුම් ය;
q2 25 අතිශයින් පැසසිය යුතු ය.
q2 25 සියලු දෙවිවරුන්ට වඩා එතුමන්ට ගරුබිය පෑ
යුතු ය.
26 මන්ද, ජනයන්ගේ සියලු දෙවිවරු පිළිම පමණකි;
q2 26 සමිඳාණෝ ම අහස් මඬල සෑදූ සේක.
27 ගෞරවය ද තේජස ද එතුමන් ඉදිරියෙහි
පවත්නේ ය;
q2 27 ශක්තිය ද ප්‍රීතිය ද එතුමන්ගේ මැඳුරෙහි
ඇත්තේ ය.
28 ජනයෙනි, සමිඳුන් පසසන්න;
q2 28 ගෞරවය ද බලය ද සමිඳුන් හට පිරිනමන්න.

29 සමිඳුන් නමට හිමි ගෞරවය පිරිනමන්න;
q229 පඬුරක් රැගෙන එතුමන් ඉදිරියට එන්න;
q229 ශුද්ධ මළුවෙහි සමිඳුන් නමදින්න.
30 පොළෝ වැසි සියල්ලනේ, එතුමන් අබිමුව
බියෙන් ඇලළී සිටින්න;
q230 එතුමාණෝ නොසැලෙන ලෙස තිරසාර ව
ලොව සෑදූ සේක.
31 ස්වර්ගයෝ සන්තෝෂ වෙත් වා!
q231 පොළොව ද ප්‍රීති වේ වා!
q231 "සමිඳාණෝ රජකම් කරන සේකැ"යි ජාතීන්
අතරේ කියත් වා!
32 මුහුදත්, එහි ඇති සියල්ලත් ගිගුරුම් හඬ දේ වා!
q232 කෙත්වතු සහ එහි ඇති සියල්ල ප්‍රීතිමත් වේ
වා!
33 වනයේ ගස් කොළන් සමිඳුන් අබිමුව ප්‍රීතියෙන්
ගී ගයා වා!
q233 මන්ද, එතුමාණෝ පොළොව පාලනය කරන
පිණිස වඩින සේක.
34 2 වංශා 5:13; 7:3; එස්රා 3:11; ගීතා 100:5;
106:1; 107:1; 118:1; 136:1; ජෙර 33:11 සමිඳුන් හට
තුති පුදන්න;
q234 මන්ද, එතුමාණෝ යහපත් ය;
q234 එතුමන්ගේ ස්ථිරසාර ප්‍රේමය සදහට ම
පවත්නේ ය.
35 "අපේ ගැළවුම්කාර දෙවිඳාණෝ, එතුමන්ගේ
ශුද්ධ නාමයට තුති කරන පිණිසත්, එතුමන්ගේ
ප්‍රශංසා ගැන ජයඝෝෂා පවත්වන පිණිසත්, අප
ගළවා, ජාතීන් අතරෙන් අප රැස් කොට, අප නිදහස්
කරන සේකැ"යි කියන්න.
36 ඉශ්‍රායෙලේ දෙවි සමිඳුන් හට සදාකාලයෙන්
සදාකාලයට ප්‍රශංසා වේ වා!
36 මුළු සෙනඟ ද, "ආමෙන්" කියා සමිඳාණන්
වහන්සේට ප්‍රශංසා කළෝ ය.

### ජෙරුසලමේ සහ ගිබියොන්හි වන්දනාව

37 ඉක්බිති සමිඳාණන් වහන්සේගේ ගිවිසුම්
කරඬුව ඉදිරියෙහි නිතර ම එක එක දවසට සුදුසු
ලෙස සේවය කිරීමට දාවිත් රජ ගිවිසුම් කරඬුව
ඉදිරියෙහි ආසාප් ද ඔහුගේ සහෝදරයන් ද
38 ඕබද්-ඒදොම් ද ඔවුන්ගේ සහෝදරයන්
හැටඅටදෙනෙකු ද සිටවේවේ ය. ජදූතුන්ගේ පුත්
ඕබද්-ඒදොම් ද හෝසා ද දොරටු පාලයන් කොට
නියම කළේ ය.
39 පූජක ශාදොක් ද පූජකයන් වන ඔහුගේ
සහෝදරයන් ද ගිබියොන්හි ගිරිකුළක තිබෙන
සමිඳාණන් වහන්සේගේ මණ්ඩපය ඉදිරියෙහි
සිටින්න නියම කළේ ය. 40 එසේ කළේ,
සමිඳාණන් වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට අණ කළා වූ
උන් වහන්සේගේ ව්‍යවස්ථාවෙහි ලියා තිබෙන
සියල්ල ප්‍රකාරයට දවන යාග පූජා පුදන පූජාසනය
පිට නිතර ම උදය සවස දවන යාග පූජා සමිඳාණන්
වහන්සේට ඔප්පු කරන පිණිස ය. 41 ඔවුන් සමඟ
හේමන් ද ජදූතුන් ද නම් කියා තෝරාගනු ලැබූ
අනික් අය ද, "සමිඳාණන් වහන්සේගේ කරුණාව
සදහට ම පවත්නේ ය" කියමින් උන් වහන්සේට
ස්තුති කිරීමට නියම කළේ ය. 42 ඔවුන් සමඟ
හේමන් ද ජදූතුන් ද පත් කළේ, දෙවියන්
වහන්සේට ගී ගයමින් නළාවලිනුත්, අත්තල්වලිනුත්,
තූර්ය භාණ්ඩවලිනුත් ශබ්ද කිරීමට ය. තවද, දාවිත්
රජ ජදූතුන්ගේ පුත්‍රයන් දොරටු පාලකයන් කොට
පත් කළේ ය.
43 2 සාමු 6:19-20 පසු ව මුළු සෙනඟ තම
තමන්ගේ ගෙවලට ගියෝ ය. දාවිත් තමාගේ ගෙදර
වැසියන්ට ආශීර්වාද කරන පිණිස හැරී ගියේ ය.

### දාවිත් රජුට නාතාන්ගේ පණිවුඩය

(2 සාමු 7:1-17)

17 තවද, දාවිත් තමාගේ ගෙදර වසන කල්හි
දිවැසිවරයා වන නාතාන්ට කතා කොට,
"මෙන්න, මම කිහිරි ලී ගෙයක වාසය කරමි.
එහෙත්, සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
කූඩාරමක වියනක් යට තිබේ ය"යි කීවේ ය.
2 නාතාන් ද කතා කොට, "ඔබේ සිතේ තිබෙන
සියල්ල කළ මැනව. මන්ද, දෙවියන් වහන්සේ ඔබ
සමඟ වැඩ සිටින සේකැ"යි දාවිත්ට කී ය.
3 එහෙත්, එම රාත්‍රියේ ම දෙවියන් වහන්සේගේ
වචනය නාතාන්ට පැමිණ කියනුයේ, 4 "නුඹ ගොස්,
'සමිඳාණන් වහන්සේ මෙසේ කියන සේකැ'යි මාගේ
මෙහෙකරු වූ දාවිත්ට කියන්න; 'මාගේ වාසය පිණිස
නුඹ මාලිගාවක් ගොඩ නොනඟන්නෙහි ය. 5 මන්ද,
මම ඉශ්‍රායෙල්වරුන් ගෙනා දවස පටන් අද දක්වා
මාලිගාවක වාසය නොකොට, කූඩාරමෙන් කූඩාරමට
ද මණ්ඩපයෙන් මණ්ඩපයට ද යමින් හැසුරුණෙමි.
6 මාගේ සෙනඟ පාලනය කරන්න මා විසින් අණ
කරන ලද ඉශ්‍රායෙලේ වීර නායකයන්ගෙන් යමකුට
කතා කොට, නුඹලා මට කිහිරි ලී මාලිගාවක්
ගොඩනොනැඟුවේ මක්නිසා ද යන වචනයක් සියලු
ඉශ්‍රායෙල්වරුන් අතරෙහි මා ආ ගිය කොයි
ස්ථානයක දී වත් කීවෙමි ද?'
7 "එබැවින් මාගේ මෙහෙකරු වන දාවිත්ට මෙසේ
කියන්න; 'සර්ව පරාක්‍රම සමිඳාණන් වහන්සේ
මෙසේ කියන සේක: මාගේ සෙනඟ වන
ඉශ්‍රායෙල්වරුන්ගේ අධිපතියා නුඹ වන පිණිස තණ
බිමෙන් ද බැටළුවන් රැකබලාගැනීමෙන් ද මම නුඹ
වෙන් කොට ගතිමි. 8 නුඹ ගිය හැම තැන්හි ම මම
නුඹ සමඟ සිට, නුඹේ සියලු සතුරන් නුඹ ඉදිරියෙන්
පන්නා දැම්මෙමි; පොළොවේ සිටින උත්තමයන්ගේ
යසෝ කීර්තිය වැනි යසෝ කීර්තියක් නුඹට
දෙන්නෙමි. 9 මාගේ සෙනඟ වන ඉශ්‍රායෙලේ
තමන්ගේ ම දේශයෙහි වාසය කොට, මතු එයින්
නොයෙන ලෙස මම ඔවුන්ට දේශයක් නියම කොට
ඔවුන් පිහිටුවන්නෙමි; තවද, මුල දී සිදු වූ පරිදි
10 එනම්, මා විසින් මාගේ සෙනඟ වන
ඉශ්‍රායෙල්වරුන්ට වීර නායකයන් පත් කරන ලද
කාලයේ සිදු වූ පරිදි දුෂ්ට මනුෂ්‍යයෝ තවත් ඔවුන්
නාස්ති නොකරන්නෝ ය. මම නුඹේ සියලු සතුරන්
යටත් කරන්නෙමි. ඇරත්, සමිඳාණන් වහන්සේ නුඹට

වංශයක් ගොඩනඟන බව නුඹට දන්වමි, 11 නුඹේ
දවස් සම්පූර්ණ වූ කල, මම නුඹේ පුත්‍රයකු වන
නුඹේ ම දරුවකු නුඹට පසු ව පිහිටුවා ඔහුගේ
රාජ්‍යය ස්ථිර කරන්නෙමි. 12 ඔහු මට මාළිගාවක්
ගොඩනඟන්නේ ය. ඔහුගේ සිංහාසනය ද මම
සදහට ම ස්ථිර කරන්නෙමි. 13 2 වංශා 6:18;
හෙබ්‍රෙ 1:5මම ඔහුට පියකු වන්නෙමි. ඔහු ද මට
පුත්‍රයකු වන්නේ ය. නුඹට පළමු සිටි
තැනැත්තාගෙන් මාගේ කරුණාව පහ කළ ලෙස මම
ඔහුගෙන් එය පහ නොකර, 14 මාගේ මාළිගාවෙහි
ද මාගේ රාජ්‍යයෙහි ද ඔහු සදහට ම
පිහිටුවන්නෙමි. ඔහුගේ සිංහාසනය ද සදහට ම
ස්ථිර කරනු ලබන්නේ ය' "යි වදාළ සේක.
15 මේ සියලු වචන ද මේ මුළු ප්‍රකාශනය ද
නාතාන් දාවිත්ට දැන්වී ය.

## දාවිත් රජුගේ ස්තුති දීමේ යාච්ඤාව

(2 සාමු 7:18-29)

16 එවිට දාවිත් රජු කූඩාරම ඇතුළට ගොස්,
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි වාඩි වී මෙසේ
කීවේ ය: "දෙවි සමිඳාණන් වහන්ස, ඔබ විසින්
මෙපමණ දුරට මා ගෙන එනු ලැබීමට මම කවරකු
ද? මාගේ වංශය කුමක් ද? 17 එහෙත්, දෙවියන්
වහන්ස, මෙය ද ඔබේ ඇස් හමුයෙහි සුළු දෙයක් වූ
ලෙස තකා, මතු කාලයට ඔබේ මෙහෙකරුවාගේ
වංශය ගැන ඔබ කතා කොට, දෙවි සමිඳාණන්
වහන්ස, උත්තම මනුෂ්‍යයකු හැටියට ඔබ මා
සැලකූ සේක. 18 ඔබේ මෙහෙකරුවාට පනේවූ
ගෞරවය ගැන දාවිත් ඔබට තවත් කුමක් කියන්න
ද? මන්ද, ඔබ වහන්සේ ඔබේ මෙහෙකරුවා දන්න
සේක. 19 සමිඳාණන් වහන්ස, ඔබේ සිතේ හැටියට
ඔබේ මෙහෙකරුවා උදෙසා ඔබ මේ මහා දේ කර,
ඉදිරියට වන්න යන දේ ඔබ දන්න සේක.
20 සමිඳාණන් වහන්ස, අපේ කන්වලින් අප ඇසූ
සියල්ල ලෙස ඔබට සමාන කෙනෙක් නැත. ඔබ
වහන්සේ හැර වෙන කිසි දෙවි කෙනෙක් ද නැත.
21 ඔබේ ඉශ්‍රායෙලේ සෙනඟට සමාන ව සිටින්නේ
පොළොවේ කවර ජාතිය ද? මන්ද, දෙවියන්
වහන්සේ තමන්ට සෙනඟක් කොට ඔවුන් මුදා ගනු
පිණිස ගොස්, මිසරයෙන් මුදා ගත් ඔබේ සෙනඟ
ඉදිරියෙහි ජාතීන් එළවා දමා, මහත් වූ භයානක වූ
දේවල් කිරීමෙන් ඔබට කීර්තිය හිමි කරගත් සේක.
22 මෙසේ ඔබේ සෙනඟ වන ඉශ්‍රායෙල්වරුන්
සදහට ම ඔබට සෙනඟක් කොට තබාගෙන, ඔබ ම,
සමිඳාණන් වහන්ස, ඔවුන්ගේ දෙවියන් වහන්සේ වී
සිටින සේක.
23 "දැන් ඉතින් සමිඳාණන් වහන්ස, ඔබේ
මෙහෙකරුවාත්, ඔහුගේ වංශයත් ගැන ඔබ කී
වචනය සදහට ම ස්ථිර වේ වා! ඔබ කී ලෙස ම
කළ මැනව. 24 ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවියන්
වහන්සේ වන සර්ව පරාක්‍රම සමිඳාණන් වහන්සේ,
ඉශ්‍රායෙල්වරුන් සඳහා වූ දෙවියන් වහන්සේ ය.
මෙසේ, ඔබේ නාමය සදහට ම උතුම් වේ වා!
ඔබේ මෙහෙකරු වන දාවිත්ගේ වංශය ද ඔබ
ඉදිරියෙහි ස්ථිර ව පවතින්නේ ය. 25 මන්ද, මාගේ
දෙවියන් වහන්ස, ඔබේ මෙහෙකරුවා උදෙසා ඔබ
වංශයක් ගොඩනඟන බව ඔබ ඔහුට එළිදරව් කළ
සේක. එබැවින් ඔබ ඉදිරියෙහි යාච්ඤා කරන්න
ඔබේ මෙහෙකරුවා ඉදිරිපත් විය. 26 දැනුදු,
සමිඳාණන් වහන්ස, ඔබ ම දෙවියන් වහන්සේ ය,
ඔබේ මෙහෙකරුවාට මේ යහපත් දේ පොරොන්දු වූ
සේක. 27 එසේ ඔබේ මෙහෙකරුවාගේ වංශය
සදහට ම ඔබ ඉදිරියෙහි පවතින පිණිස ඊට
ආශීර්වාද කරන්න ඔබ ප්‍රසන්න වුව මැනව. මන්ද,
සමිඳාණන් වහන්ස, ඔබ වහන්සේ ආශීර්වාද කළ
අය සදහට ම ආශීර්වාද ලද්දෝ වෙති."

## දාවිත් රජ විජාතීන් යටත් කිරීම

(2 සාමු 8:1-18)

18 මින්පසු දාවිත් පිලිස්තිවරුන්ට පහර දී ඔවුන්
යටත් කරගෙන, ගාත් ද ඊට අයිති නගර ද
පිලිස්තිවරුන්ගේ අතින් පැහැර ගත්තේ ය. 2 ඔහු
මෝවබ්වරුන්ටත් පහර දුන්නේ ය. මෝවබ්වරු
දාවිත්ට මෙහෙකරුවන් වී කප්පම් ගෙනො හ.
3 තවද, ශෝබාහි රජු වූ හදද්-එශරේ යුප්‍රටීස් ගඟ
අද්දර ප්‍රදේශයෙහි තම බලය පිහිටුවන්න යද්දී,
දාවිත් හමාත් දක්වා ඔහුට පහර දී, 4 රථ දහසක් ද
අසරුවන් සත්දහසක් ද පා බළ සෙනඟ විසිදහසක් ද
ඔහුගෙන් අල්ලාගෙන, රථ-අශ්වයන් සියයක් ඉතුරු
කරගෙන, අනික් සියලු අශ්වයන්ගේ කුදි කපා
අබලන් කළේ ය.
5 දමස්කයේ සිරියන්වරු ශෝබාහි රජ වූ හදද්-
එශරේට උපකාර කරන්න ආවෝ ය. එවිට දාවිත්
සිරියන්වරුන්ගෙන් මනුෂ්‍යයන් විසිදෙදහසකට පහර
දී, 6 දමස්කයේ සිරියාවෙහි මුර හමුදාවල් තැබුවේ
ය. සිරියන්වරු දාවිත්ට මෙහෙකරුවන් වී කප්පම්
ගෙනොවෝ ය. දාවිත් ගිය ගිය තැන සමිඳාණන්
වහන්සේ ඔහුට ජය අත්කර දුන් සේක. 7 දාවිත්
හදද්-එශරේගේ සේවකයන්ට තිබූ රන් පලිස්
රැගෙන ඒවා ජෙරුසලමට ගෙනොවේ ය. 8 1 රාජා
7:40-47; 2 වංශා 4:11-18තිබ්හත් ද කුන් ද යන හදද්-
එශරේගේ නගරවලින් දාවිත් බොහෝ ලෝකඩ
ගත්තේ ය. එයින් සලමොන් ලෝකඩ තටාකයත්,
කුළුනුත්, ලෝකඩ භාජනත් සෑදී ය.
9 දාවිත් ශෝබාහි රජ වූ හදද්-එශරේගේ මුළු
සේනාවට පහර දුන් බව හමාත්හි රජ වූ තොයූ
අසා, 10 දාවිත් එසේ හදද්-එශරේට විරුද්ධ ව සටන්
කොට ඔහුට පහර දුන් බැවින්, දාවිත්ට ආචාර
කරන්නටත්, ඔහුට ආශීර්වාද කරන්නටත් ඔහු වෙත
තමාගේ පුත් හදෝරාම් සහ සියලු ආකාර රන් රිදී
ලෝකඩ බඩුත් එව්වේ ය. මන්ද, හදද්-එශරේ සහ
තොයූ අතරේ යුද්ධ තිබිණි. 11 ඒ බඩුත් දාවිත් රජු
සියලු ජාතීන්ගෙන් එනම්, ඒදොම්වරුන්ගෙන් ද
මෝවබ්වරුන්ගෙන් ද අම්මොන්වරුන්ගෙන් ද
පිලිස්තිවරුන්ගෙන් ද අමලෙක්වරුන්ගෙන් ද ගත් රන්
රිදී සමඟ සමිඳාණන් වහන්සේට කැප කළේ ය.

12 ගීතා 60 ඇරත්, ශෙරුයාගේ පුත් අබිෂයි ලුණු
මිටියාවතේ දී ඒදොම්වරුන්ගෙන් දහඅටදහසකට
පහර දුන්නේ ය. 13 ඔහු ඒදොමේහි මුර හමුදාවල්
තැබී ය. සියලු ඒදොම්වරු දාවිත්ට මෙහෙකරුවෝ වූ
හ. දාවිත් ගිය ගිය තැන සමිඳාණන් වහන්සේ ඔහුට
ජය අත් කර දුන් සේක.
14 දාවිත් මුළු ඉශ්‍රායලේ ජාතිය පාලනය කරමින්
තමාගේ මුළු සෙනඟට සාධාරණකම ද යුක්තිය ද
ඉෂ්ට කෙළේ ය. 15 ශෙරුයාගේ පුත් ජෝවාබ්
සේනාධිපතියා ව සිටියේ ය. අහිලුද්ගේ පුත්
ජෙහෝෂාපාට් වාර්තාකරු ව සිටියේ ය.
16 අහිතුබ්ගේ පුත් ශාදොක් සහ අබියාතර්ගේ පුත්
අබිමලෙක් පූජකයන් ව සිටියෝ ය. ෂව්ෂා ලේකම්
ව සිටියේ ය. 17 ජෙහෝයාදාගේ පුත් බෙනායා
කෙරෙතීවරුන්ටත්, පෙලෙතීවරුන්ටත් ප්‍රධානියා ව
සිටියේ ය. දාවිත්ගේ පුත්‍රයෝ ද රාජ සේවයේ
ප්‍රධානියන් ව සිටියහ.

### අම්මෝන්වරුන් හා සිරියන්වරුන් පරාජය කිරීම
(2 සාමු 10:1-19)

19 ඉක්බිති අම්මෝන්වරුන්ගේ රජ වූ නාහාෂ්
මළේ ය. ඔහුගේ පුත්‍රයා වූ හානුන් ඔහු
වෙනුවට රජ විය. 2 දාවිත් වනාහි, “හානුන්ගේ පියා
වූ නාහාෂ් මට කරුණාව පෙනේ වූ නිසා මමත්
හානුන්ට කරුණාව පෙන්වන්නෙමි”යි ඔහුගේ පියාගේ
මරණය ගැන ඔහු සනසන පිණිස දූතයන් යැවී ය.
දාවිත්ගේ සේවකයෝ හානුන් සනසන්න
අම්මෝන්වරුන්ගේ දේශයට ඔහු වෙත පැමිණියෝ
ය. 3 එවිට අම්මෝන්වරුන්ගේ අධිපතීහු හානුන්ට
කතා කොට, “දාවිත් ඔබ ළඟට ඔබ සනසන පිණිස
දූතයන් එවූ නිසා, ඔහු ඔබේ පියාට ගෞරව
කරන්නේ යයි ඔබ සිතන්නෙහි ද? ඔහුගේ
සේවකයන් ඔබ වෙත ආවේ, දේශය පරීක්ෂා කර,
ඔත්තු බලා, එය නාස්ති කරන අදහසින් නොවේ
දැ”යි කීවෝ ය.
4 එවිට හානුන් දාවිත්ගේ සේවකයන් අල්ලා,
ඔවුන්ගේ රැවුල් බූගා, දණ හිසෙන් ඉහළට
ඔවුන්ගේ ඇඳුම් මැදින් කපා දමා ඔවුන් යන්න
හැරියේ ය. 5 මිනිස්සු අවුත් ඒ මනුෂ්‍යයන් ගැන
දාවිත්ට දැන්නූ හ. ඔහු ද ඔවුන් සම්බවන්න මිනිසුන්
යැවී ය. මන්ද, ඒ මනුෂ්‍යයන් බොහෝ සයෙන්
ලජ්ජාවට පත් වී සිටි බැවිනි. රජතුමා කතා කොට,
“ඔබේ රැවුල් වැඩෙන කල් ජෙරිකෝවෙහි නැවතී
පසු ව එන්නැ”යි කියා යැවී ය.
6 තවද, දාවිත් තමන්ගේ සතුරකු වී සිටින බව
දුටු හානුන් රජ ද අම්මෝන්වරු ද උතුරු
මෙසොපොතේමියාවෙනුත් මයකා සහ ශෝබායෙහි
සිරියන්වරුන්ගෙනුත් රථ සහ අසරුවන් කුලියට ගන්න
රිදී කිලෝග්‍රෑම් තිස්හතරදහසක් යැවූ හ. 7 මෙසේ
ඔව්හු රථ තිස්දෙදහසක් ද මයකාහි රජු ද ඔහුගේ
සෙනඟ ද කුලියට ගත්තෝ ය. ඔව්හු අවුත් මෙදේබා
ඉදිරිපිට කඳවුරු බැඳගත්හ. අම්මෝන්වරුත් තමන්ගේ
නගරවලින් පිටත් ව එහි රැස් වී සටනට ආවෝ ය.
8 දාවිත් ඒ අසා ජෝවාබ් ද බලවන්තයන් සමඟ
මුළු සේනාව ද යැවී ය. 9 අම්මෝන්වරු ද පිටතට
අවුත් නගර දොරටුව ළඟ සටනට පෙළ ගැසී
සිටියෝ ය. එහෙත්, පැමිණි රජවරු එළිමහනෙහි ඇත්
වී සිටියෝ ය.
10 තමාට විරුද්ධ ව ඉදිරියෙන් ද පස්සෙන් ද
සටනට එන බව ජෝවාබ් දැක, සියලු බලවන්ත
ඉශ්‍රායලේවරුන්ගෙන් කොටසක් තෝරාගෙන
සිරියන්වරුන්ට විරුද්ධ ව සිටුවා, 11 ඉතිරි සෙනඟ
අම්මෝන්වරුන්ට විරුද්ධ ව සිටින පිණිස තමාගේ
සහෝදර අබිෂයි අතට භාර දුන්නේ ය. 12 තවද,
ඔහු කතා කොට, “සිරියන්වරුන් මට වඩා බලවත්
වුණොත් ඔබ මට උපකාර කරන්න. අම්මෝන්වරුන්
ඔබට වඩා බලවත් වුණොත් මම ඔබට උපකාර
කරන්නෙමි. 13 ධෛර්යවත් ව සිටින්න. අපේ සෙනඟ
උදෙසාත්, අපේ දෙවියන් වහන්සේගේ නගර
උදෙසාත් ස්ථිර ව ක්‍රියා කරන්න. සමිඳාණන්
වහන්සේ තමන්ට යහපත් ව පෙනෙන ලෙස කරන
සේක්වා”යි කීවේ ය.
14 මෙසේ ජෝවාබ් ද ඔහු සමඟ සිටි සෙනඟ ද
සිරියන්වරුන්ට විරුද්ධ ව සටනට ළං වූ හ. එවිට
ඔව්හු ඔහු ඉදිරියෙන් පලා ගියෝ ය. 15 සිරියන්වරුන්
පලා ගිය බව අම්මෝන්වරුන් දුටු විට, ඔව්හු ද
ඔහුගේ සහෝදර අබිෂයි ඉදිරියෙන් පලා ගොස්
නගරයට ඇතුළු වූ හ. එවිට ජෝවාබ් ජෙරුසලමට
ආයේ ය.
16 සිරියන්වරු තමන් ඉශ්‍රායලේවරුන් අතින් පරාජය
වූ බව දැක දූතයන් යවා යුප්‍රටීස් ගංගාවට
එගොඩින් සිටි සිරියන්වරුන් ගෙන්වාගත්හ. හදද්-
එශෙරේගේ සේනාපතියා වූ ෂෝපාක් ඔවුන්ට පෙරටු
ව ආවේ ය. 17 එපවත් දාවිත්ට දැන් වූ කල ඔහු
සියලු ඉශ්‍රායලේවරුන් රැස් කරගෙන, ජොර්දානෙන්
එගොඩ වී ඔවුන් ළඟට අවුත්, ඔවුන්ට විරුද්ධ ව
යුද්ධයට පෙළ ගැසී සිටියේ ය. එසේ දාවිත්
සිරියන්වරුන්ට විරුද්ධ ව යුද්ධයට පෙළ ගැසී සිටි විට,
ඔව්හු ඔහුට විරුද්ධ ව සටන් කළෝ ය. 18 එහෙත්,
ඉශ්‍රායලේවරුන් ඉදිරියෙන් සිරියන්වරු පලා ගියෝ ය.
දාවිත් සිරියන්වරුන්ගෙන් රථ සත්දහසක මිනිසුන් ද
පා බළ සේනාවෙන් සතළිස්දහසක් ද මරා දමා,
සේනාපතියා වූ ෂෝපාක් ද මැරුවේ ය. 19 හදද්-
එශෙරේගේ සේවකයෝ තමන් ඉශ්‍රායලේවරුන්ට
පරාජය වූ බව දැක, දාවිත් සමඟ සාමදාන වී ඔහුට
මෙහෙකෙළෝ ය. ඉන්පසු සිරියන්වරු අම්මෝන්වරුන්ට
තවත් උපකාර කරන්න කැමැති නොවූ හ.

### දාවිත් රජ රබ්බා යටත් කිරීම
(2 සාමු 12:26-31)

20 2 සාමු 11:1 තවද, ඊළඟ අවුරුද්දේ රජවරුන්
සටනට පිටත් ව යන කාලය පැමිණි විට,
ජෝවාබ් යුද්ධ සේනාව ගෙන ගොස්
අම්මෝන්වරුන්ගේ රට පාළු කොට, රබ්බා නුවරට
අවුත් එය වටලාගත්තේ ය. එහෙත්, දාවිත්
ජෙරුසලමෙහි නැවතී සිටියේ ය. ජෝවාබ් රබ්බාට
පහර දී එය නාස්ති කෙළේ ය. 2 දාවිත් ඔවුන්ගේ

රජුගේ රන් ඔටුන්න මිල්කොම් රජුගේ හිසින් පැහැර
ගෙන එය කිලෝග්‍රෑම් තිස්හතරක් බර ඇති බව
දැනගත්තේ ය. එහි අනර්ඝ මැණික් ද තිබුණේ ය.
එය දාවිත්ගේ හිස පිට තබන ලද්දේ ය. ඔහු ද
කොල්ලකාගත් බඩු රාශියක් නුවරින් පිටතට
ගෙනාවේ ය. 3 ඔහු එහි සිටි සෙනඟ පිටතට
ගෙනේවා කියත් ද යකඩ දැති පෝරු ද පොරෝ ද
ඔවුන්ට දී ඔවුන්ගෙනේ වැඩ ගත්තේ ය. ඔහු
අම්මොන්වරුන්ගේ සියලු නුවරවලට මෙසේ කළේ
ය. ඉන්පසු දාවිත් ද මුළු සෙනඟ ද ජෙරුසලමට හැරී
ආවෝ ය.

### පිලිස්තිවරුන් පරාජය කිරීම

(2 සාමු 21:15-22)

4 ඉන්පසු පිලිස්තිවරුන් සමඟ ගෙශෙරේහි යුද්ධයක්
හට ගත්තේ ය. එකල හුෂාතිය සිබ්බකෙයි තමෙේ
යෝධයාගේ පුත්‍රයන්ගෙනේ එක් කෙනෙකු වූ සිප්පයි
මැරුවේ ය. පිලිසිතිවරු යටත් කරනු ලැබුවෝ ය.
5 1 සාමු 17:4-7 නැවතත් පිලිස්තිවරුන් සමඟ
යුද්ධයක් විය. ජායිර්ගේ පුත් එල්හානාන් ගිත්තීය
ජාතික ගොලියත්ගේ සහෝදර වූ ලහමි මැරුවේ ය.
ඔහුගේ හෙල්ලයේ මිට වියන යන්ත්‍රයක දණ්ඩකට
සමාන විය.
6 නැවතත් ගාත්හි යුද්ධයක් විය. එහි ඉතා උස
මහත ඇති මනුෂ්‍යයෙකේ විය. ඔහුට අත් පා ඇඟිලි
හය හය බැගින් ඇඟිලි විසිහතරක් තිබුණේ ය. ඔහු
ද යෝධයාට දාව උපන් කෙනෙකේ. 7 ඔහු
ඉශ්‍රායලේවරුන්ට විරෝධය දැක්වූ කල දාවිත්ගේ
සහෝදරයා වන ෂිමියාගේ පුත් ජොනතන් ඔහු
මැරුවේ ය.
8 මොවුහු ගාත්හි දී යෝධයන්ට දාව උපන් අය ය.
ඔව්හු දාවිත් අතින් ද ඔහුගේ සේවකයන් අතින් ද
පැරදී මියගියෝ ය.

### දාවිත් රජ සෙනඟ සංගණනය කිරීම

(2 සාමු 24:1-25)

21 එවිට සාතන් ඉශ්‍රායලේවරුන්ට විරුද්ධ ව
නැඟිට ඔවුන් සංගණනය කරන්න දාවිත්
පෙළඹ වී ය. 2 දාවිත් ජෝවාබ්ටත්, සෙනඟගේ
අධිපතීන්ටත් කතා කොට, "මට සෙනඟගේ ගණන
දැනගන්න පිණිස ඔබ ගොස් බයෙර්-ෂබො පටන්
දාන් දක්වා ඔවුන් ගණන් කර ඔවුන්ගේ සංඛ්‍යාව
මට දන්වන්නැ"යි කීවේ ය.
3 ජෝවාබ් කතා කොට, "දැන් සිටින පමණට වඩා
සමිඳාණන් වහන්සේ තමන්ගේ සෙනඟ සිය
ගුණයක් වැඩි කරන සේක්වා. එහෙත්, මාගේ
ස්වාමීන් වන රජතුමනි, ඔව්හු සියල්ලෝ ම මාගේ
ස්වාමියාගේ සේවකයෝ නොවෙත් ද? මාගේ
ස්වාමියා මෙය අණ කර ඉශ්‍රායලේවරුන් පිට වරද
පමුණුවන්නේ කුමක් නිසා දැ"යි ඇසී ය. 4 එහෙත්,
ජෝවාබ්ගේ වචනය නොව රජුගේ වචනය ස්ථිර
විය. ඒ නිසා ජෝවාබ් පිටත් වී මුළු ඉශ්‍රායලේ
දේශයෙහි ඇවිද, 5 ජෙරුසලමට අවුත්, ගණන් ගත්
සෙනඟගේ මුළු සංඛ්‍යාව දාවිත්ට දුන්නේ ය. කඩුව
පාවිච්චි කිරීමට සමත් ඉශ්‍රායලේවරු සියල්ලෝ
එකොළොස්ලක්ෂයක් ය. කඩුව පාවිච්චි කිරීමට
සමත් ජුදාහි මනුෂ්‍යයෝ හාරලක්ෂ සැත්තෑදහසක්
ය. 6 එහෙත්, රජුගේ වචනය ජෝවාබ් ට පිළිකුල් ව
තිබුණු නිසා ඔහු ලෙවීවරුන් ද බෙන්ජමින්වරුන් ද
ඔවුන් අතරේ ගණන් කළේ නැත.
7 දෙවියන් වහන්සේ මේ කාරණය ගැන
අප්‍රසන්න වී ඉශ්‍රායලේවරුන්ට පහර දුන් සේක.
8 දාවිත් දෙවියන් වහන්සේට කතා කොට, "මම මේ
දේ කිරීමෙනේ බොහෝ සේ පව් කළෙමි. එහෙත්,
දැන් ඔබේ මෙහෙකරුවාගේ අපරාධය පහකළ
මැනව. මන්ද, මම බොහෝ අනුවණ ලෙස ක්‍රියා
කළෙමි"යි කීවේ ය.
9 සමිඳාණන් වහන්සේ දාවිත්ගේ දර්ශකයා වූ
ගාද්ට කතා කොට, 10 "නුඹ ගොස්, මෙයෙ කියන්න,
'මම කාරණා තුනක් නුඹ ඉදිරියේ තබමි. මා විසින්
නුඹට කරනු ලබනු පිණිස එයින් එකක්
තෝරාගන්නැ'යි සමිඳාණන් වහන්සේ වදාරන සේක
කියා දාවිත්ට කියන්නැ"යි වදාළ සේක.
11 ගාද් දාවිත් ළඟට අවුත් ඔහුට කතා කොට, 12 "
'තුන් අවුරුදු සාගතයක් හෝ තුන් මාසයක් නුඹේ
එදිරිකාරයන්ගේ කඩුවට නුඹ අසු වී, නුඹේ සතුරන්
අතින් විනාශ වීම හෝ තුන් දවසක් සමිඳාණන්
වහන්සේගේ කඩුව වන වසංගතය දේශයට පැමිණ
උන් වහන්සේගේ දූතයා විසින් ඉශ්‍රායලේ පළාත්
මුළුල්ල විනාශ කරනු ලැබීම හෝ යන තුනෙනේ
එකක් තෝරාගන්නැ'යි සමිඳාණන් වහන්සේ වදාරන
සේක. ඒ නිසා මා එවූ තැනැන් වහන්සේට මා
මොන උත්තරයක් දෙන්නේ ද කියා කල්පනා
කරන්නැ"යි කීවේ ය.
13 දාවිත් උත්තර දෙමින්, "මම ලොකු ප්‍රශ්නයකට
මූණ පා සිටිමි. ඉතින් සමිඳාණන් වහන්සේගේ අතට
අසු වන්නෙමි. මන්ද, උන් වහන්සේගේ අනුකම්පාව
ඉමහත් ය. මනුෂ්‍යයාගේ අතට අසු වන්න මට සිද්ධ
නොවේවා"යි ගාද්ට කීවේ ය.
14 එබැවින් සමිඳාණන් වහන්සේ ඉශ්‍රායලේවරුන්
අතරට වසංගතයක් එවූ සේක. එයින්
ඉශ්‍රායලේවරුන්ගෙනේ සැත්තෑදහසක් මනුෂ්‍යයෝ
මළෝ ය. 15 දෙවියන් වහන්සේ ජෙරුසලම විනාශ
කරන්න දූතයෙකු යැවූ සේක. ඔහු එය විනාශ
කරන්න යන විට සමිඳාණන් වහන්සේ බලා ඒ විපත
ගැන තැවී, විනාශකාර දූතයාට කතා කොට, "ඉතින්
ඇත. නුඹේ අත නවත්වන්නැ"යි වදාළ සේක.
සමිඳාණන් වහන්සේගේ දූතයා ජෙබුසි ජාතික
ඔර්ණාන්ගේ කමත ළඟ සිටියේ ය.
16 දාවිත් තමාගේ හිස ඔසවා සමිඳාණන්
වහන්සේගේ දූතයා තමාගේ කඩුව ඇද ජෙරුසලම්
කරෙහි දිගු කරගෙන පොළොවටත් අහසටත්
අතරේ සිටිනු දුටුවේ ය. එවිට ගෝණි රෙදි ඇඳගෙන
සිටි දාවිත් ද ප්‍රජා මූලිකයෝ ද මුණින්තළා
වැටුණෝ ය. 17 දාවිත් දෙවියන් වහන්සේට කතා
කොට, "සෙනඟ ගණන් කරන්න අණ කළ තැනැත්තා
මම නොවෙමි ද? පව් කොට ඉතා දුෂ්ට ලෙස ක්‍රියා

කළේ මම ය. එහෙත්, මේ බැටළුවෝ කුමක්
කළෝ ද? අනේ! මාගේ දෙවි සමිඳාණන් වහන්ස,
පහර දීම පිණිස ඔබේ හස්තය ඔබේ සෙනඟ පිට
නොව මා පිටත්, මාගේ පිය වංශය පිටත්
පැමිණේවා”යි කීවේ ය.
18 එවිට සමිඳාණන් වහන්සේගේ දූතයා ගාද්ට
කතා කොට, “ජබූසිය ඔර්ණාන්ගේ කමතේ
සමිඳාණන් වහන්සේට පූජාසනයක් ගොඩනඟන
පිණිස නැඟී යන ලෙස දාවිත්ට කියන්නැ”යි අණ
කළේ ය. 19 දාවිත් සමිඳාණන් වහන්සේගේ
නාමයෙන් ගාද් කී වචනය ලෙස නැඟිට ගියේ ය.
20 තිරිඟු මඩිමින් සිටි ඔර්ණාන් පස්සට හැරී දූතයා
දැක ඔහු ද ඔහු සමඟ සිටි ඔහුගේ පුත්‍රයෝ
සතරදෙනා ද සැඟවුණෝ ය. 21 දාවිත් ඔර්ණාන්
ළඟට ගියේ ය. ඔර්ණාන් බලා දාවිත් දැක, කමතෙන්
පිටතට අවුත් මුණින්තළා වී දාවිත්ට වැන්දේ ය.
22 එවිට දාවිත් කතා කොට, “සෙනඟ අතරෙන්
වසංගතය පහවන පිණිස සමිඳාණන් වහන්සේට
පූජාසනයක් ගොඩනැඟීමට කමතේ ඉඩම මට
දෙන්න. එහි මුළු වටිනාකම අනුව එය මට දෙන්න
ඕනෑ ය”යි ඔර්ණාන්ට කීවේ ය.
23 ඔර්ණාන් පිළිතුරු දෙමින්, “මාගේ ස්වාමීන් වන
රජ තුමාණෝ එය පිළිගෙන තමන්ට හොඳ යයි
හිතෙන දේ කරත්වා. මෙන්න, දවන යාග පූජාවලට
ගවයන් ද දර සඳහා මඩින උපකරණ ද ආහාර
පූජාවට තිරිඟු ද දෙමි; ඒ සියල්ල ම දෙමි”යි දාවිත්ට
කීවේ ය.
24 දාවිත් රජ ද පිළිතුරු දෙමින්, “එසේ නොවේ,
එහි මුළු වටිනාකම අනුව එය මම ඔබෙන් ගන්නෙමි.
මන්ද, ඔබට අයිති දේ මම සමිඳාණන් වහන්සේ
උදෙසා නොගන්නෙමි. වියදමක් නැති ව දවන යාග
පූජා නොපුදන්නෙමි”යි ඔර්ණාන්ට කීවේ ය.
25 මෙසේ දාවිත් ඒ ඉඩමට රන් කාසි හයසියයක
බර රන්, ඔර්ණාන්ට දුන්නේ ය. 26 දාවිත් සමිඳාණන්
වහන්සේට පූජාසනයක් එහි ගොඩනඟා, දවන යාග
පූජා ද සහභාගිකමේ පූජා ද ඔප්පු කොට,
සමිඳාණන් වහන්සේට යාච්ඤා කළේ ය. උන්
වහන්සේ ද දවන පූජාසනය පිට අහසෙන් ගිනි එවා
ඔහුට උත්තර දුන් සේක.
27 තවද, සමිඳාණන් වහන්සේ දේව දූතයාට අණ
කළ විට, ඔහු තමාගේ කඩුව නැවත කොපුවේ
දමාගත්තේ ය. 28 ඒ කාලයෙහි සමිඳාණන් වහන්සේ
ජබූසිය ඔර්ණාන්ගේ කමතේ දී තමාට උත්තර දුන්
බව දාවිත් දැක එහි දී පූජා ඔප්පු කළේ ය.
29 මන්ද, මෝසෙස් පාළුකරයේ දී සෑදූ සමිඳාණන්
වහන්සේගේ මණ්ඩපයත්, දවන පූජාසනයත් ඒ
කාලයෙහි ගිබියොන්හි ගිරිකුළක තිබුණේ ය.
30 එහෙත්, සමිඳාණන් වහන්සේගේ දූතයාගේ
කඩුවට බිය වූ නිසා දෙවියන් වහන්සේගෙන්
විචාරණ පිණිස එය ඉදිරියට යන්න දාවිත්ට
නොහැකි විය.

22 එවිට දාවිත් කතා කොට, “දෙවි සමිඳාණන්
වහන්සේගේ මාලිගාව මේ ය;
ඉශ්‍රායෙල්වරුන්ගේ දවන යාග පූජා ඔප්පු කරන
පූජාසනය ද මේ ය”යි කීවේ ය.

## දේව මාලිගාව සෑදීමට සූදානම

2 තවද, දාවිත් ඉශ්‍රායෙලේ දේශයෙහි සිටි සියලු
විදේශීන් රැස් කරන්න අණ කොට, දෙවියන්
වහන්සේගේ මාලිගාව ගොඩනඟන පිණිස හතරැස්
හැඩේට ගල් කපන්න ගල් වඩුවන් පත් කළේ ය.
3 දොරටුවල ඇණ පිණිසත්, සන්ධි පිණිසත් දාවිත්
යකඩ රාශියක් සූදානම් කළේ ය. කිරන්න බැරි
තරම් බොහෝ ලෝකඩත්, ගණන් නැති කිහිරි ලීත්
සූදානම් කළේ ය. 4 මන්ද, සීදොන්වරු ද තීර්වරු ද
කිහිරි ලී බොහෝ සෙයින් දාවිත් ළඟට ගෙනා හ.
5 එවිට දාවිත් කතා කොට, “මාගේ පුත් සලමොන්
ළා බාල ය; සමිඳාණන් වහන්සේට ගොඩනඟන්න
තිබෙන මාලිගාවේ කීර්තිය ද තේජස ද සියලු
රටවලට පතළ වී යන හැටියට එය අතිශයින්
අලංකාර ව තිබිය යුතු ය. එබැවින් මම ඒ කාර්යය
පිණිස ඔහු සූදානම් කරන්නෙමි”යි කී ය. මෙසේ
දාවිත් තමාගේ මරණයට පළමුවෙන් බොහෝ දේ
සූදානම් කළේ ය.
6 එවිට ඔහු තම පුත් සලමොන් කැඳවා
ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේට
මාලිගාවක් ගොඩනඟන පිණිස ඔහුට අණ කළේ
ය. 7 2 සාමු 7:1-16; 1 වංශා 17:1-14දාවිත් තමාගේ
පුත් සලමොන්ට කතා කොට, “මාගේ පුත්‍රය, දෙවි
සමිඳාණන් වහන්සේගේ නාමයට මාලිගාවක්
ගොඩනඟන්න මම අදහස් කළෙමි. 8 එහෙත්,
සමිඳාණන් වහන්සේ මට පණිවුඩයක් ප්‍රකාශ
කරමින්, ‘නුඹ බොහෝ සේ ලේ වැගිරීමත්, මහා
යුද්ධත් කළෙහි ය. එලෙස නුඹ මා ඉදිරියෙහි
බොහෝ ලේ බිම වැගිරවූ නිසා මාගේ නාමයට
මාලිගාවක් ගොඩ නොනඟන්නෙහි ය. 9 එහෙත්,
නුඹට උපදින පුත්‍රයෙක් සාමකාමී මනුෂ්‍යයෙක්
වන්නේ ය. හාත්පසින් ම ඔහුගේ සියලු
සතුරන්ගෙන් ඔහුට නිදහස දෙන්නෙමි. එසේ ය,
ඔහුගේ නාමය සාමය යන අර්ථය ඇති සලමොන්
වන්නේ ය. ඔහුගේ දවස්වල දී ඉශ්‍රායෙල්වරුන්ට
සාමය ද සමඟිය ද දෙන්නෙමි. 10 ඔහු ම මාගේ
නාමයට මාලිගාවක් ගොඩනඟනු ඇත. ඔහු මට
පුත්‍රයෙක් වන්නේ ය. මම ඔහුට පියෙක් වන්නෙමි.
ඔහුගේ රාජ සිංහාසනය ඉශ්‍රායෙල්වරුන් කෙරෙහි
සදහට ම ස්ථිර කරන්නෙමි’යි වදාළ සේක.
11 “ඉතින් මාගේ පුත්‍රය, ඔබ සඵල වී, ඔබේ
දෙවි සමිඳාණන් වහන්සේ ඔබ ගැන වදාළ ලෙස උන්
වහන්සේගේ මාලිගාව ගොඩනඟන පිණිස උන්
වහන්සේ ඔබ සමඟ වැඩ සිටින සේක් වා!
12 එසේය, ඔබ ඔබේ දෙවි සමිඳාණන් වහන්සේගේ
ආඥා රක්ෂා කරන පිණිස ඔබට නැණනුවණ සහ
බුද්ධි මහිමය දී, ඉශ්‍රායෙල්වරුන් ගැන වගකීමක්
ඔබට දෙන සේක් වා! 13 ජෝෂු 1:6-9සමිඳාණන්

වහන්සේ මෝසෙස් ලවා ඉශ්රායෙල්වරුන්ට අණ
කරවූ පණත් හා විනිශ්චයයන් පිළිපදින්නට වග
බලාගත්තොත් ඔබ සඵල වන්නෙහි ය. ශක්තිමත් ව,
ස්ථිර ව සිටින්න. බිය නොවන්න; තැති නොගන්න.
14 මෙන්න, මා දිළිඳු වුව ද, සමිඳාණන් වහන්සේගේ
මාලිගාවට රන් මෙට්රික් ටොන් තුන්දාස්
හාරසියයකුත්, රිදී මෙට්රික් ටොන්
තිස්හතරදහසකුත් ගණන් නැති තරම් ලෝකඩත්,
යකඩත් සූදානම් කළෙමි. ඒවා අතිශයින් වැඩි ය. ඒ
ඇර ලී ද ගල් ද සූදානම් කළෙමි. ඒවාට තව එකතු
කරන්න ඔබට පුළුවන. 15 තවද, ශිල්පීන් වන
ගල්වඩුවෝ ද ගල් හා ලී වැඩ කරන්නෝ ද සියලු
ආකාර වැඩවලට සියලු ආකාර ප්රඥාවන්තයෝ ද
බොහෝ දෙනෙක් ම ඔබට සිටිති. 16 ගණන් නැති
තරම් රන් ද රිදී ද ලෝකඩ ද යකඩ ද තිබේ.
නැඟිට වැඩ පටන් ගන්න. සමිඳාණන් වහන්සේ ඔබ
සමඟ වැඩ සිටින සේක්වා"යි කී ය.
17 තවද, දාවිත් තමාගේ පුත් සලමොන්ට උපකාර
කරන පිණිස ඉශ්රායෙල්හි සියලු අධිපතීන්ට අණ
කරමින්, 18 "ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබ
සමඟ සිටිනු නොවේ ද? හැම අතින් ම උන්
වහන්සේ ඔබට සාමය දී තිබෙනු නොවේ ද? මන්ද,
උන් වහන්සේ දේශයේ වැසියන් මා අතට පාවා දී
තිබේ. දේශය සමිඳාණන් වහන්සේට ද උන්
වහන්සේගේ සෙනඟට ද යටත් කරන ලද්දේ ය.
19 ඉතින් ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ
සොයන්න ඔබේ සිතත්, බුද්ධියත් යොමු කරන්න.
සමිඳාණන් වහන්සේගේ නාමයට ගොඩනඟන්න
තිබෙන මාලිගාව තුළට උන් වහන්සේගේ ගිවිසුම්
කරඬුව ද දෙවියන් වහන්සේගේ ශුද්ධ භාණ්ඩ ද
ගෙන යන පිණිස නැඟිට දෙවි සමිඳාණන්
වහන්සේගේ ශුද්ධස්ථානය ගොඩනඟන්නැ"යි කීවේ
ය.

### ලෙවීවරුන්ගේ මෙහෙයෙ

23 1 රාජා 1:1-40 දාවිත් දිගායු වළඳා මහලු වූ
විට තමාගේ පුත් සලමොන්
ඉශ්රයෙල්වරුන්ගේ රජ කොට පත් කළේ ය.
2 තවද, දාවිත් ඉශ්රායෙල්වරුන්ගේ සියලු අධිපතීන්
ද පූජකයන් ද ලෙවීවරුන් ද රැස් කළේ ය.
3 ලෙවීවරුන්ගෙනේ ගණන් ගන්නා ලද්දේ, තිස්
අවුරුද්දක පටන් ඉන් ඉහළට වයස් ඇති අය ය.
එසේ එක් කෙනෙකු එක් කෙනෙකු පාසා ගණන්
ගන්න ලද පුරුෂයන්ගේ ගණන තිස්අටදහසක් විය.
4 මොවුන්ගෙනේ විසිහතරදහසක් සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ වැඩ බලා ගැනීමට සිටියෝ
ය. හයදහසක් මුලාදෑනියෝ ද විනිශ්චයකාරයෝ ද වූ
හ. 5 හාරදහසක් දොරටු පාලකයෝ වූ හ. 'ප්රශංසා
කිරීමට මම සෑදූවෙමි'යි දාවිත් කී තූර්ය භාණ්ඩවලින්
සමිඳාණන් වහන්සේට ප්රශංසා කරන්නෝ
හාරදහසක් වූ හ.

6 දාවිත් ගේර්ෂොන් ද කොහාත් ද මෙරාරී ද යන
ලෙවීගේ පුත්රයන්ගේ වංශවල හැටියට ඔවුන්
පංතිවලට බෙදුවේ ය.
7 ගේර්ෂොන්ගේ පුත්රයෝ ලාදාන් සහ ෂිමෙයි ය.
8 ලාදාන්ගේ පුත්රයෝ නම්: ප්රධානියා වූ ජෙහීයෙල්
ද සේතාම් ද ජෝවෙල් ද යන තුන්දෙනා ය.
9 ෂිමෙයිගේ පුත්රයෝ නම්: ෂෙලොමිත් ද හශීයෙල්
ද හාරාන් ද යන තුන්දෙනා ය. මොවුහු ලාදාන්ගේ
පිය පෙළෙපත්වල ප්රධානියෝ ය. 10 ෂිමෙයිගේ
පුත්රයෝ නම්: ජහත්, ශීනා, ජෙවුෂ් සහ බෙරියා ය.
මේ හතර දෙනෙ ෂිමෙයිගේ පුත්රයෝ ය. 11 ජහත්
ප්රධානියා ය, ශීනා දෙවැනියා ය. එහෙත්, ජෙවුෂ්ටත්,
බෙරියාටත් බොහෝ පුත්රයෝ නුවූ හ. එබැවින්
ඔව්හු එක පිය පෙළෙපතක් කොට ගණන්ගනු
ලැබුවෝ ය.
12 කොහාත්ගේ පුත්රයෝ නම්: අම්රාම් ද ඉශ්හාර්
ද හෙබ්රොන් ද උශ්ශියෙල් ද යන සතරදෙනා ය.
13 නික්ම 28:1අම්රාම්ගේ පුත්රයෝ නම්: ආරොන්
සහ මෝසෙස් ය. ආරොන් ද ඔහුගේ පුත්රයෝ ද
ඉතා ශුද්ධ දේ කැප කරන පිණිසත්, සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි සුවඳ දුම් ඔප්පු කරන පිණිසත්,
උන් වහන්සේට සේවය කරන පිණිසත්, සෑම කල්හි
ම උන් වහන්සේගේ නාමයෙනේ ආශීර්වාද කරන
පිණිසත්, හැම කලට ම වෙනේ කරනු ලැබුවෝ ය.
14 එහෙත්, දෙවියන් වහන්සේට කැප වූ මනුෂ්යයා
වන මෝසෙස්ගේ පුත්රයෝ ලෙවී ගෝත්රයට අයිති
යයි ගණන් ගන්නා ලද්දෝ ය. 15 මෝසෙස්ගේ
පුත්රයෝ නම්: ගේර්ෂොම් සහ එලියෙසෙර් ය.
16 ගේර්ෂොම්ගේ පුත්රයෝ නම්; ප්රධානියා වූ
ෂෙබුයෙල් ය. 17 එලියෙසෙර්ගේ පුත්රයෝ:
ප්රධානියා වූ රෙහෙබියා ය. එලියෙසෙර්ට වෙනෙ
පුත්රයෝ නුවූ හ. එහෙත්, රෙහෙබියාට පුත්රයෝ
බොහෝ දෙනෙක් සිටියෝ ය.
18 ඉශ්හාර්ගේ පුත්රයෝ: ප්රධානියා වූ ෂෙලොමිත්
ය; 19 හෙබ්රොන්ගේ පුත්රයෝ: ප්රධානියා වූ
ජෙරියා ය, දෙවැනියා වූ අමරියා ය; තුන්වැනියා වූ
ජහසියෙල් ය; හතරවැනියා වූ ජෙකමෙයොම් ය.
20 උශ්ශියෙල්ගේ පුත්රයෝ: ප්රධානියා වූ මීකා ය;
දෙවැනියා වූ ඉෂ්ෂියා ය.
21 මෙරාරීගේ පුත්රයෝ: මාලී සහ මුෂී ය.
මාලීගේ පුත්රයෝ: එලයොසර් සහ කිෂ් ය.
22 එලයොසර් මළේ ය. ඔහුට දූවරුන් මිස පුත්රයෝ
නොසිටියෝ ය. ඒ තැනැත්තියන්ගේ සහෝදරයන් වූ
කිෂ්ගේ පුත්රයෝ ඔවුන් පාවාගත්තෝ ය.
23 මුෂීගේ පුත්රයෝ: මාලී ද ඒදෙර් ද ජෙරේමොත් ද
යන තුන්දෙනා ය.
24 ඔව්හු තමන්ගේ පිය පෙළෙපත්වල හැටියට, පිය
පෙළෙපත්වල ප්රධානියන් වන විසි අවුරුදු වයසේ
පටන් ඉන් ඉහළට එක් කෙනෙකු එක් කෙනෙකු
පාසා නම් වශයෙනේ ගණන් කරන ලද්දා වූ,
සමිඳාණන් වහන්සේගේ මාලිගා සේවයේ වැඩ
කළා වූ ලෙවීගේ පුත්රයෝ ය.

25 තවද, දාවිත් කතා කොට, “ඉශ්‍රායලේගේ දෙවි
සමිඳාණන් වහන්සේ තමන්ගේ සෙනඟට සාමදානය
දී තිබේ ය”යි ද, “උන් වහන්සේ ජෙරුසලමෙහි සෑම
කල්හි ම වාසය කරන සේකැ”යි ද, 26 ද්වි.නී.
10:8“මණ්ඩපය සහ එහි සේවයට අයිති සියලු
භාණ්ඩත් ලෙවීවරුන්ට තවත් උසුලා ගෙන යන්න
වන්නේ නැතැ”යි ද කීවේ ය. 27 දාවිත්ගේ අන්තිම
වචනවල හැටියට විසි අවුරුද්ද පටන් ඉන් ඉහළට
වයස් ඇති පුත්‍රයෝ ගණන් ගන්න ලද්දෝ ය.
28 ගණන් 3:5-9මන්ද, ඔවුන්ගේ තනතුර නම්,
සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ සේවය
සම්බන්ධයෙනේ ආරොන්ගේ පුත්‍රයන්ට උපකාර
කිරීම ය. එනම්, මළුව, ඇතුල් ගවෙල් සහ සියලු
ශුද්ධ දේවල් පවිත්‍ර කිරීමත්, දෙවියන් වහන්සේගේ
මාලිගාවේ සේවයේ වැඩ ද පිදීමේ රොටි ද
29 ආහාර පූජාවටත්, මුහුන් නැති රොටිවලටත්
ඇතිළියටත්, පොඟවන ඒවාටත් ඕනෑ කරන සිහින්
පිටි ද සියලු ආකාර මිම් ද මැනීම් ද බලාගැනීමත්,
30 දිනපතා උදේ සවස සමිඳාණන් වහන්සේට ස්තුති
ප්‍රශංසා කිරීමට සිටීමත්, 31 සබත් දවස්වල දී ද
අමාවක දවස්වල දී ද මංගල්‍යවල දී ද ගණනින්
නියම ප්‍රකාරයට නිතර ම සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි සියලු දවන යාග පූජා ඔප්පු කිරීමත්,
32 සම්මුඛ මණ්ඩපයේ වත්පිළිවෙත් ද
ශුද්ධස්ථානයේ වත්පිළිවෙත් ද සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ සේවය සම්බන්ධයෙනේ තම
සහෝදරයන් වූ ආරොන්ගේ පුත්‍රයන්ගේ
වත්පිළිවෙත් ද බලාගැනීමත් ය.

## පූජකවරුන්ගේ වගකීම්

24 ආරොන්ගේ පුත්‍රයන්ගේ පංති මේ ය.
ආරොන්ගේ පුත්‍රයෝ නම්: නාදාබ්, අබිහු,
එලයාසර් සහ ඊතාමාර් ය. 2 ලෙවී 10:1-2නාදාබ්
සහ අබිහු තමන්ගේ පියාට පළමුවෙනේ මැරුණෝ ය.
ඔවුන්ට පුත්‍රයෝ නොසිටියෝ ය. ඒ නිසා
එලයාසර් සහ ඊතාමාර් පූජක තනතුරේ වැඩ
කළෝ ය. 3 දාවිත් එලයාසර් පුත්‍රයන්ගෙනේ
ශාදොක් ද ඊතාමාර් පුත්‍රයන්ගෙනේ අහිමලෙක් ද
සමඟ ඔවුන්ගේ මෙහෙයේ නියමයේ ප්‍රකාරයට
ඔවුන් සංවිධානය කළේ ය. 4 ඊතාමාර්ගේ
පුත්‍රයන් අතරේ සිටි ප්‍රධාන මනුෂ්‍යයන්ගේ
ගණනට වඩා එලයාසර්ගේ පුත්‍රයන් අතරේ
සිටියෝ ය. එබැවින් මලෙසෙ ඔව්හු සංවිධානය
කරනු ලැබුවෝ ය. එලයාසර්ගේ පුත්‍රයන්ට පිය
වංශවල ප්‍රධානීහු දහසයදෙනෙක් ද ඊතාමාර්ගේ
පුත්‍රයන්ට ඔවුන්ගේ පිය වංශවල ප්‍රධානීහු
අටදෙනෙක් ද සිටියෝ ය. 5 දගෙපොල්ල ගැන ම
එකට පස ඇට දමා සංවිධාන කළේ ය. මන්ද,
ශුද්ධස්ථානයේ අධිපතියෝත්; දෙවියන් වහන්සේගේ
අධිපතියෝත් එලයාසර්ගේ පුත්‍රයන් අතරේ සහ
ඊතාමාර්ගේ පුත්‍රයන් අතරේත් වූ හ. 6 ලෙවී
ජාතික වූ නතෙනේල්ගේ පුත් ෂමෝයා නම් ලේකම්,
රජු ද අධිපතීන් ද ශාදොක් පූජකයා ද අබියාතර්ගේ
පුත් අහිමලෙක් ද පූජකයන්ගේ සහ ලෙවීවරුන්ගේ
පිය වංශවල ප්‍රධානීන් ද ඉදිරියෙහි ඔවුන්ගේ නාම
වාර්තාගත කළේ ය. එලයාසර්ට එක පිය
වංශයක් ද ඊතාමාර්ට එක පිය වංශයක් ද බැගින්
පස ඇට දමා තෝරාගන්නා ලද්දේ ය.
7 පළමු වන පස ඇටය වැටුණේ ජෙහෝයාරීබ්ට ය;
දෙ වන එක ජෙදොයාට ය; 8 තුන් වන එක හාරීම්ට
ය; හතර වැනි එක සයොරීම්ට ය; 9 පස් වැනි එක
මල්කියාට ය; හය වැනි එක මියාමින්ට ය; 10 හත්
වැනි එක හක්කොශ්ට ය; අට වැනි එක අබියාට ය;
11 නව වැනි එක ජේෂුවාට ය; දස වැනි එක
ෂකෙනියාට ය; 12 එකොළොස් වැනි එක එලියාෂිබ්ට
ය; දොළොස් වැනි එක ජාකීම්ට ය; 13 දහතුන් වැනි
එක හුප්පාට ය; දසසතර වැනි එක ජෙෂෙබෙයොබ්ට
ය; 14 පහළොස් වැනි එක බිල්ගාට ය; දහසය වැනි
එක ඉම්මෙර්ට ය; 15 දහහත් වැනි එක හසීර්ට ය;
දහඅට වැනි එක හප්පිශ්ශෙශ්ට ය; 16 දහනව වැනි
එක පතෙහියාට ය; විසි වැනි එක ජෙහෙස්කලේට
ය; 17 විසිඑක් වැනි එක ජාකීන්ට ය; විසිදෙ වැනි
එක ගාමුල්ට ය; 18 විසිතුන් වැනි එක දලොයාට ය;
විසිහතර වැනි එක මයශියාට ය.
19 ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ
ඔවුන්ගේ පිය වූ ආරොන්ට අණ කළ ප්‍රකාරයට
ඔහු ලවා කරවූ නියෝගය ලෙසෙ ඔවුන්ගේ යුතුකම්
අනුව සමිඳාණන් වහන්සේගේ මාලිගාවට ඇතුල්
වීමේ පිළිවෙළෙ මේ ය.

## ලෙවීවරුන්ගේ පවුල්

20 ලෙවීගේ අනික් පුත්‍රයෝ නම්: අම්රාම්ගේ
පුත්‍රයන්ගෙනේ ෂූබායලේ ය. ෂූබායලේගේ
පුත්‍රයන්ගෙනේ ජෙදෙයො ය.
21 රෙහෙබියාගෙනේ එනම්, රෙහෙබියාගේ
පුත්‍රයන්ගෙනේ ප්‍රධානියා වූ ඉෂ්ෂියා ය.
22 ඉශ්හාරිවරුන්ගෙනේ ෂලෙලොමොත් ය.
ෂලෙලොමොත්ගේ පුත්‍රයන්ගෙනේ ජහත් ය.
23 හෙබ්රොන්ගේ පුත්‍රයෝ නම්: ප්‍රධානියා වූ
ජෙරියා ය; දෙවෙනියා වූ අමරියා ය; තුන්වැනියා වූ
ජහසියලේ ය; සතරවැනියා වූ ජකෙමයොම් ය.
24 උශ්ශියලේගේ පුත්‍රයන්ගෙනේ මීකා ය. මීකාගේ
පුත්‍රයන්ගෙනේ ෂාමීර් ය.
25 මීකාගේ සහෝදරයා වූ ඉෂ්ෂියා ය. ඉෂ්ෂියාගේ
පුත්‍රයන්ගෙනේ ශකෙරියා ය.
26 මෙරොරීගේ පුත්‍රයෝ නම්: මාලී සහ මූෂී ය.
ජාසියාගේ පුත්‍රයෝ නම්: බෙනෝ ය. 27 මෙරොරීගේ
පුත්‍රයෝ නම්: තමාගේ පුත් ජාසියා නිසා උපන්
බෙනෝ, ෂොහම්, ශක්කූර් සහ ඉබ්රී ය. 28 මාලී
නිසා උපන් එලයාසර් ය. ඔහුට පුත්‍රයෝ නොවූ හ.
29 කිෂ්ගෙනේ එනම්, කිෂ්ගේ පුත්‍රයන්ගෙනේ
ජෙරොමයෙලේ ය. 30 මූෂීගේ පුත්‍රයෝ නම්: මාලී,
ඒදෙර් සහ ජෙරේමොත් ය. ඔව්හු තමන්ගේ පිය වංශ
ප්‍රකාරයට ලෙවීගේ පුත්‍රයෝ ය.

31 ඔව්හු ද තමන්ගේ සහෝදරයන් වන
ආරොන්ගේ පුත්‍රයන් මෙන් ම දාවිත් රජු ද
සාදොක් ද අහිමලෙක් ද පූජකයන්ගේ සහ
ලෙවීවරුන්ගේ පිය වංශවල ප්‍රධානීන් ද ඉදිරියෙහි
පස ඇට දැමුවෝ ය. පිය වංශවල ප්‍රධානියා
තමාගේ බාල සහෝදරයා මෙන් ම පස ඇට දැමුවේ
ය.

## දේව මාලිගාවේ ගායකයෝ

25 දාවිත් ද සේනාවේ අධිපතියෝ ද
ආසාප්ගේත්, හේමන්ගේත්, ජදුතුන්ගේත්
පුත්‍රයන්ගෙන් වීණා හා කුඩා වීණා ද අත්තල් ද නාද
කොට ගායනා කරමින්, දෙවි සමිඳාණන්
වහන්සේගේ වචනය ප්‍රකාශ කිරීමේ සේවය
සඳහා තැනැත්තන් වෙන් කර තැබූ ය. තමන්ගේ
සේවයේ වැඩය කළා වූ ඒ මනුෂ්‍යයන්ගේ නාම
ලේඛනය මෙසේ ය:
2 ආසාප්ගේ පුත්‍රයන්ගෙන් සක්කූර් ද ජෝසෙප් ද
නතෙනියා ද අසිරේලා ද යන ආසාප්ගේ පුත්‍රයෝ
ය. මොවුහු රජුගේ අණ ලෙස ධර්ම වාක්‍ය ගායනා
කළා වූ ආසාප් යටතේ සිටියෝ ය.
3 ජදුතුන්ගේ පුත්‍රයන් වූ ගෙදලියා ද සෙරී ද
ජෙෂොයා ද හෂබියා ද මත්තිතියා ද ඇතුළු හයදෙනා
ය. මොවුහු මහා වීණා නාද කර සමිඳාණන්
වහන්සේගේ වචනය ප්‍රකාශ කරමින් ද, උන්
වහන්සේට ස්තුති ප්‍රශංසා දෙමින් ද ජදුතුන්
යටතේ සිටියෝ ය.
4 හේමාන්ගේ පුත්‍රයන් වූ බුක්කියා, මත්තනියා,
උස්සියෙල්, ෂෙබුයෙල්, ජෙරිමොත්, හනනියා, හනානි,
එලියාතා, ගිද්දල්ති, රොමම්ති-එසෙර්, ජොෂ්බෙකෂා,
මල්ලෝති, හෝතීර් සහ මහසියොත් ය. 5 ඔව්හු
සියල්ලෝ දෙවියන් වහන්සේ කළ දේ ගැන රජුගේ
දර්ශකයා ව සිටි, හොරණෑවෙන් නාද කළා වූ
හේමන්ගේ පුත්‍රයෝ ය. දෙවියන් වහන්සේ
හේමන්ට පුත්‍රයන් දහහතරදෙනෙකු ද දූවරුන්
තුන්දෙනෙකු ද දුන් සේක. 6 මේ සියල්ලෝ දෙවියන්
වහන්සේගේ මාලිගාවේ සේවය පිණිස අත්තල් ද
කුඩා වීණා ද මහා වීණා ද සහිත ව සමිඳාණන්
වහන්සේගේ මාලිගාවෙහි ගායනා කිරීමට තම පියා
යටතේ සිටියෝ ය. ආසාප් ද ජදුතුන් ද හේමන් ද
රජු යටතේ සිටියෝ ය.
7 සමිඳාණන් වහන්සේට ගැයීම ගැන ඉගෙනගෙන,
දැනගැන්ම ඇති ව සිටි ඔවුන්ගේ සියලු සහෝදරයන්
ඇතුළු ව ඔවුන්ගේ ගණන දෙසිය අසූඅටදෙනෙකි ය.
8 ඔව්හු ලොකු අය මෙන් කුඩා ම අය ද ගෝලයා
මෙන් ම ගුරුවරයා ද තමන්ගේ මෙහෙයෙ ගැන පස
ඇට දැමුවෝ ය.
9 පළමු වන කොටස වැටුණේ ආසාප්ට අයිති
ජෝසෙප්ට ය; දෙ වන එක ගෙදලියා ද ඔහුගේ
සහෝදරයන් ද පුත්‍රයන් ද යන දොළොස්දෙනෙකුට
ය; 10 තුන් වන එක සක්කූර් ද ඔහුගේ පුත්‍රයන් ද
සහෝදරයන් ද යන දොළොස්දෙනෙකුට ය; 11 හතර
වන එක ඉස්රී ද ඔහුගේ පුත්‍රයන් ද සහෝදරයන්
ද යන දොළොස්දෙනෙකුට ය; 12 පස් වන එක
නතෙනියා ද ඔහුගේ පුත්‍රයන් ද සහෝදරයන් ද
යන දොළොස්දෙනෙකුට ය; 13 හය වන එක
බුක්කියා ද ඔහුගේ පුත්‍රයන් ද සහෝදරයන් ද යන
දොළොස්දෙනෙකුට ය; 14 හත් වන එක ජෙෂරේලා
ද ඔහුගේ පුත්‍රයන් ද සහෝදරයන් ද යන
දොළොස්දෙනෙකුට ය; 15 අට වන එක ජෙෂොයා ද
ඔහුගේ පුත්‍රයන් ද සහෝදරයන් ද යන
දොළොස්දෙනෙකුට ය; 16 නව වන එක මත්තනියා
ද ඔහුගේ පුත්‍රයන් ද සහෝදරයන් ද යන
දොළොස්දෙනෙකුට ය; 17 දහ වන එක ෂිමෙයි ද
ඔහුගේ පුත්‍රයන් ද සහෝදරයන් ද යන
දොළොස්දෙනෙකුට ය; 18 එකොළොස් වන එක
අසරියෙල් ද ඔහුගේ පුත්‍රයන් ද සහෝදරයන් ද
යන දොළොස්දෙනෙකුට ය; 19 දොළොස් වන එක
හෂබියා ද ඔහුගේ පුත්‍රයන් ද සහෝදරයන් ද යන
දොළොස්දෙනෙකුට ය; 20 දහතුන් වන එක
ෂුබායෙල් ද ඔහුගේ පුත්‍රයන් ද සහෝදරයන් ද යන
දොළොස්දෙනෙකුට ය; 21 දහහතර වන එක
මත්තිතියා ද ඔහුගේ පුත්‍රයන් ද සහෝදරයන් ද
යන දොළොස්දෙනෙකුට ය; 22 පහළොස් වන එක
ජෙරේමොත් ද ඔහුගේ පුත්‍රයන් ද සහෝදරයන් ද
යන දොළොස්දෙනෙකුට ය; 23 දහසය වන එක
හනනියා ද ඔහුගේ පුත්‍රයන් ද සහෝදරයන් ද යන
දොළොස්දෙනෙකුට ය.
24 දහහත් වන එක ජොෂ්බෙකෂා ද ඔහුගේ
පුත්‍රයන් ද සහෝදරයන් ද යන දොළොස්දෙනෙකුට
ය; 25 දහඅට වන එක හනානි ද ඔහුගේ පුත්‍රයන් ද
සහෝදරයන් ද යන දොළොස්දෙනෙකුට ය;
26 දහනව වන එක මල්ලෝති ද ඔහුගේ පුත්‍රයන්
ද සහෝදරයන් ද යන දොළොස්දෙනෙකුට ය; 27 විසි
වන එක එලියාතා ද ඔහුගේ පුත්‍රයන් ද
සහෝදරයන් ද යන දොළොස්දෙනෙකුට ය;
28 විසිඑක් වන එක හෝතීර් ද ඔහුගේ පුත්‍රයන් ද
සහෝදරයන් ද යන දොළොස්දෙනෙකුට ය; 29 විසිදෙ
වන එක ගිද්දල්ති ද ඔහුගේ පුත්‍රයන් ද
සහෝදරයන් ද යන දොළොස්දෙනෙකුට ය;
30 විසිතුන් වන එක මහසියොත් ද ඔහුගේ
පුත්‍රයන් ද සහෝදරයන් ද යන දොළොස්දෙනෙකුට
ය; 31 විසිහතර වන එක රොමම්ති-එසෙර් ද
ඔහුගේ පුත්‍රයන් ද සහෝදරයන් ද යන
දොළොස්දෙනෙකුට ය.

## දොරටු පාලකයෝ

26 දොරටු පාලකයන්ගේ පංති මෙසේ ය:
කෝරාවරුන්ගෙන් ආසාප්ගේ පුත්‍රයකු වන
කෝරේගේ පුත් මෙෂෙලෙමියා ය;
2 මෙෂෙලෙමියාගේ පුත්‍රයන් වන කුලුඳුලා වූ
සෙකරියා ය; දෙවෙනියා වූ ජෙදීයයෙල් ය; තුන්වැනියා
වූ සෙබදියා ය; හතරවැනියා වූ ජත්නියෙල් ය;
3 පස්වැනියා වූ ඒලාම් ය; හයවැනියා වූ
ජෙහෝහානාන් ය; හත්වැනියා වූ එලියෙහෝයේනයි
ය.

4 2 සාමු 6:11; 1 වංශා 13:14 ඕබදේ-ඒදොම්ගේ
පුත්‍රයන් වන කුලුඳුලා වූ ෂමොයා ය; දෙවෙනියා වූ
ජෙහෝශාබාද් ය; තුන්වැනියා වූ ජෝවා ය;
හතරවැනියා වූ සාකාර් ය; පස්වැනියා වූ නතනෙයේල්
ය; 5 හයවැනියා වූ අම්මීයෙලේ ය; හත්වැනියා වූ
ඉස්සාකර් ය; අටවැනියා වූ පයුලේල්ලතෙයි ය. මන්ද,
දෙවියන් වහන්සේ ඔහුට ආශීර්වාද කළ සේක.
6 ඔහුගේ පුත් ෂමොයාට දාව පුත්‍රයෝ උපන්නෝ
ය. ඔව්හු බලවන්ත මනුෂ්‍යයන් ව සිටි නිසා
තමන්ගේ පිය වංශයෙහි ආණ්ඩුකාරයන් ව සිටියෝ
ය. 7 ෂමොයාගේ පුත්‍රයන් ඔත්නී, රපොයෙලේ,
ඕබදේ සහ එල්ශාබාද් ය. ඔහුගේ සහෝදරයන් වන
බලවන්ත මනුෂ්‍යයන් එලීහු සහ සමොකියා ය.
8 මොවුහු සියල්ලෝ ඕබදේ-ඒදොම්ගේ පුත්‍රයෝ
ය. ඔව්හු ද ඔවුන්ගේ පුත්‍රයෝ ද සහෝදරයෝ ද
සේවයට බලවන්ත ව, ශක්තිමත් ව සිටියෝ ය.
මෙසේ ඕබදේ-ඒදොම්ගේ හැටදෙදෙනෙක් සිටියෝ
ය.
9 මෙෂෙලෙමියාට බලවන්තයන් වන පුත්‍රයෝ ද
සහෝදරයෝ ද දහඅටදෙනෙක් වූවෝ ය.
10 මෙරාරීගේ පුත්‍රයකු වූ හෝසාගේ පුත්‍රයන්
වන ප්‍රධානියා වූ ෂිම්රී ය. ඔහු කුලුඳුලා නොවන
නමුත්, ඔහුගේ පියා ඔහු ප්‍රධානකමට පත් කළේ
ය. 11 දෙවෙනියා වූ හිල්කියා ය; තුන්වැනියා වූ
ටෙබලියා ය; සතරවැනියා වූ ශෙකරියා ය;
හෝසාගේ සියලු පුත්‍රයෝ හා සහෝදරයෝ
දහතුන්දෙනෙක් ය.
12 සමිඳාණන් වහන්සේගේ මාලිගාවෙහි මෙහෙ
කරන පිණිස තමන්ගේ සහෝදරයන් සමඟ මාරුවට
සිටියා වූ ප්‍රධාන මනුෂ්‍යයන් වූ ඔවුන්ට දොරටු
පාලකයන්ගේ පංති වැටුණේ ය. 13 ඔව්හු ද
තමන්ගේ පිය වංශ ලෙස ලොකු අය මෙන් ම කුඩා
අයත් එක එක දොරටුව ගැන පස ඇට දැමුවෝ ය.
14 නැගෙනහිර පැත්තේ පස ඇටය වැටුණේ
ෂෙලෙමියාට ය. ඉන්පසු ඔහුගේ පුත් නැණවත්
මන්ත්‍රීවරයකු වූ ශෙකරියා ගැන පස ඇට දැමුවෝ
ය. ඔහුගේ පස ඇටය වැටුණේ උතුරු පැත්තට ය.
15 ඕබදේ-ඒදොම්ට වැටුණේ දකුණු පැත්ත ය.
ඔහුගේ පුත්‍රයන්ට වැටුණේ භාණ්ඩාගාරය ය.
16 බස්නාහිර පැත්තේ නඟින මාවතෙහි තිබෙන
ෂල්ලකෙතේ දොරටුව ෂුප්පීම්ටත්, හෝසාටත්
වැටුණේ ය. දොරටු පාලකයෝ මාරුවෙන් මාරුවට
සිටියෝ ය. 17 නැගෙනහිරට සිටියේ ලෙවීවරු
හයදෙනෙක් ය; උතුරට දවසට සතරදෙනෙක් ය;
දකුණට දවසට සතරදෙනෙක් ය; භාණ්ඩාගාරය ළඟ
දෙදෙනා ය. 18 බස්නාහිරට බරාඳය ළඟ මාවතේ
හතරදෙනෙක් ය; බරාඳයෙහි දෙදෙනෙක් ය.
19 කොරාගේ පුත්‍රයන්ගෙන් ද මෙරාරීගේ
පුත්‍රයන්ගෙන් ද තෝරාගත් දොරටු පාලකයන්ගේ
පංති මේවා ය.

## දේව මාලිගාවේ වෙනත් යුතුකම්

20 අනික් ලෙවීවරුන්ගෙන් අහියා දෙවියන්
වහන්සේගේ මාලිගාවේ ගබඩා සහ කැප කළ
දේවල ගබඩා කරෙහි පත් ව සිටියේ ය.
21 ලාදාන්ගේ වංශයේ ගේර්ෂොන්වරුන්ගේ
පුත්‍රයන් වන ලාදාන්ගේ පිය වංශවල ප්‍රධානියන්
ව සිටි ගේර්ෂොනිවය වූ ලාදාන්ගේ පුත්‍රයෝ නම්:
22 ජෙහියෙලී සහ ජෙහියෙලීගේ පුත්‍රයන් වූ
සේතාම් සහ ඔහුගේ සහෝදර වූ ජෝවෙලේ ය.
ඔව්හු සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ ගබඩා
කරෙහි පත් වී සිටියෝ ය.
23 අම්රාම්වරුත්, ඉෂ්හාර්වරුත්, හෙබ්රොන්වරුත්,
උශ්ශියෙලේවරුත් වූවෝ ය.
24 මෝසෙස්ගේ පුත්‍රයා වන ගේර්ෂොම්ගේ පුත්
ෂෙබුයෙලේ ගබඩාවල ප්‍රධානියා ව සිටියේ ය.
25 එලියෙසෙර්ගෙන් පැවත ආ ඔහුගේ සහෝදරයෝත්
සිටියෝ ය. ඔහුගේ පුත්‍රයා රෙහෙබියා ය; ඔහුගේ
පුත්‍රයා ජෙෂොයා ය; ඔහුගේ පුත්‍රයා ජෝරාම් ය;
ඔහුගේ පුත්‍රයා ශික්රී ය; ඔහුගේ පුත්‍රයා
ෂෙලොමොත් ය. 26 මෙම ෂෙලොමොත් සහ
ඔහුගේ සහෝදරයෝ, දාවිත් රජු විසින් ද
සහශ්‍රාධිපතීන් ව ශතාධිපතීන් ව සිටි පිය වංශවල
ප්‍රධානීන් විසින් ද සේනාවේ අධිපතීන් විසින් ද
කැප කරන ලද්දා වූ ශුද්ධ දේවල සියලු ගබඩා
කරෙහි පත් ව සිටියෝ ය. 27 ඔව්හු යුද්ධවල දී
ලබාගත් කොල්ලයෙන් කොටසක් සමිඳාණන්
වහන්සේගේ මාලිගාව අලුත්වැඩියා කිරීම පිණිස
කැප කළෝ ය. 28 දිවැසිවරයා වූ සාමුවෙලේ ද
කිෂ්ගේ පුත් සාවුල් ද නේර්ගේ පුත් අබ්නේර් ද
ශෙරුයාගේ පුත් ජෝවාබ් ද විසින් කැප කරන ලද
සියල්ලත්, කවුරුන් විසින් නමුත් කැප කරන ලද
දේත් ෂෙලොමොත් සහ ඔහුගේ සහෝදරයන්
යටතේ තිබුණේ ය.

## අනික් ලෙවීවරුන්ගේ යුතුකම්

29 ඉශ්හාර්වරුන්ගෙන් කෙනෙනියා ද ඔහුගේ
පුත්‍රයෝ ද පරිපාලන කටයුතු ගැන
ඉශ්‍රායෙලේවරුගේ මූලාදෑනියන් ව හා
විනිශ්චයකාරයන් ව සිටියෝ ය.
30 හෙබ්රොන්වරුන්ගෙන් හෂබියා ද ඔහුගේ
සහෝදරයෝ ද යන බලවන්තයෝ එක්දහස්
හත්සියයක් බස්නාහිර දිශාවේ ජොර්දාන් ගඟින්
මෙගොඩ සමිඳාණන් වහන්සේ සම්බන්ධ දේ ගැන ද
රජුගේ වැඩ ගැන ද ඉශ්‍රායෙලේවරුන් පාලනය
කිරීමට පත් ව සිටියෝ ය. 31 හෙබ්රොන්වරුන්ගේ
පිය පළපත් ප්‍රකාර හෙබ්රොන්වරුන්ගේ ප්‍රධානියා
නම් ජෙරියා ය. දාවිත්ගේ රජ කාලයෙහි සතළිස්
වැනි අවුරුද්දේ දී ඔවුන් ගැන විභාග කොට
බලවන්ත මනුෂ්‍යයෝ ගිලියද්-ජාශර්හි ඔවුන් අතරේ
සිටිනු සම්බ වූ හ. 32 බලවන්තයන් ව පිය වංශවල
ප්‍රධානියන් ව සිටි ඔහුගේ සහෝදරයෝ දෙදොස්
සත්සියයක් වූ හ. දාවිත් රජ දෙවියන් වහන්සේ හා

රජු සම්බන්ධ සියල්ල ගැන රූබන්වරුන් ද ගාද්වරුන් ද
මනස්සේගේ අර්ධ ගෝත්‍රය ද කරෙහි මුලාදෑනීන්
කොට ඔවුන් පත් කළේ ය.

## රජයේ නිලධාරීහු

27 අවුරුද්දේ සියලු මාසවල මාසයෙන් මාසයට
තමන්ගේ නිල සේවාවන් මාරුවෙන් මාරුවට
ඉටු කළා වූ ද පංතිවල සියලු කාරණා ගැන රජුට
සේවය කළා වූ ද ඉශ්‍රායෙල්වරුන්ගේ පිය වංශවල
ප්‍රධානීන්ගේත්, සහශ්‍රාධිපතීන්ගේත්,
ශතාධිපතීන්ගේත්, ඔවුන්ගේ මුලාදෑනීන්ගේත්
ගණන නම්, එක එක පංතියට විසිහතරදහසක් ය.
2 පළමු වැනි මාසයට පංතිය කරෙහි ශබ්දියෙල්ගේ
පුත් ජාෂොබෙයාම් පත් ව සිටියේ ය. ඔහුගේ
පංතියෙහි විසිහතරදහසක් සිටියෝ ය. 3 ඔහු
පෙරෙශ්වරුන්ගෙන් එක් කෙනෙකු ව පළමු වැනි
මාසයේ සේනාවල සියලු අධිපතීන්ගේ ප්‍රධානියා ව
සිටියේ ය.
4 දෙ වැනි මාසයට පංතිය කරෙහි අහෝහිය
දෝදයි පත් ව සිටියේ ය. ඔහුගේ පංතියේ
මුලාදෑනියා මික්ලොත් ය. ඔහුගේ පංතියෙහි
විසිහතරදහසක් ය.
5 තුන් වැනි මාසයට තුන් වැනි සේනාවේ
අධිපතියා නම්, පූජක වූ ජෙහෝයාදාගේ පුත්‍රයා
වන ප්‍රධානියා වූ බෙනායා ය. ඔහුගේ පංතියෙහි
විසිහතරදහසක් සිටියෝ ය. 6 බෙනායා වනාහි ඒ
තිස්දෙනාගෙන් බලවන්තයා ව, තිස්දෙනා කරෙහි
අධිපතියා ව සිටියේ ය. ඔහුගේ පුත් අම්මිසාබාද්
ඔහුගේ පංතියේ සිටියේ ය.
7 හතර වැනි මාසයට හතර වැනි අධිපතියා නම්,
ජෝවාබ්ගේ සහෝදර වූ අසාහෙල් ය. ඔහුට පසු ව
ඔහුගේ පුත් සබෙදියා ය. ඔහුගේ පංතියෙහි
විසිහතරදහසක් සිටියෝ ය.
8 පස් වැනි මාසයට පස් වැනි අධිපතියා නම්,
ඉශ්‍රාහී ෂම්හුත් ය. ඔහුගේ පංතියෙහි
විසිහතරදහසක් සිටියෝ ය.
9 හය වැනි මාසයට හය වැනි අධිපතියා නම්,
තකෝයිය ඉක්කෙෂ්ගේ පුත් ඊරා ය. ඔහුගේ
පංතියෙහි විසිහතරදහසක් සිටියෝ ය.
10 හත් වැනි මාසයට හත් වැනි අධිපතියා නම්,
එප්‍රායිම්වරුන්ගෙන් එක් කෙනෙකු වූ පලෝනීය
හෙලෙෂ් ය. ඔහුගේ පංතියෙහි විසිහතරදහසක්
සිටියෝ ය.
11 අට වැනි මාසයට අට වැනි අධිපතියා නම්,
ශෙරාහිවරුන්ගෙන් එක් කෙනෙකු වූ හුෂාතීය
සිබ්බෙකයි ය. ඔහුගේ පංතියෙහි විසිහතරදහසක්
සිටියෝ ය.
12 නව වැනි මාසයට නව වැනි අධිපතියා නම්,
බෙන්ජමින් වංශයට අයිති වූ අනාතෝතිය
අබියෙෂෙර් ය. ඔහුගේ පංතියෙහි විසිහතරදහසක්
සිටියෝ ය.
13 දස වැනි මාසයට දස වැනි අධිපතියා නම්,
ශෙරාහිවරුන්ගෙන් එක් කෙනෙකු වූ නටෝපාතිය
මහරයි ය. ඔහුගේ පංතියෙහි විසිහතරදහසක්
සිටියෝ ය.
14 එකොළොස් වැනි මාසයට එකොළොස් වැනි
අධිපතියා නම්, එප්‍රායිම්වරුන්ගෙන් එක් කෙනෙකු වූ
පිරාතෝනිය බෙනායා ය. ඔහුගේ පංතියෙහි
විසිහතරදහසක් සිටියෝ ය.
15 දොළොස් වැනි මාසයට දොළොස් වැනි
අධිපතියා නම්, ඔත්නියෙල්ගේ වංශයට අයිති
නටෝපාතිය හෙල්දයි ය. ඔහුගේ පංතියෙහි
විසිහතරදහසක් සිටියෝ ය.
16 තවද, ඉශ්‍රායෙල් ගෝත්‍රවල ප්‍රධානියෝ නම්
මොවුහු ය. රූබන්වරුන්ට ආණ්ඩුකාරයා ව සිටියේ
ශික්‍රීගේ පුත් එලියෙසෙර් ය. සිමියොන්වරුන්ට
මයකාගේ පුත් ෂෙෆටියා ය. 17 ලෙවීවරුන්ට
කමුවෙල්ගේ පුත් හෂබියා ය. ආරොන් වංශයට
ශාදොක් ය. 18 යුදාවරුන්ට දාවිත්ගේ සහෝදරයෙකු
වූ එලිහු ය. ඉස්සාකර්වරුන්ට මිකායෙල්ගේ පුත්
ඔම්රී ය. 19 සාබුලොන්වරුන්ට ඔබදියාගේ පුත්
ඉෂ්මායා ය. නප්තලීවරුන්ට අස්රියෙල්ගේ පුත්
ජෙරිමොත් ය. 20 එප්‍රායිම්වරුන්ට අශශියාගේ පුත්
හෝෂෙයා ය. මනස්සේගේ අර්ධ ගෝත්‍රයට
පදොයාගේ පුත් ජෝවෙල් ය. 21 ගිලියද්හි සිටි
මනස්සේගේ අර්ධ ගෝත්‍රයට ශකෙරියාගේ පුත්
ඉද්දෝ ය. බෙන්ජමින්වරුන්ට අබ්නේර්ගේ පුත්
ජයසීයෙල් ය. 22 දාන්වරුන්ට ජෙරොහාම්ගේ පුත්
අශරියෙල් ය. ඉශ්‍රායෙල් ගෝත්‍රවල අධිපතියෝ
මොවුහු ය.
23 උත් 15:5; 22:17; 26:4 එහෙත්, “අහසේ තාරකා
මෙන් ඉශ්‍රායෙල්වරුන් වැඩි කරන්නෙමි”යි සමිඳාණන්
වහන්සේ කියා තිබුණ නිසා විසි අවුරුදු වයසේ
පටන් ඊට බාල වූ තැනැත්තන් දාවිත් ගණන් කළේ
නැත. 24 2 සාමු 24:1-15; 1 වංශා 21:1-14ශෙරූයාගේ
පුත් ජෝවාබ් සෙනඟ ගණන් කරන්න පටන්ගත්
නමුත්, එය අවසාන කළේ නැත. තවද, ඒ ගැන
ඉශ්‍රායෙල් පිට උදහස පැමිණියේ ය. ඒ ගණන ද
දාවිත් රජුගේ වාර්තා පොතේ ඇතුළත් නොකරන
ලද්දේ ය.

## රජුගේ ගබඩා පාලකයෝ

25 රජුගේ ගබඩා කරෙහි අදීයෙල්ගේ පුත්
අශ්මාවෙත් පත් ව සිටියේ ය. පිටිසර පළාත්වල ද
නුවරවල ද ගම්වල ද බලකොටුවල ද පිහිටි ගබඩා
කරෙහි උශ්ශියාගේ පුත් ජොනතන් පත් ව සිටියේ
ය. 26 ගොවිතැන් කිරීමට කෙත්වල වැඩ කළවුන්
කරෙහි කලෙබ්ගේ පුත් එස්රී පත් ව සිටියේ ය.
27 මිදි වතු කරෙහි රාමාතීය ෂිමෙයි පත් ව සිටියේ
ය. මිදි වතුවල තිබුණු මුද්‍රික ගබඩා කරෙහි
ෂිප්මීය ශබ්දී පත් ව සිටියේ ය. 28 පාත රටේ
තිබුණු ඔලීව ගස් ද අත්තික්කා ගස් ද කරෙහි
ගෙදේරිය බාල්-හානාන් පත් ව සිටියේ ය. තෙලේ
ගබඩා කරෙහි ජෝවාෂ් පත් ව සිටියේ ය.

29 ෂාරොන්හි තණ බිම්වල සිටි ගවයන් කරෙහි
ෂාරෝනීය ෂිත්රයි ද මිටියාවත්වල සිටි ගවයන්
කරෙහි අද්දයිගේ පුත් ෂාපාත් ද පත් ව සිටියෝ ය.
30 ඔටුවන් කරෙහි ඉෂ්මායලේීය ඕබීල් ද,
කොටළුවන් කරෙහි මෙරොනොතිය ජේදයො ද,
31 එළු බැටළු පට්ටි කරෙහි හග්රිය ජාසිස් ද පත් ව
සිටියෝ ය. මේ සියල්ලෝ දාවිත් රජුගේ සම්පත්වල
අධිපතියන් ව සිටියෝ ය.

## රජුගේ මන්ත්රීවරයෝ

32 දාවිත්ගේ මාමා වූ ජොනතන් මන්ත්රීවරයකු
ව, තේරුම් ඇති මනුෂ්යයකු ව, ලේකම් කෙනෙකු
ව සිටියේ ය. හක්මෝනිගේ පුත් ජෙහීයෙල් රජුගේ
පුත්රයන් සමඟ සිටියේ ය. 33 අහිතොපෙල් වනාහි
රජුගේ මන්ත්රීවරයා ව සිටියේ ය. අර්කීය හූෂයි
රජුගේ මිත්රයා විය. 34 අහිතොපෙල් ළඟට
බෙනායාගේ පුත් ජෙහෝයාදා සහ අබියාතර් ද
මන්ත්රීවරයන් ව සිටියෝ ය. රජුගේ සේනාපතියා
ජෝවාබ් ය.

## දේව මාලිගාව සෑදීමට විධිවිධාන

28 දාවිත් ඉශ්රායෙල්හි සියලු අධිපතීන් වන
ගෝත්රවල අධිපතීන් ද රජුට සේවය කළ
පංතිවල අධිපතීන් ද සහශ්රාධිපතීන් ද ශතාධිපතීන්
ද රජුටත් ඔහුගේ පුත්රයන්ටත් අයිති සියලු වස්තු
සම්පත්වල අධිපතීන් ද ඇමතියන් සහ
බලවන්තයනුත්, සියලු බලවන්ත යුද්ධ භටයිනුත්
සමඟ ජෙරුසලමට කැඳවාගත්තේ ය.
2 2 සාමු 7:1-16; 1 වංශා 17:1-14 එකල දාවිත් රජු
නැඟිට සිට කතා කොට, “මාගේ සහෝදරයෙනි,
මාගේ ජනයෙනි, මට සවන් දෙන්න. සමිඳාණන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව තබන පිණිස එනම්,
අපගේ දෙවියන් වහන්සේට වැඩ විසීම පිණිස ස්ථිර
නිවාසයක් ගොඩනඟන්න මම අදහස් කළෙමි. එය
ගොඩනැඟීමට මා විසින් සූදානම් කරනු ලැබ
තිබුණේ ය. 3 එහෙත්, දෙවියන් වහන්සේ මට කතා
කොට, ‘නුඹ මාගේ නාමයට මාලිගාවක් ගොඩ
නොනඟන්නෙහි ය; මන්ද, නුඹ රණකාමී
මනුෂ්යයෙකි; නුඹ ලේ වැගිරෙව්වෙහි ය’යි වදාළ
සේක. 4 එහෙත්, ඉශ්රායෙල්වරුන් කරෙහි සදහට
ම රජ කෙනෙකු ව සිටීමට ඉශ්රායෙල්ගේ දෙවි
සමිඳාණන් වහන්සේ මාගේ පියාගේ මුළු වංශයෙන්
මා තෝරාගත් සේක. මන්ද, උන් වහන්සේ ජුදා ද
ජුදාගේ වංශයෙන් මාගේ පියාගේ පවුල ද
අධිපතිකමට තෝරාගෙන සියලු ඉශ්රායෙල්වරුන්
කරෙහි රජකමට මා පත් කරන්න මාගේ පියාගේ
පුත්රයන් අතරෙන් මා කෙරෙහි ප්රසන්න වූ සේක.
5 සමිඳාණන් වහන්සේ මට බොහෝ පුත්රයන් දුන්
සේක. එහෙත්, ඉශ්රායෙල්වරුන් කරෙහි සමිඳාණන්
වහන්සේගේ රජකම් කිරීමේ සිංහාසනයේ හිඳින
පිණිස මාගේ සියලු පුත්රයන් අතරෙන් මාගේ පුත්
සලමොන් තෝරාගත් සේක.
6 “උන් වහන්සේ මට කතා කොට, ‘නුඹේ පුත්
සලමොන් ම මාගේ මාලිගාව ද මණ්ඩපය ද
සාදන්නේ ය. මන්ද, මාගේ පුත්රයකු කොට මම
ඔහු තෝරා ගතිමි. මම ඔහුට පියකු වන්නෙමි.
7 අද දවසේ මෙන් ඔහු මාගේ ආඥා ද
විනිශ්චයයන් ද රක්ෂා කරමින් ස්ථිර ව සිටියොත්,
ඔහුගේ රජකම සදහට ම ස්ථිර කරන්නෙමි’යි වදාළ
සේක.
8 “ඉතින්, ඔබ මේ හොඳ දේශය භුක්ති විඳ,
ඔබට පසු ව ඔබේ පුත්රයන්ට එය සදහට ම උරුම
කර දෙන පිණිස, ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේගේ සියලු ආඥා පිළිපදිමින් ඒවා සොයන්න
කියා සමිඳාණන් වහන්සේගේ සභාව වන සියලු
ඉශ්රායෙල්වරුන්ගේ ඇස් ඉදිරිපිට ද අපගේ දෙවියන්
වහන්සේට ඇසෙන ලෙස ද මම ඔබට අවවාද
කරමි.
9 “සලමොන්, මාගේ පුත්රය, ඔබ ඔබේ පියාගේ
දෙවියන් වහන්සේ දැන හැඳිනගෙන, මුළු හෘදයෙන්
හා සම්පූර්ණ කැමැත්තෙන් උන් වහන්සේට මෙහෙ
කරන්න. මන්ද, සමිඳාණන් වහන්සේ සියලු සිත්
විමසා අපගේ සිතුම් පැතුම් තේරුම් ගන්න සේක. ඔබ
උන් වහන්සේ සොයන්නෙහි නම්, උන් වහන්සේ
ඔබට සම්බ වනු ඇත. එහෙත්, යම් හෙයකින් ඔබ
උන් වහන්සේ අත්හැරියොත්, උන් වහන්සේ ඔබ
සදහට ම අහක දමනු ඇත. 10 ඒ නිසා මයෙ සිතට
ගන්න. මන්ද, ශුද්ධස්ථානයක් වන පිණිස දේව
මාලිගාවක් ගොඩනැඟීමට සමිඳාණන් වහන්සේ ඔබ
තෝරාගෙන සිටින සේක. ශක්තිමත් ව සිට එය
කරන්නැ”යි කී ය.
11 එවිට දාවිත් දේව මාලිගාවේ ද්වාර
මණ්ඩපයේත්, එහි ගෙවලත්, එහි ගබඩාවලත්, එහි
උඩුමහල්වලත්, එහි ඇතුළු ගෙවලත්, කරුණාසනයේ
ගයේත් සැලැස්ම ද, 12 තමාගේ හිතේ තිබුණු
සියල්ල වන සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ
මණ්ඩපවලත්, වට කාමරවලත්, දෙවියන්
වහන්සේගේ මාලිගාවේ ගබඩාවලත්, කැප කරන
ලද දේ තිබූ ගබඩාවලත්, 13 පූජකයන්ගේ ද
ලෙවීවරුන්ගේ ද පංතිවලත්, උන් වහන්සේගේ
මාලිගාවේ මෙහෙයෙ පිණිස සියලු කර්මාන්තවලත්,
උන් වහන්සේගේ මාලිගාවේ මෙහෙයෙ පිණිස සියලු
බඩුවලත් සැලැස්ම ද තමාගේ පුත් සලමොන්ට
දුන්නේ ය. 14 එක එක සේවයේ සියලු රන් බඩුවල
සැලැස්ම ද රන්වල බර ද සියලු රිදී බඩුවල සැලැස්ම
ද එක එක සේවයේ සියලු බඩුවල බර ද 15 රන්
පහන් රුක්වලත් ඒවායේ රන් පහන්වලත් බර ද එක
එක පහන් රුකේත්, එහි පහන්වලත් බර ද රිදී
පහන් රුක්වලත් එක එක පහන් රුකේ වැඩ ලෙසෙ
එක එකේ සහ ඒවායේ පහන්වලත් බර ද
16 පිදීමේ රොටි තබන එක එක මේසයේ රන් බර
ද රිදී මේසවලට රිදී බර ද 17 පවිත්ර රන් මස්
කොකුවලත්, තාලිවලත්, පාත්රවලත්, රන්
කුසලාන්වලත්, සැලැස්ම ද එක එක කුසලානේ බර
ද රිදී කුසලාන්වල සැලැස්ම ද එක එක කුසලානේ
බර ද 18 පවිත්ර රන් දුම් පූජාසනයේ සැලැස්ම ද

බර ද පියාපත් දිගහැර උන් වහන්සේගේ ගිවිසුම්
කරඬුව වසාගන්න රන් කරුබ් රථයේ සැලැස්ම ද
කියා දුන්නේ ය. 19 “මේ සටහනේ සියලු වැඩ
තේරුම් කර දුන් සමිඳාණන් වහන්සේගේ අතින් මා
ලවා සියල්ල ම ලියවා තිබේ ය”යි දාවිත් කීවේ ය.
20 තවද, දාවිත් තමාගේ පුත් සලමොන්ට කතා
කොට, “ඔබ ශක්තිමත් ව, ධෛර්ය සම්පන්න ව සිට
එය ඉෂ්ට කරන්න. බිය නොවන්න; නොකැළඹෙන්න.
මන්ද, මාගේ දෙවියන් වහන්සේ වන දෙවි
සමිඳාණන් වහන්සේ ඔබ සමඟ වැඩ වසන සේක.
සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ මෙහෙයෙ පිණිස
සියලු කර්මාන්ත නිම වන තුරු උන් වහන්සේ
ඔබනේ ඉවත් නොවන සේක; ඔබ අත් නොහරින
සේක. 21 ඇරත් පූජකයන්ගේ ද ලෙවීවරුන්ගේ ද
පංතිවල අය දෙවියන් වහන්සේගේ මාලිගාවේ
සියලු වැඩ පිණිස සිටිති. සියලු කටයුතුවල දී සියලු
ආකාර වැඩට දක්ෂකම ද කැමැත්ත ද ඇති හැම
දනො ද ඔබ සමඟ සිටිති. ඇරත් අධිපතියෝත්, මුළු
සෙනඟත් ඔබේ අණට මුළුමනින් යටත් වන්නෝ
ය”යි කීවේ ය.

### දේව මාලිගාව ගොඩනැඟීමට දුන් පුද පඬුරු

29 1 වංශා 22:5 දාවිත් රජ මුළු සභාවට කතා
කොට, “දෙවියන් වහන්සේ විසින් තෝරා
ගනු ලැබූ එක ම තැනැත්තා වන මාගේ පුත්
සලමොන් තව ම ළා බාල ය; කාර්යය නම් බරපතල
ය. මන්ද, මාලිගාව මනුෂ්‍යයාට නොව දෙවි
සමිඳාණන් වහන්සේට ය. 2 එබැවින් මාගේ මුළු
ශක්තියෙනේ මාගේ දෙවියන් වහන්සේගේ මාලිගාව
ගැන රන් වැඩට රන් ද රිදී වැඩට රිදී ද ලෝකඩ
වැඩට ලෝකඩ ද යකඩ වැඩට යකඩ ද ලී වැඩට ලී
ද නබමාණික්‍ය ද බැඳීමට ගල් ද ඔබ්බනු පිණිස ගල්
ද විසිතුරු ගල් ද සියලු ආකාර මැණික් ගල් ද
කිරිගරුඬ ගල් ද බොහෝ සයෙින් ම සූදානම්
කළෙමි. 3 තවද, ශුද්ධ මාලිගාවට මා විසින් සපයනු
ලැබ තිබෙනෙ සියල්ලට අමතර ව මාගේ දෙවියන්
වහන්සේගේ මාලිගාව කෙරෙහි ඇති මාගේ ළැදිකම
නිසා මාගේ ම සම්පත වන රන් ද රිදී ද මාගේ
දෙවියන් වහන්සේගේ මාලිගාවට දුන්නෙමි.
4+1CH එනම්, මාලිගාවේ බිත්ති වසාලන පිණිස ද
රන් වැඩවලටත්, රිදී වැඩවලටත්, කාර්මිකයන්ගේ
සියලු වැඩවලටත් පාවිච්චි කරන පිණිස ද ඔපීර්හි
රන් මෙට්‍රික් ටොන් සියයකුත්, පවිත්‍ර කළ රිදී
මෙට්‍රික් ටොන් දසෙිය සතළිසකුත් දුන්නෙමි. ඉතින්
අද සේවය සඳහා කැමැත්තෙනේ ම සමිඳාණන්
වහන්සේට පූජා කරන්නේ වෙනෙ කවරෙකේ දැ”යි
කීවේ ය.
6 එවිට පිය වංශවල අධිපතීහු ද ඉශ්රායලේ
ගෝත්‍රවල අධිපතීහු ද සහශ්‍රාධිපතීහු ද
ශතාධිපතීහු ද රාජකාරියේ අධිපතීහු ද කැමැත්තෙනේ
ම පඬුරු ඔප්පු කරමින් 7 දෙවියන් වහන්සේගේ
මාලිගාවේ සේවයට රන් මෙට්‍රික් ටොන් එකසිය
හැත්තෑවට වැඩි ගණනකුත්, රිදී මෙට්‍රික් ටොන්
තුන්සිය සතළිසකට වැඩි ගණනකුත්, ලෝකඩ
මෙට්‍රික් ටොන් හයසිය විස්සක් පමණකුත්, යකඩ
මෙට්‍රික් ටොන් තුන්දාස් හාරසියයකට වැඩි
ගණනකුත් දුන්නෝ ය. 8 අනර්ඝ මැණික් ගල්
ඇත්තෝ ද ගේර්ෂෝනීය ජෙහීයලේ අතින් ඒවා
සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ ගබඩාවට
දුන්නෝ ය. 9 සෙනඟ එසේ කැමැත්තෙනේ ම ඒවා
ඔප්පු කළ බැවින් ඔව්හු ප්‍රීති වූණෝ ය. මන්ද,
ඔවුන් අවංක සිතකින් සමිඳාණන් වහන්සේට ඒවා
පූජා කළ බැවිනි. දාවිත් රජු ද ඉමහත් ප්‍රීතියකට
පත් විය.

### දාවිත් රජු සමිඳුන් පැසසීම

10 දාවිත් මුළු සභාව ඉදිරියෙහි සමිඳාණන්
වහන්සේට ප්‍රශංසා කරමින් කතා කොට, මෙසේ
කීවේ ය: “අපේ පිය වන ඉශ්රායලේවරුන්ගේ දෙවි
සමිඳාණන් වහන්ස, ඔබට සදහට ම ප්‍රශංසා
වේවා. 11 මතෙ 6:13සමිඳාණන් වහන්ස,
ශ්‍රේෂ්ඨත්වය ද බලපරාක්‍රමය ද තේජස ද
වික්‍රමය ද මහිමය ද අයත් ඔබට ය. මන්ද,
ස්වර්ගයෙහිත්, පොළොවෙහිත් ඇති සියල්ල ඔබේ
ය. සමිඳාණන් වහන්ස, රාජ්‍යයත් ඔබට අයිති ය.
ඔබ සියල්ල කෙරෙහි විශිෂ්ට ලෙස උසස් ව සිටින
සේක. 12 වස්තුව ද ගෞරවය ද පැමිණෙන්නේ
ඔබනේ ය. ඔබ සියල්ල පාලනය කරන සේක. බලය
ද පරාක්‍රමය ද ඔබ අතෙහි ය. සියල්ලන් උසස්
කරන්නටත්, ශක්තිමත් කරන්නටත්, බලය
තිබෙන්නේ ඔබ අතෙහි ය. 13 එබැවින් අපේ
දෙවියන් වහන්ස, අපි ඔබට ස්තුති කරමින් ඔබේ
තේජාන්විත නාමය වර්ණනා කරමු.
14 “එහෙතේ, මේ ආකාරයෙනේ ඔබට මේවා ඔප්පු
කිරීමට පොහොසත් වූ මමත්, මාගේ සෙනඟත්
කවුරු ද? මන්ද, සියල්ල ම පැමිණෙන්නේ ඔබනේ ය.
ඔබේ ම දෙයින් අපි ඔබට දුනිමු. 15 මන්ද, අපේ
සියලු පියවරුන් මෙනේ අපි ඔබ ඉදිරියෙහි
ආගන්තුකයන් ව හා කලක් නේවාසිකයන් ව සිටිමු.
පොළොවේ අපේ ආයු කාලය සෙවණැල්ලක් මෙනේ
ගෙවී යයි. බලාපොරොත්තුවක් ද අපට නැත්තේ ය.
16 අපේ දෙවි සමිඳාණන් වහන්ස, ඔබේ ශුද්ධ
නාමය උදෙසා ඔබට දේව මාලිගාවක් ගොඩනැඟීමට
අප විසින් සූදානම් කරන ලද මේ මහත් ද්‍රව්‍ය
රාශිය පැමිණෙන්නේ ඔබ අතින් ය. සියල්ල ම ඔබේ
ය. 17 මාගේ දෙවියන් වහන්ස, ඔබ සිත සෝදිසි
කරන බවත්, අවංකකමට ප්‍රසන්න බවත් දනිමි. මම
වනාහි මාගේ සිතේ අවංකකමින් මේ සියල්ල
කැමැත්තෙනේ ම ඔප්පු කළෙමි. දැන් මෙහි සිටින
ඔබේ සෙනඟ ද සතුටු සිතින් ඔබට පඬුරු පූජා
කරන බව ප්‍රීතියෙනේ දිටිමි. 18 අපේ පියවරුන් වූ
ආබ්‍රහම්ගේ ද ඊසාක්ගේ ද ඉශ්රායලේගේ ද දෙවි
සමිඳාණන් වහන්ස, මේ අදහස් හා කල්පනා ඔබේ
සෙනඟගේ සිත්වල සදහට ම පිහිටුවා, ඔවුන්ගේ
සිත් ඔබ වෙත ම නමාගත මැනව. 19 ඔබේ ආඥා ද
ශික්ෂා ද පණත් ද පිළිපදින්නටත්, මේ සියල්ල ම

ඉෂ්ට කරන්නටත්, මා සූදානම් කර තිබෙන මාලිගාව
ගොඩනඟන්නටත් මාගේ පුත් සලමොන්ට ස්ථිර
සිතක් දුන මැනව.”
20 එවිට දාවිත් මුළු සභාවට කතා කොට, “ඔබේ
දෙවි සමිඳාණන් වහන්සේට ප්‍රශංසා කරන්නැ”යි කී
ය. මුළු සභාව ද තමන්ගේ පියවරුන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේට ප්‍රශංසා කරමින්, හිස නමා
සමිඳාණන් වහන්සේටත්, රජුටත් වැන්දෝ ය.
21 ඒ දවසට පසු දා ඉශ්‍රායලේවරු සමිඳාණන්
වහන්සේට පූජා ඔප්පු කරමින්, ගොනුන් දහසකුත්,
බැටළුවන් දහසකුත්, බැටළු වස්සන් දහසකුත් දවන
පූජා කොට ද ඒවා සමඟ පානීය පූජා ද වෙනත් පූජා
ද බොහෝ සයෙන් ම සියලු ඉශ්‍රායලේවරුන් උදෙසා
සමිඳාණන් වහන්සේට ඔප්පු කළෝ ය.

### සලමොන් රජකමට පැමිණීම

22 ඔව්හු ඒ දවසේ සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි
ඉමහත් සන්තෝෂයෙන් ආහාර පාන භුක්ති වින්දාහ.
ඉන්පසු දෙ වන වර දාවිත්ගේ පුත් සලමොන්
රජකමට පත් කළෝ ය. තවද, ඔව්හු සමිඳාණන්
වහන්සේ උදෙසා ඔහු ප්‍රධානාධිපතියා කොට ද
ශාදොක් පූජකයා කොට ද ආලේප කළෝ ය. 23 1
රාජා 2:12එවිට සලමොන් තමාගේ පිය වූ දාවිත්
වෙනුවට රජ ව සමිඳාණන් වහන්සේගේ
සිංහාසනයෙහි හිඳ සමෘද්ධිමත් විය. සියලු
ඉශ්‍රායලේවරු ඔහුට කීකරු වූ හ. 24 සියලු අධිපතීහු
ද බලවන්තයෝ ද දාවිත් රජුගේ සියලු පුත්‍රයෝ ද
සලමොන් රජුට පක්ෂපාතී ව සිටින්න පොරොන්දු වූ
හ. 25 සමිඳාණන් වහන්සේ ද මුළු
ඉශ්‍රායලේවරුන්ගේ ඇස් හමුයෙහි සලමොන් ඉතා
උසස් කොට, ඉශ්‍රායලේහි ඔහුට පළමුවෙනේ සිටි
කිසි රජකෙුට නොතිබුණු පරිද්දෙන් ඔහුට
රාජශෞර්වර්යය දුන් සේක.
26 ජෙසේසේගේ පුත් දාවිත් රජු මුළු ඉශ්‍රායලේ
ජනයා පාලනය කළේ ය. 27 2 සාමු 5:4-5; 1 වංශා
3:4ඔහු ඉශ්‍රායලේවරුන් පාලනය කළ කාලය සතළිස්
අවුරුද්දකි. ඔහු හෙබ්රොන්හි සත් අවුරුද්දක් ද
ජෙරුසලමෙහි තිස්තුන් අවුරුද්දක් ද රජකම් කළේ
ය. 28 ඔහු වයසනේ ද වස්තුවනේ ද ගෞරවයනේ ද
පූර්ණ ව දීගායු වළඳා මරණයට පත් විය. ඔහුගේ
පුත් සලමොන් ඔහු වෙනුවට රජකම් කළේ ය.
29 මුල පටන් අන්තිම දක්වා දාවිත් රජුගේ පුවත්
එනම්, ඔහුගේ රාජ්‍ය පාලනය ද බලවන්තකම් ද
ඔහුටත්, ඉශ්‍රායලේවරුන්ටත්, 30 දේශවල සියලු
රාජ්‍යවලටත් සිදු වූ කාරණා ද යන සියල්ල දිව්‍යසිවර
සාමුවලේගේ ද දිව්‍යසිවර නාතාන්ගේ ද දිව්‍යසිවර
ගාද්ගේ ද පුරාවෘත්ත ග්‍රන්ථවල ලියා තිබේ.

# 2 වංශාවලියේ

### සලමොන් රජු ප්‍රඥාව ඉල්ලා යැදීම
(1 රාජා 3:1-15;10:26-29)

1 දාවිත්ගේ පුත් සලමොන් සිය රජකමෙහි
ස්ථිර විය. ඔහුගේ දෙවි සමිඳාණන් වහන්සේ
ඔහු සමඟ සිට ඔහු ඉතා උසස් කළ සේක.
2 සලමොන් සියලු ඉශ්රායලේවරුන්ට එනම්,
සහශ්රාධිපතීන්ට හා ශතාධිපතීන්ට ද
විනිශ්චයකාරයන්ට ද පිය වංශවල ප්‍රධානීන් වන
මුළු ඉශ්රායලේහි අධිපතීන් සියල්ලන්ට ද කතා
කළේ ය. 3 ඉක්බිති සලමොන් ද ඔහු සමඟ මුළු
සභාව ද ගිබියොන්හි ගිරිකුළට ගියෝ ය. මන්ද,
සමිඳාණන් වහන්සේගේ මෙහෙකරු වූ මෝසෙස්
විසින් පාළුකරයේ දී සාදන ලද දෙවියන්
වහන්සේගේ සම්මුඛ මණ්ඩපය එහි තිබූ බැවිනි.
4 2 සාමු 6:1-17; 1 වංශා 13:5-14;
15:25—16:1එහෙත්, දෙවියන් වහන්සේගේ ගිවිසුම්
කරඬුව කිරියත්-ජයොරිම් සිට දාවිත් ඊට සූදානම්
කළ ස්ථානයට ඔහු විසින් ගෙනෙනු ලැබ තිබිණි.
එසේ වූයේ, ඔහු ජෙරුසලමෙහි ඊට කූඩාරමක්
පිහිටුවා තිබුණ නිසා ය. 5 නික්ම 38:1-7තවද,
හූර්ගේ පුත්‍රයා වන උරීගේ පුත් බෙසලලේ සෑදූ
ලෝකඩ පූජාසනය සමිඳාණන් වහන්සේගේ
මණ්ඩපය ඉදිරිපිට විය. සලමොන් ද සභාව ද ඊට
ළඟා වූ හ. 6 එහි සමිඳාණන් වහන්සේ අබිමුව
සම්මුඛ මණ්ඩපය ඉදිරිපිට තිබෙන ලෝකඩ
පූජාසනය පිට සලමොන් දවන යාග පූජා දහසක්
ඔප්පු කළේ ය.
7 එදා රාත්‍රියේ දෙවියන් වහන්සේ සලමොන්ට
පෙනී, “මා විසින් නුඹට දෙනු ලැබිය යුත්තේ කුමක්
ද කියා ඉල්ලන්නැ”යි ඔහුට වදාළ සේක.
8 සලමොන් කතා කරමින්, “ඔබ මාගේ පිය වූ
දාවිත්ට මහත් කරුණාව පෙන්වමින් ඔහු වෙනුවට මා
රජකමට පත් කළ සේක. 9 උත් 13:16; 28:14දැනුදු
දෙවි සමිඳුනි, ඔබ මාගේ පිය වූ දාවිත්ට දුන්
පොරොන්දුව ස්ථිර වී ඇත. මන්ද, ගණනින්
පොළොවේ ධූලි මෙන් වන සෙනඟගේ රජ කොට
ඔබ මා පත් කළ සේක. 10 එබැවින් මා මේ සෙනඟ
විනිශ්චය කරන පිණිස මට ප්‍රඥාවත්, දැනගැන්මත්
දුන මැනව. මන්ද, ඔබේ මේ මහත් සෙනඟ
විනිශ්චය කරන්න කා හට පුළුවන් දැ”යි දෙවියන්
වහන්සේට කීවේ ය.
11 දෙවියන් වහන්සේ සලමොන්ට කතා කොට,
“නුඹ වස්තුව වත්, සම්පත වත්, ගෞරවය වත්,
නුඹට වෛරවන්නන්ගේ ජීවිත වත් ඉල්ලන්නේ නැති
ව, දීර්ඝායුෂ ද නොඉල්ලා, නුඹේ පාලනයට මා
විසින් භාර දෙන ලද මාගේ සෙනඟ විනිශ්චය කරන
පිණිස ප්‍රඥාව ද දැනගැන්ම ද ඉල්ලූ නිසා,
12 ප්‍රඥාවත්, දැනගැන්මත් මම නුඹට දෙමි. තවද,
නුඹට පළමුවෙනි සිටි කවර රජකෙනෙකුට වත්
නොතිබුණ, නුඹට පසු ව කවර රජ කෙනෙකුට වත්
නොලැබෙන තරම් වස්තුවත්, සම්පතත්, ගෞරවයත්
නුඹට දෙන්නෙමි”යි වදාළ සේක.
13 එවිට සලමොන් ගිබියොන්හි ගිරිකුළෙහි තිබුණ
සම්මුඛ මණ්ඩපය වෙතින් ජෙරුසලමට ආවේ ය.
ඔහු ඉශ්රායලේවරුන්ගේ රජ විය. 14 1 රාජා
4:26තවද, සලමොන් රථ ද අසරුවන් ද රැස්
කරගත්තේ ය. ඔහුට එක්දහස් හාරසියයක් රථ ද
දොළොස්දහසක් අසරුවෝ ද වූ හ. ඔහු ඒවා රථ
නවතන නුවරවල ද රජු ළඟ ජෙරුසලමෙහි ද
තැබුවේ ය. 15 ඇරත්, රජ රන් රිදී ජෙරුසලමෙහි ගල්
මෙන් ද කිහිරි ගස් පාත රටෙහි අත්තික්කා ගස්
මෙන් ද ගණනින් වැඩි වන්න සැලැස්සුවේ ය.
16 ද්වි.නී. 17:16සලමොන්ට සිටි අශ්වයෝ මිසර හා
කූවේ දේශයෙන් ගෙනෙන ලද්දෝ ය. රජුගේ
වෙළෙන්දෝ උන් රැළක් රැළක් වශයෙන් නියමිත
මිලකට ලබාගත්හ. 17 ඔව්හු රථයකට රිදී කාසි
හයසියය බැගින් ද අශ්වයකුට එකසියපණහ
බැගින් ද ගෙවා මිසර දේශයෙන් ගෙනාවෝ ය.
එසේ ම ඔව්හු හිත්තීවරුන්ගේ සියලු රජුන්ටත්,
සිරියාවේ රජුන්ටත් ගෙනවුත් දුන්නෝ ය.

### දේව මාලිගාව සාදන්න සූදානම් වීම
(1 රාජා 5:1-18)

2 සලමොන් සමිඳාණන් වහන්සේගේ නාමයට
මාලිගාවක් ද තමාට රජමැදුරක් ද
ගොඩනඟන්න අදහස් කරගෙන, 2 බර අදින පිණිස
මිනිසුන් සැත්තෑදහසක් ද කඳුකරයේ ලී කපන
පිණිස මිනිසුන් අසූදහසක් ද ඔවුන් කෙරෙහි
නිලධාරීන් තුන්දහස් හයසියයක් ද නියම කළේ ය.
3 සලමොන් තීර්හි හූරාම් රජුට පණිවුඩයක්
යවමින්, “මාගේ පිය වූ දාවිත්ට වාසය කිරීමට
ගෙයක් ගොඩනැඟීම පිණිස ඔබ කිහිරි ලී එවීමෙන්
ඔහු සමඟ ගනු දෙනු කළ පරිදි මා සමඟත් ගනු
දෙනු කළ මැනව. 4 මම මාගේ දෙවි සමිඳාණන්
වහන්සේගේ නාමයට මාලිගාවක් ගොඩනඟා උන්
වහන්සේ ඉදිරියෙහි සුවඳ දුම් ඔප්පු කරන පිණිසත්,
නිරන්තර පිදීමේ රොටි තබන පිණිසත්, උදේ සවස
ද සබත් දවස්වල ද අමාවක් දිනවල ද අපේ දෙවි
සමිඳාණන් වහන්සේගේ නියම මංගල්‍යවල දී ද

දවන යාග පූජා ඔප්පු කරන පිණිසත් එය උන්
වහන්සේට කැප කරන්න යමි. මෙය සදහට ම
ඉශ්රායලේවරුන්ට නියෝගයක් වනු ඇත. 5 අපගේ
දෙවියන් වහන්සේ සියලු දෙවිවරුන්ට වඩා උතුම්
නිසා මා ගොඩනඟන මාලිගාවත් විශාල ය. 6 1
රාජා 8:27; 2 වංශා 6:18එහෙත්, ස්වර්ගයට ද අති
උසස් ස්වර්ගයට ද උන් වහන්සේ දරන්න අවකාශ
තිබදේදී උන් වහන්සේට මාලිගාවක් ගොඩනඟන්න
කවරකුෙ හට පුළුවන්කම තිබේ ද? උන් වහන්සේ
ඉදිරියෙහි සුවඳ දුම් ඔප්පු කිරීමට මිස, වෙන කුමන
හේතුවක් නිසා උන් වහන්සේට මාලිගාවක්
ගොඩනඟන්න මම කවරෙක් ද? 7 ඉතින් මාගේ පිය
දාවිත් සපයා දුන්, ජුදාහිත්, ජෙරුසලමෙහිත් මා ළඟ
සිටින දක්ෂ ප්රඥාවන්ත මිනිසුන් සමඟ රන්, රිදී,
ලෝකඩ, යකඩ වැඩත්, නිල් පාට, දම් පාට, තද රතු
පාට නූල් වැඩත් වන සියලු ආකාර කැටයම් වැඩ
කරන්න දන්න මිනිසකුෙ මට එවුව මැනව.
8 ලබෙනොන්හි සිට කිහිරි ලී ද දේවදාර ලී ද හඳුන්
ලී ද මා වෙත එවුව මැනව. මන්ද, ඔබේ
මෙහෙකරුවන් ලබෙනොන්හි ලී කැපීමෙහි දක්ෂ බව
මම දනිමි. මාගේ මෙහෙකරුවන් ඔබේ
මෙහෙකරුවන් සමඟ වැඩ කරනු ඇත. 9 මා
ගොඩනඟන මාලිගාව මහා ආශ්චර්යමත් එකක්
නිසා, මට බොහෝ සයෙන් ලී සූදානම් කළ යුතු ව
තිබේ. 10 ලී කපන ඔබේ මෙහෙකරුවන්ගේ ආහාර
පිණිස තිරිඟු මෙට්රික් ටොන් දදෙහසක් ද යව
මෙට්රික් ටොන් දදෙහසක් ද මුද්රික පාන ලීටර්
භාරලක්ෂයක් ද තලේ ලීටර් භාරලක්ෂයක් ද මම
දෙන්නමේ”යි කියා යැවී ය.
11 එවිට තීර්හි රජ වන හූරාම්, සලමොන්ට
ලියුමකින් උත්තර දමේන්, “සමිඳාණන් වහන්සේ
තමන් සෙනඟට ප්රේම කරන නිසා උන් වහන්සේ
ඔබ ඔවුන්ගේ රජ කොට පත් කළ සේකැ”යි කී ය.
12 තවදුරටත් හූරාම් කියනුයේ, “අහසත්,
පොළොවත් මැවූ ඉශ්රායලේවරුන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේට ප්රශංසා වේ වා! මන්ද,
සමිඳාණන් වහන්සේට මාලිගාවක් ද තමාට ම
රජමැදුරක් ද ගොඩනැඟීමට සිහි කල්පනාවෙන් හා
නැණ නුවණින් යුක්ත පුත්රයකුෙ උන් වහන්සේ
දාවිත් රජුට දුන් සේක. 13 ඉතින් ප්රඥාවන්ත,
කලාශිල්පියකුෙ වන හූරාම්-අබි මම එවමි.
14 ඔහුගේ මව දාන්ගේ ගෝත්රයේ ස්ත්රියකි.
ඔහුගේ පියා තීර්හි වැසියෙකි. ඔබේ ශිල්පීන් හා
ඔබේ පියා වන මාගේ ස්වාමී වූ දාවිත්ගේ ශිල්පීන්
සමඟ ඔහු වැඩ කළ යුතු ය. ඔහු රන්, රිදී, ලෝකඩ,
යකඩ, ගල්, ලී වැඩ හා රත්නිල්, නිල්වන්, සිහින්
හණ, රතු නූල් වැඩ කරන්න හා කොයි යම් කැටයම්
වැඩක් නමුත් කරන්න සමර්ථ වේ. 15 ඉතින්, මාගේ
ස්වාමියා කී පරිදි තිරිඟු ද යව ද තලේ ද මුද්රික
පානය ද තම මෙහෙකරුවන්ට එවිය යුතු ය. 16 අපි
ද ඔබට ඕනෑ හැටියට ලබෙනොන් සිට ලී කපා, ඒවා
පහුරු බැඳ, මුහුදෙන් ජොප්පාවට ගෙනවුත් ඔබට
දෙන්නමු. එවිට ඔබට ඒවා ජෙරුසලමට ගෙනේවා
ගත හැකි ය”යි ද දැන්වී ය.

## දේව මාලිගාව ගොඩනැඟීම ආරම්භ කිරීම

(1 රාජා 6:1-38)

17 සලමොන් ඉශ්රායලේ දේශයෙහි සිටි සියලු
විදේශීන් තමාගේ පිය වූ දාවිත් ඔවුන් ගණන් කළ
ලෙස නැවත ඔවුන් ගණන් කළේ ය. ඔව්හු
එක්ලක්ෂ පණස්තුන්දාස් හයසියයක් වූවෝ ය.
18 ඔහු ඔවුන්ගෙන් හැත්තෑදහසක් බර අදින පිණිස
ද අසූදහසක් කඳුකරයේ ලී කැපීමට ද තුන්දහස්
හයසියයක් සෙනඟ ලවා වැඩ කරවන නිලධාරීන්
කොට ද පත් කළේ ය.

3 උත් 22:2 එකල සලමොන් තමාගේ පිය වූ
දාවිත්ට ජෙරුසලමෙහි දී සමිඳාණන් වහන්සේ
දර්ශනය වූ මොරියා කන්දේ ජබෙුසිය වූ
ඔර්ණාන්ගේ කමතේ දාවිත් විසින් නියම කරන ලද
ස්ථානයෙහි සමිඳාණන් වහන්සේගේ මාලිගාව
ගොඩනඟන්න පටන්ගත්තේ ය. 2 ඔහු තමා
රජකමට පත් වූ හතර වන අවුරුද්දේ දෙ වන
මාසයේ දෙ වන දා එය ගොඩනඟන්න
පටන්ගත්තේ ය. 3 දෙවියන් වහන්සේගේ මාලිගාව
ගොඩනැඟීමට සලමොන් දැමූ අත්තිවාරම මෙය
වේ. පළමුවෙනි තිබූ නියමිත මිම්මේ හැටියට එහි
දිග මීටර් විසිහතකි; පළල මීටර් නවයකි: 4 ඉස්සරහ
තිබුණු ද්වාර මණ්ඩපයේ දිග ගෘහයේ පළල ලෙසෙ
ම මීටර් නවයකි; උස මීටර් පණස්හතරකි. එහි
ඇතුළත ඔහු පවිත්ර රන් ආලේප කළේ ය. 5 ඔහු
ලොකු මාලිගාවේ ඇතුළ දේවදාර ලීවලින් වසා, එහි
පරේ රත්රන් ආලේප කොට, ඒ මතු පිට තල්ගස් ද
දම්වැල් ද සාදා, 6 අලංකාරය පිණිස අනර්ඝ
ගල්වලින් මාලිගාව සැරසුවේ ය. ඒ රන්, පර්වායිම්
නම් ස්ථානයේ රන් ය. 7 ඔහු මාලිගාව ද බාල්ක ද
උළුවහු ද එහි බිත්ති ද දොරවල් ද රනින් ආලේප
කළේ ය. බිත්තිවල කරෙුබ් රූප ද කැටයම් කළේ
ය. 8 නික්ම 26:33-34ඔහු අතිශුද්ධස්ථානයක් සෑදුවේ
ය. එහි දිග මාලිගාවේ පළල ලෙසෙ ම මීටර් නවයකි;
එහි පළලත් මීටර් නවයකි. ඔහු එය පරේ රන්
මෙට්රික් ටොන් විස්සකින් පමණ ආලේප කළේ ය.
9 ඇණවල බර රන් ග්රෑම් පන්සියහැත්තෑවකි. ඔහු
උඩුමහල් තලයත් රන් ආලේප කළේ ය.
10 නික්ම 25:18-20 තවද, ඔහු අතිශුද්ධස්ථානයෙහි
කරෙුබ් රූප දෙකෙක් කපා සාදා තැබුවේ ය. ඒවා
රනින් ආලේප කරන ලද්දේ ය. 11 කරෙුබ් රූප
පියාපත්වල දිග මීටර් නවයකි. එක පියාපතක් මීටර්
දෙකෙයි දශම දෙකෙකි. එකක් මාලිගාවේ බිත්තියට
ස්පර්ශ වන ලෙසෙ ද, අනික් පියාපත මීටර් දෙකෙයි
දශම දෙකෙක් දික් ව, අනික් කරෙුබ් රූපයේ
පියාපතකට ස්පර්ශ වන ලෙසෙ ද තිබුණේ ය.
12 අනික් කරෙුබ් රූපයේ පියාපතක් මීටර් දෙකෙයි
දශම දෙකෙක් දිග ව මාලිගාවේ බිත්තියට ස්පර්ශ
වන ලෙසෙ ද, අනික් පියාපත මීටර් දෙකෙයි දශම
දෙකෙක් දිග ව අනික් කරෙුබ් රූපයේ පියාපතකට
ස්පර්ශ වන ලෙසෙ ද තිබුණේ ය. 13 මේ කරෙුබ්
රූපවල පියාපත් මීටර් නවයක් විහිදී තිබුණේ ය.
ඒවා කළෙන් පිහිටා තිබිණි. ඒවායේ මුහුණු මාලිගාව

දසෙට විය. 14 නික්ම 26:31ඔහු නිල් පාට, තද රතු
පාට, දම් පාට නූල්වලිනුත්, සිහින් හණ නූල්වලිනුත්
තිරය ද ඒ පිට කරූබ් රූප ද සෑදුවේ ය.

### කුළුණු දෙක
(1 රාජා 7:15-22)

15 මාලිගාව ඉදිරිපිට ඔහු මීටර් පහළොවෙයි දශම
පහක් උස ඇති කුළුණු දෙකක් සෑදුවේ ය. එක
එකේ මුදුන පිට තිබුණ පේකඩය මීටර් දෙකෙයි දශම
දෙකෙකි. 16 දිව්‍ය-වාක්‍යස්ථානයෙහි තිබුණ පරිදි ඔහු
දම්වැල් සාදා ඒවා කුළුණු මුදුන්වල තබා දළෙම්
සියයක් ලෝකඩවලින් සාදා ඒවා දම්වැල්වල
එල්ලුවේ ය. 17 ඔහු මාලිගාව ඉදිරිපිට ඒ කුළුණු,
එකක් දකුණු පැත්තේ ද එකක් වම් පැත්තේ ද
පිහිටුවා, දකුණු පැත්තේ එකට, 'එතුමාණෝ පිහිට
වන සේක' යන අර්ථය ඇති 'ජාකීන්' යන නම ද,
වම් පැත්තේ එකට, 'එහි ශක්තිය තිබේ' යන
අර්ථය ඇති 'බෝවස්' යන නම ද තැබී ය.

### දේව මාලිගාවේ භාණ්ඩ
(1 රාජා 7:23-51)

4 නික්ම 27:1-2 ඔහු ලෝකඩ පූජාසනයක් ද
සෑදුවේ ය. එහි දිග මීටර් නවයකි; පළල මීටර්
නවයකි; උස මීටර් හතරයි දශම පහකි. 2 ඔහු වතුර
පොකුණ වාත්තු කර සෑදුවේ ය. එහි ගැට්යේ එක්
පැත්තක සිට අනික් පැත්ත දක්වා මීටර් හතරයි
දශම හතරකි. එය වටකුරු ව තිබුණේ ය. එහි උස
මීටර් දෙකෙයි දශම දෙකෙකි. එහි වට ප්‍රමාණය මීටර්
දහතුනයි දශම දෙකෙකි. 3 එහි පහළ කොටේඨාශයේ
මීටර් දශම පහකට ගව රූප දහය බැගින්, එය
වාත්තු කරන විට වාත්තු කළ දපෙළියක ගව රූප
වටේට ම තිබිණි. 4 ඒ පොකුණ ගව රූප
දොළොසක් පිට තැබී ය. රූප තුනක් උතුරු දසෙට ද
තුනක් බටහිර දසෙට ද තුනක් දකුණු දසෙට ද
තුනක් නැගෙනෙහිර දසෙට ද හැරී තිබිණි. වතුර
පොකුණ ඒවාට උඩින්, ඒවා පිට, විය. ඒවායේ
පසුපස කොටේඨාශ සියල්ල ම ඇතුළට තිබිණි. 5 එහි
ඝනකම මිලිමීටර් හැත්තෑපහකි. එහි ගැට්ය කුසලාන්
ගැට්යක හැඩේට මනේ මානලේ මලක් ලසෙ සාදා
තිබිණි. එහි වතුර ප්‍රමාණය ලීටර් හැටදහසක්
පමණ විය. 6 නික්ම 30:17-21සේදීම පිණිස ඔහු
භාජන දහයක් සාදා, පහක් දකුණු පැත්තේ ද පහක්
වම් පැත්තේ ද තැබී ය. දවන යාග පූජාවට ඔප්පු
කළ දේ එහි සෝදන ලද්දේ ය. එහතේ, වතුර
පොකුණ තිබුණේ පූජකයන්ට ස්නානය කරන පිණිස
ය.
7 නික්ම 25:31-40 ඔහු රන් පහන් රුක් දසයත්
ඒවායේ නියම පිළිවළෙට සාදා, මාලිගාවේ දකුණේ
පහකුත්, වමේ පහකුත් තැබුවේ ය. 8 නික්ම
25:23-30ඔහු මේස දහයක් ද සාදා, පහක්
මාලිගාවේ දකුණේ ද පහක් වමේ ද තැබුවේ ය.
ඔහු රන් තලි සියයකුත් සෑදුවේ ය.
9 පූජකයන්ගේ මළුව ද මහ මළුව ද ඒ මළුවට
දොරවල් ද සාදා, ඒ දොරවල් ලෝකඩනේ වැසුවේ
ය. 10 ඔහු දකුණු පැත්තනේ පූර්ව දිශාවටත් දකුණු
දිශාවටත් අතරහෙි වතුර පොකුණ තැබුවේ ය.
11 තවද, හූරාම්, සැළිත්, හැඳිත්, තාලිත් සෑදුවේ ය.
මසේ හූරාම් දවේියන් වහන්සේගේ මාලිගාවහෙි
සලමොන් රජ උදසො කළ වැඩ ඉෂ්ට කොට නිම
කළෙේ ය. 12 ඒ වැඩ නම්, කුළුණු දෙක ද, කුළුණු
මුදුන් පිට ගෝල සහ පේකඩ දෙක ද, කුළුණු මුදුන්
පිට වූ පේකඩවල ගෝල දෙක වැසීමට දැල් වැඩ
දෙක ද, 13 කුළුණු පිට තිබුණු පේකඩවල ගෝල
වැසීමට එක එක දැල් වැඩේට දළෙම් දපෙළියක්
බැගින් දැල් වැඩ දෙකට දළෙම් හාරසියයක් ද යන
මේවා ය. 14 ඔහු මැසි ද සෑදුවේ ය. මැසි පිට
භාජන ද 15 වතුර පොකුණ ද ඒ යට ගව රූප
දොළොස ද 16 සැළි ද හැඳි ද මස් කොකු ද ඒවායේ
සියලු බඩු ද ඔහු සෑදුවේ ය. ඔහුට පියකු වූ
හූරාම්-අබි සමිඳාණන් වහන්සේගේ මාලිගාව උදසො
සලමොන් රජුට ඒ බඩු ඔප දැමූ පිත්තලනේ සෑදුවේ
ය.
17 ජොර්දාන් සමභූමියෙහි සුක්කොත් ද ශරෙදො ද
අතරේ තිබනෙ මැටි බිමහෙි රජ ඒවා වාත්තු කරවී
ය. 18 මසේ සලමොන් මේ සියලු භාණ්ඩ මහත්
රාශියක් සෑදුවේ ය. ලෝකඩවල බර දැනගත
නොහැකි විය. 19 සලමොන් දවේියන් වහන්සේගේ
මාලිගාවේ සියලු බඩු වන රන් පූජාසනය ද, පිදීමේ
රොටි තිබුණු මේස ද, 20 දිව්‍ය-වාක්‍යස්ථානය
ඉදිරිපිට නියමයේ සැටියට දැල්වීමට පවිත්‍ර රන්
පහන් රුක් ද, ඒවායේ පහන් ද, 21 රනින් එනම්,
ඉතා අනර්ඝ රනින් මල් ද පහන් ද අඬු ද සෑදුවේ ය.
22 පවිත්‍ර රනින් පහන් කතුරු ද තලි ද හැඳි ද ගිනි
කබල් ද සෑදවේවේ ය. මාලිගාවට ඇතුළු වන තැන
එනම්, අතිශුද්ධස්ථානයේ ඇතුළු දොරවල් ද
ගෘහයේ එනම්, මාලිගාවේ දොරවල් ද රනින් විය.
5 2 සාමු 8:11; 1 වංශා 18:11 මසේ සලමොන්
සමිඳාණන් වහන්සේගේ මාලිගාව උදසො කළ
සියලු වැඩ සම්පූර්ණ විය. සලමොන් තමාගේ පිය
දාවිත් විසින් කැප කරනු ලැබ තිබුණු දේවල් එනම්,
රිදී ද රන් ද සියලු භාණ්ඩ ද ඇතුළට ගනෙවුත්
දවේියන් වහන්සේගේ මාලිගාවේ ගබඩාවල ඒවා
තැබී ය.

### ගිවිසුම් කරඬුව දේව මාලිගාවට ගනෙ ඒම
(1 රාජා 8:1-9)

2 2 සාමු 6:12-15; 1 වංශා 15:25-28 එකල
සලමොන් සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
දාවිත්ගේ නුවර වූ සියොන්හි සිට ගනෙන්නේට
ඉශ්‍රායලේවරුන්ගේ ප්‍රජා මූලිකයන් ද
ඉශ්‍රායලේවරුන්ගේ පිය වංශ ගෝත්‍රවල සියලු
ප්‍රධානීන් ද ජරෙුසලමට රැස් කරවී ය. 3 සියලු
ඉශ්‍රායලේ මනුෂ්‍යයෝ ද සත් වන මාසයේ පැවැත්වූ
මංගල්‍යයේ දී රජු වතෙ රැස් වූවෝ ය.
4 ඉශ්‍රායලේවරුන්ගේ සියලු ප්‍රජා මූලිකයන් ආ
කල, ලෙවීවරු ගිවිසුම් කරඬුව උසුලාගනෙ 5 කරඬුව

ද සම්මුඛ මණ්ඩපය ද කූඩාරමෙහි තිබුණු සියලු
ශුද්ධ භාණ්ඩ ද ගෙනෙහ. පූජකයෝත්, ලෙවීවරුත්
ඒවා ගෙනෙහ. 6 සලමොන් රජු හා ඔහු වෙත රැස් ව
සිටි මුළු ඉශ්‍රායෙල් සභාව කියන්න හෝ ගණින්න
හෝ බැරි තරම් බැටළුවන් ද ගවයන් ද පූජා කරමින්
ගිවිසුම් කරඬුව ඉදිරියෙහි සිටියෝ ය. 7 පූජකයෝ
සමිඳාණන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
අතිශුද්ධස්ථානය වන මාලිගාවේ දිව්‍ය-
වාක්‍යස්ථානයට ගෙනෙවුත්, කෙරුබ්වරුන්ගේ පියාපත්
යට ඊට නියම ස්ථානයෙහි තැබුවෝ ය. 8 එසේ
කරඬුව තැබූ ස්ථානයට උඩින් විහිදී තිබුණු
කෙරුබ්වරුන්ගේ පියාපත්වලට කරඬුවත් එහි
පොලුත් වැසී තිබුණේ ය. 9 පොලු දිග බැවින්
පොලුවල කෙළවරවල් ගිවිසුම් කරඬුවෙන් පිට දිව්‍ය-
වාක්‍යස්ථානය ඉදිරියෙහි පෙනුණේ ය. එහෙත්, ඒවා
පිටතට පෙනුණේ නැත. ඒවා අද දක්වා ම එහි
තිබේ. 10 ද්වි.නී. 10:5ඉශ්‍රායෙල්වරුන් මිසරයෙන්
පැමිණි පසු සමිඳාණන් වහන්සේ ඔවුන් සමඟ
ගිවිසුමක් කළ විට, මෝසෙස් හොරෙබ්හි දී එහි
තැබූ ගල්ලෑලි දෙක මිස කරඬුවේ වෙන කිසිවක්
නොතිබුණේ ය.

### දිව්‍ය තේජස ප්‍රකාශ වීම

11 එතැන සිටි සියලු පූජකයෝ කවර පංතියට
අයිති වුව ද පවිත්‍ර වී සිටියෝ ය. 12 ආසාප් ද
හේමන් ද ජෙදූතුන් ද ඔවුන්ගේ පුත්‍රයෝ ද
සහෝදරයෝ ද යන ගායකයන් වූ ලෙවීවරු
සියල්ලෝ ම සිහින් හණ සළු හැඳ, අත්තල් ද වීණා
ද මහා වීණා ද ඇති ව පූජාසනයට පෙරදිගින්
සිටියෝ ය. ඔවුන් සමඟ පූජකයෝ එකසිය
විසිදෙනෙක් නළා පිඹිමින් සිටියෝ ය. 13 1 වංශා
16:34; 2 වංශා 7:3; එස්රා 3:11; ගීතා 100:5; 106:1;
107:1; 116:1; 136:1; ජෙරෙ 33:11නික්ම 40:34-35එවිට
පූජකයන් ශුද්ධස්ථානයේ සිට පිටතට අවුත්,
සමිඳාණන් වහන්සේට ස්තුති ප්‍රශංසා කිරීමට නළා
පිඹින්නන් හා ගීතිකාකාරයන් සියල්ලන් ම එක
ශබ්දයක් ඇසෙන පිණිස එක් කෙනෙකු මෙන් සිට,
නළාවලින් ද අත්තල්වලින් ද වෙනත් තූර්ය
භාණ්ඩවලින් ද “උන් වහන්සේ යහපත් ය. උන්
වහන්සේගේ ස්ථිරසාර ප්‍රේමය සදාකාලයට ම
පවත්නේ ය” කියා සමිඳාණන් වහන්සේට ප්‍රශංසා
කිරීමෙන් ශබ්ද පැවැත්වූ කල, මාලිගාව එනම්,
සමිඳාණන් වහන්සේගේ මාලිගාව වලාපටලයෙන්
පිරී ගියේ ය. 14 ඒ වලාපටලය නිසා සේවය කිරීම
පිණිස පූජකයන්ට එහි සිටින්නට බැරි විය. එසේ
වූයේ, සමිඳාණන් වහන්සේගේ තේජසින් දෙවියන්
වහන්සේගේ මාලිගාව පිරී ගිය බැවිනි.

### දේව මාලිගාව කැප කිරීම

(1 රාජා 8:12-21)

6 එවිට සලමොන් කතා කොට, සමිඳාණන්
වහන්සේ වැඩ විසීමට වලාපටල හා
ඝනාන්ධකාරය තෝරා ගත් සේක. 2 එහෙත්, මම
ඔබට නිවාසයක් ද සදහට ම ඔබට වැඩ සිටීමට
ස්ථානයක් ද ගොඩනැඟුවෙමි”යි කීවේ ය.
3 රජ තෙමේ සෙනඟ දෙසට හැරී මුළු ඉශ්‍රායෙල්
සභාව නැඟිට සිටිය දී මුළු සභාවට ආශීර්වාද
කෙළේ ය. 4 2 සාමු 7:1-13; 1 වංශා 17:1-12ඔහු
කතා කොට, “ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේට ප්‍රශංසා වේ වා! මන්ද, උන් වහන්සේ
ස්වකීය මුඛයෙන් මාගේ පිය වූ දාවිත්ට කතා
කොට, 5 ‘මම මාගේ සෙනඟ මිසර දේශයෙන්
ගෙනා දවසේ පටන් මාගේ නාමය එහි වන පිණිස
මාලිගාවක් ගොඩනඟන්න සියලු ඉශ්‍රායෙල්
ගෝත්‍රවලින් කිසි නුවරක් තෝරා නොගතිමි. මාගේ
සෙනඟ වන ඉශ්‍රායෙල්වරුන්ගේ අධිපතියා ව
සිටින්න කිසි මනුෂ්‍යයෙකු ද තෝරා නොගතිමි.
6 එහෙත්, මාගේ නාමයේ ගෞරවය රක්ෂා කරන
ලෙස ජෙරුසලම ද මාගේ සෙනඟ වන
ඉශ්‍රායෙල්වරුන්ගේ ප්‍රධානියා වන පිණිස දාවිත් ද
තෝරා ගතිමි’යි වදාරා ස්වකීය හස්තයෙන් එය ඉෂ්ට
කළ සේක.
7 “ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේගේ නාමයට මාලිගාවක් ගොඩනඟන්න
මාගේ පිය වූ දාවිත්ගේ සිතේ අදහසක් තිබිණි.
8 එහෙත්, සමිඳාණන් වහන්සේ මාගේ පිය වූ
දාවිත්ට කතා කොට, ‘මාගේ නාමයට මාලිගාවක්
ගොඩනඟන්න නුඹේ සිතේ අදහසක් තිබිණි. එය
හොඳ දෙයකි. 9 එහෙත්, නුඹ ඒ මාලිගාව
ගොඩනොනඟන්නෙහි ය. නුඹට දාව උපදින නුඹේ
පුත්‍රයා මාගේ නාමයට ඒ මාලිගාව
ගොඩනඟන්නේ ය’යි වදාළ සේක.
10 “සමිඳාණන් වහන්සේ තමන් වදාළ වචනය
ඉෂ්ට කර තිබේ. මන්ද, සමිඳාණන් වහන්සේ වදාළ
හැටියට මම මාගේ පිය වූ දාවිත් වෙනුවෙන්
ඉශ්‍රායෙල් සිංහාසනයේ හිඳ, ඉශ්‍රායෙල් දෙවි
සමිඳාණන් වහන්සේගේ නාමයට මාලිගාවක්
ගොඩනැඟුවෙමි. 11 සමිඳාණන් වහන්සේ
ඉශ්‍රායෙල්වරුන් සමඟ කළ ගිවිසුම අඩංගු වූ
කරඬුව එහි තැබුවෙමි”යි කීවේ ය.

### සලමොන් රජුගේ යාච්ඤාව

(1 රාජා 8:22-53)

12 එවිට සලමොන් මුළු ඉශ්‍රායෙල් සභාව
ඉදිරියෙහි සමිඳාණන් වහන්සේගේ පූජාසනය
ඉදිරිපිට සිට තමාගේ අත් විදහාගත්තේ ය.
13 මන්ද, ඔහු මීටර් දෙකෙයි දශම දෙකෙක් දිග ඇති,
මීටර් දෙකෙයි දශම දෙකෙක් පළල ඇති, මීටර් එකයි
දශම තුනක් උස ඇති ලෝකඩ වේදිකාවක් සාදා
මළුව මැද තබා තිබුණේ ය. ඔහු එහි සිටගෙන මුළු
ඉශ්‍රායෙල් සභාව ඉදිරියේ දණ නමා, අහස දෙසට
තම අත් විදහාගෙන මෙසේ යාච්ඤා කෙළේ ය:
14 “ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවි සමිඳුනි, ස්වර්ගයෙහි
වත්, පොළොවෙහි වත් ඔබට සමාන දෙවි කෙනෙක්
නැත. ඔබ වනාහි, ඔබ ඉදිරියෙහි තමන්ගේ මුළු
සිතින් කීකරු වන ඔබේ මෙහෙකරුවන් සමඟ
ගිවිසුමත්, කරුණාවත් පවත්වන සේක. 15 ඔබේ

මහෙකෙරු වූ මාගේ පිය වූ දාවිත්ට ඔබ පොරොන්දු
වූ දේ ඔබ ඔහුට ඉෂ්ට කර දුන් සේක. එසේ ය,
ඔබ ස්වකීය මුඛයනේ එය වදාරා අද දවසේ ස්වකීය
හස්තයනේ එය ඉෂ්ට කළ සේක. 16 1 රාජා
2:4එබැවින්, ඉශ්රායලේවරුන්ගේ දවේ සමිඳුනි, ඔබ
ස්වකීය මහෙකෙරු වූ මාගේ පිය දාවිත්ට කතා
කොට, 'නුඹ මා ඉදිරියහෙි හැසුරුණු පරිදි නුඹේ
දරුවෝ මාගේ ව්යවස්ථාව පිළිපදින හැටියට
තමන්ගේ මාර්ගය ගැන ප්රවේසම් වන්නෝ නම්,
ඉශ්රායලේ සිංහාසනයහෙි හිඳීමට මා ඉදිරියහෙි
නුඹට කනෙකේ නැති ව නොයන්නේ ය'යි ඔබ වදාළ
කාරණා ඔහුට ඉෂ්ට කළ මැනව. 17 එබැවින් දැන්
ඉශ්රායලේවරුන්ගේ දවේ සමිඳුනි, ඔබේ
මහෙකෙරුවා වූ දාවිත්ට ඔබ වදාළ ඔබේ වචනය
ස්ථිර වේ වා!
18 2 වංශා 2:6 "එහතේ, දවේයන් වහන්සේ
සැබැවින් ම මනුෂ්යයන් සමඟ පොළොවේ වැඩ
වසන සේක් ද? ස්වර්ගය ද ස්වර්ගවල ස්වර්ගය ද
ඔබට ඉඩ මදි ය; එසේ නම්, මා විසින් ගොඩනඟන
ලද මේ මාළිගාව ඊටත් වඩා කොපමණ නොසෑහේ
ද! 19 එහතේ, මාගේ දවේ සමිඳුනි, ඔබේ
මහෙකෙරුවාගේ යාච්ඤාව ද කන්නලව්ව ද සලකා,
ඔබ ඉදිරියහෙි ඔබේ මහෙකෙරුවා ඔප්පු කරන
ඉල්ලීම ද යාච්ඤාව ද ඇසුව මැනව. 20 ද්වි.නී.
12:11ඔබ යම් ස්ථානයක් ගැන, 'මාගේ නාමය එහි
තබන්නමේ'යි වදාළ සේක් ද, ඒ ස්ථානය වන මේ
මාළිගාව දසෙ ඔබේ ඇස් දිවා රෑ දකේහි යොමු වී
තිබේ වා! ඔබේ මහෙකෙරුවා මේ ස්ථානය දසෙට
හැරී ඔප්පු කරන යාච්ඤාව ඇසුව මැනව. 21 ඔබේ
මහෙකෙරුවා ද ඔබේ සනෙඟ ද වන
ඉශ්රායලේවරුන් ද මේ ස්ථානය දසෙට හැරී ඔප්පු
කරන ඔවුන්ගේ කන්නලව්වට කන් දුන මැනව.
එසේ ය, ඔබේ වාසස්ථානය වන ස්වර්ගයේ සිට
ඇසුව මැනව; අසා කමා කළ මැනව.
22 "යමකෙු තමාගේ අසල්වැසියාට විරුද්ධ ව වරද
කොට, ඔහු දිවුරවන පිණිස දිවුරුමක් ඔහු පිට තබන
ලදුව, ඔහු අවුත් මේ ගෘහයේ ඔබේ පූජාසනය
ඉදිරිපිට දිවුළහොත්, 23 ඔබ ස්වර්ගයහෙි සිට එය
අසා වදාරමින් ක්රියා කළ මැනව; ඔබේ
මහෙකෙරුවන් විනිශ්චය කළ මැනව; වරදකරු හට
ඔහුට නිසි විපාකය අනුව දඬුවම් කළ මැනව;
නිවැරැදිකරු හට ඔහුගේ නිදොස්කම අනුව විපාක
දුන මැනව.
24 "ඔබේ සනෙඟ වන ඉශ්රායලේවරුන් ඔබට
විරුද්ධ ව පව් කළ බැවින් සතුරා ඉදිරියහෙි ඔවුන්
පරාජය වූ කල, ඔව්හු ඔබ වතෙ හැරී ඔබේ නාමය
ප්රකාශ කර මේ මාළිගාවහෙි දී ඔබට යාච්ඤා
කොට කන්නලව් කරන්නෝ නම්, 25 ඔබ
ස්වර්ගයහෙි සිට එය අසා, ඔබේ සනෙඟ වන
ඉශ්රායලේවරුන්ගේ පාපය කමා කොට, ඔවුන්ටත්,
ඔවුන්ගේ පියවරුන්ටත් ඔබ දුන් දේශයට ඔවුන්
නැවත පැමිණවෙුව මැනව.
26 "ඔවුන් ඔබට විරුද්ධ ව පව් කළ බැවින්, අහස
පිය වී වර්ෂාව නැති ව ගොස්, ඔබ ඔවුන්ට මසෙේ
දඬුවම් කරන කල, ඔව්හු මේ ස්ථානය දසෙට හැරී
යාච්ඤා කොට, ඔබේ නාමය ප්රකාශ කර,
තමන්ගේ පාපය අත්හරින්නෝ නම්, ඔබ
ස්වර්ගයහෙි සිට අසා, 27 ඔවුන් යා යුතු යහපත්
මාර්ගය ඔවුන්ට පනේනා දුන් කල, ඔබේ
මහෙකෙරුවන් හා ඔබේ සනෙඟ වන
ඉශ්රායලේවරුන්ගේ පාපයට කමා වී, උරුමයක්
කොට ඔබේ සනෙඟට ඔබ දී තිබනෙ දේශයට
වර්ෂාව එවුව මැනව.
28 "දේශයට සාගතයක් නොහොත් වසංගතයක්
පැමිණියොත්, වැසි නැත්නම්, ගොයම් වියළී යාම
හෝ ගොයම් රෝගය, පළඟැටියන් හෝ දළඹුවන්
හෝ පැමිණීම සිදු වුවහොත්, ඔවුන්ගේ දේශයේ
නගර ඔවුන්ගේ සතුරන් විසින් ඔවුන් වටලාගනු
ලබන්න හෝ යම්කිසි පීඩාවක් හෝ රෝගයක් හෝ
පමුණුවනු ලබන්න යදෙුණොත්, 29 කොයි
මනුෂ්යයකෙු විසින් හෝ ඔබේ මුළු සනෙඟ වන
ඉශ්රායලේ විසින් හෝ තම තමන්ගේ සිත්වල
සෝදුකින් මේ මාළිගාව දසෙට තමන්ගේ අත්
විදහාගනෙ යම් යාච්ඤාවක් හෝ කන්නලව්වක් හෝ
ඔප්පු කරනු ලැබුවහොත්, 30 ඔබේ වාසස්ථානය
වන ස්වර්ගයහෙි සිට ඒවා අසා කමා වුව මැනව:
සෑම මනුෂ්යයකෙුගේ ම සිත් ඔබ පමණක් දන්න
සේක. ඔබ එකිනකොට සුදුසු පරිදි ඒවා ඉෂ්ට කර
දුන මැනව. 31 එවිට ඔබ අපේ පියවරුන්ට දුන් භූමිය
මතු පිට ඔවුන් ජීවත් වන මුළු කාලයේ දී ඔව්හු ඔබ
කරෙහෙි බිය වී ඔබේ මාර්ගවල ගමන් කරන්නෝ
ය.
32 "තවද, ඔබේ සනෙඟ වන ඉශ්රායලේ
ජාතිකයකෙු නොවන විදේශිකයකෙු ඔබේ උතුම්
නාමයත්, ප්රබල බාහුවත්, දිගු කළ හස්තයත් නිසා,
දුර රටක සිට අවුත් මේ මාළිගාව දසෙට හැරී
යාච්ඤා කළොත්, 33 ඔබේ සනෙඟ වන
ඉශ්රායලේවරුන් මනේ පොළොවේ සියලු සනෙඟ ද
ඔබේ නාමය හැඳිනගනෙ ඔබ කරෙහෙි ගරුබිය
දක්වන පිණිසත්, මා විසින් ගොඩනඟන ලද මේ
මාළිගාවට ඔබේ නාමය තබා තිබනෙ බව
දැනගන්න පිණිසත් ඔබේ වාසස්ථානය වන
ස්වර්ගයේ සිට අසා, විදේශිකයා ඔබනේ ඉල්ලන
සියල්ල ලසෙ ඔහුට ඉටු කළ මැනව.
34 "ඔබේ සනෙඟ තමන්ගේ සතුරන්ට විරුද්ධ ව
යුද්ධ කරන්න ඔබ විසින් යවනු ලබන යම්
මාර්ගයකින් ගොස්, ඔබ තෝරාගත් නුවර ද ඔබේ
නාමයට මා විසින් ගොඩනඟන ලද මාළිගාව ද
දසෙට හැරී ඔබට යාච්ඤා කරන්නෝ නම්, 35 ඔබ
ස්වර්ගයේ සිට ඔවුන්ගේ යාච්ඤාව ද කන්නලව්ව ද
අසා ඔවුන්ට යුක්තිය ඉටු කළ මැනව.
36 "තවද, පව් නොකරන කනෙකෙු නැති බැවින්
ඔවුන් ඔබට විරුද්ධ ව පව් කළොත්, ඔබ ඔවුන්
කරෙහෙි උදහස් වී ඔවුන්ගේ සතුරන්ට ඔවුන් පාවා
දී ඔවුන් වහල්කමට ගන්න අය විසින් දුර හෝ ළඟ
හෝ තිබනෙ දේශයකට ඔවුන් ගනෙයනු ලැබූ පසු,

37 ඔවුන් වහලුන් කොට ගෙනයනු ලැබූ දේශයෙහි දී
ඔවුන් එය සිතට ගෙන පසුතැවී සිත් හරවා ගෙන
එම දේශයේ දී ඔබට කන්නලව් කර, 'අපි පව්
කළෙමු; අපි හිතුවක්කාරකම් කොට දුෂ්ට ලෙස
ක්‍රියා කළෙමු'යි කියමින්, 38 ඔවුන් වහල්කමට
ගෙන ගිය අයගේ දේශයෙහි දී ඔවුන්ගේ මුළු
හෘදයෙන් ද මුළු ආත්මයෙන් ද ඔබ දෙසට හැරී, ඔබ
ඔවුන්ගේ පියවරුන්ට දුන් ඔවුන්ගේ දේශය ද ඔබ
තෝරාගත් නුවර ද ඔබේ නාමයට මා විසින්
ගොඩනඟන ලද මාලිගාව ද දෙසට හැරී ඔව්හු
යාච්ඤා කරන්නෝ නම්, 39 ඔබේ වාසස්ථානය වන
ස්වර්ගයේ සිට ඔබ ඔවුන්ගේ යාච්ඤාව ද
කන්නලව්ව ද අසා ඔවුන්ට යුක්තිය ඉටු කළ මැනව,
ඔබට විරුද්ධ ව පව් කළ ඔබේ සෙනඟට කමා වුව
මැනව.
40 "දැන්, මාගේ දෙවියන් වහන්ස, මේ ස්ථානයෙහි
දී කරන යාච්ඤාවට ඔබේ ඇස් ඇරී, ඔබේ කන්
යොමු වී තිබේ වා! 41 ගීතා 132:8-10ඉතින්, දෙවී
සමිඳුනි, ඔබ නැඟිට ඔබේ බලයේ සංකේතය වන
ගිවිසුම් කරඬුව සමඟ ඔබේ නිවාසයට වැඩිය
මැනව. දෙවී සමිඳුනි, ඔබේ පූජකයෝ ගැළවීමේ
සළුව පැළඳගෙන සිටිත් වා! ඔබේ සැදැහැවත්හු ද
යස ඉසුරින් ප්‍රීති වෙත් වා! 42 දෙවී සමිඳුනි, ඔබේ
අභිෂේක ලත් තැනැත්තා වෙතින් අහකට
නොහැරනු මැනව. ඔබේ මෙහෙකරු වූ දාවිත්ට ඔබ
දැක්වූ කරුණාව ප්‍රසාදයෙන් සිහි කළ මැනව."

### දේව මාලිගාව කැප කිරීම

(1 රාජා 8:62-66)

7 ලෙවී 9:23-24 සලමොන් යාච්ඤා කර නිම
කළ විට අහසින් ගිනි බැස අවුත් දවන යාග
පූජාව ද යාගයන් ද දවාදැමී ය. සමිඳාණන්
වහන්සේගේ තේජාලංකාරයෙන් මාලිගාව පිරී ගියේ
ය. 2 සමිඳාණන් වහන්සේගේ තේජාලංකාරයෙන්
උන් වහන්සේගේ මාලිගාව පිරී තිබුණු නිසා
පූජකයන්ට ඒ මාලිගාවට ඇතුල් වන්න බැරි විය. 3 1
වංශා 16:34; 2 වංශා 5:13; එස්රා 3:11; ගීතා 100:5;
106:1; 107:1; 118:1; 136:1; ජෙරෙ 33:11 සියලු
ඉශ්‍රායලේවරු ගිනි බසිනවාත් සමිඳාණන්
වහන්සේගේ තේජාලංකාරය මාලිගාව පිට
තිබෙනවාත් දැක, ගල් ඇල්ලූ බිමට තමන්ගේ හිස්
නමා නමස්කාර කොට, "උන් වහන්සේ යහපත් ය;
උන් වහන්සේගේ කරුණාව සදහට පවත්නේ ය"යි
කියමින් සමිඳාණන් වහන්සේට ස්තුති කළෝ ය.
4 ඉන්පසු ව රජ ද මුළු සෙනඟ ද සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි පූජා ඔප්පු කළහ. 5 සලමොන්
රජ ගවයන් විසිදෙදහසක් ද බැටළුවන් එක්ලක්ෂ
විසිදහසක් ද ඔප්පු කළේ ය. මෙසේ රජ ද මුළු
සෙනඟ ද දෙවියන් වහන්සේගේ මාලිගාව කැප
කළහ. 6 පූජකයෝ ද තම තමන්ගේ තනතුරුවල
යෙදී සිටියහ. ලෙවීවරුත් සමිඳාණන් වහන්සේගේ
තූර්ය භාණ්ඩ රැගෙන සිටියෝ ය. ඔව්හු දාවිත් රචිත
ගී ගයමින්, "සමිඳාණන් වහන්සේගේ කරුණාව
සදහට ම පවත්නේ ය"යි කියමින් උන් වහන්සේට
ප්‍රශංසා කළහ. උන් වහන්සේට ස්තුති කිරීමට
දාවිත් විසින් ඒවා රචනා කරනු ලැබ තිබිණි.
පූජකයෝ ද ඔවුන් ඉදිරිපිටින් සිටගෙන නළා පිම්බෝ
ය; සියලු ඉශ්‍රායලේවරු ද නැඟිට සිටියහ.
7 තවද, සලමොන් සමිඳාණන් වහන්සේගේ
මාලිගාව ඉදිරිපිට තිබුණු මිදුලේ මැදහාගය විශුද්ධ
කළේ ය. මන්ද, ඔහු දවන යාග පූජා ද
සහභාගිකමේ පූජාවල තෙල ද එහි ඔප්පු කළ
බැවිනි. එසේ කළේ, සලමොන් සෑදූ ලෝකඩ
පූජාසනය දවන යාග පූජාව ද ආහාර පූජාව ද තෙල
ද තැබීමට ප්‍රමාණවත් නොවූ නිසා ය.
8 මෙසේ ඒ කාලයේ දී සලමොන් ද ඔහු සමඟ
සියලු ඉශ්‍රායලේවරු ද හමාත්ට ඇතුළු වන තැන
පටන් මිසරයේ ඔය දක්වා සිට පැමිණි ඉතා විශාල
සමූහයක් ද මංගල්‍යය පැවැත්වූ හ. 9 අට වන දා
ඔව්හු මංගල්‍ය රැස්වීමක් පැවැත්වූ හ. මන්ද, ඔවුන්
සත් දවසක් පූජාසනය කැප කිරීම ද සත් දවසක්
මංගල්‍යය ද පැවැත්වූ බැවිනි. 10 සත් වන මාසයේ
විසිතුන් වන දා ඔහු සෙනඟ තම තමන්ගේ
කූඩාරම්වලට යන්නට හැරියේ ය. ඔව්හු ද
සමිඳාණන් වහන්සේ දාවිත්ටත්, සලමොන්ටත්,
තමන්ගේ සෙනඟ වන ඉශ්‍රායලේවරුන්ටත් කළ
යහපත ගැන ප්‍රීති සන්තෝෂ වමින් යන්න ගියෝ
ය.

### දෙවියන් වහන්සේ සලමොන් රජුට යළි දර්ශනය වීම

(1 රාජා 9:1-9)

11 මෙසේ සලමොන් සමිඳාණන් වහන්සේගේ
මාලිගාව ද රජ මැඳුර ද සාදා නිම කළේ ය. උන්
වහන්සේගේ මාලිගාවෙහිත්, තමාගේ ම රජ
මැඳුරෙහිත් කරන්න අදහස් කළ සියල්ල සලමොන්
ඉෂ්ට කළේ ය. 12 එවිට සමිඳාණන් වහන්සේ
රාත්‍රියේ සලමොන්ට දර්ශනය වී මෙසේ වදාළ
සේක: "මම නුඹේ යාච්ඤාව අසා මේ ස්ථානය මට
පූජාසනයක් කොට තෝරාගතිමි. 13 වැසි නොවෙසින
ලෙස මම අහස වසාලන්නෙමේ නම්, නොහොත් රට
පාළු කිරීමට පළඟැටියන්ට අණ කරන්නෙමේ නම්,
නොහොත් මාගේ සෙනඟ අතරට වසංගතය
එවන්නෙමේ නම්, 14 මාගේ නාමය දරන මාගේ
සෙනඟ බැගෑපත් වී, යාච්ඤා කර, මා සොයා
තමන්ගේ නපුරු මාර්ග අත්හැරියොත්, මම
ස්වර්ගයේ සිට එය අසා, ඔවුන්ගේ පව් කමා කොට
ඔවුන්ගේ දේශයට සෙත සලසන්නෙමි. 15 දැන් ද
මින් ඉදිරියට ද මේ ස්ථානයේ දී කරන යාච්ඤාවට
මාගේ ඇස් ඇර, මාගේ කන් යොමු කරනු ලැබේ.
16 දැන් ද ඉදිරියට ද මාගේ නාමය මේ මාලිගාවෙහි
සදහට ම තිබෙන පිණිස මෙය තෝරාගෙන විශුද්ධ
කළෙමි. මාගේ නෙත් ද මාගේ සිත ද නිතර ම
මෙතැනට යොමු වී තිබෙන්නේ ය. 17 ඉතින්, නුඹේ
පිය දාවිත් හැසුරුණ පරිදි නුඹ මා ඉදිරියෙහි
හැසිරෙමින්, මා විසින් නුඹට අණ කරන ලද සියල්ල
කරමින්, මාගේ පණත් ද විනිශ්චයයන් ද
පිළිපදින්නෙහි නම්, 18 1 රාජා 2:4ඉශ්‍රායලෙහි
ආණ්ඩුකාරයෙකු වීමට නුඹෙන් කෙනෙකේ නැති ව

නොයන්නේ ය කියා මා නුඹේ පිය දාවිත්ට
පොරොන්දු වූ ලෙසෙ නුඹේ රාජ්‍යයේ සිංහාසනය
ස්ථිර කරන්නෙමි. 19 එහෙත්, නුඹලා මා වෙතින්
ඉවත් ව ගොස්, මා නුඹලා ඉදිරියෙහි තබා තිබෙන
මාගේ පණත් ද ආඥා ද අත්හැර ගොස්, වෙනෙ
දෙවිවරුන්ට වැඳුම්පිදුම් කර ඔවුන්ට නමස්කාර
කරන්නහු නම්, 20 මා ඔවුන්ට දී තිබෙන මාගේ
දේශයෙන් මම ඔවුන් සහමුලින් ම පහකරන්නෙමි.
මාගේ නාමයට මා විශුද්ධ කළ මේ මාලිගාව මාගේ
ඇස් හමුයෙන් පහකර දමන්නෙමි. එය සියලු ජාතීන්
අතරේ විහිළුවක් ද උපහාසයක් ද නටබුන් ගොඩක්
ද වනු ඇත.
21 “මේ මාලිගාව ළඟින් යන සියල්ලෝ විස්මයට
පත් ව, ‘සමිඳාණන් වහන්සේ මේ දේශයටත්, මේ
මාලිගාවටත් කුමක් නිසා මෙසේ කළ සේක් දැ’යි
අසන්නෝ ය. 22 එවිට මනුෂ්‍යයන් කතා කොට,
‘ඔවුන් මිසර දේශයෙන් ගෙනෙ ආ ඔවුන්ගේ
පියවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ අත්හැර, අන්
දෙවිවරුන්ට ඇළුම් ව, ඔවුන්ට නමස්කාර කොට
වැඳුම්පිදුම් කළ නිසා, උන් වහන්සේ මේ සියලු
විපත්ති ඔවුන් පිට පැමිණෙවූ සේකැ’යි කියනු ඇත.”

### සලමොන් රජුගේ වීර ක්‍රියා

(1 රාජා 9:10-28)

8 සලමොන් රජ සමිඳාණන් වහන්සේගේ
මාලිගාව ද තමාගේ රජ මැදුර ද
ගොඩනැඟීමට ගත කළ විසි අවුරුද්දට පසු, 2 හූරාම්
විසින් සලමොන්ට දෙනෙ ලද නගර ඔහු ගොඩනඟා
ඒවායේ ඉශ්රායලේවරුන් වාසය කරවී ය.
3 සලමොන් හමාත්-ශෝබාට ගොස් එය යටත් කර
ගත්තේ ය. 4 ඔහු පාළුකරයෙහි තද්මෝර් ද
හමාත්හි ගොඩනැඟුවා වූ ගබඩා-නගර සියල්ල ද
ඉදි කළේ ය. 5 එසේ ම ඉහළ බෙත්-හෝරොන් ද
පහළ බෙත්-හෝරොන් ද යන පවුරු, දොරටු හා අගුල්
ඇති බලකොටු සහිත නගර ද 6 බාලාත් නගරය ද
සලමොන්ට තිබුණ සියලු ගබඩා-නගර ද තමාගේ
රථවලට සියලු නගර ද තමාගේ අසරුවන්ට නගර ද
තමාගේ සතුට පිණිස ඉදි කරන්න කැමැති වූ
සියල්ල ද ජෙරුසලමෙහිත්, ලෙබනොන්හිත්, තමාගේ
ආණ්ඩුවට අයත් මුළු දේශයෙහිත් ගොඩනැඟුවේ ය.
7 ඉශ්රායලේවරුන්ගෙන් නොවූ, ඉශ්රායලේවරුන්
විනාශ නොකළ හිත්තීවරුන්ගෙන් ද
අමෝරිවරුන්ගෙන් ද පෙරිස්සිවරුන්ගෙන් ද,
8 හිව්වරුන්ගෙන් ද ජෙබුසිවරුන්ගෙන් ද ඉතිරි ව සිටි
ඔවුන්ගේ පුත්‍රයන් සලමොන් අද දවස දක්වා
රාජකාරියට ගත්තේ ය. 9 එහෙත්, සලමොන්
ඉශ්රායලේවරුන්ගෙන් කිසිවකු තමාගේ වැඩට
දාසයකු කොට පත් නොකළේ ය. ඔව්හු වනාහි
යුද්ධ භටයන් ව ඔහුගේ අධිපතියන් ව, ඔහුගේ
රථාධිපතියන් ව, ඔහුගේ අසරුවන් ව සිටියෝ ය.
10 සනෙඟ ආණ්ඩු කළා වූ ප්‍රධාන නිලධාරීහු දෙසිය
පණස්දෙනෙකුත් සලමොන් රජුට සිටියෝ ය.
11 සලමොන් වනාහි පාරාවෝගේ දුව දාවිත්ගේ
නුවරින් කැඳවාගෙන විත්, ඇය සඳහා ගොඩනැඟුවා
වූ මාලිගාවට ඇය ගෙනොවේ ය. මන්ද, “සමිඳාණන්
වහන්සේගේ ගිවිසුම් කරඬුව පැමිණි ස්ථාන ශුද්ධ
බැවින් මාගේ භාර්යාවක ඉශ්රායලේ රජ වූ
දාවිත්ගේ මාලිගාවෙහි නොවිසිය යුතු ය”යි ඔහු
කීවේ ය.
12 එකල සලමොන් ද්වාර මණ්ඩපය ඉදිරිපිට තමා
ගොඩනඟා තිබූ සමිඳාණන් වහන්සේගේ පූජාසනය
පිට උන් වහන්සේට දවන යාග පූජා ඔප්පු කළේ
ය. 13 නික්ම 23:14-17; 34:22-23; ගණන් 28:9-15;
28:16—29:39; ද්වි.නී. 16:16සබත් දවස්වල දී ද
අමාවක්වල දී ද නියම මංගල්‍යවල දී ද අවුරුද්දට
තුන් වතාවක් පවත්වන මුහුන් නැති රොටි
මංගල්‍යයේ දී ද සති මංගල්‍යයේ දී ද කූඩාරම්
මංගල්‍යයේ දී ද මෝසෙස්ගේ ආඥාවේ හැටියට
එක එක දවසට සුදුසු ලෙසෙ ඔහු පූජා ඔප්පු කළේ
ය. 14 තවද, ඔහු තමාගේ පිය වූ දාවිත්ගේ
නියෝගය ලෙසෙ පූජක පන්ති ඔවුන්ගේ සේවයට ද
ලෙවීවරුන් එක එක දවසට සුදුසු ලෙසෙ පූජකයන්
ඉදිරියෙහි සේවය කිරීමත්, ප්‍රශංසා කිරීමත් යන
ඔවුන්ට භාර වූ වැඩට ද දොරටු පාලකයන්
ඔවුන්ගේ පන්තිවල හැටියට එක එක දොරටුවට ද
නියම කළේ ය. මන්ද, දෙවියන් වහන්සේට කැප
මනුෂ්‍යයා වූ දාවිත් මෙසේ අණ කර තිබූ බැවිනි.
15 කොයි කාරණයක් ගැන වත්, අගනා වස්තු ගැන
වත් පූජකයන්ට සහ ලෙවීවරුන්ට රජු දුන් ආඥාවෙන්
ඔව්හු ඉවත් නො වූ හ.
16 සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ අත්තිවාරම
දැමූ දවස දක්වාත්, එය නිම වන තුරුත්
සලමොන්ගේ සියලු වැඩ සූදානම් ව තිබුණේ ය.
මෙසේ සමිඳාණන් වහන්සේගේ මාලිගාව සම්පූර්ණ
විය.
17 එකල සලමොන් ඒදොම් දේශයේ මුහුදුබඩ
තිබෙන එශියොන්-ගෙබෙර් සහ ඒලෝත් යන
නගරවලට ගියේ ය. 18 හූරාම් තමාගේ
සේවකයන්ගේ මෙහෙයීම යටතේ නැව් ද මුහුදේ
තතු දන්න සේවකයන් ද ඔහු වෙත එවුවේ ය.
ඔව්හු සලමොන්ගේ සේවකයන් සමඟ ඔෆීර්
දේශයට ගොස් එතැනින් රන් කිලෝග්‍රෑම්
පසළොස්දහසක් සලමොන් රජු වෙත ගෙනොවෝ ය.

### ෂෙබොහි රැජිනගේ පැමිණීම

(1 රාජා 10:1-13)

9 මතෙ 12:42; ලූක් 11:31 ෂෙබොහි රැජින
සලමොන්ගේ කීර්තිය අසා, ගැටලු
ප්‍රශ්නවලින් ඔහු පිරික්සන පිණිස ඉතා විශාල
පිරිවරක් ද සුවඳ ද්‍රව්‍ය සහ රන් මහා රාශියකුත්,
මැණික් ගලුත් පටවන ලද ඔටුවන් ද ඇති ව
ජෙරුසලමට ආවා ය. ඈ සලමොන් වෙත පැමිණ
ඇගේ සිතේ තිබුණු සියල්ල ගැන ඔහු සමඟ කතා
කළා ය. 2 සලමොන් ද ඇගේ සියලු ප්‍රශ්න ඈට
විසඳා දුන්නේ ය. ඈට තෝරා දිය නොහැකි කිසි
ප්‍රශ්නයක් රජුට නො වී ය. 3 සලමොන්ගේ ප්‍රඥා

මහිමය ද ඔහු විසින් ගොඩනඟන ලද මාලිගාව ද
ඔහුගේ මේසයේ කෑම ද, 4 ඔහුගේ
මෙහෙකරුවන්ගේ වාසස්ථාන හා ඔහුගේ
ඇමතියන්ගේ සේවය ද ඔවුන්ගේ ඇඳුම් ද ඔහුගේ
පානපාත්‍ර දරන්නන් හා ඔවුන්ගේ ඇඳුම් ද ඔහු
සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ ඔප්පු කළ දවන
යාග පූජා ද දුටු කල ෂෙබොහි බිසව තුෂ්ණිම්භූත
වූවා ය.
5 ඈ රජුට කතා කොට, "මාගේ දේශයේ දී මා
ඔබේ ප්‍රඥා මහිමය ද ඔබ ද ගැන ඇසූ
ප්‍රවෘත්තිය සැබෑ ය. 6 එසේ වී නමුත්, මා අවුත්
මාගේ ම ඇස්වලින් දකින තුරු ඔවුන්ගේ වචන
විශ්වාස නොකළෙමි. ඔබේ ප්‍රඥා මහිමයේ
විශාලත්වයෙන් අර්ධයක් වත් මට නොකියන ලද්දේ
ය. මා ඇසූ කීර්තියේ පමණටත් වඩා ඔබ උසස් ව
සිටින්නෙහි ය. 7 ඔබේ භාර්යාවෝ වාසනාවන්තියෝ
ය. ඔබ ඉදිරියෙහි නිතර ම සිට ඔබේ ප්‍රඥාව අසන
ඔබේ මේ මෙහෙකරුවෝ වාසනාවන්තයෝ ය.
8 ඉශ්‍රායලේවරුන්ගේ සිංහාසනයට ඔබ පත් කරන
පිණිස ඔබ කෙරෙහි ප්‍රසන්න වූ ඔබේ දෙවි
සමිඳාණන් වහන්සේට ප්‍රශංසා වේ වා! ඔබේ
දෙවියන් වහන්සේ ඉශ්‍රායලේවරුන්ට ප්‍රේම කළ
බැවින්, ඔවුන් සදහට ම ස්ථිර කරන පිණිස ඔවුන්ට
විනිශ්චයත්, යුක්තියත් ඉෂ්ට කරන්න උන්
වහන්සේගේ නාමයෙන් ඔබ ඔවුන්ගේ රජ කොට
පත් කළ සේකැ"යි කීවා ය.
9 තවද, ෂෙබොහි රැජින රන් කිලෝග්‍රෑම්
භාරදහසක් පමණ ද සුගන්ධ ද්‍රව්‍ය මහා රාශියක් ද
මැණික් ගල් ද රජුට දුන්නා ය. ෂෙබොහි රැජින
සලමොන් රජුට දුන් සුගන්ධ ද්‍රව්‍යවලට සමාන ඒවා
තවත් නොලැබුණේ ය.
10 ඕපීර් සිට රන් ගෙනෙ හූරාම්ගේ සේවකයෝ ද
සලමොන්ගේ සේවකයෝ ද හඳුන් ලී සහ මැණික්
ගල් ගෙනාවෝ ය. 11 රජ ඒ හඳුන් ලීවලින්
සමිඳාණන් වහන්සේගේ මාලිගාවෙහිත්, රජ
මැදුරෙහිත් පඩිපෙළෙවල් ද ගායකයන්ට වීණා සහ
කුඩා වීණා ද සෑදවේවේ ය. ඊට කලින් එබඳු ඒවා
ජුදා දේශයේ නොදක්නා ලදී.
12 ෂෙබොහි රැජින සලමොන් රජුට ගෙනෙ දේවල්
වෙනුවට දුන් ඒවා හැර, ඈ සිතූපැතූ සියල්ලත්
රජතුමා ඈට දුන්නේ ය. ඉන්පසු ඈගේ
සේවකයෝත්, ඈත් හැරී තමන්ගේ දේශයට යන්නට
ගියෝ ය.

### සලමොන් රජුගේ යස ඉසුරු

(1 රාජා 10:14-29)

13 සලමොන් රජුට ව්‍යාපාරික වෙළෙන්දන්ගෙන් ද
වෙනත් වෙළෙන්දන්ගෙන් ද ලැබුණු රත්‍රන් හැර,
අවුරුද්දකට ලැබුණු රත්‍රන්වල බර කිලෝග්‍රෑම්
විසිතුන්දහසක් පමණ වේ. 14 අරාබියේ සියලු
රජවරු ද දේශයේ ආණ්ඩුකාරයෝ ද සලමොන්ට
රන් රිදී ගෙනාවෝ ය. 15 සලමොන් රජ තැළූ රනින්
පලිස් දෙසියයක් සෑදී ය. එක එක පලිහක තැළූ රන්
කිලෝග්‍රෑම් සතක් විය. 16 ඔහු කුඩා පලිස්
තුන්සියයක් ද තැළූ රනින් සෑදුවේ ය. එක එක කුඩා
පලිහක රන් කිලෝග්‍රෑම් තුනක් විය. රජ
ලබෙනොන් ආරණ්‍ය ශාලාවෙහි ඒවා තැබී ය.
17 තවද, රජ ඇත් දත්වලින් විශාල සිංහාසනයක්
සාදා තනිකර රනින් එය ආලේප කළේ ය.
18 සිංහාසනයට සවි කළ පඩි හයක් ද රන් පා
පුටුවක් ද ආසනයේ දෙපැත්තෙහි අත් දඬු ළඟ සිංහ
රූප දෙකෙක් ද තිබිණි. 19 පඩිවල පිට දෙපැත්තේ
සිංහ රූප දොළොසක් ද විය. කිනම් රාජ්‍යයකට වත්
එයාකාර සිංහාසනයක් නො වී ය.
20 සලමොන් රජුගේ පාන පාත්‍ර සියල්ල ම රනින්
විය. ලබෙනොන් ආරණ්‍ය ශාලාවෙහි සියලු භාජනත්
තනිකර රනින් විය. සලමොන්ගේ කාලයේ දී රිදී
අගය නොකරන ලදී. 21 මන්ද, හූරාම්ගේ
සේවකයන් සමඟ තර්ෂිෂ්ට යන නැව් රජුට තිබිණි.
ඒ තර්ෂිෂ් නැව්වලින් රන් ද රිදී ද ඇත් දත් ද වඳුරන්
ද රිළවුන් ද තුන් අවුරුද්දකට වරක් ගෙනෙනෙ ලද
බැවිනි.
22 මෙසේ සලමොන් රජ ධන සම්පතින් ද
ප්‍රඥාවෙන් ද මිහි පිට සියලු රජවරුන්ට වඩා
ශ්‍රේෂ්ඨ ව සිටියේ ය. 23 දෙවියන් වහන්සේ
සලමොන්ගේ සිතේ නිදන් කර තිබූ ප්‍රඥාව අසන
පිණිස මිහි පිට සියලු රජවරු ඔහු වෙත පැමිණියහ.
24 ඔව්හු අවුරුද්දෙන් අවුරුද්ද තම තමන්ගේ තෑගි
වන රිදී භාජන ද රන් භාජන ද වස්ත්‍ර ද යුද්ධායුධ
ද සුගන්ධ ද්‍රව්‍ය ද අශ්වයන් ද කොටළුවන් ද නියම
ගණනක් ගෙනාවෝ ය.
25 1 රාජා 4:26 සලමොන් රජුට අශ්වයන් සහ රථ
සඳහා ගාල් භාරදහසක් තිබිණි. අසරුවෝ
දොළොස්දහසකුත් සිටියෝ ය. රජ ඒවා රථ
නවත්වන නගරවල ද තමා ළඟ ජෙරුසලමෙහි ද
තැබුවේ ය. 26 උත් 15:18; 1 රාජා 4:21ඔහු යුප්‍රටීස්
ගංගාවේ පටන් පිලිස්තිවරුන්ගේ දේශය සහ
මිසරයේ සීමාව දක්වා සිටි සියලු රජවරුන් පාලනය
කළේ ය. 27 තවද, රජ ජෙරුසලමෙහි රිදී ගල් මෙන්
ද, කිහිරි ලී පහත රටේ තිබෙන අත්තික්කා ගස්
මෙන් ද ගණනින් වැඩිවන්නට සැලැස්සුවේ ය.
28 ද්වි.නී. 17:16මිසරයෙනුත්, සියලු දේශවලිනුත්
සලමොන් වෙත අශ්වයෝ ගෙනෙනෙ ලදහ.

### සලමොන් රජුගේ අභාවය

(1 රාජා 11:41-43)

29 සලමොන් රජුගේ සෙසු ක්‍රියා මුල පටන් අග
දක්වා, දිවැසිවර නාතාන්ගේ ඉතිහාසයේ ද
ෂිලෝනීය අහියාගේ දිවැස් වැකියේ ද නබොත්ගේ
පුත් ජෙරොබෝවම් ගැන දිවැස් ඇත්තා වන ඉද්දෝ
ලියූ දර්ශන ග්‍රන්ථයේ ද ලියා තිබෙනු නොවේ ද?
30 සලමොන් මුළු ඉශ්‍රායලේ ජාතිය හතළිස්
අවුරුද්දක් ජෙරුසලමෙහි පාලනය කළේ ය.
31 සලමොන් මියගොස් තමාගේ පිය වූ දාවිත්ගේ
නුවර තැන්පත් කරනු ලැබී ය. ඔහුගේ පුත්
රෙහොබෝවම් ඔහු වෙනුවට රජ විය.

### ගෝත්‍ර දසය කැරලි ගැසීම
(1 රාජා 12:1-20)

10 තවද, රෙහොබෝවම් ෂකෙමේ නුවරට
ගියේ ය. මන්ද, ඔහු රජකමට පත් කරන
පිණිස සියලු ඉශ්‍රායලේවරුන් ෂකෙමේ නුවරට
පැමිණ සිටි බැවිනි. 2 සලමොන් රජු ඉදිරියෙන් පලා
ගොස් සිටි නබොත්ගේ පුත් ජෙරොබෝවම්
මිසරයේ දී ඒ බව අසා මිසරයෙන් හැරී ආයේ ය.
3 ඔව්හු පණිවුඩයක් යවා ඔහු ගෙන්වාගත්හ. එවිට
ජෙරොබෝවම් ද සියලු ඉශ්‍රායලේවරු ද අවුත්
රෙහොබෝවම්ට කතා කොට, 4 "ඔබ පියාණෝ
අපේ වියගහ බර කළහ. ඒ නිසා ඔබේ
පියාණන්ගේ අමාරු සේවය ද ඔහු අප පිට තැබූ
ඔහුගේ බර වියගහ ද සැහැල්ලු කළ මැනව. එවිට
අපි ඔබට සේවය කරන්නමෝ"යි කීවෝ ය.
5 ඔහු උත්තර දෙමින්, "ඔබ තුන් දවසකින් නැවත
මා ළඟට එන්නැ"යි ඔවුන්ට කීවේ ය. සෙනඟ ද
යන්න ගියෝ ය.
6 රෙහොබෝවම් රජ තමාගේ පිය වූ සලමොන්
ජීවත් ව සිටිය දී ඔහුගේ සේවයෙහි සිටි ප්‍රජා
මූලිකයන් සමඟ සම්මන්ත්‍රණය කරමින්, "මා මේ
සෙනඟට උත්තර දෙනෙ පිණිස ඔබ සාකච්ඡා කොට
මට කියන්නේ කුමක් දැ"යි ඇසුවේ ය.
7 ඔව්හු කතා කොට, "ඔබ මේ සෙනඟට
කරුණාවන්ත ව, ඔවුන් ප්‍රසන්න කොට, ප්‍රිය මනාප
වචන ඔවුන්ට කතා කළොත්, ඔවුන් සෑම කල්හි ම
ඔබේ මෙහෙකෙරුවන් වනු ඇතැ"යි ඔහුට කීවෝ ය.
8 එහෙත්, ප්‍රජා මූලිකයන් ඔහුට දුන් දැනුමැතිකම
ඔහු අත්හැර, තමා සමඟ වැඩුණු, තමාගේ
සේවයෙහි සිටි තරුණයන් සමඟ සම්මන්ත්‍රණය
කරමින්, 9 " 'ඔබේ පියා අප පිට තැබූ වියගහ
සැහැල්ලු කළ මැනවැ'යි මට කී මේ සෙනඟට
උත්තර දෙනෙ පිණිස ඔබ සාකච්ඡා කොට මට
කියන්නේ කුමක් දැ"යි ඔවුන්ගෙන් ඇසුවේ ය.
10 ඔහු සමඟ වැඩුණු තරුණයෝ ඔහුට කතා
කොට, " 'ඔබේ පියා අපේ වියගහ බර කළේ ය;
එහෙත්, ඔබ එය අපට සැහැල්ලු කළ මැනවැ'යි
ඔබට කී ඒ සෙනඟට කතා කොට, 'මාගේ පියාගේ
තුනටියට වඩා මාගේ හුළැඟිල්ල ලොකු ය.
11 මාගේ පියා ඔබ පිට බර වියගහක් තැබී ය. මම
ඔබේ වියගහ වඩා බර කරන්නෙමි. මාගේ පියා
කසවලින් ඔබට දඬුවම් කළේ ය. මම වනාහි කටු
කසවලින් දඬුවම් කරන්නෙමි' කියා කිව යුතු ය"යි
දැන්වූහ.
12 'තුන් වන දා නැවත මා ළඟට එන්නැ'යි රජු කී
හැටියට ජෙරොබෝවම් ද මුළු සෙනඟ ද තුන් වන
දා රෙහොබෝවම් ළඟට ආවෝ ය. 13 රජ ප්‍රජා
මූලිකයන්ගේ අවවාද අත්හැර, 14 තරුණයන්ගේ
අවවාද ප්‍රකාර ඔවුන්ට තදින් කතා කොට, උත්තර
දෙමින්, "මාගේ පියා ඔබේ වියගහ බර කළේ ය,
මම එය වඩා බර කරන්නෙමි. මාගේ පියා කසවලින්
ඔබට දඬුවම් කළේ ය, මම ඔබට කටු කසවලින්
දඬුවම් කරන්නෙමි"යි කීවේ ය. 15 මෙසේ රජ තමෙ
සෙනඟට ඇහුම්කන් නුදුන්නේ ය. මන්ද, සමිඳාණන්
වහන්සේ ෂිලෝහි අහියා ලවා නබොත්ගේ පුත්
ජෙරොබෝවම්ට කිය වූ ස්වකීය වචනය ඉෂ්ට කරන
පිණිස ඒ කාරණය දෙවියන් වහන්සේගෙන්
පැමිණියේ ය.
16 2 සාමු 20:1 රජු තමන්ට ඇහුම්කන් නුදුන් බව
සියලු ඉශ්‍රායලේවරුන් දුටු කල, ඔව්හු රජුට උත්තර
දෙමින්, "දාවිත්ගෙන් අපට ඇති කොටස කිමෙක් ද?
ජෙසේගේ පුත්‍රයාගෙන් අපට උරුමයක් නැත.
ඉශ්‍රායලේවරුනි, ඔබේ කූඩාරම්වලට යන්න. ඉතින්
දාවිත් තුමනේ, ඔබ ඔබේ ම වංශය බලාගන්නැ"යි
කීවෝ ය. මෙසේ සියලු ඉශ්‍රායලේවරු තම
තමන්ගේ කූඩාරම්වලට ගියෝ ය. 17 එහෙත්,
රෙහොබෝවම් රජ ජුදා නගරවල විසූ
ඉශ්‍රායලේවරුන් පාලනය කළේ ය.
18 එවිට රෙහොබෝවම් රජ රාජකාරියේ
නිලධාරියා වූ හදෝරාම් එහි යැවුවේ ය.
ඉශ්‍රායලේවරු ඔහුට ගල් ගසා ඔහු මැරුවෝ ය.
එවිට රෙහොබෝවම් රජ ජෙරුසලමට පලා යන
පිණිස ඉක්මනින් රථයට නැඟුණේ ය. 19 මෙසේ අද
දවස දක්වා තිබෙනෙ පරිදි ඉශ්‍රායලේවරු දාවිත්ගේ
වංශයට විරුද්ධ ව කැරලි ගැසූ හ.

### ෂමොයාගේ දිව්‍යස් වැකිය
(1 රාජා 12:21-24)

11 රෙහොබෝවම් ජෙරුසලමට පැමිණ, තමාට
රාජ්‍යය නැවත ලබාගන්න ඉශ්‍රායලේවරුන්ට
විරුද්ධ ව යුද්ධ කරන පිණිස, ජුදා වංශයෙන් ද
බෙන්ජමින් වංශයෙන් ද වන තෝරාගත් යුද්ධ
භටයන් එක්ලක්ෂ අසූදහසක් රැස් කළේ ය.
2 එහෙත්, සමිඳාණන් වහන්සේගේ වචනය දෙවියන්
වහන්සේට කැප මනුෂ්‍යයා වූ ෂමොයා වෙත පැමිණ,
3 "නුඹ සලමොන්ගේ පුත් ජුදාහි රජ වන
රෙහොබෝවම්ටත්, ජුදාහි සහ බෙන්ජමින්හි සියලු
ඉශ්‍රායලේවරුන්ටත් කතා කොට, 4 'නුඹලා
නොයෙන්න. නුඹලාගේ සහෝදරයන්ට විරුද්ධ ව යුද්ධ
නොකරන්න. එක් එක්කෙනා තම තමාගේ ගෙදරට
හැරී යන්න. මන්ද, මේ කාරණා පැමිණියේ මාගෙන්
ය කියා සමිඳාණන් වහන්සේ වදාරන සේක' කියා
දන්වන්නැ"යි කී ය. එවිට ඔව්හු සමිඳාණන්
වහන්සේගේ වචනවලට ඇහුම්කන් දී,
ජෙරොබෝවම්ට විරුද්ධ ව නොගොස් හැරී ආවෝ
ය.

### රෙහොබෝවම් රජ බලකොටු තැනීම

5 රෙහොබෝවම් ජෙරුසලමෙහි වාසය කරමින්
ආරක්ෂාව පිණිස ජුදාහි නගර ගොඩනැඟුවේ ය.
6 මේ නගර නම්, බෙත්ලෙහෙමේ, ඒතාම්, තකෝවා;
7 බෙත්-ශූර්, ශෝකෝ, අදුල්ලාම්; 8 ගාත්, මාරේෂා,
ශීප්; 9 අදොරයිම්, ලාකීෂ්, අශේකා; 10 ශොරා,
අයාලෝන් සහ හෙබ්රොන් වේ. ජුදාහි ද
බෙන්ජමින්හි ද තිබෙනෙ නගරවලට බලකොටු තැනී
ය. 11 ඔහු මේ බලකොටු සවි කර, ඒවායේ

අධිපතීන් සිටුවා, ඒවායේ ආහාර සහ තලේ ද
මුද්‍රික පානය ද රැස් කොට තැබී ය. 12 යළිත්
හතෙමෙ එක එක නගරයෙහි පලිස් සහ හලේල
තැබී ය. ඔහු ඒවා ඉතා බලවත් ලසෙ ශක්තිමත්
කළෙේ ය. එසේ කළෙේ, ජුදා සහ බනේජමින්
පදෙසේවල සනෙඟ මලේල කරන පිණිස ය.
13 සියලු ඉශ්රායලේවරුන් අතරෙහි සිටි පූජකවරු ද
ලවේවරු ද තමන්ගේ සියලු පළාත්වලින් ඔහු වෙත
ආවෝ ය. 14 මන්ද, ජරෙොබෝවම් සහ ඔහුගේ
පුත්‍රයන් විසින් සමිඳාණන් වහන්සේගේ පූජක
තනතුරනේ ලවේවරුන් අහක් කරනු ලැබූ නිසා,
තමන්ගේ තණ බිම් ද තමන්ගේ උරුමය ද අත්හැර
ජුදාටත්, ජරෙුසලමටත් එන්න ඔවුන්ට සිදු වූ බැවිනි.
15 1 රාජා 12:31තවද, ඔහු තමා සෑදූ ගිරිකුළු
දේවාලවලටත්, එළු රූප හා ගව රූප වන
දේවතාවන්ටත් පූජකයන් පත් කරගත්තේ ය.
16 ලවේවරුන්ට පසු, සියලු ඉශ්රායලේ ගෝත්‍රවලින්
ඉශ්රායලේගේ දවේ සමිඳාණන් වහන්සේට
වැඳුම්පිදුම් කිරීමට තමන් සිත් යොමු කරගත් අය
තමන්ගේ පියවරුන්ගේ දවේ සමිඳාණන් වහන්සේට
පූජා කරන පිණිස ජරෙුසලමට ආවෝ ය. 17 මසෙේ
ඔව්හු ජුදා රාජ්‍යය ශක්තිමත් කොට සලමොන්ගේ
පුත් රෙහොබෝවම්ට තුන් අවුරුද්දක් සහාය දුන්හ.
මන්ද, ඔවුන් තුන් අවුරුද්දක් ම දාවිත්ගේ ද
සලමොන්ගේ ද මාර්ගයෙහි ගමන් කළ බැවිනි.

### රෙහොබෝවම් රජුගේ පවුල

18 තවද, රෙහොබෝවම් දාවිත්ගේ පුත්
ජරෙිමොත්ගේ ද ජසේසේගේ පුත් එලියාබ්ගේ දුව
වන අබිහයිල්ගේ ද දුව වන මහලත් භාර්යාව
කොට පාවාගත්තේ ය. 19 ඈ ජවෙුෂ් ද ෂමෙරියා ද
සාහම් ද යන පුත්‍රයන් ඔහුගනේ ලැබුවා ය. 20 ඈට
පසු ව ඔහු අබ්සලොම්ගේ දූ වන මයකා
පාවාගත්තේ ය. ඈ අබියා ද අත්තයි ද සීසා ද
ෂලෙොමිත් ද ඔහුගනේ ලැබුවා ය.
21 රෙහොබෝවම් තමාගේ සියලු භාර්යාවන්ටත්,
උපභාර්යාවන්ටත් වඩා අබ්සලොම්ගේ දූ වන
මයකාට ප්‍රමේ කළෙේ ය. ඔහු භාර්යාවන්
දහඅටදනෙකුත්, උපභාර්යාවන් හැටදනෙකුත්
පාවාගත්තේ ය. පුත්‍රයෝ විසිඅටදනෙකේ ද දූවරු
හැටදනෙකේ ද ඔහුට උපන්නෝ ය.
22 රෙහොබෝවම් වනාහි මයකාගේ පුත් අබියා
රජකමට පත් කරන්නට සිතාගනෙ ඔහු ඔහුගේ
සහෝදරයන් අතරේ අධිපතියා කොට ප්‍රධානකමට
පත් කළෙේ ය. 23 ඔහු සිහි නුවණින් හැසිර
තමාගේ සියලු පුත්‍රයන්ට වගකීම් පවරා දී
ඔවුන්ගනේ කීප දනෙකු ජුදාහිත්, බනේජමින්හිත්
පළාත් මුළුල්ලහෙි සියලු බලකොටු නගරවලට බෙදා
යැවී ය. තවද, බොහෝ සයෙින් ඔවුන්ට ආහාර
සපයා දුන්නේ ය. ඔවුන්ට බොහෝ භාර්යාවන් ද
සොයා දුන්නේ ය.

### මිසරයේ රජු ජුදා වටලෑම

(1 රාජා 14:25-28)

12 තවද, රෙහොබෝවම්ගේ රාජ්‍යය ස්ථිර වී
ඔහු බලවත් වූ කල්හි ඔහුත්, සියලු
ඉශ්රායලේවරුත් සමිඳාණන් වහන්සේගේ
ව්‍යවස්ථාව අත්හැරියෝ ය. 2 ඔවුන් සමිඳාණන්
වහන්සේට විරුද්ධ ව ද්‍රෝහිකම් කළ නිසා,
රෙහොබෝවම් රජුගේ පස් වන අවුරුද්දේ දී
මිසරයේ රජ වූ ෂීෂක් ජරෙුසලමට විරුද්ධ ව සටනට
ආයේ ය. 3 ඔහු රථ එක්දහස් දසෙියයක් ද අසරුවන්
සැටදහසක් ද ඇති ව පැමිණියේ ය. ඔහු සමඟ
මිසරයනේ ආ සනෙඟ වන ලුබ්වරු ද සුක්කිවරු ද
කුෂ්වරු ද ගණනාවක් නැති ව සිටියහ. 4 ඔහු ජුදා
දේශයෙහි බලකොටු නගර අල්ලා, පසු ව ජරෙුසලම
දක්වා ආයේ ය.
5 එවිට දිවැසිවර ෂමොයා රෙහොබෝවම්
වෙතටත්, ෂීෂක්ට බියනේ ජරෙුසලමෙහි රැස් ව සිටි
ජුදාහි අධිපතීන් වෙතටත් අවුත්, ඔවුන්ට කතා
කොට, “ ‘නුඹලා මා අත්හැරියහු ය. එබැවින් මමත්
නුඹලා ෂීෂක් අතට පාවා දනේනමේ’යි සමිඳාණන්
වහන්සේ වදාරන සේක”යි කීවේ ය.
6 එවිට ඉශ්රායලේහි අධිපතීහු ද රජු ද යටත් වී,
“සමිඳාණන් වහන්සේ ධර්මිෂ්ඨ ය”යි කීවෝ ය.
7 ඔවුන් යටත් වූ බව සමිඳාණන් වහන්සේ දුටු විට,
උන් වහන්සේ ෂමොයාට කතා කොට, “ඔව්හු යටත්
වූවෝ ය. මම ඔවුන් විනාශ නොකොට ස්වල්ප
කලකින් ඔවුන්ට ගැළවීම දනේනමේ. මාගේ උදහස
ද ෂීෂක් අතින් ජරෙුසලම පිට වගුරුවනු
නොලබන්නේ ය. 8 එසේ වී නමුත්, මාගේ සේවය
හා විදේශීය රාජ්‍යයන්ගේ සේවය අතර වනෙස
ඔවුන් දැනගන්න පිණිස ඔව්හු ඔහුගේ සේවකයෝ
වන්නෝ ය”යි වදාළ සේක.
9 1 රාජා 10:16-17; 2 වංශා 9:15-16 මසෙේ
මිසරයේ රජ වන ෂීෂක් ජරෙුසලමට විරුද්ධ ව
සටනට අවුත් සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ
වස්තු ද රජ ගයෙි තිබුණු වස්තු ද හැරගනෙ ගියේ
ය. ඔහු සලමොන් සෑදූ රන් පලිස් ද ඇතුළු සියල්ල ම
ගනෙ ගියේ ය. 10 රෙහොබෝවම් රජ ඒ වනුෙවට
ලෝකඩ පලිස් සාදා රජ ගයෙි දොරකඩ රැකවල්
කළ මුරකාරයන්ගේ අධිපතීන් අතට බාර දුන්නේ ය.
11 රජ සමිඳාණන් වහන්සේගේ මාලිගාවට එන
සියලු අවස්ථාවන්හි දී මුරකාරයෝ ඒවා ඔසවාගනෙ
අවුත් නැවත මුරගටෙ ගනෙ ගියෝ ය. 12 තවද, ඔහු
යටත් වූ බැවින් ඔහු මුළුමනින් ම විනාශ නොකරන
හැටියට සමිඳාණන් වහන්සේගේ උදහස ඔහු
කරෙනේ හැරිණි. ඇරත් ජුදා දේශයෙහි ද
සෞභාග්‍යය උදාවිය.

### රෙහොබෝවම් රජුගේ අභාවය

13 මසෙේ රෙහොබෝවම් රජ ජරෙුසලමෙහි ස්ථිර
වී රජකම් කළෙේ ය. රෙහොබෝවම් තමෙ රජකමට
පත් වන කල සතළිස් එක් අවුරුද්දක් වයස් ව

සිටියේ ය. සමිඳාණන් වහන්සේ තමන්ගේ නාමයේ
ගෞරවය රක්නා ස්ථානය වශයෙන් සියලු
ඉශ්රායලේ ගෝත්‍රවලින් තෝරාගත් නගරය වන
ජෙරුසලමෙහි ඔහු දහහත් අවුරුද්දක් රජකම් කළේ
ය. අම්මොනිය ස්ත්‍රියක වූ ඔහුගේ මවගේ නම
නාමා ය. 14 ඔහු සමිඳාණන් වහන්සේ සෙවීමට තම
සිත යොමු නොකර නපුරුකම් කළේ ය.
15 මුල පටන් අන්තිම දක්වා රෙහොබෝවම්ගේ
ක්‍රියා දිවැසිවර ෂෙමායාගේ ද ඉද්දෝ නම්
දිවැසිවරයාගේ ද පුරාවෘත්ත ග්‍රන්ථවල පරම්පරා
වශයෙන් වාර්තාකර තිබෙනු නොවේ ද?
රෙහොබෝවම් සහ ජෙරොබෝවම් අතරේ නිතර ම
යුද්ධ පැවතුණේ ය. 16 රෙහොබෝවම් මියගිය පසු
දාවිත්ගේ නුවර තැන්පත් කරන ලද්දේ ය. ඔහුගේ
පුත් අබීයා ඔහු වෙනුවට රජ විය.

### අබීයා රජ ජෙරොබෝවම් රජ සමඟ යුද්ධ කිරීම
(1 රාජා 15:1-8)

13 ජෙරොබෝවම් රජුගේ දහඅට වන අවුරුද්දේ
දී අබීයා ජුදා දේශයෙහි රජ වී 2 තුන්
අවුරුද්දක් ජෙරුසලමෙහි රජකම් කළේ ය. ඔහුගේ
මවගේ නම මීකායා ය. ඈ ගිබියාහි උරියෙල්ගේ
දුවක් ය. අබීයා ද ජෙරොබෝවම් ද අතරේ යුද්ධ
පැවතිණි. 3 එවිට අබීයා යුද්ධයට බලවන්ත,
තෝරාගත් මනුෂ්‍යයන් හාරලක්ෂයකින් යුත්
සේනාවක් ඇති ව යුද්ධාරම්භ කළේ ය.
ජෙරොබෝවම් ද ඔහුට විරුද්ධ ව තෝරාගත්
බලසම්පන්න මනුෂ්‍යයන් අටලක්ෂයක් ඇති ව
යුද්ධයට සැරසී පිළිවෙළෙන් සිටියේ ය.
4 එවිට අබීයා එප්‍රායිම් කඳු රටේ තිබෙන
ශෙමොරයිම් කන්ද උඩ සිට මෙසේ කී ය:
“ජෙරොබෝවම් සහ සියලු ඉශ්රායලේවරුනි, මාගේ
බස් අසන්න. 5 ඉශ්රායලේවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේ ඔවුන් කෙරෙහි රජකම් කිරීම දාවිත්ට ද
ඔහුගේ පුත්‍රයන්ට ද නොබිඳෙන ගිවිසුමකින්
සදහට ම දුන් බව ඔබ හැම දැනගත යුතු නොවේ
ද? 6 එහෙත්, දාවිත්ගේ පුත්‍රයා වන සලමොන්ගේ
සේවක නබොත්ගේ පුත් වන ජෙරොබෝවම් නැඟිට
තමාගේ ස්වාමියාට විරුද්ධ ව කැරලි ගැසුවේ ය.
7 කමකට නැති දුර්ජන මනුෂ්‍යයෝ ඔහුට එකතු ව
ඔවුන්ගේ කැමැත්ත කිරීමට සලමොන්ගේ පුත්
රෙහොබෝවම්ට විරුද්ධ ව ඔහු තදින් පෙළෙඹ වූ හ.
ඔහු වයසින් බාල ව, සිතින් මෘදු ව සිටි බැවින්
ඔවුන්ට විරුද්ධ ව සිටින්න ඔහුට බැරි විය. 8 දැන්
ඔබ හැම දාවිත්ගේ පුත්‍රයන් අතේ තිබෙන
සමිඳාණන් වහන්සේගේ රාජ්‍යයට විරුද්ධ ව සිටින්න
කල්පනා කරන්නහු ය. ඔබ හැම මහත් සමූහයක් ය.
දෙවිවරුන් කොට ජෙරොබෝවම් ඔබට සාදා දුන් රන්
වහු රූප ඔබ හැම සමඟ ඇත. 9 ඔබ හැම
ආරොන්ගේ පුත්‍රයන් වන සමිඳාණන් වහන්සේගේ
පූජකයන් ද ලෙවීවරුන් ද එළවා දමා වෙන දේශවල
ජාතීන් මෙන් පූජකයන් නියම කරගත්තෝ
නොවන්නහු ද? මෙසේ කැප වන පිණිස
ගොනෙකුත්, බැටළුවන් සත්දෙනෙකුත් රැගෙන එන
කවුරු නමුත්, නම්න් දෙවිවරුන් වූ අයට පූජකයෙක්
වන්නේ ය.
10 “එහෙත්, අපගේ දෙවියන් වහන්සේ නම්,
සමිඳාණන් වහන්සේ ය. අපි උන් වහන්සේ අත්
නොහැරියෙමු, සමිඳාණන් වහන්සේට සේවය කරන
පූජකයන් වූ ආරොන්ගේ පුත්‍රයෝ ද තමන්ගේ
මෙහෙයේ යෙදෙන ලෙවීවරු ද අපට සිටිති. 11 ඔව්හු
සමිඳාණන් වහන්සේට හැම උදය ද හැම සවස ද
දවන යාග පූජා ද සුවඳ දුම් ද ඔප්පු කරති. පිදීමේ
රොටි රන් මේසය උඩ පිළිවෙළට තබති. රන් පහන්
රුක සමඟ එහි පහන් හැම සවස ම දල්වති. මන්ද,
අපි අපගේ දෙවි සමිඳාණන් වහන්සේගේ ආගමික
වත්පිළිවෙත් පවත්වමු. එහෙත්, ඔබ හැම උන්
වහන්සේ අත්හැරියහු ය. 12 මෙන්න, දෙවියන්
වහන්සේ අප කෙරෙහි ප්‍රධාන ව අප සමඟ සිටින
සේක; උන් වහන්සේගේ පූජකයෝ ද ඔබ හැමට
විරුද්ධ ව පිඹින පිණිස හොරණෑ ගෙන සිටිති.
ඉශ්රායලේවරුනි, ඔබේ පියවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේට විරුද්ධ ව සටන් නොකරන්න; මන්ද,
ඔබට ද ජය අත් නොවන්නේ ය.”
13 අබීයා මෙසේ කී පසු ජෙරොබෝවම් ඔවුන්ට
පිටුපසින් එන පිණිස සේනාවක් රහසින් වටේට යැවී
ය. මෙසේ ඔව්හු ජුදාවරුන්ට ඉස්සරහින් ද රහස්
සේනාව ඔවුන්ට පිටුපසින් ද සිටියෝ ය. 14 ජුදාවරු
හැරී බැලූ විට තමන්ට විරුද්ධ ව ඉස්සරහින් ද
පිටුපසින් ද යුද්ධය ඇති බව දැක සමිඳාණන්
වහන්සේට මොරගැසුවෝ ය. පූජකයෝ හොරණෑ
පිම්බෝ ය. 15 එවිට ජුදා මනුෂ්‍යයන් ඔල්වර හඬ
නැඟුව කල, දෙවියන් වහන්සේ ජෙරොබෝවම් සහ
සියලු ඉශ්රායලේවරුන් අබීයාත්, ජුදාත් ඉදිරියේ
පරදවා හැරිය සේක. 16 එවිට ඉශ්රායලේවරු
ජුදාවරුන් ඉදිරියෙන් පලා ගියෝ ය. දෙවියන්
වහන්සේ ඔවුන් ජුදාවරුන් අතට පාවා දුන් සේක.
17 අබීයා ද ඔහුගේ සෙනඟ ද ඔවුන් ඝාතනය
කළහ. තෝරාගත් ඉශ්රායලේ මනුෂ්‍යයෝ
පන්ලක්ෂයක් මැරුම් කා වැටුණෝ ය. 18 මෙසේ ඒ
කාලයේ දී ඉශ්රායලේවරු යටත් කරන ලද්දෝ ය.
ජුදාවරු තමන්ගේ පියවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේ කෙරේ විශ්වාසය තැබූ නිසා ජයගත්හ.
19 අබීයා තමේ ජෙරොබෝවම් ලුහුබැඳ ගොස්
බෙතෙල් සහ ඊට අයිති නගර ද ජෙෂොනා හා ඊට
අයිති නගර ද එප්‍රොන් සහ ඊට අයිති නගර ද
අල්ලාගත්තේ ය. 20 මෙසේ ජෙරොබෝවම්,
අබීයාගේ කාලයේ දී නැවත බලවත් නො වී ය.
සමිඳාණන් වහන්සේ ඔහුට පහර දුන් සේක. ඔහු
මළේ ය.
21 එහෙත්, අබීයා බලවත් විය; හතෙමෙ
භාර්යාවන් දහහතරදෙනෙකු පාවාගත්තේ ය.
පුත්‍රයෝ විසිදෙදෙනෙක් ද දූවරු දහසයදෙනෙක් ද
ඔහුට දාව උපන්නෝ ය. 22 අබීයාගේ සෙසු ක්‍රියා ද
ඔහුගේ ප්‍රතිපත්ති ද කියමන් ද දිවැසිවර
ඉද්දෝගේ අටුවා පොතෙහි ලියා තිබේ.

## ආසා රජකමට පැමිණීම

14 මෙසේ අබියා මියගිය පසු දාවිත්ගේ නුවර
තැන්පත් කරනු ලැබුවේ ය. ඔහුගේ පුත්‍ර වූ
ආසා ඔහු වෙනුවට රජ විය. ඔහුගේ කාලයෙහි දස
අවුරුද්දක් දේශයේ සාමය පැවතිණි. 2 ආසා තම
දෙවි සමිඳාණන් වහන්සේගේ ඇස් හමුයෙහි යහපත්
දේ කළේ ය. 3 මන්ද, ඔහු විදේශීය පූජාසන ද
ගිරිකුළු දේවාල ද පහකොට, රූපස්තම්භ බිඳ,
අෂේරා කප් කණු ද කපා දැමුවේ ය. 4 තවද,
තමන්ගේ පියවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ
සොයන්න ද ව්‍යවස්ථාව හා ආඥාව පිළිපදින්න ද
ජුදාවරුන්ට ඔහු අණ කළේ ය. 5 ඔහු ජුදාහි සියලු
නගරවලින් ගිරිකුළු දේවාල සහ සුවඳ දුම් පූජාසන
පහකළේ ය. ඔහුගේ කාලයේ රාජ්‍යයෙහි ද සාමය
පැවතිණි. 6 තවද, ඔහු ජුදාහි බලකොටු නගර යළි
ගොඩනැඟුවේ ය. මන්ද, සමිඳාණන් වහන්සේ ඔහුට
සාමය දුන් බැවින් දේශයේ සමගිය තිබුණේ ය. ඒ
අවුරුදුවල එහි යුද්ධයක් නො වී ය. 7 ඔහු
ජුදාවරුන්ට කතා කොට, “අපි මේ නගර ගොඩනඟා,
අවට පවුරු ද කොටු ද දොරටු ද අගුල් ද සාදමු. අප
විසින් අපේ දෙවි සමිඳාණන් වහන්සේ සොයනු ලැබූ
බැවින් දේශය තවම නිරවුල් ව අප ඉදිරියෙහි තිබේ.
අපි උන් වහන්සේ සෙවුවෙමු. උන් වහන්සේ ද හැම
අතින් ම අපට සාමය දී තිබේ ය”යි කීවේ ය.
මෙසේ ඔව්හු නගර ගොඩනඟමින් සමෘද්ධිමත්
වූවෝ ය. 8 ජුදාවරුන්ගෙන් පලිස් සහ හෙල්ල දරන
තුන්ලක්ෂයකින් ද බෙන්ජමින්වරුන්ගෙන් පලිස් දරන
දුනු ගත් දෙලක්ෂ අසූදහසකින් ද යුක්ත වූ
සේනාවක් ආසාට සිටියහ. මේ සියල්ලෝ බලවත්
වික්‍රමාන්විත මනුෂ්‍යයෝ වූ හ.
9 ඔවුන්ට විරුද්ධ ව කුෂ්හි ශෙරා දසලක්ෂයක්
සෙනඟ ද රථ තුන්සියයක් ද අඩංගු වූ සේනාවක්
ඇති ව පිටත් වී මාරේෂා දක්වා පැමිණියේ ය.
10 ආසා වනාහි ඔහුට විරුද්ධ ව සටනට ගියේ ය.
එවිට මාරේෂාහි ශෙපොතා මිටියාවතෙහි ඔව්හු
යුද්ධයට සැරසී සිටගත්හ. 11 ආසා තම දෙවි
සමිඳාණන් වහන්සේට යාච්ඤා කොට, “සමිඳුනි,
බලසම්පන්න අයට විරුද්ධ ව බලහීන අයට පිහිට
වන්න ඔබ හැර අන් කිසිවකේ නැත්තේ ය. අපේ
දෙවි සමිඳුනි, අපට පිහිට වුව මැනව. මන්ද, අපි ඔබ
කෙරේ විශ්වාසය තබා, ඔබේ නාමයෙන් මේ
සමූහයට විරුද්ධ ව අවුත් සිටිමු. සමිඳුනි, ඔබ අපේ
දෙවියන් වහන්සේ ය. ඔබට විරුද්ධ ව මනුෂ්‍යයා ජය
නොගනීවා”යි කීවේ ය.
12 සමිඳාණන් වහන්සේ ආසා සහ ජුදාවරුන්
ඉදිරියෙහි කුෂ්වරුන් පැරද වූ සේක. කුෂ්වරු පලා
ගියෝ ය. 13 ආසා ද ඔහු සමඟ සිටි සෙනඟ ද
ගෙරොර් දක්වා ලුහුබැඳ ගියෝ ය. කුෂ්වරුන්ගෙන්
කිසිවකු ජීවත් ව ඉතුරු නොවෙන ලෙස ඔව්හු
මැරුම්කෑහ. මන්ද, ඔව්හු සමිඳාණන් වහන්සේ ද උන්
වහන්සේගේ සේනාව ද ඉදිරියෙන් විනාශ කරනු
ලැබුවෝ ය. ඔව්හු ඉතා මහත් කොල්ලයක් ද
රැගෙන ආවෝ ය. 14 ගෙරොර් නගරය අවට සියලු
නගරවලට ඔව්හු පහර දුන්නෝ ය. මන්ද, සමිඳාණන්
වහන්සේ කෙරෙන් ඔවුන් පිට භීතියක් පැමිණි
බැවින් ඔව්හු ඒ සියලු නගර කොල්ලකෑවෝ ය.
ඒවායේ බොහෝ කොල්ලය තිබිණි. 15 ඔව්හු
සිවුපාවුන්ගේ මඩුවලටත් පහර දී බොහෝ
බැටළුවන් ද ඔටුවන් ද අල්ලාගෙන ජෙරුසලමට හැරී
ආවෝ ය.

## දිවැසිවර අසරියාගේ දිවැස් වැකිය

15 තවද, දෙවියන් වහන්සේගේ ආත්මානුභාව
ඕදේදගේ පුත් අසරියා කෙරෙහි පැමිණියේ
ය. 2 ඔහු ආසාගේ පෙරමඟට ගොස් මෙසේ කී ය:
“ආසා සහ සියලු ජුදාවරුනි, බෙන්ජමින්වරුනි, මට
සවන් දෙන්න. ඔබ සමිඳාණන් වහන්සේ සමඟ
සිටින තුරු උන් වහන්සේ ඔබ සමඟ වැඩ සිටින
සේක. ඔබ උන් වහන්සේ සොයන්නහු නම්, උන්
වහන්සේ ඔබ සියල්ලන්ට සම්බ වනු ඇත. ඔබ උන්
වහන්සේ අත්හැරියොත්, උන් වහන්සේ ද ඔබ
අත්හරිනු ඇත. 3 බොහෝ කාලයක සිට
ඉශ්රායලේවරු සැබෑවන දෙවියන් වහන්සේ ද
උගන්වන පූජකයකු ද ව්‍යවස්ථාව ද නැති ව
සිටියෝ ය. 4 එහෙත්, ඔවුන් තමන්ගේ විපතේ දී
ඉශ්රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ දෙස
හැරී, උන් වහන්සේ සෙවූ විට ඔවුන්ට උන් වහන්සේ
සම්බ වූ සේක. 5 ඒ කාලයේ ගමන් බිමන්වල
යෙදුණු කිසි කෙනෙකුට ආරක්ෂාවක් නැති විය.
දේශවල සියලු වැසියන්ට මහා පීඩා පැමිණියේ ය.
6 ජාතියක් විසින් ජාතියක් ද නුවරක් විසින් නුවරක්
ද පොඩි කරනු ලැබූ හ. මන්ද, දෙවියන් වහන්සේ
සියලු ආකාර විපත්තිවලින් ඔවුන්ට පීඩා කළ බැවිනි.
7 එහෙත්, ඔබ දුබල නොවී ශක්තිමත් වන්න. මන්ද,
ඔබ හැමගේ වැඩට විපාක ලැබෙන්නේ ය.”

## ආසා රජුගේ යහපත් වැඩ

8 ආසා මේ පණිවුඩය ද දිවැසිවර ඕදේදගේ දිවැස්
වැකිය ද ඇසූ කල ධෛර්‍ය උපදවාගෙන,
ජුදාවරුන්ගේත්, බෙන්ජමින්වරුන්ගේත් මුළු
දේශයෙන් ද එප්රායිම් කඳු රටින් තමා අල්ලාගත්
නගරවලින් ද පිළිකුල් දේව රූප අහක් කළේ ය.
ඔහු සමිඳාණන් වහන්සේගේ ද්වාර මණ්ඩපය
ඉදිරිපිට තිබූ සමිඳාණන් වහන්සේගේ පූජාසනය ද
අලුත් වැඩියා කළේ ය.
9 තවද, ඔහු සියලු ජුදාවරුන් ද බෙන්ජමින්වරුන් ද
ඔවුන් සමඟ එප්රායිම්වරුන්ගෙනුත්,
මනස්සේවරුන්ගෙනුත්, සිමියොන්වරුන්ගෙනුත් අවුත්
සිටි ආගන්තුකයින් ද රැස් කරගත්තේ ය. මන්ද,
ඔහුගේ දෙවි සමිඳාණන් වහන්සේ ඔහු සමඟ සිටින
බව දුටු කල ඉශ්රායලේවරුන්ගෙන් බොහෝ දෙනෙකු
ඔහුට එක් වූ බැවිනි. 10 ආසා රජකමට පත් වූ
පහළොස් වන අවුරුද්දේ තුන් වන මාසයේ දී ඔව්හු
ජෙරුසලමට රැස් වූ හ. 11 ඔවුන් ගෙනා
කොල්ලයෙන් ගවයන් සත්සියයකුත්, බැටළුවන්

සත්දහසකුත් සමිඳාණන් වහන්සේට ඔව්හු ඒ දවසේ
පූජා කළෝ ය. 12 තවද, ඔව්හු තමන්ගේ
පියවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ තමන්ගේ
මුළු හෘදයෙන් ද මුළු ආත්මයෙන් ද සොයන්නත්,
13 ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ
නොසොයන සියල්ලන්, ලොකු කෙනෙකු වුවත්, කුඩා
කෙනෙකු වුවත්, පුරුෂයෙකු වුවත්, ස්ත්‍රියක වුවත්
මරණයට පත් කළ යුතු යයි නියම කරගන්නත් වූ හ.
14 ඔව්හු මහා හඬ ද සන්තෝෂ හඬ ද හොරණෑවලත්,
නළාවලත් ශබ්දය ද ඇති ව සමිඳාණන් වහන්සේට
දිවුරුම දුන්නෝ ය. 15 සියලු ජුදාවරු ඒ දිවුරුම ගැන
ප්‍රීති වූ හ. මන්ද, ඔවුන් තමන්ගේ මුළු සිතින් දිවුරා,
තමන්ගේ මුළු කැමැත්තෙන් උන් වහන්සේ සෙවූ
බැවිනි. සමිඳාණන් වහන්සේ ද ඔවුන්ට තමන්
වහන්සේ සොයා ගැන්මට ඉඩ දුන් සේක. උන්
වහන්සේ ඔවුන්ට හාත්පසින් ම සාමය ලබා දුන්
සේක.
16 ආසා රජුගේ මව වූ මයකා විසින් අෂේරා
දේවතාවියට පිළිකුල් රූපයක් සාදනු ලැබූ නිසා, ආසා
ඇය බිසෝකමෙන් අහක් කර, ඇගේ පිළිම කප්
කණුව කපා දමා, සුණු කර, කිද්‍රොන් ඔය ළඟ දී
එය පුළුස්සා දැමුවේ ය. 17 එහෙත්, ඉශ්‍රායෙල්වරුන්
අතරෙන් ගිරිකුළු දේවාල පහ කරනු නොලැබුවේ ය.
එසේ වුවත්, ආසාගේ සිත ඔහුගේ මුළු කාලයේ දී
නිර්දෝෂිව තිබුණේ ය. 18 ඔහු තමාගේ පියා ද
තමා ද කැප කළ රන් රිදී සහ බඩු භාණ්ඩ දෙවියන්
වහන්සේගේ මාලිගාව ඇතුළට ගෙනාවේ ය.
19 ආසා රජකම් කළ තිස්පස් වන අවුරුද්ද දක්වා
තවත් යුද්ධ නො වී ය.

## ආසා රජු බාෂා රජු සමඟ යුද්ධ කිරීම

(1 රාජා 15:17-22)

16 ආසා රජකම් කළ තිස්හය වන අවුරුද්දේ දී
ඉශ්‍රායෙල්හි රජ වූ බාෂා ජුදාට විරුද්ධ ව
ගොස් ජුදාහි රජු වූ ආසා වෙත කිසිවකුට යන්න
එන්න ඉඩ නාරින පිණිස රාමා නගරය
ගොඩනැඟුවේ ය. 2 එවිට ආසා සමිඳාණන්
වහන්සේගේ දේව මාලිගාවේ හා රජ මැදුරේ
ගබඩාවලින් රන් රිදී පිටතට ගෙනෙවුත්, දමස්කයෙහි
වාසය කළ සිරියාවේ රජ වන බෙන්-හදද්ට ඒවා
යවමින්, 3 "මාගේ පියා ද ඔබේ පියා ද අතරේ
තිබුණ පරිදි, මා සහ ඔබ අතරේ ද ගිවිසුමක් තිබේ.
මෙන්න, රන් රිදී ඔබට එවමි. ඉශ්‍රායෙල්හි රජු වන
බාෂා මාගේ රටින් අහක් ව යන පිණිස, ඔබ අවුත්
ඔහු සමඟ තිබෙන ගිවිසුම කඩ කළ මැනවැ"යි කියා
හැරියේ ය.
4 එවිට බෙන්-හදද් ආසා රජුට ඇහුම්කන් දී
තමාගේ යුද්ධ සේනාපතීන් ඉශ්‍රායෙල් නගරවලට
විරුද්ධ ව යැවී ය. ඔහු ඊයොන්ටත්, දාන්ටත්, ආබෙල්-
මායිම්ටත්, නප්තලීහි සියලු ගබඩා-නගරවලටත්
පහර දුන්නේ ය. 5 බාෂා රජ එය ඇසූ විට, ඔහු
රාමා නගරය ගොඩනැඟීමෙන් නැවතී තම වැඩ අත්
හිටවී ය. 6 එවිට ආසා රජ සියලු ජුදාවරුන්
කැඳවාගෙන ගොස්, බාෂා ගොඩනැඟුවා වූ රාමාහි
ගල් ද ලී ද ඔවුන් ලවා ගෙන්වාගෙන, එයින් ගෙබා ද
මිශ්පා ද යන නගර ගොඩනැඟුවේ ය.

## දිවැසිවර හනානි

7 එවිට දිවැසිවර හනානි ජුදාහි රජ වූ ආසා ළඟට
අවුත් කතා කොට, " 'ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ කෙරෙහි ඔබ විශ්වාසය නොතබා,
සිරියාවේ රජු කෙරෙහි විශ්වාසය තැබූ බැවින්
සිරියාවේ රජුගේ සේනාව ඔබේ අතින් ගැළවී
යන්නේ ය. 8 කූෂ්වරු ද ලූබ්වරු ද රථ සහ අසරුවන්
මහා රාශියක් ඇති මහා සේනාවක් ව සිටියෝ
නොවෙත් ද? එහෙත්, ඔබ සමිඳාණන් වහන්සේ
කෙරෙහි විශ්වාසය තැබූ නිසා, උන් වහන්සේ ඔවුන්
ඔබ වෙත පාවා දුන් සේක. 9 මන්ද, සමිඳාණන්
වහන්සේ තමන් කෙරෙහි සම්පූර්ණ විශ්වාසය ඇති
අයට පිහිට වන පිණිස උන් වහන්සේගේ බලය
පාමින්, උන් වහන්සේගේ බැල්ම පොළොව
මුළුල්ලෙහි සෑම තැන ම යොමු කරන සේක. මේ
ගැන ඔබ අනුවණ ලෙස ක්‍රියා කළෙහි ය. මෙතැන්
පටන් ඔබට විරුද්ධ ව යුද්ධ ඇති වන්නේ ය"යි
කීවේ ය. 10 එවිට ආසා රජ දිවැසිවරයා කෙරෙහි
කෝප වී ඔහු හිර ගෙයි දැමී ය. මන්ද, ඔහු මේ
කාරණය ගැන ඔහු සමඟ උදහස් ව සිටි බැවිනි. එම
කාලයේ ම ආසා සෙනඟගෙන් සමහරකුටත් පීඩා
කළේ ය.

## ආසා රජුගේ පාලනයේ අවසානය

(1 රාජා 15:23-24)

11 ආසාගේ ක්‍රියා මුල පටන් අග දක්වා ජුදාහි ද
ඉශ්‍රායෙල්හි ද රජුන්ගේ පොතෙහි ලියා තිබේ.
12 ආසා රජකම් කළ තිස්නව වන අවුරුද්දේ දී
ඔහුගේ පාදවල රෝගයක් විය; ඒ රෝගය තදබල
විය. එහෙත්, ඔහු තමාගේ රෝගයේ දී සමිඳාණන්
වහන්සේ නොව වෛදේයවරුන් සෙවී ය. 13 එහෙත්,
ආසා මියගියේ ය. ඔහු මියගියේ, තමා රජ කළ
සතළිස්එක් වන අවුරුද්දේ දී ය. 14 ඔව්හු දාවිත්ගේ
නුවර ඔහු තමාට කපාගෙන තිබූ ඔහුගේ ම
සොහොන් ගෙයි ඔහු තැන්පත් කළෝ ය. තවද,
තෙලෙ සංයෝගකරුගේ ශාස්ත්‍රය අනුව පිළියෙළ
කළ නොයෙකේ ආලේපනයෙන් සහ සුවඳ ද්‍රව්‍යයෙන්
පිරූ යහනේ ඔහු තැබූ පසු ඔව්හු ඔහුගේ ගෞරවය
පිණිස ඉමහත් ගිනිමැලයක් දැල්වූවෝ ය.

## ජෙහෝෂාපාට් රජ වීම

17 ආසාගේ පුත් ජෙහෝෂාපාට් ඔහු වෙනුවට
රජ වී ඉශ්‍රායෙල්වරුන්ට විරුද්ධ ව තමාගේ
බලය තහවුරු කරගත්තේ ය. 2 ඔහු ජුදා රටේ
සියලු බලකොටු නගරවල හමුදාවන් සිටුවා, ජුදා
දේශයෙහි ද තමාගේ පිය වූ ආසා අල්ලාගත්
එප්‍රායිම් නගරවල ද මුර සේනාවන් සිටවේවේ ය.
3 සමිඳාණන් වහන්සේ ජෙහෝෂාපාට් සමඟ වැඩ
සිටි සේක. මන්ද, ඔහු තමාගේ පිය වූ දාවිත්ගේ
මුල් කාලයේ ආදර්ශ අනුව හැසිර, බාල්

දේවතාවුන්ට වැඳුම්පිදුම් නොකර, 4 තම පියාගේ
දෙවියන් වහන්සේට වැඳුම්පිදුම් කරමින්,
ඉශ්රායලේවරුන්ගේ ක්රියා අනුව නොව, උන්
වහන්සේගේ ආඥා අනුව හැසුරුණේ ය. 5 එබැවින්
සමිඳාණන් වහන්සේ ඔහු යටතේ රාජ්යය ස්ථිර කළ
සේක. සියලු ජුදාවරු ජෙහෝෂාපාට්ට තෑගි ගෙනාහ.
වස්තුව ද ගෞරවය ද ඔහුට බොහෝ සෙයින්
තිබිණි. 6 ඔහු සමිඳාණන් වහන්සේට වන්දනා
කිරීමට ධෛර්යවත් වී, නැවත ජුදා රටින් ගිරිකුළු
දේවාල ද අෂේරා කප් කණු ද පහකළේ ය.
7 තවද, ඔහු තමා රජකම් කළ තුන් වන අවුරුද්දේ
දී ජුදා නගරවල උගන්වන පිණිස තමාගේ අධිපතීන්
වන බෙන්හයිල් ද ඔබදියා ද ශකරියා ද නතෙනේල්
ද මීකායා ද 8 ඔවුන් සමඟ ලෙවීවරුන් වන ෂෙමායා
ද නතෙනියා ද ශබදියා ද අසාහෙල් ද ෂෙමීරාමොත්
ද ජෙහොනාතාන් ද අදොනියා ද ටෝබියා ද ටෝබ්-
අදොනියා ද ඔවුන් සමඟ පූජකවරුන් වූ එලීෂාමා ද
ජෙහෝරාම් ද යැවී ය. 9 ඔව්හු ද ජුදාහි උගන්වමින්,
සමිඳාණන් වහන්සේගේ ව්යවස්ථා පොත රැගෙන
ජුදාහි සියලු නගරවලට ගොස් සෙනඟ අතරෙහි එය
ඉගැන්නුවෝ ය.

### ජෙහෝෂාපාට් රජුගේ බලවත් ක්රියා

10 සමිඳාණන් වහන්සේ ජුදා රට අවට දේශවල
සියලු රාජ්යයන් භීතියට පත් කළ නිසා, ඔව්හු
ජෙහෝෂාපාට්ට විරුද්ධ ව යුද්ධ නොකළෝ ය.
11 පිලිස්තිවරුන්ගෙන් සමහරෙක් ජෙහෝෂාපාට්ට
තෑගි ද රිදී ද කප්පම් පිණිස ගෙනාවෝ ය. අරාබිවරු
ද බැටළුවන් හත්දහස් හත්සියයක් හා එළුවන්
හත්දහස් හත්සියයක් ද යන සිවුපාවුන් ගෙනාවෝ ය.
12 ජෙහෝෂාපාට් අතිශයින් උතුම් ව ජුදාහි
බලකොටු ද ගබඩා-නගර ද ගොඩනැඟුවේ ය.
13 ඔහුට ජුදා නගරවල බොහෝ බලකොටු
තිබුණේ ය. යුද්ධයට බලවත්, වික්රමාන්විත
මනුෂ්යයෝ ද ජෙරුසලමෙහි සිටියෝ ය. 14 ඔවුන්ගේ
පියවංශ ලෙස ඔවුන්ගේ ගණන් මේ ය: ජුදාවරුන්
අතර සහශ්රාධිපතියෝ නම්, අධිපතියා වන අද්නා
ය. ඔහු සමඟ බලවත් වික්රමාන්විත මනුෂ්යයෝ
තුන්ලක්ෂයක් සිටියෝ ය. 15 ඊළඟට අධිපතියා වූ
ජෙහෝහානාන් ය. ඔහු සමඟ වික්රමාන්විත
මනුෂ්යයෝ දලෙක්ෂ අසූදාහක් සිටියෝ ය.
16 ඊළඟට සිටියේ, කැමැත්තෙන් ම සමිඳාණන්
වහන්සේගේ සේවයට බාර වූ සික්රීගේ පුත්
අමසියා ය. ඔහු සමඟ බලවත් වික්රමාන්විත
මනුෂ්යයෝ දලෙක්ෂයක් සිටියෝ ය. 17 ඊළඟට
සිටියේ බෙන්ජමින්වරුන් අතර බලවත් වික්රමාන්විත
මනුෂ්යයකු වූ එල්යාදා ය. ඔහු සමඟ දුනු හා
පලිස්වලින් සන්නද්ධ වූ මනුෂ්යයෝ දලෙක්ෂයක්
වූවෝ ය. 18 ඊළඟට සිටියේ, ජෙහෝශාබාද් ය;
යුද්ධයට සැරසී සිටි එක්ලක්ෂ අසූදහසක් ඔහු සමඟ
වූවෝ ය. 19 ඔව්හු රජුට මෙහෙ කළ අය වූ හ.
ඔවුන් හැර රජු විසින් මුළු ජුදාහි බලකොටු නගරවල
නවතනු ලැබූ අයත් රජුට මෙහෙ කළෝ ය.

### ආහබ් රජුට අනතුරු ඇඟවීම
(1 රාජා 22:1-27)

18 තවද, ජෙහෝෂාපාට්ට බොහෝ සෙයින්
වස්තුව ද ගෞරවය ද තිබිණි. ඔහු ආහබ්
සමඟ විවාහ නෑකම් බැඳගත්තේ ය. 2 අවුරුදු
ගණනකට පසු ඔහු සමාරියේ විසූ ආහබ් වෙත
ගියේ ය. එවිට ආහබ් ඔහු ද ඔහු සමඟ සිටි
සෙනඟ ද උදෙසා බොහෝ බැටළුවන් ද ගවයන් ද
මරා, තමා සමඟ රාමොත්-ගිලියද්ට යන්න ඔහු
පෙළෙඹෙව්වේ ය. 3 ඉශ්රායලේ රජ වන ආහබ් ජුදාහි
රජ වන ජෙහෝෂාපාට්ට නැවත කතා කොට, "ඔබ
මා සමඟ රාමොත්-ගිලියද්ට යන්නෙහි දැ"යි ඇසුවේ
ය. ඔහු ද උත්තර දෙමින්, "මමත් ඔබ මෙන් සටනට
සූදානම් ය; මාගේ සෙනඟත්, ඔබේ සෙනඟ මෙන්
සටනට සූදානම් ය. යුද්ධයේ දී අපි ඔබ සමඟ
සිටින්නෙමු"යි ඔහුට කීවේ ය. 4 තවද, ජෙහෝෂාපාට්
කතා කොට, "සටනට යෑම ගැන අද සමිඳාණන්
වහන්සේගෙන් විචාළ මැනවැ"යි ඉශ්රායලේ රජුට
කීවේ ය.
5 එකල ඉශ්රායලේ රජ ගණනින් හාරසියයක් වන
දිවැසිවරුන් රැස් කොට, "අප යුද්ධය පිණිස රාමොත්-
ගිලියද්ට යන්න ද නොහොත් මා නොගොස් සිටින්න
දැ"යි ඔවුන්ගෙන් ඇසුවේ ය. ඔව්හු ද, "ගියමැනව;
දෙවියන් වහන්සේ එය රජු අතට පාවා දෙන
සේකැ"යි කීවෝ ය.
6 එහෙත්, ජෙහෝෂාපාට් කතා කොට, "මොවුන්
හැර අප විසින් විචාරනු ලබන පිණිස සමිඳාණන්
වහන්සේගේ වෙන දිවැසිවරයෙක් මෙහි නැද්දැ"යි
ඇසුවේ ය.
7 ඉශ්රායලේ රජ ද උත්තර දෙමින්, "සමිඳාණන්
වහන්සේගෙන් විචාරන පිණිස ඉම්ලාගේ පුත්
මීකායා නම් වන තව එක් කෙනෙක් සිටියි. එහෙත්,
ඔහු නිතර ම මා ගැන නපුරක් මිස යහපතක් දිවැස්
වැකියෙන් නොකියන නිසා මම ඔහුට වෛර වෙමි"යි
ජෙහෝෂාපාට්ට කීවේ ය. ජෙහෝෂාපාට් කතා
කරමින්, "රජ්ජුරුවෝ එසේ නොකියත්වා"යි කීවේ ය.
8 එවිට ඉශ්රායලේ රජ ඇමතියෙකු කැඳවා,
"ඉම්ලාගේ පුත් මීකායා ඉක්මනින් ගෙන්වන්නැ"යි
කීවේ ය. 9 ඉශ්රායලේ රජ ද ජුදාහි රජ වන
ජෙහෝෂාපාට් ද රාජ වස්ත්ර හැඳ තම තමන්ගේ
සිංහාසනවල හිඳගත්හ. ඔව්හු සමාරියේ දොරකඩ
එළිමහන් තැනක වාඩි වී සිටියහ. සියලු දිවැසිවරු
ඔවුන් ඉදිරියෙහි දිවැස් වැකි කියමින් සිටියහ.
10 කෙනානාගේ පුත් ශදෙකියා යකඩ අං සාදාගෙන,
" 'නුඹ සිරියන්වරුන් විනාශ වන තුරු මේවායින්
ඔවුන්ට අනින්නෙහි ය'යි සමිඳාණන් වහන්සේ
වදාරන සේකැ"යි කීවේ ය. 11 සියලු දිවැසිවරු එසේ
ම දිවැස් වැකි කියමින්, "රාමොත්-ගිලියද්ට ගොස්
ජයගත මැනව. සමිඳාණන් වහන්සේ එය රජු අතට
පාවා දෙන සේකැ"යි කීවෝ ය.
12 මීකායා කැඳවාගෙන එන්න ගිය පණිවුඩකාරයා
ඔහුට කතා කොට, "බලන්න, දිවැසිවරුන්ගේ
වචනවලින් එක ලෙස ම රජු ගැන සුබ දයෙක් ම

කියැවේ. ඒ නිසා ඔබේ වචනයත් ඔවුන්ගනේ
කනෙකුගේ වචන ම මනේ වන පිණිස, සුබ දයෙක්
ම කියන්නැ"යි කීවේ ය.
13 මීකායා ද, "ජීවමාන සමිඳාණන් වහන්සේගේ
නාමයනේ දිවුරා මාගේ දවේියන් වහන්සේ කියන
දයෙ ම කතා කරන්නමේ"යි කීවේ ය.
14 ඔහු රජු ළඟට ආ කල රජු ඔහුට කතා කොට,
"මීකායා, අප යුද්ධ පිණිස රාමොත්-ගිලියද්ට යන්න ද
නැතහොත් මා නොගොස් සිටින්න දැ"යි ඔහුගනේ
ඇසුවේ ය. ඔහු ද, "ගොස් ජයගන්න. ඔව්හු ඔබ
අතට පාවා දනෙු ලබන්නෝ ය"යි කී ය.
15 රජ තමෙේ ඔහු අමතා, "සමිඳාණන්
වහන්සේගේ නාමයනේ සැබෑව මිස වනෙ කිසිවක්
මට නොකියන ලසෙ මම කී වරක් ඔබ දිවුරුවමේ
දැ"යි ඔහුට කී ය.
16 ගණන් 27:17; එසකි 34:5; මතෙ 9:36; මාක්
6:34 එවිට ඔහු කතා කොට, "සියලු ඉශ්රායලේවරුන්
එඩේරකෙු නැති බැටළුවන් මනේ කඳුවල ඉඳිනු
දිටිමි. එවිට සමිඳාණන් වහන්සේ 'මොවුන්ට
ස්වාමියකේ නැත. එකිනකො තම තමාගේ ගදෙරට
සාමදානයනේ හැරී යේවා'යි වදාළ සේකැ"යි කීවේ
ය.
17 ඉශ්රායලේ රජ ද කතා කොට, "ඔහු මා ගැන
දිවැස් වැකියනේ අසුබ දයෙක් මිස සුබ දයෙක්
නොකියන්නේ ය කියා මම ඔබට නොකීවමේ දැ"යි
ජහෙෝෂාපාට්ට කීවේ ය.
18 මීකායා කතා කොට මසෙේ කී ය: "එබැවින්
සමිඳාණන් වහන්සේගේ වචනය අසන්න. සමිඳාණන්
වහන්සේ තමන් සිංහාසනයහෙි වැඩහිඳිනවා ද මුළු
ස්වර්ග සේනාව උන් වහන්සේගේ දකුණු පැත්තේ ද
වම් පැත්තේ ද සිටිනවා ද මම දිටිමි. 19 සමිඳාණන්
වහන්සේ ද, 'ඉශ්රායලේ රජ වන ආහබ් රාමොත්-
ගිලියද්හි දී පරාජය වන පිණිස එහි යන්න ඔහු
කැමැති කරවන්නේ කවුරු දැ'යි ඇසූ සේක. එවිට
එක් කනෙකේ මේ ආකාරයට ද අනික් කනෙකේ ඒ
ආකාරයට ද කීවෝ ය. 20 එකල භූතාත්මයක්
පැමිණ සමිඳාණන් වහන්සේ ඉදිරියහෙි සිට, 'මම
ඔහු කැමැති කරවමි'යි කී ය. 'කුමකින් දැ'යි
සමිඳාණන් වහන්සේ ඔහුගනේ ඇසූ සේක. 21 'මම
ගොස් ඔහුගේ සියලු දිවැසිවරුන්ගේ මුඛවල
මුසාවාදී ආත්මයක් වමේ'යි ඔහු කීවේ ය. උන්
වහන්සේ ද, 'නුඹ ගොස් ඔහු පොළඹවා ජයගන්න;
ගොස් එසේ කරන්නැ'යි වදාළ සේක.
22 "එබැවින් සමිඳාණන් වහන්සේ ඔබේ මේ
දිවැසිවරුන්ගේ මුඛවල මුසාවාදී ආත්මයක් තැබූ
සේක. සමිඳාණන් වහන්සේ ඔබ ගැන අසුබ දයෙක්
කියා තිබේ."
23 මයෙ ඇසූ විට කනෙනාගේ පුත් ශදෙකියා ළං
වී, මීකායාගේ කම්මුලට ගසා, "සමිඳාණන්
වහන්සේගේ ආත්මානුභාවය ඔබට කතා කරන්න
මා කරෙනේ ගියේ මොන මාර්ගයනේ දැ"යි ඇසුවේ
ය.
24 මීකායා ද උත්තර දමෙින්, "බලන්න, ඔබ
සැඟවනේන ඇතුල් ගයෙකට යන දවසේ දී එය දැන
ගන්නහෙි ය"යි කීවේ ය.
25 ඉශ්රායලේ රජ කතා කොට, "ඔබ මීකායා ගනෙ
නුවර අධිපතියා වන ආමොන් ද රජුගේ පුත්
ජෝවාෂ් ද ළඟට ගොස්, 'මොහු හිරගහෙි ලා, 26 මා
සාමදානයනේ හැරී එන තුරු මොහුට කන්න රොටි ද
බොන්න වතුර ද පමණක් දනේන' කියා කියන්නැ"යි
පැවසී ය.
27 මීකායා ද උත්තර දමෙින්, "ඔබ ඇත්තට ම සුව
සේ හැරී එන්නහෙි නම්, සමිඳාණන් වහන්සේ මා
ලවා කතා කළෙේ නැත. ජනයනෙි, ඔබ සියල්ලන් ම
මයෙ අසන්නැ"යි කීවේ ය.

### ආහබ් රජුගේ මරණය

(1 රාජා 22:29-35)

28 මසෙේ ඉශ්රායලේ රජ ද ජුදාහි රජ වන
ජහෙෝෂාපාට් ද රාමොත්-ගිලියද්ට විරුද්ධ ව සටනට
ගියෝ ය. 29 ඉශ්රායලේ රජ ජහෙෝෂාපාට්ට කතා
කොට, "මම වසේ මාරු කරගනෙ යුද්ධයට යන්නමේ.
එහතේ, ඔබ ඔබේ වස්ත්ර හැඳගත මැනව"යි කීවේ
ය. මසෙේ ඉශ්රායලේ රජ වසේ මාරු කරගත් පසු
ඔව්හු සටනට ගියෝ ය.
30 සිරියාවේ රජ තමාගේ රථාධිපතීන්ට කතා
කරමින්, "ඉශ්රායලේ රජු සමඟ මිස, ලොකු කුඩා
වනෙ කිසිවකෙු සමඟ සටන් නොකරන්නැ"යි
අණකර තිබුණේ ය. 31 රථාධිපතීහු ජහෙෝෂාපාට්
දුටු විට, "මොහු ඉශ්රායලේ රජ ය"යි ඔහුට විරුද්ධ
ව සටන් කරන්න ඔහු වට කරගත්තෝ ය. එවිට
ජහෙෝෂාපාට් මොරගැසී ය. සමිඳාණන් වහන්සේ
ඔහුට පිහිට වී ඔහු වතෙින් ඔවුන් අහක් කර වූ
සේක. 32 ඔහු ඉශ්රායලේ රජු නොවන බව
රථාධිපතීහු දැක, ඔහු លුහුබැඳයාමනේ ආපසු
හැරුණෝ ය. 33 එහතේ, එක්තරා මනුෂ්යයකේ දුන්න
තැත්කවා, නොදැන ම ඉශ්රායලේ රජුගේ
සන්නාහයේ සන්ධි අතරනේ ඔහුට විද්දේ ය. එවිට
ඔහු රථාචාර්යාට කතා කොට, ඔබ ආපසු හැරී,
සේනාවනේ පිටතට මා ගනෙ යන්න. මන්ද, මට
හොඳට ම තුවාළ ය"යි කීවේ ය. 34 ඒ දවස ගත
වීමත් සමඟ යුද්ධය තදබල විය. එසේ වී නමුත්,
ඉශ්රායලේ රජ සවස වන තුරු සිරියන්වරුන්ට
ඉදිරියනේ ආධාර ඇති ව රථයේ කළෙින් සිටුවනු
ලැබූ පසු, ඉර බසින වේලාව පමණේ දී මළේ ය.

### ජේහුගේ තරවටුව

19 ජුදාහි රජ වන ජහෙෝෂාපාට් ජරෙුසලමේ
තම මාලිගාවට සුව සේ හැරී ගියේ ය.
2 එහතේ, හනානිගේ පුත් ජේහු නම් දිවැසිවරයා
ජහෙෝෂාපාට්ගේ පරෙමඟට පිටත් ව ගොස්, ඔහුට
කතා කොට, "දුෂ්ටයාට උපකාර කිරීමත්, සමිඳාණන්
වහන්සේට වරෛ වන්නන්ට ප්රේම කිරීමත් ඔබට
යුතු ද? මේ කාරණය නිසා ඔබට විරුද්ධ ව
සමිඳාණන් වහන්සේගේ උදහස පැමිණ තිබේ.

3 එසේ වුවත්, ඔබ දේශයෙන් අෂේරා කප් කණු
පහකර දැමීම ද දෙවියන් වහන්සේ සෙවීමට ඔබේ
සිත යොමු කිරීම ද යන යහපත් ක්‍රියා කර ඇත්තේ
ය”යි කීවේ ය.

## ජෙහෝෂාපාට් රජුගේ ප්‍රතිසංස්කරණ

4 ජෙහෝෂාපාට් ජෙරුසලමෙහි කලක් වාසය
කොට, බයෙර්-ෂෙබා පටන් එප්‍රායිම් කඳු රට දක්වා
සෙනඟ අතරට ගොස්, ඔවුන්ගේ පියවරුන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේ වෙත ඔවුන් නැවත හරවා
ගත්තේ ය. 5 ඔහු ජුදා දේශයේ සියලු බලකොටු
නගරවල, නගරයක් නගරයක් පාසා
විනිශ්චයකාරයන් සිටුවා කතා කොට, 6 “ඔබ හැම
කරන්නේ කුමක් ද කියා වග බලාගන්න. මන්ද, ඔබ
විනිශ්චය කරන්නේ, මනුෂ්‍යයා උදෙසා නොව,
සමිඳාණන් වහන්සේ උදෙසා ය. විනිශ්චයයේ දී උන්
වහන්සේ ඔබ සමඟ වැඩ සිටින සේක. 7 එබැවින්
සමිඳාණන් වහන්සේ කෙරෙහි ගරුබිය ඇති ව
ප්‍රවේසමින් ක්‍රියා කරන්න. මන්ද, අපේ දෙවි
සමිඳාණන් වහන්සේ වංචාවක් වත්, අයුක්තියක්
වත්, අල්ලස් ගැනීමක් වත් නොකරන කෙනෙකු වන
බැවිනි”යි විනිශ්චයකාරයන්ට කීවේ ය.
8 තවද, ජෙහෝෂාපාට් සමිඳාණන් වහන්සේ
වෙනුවෙනේ විනිශ්චය කිරීමටත්, නඩු හබ විසඳීමටත්
ලෙවීවරුන්ගෙන් ද පූජකයන්ගෙන් ද ඉශ්‍රායලේ පිය
වංශවල ප්‍රධානීන්ගෙන් ද සමහර අය ජෙරුසලමට
පත් කළේ ය. ඔව්හු ජෙරුසලමට හැරී ආවෝ ය.
9 ඔහු ඔවුන්ට අණ කොට, “සමිඳාණන් වහන්සේ
කෙරෙහි ගරුබිය ඇති ව විශ්වාසවන්තකමින් ද මුළු
සිතින් ද මෙසේ කරන්න. 10 තමන්ගේ නගරවල
වාසය කරන ඔබේ සහෝදරයන්ගේ ලේ වැගිරවීම
ගැන වත්, ව්‍යවස්ථාව සහ ආඥාව ගැන වත්, පණත්
හා විනිශ්චයයන් ගැන වත් ඔබ වෙත පැමිණෙනෙ
සියලු පැමිණිලිවල දී ඔවුන් සමිඳාණන් වහන්සේට
විරුද්ධ ව වරදකාරයන් නොවන පිණිසත්, ඔබ සහ
ඔබේ සහෝදරයන්ට විරුද්ධ ව උදහස
නොපැමිණෙනෙ පිණිසත් ඔවුන්ට අවවාද කරන්න.
ඔබ වරදකාරයන් නොවන පිණිස මෙසේ කරන්න.
11 මෙන්න, සමිඳාණන් වහන්සේගේ සියලු කටයුතු
ගැන උත්තම පූජක වන අමරියා ද, රජුගේ සියලු
කටයුතු ගැන ජුදා වංශයේ අධිපතියා වන
ඉෂ්මායලේගේ පුත් සබෙදියා ද ඔබ හැමගේ
ප්‍රධානියෝ ය. ලෙවීවරු ද ඔබ ඉදිරියෙහි නිලධාරීහු
වෙති. ධෛර්යවත් ව ක්‍රියා කරන්න. උපදෙසේ
පිළිපදින්න. සමිඳාණන් වහන්සේ ඔබට යහපත
සලසන සේක් වා!”යි කීවේ ය.

## ඒදෝමේට විරුද්ධ සටන

20 මින්පසු මෝවබ්වරු ද අම්මොන්වරු ද ඔවුන්
සමඟ මයෙනිවරුන්ගෙනේ සමහරකේ ද
ජෙහෝෂාපාට්ට විරුද්ධ ව යුද්ධයට ආවෝ ය.
2 එවිට සමහරකේ අවුත්, ජෙහෝෂාපාට්ට කතා
කොට, “මුහුද එගොඩින් ඒදොමේහි සිට මහත්
සමූහයක් ඔබට විරුද්ධ ව එන්නාහ. ඔව්හු
හශශොන්-තාමාර්හි හවෙත් එන්-ගෙදියෙහි සිටිති”යි
දැන්වූ හ. 3 එවිට ජෙහෝෂාපාට් බිය වී, සමිඳාණන්
වහන්සේට යැදීමට ඉටාගෙන ජුදා මුළුල්ලෙහි
උපවාසයක් ප්‍රකාශ කළේ ය. 4 සමිඳාණන්
වහන්සේගෙනේ පිහිට ඉල්ලන පිණිස ජුදාවරු රුස්
වූවෝ ය. ජුදාහි සියලු නගරවලින් ඔව්හු සමිඳාණන්
වහන්සේට යැදීමට ආවෝ ය. 5 එවිට ජෙහෝෂාපාට්
සමිඳාණන් වහන්සේගේ මාලිගාවෙහි අලුත් මළුව
ඉදිරිපිට, ජුදා දේශයේ සහ ජෙරුසලමේ සිට රුස් වූ
සභාව මැද සිට මෙසේ කීවේ ය: 6 “අපේ
පියවරුන්ගේ දෙවි සමිඳුනි, ඔබ ස්වර්ගයෙහි දෙවියන්
වහන්සේ නොවන සේක් ද? ජාතීන්ගේ සියලු
රාජ්‍යයන් කෙරෙහි ආණ්ඩු කරන්නේත් ඔබ
වහන්සේ නොවන සේක් ද? ඔබේ හස්තයේ බලය
හා පරාක්‍රමය තිබේ. ඔබට විරුද්ධ ව සිටින්න
පුළුවන් කෙනෙකුත් නැත. 7 යෙසා 41:8; ජාකො
2:23අපේ දෙවියන් වහන්ස, ඔබේ සෙනඟ වන
ඉශ්‍රායලේ ඉදිරිපිටින් ඔබ වහන්සේ ම මේ
දේශයේ වැසියන් පන්නා දමා, ඔබේ මිත්‍ර වන
ආබ්‍රහම්ගේ වංශයට එය සදහට ම නුදුන් සේක්
ද? 8 ඔව්හු මෙහි වාසය කොට, ඔබේ නාමයට
මෙහි ශුද්ධස්ථානයක් ගොඩනඟා කතා කොට,
9 ‘අප පිට යම් විපත්තියක් එනම්, යුද්ධයක් හෝ
දඬුවමක් හෝ වසංගතයක් හෝ සාගතයක් හෝ
පැමිණියොත්, ඔබේ මේ මාලිගාව ඔබේ නාමය
දරන නිසා, අපි මේ මාලිගාවෙහි හා ඔබ ඉදිරියෙහි
සිට අපේ දුකේ දී ඔබට යාච්ඤා කරන්නෙමු, එවිට
ඔබ ඇහුම්කන් දී අප ගළවන සේකැ’යි කීවෝ ය.
10 ද්වි.නී. 2:4-19 “බැලුව මැනව, ඉශ්‍රායලේවරුන්
මිසරයෙනේ ආ කල, අම්මොන්වරුන් සහ මෝවබ්වරුන්
ද සේයිර් කඳුකරේ වැසියන් ද අතරට පැමිණෙන්න
ඔබ ඔවුන්ට ඉඩ නුදුන් බැවින්, ඔව්හු ඔවුන් විනාශ
නොකර ඔවුන් වෙතින් අහක් ව ගියෝ ය.
11 එහෙත්, ඔබ අපට හිමිකර දුන් ඔබේ උරුමයෙනේ
අප පන්නා දමන්න ඊමෙනේ ඔවුන් අපට ප්‍රතිඵල
දෙන හැටි බැලුව මැනව. 12 අපේ දෙවියන් වහන්ස,
ඔබ ඔවුන් විනිශ්චය නොකරන සේක් ද? මන්ද,
අපට විරුද්ධ ව එන මේ විශාල සෙනඟ ඉදිරියෙහි
සිටින්න අපට ශක්තිය නැත: අපි කුමක් කරමු ද
කියාත් නොදනිමු. එබැවින්, අපේ ඇස් ඔබ දෙස ම
යොමු කර තිබේ.”
13 ජුදා දේශයේ පිරිමි සියල්ලෝ ම තමන්ගේ අත
දරුවන් ද භාර්යාවන් ද දරුවන් ද සමඟ සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි සිටියෝ ය. 14 එවිට සමිඳාණන්
වහන්සේගේ ආත්මානුභාවය සභාව මැද සිටි
ආසාප්ගේ පුත්‍රයන්ගෙනේ එක් කෙනෙකු වන ලෙවීය
මත්තනියාගේ පුත් ජයීයෙලේගේ පුත්‍රයා වන
බෙනායාගේ පුත් ශකෙරියාගේ පුත්‍රයා වන
ජහසියලේ මත පහළ විය. 15 ද්වි.නී. 20:1-4ඔහු කතා
කොට, “සියලු ජුදාවරුනි, ජෙරුසලම් වැසියෙනි,
ජෙහෝෂාපාට් රජතුමනි, සවන් දෙන්න. සමිඳාණන්
වහන්සේ ඔබ හැමට මෙසේ කියන සේක: ‘මේ
විශාල සමූහය නිසා බිය නොවන්න;

නොකැළඹෙන්න, මන්ද, මේ යුද්ධය ඔබ සැමගේ
නොව දෙවියන් වහන්සේගේ වන බැවිනි. 16 හෙට
ඔවුන්ට විරුද්ධ ව යන්න. බලන්න, ඔව්හු ශීශ් නම්
බෑවුමෙන් නැඟී එති; ජෙරූයෙලේ පාළුකරය ඉදිරිපිට
මිටියාවතේ කෙළවර දී ඔව්හු ඔබ සියල්ලන්ට සම්බ
වන්නෝ ය. 17 නික්ම 14:13-14ජුදාවරුනි, ජෙරුසලමේ
වැසියනි, මේ යුද්ධයේ දී ඔබ සටන් කරන්න ඕනෑ
නැත.' සැරසී නිශ්චල ව සිට සමිඳාණන් වහන්සේ
ඔබට දෙන ගැළවීම බලා සිටින්න. සමිඳාණන්
වහන්සේ ඔබ සමඟ වැඩ සිටින නිසා බිය නොවී,
නොකැළඹී, හෙට ඔවුන් වෙත පිටත් ව යන්නැ"යි
පැවසී ය.
18 එවිට ජෙහෝෂාපාට් බිමට නැමුණේ ය. සියලු
ජුදාවරු ද ජෙරුසලමේ වැසියෝ ද සමිඳාණන්
වහන්සේට නමස්කාර කරමින් උන් වහන්සේ
ඉදිරියෙහි වැඳ වැටුණෝ ය. 19 කොහොත්වරුන්ගේ
පුත්‍රයන් ද කොරාවරුන්ගේ පුත්‍රයන් ද වන
ලෙවීවරු ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේට ඉමහත් හඬකින් ප්‍රශංසා කිරීමට පටන්
ගත්හ.
20 ඔව්හු පසු දා අලුයම නැඟිට තෙකෝවා
පාළුකරයට පිටත් ව ගියෝ ය. ඔවුන් පිටත් වෙද්දී
ජෙහෝෂාපාට් නැඟිට කතා කොට, "ජුදාවරුනි,
ජෙරුසලමේ වැසියනි, මාගේ වචන අසන්න, ඔබේ
දෙවි සමිඳාණන් වහන්සේ කෙරෙහි විශ්වාසය
තබන්න. එවිට ඔබ සුරක්ෂිත වන්නහු ය. උන්
වහන්සේගේ දිවැසිවරුන් විශ්වාස කරන්න. එවිට
ඔබ ජයග්‍රාහී වන්නහු ය"යි කීවේ ය. 21 ඔහු
සෙනඟ සමඟ සම්මන්ත්‍රණය කොට සමිඳාණන්
වහන්සේට ගායනා කරන්නන් පත් කළේ ය. ඔව්හු
නමස්කාරයට සුදුසු ඇඳුම් ලා ගෙන යුද්ධ සේනාවට
පෙරටු ව යමින්, උන් වහන්සේට ප්‍රශංසා කරමින්,
"සමිඳාණන් වහන්සේට ස්තුති කරන්න; මන්ද, උන්
වහන්සේගේ කරුණාව සදහට ම පවත්නේ ය"යි
ගැයුවෝ ය.

## සතුරන්ගේ විනාශය

22 ඔවුන් ප්‍රීති ඝෝෂාව ද ප්‍රශංසාව ද පටන්ගත්
වේලාවේ දී ජුදාහි ජනයාට විරුද්ධ ව අවුත් සිටි
අම්මොන්වරුන්ට සහ මෝවබ්වරුන්ට ද සේයිර්
කඳුකරයේ වැසියන්ට ද විරුද්ධ ව සැඟවී සිට පහර
දෙන සේනාවක් සමිඳාණන් වහන්සේ සිටවූ සේක.
ඔව්හු පැරදුණෝ ය. 23 මන්ද, අම්මොන්වරු සහ
මෝවබ්වරු සේයිර් කඳුකරයේ වැසියන් නසා
වනසන පිණිස ඔවුන්ට විරුද්ධ ව සටනට ගියහ.
සේයිර් වැසියන් මුළුමනින් ම නැති කළ පසු ඔව්හු
එකෙකු අනිකෙකු විනාශ කරන්න උපකාර වූ හ.
24 ජුදාවරු වනාහි පාළුකරයේ මුරකොටුව උඩට
අවුත් ඒ සමූහයා දෙස බැලූ විට, ඔවුන් මළකඳන් ව
බිම වැටී සිටිනු දුටුවෝ ය. ගැළවී ගිය කිසිවෙක් ද
නොසිටියේ ය.

25 ජෙහෝෂාපාට් ද ඔහුගේ සෙනඟ ද ඔවුන්ගෙන්
කොල්ලය ගන්න ආ කල, ගවයන් ද වස්තුව ද
වස්ත්‍ර ද අනර්ඝ බඩු ද ඔවුන්ට සම්බ විය.
ගෙනයන්න බැරි තරමට ඔව්හු ඒවා එකතු
කරගත්තෝ ය. කොල්ලය අධික බැවින් ඔව්හු තුන්
දවසක් ඒවා එකතු කරමින් සිටියහ. 26 සතර වන දා
ඔව්හු බෙරොකා මිටියාවතේ රැස් වුණෝ ය. ඔවුන්
එහි දී සමිඳාණන් වහන්සේට ප්‍රශංසා කළ බැවින්
අද දක්වා තිබෙන පරිදි ඒ ස්ථානයට බෙරොකා
මිටියාවත යයි කියන ලද්දේ ය. 27 එවිට ජුදාහි සහ
ජෙරුසලමේ සියලු මනුෂ්‍යයෝ ද ඔවුන්ට පෙරටුව
ජෙහෝෂාපාට් ද ප්‍රීතියෙන් ජෙරුසලමට හැරී යන්න
පිටත් වුණෝ ය. මන්ද, සමිඳාණන් වහන්සේ
ඔවුන්ගේ සතුරන් ගැන ප්‍රීති වන්න ඔවුන්ට
සැලැස්සූ බැවිනි. 28 ඔව්හු වීණා ද මහා වීණා ද
හොරණෑ ද ඇති ව ජෙරුසලමෙහි සමිඳාණන්
වහන්සේගේ මාලිගාවට ආවෝ ය. 29 සමිඳාණන්
වහන්සේ ඉශ්‍රායලේවරුන්ගේ සතුරන්ට විරුද්ධ ව
සටන් කළ බව දේශ දේශාන්තරවල රාජ්‍යයන් ඇසූ
විට, ඔව්හු දෙවියන් වහන්සේ ගැන භීතියට පත් වූ
හ. 30 මෙසේ ජෙහෝෂාපාට්ගේ රාජ්‍යය සාමකාමී ව
පැවතුණේ ය. එසේ වූයේ, ඔහුගේ දෙවියන්
වහන්සේ හාත්පසින් ම ඔහුට සාමදානය දුන් බැවිනි.

## ජෙහෝෂාපාට්ගේ රජ කාලය

(1 රාජා 22:41-50)

31 ජෙහෝෂාපාට් ජුදා දේශයෙහි රජකම් කළේ
ය. ඔහු සිංහාසනාරූඪ වන කල අවුරුදු තිස්පහක්
වයස් ව සිටියේ ය. ඔහු ජෙරුසලමෙහි විසිපස්
අවුරුද්දක් රජකම් කළේ ය. ඔහුගේ මවගේ නම
අශූබා ය. ඈ ෂිල්හිගේ දූව ය. 32 ඔහු තමාගේ පිය
වන ආසාගේ අඩි පාරේ ගමන් කරමින් එයින් අහක්
නොවී, සමිඳාණන් වහන්සේගේ ඇස් හමුයෙහි
යහපත් දේ කළේ ය. 33 එසේ වුවත්, ගිරිකුළු
දේවාල විනාශ නොකරන ලද්දේ ය. ඒ වන තුරු
සෙනඟ තමන්ගේ පියවරුන්ගේ දෙවියන් වහන්සේ
දෙසට තමන්ගේ සිත් යොමු කළේ නැත.
34 ජෙහෝෂාපාට්ගේ ඉතිරි ක්‍රියා මුල පටන් අග
දක්වා ඉශ්‍රායලේ රජුන්ගේ ග්‍රන්ථයෙහි අන්තර්ගත
ය. ඒවා හනානිගේ පුත් ජේහුගේ පුරාවෘත්ත
ග්‍රන්ථයේ වාර්තාකර තිබේ.
35 මින්පසු ජුදාහි රජ වූ ජෙහෝෂාපාට් ඉතා දුර්ජන
ලෙස හැසුරුණු ඉශ්‍රායලේ රජ වූ අහසියාට එකතු
වුණේ ය. 36 ඔහු තර්ෂිෂ්ට යාමට නැව් සාදන පිණිස
ඔහුට එකතු විය. ඔව්හු එශියොන්-ගෙබෙරේහි නැව්
සෑදුවෝ ය. 37 එවිට මරේෂාහි දෝදාවාහුගේ පුත්
එලියෙසෙර් ජෙහෝෂාපාට්ට විරුද්ධ ව දිවැස් වැකියක්
පවසමින්, "ඔබ අහසියාට එකතු වූ නිසා සමිඳාණන්
වහන්සේ ඔබේ වැඩ කඩාකප්පල් කළ සේකැ"යි
කීයේ ය. තවද, නැව් බිඳී තර්ෂිෂ්ට යන්න ඒවාට
බැරි විය.

### ජෙහෝරාම් රජ
(2 රාජා 8:17-24)

21 ජෙහෝෂාපාට් මියගිය පසු දාවිත්ගේ නුවර
තමාගේ පියවරුන් සමඟ තැන්පත් කරන
ලද්දේ ය. ඔහුගේ පුත් ජෙහෝරාම් ඔහු වෙනුවට
රජ විය. 2 ජෙහෝෂාපාට්ගේ පුත්‍රයන් වන අශරියා,
ජෙහීයෙලේ, ශකෙරියා, අශරියා, මීකායෙලේ, ෂෙපටියා
යන මොවුහු ඔහුගේ සහෝදරයෝ ය. මේ
සියල්ලෝ ඉශ්‍රායෙලේහි රජ වූ ජෙහෝෂාපාට්ගේ
පුත්‍රයෝ ය. 3 ඔවුන්ගේ පියා රන් රිදී ද අනර්ඝ
දේවල් ද වන බොහෝ තෑගි ද ජුදාහි බලකොටු
නගර ද ඔවුන්ට දුන්නේ ය. එහෙත්, ජෙහෝරාම්
කුලුඳුලා නිසා ඔහුට රාජ්‍යය බාර දුන්නේ ය.
4 ජෙහෝරාම් තම පියාගේ රාජ්‍යයට පැමිණ බලවත්
වූ කල, තමාගේ සියලු සහෝදරයන් ද ඉශ්‍රායෙලේහි
සමහර අධිපතීන් ද කඩුවෙන් මැරී ය.
5 ජෙහෝරාම් තිස්දෑවුරුදු වයසේ දී රජ වී
ජෙරුසලමහි අට අවුරුද්දක් රජකම් කළේ ය.
6 ආහබ්ගේ වංශය කළ පරිදි ඔහු ඉශ්‍රායෙලේ
රජුන්ගේ අඩි පාරේ ගමන් කළේ ය. මන්ද, ඔහු
ආහබ්ගේ දුවක සරණ පාවා ගත්තේ ය. මෙසේ
ඔහු සමිඳාණන් වහන්සේගේ ඇස් හමුයෙහි නපුරු
දේ කළේ ය. 7 1 රාජා 11:36එහෙත්, සමිඳාණන්
වහන්සේ දාවිත් සමඟ කළ ගිවිසුම නිසා ද ඔහුටත්,
ඔහුගේ දරුවන්ටත් සෑමකල්හි ම නොනිවෙන
පහනක් සේ එහි රජකම දෙන්න පොරොන්දු වූ
නිසා ද දාවිත්ගේ වංශය නැති කරන්න අකමැති වූ
සේක.
8 උත් 27:40 ඔහුගේ කාලයේ දී ඒදොම්වරු කැරලි
ගසා ජුදාවරුන් යටතෙන් අහක් ව තමන්ට රජකු
පත්කර ගත්තෝ ය. 9 එවිට ජෙහෝරාම් තමාගේ
අධිපතීන් ද සියලු රථ ද සමඟ ගොස්, රාත්‍රියේ
නැඟිට, තමා වටකර සිටි ඒදොම්වරුන්ටත්,
රථාධිපතීන්ටත් පහර දුන්නේ ය. 10 මෙසේ
ඒදොම්වරු අද දක්වා ජුදාවරුන්ගේ පාලනයෙන් ඉවත්
වී සිටිති. තවද, ලිබ්නාවරුත් එම කාලයේ දී කැරලි
ගසා ඔහුගේ පාලනයෙන් ඉවත් වූ හ. මෙසේ වූයේ,
ඔහු තමාගේ පියවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේ අත් හැරිය නිසා ය. 11 ඇරත්, ඔහු ජුදා
ගිරිකුළු දේවාල සාදා, ජෙරුසලමේ වැසියන් අන්
දෙවිවරුන් ඇදහීමට පොළඹවා ජුදාවරුන් මුළා කරවී
ය.
12 තවද, දිවැසිවර එලියා විසින් ලියන ලද
ලියවිල්ලක් ඔහුට ලැබුණේ ය. එහි ලියා තිබුණේ,
“ඔබේ පියා වන දාවිත්ගේ දෙවි සමිඳාණන්
වහන්සේ මෙසේ වදාරන සේක. ඔබේ පිය වූ
ජෙහෝෂාපාට්ගේ අඩි පාරේත්, ජුදාහි රජ වූ
ආසාගේ අඩි පාරේත් ඔබ නොගොස්, 13 ඉශ්‍රායෙලේ
රජුන්ගේ අඩි පාරේ ගමන් කරමින්, ආහබ්ගේ
වංශය කළ පරිදි ජුදාවරුන් ද ජෙරුසලමේ වැසියන් ද
අන් දෙවිවරුන් ඇදහීමට පමුණුවා, ඔබේ පියාගේ
වංශය වන, ඔබට වඩා යහපත් වන ඔබේ
සහෝදරයන් මැරූ බැවින්, 14 සමිඳාණන් වහන්සේ
ඔබේ සෙනඟටත්, ඔබේ දරුවන්ටත්, ඔබේ
භාර්යාවන්ටත්, ඔබේ සියලු සම්පත්වලටත් මහත්
පීඩාවකින් පීඩා කරනු ඇත. 15 ඔබේ බඩවැල්
දවසින් දවස රෝගාතුරකමෙන් වැටී යන ලෙස
ඒවායෙහි දරුණු රෝග වන්නේ ය” කියා ය.
16 එලෙස සමිඳාණන් වහන්සේ පිලිස්තිවරුන්ගේ ද
කූෂ්වරුන්ට ළං ව වාසය කරන අරාබිවරුන්ගේ ද සිත්
ජෙහෝරාම්ට විරුද්ධ ව පෙළඹවූ සේක. 17 ඔව්හු
ජුදාට විරුද්ධ ව අවුත් ඇතුළට වැද රජ ගෙදර තිබූ
සම්පත් සියල්ල ද ඔහුගේ පුත්‍රයන් ද භාර්යාවන් ද
රැගෙන ගියෝ ය. ඔහුගේ පුත්‍රයන්ගෙන් බාලයා වූ
අහසියා හැර වෙන කිසි පුත්‍රයෙක් ඔහුට ඉතිරි නො
වී ය.
18 මේ සියල්ලට පසු ඔහුගේ බඩවැල් වල වැළඳි
අසාධ්‍ය රෝගයකින් සමිඳාණන් වහන්සේ ඔහුට
පහර දුන් සේක. 19 එම රෝගය කලක් පැවතිණි.
දෑවුරුද්දක් පසු වූ කල, ඒ රෝගය නිසා ඔහුගේ
බඩවැල් වැටී ගියේ ය. ඔහු ද දරුණු රෝග
වේදනාවෙන් මළේ ය. ඔහුගේ පියවරුන්ගේ
ගෞරවය ලෙස ගිනි මැලයක් දැල් වූ පරිදි ඔහුගේ
සෙනඟ ඔහු ගැන ගිනි මැලයක් නොදැල් වූ හ.
20 ඔහු තිස්දෑවුරුදු වයසේ දී රජ වී අට අවුරුද්දක්
ජෙරුසලමහි රජකම් කළේ ය. ඔහුගේ මරණය
ගැන කිසිවෙකේ කණගාටු නො වූ හ. ඔව්හු
දාවිත්ගේ නුවර ඔහු තැන්පත් කළෝ ය. එහෙත්,
තැන්පත් කළේ රජවරුන්ගේ සොහොන් ගවෙල්හි
නොවේ.

### අහසියාගේ රජකම
(2 රාජා 8:24-29;9:21-28)

22 ජෙරුසලමේ වැසියෝ රජුගේ බාල පුත්
අහසියා ඔහු වෙනුවට රජකමට පත් කළෝ
ය. මන්ද, අරාබිවරුන් සමඟ කඳවුරට ආ හමුදාව
රජුගේ සියලු වැඩිමහල් පුත්‍රයන් මරා දමා තිබිණි.
එබැවින් ජුදාහි රජ වූ ජෙහෝරාම්ගේ පුත් අහසියා
රජකම් කළේ ය. 2 අහසියා හතළිස්දෑවුරුදු වයසේ
දී රජ වී අවුරුද්දක් ජෙරුසලමහි රජකම් කළේ ය.
ඔහුගේ මවගේ නම අතලියා ය. ඈ ඔම්රීගේ
මිණිබිරියකි. 3 ඔහු ද ආහබ්ගේ වංශයෙන්
පැවතෙන්නන්ගේ අඩි පාරේ ගමන් කළේ ය. මන්ද,
දුෂ්ටකම් කිරීමට ඔහුගේ මවු තොමෝ ඔහුට
උපදෙස් දුන්නා ය. 4 ආහබ්ගේ වංශය කළාක් මෙන්
ඔහු සමිඳාණන් වහන්සේගේ ඇස් හමුයෙහි නපුරු
දේ කළේ ය. මන්ද, ඔහුට විනාශය පැමිණෙන ලෙස
ඔව්හු ඔහුගේ පියාගේ මරණයෙන් පසු ඔහුගේ
උපදේශකයෝ වූ හ. 5 ඔහුත් ඔවුන්ගේ අවවාද
ලෙස හැසිර, ආහබ්ගේ පුත් ඉශ්‍රායෙලේ රජ වූ
ජෙහෝරාම් සමඟ සිරියාවේ රජ වූ හසායෙල්ට
විරුද්ධ ව රාමොත්-ගිලියද්හි යුද්ධයට ගියේ ය.
සිරියන්වරු ජෙහෝරාම්ට තුවාළ කළෝ ය. 6 ඔහු
සිරියාවේ රජ වූ හසායෙල්ට විරුද්ධ ව සටන් කරන
අතර, රාමාහි දී සිරියන්වරුන් විසින් ඔහුට කරන ලද
තුවාළ ජෙශ්‍රයෙලේහි දී සුව කරවාගන්න පිණිස
හැරී ආවේ ය. ජුදාහි රජ ජෙහෝරාම්ගේ පුත්

අහසියා ද ආහබ්ගේ පුත් ජෙහෝරාම් රෝගාතුර ව
සිටි බැවින් ඔහු බලන්න ජෙශ්‍රෙයෙලේට ගියේ ය.
7 ජෙහෝරාම් ළඟට යාම නිසා අහසියාට වූ
විනාශය දෙවියන් වහන්සේ කෙරෙන් විය. මන්ද, ඔහු
ගිය කල ආහබ්ගේ වංශය වනසන පිණිස
සමිඳාණන් වහන්සේ විසින් අභිෂේක කරන ලද
නිම්ෂිගේ පුත් ජේහුට විරුද්ධ ව ඔහු ජෙහෝරාම්
සමඟ ගියේ ය. 8 තවද, ජේහු ආහබ්ගේ වංශය
කෙරෙහි විනිශ්චය ඉෂ්ට කරද්දී ජුදාහි අධිපතීන් ද
අහසියාට සේවය කළ අහසියාගේ සහෝදරයන්ගේ
පුත්‍රයන් ද සම්බ වී ඔවුන් මැරුවේ ය. 9 ඔහු
අහසියා සොයා ගියේ ය. ඔව්හු සමාරියේ සැඟවී
සිටි ඔහු අල්ලා ජේහු ළඟට ගෙනවුත් මැරුවෝ ය.
තවද, ඔව්හු කතා කොට, "මොහු වනාහි තමාගේ
මුළු සිතින් සමිඳාණන් වහන්සේ සොයා ගිය
ජෙහෝෂාපාත්ගේ පුත්‍රයා ය"යි ඔහු තැන්පත් කළෝ
ය. රාජ්‍යය ගෙන යාමට අහසියාගේ වංශයේ
කිසිවෙක් සිටියේ නැත.

### අතලියා බිසව කළ අපරාධය
(1 රාජා 11:1-3)

10 එකල අහසියාගේ මව වූ අතලියා තමාගේ
පුත්‍රයා මළ බව දැක, නැඟිට මුළු ජුදා රාජ වංශය
නැති කළා ය. 11 එහෙත්, රජුගේ දූ වන
ජෙහෝෂෙබත් මරන්න නියම රාජ පුත්‍රයන් අතරෙන්
අහසියාගේ පුත් ජෝවාෂ් හොරෙන් හැරගෙන
ගොස්, ඔහු ද ඔහුගේ කිරි මව ද යහන් ගබඩාවෙහි
සඟවා තැබුවා ය. මෙසේ ජෙහෝරාම් රජගේ දූ වූ,
ජෙහෝයාදා පූජකයාගේ භාර්යාව වූ අහසියාගේ
සහෝදරී වූ ජෙහෝෂෙබත්, අතලියා විසින් නොමරනු
ලබන ලෙස ඈ කෙරෙන් ඔහු සැඟවුවා ය. 12 ඔහු
දෙවියන් වහන්සේගේ මාලිගාවෙහි ඔවුන් සමඟ
අවුරුදු හයක් සැඟවී සිටියේ ය. අතලියා දේශයෙහි
රජකම් කළා ය.

### අතලියා රැජිනගේ මරණය
(2 රාජා 11:4-16)

23 සත් වන අවුරුද්දේ දී ජෙහෝයාදා ධෛර්‍ය
වඩා, ශතාධිපතීන් වන ජෙරොහාම්ගේ පුත්
අශරියා ද ජෙහෝහානාන්ගේ පුත් ඉෂ්මායෙල් ද
ඕබෙද්ගේ පුත් අසරියා ද අදායාගේ පුත් මයසේයා
ද සික්රිගේ පුත් එලිෂාපාට් ද සමඟ ගිවිසුමක් කර
ගත්තේ ය. 2 ඔව්හු ජුදා දේශයෙහි ඔබමොබ
ගොස්, ජුදාහි සියලු නගරවලින් ලෙවීවරුන් ද
ඉශ්‍රායෙල්වරුන්ගේ පිය වංශවල ප්‍රධානීන් ද රැස්
කරගෙන ජෙරුසලමට ආවෝ ය.
3 2 සාමු 7:12 මුළු සභාව දෙවියන් වහන්සේගේ
මාලිගාවෙහි රජු හා සමඟ ගිවිසුමක් කරගත්තා ය.
ජෙහෝයාදා ඔවුන්ට කතා කොට, "සමිඳාණන්
වහන්සේ දාවිත්ගේ පුත්‍රයන් ගැන කී ප්‍රකාරයට
රජුගේ පුත්‍රයා රජකමට පත් විය යුතු ය. 4 ඔබ
හැම කරන්නට ඕනෑ දේ මේ ය. සබත් දවසේ දී
දේව මාලිගාවට ඇතුල් වන පූජකයන් ද ලෙවීවරුන්
ද වන ඔබෙන් තුනෙන් කොටසක් දොරටු පාලකයන්
විය යුතු ය. 5 තුනෙන් කොටසක් රජ ගෙයි ද
තුනෙන් කොටසක් අත්තිවාරම් දොරටුවෙහි ද සිටිය
යුතු ය. මුළු සෙනඟ ද සමිඳාණන් වහන්සේගේ
මාලිගාවෙහි මණ්ඩපවල සිටිත්වා. 6 එහෙත්,
පූජකයන් ද ලෙවීවරුන්ගෙන් සේවය කරන්නන් ද
හැර වෙන කිසිවෙක් සමිඳාණන් වහන්සේගේ
මාලිගාවට ඇතුල් නොවෙත්වා. ඔව්හු විශුද්ධ ව
සිටින නිසා ඇතුළු වෙත්වා. එහෙත්, මුළු සෙනඟ
සමිඳාණන් වහන්සේගේ නියමයන් පිළිපැද්ද යුතු ය.
7 ලෙවීවරුන් එක් එක්කෙනා තම තමාගේ ආයුධ
අතින් ගෙන රජු වටකර සිටිය යුතු ය. දේව
මාලිගාවට ඇතුළු වන කවුරුන් නමුත් මරනු ලැබිය
යුතු ය. රජු ඇතුළු වන කල්හි ද පිටත යන කල්හි ද
ඔබ හැම ඔහු සමඟ සිටින්නැ"යි කීවේ ය.
8 ලෙවීවරු ද සියලු ජුදාවරු ද ජෙහෝයාදා පූජකයා
විසින් අණ කරනු ලැබූ සියල්ල ලෙස කොට,
එකිනෙකා තම තමාගේ මිනිසුන් වන, සබත් දවසේ
දී ඇතුළු වන තැනැත්තන් පිටත යන තැනැත්තන්
සමඟ කැඳවාගත්තෝ ය. මන්ද, ජෙහෝයාදා
පූජකයා මුරකාවල් නිදහස් කර නොහැරියේ ය.
9 එවිට ජෙහෝයාදා පූජකයා දෙවියන් වහන්සේගේ
මාලිගාවෙහි තිබූ දාවිත් රජුගේ හෙල්ල ද කුඩා
පලිස් සහ මහ පලිස් ද ශතාධිපතීන්ට දී, 10 මුළු
සෙනඟ එකිනෙකා තම තමාගේ ආයුධ අතේ ඇති
ව දේව මාලිගාවේ දකුණු පැත්තේ සිට දේව
මාලිගාවේ වම් පැත්ත දක්වා පූජාසනයත්, දේව
මාලිගාවත් ළඟ රජු වටකර සිටෙව්වේ ය. 11 ඉන්පසු
ඔව්හු රජ කුමාරයා පිටතට ගෙනවුත්, ඔහු මත්තෙහි
ඔටුන්න තබා, ව්‍යවස්ථාව ඔහුට දී, ඔහු රජකමට
පත් කළෝ ය. ජෙහෝයාදා ද ඔහුගේ පුත්‍රයෝ ද
ඔහු අභිෂේක කොට, "මහ රජ සැරදේවා" කියා
හඬ නැඟුවෝ ය.
12 සෙනඟ රජ වෙත දුවමින්, රාජ ප්‍රශස්ති ගී
ගයන හඬ අතලියාට ඇසුණු විට, ඈ සමිඳාණන්
වහන්සේගේ මාලිගාවෙහි සිටි සෙනඟ ළඟට ආවා
ය. 13 ඈ බැලූ විට ඇතුළු වන තැන රජ තමෙ තම
වේදිකාව උඩ සිටිනවාත්, රජු ළඟ අධිපතීන් ද
නළාකාරයන් ද සිටිනවාත් දැක, දේශයේ මුළු
සෙනඟ ප්‍රීතිමත් ව හොරණෑ පිඹිනවාත්, ගී
කියන්නන් ද තූර්ය භාණ්ඩවලින් ගායනා කරන්නන් ද
ප්‍රශස්ති ගී ගයනවාත් අසා, කෝපයෙන් ඇගේ
ඇඳුම් ඉරාගෙන, "ද්‍රෝහිකම ය, ද්‍රෝහිකම ය"
කියා කෑ ගැසුවා ය.
14 එවිට ජෙහෝයාදා පූජකයා සේනාවේ
ප්‍රධානීන් වන ශතාධිපතීන් පිටතට ගෙනවුත්,
ඔවුන්ට කතා කොට, "ඇය පේළි අතරෙන් පිටතට
ගෙන එන්න. ඈ පස්සේ යමෙක් ආවොත් ඔහු
කඩුවෙන් මරන්නැ"යි අණ කළේ ය. "දේව
මාලිගාවෙහි දී ඈ මරනු නොලබාවා"යි පූජකයා කියා
තිබිණි.
15 ඔව්හු ඇය අත්අඩංගුවට ගත්හ; ඈ රජ ගෙදරට
ගෙන ගියෝ ය. එහි දී අශ්ව දොරටුව ළඟ ඔව්හු ඈ
මැරුවෝ ය.

## දේව නමස්කාරය නැවත පිහිටුවීම

(2 රාජා 11:17-20)

16 සමිඳාණන් වහන්සේගේ සෙනඟ වී සිටින ලෙස
ජෙහෝයාදා තමා සහ මුළු සෙනඟත්, රජුත් අතරේ
ගිවිසුමක් කළේ ය. 17 මුළු සෙනඟ බාල්
දෙවියාගේ ගෘහයට ගොස් එය කඩා දමා, ඔහුගේ
පූජාසන ද ඔහුගේ පිළිම ද බිඳ දමා පූජාසන
ඉදිරියෙහි බාල්ගේ පූජකයා වන මත්තන් මැරුවෝ
ය. 18 තවද, දාවිත්ගේ නියමයේ ප්‍රකාරයට ප්‍රීතිය
ද ගී ගැයීම ද ඇති ව, සමිඳාණන් වහන්සේගේ
දවන යාග පූජා මෝසෙස්ගේ ව්‍යවස්ථාවෙහි ලියා
තිබෙන ලෙස ඔප්පු කිරීමට, ජෙහෝයාදා උන්
වහන්සේගේ මාලිගාවේ මුර මෙහෙයෙවල් දාවිත්
විසින් උන් වහන්සේගේ මාලිගාවේ සේවයට බෙදා
නියම කරන ලද ලෙවීවරුන් වන පූජකයන් අතට
බාර කළේ ය. 19 යම් හයෙකින් අපවිත්‍ර කිසිවකු
ඇතුළු නොවන පිණිස ඔහු සමිඳාණන් වහන්සේගේ
මාලිගාවේ දොරකඩවල දොරටු පාලකයන්
සිටවූවේ ය. 20 තවද, ඔහු ශතාධිපතීන් ද
වංශාධිපතීන් ද සෙනඟගේ ආණ්ඩුකාරයන් ද
දේශයේ මුළු සෙනඟ ද කැඳවාගෙන, සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ සිට රජු ගෙන ගියේ ය.
ඔව්හු ඉහළ දොරටුවෙන් රජ ගෙට පැමිණ රජතුමන්
රාජාසනයෙහි වාඩි කරවූ හ. මෙසේ දේශයේ මුළු
සෙනඟ ප්‍රීති වූ හ. 21 නගරය ද සාමකාමී ව
තිබුණේ ය. මෙලෙසෙ ඔව්හු අතලියා කඩුවෙන්
මැරුවෝ ය.

## ජෝවාෂ් රජ දේව මාලිගාව ප්‍රතිසංස්කරණය කිරීම

24 ජෝවාෂ් සත් අවුරුදු වයසේ දී රජ වී
ජෙරුසලමෙහි සතළිස් අවුරුද්දක් රජකම්
කළේ ය. ඔහුගේ මවගේ නම ශිබියා ය. ඈ
බෙයෙර්-ෂෙබාහි ස්ත්‍රියකි. 2 ජෙහෝයාදා පූජකයාගේ
කාලයේ මුළුල්ලෙහි ජෝවාෂ් සමිඳාණන්
වහන්සේගේ ඇස් හමුයෙහි හරි දේ කළේ ය.
3 ජෙහෝයාදා ඔහුට භාර්යාවන් දදෙනෙකු පාවා
දුන්නේ ය. ඔහුට දාව පුත්‍රයෝත්, දූවරුත් උපන්නෝ
ය.
4 ඉන්පසු ජෝවාෂ් සමිඳාණන් වහන්සේගේ
මාලිගාව ප්‍රකෘතිමත් කරන්න සිතට ගෙන,
5 පූජකයන් ද ලෙවීවරුන් ද රැස් කරගෙන ඔවුන්ට
කතා කොට, “ඔබ හැම ජුදාහි නගරවලට ගොස්
අවුරුද්දෙන් අවුරුද්ද ඔබේ දෙවියන් වහන්සේගේ
මාලිගාව අලුත්වැඩියා කරන පිණිස සියලු
ඉශ්‍රායලේවරුන්ගෙන් මුදල් එකතු කරන්න. ඒ
කාරණය ගැන ඉක්මන්වන්නැ”යි කීවේ ය. එහෙත්,
ලෙවීවරු ඉක්මන් නො වූ හ. 6 නික්ම 30:11-16එවිට
රජ තමෙ ප්‍රධානියා වන ජෙහෝයාදා කැඳවා,
“සමිඳාණන් වහන්සේගේ මෙහෙකරු වූ මෝසෙස් ද
ඉශ්‍රායලේ සභාව ද විසින් සම්මුඛ මණ්ඩපය උදෙසා
නියම කරන ලද බදු මිල ලෙවීවරුන් විසින් ජුදා
දේශයෙන් සහ ජෙරුසලමෙන් එකතු කර ගෙනෙනු
ලබන හැටියට ඔබ වග බලා නොගත්තේ මන්දැ”යි
ඇසී ය.
7 මන්ද දුෂ්ට වූ අතලියා සහ ඇගේ පුත්‍රයන්
දෙවියන් වහන්සේගේ මාලිගාව කඩා, උන්
වහන්සේගේ මාලිගාවේ කැප වූ සියලු දේවල් බාල්
දේවතාවන් උදෙසා පාවිච්චියට ගෙන ගොස් තිබුණු
හයෙනි.
8 තවද, පෙට්ටියක් සාදා සමිඳාණන් වහන්සේගේ
මාලිගාවේ දොරකඩ පිටතින් තබන ලෙස රජ අණ
කළේ ය. 9 එවිට දෙවියන් වහන්සේගේ
මෙහෙකරුවා වූ මෝසෙස් පාළුකරයේ දී
ඉශ්‍රායලේවරුන්ට නියම කළ බද්ද සමිඳාණන්
වහන්සේ උදෙසා ගෙනෙන්න කියා ජුදාහි සහ
ජෙරුසලමෙහි ප්‍රසිද්ධ කරන ලද්දේ ය. 10 එවිට
සියලු අධිපතීහු ද මුළු සෙනඟ ද සන්තෝෂ ව, බදු
ගෙවා නිම වන තුරු මුදල් ගෙනවුත් පෙට්ටියේ
දැම්මෝ ය. 11 මයොකාරයෙන් ඒ පෙට්ටිය ලෙවීවරුන්
ලවා රාජ භාණ්ඩාගාරයට ගෙන්වන විටත්, බොහෝ
මුදල් තිබෙන බව දකින විටත්, රජුගේ ලේකම් ද
උත්තම පූජකයාගේ සේවකයා ද අවුත් පෙට්ටිය
හිස්කර, එය නැවත ගෙන ගොස් පළමු තිබුණු තැන
තැබූ හ. ඔව්හු දවසින් දවස මෙසේ කොට බොහෝ
මුදල් එකතු කළෝ ය.
12 රජ සහ ජෙහෝයාදා සමිඳාණන් වහන්සේගේ
මාලිගාවේ මෙහෙයේ කටයුතු කරවන්නට ඒවා
දුන්නෝ ය. ඔව්හු උන් වහන්සේගේ මාලිගාව
අලුත්වැඩියා කරන පිණිස ගල්වඩුවන් ද වඩුවන් ද
උන් වහන්සේගේ මාලිගාව හරිගැස්සීමට යකඩ සහ
ලෝකඩ වැඩ කරන්නන් ද කුලියට ගත්හ.
13 කම්කරුවෝ වීර්යයෙන් වැඩ කළෝ ය. මෙසේ
ඔවුන් විසින් ඒ වැඩ සම්පූර්ණ කරන ලදී. ඔව්හු
දෙවියන් වහන්සේගේ මාලිගාව නිසි ලෙසෙ පිහිටුවා
එය සවි කළෝ ය. 14 වැඩ නිම කළ පසු ඔව්හු
ඉතිරි මුදල රජු සහ ජෙහෝයාදා ඉදිරිපිටට
ගෙනාවෝ ය. එයින් සමිඳාණන් වහන්සේගේ
මාලිගාවට භාණ්ඩ එනම්, මෙහෙයටත්, පූජා ඔප්පු
කිරීමටත් බඳු ද හැඳි ද රන් රිදී භාජන ද සාදන
ලද්දේ ය. ජෙහෝයාදාගේ මුළු කාලයේ දී
සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ දවන යාග පූජා
නිතර ම ඔප්පු කරන ලද්දේ ය.

## ජෝවාෂ් රජුගේ වැටීම සහ මරණය

15 එහෙත්, ජෙහෝයාදා මහලු ව දීර්ඝ ආයු වළඳා
මළේ ය. මැරෙන කල ඔහුට වයස අවුරුදු එකසිය
තිහකි. 16 ඔහු ඉශ්‍රායලේහි ද දෙවියන් වහන්සේ
සහ උන් වහන්සේගේ මාලිගාව උදෙසා ද යහපත
කළ බැවින් දාවිත්ගේ නුවර රජවරුන් අතරේ
තැන්පත් කරනු ලැබී ය.
17 ජෙහෝයාදා මියගිය පසු ජුදාහි අධිපතීහු අවුත්
රජුට ආචාර කළහ. එවිට රජ ඔවුන්ට සවන් දුන්නේ
ය. 18 ඔව්හු තමන්ගේ පියවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේගේ මාලිගාව අත්හැර දමා අෂේරා කප්
කණුවලටත්, පිළිමවලටත් සේවය කළෝ ය.

ඔවුන්ගේ මේ වරද නිසා ජුදා දේශය ද ජෙරුසලම ද
පිට දේව උදහස පැමිණියේ ය. 19 එහෙත්, ඔවුන්
සමිඳාණන් වහන්සේ වෙත හරවන පිණිස උන්
වහන්සේ දිවැසිවරුන් ඔවුන් අතරට එවූ සේක. ඒ
දිවැසිවරුන් ඔවුන්ට අවවාද කළ නමුත්, ඔව්හු
ඇහුම්කන් නුදුන්හ. 20 මතෙ 23:35; ලූක්
11:51දෙවියන් වහන්සේගේ ආත්මානුභාවය
ජෙහෝයාදා පූජකයාගේ පුත් ශකෙරියා පිට
පැමිණියේ ය. ඔහු සෙනඟට ඉහළින් නැඟිට සිට
ඔවුන්ට කතා කොට, "දෙවියන් වහන්සේ මෙසේ
වදාරන සේක: 'නුඹලා සමිඳාණන් වහන්සේගේ
ආඥා කඩ කරන්නේ මන් ද? නුඹලාට යහපතක්
නොවන්නේ ය. නුඹලා සමිඳාණන් වහන්සේ
අත්හැරිය නිසා උන් වහන්සේත් නුඹලා අත්හැරිය
සේකැ' "යි කීවේ ය. 21 ඔව්හු රජුගේ ආඥාව පිට
ඔහුට විරුද්ධ ව කුමන්ත්‍රණ කොට, සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ මළුවේ දී ඔහුට ගල්
ගැසුවෝ ය. 22 මෙසේ ජෝවාෂ් රජ ශකෙරියාගේ
පිය වූ ජෙහෝයාදා තමාට පෑ වූ කරුණාව සිහි
නොකොට ඔහුගේ පුත්‍රයා මැරී ය. ඔහු මැරෙද්දී
කතා කොට, "සමිඳාණන් වහන්සේ මෙය බලා
ප්‍රතිවිපාක දෙන සේක්වා"යි කීවේ ය.
23 ඊළඟ අවුරුද්දෙහි සිරියන්වරුන්ගේ සේනාව
ජෝවාෂ්ට විරුද්ධ ව පැමිණියේ ය. ඔව්හු ජුදා
දේශයටත්, ජෙරුසලමටත් පැමිණ, සෙනඟ අතරෙන්
සෙනඟගේ සියලු අධිපතීන් නැතිකර දමා,
ඔවුන්ගෙන් ගත් මුළු කොල්ලය දමස්කයේ රජුට
යැවූ හ. 24 සිරියන්වරුන්ගේ සේනාව ගණනින්
ස්වල්ප දෙනෙකු ව පැමිණි නමුත්, ජුදාවරුන් තම
පියවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ අත්හළ
නිසා, සමිඳාණන් වහන්සේ ඉතා විශාල සේනාවක්
ඔවුන් අතට පාවා දුන් සේක. මෙසේ ඔව්හු
ජෝවාෂ්ට සුදුසු ලෙස දඬුවම් දුන්හ. 25 ඔහු
බොහෝ තුවාළ වී සිටිද්දී ඔවුන් ඔහු අත්හැර ඔහු
වෙතින් ගිය පසු, ඔහුගේ සේවකයෝ පූජක වූ
ජෙහෝයාදාගේ පුත්‍රයන්ගේ මරණය ගැන ඔහුට
විරුද්ධ ව කුමන්ත්‍රණ කොට ඔහුගේ ඇඳේ දී ඔහු
මැරුවෝ ය. මෙසේ ඔහු මියගියේ ය. ඔව්හු
දාවිත්ගේ නුවර ඔහු තැන්පත් කළ නමුත්,
රජවරුන්ගේ සොහොන් ගෙවල තැන්පත් නොකළෝ
ය. 26 ඔහුට විරුද්ධ ව කුමන්ත්‍රණ කළ අය නම්,
අම්මොනිය ස්ත්‍රියක වන ෂිමයොත්ගේ පුත් සාබාද්
සහ මෝවබිය ස්ත්‍රියක වන ෂිම්රීත්ගේ පුත්
ජෙහෝශාබාද් ය. 27 ඔහුගේ පුත්‍රයන් ගැන ද, ඔහු
පිට තබන ලද විශාල වගකීම සහ දෙවියන්
වහන්සේගේ මාලිගාව දෙවෙනුව ගොඩනැඟීම ගැන
ද රාජාවලී අටුවා පොතෙහි ලියා තිබේ. ඔහුගේ
පුත් අමශියා ඔහු වෙනුවට රජ විය.

## අමශියාගේ රාජ්‍ය කාලය

(2 රාජා 14:2-6)

25 අමශියා විසිපස් අවුරුදු වයසේ දී රජ වී
ජෙරුසලමෙහි විසිනව අවුරුද්දක් රජකම්
කළේ ය. ඔහුගේ මවගේ නම ජෙහෝයද්දාන් ය.
ඈ ජෙරුසලමේ ස්ත්‍රියකි. 2 ඔහු සමිඳාණන්
වහන්සේගේ ඇස් හමුයෙහි හරි දේ කළේ ය.
එහෙත්, එසේ කළේ මුළු සිතින් නොවේ. 3 තවද,
රජකම ඔහුට ස්ථිර වූ කල, ඔහු තමාගේ පිය
රජ්ජුරුවන් නැසූ තම සේවකයන් මරා දැම්මේ ය.
4 ද්වි.නී. 24:16එහෙත්, "දරුවන් නිසා පියවරු වත්,
පියවරුන් නිසා දරුවෝ වත් මරනු නොලබත්වා; එක්
එක්කෙනා තම තමාගේ ම පාපය නිසා මරනු
ලැබේවා"යි සමිඳාණන් වහන්සේ අණ කළ ලෙස,
මෝසෙස්ගේ ව්‍යවස්ථා පොතේ ලියා තිබෙන
පරිද්දෙන් ඔහු ඔවුන්ගේ දරුවන් නොමරා හැරියේ ය.

## ඒදොම්ට විරුද්ධ යුද්ධය

(2 රාජා 14:7)

5 තවද, අමශියා ජුදාවරුන් රැස්කර, මුළු ජුදා
දේශයෙහි ද බෙන්ජමින් දේශයෙහි ද ඔවුන්ගේ පිය
වංශවල හැටියට ඔවුන් සහශ්‍රාධිපතීන් ද
ශතාධිපතීන් ද යටතේ පත්කොට, විසි අවුරුද්ද පටන්
ඉන් ඉහළට වයස් වූවන් ගණන් කර, හෙල්ල ද පලිස්
ද ගෙන යුද්ධ කරන්න දක්ෂ වූ තෝරා ගත්
මනුෂ්‍යයන් තුන්ලක්ෂයක් සිටි බව දැනගත්තේ ය.
6 ඔහු ඉශ්‍රායලේවරුන්ගෙන් යුද්ධයට දක්ෂ අය
ලක්ෂයක් රිදී කිලෝග්‍රෑම් තුන්දහස් හාරසියයකට
කුලියට ගත්තේ ය. 7 එහෙත්, දෙවියන් වහන්සේට
කැප වූ මනුෂ්‍යයෙක් ඔහු ළඟට අවුත්, "රජතුමනි,
සියලු එප්‍රායිම්වරුන් වන ඉශ්‍රායලේවරුන් සමඟ
සමිඳාණන් වහන්සේ වැඩ සිටින නිසා ඉශ්‍රායලේ
යුද්ධ සේනාව ඔබ සමඟ නොයෙත්වා. 8 එහෙත් ඔබ
යන්නෙහි නම්, ශක්තිමත් වී සටනට බලවත් වන්න.
දෙවියන් වහන්සේ සතුරා ඉදිරියෙහි ඔබ හෙළා දමන
සේක. මන්ද, උපකාර කරන්නටත්, හෙළා දමන්නටත්
දෙවියන් වහන්සේට බලය ඇත්තේ ය"යි කීවේ ය.
9 අමශියා ද, "එසේ නම්, මා ඉශ්‍රායලේ සේනාවට
දුන් රිදී කිලෝග්‍රෑම් තුන්දහස් හාරසියය ගැන අපි
කුමක් කරමු දැ"යි දෙවියන් වහන්සේට කැප වූ
මනුෂ්‍යයාගෙන් ඇසුවේ ය. දෙවියන් වහන්සේට
කැප වූ මනුෂ්‍යයා උත්තර දෙමින්, "ඊටත් වඩා ඔබට
දෙන්න සමිඳාණන් වහන්සේට පුළුවනැ"යි කී ය.
10 එකල අමශියා එප්‍රායිම්හි සිට තමා වෙත පැමිණි
හමුදාව ස්වකීය ස්ථානයට යන පිණිස වෙන් කළේ
ය. ඒ නිසා ඔවුන්ගේ කෝපය ජුදා කෙරෙහි
බොහෝ සෙයින් ඇවිළී, ඔව්හු තද කෝපයෙන්
තමන්ගේ ස්ථානයට හැරී ගියෝ ය.
11 ඉක්බිති අමශියා ධෛර්යය වඩා තම සෙනඟ
කැඳවාගෙන, ලුණු මිටියාවතට පැමිණ
සේයිර්වරුන්ගෙන් දසදහසක් මැරී ය. 12 ජුදාවරු තව
දසදහසක් පණපිටින් අල්ලාගෙන, ඔවුන් පර්වතයේ
මුදුනට ගෙන ගොස් පර්වතය මුදුනෙන් පහළට
හෙළා දැමුවෝ ය. ඔව්හු සියල්ලෝ ද සුණු විසුණු වූ
හ.
13 අමශියා තමා සමඟ යුද්ධයට නොයෙන පිණිස
ආපසු හැරියා වූ හමුදාවේ භටයෝ සමාරියේ සිට
බෙත්-හෝරොන් දක්වා ජුදාහි නුවරවලට වැද, එහි දී

තුන්දහසකට පහර දී බොහෝ කොල්ලය ගත්තෝ
ය.
14 අමශියා ඒදොම්වරුන් මරා පැමිණි පසු,
සේයිර්වරුන්ගේ දේවවරුන් ගෙන වුත් තමාට
දේවවරුන් කොට තබාගෙන, ඒවා ඉදිරියෙහි වැඳ
වැටී ඒවාට සුවඳ දුම් ඔප්පු කළේ ය. 15 එවිට
සමිඳාණන් වහන්සේගේ උදහස අමශියා කෙරෙහි
ඇවිළුණේ ය. උන් වහන්සේ දිවැසිවරයකු ඔහු
වෙත යැවූ සේක. ඔහු කතා කොට, “තමන්ගේ
සෙනඟ ඔබේ අතින් ගළවා නොගත් සෙනඟගේ
දෙවියන් වෙත හැරුණේ මන්දැ”යි ඔහුගෙන් ඇසුවේ
ය.
16 මෙසේ ඔහු රජු සමඟ කතා කරද්දී අමශියා
ඔහුට කතා කොට, “ඔබ රජුගේ මන්ත්‍රීවරයකු
කොට පත් කළෙමු ද? ඔබ මැරුම්කන්න කැමැති
නැත්නම් නිකම් සිටින්නැ”යි කීවේ ය.
16 එවිට දිවැසිවරයා නැවතී, “ඔබ මාගේ
දැනුමැතිකම නොඅසා මෙය කළ බැවින්, දෙවියන්
වහන්සේ ඔබ විනාශ කරන්න තීරණය කර ගත් බව
මට පෙනේ ය”යි කීවේ ය.

### ඉශ්රායලේවරුන්ට විරුද්ධ යුද්ධය
(2 රාජා 14:8-20)

17 එකල ජුදාහි රජ වූ අමශියා මන්ත්‍රණය කොට,
“එන්න, අපේ ශක්තිය උරගා බලමු” කියා ජේහුගේ
පුත් ජහෝවාස්ගේ පුත් ඉශ්රායලේ රජ වන
ජෝවාෂ්ට කියා හැරියේ ය. 18 ඉශ්රායලේ රජ වන
ජෝවාෂ් උත්තර දෙමින්, “ ‘ඔබේ දුව මාගේ
පුත්‍රයාට භාර්යාව කොට පාවාදෙන්නැ’යි
ලෙබනොන්හි තිබෙන ගොකටු ගස ලෙබනොන්හි
තිබෙන කිහිරි ගසට කියා ඇරියේ ය. එහෙත්,
ලෙබනොන්හි වන මෘගයෝ එහි යන විට ගොකටු
ගස පාගා දැමූ හ. 19 ‘මෙන්න, මම ඒදොම්වරුන්ට
පහර දුන්නෙමි’යි ඔබ කියයි. ඔබේ සිත ද පාරට්ටු
කරගන්න පිණිස අහංකාර වී තිබේ. ගෙදර සිටින්න.
ඔබ ද ඔබ සමඟ ජුදාවරුන් ද වැටෙන ලෙස ඔබ
අන්තරායට මැදි වන්නේ මන්දැ”යි ජුදාහි රජුට කියා
හැරියේ ය.
20 එහෙත්, අමශියා ඇහුම්කන් නුදුන්නේ ය. ඔවුන්
ඒදොම්හි දේවවරුන් වෙත හැරුණු බැවින්, ඔවුන්
පාවා දෙන පිණිස එය දෙවියන් වහන්සේ කෙරෙන්
පැමිණියේ ය. 21 මෙසේ ඉශ්රායලේහි රජ වන
ජෝවාෂ් පිටත් ව ගියේ ය. ඔහු ද ජුදාහි රජ වූ
අමශියා ද ජුදාට අයිති බෙත්-ෂෙමෙෂ්හි දී මුණ
ගැසුණෝ ය. 22 ජුදාවරු ඉශ්රායලේවරුන්ට පරාජය වූ
එක් එක්කෙනා තම තමාගේ කූඩාරමට පලා ගියෝ
ය. 23 ඉශ්රායලේ රජ වන ජෝවාෂ් තමෙේ
ජහෝවාහාස්ගේ පුත් ජෝවාෂ්ගේ පුත් ජුදාහි රජ
වන අමශියා බෙත්-ෂෙමෙෂ්හි දී අල්ලාගෙන
ජෙරුසලමට ගෙනවුත්, එප්රායිම් දොරටුව සිට
කොනේ දොරටුව දක්වා ජෙරුසලමේ පවුරෙන් මීටර්
දෙසියයක් පමණ බිඳ හෙළා, 24 දෙවියන්
වහන්සේගේ මාලිගාවෙහි ඕබෙද්-ඒදොම්ගේ
පළෙපතේ අය ළඟ තිබුණු රන් රිදී සියල්ල ද සියලු
භාජන ද රජ ගෙයි වස්තු ද ඇපකාරයන් ද රැගෙන
සමාරියට හැරී ගියේ ය.
25 ජහෝවාහාස්ගේ පුත් ඉශ්රායලේ රජ වූ
ජෝවාෂ්ගේ මරණයෙන් පසු ජුදාහි රජ වන
ජෝවාෂ්ගේ පුත් අමශියා අවුරුදු පහළොවක් ජීවත්
ව සිටියේ ය. 26 අමශියාගේ සෙසු ක්‍රියා මුල පටන්
අග දක්වා ජුදාහි රජුන්ගේ ද ඉශ්රායලේ රජුන්ගේ ද
පොතෙහි ලියා තිබෙනු නොවේ ද? 27 අමශියා
සමිඳාණන් වහන්සේ වෙතින් අහක් ව ගිය පසු
ජෙරුසලමෙහි මනුෂ්‍යයන් විසින් ඔහුට විරුද්ධ ව
කුමන්ත්‍රණයක් කරන ලදී. ඔහු ලාකීෂ්ට පලා ගියේ
ය. එහෙත්, සෙනඟ ඔහු පසුපස්සේ ලාකීෂ්ට මිනිසුන්
යවා එහි දී ඔහු මරා, 28 අශ්වයන් පිට තබා
ගෙනවුත්, දාවිත්ගේ නුවර ඔහුගේ පියවරුන් ළඟ
ඔහු තැන්පත් කළෝ ය.

### උශ්ශියාගේ රාජ්‍ය කාලය
(2 රාජා 14:21-22;15:1-7)

26 එකල ජුදාහි මුළු සෙනඟ දහසය අවුරුදු
වයස් වන උශ්ශියා තෝරාගෙන ඔහුගේ පිය
වූ අමශියා වෙනුවට ඔහු රජකමට පත් කළෝ ය.
2 අමශියා රජු මියගිය පසු ඔහු ඒලොත් ගොඩනඟා
එය ජුදා දේශයට නැවත අයිති කරගත්තේ ය.
3 උශ්ශියාට දහසය අවුරුදු වූ කල ඔහු රජ වී
ජෙරුසලමෙහි පණස්දෑවුරුද්දක් රජකම් කළේ ය.
ඔහුගේ මවගේ නම ජකොලියා ය. ඈ ජෙරුසලමේ
ස්ත්‍රියකි. 4 ඔහු තමාගේ පිය වන අමශියා කළ
සියල්ල ලෙස සමිඳාණන් වහන්සේගේ ඇස්
හමුයෙහි හරි දේ කළේ ය. 5 දේව ගරුබිය පිළිබඳ
ව තමාට පහදා දුන් ශකරියාගේ දවස්වල දී ඔහු
දෙවියන් වහන්සේ සෙව්වේ ය. ඔහු සමිඳාණන්
වහන්සේ සෙවූ තාක් කල් දෙවියන් වහන්සේ ඔහු
සමෘද්ධිමත් කළ සේක.
6 ඔහු නික්ම ගොස් පිලිස්තිවරුන්ට විරුද්ධ ව යුද්ධ
කොට, ගාත්හි පවුරත්, ජබ්නෙහි පවුරත්, අෂ්දොද්හි
පවුරත් බිඳ දමා, අෂ්දොද් රටෙහි ද පිලිස්තිවරුන්
අතරේ ද නගර ගොඩනැඟුවේ ය. 7 දෙවියන්
වහන්සේ පිලිස්තිවරුන්ටත්, ගුර්-බාල්හි සිටි
අරාබිවරුන්ටත්, මයුෙනිවරුන්ටත් විරුද්ධ ව ඔහුට
උපකාර කළ සේක. 8 අම්මොනිවරුන් උශ්ශියාට
කප්පම් ගෙව්වෝ ය. ඔහු ඉතා ම බලවත් වූ බැවින්
ඔහුගේ කීර්තිය මිසරයේ සීමාව දක්වා පතළ වී
ගියේ ය.
9 තවද, උශ්ශියා ජෙරුසලමෙහි කොනේ දොරටුව
ළඟ ද මිටියාවතේ දොරටුව ළඟ ද පවුරු මුලුවල ද
මුරකොටු ගොඩනඟා ඒවා සවිශක්තිමත් කළේ ය.
10 ඔහුට පහත රටෙහිත්, සමභූමියෙහිත් බොහෝ
සිවුපාවුන් සිටි නිසා ඔහු පාළුකරයෙහි මුරකොටු
ගොඩනඟා බොහෝ ජලාශයන් ද සෑදුවේ ය. ඔහු
ගොවි කර්මාන්තයට සතුටු ව සිටි බැවින් ඔහුට
කඳුවලත්, සරු කෙත්වලත් ගොවියෝ ද මිදි වතු
වවන්නෝ ද සිටියෝ ය.

11 යුද්ධයට පුහුණු වූ සේනාවක් ද උශ්ශියාට
සිටියේ ය. ලේකම් වන ජෙයීයෙල් විසින් ද
නිලධාරියා වූ මයසේයා විසින් ද ඔවුන් ගණන් කරන
ලද සංඛ්‍යාවේ හැටියට ඔව්හු රජුගේ අධිපතියකු වූ
හනනියාගේ පාලනය යටතේ හමුදා වශයෙන්
සේවයට පිටත් ව ගියෝ ය. 12 බලවත්
වික්‍රමාන්විත මනුෂ්‍යයන්ගේ පිය වංශවල
ප්‍රධානීන්ගේ මුළු ගණන දෙදෙස් හයසියයක් ය.
13 ඔවුන් යටතේ සතුරාට විරුද්ධ ව රජුට උදව් වන
පිණිස බලවත් ලෙස යුද්ධ කරන මිනිසුන් තුන්ලක්ෂ
හත්දහස් පන්සියයකින් යුත් යුද්ධ සේනාවක් ඔහුට
සිටියේ ය. 14 උශ්ශියා ඒ මුළු සේනාවට පලිස් ද
හෙල්ල ද තොප්පි ද යුද්ධ සැට්ට ද දුනු ද විසි
කිරීමට ගල් ද පිළියෙළ කළේ ය. 15 තවද, ඔහු
ඊගස්වලින් ද ලොකු ගල්වලින් ද විදින පිණිස
මුරකොටු උඩත්, කොත් උඩත් තැබීමට දක්ෂ
මිනිසුන් විසින් නිපදවන ලද යන්ත්‍ර ජෙරුසලමෙහි
සෑදවේවේ ය. ඔහුගේ කීර්තිය දස දෙස පතළ ව
ගියේ ය. මන්ද, ඔහුට සව් ශක්තිය ලැබුණේ ඉතා
පුදුමාකාර මාර්ගයකින් බැවිනි.

### රජ කුෂ්ඨ රෝගියකු වීම

16 එහෙත්, ඔහු බලවත් වන්න වන්න ඔහුගේ සිත
උඩඟු විය. මයෙ ඔහුගේ වැටීමට හේතු විය. ඔහු
දුම් පූජාසනය පිට සුවඳ දුම් ඔප්පු කරන පිණිස
සමිඳාණන් වහන්සේගේ මාලිගාවට ඇතුළු වීමෙන්
තම දෙවි සමිඳාණන් වහන්සේට විරුද්ධ ව වරද
කළේ ය. 17 එහෙත්, අශරියා පූජකයා ද ඔහු සමඟ
වික්‍රමාන්විත මනුෂ්‍යයන් ව සිටි සමිඳාණන්
වහන්සේගේ පූජකයෝ අසූදෙනෙකේ ද උශ්ශියා රජු
පසුපස ගොස් ඇතුළු වී, 18 නික්ම 30:7-8; ගණන්
3:10ඔහුට විරුද්ධ ව සිටිමින්, ඔහුට කතා කොට,
“උශ්ශියා, සුවඳ දුම් ඔප්පු කිරීමට කැප කරන ලද
ආරොන්ගේ පුත්‍රයන් වන පූජකයන්ට මිස,
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි සුවඳ දුම් ඔප්පු
කිරීම ඔබට අයිති වැඩක් නොවේ. ශුද්ධස්ථානයෙන්
පිටතට යන්න. මන්ද, ඔබ වරද කළෙහි ය. මයෙ
දෙවියන් වහන්සේගෙන් ඔබට ගෞරව පිණිස
නොවන්නේ ය”යි කීවෝ ය.
19 එවිට උශ්ශියා කෝපාවිෂ්ට විය, සුවඳ දුම් ඔප්පු
කිරීමට දුම් භාජනයක් ඔහුගේ අතේ තිබුණේ ය.
සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ දුම් පූජාසනය
ළඟ ඔහු පූජකයන් සමඟ උදහස් ව සිටිය දී,
පූජකයන් ඉදිරියෙහි ඔහුගේ නළලේ ලාදුරු
රෝගයක් මතු විය. 20 උත්තම පූජකයා වූ අශරියා ද
සියලු පූජකයෝ ද ඔහු දෙස බැලූ විට ඔහුගේ
නළලේ ලාදුරු රෝගයක් මතු වී තිබෙන බව දැක,
ඔහු එතැනින් වහා ම නෙරපා දැමූ හ. එසේ ය,
සමිඳාණන් වහන්සේ තමාට පහර දුන් නිසා, පිටතට
යන්න ඔහු ම ඉක්මන් කළේ ය.
21 උශ්ශියා රජ තමේ තමාගේ මරණයේ දවස
දක්වා ලාදුරු රෝගියකු වී සිටියේ ය. ලාදුරු
රෝගියකු ලෙස වෙන් වූ නිසා ඔහු ගිලන් ගෙයක
වාසය කළේ ය. මන්ද, සමිඳාණන් වහන්සේගේ
මාලිගාවට ඇතුළු වීම ඔහුට තහනම් ව තිබිණි.
ඔහුගේ පුත් ජෝතාම් රජ ගෙදෙර ප්‍රධානියා ව සිට
දේශයේ සෙනඟ පාලනය කළේ ය.
22 උශ්ශියාගේ අනික් ක්‍රියා මුල පටන් අග දක්වා
ආමොස්ගේ පුත් දිවැසිවර යෙසායා විසින් ලියන
ලද්දේ ය. 23 යෙසා 6:1උශ්ශියා මියගියේ ය.
මනුෂ්‍යයෝ ඔහු ලාදුරු රෝගියෙකේ ය කියා ඔහුගේ
පියවරුන් ළඟ රජවරුන්ගේ සොහොන් පළේ
පිට්ටනියෙහි ඔහු තැන්පත් කළෝ ය. ඉන්පසු
ඔහුගේ පුත් ජෝතාම් ඔහු වෙනුවට රජ විය.

### ජෝතාම්ගේ රාජ්‍ය කාලය

(2 රාජා 15:32-38)

27 ජෝතාම් විසිපස් අවුරුදු වයසේ දී රජ වී
ජෙරුසලමේ දහසය අවුරුද්දක් රජකම් කළේ
ය. ඔහුගේ මවගේ නම ජෙරූෂා ය. ඈ ශාදොක්ගේ
දුවකි. 2 තමාගේ පිය වූ උශ්ශියා කළ සියල්ල ලෙස
ඔහු සමිඳාණන් වහන්සේගේ ඇස් හමුයෙහි හරි දේ
කළේ ය. එහෙත්, ඔහු සමිඳාණන් වහන්සේගේ
මාලිගාවට ඇතුළු වූයේ නැත. ඒ කාලයෙහිත්
සෙනඟ දුෂ්ටකම් කළෝ ය.
3 ඔහු සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ ඉහළ
දොරටුව ද ඕපලේ පවුරේ බොහෝ තැන් ද
ගොඩනැඟුවේ ය. 4 ජුදා කඳු රටෙහි නගර ද
මූකළන්වල බලකොටු ද මුරකොටු ද ඔහු
ගොඩනැඟුවේ ය. 5 ඔහු අම්මොන්වරුන්ගේ රජුට
විරුද්ධ ව යුද්ධ කොට ඔවුන්ගෙන් ජයගත් පසු,
අම්මොන්වරු ඒ අවුරුද්දේ රිදී කිලෝග්‍රෑම් තුන්දහස්
හාරසියයක් ද තිරිඟු මෙට්‍රික් ටොන් දහසක් ද යව
මෙට්‍රික් ටොන් දහසක් ද ඔහුට දුන්නෝ ය. දෙ
වන, තුන් වන අවුරුදුවල දීත් අම්මොන්වරු එසේ
ගෙවූ හ. 6 මෙසේ ජෝතාම් දෙවි සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි යහ මඟ ගිය බැවින් බලවත්
විය. 7 ජෝතාම්ගේ අනික් ක්‍රියා ද සියලු යුද්ධ ද
ඔහුගේ ප්‍රතිපත්ති ද ඉශ්රායලේ සහ ජුදා රජුන්ගේ
පොතෙහි ලියා තිබේ. 8 ඔහු විසිපස් අවුරුදු වයසේ
දී රජ වී ජෙරුසලමෙහි දහසය අවුරුද්දක් රජකම්
කළේ ය. 9 ජෝතාම් මියගිය පසු දාවිත්ගේ නුවර
තැන්පත් කරන ලදී. ඔහුගේ පුත් ආහාස් ඔහු
වෙනුවට රජ විය.

### ආහාස්ගේ රාජ්‍ය කාලය

(2 රාජා 16:1-4)

28 ආහාස් විසි අවුරුදු වයසේ දී රජ වී
ජෙරුසලමෙහි දහසය අවුරුද්දක් රජකම්
කළේ ය. 2 ඔහු තමාගේ පිය වූ දාවිත් කළාක්
මෙන් සමිඳාණන් වහන්සේගේ ඇස් හමුයෙහි හරි
දේ නොකොට, ඉශ්රායලේ රජුන්ගේ අඩි පාරේ
ගමන් කරමින්, බාල් දේවතාවුන්ට වාත්තු පිළිම
සෑදුවේ ය. 3 ඇරත් ඔහු හින්නොම්ගේ පුත්‍රයාගේ
මිටියාවතෙහි සුවඳ දුම් ඔප්පු කොට, සමිඳාණන්
වහන්සේ ඉශ්රායලේවරුන් ඉදිරියෙන් පන්නා දැමූ

ජාතීන්ගේ පිළිකුල් ක්‍රියා හැටියට තමාගේ
පුත්‍රයන් ගින්නෙහි දැවුවේ ය. 4 ඔහු ගිරිකුළු පිටත්,
හලේ පිටත්, අතු පතර ඇති සියලු ගස් යටත් පූජා ද
සුවඳ දුම් ද ඔප්පු කළේ ය.

### සිරියාව හා ඉශ්‍රායලේ සමඟ ජුදා යුද්ධය

5 2 රාජා 16:5; යසා 7:1 ඒ නිසා ඔහුගේ දෙවි
සමිඳාණන් වහන්සේ ඔහු සිරියාවේ රජු අතට පාවා
දුන් සේක. සිරියන්වරු ඔහුට පහර දී ඔහුගේ
සෙනඟගෙන් මහත් සමූහයක් අල්ලා දමස්කයට
ගෙන ගියෝ ය. ඔහු ඉශ්‍රායලේ රජු අතටත්
අසුවූයෙන් ඒ රජ තමේ මහා ඝාතනයකින් ඔහු
පරාජය කළේ ය. 6 රෙමලියාගේ පුත් පෙකා
බලවන්තයන් ව සිටි එක්ලක්ෂ විසිදහසක් එක
දවසේ ජුදාහි දී මැරුවේ ය. මෙසේ වූයේ, ඔවුන්
තමන්ගේ පියවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ
අත්හැරිය නිසා ය. 7 එප්‍රායිම්හි බලසම්පන්න
මනුෂ්‍යයෙකු වූ ශික්රී තමෙ රජුගේ පුත් මයසේයා
ද රජගෙයි අධිපතියා වූ අශ්රිකාම් ද රජුගේ
දෙවෙනියා වූ එල්කානා ද මැරුවේ ය. 8 තවද,
ඉශ්‍රායලේවරු තමන්ගේ සහෝදරයන්ගෙන් ස්ත්‍රීන්
ද පුත්‍රයන් ද දූවරුන් ද දලක්ෂයක් අල්ලාගෙන,
ඔවුන්ගෙන් විශාල කොල්ලයකුත් රැගෙන ඒ
කොල්ලය සමාරියට ගෙන ගියෝ ය.

### ඕදෙද් දිවැසිවරයා

9 එහෙත්, එහි සිටි ඕදෙද් නමැති සමිඳාණන්
වහන්සේගේ දිවැසිවරයෙක් සමාරියට ආ සේනාව
සම්මුඛ වන්න පිටත් ව ගොස් ඔවුන්ට කතා කොට,
“ඔබ සැමගේ පියවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේ ජුදා කෙරෙහි උදහස් වූ නිසා උන්
වහන්සේ ඔවුන් ඔබ අතට පාවා දුන් සේක. ඔබ
අහසට නැඟෙන තරම් මහා කෝපයකින් ඔවුන්
මැරුවහු ය. 10 දැනුත් ජුදාහි ද ජෙරුසලමේ ද දරුවන්
දාස දාසීන් කොට, යටත් කරගන්න ඔබ අදහස්
කරන්නහු ය. එහෙත්, දෙවි සමිඳාණන් වහන්සේට
විරුද්ධ ව කළ අපරාධ ඔබ පිටත් නැද් ද? 11 එබැවින්
මට ඇහුම්කන් දී ඔබේ සහෝදරයන්ගෙන් අල්ලාගත්
තැනැත්තන් ආපසු යවන්න. මන්ද, සමිඳාණන්
වහන්සේගේ තද උදහස ඔබ කෙරෙහි තිබේ ය”යි
කීවේ ය.
12 එකල එප්‍රායිම්වරුන්ගේ ප්‍රධානීන්ගෙන්
සමහරෙකු වූ ජොහානාන්ගේ පුත් අශරියා ද
මෙෂිල්ලේමොත්ගේ පුත් බෙරෙකියා ද ෂල්ලුම්ගේ
පුත් ජෙහෙස්කියා ද හද්ලයිගේ පුත් අමාසා ද
යුද්ධයෙන් ආ අයට විරුද්ධ ව නැඟිට සිට, 13 ඔවුන්ට
කතා කොට, “අල්ලාගෙන ආ තැනැත්තන් මෙහි
නොගෙනො යුතු ය. මන්ද, සමිඳාණන් වහන්සේට
විරුද්ධ ව අප කළ වරද හැර, අපේ පාප සහ අපේ
අපරාධ වැඩි කරන්න ඔබ සිතන්නහු ය. අපේ
අපරාධය බරපතල ය, දේව උදහස ද ඉශ්‍රායලේ
කෙරෙහි තිබේ ය”යි කීවෝ ය. 14 මෙසේ කී පසු
ආයුධ ගත් තැනැත්තෝ අල්ලාගනු ලැබූ අය සහ
කොල්ලය, අධිපතීන් සහ මුළු සභාව ඉදිරියෙහි හැර
දමා යන්න ගියෝ ය. 15 එවිට නම් සඳහන් කොට
පත් කරන ලද මනුෂ්‍යයෝ නැඟිට, අසුවුණ අය
කැඳවාගෙන, ඔවුන් අතරේ වස්ත්‍ර නැති සියල්ලන්ට
කොල්ලයෙන් ගත් දයෙන් වස්ත්‍ර දී, ඔවුන්ට හඳවා,
ඔවුන්ට වහන් ද කෑම බීම ද දී, තෙලේ ගා, බෙලෙහීන
ව සිටි සියල්ලන් කොටළුවන් පිට නංවා, ඉඳිගස්
නුවර වූ ජෙරිකෝවේ ඔවුන්ගේ සහෝදරයන් වෙත
ගෙනවුත්, පසු ව සමාරියට හැරී ගියෝ ය.

### ආහාස් රජ අසිරියාවෙන් උපකාර ඉල්ලීම

(2 රාජා 16:7-9)

16 ඒ කාලයෙහි ආහාස් රජ තමාට උපකාර කරන
ලෙසෙ අසිරියාවේ රජු වෙත පණිවුඩයක් යැවී ය.
17 කුමක් නිසා ද ඒදොම්වරු නැවත අවුත් ජුදාවරුන්ට
පහර දී සමහරුන් අල්ලාගෙන ගියෝ ය.
18 පිලිස්තිවරු ද පහත රටේ සහ ජුදාහි දකුණු
දිශාවේ නගරවලට වැද, බෙත්-ෂමෙෂ් ද අයාලෝන්
ද ගෙදේරෝත් ද ශෝකෝව සහ එහි ගම් ද තිම්නා
සහ එහි ගම් ද ගිම්සෝ සහ එහි ගම් ද අල්ලාගෙන
ඒවායේ වාසය කළෝ ය. 19 මන්ද, ජුදාහි රජු වූ
ආහාස් ජුදාවරුන් අවිශ්වාසයට පමුණුවා සමිඳාණන්
වහන්සේට විරුද්ධ ව ද්‍රෝහිකම් කළ බැවින්, උන්
වහන්සේ ජුදා මනුෂ්‍යයන් යටත් කළ සේක.
20 අසිරියාවේ රජ වූ තිල්ගත්-පිලනසෙරේ ඔහු වෙත
අවුත් ඔහුට පීඩා කළා මිස ඔහු ශක්තිමත් කළේ
නැත. 21 ආහාස් සමිඳාණන් වහන්සේගේ
මාලිගාවෙන් ද රජුගේත්, අධිපතීන්ගේත් ගෙවලින් ද
වස්තු රැගෙන අසිරියාවේ රජුට දුන් නමුත් එයින්
ඔහුට පලක් නො වී ය.

### ආහාස් රජුගේ පාප

22 මෙමෙ ආහාස් රජු තමාට විපත පැමිණි කාලයේ
දී තව තවත් සමිඳාණන් වහන්සේට විරුද්ධ ව
ද්‍රෝහිකම් කළේ ය. 23 තමාට පහර දුන්
දමස්කයේ දෙවිවරුන්ට ඔහු පූජා කොට, “සිරියාවේ
රජුන්ගේ දෙවිවරුන් ඔවුන්ට පිහිට වන බැවින්, ඔවුන්
මටත් පිහිට වන පිණිස මම ඔවුන්ට පූජා කරමි”යි
කී ය. එහෙත්, ඒ දෙවිවරු ඔහුගේ ද මුළු ඉශ්‍රායලේ
සෙනඟගේ ද විනාශයට හේතු වූ හ. 24 ආහාස්
දෙවියන් වහන්සේගේ මාලිගාවේ භාණ්ඩ එකතු
කර, එහි වෙනත් භාණ්ඩ කැබලි කොට කපා, උන්
වහන්සේගේ මාලිගාවේ දොරවල් වසා, ජෙරුසලමේ
අස්සක් මුල්ලක් නෑර පූජාසන සාදා ගත්තේ ය.
25 ජුදාහි සියලු නගරවල ම අන් දෙවිවරුන්ට සුවඳ
දුම් ඔප්පු කරන පිණිස ඔහු ගිරිකුළු දේවාල සාදා
තමාගේ පියවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ
කෝප කළේ ය.
26 මුල පටන් අග දක්වා ඔහුගේ අනික් ක්‍රියා ද
ඔහුගේ සියලු ප්‍රතිපත්ති ද ජුදා සහ ඉශ්‍රායලේ
රජුන්ගේ පොතෙහි ලියා තිබේ. 27 යසා
14:28ආහාස් මියගිය පසු ඔව්හු ජෙරුසලම් නුවර ඔහු
තැන්පත් කළෝ ය. ඔව්හු ඉශ්‍රායලේ රජුන්ගේ

සගොහගොන් ගවෙල ඔහු නගොතැබූවෝ ය. ඔහුගේ
පුත් හසෙකියා ඔහු වෙනුවට රජ විය.

### හසෙකියා රජු විසින් දේව මාලිගාව පවිත්‍ර කරනු ලැබීම

29 හසෙකියා වයස අවුරුදු විසිපහේ දී රජ වී
විසිනව අවුරුද්දක් ජෙරුසලමෙහි රජකම්
කළේ ය. ඔහුගේ මවගේ නම අබීයා ය. ඈ
ශකෙරියාගේ දූවකි. 2 ඔහුගේ පිය වූ දාවිත් කළ
සියල්ල ලෙසෙ ඔහු සමිඳාණන් වහන්සේගේ ඇස්
හමුයෙහි හරි දේ කළේ ය. 3 ඔහු රජකමට පත් වූ
පළමු වන අවුරුද්දේ පළමු වන මාසයේ දී සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ දොරවල් ඇර ඒවා
ප්‍රතිසංස්කරණය කළේ ය. 4 ඔහු පූජකයන් ද
ලෙවීවරුන් ද ගෙන්වා ගෙන, නැගෙනහිරින් වූ
එළිමහන් තැන ඔවුන් රැස් කර, 5 ඔවුන්ට කතා
කොට මෙසේ කීවේ ය: “ලෙවීවරුනි, මට සවන්
දෙන්න; ඔබ දැන් පවිත්‍ර වී, ඔබේ පියවරුන්ගේ
දෙවි සමිඳාණන් වහන්සේගේ මාලිගාවත් පවිත්‍ර
කොට, ශුද්ධස්ථානයෙන් අපවිත්‍රකම පහකරන්න.
6 මන්ද, අපේ පියවරු ද්‍රෝහිකම් කරමින්, අපේ
දෙවි සමිඳාණන් වහන්සේගේ ඇස් හමුයෙහි නපුරු
දේ කොට, උන් වහන්සේ අත්හැර උන්
වහන්සේගේ වාසස්ථානය වෙතින් අහක් වී උන්
වහන්සේට පිටු පෑවෝ ය. 7 ඔව්හු ද්වාර
මණ්ඩපයේ දොරත් වසා තබා, පහන් නිවා,
ශුද්ධස්ථානයෙහි ඉශ්රායලේවරුන්ගේ දෙවියන්
වහන්සේට සුවඳ දුම් වත්, දවන යාග පූජා වත්
ඔප්පු නොකළෝ ය. 8 ඒ නිසා සමිඳාණන්
වහන්සේගේ උදහස ජුදා සහ ජෙරුසලම කෙරෙහි
පැමිණියේ ය. ඔබේ ඇස්වලට පෙනෙන හැටියට
ඔවුන් ඉතා අප්‍රිය වීමට ද බියජනක නින්දාවක්
වීමට ද උන් වහන්සේ පාවා දුන් සේක. 9 මේ නිසා
අපේ පියවරු කඩුවෙන් මැරී වැටුණෝ ය. අපේ
පුත්‍රයෝ ද දූවරු ද භාර්යාවෝ ද වහල්කමෙහි
සිටිති.
10 “ඉතින් ඉශ්රායලේවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේගේ තද උදහස අප කෙරෙන් පහ ව යන
පිණිස උන් වහන්සේ සමඟ ගිවිසුමක් කරන්න මම
අදහස් කර ඇත්තෙමි. 11 මාගේ පුත්‍රයෙනි, දැන්
අලස ව නොසිටින්න. සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි සිටින්නත්, උන් වහන්සේට වැඳුම්පිදුම්
කරන්නත්, උන් වහන්සේගේ සේවකයන් ව සුවඳ
දුම් ඔප්පු කරන්නත් උන් වහන්සේ ඔබ තෝරාගත්
සේක.”
12 මෙසේ කී පසු, කොහාත්වරුන්ගේ
පුත්‍රයන්ගෙන් අමාසයිගේ පුත් මහත් ද අශරියාගේ
පුත් ජෝවෙල් ද; මෙරොරීගේ පුත්‍රයන්ගෙන් අබ්දීගේ
පුත් කිෂ් සහ ජෙහෙල්ලලෙලේගේ පුත් අශිරියා ද;
ගේර්ෂොන්වරුන්ගෙන් සිම්මාගේ පුත් ජෝවා ද
ජෝවාගේ පුත් ඒදෙන් ද; 13 එලිශාපාන්ගේ
පුත්‍රයන්ගෙන් ෂිම්රි ද ජවෙයෙල් ද; ආසාප්ගේ
පුත්‍රයන්ගෙන් ශකෙරියා ද මත්තනියා ද;
14 හේමන්ගේ පුත්‍රයන්ගෙන් ජෙහුවෙල් ද ෂිමෙයි ද
ජෙදුතුන්ගේ පුත්‍රයන්ගෙන් ෂෙමායා ද උශ්ශියෙල් ද
යන ලෙවීවරු නැඟිට, 15 තමන්ගේ සහෝදරයන් රැස්
කර, තුමූ ම පවිත්‍ර වී, රජුගේ ආඥාව පරිද්දෙන්
සමිඳාණන් වහන්සේගේ වචනය ලෙසෙ උන්
වහන්සේගේ මාලිගාව පිරිසිදු කරන්නට ආවෝ ය.
16 පූජකයෝ උන් වහන්සේගේ මාලිගාව පිරිසිදු
කරන පිණිස එහි ඇතුළට ගොස් උන් වහන්සේගේ
මාලිගාවෙහි සම්බ වූ සියලු අපිරිසිදු දේ ඒ
මාලිගාවේ මළුවට ගෙනාවෝ ය. ලෙවීවරු ඒවා
කිද්‍රොන් ඔයට ගෙන ගියහ.
17 ඔව්හු පළමු වන මාසයේ පළමු වන දා දේව
මාලිගාව පවිත්‍ර කරන්නට පටන්ගෙන, මාසයේ අට
වන දා සමිඳාණන් වහන්සේගේ ද්වාර මණ්ඩපයට
ආවෝ ය. අට දවසකින් ඔව්හු සමිඳාණන්
වහන්සේගේ මාලිගාව පවිත්‍ර කර පළමු වන
මාසයේ දහසය වන දා එය නිම කළෝ ය.

### දේව මාලිගාව යළි කැප කිරීම

18 එවිට ඔව්හු රජ මැඳුරේ සිට හසෙකියා රජු
වෙත ගොස් කතා කොට, “අපි සමිඳාණන්
වහන්සේගේ මුළු මාලිගාවත්, දවන යාග
පූජාසනයත්, ඊට අයිති සියලු භාණ්ඩත්, පිදුම් පූප
මේසයත්, ඊට අයිති සියලු භාණ්ඩත් පිරිසිදු
කළෙමු. 19 ඇරත් ආහාස් රජු රජකම් කරන කල
ඔහුගේ ද්‍රෝහිකමේ දී අහක දැමූ සියලු භාණ්ඩත්
අපි සූදානම් කර පවිත්‍ර කළෙමු. ඒවා සමිඳාණන්
වහන්සේගේ පූජාසනය ඉදිරිපිට තිබේ ය”යි කීවෝ
ය.
20 එවිට හසෙකියා රජ අලුයම නැඟිට, නුවර
අධිපතීන් රැස් කරවා සමිඳාණන් වහන්සේගේ
මාලිගාවට ගියේ ය. 21 ඔව්හු රාජ්‍යය ද
ශුද්ධස්ථානය ද ජුදාවරුන් ද උදෙසා පාප පූජාවක්
පිණිස ගොනුන් සත්දෙනෙකුත්, බැටළුවන්
සත්දෙනෙකුත්, බැටළු පැටවුන් සත්දෙනෙකුත්, එළුවන්
සත්දෙනෙකුත් ගෙනොහ. ඒ සතුන් සමිඳාණන්
වහන්සේගේ පූජාසනය පිට ඔප්පු කරන්න ඔහු
පූජකයන් වන ආරොන්ගේ පුත්‍රයන්ට කීවේ ය.
22 ගොනුන් මැරූ විට පූජකයෝ ලේ රැගෙන
පූජාසනය පිට ඉස්සෝ ය. බැටළුවන් ද මරා ලේ
පූජාසනය පිට ඉස්සෝ ය. එසේ ම බැටළු පැටවුන් ද
මරා ලේ පූජාසනය පිට ඉස්සෝ ය. 23 ඔව්හු පාප
පූජාවේ එළුවන් රජු සහ සභාව ඉදිරියට ගෙනාවෝ
ය. ඔව්හු තමන්ගේ අත් උන් පිට තැබූ හ. 24 ඉන්පසු
පූජකයෝ උන් මරා, මුළු ඉශ්රායලේ උදෙසා සමඟි
කරන පිණිස උන්ගේ ලේ පාප පූජාවක් කොට
පූජාසනය පිට ඉස්සෝ ය. මන්ද, “මුළු ඉශ්රායලේ
සනෙඟ උදෙසා දවන යාග පූජා වත්, පාප පූජා වත්
ඔප්පු කළ යුතු ය”යි නියම කර තිබිණි.
25 තවද, ඔහු දාවිත්ගේ ද රජුගේ දිවැසිවරයා වූ
ගාද්ගේ ද දෙවියන් වහන්සේට කැප මිනිසකු වූ
දිවැසිවර නාතාන්ගේ ද අණ පරිද්දෙන් අත්තල් ද
වීණා ද මහා වීණා ද ඇති ව ලෙවීවරුන් සමිඳාණන්

වහන්සේගේ මාලිගාවෙහි සිටවේවා ය. මන්ද, ඒ
ආඥාව දිවැසිවරුන් මඟින් සමිඳාණන් වහන්සේගෙන්
පැමිණ තිබිණි. 26 ලෙවීවරු දාවිත්ගේ තූර්ය භාණ්ඩ
ද පූජකයෝ හොරණෑ ද රැගෙන සිටියෝ ය.
27 හසෙකියා ද පූජාසනය පිට දවන යාග පූජාව
ඔප්පු කරන්න අණ කළේ ය. දවන යාග පූජාව
පටන්ගන්න වේලාවේ සමිඳාණන් වහන්සේගේ ගී ද
හොරණෑ ශබ්දය ද ඉශ්‍රායලේ රජ වූ දාවිත්ගේ
තූර්ය භාණ්ඩවල හඬ ද ඇති ව එය පටන්ගන්න
ලදී. 28 මුළු සභාව වැඳ වැටී සිටියා ය. ගී ගයන්නෝ
ගී ගැයූ හ. හොරණෑකාරයෝ නළා පිඹියෝ ය. දවන
යාග පූජාව නිම වන තුරු සියල්ල එසේ පැවතිණි.
29 පූජා ඔප්පු කර නිම වූ කල රජ ද ඔහු සමඟ සිටි
සියල්ලෝ ද දණින් වැටී වැන්දෝ ය. 30 හසෙකියා
රජ ද අධිපතීහු ද දාවිත්ගේත්, දිවැසිවරයා වන
ආසාප්ගේත් වචනවලින් සමිඳාණන් වහන්සේට
ප්‍රශංසා ගී කියන්න ලෙවීවරුන්ට අණ කළෝ ය.
ඔව්හු ප්‍රීතියෙන් ප්‍රශංසා ගී ගයා හිස නමා
වැන්දෝ ය.
31 එවිට හසෙකියා කතා කොට, “දැන් ඔබ හැම
සමිඳාණන් වහන්සේට කැප වී සිටින බැවින් ළං වී
යාග ද ස්තුති පූජා ද සමිඳාණන් වහන්සේගේ
මාලිගාවට ගෙනෙන්නැ”යි කීවේ ය. සභාව යාග ද
ස්තුති පූජා ද භාර පඬුරු වශයෙන් දවන යාග පූජා ද
සතුටින් ගෙනාහ. 32 සභාව ගෙනා දවන යාග
පූජාවල ගණන ගොනුන් හැත්තෑවකුත්, බැටළුවන්
සියයකුත්, බැටළු පැටවුන් දෙසියයකුත් ය. මේ
සියල්ල ගෙනාවේ, සමිඳාණන් වහන්සේට දවන යාග
පූජා පිණිස ය. 33 කැප කරනු ලැබූ පඬුරු නම්,
ගොන්නු හයසියයකුත්, බැටළුවෝ තුන්දහසකුත් ය.
34 එහෙත්, පූජකයන් මදි වූ නිසා සියලු දවන යාග
පූජා සූදානම් කරන්න බැරි විය. ඒ නිසා ඔවුන්ගේ
සහෝදර ලෙවීවරු, වැඩ කටයුතු නිම වන තුරුත්,
අනික් පූජකයන් පවිත්‍ර වන තුරුත් ඔවුනට උදව්
වූවෝ ය. මන්ද, තමන් පවිත්‍ර වීම ගැන ලෙවීවරු
පූජකයන්ට වඩා අවංක ව සිටියෝ ය.
35 සහභාගිකමේ පූජාවල තෙලත්, දවන යාග සඳහා
වූ පාන පූජාවලුත් ඇතුළු ව දවන යාග පූජා බොහෝ
සෙයින් තිබිණි.
35 මෙසේ සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ
මෙහෙය පිළිවෙළට නැවත සිදු කරන ලද්දේ ය.
36 දෙවියන් වහන්සේ සෙනඟ උදෙසා සූදානම් කළ
දේ හදිසියෙන් පවත්වන්න සිදු වූ නිසා හසෙකියා ද
මුළු සෙනඟ ද ප්‍රීති වූ හ.

## පාස්කු මංගල්‍යය පැවැත්වීමට සූදානම

30 ඉන්පසු හසෙකියා ඉශ්‍රායලේවරුන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේට පාස්කු මංගල්‍යය
පවත්වන පිණිස ජෙරුසලමෙහි සමිඳාණන්
වහන්සේගේ මාලිගාවට එන්න කියා ඉශ්‍රායලේ රට
හා ජුදා දේශය මුළුල්ලෙහි දන්වා යැවී ය. එප්‍රායිම්
ජනයාට සහ මනස්සේ ජනයාටත් ලියුම් ලියා යැවී
ය. 2 ගණන් 9:9-11සෑහෙන පමණ පූජකයන් පවිත්‍ර
නොවූ නිසාත්, සෙනඟ ජෙරුසලමට රැස් නොවූ
නිසාත්, නියම කාලයට පාස්කු මංගල්‍යය පවත්වන්න
නොහැකි ව, 3 දෙ වන මාසයේ එය පවත්වන්න රජ
ද ඔහුගේ අධිපතීහු ද සම්මත කරගත්හ. 4 ඒ
කරුණ රජුටත්, මුළු සභාවටත් සුදුසු යයි පෙනිණි.
5 බොහෝ කාලයක පටන් විශාල පිරිසක්
ව්‍යවස්ථාවේ ලියා තිබෙන ආකාරයට පාස්කුව
නොපැවැත් වූ නිසා, ඉශ්‍රායලේවරුන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේගේ පාස්කුව ජෙරුසලමෙහි
පවත්වන පිණිස එන ලෙස ඔව්හු බෙයර්-ෂෙබා සිට
දාන් දක්වා ඉශ්‍රායලේ රට මුළුල්ලෙහි ප්‍රසිද්ධ
කරන ලෙස නියෝගයක් කළෝ ය. 6 මෙසේ
පණිවුඩකාරයෝ රජුගෙන් ද ඔහුගේ අධිපතීන්ගෙන්
ද ලැබූ ලියුම් රැගෙන, රජුගේ ආඥාවේ ප්‍රකාරයට
ඉශ්‍රායලේ රට ද ජුදා දේශය ද මුළුල්ලෙහි ගොස්
කතා කොට,
6 “ඉශ්‍රායලේ ජනයෙනි, ආබ්‍රහම්ගේ ද ඊසාක්ගේ
ද ජාකොබ්ගේ ද දෙවි සමිඳාණන් වහන්සේ වෙත
හැරී එන්න. එවිට අසිරියාවෙහි රජුන්ගේ අතින්
ගැළවී ඉතුරු ව සිටින ඔබ වෙත උන් වහන්සේ
හැරෙනු ඇත. 7 තමන්ගේ පියවරුන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේට විරුද්ධ ව ද්‍රෝහිකම් කළ
ඔබේ පියවරුන්ටත්, සහෝදරයන්ටත් සමාන
නොවන්න. ඔබට පෙනෙන හැටියට උන් වහන්සේ
ඔවුන් ව්‍යසනයට පාවා දුන් සේක. 8 ඉතින් ඔබේ
පියවරුන් මෙන් ඔබ මුරණ්ඩු නොවී සමිඳාණන්
වහන්සේට ගිවිසුම් දී, උන් වහන්සේ සදහට ම
පවිත්‍ර කළ උන් වහන්සේගේ ශුද්ධස්ථානයට ඇතුළු
වී උන් වහන්සේගේ තද උදහස ඔබ කෙරෙන්
පහවන පිණිස ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට
වන්දනා නමස්කාර කරන්න. 9 මන්ද, ඔබ සමිඳාණන්
වහන්සේ වෙත හැරුණොත්, ඔබේ සහෝදරයන් ද
දරුවන් ද තමන් අල්ලාගෙන ගිය අයගෙන් කරුණාව
ලැබ මේ දේශයට නැවත හැරී එනු ඇත. මන්ද,
ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ දයානුකම්පාව ඇති
කෙනෙකි; ඔබ උන් වහන්සේ වෙත හැරුණොත්, උන්
වහන්සේ ස්වකීය මුහුණ ඔබ කෙරෙන් හරවා
නොගන්න සේකැ”යි කීවෝ ය.
10 මෙසේ පණිවුඩකාරයෝ එප්‍රායිම් සහ
මනස්සේ රට මුළුල්ලෙහි සාබුලොන් දක්වා ම
නුවරින් නුවරට ගියෝ ය. එහෙත්, මිනිස්සු ඔවුන්ට
සිනාසී සරදම් කළහ. 11 එසේ වුවත්, ආෂේර්හි ද
මනස්සේහි ද සාබුලොන්හි ද සමහරු අවනත වී
ජෙරුසලමට ආවෝ ය. 12 සමිඳාණන් වහන්සේගේ
වචනය පරිදි රජුගේ සහ අධිපතීන්ගේ ආඥාව
පිළිපදින පිණිස ජුදාවරුන් එක් සිත් කරවන ලෙස
දෙවියන් වහන්සේගේ හස්තය ඔවුන් පිට ද වූයේ
ය.

## පාස්කු මංගල්‍යය පැවැත්වීම

13 මෙසේ දෙ වන මාසයේ මුහුන් නොදැමූ රොටි
මංගල්‍යය පවත්වන පිණිස ඉමහත් සභාවක් වූ
බොහෝ සෙනඟ ජෙරුසලමට රැස් වුණෝ ය.

14 ඔව්හු පැමිණ ජෙරුසලමෙහි තිබූ පූජාසන
පහකළෝ ය. සියලු දුම් පූජාසනත් පහකොට ඒවා
කිද්‍රොන් ඔයට දැමුවෝ ය. 15 යළිත් ඔව්හු දෙ වන
මාසයේ දහහතර වන දා පාස්කු බැටළුවන් මැරූ හ.
පූජකයෝ ද ලෙවීවරු ද ලජ්ජාවට පැමිණ තුමූ ම
පවිත්‍ර වී, සමිඳාණන් වහන්සේගේ මාලිගාවට දවන
යාග පූජා ගෙනාවෝ ය. 16 ඔව්හු දෙවියන්
වහන්සේට කැප වූ මනුෂ්‍යයා වන මෝසෙස්ගේ
ව්‍යවස්ථාවේ හැටියට තම තමන්ගේ නියම
පිළිවෙළට තම තමන්ගේ ස්ථානවල සිටගත්හ.
පූජකයෝ ලෙවීවරුන්ගේ අතින් ලේ රැගෙන ඉස්සෝ
ය. 17 මන්ද, පවිත්‍ර නොවූ බොහෝ දෙනෙක්
සභාවෙහි සිටියෝ ය. ඒ නිසා සමිඳාණන් වහන්සේට
ඔප්පු කරන පිණිස පිරිසිදු නොවූ සියල්ලන් උදෙසා
පාස්කු බැටළු පැටවුන් මැරීම ලෙවීවරුන්ට බාර විය.
18 මන්ද, ජනයාගෙන් විශාල සමූහයක් එනම්,
එප්‍රායිම්ගෙන් ද මනස්සේගෙන් ද ඉස්සාකර්ගෙන් ද
සාබුලොන්ගෙන් ද බොහෝ දෙනෙක් පිරිසිදු නොවී,
ව්‍යවස්ථාවේ ලියා තිබෙන අන්දමට නියමයන් ඉටු
නොකර පාස්කුව වැළඳූ හ. හෙසකියා ඔවුන් උදෙසා
යාච්ඤා කරමින්, 19 “ශුද්ධස්ථානයේ පවිත්‍ර කිරීම
ලෙස පිරිසිදු නොවූ නමුත්, තමන්ගේ පියවරුන්ගේ
දෙවි සමිඳාණන් වහන්සේ වන දෙවියන් වහන්සේ
සොයන්න තමන්ගේ සිත් යොමු කරගෙන සිටින
සියල්ලන්ට කරුණාවන්ත සමිඳාණන් වහන්සේ කමා
වන සේක්වා”යි කීවේ ය. 20 සමිඳාණන් වහන්සේ
හෙසකියාට ඇහුම්කන් දී සෙනඟ සුව කළ සේක.
21 ජෙරුසලමෙහි සිටි ඉශ්‍රායෙල්වරු ද මුහුන් නොදැමූ
රොටි මංගල්‍යය ඉමහත් ප්‍රීතියෙන් සත් දවසක්
පැවැත් වූ හ. ලෙවීවරු ද පූජකයෝ ද මුළු ශක්තිය
යොදා තූර්ය භාණ්ඩ රැගෙන ගී ගයමින්, සමිඳාණන්
වහන්සේට දවසින් දවස ප්‍රශංසා කළෝ ය.
22 හෙසකියා සමිඳාණන් වහන්සේගේ මෙහෙයෙ ගැන
දක්ෂතාව ඇති සියලු ලෙවීවරුන් දිරි ගන්වන ලෙස
මිත්‍ර ලීලාවෙන් කතා කළේ ය.

## මංගල්‍යය තවත් වරක් පැවැත්වීම

22 ඔව්හු සහභාගිකමේ පූජා ඔප්පු කරමින් ද
තමන්ගේ පියවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේට
ස්තුති ප්‍රශංසා කරමින් ද සත් දවසක් මංගල්‍ය
පූජාවලින් වැළඳුවෝ ය. 23 මුළු සභාව ද තවත් සත්
දවසක් මංගල්‍යය පවත්වන්න සම්මත කරගෙන, එය
සත් දවසක් ප්‍රීතියෙන් පැවැත් වූ හ. 24 මන්ද, ජුදාහි
රජ වූ හෙසකියා ගොනුන් දහසක් සහ බැටළුවන්
හත්දහසක් ද පූජා සඳහා සභාවට දුන්නේ ය.
අධිපතීහු ද ගොනුන් දහසක් හා බැටළුවන්
දසදහසක් සභාවට දුන්නෝ ය. පූජකයන්ගෙන්
බොහෝ දෙනෙක් ද පවිත්‍ර වූ හ. 25 ජුදාහි මුළු
සභාව ද පූජකයෝ ද ලෙවීවරු ද ඉශ්‍රායෙල්
දේශයෙන් අවුත් සිටි නොහොත් ජුදාහි වාසය කළ
විදේශිකයෝ ද ප්‍රීති වූ හ. 26 මෙසේ ජෙරුසලමෙහි
ඉමහත් ප්‍රීතියක් විය. මන්ද, දාවිත්ගේ පුත්
ඉශ්‍රායෙල් රජ වූ සලමොන්ගේ කාලයට පසු
ජෙරුසලමෙහි එයාකාර සිද්ධියක් නොවී ය. 27 එවිට
ලෙවීවරුන් වූ පූජකයෝ නැඟිට සෙනඟට ආශීර්වාද
කළෝ ය. ඔවුන්ගේ හඬ අසනු ලැබී ය. ඔවුන්ගේ
යාච්ඤාව උන් වහන්සේගේ පිරිසිදු වාසස්ථානය වන
ස්වර්ගයෙහි පිළිගන්න ලදී.

## පූජක සේවය යළි පිහිටුවීම

31 මේ සියල්ල නිම වූ කල එහි සිටි සියලු
ඉශ්‍රායෙල්වරු ජුදාහි නගරවලට ගොස්
රූපස්තම්භ බිඳ දමා, අෂේරා කප් කණු කපා දමා,
ජුදාගේ මුළු රටේ ද බෙන්ජමින්ගේ රටේ ද
එප්‍රායිම්ගේ රටේ ද මනස්සේගේ රටේ ද ගිරිකුළු
සහ පූජාසන නැති වී යන තුරු ඒවා කඩා දැමුවෝ ය.
ඉන්පසු ඉශ්‍රායෙල්වරු තම තමන්ගේ නගරවල තම
තමන්ගේ උරුම දේශවලට හැරී ගියෝ ය.
2 හෙසකියා දවන යාග පූජා සහ සහභාගිකමේ
පූජා ඔප්පු කරන්නත්, සමිඳාණන් වහන්සේගේ
කඳවුරේ දොරටුවල සේවය කරන්නත්, ස්තුති
ප්‍රශංසා කරන්නත්, පූජකයන්ගේත්, ලෙවීවරුන්ගේත්
පංතිවල ප්‍රකාරයට, පූජකයන්ගෙන් ද
ලෙවීවරුන්ගෙන් ද එකිනෙකාගේ සේවයේ හැටියට
ඔවුන්ගේ පංති නියම කළේ ය. 3 ගණන්
28:1—29:39තවද, සමිඳාණන් වහන්සේගේ
ව්‍යවස්ථාවේ ලියා තිබෙන පරිදි දවන යාග පූජා
සඳහා එනම්, උදේ සවස දවන යාග පූජා ද සබත්
දවස්, අමාවක් සහ ප්‍රසිද්ධ මංගල්‍ය සම්බන්ධ දවන
යාග පූජා ද සඳහා ඔහු ස්වකීය රාජ සම්පතින්
කොටසක් නියම කළේ ය.
4 ගණන් 18:12-13,21 ඇරත්, පූජකයන් ද ලෙවීවරුන්
ද සමිඳාණන් වහන්සේගේ ව්‍යවස්ථාවෙහි යෙදී
සිටීම පිණිස ඔවුන්ගේ කොටස් දෙන ලෙස ඔහු
ජෙරුසලමෙහි විසූ සෙනඟට අණ කළේ ය. 5 මේ
ආඥාව පතළ වූ විට ඉශ්‍රායෙල්වරු බොහෝ සෙයින්
ම ධාන්‍යවලිනුත්, මුද්‍රික යුෂයෙනුත්, තලේවලිනුත්,
මී පැණිවලිනුත්, භූමියේ සියලු අස්වනුවලිනුත්
ප්‍රථම පල සහ සියල්ලෙන් දසයෙන් කොටසක් ද
යහමින් ගෙනාවෝ ය. 6 ජුදාහි නගරවල විසූ
ඉශ්‍රායෙල්වරු සහ ජුදාවරු ගොනුන්ගෙනුත්,
බැටළුවන්ගෙනුත් දසයෙන් කොටසක් ගෙනාහ.
ඔවුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේට කැප කළ
පවිත්‍ර දේවලින් දසයෙන් කොටසක් ද ඔව්හු
ගෙනවුත් ගොඩවල් වශයෙන් තැබූ හ. 7 ඔව්හු තුන්
වන මාසයේ දී ඒවා ගොඩගසන්න පටන් ගෙන හත්
වන මාසයේ දී එම වැඩය නිම කළෝ ය.
8 හෙසකියා ද අධිපතීහු ද අවුත් ඒ ගොඩවල් බලා
සමිඳාණන් වහන්සේටත්, උන් වහන්සේගේ සෙනඟ
වන ඉශ්‍රායෙල්වරුන්ටත් ප්‍රශංසා කළෝ ය.
9 හෙසකියා රජ ඒ ගොඩවල් ගැන පූජකයන්ගෙන් ද
ලෙවීවරුන්ගෙන් ද විභාග කළේ ය. 10 එවිට
සාදොක්ගේ වංශයේ උත්තම පූජකයා වන අශරියා
ඔහුට උත්තර දෙමින්, “සෙනඟ සමිඳාණන්
වහන්සේගේ මාලිගාවට පඬුරු ගෙනෙන්න පටන්
ගත් දා සිට අපි සෑහෙන පමණ අනුභව කොට

බොහෝ සයෙන් ඉතුරු කළෙමු. මන්ද, සමිඳාණන්
වහන්සේ ස්වකීය සෙනඟට ආශීර්වාද කළ සේක.
මේ විශාල කොටස ද ඉතිරි වී තිබේ ය"යි කීවේ
ය.
11 එකල හෙසකියා සමිඳාණන් වහන්සේගේ
මාලිගාවෙහි ඇතුළු ගබඩා පිළියෙළ කරන්න අණ
කළේ ය. ඔව්හු එසේ පිළියෙළ කොට, 12 පඬුරු ද
දසයෙන් කොටස් ද කැප කළ දේවල් ද සුරැකි ව
තැබීමට ඒවා ඇතුළට ගෙනාහ. ලෙවීයයකු වූ
කොනනියා ඒවා බලාගැනීමට පත් ව සිටියේ ය.
ඔහුගේ සහෝදර ෂිමයි ඔහුට දෙවෙනියා ව සිටියේ
ය. 13 හෙසකියා රජුගේත්, දෙවියන් වහන්සේගේ
මාලිගාවේ අධිපතියා වූ අශරියාගේත් නියමයේ
ප්‍රකාරයට කොනනියා සහ ඔහුගේ සහෝදර වූ
ෂිමයි යටතේ ජෙහීයෙල් ද අශශියා ද නහත් ද
අසාහෙල් ද ජෙරීමොත් ද ජෝශාබාද් ද එලීයෙල් ද
ඉස්මාකියා ද මහත් ද බෙනායා ද යන මොවුහු
නිලධාරීන් ව සිටියෝ ය. 14 නැඟෙනහිර දොරටු
පාලකයා වූ, ලෙවීයයකු වූ ඉම්නාගේ පුත් කෝරේ
සමිඳාණන් වහන්සේගේ පඬුරුත්, අතිශුද්ධ දේත්
බෙදා දෙන පිණිස සිය කැමැත්තෙන් ම දෙවියන්
වහන්සේට ඔප්පු කළ දේවල් බාර ව සිටියේ ය.
15 ඔහු යටතේ වාර පිළිවෙළින් තමන්ගේ
සහෝදරයන්ගෙන් ලොකු අයටත් කුඩා අයටත් බෙදා
දෙන පිණිස, විශ්වාසවන්ත ව සහාය වීමට ඒදෙන් ද
මිනියාමින් ද ජේෂුවා ද ෂෙමායා ද අමරියා ද
ෂෙකනියා ද පූජකයන්ගේ නගරවල පත් ව සිටියෝ
ය. 16 තුන් අවුරුදු වයසේ පටන් වංශ වශයෙන්
ලියාපදිංචි වූ ඔවුන්ගේ පිරිමින් හැර, තමන්ගේ
පංතිවල හැටියට තම තනතුරු ලෙස සේවය කිරීමට
දවසින් දවස සමිඳාණන් වහන්සේගේ මාලිගාවට
ඇතුළු වූ සියල්ලන්ටත් ඔව්හු එසේ දුන්නෝ ය.
17 එනම්, තමන්ගේ පිය වංශවල හැටියට ලියාපදිංචි
වූ අවුරුදු විස්සේ පටන් ඉන් ඉහළට වයස් ඇති
තමන්ගේ පංතිවල තම තනතුරුවල සිටි පූජකයන් ද
ලෙවීවරුන් ද 18 ලියාපදිංචි වූ ඔවුන්ගේ සියලු
බාලයන් ද ඔවුන්ගේ භාර්යාවන් ද පුත්‍රයන් ද
දූවරුන් ද යන මුළු සභාවට ඔව්හු ඒවා දුන්නෝ ය.
තවද, තමන්ගේ නියම සේවය සඳහා ඔව්හු විශුද්ධ
ව සිටියෝ ය. 19 තවද, තමන්ගේ නගරබද තණ
බිම්වල විසූ පූජකයන් වූ ආරොන්ගේ පුත්‍රයන්
උදෙසාත්, පූජකයන්ගේ සියලු පිරිමින්ට හා
ලියාපදිංචි වූ සියලු ලෙවීවරුන්ට කොටස් දෙන
පිණිස, නම් වශයෙන් පත් කොට ඇති මනුෂ්‍යයෝ
සියලු නගරවල සිටියෝ ය.
20 හෙසකියා ජුදා මුළුල්ලෙහි මෙසේ කරමින්
තමාගේ දෙවි සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි
යහපත් දේ ද හරි දේ ද යුක්තිසහගත දේ ද
කළේ ය. 21 ඔහු තමාගේ දෙවියන් වහන්සේ
සොයමින් උන් වහන්සේගේ මාලිගාවේ මෙහෙයෙ ද
ව්‍යවස්ථාව ද ආඥාව ද සම්බන්ධ ව පටන්ගත් සියලු
කර්තව්‍යයන් තමාගේ මුළු සිතින් ඉෂ්ට කොට
සමෘද්ධිමත් විය.

### අසිරියාවේ රජු විසින් ජුදා දේශය වටලනු ලැබීම

(2 රාජා 18:13-37;19:14-19-35-37)

32 මේ කාරණාවලටත්, මේ සේවයටත් පසු ව,
අසිරියාවේ රජ වන සෙනකෙරිබ් අවුත්, ජුදා
දේශයට ඇතුළු ව, පවුරු ඇති නගර අල්ලාගන්න
සිතා ඒවාට විරුද්ධ ව කඳවුරු බැන්දේ ය.
2 සෙනකෙරිබ් පැමිණ ජෙරුසලමට විරුද්ධ ව යුද්ධ
කරන්න යන බව හෙසකියා දැක, 3 නගරයට
පිටතින් තිබුණු උල්පත්වල වතුර නවත්වන්න
තමාගේ අධිපතීන් ද බලවන්තයන් ද සමඟ
මන්ත්‍රණය කරගත්තේ ය. ඔහුගේ යුද්ධ මණ්ඩලය
ද ඔහුට උපකාර කළේ ය. 4 මෙසේ විශාල
සෙනඟක් රැස් ව කතා කොට, "අසිරියාවේ රජවරුන්
පැමිණි විට ඔවුන්ට බොහෝ වතුර ලැබෙන්නේ ඉඩ
තබන්නේ කුමට දැ"යි කියා සියලු උල්පත් ද දේශය
මැදින් ගලා යන ඔය ද නැවැත්තූ හ. 5 හෙසකියා
ධෛර්යය වඩා, කඩා වැටී තිබුණු මුළු පවුර කොත්
දක්වා ගොඩනැඟුවේ ය. පිටතින් ඔහු තවත් පවුරක්
ගොඩනඟා, දාවිත්ගේ නුවරට තිබුණු මිටියාවතෙහි
ආරක්ෂා සංවිධාන මිල්ලෝ සවිකර බොහෝ ආයුධ
හා පලිස් සෑදුවේ ය. 6 ඔහු සෙනඟ කෙරෙහි
යුද්ධාධිපතීන් පත් කොට, නුවර දොරකඩ එළිමහන්
තැන ඔවුන් රැස්කර, ඔවුන්ට මිත්‍ර ලීලාවෙන් කතා
කොට, 7 "අසිරියාවේ රජුට වත්, ඔහු සමඟ සිටින
මුළු සමූහයට වත් බිය නොවී, නොකැළඹී, බලවත්
ව, ධෛර්යවත් ව සිටින්න. මන්ද, ඔහු සමඟ සිටින
තැනැත්තාට වඩා බලවන්තයෙක් අප සමඟ
සිටින්නේ ය. 8 ඔහුට ඇත්තේ මනුෂ්‍ය බලයකි,
එහෙත්, අපට පිහිට වී, අපේ යුද්ධ කරන පිණිස අප
සමඟ වැඩ සිටින්නේ, අපේ දෙවි සමිඳාණන්
වහන්සේ ය"යි කීවේ ය. සෙනඟ ජුදාහි රජ වන
හෙසකියාගේ වචනය විශ්වාස කළහ.

### දේවාපහාස

9 මින්පසු අසිරියාවේ රජ වන සෙනකෙරිබ් තමෙ
තමාගේ මුළු සේනාව ඇති ව ලාකීෂ් ඉදිරිපිට සිටිය
දී, ජෙරුසලමෙහි සිටි ජුදාහි රජ වන හෙසකියාටත්,
ජෙරුසලමෙහි සිටි සියලු ජුදාවරුන්ටත් තමාගේ
සේවකයන් අත මෙසේ කියා යැවී ය:
10 "අසිරියාවේ රජ වන සෙනකෙරිබ් මෙසේ
කියන්නේ ය: ඔබ ජෙරුසලමේ බලකොටුවෙහි
සිටින්නේ කුමක් කෙරෙහි විශ්වාස කරගෙන ද?
11 අපේ දෙවි සමිඳාණන් වහන්සේ අසිරියාවේ
රජුගේ අතින් අප ගළවාගන්න සේක යි කියමින්,
හෙසකියා ඔබ හැම පොළඹවන්නේ සාපිපාසයෙන්
මැරෙන්නෙ ඔබ සියල්ලන් භාර දෙන පිණිස නොවේ
ද? 12 ගිරිකුළු දේවාල ද පහකොට, ඔබ එක ම
පූජාසනයක් ඉදිරියෙහි නමස්කාර කරන්නටත්, ඒ පිට
සුවඳ දුම් ඔප්පු කරන්නත් ඕනෑ ය කියා ජුදාටත්,
ජෙරුසලමටත් අණ කළේ මේ හෙසකියා නොවේ
ද? 13 මා සහ මාගේ පියවරුන් අන් දේශවල සියලු
ජනයන්ට කළ දේ ඔබ දන්නේ නැද් ද? අන්

දේශවල ජාතීන්ගේ දේවවරුන්ට කොයි අන්දමකින්
වත් ඔවුන්ගේ දේශය මාගේ අතින් ගළවාගන්න
පුළුවන් වූයේ ද? 14 මාගේ අතින් ඔබ හැම
ගළවන්න ඔබේ දෙවියන්ට පුළුවන් වන ලෙස, මාගේ
පියවරුන් වනසා ලූ ඒ ජාතීන්ගේ සියලු දේවවරුන්
අතරෙන් තමාගේ සෙනඟ මාගේ අතින් ගළවන්න
පුළුවන් වූයේ කාට ද? 15 එබැවින් ඔබ රවටන්න
වත්, මෙලෙස ඔබ පොළඹවන්න වත් හෙසකියාට
ඉඩ නොදෙන්න. ඔහු විශ්වාස නොකරන්න. මන්ද,
කවර ජාතියක හෝ රාජ්‍යයක හෝ කිසි දේව
කෙනෙකුට වත් තමාගේ සෙනඟ මාගේ අතින් වත්,
මාගේ පියවරුන්ගේ අතින් වත් ගළවාගන්න පුළුවන්
නො වී ය. එසේ නම්, ඔබේ දෙවියන් වහන්සේ ඔබ
හැම මාගේ අතින් ගළවන්නේ කෙසේ දැ”යි කීවේ
ය.
16 ඔහුගේ නිලධාරීහු දෙවි සමිඳාණන්
වහන්සේටත්, උන් වහන්සේගේ මෙහෙකරු වන
හෙසකියාටත් විරුද්ධ ව තවදුරටත් කතා කළෝ ය.
17 “තවද, අන් දේශවල ජාතීන්ගේ දේවවරුන්
තමන්ගේ සෙනඟ මා අතින් නොගැළවූ ලෙස
හෙසකියාගේ දෙවියනුත් තමන්ගේ සෙනඟ මාගේ
අතින් ගළවන්නේ නැත” කියා ඉශ්රායලේගේ දෙවි
සමිඳාණන් වහන්සේට නින්දාකර, උන් වහන්සේට
විරුද්ධ ව කතා කරන පිණිස සෙනකෙරිබ් ලියුම්
එවුවේ ය. 18 ඔව්හු නගරය අල්ලාගන්න පිණිස,
පවුර පිට සිටි ජෙරුසලමේ සෙනඟ බයගන්වන්නත්,
ඔවුන් කළඹන්නත් ජුදවේ භාෂාවෙන් මහා හඬකින්
මොරගසා, 19 මනුෂ්‍ය අතින් සාදා නිම කරන ලද
මිහි පිට ජනයන්ගේ දේවවරුන් ගැන කතා කරන
පරිදි, ජෙරුසලමේ දෙවියන් වහන්සේ ගැන කතා
කළෝ ය.

### යාච්ඤාවෙන් ජය ලබාගැනීම

20 ඒ නිසා හෙසකියා රජ ද ආමොස්ගේ පුත්
දිවැසිවරයා වන යෙසායා ද යාච්ඤා කොට
ස්වර්ගයට මොරගැසූ හ. 21 එවිට සමිඳාණන්
වහන්සේ දේව දූතයකු එවූ සේක. ඔහු
අසිරියාවේ රජුගේ කඳවුරේ සියලු බලවන්ත යුද්ධ
භටයන් ද ප්‍රධානීන් ද අධිපතීන් ද මරා දැමුවේ ය.
මෙසේ සෙනකෙරිබ් රජ අපකීර්තියට පත් වී හැරී
තම දේශයට ආපසු ගියේ ය. ඔහු තමාගේ
දෙවියන්ගේ ගෘහයට ගිය විට, තමාගේ ම පුත්‍රයෝ
එහි දී ඔහු කඩුවෙන් මැරුවෝ ය.
22 මෙසේ සමිඳාණන් වහන්සේ හෙසකියා ද
ජෙරුසලමේ වැසියන් ද අසිරියාවේ රජු වූ
සෙනකෙරිබ්ගේ අතින් ද අනික් සියල්ලන්ගේ අතින්
ද ගළවා හැම අතින් ම ඔවුන් ආරක්ෂා කළ සේක.
23 එවිට බොහෝ දෙනෙක් සමිඳාණන් වහන්සේට
පඬුරු ද ජුදාහි රජ වන හෙසකියාට අනර්ඝ දේ ද
දෙන පිණිස ජෙරුසලමට ඒවා ගෙනාවෝ ය. එතැන්
පටන් ඔහු සියලු ජාතීන් ඉදිරියෙහි ශ්‍රේෂ්ඨ ව
සිටියේ ය.

### හෙසකියා රජ ලෙඩ වීම

(2 රාජා 20:1-3-12-19)

24 ඒ කාලයේ දී හෙසකියා මරණාසන්න වන තරම්
රෝගාතුර වී සමිඳාණන් වහන්සේට යාච්ඤා කළේ
ය. උන් වහන්සේ ඔහුට කතා කොට සලකුණක්
ඔහුට දුන් සේක. 25 එහෙත්, හෙසකියා තමාට
ලැබුණු කරුණාවේ හැටියට කෘතඥ නොවී සිතින්
උඩඟු විය. ඒ නිසා ඔහු පිට ද ජුදා සහ ජෙරුසලම
පිට ද උදහස පැමිණියේ ය. 26 එහෙත්, තම සිතේ
උඩඟුකම ගැන හෙසකියා ද ජෙරුසලමේ වැසියන් ද
යටත් වූ නිසා, හෙසකියාගේ දවස්වල දී සමිඳාණන්
වහන්සේගේ උදහස නිසා උන් වහන්සේ ඔවුන්ට
දඬුවම් නොකර පසු ව දඬුවම් කළ සේක.

### හෙසකියාගේ වස්තුව හා ඓශ්වර්යය

27 හෙසකියා බොහෝ වස්තුව හා කීර්තිය භුක්ති
වින්දේ ය. ඔහු රන් රිදීවලටත්, අනර්ඝ මැණික්
ගල්වලටත්, සුවඳ ද්‍රව්‍යවලටත්, පලිස්වලටත්, සියලු
ආකාර අනර්ඝ බඩුවලටත් ගබඩා ගෙවල් ද,
28 ධාන්‍යවල අස්වැන්නටත්, මුද්‍රික පානයටත්,
තලේවලටත් ගබඩා ද, සියලු ආකාර ගවමහිෂයන්ට
ගව මඩු ද, රැළවලට ගාල් ද සෑදුවේ ය. 29 දෙවියන්
වහන්සේ ඔහුට අතිශයින් ම සම්පත් දුන් නිසා ඔහු
නගර ද බොහෝ එළු බැටළු ගව පට්ටි ද සපයා
ගත්තේ ය. 30 මේ හෙසකියා රජ ගීහොන්හි වතුර
ගලා එන ඉහළ උල්පත නවත්වා එය දාවිත්ගේ
නුවරට බස්නාහිරෙන් කළේන් බැස එන්න
සැලැස්සුවේ ය. හෙසකියා තමාගේ සියලු වැඩවල දී
සමෘද්ධිමත් විය. 31 එසේ වුවත්, දේශයෙහි සිද්ධ වූ
ආශ්චර්යය ගැන විභාග කරන්න බබිලෝනියේ
අධිපතීන් ඔහු ළඟට තානාපතීන් එවූ කල, ඔහුගේ
සිතුම් පැතුම් සියල්ල දැන ගන්න පිණිස දෙවියන්
වහන්සේ ඔහු සෝදිසි කිරීමට පමණක් ඔහු
අත්හැරිය සේක.

### හෙසකියා රජුගේ අවසාන කාලය

32 හෙසකියාගේ අනික් ක්‍රියා ද ඔහුගේ
භක්තිමත් කෘත්‍යයන් ද ආමොස්ගේ පුත් යෙසායා
දිවැසිවරයාගේ දර්ශන පොතෙහි ද ජුදා සහ
ඉශ්රායලේ රජුන්ගේ පොතෙහි ද ලියා තිබේ.
33 හෙසකියා මියගිය පසු දාවිත්ගේ පුත්‍රයන්ගේ
සොහොන් ගෙවල ඉහළ කොටේඨාශයෙහි තැන්පත්
කරනු ලැබුවේ ය. ඔහුගේ මරණයේ දී සියලු
ජුදාවරු ද ජෙරුසලම් වැසියෝ ද ඔහුට ගෞරව
කළෝ ය. ඔහුගේ පුත් මනස්සේ ඔහු වෙනුවට රජ
විය.

### මනස්සේ රජුගේ රාජ්‍ය කාලය

(2 රාජා 21:1-10)

33 මනස්සේ දොළොස් අවුරුදු වයසේ දී රජ වී
පණස්පස් අවුරුද්දක් ජෙරුසලමෙහි රජකම්
කළේ ය. 2 ජරෙ 15:4සමිඳාණන් වහන්සේ

ඉශ්‍රායලේවරුන් ඉදිරියනේ පන්නා දැමූ ජාතීන්ගේ
පිළිකුල් ක්‍රියා හැටියට ඔහු සමිඳාණන්
වහන්සේගේ ඇස් හමුයෙහි නපුරු දේ කළේ ය.
3 තම පිය වූ හසෙකියා කඩාදැමූ ගිරිකුළු දේවාල
ඔහු නැවත ගොඩනඟා, බාල් දේවතාවන්ට පූජාසන
ඉදි කොට අෂේරා කප් කණු සෑදුවේ ය. ඔහු
අහසේ ග්‍රහතාරකාවන් සියල්ලට නමස්කාර කරමින්
ඒවාට සේවය කළේ ය. 4 2 වංශා 6:6තවද,
“මාගේ නාමය ජෙරුසලමෙහි සදහට ම පවතින්නේ
ය”යි සමිඳාණන් වහන්සේ වදාළ උන් වහන්සේගේ
මාලිගාවෙහි ඔහු අන් දෙවිවරුන්ට පූජාසන
ගොඩනැඟුවේ ය. 5 මසෙේ ඔහු සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ මණ්ඩප දකෙේ
ග්‍රහතාරකාවන් සියල්ලට පූජාසන ගොඩනැඟුවේ
ය. 6 ඔහු තමාගේ පුත්‍රයන් හින්නොමේගේ
පුත්‍රයාගේ මිටියාවතේ දී ගිනි පූජාවක් වශයනේ
ඔප්පු කළේ ය. ඔහු නිමිති බැලීම් ද ශාස්ත්‍ර කීම්
ද මායම් ද උපයෝගී කොට, ආත්මබන්ධනකාරයන්
ද අනාවැනකාරයන් ද ආශ්‍රය කළේ ය. සමිඳාණන්
වහන්සේ කෝප කරවන හැටියට උන් වහන්සේගේ
ඇස් හමුයෙහි ඔහු නපුරු දේ බොහෝ සයෙින් ම
කළේ ය. 7 1 රාජා 9:3-5; 2 වංශා 7:12-18ඔහු සෑදූ
දේවතා රූපය ද දෙවියන් වහන්සේගේ මාලිගාවෙහි
තැබී ය. ඒ මාලිගාව ගැන දෙවියන් වහන්සේ
දාවිත්ටත්, ඔහුගේ පුත් සලමොන්ටත් කතා කොට,
“මේ මාලිගාවෙහිත්, මා විසින් සියලු ඉශ්‍රායලේ
ගෝත්‍ර අතරනේ තෝරාගනු ලැබූ ජෙරුසලමෙහිත්
මාගේ නාමය සදහට ම පවතින්නට සලසන්නෙමි.
8 මෝසසේ අතින් ඉශ්‍රායලේවරුන් ලැබූ මුළු
ව්‍යවස්ථාවේ ද පණත්වල ද නියෝගවල ද
ප්‍රකාරයට මා ඔවුන්ට අණ කළ සියල්ල කරන
හැටියට ඔව්හු බලාගන්නෝ නම්, නුඹලාගේ
පියවරුන්ට මා නියම කළ දේශයනේ ඔවුන්ට තවත්
අහක් ව යන්න නොසලස්වන්නෙමි”යි වදාළ සේක.
9 එහෙත්, සමිඳාණන් වහන්සේ ඉශ්‍රායලේ ජනයා
ඉදිරියනේ විනාශ කරදැමූ ජාතීන්ට වඩා නපුරුකම්
කරන හැටියට මනස්සේ ජුදාවරුන් ද ජෙරුසලමේ
වැසියන් ද මුළා කළේ ය.

## මනස්සේ රජ පසුතැවී සිත හරවා ගැනීම

10 සමිඳාණන් වහන්සේ මනස්සේටත්, ඔහුගේ
සනෙඟටත් කතා කළ නමුත් ඔව්හු සවන් නුදුන්නෝ
ය. 11 ඒ නිසා සමිඳාණන් වහන්සේ අසිරියාවේ
රජුගේ සේනාපතීන් ඔවුන්ට විරුද්ධ ව එවූ සේක.
ඔව්හු මනස්සේ අල්ලා විලංගුවලින් ද දම්වැල්වලින්
ද බැඳ බබිලෝනියට ගනෙ ගියෝ ය. 12 ඔහු
තමාගේ විපතේ දී තම දෙවි සමිඳාණන් වහන්සේට
කන්නලව් කොට, තම පියවරුන්ගේ දෙවියන්
වහන්සේ ඉදිරියෙහි ඉතා යටහත් වී, 13 උන්
වහන්සේට යාච්ඤා කළේ ය. උන් වහන්සේ ඔහුට
සවන් දී ඔහුගේ කන්නලව්ව අසා ජෙරුසලමටත්,
ඔහුගේ රාජ්‍යයටත් නැවත ඔහු පැමිණවූ සේක.
එවිට සමිඳාණන් වහන්සේ දෙවියන් වහන්සේ බව
මනස්සේ දැනගත්තේ ය.
14 මින්පසු ඔහු දාවිත්ගේ නුවරින් පිට ගීහොන්ට
බස්නාහිරනේ මිටියාවතෙහි මත්ස්‍ය-දොරටුවනේ
ඇතුළු වන තැන දක්වා ඕපලේ තාප්පය වටේට ඉතා
උසට පවුරක් ගොඩනඟා, ජුදා දේශයෙහි පවුරු ඇති
සියලු නගරවල සේනාපතීන් සිටවුවේ ය. 15 ඔහු
සමිඳාණන් වහන්සේගේ මාලිගාවනේ අන් දෙවිවරුන්
ද පිළිම ද උන් වහන්සේගේ මාලිගාව පිහිටි
කන්දෙහිත්, ජෙරුසලමෙහිත් ගොඩනඟා තිබුණු සියලු
පූජාසන ද පහකොට ඒවා නගරයනේ පිටත දැමුවේ
ය. 16 තවද, ඔහු සමිඳාණන් වහන්සේගේ පූජාසනය
පිහිටුවා, ඒ පිට සහභාගිකමේ පූජා ද ස්තුති පූජා ද
ඔප්පු කොට, ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේට වැඳුම්පිදුම් කරන්න ජුදාවරුන්ට අණ
කළේ ය. 17 එහෙත්, සනෙඟ ඊට පසුත් ගිරිකුළු
දේවාලවල පූජා කළෝ ය. එහෙත්, එසේ කළේ
තමන්ගේ දෙවි සමිඳාණන් වහන්සේට පමණක් ය.

## මනස්සේගේ රාජ්‍යයේ අවසානය

(2 රාජා 21:17-18)

18 මනස්සේගේ අනික් ක්‍රියා ද ඔහු තමාගේ
දෙවියන් වහන්සේට ඔප්පු කළ යාච්ඤාව ද
ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේගේ
නාමයනේ ඔහුට කතා කළ දිවැසිවරයාගේ වචන ද
ඉශ්‍රායලේ රජවරුන්ගේ පුරාවෘත්ත ග්‍රන්ථයෙහි
ලියා තිබේ. 19 ඔහුගේ යාච්ඤාව ද දෙවියන්
වහන්සේ ඔහුට ඇහුම්කන් දුන් හැටි ද ඔහුගේ
සියලු පාපයන් ද ඔහුගේ ද්‍රෝහිකම් ද ඔහු යටහත්
වන්න පළමුවනේ ඔහු ඉදි කළ කඳු මත පූජාස්ථාන ද
අෂේරා කප් කණු සහ කැපූ රූප සිටවූ ස්ථාන ද
දර්ශකයන්ගේ පුරාවෘත්ත ග්‍රන්ථයෙහි ලියා තිබේ.
20 මසෙේ මනස්සේ මියගිය පසු ඔහුගේ ගෙදර
සොහොන් ගයෙි ඔහු තැන්පත් කරනු ලැබුවේ ය.
ඔහුගේ පුත් ආමොන් ඔහු වනුෙවට රජ විය.

## ආමොන්ගේ රාජ්‍ය කාලය

(2 රාජා 21:19-26)

21 ආමොන් විසි අවුරුදු වයසේ දී රජ වී දෑවුරුද්දක්
ජෙරුසලමෙහි රජකම් කළේ ය. 22 ඔහු තමාගේ
පිය වූ මනස්සේ කළ පරිදි සමිඳාණන් වහන්සේගේ
ඇස් හමුයෙහි නපුරු දේ කරමින්, තමාගේ පිය වූ
මනස්සේ සෑදූ සියලු රූපවලට පූජා කොට වැඳුම්පිදුම්
කළේ ය. 23 ඔහුගේ පිය වූ මනස්සේ යටහත් වුණ
ලසෙ ඔහු සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි යටහත්
නො වී ය. මමෙ ආමොන් වඩ වඩා අපරාධ කළේ
ය.
24 ඔහුගේ සේවකයෝ ඔහුට විරුද්ධ ව
කුමන්ත්‍රණ කොට ඔහුගේ ම රජ මැඳුරේ දී ඔහු
මැරුවෝ ය. 25 එහෙත්, දේශයේ සනෙඟ ආමොන්
රජුට විරුද්ධ ව මන්ත්‍රණය කළ සියල්ලන් මරා
ඔහුගේ පුත් ජොෂියා ඔහු වනුෙවට රජකමට පත්
කළෝ ය.

## ජෝෂියා රජ වීම
(2 රාජා 22:1-2)

34 ජරෙ 3:6 ජෝෂියා අට අවුරුදු වයසේ දී රජ
වී තිස්එක් අවුරුද්දක් ජෙරුසලමෙහි රජකම්
කළේ ය. 2 ඔහු සමිඳාණන් වහන්සේගේ ඇස්
හමුයෙහි යහපත් දේ කරමින් තමාගේ පිය වූ
දාවිත්ගේ ආදර්ශය අකුරට ම පිළිපැද්දේ ය.

## රූප වන්දනා නැති කිරීම

3 ඔහු රජකමට පත් වූ අට වන අවුරුද්දේ, බාල
වියේ සිටිය දී ම, තමාගේ පිය වූ දාවිත්ගේ
දෙවියන් වහන්සේ සොයන්න පටන්ගෙන, දොළොස්
වන අවුරුද්දේ දී ගිරිකුළු දේවාල ද අෂේරා කප්
කණු ද කැපූ රූප ද වාත්තු රූප ද පහකර ජුදා සහ
ජෙරුසලම පිරිසිදු කරන්න පටන් ගත්තේ ය. 4 2
රාජා 21:3; 2 වංශා 33:3ඔහු බලාගෙන සිටිය දී බාල්
පූජාසන කඩා දමන ලද්දේ ය. ඒවාට උඩින් තිබුණු
සුවඳ දුම් පුදන පූජාසන ඔහු කඩා දමා, අෂේරා කප්
කණු ද කැපූ රූප ද වාත්තු රූප ද බිඳ කුඩු කොට,
ඒවාට පූජා කළ අයවලුන්ගේ මිනීවළවල් පිට ඔහු
ඒවා ඉස්සේ ය. 5 1 රාජා 13:2ඔහු පූජකයන්ගේ
ඇටකටු ඔවුන්ගේ පූජාසන පිට පුළුස්සා, ජුදා ද
ජෙරුසලම ද පිරිසිදු කළේ ය. 6 තවද, ඔහු නප්තලී
දක්වා මනස්සේගේ ද එප්‍රායිම්ගේ ද සිමියොන්ගේ
ද දේශයන්හි නගර මුළුල්ලෙහි ද ඒවා අවට
කලෙසන ලද පළාත්හි ද එලෙසෙ කළේ ය. 7 ඔහු
ඉශ්‍රායලේ දේශය මුළුල්ලෙහි තිබූ පූජාසන කඩා
දමා, අෂේරා කප් කණු ද කැපූ රූප ද බිඳ දමා, ඒවා
කුඩුකර, සියලු සුවඳ දුම් පූජාසන වනසා ජෙරුසලමට
හැරී ආයේ ය.

## දේව මාලිගාව ප්‍රකෘතිමත් කිරීම
(2 රාජා 22:3-7)

8 තවද, ඔහු රජකමට පත් වූ දහඅට වන
අවුරුද්දේ දී දේශයත්, දේව මාලිගාවත් පවිත්‍ර කළ
පසු, තමාගේ දෙවි සමිඳාණන් වහන්සේගේ
මාලිගාව අලුත්වැඩියා කරන පිණිස, අසලියාගේ පුත්
ෂාපාන් ද නුවර අධිපතියා වූ මයසේයා ද
වාර්තාකරුවා වන ජෝවාහාස්ගේ පුත් ජෝවා ද යැවී
ය. 9 ඔව්හු උත්තම පූජකයා වූ හිල්කියා ළඟට
පැමිණ දෙවියන් වහන්සේගේ මාලිගාවට ගෙනෙන
ලද, දොරටු පාලකයන් වන ලෙවීවරුන් විසින්
මනස්සේවරුන්ගෙනේ ද එප්‍රායිම්වරුන්ගෙනේ සහ ඉතුරු
ව සිටි සියලු ඉශ්‍රායලේවරුන්ගෙනේ ද සියලු
ජුදාවරුන්ගෙනේ ද බෙන්ජමින්වරුන්ගෙනේ ද
ජෙරුසලමේ වාසීන්ගෙනේ ද එකතු කර ගන්න ලද
මුදල් භාරගෙන, 10 සමිඳාණන් වහන්සේගේ
මාලිගාව හරිගැස්සීමටත්, අලුත්වැඩියා කිරීමටත්
මාලිගාවේ වැඩ කරන කර්මාන්තකාරයන්ට දෙන
පිණිස, උන් වහන්සේගේ මාලිගාවේ වැඩ කිරීමට
පත් වී සිටින තැනැත්තන් අතට ඒවා දුන්නෝ ය.
11 ඔව්හු කැපූ ගල් ද ජුදා රජුන් විසින් නැති කරන
ලද ගෙවල යටලීවලට සහ බාල්කවලට ලී ද මිලේට
ගන්න පිණිස වඩුවන්ටත්, ගල්වඩුවන්ටත් ඒවා
දුන්නෝ ය. 12 ඒ මනුෂ්‍යයෝ විශ්වාසවන්ත ව වැඩ
කළෝ ය. වැඩ බලා ගැනීමට මෙරොරීගේ
පුත්‍රයන්ගෙනේ ලෙවීවරුන් වන ජහත් ද ඔබදියා ද
කොහාත්ගේ පුත්‍රයන්ගෙනේ සකෙරියා ද මෙෂුල්ලාම්
ද ඔවුන් කෙරෙහි පත් වී සිටියෝ ය. ලෙවීවරු
සියල්ලෝ ම තූර්ය භාණ්ඩ ගැන තේරුම් පැහැදුම්
ඇති අය වූ හ. 13 ඔව්හු බර උසුලන්නන් කෙරෙහිත්,
එක එක සේවයේ වැඩය කරන සියල්ලන්
කෙරෙහිත් නිලධාරීන් ව සිටියෝ ය. ලෙවීවරුන්ගෙනේ
සමහරු ලිපිකරුවන් ව, නිලධාරීන් ව, දොරටු
පාලකයන් ව සිටියෝ ය.

## ව්‍යවස්ථා පොත සම්භ වීම
(2 රාජා 22:8-20)

14 තවද, සමිඳාණන් වහන්සේගේ මාලිගාවට
ගෙනො මුදල් ඔවුන් එළියට ගන්න කල මෝසෙසේ
මඟින් දෙන ලද සමිඳාණන් වහන්සේගේ ව්‍යවස්ථා
පොත හිල්කියා පූජකයාට සම්භ විය. 15 හිල්කියා
තමේ ලේකම් වන ෂාපාන්ට කතා කොට,
"ව්‍යවස්ථා පොත සමිඳාණන් වහන්සේගේ
මාලිගාවෙහි තිබී මට සම්භ වී ය"යි කියා ඒ පොත
ෂාපාන්ට භාර දුන්නේ ය. 16 ෂාපාන් ද පොත ගෙන
නැවත රජු ළඟට ගෙන ගොස්, "ඔබේ
මෙහෙකෙරුවන්ට භාර දුන් සියල්ල ම ඔව්හු කරති.
17 සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ තිබූ මුදල්
ගෙන ඔව්හු නිලධාරීන් අතටත්, කර්මාන්තකාරයන්
අතටත් දුන්නෝ ය"යි රජුට දැන්වී ය. 18 තවද,
ලේකම් වන ෂාපාන් රජුට කතා කොට, "පූජක වන
හිල්කියා මට පොතක් භාර දුන්නේ ය" කියා රජු
ඉදිරිපිට එයින් කියවූවේ ය.
19 රජ වනාහි ඒ ව්‍යවස්ථාවේ වචන ඇසූ විට
ශෝකයෙන් තමාගේ ඇඳුම් ඉරාගත්තේ ය. 20 තවද,
රජ හිල්කියාට ද ෂාපාන්ගේ පුත් අහිකාම්ට ද
මීකාගේ පුත් අබ්දොන්ට ද ලේකම් වන ෂාපාන්ට ද
රජුගේ සේවකයා වන අසායාට ද අණ කොට,
21 "ඔබ ගොස් මා උදෙසාත්, ඉශ්‍රායලේවරුන්ගෙනේ ද
ජුදාවරුන්ගෙනේ ද ඉතුරු ව සිටින්නන් උදෙසාත් සම්භ
වූ පොතේ වචන ගැන සමිඳාණන් වහන්සේගෙනේ
විමසන්න. මන්ද, මේ පොතෙහි ලියා තිබෙන
සියල්ලේ හැටියට කරන ලෙස අපේ පියවරුන්
සමිඳාණන් වහන්සේගේ වචනය රක්ෂා නොකළ
බැවින්, අප පිට වගුරුවා තිබෙන උන් වහන්සේගේ
උදහස මහත් ය"යි කීවේ ය.
22 එවිට හිල්කියා ද රජුගේ ආඥාව ලැබූ අනික්
අය ද හස්රාගේ පුත්‍රයා වන තොක්හත්ගේ පුත්
පූජක වස්ත්‍ර භාරකාරයා වූ ෂල්ලුම්ගේ භාර්යාව
වන හුල්දා නම් දිවැසිවරිය වෙත ගොස් මේ ගැන
ඇට කතා කළෝ ය. හුල්දා ජෙරුසලමේ දෙ වන
කොටසෙහි විසුවා ය. 23 ඈ ඔවුන්ට මෙසේ කීවා ය:
"ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ
මෙසේ වදාරන සේක: 'ඔබ මා වෙත එවූ
මනුෂ්‍යයාට සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන

සෝකැ'යි කියන්න. 24 'බලන්න, මම මේ දේශය
පිටත්, මෙහි වැසියන් පිටත් විපත්තියක් වන ජුදා රජු
ඉදිරියෙහි කියවූ පොතෙහි ලියා තිබෙන සියලු සාප
පමුණුවන්නෙමි. 25 ඔවුන් මා අත්හැර තමන්ගේ
සියලු හස්ත කර්මාන්තවලින් මා කෝප කරවන
හැටියට වෙනෙ දෙවිවරුන්ට සුවඳ දුම් ඔප්පු කළ
බැවින්, මාගේ උදහස මේ දේශය පිට වගුරුවා
තිබේ. එය නිවෙන්නේ නැත.' 26 එහෙත්, සමිඳාණන්
වහන්සේගෙන් විචාරන පිණිස ඔබ එවූ ජුදාහි රජුට
මෙසේ කියන්න: 'ඔබ ඇසූ වචන සම්බන්ධ ව
ඉශ්රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ
මෙසේ වදාරන සේක. 27 මේ දේශයටත්, මෙහි
වැසියන්ටත් විරුද්ධ ව දෙවියන් වහන්සේ වදාරා
තිබෙන වචන ඔබ ඇසූ විට ඔබ සිත මොළොක් වී
ඔබ උන් වහන්සේ ඉදිරියෙහි යටහත් වී, ශෝකයෙන්
ඔබේ ඇඳුම් ඉරාගෙන මා ඉදිරියෙහි හැඬූ බැවිනුත්,
මමත් ඔබට කන් දුනිමි. සමිඳාණන් වහන්සේ
මෙසේ වදාරන සේක. 28 මම ඔබේ පියවරුන්ගේ
සොහොනේ බිමට ඔබ පමුණුවන්නෙමි. මා විසින් මේ
දේශයටත් මෙහි වැසියන්ටත් පමුණුවනු ලබන සියලු
විපත්ති ඔබේ ඇස්වලින් නොදැක, ඔබේ
සොහොනෙට ඔබ සාමදානයෙන් පැමිණෙන්නෙහි ය.'
" ඔව්හු ද හැරී ඇවිත් රජුට එපවත් සැළ කළෝ ය.

## ගිවිසුම ප්රතිස්ථාපනය කිරීම

(2 රාජා 23:1-20)

29 එවිට රජ, පණිවුඩකාරයන් යවා ජුදා සහ
ජෙරුසලමේ සියලු ප්රජා මූලිකයන් රැස් කරවාගෙන,
30 ජුදාහි සියලු මනුෂ්යයන් ද ජෙරුසලමේ වැසියන් ද
පූජකයන් ද ලෙවීවරුන් ද ලොකු කුඩා මුළු සෙනඟ ද
සමඟ සමිඳාණන් වහන්සේගේ මාලිගාවට ගියේ ය.
තවද, ඔහු සමිඳාණන් වහන්සේගේ මාලිගාවෙහි
තිබී සම්භ වූ ගිවිසුම් පොතේ සියලු වචන ද ඔවුන්
අසාගෙන සිටිද්දී කියවේවේ ය. 31 රජ ස්වකීය
ස්ථානයෙහි සිට ඒ පොතෙහි ලියන ලද ගිවිසුමේ
වචන ඉෂ්ට කිරීමට සමිඳාණන් වහන්සේ අනුව යන
හැටියටත්, උන් වහන්සේගේ ආඥා ද ශික්ෂා පද ද
පණත් ද තමාගේ මුළු හෘදයෙන් ද තමාගේ මුළු
ආත්මයෙන් ද පවත්වන හැටියටත් උන් වහන්සේ
ඉදිරියෙහි ගිවිසුමක් කළේ ය. 32 ඔහු ජෙරුසලමෙහි
ද බෙන්ජමින්ගේ දේශයෙහි ද සිටි සියල්ලන් ඊට
එකඟ වන්නට සැලැස්සුවේ ය. ජෙරුසලමේ වැසියෝ
ද දෙවියන් වහන්සේගේ එනම්, තමන්ගේ
පියවරුන්ගේ දෙවියන් වහන්සේගේ ගිවිසුම ලෙසෙ
කළෝ ය. 33 ජොෂියා වනාහි ඉශ්රායලේවරුන්ට
අයිති සියලු රටවලින් සියලු පිළිකුල් දේවල්
පහකොට, ඉශ්රායලේහි සිටි සියල්ලන් තමන්ගේ
දෙවි සමිඳාණන් වහන්සේට වැඳුම්පිදුම් කරන්න
සැලැස්සුවේ ය. ඔහුගේ සියලු දවස්වල ඔව්හු
තමන්ගේ පියවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ
වෙතින් පහව නොගියෝ ය.

## විශේෂ පාස්කු මංගල්යයක් පැවැත්වීම

(2 රාජා 23:21-23)

35 ජොෂියා ජෙරුසලමෙහි සමිඳාණන්
වහන්සේට පාස්කු මංගල්යයක් පැවැත්වී ය.
ඔව්හු පළමු වන මාසයේ දහහතර වන දා පාස්කු
බැටළු පැටවුන් මැරූ හ. 2 ජොෂියා, පූජකයන්
ඔවුන්ගේ තනතුරුවලට පත්කොට, සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ මෙහෙයට ඔවුන් ධෛර්ය
කරවී ය. 3 සියලු ඉශ්රායලේවරුන්ට ඉගැන්නුවා වූ ද
සමිඳාණන් වහන්සේ උදෙසා ශුද්ධ ව සිටියා වූ ද
ලෙවීවරුන්ට ඔහු කතා කොට, "ඉශ්රායලේ රජ වූ
දාවිත්ගේ පුත් සලමොන් විසින් සාදන ලද
මාලිගාවෙහි ශුද්ධ ගිවිසුම් කරඬුව තබන්න. ඔබේ
කර පිට තවත් බරක් නැත. දැන් ඔබේ දෙවි
සමිඳාණන් වහන්සේට වැඳුම්පිදුම් කරන්නටත්, උන්
වහන්සේගේ සෙනඟ වන ඉශ්රායලේවරුන්ට සේවය
කරන්නටත්, 4 2 වංශා 8:14ඉශ්රායලේ රජ වූ
දාවිත්ගේ ලියවිල්ලේ ද ඔහුගේ පුත් සලමොන්ගේ
ලියවිල්ලේ ද ප්රකාරයට ඔබේ පිය වංශවල
හැටියට ඔබේ පංති ලෙසෙ සූදානම් වී, 5 සෙනඟගේ
පුත්රයන් වන ඔබේ සහෝදරයන් උදෙසා පිය
වංශවල බෙදීම්වල හැටියට ද ලෙවීවරුන් උදෙසා පිය
වංශයකින් කොටසක් ඇති ව ද ශුද්ධස්ථානයෙහි
සිට 6 පාස්කු බැටළු පැටවුන් මරන්න. ඔබ පවිත්ර වී,
මෝසෙස් මඟින් ලත් සමිඳාණන් වහන්සේගේ
වචනයේ හැටියට කිරීමට ඔබේ සහෝදරයන්
උදෙසා උන් සූදානම් කරන්නැ"යි කීවේ ය.
7 ජොෂියා රජ ද පැමිණ සිටි සෙනඟගේ පුත්රයන්
සියල්ලන්ට පාස්කු පූජා පිණිස ම ගණනේ හැටියට
බැටළු පැටවුන් ද එළු පැටවුන් ද තිස්දහසකුත්,
ගොනුන් තුන්දහසකුත් තමාගේ ම සම්පතෙන්
දුන්නේ ය. 8 ඔහුගේ අධිපතීහු ද සෙනඟගේ
ස්වේච්ඡා පූජා සඳහා සෙනඟටත්, පූජකයන්ටත්,
ලෙවීවරුන්ටත් එලෙසෙ දුන්නෝ ය. දෙවියන්
වහන්සේගේ මාලිගාවේ අධිපතියන් වූ හිල්කියා ද
ශකරියා ද ජෙහියෙලේ ද පාස්කු පූජා පිණිස බැටළු
පැටවුන් දදොස් හයසියයකුත්, ගොනුන් තුන්සියයකුත්
පූජකයන්ට දුන්නෝ ය. 9 ලෙවීවරුන්ගේ අධිපතියන්
වූ කොනනියා ද ෂමොයා සහ නතෙනේල් යන
ඔහුගේ සහෝදරයෝ ද හෂබියා ද ජයියෙලේ ද
ජෝශාබාද් ද පාස්කු පූජා පිණිස බැටළු පැටවුන්
පන්දහසකුත්, ගොනුන් පන්සියයකුත් ලෙවීවරුන්ට
දුන්නෝ ය.
10 මෙසේ පූජාකිරීමේ පිළිවෙත සූදානම් කරන
ලද්දේ ය. පූජකයෝ තමන්ගේ ස්ථානයේ ද ලෙවීවරු
තමන්ගේ පංතිවල ප්රකාරයට ද රජුගේ ආඥාව
පරිද්දෙන් සිටියෝ ය. 11 ඔව්හු පාස්කු බැටළු පැටවුන්
මැරුවෝ ය. පූජකයෝ ද ඔවුන් අතින් ලේ රැගෙන
ඉස්සෝ ය. ලෙවීවරු සතුන් හම ගසා සූදානම් කළහ.
12 ඔව්හු මෝසෙස්ගේ පොතෙහි ලියා තිබෙන ලෙසෙ
සමිඳාණන් වහන්සේට ඔප්පු කරන පිණිස දවන
යාග පූජාව සෙනඟගේ පුත්රයන්ගේ පිය වංශ
බෙදීම්වල හැටියට දීමට වෙන් කළෝ ය. ගවයින්ටත්

එසේ ම කළෝ ය. 13 නික්ම 12:8-9ඔව්හු පාස්කුව
නීත්‍යනුකූල ව ගින්නනේ පුළුස්සා, අනික් ශුද්ධ
ආහාර ඇතිළිවල ද කටාරම්වල ද හැළිවල ද තම්බා,
ඉක්මනින් ගනෙවුත් මුළු සනෙඟට ඒවා දුන්නෝ ය.
14 ඉන්පසු ඔව්හු තමන්ටත්, පූජකයන්ටත් ඒවා
පිළියළෙ කළෝ ය. මන්ද, ආරොන්ගේ පුත්‍රයන් වූ
පූජකයෝ දවන යාග පූජා ද තලේ ද රූ වන තුරු
ඔප්පු කරමින් සිටියහ. ලවේවරු තමන්ටත්,
ආරොන්ගේ පුත්‍රයන් වන පූජකයන්ටත් ඒවා
පිළියළෙ කළෝ ය. 15 1 වංශා 25:1ආසාප්ගේ
පුත්‍රයන් වූ ගායකයෝ ද දාවිත්ගේත්, ආසාප්ගේත්,
හේමන්ගේත්, රජුගේ දිවැසිවරයා වන
ජදෙුතුන්ගේත් ආඥාවේ ප්‍රකාරයට තම තමන්ගේ
ස්ථානයහෙි සිටියෝ ය. දොරටු පාලකයෝ එක එක
දොරටුවහෙි සිටියෝ ය. තමන්ගේ සේවයනේ අහක්
ව යන්න ඔවුන්ට ඕනෑ කළෙේ නැත. මන්ද,
ඔවුන්ගේ සහෝදර වූ ලවේවරුන් ඔවුන් උදසො ඒවා
පිළියළෙ කළ බැවිනි. 16 මසේ ජොෂියා රජුගේ
ආඥාව ලසෙ පාස්කුව පවත්වන්නත්, සමිඳාණන්
වහන්සේගේ පූජාසන පිට දවන යාග පූජා ඔප්පු
කරන්නත් සමිඳාණන් වහන්සේගේ මුළු මහෙයෙ
එම දවසේ පිළියළෙ කර තිබුණේ ය. 17 නික්ම
12:1-20එහි සිටි ඉශ්‍රායලේවරු පාස්කුවත්, මුහුන්
නොදැමූ රොටි මංගල්‍යයත් ඒ කාලයහෙි සත්
දවසක් පැවැත් වූ හ. 18 එයාකාර පාස්කුවක්
දිවැසිවර සාමුවලේගේ කාලයට පසු ව
ඉශ්‍රායලේවරුන් අතරේ නොපවත්වන ලදී. ජොෂියා
ද පූජකයන් ද ලවේවරුන් ද එහි සිටි ජුදා හා
ඉශ්‍රායලේහි සියල්ලන් ද ජරෙුසලමේ වැසියන් ද
පැවැත්වූවාක් මනේ ඉශ්‍රායලේ රජුන්ගනේ කිසිවකෙු
වත් එයාකාර පාස්කුවක් පැවැත්වූයේ නැත. 19 ඒ
පාස්කුව පැවැත්වූයේ ජොෂියා රජකමට පත් වූ
දහඅට වන අවුරුද්දේ දී ය.

### ජොෂියා රජුගේ අවසානය

(2 රාජා 23:28-30)

20 ජොෂියා මේ සියල්ල කර මාලිගාව පිළියළෙ
කළායින් පසු, මිසරයේ රජ වූ නකෙෝ, යුප්‍රටීස්
ගඟ ළඟ තිබනෙ කර්කමේෂ් නම් ස්ථානයට ඔවුන්ට
විරුද්ධ ව යුද්ධ කරන්න ආවේ ය. ජොෂියා ද ඔහුට
විරුද්ධ ව පිටත් ව ගියේ ය. 21 එහතේ, මිසරයේ
රජ ජොෂියා වතෙ තානාපතියන් එවමින්, "ජුදාහි
රජතුමනේි, මාගනේ ඔබට කුමන වැඩක් ද? ඔබට
විරුද්ධ ව නොව මා සමඟ යුද්ධ කරන වංශයට
විරුද්ධ ව අද මම එමි. ඉක්මන් වන්න කියා දවේයන්
වහන්සේ මට අණකළ සේක; දවේයන් වහන්සේ මා
සමඟ සිටින සේක. උන් වහන්සේ ඔබ විනාශ
නොකරන පිණිස උන් වහන්සේගේ කාරණා ගැන
හරස් නොවිය යුතු ය" කියා දැන්වී ය. 22 එහතේ,
ජොෂියා, නකෙෝ කී දවේයන් වහන්සේගේ වචනය
නොඅසා, ඔහු වතෙින් අහක් ව නොගොස්, ඔහු
සමඟ යුද්ධ කරන පිණිස, වසේ මාරුකරගනෙ
මගිද්දෝ මිටියාවතහෙි සටනට පැමිණියේ ය.

23 දුනුකාරයෝ ජොෂියා රජුට විද්දෝ ය. එවිට රජු
කතා කොට, "මට බොහෝ තුවාළ වූ බැවින් අහකට
ගනෙයන්නැ"යි තම සේවකයන්ට කී ය. 24 ඔහුගේ
සේවකයෝ රථයනේ ඔහු රැගනෙ ඔහුගේ දවෙන
රථයට නංවාගනෙ ජරෙුසලමට ආවෝ ය. ඔහු
මියගිය පසු තමාගේ පියවරුන්ගේ සොහොන්
ගවෙල තැන්පත් කරන ලද්දේ ය. සියලු ජුදාවරු ද
ජරෙුසලමේ වැසියෝ ද ජොෂියා ගැන වැළපුණාහ.
25 ජරෙමියා වනාහි ජොෂියා ගැන විලාප
ගීතිකාවක් කළෙේ ය. ගී ගයන සියලු මිනිස්සු ද ගී
ගයන සියලු ස්ත්‍රීහු ද අද දක්වා තමන්ගේ විලාප
ගීතිකාවලින් ජොෂියා ගැන කතා කරති. ඔව්හු ඒවා
ඉශ්‍රායලේ අතරහෙි නියෝගයක් කොට දුන්නෝ ය.
26 ඒවා විලාප ගීතිකාවල ලියා තිබේ. ජොෂියාගේ
අනික් ක්‍රියා ද සමිඳාණන් වහන්සේගේ ව්‍යවස්ථාවේ
ලියා තිබනෙ හැටියට ඔහු කළ භක්තිමත් වැඩ ද,
27 මුල පටන් අග දක්වා ඔහුගේ ඉතිහාසය ද
ඉශ්‍රායලේ සහ ජුදා රජවරුන්ගේ පුරාවෘත්ත
ග්‍රන්ථයහෙි වාර්තාකර තිබේ.

### ජහෝවාහාස් රජ

(2 රාජා 23:30-35)

36 එවිට දේශයේ සනෙඟ ජොෂියාගේ පුත්
ජහෝවාහාස් කැඳවාගනෙ, ඔහුගේ පියා
වනෙුවට ඔහු ජරෙුසලමහෙි රජකමට පත් කළෝ ය.
2 ජහෝවාහාස් විසිතුන් අවුරුදු වයසේ දී රජ වී,
ජරෙුසලමහෙි තුන් මාසයක් රජකම් කළෙේ ය.
3 මිසරයේ රජ තමෙේ ජරෙුසලමේ දී ඔහු නරෙපා
රිදී කිලෝග්‍රෑම් තුන්දහස් හාරසියයකුත්, රන්
කිලෝග්‍රෑම් තිස්හතරකුත්, දේශයට දඩගසා, 4 ජරෙ
22:11-12ඔහුගේ සහෝදර වූ එලියාකීම් ජුදාහි සහ
ජරෙුසලමහෙි රජකමට පත් කොට, ඔහුගේ නාමය
ජහෝයාකිම් ය කියා වනෙස් කළෙේ ය. තවද,
නකෙෝ ඔහුගේ සහෝදර වූ ජහෝවාහාස් රැගනෙ
මිසරයට ගියේ ය.

### ජහෝයාකිම් රජ

(2 රාජා 23:36;24:7)

5 ජරෙ 22:18-19; 26:1-6; 35:1-19 ජහෝයාකිම්
විසිපස් අවුරුදු වයසේ දී රජ වී, එකොළොස්
අවුරුද්දක් ජරෙුසලමහෙි රජකම් කළෙේ ය. ඔහු
තමාගේ දවේ සමිඳාණන් වහන්සේගේ ඇස්
හමුයහෙි නපුරු දේ කළෙේ ය. 6 ජරෙ 25:1-38;
36:1-32; 45:1-5; දානි 1:1-2බබිලෝනියේ රජ වූ
නබෙුකද්නසෙර් ඔහුට විරුද්ධ ව පැමිණ,
බබිලෝනියට ගනෙයන පිණිස දම්වැල්වලින් ඔහු
බැන්දේ ය. 7 සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ
සමහර භාණ්ඩත් නබෙුකද්නසෙර් බබිලෝනියට
ගනෙ ගොස් බබිලෝනියේ තම මාලිගාවහෙි
තැබුවේ ය. 8 ජහෝයාකිම්ගේ අනික් ක්‍රියා ද ඔහු
කළ පිළිකුල් දේවල් ද ඔහුට විරුද්ධ ව දැනගත්
කාරණා ද ඉශ්‍රායලේ සහ ජුදා රජවරුන්ගේ

පුරාවෘත්ත ග්‍රන්ථයෙහි වාර්තා කර තිබේ. ඔහුගේ
පුත් ජෙහෝයාකීන් ඔහු වෙනුවට රජ විය.

### ජෙහෝයාකීන් රජ
(2 රාජා 24:8-17)

9 ජෙහෝයාකීන් දහඅට අවුරුදු වයසේ දී රජකමට
පත් වී තුන් මාසයකුත් දස දවසක් ජෙරුසලමෙහි
රජකම් කළේ ය. ඔහු සමිඳාණන් වහන්සේගේ
ඇස් හමුයෙහි නපුරු දේ කළේ ය. 10 ජෙරෙ
22:24-30; 24:1-10; 29:1-2; 37:1; එසකි 17:12,13ඊළඟ
අවුරුද්දේ දී නබුකද්නෙසර් රජ ඔහු සහ සමිඳාණන්
වහන්සේගේ මාලිගාවෙහි අනර්ඝ භාණ්ඩත්
බබිලෝනියට ගෙනිවා, ඔහුගේ සහෝදර වූ
ශෙදෙකියා ජුදා සහ ජෙරුසලමෙහි රජ කොට පත්
කළේ ය.

### ශෙදෙකියා රජ
(2 රාජා 24:18-20;ජෙරෙ 52:1-3)

11 ජෙරෙ 27:1-22; 28:1-17 ශෙදෙකියා විසිඑක් අවුරුදු
වයසේ දී රජ වී, එකොළොස් අවුරුද්දක්
ජෙරුසලමෙහි රජකම් කළේ ය. 12 ඔහු තමාගේ
දෙවි සමිඳාණන් වහන්සේගේ ඇස් හමුයෙහි නපුරු
දේ කළේ ය. සමිඳාණන් වහන්සේගේ වචන කී
දිවැසිවරයා වූ ජෙරෙමියා ඉදිරියෙහි ඔහු යටහත්
වූයේත් නැත.

### ජෙරුසලමේ වැටීම

13 එසකි 17:15 තවද, දෙවියන් වහන්සේගේ
නමින් ඔහු දිවුර වූ නබුකද්නෙසර් රජුට විරුද්ධ ව
ඔහු කැරලි ගැසුවේ ය. ඔහු ඉශ්‍රායලේවරුන්ගේ
දෙවි සමිඳාණන් වහන්සේ වෙත නොහැරෙන ලෙස
මුරණ්ඩු වී තමාගේ සිත දැඩි කරගත්තේ ය.
14 පූජකයන්ගේ සියලු ප්‍රධානීහු ද සෙනඟ ද
ජාතීන්ගේ සියලු පිළිකුල් ක්‍රියා හැටියට බොහෝ
සේ අපරාධ කරමින්, සමිඳාණන් වහන්සේ
ජෙරුසලමෙහි විශුද්ධ කළ උන් වහන්සේගේ
මාලිගාව අපවිත්‍ර කළෝ ය. 15 ඔවුන්ගේ
පියවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ ස්වකීය
සෙනඟටත්, ස්වකීය වාසස්ථානයටත් අනුකම්පා කළ
නිසා, උන් වහන්සේ නැවත නැවත පණිවුඩකාරයන්
අත ඔවුන්ට කියා ඇරිය සේක. 16 එහෙත්, පිළියමක්
නැති තරමට සමිඳාණන් වහන්සේගේ කෝපය
තමන්ගේ සෙනඟට විරුද්ධ ව පැමිණෙන ලෙස ඔව්හු
දෙවියන් වහන්සේගේ පණිවුඩකාරයන්ට සරදම්කර,
උන් වහන්සේගේ වචන සුළුකර උන් වහන්සේගේ
දිවැසිවරුන්ට නින්දා කළෝ ය.
17 ජෙරෙ 21:1-10; 34:1-5 ඒ නිසා උන් වහන්සේ
ඔවුන්ට විරුද්ධ ව කල්දිවරුන්ගේ රජ එවූ සේක.
ඔහු ඔවුන්ගේ ශුද්ධස්ථානයේ දී ඔවුන්ගේ
යෞවනයන් කඩුවෙන් මැරී ය. ඔහු යෞවනයාට
වත්, කන්‍යාවට වත්, මහල්ලාට වත්, රෝගියාට වත්
අනුකම්පා නොකළේ ය. උන් වහන්සේ ඔවුන්
සියල්ලන් ඔහු අතට පාවා දුන් සේක. 18 ඔහු
දෙවියන් වහන්සේගේ මාලිගාවේ ලොකු කුඩා සියලු
භාණ්ඩ ද සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ වස්තු
ද රජුගේත්, ඔහුගේ අධිපතීන්ගේත් වස්තු ද යන
සියල්ල ම බබිලෝනියට ගෙන ගියේ ය. 19 1 රාජා
9:8ඔව්හු දෙවියන් වහන්සේගේ මාලිගාව දවාදමා,
ජෙරුසලමේ පවුර කඩා, එහි සියලු මාලිගා ගින්නෙන්
දවා, එහි තිබුණු සියලු අනර්ඝ බඩු විනාශ කළහ.
20 ඔහු කඩුපහරින් නොමළ අය බබිලෝනියට ගෙන
ගියේ ය. පාර්සිවරුන් රජකමට පත්වීම දක්වා
ඔහුටත්, ඔහුගේ පුත්‍රයන්ටත් ඔව්හු දාසයන් ව
සිටියෝ ය. 21 ජෙරෙ 25:11; 29:10මෙසේ වූයේ
ජෙරෙමියාගේ මුඛයෙන් කියවන ලද සමිඳාණන්
වහන්සේගේ වචනය සම්පූර්ණ වන පිණිස ය. ඒ
වචනය නම්, “නොපවත්වන ලද සබත් විශ්‍රාමය
පිරිමසන පිණිස සැත්තෑ අවුරුද්දක් දේශය පාළු වනු
ඇත” යන්න යි.

### සයිරස් රජුගේ ප්‍රකාශය
(එස්රා 1:1-4)

22 එහෙත්, සමිඳාණන් වහන්සේ ජෙරෙමියාගේ
මුඛයෙන් කියවූ වචනය සම්පූර්ණ වන පිණිස
පාර්සියාවේ රජ වූ සයිරස්ගේ පළමු වන අවුරුද්දේ දී
සමිඳාණන් වහන්සේ පාර්සියාවේ රජ වූ සයිරස්ගේ
සිත පෙළඹවූ සේක. ඔහු වනාහි ප්‍රකාශයක්
කරමින්, “ස්වර්ගයේ දෙවි සමිඳාණන් වහන්සේ
පොළොවේ සියලු රාජ්‍යයන් මට දී තිබේ.
23 යෙසා 44:28 “තවද, උන් වහන්සේ ජුදාහි
තිබෙන ජෙරුසලමෙහි උන් වහන්සේට මාලිගාවක්
ගොඩනඟන්නට මට අණකර තිබේ. උන්
වහන්සේගේ මුළු සෙනඟගෙන් ඔබ අතරේ
සිටින්නේ කවරෙක් ද? ඔහු සමඟ ඔහුගේ දෙවි
සමිඳාණන් වහන්සේ වැඩ සිටින සේක් වා! ඔහු
එතැනට යේවා යි පාර්සියාවේ සයිරස් දන්වන්නේ
ය” කියා තමාගේ රාජ්‍යය මුළුල්ලෙහි ප්‍රසිද්ධ කොට
ලියවිල්ලෙනුත් එය පතළ කරවී ය.
io1 පරිච්ඡේද 1-2 විප්‍රවාසයෙන් මිදී පැමිණි ප්‍රථම
කණ්ඩායම.
io1 පරිච්ඡේද 3-6 දේව මාලිගාව ගොඩනඟා කැප
කිරීම.
io1 පරිච්ඡේද 7-10 එස්රා සමඟ සෙනඟත් සමඟ
පැමිණීම.

# එස්රා

### හැඳින්වීම

මේ පොතේ ඇත්තේ, බබිලෝනියාවේ විප්‍රවාසගත වී සිටි ජුදෙව්වරුන් සමහර දෙනෙකු ආපසු සිය රටට පැමිණ ජෙරුසලමේ දේව මාලිගාවේ යළිත් නමස්කාරය ආරම්භ කිරීම පිළිබඳ විස්තරයකි. මේ විස්තරය කොටස් තුනකට බෙදිය හැකි ය. පළමුව, පර්සියාවේ සයිරස් නම් අධිරාජයාගේ නියෝගයක් අනුව බබිලෝනියේ විප්‍රවාසගත ව සිටි ජුදෙව්වරුන් කණ්ඩායමක් ආපසු සිය රටට පැමිණීම; දෙවෙනුව, දේව මාලිගාව යළිත් ගොඩනඟා කැප කොට දේව නමස්කාරය නැවත ආරම්භ කිරීම; තෙවෙනුව, අවුරුදු කීපයකට පසු, ව්‍යවස්ථාව පිළිබඳ මනා දැනුමක් ඇති එස්රාගේ නායකත්වය යටතේ තවත් ජුදෙව් කණ්ඩායමක් විප්‍රවාසයෙන් මිදී ආපසු පැමිණීම හා එස්රාගේ අනුග්‍රහයෙන් සෙනඟගේ පැරණි ආධ්‍යාත්මික සම්ප්‍රදාය රැකෙන පරිදි ඔවුන්ගේ ආගමික හා සාමාජයික ජීවිතයට නව පණක් ලැබීම.

මෙහි අඩංගු කරුණු:
පරිච්ඡේද 1-2 විප්‍රවාසයෙන් මිදී පැමිණි ප්‍රථම කණ්ඩායම.
පරිච්ඡේද 3-6 දේව මාලිගාව ගොඩනඟා කැප කිරීම.
පරිච්ඡේද 7-10 එස්රා සමඟ සෙනඟත් සමඟ පැමිණීම.

### සයිරස් රජුගේ ප්‍රකාශනය

1 ජෙරෙ 25:11; 29:10 පර්සියාවේ රජ වූ
සයිරස්ගේ පළමු වන අවුරුද්දේ දී, සමිඳාණන්
වහන්සේ ජෙරමියා මඟින් ප්‍රකාශ කළ වචනය ඉටු
වන පිණිස, උන් වහන්සේ පර්සියාවේ රජ වූ
සයිරස්ගේ සිත උද්යෝගවත් කළ සේක. ඔහු
තමාගේ රාජ්‍යයේ සතර දිග් භාගයෙහි ප්‍රසිද්ධියේ
කියවන පිණිස ප්‍රකාශනයක් නිකුත් කළේ ය.
2 යෙසා 44:28එය මෙසේ ය: "පර්සියාවේ රජු වන
සයිරස් තමෙමේ මෙසේ කියයි: 'ස්වර්ගයේ දෙවි
සමිඳාණන් වහන්සේ පොළොවේ තලයෙහි සියලු
රාජ්‍යයන් මට දී තිබේ. තවද, උන් වහන්සේ ජුදාහි
ඇති ජෙරුසලම් නගරයෙහි උන් වහන්සේට
මාලිගාවක් ගොඩනඟන්නට මට අණ කර තිබේ.
3 උන් වහන්සේගේ මුළු සෙනඟගෙන් ඔබ අතරේ
සිටින කවර මිනිසකු හෝ වේවා, දෙවි සමිඳාණන්
වහන්සේ ඔහු සමඟ වැඩ සිටින සේක් වා! ඔහු
ජුදාහි ඇති ජෙරුසලමෙහි සිටින ඉශ්රායලේවරුන්ගේ
දෙවි සමිඳාණන් වහන්සේගේ මාලිගාව
ගොඩනඟන්නට ජෙරුසලමට යා යුතු ය. උන්
වහන්සේ වූ කලී, ජෙරුසලමේ වැඩ සිටින දෙවියන්
වහන්සේ ය. 4 යම් ජුදෙව්වකේ ඉතිරි ව යම් තැනක
සිටී ද, ඒ ස්ථානයේ සිටින මනුෂ්‍යයෝ ජෙරුසලමේ
තිබෙන දෙවියන් වහන්සේගේ මාලිගාව උදෙසා සිය
කැමැත්තෙන් දෙන පඬුර හැර, රන් රිදී ද
බඩුබාහිරාදිය හා ගවමහිෂයන් ද දමේන් ඔහුට
උපකාර කරත් වා!' "
5 ජෙරුසලමෙහි සමිඳාණන් වහන්සේගේ මාලිගාව
ගොඩනඟන පිණිස, දෙවියන් වහන්සේ විසින් සිත්
උද්යෝගවත් කරවන ලද සියලු දෙනා ම එනම්,
ජුදාවරුන්ගේත්, බෙන්ජමින්වරුන්ගේත් පිය වංශවල
ප්‍රධානීහු ද පූජකයෝ ද ලෙවීවරු ද එහි යන්නට
සූදානම් වූ හ. 6 ඔවුන් අවට සිටි සියල්ලෝ ද සිය
කැමැත්තෙන් දුන් නා නා විධ පඬුරුවලට අමතර ව
රිදී භාණ්ඩ ද රන් ද බඩුබාහිරාදිය ද ගවමහිෂයන් ද
අනර්ඝ දේවල් ද යන මේවායින් ඔවුන්ට උපකාර
කළහ.
7 තවද, සයිරස් රජු නබුකද්නෙසර් රජු
ජෙරුසලමෙන් ගෙනවුත්, තමාගේ දේවාලයේ තැබූ
සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ භාණ්ඩ පිටතට
ගෙනාවේ ය. 8 පර්සියාවේ රජ වූ සයිරස් ඒවා
භාණ්ඩාගාරික වූ මිත්‍රදොත්ට භාර දුන්නේ ය. ඔහු
ද ඒවා ජුදාහි අධිපති ෂෙෂ්බෂර්ට ගණන් කර
දුන්නේ ය. 9 බඩු ලැයිස්තුව මෙසේ ය: රන් තලි
තිහකි, රිදී තලි දහසකි, විවිධ බඳුන් විසිනවයකි;
10 රන් ධූම පාත්‍ර තිහකි, දෙ වන තරමේ රිදී පාත්‍ර
හාරසිය දහයකි, වෙනත් භාණ්ඩ දහසකි;
11 රන් රිදී සියලු භාණ්ඩවල ගණන පන්දාස්
හාරසියයකි. විප්‍රවාසගත ව සිටි අය
බබිලෝනියෙන් ජෙරුසලමට ආපසු පැමිණි විට
ෂෙෂ්බෂර් විසින් මේ සියල්ල ගෙනෙන ලද්දේ ය.

### බබිලෝනියෙන් ආපසු පැමිණි අය
(නෙහෙ 7:4-73)

2 බබිලෝනියේ රජු වූ නබෙකද්නෙසර් විසින්
අල්ලාගනු ලැබ, බබිලෝනියට ගෙන යන
ලද්දවුන්ගෙන් විප්‍රවාසයෙන් මිදී, ආපසු පැමිණි
දේශවාසීහු ජෙරුසලමේ හා යූදාවේ තම තමන්ගේ
නගරවලට පෙරළා පැමිණියහ. ඔවුන්ගේ නම්
මෙසේ ය: 2 ඔවුන් පැමිණියේ, සෙරුබ්බාබෙල් ද
ජේෂුවා ද නෙහෙමියා ද සෙරායා ද රේලායා ද
මොර්දෙකයි ද බිල්ෂාන් ද මිශ්පාර් ද බිග්වායි ද
රෙහුම් ද බානා ද සමඟ ය.
2 ඉශ්‍රායෙල් ජනයා අතර වූ පිරිමින්ගේ ගණන
මෙසේ ය: 3 පරෝෂ්ගේ පුත්‍රයෝ දෙදොස් එකසිය
හැත්තෑදෙදෙනෙක් ය. 4 ෂෙපටියාගේ පුත්‍රයෝ
තුන්සිය හැත්තෑදෙදෙනෙක් ය. 5 ආරාන්ගේ පුත්‍රයෝ
හත්සිය හැත්තෑපස්දෙනෙක් ය. 6 පාහත්-මෝවබ්ගේ
පුත්‍රයන් වූ ජේෂුවාගේ ද ජෝවාබ්ගේ ද පුත්‍රයෝ
දෙදොස් අටසිය දොළොස්දෙනෙක් ය. 7 ඒලාම්ගේ
පුත්‍රයෝ එක්දාස් දෙසිය පණස්හතරදෙනෙක් ය.
8 සට්ටුගේ පුත්‍රයෝ නවසිය හතළිස්පස්දෙනෙක් ය.
9 සක්කායිගේ පුත්‍රයෝ හත්සිය හැටදෙනෙක් ය.
10 බානීගේ පුත්‍රයෝ හයසිය හතළිස්දෙදෙනෙක් ය.
11 බෙබායිගේ පුත්‍රයෝ හයසිය විසිතුන්දෙනෙක් ය.
12 අශ්ගාද්ගේ පුත්‍රයෝ එක්දාස් දෙසිය
විසිදෙදෙනෙක් ය. 13 අදොනිකාම්ගේ පුත්‍රයෝ
හයසිය හැටහයදෙනෙක් ය. 14 බිග්වායිගේ
පුත්‍රයෝ දෙදොස් පණස්හයදෙනෙක් ය. 15 ආදීන්ගේ
පුත්‍රයෝ හාරසිය පණස්හතරදෙනෙක් ය.
16 හෙසෙකියාගෙන් වූ ආටෙර්ගේ පුත්‍රයෝ
අනූඅටදෙනෙක් ය. 17 බේශායිගේ පුත්‍රයෝ තුන්සිය
විසිතුන්දෙනෙක් ය. 18 ජෝරාගේ පුත්‍රයෝ එකසිය
දොළොස්දෙනෙක් ය. 19 හාෂුම්ගේ පුත්‍රයෝ දෙසිය
විසිතුන්දෙනෙක් ය. 20 ගිබ්බාර්හි පුත්‍රයෝ
අනූපස්දෙනෙක් ය.
21 බෙත්ලෙහෙමේ පුත්‍රයෝ එකසිය
විසිතුන්දෙනෙක් ය. 22 නෙටෝපාහි මනුෂ්‍යයෝ
පණස්හයදෙනෙක් ය. 23 අනාතෝත්හි මනුෂ්‍යයෝ
එකසිය විසිඅටදෙනෙක් ය. 24 අශ්මාවෙත්හි
පුත්‍රයෝ හතළිස්දෙදෙනෙක් ය. 25 කිරියත්-ආරිමෙත්,
කෙපිරායෙත් බෙයේරොතෙත් පුත්‍රයෝ හත්සිය
හතළිස්තුන්දෙනෙක් ය. 26 රාමාහිත්, ගෙබොහිත්
පුත්‍රයෝ හයසිය විසිඑක්දෙනෙක් ය. 27 මික්මාස්හි
මනුෂ්‍යයෝ එකසිය විසිදෙදෙනෙක් ය. 28 බෙතෙල්හි
ද ආයිහි ද මනුෂ්‍යයෝ දෙසිය විසිතුන්දෙනෙක් ය.
29 නෙබෝහි පුත්‍රයෝ පණස්දෙදෙනෙක් ය.
30 මග්බිෂ්හි පුත්‍රයෝ එකසිය පණස්හයදෙනෙක් ය.
31 අනික් ඒලාම්හි පුත්‍රයෝ එක්දාස් දෙසිය
පණස්හතරදෙනෙක් ය. 32 හාරීම්හි පුත්‍රයෝ
තුන්සිය විසිදෙනෙක් ය. 33 ලොද්හි ද හාදීද්හි ද
ඕනෝහි ද පුත්‍රයෝ හත්සිය විසිපස්දෙනෙක් ය.
34 ජෙරිකෝවේ පුත්‍රයෝ තුන්සිය
හතළිස්පස්දෙනෙක් ය. 35 සෙනායාහි පුත්‍රයෝ
තුන්දාස් හයසිය තිස්දෙනෙක් ය.
36 පූජකයෝ නම්: ජේෂුවාගේ වංශයේ
ජෙදායාගේ පුත්‍රයෝ නවසිය හැත්තෑතුන්දෙනෙක්
ය. 37 ඉම්මෙර්ගේ පුත්‍රයෝ එක්දාස්
පණස්දෙදෙනෙක් ය. 38 පෂ්හූර්ගේ පුත්‍රයෝ
එක්දාස් දෙසිය හතළිස්හත්දෙනෙක් ය. 39 හාරිම්ගේ
පුත්‍රයෝ එක්දාස් දහහත්දෙනෙක් ය.
40 ලෙවීවරු නම්: හෝදවියාගේ පුත්‍රයන්ගෙන් වූ
ජේෂුවාගේ ද කද්මියෙල්ගේ ද පුත්‍රයෝ
හැත්තෑහතරදෙනෙක් ය. 41 ගීතිකාකාරයන් වූ
ආසාප්ගේ පුත්‍රයෝ එකසිය විසිඅටදෙනෙක් ය.
42 දොරටු පාලකයන්ගේ පුත්‍රයෝ එනම්:
ෂල්ලුම්ගේ පුත්‍රයෝ ද ආටෙර්ගේ පුත්‍රයෝ ද
ටල්මොන්ගේ පුත්‍රයෝ ද අක්කුබ්ගේ පුත්‍රයෝ ද
හටීටාගේ පුත්‍රයෝ ද ෂෝබයිගේ පුත්‍රයෝ ද යන
සියල්ලෝ එකසිය තිස්නවදෙනෙක් ය.
43 දේව මාලිගාවේ සේවකයන් වන නෙතිනීම්වරු
නම්: ශීහාගේ පුත්‍රයෝ ය; හසුපාගේ පුත්‍රයෝ ය;
ටබ්බාවොත්ගේ පුත්‍රයෝ ය; 44 කේරොස්ගේ
පුත්‍රයෝ ය; සියාගේ පුත්‍රයෝ ය; පාදොන්ගේ
පුත්‍රයෝ ය; 45 ලබොනාගේ පුත්‍රයෝ ය;
හගාබාගේ පුත්‍රයෝ ය; අක්කුබ්ගේ පුත්‍රයෝ ය;
46 හාගාබ්ගේ පුත්‍රයෝ ය; ෂම්ලායිගේ පුත්‍රයෝ
ය; හානාන්ගේ පුත්‍රයෝ ය; 47 ගිද්දෙල්ගේ
පුත්‍රයෝ ය; ගහර්ගේ පුත්‍රයෝ ය; රයොයාගේ
පුත්‍රයෝ ය; 48 රෙශීන්ගේ පුත්‍රයෝ ය;
නෙකෝදාගේ පුත්‍රයෝ ය; ගස්සාම්ගේ පුත්‍රයෝ
ය; 49 උශ්ශාගේ පුත්‍රයෝ ය; පාසේයාගේ
පුත්‍රයෝ ය; බේසයිගේ පුත්‍රයෝ ය; 50 අස්නාගේ
පුත්‍රයෝ ය; මයුනීම්ගේ පුත්‍රයෝ ය; නෆීසිම්ගේ
පුත්‍රයෝ ය; 51 බක්බුක්ගේ පුත්‍රයෝ ය;
හකුපාගේ පුත්‍රයෝ ය; හර්හූර්ගේ පුත්‍රයෝ ය;
52 බශ්ලූත්ගේ පුත්‍රයෝ ය; මෙහිදාගේ පුත්‍රයෝ
ය; හර්ෂාගේ පුත්‍රයෝ ය; 53 බර්කොස්ගේ
පුත්‍රයෝ ය; සීසෙරාගේ පුත්‍රයෝ ය; තෙමාගේ
පුත්‍රයෝ ය; 54 නෙශියාගේ පුත්‍රයෝ ය; හටීපාගේ
පුත්‍රයෝ ය;
55 සලමොන්ගේ සේවකයන්ගේ පුත්‍රයෝ නම්:
සෝටයිගේ පුත්‍රයෝ ය; හස්සොපෙරෙත්ගේ
පුත්‍රයෝ ය; පරූදාගේ පුත්‍රයෝ ය; 56 ජයලාගේ
පුත්‍රයෝ ය; දර්කොන්ගේ පුත්‍රයෝ ය; ගිද්දෙල්ගේ
පුත්‍රයෝ ය; 57 ෂෙපටියාගේ පුත්‍රයෝ ය;
හට්ටිල්ගේ පුත්‍රයෝ ය; පොකෙරෙත්-
හශ්ශබොයිම්ගේ පුත්‍රයෝ ය; ආමීගේ පුත්‍රයෝ ය.
58 දේව මාලිගාවේ සේවකයෝ ද සලමොන්ගේ
සේවකයන්ගේ පුත්‍රයෝ ද යන සියල්ලෝ තුන්සිය
අනූදෙදෙනෙක් ය.
59 තේල්-මෙලා, තේල්-හර්ෂා, කෙරූබ්, අද්දාන්,
ඉම්මෙර් යන ස්ථානවල සිට ආවා වූ, තමන්
ඉශ්‍රායෙල්වරුන් බවට තම තමන්ගේ පෙළපතත්,
වංශයත් පෙන්වන්නට බැරි වුණා වූ අය නම්:
60 දෙලායාගේ පුත්‍රයෝ ද ටෝබියාගේ පුත්‍රයෝ ද
නෙකෝදාගේ පුත්‍රයෝ ද යන මොවුහු හයසිය
පණස්දෙදෙනෙක් ය.

61 පූජකයන්ගේ පුත්‍රයන්ගෙනේ හබායාගේ
පුත්‍රයෝත්, හක්කොශ්ගේ පුත්‍රයෝත්, ගිලියදීය
බර්ශල්ලයිගේ දූවරුන්ගෙනේ භාර්යාවක පාවාගෙන
ඔවුන්ගේ නාමය ලැබූ බර්සිල්ලයිගේ පුත්‍රයෝත් ය.
62 පෙළපත් වශයෙනේ ගණන් ගන්නා ලද
ලේඛනයෙහි ඔවුන්ගේ නම් සෙවූ නමුත්, හමුනොවූ
බැවින්, මොවුහු අපවිත්‍ර යයි සලකනු ලැබ, පූජක
තනතුරෙනේ ඉවත් කරනු ලැබුවෝ ය. 63 ගණන්
27:21ඌරීම් සහ තුම්මීම් දරන පූජකයෙකු නැඟිටින
තුරු, අතිශුද්ධ දේවලින් නොකෙන හැටියට
ආණ්ඩුකාරයා ඔවුන්ට අණ කළේ ය.
64 මුළු සභාවේ ගණන හතළිස් දදොස් තුන්සිය
හැටක් ය. 65 ඒ හැර ඔවුන්ගේ දාසදාසීහු හත්දාස්
තුන්සිය තිස්හත්දනෙකේ ද සිටියෝ ය. ඔවුන් අතරේ
ගායක ගායිකාවෝ දසෙියයක් සිටියෝ ය.
66 ඔවුන්ගේ අශ්වයෝ හත්සිය තිස්හයදනෙකේ ය;
ඔවුන්ගේ අශ්වතරයෝ දසෙිය හතළිස්පස්දනෙකේ
ය; 67 ඔවුන්ගේ ඔටුවෝ හාරසිය තිස්පස්දනෙකේ ය;
කොටළුවෝ හයදාස් හත්සිය විසිදනෙකේ ය.
68 තවද, ඒ ඒ වංශවල ප්‍රධානීන්ගෙනේ සමහරු
ජරෙුසලමෙහි තිබෙන සමිඳාණන් වහන්සේගේ
මාලිගාවට පැමිණි කල්හි, දවෙියන් වහන්සේගේ
මාලිගාව ස්වකීය ස්ථානයෙහි ගොඩනඟන පිණිස
සිය කැමැත්තෙනේ දුන් පඩුරු ඔප්පු කළහ. 69 ඔව්හු
තමන්ගේ පුළුවන්කමේ හැටියට රන් කිලෝග්‍රෑම්
පන්සියයක් ද රිදී කිලෝග්‍රෑම් දදෙහස් අටසියයක් ද
පූජකවස්ත්‍ර සියයක් ද කර්මාන්ත සඳහා ගබඩාවට
දුන්නෝ ය.
70 1 වංශා 9:2; නහෙ 11:3 මසෙේ පූජකයෝ ද
ලෙවීවරු ද සනෙඟගෙනේ සමහරු ද ගායකයෝ ද
දොරටු පාලකයෝ ද මාලිගාවේ සේවකයෝ ද
ස්වකීය නගරවල විසූ හ. සියලු ඉශ්රායලේවරු ද
ස්වකීය නගරවල විසූ හ.

## නමස්කාරය යළි ඇරඹීම

3 හත් වන මාසය වන විට, ඉශ්රායලේ සනෙඟ
තම තමන්ගේ නගරවල පදිංචි වී සිටියහ.
එකල ඔව්හු එක් කනෙකු මනේ ජරෙුසලමට රුස්
වූ හ. 2 නික්ම 27:1ඒ අවස්ථාවේ දී ජෝශාදාක්ගේ
පුත් ජෝෂුවා ද පූජකයන් වූ ඔහුගේ සහෝදරයෝ ද
ෂයෙල්තියලේගේ පුත් සරෙුබ්බාබලේ ද ඔහුගේ
සහෝදරයෝ ද දවෙියන් වහන්සේට කැප වූ
මනුෂ්‍යයා වූ මෝසසේගේ ව්‍යවස්ථාවේ ලියා
තිබෙන ලසෙ, දවන යාග පූජා ඔප්පු කරන පිණිස,
ඉශ්රායලේවරුන්ගේ දවෙියන් වහන්සේගේ
පූජාසනය ගොඩනැඟීමට පටන්ගත්හ. 3 ගණන්
28:1-8ඔව්හු විදසේවල ජනයාට බියෙනේ සිටි නමුත්,
පූජාසනය කලින් තිබුණ ස්ථානයෙහි පිහිටවූවෝ ය.
ඔව්හු ඒ පූජාසනය මත උදය සවස සමිඳාණන්
වහන්සේට දවන යාග පූජා ඔප්පු කළෝ ය.
4 ගණන් 29:12-38ලියා තිබෙන නියමයන් ලසෙ ඔව්හු
කූඩාරම් මංගල්‍යයන් පවත්වමින්, එක එක දවසට
නියම ගණන අනුව දවස් පතා දවන යාග පූජා ඔප්පු
කළහ. 5 ගණන් 29:11—29:39ඒවාට අමතර ව ඔව්හු
නිරන්තර දවන යාග පූජා ද අමාවක්වලත්,
සමිඳාණන් වහන්සේගේ සියලු නියමිත ශුද්ධ
මංගල්‍යවලත් පූජා ද සමිඳාණන් වහන්සේට ඔප්පු
කරන සියල්ලන්ගේ ස්වේච්ඡා පූජා ද ඔප්පු කළහ.
6 ඔව්හු හත් වන මාසයේ පළමු වන දා පටන්
සමිඳාණන් වහන්සේට දවන යාග පූජා ඔප්පු
කරන්නට පටන්ගත්හ. එහතේ, සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ අත්තිවාරම් ඒ වන තකේ
නොදමන ලද්දේ ය. 7 පර්සියාවේ රජ වූ
සයිරස්ගෙනේ තමන්ට ලැබුණු අවසරයේ හැටියට
ලබෙනොන්හි සිට ජොප්පාවට මුහුදනේ කිහිරි ගස්
ගනෙෙන පිණිස ඔව්හු මේසන්වරුන්ටත්, වඩුවන්ටත්
මුදල් ද සීදොන් වැසියන්ටත්, තීර් වැසියන්ටත් කෑම,
බීම හා තලේ ද දුන්නෝ ය.

## දේව මාලිගාවේ අත්තිවාරම් දැමීම

8 ජරෙුසලමෙහි තිබෙන දවෙියන් වහන්සේගේ
මාලිගාවට ඔවුන්ගේ පැමිණීමනේ පසු, දෙ වන
අවුරුද්දේ දෙ වන මාසයේ දී ෂයෙල්තියලේගේ පුත්
සරෙුබ්බාබලේ ද ජෝශාදාක්ගේ පුත් ජෝෂුවා ද එහි
වැඩ පටන්ගත්හ. ඔවුන්ගේ සසෙු සහෝදරයෝ ද
පූජකයෝ ද ලෙවීවරු ද විප්‍රවාසයෙනේ මිදී
ජරෙුසලමට පැමිණි සියල්ලෝ ද ඔවුන්ට සහාය වූ
හ. ඔව්හු සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ වැඩ
බලාගැනීමට විසි අවුරුදු හා ඊට වැඩි වයසැති
ලෙවීවරුන් පත් කළෝ ය. 9 එවිට ජේෂුවා සහ
ඔහුගේ පුත්‍රයෝ ද සහෝදරයෝ ද කද්මියලේ සහ
ඔහුගේ පුත්‍රයන් වූ ජුදාගේ පුත්‍රයෝ සහ
හනෝදාද්ගේ පුත්‍රයෝ ද ඔවුන්ගේ පුත්‍රයෝ ද
සහෝදරයෝ ද යන ලෙවීවරු එකමුතු ව දවෙියන්
වහන්සේගේ මාලිගාවේ වැඩ කරන්නන් පිළිබඳ
වගකීම තමන් අතරේ බදොගත්හ.
10 1 වංශා 25:1 ගොඩනඟන අය සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ අත්තිවාරම් දැමූ කල,
ඉශ්රායලේහි රජ වූ දාවිත් නියම කළ අන්දමට
සමිඳාණන් වහන්සේට ප්‍රශංසා කරන පිණිස,
පූජකයෝ ස්වකීය ඇඳුමනේ සැරසී හොරණෑ ඇති ව
ද ආසාප්ගේ පුත්‍රයන් වන ලෙවීවරු අත්තල් ඇති ව
ද ඉදිරියට ආහ. 11 1 වංශා 16:34; 2 වංශා 5:13;
7:3; ගීතා 100:5; 106:1; 107:1; 118:1; 136:1; ජරෙ
33:11ඔව්හු සමිඳාණන් වහන්සේට ස්තුති ප්‍රශංසා
කරමින්, “උන් වහන්සේ යහපත් ය; මන්ද,
ඉශ්රායලේ කෙරෙහි උන් වහන්සේගේ කරුණාව
සදහට ම පවතින්නේ ය”යි කියමින් ගී ගැයූ හ.
සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ අත්තිවාරම දැමූ
නිසා ඔවුන් සමිඳාණන් වහන්සේට ප්‍රශංසා කළ
විට, මුළු සනෙඟ දවෙියන් වහන්සේට මහා ප්‍රශංසා
ඝෝෂාවක් නැඟුවෝ ය. 12 එහතේ, පළමු මාලිගාව
දුටු මහලු අය වන බොහෝ පූජකයෝ ද ලෙවීවරු ද
පිය වංශවල ප්‍රධානියෝ ද මාලිගාවේ අත්තිවාරම්
දැමූ බව දුටු විට මහා හඬින් හැඬුවෝ ය. තවත්
බොහෝ දනෙකේ ප්‍රීති ඝෝෂා ද පැවැත්වූ හ. 13 ඒ

නිසා ප්‍රීති ඝෝෂාවේ හඬ කුමක් ද කියා වත්,
සෙනඟගේ හැඬීමේ හඬ කුමක් ද කියා වත්
කිසිවකුට වෙනේ වෙනේ වශයෙන් හඳුනාගත
නොහැකි විය. මන්ද, සෙනඟ මහා හඬින් ඝෝෂා
කළෝ ය. ඒ ඝෝෂාව බොහෝ දුරට ඇසිණි.

### සමාරියයන්ගේ විරෝධය

4 විප්‍රවාසයෙන් මිදී පැමිණි අය ඉශ්‍රායලේහි
දෙවි සමිඳාණන් වහන්සේට මාලිගාවක්
ගොඩනඟන බව ජුදාවරුන්ගේ ද
බෙන්ජමින්වරුන්ගේ ද එදිරිකාරයෝ අසා, 2 2 රාජා
17:24-41සරුබ්බාබෙල් ද පිය වංශවල ප්‍රධානීන් ද
වෙත අවුත්, ඔවුන්ට කතා කොට, “ඔබ හා සමඟ
මාලිගාව ගොඩනඟන්නට අපටත් ඉඩ දෙන්න; මන්ද,
ඔබ සේ ම අපිත් ඔබේ දෙවියන් වහන්සේ අදහමු;
මෙතැනට අප ගෙනාවා වූ අසිරියාවේ රජු වන ඒසර්-
හද්දොන්ගේ කාලයේ පටන් අපි උන් වහන්සේට
පූජා කරමින් සිටියෙමු”යි කී හ.
3 එහෙත්, සරුබ්බාබෙල් ද ජෝෂුවා ද ඉශ්‍රායලේ
පිය වංශවල සෙසු ප්‍රධානීහු ද ඔවුන්ට කතා කොට,
“අපේ දෙවියන් වහන්සේට මාලිගාවක්
ගොඩනැඟීමේ දී ඔබ අප සමඟ එක් වීමෙන් අපට
කිසි වැඩක් නැත. පර්සියාවේ සයිරස් රජ අපට අණ
කර තිබෙන පරිදි, අපි පමණක් ම ඉශ්‍රායලේ දෙවි
සමිඳාණන් වහන්සේට එය ගොඩනඟන්නෙමු”යි කී
හ.
4 එවිට දේශයේ සෙනඟ, ජුදා සෙනඟ
අධෛර්යවත් කරවන්නටත්, තවදුරටත්
ගොඩනැඟීමේ වැඩ නොකරන ලෙස ඔවුන්
බියගන්වන්නත් පටන්ගත්හ. 5 තවද, ඔවුන්ගේ වැඩ
ව්‍යර්ථ කරන පිණිස ඔව්හු රජයේ නිලධාරීන්ට
අල්ලස් දුන්හ. මේ තත්ත්වය පර්සියාවේ රජු වූ
සයිරස්ගේ මුල් කාලයේ සිට පර්සියාවේ රජු වූ
දාරියුස් රජකමට පැමිණෙන තුරු ම පැවතිණි.
6 එස්ත 1:1 අහස්වේරොෂ් රජකමට පත් වූ මුල්
කාලයේ දී ඔව්හු ජුදාහි ද ජෙරුසලමෙහි ද වැසියන්ට
විරුද්ධ ව චෝදනාවක් ලියා ඉදිරිපත් කළහ.
7 තවද, අර්තක්ෂස්තා රජු දවස, බිෂ්ලාම් ද
මිත්‍රේදාත් ද ටබයෙල් ද ඔවුන්ගේ සෙසු
සහකාරයෝ ද පර්සියාවේ රජු වූ අර්තක්ෂස්තාට
ලියුමක් ලියා යැවූ හ. ඒ ලියුම අරමීය භාෂාවෙන්
අරමීය අකුරුවලින් ලියන ලද්දේ ය.
8 ආණ්ඩුකාරයා වූ රෙහුම් ද ලේකම් වූ ෂිම්ෂයි ද
ජෙරුසලමට විරුද්ධ ව මතු දැක්වෙන ලියුම
අර්තක්ෂස්තා රජුට ලියා යැවූ හ.
9 ආණ්ඩුකාර වූ රෙහුම් ද ලේකම් වූ ෂිම්ෂයි ද
ඔවුන්ගේ සෙසු සහකාරයෝ ද විනිශ්චයකරුවෝ ද
තානාපතියෝ ද පර්සියානු නිලධාරීහු ද උරුක් හා
බබිලෝනි වැසියෝ ද සූසාහි ඒලාම්වරු ද 10 උතුම්
වූ, ගරුතර වූ අසුර්බනිපාල් විසින් ගෙනෙනෙ ලදුව,
සමාරියේ නගරවල හා යුප්‍රටීස් ගඟෙන් එතරෙ
පළාතේ පදිංචි කරවන ලද සෙසු සෙනඟ ද එයට
පංගුකාර වූ හ.
11 ඔව්හු අර්තක්ෂස්තා රජු වෙත මෙසේ ලියා යැවූ
හ: “ගඟින් එතරෙ වාසය කරන සෙනඟ වන අපි,
රජතුමා වෙත මෙසේ ලියා එවමු: 12 ඔබ කරෙන්
අප වෙත ආ ජුදෙව්වන් ජෙරුසලමට පැමිණ ඒ
කැරලිකාර නපුරු නගරය ගොඩනඟන බව ඔබ
තුමාට දැන්විය යුතු ය. පවුරුවල වැඩ නිම කරන්නට
ළඟ ය. ඔව්හු අත්තිවාරම අලුත්වැඩියා කරගනෙ
යති. 13 ඉතින් මේ නගරය ගොඩනඟා පවුරු සාදා
නිම කරනු ලැබුවොත් මොවුන් තීරු බද්ද වත්,
ආදායම් බද්ද වත්, සුංගම් වත් නොදෙන බව ද
මෙසේ අන්තිමේ දී රජුට එයින් අලාභ හානි සිද්ධ
වන බව ද ඔබ තුමාට දැන්විය යුතු ය. 14 ඉතින් අපි
ඔබ තුමාට ණයගැති ව සිටිය දී ඔබට අලාභ හානි
පැමිණෙනු බලා සිටීම අපට නුසුදුසු බැවින්, 15 ඔබේ
පියවරුන්ගේ ලේඛනාගාරයේ වාර්තා පොත විභාග
කරන පිණිස ඔබ තුමාට දන්වා එවමු. මෙසේ ඔබ
වාර්තා පොතෙහි සොයා බැලුවොත්, මේ නගරය
කැරලිකාර, රජුටත් රටවලටත් අලාභ හානි කරන
නගරයක් බවත්, පරෙ සිට ම එහි ද්‍රෝහිකම්වලට
තුඩු දීම් සිදු වූ බවත්, එම කාරණය නිසා ඒ නගරය
වනසනු ලැබූ බවත් ඔබට දැනගන්නට ලැබෙනු ඇත.
16 මේ නගරය ගොඩනඟා පවුරු සාදා නිම කරනු
ලැබුවොත්, යුප්‍රටීස් ගඟින් මෙගොඩ ඔබට කිසි
පදෙසෙක් අයිති නොවන බව අපි ඔබ තුමාට දන්වා
සිටිමු.”

### රජතුමාගේ පිළිතුර

17 එවිට රජතුමා මේ පිළිතුර යැවී ය: “රෙහුම්
ආණ්ඩුකාරයාටත්, ෂිම්ෂයි ලේකම්ටත්, සමාරියේ
වාසය කරන ඔවුන්ගේ සෙසු සහකාරයන්ටත්,
යුප්‍රටීස් ගඟින් එගොඩ සිටින සෙසු අයටත් සෙත්
වේ වා! 18 ඔබ අප වෙත එවූ ලිපිය පරිවර්තනය
කර මා ඉදිරියෙහි පැහැදිලි ලෙස කියවන ලද්දේ ය.
19 මා අණ දුන් පරිදි විභාගයක් ද කරන ලද්දේ ය.
ඒ අනුව, මේ නගරය පුරාණ කාලයේ සිට
රජවරුන්ට එදිරිවාදිකම් කර ඇති බවත්, එහි
කැරලිගැසීම් ද ද්‍රෝහිකම් ද සිදු වී ඇති බවත් පෙනී
ගොස් තිබේ. 20 තවද, යුප්‍රටීස් ගඟින් එගොඩ
තිබෙන මුළු රට ආණ්ඩු කළ රජුන් ජෙරුසලමෙහි සිටි
බවත්, තීරු බද්ද ද ආදායම් බද්ද ද සුංගම් ද ඔවුන්ට
දෙන ලද බවත් දැනගන්නට ලැබී ඇත. 21 එබැවින්
මා විසින් නියෝගයක් පමුණුවන තුරු ඒ නගරය
ගොඩනොනඟන පිණිස ඒ මිනිසුන්ගේ වැඩ
නවත්වන හැටියට නියෝගයක් කරන්න. 22 රජුට
අලාභ හානි වන විධියේ අනතුරු වැඩී වන්නට ඉඩ
නොහරින පිණිස අප්‍රමාද ව මෙය කරන ලෙස
වගබලාගන්න.”
23 අර්තක්ෂස්තා රජුගේ මේ ලිපියේ පිටපත
රෙහුම් ද ෂිම්ෂයි ලේකම් ද ඔවුන්ගේ සහකාරයන් ද
ඉදිරියෙහි කියවෙූ විගස ම, ඔව්හු ජෙරුසලමෙහි සිටි
ජුදෙව්වරුන් වෙත සැණෙකින් ගොස්
බලහත්කාරයෙන් ඔවුන්ගේ වැඩ නතර කළහ.
24 හග් 1:1; සකෙරි 1:1එකල ජෙරුසලමෙහි තිබෙන

දෙවියන් වහන්සේගේ මාලිගාවේ වැඩ නැවතුණේ
ය; පර්සියාවේ රජ වූ දාරියුස්ගේ රාජ පාලනයේ දෙ
වන අවුරුද්ද දක්වා එය නැවතී තිබිණි.

### දේව මාලිගාවේ වැඩ යළි ඇරඹීම

5 හග් 1:1; සකරි 1:1 එකල හග්ගයි සහ
ඉද්දෝගේ පුත් සකරියා යන දිවැසිවරු ජුදාහි
ද ජෙරුසලමෙහි ද සිටි ජුදෙව්වරුන්ට, ඔවුන් සමඟ
වැඩ විසූ ඉශ්රායලේවරුන්ගේ දෙවියන් වහන්සේගේ
නාමයෙන් දිවැස් වැකි පැවසූ හ. 2 හග් 1:12; සකරි
4:6-9එවිට ෂයෙල්තියෙල්ගේ පුත් සරුබ්බාබෙල් ද
ජෝශාදාක්ගේ පුත් ජෝෂුවා ද ජෙරුසලමෙහි තිබෙන
දෙවියන් වහන්සේගේ මාලිගාව ගොඩනඟන්නට
පටන්ගත්හ; ඔවුන් සමඟ දෙවියන් වහන්සේගේ
දිවැසිවරු ද ඔවුන්ට උපකාර කරමින් සිටියෝ ය.
3 ඒ කාලයේ දී යුප්රටීස් ගඟින් එගොඩ සිටි
තත්තෙනයි නම් දිශාධිපතියා ද ෂෙතර්-බෝසෙනයි ද
ඔවුන්ගේ සහකාරයෝ ද ඔවුන් වෙත අවුත්, කතා
කොට, “මේ මාලිගාව ගොඩනැඟීමට,
ප්රතිසංස්කරණය කිරීමට ඔබට නියෝග කළේ
කවරෙක් දැ”යි ඔවුන්ගෙන් ඇසූ හ. 4 තවදුරටත්
ඔව්හු ප්රශ්න කරමින්, “මේ මාලිගාව ගොඩනඟන
මිනිසුන්ගේ නම් කවරේ දැ”යි ඇසූ හ. 5 එහෙත්,
ජුදෙව්වරුන්ගේ දෙවියන් වහන්සේගේ ආරක්ෂා
බැල්ම ඔවුන්ගේ ප්රජා මූලිකයන් කෙරෙහි වූ බැවින්
දාරියුස්ට මේ සම්බන්ධයෙන් දන්වා යවා, ලියුමකින්
පිළිතුරු ලැබෙන තුරු ඔව්හු ඔවුන්ගේ වැඩ නතර
නොකළහ.
6 යුප්රටීස් ගඟින් එගොඩ සිටි දිශාධිපති තැන වූ
තත්තෙනයි ද ෂෙතර්-බෝසෙනයි ද යුප්රටීස් ගඟින්
එගොඩ සිටි පර්සියානු නිලධාරීන් වූ ඔහුගේ
සහකාරයන් ද විසින් දාරියුස් රජුට යැවුණු ලිපියේ
පිටපත මතු දැක්වේ. 7 ඔවුන් යැවූ රපෝර්තුවේ
මෙසේ ලියා තිබිණි: “දාරියුස් රජු හට සව් සෙත් වේ
වා! 8 අප ජුදා රටේ තිබෙන, උතුම් දෙවියන්
වහන්සේගේ මාලිගාවට ගිය බව රජතුමාට දැන්විය
යුතු ව තිබේ. එය ලොකු ගල්වලින් ගොඩනඟාගෙන
යනු ලැබේ. බිත්තිවලට ලී බාල්ක යොදා තිබේ. ඒ
වැඩකටයුතු උනන්දුවෙන් හොඳින් කෙරීගෙන යයි.
9 අපි ද එහි ප්රජා මූලිකයන්ගෙන් ප්රශ්න කරමින්,
‘මේ මාලිගාව ගොඩනඟන්නත්, එයට ගෘහ භාණ්ඩ
සැපයීමටත් ඔබට නියෝගයක් කළේ කවරෙක්
දැ’යි ඔවුන්ගෙන් ඇසීමු. 10 තවද, ඔවුන්ට මූලික ව
ක්රියා කරන මිනිසුන්ගේ නම් ලියාගෙන ඔබට
දන්වනු පිණිස, ‘ඔවුන්ගේ නම් කවරේ දැ’යි
ඔවුන්ගෙන් ඇසීමු. 11 ඔව්හු පිළිතුරු දෙමින්, ‘අපි
ස්වර්ගයේත්, පොළොවේත් දෙවියන් වහන්සේගේ
මෙහෙකරුවෝ වම්හ. මීට බොහෝ අවුරුදු
ගණනකට පෙර ගොඩනඟන ලද, ඉශ්රායලේහි
උතුම් රජකු විසින් ගොඩනඟා නිම කරන ලද
මාලිගාව අපි නැවත ගොඩනගමු. 12 2 රාජා
25:8-12; 2 වංශා 36:17-20; ජෙරෙ 52:12-15එහෙත්,
අපේ පියවරුන් විසින් ස්වර්ගයේ දෙවියන් වහන්සේ
උදහස් කරනු ලැබූ බැවින් උන් වහන්සේ කල්දිය වූ
බබිලෝනියේ රජු වූ නබුකද්නෙසර් අතට ඔවුන්
පාවා දුන් සේක. ඔහු ද මේ මාලිගාව විනාශ කොට
සෙනඟ බබිලෝනියට ගෙන ගියේ ය. 13 එස්රා
1:2-11එහෙත්, බබිලෝනියේ රජු වූ සයිරස්ගේ පළමු
වන අවුරුද්දේ දී, දෙවියන් වහන්සේගේ මේ
මාලිගාව ගොඩනඟන්නට සයිරස් රජ නියෝගයක්
කළේ ය. 14 තවද, නබුකද්නෙසර් රජු
ජෙරුසලමෙහි තිබුණු මාලිගාවෙන් ගෙන ගොස්,
බබිලෝනියේ දේවාලයේ තැබූ දෙවියන්
වහන්සේගේ මාලිගාවේ රන් රිදී භාණ්ඩ, සයිරස්
රජ බබිලෝනියේ දේවාලයෙන් රැගෙන, තමා
දිශාධිපතියා වශයෙන් පත් කළ ෂෙෂ්බෂර් යන
නාමය ඇති තැනැත්තාට භාර දුන්නේ ය. 15 ඔහු
කතා කොට, ‘මේ භාණ්ඩ ගෙන ගොස්
ජෙරුසලමෙහි තිබෙන මාලිගාවේ තබන්න; දෙවියන්
වහන්සේගේ මාලිගාව ද කලින් තිබූ ස්ථානයෙහි
ගොඩනඟනු ලබාවා’යි ද කීවේ ය. 16 එවිට එම
ෂෙෂ්බෂර් අවුත් ජෙරුසලමෙහි තිබෙන දෙවියන්
වහන්සේගේ මාලිගාවේ අත්තිවාරම දැමුවේ ය.
එතැන් පටන් මේ දක්වා එය ගොඩනඟාගෙන යන
නමුත් තව ම එය නිමකර නැතැ’යි අපට කීවෝ ය.
17 ඒ නිසා රජුට යහපතැ යි පෙනේ නම්,
ජෙරුසලමෙහි දෙවියන් වහන්සේගේ මේ මාලිගාව
ගොඩනඟන්නට සයිරස් රජු විසින් නියෝගයක්
කරන ලද්දේ දැ යි බබිලෝනියේ තිබෙන රජුන්ගේ
භාණ්ඩාගාරයෙහි සොයා බලන්න සලස්වා, මේ
කාරණය ගැන රජතුමාගේ කැමැත්ත අපට දන්වා
එවුව මැනව.”

### දාරියුස් රජුගේ පිළිතුර

6 එකල දාරියුස් රජු කළ නියෝගයක් අනුව
බබිලෝනියෙහි ලේඛනාගාරයේ ගබඩාවල
තැන්පත් කරන ලද පොත් සොයා බලන ලදී. 2 එවිට
මේදියා ජනපදයේ තිබෙන එක්බතානා
බලකොටුවෙහි වාර්තා පොතක් සම්භ විය. එහි
මෙසේ කියා තිබිණි:
3 “සයිරස් රජුගේ පළමු වන අවුරුද්දේ දී සයිරස්
රජ ජෙරුසලමෙහි තිබෙන දෙවියන් වහන්සේගේ
මාලිගාව ගැන මෙසේ නියෝගයක් කළේ ය: ‘ඒ
මාලිගාව පූජා ඔප්පු කරන ස්ථානයක් වශයෙන්
ගොඩනඟනු ලැබේවා. එහි අත්තිවාරම් සවි කොට
පිහිටුවනු ලැබේවා. එහි උස මීටර් විසිහතක් ද පළල
මීටර් විසිහතක් ද විය යුතු ය. 4 මහා ගල් පේළි
තුනකුත්, අලුත් ලී පේළියකුත් ඇති ව එය සාදනු
ලැබේවා. වියදම ද රාජ භාණ්ඩාගාරයෙන් ගෙවනු
ලැබේවා. 5 තවද, නබුකද්නෙසර් විසින්
ජෙරුසලමෙහි තිබෙන මාලිගාවෙන් රැගෙන,
බබිලෝනියට ගෙනෙන ලද දෙවියන් වහන්සේගේ
මාලිගාවේ රන් රිදී භාණ්ඩ ආපසු දෙනු ලැබ,
ජෙරුසලමෙහි තිබෙන මාලිගාවේ නියම තැන්වල
තැබීමට ගෙනෙයනු ලබාවා. ඒවා දෙවියන්
වහන්සේගේ මාලිගාවේ තැබිය යුතු ය.’ “

6 දාරියුස් රජ මේ නියෝගය නිකුත් කළේ ය:
"මේ නිසා යුප්‍රටීස් ගඟින් එගොඩ සිටින දිශාධිපති
තැන වන තත්තනෙයි ද ෂෙතර්-බෝසනෙයි ද
යුප්‍රටීස් ගඟින් එගොඩ සිටින පර්සියාවේ
නිලධාරීන් ද ඔබේ සහකාරයන් ද යන ඔබ හැම
දෙන ම එතැනින් ඈත් ව සිටින්න.
7 "දෙවියන් වහන්සේගේ මේ මාලිගාවේ වැඩ
කරගෙන යන පිණිස ජුදෙව්වරුන්ගේ දිශාධිපතියාට ද
ජුදෙව්වරුන්ගේ ප්‍රජා මූලිකයන්ට ද ඉඩ හරින්න.
දෙවියන් වහන්සේගේ මේ මාලිගාව කලින් තිබුණු
ස්ථානයෙහි ඔව්හු ගොඩනඟත් වා. 8 ඇරත් දෙවියන්
වහන්සේගේ මේ මාලිගාව ගොඩනැඟීම පිණිස ඔබ
ජුදෙව්වරුන්ගේ ඒ ප්‍රජා මූලිකයන්ට කළ යුතු දේ
ගැන මම මෙසේ නියෝගයක් කරමි: වැඩට
අවහිරයක් නොවන පිණිස රාජ භාණ්ඩාගාරයේ
දෙයින් එනම්, යුප්‍රටීස් ගඟින් එගොඩ පෙදෙසින්
ලැබෙන බදු ආදායමෙන් නොපමා ව මුළු වියදම දිය
යුතු ය. 9 ඔවුන්ට ඕනෑ කරන දේ එනම්,
ජෙරුසලමෙහි සිටින පූජකයන්ගේ නියමය ප්‍රකාර
ස්වර්ගයේ දෙවියන් වහන්සේට දවන යාග පූජා
ඔප්පු කිරීමට ගොන් වස්සන් ද බැටළුවන් ද බැටළු
පැටවුන් ද තිරිඟු ද ලුණු ද මුද්‍රික පානය ද තෙල් ද
දවස් පතා නොවරදවා ඔවුන්ට සැපයිය යුතු ය.
10 එසේ කළ යුත්තේ, ඔවුන් ස්වර්ගයේ දෙවියන්
වහන්සේට මිහිරි සුවඳ ඔප්පු කර රජුගේ ද ඔහුගේ
පුත්‍රයන්ගේ ද ශුභසිද්ධිය උදෙසා යාච්ඤා කරන
පිණිස ය. 11 තවද, යමෙකු මේ ආඥාව කඩ
කළොත්, ඔහුගේ ගෙයින් බාල්කයක් ගලවාගෙන,
ඔහු එහි මත උල තැබිය යුතු ය. ඒ හැර මේ
අපරාධය නිසා ඔහුගේ ගෙය ද කසළ ගොඩක් කළ
යුතු ය. 12 මෙය වෙනස් කර ජෙරුසලමෙහි තිබෙන
දෙවියන් වහන්සේගේ මේ මාලිගාව විනාශ
කරන්නට තමන්ගේ අත පොවන සියලු රජුන් හෝ
ජාතීන් හෝ ස්වකීය නාමය එහි පිහිටවුවා වූ
දෙවියන් වහන්සේ විනාශ කරන සේක් වා!"

### දේව මාලිගාව කැප කිරීම

13 එවිට යුප්‍රටීස් ගඟින් මෙගොඩ සිටි දිශාධිපති
තැන වූ තත්තනෙයි ද ෂෙතර්-බෝසනෙයි ද
ඔවුන්ගේ සහකාරයෝ ද දාරියුස් රජු විසින් කරන
ලද නියමයන් අකුරට ම ඉටු කළෝ ය. 14 හග් 1:1;
සකෙරි 1:1ජුදෙව්වරුන්ගේ ප්‍රජා මූලිකයෝ ද
දිවැසිවර හග්ගයිගේත්, ඉද්දෝගේ පුත්
ශකෙරියාගේත් දිවැස් වැකියෙන් උනන්දු වී දේව
මාලිගාව ගොඩනැඟීම සාර්ථක ලෙස කරගෙන
ගියහ. ඔව්හු ඉශ්‍රායෙල්හි දෙවියන් වහන්සේගේ
ආඥාවේ හැටියටත්, සයිරස්ගේ ද දාරියුස්ගේ ද
පර්සියාවේ රජ වූ අර්තක්ෂස්තාගේ ද නියෝගයේ
හැටියටත් මාලිගාව ගොඩනඟා නිම කළෝ ය.
15 දාරියුස් රජුගේ රාජ්‍ය කාලයේ හය වන
අවුරුද්දේ අදාර් මාසයේ තුන් වන දින මේ මාලිගාව
සාදා නිම කරන ලදී. 16 ඉශ්‍රායෙල් සෙනඟ වන
පූජකවරු ද ලෙවීවරු ද විප්‍රවාසයෙන් මිදී පැමිණි
සෙසු අය ද දෙවියන් වහන්සේගේ මාලිගාව කැප
කිරීමේ උත්සවය මහා හරසරින් පැවැත්වූ හ.
17 තවද, ඔව්හු දෙවියන් වහන්සේගේ මාලිගාව
කැප කිරීමේ දී ගොනුන් සියයක් ද බැටළුවන්
දෙසියයක් ද බැටළු පැටවුන් හාරසියයක් ද
ඉශ්‍රායෙල්වරුන්ගේ ගෝත්‍රවල ගණන ලෙස සියලු
ඉශ්‍රායෙල්වරුන් උදෙසා පාප පූජාවක් වශයෙන්
එළුවන් දොළොස් දෙනෙකු ද ඔප්පු කළෝ ය.
18 මෝසෙස්ගේ ව්‍යවස්ථා පොතේ නියම කර
තිබෙන ප්‍රකාරයට ඔව්හු තමන්ගේ පූජකයන්
ඔවුන්ගේ කොට්ඨාශවල හැටියටත්, ලෙවීවරුන්
ඔවුන්ගේ පංතිවල හැටියටත් ජෙරුසලමෙහි දෙවියන්
වහන්සේගේ මාලිගාවේ සේවය පිණිස පත් කළෝ
ය.

### පාස්කු මංගල්‍යය පැවැත්වීම

19 නික්ම 12:1-20 විප්‍රවාසයෙන් මිදී ආ අය පළමු
වන මාසයේ දහහතර වන දින පාස්කු මංගල්‍යය
පැවැත්වූ හ. 20 පූජකවරු ද ලෙවීවරු ද එක් කෙනෙකු
වත් නෑර සියලු දෙන ම පිරිසිදු වී සිටියෝ ය. ඔව්හු
සියල්ලෝ පිරිසිදු ව සිට විප්‍රවාසයෙන් මිදී ආ
සියල්ලන් උදෙසා ද, පූජකයන් වූ තමන්ගේ
සහෝදරයන් උදෙසා ද තමන් ම උදෙසා ද පාස්කු
මංගල්‍යය සඳහා බැටළු පැටවුන් මැරූ හ. 21 එසේ
විප්‍රවාසයෙන් හැරී ආ ඉශ්‍රායෙල් සෙනඟත්,
ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ
සොයන පිණිස අවට ජාතීන්ගේ අපිරිසිදුකමෙන්
වෙන් වී ඉශ්‍රායෙල්වරුන්ට එකතු වූ සියල්ලෝත්
පාස්කුව වැළඳූ හ. 22 ඔව්හු මුහුන් නොදැමූ රොටි
මංගල්‍යය සත් දවසක් හරසරින් පැවැත්වූ හ. මන්ද,
දෙවියන් වහන්සේගේ එනම්, ඉශ්‍රායෙල්හි දෙවියන්
වහන්සේගේ මාලිගාවේ වැඩට ඔවුන් දිරි ගන්වන
අසිරියාවේ රජුගේ සිත ඔවුන්ට ප්‍රියමනාප වන
ලෙස වෙනස් කිරීමෙන් සමිඳාණන් වහන්සේ ඔවුන්
ප්‍රීතියෙන් පිනවූ සේක.

### එස්රා ජෙරුසලමට පැමිණීම

7 මේ සිද්ධිවලින් පසු, පර්සියාවේ
අර්තක්ෂස්තාගේ රාජ්‍ය කාලයේ දී එස්රා නම්
මිනිසෙක් සිටියේ ය. එස්රා සෙරායාගේ පුත්‍රයා ය;
ඔහු අශරියාගේ පුත්‍රයා ය; ඔහු හිල්කියාගේ
පුත්‍රයා ය. 2 ඔහු ෂල්ලුම්ගේ පුත්‍රයා ය; ඔහු
ශාදොක්ගේ පුත්‍රයා ය; ඔහු අහිටුබ්ගේ පුත්‍රයා ය.
3 ඔහු අමරියාගේ පුත්‍රයා ය; ඔහු අසරියාගේ
පුත්‍රයා ය; ඔහු මෙරායොත්ගේ පුත්‍රයා ය. 4 ඔහු
සෙරහියාගේ පුත්‍රයා ය; ඔහු උශ්ශීගේ පුත්‍රයා ය;
ඔහු බුක්කීගේ පුත්‍රයා ය. 5 ඔහු අබිෂූවාගේ
පුත්‍රයා ය; ඔහු පිනෙහාස්ගේ පුත්‍රයා ය; ඔහු
එලෙයාසර්ගේ පුත්‍රයා ය; ඔහු උත්තම පූජක
ආරොන්ගේ පුත්‍රයා ය.
6 මේ එස්රා බබිලෝනියේ සිට පැමිණි කෙනෙකි.
ඔහු ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ
විසින් දෙන ලද මෝසෙස්ගේ ව්‍යවස්ථාව ගැන මනා

දැනීමක් ඇති නීතිවේදියෙකි. ඔහු කෙරෙහි ඔහුගේ
දෙවි සමිඳාණන් වහන්සේගේ අනුග්‍රහය තිබුණු
බැවින් ඔහු ඉල්ලූ සියල්ල රජතුමා ඔහුට දුන්නේ ය.
7 තවද, අර්තක්ෂස්තා රජුගේ සත් වන අවුරුද්දේ දී
ඉශ්‍රායෙල් සෙනඟගෙන් ද පූජකයන්ගෙන් ද
ලෙවීවරුන්ගෙන් ද ගායනාකාරයන්ගෙන් ද දොරටු
පාලකයන්ගෙන් ද දේව මාලිගාවේ සේවකයන්ගෙන්
ද සමහර දෙනෙක් ජෙරුසලමට පැමිණියෝ ය.
8 එස්රා, රජුගේ සත් වන අවුරුද්දේ පස් වන
මාසයේ දී ජෙරුසලමට ආවේ ය. 9 ඔහු පළමු වන
මාසයේ පළමු වන දා බබිලෝනියෙන් පිටත් වන්න
තීරණය කරගෙන තිබුණේ ය. ඔහුගේ දෙවියන්
වහන්සේගේ කරුණානුග්‍රහය ඔහු සමඟ සැබැවින්
ම තිබුණේ ය. පස් වන මාසයේ පළමු වන දා ඔහු
ජෙරුසලමට පැමිණියේ ය. 10 එස්රා සමිඳාණන්
වහන්සේගේ ව්‍යවස්ථාව හදාරන්නත් එය
පිළිපදින්නත්, එහි ඇති අණපණත් ඉශ්‍රායෙල්
සෙනඟට උගන්වන්නත් ඇප කැප වී සිටියේ ය.

## අර්තක්ෂස්තා රජු එස්රාට ලියූ හසුන

11 ඉශ්‍රායෙල්වරුන් සම්බන්ධයෙන් පනවන ලද
සමිඳාණන් වහන්සේගේ අණපණත් පිළිබඳ ව
විශේෂ දැනුමක් තිබුණු පූජකයෙකු ද නීතිවේදියෙකු
ද වූ එස්රාට අර්තක්ෂස්තා රජු විසින් දෙන ලද
හසුනේ පිටපත මෙසේ ය: 12 “රාජාධිරාජ
අර්තක්ෂස්තා වන මම ස්වර්ගයේ දෙවියන්
වහන්සේගේ ව්‍යවස්ථාවේ නීතිවේදියෙකු ව සිටින
පූජක එස්රා වෙත ලියා එවමි. 13 මාගේ රාජ්‍යයේ
සිටින ඉශ්‍රායෙල් සෙනඟගෙන් ද ඔවුන්ගේ
පූජකයන්ගෙන් ද ලෙවීවරුන්ගෙන් ද සිය කැමැත්තෙන්
ජෙරුසලමට යන්න කැමැති සියල්ලන්ට ඔබ සමඟ
යන්න අවසර ඇත කියා මම නියෝගයක් කරමි.
14 ඔබේ භාරයේ ඇති ඔබේ දෙවියන් වහන්සේගේ
ව්‍යවස්ථාව අනුව ජුදා හා ජෙරුසලම ගැන කරුණු
විභාග කරන පිණිස, රජු සහ ඔහුගේ මන්ත්‍රීන්
සත්දෙනා විසින් ඔබ යවනු ලැබ ඇත. 15 රජු සහ
ඔහුගේ මන්ත්‍රීන් විසින් ජෙරුසලමෙහි වැඩ වසන
ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවියන් වහන්සේට සිය
කැමැත්තෙන් පුදන ලද රන් රිදී ඔබ ගෙන යා යුතු ය.
16 ඒ සමඟ මුළු බබිලෝනි ප්‍රදේශයේ ඔබට
සොයා ගත හැකි රන් රිදී සියල්ල ද ජෙරුසලමෙහි
ඇති, තමන්ගේ දෙවියන් වහන්සේගේ මාලිගාව
උදෙසා සෙනඟ සහ පූජකයන් සිය කැමැත්තෙන්
දෙන පඬුරු ද ඔබ ගෙන යා යුතු ය. 17 එබැවින් මේ
මුදල වැය කළ යුත්තේ, ගොනුන් ද බැටළුවන් ද
බැටළු පැටවුන් ද ඒ සමඟ ඕනෑ කරන ආහාර පූජා
සහ පානීය පූජා ද ගැනීමට පමණකි. ජෙරුසලමෙහි
තිබෙන, ඔබේ දෙවියන් වහන්සේගේ මාලිගාවේ
පූජාසනය පිට ඒවා ඔප්පු කරන්න. 18 ඉතිරි වන රන්
රිදීවලින් ඔබටත්, ඔබේ සහෝදරයන්ටත් කරන්න
සුදුසු යයි පෙනෙන දෙයක් ඔබේ දෙවියන්
වහන්සේගේ කැමැත්ත ලෙස කරන්න. 19 තවද,
ඔබේ දෙවියන් වහන්සේගේ මාලිගාවේ මෙහෙයෙ
පිණිස ඔබට දෙන ලද භාණ්ඩ ජෙරුසලමේ දෙවියන්
වහන්සේ ඉදිරියෙහි බාර දෙන්න. 20 ඔබේ දෙවියන්
වහන්සේගේ මාලිගාව උදෙසා දෙන්නට ඔබට
වුවමනා තවත් දේවල් රජුගේ භාණ්ඩාගාරයෙන්
රැගෙන දෙන්න.
21 “තවද, අර්තක්ෂස්තා රජු වන මම, ස්වර්ගයේ
දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාව පිළිබඳ
නීතිවේදියා වන පූජක එස්රා විසින් ඔබෙන් ඉල්ලනු
ලබන සියල්ල සැණෙකින් දෙන්න යුප්‍රටීස් ගඟෙන්
එගොඩ සිටින සියලු භාණ්ඩාගාරිකයන්ට නියෝග
කරමි. 22 රිදී කිලෝග්‍රෑම් දෙදහස් අටසියයක් වන
තෙක් ද තිරිඟු කිලෝග්‍රෑම් දහතුන්දහස් පන්සියයක්
වන තෙක් ද මුද්‍රික පාන ලීටර් දෙදහසක් වන තෙක්
ද තෙල් ලීටර් දෙදහසක් වන තෙක් ද ලුණු ඇති
තරම් ද දිය යුතු ය. 23 ස්වර්ගයේ දෙවියන්
වහන්සේ විසින් අණ කරනු ලැබ තිබෙන සියල්ල,
ස්වර්ගයේ දෙවියන් වහන්සේගේ මාලිගාව උදෙසා
හරියාකාර කරනු ලැබේවා. එසේ නොකළොත්
රජුගේත්, ඔහුගේ පුත්‍රයන්ගේත් රාජ්‍යය කෙරෙහි
උදහස පැමිණෙන්නට ඉඩ තිබේ. 24 තවද, පූජකයන්,
ලෙවීවරුන්, ගායනාකාරයන්, දොරටු පාලකයන්, දේව
මාලිගාවේ සේවකයන් හා දෙවියන් වහන්සේගේ
මේ මාලිගාවේ සෙසු සේවකයන් යන
කිසිවෙකුගෙන් තීරු බද්ද ද ආදායම් ද සුංගම් ද අය
කරන්න තහනම් බව අපි ඔබට දැනුම් දෙමු.
25 “එස්රා, ඔබ යුප්‍රටීස් ගඟින් එගොඩ සිටින
සියලු සෙනඟ විනිශ්චය කරන පිණිස, ඔබේ
දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාව දන්න
විනිශ්චයකාරයන් ද නඩුකාරයන් ද ඔබට ප්‍රදානය
කොට ඇති ඔබේ දෙවියන් වහන්සේගේ ප්‍රඥාව
ලෙස පත් කරගන්න; නොදන්න අයට එය
උගන්වන්න. 26 ඔබේ දෙවියන් වහන්සේගේ
ව්‍යවස්ථාව ද රාජ ආඥාව ද නොපවත්වන
සියල්ලන්ට මරණයෙන් හෝ රටින් පිටමං කිරීමෙන්
හෝ දේපළ රාජසන්තක කිරීමෙන් හෝ හිර අඩස්සි
කිරීමෙන් හෝ වහාම යුක්තිය ඉටු කරනු ලැබේ වා!”
27+EZR එවිට එස්රා මෙසේ කීවේ ය:
“ජෙරුසලමෙහි තිබෙන සමිඳාණන් වහන්සේගේ
මාලිගාව අලංකාර කරන්නට රජුගේ සිතෙහි
කැමැත්තක් ඇති කළා වූ ද රජු ද උපදේශකයන් ද
රජුගේ සියලු බලවත් අධිපතීන් ද ඉදිරියෙහි මට
කරුණාව ලැබීමට සැලසුවා වූ ද අපේ පියවරුන්ගේ
දෙවි සමිඳාණන් වහන්සේට ප්‍රශංසා වේ වා!
එබැවින් මාගේ දෙවි සමිඳාණන් වහන්සේගේ
හස්තය මා පිට තිබෙන බව දැනගෙන, මා
ධෛර්යවත් වී මා සමඟ යන පිණිස,
ඉශ්‍රායෙල්වරුන් අතරෙන් ප්‍රධානීන් මම රැස්
කරගතිමි.”

## විප්‍රවාසයෙන් මිදී පැමිණි අයගේ නාම ලේඛනය

8 “අර්තක්ෂස්තා රජුගේ රාජ්‍යය කාලයේ දී මා
සමඟ බබිලෝනියේ සිට පැමිණි අයගේ
පවුල්වල ප්‍රධානීහු මොවුහු ය. ඔවුන්ගේ පෙළපත්

ලේඛන මසේ ය: 2 පිනෙහාස්ගේ පුත්‍රයන්ගෙන්
ගේර්ෂොම් ය; ඊතාමාර්ගේ පුත්‍රයන්ගෙන් දානියෙල්
ය; දාවිත්ගේ පුත්‍රයන්ගෙන් හට්ටුෂ් ය;
3 පරොෂ්ගේ පුත්‍රයන්ගෙන් එක් කෙනෙකු වූ
ෂෙකනියාගේ පුත්‍රයන්ගෙන් ශකරියා ය; ඔහු
සමඟ පෙළපත් වශයෙන් පිරිමි එකසිය පණසක්
ලියාපදිංචි කරනු ලැබූ හ. 4 පාහත්-මෝවබ්ගේ
පුත්‍රයන්ගෙන් ශෙරහියාගේ පුත් එලියෙහෝනයි සහ
ඔහු සමඟ පිරිමි දෙසියයක් ය; 5 ෂෙකනියාගේ
පුත්‍රයන්ගෙන් ජහසීයෙල්ගේ පුත්‍රයා සහ ඔහු
සමඟ පිරිමි තුන්සියයක් ය; 6 ආදින්ගේ
පුත්‍රයන්ගෙන් ජොනතන්ගේ පුත් ඒබෙද් සහ ඔහු
සමඟ පිරිමි පණසක් ය; 7 ඒලාම්ගේ පුත්‍රයන්ගෙන්
අතලියාගේ පුත් ජෙෂොයා සහ ඔහු සමඟ පිරිමි
හැත්තෑවක් ය; 8 ෂෙපටියාගේ පුත්‍රයන්ගෙන්
මීකායෙල්ගේ පුත් සබදියා සහ ඔහු සමඟ පිරිමි
අසූවක් ය; 9 ජෝවාබ්ගේ පුත්‍රයන්ගෙන්
ජෙහියෙල්ගේ පුත් ඔබදියා සහ ඔහු සමඟ පිරිමි
දෙසිය දහඅටදෙනෙක් ය; 10 ෂෙලොමීත්ගේ
පුත්‍රයන්ගෙන් ජෝසිපියාගේ පුත්‍රයා සහ ඔහු
සමඟ පිරිමි එකසිය හැටක් ය. 11 බේබයිගේ
පුත්‍රයන්ගෙන් බේබයිගේ පුත් ශකරියා සහ ඔහු
සමඟ පිරිමි විසිඅටදෙනෙක් ය. 12 අස්ගාද්ගේ
පුත්‍රයන්ගෙන් හක්කාටාන්ගේ පුත් ජෝහානාන් සහ
ඔහු සමඟ පිරිමි එකසිය දහදෙනෙක් ය.
13 අදොනිකාම්ගේ පුත්‍රයන්ගෙන් අන්තිමයන් වූ
එලිපෙලෙත් ද ජෙයුයෙල් ද ෂෙමායා ද යන නම්
සඳහන් අය සහ ඔවුන් සමඟ පිරිමි හැටක් ය.
14 බිග්වායිගේ පුත්‍රයන්ගෙන් ඌතයි සහ සබ්බුද් ය;
ඔවුන් සමඟ පිරිමි හැත්තෑවක් ය.”

## එස්රා ලෙවීවරුන් පත් කිරීම

15 “අහවා නගරයට ගලා යන ගංගාව ළඟ මම
ඔවුන් රැස් කෙළෙමි. අපි එහි තුන් දවසක් කූඩාරම්
ගසාගෙන සිටියෙමු. සෙනඟ ද පූජකයන් ද දෙස බැලූ
විට ඔවුන් අතර ලෙවීවරුන්ගෙන් කිසිවකු නැති බව
මම දිටිමි. 16 එවිට මම එලියෙසෙර් ද අරියෙල් ද
ෂෙමායා ද එල්නාතාන් ද ජාරිබ් ද එල්නාතාන් ද
නාතාන් ද ශකරියා ද මෙෂුල්ලාම් ද යන ප්‍රධානීන්
සහ ජෝයාරිබ් ද එල්නාතාන් ද යන බුද්ධිමතුන් ද
කැඳවාගෙන, 17 කාසිපියා යන ස්ථානයේ සිටි
ප්‍රධානියා වූ ඉද්දෝ වෙත ඔවුන් යැවීමි. දෙවියන්
වහන්සේගේ මාලිගාවට සේවකයන් අප වෙත
සපයා දෙන ලෙස ඉද්දෝටත්, කාසිපියා යන
ස්ථානයෙහි සිටි ඔහුගේ ඥාතීන් වන දේව
මාලිගාවේ සේවකයන්ටත් කිය යුතු දේ මම ඔවුන්ට
කීමි. 18 ඔව්හු ද අප කෙරෙහි පිහිටි දේව
වරප්‍රසාදය හේතුකොටගෙන ඉශ්‍රායෙල්ගේ
පුත්‍රයා වන ලෙවීගේ පුත් මාලීගේ පුත්‍රයන්ගෙන්
බුද්ධිමත් මිනිසෙකු වූ ෂේරෙබියා ද ඔහුගේ
පුත්‍රයින් හා ඥාතීන් දහඅටදෙනෙකු ද අප වෙත එවූ
හ. 19 ඒ හැර හෂබියා ද ඔහු සමඟ මෙරාරීගේ
පුත්‍රයන්ගෙන් ජෙෂායා ද ඔහුගේ සහෝදරයෝ ද
ඔවුන්ගේ පුත්‍රයන් විසිදෙනෙක් ද එවන ලදහ.
20 තවද, ලෙවීවරුන්ගේ මෙහෙයට ද දාවිත් සහ
අධිපතීන් විසින් නියම කරන ලද දේව මාලිගාවේ
සේවකයන්ගෙන් දෙසිය විසි දෙනෙක් අප වෙත
එවන ලදහ. ඔවුන් සියල්ලෝ ලියාපදිංචි කරන
ලදහ.”

## එස්රා උපවාසයක් ප්‍රසිද්ධ කිරීම

21 “එවිට අපේ දෙවියන් වහන්සේ ඉදිරියෙහි අප
යටහත් පහත් වී, අපට සුබ ගමනක් සලසා දී, අප ද
අපේ දරුදැරියන් ද අපේ සම්පත ද ආරක්ෂා කරන
හැටියට උන් වහන්සේගෙන් ඉල්ලන පිණිස එහි
අහවා ගංගාව ළඟ දී මම උපවාසයක් ප්‍රසිද්ධ
කෙළෙමි. 22 මා එසේ කෙළේ, ‘අපේ දෙවියන්
වහන්සේගේ ආශීර්වාද දායක හස්තය උන්
වහන්සේ සොයන සියල්ලන් කෙරෙහි පවතින්නේ
ය’ කියා ද ‘උන් වහන්සේගේ බලවත් උදහස උන්
වහන්සේ අත්හරින සියල්ලන්ට විරුද්ධ ව
පවතින්නේ ය’ කියා ද අප රජුට කියා තිබූ නිසා,
ගමන් මාර්ගයේ දී අප සතුරන්ගෙන් ආරක්ෂා කරන
පිණිස හේවා හමුදාවක් ද අසරුවන් ද රජුගෙන්
ඉල්ලන්නට ලජ්ජා වූ බැවිනි. 23 ඒ නිසා අපි නිරාහාර
ව සිට මේ ගැන අපේ දෙවියන් වහන්සේට යාච්ඤා
කෙළෙමු. උන් වහන්සේ ද අපේ අයැදීමට පිළිතුරු
දුන් සේක.”

## දේව මාලිගාවට පඬුරු

24 “ඉන්පසු ප්‍රධාන පූජකයන්ගෙන්
දොළොස්දෙනෙකු එනම්, ෂෙරෙබියා ද හෂබියා ද
ඔවුන් සමඟ ඔවුන්ගේ ඥාතීන්ගෙන් දසදෙනෙකු ද
තෝරා ගෙන, 25 රජු ද ඔහුගේ උපදේශකයන් ද
අධිපතීන් ද එහි සිටි සියලු ඉශ්‍රායෙල්වරුන් ද විසින්
අපේ දෙවියන් වහන්සේගේ මාලිගාව උදෙසා දෙන
ලද පඬුරු වන රිදී ද රන් ද භාණ්ඩ ද කිරා ඔවුන්ට
භාර දිනිමි. 26 රිදී මෙට්‍රික් ටොන් විසිදෙකකුත්,
කිලෝග්‍රෑම් හැත්තෑවක් බර ඇති රිදී භාණ්ඩ
සියයකුත්, රන් කිලෝග්‍රෑම් තුන්දහස් හාරසියයකුත්,
27 කිලෝග්‍රෑම් අටයි දශම හතරක් බර ඇති රන්
තලි විස්සකුත්, රන් මෙන් අනර්ඝ වූ හොඳ දීප්තිමත්
ලෝකඩ භාජන දෙකකුත් කිරා ඔවුන් අතට දිනිමි.
28 මම ඔවුන්ට කතා කොට, ‘ඔබ හැම සමිඳාණන්
වහන්සේට කැප වූ අය ය; භාණ්ඩ ද කැප ය; මේ
රන් රිදී ඔබේ පියවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේට ඔප්පු කරන ලද ස්වේච්ඡා පූජා ය.
29 ජෙරුසලමෙහි සමිඳාණන් වහන්සේගේ ගෘහයේ
ඇතුළු ගෙවල්වල දී ප්‍රධාන පූජකයන් සහ
ලෙවීවරුන් ද ඉශ්‍රායෙල් පිය වංශවල අධිපතීන් ද
ඉදිරිපිට දී ඒවා කිරන තුරු, ඒවා මුර කරමින්
ප්‍රවේසම් කරගන්නැ’යි කීමි. 30 මෙසේ
පූජකයෝත්, ලෙවීවරුත් කිරන ලද ඒ රිදී ද රන් ද
භාණ්ඩ ද ජෙරුසලමේ අපේ දෙවියන් වහන්සේගේ
මාලිගාවට ගෙනෙන පිණිස භාරගත්හ.”

### ජෙරුසලමට ආපසු පැමිණීම

31 “ඉක්බිති අපි පළමු වන මාසයේ දොළොස් වන
දා ජෙරුසලමට යන පිණිස අහවා ගඟ ළඟ සිට
පිටත් වුණමෝ. අපගේ දෙවියන් වහන්සේගේ
අනුග්‍රහය අප කෙරෙහි විය. උන් වහන්සේ
සතුරන්ගේ අතිනුත්, මංකොල්ලකාරයන්ගෙනුත් අප
ගැළවූ සේක. 32 අපි ජෙරුසලමට පැමිණ තුන් දිනක්
එහි නැවතී සිටියමෝ. 33 සතර වන දා ඒ රිදී ද රන්
ද භාජන ද පූජක උරියාගේ පුත් මෙරේමොත් අතට
අපගේ දෙවියන් වහන්සේගේ මාලිගාව තුළ දී කිරා
දෙන ලද්දේ ය. 34 ඒ සියල්ල ගණන් කරනු ලැබී ය.
ඒවායේ මුළු බර ලියා සටහන් කරන ලදී. ඔහු සමඟ
පිනෙහොස්ගේ පුත් එලයොසර් සිටියේ ය. ඔවුන්
සමඟ ජේෂුවාගේ පුත් ජෝසාබාද් ද බින්නුයිගේ
පුත් නොවදියා ද යන ලෙවීවරුත් සිටියෝ ය.
35 ඒ අවස්ථාවේ දී, විප්‍රවාසයෙන් මිදී ආපසු
පැමිණි අය ඉශ්‍රායලේවරුන්ගේ දෙවියන් වහන්සේට
දවන යාග පූජා පිණිස සියලු ඉශ්‍රායලේවරුන් උදෙසා
ගොනුන් දොළොස්දෙනෙකු ද බැටළුවන්
අනූහයදෙනෙකු ද බැටළු පැටවුන් හැත්තෑහත්දෙනෙකු
ද පාප පූජාවක් පිණිස එළුවන් දොළොස්දෙනෙකු ද
ඔප්පු කළෝ ය. ඒ සියල්ල සමිඳාණන් වහන්සේට
ඔප්පු කළ මහා දවන පූජාවක් විය. 36 තවද, ඔව්හු
රජුගේ ආඥා යුප්‍රටීස් ගඟින් එගොඩ සිටි රජුගේ
දිශාධිපතීන්ටත්, ආණ්ඩුකාරයන්ටත් භාර දුන්නෝ ය.
එවිට ඔව්හු සෙනඟටත්, දෙවියන් වහන්සේගේ
මාලිගාවටත් සහාය දුන්නෝ ය.”

### මිශ්‍ර විවාහ ගැන ප්‍රශ්නය

9 “මේ කටයුතු නිම වූ කල, අධිපතීහු මා ළඟට
අවුත් කතා කොට, ‘ඉශ්‍රායලේ සෙනඟ ද
පූජකයන් හා ලෙවීවරුන් ද විදේශ වැසියන් වන
කානානිවරුන්ගේ ද හිත්තීවරුන්ගේ ද
පෙරෙස්සිවරුන්ගේ ද ජෙබුසිවරුන්ගේ ද
අම්මොන්වරුන්ගේ ද මෝවබ්වරුන්ගේ ද
මිසරවරුන්ගේ ද අමෝරිවරුන්ගේ ද පිළිකුල්
ක්‍රියාවලින් වැළකී සිටියේ නැත. 2 ඔවුන් තමන්ටත්,
තම පුත්‍රයන්ටත් මේ විදේශීය කාන්තාවන් සරණ
පාවාගෙන ඇත. මෙසේ ශුද්ධ ජාතිය විදේශිකයන්
සමඟ මිශ්‍ර වී ඇත. එසේ ය, මේ ද්‍රෝහිකමට
මූලික වූවෝ අධිපතීහු හා නිලධාරීහු ය’යි කීවෝ ය.
3 මේ පුවත මා ඇසූ විට, මම බලාපොරොත්තු
රහිත ව මාගේ වස්ත්‍රයත්, සළුවත් ඉරාගෙන,
මාගේ හිසකෙස් ද රැවුල ද උදුරාගෙන, තුෂ්ණීම්භූත
ව හිඳගතිමි. 4 එවිට විප්‍රවාසයෙන් මිදී පැමිණි
අයගේ ද්‍රෝහිකම ගැන ඉශ්‍රායලේවරුන්ගේ
දෙවියන් වහන්සේ කී දෙයින් කම්පා වූ හැම දෙන ම
මා ළඟට රැස් වූ හ. මම වනාහි සවස පූජාව ඔප්පු
කරන තෙක් තුෂ්ණීම්භූත ව එහි ම උන්නෙමි.”

### එස්රා කරුණාව ඉල්ලා යැදීම

5 “සවස පූජාව පවත්වන වේලාව පැමිණි විට, මම
මාගේ සිහි නැති භාවයෙන් නැඟිට, ඉරාගත් මාගේ
වස්ත්‍රය ද මාගේ සළුව ද ඇති ව දණින් වැටී,
මාගේ දෙවි සමිඳාණන් වහන්සේ දෙසට මාගේ අත්
විදහාගෙන කතා කොට, 6 ‘මාගේ දෙවියන් වහන්ස,
මම ලජ්ජාවට පත් වී, මාගේ දෙවි වන ඔබ දෙසට
මාගේ මුහුණ ඔසවන්නට බියෙන් සිටිමි. මන්ද, අපගේ
ද්‍රෝහිකම අපගේ හිස්වලටත් ඉහළින් නැඟී ගොස්
ඇත. අපගේ පාප ස්වර්ගය දක්වා නැඟී තිබේ.
7 අපගේ පියවරුන්ගේ කාලයේ පටන් අද දක්වා අප
අතිශයින් වරදකාරයන් ව සිට, අපගේ අපරාධ නිසා,
අපි ද අපගේ රජවරු ද අපගේ පූජකයෝ ද අද දවසේ
තිබෙන හැටියට විදේශවල රජවරුන් අතටත්,
කඩුවටත්, වහල් කමටත්, කොල්ලකෑමටත්,
විළිලජ්ජාවටත් පාවා දෙනු ලැබීමු. අද අපගේ දුඃඛිත
තත්ත්වය එය යි. 8 එහෙත්, දැන් ස්වල්ප
වේලාවකට අපගේ දෙවි සමිඳාණන් වහන්සේ අපට
කරුණා කොට, අපගෙන් ස්වල්ප දෙනෙකුට ඉතිරි ව
සිටින්නත්, මේ ශුද්ධස්ථානයේ සුරැකි ව විසීමටත්
ඉඩ දී තිබේ. අපගේ දෙවියන් වහන්සේ අපට නව
ජීවිතයක් ද අපගේ වහල්කමේ දී අපට තරමක
සහනයක් ද දී ඇත්තේ මේ අන්දමට ය. 9 මන්ද,
අපි වහල්ලු ය; එහෙත්, අපගේ වහල්කමේ දී අපගේ
දෙවියන් වහන්සේ අප අත් නොහැර, අපගේ දෙවියන්
වහන්සේගේ මාලිගාව ගොඩනැඟීමටත්, එහි
කැඩුම්බිඳුම් ප්‍රතිසංස්කරණය කිරීමටත්, ජුදාහි ද
ජෙරුසලමෙහි ද අපට සුරැකි ව විසීමටත් පර්සියාවේ
රජවරුන් අභිමුවෙහි අපට කරුණාව පෙන්නූ සේක.
10 “ ‘එබැවින් අපගේ දෙවියන් වහන්ස, මේ
සියල්ලට පසු අපි කුමක් කියමු ද? මන්ද, ඔබගේ
මෙහෙකරුවන් වූ දිවැසිවරුන් මඟින් ඔබ අණ කරවන
ලද ඔබගේ ආඥාවන් අපි කඩ කළෙමු. 11 ඔවුන් කී
දේ මෙසේ ය: ඔබ හිමි කරගන්නට යන දේශය,
එහි ජනයන්ගේ පිළිකුල් ක්‍රියාවලින් ද
කිලුටුකම්වලින් ද එක් කොණක සිට අනික් කොණ
දක්වා පිරී තිබේ. ඔවුන්ගේ අපවිත්‍රකම නිසා එය
අපවිත්‍ර දේශයක් ව තිබේ. 12 නික්ම 34:11-16;
ද්වි.නී. 7:1-5ඒ නිසා, ඔබගේ දූවරුන් ඔවුන්ගේ
පුත්‍රයන්ට පළෙවහට දීම වත්, ඔවුන්ගේ දූවරුන්
ඔබගේ පුත්‍රයන්ට පළෙවහට ගැනීම වත්, ඔවුන්ගේ
සාමය හා ශුභසිද්ධිය සෙවීම වත් නොකළ යුතු ය.
මෙසේ ඔබ බලවත් ව සිට, දේශයේ සරු පලදාව
භුක්ති විඳ, එය සදහට ම ඔබගේ දරුවන්ට උරුම කර
දෙන්නෙහු ය. 13 ඉතින් අපගේ නපුරු ක්‍රියා හා
අපරාධකාරකම ද නිසා අපට පැමිණි සියල්ලට පසුව,
අපගේ දෙවි වන ඔබ, අපගේ අයුතුකම්වල තරමට
අපට දඬුවම් නොකර, මෙලෙසෙ ගැළවී සිටින්නට
අපට ඉඩ සලසා දී තිබිය දී, 14 අපි නැවතත් ඔබගේ
ආඥා කඩ කර, මේ පිළිකුල් දේ කරන ජනයන් හා
සමඟ ආවාහ විවාහ කර ගනිමු ද? එසේ කළොත්,
එක් කෙනෙකු වත් ගැළවී ඉතුරු නොවන ලෙස අප

නැති කර දමන තුරු, ඔබ අප කරෙහි උදහස්
නොවන සේක් ද? 15 ඉශ්රායලේවරුන්ගේ දෙවි
සමිඳාණන් වහන්ස, ඔබ ධර්මිෂ්ඨ ය. මන්ද, අද
තිබෙන ලෙස අපි කුඩා පිරිසක් ඉතිරි ව සිටිමු.
මෙන්න, අපි ඔබ ඉදිරියේ අපේ අපරාධවල ගැලී
සිටිමු. මන්ද, මේ කාරණය නිසා ඔබට මූණ දී
සිටින්නට අපට නොහැකි ය.' "

## සෙනඟ පසුතැවී සිත් හරවා ගැනීම

10 මෙසේ එස්රා අඬමින් දෙවියන්
වහන්සේගේ මාලිගාව ඉදිරියේ මුණින්තළා
වී යාච්ඤා කර පාපෝච්චාරණය කරමින් සිටිය දී,
පුරුෂයන්ගෙන් ද ස්ත්රීන්ගෙන් ද ළමයින්ගෙන් ද යුත්
ඉශ්රායලේවරු ඉතා විශාල සමූහයක් ඔහු වෙත
රැස්වුණෝ ය. ඔව්හු මහා දුකින් හැඬූ හ. 2 එවිට
ඒලාම්ගේ පුත්රයකු වූ ජෙහියලේගේ පුත්
ෂෙකෙනියා එස්රාට කතා කරමින්, "අපි විදේශවලින්
අන්‍ය ජාතික ස්ත්රීන් සරණ පාවාගැනීම
හේතුකොටගෙන, අපේ දෙවියන් වහන්සේට විරුද්ධ
ව පව් කළෙමු. එසේ වුවත්, ඉශ්රායලේවරුන්ට
තවමත් බලාපොරොත්තු තිබේ. 3 ඒ නිසා, ඒ සියලු
භාර්යාවන් ද ඔවුන්ගෙන් උපන් දරුවන් ද ඉවත් කරන
ලෙස, මාගේ ස්වාමීන්ගේ ද අපේ දෙවියන්
වහන්සේගේ ආඥාවට බිය වන්නන්ගේ ද
දැනුමැතිකමේ හැටියට අපේ දෙවියන් වහන්සේ
සමඟ ගිවිසුමක් කරමු. අපි ව්‍යවස්ථානුකූල ව ක්රියා
කරමු. 4 නැඟිටින්න, මේ ගැන වගකීම ඔබට අයිති
ය; අපිත් ඔබට සහාය දෙමු. නිර්භීත ව ක්රියා
කරන්නැ"යි එස්රාට කීවේ ය.
5 එවිට එස්රා නැඟිට, ෂෙකෙනියා කී පරිදි කරන
ලෙස පූජකයන්ගෙන් ද ලෙවීවරුන්ගෙන් ද සියලු
ඉශ්රායලේවරුන්ගෙන් ද අධිපතීන්ගෙන් ද දිවුරුම්
ගත්තේ ය. ඔව්හු ද දිවුරුම් දුන්හ. 6 එවිට එස්රා
දෙවියන් වහන්සේගේ මාලිගාව ඉදිරියෙන් නික්ම
එලියාෂිබ්ගේ පුත් ජොහෝහානාන්ගේ කාමරයට
ගියේ ය. ඔහු එහි ගොස් කෑම නොකා, වතුර
නොබී සිටියේ ය. මන්ද, විප්රවාසයෙන් මිදී පැමිණි
අයගේ අපරාධය ගැන ඔහු වැළපුණ බැවිනි.
7 එවිට විප්රවාසයෙන් මිදී ආපසු පැමිණි සියලු
දෙනෙ ම ජෙරුසලමට රැස් වන්නට කියා
ප්රකාශනයක් ජුදා හා ජෙරුසලම මුළුල්ලේ පළ
කරන ලදී. 8 තවද, අධිපතීන්ගේ ද ප්රජා
මූලිකයන්ගේ ද නියමය අනුව තුන් දවසක් ඇතුළත
දී යමෙකු නොපැමිණියොත්, ඔහුගේ සියලු දේපළ
පවරා ගනු ලබන බවත්, විප්රවාසයෙන් මිදී ආපසු
පැමිණි අයගේ සමාගමෙන් ඔහු නෙරපනු ලබන
බවත් පළ කරන ලදී. 9 එවිට ජුදාහි ද බෙන්ජමින්හි
ද සියලු මනුෂ්‍යයෝ තුන් දවසක් ඇතුළත
ජෙරුසලමට රැස් වූ හ. ඒ දවස නව වන මාසයේ
විසි වන දා ය. මුළු සෙනඟ මේ කාරණය නිසාත්,
තද වර්ෂාව නිසාත් දෙවියන් වහන්සේගේ මාලිගාව
ඉදිරිපිට එළිමහනේ වෙවුලමින් ඉඳගෙන සිටියෝ ය.
10 පූජක එස්රා නැඟිට සිට, ඔවුන්ට කතා කොට,
"ඔබ හැම අන්‍ය ජාතික ස්ත්රීන් සරණ
පාවාගැනීමෙන් මහා ද්රෝහිකමක් කර
ඉශ්රායලේවරුන්ගේ පාප තවත් වැඩි කර ඇත.
11 එබැවින් දැන් ඔබේ පියවරුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේට පාපෝච්චාරණය කර, උන් වහන්සේගේ
කැමැත්ත කරමින්, දේශයේ වැසියන්ගෙනුත්, අන්‍ය
ජාතික ස්ත්රීන්ගෙනුත් වෙන් වන්නැ"යි කී ය.
12 එවිට මුළු සභාව මහා හඬකින් පිළිතුරු දෙමින්,
"එසේ ය, ඔබ කී ලෙස අප කළ යුතු ය. 13 එහෙත්,
සෙනඟ බොහෝ ය. මෙය ඉතා තද වර්ෂා කාලයකි.
අපට ද එළිමහනේ හිටගෙන සිටින්නට නුපුළුවන.
තවද, අප මේ කාරණය සම්බන්ධයෙන් තදබල
වරදක් කර ඇති බැවින්, මෙය දවසකින් වත්,
දෙදවසකින් වත් නිම කළ හැකි කාර්යයක් නොවේ.
14 දැන් අපේ අධිපතියෝ මුළු සභාව වෙනුවෙන්
ක්රියා කරත්වා. මේ කාරණය නිසා, අපේ දෙවියන්
වහන්සේගේ බලවත් උදහස අප කෙරෙන් පහ ව
යන තුරු, අපේ නගරවල අන්‍ය ජාතික ස්ත්රීන්
පාවාගෙන සිටින සියල්ලෝ ද ඔවුන් සමඟ එක එක
නුවර ප්රජා මූලිකයෝ ද විනිශ්චයකරුවෝ ද
නියමිත කාලවල දී පැමිණෙත්වා"යි කීවෝ ය. 15 මීට
විරුද්ධ වූයේ, අසාහෙල්ගේ පුත් ජොනතන් ද
තික්වාගේ පුත් ජාසයො ද පමණක් ය. මෙෂුල්ලාම් ද
ලෙවීය වූ ෂබ්බතෙයි ද ඔවුන්ට සහාය දුන්හ.
16 විප්රවාසයෙන් මිදී ආපසු පැමිණි අය එසේ
කළෝ ය. පූජක එස්රා ද තමන්ගේ පිය වංශවල
හැටියට පිය වංශවල ප්රධානීන් එකිනෙකා නම්
වශයෙන් පත් කළේ ය. ඔව්හු මේ කාරණය විභාග
කරන්නට දස වන මාසයේ පළමු වන දා ආරම්භ
කළෝ ය. 17 අන්‍ය ජාතික ස්ත්රීන් සරණ පාවාගෙන
සිටි සියලු දෙනා සම්බන්ධ කරුණු ඔව්හු පළමු වන
මාසයේ පළමු වන දා තීන්දු කළෝ ය.

## වරදකරුවන්ගේ නාම ලේඛනය

18 පූජකයන්ගේ පුත්රයන් අතරෙන් අන්‍ය ජාතික
ස්ත්රීන් සරණ පාවාගත් සමහර දෙනෙක් සම්බ වූ
හ. එනම්: ජෝශාදාක්ගේ පුත් ජේෂූවාගේ
පුත්රයන්ගෙන් ද ඔහුගේ සහෝදරයන්ගෙන් ද
මයසේයා, එලියෙසෙර්, ජාරීබ් සහ ගෙදලියා ය.
19 ඔව්හු තමන්ගේ භාර්යාවන් අත්හරින බවට
පොරොන්දු දුන්හ. තවද, ඔව්හු පාප පූජාවක්
වශයෙන් රැළෙන් බැටළුවකු බැගින් ඔප්පු කළෝ ය.
20 ඉම්මෙර්ගේ පුත්රයන්ගෙන් හනානි සහ
සෙබදියා ය.
21 හාරීම්ගේ පුත්රයන්ගෙන් මයසේයා, එලියා,
ෂෙමොයා, ජෙහියලේ සහ උශ්ශියා ය.
22 පෂ්හුර්ගේ පුත්රයන්ගෙන් එලියෝයේනයි,
මයසේයා, ඉෂ්මායලේ, නතෙනලේ, ජෝසාබාද් සහ
එලාසා ය.
23 ලෙවීවරුන්ගෙන් ජෝසාබාද්, ෂිමයි, කේලායා
එනම්, කලීටා, පතෙහියා, ජුදා සහ එලියෙසෙර් ය.

24 ගීතිකාකාරයන්ගෙනේ එලියාෂිබ් ය. දොරටු
පාලකයන්ගෙනේ ෂල්ලුම්, ටෙලෙමේ සහ උරී ය.
25 ඉශ්රායලේවරුන් අතරෙනේ පරොෂ්ගේ
පුත්රයන්ගෙනේ රමීයා, ඉස්සියා, මල්කියා, මියාමින්,
එලයොසර්, මල්කියා සහ බෙනොයා ය.
26 ඒලාම්ගේ පුත්රයන්ගෙනේ මත්තනියා, ශකෙරියා,
ජෙහියලේ, අබ්දි, ජරෙේමොත් සහ එලියා ය.
27 සට්ටුගේ පුත්රයන්ගෙනේ එලියෝයේනයි,
එලියාෂිබ්, මත්තනියා, ජරෙේමොත්, සාබාද් සහ
අසීසා ය.
28 බේබයිගේ පුත්රයන්ගෙනේ ජෙහෝහානාන්,
හනනියා, සබ්බයි සහ අත්ලයි ය.
29 බානීගේ පුත්රයන්ගෙනේ මෂුල්ලාම්, මල්ලුක්,
අදායා, ජාෂුබ්, ෂයොල් සහ ජරෙේමොත් ය.
30 පාහත්-මෝවබ්ගේ පුත්රයන්ගෙනේ අද්නා,
කලොල්, බෙනොයා, මයසේයා, මත්තනියා, බෙසලලේ,
බින්නුයි සහ මනස්සේ ය.
31 හාරීම්ගේ පුත්රයන්ගෙනේ එලියසෙරේ, ඉෂ්ෂියා,
මල්කියා, ෂමොයා, ෂිමයෙොන්; 32 බෙනේජමින්,
මල්ලුක් සහ ෂමෙරියා ය.
33 හාෂුම්ගේ පුත්රයන්ගෙනේ මත්තනෙයි,
මත්තත්තා, සාබාද්, එලිපලෙතේ, ජරෙේමයි,
මනස්සේ සහ ෂිමයෙි ය.
34 බානීගේ පුත්රයන්ගෙනේ මයදයි, අම්රාම් සහ
ඌයලේ ය; 35 බෙනොයා, බේදයො, කලුෙහී;
36 වනියා, මරෙේමොත්, එලියාෂිබ්, 37 මත්තනියා,
මත්තනෙයි සහ ජාසු ය;
38 බානී, බින්නුයි සහ ෂිමයෙි ය. 39 ෂලෙමියා,
නාතාන් සහ අදායා ය; 40 මක්නදබෙයි, ෂාෂයි,
ෂාරයි; 41 අසරේල්, ෂලෙමේයා, ෂමෙරියා; 42 ෂල්ලුම්,
අමරියා සහ ජෝසපේ ය.
43 නබෝගේ පුත්රයන්ගෙනේ ජයීයලේ,
මත්තිතියා, සාබාද්, සබීනා, ඉද්දෝ, ජෝවලේ සහ
බෙනොයා ය.
44 මේ හැම දෙනෙ ම අන්ය ජාතික ස්ත්රීන්
පාවාගෙන සිටියෝ ය. ඒ භාර්යාවන්ගෙනේ සමහරු
දරුවන් ද ලැබ සිටියෝ ය.
io1 පරිච්ඡේද 1-2 නහෙමේයා ආපසු ජරුෙසලමට
පැමිණීම.
io1 පරිච්ඡේද 8-10 ව්යවස්ථාව කියවීම; ගිවිසුම
අලුත්කිරීම.
io1 පරිච්ඡේද 11-13 නහෙමේයාගේ තවත් ක්රියා.

# නහෙමියා

### හැඳින්වීම

නහෙමියා වූකලී, ජුදා දේශයෙහි නායකයා වශයෙන් පර්සියානු අධිරාජයා විසින් පත් කරන ලද ජුදවේවන්ගේ මූලිකයකේ. ජුදවේ ඉතිහාසයේ ඔහු විශේෂ තැනක් ගන්නේ, ජෙරුසලමේ ප්රාකාරය නැවත ගොඩනැඟුවා වූ තැනැත්තා වශයෙනි. ඔහුගේ කාලයේ දී ආගමික හා සාමාජයික ප්රතිසංස්කරණයන් කීපයක් ම ඇති කරන ලදී. ඔහු දවේයන් වහන්සේට කළ යාච්ඤා පිළිබඳ සටහන් ද මේ පොතේ විශේෂ තැනක් ගනී.

මෙහි අඩංගු කරුණු:
පරිච්ඡේද 1-2 නහෙමියා ආපසු ජෙරුසලමට පැමිණීම.
පරිච්ඡේද 8-10 ව්යවස්ථාව කියවීම; ගිවිසුම අලුත්කිරීම.
පරිච්ඡේද 11-13 නහෙමියාගේ තවත් ක්රියා.

### ජෙරුසලම ගැන නහෙමියාගේ අයැදීම

1 මයෙ වනාහි හකලියාගේ පුත් නහෙමියා
වන මාගේ කතා වස්තුවකි. අර්තක්ෂස්තා
රජුගේ විසි වන අවුරුද්දේ කිස්ලවේ මාසයේ සූසා
නම් අගනුවර මා සිටි කල, 2 මාගේ ඥාතීන්ගනේ
එක් කනෙකු වූ හනානි ද ඔහු සමඟ තවත්
මනුෂ්යයෝ ද ජුදයෙන් ආහ. එවිට විප්රවාසයනේ
ගැළවී ඉතුරු වූ ජුදවේවරුන් ගැන ද ජෙරුසලම ගැන
ද මම ඔවුන්ගනේ විචාළෙමේ. 3 ඔව්හු කතා කොට,
"විප්රවාසයනේ බේරී ඒ රටේ ඉතිරි ව සිටින අය
මහා දුක් කරදරවලටත්, නින්දාවටත් භාජන වී
සිටිති. ජෙරුසලමේ පවුර ද බිඳ දමා තිබේ. එහි
දොරටු ගිනිබත් කර තිබේ ය"යි මට කී හ. 4 මම ඒ
වචන ඇසූ කල හිඳගනෙ ඇඬුවෙමේ. මම කීප දවසක්
වැලපමෙන්, නිරාහාර ව සිටිමින් ස්වර්ගයේ දවේයන්
වහන්සේ ඉදිරියෙහි මසෙේ යාච්ඤා කළෙමේ:
5 "අහෝ! ස්වර්ගයේ දවේ සමිඳාණන් වහන්ස,
ඔබට ප්රමේ කරමින් ඔබේ ආඥා රක්ෂා කරන්නන්
සමඟ විශ්වාසවන්ත ව ගිවිසුම පවත්වන, ගරුබිය
දනවන දවේයන් වහන්ස, 6 ඔබේ මහෙකෙරුවන් වන
ඉශ්රායලේ සනෙඟ උදසො ඔබේ මහෙකෙරු මා
දැනට රෑ දාවල් දකේහි ඔබ ඉදිරියෙහි ඔප්පු කරන
යාච්ඤා අසන පිණිස ඔබේ කන් යොමා මා දසෙ
බැලුව මැනව. ඉශ්රායලේ සනෙඟ වන අප ඔබට
විරුද්ධ ව කළ පව් මම කියා සිටිමි. මාගේ පියාගේ
වංශයේ අය ද මම ද පව් කළෙමු. 7 අපි ඔබට
විරුද්ධ ව ඉතා දුෂ්ට ලසෙ ක්රියා කළෙමු; ඔබේ
මහෙකෙරුවා වූ මෝසසේට ඔබ අණ කළ අණපණත්
ද නියෝග ද රක්ෂා නොකළෙමු. 8 ලවේ
26:33ඔබේ මහෙකෙරුවා වූ මෝසසේට ඔබ අණ
කළ දයෙ සිහි කළ මැනව. එනම්, 'නුඹලා
ද්රෝහිකම් කළොත් මම නුඹලා ජාතීන් අතර
විසුරුවන්නමේ. 9 ද්වි.නී. 30:1-5එහතේ, නුඹලා මා
වතෙ හැරී, මාගේ ආඥා රක්ෂා කරමින්, ඒවා ඉෂ්ට
කළොත්, නුඹලාගනේ සමහරකෙු පන්නා දමනු ලැබ
අහසේ කළෙවර සිටියත්, මම ඔවුන් එතැනින් රුස්
කර, මාගේ නාමය පිහිටුවන්නට මා විසින්
තෝරාගනු ලැබූ ස්ථානයට ඔවුන් ගනෙනේනමේ'
යනුයි.
10 "මොවුහු වනාහි ඔබේ බලයනේ ද බලවත්
හස්තයනේ ද ඔබ විසින් මුදාගනු ලැබූ ඔබේ ම
මහෙකෙරුවන් හා සනෙඟත් ය. 11 අහෝ සමිඳාණන්
වහන්ස! ඔබේ මහෙකෙරුවාගේ යාච්ඤාවටත්,
ඔබේ නාමයට ගරුබිය දක්වන්නට ප්රිය වන
මහෙකෙරුවන්ගේ යාච්ඤාවලටත් ඔබේ කන් යොමු
කළ මැනව. අද ඔබේ මහෙකෙරුවාට ශුභසිද්ධිය
සලසා දී රජ්ජුරුවන් ඉදිරියෙහි ඔහුට කරුණාව
ලැබනේනට සැලසුව මැනව."
11 එවකට මම රජුගේ පාත්රධාරී ව සිටියමේ.

### නහෙමියා ජෙරුසලමට යෑම

2 දිනක් අර්තක්ෂස්තා රජුගේ විසි වන
අවුරුද්දේ නිසාන් මාසයේ ඔහු ඉදිරිපිට මුද්රික
පානය තිබදේදී මම මුද්රික පානය රැගනෙ රජුට
දිනිමි. මීට පරෙ මම ඔහු ඉදිරියෙහි දී දුක්මුසු ව
නොසිටියමේ. 2 එවිට රජු මට කතා කර, "ඔබට
අසනීපයක් නැති නමුත්, ඔබේ මුහුණ දුක්මුසු ව
තිබනේනේ මන් ද? මයෙ සිතේ කණගාටුවක් මිස
වනෙ කිසිවක් නොවේ ය"යි කීවේ ය.

3 2 රාජා 25:8-10; 2 වංශා 36:19; ජෙරෙ 52:12-14
එවිට මම ඉතා බියෙනේ රජුට කතා කොට, “රජතුමා
සදහට ම ජීවත් වේ වා! මාගේ පියවරුන්ගේ
සොහොන් තිබෙන නගරය පාළු වී, එහි දොරටු
ගින්නෙන් දැවී ගොස් තිබිය දී මාගේ මුහුණ දුක්මුසු
නොවන්නේ කෙසේ දැ”යි කීමි.
4 එවිට රජතුමා කතා කොට, “ඔබ ඉල්ලා
සිටින්නේ කුමක් දැ”යි මාගෙන් ඇසී ය. එවිට, මම
ස්වර්ගයේ දෙවියන් වහන්සේට යාච්ඤා කොට,
5 “රජතුමා සතුටු නම්, ඔබේ දාසයා රජු ඉදිරියෙහි
කරුණාව ලබා සිටී නම්, ජුදාහි මාගේ පියවරුන්ගේ
සොහොන් තිබෙන නගරය ගොඩනඟනු පිණිස මා
එහි යැව්ව මැනවැ”යි කීමි.
6 රජ තෙමේ, බිසවත් තමා ළඟ වාඩිවී සිටිය දී,
කතා කොට, “ඔබේ ගමනට කොපමණ කල් ගත
වේ ද” කියාත්, “ඔබ නැවත එන්නේ කවදා ද”
කියාත්, මාගෙන් ඇසී ය. මම රජුට කාලයක් නියම
කර කීවෙමි. රජතුමා මා යවන්නට සතුටු විය.
7 ඇරත් මම රජුට කතා කොට, “රජතුමා සතුටු
නම්, මා ජුදයට පැමිණෙන තුරු රට මැදින් මට
යන්නට දෙන ලෙස, එගොඩ සිටින දිශාධිපතීන්ට
දීමට ලියුම් ද 8 ගෘහයට අයිති කොටුවේ දොරටුවල
බාල්කවලටත්, නුවර පවුරුවලටත්, මා පදිංචි වන්නට
යන නිවාසයටත් ලී දෙන ලෙස රජුගේ මූකළාන
භාරකාරයා වන ආසාප්ට දීමට ලියුමක් ද මට ලැබේ
වා”යි කීමි. මාගේ දෙවියන් වහන්සේගේ යහපත්
හස්තය මා කෙරෙහි තිබුණු හයින් රජ තෙමේ එසේ
ම මට දුන්නේ ය.
9 එකල මම ගඟ එගොඩ සිටි දිශාධිපතීන් ළඟට
අවුත් රජුගේ හසුන් පත් ඔවුන්ට දිනිමි. රජ වනාහි
සේනාධිපතීන් ද අසරුවන් ද මා සමඟ එවුවේ ය.
10 හොරොනීය ජාතික සන්බලට් ද සේවකයා වූ
අම්මොනි ජාතික ටොබියා ද ඒ අසා, ඉශ්‍රායලේ
සෙනඟගේ ශුභසිද්ධිය දියුණු කරන්නට මනුෂ්‍යයෙකු
ආ බව දැනගෙන ඉතාමත් අමනාප වූ හ.
11 මෙසේ මම ජෙරුසලමට අවුත් තුන් දවසක් එහි
සිටියෙමි. 12 තවද, මම රාත්‍රියේ නැඟිට,
මනුෂ්‍යයන් ස්වල්ප දෙනෙකු සමඟ ජෙරුසලම උදෙසා
කරන්නට මාගේ දෙවියන් වහන්සේ මාගේ සිතේ
තැබූ කල්පනාව කිසි ම මනුෂ්‍යයෙකුට නොදන්වා,
මා නැඟී ගිය සතා මිස වෙන යම් සතෙකු නැති ව,
රාත්‍රියේ මිටියාවතේ දොරටුවෙන් පිටත් වී, 13 නාග
උල්පත ළඟටත්, කසළ දොරටුව ළඟටත් ගොස්,
ජෙරුසලමේ කඩා දමන ලද පවුරත්, ගින්නෙන් දා
ගොස් තිබුණු එහි දොරටුත් බලා, 14 පසු ව උල්පත්
දොරටුව සහ රජ පොකුණ ළඟට ගියෙමි. එහෙත්,
මා නැඟී උන් සතාට යන්නට ඉඩ නොතිබුණේ ය.
15 මම රාත්‍රියේ ඔය ළඟින් ගොස් පවුර බලා,
ආපසු හැරී, මිටියාවතේ දොරටුවෙන් ඇතුළු වී
පැමිණියෙමි.
16 මා ගිය ගමන ගැන වත්, මා කළ දේ වත්
නිලධාරීහු නොදත්හ. මම ඒ වන තුරු ජුදෙව්වරුන්ට
වත්, පූජකයන්ට වත්, නායකයන්ට වත්, නිලධාරීන්ට
වත්, පවුර ගොඩනැඟිය යුතු සෙසු අයට වත් ඒ බව
නොදැන්වීමි. 17 එකල මම ඔවුන්ට කතා කොට,
“ජෙරුසලම පාළු වී තිබෙන හැටි ද එහි දොරටු කැඩී
ගොස් තිබෙන හැටි ද අපට පැමිණ තිබෙන
විපත්තිය ද ඔබට පෙනේ. ඉතින් එන්න, අපට තවත්
නින්දා නොපැමිණෙන පිණිස ජෙරුසලමේ පවුර
ගොඩනඟමු”යි කීවෙමි. 18 තවද, මාගේ දෙවියන්
වහන්සේගේ කරුණා හස්තය මා කෙරෙහි තිබෙන
බව ද රජු මට කී වචන ගැන ද මම ඔවුන්ට
දැන්වීමි. ඔව්හු පිළිතුරු දෙමින්, “අපි නැඟිට
ගොඩනඟමු”යි කී හ. මෙසේ ඔව්හු ඒ යහපත්
වැඩය සඳහා තමන්ගේ ශ්‍රමශක්තිය යෙදෙවුවෝ ය.
19 එහෙත්, හොරොනීය ජාතික සන්බලට් ද
සේවකයා වූ අම්මොනි ජාතික ටොබියා ද අරාබි
ජාතික ගෙෂෙම් ද ඒ අසා, අපට කවටකම් කරමින්
අප හෙළා දැක, “ඔබ කරන මේ දෙය කුමක් ද? ඔබ
රජුට විරුද්ධ ව කැරලිගසන්නට සිතන්නහු දැ”යි ඇසූ
හ.
20 එවිට මම ඔවුන්ට පිළිතුරු දෙමින්, “ස්වර්ගයේ
දෙවියන් වහන්සේ ම අපේ කාර්යය සාර්ථක කරනු
ඇත. එබැවින් උන් වහන්සේගේ සේවකයන් වන
අපි ගොඩනැඟීමේ වැඩ පටන්ගනිමු. එහෙත්, ඔබට
ජෙරුසලමෙහි කිසි කොටසක් වත්, අයිතිවාසිකමක්
වත්, සිහිවීමේ ලකුණක් වත් නැතැ”යි කීවෙමි.

### පවුර ගොඩනැඟීම

3 එකල උත්තම පූජකයා වූ එලියාෂිබ් තෙමේ
පූජකයන් වූ ඔහුගේ සහෝදරයන් සමඟ වැඩ
අරඹා බැටළු දොරටුව යළි ගොඩනඟා, උළුවහු
යොදා, එහි දොරවල් සවි කොට, හම්මේයාගේ
කොත ද හනනේල්ගේ කොත ද දක්වා පවුර
ගොඩනැඟුවේ ය.
2 එලියාෂිබ්ට පසු ව ජෙරිකෝවේ මනුෂ්‍යයෝ
පවුර ගොඩනැඟුවෝ ය. ඔවුන්ට පසු ව ඉම්රිගේ
පුත් ශක්කූර් ඒවා ගොඩනැඟුවේ ය.
3 මත්ස්‍ය දොරටුව හස්සෙනායාගේ පුත්‍රයෝ
ගොඩනැඟුවෝ ය. ඔව්හු එහි බාල්ක පිහිටුවා එහි
දොරවල් හා තහඩු ද අගුල් ද සවි කළහ. 4 ඔවුන්ට
පසු ව හක්කොශ්ගේ පුත් ඌරියාගේ පුත්‍රයා වන
මෙරේමොත් පවුර අලුත්වැඩියා කිරීමේ වැඩ කළේ
ය. ඔහුට පසු ව මෙෂේසබලේගේ පුත්
බෙරෙකියාගේ පුත්‍රයා වන මෙෂුල්ලාම් එය
අලුත්වැඩියා කිරීමේ වැඩ කළේ ය. ඔහුට පසු ව
බානාගේ පුත්‍ර ශාදොක් අලුත්වැඩියා කිරීමේ වැඩ
කළේ ය.
5 ඔහුට පසු ව තකෝවෙරු එය අලුත්වැඩියා
කිරීමේ වැඩ කළෝ ය. එහෙත්, ඔවුන්ගේ
නායකයෝ තමන්ගේ ස්වාමීන්ගේ සේවයට
කරගසන්නට කැමැති නුවූ හ.
6 පාසේයාගේ පුත් ජෝයාදා ද බෙසෝදයාගේ
පුත් මෙෂුල්ලාම් ද පරණ දොරටුව අලුත්වැඩියා
කිරීමේ වැඩ කළෝ ය. ඔව්හු එහි බාල්ක පිහිටුවා,
එහි දොරවල් හා තහඩු ද අගුල් ද සවි කළෝ ය.

7 ඔවුන්ට පසු ව ගිබියෝනි ජාතික මලෙටියා ද
මෙරොනොතීය ජාතික ජාදොන් ද ගිබියොන්හි සහ
මිශ්පාහි මනුෂ්‍යයෝ ද යුප්‍රටීස් ගඟින් මෙගොඩ
සිටි දිශාධිපතීන් උදෙසා අලුත්වැඩියා කිරීමේ වැඩ
කළෝ ය.
8 ඔවුන්ට පසු ව රන් කරුවන් වූ හර්හායාගේ පුත්
උශ්ශියෙල් අලුත්වැඩියා කිරීමේ වැඩ කළේ ය.
ඔහුට පසු ව සුගන්ධ ද්‍රව්‍ය මිශ්‍ර කරන්නන්ගෙන්
කෙනෙකු වූ හනනියා අලුත්වැඩියා කිරීමේ වැඩ
කළේ ය. ඔව්හු පළල් පවුර දක්වා ජෙරුසලම
ශක්තිමත් කළෝ ය.
9 ඔවුන්ට පසු ව ජෙරුසලම් පළාතෙන් දෙකෙන්
කොටසකට අධිපතියා වූ හූර්ගේ පුත් රෙපායා
අලුත්වැඩියා කිරීමේ වැඩ කළේ ය.
10 ඔහුට පසු ව හරුමප්ගේ පුත් ජදායා තමාගේ
ගෙය ඉදිරිපිට අලුත්වැඩියා කිරීමේ වැඩ කළේ ය.
ඔහුට පසු ව හෂබ්නයාගේ පුත් හට්ටූෂ්
අලුත්වැඩියා කිරීමේ වැඩ කළේ ය.
11 හාරීම්ගේ පුත් මල්කියා ද පාහත්-මෝවබ්ගේ
පුත් හෂ්ෂූබ් ද තව කොටසක් හා උදුන් කොත
අලුත්වැඩියා කළෝ ය.
12 ඔවුන්ට පසු ව ජෙරුසලම් පළාතෙන් දෙකෙන්
කොටසකට අධිපතියා වූ හල්ලෝහෙෂ්ගේ පුත්
ෂල්ලුම් ද ඔහුගේ දූවරු ද අලුත්වැඩියා කිරීමේ වැඩ
කළෝ ය.
13 මිටියාවතේ දොරටුව හානුන් ද ශානොවේ
වැසියෝ ද අලුත්වැඩියා කළෝ ය. ඔව්හු එය
ගොඩනඟා, එහි දොරවල් හා තහඩු ද අගුල් ද
තබා, කසළ දොරටුව දක්වා පවුරෙන් මීටර් හාරසිය
හතළිහක් ද අලුත්වැඩියා කළෝ ය.
14 කසළ දොරටුව බෙත්-හක්කෙරෙම් පළාතේ
අධිපතියා වූ රේකාබ්ගේ පුත් මල්කියා අලුත්වැඩියා
කළේ ය. ඔහු එය ගොඩනඟා එහි දොරවල් හා
තහඩු ද අගුල් ද සවි කළේ ය.
15 මිශ්පා පළාතේ අධිපතියා වූ කොල්-හෝශෙගේ
පුත් ෂල්ලුම් උල්පත් දොරටුව අලුත්වැඩියා කිරීමේ
වැඩ කළේ ය. ඔහු එය ගොඩනඟා, එහි දොරවල්
හා තහඩු ද අගුල් ද සවි කර රජ උයන ළඟ
දාවිත්ගේ නුවර සිට බසින පඩි පෙළ දක්වා
ෂෙලහේ පොකුණේ පවුර ගොඩනැඟුවේ ය.
16 ඔහුට පසු ව බෙත්-ශුර් පළාතෙන් දෙකෙන්
කොටසකට අධිපතියා වූ අශ්බූක්ගේ පුත්
නහෙමියා දාවිත්ගේ සොහොන ඉදිරිපිටට
පැමිණෙන තුරුත්, සාදන ලද පොකුණ දක්වාත්,
බලවතුන්ගේ ගෙය දක්වාත් අලුත්වැඩියා කළේ ය.

## අලුත්වැඩියා වැඩ කළ ලෙවීවරු

17 ඔහුට පසු ව, ලෙවීවරු බානීගේ පුත් රෙහුම්
යටතේ අලුත්වැඩියා කිරීමේ වැඩ කළෝ ය. ඔවුන්ට
පසු ව කෙයිලා පළාතෙන් දෙකෙන් කොටසකට
අධිපතියා වූ හෂබියා තමාගේ පළාත වෙනුවට
අලුත්වැඩියා කිරීමේ වැඩ කළේ ය.
18 ඔහුට පසු ව ඔහුගේ සහෝදරයෝ කෙයිලා
පළාතෙන් දෙකෙන් කොටසකට අධිපතියා වූ
හෙනොදාද්ගේ පුත් බව්වයි යටතේ අලුත්වැඩියා
කිරීමේ වැඩ කළෝ ය.
19 ඔවුන්ට පසු ව මිශ්පායේ අධිපතියා වූ
ජේෂුවාගේ පුත් එශෙර් පවුරු කොනේ ආයුධ
ගබඩාවේ නැඟුම ඉදිරිපිට තව කොටසක්
අලුත්වැඩියා කිරීමේ වැඩ කළේ ය.
20 ඔහුට පසු ව සබ්බයිගේ පුත් බාරුක් පවුරු
කොනේ සිට උත්තම පූජකයා වූ එලියාෂිබ්ගේ ගෙයි
දොරකඩ දක්වා තව කොටසක් අලුත්වැඩියා කිරීමේ
වැඩ උනන්දුවෙන් කළේ ය.
21 ඔහුට පසු ව හක්කොශ්ගේ පුත් උරියාගේ
පුත්‍රයා වන මෙරේමොත් එලියාෂිබ්ගේ ගෙයි
දොරකඩ පටන් එලියාෂිබ්ගේ ගෙයි කෙළවර දක්වා
තව කොටසක් අලුත්වැඩියා කළේ ය.
22 ඔහුට පසු ව සමභූමියේ මනුෂ්‍යයන් වූ
පූජකයෝ අලුත්වැඩියා කිරීමේ වැඩ කළෝ ය.
23 ඔවුන්ට පසු ව බෙන්ජමින් ද හෂ්ෂූබ් ද
තමන්ගේ ගෙය ඉදිරිපිට කොටස අලුත්වැඩියා
කළෝය. ඔවුන්ට පසු ව අනනීයාගේ පුත්‍රයා වන
මයසේයාගේ පුත් අශරියා තමාගේ ගෙය ළඟ
අලුත්වැඩියා කළේ ය.
24 ඔහුට පසු ව හෙනොදාද්ගේ පුත් බින්නුයි
අශරියාගේ ගෙය පටන් පවුර හැරෙන තැන සහ
කොත දක්වාත් තව කොටසක් අලුත්වැඩියා කළේ
ය.
25 ඌසයිගේ පුත් පාලාල් පවුරු කොතත්, හිරගෙයි
මිදුල ළඟ ඉහළ රජ ගෙදරට ඉදිරිපිටින් තිබෙන
කොතත් අලුත්වැඩියා කළේ ය. ඔහුට පසු ව
පරොෂ්ගේ පුත් පදායා අලුත්වැඩියා කිරීමේ වැඩ
කළේ ය. 26 එකල ඕපෙලේහි විසූ දේව මාලිගයේ
සේවකයෝ නැගෙනහිර දිශාවේ වතුර දොරටුව ද
පිටතින් තිබෙන කොත ඉදිරිපිට තැන දක්වා
අලුත්වැඩියා කළෝ ය.

## අලුත්වැඩියාවේ නියැලුණු පූජකවරු හා අන් අය

27 පදායාට පසු ව තකෝවරු පිටතින් තිබෙන
ලොකු කොත ඉදිරිපිට ද ඕපෙලේහි පවුර දක්වා ද
තව කොටසක් අලුත්වැඩියා කළෝ ය.
28 පූජකයෝ එකිනෙකා අශ්ව දොරටුවට ඉහළින්,
තම තමාගේ ගෙය ඉදිරිපිට අලුත්වැඩියා කළෝ ය.
29 ඔවුන්ට පසු ව ඉම්මෙරේගේ පුත් ශාදොක්
තමාගේ ගෙය ඉදිරිපිට අලුත්වැඩියා කළේ ය.
ඔහුට පසු ව නැගෙනහිර දොරටුවේ රැකවලා වූ
ෂෙකෙනියාගේ පුත් ෂමායා අලුත්වැඩියා කිරීමේ
වැඩ කළේ ය.
30 ඔහුට පසු ව ෂෙලෙමියාගේ පුත් හනනියා ද
ශාලාප්ගේ ස වන පුත්‍රයා වූ හානුන් ද තව
කොටසක් අලුත්වැඩියා කිරීමේ වැඩ කළෝ ය.
ඔවුන්ට පසු ව බෙරෙකියාගේ පුත් මෙෂුල්ලාම්
තමාගේ ගෙය ඉදිරිපිට කොටස අලුත්වැඩියා කළේ
ය.

31 ඔහුට පසු ව රන්කරුවකු වූ මල්කියා මුර
දොරටුව ඉදිරිපිට දේව මාලිගාවේ සේවකයන්ගේ ද
වෙළෙන්දන්ගේ ද ගවෙල් දක්වාත්, කොනේ
උඩුමහල දක්වාත් අලුත්වැඩියා කිරීමේ වැඩ කළේ
ය.
32 කොනේ උඩුමහලටත්, බැටළු දොරටුවටත්
අතරේ රන්කරුවෝ ද වෙළෙන්දෝ ද අලුත්වැඩියා
කිරීමේ වැඩ කළෝ ය.

### විරෝධ මැඩලීම

4 අප පවුර සාදන බව සන්බලට් ඇසූ විට, ඔහු
කෝප වී, අතිශයින් උදහස් වී ජුදෙව්වරුන්ට
නින්දා කළේ ය. 2 ඔහු සිය සහෝදරයන් සහ
සමාරියේ සේනාව ඉදිරියේ දී කතා කොට, “මේ
බලහීන ජුදෙව්වරු කුමක් කරත් ද? මේ ස්ථානය
යළි ගොඩනඟන්නට ඔව්හු සිතත් ද? ඔවුන් පූජා
කරනු ඇද් ද? දවසකින් වැඩ නිම කරනු ඇද් ද? දවා
දැමූ කුණු කන්දරාවලින් ඔවුන් නැවත ගඩොල්
සාදාගනු ඇද්දැ”යි කීවේ ය.
3 ඔහු ළඟ සිටි අම්මොනි ජාතික ටෝබියා ද කතා
කොට, “ඔවුන් ගොඩනඟන මේ පවුර කුමක් ද?
හිවලකු එයට නැඟුණොත් ඌ ඔවුන්ගේ ගල් පවුර
කඩා දමනු ඇතැ”යි කීවේ ය.
4 මම මෙසේ යාච්ඤා කළෙමි: “අපේ දෙවියන්
වහන්ස! ඇසුව මැනව. අනේ ඔවුන් අප පහත්
කොට සලකන හැටි! ඔවුන් කරන නින්දාව ඔවුන්ගේ
හිස පිට කඩා වැටුණාවේ! වහල්කමට වැටෙන රටක
කොල්ලයට ඔවුන් පාවා දුන මැනව. 5 ඔවුන්ගේ
අපරාධය නොවසුව මැනව. ඔවුන්ගේ පාපය ඔබ
ඉදිරියෙන් නොමැකේ වා! මන්ද, ගොඩනඟන අය
ඉදිරිපිට දී ඔවුන් ඔබ උදහස් කර ඇත.”
6 එහෙත්, අපි පවුර ගොඩනඟාගෙන ගියෙමු.
මෙසේ හරි අඩක් උසට මුළු පවුර සාදන ලද්දේ ය.
එසේ කළ හැකි වූයේ, වැඩ කරන්නට සෙනඟට
සිතේ ධෛර්යය තිබුණ බැවිනි.
7 ජෙරුසලමේ පවුර අලුත්වැඩියා කිරීමේ වැඩ
ඉෂ්ට වන බවත්, එහි කැඩුම්බිඳුම් හරිගස්සාගෙන
යන බවත් අසා, සන්බලට් ද ටෝබියා ද අරාබිවරු ද
අම්මොන්වරු ද අෂ්දොද්වරු ද ඉතා කෝපාවිෂ්ට වූ
හ. 8 ඔව්හු සියල්ලෝ ම ජෙරුසලමට විරුද්ධ ව යුද්ධ
කර එහි වියවුලක් හටගන්වන්නට එක් ව
කුමන්ත්‍රණය කළෝ ය. 9 එහෙත්, අපි අපේ
දෙවියන් වහන්සේට යාච්ඤා කර, ඔවුන්ගෙන්
ආරක්ෂා වන පිණිස රෑ දාවල් දෙකේහි මුර තැබීමු.
10 ජුදාවරු කතා කොට, “බර ගෙන යන අයගේ
ශක්තිය හීන වී තිබේ; කුණුකන්දල් ගොඩගැසී
තිබේ. එබැවින් අපට පවුර ගොඩනඟන්නට
නොහැකි ය”යි කී හ.
11 අපේ එදිරිකාරයෝ කතා කොට, “ඔවුන්
දැනගන්නට වත්, කිසිවක් දකින්නට වත් පෙර, අපි
ඔවුන් පිට කඩා පැන, ඔවුන් මරාදමා ඔවුන්ගේ වැඩ
නවත්වන්නමෝ”යි කී හ. 12 තවද, ඔවුන් අතර විසූ
ජුදෙව්වරු පැමිණ, “ඔවුන්, ජීවත් ව සිටින සියලු
තැන්වලින් අවුත්, අප පිට කඩා පනිනු ඇතැ”යි කීප
වරක් ම අපට කී හ. 13 ඒ නිසා මම පවුරට
පිටුපසින් තිබූ පහත් එළිමහන් ඉඩම්වල තමන්ගේ
පවුල්වල ප්‍රකාරයට කඩුත්, හෙල්ලත්, දුනුත් ඇති ව
සෙනඟ සිටවෙව්වෙමි.
14 මම කරුණු විමසා බලා නැඟිට, නායකයන්ටත්,
නිලධාරීන්ටත්, ඉතිරි සෙනඟටත් කතා කොට, “ඔවුන්
ගැන බිය නොවන්න. බියජනක ශ්‍රේෂ්ඨ සමිඳාණන්
වහන්සේ සිහි කරමින්, ඔබේ ඥාතීන් ද පුත්‍රයන් ද
දූවරුන් ද භාර්යාවන් ද ගවෙල් ද උදෙසා සටන්
කරන්නැ”යි කීවෙමි. 15 තවද, අප ඒ දේ දැනගත්
බව ද දෙවියන් වහන්සේ ඔවුන්ගේ මන්ත්‍රණය
ව්‍යර්ථ කළ බව ද අපේ සතුරන්ට ආරංචි වූ කල,
අපි සියල්ලෝ ම එකිනෙකා තම තමාගේ වැඩ
කිරීමට පවුරට ආපසු ගියෙමු.
16 එතැන් පටන් මාගේ සේවකයන්ගෙන් දෙකෙන්
කොටසක් වැඩවල යෙදී සිටියෝ ය. කොටසක්
හෙල්ල ද පලිස් ද දුනු ද යුද්ධ සැට්ට ද රැගෙන
සිටියෝ ය. අධිපතියෝ ද පවුර ගොඩනැඟීම කළ
මුළු ජුදා සෙනඟගේ වැඩ පරිපාලනය කළෝ ය.
17 බර උසුලාගෙන යන අය එක අතකින් වැඩ
කරමින්, අනික් අතින් ආයුධයක් රැගෙන සිටියෝ ය.
18 ගොඩනඟන අය ද එකිනෙකා තම තමාගේ
කඩුව ඉඟටියේ බැඳගෙන ගොඩනැඟුවෝ ය.
හොරණෑ පිඹින්නා මා ළඟ සිටියේ ය. 19 මම
නායකයන්ටත්, නිලධාරීන්ටත්, ඉතිරි සෙනඟටත්
කතා කොට, “මයෙ ඉතා වැදගත් විශාල වැඩකි. අපි
පවුර පිට විසිරී එකිනෙකාගෙන් දුරස්තර ව සිටිමු.
20 යම් තැනකින් ඔබට හොරණෑ ශබ්දය ඇසේ ද,
එතැන සිට අප ළඟට රැස් වන්න. අපේ දෙවියන්
වහන්සේ අප උදෙසා සටන් කරන සේකැ”යි කීමි.
21 මෙසේ අපි වැඩහෙි නියුක්ත ව සිටියෙමු.
ඔවුන්ගෙන් දෙකෙන් කොටසක් අලුයම් වේලේ
පටන් තාරකා පෙනෙන තුරු හෙල්ල රැගෙන සිටියෝ
ය.
22 එකල මම සෙනඟට තවදුරටත් කතා කොට,
“රාත්‍රියේ අපට රැකවලක් වන පිණිසත්, දවල් වැඩ
කරන පිණිසත් එක එකා තම තමාගේ මෙහෙකරුවා
සමඟ ජෙරුසලමහි රාත්‍රිය ගත කරේවා”යි
කීවෙමි. 23 මාගේ ඥාතීහු වත්, මාගේ සේවකයෝ
වත්, මා කැටුව පැමිණි රැකවල්ලු වත්, මම වත්
ඇඳුම් නොගැලවෙව්වෙමු. එකිනෙකා තම තමාගේ
ආයුධ අතේ ඇති ව සිටියෝ ය.

### සමාජ ගැටලුවලට මුහුණ පෑම

5 එකල සෙනඟ ද ඔවුන්ගේ භාර්යාවෝ ද
තමන්ගේ සහෝදර ජුදෙව්වරුන්ට විරුද්ධ ව
මහා කෑමොරගැසීමක් කළෝ ය. 2 සමහර දෙනෙක්
කතා කොට, “කෑමට හා ජීවත් වීමට ධාන්‍ය ලබා
ගන්න පිණිස අපේ දූ පුතුන් උකසට තබන්නට අපට
සිදු වී තිබේ ය”යි කී හ.

3 සමහරු, "සාගතය නිසා ධාන්‍ය ලබා ගනු පිණිස
අපේ කෙත් ද මිදි වතු ද ගෙවල් ද උකස් තබන්නට
අපට සිදු වී තිබේ ය"යි කී හ.
4 තවත් සමහරු, "අපේ බිම්වලට හා මිදි වතුවලට
රජුගේ තීරු බදු ගෙවීමට අපට මුදල් ණයට ගන්නට
සිදු වී තිබේ. 5 ඉතින් අපේ ශාරීරික වුවමනා අපේ
සහෝදරයන්ගේ වුවමනාවලට සමාන නොවේ ද?
අපේ දරුවෝ ඔවුන්ගේ දරුවන්ට සමාන නොවෙත්
ද? එහෙත්, අපේ පුත්‍රයන් ද දූවරුන් ද දාසකමට
දෙන්නට අපට සිදු වී ඇත. අපේ දූවරුන්ගෙන්
සමහරෙක් දැනට ම දාසකමට පත් ව සිටිති. අපට
කරකියාගන්නට දෙයක් නැත. කුමක් නිසා ද අපේ
බිම් ද මිදි වතු ද අනුන්ට අයිති වී තිබේ ය"යි
කීවෝ ය.
6 ඔවුන්ගේ කෑමොරගැසීම ද මේ දුක්ගැනවිල්ල ද
ඇසූ විට මම ඉතා කෝප වීමි. 7 නික්ම 22:25; ලෙවී
25:35-37; ද්වි.නී. 23:19-20මම මේ ගැන හොඳට
කල්පනා කළ පසු, නායකයන්ට ද නිලධාරීන්ට ද
තරවටු කර, "ඔබ එක එකා තම තමාගේ
සහෝදරයාගෙන් පොළී ගන්නවා නොවේ දැ"යි
ඔවුන්ගෙන් ඇසුවෙමි. මම ඔවුන්ට විරුද්ධ ව මහා
සමූහයක් රැස් කරවා ඔවුන්ට කතා කොට, 8 "අන්‍ය
ජාතීන්ට විකුණනු ලැබූ ජුදෙව්වරුන් වන අපේ
සහෝදරයන් අපේ පුළුවන්කමේ හැටියට අපි මිල දී
මුදා ගත්තෙමු. එහෙත් දැන් ඔබ, ඔබේ ම
සහෝදරයන් විකුණන්නහු ය. ඔවුන් මිල දී මුදා
ගැනීමට අපට සිදු වනු ඇතැ"යි කීවෙමි. එවිට ඔව්හු
වචනයක් වත් කියා ගත නොහැකි ව නිශ්ශබ්ද වී
සිටියෝ ය.
9 මම තවදුරටත් කතා කරමින්, "ඔබ කරන දේ
හොඳ නැත. අපේ සතුරන් වන අන්‍ය ජාතීන්ගේ
අපහාසයට අප ලක් නොවන පිණිස, අපේ දෙවියන්
වහන්සේට ගරුබිය ඇති ව හැසිරිය යුතු නොවේ ද?
10 මමත්, මාගේ ඥාතියෝත්, සේවකයෝත් ඔවුන්ට
මුදල් ද ධාන්‍ය ද පොළියට දෙමින් සිටිමු. මයොකාර
පොළී ගැනීම අපි අත්හැරදමමු. 11 ඔවුන්ගේ කෙත්
ද මිදි වතු ද ඔලීව වතු ද ගෙවල් ද මුදල්වලටත්
ධාන්‍යවලටත් මුද්‍රික පානයටත් තෙල්වලටත් ඔබ
ඔවුන්ගෙන් අය කරන සියයෙන් කොටස ද අද ම
ඔවුන්ට ආපසු දෙන්නැ"යි කීමි.
12 එවිට ඔව්හු උත්තර දෙමින්, "අපි ඒවා ආපසු දී,
ඔවුන්ගෙන් කිසිත් අය නොකර ඔබ කියන ලෙසෙ ම
කරන්නෙමු"යි කීවෝ ය. එවිට මම පූජකයන්ට
අඬගසා, පොරොන්දුවේ හැටියට ක්‍රියා කරන ලෙසෙ
ඔවුන්ගෙන් දිවුරුම් ගතිමි. 13 මම මාගේ බඳ පටිය
ගසා දමා, හිස් බව පෙන්වා, කතා කොට, "මේ
පොරොන්දුව ඉෂ්ට නොකරන කවුරුන් නමුත්, තම
තමාගේ ගෙයිනුත්, වැඩපළවලිනුත් දෙවියන්
වහන්සේ මෙසේ ගසා දමන සේක් වා! ඔහු මෙසේ
ගසා දමනු ලැබ හිස් වේවා"යි කීවෙමි. එවිට මුළු
සභාව, "ආමෙන්" කියා සමිඳාණන් වහන්සේට
ප්‍රශංසා කළහ. සෙනඟ මේ පොරොන්දුවේ
ප්‍රකාරයට කළෝ ය.
14 තවද, ජුදා දේශයේ ඔවුන්ගේ දිශාධිපතියා
වශයෙන් මා පත් කරනු ලැබූ දවසේ සිට එනම්,
අර්තක්ෂස්තා රජුගේ විසි වන අවුරුද්දේ පටන් තිස්
දෙ වන අවුරුද්ද දක්වා දොළොස් අවුරුද්දක් මුළුල්ලේ
මාගේ ඥාතීහු වත්, මම වත් දිශාධිපතියාට හිමි
කෑම නොකෑවෙමු. 15 එහෙත්, මට පෙර සිටි
පුරෝගාමී දිශාධිපතිවරු සෙනඟට බරක් වී, කෑමත්
මුද්‍රික පානයත් හැර රිදී කාසි හතළිහකුත් අය
කරගත්තෝ ය. ඒ පමණක් නොව, ඔවුන්ගේ
සේවකයෝ පවා සෙනඟට හිරිහැර කළෝ ය.
එහෙත්, මම දෙවියන් වහන්සේ කෙරෙහි ගරුබිය
ඇති ව සිටි නිසා එසේ නොකළෙමි. 16 එපමණක්
නොව, මම පවුර සෑදීමේ වැඩට මාගේ මුළු ශ්‍රමය
යෙදෙව්වෙමි. මම කිසිදු ඉඩමක් මිලේට නොගතිමි.
මාගේ සියලු සේවකයෝ ද ඒ වැඩය කිරීම සඳහා
එහි රැස් ව සිටියෝ ය. 17 අප අවට විසූ
ජාතීන්ගෙන් අප වෙත පැමිණි අය හැර ජුදෙව්වරු
සහ නිලධාරීහු එකසිය පණස්දෙනෙක් මාගේ කෑම
මේසයෙන් සංග්‍රහ ලැබූ හ. 18 මා සඳහා දවසකට
ගොනෙකුත්, තර බැටළුවෝ හයදෙනෙකුත් පිළියෙළ
කරන ලදහ. කුකුළෝ ද මා සඳහා පිළියෙළ කරන
ලදහ. දස දවසකට වරක් මුද්‍රික පාන සම් බඳුන්
තොග වශයෙන් ගෙනෙන ලදී. එසේ වුව ද,
සෙනඟට බොහෝ බර උසුලන්නට තිබුණු නිසා
දිශාධිපතියාට හිමි කෑම මම නොඉල්ලුවෙමි.
19 "මාගේ දෙවියන් වහන්ස, මේ සෙනඟ උදෙසා
මා කළ සියල්ල මාගේ යහපත පිණිස සිහි කළ
මැනව."

### සතුරන් යෙදූ කූටෝපාය

6 ප්‍රාකාරයේ කැඩුම්බිඳුම් කිසිවක් ඉතුරු
නොවන ලෙසෙ මා විසින් එය ගොඩනංවන ලද
බව සන්බලට්ට ද ටෝබියාට ද අරාබිය ගෙෂෙම්ට ද
අපේ සෙසු සතුරන්ට ද සැළ විය. එහෙත්, ඒ කාලය
වන තුරු ම මා දොරටුවල දොරවල් සවි කර
නොතිබුණේ ය. 2 එවිට සන්බලට් ද ගෙෂෙම් ද,
"එන්න, ඕනෝහි සමභූමියේ ගම්වලින් එකක අපි
සම්මුඛ වෙමු"යි මට ආරාධනා කර එවුවෝ ය.
එහෙත්, මයෙ ඔවුන් මට අනතුරු කරන්නට යෙදූ
උපායකි. 3 මම ඔවුන් ළඟට පණිවුඩකාරයන්
යවමින්, "මම වැදගත් වැඩක යෙදී සිටිමි. ඒ නිසා
එන්නට නොහැකි ය. ඔබ වෙත පැමිණෙන පිණිස මා
මේ වැඩ අත්හැරියොත් වැඩය නවතිනු ඇතැ"යි
කියා යැව්වෙමි.
4 ඔව්හු මේ අයුරින් සතර වරක් ආරාධනා කර එවූ
හ. මමත් ඒ අයුරින් ම ඔවුන්ට පිළිතුරු යැව්වෙමි.
5 එවිට සන්බලට් තමෙ ඒ අයුරින් ම සිය
සේවකයා අත විවෘත ලිපියක් පස් වන වරට මා
වෙත එවුවේ ය. 6 එහි මෙසේ ලියා තිබුණේ ය:
"ඔබත්, ජුදෙව්වරුනුත් කැරලිගසන්නට සිතන බව
මේ ජාතීන් අතරෙහි සැළ වී තිබේ. ගෂ්මු තමෙමේ ද
එය අනුමත කරයි. ඔබ පවුර ගොඩනඟන්නේ ඒ
නිසා බවත්, මයොකාරයෙන් ඔබ ඔවුන්ගේ රජ

වන්නට සිතන බවත් ඒ වාර්තාවනේ පනේ. 7 තවද,
ජුදාහි රජකේ සිටී යි කියමින් ඔබ ගැන ම
ජරුසලමහෙි නිවදේනයක් කරනු පිණිස
දිවැසිවරුන්ට නියම කර ඇත. ඉතින් මේ ගැන
රජ්ජුරුවන්ට සත්තකින් ම ආරංචි වනු ඇත. ඒ නිසා
එන්න, අපි එක් ව මන්ත්‍රණය කරගනිමු.”
8 මීට පිළිතුරක් වශයනේ මම පණිවුඩයක් යවමින්,
“ඔබ කියන ඔය කිසිවක් සිදු වී නැත. ඔබ ඒවා
සිතින් මවාගනෙ ඇතැ”යි කීමි.
9 අපි අපේ වැඩ අතපසු කර, ඒ හතේුවනේ ඒ
වැඩය කිසි කලක නිම කරනු නොලැබේ ය යන
බලාපොරොත්තුවනේ ඔව්හු සියල්ලෝ ම අප බිය
ගන්වන්නට උත්සාහ කළෝ ය. එහතේ, “දවේියන්
වහන්ස, දැන් මාගේ අත් ශක්තිමත් කළ මැනව.”
10 ඉක්බිති මම මහෙතොබල්ගේ පුත් දලොයාගේ
පුත්‍රයා වන ෂමොයාගේ ගදෙරට ගියමේි. එසේ
ගියේ ඔහුට මා වතෙ එන්නට නොහැකි වූ බැවිනි.
එවිට ඔහු මා අමතා, “අපි එක් ව දවේියන්
වහන්සගේේ මාලිගාව ඇතුළට ගොස්
ශුද්ධස්ථානයේ දොරවල් වසාගනෙ සිටිමු. මන්ද,
ඔවුන් ඔබ මරන්නට එනු ඇත. ඔබ මරන්නට ඔව්හු
අද රාත්‍රියේ ම එති”යි කීවේ ය.
11 මම ද උත්තර දමේින්, “මා වැනි කනෙකු පලා
යන්නට සුදුසු ද? මා වැනි කවරකේ ජීවිතය
ගළවාගන්න පිණිස දවේ මාලිගාවට ඇතුළු වේ ද?
මම ඇතුළු නොවන්නමේ”යි කීවමේි.
12 ඒ ගැන මා සිතා බැලූ විට, දවේියන් වහන්සේ
ඔහු නොඑවූ බවත්, ටොබියා ද සන්බලට් ද ඔහුට
අල්ලස් දුන් නිසා ඔහු මා ගැන ඒ අනාගත වචනය
කී බවත් මට වැටහිණි. 13 ඔවුන් ඔහුට අල්ලස්
දුන්නේ, මා භය වී, කී ලසෙ කර පව්කරන පිණිසත්
එවිට මට නරක නමක් ලැබී, මට අපහාස වන
පිණිසත් ය.
14 “මාගේ දවේියන් වහන්ස, ටොබියා ද සන්බලට්
ද කළ මේ ක්‍රියා නිසා, ඔවුන් සහ දිවැසිවරිය වන
නෝවදියා ද මා බිය ගන්වන්නට උත්සාහ කළ
අනකේ දිවැසිවරුන් ද අමතක නොකරන්න.”

## පවුර සාදා නිම කිරීම

15 පණස් දදෙවසකින් එලුල් මාසයේ විසිපස් වන
දා පවුරේ වැඩ නිම කරන ලදී. 16 අපේ සියලු
සතුරන් ඒ බව ඇසූ විට ද අප අවට සිටි සියලු
ජාතීන් එය දුටු විට ද එය විස්මයජනක යැයි සිතා,
මේ වැඩය ඉටු වුණේ අපේ දවේියන් වහන්සගේේ
උපකාරයනේ බව ඔව්හු තරේුම්ගත්හ.
17 තවද, ඒ දවස්වල දී ජුදාහි නායකයෝ ලියුම්
බොහොමයක් ටොබියාට යැව්වෝ ය. ටොබියාගනේ
ද ඔවුන්ට ලියුම් ලැබුණේ ය. 18 කුමක් නිසා ද ඔහු
ආරාගේ පුත් ෂකෙනියාගේ බෑණා නිසාත්, ඔහුගේ
පුත් ජහෝහානාන් බරෙකේියාගේ පුත් මෂුෙල්ලාම්ගේ
දුව පාවාගනෙ සිටි නිසාත්, ජුදාහි බොහෝ දනෙකේ
ඔහු සමඟ දිවුරුමකින් බැඳී සිටියෝ ය. 19 තවද,
ඔහුගේ හොඳ ක්‍රියා ගැන ඔව්හු මා ඉදිරියහෙි දී
කීවෝ ය. මාගේ වචනය ද ඔහුට දැන්නුවෝ ය.
ටොබියා ද මා බිය ගන්වන පිණිස ලියුම් එවුවේ ය.

## නුවර ආරක්ෂා කිරීමට විධිවිධාන

7 පවුර ගොඩනැඟුවාට පසු මම දොරවල්
පිහිටවේවමේි. දොරටු පාලකයෝ ද
ගායනාකාරයෝ ද ලවේවරු ද පත් කරනු ලැබූ හ.
2 ඉන්පසු මම මාගේ සහෝදර වූ හනානි ද
බලකොටුවේ අධිපතියා වූ හනනියා ද ජරුසලමේ
පරිපාලනයට පත් කළෙමේි. කුමක් නිසා ද, හනනියා
බොහෝ මිනිසුන්ට වඩා විශ්වාස වූ දවේියන්
වහන්සේ කරෙහෙි ගරුබිය ඇති කනෙකු වී සිටියේ
ය. 3 මම ඔවුන්ට කතා කොට, “අවු රස්නය සැර
වන්නට පරෙ ජරුසලමේ දොරවල් අරින්න
නොදනේන. ඔවුන් මුර කරන අතර ම දොරවල් වසා
පොලු දමා තිබිය යුතු ය. ජරුසලමේ වැසියන්ගනේ
සමහරකු මුර වැඩවලට ද අන් සමහරකු
ඔවුන්ගේ ගවෙල් ඉදිරිපිට ද මුරට යොදවා ගත යුතු
ය”යි කීවමේි.

## බබිලෝනියනේ පැමිණි අයගේ නම්

(එස්රා 2:1-70)

4 නගරය පළල් ව විශාල ව තිබුණේ ය. එහතේ,
එහි විසූ සනෙඟ ස්වල්ප ය. ගවෙල් ගොඩනඟා
තිබුණේ නැත. 5 එවිට පළපෙත් වශයනේ ජන
සංගණනයක් කරන පිණිස උත්තමයන් ද නිලධාරීන්
ද සනෙඟ ද රැස් කරවන්නට මාගේ දවේියන්
වහන්සේ මාගේ සිතහෙි අදහසක් ඇති කළ සකේ.
පළමුවනේ ම ආ අයගේ පළපෙත් ලබේනය මට
සම්බ විය. එහි මසෙේ ලියා තිබුණි.
6 බබිලෝනියේ රජ වූ නබෙුකද්නසෙර් විසින්
ගනෙයනු ලැබූ බොහෝ දනෙකේ වහල්කමනේ මිදී
බබිලෝනියේ සිට ජරුසලමටත් ජුදාහි තම
තමන්ගේ නගරවලටත් පැමිණියහ. 7 ඔවුන්ගේ
ප්‍රධානියෝ සරුබ්බාබලේ ද ජෝෂුවා ද නහෙමියා
ද අශරියා ද රයමියා ද නහමානි ද මොර්දකෙයි ද
බිල්ෂාන් ද මිස්පරෙතේ ද බිග්වායි ද නහෙුම් ද බානා
ද යන මොවුහු වතෙි.
8 ඉශ්‍රායලේ සනෙඟ වූ මනුෂ්‍යයන්ගේ ගණන
මසෙේ ය: පරොෂ්ගේ පුත්‍රයෝ දදොස් එකසිය
හැත්තෑදදෙනෙකේ ය. 9 ෂපෙටියාගේ පුත්‍රයෝ
තුන්සිය හැත්තෑදදෙනෙකේ ය. 10 ආරාගේ පුත්‍රයෝ
හයසිය පණස්දදෙනෙකේ ය. 11 පාහත්-මෝවබ්ගේ
පුත්‍රයන් වූ ජෂේුවාගේ ද ජෝවාබ්ගේ ද පුත්‍රයෝ
දදොස් අටසිය දහඅටදනෙකේ ය. 12 ඒලාම්ගේ
පුත්‍රයෝ එක්දාස් දසෙිය පණස්හතරදනෙකේ ය.
13 ශට්ටුගේ පුත්‍රයෝ අටසිය හතළිස්පස්දනෙකේ ය.
14 ශක්කයිගේ පුත්‍රයෝ හත්සිය හැටදනෙකේ ය.
15 බින්නුයිගේ පුත්‍රයෝ හයසිය හතළිස්අටදනෙකේ
ය. 16 බබේයිගේ පුත්‍රයෝ හයසිය විසිඅටදනෙකේ
ය. 17 අශ්ගාද්ගේ පුත්‍රයෝ දදොස් තුන්සිය
විසිදදෙනෙකේ ය. 18 අදොනිකාම්ගේ පුත්‍රයෝ
හයසිය හැටහත්දනෙකේ ය. 19 බිග්වායිගේ

පුත්‍රයෝ දෙදොස් හැටහත්දෙනෙක් ය. 20 ආදීන්ගේ
පුත්‍රයෝ හයසිය පණස්පස්දෙනෙක් ය.
21 හසෙකියාගේ වංශයට අයිති වූ ආටේරගේ
පුත්‍රයෝ අනූඅටදෙනෙක් ය. 22 හාෂුම්ගේ පුත්‍රයෝ
තුන්සිය විසිඅටදෙනෙක් ය. 23 බේශායිගේ පුත්‍රයෝ
තුන්සිය විසිහතරදෙනෙක් ය. 24 හාරිප්ගේ පුත්‍රයෝ
එකසිය දොළොස්දෙනෙක් ය. 25 ගිබියොන්හි
පුත්‍රයෝ අනූපස්දෙනෙක් ය.
26 බෙත්ලෙහෙමේ සහ නෙටොපාහි මනුෂ්‍යයෝ
එකසිය අසූඅටදෙනෙක් ය. 27 අනාතොත්හි
මනුෂ්‍යයෝ එකසිය විසිඅටදෙනෙක් ය. 28 බෙත්-
අශ්මාවෙත්හි මනුෂ්‍යයෝ හතළිස්දෙදෙනෙක් ය.
29 කිරියත්-ජෙයාරීම්හි ද කෙපීරාහි ද බෙයේරොත්හි
ද මනුෂ්‍යයෝ හත්සිය හතළිස්තුන්දෙනෙක් ය.
30 රාමාහිත්, ගෙබාහිත් මනුෂ්‍යයෝ හයසිය
විසිඑක්දෙනෙක් ය. 31 මික්මාස්හි මනුෂ්‍යයෝ
එකසිය විසිදෙදෙනෙක් ය. 32 බෙතෙල්හි ද ආයිහි ද
මනුෂ්‍යයෝ එකසිය විසිතුන්දෙනෙක් ය. 33 අනික්
නෙබෝහි මනුෂ්‍යයෝ පණස්දෙදෙනෙක් ය. 34 අනික්
ඒලාම්හි පුත්‍රයෝ එක්දාස් දෙසිය
පණස්හතරදෙනෙක් ය. 35 හාරීම්හි පුත්‍රයෝ
තුන්සිය විසිදෙනෙක් ය. 36 ජෙරිකෝවේ පුත්‍රයෝ
තුන්සිය හතළිස්පස්දෙනෙක් ය. 37 ලෝද්හි ද හාදිද්හි
ද ඕනෝහි ද පුත්‍රයෝ හත්සිය විසිඑක්දෙනෙක් ය.
38 සෙනායාහි පුත්‍රයෝ තුන්දාස් නවසිය තිස්දෙනෙක්
ය.
39 පූජකයෝ නම්: ජේෂුවාගේ වංශයේ
ජෙදායාගේ පුත්‍රයෝ නවසිය හැත්තෑතුන්දෙනෙක්
ය. 40 ඉම්මේරගේ පුත්‍රයෝ එක්දාස්
පණස්දෙදෙනෙක් ය. 41 පෂ්හූර්ගේ පුත්‍රයෝ
එක්දාස් දෙසිය හතළිස්හත්දෙනෙක් ය. 42 හාරීම්ගේ
පුත්‍රයෝ එක්දාස් දහහත්දෙනෙක් ය.
43 ලෙවීවරු නම්: හෝදවාගේ පුත්‍රයන්ගෙන්
කෙනෙකු වූ කද්මියෙල්ගෙන් පැවත ආ ජේෂුවාගේ
පුත්‍රයෝ හැත්තෑහතරදෙනෙක් ය.
44 ගායනාකාරයන් වූ ආසාප්ගේ පුත්‍රයන් එකසිය
හතළිස්අටදෙනෙක් ය. 45 දොරටු පාලකයන් වූ
ෂල්ලුම්ගේ පුත්‍රයෝ ද ආටේරගේ පුත්‍රයෝ ද
ටල්මොන්ගේ පුත්‍රයෝ ද අක්කුබ්ගේ පුත්‍රයෝ ද
හටීටාගේ පුත්‍රයෝ ද ෂෝබයිගේ පුත්‍රයෝ ද
එකසිය තිස්අටදෙනෙක් ය.
46 දේව මාලිගාවේ සේවකයන් වන නේතිනීම්වරු
නම්: ශීහාගේ පුත්‍රයෝ ය; හසූපාගේ පුත්‍රයෝ ය;
ටබ්බාවොත්ගේ පුත්‍රයෝ ය; 47 කේරොස්ගේ
පුත්‍රයෝ ය; සියාගේ පුත්‍රයෝ ය; පාදොන්ගේ
පුත්‍රයෝ ය; 48 ලෙබානාගේ පුත්‍රයෝ ය;
හගාබාගේ පුත්‍රයෝ ය; සල්මයිගේ පුත්‍රයෝ ය;
49 හානාන්ගේ පුත්‍රයෝ ය; ගිද්දෙල්ගේ පුත්‍රයෝ
ය; ගහර්ගේ පුත්‍රයෝ ය; 50 රෙයායාගේ පුත්‍රයෝ
ය; රෙශීන්ගේ පුත්‍රයෝ ය; නෙකෝදාගේ පුත්‍රයෝ
ය; 51 ගශ්ශාම්ගේ පුත්‍රයෝ ය; උස්සාගේ පුත්‍රයෝ
ය; පසේයාගේ පුත්‍රයෝ ය; 52 බේසයිගේ
පුත්‍රයෝ ය; මෙයුනිම්ගේ පුත්‍රයෝ ය;
නෙපුෂසීම්ගේ පුත්‍රයෝ ය; බක්බූක්ගේ පුත්‍රයෝ
ය; 53 හකුපාගේ පුත්‍රයෝ ය; හර්හූර්ගේ පුත්‍රයෝ
ය; 54 බශ්ලීත්ගේ පුත්‍රයෝ ය; මෙහිදාගේ
පුත්‍රයෝ ය; හර්ෂාගේ පුත්‍රයෝ ය;
55 බර්කොස්ගේ පුත්‍රයෝ ය; සීසෙරාගේ පුත්‍රයෝ
ය; තාමාගේ පුත්‍රයෝ ය; 56 නෙෂියාගේ පුත්‍රයෝ
ය; හටීපාගේ පුත්‍රයෝ ය.
57 සලමොන්ගේ සේවකයන්ගේ පුත්‍රයෝ නම්:
සෝටයිගේ පුත්‍රයෝ ය; සොපෙරෙත්ගේ පුත්‍රයෝ
ය; පෙරීදාගේ පුත්‍රයෝ ය; 58 ජයලාගේ පුත්‍රයෝ
ය; දර්කොන්ගේ පුත්‍රයෝ ය; ගිද්දෙල්ගේ පුත්‍රයෝ
ය; 59 ෂෙපටියාගේ පුත්‍රයෝ ය; හට්ටිල්ගේ
පුත්‍රයෝ ය; පොකෙරෙත්-හශ්ශෙබායිම්ගේ
පුත්‍රයෝ ය; ආමොන්ගේ පුත්‍රයෝ ය;
60 දේව මාලිගාවේ සේවකයන්ගේ ද
සලමොන්ගේ සේවකයන්ගේ පුත්‍රයෝ ද සියල්ලෝ
තුන්සිය අනූදෙදෙනෙක් ය.
61 තේල්-මෙලෙහෙනේ ද තේල්-හර්ෂායනේ ද
කෙරුබනේ ද අද්දෝනනේ ද ඉම්මෙරෙනේ ද ආ, තමන්
ඉශ්රායෙල්වරුන් බවට තමන්ගේ පිය වංශයත්,
තමන්ගේ පෙළපතත් පෙන්වන්නට බැරි වූ අය නම්:
62 දෙලායාගේ පුත්‍රයෝත්, ටෝබියාගේ
පුත්‍රයෝත්, නෙකෝදාගේ පුත්‍රයෝත් හයසිය
හතළිස්දෙදෙනෙක් ය.
63 පූජකයන්ගෙන් හබායාගේ පුත්‍රයෝත්,
හක්කොශ්ගේ පුත්‍රයෝත් ගිලියද්දිය බර්සිල්ලයිගේ
දූවරුන්ගෙන් භාර්යාවක පාවාගෙන ඔවුන්ගේ නාමය
ලැබූ බර්සිල්ලයිගේ පුත්‍රයෝත් ය. 64 නාම සටහන්
වූ තමන්ගේ පෙළපත් ලේඛනය සෙව්වේ නමුත්, සම්බ
නොවූ බැවින් මොවුහු අපවිත්‍ර අය ලෙස
ගණන්ගන්න ලදුව පූජකකමෙන් ඉවත් කරනු
ලැබුවෝ ය. 65 නික්ම 23:30; ද්වි.නී. 33:8ඌරිම් සහ
තුම්මිම් ඇති පූජකයන් නැඟිටින තුරු ඔවුන් ඉතා
ශුද්ධ දේවල් නොකෑ යුතු යයි තිර්ෂාතා තෙමේ
ඔවුන්ට කීවේ ය.
66 මුළු සභාවේ ගණන නම්, හතළිස්දෙදාස් තුන්සිය
හැටක් ය. 67 ඒ හැර ඔවුන්ගේ වැඩකාරයෝත්,
වැඩකාරියෝත් හත්දාස් තුන්සිය තිස්හත්දෙනෙක්
වූවෝ ය. ඔවුන් අතරේ ගායක ගායිකාවෝ දෙසිය
හතළිස්පස්දෙනෙක් සිටියෝ ය. 68 ඔවුන්ගේ
අශ්වයෝ හත්සිය තිස්හයදෙනෙක් ය. ඔවුන්ගේ
අශ්වතරයෝ දෙසිය හතළිස්පස්දෙනෙක් ය.
69 ඔටුවෝ හාරසිය තිස්පස්දෙනෙක් ය. කොටළුවෝ
හයදාස් හත්සිය විසිදෙනෙක් ය.

## වැඩය සඳහා පඩුරු දීම

70 තවද, පවුල්වල ප්‍රධානීන් අතරෙන් සමහරු
වැඩයට දායකයෝ වූ හ. තිර්ෂාතා රන් කිලෝග්‍රෑම්
අටකුත්, පාත්‍රා පණසකුත්, පූජක ඇඳුම් පන්සිය
තිහකුත් ගබඩාවට දුන්නේ ය. 71 පිය වංශවල
ප්‍රධානීන්ගෙන් සමහරු රන් කිලෝග්‍රෑම් එකසිය
හැටඅටකුත්, රිදී කිලෝග්‍රෑම් එක්දාස් දෙසිය
පණහකුත් වැඩ සඳහා ගබඩාවට දුන්නෝ ය.
72 සෙනඟගෙන් ඉතිරි අය දුන්නේ, රන් කිලෝග්‍රෑම්

එකසිය හැටඅටකුත්, රිදී කිලෝග්‍රෑම් එකසිය
හතළිසකුත්, පූජක ඇඳුම් හැටහතකුත් ය.
73 1 වංශා 9:2; නහෙ 11:3 මෙසේ පූජකයෝ ද
ලෙවීවරු ද දොරටු පාලකයෝ ද ගායනාකාරයෝ ද
සෙනඟගනේ සමහරු ද දේව මාලිගාවේ සේවකයෝ
ද සියලු ඉශ්‍රායලේවරු ද තම තමන්ගේ නගරවල
විසූහ.

### ව්‍යවස්ථා පොත කියවා තේරුම් කර දීම

8 හත් වන මස පළමු වන දවස පැමිණි කල
ඉශ්‍රායලේ සෙනඟ තමන්ගේ නගරවල
සිටියෝ ය. මුළු සෙනඟ ද එක් කෙනෙකු මෙන් වතුර
දොරටුව ඉදිරිපිට චතුරශ්‍රයෙහි රැස් වූ හ. එවිට
ඔව්හු සමිඳාණන් වහන්සේ විසින් ඉශ්‍රායලේවරුන්ට
අණ කරන ලද මෝසෙස්ගේ ව්‍යවස්ථා පොත
ගෙනෙන්නට නීතිවේදියා සහ පූජකයා වන එස්රාට
කී හ. 2 පූජකයා වන එස්රා ද හත් වන මාසයේ
පළමු වන දා සභාව එනම්, පුරුෂයන් ද ස්ත්‍රීන් ද
තේරුම්ගන්නට පුළුවන් වයසට පැමිණි දරුදැරියන් ද
ඉදිරිපිට ව්‍යවස්ථා පොත ගෙනෙවුත්, 3 වතුර
දොරටුව ඉදිරියේ තිබුණු චතුරශ්‍රය ඉදිරිපිට සිට,
ස්ත්‍රී පුරුෂයන් ද තේරුම්ගත හැකි වයසට පැමිණි
දරුදැරියන් ද ඉදිරියේ දී අලුයම් වේලේ පටන් ඉර
මුදුන් වේලාව දක්වා ඒ පොත කියවෙව්වේ ය. මුළු
සෙනඟ ද ව්‍යවස්ථා පොතට සවන් දුන්හ.
4 ව්‍යවස්ථා පොත කියවීම පිණිස සාදන ලද
වේදිකාවක් පිට නීතිවේදියා වන එස්රා සිටියේ ය.
ඔහු ළඟ ඔහුගේ දකුණු පැත්තනේ මත්තිතියා ද
ෂෙමා ද අනායා ද උරියා ද හිල්කියා ද මයසේයා ද;
වම් පැත්තනේ පදොයා ද මීෂායලේ ද මල්කියා ද
හාෂුම් ද හෂ්බද්දානා ද ශකෙරියා ද මෙෂුල්ලාම් ද
සිටියෝ ය.
5 මුළු සෙනඟට වඩා උස් තැනක සිටි එස්රා මුළු
සෙනඟ ඉදිරියෙහි පොත දිග ඇරියේ ය. ඔහු එය
දිග අරින විට සෙනඟ සියලු දෙන නැඟිට සිටියෝ ය.
6 එස්රා අති උත්තම දෙවී සමිඳාණන් වහන්සේට
ප්‍රශංසා කළේ ය. මුළු සෙනඟ ද අත් ඔසවමින්,
“එසේ ම වේ වා!” කියා හිස් නමා මුණින්තලා වී
සමිඳාණන් වහන්සේට නමස්කාර කළෝ ය.
7 තවද, ජේෂුවා ද බානී ද ෂෙරෙබියා ද ජාමීන් ද
අක්කුබ් ද ෂබ්බතෙයි ද හෝදියා ද මයසේයා ද
කලේටා ද අශරියා ද ජොශාබාද් ද හානාන් ද
පලොයා ද යන ලෙවීවරු ද සෙනඟ ඔවුන් සිටි
තැන්වල නැවතී සිටිය දී ම ඔවුන්ට ව්‍යවස්ථාව
තේරුම් කර දුන්හ. 8 මෙසේ ඔව්හු දෙවියන්
වහන්සේගේ ව්‍යවස්ථා පොත පැහැදිලි ලෙස කියවා
එහි අර්ථය තෝරා දුන්හ. මිනිස්සු ද කියවූ දේ
තේරුම් ගත්හ.
9 තිර්ෂාතා වූ නහෙමියා ද නීතිවේදියා වූ පූජක
එස්රා ද සෙනඟට ඉගැන්වූ ලෙවීවරු ද මුළු සෙනඟට
කතා කොට, “අද දින ඔබ හැමගේ දෙවී සමිඳාණන්
වහන්සේට ශුද්ධ දිනයක් ය. වැලපෙන්නට වත්,
අඬන්නට වත් එපා ය”යි කී හ. එසේ කීවේ, මුළු
සෙනඟ ව්‍යවස්ථාවේ වචන ඇසූ කල ඇඬූ බැවිනි.
10 එවිට ඔහු ඔවුන්ට කතා කොට, “ඔබ ගොස්
රසවත් දේවල් කා, මිහිරි පානය බී, කිසිවක් සූදානම්
කර නොගත් අයට ආහාර පංගු යවන්න. කුමක්
නිසා ද අද දින අපේ සමිඳාණන් වහන්සේට ශුද්ධ
දිනයකි. ශෝක නොවෙන්න. මන්ද, සමිඳාණන්
වහන්සේ කෙරෙහි ප්‍රීති වීම ඔබේ ශක්තිය වේ
ය”යි කී ය.
11 ලෙවීවරු ද කතා කරමින්, “අද දවස ශුද්ධ
දිනයක් නිසා, නිශ්ශබ්ද වන්න. ශෝක නොවෙන්නැ”යි
මුළු සෙනඟ නිශ්චල කළෝ ය. 12 එසේ සෙනඟ
සියලු දෙන කන්නටත්, බොන්නටත්, කෑම පංගු
යවන්නටත්, බොහෝ සේ ප්‍රීතිවන්නටත් පිටත් වී
ගියෝ ය. කුමක් නිසා ද ඔවුන් ප්‍රකාශ කළ වචන
ඔව්හු තේරුම් ගත්තෝ ය.

### කූඩාරම් මංගල්‍යය යළිත් පිහිටු වීම

13 දෙ වන දා මුළු සෙනඟගේ පිය වංශවල
ප්‍රධානීහු ද පූජකයෝ ද ලෙවීවරු ද නව ව්‍යවස්ථාව
උගනීම පිණිස නීතිවේදියා වූ එස්රා වෙත රැස් වූ
හ. 14 එවිට හත් වන මාසයේ පවත්වන
මංගල්‍යයේ දී ඉශ්‍රායලේ සෙනඟ පැල්පත්වල වාසය
කළ යුතුය කියා සමිඳාණන් වහන්සේ මෝසෙස්
මඟින් ආඥා කළ බව ව්‍යවස්ථාවේ ලියා තිබෙනු
ඔවුන්ට සම්බ විය. 15 ලෙවී 23:33-36,39-43; ද්වි.නී.
16:13-15මයෙ දැනගන්නට ලැබුණු වහා ම, ඔව්හු
ඔවුන්ගේ නගරවල ද ජෙරුසලමහෙි ද ප්‍රකාශනයක්
කළෝ ය. ඒ මෙසේ ය: “පොතේ ලියා තිබෙන
ලෙස, පැල්පත් සාදනු පිණිස ඔබ කඳුකරයට ගොස්,
ඔලීව අතු ද වල් ඔලීව අතු ද මරඳ අතු ද තල් අතු
ද අතු ඝන ව තිබෙන ගස්වල අතු ද ගෙනෙන්න.”
16 එබැවින් සෙනඟ ගොස් ඒවා ගෙනෙවුත් එක්
එක්කෙනා තම තමාගේ පියස්ස උඩත්, තමන්ගේ
මිදුල්වලත්, දෙවියන් වහන්සේගේ මාලිගාවේ
මිදුල්වලත්, වතුර දොරටුව චතුරශ්‍රයේත්, එප්‍රායිම්
දොරටුවේ එළිමහනේත් පැල්පත් සාදාගත්තෝ ය.
17 විප්‍රවාසයෙන් මිදී ආ අයගනේ යුත් මුළු සභාව
පැල්පත් සාදාගෙන පැල්පත්වල විසුවෝ ය. නූන්ගේ
පුත් ජෝෂුවාගේ දවස්වල පටන් ඒ දවස දක්වා
ඉශ්‍රායලේ සෙනඟ මෙවෙන්නක් කර තිබුණේ නැත.
ඒ නිසා ඉමහත් සන්තෝෂයක් ද විය. 18 තවද, පළමු
වන දා පටන් අන්තිම දවස දක්වා එස්රා දවසින්
දවස දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථා පොත
කියවෙව්වේ ය. ඔව්හු සත් දවසක් මංගල්‍යය
පැවැත්වූවෝ ය. අට වන දා නියමය ලෙස,
ගරුගාම්භීර මංගල රැස්වීමක් පවත්වනු ලැබී ය.

### සෙනඟ පාපෝච්චාරණය කිරීම

9 තවද, ඒ මාසයේ විසිහතර වන දා ඉශ්‍රායලේ
සෙනඟ නිරාහාර ව ගෝණි රෙදි හැඳ,
තමන්ගේ හිස පිට පස් ලා ගෙන, උපවාසයක් සඳහා
රැස් වූ හ. 2 ඉශ්‍රායලේ ජාතිය අන්‍ය සියලු
ජාතීන්ගනේ වෙන් වී, තමන්ගේ පව් ද තමන්ගේ

පියවරුන්ගේ අපරාධ ද ප්‍රකාශ කළහ. 3 ඔව්හු
තමන්ගේ ස්ථානයෙහි නැඟිට සිට, දවසනේ
හතරනේ කොටසක් තුළ තමන්ගේ දවේ සමිඳාණන්
වහන්සේගේ ව්‍යවස්ථා පොත කියවේවෝ ය; තවත්
හතරනේ කොටසක් තුළ එකිනකො පාපෝච්චාරණය
කර, දවේ සමිඳාණන් වහන්සේට නමස්කාර කළෝ
ය.
4 එවිට ජේෂුවා ද බානී ද කද්මීයලේ ද ෂබෙනියා
ද බුන්නී ද ෂරෙබ්යා ද බානී ද කනොනි ද
ලවේවරුන්ගේ වේදිකාවේ උඩ සිට මහා හඬකින්
තමන්ගේ දවේ සමිඳාණන් වහන්සේට යාච්ඤා
කළෝ ය.
5 පසුව ජේෂුවා ද කද්මීයලේ ද බානී ද හෂබ්නයො
ද ෂේරබ්යා ද හෝදියා ද ෂබෙනියා ද පතෙහියා ද
යන ලවේවරු කතා කොට, “ඔබ නැඟිට ඔබේ දවේ
සමිඳාණන් වහන්සේට සදාකාලයනේ සදාකාලයට
ප්‍රශංසා කරන්න. එසේ ය, සියලු ප්‍රශංසා හා
වර්ණනා ඉක්මවා ඇති ඔබේ තේජාන්විත නාමයට
ප්‍රශංසා වේවා”යි කී හ.

## පාපෝච්චාරණ යැදුම

6 එස්රා මසෙේ යාච්ඤා කළෙේ ය: “ඔබ ම, ඔබ
පමණක් ම සමිඳාණන් වහන්සේ ය. ඔබ ස්වර්ගය ද
ස්වර්ගවල ස්වර්ගය ද එහි සියලු ග්‍රහතාරකා ද
පොළොව සහ එය මතුපිට ඇති සියල්ල ද සත්
සමුදුර සහ එහි ඇති සියල්ල ද මැවූ සේක. ඔබ ම
ඒ සියල්ල ආරක්ෂා කරන සේක. ග්‍රහතාරකාවෝ ද
ඔබට නමස්කාර කරති. 7 උත් 11:31; 12:1; 17:5ඔබ
වනාහි ආබ්‍රම් තෝරාගනෙ, ඌර් නම් කල්දිවරුන්ගේ
නුවරින් ඔහු ගනෙවුත්, ආබ්‍රහම් යන නම ඔහුට
තැබූ දවේ සමිඳාණන් වහන්සේ ය. 8 උත්
15:18-21ඔබ ඉදිරියෙහි ඔහු විශ්වාසවන්ත ව සිටින
බව දැක, ඔබ කානානිවරුන්ගේ ද හිත්තීවරුන්ගේ ද
අමෝරිවරුන්ගේ ද පරෙිස්සිවරුන්ගේ ද
ජබුෙසිවරුන්ගේ ද ගිර්ගාෂිවරුන්ගේ ද දේශය
දනේනට, ඔහුගේ වංශයට දනේනට ඔහු සමඟ
ගිවිසුමක් කර ඔබේ පොරොන්දුව ඔබ ඉෂ්ට කළ
සේක. කුමක් නිසා ද ඔබ ධර්මිෂ්ඨ ය.
9 නික්ම 3:7; 14:10-12 “තවද, මිසරයේ දී අපේ
පියවරුන්ගේ පීඩාව ඔබ දුටු සේක. රතු මුහුද ළඟ දී
ඔවුන්ගේ මොරගැසීම ද ඔබ ඇසූ සේක. 10 නික්ම
7:8—12:32පාරාවෝට ද ඔහුගේ සියලු සේවකයන්ට
ද ඔහුගේ දේශයේ මුළු සනෙඟට ද විරුද්ධ ව
හාස්කම් හා අරුමපුදුම දේ කර වදාළ සේක. කුමක්
නිසා ද ඔවුන්ට විරුද්ධ ව ඒ අය උඩඟුකම් කරන
බව ඔබ දැනගනෙ සිටි සේක. ඔබ ද අද දක්වා
පවතින කීර්තිමත් නාමයක් දිනාගත් සේක.
11 නික්ම 14:21-29; 15:4-5තවද ඔවුන් මුහුද මැදින්
වියළි බිම පිට යන ලසෙ ඔවුන්ට පරෙටුවනේ ඔබ
මුහුද දබෙෑ කළ සේක. ඔවුන් පසුපස ලුහුබැඳගනෙ
ආ අය ඔබ මහා ජලයෙහි ගලක් දමන ලසෙ
ගැඹුරට හළෙූ සේක. 12 නික්ම 13:21-22ඔබ දවල්
වලා ටැඹකින් ද ඔවුන් යන මාර්ගයෙහි දී ඔවුන්ට
එළිය දනෙ පිණිස රෑ ගිනි ටැඹකින් ද ඔවුන් ගනෙ
ගිය සේක. 13 නික්ම 19:18—23:33ඔබ සීනයි කන්ද
පිටට බැස, ස්වර්ගයේ සිට ඔවුන් සමඟ කතා කර,
සාධාරණ විනිශ්චයයන් ද සැබෑ ව්‍යවස්ථාවන් ද සුදුසු
පණත් ද ආඥා ද ඔවුන්ට දුන් සේක.
14 “ඔබේ මහෙකෙරු වූ මෝසසේ මඟින් ඔබේ
ශුද්ධ සබත් දවස් ද ඔබ ඔවුන්ට දන්වා, ආඥාවන් ද
ව්‍යවස්ථාවන් ද ඔවුන්ට නියම කළ සේක. 15 නික්ම
16:4-15; 17:1-7; ද්වි.නී. 1:21ඔවුන්ගේ කුසගින්නට
ඔබ ස්වර්ගයනේ ඔවුන්ට ආහාර දුන් සේක.
ඔවුන්ගේ පිපාසයට පර්වතයනේ ඔවුන්ට වතුර
නික්ම වූ සේක. 16 ගණන් 14:1-4; ද්වි.නී.
1:26-33ඔබ ඔවුන්ට දනෙ බවට දිවුරුම් දුන් දේශය
හිමි කරගැනීමට ඇතුළුවන්නට කියා ද ඔවුන්ට අණ
කළ සේක. එහතේ, අපේ පියවරු මුරණ්ඩු ව ඔබේ
ආඥාවන්ට අකීකරු වූ හ. 17 නික්ම 34:6; ගණන්
14:18ඔව්හු කීකරු වන්නට අකමැති වී, ඔවුන් අතරේ
ඔබ කළ පුදුම දේ සිහි නොකර, මුරණ්ඩු ව සිටිමින්,
පරෙළා වහල්කමට යන පිණිස තමන්ගේ
ප්‍රධානියකු පත් කරගත්හ. එහතේ, ඔබ කමා වන,
දයාබර, අනුකම්පාවනේ පූර්ණ, ඉවසිලිවන්ත,
කරුණාහරිත දවේ කනෙකෙු බැවින් ඔබ ඔවුන් අත්
නොහැරිය සේක. 18 නික්ම 32:1-4එපමණක් නොව,
ඔව්හු තමන්ට වාත්තු වස්සකෙු සාදාගනෙ
‘මිසරයනේ ඔබ ගනො ඔබේ දවේයන් වහන්සේ මේ
ය’යි මහා දේව අපහාසයක් කළ විටත්, 19 ද්වි.නී.
8:2-4ඔබේ මහානුකම්පාව නිසා ඔබ ඔවුන්
පාළුකරයෙහි අත් නොහැරිය සේක. මාර්ගයේ ඔවුන්
ගනෙ ගිය වලා ටැඹ දවාලේ වත්, ඔවුන් යා යුතු
මාර්ගයේ දී ඔවුන්ට එළිය දුන් ගිනි ටැඹ රාත්‍රියේ
වත් ඔවුන් කරෙනේ පහ නොවී ය. 20 ඔවුන්ට
ගුරුකම් දනෙ පිණිස ඔබේ යහපත් ආත්මානුභාවය
ඔබ ඔවුන්ට දුන් සේක. ඔවුන්ගේ ආහාරය වූ
මන්නා ඔබ ඔවුන්ගනේ අහක් කර නොගත් සේක.
ඔවුන්ගේ පිපාසයේ දී ඔබ ඔවුන්ට වතුර දුන් සේක.
21 එසේ ය, ඔබ හතළිස් අවුරුද්දක් පාළුකරයේ දී
ඔවුන් පෝෂණය කළ සේක. ඔවුන්ට කිසි
අගහිඟයක් නොවී ය. ඔවුන්ගේ ඇඳුම් පරණ
වුණේ වත්, ඔවුන්ගේ පාද ඉදිමුණේ වත් නැත.
22 ගණන් 21:21-35 “තවද, ඔබ රාජ්‍යයන් ද
ජනයන් ද ඔවුන්ට දී, ඔවුන් පළාත්වලට බදො නියම
කළ සේක. මසෙේ ඔව්හු සීහොන්ගේ දේශයත්
එනම්, හෙෂ්බොන්හි රජුගේ දේශයත්, බාෂාන්හි රජ
වූ ඕග්ගේ දේශයත් හිමි කරගත්තෝ ය. 23 උත්
15:5; 22:17; ජෝෂු 3:14-17ඔබ අහසේ තාරකා මනේ
ඔවුන්ගේ දරුවන් වැඩිකර, හිමි කරගන්නට ඔවුන්ට
ඇතුළු විය යුතු ය කියා ඔබ ඔවුන්ගේ පියවරුන්ට කී
දේශයට ඔවුන් පැමිණවෙූ සේක. 24 ජෝෂු
11:23ඔවුන්ගේ දරුවෝ ද ඇතුළු වී දේශය හිමි
කරගත්තෝ ය. ඔබ ඔවුන්ට පරෙටුවනේ දේශයේ
වැසියන් වූ කානානිවරුන් යටත් කර ඔවුන්ගේ
කැමැත්ත ලසෙ කිරීමට ඒ තැනැත්තන් ද ඔවුන්ගේ
රජවරුන් ද දේශයේ ජාතීන් ද ඔවුන් අතට පාවා දුන්
සේක. 25 ද්වි.නී. 6:10-11ඔව්හු පවුරු ඇති නගර ද

සශ්රීක රටක් ද අල්ලාගෙන, සියලු ආකාර හොඳ
දේවලින් පිරී තිබුණු ගෙවල් ද කණින ලද තටාක ද
මිදි වතු ද ඔලීව වතු ද පල දෙන බොහෝ ගස් ද
හිමි කරගත්හ. ඒවා අනුභව කොට, තෘප්තියට
පැමිණ, තර වී, ඔබේ මහා යහපත්කම
කරණකොටගෙන සැපෙනේ පසු වූවෝ ය.
26 වීරා 2:11-16 “එසේ වී නමුත්, ඔව්හු අකීකරු වී
ඔබට විරුද්ධ ව කැරලි ගසා, ඔබේ ව්‍යවස්ථාවට
පිටුපා, ඔබ වෙත ඔවුන් හරවාගන්නට ඔවුන්ට
අවවාද කළ ඔබේ දිවැසිවරුන් මරා මහා දේව
අපහාසයක් කළෝ ය. 27 එහෙයින් ඔබ ඔවුන්ගේ
එදිරිකාරයන් අතට ඔවුන් පාවා දුන් සේක. ඔව්හු
ඔවුන්ට පීඩා කළෝ ය. ඔවුන්ගේ පීඩා කාලයේ දී
ඔවුන් ඔබට මොරගැසූ කල ඔබ ස්වර්ගයේ සිට
සවන් දී, ඔබේ මහානුකම්පාව නිසා ඔවුන්ගේ
එදිරිකාරයන්ගේ අතින් ඔවුන් ගළවාගත්
විමුක්තිදායකයන් ඔවුන්ට දුන් සේක. 28 එහෙත්,
ඔවුන්ට නිදහස ලැබුණ විට ඔව්හු නැවත ඔබ
ඉදිරියෙහි නපුරුකම් කළෝ ය. එවිට ඔවුන්ගේ
සතුරන් ඔවුන් කෙරෙහි බලය පවත්වනු පිණිස ඔබ
ඔවුන් සතුරන්ගේ අතට පාවා දුන් සේක. එහෙත්,
ඔවුන් නැවතත් මොරගැසූ විට ඔබ ස්වර්ගයේ සිට
අසා, ඔබේ අනුකම්පාවේ හැටියට, බොහෝ
වතාවල ඔවුන් නිදහස් කළ සේක. 29 ලෙවී
18:5ඔබේ ව්‍යවස්ථාවට ඔවුන් හරවා ගන්නට ඔබ
ඔවුන්ට අවවාද කළ සේක. එහෙත්, ඔව්හු උඩඟුකම්
කර, ඔබේ ආඥාවලට සවන් නො දී, මනුෂ්‍යයා
ජීවත් වන පිණිස ඔහු කළ යුතු ඔබේ
විනිශ්චයයන්ට විරුද්ධ ව පව් කොට දරදඬු වී,
හිතුවක්කාරකමින් සවන් නො දී සිටියෝ ය. 30 2
රාජා 17:13-18; 2 වංශා 36:15-16එහෙත්, ඔබ
බොහෝ අවුරුදු ගණනක් ඔවුන් ගැන ඉවසා, ඔබේ
ආත්මානුභාවයෙනේ ඔබේ දිවැසිවරුන් මඟින් ඔවුන්ට
අවවාද කළ සේක. එහෙත්, ඔව්හු සවන් නුදුන්හ.
ඔබ ද දේශවල ජනයන් අතට ඔවුන් පාවා දුන්
සේක. 31 එසේ වී නමුත්, ඔබේ මහානුකම්පාව
නිසා ඔබ ඔවුන් මුළුමනින්ම නැති කර දැමුවේ වත්,
ඔවුන් අත්හැර දැමුවේ වත් නැත. කුමක් නිසා ද ඔබ
දයාබර අනුකම්පා ඇති දෙවි කෙනෙකු බැවිනි.
32 2 රාජා 15:19,29; 17:3-6; එස්රා 4:2,10 “ඉතින්
අපේ දෙවියන් වහන්ස, මහත් වූ, බලවන්ත වූ,
භයානක වූ ගිවිසුම ද කරුණාව ද පවත්වන්නා වූ
දෙවියන් වහන්ස, අසිරියාවේ රජුන්ගේ කාලයේ සිට
අද දක්වා අපටත්, අපේ පියවරුන්ටත්, අපේ
අධිපතීන්ටත්, අපේ පූජකයන්ටත්, අපේ
දිවැසිවරුන්ටත්, ඔබේ මුළු සෙනඟටත් පැමිණි සියලු
දුක් ගැහැට ඔබ ඉදිරියෙහි සුළු ලෙස නොපෙනේ වා!
33 ඔබ වනාහි අපට පැමිණි සියල්ල සම්බන්ධයෙනේ
සාධාරණ ව සිටි සේක. කුමක් නිසා ද, ඔබ
විශ්වාසවන්ත ව ක්‍රියා කළ සේක. අපි නම්
දුෂ්ටකම් කළෙමු. 34 අපේ රජවරුන් ද අපේ
අධිපතීන් ද අපේ පූජකයන් ද අපේ පියවරුන් ද
ඔබේ ව්‍යවස්ථාව පැවැත්වූයේ වත්, ඔබේ
ආඥාවලට ද ඔබ ඔවුන්ට කළ ඔබේ අවවාදවලට ද
සවන් දුන්නේ වත් නැත.
35 ඔවුන් සිය රජවරුන් යටතේ ඔබ ඔවුන්ට දුන්
සෞභාග්‍යය භුක්තිවිඳින විට ද ඔබ ඔවුන්ට දුන්
විශාල සාරවත් දේශයේ දී ද ඔබට සේවය කළේ
වත්, තමන්ගේ නපුරු ක්‍රියාවලින් වෙනේ වූණේ වත්
නැත. 36 මෙන්න අපි දැනට දාසයන් වී සිටිමු.
භූමියේ උපදින ඵල ද හොඳ දේවල් ද භුක්තිවිඳීමට
ඔබ අපේ පියවරුන්ට දුන් දේශයෙහි ම අපි දාසයන්
වී සිටිමු. 37 අපේ පව් නිසා ඔබ අප කෙරෙහි පත්
කළ රජුන්ට දේශයේ අස්වැන්න අයිති වන්නට
සලසා ඇත. ඔව්හු සිය කැමැත්ත පරිදි අප කෙරෙහි
ද අපේ ගවයන් කෙරෙහි ද බලය පවත්වති. අපි
මෙබඳු මහා දුකකින් සිටිමු.
38 “මේ සියල්ල නිසා අපි ලියවිල්ලකින් ස්ථිර
ගිවිසුමක් කරමු. අපේ අධිපතීහු ද අපේ ලෙවීවරු ද
අපේ පූජකයෝ ද ඒ පිට ඔවුන්ගේ මුද්‍රාව තබති.”

### ගිවිසුමට බැඳුණු අය

10 මුද්‍රා කළ අය නම්: හකලියාගේ පුත්
තිර්ෂාතා වන නහෙමියා ද ශෙදෙකියා ද;
2 සරොයා ද අශරියා ද ජෙරෙමියා ද; 3 පෂ්හුර් ද
අමරියා ද මල්කියා ද; 4 හට්ටුෂ් ද ෂෙබෙනියා ද
මල්ලුක් ද; 5 හාරීම් ද මෙරේමොත් ද ඔබදියා ද;
6 දානියලේ ද ගින්නතොනේ ද බාරුක් ද;
7 මෙෂුල්ලාම් ද අබියා ද මියාමින් ද; 8 මයශයා ද
බිල්ගයි ද ෂෙමොයා ද යන පූජකයෝ ය.
9 ලෙවීවරුන් වන අශනියාගේ පුත් ජේෂුවා ද
හෙනොදාද්ගේ පුත්‍රයන්ගෙනේ එක් කෙනෙකු වන
බින්නුයි ද කද්මියලේ ද; 10 ඔවුන්ගේ සහෝදරයන්
වන ෂෙබෙනියා ද හෝදියා ද කලීටා ද පලොයා ද
හානාන් ද; 11 මීකා ද රෙහොබ් ද හෂබියා ද;
12 ශක්කූර් ද ෂේරෙබියා ද ෂෙබෙනියා ද; 13 හෝදියා
ද බානී ද බෙනීනු ද යන තැනැත්තෝ ය.
14 සෙනඟගේ ප්‍රධානියන් වන පාරොෂ් ද පාහත්-
මෝවබ් ද ඒලාම් ද ශට්ටු ද බානී ද, 15 බුන්නී ද
අශ්ගාද් ද බේබයි ද; 16 අදොනියා ද බිග්වායි ද
ආදීන් ද; 17 ආටරේ ද හසෙකියා ද අශ්ශූර් ද;
18 හෝදියා ද හාෂුම් ද බේශයි ද; 19 හාරීප් ද
ආනාතොත් ද නෝබයි ද; 20 මග්පියාෂ් ද මෙෂුල්ලාම්
ද හෙසීර් ද; 21 මෙෂේශබයලේ ද ශාදොක් ද ජද්දූවා
ද; 22 පලෙටියා ද හානාන් ද අනායා ද 23 හෝෂෙයා
ද හනනියා ද හෂ්ෂුබ් ද; 24 හල්ලෝහෙෂ් ද පිල්හා ද
ෂෝබෙක් ද; 25 රෙහුම් ද හෂබ්නා ද මයසේයා ද;
26 අහියා ද හානාන් ද ආනාන් ද; 27 මල්ලූක් ද
හාරීම් ද බානා ද යන තැනැත්තෝ ය.

### ගිවිසුමට අදාළ උපදෙස්

28 සෙනඟගෙනේ ඉතිරි අය ද පූජකයෝ ද ලෙවීවරු
ද දොරටු පාලකයෝ ද ගීතිකාකාරයෝ ද දේව
මාලිගාවේ සේවකයෝ ද දේශවල ජනයන්ගෙනේ
වෙනේ ව දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාවට හැරුණු
සියල්ලෝ ද ඔවුන්ගේ භාර්යාවෝ ද ඔවුන්ගේ

පුත්‍රයන්ගනේ සහ දූවරුන්ගනේ දැනුම් තේරුම් ඇති
සියල්ලෝ ද 29 තමන්ගේ නායකයන් වන තමන්ගේ
සහෝදරයන්ට එකතු වී, දෙවියන් වහන්සේගේ
මෙහෙකරු මෝසෙස් අතින් දෙන ලද උන්
වහන්සේගේ ව්‍යවස්ථාවෙහි හැසිරෙන හැටියටත්,
අපේ සමිඳාණන් වහන්සේගේ ආඥා ද විනිශ්චයයන්
ද පණත් ද පවත්වා ඉෂ්ට කරන හැටියටත්,
30 නික්ම 34:16; ද්වි.නී. 7:3 දේශයේ ජාතීන්ට
අපේ දූවරුන් නොදෙන හැටියටත්, ඔවුන්ගේ දූවරුන්
අපේ පුත්‍රයන්ට නොගන්න හැටියටත්,
31 නික්ම 23:10-11; ලෙවී 25:1-7; ද්වි.නී. 15:1-2
දේශයේ ජනයන් විකිණීමට බඩු හෝ ආහාර හෝ
සබත් දවසේ ගෙනාවොත් ඒවා සබත් දවසේ වත්,
ශුද්ධ දවසක වත් ඔවුන්ගෙන් මිලේට නොගන්න
හැටියටත්, හත් වන අවුරුද්දේ පලදාව සහ සියලු
ණය ද අත්හරින හැටියටත් සාපයකින් හා දිවුරුමකින්
බැඳුණෝ ය.
32+NEH නික්ම 30:11-16 තවද, අපේ දෙවියන්
වහන්සේගේ මාලිගාවේ සේවයට සබත් දවස්වල ද
අමාවක්වල ද පිදීමේ රොටි සඳහාත්, නිරන්තර
ආහාර පූජාව සඳහාත්, නිරන්තර දවන යාග පූජාව
සඳහාත්, නියම මංගල්‍ය සඳහාත්, ඉශ්‍රායලේවරුන්
උදෙසා සමඟි කිරීමේ පාප පූජා සඳහාත්, අපේ
දෙවියන් වහන්සේගේ මාලිගාවේ මුළු වැඩ සඳහාත්,
රිදී ග්‍රෑම් පහක් අවුරුදුපතා දෙන ලෙස අපට
නියෝග පණවාගතිමු.
34 තවද, ව්‍යවස්ථාවේ ලියා තිබෙන ලෙස අපේ
දෙවි සමිඳාණන් වහන්සේගේ පූජාසනය පිට ගිනි
දල්වන පිණිස අවුරුද්දෙන් අවුරුද්ද නියම කාලයට
අපේ පිය වංශවල ප්‍රකාරයට අපේ දෙවියන්
වහන්සේගේ මාලිගාවට දෙන පඬුරු ගෙන ඒම ගැන
පූජකයන් ද ලෙවීවරුන් ද සෙනඟ ද වන අපි පස
ඇට දැමුවෙමු.
35 නික්ම 23:19; 34:26; ද්වි.නී. 26:2 අපේ බිම්වල
ප්‍රථම අස්වැන්න ද සියලු ආකාර ගස්වල සියලු
පලවලින් ප්‍රථම පල ද අවුරුද්දෙන් අවුරුද්ද
සමිඳාණන් වහන්සේගේ මාලිගාවට ගෙනෙන
හැටියටත්,
36 නික්ම 13:2 ව්‍යවස්ථාවෙහි ලියා තිබෙන
ප්‍රකාරයට අපේ පුත්‍රයන්ගෙන් සහ සිවුපාවුන්ගෙන්
කුලුඳුලන් ද අපේ ගවයින්ගෙන් හා බැටළුවන්ගෙන්
කුලුඳුලන් ද අපේ දෙවියන් වහන්සේගේ මාලිගාවට
එනම්, අපේ දෙවියන් වහන්සේගේ මාලිගාවෙහි
සේවය කරන පූජකයන් වෙත ගෙනෙන හැටියටත්,
37 ගණන් 18:21 අපේ අනාපු පිටිවලින් ප්‍රථම ඒවා
ද අපේ පිළිගැන්වීමේ පූජා ද සියලු ආකාර ගස්වල
පල ද මුද්‍රික යුස හා තෙල් ද අපේ දෙවියන්
වහන්සේගේ මාලිගාවේ ඇතුළු ගෙවල පූජකයන්
වෙත ද අපේ සියලු ගොවිතැන් නුවරවල දසයෙන්
කොටසක් ලෙවීවරුන්ට නියම බැවින් අපේ බිම්වල
අස්වැන්නෙන් දසයෙන් කොටසක් ලෙවීවරුන් වෙත ද
ගෙනෙන හැටියටත්, 38 ගණන් 18:26ලෙවීවරුන් ඒ
කොටස්වලින් දසයෙන් කොටසක් අපේ දෙවියන්
වහන්සේගේ මාලිගාවේ ගබඩාවේ ඇතුළු ගෙවලට
ගෙනෙන පිණිස දසයෙන් කොටසක් දෙන විට,
ආරොන්ගේ පුත්‍රයෙකු වන පූජකයෙකු ඔවුන් සමඟ
සිටින හැටියටත් නියම කරගතිමු. 39 කුමක් නිසාද,
ශුද්ධස්ථානයට අයිති භාණ්ඩ තිබෙන, සේවය කරන
පූජකයන් ද දොරටු පාලකයන් ද ගායකයන් ද සිටින
ඇතුළු ගෙවලට ඉශ්‍රායලේවරුන් ද ලෙවීවරුන් ද
ධාන්‍යවලිනුත්, මිදියුසෙනුත්, තෙල්වලිනුත්
පිළිගැන්වීමේ පඬුරු ගෙනෙන්නට යුතු ය. තවද, අපි
අපේ දෙවියන් වහන්සේගේ මාලිගාව අත්
නොහරින්නෙමු.

### ජෙරුසලමේ විසූ සෙනඟ

11 තවද, සෙනඟගේ අධිපතීහු ජෙරුසලමෙහි
වාසය කළෝ ය. සෙසු සෙනඟ තමන්
අතරෙන් දසදෙනෙකුගෙන් එක් කෙනෙකු බැගින්
ශුද්ධ නුවර වන ජෙරුසලමෙහි වාසය කිරීමට එවන
පිණිස පස ඇට දැමුවෝ ය. අනික් කොටස් නුවරවල
වාසය කළෝ ය. 2 ජෙරුසලමෙහි වාසය කිරීමට
කැමැත්තෙන් ම පැමිණි සියලු මනුෂ්‍යයන්ට සෙනඟ
ආශීර්වාද කළෝ ය. 3 නෙහෙ 7:73ජුදාහි නුවරවල
ඉශ්‍රායලේවරු ද පූජකයෝ ද ලෙවීවරු ද මාලිගාවේ
සේවය කරන්නෝ ද සලමොන්ගේ සේවකයන්ගේ
පුත්‍රයෝ ද තමන්ගේ නුවරවල තිබුණ තම
තමන්ගේ උරුම කොටස්වල වාසය කළෝ ය.
3 ජෙරුසලමෙහි වාසය කළ රටේ ප්‍රධානියෝ නම්
මොවුහු ය: 4 ජුදාවරුන්ගෙන් ද බෙන්ජමින්වරුන්ගෙන්
ද සමහරෙක් ජෙරුසලමෙහි වාසය කළෝ ය.
ජුදාවරුන් අතරෙන්, පෙරෙෂ්ගේ පුත්‍රයන්ගෙන් එක්
කෙනෙකු වූ මහලලේල්ගේ පුත් ෂෙපටියාගේ
පුත්‍රයා වන අමරියාගේ පුත් ශකෙරියාගේ පුත්‍රයා
වන උස්සියාගේ පුත් අතායා ය.
5 ශිලෝනියයාගේ පුත් ශකෙරියාගේ පුත්‍රයා වන
ජෝයාරීබ්ගේ පුත් ආදායාගේ පුත්‍රයා වන
හසායාගේ පුත් කොල්-හෝශෙගේ පුත්‍රයා වන
බාරුක්ගේ පුත් මයසේයා ය. 6 ජෙරුසලමෙහි විසූ
පෙරෙශ්ගේ සියලු පුත්‍රයන් වූ වික්‍රමාන්විත
මනුෂ්‍යයෝ හාරසිය හැටඅටදෙනෙක් ය.
7 බෙන්ජමින්වරුන්ගෙන්, ජෙෂොයාගේ පුත්
ඊතියලේල්ගේ පුත්‍රයා වන මයසේයාගේ පුත්
කෝලායාගේ පුත්‍රයා වන පෙදායාගේ පුත්
ජෝවෙදේගේ පුත්‍රයා වන මෙෂුල්ලාම්ගේ පුත් සල්ලු
ය.
8 ඔව්හු ගබ්බයි සහ සල්ලයි ආදි වූ නවසිය
විසිඅටදෙනෙක් ය. 9 සික්‍රීගේ පුත් ජෝවෙල්
ඔවුන්ගේ නායකයා ව සිටියේ ය. හස්සෙනුවාගේ
පුත් ජුදා තමෙ නගරයේ දෙවැන්නා ව සිටියේ ය.
10 පූජකයන්ගෙන්, ජෝයාරීබ්ගේ පුත් ජෙදොයා ද
ජාකින් ද
11 දෙවියන් වහන්සේගේ මාලිගාවේ අධිපතියා වූ
අහිටුබ්ගේ පුත් මෙරොයොත්ගේ පුත්‍රයා වන
ශාදොක්ගේ පුත් මෙෂුල්ලාම්ගේ පුත්‍රයා වන
හිල්කියාගේ පුත් සෙරොයා ද 12 දේව මාලිගාවේ
වැඩ කළා වූ ඔවුන්ගේ සහෝදරයන් අටසිය

විසිදදෙනෙකේ ද මල්කියාගේ පුත් පෂ්හුර්ගේ
පුත්රයා වන ශකෙරියාගේ පුත් අම්ශීගේ පුත්රයා
වන පලෙලියාගේ පුත් ජරොහාම්ගේ පුත්රයා වන
අදායා ද 13 පිය වංශවල ප්රධානීන් වන ඔහුගේ
සහෝදරයන් දසිය හතළිස්දදෙනෙකේ ද
ඉම්මරේගේ පුත් මෂිල්ලේමොත්ගේ පුත්රයා වන
ආසයිගේ පුත් අශරියලේගේ පුත්රයා වන අමෂ්සයි
ද 14 බලවත් වික්රමාන්විත මනුෂ්යයන් වන
ඔවුන්ගේ සහෝදරයන් එකසිය විසිඅටදනෙකේ ද
යන මොවුහු ය. හග්ගදෙෝලීම්ගේ පුත් ශබ්දීයලේ
ඔවුන්ගේ නායකයා ව සිටියේ ය.
15 ලවේවරුන්ගනේ, බුන්නීගේ පුත් හෂබියාගේ
පුත්රයා වන අශ්රිකාම්ගේ පුත් හෂ්ෂුබ්ගේ පුත්රයා
වන ෂමොයා ද
16 ලවේවරුන්ගේ ප්රධානීන්ගනේ, දවේයන්
වහන්සේගේ මාලිගාවේ දී පිටත කාරණා
බලාගන්න ෂබ්බතෙයි ද ජෝෂාබාද් ද
17 යාච්ඤාවේ දී ස්තුති දීම පටන්ගැනීමට
ප්රධානියා ව සිටි ආසාප්ගේ පුත්රයා වන ශබ්දීගේ
පුත් මීකාගේ පුත්රයා වන මත්තනියා ද ඔහුගේ
සහෝදරයන් අතරේ දවෙන්නා වන බක්බුකියා ද
ජදෙුතුන්ගේ පුත් ගාලාල්ගේ පුත්රයා වන
ෂම්මුවාගේ පුත් අබ්දා ද යන මොවුහු ය.
18 ශුද්ධ නුවර සිටි සියලු ලවේවරු දසිය
අසූහතරදනෙකේ ය.
19 තවද, දොරටු රැකවල් කළා වූ අක්කුබ් ද
ටල්මොන් ද ඔවුන්ගේ සහෝදරයන් වූ දොරටු
පාලකයෝ ද එකසිය හැත්තෑදදෙනෙකේ ය.
20 සසෙු ඉශ්රායලේවරු ද පූජකයෝ ද ලවේවරු ද
ජුදාහි සියලු නුවරවල එක්නකො තම තමාගේ උරුම
භූමියහෙි සිටියෝ ය. 21 එහතේ, දේව මාලිගාවේ
සේවය කරන්නෝ ඕපලේහි වාසය කළෝ ය. ශීහා ද
ගිෂ්පා ද දේව මාලිගාවේ සේවකයන්ට ප්රධානියන්
ව සිටියෝ ය.
22 ජරෙුසලමහෙි සිටි ලවේවරුන්ගේ නායකයා නම්,
ගායකයන් වන ආසාප්ගේ පුත්රයන්ගනේ එක්
කනෙකෙු වන මීකාගේ පුත් මත්තනියාගේ පුත්රයා
වන හෂබියාගේ පුත් බානීගේ පුත්රයා වන උස්සී ය.
ඔහු දවේයන් වහන්සේගේ මාලිගාවේ වැඩපළට
පත් ව සිටියේ ය. 23 කුමක් නිසාද, ගායකයන් ගැන
රජුගේ ආඥාවක් තිබුණේ ය. ඔවුන් උදසො දවස්
පතා වුවමනා වූ කොටසක් ද නියම කර තිබුණේ ය.
24 ජුදාගේ පුත්රයා වන ශරොගේ පුත්රයන්ගනේ
එක් කනෙකෙු වන මෂෙේශබලේගේ පුත්රයා වන
පතෙහියා සනෙඟගේ සියලු කාරණා ගැන රජු වතෙ
සිටියේ ය.

### ජරෙුසලම අවට පදෙසේවල විසූ සනෙඟ

25 තමන්ගේ කතේ ළඟ පිහිටි ගම්වල බොහෝ
දනෙ විසූ හ. ජුදාවරුන්ගනේ සමහරකේ කිරියත්-
අර්බා, දිබොන්, ජකෙබ්ශයෙලේ සහ ඒවායේ ගම්වල
ද 26 ජේෂුවාහි ද මොලාදාහි ද බතේ-පලෙතේහි ද
27 හශර්-ෂුවාල්හි ද බයෙර්-ෂබොහි සහ ඒවායේ
ගම්වල ද 28 ශික්ලග්හි ද මකෙොනාහි සහ ඒවායේ
ගම්වල ද 29 ඒන්-රිම්මෝන්හි ද ශෝරාහි ද
ජර්මුත්හි ද 30 ශානොවාහි ද අදුල්ලාම්හි සහ
ඒවායේ ගම්වල ද ලාකීෂ්හි සහ එහි කතේවල ද
අශේකාහි සහ එහි ගම්වල ද විසූ හ. මසෙේ ඔව්හු
බයෙර්-ෂබො සිට හින්නොම්ගේ මිටියාවත දක්වා
කූඩාරම් ගසාගත්තෝ ය.
31 බනේජමින්වරුන් ගබොහි සිට මික්මාෂ්හි ද
අයියාහි ද බතෙලේහි ද ඒවායේ ගම්වල ද;
32 අනාතොත්හි ද නොබ්හි ද අනනියාහි ද;
33 හශෝර්හි ද රාමාහි ද ගිත්තයිම්හි ද; 34 හාදීද්හි
ද ශබෝයිම්හි ද නබෙල්ලාට්හි ද;
35 කර්මාන්තකාරයන්ගේ මිටියාවතේ තිබනෙ
ලොද්හි ද ඕනෝහි ද විසුවෝ ය. 36 ජුදාහි විසූ
ලවේවරුන්ගනේ ද සමහර පන්ති බනේජමින්වරුන්
සමඟ සිටියෝ ය.

### බබිලෝනියනේ පැමිණි පූජකයන් සහ ලවේවරුන්

12 ෂයෙල්තියලේගේ පුත් සරෙුබ්බාබලේ ද
ජේෂුවා ද සමඟ පැමිණි පූජකයෝත්
ලවේවරුත් මොවුහු ය; 2 සරොයා, ජරෙමියා, එස්රා,
අමරියා, මල්ලුක්, හට්ටුෂ්; 3 ෂකෙනියා, රහෙුම්,
මරෙේමොත්; 4 ඉද්දෝ, ගින්නතෙොන්, අබියා;
5 මියාමින්, මයදියා, බිල්ගා; 6 ෂමොයා, ජෝයාරිබ්,
ජදොයා; 7 සල්ලු, ආමොක්, හිල්කියා සහ ජදොයා ය.
මොවුහු ජේෂුවාගේ දවස්වල දී පූජකයන්ගනේ ද
ඔවුන්ගේ සහෝදරයන්ගනේ ද ප්රධානියන් ව
සිටියෝ ය.
8 තවද, ලවේවරු නම්: ජේෂුවා, බින්නුයි,
කද්මියලේ, ෂේරබෙියා, ජුදා සහ මත්තනියා ය.
ඔවුහුත්, ඔවුන්ගේ සහෝදරයෝත් ස්තුති ගායනා
කණ්ඩායම්වලට පත් ව සිටියෝ ය.
9 තවද, ඔවුන්ගේ සහෝදරයන් වන බක්බුකියා ද
උන්නෝ ද ඔවුන් ඉදිරිපිට වාර පිළිවළෙින් සිටියෝ ය.
10 ජේෂුවාට දාව ජෝයාකීම් උපන්නේ ය.
ජෝයාකීම්ට දාව එලියාෂිබ් උපන්නේ ය. එලියාෂිබ්ට
දාව ජෝයාදා උපන්නේ ය. 11 ජෝයාදාට දාව
ජොනතන් උපන්නේ ය. ජොනතන්ට දාව ජද්දූවා
උපන්නේ ය.

### පූජකවරුන්ගේ ප්රධානියෝ

12 ජෝයාකීම්ගේ දවස්වල පිය පළෙපත්
ප්රධානියන් වූ පූජකයෝ නම්: සරොයාගනේ මරොයා
ය; ජරෙමියාගනේ හනනියා ය; 13 එස්රාගනේ
මෂුෙල්ලාම් ය; අමරියාගනේ ජහෙෝහානාන් ය.
14 මල්ලුකීගනේ ජොනතන් ය; ෂබෙනියාගනේ
ජෝසෆේ ය; 15 හාරීම්ගනේ අද්නා ය;
මරොයාොත්ගනේ හලේකයි ය; 16 ඉද්දෝගනේ
ශකෙරියා ය; ගින්නතෙොන්ගනේ මෂුෙල්ලාම් ය;
17 අබියාගනේ සික්රී ය; මිනියාමින්ගනේ
මොවාදියාගේ පිල්ටයි ය; 18 බිල්ගාගනේ ෂම්මුවා ය;
ෂමොයාගනේ ජහෙෝනාතාන් ය; 19 ජෝයාරිබ්ගනේ
මත්තනෙයි ය; ජදොයාගනේ උශ්ශී ය;

20 සල්ලයිගෙනේ කල්ලයි ය; ආමොක්ගෙනේ ඒබෙර් ය;
21 හිල්කියාගෙනේ හෂබියා ය; ජදොයාගෙනේ
නතනෙල් ය.
22 එලියාෂිබ්ගේ ද ජෝයාදාගේ ද ජෝහානාන්ගේ
ද ජද්දූවාගේ ද දවස්වල ලෙවීවරුන්ගේ පිය පළපත්
ප්‍රධානියෝ ලියාපදිංචි කරනු ලැබුවෝ ය.
පූජකයෝත් පර්සියාවේ දාරියුස්ගේ රජ කාලය
දක්වා එසේ වූ හ.
23 පිය පළපත්වල ප්‍රධානියන් වූ ලෙවීගේ
පුත්‍රයෝ එලියාෂිබ්ගේ පුත් ජෝහානාන්ගේ දවස්
දක්වා ම ලේකම් පොතෙහි ලියවුණෝ ය.
24 ලෙවීවරුන්ගේ ප්‍රධානියන් වූ හෂබියා,
ෂෙරෙබියා සහ කද්මියෙල්ගේ පුත් ජේෂුවා ද
තමන්ගේ සහෝදරයන් ඉදිරිපිට ඇති ව දෙවියන්
වහන්සේගේ මනුෂ්‍යයා වූ දාවිත්ගේ අණ ලෙස
ස්තුති ප්‍රශංසා කිරීමට මාරුවෙන් මාරුවට සිටියෝ
ය.
25 මත්තනියා ද බක්බුකියා ද ඔබදියා ද මෙෂුල්ලාම්
ද ටල්මොන් ද අක්කුබ් ද දොරටු ගබඩාවල දොරටු
පාලකයන් ව සිට රැකවල් කළෝ ය.
26 මොවුහු ජොශාදාක්ගේ පුත් ජේෂුවාගේ
පුත්‍රයා වන ජෝයාකීම්ගේ දවස්වල දිශාධිපතියා
වන නහෙමියාගේත්, නීතිවේදියා වන පූජක
එස්රාගේත් දවස්වල ද සිටියෝ ය.

## පවුර කැප කිරීම

27 ජෙරුසලමේ පවුර කැප කිරීමේ දී ප්‍රීති
ප්‍රමෝදයෙනේ ද ස්තුති කිරීමෙනේ ද ගීතිකා කිරීමෙනේ
ද අත්තල්වලින් ද වීණා හා මහා වීණාවලින් ද කැප
කිරීමේ උත්සවය පවත්වන පිණිස ලෙවීවරු වීසූ සෑම
තැන්වලින් ඔවුන් සොයාගෙන ජෙරුසලමට ගෙනෙන
ලදහ. 28 එවිට ගායකයන් වූ ලෙවීවරු ජෙරුසලම
අවට ප්‍රදේශයෙනුත්, නටොපාතිවරුන්ගේ
ගම්වලිනුත්, 29 බෙත්-ගිල්ගාලෙනුත්, ගෙබොහි ද
අස්මාවෙතෙහි ද ගම්වලිනුත් රැස් වූ හ. ගායකයෝ
ජෙරුසලම අවට ගම් සාදාගෙන සිටියෝ ය.
30 පූජකයෝත් ලෙවීවරුත් පවිත්‍ර වී, සෙනඟ ද
දොරටු ද පවුර ද පවිත්‍ර කළෝ ය.
31 එවිට මම ජුදාහි අධිපතීන් පවුර පිටට
නඟින්නට සලස්වා, ස්තුති කිරීමටත්, පෙරහැරින්
යාමටත් මහා කණ්ඩායම් දෙකෙක් නියම කළෙමි.
එයින් එකක් දකුණට පවුර පිට කසළ දොරටුව
දෙසට ගියේ ය. 32 ඔවුන් පස්සේ හෝෂායා ද ජුදාහි
අධිපතීන්ගෙනේ භාගයක් ද 33 අසරියා ද එස්රා ද
මෙෂුල්ලාම් ද 34 ජුදා සහ බෙන්ජමින් ද ෂෙමායා ද
ජෙරමියා ද 35 නළා ඇති ව, පූජකයන්ගේ
පුත්‍රයන්ගෙනේ සමහරකේ එනම්, ආසාප්ගේ පුත්
සක්කූර්ගේ පුත්‍රයා වන මීකායාගේ පුත්
මත්තනියාගේ පුත්‍රයා වන ෂෙමායාගේ පුත්
ජොනතන්ගේ පුත්‍රයා වන සකරියා සහ
36 දෙවියන් වහන්සේට කැප මනුෂ්‍යයා වූ දාවිත්ගේ
තූර්ය භාණ්ඩ ඇති ව, ඔහුගේ සහෝදරයන් වන
ෂෙමායා ද අසරියෙල් ද මිලලයි ද ගිලලයි ද මායයි ද
නතනෙල් ද ජුදා ද හනානි ද ඔවුන්ට පෙරටුවෙනේ
සිටි නීතිවේදී එස්රා ද ගියෝ ය. 37 ඔව්හු උල්පත්
දොරටුව ළඟින් ද තමන් ඉදිරිපිට ද තිබුණු දාවිත්ගේ
නිවසෙට ඉහළින් පවුරට නැඟුමෙහි දාවිත්ගේ
නගරයේ පඩිවලින් නැඟී නැගෙනහිරට තිබෙන
වතුර දොරටුව ළඟට ගියෝ ය.
38 අනික් පැත්තට දෙ වන ගායක කණ්ඩායම ද
ඔවුන් පස්සේ සෙනඟගෙනේ භාගයක් ද මම ද පවුර
පිට මුදුන් කොත උඩින් පළල් පවුර දක්වාත්,
39 එප්‍රායිම් දොරටුව උඩිනුත්, පුරාණ දොරටුව
ළඟිනුත්, මත්ස්‍ය දොරටුව ද හනනේල්ගේ කොත
සහ හම්මෙයාගේ කොත ළඟිනුත් බැටළු දොරටුව
දක්වා ගොස් මුර දොරටුව ළඟ නැවතුණෙමු.
40 මෙසේ දෙවියන් වහන්සේගේ මාලිගාවේ
ගායක කණ්ඩායම් දෙක ද මා සමඟ මුලාදෑනීන්ගෙනේ
කොටසක් ද නළා ඇති ව 41 එලියාකිම්, මයසේයා,
මිනියාමින්, මීකායා, එලියෝයේනයි, සකරියා,
හනනියා යන පූජකයෝ ද; 42 මයසේයා, ෂෙමායා,
එලයාසර්, උස්සී, ජෙහෝහානාන්, මල්කියා, ඒලාම්,
ඒසෙර් යන මොවුහු ද මම ද සිටියෙමු. ජෙස්‍රාහියා
තමන්ගේ ප්‍රධානියා වශයෙනේ ඇති ව
ගීතිකාකාරයෝ ශබ්ද නඟා ගායනා කළෝ ය.
43 එදා ඔව්හු මහා පූජා ඔප්පු කොට ප්‍රීති වූ හ.
මන්ද, දෙවියන් වහන්සේ ඔවුන්ට අතිශයින් ප්‍රීති
ප්‍රමෝද වන්නට සැලැසූ සේක. ස්ත්‍රීහු ද දරුවෝ ද
ප්‍රීති වූ හ. මෙසේ ජෙරුසලමේ ප්‍රීති ඝෝෂාව දුරට
ඇසුණේ ය.

## නමස්කාරයට අවශ්‍ය දේ සැපයීම

44 ඒ දවසේ පූජකයන්ටත්, ලෙවීවරුන්ටත්
ව්‍යවස්ථාවෙනේ නියම වූ කොටස් නගර ආසන්න
කෙත්වල ප්‍රමාණයේ හැටියට ගබඩාවල රැස් කර
තබන පිණිස, ඒවා කෙරෙහි පිළිගැන්වීමේ පූජා ද
ප්‍රථම පල ද දසයෙනේ එක ද සම්බන්ධ ව පාලනය
කිරීමට මනුෂ්‍යයෝ පත් වූ හ. මන්ද සේවය කරමින්
සිටි පූජකවරු ද ලෙවීවරු ද ගැන ජුදාවරු සතුටු ව
සිටියෝ ය. 45 1 වංශා 25:1-8; 26:12ඔව්හු ද
ගායකයෝ ද දොරටු පාලකයෝ ද දාවිත්ගේ සහ
ඔහුගේ පුත් සලමොන්ගේ ආඥාව ලෙස තමන්ගේ
දෙවියන් වහන්සේට නියම පූජා විධි ද පවිත්‍ර වීම
පිළිබඳ නියම වත්පිළිවෙත් ද පැවැත්වූ හ. 46 මන්ද,
පෙර දාවිත්ගේ ද ආසාප්ගේ ද කාලයේ පටන්
ගායකයන්ගේ ප්‍රධානියකේ සිටියේ ය. එපමණක්
නොව දෙවියන් වහන්සේට තුති පැසසුම් ගී ද ගයනු
ලැබී ය. 47 සියලු ම ඉශ්‍රායෙල්වරු ද
සෙරුබ්බාබෙල්ගේ දවස්වලත්, නහෙමියාගේ
දවස්වලත් දිනපතා ගායකයන්ගේත්, දොරටු
පාලකයන්ගේත් කොටස් සහ ලෙවීවරුන්ට කැප කළ
යුතු දේත් දුන්හ. ලෙවීවරු ද ආරොන්ගේ පුත්‍රයන්ට
කැප කළ යුතු දේ දුන්හ.

### විදේශිකයන්ගෙන් වෙන් වීම

13 ද්වි.නී. 23:3-5 ඒ දවසේ සෙනඟ ඉදිරියෙහි
මෝසෙස්ගේ පොත කියවද්දී, අම්මොනි
ජාතිකයන් ද මෝවබ් ජාතිකයන් ද රොටි සහ වතුර
රැගෙන ඉශ්රායලේ පුත්‍රයන්ගේ පෙරමඟට නෑවිත්
ඔවුන්ට සාප කරන පිණිස බාලාම් කුලියට ගත් නිසා,
2 ගණන් 22:1-6අම්මොනි ජාතිකයෙක් වත්, මෝවබ්
ජාතිකයෙක් වත්, දෙවියන් වහන්සේගේ සභාවට
කිසි කලෙක ඇතුළු නොවන්නේ ය කියා ලියා
තිබෙනවා සම්බ විය. ඒ සාපය අපේ දෙවියන්
වහන්සේ ආශීර්වාදයකට හැරවූ සේක. 3 සෙනඟ
මේ නියෝගය ඇසූ විට ඔව්හු මිශ්‍ර විවාහයෙන්
පැවත ආ අය ඉශ්රායලේ සෙනඟගෙන් වෙන් කළහ.

### නහෙමියාගේ ප්‍රතිසංස්කරණ

4 මීට පෙර අපේ දෙවියන් වහන්සේගේ
මාලිගාවේ ගබඩා බාර ව සිටි පූජක එලියාෂිබ්
ටෝබියාට විවාහයෙන් නෑකමක් ඇති ව සිටියේ ය.
5 ඔහු ටෝබියාට විශාල කාමරයක් සකස් කර දී
තිබිණි. කලින් ඒ කාමරයේ ආහාර පූජා ද තුවරලා ද
භාණ්ඩ ද ලෙවීවරුන්ගේත්, ගීතිකාකාරයන්ගේත්,
දොරටු පාලකයන්ගේත් නියම කොටස වූ
ධාන්‍යයෙන් සහ මිදි යුසෙනුත්, තෙලිනුත් දසයෙන්
කොටස ද පූජකයන්ට ලැබෙන පිළිගැන්වීමේ පූජා ද
තැන්පත් කර තිබිණි. 6 මේ මුළු කාලයේ දී මම
ජෙරුසලමෙහි නොසිටියෙමි. කුමක් නිසාද
බබිලෝනියේ රජ වූ අර්තක්ෂස්තාගේ තිස් දෙ වන
අවුරුද්දේ දී මා රජු වෙත ගිය බැවිනි. ටික කලකට
පසු මම රජුගෙන් අවසර ලැබගෙන 7 ජෙරුසලමට
පෙරළා පැමිණියෙමි. එවිට, එලියාෂිබ් දෙවියන්
වහන්සේගේ මාලිගාවේ මළුවල ටෝබියා උදෙසා
කාමරයක් සකස් කර දීමෙන් ඔහු කළ ඒ නපුරු දේ
ගැන දැනගතිමි. 8 මම ඊට අතිශයින් කිපී
ටෝබියාගේ කාමරයෙහි තිබුණු බඩු භාණ්ඩ සියල්ල
පිටතට වීසි කළෙමි. 9 ඉන්පසු ඒ කාමරය පිරිසිදු
කරන ලෙස ද දෙවියන් වහන්සේගේ මාලිගාවේ
භාණ්ඩ ද ආහාර පූජා ද තුවරලා ද නැවත එහි
තබන ලෙස ද අණ කළෙමි.
10 ද්වි.නී. 12:19 ලෙවීවරුන්ට හිමි කොටස් ඔවුන්ට
නොදී තිබුණු බව ද කටයුතු බාර ව සිටි ලෙවීවරුන්
ද ගීතිකාකාරයන් ද තම තමන්ගේ කෙත්වලට පලා
ගිය බව ද මට දැනගන්නට ලැබිණි. 11 ඒ නිසා
නිලධාරීන්ට කතා කර, "දෙවියන් වහන්සේගේ
මාලිගාව පාළු වී ඇත්තේ මන් ද?" කියා තරවටු
කළෙමි. මම ඔවුන් රැස් කරවා, ඔවුන්ගේ
තනතුරුවලට ඔවුන් පත් කළෙමි. 12 මලාකි
3:10එවිට සියලු ජුදාවරු ධාන්‍යයෙනුත්, මිදි යුසෙනුත්,
තෙල්වලිනුත් දසයෙන් කොටස ගබඩාවලට
ගෙනාවෝ ය. 13 මම ඒ ගබඩා පූජක වූ
ෂෙලෙමියාට ද ලේකම්වරයා වූ ශාදොක්ට ද
ලෙවීවරුන්ගෙන් පදායාට ද ඔවුන්ගේ සහකාර
මත්තනියාගේ පුත් ශක්කූර්ගේ පුත් හනාන්ට ද බාර
කළෙමි. කුමක් නිසාද, ඔව්හු විශ්වාස අය ලෙස
සලකන ලද්දෝ ය. තමන්ගේ සහෝදරයන්ට හිමි
කොටස් බෙදා දීම ඔවුන්ගේ යුතුකම විය.
14 "මාගේ දෙවියන් වහන්ස, මා කළ මේ දේ සිහි
කළ මැනව. මාගේ දෙවියන් වහන්සේගේ මාලිගාව
උදෙසා ද එහි නමස්කාරය උදෙසා ද මා කළ යහපත්
ක්‍රියා අමතක නොකළ මැනව."

### සබත් දවස පැවැත්වීම ගැන

15 නික්ම 20:8-10; ද්වි.නී. 5:12-14; ජරෙ 17:21-22 ඒ
දවස්වල දී ජුදාහි සමහරුන් සබත් දවසේ මුද්‍රික
යන්ත්‍රය පාගන බවත්, ගොයම් මිටි ගෙනවුත් ඒවා
සහ මුද්‍රික පානය ද මිදි වලු ද අත්තික්කා පල ද
සියලු ආකාර බර ද කොටළුවන් පිට පටවාගෙන
සබත් දවසේ දී ජෙරුසලමට ගෙනෙන බවත් මම
දිටිමි. එහයින් සබත් දවසේ දී කිසිවක්
නොවිකුණන ලෙස මම තරයේ කියා සිටියෙමි.
16 ජෙරුසලමේ විසූ තීර්වරු මාළු සහ සියලු ආකාර
බඩු ගෙනවුත් ජුදාහි සෙනඟට පමණක් නොව,
ජෙරුසලමෙහිත් සබත් දවසේ දී විකුණෝ ය.
17 එබැවින් මම ජුදාහි උත්තමයන්ට තරවටු කරමින්,
"සබත් දවස කලෙසා, ඔබ කරන මේ නපුරු
ක්‍රියාවේ තේරුම කුමක් ද? 18 ඔබේ පියවරුන්
මෙසේ කළ බැවින් අපේ දෙවියන් වහන්සේ මේ
සියලු විපත්ති අප පිටත්, මේ නුවර පිටත්
පැමිණවූවා නොවේ ද? එසේ වී නමුත්, ඔබ සබත්
දවස කලෙසමින් ඉශ්රායලේවරුන් කෙරෙහි දේව
උදහස වැඩිකරන්නහු ය"යි ඔවුන්ට කීවෙමි.
19 තවද, මම සබත් දවසට පෙර ජෙරුසලමේ
දොරටුවලට අඳුර වැටෙන කල දොරටු වසා
තබන්නටත්, සබත් දවස පසු වන තුරු ඒවා
නාරින්නටත් අණ කර, සබත් දවසේ කිසි බරක්
ඇතුළට නොගෙනෙන පිණිස මාගේ
මෙහෙකරුවන්ගෙන් සමහරෙකු දොරටු ළඟ
සිටවූවෙමි. 20 ඒ නිසා වෙළෙන්දෝ ද සියලු ආකාර
බඩු විකුණන්නෝ ද වරක් දෙවරක් ජෙරුසලමෙන්
පිට නැවතුණෝ ය. 21 මම ඔවුන්ට තරවටු කොට,
"ඔබ පවුර ළඟ නවතින්නේ මන් ද? ඔබ නැවත
එසේ කළොත් ඔබට දඬුවම් කරන්නෙමි"යි ඔවුන්ට
කීවෙමි. එතැන් පටන් ඔවුන් සබත් දවසේ දී
නගරයට ආවේ නැත. 22 තවද, සබත් දවස ශුද්ධ
ලෙස පවත්වන පිණිස පිරිසිදු වී අවුත්, දොරටු
රැකවල් කරන ලෙස මම ලෙවීවරුන්ට අණ කළෙමි.
22 "මාගේ දෙවියන් වහන්ස, මේ නිසාත් මා සිහි
කර ඔබේ ඉමහත් කරුණාව පරිද්දෙන් මට දයා වී
වදාළ මැනව."

### අන්‍ය ජාතික ස්ත්‍රීන් පාවා ගැනීම ගැන

23 නික්ම 34:11-16; ද්වි.නී. 7:1-5 ඒ දවස්වල දී
සමහර ජුදාවරුන් අෂ්දොද්හි ද අම්මොන්හි ද
මෝවබ්හි දී ස්ත්‍රීන් පාවාගෙන සිටිනු මම දුටුවෙමි.
24 ඔවුන්ගේ දරුවන්ගේ සංඛ්‍යාවෙන් අඩක් අෂ්දොද්
භාෂාව හෝ අන් ජාතීන්ගේ භාෂා හෝ කතා කළෝ

ය. ජුදාවේ භාෂාව කතා කරන්න ඔව්හු නොදත්හ.
25 මම ඔවුන්ට තරවටු කර, සාප කර, ඔවුන්ගෙන්
සමහරෙකුට ගසා, ඔවුන්ගේ හිසකේ උගුලා, "ඔබේ
දූවරු ඔවුන්ගේ පුත්‍රයන්ට පාවාදෙන්න වත් ඔබේ
පුත්‍රයන් හෝ ඔබ ඔවුන්ගේ දූවරුන් පාවාගන්න
වත් එපාය" කියා දෙවියන් වහන්සේ නමින්
දිවුරන්නට සැලැස්සුවෙමි. 26 2 සාමු 12:24-25; 1 රාජා
11:1-8මම ඔවුන් අමතා මෙසේ කීවෙමි: "ඉශ්‍රායෙල්
රජු වූ සලමොන් මේ දේ කිරීමෙන් පව් කළා
නොවේ ද? බොහෝ ජාතීන් අතරේ ඔහුට සමාන
රජෙක් සිටියේ නැත; ඔහුගේ දෙවියන් වහන්සේ ද
ඔහුට ප්‍රේම කොට මුළු ඉශ්‍රායෙල්වරුන්ගේ රජු
වශයෙන් ඔහු පත් කළ සේක. එසේ වී නමුත්, ඔහු
පවා අන්‍ය ජාතික ස්ත්‍රීන් විසින් පාපයට පොළඹවන
ලදී. 27 එසේ නම්, ඔබත් ඔහුගේ ආදර්ශය
අනුගමනය කරමින්, අන්‍ය ජාතික ස්ත්‍රීන්
පාවාගැනීමෙන් මේ මහා නපුරු ක්‍රියාව කර, අපත්
අපේ දෙවියන් වහන්සේට විරුද්ධ ව ද්‍රෝහිවිය යුතු
ද?"
28 නහෙ 4:1 උත්තම පූජක වූ එලියාෂිබ්ගේ
පුත්‍රයා වන ජෝයාදාගේ පුත්‍රයෙකු හොරොනීය
ජාතික සන්බලට්ට බෑණා ව සිටිය නිසා ඔහු මා
වෙතින් එළවේවෙමි.
29 "මාගේ දෙවියන් වහන්ස, ඔවුන් පූජක තනතුර
ද පූජකකමේත්, ලෙවීවරුන්ගේත් ගිවිසුම ද අපිරිසිදු
කළ හැටි සිහි කළ මැනව."
30 මෙසේ මම විදේශික වන සියල්ලෙන් ඔවුන්
පිරිසිදු කර, පූජකයන්ගේත්, ලෙවීවරුන්ගේත්
කටයුතු එකිනෙකොට බාර වූ අන්දමට නියම
කළෙමි. 31 තවද, නියම කාලවලට දර, පඬුරු හා
ප්‍රථම පල ද ගෙනෙ ඊම පිළිබඳ විධිවිධාන
සැලැස්සුවෙමි.
31 "මාගේ දෙවියන් වහන්ස, මාගේ යහපත පිණිස
මා සිහි කළ මැනව."

# ජෝබ්

## ප්‍රස්තාවනාව

1 යටගිය දවස ජෝබ් නම් මනුෂ්‍යයෙක් ඌශ්
දේශයෙහි වාසය කළේ ය. ඔහු වනාහි විනය
ගරුක, අවංක, දේව භය ඇති, පවින් වැළකී සිටි
කෙනෙකි. 2 ඔහුට පුත්‍රයෝ සත්දෙනෙක් ද දූවරු
තුන්දෙනෙක් ද වූ හ. 3 සත්දහසක් බැටළුවෝ ද
තුන්දහසක් ඔටුවෝ ද එක්දහසක් ගවමහිෂයෝ ද
පන්සියයක් කොටළු දෙනෝ ද ඔහුට වූ හ. ඔහුට
දැසිදැස්හු ද විශාල සංඛ්‍යාවක් සිටියෝ ය. මේ සා
මහත් ධන සම්භාරයක් ඇති අන් කිසිවෙක් මුළු පූර්ව
දිශා භාගයෙහි නො වී ය.
4 ඔහුගේ පුත්‍රයෝ එකිනෙකා තම තමාට නියමිත
දවසෙහි තම තමාගේ ගෙදර මංගල භෝජනයක්
පිළියෙළ කිරීම ද ඊට සහභාගි වන ලෙස තම
සහෝදරියන් තිදෙනාට ආරාධනා කිරීම ද
ඔවුනොවුන්ගේ සිරිතක් ලෙස කළහ. 5 මංගල
භෝජන සංග්‍රහ වටය නිම වූ එක එක වාරයේ දී
ජෝබ් තම පුත්‍රයන් වෙත පණිවුඩ යවා ඔවුන්
ගෙන්වා, ඔවුන්ගේ පවිත්‍රවීම පිණිස පසු දා අලුයම
නැඟිට ඔවුන් එකිනෙකා වෙනුවෙන් දවන යාග පූජා
පුද කළේ ය. එසේ කළේ, යම් හෙයකින් ඔවුන්
තමන් සිතින් පව් කොට, නොදැනුවත් ව
දේවාපහාස කිරීමේ වරදට වැටෙන්නට ඇද්දැ යි
ජෝබ් සිතූ බැවිනි. හැම වාරයෙහි ම ඔහු මෙසේ
කළේ ය.

## දිව්‍ය රාජ සභාව

6 උත් 6:2 තවද, එක් දිනෙක සගලොව රාජ
සභාවෙහි ඇමති මණ්ඩලය සමිඳාණන් වහන්සේ
ඉදිරියෙහි රැස් වූ අවස්ථාවේ දී විරෝධකාරී සාතන්
ද ඔවුන් අතර විය. 7 “නුඹ දැන් මෙහි පැමිණියේ
කොහේ සිට දැ”යි සමිඳාණන් වහන්සේ සාතන්ගෙන්
විචාළ සේක. සාතන් සමිඳාණන් වහන්සේට උත්තර
දෙමින්, “මම මහ පොළොවේ තැනින් තැන සැරිසරා
මෙහි ආවෙමි”යි කී ය.
8 එවිට සමිඳාණන් වහන්සේ, “මාගේ සේවක
ජෝබ් ගැන සොයා බැලීමට නුඹට අවස්ථාවක් වී ද?
ඔහු වැනි විනය ගරුක, අවංක, දේව භය ඇති,
පවින් වැළකී සිටින අන් කිසි අයෙක් මුළු මහ
පොළොවෙහි නැතැ”යි වදාළ සේක.
9 එළිද 12:10 සාතන් උන් වහන්සේට පිළිතුරු
දෙමින්, “ජෝබ් දේව ගරුබිය ඇති කෙනෙකු ව කල්
යවන්නේ යම් හේතුවක් ඇති නිසා නොවේ ද?
10 ඔබ ඔහු ද ඔහුගේ පවුල ද සතු සකල සම්පත්
වටා පවුරු බැඳ රැකවරණය දී නැද් ද? ඔහුගේ හැම
වැඩ කටයුතුවලට ඔබ ආශිර්වාද කොට ඇත.
එබැවින් දේශය මුළුල්ලෙහි ඔහුගේ සම්පත් අති
විශාල ය. 11 හොඳයි, ඔබේ හස්තය දිගු කොට ඔහු
සතු සියල්ලට පහර දී බලන්න. එසේ කළොත්, ඔහු
ඔබේ මුහුණට ම ඔබට සාප කරනු ඇත. එය මට
සිකුරු ය”යි පැවසී ය.
12 එවිට සමිඳාණන් වහන්සේ පිළිතුරු දෙමින්,
“හොඳයි, ජෝබ් සහ ඔහු සතු සියල්ල දැන් ඉතින්
නුඹේ බලයට යට ය. හැබැයි, එකක් කියමි; ඔහුගේ
ඇඟට පමණක් අත තබන්නට නුඹට අවසර නැතැ”යි
සාතන්ට වදාළ සේක. එවිට සාතන් සමිඳාණන්
වහන්සේ වෙතින් ඉවත් ව ගියේ ය.

## ජෝබ්ට පැමිණි විපත්ති

13 එක් දිනක් ජෝබ්ගේ දූ පුතුන් තම වැඩිමහල්
සහෝදරයාගේ නිවසෙහි ආහාර වළඳමින්, මුද්‍රික
පානය බොමින් සිටිය දී මෙසේ සිදු විය:
14 පණිවුඩකාරයෙක් ජෝබ් වෙත වහා දිව අවුත්,
“ගවමහිෂයන් සී සාමින් ද කොටළු දෙනුන් තණ
කමින් ද සිටියදී 15 ෂබොවරු උන් වෙත කඩා පැන,
උන් පැහැරගෙන ගියෝ ය. මෙහෙකරුවන් කඩුවෙන්
මැරූ හ. මපෙවත් ඔබට සැළ කිරීමට යම්තම් ඉතිරි
වූයේ මා පමණකි”යි කී ය.
16 ඔහු කතා කරමින් සිටියදී ම තවත් කෙනෙක්
අවුත්, “අහසින් අකුණක් වැදී බැටළුවන් සහ
එඬේරුන් පිට ඇවිළී ඔවුන් දවා දැමී ය. මපෙවත්
ඔබට සැළ කිරීමට යම්තම් ඉතිරි වූයේ මා
පමණකි”යි කී ය.
17 ඔහු කතා කරමින් සිටියදී ම තවත් කෙනෙක්
අවුත්, “කල්දිවරු කණ්ඩායම් තුනකට සැදී ඔටු රංචු
වෙත පැමිණ පහර දී උන් පැහැරගෙන ගියෝ ය;
මෙහෙකරුවන් කඩු පහරින් මරාදැමූ හ. ඔබට
මපුවත සැළ කිරීමට ඉතිරි වූයේ මා පමණකි”යි කී
ය.
18 ඔහු කතා කරමින් සිටියදී ම සතර වැනි
කෙනෙක් ද අවුත්, “ඔබේ දූ පුතුන් තම වැඩිමහල්
සහෝදරයාගේ නිවසෙහි ආහාර වළඳමින්, මුද්‍රික
පානය බොමින් සිටියදී, 19 කාන්තාරය හරහා චණ්ඩ
මාරුතයක් හමා අවුත් ගෙයි සතර කොණට වැදුණේ
ය. එය දූ පුතුන් පිට කඩා වැටී ඔව්හු මළෝ ය. මේ
පුවත සැළ කිරීමට යම්තම් ඉතිරි වූයේ මා
පමණකි”යි කී ය.

20 මෙපෙවත් ඇසූ ජෝබ් නැඟිට, දුක දරාගත
නොහැකි ව තම වස්ත්‍ර ඉරාගෙන, හිස මුඩු කොට,
මුණින් වැටී වැඳ මෙසේ කී ය:
21 “මම කිසිත් නැති ව මව් කුසින් ආවෙමි;
q2 21 කිසිත් නැති ව පරලොව යන්නෙමි.
q2 21 සමිඳාණෝ දුන් සේක;
q2 21 සමිඳාණෝ ගත් සේක;
q2 21 සමිඳුන් නමට ගරු පැසසුම් වේ වා.”
22 මේ සියල්ලේ දී ජෝබ් පව් කළේත් නැත,
දෙවියන් වහන්සේ පිට දොස් තැබුවේත් නැත.

## සාතන් යළිත් ජෝබ් පෙළෙඹවීම

2 නැවත සගලොව රාජ සභාවෙහි ඇමති
මණ්ඩලය සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි රැස්
වූ විට සාතන් ද ඔවුන් අතර විය. 2 සමිඳාණන්
වහන්සේ කතා කරමින්, “නුඹ දැන් මෙහි පැමිණියේ
කොතැන සිට දැ”යි සාතන්ගෙන් විචාළ සේක.
සාතන් සමිඳාණන් වහන්සේට උත්තර දෙමින්, “මම
මහ පොළොවේ තැනින් තැන සැරිසරා මෙහි
ආවෙමි”යි කී ය.
3 එවිට සමිඳාණන් වහන්සේ කතා කරමින්,
“මාගේ සේවක ජෝබ් ගැන සොයා බැලීමට නුඹට
අවස්ථාවක් වී ද? ඔහු වැනි විනය ගරුක, අවංක,
දේව භය ඇති, පවින් වැළකී සිටින අන් කිසිවෙකු
මුළු මහ පොළොවෙහි නැත. නිරපරාදේ ඔහු
විනාශ කිරීමට නුඹ මා පෙළෙඹවූ නමුත්, ඔහුගේ දේව
භක්තිය කිසි සේත් තව ම අඩු වී නැතැ”යි සාතන්ට
වදාළ සේක.
4 සාතන් ද උත්තර දෙමින්, “ඇඟ බේරාගෙන, පණ
රැක ගැනුම පිණිස මිනිහෙකු නොදෙන දෙයක් ඇද්
ද? 5 හොඳයි, ඔබේ හස්තය දිගු කොට ඔහුගේ
ඇටකටු හා මාංසයට පහර දී බලන්න. එවිට ඔහු
ඔබේ මුහුණට ම ඔබට සාප කරනු ඇතැ”යි කී ය.
6 එවිට සමිඳාණන් වහන්සේ කතා කරමින්,
“හොඳයි, මම ඔහු නුඹ අතට බාර දෙමි. හැබැයි,
ඔහුගේ ප්‍රාණයට නම් අත නොතියන්නැ”යි
සාතන්ට වදාළ සේක.
7 සාතන් සමිඳාණන් වහන්සේ වෙතින් නික්ම
ගොස්, ජෝබ්ගේ යටිපතුල පටන් හිස් මුදුන දක්වා
ඇඟ හැම තැන ම දරුණු කුෂ්ඨයක් හටගන්වා ඔහුට
වද දුන්නේ ය. 8 ජෝබ් අළු ගොඩේ වාඩි වී ඇඟ
කසා ගැනීමට වළං කැබිලිත්තක් ගත්තේ ය. 9 එවිට
ඔහුගේ භාර්යාව කතා කරමින්, “ඔය දේව භක්තිය
පැවැත්තුවා මදි ද? දෙවියන්ට සාප කොට මැරෙණෙ
එක වඩා හොඳ නැද්දැ”යි කීවා ය.
10 එහෙත්, ජෝබ් පිළිතුරු දෙමින්, “මෝඩ ගෑණියක
වාගේ ඔබ කතා කරයි. අපි දෙවියන් වහන්සේ
අතින් සැපත පිළිගනිමු නම්, විපතත් පිළිගත යුතු
නොවේ දැ”යි ඇසී ය. මේ සියල්ලේ දී ම ජෝබ්
වචන මාත්‍රයකින් වත් පව් කළේ නැත.

## මිතුරන්ගෙනේ අස්වැසුම්

11 ජෝබ්ට මිතුරෝ තුන්දෙනෙක් වූ හ. තේමාන්
නුවර එලිපස් ද ෂූහිය බිල්දද් ද නයමා නුවර ශෝපර්
ද ජෝබ්ට පැමිණි දරුණු විපත්ති ගැන දැන ගත්හ.
ඔහු දැක, ශෝකය ප්‍රකාශ කොට ඔහු සනසනු වස්,
සිය ගම්රටවලින් ඔහු වෙත යාමට ඔව්හු නියම
කරගත්හ. 12 ඔවුන් දුර තියා ජෝබ් දුටු විට ඔවුන්ට
ඔහු හඳුනා ගත නොහැකි විය. එහෙත්, ඔහු
හඳුනාගත් කෙණෙහි ම ඔව්හු මහ හඬින් හඬන්නට
වූ හ. ශෝකයෙන් තමන්ගේ සළු ඉරා ගෙන තම
හිස් පිට දූවිලි දමාගත්හ. 13 මෙසේ ඔව්හු රෑ
සතකුත්, දවල් සතකුත් ඔහු සමඟ බිම වාඩි වී
උන්හ. කිසිවෙකේ ඔහුට වචන මාත්‍රයකුදු නොකී හ.
මන්ද, ඔහුගේ ශෝකය ඉතා බලවත් බව ඔවුන්
තේරුම්ගත් බැවිනි.

## ජෝබ් සිය උපන් දිනයට සාප කිරීම

3 ජරෙ 20:14-18 ඉන්පසු මේ තාක් නිහඬ ව
සිටි ජෝබ් තමා උපන් දිනයට සාප කරගනිමින්
2 මෙසේ කී ය:
3 “මා උපන් දිනයට සාප වේ වා!
q2 3 මා වැනි පිරිමි දරුවකු පිළිසිඳ ගත් රාත්‍රියට
සාප වේ වා!
4 ඒ දවස අඳුරෙන් වැසේ වා!
q2 4 සගලොව දෙවිඳාණෝ එය නොතකා හරිත් වා!
q2 4 අරුණාලු එහි නොදිළේ වා!
5 ඒ දවස, ගන'දුරින් හා තද කළු වැහි පටලින්
වැසීයේ වා!
q2 5 හිරු මඬල ද මැකීයේ වා!
6 ඒ රාත්‍රිය, ගන'දුරින් වැසීයේ වා!
q2 6 අවුරුද්දේ දවස්වලත්, මාසයේ දවස්වලත් එය
මකා දමනු ලැබේ වා!
7 එවන් රැයක, වෙනෙ දරු උපතක් සිදු නො වේ වා!
q2 7 සතොස වඩන කිසි හඬකුත් නො වේ වා!
8 මුහුදු සතුන්, දිය රකුසන්, මන්ත්‍ර බලයෙන්
මැඩලන අය එදිනට සාප කරත් වා!
9 ඒ දවස හිරු බැස යන කල අහසෙහි තරු
නොදිළේ වා!
q2 9 එළිය ලැබෙනෙ පැතුම සුන් වේ වා!
q2 9 අරුණාලු උදා නො වේ වා!
10 මේ සියල්ල, මෙසේ සිදු විය යුත්තේ, මවු
කුසෙනේ මා බිහි වී දුක දැක්මෙනේ මා නොවැළැක් වූ
බැවිනි.
11 මවු කුසේ දී ම මා නොමළේ මන් ද?
q2 11 කුසෙනේ නික්ම ආ විගස ම මාගේ පණ
නොගියේ මන් ද?
12 මවු තුරුල්ලට මා පිළිගත්තේ කුමට ද?
q2 12 මවගේ ළයෙහි මව් කිරි මට පෙව්වේ කුමට
ද?
13 මම් එසේ මළෙමේ නම්, දැන් නිසංසල ව
මිනීවළෙහි මට ඉන්න තිබිණි;

q2 13 කරදරයක් කිසිත් නැති ව මරණ නින්දට යන්න
තිබිණි.
14 එසේ වී නම්, නැති වී යන රාජ මාලිගා ඉදි කළ
නිරිඳුන් සහ ඇමතිවරුන් සමඟ මටත් සැතපෙන්නට
තිබිණි.
15 සිය මැදුරු රන් රිදීයෙන් පුරවාගත් කුමරුන් සමඟ
ද මට සැතපෙන්නට තිබිණි.
16 මලොව එළිය නුදුටු දරුවන් මෙන් ගබ්සා වී මා
මිය නොගියේ මන් ද?
17 සොහොනෙහි පව්ටු දනන් තම පව්කම් නිම කර
ඇත;
q2 17 වෙහෙසට පත් කම්කරු දනන් සිය වෙහෙසින්
තොර වී ඇත.
18 සිරකරුවන් හට සොහොනෙහි සාමය ඇත;
q2 18 අණ දෙන නිලධාරීන්ගේ කට හඬ දැන්
ඇසෙන්නේ නැත.
19 සොහොන් ගැබ තුළ ලොකු කුඩා සියල්ලෝ එක
හා සමාන ය;
q2 19 වහලා තම ස්වාමියාගෙන් නිදහස් ය.
20 “එතුමා දුකින් සිටින අයට එළිය දෙන්නේ මන්
ද?
q2 20 සොවින් පෙළෙන අයට දිවි දෙන්නේ මන් ද?
21 එළිද 9:6 ඔව්හු මරු එන තුරු බලා සිටිති;
එහෙත්, මරු එන්නේ නැත.
q2 21 අන් සැම සම්පතට වඩා ඔව්හු සොහොන
අගයේ කරති.
22 සොහොනට යෑම ඔවුන්ට සතුටකි;
q2 22 මිනීවළට යන විට ඔව්හු ප්‍රිය හඬ දෙති.
23 දෙවි තුමන් හැම අතින් ම හිර කර සිටින, තමා
යා යුතු මඟ නොපෙනෙන මිනිසා උපත ලැබුවේ මන්
ද?
24 මාගේ ආහාරය සුසුම් කඳුළු පමණකි;
q2 24 මාගේ කෙඳිරිගෑම, ගලා බසින දිය දහරකි.
25 මා බියජනක දේ මට පැමිණ ඇත.
q2 25 මා තැති ගන්වන හැම දේ මා පිට වැටී ඇත.
26 මාගේ සිතට ශාන්තියක්, සැනසිල්ලක් කොහෙත්
ම නැත;
q2 26 මාගේ දුකට අවසානයක් ඇත්තේ ම නැත.”

### එලිපස්ගේ පළමු වන කතාව

4 එවිට තේමානීය එලිපස් පිළිතුරු දෙමින්
මෙසේ කී ය:
2 “මා ඔබට වචනයක් කීවොත්, එය ඔබට
කරදරයක් වේ ද?
q2 2 අනේ!
q2 2 මා තවත් දුරට නිහඬ ව සිටින්නේ කෙසේ ද?
3 ඔබ, බොහෝ අයට දිරිය දුන් හැටිත්, දුබල අයට
සවිය දුන් හැටිත් සිතා බලන්න.
4 පැකිළෙන අය ඔබා බසින් තිර කොට වැනෙන,
සැලෙන දෙදණ සවි කළ හැටි සිතා බලන්න.
5 එහෙත්, දැන් ඔබ විපතට පත් වී ඇත;
q2 5 ඔබට ඉවසිල්ලක් නැත.
q2 5 විපත ඔබ වෙත පැමිණ ඇත;
q2 5 ඔබ කැළඹී ඇත.
6 ඔබේ ආගමනේ ඔබට සැනසුමක් නැද් ද?
q2 6 දැහැමි ජීවිතයෙන් ඔබට බලාපොරොත්තුවක්
නැද් ද?
7 නිදොස් කෙනෙකු විපතට පත් වූ බව ඔබ අසා
ඇද් ද?
q2 7 දැහැමි අය විනාශයට පත් වූ දවසක් ඔබට
මතක ඇද් ද?
8 මා දැක ඇති ලෙසෙ නම්, අදමිටුකම සී සාමින්
අයුක්තිය වපුරන අය, ඒවා ම නෙළා ගනිති.
9 දෙවිඳුන්ගේ එක හුස්මෙන් පව්ටු දනෝ වැනසී
යති.
q2 9 එතුමන්ගේ උදහස් මාරුතයෙන් ඔව්හු සැම ම
පහ වී යති.
10 සිංහයාගේ ගර්ජනය ද රුදුරු සිංහ රජුගේ
ගෙරවීම ද පහ වී ඇත;
q2 10 සිංහ පෝතකයාගේ දත් ඇදී බිඳී ඇත.
11 සිහ රද ගොදුරක් නොලැබ මිය යයි.
q2 11 සිහදෙනගේ පෝතකයෝ හිස් ලූ ලූ අත විසිර
දුවති.
12 මට එක් කරුණක් රහසින් හෙළි වී ඇත;
q2 12 එහි සියුම් නාදය මා සවනහෙි රුව් දයි.
13 ජෝබ් 33:15 මිනිසා රෑ යාමයෙහි බර නින්දට
පත් ව, ස්වප්න දකින විට, ගැඹුරු සිතුවිලි උදා වන
විට,
14 මා සිරුරහෙි ඇටකටු සැලෙන්නට විය.
q2 14 භීතිය හා කැළඹීම ද මට ඇති විය.
15 මඳ පවනක් මා මුහුණට වැදිණි.
q2 15 එයින් මා සිරුරෙහි හිරිගඩු පිපිණි.
16 යමකේ අවුත් මා ළඟ නැවතුණේ ය.
q2 16 එහෙත්, ඔහුගේ මුහුණුවර මට හඳුනාගත
නොහැකි විය.
q2 16 ඒ රූපය මා අබිමුව විය;
q2 16 අවට නිහඬතාව බිඳ දමමින් මවෙන් හඬක්
ඉන් නිකුත් විය.
17 දෙවිඳුන් අබිමුව කිසිවකුට තමා නිදොස් යැයි
සිතිය හැකි ද?
q2 17 සිය මැවුම්කරු අබිමුව පිවිතුරු කෙනෙකේ සිටිත්
ද?
18 එතුමාණෝ සිය මෙහෙකෙරුවන් කෙරේ වත්
විශ්වාසය නොතබන සේක;
q2 18 දේව දූතයන් හට වුව ද දොස් නඟන සේක.
19 එසේ නම්, පොළොවේ දූවිල්ලෙහි තනන ලද
මැටි ගෙවල වසන අය ගැන කියනුම කවරේ ද?
q2 19 ඔව්හු කාවුන් මෙන් පොඩි කරනු ලබති.
20 උදය සිට සවස වන තුරු ඔව්හු වැනසී යති;
q2 20 කිසිවකුගෙන් සැලකිලි නොලැබ ඔව්හු සදහට
ම වැනසී යති.
21 ඔවුන් සතු සියලු දේ පැහැරගෙන ඇත.
q2 21 කිසි දා ප්‍රඥාව වත් නොලබා ඔව්හු මියයති.
5 “දැන් ඉතින් හඬගා බලන්න.
q2
5 පිළිතුරු දෙන කෙනෙකේ ඇද් ද?
q2

5 සගලාව කවර දේව දූතයකු වෙත ඔබ හැරෙන්නෙහි ද?
2 දැඩි අමනාපය නිසා අනුවණයා නැසීයන්නේ ය.
q2[2] කෝපය නිසා මෝඩයා මියයන්නේ ය.
3 අඥානයා මුල දී සාර්ථක වන සැටි මා දැක ඇත;
q2[3] එහෙත් සැණකින් ඔහුගේ නිවසෙට සාපය පැමිණියේ.
4 ඔහුගේ දරුවන්ට සුරුකියාවක් නැත;
q2[4] නඩුහබවල දී පිහිට වන්න කිසිවකේ නැත.
q2[4] උසාවියේ දී ඔවුන් වෙනුවෙන් පෙනී සිටින කෙනෙකේ නැත.
5 අනුවණයන් රුස් කරන අස්වැන්න සාගිනි ඇති අය කාදමති;
q2[5] කටු අතර වැඩුණු ධාන්‍ය වුව ද ඔව්හු කපා ගනිති;
q2[5] තණ්හා ඇති අය ඔවුන්ගේ වස්තුව පැහැරගන්නට බලා සිටිති.
6 විපත පොළොවේ පසින් හට නොගනියි;
q2[6] දුක භූමියෙන් මතු නොවෙයි.
7 ගිනි පුපුර ගිනි මැලයෙන් ම ඉහළ නඟින්නාක් මෙන් මිනිසාගේ දුක මිනිසාගෙන් ම පැමිණෙයි.
8 එහෙත්, මම නම්, දෙවි තුමන් වෙත හැරී මාගේ නඩුව එතුමන්ට බාර කරමි.
9 එතුමන්ගේ ප්‍රබල ක්‍රියා අචින්ත්‍ය ය;
q2[9] අරුමපුදුම දේ අසංඛ්‍ය ය.
10 දෙවි තුමාණෝ මහ පොළොවට වැසි වස්වන සේක;
q2[10] කෙතේවතු පිට දිය වගුරුවන සේක;
11 එතුමාණෝ පහත් අය උසස් කරන සේක.
q2[11] ශෝක වන්නන්ට ප්‍රීතිය ගෙනෙ දෙන සේක.
12 එතුමාණෝ කපටින්ගේ උපා වළකන සේක;
q2[12] ඔවුන්ගේ හැම ප්‍රයෝග ව්‍යර්ථ කරන සේක.
13 1 කොරි 3:19 කපටින් ඔවුන්ගේ ම උපාවලින් අසුකරගන්න සේක;
q2[13] ශූරයින්ගේ කුමන්ත්‍රණ සැණකින් බිඳ දමන සේක.
14 මහ දවාල ඔවුන්ට තිත්ත කළුවරක් වේ;
q2[14] මද්දහනේ දී රෑ කාලයේ දී මෙන් ඔව්හු අතපත ගාමින් ගමන් කරති.
15 එතුමාණෝ දිළිඳුන් කඩුපතින් ද දුබලුන් බලවතුන්ගෙන් ද ගළවාගන්න සේක.
16 මෙසේ දිළිඳුන් හට පැතුමක් ඇත;
q2[16] අදමිටු දන නිහඬ වනු ඇත.
17 හිතෝ 3:11-12; හෙබ්‍රෙ 12:5-6 දෙවි තුමන්ගෙන් දඬුවම් ලබන මිනිසා වාසනාවන්ත ය.
q2[17] සව් බලැති දෙවි තුමන්ගේ තරවටුවට පිටුපා නොයන්න.
18 හොසි 6:1 තුවාළ කරන්නේත් එතුමාණෝ ය;
q2[18] තුවාළ බඳින්නේත් එතුමාණෝ ය;
q2[18] වේදනාව ඇති වන්නේත් එතුමන්ගේ අතින් ය;
q2[18] සුවය ලැබෙන්නේත් එතුමන්ගේ ම අතින් ය.
19 පිට පිට විපත් පැමිණියත් එතුමාණෝ ඔබ ගළවන සේක;
q2[19] පිට පිට විපත් පැමිණියත් ඔබට අනතුරක් නොවනු ඇත;
20 සාගත සමයෙහි එතුමාණෝ ඔබ මරණින් මුදාගන්න සේක;
q2[20] සටන් සමයෙහි කඩු මුවහතින් ඔබ ගළවාගන්න සේක.
21 බොරුවෙන් හා වැරදි චෝදනාවෙන් ඔබ රැක ගනු ඇත;
q2[21] විනාශයෙන් සිතට භීතියක් නොවනු ඇත;
22 විපත ද සාගතය ද දැක ඔබ සිනාසෙනු ඇත;
q2[22] වග වලසුන්ගෙන් බියක් ඔබට නැත;
23 ඔබේ කෙතේ යායෙහි ගල් මුල් නැත;
q2[23] වන සිවුපාවුන්ගෙන් පීඩාවක් නැත;
24 ඔබේ කූඩාරමෙහි සාමය වැජඹෙන බව ඔබ දන්නෙහි ය;
q2[24] බැටළු ගාලෙන් කිසිදු සතකු නැති නොවන බව ඔබ දන්නෙහි ය.
25 ඔබේ දරු පරපුර වැඩි වනු ඇත;
q2[25] මහා පොළොව මත තණ පත් මෙන් වැඩි වනු ඇත;
26 නියම කන්නයේ පැසුණු ගොයම් මිටියක් මෙන් ඔබ දිගායු වළඳා මිය යනු ඇත;
27 කිරි ගසට ඇන්නාක් මෙන් මේවා සැබෑ බව අත්දැකීමෙන් අපි දනිමු.
q2[27] ඔබත් විමසා බලා මේවා ඔබේ යහපතට බව ඔබ ම දැනගන්න."

### ජෝබ්ගේ පිළිතුර

1+JOB ජෝබ් මෙසේ පිළිතුරු දුන්නේ ය:
q2[1+JOB] "අනේ!
q2[1+JOB] මාගේ සෝදුක් මනින්නටත්, මාගේ විපත් තරාදියේ කිරා බලන්නටත් ඇත්නම්, කොතරම් හොඳ ද?
3 කිරා බැලුවොත්, ඒවා මුහුදේ වැලිවලට වඩා බර ය;
q2[3] මා සැර පරුෂ වචන පැවසීම පුදුමයක් ද?
4 සව් බලැති දෙවිඳුන්ගේ ඊතල මා තුළට වැදී ඇත;
q2[4] ඒවායේ වස විස මසිතට කා වැදී ගොස් ඇත.
q2[4] දෙවි තුමන්ගේ බියකරු ක්‍රියා මට එරෙහි ව පෙළෙගැසී ඇත.
5 තණ කොළ තිබේ නම්, වල් කොටළුවාගේ රාවයක් ඇද් ද?
q2[5] පිදුරු තිබේ නම්, ගොනා තප්පුලයි ද?
6 ලුණු නැති නීරස අහර වළඳන්නේ කවරෙකේ ද?
q2[6] බිත්තර සුදු මදයේ කවර රසක් ඇද් ද?
7 එවන් කෑම කන්නට මට ප්‍රිය නැත;
q2[7] මා කන හැම දේ ම මට අප්‍රිය වේ.
8 මාගේ යැදුම ඉටු වුවහොත්, මාගේ පැතුම දෙවි තුමන් ඉටු කළහොත් කොතරම් හොඳ ද?
9 දෙවි තුමාණෝ මාගේ ඇට කටු බිඳ, සිය අත දිගු කොට මා වනසන සේක් වා!
10 එසේ කළොත්, මට සැනසිල්ලක් ඇත;
q2[10] මාගේ දැඩි දුක මැද මම සතුටින් නටන්නෙමි.

q2 10 මන්ද, කිසි දාක මම ශුද්ධ දවේඳුන්ගේ වචනය
ප්‍රතික්ෂේප නොකළෙමේ.
11 මාගේ දිවි ගෙන යාමට කුමන ශක්තියක් මට
ඇද් ද?
q2 11 මරණය මට නියත නම්, ජීවත් වීමනේ වැඩක්
මට ඇද් ද?
12 ගල් බඳු සවියක් මට ඇද් ද?
q2 12 මාගේ සිරුර ලෝකඩයනේ තනා ඇද් ද?
13 විපතින් මිදනේනට මා තුළ ම ශක්තියක් නැත;
q2 13 පිහිටක් සොයමින් කොයි අත යම් ද?
14 මා දවේඳුන් අත්හැරියත්, නැතත්, මවෙන් දුකේ දී
හිත මිතුරෝ අවශ්‍ය වතේ.
15 එහතේ, මා මිතුරන් වන ඔබ ඔයක් මනේ ද
q2 15 ඉඩෝරයේ දී වේළී යන දිය කඩක් මනේ ද මා
රැවටුවහු ය.
16 ඔයවල් හිමනේ බොර පාට වී හිම කැටිවලින්
වැසී යනු ඇත.
17 ගංවතුර ගැලිය යුතු කාලයේ දී ඒවා අතුරුදහන්
වී, ගිම්හානයේ දී දිය පතුලට ම හිඳී යයි.
18 තවලම්කරුවෝ වතුර සොයමින් වනෙ පාරක
යති.
q2 18 එසේ ගොස් මරුකතරහේ විනාශ වති.
19 තේමාහි තවලම්කරුවෝ වතුර සවෙවෝ ය;
q2 19 ෂබොහි මඟියෝ වතුර බලාපොරොත්තු වූ හ.
20 ඔවුන්ගේ පැතුම් බිඳ වැටිණි;
q2 20 එතැනට පැමිණි විට ඔව්හු වියවුල් වූ හ.
21 විපතක් දැක බිය වන මා මිතුරන් වන ඔබ මට
එවන් ඔයවල් වැන්න.
22 මට යමක් දනේන කියා වත් මා වනුෙවනේ
අල්ලසක් දනේන කියා වත්,
23 රුපුන් අතින් මා මුදන්න කියා වත්,
දාමරිකයන්ගේ අතින් මා ගළවන්න කියා වත් මම
කිසි දා ඔබට කීවමේ ද?
24 හොඳයි! ඔබ මට ඔවදන් දනේන;
q2 24 මාගේ වැරදි පනේවා දනේන;
q2 24 මම නිහඬ ව සිට ඔබට සවන් දනේනමේ.
25 නැණවත් අවවාදය කොතරම් වැඩදායක ද?
q2 25 එහතේ, ඔබ නඟන තර්කයනේ මට කුමන
වැඩක් ද?
26 මා කියන්නේ, පුහු වචනය කියා ඔබ සිතන්නහු
ද?
q2 26 එසේ නම්, පැතුම් සුන් වූ කනෙකේ කුමන
පිළිතුරු බලාපොරොත්තු වන්නේ ද?
27 ඔබ බලන්නේ, කාත් කවුරුත් නැති කනෙකුෙ දාදු
දමා අයිති කරගන්නට ද?
q2 27 සිය මිතුරා වළෙඳෙ බඩුවක් ලසෙ තක්සේරු
කරන්නහු ද?
28 ඉතින් කරුණාකර මා දසෙ බලන්න.
q2 28 ඔබේ මුහුණට ම මම බොරු නොකියමි.
29 ඔය කිව්වා හොඳට ම ඇති!
q2 29 මා ගැන අයුතු කතා නවත්වන්න;
q2 29 මාගේ පැමිණිල්ල යුක්ති සහගත ය;
q2 29 මට වරද නොතබන්න.
30 මා බොරු කියති යි ඔබ තවමත් සිතන්නහු ද?
q2 30 ඇත්ත නැත්ත තීරණයට මට පුළුවන්කමක් නැද්
ද?

7 “මිහි මත මිනිස් ජීවිතය සටනක් නොවන්නේ
ද?
q2

7 එය දවසේ කුලියට වැඩ කරන
කුලීකරුවකුෙගේ දිවිය මනේ නොවේ ද?
2 තුරු සවෙණෙහි විවේකය සොයන වහලකුෙ
මනේ ද වැටුප ගවෙන තුරු බලා හිඳින කුලීකරුවකුෙ
මනේ ද
3 මසින් මසට පාළු සිතින් කල්යැවීමට මට නියම ව
ඇත;
q2 3 රැයින් රැය මම දුකින් දුකට පත්වන්නමේ.
4 මම නින්දට යන කල, ‘රැය ගවේ කොයි වේලේ
නැඟිටිම් දැ’යි කියා ගනිමි.
q2 4 පහන් වන තුරු ඒ මේ අත පරෙළමින්
සිටින්නමේ.
5 මා සිරුරහේ සෑම තැන ම පණුවෝ ඇත;
q2 5 මාගේ ඇඟ හැම තැන හොරිවලින් වැසී ඇත;
q2 5 මාගේ වණවලින් සැරව ගලා යනු ඇත.
6 බලාපොරොත්තු රහිත ව මම දවස් යවමි;
q2 6 ඒවා නූල් කටින නඩාව මනේ යුහුව දුව යයි.
7 “දවේ සමිඳුනි, මාගේ දිවිය සුළං රොදක් පමණක්
බව සිහි කරන්න;
q2 7 වාසනාව මින් මතු මා නොදකිනු ඇත.
8 දැන් ඔබ මා දකින දනෙතේ යළි කිසි දා මා
නොදකිනු ඇත;
q2 8 ඔබේ දනෙතේ මා සොයතත්, මින්පසු මා
දක්නට නැත.
9 නැති වී නොපනෙේ යන වලාකුළක් විලසින්
පාතාලයට බැස යන මිනිසා ආපසු නැඟී නොඑයි.
10 සිය නිවසෙට ඔහු හැරී නොඑයි;
q2 10 ගදෙර උදවිය තවත් ඔහු නොදකිති.
11 “මට නම්, කට වසාගනෙ ඉන්න බැරි ය;
q2 11 දැඩි සිත් තැවුළින් මම කතා කරමි.
q2 11 මා හද තුළ ඇවිලනෙ සෝගින්නනේ විලාප
කියමි.
12 ඇයි මා වටකර මුර කරගනෙ ඉන්නේ?
q2 12 මම දිය රකුසකේ ද?
q2 12 මහ මුහුදේ නාගයකේ ද?
13 ‘මාගේ ඇඳහේ මම සහනය ලබමි.
q2 13 මාගේ යහනහේ සෝදුක නැති කරගනිමි’යි
මම සිතන්නමේ.
14 එවිට, ඔබ ස්වප්නවලින් මා බිය ගන්වන සේක;
q2 14 දර්ශනවලින් මා තැති ගන්වන සේක.
15 මසෙේ ජීවත් වීමට වැඩියනේ ගලෙ මිරිකා
මරණු ලැබීම මට හොඳ ය;
q2 15 මවෙන් දුක් රාශියට වඩා මරණය යහෙකේ.
16 මට කිසි පැතුමක් නැත;
q2 16 මට ජීවිතය තිත්ත වී ඇත;
q2 16 මට හුදකලා ව ඉන්නට ඉඩ දුන මැනව.
q2 16 මාගේ දිවිය සුළං රොදක් පමණකි.

17 ගීතා 8:4; 144:3 ඔබ මිනිසා ගැන මතෙරම්
ඉහළින් සලකන්නටත්, ඔහු වෙත ඔබ සිත
යොමුකරන්නටත්,
18 උදයනේ උදය, මොහොතින් මොහොත ඔහු
සෝදිසි කරන්නටත් මිනිසා කවරකේ ද?
19 මොහොතකට වත් ඔබ මා කරෙනේ ඔබේ
බැල්ම ඉවතට නොගන්න සේක් ද?
q2 19 කළෙ පිඬ ගිලින තකේ වත්, ඔබ මට ඉන්නට
ඉඩ නොදනෙ සේක් ද?
20 මුරකාරයාණනේ, මාගේ පව්න් ඔබට වරදක් වී
ද?
q2 20 ඔබේ දුන්නට මා ඉලක්කයක් කර ගත්තේ
මන් ද?
q2 20 ඔබ හට මා එතරම් බරක් වී ද?
21 ඔබ මාගේ වරදට කමා වී, මාගේ අයුතුකම
පහනොකරන්නේ මන් ද?
q2 21 යුහුව මා දූවිල්ලට හැරනෙු ඇත.
q2 21 ඔබ මා සවේවත් මා දක්නට නැත."

## බිල්දද්ගේ මුල් කතාව

8 එවිට ෂුහිය බිල්දද් මසෙේ කී ය:
q2
8 "හමන සුළඟක් වැනි
2 ඔබේ ප්‍රලාප දඬේම දැන් වත් ඉවරයක් නැද්
ද?
3 දවේ තුමාණෝ යුක්තිය අයුක්තියට පරෙළන
සේක් ද?
q2 3 සව් බලැති දවේඳුන් නඩුව අවනඩුව කරනු ඇද්
ද?
4 ඔබේ දූ දරුවන් දවේඳුන්ට විරුද්ධ ව පව් කළ
බැවින්, ඔවුන්ට දවේඳාණෝ නිසි දඬුවම දුන් සේක.
5 දැන් ඉතින්, ඔබ උනන්දුවනේ දවේඳුන් සොයා, සව්
බලැති එතුමන්ට කන්නලව් කරන්නහෙි නම්,
6 ඔබ නිදොස් ව, අවංක ව සිටින්නහෙි නම්,
සැබැවින් එතුමාණන් ඔබ වනෙුවනේ පිබිද, ඔබේ
දැහැමි නිවසෙට ආසිරි වස්වනු ඇත.
7 "ඔබේ පටන්ගැන්ම සුළු වුව ද අවසානය උසස්
වනු ඇත.
8 ඔබේ පැරණියන් විමසා, මුතුන්මිත්තන් අත්දුටු
දයෙට සිත යොදන්න.
9 අද ඊයේ උදවිය වන අපි කුමක් දනිමු ද?
q2 9 මිහි මත අප දිවිය පහ ව යන සවෙණැල්ලක්
මනේ ය.
10 එහතේ, ඒ පැරණියෝ තමන් රුස් කර දැනගත්
ප්‍රඥාවනේ අපට කතා කරති;
q2 10 ඔවුන්ට සවන් දනේන.
11 "මඩ වගුරු නැති තැන තුන්හිරියා මනා ව
වැවනෙු ඇද් ද?
q2 11 ගොහොරු බිමක් නැති තැන වැටකයෙියා
වැවනෙු ඇද් ද?
12 අමු අමුවේ තිබිය දී ම කැපුවත්, අන් පලා
ජාතීන්ට කලින් ඒවා වියළී යනු ඇත.
13 දවේඳුන් අමතක කරන කොයි මිනිසාගේත්
ඉරණම එසේ ම වේ.
q2 13 දවේඳුන් නොහඳුනන්නාගේ පැතීම ද එසේ ම
වැනසී යන්නේ ය.
14 ඔවුන්ගේ විශ්වාසය නූල් පොටක් මනේ කැඩී
යයි;
q2 14 ඔවුන් අදහන දයෙ මකුළු දැලක් හා සමාන ය.
15 මකුළු දැලට ඔවුන් හේත්තු වුණොත්, එයට
ඔවුන් වාවා ගත හැකි ද?
q2 15 නූල් පොටේ එල්ලුණොත් එයට ඔවුන් දරා
ගත හැකි ද?
16 නපුරු දනෝ හිරු එළියේ සශ්‍රීක වන, වත්ත
පුරා විහිදී යන වල් පැළෑටි වැන්න.
17 ඒවායේ මුල්, ගල් ගොඩේ එතනෙු ඇත;
q2 17 ගල් ඉඩමේ දූව යනු ඇත.
18 යම් කිසිවකෙු ඒවා එතැනින් උදුරා දැමුවොත්,
ඒවා එතැන තිබූ බව වත් කිසිවකේ නොදනිති.
19 ඉන් ඇති වන ප්‍රීතිය නම්, එම බිමනේ අන්
පැළෑටි මතු වීම ය.
20 දවේ තුමන් නිදොස් කනෙකෙු ඉවත ලන්නේ
වත්, නපුරකෙු සමඟ සමගි වන්නේ වත් නැත.
21 එතුමාණෝ ඔබ මුව සිනා රැල්ලනේ ද ඔබ
දතෙොල සතුටු ගීතයනේ ද සරසන සේක.
22 ඔබේ සතුරන්ට අපකීර්තිය අත් වේ;
q2 22 දුදනන්ගේ නිවහන අතුරුදහන් වේ."

## ජෝබ්ගේ පිළිතුර

9 එවිට ජෝබ් මසෙේ පිළිතුරු දුන්නේ ය:
2 ජෝබ් 4:17 "ඔය සියල්ල ඇත්ත ම බව මම
හොඳින් දනිමි.
q2 2 එතුමන්ට විරුද්ධ ව පැමිණිල්ලක් කර මිනිසකෙුට
ජයගත හැකි ද?
3 පැමිණිලිකරු මනේ මිනිසාට දවේඳුන් සමඟ වාද
කළ හැකි ද?
q2 3 එතුමන් අසන ප්‍රශ්න දහසකින් එකකට වත්
මිනිසාට පිළිතුරු දිය හැකි ද?
4 දවේඳාණෝ ප්‍රඥාසම්පන්න ය;
q2 4 සර්ව බලධාරී ය.
q2 4 එතුමන්ට එරහෙි ව කිසිවකෙුට ජයගත හැකි
වේ ද?
5 එතුමාණෝ හිටි හැටියේ ගිරිකුළු දදෙරවා හරින
සේක;
q2 5 සිය උදහසින් ඒවා පරෙළා දමන සේක;
6 මහ පොළොවේ පදනම් කම්පා කරවන සේක;
q2 6 එහි කණු සොලවන සේක;
7 එතුමාණන් අණ කළහොත්, හිරු උදා නොවන්නේ
ය;
q2 7 තරු සඟවා වසා ලීමට එතුමාණන්ට හැකි
වන්නේ ය.
8 ඒ උතුමාණෝ පමණක් ම අහස් තලය දිග හරින
සේක;
q2 8 මහ සයුර පිට ඇවිදින සේක.

9 ජෝබ් 38:31; ආමොා 5:8 මහ වලසා ද මුව සිරස
ද හත්දින්න ද දකුණු දිග තාරකා ද මැවූ සේක.
10 මිනිස් මනසින් සොයාගත නොහැකි මහත් දේ ද
ගණනාවක් නොමැති අසිරිමත් දේ ද කරන සේක.
11 මා ළඟින් ම වැඩියත්, එතුමන් මට පනෙනේනේ
නැත;
q2[11] මා පසු කොට ගියත් මට දකින්න නොහැකි ය,
12 දෙවි තුමන් යමක් ගන්න කල එය වැළැක්විය
හැකි සමතා කවරකේ ද?
q2[12] 'ඔබ ඔය කරන්නේ කුමක් දැ'යි පවසන්නට
කාට හැකි ද?
13 දෙවි තුමන්ගේ උදහස නිරතුරු ව ම පවතිනු
ඇත;
q2[13] රාහබ් නම් දියරකුසාගේ සහචරයෝ එතුමන්
හට අවනත වෙති.
14 එසේ නම්, එතුමන් සමඟ සුදුසු වචනින් වාද
විවාද කිරීමට හැකියාවක් මට ඇද් ද?
15 මා නිදොස් වුව ද එතුමන්ට උත්තර දීමට මම
අපොහොසත් වෙමි.
q2[15] මම විනිසකරුගෙනේ දයාව පතමි.
16 මා එතුමන් ඇමතූ විට එතුමන්ගෙනේ පිළිතුරක්
ලැබුණේ ය.
q2[16] එතුමාණෝ මට සවන් දනෙ සේකැ යි විශ්වාස
කළ හැකි ද?
17 එතුමාණෝ සැඬ සුළඟින් මට පහර දී තව
තවත් මට නිකරුණේ තුවාළ කරන සේක.
18 එතුමාණෝ මට හුස්ම ගන්නට වත් ඉඩ නොදී
සිත් තැවුළින් මා පුරවන සේක.
19 ශක්තිය ගැන සිතමු නම්, එය ඇත්තේ එතුමන්ට
ය.
q2[19] මා ගැන යුක්තිය විසඳීම උදසො එතුමන්
කැඳවීමට සමතා කවරකේ ද?
20 'මම නිදොස් වෙමි'යි මා කටින් කීවත්, මාගේ ම
වචනය මා වරදට පත් කරයි.
q2[20] මාගේ හැම උත්තරයක් ම මා වරදකරුවකු
කරයි.
21 මා නිදොස් වුවත්, ජීවිතයනේ මට කමක් නැත;
q2[21] ජීවිතයනේ මට වැඩක් නැත.
22 මට කොයි එකත් එක ය.
q2[22] වැරදි වුවත්, නිවැරැදි වුවත් දෙවි තුමන් අප
විනාශ කරන බව මට පනේ.
23 විපතින් හදිසි මරණය එන විට නිදොස් අයගේ
විපත්තිය ගැන එතුමාණෝ සිනාසනෙ සේක.
24 ලෝකය කුදිටු අය අතට බාර දී තිබේ;
q2[24] විනිසකරුවන්ගේ ඇස් අන්ධ කර ඇත.
q2[24] එසේ නොවේ නම්, මෙසේ වන්නේ කෙසේ
ද?
25 මාගේ කල දවස, දුවන පණිවුඩකාරයකුට වඩා
වේගයනේ ගවෙයි.
q2[25] එය හොඳක් නොදැක පලා යයි.
26 මාගේ දිවිය වේගයනේ යන නැවක් මෙනේ ද
ගොදුරු පිට කඩා වදින රාජාලියකු මෙනේ ද පහ ව
යයි.
27 මාගේ විලාපය අමතක කොට, 'මම මාගේ
දොම්නස් පනෙම සොම්නසට වනෙස් කරමි'යි කීවත්,
28 මම මාගේ සියලු දුක්ගැනවිලිවලට බියනේ
සිටිමි.
q2[28] මා නිදොස් ලසෙ ඔබ ගණන් නොගන්න බව
මම දනිමි.
29 'නුඹ වරදකරුවකෙ'යි ඔබ වදාරන සේක් නම්,
මාගේ වහෙසෙ වීමනේ වැඩක් ඇද් ද?
30 සුදු හිම දියනේ නා ගනෙ මාගේ දෑත කොතරම්
සුදෝ සුදු කරගත්තත්,
31 ඔබ මා මඩ වළට හළෙන සේක.
q2[31] මාගේ ම ඇඳුම් මට ම පිළිකුලකි.
32 එතුමන්ට කට උත්තර දනේනට වත්, එතුමන්
සමඟ උසාවියට යන්නට වත් මට පුළුවන්කමක්
නැත.
q2[32] එතුමාණෝ මා වැනි මිනිසකේ නොවන සේක.
33 අප දපෙසට මැදින් අප අතර සමගිය ඇති
කිරීමට මැදහත්කරුවකේ නැත.
34 ඔබේ දඬුවම මා කරෙනේ පහකළ මැනව.
q2[34] ඔබේ භීතියනේ මා ත්‍රස්ත නොකළ මැනව.
35 එවිට මම නොබිය ව කරුණු කියමි.
q2[35] එසේ නම්, බියට හේතුවක් මට නැත.

10 "මට ජීවිතය තිත්ත වී ඇත;
q2
10 මාගේ දුක් ගැනවිලි නොවළහා කියා පාමින්
සොවින් පිරුණු හදවතකින් මම කතා කරමි.
2 මම දෙවිඳුන්ට මෙසේ කියමි:
q2[2] 'මා වරදට පත් නොකළ මැනව;
q2[2] මට විරුද්ධ ව ඔබ කරන පැමිණිල්ලට හේතුව
පැවසුව මැනව.
3 මෙසේ මා පළෙීමත්, ඔබේ ම මැවිල්ල වන මා
හළො දැකීමත්, දුදනන්ගේ ක්‍රියා කලාපය ගැන
සතුට පහළ කිරීමත් ඔබට සුදුසු යැයි වැටහේ ද?
4 ඔබට ඇත්තේ මිනිස් දනෙතෙක් නොවේ.
q2[4] ඔබ අප වාගේ මිනිස් ඇසින් බලන්නේ නැත.
5 ඔබේ දවස් මිනිසාගේ දවස් මෙනේ නොවේ.
q2[5] ඔබේ අවුරුදු මිනිසාගේ අවුරුදුවලට සමාන
නැත.
6+JOB ඔබ මා දුදනකු නොවන බව දැන දැනත්,
ඔබ අතින් මා මුදාගැනීමට අන් කිසිවකු නැති බව
ඔබට පනෙී පනෙීත්, මාගේ අපරාධ ගැන සොයා
බලන්නේ මන් ද?
q2[6+JOB] මාගේ පව් විමසන්නේ මන් ද?
8 ඔබේ දෑතින් මට රූපය දී ඔබ මා මැවූ සේක.
q2[8] ඒ දෑතින් ම දැන් ඔබ මා නසන සේක් ද?
9 ඔබ මා මැටි අඹන ලසෙ සෑදූ බව සිහි කරන්න.
q2[9] දැන් ඔබ මා යළි දූවිල්ලට හරවන සේක් ද?
10 කිරි බිඳක් කැටි වන ලසෙ ඔබ මාගේ කළල
රූපය මවු කුසහෙි සවි වන්නට සැලැසූ සේක;
11 ඇට හා නහර මට දී හම හා මස්වලින් ඔබ මා
පැළඳවූ සේක.
12 ඔබ මට ජීවිතයත්, ප්‍රමේයත් දානය කළ
සේක.

q2 12 දයාන්විත බැල්මනේ මාගේ පණ නළ රැක දුන්
සේක.
13 එහතේ, ඔබ හදවතහෙි මේ සියලු දේ සඟවා
ගත් සේක.
q2 13 ඔබේ අරමුණ කුමක් දැ යි මම දනිමි.
14 මා පව් කරන විට ඔබ සටහන් කර ගන්න
සේක;
q2 14 මාගේ අපරාධයනේ නිදහොස් වීමට ඔබ මට
ඉඩ නාෙදනෙ සේක.
15 මම දුෂ්ටයකේ වීම් නම්, මට වන විපතක
මහත!
q2 15 මම දැහැමි කනෙකේ වීම් නම්, ලජ්ජාවනේ
මිරිකී කාලකණ්ණි ව සිටිනු මිස හිස එසවීමක් මට
නැත.
16 මා හිස එසවේවත්, සිංහයකෙු මනේ ඔබ මා
ලුහුබැඳ අරුමපුදුම ලසෙ ඔබ තවත් ජයග්‍රහණයක්
ලබන සේක.
17 මට විරුද්ධ ව අලුත් සාක්ෂි ඔබ ඉදිරිපත් කරන
සේක.
q2 17 මා කරෙේ ඔබේ උදහස තව තවත් වැඩි
කරන සේක.
q2 17 පහර පිට පහර මට එල්ල කරන සේක.
18 ‘ඉතින් ඔබ මවු කුසින් මා ගනොයේ කුමට ද?
q2 18 කවුරුත් නාෙදැක මා එහි ම මළා නම් හාෙඳ
ය.
19 උපත වනෙුවට මවු ගැබනේ කළෙින් ම
සාෙහාෙන් ගැබට ගියා නම්, එය මට යහෙකෙ’යි
සිතමි.
20 මාගේ ජීවිතය ලුහුඬු ය, මා සිතූ හැටියට
නිදහසේ සිටින්නට මට ඉඩ දී අල්ප මාත්‍ර ප්‍රීතියක්
මට දුන මැනව.
21 මම විගසින් තුරන් වී යමි;
q2 21 ගාෙස් කිසි දා ආපසු නාෙඑමි.
q2 21 අඳුරු, කළුවර දේශයට යමි.
22 ඒ දේශය වියවුලින් පිරී ඇත;
q2 22 දැඩි අන්ධකාරයනේ ද කළු සවෙණැල්ලනේ ද
වියවුලනේ ද පිරී ඇත.
q2 22 එහි ආලෝකය පවා අන්ධකාරයකි.”

### ශෝපර්ගේ පළමු වන කතාව

**11** එවිට නයමාතීය ශෝපර් පිළිතුරු දමේන්
මසෙේ කී ය:
2 “මේ වාග් ප්‍රවාහයට පිළිතුරක් දිය යුතු නාෙවේ
ද?
q2 2 කනෙකෙු බාෙහාෙ කතා කරන පළියට ඔහු
වරදින් නිදහස් ද?
3 සීමාවක් නැති ඔබේ ප්‍රලාපවලින් අප නිහඬ
කිරීමට ඔබ සිතන්නහෙි ද?
q2 3 ඔබ අනන්මනන් දාෙඩන විට යමකෙු ඔබට
දාෙස් නාෙනඟා සිටිනු ඇද් ද?
4 ඔබ පවසන දයෙ ඇත්ත යයි ඔබ සිතන්නහෙි ය.
q2 4 ‘දවෙිඳුනි, ඔබ අබිමුව මම නිදාෙස් යැ’යි ඔබ
කියන්නහෙි ය.
5 දවෙියන් වහන්සේ සිය මුව විදහා ඔබට කතා
කරන සේක් නම්,
q2 5 මම කාෙතරම් කැමැති ද?
6 එවිට එතුමාණන් තමන් ප්‍රඥාව නන් වැදෑරුම්
බවත්, මිනිස් මනසින් දත නාෙහැකි ගැඹුරු දේ
තිබනෙ බවත් ඔබට පනේවනු ඇත.
q2 6 දවෙියන් වහන්සේ ඔබට දී ඇත්තේ දිය යුතු
දඬුවමට අඩුවනේ බව දැනගන්න.
7 ඔබට දවෙිඳුන්ගේ අබිරහසේ ගැඹුර දැකිය හැකි
ද?
q2 7 සව් බලැති එතුමන්ගේ සම්පූර්ණත්වය දැක ගත
හැකි ද?
8 එය අහසටත් වඩා උස ය;
q2 8 ඔබට කළ හැකි කිසිවක් ඇද් ද?
q2 8 එය පාතාල ලෝකයට වඩා ගැඹුරු ය;
q2 8 ඔබට දැනගත හැකි කිසිවක් ඇද් ද?
9 එය මහ පාෙළාෙවට වඩා විශාල ය.
q2 9 මුහුදට වඩා පළල ය.
10 එතුමාණන් අවුත් ඔබ හිරබාරයට ගනෙ නඩු
ආසනය වතෙ ගනෙ ගියාෙත්, එය වැළැක්විය හැකි
කාට ද?
11 එතුමාණෝ හාෙර බාෙරු කරන අය මැනවින්
දන්න සේක.
q2 11 ඔවුන්ගේ නපුරු ක්‍රියා දුටු විට එතුමන්ට
නාෙසලකා සිටිය හැකි ද?
12 මාෙළේ නැති කනෙකෙුට නැණවත් විය හැකි ද?
q2 12 වල් බූරු පැටියකෙු හීලෑ කළ හැකි ද?
13 ඔබේ සිත හරි මඟ යවන්න;
q2 13 දාෙහාෙත් මුදුන් දී දවෙිඳුන් වතෙ හැරනේන.
14 ඔබ අත වරද තිබේ නම්, එය ඉවත ලන්න;
q2 14 ඔබේ නිවසෙහෙි අයුක්තියට ඉඩ නාෙදනේන.
15 එවිට ඔබට නිදාෙස් ව, හිස ඔසවා සිටිය හැකි
ය.
q2 15 බිය සැක නැති ව සුරක්ෂිත ව විසිය හැකි ය.
16 ඔබේ දුක් ගැනවිලි, බැස ගිය ගංවතුරක් මනේ
ඔබට අමතක වනු ඇත.
17 ඔබේ ජීවිතය මද්දහනේ හිරුට වඩා දීප්තිමත්
වනු ඇත.
q2 17 ඔබේ ගන’ඳුර හිරු උදාවට හැරනෙු ඇත.
18 බලාපාෙරාෙත්තු ඇති බැවින් ඔබට ආත්ම
විශ්වාසය ඇත;
q2 18 ඔබ සිත් සතාෙසින් සුරක්ෂිත ව සැතපනෙු
ඇත.
19 ඔබ කිසිවකෙුගනේ බියක් නැති ව සුව සේ
නිදනු ඇත.
q2 19 බාෙහාෙ දනෙකෙු ඔබනේ කරුණාව සාෙයා එනු
ඇත.
20 එහතේ, දුදනන්ගේ ඇස් නාෙපනේී යයි;
q2 20 ගැළවීමේ මඟක් ඔවුන්ට නැත.
q2 20 ඔවුන්ට ඇති එක ම පැතුම මරණය වේ.”

### ජෝබ්ගේ පිළිතුර

12 ඊට පිළිතුරු වශයෙන් ජෝබ් මෙසේ කී ය:
2 “ඔබයි, පණ්ඩිතවරු!
q22 ඔබ මියයන දා ප්‍රඥාවත් මිය යනු ඇත!
3 මටත් ඔබට මෙන් ම මොළේ නැද් ද?
q23 මම ඔබට දෙ වැනි නොවෙමි.
q23 ඔය කී දේවල් නොදන්නෝ කවුරු ද?
4 මම දෙවියන් අයැද උත්තර ලත් මිනිසෙකිමි;
q24 එහෙත්, මාගේ මිතුරන් හට දැන් මම විහිළුවක්
වී සිටිමි.
q24 අනේ!
q24 දැහැමි, අවංක මිනිසා විහිළුවක් වන හැටි!
5 සැප ඇති අය අසරණයන් සුළු කර සිතති;
q25 වැටෙන්නට යන අයට පහර දී බිම හෙළති.
6 කොල්ලකාරයන්ගේ නිවසෙට සාමය උදා වෙයි;
q26 දෙවියන් කෝප කරන අය යහතින් වසති.
q26 ඔවුන්ගේ ම ශක්තිය ඔවුන්ගේ දෙවියන් වී
ඇත.
7 එහෙත්, පොළොවේ සතුන්ගෙන් අසන්න;
q27 උන් ඔබට උගන්වනු ඇත.
q27 අහසේ සියොතුන්ගෙන් අසන්න;
q27 උන් ඔබට දන්වනු ඇත.
8 පොළොවේ බඩ ගා යන සතුන් ඔබට කරුණු
පහදා දෙනු ඇත.
q28 මුහුදේ මසුන් ඔබට තේරුම් කර දෙනු ඇත.
9 සමිඳුන්ගේ හස්තය මේ සියල්ල කළ බව
තේරුම්ගන්නෝ ඔවුන්ගෙන් කවුරු ද?
10 දිවි ඇති සියලු සතුන්ගේ පණ නළ ද මුළු මිනිස්
සංහතියේ ජීවිතය ද එතුමන් අතෙහි ඇත.
11 දිවෙන් කෑම රස බලන්නාක් මෙන් කනින් අසන
වචන මනස විමසනවා නොවේ ද?
12 වයස්ගත අය හට ප්‍රඥාව ඇත.
q212 වයස්ගත වීම සමඟ නැණ නුවණ උදා වේ.
13 දෙවියන් වෙත ප්‍රඥාව හා බලය යන දෙක ම
ඇත.
q213 විනිශ්චය හා නුවණ එතුමන් අතෙහි ය.
14 එතුමාණන් කඩාදමන තැන පුනරුත්ථානයක්
නැත.
q214 එතුමාණන් සිරගත කරන මිනිසාට විමුක්තියක්
නැත.
15 එතුමාණන් වැස්ස දුන් විට එය නැවතුවහොත්
ඉඩෝරය පැමිණේ.
q215 යළි වැස්ස දුන් විට රට යට කරන මහ
ගංවතුරු ගලයි.
16 බලය හා දක්ෂකම එතුමන් වෙත ඇත.
q216 රැවටෙන්නාත්, රවටන්නාත් දෙදෙනා ම
එතුමන්ගේ බලය යටතේ ය.
17 එතුමාණෝ අනුශාසකයන් මන්ද බුද්ධිකයන්
කරන සේක;
q217 විනිශ්චයකාරයන් මෝඩයන් කරන සේක.
18 එතුමාණෝ රාජ බලය බිඳදමා, රජවරුන් දාසයන්
කරන සේක;
19 එතුමාණෝ පූජකවරුන් බලයෙන් ඉවත් කරන
සේක.
q219 බලවතුන් පහළට හෙළෙන සේක;
20 එතුමාණෝ චතුර කථිකයන් නිහඬ කරන
සේක;
q220 මහලු අයගේ තැන්පත් බුද්ධිය ඉවත් කරවන
සේක.
21 එතුමාණෝ රජ කුමරුන් අවමානයට ලක් කරන
සේක;
q221 වංශාධිපතීන්ගේ අභිමානය බිඳ හෙළෙන සේක.
22 කළුවර තැන්වලට ආලෝකය එවන සේක;
q222 තිත්ත කළුවර ආලෝක කරන සේක,
23 එතුමාණෝ ජාතියක් උසස් කොට එය විනාශ
කරන සේක;
q223 ජනතාවක් වර්ධනය කොට ඔවුන් නසා ලන
සේක.
24 එතුමාණෝ ලොවේ ජන නායකයන්ගේ නුවණ
පහකරන සේක;
q224 හසරක් නැති වැලි කතරෙහි ඔවුන් මුළා කරන
සේක;
25 ඔව්හු එළියක් නැති දැඩි අඳුරෙහි අතපතගාමින්
ඇවිදිති;
q225 වෙරි මතින් වැනි වැනි ගමන් කරන බේබද්දන්
මෙන් යති.
13 “බලන්න, ඔබ කී සියල්ල මාගේ ඇසින් දැක,
කනින් අසා තේරුම් ගතිමි.
2 ඔබ දන්න දේ මමත් දනිමි.
q22 මාගේ දැනුම ඔබේ දැනුමට දෙ වැනි නොවේ.
3 එහෙත්, මාගේ කතාව සව් බලැති දෙවියන් සමඟ
ය.
q23 එතුමන් සමඟ තර්ක කරන්නට සැරසී සිටිමි.
4 ඔබ වනාහි ඇත්ත සඟවා නැත්ත කියන අය
වන්නහු ය.
q24 ඔබ කවුරුත් කූට වෙද්දු ය.
5 ඔබ නිහඬ ව ඉන්නහු නම්, ඔබ පැණවත්හු යයි
සලකනු ලබන්නහු ය.
6 කරුණාකර, මාගේ තර්කවලට සවන් දෙන්න.
q26 මාගේ විවාදවලට කන් දෙන්න.
7 ඔබ ඇත්ත සඟවන්නේ දෙවියන් වෙනුවෙන් ද?
q27 ඔබ නැත්ත කියන්නේ එතුමන් උදෙසා ද?
8 ඔබ දෙවියන්ට පක්ෂ ව වාද ඉදිරිපත් කරන්නහු
ද?
q28 උසාවියෙහි එතුමන්ගේ නඩුව තර්ක කරන්නහු
ද?
9 එතුමන් ඔබ හොඳින් විමසා බැලුවොත් යහපත්
දෙයක් සම්බ වනු ඇද් ද?
q29 මිනිසුන් රවටන්නාක් මෙන් එතුමන් රවටන්නට
ඔබට හැකි වේ ද?
10 ඔබ, නිකරුණේ මට වරද තබන්නහු නම්,
එතුමන් නොවරදවා ම ඔබට දඬුවම් දෙන බව
සත්තක ය.
11 එතුමන්ගේ ශ්‍රී මහිමය ඔබ බිය ගන්වන්නේ
නැද් ද?

q2 11 එතුමන්ගේ භයංකරකම ඔබ යටපත්
කරන්නේ නැද් ද?
12 ඔබේ උපදේශ පරණ හණ මිටි වැනි ය.
q2 12 ඔබේ තර්ක කඩා හැලනෙ මැටි තාප්ප වැනි ය.
13 නිශ්ශබ්ද වන්න;
q2 13 මට කතා කරන්න ඉඩ දනේන:
q2 13 වන දයෙක් වුණා වේ.
14 මම බලේලේ වැල දමාගන්නට කැමැත්තමේ;
q2 14 දිවි නසාගන්නට පවා සූදානම් ය.
15 එතුමාණන් මා මැරුවත් මට කමක් නැත.
q2 15 මට බලාපොරොත්තුවක් නැත.
q2 15 එහතේ, එතුමන් ඉදිරියෙහි මාගේ නඩුව කියා
පාන්නමේ.
16 මසෙේ මුහුණ පෑම ම මාගේ ගැළවීම විය හැක.
q2 16 මන්ද යත්, අභක්තික කිසිවකෙු එතුමාණන්ට
මුහුණ නොපාන බව මම දනිමි.
17 මට සවන් දනේන;
q2 17 මාගේ මේ කතාව හොඳ හැටි අසන්න.
18 මනේන, මාගේ විත්තිය පිළියළෙ කොට ඇත, මා
නිදොස් වන බව සිකුරු ය.
19 නඩුවේ දී මා සමඟ තර්ක කරන සමතකේ ඇද්
ද?
q2 19 එවැන්නකේ ඇත්නම්, මම නිහඬ වී මරණයට
යමි.
20 මේ කරුණු දකෙ පමණක් ඉල්ලා සිටිමි.
q2 20 එවිට මම ඔබ අබිමුවින් සැඟවී නොයෙමි.
21 ඔබේ හස්තය මා කරෙනේ ඉවතට ගත මැනව.
q2 21 ඔබේ භයංකරකමින් මා යටත් නොකළ
මැනව.
22 ඉන්පසු ඔබ මට විරුද්ධ ව චෝදනා කළොත් මම
උත්තර දමේ.
q2 22 නැතහොත් මම සිතාසිය නිකුත් කරමි;
q2 22 ඔබ විත්තිය කියන්න.
23 අපරාධ හා පව් කීයක් ගැන මම වරදකරු වමේ
ද?
q2 23 මාගේ වරද හා පාපය මට දැන්නුව මැනව.
24 ඔබ මාගනේ මුහුණ සඟවාගනෙ මා ඔබේ
සතුරකෙු කොට ගණන් ගන්නේ මන් ද?
25 සුළඟේ ගසාගනෙ යන පරඬලාපතකට ඔබ
හිරිහැර කරන සේක් ද?
q2 25 වියළි පිදුරු ගසක් පසුපස එළවාගනෙ යන
සේක් ද?
26 ඔබ මට විරුද්ධ ව දරුණු චෝදනා ගනෙනෙ
සේක:
q2 26 මා තරුණ වියේ දී කළ අයුතුකම් පවා ඔබ
දැන් මා පිට පවරන සේක.
27 ජෝබ් 33:1 මාගේ දපො දඬුකඳහෙි දමන
සේක.
q2 27 ඔබ මා යන යන තැන විමසන සේක.
q2 27 මාගේ ගමනට සීමා තබන සේක.
28 ඒ නිසා මාගේ දිවිය දිරා ගිය ලීයක් මනේ ද
කාවුන් කෑ කබායක් මනේ ද දුබල වී ඇත.
14 "මවු කුසින් උපන් හැම කනෙකෙුගේ ම
ජීවිත කටේ ය, දුකින් පිරී ඇත.
2 ඔහු මලක් මනේ පිපී, පර වී යන්නේ ය.
q2 2 නොපවතින සවෙණැල්ලක් මනේ පහ ව
යන්නේ ය.
3 එවැන්නකෙු දසෙ ඔබ නතේ යොමා බලන සේක්
ද?
q2 3 උසාවියහෙි ඔබ වතෙ ඔහු කැඳවන සේක් ද?
4 අපවිත්ර දයෙකින් පවිත්ර දයෙක් උපදවන්න කාට
හැකි ද?
q2 4 කිසිවකෙුට බැරි ය!
5 මිනිසාගේ ආයු මිම්මක් ඇත.
q2 5 ඔහුගේ අවුරුදු ඔබ අතේ ය.
q2 5 ඔහුගේ කාල සීමා ඉක්මවා නොයෙන පරිදි ඒවා
පිහිටුවා ඇත.
6 පැයවල් ගණන් බලමින් කුලීකරුවකෙු මනේ සිටින
ඔහුගනේ ඔබේ ඇස් ඉවතට ගනෙ ඔහුට විවේකය
දුන මැනව.
7 ගසක් කපා දැමුවොත්, එය යළිත් ලියලා එහි
රිකිලි හටගනු ඇතැ යි බලාපොරොත්තුවක් ඇත.
8 ඒ ගසේ මුල් බොහෝ කල් පොළොවේ දිරා
ගියත් එහි කඳ බිම වියළී ගියත්,
9 වතුර උරා ගත්තොත් දලු ලා පැළෑටියක් මනේ
යළිත් අතු ලියලනු ඇත.
10 එහතේ, මනුෂ්යයා මැරුණොත් මැරුණා ම යි.
q2 10 ඔහු මියගිය විට යන්නේ කොතැනට ද?
11 වැවේ වතුර සිඳී යන්නේ ය;
q2 11 ගඟ හිඳී වියළී යන්නේ ය;
12 එසේ ම, මිනිසා මියගිය කල යළි නොනැඟිටියි;
q2 12 ඉර හඳ පහවන තුරු ඔහු නොපිබිදයෙි.
q2 12 සිය නින්දනේ නැඟිට නොඑයි.
13 අනේ!
q2 13 ඔබ මා පාතාල ලෝකයේ වසා දමා ඔබේ
උදහස පහවන තුරු මට රැකවරණය දී, මට
කාලාන්තරයක් නියම කොට මා සිහි කරන සේක්
නම්, මම කැමැත්තමේ.
14 මියගිය පසු, මිනිසකේ යළිත් ජීවත් වයෙි ද?
q2 14 මම නම්, මාගේ නිදහස පැමිණනෙ තකේ
ජීවිත සටනේ සියලු දවස්වල බලාපොරොත්තුවනේ
පසු වමේ.
15 ඔබ හඬගසන සේක:
q2 15 මම උත්තර දනේනමේ;
q2 15 ඔබ මැවූ මැවිල්ල ගැන ඔබ සතුටු වන සේක.
16 එහතේ දැන් ඔබ මාගේ පියවර ගණන් කරන
සේක;
q2 16 මාගේ පව් ගණන් කර බලන සේක.
17 ඔබ මාගේ පව් මල්ලක දමා මුද්රා තබා ඇත.
q2 17 මාගේ අපරාධ වසා සඟවා ඇත.
18 "කන්දක් ගරා වැටී සුණු විසුණු වන්නාක් මනේ,
පර්වතයක් එය පිහිටි තැනින් පහ ව යන්නාක් මනේ,
19 වතුරනේ ගල් ගවේ යන්නාක් මනේ,
ජලප්රවාහයනේ පොළොව සේදී යන්නාක් මනේ
ඔබ මිනිසාගේ පැතුම් සුන් කරන සේක.
20 ඔබ අවසානය දක්වා ඔහු පරාජය කරන සේක.
q2 20 ඔහු අතුරුදහන් වී යයි;

q2[20] ඔහුගේ මුහුණේ රූප විලාශය වනෙස් කොට
ඔබ ඔහු පහකරන සේක.
21 ඔහුගේ පුත්‍රයන් ගෞරවයට පැමිණෙන විට,
එපවත් ඔහු නොදනියි.
q2[21] ඔවුන් අවමානයට පැමිණෙන විට ද ඔහුට
දැනුමක් නැත.
22 එහෙත්, ඔහුට දැනෙන්නේ ඔහුගේ සිරුරේ
වේදනාව පමණකි.
q2[22] ඔහු වැලපෙන්නේ තමා ගැන පමණකි."

### එලිපස්ගේ දෙවන කතාව

15 ඊට පිළිතුරු වශයෙන් තේමානීය එලිපස්
මෙසේ කී ය:
2 "සිහි නුවණ ඇති කිසිවෙක් සුළඟක් වැනි පුහු
ප්‍රලාප දොඩයි ද?
q2[2] වැදගැම්මකට නැති වචනවලින් සිය සිත් පුරවා
ගනු ඇද් ද?
3 ඔහු නිෂ්ඵල වචන හා වැඩක් නැති කතාවලින්
තර්ක කරනු ඇද් ද?
4 ඔබ දේව භක්තිය ඉවත ලා දෙවිඳුන් ඉදිරියෙහි
භාවනා නවත්වා ඇත.
5 ඔබේ ම වචනවලින් ඔබ වරදකරු බව පෙනෙයි.
q2[5] චාටු කතාවලින් ඔබ නිවැරැදි වන්න සොයයි.
6 ඔබ වරදට පත් කරන්නේ ඔබේ ම වචනය වේ;
q2[6] මම නොවෙමේ.
q2[6] ඔබේ ම මුඛය ඔබට විරුද්ධ ව සාක්ෂි දරයි.
7 "මලොව උපන් පළමු වන මිනිසා ඔබ යයි ඔබ
සිතන්නෙහි ද?
q2[7] ඔබ කඳු හලේවලට පෙර බිහි වුණෙහි ද?
8 දෙවිඳුන්ගේ රහස් මන්ත්‍රණවලට ඔබ සවන් දී
ඇද් ද?
q2[8] මිනිස් ප්‍රඥාව ඇත්තේ ඔබට පමණකැ යි
සිතන්නෙහි ද?
9 අපට නොමැති දැනුමක් ඔබට ඇත්තේ ද?
q2[9] අපට නැති තීක්ෂණ බුද්ධියක් ඔබ සතු ව
ඇත්තේ ද?
10 ඔබේ පියාට වඩා වයෝවෘද්ධ, කෙස් පැසුණු
පැරැන්නෝ අප අතර සිටිත්.
11 දෙවිඳාණන් ඔබ සවනතට මෘදු ලෙස කොඳුරා
කියන අස්වැසිලි වදන් ඔබ අගේ නොකරන්නෙහි ද?
12 ඔබේ සිත දමනය කිරීමට ඔබ අසමත් ද?
q2[12] ඔබේ දෙනෙත ගිනි පුපුරු මෙන් දිළිසෙන්නේ
මන් ද?
13 දෙවිඳුන්ට විරුද්ධ ව නැඟී සිට මෙවැනි වචන
ඔබ දොඩන්නේ මන් ද?
14 ජෝබ් 25:4-6 පවට නැමුණු මිනිසාට සුපිරිසිදු
කෙනෙකු විය හැකි ද?
q2[14] මව් කුසින් උපන් කවරකු කොතෙකේ දැහැමි
වනු ඇද් ද?
15 දෙවිඳාණෝ සැදැහැවතුන් වුව ද විශ්වාස
නොකරන සේක;
q2[15] සගලොව වුව ද එතුමන් ඉදිරියෙහි පිරිසිදු
නැත.
16 එසේ නම්, දිය මෙන් අපරාධ බොන, පිළිකුල්,
පව්ටු මිනිසා ගැන කියනුම කවරේ ද?
17 "මට සවන් දෙන්න.
q2[17] මම කරුණු පහදා දෙමි.
q2[17] අත්දැකීමෙන් ලත් මාගේ දැනුම විස්තර කරමි.
18 ප්‍රාඥයෝ සිය මුතුන්මිත්තන්ගෙන් අසා දැනගත්
දෙය නොවළහා පවසති.
19 දේශය ඔවුන්ට ම හිමි ව තිබිණි;
q2[19] පිටරැටියෝ ඔවුන් අතර නොවූ හ.
20 දුෂ්ටයා ජීවිතයේ සියලු දවස්වල ද සාහසිකයා
දිවි ඇති තාක් ද දුක් වේදනාවෙන් පෙළෙනු ඇත.
21 බියකරු හඬ ඔහුගේ සවනත රැව් දෙයි.
q2[21] සුව සේ සිටින විට පවා සොර සතුරෝ ඔහුට
පහර දෙති.
22 අඳුරු මරු මුවින් මිදීමේ බලාපොරොත්තුවක්
ඔහුට නැත.
q2[22] කඩු පහර තමාගේ ඉරණම බව ඔහුට
සහතික ය.
23 ගිජු ලිහිණියන්ට ගොදුරු වීම ඔහුට නියම වී
ඇත.
q2[23] තමාගේ විනාශය ළඟ බව ඔහුට සහතික ය.
24 අඳුරු දවස ඔහු බිය ගන්වයි.
q2[24] සටනට සැරසුණු බලවත් නිරිඳකු මෙන්
විපත්තිය හා වේදනාව ඔහුට පහර දෙයි.
25 මන්ද, ඔහු දෙවිඳුන්ට විරුද්ධ ව අත අමෝරා
ගත්තේ ය;
q2[25] සව් බලැති දෙවිඳුන්ට එරෙහි ව අභියෝග
කළේ ය.
26 සිය දැවැන්ත පලිහ ඔසවාගෙන
හිතුවක්කාරකමින් එතුමන්ට විරුද්ධ ව දිව ගියේ ය.
27 ඔහුට තරබාරුකමින් පිපුණු මුහුණක් ද තරකමින්
නෙරා ගිය තුනටියක් ද ඇත.
28 ඔහු නටබුන් නගර හිමි කරගත්තේ ය;
q2[28] ගරා වැටුණු ගෙවල වාසය කළේ ය;
q2[28] ඒවා ගල් ගොඩවල් බවට පත් වන්නේ ය.
29 එහෙත්, ඔහු සමෘද්ධ නොවන්නේ ය;
q2[29] ඔහුගේ වස්තුව නොපවතින්නේ ය, මලොව
ඔහුට ස්ථිර ජීවිතයක් නැත.
30 ඔහු දුක 'ඳුරෙන් එළියට එන්නේ නැත.
q2[30] ඔහු ගිනි දලුවෙන් වියළී ගිය අතු ඇති,
q2[30] මල් සුළඟට ගසාගෙන ගිය ගසක් මෙන් වනු
ඇත.
31 දුෂ්ටකමෙහි විශ්වාසය තැබීමෙන් ඔහු තමා ම
රවටා ගනියි.
q2[31] මෙසේ දුෂ්ටකම ඔහුගේ දුර්විපාකය වනු ඇත.
32 ඔහු, අකලට වියළී යන අතු ඇති, කිසි දා අතු
විහිදී නොයන තාල වර්ග ගසක් මෙන් වනු ඇත.
33 ඔහු, පැසෙන්නට පෙර ගෙඩි වැටී යන මිදි
වැලක් ද මල් පර වී වැටෙන ඔලීව ගසක් ද වැනි ය.
34 මන්ද, අභක්තිකයන්ට දරු පරපුරක් නොලැබෙනු
ඇත.
q2[34] අල්ලසෙන් පොහොසත් වූ ඔවුන්ගේ ගේදොර
ගින්නෙන් දැවී යනු ඇත.

35 අයුක්තිය පිළිසිඳගනෙ අපරාධය බිහි කරන අය
මොවුහු ය.
q235 මොවුන්ගේ සිත් වංචාවනේ පිරී ඇත.”

ජෝබ්ගේ පිළිතුර

16 ජෝබ් මසෙේ පිළිතුරු දුන්නේ ය:
2 “මීට පරෙත් මවෙැනි බොහෝ දේ මා අසා
ඇත;
q22 ඔබ දනෙ සහනය මට අසහනයක් පමණි.
3 සුළං හමන්නාක් මනේ වදින මේ වචන රැල්ලහෙි
කළෙවරක් නැද් ද?
q23 මබෙඳු පිළිතුරු දීමට කුමක් ඔබ පොළඹවන්නේ
ද?
4 මා සිටින තැන ඔබ සිටියොත්, මටත් ඔබ වාගේ
ම ව්‍යක්ත ලසෙ කතා කළ හැකි ය;
q24 ඔබට විරුද්ධ ව වචන ගොඩක් නඟා ඔබ දසෙට
මාගේ හිස වනමින් සරදම් කිරීමට මටත් පුළුවන.
5 එහතේ, මම එසේ නොකරමි;
q25 මම දිරිය වඩන වචන ම කියමි;
q25 එවිට මාගේ අස්වැසිල්ල දිය පාරක් මනේ ගලා
යනු ඇත.
6 මා කතා කළත් මාගේ දුක තුනී වන්නේ නැත.
q26 මා නිහඬ ව සිටියත් මට ඇති සහනය කුමක්
ද?
7 සැබැවින් ම දවේඳුනි, ඔබ මා දුබල කොට ඇත;
q27 ඔබ මාගේ දූ පුතුන් මැරනේනට සලස්වා ඇත;
8 ඔබ මා කය පොඩී කර ඇත;
q28 මම ඇටකටු ගොඩක් පමණි.
q28 එය මා වැරදිකරු බවට සාක්ෂි දයෙි.
9 එතුමාණන් කෝපයනේ මා කැබලි කොට, ඉරා
දමනු ඇත.
q29 එතුමාණන් දත්මිටි කා, තියුණු ලසෙ මා දසෙ
රවා බලනු ඇත.
10 මාගේ සතුරෝ මට විරුද්ධ ව නින්දා කොට මට
කම්මුල් පහර දුන්හ.
q210 ඔව්හු මට එරහෙි ව රුස් වී සිටියහ.
11 දවේඳුන් මා අභක්තිකයන් අතට පාවා දී ඇත;
q211 දුදනන් වතෙ මා පලවා හැර ඇත.
12 එතුමාණන් මා මැඩ ලන තුරු මම යහෙනේ කල්
යැවීමි.
q212 එතුමාණෝ මාගේ ගලෙ අල්ලා, මා බිම ගසා
සුණු විසුණු කළ සේක.
q212 එතුමාණන්ගේ දුනුවායෝ මා වට කරගත්හ.
q212 එතුමාණෝ මා ඉලක්කයක් කරගත්හ.
13 එතුමාණන්ගේ ඊතල හැම දසෙින් ම පිට පතිත
වේ;
q213 එතුමාණෝ කරුණා විරහිත ව මාගේ වකුගඩු
පළාදමන සේක;
q213 පිත බිම වගුරුවන සේක;
14 පහර පිට පහර දී මාගේ ආරක්ෂා පවුර බිඳ
දමන සේක.
q214 නිර්භීත සබෙළකු මනේ එතුමාණෝ මට
විරුද්ධ ව දුව එන සේක.

15 මම ගෝණි රදෙි මසා, මාගේ හම වසාගනෙ,
දුකින් දුබල ව දූවිල්ලහෙි හිඳගතිමි.
16 හැඬීමනේ මාගේ මුහුණ රතු වී ඇත;
q216 මාගේ ඇස් වටා කළු වී ඇත.
17 මා සැහැසිකමින් තොර ව සිටියදීත් මාගේ
යාච්ඤා අවංක ව තිබියදීත් මේ දේ මට සිදු වී
ඇත.
18 එම්බා මිහිකත!
q218 මට කර ඇති අපරාධ පස් යට නොසඟවන්න.
q218 මාගේ අඳෝනාව අවසන් නො වේ වා!
19 ජෝබ් 19:25 මා වනෙුවනේ සාක්ෂිකරුවකේ
සඟලොව ඇත.
q219 මට පක්ෂ ව කතා කරන කනෙකේ උසස්
ස්ථානයහෙි වසයි.
20 මාගේ ආයාචනය දවේඳුන් වතෙ නඟියි.
q220 මාගේ දනෙතෙහෙි කඳුළු එතුමන් දසෙ ගලා
යයි.
21 මිනිසා දවේඳුන් සමඟ ද මිනිසා මිනිසා සමඟ ද
ඉටු කළ යුතු යුක්තිය එතුමාණෝ ආරක්ෂා කරන
සේක් වා!
22 ආපසු ඊමක් නැති අවසන් ගමනහෙි මම යමි.
q222 මට ඉතිරි ව ඇත්තේ තව අවුරුදු ස්වල්පයකි.
17 “මට හුස්ම ගන්න පවා බැරි ය;
q2
17 මාගේ අවසානය හොඳට ම ළඟ ය.
q2
17 දැන් මට ඉතිරි ව ඇත්තේ සොහොන පමණ
ය.
2 කොයි අතට හැරුණත්, මිනිස්සු මට සරදම් කරති.
q22 ඔවුන්ගේ ඇණුම්බැණුම්වලට මට මූණ පාන්නට
වී ඇත.
3 “ඔබ ඉදිරියහෙි ඔබ ම මාගේ ඇපකරු වුව
මැනව.
q23 මා වනෙුවට ඇප දීමට වනෙ කිසිවකේ ඇද් ද?
4 තේරුම් නොගන්න පිණිස චින්තන බුද්ධිය ඔබ
අඳුරු කර ඇත.
q24 මා පරදා ජය ගැන්මට ඔබ ඔවුන්ට ඉඩ නුදුන
මැනව.
5 සිය වාසිය පිණිස මිතුරන් පාවා දනෙ මිනිසාගේ
දරුවන් දුක් විඳිනු ඇත.
6 සමිඳුන් මිනිසුන් අතර මා නින්දා පාඨයක් කර
ඇත.
q26 ඔව්හු මාගේ මුහුණට කළෙ ගසති.
7 මාගේ ඇස් සෝදුකින් අඳුරු වී ඇත.
q27 මාගේ අවයව සියල්ල සවෙණැල්ලක් වැනි ය.
8 දැහැමි අය මා දැක මවිත වතෙි.
q28 සුදනෝ මාගේ විපත දැක කෝප වතෙි.
9 දැහැමියා සිය දිවි මඟහෙි ස්ථිර ව වසෙයෙි;
q29 සුපිරිසිදු අත් ඇති තැනැත්තේ වඩ වඩා
ශක්තිමත් වයෙි.
10 එහතේ, ඔබ සියලු දනෙ ම මා වතෙ යළි
පැමිණියත්, ඔබ අතර පැණවතකේ මට හමු වනු ඇද්
ද?
11 මාගේ දවස් ගවේී ගොස් ඇත;

q2[11] මාගේ පැතුම් බිඳී ගොස් ඇත;
q2[11] මාගේ අරමුණු ව්‍යර්ථ වී ඇත.
12 එහෙත්, මාගේ මිතුරෝ මාගේ රැය දවාලට
හරවති;
q2[12] ආලෝකය ළඟ යයි කියති;
q2[12] එහෙත්, මා අවට තවමත් අඳුර ය.
13 මාගේ බලාපොරොත්තුව මළවුන්ගේ ලොව
ගැන පමණ ය.
q2[13] අන්ධකාරයෙහි මම සැතපෙන්නෙමි.
14 මිනීවළට මම, 'පියා ය'යි කියමි;
q2[14] පණුවන්ට මම, 'මව හා සහෝදරිය ය'යි
කියමි.
15 එසේ නම්, මාගේ පැතුම කොතැන ද?
q2[15] 'ප්‍රීතියක් ඇතැ'යි කා හට වත් පෙනේ ද?
16 දූවිල්ලට හැරෙන විට, මළවුන්ගේ ලොවට බැස
යන විට පැතුම හා ප්‍රීතිය මට ගෙන යා නොහැකි
ද?"

## බිල්දද්ගේ දෙ වන කතාව

18 එවිට ෂූහිය බිල්දද් මෙසේ පිළිතුරු දුන්නේ
ය:
2 "ඔබේ කතාවට ඉවරයක් නැද් ද?
q2[2] ටිකක් කල්පනා කරන්න;
q2[2] ඉන්පසු ව කතාවට බසිමු.
3 අප ගොන් රැළකැ යි ඔබ සිතන්නෙහි ද?
q2[3] තිරිසන් ගණයට අප දමන්නේ මන් ද?
4 ඔබ කෝපයෙන් ඔබ ම කැබලිවලට ඉරාගන්නේ
මන් ද?
q2[4] ඉරාගත්තත් පොළෝ තලය පාළුකරයක්
නොවනු ඇත.
q2[4] ගිරිකුළු නොසෙල්වෙනු ඇත.
5 ජෝබ් 21:17 එසේ ය, දුදනාගේ පහන නිවී යයි;
q2[5] ඔහුගේ පහන් දැල්ල තවත් නොබැබළෙයි.
6 ඔහුගේ කූඩාරමෙහි පහන අඳුරු වෙයි.
q2[6] ඔහුට ඉහළින් ඇති පහන නිවී යයි.
7 ස්ථිර ව තිබූ ඔහුගේ පාද දැන් වැනෙන සුලු ය.
q2[7] තමාගේ ම කූට උපාවලින් ඔහු වැටෙයි.
8 ඔහු වහා දුව ගොස් දැලකට අසු වෙයි;
q2[8] ඔහු මලපත් මත ඇවිදියි.
9 ඔහුගේ විළුඹ උගුලක අසු වෙයි.
q2[9] උගුල ගැස්සී ඔහු තදින් පැටලෙයි.
10 පොළොවෙහි ඔහුට මරුවැලක් ද ඔහු යන
පාරෙහි බොරු වළක් ද ඇත.
11 භීතිය සැම' තින් ඔහු බිය ගන්වයි;
q2[11] ඔහුගේ පාද ළඟින් ම එය ඔහු ලුහුබැඳ එයි.
12 සාගින්නෙන් ඔහුගේ වෙරෙ වීරිය හීන වෙයි;
q2[12] වැටී වැටී යන ඔහුට විපත සමීප ව ඇත.
13 දරුණු රෝගයක් ඔහුගේ හමට කා වැදී ඇත;
q2[13] ඒ මාරක රෝගය ඔහුගේ අවයව කාදමයි.
14 ඔහුගේ නිවාසයේ සුරුකුම් බවින් ඔහු පැහැර
ගනු හැක, මරු මුවට ඔහු ඇදගෙන යනු ඇත.
15 ගෙන්දගම් දුම් අල්ලා පිරිසිදු කළ පසු ඔහුගේ
නිවාසයේ අන් කෙනෙකු වසනු ඇත.
16 ඔහු වනාහි, යටින් මුල් වියළී ගිය, උඩින් අතු
කපාදමනු ලැබූ ගසක් වැනි ය.
17 මිහි මත කිසි රටක ඔහු සිහිපත් නොවනු ඇත.
q2[17] සිය රටෙහි පවා ඔහුගේ නම නොකියවෙනු
ඇත.
18 එළියෙන් අඳුරට ඔහු නෙරපාදමනු ලැබේ.
q2[18] ජීවතුන්ගේ ලෝකයෙන් ඔහු පලවා හරිනු
ලැබේ.
19 ඔහුගේ සෙනඟ අතර ඔහුට දරු මුණුබුරෝ
නැත;
q2[19] ඔහුගෙන් පැවත එන කිසිවකේ ඔහුගේ
නිවසෙහි ඉතිරි ව නැත.
20 අපරදිග දනෝ ඔහුගේ විනාශය ගැන අසා
බියෙන් තිගැස්සෙති;
q2[20] පෙරදිග දනෝ භීතියෙන් වෙවුලති.
21 අදමිටු අයගේ ඉරණම එය වේ;
q2[21] දෙවිඳුන් නොසලකන අයගේ ඉරණම ද එය
වේ."

## ජෝබ්ගේ පිළිතුර

19 ජෝබ් මෙසේ පිළිතුරු දුන්නේ ය:
2 "ඔබ කොපමණ කල් මා වෙහෙසා කොට
වාග් ප්‍රහාරයෙන් මා සුණු විසුණු කරන්නහු ද?
3 දිගින් දිගට ම ඔබ මට අපහාස කළහු ය;
q2[3] විළි බිය නැති ව මට අයුක්තිය කළහු ය.
4 මම ඇත්තට ම වරදක් කළෙමේ නම්, එහි පල
විපාක මට මිස ඔබට නොවේ.
5 එහෙත් ඔබ, මහේශාක්‍ය ගතියක් පෙන්වමින් මා
වෙත එල්ල කළ නින්දාපහාස යුක්ති සහගත යයි
කියන්නහු නම්,
6 මම එකක් කියමි:
q2[6] මා වරදට පත් කළේ, දෙවිඳුන් බවත්, දැලක්
දමා මා වටකර ඇත්තේ, එතුමන් බවත් දැනගන්න.
7 මෙන්න, මට දෙන දැඩි පහර ගැන මා මොරගසන
නමුත්, උත්තර දෙන කෙනෙකේ නැත.
q2[7] පිහිට ඉල්ලා කෑ ගසන නමුත්, යුක්තිය ඉටු
කරන කෙනෙකේ නැත.
8 මා පිටත නොඑන ලෙස එතුමන් මා අවට වැට
කොටු බැඳ, පාර අහුරා, මාගේ මාවත අඳුරු
පටලයකින් වසා ඇත.
9 එතුමන් මාගේ යසඉසුරු පැහැරගෙන මාගේ
හිසෙන් කිරුළ පහකර ඇත.
10 මා නැති වන ලෙස එතුමන් හතර වටින් මට
පහර දී, උදුරා දමන ලද ගසක් මෙන් මාගේ
බලාපොරොත්තුව බිඳ දමා ඇත.
11 එතුමන් සිය කෝපාග්නිය දල්වා මා සතුරකු
ලෙස ගණන් ගනු ඇත.
12 මට පහර දීමට සිය යුද හමුදා එවා ඇත.
q2[12] ඔවුන් මාගේ කූඩාරම වටලාගෙන ඇත.
13 එතුමන් මාගේ සහෝදරයන් මා වෙතින් ඈත්
කර ඇත.
q2[13] මාගේ මිතුරෝ මට අමුත්තන් වී සිටිති.
14 මාගේ ඥාතීහු අහක් ව ගියහ.

q2 14 මාගේ කලණ මිතුරෝ මා අමතක කළහ.
15 අමුත්තෝ හා මාගේ සේවිකාවෝ මා පිට
කනෙකු ලෙස ගණන් ගනිති.
q2 15 මා ඔවුන්ට විදේශිකයකු වී ඇත.
16 සේවකයාට මා හඬගැසුවත්, ඔහු මට උත්තර
නොදෙයි;
q2 16 ඔහුට ආයාචනා කිරීමට මට සිදු වී ඇත.
17 මාගේ බිරිඳට මාගේ හුස්ම පවා දරන්නට බැරි
ය;
q2 17 එක කුසේ උපන් අයටත් මම පිළිකුලක් වී
සිටිමි.
18 බාල දරුවෝ පවා මට උසුළු-විසුළු කරති;
q2 18 මා නැඟිටින්නට හදන විට පිටුපස හරවා යති.
19 මාගේ සියලු හිත මිතුරෝ මා තදින් පිළිකුල්
කරති;
q2 19 මා පෙම්වත් අය මට එරෙහි ව නැඟී සිටිති.
20 මාගේ ඇටකටු හමට ඇලී ඇත;
q2 20 මම මාගේ යටි තොල විකාගෙන සිටිමි.
21 මාගේ මිතුරනි, අනේ! මට අනුකම්පා කරන්න;
q2 21 මට අනුකම්පා කරන්න.
q2 21 දෙවිඳාණෝ මට පහර දුන් සේක.
22 දෙවිඳුන් මෙන් ඔබත් මා ලුහුබැඳ එන්නේ මන්
ද?
q2 22 මාගේ කයට සිදු වී ඇති විපත ගැන ඔබ
සෑහීමට පත් වී නැද් ද?
23 "අනේ!
q2 23 මාගේ වචන ලියා තැබුවොත් කොපමණ
හොඳ ද?
q2 23 ඒවා ග්‍රන්ථාරූඪ කරන්නට ඇත්නම්!
24 යකඩ පන්හිඳකින් ගලේ කොටා, ඊයම් යොදා,
සදහට ම තබන්නට ඇත්නම්,
q2 24 කොපමණ හොඳ ද?
q2 24 මට එක දෙයක් සහතික ය:
25 එනම්, මාගේ මිදුම්කාරයාණන් ජීවත් ව සිටින
බව ද අන්තිමේ දී, මා වෙනුවෙන් කතා කරන බව ද
මම දනිමි.
26 කුෂ්ඨයක් මාගේ හමට කා වැදී, මාගේ මාංසය
දිරා ගිය පසුත් මම මාගේ දෙනෙතින් දෙවිඳුන්
දකින්නෙමි.
27 මම ම එතුමාණන් දකිමි;
q2 27 අන්‍යයකු නොව මම, මාගේ දෙනෙතින් ම
එතුමාණන් දකිමි.
28 මේ ගැටළුවේ මුල මා බැවින්, අප ඔහුට පහර
දෙන්නේ කෙසේ දැ යි ඔබ කියන්නහු නම්,
29 කඩුපතට බිය වන්න;
q2 29 මන්ද, කඩුපත කෝපයේ ප්‍රතිඵලයකි.
q2 29 එවිට විනිශ්චයයක් ඇති බව ඔබ දැනගන්නහු
ය."

### ශෝපර්ගේ දෙවන කතාව

20 ඊට පිළිතුරු වශයෙන් නයමාතීය ශෝපර්
මෙසේ කී ය:
2 "ඇවිස්සුණු මාගේ චිත්තය ඔබට පිළිතුරු දීමට
නොඉවසිල්ලෙන් බලා සිටියි.
3 ඔබ ඉදිරිපත් කළ චෝදනා මට අපහාසයකි.
q2 3 එහෙත්, මාගේ බුද්ධිය ඉක්මවා යන
ආත්මානුභාවය ඊට පිළිතුරු සපයනු ඇත.
4 කාලයාගේ උපත සිදු වූ දා සිට, මිනිසා මිහි පිට
පහළ වූ දා පටන්,
5 දුෂ්ටයාගේ ජය ඝෝෂාව කෙටි කාලීන බවත්,
අභක්තිකයාගේ ප්‍රීතිය එක මොහොතකට පමණක්
බවත් ඔබ නොදන්නෙහි ද?
6 ඔහුගේ මහන්තත්ත්වය අහස දක්වා නැංගත්,
ඔහුගේ හිස වලාකුළුවල ගැටෙන තරම් ඔහු උස
ගියත්,
7 කුණු කසළ මෙන් ඔහු සදහට ම නැති වී යයි.
q2 7 ඔහු දැන සිටි අය, 'දැන් ඔහු කොහේ දැ'යි
ප්‍රශ්න කරති.
8 ඔහු සිහිනයක් මෙන් පහ ව ගොස් අතුරුදන්
වෙයි;
q2 8 රෑ යාමේ දර්ශනයක් මෙන් පහ ව යයි.
9 ඔහු දැක ඇති අය තවත් ඔහු නොදකිති.
q2 9 ඔහුගේ ඉඩමෙහි තවත් ඔහු දක්නට
නොලැබේ.
10 ඔහුගේ දරුවෝ දිළිඳුන්ගෙන් කරුණාව
සොයන්නෝ ය.
q2 10 ඔහු පැහැර ගත් සම්පත් ඔහුගේ අතින් ම
ආපසු දෙනු ඇත.
11 යොවුන් වියේ ශක්තියෙන් පිරුණු ඔහුගේ සිරුර,
දැන් ඔහු සමඟ දූවිල්ලට හැරෙනු ඇත.
12 දුෂ්ටකම ඔහුගේ කටට මිහිරි ව දැනෙතත්, ඔහු
එය සිය දිව යට සඟවාගනියි.
13 ඉවතට යන්න නොදී හමේහිට එය රස බැලුවත්,
උඩුතල්ලේ තබා ගනිතත්,
14 පසු ව ඒ ආහාර සර්ප විෂට හැරී බඩ දැඟලීම
ඇති කරයි.
15 තමා ගිලගත් ධන සම්පත් ඔහු වමාරන්නේ ය;
q2 15 දෙවිඳාණෝ ඒවා ඔහුගේ උදරයෙන් පිට කරන
සේක.
16 ඔහු සපුන්ගේ විස උරා බොන්නේ ය;
q2 16 පොළඟාගේ දළයෙන් ඔහු මැරුම් කන්නේ ය.
17 ඔහු, ගිතලේ ගලන ඔයවල් ද කිරි පැණි ගලා
යන ගංගා ද නොදකින්නේ ය.
18 ඔහු වැර වීරියෙන් ලබාගත් දේ භුක්ති නොවිඳ
ඒවා ආපසු දෙන්නේ ය.
q2 18 ඔහු තම වැඩ කටයුතුවලින් ලබා ගත්
ප්‍රතිඵලවල රස නොවිඳින්නේ ය.
19 මන්ද, ඔහු දිළිඳුන් තළා පෙළා අත්හැරදැම්මේ ය;
q2 19 අනුන් තැනූ ගේදොර බලහත්කාරයෙන්
ගත්තේ ය.
20 ඔහුගේ මසුරුකමට සීමාවක් නැති බැවින්, සිය
වස්තුවෙන් සතෙක් ඔහු ලබා නොගනියි.
21 ඔහුගේ තණ්හාවට ගොදුරු නොවූ දෙයක් තවත්
ඇද් ද?
q2 21 ඔහුගේ සැප සම්පත චිරස්ථායික නොවේ.

22 විපුල සමෘද්ධත්වයෙහි සිටියත් ඔහුට
අගහිඟකම් ඇත;
q2 22 දුෘඛිතයන්ට පැමිණෙන හැම දුක ම ඔහු කරාත්
පැමිණෙන්නේ ය.
23 ඔහු බඩ පුරා කෑම කෑවත්, දෙවිඳාණෝ බලවත්
උදහසින් හා සිය කෝපයෙන් ඔහුට දඬුවම් දෙන
සේක.
24 ඔහු යකඩ අවියෙන් පහර ලැබ, ගැළවෙන්නට
වෑයම් කරන විට ලෝකඩ දුන්නෙන් බිම හෙළෙනු
ලබන්නේ ය.
25 ඊතලය ඔහුගේ සිරුර පසා කර, එහි දිළිසෙන
තුඩ ඔහුගේ පිත්තාශයෙන් පිට කරන්නේ ය.
q2 25 භීතිය ඔහුගේ හදවත විනිවිද යයි.
26 ඔහු රුස් කර තිබූ සම්පත් සියල්ල නාස්ති වී
යයි.
q2 26 මිනිසා නොදැල්වූ ගින්නක් ඔහු ද ඔහුගේ
නිවසෙහි වසන අනික් අය ද දවාදමයි.
27 අහස් තලය ඔහුගේ පාප දෝස අනාවරණය
කරයි;
q2 27 මිහි තලය ඔහු වරදට පත් කරයි.
28 ඔහුගේ ගෙදර ධන සම්පත් ගංවතුරේ
ගසාගෙන යයි;
q2 28 දේව උදහසේ දවසේ දී ඒවා නැති වී යයි.
29 දුදනා හට දෙවිඳුන්ගේ නියමය එය වේ.
q2 29 එතුමාණන්ගෙන් ඔහුට නියමිත ප්‍රතිවිපාකය
එය වේ.”

### ජෝබ්ගේ පිළිතුර

21 එකල ජෝබ් මෙසේ පිළිතුරු දුන්නේ ය:
2 “මාගේ මේ කතාව සාවධාන ව අසන්න.
q2 2 ඔබ මට දෙන සැනසිල්ල එය වේ.
3 මට වචනයක් කීමට ඉඩ දෙන්න.
q2 3 කැමැති නම්, ඉන්පසු අපහාස කරන්න.
4 මාගේ පැමිණිල්ල මනුෂ්‍යයාට විරුද්ධ ව යයි ඔබ
සිතන්නහු ද?
q2 4 මාගේ අසහනයට වෙන හේතුවක් තිබෙන්නට
බැරි ද?
5 මට සවන් දෙන්න;
q2 5 එවිට ඔබ විස්මිත ව, දෑතින් කට වසාගෙන
නිහඬ වනු නියත ය.
6 මේ ගැන මෙනෙහි කරන විට පවා මම
අන්දුන්කුන්දුන් වෙමි.
q2 6 මාගේ ඇඟ ගැහෙන්නට පටන්ගනියි.
7 දුෂ්ටයන් දිගින් දිගට ජීවත් වී, දිගායු වළඳා,
බලවත් වන්නේ කෙසේ ද?
8 ඔවුන්ට දරු මුණුබුරෝ ඇති වන්නෝ ය.
q2 8 ඔවුන් වැඩෙනු දකින්නට ඔව්හු ද ජීවත් වන්නෝ
ය.
9 ඔවුන්ගේ නිවාස බියෙන් තොර ව සුරක්ෂිත ව
ඇත;
q2 9 දෙවිඳුන්ගේ දඬුවම ඔවුන් පිට නැත.
10 ඔවුන්ගේ ගවයෝ නොවරදවා පැටව් ගසති;
q2 10 ඔවුන්ගේ එළදෙනුන්ට ගබ්සා වීමක් නැත.
11 ඔව්හු තමන්ගේ බාලයන් බැටළු රැළක් මෙන්
පිටතට යවති.
q2 11 ඔවුන්ගේ දරුවෝ නටන්නෝ ය.
12 ඔව්හු රබාන ද වීණාව ද වයමින් ගී ගයති;
q2 12 නළා හඬ අසා ප්‍රීති වෙති.
13 ඔව්හු සැපතින් දවස් යවති;
q2 13 දුක් නොවිඳ, සාමදානයෙන් පාතාල ලෝකයට
යති.
14 ඔව්හු දෙවිඳුන්ට මෙසේ කියති:
q2 14 ‘අප වෙතින් යනු මැනව;
q2 14 ඔබේ දහම් මඟ ඉගෙනීමට අපට ආශාවක්
නැත.
15 සර්ව බලැති දෙවිඳුන්ට වැඳ නමස්කාර කිරීමට
එතුමාණෝ කවරෙක් ද?
q2 15 එතුමන්ට අයැදුම් කිරීමෙන් කුමන වැඩක් සිදු
වේ ද?’
16 ඔවුන්ගේ ම සවි ශක්තියෙන් ඔව්හු සමෘද්ධිමත්
නොවන්නෝ ද?
q2 16 එහෙත්, එයාකාර සිතුවිල්ලක් මට පිළිගත
නොහැකි ය.
17 කොපමණ වරක් දුදනන්ගේ පහන නිවී ගියේ
ද?
q2 17 කොපමණ වරක් ඔවුන් පිට විපත පැමිණියේ
ද?
q2 17 කොපමණ වරක් දෙවිඳාණෝ සිය උදහසින්
ඔවුන් වෙත දුක් දොම්නස් එවූ සේක් ද?
18 කොපමණ වරක් සුළඟේ ගසාගෙන යන පිදුරු
හා බොල් මෙන් ඔව්හු පහ ව ගියෝ ද?
19 ‘දෙවිඳුන් ඔවුන්ගේ අපරාධ ඔවුන්ගේ දරුවන් පිට
පමුණුවනු ඇතැ’යි ඔබ කියන්නහු ය.
q2 19 එය එසේ නොවේ;
q2 19 තම පව් තමන්ට ම දුක් දෙන බව ඔවුන්
දැනගන්න පිණිස, එතුමාණෝ ඔවුන් පිට ම විපත්
පමුණුවන සේක.
20 ඔවුන්ගේ විනාශය ඔව්හු ම සිය දෑසින් දකිත්
වා!
q2 20 සර්ව බලැති දෙවිඳුන්ගේ උදහස ඔව්හු ම පානය
කරත් වා!
21 ඔවුන්ගේ ආයු ගෙවී ගිය කල්හි, ඔවුන්ගේ දරු
මුණුබුරන්ගේ සැපත ගැන ඔව්හු ම සලකත් ද?
22 සගලොව වසන අය පවා විනිශ්චය කරන
දෙවිඳුන් හට උපදෙස් දීමට කවර නම් මිනිසෙකුට
හැකි වේ ද?
23 එහෙත්, එක් අයෙකු සර්ව සැපතින් පිරී, සුවයෙන්
යහෙන් ජීවත් ව සිට මිය යයි.
24 ඇඟ පත ආහාරයෙන් පුෂ්ටිමත් ව තිබිණි;
q2 24 ඇට මිදුළු තතේ ව තිබිණි.
25 වෙන අයෙකු කිසිදු සැපතක් නොවිඳ, සෝදුකින්
යුතු ව මිය යයි.
26 එහෙත්, ඒ දදෙනා ම එක සේ දූවිල්ලෙහි වැද
හෙව සිටිති.
q2 26 පණුවෝ එක සේ ඔවුන් වසා ගනිති.
27 මට එරෙහි ව ඇති ඔබේ කල්පනා ද ඔබ
ගෙනෙන යෝජනා ද මම දනිමි.

28 ප්‍රභූවරයාගේ මන්දිරය කොතැන්හි ද?
q228 දුෂ්ටයා විසූ නිවෙස කොහේ ද කියා ඔබ
ප්‍රශ්න කරන්නහු ද?
29 සංචාරකයන්ගෙන් ඔබ අසා නැද්ද?
q229 ඔවුන් ගෙනෙන සාක්ෂි ඔබ පිළිගන්නේ නැද්ද?
30 විපත් දිනයේ දී දුදනා හැම විට ම බේරෙනු
නොවේ ද?
q230 දෙවිඳුන් කෝප වන දවසේ දී දුදනා හැම විට
ම ගැළවෙනු නොවේ ද?
31 ඔහුගේ වරද ඔහුගේ මුහුණට ම කියන
කිසිවෙක් නැත.
q231 ඔහු කළ නපුරු දේ ගැන ඔහුට විපාක දෙන
කිසිවෙක් නැත.
32 ඔහු සොහොන් බිම වෙත ගෙන ගිය විට
සොහොන මුර කරනු ලැබේ.
33 ඔහු පරෙටුවෙන් හා පිටුපසින් ඔහුගේ අවමඟුල්
පෙරහැරේ දහස් ගණන් සෙනඟ ගමන් කරති.
q233 පොළොවේ පස පවා ඔහු පිට මෘදු ලෙස
වැටෙයි.
34 එසේ නම්, ඔබ මට දෙන සැනසිල්ලෙන් වැඩක්
නැත.
q234 ඔබේ පිළිතුරුවල ඇත්තක් නැත.”

### එලිපස්ගේ තුන් වන කතාව

22 ඉන්පසු එලිපස් මෙසේ පිළිතුරු දුන්නේ ය:
2 ජෝබ් 35:6-8 “මිනිසාගෙන් දෙවි තුමන් හට
කුමන ප්‍රයෝජනයක් ඇද්ද?
q22 පැණවතකුගෙන් වුවත් කවර ප්‍රයෝජනයක්
ඇද්ද?
3 ඔබ දැහැමි ව සිටියත්, සර්ව බලැති දෙවිඳුන්ට එය
සතුටක් වේ ද?
q23 ඔබ නිදොස් ව හැසුරුණත් ඉන් එතුමන්ට
ලාභයක් ඇද්ද?
4 එතුමාණන් ඔබට තරවටු කර, ඔබ විනිශ්චයට
ගෙන එන්නේ ඔබේ දේව ගරුබිය නිසා නොවෙන්නේ
ය.
5 එසේ වන්නේ, ඔබ ඉතා නපුරු මිනිසකු බැවිනි.
q25 ඔබේ දුෂ්ටකම නිම් හිම් නැති බැවිනි.
6 ඔබ අසාධාරණ ලෙස සොහොයුරන්ගෙන් උකස්
ගත්තෙහි ය;
q26 ඇඳුම් නැති අයගෙන් රෙදිපිළි උදුරා ගත්තෙහි ය.
7 පිපාසයෙන් පෙළෙනු අයට ඔබ වතුර දුන්නේ
නැත;
q27 බඩගිනි අයට කෑම දුන්නේ නැත.
8 මුළු දේශය අයිති කරගන්නට නිල බලය හා
සමාජ තත්ත්වය ඔබ පාවිච්චි කළෙහි ය.
9 ඔබ කණවැන්දුම්යන් හිස් අතින් යන්නට
හැරියෙහි ය.
q29 අනාථ දරුවන් හට කුරිරුකම් කළෙහි ය.
10 ඉතින්, ඔබ වටකර මලපත් ඇත.
q210 හදිසි භීතිය ඔබ කළඹන්නේ ය.
11 ඔබේ දෑස නොපෙනෙන ලෙස එළිය අඳුරට
හැරෙයි.
q211 ජලධාරා ගලා විත් ඔබ වසාගන්නේ ය.
12 සැබැවින් ම, දෙවි තුමන් සගයේ ඉහළ ම තැන
වැඩ වසන්නේ නැද්ද?
q212 බබළන තරු කොතරම් දුර දැ යි බලන්න.
13 එහෙත් ඔබ, මෙසේ කියන්නෙහි ය:
q213 ‘දෙවිඳාණෝ කුමක් දන්න සේක් ද?
q213 විනිශ්චයක් කිරීමට ගන’ඳුර බිඳ බලනු ඇද්ද?’
14 මිහිතල නිම් වළල්ල මත ඔබමොබ සැරිසරන
විට, ඝන වලාකුළු නිසා එතුමාණන්ට දෑස විදහා
බැලිය හැකි ද?
15 දුෂ්ටයන් කවර දාත් ගමන් කළ ඒ පැරණි
මාවතෙහි ඇවිදින්නට ඔබත් තීරණය කරගත්තෙහි
ද?
16 ඔවුන් නියම කාලයට කලින් ඉදිරී වැටෙනු ඇත.
q216 ඔවුන්ගේ අත්තිවාරම් ද මහ ගංවතුරකින්
මෙනේ ගහගෙන යනු ඇත.
17 එසේ වන්නේ, ‘අපට ඉන්න ඉඩ දී අහක් ව ගිය
මැනව.
q217 සර්ව බලැති දෙවිඳුන් විසින් අපට කරනු ලැබිය
හැකි කිසිවක් ඇද්දැ’යි ඔවුන් දෙවිඳුන්ට කී නිසා ය.
18 ඔවුන්ගේ අදහස් එතුමන්ට විරෝධී ව තිබියදීත්,
ඔවුන්ගේ ගෙවල් සැප සම්පතින් සමෘද්ධ කළේ
එතුමාණෝ ය.
19 දැහැමියෝ ඒ දැක සන්තෝෂ වෙති;
q219 නිදොස් අය ඔවුන්ට අපහාස කොට සරදමින්
මෙසේ කියති:
20 ‘අපට විරුද්ධ ව නැඟී ආ අය සැබැවින් ම සිඳිනු
ලැබූ හ.
q220 ඔවුන්ගේ ඉතිරි වස්තුව ගින්නෙන් දැවී ගියේ
ය.’
21 ජෝබ් තුමනි, එතුමාණන් සමඟ සමඟි වන්න.
q221 එයින් ඔබට ආසිරි ලැබෙනු ඇත.
22 එතුමාණන්ගේ මුවින් ඔවදන් ගෙන, එතුමන්
වදන් ඔබේ සිතෙහි නිදන් කරගන්න.
23 ඔබ සර්ව බලැති දෙවිඳුන් වෙත බැගෑපත් ව හැරී,
ඔබේ නිවසින් අසාධාරණකම් පහකළොත්,
24 ඔබේ රන් දූවිල්ල මෙන් ද ඔබේ තනි රන් දොළ
පතුලේ ගල් කැට මෙන් ද සැලකුවොත්,
25 සර්ව බලැති දෙවිඳාණෝ ම ඔබට මුතු මැණික් හා
රන් රිදී වන සේක.
26 එවිට ඔබ සර්ව බලැති දෙවිඳුන් කෙරෙහි
ප්‍රීතිමත් ව, ඔබේ මුහුණ එතුමාණන් වෙත ඔසවනු
ඇත.
27 ඔබ එතුමාණන්ට යැදුම් පුදන විට එතුමාණෝ
සවන් දෙන සේක.
q227 ඔබ ද ඔබේ බාරහාර ඉටු කරනු ඇත.
28 ඔබ ගන්න තීරණය සඵල වනු ඇත.
q228 ඔබේ මාවත පිට එළිය බැබළෙනු ඇත.
29 එතුමාණෝ උඩඟු සිත් ඇති අය පහත හෙළන
සේක.
q229 යටහත් සිත් ඇති අය රැකගන්න සේක.
30 ඔබ නිදොස් ව සිටියොත්, ඔබේ අතින් හරි දේ
කළොත්, ඔබට මිදීම ඇත.”

## ජෝබ්ගේ පිළිතුර

23 එවිට ජෝබ් මෙසේ පිළිතුරු දුන්නේ ය:
2 “අද මාගේ විලාපය කටුක ය.
q22 දෙවිඳුන්ගෙන් මා ලත් පහර බරපතල නිසා
කෙඳිරිගාමි.
3 අහෝ!
q23 එතුමන්ගේ නඩු ආසනය ළඟට පැමිණෙන්නත්,
එතුමන් හමුවන්නත් මට පුළුවන්කමක් ඇත්නම්.
4 එතුමන් ඉදිරියෙහි මාගේ නඩුව පිළිවෙළින් කියා
සිටිමි.
q24 කථිකයකු මෙන් හැම තර්කයක් ම ඉදිරිපත්
කරමි.
5 එවිට එතුමන් පවසන දෙය තේරුම් ගෙන, මට
දෙන උත්තරය දැනගන්නෙමි.
6 එතුමන් සිය බල මහිමය පා මා සමඟ වාද කරනු
ඇද් ද?
q26 නැත.
q26 එතුමාණෝ මා කියන දෙයට සවන් දෙන සේක.
7 එහි දී, මා වැනි දැහැමි කෙනෙකු සමඟ වාද කළ
බව එතුමන්ට පෙනෙනු ඇත.
q27 විනිසකරුවන් විසින් මම නිදහස් කරනු
ලබන්නෙමි.
8 මම පෙරදිග බලා ගියෙමි;
q28 දෙවිඳාණෝ එහි නැත.
q28 අපරදිග බලා ගියෙමි;
q28 එතුමෝ එහිත් නැත.
9 මම උතුරට හැරී, මම දකුණට හැරී, එතුමන්
සෙව්වෙමි.
q29 ඒ කිසි තැනක එතුමෝ දකින්නට නැත.
10 එහෙත්, මා ගන්න හැම පියවර ම එතුමාණෝ
දන්න සේක;
q210 මා පරීක්ෂණයකට භාජන කළොත් මා තනි
රත්රන් බව දැනගනු ඇත.
11 මට එතුමන් නියම කොට ඇති මාවතහි ම මම
ගමන් කරමි.
q211 එතුමන්ගේ නියෝගවලින් ඉවත් ව නොයෙමි.
12 එතුමන්ගේ ආඥා මම නිරතුරු පිළිපදිමි.
q212 එතුමන්ගේ වදන් මා හද තුළ නිදන් කර
ගනිමි.
13 එතුමාණන් යමක් තීරණය කළොත් එය වෙනස්
නොවන්නේ ය;
q213 ඒවා වෙනස් කළ හැක්කේ කාට ද?
q213 එතුමාණෝ තමන් සිතූ දේ ඉටු කරන සේක.
14 මා පිළිබඳ සිය අදහස එතුමන් සපුරාලනු ඇත;
q214 එවැනි අදහස් එතුමන්ගේ සිතෙහි තව
බොහෝ ඇත.
15 ඒ නිසා එතුමාණන් හමු වීමට මම බිය වෙමි.
q215 එතුමන් ගැන සිතන විට මම බිය පත් වෙමි.
16 සව් බලැති දෙවි තුමාණෝ මහද දුබල කළ
සේක;
q216 එතුමාණෝ මාගේ සිතෙහි දිරිය පහකළ
සේක.
17 අඳුරින් මම වට වී සිටිමි;
q217 එතුමන් නොපෙනෙන ලෙස ගන'ඳුරින් මාගේ
මුහුණ ආවරණය වී තිබේ.
24 “සව් බලැති දෙවිඳාණන්ගේ විනිශ්චය දවස
නියම නොකරන්නේ මන් ද?
q2
24 එතුමන් නමදින දනන් ඒ දිනය නොදන්නේ
මන් ද?
2 දුෂ්ට දනෝ, ඉඩම් ලෝභීහු මායිම් ගල් වෙනස්
කරති;
q22 ඔව්හු බැටළුවන් සොරාගෙන උන්ට කවා පොවා
හදාගනිති.
3 සමහරු අනාථයන්ගේ කොටළුවන් සොරා ගනිති;
q23 වැන්දඹුවක ණය ගෙවෙන තුරු ඇගේ ගොනා
තබා ගනිති.
4 දිළිඳුන්ගේ අයිතිවාසිකම් ලබා ගැනීම ඔව්හු
වළක්වති.
q24 දුව ගොස් සැඟවෙන ලෙස දිළිඳුන් හට ඔව්හු
බල කරති.
5 දිළින්දෝ වල් කොටළුවන් විලසින් මරුකතරෙහි
කෑම සොයා ඔබමොබ යති.
q25 අන් කිසි තැනකින් දූප්පතුන්ට කෑම
සොයාගන්නට බැරිය.
6 ඔව්හු අන් අය සතු කෙතේ වතුවලින් අස්වැන්න
රුස් කරගනිති;
q26 දුදනන්ගේ මිදිවතුවලින් මිදි පල නෙළාගනිති.
7 රාත්රියේ දී පොරොවාගන්නට වස්ත්ර නැති ව,
ශීතලයට වැස්ම නැති ව ඔව්හු නින්දට යති.
8 කඳුකරයෙන් එන වැස්සට දියබත් වී මුවා වන
පිණිස පර්වතය අසල ඔව්හු රොක් වී සිටිති.
9 දුදනෝ මවු ළයෙන් අනාථ දරුවන් උදුරාගනිති.
q29 දිළිඳුන්ගේ දූ දරුවන් ඇප වෙනුවට තබාගනිති.
10 කය වැසුමට වත්කමක් නැති ව, නග්න ව ඒ
අසරණයෝ ගමන් කරති.
q210 ඔව්හු අස්වැන්න නෙළුවත් සාගින්නෙන්
පෙළෙති.
11 දුදනන් ඔලීව තෙලේ හිඳිතත්, මිදි පල පාගා
මිදියුස පෙරෙතත්, ඔව්හු පිපාසයෙන් පෙළෙති.
12 නගරයේ මරණාසන්න වූවෝ කෙඳිරි ගැසුවත්,
තුවාළ වූවෝ උදව් ඉල්ලා මොරගසතත්, දෙවිඳුන්
හට නො ඇසේ.
13 ආලෝකයට එරෙහි ව කැරලි ගසන මිනිස්සු
ඇත.
q213 ආලෝකය ගැන ඔවුන්ට තේරුමක් නැත.
q213 ඒ මාවතහි ගමනක් නැත.
14 මිනීමරුවා අලුයමින් නැඟිට දිළිඳුන් හා
අසරණයන් මැරීමට යයි;
q214 රාත්රියේ දී සොරකමට යයි.
15 පරදාර සේවනය කරන්නා ඇඳිරි වන තුරු බලා
සිට, කිසිවකුට නොපෙනෙන පරිදි තම මුහුණට
වැස්මක් දමා ගනියි.
16 සොරු රෑ අඳුරෙහි ගෙවල් බිඳිති;
q216 දවාලෙහි සැඟවී සිට එළිය මඟ හරිති.
17 ඔවුන්ට එළිය දරුණු ලෙස බියකරු ය;

q2[17] රෑ අඳුරට ඔව්හු ප්‍රිය කරති."

### ශෝපර්ගේ කතාව

q2[17] ශෝපර් මෙසේ පිළිතුරු දුන්නේ ය:
18 "දුදනෝ ජලය මත පාවෙන කුණු රොඩු වැන්න;
q2[18] ඔවුන් සතු වතුපිටිවල දෝව සාපය ඇත.
q2[18] ඔව්හු තවත් මිදි වත්තේ වැඩට නොයෙති.
19 නියඟය හා ග්‍රීෂ්මය නිසා හිම දිය වී යන්නේ
ය;
q2[19] පාපිෂ්ඨයා එලෙසෙ ම ජීවතුන් අතරෙන් පහ ව
යයි.
20 වැදූ මව පවා ඔහු සිහි නොකරයි;
q2[20] පණුවෝ ඔහු කා දමති;
q2[20] බිඳ වැටුණු ගසක් මෙන් දුෂ්ටකම අවසන් වෙයි.
21 මෙසේ වන්නේ, ඔහු දරුවන් නැති ස්ත්‍රියට පීඩා
කොට, වැන්දඹුවට කරුණාව නොදැක්වූ හෙයිනි.
22 දෙවි තුමන් සිය බලයෙන් බලවතුන් ඉවතට ඇද
දමනු ඇත;
q2[22] ඔවුන් නැඟිට සිටියත්, ස්ථිර ජීවිතයක් ගැන
ඔවුන්ට විශ්වාසයක් නැත.
23 දෙවි තුමාණෝ යහතින් විසුමට ඔවුන්ට
රැකවරණය දෙන සේක;
q2[23] හැම මොහොතෙහි ම එතුමන්ගේ දෙනෙත
ඔවුන් යන මඟ වෙත යොමු වේ.
24 මොහොතකට ඔව්හු උසස් වෙති;
q2[24] එහෙත්, වල් පැළෑටි මෙන් ඔව්හු වහා මැලවී
යති.
q2[24] කපා දැමූ ගොයම් මෙන් ඔව්හු තුරන් ව යති.
25 මේ මාගේ කියමන් බොරු නම්, මාගේ ඒ
තර්කය බිඳලිය හැකි යම්කිසි සමතෙක් මෙලොව
ඇද් ද?"

### බිල්දද්ගේ තුන් වන කතාව

25 එවිට ෂුහිය බිල්දද් පිළිතුරු දෙමින් මෙසේ කී
ය:
2 "ආධිපත්‍යය හා ගරුත්වය දෙවිඳුන් වෙත ඇත;
q2[2] එතුමන් සග ලොව විජිතයෙහි සාමය පවත්වනු
ඇත.
3 එතුමන්ගේ දෙවි බළ සෙන් අති විශාල ය;
q2[3] එතුමන්ගේ එළිය උදා නොවන තැනක්
ලොවෙහි ඇද් ද?
4 එවන් දෙවිඳුන් අබිමුවෙහි දමිටු කෙනෙකු සිටිය
හැකි ද?
q2[4] මෙලෝ උපන් දනන් අතර නිමල කෙනෙකු සිටිය
හැකි ද?
5 එතුමන් අබිමුව සඳ මඬලෙහි දීප්තියක් නැත;
q2[5] තරු පෙළෙ මැද කාන්තිය නැත;
6 එසේ නම්, කුරා කුහුඹුවකු වැනි, නර පණුවකු
වැනි මිනිසා ගැන කියනුම කිම?"

### ජෝබ්ගේ පිළිතුර

26 එකල ජෝබ් මෙසේ පිළිතුරු දුන්නේ ය:
2 "අසරණ මමෝ හට ඔබ දිරිය දුන් හැටි හරි කදිම
යි!
q2[2] මාගේ දුබල අතට වීරිය දුන් හැටි හරි අගයේ!
3 අනුවණ කෙනෙකුට ඔවා වදන් දී, හරි අවබෝධය
ගෙන දුන් හැටි අනේ යස යි!
4 ඔබ ඔය දිග හැල්ල කීවේ කාට ද?
q2[4] එය පැවසීමට වරම් ලැබුවේ කාගෙන් ද?"

### බිල්දද්ගේ කතාව

5 බිල්දද් මෙසේ කී ය:
q2[5] "පාතාල ලෝකය වෙවුළා යයි;
q2[5] එහි වැසියෝ බියෙන් කම්පිත වෙති.
6 පාතාල ලෝකය දෙවිඳුන් අබිමුව විවර වී ඇත;
q2[6] දෙවි බැල්මෙන් එය මුවා කිරීමට වැස්මක් නැත.
7 දෙවි තුමාණෝ උතුරු දිග අහස විහිදුවා හළ
සේක.
q2[7] හිස් අවකාශයෙහි පොළොව එල්ලා තබන
සේක.
8 එතුමාණෝ වලාකුළුවල වතුර පුරවා තබන
සේක;
q2[8] එහි බරෙන් වලාකුළු පුපුරන්නට ඉඩ නොදෙන
සේක.
9 එතුමාණෝ සඳ මඬල ආවරණය කරන සේක;
q2[9] එය මත වලාකුළු විහිදුවන සේක.
10 එළිය අඳුරෙන් වෙන් කරන සීමාවෙහි සමුදුර මත
නිම් වළල්ල අඳින සේක.
11 එතුමන්ගේ තර්ජන අසා, අහස උසුලා සිටින
කණු බියෙන් වෙවුළා තැති ගනියි.
12 එතුමාණෝ සිය බලවත් බාහුවෙන් දස්කම් පා
දිය රකුසා දබෑ කළ සේක;
q2[12] සත් සමුදුර නිසල කළ සේක.
13 එතුමන්ගේ හුස්මෙන් අහස පිවිතුරු වෙයි.
q2[13] එතුමන්ගේ බාහුව පලා යන දිය රකුසා දබෑ
කරයි.
14 මේ එතුමන්ගේ තදෙ විකුමෙන් බිඳක් පමණි;
q2[14] එතුමන් ගැන අපට ඇසෙන්නේ සිහින් රාවයක්
පමණි;
q2[14] එතුමන්ගේ වීර වික්‍රම ගිගුරුම් හඬ
තේරුම්ගත හැකි කාට ද?"

### ජෝබ්ගේ පිළිතුර

27 ඉක්බිති ජෝබ් යළිත් මෙසේ පැවසී ය:
2 "මා කෙරෙන් යුක්තිය වළක්වා, සෝදුකින්
මා පිරවූ, සව් බලැති දෙවිඳුන් නමින් මම මෙය
දිවුරා කියමි:
3 මාගේ පණ නළ තිබෙන තුරු, දෙවිඳුන් දුන් හුස්ම
ටික මා තුළ පවතින තුරු,
4 මා මුවින් අසත්‍යයක් වත්, කිසි මුසාවක් වත්
නොකියමි.
5 ඔබ පවසන දේ සැබෑ යයි මම කිසි සේත්
නොකියමි.
q2[5] දිවි ඇති තාක් මා නිවැරදි බව ම කියා සිටිමි.
6 මා නිවැරදි බව මම තරයේ කියා සිටිමි.

q2 6 දිවි ඇති තාක් මාගේ හෘදය සාක්ෂිය මට වරද
නොතබයි.
7 'මාගේ සතුරාට දුදනකුට මෙන් අවැඩක්
වේවා'යි ද 'මාගේ විරුද්ධකාරයාට නපුරක් ම
වේවා'යි ද පතමි.
8 අභක්තිකයාගේ අවසන් හුස්ම පහ කොට,
දෙවිඳුන් මරණය එවන විට ඔහුට කවර
බලාපොරොත්තුවක් ඇද් ද?
9 විපත පැමිණෙනෙ විට දෙවි තුමාණන් ඔහුගේ
යැදුම් අසනු ඇද් ද?
10 ඔහු සව් බලැති දෙවි තුමන් කෙරෙහි ප්‍රීති
වන්නේ ද?
q2 10 එතුමන්ට නිරතුරු යැදුම් පුදනු ඇද් ද?
11 නැත.
q2 11 දෙවි තුමන්ගේ බලය ක්‍රියා කරන හැටි මම
ඔබට පවසන්නෙමි.
q2 11 සව් බලැති දෙවි තුමන්ගේ අදහස් මම ඔබට
කියා දෙමි.
12 මේ හැම දයෙ ඔබ තේරුම් ගන්නහු නම්,
මවෙනි වල්පල් ඔබ නොදොඩන්නහු ය."

## ශෝපර්ගේ කතාව

13 ශෝපර් මෙසේ පැවසී ය:
q2 13 "සැහැසි ලෙසෙ ජීවත් වන දුදනන් හට සව්
බලැති දෙවිඳුන්ගේ දඬුවම මෙසේ ය:
14 ඔවුන්ට දූ දරුවන් බොහෝ ඇතත්, ඔව්හු රණ
බිම්හි මැරී වැටෙති.
q2 14 මුළු පරපුර සාගින්නෙන් පෙළෙති.
15 ඔවුන්ගෙන් ඉතුරු වන අය වසංගතයෙන්
නැසෙති;
q2 15 ඔවුන් ගැන වැන්දඹුවෝ පවා නොවැලපෙති.
16 ඔවුන්ට පොළොවේ වැලි මෙන් රන් රිදී
තිබුණත්, අපමණ රෙදිපිළි ගොඩගැහුණත්,
17 ඒවා පැළඳගන්නේ ඔවුන් නොව, දැහැමි අය ය;
q2 17 ඔවුන්ගේ රන් රිදී ද බෙදාගන්නේ නිදොස් අය
ය.
18 දුදනා සාදන ගෙයෙ මකුළු දැල මෙන් ද කෙතෙ
රක්නා ගොවියාගේ පැල්පත මෙන් ද වැඩි කල්
නොපවතියි.
19 එක් දිනක් ඔහු පොහොසතකු ලෙසෙ සැතපෙයි;
q2 19 නැවත එසේ නොකරයි.
q2 19 පසු දා අවදි වන විට ඔහු අතේ සතයක් නැත.
20 බියකරු විපත ගංවතුර මෙන් ඔහු පලවා හරියි;
q2 20 රෑ හමන කුණාටුව ඔහු පැහැරගෙන යයි.
21 පෙරදිග මාරුතයෙන් ඔහු ගහගෙන යයි;
q2 21 සිය නිවසෙන් ඈත පෙදෙසෙකට ඔහු නෙරෙපී
යයි.
22 ඔහු එක පිම්මෙන් පලා යන්න හැදුවත්, මාරුතය
දයාව නොපෙන්වයි;
q2 22 ඔහුට පහර පිට පහර දෙනු ඇත.
23 ඔහු පලා යන විට මාරුතය ලුහුබැඳ ගිගුරුම්
දෙයි.
q2 23 විනාශකාරී බලයකින් ඔවුන් බිය ගන්වයි."

## ප්‍රඥාවට ප්‍රශංසා

28 රිදී කණින ආකර ඇත;
q2
28 රන් පවිත්‍ර කරන කෝව ඇත.
2 මිනිස්සු පොළොවෙන් යකඩ හාරාගනිති;
q2 2 ගල් උණු කර තඹ ලබාගනිති.
3 මිනිස්සු ගන 'දුර ඉක්මවා බලති;
q2 3 පොළෝ ගැබෙහි යට තැන් සොයති.
q2 3 අඳුරෙන් වැසුණු පර්වත සොයා හාරති.
4 මිනිස් වාසයෙන් ඈත, මිනිසකු කිසි දා පා
නොතැබූ තැන්වල මිනිස්සු පතල් හාරති.
q2 4 කඹවල එල්ලී ඒවාට බැස තනියම වැඩ කරති.
5 මහ පොළොවෙන් ආහාර හට ගනියි;
q2 5 එහි යට පෙදෙස්වල පස ගින්නෙන් මෙන්
දැවෙනු ඇත.
6 එහි ගල් අතර නිල්මිණි ද එහි දූවිල්ලෙහි රන්
කුඩු ද ඇත.
7 පතල්වලට යන මාවත උකුස්සාට නොපෙනෙයි;
q2 7 ඊට උඩින් පියාඹා යන්නට ගිජු ලිහිණියාට එය
නොපෙනෙයි.
8 සිංහයෙකු වත්, අන් කිසි චණ්ඩ මෘගයෙකු වත් ඒ
හුදකලා මාවත්වල කිසි දා නොයයි.
9 මිනිස්සු කළුගල් පර්වත හාරති;
q2 9 කඳු හලේ මුලින් ම උදුරා දමති.
10 ඔව්හු පර්වතවල බිංගෙවල් හාරා නන් වැදෑරුම්
මැණික් සොයාගනිති.
11 ඔව්හු ගංගා නොගලන ලෙසෙ අමුණු බැඳ, සැඟවී
ඇති ධන සම්පත් හාරා පාදා ගනිති.
12 එහෙත්, ප්‍රඥාව සම්බ වන්නේ කොතැන්හි ද?
q2 12 නැණ නුවණ ඇත්තේ කොතැන ද?
13 ප්‍රඥාව මිනිසුන් අතර සම්බ වන්නේ නැත;
q2 13 කිසිවෙක් එහි අගය නොදනිති.
14 'එය මා තුළ නැතැ'යි ගැඹුරු මහ සයුර කියයි;
q2 14 'එය මා වෙත නොවේ ය'යි මහ මුහුද පවසයි.
15 රත්රන් දී, එය මිලට ගත නොහැකි ය;
q2 15 එහි වටිනාකම රිදීයෙන් මිල කළ නොහැකි ය.
16 එය ඕෆීර් රටේ රනින් වත්, අනගි
නබමාණික්‍යයෙන් වත්, නීල මාණික්‍යයෙන් වත් මිල
කළ නොහැකි ය.
17 රන් වත්, වෛදූර්ය වත් ඊට සම කළ නොහැකි
ය;
q2 17 පිවිතුරු රන් ආභරණවලට එය මාරු කළ
නොහැකි ය.
18 රතු කැට හෝ පළිඟු හෝ සඳහන් කරන්නට
වත් උවමනාවක් නැත.
q2 18 ප්‍රඥාව මුතුවලට වඩා අගනේ ය.
19 ඉතියෝපියාවේ පුෂ්පරාග ඊට සම කළ
නොහැකි ය;
q2 19 දඹ රනින් වත් එහි අගය නියම කළ නොහැකි
ය.
20 එසේ නම්, ප්‍රඥාව උදා වන්නේ කොතැනින් ද?
q2 20 නැණ නුවණ ඇත්තේ කොහේ ද?

21 මලෙෝ වැසි කිසිවකුගේ ඇසට ප්‍රඥාව
නොපෙනේ.
q2[21] අහසේ පියාඹන පක්ෂියකුට වත් එය
නොපෙනේ.
22 ‘අප අසා ඇත්තේ ඒ ගැන කට කතා පමණකැ’යි
විනාශයත්, මරණයත් කියති.
23 ප්‍රඥා මාර්ගය දන්නේ දවේිදාණෝ ය;
q2[23] එය තිබෙන තැන දන්නේත් එතුමාණෝ ය.
24 මන්ද, එතුමාණෝ පොළොවේ සීමාන්ත දන්න
සේක;
q2[24] අහස යට සියල්ල දකින සේක.
25 එතුමාණන් සුළඟට බලවේගය දුන් විටත්,
මුහුදේ ප්‍රමාණය නියම කළ විටත්,
26 වැසි වසින තැන් නියම කළ විටත්, මේඝගර්ජනා
යා යුතු මඟ සලකුණු කළ විටත්,
27 එතුමාණෝ ප්‍රඥාව දැක එහි වටිනාකම
ප්‍රකාශ කළ සේක.
q2[27] එය සොයා බලා සම්මත කළ සේක.
28 ගීතා 111:10; හිතෝ 1:7; 9:10 එතුමාණෝ
මිනිසාට මසෙේ වදාළ සේක:
q2[28] ‘දවේිඳුන්ට ගරුබිය දැක්වීම ප්‍රඥාව වේ.
q2[28] නපුරනේ වැළකී සිටීම නැණ නුවණ වේ.’ “

## ජෝබ්ගේ අවසන් කතාව

29 ජෝබ් යළිදු සිය කතාව ඇරඹී ය:
2 “අනේ!
q2[2] දවේිදාණන් මා රැක බලා ගත් පරෙ කාලයට
ආපසු යා ගත හැකි නම්!
3 එකල එතුමාණන්ගේ පහන මාගේ හිසට උඩින්
බැබළිණි.
q2[3] ඒ එළියනේ මම අඳුර මැදින් ගමන් කළෙමේ.
4 එකල මම සමෘද්ධිමත් ව සිටියමේ;
q2[4] එතුමාණන්ගේ මිතුරුකම මාගේ නිවසෙ
රැකවල් කළෙේ ය.
5 එකල සව් බලැති දවේ තුමාණෝ මා සමඟ සිටි
සේක;
q2[5] මාගේ දූ දරුවෝ මා අවට වූ හ.
6 මාගේ ගව සම්පතනේ කිරි ද පර්වතයේ ඔලීව
ගස්වලින් තලේ ගංගා ද ගලා ආවේ ය.
7 නගරයේ වාසල් දොරටු ළඟ උතුමන් සමඟ මා
අසුන් ගත් කල,
8 තරුණයෝ මා දැක පසකට වූ හ;
q2[8] වයසක උදවිය සිය අසුන්වලින් නැඟී හරසර
දැක්වූ හ.
9 ජන නායකයෝ අතින් මුව වසාගනෙ කතාව
නැවැත්වූ හ.
10 මැති ඇමතිවරු කට වසාගත් හ;
q2[10] සියල්ලෝ ම නිහඬ වූ හ.
11 මා ගැන ඇසූ දුටු කවුරු කවුරුත් මාගේ ගුණ
වර්ණනා කළහ.
12 එසේ කළෙේ, මා දිළිඳාගේ දුක් අසා ඔවුන් මුදා
ගත් බැවිනි;
q2[12] සරණක් නැති අනාථයන්ට මා ආධාර කළ
බැවිනි.
13 දැඩි විපතට පත් අය මට ආසිරි පැතූ හ;
q2[13] මම වැන්දඹුවන්ගේ සිත ප්‍රීතියනේ පිනා
යාමට සැලැසීමි.
14 මම දැහැමිකම නමැති වස්ත්‍රයනේ සැරසී, රන්
සළුවක් ද මකුටයක් ද මනේ යුක්තිය පැළඳගත්තමේ.
15+JOB මම, අන්ධයාට දනෙතේ මනේ ද කොරොට
දපො මනේ ද දිළිඳාට පියා මනේ ද වූයමේ.
q2[15+JOB] මම, නොහඳුනන අය වනුෙවනේ මැදිහත්
වූයමේ.
17 මම අදමිටුවාගේ හක්ක බිඳ, විපතට පත් වූ අය
ඔහුගේ කටින් මුදා හැරියමේ.
18 එදා මා සිතුවේ මසෙේ ය:
q2[18] ‘මම දිගායු වළඳා දරු කැල මැද මාගේ
නිවසෙහි යහෙනේ මිය යෑමට නිරතුරු
බලාපොරොත්තු වීමි.
19 පොළොවේ දිය දහර තකේ මුල් බැස ගිය, රෑ
පිනිනනේ තමේ ගිය, අතුපතර ඇති ගසකට මම
සමාන වීමි.
20 එවිට සියලු දනෙ නිරතුරු මට පැසසුම් කළහ.
q2[20] මාගේ ශක්තිය ද කිසි දා හීන නො වී ය.’
21 මා උවදසේ දුන් විට සනෙඟ නිහඬ ව මට සවන්
දුන්හ.
22 මාගේ කතාව නිම කළ විට ඔව්හු වනෙ
කිසිවක් ඊට එකතු නොකළහ.
q2[22] මාගේ වචන ඔවුන්ගේ සිතට වැහි බිංදු මනේ
කාන්දු වී ගියේ ය.
23 වැසි එන තුරු බලා සිටින, පොසොනේ වැසි වලා
එන විට ප්‍රීති වන ගොවීන් මනේ ඔව්හු මුව
අයාගනෙ මට සවන් දුන්හ.
24 මා මඳහසින් ඔවුන් දසෙ බැලූ විට ඔව්හු
දිරිගත්හ.
q2[24] මාගේ සොම්නස් මුහුණ දුටු විට ඔවුන්ගේ
දොම්නස් බැල්ම පහවිය.
25 මම රුස්වීමේ මූලාසනය ගනෙ ඔවුන් ගත යුතු
පියවර සකස් කළෙමේ.
q2[25] සිවුරඟ සනෙඟ පිරිවරා කඳවුරු බැඳගත්
රජකු මනේ මම වැජඹමේින් අසරණයන්
සැනසුවමේ.”

## තමාට දැන් පැමිණ ඇති විපත

30 “එහතේ දැන්, වයසින් බාල උදවිය මට
සරදම් කරති.
q2
30 ඔවුන්ගේ පියවරු මාගේ ගව රැළ රකින
බල්ලන් සමඟ නවතින්න වත් වටිත් යයි මම
නොසිතුවමේ.
2 ඔව්හු, වැඩපල කිරීමට දෑතේ ශක්තිය නැති,
කාය බලය පිරිහී ගිය මනුෂ්‍යයෝ ය.
3 හිඟකම ද සාගතය ද නිසා දිවි රැක ගන්න
පිණිස ඔව්හු පාළුකරයේ වියළි මුල් විකා කෑහ.
4 ඔව්හු, වල් පැළෑටි පඳුරු පිටින් උදුරාගත්හ;

q2 4 කටු ගස්වල මුල් ඔවුන්ගේ කෑම විය.
5 මිනිසුන් අතරෙහි ඔව්හු පලවා හරිනු ලැබූ හ.
q2 5 සොරුන්ට මෙන් ඔවුන්ට විරුද්ධ ව කෑගසමින්
මිනිස්සු ඔවුන් ලුහුබැඳ ගියහ.
6 අඳුරු මිටියාවතේ අගල් හා කාණුවල ද
පොළොවේ වළවල් හා ගුහාවල ද ඔව්හු වාසය
කළහ.
7 කටු ගස් යට එක් රොක් වී පඳුරු අතර වන
සතුන් මෙන් ඔව්හු බෙරිහන් දී කෑගැසූ හ.
8 ඔව්හු කමකට නැති, තකතීරුවන්ගේ පුතුන් මෙන්
වූ හ.
q2 8 ඔව්හු රටෙන් නෙරපාදමනු ලැබූ හ.
9 එහෙත් දැන්, ඔවුන්ගේ සිනාවට ලක් වී විහිළුවක්
වී සිටිමි.
10 ඔව්හු මා පිළිකුල් කොට මාගෙන් ඈත් වෙති;
q2 10 මාගේ මූණට කෙළ ගැසීමට වුවත් ඔවුන්ට
බියක් නැත.
11 දෙවිඳුන් මා දුබලයකු, අසරණයකු කළ බැවින්
ඔව්හු මා අබිමුව කිසි බියක් නැති ව හැසිරෙති.
12 මේ කලහකාරී පිරිස දකුණු පසින් මට පහර
දෙති;
q2 12 මා තල්ලු කර දමති;
q2 12 මට විරුද්ධ ව අවසාන ප්‍රහාරයට සැරසී සිටිති.
13 ඔව්හු මාගේ මාර්ග අවහිර කරති;
q2 13 කිසි පිහිටක් නැති මට විපත්ති වැඩි කරති.
14 මාගේ කොටු පවුරු බිඳුණු තැන්වලින් ඇතුළට
වැදී ඔව්හු මා පිට කඩා පනිති.
15 භීතියෙන් මම මිරිකී සිටිමි.
q2 15 මාගේ ගරුත්වය සුළං රැල්ලක් මෙන් ද මාගේ
යස ඉසුරු වලාකුළක් මෙන් ද පහ ව ගියේ ය.
16 මාගේ අවසානය ඉතා ආසන්න ය.
q2 16 මාගේ විපතේ දී මට සහනයක් නැත.
17 රාත්‍රියේ දී මාගේ ඇටකටුවල වේදනාව ඇත.
q2 17 මා විකා කන, වේදනාවල අඩු වීමක් නැත.
18 එතුමාණෝ ප්‍රචණ්ඩ ලෙසින් මාගේ වස්ත්‍රය
ග්‍රහණය කළහ.
q2 18 මාගේ කබායේ කරපටියෙන් දැඩි ලෙසෙ අල්ලා
ගත්හ.
19 එතුමාණන් මා මඩේ හෙළා ඇත;
q2 19 මම කුණු කසළ මෙන් වී සිටිමි.
20 මා ඔබට හඬ නැඟුවත් ඔබ පිළිතුරු නොදෙනෙ
සේක;
q2 20 මා නැඟිට අයැදුම් කළත් මට පිහිටක් නැත;
21 ඔබ මට කෲරතර ලෙස ක්‍රියා කරන සේක;
q2 21 ඔබේ මුළු බලය යොදා මට පීඩා කරන සේක.
22 ඔබ මා මාරුතයෙන් ගසාගෙන යන්නට හරින
සේක.
q2 22 කුණාටුවෙන් ඒ මේ අත පරෙළනේනට
සලස්වන සේක.
23 මරණ මංචකයට ද කාටත් නියම වූ තැනට ද
ඔබ මා පමුණුවන බව මම දනිමි.
24 නටඹුන් ගොඩක් වැනි මට විරුද්ධ ව ඔබ පහර
දෙන්නේ මන් ද?
q2 24 මට කළ හැකි එක ම දයෙ නම්, දයාව ඉල්ලා
කන්නලව් කිරීම ය.
25 දුකට පත් වූවන් ගැන මා වැළපුණේ නැද් ද?
q2 25 දිළිඳුන් ගැන මාගේ හදවතෙහි කැක්කුමක්
නොවී ද?
26 සැපත පැතූ මා වෙත පැමිණියේ විපත ය;
q2 26 එළිය පැතූ මා වෙත පැමිණියේ අඳුර ය.
27 දහදුකින් මම පීඩිත වී සිටිමි;
q2 27 විපත හැර අන් කිසිවක් මා ඉදිරියෙහි නැත.
28 මම අව්රශ්මියෙන් නොව ශෝකයෙන් කළු ව
ඇවිදිමි;
q2 28 සභාව මැද නැඟිට පිහිට සොයා මොරහඬ
දමේ.
29 මම සිවලුන්ගේ සොහොයුරකු ද පැස්බරුන්ගේ
සහචරයකු ද වී සිටිමි.
30 මාගේ හම කළු වී, එහි පොතු ගැලවී වැටයෙි;
q2 30 මාගේ ඇටකටු උණෙන් දැවී යයි.
31 මාගේ වීණා නාදය විලාප ශබ්දයට ද මාගේ
නළා ස්වර ශෝක හඬට ද වෙනස් වී ඇත.”

## ජෝබ් නිදොස් බව කියා සිටීම

31 “දැරියක දෙසෙ අනුරාගී බැල්මක්
නොහෙළෙන්නට මම මාගේ දෙනෙත් සමඟ
ගිවිසුමක් කළෙමේ.
2 ඉහළ වසන දෙවිඳුන්ගෙන් වන ප්‍රතිවිපාක ද
සගලොව සව් බලැති එතුමාණන් නියම කළ ඉරණම
ද කාට නම් කිව හැකි ද?
3 අදමිටු දනට විනාශයත්, අයුතුකම් කරන අයට
විපතත් එතුමාණන් නියම කර ඇත.
4 එතුමාණෝ මා යන එන තැන් බලා මාගේ හැම
පියවරක් ම ගණන් නොකරන සේක් ද?
5 මම කපටිකමේ හැසුරුණමේ නම්,
බොරුකාරකමින් නොවැළකුණමේ නම්,
6 දැහැමි බව නමැති තරාදියෙහි දමා එතුමාණෝ
මා කිරා බලන සේක් නම්, මා අවංක බව දැන ගනු
ඇත.
7 මම යහ මඟින් ඉවත් ව ගියමේ නම්, මා සිත
මාගේ බැල්මෙන් නොමඟ ගියේ නම්, මාගේ ක්‍රියා
පවින් කිළිටි වී නම්,
8 මා වවන දයෙහෙි පලදාව අනිකකේ අනුභව කරා
වා!
q2 8 මාගේ කතේ අස්වැන්න නැති නාස්ති වේ වා!
9 අන් ස්ත්‍රියකට මාගේ සිත වසඟ වී නම්, මාගේ
අසල්වැසියාගේ බිරිඳ ගැන සිතා, ඇගේ දොරකඩ
ළඟ සැඟවී රුක සිටියමේ නම්,
10 මාගේ ම බිරිඳ අන් කෙනෙකුට බැල මෙහෙවෙර
කරා වා!
q2 10 අන් පුරුෂයෝ ඇය සමඟ සයනය කරත් වා!
11 මන්ද, එය දූෂිත අපරාධයකි, නීතියෙන් දඬුවම්
දිය යුතු දරුණු ක්‍රියාවකි.
12 එය විනාශය දක්වා දවාගෙන යන ගින්නකි;
q2 12 එයින් මාගේ මුළු සම්පත විනාශ වී යනු ඇත.

13 මාගේ මෙහෙකෙරුවා හෝ මෙහෙකොරිය හෝ මට
විරුද්ධ ව පැමිණිල්ලක් ගෙනෙ විට මම ඔවුන්ට
යුක්තිය ඉටු නොකර හැරියෙම් නම්,
14 දෙවිඳුන් විනිසුමට පැමිණෙනෙ විට, මම කුමක්
කරම් ද?
q2 14 දෙවිඳුන්ගේ නඩු ආසනය ඉදිරියෙහි මම කවර
උත්තරයක් දෙම් ද?
15 කුසෙහි මා මැවූ දෙවිඳාණෝ ඔවුනුත් නොමැවූ
සේක් ද?
q2 15 මවු ගැබෙහි අප මැව්වේ එක ම දෙවි
තුමාණෝ නොවෙන සේක් ද?
16 මම කිසි දා දිළිඳුන්ට පිහිට නොවී නොසිටියෙමි.
q2 16 වැන්දඹුවක දුක් බරින් පසු වන්නට ඉඩ
නොහැරියෙමි.
17 පියා නැත්තා හට කෑම ටිකක් නොදී මම
තනියම කෑම නොකෑවෙමි.
18 මම මාගේ බාල වියේ පටන් පියා නැත්තා හට
පියකේ වූයෙමි;
q2 18 උපන් දා සිට මම ඔහුට මඟ පෙන්වූයෙමි.
19 වස්ත්‍ර නැති ව නසින්නට යන අය ද
පොරෝනාව නැති දිළිඳු අය ද දුටු විට,
20 මම මාගේ ම බැටළු ලොම්වලින් ඔවුන්ගේ ඇඟ
උණුසුම් කළෙමි.
q2 20 එවිට ඔව්හු හද පත්ලෙනේ මට ප්‍රශංසා කළෝ
ය.
21 උසාවියේ දී මාගේ පැත්ත ගන්න අය සිටින බව
මා දන්න නිසා, මම නිදොස් අයට විරුද්ධ ව අත
එසවීම් නම්,
22 මාගේ උරහිස එහි හන්දියෙනේ ගැලවී වැටේ වා!
q2 22 මාගේ අත වැලමිටනේ බිඳී යේ වා!
23 මන්ද දෙවිඳාණන්ගෙනේ පැමිණෙනෙ විනාශය මට
භීතියක් විය;
q2 23 එතුමාණන්ගේ මහානුභාවයට මුහුණ දීමට මට
ශක්තියක් නො වී ය.
24 මම කවදාවත් මාගේ ධනසම්පත් කෙරෙහි වත්,
මාගේ රන් රිදී කෙරෙහි වත් විශ්වාසය නොතැබීම්.
25 මාගේ යසඉසුරු ගැන වත්, මා උපයා ගත්
වස්තුව ගැන වත් අහංකාර නොවූයෙමි.
26 මම කවදාවත් ප්‍රතාපවත් හිරු දෙවියන්ට හෝ
රුවින් යුත් සඳ දෙවියන්ට හෝ නමස්කාර
නොකළෙමි.
27 හස්තමුද්‍රාවෙනේ සිඹීමේ පමේ ලකුණ දක්වා,
ඔවුන් නමදින පිණිස මට පෙළඹීමක් නො වී ය.
28 එය සව් බලැති දෙවිඳුන්ට පිටුපා යාමකි.
q2 28 එවන් පාප ක්‍රියාවකට යුතු දඬුවම මරණය
වේ.
29 මට වෛර වූ අයට විනාශය පැමිණි විට මම
සන්තෝෂ නොවූයෙමි.
q2 29 ඔවුන් විපතට අසු වූ විට ප්‍රීති නොවූයෙමි.
30 'ඔවුන්ට මරණය පැමිණේ වා'යි සාප කිරීමෙනේ
හෝ දසේ කීමෙනේ හෝ මම පව් නොකළෙමි.
31 මා අමුත්තන් සතුටින් පිළිගන්න බව මට සේවය
කරන හැම දෙනෙ ම දනිති.
32 අමුත්තන්ට පිටත වීදිවල රැය ගත කිරීමට නෑර
මම ඔවුන් මාගේ නිවසෙට පිළිගතිමි.
33 වෙනෙ අය සිය පව්කම් සිතේ සඟවා තබාගනිති;
q2 33 එහෙත්, මම මාගේ අපරාධ කිසි කලෙක වසන්
නොකළෙමි.
34 සෙනඟගේ කටකතාවලට බියෙනේ වත්,
මිනිසුන්ගේ අපරාධ නිසා කැළඹීමෙනේ වත් මම
නිහඬ වී, ගේ ඇතුළට වී නොසිටියෙමි.
35 අහෝ!
q2 35 මට සවන් දෙනෙ කෙනෙකේ නැද් ද?
q2 35 මා කියන හැම වචනයක් ම සත්‍ය බවට
මෙන්න, මාගේ අත්සන තබමි.
q2 35 සව් බලැති දෙවිඳාණෝ මට උත්තර දෙනෙ
සේක් වා!
q2 35 මාගේ එදිරිකරු මට විරුද්ධ ව ලියූ පැමිණිලි
පත්‍රය මට ඇත්නම්!
36 සැබැවින් මම එය කරපින්නා ගන්නෙමි;
q2 36 හිස මත කිරුළක් මෙනේ පළඳින්නෙමි.
37 මා ගත් පියවර සියල්ල එතුමාණන්ට කියා
සිටින්නෙමි;
q2 37 රාජ කුමාරයෙකු මෙනේ එතුමාණන් වෙතෙ
යන්නෙමි.
38 මාගේ කෙතේ වතු මට විරුද්ධ ව කෑගැසී නම්,
ඒවායේ සියලු හීව්ටි හඬා පැමිණිලි කළේ නම්,
39 මම මිල නොගෙවා අස්වැන්න බුදිම් නම්, ඉඩම්
හිමියන්ගේ ජීවිත හානි කළෙමේ නම්,
40 මාගේ කෙතේවල තිරිඟු වෙනුවට කටු ගස් ද යව
වෙනුවට වල්ගස් ද වැවේ වා!"
q2 40 ජෝබ්ගේ කතාව නිමි.

## එලීහුගේ කතාව

32 තමා නිවැරදි යයි ජෝබ් සිතූ බැවින්, මේ
මිනිස්සු තුන්දෙනෙ ඔහුට පිළිතුරු දීම නැවැත්වූ
හ. 2 එවිට රාම්ගේ පෙළෙපතේ බූසීය බාරකලේගේ
පුත් එලීහුගේ කෝපාග්නිය ඇවිළිණි. ජෝබ්ට විරුද්ධ
ව ඔහුගේ කෝපාග්නිය ඇවිළී ගියේ, ජෝබ් තමා
නිවැරදි බවත්, දෙවියන් වහන්සේ වැරදි බවත් කියා
පෑ බැවිනි. 3 ඔහුගේ මිතුරන් තුන්දෙනෙ ද ජෝබ්
කෙරේ වරද තැබූ නමුත්, ඔහුට පිළිතුරු දීමට අසමත්
වූ බැවින් ඔවුන්ට විරුද්ධ ව ද ඔහුගේ කෝපාග්නිය
ඇවිළී ගියේ ය. 4 එලීහු ඔහුගේ මිතුරන්ට වඩා
වයසින් බාල වූයෙනේ, ජෝබ්ට පිළිතුරු දීමට ඉදිරිපත්
නො වී ය. 5 එහෙත්, ඒ තුන්දෙනා පිළිතුරක්
නොදෙනෙ බව ඔහු දුටු විට ඔහුගේ කෝපය
ඇවිස්සුණේ ය.
6 එකල බූසීය බාරකලේගේ පුත් එලීහු පිළිතුරු
දෙමින් මෙසේ කීවේ ය:
q2 6 "මම නම් වයසින් බාල ය;
q2 6 ඔබ වනාහි වයසක උදවිය ය;
q2 6 එබැවින් මා දන්න දේ ඔබ ඉදිරියේ පැවසීමට
බිය ව මම පසකෙට වී සිටියෙමි.
7 'වයසක උදවිය කතා කළ යුතු යි;

q2 7 දිගායු වැළඳූ අය ප්‍රඥාව පැවසිය යුතු යි,’ යනු
මාගේ වැටහීම යි.
8 එහෙත්, මිනිසාට ප්‍රඥාව දෙන්නේ, සර්ව බලැති
දෙවිඳුන්ගේ ආනුභාවය බව දැන් මම දනිමි.
9 ප්‍රඥාව ඇති වන්නේ, වයස්ගත වීමෙන් පමණක්
නොවේ.
q2 9 හරි දේ දන්නෝ, වැඩිමහල් අය පමණක්
නොවෙති.
10 එබැවින් මා වදන්වලට සවන් දෙන්න;
q2 10 මමත් දන්න දේ කියන්නෙමි.
11 මෙන්න, ඔබේ නැණවත් කතාවට සතුටින් මම
සවන් දුනිමි.
q2 11 ඔබේ වාදයට හොඳින් කන් දී සිටියෙමි.
12 ඔබ තිදෙනා කී දේට මාගේ අවධානය
යොදවූවෙමි.
q2 12 එහෙත්, ජෝබ්ගේ තර්ක බිඳීමට වත්, ඔහුගේ
ප්‍රශ්නවලට පිළිතුරු දීමට වත් සමතකේ ඔබ අතර
නො වී ය.
13 එබැවින්, ‘අපට ප්‍රඥාව සම්බ වී ය’යි
නොකියන්න වග බලාගන්න.
q2 13 ඔහු පරාජය කළ හැකි දෙවිඳුන්ට ම පමණකි,
මිනිසාට නම් නොහැකි ය.
14 ජෝබ්ගේ තර්ක එල්ල කළේ මට නොවේ,
ඔබට ය;
q2 14 එහෙත්, ඔබ පිළිතුරු දුන් ලෙස මම පිළිතුරු
නොදෙමි.
15 ඔව්හු හිරාන්ත ව නිහඬ ව සිටිති;
q2 15 පිළිතුරු දීමට ඔවුන්ට වචන නැත.
16 කිය හැකි දෙයක් නැති ව ඔව්හු බලාගෙන
සිටිති;
q2 16 ඔවුන් නිහඬ ව සිටිය දී මම කිසිත් නොකියා
නිකම් හිඳිම් ද?
17 දැන් මටත් පිළිතුරු දීමට වාරයක් ඇත;
q2 17 මා දන්න දෙයක් මමත් කියමි.
18 කට පුරා වචන ධාරා ගලා එද්දී, මට කතා
නොකර සිටිය හැකි ද?
19 මට සුවය ලැබෙන ලෙස කතා කිරීමට ඉඩක්
නොලැබුණොත් මාගේ හදවත රුස් නොගිය අලුත්
මිදි පැන් දැමූ සම් භාජනයක් මෙන් පුපුරා යනු ඇත.
20 මෙයෙ මට දරාගත නොහැකි ය.
q2 20 නිහඬ ව නොසිට මා පිළිතුරු දිය යුතු ම ය.
21 මම කිසිවකුගේ පැත්ත නොගනිමි.
q2 21 මම කිසිවකුට ඉච්ඡා බස් නොකියමි.
22 ඉච්ඡා බස් තපෙලීමට මම නොදනිමි.
q2 22 මා එසේ කළොත් මාගේ මැවුම්කරුවාණන්
වහා ම මා ලොවින් තුරන් කරනු ඇත.”

### ජෝබ්ගේ අහංකාරය

33 “කසේ වුව ද, ජෝබ් තුමනි, මා කියන
හැම දයෙට ම ඉතා හොඳින් සවන් දෙන්න.
2 මෙන්න, මම පිළිතුරු දීමට සැරසී සිටිමි.
q2 2 මාගේ වචන දැන් දිව’ග ලලෙ දයි.
3 මා කියන හැම දයෙ ම අවංක ය, මා මුවින්
නික්මෙන දයෙ සත්‍ය ය.
4 දිව්‍ය ආත්මයාණෝ මා මැවූ සේක;
q2 4 සර්ව බලැති එතුමන්ගේ හුස්ම මට දිවිය දී ඇත.
5 ඔබට හැකි නම්, මට උත්තර දෙන්න;
q2 5 හොඳින් සූදානම් වී මට විරුද්ධ ව තර්ක
ඉදිරිපත් කරන්න.
6 දවේ තුමන් අබිමුව ඔබත්, මමත් එක වාගේ ම
ය.
q2 6 අපි දදෙනො ම පොළොවේ පසින් සාදනු
ලැබූවමෙු.
7 මා ගැන බියනේ තැති ගත යුතු නොවේ.
q2 7 මාගේ බලපෑම ඔබට වෙහෙසෙක් නො වේ වා!
8 ඔබේ කීම්වලට මමත් සවන් දුනිමි;
q2 8 මෙන්න, ඔබ මෙසේ කියනු මම අසාගෙන
සිටියෙමි;
9 ‘මම නිදොස් ය;
q2 9 අයුතුකමක් මා තුළ නැත.
q2 9 මම නිර්මල ය;
q2 9 මා තුළ පවක් නැත.
10 එහෙත්, දෙවිඳාණෝ මට එරෙහි ව කරුණු
සොයා, මා සතුරකු ලෙස ගණන් ගන්න සේක.
11 ජෝබ් 13:27 මාගේ පාද දඬුකඳේ දමන සේක;
q2 11 මා කරන හැම දයෙ ම මුර කරන සේක.’
q2 11 මේ වදන් ඔබ කීවෙහි ය.
12 ජෝබ් තුමනි, මෙන්න, ඊට මාගේ පිළිතුර;
q2 12 ඔබ කීවා වැරදි ය.
q2 12 දෙවිඳාණෝ මිනිසාට වඩා උතුම් ය.
13 එතුමන්ට එරෙහි ව වාද විවාද කරන්නේ මන්
ද?
q2 13 එතුමන්ගේ තර්කවලට කාට මූණ දිය හැකි ද?
14 දවේ තුමාණෝ නැවත නැවත කතා කරන
සේක;
q2 14 එහෙත්, මිනිසා සලකන්නේ නැත.
15 ජෝබ් 4:13 එතුමාණෝ සිහිනයකින් හෝ රැයේ
දර්ශනයකින් හෝ මිනිසා බර නින්දට පැමිණි විට
යහන මත නින්දේ දී හෝ ඔහුට කතා කරන සේක.
16 දෙවිඳාණෝ මිනිසුන්ගේ කනට කොඳුරා
එතුමන්ගේ තර්ජනවලින් ඔවුන් බිය ගන්වන සේක.
17 එකල මිනිසා ඔහුගේ පාපයනේ වළක්වන
පිණිස, ඔහුගේ උඩඟුකම පහකරන පිණිස,
18 ඔහුගේ ජීවිතය මිනීවළනේ ද ඔහුගේ පණ
කනේද කඩුපතින් ද රැක ගන්න පිණිස දෙවිඳාණෝ
එසේ කරන සේක.
19 දෙවිඳාණෝ, මිනිසාට ලඩෙ රෝග එවීමනේ ද
ඔහුගේ ඇඟපතට වේදනා ඇති කිරීමනේ ද ඔහු
යහ මඟ යවන සේක.
20 එවිට රෝගියාට කෑම ප්‍රිය නැත;
q2 20 රස බොජුන් වුව ද, ඔහු අප්‍රිය කරයි.
21 ඔහුගේ සිරුර ක්ෂය වී ගොස්, හමින් වැසුණු
ඇටකටු පෑදී පනෙයේ.
22 ඔහුගේ ප්‍රාණය මිනීවළට ද ජීවිතය මළවුන්ගේ
ලොවට ද ළං වේ ගනෙ යයි.

23 මිනිසා හට තම හරි වැරදි පහදන පිණිස,
ඔහුගේ සහයට දූතයන් දහසකගනේ එක් කනෙකු
වත් සමහර විට එනු ඇත.
24 දූතයා ඔහුට දයා වී, ‘මනේන, ඔහුගේ මිදීමේ
මිලය!
q2 24 එය රුගනෙ ඔහු මිනීවළට යන්නට නාොදී, ඔහු
මුදාහරින්නැ’යි කියනු ඇත.
25 එවිට ඔහුගේ මාංසය තරුණයකුගේ මාංසය
මනේ සවිමත් වනු ඇත;
q2 25 ඔහු යළි සිය නව යාොවුන් වියට පැමිණනෙු
ඇත.
26 ඔහු දවේඳුන්ට අයැදින විට එතුමාණෝ ඔහුට
පිළිතුරු දනෙ සේක.
q2 26 එවිට ඔහු ප්‍රීතියනේ එතුමාණන් නමදින්නේ
ය.
q2 26 දවේ තුමාණෝ යළි ඔහු දැහැමිකමට පමුණුවන
සේක.
27 ඔහු මිනිසුන් ඉදිරියහෙි ගී ගයමින්, ‘මම පව්
කළෙමේ;
q2 27 දූෂණය කළෙමේ.
q2 27 එහතේ, දවේ තුමාණෝ මට සමාව දුන් සේක.
28 මිනීවළට යාමනේ එතුමාණෝ මා මිදූ සේක;
q2 28 දැන් මාගේ ජීවිතයට එළිය දැක්ක හැකි ය’යි
කියනු ඇත.
29 මිනිසා මරණින් මුදන පිණිසත්
30 ජීවත් වීමේ ප්‍රීතිය ඔහුට දනෙ පිණිසත් දවේ
උතුමාණෝ නැවත නැවත මේ සියල්ල ඔහු උදසො
කරන සේක.
31 එම්බා, ජෝබ් තුමනේ, හාොඳට සවන් දනේන.
q2 31 මා කතා කරන විට නිහඬ ව ඉන්න.
32 කියන්න යමක් ඔබට ඇත්නම්, මට පිළිතුරු දී
කතා කරන්න.
q2 32 මාගේ කැමැත්ත නම්, ඔබ නිවැරදි බව
පිළිගැනීම ය.
33 නැති නම්, මට සවන් දී නිහඬ ව ඉන්න.
q2 33 මම ඔබට ප්‍රඥාව පහදා දමේ.”

## එලීහු ජෝබ්ගේ මිතුරන් අමතයි

34 තවදුරටත් එලීහු පිළිතුරු දමේින්
2 “ප්‍රඥාවන්තයනේි, මට කන් දනේන;
q2 2 හසළ බුද්ධිමතුනි, ම බසට සවන් දනේන.
3 දිව කෑමහෙි රස බලන්නාක් මනේ කන කතාවක
අගය දනියි.
4 යුක්තිය කාොහේ දැ යි අපි සාොදිසි කර බලමු;
q2 4 යහපත කවරේ දැ යි අපි තීරණය කරමු.
5 ජෝබ් කතා කාොට මසේ කී ය:
q2 5 ‘මා තුළ වරදක් නැත;
q2 5 එහතේ, දවේඳාණෝ මාගේ අයිතිය පහකළ
සේක;
6 මා යුක්ති සහගත වුව ද, මා බාොරුකාරයකෙු යි
ගණන් ගනු ලැබේ.
q2 6 මා අත වරදක් නැතත් මම තුවාළවලින් අසාධ්‍ය
ව සිටිමි.’
7 දවේඳුන්ට ගෞරව නාොකරන ජෝබ් වැනි
මිනිසකේ තවත් ඇද් ද?
8 ඔහු දුදනන් හා සමාගම් පවත්වමින් පව්ටුන්
සමඟ ගමන් කරන්නේ ය.
9 ‘දවේඳුන්ගේ ප්‍රසාදය දිනාගැනීමනේ මිනිසකුෙට
කවර ප්‍රයාොජනයක් වේ දැ’යි ඔහු කියයි.
10 දැනුම් තේරුම් ඇති භවතුනි, මයෙ අසන්න.
q2 10 දවේඳාණෝ කිසිදාක වරදක් කරන සේක් ද?
q2 10 සව් බලැති උතුමාණෝ අයුත්තක් කරන සේක්
ද?
11 මන්ද, එතුමාණෝ මිනිසකුෙගේ ක්‍රියාවල
හැටියට ඔහුට ප්‍රතිඵල දනෙ සේක.
q2 11 ගීතා 62:12 එකිනකොගේ හැසිරීම අනුව
විපාක දනෙ සේක.
12 එසේ ය, සැබැවින් ම දවේ තුමාණෝ වරදක්
නාොකරන සේක.
q2 12 සව් බලැති දවේඳාණෝ යුක්තිය නාොපරළෙන
සේක.
13 මහ පාොළාොව එතුමාණන්ට භාර දුන් කනෙකේ
ඇද් ද?
q2 13 මුළු සක්වළ ආධිපත්‍යය එතුමාණන් අන්
කනෙකුෙගනේ ලත් දයෙක් ද?
14 දවේ තුමාණන් මිනිසාගේ ජීවිතය පැහැර
ගතහාොත්, ඔහුගේ හුස්ම ඔහුගනේ ඇදගතහාොත්
15 මුළු මිනිස් සංහතිය ම නසිනු ඇත;
q2 15 පරළො දූවිල්ලට යනු ඇත.”

## එලීහු ජෝබ් අමතයි

16 “ඉතින් ජෝබ්, ඔබ නුවණ ඇති කනෙකේ නම්,
මේ මාගේ වචනයට සවන් දනේන.
17 යුක්තිය නුරුස්නා කනෙකුෙට ලාොවක් ආණ්ඩු
කළ හැකි ද?
q2 17 සව් බලැති, ධර්මිෂ්ඨ තැනැන් වහන්සේ පිට
ඔබ වරද තබන්නහෙි ද?
18 රජකුෙට, ‘නපුරා ය’යි ද උතුමකුෙට, ‘දුෂ්ටයා ය’යි
ද කියන,
19 අධිපතීන්ගේ තරාතිරම් නාොබලන, දිළිඳාට වඩා
ධනවතාට කරුණාව නාොදක්වන දවේඳුන් පිට ඔබ
වරද තබන්නහෙි ද?
q2 19 ඒ හැම දනෙ ම මැවූයේ දවේ තුමාණෝ ය.
20 ඔව්හු මාොහාොතකින් නසිති;
q2 20 ඔවුන් හැම, මැදියම් රෑ එක් ඇසිල්ලකින් නැසී
යනු හැක;
q2 20 බලවතකු වුව ද පහසුවනේ පහ ව යනු ඇත.
21 එතුමාණන්ගේ දෑස මිනිසුන්ගේ ක්‍රියා මාර්ගය
දසෙ ඇත.
q2 21 ඔවුන්ගේ හැම පියවරක් ම එතුමාණෝ දන්න
සේක.
22 දුදනන් හට එතුමාණන් කරෙනේ සැඟවී සිටිය
හැකි තරම් ගන’දුරක් වත්, තද කළුවරක් වත් නැත.
23 නඩු විනිශ්චය සඳහා මිනිසකු දවේ තුමන් වතෙ
පමුණුවනු වස් නියමිත දිනයක් නැත.

24 විභාගයක් නොපවත්වා එතුමාණෝ බලවතුන්
පහකොට ඒ වෙනුවට වෙන අය පත් කරන සේක.
25 එතුමාණෝ ඔවුන්ගේ ක්‍රියා දන්න බැවින්,
ඔවුන් සුන් වන ලෙස රැයේ දී ඔවුන් පෙරළාදමන
සේක.
26 එබැවින් දෙවි තුමාණෝ ප්‍රසිද්ධියේ ම ඔවුන්
දුදනන් ලෙස සලකා පහර දෙන සේක.
27 එසේ වූයේ:
q2 27 ඔවුන් එතුමාණන්ට කීකරු වීම අත්හැරදැමූ
නිසා ය;
q2 27 එතුමාණන්ගේ සියලු මාර්ග නොසලකා හැරිය
නිසා ය.
28 ඔව්හු දිළිඳුන්ගේ මොරගැසීම එතුමාණන් වෙත
නැඟී එන්නට සැලැස්වූ හ, දුගී ජනයාගේ අයැදුමට
එතුමාණෝ සවන් දුන් සේක.
29 නිහඬ ව සිටියත්, එතුමාණන්ට වරද තබන්නෝ
කවරහු ද?
q2 29 කිසිත් නොකර සිටියත්, එතුමාණන්ට දොස්
තැබිය හැකි ද?
30 හිතුවක්කාර සෙනඟක් කෙරේ හෝ ජාතියක්
කෙරේ හෝ එතුමාණන් අභක්තිකයකු රජකමට
පත් කළත් කුමක් කළ හැකි ද?
31 යම් කෙනෙකු දෙවිඳුන්ට මෙසේ කීවොත්, එනම්,
'මම දඬුවම් වින්දෙමි;
q2 31 මින්පසු තවදුරටත් වැරදි නොකරමි;
32 අනේ!
q2 32 මා වැනි නීච කාලකණ්ණියකේ, මට හරි මඟ
පෙන්වනු මැනව.
q2 32 මම මීට පෙර කුමන වරදක් කළත්, මින්මතු
පව් නොකරමි.'
33 මේ කියමන නිසා, දෙවිඳුන් ප්‍රතික්ෂේප කිරීමේ
ඔබේ වරද දෙවි තුමන් ගණන් නොගෙන හරිනු ඇද්
ද?
q2 33 තීරණය ඔබ අතේ ය, මා අත නොවේ.
q2 33 ඔබ දත් පමණින් පිළිතුර අපට කියන්න.
34 සිහි නුවණ ඇති උදවිය, නැණ නුවණ ඇති හැම
දෙන, මට මෙසේ කියනු නිසැක ය;
35 'ජෝබ් අඥාන ලෙස කතා කරයි;
q2 35 ඔහු කියන දෙයෙහි තේරුමක් නැත.
36 ජෝබ් දුෂ්ට මිනිසකු මෙන් උත්තර දෙන බැවින්,
ඔහු අවසාන තීන්දුවට ම ඉදිරිපත් කළොත් යහෙකි.
37 ඔහු පව්කරුවකු පමණක් නොව,
කැරලිකරුවකු ද වී ඇත;
q2 37 ඔහු ප්‍රලාප දොඩමින් දෙවිඳුන් හට අවමන්
කරයි.' "

35 එලීහු තවදුරටත් කතා කරමින් මෙසේ කීවේ
ය:
2 "ජෝබ්, ඔබ කියන දේ යුක්ති සහගත යයි ඔබ
සිතන්නෙහි ද?
q2 2 දෙවිඳුන් ඉදිරියෙහි ඔබ නිවැරදි යයි සිතන්නෙහි
ද?
3 'මාගේ පව්වලින් ඔබට කුමන පලක් ද?
q2 3 පව් නොකර සිටීමෙන් මට ලැබුණු වාසිය කුමක්
දැ යි අසන එක හරි ද?
4 ඔබටත්, ඔබේ මිතුරන්ටත් මම මේ පිළිතුර දෙමි.
5 අහස දෙස නෙතේ යොමා බලන්න;
q2 5 ඈත ඉහළ අහසෙහි පාවෙන වැහි වලාකුළු දෙස
බලන්න;
q2 5 ඒවා කොපමණ ඉහළින් ඇද්දැ යි කල්පනා
කරන්න.
6 ජෝබ් 22:2-3 ඔබ පව් කළත්, දෙවිඳුන්ට එයින්
විපතක් ඇද් ද?
q2 6 ඔබ කොතරම් වැරදි කළත්, දෙවිඳුන්ට එයින්
පීඩාවක් ඇද් ද?
7 ඔබ දැහැමි ව සිටීමෙන් දෙවිඳුන්ට කුමන
ආධාරයක් දෙන්නෙහි ද?
q2 7 එයින් දෙවි තුමන්ට ලැබෙන වාසිය කුමක් ද?
8 ඔබේ දුෂ්ටකමින් අවැඩක් වන්නේ ඔබ වැනි
මිනිසුන්ට පමණකි.
q2 8 ඔබේ දැහැමිකමින් මුළු මිනිස් වර්ගයාට වැඩක්
වනු ඇත.
9 තාඩන පීඩන නිසා මිනිස්සු විලාප කියති;
q2 9 බලවතුන්ගේ පීඩාව නිසා ඔව්හු පිහිට සොයා
කෑගසති.
10+JOB එහෙත්, වනයේ මෘගයන්ට වඩා අපට දැනුම
දෙන, අහසේ පක්ෂීන්ට වඩා අපට නැණ නුවණ
දෙන, අඳුරේ දී අපට සවිය දෙන මැවුම්කාර දෙවි
උතුමාණෝ කොතැන්හි දැ යි අසන කිසිවකේ නැත.
12 ඔවුන් පිහිට ඉල්ලා මොරගසන නමුත්, ඔවුන්ගේ
අහංකාරය හා දුෂ්ටකම නිසා, දෙවිඳුගෙන් ඔවුන්ට
පිළිතුරක් නැත.
13 ඒ මොරගැසීමෙන් වැඩක් නැත;
q2 13 දෙවිඳාණෝ සවන් නොදෙන සේක.
q2 13 සව් බලැති උතුමාණෝ එය නොසලකන
සේක.
14 ජෝබ්, 'මට දෙවිඳුන් නොපෙනේ ය.
q2 14 එහෙත්, නඩුව එතුමාණන් අතේ ය;
q2 14 මම ඉවසිල්ලෙන් බලා සිටින්නෙමි'යි ඔබ
කියන්නෙහි ය,
15 'දැන්, එතුමාණෝ උදහස් ව දඬුවම් නොකරන
සේකැ'යි ද 'ඒ අපරාධය ගැන වැඩි සැලකිල්ලක්
නොදක්වන සේකැ'යි ද ඔබ සිතන්නෙහි ද?
16 එබැවින් ජෝබ්, ඔබ මුව අයා කතා කරන්නට
යාමෙන් වැඩක් නැත;
q2 16 ඔබ පවසන දෙය ඔබට ම තේරෙන්නේ නැත."

36 එලීහු මෙසේ ද කීවේ ය:
2 "දෙවිඳුන් ගැන කිය යුතු තවත් දේ ඇත;
q2 2 ඒවා ඔබට පෙන්වා දෙන තුරු මඳක් ඉවසන්න.
3 මා දන්න දෙයින්, මාගේ පුළුල් අවබෝධයෙන්
මාගේ මැවුම්කාර උතුමාණන්ගේ දැහැමි බව
පෙන්වා දෙමි.
4 මන්ද, මාගේ තර්කවල බොරුවක් නැත.
q2 4 විශිෂ්ට පැණවතකු ඔබ ඉදිරියෙහි සිටින බව
ඔබට පෙනෙනු ඇත.
5 දෙවිඳාණෝ බලවත් ය, එහෙත්, කිසිවකු, සුළු
නොකරන සේක.
q2 5 එතුමාණන්ගේ ප්‍රඥා මහිමය උදාර ය.

6 දෙවි තුමාණෝ අදමිටුවන්ට ඉසුරුමත් වන්නට ඉඩ
නොදෙන සේක.
q2 6 එහෙත්, දිළිඳුන්ගේ හා පීඩිතයන්ගේ
අයිතිවාසිකම් සලසා දෙන සේක.
7 එතුමාණෝ, දැහැමියන්ට රැකවරණය දෙන
සේක;
q2 7 සිහසුන් අරා, නිරිඳුන් මෙන් ගෞරවයෙන් සැම
දා රට පාලනය කරන්නට ඔවුන්ට ඉඩ දෙන සේක.
8 එහෙත්, සනෙඟ විලංගුවලින් බඳිනු ලැබ, දුක්
පීඩා නමැති යදම්වලට අසු වී සිටිත් නම්,
9 දෙවිඳාණෝ ඔවුන්ගේ පාපය හා අහංකාරය
ඔවුන්ට පෙන්වා දෙන සේක.
10 ඔවුන්ට දැනුමැතිකම් දී, අයුක්තියෙන් ඉවත් වන
ලෙස අණ කරන සේක.
11 ඔවුන් කීකරු වී එතුමාණන්ට මෙහෙ කළොත්,
ඔව්හු දිවි ඇති තාක් යස ඉසුරෙන්, සව් සැපතින්
දවස් යවති.
12 එහෙත්, අකීකරු වුවහොත්, කඩු පහරින් වැනසී,
මළවුන්ගේ ලොවට එතෙර වී යති.
13 එහෙත්, අභක්තිකයන් උදහස් ව ම සිටිනු ඇත.
q2 13 ඔවුන්ට දඬුවම ආවත් ඔව්හු පිහිට පතා
අයැදුම් නොකෙරති.
14 යොවුන් වියෙහි සිටිය දී ම ඔව්හු අපකීර්තියට
ලක් වී විනාශ වෙති.
15 දෙවිඳාණෝ, දුක් විඳීම මඟින් දුක් විඳින්නන්ට
ගැළවීම දෙන සේක.
q2 15 පීඩාව කරණකොටගෙන ඔවුන්ගේ ඇස්
පහදන සේක.
16 දෙවිඳාණෝ ඔබ විපතින් මුදා, සුරැකෙන තැනක
පිහිටුවා ඔබේ කෑම මේසය මංගල භෝජනයෙන්
පිරවූ සේක.
17 එහෙත් දැන්, ඔබ දුදනන් සාධාරණ ලෙස
විනිශ්චය නොකරන්නෙහි ය.
q2 17 විනිශ්චයයට හා සාධාරණකමට ගරු
නොකරන්නෙහි ය.
18 අල්ලසින් මුළා නොවීමට ද ධන සම්පතින්
නොරැවටෙන්නට ද වග බලාගන්න.
19 ඔබේ මොරගැසීම වත්, ශක්තියේ බලය වත්
ඔබට පීඩාවෙන් ගැළවීමට ආධාරයක් නොවෙනු ඇත.
20 ජාතීන්ගේ විනාශය පමුණුවන අඳුරු රැයට ආසා
නොවන්න.
21 අදමිටු මඟෙහි නොයාමට බලාගන්න;
q2 21 දුක් පීඩා පැමිණියේ, ඔබ ඒ මඟින් වළක්වන
පිණිස ය.
22 දෙවිඳුන්ගේ බල මහිමය කොතරම් විශාල ද?
q2 22 දෙවිඳුන් සම ගුරුවරයෙක් තවත් ඇද්ද ද?
23 දෙවිඳුන් යා යුතු මඟ නියම කරන්නට සමතා
කවරේ ද?
q2 23 'ඔබ වරද කර ඇතැ'යි එතුමාණන්ට කීමට
කාට හැකි ද?
24 මිනිසුන් කවදාත් එතුමාණන්ට පැසසුම් දී ඇත;
q2 24 ඔබත් එතුමාණන්ට පැසසුම් දීමට සිතට ගන්න.
25 එතුමාණන් කර ඇති සියල්ල සැම දෙන දැක
ඇත.
q2 25 එහෙත්, එතුමාණන් යථා පරිදි තේරුම්ගත
හැකි කිසිවෙක් නැත.
26 දෙවිඳුන් අති ශ්‍රේෂ්ඨ ය;
q2 26 අපි එතුමාණන් නොදනිමු.
q2 26 එතුමාණන්ගේ ආයු ප්‍රමාණය දන්නෝ කවුරු
ද?
27 දිය බිංදු පොළොවෙන් ඉහළට ඇදගෙන, වාෂ්ප
මඟින් වැසි වස්වන්නේ දෙවිඳාණෝ ය.
28 වලාකුළුවලින් වැස්ස මවා, සව් සත වෙත එය
එවන්නේ එතුමාණෝ ය.
29 වලාපටල විහිදී යන්නේ කෙසේ ද කියාවත්,
එතුමාණන්ගේ මණ්ඩපවලින් ගිගුරුම් නඟින්නේ
කෙසේ ද කියාවත් දන්නෝ කවුරු ද?
30 දෙවි තුමාණෝ විදුලි එළිය අහස පුරා විහිදුවන
සේක;
q2 30 එහෙත්, මුහුදේ පතුල අඳුරෙහි තබන සේක.
31 වැසි වස්වා, ජනතාවට ආහාර සපයා,
එතුමාණෝ විපුල ලෙසින් කෑම බීම උපයා දෙන
සේක.
32 දෙවි තුමාණෝ විදුලිය අතින් ගෙන, නියම
ඉලක්කය බලා යන්නට එයට අණ දෙන සේක,
33 අහස් ගිගුරුම, කුණාටුව එන බව කලින් දන්වන
සේක.
q2 33 එය එන බව ගව රැළ දනිති."

37 "චණ්ඩ මාරුත නිසා මහද සැලී දැඩි ලෙස
වෙවුළයි.
2 ඔබ හැම එතුමාණන්ගේ ගිගුරුම් හඬටත්,
එතුමාණන් මුවින් නික්මෙන ගර්ජනාවටත් හොඳින්
සවන් දෙන්න.
3 එතුමාණෝ ඒ හඬ අහස පුරා විහිදුවන සේක;
q2 3 විදුලිය පොළොවේ සීමාන්ත දක්වා පතුරුවන
සේක.
4 එවිට එතුමාණන්ගේ ගිගුරුම් හඬ ද ප්‍රතාපවත්
ගර්ජනා හඬ ද දිගට ම ඇසේ.
q2 4 විදුලිය නොනැවතී දිගට යයි.
5 දෙවිඳුන්ගේ හඬ පුදුම ලෙස ගිගුරුම් දෙයි;
q2 5 අපට තේරුම් ගත නොහැකි අරුමපුදුම දේ සිදු
වෙයි.
6 මිහි මත හිම පතනය වන ලෙස ද මොරසූරන
වැස්ස වහින ලෙස ද එතුමාණෝ අණ දෙන සේක.
7 සියල්ල එතුමාණන්ගේ ක්‍රියා බව සියලු මිනිසුන්
දැනගන්න පිණිස සෑම ක්‍රියාවකට ම එතුමාණෝ
මුද්‍රාව තබන සේක.
8 එකල මෘගයෝ ගුහාවලට වදිති.
q2 8 එහි සුරක්ෂිත ව ලගිති.
9 දකුණු දිශාවෙන් සුළි සුළඟ ද උතුරු දිශාවෙන් තද
ශීත ද හමා එයි.
10 දෙවිඳුන්ගේ හුස්මෙන් වතුර මිදෙයි;
q2 10 ඒවා තද අයිස් කැටිවලට හැරෙයි.
11 එතුමාණෝ දියෙන් බර වැහි වලාකුළු එවන
සේක.
q2 11 වලාකුළු මැදින් විදුලිය පැතිර යයි.
12 දේව ආඥා අනුව විදුලිය කොටනු ඇත.
q2 12 දේව අදහස අනුව ලොව පුරා විදුලිය දුවයි.

13 දඬුවමක් වශයෙන් හෝ පොළොව සරුසාර වන
පිණිස හෝ දිව්‍ය කරුණාවේ ලකුණක් වශයෙන්
හෝ මේ සියල්ල සිදු වෙයි.
14 ජෝබ්, මඳක් නවතින්න, මේ අසන්න.
q2 14 දෙවිඳුන්ගේ පුදුම ක්‍රියා ගැන කල්පනා
කරන්න.
15 දෙවිඳාණන් අණ දී වලාකුළු අතරින් විදුලිය
බැබළෙන්නේනට සලස්වන්නේ කෙසේ දැ යි ඔබ
දන්නෙහි ද?
16 සර්ව ප්‍රඥාවෙන් යුත් දෙවිඳුන්ගේ විස්මයජනක
මැවිලි වන වලාකුළු අහසේ පාවෙන හැටි ඔබ
දන්නෙහි ද?
17 දකුණු දෙසින් හමන සුළඟ නැවතුණ කල, ඔබේ
ඇඟට රස්නය එන්නේ කෙසේ දැ යි ඔබ දන්නෙහි
ද?
18 අහස ලෝහමය තලයක් මෙන් සවි ඇති දෙයක්
කිරීමට දෙවිඳුන්ට මෙන් ඔබටත් හැකි ද?
19 අප දෙවිඳුන්ට කිය යුතු දෙය ඔබ අපට
උගන්වන්න;
q2 19 අපගේ බුද්ධිය අඳුරු ය;
q2 19 එතුමන්ට කියන්නට අපට කිසි දෙයක් නැත.
20 'කතා කරන්නට මට ඉඩ දෙන්නේ'යි මා
කියන්නේ කොහොමෙ ද?
q2 20 මිනිසකු වන මා නාස්ති කිරීමට එතුමාණන්ට
මා ඉඩ දෙන්නේ මන් ද?
21 සුළඟ හමා අහස පිරිසිදු වී ඇත.
q2 21 ඇස් නිලංකාර කරන ආලෝකය විහිදී
බැබළෙයි.
q2 21 මේ දෙනෙතින් එය බැලිය නොහැකි ය.
22 උතුරුදිග රන්වන් කාන්තිය විහිදී ඇත.
q2 22 දෙවිඳුන්ගේ මහිමය අප තුළ බිය දනවයි.
23 දෙවිඳුන්ගේ මහානුභාවය අචින්ත්‍ය ය,
බලපරාක්‍රමයෙන් ද යුක්තියෙන් ද දැහැමිකමෙන් ද
එතුමාණෝ උත්තරීතර ය.
q2 23 එතුමාණන්ට ළඟා වීමට අපට නොහැකි ය.
24 එබැවින් මනුෂ්‍යයෝ එතුමාණන්ට බිය වෙති.
q2 24 'අපි පැණවත්තු ය'යි සිතන්නවුන් එතුමාණෝ
නොසලකන සේක."

### දෙවිඳාණන් ජෝබ් අමතීම

38 එවිට දෙවිඳාණෝ කුණාටුව මැදින් ජෝබ්ට
මෙසේ පිළිතුරු දුන් සේක;
2 "අනුවණ බස් තෙපලා මාගේ පැණවත් අරමුණු
අඳුරු කරන, මොහු කවරෙක් ද?
3 එඩිතර ව මිනිසකු මෙන් නැඟිට සිට මාගේ
ප්‍රශ්නවලට පිළිතුරු දෙව.
4 මා මහ පොළොවේ පදනම් දමන විට නුඹ
කොතැන සිටියෙහි ද?
5 එතරම් දැනුම ඇත්නම්, කියව, එහි දිග පළල
තීරණය කළෝ කවුරු ද?
q2 5 ඒ මත රේඛා ලණුව ඇද්දේ කවරෙක් ද?
q2 5 දන්නෙහි නම් කියව.
6 එය දරා සිටින මහ කුළුණු රඳා ඇත්තේ කුමක්
පිට ද?
q2 6 එහි මුල් ගල තැබුවේ කවරෙක් ද?
7 ඒ අරුණෝදයෙහි පහන්තරු ගී ගැයී ය.
q2 7 සියලු දෙව් පුත්හු තුති ගොස නැඟුවා හ.
8 පොළෝ ගැබින් මහ මුහුද බිහි වූ විට දොරටු
වසා මුහුදු ජලය නැවැත්වූයේ කවරෙක් ද?
9 ජරෙ 5:22 මහ මුහුද වලාකුළුවලින් පළඳා, අඳුර
නමැති සළුව පෙරෙවූයේ මම ය.
10 මුහුදේ මායිම් නියම කළෙමේත්, එහි දොර අගුල්
තැබුවේත් මම ය.
11 'මේ දක්වා එන්නෙහි ය;
q2 11 මින් එහා නොයන්නෙහි ය;
q2 11 නුඹේ එඩිතර රළ පතර මෙහි නවතින්නේ ය'
කියා කීවේත් මම ය.
12 ජෝබ්, නුඹ උපන් දින සිට කිසි ම දාක අලුත්
දිනක් උදා වන්නට නුඹ අණ දුන්නෙහි ද?
13 පොළොව පුරා අරුණෝදය නැඟී එන්නටත්,
දුදනන් මිහි පිටින් පැන්නීමටත් නුඹ ආඥාවක්
පැණවූයෙහි ද?
14 හිරු උදාව, කඳු හා නිම්න මතු කරයි;
q2 14 ඒවා මැටිවල තබන ලද මුද්‍රාව මෙන් ද
ඇඳුමක රැළි මෙන් ද කැපී පෙනෙයි.
15 දවල් එළිය දුදනන්ට දැරිය නොහැකි තරම්
දීප්තිමත් ය.
q2 15 එය ඔවුන්ගේ සැහැසිකම් වළක්වාලයි.
16 නුඹ මුහුදේ උල්පත්වලට ළං වූයෙහි ද?
q2 16 මුහුදු පත්ලේ යා ගත නොහැකි පෙදෙස්වල
ඇවිද්දෙහි ද?
17 මරහුගේ ලොවට පිවිසෙන දොරටු නුඹට
පෙනේවා ඇත්තේ ද?
q2 17 අඳුරු ලොවේ මුර දොරටු කවදාවත් නුඹ
දුටුවෙහි ද?
18 මහ පොළොව කොතරම් විසල් දැ යි නුඹ මඳක්
වත් දන්නෙහි ද?
q2 18 දන්නෙහි නම් මට කියව.
19 ආලෝකය එන්නේ කෙහෙන් දැ යි, අඳුර බිහි
වන්නේ කොහේ දැ යි නුඹ දන්නෙහි ද?
20 නුඹට ඒවායේ නියම ස්ථානවලට මඟ පෙන්විය
හැකි ද?
q2 20 නුඹට ඒවායේ නිවසේවලට ඒවා ගෙන ගිය
හැකි ද?
21 නුඹ මෙපමණ දිගායු වළඳා සිටින බැවින්,
විශ්වය මැවෙන්නට පෙර නුඹ ජීවත් වී සිටි හෙයින්
ඔය කොයි දේත් නුඹට කළ හැකි නොවේ ද?
22 ම විසින් හිම හා ගල් වැහි තැන්පත් කරනු ලැබ
ඇති ගබඩාවලට නුඹ කවදාවත් ගොස් තිබේ ද?
23 ඒවා විපත හා යුද කෝලාහල ඇති වන කාලය
සඳහා සූදානම් කොට තබා ඇත.
24 හිරු උදා වන ස්ථානයටත්, පෙරෙදිග සුළං
පටන්ගන්න ස්ථානයටත් නුඹ ගොස් තිබේ ද?
25 කඩා වැටෙන වර්ෂාවට දිය අගලක් කැපුවේ
කවරෙක් ද?

q2 25 අකුණු කොටන අහස් තලයට මං පෑදුවේ කවරකේ ද?
26 මිනිසුන් නැති දේශයකට, කිසිවකු නැති මරුකතරකට වැසි වස්වන්නේ කවරකේ ද?
27 නිල් තණකොළ වැවෙන ලෙසට වියළි පොළොව නිලනේ වසන්නට ජලය සපයන්නේ කවරකේ ද?
28 වහින වලාවට, වැටෙන පින්නට පියකේ නැද් ද?
29 වතුර ගල් කොට, මුහුදු ජලය මිදනේනට සලස්වන්නේ කවරකේ ද?
30 හිම කැට හා අහසේ තුෂාර තම කුසින් ජනිත කරවන මාතාව කවරකේ ද?
31 ජෝබ් 9:9; ආමොස් 5:8 හත්දින්නේ තරු වැළ බැඳ තබන්නට හෝ මුව සිරසේ බඳ පටිය ලිහන්නට හෝ නුඹට හැකි ද?
32 නියම කලට ග්රහ රාශි චක්ර ලග්නවල පිහිටුවන්නට නුඹට හැකි ද?
q2 32 මහ වලසා සහ කුඩා වලසා නම් තරු වැල් හසුරුවන්නට නුඹට හැකි ද?
33 අහසේ නක්ෂත්ර නීති නුඹ දන්නහෙි ද?
33 පොළොව කරෙහි ඒවායේ බලපෑම නුඹට නියම කළ හැකි ද?
34 මහ වැසි දහරින් නුඹ තමොලන්නට වලාකුළුවලට අණ දීමට නුඹට හැකි ද?
35 විදුලි කොටන ලෙස එයට අණ දුන්නහොත් ‘හොඳ ම යි මම සූදානම් ය’යි එය නුඹට කියනු ඇද් ද?
36 නයිල් ගඟේ වතුර ගලන්නේ කවදා දැ යි කීමට, අයිබිස් පක්ෂියාට ඉගැන්නුවේත්, වැසි වස්නා දිනය කවදා දැ යි කීමට, කුකුළාට ඉගැන්නුවේත්, කවරකේ ද?
37 ප්රඥාවනේ වළාකුල් ගනින්ට කාට පුළුවන් ද?
q2 37 අහසේ භාජනවලින් දිය වගුරුවන්ට කාට පුළුවන් ද?
38 වැසි වැස්වීමනේ දූවිලි දැඩි කොට පස් පිඬලි සකස් කරන්නේ කවරකේ ද?
39+JOB නුඹ සිංහ ධේනුවට ගොදුරු දඩයම් කර දනේනහෙි ද?
q2 39+JOB තරුණ සිංහ රාජයන් උන්ගේ ගුහාවල ලැග, වනයේ සැඟවී බලා සිටින විට, නුඹ උන්ගේ සාගින්න නිවන්නහෙි ද?
41 කපුටුවන් සාගින්නනේ ඔබමොබ පියාඹන විට, උන්ගේ පැටවුන් කෑම ඉල්ලා දවේදුන්ට කෑ ගසන විට උන්ට කෑම සපයන්නේ කවරකේ ද?

39 “පර්වතවල සිටින වල් එළුවන් පැටව් ගසන කාලය නුඹ දන්නහෙි ද?
q2
39 නොහොත් මුව දනුෙන්ගේ ප්රසූත වේලාව නුඹට දැනගත හැකි ද?
2 උන් ගැබ් ගෙන සිටින මාස ගණන් කරන්නට නුඹට පුළුවන් ද?
q2 2 උන් පැටව් ගසන කාලය නුඹ දන්නහෙි ද?
3 උන් නැඹුරු වී පැටවුන් බිහි කොට විළි රුදා පහ කරගන්න කාලය නුඹ දන්නහෙි ද?
4 උන්ගේ පැටව් වනයේ වැඩී, ලොකු වී, ශක්තිමත් වී පිට වී යති.
q2 4 යළි ආපසු නොඑති.
5 වල් කොටළුවාට නිදහස දානය කළෙේත්, උගේ බැඳුම් ලිහා මුදා හැරියේත් කවරකේ ද?
6 මම පාළුකරය ඌට ගයෙක් කොට, ලේවාය ඌට තිප්පලක් කොට නියම කළෙමේ.
7 ඌ නගරයේ ඝෝෂාව ගණන් නොගනියි.
q2 7 ඌ රියැදුරාගේ කෑගැසීම නොසලකයි.
8 කඳුකරය උගේ ගොදුරු බිම වේ;
q2 8 කෑම පිණිස ඌ හැම පලා ජාති සොයා යයි.
9 කුළු හරකා නුඹට වැඩ කරන්නට කැමැති වේ ද?
q2 9 ඌ රැයහෙි නුඹේ ගාලහෙි ලගිනු ඇද් ද?
10 කුළු හරකා ලණුවකින් හීවීටේ බඳින්නට නුඹට හැකි ද?
q2 10 නොහොත් නුඹට පිටුපසින් ඌ කුඹුර පෝරු ගානු ඇද් ද?
11 උගේ ශක්තිය මහත් බැවින්, නුඹ ඌ විශ්වාස කර, නුඹේ බර වැඩ ඌට බාර දනේනහෙි ද?
12 නුඹේ අස්වැන්න කමතට රුස්කර ගනෙනුෙ ඇතැ යි
q2 12 නුඹ ඌ කරෙහි විශ්වාසයක් තබන්නහෙි ද?
13 පැස්බරාගේ පියාපත් වැනනෙ වේගය කදිමයි.
q2 13 එහතේ, පැස්බරාට කණා කොකා මනේ පියාඹන්නට නොහැකි ය.
14 ඌ පොළොවහෙි බිජු දමා, පසහෙි තාපයනේ ඒවා උණුසුම් වීමට තබයි.
15 එහතේ, ඒවා පයට පෑගනේනටත්, වන සතුන්ගේ පාදවලට පොඩි වන්නටත් පුළුවන් බව අමතක කරයි.
16 උගේ පැටවුන් ඌට අයිති නැතිවාක් මනේ ඌ දැඩි සිතින් උන්ට සලකයි.
q2 16 උගේ මහන්සිය නිෂ්ඵල වුව ද, එය ගණන් ගන්නේ නැත.
17 දවේදාණෝ උගනේ ප්රඥාව වළක්වා, ඌට නැණ නුවණ නො දී හැරිය සේක.
18 ඌ පියාපත් විදහා දුවන කල ඌ අසුටත්, අසරුවාටත් සිනාසයේ.
19 ජෝබ්, අසුට වරෙ වීරිය දුන්නේ නුඹ ද?
q2 19 ලලෙ දනෙ කසෙරු උගේ ගලෙහෙි පැළඳවේවේ නුඹ ද?
20 උගේ හේෂාරවයනේ මිනිසුන් බියගන්වා, පළඟැටියකු මනේ පැන පැන යන්න ඌට සැලැස්සුවේ නුඹ ද?
21 ඌ මිටියාවතහෙි කුර ගසා, ශක්තියනේ ඔද වැඩී දුවමින් යුද සේනාවලට මුහුණ දයේ.
22 ඌ භීතියට සරදම් කොට තැති නොගනෙ සිටියි.
q2 22 කඩුපහට පිටුපා නොයයි.
23 හී කොපුව ද දිළිසනෙ හලේලය ද කුඩා හලේලය ද උගේ ඇඟේ වැදී දෝංකාර දයේ.
24 උද්යෝගයනේ කම්පිත ව
25 ඌ වේගයනේ දුවයි.
q2 25 පැතිරී යන හොරණෑ හඬ ඇසනෙ විට, ඌට නිසල ව සිටිය නොහැකි ය.

q225 ඒ ඒ හොරණෑ හඬට ඌ සතුටු හඬ නඟයි.
q225 සටන ද සෙනෙවියන් අණ දෙන හඬ ද ඌ ඉව අල්ලා දුර දී ම දැන ගනියි.
26 උකුස්සා අහසට නැගී දකුණු දෙසට පියාපත් විදහා යන්නේ නුඹේ නුවණින් ද?
27 රාජාලියා අහසට පියඹා උගේ කැදැල්ල උස් තැනක සාදන්නේ නුඹේ අණ පිට ද?
28 ඌ උස් පර්වත මත වසයි.
q228 ගිරිකුළු මුදුන්වල කැදැල්ල සාදයි.
29 එහි සිට ඈත මෑත බලා, දුර දක්නා දෙනෙතින් ඌ ගොදුරු සොයා ගනියි.
30 මතෙ 24:28; ලූක් 17:37 මළසිරුර කොතෙන ද රාජාලියා එතැන ය.
q230 උගේ පැටව් එහි ලේ උරා බොති.”
40 තවද, දෙවිඳාණෝ ජෝබ්ට පිළිතුරු දෙමින්,
2 “ජෝබ්, නුඹ සර්ව බලැති දෙවිඳුන්ට අභියෝග කළෙහි ය:
q22 දැන්වත් නුඹ එය අත්හරින්නෙහි ද?
q22 නැතහොත් එයට පිළිතුරු දෙන්නෙහි දැ”යි වදාළ සේක.

### ජෝබ්ගේ පිළිතුර

3 එවිට ජෝබ් පිළිතුරු දෙමින් මෙසේ කී ය:
4 “සමිඳුනි, මම අනුවණ ලෙසෙ කතා කළෙමි.
q24 ඔබට කුමන පිළිතුරක් දෙන්නෙමි ද?
q24 මම කට පියා නිහඬ වන්නෙමි.
5 මම එක් වරක්, කතා කළෙමි;
q25 පිළිතුරු නොදෙමි.
q25 මම දෙවරක් කතා කළෙමි.
q25 ඉන්පසු කතා නොකරමි.”

### දෙවිඳාණන්ගේ කතාව

6 එවිට දෙවි තුමාණෝ සැඬ සුළඟෙහි වැඩ සිටිමින් මෙසේ පිළිතුරු දුන් සේක:
7 “ජෝබ්, මිනිසෙකු මෙන් එඩිතර ව නැඟිට මගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙව.
8 ‘මා අසාධාරණ ය’යි තර්ක කොට, ‘නුඹ නිවැරදි ය’යි කියාගෙන නුඹ මට වරද තබන්නට උත්සාහ කරන්නෙහි ද?
9 නුඹ මා වාගේ ම බලසම්පන්න ද?
q29 මා වාගේ ම හඬ නඟා ගර්ජනා කරන්නට නුඹට හැකි ද?
10 හැකි නම්, ගෞරවයෙන් හා උදාරත්වයෙන් සැරසී, විභූතිය හා ශෝභාව පැළඳගෙන නැඟිට එන්න.
11 උඩඟු අය දෙස බලා, උදහස වගුරුවා ඔවුන් පහත හෙළන්න.
12 දුදනන් දෙස නෙතේ යොමා යටපත් කර, ඔවුන් වසන තැනෙහි ඔවුන් පොඩි කරදමන්න.
13 ඔවුන් හැම දෙන ධූලියෙහි වළලා, මළවුන්ගේ ලොවෙහි ඔවුන් බැඳ තබව.
14 මෙසේ කළොත්, නුඹේ බාහු බලයෙන් නුඹ ම ගැළවෙන්නට සමත් බැවින් මමත් නුඹ පසසන්නෙමි.
15 දැවැන්ත බෙහෙමොත් නම් සතා දෙස බලන්න.
q215 ඌ මැව්වේත් මම ය;
q215 නුඹ මැව්වේත් මම ය.
q215 ඌ ගොනෙකු මෙන් තණ කොළ කයි.
16 එහෙත්, උගේ තුනටියේ ශක්තිය ද බඩේ මස් ගොබවල බලය ද කල්පනාවට ගන්න.
17 කිහිරි ගසක් මෙන් උගේ වල්ගය කෙළින් වී සිටියි.
q217 උගේ ගාත්වල නහර ශක්තිමත් ය,
18 උගේ ඇටකටු ලෝකඩ වැනි ය;
q218 ඉළ ඇට යකඩ පොලු වැනි ය.
19 දෙවිඳුන් මැවූ සතුන් අතර ඉහළ ම තැන ඌ අතේ ය.
q219 ඌ පරාජය කළ හැකි වනුයේ උගේ මැවුම්කාර දෙවි තුමන් හට පමණ ය.
20 සියලු වන සතුන්ගේ කෙළි මඬල වන කඳුවල ඌට අහර පිණිස තණ කොළ ඇත.
21 ඌ කටු පඳුරු යට බට පඳුරු හා වගුරු සෙවණෙහි ලගියි.
22 කටු පඳුරු ඌට සෙවණ දෙයි.
q222 දොළ අසබඩ බට ගස්වලින් ඌ වට වී ඇත.
23 ගං ඉවුරු තළා වතුර නැඟුණත්, ඌට බියක් නැත.
q223 කට දක්වා ගංවතුර ගැලුවත් ඌට කරදරයක් නැත.
24 කොක්කක් දමා ඌ අල්ලා ගන්නට වත් ඌට නාස් ලණුවක් දමන්නට වත් හැකි සමතෙකේ ඇද් ද?
41 ගීතා 74:14; 104:26; යෙසා 27:1 ලෙවියාතන් නම් මුහුදු සර්පයා බිලී කටුවකින් අදින්නට වත්, උගේ දිව කඹයකින් බඳින්නට වත් නුඹට හැකි ද?
2 උගේ නාසයේ ලණු පටක් දමන්නට වත්, උගේ හක්ක උලකින් සිදුරු කරන්නට වත් නුඹට පුළුවන් ද?
3 ඌ නුඹට බොහෝ කන්නලව් කරනු ඇද් ද?
q23 නුඹෙන් දයානුකම්පාව අයැදිනු ඇද් ද?
4 සදහට ම ඌ නුඹට මෙහෙකරුවකු වන පිණිස, නුඹ සමඟ ගිවිසුමක් කරනු ඇද් ද?
5 සුරතල් පක්ෂියෙකු සමඟ මෙන් නුඹ ඌ සමඟ සෙල්ලම් කරනු ඇද් ද?
q25 නොහොත්, නුඹේ යුවතියන්ගේ විනෝදය පිණිස නුඹ ඌ බැඳ තබන්නෙහි ද?
6 වෙළෙඳ පොළේ ධීවරයන් ඌ ගැන කේවලේ කරනු ඇද් ද?
q26 වෙළෙඳුන් අතර කපා බෙදාගනු ඇද් ද?
7 උගේ හම මස් හෙල්ලවලින් වත්, උගේ ඔළුව ඇවුළුම් බිලියකින් වත් සිදුරු කරන්නට නුඹට හැකි ද?
8 නුඹ ඌ සමඟ පොරබැදුවොත් ඒ සටනේ තරම සිතා බලනු;
q28 සිතා නිකම් සිටිනු.
9 අනේ!
q29 ලෙවියාතන් නම් තල්මහ දෙස බැලීමෙන් වැඩක් නැත.
q29 ඌ දුටු පමණින් මිනිසා ඇද වැටෙනු නියත ය.

10 ඌ ඇවිස්සීමට තරම් දිරිය ඇති කෙනෙකේ නැත.
q2 10 ඌ සමඟ සටන් කරන්නට සමත් කවරකේ ද?
11 ඌට පහර දී බ්රේෙන මිනිසා කවරකේ ද?
q2 11 මේ මුළු දරෙණහෙි කවුරුත් නැත.
12 උගේ අවයව, ශූර භාවය හා අංග ලක්ෂණවල
රම්යතාව ගැන නොකියා සිටින්නට මට නොහැකි ය.
13 උගේ පිට හම ගලවන්නට කාට හැකි වේ ද?
q2 13 උගේ යකඩ වැනි වැස්ම පසා කරගෙන
යන්නේ කවරකේ ද?
14 ඒසා භයංකාර දත් දපෙළේින් යුතු උගේ හකු
පාඩා දිගහරින්නට හැකි කාට ද?
15 පලිස් පිට පලිස්වලින් වැසීගත් උගේ පිට කළු
ගල් මනේ සවිය ඇත.
16 ඒවා අස්සට සුළඟ පවා නොවදින ලසෙ ඒවා
එකිනකෙට දැඩි ලසෙ යා වී ඇත.
17 ඒවා එකිනකෙට ඇලී, වනේ කළ නොහැකි ලසෙ
එකිනකෙට බද්ධ වී ඇත.
18 ඌ කිඹිසින විට එළියක් බබළයි.
q2 18 උදා වන හිරු මනේ උගේ ඇස් බබළයි.
19 උගේ මුවින් ගිනි දලු නික්ම යයි.
q2 19 ගිනි පුපුරු ධාරා ගලා යයි.
20 උදුනේ නටන කල්දේරමකින් මනේ ද දැවනෙ
පරඬැල් මනේ ද උගේ නාස් පුඩුවලින් දුම් නඟියි.
21 උගේ හුස්මනේ ගිනි අඟුරු නඟියි.
q2 21 ගිනි ජාලාවක් උගේ කටින් නික්මයි.
22 උගේ ගලෙ අති බලසම්පන්න ය.
q2 22 ඌට මුණගැසනෙ කවුරුත් බියනේ ඇලළී යති.
23 උගේ හමේ රැළි එකට ඇලී ඇත.
q2 23 එය නොනැමනෙ යකඩ මනේ තද ව ඇත.
24 උගේ සිත ගලක් මනේ ද යටි ඇඹරුම් ගල මනේ
ද තද ය.
25 ඌ නැඟිටින විට මහා වීරයෝ පවා බියට පත්
වති.
q2 25 ඌ කඩා පනින විට ඔව්හු බියනේ ඇලළී යති.
26 කඩුවනේ වත්, හලේලයනේ වත්, කුඩා
හලේලයනේ වත්, ඊතලයනේ වත් පහර දී ඌට
තුවාළ කළ නොහැකි ය.
27 යකඩ වුව ද ඌට පිදුරු වැනි ය.
q2 27 ලෝකඩ වුවත් දිරා ගිය ලීයක් වැනි ය.
28 ඊගස් පහරට ඌ පලා නොයයි.
q2 28 පටියනේ ගසන ගල් ඌට පිදුරු මිටක් වැනි ය.
29 පොල්ලක් වුව ද ඌ පිදුරු කැබැල්ලක් මනේ
සලකයි.
q2 29 කුඩා හලේලය ගසන විට ඌ සිනාසයෙි.
30 උගේ ඇඟේ කොරපොතු තියුණු පිඟන් කැබලි
ගොඩක් වැනි ය.
q2 30 මඬින යන්ත්රයක් මනේ ඌ මඩහෙි ඇදී යයි.
31 ඌ මුහුදු දිය කල්දේරමක වතුර මනේ නටන්නට
සලස්වයි.
q2 31 එය බුබුළු දම දමා නටන තලේ බඳුනක් මනේ
කරයි.
32 ඌ යන මඟ ඌ පසුපස පැහැදිලි ව දිළිසයෙි.
q2 32 ඌ මුහුද සුදු පණෙ ගොඩකට හරවයි.
33 ඌට සම කළ හැකි සතකේ මේ මුළු දරෙණහෙි
නැත;
q2 33 ඌ භීතිය නොහඳුනන සත්ත්වයකෙි.
34 ඌ ඉතා ම අභිමානී සතුන් වුව ද හළො දකියි.
q2 34 වන සතුන්ගේ ලොවහෙි අගරජ ලසෙ
වැජඹයෙි.”

### ජෝබ් පසුතැවී සිත හරවා ගැනීම

**42** එවිට ජෝබ්, හිමි තුමන් හට පිළිතුරු දමේින්,
මසෙේ කී ය.
2 “ඔබ සව් බලැති දවේ තුමාණන් බවත්, ඔබට
නොකළ හැකි කිසිත් නැති බවත්, මම දනිමි.
3 ජෝබ් 38:2 මා කතා කළෙේ, මට දැනුමක් නැති
දේ ගැන ය.
q2 3 මට අචින්ත්ය වන, අනවබෝධ වන අසිරිමත්
දේ ගැන ය.
4 ජෝබ් 38:3 ඔබ කතා කරන විට සවන්
දනේනටත්, ඔබේ ප්රශ්නවලට පිළිතුරු දනේනටත්
ඔබ මට අණ කළ සේක.
5 කලින් මා ඔබ ගැන කනින් අසා තිබුණේ ය.
q2 5 එහතේ, දැන් මාගේ ම දනෙතේින් මම ඔබ දැක
ගතිමි.
6 එබැවින් මම මා ගැන ම ලජ්ජා වමේි;
q2 6 දූවිල්ලහෙි හා අළුවල හිඳ පසුතැවී සිත්
තැවමේි.”

### අවසානය

7 තවද, සමිඳාණන් වහන්සේ මේ වචන ජෝබ්ට
වදාළ පසු උන් වහන්සේ තේමානීය එලිපස්ට කතා
කොට, “මාගේ සේවකයා වන ජෝබ් මනේ නුඹ
සහ නුඹේ මිතුරන් දදෙනො මා ගැන ඇත්ත නොකී
බැවින්, මාගේ උදහස නුඹලා කෙරේ ඇවිළී ඇත.
8 එබැවින් නුඹලා දවන යාග පූජාවක් ඔප්පු කරන
පිණිස, ගොන් සත්දනෙකුත් බැටළුවන්
සත්දනෙකුත් රැගනෙ මාගේ සේවකයා වන ජෝබ්
වතෙ යන්න. ඔහු නුඹලා වනෙුවනේ අයැදුම් කරනු
ඇත. එවිට නුඹලාගේ අඥානකම්වල හැටියට මා
විසින් නුඹලාට දුර්විපාක නොදනෙ පිණිස ඔහුගේ
අයැදුම් පිළිගන්නමේි. මාගේ සේවකයා වන ජෝබ්
මනේ නුඹලා මා ගැන ඇත්ත නොකීවහු ය”යි වදාළ
සේක.
9 තේමානීය එලිපස් ද ෂූහිය බිල්දද් ද නයමාතීය
ශෝපර් ද ගොස්, සමිඳාණන් වහන්සේ අණ කළ
ලසෙ කළහ. සමිඳාණන් වහන්සේ ජෝබ්ගේ
ආයාචනය පිළිගත් සේක. 10 ජෝබ් 1:1-3ජෝබ් සිය
මිතුරන් උදසො යාච්ඤා කළ විට සමිඳාණන්
වහන්සේ ඔහුගේ පරෙ පැවති යස ඉසුරු දගුෙණ
කොට යළි දුන් සේක. 11 ඔහුගේ සියලු සහෝදර
සහෝදරියෝ ද පළමු ඔහු දැන හැඳින සිටි සියල්ලෝ
ද ඔහු වතෙ පැමිණ ඔහුගේ නිවසහෙි ඔහු සමඟ
කෑම කා, සමිඳාණන් වහන්සේ ඔහුට පැමිණවේ
විපත්ති සමුදාය ගැන ශෝකය ප්රකාශ කොට ඔහු
අස්වැසූ හ. ඔව්හු එකිනකො රිදී කාසියක් හා රන්

මුද්දක් ඔහුට ත්‍යාගි කළහ. 12 මෙසේ සමිඳාණන්
වහන්සේ ජෝබ්ගේ මුල් කාලයට වඩා අවසාන
කාලයට ආශීර්වාද කළ සේක. බැටළුවන් දහහතර
දහසක් ද ඔටුවන් හයදහසක් ද ගොන්බාන් දහසක්
ද කොටෙළු දෙනුන් දහසක් ද ඔහුට සිටියෝ ය. 13 ඒ
ඇර ඔහුට පුත්‍රයන් සත්දෙනෙකේ ද දූවරු
තුන්දෙනෙකේ ද වූ හ. 14 ඔහු වැඩිමල් දූවට
පාරාපතිනිය යන අර්ථය ඇති ජමේමා ද දෙ වැනි
දූවට සුගන්ධනී යන අර්ථය ඇති කශියා ද තුන්
වැනි දූවට සුලෝචනී යන අර්ථය ඇති කරෙනේ-
හප්පූක් ද කියා නම් තැබී ය. 15 ජෝබ්ගේ දූවරු
තරම් සුරූපී කාන්තාවෝ ඒ මුළු රටෙහි ම
නොසිටියහ. ඔවුන්ගේ පියා ඔවුන්ගේ සොහොයුරන්
සමඟ ඔවුන්ට ද සම්පත් උරුම කොට දුන්නේ ය.
16 ඉන්පසු, කාලයාගේ ඇවෑමෙන් ජෝබ් එකසිය
සතළිස් වසක් ජීවත් වී සතර වැනි පරපුර දක්වා දරු
මුණුබුරන් දැක 17 දිගායු වළඳා මරණයට පත් වී ය.

# ගීතාවලිය

## පළමු වන කාණ්ඩය

(ගීතා 1—41)

### සැබෑ වාසනාව

1 දුදනන් උපදෙසේ අනුව නොයෙන, පව්කරුවන්ගේ
මඟ නොයෙන, දෙවිඳුන් ගරහන්නන් ඇසුරු
නොකරන,
2 සමිඳුන්ගේ විනයෙහි ප්‍රීති ප්‍රමුදිත වන, දිවා රෑ
එය භාවනා කරන මිනිසා භාග්‍යවන්තයෙකි වන්නේ
ය.
3 ජරෙ 17:8 ඔහු ඇල දොළ අද්දර සිටුවා ඇති,
නියම කලට පල දරන, කොළ පර වී නොයෙන
ගසකට සමාන ය;
q23 ඔහු කරන සැම දේ සරු සාර වේ.
4 පව්ටු දනෝ එසේ නොවෙති;
q24 ඔව්හු සුළඟේ යන බොල් හා සමාන වන්නෝ
ය.
5 විනිසය එන දා දුදනන්ට නම් වරද පැවරේ;
q25 දමිටුන් සමඟ ඔවුන්ට ගැවසුම් නැත්තේ ය.
6 දමිටුන් හට සමිඳාණෝ සරණ වන සේක.
q26 පව්ටුන්ගේ මාර්ගය විනාශයට යන්නේ ය.

### මෞලි මංගල ගීයක්

2 ක්‍රියා 4:25-26 ජාතීන් විප්ලවයට සැරසෙනුයේ
මන් ද?
q2
2 ජනතාවන් නිස්සාර කුමන්ත්‍රණ කරනුයේ මන්
ද?
2 සමිඳාණන්ට ද එතුමන්ගෙනේ අබිසෙස් ලත්
නිරිඳාණන්ට ද මහීපාලයෝ විරෝධී ව නැඟිට
සිටින්නෝ ය;
q22 අධිපතිවරු එක් රැස් වී උපා යොදන්නෝ ය.
3 අප හිර කර ඇති විලංගු බිඳදමමින්, යදම්
කඩාදමමින් 'අපි නිදහස ලබමු'යි ඔව්හු පවසන්නෝ
ය.
4 සගලොව සිහසුන් අරා වැඩ සිටින උත්තමයාණෝ
සිනාසෙන සේක.
5 සමිඳාණෝ ඔවුන් හට පරිහාස කරන සේක;
q25 එකල උන් වහන්සේ කෝපයෙනේ ඔවුන්ට
තරවටු කරන සේක;
q25 උදහසින් ඔවුන්ට තර්ජන කරන සේක.
6 මාගේ ශුද්ධ සියොන් ගිර මත්තෙහි මා රජිඳු හට
කිරුළු පළඳවා රජකම දුන්නෙමි.
7 ක්‍රියා 13:33; හෙබ්‍රෙ 1:5; 5:5 මම මේ දේව
නියෝගය ප්‍රකාශ කරන්නෙමි;
q27 එතුමාණෝ මට කතා කොට, "නුඹ මාගේ පුත්
කුමරු ය, අද මම ඔබේ පිය රජ වූයෙමි.
8 නුඹ කැමැති දෙයෙක් මාගෙනේ අයැදින්න.
q28 සකල ජාතීහු නුඹ උරුමය වන්නෝ ය;
q28 මුළු මහ පොළොව ද නුඹ සන්තක වන්නේ ය.
9 එළිද 2:26-27; 12:5; 19:15 නුඹ දරදඬු
පාලනයකින් ඔවුන් සිඳබිඳ, මැටි බඳුනක් සේ සුණු
විසුණු කර ඇතැ"යි වදාරන සේක.
10 රජවරුනි!
q210 ඒ නිසා සිහි පරීක්ෂාකාරී ව සිටින්න.
q210 භූපතිවරුනි!
q210 මයෙන් ගුරුකම් සිතට ගන්න.
11 සමිඳුන් හට ගරුබියෙනේ සේවය කරන්න;
12 බියෙනේ ඇලළමෙන්, රජිඳුන් පා සිඹගන්න.
q212 නැතහොත් එතුමාණන් උදහසින් විගසින් ඔබ
වැනසෙනු ඇත.
q212 මන්ද, එතුමන් උදහස වහා ඇවිලෙන්නේ ය.
q212 සමිඳුන් සරණ සොයා යන සියල්ලෝ ආසිරි
ලබන්නෝ ය.

### පිහිට පතා අලුයම යැදුම

*දාවිත්ගේ ගීතයකි.*

3 2 සාමු 15:13-17-22 සමිඳුනි, මට සතුරෝ
ගණනින් බොහෝ වන්නෝ ය;
q2
3 මට විරුද්ධ වන්නෝ එන්න එන්න වැඩි වන්නෝ
ය.
2 "දෙවි පිහිටක් ඔහුට නැතැ"යි මා ගැන කියන්නෝ
වැඩි වැඩියෙනේ නැඟී එන්නෝ ය.
3 සමිඳුනි, එහෙත් ඔබ මා අවට පලිහක් වැන්න.
q23 මා මහිමය ඔබ ය;
q23 ඔබ මා දිරි ගන්වන සේක.
4 මම සමිඳුන්ට හඬ නඟා මොරගසමි;
q24 එතුමාණෝ සිය ශුද්ධ කන්දේ සිට මට පිළිතුරු
දෙන සේක.
5 මම වැදහෙව නිදාගනිමි;
q25 යළි අවදි වමි.
q25 මන්ද, සමිඳාණෝ මට රැකවරණය දෙන සේක.
6 දස දහසක් සතුරන් සිටියත් මා වට කොට, බිය
සැක කිසිත් මාගේ සිතට නැත්තේ ය.
7 සමිඳුනි, වැඩිය මැනව;
q27 දෙවිඳුනි, මා මුදාලුව මැනව.
q27 මන්ද, ඔබ සතුරන්ගේ බල සිඳලන සේක;

q2 7 දුදනන්ගේ දළ බිඳලන සේක.
8 ජය සිරි එන්නේ සමිඳුන්ගෙනේ ය.
q2 8 ආසිරි ඔබ සෙනඟ කෙරෙහි වේ වා!

## පිහිට පතා සවස යැදුම

*දාවිත්ගේ ගීතයකි.*

4 මා රක්නා මාගේ දෙවිඳුනි, මේ යාදින්නට
පිළිතුරු දුන මැනව.
q2
4 විපතේ දී ඔබ මා මිදූ සේක, මට කරුණාකර
මේ යැදුමට සවන් දුන මැනව.
2 මිනිසුනි, ඔබ මට කොපමණ කල් හරසර
වෙනුවට ගැරහුම් දෙන්නෙහු ද?
q2 2 නිෂ්ඵල දෙයට නැමී, මුසාවාදයට ඇදී යන්නහු
ද?
3 සමිඳාණන් දැහැමි අය තමන්ට ම තෝරාගත් බව
සිතට ගන්න.
q2 3 එතුමාණෝ මාගේ යැදුමට සවන් දෙන සේක.
4 එපී 4:26 බියෙන් ඇලළී ගියත් පාපයෙන් දුරු
වන්න;
q2 4 සංසුන් සිතින් යහනට වී භාවනා කරන්න.
5 නියමිත පූජා සමිඳුන්ට පුදන්න;
q2 5 එතුමන් කෙරේ විශ්වාසය තබන්න.
6 “අපට ප්‍රීතිය පෙන්වන්නේ කවරෙක් දැ”යි
බොහෝ දෙන කියති.
q2 6 සමිඳුනි, අප වෙත ඔබ කුළුණැස යොමු කළ
මැනව.
7 ධන ධාන්‍ය, මිදිපැන් බහුල ව ඇති අයට වඩා,
ඔබ මසිත ඉමිහිරි ප්‍රීතියෙන් පුරවා ඇත.
8 මම ශාන්ත සිතින් සැතපී, වහා නින්දට යමි.
q2 8 මන්ද, සමිඳුනි, ඔබ පමණක් මට සුරැකි ව
විසීමට වර දෙන සේක.

## ආරක්ෂාව සඳහා යැදුම

*දාවිත්ගේ ගීතයකි.*

5 සමිඳුනි, මා යැදුමට සවන් දෙනු මැනව;
q2
5 මාගේ භාවනාව සැලකුව මැනව.
2 රජිඳුනි, මාගේ දෙවිඳුනි, ඔබ සරණ පතා මම
එන්නෙමි.
q2 2 කරුණාවෙන් මා යැදුමට සවන් දෙනු මැනව.
3 සමිඳුනි, අලුයම මාගේ යැදුමට සවන් දෙනු
මැනව;
q2 3 අරුණ’ලු එන කල පූජා පුද කොට ඔබ එන තුරු
බලා සිටින්නෙමි.
4 ඔබ දුෂ්ටකමට ප්‍රිය කරන දෙවි කෙනෙකේ
නොවන සේක;
q2 4 ඔබ අබිමුව නපුරට ඉඩ නොතබන සේක.
5 අහංකාර අයට ඔබ අබිමුවෙහි තැනක් නැත්තේ
ය.
q2 5 අපරාධකරුවන්ට ඔබ ද්වේෂ කරන සේක.
6 සමිඳාණෝ බොරු තෙපලන දන වනසන සේක;
q2 6 මිනීමරු කපටි අය පිළිකුල් කරන සේක.
7 මම ඔබ විපුල පෙම පෙරදැරි කොට ඔබ
නිවෙසට පිවිසෙන්නෙමි;
q2 7 ගරුබිය පාමින් ශුද්ධ මැදුර අබිමුව නමදින්නෙමි.
8 සමිඳුනි, මට සතුරන් බොහෝ සිටින බැවින්,
දැහැමි මඟ මා ගෙනෙ ගිය මැනව;
q2 8 ගත යුතු මඟ මට පෙන්නුව මැනව.
9 රෝම 3:13 මා සතුරන් පවසන දේ විශ්වාස කළ
නොහැකි ය.
q2 9 ඔවුන්ගේ සිත දැඩි දුෂ්ටකමින් පිරී ඇත්තේ ය.
q2 9 ඔවුන්ගේ උගුර අමු සොහොනක් වැනි ය.
q2 9 ඔව්හු දිවෙන් ඉච්ඡා බස් දොඩන්නෝ ය.
10 දෙවිඳුනි, ඔවුන් නසා වනසා ලුව මැනව;
q2 10 ඔවුන්ගේ කූට උපායවලට ඔවුන් ම අසු කළ
මැනව;
q2 10 ඔවුන්ගේ බොහෝ අපරාධ නිසා ඔවුන් දුරින්
දුරු කළ මැනව.
q2 10 මන්ද, ඔව්හු ඔබට එරෙහි ව කැරලි ගැසුවෝ
ය.
11 ඔබ සරණ යන්නෝ ප්‍රීතියෙන් පිනා යත් වා!
q2 11 ඔබ ඔවුන් රක්නා බැවින් ඔව්හු විපුල සතුටින්
q2 11 උදම් වෙත් වා!
q2 11 ඔබ නම ප්‍රිය කරන්නෝ ප්‍රීති ප්‍රමෝද වෙත්
වා!
12 මන්ද ඔබ දැමිටුන්ට ආසිරි දෙන සේක;
q2 12 සමිඳුනි, ඔබ පෙම පලිහක් මෙන් ඔවුන් වට
කරන සේක.

## සුවය පතා යැදුම

*දාවිත්ගේ ගීතයකි.*

6 ගීතා 38:1 සමිඳුනි, ඔබ උදහසින් මට තරවටු
නොකළ මැනව;
q2
6 දැඩි කෝපයෙන් දඬුවම් නුදුන මැනව.
2 සමිඳුනි, දුබල මට කරුණා කළ මැනව;
q2 2 මාගේ ඇටකටු පෙළෙයි වී ඇත;
q2 2 මා සුව කළ මැනව.
3 මම මුළුමනින් ම කැළඹී සිටිමි;
q2 3 සමිඳුනි, ඔබ කොපමණ කල් පමා වන සේක්
ද?
4 සමිඳුනි, යළි වැඩම කොට මරණින් මා
ගළවාගන්න;
q2 4 ඔබ තිර පෙමෙන් දැන් මා මුදාලන්න.
5 මන්ද, මරණින් පසු ඔබ ගැන සිහිවීමක් නැත්තේ
ය;
q2 5 පාතාලයේ ඔබ හට පැසසීමක් නැත්තේ ය.
6 මම සෝදුකින් වැරී සිටිමි.
q2 6 හැම රැයක ම කඳුළු සැලීමෙන් යහන තෙත් වී
ඇත;
q2 6 කඳුළු දහරින් කොට්ටය පෙඟී ඇත;
7 වැලපීමෙන් මාගේ දෙනෙත ඉදිමී ඇත;
q2 7 සතුරන් නිසා මා ඇස් අඳුරු වී ඇත.
8 මතෙ 7:23; ලූක් 13:27 සියලු පව්ටුනි, මා වෙතින්
යන්න;

q2 8 මන්ද, සමිඳාණෝ මා විලාප හඬ ඇසූ සේක.
9 සමිඳාණෝ මාගේ යාදිනි ඇසූ සේක;
q2 9 එතුමාණෝ මා යැදුම පිළිගන්න සේක.
10 මාගේ සියලු සතුරෝ පරාජය වී ලජ්ජාවට
පැමිණෙත් වා!
q2 10 හදිසියනේ ම වියවුල් වී ආපසු හැරී යත් වා!

## යුක්තිය සඳහා යැදුම

*බෙන්ජමීය කුෂ්ගේ වචන නිසා දාවිත් විසින් සමිඳුන්ට ගායනා කරන ලද කාව්‍යයකි.*

7 සමිඳුනි, මාගේ දෙවියනේ, මා රැකවරණය
ඔබ වෙත ම ය.
q2
7 ලුහුබැඳ එන රුපු කැලනේ නිදහස් කොට මා
මුදාලන්න.
2 නැතහොත්, ගළවන්නට බැරි තැනකට සිංහයකු
මෙන්, ඔවුන් මා ඩැහැගෙන යනු ඇත;
q2 2 එහිදී මා කැබලි කොට මරා දමනු ඇත.
3 සමිඳුනි, මාගේ දෙවියනේ, කෙනෙකුට යම්
අයුක්තියක් මා කර ඇත්නම්,
4 මිතුරකු හට හොඳක් වෙනුවට නපුරක් කර
ඇත්නම්, මට වරදක් කළ සතුරකු නිදහස් කර
ඇරියමේ නම්;
5 සතුරෝ මා ලුහුබැඳ අවුත් මා අල්ලාගනිත් වා!
q2 5 ඔව්හු මා කපා, කොටා මරත් වා!
q2 5 මාගේ මළකඳ දූවිල්ලෙහි දමත් වා!
6 සමිඳුනි, ඔබේ උදහසින් නැඟුටුණු මැනව;
q2 6 මාගේ එදිරිකාරයන්ගේ කෝපාග්නියට විරුද්ධ
ව සිටිය මැනව;
q2 6 අවදි ව මට පිහිට වුව මැනව.
q2 6 ඔබේ නියමය යුක්තිය ඉටු කිරීම ය.
7 සව් ලෝ සත එක් රැස් ව ඔබ වට කර සිටිත්
වා!
q2 7 ඉහළ අහසේ ඔවුන් මැද ඔබ සිහසුන් අරා වැඩ
සිටින්න.
8 සමිඳාණෝ සව් සත හට යුක්තිය සලසා දෙන
සේක.
q2 8 සමිඳුනි, මාගේ දැහැමිකමත්, අහිංසකකමත්
අනුව මා විනිශ්චය කළ මැනව.
9 එළිද 2:23 මිනිස් සිතහි සිතුම්පැතුම් විමසාලන,
දැහැමිකමින් අගතැන් පත් දෙවි උතුමාණනේ,
අදමිටුකම් බිඳ දමන්න;
q2 9 දහම් රජය පිහිටුවන්න.
10 දෙවිඳාණෝ මට රැකවරණය දෙන පලිහ වන
සේක;
q2 10 අවංක සිත් ඇතියන් හට පිළිසරණ වන සේක.
11 දෙවිඳාණෝ දැහැමි විනිසකරුවකෝ වන සේක;
q2 11 එහෙත් නිරතුරු ව උදහස් ව නොසිටින සේක.
12 පව්ටු දනන් වැරදි මඟින් නොහැරෙනෙ විට,
දෙවිඳාණෝ සිය අසිපත තියුණු කරන සේක;
q2 12 දුනු දිය තැත්කවා සූදානම් කරන සේක.
13 මාරක අවි සකස් කරන සේක;
q2 13 ඊතල, ගිනි ඊතල කරන සේක.
14 එසේ වුව ද, නපුරු දනෝ නපුරුකම
පිළිසිඳගනිති, අයුතුකම ගැබ් ගෙන සිටිති, මුසාවාදය
ප්‍රසූත කරති.
15 ඔව්හු බිම තැනක ගැඹුරු වළක් හාරා තබති,
කැපූ වළෙහි ඔව්හු ම වැටෙති.
16 ඔවුන් කළ නපුර ඔවුන් පිට ම ආපසු එයි,
ඔවුන්ගේ ඒ දුෂ්ටකම ද ඔවුන්ට ම යළි පටිසන් දෙයි.
17 සමිඳුන්ගේ යුක්තිය ගැන මම තුති ගී ගයමි.
q2 17 අති උත්තම හිමි තුමන් හට තුති ගී පවසමි.

## දේව මහිමය හා මිනිසාගේ උදාරත්වය

8 සමිඳුනි, අපේ සමිඳුනි, ඔබේ නාමය ලෝ පුරා
කොතරම් මහිමාන්විත වන්නේ ද?
q2
8 ඔබේ තේජෝ මහිමය සගලොවින් එපිට
පිළිරුව් දෙන්නේ ය.
2 මතෙ 21:16 කිරි දරු බිළිඳු සිඟිති මුවින් ඔබ
සතුරා ද පළිගන්නා ද නිහඬ කළ සේක.
q2 2 රුපු ඔද බිඳිමින් බලකොටුවක් ද ඉදි කළ සේක.
3 සිය’තින් ඔබ නිම කළ අහස් තලය ද ඔබ
පිහිටවූ සඳ මඬල ද තරු වැල් ද මා නරඹන කල්හි,
4 ජෝබ් 7:17-18; ගීතා 144:3; හෙබ්රෙ 2:6-8 මිනිසා
ගැන සිතන්නට තරම් ඔහු කවරෙක් ද?
q2 4 මිනිසා ගැන සලකන්නට තරම් ඔහු සතු
වටිනාකම කුමක් දැ යි මට සිතෙන්නේ ය.
5 එහෙත්, ඔබ මිනිසා මවා ඇත්තේ, දෙවිඳුන්ට
පමණක් දෙ වැනි වන ලෙසින් ය.
q2 5 තෙද යස කිරුළක් ඔහු හිස පළඳන ලද්දේ ය.
6 1 කොරි 15:27; එපී 1:22; හෙබ්රෙ 2:8 ඔබ මැවූ
හැම දේ ඔහුට යටත් කළ සේක.
q2 6 ඔබ ඔහු මුළු සක්වළට අධිපති කළ සේක.
7 ගව, බැටළු ආදී සතුන් ද වන සතුන් ද ඔහුට
යටත් කළ සේක.
8 ආකාශ පක්ෂීන් හා මුහුදු මසුන් ද සත් සමුදුර
හැම සතුන් ද කරෙේ අධිපතිකම මිනිසා හට පවරා
දුන් සේක.
9 දෙවිඳුනි, අපේ සමිඳුනි, ඔබේ නාමය ලෝ පුරා
කොතරම් මහිමාන්විත වන්නේ ද?

## දැහැමි විනිශ්චය ගැන පැසසුම්

*දාවිත්ගේ ගීතයකි.*

9 සමිඳුනි, හද පත්ලෙන් මම ඔබ හට තුති
පුදමි;
q2
9 ඔබ කළ හැම අසිරිමත් ක්‍රියා පතුරා
හරින්නමේ;
2 ඔබ ගැන සිත සිතා කුල්මත් වී උදන් අනන්නමෙ;
2 මහෝත්තමයාණනේ, ඔබේ නම ප්‍රශස්ති
ගීතයනේ පසසන්නමේ.
3 ඔබේ ආගමනය නරඹා සතුරෝ පසු බැස යති;
q2 3 පැකිළ වැටෙති, වැනසෙති.
4 සාධාරණ විනිසකරුනි, සිහසුන් අරා ඔබ වැඩ
හිඳින සේක;

q2 4 මා ගැන නඩුව අසා මට යුක්තිය ඉටු කළ
සේක.
5 ජාතීන්ට තරවටු කොට, අදමිටුවන් විනාශ කොට,
ඔවුන්ගේ නම සදහට ම මකා හරින සේක.
6 සතුරන්ගේ නගර සුණු විසුණු කර ඇත.
q2 6 ඒවායේ නම්ගම් මතකයෙනේ පහකර ඇත.
q2 6 ඔවුන් සදාකල් විනාශයට පැමිණාවෙූ සේක.
7 සමිඳාණෝ සිහසුන් අරා සදා වැඩ සිටින සේක;
q2 7 විනිසය පිණිස සිය සිහසුන පිහිටවෙූ සේක.
8 එතුමාණෝ දැහැමිකමින් මුළු ලොව නඩු
විසඳාලන සේක;
q2 8 ජාතීන් යුක්ති සහගත ලසෙ විනිශ්චය කරන
සේක.
9 සමිඳාණෝ පීඩිතයන් හට උස් බලකොටුවකි;
q2 9 විපත්ති සමයහෙි මහ බලකොටුවකි.
10 ඔබ පිළිගන්නෝ ඔබ විශ්වාස කරති.
q2 10 ඔබ සොයා එන්නන් ඔබ කිසි දා අත්
නොහරින සේක.
11 සියොන් ගිරහෙි වැඩ වසන සමිඳුන් හට ගී
ගයන්න;
q2 11 මුළු ලොව හැම ජාතීන්ට සමිඳුන් කළ දයෙ
පවසන්න.
12 දුක්ගැනවිලි ඇති කවරකෙු වත් එතුමාණෝ
අමතක නොකරන සේක.
q2 12 වරද කරන කාටත් සමිඳුන්ගේ දඬුවම හිමි
වේ.
13 සමිඳුනි, මට කරුණා කළ මැනව.
q2 13 සතුරන්ගනේ වූ මාගේ දැඩි දුක සලකාලුව
මැනව.
q2 13 මරු මුවනේ මා වනේ කරගත මැනව.
14 එවිට ඔබ මට දුන් සතේ සිරි ගැන ජරෙුසලමේ
සව් සත හට ජය තුති ගී පවසන්නමේ.
15 විජාතීහු වළක් කපා එම වළහෙි වැටී සිටිති.
q2 15 එලසෙ ම උගුලක් අටවා එම උගුලට අසු වී
සිටිති.
16 සමිඳාණෝ යුක්තිය ඉටු කොට ප්‍රකාශ වූ
සේක.
q2 16 කුදිටු දනෝ තමන් හළෙන උපා දැලේ පැටලී
සිටිති.
17 දුදනන්ගේ ඉරණම පාතාලය වේ;
q2 17 දවේිඳුන් අමතක කරන ජාතීන්ටත් එසේ ම
වේ.
18 දිළිඳා හැම දා අමතක නොවනු ඇත.
q2 18 පීඩිත අයගේ පැතුමත් සදහට ම යටපත්
නොවනු ඇත.
19 වඩිනු මැනව සමිඳුනි, ඔබට එරහෙි ව
නැඟිටින්නට මිනිසාට ඉඩ නුදුන මැනව.
q2 19 ජාතීහු ඔබ අබිමුව විනිශ්චය කරනු ලබත් වා!
20 සමිඳුනි, ඔවුන් භීතියනේ ඇලළී යන්නට සැලසුව
මැනව.
q2 20 ජාතීන් මැරනෙ සුලු අය පමණක් බව
දැනගන්නට සැලසුව මැනව.

## පිහිට සඳහා යැදුම

10 සමිඳුනි, ඔබ ඈත් වී සිටින්නේ මන් ද?
q2
10 විපත් සමයේ කුමට සැඟවී සිටින සේක් ද?
2 අහංකාර පවිටු දනෝ දිළිඳුන් හට පීඩා
කරති;
q2 2 එබැවින් තමන් අටවන උගුල්වල තුමූ ම
අසුවති.
3 දුදනන්ගේ පාරට්ටුව තමන් ගැන ම වයෙි.
q2 3 මසුරු දනෝ සමිඳුන්ට නිගා කරති, එතුමන්
හළො දකිති.
4 දුදනා උඩඟුකම නිසා දවේිඳුන් සොයා නොයයි.
q2 4 'දවේ කනෙකේ ලොවේ නැත' යනු ඔහුගේ
නිගමනය යි.
5 ඒ මිනිසා සැම විට ම සව් ඉසුරනේ වැජඹනෙු
ඇත.
q2 5 ඉහළින් එන දවේ නියමය ගැන නම් කිසි
දැනුමක් ඔහුට නැත.
q2 5 සිය සතුරන්ට ඔහු නිගා කරයි.
6 ඔහු තමා හට මසේ කියාගනියි:
q2 6 "නොවැටමේ මම කවදාවත්;
q2 6 කිසි විපතක් නැත මා හට."
7 රෝම 3:14 සාපයනේ, රැවටිල්ලනේ,
සැහැසිකමනේ ඔහුගේ මුව පිරී තිබේ.
q2 7 නපුර සමඟ අයුක්තිය ඔහුගේ දිවග ලලෙ දයෙි.
8 ගම්මානයේ සැඟවී සිට ඔහු නිදොස් අය කපා
කොටයි;
q2 8 පිහිටක් නැති අසරණයින් එන තුරු ඔහු මාන
බලයි.
9 ගුහාවේ නිදන සිහ රදකු මනේ ඔහු ගොදුරු
සොයා රහස් තැනක ලැග ඇත;
q2 9 දිළිඳු දනන් ඩැහැගනු ඇත;
q2 9 මරු දැල දා ඇදගනු ඇත.
10 සුදනා පහර ලබා, බිම වැටී, ගුළි ගැසී සිටියි;
q2 10 ඒ අසරණ අය දුදනන්ගේ අතට අසු වී සිටිති.
11 "දවේිඳුන් මතෙන නැත;
q2 11 එතුමාණන් මුහුණ වසාගනෙ ඇත.
q2 11 කිසි කලක එය නොදකිනු ඇතැ"යි ඔහු සිතින්
සිතාගනියි.
12 සමිඳුනි, අවදි වන්න;
q2 12 ඔබ අත ඔසවා මුදාගන්න;
q2 12 දිළිඳු අය සිහි කරන්න.
13 දුෂ්ටයා දවේිඳුන් හට නිගා කරන්නේ මන් ද?
q2 13 "ඔබ දඬුවම් නොදනෙ සේකැ"යි ඔහු සිතින්
කියාගන්නේ මන් ද?
14 ඔබ දුක් කරදර ගැන සලකන සේක;
q2 14 ඔබ උපකාර කරන්නට නිතර සූදානම් ය.
q2 14 අසරණයා සිය ජීවිතය ඔබට භාර දයෙි.
q2 14 ඔබ අනාථයාගේ ආධාරකරු වන සේක.
15 නපුරන්ගේ හා දුදනන්ගේ බලය සිඳ බිඳලන්න;
q2 15 කිසි නපුරක් ඉතිරි නොවන ලසෙ ඔවුන්ට
දඬුවම් කරන්න.

16 සදහට ම සමිඳාණෝ රජිඳාණෝ ය, එතුමන්ගේ
විජිතයෙන් විජාතීන් වැනසෙනු ඇත.
17 සමිඳුනි, පීඩිතයන්ගේ විලාපයන්ට ඔබ සවන්
දෙන සේක;
q2 17 ඔවුන්ට ඔබ දිරිය දෙන සේක.
18 මිහි පිට වසන මිනිසාගෙන් තවත් බියක් ඇති
නොවන පරිදි, අනාථයා හා පීඩිතයා සාධාරණ ලෙස
විනිශ්චය කළ මැනව.

### සමිඳුන් කෙරේ තිරසර බැති පෙම

*දාවිත්ගේ ගීතයකි.*

11 හිමි තුමන් වෙත රැකවරණය මට ඇත.
q2
11 එබැවින්, "පක්ෂියකු මෙන් කඳු යායට
පියාඹන්නැ"යි ඔබ මට කියන්නේ කුමට ද?
2 අන්න බලන්න, නපුරු දනෝ දුන්න තැත්කවති;
q2 2 අඳුරේ සිට සුදනන් හට විදින පිණිස ඊතල දුනු
දියෙහි යොදති.
3 පදනම් දෙදරා බිඳ වැටුණොත් දැහැමි අයට කර
ගත හැකි දෙයක් වේ ද?
4 හිමි තුමාණෝ සිය ශුද්ධ මැඳුරේ වැඩ වසන
සේක.
q2 4 එතුමාණන්ගේ සිහසුන සගලොවෙහි ය.
q2 4 හිමි තුමාණෝ සියැසින් ලෝ සත විමසා බලන
සේක.
5 සමිඳාණෝ සුදනන් හා දුදනන් හැම විමසා බලන
සේක;
q2 5 එතුමාණෝ සැහැසිකම් කරන්නාට වෛර බඳින
සේක;
6 දුදනන් මත ගිනි පුපුරු වස්වන සේක;
q2 6 ගන්දගම් දවා පුළුස්සන සුළඟ ද ඔවුන් හිස
පිටට එවන සේක.
7 හිමි තුමාණෝ දැහැමි ය, ගුණ දහමට ප්‍රිය
ඇත්තෙකි.
q2 7 දැහැමි අය එතුමන්ගේ මුහුණ දකින්නෝ ය.

### අභක්තිය පැවති කලක කළ අයැදුම

*දාවිත්ගේ ගීතයකි.*

12 සමිඳුනි, පිහිට වුණ මැනව.
q2
12 සැදැහැවතුන් ඉතිරි ව නැත.
q2
12 විශ්වාසවන්තකම ලොවින් තුරන් වී ඇත.
2 මිනිසා මිනිසාට බොරු පවසයි;
q2 2 චාටු බසින් දෙසිත් ඇති ව කතා කරයි.
3 සමිඳුනි, ඔවුන්ගේ චාටු බස් නවත්වන්න;
q2 3 පුරසාරම් නැති කරන්න.
4 ඔව්හු මෙසේ උදන් අනති:
q2 4 "අප රිසි දෙය අපි කියමු;
q2 4 කුමට ද අප නිහඬ වන්නේ?
q2 4 කවුරු ද එය නවතන්නේ?"
5 අප සමිඳාණෝ මෙසේ වදාරති:
q2 5 "පිහිටක් නැති දිළිඳා තළාපෙළා දමන නිසා,
q2 5 ඒ දුක මට ඇසෙන නිසා, මම දැන් එහි වඩිම
කරමි;
q2 5 ඔවුන් පතන රැකවරණය සලසා දෙමි."
6 කෝවෙහි සත්වරක් දමා උණු කරන ලද රිදී මෙන්
සමිඳුන් බස් සුපිරිසිදු ය.
7 සමිඳුනි, අප රැකගත මැනව;
q2 7 කුදිටු අනාචාරික පරපුරකින් අප නිරතුරු
රැකගත මැනව.
8 පව්ටු දනෝ ඔබමොබ යති.
q2 8 රට සැම දෙස දුසිරිත වැජඹෙයි.

### සමිඳුන් වෙත යැදුම

*දාවිත්ගේ ගීතයකි.*

13 සමිඳුනි, කොතෙක් කලක් ඔබ මා අමතක
කරන සේක් ද?
q2
13 සදහට ම ද?
q2
13 ඔබ මා හැර දමා අහක බලාගෙන සිටින
සේක් ද?
2 සිත් වේදනාවෙන් තැවීතැවී කොපමණ කල්
සිටින්න ද?
q2 2 දිවා රෑ සෝදුකින් පෙළෙපෙළී කොපමණ කල්
සිටින්න ද?
q2 2 මා සතුරෝ මට ඉහළින් කොපමණ කල්
වැජඹෙන්නෝ ද?
3 දෙවි සමිඳුනි, මා සලකා මට පිළිතුරු දුන මැනව;
q2 3 මරණ නින්ද වළක්වන පිණිස මා දෙනෙතට
එළිය දෙන්න.
4 එවිට නොහැක, මාගේ සතුරාට, "ඔහු
පැරදුවෙමි"යි මා ගැන, කියන්නට;
q2 4 නොහැකි ය, මාගේ සතුරන්ට මාගේ වැටීම
ගැන සිනාසෙන්නට.
5 ඔබගේ තිර පෙමෙහි මම රඳා සිටිමි.
q2 5 ඔබ මා ගැළවූ බැවින් මම ප්‍රීති වන්නෙමි.
6 සමිඳුන් දයා කරුණා පෑ බැවින් එතුමන් හට මම
ගී ගයන්නෙමි.

### අදේවදෘෂ්ටිකයන්ගේ ඉරණම

*දාවිත්ගේ ගීතයකි.*

14 රෝම 3:10-12 "දෙවි කෙනෙක් නැතැ"යි
අනුවණයෝ සිතින් සිතති.
q2
14 එවැනි අය අධම කුදිටු දේ ම කරති;
q2
14 යහපත කරන කිසිවෙක් ඔවුන් අතර තවත්
නැත.
2 සමිඳාණෝ සුරලොව සිට බලන සේක;
q2 2 මිනිස් ලොවෙහි නැණවත් අය, දෙවිඳුන් වැඳ
පුදන අය, ඇද්දැ යි විමසන සේක.
3 ඔවුන් සියල්ලන් ම මුළා ව ගොස් ඇත;
q2 3 සව් සත කෙලෙසේ මලින් පිරී ඇත.
q2 3 හොඳක් කරන කිසිවෙක් නැත;

q2 3 ඇත්තට ම නැත.
4 කෑම කන්නාක් මනේ මාගේ සනෙඟ කා දමන,
මා හට අයැදුම් නොකරන, අදමිටු මේ අයට සිහි
නුවණ නැද් ද?
5 දවේ තුමන් තමන් කීකරු අයට ළං ව වැඩ වසන
බැවින්, පව්ටු දනෝ මහත් බියනේ ඇලළී යති.
6 පව්ටු දනෝ දිළිඳුන්ගේ සිතුම්පැතුම් ව්යර්ථ
කරති.
q2 6 එහතේ, සමිඳාණෝ ඔවුන්ගේ සරණ වන සේක.
7 සියොන් කන්දනේ විමුක්තිය පැමිණියොත්
කතෙරම් හොඳ ද?
q2 7 හිමි තුමන් සිය සනෙඟට සැප සම්පත දුන් විට,
ජාකොබ් පළෙපතට කොපමණ ප්රීතියක් ද?
q2 7 ඉශ්රායලේ සනෙඟට කොපමණ සතුටක් ද?

### බැතිමතුන්ගේ චරිත ලක්ෂණ

*දාවිත්ගේ ගීතයකි.*

15 සමිඳුනි, ඔබේ දවේ මැදුරහෙි කවරකුෙට
සිටිය හැක්කේ ද?
q2
15 ඔබේ ශුද්ධ කන්දේ කවරකුෙට විසිය
හැක්කේ ද?
2 නිදොස් ලසෙ කල් යවන, දැහැමි ලසෙ වැඩ
කරන, අවංක වදන් පවසන තැනැත්තාට ය.
3 ගතු කේළාම් නොකියන, මිතුරාට නපුර
නොකරන, අසල්වැසියාට එරහෙි ව කට කතා
නොපතුරන තැනැත්තාට ය.
4 ඔහු දුදනන් පිළිකුල් කරන්නේ ය.
q2 4 සමිඳුන්ට ගරු කරන අයට ඔහු ගරුසරු පා, වාසි
අවාසි නොතකා, සිය පොරොන්දු ඉටු කරයි.
5 ඔහු මුදල් පොළියට නොදයෙි;
q2 5 නිදොස් අයට විරුද්ධ ව අල්ලස් නොගන්නේ ය.
q2 5 මවෙන් ගුණැති මිනිසා හට පිරිහීමක් කිසි
කලක නොවන්නේ ය.

### හිමි තුම පරම සැපත ය.

*දාවිත්ගේ මික්තාම් නම් කාව්යයකි.*

16 දවේඳුනි, මම ඔබ සරණකොට ගතිමි.
q2
16 එබැවින් මා රැකගත මැනව.
2 මම මසෙේ කීමි:
q2 2 "සමිඳුනි, ඔබ මාගේ සමිඳාණන් වහන්සේ ය,
මාගේ සව් සම්පත ය.
q2 2 ඔබ හැර අන්කිසි සතෙක් මට නැත්තේ ය."
3 මිහි මත වසන බැතිමත්හු උතුම් වන්නෝ ය;
q2 3 ඔවුන් පිළිබඳ විපුල සතුටක් මට ඇත්තේ ය.
4 අන් දවේ පිහිටක් පතා දුවන අයගේ දුක
බොහෝ වන්නේ ය.
q2 4 පානීය ලේ පූජා මම ඔවුන්ට නොපුදන්නමේ;
q2 4 ඔවුන්ගේ නාම මා මුවින් නොපවසන්නමේ.
5 සමිඳුනි, මාගේ උරුමය හා ඉරණම ඔබ වහන්සේ
ය.
q2 5 ඔබ, ඔබ පමණක් ම මා උරුම කොටෙස රක්නා
සේක.
6 මාගේ වතු පිටිවල සීමා රම්ය තැන්වල පිහිටා
ඇත්තේ ය.
q2 6 මා සතු උරුමය ප්රියංකර ය.
7 මට උවදසේ දනෙ හිමි තුමන් හට තුති
කරන්නමේ.
q2 7 රූ යාම්වල දී මා සිත්සතන්හි නුවණ පහළ
වන්නේ ය.
8 ක්රියා 2:25-28 හිමි තුමන් නිරතුරු මා අබියස
තබාගන්නමේ.
q2 8 මා දකුණු පස එතුමාණන් වැඩ වසන බැවින්
මම නොසැලනේනමේ.
9 එබැවින් මසිත උදන් අනයි;
q2 9 මහද ප්රීතියනේ පිනා යන්නේ ය;
q2 9 මා ගත සුරැකි ව ඇත්තේ ය.
10 ක්රියා 13:35 මන්ද, ඔබ මා පාතාලයහෙි
නොරඳවන සේක;
q2 10 ඔබේ දැහැමි තැනැත්තාට ජරාපත් වීමට ඉඩ
නොදනෙ සේක.
11 ඔබ මට ජීවන මඟ හළෙි කරන සේක.
q2 11 ඔබ අබිමුවහෙි පිරිපුන් සතුට මට වන්නේ ය.
q2 11 ඔබ දකුණු පස සැප සම්පත් සදහට ම
ඇත්තේ ය.

### නිදොස් කනෙකුෙගේ ආයාචනය

*දාවිත්ගේ යාච්ඤාවකි.*

17 සමිඳුනි, මාගේ මේ සාධාරණ යැදුමට සවන්
දුන මැනව;
q2
17 මාගේ හඬගැසීමට කන් දුන මැනව. මන්ද, මා
එය පුදන්නේ අවංක සිතිනි.
2 මා ගැන නඩු තීන්දුව ඔබනේ ම පැමිණේ වා!
q2 2 ඔබේ දනෙතෙට යුක්තිය පනෙේ වා!
3 ඔබ මසිත උරගා බැලූ සේක;
q2 3 රාත්රියේ මා පරීක්ෂා කළ සේක;
q2 3 ඔබ මා විමසා බැලූ සේක;
q2 3 එහතේ, කිසි නපුරක් නැති බව දුටු සේක.
4 අන් අය මනේ මම නපුර කතා නොකළෙමේ.
q2 4 ඔබේ නීති පිළිපැද්දමේ;
q2 4 සැහැසි ක්රියා මාර්ගයනේ වැළකී සිටියමේ.
5 ඔබ පැවසූ දහම් මඟහෙි ගමන් කළෙමේ.
q2 5 ඉන් ඉවත් ව මා ඉක්ම ගියේ නැත.
6 දවේඳුනි, ඔබ මට පිළිතුරු දනෙ නිසා මම ඔබට
හඬගසමි.
q2 6 මා අයැදුමට කන් යොමු කළ මැනව;
q2 6 මාගේ බස් ඇසුව මැනව.
7 මිඳුම්කරුනි, ඔබේ දකුණු අතින් සතුරු බියනේ අප
ගළවනු මැනව;
q2 7 ඔබේ අසිරිමත් පමෙ හළෙි කළ මැනව.
8 ඔබේ ම දනෙතෙ රක්නා සේ මා රැකගන්න;
q2 8 ඔබ පියාපත් සවෙණහෙි සුරැකි ව මා සඟවන්න.

9 වරෙ බැඳ මා අවටින් සිටින සතුරන්ගනේ ද මා
කාොල්ලකන දුදනන්ගනේ ද මා රැකගන්න.
10 මා සතුරන්ට දයාව නැත;
q2 10 ඔව්හු උඩඟුකමින් බස් තපෙලති.
11 මා වටකර සැම දසෙින් බලා සිටිති;
q2 11 මා බිම හළෙීමට මාන බලති.
12 ඔව්හු ගිජු ලසෙ ගාොදුර බලා යන සිංහයකුෙට
සමාන ය;
q2 12 රහසිගත ව රැක සිටින තරුණ සිංහයකුෙට
සමාන ය.
13 සමිඳුනි, නැඟිටිනු මැනව;
q2 13 මාගේ සතුරන්ට මුණ දී ඔවුන් පරාජය කළ
මැනව;
q2 13 ඔබේ කඩුපත ලලෙවා දුදනන්ගනේ මා මිදුව
මැනව;
14 ඔබේ බලය පා ඔවුන්ගනේ මා ගැළවෙව මැනව.
q2 14 දුදනන්ගේ පල විපාක මලොොව දී ම ඔවුන්ට
ලැබනෙු ඇත.
q2 14 ඔවුන්ට නියම කාොට ඇති දුක් පීඩාවලින්
ඔවුන්ට දඬුවම් කළ මැනව;
q2 14 ඒ දඬුවම ඔවුන්ගේ දරුවන්ට ද ඉතිරි කාොටස
දරුවන්ගේ දරුවන්ට ද දුන මැනව.
15 මා දමිටු හයෙින් මම ඔබේ මුහුණ දකින්නමේ;
මා අවදි වන කල ඔබේ ස්වරූපය දැක සෑහීමට පත්
වන්නමේ.

### ජය තුති ගීතය

*සමිඳාණන් වහන්සේගේ මෙහෙකරු, දාවිත්ගේ
ගීතයකි. ඔහුගේ සියලු සතුරන්ගනේ ද සාවුල්
අතින් ද සමිඳාණන් වහන්සේ ඔහු මිදූ කල ඔහු
මේ ගීතිකාවේ වචන සමිඳාණන් වහන්සේට
කීවේ ය.*

18 මාගේ සවි ශක්තිය වන සමිඳුනි, මම ඔබට
ප්රේම කරමි;
2 සමිඳාණෝ මාගේ පර්වතය ය;
q2 2 බලකාොටුව ය;
q2 2 මිදුම්කාරයාණෝ ය.
q2 2 ඔබ මා දවේිඳාණෝ ය;
q2 2 පර්වතය ය.
q2 2 මම ඔබ සරණකාොට ගනිමි.
q2 2 ඔබ මට පලිහ ය;
q2 2 ගැළවීමේ බලය ය;
q2 2 උස් කාොටු පවුර ය.
3 සියලු පැසසුම්වලට හිමිකම් ඇති සමිඳුනි, මම
ඔබට අයැද සිටිමි.
q2 3 මසෙේ මාගේ සතුරන්ගනේ මම ගැළවනේනමේ.
4 මරහුගේ රුහැන් මා වළොගත්තේ ය;
q2 4 වනසන ජලධාරා මා ගිලගත්තේ ය;
5 පාතාල රුහැන් මා වළොගති;
q2 5 මරණයේ මලපත් මට අටවා තිබිණි.
6 මාගේ විපතේ දී සමිඳුන්ට අයැදීමි, මාගේ
දවේිඳුන්ට මාොරගැසීමි.
q2 6 එතුමාණෝ සිය මාලිගාවේ සිට මා හඬට සවන්
දුන් සේක.
q2 6 මා යාදිනි එතුමන් වතෙ නැඟිණි.
7 එවිට මිහිකත සලෙවී කම්පා වූවා ය;
q2 7 කඳුවල පදනම් දදෙරා සලෙවුණේ ය;
q2 7 මන්ද, එතුමාණෝ උදහස් වූ සේක.
8 එතුමාණන්ගේ නාස්පුඩුවලින් දුම් වලා නැඟිණි;
q2 8 මුවින් අග්නි ජාලා නික්ම සියල්ල දවා දැමී ය.
9 එතුමාණෝ අහස නමාගනෙ පහළ වූ සේක.
q2 9 එතුමන්ගේ පා යට ගන'ඳුර පැවතිණි.
10 එතුමාණෝ දිව්ය රථය අරා යාත්රා කළ සේක;
q2 10 මාරුතය නමැති පියාපත් විදහා වගේයනේ
වැඩිය සේක.
11 එතුමාණෝ අඳුර තමන්ට පාොරෝනාවක් කරගත්
සේක;
q2 11 වැහි වලා පටල තමන්ට මණ්ඩපයක් කරගත්
සේක.
12 එතුමාණන් වතෙ වූ උද්දීප්තියනේ ඝන වලාකුළු ද
ගල් වැසි හා ගිනි අඟුරු ද නික්මිණි.
13 සමිඳාණෝ අහස් කුසහෙි ගිගුරුම් දුන් සේක.
q2 13 මහාොත්තමයාණෝ සිය හඬ නික්මවූ සේක.
q2 13 එවිට ගල් වැසි හා ගිනි අඟුරු නික්මිණි.
14 එතුමාණෝ සිය ඊතල විද සතුරන් දස දසෙ යැවූ
සේක;
q2 14 විදුලි සැර එවා ඔවුන් පරාජය කළ සේක.
15 සමිඳුනි, ඔබේ තරවටු කිරීමනේ ද ඔබේ
නාසයේ හුස්මේ වගේයනේ ද සත් සමුදුර හළෙි
පහෙළෙි විය.
16 එතුමාණෝ ඉහළින් අත පාොවා, මා අල්ලාගත්
සේක;
q2 16 ගැඹුරු ජලධාරාවලින් මා ඇදගත් සේක.
17 එතුමාණෝ මාගේ බලවත් සතුරන්ගනේ ද
එදිරිකාරයන්ගනේ ද මා මුදාගත් සේක.
q2 17 එසේ කළෙේ, ඔවුන් මට වඩා බලසම්පන්න
බැවිනි.
18 මාගේ විපත්ති කාලයේ දී ඔව්හු මට විරුද්ධ ව
නැඟී ආහ;
q2 18 එහතේ, සමිඳාණෝ මට සරණ වූ සේක.
19 එතුමාණෝ ඉඩකඩ ඇති තැනකට මා ගනො
සේක;
q2 19 මා කරේ ප්රිය මනාප වූයනේ මා මිදූ සේක.
20 මාගේ දැහැමි ජීවිතය අනුව ද මාගේ ක්රියා
සුපිරිසිදු වූයනේ ද සමිඳාණෝ මට ප්රතිඵල දුන්
සේක.
21 මම සමිඳාණන්ගේ මාර්ගවල ගමන් කළෙමේ.
q2 21 මාගේ දවේිඳුන් කරෙනේ දුෂ්ට ලසෙ වනේ
නාොවීමි.
22 එතුමන්ගේ සියලු නියෝග මා ඉදිරියහෙි
තබාගතිමි.
q2 22 එතුමන්ගේ ආඥා අත් නාොහළෙමේ.
23 මම එතුමන් අබිමුවහෙි නිදාොස් ව සිටියමේ;
q2 23 පවින් වැළකී සිටියමේ.
24 එබැවින්, සමිඳාණෝ මාගේ දැහැමි ක්රියා අනුව,

q2 24 මාගේ පිරිසිදු පැවැත්ම අනුව මට ප්‍රතිඵල දුන්
සේක.
25 පක්ෂපාත අයට ඔබ පක්ෂපාතකම ද නිදොස්
අයට නිදොස් බව ද දක්වන සේක.
26 පිවිතුරු අයට පිවිතුරු බව ද හිතුවක්කාර අයට
විරෝධය ද දක්වන සේක.
27 ඔබ පීඩිතයන් මුදන සේක;
q2 27 එහෙත්, ඔබ උඩඟු වූවන් පහතට හළෙන
සේක.
28 සමිඳුනි, ඔබ මාගේ පහන දල්වන සේක;
q2 28 මාගේ දෙවි සමිඳාණෝ මාගේ අඳුර එළිය
කරන සේක.
29 ඔබගේ පිහිටනේ මම යුද හමුදා අබිබවමි:
q2 29 දෙවි සරණින් මම පවුරු උඩින් පැන යමි.
30 දෙවි මඟ සර්ව සම්පූර්ණ ය;
q2 30 සමිඳුන්ගේ වචනය තිරසර ය.
q2 30 සරණ පතා එන හැම අයට එතුමාණෝ
පලිහකි.
31 හිමි තුමන් හැර වෙන දෙවි කෙනෙකේ ඇද් ද?
q2 31 අපගේ දෙවිඳුන් හැර පර්වතයක් තවත් ඇද් ද?
32 මාගේ ඉඟටිය බලයෙන් පළඳවන්නෝ
දෙවිඳාණෝ ය.
q2 32 මාගේ මාර්ගය සර්ව සම්පූර්ණ කරන්නෝත්
එතුමාණෝ ය.
33 හබ 3:19 මාගේ දෙපා මුව පාද මෙන් ශීඝ්‍ර
කරන්නෝත්,
q2 33 උස් ගිරි මුදුන්වල මා පිහිටුවන්නෝත්
එතුමාණෝ ය.
34 මාගේ බාහුවෙන් ලෝකඩ දුනු නමන තරමට
යුද බිමට මා පුහුණු කරන්නෝත් එතුමාණෝ ය.
35 ගැළවීමේ පලිහ ඔබ මට දුන් සේක.
q2 35 ඔබගේ දකුණත මාගේ අනුග්‍රහය විය.
q2 35 ඔබගේ පිහිට මා උසස් කළේ ය.
36 ඔබ මා යන මඟ පළල් කළ සේක;
q2 36 මාගේ දෙපා ස්ථිර ව පිහිටිණි.
37 මාගේ සතුරන් ලුහුබැඳ අල්ලාගනිමි;
q2 37 ඔවුන් වනසා මිස ආපසු නොහැරමේ.
38 යළි නොනැඟිටින පරිදි ඔවුන්ට පහර දෙමි.
q2 38 ඔව්හු මා පා සවෙණහි වැටෙති.
39 සටනට ඔබ මාගේ ඉඟටිය බලයෙන් පළඳවන
සේක;
q2 39 මට විරුද්ධ ව නැඟුණු අය ඔබ මා යටතෙහි
මැඩලන සේක.
40 මාගේ වෛරක්කාරයන් මා විසින් සිඳලනු ලබන
පිණිස, මාගේ සතුරන් මට පිටු පාන්නට සලසන
සේක.
41 ඔව්හු පිහිට සොයා මොරගසති.
q2 41 එහෙත්, ඔවුන්ට ගැළවුම්කාරයෙක් නැත.
q2 41 සමිඳුන්ට මොරගසති;
q2 41 එහෙත්, එතුමාණන්ගෙන් පිළිතුරක් නැත.
42 එවිට මම සුළඟහි පාවෙන දූවිල්ල මෙන් ඔවුන්
සුණු විසුණු කරමි;
q2 42 වීදිවල මඩ මෙන් ඔවුන් පයින් පාගාදමමි.
43 ඔබ ජනතාවගේ උද්ඝෝෂණවලින් මා මුදාගන්න
සේක;
q2 43 මා ජාතීන්ගේ නායකයා කරන සේක.
q2 43 මා පෙර දැන නොසිටි සෙනඟක් මට සේවය
කරති.
44 මා ගැන ඇසූ කෙණෙහි ම ඔව්හු මට කීකරු
වන්නෝ ය;
q2 44 විදේශීහු බැගෑපත් ලීලාවෙන් මා සොයා
එන්නාහ.
45 විදේශීහු මට අවනත වන්නෝ ය;
q2 45 සිය බලකොටුවලින් වෙව්ල වෙව්ලා පිටතට
එන්නෝ ය.
46 සමිඳාණෝ සැරදෙත්වා!
q2 46 මාගේ ප්‍රාකාරය වන එතුමන්ට පැසසුම් වේ
වා!
q2 46 මාගේ විමුක්තිදායකයාණෝ අන් හැමට
පරමෝත්තම වන සේක.
47 එතුමාණෝ වනාහි මා වෙනුවෙන් පළිගන්න,
ජාතීන් මට යටත් කර දෙන දෙවිඳාණෝ ය.
48 එතුමාණෝ මාගේ සතුරන්ගෙන් මා මුදන සේක;
q2 48 මට විරුද්ධ ව නැඟිටිනවුන්ට ඉහළින් ඔබ මා
පිහිටුවන සේක.
q2 48 ප්‍රචණ්ඩකාරීන්ගෙන් මා මුදන සේක.
49 රෝම 15:9 එබැවින් සමිඳුනි, මම විජාතීන් අතර
ඔබට පැසසුම් පුදමි;
q2 49 ඔබගේ නමට තුති ගී ගයන්නෙමි.
50 එතුමාණෝ සිය රජුට ජය සිරි දෙන සේක;
q2 50 තමන් අතින් අභිසෙස් ලත් දාවිත් රජුට ද
ඔහුගේ වංශයට ද සදහට ම කරුණා කරන සේක.

## මැවිල්ලෙන් පළ වන දේව මහිමය

*දාවිත්ගේ ගීතයකි.*

19 අහස් තලය දෙවි මහිමය ප්‍රකාශ කරන්නේ
ය;
q2
19 ගුවන් තලය එතුමන්ගේ අත්කම් විදහා
පාන්නේ ය.
2 එක් දිනක් තව දිනකට මෙපුවත කියන්නේ ය;
q2 2 එක් රැයක් තව රැයකට එය ම පවසන්නේ ය.
3 කතාවක්, වදනක්, කිසියම් හඬක් ඇසෙන්නේ
නැති වුව ද ඒ පණිවුඩය ලොව පුරා පැතිරී යන්නේ
ය.
4 රෝම 10:18 එය දියත දසත විහිදී යයි, දෙවි
තුමාණෝ හිරුට එහි මණ්ඩපයක් සාදා දුන් සේක.
5 මඟුල් පෝරුවකින් බැස එන මනාලයකු ලෙසින්,
ප්‍රීතියෙන් තරඟයට අරඅඳින වීර ධාවකයකු
විලසින්,
6 හිරු රජිඳාණෝ අහසේ කොණකින් උදා වී අනික්
කොණින් චාරිකාව නිම කරති.
q2 6 එහි රස්නය නොවදින තැනක් නැත්තේ ය.

## සමිඳුන්ගේ ව්‍යවස්ථාව

7 සමිඳුන්ගේ ව්‍යවස්ථාව පරිසමාප්ත ය;

q2 7 ජීවිතය පණ ගන්වන්නේ ය.
q2 7 සමිඳුන්ගේ නීතිය සත්‍යවාදී ය;
q2 7 අනුවණයන්ට නුවණ දෙන්නේ ය.
8 සමිඳුන්ගේ අණපණත් සාධාරණ ය;
q2 8 සිතට සතොස වඩන්නේ ය.
q2 8 සමිඳුන්ගේ අණසක පැහැදිලි ය;
q2 8 දෙනෙතට එළිය දෙන්නේ ය,
9 සමිඳුන් කෙරෙහි ගරුබිය නිර්මල ය;
q2 9 එය සදහට ම පවතින්නේ ය.
q2 9 සමිඳුන්ගේ විනිශ්චය යුක්තිසහගත ය;
q2 9 මුළුමනින් දැහැමි වේ ම ය.
10 රනට වඩා, පරෙ රනට වඩා, එය මනහර ය;
q2 10 පැණියට වඩා, මී පැණියට වඩා, එය සුමිහිරි ය.
11 එය ඔබ සේවකයා හට අනතුරු ඇඟවීමක්
වන්නේ ය;
q2 11 එය පිළිපැදීමෙන් විපුල විපාක අත්වන්නේ ය.
12 මාගේ රහස් වැරදි දන්නෝ කවුරු ද?
q2 12 නොදැන මා කළ පව් සෝදා හළ මැනව.
13 උඩඟුකමේ පාපයෙන් මා වැළැක්වුව මැනව.
q2 13 එහි බලපෑමට මම යටත් නොවෙමේවා.
q2 13 එවිට මම දරුණු පවින් නිදහස් වී, නිදොස්
කෙනෙක් වන්නෙමි.
14 මාගේ පර්වතය ද මාගේ මිදුම්කරු ද වන
සමිඳුනි, මා මුවේ වචන ද මා සිතෙහි භාවනා ද ඔබ
හට ප්‍රිය මනාප වේ වා!

### රජුගේ විජයශ්‍රීය

*දාවිත්ගේ ගීතයකි.*
**20** විපත්ති දවසේ දී හිමි තුමාණෝ ඔබට
පිළිතුරු දෙන සේක් වා!
q2
**20** ජාකොබ්ගේ දෙවිඳාණෝ ඔබට බලකොටුවක්
වන සේක් වා!
2 එතුමාණෝ ශුද්ධස්ථානයෙන් ඔබට පිහිට එවා,
සියොන් කන්දේ සිට ඔබ බලවත් කරන සේක් වා!
3 ඔබේ පුද පූජා සියල්ල සිහි කරන සේක් වා!
q2 3 ඔබේ දවන යාග පූජා පිළිගන්න සේක් වා!
4 ඔබේ මන දොළ ඉටු කරන සේක් වා!
q2 4 ඔබේ පැතුම් සාර්ථක කරන සේක් වා!
5 ඔබේ ජය සිරි ගැන අපි තුති පසස් නගමු;
q2 5 අපේ දෙවිඳුන් නමින් ජය කෙහෙලි නංවමු.
q2 5 සමිඳාණෝ නුඹේ සියලු අයැදුම් ඉටු කරන
සේක් වා!
6 හිමි සඳ සිය අබිසෙසේ ලත් අය මුදන බව දනිමි.
q2 6 සමිඳාණෝ, සිය සුපිරිසිදු සගලොව සිට සිය
දකුණතේ විමුක්ති ශක්තියෙන් ඔහුට පිළිතුරු දෙනෙ
සේක.
7 සමහරු යුද රිය කෙරෙහි ද ඔවුන්ගේ අශ්වයන්
කෙරෙහි ද විශ්වාසය තබති.
q2 7 එහෙත්, අපි නම් දෙවි සමිඳාණන් කෙරෙහි
විශ්වාසය තබමු.
8 ඔව්හු වකුටු වී වැටෙන්නෝ ය.
q2 8 එහෙත්, අපි නැඟිට කෙළින් සිටිමු.
9 සමිඳුනි, රජතුමා මිදුව මැනව;
q2 9 අප යදින විට පිළිතුරු දුන මැනව.

### විජයශ්‍රීය ගැන ප්‍රශංසා

*දාවිත්ගේ ගීතයකි.*
**21** සමිඳුනි, ඔබේ බල පැරකුම් ගැන රජ
තමෙ ් උදන් අනයි;
q2
**21** ඔබ දුන් විමුක්තිය ගැන ඔහු කොතරම්
ප්‍රමෝද වන්නේ ද!
2 ඔබ ඔහුගේ මන දොළ පුරවා ලූ සේක;
q2 2 ඔහුගේ යාදිනි නොපිරිහෙළා ඉටු කළ සේක.
3 ඔබ සැප සම්පත් රැගෙන ඔහු වෙත එන සේක;
q2 3 ඔහුට පිවිතුරු රන් කිරුළක් පළඳවන සේක.
4 ඔහු ඔබෙන් දිවි සම්පත අයැදී ය, ඔබ ඔහුට එය
දුන් සේක;
q2 4 දිගායු ද ප්‍රදානය කළ සේක.
5 ඔබෙන් ලත් විමුක්තිය රජුට යස ඉසුරු ගෙනෙ
දෙයි.
q2 5 කීර්තිය හා ප්‍රතාපය ඔබ ඔහුට දෙනෙ සේක.
6 ඔබ ඔහුට සදහට ම ඉමහත් ආසිරි දානය කරන
සේක;
q2 6 ඔබ ඔහු සමඟ සිටීමෙන් ඇති වන ප්‍රීතියෙන්
ඔහු පිනවන සේක.
7 මන්ද, සමිඳුන් කෙරෙ ් රජ තමෙ ් විශ්වාසය
තබයි;
q2 7 මහෝත්තමයාණන්ගේ කරුණා මහිමය නිසා
ඔහු නොසැලී රජකම් කරයි.
8 රජුගේ වමතට සියලු සතුරෝ ද දකුණතට වෛරෙ
බඳින්නෝ ද අසු වන්නෝ ය.
9 ඔබේ කෝපය ඔවුන්ට බුර බුරා නඟින ගිනි
උදුනක් වනු ඇත, හිමි තුමාණෝ සිය උදහසින් ඔවුන්
වනසාලන සේක.
q2 9 ගින්නකින් මෙන් ඔවුන් දවා ලන සේක.
10 ඔබ ඔවුන්ගේ දූ දරුවන් සිඳ දමන සේක;
q2 10 ඔවුන්ගේ මුණුබුරන් මිනිස් ලොවින් සහමුලින්
වනසන සේක.
11 මන්ද, ඔබට විරුද්ධ ව ඔවුන් කුමන්ත්‍රණය
කළත්, උපා මාර්ග යෙදුවත් ඒවා සාර්ථක නොවනු
ඇත.
12 ඔබේ ඊගස් ඔවුන්ගේ මුහුණට එල්ල කරනු
ඇත;
q2 12 එවිට ඔවුන් පිටුපා යනු ඇත.
13 සමිඳුනි, ඔබේ වික්‍රම පාමින් උසස් වනු මැනව.
q2 13 එවිට අපි ඔබේ තෙදෙ බල විකුම් ගැන
ප්‍රශස්ති ගීත ගයන්නෙමු.

### සන්තාපය හා ප්‍රශස්ති

*දාවිත්ගේ ගීතයකි.*
**22** මතෙ 27:46; මාක් 15:34 මාගේ දෙවියෙනි,
මාගේ දෙවියෙනි, ඔබ මා අත්හැරියේ මන් ද?
q2

22 මට පිහිට නොවී මාගේ යාදිනිවලින් ඈත් ව
සිටින්නේ මන් ද?
2 මාගේ දෙවියනේ, දවාලෙහි මම ඔබට හඬගසමි;
q2[2] පිළිතුරක් නැත;
q2[2] රාත්‍රියේදීත් හඬගසමි;
q2[2] ඉස්පාසුවක් නැත.
3 ඉශ්‍රායලේ ජනතාවගේ ප්‍රශස්ති ගීත මැද වැඩ
වසන සුවිශුද්ධවරයාණෝ ඔබ ම ය.
4 අපගේ මුතුන්මිත්තෝ ඔබ අදහා, ඔබ සරණ
සොයා ගියෝ ය.
q2[4] ඔබ ඔවුන්ට මිදුම දුන් සේක.
5 ඔව්හු ඔබට යැදුම් කළහ;
q2[5] මුදනු ලැබුවෝ ය.
q2[5] ඔබ මත විශ්වාසය තැබූ හ;
q2[5] ලජ්ජා නොවූවෝ ය.
6 අනේ!
q2[6] මම මිනිසෙක් නොව නර පණුවෙකි;
q2[6] මිනිසුන් අතර නීචයෙකි.
q2[6] ඔව්හු මෙමා හෙළා දකිති.
7 මතෙ 27:39; මාක් 15:29; ලූක් 23:35 සියල්ලෝ මා
දෙස බලා, කවටකම් කරති;
q2[7] දත නියවා, හිස වනා මෙසේ කියති:
8 මතෙ 27:43 “සමිඳුන්ට ඔහු බාර විණි, එතුමන්
ඔහු ගළවා නොගන්නේ මන් ද?
q2[8] සමිඳුන්ට ඔහු ප්‍රිය මනාප විණි, එතුමන් ඔහු
මුදා නොගන්නේ මන් ද?”
9 මව් කුසයෙන් මා බිහි කළ, මවගේ ළයෙහි මා
සැතපූ උතුමාණෝ ඔබ නොවන සේක් ද?
10 මව් කුස හොත් අවදියේ සිට, උපත ලැබූ
දිනයේ සිට මා රැකගත් දෙවිඳාණෝ ඔබ ය.
11 දුක් කරදර ළඟ ළඟ ඇත.
q2[11] ම වෙතින් ඈත් ව නොගිය මැනව.
q2[11] අන් සරණක් මට නැත.
12 මාගේ සතුරෝ ගොන් රැළක් මෙන් මා වටකර
සිටිති.
q2[12] බාෂාන්හි කුළු හරකුන් මෙන් මා වටලා සිටිති.
13 ගොදුරු කකා ගොරවන සිංහයන් මෙන් කට
අයා,
q2[13] ඔව්හු මා දෙස බලා සිටිති.
14 මම බිම ඉහිරුණ වතුර වැනි ය.
q2[14] මාගේ ඇඟ කටු හන්දිවලින් වෙන් වී ඇත.
q2[14] මසිත මා තුළ උණු වී ගිය ඉටි පිඩක් වැනි ය.
15 මාගේ උගුර කැබලිත්තක් මෙන් වියළී තිබේ.
q2[15] මාගේ දිව ද උඩුතල්ලේ ඇලී ඇත.
q2[15] ඔබ මා මළ කෙනෙකු මෙන් පසට හාර දී ඇත.
16 මන්ද, නපුරු මිනිස්සු බලු රැළක් මෙන් මා
වටකර ගත්තෝ ය.
q2[16] මැරවරයෝ රැළක් මා වටලා ගත්තෝ ය.
q2[16] ඔව්හු මාගේ දෑත් දෙපා සිදුරු කළෝ ය.
17 මාගේ ඇටකටු ගණන් කළ හැකි තරමට පෑදී
ඇත.
q2[17] සතුරෝ මා දෙස රවා ඔරවා බලති.
18 මතෙ 27:35; මාක් 15:24; ලූක් 23:34; ජොහ
19:24 මාගේ වස්ත්‍ර තම තමන් අතර බෙදා ගනිති;
q2[18] මාගේ සළුව ගැනීමට දාදු දමති.
19 හිමි තුමාණෙනි, මා හැර දමා ඈත් නොවනු
මැනව;
q2[19] මාගේ බලය වන ඔබ මට පිහිට වන්නට
කඩිනම් වුව මැනව.
20 කඩුවෙන් මා මිදුව මැනව;
q2[20] ඒ බල්ලන්ගේ උවදුරෙන් මා ගැළවුව මැනව.
21 සිංහ කටෙන් මා ගැළවුව මැනව;
q2[21] කුළු හරකුන්ගේ අංවලට මැදි වූ මා මිදුව
මැනව.
22 හෙබ්‍රෙ 2:12 ඔබේ නාමය මාගේ
සහෝදරයන්ට ප්‍රකාශ කරන්නෙමි;
q2[22] බැතිමතුන්ගේ සභාවේ දී ඔබට ප්‍රශංසා
කරන්නෙමි.
23 හිමි සමිඳාණන්ට ගරුබිය ඇත්තෙනි, එතුමන්
පසසන්න;
q2[23] ජාකොබ් වංශයේ සියල්ලෙනි, එතුමන්ට
ගෞරවය දෙන්න;
q2[23] ඉශ්‍රායලේ වංශයේ සියල්ලෙනි, එතුමන්
ඉදිරියෙහි ගරු බියෙන් සිටින්න;
24 එතුමාණෝ විපතට පත් අයගේ විපතට අවමන්
නොකළ සේක;
q2[24] එය පිළිකුල් කොට නොසිතූ සේක;
q2[24] ඔහු කෙරෙන් සිය මුහුණ අහකට හරවා
නොගත් සේක;
q2[24] ඔහු හඬගැසූ කල එතුමාණෝ සවන් දුන්
සේක.
25 මහා සභාවේ මාගේ ප්‍රශංසාවේ තේමාව ඔබ
ය.
q2[25] එතුමන්ට ගරුබිය ඇති අය අබිමුව මාගේ භාර
ඉටු කරන්නෙමි.
26 දුගී දුප්පත් අය කා බී තෘප්තිමත් වන්නෝ ය;
q2[26] හිමි තුමන් සොයන්නෝ එතුමන්ට ගී පසස්
නඟන්නෝ ය.
q2[26] ඔව්හු සදහට ම සෞභාග්‍යය ලබත් වා!
27 මහ පොළොවේ සතර දිගින් ජනයෝ සමිඳුන්
සමරමින් එතුමන් වෙත හැරී එති.
q2[27] සකල ලෝක වාසීහු ඔබ අබිමුව වැඳ වැටෙති.
28 මන්ද, සමිඳාණෝ රජිඳාණෝ ය, ජාතීන්ගේ
පාලකයාණෝ ය.
29 පොළොවෙහි උඩගු අය එතුමන්ට වැඳ වැටෙනු
ඇත;
q2[29] පොළොවේ මැරෙන සුලු අය එතුමන් නමදිනු
ඇත.
30 මාගේ වංශය එතුමන්ට මෙහෙ කරනු ඇත;
q2[30] මතු පරම්පරාවලට සමිඳුන් පිළිබඳ මෙපුවත
කියනු ඇත.
31 “එතුමාණෝ මෙසේ කළ සේකැ”යි කියමින්,
ඔව්හු මතු ඇති වන පරම්පරාවලට එතුමන්ගේ
දැහැමි ක්‍රියා පවසනු ඇත.

## දිව්‍ය එඬේරාණෝ

*දාවිත්ගේ ගීතයකි.*

23 සමිඳාණෝ මා එඬේරාණෝ ය;
q2
23 අඟ හිඟ මට නොවන්නේ ය.
2 එළිද 7:17 එතුමාණෝ නිල් තණ බිම් මත
මා සතප්වා, නිසල දිය වෙත පමුණුවා,
3 මා පණගන්වන සේක.
q2 3 සිය නාමයේ මහිමය සැලසෙන ලෙස දැමිටු මඟ
මා ගෙන යන සේක.
4 මරණය වැනි ගන'දුරු රුදුරු නිම්නය මැදින් ගියත්,
ඔබ මා සමඟ බැවින්, මට කිසි බියක් නොවන්නේ
ය.
q2 4 ඔබේ කවේට ද සැරයටිය ද මා නියත
සැනසිල්ල වන්නේ ය.
5 ඔබ මාගේ සතුරන් ඉදිරියේ දී, මංගල බොජුනක්
පිළියෙළ කර දී, මා සිරස තලෙින් ආලේප කරන
සේක.
q2 5 මාගේ කුසලාන උතුරා යන්නේ ය.
6 ඔබේ දයාව හා කරුණාව නියත ව, දිවිහිමියනේ
මා අනුව එන්නේ ය.
q2 6 සමිඳුන්ගේ නිවාසය මාගේ සදාතන වාසය
වන්නේ ය.

### මහිමාන්විත රාජයාණෝ

*දාවිත්ගේ ගීතයකි.*

24 1 කොරි 10:26 පොළොව හා එහි ඇති සෑම
දයෙ ද සකල ලෝ වාසීහු ද සමිඳුන් සන්තක
වෙති.
2 මුහුදු ජලය පිට පොළොව පිහිටුවා, සයුරු
පත්ලහෙි එය ස්ථාපිත කළෙේ එතුමාණෝ ය.
3 හිමි තුමන්ගේ කන්දට නඟින්නට ශුද්ධ කවුරු ද?
q2 3 එතුමන්ගේ ශුද්ධ දවේ මැදුරහෙි නවතින්නට
හැකි කාට ද?
4 මතෙ 5:8 ක්රියාවනේ පිරිසිදු, සිතින් නිර්මල,
නිෂ්ඵල දයෙට වැඳුම්පිදුම් නොකරන, බොරුවට
නොදිවුරන, තැනැත්තාට ය.
5 එවැනි අයට සමිඳාණෝ ආසිරි දෙති;
q2 5 මිදුම්කාර දවේඳාණෝ මොක් සුව දෙති.
6 දවේඳුන් සොයා යන්නෝ ද ජාකොබ්ගේ
දවේඳුන්ගේ සරණ පතා යන්නෝ ද එවැනි අය ය.
7 ද්වාරයනෙි, විවෘත ව සිටින්න;
q2 7 පැරණි දොරටුවනෙි, විවෘත ව ම සිටින්න;
q2 7 ප්රතාපවත් මහා නිරිඳාණෝ වඩින සේක.
8 ඒ මහා ප්රතාපවත් නිරිඳාණෝ කවරකේ ද?
q2 8 තදෙ බල යුතු හිමි තුමාණෝ ය;
q2 8 යුද්ධ ජයගත් හිමි තුමාණෝ ය.
9 වාසල් දොරටු හොඳෙට ම විවෘත කොට තබන්න;
q2 9 පැරණි දොරටු විවෘත කොට තබන්න.
q2 9 ප්රතාපවත් මහා නිරිඳාණෝ වඩින සේක.
10 මේ ප්රතාපවත් මහා නිරිඳාණෝ කවරකේ ද?
q2 10 ඒ ප්රතාපවත් මහා නිරිඳාණෝ, සව් බලැති
හිමි තුමාණෝ වෙති.

### මඟපෙන්වීම පතා යැදුම

*දාවිත්ගේ ගීතයකි.*

25 ඔබ වෙත සමිඳුනි මා හදවත ඔසවමි.
2 මාගේ දවේයනෙි ඔබ කෙරෙහි විශ්වාසය
තබමි.
q2 2 මා ලජ්ජාවට පත් වන්න ඉඩ නුදුන මැනව;
q2 2 මා පරදා ජය හඬ නඟන්න මා සතුරන්ට ඉඩ
නොතැබුව මැනව.
3 ඔබ කෙරෙහි විශ්වාසය තබන කිසිවකු පරාජය
වන්නේ නැත.
q2 3 හිතුවක්කාර ලෙස විශ්වාසය කඩ කරන අය
පරාජය වන්නෝ ය.
4 සමිඳුනි, ඔබේ ක්රියා මාර්ගය මට හළෙි කළ
මැනව;
q2 4 ඔබේ මාවත් මට පැහැදිලි කළ මැනව.
5 ඔබේ සත්යය අනුව මා ගෙන ගිය මැනව;
q2 5 මට එය ඉගැන්නුව මැනව;
q2 5 මන්ද, ඔබ මාගේ විමුක්තිදායක දවේඳාණෝ ය.
q2 5 දවස පුරා ඔබ එන මඟ බලා සිටිමි.
6 සමිඳුනි, ඔබේ කරුණා ගුණයත්, තිර පමෙත් සිහි
කළ මැනව.
q2 6 මේවා ඔබේ චිරාගත ගුණාංගයෝ ය.
7 සමිඳුනි, මාගේ යොවුන් වියේ පාප ද අපරාධ ද
සිහි නොකළ මැනව.
q2 7 සමිඳුනි, ඔබේ යහපත්කම ද මහා කරුණාව ද
අනුව මා සිහි කළ මැනව.
8 සමිඳාණෝ යහපත් ය;
q2 8 අවංක ය.
q2 8 එතුමාණෝ පව්ටුන් හට යා යුතු මාර්ගය
උගන්වන සේක.
9 එතුමාණෝ නිහතමානී අය යුක්තියහෙි හසුරුවන
සේක.
q2 9 එතුමාණෝ යටහත් පහත් අයට තම මාර්ගය
උගන්වන සේක.
10 හිමි තුමන්ගේ ගිවිසුම හා ශික්ෂා පද පිළිපදින
අයට එතුමන්ගේ සියලු මාවත් කරුණාවේ හා
සත්යයේ මාවත් වනු ඇත.
11 හිමි සමිඳුනි, මාගේ අයුතුකම් මහත් බැවින්,
ඔබේ නාමය නිසා, මට කමාවුව මැනව.
12 සමිඳුන් කෙරෙහි ගරුබිය ඇති අය හට ඔහු යා
යුතු මඟ එතුමාණෝ පහදා දෙන සේක.
13 ඔහු සුව සේ වාසය කරයි;
q2 13 ඔහුගේ වංශයට දේශය හිමි වයෙි.
14 හිමි තුමන්ගේ රහස් සැලැස්ම එතුමාණන්
කෙරෙහි ගරුබිය දක්වන අයට පනේවා ඇත;
q2 14 එතුමාණන් ස්වකීය ගිවිසුම ඔවුන්ට දන්වා
ඇත.
15 මාගේ දෙනෙත නිරතුරු හිමි සමිඳාණන් දෙසට
යොමුව ඇත;
q2 15 මන්ද, එතුමාණෝ මාගේ දෙපා සතුරාගේ
දැලනේ මුදාගන්න සේක.
16 මා දෙස බලා මට කරුණා කළ මැනව.

q2 16 මන්ද, මම අසරණවමේ;
q2 16 පීඩිතවමේ.
17 මසිත දුකින් පිරී ඇත;
q2 17 මාගේ විපත්වලින් මා මිදුව මැනව.
18 මාගේ දුක්ගැනවිලි හා වේදනා කල්පනාවට ගත
මැනව;
q2 18 මාගේ සියලු පව් කමා කළ මැනව.
19 බලන්න, මාගේ සතුරෝ බොහෝ ය.
q2 19 කෲර වෛරයෙනේ ඔව්හු මට වෛර බඳිති.
20 මා රැකවල් කොට මා මිදුව මැනව.
q2 20 ඔබ කෙරේ විශ්වාසය තැබූ මම පරාජය
නොවෙමේ වා!
21 සත්‍යය හා අවංකකම මාගේ රැකවරණ වේ
වා!
q2 21 මාගේ බලාපොරොත්තුව ඔබ ය.
22 දෙවියනි, ඉශ්රායලේ ජනතාව සියලු ආපදාවලින්
මිදුව මැනව.

## සුදනකුගේ අයැදුම

*දාවිත්ගේ ගීතයකි.*

26 සමිඳුනි, මා ගැන යුක්තිය ඉටු කළ මැනව.
q2
26 මන්ද, මාගේ හැසිරීම නිදොස් ය.
q2
26 සමිඳුන් කෙරේ අචල විශ්වාසයක් මට ඇත.
2 සමිඳුනි, මා සෝදිසි කොට, පරීක්ෂා කර
බැලුව මැනව;
q2 2 මාගේ සිත හා මනස විමසා බැලුව මැනව.
3 ඔබේ මහා කරුණාව මාගේ දෙනෙතින් දිටිමි.
q2 3 ඔබට විශ්වාසී ව දවස් යැවීමි.
4 මම වැදගැම්මකට නැති මිනිසුන් සමඟ
නොහැසිරමේ;
q2 4 කෛරාටිකයන් ඇසුරු නොකරමි.
5 දුදනන්ගේ සමාගමට මම තදින් ම විරුද්ධ ය.
q2 5 ඔවුන් සමඟ පයිරුපාසනයක් මාගේ නැත.
6 නිදොස් බව දැක්වීමට මාගේ අත් සෝදා,
සමිඳුනි, ඔබේ පූදසුන පැදකුණු කරන්නමේ.
7 සමිඳුනි, තුති ගොස පතුරා හරින පිණිසත්, ඔබේ
අසිරිමත් ක්‍රියා පසසන පිණිසත් මම එසේ කරමි.
8 සමිඳුනි, ඔබේ වාසභවනයටත්, ඔබ තේජසින්
වැජඹෙන මන්දිරයටත් මම ප්‍රේම කරමි.
9 පව්ටුන් හා සමඟ මා විනාශ නොකළ මැනව;
q2 9 මිනීමරුවන් සමඟ මා පහ නොකළ මැනව.
10 ඔවුන්ගේ අත්වල නපුරු උපායන් වේ;
q2 10 ඔවුන්ගේ දකුණත අල්ලසින් දූෂණය වී ඇත.
11 මම මේ නිදොස්කමින් දවස් යවමි;
q2 11 මා මුදා, මට කරුණා කළ මැනව.
12 මාගේ පාද යහ මඟ පිහිටා ඇත.
q2 12 ප්‍රසිද්ධ නමස්කාරයේ දී සමිඳුන් හට පැසසුම්
ගී ගයන්නමේ.

## විශ්වාසය හා ධෛර්යය

*දාවිත්ගේ ගීතයකි.*

27 හිමිසඳ මාගේ ආලෝකය හා විමුක්තිය ය;
q2
27 මම කිසිවකුට බිය නොවෙමේ.
q2
27 හිමිසඳ මාගේ ජීව ශක්තිය ය;
q2
27 මට භීතියක් නැත.
2 දුදනන් වන මාගේ විරුද්ධකාරයෝ සහ
සතුරෝ මා කා දමන පිණිස ආ කල ඔව්හු පැකිළී
වැටුණෝ ය.
3 බළ ඇණියක් මට විරුද්ධ ව කඳවුරු බැන්දත්,
මසිතට බියක් නැත.
q2 3 මට විරුද්ධ ව යුද ගිනි ඇවිළුණත්, මම සුරක්ෂිත
ව සිටිමි.
4 හිමි තුමන්ගනේ එක ම යැදුමක් යදිමි;
q2 4 එය තරයේ සොයන්නමේ.
q2 4 එනම්, හිමි තුමන්ගේ ශෝභාලංකාරය නරඹන
පිණිසත්, දේව මාලිගාවේ දී උදය භාවනා කරන
පිණිසත් මා දිවි ඇති තාක් හැම දා සමිඳුන්ගේ
මන්දිරයේ විසීමට ය.
5 විපත් දවසේ දී එතුමාණෝ සිය භවනහෙි මා
තබා රක්නා සේක;
q2 5 සිය මණ්ඩපයහෙි රහස් කාමරයක මා සඟවන
සේක.
q2 5 එතුමාණෝ මා ඔසවා පව්වක් මත මා තබන
සේක.
6 දැනුදු මා සිසාරා සිටින මාගේ සතුරන්ට ඉහළින්
මාගේ හිස ඔසවමි;
q2 6 එතුමන්ගේ මණ්ඩපයහෙි ප්‍රීති පූජා පුදන්නමේ;
q2 6 හිමි සඳුට ගී ගයා වාදනය කරන්නමේ.
7 හිමි තුමාණනෙි, මා හඬ නගා කියන දයෙට
සවන් දුන මැනව;
q2 7 මට කරුණා කොට උත්තර දුන මැනව.
8 “මා අබිමුවට එන්නැ”යි ඔබ කියන කල, සමිඳුනි,
“ඔබ අබිමුවට එන්නමේ”යි මාගේ සිතින් කීවමේ.
9 මා කෙරෙනේ ඔබේ මුහුණ සඟවා නොගත
මැනව;
q2 9 උදහසින් ඔබ මෙහෙකරුවා බැහැර නොකළ
මැනව.
q2 9 ඔබ මාගේ සරණ වන සේක.
q2 9 මාගේ විමුක්තිදායක දෙවියනෙි, මා පහ
නොකළ මැනව;
q2 9 මා අත් නොහළ මැනව.
10 මාගේ මවුපිය දදෙනො මා අත්හැරියෝ ය;
q2 10 එහෙත්, හිමි තුමාණෝ මා පිළිගන්න සේක.
11 සමිඳුනි, ඔබේ දහම් මඟ මට ඉගැන්නුව මැනව;
q2 11 මාගේ සතුරන් නිසා උවදුරු රහිත මඟක මා
ගෙන ගිය මැනව.
12 මාගේ එදිරිකරුවන්ගේ අභිප්‍රායවලට මා පාවා
නුදුන මැනව.
q2 12 බොරු සාක්ෂිකාරයෝ ද කෲර ලෙස තර්ජන
කරන්නෝ ද මට විරුද්ධ ව නැඟී සිටිති.
13 “ජීවතුන් අතර සමිඳුන්ගේ යහපත්කම මට
දක්නට ලැබේ ය”යි මම විශ්වාස කරමි.

14 සමිඳුන් කරෙ ේ බලා සිටින්න;
q2 14 ශක්තිමත් වන්න;
q2 14 ධරෛ ේයවත් වන්න;
q2 14 සමිඳුන් කරෙ ේ බලා සිටින්න.

### දවේ සරණ අයැදීම

*දාවිත්ගෙ ේ ගීතයකි.*

28 සමිඳුනි, ඔබට හඬගසමි, මාගෙ ේ පර්වත රාජයාණනෙි, මට සවන් නො දී නොසිටිය මැනව.
q2
28 ඔබ නිහඬ වුවහොත්, මාත් පාතාලයට බැස යන්නවුන්ගනේ කනෙකෙු වනු ඇත.
2 මා ඔබට හඬ නඟන කල ද ඔබ ේ ශුද්ධස්ථානය දසෙට මාගෙ ේ දොහොත් මුදුන් තබන කල ද මාගෙ ේ යාදිනි හඬට කන් දුන මැනව.
3 සිය අසල්වැසියන් සමඟ සාමදානයනේ කතා කළත්, හිත යට නපුරු චතේනා ඇති දුෂ්ටයන් ද නොපණත්කම් කරන්නන් ද සමඟ මා පහ නොකළ මැනව.
4 එළිද 22:12 ඔවුන්ගෙ ේ ක්රියාවල හැටියට ද දුෂ්ට කල්ක්රියා අනුව ද ඔවුන්ට පල විපාක දුන මැනව;
q2 4 ඔවුන් කළ ද ේ අනුව ඔවුන්ට පල විපාක දුන මැනව.
5 ඔවුන් සමිඳුන්ගෙ ේ ක්රියා හෝ එතුමන්ගෙ ේ නිර්මාණ හෝ නොසලකන බැවින්, එතුමාණෝ ඔවුන් සදහට ම සුණු විසුණු කරන සේක;
q2 5 යළි නොපිහිටුවන සේක.
6 සමිඳුන් හට ප්රශංසා ව ේ වා!
q2 6 මන්ද, එතුමාණෝ මාගෙ ේ යාදිනි හඬට සවන් දුන් සේක.
7 සමිඳාණෝ මාගෙ ේ ශක්තිය ය;
q2 7 මාගෙ ේ පලිහ ය.
q2 7 මම එතුමාණන් කරෙ ේ විශ්වාසය තැබීමි;
q2 7 මම පිහිට ලදිමි.
q2 7 එබැවින් මාගෙ ේ සිත අතිශයින් උදන් අනයි;
q2 7 මම එතුමන්ට හද පත්ලනේ තුති ගී ගයන්නමේ.
8 සමිඳාණෝ සිය සනෙඟගෙ ේ ශක්තිය ය.
q2 8 එතුමාණෝ සිය රාජාභිෂකේය දුන් අයට විමුක්තියෙ ේ බලකොටුව වන සේක.
9 ඔබ ේ සනෙඟ මුදා, ඔබ ේ ආවණේික සනෙඟට ආසිරි දුන මැනව;
q2 9 ඔවුන් පෝෂණය කොට සදහට ම රැකබලාගත මැනව.

### මාරුත මැදින් ද ේව හඬ

*දාවිත්ගෙ ේ ගීතයකි.*

29 ගීතා 96:7-9 දිව්ය පුත්රයනෙි, සමිඳුන්ට පැසසුම් දනේන;
q2
29 එතුමන් තදෙ බල පසසන්න.
2 හිමි තුමන් නමට දිය යුතු මහිමය දනේන;
q2 2 පාරිශුද්ධත්වයනේ සැරසී එතුමන් නමදින්න.
3 සමිඳාණන්ගෙ ේ හඬ ජල මතුයෙහි ඇස ේ.
q2 3 ජල මතුයෙහි වැඩ වසන මහිමාන්විත හිමි සමිඳාණෝ ගර්ජනා කරන සේක.
4 සමිඳාණන්ගෙ ේ හඬ බලවත් ය;
q2 4 සමිඳාණන්ගෙ ේ හඬ තජේාන්විත ය.
5 සමිඳාණන්ගෙ ේ හඬ කිහිරි ගස් බිඳලයි;
q2 5 ලබෙනොනෙ ේ කිහිරි රුක් සුණු විසුණු කරයි.
6 ලබෙනොන්හි කඳු වැටි උඩ පනින වහු පැටවුන් මනේ ද හර්මොන් කන්ද දුව පනින ගොන් වස්සකු මනේ ද නටන්න සලස්වන සේක.
7 සමිඳුන්ගෙ ේ කටහඬ ගිනි දලු බදොලයි;
8 සමිඳුන්ගෙ ේ කටහඬ වන ගැබ සොලවයි;
q2 8 හිමි තුමාණෝ කාදෂේ වන ගැබ සොලවති.
9 සමිඳුන්ගෙ ේ කටහඬ මුව දනෙුන්ට පැටවුන් බිහි කරවයි, වනය පාළු කරවයි, එතුමන්ගෙ ේ මාලිගාවහෙි සැම දයෙ ම, "ඔබට මහිමය ව ේවා"යි කියයි.
10 සමිඳාණෝ ජල කඳ මත රාජ තජේසින් වැඩ හිඳින සේක;
q2 10 රාජ ලීලාවනේ සදහට ම වැඩ හිඳින සේක.
11 සමිඳාණෝ සිය සනෙඟට ශක්තිය දනෙ සේක;
q2 11 සිය සනෙඟට සාමදානයනේ ආසිරි දනෙ සේක.

### සුවය ගැන ප්රශස්ති ගීයක්

*දාවිත්ගෙ ේ ගීතයකි. ද ේව ගෘහය කැප කිරීමෙ ේ ගීතයකි.*

30 ඔබ මා උසස් කළ බැවින් ද මාගෙ ේ දුක් ගැන මා සතුරන්ට ප්රීති වීමට නුදුන් බැවින් ද සමිඳුනි, ඔබට ප්රශස්ති ගී ගයමි.
2 මාගෙ ේ දවේ සමිඳුනි, ඔබට යාදිනි කීවමේ, ඔබ මට සුව සතෙ දුන් සේක.
3 සමිඳුනි, ඔබ පාතාලයනේ මා ගොඩ ගත් සේක;
q2 3 මා වළ පල්ලට නොයෙන පරිදි ඔබ මා දිවි රැකගත් සේක.
4 පින්වතුනි, සමිඳුන්ට ගී පසස් නඟන්න;
q2 4 ඒ නිර්මල නාමයට තුති ගී ගයන්න.
5 මන්ද, එතුමන්ගෙ ේ උදහස ඇසිල්ලකට පමණ ය.
q2 5 එතුමන්ගෙ ේ කරුණාව දිවි ඇති තාක් ය.
q2 5 රෑයෙ ේ හැඬීම පවතියි;
q2 5 උදය ප්රීතිය උදා වයෙි.
6 "සැප සම්පතෙ ේ දී කිසිදාක මම නොසලේවනේනමේ"යි කියා ගතිමි.
7 සමිඳුනි, ඔබ ේ කරුණාවනේ ඔබ මා නොසැලනෙ පර්වතක් මනේ තහවුරු කළ සේක.
q2 7 එහතේ, ඔබ මා කරෙනේ සැඟවුණ විට, මම කැළඹුණාමේ.
8 සමිඳුනි, ඔබට හඬගැසීමි;
q2 8 සමිඳුන් හට කන්නලව් කළෙමේ.
9 මා වළ පල්ලට ගිය විට මාගෙ ේ මරණයනේ කුමක් ව ේ ද?
q2 9 පොළොවෙ ේ පසට හැරුණු අයට ඔබ ේ සත්යය පැවසිය හැකි ද?
10 සමිඳුනි, සවන් දී මට කරුණා කළ මැනව.
q2 10 සමිඳුනි, ඔබ මාගෙ ේ සරණ වුව මැනව.

11 ඔබ මාගේ දොම්නස සොම්නසට හැරවූ
සේක.
q2[11] ඔබ මාගේ ගෝණි රෙදි මුදා තුටු පිළියෙන් මා
සැරසූ සේක.
12 දැන් ඉතින් මම නිහඬ ව නොසිටිමි.
q2[12] ඔබට ගී පසස් ගයන්නමේ.
q2[12] මාගේ දෙවි සමිඳුනි, සදහට ම ඔබ හට ගී
ගයන්නමේ.

### දේවාරක්ෂාවට භාර වීම

*දාවිත්ගේ ගීතයකි.*

31 සමිඳුනි, ඔබේ රැකවරණය සොයා එමි.
q2
31 කිසිදාක මම නින්දාවට පත් නොවෙමේවා.
q2
31 ඔබේ දැහැමිකමින් මා මුදාලුව මැනව.
2 මා දෙසෙ ඔබේ දෙසවන යොමා,
q2[2] නොපමා ව මා මිදුව මැනව,
q2[2] මට බලගතු විමුක්ති පර්වතයක් ද ආරක්ෂක
බලකොටුවක් ද වුව මැනව.
3 ඔබ මාගේ පර්වතය හා බලකොටුව ය.
q2[3] එබැවින් ඔබේ නාමයේ අනුහසින් මට
මඟපෙන්වා මා ගෙන ගිය මැනව.
4 මා ඇල්ලීමට ඔවුන් සඟවා ඇති දැලෙන් මා
බේරාගත මැනව.
q2[4] ඔබ මාගේ රක්ෂස්ථානය ය.
5 ලූක් 23:46 ඔබ අතට මාගේ ජීවිතය භාර කරමි.
q2[5] සත්‍යවාදී දෙවි සමිඳුනි, ඔබ මා මිදූ සේක.
6 බොරු දෙවි දේවතාවන් නමදින අයට මම ද්වේෂ
කරමි.
q2[6] එහෙත්, මම සමිඳුන් කෙරේ විශ්වාසය තබමි.
7 ඔබේ කරුණාව ගැන සතුටු වී උදන් අනමි.
q2[7] ඔබ මාගේ දුක් පීඩා දුටු සේක;
q2[7] ඔබ මාගේ සිත් වේදනා තේරුම් ගත් සේක.
8 සතුරා අතේ මා සිර කොට නොතබා, නිදහසේ
යන්න එන්න ඔබ මට ඉඩ දුන් සේක.
9 සමිඳුනි, මට කරුණා කළ මැනව.
q2[9] මම දුකින් මිරිකී සිටිමි.
q2[9] මාගේ දෑස ද ගතසිත ද සෝදුකින් වෑරී ඇත.
10 මාගේ ජීවිතය දුකින් ගත වෙයි;
q2[10] මා කල දවස සුසුම්ලෑමෙන් ගෙවේ යයි;
q2[10] මාගේ ශක්තිය කනස්සල්ලෙන් පිරිහෙයි;
q2[10] මාගේ ඇට මිදුළු ක්ෂය වී යයි.
11 මාගේ එදිරිකරුවන් නිසා මම අසල්වැසියන් අතර
නව නින්දාවක් වී සිටිමි;
q2[11] මා දන්නා අඳුනන අයට මම භීතියක් වී සිටිමි;
q2[11] වීදියේ මා දක්නා අය මා වෙතින් පලා යන්නෝ
ය.
12 මා මතකයෙන් ඉවත ගිය, මියගිය කෙනෙකු
මෙන් අමතක වී ඇත;
q2[12] බිඳුණු බඳුනක් මෙන් ඉවත දා ඇත.
13 බොහෝ දෙනෙකුගේ කලෙඉසුම් බස් මට
ඇසේ;
q2[13] මා අවට භීතිය ඇත.
q2[13] මිනිස්සු මට විරුද්ධ ව කුමන්ත්‍රණය කොට
මාගේ දිවි නසාලීමට උපා යොදති.
14 එහෙත් සමිඳුනි, මා විශ්වාසය තැබුවේ ඔබ
කෙරෙහි ම ය.
q2[14] "මාගේ දෙවියෝ ඔබ ය"යි කියමි.
15 මාගේ ජීවිත ගමන ඔබ අතෙහි ය, මාගේ
සතුරන් හා මට පීඩා කරන්නවුන් අතින් මා මුදා
හැරිය මැනව.
16 ඔබ මෙහෙකෙරු වන මා දෙසෙ කරුණාවෙන් බැලුව
මැනව;
q2[16] ඔබේ තිර පෙමෙන් මා ගැළවුව මැනව.
17 මම ඔබට හඬගසමි;
q2[17] මම නින්දාවට පත් නොවෙමේ වා!
q2[17] දුදනෝ නින්දාවට පත් වෙත් වා!
q2[17] ඔව්හු නිහඬ ව පාතාලයට යත් වා!
18 අභිමානයෙන් හා උඩඟුකමින් සුදනන්
හෙළාදක්නා, බොරු කියන දිව නිහඬ කළ මැනව.
19 දේව ගරුබිය ඇත්තන් උදෙසා තබා ඇති ඔබේ
ගුණවත්කම කොතරම් ද?
q2[19] ඔබ කෙරේ විශ්වාසය තැබූ අය වෙත එය
කොතරම් මහත් ලෙසෙ පෙනේ ද?
20 මිනිසුන්ගේ කුමන්ත්‍රණවලින් ඔබ ආරක්ෂාවෙහි
ඔබ ඔවුන් සඟවන සේක;
q2[20] කලහකාරි අයගෙන් ඔවුන් වෙන් කොට ඔබේ
මැදුරෙහි සුරැකි ව තබන සේක.
21 සමිඳුන් හට ප්‍රශංසා වේ වා!
q2[21] මන්ද, එතුමාණෝ බලකොටු නුවරක දී එතරම්
පුදුම ලෙසෙ මට කරුණාව දැක්වූ සේක.
22 "ඔබ වෙතින් මා ඉවත දැමූ සේකැ"යි මාගේ
ඉක්මන්කාරකමින් කීවෙමේ.
q2[22] එහෙත්, මා ඔබේ පිහිට සෙවූ කල මාගේ
කන්නලව්වට ඔබ සවන් දුන් සේක.
23 සමිඳුන්ගේ සියලු සැදැහැවතුනි, එතුමන්ට
ප්‍රේම කරන්න;
q2[23] හිමි තුමාණෝ සැදැහැවතුන් රක්නා සේක;
q2[23] උඩඟුකම් කරන්නවුන්ට විපුල ප්‍රතිවිපාක දෙනෙ
සේක.
24 සමිඳුන් කෙරේ විශ්වාසය තබන සියල්ලෙනි,
ශක්තිමත් වන්න;
q2[24] සිතින් ධෛර්යවත් වන්න.

### කමාව ලැබීමේ වාසනාව

*දාවිත්ගේ අනුශාසනා ගීතයකි.*

32 රෝම 4:7-8 අපරාධයට සමාව ද පාපයට
සමාව ද ලත් මිනිසා ආසිරි ලද්දකේ.
2 වරදක් ගැන සමිඳුන්ගෙන් චෝදනාවක් නොලබන,
වංක සිතක් නොමැති මිනිසා ආසිරි ලද්දකේ.
3 මාගේ වරද ගැන නිහඬ ව සිටිමින්, දවස පුරා
කඳුළු හෙළා සුසුම් ලෑමෙන් මාගේ ඇඟපත දිරා
ගියේ ය.
4 දිවා රෑ දෙකේ දී ම ඔබ මට දඬුවම් කළ සේක;
q2[4] මාගේ ශක්තිය පහ ව ගියේ ය.

q2 4 ග්‍රීෂ්මානයේ දී නැති වන දියසීරාව මෙන් වියළී
ගියේ ය.
5 2 සාමු 12:13 මාගේ පව් නොසඟවා මම
පාපෝච්චාරණය කළෙමි.
q2 5 “හිමි තුමන්ට මාගේ පව් කියන්නෙමි”යි කීමි.
q2 5 ඔබ ද මාගේ පාප දෝෂ කමා කළ සේක.
6 එබැවින් ඔබේ සැදැහැවත්තු විපතේ දී ඔබට
යාච්ඤා කරත් වා!
q2 6 ඉවුරු තළා නඟින මහ ජලධාරා මෙන් විපත්ති
පැමිණියත්, ඒවා ඔවුන් අසලටවත් නොපැමිණෙයි.
7 මා රැකවරණය ඔබ ය;
q2 7 දුක් දෝමනසින් ඔබ මා රක්නා සේක.
q2 7 විමුක්ති ගීත මා අවටින් මතු වයි.
8 “නුඹට උගන්වන්නෙමි;
q2 8 යා යුතු මඟ ගැන උවදෙස් දෙන්නෙමි;
q2 8 මා දෙනෙතින් නුඹ දෙස බලා නුඹට දැනමුතුකම්
දෙන්නෙමි.
9 අශ්වයකු හෝ කොටළුවකු හෝ මෙන් මෝඩ
නොවන්න;
q2 9 උන් දමනය කිරීමට කටකලියාව හා පටිය
අවශ්‍ය ය.
q2 9 නැතහොත් නුඹට උන් පාලනය කළ නොහැකි
ය.”
10 දුදනන් හට බොහෝ දුක් දෝමනස් ඇත.
q2 10 එහෙත්, හිමි තුමන් කෙරෙහි විශ්වාසය තබන්නා
දිව්‍ය කරුණාවෙන් වට වී සිටියි.
11 දැහැමියනි, හිමි තුමන් කෙරෙහි ප්‍රීති වී උදන්
අනන්න.
q2 11 අවංක සිත් ඇති සියල්ලෙනි, ප්‍රීති ඝෝෂා
පවත්වන්න.

## විමුක්ති ඉතිහාසය ගැන ප්‍රශංසා

33 දැහැමියනි, හිමි තුමන් කෙරෙහි ප්‍රීති සන්තෝෂ
වන්න.
q2
33 ප්‍රශංසාව අවංක අයට හොබිනා දෙයකි.
2 වීණාව වයා හිමි තුමන් පසසන්න;
q2 2 තත් දසයේ වීණාව ගෙන එතුමන්ට පැසසුම්
ගීත ගයන්න.
3 එතුමන්ට නව ගීතයක් නඟන්න;
q2 3 මහ හඬකින් දක්ෂ ලෙස වාදනය කරන්න.
4 සමිඳුන්ගේ වචනය අවංක ය;
q2 4 එතුමන්ගේ ක්‍රියා සියල්ලක් ම විශ්වාසශීලී ය.
5 දැහැමි බව හා යුක්තිය එතුමන්ට ප්‍රිය ය.
q2 5 මහ පොළොව හිමි තුමන්ගේ කරුණාවෙන් පිරී
ඇත.
6 හිමි තුමන්ගේ වචනයෙන් ආකාශය ද
එතුමන්ගේ හුස්මෙන් සියලු ආකාශ වස්තූහු ද මවනු
ලැබූ හ.
7 එතුමාණෝ මුහුදු දිය දහර එක් ගොඩකට රැස්
කරන සේක;
q2 7 ගැඹුරු දිය ගබඩාවල නිදන් කරන සේක.
8 මුළු මහ පොළොව හිමි තුමන්ට බිය වේවා.
q2 8 සියලු ලෝ වැසියෝත් එතුමන්ට බියෙන් සිටිත්
වා!
9 මන්ද, එතුමාණෝ වචනයෙන් සියල්ල මවන
සේක;
q2 9 ආඥාවකින් සියල්ල තහවුරු කරන සේක.
10 හිමි තුමාණෝ ජාතීන්ගේ සැලසුම් නිෂ්ප්‍රභා
කරන සේක;
q2 10 මනුෂ්‍යය ජාතීන්ගේ සිතුවිලි ව්‍යර්ථ කරන
සේක.
11 එහෙත්, සමිඳුන්ගේ සැලසුම් සදහට ම ද
එතුමන්ගේ සිතිවිලි පරපුරෙන් පරපුරට ද පවත්නේ
ය.
12 සමිඳුන් තමන් දෙවියන් කොට සලකන ජාතිය ද
දෙවිඳුන් සතු උරුමය ලෙස තෝරුණු සෙනඟ ද ආසිරි
ලද්දෝ ය.
13 හිමි තුමාණෝ සගලොව සිට නරඹන සේක;
q2 13 මුළු මිනිස් සංහතිය දක්නා සේක.
14 එතුමාණෝ සිය මන්දිරයෙහි සිට ලෝවැසි
සියල්ලන් දෙස බලන සේක.
15 ඔවුන්ගේ සිතුවිලි හැඩ ගස්වන්නේත්, ඔවුන්ගේ
ක්‍රියා කල්පනාවට ගන්නේත් එතුමාණෝ ය.
16 චතුරංගනි සේනා බලය නිසා ගැළවුණු රජෙක්
නැත;
q2 16 තම වීර වික්‍රමයෙන් ගැළවීම සලසා ගත් රණ
ශූරයෙක් නැත.
17 ස්වාරක්ෂාව පිණිස යුද්ධ අශ්වයකුගෙන් වැඩක්
නැත;
q2 17 උගේ මහත් බලයෙන් ඌ කිසිවකු
නොගළවයි.
18 සමිඳුන්ගේ නෙත් දේව ගරුබිය ඇත්තන්
කෙරෙහි ය;
q2 18 මරණයෙන් ගළවන පිණිස ද
19 දුබික් දුරු කොට දිවි රක්නා පිණිස ද එතුමාණෝ
දිවැසින් බලන සේක.
20 අපි හිමි තුමන් කෙරෙහි විශ්වාසයෙන් බලා
සිටියෙමු.
q2 20 අපේ පිහිටත්, පලිහත් එතුමාණෝ ය.
21 අපි එතුමන්ගේ සුවිශුද්ධනාමය කෙරෙහි
විශ්වාසය තැබුවෙමු.
q2 21 එබැවින් අපේ සිත් ප්‍රීතියෙන් පිනා යයි.
22 සමිඳුනි, ඔබ කෙරෙහි අපේ බලාපොරොත්තු
පිහිටවූ ලෙස ම ඔබේ කරුණාව අප කෙරෙහි වේ
වා!

## දෙවිඳුන්ගේ යහපත් බවට ප්‍රශංසාව

*අබිමෙලෙක් වෙතින් නෙරපනු ලැබූ පසු දාවිත්
ගැයූ ගීතයකි.*

34 1 සාමු 21:13-15 හැම වේලේ ම හිමි
තුමන්ට මම ප්‍රශස්ති ගී ගයමි.
q2
34 එතුමන්ගේ ගුණ වැණුම් මා මුවින් තොර
නොවෙයි.
2 මම එතුමන්ගේ ගුණ වර්ණනා කරමි.

q2[2] නිහතමානී අය ඒ අසා තොස් වත්වා;
3 මා සමඟ හිමි තුමන් වර්ණනා කරන්න;
q2[3] අපි එක් වී එතුමන්ගේ නාමය පසසමු.
4 මම හිමි තුමන් සොයා ගියෙමි;
q2[4] එතුමාණෝ මට පිළිතුරු දී හැම බියෙන් මා මිදූ සේක.
5 එතුමන් දෙස බලන්නා ප්‍රීතියෙන් බැබළෙන්නේ ය.
q2[5] ඔහුගේ මුහුණ කවදාවත් ලජ්ජාවෙන් අඳුරු නොවන්නේ ය.
6 හිමි තුමන්ට කන්නලව් කළ එක් අසරණයෙක් වීය;
q2[6] එතුමාණෝ ඔහුගේ බස් අසා,
q2[6] සියලු දුක් ගැහැටවලින් ඔහු මිදූ සේක.
7 හිමි තුමන්ගේ දූතයා දේව බය ඇති අය වට කර,
q2[7] කඳවුරු බැඳ, ඔවුන් මුදා හරියි.
8 1 පේදු 2:3 හිමි තුමන් ගුණවත් බව ඔබ ම අත්දැකීමෙන් දැනගන්න;
q2[8] එතුමන්ගේ රැකවරණය ලබන තැනැත්තේ ආසිරි ලබයි.
9 එතුමන්ගේ සැදැහැවතුනි, එතුමන්ට ගරුබිය දක්වන්න;
q2[9] මන්ද, දේව ගරුබිය ඇති අයට අගහිඟයක් නැත.
10 ධනපතිහුපවා කෑම නැති ව සාගින්නෙන් පෙළෙති;
q2[10] එහෙත්, හිමි තුමන් සරණ යන අයට යහපත් දෙයින් කිසි අඩුවක් නැත.
11 දරුවෙනි, මට සවන් දෙන්න.
q2[11] සමිඳුන්ට ගරු කිරීමට මම ඔබට උගන්වන්නෙමි.
12 1 පේදු 3:10-12 සැප ජීවිතය භුක්ති විඳීමට යම් කෙනෙක් කැමැති ද?
q2[12] දිගායු වළඳා සුව සම්පත් රස විඳීමට කැමැති ද?
13 එසේ නම්, ඔහු නපුරු කතාවෙන් ද මුසාවාදයෙන් ද වැළකී සිටිය යුතු ය.
14 නපුර හැර දමා යහපත කරන්න;
q2[14] සාමය සොයා ඒ අනුව යන්න.
15 හිමි තුමන්ගේ දෑනෙත දමිටුන් දෙසට ද එතුමන්ගේ දෑසවන ඔවුන්ගේ කන්නලව්වට ද යොමා ඇත.
16 පව්කම් කරන අය පොළොවෙන් අමතක වී යන ලෙසෙ හිමි තුමාණෝ ඔවුන්ට විරෝධය දක්වන සේක.
17 දැහැමි අය අයැදුම් කළහ;
q2[17] හිමි තුමාණෝ සවන් දී සියලු දුක් වේදනාවලින් ඔවුන් මිදූ සේක.
18 හිමි තුමාණෝ බිඳුණු සිත් ඇත්තන්ට ළං ව සිටින සේක;
q2[18] තැළුණු හදවත් ඇත්තන්ට පිහිට වන සේක.
19 දමිටුන්ට බොහෝ ආපදා ඇතත්, හිමි තුමාණෝ ඒ සියල්ලෙන් ඔවුන් මුදා හරින සේක.
20 ජොහ 19:36 එතුමාණෝ ඔවුන්ගේ ඇඟේ එක ඇටයකුදු නැර ඔවුන් රක්නා සේක;
q2[20] ඉන් එකක් වත් බිඳුනේන නොහරින සේක;
21 දුෂ්ටයා නපුරනේ වැනසයෙි.
q2[21] දැහැමි අයට දෙස් තබන්නෝ දඬුවම් ලබන්නෝ ය.
22 හිමි තුමාණෝ සිය මෙහෙකෙරුවන් මුදන සේක.
q2[22] එතුමන්ගේ රැකවරණය සොයන කිසිවකේ දඬුවම් නොලබන්නෝ ය.

### පිළිසරණ සඳහා යැදුම

*දාවිත්ගේ ගීතයකි.*

35 සමිඳුනි, මාගේ විවාදකරුවන් සමඟ විවාද කළ මැනව;
q2
35 මා හා සටනට එන අය සමඟ සටන් කළ මැනව.
2 පලිහත්, මහා පලිහත් ගෙන මට පිහිට වුව මැනව.
3 හෙල්ලය ඇද, මා ලුහුබැඳ එන අය වළකා ලුව මැනව;
q2[3] ඔබ මාගේ පිළිසරණ බව මට පැවසුව මැනව.
4 මා වැනසීමට සොයන්නෝ ලජ්ජාවට හා නින්දාවට පැමිණෙත් වා!
q2[4] මා නැසුමට උපා යොදන්නෝ වියවුල් වී ආපසු යත් වා!
5 ඔව්හු පවනෙහි පා වන බොල් මෙන් වෙත් වා!
q2[5] සමිඳුන්ගේ දූතයා ඔවුන් පලවා හරී වා!
6 ඔවුන්ගේ මාවත අඳුරු, ලිස්සන පාරක් වේ වා!
q2[6] සමිඳුන්ගේ දූතයා ඔවුන් ලුහුබැඳ යේ වා!
7 කරුණාක් නැතිව ම මා ඇල්ලීමට ඔව්හු මලපත් දැමූ හ;
q2[7] මා බැඳගැන්මට ගැඹුරු වළක් තැනූ හ.
8 නොදැනුවත්ව ම ඔව්හු විපතට යත් වා!
q2[8] තමන් දැමූ දැලෙහි තුමූ ම අසු වෙත් වා!
q2[8] තමන් කැපූ වළෙහි තුමූ ම වැටෙත් වා!
9 මම හිමි තුමන් ගැන ප්‍රීති ප්‍රමෝද වන්නෙමි;
q2[9] මා ගැළවේවේ හිමි තුමන් බැවින් තුටු පහටු වන්නෙමි.
10 මාගේ මුළු සිතින් මෙපෙවත් මම පවසන්නෙමි:
q2[10] "ඔබ වැනි උතුමකේ මුළු ලොව ඇද් ද?
q2[10] ප්‍රබලයන්ගෙන් දුබලයන් රක්නා,
q2[10] පීඩාකරුන්ගෙන් දිළිඳුන් රැකගන්න වෙනෙ උතුමකේ තවත් ඇද් ද?"
11 අදමිටු දන නැඟී ඉදිරිපත් ව මා කිසිවක් නොදන්න අපරාධ ගැන වරද තබා සාක්කි කියති.
12 යහපත කළ මට ඇත්තේ නපුර පමණි;
q2[12] මට කිසි බලාපොරොත්තුවක් දැන් නැත.
13 ඔවුන් රෝගාතුර වූ දවසේ දී මම ගෝණි රෙදි ඇන්දෙමි;
q2[13] උපවාසයේ සිටියෙමි;
q2[13] සිරස නමා යාදිනි පිදුවෙමි.

14 මිතුරකුෙ හෝ සහෝදරයකුෙ හෝ ගැන මෙන්
ක්රියා කළෙමේ;
q2 14 සිය මව ගැන දුක් වන සේ දුකින් වැතිර
සිටියෙමේ.
15 එහෙත්, මා විපතට වැටුණු දිනේ ඔව්හු මා
අවටින් රුස් කකා ප්රීති වූ හ.
q2 15 මා නොදත් දුදනෝ නොනැවතී මට නිගා
කළහ.
16 මට දුක් දී සමච්චල් කොට, මා කරේ වරෙ
බැඳ දත්මිටි කෑ හ.
17 සමිඳුනි, මයෙ දැක දැක කොපමණ කල් ඔබ
බලා සිටින සේක් ද?
q2 17 ඔවුන්ගේ පහරවලින් මා මිදුව මැනව;
q2 17 මේ රුදුරු සිංහයන්ගනේ මා දිවි රැක දුන
මැනව.
18 එවිට මම මහා සභාවේ දී ඔබට තුති
පුදන්නමේ;
q2 18 විසල් ජනකායක් අබිමුව ඔබට පැසසුම්
කරන්නමේ.
19 ගීතා 69:5; ජොහ 15:25 මාගේ සතුරෝ අයුක්ති
සහගත ව මාගේ දුක ගැන ප්රීතිමත් නොවතේ වා!
q2 19 මාගේ දුක් ගැනවිලි ගැන බැල්මනේ සනෙඟ
කුල්මත් නොවතේ වා!
20 සුහද කතා ඔවුන් වතෙ නැත;
q2 20 රටේ සාමකාමී අයට එරහෙි ව ඔව්හු බොරු
බේගල් ගොතති.
21 ඔව්හු මට විරුද්ධ ව කට අයා, “අනේ හොඳ යි!
q2 21 ඔබ කළ දේ අප දුටුවා”යි කියති.
22 සමිඳුනි, ඔබ එය දුටු සේක.
q2 22 නිහඬ ව නොසිටිය මැනව.
q2 22 මා වතෙින් ඈත් ව නොගිය මැනව.
23 මාගේ දවේිඳුනි, මාගේ සමිඳුනි, මා වනුෙවනේ
ඉදිරිපත් වුව මැනව;
q2 23 මාගේ නඩුව අසා, යුක්තිය ඉටු කළ මැනව.
24 මාගේ දවේ සමිඳුනි, ඔබ සාධාරණකම අනුව මා
විනිශ්චය කළ මැනව;
q2 24 සතුරෝ මා ගැන කුරිරු සිතින් ප්රීති නොවතේ
වා!
25 “අපේ වැඩේ හරි”යි ඔව්හු නොකියත් වා!
q2 25 “අප ඔහු කා දැම්මා” කියා ඔව්හු නොකියත්
වා!
26 මාගේ දුක ගැන හිත පුරා ප්රීති වන අය
ලජ්ජාවට හා වියවුලට පැමිණතේ වා!
q2 26 මට අපහාස කරන අය ලජ්ජාවට හා
අපකීර්තියට ලක් වතේ වා!
27 මා නිදහස්වීම ගැන සන්තෝෂ වන අය ප්රීති
ඝෝෂා පවත්වමින්, යළි යළිත් මසේ කියත් වා!
q2 27 “සමිඳාණෝ උසස් වන සේක;
q2 27 තම මහෙකෙරුගේ ජය ගැන එතුමාණෝ ප්රීති
වන සේක.”
28 එවිට මා මුවින් ඔබේ දැහැමිකම වර්ණනා
කරමි;
q2 28 දවස පුරා ඔබ ගැන ප්රශස්ති ගීත ගයන්නමේ.

### මිනිසාගේ දුෂ්ටකම

*සමිඳාණන් වහන්සේගේ සේවක දාවිත්ගේ ගීතයකි.*

36 රෝම 3:18 දුදනාගේ හද පත්ලහෙි පවට
පළෙඹීම ඇත;
q2
36 ඔහු තුළ දේව ගරුබිය නැත.
2 සිය අයුතුකම් හළෙි වී පිළිකුල් කරනු
නොලබන්නේ යැයි ඔහු තමා ම පාරට්ටු කරගනියි.
3 ඔහුගේ මුඛය අයුතුකම හා වංචාවනේ පිරී ඇත;
q2 3 ඔහු ප්රඥාවට පිටුපා යහපත නොකරයි.
4 ඔහු යහනේ සිටින විට පවා මැරවරකම් යෝජනා
කරයි;
q2 4 අයහපත් මඟක ම හැසිරයෙි;
q2 4 නපුරු කිසිවකට පිළිකුල් නොකරයි.

### දවේිඳුන්ගේ යහපත්කම

5 සමිඳුනි, ඔබේ නොනෙස්නා පමේකඳ අහස දක්වා
නඟියි;
q2 5 ඔබේ විශ්වාසවන්තකම වලාකුළු ඉක්මවා යයි.
6 ඔබේ දැහැමිකම උස් කඳුවැටි හා සමාන ය;
q2 6 ඔබේ විනිශ්චයයෝ මහ සයුර මනේ ගැඹුරු ය.
q2 6 සමිඳුනි, ඔබ මිනිසා ද මෘගයා ද රක්නා සේක.
7 ඔබේ නොනෙස්නා පමේකඳ කොතරම් අනගි ද?
q2 7 නර සුර දගෙොල්ල ම ඔබේ පියාපත්
සවෙණහෙි රැකවරණය ලබති.
8 ඔව්හු ඔබේ මැදුරහෙි සව්සිරි සැපතින් මොනවට
සතුටු වතෙි;
q2 8 ගලා යන ඔබේ ප්රීති ගංගාවනේ ඔබ ඔවුන්ට
බොන්න දනෙ සේක.
9 ජීවන උල්පත ඔබ වතෙ ඇත;
q2 9 ඔබේ එළියනේ අපි එළිය දකිමු.
10 ඔබ හඳුනන අයට ඔබේ තිර පමේකඳ ද අවංක
සිත් ඇති අයට ඔබේ දැහැමිකම ද නොනෙවත්වා
පනේනුව මැනව.
11 උඩඟු අය මට පහර නොදතේ වා!
q2 11 නපුරු අය මා පලවා නොහරිත් වා!
12 දුදනෝ බිමට වැටී පරෙළී සිටිති.
q2 12 ඔවුන්ට තවත් නැඟිටීමක් නැත.

### තලතුනා කනෙකුෙගේ අවවාද

*දාවිත්ගේ ගීතයකි.*

37 නපුර කරන අය ගැන නොකලකිරනේන;
q2
37 අදමිටුකම් කරන අයට ඊර්ෂ්යා නොකරන්න.
2 ඔව්හු තණ පත් මනේ වියළී යති;
q2 2 නිල් පලා මනේ මැලවී යති.
3 සමිඳුන් කරේ විශ්වාසය තබා යහපත කරන්න;
q2 3 දේශයහෙි සුව සේ වසෙනේන.
4 සමිඳුන් කරේ ප්රීතිමත් වන්න;
q2 4 එතුමන් ඔබේ මන දොළ ඉටු කරනු ඇත.
5 ඔබේ ඉරණම හිමි තුමන්ට භාර දනේන;

q2 5 එතුමන් කෙරෙහි විශ්වාසය තබන්න;
q2 5 හිමි තුමන් හැම දයෙ ඉටු කර දනෙු ඇත.
6 හිමි තුමන් ඔබගේ යහපත්කම ඉර එළිය මනේ ද
ඔබගේ දැහැමිකම මද්දහන මනේ ද බබළවන සේක.
7 සමිඳුන් කෙරෙහි රඳා, ඉවසිල්ලනේ එතුමන්ගේ
පැමිණීම බලා ඉන්න;
q2 7 සිය ජීවිතයෙහි දියුණු වන්නා ගැන වත්, වැරදි
දේ කොට ජයගන්නා ගැන වත් ඊර්ෂ්‍යා
නොකරන්න.
8 කෝපයෙනේ වැළකනේන;
q2 8 උදහසින් ඈත් වන්න;
q2 8 නොකලකිරෙනේන;
q2 8 මෙයින් ඇති වන්නේ නපුර පමණ ය.
9 නපුර කරන්නෝ නරෙපා දමනු ලබන්නෝ ය.
q2 9 හිමි තුමන් කෙරෙහි විශ්වාසය තබන්නෝ දේශය
හිමි කරගන්නෝ ය.
10 දුදනා මඳ කලකින් නැති වී යයි;
q2 10 ඔබ ඔහු සෙව්වත් ඔහු නැත.
11 මතෙ 5:5 මුදු මොළොක් සිත් ඇත්තෝ දේශය
හිමි කරගනිති;
q2 11 ඔව්හු සව්සිරි වින්දනය කරති.
12 දුදනා සුදනාට එරෙහි ව උපා යොදයි;
q2 12 ඔහුට විරුද්ධ ව දත්මිටි කයි.
13 සමිඳාණෝ ඔහු ගැන සිනාසෙන සේක;
q2 13 ඔහුගේ අවසානය ළඟ බව දන්න සේක.
14 දුගී දුප්පතුන් හෙළා දමන පිණිස ද අවංක අය
වනසන පිණිස ද දුදනෝ කඩුව ඇද, දුන්න තැත්
කවාගෙන සිටිති.
15 එහෙත්, ඔවුන්ගේ කඩුපත ඔවුන්ගේ ම හදවත
තුවාළ කරයි;
q2 15 ඔවුන්ගේ දුන්න බිඳ දමනු ලැබේ.
16 දුදනන් සතු වස්තු රැසකට වඩා සුදනා සතු
වස්තු බිඳක් යහපත.
17 දුදනන්ගේ බාහු බලය බිඳ දමනු ඇත. එහෙත්
q2 17 හිමි තුමන් සුදනන් හට පිහිට වනු ඇත.
18 හිමි තුමාණෝ සැදැහැවතුන් දිනනේ දින
රැකගනිති;
q2 18 ඔවුන්ගේ උරුමය සදහට ම පවතියි.
19 විපත් සමයේ දී ඔවුන්ට විපතක් නැත;
q2 19 සාගත සමයේ දී ඔවුන්ට හිඟයක් නැත.
20 එහෙත්, දුදනෝ වැනසෙති;
q2 20 හිමි තුමන්ගේ සතුරෝ වන මල් මනේ මිය
යති;
q2 20 දුම මනේ පහවෙති.
21 දුදනෝ ණය ගෙන යළි නොගෙවති;
q2 21 සුදනෝ කාරුණික ය, ත්‍යාගශීලී ය.
22 හිමි තුමන්ගෙනේ ආසිරි ලද්දෝ දේශයෙහි
යහෙනේ වැජඹෙති;
q2 22 දේව සාපය ලද්දෝ රටෙනේ නරෙපනු ලබති.
23 සමිඳාණෝ මිනිසකුගේ දිවි මඟ හසුරුවන
සේක;
q2 23 ඔහුගේ ක්‍රියා කලාපය ගැන සතුටු වන
සේක.
24 ඔහු වැටුණත් වැටී ම නොසිටියි;
q2 24 සමිඳාණෝ සිය'තින් ඔහු නැඟුටුවන සේක.
25 මම දැන් යොවුන් විය ගෙවා මහලු ව සිටිමි;
q2 25 සමිඳුන් සුදනකු අත්හළ බව වත්, ඔහුගේ
දූදරුවන් සිඟමනේ ගිය බව වත් කිසි දා නුදුටිමි.
26 දවස දවේලේ ඔහු නොමසුරු ව ණයට දයි;
q2 26 ඔහුගේ දරු පරපුර රටට ආසිරියකි.
27 නපුර දුරු කොට යහපත කරන්න.
q2 27 තිර කල් යහෙනේ වැජඹනෙු ඇත.
28 හිමි තුමාණෝ යුක්තියට ප්‍රිය මනාප ය;
q2 28 සිය සැදැහැවතුන් අත් නොහරිති.
q2 28 ඔව්හු සදහට ම රැකවරණය ලබති.
q2 28 එහෙත්, දුදනන්ගේ පරපුර වැනසෙති.
29 දැහැමියෝ දේශය හිමි කරගන්නෝ ය.
q2 29 එහි සදහට ම යහෙනේ වසන්නෝ ය.
30 දැහැමියන්ගේ මුවින් නැණ නුවණ නික්මයි;
q2 30 ඔව්හු යුක්ති සහගත දයෙ ම පවසති.
31 ඔව්හු දේව අණසක හදවතෙහි නිදන් කරති;
q2 31 ඒවා නොපිරිහෙළා රැකගනිති.
32 දුදනා සුදනාගේ වගතුග සොයා, බලා හිඳ, ඔහු
මැරීමට සොයයි.
33 එහෙත්, සමිඳාණෝ දුදනාගේ අතට ඔහු අත්
නොහරින සේක;
q2 33 ඔහු උසාවියට ගෙන ගියත්, වරදට පත්
නොකරන සේක.
34 සමිඳුන් කෙරෙහි බලාපොරොත්තුව රඳවා,
එතුමන්ගේ අණපණත් රක්ෂා කරන්න;
q2 34 දේශය ඔබට හිමි වන පිණිස එතුමන් ඔබ
උසස් කරනු ඇත;
q2 34 දුදනන් වැනසෙන හැටි ඔබේ ඇසින් ඔබ දකිනු
ඇත.
35 දුෂ්ටයා දැඩි කුරිරු නායකයකු වී, ලබෙනොන්හි
දේවදාර රුකක් මනේ සශ්‍රීක ව වැඩනෙු බලා
සිටියෙමි.
36 එහෙත්, කලකට පසු මම ඔහු වෙත ගියෙමි;
q2 36 ඔහු සිටියේ නැත.
q2 36 ඔහු සෙව්මි;
q2 36 එහෙත්, සම්බ වූයේ නැත.
37 නිදොස් තැනැත්තකු සොයන්න;
q2 37 අවංක කෙනෙකු දෙස බලන්න;
q2 37 ඔහුට නම්, සාමකාමී අනාගතයක් ඇත.
38 අපරාධකරුවෝ එක ගොඩේ විනාශ කරනු
ලබති;
q2 38 දුදනන්ගේ පරපුර වැනසී නිම වයේ.
39 හිමි තුමාණෝ දැහැමියන් ගළවන සේක.
q2 39 විපතේ දී ඔවුන්ට බලකොටුවක් වන සේක.
40 හිමි තුමාණෝ ඔවුන්ට පිහිට වී ඔවුන් මුදන
සේක.
q2 40 සිය සරණ සොයා එන ඔවුන් එතුමාණෝ
දුදනන්ගෙනේ මුදා ලන සේක.

### දහ දුක් විඳින්නකුගේ යාදින්න

*දාවිත්ගේ ගීතයකි. සිහි කරවීමටයි.*

38 සමිඳුනි, උදහස් වී මට තරවටු නොකළ මැනව;
q2
38 කෝපයෙනේ ඇවිළී මට දඬුවම් නුදුන මැනව.
2 ඔබ ඊගසින් විද මට තුවාළ කොට ඇත;
q2 2 බලවත් ලෙස මා තළා පෙළා ඇත.
3 ඔබේ උදහස නිසා මම දහ දුක් විඳිමි;
q2 3 මාගේ පව් නිසා සර්වාංගය රෝගී වී ඇත.
4 මාගේ අයුතුකම් මාගේ හිසටත් උඩින් නැඟී ඇත;
q2 4 ඒවා දැරිය නොහැකි බරක් වී ඇත.
5 මාගේ මෝඩකම් හේතුකොටගෙන මාගේ තුවාළ දුර්ගන්ධ ව, පිළිකුල් ව ඇත.
6 වේදනා විඳිමින්, කුදුගැසී වැතිර සිටිමි.
q2 6 දවස පුරා වැලපමෙන් කල් යවමි.
7 උණෙන් මාගේ තුනටිය දැවෙයි.
q2 7 මාගේ ඇඟපතට කිසි සුවයක් නැත.
8 මම තහෙවේටු වී දැඩි ලෙස තැළී පෙළී සිටිමි;
q2 8 සිතේ කරදර නිසා මම කෙඳිරිගාමි.
9 සමිඳුනි, මාගේ මුළු ආශාව ඔබ දන්න සේක;
9 මාගේ සුසුම්ලෑම ඔබට ඇසේ.
10 මාගේ පපුව ගැහෙයි;
q2 10 කාය ශක්තිය හීන වේගන යයි;
q2 10 ඇස් ද ඇඳිරි වේගන යයි.
11 අසල්වැසියෝ ද හිත මිතුරෝ ද මාගේ තුවාළවල දුගඳ නිසා ඈත් වී සිටිති;
q2 11 මාගේ පවුලේ උදවිය ද මා ළඟට එන්නේ නැත.
12 මා මැරීමට සොයන අය මට උගුල් අටවා ඇත;
q2 12 මට අනතුරු කරන්න සොයන අය නපුරු දේ කිය කියා දවස පුරා කූට උපා යොදති.
13 බිහිරෙකුට මෙන් මට ඇසෙන්නේ නැත;
q2 13 ගොළුවකුට මෙන් මට කතා ශක්තිය නැත.
14 මට කන් නොඇසෙන නිසා මම පිළිතුරු දිය නොහැකි මිනිසකු හා සමාන ය.
15 සමිඳුනි, මාගේ විශ්වාසය ඔබ කෙරෙහි ය.
q2 15 මාගේ දෙවි සමිඳුනි, ඔබ මට පිළිතුරු දෙනු නියත ය.
16 මාගේ දුක ගැන ප්‍රීති වන්නට සතුරන්ට ඉඩ නුදුන මැනව;
q2 16 මාගේ වැටීම ගැන උදන් ඇනීමට ද ඉඩ නුදුන මැනව.
17 මාගේ වැටීම ඉතා ළඟ ය;
q2 17 මාගේ වේදනාවට කෙළවරක් නැත.
18 මම පාපය ගැන උච්චාරණය කරමි;
q2 18 ඒ ගැන ළතැවෙමි.
19 මාගේ සතුරෝ සනීප ශක්තියෙන් සිටිති;
q2 19 නිකරුණේ මට වෛර බඳින අය වැඩි වේගන එති.
20 යහපතට නපුර කරන අය, මා හරි දේ කරන බැවින් මට සතුරු වී සිටිති.
21 සමිඳුනි, මා අත්නෑරිය මැනව.
q2 21 මාගේ දෙවියෙනි, මා කෙරෙන් ඈත් නොවුව මැනව.
22 මාගේ ගැළවුම්කාර සමිඳුනි, මට පිහිට වන පිණිස වහා වැඩිය මැනව.

### කෙටි ජීවිතය ගැන භාවනාව

*දාවිත්ගේ ගීතයකි.*
39 මම මෙසේ පැවසීමි:
q2
39 "වචනයෙන් පව් නොකරන පිණිස හැසිරීම ගැන ප්‍රවේසම් වෙමි;
q2
39 දුදනන් මා අබිමුව සිටිය දී කට රැකගනිමි."
2 මම වචනයක් වත් නොකීමි;
q2 2 හොඳ දෙයක් කීමෙන් පවා වැළකුණෙමි.
q2 2 එහෙත්, මාගේ ශෝකය තවත් උග්‍ර විය;
3 මාගේ සිත කාංසාවෙන් දැදෙරා ගියේ ය;
q2 3 සිතන්න සිතන්න, වැඩි වැඩියෙන් මම කැළඹුණෙමි.
q2 3 තවත් නිහඬ ව සිටීමට බැරි විට, මෙසේ ප්‍රශ්න නොකිරීමට මට බැරි විය:
4 "සමිඳුනි, මාගේ අවසානය කවදා එයි ද?
q2 4 මාගේ ආයු ප්‍රමාණය කොතරම් ද?
q2 4 මා කොතරම් බලහීන දැ යි දැනගැනීමට මට සැලසුව මැනව."
5 අනේ, ඔබ මාගේ වයස කෙටි කර තිබෙන හැටි!
q2 5 ඔබ අබිමුව මාගේ ජීවිතයෙන් වැඩක් ඇද් ද?
q2 5 දිවි ඇති හැම දෙන සුළං රොදක් වැනි ය.
6 හැම මිනිසා ම සෙවෙණැල්ලක් වැනි ය;
q2 6 ඔහු කොයි දේ කළත් එය නිෂ්ඵල ය.
q2 6 ඔහු වස්තු රැස් කරතත්, ඒවා කාට හිමි වේ දැ යි නොදනියි.
7 සමිඳුනි, මට කවර බලාපොරොත්තුවක් ඇද් ද?
q2 7 මාගේ බලාපොරොත්තුව ඔබ කෙරෙහි ය.
8 මාගේ සියලු පවින් මා මිඳුව මැනව.
q2 8 අනුවණයෝ මට සමච්චල් නොකරත් වා.
9 ඔබ මට මෙසේ දුක් දුන් නිසා මම නිහඬ වීමි;
q2 9 කට පියාගෙන සිටියෙමි.
10 ඔබ මට තවත් දඬුවම් නොකළ මැනව.
q2 10 ඔබ දුන් පහරවලින් මා මැරෙන්න ආසන්න ය.
11 ඔබේ තරවටුවෙන් ඔබ මිනිස් පවට දඬුවම් දෙන සේක;
q2 11 කාවකු කා දමන සේ ඔබ ඔහු රිසි දෙය වනසා ලන සේක.
q2 11 මිනිසා නම්, සුළං රොදක් පමණ ය.
12 සමිඳුනි, මාගේ අයැදුම ඇසුව මැනව;
q2 12 මාගේ මොරගෑමට සවන් දුන මැනව;
q2 12 මාගේ කඳුළු දැක නිහඬ ව නොසිටිය මැනව.
q2 12 මන්ද, ඔබ සමඟ ආගන්තුකයෙක් ද මාගේ පියවරුන් මෙන් කලක් නේවාසිකයෙක් ද වෙමි.
13 මා මෙලොවින් චුත වී, නැති වී යන්නට පෙර, මඳ කලකට ප්‍රීති වන පිණිස මට ඉඩ සැලසුව මැනව.

### තුති පැසසුම් ගීතයක්

*දාවිත්ගේ ගීතයකි.*

40 මම ඉවසිල්ලෙනේ හිමි තුමන් ගැන
බලාපොරොත්තුවෙනේ සිටියෙමේ, හිමි
තුමාණෝ මාගේ දුක් ගැනවිලිවලට සවන් දුන්
සේක.
2 හිමි තුමාණෝ මා බියකරු වළකින්, මඩ වළකින්
ගොඩට ගනෙ, පර්වතයක් මත පිහිටුවා, මා
සුරක්ෂිත කළ සේක.
3 දෙවිඳුන් හට තුති පවසන, නව ගීයක් මා මුවේ
තැබූ සේක.
q23 මයෙ දැක බොහෝ දනෙකෙු ගරුබියෙනේ ඇලළී,
සමිඳුන් කෙරේ අදහනු ඇත.
4 පිළිම රූප නොනෙමදින, බොරු දෙවිවරුන්
නොඅදහන, සමිඳුන් කෙරෙහි අදහන තැනැත්තේ
ආසිරි ලද්දකෙි.
5 දෙවි සමිඳුනි, ඔබ අප උදසො කර ඇති හාස්කම්
කොපමණ ද?
q25 ඔබ අප උදසො අදහස් කළ දේ කොපමණ ද?
q25 ඔබට සම අන් කනෙකේ සිටී ද?
q25 ඒ සියල්ල පවසා නිම කරන්නට කිසි දා මට
බැරි ය.
q25 ඒවායේ ගණන ඉමහත් ය.
6 හබේ‍රෙ 10:5-7 ඔබ පුද පඬුරට ප්‍රසන්න නැත;
q26 දවන යාග පූජා හා පාප පූජාවලින් ඔබට වැඩක්
නැත.
q26 ඒ වනෙුවට ඔබ වදන් අසන පිණිස මාගේ
දසෙවන දුන් සේක.
7 එවිට මම, “මනේන, මම මහෙි ය”යි කීවෙමේ.
q27 “මා පිළිබඳ අණපණත් ඔබේ ව්‍යවස්ථාවලියෙහි
ලියා ඇත.
8 මාගේ දෙවියෙනි, ඔබේ කැමැත්තට ප්‍රිය වමේ,
ඔබේ නීති මසිතහෙි නිදන් කරගතිමි.”
9 සමිඳුනි, ඔබට වඳින පිරිස් මැද, ඔබේ ගැළවීමේ
ක්‍රියා වර්ණනා කළෙමේ.
q29 නොනෙවත්වා එය තවත් වර්ණනා කරන බව
ඔබ දන්න සේක.
10 ඔබ දනෙ ගැළවීම සිතහෙි රඳවා නිකම්
නොසිටියෙමේ;
q210 ඔබේ ගැළවීම හා විශ්වාසවන්තකම ප්‍රකාශ
කළෙමේ;
q210 මහ පිරිස් මැද ඔබේ කරුණාව ද
විශ්වාසවන්තකම ද නොවළෙහා දන්වා සිටියෙමේ.
11 සමිඳුනි, ඔබේ දයානුකම්පාව මා කෙරෙනේ
නොවැළැක්වුව මැනව.
q211 ඔබේ කරුණාව හා විශ්වාසවන්තකම නිරතුරු
මා රකීවා.

### පිහිට පතා යැදීම

(ගීතා 70)

12 මම දහස් ගණන් උවදුරින් වට වී සිටිමි.
q212 හිස එසවීමට බැරි තරම් මාගේ පව් මා පිට
පැමිණ ඇත.
q212 ඒවා මාගේ හිසකෙේවලට වඩා වැඩි ය.
q212 මාගේ සිතට දිරියක් නැත.
13 සමිඳුනි, මා මුදාගත මැනව.
q213 අහෝ සමිඳුනි, මට සහාය වීමට කඩිනම් කළ
මැනව.
14 මා නැසීමට සොයන්නෝ ලජ්ජා වී, වියවුල්
වතේවා.
q214 මාගේ විනාශයට ආශා වූවෝ පසු බැස
අපකීර්තියට පැමිණතේ වා!
15 හහා! හහා!
q215 කියමින් මට සමච්චල් කරන්නෝ මවෙන්
නින්දාව නිසා පසු බසිත් වා!
16 ඔබ සොයා එන්නෝ ප්‍රීති ප්‍රමෝද වී සතුටු
වතේ වා!
q216 ඔබේ විමුක්තියට ප්‍රමේ කරන්නෝ “හිමි
තුමෝ ශ්‍රේෂ්ඨ ය”යි නිරතුරු කියත් වා!
17 මම දුගියකෙමි, දිළිඳකෙමි, එහතේ, හිමි
තුමාණෝ මා සිහි කරන සේක.
q217 ඔබ මාගේ පිළිසරණ ය;
q217 ඔබ මාගේ මිදුම්කරු ය.
q217 මාගේ දෙවියෙනි, පමා නොවී වැඩිය මැනව.

### රෝගියකෙුගේ අයැදුම

*දාවිත්ගේ ගීතයකි.*

41 දිළින්දා සලකන්නා ආසිරි ලද්දේ ය.
q2
41 ඔහුගේ විපතින් සමිඳාණෝ ඔහු මුදන සේක.
2 සමිඳාණෝ ඔහු රක්නා සේක;
q22 ඔහුට රැකවරණය දනෙ සේක;
q22 මිහි මත ඔහුට ආසිරි දනෙ සේක;
q22 සමිඳාණෝ සතුරන් අතට ඔහු පාවා නොදනෙ
සේක.
3 ලඩෙ ඇඳේ සිටින විට සමිඳාණෝ ඔහුට පිහිට
වන සේක;
q23 රෝගාතුර ව සිටින විට සුවය දනෙ සේක.
4 “සමිඳුනි, මට කරුණා කළ මැනව;
q24 ඔබට විරුද්ධ ව පව් කළෙමේ, මමො සුව කළ
මැනව”යි මම පවසමි.
5 “ඔය මිනිසා කවදා මැරේ ද?
q25 කවදා ඔහුගේ නාමය මැකී යන්නේ දැ”යි
මාගේ සතුරෝ මා ගැන අවලාද කියති.
6 මා බලන්න එන අය අවංක නැත.
q26 ඔවුහු මා ගැන කිව හැකි නපුරු දේ රැස්
කරගනිති;
q26 පිටත ගොස් හැම තැන ම ඒවා පළ කරති.
7 මට වරෛ කරන්නෝ මට විරුද්ධ ව රහස් කියති;
q27 මා වැනසීමට රහසින් උපා යොදති.
8 “අසාධ්‍ය ලඩෙක් ඔහුට වැළඳී ඇත.
q28 කවදාවත් ඇඳනේ නොබසිනු ඇතැ”යි ඔවුහු
පවසති.

9 මතෙ 26:23; මාක් 14:20; ලූක් 22:21; ජොහ
13:18 මාගේ හොඳ ම විශ්වාසය දිනාගත් යහළුවා,
එක පිඟානෙන් බත් කෑ කල්‍යාණ මිත්‍රයා පවා මට
එරෙහි ව සතුරුකම් කළේ ය.
10 මාගේ සතුරන්ට යස පාඩමක් උගන්වන පිණිස
සමිඳුනි, මට කරුණා කළ මැනව;
q2 10 ලෙඩෙ ඇඳෙන් මා නැඟිටවුව මැනව.
11 ඔවුන්ට ජය අත් නොවන විට ඔබ මා කෙරෙහි
ප්‍රිය බව මම දනිමි.
12 මා හරි දේ ඉටු කරන බැවින් ඔබ මට පිහිට
වන සේක;
q2 12 සදහට ම ඔබ අබිමුව මා තබාගන්න සේක.
13 ගීතා 106:48 ඉශ්‍රායලේ ජනතාවගේ දෙවි
සමිඳුන් හට ප්‍රශංසා වේ වා!
q2 13 සදාකාලයනේ සදාකාලයට ම ප්‍රශංසා වේ වා!
q2 13 ආමනේ, ආමනේ.

## දෙ වන කාණ්ඩය

(ගීතා 42—72)

### මවු බිමනේ ඈත් වූවකුගේ පැතුම

*කෝරාගේ පුත්‍රයන්ටයි.*

42 දෙවියනෙි, මුවා සිසිල් දිය දහරට ලොල් වන
සේ ඔබ කෙරෙහි මට තද පිපාසයක් ඇත.
2 දෙවිඳුන් කෙරෙහි, ජීවමාන දෙවිඳුන් කෙරෙහි,
මාගේ සිත පිපාසා වන්නේ ය.
q2 2 මම කවදා අවුත් දෙවිඳුන් ඉදිරියේ පෙනී සිටිම්
ද?
3 'ඔබේ දෙවියෝ කොහේ ද' කියා දවස පුරා
මිනිසුන් මට කියන කල මම දිවා රෑ දෙකේහි කඳුළු
වගුරුවමි.
4 බැති පමෙින් කුල්මත් වූ වන්දනාකරුවන් සමඟ
පැසසුම් ගී ගයමින්,
q2 4 මහ පිරිස් මැද දෙවි මැදුරට මා ගිය හැටි සිහි
වන විට මා හද දදෙරා යයි.
5 ඇයි මා මසෙේ දුක් සයුරේ කිමිදනේනේ?
q2 5 ඇයි මා මසෙේ කඳෙිරිගාමින් ළතවන්නේ?
q2 5 දෙවි තුමන් ගැන බලා සිටිමි.
q2 5 මාගේ දෙවිඳුන් හට, මිදුම්කරුන් හට, යළිත් මෙ
මම් පැසසුම් දමේ.
6 මාගේ දෙවියනෙි, මාගේ හදවත දදෙරා යන්න
ළඟ ය, එබැවින් මවු බිමනේ ඈත, ජෝර්දාන්
ගංතරෙ ද හර්මොන් කඳුකරයෙහි ද මිශාර්
කන්දෙහි ද සිට මම ඔබ සිහි කරමි.
7 ඔබේ දිය ඇලිවල ඝෝෂාවනේ කැළඹී, මම
ගැඹුරනේ ගැඹුරට කිඳා බසිමි.
q2 7 ඔබේ රළ පතර මා වසාගනෙ ඇත.
8 එබැවින් හිමි තුමාණෝ සිය තිර පමේ කඳ දිවා
භාගයේ දී මට දක්වන සේක් වා!
q2 8 රෑ යාමවල දී එතුමන්ට මසිතහි නඟින ගීය
මට දිවි දනෙ දෙවිඳුන් හට යැදුමක් වේ වා!
9 මා රක්නා දෙවිඳුන් හට මම මසෙේ කියමි:
q2 9 "ඔබ මා අමතක කළේ මන් ද?
q2 9 සතුරාගනේ පීඩා විඳ විලාප කීමට මට ඉඩ
හැරියේ මන් ද?"
10 මාගේ සතුරෝ, 'ඔබේ දෙවියෝ කොහේ දැ'යි
නිරතුරු කියමින්,
q2 10 කඩුපතින් ඇන මාගේ ඉල ඇට කඩන්නාක්
මනේ නිගා කරති.
11 ඇයි මා මසෙේ දුක් සයුරේ කිමිදනේනේ?
q2 11 ඇයි මා මසෙේ කඳෙිරිගාමින් ළතවන්නේ?
q2 11 දෙවි තුමන් ගැන බලා සිටිමි.
q2 11 මාගේ දෙවිඳුන් හට, මිදුම්කරුන් හට, යළිත් මෙ
මම් පැසසුම් දමේ.

### මවු බිමනේ ඈත් වූවකුගේ පැතුම

(ගීතා 42)

43 දෙවිඳුනි, අභක්තික සනෙඟට එරෙහි ව, මා
වනෙුවනේ කරුණු කියා මා නිදහස් කළ
මැනව.
q2
43 කපටි, අසාධාරණ මිනිසුන්ගනේ මා මුදාගත
මැනව.
2 මාගේ ආරක්ෂාකරු ඔබ ය;
q2 2 මා අත් හැරියේ මන් ද?
q2 2 සතුරාගනේ පීඩා විඳ විලාප කීමට මට ඉඩ
හැරියේ මන් ද?
3 ඔබේ ආලෝකය හා සත්‍යය මට දුන මැනව;
q2 3 ඒවායින් මට මඟපනේවීම ලැබී, ඔබේ ශුද්ධ
සියොන් පව්වට ආපසු ගොස්, ඔබේ වාසභවනය
වන දෙවි මැදුරට පිවිසීමට මට ලැබේවා.
4 දෙවියනෙි, මාගේ දෙවියනෙි, එවිට මම දිව්‍ය
පූජාසනය වතෙ, මාගේ පස්වණක් ප්‍රීතිය වන
දෙවිඳුන් වතෙ ගොස් වීණා වාදනයනේ ඔබ
පසසන්නමේ.
5 ඇයි මා මසෙේ දුක් සයුරේ කිමිදනේනේ?
q2 5 ඇයි මා මසෙේ කඳෙිරිගාමින් ළතවන්නේ?
q2 5 දෙවි තුමන් ගැන බලා සිටිමි.
q2 5 මාගේ දෙවිඳුන් හට, මිදුම්කරුන් හට යළිත් මෙ
මම් පැසසුම් දමේ.

### රැකවරණය සඳහා අයැදීම

*කෝරාගේ පුත්‍රයන්ටයි. අනුශාසනාවකි.*

44 දෙවිඳුනි, ඈත අතීතයේ දී ඔබ කළ උදාර
ක්‍රියා අපේ ම කනින් අප අසා ඇත;
q2
44 අපේ පියවරුන් ඒවා අපට කියා ඇත.
2 ඔබේ බාහු බලයනේ මිසදිටු ජාතීන් පලවා
හැර, ඔබේ සනෙඟ ඔබ එහි වාසය කරවූ සේක;
q2 2 විජාතීන්ට පහර දී ඔබේ ම සනෙඟට සව්සිරි
සැපත දුන් සේක.
3 ඔබේ සනෙඟ සතුරන් පරදා ජය කහෙලේ
නැංවූයේ, තමන්ගේ ම කඩු පහරින් හෝ බාහු
බලයනේ හෝ නොවේ;
q2 3 එසේ වූයේ, ඔබ ඔවුන්ට ප්‍රේම කළ නිසා
ඔබේ ම සුරතිනි, බාහු බලයනේ;

q2[3] ඔබ සහතික ලෙස ඔවුන් සමඟ වැඩ සිටි
බැවිනි.
4 ඔබ මාගේ රජිඳාණෝ ය;
q2[4] ඔබ මාගේ දෙවිඳාණෝ ය.
q2[4] ඔබේ අණ පරිදි ඔබ සෙනඟට ජය සිරි අත් කර
දෙන සේක.
5 ඔබේ බලයෙන් අපි අපේ සතුරන් පරදාලමු;
q2[5] ඔබේ නාමයේ අනුහසින් අපේ රුපුන් පාගා
දමමු.
6 මාගේ දුන්න කෙරෙහි විශ්වාසය නොතබමි.
q2[6] මට විමුක්තිය එන්නේ මාගේ කඩුපතින්
නොවේ.
7 ඔබ අපේ එදිරිකරුවන්ගෙන් අප ගැළවූ සේක;
q2[7] අපට වෛර බඳින අය පලවා හැරිය සේක.
8 දවස පුරා අපි ඔබ පසසමු;
q2[8] සදහට ම අපි ඔබට තුති දෙමු.
9 එහෙත් දෙවියෙනි, දැන් ඔබ අප හැර දමා
පරාජයට පමුණුවා ඇත.
q2[9] අපේ යුද හමුදා සමඟ ඔබ තවත් නොවඩින
සේක.
10 සතුරන්ට බිය වී පලා යාමට ඔබ අපට සැලැසූ
සේක.
q2[10] සතුරෝ අපේ රට කොල්ලකාගත්හ.
11 මරණයට නියම වූ බැටළුවන් මෙන් ඔබ අප
මරණයට නියම කළ සේක;
q2[11] විජාතීන් අතරට අප විසුරුවා හැරිය සේක;
12 ඔබ අප තඹ දොයිතුවට විකුණූ සේක;
q2[12] ඒ වෙළෙඳාමෙන් කිසි ලාභයක් නොගත් සේක.
13 ඔබ අප, අසල්වැසියන්ට සරදමක් ද අප අවට
සිටින කොයි කාටත් අපහාසයක් හා අවමානයක් ද
වන්නට සලසා ඇත.
14 ඔබ අප විජාතීන් අතර නින්දාවක් ද මිනිසුන්
අතර සමච්චලයක් ද වන්නට සලසා ඇත.
15 මම හැම විට ම අපකීර්තියට පත් වී සිටිමි;
q2[15] මම ලජ්ජාවෙන් මුහුණ වසාගෙන සිටිමි.
16 එසේ වන්නේ, සතුරන්ගෙන් ද
නින්දාකරුවන්ගෙන් ද මට අගෞරවය ලැබෙන
බැවිනි.
17 මේ සියල්ල අපට පැමිණි බව ඇත්ත ය;
q2[17] එහෙත් අපි, ඔබ අමතක නොකෙළෙමු;
q2[17] ඔබ සමඟ කළ අපේ ගිවිසුම කඩ
නොකෙළෙමු.
18 අපි ඔබට අපක්ෂපාත නොවීමු;
q2[18] ඔබේ ආඥා කඩ නොකෙළෙමු.
19 එහෙත්, ඔබ අප වන සතුන් අතර අනාථ කළ
සේක;
q2[19] තිත්ත කළුවරෙහි අප අත්හළ සේක.
20 ඉතින් අපි, අපේ දෙවිඳුන් අමතක කෙළෙමු නම්,
අන් දෙවියෙකුට යාච්ඤා කෙළෙමු නම්,
21 ඔබ එය දැනගන්නේ නැද් ද?
q2[21] මන්ද, මිනිස් සිතේ සියලු රහස් ඔබ දන්න
සේක.
22 රෝම 8:36 දවස පුරා අපි ඔබ නිසා මරනු ලබමු;
q2[22] මැරීමට නියම බැටළුවන් මෙන් ගණන්ගනු
ලබමු.
23 සමිඳුනි, පිබිදුණ මැනව!
q2[23] ඔබ නිදා ඉන්නේ මන් ද?
q2[23] නැඟුටුණු මැනව;
q2[23] සදහට ම අප ඉවත නොදැමුව මැනව.
24 ඔබ අප කෙරෙන් සැඟවී ඉන්නේ මන් ද?
q2[24] අපේ විපත හා පීඩාව අමතක කරන්නේ මන්
ද?
25 අප පොළොවේ ධූලිවලට යට වී ඇත.
q2[25] සිරුර පොළොවේ ඇද වැටී ඇත.
26 නැඟිට, අපට පිහිට දුන මැනව.
q2[26] ඔබේ තිර පෙමේකඳ නිසා අප මිදුව මැනව.

### රාජකීය මංගල ගීතයක්

*කෝරාගේ පුත්‍රයන්ටයි. අනුශාසනාවක් වන,*
*ප්‍රේමවන්තියන් ගැන සෑදූ ගීතිකාවකි.*

45 රජිඳුන් උදෙසා මේ කාව්‍යය රචනා කරමි.
q2
45 එවිට මාගේ සිත විසිතුරු තේමාවකින්
පිබිදෙයි.
q2
45 මාගේ දිව දක්ෂ ලේඛකයකුගේ පන්හිඳ
වැනි ය.
2 රජිඳුනි, ඔබ මෙන් රූපසම්පන්න කෙනෙක් මිනිසුන්
අතර තවත් නැත.
q2[2] ඔබ ව්‍යක්ත කථිකයෙකි, දෙවි තුමාණෝ ඔබට
සැම දා ආසිරි දුන් සේක.
3 ප්‍රතාපවත් නිරිඳුනි, ඔබේ මඟුල් කඩුව
ඉඟටියෙහි බැඳගන්න;
q2[3] ඔබ වික්‍රමාන්විත ය;
q2[3] තේජාන්විත ය.
4 සත්‍යය හා යුක්තිය රක්නා පිණිස මංගල
රථයෙන් තේජසින් ජය බිම් බලා වැඩිය මැනව;
q2[4] ඔබේ බාහු බලයෙන් ඔබ උදුල ජය කෙහෙළි
නංවනු ඇත.
5 ඔබේ ඊගස් තියුණු ය;
q2[5] ඒවා ඔබේ රුපුන් හදවත් විදගෙන යයි.
q2[5] විජාතීහු පැරදී ඔබ පාමුල වැටෙති.
6 හෙබ්‍රෙව් 1:8-9 ඔබේ සිහසුන දෙවි සිහසුන මෙන්
සදා වැජඹෙනු ඇත.
q2[6] ඔබේ රජයේ ජයකොන්තය සාධාරණකමේ
ජයකොන්තයකි.
7 ඔබ යුක්තියට ප්‍රේම කොට, අයුක්තියට ද්වේෂ
කරයි.
q2[7] එබැවින් දෙවිඳුන්, ඔබේ දෙවිඳුන්, ඔබ
තෝරාගෙන අන් හැමට වඩා ඔබට සව්සිරි දී ඇත.
8 ඔබේ රාජකීය වස්ත්‍රවලින් සඳුන්, කපුරු, කස්තුරි
සුවඳ විහිදෙයි.
q2[8] ඇත්දත් මාලිගාවල සංගීතකරුවෝ ඔබ මන
පිනවති.
9 ඔබේ කුලකතුන් අතර රජ කුමරියෝ ඇත.

q2 9 ඕෆීර්හි රන් අබරණින් සැරසුණු ඔබේ අග
රැජින ඔබ සිහසුනේ දකුණු පසින් වැජඹෙන්නී ය.
10 දියණියනි, මා වදනට සවන් දෙන්න;
q2 10 ඒවා සිතට ගන්න.
q2 10 ඔබේ ජාතිය, ඔබේ ගම රට සිතින් අමතක
කරන්න.
11 එවිට නිරිඳු ඔබේ රූ සපුවට ප්‍රිය වනු ඇත;
q2 11 ඔහු ඔබේ ස්වාමියා ය, ඔහුට අවනත වන්න.
12 තීර්හි වැසියන් පඬුරු රැගෙන ඔබ වෙත එනු
ඇත.
13 මාලිගයෙහි රාජ දියණිය, රාජ තේජසින්
වැජඹෙන්නී ය.
q2 13 ඇගේ සළුව රන්කමින් විසිතුරු කොට ඇත.
14 මල්කම් හා ලියකම් කළ සළුවෙන් සැරසී, ඈ රජු
වෙත එන්නී ය.
q2 14 ඇගේ යහෙළියෝ ද රජු වෙත ගෙනෙනු
ලබන්නෝ ය.
15 සිත් සතොසින් ඇලළී ඔව්හු රජ මැඳුරට
පිවිසෙති.
16 නිරිඳුනි, ඔබේ පිය රජුන් වෙනුවට, ඔබට පුත්
කුමරුවෝ රැසක් ඇති වන්නෝ ය.
q2 16 ඔබ ඔවුන් මුළු පොළොවෙහි මහීපාලයන්
කරන්නෙහි ය.
17 මම ඔබේ යසස, සියලු පරපුරට සිහි
කරවන්නෙමි.
q2 17 සව් සත සදා ඔබට පසස් ගී ගයන්නෝ ය.

### දෙවිඳාණෝ අප සමඟ ය

*කෝරාගේ පුත්‍රයන්ට යි.*

46 දෙවිඳාණෝ අපේ ශක්තිය හා සරණ වන
සේක;
q2
46 හැම දා විපතේ දී අප හට පිළිසරණක් වන
සේක.
2 මහ පොළොව කම්පා වෙතත්, කඳු වැටී මහ
මුහුදට කඩා වැටෙතත්,
3 සත් සමුදුර ගුගුරා කැළඹෙතත්, එයින් නැඟෙන
රැළ වේගයෙන් කඳු වැටී සැලෙතත් අපට කිසි විටක
බියක් නැත.
4 එක් ගංගාවක් ඇත.
q2 4 එහි දිය පාරවල් ගලා ගොස්, අපේ උතුම්
දෙවිඳුන්ගේ ශුද්ධ මණ්ඩපය වන දෙවි නුවරට
සතොස ගෙනෙ දෙයි.
5 දෙවි තුමාණෝ ඒ නුවර වැඩ වසන සේක.
q2 5 ඊට කිසි දා විපතක් නොවෙනු ඇත.
q2 5 දෙවි තුමාණෝ අලුයම් වේලෙහි ඊට පිහිට වන
සේක.
6 ජාතීහු කෝලාහල කළහ;
q2 6 රාජධානි බිඳ වැටිණි.
q2 6 දෙවි තුමාණෝ ගිගුරුම් දුන් සේක.
q2 6 මහ පොළොව දිය විණි.
7 සව් බලැති සමිඳාණෝ අප සමඟ ය.
q2 7 ජාකොබ්ගේ දෙවිඳාණෝ අපේ බලකොටුව ය.
8 එන්න, සමිඳුන්ගේ වික්‍රම ක්‍රියා බලන්න;
q2 8 මිහි මත කර ඇති පුදුම ක්‍රියා නරඹන්න.
9 එතුමාණෝ මිහි මත දස දෙස යුද බිය නවත්වන
සේක;
q2 9 දුනු බිඳ, හෙල්ලය කපා, පලිහ ගින්නෙන් දවන
සේක.
10 නිශ්චල වන්න;
q2 10 මා දෙවිඳුන් බව සිතට ගන්න;
q2 10 මුළු දෙරණට අග රජ බව, සව් සත හට අග
රජ බව වටහාගන්න;
11 සව් බලැති සමිඳාණෝ අප සමඟ ය;
q2 11 ජාකොබ්ගේ දෙවිඳාණෝ අපේ බලකොටුව ය.

### මහීපාල දෙවිඳාණෝ

*කෝරාගේ පුත්‍රයන්ගේ ගීතයකි.*

47 සව් සතුනි, අත්පොළසන් දෙන්න;
q2
47 ජය ගොස නංවා දෙවිඳුන්ට තුති දෙන්න.
2 අති උතුම් සමිඳාණෝ බියකරු ය, මුළු මහ
පොළොව කරෙහි අග රජ ය.
3 එතුමාණෝ ජාතීන් පරදා අපට ජය දුන් සේක;
q2 3 සව් සත කරෙහි අග රජ වන සේක.
4 තම හට ප්‍රිය ජාකොබ්ගේ සෙනෙඟ වන අප හට
මවු බිමක් ලබා දුන් සේක.
5 ජය ගොස නංවා, කාහල හඬ පතුරා, එතුමාණෝ
සිහසුන මත නැඟුණ සේක.
6 දෙවි තුමන් හට ගී පසස් නඟන්න.
q2 6 ගී පසස් නඟන්න.
q2 6 අපේ නිරිඳු හට ගී පසස් නඟන්න;
q2 6 ගී පසස් නඟන්න.
7 දෙවිඳාණෝ මුළු දෙරණට නිරිඳාණෝ ය.
q2 7 එතුමන් හට ගී පැසසුම් ගයන්න.
8 දෙවිඳාණෝ ජාතීන් අතර රජිඳාණෝ ය;
q2 8 එතුමාණෝ සුවිශුද්ධ සිහසුන් අරා වැඩ සිටින
සේක.
9 ජාතීන්ගේ අධිපතීහු, ආබ්‍රහම්ගේ වංශයට අයත්
දේව සෙනෙඟ සමඟ එක් රැස් වන්නෝ ය.
q2 9 පොළොවේ බලවත් ජාතීහු දෙවි තුමන්ට අයිති
ය;
q2 9 එතුමාණෝ උන් හැම කරෙහි රජකම් කරන
සේක.

### දෙවි නුවර තේජස

*ගීතයකි. කෝරාගේ පුත්‍රයන්ට ගීතයකි.*

48 අප දෙවි නුවර වන එතුමන්ගේ ශුද්ධ
කන්දෙහි හිමි තුමාණෝ උදාර ය.
q2
48 විපුල පැසසුම් ලද යුතු ය.
2 උතුරු දෙසින් වන, මහ රජුගේ නුවර වූ
සියොන් කන්ද උස මහතින් මනරම් ය;
q2 2 මුළු පොළොවට පියකරු ය.
3 නුවර බලකොටු ඇතුළෙහි සුරැකි ව විසිය හැකි
බව, දෙවි තුමන් පෙන්වා දී ඇත.

4 රජවරුන් රාශිභූත ව, නුවරට එරෙහි ව සටනට
යන හැටි නරඹන්න;
5 ඔව්හු එනුවර නරඹා විස්මිත වූ හ;
q2 5 බියෙනේ තැති ගෙන පලා ගියහ;
6 ඔව්හු බියෙනේ හා සන්තාපයෙනේ ඇලළී, ප්‍රසූතියට
ළං වූ කතුන් මෙනේ වූ හ;
7 තද කුණාටුවට අසු වී, සැලෙන, පරෙළනෙ මහ
නැව් මෙනේ වූ හ.
8 අප පරෙ කල ඇසූ විලස, සව් බලැති සමිඳාණන්
සිය නුවරහෙි සිදු කළ දයෙ අපේ ම දනෙතෙින් දුටිමු.
q2 8 එතුමාණෝ එනුවර සදහට ම රක්නා සේක.
9 දවේදුනි, ඔබ මැදුරහෙි ඔබේ තිර පමේකඳ අපි
සිහි කළෙමු.
10 දවේදුනි, ඔබට හිමි ගරු පැසසුම් දස දසෙින් ඔබ
වතෙ නැඟී එයි.
q2 10 ඔබේ කිතු ගාෙස පාළොව පුරා පැතිර ඇත.
q2 10 ඔබ සාධාරණ ලසෙ රජ කරන සේක.
11 ඔබේ සාධාරණ විනිසයන් නිසා සියාෙන් කන්දේ
වැසියෝ සතුටින් පිනා යත් වා!
q2 11 ජුදාහි නුවරවල ප්‍රීති ගීත ඇසේ වා!
12 මතු පරම්පරාවලට කරුණු කියන පිණිස සියාෙන්
පව්ව වටේ ඇවිද බලන්න;
13 එහි කාටෙු පවුරු හාෙඳින් බලා ගණන් කරන්න;
q2 13 මාලිගා සෝදිසි කරන්න.
14 මේ දවේදාණෝ සදහට ම අපේ දවේදාණෝ ය;
q2 14 “ඉර හඳ පවතින තුරු එතුමාණෝ අපට
මඟපනේවන සේකැ”යි කියන්න.

### වස්තු තණ්හාවේ දුර්විපාක

*කෝරාගේ පුත්‍රයන්ට ගීතයකි.*

49 සියලු ජාතීනි, මයෙ අසන්න;
q2

49 සියලු ලෝ වැසියනෙි, එක් ව සවන් දනේන.
2 ලාකෙු කුඩා සියල්ලනෙි, දුප්පත්
පාහොසෙත් සියල්ලනෙි, සවන් දනේන.
3 මම නැණවත් සිතුවිලි සිතමි;
q2 3 මම පැණවත් වදන් පවසමි.
4 මම හිතෝපදේශවලට අවධානය යාමෙු කරමි;
q2 4 වීණාව වයමින් ඒවායේ විසඳුම පහදා
දනේනමේ.
5 අන්තරා කාලවල දී, නපුරු සතුරන් මා සිසාරා
සිටින විට,
6 සිය ධන සම්පත් කරේ විශ්වාසය තැබූ, සිය
වස්තු සම්භාරය නිසා අහංකාර වූ අය මා අවටින්
සිටින විට, මම කිසිසේත් බිය නාවෙන්නමේ.
7 තම විමුක්තිය තමාට ම සාදා ගත නාහෙැකි ය;
q2 7 ජීවිතය සඳහා මිදීමේ මිලය දවේදුන්ට ගවේමට
ඔහුට නුපුළුවන.
8 මිනිසකුගේ ජීවිතය සඳහා ගවේය යුතු මිදීමේ
මිලය ඉතා විශාල ය;
q2 8 මිනී වළට යාමනේ වැළකනෙ පිණිසත්,

9 සදා ජීවත් වීමට වරයක් ලබන පිණිසත්, තමා
විසින් ගවෙනු ලැබිය හැකි මිලය කිසිසේත්
නාසෙෑහේ.
10 පැණවතුන් මියයන බව ද නූගතුන් හා
අනුවණයන් යන දගෙලෝල ම වැනසනෙ බව ද
ඔවුන්ගේ ධනය අනුන්ට තබා යන බව ද නාදෙන්න
කනෙකේ නැත.
11 වරක් ඔවුන්ගේ ම නමින් ගම්බිම් තිබුණ නමුත්,
දැන් ඔවුන්ගේ ගවෙල් සදහට ම සාහොනේ ගවෙල්
වී ඇත.
q2 11 ඔවුන් එහි සදහට ම වාසය කරනු ඇත.
12 කාතෙරම් උසස් මිනිසකුට වුව ද මරණින්
වැළකිය නාහෙැකි ය.
q2 12 ඔහු ද මියයන තිරිසනුන් හා සමාන ය.
13 තමා කරෙහෙි ම විශ්වාසය තබන, තම
වස්තුවනේ සෑහීමට පැමිණ සිටින අයගේ ඉරණම
එය වේ.
14 ඔවුන් බැටළු රැළක් මනේ මරණයට නියම වී
ඇත;
q2 14 ඔවුන්ගේ එඬෙරා මරණය වී ඇත.
q2 14 ඔවුන් කළෙින් ම යන්නේ මිනී වළට ය,
q2 14 ඔවුන්ගේ සිරුරු දිරා යන්නේ ය.
q2 14 ඔවුන්ගේ නිවාසය පාතාලය වන්නේ ය.
15 එහතේ, දවේදාණෝ මා මුදාගනෙ මරණයේ
බලයනේ මා ගළවන සේක.
16 යමකු පාහොසෙත් වන විට, ඔහුගේ යස ඉසුරු
වැඩි වන විට බිය නාවෙන්න.
17 මියයන විට, ඔහු ඉන් කිසිවක් ගනෙයන්නේ
නැත;
q2 17 ඔහුගේ යස ඉසුරු ඔහු කැටුව මිනී වළට
නායෙනු ඇත.
18 මිනිසකේ සිය ජීවිත කාලයේ දී තෘප්තියට පත්
වී සිටියත්,
q2 18 තමන් ගැන පුරසාරම් දඩෙවුවත්, ඔහුගේ
දියුණුව ප්‍රශංසාවට ලක් වුවත්,
19 ඔහු තම මුතුන්මිත්තන් මනේ මිය යන්නේ ය;
q2 19 එහි සදහට ම අඳුර පවතින්නේ ය.
20 කාතෙරම් උසස් මිනිසකුට වුව ද මරණින්
වැළකිය නාහෙැකි ය.
q2 20 ඔහු ද මියයන තිරිසනුන් හා සමාන ය.

### සැබෑ නමස්කාරය

*ආසප්ගේ ගීතයකි.*

50 සව් බලැති දවේ සමිඳාණෝ ශ්‍රී මුඛය
විවෘත කර පරෙදිග පටන් අපර දිග දක්වා
මුළු ලාවෙට කතා කරන සේක.
2 අලංකාරයනේ අගතැන් පත් සියාෙන්හි සිට,
දවේදාණෝ වැජඹනෙ සේක.
3 අපේ දවේදාණෝ වඩින සේක;
q2 3 නිහඬ ව නාසෙිටින සේක.
q2 3 එතුමන් අබිමුව විනාශකාරී ගින්නක් ඇත;
q2 3 එතුමන් සිසාරා චණ්ඩ මාරුතයක් හමයි.

4 සිය සනෙඟ හට නඩු තීන්දුව දනෙ විට ඉහළ
අහසටත්, පහළ පොළොවටත් සාක්ෂිකරුවන් වීමට
එතුමාණෝ හඬ ගසන සේක.
5 “පූද පූජා ඇති ව මා සමඟ ගිවිසුමක් කළ මාගේ
සැදැහැවතුන් මා වෙත රැස් කරන්නැ”යි එතුමාණෝ
වදාළ සේක.
6 දවේිඳාණන් දැහැමි බව ද දවේිඳාණන්
විනිසකරුවන් බව ද අහස් මඬල ලොවට දන්වයි.
7 “එම්බා මාගේ සනෙඟනෙි, සවන් දනේන.
q2 7 මම මයෙ වදාරන්නමේ.
q2 7 එම්බා ඉශ්රායලේ ජනයනෙි, නුඹලාට විරුද්ධ ව
මම සාක්ෂි දමේ.
q2 7 මම දවේිඳාණෝ ය;
q2 7 නුඹලාගේ දවේිඳාණෝ ය.”
8 නුඹලාගේ පූජා ගැන වත්, නිරතුරු මා වෙත
ගනෙනෙ දවන යාග පූජාවන් ගැන වත් මම දොස්
නොපවරමි.
9 එහතේ, නුඹේ පට්ටිවලින් ගොනුන් වත්, නුඹේ
ගාල්වලින් එළුවන් වත් මට වුවමනා නැත.
10 වනයේ වසන සියලු සත්තු මාගේ ය;
q2 10 දහසක් කඳුවල වසන ගවයෝත් මාගේ ය;
11 අහසේ සියලු කුරුල්ලෝ මාගේ ය;
q2 11 කතේවතුවල සියලු සත්තු මාගේ ය.
12 “මට කුසගිනි නම්, නුඹට දන්වන්නට
වුවමනාවක් නැත;
q2 12 ලොවත්, එහි ඇති සියලු දේත් මා සතු
නොවේ ද?
13 ගවමස් බුදීමට හෝ එළු ලේ පානය කිරීමට
හෝ මට වුවමනාවක් ඇද් ද?
14 දවේියන්ට තුති දීම නුඹේ යාගය වේවා.
q2 14 සර්ව බලැති දවේිඳුන්ට නුඹේ භාර ඉටු කරන්න.
15 විපත්තියේ දී මට යාච්ඤා කරන්න;
q2 15 මම නුඹ මුදන්නමේ.
q2 15 නුඹ මට ගෞරව කරනු ඇත.”
16 එහතේ, දුදනා හට දවේි තුමාණෝ මසෙේ
වදාරන සේක:
q2 16 “නුඹ මාගේ ආඥා කටපාඩමින් කියන්නේත්,
q2 16 මාගේ ගිවිසුම ගැන කතා කරන්නේත් කුමකට
ද?
17 මන්ද, නුඹ මාගේ අවවාදය නුරුස්සන්නහෙි ය;
q2 17 මාගේ වචනවලට පිටුපා යන්නහෙි ය.
18 නුඹ සොරකෙු දුටු විට ඔහුගේ මිතුරා වන්නහෙි
ය;
q2 18 කාමමිථ්යාචාරීන් ඇසුරු කරන්නහෙි ය.
19 නුඹේ කට නපුරට පාවා දී ඇත;
q2 19 නුඹ කට ඇරියොත් කියන්නේ බොරු ම ය.
20 එක් කුසේ උපන් නුඹේ සොහොයුරන්ට විරුද්ධ
ව කතා කිරීමට ද ඔවුන්ට දොස් පැවරීමට ද නුඹ
සූදානම් ය.
21 මේ සියල්ල නුඹ කළෙහෙි ය;
q2 21 මම කිසිවක් නොකීවමේ.
q2 21 ඒ නිසා ‘මාත් නුඹ වාගේ ම ය’යි
q2 21 නුඹ සිතුවහෙි ය.
q2 21 එහතේ, දැන් මම නුඹට දොස් පවරන්නමේ;
q2 21 නුඹට කරුණු පහදා දනේනමේ.
22 මට පිටුපා යන්නනෙි, මයෙ කල්පනාවට ගන්න;
q2 22 නැතහොත්, මම නුඹලා වනසන්නමේ.
q2 22 නුඹලා ගළවන්නට කිසිවකෙු නොසිටිනු ඇත.
23 ස්තුති පූජා පුදන තැනැත්තේ මට ගෞරව
කරයි;
q2 23 මට කීකරු වන හැම දනෙ ම මම සැබැවින්
ගළවාගන්නමේ.”

### පව් කමාව සඳහා අයැදීම

*බැත්-ෂබෝ සමඟ පරදාර සේවනයහෙි යදෙුණු
දාවිත් වෙත නාතාන් ගිය පසු දාවිත් තැනූ
ගීතයකි.*

**51** 2 සාමු 12:1-15 දවේිඳුනි, ඔබේ දයා
කරුණාවනේ මට අනුකම්පා කළ මැනව;
q2

**51** ඔබේ විපුල දයාවනේ මාගේ අපරාධ
මකාදැමුව මැනව.
2 මාගේ කලෙසේ මලින් මා මුළුමනින් සෝදාලුව
මැනව;
q2 2 මාගේ පාප මලින් මා පිවිතුරු කළ මැනව.
3 මාගේ අපරාධ මම මැනැවින් දනිමි.
q2 3 දිවා රෑ දකේහි මාගේ පාප මට සිහි වේ.
4 රෝම 3:4 ඔබට විරුද්ධව, ඔබට පමණක් විරුද්ධ
ව මම පව් කළෙමේ;
q2 4 ඔබ හමුවහෙි මම නපුර කළෙමේ.
q2 4 එබැවින් ඔබේ තීන්දුව සාධාරණ ය;
q2 4 ඔබේ විනිශ්චය යුක්ති සහගත ය.
5 පවට නැම්ම ඇතිව යි, මා මලෙොව උපන්නේ;
q2 5 කලෙසේ මලින් යුතුව යි, මා මව් කුසේ
පිළිසිඳුණේ.
6 සත්යයට හා අවංක බවට ඔබ ප්රිය කරන
සේක.
q2 6 එබැවින් සැබෑ ප්රඥාව මට ඉගැන්නුව මැනව.
7 ආසිරි පැන් මට ඉසිනු මැනව;
q2 7 එවිට මම පිවිතුරු වන්නමේ.
q2 7 මා ධෝවනය කළ මැනව;
q2 7 එවිට මම හිමට වඩා සුදු වන්නමේ.
8 මා සිතට සතුට හා සොම්නස දුන මැනව;
q2 8 ඔබ තැළූ පළෙ මා කයට යළි සුව සතෙ දුන
මැනව.
9 මාගේ පවින් ඔබේ බැල්ම හරවා ගත මැනව;
q2 9 මාගේ සියලු අපරාධ මකා හැරිය මැනව.
10 දවේිඳුනි, මා තුළ නිර්මල සිතක් මවා වදාළ
මැනව;
q2 10 තිරසර නව ආධ්යාත්මයක් මට දුන මැනව.
11 ඔබ හමුයනේ මා පලවා නොහැරිය මැනව;
q2 11 ඔබේ ශුද්ධාත්මය මා කරෙනේ ඉවත් නොකළ
මැනව.
12 විමුක්තියේ ප්රීතිය මට යළි දුන මැනව;
q2 12 අවනත සිතක් දී මා දැරුව මැනව.
13 එවිට මම අපරාධකරුවන්ට ඔබ මඟ පහදා
දනේනමේ;

q2[13] පව්කරුවන් ඔබ වෙත හරවාගෙන එන්නෙමි.
14 දෙවිඳුනි, මා ගැළවුම්කාර දෙවිඳුනි, මිනී මැරීමේ
අපරාධයෙන් මා මුදාලුව මැනව.
q2[14] එවිට ඔබේ දැහැමි ක්‍රියා ගැන මම උස්
හඬින් ගීත ගයන්නෙමි.
15 සමිඳුනි, ගී ගැයුමේ වරම මට දුන මැනව.
q2[15] එවිට මා මුවින් ඔබ පැසසුම් ගයන්නෙමි.
16 ඔබ පුද පඬුරුවලට රිසි නැත;
q2[16] ඔබ ඒවාට රිසි නම්, මම ඒවා ඔබට
පුදන්නෙමි.
q2[16] දවන යාග පූජාවලට ද ඔබ රිසි නොවන
සේක.
17 දෙවිඳුන් ප්‍රිය පඬුර නම්, බිඳුණු හදවතකි.
q2[17] දෙවිඳුනි, ඔබ තැළුණුබිඳුණු සිතක් ඉවත
නොදමන සේක.
18 සියොන් ගිරට ඔබ කරුණාව පා සතෙ සැලසුව
මැනව;
q2[18] ජෙරුසලමේ කොටු පවුරු යළි ඉදි කළ මැනව.
19 එකල, දවන යාග පූජා වන නියමිත පඬුරුවලට
ඔබ ප්‍රිය වන සේක.
q2[19] එවිට ඔබේ පුදසුන මත ඔව්හු ගව පූජා
පුදන්නෝ ය.

## දුෂ්ටකමේ දුර්විපාක

*දාවිත්ගේ සංගීතයකි. ඒදොමීය ජාතික දොවෙගේ
නමැත්තා පැමිණ, "දාවිත් අබිමලෙක්ගේ
ගෙදරට ඇතුළු වී ය"යි සාවුල්ට දැන් වූ පසු
දාවිත් විසින් ලියන ලද්දකි.*

52 1 සාමු 22:9-10 එම්බා බලවන්තය!
q2
52 ඔබේ දුෂ්ටකම ගැන පාරට්ටු කරගන්නේ මන්
ද?
q2
52 දෙවියන් වහන්සේගේ කරුණාව සදහට ම
පවත්නේ ය.
2 දවස පුරා නිතර ම දුෂ්ට සිතුවිලි සිතන්නේ මන්
ද?
q2[2] ඔබේ දිව මුවහත් දැළි පිහියක් බඳු ය;
q2[2] ඔබ කපටිකමට රුසියකේ වන්නහෙි ය.
3 යහපතට වඩා අයහපතට ඔබ ආලය කරන්නහෙි
ය.
q2[3] ඇත්තට වඩා බොරුවට ඔබ ප්‍රිය වන්නහෙි ය.
4 එම්බා කපටි දිව!
q2[4] විනාශකාරී සෑම වචනයකට ම ඔබ ප්‍රිය
වන්නහෙි ය.
5 දෙවිඳාණෝ ඔබ සදහට ම නසා, වනසාදමන
සේක;
q2[5] එතුමාණෝ ඔබ කූඩාරම්වලින් ඇද දමා, ජීවතුන්
අතරෙන් ඔබ උදුරාදමන සේක.
6 එවිට දැහැමියෝ බියෙන් මේ දේ නරඹන්නෝ ය;
q2[6] ඔහුගේ විපත ගැන සිනාසමින් මෙසේ
පවසන්නෝ ය:
7 "දෙවි තුමන් සරණ කොට නොගන්න මිනිසා
මොහු ය;
q2[7] තම සම්පත කෙරෙහි විශ්වාසය තබමින්
දුෂ්ටකම සරණ කොටගත් තැනැත්තා මොහු ය."
8 මම වනාහි දෙවි විමනෙහි සරුසාර ඔලීව ගසක්
මෙන් වන්නෙමි.
q2[8] දෙවි පෙමෙ තුළ සදහට ම විශ්වාසය තබන්නෙමි.
9 ඔබ එසේ කළ බැවින් මම සදහට ම ඔබ
පසසන්නෙමි.
q2[9] ඔබේ සැදැහැවතුන් අබිමුව ඔබේ නම යහපත්
ය.
q2[9] එබැවින් මම එය පතුරා හරින්නෙමි.

## අභක්තික මිනිසා

*දාවිත් ලියූ සංගීතයකි.*
53 රෝම 3:10-12 අඥානයා, "දෙවි කෙනෙක්
නැත"යි සිතින් සිතන්නේ ය.
q2
53 එසේ සිතන්නෝ, දූෂිත, පිළිකුල්, අපරාධ
කරන්නෝ ය.
q2
53 යහපත කරන කිසිවකේ නැත.
2 සුරලොව සිට දෙවිඳාණෝ නරලොව
නරඹන සේක.
q2[2] එසේ ය, දෙවිඳුන් සොයා යන නුවණැති අය
ඇද්දැ යි එතුමාණෝ විමසන සේක.
3 සියලු දෙනා නපුරට වැටී ඇත;
q2[3] එක ලෙස දූෂණය වී ඇත.
q2[3] යහපත කරන්නකේ නැත;
q2[3] ඇත්තේ ම නැත.
4 අහරක් බුදින ලෙස මාගේ සෙනඟ කාදමන,
දෙවිඳුන් නොඅයදින, අපරාධ කරන අයට කිසි ම
දැනුමක් නැද් ද?
5 පෙරෙ නොවූ විරූ බියකින් ඔව්හු බියට පත් වූ හ.
q2[5] ඔබ වැටලූ සතුරන්ගේ ඇටකටු දෙවිඳාණෝ
විසුරුවා හැරිය සේක.
q2[5] එතුමාණන් ඔවුන් ප්‍රතික්ෂේප කළ බැවින්
ඔව්හු අවමන් ලැබූ හ.
6 සියොන් කන්දෙන් ඉශ්‍රායලේවරුන්ගේ විමුක්තිය
පැමිණියොත් කොතරම් යහපත් ද?
q2[6] දෙවිඳුන් සිය සෙනඟට සැප සම්පත් සලසා දුන්
විට,
q2[6] ජාකොබ්ගේ සෙනඟ ප්‍රීති ප්‍රමෝද වන්නෝ
ය;
q2[6] ඉශ්‍රායලේ ජනතාව ප්‍රීති සන්තෝෂ වන්නෝ
ය.

## අන්තරායෙන් මිදීමට යැදුමක්

*දාවිත්ගේ සංගීතයකි. සිප්වරුන් පැමිණ,
"බලන්න, දාවිත් අප අතර සැඟවී සිටින්නේ
ය"යි සාවුල්ට කී පසු දාවිත් විසින් ලියන ලද
අනුශාසනාවකි.*

54 1 සාමු 23:19; 26:1 අහෝ දෙවිඳුනි, ඔබ
නාමයේ අනුහසින් මා මුදාලුව මැනව;
q2
54 ඔබ බල මහිමයෙන් මා නිදහස් කළ මැනව;
2 දෙවිඳුනි, මාගේ යැදුමට සවන් දුන මැනව;
q2[2] මා පවසන වදනට ද සවන් දුන මැනව.
3 විදේශිකයෝ මට විරුද්ධ ව නැඟිට්ටෝ ය;
q2[3] සාහසිකයෝ මා මරන්නට සවෙවුවෝ ය.
q2[3] මාගේ අධිපතියාණන් දෙවිඳුන් බව ඔව්හු
නොපිළිගත්තෝ ය.
4 දෙවිඳාණෝ මාගේ සහායට වඩින සේක;
q2[4] සමිඳාණෝ මාගේ දිවියට රැකවරණය දෙන
සේක.
5 මාගේ සතුරන් මට කළ නපුර ඔවුන්ට ම පල දේ
වා!
q2[5] තම විශ්වාසවන්තකම නිසා එතුමාණෝ ඔවුන්
සහමුලින් ම වනසාලන සේක් වා!
6 තුටුපහටු සිතින් මම ඔබට පඬුරු පුදන්නමේ.
q2[6] සමිඳුනි, සැබැවින් ම ඔබ යහපත් බැවින් මම
ඔබේ නාමය පසසන්නමේ.
7 එතුමාණෝ සැම විපතින් මා මුදා ලූ සේක.
q2[7] මා දෙනෙතින් මා සතුරන්ගේ විපත දැක මම
සතොස් වන්නමේ.

## පීඩනයේ දී යැදුම

*දාවිත්ගේ සංගීතයකි.*

55 අහෝ දෙවිඳුනි!
q2
55 මාගේ යැදුමට සවන් දුන මැනව;
q2
55 මාගේ ඉල්ලීම පැහැර නොහැරිය මැනව.
2 මා කියන දේ සලකා පිළිතුරු දුන මැනව.
q2[2] මම කරදරයෙහි ගිලී සිටිමි.
3 සතුරාගේ ගෝරනාඩුවෙන් ද දුදනාගේ පීඩනයෙන්
ද මම තැතිගනිමි.
q2[3] ඔව්හු මා පිට කරදර පටවා මට සතුරුකම්
කරන්නෝ ය.
4 මාගේ හදවත ගැහි ගැහී ඇත්තේ ය;
q2[4] මරණ බිය මා ලුහුබැඳ එන්නේ ය.
5 භීතිය ද ත්‍රාසය ද මට තදින් පීඩා කරන්නේ ය;
q2[5] බියෙන් මාගේ ඇඟ කිලිපොළා යන්නේ ය.
6 අනේ!
q2[6] මටත් පරවියෙකුට මෙන් පියාපත් ඇත්නම්!
q2[6] එවිට මම පියාඹා ගොස් විවේකය ලබන්නමේ.
7 මම බොහෝ ඈතට ම පියාඹා යන්නමේ;
q2[7] පාළුකරයට ගොස් පදිංචි වන්නමේ.
8 සැඬ සුළඟින් සහ චණ්ඩ මාරුතයෙන් මම අහක්
ව යන්නමේ.
q2[8] මාගේ අභය භූමියට වහා ඉගිල යන්නමේ.
9 සමිඳුනි, ඔවුන්ගේ කතාව වියවුල් කළ මැනව.
q2[9] මන්ද, නුවර තුළ සැහැසිකම ද ආරාවුල ද මට
පෙනේ.
10 දිවා රෑ දෙකේහි ඒවා පවුරු මත සැරිසරන්නේ ය;
q2[10] එහි අපරාධය ද මැරවරකම ද ඇත්තේ ය.
11 නුවර මැද දුෂ්ටකම් බහුල ව ඇත්තේ ය.
q2[11] එහි වෙළෙඳ පොළෙහි ඇති අපරාධයට හා
වංචාවට කෙළවරක් නැත්තේ ය.
12 මට අපවාද කළෝ සතුරෝ නම්, එය මට ඉවසා
ගන්නට තිබුණේ ය;
q2[12] මට සතුරු ව නැඟිට සිටියෝ එදිරිකාරයෝ
නම්, මට ඔවුන්ගෙන් සැඟවෙන්නට තිබුණේ ය.
13 එසේ කෙළේ, මා හා සමාන කෙනෙකු වන ඔබ
ය;
q2[13] මාගේ හිත මිතුරා ද සහකාරයා ද ඔබ ය.
14 අපි එකට සතුටු සාමීචි කතාවේ යෙදුණෙමු;
q2[14] එකට දෙවි මැඳුරෙහි නමස්කාර කෙළෙමු.
15 අකාල මරණය සතුරන් පිට පැමිණේ වා!
q2[15] ඔව්හු පණපිටින් පාතාලයට යත් වා!
q2[15] මන්ද, ඔවුන්ගේ සිත්හි හා නිවසේහි දුෂ්ටකම
ඇත්තේ ය.
16 මම දෙවිඳාණන්ට හඬගසන්නමේ;
q2[16] සමිඳාණෝ මා ගළවන සේක.
17 උදය, මද්දහන හා සවස මාගේ මැසිවිලි කිය
කියා මම වැලපෙන්නේමේ.
q2[17] එතුමාණෝ මා හඬට සවන් දෙන සේක.
18 මට විරුද්ධ ව කරන ලද සටනින් එතුමාණෝ මා
මුදා මට සාමදානය දුන් සේක.
18 මන්ද, බොහෝ දෙනා මට විරුද්ධ ව සිටියෝ ය.
19 අතීතයේ සිට සිහසුන් අරා සිටින දෙවිඳාණෝ
මට සවන් දී පිළිතුරු දුන් සේක.
q2[19] මන්ද, මාගේ සතුරෝ නීතිය නොරකිති;
q2[19] දෙවිඳුන් හට ගරුබිය නොදක්වති.
20 සතුරා තම මිතුරා හට විරුද්ධ ව තම අත දිගු
කෙළේ ය;
q2[20] එසේ කොට, ඔහු ගිවිසුම කඩ කෙළේ ය.
21 බද්ධ වෛරය සිත තුළ පැසෙන නමුත්,
q2[21] ඔහුගේ කතාව වඬේරු මෙන් සුමුදු ය;
q2[21] ඔහුගේ වචන, තෙලට වඩා මොළොක් ය.
q2[21] එහෙතේ ඒවා, මුවහත් කඩු පහර මෙන් වූයේ
ය.
22 ඔබේ දුක් බර සමිඳුන් පාමුල තබන්න;
q2[22] එතුමාණෝ ඔබ ආරක්ෂා කරන සේක;
q2[22] සැදැහැවතුන්ගේ වැටීමට කිසි දා ඉඩ නොදෙන
සේක.
23 දෙවිඳුනි, ඔබ ඔවුන් වළ පත්ලට නරෙපා ලන
සේක.
q2[23] මිනීමරුවන් ද කපටියන් ද අඩු වයසින් මියයනු
ඇත.
q2[23] එහෙතේ දෙවිඳුනි, මම නම්, ඔබ කෙරෙහි
විශ්වාස කරන්නමේ.

## අනතුරේ දී දෙවිඳුන් කෙරෙහි විශ්වාසය

*පිලිස්තිවරුන් ගාත් නම් ස්ථානයේ දී දාවිත්*
*අල්ලාගත් පසු ඔහු ලියූ සලේ ලිපියකි.*

56 1 සාමු 21:13-15 දෙවිඳුනි, මට දයා වුව
මැනව.

q2
56 මිනිස්සු මා ලුහුබැඳ එන්නෝ ය;
q2
56 දවස පුරා ඔව්හු මට පීඩා කරන්නෝ ය.
2 සතුරෝ දවස පුරා මා ලුහුබැඳ එන්නෝ ය.
q2 2 මට එරෙහි ව කාෙපමණ අය සටන් කරන්නෝ
ද?
3 අතිඋතුම් දෙවිඳුනි, යම් දිනකෙ මම බිය වන්නමේ
ද?
q2 3 එදින මම ඔබ තුළ විශ්වාසය තබන්නමේ.
4 මම දෙවිඳුන්ගේ වචනය පසසන්නමේ;
q2 4 මම නාෙබිය ව, එතුමන් තුළ විශ්වාසය
තබන්නමේ.
q2 4 සතුරන් විසින් මට කරනු ලැබිය හැකි දයෙක්
ඇද් ද?
5 ඔව්හු දවස පුරා මට ගරහන්නෝ ය;
q2 5 ඔවුන්ගේ එක ම අදහස මට නපුරක් කිරීම
වන්නේ ය.
6 ඔව්හු කුමන්ත්‍රණය කරමින් සැඟවී සිට, මා යන
එන විට බලා සිටින්නෝ ය;
q2 6 මා වැනසීමට නිරතුරු බලා සිටින්නෝ ය.
7 ඔවුන්ගේ අපරාධයට විපාක දුන මැනව;
q2 7 අහෝ දෙවිඳුනි!
q2 7 උදහස් වී ඔබ ඒ ජනයා පරාජය කළ මැනව.
8 මාගේ කන්නලව්ව ඔබ ම සටහන් කළ මැනව;
q2 8 ඔබේ බඳුනහෙි මාගේ කඳුළු එකතු කළ මැනව;
q2 8 ඒවා ඔබේ පාෙතේ සටහන් වී නැද් ද?
9 මා ඔබ අයැදින දවසහෙි මාගේ සතුරෝ පසු බැස
යන්නෝ ය.
q2 9 දෙවිඳුන් මට පක්ෂ බව එවිට මම දැනගන්නමේ.
10 මම දෙවිඳුන්ගේ වචනය පසසන්නමේ;
q2 10 දෙවිඳුන්ගේ වචනය ගැන උදන් අනන්නමේ.
11 දෙවිඳුන් කෙරෙහි නාෙබිය ව මාගේ විශ්වාසය
තබන්නමේ;
q2 11 මිනිසා මට කුමන අනතුරක් කිරීමට සමත්
වන්නේ ද?
12 දෙවිඳුනි, ඔබට පාෙරාොන්දු වූ බාරහාර මම ඉටු
කරන්නමේ;
q2 12 ඔබට තුති පූජා පුදන්නමේ.
13 මන්ද, ඔබ, මා මරණින් මිදූ සේක.
q2 13 මාගේ පාද පැකිළීමනේ වැළැක්වූ සේක.
q2 13 එසේ කළෙේ, ජීවනාලාෝකයහෙි දෙවිඳුන්
අබියස මා හැසිරනෙ පිණිස ය.

## කුරිරු රුපුන් මැද විශ්වාසය

*දාවිත් සාවුල් ඉදිරියනේ ගුහාවට පලා ගිය පසු දාවිත් ගැයූ ගීතයකි.*
57 1 සාමු 22:1; 24:3 මට අනුකම්පා කළ
මැනව;
q2
57 අහෝ දෙවිඳුනි!
q2
57 මට අනුකම්පා කළ මැනව.
q2
57 මම ඔබ සරණ පතමි;
q2
57 විපත් කුණාටුව පහ වී යන තකේ, ඔබ
පියාපත් සවෙණහෙි මම රැකවරණය පතමි.
2 අතිඋතුම් දෙවිඳුන් හට මම හඬ ගසන්නමේ;
q2 2 මට සියල්ල සලසා දනෙ අතිඋතුම් දෙවිඳුන් හට
මම හඬ ගසන්නමේ.
3 මා පළෙන අයගනේ මා මුදාලීමට එතුමාණෝ
සගලාොවින් පිහිට එවන සේක.
q2 3 දෙවිඳාණෝ තමන් කරුණාවත්, සත්‍යතාවත්
එවන සේක.
4 මිනිසුන් කන සිංහයන් වැනි රුපුන් මැද මම වැතිර
සිටින්නමේ.
q2 4 උන්ගේ දත් හලේල හා ඊගස් වැන්න;
q2 4 උන්ගේ දිව් මුවහත් අසිපත් වැන්න.
5 දෙවිඳුනි, ඉහළින් වැඩ සිට ඔබේ ශ්‍රේෂ්ඨත්වය
දැක්වුව මැනව.
q2 5 ඔබේ මහිමාලංකාරය ලාෝව පුරා පැතිර
ඇත්තේ ය.
6 මා දුක් බරින් යට වූ විට මාගේ සතුරෝ මා
පයට දැලක් එළූ හ;
q2 6 මා වැටනෙ පිණිස කැණූ වළහෙි ඔව්හු ම
වැටුණෝ ය.
7 දෙවිඳුනි!
q2 7 මට අවල විශ්වාසයක් ඇත්තේ ය.
q2 7 මම ගී ගයා ඔබ පසසමි.
8 මාගේ හදවත, අවදි වන්න!
q2 8 එම්බා!
q2 8 කුඩා වීණාව, මහා වීණාව, පිබිදනේන!
q2 8 එවිට මම උදාහිරු අවදි කරන්නමේ.
9 සමිඳුනි!
q2 9 මම ජනතාව අතර ඔබ පසසමි;
q2 9 විජාතීන් අතර මම ඔබට ගී ගයමි.
10 ඔබේ කරුණාව සගලාෝව දක්වා නඟින්නේ ය.
q2 10 ඔබේ සත්‍යවාදිකම අහස උසට නැඟී ඇත්තේ
ය.
11 දෙවිඳුනි, අහසට වඩා ඔබේ ශ්‍රේෂ්ඨත්වය
උසස් බව දැක්වුව මැනව.
q2 11 ඔබේ මහිමාලංකාරය ලාෝව පුරා පැතිරේ වා!

## විනිසකරුවන්ගේ විනිසකරුවාණෝ

*දාවිත් ලියූ සලේ ලිපියකි.*
58 බලවතුනි, ඔබ සාධාරණ තීන්දු දනේනහු ද?
q2
58 නායකයනෙි, ඔබ යුතු ලසෙ සනෙඟ පාලනය
කරන්නහු ද?
2 එහතේ, ඔබ එසේ නාෙකර දුෂ්ට අදහස් සිත්හි
මවාගන්නහු ය;
q2 2 නීතියට පිටුපා සැහැසිකම් කරන්නහු ය.
3 දුදනෝ මවු කුස පටන් නාෙමඟ යන්නෝ ය;
q2 3 උපන් දා සිට ම ඔව්හු බාෙරු කියන්නෝ ය.

4 ඔවුන්ගේ වස විස සර්ප විස මෙන් වන්නේ ය.
q2 4 ඔව්හු කන් බිහිරි කරගත් පොළඟුන් වැනි ය.
5 එවැන්නෝ නයි නටවන්නන්ගේ හඬට කන්
නොදෙති;
q2 5 මතුරන්නන්ගේ මැතිරීමට සවන් නොදෙති.
6 අහෝ දෙවිඳුනි!
q2 6 ඔවුන්ගේ මුඛයේ දත් පොඩි කළ මැනව;
q2 6 මේ සිංහ පෝතකයන්ගේ දළ බිඳ දැමුව මැනව.
7 ඔව්හු වේගයෙන් ගලා යන වතුර මෙන් පහ ව
යත් වා!
q2 7 පයට පෑගුණ තණ මෙන් වියළී යත් වා!
8 සවෙලහෙි ම දිරා යන ගොළුබෙලේලන් මෙන්
ඔව්හු දිරා යත් වා!
q2 8 මියගිය කළල රූප මෙන් ඔව්හු ඉරු එළිය
නොදකිත් වා!
9 ඔව්හු මුලිනුපුටා දැමූ කටු පඳුරු මෙන් වතේ වා!
q2 9 කෝපයෙන් උදලුගා දැමූ වල් පැළෑටි මෙන් වතේ
වා!
10 පව්ටුන්ට දඬුවම් ලැබෙන විට දැහැමියා ප්‍රීති
ප්‍රමෝද වන්නේ ය.
q2 10 දුදන ලයෙින් ඔහු තම පා සෝදා ගන්නේ ය.
11 එවිට සනෙඟ මසෙේ කියති:
q2 11 “දැහැමියාට විපාකයක් සත්තට ම හිමි වන්නේ
ය;
q2 11 මිහි පිට යුක්තිය ඉටු කරන දවේඳාණෝ
සැබැවින් ම වැඩ සිටින සේක.”

### පිහිට පතා යැදුම

*දාවිත් මරණ පිණිස ගයෙ රැක සිටීමට සාවුල්*
*මිනිසුන් යැවූ පසු දාවිත් ලියූ ගීතයකි.*

59 1 සාමු 19:11 අහෝ මාගේ දවේඳුනි!
q2
59 මාගේ සතුරන්ගනේ මා මුදාගත මැනව;
q2
59 මට පහර දනෙ අයගනේ මා රැකගත මැනව.
2 නපුර කරන්නන්ගනේ මා මුදාගත මැනව;
q2 2 මිනී මරුවන්ගනේ මා ගළවාගත මැනව.
3 මාගේ ජීවිතය නැසීමට මාන බලා සිටින්නන් හා
මට සතුරු ව සැරසී සිටින්නන් දසෙ බැලුව මැනව.
q2 3 මා අත පාපයක් හා වරදක් නොවූවත්,
4 මා අපරාධයක් නොකළත්, ඔව්හු මට චෝදනා
කොට සටනට සැරසනේනෝ ය.
q2 4 සමිඳුනි, මාගේ සහායට පිබිද, මා දසෙ බැලුව
මැනව!
5 සමිඳුනි, සව් බලැති දවේඳුනි, ඉශ්‍රායලේ දවේඳුනි,
සියලු විජාතීන් හට දඬුවම් දීමට නැඟී සිටින සේක්
වා!
q2 5 දුෂ්ට ද්‍රෝහින් කිසිවකුෙට වත් දයාව
නොදක්වන සේක් වා!
6 ඔව්හු සවස් කාලය වන තකේ බලා සිටින්නෝ ය;
q2 6 ඉන්පසු ගොරවන සුනඛයන් මෙන් නුවර
සැරිසරන්නෝ ය.
7 ඔව්හු බරෙහන් දමේන් තියුණු කඩුපත් වැනි
කටුක වචන කියති;
q2 7 “ඒවා ඇසනෙ කිසිවකේ නැතැ”යි ඔව්හු සිතති.
8 එහතේ සමිඳුනි, ඔබ ඔවුන් ගැන සිනාසනෙ
සේක;
q2 8 ඔබ සියලු විජාතීන් සමච්චලයට පාත්‍ර කරන
සේක.
9 මාගේ සවිය වන ඔබ මම පසසමි.
q2 9 මන්ද, දවේඳාණෝ මාගේ බලකොටුව වන
සේක.
10 මට ප්‍රමේ කරන දවේඳාණෝ වඩින සේක;
q2 10 මාගේ සතුරන්ගේ පරාජය මට දැකගන්නට
සලසන සේක.
11 අහෝ දවේඳුනි!
q2 11 මා සනෙඟ නොපැකිළනෙ පිණිස සතුරන්
නොනැසුව මැනව;
q2 11 ඔබේ බලයනේ ඔවුන් සලිත කොට පහතට
හළෙුව මැනව.
q2 11 සමිඳාණෝ අපේ පලිහ වන සේක.
12 ඔවුන්ගේ මුවින් පිට වන පාපී බස් හා
තොල්වලින් පවසන පුරසාරම් නිසා ඔව්හු වරදට අසු
වතේ වා!
q2 12 උඩඟුවනේ වැනසතේ වා!
13 ඔබ කෝපාග්නියනේ ඔවුන් වනසත් වා!
q2 13 සහමුලින් ම ඔවුන් වනසත් වා!
q2 13 එවිට ඉශ්‍රායලේ දේශයේ සිට පොළොවේ
සීමාන්තය දක්වා දවේඳුන් පාලනය කරන බව ඔව්හු
දැනගන්නෝ ය.
14 ඔව්හු සවස් කාලය වන තකේ බලා සිටින්නෝ
ය;
q2 14 ඉන්පසු ගොරවන සුනඛයන් මෙන් නුවර
සැරිසරන්නෝ ය;
15 ඔව්හු ගොදුරු සොය සොයා සැරිසරන්නෝ ය;
q2 15 ඔව්හු සෑහීමට පත් නොවුවොත් ගොරවන්නෝ
ය.
16 ඔබේ බල මහිමය ගැන මම ගී ගයන්නමේ;
q2 16 ඔබේ තිර පමෙ ගැන හැම උදය ම මම හඬ
නඟා ගයන්නමේ.
q2 16 මන්ද, ඔබ මාගේ බලකොටුව වූ සේක;
q2 16 මාගේ විපතේ දී ඔබ මාගේ සරණය වූ
සේක.
17 මාගේ සවිය වන ඔබ මම පසසමි;
q2 17 මන්ද, දවේඳාණෝ මාගේ බලකොටුව වන
සේක.
q2 17 ඔබ මට ප්‍රමේ කරන සේක.

### පරාජයේ දී ජාතික යැදුමක්

*මයෙ ප්‍රසිද්ධ ආඥාවක් වශයනේ ඉගැන්වීමට*
*ය. මයෙ ඉගැන්විය යුතු දාවිත්ගේ සංගීතයකි.*
*දාවිත් ආරම්-නහරයිම් සහ ආරම්-ශෝබා නමැති*
*අය සමඟ සටන් කරන විට, ජෝවාබ් හැරී අවුත්*
*ලවණ නම් මිටියාවතේ දී ඒදොමිය*

*ජාතිකයන්ගෙනේ දාොළාොස් දහසකට පහර දුන් පසු මයෙ ලියන ලදී.*
60 2 සාමු 8:13; 1 වංශා 18:12 අහෝ දවේදුනි!
q2
60 ඔබ අප අත්හැර අප බලකාොටු බිඳදැමූ සේක;
q2
60 ඔබ උදහස් වූ සේක.
q2
60 අප වෙත යළි වැඩිය මැනව.
2 ඔබ දේශය කම්පා කරමින් එය දපෙළු කළ සේක;
q2 2 කඩා වැටී යන එහි කැඩුම්බිඳුම් අලුත්වැඩියා කළ මැනව.
3 ඔබ ජනතාවට දුක් විඳින්නට සැලැසූ සේක;
q2 3 වරෙමත් කරවන මිදියුස ඔබ අපට පවෙූ සේක.
4 ඔබට ගරුබිය පාන අයට ඔබ අනතුරු ඇඟවීමක් කළ සේක;
q2 4 එසේ කළෙේ, පැමිණනේනට යන විපතනේ පලා යන පිණිස ය.
5 ඔබට ප්‍රමේ කරන්නන් මිදනෙු පිණිස ඔබේ දකුණාතින් අපට ගැළවීම දුන මැනව;
q2 5 අපේ යැදුමට පිළිතුරු දුන මැනව.
6 දවේඳාණෝ සිය ශුද්ධස්ථානයනේ මසෙේ වදාළ සේක:
q2 6 "විජයශ්‍රීයනේ මම ෂකෙමේ නම් පදෙසෙ බදො දනේනමේ;
q2 6 සුක්කාොත් නම් මිටියාවත මැන වනේ කර දනේනමේ.
7 ගිලියද් සහ මනස්සේ යන රටවල් මාගේ ය;
q2 7 එප්‍රායිම් දේශය මාගේ හිස් වැස්ම වන්නේ ය;
q2 7 ජුදා පදෙසෙ මාගේ රාජකීය ජයකාොන්තය වන්නේ ය;
8 මෝවබ් පදෙසෙ මාගේ පා දෝවන බඳුන වන්නේ ය;
q2 8 මාගේ පාවහන් ඒදාොම් දේශයට වීසි කාොට එය අයිති කරගන්නමේ;
q2 8 පිලිස්තිය යටත් කාොට ජය සාෝෂා නඟන්නමේ."
9 කාොටු පවුරු ඇති පුරයට මා කැඳවාගනෙ යන්නේ කවරකේ ද?
q2 9 ඒදාොම් දේශයට මා ජය පරෙහරින් ගනෙයන්නේ කවරකේ ද?
10 අහෝ දවේදුනි!
q2 10 ඔබ අප සමඟ කෝප වී සිටින සේක් ද?
q2 10 අප සේනාවන් සමඟ ඔබ නාොවඩින සේක් ද?
11 එදිරිකරුට විරුද්ධ ව ඔබ අපට සහාය දානය කළ මැනව.
q2 11 මන්ද, මිනිසාගේ උපකාරය නිෂ්ඵල වන්නේ ය.
12 දවේදුන්ගේ සහාය ඇති ව අපි වීරයන් මනේ සටන් කරන්නමෙු;
q2 12 එතුමාණෝ ම අපේ එදිරිකරුවන් පයින් පාගාදමන සේක.

### විප්‍රවාසගත වූවකෙුගේ යැදුම

*දාවිත්ගේ ගීතයකි.*
61 අහෝ දවේදුනි!
q2
61 මාගේ මාොරගැසීම ඇසුව මැනව;
q2
61 මාගේ යැදුමට සවන් දුන මැනව.
2 මාගේ සිතහෙි දිරිය සුන් වන කල පාතාල ලාොව ගැටියේ සිට මම ඔබට හඬගසමි.
q2 2 මට නැඟිය නාොහැකි පර්වතයකට මා ගනෙ ගිය මැනව.
3 මන්ද, ඔබ තුමාණෝ මාගේ සරණය වූ සේක;
q2 3 සතුරාට එරහෙි ව සවි බලකාොටුවක් වූ සේක.
4 මම ඔබේ නිවසෙහෙි සදහට ම වාසය කරන්නමේ;
q2 4 ඔබේ පියාපත් සවෙණහෙි සරණ ලබන්නමේ.
5 අහෝ දවේදුනි!
q2 5 ඔබ මාගේ බාර භාරවලට සවන් දුන් සේක.
q2 5 ඔබේ නාමයට ගරුබිය පාන අයගේ උරුමය මට දුන් සේක.
6 රජතුමන්ගේ ආයු වැඩි කළ මැනව!
q2 6 එතුමන්ගේ ජීවිත කාලය චිරාත් කාලයක් පවතී වා!
7 ඒ රජ දවේදුන් අබියස සදහට සිහසුන අරා වැඩ සිටී වා!
q2 7 එතුමා ආරක්ෂා කරනු වස් ඔබ තිර පමේන් සත්‍යතාව එතුමාට ප්‍රදානය කරන සේක් වා!
8 එවිට මම නිතර ම ඔබේ නාමයට පැසසුම් ගී ගයන්නමේ;
q2 8 දිනනේ දින පාොරාොන්දු ඉටු කරන්නමේ.

### මිනිසාගේ එක ම බලාපාොරාොත්තුව

*දාවිත්ගේ ගීතයකි.*
62 මාගේ සිතට සහනය ඇත්තේ දවේදුන් තුළ පමණකි;
q2
62 මට ගැළවීම ලැබනේනේ එතුමාණන්ගනේ පමණකි.
2 මාගේ පර්වතයත්, ගැළවීමත්, බලකාොටුවත් එතුමාණෝ පමණකි;
q2 2 එබැවින් මම නාොසැලී සිටින්නමේ.
3 මම ඇල වුණ බිත්තියක් ද සලෙවනෙ තාප්පයක් ද වැනි මිනිසකේ වමේ;
q2 3 ඔබ කාොපමණ කල් මට තාඩන පීඩන කරන්නහු ද?
4 උසස්කමනේ ඔහු නරෙපාදැමීමට ඔව්හු උපා යාොදති;
q2 4 බාොරු කීමට ප්‍රිය වති;
q2 4 මුවින් ආසිරි පතන නමුත්, සිතින් සාප කරති.
5 මාගේ සිතට සහනය ඇත්තේ දවේදුන් තුළ පමණකි;

q2[5] මට ගැළවීම ලැබෙන්නේ එතුමාණන්ගෙනේ පමණකි.
6 මාගේ පර්වතයත්, ගැළවීමත්, බලකොටුවත් එතුමාණෝ පමණකි;
q2[6] එබැවින් මම නොසැලී සිටින්නෙමේ.
7 මාගේ ගැළවීමත්, මාගේ මහිමයත් දෙවිඳුන්ගෙනේ ය;
q2[7] මාගේ ශක්තිය රඳා ඇති පර්වතයත්, සරණත් එතුමාණෝ ය.
8 ජනයෙනි, දෙවිඳාණන් තුළ සැමදා විශ්වාසය තබන්න;
q2[8] එතුමාණෝ අප සරණය වන සේක.
q2[8] එතුමාණන් අබිමුව ඔබේ දුක්ගැනවිලි පවසන්න.
9 පහළ පෙළේ අය සුළං රොදකි;
q2[9] ඉහළ පෙළේ අය මායාවකි;
q2[9] කිරා බලන විට දපෙක්ෂය ම සැහැල්ලු ය.
q2[9] සුළං රොදකටත් වඩා සැහැල්ලු ය.
10 බලහත්කාරකම කෙරෙහි විශ්වාසය නොතබන්න;
q2[10] කොල්ලකාගත් දේ ගැන සිත යොමු නොකරන්න;
q2[10] වස්තුව වැඩි වුණත් ඊට ඇලුම් නොවන්න.
11 දෙවිඳුන් මෙසේ පැවසූ බව මා බොහෝ වර අසා ඇත.
q2[11] එනම්, 'බලය දෙවිඳුන් සතු ය;
12 ජෝබ් 34:11; ජෙරෙ 17:10; මතෙ 16:27; රෝම 2:6; එළිද 2:23 සමිඳුනි, තිර පෙමෙ ඔබ සතු ය.
q2[12] මන්ද, මිනිසා කළ කළ දේ අනුව ඔබ විපාක දෙනෙ සේක' යනු යි.

## දෙවියන් වහන්සේට ආශා වීම

*ජුදා දේශයේ පාළුකරයේ දී දාවිත් ලියූ ගීතයකි.*

63 1 සාමු 23:14 දෙවිඳුනි, මාගේ දෙවිඳුනි, දැඩි ආශාවෙනේ මම ඔබ සොයෙන්නෙමේ.
q2
63 මා හද ඉතා ගිජු ලෙසෙ ඔබ කෙරෙහි පිපාසයෙනේ පෙළෙන්නේ ය.
q2
63 වියළි බිම ජලයට පිපාසා වන පරිදි මම ඉතා ආශාවෙනේ ඔබ වෙතෙ ඇදී යන්නෙමේ.
2 ඔබේ ශුද්ධස්ථානයේ දී මම ඔබ දෙසෙ ඕනෑකමින් බලා සිටින්නෙමේ.
q2[2] ඔබේ බලය ද මහිමාලංකාරය ද නරඹන්නෙමේ.
3 ඔබේ තිර පෙමෙ මාගේ ජීවිතයටත් වඩා මට අගනේ ය;
q2[3] මාගේ මුව ඔබට ප්‍රශංසා කරන්නේ ය.
4 මුළු ජීවිතයේ දී ම මම ඔබට ප්‍රශංසා කරන්නෙමේ;
q2[4] ඔබේ නාමයෙනේ අයැදිමින් මම ඔබ දෙසෙට දෑත නඟන්නෙමේ.
5 රස මස'වුලින් මෙනේ මම සෑහීමට පත් වන්නෙමේ;
q2[5] මා මුවින් තුති ගී ගයා මම ඔබ පසසන්නෙමේ.
6 යහනේදීත් මම ඔබ ගැන සිතන්නෙමේ;
q2[6] රෑ යාමවල දී ඔබ ගැන මෙනෙහි කරන්නෙමේ.
7 මන්ද, ඔබ වහන්සේ මාගේ ආධාරය වූ සේක.
q2[7] ඔබේ පියාපත් සෙවණෙහි මම ප්‍රීති වන්නෙමේ.
8 ම සිතෙහි ඔබ කෙරෙහි තද ඇල්මක් ඇත;
q2[8] ඔබ දකුණතින් මා උසුලන සේක.
9 මා වනසනු වස්, මා සොය සොයා සිටින අය ඇත;
q2[9] ඔව්හු පාතාල ලෝකයේ පත්ලට ම යත් වා!
10 ඔව්හු කඩු මුවහතින් පහර කත් වා!
q2[10] ඔවුහු සිවලුන්ට ගොදුරු වතේ වා!
11 එහෙතේ, රජ තමෙ දෙවිඳුන් තුළ ප්‍රීති ප්‍රමෝද වන්නේ ය.
q2[11] මුසා දොඩන්නවුන්ගේ මුව පියවෙනෙ විට සමිඳුන් නමින් දිවුරන්නෝ ප්‍රීතිමත් වන්නෝ ය.

## ගරහන්නන්ට ලැබෙනෙ දඬුවම

*දාවිත්ගේ ගීතයකි.*

64 දෙවිඳුනි, මා පැමිණිලි කරන විට මා හඬට කන් දුන මැනව;
q2
64 මේ භයානක සතුරන්ගෙනේ මාගේ ජීවිතය ආරක්ෂා කළ මැනව.
2 දුෂ්ටයන්ගේ උපායවලින් මා රැකගත මැනව;
q2[2] කලහකාරී සෙනඟගෙනේ මා ආරක්ෂා කළ මැනව.
3 ඔව්හු අසිපත් මෙනේ තමන්ගේ දිව් මුවහත් කරගනිති;
q2[3] ඔව්හු ඊගස් මෙනේ පරුෂ වචන විදිති.
4 ඔව්හු සැඟවී සිට නිදොස් අයට විදින්නෝ ය;
q2[4] අනතුරු ඇඟවීමක් නොකර හදිසියෙනේ විදින්නෝ ය.
5 දුෂ්ට අරමුණු සඳහා ඔව්හු එකිනෙකොට අනුබල දෙන්නෝ ය;
q2[5] ඔවුන්ගේ උගුල කොතැන සඟවා අටවන්න දැ යි සාකච්ඡා කරන්නෝ ය.
q2[5] "අප දකින කෙනෙකේ නැතැ"යි ඔව්හු සිතන්නෝ ය.
6 "අපේ අපරාධ සොයා ගත හැක්කේ කවරකුට ද?
q2[6] අපි කෙරොට්ක ලෙසෙ උගුලක් ඇටවීමු."
q2[6] මන්ද මනුෂ්‍යයාගේ සිතුවිලි හා අභ්‍යන්තරය ඉතා ගැඹුරු බැවිනි.
7 දෙවිඳාණෝ ඔවුන්ට ඊගසින් විදින සේක;
q2[7] අනතුරු ඇඟවීමක් නොකර හදිසියෙනේ ඔවුන්ට තුවාළ කරන සේක.
8 අති උත්තමයාණෝ මුසා දොඩන්නන් වනසන සේක.
q2[8] ඔවුන් දකින සියල්ලෝ හිස් වනන්නෝ ය.
9 මිනිසුන් සැම දෙනෙ බිය වී දෙවිඳුන්ගේ ක්‍රියා ප්‍රකාශ කරන්නෝ ය.
q2[9] "එතුමාණන් එසේ කළේ කුමක් නිසා දැ"යි
q2[9] ඔව්හු සිතන්නෝ ය.

10 දැහැමියා, සමිඳුන් තුළ ප්‍රීති ප්‍රමෝද වී
එතුමාණන් සරණ සොයා යන්නේ ය;
q2 10 අවංක සිතැති තැනැත්තා ප්‍රීතියෙන් පිරී
යන්නේ ය.

### විමුක්ති යැදීම හා වැණීම

*දාවිත්ගේ ගීතයකි.*

65 සියොන්හි දෙවිඳුනි, ඔබට පැසසුම් හිමි ය.
q2

65 අපි ඔබට බාරහාර ඔප්පු කරන්නමෝ.
2 මන්ද, ඔබ අපගේ යැදුමට සවන් දෙන සේක.
q2 2 සියල්ලෝ තම තමන්ගේ පව් නිසා ඔබ වෙත
ආ යුත්තෝ ය.
3 අපගේ පව්කම් අපට ඉසිලිය නොහැකි ය;
q2 3 ඔබ තුමාණන් ඒවාට කමා වුව මැනව.
4 ඔබගේ රජ මැඳුරෙහි වසන පිණිස ඔබ තෝරාගත්
තැනැත්තා කොපමණ වාසනාවන්ත ද?
q2 4 ඔබගේ දෙවි මැඳුර වන ඔබගේ නිවසෙහි යහපත්
දයෙන් අප සෑහීමට පත් කළ මැනව.
5 ගැළවුම්කාර දෙවිඳුනි, ඔබගේ ප්‍රබල ක්‍රියා මඟින්
අප ගළවාගත මැනව;
q2 5 මුළු පොළොවේ ද ඈත සමුදුරේ ද
බලාපොරොත්තුව ඔබ වන සේක.
6 ඔබ තුමාණෝ සවිය යොදා කඳු හලේ පිහිටවූ
සේක;
q2 6 ඔබ බලපරාක්‍රමය නමැති ඉඟ පටියෙන්
සැරසුණු සේක.
7 සමුදුරු ගිගුරුම් ද රළ ගොස ද ඔබ නිසල කළ
සේක;
q2 7 ජනයාගේ ආරාවුල් සමථයට පත් කළ සේක.
8 මිහි පිට සියල්ලෝ ඔබ පෑ ලකුණු දැක බියෙන්
තැතිගෙන සිටින්නෝ ය;
q2 8 නැඟී එන උදයට ද බැස යන සවසට ද
ප්‍රීතියෙන් මොරගසන්නට ඔබ සැලැසූ සේක.
9 ඔබ පොළොව දෙස බලා, එයට වැහි වස්වා, එය
සරුසාර කරන සේක.
q2 9 අහස් ගඟ දිය දහරින් පිරී ඇත.
q2 9 ඔබ පොළොව මෙසේ පිළියෙළ කොට ධාන්‍ය
සපයා දෙන සේක.
10 එහි හීවිට් බොහෝ සේ දියෙන් පොඟවා පස්
පිඩලි සමතලා කරන සේක.
q2 10 ඒ පිට බහුල ව වැසි වස්වා, පොළොව බුරුල්
කර එහි වගාවට ආසිරි දෙන සේක.
11 ඔබ වැසි වස්වා රට සරුසාර කරවන සේක;
q2 11 ඔබ සැරිසරන තැන සාරත්වය උතුරා යන්නේ
ය.
12 පාළුකරයේ තණ බිම සරුසාර වනු ඇත;
q2 12 කඳු හලේ ප්‍රීතියෙන් උදම් අනනු ඇත.
13 තණ බිම එළු බැටළු පට්ටිවලින් පිරී ඇත.
q2 13 මිටියාවත් ධන ධාන්‍යයෙන් සපුරාලන සේක.
q2 13 ඒවා ප්‍රීතියෙන් කුල්මත් වී ගී ගයයි.

### ජනතාව දෙවිඳුන් පැසසීම

*ගීතයකි.*

66 ලෝ වැසි සියල්ලෙනි, දෙවිඳුන් හට ප්‍රීති
සෝෂා පවත්වන්න.
2 එතුමන්ගේ කීර්තිමත් නාමයට ගී ගයන්න.
3 දෙවි තුමන්ට මෙලෙසෙ කියන්න:
q2 3 "ඔබගේ ක්‍රියා කොපමණ බියජනක ද?
q2 3 ඔබගේ බලපරාක්‍රමය අතිමහත් ය.
q2 3 එබැවින් ඔබගේ සතුරෝ ඔබ අබිමුව බියෙන්
මිරිකෙන්නෝ ය.
4 ලෝ වැසි සියල්ලෝ ඔබ නමදින්නෝ ය;
q2 4 ඔබට ගී ගයා ඔබගේ නම පසසන්නෝ ය.
5 එන්න, දෙවිඳුන්ගේ පුදුම ක්‍රියා නරඹන්න.
q2 5 එතුමන්ගේ ක්‍රියා මිනිසුන් අතර බියජනක ය.
6 නික්ම 14:21; ජෝෂු 3:14-17 එතුමාණෝ මුහුද
වියළි බිමක් කළ සේක.
q2 6 සෙනඟ එය මැදින් පයින් ගමන් කළෝ ය.
q2 6 එබැවින් එතුමන් තුළ අපි ප්‍රීති ප්‍රමෝද
වන්නමෝ.
7 එතුමාණෝ බලපරාක්‍රමයෙන් සදහට ම ලොව
පාලනය කරන සේක;
q2 7 එතුමාණෝ විජාතීන් දෙස නතේ යොමා බලන
සේක.
q2 7 කිසි ම කැරලිකරුවෙක් එතුමන්ට එරෙහි ව
නොනැඟිටී වා!
8 ජනතාවෙනි, අපගේ දෙවිඳුන් හට ආසිරි පතන්න;
q2 8 එතුමන් වෙත නඟන පැසසුම පතුරුවා හරින්න.
9 එතුමාණෝ ජීවතුන් අතර අප රැක ගත් සේක;
q2 9 අපගේ පාද නොපැකිළෙන්නට සැලැසූ සේක.
10 අහෝ දෙවිඳුනි!
q2 10 ඔබ අප පරීක්ෂා කළ සේක;
q2 10 රිදී සෝදිසි කරන පරිදි ඔබ අප සෝදිසි කළ
සේක.
11 ඔබ අප දැලට අසු කරගත් සේක;
q2 11 අපගේ කර පිට තද බර පැටවූ සේක.
12 අප පාගා දැමීමට අප සතුරන් හට ඔබ ඉඩ දුන්
සේක;
q2 12 අපි ගිනි මැදින් ද ජලය මැදින් ද ගියමෝ.
q2 12 එහෙත්, ඔබ අප සුරැකි බිමට ගෙනා සේක.
13 දවන යාග පූජා රැගෙන මම ඔබගේ නිවාසයට
ඇතුල් වන්නමේ;
q2 13 මාගේ බාරහාර මම ඔබට ඔප්පු කරන්නමේ.
14 මාගේ තොල්වලින් මම ඒ බාරහාර ප්‍රකාශ
කළෙමේ;
q2 14 මම මාගේ විපතේ දී මා මුවින්
q2 14 ඒවා උච්චාරණය කළෙමේ.
15 දැවෙන බැටළු පැටවුන්ගේ සුවඳ දුම් සමඟ
තරබාරු සතුන්ගෙන් දවන යාග පූජා පුදන්නමේ.
q2 15 මම ගවයන් ද එළුවන් ද පුදන්නමේ.
16 දෙවිඳුන් නමදින සියල්ලෙනි!
q2 16 එන්න, සවන් දෙන්න.

q2 16 එවිට එතුමාණන් මට කළ දේ මම කියා
දන්නෙමේ.
17 මා මුවින් මම එතුමන්ට මොරගැසුවෙමේ;
q2 17 මාගේ දිවනේ එතුමන්ගේ මහිමය ඉහළින්
වර්ණනා කළෙමේ.
18 වරදට මා හද තුළ ආශාවක් තිබේ නම්, මා
සමිඳාණෝ මට කවදාවත් සවන් නොදෙන සේක.
19 එහෙත්, දෙවිඳාණෝ මට සවන් දුන් සේක;
q2 19 මාගේ අයැදුම් හඬ ද සලකා බැලූ සේක.
20 දෙවිඳුන්ට ප්‍රශංසා වේ වා!
q2 20 මාගේ අයැදුම එතුමාණෝ ඉවත නොදැමූ
සේක;
q2 20 සිය පමේන් මා ඈත් නොකළ සේක.

### අස්වැන්න ගීයක්

*කාව්‍යයකි; ගීතයකි.*

67 දෙවිඳාණෝ අප වෙත දයාව පනේවමින්
අපට ආශීර්වාද කරන සේක් වා!
q2
67 ස්වකීය මුහුණ අප කෙරෙහි බබළවන සේක්
වා!
2 එවිට මුළු ලොව ඔබගේ කැමැත්ත දැනගන්නෝ ය;
q2 2 සියලු විජාතීහු ඔබගේ ගැළවීමේ බලය
දැනගන්නෝ ය.
3 අහෝ දෙවිඳුනි, ජනතාවෝ ඔබ පසසත් වා!
q2 3 සියලු ජාතීහු ඔබ පසසත් වා!
4 ඔබ සාධාරණ ලෙස මිනිසුන් විනිශ්චය කරන
සේක;
q2 4 මිහි පිට සියලු විජාතීන් හට ඔබ මඟපනේවන
සේක;
q2 4 එබැවින් සකල ජනයා ප්‍රීතිමත් ව සතුටින් ගී
ගයත් වා!
5 අහෝ දෙවිඳුනි, ජනතාවෝ ඔබ පසසත් වා!
q2 5 සියලු ජාතීහු ඔබ පසසත් වා!
6 පොළොව පලදාව බහුල ව නිපදවිය;
q2 6 දෙවිඳාණෝ, අපගේ දෙවිඳාණෝ, අපට ආසිරි දුන්
සේක.
7 අපගේ දෙවිඳාණෝ අපට ආසිරි වස්වන සේක් වා!
q2 7 පොළෝ වැසි සියල්ලෝ එතුමන්ට ගරු කරත්
වා!

### ජයග්‍රාහී ජාතික ගීයක්

*දාවිත්ගේ ගීතයකි, කාව්‍යයකි.*

68 දෙවිඳාණෝ නැඟිට සතුරන් විසුරුවා හරින
සේක.
q2
68 එතුමන්ට වෛර කරන්නෝ එතුමන් ඉදිරියෙනේ
පලා යන්නෝ ය.
2 සුළඟට ගසාගෙන යන දුමක් මෙනේ එතුමාණෝ
ඔවුන් පහකරන සේක;
q2 2 ගිනි ළඟ දිය වන ඉටි මෙනේ දෙවිඳුන් අබිමුව
දුදනෝ වැනසී යත් වා!
3 එහෙත්, දැහැමියෝ දෙවිඳුන් අබිමුව ප්‍රීති
ප්‍රමෝද වෙත් වා!
q2 3 ප්‍රීතියෙනේ තුල්මත් වී ගී ගයත් වා!
4 දෙවිඳුන්ට ගී ගයන්න;
q2 4 එතුමන්ගේ නම කියා එතුමන් පසසන්න.
q2 4 වලාකුළු අරා වඩින සමිඳුන් හට මාවතක්
පිළියෙළ කරන්න;
q2 4 එතුමන්ගේ නාමය සමිඳාණෝ ය, එතුමන්
අබිමුව ප්‍රීතියෙනේ සිටින්න.
5 එතුමාණෝ, අනාථයන්ගේ පියාණෝ ද
වැන්දඹුවන්ගේ ආරක්ෂකයාණෝ ද වන සේක.
q2 5 සිය ශුද්ධ නිවාසයෙහි වසන එතුමාණෝ
දෙවිඳාණෝ ය.
6 දෙවිඳාණෝ අනාථ වූවන්ට නිවසේ තනා දෙන
සේක;
q2 6 හිරකරුවන්ට නිදහස දෙන සේක;
q2 6 එහෙත්, කැරලිකරුවන් මරුකතරේ විසීමට හරින
සේක.
7 අහෝ දෙවිඳුනි!
q2 7 සෙනඟට පෙරටුවෙනේ ඔබ ගමන් කළ සේක;
q2 7 කාන්තාරය ඔස්සේ යුද පෙරහැරින් ඔබ වැඩිය
සේක.
8 නික්ම 19:18 පොළොව කම්පා විය, අහසින් වැසි
වැස්සේ ය;
q2 8 ඉශ්‍රායලේවරුන්ගේ දෙවිඳුන් අබිමුව සීනයි
කන්ද පවා කම්පනය විය.
9 අහෝ දෙවිඳුනි!
q2 9 ඔබ බහුල ව වැසි වස්වන සේක;
q2 9 ඔබගේ උරුමය මැලවී යන විට ඔබ එය යළි
සාරවත් කළ සේක.
10 ඔබගේ සෙනඟ එහි පදිංචි වූ හ;
q2 10 අහෝ දෙවිඳුනි!
q2 10 එහි දිළිඳුන් හට උවමනා දේ ඔබ සපයා දුන්
සේක.
11 සමිඳාණෝ අණ දුන් සේක.
q2 11 බොහෝ දූතයෝ ආරංචිය පතුරුවා හළහ.
12 රජවරු ද ඔවුන්ගේ සේනාවෝ ද පලා යන්නෝ
ය;
13 බැටළු රූළ රකිමින් ගෙදර සිටින බවලත්හු
කොල්ලය බෙදා ගන්නෝ ය.
q2 13 ඒ කොල්ලයේ රිදී කොබෙයි රූප විය.
q2 13 අත්තටු පව්ච පාට රනින් ද ඔප දමා තිබුණේ
ය.
14 සර්ව බලැති දෙවිඳාණෝ සල්මොන් කන්ද පිට
රජුන් විසුරුවා හැරිය සේක;
q2 14 එවිට ඔබ එහි හිම වැටෙනේනට සැලැසූ සේක.
15 බාෂාන් කන්ද අති උස් කන්දකි;
q2 15 එය බොහෝ ශිඛර ඇති කන්දකි.
16 එම්බා ශිඛර බහුල කන්ද!
q2 16 දෙවිඳාණන් තමන් නිවසෙ ලෙස තෝරාගත්
කන්ද දෙස ඔබ ඊර්ෂ්‍යාවෙනේ බලන්නේ මන් ද?
q2 16 සමිඳාණෝ සදහට ම එහි වාසය කරන සේක.
17 යුද්ධ රථ දසදහස් ගණන් සමඟ සමිඳාණෝ
සීනයි කන්දෙනේ ශුද්ධස්ථානයට වඩින සේක.

18 එපී 4:8 එතුමාණෝ අල්ලාගත් සිරකරුවන් උස්
කන්දට ගෙන ගිය සේක.
q2[18] කැරලිකරුවන්ගෙන් පඬුරු ලැබූ සේක.
q2[18] දෙවි සමිඳාණෝ සදහට ම එහි වාසය කරන
සේක.
19 දවසින් දවස අපගේ බර උසුලන සමිඳුන් හට
පැසසුම් වේ වා!
q2[19] එතුමාණෝ අප ගළවන දෙවිඳාණෝ වන
සේක.
20 අපගේ දෙවිඳාණෝ, අප ගැළවුම්කාර දෙවිඳාණෝ
වන සේක;
q2[20] අප මරණින් මුදන දෙවි සමිඳාණෝ වන සේක.
21 දෙවිඳාණෝ සතුරන්ගේ හිස් පොඩි කරදමන
සේක;
q2[21] පව්වූ මඟහෙි ඇලී ගැලී සිටින අයගේ හිස්
ගසාදමන සේක.
22 සමිඳාණෝ මෙසේ වදාරන සේක:
q2[22] "මම බාෂාන් දේශයෙන් ඔබේ සතුරන් ආපසු
ගෙනෙන්නෙමේ;
q2[22] සමුදුර පත්ලෙන් ඔවුන් ආපසු ගෙනෙන්නෙමේ.
23 එවිට ඔබේ පාද ඔවුන්ගේ ලෙයින් සෝදාගත
හැකි වන්නේ ය;
q2[23] ඔබේ බල්ලෝ සතුරන්ගේ ලේ ඕනෑ පමණ
ලෙව කන්නෝ ය."
24 දෙවිඳුනි, සියල්ලෝ ඔබේ ජය පෙරහර
දකින්නෝ ය;
q2[24] සිය ශුද්ධස්ථානයට යන මඟ මාගේ දෙවි
රජිඳුන්ගේ ගමන නරඹන්නෝ ය.
25 ගායකයෝ පෙරටුවෙන් ද සංගීතකරුවෝ
පසුපසින් ද යන්නෝ ය;
q2[25] ලලනාවෝ සිඟිති රබන් පොඩි ගසමින් මැදින්
ගමන් කරන්නෝ ය.
26 සභාව තුළ දෙවිඳාණන් පසසන්න.
q2[26] ඉශ්රායලේ ජනතාවෙනි, සමිඳාණන් පසසන්න.
27 කුඩා ම පළෙපත වන බෙන්ජමින්ගේ පළෙපත
මුලින් ම ගමන් කරන්නෝ ය.
q2[27] ඉන්පසු ජුදාගේ ද සාබුලොන්ගේ ද
නප්තලීගේ ද කුමරුවෝ ගමන් කරන්නෝ ය.
28 දෙවිඳුනි!
q2[28] ඔබේ ශක්තිය දැක්වුව මැනව.
q2[28] දෙවිඳුනි, ඔබ අප උදෙසා දැක්වූ බලය පෑව
මැනව.
29 ජෙරුසලමෙහි ඇති ඔබේ මන්දිරය නමින් රජවරු
පඬුරු ගෙනෙවුත් ඔබට පුදන්නෝ ය.
30 රජවරුන් යටහත් වී රිදී පඬුරු ගෙනෙන තෙක්,
q2[30] බට ගස් අතර සිටින වන සතා වන මීසරයට ද
ඔහුගේ පැටවුන් සහිත වන ගව රැළ වන විජාතීන්ට
ද තරවටු කළ මැනව.
q2[30] සටනට ලැදි වන සියලු සෙනඟ විසුරුවා හැරිය
මැනව.
31 මීසරයෙන් තානාපතීහු නික්ම එන්නෝ ය;
q2[31] එතියෝපියාව දෙවිඳුන් වෙත අයැදිමින් අත් දිගු
කරන්නේ ය.
32 මුළු ලොවෙහි රාජ්යයෙනි, දෙවිඳුන් හට ගායනා
කරන්න;
q2[32] සමිඳුන් හට පසස් ගී ගයන්න.
33 ආදි කාලීන අහස් තලයෙනි, අහස් කුස සැරිසරන
හිමි තුමන්ට ගායනා කරන්න;
q2[33] එතුමන්ගේ හඬ වන ගිගුරුම් හඬට සවන්
දෙන්න.
34 දෙවිඳුන්ගේ බලය ප්රකාශ කරන්න.
q2[34] එතුමන්ගේ මහිමය ඉශ්රායලේ කෙරෙහි ය;
q2[34] එතුමන්ගේ බලය අහස් කුස ඇත්තේ ය.
35 සිය ශුද්ධස්ථානයෙහි වසන දෙවිඳාණෝ
බියජනක ය;
q2[35] එතුමාණෝ ඉශ්රායලේවරුන්ගේ දෙවිඳාණෝ ය.
q2[35] එතුමාණෝ සෙනඟට බලය ද ශක්තිය ද දෙන
සේක.
q2[35] දෙවිඳුන්ට පැසසුම් වේ වා!

## විලාප ගීයක්

*දාවිත්ගේ ගීතයකි.*

69 අනේ දෙවිඳුනි!
q2
69 මා මුදාලුව මැනව.
q2
69 කුමක් නිසා ද, දිය කඳ මාගේ ගලෙ දක්වා
නැඟී ඇත්තේ ය.
2 මම පය තැබීමට තැනක් නොමැති මඩ
ගොහොරුවේ කිඳා සිටිමි;
q2[2] මම ගැඹුරු දියට පැමිණ සිටිමි.
q2[2] රළපතර මා යට කර උඩින් ගලා යයි.
3 මොරගැසීමෙන් මා විඩාපත් ව මාගේ උගුර වියළී
ඇත්තේ ය.
q2[3] මාගේ දෙවිඳුන් ගැන බලා සිටීමෙන් දෙනෙත
අඳුරු වී ඇත්තේ ය.
4 ගීතා 35:19; ජොහ 15:25 නිකරුණේ මට වෛර
කරන්නන්ගේ ගණන මාගේ ඉසකෙස්වලටත් වඩා
වැඩි ය.
q2[4] මුසා දොඩමින් මා වනසන්නට බලන අය
බලවත් ය.
q2[4] එබැවින් මා සොරා නොගත් දේ ආපසු දෙන්න
ඔව්හු මට බල කරන්නෝ ය.
5 අනේ දෙවිඳුනි!
q2[5] ඔබ මාගේ මෝඩකම දන්න සේක.
q2[5] මාගේ වැරදි ඔබෙන් සැඟවී නැත්තේ ය.
6 සව් බලැති මහෝත්තම දෙවි ස්වාමීනි, ඔබ
කෙරෙහි බලාපොරොත්තුව තබන්නෝ මා නිසා
ලජ්ජාවට පත් නොවෙත්වා!
q2[6] ඉශ්රායලේවරුන්ගේ දෙවිඳුනි, ඔබ සොයන්නෝ
මා නිසා නින්දාවට නොපැමිණෙත් වා!
7 ඔබ තුමන් උදෙසා මම අපවාදයට ලක් වුණෙමේ.
q2[7] මාගේ මුහුණ ඒ ලජ්ජාවෙන් වැසී ඇත්තේ ය.
8 මාගේ සොහොයුරන්ට මම නාඳුනන්නෙක් වීමි;
q2[8] මාගේ මවගේ පුත්රයන් හට මම
විදේශිකයෙක් වීමි.

9 ජොහ 2:17; රෝම 15:3 ඔබගේ දෙව්මැඳුරට ඇති
උද්යෝගය මා දවන්නේ ය.
q2[9] ඔබට නින්දා කරන්නන්ගේ නින්දා මා පිට පැටවී
ඇත්තේ ය.
10 එබැවින් මා කඳුළු සලමින් උපවාස කරන විට
සෙනඟ මට නින්දා කරන්නෝ ය.
11 ගෝණි රෙදිදනේ මාගේ වස්ත්‍ර මම සාදාගතිමි.
q2[11] එවිට මම ඔවුන්ගේ සමච්චලයට ලක් වුණෙමි.
12 මඟ තොටේ කට කතාව මා ගැන ය;
q2[12] බේබද්දෝ මා ගැන අවමන් කවි කියන්නෝ ය.
13 එහෙත් සමිඳුනි, මාගේ අයැදුම ඔබට ය.
q2[13] අනේ දෙවිඳුනි!
q2[13] ඔබ රිසි වේලාවක මට පිළිතුරු දුන මැනව!
q2[13] ඔබේ අධික ප්‍රේමයෙනේ ඔබ දුන් ගැළවීමේ
පොරොන්දුව ඉටු කරන නිසා, මට උත්තර දුන
මැනව!
14 මට එරී යන්න නොදී මඩ වගුරෙනේ මා මුදාගත
මැනව!
q2[14] මාගේ සතුරාගෙනේ ද ගැඹුරු ජලයෙනේ ද මා
මුදාගත මැනව!
15 රළ පතරට මම යට නොවෙමේ වා!
q2[15] ගැඹුරු සමුදුරට මම ගොදුරු නොවෙමේ වා!
q2[15] පාතාලය මුව අයා මා ගිල නොගනී වා!
16 සමිඳුනි, ඔබේ තිර පෙමෙ යහපත් බැවින් මට
පිළිතුර දුන මැනව!
q2[16] ඔබේ ඉමහත් දයාව අනුව ඔබේ මුහුණ මා
වෙත හැරවේව මැනව!
17 ඔබේ දාසයා වෙතින් ඔබ මුහුණ ඉවතට
නොගත මැනව!
q2[17] මා විපතට පත් ව සිටින බැවින් යුහු ව මට
පිළිතුරු දුන මැනව!
18 මා වෙත ළඟා වී මා ගළවාගත මැනව;
q2[18] සතුරන්ගෙනේ මා මුදාගත මැනව!
19 මාගේ නින්දාව ද ලජ්ජාව ද අපකීර්තිය ද ඔබ
දන්න සේක;
q2[19] ඔබ මාගේ සියලු සතුරන් දන්න සේක.
20 නින්දාව නිසා මාගේ සිත බිඳී ගොස් මම
ශෝකයෙනේ පිරී සිටිමි.
q2[20] සනසන්නකු සෙවුවෙමේ;
q2[20] එවැන්නකේ නො වී ය.
q2[20] අස්වසන්නකු සෙවුවෙමේ;
q2[20] කිසිවකේ සම්බ නො වී ය.
21 මතෙ 27:48; මාක් 15:36; ලූක් 23:26; ජොහ
19:28-29 සාගින්නේ දී ඔව්හු මට වහ දුන්නෝ ය;
q2[21] පිපාසයේ දී ඔව්හු මට තිත්ත කාඩි බොන්න
දුන්නෝ ය.
22 රෝම 11:9-10 ඔවුන්ගේ කෑම මේසය ඔවුන්ට
ම මලපතක් වේ වා!
q2[22] ඔවුන්ගේ මංගල උත්සව ඔවුන්ට මර උගුලක්
වේ වා!
23 නොපෙනෙන ලෙස ඔවුන්ගේ ඇස් අඳුරු වේ වා!
q2[23] ඔවුන්ගේ ඉඟටිය නිබඳ සැලේ වා!
24 ඔබේ කෝපය ඔවුන් පිට වැගිරවේව මැනව!
q2[24] ඔබේ කෝපාග්නියට ඔව්හු යටපත් වෙත් වා!
25 ක්‍රියා 1:20 ඔවුන්ගේ කඳවුරු පාළු වන්නට
සැලසුව මැනව!
q2[25] ඔවුන්ගේ කූඩාරම් තුළ කිසිවකේ නොවෙසෙත්
වා!
26 මන්ද, ඔබ පහර දුන් තැනැත්තාට ඔව්හු පීඩා
කළෝ ය.
q2[26] ඔබ තුවාළ කළ තැනැත්තාගේ වේදනාව ඔව්හු
තව තවත් වැඩි කළෝ ය.
27 එබැවින් අපරාධ පිට අපරාධ ඔවුන් පිට පැවරුව
මැනව!
q2[27] ඔබේ ධර්මිෂ්ඨකමට ඔවුන්ට හවුල් වන්නට
ඉඩ නුදුන මැනව!
28 නික්ම 32:32; එළිද 3:5; 13:8; 17:8 ජීවතුන්ගේ
පොතෙනේ ඔවුන්ගේ නාම මකාදැමුව මැනව!
q2[28] දැහැමියන්ගේ නාම අතරෙනේ ඔවුන්ගේ නාම
කපාදැමුව මැනව!
29 එහෙත්, මම පීඩා විඳිමින් වේදනාවෙනේ සිටිමි.
q2[29] අනේ දෙවිඳුනි!
q2[29] මා සනසා, මා ගළවා ගත මැනව!
30 එවිට මම ගී ගයා දෙවිඳුන් පසසන්නෙමේ;
q2[30] තුති ගී ගයමින් මම එතුමන් බොහෝ සේ
පසසන්නෙමේ.
31 ගවයකු පිදීමට වඩා මෙවැන්නක් සමිඳුන්ට
ප්‍රසන්න වන්නේ ය.
q2[31] අං සහ කුර සහිත ගොනෙකු පිදීමට වඩා එය
ප්‍රසන්න වන්නේ ය.
32 පීඩිතයෝ මෙය දැක ප්‍රීති ප්‍රමෝද වන්නෝ ය;
q2[32] දෙවිඳුන් සොයා යන්නෝ දිරිමත් වන්නෝ ය.
33 මන්ද, සමිඳාණෝ දිළිඳුන් හට සවන් දෙන සේක;
q2[33] හිරගත වී සිටින තම සෙනඟ අත් නොහරින
සේක.
34 අහසත්, පොළොවත් උන් වහන්සේට ප්‍රශංසා
කරත් වා!
q2[34] මුහුදත්, එහි හැසිරෙන සියල්ලෝත් එතුමන්ට
ප්‍රශංසා කරත් වා!
35 දෙවිඳාණෝ සියොන් කන්ද මුදාගෙන ජුදාගේ
නගර ගොඩනඟන සේක.
q2[35] එතුමන් සෙනඟ එහි වසමින් එය භුක්ති
විඳින්නෝ ය.
36 එතුමන්ගේ සේවක පළෙපත එය උරුම
කරගන්නෝ ය.
q2[36] දෙවි නමට පෙමේ කරන්නෝ එහි වාසය
කරන්නෝ ය.

### විපතේ දී මොරගැසීම

*දාවිත්ගේ ගීයකි; සැමරීම පිණිස ය.*

70 අනේ දෙවිඳුනි!
q2
70 මා මුදාගත මැනව!
q2
70 අනේ සමිඳුනි!
q2

70 මට සහාය වීමට ඉක්මන් වුව මැනව!
2 මා නැසීමට සොයන්නෝ ලජ්ජා වී වියවුල්
වත්වා!
q22 මාගේ විනාශයට ආශා වූවෝ පසු බැස
අපකීර්තියට පැමිණෙත්වා!
3 "හහා, හහා" කියමින් මට සමච්චල් කරන්නෝ
තමන්ට වන නින්දාව නිසා පසු බසිත්වා!
4 ඔබ සොයා එන්නෝ ප්‍රීති ප්‍රමෝදයෙන් සතුටු
වෙත්වා!
q24 ඔබ දෙන විමුක්තියට ප්‍රේම කරන්නෝ
'දෙවිඳාණෝ ශ්‍රේෂ්ඨ ය'යි නිතර ම කියත්වා!
5 එහෙත්, මම දිළිඳු ය;
q25 අසරණ ය.
q25 අනේ දෙවිඳුනි!
q25 මා වෙත කඩිනමින් වඩිනු මැනව!
q25 අනේ සමිඳුනි!
q25 ඔබ මාගේ පිහිට ද ගැළවුම්කරු ද වන බැවින්
පමා නොවුව මැනව!

## මහල්ලකුගේ අයැදුම

71 අහෝ සමිඳුනි!
q2
71 සරණ පතා මම ඔබ වෙත පැමිණියෙමි.
q2
71 කිසි කලක මා ලජ්ජාවට පත් නොකළ මැනව!
2 ඔබේ සාධාරණකම නිසා මට පිහිට වී මා
මුදාලුව මැනව!
q22 මට සවන් දී මා ගැළවුව මැනව!
3 ඔබ මාගේ පර්වතය ද බලකොටුව ද වන බැවින්
ඔබ මට රැකවරණය දෙන පර්වතයක් වුව මැනව!
q23 මා මුදාලන බලකොටුවක් වුව මැනව!
4 මාගේ දෙවිඳුනි!
q24 දුෂ්ටයන්ගේ බලයෙන් මා මුදාගත මැනව;
q24 අපරාධකරුගේ ද දුදනාගේ ද ග්‍රහණයෙන් මා
මිදුව මැනව!
5 මහෝත්තම දෙවි ස්වාමීනි, ඔබ මාගේ
බලාපොරොත්තුව වන සේක.
q25 සමිඳුනි, මාගේ තරුණ වියේ සිට මාගේ
විශ්වාසය මම ඔබ තුළ තැබුවෙමි.
6 උපන් දා සිට ඔබ මට පිහිට වූ සේක;
q26 මවු කුසේ සිට ඔබ මා රැකගත් සේක.
q26 මම ඔබ ගැන නිරතුරු ප්‍රශංසා කරන්නෙමි.
7 මම වනාහි බොහෝ දෙනෙකුට ගැටලුවක් මෙන්
වූයෙමි.
q27 මන්ද, ඔබ මාගේ බලවත් රක්ෂස්ථානය වූ
සේක.
8 මාගේ මුඛය ඔබ පැසසීමෙන් පිරී ඇත්තේ ය.
q28 මම දවස පුරා ඔබ මහිමය ප්‍රකාශ කරන්නෙමි.
9 මහලු වියේ දී මා ඉවත් නොකළ මැනව;
q29 මාගේ ශක්තිය පිරිහෙන කල මා අත්
නොහැරිය මැනව!
10 මාගේ සතුරෝ මට විරුද්ධ ව කතා කරන්නෝ
ය.
q210 මගේ පණ නැසීමට බලා සිටින්නෝ එකට
කුමන්ත්‍රණය කරන්නෝ ය.
11 "දෙවිඳාණෝ ඔහු අත්හැරිය සේක.
q211 ඔහු ගැළවීමට කිසිවකු නැති බැවින් අපි ඔහු
ලුහුබැඳ අල්ලාගනිමු"යි ඔව්හු කියන්නෝ ය.
12 මාගේ දෙවිඳුනි!
q212 මාගෙන් ඈත් නුවුව මැනව!
q212 අනේ මාගේ දෙවිඳුනි!
q212 මට සහාය වීමට කඩිනමින් වැඩිය මැනව!
13 මට පහර දෙන්නෝ පරාජය වී වැනසෙත්වා!
q213 මට හානි කරන්නට සොයන්නෝ ලජ්ජාවටත්,
අපකීර්තියටත් පැමිණෙත්වා!
14 එහෙත්, මම නිරතුරු ඔබ බලාපොරොත්තුවෙන්
සිටින්නෙමි;
q214 නිතර ම වැඩි වැඩියෙන් ඔබට ප්‍රශංසා
කරන්නෙමි.
15 දවස පුරා ඔබේ සාධාරණ ක්‍රියා ද ඔබේ
විමුක්තිදායක ක්‍රියා ද මා මුවින් ප්‍රකාශ කරමි.
q215 මන්ද, මම ඒවායේ ප්‍රමාණය නොදන්නෙමි.
16 දෙවි සමිඳුනි, ඔබේ බල මහිමය මම
පසසන්නෙමි, ඔබේ ම, එසේ ය ඔබේ ම
යහපත්කම මම ප්‍රකාශ කරන්නෙමි.
17 අනේ දෙවිඳුනි!
q217 මාගේ තරුණ වියේ සිට ඔබ මට උගන්වා
වදාළ සේක.
q217 මම අද දක්වා ඔබේ පුදුමාකාර ක්‍රියා
වර්ණනා කළෙමි.
18 අනේ දෙවිඳුනි!
q218 පැසුණු කෙස් සහිත ව මහලු වියේ සිටින මා
අත්නෑරිය මැනව.
q218 ඔබේ මහිමය සහ ශක්තිය මතු පරම්පරාවලට
කියා පාන තෙක් මා සමඟ සිටිය මැනව.
19 අනේ දෙවිඳුනි!
q219 ඔබේ දැහැමිකම අහස දක්වා උසස් ය.
q219 ඔබ ප්‍රබල ක්‍රියා කළ සේක.
q219 ඔබට සමාන අන් කෙනෙක් නැත්තේ ය.
20 ඔබ මට බොහෝ කරදර සහ වේදනා
පැමිණෙවූ නමුත්, මා යළි ප්‍රාණවත් කරන සේක.
q220 පාතාලයේ පත්ලෙන් ඔබ මා යළි ගොඩගන්න
සේක.
21 ඔබ මා උසස් කරන සේක.
q221 ඔබ මා නැවත සනසන සේක.
22 මාගේ දෙවිඳුනි!
q222 මම කුඩා වීණාවෙන් ඔබ ද ඔබේ
විශ්වාසවන්තකම ද පසසන්නෙමි.
q222 ඉශ්‍රායෙල්වරුන්ගේ ශුද්ධ තැනැන් වහන්ස,
මහා වීණාවෙන් මම ඔබට ගී ගයන්නෙමි.
23 මම ඔබට ගී ගයමින් ප්‍රශංසා කරන්නෙමි;
q223 ඔබ මා මිදූ බැවින් මම ඔබට හද පත්ලෙන් ගී
ගයන්නෙමි.
24 දවස පුරා මම ඔබේ දැහැමි ක්‍රියා ගැන කතා
කරන්නෙමි.
q224 මන්ද, මාගේ විනාශය සොයන්නන් ලජ්ජාවටත්,
වියවුලටත් පත් කර ඇත.

### රාජකීය ස්තෝත්‍රයක්

*සලමොන් රජුගේ ගීතයකි.*

72 දෙවිඳුනි, රජතුමාට ඔබගේ විනිශ්චය කිරීමේ ඥානය දුන මැනව!
q2
72 රජ කුමරු හට යුක්තිගරුක ව ක්‍රියා කිරීමට ඔබගේ හැකියාව දුන මැනව!
2 එවිට එතුමා ඔබේ ජනතාව සාධාරණ ලෙසෙ
පාලනය කරන්නේ ය.
q2 2 ඔබේ පීඩිත ජනතාවට යුක්තිය ඉටු කරන්නේ
ය.
3 කඳු වැටි ඔබේ ජනතාවට සමෘද්ධිය ගෙනේ වා!
q2 3 කඳුහෙලේ ඔබේ ජනතාවට යුක්තිය ඉටු කෙරේ
වා!
4 රජ තෙමේ ජනතාව අතර දිළිඳුන්ගේ නඩු විසඳා
වා!
q2 4 අසරණයන් මුදාගනී වා!
q2 4 පීඩාකරුවන් වනසා වා!
5 ඉර හඳ පවතින තාක් ඔබේ ජනතාව ඔබට
නමදිත් වා!
q2 5 පරපුරෙන් පරපුරට ම එලෙසෙ කරත් වා!
6 කැපූ තණ කෙතේ මත වර්ෂාව මෙන් රජ තෙමේ
වැජඹේ වා!
q2 6 වියළි බිම මත වැසි මෙන් නිරිඳු වඩී වා!
7 එතුමන් සමයෙහි දමිටු බව දියුණු වේ වා!
q2 7 ඉර හඳ පවතින තෙක් සාමය පැතිරේ වා!
8 සකෙරි 9:10 මුහුදින් මුහුදට එතුමාගේ රජ දහන
පැතිරේ වා!
q2 8 යුප්‍රටීස් නදියේ සිට පොළොවේ කෙළෙවර
දක්වා එසේ ම වේ වා!
9 එතුමන් අබිමුව මරුකතර වැසියෝ වැඳ
වැටෙන්නෝ ය;
q2 9 එතුමාගේ සතුරෝ මුණින්තළා වී වැඳ
වැටෙන්නෝ ය;
10 තාර්ෂිෂ්හි සහ ද්වීපවල රජවරු එතුමාට කප්පම්
ගෙවන්නෝ ය;
q2 10 ෂබා සහ සේබාහි රජවරු පඬුරු පුදන්නෝ ය;
11 එතුමන් අබිමුව රජවරු වැඳ වැටෙන්නෝ ය;
q2 11 සියලු ජාතීහු එතුමාට මෙහෙ කරන්නෝ ය.
12 එතුමා සහන පතා මොරගසන අසරණයන්
මුදාගත්තේ ය;
q2 12 පිහිට නැති පීඩිතයන් ද නිදහස් කරගත්තේ ය.
13 එතුමා, දුගී දුප්පතුන්ට හා දුබලුන්ට අනුකම්පා
කරන්නේ ය;
q2 13 දිළිඳුන්ගේ ජීවිත මුදාගත්තේ ය.
14 එතුමා, අයුතු පීඩනයෙන් හා සැහැසිකමෙන්
ඔවුන් ගළවන්නේ ය;
q2 14 ඔවුන්ගේ ජීවිත අගය කොට සලකන්නේ ය.
15 එතුමා චිරාත් කාලයක් ජීවත් වේ වා!
q2 15 ෂබාහි රත්රන් එතුමාට පුදනු ලැබේ වා!
q2 15 නිරතුරු එතුමා උදෙසා අයැදුම් කරනු ලැබේ වා!
q2 15 දවස පුරා ආසිරි පතනු ලැබේ වා!
16 කඳු මත ගොයම් ලළෙ දේ වා!
q2 16 ධාන්‍ය බහුල ව ඉතිරේ වා!
q2 16 ලෙබනොන්හි මෙන් පලදාව සරුසාර වේ වා!
q2 16 කෙතේ තණ මෙන් වැසියන්ගෙන් නගර සපිරේ
වා!
17 එතුමාගේ නාමය සදහට ම පවතී වා!
q2 17 ඉර හඳ පවතින තෙක් එතුමාට කීර්තිය අත්
වේ වා!
q2 17 එතුමා අතින් සව් සත ආසිරි ලබත් වා!
q2 17 සියලු ජාතීහු එතුමාට සව්සිරි පතත් වා!
18 ඉශ්රායලේවරුන්ගේ දෙවිඳුන් හට, දෙවි සමිඳුන්
හට, පැසසුම් වේ වා!
q2 18 අරුමපුදුම දේ කරන්නේ එතුමාණෝ පමණක්
ය.
19 එතුමන්ගේ ශ්‍රී නාමයට සදා පැසසුම් වේ වා!
q2 19 එතුමන්ගේ මහිමය ලොව පුරා පැතිරේ වා!
q2 19 එසේ ම වේ වා! එසේ ම වේ වා!
20 ජෙස්සේගේ පුත් දාවිත්ගේ යැදුම මෙසේ
අවසන් වේ.

## තුන් වන කාණ්ඩය

(ගීතා 73—89)

### යුක්තියේ ජයග්‍රහණය

*ආසාප්ගේ ගීතයකි.*

73 අහෝ ඉශ්රායලේවරුනි!
q2
73 නිර්මල සිත් ඇත්තන් හට දෙවිඳාණෝ කොපමණ යහපත් ද?
2 මා මොහොතකින් ලිස්සා යන්න තිබිණි.
q2 2 මාගේ පය ලිස්සන්නට විය.
3 එසේ වූයේ, දුදනන්ගේ අභිවෘද්ධිය මා දැක
ඔවුන්ගේ පාරට්ටු නිසා මා ඔවුන්ට ඊර්ෂ්‍යා කළ විට
ය.
4 ඔවුන් හට දුක් ගැහැට නැත්තේ ය.
q2 4 ඔවුන්ගේ කය නිදුක් නිරෝගී ව ඇත්තේ ය.
5 අන් අයට මෙන් ඔවුන්ට කම්කටොලු කිසිත්
නැත්තේ ය.
q2 5 අන් අය මෙන් ඔව්හු තාඩන පීඩන
නොලබන්නෝ ය.
6 එබැවින්, ඔව්හු අහංකාරකම ගෙලෙ පළඳනාවක්
මෙන් ද බලහත්කාරය වස්ත්‍රයක් මෙන් ද පැළඳ
සිටින්නෝ ය.
7 ඔවුන්ගේ නෙතේ අහංකාරයෙන් ඉදිමී ඇත්තේ ය.
q2 7 ඔවුන්ගේ සිත් නිෂ්ඵල සිතුවිලිවලින් පිරී
ඇත්තේ ය.
8 ඔව්හු අන් අයට සිනාසෙන්නෝ ය;
q2 8 නපුරු දේ ගැන කතා කරන්නෝ ය;
q2 8 අහංකාරයෙන් ඉදිමී අන් අයට පීඩා කිරීමට
සිතන්නෝ ය.
9 ඔව්හු සුරලොව දෙවිඳුන්ට විරුද්ධ ව නපුර කතා
කරන්නෝ ය.

q29 ඔව්හු නරලොව මිනිසුන්ට අහංකාර ලෙසෙ අණ
දෙන්නෝ ය.
10 එබැවින්, දේව සෙනඟ පවා ඔවුන් වෙත
හැරෙන්නෝ ය.
q210 ඔවුන් කියන සෑම දෙයක් ම මහා ආශාවෙන්
විශ්වාස කරන්නෝ ය.
11 ඔව්හු කතා කොට, "දෙවිඳාණෝ කෙසේ දන්න
සේක් ද?
q211 මහෝත්තමයාණන්ට දැනුමක් ඇත්තේ දැ"යි
විමසන්නෝ ය.
12 දුදනන් දෙස බලන්න;
q212 ඔවුන්ට විපුල සම්පත් ඇත.
q212 ඒවා තවතවත් ඔව්හු වැඩි කරගන්නෝ ය.
13 මා සිත නිර්මල ව තබාගත්තේත්, පවින් මා දුරු
ව සිටියේත් නිකරුණේ ය.
14 දෙවිඳුනි, ඔබ මට දවස පුරා පීඩා විඳීමට සැලැසූ
සේක;
q214 ඔබ මට උදයක් උදයක් පාසා දඬුවම් කළ
සේක;
15 "මම මෙසේ කතා කරන්නෙමි"යි ඔවුන් මෙන්
කියන්නට මට තිබුණේ ය.
q215 එසේ කළෙමි නම්, ඔබේ ජනතාවට
ද්‍රෝහියෙකු වන්නට මට ඉඩ තිබිණි.
16 මම මේ ගැටළුව තේරුම්ගන්නට තැත් කළෙමි.
q216 එහෙත්, මට එය ඉතා දුෂ්කර විය.
17 ශුද්ධස්ථානයට ඇතුළු වන තෙක් එය මට දුෂ්කර
ගැටළුවක් විය.
q217 එහි ඇතුළු වූ පසු දුදනන්ගේ අවසන් ඉරණම
මම තේරුම්ගතිමි.
18 ඇත්තට ම ඔබ ඔවුන් විනාශයට පත් කරන
සේක.
q218 පාතාල ලෝකයට ඔවුන් හෙළාදමන සේක.
19 ඔව්හු සැණෙකින් වැනසී යන්නෝ ය.
q219 තැතිගෙන අන්ත විනාශයට ම වැටී යන්නෝ ය.
20 ඔව්හු, අවදි වූ විට අමතක වී යන සිහිනයක්
බඳු ය.
q220 අහෝ සමිඳුනි!
q220 ඔබ පිබිදෙන කල ඔව්හු මායා මෙන් මැකී
යන්නෝ ය.
21 මාගේ සිත කලකිරුණේ ය;
q221 මට වේදනා දැනෙන්නට විය.
22 එවිට මම වැටහීමක් නැති මෝඩයෙකු මෙන්
වූයෙමි.
q222 ඔබ අබිමුව තිරිසනෙකු බවට පත් වුණෙමි.
23 එහෙත්, නිරතුරු මම ඔබ සමඟ සිටියෙමි.
q223 ඔබ මා දකුණතින් අල්ලාගත් සේක.
24 ඔබේ උවදෙසින් ඔබ මට මඟපෙන්වන සේක.
q224 පසු ව ඔබ මට ගරු සම්මාන දී මා පිළිගන්න
සේක.
25 ඔබ හැර සුරලොව මට සිටින්නේ කවරකේ ද?
q225 ඔබ ඇති විට නරලොව කිසිවකුට මම ලොල්
නොකරමි.
26 මාගේ ගත සිත කමෙනේ වැහැරයෙි;
q226 එහෙත්, දෙවිඳාණෝ මාගේ ශක්තිය ද උරුමය
ද වන සේක.
27 ඔබ අත්හැර දමන්නෝ සැබැවින් ම වැනසී
යන්නෝ ය;
q227 ඔබට ද්‍රෝහි වූවන් ඔබ වනසන සේක.
28 මාගේ පරමානන්දය දෙවිඳුන් හට සමීප ව සිටීම
ය.
q228 ඔබේ ක්‍රියා සියල්ල ප්‍රකාශ කරන පිණිස
මම මහෝත්තම දෙවි ස්වාමීන් සරණ කොටගතිමි.

## ජාතියේ විලාපයක්

*ආසාප්ගේ ගීතයකි.*

74 අහෝ දෙවිඳුනි!
q2
74 ඔබ සදහට ම අප අත්හරින්නේ මන් ද?
q2
74 ඔබේ තණ බිම්හි බැටළුවන්ට විරුද්ධ ව ඔබේ
උදහස නඟින්නේ මන් ද?
2 පෙරෙ කල ඔබට ම තෝරාගත්, උරුම වංශය
කරගන්න පිණිස වහල්කමින් මුදාගත්,
q22 ඔබේ සෙනඟ සිහි කළ මැනව.
q22 ඔබේ නිවාසය වූ සියොන් කන්ද සිහි කළ
මැනව.
3 නිමක් නැති මේ නටබුන් ගොඩ මතු පිටින් දෙ
පා නැඟුව මැනව.
q23 අපේ සතුරා ඔබේ ශුද්ධස්ථානයේ සියල්ල
වනසා ඇත්තේ ය.
4 ඔබේ සෙනඟ මැද එදිරිකාරයෝ බෙරිහන්
දුන්නෝ ය.
q24 ඔව්හු තම ජය කෙහෙලි එහි නැංවූ හ.
5 ඔව්හු ඉහළ දොරටුවේ කැටයම් වැඩ
පොරොවලින් කපා සුණු විසුණු කළහ.
6 එහි පනේල සියල්ල ම ඔව්හු බිඳදැමූ හ.
q26 කැත්තෙන් සහ මිටියෙන් ඒවාට පහර දුන්නෝ
ය.
7 ඔව්හු ඔබේ ශුද්ධස්ථානය ගිනිබත් කළෝ ය.
q27 ඔව්හු ඔබේ නාමයට කැප වූ වාසභවනය
කෙලෙසා බිමට සමතලා කළෝ ය.
8 "අපි ඔවුන් සියල්ලන් සම්පූර්ණයෙන් විනාශ
කරමු"යි ඔවුන් සිතාගෙන මුළු රටෙහි දහම් හල්
ගිනිබත් කළහ.
9 අපට අනාගතයක් නැත;
q29 දිවැසිවරයෙක් ද අපට නැත;
q29 මේ තත්ත්වය කොපමණ කල් පවතී දැ යි
දන්න කෙනෙක් ද නැත.
10 දෙවිඳුනි, එදිරිකාරයා කොපමණ කලක් ඔබට
නින්දා කරන්නේ ද?
q210 ඔහු ඔබේ නාමයට සදහට ම ගරහන්නේ ද?
11 ඔබ අපට අත නො දී ඉන්නේ මන් ද?
q211 ඔබ දෑත අකුළාගෙන ඉන්නේ මන් ද?
12 දෙවිඳුනි, පුරාතනයේ සිට ම ඔබ අපේ
රජතුමාණෝ ය;

q2 12 ලෝ පුරා ගැළවීමේ ක්‍රියාවල කතුවරයාණෝ
ඔබ වහන්සේ ය.
13 නික්ම 14:21 ඔබ සිය සවියෙනේ සමුදුර දබෙෑ කළ
සේක;
q2 13 මුහුදු සපුන්ගේ හිස් ද පොඩිකළ සේක.
14 ජෝබ් 41:1; ගීතා 104:26; යසො 27:1 ඔබ
ලවේයාතන් නම් සර්පයාගේ හිස පොඩිකර දැමූ
සේක;
q2 14 උගේ මස් කාන්තාර සතුන්ට ආහාරයක් කොට
දුන් සේක.
15 උල්පත් සහ ජල ධාරා මුදා හැරියේ ඔබ
වහන්සේ ය;
q2 15 ගලන ගංගා වියළී යෑමට සැලසුවේත් ඔබ
වහන්සේ ය.
16 දිවා රෑ දකෙ ම අයිති ඔබ වහන්සේට ය;
q2 16 ඉර හඳ මැව්වේත් ඔබ වහන්සේ ය.
17 පොළොවෙේ සීමාවන් පිහිටුවා වදාළේ ඔබ
වහන්සේ ය;
q2 17 ග්‍රීෂ්මය සහ සිසිරය ඇති කළෙේ ඔබ
වහන්සේ ය.
18 සමිඳුනි, ඔබට නිගා කළ සතුරන්ගේ අපහාස
සිහිකළ මැනව.
q2 18 ඔබේ නාමය ගැරහු අදමිටුන් සිහිකළ මැනව.
19 ඔබේ නිදොස් සනෙඟ කුරිරු සතුන්ට බිලිකර
නුදුන මැනව;
q2 19 ඔබේ අසරණයන් සදහට ම අමතක නොකළ
මැනව.
20 ඔබ අප සමඟ කළ ගිවිසුම සිහිකළ මැනව.
q2 20 මන්ද, රටේ සෑම අඳුරු මුල්ලක් ම සැහැසිකමින්
පිරී ඇත.
21 පීඩිත වූවන්ට ලජ්ජාවනේ පසු බැසීමට ඉඩ
නුදුන මැනව.
q2 21 දුගීන් හට සහ දිළිඳුන් හට ඔබේ නාමය
පැසසීමට ඉඩ සැලසුව මැනව.
22 දවේඳුනි, නැඟිට විසඳුව මැනව.
q2 22 යුක්තිය රුක ගැනීමට සටන් කළ මැනව.
q2 22 නොදැහැමියන් දවස පුරා ඔබට නිගා කරන
බව සිහි කළ මැනව.
23 ඔබේ එදිරිකාරයන්ගේ හඬ ද නොකඩවා
නඟින ඔබේ සතුරන්ගේ කොලහල ගොස ද
අමතක නොකළ මැනව.

### ප්‍රශංසාවේ සහ විනිශ්චයයේ ගීතය

*ආසාප්ගේ කාව්‍යයකි. ගීතයකි.*

75 දවේඳුනි, අපි ඔබට තුති කරමු;
q2
75 ඔබේ ප්‍රබල ක්‍රියා ප්‍රකාශ කරමු;
q2
75 ඔබේ නාමයට අයැද තුති කරමු.
2 දවේ තුමාණෝ මසෙේ වදාරන සේක:
q2 2 "විනිශ්චය කරන කාලය මා නියමකර ඇත.
q2 2 එවිට මම යුක්තිසහගත ව විනිශ්චය
කරන්නමේ.
3 පොළොවත්, එහි සියලු වැසියෝත් කම්පා
වන්නෝ ය.
q2 3 එසේ වුවත්, පොළොවේ කණු සවිමත් ව
තබන්නේ මම ය."
4 මම මසෙේ කියමි:
q2 4 "පාරට්ටු කරන්නනෙි, පාරට්ටු නවතාලන්න;
q2 4 දුදනනෙි, අහංකාරකමින් උදම් නොවන්න;
5 මහෝත්තමයාණන්ට විරුද්ධ ව අහංකාර
නොවන්න;
q2 5 මැවුම්කරුන් හට විරුද්ධ ව උඩඟුවනේ කතා
නොකරන්න.
6 පරෙ අපර දදෙිගින් හෝ උතුරු දකුණු දදෙිගින්
හෝ විනිශ්චය නොවන්නේ ය, එය නොඑන්නේ ය.
7 එහතේ, විනිශ්චය පැමිණනේනේ දවේඳුන්ගනේ ය.
q2 7 කනෙකෙු පහතට හළෙන්නේ ද කනෙකෙු
ඉහළට ඔසවන්නේ ද
q2 7 උන් වහන්සේ ම ය.
8 සමිඳුන් අතහෙි කුසලානකි;
q2 8 කෝපයනේ පැසුණු මිදි රසින් එය පිරී ඇත.
q2 8 එතුමාණෝ එයින් බිඳක් වත්කරන සේක.
q2 8 මිහි පිට දුදනෝ එහි අන්තිම බිඳ දක්වා ම
බොන්නෝ ය.
9 මම සදහට ම ජාකොබ්ගේ දවේඳුන්
පසසන්නමේ;
q2 9 එතුමන් හට සදහට ම ගී ගයන්නමේ.
10 දුදනන්ගේ ඔද මම බිඳ ලන්නමේ.
q2 10 එහතේ, සුදනන්ගේ බලය ඔසවනු ලබන්නේ
ය."

### ජයග්‍රාහී දවේයන් වහන්සේ

*ආසාප්ගේ කාව්‍යයකි. ගීතයකි.*

76 දවේඳාණෝ ජුදාහි ප්‍රකාශ වූ සේක.
q2
76 ඉශ්‍රායලේවරුන් අතර එතුමන්ගේ නාමය
ශ්‍රේෂ්ඨ ය.
2 එතුමන්ගේ මණ්ඩපය ජරෙුසලමහෙි වූයේ ය.
q2 2 එතුමන්ගේ නිවාසය සියොන් කන්දහෙි වූයේ ය.
3 එහි දී එතුමාණෝ සතුරන්ගේ ඊ සැරය බිඳ දැමූ
සේක.
q2 3 ඔවුන්ගේ කඩුවට, පලිහට හා යුද අවියට
එලසෙ ම කළ සේක.
4 අහෝ දවේඳුනි!
q2 4 ඔබ කොපමණ මහිමාන්විත ද?
q2 4 සදා පවතින කඳු වැටියට වඩා කොපමණ
තේජාන්විත ද?
5 ඔවුන්ගේ එඩිතර සබෙළුන් සතු දේ කොල්ලකනු
ලැබී ය.
q2 5 දැන් ඒ වීරයෝ අවසාන නින්දට වැටී ඇත්තෝ
ය.
q2 5 ඔවුන්ගේ බල විකුම් නිෂ්ඵල වී ඇත්තේ ය.
6 ජාකොබ්ගේ පරපුරේ දවේඳුනි, ඔවුන්ට ඔබ
තර්ජනය කළ සේක.
q2 6 අශ්වයෝ හා අසරුවෝ මැරී වැටුණෝ ය.

7 සමිඳුනි, සියලු දෙන ඔබට ගරුබිය පෑ යුතු ය.
q2[7] ඔබේ දැවෙන උදහසට මූණ දීමට කවරෙක් සමත් වන්නේ ද?
8 ඔබ සුරපුර සිට තීන්දුව දීමට සැලැසූ සේක.
q2[8] ලොව තැති ගෙන නිහඬ වූයේ ය.
9 දෙවිඳුනි, ඔබ වහන්සේ විනිශ්චය සඳහා නැඟිටින සේක;
q2[9] මිහි පිට පීඩිත වූවන් ගළවනු පිණිස වඩින සේක.
10 මිනිසාගේ උදහසින් පවා ඔබේ මහිමය වැඩි වන්නේ ය.
q2[10] ඒ උදහසින් මිදෙන අය ඔබේ මංගල්‍යය පවත්වන්නෝ ය.
11 ඔබේ දෙවි සමිඳුන් හට බාරහාර වී ඒවා ඉටු කරන්න.
q2[11] එතුමන් වටා සිටින්නෝ ගරුබිය පෑ යුතු තැනැන් වහන්සේට පඬුරු ගෙනෙත්වා!
12 එතුමාණෝ රජ දරුවන් මඬින සේක.
q2[12] ශ්‍රේෂ්ඨ භූපතීන් තුළ බිය ඇති කරවන සේක.

## විපතේ දී මඟපෙන්වීම

*ආසාප්ගේ ගීතයකි.*

77 මම දෙවිඳුන් හට මොරගසමි;
q2
77 එසේ ය, උස් හඬින් දෙවිඳුන් හට මොරගසමි.
q2
77 එතුමාණෝ මට සවන් දෙන සේක.
2 විපත්ති කාලයේ දී මම මාගේ සමිඳුන්ට යදිමි.
q2[2] මුළු රැය ම එතුමන් වෙත දෑත ඔසවා යැදුම් යදිමි.
q2[2] එහෙත්, මට සැනසුම සොයාගත නොහැකි ය.
3 දෙවිඳුන් ගැන සිතමින් මම සුසුම් හෙළන්නෙමි;
q2[3] මා භාවනා කරන විට මම අධෛර්ය වන්නෙමි.
4 එතුමාණෝ මුළු රැය ම මා අවදිව තබන සේක.
q2[4] කතා කරන්නට බැරි තරමට මම කැළඹී සිටින්නෙමි.
5 යටගිය දවස් ගැන මම කල්පනා කරන්නෙමි;
q2[5] ගෙවී ගිය අවුරුදු සිහිපත් කරන්නෙමි.
6 මුළු රෑ පුරා මම භාවනා කරන්නෙමි.
q2[6] මම මෙනෙහි කරමින් මාගෙන් ම මෙලෙස අසන්නෙමි.
7 “සමිඳාණෝ සදහට ම අප අත් හරින සේක් ද?
q2[7] එතුමාණෝ යළි අපට කරුණාව නොපෙන්වන සේක් ද?
8 එතුමන්ගේ තිර පෙම සහමුලින් ම පහ ව ගොස් තිබේ ද?
q2[8] එතුමන් දුන් පොරොන්දුව සදහට ම ඉටු නොකරන සේක් ද?
9 දෙවිඳාණෝ කරුණාව පෑමට අමතක කර ඇද් ද?
q2[9] නැතහොත් උදහස නිසා දයාව අත්හළ සේක් ද?”
10 එවිට මම කතා කොට, “මට ඉතා වේදනා දෙන්නේ මෙය වේ;
q2[10] මන්ද, මහෝත්තමයාණන්ගේ බලය ඉවත් ව ගොස් තිබේ යැ”යි කීවෙමි.
11 සමිඳුනි, ඔබේ තේජාන්විත ක්‍රියා මම සිහි කරන්නෙමි.
q2[11] ඔබ පෙර කළ අරුමපුදුම දේ මම කියා පාන්නෙමි.
12 ඔබේ ක්‍රියා සියල්ල මම සිහි කරන්නෙමි,
q2[12] ඔබේ ප්‍රබල ක්‍රියා ගැන මම භාවනා කරන්නෙමි.
13 අහෝ දෙවිඳුනි!
q2[13] ඔබේ ක්‍රියා මාර්ගය විශුද්ධ ය;
q2[13] අපේ දෙවිඳුන්ට වඩා ශ්‍රේෂ්ඨ දෙවි කෙනෙක් ඇද් ද?
14 හාස්කම් පාන දෙවිඳාණෝ ඔබ වහන්සේ ය.
q2[14] ජාතීන් අතර ඔබේ බල මහිමය ඔබ පෙන්වා ඇත්තේ ය.
15 ඔබේ බලවත් හස්තයෙන් ඔබ තුමන් සෙනඟ මුදා ලූ සේක.
q2[15] ජාකොබ්ගේ සහ ජෝසෙප්ගේ පෙළෙපත් ඔබ ගළවා ලූ සේක.
16 අහෝ දෙවිඳුනි!
q2[16] ජලධාරාවෝ ඔබ දුටු විට භය වූ හ.
q2[16] සාගර පත්ල පවා බියෙන් ඇලළී ගියේ ය.
17 වලාකුළුවලින් වැසි වැස්සේ ය;
q2[17] අහස ගිගුරුම් හඬ දුන්නේ ය;
q2[17] විදුලි සැර දසත විහිදී ගියේ ය.
18 ඔබේ හෙණ හඬ අහස් කුසේ ගිගුම් දිනි.
q2[18] විදුලි කෙටීම් ලොව එළි කළේ ය.
q2[18] පොළොව කම්පා වී දෙදරා ගියේ ය.
19 මුහුද මැදින් ඔබේ මාවත විය.
q2[19] ගැඹුරු සමුදුර මැදින් ඔබ ගමන් කළ සේක.
q2[19] එහෙත්, ඔබේ පා සටහන් පෙනෙන්නට නො වී ය.
20 මෝසෙස්ගේ සහ ආරොන්ගේ මඟපෙන්වීම ඇති ව, ඔබ ඔබේ ජනතාව බැටළුවන් මෙන් ගෙන ගිය සේක.

## ඉශ්රායලේ ඉතිහාසයෙන් උපදෙස්

*ආසාප්ගේ ගීතයකි.*

78 මාගේ ජනයෙනි, මාගේ ඉගැන්වීමට කන් දුන මැනව.
q2
78 මා පවසන වදන්වලට සවන් දුන මැනව.
2 මතෙ 13:35 උපමාවක් මඟින් මම කතා කරන්නෙමි.
q2[2] පුරාතනයේ අබිරහස් පවසන්නෙමි.
3 අප අසා දැනගත් දේවල් ද අපේ පියවරුන් අපට දැන්වූ දේවල් ද අපි දන්වන්නෙමු.
4 දරු මුණුබුරන් කෙරෙන් නොසඟවා ඊළඟ පරපුරට දන්වන්නෙමු.

q2 4 සමිඳුන්ගේ ප්‍රබල ක්‍රියා හා බල මහිමය ද
එතුමන් කළ හාස්කම් ද කියාපාන්නමෙු.
5 එතුමාණෝ, ඉශ්‍රායලේ ජනතාවට නීති නියෝග
ද ජාකොබ්ගේ පරපුරට අණපණත් ද දුන් සේක.
q2 5 ඔවුන්ගේ දරුවන්ට ඒවා ඉගැන්වීමට ඔවුන්ගේ
පියවරුන්ට අණ දුන් සේක.
6 මලෙසෙ ඊළඟ පරපුර ඒවා දැනගන්නෝ ය;
q2 6 ඉපදනේනට සිටින දරු පරපුර ඒවා දැනගන්නෝ
ය.
q2 6 ඔව්හු නැඟිට ඔවුන්ගේ පරපුරට ඒවා
දන්වන්නෝ ය.
7 මසෙේ ඔව්හු දවෙිඳුන් තුළ බලාපොරොත්තුව
තබා, එතුමන්ගේ ක්‍රියා කවදා වත් අමතක
නොකරන්නෝ ය.
q2 7 එතුමන්ගේ අණපණත් සදහට ම පිළිපදින්නෝ
ය.
8 මසෙේ ඔව්හු ඔවුන්ගේ පියවරුන් මනේ
හිතුවක්කාර, කැරලිකාර පරපුරක් නොවන්නෝ ය.
q2 8 මන්ද, ඒ පරපුරේ අය දවෙිඳුන් කෙරෙහි ස්ථිර ව
නොසිටියහ.
q2 8 ඔව්හු දවෙිඳුන්ට පක්ෂපාත ව නොසිටියෝ ය.
9 එප්‍රායිම්ගේ පරපුර දුනුවායෝ වූ හ.
q2 9 ඔව්හු සටන් දිනේ දී පසුපස හැරී පලා ගියෝ
ය.
10 ඔව්හු දවෙිඳුන් සමඟ වූ ගිවිසුම ඉටු නොකළෝ
ය.
q2 10 එතුමන්ගේ නීතිය අනුව හැසිරීමට
q2 10 එකඟ නොවූවෝ ය.
11 එතුමන්ගේ ක්‍රියා ඔව්හු අමතක කළෝ ය.
q2 11 ඔවුන්ට දැක්වූ අරුමපුදුම දේ සිහි නොකළෝ
ය.
12 නික්ම 7:8—12:32 ඔවුන්ගේ පියවරුන් අබියස
එතුමාණෝ හාස්කම් පෑ සේක.
q2 12 මිසර දේශයහෙි ද ශෝවන් මිටියාවතහෙි ද
එලසෙ කළ සේක.
13 නික්ම 14:21-22 මුහුද දබෙෑ කොට එය මැදින්
එතුමාණෝ ඔවුන් ගනෙ ගිය සේක.
q2 13 ජලකඳ වේල්ලක් මනේ සිටීමට සැලැසූ සේක.
14 නික්ම 13:21-22 දිවා කාලයේ වලාකුළක් මඟින්
එතුමාණෝ ඔවුන් ගනෙ ගිය සේක.
q2 14 රෑ කාලයේ ආලෝකයක් මඟින් ඔවුන්ට
මඟපනේවූ සේක.
15 නික්ම 17:1-7; ගණන් 20:2-13 පාළුකරයේ දී
එතුමාණෝ පර්වතය දදෙරවා හැරිය සේක;
q2 15 ගැඹුරු ජලාශයකින් මනේ ඔවුන්ට බොන්නට
ජලය දුන් සේක.
16 පර්වතයනේ දිය දහර ගලා එන්න සැලැසූ සේක.
q2 16 ජලය ගංගා මනේ ගලා යන්න සැලැසූ සේක.
17 එහතේ, ඔව්හු පරෙටෙත් වඩා එතුමන්ට විරුද්ධ ව
නිතර පව් කළෝ ය.
q2 17 වියළි පාළුකරයේ දී මහෝත්තමයාණන්ට
විරුද්ධ ව කැරලි ගැසුවෝ ය.
18 නික්ම 16:2-15; ගණන් 11:4-23-31-35 ඕනෑකමින්
ම ඔව්හු දවෙිඳුන්ට අභියෝග කළෝ ය;
q2 18 තමන් රිසි ආහාර ඉල්ලා ඔව්හු එසේ කළෝ
ය.
19 දවෙිඳුන්ට විරුද්ධ ව ඔව්හු කතා කරමින්,
“පාළුකරයේ දී ආහාර සැපයීමට එතුමන්ට හැකි
ද?”යි ඇසුවෝ ය.
20 තවද, “ගංගාවක් මනේ වේගයනේ වතුර ගලා
බසින පිණිස එතුමන් පර්වතයට පහර දුන් නමුත්,
ජනතාවට රොටි දිය හැකි ද?
q2 20 ඔවුන්ට මාංස දිය හැකි ද?”
q2 20 කියා ඔව්හු ඇසුවෝ ය.
21 සමිඳාණෝ මේවා ඇසූ කල උදහසින් පිරී ගිය
සේක.
q2 21 ජාකොබ් පරපුරට විරුද්ධ ව එතුමන්ගේ
කෝපාග්නිය ඇවිළී, ඉශ්‍රායලේ වංශයට විරුද්ධ ව
උදහස නැංගේ ය.
22 එසේ වූයේ, ඔවුන් දවෙිඳුන් විශ්වාස නොකළ
බැවිනි;
q2 22 එතුමන්ගේ විමුක්තිදායක බලය කෙරෙහි
ඔවුන් විශ්වාසය නොතැබූ බැවිනි.
23 එහතේ, එතුමාණෝ ඉහළ අහසට කතා කළ
සේක;
q2 23 සුරලොව දොරටු විවෘත කළ සේක.
24 ජොහ 6:31 ඔවුන්ට කෑමට මන්නා වැසි වැස්වූ
සේක.
q2 24 සගලොවින් ධාන්‍ය ප්‍රදානය කළ සේක.
25 දවේ දූතුන්ගේ ආහාර පොදු ජනතාව අනුභව
කළහ.
q2 25 එතුමාණෝ පමණටත් වඩා ආහාර පාන එවූ
සේක.
26 අහසහෙි පරෙදිග සුළඟක් හමන්නට සැලැසූ
සේක;
q2 26 සිය බලයනේ දකුණු දිග සුළඟ කළඹා හැරිය
සේක.
27 ඔවුන් පිට දූවිලි මනේ මස් මාංස වස්වා වදාළ
සේක;
q2 27 පියාඹන පක්ෂීන් මුහුදු වැලි මනේ එවූ සේක.
28 ඔවුන්ගේ කඳවුරු මැදට ඒවා හළෙූ සේක;
q2 28 ඔවුන් වසන තැන් සිසාරා ඒවා වැටනේනට
සැලැසූ සේක.
29 මසෙේ ඔව්හු කා බී සෑහීමට පත් වූවෝ ය.
q2 29 ඔවුන් ආශා කළ දේ එතුමාණෝ ප්‍රදානය කළ
සේක.
30 එහතේ, ඔවුන්ගේ ආශාව සංසිඳනේනත් ප්‍රථම,
ඔවුන්ගේ කටේ ආහාර තිබිය දී පවා මැසිවිලි
දඩීම ඔව්හු නොනැවැත්වූවෝ ය.
31 දේව උදහස ඔවුන්ට විරුද්ධ ව ඇවිළුණේ ය.
q2 31 එතුමාණෝ ඔවුන’තර සිටි සවිමත් දනන් නසා
ඉශ්‍රායලේ වංශයේ හොඳ ම තරුණ පළෙ වනසාදැමූ
සේක.
32 මේ සියල්ල තිබිය දී ම ඔවුහු දිගින් දිගට ම
පව් කළෝ ය;
q2 32 එතුමාණන්ගේ විස්මිත ක්‍රියා විශ්වාස
නොකළෝ ය.

33 එබැවින් එතුමාණෝ ඔවුන්ගේ ජීවිත කාලය
හුමාලයක් මෙන් නැතිවන්න සැලැසූ සේක.
q2[33] ඔවුන්ගේ ආයු කාලය බියෙන් ගෙවේ යන්න
සැලැසූ සේක.
34 එතුමාණන් ඔවුන්ගෙන් සමහරුන් වැනසූ කල,
සෙසු අය එතුමාණන් සෙව්වෝ ය.
q2[34] ඔව්හු පසුතැවී සිත් හරවා ගෙන දෙවිඳාණන්
සොයා ගියෝ ය.
35 ඔවුන්ගේ පර්වතය දෙවිඳාණන් බව ඔව්හු
සිහිපත් කළෝ ය.
q2[35] ඔවුන්ගේ මිදුම්කරුන් උත්තම දෙවිඳාණන් බව
ඔව්හු සිහි කළෝ ය.
36 එහෙත්, ඔව්හු එතුමන්ට තම මුවින් චාටු බස්
කීවෝ ය;
q2[36] දිවෙන් මුසා බස් දෙඩුවෝ ය.
37 ක්‍රියා 8:21 ඔවුන්ගේ සිත් එතුමන් කෙරෙහි
නිතර ම එකඟ නො වී ය.
q2[37] එතුමන්ගේ ගිවිසුමට විශ්වාසවන්ත ව
නොසිටියෝ ය.
38 එහෙත්, දයානුකම්පාවෙන් එතුමාණෝ ඔවුන්ගේ
පාප කමා කළ සේක;
q2[38] ඔවුන් නොවැනසූ සේක;
q2[38] විටින් විට තම කෝපය සංසිඳුවාගෙන තම
උදහස ඇවිලෙන්නට ඉඩ නුදුන් සේක.
39 ඔවුන් හුදෙක් මියයන සුලු මිනිසුන් බව
එතුමාණෝ සිහිපත් කළ සේක;
q2[39] ඔවුන් ආපසු නොඑන හමා යන හුස්මක් බව
සිහි කළ සේක.
40 පාළුකරයේ දී කොපමණ වාරයක් ඔව්හු
එතුමන්ට විරුද්ධ වූවෝ ද?
q2[40] කාන්තාරයේ දී කොපමණ වාරයක් ඔව්හු
එතුමන්ට දුක් දුන්නෝ ද?
41 ඔව්හු නැවත නැවතත් දෙවිඳුන් පිරික්සූ හ.
q2[41] ඉශ්‍රායලේවරුන්ගේ ශුද්ධ දෙවිඳුන් කුපිත
කළෝ ය.
42 එතුමන්ගේ බල මහිමය වත්, සතුරන්ගෙන්
ගළවාගත් දිනය වත් ඔව්හු සිහි නොකළෝ ය.
43 එතුමාණන් මිසරයේ දී කළ හාස්කම් වත්,
ශෝවන් මිටියාවතේ දී කළ අසිරිමත් ක්‍රියාවන්වත්
ඔව්හු සිහි නොකළෝ ය.
44 නික්ම 7:17-21 එතුමාණෝ ඔවුන්ගේ ගංගා
ජලය ලේ බවට හැරවූ සේක;
q2[44] පානය කිරීමට නොහැකි වන ලෙස දියකඳ ලේ
බවට හැරවූ සේක.
45 නික්ම 8:1-6-20-24 ඔවුන්ට හිරිහැර කිරීමට
එතුමාණෝ මැසි කැල එවූ සේක;
q2[45] ඔවුන්ගේ රට වනසාලීමට මැඩියන් එවූ සේක.
46 නික්ම 10:12-15 එතුමාණෝ ඔවුන්ගේ අස්වැන්න
දළඹුවන්ට දුන් සේක;
q2[46] ඔවුන්ගේ ශ්‍රමයේ පලදාව පළඟැටියන්ට දුන්
සේක.
47 නික්ම 9:22-25 එතුමාණෝ ගල් වර්ෂාවෙන්
ඔවුන්ගේ මිදි වැල් නසා ලූ සේක;
q2[47] තුෂාරයෙන් ඔවුන්ගේ අත්තික්කා ගස් විනාශ
කළ සේක.
48 ඔවුන්ගේ ගවමහිෂයන් ගල් වැස්සෙන් යට කළ
සේක;
q2[48] එළු බැටළු පට්ටි හෙණ අකුණුවලට පාවා දුන්
සේක;
49 ඔවුන්ට විරුද්ධ ව තමන්ගේ දැවෙන කෝපයත්,
රෝෂයත්, විනාශයත් එවූ සේක;
q2[49] මේවා මාර දූත පිරිසක් මෙන් එවූ සේක.
50 එතුමාණෝ තම කෝපයට ඉඩ දී ඔවුන්
මරණයෙන් බේරා නොගත් සේක;
q2[50] වසංගතයෙන් ඔවුන් වනසා ලූ සේක.
51 නික්ම 12:29 මිසරයේ සියලු කුලුඳුලන් මරාදැමූ
සේක.
q2[51] හාම්ගේ කූඩාරම්හි සිටි ඔවුන්ගේ කුලුඳුලන්
විනාශ කළ සේක.
52 නික්ම 13:17-22 ඉන්පසු එතුමාණෝ තමන්
සෙනඟ බැටළුවන් මෙන් ගෙන ගිය සේක.
q2[52] පාළුකරය මැදින් යන බැටළු රැළකට මෙන්
ඔවුන්ට මඟපෙන්වූ සේක.
53 නික්ම 14:26-28 නොබිය ව, සුරැකි ව යාමට
එතුමාණෝ ඔවුන්ට මඟපෙන්වූ සේක.
q2[53] එහෙත්, මුහුද ඔවුන්ගේ සතුරන් ගිලිගත්තේ
ය.
54 නික්ම 15:17; ජෝෂු 3:14-17 එතුමාණෝ තම
ශුද්ධ දේශයට ඔවුන් ගෙනා සේක;
q2[54] තම බලයෙන් දිනාගත් කන්දට ඔවුන් ගෙනා
සේක.
55 ජෝෂු 11:16-23 එහි පෙර විසූ මිසදිටු ජාතීන්
පන්නාදමා ඔවුන්ට ඒ රට උරුම කොට බෙදා දුන්
සේක;
q2[55] ඔවුන්ගේ කූඩාරම්වල ඉශ්‍රායලේ ගෝත්‍රයන්
පදිංචි කරවූ සේක.
56 විනි 2:11-15 එහෙත්, ඔව්හු දෙවිඳුන් පිරික්සමින්
එතුමන්ට විරුද්ධ ව කැරලි ගැසුවෝ ය.
q2[56] මහෝත්තමයාණන්ගේ අණපණත් නොතකා
හැරියෝ ය.
57 ඔව්හු ඔවුන්ගේ පියවරුන් මෙන් ආපසු හැරී
යමින් විශ්වාසය කඩ කළෝ ය.
q2[57] ඇද වුණු දුන්නක් මෙන් ඔවුන්ගේ විශ්වාසය
වක් විය.
58 මිසදිටු ගිරිකුළු දේවාලවලින් ඔව්හු එතුමාණන්
කුපිත කළෝ ය.
q2[58] ඔවුන්ගේ පිළිම රූපවලින් එතුමාණන්ගේ
කෝපය ඇවිස්සුවෝ ය.
59 දෙවිඳුන්ට මෙය ඇසුණු විට එතුමාණෝ බලවත්
ලෙස උදහස් වූ සේක;
q2[59] එතුමාණෝ ඉශ්‍රායලේවරුන් ප්‍රතික්ෂේප කළ
සේක.
60 ජෝෂු 18:1; ජරෙ 7:12-14; 26:6 එතුමාණෝ
ෂිලෝහි වාසභවනය අත්හළ සේක;
q2[60] මිනිසුන් අතර පිහිටවූ කූඩාරම හැර ගිය
සේක.

61 1 සාමු 4:4-22 එතුමාණන්ගේ බල මහිමය සහ
තේජාලංකාර සලකුණ වන ගිවිසුම් කරඬුව සතුරන්
අතට පත් වීමට එතුමාණෝ ඉඩ හැරිය සේක.
62 එතුමාණෝ සිය සෙනඟ කඩු පහරට භාර දුන්
සේක.
q2 62 සිය උරුමය වන සෙනඟ කෙරෙහි උදහස් වූ
සේක.
63 ගින්න ඔවුන්ගේ තරුණයන් ගිලගත්තේ ය;
q2 63 ඔවුන්ගේ තරුණියන්ට විවාහ ගීතයක් නො වී
ය.
64 ඔවුන්ගේ පූජකවරු කඩුවෙනේ නැසුණෝ ය.
q2 64 ඔවුන්ගේ වැන්දඹුවෝ ශෝක ගීත ගායනා
නොකළෝ ය.
65 සමිඳාණෝ නින්දනේ අවදි වන කෙනෙකුන් මෙනේ
පිබිදුණ සේක;
q2 65 මිදිපැන් මතින් කෑමෝරගසන වීර භටයකු
මෙනේ වූ සේක.
66 එතුමාණෝ සිය සතුරන්ට පහර දී ඔවුන් පලවා
හැරිය සේක;
q2 66 සදා ලජ්ජාවට ඔවුන් පත් කළ සේක.
67 එතුමාණෝ ජෝසෙජ්ගේ පරපුර අත්හළ සේක;
q2 67 එජ්රායිම්ගේ වංශය තෝරා නොගත් සේක.
68 එහෙත්, එතුමාණෝ ජුදාගේ ගෝත්‍රය
තෝරාගත් සේක;
q2 68 සියොන් කන්දට ප්‍රේම කළ සේක.
69 එතුමාණෝ සදහට ම පිහිටවූ පොළොව මෙනේ
ස්ථිර ව ද අහස් තලය මෙනේ උසස් ව ද සිය
ශුද්ධස්ථානය ඉදි කළ සේක.
70 1 සාමු 16:11-12; 2 සාමු 7:8; 1 වංශා 17:7
එතුමාණෝ තම සේවක දාවිත් තෝරා ගත් සේක;
q2 70 බැටළු රැළ රැකබලාගැනීමෙනේ ඔහු ඉවතට ගත්
සේක.
71 සිය උරුමය ද ජාකොබ්ගේ පරපුර ද වන
ඉශ්රායලේවරුන් පාලනය කිරීම සඳහා එතුමාණෝ
බැටළුවන් රැකබලාගැනීමෙනේ දාවිත් කැඳවාගත්
සේක.
72 දාවිත් අවංක සිත් ඇති ව සෙනඟ
රැකබලාගත්තේ ය.
q2 72 මහ දස්කම් දක්වා ඔහු ඔවුන්ට මඟපෙන්වූ
සේක.

### ජෙරුසලම ගැන විලාපය

*ආසාජ්ගේ ගීතයකි.*

79 2 රාජා 25:8-10; 2 වංශා 36:17-19; ජෙරෙ
52:12-14 අහෝ දෙවිඳුනි, මිසදිටුවෝ ඔබේ
උරුමය ආක්‍රමණය කළෝ ය.
q2
79 ඔබේ ශුද්ධ මාලිගාව කෙලෙසුවෝ ය.
q2
79 ජෙරුසලම් නගරය නටබුන් ගොඩක් කළෝ ය.
2 ඔබේ සේවකයන්ගේ මළකඳන් ඔව්හු
ආකාශ පක්ෂීන්ට කෑමට දුන්නෝ ය.
q2 2 ඔබේ දැහැමියන්ගේ මාංසය මිහි පිට
තිරිසනුන්ට කෑමට දුන්නෝ ය.
3 ඔව්හු ඔවුන්ගේ ලේ ජෙරුසලම වටා ජලය මෙනේ
වැගිරවූවෝ ය.
q2 3 ඔවුන් වළලීමට කිසිවකේ නොසිටියෝ ය.
4 අපේ අසල්වැසියන් හට අපි සරදමක් වූයෙමු;
q2 4 අප අවට සිටින්නන් හට විහිළුවක් ද නින්දාවක්
ද වූයෙමු.
5 අහෝ සමිඳුනි!
q2 5 ඔබ කොපමණ කල් කෝප වී සිටින සේක් ද?
q2 5 සදහට ම ද?
q2 5 ඔබේ උදහස කොපමණ කල් ගින්න මෙනේ
දැවනේනේ ද?
6 ඔබ නාඳුනන ජාතීන් පිට ඔබේ උදහස වැගිරවුව
මැනව.
q2 6 ඔබේ නාමය කියා නොඅයදින රාජධානි පිට ද
එසේ ම කළ මැනව.
7 මන්ද, ඔව්හු ජාකොබ්ගේ පරපුර බිඳදැම්මෝ ය;
q2 7 ඔවුන්ගේ ගම්බිම් පාළු කොට දැම්මෝ ය.
8 අපේ පියවරුන්ගේ දුෂ්ට ක්‍රියා අපට විරුද්ධ ව
සිහි නොකළ මැනව.
q2 8 ඔබේ මෘදු දයාව අප කෙරෙහි විගස
පැමිණවුව මැනව.
q2 8 අපේ බලාපොරොත්තු සියල්ල සුන් වී ඇත.
9 අපේ මිදුම්කාර දෙවිඳුනි, ඔබේ මහිමාන්විත
නාමය නිසා අපට සරණ වුණ මැනව;
q2 9 ඔබේ නාමය උදෙසා අප මුදා අපට කමා කළ
මැනව.
10 "ඔවුන්ගේ දෙවිඳාණෝ කොහේ දැ"යි මිසදිටු
ජාතීන් අසන්නේ කුමට ද?
q2 10 ඔබේ සේවකයන්ගේ ලයෙට පළිගන්න බව
මිසදිටු ජාතීන් අතර අපේ ඇස් ඉදිරියෙහි ම ප්‍රකාශ
වේ වා!
11 ඔබේ සිරකරුවන්ගේ කන්කෙඳිරිය ඔබ ඉදිරියට
පැමිණේ වා!
q2 11 මරණයට නියම වූ අය ඔබේ මහිමයනේ
ආරක්ෂා වතේ වා!
12 අහෝ සමිඳුනි, අපේ අසල්වාසීන් ඔබට සමච්චල්
කර ඇත.
q2 12 එය හත් ගුණයකින් ඔවුන් වෙත ම හැරවුව
මැනව.
13 එවිට ඔබේ තණ බිමේ බැටළුවෝ ද ඔබේ
සෙනඟ ද වන අපි සදහට ම ඔබට ස්තුති
කරන්නමෙු.
q2 13 පරපුරනේ පරපුරට අපි ඔබට පැසසුම්
කරන්නමෙු.

### ජාතියේ ශෝක ගීය

*ප්‍රසිද්ධ ආඥාවකි. ආසාජ්ගේ ගීතයකි.*

80 නික්ම 25:22 ජෝසෙජ්ගේ පරපුර බැටළු
රැළක් මෙනේ ගෙන යන
q2

80 ඉශ්රායලේවරුන්ගේ එඬේරාණනි, අපට
සවන් දුන මැනව.
2 කරූබ්වරුන් මත අසුන් අරා දර්ශනය වුව මැනව.
q2[2] එප්රායිම්, බෙන්ජමින් සහ මනස්සේ යන
අයගේ පළෙපත් අබිමුව තදෙින් වැජඹනෙු මැනව.
q2[2] අප මුදාගැනීමට වැඩිය මැනව.
3 අහෝ දවේදුනි!
q2[3] අප ආපසු ගනෙ ගිය මැනව.
q2[3] අප මිදනෙ පිණිස ඔබගේ සිරි වත සිරිය පනේවුව
මැනව.
4 අහෝ සමිඳුනි!
q2[4] සව් බලැති දවේදුනි, ඔබගේ සනෙඟගේ අයැදීම
ගැන කොපමණ කල් ඔබ උදහස් ව සිටින සේක් ද?
5 දුක් නමැති ආහාර ඔබ අපට කන්න දුන් සේක;
q2[5] අපට කඳුළින් පිරුණු බඳුනක් බොන්න දුන්
සේක.
6 අපගේ අසල්වැසියන්ගේ පරිහාසයට ඔබ අප ලක්
කළ සේක.
q2[6] අපගේ සතුරෝ අපට උසුළු-විසුළු පෑවෝ ය.
7 සව් බලැති දවේදුනි, අප ආපසු ගනෙ ගිය මැනව.
q2[7] අප මිදනෙ පිණිස ඔබගේ සිරි වත සිරිය පනේවුව
මැනව.
8 ඔබ මිදි වැලක් වන අප මිසරයනේ ගනෙ සේක;
q2[8] විජාතීන් පන්නාදමා ඔබ එය රෝපණය කළ
සේක.
9 එය වැඩනෙ පිණිස ඔබ තැනක් සූදානම් කළ
සේක;
q2[9] එය ගැඹුරට මුල් ඇද්දේ ය.
q2[9] එය දේශය පුරා පැතිර ගියේ ය.
10 එහි සවෙණින් කඳුකර පදෙසෙ ද එහි අතු
රිකිලිවලින් මහ සීඩර් ගස් ද පවා වැසී ගියේ ය.
11 එහි අතු මුහුද දක්වා ද එහි රිකිලි යුප්රටීස්
දක්වා ද විහිදී ගියේ ය.
12 මඟ යන එන සියල්ලන් එහි පල නළෙනු පිණිස
එහි වැට කඩුලු වනසාලූයේ කුමක් නිසා ද?
13 වල් ඌරෝ එය පාගා දැම්මෝ ය;
q2[13] නිදැල්ලේ සැරිසරන වල් සත්තු එය කා
දැම්මෝ ය.
14 අහෝ සව් බලැති දවේදුනි!
q2[14] අප වතෙ හැරුණ මැනව.
q2[14] සගලොව සිට නතෙ යොමා බලා මේ මිදිවැල
වන අප රැකගත මැනව.
15 ඔබගේ දකුණතින් රෝපණය කළ දේ සැලකුව
මැනව;
q2[15] ඔබට ම සවිමත් කරගත් දේ බැලුව මැනව.
16 අපගේ සතුරෝ එය කපා ගින්නනේ පුළුස්සා
දැමුවෝ ය.
q2[16] ඔබගේ බැල්මේ තර්ජනයනේ ඔව්හු වැනසී යති.
17 ඔබගේ හස්තය ඔබගේ දකුණු පස සිටින මිනිසා
කරෙහෙි පතිත වේ වා!
q2[17] ඔබගේ යහපතට ඔබ ම සවි ශක්තිමත් කළ
ජාතිය කරෙහෙි එය පහළ වේ වා!
18 එවිට අපි කවදාවත් ඔබට පිටුපා නොයන්නමු.
q2[18] අපට ජීවත් වීමට ඉඩ දුන මැනව.
q2[18] අපි ඔබගේ නාමයනේ අයැද ඔබ පසසන්නමු.
19 අහෝ සමිඳුනි!
q2[19] සව් බලැති දවේදුනි!
q2[19] අප ආපසු ගනෙ ගිය මැනව.
q2[19] අප මිදනෙ පිණිස ඔබගේ සිරි වත සිරිය
පනේවුව මැනව.

### මංගල ගීයක්

*ආසාප්ගේ ගීතයකි.*

81 අපගේ ශක්තිය වන දවේදුන්ට ඉමහත් ප්රීති
හඬ නඟන්න;
q2
81 යාකොබ්ගේ දවේදුන්ට තුති ගී හඬ නඟන්න.
2 ගී ගයා කිකිණි රබන් ගසන්න;
q2[2] මිහිරි වීණාව සහ කුඩා වීණාව වයන්න.
3 ගණන් 10:10 අමාවක දවසේ දී ද පසළොස්වක
දවසේ දී ද අපගේ මහා මංගල දවසේ දී ද
හොරණෑව පිඹින්න.
4 එය ඉශ්රායලේ ජනයාට නීතියක් වන්නේ ය;
q2[4] යාකොබ්ගේ දවේදුන් පැනවූ නියෝගයක්
වන්නේ ය.
5 ජෝසපේ මිසර දේශයනේ පිටත් ව යන ගමනේ
දී එතුමාණෝ එය ඔහුට නියෝගයක් ලසෙ භාර දුන්
සේක.
q2[5] නුපුරුදු හඬක් මසෙේ කියනු මම ඇසුවමේ:
6 “මම ඔබගේ කරනේ බර ඉවත් කළෙමේ;
q2[6] ඔබගේ අත් දකෙ කුඩා ඇදීමනේ නිදහස්
කළෙමේ.
7 නික්ම 17:7; ගණන් 20:13 විපතේ දී ඔබ
අඬගැසුවහු ය;
q2[7] මම ඔබ නිදහස් කළෙමේ.
q2[7] මම අහස් ගිගුරුමේ සිට ඔබට පිළිතුරු දුන්නමේ.
q2[7] මරේබා දිය උල්පත ළඟ දී මම ඔබ සෝදිසි
කළෙමේ.
8 අහෝ මාගේ සනෙඟනෙි!
q2[8] මා ඔබට විරුද්ධ ව අනතුරු අඟවන විට මට
සවන් දනේන;
q2[8] අහෝ ඉශ්රායලේවරුනි!
q2[8] ඔබ මට සවන් දනේනහු නම්, කොපමණ
යහපත් ද?
9 නික්ම 20:2-3; ද්වි.නී. 5:6-7 ඔබ අතර බොරු දවේ
දේවතාවන් නොසිටිය යුතු ය;
q2[9] විදේශීය දවේ දේවතාවන් හට නමස්කාර
නොකළ යුතු ය.
10 මිසරයනේ ඔබ මුදා, ඔබ පිටතට ගනෙ දවේ
සමිඳාණෝ මම වන්නමේ.
q2[10] ඔබගේ මුව හොඳින් විවර කරන්න;
q2[10] එවිට මම ඔබ පෝෂණය කරන්නමේ.
11 එහතේ, මාගේ සනෙඟ මාගේ හඬට සවන්
නුදුන්නෝ ය.
q2[11] ඉශ්රායලේවරු මට කීකරු නො වූ හ.
12 ඔවුන්ගේ ගල් සිත නිසා, මම ඔවුන්
ප්රතික්ෂේප කළෙමේ.

q2 12 එවිට ඔව්හු ඔවුන්ගේ ම මතිමතාන්තර අනුව
ගමන් කළෝ ය.
13 මාගේ සෙනඟ මට සවන් දුන්නෝ නම්,
ඉශ්රායලේවරු මා අනුව එන්නෝ නම්, කොතරම්
යහපත් ද?
14 එවිට මම ඔවුන්ගේ සතුරන් වහා පරාජය
කරන්නෙමි;
q2 14 ඔවුන්ගේ එදිරිකාරයන්ට විරුද්ධ ව මම පහර
දෙන්නෙමි.
15 සමිඳුන් හට වෛර කරන්නෝ එතුමන් අබිමුව
බියෙන් පැකිළෙන්නෝ ය.
q2 15 ඔවුන්ගේ විපත සදහට ම තිර වන්නේ ය.
16 එතුමාණෝ ඉස්තරම් ධාන්‍යයෙන් ඔබ පෝෂණය
කරන සේක.
q2 16 වන මී පැණියෙන් මම ඔබ සෑහීමට පත්
කරන්නෙමි."

## අදමිටු විනිසකරුවන්ට තරවටුවක්

*ආසාප්ගේ ගීතයකි.*

82 දෙවිඳාණෝ දේව සභාවෙහි මුල'සුන ගන්න
සේක.
q2
82 දෙවිවරුන් මැද විනිශ්චය කරන සේක.
2 ඔබ කොපමණ කලක් අයුතු ලෙස විනිශ්චය
කරන්නහු ද?
q2 2 දුදනන්ගේ පැත්ත ගෙන ක්‍රියා කරන්නහු ද?
3 දුබලුන්ට හා අනාථයන්ට යුක්තිය පසිඳලන්න;
q2 3 පීඩිතයන්ට හා දිළිඳුන්ට යුක්තිය ඉටු කරන්න;
4 දුබලුන් හා දිළිඳුන් මුදාලන්න;
q2 4 දුදනන්ගේ ග්‍රහණයෙන් ඔවුන් බේරාගන්න.
5 නියම දැනීමක් හා තේරුමක් නැති ව ඔව්හු
අඳුරෙහි සැරිසරන්නෝ ය.
q2 5 පොළෝ පදනම් සියල්ල කම්පා වන්නේ ය.
6 ජොහ 10:34 "ඔබ දෙවිවරු ය"යි මම කීවෙමි;
q2 6 ඔබ සියල්ලෝ අති උත්තමයාණන්ගේ දරුවෝ
වන්නහු ය.
7 එහෙත්, ඔබ අන් මිනිසුන් මෙන් මරණයට බිලි
වන්නහු ය.
q2 7 රජ දරුවන් මෙන් ඔබ සියලු දෙන වැටී යන්නහු
ය.
8 අහෝ දෙවිඳුනි!
q2 8 ඔබ නැඟිට මිහිතලය විනිශ්චය කරන සේක්
වා!
q2 8 සියලු ජාතීහු ඔබ වහන්සේට අයිති ය.

## සතුරන්ගේ පරාජය සඳහා යැදුම

*ආසාප්ගේ ගීතයකි.*

83 මාගේ දෙවිඳුනි, නිහඬ ව නොසිටිනු මැනව.
q2
83 දෙවිඳුනි, නිසංසල ව නොසිටිනු මැනව.
q2
83 පිළිතුරු නො දී නොසිටිනු මැනව.
2 බලනු මැනව, ඔබේ විරුද්ධකරුවෝ කලබල
කරන්නෝ ය.
q2 2 ඔබේ සතුරෝ කැරලි ගසන්නෝ ය.
q2 2 ඔබට විරුද්ධ ව නැඟී සිටින්නෝ ය.
3 ඔව්හු ඔබේ සෙනඟට විරුද්ධ ව කූට උපා
යොදන්නෝ ය.
q2 3 ඔබ රැකවරණය දෙන අයට එරෙහි ව
කුමන්ත්‍රණ කරන්නෝ ය.
4 ඔව්හු කතා කොට, "එන්න, ඉශ්රායලේ නාමය
මින් මතු සිහි නොවන පිණිස ඒ මුළු ජාතිය ම
වනසාලමු"යි කියන්නෝ ය.
5 සත්තට ම ඒකමතික ව ඔව්හු කුමන්ත්‍රණය
කරන්නෝ ය;
q2 5 ඔබට විරුද්ධ ව පරෙමුණු බඳින්නෝ ය.
6 ඔව්හු ඒදොම්ගේ සහ ඉෂ්මායලේගේ
ගෝත්‍රවලට අයිති තැනැත්තෝ ය.
q2 6 මෝවබ්ගේ සහ හගරීනයන්ගේ ගෝත්‍රවලට
අයිති තැනැත්තෝ ය.
7 මොවුහු ගබොල්ගේත්, අම්මොන්ගේත්,
අමලෙක්ගේත් වංශවලට අයිති තැනැත්තෝ ය.
q2 7 තීර්හි වාසීන් සමඟ පිලිස්තියාවේ වැසියෝ ය.
8 අසිරියාව ද ඔවුන් සමඟ අත්වැල් බැඳගත්තේ ය.
q2 8 එය ලොත්ගේ පරපුරට අයත් බලවත් මිතුරා වී
ඇත්තේ ය.
9 විනි 4:6-22; 7:1-23 මිදියන්වරුන්ට සහ සිසෙරාට
කළ පරිදි ද කිෂොන් නදිය අසල ජාබින්ට කළ පරිදි
ද ඔවුන්ට කළ මැනව.
10 ඔබ ඔවුන් එන්දෝර්හි දී විනාශ කළ සේක.
q2 10 ඔව්හු පොළොවට පොහොර මෙන් වූ හ.
11 විනි 7:25; 8:12 ඔබ ඕරබේට සහ ශිබ්ට කළ
පරිදි ඔවුන්ගේ නායකයන්ටත් කළ මැනව.
q2 11 ඔබ සබො සහ ශල්මුන්නා පරාජය කළ පරිදි
ඔවුන්ගේ පාලකයන් ද පරාජය කළ මැනව.
12 ඔව්හු කතා කොට, "දෙවිඳුන්ට අයිති සාර භූමිය
අපේ අයිතිය පිණිස පැහැර ගනිමු"යි කීවෝ ය.
13 මාගේ දෙවිඳුනි, ඔවුන් සුළඟට ගසාගෙන යන
ධූලි මෙන් ද බොල් වී මෙන් ද කළ මැනව.
14 ගින්න වනාන්තරය දවන සේ ද ගිනිදැල්ල
කඳුකරය දවන සේ ද
15 ඔබේ චණ්ඩ මාරුතයෙන් ඔවුන් ලුහුබැඳ යනු
මැනව.
q2 15 ඔබේ සැඩ සුළඟින් ඔවුන් බිය ගැන්වුව මැනව.
16 සමිඳුනි, ඔවුන්ගේ මුහුණු විළි ලජ්ජාවෙන්
පිරවුව මැනව.
q2 16 ඔබේ නාමය පිළිගන්න තකේ එලෙසෙ කළ
මැනව.
17 ඔව්හු සදහට ම පරාජය වී භීතියෙන් පළෙත්
වා!
q2 17 අපකීර්තියෙන් ඔව්හු වැනසී යත් වා!
18 ඔබ වහන්සේගේ නාමය පමණක් 'සමිඳාණෝ'
බව ද මිහි පිට ඔබ පමණක් 'අති උත්තමයාණෝ'
බව ද ඔව්හු දැනගනිත් වා!

## වන්දනා ගීතයක්

84 සව් බලැති දෙවිඳුනි, ඔබගේ වාසභවනය
කොතරම් මනහර ද?
2 මසිත සමිඳුන්ගේ මන්දිර දෙස දැවෙන ආශාවෙන්
බලා සිටියි.
q2[2] මාගේ ගත සිත ජීවමාන දෙවිඳුන්ට ප්‍රීතියෙන්
ගී ගයයි.
3 සව් බලැති දෙවිඳුනි, මාගේ රජාණන් වන
දෙවිඳුනි, ගේ කිරිල්ලිය ගයෙක් ද වැහිලිහිණිය
ඈගේ පැටවුන් දැමීමට කැදැල්ලක් ද ඔබගේ
පූජාසනයෙහි සොයාගෙන ඇත.
4 ඔබගේ ගෘහයෙහි වසන්නෝ කොපමණ
වාසනාවන්ත ද?
q2[4] ඔව්හු නිරතුරු ඔබට පසස් ගී ගයන්නෝ ය.
5 වන්දනාවේ යන පිණිස සිත යොමු කරගත්, ඔබ
සරණ කොටගත් අය කොපමණ වාසනාවන්ත ද?
6 ඔව්හු වැලපීමේ මිටියාවත මැදින් යන කල එය
උල්පත් සහිත ස්ථානයක් කරගනිති.
q2[6] පළමු වන වැහි වලාව එය දිය කඩිතිවලින්
පුරවන්නේ ය.
7 ඔව්හු වැඩි වැඩියෙන් ශක්තිමත් වන්නෝ ය;
q2[7] සියොන් කන්දෙහි වැඩ සිටින දේවාතිදෙවිඳුන්
දකින්නෝ ය.
8 සමිඳුනි, සව් බලැති දෙවිඳුනි, මා අයැදුම ඇසුව
මැනව.
q2[8] අහෝ ජාකොබ්ගේ දෙවිඳුනි!
q2[8] මට සවන් දුන මැනව.
9 අපගේ පලිහ වන දෙවිඳුනි, බලනු මැනව.
q2[9] ඔබගේ අභිෂේක ලත් තැනැත්තා දෙස කරුණා
බැල්ම හෙළනු මැනව.
10 ඔබගේ මණ්ඩපයෙහි එක් දිනක් සිටීම අන්
තැනක දින දහසකට වඩා කොපමණ වාසනාවන්ත
ද?
q2[10] දුදනන්ගේ නිවසේවල ජීවත් වීමට වඩා මාගේ
දෙවිඳුන්ගේ නිවසෙහි දොරටුව ළඟ සිටීමට මම
කැමැත්තෙමි.
11 සමිඳාණෝ පවුර ද පලිහ ද වන සේක;
q2[11] අපට කරුණාවත්, මහිමයත් පෙන්වමින්
ආශීර්වාද කරන සේක;
q2[11] නිදොස් ලෙස හැසිරෙන අයට සෑම යහපතක්
දෙන සේක.
12 අහෝ සව් බලැති සමිඳුනි!
q2[12] ඔබ අදහන මිනිසා කොපමණ වාසනාවන්ත ද?

## ජාතික අභිවෘද්ධිය සඳහා යාච්ඤාවක්

*කෝරාගේ පුත්‍රයන්ගේ ගීතයකි.*

85 සමිඳුනි,
q2
85 ඔබ දේශයට කරුණා කළ සේක;
q2
85 ජාකොබ්ගේ සම්පත ආපසු දුන් සේක.
2 ඔබ ඔබගේ සෙනඟගේ වරදට කමා කළ සේක;
q2[2] ඔවුන්ගේ සියලු ම පාපවලට ද සමාව දුන්
සේක.
3 ඔබ ඔබගේ සියලු කෝපාග්නිය නිවාදැමූ සේක;
q2[3] ඔබගේ ඇවිලෙන උදහස පහකළ සේක.
4 අපගේ ගැළවුම්කාර දෙවිඳුනි, අප ආපසු ගෙන අව
මැනව.
q2[4] ඔබගේ කෝපය අප වෙතින් ඉවත් කළ මැනව.
5 සදහට ම ඔබ අප සමඟ උදහස් ව සිටින සේක්
ද?
q2[5] ඔබගේ කෝපය පරපුරෙන් පරපුරට ඇවිළි ඇවිළී
යන්න ඉඩ දෙන සේක් ද?
6 ඔබගේ සෙනඟ ඔබ තුළ ප්‍රීති ප්‍රමෝද වන
පිණිස ඔබ යළි අපට ජීවනය දුන මැනව.
7 සමිඳුනි, ඔබගේ තිර පෙම අපට පෙන්නුව මැනව.
q2[7] ගැළවීමේ පිහිට අපට ද දානය කළ මැනව.
8 දෙවි සමිඳුන් වදාරන වදනට සවන් දෙමි,
q2[8] මන්ද, සිය සෙනඟට ද සැදැහැවතුන්ට ද
එතුමාණන් තුළ විශ්වාසය තබන අයට ද සමිඳාණෝ
සාමදානය දීමට පොරොන්දු වූ සේක.
9 එතුමන් හට ගරුබිය පාන අයට ගැළවීම ඉතා
සමීප ව ඇත්තේ ය.
q2[9] සත්තට ම එතුමන්ගේ මහිමාලංකාරය අප
රටෙහි බබළන්නේ ය.
10 තිර පෙම සහ විශ්වාසවන්තකම හමු වන්නේ
ය.
q2[10] දැහැමි බව සහ සාමය වැළඳ ගන්නේ ය.
11 විශ්වාසවන්තකම මිහි තලයෙන් ඉහළට
නඟින්නේ ය.
q2[11] දැහැමි බව සගලොවින් පහළට බසින්නේ ය.
12 සමිඳාණෝ අප සමෘද්ධිමත් කරන සේක.
q2[12] අපගේ දේශය එහි පලදාව නිපදවන්නේ ය.
13 දැහැමි බව එතුමන්ට පෙරටු ව යන්නේ ය.
q2[13] එතුමන්ගේ පා සළකුණු මාර්ගයක් වන්නේ ය.

## විශ්වාස මහෙකෙරුවාගේ යැදුම

*දාවිත්ගේ යාච්ඤාවකි.*

86 සමිඳුනි, ඔබ කන් යොමා මට පිළිතුරු දුන
මැනව.
q2
86 මන්ද, මම අසරණ ය;
q2
86 මම දුබල ය.
2 මා භක්තිවන්ත බැවින් මා මරණින් මුදනු
මැනව;
q2[2] ඔබ කෙරෙහි විශ්වාස කරන ඔබගේ දාසයා
මුදාලුව මැනව.
3 මාගේ සමිඳුනි, මට අනුකම්පා කළ මැනව.
q2[3] මුළු දවස පුරා මම ඔබට අයැදිමි.
4 ඔබගේ දාසයාගේ සිත ප්‍රීතිමත් කළ මැනව.
q2[4] මන්ද, මාගේ සමිඳුනි, මම ඔබට යාච්ඤා කරමි.
5 මාගේ සමිඳුනි, ඔබ යහපත් ය, ඔබ කමා කරන
සේක;

q2 5 ඔබට අයැදින සියල්ලන්ට තිර පෙම බහුල ව
ප්‍රදානය කරන සේක.
6 සමිඳුනි, මාගේ අයැදුමට සවන් දුන මැනව.
q2 6 පිහිට පතමින් මා කරන අයැදුමට කන් දුන
මැනව.
7 විපත් කාලයේ දී මම ඔබට හඬගසන්නෙමි.
q2 7 ඔබ මට පිළිතුරු දෙන සේක.
8 අහෝ සමිඳුනි!
q2 8 දෙවිවරුන් අතර ඔබට සමාන අන් කෙනෙකේ
නැත්තේ ය.
q2 8 ඔබේ ක්‍රියාවන්ට සම කළ හැකි අන් ක්‍රියා ද
නැත්තේ ය.
9 එළිද 15:4 මාගේ සමිඳුනි, ඔබ මැවූ සියලු ජාතීහු
ඔබ වෙත පැමිණ ඔබට නමදින්නෝ ය.
q2 9 ඔව්හු ඔබේ නාමය පසසමින් ඔබට ගරු
කරන්නෝ ය.
10 ඔබ බලසම්පන්න ය, අරුමපුදුම දේ කරන
සේක.
q2 10 ඔබ පමණක් දෙවිඳාණෝ ය.
11 සමිඳුනි, ඔබේ සත්‍යයෙහි පමණක් ගමන් කරන
පිණිස ඔබේ මාර්ගය මට පෙන්නුව මැනව.
q2 11 ඔබේ නාමයට ගරු කරන පිණිස හිතවත්කමින්
ම හද එක් කළ මැනව.
12 මාගේ දෙවි සමිඳුනි, හද පත්ලෙන් මම ඔබට
තුති කරමි.
q2 12 ඔබේ නාමය සදහට ම වර්ණනා කරමි.
13 මා වෙත ඇති ඔබේ තිර පෙම කොපමණ මහත්
ද?
q2 13 ගැඹුරු පාතාලයෙන් ඔබ මා මිදූ සේක.
14 දෙවිඳුනි, අහංකාර අය මට එරෙහි ව
නැඟිටින්නෝ ය.
q2 14 ඔබට ගරු නොකරන කුරිරු මිනිස් පිරිසක් මා
මරන්නට සොයන්නෝ ය.
15 මාගේ සමිඳුනි, ඔබ මතේ සිත් ඇති
දයානුකම්පාව පාන දෙවිඳාණෝ ය, ඉවසන සුලු,
කරුණාවන්තේ සහ විශ්වාසවන්තකමින් සපිරි තැනැන්
වහන්සේ ය.
16 මා වෙත හැරී මට අනුකම්පා කළ මැනව;
q2 16 මා ශක්තිමත් කොට මා ගැළවුව මැනව.
q2 16 මන්ද, මාගේ මව ඔබට සේවය කළ පරිදි මම
ද ඔබට සේවය කරමි.
17 ඔබ මට ආධාරය සහ සැනසීම දුන් බව මාගේ
සතුරන් දැන ලජ්ජා වන පිණිස, ඔබේ දයා
කරුණාවට සාක්ෂියක් දුන මැනව.

### සියොන් කන්දේ තේජස

*කෝරාගේ පුත්‍රයන්ගේ කාව්‍යමය ගීතයකි.*

87 ශුද්ධ කන්ද මත සමිඳාණෝ
q2
87 සිය නගරය ගොඩනැඟුව සේක.
2 ඉශ්‍රායලේහි අන්කිසි තැනකට වඩා
සමිඳාණෝ ජෙරුසලමට ප්‍රේම කරන සේක.
3 එම්බා දෙවි නුවර!
q2 3 ඔබ ගැන අසිරිමත් දෙයෙ පවසනු ලබන්නේ ය.
4 "මා පිළිගන්න ජාතීන් අතර මිසරය සහ
බබිලෝනිය සඳහන් කරන්නෙමි.
q2 4 ජෙරුසලමේ වැසියන් සමඟ පිලිස්තිය, තීර් සහ
එතියෝපියාව යන දේශවල ජනයා ද ගණන්
කරන්නෙමි.
q2 4 'මොහු මෙතැන ජන්ම ලාභය ලැබී යැ'යි මිනිස්සු
කියන්නෝ ය.
5 සියොන් කන්ද ගැන මෙසේ කියනු ලබන්නේ ය;
q2 5 'සියලු ජාතීහු එහි උපත ලද්දෝ ය;
q2 5 මහෝත්තමයාණෝ ඇය ශක්තිමත් කරන
සේක.'
6 ජනතාවන්ගේ ලේඛනයක් සකස් කරන විට,
සියලු දෙන ජෙරුසලම් වැසියන් ලෙස, 'මොහු
මෙතැන ජන්ම ලාභය ලැබී ය'යි සමිඳාණෝ
ගණන්ගන්න සේක.
7 'අපේ සියලු ආසිරිවල උල්පත සියොන් ය'යි
කියමින්, ඔව්හු ගී ගයමින් නටන්නෝ ය.

### දුගියාගේ මොරගැසීම

*කෝරාගේ පුත්‍රයන්ගේ කාව්‍යමය ගීතයකි. නිජ*
*බිම හේමාන් යන තැනැත්තාගේ ගීතයකි.*

88 මාගේ දෙවි සමිඳුනි, මාගේ
ගැළවුම්කාරයාණනි, දිවා කාලයේ මම ඔබට
යදිමි;
q2
88 රෑ කාලයේ මම ඔබට හඬගසමි.
2 මාගේ අයැදුම ඔබ වෙත පැමිණේ වා!
q2 2 මාගේ හඬට සවන් දුන මැනව.
3 මාගේ සිත කරදරවලින් ගහණ වී ඇත්තේ ය.
q2 3 මාගේ ජීවිතය මිනී වළට ආසන්න ය,
4 මරණාසන්න කෙනෙකු මෙන් මම ගණන්ගනු
ලැබුවෙමි.
q2 4 මම දුබලයකු මෙන් වී ඇත්තෙමි.
5 මළවුන් අතර ම උන් කෙනෙකු මෙන් මම
අත්හරිනු ලැබුවෙමි;
q2 5 සොහොනේ තැන්පත් කරනු ලැබූ කෙනෙකු
මෙන් මම වැටී සිටියෙමි;
q2 5 ඔබ විසින් සදහට ම අමතක කරන ලද ඔබේ
සරණින් ඈත් වූවකු මෙන් වී සිටිමි.
6 ඔබ මා පාතාලයේ පතුලට හෙළූ සේක.
q2 6 අඳුරු ගැඹුරු පෙදෙසෙට මා දැමූ සේක.
7 ඔබේ උදහස මට මහ බරකි;
q2 7 ඔබේ කෝපාග්නිය මට පීඩා කරන්නේ ය.
8 ඔබ මාගේ මිතුරන් මා වෙතින් ඈත් කළ සේක.
q2 8 මා ඔවුන්ට පිළිකුලක් මෙන් වන්නට හළ සේක.
q2 8 සිරගත වී සිටි බැවින් මට මිදී යා නොහැකි ය.
9 කරදර නිසා මාගේ නෙතේ අඳුරු වී ඇත්තේ ය.
q2 9 සමිඳුනි, මම දිනපතා ඔබ අයැදිමි;
q2 9 ඔබ වෙත මාගේ අත් ඔසවන්නෙමි.
10 ඔබ වහන්සේ මළවුන් උදෙසා අසිරිමත් දේ
කරන සේක් ද?
q2 10 ඔව්හු නැඟිට ඔබ පසසන්නෝ ද?

11 සොහොන් වළෙහි දී ඔබේ තිර පෙම ගැන ද
පාතාලයෙහි දී ඔබේ විශ්වාසවන්තකම ගැන ද කතා
කරනු ලැබේ ද?
12 ඔබේ අසිරිමත් ක්‍රියා අඳුරෙහි දී පෙනේවනු
ලැබේ ද?
q212 ඔබේ යහපත්කම මළවුන්ගේ දේශයෙහි දී
සිහි කරනු ලැබේ ද?
13 සමිඳුනි, මම ඔබට හඬගසන්නෙමි;
q213 අලුයම මාගේ අයැදුම ඔබ වෙත පැමිණේ වා!
14 සමිඳුනි!
q214 ඔබ මා ප්‍රතික්ෂේප කරන්නේ මන් ද?
q214 මා වෙතින් ඔබේ මුහුණ සඟවා ගන්නේ මන්
ද?
15 යොවුන් වියේ පටන් පීඩිත ව කඳේරි ගාමින්
මම මැරෙන්නට ආසන්න ව සිටියෙමි;
q215 ඔබනේ පැමිණෙනෙ දඬුවම්වල බරින් මම තැළී
පොඩි වී සිටියෙමි.
16 ඔබේ කෝපාග්නිය මා ඉහවහ ගොස් ඇත්තේ
ය.
q216 ඔබේ බියකරු පහර මා විනාශ කර ඇත්තේ
ය.
17 ගංවතුරක් මෙන් ඒවා දවස පුරා මා වටලා
සිටින්නේ ය.
q217 හාත්පසින් ඒවා ළං වී මා වසා ගන්නේ ය.
18 මාගේ හිත මිතුරු අසල්වාසීන් පවා ඔබ මා
වෙතින් දුරු කළ සේක.
q218 මාගේ එක ම හිත මිතුරා නම් අඳුර වේ.

## විශ්වාසී දෙවිඳුන්ට තුති ගීයක්

*එස්‍රාහි උපන් ඒතාන් නමැත්තාගේ කාව්‍යයකි.*
**89** 1 රාජා 4:31 සමිඳුනි, ඔබේ තිර පෙම ගැන
මම සදහට ම ගයන්නෙමි.
q2
**89** ඔබේ විශ්වාසවන්තකම පරපුරෙන් පරපුරට
පවසන්නෙමි.
2 ඔබේ තිර පෙම සදහට ම පවතින බව මම
ඒකාන්තයෙන් ම පිළිගනිමි;
q22 ඔබේ විශ්වාසවන්තකම අහස මෙන් තිරසර
බව මම දනිමි.
3 ඔබ මෙසේ වදාළ සේක:
q23 “මා තෝරාගත් තැනැත්තා සමඟ මම ගිවිසුමක්
කළෙමි;
q23 මාගේ සේවක දාවිත්ට මම මෙසේ දිවුළෙමි:
4 2 සාමු 7:12-16; 1 වංශා 17:11-14; ගීතා 132:11;
ක්‍රියා 2:30 ‘මම ඔබේ පෙළපත සදහට ම
පිහිටුවන්නෙමි.
q24 පරපුරෙන් පරපුරට ඔබේ සිහසුන
ගොඩනඟන්නෙමි.’ ”
5 අහෝ සමිඳුනි!
q25 ඔබ කරන අසිරිමත් ක්‍රියා ගැන අහස් තලය ගී
ගයන්නේ ය.
q25 සුරලොව පිරිස් ඔබේ විශ්වාසවන්තකම ගැන
ගීතිකා කරන්නෝ ය.
6 සමිඳුන්ට සම කළ හැකි කිසිවකේ අහස් තලයෙහි
ඇද් ද?
q26 දෙවිවරුන් අතර සමිඳුන්ට සමාන වනුයේ
කවරෙක් ද?
7 සුද්ද සෙනේ සබ මැද ඔබට ගරුබිය දක්වන්නෝ ය.
q27 සියල්ලෝ ඔබට බියෙන් සිටින්නෝ ය.
8 සව් බලැති දෙවි සමිඳුනි, ඔබ හා සම,
බලසම්පන්න අන් කවරෙක් ද?
q28 සමිඳුනි, සියල්ලෙහි දී ඔබ විශ්වාසවන්ත ය.
9 ඔබ චණ්ඩ සමුද්‍රය පාලනය කරන සේක;
q29 එහි රළපතර නඟින කල ඔබ ඒවා දමනය
කරන සේක.
10 ඔබ රාහබ් නම් දිය රකුසා කැබලි කොට සුණු
විසුණු කරදැමූ සේක;
q210 සිය බාහු බලය පා සතුරන් පලවා හළ සේක.
11 අහස් තලය ඔබේ ය, මිහි තලය ද ඔබේ ය,
පොළොවත්, එහි ඇති සියල්ලත් ඔබ මැවූ සේක.
12 උතුරත්, දකුණත් ඔබ මැවූ සේක;
q212 තාබෝර් සහ හර්මොන් යන කඳු ඔබේ නමට
ප්‍රීතියෙන් ගී ගයන්නේ ය.
13 ඔබේ බාහුව ප්‍රබල ය;
q213 ඔබේ අත බලවත් ය.
q213 ඔබේ දකුණත ජයෙන් ඔසවා ඇත්තේ ය.
14 සාධාරණකම සහ යුක්තිය ඔබ සිහසුනේ පදනම්
ය;
q214 තිර පෙම හා සත්‍යය ඔබ කරන සියල්ලෙහි
වේ.
15 සමිඳුනි, ගී ගයමින් ඔබ නමදින්නෝ ද ඔබේ
කරුණා ආලෝකය තුළ හැසිරෙන්නෝ ද
භාග්‍යවන්තයෝ ය.
16 දවස පුරා ඔව්හු ඔබ අබියස ප්‍රීති ප්‍රමෝද
වන්නෝ ය;
q216 ඔබේ දැහැමිකම ගැන වෙසෙසින් පසසන්නෝ
ය.
17 ඔබ අපට මහිමාන්විත ජයග්‍රහණ දෙනෙ සේක.
q217 ඔබේ කරුණාවෙන් ඔබ අපට ජය අත්කර දෙනෙ
සේක.
18 සමිඳුනි, ඔබ අපේ ආරක්ෂාකරු අපට තෝරා දුන්
සේක.
q218 ඉශ්‍රායලේවරුන්ගේ සුවිශුද්ධ දෙවිඳුන් වන ඔබ
අපේ රජු අපට දුන් සේක.

## දාවිත්ට දේව පොරොන්දුව

19 කලකට පෙර ඔබ දර්ශනය වී, බැතිමතුන් හට
කතා කොට මෙසේ වදාළ සේක:
q219 “මම වීරයකු හිස මත කිරුළ තැබුවෙමි;
q219 මාගේ සෙනඟ අතරෙන් තෝරාගත්
තැනැත්තකුට සිහසුන දිනිමි.
20 1 සාමු 13:14; 16:12; ක්‍රියා 13:22 මා සේවක
දාවිත් මම සොයාගත්තෙමි;
q220 ශුද්ධ තෙලෙයන් මම ඔහු ආලේප කළෙමි.
21 මාගේ ශක්තිය නිරතුරු ඔහු සමඟ වන්නේ ය;
q221 මාගේ බලය ඔහු සවිමත් කරන්නේ ය.

22 කිසි ම සතුරකේ ඔහුට විරුද්ධ ව නැඟිට ජය
ගන්නේ නැත;
q2[22] කිසි ම දුදනකේ ඔහු පරාජය කරන්නේ නැත.
23 මම ඔහුගේ එදිරිකරුවන්ට පහර දෙන්නෙමි;
q2[23] ඔහුට වෛර කරන සියල්ලන් වනසාලන්නෙමි.
24 මාගේ විශ්වාසවන්තකම සහ තිර පෙම ඔහු
සමඟ වන්නේ ය;
q2[24] මාගේ නාමයෙන් ඔහු ජයග්‍රාහී වන්නේ ය.
25 මම ඔහුගේ බලය මහ මුහුදේ පිහිටුවන්නෙමි;
q2[25] එය ගංගාව දක්වා පතුරුවා හරින්නෙමි.
26 ඔහු මට මොරගසමින්, 'ඔබ මාගේ දෙවිඳාණෝ
ය, මාගේ පියාණෝ ය, මාගේ ආරක්ෂක
පර්වතයාණෝ ය' කියන්නේ ය.
27 එළිද 1:5 ඔහු මාගේ කුලුඳුල් පුතණුවන් කොට
ද මිහි පිට රජුන් අතර අග රජු කොට ද මම ඔහු
පත් කරන්නෙමි.
28 මම ඔහුට සදහට ම ප්‍රේම කරන්නෙමි;
q2[28] ඔහු උදෙසා මාගේ ගිවිසුම ස්ථිර ව පවත්නේ
ය.
29 ඔහුගේ රාජ වංශය අහස මෙන් තිරසර ව
පවතින්නේ ය;
q2[29] ඔහුගේ පළෙපතෙන් ම කෙනෙකේ නිරතුරු
රජකමට පත් වන්නේ ය.
30 ඔහුගේ දරුදැරියෝ මාගේ නීතියට අකීකරු
වන්නෝ නම්, මාගේ නියමයන්ට අනුව ජීවත්
නොවන්නෝ නම්,
31 ඔව්හු මාගේ නියෝග නොසලකා හරින්නෝ
නම්, මාගේ අණපණත් නොපිළිපදින්නෝ නම්,
32 එවිට, ඔවුන්ගේ කැරලිගැසීමට දණ්ඩෙන් ද
ඔවුන්ගේ අපරාධවලට කස පහරින් ද මම දඬුවම්
දෙන්නෙමි.
33 එහෙත්, මම මාගේ ප්‍රේමය කවදාවත්
දාවිත්ගෙන් ඉවත් නොකරන්නෙමි.
q2[33] ඔහු කෙරෙහි මාගේ විශ්වාසවන්තකම
නිෂ්ප්‍රභ නොකරන්නෙමි.
34 මම මාගේ ගිවිසුම කඩ නොකරන්නෙමි;
q2[34] පොරොන්දු කිසිවක් වෙනස් නොකරන්නෙමි.
35 මම මාගේ ශුද්ධවන්තකම පිට සදහට ම
දිවුළෙමි;
q2[35] එබැවින් දාවිත්ට මම බොරුවක්
නොකියන්නෙමි.
36 ඔහුගේ පළෙපත සදහට ම පවතින්නේ ය;
q2[36] ඔහුගේ සිහසුන මා අබියස හිරු මෙන්
බබළන්නේ ය.
37 ඔහුගේ පළෙපත සඳ මෙන් දිගට ම ජීවත්
වන්නේ ය;
q2[37] අහස පවත්නා තෙක් එය තිරසර ව
පවතින්නේ ය."

## පරාජය ගැන විලාපය

38 එහෙත්, ඔබ ඒ රජ කෝපයෙන් පහකළ සේක.
q2[38] ඔබේ අබිසසේ ලත් තැනැත්තා කෙරෙහි
උදහසින් රොස් වූ සේක;
39 ඔබේ සේවකයා සමඟ ඔබ කළ ගිවිසුම ඔබ
කඩකළ සේක.
q2[39] ඔහුගේ කිරුළ බිම හළො කලෙසො දැමූ සේක.
40 ඔබ ඔහුගේ පවුරු සියල්ල බිඳදැමූ සේක;
q2[40] ඔහුගේ බලකොටු නටබුන් කළ සේක.
41 මඟ යන එන සියල්ලෝ ඔහුගෙන් කොල්ල
කන්නෝ ය;
q2[41] ඔහුගේ අසල්වැසියෝ ඔහුට සමච්චල්
කරන්නෝ ය.
42 ඔබ ඔහුගේ එදිරිකරුවන්ට ජය අත්කර දුන්
සේක;
q2[42] ඔබ ඔහුගේ සියලු සතුරන්ට ප්‍රීතිය ගෙන දුන්
සේක.
43 ඔබ උදහසින් ඔහුගේ කඩු මුවහත නමාදැමූ
සේක;
q2[43] සටනේ දී ඔහුගේ කඩුව එසවීමට ඉඩ
නොහැරිය සේක.
44 ඔබ ඔහුගේ ජයකොන්තය පැහැර ගත් සේක;
q2[44] ඔහුගේ සිහසුන බිම හළෙ සේක.
45 ඔබ ඔහුගේ යොවුන් විය කෙටි කළ සේක.
q2[45] ඔහු අපකීර්තියට පත් කළ සේක.

## විමුක්තිය සඳහා යැදුම

46 සමිඳුනි, ඔබ සදහට ම අපෙන් ඈත් වී සිටින
සේක් ද?
q2[46] කොපමණ කලක් ඔබේ උදහස් ගින්න
ඇවිලෙන්නේ ද?
47 මාගේ කාලය කොපමණ කෙටි දැ යි සිහි කරනු
මැනව.
q2[47] මන්ද, මැරෙන සුලු අය මෙන් ඔබ සියලු
මිනිසුන් මැවූ සේක.
48 ජීවමාන කවරකේ නම්, මරණයට ගොදුරු
නොවන්නේ ද?
q2[48] පාතාල ලෝකයේ බලයෙන් කවරකේ තමා ම
මුදාගන්නේ ද?
49 අහෝ සමිඳුනි!
q2[49] ඔබ කලින් පෑ තිර පෙම දැන් කොතැන්හි ද?
q2[49] දාවිත්ට දුන් විශ්වාසවන්ත පොරොන්දු දැන්
කොහි ද?
50 සමිඳුනි, ඔබේ සේවකයා ලබන නින්දාව සිහි
කරනු මැනව.
q2[50] විජාතීන්ගේ නින්දාව මා විඳින රඟ සිහි කරනු
මැනව.
51 සමිඳුනි, ඔබේ සතුරෝ ඔබේ ආලේප ලත් රජුට
අපහාස කරන්නෝ ය;
q2[51] ඔහු යන යන තැන ඔහුට ගරහන්නෝ ය.
52 සමිඳුන්ට සදහට ම ආසිරි වේ වා!

# සතර වන කාණ්ඩය

(ගීතා 90—106)

## අපේ සදාතන සරණ

*දේව භක්තික මෝසෙස්ගේ යාච්ඤාවකි.*

90 සමිඳුනි, පරපුරනේ පරපුරට ඔබ වහන්සේ
අපගේ වාසස්ථානය වන සේක.
2 කඳු හලේ ඇති වන්නට පෙර සිට ඔබ පොළොව
ද සක්වළ ද මවන්නට පෙර සිට සදාකාලයනේ
සදාකාලයට ම ඔබ දෙවියන් වහන්සේ වන සේක.
3 ඔබ මිනිසා යළි දූවිල්ලට හරවන සේක, “මිනිසුනි,
දූවිල්ලට හැරේවා” කියා ඔබ වදාරන සේක.
4 2 පේදු 3:8 ඔබ ඇස් ඉදිරියෙහි වසර දහසක්
ගෙවී ගිය ඊයේ දවස වැනි ය,
q2[4] රැයේ එක යාමයක් වැනි ය.
5 සැඩ පහරකින් මෙන් ඔබ මිනිසුන් ගෙන යන
සේක;
q2[5] ඔව්හු සිහිනයක් මෙන් පහ වී යති;
q2[5] උදේ දලු දැමූ තණ පත හා සමාන වන්නෝ ය.
6 උදේ ඒවා සරුසාර ලෙස වැඩෙන්නේ ය, සවස්
කල පර වී වියළී යන්නේ ය.
7 ඔබේ කෝපය අප දවාලන්නේ ය;
q2[7] ඔබේ උදහස අප කළඹාලන්නේ ය.
8 අප අයුතුකම් ඔබට පෙනෙන්නේ ය.
q2[8] අපේ රහස් පව් ඔබේ මුහුණේ එළියට ලක්
වන්නේ ය.
9 අප දිවි පැවැත්ම ඔබේ උදහස මැද ගෙවී යන්නේ
ය;
q2[9] අප ආයු සුසුමක් සේ කෙළවර වන්නේ ය.
10 අප ආයු හැත්තෑ අවුරුද්දකි, සවි ශක්තිය
ඇත්නම්, අසූවක් විය හැකි ය.
q2[10] එහෙත්, ඒ කාලය කම්කටොළු හා දුක ම ය.
q2[10] අප ආයු ගෙවී ගොස් දිවි පැවැත්ම වහා නිම
වන්නේ ය.
11 ඔබේ කෝපයේ බලවත්කම දන්නේ කවරෙක්
ද?
q2[11] ඔබේ උදහසින් වන භීතිය කාට තේරුම්ගත
හැක්කේ ද?
12 දිවි පැවැත්ම කොතරම් ලුහුඬු ද කියා වටහා දුන
මැනව.
q2[12] මයෙ මනෙහි කරන පිණිස නැණවත් සිතක්
අපට දුන මැනව.
13 සමිඳුනි, මෙපමණ දිගු කලක් ඇත් වී නොසිට
ඔබ අප වෙත පෙරළා පැමිණිය මැනව.
q2[13] ඔබේ දාසයන්ට අනුකම්පා කළ මැනව.
14 උදයෙන් උදය ඔබේ ප්‍රේමයෙන් පිරී අපි අවදි
වමු.
q2[14] දිවිය පුරා තුටු පහටු සිතින් අපි ගී ගයමු.
15 අප පීඩා වින්ද සමය පමණට ද අප නපුරට ලක්
වූ කාලය තරමට ද අපට සොමිනස් සමයක් දුන
මැනව.
16 ඔබේ ප්‍රබල ක්‍රියා ඔබේ මෙහෙකරු අපට ද
ඔබේ තේජස අප පරපුරට ද දක්නට වරම් දුන
මැනව.
17 අප දෙවිඳුන්ගේ කරුණාව අප කෙරෙහි බැබළේ
වා!
q2[17] අපේ වැඩ කටයුතු ඔබ මඟින් ජයනේ ජයට
පැමිණේ වා!
q2[17] අපේ වැඩ කටයුතු ඔබ මඟින් ජයනේ ජයට ම
පැමිණේ වා!

### දෙවිඳුන් කෙරේ අචල විශ්වාසය

91 පරමෝත්තමයාණන්ගේ රැකවරණයෙහි
වසන තැනැත්තේ, සර්ව බලැති දෙවිඳුන්ගේ
සරණෙහි සුරැකි වන්නේ ය.
2 ඔහු සමිඳුන්ට මෙසේ පවසයි:
q2[2] “එතුමාණෝ මාගේ රැකවරණය ය;
q2[2] මාගේ බලකොටුව ය;
q2[2] මාගේ දෙවිඳාණෝ ය.
q2[2] මම එතුමන් කෙරෙහි මාගේ විශ්වාසය
තබන්නෙමි.”
3 එතුමාණෝ, කපටින්ගේ මලපත්වලින් ද බියකරු
ලෙඩරෝගවලින් ද අප රැකගන්න සේක.
4 සිය පියාපත්වලින් ඔබ ආවරණය කරන සේක;
q2[4] ඒවා ඔබේ රැකවරණ වන්නේ ය.
q2[4] එතුමන්ගේ විශ්වාසවන්තකම ඔබට
රැකවරණය ද පලිහ ද වන්නේ ය.
5 රෑ කාලයේ ඇති වන බියට වත්, දවාලේ ඊ
පහරින් වන උවදුරට වත් ඔබ බිය නොවන්නෙහි ය.
6 අඳුරේ සැරිසරන වසංගතයට වත්, මද්දහනේ
වනසාලන පීඩාවට වත්, ඔබ බිය නොවන්නෙහි ය.
7 දහසක් ඔබේ වම් පසින් ද දස දහසක් ඔබේ
දකුණු පසින් ද වැටෙන්නෝ ය.
q2[7] එහෙත්, පීඩාවක් ඔබට නම් ඇති නොවන්නේ
ය.
8 ඔබේ ම දෙනෙතින් මේ සියල්ල ඔබ දකින්නෙහි
ය.
q2[8] දුදනන්ට වන දඬුවම ඔබ නරඹන්නෙහි ය.
9 ඔබ, සමිඳාණන් තුළ ඔබේ රැකවරණය තැබුවෙහි
ය.
q2[9] පරමෝත්තමයාණන් ඔබේ වාසභවනය
කරගත්තෙහි ය.
10 එවිට ඔබට කිසි උවදුරක් නොවන්නේ ය;
q2[10] ඔබේ නිවසෙට කිසියම් වසංගතයක් ළං
නොවන්නේ ය.
11 මතෙ 4:6; ලූක් 4:10 ඔබ ගන්න සෑම පියවරක දී
ඔබ රක්නා පිණිස, එතුමාණෝ සිය දූතයන්ට අණ
දෙන සේක.
12 මතෙ 4:6; ලූක් 4:11 ඔබ දපො, ගල්වල
නොහැප්පෙන පිණිස, ඔව්හු සිය'තින් ඔබ
උසුලාගන්නෝ ය.
13 ලූක් 10:19 ඔබ, සිංහයකු වුවත්, සර්පයකු
වුවත් පාගන්නෙහි ය;
q2[13] ඔබ කේශර සිංහයකු වුවත්, මකරකු වුවත්
පාගා දමන්නෙහි ය.
14 සමිඳාණෝ මෙසේ වදාරන සේක:
q2[14] “ඔහු මට ප්‍රේම කරන්නේ නම්, මම ඔහුට
විමුක්තිය දෙන්නෙමි.
q2[14] ඔහු මාගේ නාමය පිළිගන්නේ නම්, මම ඔහු
රැකගන්නෙමි.

15 ඔහු මට අයැදින්නේ නම්, මම පිළිතුරු
දෙන්නෙමි.
q2 15 දුකේ දී ඔහු සමඟ සිට ඔහු මුදා මම ඔහුට
ගරු කරන්නෙමි.
16 දිගායු දී ඔහු සතුටු කරන්නෙමි.
q2 16 මාගේ ගැළවීම මම ඔහුට සපුරා දක්වන්නෙමි.”

### ප්‍රශස්ති ගීතයක්

*සබත් දින ගායනය සඳහා ය.*

92 සමිඳුනි, ඔබට තුති පිදීම හොබනේ ය;
q2
92 මහෝත්තමයාණෙනි, ඔබේ නාමය වර්ණනා
කිරීම යහපත් ය.
2 උදෑසන ඔබේ පෙම පැවසීම හොබනේ ය.
q2 2 රෑ යාමයේ දී ඔබේ විශ්වාසවන්තකම පැවසීම
යහපත් ය.
3 තත් දසයේ වීණාවේ හා කුඩා වීණාවේ වාදන
මඟින් ද මහ වීණාවේ තනුවට ද ඔබේ ගුණ වැණීම
හොබනේ ය.
4 සමිඳුනි, ඔබේ වීර ක්‍රියාවෝ මා සතුටට පත්
කරන්නෝ ය.
q2 4 ඔබේ දෑතහෙි ක්‍රියා ගැන මම තුති ගී පවසමි.
5 ඔබේ ක්‍රියා කොපමණ උත්තරීතර ද?
q2 5 ඔබේ සිතුවිලි කොපමණ ගැඹුරු ද?
6 මෝඩ මිනිසා මේ ගැන නොදන්නේ ය;
q2 6 අනුවණයන්ට මෙය තේරුම්ගත නොහැකි ය.
7 දුදනන් වල් පැළෑටි මෙන් වැඩෙන නමුත්,
නපුරුකම් කරන සියල්ලන් සශ්‍රීක වන නමුත්,
එතුමාණෝ සදහට ම ඔවුන් වනසන සේක.
8 එහෙත් සමිඳුනි, සදාකාලයට ම ඔබ
මහෝත්තමයාණෝ ය.
9 අහෝ සමිඳුනි!
q2 9 ඔබේ සතුරෝ එසේ ය, ඔබේ සතුරෝ වනසනු
ලබන්නෝ ය.
q2 9 සියලු නපුරුකම් කරන්නෝ විසුරුවනු ලබන්නෝ
ය.
10 ඔබ මා කුළු හරකකු මෙන් ශක්තිමත් කළ
සේක;
q2 10 ඔබ නව තලෙින් මා ආලේප කළ සේක.
11 මාගේ සතුරන්ගේ පරාජය මම දෑසින් දුටුවෙමි.
q2 11 දුදනන්ගේ දුක් විලාපයට සවන් දිනිමි.
12 දැහැමියෝ තාල වෘක්ෂ මෙන් සරුසාර වන්නෝ
ය;
q2 12 ලෙබනොන්හි කිහිරි ගස් මෙන් වැඩෙන්නෝ ය.
13 සමිඳුන්ගේ නිවසෙහි ඔබ ඒවා රෝපණය කළ
සේක.
q2 13 දේව මණ්ඩපයෙහි ඒවා සරු ලෙස වැඩෙන්නේ
ය.
14 වයස ගිය පසු පවා ඒවා පලදාව දෙන්නේ ය;
q2 14 සාරවත් ව නිල් පැහැ ව ඒවා පවතින්නේ ය.
15 එසේ වන්නේ, සමිඳාණන් සාධාරණ බව ද
මාගේ ආරක්ෂකයාණන් තුළ වරදක් නොමැති බව ද
දක්වනු පිණිස ය.

### සමිඳුන්ගේ රාජශ්‍රීය

93 සමිඳාණෝ රජකම් කරන සේක;
q2
93 ජයශ්‍රීය නමැති ඉඟ පටිය බැඳ
මහිමාලංකාරයෙන් සැරසී සිටින සේක.
q2
93 සදහට ම නොසැලෙන සක්වළ පිහිටවූ
සේක.
2 ඔබේ සිහසුන ආදියේ පටන් තිරසර ව පිහිටා
ඇත්තේ ය.
q2 2 ඔබ අනාදියේ පටන් වැඩ සිටින සේක.
3 සමිඳුනි, සමුදුර රළපතර, එසේ ය, සමුදුර
රළපතර, මහ හඬින් ගර්ජනා කරන්නේ ය;
q2 3 ඒවා මහ හඬින් ගිගුම් දෙන්නේ ය.
4 සමිඳාණෝ අහස් තලයෙහි ශ්‍රේෂ්ඨ ලෙස
රජකම් කරන සේක;
q2 4 එතුමාණෝ ගිගුරුම් හඬ නඟන මුහුදු ජලයට
වඩා බලසම්පන්න ය, රළපතරට වඩා බලවත් ය.
5 සමිඳුනි, ඔබේ අණපණත් සදාතනික ය.
q2 5 ඔබේ දේව මාලිගාව සැබැවින් ම සදහට ම
සුවිශුද්ධ ය.

### දේව විනිශ්චය

94 සමිඳුනි, ඔබ වරදට දඬුවම් දෙන දෙවි
කෙනෙකි;
q2
94 ඔබේ උදහස පෙන්නුව මැනව.
2 ලෝකයේ විනිසකරුවාණෙනි, නැඟිටිනු
මැනව;
q2 2 අහංකාර අය හට නියම විපාකය දුන මැනව.
3 සමිඳුනි, දුදනෝ කොපමණ කල් ජයශ්‍රීයෙන්
උදන් අනන්නෝ ද?
q2 3 තව කොපමණ කල් ජය ගොස කරන්නෝ ද?
4 අපරාධකාරයෝ තව කොපමණ කල් අහංකාර
වන්නෝ ද?
q2 4 ඔව්හු තමන්ගේ අපරාධ ගැන තව කොපමණ
කල් වහසි බස් දොඩන්නෝ ද?
5 සමිඳුනි, ඔව්හු ඔබේ ජනතාව මැඬලන්නෝ ය,
ඔබ තෝරාගත් සෙනඟට පීඩා කරන්නෝ ය.
6 ඔව්හු වැන්දඹුවන් ද අනාථයන් ද නසාදමන්නෝ
ය;
q2 6 අප රටේ වසන විදේශීන් මරාදමන්නෝ ය.
7 “සමිඳුන් හට අප පෙනෙන්නේ නැත;
q2 7 ජාකොබ්ගේ දෙවිඳාණෝ අප ගැන නොසලකන
සේකැ”යි ඔව්හු කියන්නෝ ය.
8 මෝඩයෙනි, තියුණු නැණනුවණ ලබාගැන්මට
ඉගෙනගන්න:
q2 8 ආඥානයෙනි, ඔබ කවර දා නැණවත්හු වන්නහු
ද?
9 අපේ කන් මැවූ දෙවිඳුන්ට නෑසෙන්නේ ද?
q2 9 අපට ඇස් දුන් දෙවිඳුන්ට නොපෙනෙන්නේ ද?

10 විජාතීන්ට දඬුවම් දෙන දෙවිඳාණෝ දඬුවම්
නොදෙන සේක් ද?
q2 10 මිනිසාට නැණනුවණ දෙන සමිඳාණෝ මිනිස්
සිතුවිලි නොදන්න සේක් ද?
11 1 කොරි 3:20 මිනිසුන්ගේ සිතුවිලි කවරේ ද
කියාත්, ඒවා කොපමණ නිරර්ථක ද කියාත්
සමිඳාණෝ දන්න සේක.
12 සමිඳුනි, ඔබ උවදෙසේ දුන් මිනිසා භාග්‍යවන්ත ය;
q2 12 ඔබේ අණපණත් ඔබ ඉගැන්වූ තැනැත්තා
භාග්‍යවන්ත ය.
13 ඔහුගේ විපත්ති දිනවලට පසු ඔහුට ඔබ නිදහස
දෙන සේක;
q2 13 එසේ වන්නේ, දුදනන් හට වළක් කණින තුරු
ය.
14 සමිඳාණෝ සිය සෙනඟ ඉවත නොලන සේක;
q2 14 තෝරාගත් සිය සෙනඟ අත් නොහරින සේක.
15 අධිකරණයෙන් සාධාරණ ලෙස නැවත තීන්දුව
එන්නේ ය;
q2 15 එවිට දැහැමි සිත් ඇති සියල්ලෝ එය
අනුගමනය කරන්නෝ ය.
16 දුදනන්ට විරුද්ධ ව මාගේ පක්ෂයට කවරෙක්
සිටින්නේ ද?
q2 16 නපුර කරන්නන්ට විරුද්ධ ව මාගේ පක්ෂයට
කවරෙක් සිටින්නේ ද?
17 සමිඳාණෝ මට පිහිට නො වූ සේක් නම්,
මළවුන්ගේ ලෝකයට විගස යෑමට මට සිදු වන්නට
තිබිණි.
18 "මාගේ පාද ලිස්සන්නේ ය"යි මා කී කල
සමිඳුනි, එවිට ඔබේ තිර පෙම මාගේ ආධාරය
වූයේ ය.
19 මා තුළ කරදර හා කණස්සල්ල බහුල වූ කල්හි
ඔබ මාගේ සැනසිල්ල වූ සේක;
q2 19 ඔබ මාගේ සිත ප්‍රීතිමත් කළ සේක.
20 යුක්තිය අයුක්තිය කරවන විනිසකරුවන් සමඟ
ඔබේ සබැඳියාවක් නැත.
q2 20 ඔව්හු අයුතු නීතියෙන් නපුරට මඟ පාදන්නෝ
ය.
21 ඔව්හු දැහැමියාගේ ජීවිතයට විරුද්ධ ව
කුමන්ත්‍රණය කරන්නෝ ය;
q2 21 නිදොස් තැනැත්තා රහසිගත ව වරදට පත්
කරන්නෝ ය.
22 එහෙත් සමිඳාණෝ, මා උදෙසා බලකොටුවක්
වන සේක;
q2 22 මාගේ දෙවිඳාණෝ මට රැකවරණ පර්වතය
වන සේක.
23 එතුමාණෝ ඔවුන්ගේ අදමිටුකමට දඬුවම් කරන
සේක.
q2 23 ඔවුන්ගේ නපුරුකම නිසා ඔවුන් නසා
වනසාලන සේක.
q2 23 අපේ දෙවි සමිඳාණෝ ඔවුන් විනාශ කරන
සේක.

## දෙවිඳුන් නැමදීමේ ගීයක්

95 එන්න, සමිඳුන් හට ප්‍රීති ප්‍රමෝදයෙන්
ගායනා කරමු;
q2
95 අප මිදූ පර්වතයාණන් හට සාදු හඬ නඟා
තුති ගී ගයමු.
2 තුති ගී ගයා එතුමන් අබිමුවට ගමන් කරමු;
q2 2 එතුමන් හට ජය මංගල ගී ගයමු.
3 මන්ද, සමිඳාණෝ, බලසම්පන්න දෙවිඳාණෝ වන
සේක;
q2 3 උතුම් දේවාතිදෙවිඳාණෝ වන සේක.
4 මිහිතල ගැඹුරු තැන් එතුමන් අතෙහි ය;
q2 4 කඳු ශිඛර එතුමන්ගේ ය.
5 එතුමාණන් මුහුද සෑදූ බැවින් එය එතුමාණන්ගේ
ය;
q2 5 එතුමන් වියළි බිම් ද සෑදූ බැවින් එය ද
එතුමන්ගේ ය.
6 එන්න, හිස නමා එතුමන් හට නමස්කාර කරමු;
q2 6 අප මැවූ සමිඳුන් අබිමුව දණින් වැටෙමු.
7 හෙබ්‍රෙව් 3:15; 4:7 හෙබ්‍රෙව් 3:7-11 එතුමාණෝ
අපේ දෙවිඳාණෝ ය.
q2 7 අපි එතුමන්ගේ සෙනඟ ය;
q2 7 එතුමාණන් පෝෂණය කරන බැටළුවෝ ය.
q2 7 එතුමාණන් පවසන දේට සවන් දුන්නොත්
යහපත!
8 නික්ම 17:1-7; ගණන් 20:2-13 "පාළුකරයේ මස්සා
නම් ස්ථානයේ සිටි දවසේ දී මෙන් ද මෙරිබා නම්
ස්ථානයේ දී මෙන් ද ඔබේ සිත් දැඩි කර නොගන්න.
9 එහි දී ඔබේ ආදි පියවරු මා පරීක්ෂා කළෝ ය.
q2 9 මාගේ ක්‍රියා දැක දැකත් මට අභියෝග කළෝ
ය.
10 සතළිස් වසරක් මම ඒ පරපුර පිළිකුල් කළෙමි:
q2 10 'ඔව්හු වනාහි සිත් නොමඟට හරවා ගෙන යන
මාගේ මාර්ගය නොදත් ජනතාවකි.
11 ගණන් 14:20-23; ද්වි.නී. 1:34-36; 12:9-10;
හෙබ්‍රෙව් 4:3-5 කවදාවත් ඔව්හු මා දෙන රටට ඇතුළු
නොවන්නෝ ය'යි මම උදහසින් කිපී දිවුරුම්
දුන්නෙමි."

## සව් බලැති දෙවිඳුන් නැමදීමේ ගීයක්
(1 වංශා 16:23-33)

96 සමිඳුන් හට නව ගීයක් ගයන්න;
q2
96 පොළෝ වැසි සියල්ලෙනි, සමිඳුන් හට ගී
ගයන්න.
2 සමිඳුන් හට ගී ගයා, එතුමන්ගේ නාමයට ආසිරි
පතන්න;
q2 2 එතුමන්ගේ ගැළවීමේ ශුභාරංචිය දිනෙන් දින
ප්‍රකාශ කරන්න.
3 විජාතීන් අතර එතුමන්ගේ මහිමය ප්‍රකාශ
කරන්න;

q2 3 ජනතාවන් අතර එතුමන්ගේ ප්‍රබල ක්‍රියා
පවසන්න.
4 සමිඳාණෝ උතුම් ය, අතිශයින් පැසසිය යුතු ය;
q2 4 සියලු දෙවිවරුන්ට වඩා එතුමන්ට ගරුබිය පෑ
යුතු ය.
5 ජනතාවගේ සියලු දෙවිවරු පිළිම පමණකි;
q2 5 සමිඳාණෝ ම දෙව් ලොව මැවූ සේක.
6 ගෞරවය ද තේජස ද එතුමන් අබිමුව පවත්නේ
ය;
q2 6 ශක්තිය ද ශෝභාව ද එතුමන්ගේ මැදුරෙහි
ඇත්තේ ය.
7 ගීතා 29:1-2 සකල ජනයෙනි, සමිඳුන් පසසන්න;
q2 7 ගෞරවය ද බලය ද සමිඳුන් හට පිරිනමන්න.
8 සමිඳුන් නමට හිමි ගෞරවය එතුමන් හට
පිරිනමන්න;
q2 8 පඬුරක් රැගෙන එතුමන් ඉදිරියට එන්න.
9 සමිඳුන් අබිමුව පාරිශුද්ධත්වයෙන් සැරසී වැඳ
වැටෙන්න;
q2 9 ලෝ වැසි සියල්ලෙනි, එතුමන් අබිමුව බියෙන්
ඇලළී සිටින්න.
10 විජාතීන් අතර මෙසේ පවසන්න:
q2 10 "සමිඳාණෝ රජකම් කරන සේක;
q2 10 නොසැලෙන ලෙස ලෝකය පිහිටා ඇත;
q2 10 එතුමාණෝ සාධාරණ ලෙස ජනතාවන්
විනිශ්චය කරන සේක.
11 සගලොව ප්‍රීති ප්‍රමෝද වේ වා!
q2 11 නරලොව තුටු පහටු වේ වා!
q2 11 සමුදුරත් එහි ඇති සියල්ලත් ගිගුරුම් දේ වා!
12 කෙත්වතු සහ එහි ඇති සියල්ලත් ප්‍රීතිමත් වේ
වා!
q2 12 එවිට වන රොදෙහි ගස්කොළන් ප්‍රීති නාද
දෙන්නේ ය.
13 සමිඳාණන් මිහිතලය පාලනය කිරීමට වඩින විට
ඒවා නද දෙන්නේ ය;
q2 13 එතුමාණෝ, ලෝ වැසියන් සාධාරණ ලෙස ද
අවංක ලෙස ද පාලනය කරන සේක."

## සමිඳුන්ගේ රාජ බලය

97 සමිඳාණෝ රජකම් කරන සේක, මිහිතලය
ප්‍රීති වේ වා!
q2
97 දිවයින් සියල්ල ප්‍රීති ප්‍රමෝද වේ වා!
2 වලාකුළු සහ අඳුර එතුමන් වට කර
සිටින්නේ ය.
q2 2 දැහැමිකම සහ යුක්තිය එතුමන්ගේ සිහසුනේ
පදනම් ය.
3 එතුමාණන් පෙරටුවෙන් ගින්නක් යන්නේ ය;
q2 3 එය එතුමන් සිසාරා සිටින සතුරන් දවාලන්නේ
ය.
4 එතුමන්ගේ විදුලිසැර කෙටීම ලෝකයට
ආලෝකය දෙයි;
q2 4 පොළොව එය දැක කම්පා වෙයි.
5 කඳු හලේ සමිඳාණන් දැක ඉටි මෙන් උණු
වන්නේ ය;
q2 5 මුළු මිහිතලය ද සමිඳුන් දැක එසේ වන්නේ ය.
6 දෙව්ලොව එතුමන්ගේ සාධාරණකම ප්‍රකාශ
කරන්නේ ය;
q2 6 සකල ජනතාවෝ එතුමන්ගේ මහිමය
නරඹන්නෝ ය.
7 රූප වඳින්නෝ ද පිළිම ගැන පාරට්ටු කරන්නෝ ද
ලජ්ජා වෙත් වා!
q2 7 සියලු දෙව් දේවතාවෝ දෙවිඳුන්ට හිස නමත්
වා!
8 සියොන් කන්ද ඊට සවන් දී තුටින් ඉපිලේ වා!
q2 8 සමිඳුනි, ඔබේ දේව පරිපාලනය නිසා ජුදාහි
නගර සතුටු වේ වා!
9 සව් බලැති දෙවි සමිඳුනි, ඔබ මුළු පොළෝ
තලයට ශ්‍රේෂ්ඨ වන සේක;
q2 9 සියලු දෙව් දේවතාවන්ට වඩා ඔබ උතුම් වන
සේක.
10 සමිඳුනි, ඔබ නපුරට වෛර කරන්නන්ට ප්‍රේම
කරන සේක;
q2 10 ඔබට ගැති වූවන්ගේ ජීවිත ඔබ ආරක්ෂා
කරන සේක;
q2 10 දුෂ්ටයාගේ බලයෙන් ඔබ ඔවුන් මුදාලන
සේක.
11 දැහැමියන් මත එළිය බබළයි;
q2 11 යහපත් අය මත සතුට දිළිසෙයි.
12 සැදැහැවතුනි, සමිඳුන් තුළ ප්‍රීති ප්‍රමෝද වෙත්
වා!
q2 12 එතුමන්ගේ සුවිශුද්ධ භාවය සිහි කොට
එතුමන්ට ප්‍රශංසා කරත් වා!

## සමිඳුන්ගේ රාජශ්‍රීය වර්ණනා කිරීම

98 සමිඳුන්ට නව ගීයක් ගයන්න;
q2
98 මන්ද, එතුමාණෝ අසිරිමත් ක්‍රියා කළ සේක.
q2
98 සිය බලයෙන් හා ශුද්ධ ශක්තියෙන්
ජයග්‍රහණය ලත් සේක.
2 සමිඳාණෝ ස්වකීය ජයග්‍රහණය ප්‍රකාශ කළ
සේක;
q2 2 විජාතීන්ගේ ඇස් හමුයෙහි සිය විමුක්ති බලය
එළිදරව් කළ සේක.
3 එතුමාණෝ ඉශ්‍රායලේ වංශය කෙරෙහි
එතුමන්ගේ ප්‍රේමයත්, විශ්වාසවන්තකමත් සිහි
කළ සේක.
q2 3 මිහි පිට සියලු දෙනෙ අප දෙවිඳුන්ගේ
ජයග්‍රහණය දුටුවෝ ය.
4 එම්බා ලෝ වැසි සියල්ලෙනි, සමිඳුන් හට
ප්‍රීතියෙන් ගී ගයන්න;
q2 4 ප්‍රීති ගී ගයමින් එතුමන් පසසන්න.
5 වීණාව වයමින් සමිඳුන්ට ගී ගයන්න;
q2 5 වීණාවෙන් ද ගී නාදයෙන් ද ප්‍රශංසා කරන්න.

6 හාරෝරණෑ හා නළා හඬින් ද රජාණන් වන සමිඳුන්
අබිමුව ප්රීතියනේ ගී ගයන්න.
7 මුහුද ද එහි ඇති සියල්ල ද ගර්ජනා කරෙේ වා!
q27 ලෝකය ද එහි වැසියෝ ද ගී ගයත් වා!
8 ගංගා අත් පාොළසන් දේ වා!
q28 කඳු හලේ එක් ව සමිඳුන් හට ප්රීති නාද දේ
වා!
9 මන්ද, සමිඳාණෝ මිහිතලය පාලනය කරන පිණිස
වඩින සේක;
q29 එතුමාණෝ ලෝ වැසියන් ධර්මිෂ්ඨකමින් ද
සාධාරණකමින් ද පාලනය කරන සේක.

### ශ්රේෂ්ඨ දවේ රජාණෝ

**99** නික්ම 25:22 සමිඳාණෝ රජකම් කරන
සේක.
q2
**99** විජාතීහු බියනේ කැළඹෙන්නෝ ය.
q2
**99** එතුමාණෝ කරෙබ්වරුන්ට ඉහළින් සිහසුන්
අරා වැඩ සිටින සේක.
q2
**99** මිහිතලය කම්පා වන්නේ ය.
2 සමිඳාණෝ සියාොන් කන්දහෙි උතුම් වන
සේක;
q22 සියලු ජාතීන්ට ඉහළින් වැජඹනෙ සේක.
3 අති උතුම් තදෙ බලැති එතුමන්ගේ නාමය
සියල්ලෝ පසසන්නෝ ය.
q23 එතුමාණෝ සුවිශුද්ධ වන සේක.
4 අති බලසම්පන්න රජාණන් වහන්ස, ඔබ
යුක්තියට ප්රේම කරන සේක, ඔබ ඉශ්රායලේහි
සාධාරණකම පිහිටවූෙ සේක;
q24 ඔබ දැහැමිකම සහ යුක්තිය ඉටු කළ සේක.
5 අපේ දවේ සමිඳුන් උසස් කාොට පසසන්න;
q25 එතුමන්ගේ පාපුටුව ළඟ වැඳ වැටනේන;
q25 එතුමාණෝ සුවිශුද්ධ වන සේක.
6 එතුමන්ගේ පූජකවරුන් අතර මෝසසේ ද
ආරාොන් ද වූ හ.
q26 එතුමන්ගේ නාමය අයැදි අය අතර සාමුවලේ ද
විය.
q26 ඔවුන් සමිඳුන් අයැදි විට එතුමාණෝ පිළිතුරු දුන්
සේක.
7 නික්ම 33:9 වලා ටැඹනේ එතුමාණෝ ඔවුන්ට
කතා කළ සේක.
q27 එතුමන් ඔවුන්ට දුන් අණපණත් ද නීති ද ඔව්හු
ඉටු කළෝ ය.
8 අපේ දවේ සමිඳුනි, ඔබ ම ඔවුන්ට පිළිතුරු දනෙ
සේක.
q28 ඔබ ඔවුන්ට දැඩි ලසෙ දඬුවම් දුන් නමුත්, කමා
කරන දවේඳුන් ඔබ බව ඔවුන්ට පනේවූ සේක.
9 අපේ දවේ සමිඳුන් පසසන්න, එතුමන්ගේ ශුද්ධ
කන්ද ළඟ වැඳ වැටනේන.
q29 අපේ දවේ සමිඳාණෝ සුවිශුද්ධ ය.

### තුති දීමේ ගීතයකි

**100** මුළු පාොළෝ වැසියනෙි, සමිඳුන් හට ප්රීති
ඝෝෂා පවත්වන්න.
2 සමිඳුන් හට ප්රීතියනේ වැඳ පුදා, ප්රීති ගී
ගයමින් එතුමන් ඉදිරියට පැමිණනේන.
3 සමිඳාණන් දවේඳුන් බව දැනගන්න.
q23 අප මැව්වේ එතුමාණෝ ය;
q23 අපි එතුමන්ගේ ය, එතුමන්ගේ සනෙඟ ය.
q23 එතුමන්ගේ තණ බිම්වල බැටළුවෝ ය.
4 තුති පුදා, එතුමන්ගේ වාසල් දාොරටුවලට ද තුති
ගී ගය ගයා, එතුමන්ගේ මන්දිරවලට ද ඇතුළු
වන්න.
5 1 වංශා 16:34; 2 වංශා 5:13; 7:3; එස්රා 3:11;
ගීතා 106:1; 107:1; 118:1; 136:1; ජරෙ 33:11 මන්ද,
සමිඳාණෝ යහපත් ය;
q25 එතුමන්ගේ ප්රේමය ස්ථිර ය;
q25 සදහට ම පවත්නේ ය.
q25 පරපුරනේ පරපුරට එතුමන්ගේ
විශ්වාසවන්තකම පවත්නේ ය.

### යහපත් රජ කනෙකුෙගේ ගුණ දහම්

*දාවිත්ගේ ගීතයකි.*
**101** කරුණාව හා යුක්තිය ගැන මම ගී
ගයන්නමේ;
q2
**101** සමිඳුනි, ඔබ හට පැසසුම් ගී ගයන්නමේ.
2 නිදාොස් මඟහෙි සිහි නුවණින් ගමන්
කරන්නමේ.
q22 ඔබ කවදා මා වතෙ වඩින සේක් ද?
q22 පිරිසිදු සිතින් මාගේ නිවසෙහි මම වාසය
කරන්නමේ.
3 මාගේ ඇස් කිසි නීච දයෙක් කරෙහෙි
නාොරඳවන්නමේ.
q23 දවේඳුන් කරෙනේ ඈත් වන්නන්ගේ ක්රියා මම
නුරුස්සන්නමේ.
q23 ඒවාට මම ඇලුම් නාොවන්නමේ.
4 සියලු වංක සිතුවිලි මම ප්රතික්ෂේප කරන්නමේ;
q24 නපුරට මම කිසි විටකෙ හවුල් නාොවන්නමේ.
5 සිය අසල්වැසියාට විරුද්ධ ව රහසින් අපවාද
දාොඩන්නා මම වනසන්නමේ;
q25 උඩඟු බැල්ම හා අහංකාර සිත ඇත්තා මම
නුරුස්සන්නමේ.
6 මා සමඟ වසන පිණිස මම දේශයහෙි
සැදැහැවතුන් තාෝරාගතිමි.
q26 නිදාොස් ලසෙ දිවි ගවෙන්නෝ මාගේ
සේවකයෝ වන්නෝ ය.
7 වංචනික කිසිවකේ මාගේ නිවසෙහෙි
නාොවසන්නේ ය.
q27 මුසාවාදී කිසිවකේ මා ඉදිරියහෙි නාොසිටින්නේ
ය.
8 දිනනේ දින දේශයේ සියලු දුදනන් මම
වනසන්නමේ.

q2 8 අයුතුකම් කරන සියල්ලන් මම සමිඳුන්ගේ
නුවරින් නරෙපාදමන්නමේ.

### විපතේ දී යැදුමක්

*තද විපතින් ක්ලාන්ත භාවයට පත් ව තමාගේ
දුක්ගැනවිලි සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි
වැගිරවේ කනෙකුගේ යැදුමකි.*

102 සමිඳුනි, මාගේ යැදුම ඇසුව මැනව.
q2

102 මාගේ මොරගැසීම ඔබ වෙත පැමිණේ වා!
2 මාගේ විපත්ති සමයේ දී ඔබේ මුහුණ මා
කරෙනේ සඟවා නොගත මැනව;
q2 2 යැදුම් පුදන විට මට සවන් දී නොපමා ව
පිළිතුරු දුන මැනව.
3 මන්ද, මාගේ දවස් දුම් මනේ පහ වී යයි, මාගේ
ඇටකටු ගිනි උදුනක් මනේ දැවයේ.
4 මාගේ සිත තණ කොළ මනේ තැළී වියළී ඇත.
q2 4 ආහාර ගැනීමට වත් මට රුචියක් නැත.
5 මම මහා හඬින් සුසුම්ලමින් සිටිමි.
q2 5 මාගේ ඇටකටු හමට ම ඇළී ඇත.
6 මම මරු කතරේ වසන කරවැල් කොකකුට
සමාන වමේි;
q2 6 මම පාළු තැන්හි වසන බකමූණකු මනේ වමේි.
7 මම නොනිදා සිටිමි;
q2 7 වහල උඩ තනි ව වැලපනෙ කුරුල්ලකුට සමාන
වමේි.
8 දවස මුළුල්ලේ මාගේ සතුරෝ මට නින්දා කරති;
q2 8 මට අපහාස කරන්නෝ සාප කිරීමට මාගේ
නාමය යොදා ගනිති.
9 මාගේ කෑම අළු ය;
q2 9 මාගේ බීම කඳුළින් මුසු ය.
10 එසේ වී ඇත්තේ, ඔබේ කෝපය හා උදහස
නිසා ය;
q2 10 ඔබ මා උසස් කොට පහතට හෙළා ඇති නිසා
ය.
11 මාගේ ජීවිත කාලය සැඳෑ සවෙණැලි වැනි ය,
මම තණ පත් මනේ වියළී සිටිමි.
12 එහෙත් සමිඳුනි, ඔබ සදහට සිහසුන් අරා වැඩ
සිටින සේක;
q2 12 හැම පරපුරක් ම ඔබ සිහි කරනු ඇත.
13 ඔබ පිබිද සියොන්ට කරුණා කරන සේක.
q2 13 ඊට අනුකම්පා කළ යුතු කාලය දැන් ය;
q2 13 නියම කාලය පැමිණ තිබේ.
14 සියොන්හි ගල්වලට සේවකයෝ ප්‍රිය
කරන්නෝ ය.
q2 14 ඔව්හු එහි දූවිල්ලට පවා අනුකම්පා කරන්නෝ
ය.
15 එහයෙින් විජාතීහු සමිඳුන්ගේ නාමයටත් බිය
වන්නෝ ය;
q2 15 පොළොවේ සියලු රජවරු ඔබේ මහිමයට බිය
වන්නෝ ය.
16 සමිඳාණෝ සියොන් යළි ගොඩනඟන සේක;
q2 16 සිය මහිමාලංකාරයනේ ප්‍රකාශ වන සේක.
17 එතුමාණෝ අසරණයන්ගේ යැදුමට සවන් දනෙ
සේක;
q2 17 ඔවුන්ගේ යැදුම හෙළා නොදකින සේක.
18 මේ තාක් නූපන් අය ඔබට පැසසුම් කරන
පිණිස,
q2 18 මතු එන පරම්පරාව උදෙසා මයෙ සටහන්
කරනු ලැබේ වා!
19 සමිඳාණෝ සිය ශුද්ධස්ථානයේ සිට පහත බැලූ
සේක;
q2 19 එතුමාණෝ ස්වර්ගයේ සිට පොළොව දෙස
බැලූ සේක.
20 එසේ කළේ, සිරකරුවන්ගේ දුක් සුසුම් අසන්න
ය;
q2 20 මරණයට නියම වූවන් මුදන්න ය.
21 ජනයෝ සියොන්හි දී සමිඳුන්ගේ නාමයත්
ජරෙුසලමේ දී එතුමන්ගේ ප්‍රශංසාවත් පළ
කරන්නෝ ය.
22 රාජ්‍යයෝ ද මිනිස් සංහතිය ද සමිඳුන්ට මෙහෙ
කිරීමට එක් රැස් වන සෑම විට එසේ කරන්නෝ ය.
23 එතුමාණෝ තරුණ වියේ දී මාගේ ශක්තිය හීන
කළ සේක;
q2 23 මාගේ ජීවිත කාලය කෙටි කළ සේක.
24 මම ද කතා කොට මසෙේ කීවමේි:
q2 24 "අහෝ මාගේ දවේිඳුනි!
q2 24 මා වයස්ගත වන්න පරෙ මා පහ නොකළ
මැනව.
q2 24 සමිඳුනි, ඔබ සදහට ම ජීවත් වන සේක."
25 හබේ‍රෙ 1:10-12 ආදියේ දී ඔබ පොළොවේ
පදනම ලූ සේක.
q2 25 අහස් ගැබ ඔබේ දෑතින් සාදන ලද්දේ ය.
26 ඒවා විනාශ වන්නේ ය;
q2 26 එහෙත්, ඔබ ජීවත් වන සේක.
q2 26 එසේ ය, ඒ සියල්ල වස්ත්‍රයක් මනේ පැරණි
වන්නේ ය.
q2 26 උතුරු සළුවක් මනේ ඔබ ඒවා මාරු කරන
සේක.
q2 26 ඒවා ද පහ වී යන්නේ ය.
27 එහෙත්, ඔබ ඒකාකාර ම ය, ඔබේ ජීවිතය නිම
නොවන්නේ ය.
28 ඔබේ මෙහෙකරුවන්ගේ දරුවෝ සුරැකි ව
සිටින්නෝ ය.
q2 28 ඔවුන්ගේ පරපුර ද ඔබ ඉදිරියෙහි පිහිටුවනු
ලබන්නේ ය.

### දවේ ප්‍රමේය

103 මාගේ සිත, සමිඳුන් පසසන්න;
q2

103 හද පත්ලනේ ම එතුමන්ගේ ශුද්ධ නම
පසසන්න.
2 මාගේ සිත, සමිඳුන් පසසන්න;
q2 2 එතුමන්ගේ සියලු උපකාර අමතක නොකරන්න.
3 එතුමාණෝ මාගේ සියලු පාප කමා කරන සේක;
q2 3 මාගේ සියලු රෝග සුව කරන සේක.

4 මාගේ ජීවිතය පාතාල ලෝකයෙන් මුදාලන
සේක;
q24 ප්‍රේමය හා දයාව නමැති කිරුළෙන් මා සරසන
සේක.
5 රාජාලියකුගේ මෙන් මාගේ යොවුන් බව අලුත්
කරන පිණිස, දිවි ඇති තාක් මා යහපත් දයෙන්
තෘප්තියට පමුණුවන සේක.
6 සමිඳාණෝ සාධාරණ ලෙස ක්‍රියා කරන සේක.
q26 පීඩිතයන්ට එතුමාණෝ යුක්තිය ඉටු කරන
සේක.
7 සමිඳාණෝ ස්වකීය මාර්ග මෝසෙස්ටත්, තම
බලවත් ක්‍රියා ඉශ්‍රායලේ සෙනඟටත් දැක් වූ සේක.
8 ජාකො 5:11 සමිඳාණෝ අනුකම්පාවෙන් හා
දයාවෙන් පරිපූර්ණ ය;
q28 නොකිපෙන සුලු ය, අතිශයින් කරුණාවන්ත ය.
9 එතුමාණෝ නිතර තරවටු නොකරන සේක;
q29 සදහට ම සිතෙහි කෝපය තබා නොගන්න
සේක.
10 එතුමාණෝ අපේ පාපවලට සරිලන ලෙස අපට
දඬුවම් නොදෙන සේක;
q210 අපේ අයුතුකම්වලට සැසඳෙන ලෙස
ප්‍රතිවිපාක නොදෙන සේක.
11 මන්ද, පොළොවට ඉහළින් අහස උස් ව
තිබෙන්නාක් මෙන් එතුමාණන් කෙරෙහි ගරුබිය පාන
අයට එතුමාණන්ගේ කරුණාව මහත් ය.
12 නැගෙනහිරෙන් බටහිර ඈත් ව තිබෙන්නාක්
මෙන් එතුමාණෝ අපේ පාප අපෙන් දුරු කරන
සේක.
13 පියකු දරුවන්ට අනුකම්පා කරන සේ
සමිඳාණෝ, තමන් කෙරෙහි ගරුබිය ඇත්තන්ට
අනුකම්පා කරන සේක.
14 මන්ද, එතුමාණෝ අපේ ස්වරූපය දන්න සේක;
q214 අප ධූලි බව සිහි කරන සේක.
15 මිනිසාගේ ජීවිත කාලය තණ පත් වැනි ය, ඔහු
කෙතේ කුසුමක් මෙන් සරු ලෙස වැඩේ;
16 එහෙත්, සුළං පහර වැදී එය නැති වී යයි;
q216 එය තිබුණ තැන වත් දක්නට නොලැබේ.
17 සමිඳුන්ගේ තිර පෙමෙ, තමන්ට ගරුබිය පාන අය
කෙරෙහි සදාකාලයෙන් සදාකාලයට වේ.
18 එතුමන්ගේ ගිවිසුම රක්ෂා කරන්නන්ටත්,
එතුමන්ගේ ශික්ෂාවන් ඉටු කිරීමට ඒවා මනෙහි
කරන්නන්ටත්,
q218 එතුමන්ගේ දමිටුකම පරපුරෙන් පරපුරට
පවත්නේ ය.
19 සමිඳාණෝ සිය සිහසුන සගලොවෙහි පිහිටවූ
සේක.
q219 එතුමන්ගේ රාජ්‍යය ද සියල්ලන් කෙරෙහි බල
පවත්වයි.
20 සමිඳුන්ගේ අණ පිළිපදින, එතුමන්ගේ වචනයට
සවන් දෙන, එතුමන්ගේ බලවන්ත දූතයෙනි, එතුමන්
පසසන්න.
21 සමිඳුන්ගේ සේනා සියල්ලෙනි, එතුමන්ගේ
කැමැත්ත ඉටු කරන මෙහෙකරුවෙනි, සමිඳුන්
පසසන්න.
22 සකල මැවිල්ලෙනි, සමිඳුන් සිහසුන පවතින සැම
තැන එතුමන් පසසන්න.
q222 මාගේ සිත, සමිඳුන් පසසන්න.

### මැවුම්කරුට ප්‍රශංසාවක්

104 මාගේ සිත, සමිඳුන් පසසන්න.
q2
104 මාගේ දෙවි සමිඳුනි, ඔබ ඉතා උතුම් ය, ඔබ
තෙද මහිමයෙන් සැරසී සිටින සේක.
2 ඔබ ආලෝකය නමැති වස්ත්‍රය හැඳ පැළඳ සිටින
සේක;
q22 වියනක් මෙන් අහස විහිදාලන සේක.
3 ඔබේ මාලිගාව ඉහළ දිය කඳ මත පිහිටුවන
සේක;
q23 වලාකුළු ඔබේ රිය කරගන්න සේක.
4 හෙබ්‍රෙ 1:7 සුළඟ ඔබේ දූතයන් ද ගිනි දලු
ඔබේ සේවකයන් ද කරගන්න සේක.
5 පොළොව කිසි කලෙක නොසැලෙන ලෙස එය
තිර පදනමක් මත පිහිටවූ සේක.
6 උතුරු සළුවකින් මෙන් මහා සයුරෙන් ඔබ එය
වැසූ සේක;
q26 ජලයෙන් කඳු හලේ වැසී ගියේ ය.
7 ඔබේ තරවටුවෙන් ජලය පලා ගියේ ය;
q27 ඔබේ තර්ජනයෙන් එය යුහුව ගලා ගියේ ය.
8 ජලය කඳු උඩින් ගලා ගියේ ය.
q28 ඔබ සූදානම් කළ ස්ථානය වන මිටියාවතට එය
බැස ගියේ ය.
9 ජලයෙන් පොළොව යළිත් වැසී නොයෙන පිණිස
ඉක්මවා ගිය නොහැකි සීමාවක් ඔබ එයට නියම
කළ සේක.
10 සමිඳාණෝ මිටියාවත්වල උල්පත් හටගන්වන
සේක.
q210 ඒවා කඳු අතරේ ගලා යයි.
11 ඒවා සියලු වන සතුන්ට බීමට දිය දෙයි;
q211 වල් කොටළුවෝ එයින් පිපාසා සංසිඳුවා ගනිති.
12 ඒවා අසල, අහසේ පක්ෂීහු කැදලි සාදති;
q212 අතු අතරේ ගී නද දෙති.
13 එතුමාණෝ අහස් තලයෙන් කඳුකරයට වැසි
වස්වන සේක.
q213 එතුමන්ගේ ආසිරිවලින් පොළොව සාරවත්
වන්නේ ය,
14 එතුමාණෝ, සිවුපාවුන්ට තණ කොළත්,
මිනිසුන්ගේ ප්‍රයෝජනයට ගස් කොළත්
පොළොවේ වැඩෙන්නට සලසන සේක.
q214 මිනිසාට ආහාර නිපදවන සේක.
15 තවද, ඔබ මිනිසාගේ හද සතුටු කරන මිදියුස ද
වත පැහැපත් කරන තෙල ද ගත සවිමත් කරන
අහර ද සපයන සේක.
16 සමිඳුන් ම පැළ කරවූ ලෙබනොන්හි කිහිරි ගස්,
q216 සමිඳුන්ගේ ම ඒ ගස් බොහෝ වතුර ලබයි.
17 කුරුල්ලෝ ඒ ගස්වල කූඩු සාදාගනිති.
q217 මාන කොක්කු දේවදාර ගස් මුදුන්හි කැදලි
තනාගනිති.

18 වල් එළුවන්ගේ වාසය උස් කඳුවල වේ.
q2 18 සාවුන්ගේ රැකවරණය පර්වත වේ.
19 මාස වනේ කර දක්වන පිණිස එතුමාණෝ සඳ
සෑදූ සේක;
q2 19 බැස යා යුතු වේලාව හිරු දනියි.
20 ඔබ අඳුර පමුණුවන සේක;
q2 20 එවිට රැය වේ.
q2 20 එකල සියලු වන මෘගයෝ බැහැරට එති.
21 සිංහ පොව්වෝ ගොදුරට සිහ නද කරති.
q2 21 උන් දෙවිඳුන්ගනේ ගොදුරු ඉල්ලති.
22 හිරු උදා වන කල ඒ සත්තු ආපසු යති;
q2 22 ගුහාවලට වැද ලැගුම් ගනිති.
23 එහතේ මිනිසා, සවස දක්වා වැඩ කරන පිණිස
නික්ම යයි.
24 සමිඳුනි, ඔබේ කර්මාන්ත කොපමණ විවිධාකාර
ද?
q2 24 ඔබ සියල්ල ප්‍රඥාවනේ මැවූ සේක.
q2 24 පොළොව ඔබ මැවූ සතුන්ගනේ පිරී ඇත;
25 අර තිබනේනේ සුවිසල් සාගරය!
q2 25 එහි ලොකු කුඩා සත්ත්වයෝ ගණන ඉක්මවා
සැරිසරති.
26 ජෝබ් 41:1; ගීතා 74:14; යසො 27:1 එහි
ඔබමොබ නැව් යාත්‍රා කරයි;
q2 26 ඔබ මැවූ ලවේයාතන් නම් මුහුදු සර්පයා එහි
ක්‍රීඩා කරයි.
27 උන්ගේ කෑම නියම කලට ලබන පිණිස උන්
සියලු දනෙ ඔබ දසෙ බලා සිටිති.
28 ඔබ උන්ට දනෙ දේ උන් එකතු කර ගනිති.
q2 28 ඔබේ අත විදහන විට උන් කුසගින්න
නිවාගනිති.
29 ඔබේ මුහුණ ඔබ සඟවන කල උන් කැළඹතේ.
q2 29 ඔබ උන්ගේ හුස්ම පැහැරගන්න කල උන් නැසී,
දූවිලි බවට හැරී යති.
30 එහතේ, ඔබ උන්ට හුස්ම දනෙ කල උන් යළිත්
මවනු ලබති.
q2 30 ඔබ පොළෝ තලයට නව දිවියක් දනෙ සේක.
31 සමිඳුන්ගේ මහිමය සදහට ම පවතී වා!
q2 31 සමිඳාණෝ තමන් මැවූ සියල්ල ගැන සතුටු
වතේ වා!
32 එතුමාණන් පොළොව දසෙ බලන කල එය
කම්පා වේ;
q2 32 කඳු ස්පර්ශ කරන කල ඒවායින් දුම් නඟියි.
33 මම දිවි ඇති තාක් සමිඳුන්ට ගී ගයන්නමේ;
q2 33 පණ ඇති තාක් දෙවිඳුන්ට පසස් ගී ගයන්නමේ.
34 මාගේ භාවනාව සමිඳුන්ට ප්‍රසන්න වේ වා!
q2 34 මන්ද, මගේ ප්‍රීතිය එන්නේ එතුමන්ගනේ ය.
35 පව්කාරයෝ පොළෝ තලයනේ විනාශ වී යත්
වා!
q2 35 දුෂ්ටයෝ තවත් ජීවත් නොවතේ වා!
q2 35 මාගේ සිත සමිඳුන්ට ප්‍රශංසා කරා වා!
q2 35 සමිඳුන්ට ප්‍රශංසා වේ වා!

### ප්‍රශංසා ගීයක්

105 සමිඳුන්ට තුති පුදන්න, එතුමන්ගේ
නාමයනේ අයැදින්න, ජාතීන් අතරේ
එතුමන්ගේ ක්‍රියා පළ කරන්න.
2 එතුමන්ට ගී ගයන්න;
q2 2 එතුමන්ට පසස් ගී ගයන්න;
q2 2 එතුමන්ගේ පුදුම ක්‍රියා මනෙහෙි කරන්න.
3 එතුමන්ගේ ශුද්ධ නාමය ගැන උදන් අනන්න;
q2 3 සමිඳාණන් සොයන්නන්ගේ සිත් ප්‍රීති ප්‍රමුදිත
වේ වා!
4 සමිඳාණන් ද එතුමන්ගේ බලය ද සොයා
බලන්න;
q2 4 එතුමාණන් හමුව නිතර ම සොයන්න.
5+PSA එතුමන්ගේ මහෙකෙරුන් වූ ඉශ්‍රායලේ
වංශයනි, එතුමන් තෝරාගත් ජාකොබ්ගේ දරුවනි,
එතුමන් කළ පුදුම ක්‍රියා ද එතුමන්ගේ
ආශ්චර්යයන් ද එතුමන් දුන් විනිශ්චයයන් ද සිහි
කරන්න.
7 එතුමාණෝ අපේ දෙවි සමිඳාණෝ ය.
q2 7 එතුමන්ගේ විනිසය මුළු පොළොවහෙි ය.
8 එතුමන් පරම්පරා දහසක් දක්වා අණ කළ සිය
ගිවිසුම සදහට ම සිහි කරන සේක.
9 උත් 12:7; 17:8; 26:3 ඒ ගිවිසුම එතුමාණෝ
ආබ්‍රහම් සමඟ කළ සේක.
q2 9 ඊසාක්ට ද දිවුරුම් දුන් සේක.
10 උත් 28:13 එය, එතුමාණෝ ජාකොබ්ට පණතක්
ද ඉශ්‍රායලේට සදාකාල ගිවිසුමක් ද කොට ස්ථිර
කරමින්,
11 "නුඹලාගේ උරුමය වශයනේ කානාන් දේශය
නුඹලාට දනේනමේ"යි වදාළ සේක.
12 ඔව්හු ගණනින් ස්වල්ප දනෙකු වී, ඉතා ස්වල්ප
දනෙකු වී එහි ආගන්තුකයන් වී සිටියෝ ය.
13 ඔව්හු ජාතියකින් ජාතියකට ද රාජ්‍යයකින්
රාජ්‍යයකට ද සැරිසරමින් ගියෝ ය.
14 උත් 20:3-7 එකල්හි, ඔවුන්ට තාඩන පීඩන
කරන්න එතුමාණෝ කිසිවකුෙට ඉඩ නුදුන් සේක.
q2 14 එසේ ය, එතුමාණෝ රජුන්ට පවා තරවටු
කොට,
15 "මාගේ අබිසසේ ලත් අයට අත නොගසන්න.
q2 15 මාගේ දිවැසිවරුන්ට, අනතුරු නොකරන්නැ"යි
වදාළ සේක.
16 උත් 41:53-57 සමිඳාණෝ දේශයට සාගතයක්
පැමිණවෙූ සේක;
q2 16 කෑම අහෝනියක් ඇති කරවූ සේක.
17 උත් 37:28; 45:5 එහතේ, එතුමාණෝ ඔවුන්ට
පරෙටු ව මිනිසකු යැවූ සේක.
q2 17 එනම්, වහල්කමට විකුණන ලද ජෝසපේ ය.
18 උත් 39:20—40:23 ඔහුගේ පාදවලට විලංගු
දමන ලදී;
q2 18 ගලෙ වටා යකඩ වළල්ලක් දමන ලදී.
19 ඔහු කී අනාගත කීම ඉටු වන තුරු සමිඳුන්ගේ
අතින් ඔහු පරීක්ෂා කරන ලදී.

20 උත් 41:14 එවිට මිසරයගේ රජ ඔහු මුදා
හරින්නට අණ කළේ ය.
q2 20 ජාතීන්ගේ පාලකයා ඔහු නිදහස් කළේ ය.
21 උත් 41:39-41 රජතුමා රාජකාරිය ඔහුට භාර
දුන්නේ ය.
q2 21 මුළු දේශයේ ආණ්ඩුකාරයා ලෙස ඔහු පත්
කළේ ය.
22 රජතුමා නිලධාරීන්ට නිදහසේ උවදෙස් දීම ඔහුට
පැවරී ය.
q2 22 මන්ත්‍රීවරුන්ට අනුශාසනා දීමේ අවසර ඔහුට
ලැබුණේ ය.
23 උත් 46:6; 47:11 ඉන්පසු ජාකොබ් මිසරයට
ගියේ ය.
q2 23 ඔහු ඒ රටේ පදිංචි විය.
24 නික්ම 1:7-14 සමිඳාණෝ ඔහුගේ සෙනඟට
බොහෝ දරුවන් දුන් සේක;
q2 24 ඔවුන්ගේ සතුරන්ට වඩා ඔවුන් බලවත් කළ
සේක.
25 ඔහුගේ සෙනඟට ද්වේෂ කරන්නත්, ඔහුගේ
සේවකයන් වංචාවෙන් රවටන්නත් සමිඳාණෝ මිසර
වැසියන් පෙළෙඹවූ සේක.
26 නික්ම 3:1—4:17 එවිට සිය සේවක මෝසෙස් ද
තමන් තෝරාගත් ආරොන් ද සමිඳාණෝ යැවූ සේක.
27 ඔව්හු දෙවිඳුන්ගේ බලවත් ක්‍රියා කළෝ ය;
q2 27 මිසරයේ අසිරිමත් ක්‍රියා කළෝ ය.
28 නික්ම 10:21-23 සමිඳාණෝ දේශයට අන්ධකාරය
එවා එය අඳුරු කළ සේක.
q2 28 එහෙත්, මිසර වැසියෝ එතුමන්ගේ අණට
කීකරු නො වූ හ.
29 නික්ම 7:17-21 එතුමාණෝ ඔවුන්ගේ ගංගා ලේ
බවට හැරවූ සේක;
q2 29 එහි විසූ සියලු මසුන් මැරූ සේක.
30 නික්ම 8:1-6 ඔවුන්ගේ දේශය මැඩියන්ගෙන්
වැසී ගියේ ය;
q2 30 රජ මැඳුර පවා උන්ගෙන් පිරී ගියේ ය.
31 නික්ම 8:16-17-20-24 එතුමන් අණ කළ විට මුළු
දේශය මැස්සන්ගෙන් හා කිනිතුල්ලන්ගෙන් පිරී
ගියේ ය.
32 නික්ම 9:22-25 එතුමාණෝ වැසි වෙනුවට ගල්
වැසි ද විදුලි කෙටීම් ද ඔවුන්ගේ දේශයට එවූ
සේක.
33 එතුමාණෝ ඔවුන්ගේ මිදිවැල් හා අත්තික්කා
ගස්වලට පහර දී ඔවුන්ගේ දේශ සීමා තුළ සියලු
ගස් බිඳ හෙළූ සේක.
34 නික්ම 10:12-15 එතුමාණන් අණ කළ විට
පළඟැටියෝ ද අසංඛ්‍ය ගණන් දළඹුවෝ ද ආවෝ ය.
35 උන් ඔවුන්ගේ දේශයෙහි සියලු පලා ජාති කෑහ;
q2 35 ඔවුන්ගේ කෙතේහි ගොයම් කාදැමූ හ.
36 නික්ම 12:29 එතුමාණෝ ඔවුන්ගේ පුරුෂ
ශක්තියේ නිධානයන් වූ ප්‍රථම ඵලයන් වූ මිසර
දේශයේ සියලු කුලුඳුලන් මරාදැමූ සේක.
37 නික්ම 12:33-36 එවිට, එතුමාණෝ ඉශ්‍රායෙලේ
සෙනඟ තමන්ගේ රන් රිදී සමඟ පිටතට ගෙනෝ
සේක.
q2 37 ඔවුන්ගේ ගෝත්‍ර අතර එක දුබලයකේ වත්
නො වී ය.
38 ඔවුන් පිටත් ව ගිය කල මිසර වැසියෝ සතුටු වූ
හ.
q2 38 මන්ද, ඔව්හු ඉශ්‍රායෙලේ සෙනඟට බියෙන්
සිටියහ.
39 නික්ම 13:21-22 සමිඳාණෝ සිය සෙනඟට
ආවරණයක් ලෙස වලාකුළක් විහිදා හැරිය සේක.
q2 39 රෑ කාලයේ එළිය දෙන පිණිස ගින්නක් ද දුන්
සේක.
40 නික්ම 16:2-15 ඔවුන් ඉල්ලූ කල එතුමාණෝ
වටුවන් එවූ සේක.
q2 40 එතුමාණෝ ඔවුන්ට සුරලොවින් බහුල ව අහර
දුන් සේක.
41 නික්ම 17:1-7; ගණන් 20:2-13 එතුමාණෝ
පර්වතය විවර කළ සේක;
q2 41 එවිට ජලය වේගයෙන් පැන නැංගේ ය.
q2 41 ගංගාවක් මෙන් මරුකතර මැදින් ජලය ගලා
ගියේ ය.
42 එතුමාණෝ සිය මෙහෙකෙරු ආබ්‍රහම් ද ඔහුට
දුන් ශුද්ධ ගිවිසුම ද සිහි කළ සේක.
43 මෙසේ එතුමාණෝ සිය සෙනඟ පිටත ගෙන ගිය
සේක.
q2 43 ඔව්හු ප්‍රීති ප්‍රමෝදයෙන් හඬ නඟා ගී ගැයූ
හ.
44 ජෝෂු 11:16-23 එතුමාණෝ විජාතීන්ගේ
දේශයන් ඔවුන්ට දුන් සේක;
q2 44 විජාතීන්ගේ කෙතේ වතුවල අස්වැන්න ගන්නට
ඔවුන්ට ඉඩ දුන් සේක.
45 එසේ කළේ, ඔවුන් එතුමන්ගේ අණපණත්
රක්ෂා කරන පිණිස ය, එතුමන්ගේ නීති නියෝග
පවත්වන පිණිස ය.
q2 45 සමිඳුන්ට ප්‍රශංසා වේ වා!

### ජාතික පාපෝච්චාරණයක්

106 1 වංශා 16:34; 2 වංශා 5:13; 7:3; එස්රා
3:11; ගීතා 100:5; 107:1; 118:1; 136:1; ජෙරෙ
33:11 සමිඳුන් පසසන්න;
q2
106 සමිඳුන්ට තුති පුදන්න;
q2
106 මන්ද, එතුමාණෝ යහපත් ය;
q2
106 එතුමන්ගේ තිර පෙම සදහට ම පවතින්නේ
ය.
2 සමිඳුන්ගේ ප්‍රබල ක්‍රියා කියන්නත්, එතුමන්ගේ
සියලු පැසසුම් ගයන්නත් පුළුවන් කවරකුටෙ ද?
3 යුක්තිය රක්නා අය ද හැම කල්හි දමිටුකම් කරන
අය ද භාග්‍යවන්තයෝ ය.
4 සමිඳුනි, ඔබේ සෙනඟට කරුණාව දක්වන විට මා
සිහි කළ මැනව;
q2 4 ඔවුන් ගළවන විට මට උපකාර කළ මැනව.

5 ඔබේ තෝරාගත් සෙනඟගේ ශුභසිද්ධිය
දකින්නත්, ඔබට අයිති අය සමඟ ජය ගී ගයන්නත්,
ඔබේ උරුමයෙන් මහිමය ලබන්නත් මට ඉඩ දුන
මැනව.
6 නික්ම 14:10-12 අපි අපේ පියවරුන් මෙන් පව්
කළෙමු;
q2[6] නපුරුකම් කළෙමු;
q2[6] දුෂ්ට ලෙස ක්‍රියා කළෙමු.
7 අපේ පියවරු මිසරයේ දී ඔබේ පුදුම ක්‍රියා
තේරුම් නොගත්තෝ ය.
q2[7] ඔබේ අසීමිත ප්‍රේමය සිහි නොකළෝ ය.
q2[7] රතු මුහුද ළඟ දී මහෝත්තමයාණන්ට විරුද්ධ ව
කැරලි ගැසුවෝ ය.
8 එසේ වුව ද එතුමාණෝ සිය බල විකුම් දක්වන
පිණිස තම නාමයේ අනුහසින් ඔවුන් ගැළවූ සේක.
9 නික්ම 14:21-31 එතුමාණෝ රතු මුහුදට තරවටු
කළ සේක;
q2[9] එය වියළුණේ ය.
q2[9] වැලිකතරක් මැදින් මෙන් මුහුද මැදින් ඔවුන්
ගෙන ගිය සේක.
10 ඔවුන්ට වෛර වූ අයගේ අතින් ඔවුන් ගැළවූ
සේක;
q2[10] සතුරන් අතින් ඔවුන් මිදූ සේක.
11 ජල කඳ ඔවුන්ගේ විරුද්ධකාරයන් වසාගත්තේ
ය;
q2[11] එක් කෙනෙක් වත් ඉතිරි නො වී ය.
12 නික්ම 15:1-21 එවිට, ඔව්හු එතුමන්ගේ
පොරොන්දු විශ්වාස කළෝ ය;
q2[12] එතුමන් හට පැසසුම් ගී ගැයූ හ.
13 එහෙත්, ඔව්හු එතුමන්ගේ ක්‍රියා වහා අමතක
කළෝ ය;
q2[13] එතුමන්ගේ අවවාද නොතකා ක්‍රියා කළෝ ය.
14 ගණන් 11:4-34 ඔව්හු පාළුකරයේ දී අධික ලෙස
තෘෂ්ණාවෙන් පිරී දෙවිඳුන්ට අභියෝග කළෝ ය.
15 ඒ නිසා ඔවුන් ඉල්ලූ දේ එතුමාණෝ ඔවුන්ට දුන්
සේක:
q2[15] එහෙත්, ඔවුන් වනසන රෝගයක් ද එවූ සේක.
16 ගණන් 16:1-35 කඳවුරේ දී, ඔව්හු මෝසෙස්ටත්,
සමිඳුන්ගේ ශුද්ධ තැනැත්තා වූ ආරොන්ටත් ඊර්ෂ්‍යා
කළෝ ය.
17 එවිට පොළොව විවර වී දාතාන් ගිලගත්තා ය;
q2[17] අබීරාම් සහ ඔහුගේ සෙනඟ පසට යට කළා
ය.
18 ඔවුන්ගේ කණ්ඩායම මැද ගින්නක් ඇවිළුණේ ය.
q2[18] ගිනිදැල් දුෂ්ටයන් දවාදැමී ය.
19 නික්ම 32:1-14 ඔව්හු හොරෙබ් කන්දෙහි
වස්සකු සාදා වාත්තු රූපයකට නමස්කාර කළෝ ය.
20 මෙසේ ඔව්හු, දෙවිඳුන්ගේ මහිමය තණ බුදින
ගවයකුගේ ස්වරූපයට වෙනස් කළෝ ය.
21 මිසරයේ දී බලවත් ක්‍රියා කර, ඔවුන් ගළවාගත්
දෙවිඳුන් ඔව්හු අමතක කළෝ ය.
22 එතුමාණෝ, ඒ දේශයේ දී අරුමපුදුම ක්‍රියා ද
රතු මුහුද ළඟ බියකරු ක්‍රියා ද කළ තැනැන්
වහන්සේ නොවෙන සේක් ද?
23 එබැවින් එතුමාණෝ ඔවුන් විනාශ කරන බව
වදාළ සේක.
q2[23] එහෙත්, එතුමාණන් ඔවුන් විනාශ නොකරන
ලෙස, දේව උදහස පහකරන පිණිස, එතුමාණන්
තෝරාගත් මෝසෙස් එතුමාණන් ඉදිරියේ මැදහත්
වූයේ ය.
q2[23] දේව කෝපයෙන් ඔවුන් විනාශ කිරීම
වැළැක්විය.
24 ගණන් 14:1-35 එවිට ඔව්හු සුන්දර දේශය
හෙළා දැක්කෝ ය, මන්ද, එතුමන්ගේ පොරොන්දුව
ඔව්හු විශ්වාස නොකළෝ ය.
25 ඔව්හු තමන්ගේ කූඩාරම්වල දී මැසිවිලි දෙඩුවෝ
ය;
q2[25] සමිඳුන්ගේ හඬට සවන් නුදුන්නෝ ය.
26+PSA ලෙවී 26:33 එබැවින්, ඔවුන් පාළුකරයේ දී
මරා දමන බවත්, ඔවුන්ගේ සෙනඟ විජාතීන් අතරේ
මිය යාමට සලසන බවත්, දේශවල ඔවුන් විසුරුවා
හරින බවත් වදාරා එතුමාණෝ අත ඔසවා දිවුළ
සේක.
28 ගණන් 25:1-13 එවිට ඔව්හු පෙයෝර්හි බාල්
නමස්කාරයට රුස් වූවෝ ය;
q2[28] මළවුන්ට පිදූ දේ කෑවෝ ය.
29 මෙසේ ඔව්හු තමන්ගේ ක්‍රියාවලින් එතුමාණන්
කුපිත කළහ.
q2[29] ඒ නිසා වසංගතයක් ඔවුන් අතරට පැමිණියේ
ය.
30 එවිට, පිනහොස් නැඟිට ඔවුන් අතරෙන්
වරදකරුවන්ට නිසි දඬුවම් දුන්නේ ය.
q2[30] මෙසේ වසංගතය නතර විය.
31 පරපුරෙන් පරපුරට සදහට ම ඔහුගේ දැහැමි
ගුණයක් වශයෙන් මෙය සිහිකරනු ඇත.
32 ගණන් 20:2-13 සෙනඟ මෙරිබාහි දිය උල්පත
ළඟදීත් එතුමාණන් කෝප කළහ.
q2[32] එබැවින් ඔවුන් නිසා මෝසෙස්ට දුක් කරදර
ඇති විය.
33 එසේ වූයේ, ඔවුන් ඔහුගේ සිත අතිශයෙන්
රිදවූ නිසා, ඔහු සිය මුවින් අනුවණ ලෙස කතා කළ
බැවිනි.
34 විරා 2:1-3; 3:5-6 සමිඳුන් ඔවුන්ට අණ කළ ලෙස
ඔව්හු විජාතීන් විනාශ නොකළෝ ය.
35 ඔවුන් සමඟ මිශ්‍ර විවාහ කරගෙන විජාතීන්ගේ
ක්‍රියා කරන්න ඔව්හු ඉගෙනගත්තෝ ය.
36 ඔව්හු ඔවුන්ගේ රූපවලට නමස්කාර කළෝ ය.
q2[36] ඒවා ඔවුන්ට මලපතක් විය.
37 2 රාජා 17:17 ඔව්හු තමන්ගේ දරුදැරියන්
යක්ෂයන්ට පූජා කළෝ ය.
38 ගණන් 35:33 ඔව්හු තම දූ පුතුන්ගේ නිදොස්
ලේ වැගිරෙව්වෝ ය;
q2[38] ඒ දූ දරුවෝ කානානි රූපවලට යාගකරනු
ලැබුවෝ ය;
q2[38] දේශය ද ඒ ලෙයින් දූෂණය විය.
39 මෙසේ ඔව්හු මෙවැනි ක්‍රියාවලින් අපිරිසිදු වූ
හ.

q2 39 ඔව්හු දවේඳුන් හට විශ්වාසී ව නොසිට
වසෙඟනන් මනේ හැසුරුණෝ ය.
40 විරා 2:14-18 එබැවින් සමිඳුන්ගේ උදහස තමන්
සනෙඟට විරුද්ධ ව ඇවුළුණේ ය.
q2 40 එතුමාණෝ තමන් උරුම කරගත් දශේය
පිළිකුල් කළ සේක.
41 එතුමාණෝ විජාතීන් අතට ඔවුන් පාවා දුන්
සේක.
q2 41 ඔවුන්ට වරෙ කළ අය ඔවුන් පාලනය කළෝ
ය.
42 ඔවුන්ගේ සතුරෝ ද ඔවුන්ට පීඩා කළෝ ය;
q2 42 ඔව්හු සතුරන්ගේ බලයට යටත් කරනු
ලැබුවෝ ය.
43 එතුමාණෝ බොහෝ වර සිය සනෙඟ මිදූ
සේක.
q2 43 එහතේ, ඔව්හු ඉන් පසුත් අකීකරු ව කැරලි
ගැසූ බැවින්, සිය අයුතුකම නිසා නින්දා කරනු
ලැබුවෝ ය.
44 එසේ වී නමුත්, එතුමාණෝ ඔවුන්ගේ විලාපය
ඇසූ සේක;
q2 44 ඔවුන්ගේ විපත්තිය සලකා බැලූ සේක.
45 ඔවුන් සමඟ කළ ගිවිසුම සිහි කළ සේක;
q2 45 තමන්ගේ මහා කරුණාව නිසා ඔවුන්ට
අනුකම්පා කළ සේක.
46 ඔවුන් වහල්කමට ගනෙ ගිය සියල්ලන්ගනේ
ඔවුන්ට අනුකම්පාව ලැබනේනට සැලැසූ සේක.
47 1 වංශා 16:35-36 අපගේ දවේ සමිඳුනි, අප
ගළවාගත මැනව;
q2 47 විජාතීන් අතරනේ අප එක් රුස් කරගත මැනව.
q2 47 එවිට ඔබගේ ශුද්ධ නාමයට තුති පුදන්නමෙු;
q2 47 ඔබ පසසමින් ප්රීති වන්නමෙු.
48 ඉශ්රායලේ දවේ සමිඳුන්ට සදාකාලයනේ
සදාකාලයට ම ප්රශංසා වේ වා!
q2 48 මුළු සනෙඟ ආමනේ කියත් වා!
q2 48 සමිඳුන්ට ප්රශංසා කරන්න.

## පස් වන කාණ්ඩය

(ගීතා 107—150)

### සමිඳුන්ගේ කරුණාව පැසසීම

107 1 වංශා 16:34; 2 වංශා 5:13; 7:3; එස්රා
3:11; ගීතා 100:5; 106:1; 118:1; 136:1; ජරෙ
33:11 සමිඳුන් හට තුති පුදන්න.
q2
107 එතුමාණෝ යහපත් ය;
q2
107 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.
2 සමිඳුන් විසින් මුදන ලද්දෝ ඒ වදන් යළි
යළිත් කියත් වා!
q2 2 මන්ද, එතුමාණෝ පීඩාකරුගේ අතින් ඔවුන් මිදූ
සේක.
3 එතුමාණෝ විදසේ රටවලින් ද නැගනෙහිරනේ හා
බස්නාහිරනේ ද උතුරනේ හා දකුණනේ ද ඔවුන් එක්
රුස් කළ සේක.
4 සමහරු වල් බිහි වූ පාළුකරයේ වල්මත් වූ හ.
q2 4 විසීමට නගරයක් ඔවුන්ට සොයාගත නොහැකි
විය.
5 සාගින්නනේ හා පිපාසයනේ පළෙී ඔව්හු
ක්ලාන්තයනේ බලෙහීන වූ හ.
6 එවිට, ඔව්හු තම විපතේ දී සමිඳුන්ට මොරගැසූ
හ.
q2 6 එතුමාණෝ ඔවුන්ගේ විපතින් ඔවුන් මුදාගත්
සේක.
7 වාසය කිරීමට සුදුසු නුවරකට පැමිණනෙ තුරු
එතුමාණෝ හරි මඟකින් ඔවුන් ගනෙ ගිය සේක.
8 සමිඳුන්ගේ තිර පමෙ ගැන ද මිනිසුන්ට කළ පුදුම
දේ ගැන ද ඔව්හු එතුමන්ට පැසසුම් කරත් වා!
9 මන්ද, එතුමාණෝ පිපාසිත වූවන් තෘප්තියට
පමුණුවන සේක;
q2 9 සාගිනි වූවන් යහපත් දයෙන් පිනවන සේක.
10 සමහරු තිත්ත කළුවරහෙි ලැගුම් ගත්හ;
q2 10 පීඩනයට භාජන වී සිරගත වූ හ.
11 මන්ද, ඔව්හු දවේඳුන්ගේ ආඥාවට විරුද්ධ ව
කැරලි ගැසුවෝ ය;
q2 11 මහෝත්තමයාණන්ගේ උපදසේ හළො දුටුවෝ
ය.
12 බර වැඩ නිසා ඔව්හු අධික වහෙසෙට පත් වූ හ.
q2 12 ඔව්හු ඇද වැටුණෝ ය, පිහිට වන්න කිසිවකේ
නො වූ හ.
13 එවිට ඔව්හු තම විපතේ දී සමිඳුන්ට
මොරගැසුවෝ ය.
q2 13 එතුමාණෝ ඔවුන්ට පැමිණි විපතින් ඔවුන්
ගළවාගත් සේක.
14 එතුමාණෝ තිත්ත කළුවරින් ඔවුන් පිටතට
ගනෙ, ඔවුන්ගේ යදම් බිඳදැමූ සේක.
15 සමිඳුන්ගේ තිර පමෙ ද මිනිසුන් හට කරන පුදුම
ක්රියා ද ගැන මනුෂ්යයෝ එතුමන්ට තුති පුදත් වා!
16 මන්ද, එතුමාණෝ ලෝකඩ දොරටු බිඳදැමූ
සේක;
q2 16 යකඩ පොලු කපාදැමූ සේක.
17 ඇතැම් අනුවණයෝ තමන්ගේ අපරාධ නිසාත්,
අයුතුකම් නිසාත් පීඩා විඳිති.
18 ඔවුන්ට සියලු ආකාර කෑම අප්රිය වේ;
q2 18 ඔව්හු මරුමුවට ළං ව සිටියෝ ය.
19 එවිට ඔව්හු තමන්ගේ විපතේ දී සමිඳුන්ට
මොරගැසූ හ.
q2 19 එතුමාණෝ ඔවුන්ගේ විපතින් ඔවුන් ගළවාගත්
සේක.
20 එතුමාණෝ සිය වදනින් ඔවුන් සුවපත් කළ
සේක.
q2 20 ඔවුන් මරණින් ගොඩගත් සේක.
21 සමිඳුන්ගේ තිර පමෙ ද මිනිසුන් හට කරන පුදුම
ක්රියා ද ගැන මනුෂ්යයෝ එතුමන්ට තුති පුදත් වා!
22 ඔව්හු තුති පූජා පුදත් වා!

q2 22 ප්‍රීති ගී ගයා එතුමන්ගේ ක්‍රියා ප්‍රකාශ
කරත් වා!
23 සමහරු නැව්වලින් සමුද්‍ර තරණය කරති;
q2 23 මලෙසෙ සිය ජීවිකාව සඳහා වෙළෙඳාම් කරති.
24 ඔව්හු සමිඳුන්ගේ ක්‍රියා ද මුහුද මත එතුමන්
කළ අරුමපුදුම දේ ද දකිති.
25 මන්ද, එතුමාණෝ අණ දමමින් එහි රුළ නංවන
චණ්ඩ මාරුතය හටගැන්වූ සේක.
26 නැව් අහස උඩට වීසි වී ගැඹුරේ පතිත විය.
q2 26 ඒ විපතින් නැවියෝ අධෛර්යයට පත් වූ හ.
27 ඔව්හු බේබද්දන් මෙන් වීසි වමින් වැනි වැනී
ගියහ.
q2 27 ඔවුන්ගේ දස්කමින් පලක් නොවී ය.
28 එවිට ඔව්හු තමන්ගේ විපතේ දී සමිඳුන්ට
මොරගැසූ හ.
q2 28 එතුමාණෝ ඔවුන්ට පැමිණි විපතින් ඔවුන්
මුදාගත් සේක.
29 එතුමාණෝ කුණාටුව සංසිඳවූ සේක.
q2 29 එවිට මුහුදේ රුළ නිසල විය.
30 නිසලතාව ඇති වූ බැවින් ඔව්හු සතුටු වූ හ.
q2 30 එතුමාණෝ ඔවුන් අදහස් කළ වරායට ඔවුන්
පැමිණෙවූ සේක.
31 සමිඳුන්ගේ තිර පමෙ හා මිනිසුන් හට කරන
පුදුම ක්‍රියා ගැන
q2 31 මනුෂ්‍යයෝ එතුමන්ට තුති පුදත් වා!
32 ඔව්හු මහා සභාව මැද එතුමන්ගේ
ශ්‍රේෂ්ඨත්වය පසසත් වා!
q2 32 ප්‍රජා මූලිකයන්ගේ රුස්වීමේ දී එතුමන්ට
ප්‍රශංසා කරත් වා!
33 එතුමාණෝ ගංගා වැලි කතරට හරවන සේක;
q2 33 දිය උල්පතක් වියළි බිමක් කරන සේක.
34 එතුමාණෝ සරු බිම ලුණු කතරක් කරන සේක.
q2 34 ඊට හේතුව වැසියන්ගේ අපරාධ වන්නේ ය.
35 එතුමාණෝ කාන්තාරය දිය පොකුණක් කරන
සේක;
q2 35 වියළි බිමක් දිය උල්පතක් ද කරන සේක;
36 සාගිනි වූවන් එහි වාසය කරවූ සේක;
q2 36 ඔව්හු ජීවත් වීමට සුදුසු නුවරක් සෑදුවෝ ය.
37 ඔව්හු කෙතේ වපුරා මිදි වතු වගා කළෝ ය;
q2 37 එයින් සරු අස්වැන්න ලබාගත්හ.
38 ඔවුන්ට බොහෝ දරුපල ලැබෙන ලෙස
එතුමාණෝ ඔවුන්ට ආසිරි දුන් සේක;
q2 38 ඔවුන්ගේ සිවුපාවුන්ගේ ගණන අඩු වන්න ඉඩ
නුදුන් සේක.
39 ඉන්පසු දුක් පීඩා හා විපත්ති නිසා ඔවුන්ගේ
ගණන අඩු වී ඔව්හු දුබල වූ හ.
40 එතුමාණෝ අධිපතීන් නින්දාවට පත් කොට, මං
නැති පාළු තැන්වල මුළා වී යන්න සැලැසූ සේක.
41 එහෙත්, එතුමාණෝ දිළිඳුන් පීඩාවෙන් මුදා උසස්
කොට බැටළු රැළක් මෙන් ඔවුන්ගේ පවුල් වැඩි කළ
සේක.
42 සුදනෝ ඒ දැක ප්‍රීති ප්‍රමෝද වන්නෝ ය;
q2 42 දුදනෝ කලකිරීමට පත්වන්නෝ ය.
43 නුවණැත්තෝ මේ දේ සිතට ගනිත් වා!
q2 43 ඔව්හු සමිඳුන්ගේ තිර පමෙ පිළිගනිත් වා!

## උදෑසන ගීතයක්

*දාවිත්ගේ ගීතයකි.*

**108** අහෝ දෙවිඳුනි!
q2
**108** මට අචල විශ්වාසයක් ඇත්තේ ය.
q2
**108** මම ගී ගයා ඔබ පසසමි.
q2
**108** මාගේ හදවත, අවදි වන්න!
2 එම්බා කුඩා වීණාව!
q2 2 මහා වීණාව, පිබිදනේන!
q2 2 එවිට මම උදා හිරු අවදි කරන්නමේ.
3 අහෝ සමිඳුනි!
q2 3 මම ජනතාව අතර ඔබ පසසමි;
q2 3 විජාතීන් අතර මම ඔබට ගී ගයමි.
4 ඔබේ තිර පමෙ සගලොව දක්වා නඟින්නේ ය;
q2 4 ඔබේ සත්‍යවාදීකම අහස උසට නැඟී ඇත්තේ
ය.
5 දෙවිඳුනි, ඔබේ ශ්‍රේෂ්ඨත්වය අහසට වඩා උසස්
බව දැක්වුව මැනව;
q2 5 ඔබේ මහිමාලංකාරය ලොව පුරා පැතිරේ වා!
6 ඔබ ප්‍රේම කරන්නන් මිදෙන පිණිස ඔබේ
දකුණතින් අපට ගැළවීම දුන මැනව.
q2 6 අපේ අයැදුමට පිළිතුරු දුන මැනව.
7 දෙවිඳාණෝ සිය ශුද්ධස්ථානයෙන් මෙසේ වදාළ
සේක:
q2 7 "විජයශ්‍රීයෙන් මම ෂකෙමේ නම් පදෙසෙ බෙදා
දෙන්නෙමේ;
q2 7 සුක්කොත් නම් මිටියාවත මැන වෙන්
කරන්නමේ.
8 ගිලියද් සහ මනස්සේ යන රටවල් මාගේ ය;
q2 8 එප්‍රායිම් දේශය මාගේ හිස් වැස්ම වන්නේ ය;
q2 8 ජුදා පදෙසෙ මාගේ රාජකීය ජයකොන්තය
වන්නේ ය;
9 මෝවබ් පදෙසෙ මාගේ පා දොවන බඳුන
වන්නේ ය;
q2 9 මාගේ පා වහන් ඒදොම් දේශයට වීසි කොට
එය අයිති කරගන්නමේ.
q2 9 පිලිස්තිය යටත් කොට ජය ඝෝෂා නඟන්නමේ."
10 කොටු පවුරු ඇති පුරයට මා කැඳවාගෙන
යන්නේ කවරෙක් ද?
q2 10 ඒදොම් දේශයට මා ජය පරෙහරින් ගෙන
යන්නේ කවරෙක් ද?
11 අහෝ සමිඳුනි!
q2 11 ඔබ අප සමඟ කෝප වී සිටින සේක් ද?
q2 11 අප සේනාවන් සමඟ ඔබ නොවඩින සේක් ද?
12 එදිරිකරුට විරුද්ධ ව ඔබ අපට සහාය දානය කළ
මැනව.
q2 12 මන්ද, මිනිසාගේ උපකාරය නිෂ්ඵල වන්නේ ය.
13 දෙවිඳුන්ගේ සහය ඇති ව අපි වීරයන් මෙන්
සටන් කරන්නමෙු;

q2[13] එතුමාණෝ ම අපගේ එදිරිකරුවන් පයින්
පාගාදමන සේක.

## විපතට පත්වූවකුගේ විලාපය

*දාවිත්ගේ ගීතයකි.*

**109** මාගේ පැසසුම වන හිමි දෙවිඳුනි, නිහඬ
ව නොසිටිය මැනව.
2 මන්ද, දුෂ්ටයන් ද රැවටිලිකාරයන් ද මට බැණ
වැදී ඇත;
q2[2] ඔව්හු මට විරුද්ධ ව බොරු චෝදනා නඟති.
3 ඔව්හු ද්වේෂ සහගත වචනවලින් මට පහර
දෙති;
q2[3] මට විරුද්ධ ව නිකරුණේ සටන් කරති.
4 මා ඔවුන්ට ප්‍රේම කළත්, ඔවුන් වෙනුවෙනේ
යාච්ඤා කළත් ඔව්හු මට විරුද්ධ ව චෝදනා නඟති.
5 තවද, ඔව්හු මා කළ යහපතට අයහපත කරති;
q2[5] ප්‍රේමයට වෛරය දක්වති.
6 මාගේ සතුරාට විරුද්ධ ව කුරිරු විනිශ්චයකරුවකු
පත් කළ මැනව.
q2[6] ඔහුගේ ම සතුරකු පැමිණිලිකරුවකු මෙනේ
ඉදිරිපත් කළ මැනව.
7 විනිශ්චයයේ දී ඔහු වරදකරු වේ වා!
q2[7] ඔහුගේ යාච්ඤාව ද පාපයක් මෙනේ ගණන්
ගැනේ වා!
8 ක්‍රියා 1:20 ඔහු වැඩිකල් ජීවත් නො වේ වා!
q2[8] ඔහුගේ තනතුර අනිකෙක් ගනී වා!
9 ඔහුගේ දරුවෝ අනාථයෝ වෙත් වා!
q2[9] ඔහුගේ බිරිඳ ද වැන්දඹුවක් වේ වා!
10 ඔහුගේ දරුවෝ ඉබාගාතේ යමින් සිඟා කත් වා!
q2[10] ඔවුන් වාසය කරන පැල්පත්වලින් ඔව්හු පලවා
හරිනු ලබත් වා!
11 ණය හිමියා ඔහු සන්තක සියල්ල ම පැහැර ගනී
වා!
q2[11] ඔහු වෙහෙසෙ වී සපයා ගත් සියල්ල
විදේශිකයෝ කොල්ලකත් වා!
12 ඔහුට කරුණා කරන්න කිසිවෙක් නො වේ වා!
q2[12] ඔහුගේ අනාථ දරුවන්ට අනුකම්පා කරන්න
කිසිවෙක් නොසිටී වා!
13 ඔහුගෙනේ පැවත එන්නෝ වැනසී යත් වා!
q2[13] මීළඟ පරම්පරාවේ දී ඔවුන්ගේ නම මැකී යේ
වා!
14 ඔහුගේ පියවරුන්ගේ අයුතුකම සමිඳුන්
ඉදිරියෙහි සිහිකරනු ලැබේ වා!
q2[14] ඔහුගේ මවගේ පාප නොමැකේ වා!
15 සමිඳාණෝ ඔවුන්ගේ පව් නිතර ම සිහි කරන
සේක් වා!
q2[15] මිහි මත කිසිවෙක් ඔහු සිහි නොකෙරේ වා!
16 මේ මිනිසා, දයාව දැක්වීම අමතක කර දුප්පතා
හා දිළිඳා ද බිඳුණු සිත් ඇත්තා ද මරුමුවට යන
තෙක් පීඩා කළේ ය.
17 එසේ ය, සාප කිරීමට ඔහු ප්‍රිය විය;
q2[17] ඒ සාපය ඔහු පිට ම පැමිණේ වා!
q2[17] ඔහු ආශීර්වාද කිරීමට ප්‍රිය නො වී ය, ඒ
ආශීර්වාදය ඔහුගෙනේ දුරු වේ වා!
18 ඔහු තමාගේ වස්ත්‍රය ඇඳගන්නාක් මෙනේ
පහසුවෙනේ සාප කළේ ය.
q2[18] ඒ සාපය ඔහු තුළට දිය මෙනේ ද ඔහුගේ ඇට
තුළට තෙල් මෙනේ ද උරාගනු ලැබේ වා!
19 ඇඟ දවටන සළුව මෙනේ ද නිතර බඳින ඉඟ
පටිය මෙනේ ද ඒ සාපය ඔහු සමඟ නවතී වා!
20 මාගේ එදිරිකාරයන්ටත්, මට විරුද්ධ ව නපුරු දේ
කියන්නන්ටත් සමිඳුන්ගෙනේ ලැබෙනෙ විපාකය ඒ
සාපය වේ වා!
21 එහෙත්, මහෝත්තම දෙවි ස්වාමීනි, ඔබ
පොරොන්දු වූ පරිදි මට පිහිට වුව මැනව;
q2[21] ඔබේ තිර පෙමෙ යහපත් බැවින් මා මුදාගත
මැනව.
22 මන්ද, මම දුප්පත් ය;
q2[22] අසරණ ය;
q2[22] මා සිත සන්තාපයෙනේ පළෙයෙි.
23 මම සවස සෙවණැල්ලක් මෙනේ පහ වී යමි;
q2[23] මම පළඟැටියකු මෙනේ සුළඟට ගසාගෙන යනු
ලබමි.
24 නිරාහාර ව සිටීමෙනේ මාගේ මාංසය වැහැරී යෑම
නිසා මා කෙසඟ වී ඇත.
25 මතෙ 27:39; මාක් 15:29 මම ඔවුන්ගේ
නින්දාවට ලක් වී සිටිමි;
q2[25] ඔව්හු මා දකින විට සරදම් කරමින් හිස් වනති.
26 මාගේ දෙවි සමිඳුනි, මට පිහිට වුව මැනව;
q2[26] ඔබේ තිර පෙමෙ ප්‍රකාරයට මා ගැළවෙව
මැනව.
27 එවිට මයෙ, ඔබේ ක්‍රියාවක් බවත්, සමිඳුනි,
ඔබ මයෙ කළ බවත් ඔව්හු දැනගනිත් වා!
28 ඔවුන් මට සාප කරතත් ඔබ මට ආශීර්වාද කළ
මැනව.
q2[28] මට පීඩා කරන්නෝ ලජ්ජාවට පත් වෙත් වා!
q2[28] ඔබේ මෙහෙකරුවා වන මම ප්‍රීතියට පත්
වෙමේ වා!
29 මාගේ එදිරිකාරයෝ අගෞරවයෙනේ වැසී යතේ
වා!
q2[29] උතුරු සළුවකින් මෙනේ ඔවුන්ගේ ලජ්ජාව ඔව්හු
වසාගනිත්වා.
30 මාගේ මුවින් සමිඳුන්ට බොහෝ සයෙින් තුති
කරන්නමේ;
q2[30] එසේ ය, මහා සභාවේ දී එතුමන්ට ප්‍රශංසා
කරන්නමේ.
31 දිළිඳා මරණයට තීන්දු කරන්නන්ගෙනේ ඔහු
ගළවන පිණිස එතුමාණෝ ඔහුට ආරක්ෂාව වී සිටින
සේක.

## සමිඳාණෝ තෝරාගත් පූජක රජ

*දාවිත්ගේ ගීතයකි.*

**110** මතෙ 22:44; මාක් 12:36; ලූක් 20:42-43;
ක්‍රියා 2:34-35; 1 කොරි 15:25; එෆී 1:20-22;
කොලො 3:1; හෙබ්‍රෙ 1:13; 8:1; 10:12-13

සමිඳාණෝ මා සමිඳුන්ට කතා කොට, “මා නුඹේ
සතුරන් නුඹේ පා යට ලන තෙක් මාගේ දකුණු පස
අසුන් ගන්නැ”යි වදාළ සේක.
2 සමිඳාණන් සියොන්හි සිට ජයකොන්තය ඔබ
අතට දුන් විට ඔබේ සතුරන් මැද රජකම් කළ
මැනව.
3 ඔබ සතුරන් සමඟ සටන් කරන දවසේ දී ඔබේ
සෙනඟ සිය කැමැත්තෙන් ඔබට එකතු වන්නෝ ය.
q2 3 අලුයම පිනි මෙන්, ඔබේ තරුණයෝ ඔබ වෙත
පැමිණෙති.
4 හෙබ්‍රෙ 5:6; 6:20; 7:17-21 “නුඹ
මෙල්කිසදෙක්ගේ පරපුරෙන් සදහට ම පූජකයෙකි
ය”යි සමිඳාණෝ දිවුළ සේක;
q2 4 එය වෙනස් නොකරන සේක.
5 සමිඳාණෝ ඔබ දකුණු පස වැඩ සිටින සේක.
q2 5 උදහස් දිනයේ දී එතුමාණෝ රජුන්ගේ ඔද
බිඳදමන සේක.
6 එතුමාණෝ ජාතීන් අතරෙහි විනිශ්චය කරන
සේක;
q2 6 මළකඳන්වලින් රණ බිම පුරවන සේක.
q2 6 ලොව පුරා සිටින රජවරුන් පරාජය කරන
සේක.
7 රජතුමා යන මඟ අසල ඇති දොළ පහරින් දිය
පානය කරනු ඇත;
q2 7 එයින් ශක්තිමත් කරනු ලැබ සටනින් ජයග්‍රාහී
වනු ඇත.

## සමිඳුන් පැසසුමෙහි යුතු බව

111 සමිඳුන් පසසන්න, දැහැමියන්ගේ
සමාගමේ දී ද සභාවේ දී ද මාගේ මුළු
සිතින් සමිඳුන්ට ස්තුති කරන්නෙමි.
2 සමිඳුන්ගේ ක්‍රියා කොපමණ උදාර ද?
q2 2 ඒවාට ප්‍රිය වන සියල්ලෝ ඒවා තේරුම්ගැනීමට
උත්සාහ කරති.
3 එතුමන්ගේ ක්‍රියා ගෞරවයෙන් හා මහිමයෙන්
පූර්ණ ය;
q2 3 එතුමන්ගේ දැහැමිකම සදාතන ය.
4 සිය පුදුම ක්‍රියාවන් අපට අමතක වන්නට ඉඩ
නොදෙන සේක.
q2 4 සමිඳාණෝ, දයාවන්ත ය;
q2 4 සානුකම්පිත ය.
5 එතුමාණෝ තමන් කෙරෙහි ගරුබිය ඇත්තන්ට
ආහාර දෙන සේක.
q2 5 එතුමාණෝ සිය ගිවිසුම කිසි කලක අමතක
නොකරන සේක.
6 එතුමාණෝ විජාතීන්ගේ දේශයන් තමන්
සෙනඟට දීමෙන් තමන් බලය ඔවුන්ට පෙන්වූ සේක.
7 එතුමන්ගේ ක්‍රියා සත්‍යය හා යුක්තිය ප්‍රකාශ
කරයි;
q2 7 එතුමන්ගේ පණත් සියල්ල විශ්වාසී ය.
8 ඒවා සදහට ම පවතිනු ඇත.
q2 8 සත්‍යයෙන් හා අවංකකමෙන් ඒවා සිදු කරන
ලද්දේ ය.
9 එතුමාණෝ සිය සෙනඟ මුදා ලූ සේක;
q2 9 සිය ගිවිසුම සදහට ම පිහිටෙවූ සේක.
q2 9 එතුමන්ගේ නාමය සුවිශුද්ධ ය;
q2 9 ගරු ගම්භීර ය.
10 දේව ගරුබිය පෑම ප්‍රඥාවේ මුල් පියවර වේ;
q2 10 එය පිළිපදින සියල්ලන්ට මනා බුද්ධිය ඇති
වන්නේ ය.
q2 10 එතුමන්ගේ ප්‍රශංසාව සදාකල් පවත්නේ
ය.ජෝබ් 28:28; හිතෝ 1:7; 9:10

## දැහැමියන්ගේ වාසනාව

112 සමිඳුන් පසසන්න, සමිඳුන් වෙත ගරුබිය
ඇති ව සිටින්නා ද එතුමන්ගේ ආඥාවලට
බොහෝ සේ ප්‍රිය වන්නා ද භාග්‍යවන්ත ය.
2 ඔහුගේ පරපුර දේශයෙහි බලවත් වන්නේ ය.
q2 2 දැහැමි පරපුර ආසිරි ලබන්නේ ය.
3 සම්පත ද වස්තුව ද ඔහුගේ නිවසෙහි ඇත්තේ
ය.
q2 3 ඔහුගේ දැහැමිකම සදාකල් පවත්නේ ය.
4 සුදනාට අඳුරෙහි එළියක් උදා වන්නේ ය;
q2 4 ඔහු දයාවන්ත ය;
q2 4 සානුකම්පිත ය;
q2 4 දැහැමි ය.
5 දානශීලී ව ණයට දෙන මිනිසාට සුබ සෙත වේ;
q2 5 ඔහු සිය කටයුතු අවංක ලෙස කරන්නේ ය.
6 මන්ද, දැහැමියා කිසි කලෙකත් නොපැකිළෙන්නේ
ය.
q2 6 ඔහු සදහට ම සිහිකරනු ලබන්නේ ය.
7 ඔහු නරක ආරංචිවලට බිය නොවන්නේ ය.
q2 7 ඔහුගේ ඇදහිල්ල ස්ථිර ය.
q2 7 ඔහු සමිඳුන් විශ්වාස කරන්නේ ය.
8 ඔහුගේ සිත සවිමත් ය;
q2 8 ඔහු බිය නොවන්නේ ය.
q2 8 සිය සතුරන්ගේ පරාජය දක්නට ලැබෙන බව
ඔහුට ඒකාන්ත ය.
9 2 කොරි 9:9 ඔහු දිළිඳුන්ට නොමසුරු ව දෙන්නේ
ය;
q2 9 ඔහුගේ දැහැමිකම සදාකල් පවත්නේ ය;
q2 9 ඔහු ගරු සම්මාන ලබා බලවත් වන්නේ ය.
10 දුෂ්ටයා ඒ දැන කෝප වන්නේ ය;
q2 10 ඔහු දත්මිටි කා වැහැරී යන්නේ ය;
q2 10 දුදනන්ගේ බලාපොරොත්තු සුන් වී යන්නේ ය.

## සමිඳුන්ගේ යහපත්කම වැණීම

113 සමිඳුන්ට ප්‍රශංසා කරන්න, සමිඳුන්ගේ
මෙහෙකරුවෙනි, ප්‍රශංසා කරන්න,
සමිඳුන්ගේ නාමයට ප්‍රශංසා කරන්න.
2 මතු පටන් සදහට සමිඳුන්ගේ නාමයට
ප්‍රශංසා වේ වා!
3 සමිඳුන්ගේ නාමයට නැගෙනහිර පටන් බස්නාහිර
දක්වා ප්‍රශංසා කටයුතු ය.
4 සියලු ජාතීන්ට ඉහළින් සමිඳාණෝ වැජඹෙන
සේක.

q2 4 එතුමන්ගේ මහිමාලංකාරය අහස් තලය
ඉක්මවා යයි.
5 අපගේ දෙවි සමිඳුන්ට සමාන අන් කෙනෙකේ නැත;
q2 5 එතුමාණෝ උසස් තැන්හි වැඩ හිඳින සේක.
6 එහෙත්, අහසත්, පොළොවත් බලන පිණිස
එතුමාණෝ පහතට නැමෙන සේක.
7 එතුමාණෝ දුප්පතා ධූලියෙන් නැඟුටුවන සේක;
q2 7 දිළිඳා කසළ ගොඩින් ඔසවන සේක.
8 එසේ කරන්නේ, ඔවුන් අධිපතීන් සමඟ, තම
සෙනඟගේ අධිපතීන් සමඟ හිඳුවන පිණිස ය.
9 එතුමාණෝ වඳ ස්ත්‍රිය දරුවන් ඇති ප්‍රීතිමත්
මවක කරන සේක;
q2 9 ඈට නිවසෙක් දෙන සේක.
q2 9 සමිඳුන්ට ප්‍රශංසා කරන්න.

### පාස්කු ගීයක්

**114** නික්ම 12:51 ඉශ්‍රායලේ සෙනඟ මිසර
දේශයෙන් ද ජාකොබ්ගේ පරපුර
විදේශයකින් ද නික්ම ගියෝ ය.
2 එවිට ජුදා දේශය සමිඳුන්ගේ ශුද්ධස්ථානය විය,
ඉශ්‍රායලේ දේශය එතුමන්ගේ රාජ්‍යය විය.
3 නික්ම 14:21; ජෝෂු 3:16 රතු මුහුද එය දැක පලා
ගියා ය;
q2 3 ජෝර්දාන් ගඟ ආපසු ගලා යෑම නැවතුණේ ය.
4 කඳු, බැටළුවන් මෙන් ද කුඩා හලේ, බැටළු
පැටවුන් මෙන් ද පැන පැන ක්‍රීඩා කළේ ය.
5 එම්බා රතු මුහුද!
q2 5 නුඹ පලා යන්නේත්, ජෝර්දාන් ගඟ, නුඹේ
ගැලීම නැවතුණේත් නුඹලාට කුමක් සිදු වූ නිසා ද?
6 එම්බා කඳු!
q2 6 නුඹලා බැටළුවන් මෙන් ද කුඩා හලේ, නුඹලා
බැටළු පැටවුන් මෙන් ද පැන පැන ක්‍රීඩා කරන්නේ
කුමක් නිසා ද?
7 එම්බා මිහිකත!
q2 7 පර්වත දිය පොකුණක් බවට ද ගිනි ගල දිය
උල්පතක් බවට ද හරවන දෙවිඳුන්,
8 නික්ම 17:1-7; ගණන් 20:2-13 එනම්, ජාකොබ්ගේ
දෙවිඳුන් වඩින විට එතුමන් අබියස බියෙන්
ඇලළමෙන් වෙවුලන්න.

### එක ම සැබෑ දෙවියන් වහන්සේ

**115** සමිඳුනි, අප නිසා නොව, අප නිසා නොව,
ඔබේ තිර පෙම නිසාත්, සත්‍යවාදිකම
නිසාත්, ඔබේ නාමය නිසාත් ඔබේ මහිමාලංකාරය
ප්‍රකාශ කළ මැනව.
2 "ඔවුන්ගේ දෙවිඳාණෝ දැන් කොතැන්හි දැ"යි
ජාතීන්ට අසන්න ඉඩ දෙන්නේ කුමට ද?
3 අපගේ දෙවි තුමාණෝ ස්වර්ගයේ ය;
q2 3 තමන් කැමැති කුමන දයෙක් වුවත් එතුමාණෝ
කරන සේක.
4 ගීතා 135:15-18; එළිද 9:20 ඔවුන්ගේ දේවතා රූප
රිදියෙන් හා රනින් ය;
q2 4 මිනිසුන්ගේ දෑතේ වැඩ ය.
5 ඒවාට කටවල් ඇත, එහෙත්, කතා නොකරයි;
q2 5 ඇස් ඇත, එහෙත්, නොදෙකියි;
6 කන් ඇත, එහෙත්, නොඇසෙයි; නාස් ඇත,
එහෙත්, ගඳ සුවඳ නොදැනෙයි;
7 ඒවාට දෑත ඇත, එහෙත්, ස්පර්ශ නොකරයි;
q2 7 පාද ඇත, එහෙත්, නොඇවිදියි;
q2 7 උගුරෙන් ශබ්ද නොකරයි.
8 ඔවුන් සාදන්නෝ ඔවුන් වාගේ ම ය;
q2 8 ඔවුන් විශ්වාස කරන සියල්ලෝත් එසේ ම ය.
9 එම්බා ඉශ්‍රායලේ ජනයෙනි!
q2 9 සමිඳුන් විශ්වාස කරන්න.
q2 9 ඔබේ සරණත්, පලිහත් එතුමාණෝ ය.
10 එම්බා ආරොන්ගේ වංශය!
q2 10 සමිඳුන් විශ්වාස කරන්න.
q2 10 ඔබේ සරණත්, පලිහත් එතුමාණෝ ය.
11 සමිඳුන් නමදින සියල්ලෙනි!
q2 11 සමිඳුන් විශ්වාස කරන්න.
q2 11 ඔබේ සරණත්, පලිහත් එතුමාණෝ ය.
12 සමිඳාණෝ අප සිහිකරන සේක;
q2 12 අපට ආශීර්වාද කරන සේක;
q2 12 එතුමාණෝ ඉශ්‍රායලේ වංශයට ආශීර්වාද
කරන සේක;
q2 12 එතුමාණෝ ආරොන්ගේ වංශයට ආශීර්වාද
කරන සේක.
13 එළිද 11:18; 19:5 සමිඳුන් කෙරෙහි ගරුබිය ඇති
ලොකු කුඩා සියල්ලන්ට එතුමාණෝ ආශීර්වාද කරන
සේක.
14 සමිඳාණෝ ඔබ හා ඔබේ දරුවන් වඩ වඩා
වර්ධනය කරන සේක් වා!
15 අහසත්, පොළොවත් මැවූ සමිඳාණෝ ඔබට
ආශීර්වාද කරන සේක් වා!
16 ස්වර්ගය වනාහි සමිඳුන්ට පමණක් අයිති ය.
q2 16 එහෙත්, පොළොව එතුමාණෝ මිනිසුන්ට දුන්
සේක.
17 මියගිය අය වත්, පාතාල ලෝකයේ අය වත්
සමිඳුන්ට ප්‍රශංසා නොකරති.
18 එහෙත් අපි, ජීවත් ව සිටින අපි, මෙතැන් පටන්
සදහට ම සමිඳුන්ට ප්‍රශංසා කරන්නෙමු.
q2 18 සමිඳුන්ට ප්‍රශංසා කරන්න.

### මරණින් මිදීම ගැන ස්තුති දීම

**116** සමිඳුන්ට ප්‍රේම කරමි, මන්ද, එතුමාණෝ
මගේ අයැදුම ද මාගේ කන්නලව්ව ද ඇසූ
සේක.
2 එතුමාණන් මා දෙසට කන් යොමු කළ බැවින් දිවි
ඇතිතාක් මම එතුමන්ට යාච්ඤා කරන්නෙමි.
3 මාරක රුහැනෙන් මම වෙළුණෙමි.
q2 3 පාතාලයේ වේදනා මා අසු කරගත්තේ ය;
q2 3 විපත හා දුක මා වෙළාගත්තේ ය.
4 එවිට මම සමිඳුන්ගේ නාමයෙන් අයැදිමි;
q2 4 "සමිඳුනි, මා මිදුව මැනවැ"යි කීමි.
5 සමිඳාණෝ දයාවන්ත ය;
q2 5 දැහැමි ය.

q2 5 එසේ ය, අපගේ දෙවියන්වහන්සේ අනුකම්පාවන්තයි
යුක්ත ය.
6 සමිඳාණෝ නිහතමානි අය සුරකින සේක.
q2 6 මා අනතුරේ වැටී සිටිය දී එතුමාණෝ මා
ගළවාගත් සේක.
7 මාගේ සිත, යළි සන්සුන් වන්න.
q2 7 මන්ද, සමිඳාණෝ ඔබට බොහෝ සේ
යහපත්කම් කළ සේක.
8 එතුමාණෝ මාගේ ජීවිතය මරණයෙන් ද මාගේ
ඇස් කඳුළෙන් ද මාගේ පාද පැකිළීමෙන් ද ගළවාගත්
සේක.
9 එසේ හයින්, මම ජීවතුන් අතර සමිඳුන්
ඉදිරියෙහි හැසිරෙන්නෙමි.
10 2 කොරි 4:13 “මම බොහෝ පීඩා විඳිමි”යි කී
අතර වුව ද මාගේ විශ්වාසය තිර ලෙස රැකගතිමි.
11 මා භීතියට පත් ව සිටිය දී, “මිනිසකු තුළ
බලාපොරොත්තුව තැබීම නිෂ්ඵල ය”යි කීවෙමි.
12 සමිඳුන් මා හට කළ සියලු යහපත්කම් ගැන
එතුමන්ට මම කුමක් පුදම් ද?
13 මම ගැළවීමේ කුසලාන ගන්නෙමි;
q2 13 සමිඳුන්ගේ නාමයෙන් යාච්ඤා කරන්නෙමි.
14 එසේ ය, සමිඳුන්ගේ මුළු සෙනඟ ඉදිරියෙහි
මාගේ බාරහාර මම ඉටු කරන්නෙමි.
15 සැදැහැවතුන්ගේ මරණය සමිඳුන් අබියස
අගනේ ය.
16 සමිඳුනි, මම ඔබේ මෙහෙකරුවෙකු වෙමි;
q2 16 සැබැවින් ම ඔබේ මෙහෙකරුවෙකු වෙමි;
q2 16 ඔබේ දාසියගේ පුත්‍රයා වෙමි.
q2 16 ඔබ මාගේ බැඳුම් මිදූ සේක.
17 මම ඔබට ස්තුති පූජාව පුදන්නෙමි;
q2 17 සමිඳුන්ගේ නාමය අමතා අයැදින්නෙමි.
18 එසේ ය, සමිඳුන්ගේ මුළු සෙනඟ ඉදිරියෙහි
මාගේ බාරහාර ඉටු කරන්නෙමි,
19 සමිඳුන්ගේ මාලිගාවේ මළුවල දීත්, එම්බා
ජෙරුසලම!
q2 19 තී මධ්‍යයෙහි දීත් එසේ කරන්නෙමි.
q2 19 සමිඳුන්ට ප්‍රශංසා කරන්න.

### සමිඳුන් පැසසුමට ඇරයුම්

117 රෝම 15:11 සකල ජාතීනි, සමිඳුන්ට
ප්‍රශංසා කරන්න.
q2
117 සව් සතුනි, හිමි තුම ගුණ මහිමය වර්ණනා
කරන්න.
2 මන්ද, අප කෙරෙහි සමිඳුන්ගේ ප්‍රේමය ඉමහත්
ය,
q2 2 එතුමන්ගේ විශ්වාසකම සදහට ම පවත්නේ ය.
q2 2 සමිඳුන්ට ප්‍රශංසා කරන්න.

### ගැළවුම්කරුට තුති ගීයක්

118 1 වංශා 16:34; 2 වංශා 5:13; 7:3; එස්රා
3:11; ගීතා 100:5; 106:1; 107:1; 136:1; ජෙරෙ
33:11 සමිඳුන්ට ස්තුති කරන්න. මන්ද, එතුමාණෝ
යහපත් ය.
q2
118 එතුමන්ගේ තිර පෙම සදාකාලයට පවත්නේ
ය.
2 “එතුමන්ගේ තිර පෙම සදාකාලයට පවත්නේ
ය”යි ඉශ්රායෙලේ දැන් කියත් වා!
3 “එතුමන්ගේ තිර පෙම සදාකාලයට පවත්නේ
ය”යි ආරොන්ගේ වංශය දැන් කියත් වා!
4 “සමිඳුන්ගේ තිර පෙම සදාකාලයට පවත්නේ
ය”යි එතුමන් කෙරෙහි ගරුබිය ඇත්තෝ දැන් කියත්
වා!
5 මාගේ විපතේ දී සමිඳුන්ට යාච්ඤා කළෙමි.
q2 5 සමිඳාණෝ මට පිළිතුරු දෙමින් මා නිදහස් කළ
සේක.
6 හෙබ්‍රෙ 13:6 සමිඳුන් මාගේ පැත්තට සිටින
බැවින් මම බිය නොවන්නෙමි.
q2 6 මට හානි කිරීමට කිසිවකුට හැකි ද?
7 සමිඳාණෝ මාගේ පැත්තෙහි ය;
q2 7 මාගේ උපකාරකයාණෝ ය.
q2 7 එබැවින්, වෛර කරන්නන්ගේ පරාජය මම
දකින්නෙමි.
8 මිනිසා කෙරෙහි විශ්වාසය තැබීමට වඩා සමිඳුන්
කෙරෙහි විශ්වාසය තැබීම යහපත.
9 අධිපතීන් කෙරෙහි විශ්වාසය තැබීමට වඩා
සමිඳුන් කෙරෙහි විශ්වාසය තැබීම යහපත.
10 බොහෝ සතුරෝ මා වට කරගත්හ.
q2 10 සමිඳුන්ගේ බලයෙන් මම ඔවුන් විනාශ
කළෙමි.
11 ඔව්හු මා වට කරගත්හ;
q2 11 එසේ ය, මා වට කරගත්හ.
q2 11 සමිඳුන්ගේ බලයෙන් මම ඔවුන් විනාශ
කළෙමි.
12 ඔව්හු මී මැස්සන් මෙන් මා වට කරගත්හ;
q2 12 ගිනිගත් කටු පඳුරක් මෙන් ඔව්හු ඇවිළී ගියහ.
q2 12 සමිඳුන්ගේ බලයෙන් මම ඔවුන් විනාශ
කළෙමි.
13 වැටෙන පිණිස මම තදින් තල්ලු කරන ලදිමි;
q2 13 එහෙත්, සමිඳාණෝ මට පිහිට වූ සේක.
14 නික්ම 15:2; යෙසා 12:2 සමිඳාණෝ මාගේ සවිය
ද ගීය ද වෙති;
q2 14 එතුමාණෝ මාගේ ගැළවුම්කාරයාණෝ ය.
15 ප්‍රීතිවීමේ හා ගැළවීමේ හඬට සවන් දෙන්න.
q2 15 දමිටුන්ගේ කූඩාරම්වල ජය නාදය ඇසේ.
q2 15 සමිඳුන්ගේ බාහු බලය විකුම් දක්වයි.
16 සමිඳුන්ගේ බාහු බලය උදාර ය.
q2 16 සමිඳුන්ගේ බාහු බලය විකුම් දක්වයි.
17 මම නොනැසී, ජීවත් ව සිටින්නෙමි;
q2 17 සමිඳුන්ගේ ක්‍රියා ප්‍රකාශ කරන්නෙමි.

18 සමිඳාණෝ දැඩි ලෙස මට දඬුවම් දුන් සේක.
q218 එහෙත්, මරුවාට මා පාවා නුදුන් සේක.
19 දැමිටුකමේ දොරටු මට හැර දෙන්න;
q219 එවිට, එයින් මම ඇතුල් වී සමිඳුන්ට ස්තුති
කරන්නෙමි.
20 මෙන්න, සමිඳුන්ගේ දොරටුව!
q220 දැහැමියෝ එයින් ඇතුල් වන්නෝ ය.
21 මම ඔබට ස්තුති කරන්නෙමි, මන්ද, ඔබ මට
පිළිතුරු දී මාගේ ගැළවීම වූ සේක.
22 ලූක් 20:17; ක්‍රියා 4:11; 1 පේදු 2:7 ගෘහ
ශිල්පීන් ඉවත ලූ ගල ම මුල් ගල වී ඇත.
23 මතෙ 21:42; මාක් 12:10-11 මෙයෙ සමිඳුන්ගේ
ක්‍රියාවකි;
q223 එය අපගේ දෙනෙතට අසිරිමත් ය.
24 මෙන්න, සමිඳුන්ගේ ජය මංගල දිනය!
q224 මෙදින අපි ප්‍රීති වමු;
q224 සන්තෝෂ වමු.
25 මතෙ 21:9; මාක් 11:9; ජොහ 12:13 සමිඳුනි,
දැන් අප ගැළවුව මැනව.
q225 සමිඳුනි, දැන් අපට ජය අත්කර දුන මැනව.
26 මතෙ 21:9; 23:39; මාක් 11:9; ලූක් 13:35; 19:38;
ජොහ 12:13 සමිඳුන්ගේ නාමයෙන් වඩින
තැනැත්තේ ආසිරි ලද්දෙකි.
q226 සමිඳුන්ගේ මාලිගාවේ සිට අපි ඔබට ආසිරි
පතමු.
27 සමිඳාණෝ දෙවිඳාණෝ ය;
q227 එතුමාණෝ අපට එළිය දුන් සේක;
q227 අතු ගත් අත් ඇති ව පූජාසනය වටා පෙරහැරින්
ගමන් කරන්න.
28 ඔබ මාගේ දෙවිඳාණෝ ය;
q228 මම ඔබට ස්තුති කරන්නෙමි.
q228 ඔබ මාගේ දෙවිඳාණෝ ය;
q228 මම ඔබට උස් හඬින් පැසසුම් ගී ගයන්නෙමි.
29 සමිඳුන්ට ස්තුති කරන්න;
q229 මන්ද, එතුමාණෝ යහපත් ය;
q229 එතුමන්ගේ තිර පෙම සදා පවත්නේ ය.

### දේව පණතේ මාහැඟිකම

119 නිදොස් දිවියක් ගත කරන අය,
සමිඳුන්ගේ ව්‍යවස්ථාව අනුව හැසිරෙන අය
භාග්‍යවන්ත ය.
2 එතුමන්ගේ ශික්ෂා පද පවත්වන අය, මුළු සිතින්
එතුමන් සොයන අය භාග්‍යවන්ත ය.
3 එසේ ය, ඔව්හු කිසි නපුරක් නොකරති;
q23 ඔව්හු එතුමන්ගේ මාර්ගවල හැසිරෙති.
4 අප ඔබේ නියෝග අනලස් ව පවත්වන පිණිස
ඔබ ඒවා අපට නියම කළ සේක.
5 ඔබේ පණත් පිළිපැදීමෙන් මාගේ චර්යාව ස්ථිර ව
පැවතේ වා!
6 ඔබේ ආඥා සියල්ලට ඇලුම් ව සිටින විට මම
ලජ්ජා නොවන්නෙමි.
7 ඔබේ දැහැමි අණපණත් මා දැනගත් විට අවංක
සිතින් ඔබට ස්තුති කරන්නෙමි.
8 ඔබේ පණත් පිළිපදින්නෙමි;
q28 මා කිසි දා අත් නොහැරිය මැනව.

### දේව ආඥාවට කීකරු වීම

9 තරුණයකු තම දිවි මඟ පිවිතුරු ව තබාගන්නේ
කෙසේ ද?
q29 ඔබේ ආඥාවට කීකරු වීමෙනි.
10 මාගේ මුළු සිතින් ඔබ සෙවීමි;
q210 ඔබේ ආඥාවලට පිටුපා යන්නට මට ඉඩ නුදුන
මැනව.
11 ඔබට විරුද්ධ ව පව් නොකරන පිණිස ඔබේ
වචනය මාගේ සිතේ නිදන් කරගනිමි.
12 සමිඳුනි, මම ඔබ පසසමි, ඔබේ පණත් මට
ඉගැන්නුව මැනව.
13 ඔබ ප්‍රකාශ කළ සියලු නීති මාගේ මුවින්
පතුරුවා හැරීමි.
14 සියලු යස ඉසුරෙහි ප්‍රීති වීමට වඩා ඔබේ
ශික්ෂා මාර්ගයෙහි ප්‍රීතිමත් වමි.
15 ඔබේ නියෝග ගැන භාවනා කරන්නෙමි;
q215 ඔබේ මාර්ග කෙරෙහි මාගේ සිත යොමු
කරන්නෙමි.
16 ඔබේ නියමවලට ප්‍රිය වන්නෙමි;
q216 ඔබේ වචනය අමතක නොකරන්නෙමි.

### ශික්ෂා මාර්ගයෙහි ප්‍රීති වීම

17 ඔබේ මෙහෙකරුගේ යහපත ගැන හොඳින්
සලකා බැලුව මැනව.
q217 එවිට මම ජීවත් වන්නෙමි, ඔබේ ඉගැන්වීම්
පවත්වන්නෙමි.
18 ඔබේ ව්‍යවස්ථාවෙහි පුදුම අගයන් දක්නා පිණිස
මාගේ ඇස් පැහැදුව මැනව.
19 මම මිහි පිට ආගන්තුක ව වසන්නෙක්මි.
q219 ඔබේ ආඥාවන් මාගෙන් නොසැඟවුව මැනව.
20 සැම විට ම ඔබේ නීති දැනගැනීමට මා සිත දැඩි
ආශාවෙන් දැවෙන්නේ ය.
21 ඔබේ ආඥාවලට පිටුපා යන, සාපලත් උඩඟු
අයට ඔබ තරවටු කරන සේක.
22 ඔවුන්ගේ නින්දාවත්, අවමානයත් මා කෙරෙන්
පහ කළ මැනව.
q222 මන්ද, මම ඔබේ ශික්ෂා පද රක්ෂා කළෙමි.
23 අධිපතියෝ එක් රැස් ව මට විරුද්ධ ව
කුමන්ත්‍රණ කළෝ ය.
q223 එහෙත්, ඔබේ මෙහෙකරුවා ඔබේ පණත්
භාවනා කරන්නේ ය.
24 ඔබේ ශික්ෂා පද මාගේ ප්‍රීතිය වේ. ඒවා
මාගේ උපදේශකයා ය.

### ව්‍යවස්ථාව පැවැත්වීමේ අධිෂ්ඨානය

25 මම දූවිල්ලෙහි වැතිර සිටිමි.
q225 ඔබේ පොරොන්දුව ලෙස මා ප්‍රාණවත් කළ
මැනව.
26 මා කළ සියල්ල ප්‍රකාශ කළෙමි.
q226 එවිට ඔබ පිළිතුරු දුන් සේක.

q226 දැන් ඔබගේ පණත් මට ඉගැන්නුව මැනව.
27 ඔබගේ නියෝග මට තේරුම් කර දුන මැනව.
q227 එවිට ඔබගේ බලවත් ක්‍රියා ගැන මම භාවනා
කරන්නෙමි.
28 මහද සොවින් උණු වී යයි.
q228 ඔබගේ පොරොන්දුව ලෙස මා ශක්තිමත් කළ
මැනව.
29 වංක ක්‍රියා මා කෙරෙනේ දුරින් දුරු කළ මැනව.
q229 ඔබගේ ව්‍යවස්ථාව අනුව ජීවත් වීමට මට වරම්
දුන මැනව.
30 සත්‍ය මාර්ගය මම තෝරාගතිමි.
q230 ඔබගේ නීති මා ඉදිරියෙහි තබාගතිමි.
31 අහෝ සමිඳුනි!
q231 ඔබගේ ශික්ෂා පදවලට ඇලුම් වෙමි.
q231 මා ලජ්ජාවට නොපැමිණවෙව මැනව.
32 ඔබ මාගේ දැනුම පුළුල් කරන විට ඔබගේ ශික්ෂා
මාර්ගයෙහි යුහු ව ගමන් කරන්නෙමි.

## තේරුම්ගැනීම සඳහා යැදුමක්

33 සමිඳුනි, ඔබගේ ශික්ෂා මාර්ගය මට ඉගැන්නුව
මැනව.
q233 එය දිවි හිමියෙනේ මම පිළිපදින්නෙමි.
34 මට මනා අවබෝධය දුන මැනව.
q234 එවිට ඔබගේ ව්‍යවස්ථාව රක්ෂා කරන්නෙමි;
q234 එසේ ය, මාගේ මුළු සිතින් එය පිළිපදින්නෙමි.
35 ඔබගේ ශික්ෂා මාර්ගයෙහි මා කැඳවාගෙන යනු
මැනව.
q235 මන්ද, එය මාගේ ප්‍රීතිය වේ.
36 අයුතු ලාභයට නොව, ඔබගේ ශික්ෂා පදවලට
මාගේ සිත යොමු කළ මැනව.
37 නිසරු දේ නැරඹීමෙනේ මාගේ නෙතේ වැළකුව
මැනව;
q237 ඔබගේ වචනයෙනේ මා ප්‍රාණවත් කළ මැනව.
38 ඔබ කෙරෙහි ගරුබිය ඇත්තන් හට ඔබ දෙන
පොරොන්දුව ඔබගේ මෙහෙකරුවාට ඉටුකර දුන
මැනව.
39 මා තුළ බිය උපදවන මාගේ නින්දාව මා
කෙරෙනේ පහකළ මැනව.
q239 මන්ද, ඔබගේ විශ්වාසවන්තකම යහපත් ය.
40 ඔබගේ නියෝගයන්ට ආශා වීමි.
q240 ඔබගේ දැහැමි බවෙහි මා ප්‍රාණවත් කළ
මැනව.

## ව්‍යවස්ථාව කෙරෙහි විශ්වාසය තැබීම

41 සමිඳුනි, ඔබගේ පොරොන්දුව පරිදි ඔබගේ තිර
පෙම පනේවා වදාළ මැනව.
q241 එනම්, ඔබගේ ගැළවීම මා වෙත එවා වදාළ
මැනව.
42 එවිට මට නින්දා කරන්නාට දිය යුතු පිළිතුරක්
මට ඇති වන්නේ ය.
q242 මන්ද, මම ඔබගේ වචනය විශ්වාස කරමි.
43 සත්‍ය වචනය මාගේ මුවින් ඉවත් නොකළ
මැනව.
q243 මන්ද, ඔබගේ විනිශ්චයයන් තුළ මම මාගේ
බලාපොරොත්තුව තබමි.
44 මෙසේ ඔබගේ ව්‍යවස්ථාව සදහට ම නොකඩවා
පිළිපදින්නෙමි.
45 මම නිදහස් ලෙසෙ හැසිරෙනේනෙමි.
q245 මන්ද, ඔබගේ නියෝග අනුව මම ජීවත් වීමි.
46 රජුන් ඉදිරියෙහිත් ඔබගේ ශික්ෂා පද ගැන කතා
කරමි;
q246 ලජ්ජාවට පත් නොවන්නෙමි.
47 මා සිත් ගත් ඔබගේ ආඥාවන් කෙරෙහි ප්‍රීති
වන්නෙමි.
48 මා සිත් ගත් ඔබගේ ආඥාවලට ගරුසරු දක්වා
ඔබගේ පණත් ගැන භාවනා කරන්නෙමි.

## ව්‍යවස්ථාව කෙරෙහි අචල භක්තිය

49 ඔබගේ මෙහෙකෙරුවා වන මට ඔබ දුන්
පොරොන්දුව සිහිකළ මැනව.
q249 ඔබ එය ගැන බලාපොරොත්තුව මා තුළ
ඇතිකළ සේක.
50 ඔබගේ පොරොන්දුව මා ප්‍රාණවත් කළ බැවින්
මාගේ දුකේ දී එය මාගේ සැනසීම විය.
51 උඩඟු අය මට අතිශයින් අපහාස කළෝ ය.
q251 එහෙත්, මම ඔබගේ ව්‍යවස්ථාවෙනේ ඉවත් ව
නොයන්නෙමි.
52 සමිඳුනි, ආදියේ සිට පැවති ඔබගේ විනිසුම් සිහි
කොට සැනසීම ලබා ගතිමි.
53 ඔබගේ ව්‍යවස්ථාව අත්හරින අදමිටුවන් දකින
විට මා තුළ කෝපාග්නිය ඇවිළී යයි.
54 මාගේ මේ ලුහුඬු ජීවිත ගමනේ දී ඔබගේ
පණත් ගැන ගී ගයමි.
55 සමිඳුනි, රාත්‍රියේ දී ඔබගේ නාමය සිහි
කරන්නෙමි;
q255 ඔබගේ ව්‍යවස්ථාව පිළිපදින්නෙමි.
56 මේ ආසිරි මට ලැබුණේ, මා ඔබගේ නියෝග
රක්ෂා කළ නිසා ය.

## ව්‍යවස්ථාවට බැති පෙම

57 සමිඳුනි, මාගේ එක ම සම්පත ඔබ ය.
q257 ඔබගේ නියෝග පවත්වන්නට පොරොන්දු වෙමි.
58 මාගේ මුළු සිතින් ඔබගේ කරුණාව ඉල්ලමි.
q258 ඔබගේ පොරොන්දුව පරිදි මට කරුණා කළ
මැනව.
59 මම මාගේ හැසිරීම ගැන සිහිකර ඔබගේ ශික්ෂා
පද දෙසට යළි හැරෙනේනෙමි.
60 මම ඔබගේ ආඥා පිළිපැදීමට පමා නොවී ඉක්මන්
වීමි.
61 දුදනන් මට උගුලක් අටවා ඇත.
q261 එහෙත්, මම ඔබගේ ව්‍යවස්ථාව අමතක
නොකෙළෙමි.
62 ඔබගේ දැහැමි නියෝග නිසා මැදියම් රැයේ ඔබට
ස්තුති කරන්න මම අවදි වන්නෙමි.
63 මම ඔබ කෙරෙහි ගරුබිය ඇති සියල්ලන්ගේ ද
ඔබගේ නියෝග පවත්වන්නන්ගේ ද මිතුරෙක් වෙමි.

64 සමිඳුනි, පොළොව ඔබගේ තිර පෙමින් පිරී තිබේ.
ඔබගේ පණත් මට ඉගැන්වුව මැනව.

### ව්‍යවස්ථාවේ වටිනාකම

65 සමිඳුනි, ඔබගේ පොරොන්දුව ප්‍රකාර ඔබගේ
මෙහෙකරුවාට ඔබ යහපත කළ සේක.
66 මට තියුණු නැණනුවණ හා දැනුම දුන මැනව.
q2 66 මන්ද, මම ඔබගේ ආඥා විශ්වාස කරමි.
67 පීඩා විඳින්නට පෙර මම මුළා ව ගියෙමි.
q2 67 එහෙත් දැන්, ඔබගේ වචනයට කීකරු වෙමි.
68 ඔබ යහපත් ය;
q2 68 යහපත කරන සේක.
q2 68 ඔබගේ පණත් මට ඉගැන්නුව මැනව.
69 උඩඟු අය මට විරුද්ධ ව බොරු ගොතා ඇත.
q2 69 එහෙත්, මාගේ මුළු සිතින් ඔබගේ නියෝගවලට
කීකරු වන්නෙමි.
70 ඔවුන්ට දැඩි සිතක් ඇත;
q2 70 එහෙත් මම, ඔබගේ ව්‍යවස්ථාවට ප්‍රිය වෙමි.
71 පීඩා විඳීම මට යහපතක් විය;
q2 71 එයින් ඔබගේ පණත් ඉගෙනගතිමි.
72 ඔබ වදාළ ව්‍යවස්ථාව මසුරන් දහසකට වඩා
මට අගේ ය.

### ව්‍යවස්ථාවේ සාධාරණකම

73 සිය'තින් මා මවා, රක්නා සමිඳුනි, ඔබගේ ආඥා
ඉගෙනගන්න පිණිස මට නුවණ දුන මැනව.
74 ඔබ කෙරෙහි ගරුබිය ඇත්තෝ මා දැක සතුටු
වන්නෝ ය.
q2 74 මන්ද, මම ඔබගේ පොරොන්දුව කෙරෙහි
බලාපොරොත්තුව තබමි.
75 සමිඳුනි, ඔබගේ විනිශ්චයයන් සාධාරණ බවත්,
ඔබ විශ්වාසවන්ත නිසා මට පීඩා කළ බවත් දනිමි.
76 ඔබගේ මෙහෙකරුවාට ඔබ පොරොන්දු වූ පරිදි
ඔබගේ මහ කුළුණු ගුණය මාගේ සැනසීම පිණිස වේ
වා!
77 මා ජීවත් වන පිණිස මට අනුකම්පා කළ මැනව.
q2 77 ඔබගේ ව්‍යවස්ථාව මාගේ ප්‍රීතිය වේ.
78 උඩඟු අය අයුතු ලෙස මා හළො දැමූ බැවින්,
q2 78 ඔව්හු ලජ්ජාවට පැමිණෙත් වා!
q2 78 එහෙත්, මම ඔබගේ නියෝග ගැන භාවනා
කරන්නෙමි.
79 ඔබ කෙරෙහි ගරුබිය ඇත්තෝ මා වෙත හැරී
එත් වා!
q2 79 එවිට ඔව්හු ඔබගේ ශික්ෂා පද තේරුම්ගන්නෝ
ය.
80 මා පරාජයට පත් නොවන පිණිස ඔබගේ පණත්
අනුව ජීවත් වන්නට මා හද පිරිසිදු කළ මැනව.

### මිදීම සඳහා යැදුමක්

81 මගේ සිත ඔබගේ ගැළවීමට ආශාවෙන් වැහැරී
යයි.
q2 81 මම ඔබගේ පොරොන්දු කෙරෙහි
බලාපොරොත්තු වෙමි.
82 'ඔබ කවදා මා සනසන සේක් දැ'යි මම
යදින්නෙමි.
q2 82 ඔබගේ පොරොන්දු ගැන බලා සිටීමෙන් මාගේ
ඇස් වෙහෙසී වී ඇත.
83 ඇකිළී ගිය ලබු කැටයක් මෙන් මම නිසල් වීමි.
q2 83 එහෙත්, ඔබගේ පණත් අමතක නොකරමි.
84 ඔබගේ මෙහෙකරුවා තව කොතෙක් කල් බලා
සිටින්න ද?
q2 84 මට පීඩා කරන්නන්ට ඔබ කවදා යුක්තිය ඉටු
කරන සේක් ද?
85 ඔබගේ ව්‍යවස්ථාව ලෙසෙ නොහැසිරෙන උඩඟු අය
මට බොරු වළවල් හෑරුවෝ ය.
86 ඔබගේ ආඥා සියල්ල විශ්වාස කටයුතු ය.
q2 86 මිනිස්සු අයුතු ලෙස මට පීඩා කරති.
q2 86 මට පිහිට වුව මැනව.
87 ඔවුන් සහමුලින් ම මෙනේ මා මිහි පිටින්
වනසාදමා ඇත.
q2 87 එහෙත්, මම ඔබගේ නියෝග අත් නොහරිමි.
88 ඔබගේ මහා කරුණාව ලෙසෙ මා පණ ගැන්වුව
මැනව.
q2 88 එවිට මම, ඔබ වදාළ ශික්ෂා පද පිළිපදින්නෙමි.

### ව්‍යවස්ථාව කෙරෙහි ඇදහිල්ල

89 සමිඳුනි, ඔබගේ වචනය සදාතනික ය;
q2 89 එය තිර ලෙස සගලොව ඇත.
90 ඔබගේ විශ්වාසවන්තකම පරපුරෙන් පරපුරට
පවත්නේ ය.
q2 90 ඔබ පොළොව පිහිටවූ සේක.
q2 90 එය ස්ථිර ව පවතී.
91 ඔබගේ නියමයන් ලෙසෙ ඒ මැවිලි අද දක්වා පවතී.
මන්ද, සියල්ල ඔබට මෙහෙ කරයි.
92 ඔබගේ ව්‍යවස්ථාව මාගේ ප්‍රීතිය නොවී නම්,
මාගේ විපතේ දී මා වැනසෙන්නට ඉඩ තිබුණේ ය.
93 ඔබගේ නියෝග කිසි කලෙක අමතක
නොකරන්නෙමි.
q2 93 මන්ද, ඔබ ඒවායින් මා පණ ගැන්වූ සේක.
94 මම ඔබගේ ය;
q2 94 මා මුදාලුව මැනව.
q2 94 ඔබගේ නියෝග මම මෙනෙහි කළෙමි.
95 දුෂ්ටයෝ මා විනාශ කරන්නට බලා සිටියෝ ය.
q2 95 එහෙත්, මම ඔබගේ ශික්ෂා පද සාවධානයෙන්
මෙනෙහි කරන්නෙමි.
96 හැම යහපතකට ම සීමාවක් ඇති බව මා දැක
ඇත.
q2 96 එහෙත්, ඔබගේ ආඥාවට නම් සීමාවක් නැත.

### ව්‍යවස්ථාවට ඇති ඇල්ම

97 ඔබගේ ව්‍යවස්ථාවට මම කොපමණ ප්‍රේම
කරම් ද?
q2 97 එය මාගේ දනෙනික භාවනාව වේ.
98 ඔබගේ ආඥා නිතර ම මා සමඟ ය.
q2 98 එයින් මාගේ සතුරන්ට වඩා මම පැණවත්
වෙමි.

99 මාගේ සියලු ඇදුරන්ට වඩා මට නැණනුවණ
ඇත්තේ ය.
q2 99 මාගේ භාවනාව ඔබේ ශික්ෂා ගැන ම ය.
100 මා ඔබේ නියෝග රක්ෂා කළ බැවින්
වැඩිහිටියන්ට වඩා තේරුම් පැහැදුම් මට ඇත්තේ ය.
101 ඔබේ වචනය පිළිපදින පිණිස සියලු වැරදි
මාර්ගවලින් මාගේ පාද වළක්වාගතිමි.
102 ඔබේ නියමයන්ගෙන් ඉවත් ව නොගියෙමි.
q2 102 ඔබ ම මට ඒවා ඉගැන්වූ සේක.
103 ඔබේ වචන මාගේ දිවට කොපමණ මිහිරි ද?
q2 103 එසේ ය, ඒවා මාගේ කටට මී පැණිවලට
වඩා මිහිරි ය.
104 ඔබේ නියෝග මඟින් මට නැණනුවණ ලැබේ.
q2 104 එබැවින් සියලු වංක මාර්ග මම
නුරුස්සන්නෙමි.

### ව්‍යවස්ථාවෙන් එළිය

105 ඔබේ වචන මාගේ දෙපයට පහනක් ය;
q2 105 මාගේ මාවතට එළියක් ය.
106 'ඔබේ දැහැමි නියමයන් පිළිපදින්නෙමි'යි
දිවුරුවෙමි.
q2 106 මම ඒවා ඉටු කළෙමි.
107 මම බොහෝ සේ පීඩිත වීමි.
q2 107 සමිඳුනි, ඔබේ පොරොන්දු ප්‍රකාර මා
ප්‍රාණවත් කළ මැනව.
108 සමිඳුනි, මාගේ මුවින් පැවසූ සතුටු පූජා
පිළිගෙන, ඔබේ නියමයන් මට ඉගැන්නුව මැනව.
109 ඔබ උදෙසා මාගේ දිවි පිදීමට මම නිතර ම
සූදානම් ය.
q2 109 එහෙත්, ඔබේ ව්‍යවස්ථාව මම අමතක
නොකරමි.
110 දුදනෝ මට මලපතක් තැබුවෝ ය.
q2 110 එහෙත් මම, ඔබේ නියෝගවලින් ඉවත් ව
නොගියෙමි.
111 ඔබේ ශික්ෂා පද සදහට ම උරුම කොටගතිමි.
q2 111 ඒවා මසිතට ප්‍රීතිය ගෙන දෙයි.
112 සදහට ම, මරණය දක්වා ඔබේ පණත් ඉටු
කරන්න මාගේ සිත යොමු කළෙමි.

### ව්‍යවස්ථාවේ සුරක්ෂිතතාව

113 චපල සිත් ඇත්තවුන්ට ද්වේෂ කරමි;
q2 113 එහෙත්, ඔබේ ව්‍යවස්ථාවට ප්‍රේම කරමි.
114 ඔබ මාගේ රක්ෂාස්ථානය වේ, මාගේ පලිහ
වේ.
q2 114 ඔබේ පොරොන්දුව කෙරෙහි
බලාපොරොත්තුව තබමි.
115 දුදනෙනි, මා වෙතින් පලා යන්න.
q2 115 මම මාගේ දෙවිඳුන්ගේ ආඥාවන් පිළිපදිමි.
116 මා ජීවත් වන පිණිස ඔබේ පොරොන්දු ප්‍රකාර
මට ශක්තිය දුන මැනව.
q2 116 මාගේ බලාපොරොත්තුව කඩ වීමෙන් ලජ්ජා
වන්නට ඉඩ නැරිය මැනව.
117 මට අනුබල දුන මැනව;
q2 117 එවිට මම සුරැකි ව සිටින්නෙමි.
q2 117 ඔබේ පණත් නිතර ම සලකන්නෙමි.
118 ඔබේ පණත්වලින් ඉවත් ව යන සියල්ලන් ඔබ
පිළිකෙව් කළ සේක.
q2 118 ඔවුන්ගේ කපටිකම නිෂ්ඵල ය.
119 ඔබ පොළොවේ සියලු දුෂ්ටයන් කුණු කසළ
මෙන් පහකරන සේක.
q2 119 එබැවින් මම ඔබේ ශික්ෂා පදවලට ප්‍රේම
කරමි.
120 ඔබට බියෙන් මාගේ ගත සිත වෙවුලයි.
q2 120 ඔබේ විනිශ්චයයන්ට මම බිය වෙමි.

### ව්‍යවස්ථාවට කීකරු වීම

121 යුතු දේ ද දැහැමි දේ ද මම කළෙමි;
q2 121 මට පීඩා කරන්නන් අතට මා භාර නොකළ
මැනව.
122 ඔබේ මෙහෙකරුවාට යහපත කරන බවට
පොරොන්දු වන්න.
q2 122 මට පීඩා කිරීමට උඩඟු අයට ඉඩ නුදුන
මැනව.
123 ඔබ දෙන ගැළවීම හා ඔබේ දැහැමි
පොරොන්දුව ගැන අවදි ව සිටීමෙන් මාගේ ඇස්
වෙහෙසෙ වී ඇත.
124 ඔබේ ප්‍රේමය අනුව ඔබේ මෙහෙකරුවාට නිසි
ලෙසෙ සලකන්න.
q2 124 ඔබේ පණත් මට උගන්වන්න.
125 මම ඔබේ මෙහෙකරුවා වෙමි.
q2 125 ඔබේ ශික්ෂා පද දැනගන්න පිණිස මට
නැණනුවණ දුන මැනව.
126 සමිඳුනි, ඔබට ක්‍රියා කිරීමට සුදුසු කාලය දැන්
පැමිණ ඇත.
q2 126 සනෙඟ ඔබේ ව්‍යවස්ථාව කඩකර ඇත.
127 එබැවින් රනට වඩා, එසේ ය, පරේ‍ර රනට වඩා
ඔබේ ආඥාවලට මම ප්‍රේම කරමි.
128 එබැවින් ඔබේ නියමය අනුව මම
හැසිරෙන්නෙමි;
q2 128 සියලු වංක මාර්ග නුරුස්සමි.

### ව්‍යවස්ථාව පිළිපැදීමට ආශාව

129 ඔබේ අණපණත් විස්මයජනක ය.
q2 129 එබැවින් මාගේ මුළු සිතින් මම ඒවා
පිළිපදින්නෙමි.
130 ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය
ලැබේ.
q2 130 එයින් අනුවණයන්ට නුවණ ලැබේ.
131 ඔබේ ආඥාවලට පිපාසයෙන් සිටිමි.
q2 131 මම මුව අයා හතිලන්නෙමි.
132 ඔබේ නාමයට ප්‍රේම කරන අයට ඔබ කරුණා
කරන්නාක් මෙන් මා දෙසට හැරී මට කරුණා කළ
මැනව.
133 ඔබ පොරොන්දු වූ ලෙසෙ මා දෙපා තර කළ
මැනව;

q2133 කිසි අයුක්තියකට මා කරෙහෙි බල පෑමට ඉඩ
නුදුන මැනව.
134 මිනිසුන්ගේ හිරිහැරවලින් මා මුදාලුව මැනව;
q2134 එවිට ඔබේ නියෝග මම පිළිපදින්නෙමි.
135 දයාවෙන් මා දෙස බැලුව මැනව;
q2135 ඔබේ පණත් මට ඉගැන්නුව මැනව.
136 මිනිසුන් ඔබේ ව්‍යවස්ථාව නොපිළිපදින බැවින්
මාගේ දෑසින් කඳුළු ධාරා ගලා යයි.

## ව්‍යවස්ථාවේ සාධාරණකම

137 සමිඳුනි, ඔබ දැහැමි ය;
q2137 ඔබේ විනිසුම් සාධාරණ ය.
138 ඔබ දැහැමිකමින් ද තිර විශ්වාසකමින් ද ඔබේ
ශික්ෂා පද නියම කළ සේක.
139 මාගේ එදිරිකරුවන් ඔබේ වචනය නොසලකන
නිසා මම කෝපාග්නියෙන් දැවෙමි.
140 ඔබේ පොරොන්දු සහතික ය.
q2140 එබැවින් ඔබේ මෙහෙකරුවා ඒවාට ප්‍රේම
කරයි.
141 මම සුළු කෙනෙකිමි;
q2141 හීන දීන කෙනෙකිමි.
q2141 එහෙත්, ඔබේ නියෝග අමතක නොකරමි.
142 ඔබේ දැහැමිතාව සදාකාලික දැහැමිතාවක් වේ;
q2142 ඔබේ ව්‍යවස්ථාව ද සත්‍ය වේ.
143 විපත හා සිත් තැවුල් මා වෙළාගෙන තිබේ.
q2143 එහෙත්, ඔබේ ආඥා මාගේ ප්‍රීතිය වේ.
144 ඔබේ ශික්ෂා පද සදහට ම දැහැමි ය.
q2144 මා ජීවත් වන පිණිස මට නැණනුවණ දුන
මැනව.

## මිදීම සඳහා යැදුමක්

145 මම මුළු හදවතින් යාච්ඤා කළෙමි.
q2145 සමිඳුනි, මට පිළිතුරු දුන මැනව.
q2145 ඔබේ අණපණත් මම පිළිපදින්නෙමි.
146 මම ඔබට අඬගැසීමි;
q2146 මා මුදාලුව මැනව.
q2146 එවිට ඔබේ ශික්ෂා පද මම පිළිපදින්නෙමි.
147 මම අලුයමට පෙර නැඟිට මොරගැසීමි;
q2147 ඔබේ පොරොන්දුව කෙරෙහි බලාපොරොත්තු
වීමි.
148 ඔබේ පොරොන්දුව ගැන භාවනා කරන පිණිස
රෑ යාමය මුළුල්ලේ මම අවදි ව සිටිමි.
149 ඔබේ ප්‍රේමය ස්ථිර නිසා මාගේ හඬ ඇසුව
මැනව.
q2149 සමිඳුනි, ඔබේ යුක්තිය ලෙසෙ මා දිවි රැකගත
මැනව.
150 නපුරු අරමුණු ඇති ව මට පීඩා කරන දුදනෝ
මට ළඟා වෙති.
q2150 ඔව්හු ඔබේ ව්‍යවස්ථාවෙන් ඈත් ව සිටිති.
151 සමිඳුනි, ඔබ ළඟා වී සිටින සේක.
q2151 ඔබේ සියලු ආඥා සත්‍ය ය.
152 ඔබේ ශික්ෂා පද කලක සිට දැන සිටියෙමි.
q2152 ඔබ ඒවා සදහට ම පැණවූ සේක.

## උපකාර ඉල්ලා යැදීම

153 මාගේ දුක බලා මා ගැළවුව මැනව.
q2153 ඔබේ ව්‍යවස්ථාව මම අමතක නොකෙළෙමි.
154 මාගේ නඩුව අසා මා මිදුව මැනව;
q2154 ඔබේ පොරොන්දුව ලෙසෙ මට නව දිවියක්
දුන මැනව.
155 දුදනන් හට ගැළවීමක් නැත;
q2155 ඔව්හු ඔබේ පණත් නොසලකති.
156 සමිඳුනි, ඔබේ අනුකම්පාව ඉමහත් ය.
q2156 ඔබේ නියමයන් ලෙසෙ මට නව දිවියක් දුන
මැනව.
157 මට පීඩා කරන්නෝ ද මාගේ එදිරිකාරයෝ ද
බොහෝ ය.
q2157 එහෙත් මම, ඔබේ ශික්ෂා පදවලින් ඉවත් ව
නොගියෙමි.
158 ද්‍රෝහිකම් කරන්නන් දැක මම ඔවුන් පිළිකුල්
කළෙමි.
q2158 ඔව්හු ඔබේ නියමයන් නොපිළිපදිති.
159 ඔබේ නියෝගවලට මා ප්‍රේම කරන හැටි
සිතා බැලුව මැනව.
q2159 සමිඳුනි, ඔබේ පෙමෙ තිර නිසා මට නව
දිවියක් දුන මැනව.
160 ඔබේ ව්‍යවස්ථාවේ හරය සත්‍යය වේ.
q2160 ඔබේ සියලු දැහැමි විනිසුම් සදහට පවත්නේ
ය.

## ව්‍යවස්ථාවට ඇප කැප වීම

161 අධිපතීහු නිකරුණේ මට පීඩා කළෝ ය.
q2161 එහෙත් මම, ඔබේ ව්‍යවස්ථාවට ගරු කරමි.
162 මහා නිධානයක් ලබන කෙනෙකු මෙන් මම
ඔබේ පොරොන්දුව ගැන ප්‍රීතිමත් වෙමි.
163 මුසාවට ද්වේෂ කරමි;
q2163 එය පිළිකුල් කරමි.
q2163 එහෙත්, ඔබේ ව්‍යවස්ථාවට ප්‍රේම කරමි.
164 ඔබේ දැහැමි විනිශ්චයයන් නිසා දවසට සත්
වරක් මම ඔබට ප්‍රශංසා කරමි.
165 ඔබේ ව්‍යවස්ථාවට ප්‍රේම කරන්නන්ට ඉමහත්
සාමයක් ඇත.
q2165 කිසි අවහිරයක් ඔවුන්ට නැත.
166 සමිඳුනි, ඔබේ ගැළවීම ගැන උදක් ම බලා
සිටිමි.
q2166 ඔබේ ආඥා ඉටු කළෙමි.
167 මම ඔබේ ශික්ෂා පද පිළිපැදීමි.
q2167 මම ඒවාට බොහෝ සෙයින් ප්‍රේම කරමි.
168 මම ඔබේ නියෝග හා ශික්ෂා පද පිළිපැදීමි.
q2168 මාගේ දිවි මඟ ඔබ ඉදිරියෙහි ය.

## පිහිට පතා යැදීම

169 සමිඳුනි, මාගේ මොරගැසීම ඔබ ඉදිරියට
පැමිණේ වා!
q2169 ඔබේ පොරොන්දුව අනුව මට නැණනුවණ
දුන මැනව.

170 මාගේ අයැදීම ඔබ ඉදිරියට පැමිණේ වා!
q2170 ඔබේ පොරොන්දුව ලෙසෙ මා මිදුව මැනව.
171 ඔබේ පණත් ඔබ මට උගන්වන බැවින් මා මුව
ඔබට පැසසුම් ගී පිළිරුව් දේ වා!
172 ඔබේ සියලු ආඥා සාධාරණ ය;
q2172 මම ඔබේ ව්‍යවස්ථාව ගැන ගී ගයමි.
173 ඔබේ හස්තය මට උපකාර පිණිස සූදානම් වේ
වා!
q2173 මම ඔබේ නියෝග අනුව යමි.
174 සමිඳුනි, මම ඔබ දෙනෙ ගැළවීමට ආසා වමේ.
q2174 ඔබේ ව්‍යවස්ථාව මාගේ ප්‍රීතිය වේ.
175 ඔබට ප්‍රශංසා කරන පිණිස මට ජීවත් වන්නට
ඉඩ දුන මැනව.
q2175 ඔබේ නියමයෝ මට උපකාරවත් වතේ වා!
176 නැති වූ බැටළුවකු මෙනේ මම මුළා ව ගියමේ.
q2176 ඔබේ මෙහෙකෙරුවා වන මා සොයා එනු
මැනව.
q2176 මම ඔබේ ආඥා අමතක නොකරමි.

## වන්දනා ගීයක්

120 මාගේ විපතේ දී මම සමිඳුන්ට
මොරගැසීමි.
q2
120 එතුමාණෝ මට උත්තර දුන් සේක.
2 සමිඳුනි, බොරුකාර තොල්වලින් ද
වංචාකාර දිවනේ ද මා ගැළවෙව මැනව.
3 එම්බා වංචාකාරයනෙි!
q23 දවේිඳුන් ඔබට කුමක් කළ යුතු ද?
q23 කුමන දඬුවමක් දිය යුතු ද?
4 දිළනෙ ගිනි අඟුරු ද හේවොයාගේ තියුණු ඊගස් ද
ඔබ පිට පැමිණේ වා!
5 මෙෂෙකේහි විදේශී ව සිටීම ද කේදාර්හි කූඩාරම්
මැද වාසය කිරීම ද මට දුකක් ය.
6 සාමයට ද්වේෂ කරන්නා සමඟ මම බොහෝ
කල් වාසය කළෙමේ.
7 මම සාමය සොයන්නමේ;
q27 එහතේ, ඒ ගැන කතා කරන විට ඔව්හු සටනට
සැරසතේ.

## අපේ එක ම පිහිට

121 කඳු දසෙට මාගේ ඇස් ඔසවන්නමේ.
q2
121 මට පිහිට ලැබනේනේ කොතැනින් ද?
2 මට පිහිට ලැබනේනේ සමිඳාණන්ගනේ ම
ය.
q22 අහස පොළොව මැවූ සමිඳාණන්ගනේ ම ය.
3 එතුමාණෝ ඔබ පය පැකිළනේනට ඉඩ නොදනෙ
සේක.
q23 අවදි ව සිටිමින් ඔබ නිතින් රැක බලාගන්න
සේක.
4 ඉශ්රායලේ ජාතියේ රැකවරණයාණන් හට නිදි
බරවීමක් වත්, නිදාගැනීමක් වත් නැත්තේ ය.
5 සමිඳාණෝ ඔබ රක්නා උත්තමයාණෝ ය.
q25 සමිඳාණෝ ඔබ දකුණත සිට ඔබට රැකවරණය
දනෙ සේක.
6 දවාලේ හිරු ඔබට පීඩා නොකරන්නේ ය.
q26 රාත්‍රියේ සඳ ඔබට පීඩා නොකරන්නේ ය.
7 සමිඳාණෝ සියලු නපුරනේ ඔබ රැකගන්න සේක;
q27 ඔබේ ජීවිතය රැකවල් කරන සේක.
8 මතෙැන් සිට සදාකාලයනේ සදාකාලයට
සමිඳාණෝ, ඔබේ යාම ඊම ආරක්ෂා කරන සේක.

## ජරුසෙලම ගැන පැසසුම

*දාවිත් විසිනි.*

122 “දවේ මැදුරට යමු”යි ඔවුන් මට කී විට
මම ප්‍රීතියනේ පිනා ගියමේ.
2 එම්බා ජරුසෙලම!
q22 අපේ දපො තිගේ වාසල ඇතුළේ තබා තිබේ.
3 එම්බා ජරුසෙලම!
q23 මැනවින් සදා නිම කළ නුවරක් මෙනේ තී
ගොඩනඟන ලද්දී ය.
4 ඉශ්රායලේ සනෙඟට නියම කළ ලෙසෙ
ගෝත්‍රයෝ, සමිඳුන්ගේ ගෝත්‍රයෝ, එතුමන් නමට
තුති දනෙ පිණිස මෙමෙ නගරය වතෙ පැමිණතේ.
5 මන්ද, සිංහාසනය, එනම්, දාවිත්ගේ සිංහාසනය
සනෙඟ විනිශ්චය කරන පිණිස එහි පිහිටා තිබේ.
6 ජරුසෙලමේ සාමය උදසො අයැදුම් පුදන්න;
q26 තිට ප්‍රමේ කරන්නෝ දියුණු වතේ වා!
7 තිගේ පවුරු තුළ සාමය බැබළේ වා!
q27 තිගේ මාලිගා තුළ සුරැක්තාව පවතී වා!
8 මාගේ නෑ මිතුරන් නිසා මම මසෙේ කියමි:
q28 “ජරුසෙලම තුළ සාමදානය වේ වා!”
9 අපේ දවේ සමිඳුන්ගේ මාලිගාව නිසා මම තිගේ
යහපත සොයන්නමේ.

## දයාව සඳහා යැදීම

123 සගලොව වැඩ වසන සමිඳුනි ඔබ දසෙ
මාගේ ඇස් ඔසවමි.
2 බලව, දාසයකුගේ ඇස් සිය ස්වාමියාගේ අත
දසෙත්, දාසියකගේ ඇස් සිය ස්වාමි දුවගේ අත
දසෙත් යොමු වී තිබනේනාක් මෙනේ, අපේ
දවේිඳාණන්ගේ කරුණාව අප වතෙ පහළ වන තකේ,
අපේ දෑස එතුමාණන් දසෙ යොමා තිබේ.
3 සමිඳුනි, අපට කරුණා කළ මැනව;
q23 අපට කරුණා කළ මැනව.
q23 මන්ද, අපි අධික ලෙසෙ නින්දාවට ලක් වී
සිටියමෙු.
4 සුව පහසු ලබමින් සිටින අයගේ උපහාසයටත්,
අහංකාරීන්ගේ නින්දාවටත් අපි බොහෝ කල් ලක්
වී සිටියමෙු.

## ඉශ්රායලේ සනෙඟගේ මිදුම්කාරයාණෝ

*දාවිත් විසිනි.*

124 ඉශ්රායලේ මසෙේ කියත් වා!
q2

124 “අපගේ පැත්තට සමිඳාණෝ නොසිටි සේක් නම්,
2 අපට විරුද්ධ ව සතුරන් නැඟිට ආ කල, අපගේ
පැත්තට සමිඳාණෝ නොසිටි සේක් නම්,
3 ඔවුන්ගේ උදහස අපට විරුද්ධ ව ඇවුළුණු කල,
අප පණපිටින් ගිල ගන්නට ඔවුන්ට ඉඩ තිබිණි.
4 එවිට ජලයෙන් අප වැසී යන්නට ඉඩ තිබිණි;
q2[4] දිය දහරින් අප යට කොට ගසාගෙන යන්නට
ඉඩ තිබිණි.
5 සැඬ ජල කඳ අප යට කොට ගසාගෙන යන්නට
ඉඩ තිබිණි.
6 අපගේ සතුරන්ට අප ගොදුරු වීමට ඉඩ නුදුන්
සමිඳාණන්ට ප්‍රශංසා වේ වා!
7 පක්ෂි වැද්දාගේ උගුලෙන් ගැළවී යන පක්ෂියකු
මෙන් අපි මිදුණෙමු;
q2[7] උගුල බිඳී ගියේ ය.
q2[7] අපි ගැළවුණෙමු.
8 අපගේ පිහිටට ඇත්තේ, අහසත්, පොළොවත් මැවූ
සමිඳුන්ගේ නාමය ය.”

### සැදැහැවතුන්ගේ ආරක්ෂාව

125 සමිඳුන් විශ්වාස කරන්නෝ සියොන් කන්ද
මෙන් අචල ය, සදාකාලික ය.
2 ජෙරුසලම සිසාරා කඳු වැටී ඇත්තාක් මෙන්
සමිඳාණෝ සිය සෙනඟ සිසාරා දැනටත්, සදහටත්
වැඩ සිටින සේක.
3 අදමිටු අය දමිටු අයගේ දේශය සදා පාලනය
නොකරති.
q2[3] එසේ කළොත්, දමිටු අය වුව ද අදමිටු දේ
කිරීමට පෙළෙඹෙන්නෝ ය.
4 සමිඳුනි, යහපත් අයට යහපත කළ මැනව;
q2[4] අවංක සිත් ඇත්තන්ටත් එසේ ම කළ මැනව.
5 එහෙත්, වංක මාර්ගවලට හැරී යන්නන්ට ඔබ
දඬුවම් කරන්නාක් මෙන් සමිඳුන්ට විරුද්ධ ව
අයුතුකම් කරන්නන්ට ද දඬුවම් කළ මැනව.
q2[5] ඉශ්රායෙලේ ජනතාවට සාමය වේ වා!

### මුදනු ලැබූ අයගේ ස්තුති ගීය

126 සමිඳුන් අප මුදා සියොනට ගෙනා කල,
අපට එය සිහිනයක් මෙන් විය.
2 එවිට අපි සිනාවෙන් ඉපිලී ගියෙමු;
q2[2] ප්‍රීතියෙන් ගී ගායනා කළෙමු.
q2[2] එවිට, “සමිඳාණෝ මොවුන් උදෙසා ඉමහත් දේ
කළ සේකැ”යි විජාතීහු කියන්නට ගත්හ.
3 සමිඳාණෝ අප උදෙසා ඉමහත් දේ කළ සේක;
q2[3] එබැවින් අපි සන්තෝෂ වමු.
4 සමිඳුනි, අපගේ සිරකරුවන්දකුණු දිශාවේ ගලා යන
ඇල දොළ මෙන් අපට යළි ගෙනෙ දුන මැනව.
5 දුකින් කතෙ වපුරන්නෝ තුටින් අස්වැන්න
නෙළාගන්නෝ ය.
6 ඔව්හු වී මලු රැගෙනෙ කඳුළු සල සලා පිටත් ව
ගිය නමුත්, තම ගොයම් මිටි රැගෙනෙ ප්‍රීතියෙන්
පිනා පිනා ආපසු ආහ.

### දවේඳුන් පැසසීම

127 සමිඳාණෝ ගයෙ නොසාදන සේක් නම්,
එය ඉදි කරන්නෝ නිකරුණේ වෙහෙසෙති.
q2
127 සමිඳාණෝ නගරය රැක බලා නොගන්න
සේක් නම්, මුරකරුවෝ නිකරුණේ පිබිද
සිටිති.
2 උදයෙන් ම නැඟිට රෑ බෝ වී නින්දට යාම ද
ආහාර සැපයීමට පමණ ඉක්මවා වෙහෙසෙවීම ද
නිෂ්ඵල ය.
q2[2] මන්ද, සමිඳුන්ට ප්‍රේම කරන අයට වුවමනා
දේ එතුමාණෝ සපයා දෙනෙ සේක.
3 දරු සම්පත සමිඳාණන්ගෙන් ලැබෙනෙ දායාදයකි;
q2[3] ඒ සම්පත එතුමන්ගෙන් ලැබෙනෙ ඉමහත්
ආශීර්වාදයකි.
4 හේවායකුගේ අතහෙි ඊගස යම් සේ ද තරුණ
වියේ මවුපියන්ගේ දරුවෝ ද එසේ ම ය.
5 එවැනි ඊගසින් පිරුණු කොපුව ඇති මිනිසා
වාසනාවන්තයකෙි.
q2[5] ඔව්හු උසාවියේ දී සතුරන් සමඟ නඩු කියන
විට පරාජයට පත් නොවන්නෝ ය.

### බැතිමතුන් හට ආසිරි

128 සමිඳුන් කරෙහෙි ගරුබිය ඇති, එතුමන්ගේ
මාර්ගයෙහි හැසිරෙනෙ සියල්ලෝ
භාග්‍යවන්තයෝ ය.
2 මන්ද, ඔබගේ ශ්‍රම ශක්තියේ ප්‍රතිඵලය ඔබ
භුක්ති විඳින්නෙහි ය.
q2[2] ඔබ වාසනාවන්ත ය;
q2[2] ඔබට ශුභසිද්ධ වන්නේ ය.
3 ඔබගේ බිරිඳ ඔබගේ නිවසෙ තුළ පල දෙනෙ
මිදිවැලක් මෙන් වන්නී ය.
q2[3] ඔබගේ දරුවෝ ඔබගේ මේසය වටා ඔලීව පැල
මෙන් වන්නෝ ය.
4 සමිඳුන් කරෙහෙි ගරුබිය දක්වන්නා මෙසේ ආසිරි
ලබන්නේ ය.
5 සමිඳාණෝ සියොන්හි සිට ඔබට ආශීර්වාද කරන
සේක් වා!
q2[5] ඔබගේ මුළු ජීවිත කාලයේ දී ජෙරුසලමේ සුබ
සතෙ ඔබට දක්නට ලැබේ වා!
6 ඔබගේ දරු මුණුබුරන් දකින්නට ලැබේ වා!
q2[6] ඉශ්රායෙලේ සෙනඟට සාමය වේ වා!

### සතුරන්ට විරුද්ධ ව යැදීමක්

129 ඉශ්රායෙලේ දැන් මෙසේ කියත් වා:
q2
129 “මාගේ තරුණ වයසේ පටන් සතුරෝ
බොහෝ වර මට පීඩා කළෝ ය.
2 මාගේ තරුණ වයසේ පටන් සතුරෝ බොහෝ
වර මට පීඩා කළෝ ය.
q2[2] එහෙත්, මාගෙන් ජය නොගත්තෝ ය.

3 කුඹුරක් සීසාන්නාක් මෙන් ඔව්හු මාගේ පිට
ගැඹුරට හාරා තුවාළ කළෝ ය.
4 එහෙත්, සමිඳාණෝ ධර්මිෂ්ඨ ය;
q2 4 එතුමාණෝ දුෂ්ටයන්ගේ වහල් බැම්මවලින් මා
මුදා හරින සේක.”
5 සියොන්ට ද්වේෂ කරන සියල්ලෝ ලජ්ජා වී පලා
යත් වා!
6 ඔව්හු වැඩෙන්නට පළමුවෙනේ වියළී යන, පියස්ස
පිට ඇති තෘණ මෙන් වෙත් වා!
7 කපන්නා එයින්, අත පිරෙනෙ මිටියක් වත්, මිටි
බඳින්නා ළය පුරවන මිටියක් වත් නොගන්නේ ය.
8 “සමිඳුන්ගේ ආශීර්වාද ඔබට වේ වා!
q2 8 සමිඳුන්ගේ නාමයෙන් අපි ඔබට ආශීර්වාද
කරමු”යි මඟ යන කිසිවකේ ඔවුන්ට නොකියන්නෝ
ය.

### දුක් සයුරේ සිට යැදීම

130 සමිඳුනි, දුක් සයුරේ සිට මම ඔබට
මොරගසමි.
2 සමිඳුනි, මාගේ හඬට සවන් දුන මැනව, මාගේ
කන්නලව්වට ඔබේ කන් යොමු කළ මැනව.
3 සමිඳුනි, ඔබ අපේ අයුතුකම් සටහන් කර තබන
සේක් නම්, විනිශ්චයයෙනේ බේරෙනේනට පුළුවන්
කවරකුට ද?
4 එහෙත්, ඔබ කෙරෙහි ගරුබියෙනේ සිටින පිණිස
ඔබ අපට කමාව දෙනෙ සේක.
5 මම සමිඳුන්ගේ උපකාරය උදක් ම බලා සිටිමි.
q2 5 එතුමන්ගේ වචනය කෙරෙහි බලාපොරොත්තුව
තබමි.
6 පහන් වන තුරු බලා සිටින මුරකරුන්ට වඩා,
එසේ ය, එළිය වැටෙනෙ තුරු බලා සිටින මුරකරුන්ට
වඩා මම සමිඳුන් එන තුරු බලා සිටිමි.
7 එම්බා ඉශ්රායලේ ජනයෙනි!
q2 7 සමිඳුන් කෙරෙහි බලාපොරොත්තු වන්න.
q2 7 මන්ද, සමිඳුන්ගේ ප්රේමය තිරසර ය.
q2 7 ගැළවීම මුළුමනින් ම එතුමන් අතෙහි ය.
8 මතෙ 1:21; තීතස් 2:14 එතුමාණෝ ඉශ්රායලේ
ජනයා ඔවුන්ගේ පාප සියල්ලනේ මුදා හරින සේක.

### ළදරුවකු මෙන් යටහත් වීම

131 සමිඳුනි, මාගේ සිත තුළ අහංකාරයක්
නැත.
q2
131 උදාරම් ලෙසෙ මම ඇස් නොඔසවමි.
q2
131 වඩා උසස් දේ ගැන වත්, මාගේ තරම
ඉක්මවා යන දේ ගැන වත් මම කරදර
නොවෙමි.
2 ඒ වෙනුවට මම ලද දයෙින් නිහතමානී ව සැනසී
සිටිමි.
q2 2 මවු තුරුල්ලේ සංසුන් ව සිටින ළදරුවකු සේ
මා තුළ මාගේ සිත සංසුන් වී ඇත.
3 එම්බා ඉශ්රායලේවරුනි!
q2 3 මෙතැන් පටන් සදහට ම සමිඳුන් කෙරෙහි
බලාපොරොත්තු වන්න.

### දෙවේ මැදුර ගැන ප්රශංසා ගීයක්

132 සමිඳුනි, දාවිත් වින්ද දුක් කරදර සියල්ල
ඔහුගේ යහපත උදෙසා සිහිකළ මැනව.
2 ඔහු සමිඳුන්ට දිවුරමින්, ජාකොබ්ගේ
පරාක්රමයාණන් වහන්සේට පොරොන්දු වමේන් කී
මේ දේ සිහි කළ මැනව:
3 “මාගේ නිවසෙ තුළට වත්, මාගේ යහනට වත්
මම නොයෙන්නමේ;
4 මම විවේකය නොගනිමි;
q2 4 දෑස පියා නොගනිමි.
5 සමිඳුන්ට වාසස්ථානයක් සොයෙන තුරු,
ජාකොබ්ගේ පරාක්රමයාණන් වහන්සේට
මණ්ඩපයක් සපයන තුරු මම එසේ කරන්නමේ.”
6 2 වංශා 6:41-42 බතේලහෙමේේ දී ගිවිසුම්
කරඬුව ගැන ඇසුවමෙු.
q2 6 වන ලැහැබ් තුළ එය අපට සම්බ විය.
7 අපි එතුමන්ගේ මණ්ඩපවලට යන්නමෙු;
q2 7 එතුමන්ගේ පාපුටුව ළඟ නමස්කාර කරන්නමෙු.
8 සමිඳුනි, නැඟිට ඔබේ බල මහිමයේ සංකේතය
වන ගිවිසුම් කරඬුව ඇති ව, ඔබේ විශ්රාම
ස්ථානයට වැඩිය මැනව.
9 ඔබේ පූජකයෝ දැහැමිකමින් සැරසතේ වා!
q2 9 ඔබේ සැදැහැවත්හු තුති ගොස කරත් වා!
10 ඔබේ මෙහෙකෙරු වූ දාවිත්ට දුන් පොරොන්දුව
පරිදි ඔබේ අභිෂේක ලත් තැනැත්තා පිළිකවේ
නොකළ මැනව.
11 2 සාමු 7:12-16; 1 වංශා 17:11-14; ගීතා 89:3-4;
ක්රියා 2:30 සමිඳාණෝ සැබැවින් ම දාවිත්ට මෙලෙසෙ
දිවුළ සේක:
q2 11 “නුඹේ ම කුමරකෙු නුඹේ සිහසුනට පත්
කරන්නමේ.
12 නුඹේ පුත්රයෝ මාගේ ගිවිසුම ද මා ඔවුන්ට
උගන්වන ශික්ෂා පද ද රක්ෂා කරන්නෝ නම්,
ඔවුන්ගේ පුත්රයෝත් නුඹේ සිහසුන අරා සදාකල්
හිඳගන්නෝ ය,”
13 සමිඳාණෝ සියොන් තෝරාගත් සේක.
q2 13 සිය වාසභවනය ලෙසෙ ඊට කැමැති වූ සේක.
14 මෙයෙ සදාකල් ම මාගේ වාසස්ථානය වේ.
q2 14 මම මෙහි වැඩ වසන්නමේ;
q2 14 මම ඊට කැමැති වමේ.
15 සියොන්හි වැසියන්ට ආහාර බහුලත්වයෙනේ මම
ආසිරි දෙනේනමේ;
q2 15 එහි දුප්පතුන් කෑමෙනේ තෘප්තියට
පමුණුවන්නමේ.
16 එහි පූජකයන් ගැළවීමේ සළුවෙනේ සරසන්නමේ.
q2 16 එහි සැදැහැවත්හු තුති ගොස කරන්නෝ ය.
17 1 රාජා 11:36 එහි දාවිත්ගෙනේ පැවැතෙන්නකෙු
බලවත් රජකෙු කරන්නමේ.
q2 17 මාගේ අභිෂේක ලත් තැනැත්තාට පහනක්
මෙන් දිළෙනේනට සලසන්නමේ.

18 ඔහුගේ සතුරන් ලජ්ජාවට පත් කරන්නෙමි.
q2 18 එහෙත්, ඔහු මත ඔහුගේ කිරුළ බබළන්නේ ය.

### සහෝදර ප්‍රේමයේ අලංකාරය

133 සහෝදරයන් මනේ එක් ව විසීම කතෙරම් ප්‍රියංකර ද?
q2
133 කතෙරම් යහපත් ද?
2 එය, ආරොන්ගේ හිස පිට වත් කරන ලද, ඔහුගේ රැවුල දිගේ කර පටිය දක්වා ගලා ගිය අනගි තලෙක් මනේ පැතිර යන්නකෙි.
3 එය, සියොන් ගිර මත වැටනෙ හරේමොන් කන්දේ පිනි හා සමාන ය.
q2 3 මන්ද, සමිඳාණෝ ඊට ආශීර්වාද කරන සේක.
q2 3 එනම්, සදාකාල ජීවනය ඊට දානය කළ සේක.

### සන්ධ්‍යා ගීයක්

134 රෑ කාලයේ සමිඳුන්ගේ මාලිගාවේ සිටින සමිඳුන්ගේ සියලු මෙහෙකරුවනේ, සමිඳුන්ට ප්‍රශංසා කරන්න.
2 ශුද්ධස්ථානය දෙසට අත් ඔසවා, සමිඳුන්ට ප්‍රශංසා කරන්න.
3 සමිඳාණෝ, එසේ ය, අහසත් පොළොවත් මැවූ තැනැන් වහන්සේ, සියොන් සිට ඔබට ආශීර්වාද කරන සේක් වා!

### මැවිල්ලනේ ප්‍රකාශ වන සමිඳුන්ගේ ගුණ වැණුම

135 සමිඳුන්ට ප්‍රශංසා කරන්න.
q2
135 සමිඳුන්ගේ මෙහෙකරුවනේ, සමිඳුන්ගේ නාමයට ප්‍රශංසා කරන්න.
2 සමිඳුන්ගේ මාලිගාවෙහි, අපේ දෙවිඳුන්ගේ මාලිගාවෙහි මණ්ඩපවල සිටින්නනේ, එතුමන්ට ප්‍රශංසා කරන්න.
3 සමිඳුන්ට ප්‍රශංසා කරන්න.
q2 3 එතුමාණෝ යහපත් ය.
q2 3 එතුමාණෝ කරුණාබර වන සේක.
q2 3 එතුමන්ගේ නාමයට ගී ගයන්න;
4 සමිඳාණෝ තමන්ට ම ජාකොබ්ගේ පළපෙත ද තමන්ගේ විශේෂ උරුමය කොට ඉශ්‍රායලේ සනෙඟ ද තෝරාගත් සේක.
5 සමිඳාණන් අති උතුම් බවත්, වනෙත් සියලු දෙවිවරුන්ට වඩා අපේ සමිඳාණන් උසස් බවත් දනිමි.
6 සමිඳාණෝ, යමක් කරන්නට කැමැති සේක් නම්, අහසෙහි ද පොළොවෙහි ද මුහුදුවල සහ හැම ගැඹුරු තැන්වල ද එය ඉටු කරන සේක.
7 එතුමාණෝ දරෙණ සීමාවනේ වලාකුළු නංවන සේක;
q2 7 වර්ෂාව සඳහා විදුලිය හටගන්වන සේක;
q2 7 සිය ගබඩාවලින් සුළඟ නික්මවන සේක;
8 එතුමාණෝ මිසර වැසියන්ගේත්, මෘගයන්ගේත් කුලුඳුලන්ට පහර දුන් සේක.
9 එම්බා මිසරය!
q2 9 තී මැදට, පාරාවෝට සහ ඔහුගේ සියලු මෙහෙකරුවන්ට එරෙහි ව එතුමාණෝ අරුමපුදුම දේ හා හාස්කම් පැමිණවූ සේක.
10 එතුමාණෝ බොහෝ විජාතීන්ට පහර දී, බලවත් රජුන් ඝාතනය කළ සේක.
11 අමෝරිවරුන්ගේ රජ වූ සීහොන් ද බාෂාන්හි රජ වූ ඕග් ද කානාන්හි සියලු රාජ්‍යයන් ද වැනසූ සේක.
12 ඔවුන්ගේ දේශය උරුම කොට, ස්වකීය සනෙඟ වූ ඉශ්‍රායලේට උරුම කොට දුන් සේක.
13 සමිඳුනි, ඔබේ නාමය සදාකල් පවත්නේ ය.
q2 13 සමිඳුනි, ඔබේ මහිමය සියලු පරම්පරාවන්ට පැතිර යන්නේ ය.
14 මන්ද, සමිඳාණෝ තමන් සනෙඟට යුක්තිය ඉටුකර දනෙ සේක.
q2 14 ස්වකීය මෙහෙකරුවන්ට අනුකම්පා කරන සේක.
15 ගීතා 115:4-8; එළිද 9:20 විජාතීන්ගේ රූප රනින් හා රිදීයනේ ය, ඒවා මිනිස් අතින් සෑදූ දේ ය.
16 ඒවාට කටවල් ඇත, එහෙත්, කතා නොකරයි;
q2 16 ඇස් ඇත, එහෙත්, නොදකියි;
17 කන් ඇත, එහෙත්, නොඇසයි;
q2 17 නාස් පුඩු ඇත, එහෙත්, හුස්මක් නැත.
18 ඒවා සාදන්නෝත්, එමනේ ම ඒවා විශ්වාස කරන සියල්ලෝත් ඒවාට සමාන වන්නෝ ය.
19 එම්බා ඉශ්‍රායලේ වංශය!
q2 19 සමිඳුන්ට ප්‍රශංසා කරන්න.
q2 19 එම්බා ආරොන්ගේ වංශය!
q2 19 සමිඳුන්ට ප්‍රශංසා කරන්න.
20 එම්බා ලෙවී වංශය!
q2 20 සමිඳුන්ට ප්‍රශංසා කරන්න.
q2 20 සමිඳුන්ට ගරුබිය ඇත්තනේ, සමිඳුන්ට ප්‍රශංසා කරන්න.
21 සියොන්හි, ජෙරුසලමෙහි වැඩ වසන සමිඳාණෝ ප්‍රශංසා ලබන සේක් වා!
q2 21 සමිඳුන්ට ප්‍රශංසා කරන්න.

### ප්‍රේම හරිත සමිඳුන් වැණුම

136 1 වංශා 16:34; 2 වංශා 5:13; 7:3; එස්රා 3:11; ගීතා 100:5; 106:1; 107:1; 118:1; ජෙරෙ 33:11 සමිඳුන් හට තුති පුදන්න.
q2
136 එතුමාණෝ යහපත් ය.
q2
136 එතුමන්ගේ තිර පෙම සදහට පවත්නේ ය.
2 දේවාතිදෙවිඳුන්ට තුති පුදන්න.
q2 2 එතුමන්ගේ තිර පෙම සදහට පවත්නේ ය.
3 රාජාතිරජිඳුන්ට තුති පුදන්න.
q2 3 එතුමන්ගේ තිර පෙම සදහට පවත්නේ ය.
4 අසිරිමත් දේ කරන එක ම තැනැන් වහන්සේට තුති පුදන්න.
q2 4 එතුමන්ගේ තිර පෙම සදහට පවත්නේ ය.

5 උත් 1:1 ප්‍රඥාවනේ අහස මැවූ තැනැන්
වහන්සේට තුති පුදන්න.
q25 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.
6 උත් 1:2 ජල මතුයහෙි පොළොව මැවූ තැනැන්
වහන්සේට තුති පුදන්න.
q26 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.
7 උත් 1:16 ඉර හඳ මැවූ තැනැන් වහන්සේට තුති
පුදන්න.
q27 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.
8 දවාල පාලනය කිරීමට හිරු මැවූ තැනැන්
වහන්සේට තුති පුදන්න.
q28 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.
9 රාත්‍රිය පාලනය කිරීමට සඳ හා තාරකා මැවූ
තැනැන් වහන්සේට තුති පුදන්න.
q29 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.
10 නික්ම 12:29 මිසර වැසියන්ගේ කුලුඳුලන්ට පහර
දුන් තැනැන් වහන්සේට තුති පුදන්න.
q210 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.
11 නික්ම 12:51 ඔවුන් අතරනේ ඉශ්‍රායලේවරුන්
පිටතට ගනෙ ආ තැනැන් වහන්සේට තුති පුදන්න.
q211 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.
12 ප්‍රබල බාහුවනේ ද දිගු කළ හස්තයනේ ද එසේ
කළ තැනැන් වහන්සේට තුති පුදන්න.
q212 එතුමන්ගේ තිර පමෙ සදහට ම පවත්නේ ය.
13 නික්ම 14:21-29 රතු මුහුද දපෙළු කළ තැනැන්
වහන්සේට තුති පුදන්න.
q213 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.
14 ඉශ්‍රායලේවරුන් මුහුද මැදින් ගනෙ ගිය තැනැන්
වහන්සේට තුති පුදන්න.
q214 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.
15 පාරාවෝ සහ ඔහුගේ සේනාව රතු මුහුදේ
ගිල්වාදැමූ තැනැන් වහන්සේට තුති පුදන්න.
q215 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.
16 සිය සනෙඟ පාළුකරය මැදින් ගනෙ ගිය තැනැන්
වහන්සේට තුති පුදන්න.
q216 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.
17 බලවත් රජුන්ට පහර දුන් තැනැන් වහන්සේට
තුති පුදන්න.
q217 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.
18 කීර්තිමත් රජුන් නැසූ තැනැන් වහන්සේට තුති
පුදන්න.
q218 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.
19 ගණන් 21:21-30 අමෝරිවරුන්ගේ රජ වූ
සීහොන් නැසූ තැනැන් වහන්සේට තුති පුදන්න.
q219 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.
20 ගණන් 21:31-35 බාෂාන්හි රජ වූ ඕග් නැසූ
තැනැන් වහන්සේට තුති පුදන්න.
q220 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.
21 ඔවුන්ගේ දේශය උරුමකොට සිය සනෙඟට දුන්
තැනැන් වහන්සේට තුති පුදන්න.
q221 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.
22 සිය මහෙකෙරු ඉශ්‍රායලේට එය උරුම කොට
දුන් තැනැන් වහන්සේට තුති පුදන්න.
q222 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.
23 අප පරාජයට පත් ව සිටිය දී අප සිහිකළ
තැනැන් වහන්සේට තුති පුදන්න.
q223 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.
24 අපේ සතුරන්ගනේ අප මිදූ තැනැන් වහන්සේට
තුති පුදන්න.
q224 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.
25 එතුමාණෝ සව් සත හට ආහාර සපයන සේක.
q225 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.
26 සගලෝ දවේඳුන් හට තුති පුදන්න.
q226 එතුමන්ගේ තිර පමෙ සදහට පවත්නේ ය.

## විප්‍රවාසගත වූවන්ගේ පැතීම

**137** බබිලොන්හි ගං තරෙවල අපි හිඳගතිමු.
q2
**137** සියොන් කන්ද අපට සිහි වූ විට අපි හඬා
වැලපුණමෙු.
2 එහි බට පඳුරුවල අපේ වීණා එල්ලා තැබීමු.
3 එසේ කළෙේ, අප වහල්කමට ගනෙ ගිය අය
ගැයුම් වැයුම් කරන ලසෙ අපට බල කළ බැවිනි.
q23 අපට පීඩා කළ අය, සියොන් ගීයක් ගයා ඔවුන්
විනෝද කරවන ලසෙ අපනේ ඉල්ලූ බැවිනි.
4 විදේශයක දී, සමිඳුන්ගේ ගීතය අපි කසෙේ
ගයමු ද?
5 එම්බා ජරෙුසලම!
q25 තී මට අමතක වී නම්, මාගේ දකුණත වියළී
යේ වා!
6 මම තී සිහි නොකරම් නම්, මාගේ පරමානන්දය
මනේ ජරෙුසලම මම නොසලකම් නම් මාගේ දිව
ගොළු වේ වා!
7 සමිඳුනි, ජරෙුසලම වැටුණ දවසේ දී, 'බිඳ හළෙව්,
බිඳ හළෙව්' කියමින් ඒදොම් වැසියන් කළ දේ
ඔවුන්ට විරුද්ධ ව සිහිකළ මැනව.
8 එළිද 18:6 අහෝ බබිලෝනිය!
q28 විනාශකාරී බබිලෝනිය!
q28 තී අපට කළාක් මනේ තිට ප්‍රතිවිපාක දනෙ
මිනිසා වාසනාවන්ත ය.
9 තිගේ ළදරුවන් රුගනෙ ගලේ ගසන මිනිසා
වාසනාවන්ත ය.

## සමිඳුන් කරෙහෙි විශ්වාසය

*දාවිත්ගේ ගීතයකි.*
**138** සමිඳුනි, හද පත්ලනේ ඔබට තුති
කරන්නමේ.
q2
**138** දවේවරුන් ඉදිරියහෙි ඔබට ගී ගයා ඔබ
පසසන්නමේ.
2 ඔබේ ශුද්ධ මාලිගාව දසෙ බලා නමස්කාර
කරමින් ඔබේ කරුණා ගුණය සහ
විශ්වාසවන්තභාවය නිසා ඔබේ නාමයට තුති
පුදන්නමේ.
q22 ඔබේ නාමයත්, ආඥාත් උත්තරීතර බව ඔබ
පනේවූ සේක.

3 මා ඔබ යැදි දවසේ දී ඔබ මට පිළිතුරු දුන්
සේක;
q2 3 මාගේ සිත සවි කොට, මට ධෛර්යය දුන්
සේක.
4 සමිඳුනි, මෙලොව සියලු රජවරු ඔබේ පොරොන්දු
ඇසූ බැවින් ඔබට තුති පුදන්නෝ ය.
5 එසේ ය, සමිඳුන්ගේ මහිමය උතුම් වන්නේ ය;
q2 5 ඔව්හු සමිඳුන්ගේ මාර්ග ගැන ගී ගයන්නෝ ය.
6 සමිඳාණෝ උසස් නමුත්, පහත් අය සලකන
සේක.
q2 6 එහෙත්, උඩඟු අය දුර සිට ම හැඳිනගන්න
සේක.
7 මම විපත්ති මැද හැසිරෙමි නමුත් ඔබ මා රැක
බලාගන්න සේක.
q2 7 ඔබ මාගේ සතුරන්ගේ උදහසට විරුද්ධ ව
ඔබේ හස්තය දිගු කරන සේක.
q2 7 ඔබේ සුර’තින් ඔබ මා ගළවන සේක.
8 සමිඳාණෝ මා සම්බන්ධ ව අදහස් කරන දේ ඉටු
කරන සේක.
q2 8 සමිඳුනි, ඔබේ ප්‍රේමය සදා පවත්නේ ය.
q2 8 ඔබ ඇරඹුවා වූ දේ නිම කළ මැනව.

## සර්වඥ දෙවියන් වහන්සේ

*දාවිත්ගේ ගීතයකි.*

139 සමිඳුනි, ඔබ මා සියුම් ලෙසෙ විමසා බලා
දැනගත් සේක.
2 මාගේ ඉඳුම් හිටුම් සියල්ල ඔබ දන්න සේක.
q2 2 දුර තියා ම මාගේ සිතිවිලි ඔබ තේරුම්ගන්න
සේක.
3 මා ගමනක් ගියත්, නින්දට ගියත් ඔබ මාගේ
සියලු මාර්ග දන්න සේක.
q2 3 මාගේ හැසිරීම සහමුලින් ම ඔබ දන්න සේක.
4 මා මුවට වචනයක් එන්නටත් පෙර සමිඳුනි, එහි
අග මුල ඔබ දන්න සේක.
5 පෙර පසු යන දෙපසින් ම ඔබ මා වට කර ඇත.
q2 5 ඔබේ අත මා රැකගනු ඇත.
6 මෙම ඥානය මාගේ දැනුම ඉක්මවා යයි.
q2 6 එය උසස් ය, මට ඊට ළඟාවිය නොහැකි ය.
7 ඔබෙන් සැඟවී මම කොතැනට යම් ද?
q2 7 ඔබ ඉදිරියෙන් කොතැනට පලා යම් ද?
8 මා ස්වර්ගයට නැඟුණත්, ඔබ එහි ය.
q2 8 පාතාලයට බැස සැතපුණත්, ඔබ එහි ය.
9 මා නැගෙනහිරට ඉගිළී ගියත්, බටහිර මුහුදු
සීමාන්තයේ විසුවත්
10 එහිදීත් ඔබේ අත මට මඟ පෙන්වන්නේ ය.
q2 10 ඔබේ දකුණත මට පිහිට වන්නේ ය.
11 “අඳුර මා වසාගනී වා! මා අවට පැතිරෙන එළිය
q2 11 අඳුරක් වේවා”යි මා කීවත්,
12 අඳුර ඔබට අඳුරක් නොවේ;
q2 12 අඳුරත්, එළියත් ඔබට එක හා සමාන ය.
13 ඔබ මාගේ ඇතුළාන්තය මැවූ සේක;
q2 13 මාගේ මවු කුසෙහි මා තැනූ සේක.
14 මම ඔබට තුති පුදමි.
q2 14 මන්ද, මා ඔබට ගරුබිය දැක්විය යුතු ය.
q2 14 ඔබේ සියලු ක්‍රියා අසිරිමත් ය;
q2 14 ඔබ තරයේ මා දන්න සේක.
15 මාගේ ඇටකටු සැදෙන විට, මවු කුසෙහි මා
වැඩෙන විට, රහසිගත ව මා තැනෙන විට මා එහි
වූ බව ඔබ දැන සිටි සේක.
16 මා බිහි වන්නට පෙර ඔබ මා දුටු සේක.
q2 16 මාගේ දවස් පටන්ගන්නටත් පෙර මාගේ ආයු
ඔබේ පොතෙහි සටහන් කර තිබිණි.
17 දෙවිඳුනි, ඔබේ සිතුවිලි කොපමණ ගැඹුරු ද?
q2 17 එහි අදහස් කොපමණ අසීමිත ද?
18 ගණනින් ඒවා වැලිවලටත් වැඩි ය.
q2 18 ඒවා කෙසේ මට ගිණිය හැකි ද?
q2 18 ඒවා ගැන නිම කිරීමට නම්, ඔබට මෙන් ආයුස
මටත් තිබිය යුතු ය.
19 දෙවිඳුනි, ඔබ දුෂ්ටයන් මරන සේක් නම්, මම
කොපමණ කැමැත්තෙම් ද? දුදනෝ මාගෙන් අහක් ව
යන්නෝ නම්, මම කොපමණ ආසා වෙම් ද?
20 ඔබේ සතුරෝ ඔබට විරුද්ධ ව කතා කියති;
q2 20 ඔව්හු ඔබේ වචන නොසලකා හරිති.
21 සමිඳුනි, ඔබට වෛර කරන්නන්ට මම වෛර
නොකරෙම් ද?
q2 21 ඔබට විරුද්ධ ව නැඟිටින්නන්ට මම විරුද්ධ
නොවෙම් ද?
22 මම ඔවුන්ට සහමුලින් වෛර කරමි.
q2 22 ඔවුන් මාගේ සතුරන් කොට ගණන්ගනිමි.
23 දෙවිඳුනි, මා විමසා බලා, මාගේ සිත දැනගත
මැනව.
q2 23 මා පරීක්ෂාකර, මාගේ සිතිවිලි දැනගත මැනව.
24 මම පව් මඟ ගමන් කරෙම් දැ යි බැලුව මැනව.
q2 24 සදා මාර්ගයෙහි මා ගෙන ගිය මැනව.

## දුදනන්ගෙන් ආරක්ෂාව පතා අයැදීම

*දාවිත්ගේ ගීතයකි.*

140 සමිඳුනි, දුදනන්ගෙන් මා ගැළවුව මැනව.
q2
140 සැහැසිකම් කරන අයගෙන්, මා ආරක්ෂා කළ
මැනව.
2 ඔව්හු නපුරු සිතින් උපා යොදති. නොකඩ ව ම
අඬදබර උපදවති.
3 රෝම 3:13 ඔවුන්ගේ දිව විසකුරු සපුන්ගේ දළ
මෙන් තියුණු ය.
q2 3 ඔවුන්ගේ වචන පොළොං විස වැන්න.
4 සමිඳුනි, දුදනන්ගේ අතින් මා මුදාගත මැනව.
q2 4 සැහැසිකම් කරන අයගෙන් මා ආරක්ෂා කළ
මැනව.
q2 4 ඔව්හු මාගේ පැකිළීමට උපා යොදති.
5 උඩඟු අය මට උගුල් අටවා රැහැන් ඇද්දෝ ය.
q2 5 ඔව්හු මඟ අසල දැලක් එළා මට මලපත් තැබූ
හ.
6 ‘ඔබ මාගේ දෙවිඳාණෝ ය’යි මම සමිඳුන්
ඇමතුවෙමි.
q2 6 සමිඳුනි, මාගේ කන්නලව්වට සවන් දුන් මැනව.

7 මාගේ ගැළවීමේ ශක්තිය වන මහෝත්තම දෙවි
ස්වාමීනි, සටනේ දී ඔබ මාගේ හිස වැස්මකින්
ආරක්ෂා කළ සේක.
8 සමිඳුනි, දුදනන්ගේ ආසාව ඉටු නොකළ මැනව.
q2[8] ඔවුන්ගේ නපුරු උපා සාර්ථක වන්නට ඉඩ නුදුන
මැනව.
9 මා වට කරගෙන සිටින අයට ජය ගන්නට ඉඩ
නොදෙන්න.
q2[9] ඔවුන්ගේ තර්ජන ඔවුන් පිට ම වැටේ වා!
10 ඔවුන් පිට ගිනි අඟුරු වැටේ වා!
q2[10] ඔව්හු ගොඩ ගන්නට නොහැකි ගැඹුරු වළක
හෙළෙනු ලබත් වා!
11 නපුරු, කේළාම්කාර මිනිසාට දේශයෙහි
සිටින්නට ඉඩ නුදුන මැනව.
q2[11] සාහසිකයන් හෙළන පිණිස නපුරා වේගයෙන්
ඔවුන් ලුහුබඳී වා!
12 සමිඳුනි, ඔබ දුප්පතාගේ නඩුව සාධාරණ ලෙස
අසන බවත්, දිළිඳාට යුක්තිය ඉටු කර දෙන බවත්
මම දනිමි.
13 සැබැවින් දැහැමියෝ ඔබේ නාමයට තුති
පුදන්නෝ ය.
q2[13] අවංක අය ඔබ අබිමුව යහෙන් වාසය
කරන්නෝ ය.

### පරීක්ෂාවෙන් මිදීම පිණිස අයැදුම

*දාවිත්ගේ ගීතයකි.*

**141** සමිඳුනි, මම ඔබෙන් අයැදින්නෙමි.
q2

**141** මා ළඟට වීගසින් වැඩිය මැනව.
q2

**141** ඔබෙන් අයැදින කල මට සවන් දුන මැනව.
2 එළිද 5:8 මාගේ අයැදුම ඔබ ඉදිරියෙහි
සුවඳ දුම් මෙන් ද මාගේ දෑත එසවීම සන්ධ්‍යා
පූජාව මෙන් ද පිළිගනු මැනව.
3 සමිඳුනි, මාගේ කට රැක ගැන්මට පිහිට වුණ
මැනව.
q2[3] මාගේ දෙතොල රක්ෂා කළ මැනව.
4 මා හද නපුරට ඇදී යාමට ද දුෂ්ට ක්‍රියාවලට
හවුල් වීමට ද මට ඉඩ නුදුන මැනව.
q2[4] දුෂ්ටයන්ගේ මංගල බොදුනට හවුල් වීමට ද
මට ඉඩ නුදුන මැනව.
5 සුදනෙකු මට දඬුවම් දී තරවටු කළත් එය
කාරුණික ක්‍රියාවකි.
q2[5] එහෙත්, දුදනන් දෙන ගරු සම්මාන මම ප්‍රිය
නොකරමි.
q2[5] මන්ද, මාගේ අයැදුම නිතර ම ඔවුන්ගේ
දුෂ්ටකමට විරුද්ධ ව බැවිනි.
6 ඔවුන්ගේ විනිශ්චයකාරයන් ප්‍රපාතවලින් හෙළෙනු
ලැබූ කල මාගේ වචන සැබෑ බව සනෙඟ පිළිගනු
ඇත.
7 ලී කොට කැබලිකර දමන්නාක් මෙන් ඔවුන්ගේ
ඇටකටු මිනී වළේ කට ළඟ විසිරී තිබේ.
8 එසේ ය, මහෝත්තම දෙවි ස්වාමීනි, මාගේ ඇස්
ඔබ දෙස යොමු වී තිබේ.
q2[8] මාගේ විශ්වාසය ඔබ කෙරෙහි තබමි.
q2[8] මා අනාථ වන්නට ඉඩ නුදුන මැනව.
9 ඔවුන් මට තැබූ මලපතින් ද අයුතුකම්
කරන්නන්ගේ උගුල්වලින් ද මා ආරක්ෂා කළ මැනව.
10 මා ගැළවී යන අතර, දුදනෝ තමන්ගේ ම
දැල්වලට අසු වෙත් වා!

### දැඩි අනතුරක දී කන්නලව්ව

*ගුහාවේ තමාගේ සිටීම ගැන දාවිත්ගේ
අනුශාසනා යාච්ඤාවකි.*

**142** 1 සාමු 22:1; 24:3 මම හඬ නඟා සමිඳුන්ට
මොරගසමි.
q2

**142** මම ශබ්ද නඟා සමිඳුන්ට කන්නලව් කරමි;
2 මාගේ දුක් ගැනවිලි එතුමන් ඉදිරියෙහි
තබමි.
q2[2] එතුමන් ඉදිරියෙහි මාගේ දුක් කරදර කියා
සිටිමි.
3 මාගේ සිත මා තුළ මලානික වූ කල මා යන මඟ
ඔබ දන්න සේක.
q2[3] මා යන මඟෙහි ඔව්හු මට මලපතක් තැබුවෝ
ය.
4 මම ඇස් යොමා දකුණු දෙස බැලුවෙමි.
q2[4] මා ළඟ මිතුරකු නැති බව මට පෙනිණි.
q2[4] මා ආරක්ෂා කරන්න කිසිවකු නැත.
q2[4] කිසිවකු මා ගැන සලකන්නේ නැත.
5 සමිඳුනි, මම ඔබට මොරගැසීමි:
q2[5] ඔබ මාගේ රක්ෂා ස්ථානය වන සේක.
q2[5] මේ ජීවිතේ දී මාගේ උරුමය ඔබ පමණක් ය.
6 මාගේ මොරගැසීමට කන් දුන මැනව.
q2[6] මම දුක් සයුරේ කිඳා ගොස් සිටිමි.
q2[6] මට පීඩා කරන්නන්ගෙන් මා ගැළවුව මැනව.
q2[6] මන්ද, ඔව්හු මට වඩා බලවත් ය.
7 දුක් නමැති දඟ ගෙයින් මා මිදුව මැනව.
q2[7] ඔබ මට යහපත කළ නිසා මම ඔබේ
සැදැහැවතුන්ගේ සභාවෙහි ඔබට තුති පුදන්නෙමි.

### බැගෑපත් යැදුමක්

*දාවිත්ගේ ගීතයකි.*

**143** සමිඳුනි, මාගේ යැදුම ඇසුව මැනව.
q2

**143** මාගේ කන්නලව්වට සවන් දුන් මැනව.
q2

**143** ඔබේ සත්‍යවාදීකමින් ද ධර්මිෂ්ඨකමින් ද
මට පිළිතුරු දුන මැනව.
2 රෝම 3:20; ගලා 2:16 ඔබේ දාසයා විනිශ්චයට
ගෙන නොගිය මැනව.
q2[2] ඔබ අබිමුව නිදොස් කෙනෙකේ මදෙයත නැත.
3 සතුරා මට පීඩා කළේ ය.
q2[3] ඔහු මට පහර දී මා බිම හෙළුවේ ය.
q2[3] ඔහු මා අඳුරු තැනකට දැමුවේ ය.

q2 3 මම බොහෝ කලකට පරෙ මළ කෙනෙකු මෙන් වීමි.
4 එබැවින් ම සිත අඩපණ වී ඇත.
q2 4 මාගේ හද තුළ කිසි සැනසුමක් නැත.
5 යටගිය දවස් මම සිහි කරමි;
q2 5 ඔබේ සියලු ක්රියා ගැන භාවනා කරමි;
q2 5 ඔබ කළ දේ ගැන මෙනෙහි කරමි.
6 මාගේ දොහොත් මුදුන් දී ඔබෙන් අයැදිමි;
q2 6 මාගේ සිත වියළි බිමක් මෙන් ඔබ කෙරෙහි පිපාසිත වේ.
7 සමිඳුනි, ඉක්මනින් මට පිළිතුරු දුන මැනව.
q2 7 මාගේ සිත අඩපණ වී ඇත.
q2 7 පාතාලයට බසින්නන්ට මා සමාන නොවන පිණිස ඔබේ මුහුණ මා කෙරෙන් සඟවා නොගත මැනව.
8 උදය කාලයේ ඔබේ කරුණා ගුණය දකින්න මට සැලසුව මැනව.
q2 8 මම ඔබ කෙරෙහි විශ්වාසය තබමි.
q2 8 මා යා යුතු මාර්ගය මට දැක්වුව මැනව.
q2 8 ඔබ දෙසෙ මාගේ සිත ඔසවමි.
9 සමිඳුනි, මාගේ සතුරන්ගෙන් මා ගැළවේව මැනව.
q2 9 රැකවරණය පිණිස මම ඔබ වෙත දුවගෙන එමි.
10 ඔබේ කැමැත්ත කරන්න මට ඉගැන්නුව මැනව.
q2 10 ඔබ මාගේ දෙවිඳාණෝ ය.
q2 10 ඔබ යහපත් වන බැවින් පහසු මාවතක මා ගෙන ගිය මැනව.
11 සමිඳුනි, ඔබේ නාමයේ ගෞරවය උදෙසා මා ආරක්ෂා කළ මැනව.
q2 11 ඔබේ ධර්මිෂ්ඨකම නිසා මා විපතින් මිදුව මැනව.
12 ඔබේ අධික ප්රේමයෙන් මා සතුරන් සිඳදැමුව මැනව.
q2 12 මට පීඩා කරන සියල්ලන් විනාශ කළ මැනව.
q2 12 මන්ද, මම ඔබේ මෙහෙකරු වෙමි.

## ජය දෙන සමිඳුන්ට පැසසුම්

*දාවිත්ගේ ගීතයකි.*

144 මාගේ පර්වතය වන සමිඳුන්ට ප්රශංසා වේ වා!
q2
144 එතුමාණෝ යුද්ධයට මාගේ අත් ද සටනට මාගේ ඇඟිලි ද පුහුණු කරන සේක.
2 එතුමාණෝ මට කරුණා නිධානය ය;
q2 2 මාගේ බලකොටුව ය;
q2 2 මාගේ උස් කොටුව හා මාගේ මිදුම්කරු ය;
q2 2 මාගේ පලිහ ය.
q2 2 මා විශ්වාසය තබන තැනැන් වහන්සේ ය.
q2 2 ජාතීන් මට යටත්කර දෙන්නේ එතුමාණෝ ය.
3 ජෝබ් 7:17-18; ගීතා 8:4 සමිඳුනි, ඔබ, මිනිසා ගැන කල්පනා කරන්න තරම් ඔහු කවරෙක් ද?
q2 3 මිනිසා ගැන සලකන්න තරම් ඔහු කවරෙක් ද?
4 මිනිසා සුළං රොදකට සමාන ය;
q2 4 ඔහුගේ කාලය පහ වී යන හෙවණැල්ලක් වැනි ය.
5 සමිඳුනි, ඔබ අහස විවර කොට බැස වැඩිය මැනව.
q2 5 කඳුවලින් දුම් නඟින පිණිස ඒවා ස්පර්ශ කළ මැනව.
6 විදුලිය විහිදුවා රුපුන් විසුරුවා හැරිය මැනව.
q2 6 ඔබේ ඊතල විද ඔවුන් පලවා හැරිය මැනව.
7 සගලොවින් ඔබේ හස්තය දිගු කළ මැනව.
q2 7 මහා ජල ගැල්මෙන් ද විදේශීන්ගේ අතින් ද මා බේරා මුදාගත මැනව.
8 ඔවුන්ගේ මුවින් නික්මෙන්නේ බොරු ය;
q2 8 දිවුරුම් දී ඇතත් කියන්නේ බොරු ම ය.
9 දෙවිඳුනි, ඔබට නව ගීයක් ගයන්නෙමි.
q2 9 තත් දසයේ වීණාව ගෙන ඔබට පසස් ගී ගයන්නෙමි.
10 රජුන්ට ජය දෙන්නේත්, ඔබේ මෙහෙකරු දාවිත් රුදුරු කඩුවෙන් මුදාගන්නේත් ඔබ ය.
11 විදේශීන්ගේ අතින් මා බේරා මුදාගත මැනව.
q2 11 ඔවුන්ගේ මුවින් නික්මෙන්නේ බොරු ය;
q2 11 ඔවුන් දිවුරුම් දී ඇතත් කියන්නේ බොරු ම ය.
12 තරුණ වියේ සිටින අපේ පුත්රයෝ වැඩුණු පැළ මෙන් වෙත් වා!
q2 12 අපේ දූවරු මාලිගාවල කැටයම් කරන ලද මනහර කණු මෙන් වෙත් වා!
13 අපේ ගබඩා සියලු ආකාර ධනයෙන් පිරේ වා!
q2 13 අපේ කෙත්වල බැටළුවෝ දහස් ගණන්, දස දහස් ගණන් බිහි කරත් වා!
14 අපේ ගවදෙන්නු ගැබ් ගැනීමට ශක්ති සම්පන්න වෙත් වා!
q2 14 ගබ්සා වීමක් වත්, අකලට ඉපදීමක් වත් නොවේ වා!
q2 14 අපේ වීදිවල විලාප හැඬීම් නොවේ වා!
15 මෙයාකාර ආසිරි ලත් සෙනඟ වාසනාවන්ත ය.
q2 15 සමිඳාණෝ තම දෙවිඳාණෝ යැයි පිළිගත් සෙනඟ වාසනාවන්ත ය.

## දෙවි රජිඳුන්ට ප්රශස්ති ගීතයක්

*දාවිත්ගේ ගීතයකි.*

145 මා දෙවි රජිඳුනි, ඔබ ගුණ මම ගයමි.
q2
145 ඔබ නම සදාකල් ම පසසමි.
2 සැම දා ඔබට තුති පුදමි;
q2 2 සදාකල් ඔබ නම පසසමි.
3 සමිඳාණෝ උතුම් ය, උසස් ම පැසසුම් ලැබිය යුතු ය.
q2 3 එතුමන්ගේ උතුම්කම සොයා දැනගත නොහැකි ය.
4 පරපුරෙන් පරපුරට ජනතාවෝ ඔබේ ක්රියා වර්ණනා කරති;
q2 4 ඔබේ ප්රබල ක්රියා ගැන ප්රශංසා කරති.
5 මම ඔබේ රජ සිරි තෙදෙ මහිමයත්, ඔබේ අරුමපුදුම ක්රියාත් මෙනෙහි කරන්නෙමි.

6 දනෝ ඔබගේ විස්මයජනක ක්‍රියා ගැන කතා
කරන්නෝ ය;
q2 6 මම ඔබගේ උතුම්කම පවසන්නෙමි.
7 ඔව්හු ඔබගේ මහා යහපත්කමේ පුවත ප්‍රකාශ
කරති;
q2 7 ඔබගේ දැහැමිකම ගැන ගී ගයති.
8 සමිඳාණෝ දයාවන්ත ය.
q2 8 අනුකම්පාවෙන් පූර්ණ ය;
q2 8 වහා නොකිපෙන සුලු ය;
q2 8 තිරසර පෙමින් යුතු ය.
9 සමිඳාණෝ සියල්ලන්ට කරුණාව පාන සේක;
q2 9 එතුමන්ගේ සුමුදු දයාව මවන ලද සියල්ල ද
වෙත පැතිරෙයි.
10 සමිඳුනි, ඔබ මැවූ සියලු දේ ඔබට තුති පුදයි;
q2 10 ඔබගේ සැදැහැවත්තු ද ඔබට ප්‍රශංසා කරති.
11 ඔව්හු ඔබගේ රාජ්‍යයේ මහිමය වර්ණනා කරති.
q2 11 ඔබගේ බල මහිමය ගැන ද කතා කරති.
12 එසේ කරන්නේ, දෙවිඳුන්ගේ ප්‍රබල ක්‍රියාත්,
රාජ්‍යයේ තේජෝ මහිමයත් මිනිසුන් හට දන්වන
පිණිස ය.
13 ඔබගේ රාජ්‍යය සදාකාලික ය, ඔබගේ ආධිපත්‍යය
ද සියලු පරම්පරාවල ම පවත්නේ ය
q2 13 සමිඳාණෝ සියලු පොරොන්දු ඉටු කරන සේක.
q2 13 තමන් කරන සියල්ලේ දී මෙත් සිත් වඩන
සේක.
14 වැටෙන දුබලුන් හට සමිඳාණෝ ආධාර කරන
සේක.
q2 14 නැමී සිටින සියල්ලන් කෙළින් සිටුවන සේක.
15 සියල්ලන්ගේ දෙනෙත් ඇවිටිල්ලෙන් ඔබ දෙස
යොමු කර තිබේ.
q2 15 ඔබ ද සුදුසු කාලයේ දී ඔවුන්ට ආහාර දෙන
සේක.
16 ඔබ සිය හස්තය විදහා පාන සේක;
q2 16 ජීවමාන සියල්ලන්ගේ ආසාවන් සපුරාලන
සේක.
17 සමිඳාණෝ සැම අතින් ම සාධාරණ ය,
එතුමන්ගේ සියලු ක්‍රියා දයාන්විත ය.
18 අයැදින සියල්ලන්ට සමිඳාණෝ ළං ව සිටින
සේක.
q2 18 අවංක සිතින් යදින්නන්ට ආසන්න ව සිටින
සේක.
19 තමන් කෙරෙහි ගරුබිය ඇත්තන්ගේ පැතුම්
එතුමාණෝ ඉටු කරන සේක.
q2 19 ඔවුන්ගේ මොරගැසීම් අසා ඔවුන් ගළවන
සේක.
20 සමිඳාණෝ තමන්ට ප්‍රේම කරන සියල්ලන්
ආරක්ෂා කරන සේක.
q2 20 එහෙත්, සියලු දුදනන් වනසාලන සේක.
21 මා මුවින් සමිඳුන්ට පැසසුම් ගී ගයන්නෙමි.
q2 21 සව් සත සදාකල් ම එතුමන්ගේ ශුද්ධ නාමයට
ප්‍රශංසා කරත් වා!

## එක ම ගැළවුම්කාර සමිඳුන්

146 සමිඳුන්ට ප්‍රශංසා කරන්න.
q2
146 මාගේ සිත සමිඳුන්ට ප්‍රශංසා කරන්න.
2 දිවි හිමියෙන් සමිඳුන්ට ප්‍රශංසා
කරන්නෙමි.
q2 2 දිවි ඇති තාක් මා දෙවිඳුන්ට පැසසුම් ගී
ගයන්නෙමි.
3 රජ කුමරුන් කෙරෙහි වත්, පිහිට විය නොහැකි
කිසි ම මිනිසකු කෙරෙහි වත් විශ්වාසය
නොතබන්න.
4 මිනිසා අන්තිම හුස්ම හෙළයි;
q2 4 පසට ආපසු හැරෙයි;
q2 4 එදින ම ඔහුගේ යෝජනා සුන් වී යයි.
5 යාකොබ්ගේ දෙවිඳුන් සරණ පතන, සිය දෙවි
සමිඳුන් කෙරෙහි බලාපොරොත්තු තබන තැනැත්තේ
වාසනාවන්ත ය.
6 ක්‍රියා 4:24; 14:15 එතුමාණෝ අහසත්,
පොළොවත්, මුහුදත්, එහි ඇති සියල්ලත් මැවූ
සේක.
q2 6 එතුමාණෝ සදාකල් ම විශ්වාසී ව සිටින සේක.
7 සමිඳාණෝ පීඩා විඳින්නන්ට යුක්තිය ඉටු කර
දෙන සේක;
q2 7 සාගිනි වූවන්ට ආහාර දෙන සේක;
8 එතුමාණෝ සිරකරුවන් මුදන සේක;
q2 8 අන්ධයන්ගේ ඇස් පහදන සේක;
q2 8 වැටී ගියවුන් නගා සිටුවන සේක;
q2 8 සමිඳාණෝ දමිටුන්ට ප්‍රේම කරන සේක.
9 විදේශීන් ආරක්ෂා කරන සේක;
q2 9 අනාථයන්ට හා වැන්දඹුවන්ට උපකාර කරන
සේක;
q2 9 එහෙත්, දුදනාගේ යෝජනා සුන් කරන සේක.
10 සමිඳාණෝ සදහට ම රජකම් කරන සේක.
q2 10 එම්බා සියොන් නගරය!
q2 10 ඔබගේ සමිඳාණෝ සියලු පරම්පරා දක්වා
රජකම් කරන සේක.
q2 10 සමිඳුන්ට ප්‍රශංසා වේ වා!

## සව් බලැති දෙවිඳුන් පැසසීම

147 සමිඳුන්ට ප්‍රශංසා කරන්න;
q2
147 අපගේ දෙවිඳුන්ට පසස් ගී ගැයීම යහපත් ය.
q2
147 එතුමන් පැසසීම පියකරු ය, හොබනේ ය.
2 සමිඳාණෝ ජෙරුසලම ගොඩනඟන සේක.
q2 2 විප්‍රවාසී වූ ඉශ්‍රායලේ සෙනඟ රැස් කරන
සේක.
3 එතුමාණෝ බිඳුණු සිත් ඇත්තන් සුව කරන
සේක;
q2 3 ඔවුන්ගේ තුවාළ බඳින සේක.
4 එතුමාණෝ තාරකා ගණන නියම කළ සේක.
q2 4 ඒ සියල්ලට නම් තබන සේක.

5 අප සමිඳාණෝ උතුම් ය:
q2 5 ඉතා බලසම්පන්න ය;
q2 5 එතුමන්ගේ ඥානය අසීමිත ය.
6 සමිඳාණෝ දීනයන් ඔසවන සේක;
q2 6 දුදනන් පහතට හෙළන සේක.
7 තුති පුදා සමිඳුන්ට ගී ගයන්න;
q2 7 වීණා වැයීමෙන් අපගේ දෙවිඳුන් පසසන්න.
8 එතුමාණෝ වලාකුළුවලින් අහස ආවරණය කරන
සේක;
q2 8 පොළොවට වැසි වස්වන සේක.
q2 8 කඳු මත තෘණ වැවෙන්නට සලසන සේක.
9 එතුමාණෝ මෘගයන්ටත්, හඬන කපුටු
පැටවුන්ටත් කෑම දෙන සේක.
10 සවි බලැති අසුන්ගෙන් එතුමන්ට කම් නැත.
q2 10 වේගයෙන් දුවන සෙබළුන්ගෙන් එතුමන්ට
වැඩක් නැත.
11 එහෙත් සමිඳාණෝ, තමන් කෙරෙහි ගරුබිය
ඇත්තන්ට, තමන්ගේ ප්‍රේමය පතන්නන්ට,
ප්‍රසන්න වන සේක.
12 එම්බා ජෙරුසලම!
q2 12 සමිඳුන්ට ප්‍රශංසා කරන්න.
q2 12 සියොන් ගිර, තිගේ දෙවිඳුන්ට ප්‍රශංසා
කරන්න.
13 මන්ද, එතුමාණෝ තිගේ වාසල් දොරටුවල
අගුල් සවිමත් කළ සේක;
q2 13 තිගේ දරුවන්ට ආශීර්වාද කළ සේක.
14 තිගේ සීමා තුළ සාමය සිදු කරන සේක;
q2 14 ඉස්තරම් තිරිඟු පිටියෙන් තෘප්තියට පමුණුවන
සේක.
15 එතුමාණෝ ස්වකීය ආඥාව පොළොවෙහි ඉම
දක්වා යවන සේක.
q2 15 එතුමන්ගේ වචන යුහු ව පැතිර යයි.
16 එතුමාණෝ බැටළු ලොම් මෙන් හිම වස්වන
සේක.
q2 16 අළු මෙන් පිනි කැට විසුරුවන සේක.
17 සිය හිම කැට කැබලි කොට විසුරුවන සේක.
q2 17 එතුමන් එවන ශීතලය දරන්නට පුළුවන්
කවරෙකුට ද?
18 එතුමාණෝ අණ දෙන සේක;
q2 18 හිම කැට දිය වන්න සලස්වන සේක.
එතුමාණෝ හුළඟ හමන්න සලස්වන සේක.
q2 18 එවිට ජලය ගලා යන්නේ ය.
19 එතුමාණෝ ජාකොබ්ට සිය වචනය ද
ඉශ්‍රායෙල්ට සිය පණත් සහ නියමයන් ද ප්‍රකාශ
කරන සේක.
20 එතුමාණෝ වෙන කිසි ජාතියකට මෙසේ
නොකළ සේක.
q2 20 ඔව්හු එතුමන්ගේ නියමයන් දැන නොගත්තෝ
ය.
q2 20 සමිඳුන්ට ප්‍රශංසා වේ වා!

## මුළු විශ්වයෙන් සමිඳුන්ට පැසසුම්

148 සමිඳුන් පසසන්න. සගලෝ සිට සමිඳුන්
පසසන්න.
q2
148 උස් තැන්හි දී ඔබ හැම එතුමන් පසසන්න.
2 එතුමන්ගේ සියලු දූතයෙනි, එතුමන්
පසසන්න.
q2 2 එතුමන්ගේ මුළු සේනාවෙනි, එතුමන් පසසන්න.
3 ඉර හඳ මඬලෙනි, එතුමන් පසසන්න.
q2 3 දිළිහෙන තරු සියල්ලෙනි, එතුමන් පසසන්න.
4 උසස් ම ස්වර්ගයෙනි, අහසට උඩින් තිබෙන
ජලයෙනි, එතුමන් පසසන්න.
5 ඒ සියල්ලෝ සමිඳුන්ට ප්‍රශංසා කරත් වා!
q2 5 මන්ද, එතුමාණෝ අණ කළ සේක.
q2 5 එවිට ඒවා මවන ලද්දේ ය.
6 එතුමාණෝ සදහට ම ඒවා පිහිටවූ සේක.
q2 6 ඒවාට ඉක්මවා ගිය නොහැකි සීමාවක් තැබූ
සේක.
7 මහ මුහුද හා එහි වසන මසුනි,
8 ගිනි හා ගල් වැහි වලාවෙනි, හිම හා වාෂ්පයෙනි,
එතුමන්ගේ අණ ඉටු කරන මාරුතයෙනි, පොළොවේ
සිට සමිඳුන් පසසන්න.
9 කඳු හා හෙල් සියල්ලෙනි, පල දෙන ගස් හා
කිහිරි රුක් සියල්ලෙනි,
10 වන සතුන්, උරගයින්, පක්ෂීන් හා සියලු
සිව්පාවෙනි, සමිඳුන් පසසන්න.
11 මිහි පිට රජවරුන් හා සියලු මිනිස් වර්ගයෙනි,
අධිපතිවරුනි, ලොවේ සියලු විනිසකරුවෙනි,
12 තරුණ තරුණියනි, මහල්ලන් හා බාලයෙනි,
සමිඳුන් පසසන්න.
13 මොවුහු සමිඳුන්ගේ නාමයට ප්‍රශංසා කරත් වා!
q2 13 එතුමන්ගේ නාමය පමණක් උදාරතර ය.
q2 13 එතුමන්ගේ මහිමය අහසත්, පොළොවත්
ඉක්මවා යන්නේ ය.
14 එතුමන්ගේ සියලු සෙනඟ ද එතුමන්ට ප්‍රිය
ඉශ්‍රායෙල් සෙනඟ ද සියලු සැදැහැවතුන් ද
පැසසුමට හා මහිමයට එතුමාණෝ එසවූ සේක.
q2 14 සමිඳුන්ට ප්‍රශංසා කරන්න.

## ජය මංගල ගීය

149 සමිඳුන් පසසන්න.
q2
149 සමිඳුන්ට නව ගීතිකාවක් ද සැදැහැවතුන්ගේ
සභාවේ දී එතුමන්ගේ පැසසුම් ද ගායනා
කරන්න.
2 තමන් මැවූ තැනැන් වහන්සේ කෙරෙහි
ඉශ්‍රායෙල් ප්‍රීති වෙත් වා!
q2 2 තමන්ගේ රජුන් කෙරෙහි සියොන්හි දරුවෝ
ප්‍රීතිමත් වෙත් වා!
3 එතුමන්ගේ නාමයට රඟපාමින් පැසසුම් කරත්
වා!

q2[3] රබන් ගසා, වීණා වයා එතුමන්ට පසස් ගී ගයත් වා!
4 සමිඳාණෝ සිය සෙනඟ කෙරෙහි ප්‍රසන්න වන සේක.
q2[4] දීනයන් ජය සිරියෙන් සරසන සේක.
5 සැදැහැවත්තු මහිමයෙන් යුක්ත ව ප්‍රීති වෙත් වා!
q2[5] මුළු රෑ එතුමන් නමදිමින් ප්‍රීතියෙන් ගායනා කරත් වා!
6 දමුවහත් කඩුවක් අතට ගනිත් වා!
q2[6] සිය මුවින් සමිඳුන්ට පැසසුම් කරත් වා!
7 එසේ කරන්නේ, ජාතීන් කෙරෙහි පළිගැනීම පිණිස ය;
q2[7] මිනිස් වර්ගයන් කෙරෙහි දඬුවම් පමුණුවන පිණිස ය;
8 ඔවුන්ගේ රජුන් යදමින් ද ඔවුන්ගේ අධිපතීන් විලංගුවලින් ද බඳින පිණිස ය;
9 ලියන ලද විනිශ්චය ඔවුන් කෙරෙහි ඉටු කරනු පිණිස ය;
q2[9] මේ ගෞරවය එතුමන්ගේ සියලු සැදැහැවතුන්ට ඇත්තේ ය.
q2[9] සමිඳුන්ට ප්‍රශංසා වේ වා!

### පැසසුම් ගීයක්

150 සමිඳුන් පසසන්න.
q2
150 දෙවිඳුන්ගේ ශුද්ධ ස්ථානයෙහි දී එතුමන් පසසන්න.
q2
150 එතුමන්ගේ බලය පවත්නා අහස් තලයෙහි එතුමන් පසසන්න.
2 එතුමන්ගේ බලවත් ක්‍රියා නිසා එතුමන් පසසන්න.
q2[2] එතුමන්ගේ ලොවුතුරා මහිමතාව නිසා එතුමන් පසසන්න.
3 හොරණෑ නාදයෙන් එතුමන් පසසන්න.
q2[3] කුඩා වීණාවෙන් හා මහා වීණාවෙන් එතුමන් පසසන්න.
4 රඟපාමින් හා කිකිණි රබානෙන් එතුමන් පසසන්න.
q2[4] වීණාවෙන් හා නළාවෙන් එතුමන් පසසන්න.
5 හඬැති අත්තලින් ද උස් නද දෙන අත්තලින් ද එතුමන් පසසන්න.
6 ජීවමාන සියල්ලෝ සමිඳුන් පසසත් වා!
q2[6] සමිඳුන්ට ප්‍රශංසා වේ වා!

# හිතෝපදේශ

### හිතෝපදේශවල අගය

1 1 රාජා 4:32 ඉශ්රායලේ රජ වූ, දාවිත්ගේ පුත්
සලමොන් පැවසූ හිතෝපදේශ මේ ය:
2 ඒවායින්, ප්රඥාව ද විනය ධර්ම ද
ධර්මාවබෝධය ද ලැබෙනු ඇත.
3 ඒවායින්, බුද්ධි වර්ධනය හා දැහැමි ක්රියා ද
අවංකකම ද යුක්තිය හා සාධාරණකම ද පිළිබඳ
උපදෙස් ලැබෙනු ඇත.
4 ඒවායින්, අනුවණයන් හට නුවණ ද තරුණයන්
හට මනා අවබෝධය හා සිහිකල්පනාව ද ලැබෙනු
ඇත.
5 හිතෝපදේශ හා උපහැරණ ද
6 බුද්ධිමතුන්ගේ කියුම් ද ප්රහේලිකා ද
තේරුම්ගනු වස් නුවණැතියෝ ඒවාට සවන් දී දැනුම
දියුණු කරගන්නෝ ය;
q2[6] ප්රාඥයෝ උපදෙස් ලබාගන්නෝ ය.
7 ජෝබ් 28:28; ගීතා 111:10; හිතෝ 9:10 දේව
ගරුබිය ප්රඥාවේ මුල් පියවර යි;
q2[7] අනුවණයෝ නැණනුවණ හා විනය ධර්ම හෙළා
දකිති.

### තරුණයන්ට අවවාද

8 මාගේ පුත්රය, පියාගේ අවවාදය අසන්න;
q2[8] මවගේ උපදෙස් ඉවත නොදමන්න.
9 ඒවා ඔබේ සිරසට හොබනා කිරුළක් ද ගෙලෙට
අගනා මාලයක් ද වන්නේ ය.
10 මාගේ පුත්රය, පව්ටුන් මෙසේ කියමින් ඔබ
පොළඹවන විට, එකඟ නොවන්න:
11 “අප සමඟ එන්න, අපි මඟ රැක සිට කෙනෙකු
මරාදමමු;
q2[11] සැඟවී සිට, වරදක් නොකළ නිදොස් අයකුට
පහර දෙමු.
12 පාතාලය මෙන් අපි ඔවුන් පණපිටින් ගිලදමමු;
q2[12] නිවැරදි වුව ද, ඔවුන් අපායට බසින්නවුන් මෙන්
වනු ඇත.
13 නන් වැදෑරුම් අගනා වස්තු අපි පැහැරගනිමු;
q2[13] කොල්ලකාගත් දයෙන් අපේ ගේදොර
පුරවාගනිමු.
14 එන්න, අපේ කල්ලියට එක් වන්න;
q2[14] අප කාටත් පොදු පසුම්බියක් තබාගනිමු.”
15 මාගේ පුත්රය, ඒ පාරෙහි නම් නොයන්න;
q2[15] ඔවුන්ගේ ක්රියා මාර්ගයෙන් ඈත් වන්න.
16 ඔව්හු, අපරාධ කිරීමට කඩාබිඳගෙන යති;
q2[16] ලේ වැගිරීමට වේගයෙන් දුවති.
17 කුරුල්ලා බලා සිටිය දී දැල දැමීමෙන් පලක් නැත.
18 මේ මිනිස්සු තමන්ට ම උගුල් අටවාගනිති;
q2[18] තමන්ගේ ම විනාශයට උපා යොදති.
19 අයුතු ලාභයට ගිජු වන්නා එයින් ම වැනසේ.
q2[19] ඔහුගේ ඉරණම එය වේ.

### ප්රඥාවගේ ආයාචනය

20 හිතෝ 8:1-3 ප්රඥා තොමෝ වීදිවල හඬනඟයි;
q2[20] ප්රසිද්ධ තැන්වල මොරගසයි.
21 දනෝදහසක් රැස් වන මංසන්දිවල ඈ
හඬනඟයි;
q2[21] නුවර වාසල් දොරටු ළඟ ඈ මෙසේ
නිවේදනයක් කරයි:
22 “අනුවණයෙනි, ඔබ කොතෙක් කල්
අනුවණකමට ප්රිය වන්නහු ද?
q2[22] නින්දා කරන්නෙනි, ඔබ කොතෙක් කල්
නින්දාවට ප්රසන්න වන්නහු ද?
q2[22] අඥානයෙනි, ඔබ කොතෙක් කල් දැනගැන්මට
ගරහන්නහු ද?
23 මාගේ තරවටුව හිතට ගන්න;
q2[23] එසේ කළොත්, මම මුළු හිතින් ගුරුකම්
දෙන්නෙමි.
24 මම හඬගැසුවෙමි;
q2[24] ඔබ සවන් දුන්නේ නැත.
q2[24] මම ආයාචනා කළෙමි;
q2[24] ඔබ සැලකුවේ නැත.
25 ඔබ මාගේ සියලු දැනමුතුකම් ගණනට
නොගත්තහු ය;
q2[25] මාගේ ඔවා බස් නොපිළිගත්තහු ය.
26 ඒවායින් ඔබ විපතට වැටෙන විට මම
සිනාසෙන්නෙමි;
q2[26] භීතිය පැමිණෙන විට ද මම සමච්චල්
කරන්නෙමි.
27 භීතිය, කුණාටුවක් මෙන් ඔබට පැමිණි විට ද
විනාශය, සුළි සුළඟක් මෙන් එන විට ද සිත් වේදනා
හා දුක ඇති වන විට ද මම සමච්චල් කරමි.
28 එවිට ඔබ මට හඬගසන නමුත් මම උත්තර
නොදෙමි;
q2[28] ඔබ හැමතැන ම මා සොයන නමුත් මා සම්බ
වන්නේ නැත.
29 ඔබ කවදත් දැනුම හෙළා දුටුවහු ය;
q2[29] දේව ගරුබිය එපා කළහු ය.
30 ඔබ කිසිදාක මාගේ දැනමුතුකම් පිළිගත්තේ
නැත;
q2[30] මාගේ ඔවා බස්වලට කන් දුන්නේ නැත.

31 කළ කළ දේ ඔබට පල පල දනු නියත ය;
q2 31 ඔබේ උපායවල විපාක එපා වන තුරු ලැබෙනු ඇත.
32 අනුවණ දනෝ නැණනුවණට පිටුපා මියයති;
q2 32 අමන දනෝ නොසැලකිලිකමින් වැනසී යති.
33 එහෙත් මට සවන් දෙන තැනැත්තේ සුරැකි ව, විපතට නොබා, යහෙන් වසනු ඇත.

### ප්‍රඥාව ගැන ප්‍රශංසා

2 මාගේ පුත්‍රය, මාගේ ඔවා බස් හිතට ගන්න;
q2
2 මාගේ උපදෙස් සිතහි නිදන් කරගන්න.
2 ප්‍රඥාවට සවන් දෙන්න, ඥානයට අවධානය යොමු කරන්න.
3 නුවණ ඉල්ලා සිටින්න, ඥානයට හඬගසා ඇය පතන්න.
4 රිදී සොයන්නාක් මෙන් ඇය සොයන්න;
q2 4 සැඟවී ඇති නිධානයක් මෙන් ඇය ගැන විපරම් කරන්න.
5 එසේ කළොත්, දේව ගරුබිය කුමක් දැ යි ඔබට තේරුම් යයි.
q2 5 දෙවියන් ගැන අවබෝධය ඔබට ලැබෙයි.
6 මන්ද, ප්‍රඥාව සමිඳුන්ගේ ම දීමනාවකි.
q2 6 දැනුම හා ඥානය පහළ වන්නේ සමිඳුන්ගේ මුවෙනි.
7 සමිඳාණෝ අවංක වූවන් හට නියම ප්‍රඥාව දෙන සේක;
q2 7 සත්‍යවාදී අයට එතුමාණෝ පලිහක් වන සේක.
8 සමිඳාණෝ යුක්ති මාවත ආරක්ෂා කරන සේක;
q2 8 බැතිමතුන්ගේ මාර්ගය රැකවල් කරන සේක.
9 මෙසේ ඔබ, දැහැමිකම ද යුක්තිය ද සත්‍යවාදී බව ද යන සියලු යහ මඟ තේරුම්ගන්නහෙි ය.
10 ප්‍රඥාව ඔබේ මනසට පිවිසෙයි;
q2 10 දැනුම ඔබේ සිතට ප්‍රීතිය ගෙන දෙයි.
11 සිහි නුවණ ඔබ රැකවල් කරයි;
q2 11 තියුණු නැණ ඔබ රැකගනියි.
12 එය දුදනන්ගේ මාර්ගවලින් ද මිනිසුන්ගේ රැවටිලි කතාවෙන් ද ඔබ මුදාගනියි;
13 අන්ධකාර මාර්ගවල යන පිණිස, අවංක මාවත් හැර දමන්නන්ගෙන් ඔබ මුදාගනියි.
14 ඔවුන්ගේ සතුට නපුර කිරීමට ය;
q2 14 ඔවුන්ගේ ප්‍රීතිය දුෂ්ට උපායවලට ය;
15 ඔවුන්ගේ ක්‍රියා වංක ය;
q2 15 ඔවුන්ගේ මාවත් ඇද ය.
16 ඒ මඟින්, දුසිරිතට සිත දුන් ස්ත්‍රියකගෙන්, ඉච්චා බස් දොඩන ස්ත්‍රියකගෙන්,
17 පතිවත කඩන ස්ත්‍රියකගෙන්, දේව ගිවිසුම් කඩ කරන ස්ත්‍රියකගෙන්, ඔබ ගැළවෙන්නෙහි ය.
18 ඇගේ නිවස මරණයට බැස යන බෑවුමකි;
q2 18 ඇගේ මාවත් මළවුන්ගේ ලෝකයට යන ගමනකි.
19 ඈ වෙතට යන්නකු ආපසු එන්නේ නැත;
q2 19 ජීවන මාවත්වලට යළි පැමිණෙන්නේ නැත.
20 මෙයෙ මා කියන්නේ, නුඹ යහ මඟ හැසිර, දැහැමි මඟ ඇවිදින පිණිස ය.
21 අවංක අය මිහි පිට දිගු කල් වසති;
q2 21 නිදොස් අය එහි යහෙන් කල් යවනු ඇත.
22 එහෙත් දුදනෝ පොළොවෙන් පහකර දමනු ලබති;
q2 22 ද්‍රෝහියෝ එයින් මුලිනුපුටා දමනු ලබති.

### සදාචාරයේ අගය

3 මාගේ පුත්‍රය, මාගේ ඔවදන් අමතක නොකරන්න;
q2
3 මාගේ අණපණත් ඔබ හද තුළ රැකගන්න.
2 එවිට ඔබ දිගායු වළඳන්නහෙි ය;
q2 2 චිරාත් කාලයක් ජීවත් වන්නහෙි ය:
q2 2 සව් සිරින් වැඩිවන්නහෙි ය.
3 පක්ෂපාතකම හා විශ්වාසය අත් නොහරින්න;
q2 3 ඒවා ගලෙ වටේ මාලයක් මෙන් බැඳගන්න.
q2 3 ගලහෙි කටෑ අකුරක් මෙන් සිතහෙි සටහන් කරගන්න.
4 ලූක් 2:52 එවිට ඔබ, දෙවියන් හා මිනිසුන් අබිමුව ප්‍රසාදයට හා කීර්තියට පාත්‍ර වනු නිසැක ය.
5 හුදකේ නුඹේ ම නුවණෙහි නොපිහිටා, මුළු හිතින් හිමි තුම කෙරෙහි විශ්වාසය තබන්න.
6 හැම දයෙක දී ම සමිඳුන් සිහි කරන්න;
q2 6 එතුමා ඔබට හරි මඟ පනේවනු ඇත.
7 රෝම 12:16 ඔබ මහ නැණවතකෙැ යි නොසිතන්න.
q2 7 සමිඳුන්ට ගරුබිය පා නපුරනේ දුරු වන්න.
8 එසේ කළොත්, ඔබේ සිරුරට සුව සැප ද, ඔබේ ඇට මිදුළුවලට නව පණක් ද ලැබනෙු ඇත.
9 ඔබේ ධනසම්පතින් ද අස්වැන්නේ නාඹුල් පලයනේ ද සමිඳුන් හට පුද පඬුරු දනේන.
10 එවිට ඔබේ අටුකොටු ධනධාන්‍යයනේ පිරී ඉතිරී යනු ඇත;
q2 10 මහ මුද්‍රික බඳුන්වල නව මිදිපැන් උතුරා යනු ඇත.
11 ජෝබ් 5:17 හබේ්‍රෙ 12:5-6 මාගේ පුත්‍රය, සමිඳුන් දනෙ විනය සුළු කොට නොසිතන්න.
q2 11 එතුමන්ගේ තරවටු ගැන නොකලකිරනේන.
12 එළිද 3:19 පියකෙු සිය ප්‍රියාදර පුතු හට යම් සේ දඬුවම් කරන්නේ ද, එසේ ම සමිඳාණෝ සිය පමේවතුන්ට දඬුවම් දනෙ සේක.

### ප්‍රඥා සම්පත

13 ප්‍රඥා සම්පත සොයාගන්නා, ඥාන සම්පත හිමි කරගන්නා, මිනිසාගේ වාසනාවක මහත!
14 එයින් ලැබනෙ යසඉසුරු, රිදීයටත්, තනි රත්රනටත් වඩා අගනේ ය.
15 ප්‍රඥාව රතුකැටවලට වඩා අගනේ ය;
q2 15 ඔබේ සිත්ගන්නා කවර දයෙක් වුව ද එයට සම කළ නොහැකි ය.
16 දීර්ඝායු ප්‍රඥාවේ දකුණතහෙි ය:

q2 16 ධනසම්පත් හා කීර්තිය ඇගේ වමතෙහි ය,
17 ප්‍රඥාවගේ ක්‍රියා මාර්ග ජීවන රටාවට මනහර
ය;
q2 17 ඇගේ සියලු මාවත් සත් හට සෙත් දෙයි.
18 ප්‍රඥාව අත්කර ගන්නන්ට ඈ ජීවන වෘක්ෂයකි;
q2 18 එවැනියන්ගේ වාසනාවක මහත!
19 සමිඳාණෝ ප්‍රඥාවෙන් පොළොවේ අත්තිවාරම්
ලූ සේක.
q2 19 බුද්ධියෙන් අහස් මණ්ඩලය පිහිටවූ සේක.
20 එතුමන්ගේ ඥානයෙන් පොළොවේ ගැඹුරු තැන්
කණිනු ලැබී ය;
q2 20 වලාකුළුවලින් පිනි බින්දු කාන්දු වනු ඇත.

## නැණවතුන්ගේ වාසනාව

21 මාගේ පුත්‍රය, විචක්ෂණ බුද්ධිය ද තීක්ෂණ
ඥානය ද දියුණු කරගන්න.
q2 21 ඒවා ඔබ කෙරෙන් පහ ව යන්න ඉඩ
නොදෙන්න.
22 ඒවා ඔබට ජීවනය ද ඔබේ ගෙලට ආභරණයක්
ද වනු ඇත.
23 එවිට ඔබේ දපා නොපැකිළ, ඔබ සුව සේ
ජීවන මඟ යනු ඇත;
24 සැතපෙන කල ඔබට බියක් නැත;
q2 24 ඔබේ නින්ද සැපදායක වනු ඇත.
25 හදිසි භීතියට වත් දුදනන්ගෙන් එන දුර්විපතට
වත්, බිය නොවන්න.
26 සමිඳාණෝ ඔබ සුරක්නා සේක;
q2 26 ඔබේ දපා උගුලට අසු නොවන සේ රක්නා
සේක.
27 ත්‍යාගශීලී වීමට හැකියාව තිබිය දී, උපකාර
කිරීමට මැළි නොවන්න.
28 හැකියාව තිබිය දීත්, “ගොස් නැවත එන්න, හෙට
දෙන්නෙමි”යි ඔබේ අසල්වැසියාට නොකියන්න.
29 ඔබේ අසල්වැසියා බිය සැක නැති ව යෙහෙන්
වාසය කරද්දී,
q2 29 ඔහුට විරුද්ධ ව උපායක් නොයොදන්න.
30 ඔබට වරදක් නොකරන කෙනෙකු සමඟ
නිකරුණේ නඩුහබයට නොබසින්න.
31 සාහසිකයෙකු ආදර්ශයට නොගන්න;
q2 31 ඔවුන් අනුගමනය නොකරන්න;
32 වංක සිත් ඇත්තෝ සමිඳුන්ට පිළිකුලකි;
q2 32 එතුමන්ගේ ප්‍රසාදය අවංක අය සමඟ ය.
33 දුදනන්ගේ මන්දිර මත සමිඳුන්ගේ සාපය
වැටෙනු ඇත;
q2 33 සුදනන්ගේ නිවසේවලට එතුමාණෝ ආසිරි
දෙන සේක.
34 ජාකො 4:6; 1 පේදු 5:5 නින්දා කරන අයට
එතුමාණෝ නින්දා කරන සේක;
q2 34 යටහත් අයට ප්‍රසාදය දක්වන සේක.
35 නැණවතුන් හට කීර්තිය උරුම වේ;
q2 35 නැණ හීනයන් හට අපකීර්තිය හිමි වේ.

## ප්‍රඥාවේ ඵල

4 මාගේ පුත්‍රයෙනි, පියාගේ අවවාදයට සවන්
දෙන්න;
q2
4 නැණනුවණ ලැබීමට කන් යොමු කරන්න.
2 මන්ද, මම මනා උවදෙස් ඔබට දෙමි;
q2 2 මාගේ ඔවා බස් ඉවත නොදමන්න.
3 මම මාගේ පියාගේ ද මවගේ ද ළදබොළඳ
ප්‍රියාදර එක ම පුත් රුවන වූයෙමි.
4 මාගේ පියා මට මෙසේ අවවාද කළේ ය:
q2 4 “මේ මා කියන දේ ඔබේ සිතේ නිදන්
කරගන්න;
q2 4 මාගේ උපදෙස් රැක ජීවිත ලාභය විඳින්න.
5 ප්‍රඥාව ලබාගන්න, නැණනුවණ ලබාගන්න;
q2 5 එය අමතක නොකරන්න;
q2 5 මා පවසන උපදේශවලින් ඉවත් ව නොයන්න.
6 ප්‍රඥා සම්පත ඉවත නොදමන්න;
q2 6 එවිට ඈ ඔබ සුරක්ෂිත ව තබනු ඇත.
q2 6 ඇයට සෙනෙහෙස දක්වන්න;
q2 6 ඈ ඔබ ආරක්ෂා කරනු ඇත.
7 ප්‍රඥා සම්පත හැම සම්පතට ම වඩා උදාර ය;
q2 7 ඔබ රුස් කරගන්න සකල සම්පතට වඩා
නැණනුවණ ලබාගන්න.
8 ඇයට ගරු සම්මාන පිරිනමන්න, එවිට ඈ ඔබ
උසස් කරනු ඇත.
q2 8 ඇය සෙනෙහෙසින් වැළඳගන්න, එවිට ඈ ඔබ
ගෞරවයට පමුණුවනු ඇත.
9 ඈ ඔබේ සිරසෙහි දිමුතු මල් මාලාවක් තබනු
ඇත;
q2 9 තේජස් කිරුළක් පළඳවනු ඇත.”
10 මාගේ පුත්‍රය, සවන් දී, මේ මාගේ අවවාද මුළු
සිතින් පිළිගන්න.
q2 10 එවිට ඔබ දිගායු වළඳනු ඇත.
11 ප්‍රඥාවේ මාර්ගය මම ඔබට උගන්වමි;
q2 11 හරි මාවත්වල මම ඔබ ගෙන යමි.
12 එවිට ඔබ ඇවිදින කල ඔබට අවහිරයක්
නොවනු ඇත;
q2 12 ඔබ දුවන කල පැකිළීමක් නොවනු ඇත.
13 මාගේ උපදෙස් තරයේ පිළිගෙන, ඉවත නොලා,
රැකගන්න.
q2 13 ඒවා ඔබට ජීවන සම්පත වේ.
14 අදමිටුන්ගේ මාවතෙහි පා නොතබන්න;
q2 14 දුදනන්ගේ පාරෙහි නොයන්න.
15 නපුරෙන් වළකින්න, එයට ඉඩ නොදෙන්න;
q2 15 එය දුරින් දුරු කොට, ඉදිරියට යන්න.
16 නපුරක් නොකළොත්, දුදනන්ට නින්දක් නැත;
q2 16 යමකු පාගා නොදැමුවොත්, ඔවුන්ට නින්දක්
නැත.
17 කුරිරුකම ඔවුන්ගේ ආහාරය වේ, සැහැසිකම
ඔවුන්ගේ පානය වේ.

18 එහෙත් දැහැමියන්ගේ මාවත උදේ පායන හිරු
මෙන් ය, එය මද්දහනය දක්වා දීප්තියෙන් වැඩී
වේගෙන යයි.
19 දුදනන්ගේ මඟ ගනඳුරින් වැසී ඇත;
q2[19] තමන් කුමක පැටලුණේ දැ යි ඔව්හු නොදනිති.
20 මාගේ පුත්‍රය, මා කියන දයට සවන් දෙන්න,
මාගේ අවවාදයට කන් යොමු කරන්න.
21 ඒවා ඔබේ සිතින් පහ නොවේ වා;
q2[21] ඒවා ඔබේ හදවතෙහි නිදන් කර තබන්න.
22 ඒවායින් ඔබට ජීවන සම්පත ද ඔබේ
සර්වාංගයට සුව සැපත ද අත් වේ.
23 අන් හැම දයට ම වඩා ඔබේ සිත රැකගන්න;
q2[23] මන්ද, ඔබේ දිවි මඟ හැඩගැසෙන්නේ එයිනි.
24 රැවටිලිකාර කියමන් ඔබෙන් පහකරන්න.
q2[24] කරෝටික වදන් ඔබෙන් දුරලන්න.
25 දසිත් නැති ව එක එල්ලේ කෙළින් බලන්න;
q2[25] දගෙඩියාවෙන් තොර ව ඉදිරිය බලා යන්න.
26 හෙබ්‍රෙ 12:13 ඔබ යා යුතු මඟ හිතාමතා
සලසාගන්න;
q2[26] එවිට ඔබ කරන සියල්ල ස්ථිර වනු ඇත.
27 හරි මඟින් දකුණට හෝ වමට හෝ
නොහැරෙන්න;
q2[27] ඔබේ දපා නපුරෙන් දුරු කරගන්න.

### පරදාර සේවනය ගැන අවවාද

5 මාගේ පුත්‍රය, මාගේ ප්‍රඥා සම්පතට සිත
යොමු කරන්න;
q2
5 මාගේ විමංසන බුද්ධියට අවධානය යොමු
කරන්න.
2 එවිට ඥාන සම්පතින් ඔබ රැකෙනු ඇත.
q2[2] ඔබේ කතාව ප්‍රඥාසාර වනු ඇත.
3 වෙසඟනගේ දතොලින් මී පැණි වෑහෙයි;
q2[3] ඇගේ තපුල් ඔලීව තෙලට වඩා සුමුදු ය;
4 එහෙත් ඒවා අවසානයේ දී දිවි කදුරු මෙන් තිත්ත
වනු ඇත;
q2[4] දපෙිට කැපෙන කඩුපතක් මෙන් තියුණු වනු
ඇත.
5 ඇගේ දපා මරණය බලා යයි;
q2[5] ඇගේ පියවර පාතාල ලෝකයට යයි;
6 ඇය ජීවන මාර්ගය ගැන නොසලකයි;
q2[6] ඇගේ ක්‍රියා මාර්ග අස්ථිර ය, වගකීමෙන්
තොර ය.
7 එබැවින් මාගේ පුත්‍රය, මට සවන් දෙන්න;
q2[7] මා පවසන ඔවා වදනින් ඈත් ව නොසිටින්න.
8 එවැනි ගැහැණියකගෙන් දුරු වී සිටින්න;
q2[8] ඇගේ දොරකඩට වත් නොයන්න.
9 එසේ යාමෙන්, ඔබේ ගෞරවය අනුන් ඉදිරියේ
නැති කරගනු ඇත.
q2[9] ඔබේ ආයු නපුරු අය නිසා කෙටි වනු ඇත.
10 ඔබේ සැපසම්පතින් වෙනෙ අය තෘප්තියට පත්
වනු ඇත.
q2[10] ඔබ වැරවීරියෙන් උපයන දේ අන් ගෙදරකට
අත් වනු ඇත.
11 අවසානයේ දී ඔබේ ඇඟපත දිරා ගොස්, ඔබ
කෙඳිරිගානු ඇත.
12 එවිට ඔබ මෙසේ කියනු ඇත:
q2[12] අනේ මා විනය දහමට ද්වේෂ කළ හැටි!
q2[12] මාගේ සිතින් අවවාද සුළු කළ හැටි!
13 මම ධර්ම දේශකයන්ගේ බසට කීකරු
නොවූයෙමි, ගුරු ඇදුරන්ගේ අවවාදයට කන්
නුදුන්නෙමි.
14 හැම නපුරෙහි යදේ නරක නමක් ලද්දෙමි,
ප්‍රසිද්ධියේ ම මහ නින්දාවට පත් වුණෙමි.”
15 ඔබේ ම පොකුණේ ගලන ජලය ද ඔබේ ම
ළිඳෙන් උනන වතුර ද බොන්න.
16 ඔබේ උල්පත පිටතට වත්, ජලධාරා වීදියට වත්
ගලා යා යුතු නැත.
17 ඔබේ දූදරුවන් අන් අයට නොව, ඔබට ම සතු
වස්තුවක් වේ වා!
18 ඔබේ උල්පත වන ප්‍රිය බිරිඳට සව්සිරි වේ වා!
q2[18] ඔබේ යොවුන් වියේ ප්‍රියාව සමඟ ම ප්‍රීතිය
ආස්වාදය කරන්න.
19 සුලලිත මුව දෙනෙක හා සුකොමල පැටියෙකු
මෙන් වූ, ඇගේ පියයුරුවලින් විනෝද වන්න.
q2[19] ඇගේ ආදරයෙහි සැමදා ම සතුටින් ඉපිළී
යන්න.
20 මාගේ පුත්‍රය, ඔබ පරදාර සේවනයෙන් උමතු
වන්නේ කුමට ද?
q2[20] සල්ලාල ගැහැණියක වැළඳගන්නේ මන් ද?
21 මිනිසාගේ සියලු ක්‍රියා මාර්ග සමිඳාණන්
අබිමුවෙහි ඇත.
q2[21] ඔහුගේ සියලු මාවත් එතුමන්ගේ තියුණු
බැල්මට ලක් වී ඇත.
22 දුදනාගේ පව්කම ඔහුට ම මලපතකි;
q2[22] ඔහු සිය පාප දැලෙහි පැටලෙයි.
23 ආත්මදමනයෙන් තොර මිනිසා වැනසෙයි;
q2[23] ඔහු නිම්හිම් නැති අනුවණකමින් මුළා වෙයි.

### ගැටළුවලින් ගැළවීම

6 මාගේ පුත්‍රය, ඔබ මිතුරකුට ඇප වී, අන්
අයකු උදෙසා අත්තිකාරමක් දී,
2 ඔබේ වචනවලට අසු වී, ඔබේ පොරොන්දුවලට
මැදි වී සිටින්නෙහි ද?
3 මාගේ පුත්‍රය, එසේ අසු වී සිටින්නෙහි නම්, මා
කියන දේ කර ගැළවී යන්න;
q2[3] ඔබ ගොස්, ඔහුගේ දපා ළඟ වැටී පරෙත්ත
කරන්න.
4 නිදි නොගෙන, කිරා නොවැටී,
5 දඩයක්කාරයෙකු අතින් පැන දුවන තිත් මුවකු
මෙන් ද උගුලක් ඇටවූ වැද්දකු අතින් ඉගිළී යන
කුරුල්ලකු මෙන් ගැළවී යන්න.

## කුහුඹුවාගෙන් පාඩම්

6 අලසය, කුහුඹුවා වෙත ගොස් උගේ ගතිපැවතුම්
බලා නැණවත් වන්න.
7 ඌට නායකයෙක් නැත, මුලාදෑනියෙක් නැත,
පාලකයෙක් නැත.
8 එහෙත් ඌ ගිම්හානයේ දී ආහාර සපයා ගනියි;
q2 8 ගොයම් කපන සමයේ දී කෑම රැස් කර තබයි.
9 අලසය, ඔබ කොපමණ කල් නිදාගන්නෙහි ද?
q2 9 නින්දෙන් අවදි වන්නේ කොයි වේලාවෙහි ද?
10 හිතෝ 24:33-34 ‘තව ටිකක් නිදාගනිමි, තව
ඇබිත්තක් සැතපෙමි, තව මඳක් අත් දෙක
බැඳගනිමි’යි කියන ඔබ වෙතට,
11 දිළිඳුකම, සොරෙකු මෙන් ද හිඟකම, අවිගත්
සබෙළකු මෙන් ද එනු ඇත.

## තක්කඩියාගේ විනාශය

12 සටකපට බස් දොඩමින් ඇවිදින, තැනැත්තේ
දුදනෙකි, තක්කඩියෙකි.
13 ඔහු සිය දෙනෙතින් ඉඟි කරයි, දෙපයෙන් හැඟුම්
දක්වයි, ඇඟිලිවලින් සංඥා කරයි.
14 ඔහුගේ සිත සටකපට ව ඇත, ඔහු නිතර ම
නපුරට කුමන්ත්‍රණය කොට, වාද භේද පතුරුවාලයි.
15 එබැවින් ඔහුගේ නැස්පැත්තිය හදිසියේ එයි,
ගැළවීමට මඟක් නැති ව, මොහොතකින් ඔහු සුණු
වී යයි.

## සමිඳුන් නුරුස්සන කරුණු

16 සමිඳාණන් නුරුස්සන කරුණු සයකි, එතුමන්ට
පිළිකුල් කරුණු සතකි.
17 අහංකාර ඇස් ද බොරුකාර දිව ද නිදොස් ලේ
වගුරුවන අත් ද
18 දුෂ්ට උපා යොදන සිත ද නපුරට වහා දුව යන
පා ද මුසා බස් තපෙලන බොරු සාක්කිකරු ද
19 මිතුරන් අතර වාද භේද අවුස්සන අය ද වේ.

## පරදාර සේවනයේ දුර්විපාක

20 මාගේ පුත්‍රය, ඔබේ පියාගේ අනුශාසනා
පිළිපදින්න;
q2 20 මවගේ උපදෙස් අත් නොහරින්න.
21 ඒවා නිරතුරු ඔබේ සිත්හි නිදන් කොට, මාලයක්
මෙන්, ගෙලෙ වටා බැඳගන්න.
22 ඔබ යන එන විට ඒවා මඟ පෙන්වයි;
q2 22 ඔබ නිදන විට රැකවල් කරයි;
q2 22 ඔබ අවදි වන විට අවවාද දෙයි.
23 අනුශාසනාව ඔබට පහනකි, උවදෙස් ඔබට
එළියකි, ගුරුපදේශ ඔබට ජීවන මඟකි.
24 නරක ගැහැණියකගෙන් ද ඉච්චා බස් දොඩන
අන් අඹුවන්ගෙන් ද ඒවා ඔබ රැකගනියි.
25 ඇගේ රුවට සිතින් ඇදී නොයන්න;
q2 25 ඇගේ නුවන'ග බැල්මෙන් ඈ ඔබ වසඟ කර
නොගනී වා.
26 වෙසඟනක පතන්නේ පාන් ගඩියක මිල
පමණකි;
q2 26 පර අඹුවක සොයන්නේ මුළු ජීවිතයකි.
27 ගිනිදැල් තුරුලු කර ගතහොත්, මිනිසකුගේ
ඇඳුම් නොපිළිස්සේ ද?
28 ගිනි අඟුරු මත ඇවිද්දොත්, ඔහුගේ දෙපා
නොදැවේ ද?
29 සිය අසල්වැසියාගේ බිරිඳ වෙත එළඹෙන අයට
එසේ වේ.
q2 29 ඇයට අත තබන කිසිවෙක් දඬුවම් නොලැබ
නොසිටියි.
30 සොරෙකු සිය සාගින්න නිවාගනු වස් සොරකම්
කළත් මිනිස්සු ඔහු වරදින් නිදහස් නොකරති.
31 ඔහු අසුවුණොත් සත් ගුණයක් වන්දි ගෙවීමට
සිදු වෙයි;
q2 31 සිය නිවසෙහි මුළු වත්කම ද දෙන්නට වෙයි.
32 පරදාර සේවනය කරන්නා අනුවණයෙකි;
q2 32 ඔහු තම ජීවිතය නාස්ති කරගන්නෙකි.
33 උවදුරු හා අවනම්බුව ඔහුට හිමි වෙයි;
q2 33 ඔහුගේ නින්දාව නොමැකී පවතියි.
34 මන්ද, කාම ක්‍රෝධය සැමියකු උදහස් කරලයි;
q2 34 පළිගන්න දවසේ දී ඔහුගෙන් සමාවක් නැත.
35 ඔහු කිසි වන්දි මුදලක් නොපිළිගනු ඇත;
q2 35 කොතරම් තෑගි පිරිනැමුවත් ඔහු සතුටු
නොවනු ඇත.

7 මාගේ පුත්‍රය, මාගේ ඔවා බස් පිළිපදින්න;
q2
7 මාගේ ආඥා සිතෙහි තැන්පත් කරගන්න.
2 මාගේ ආඥා පැවැත්වුවහොත් ඔබට ජීවනය
ඇත;
q2 2 මාගේ උවදෙස් ඔබේ දෙනෙත මෙන් රැකගන්න.
3 ඇඟිලිවල මුදු මෙන් ඒවා නිරතුරු තබාගන්න,
ඔබේ සිත් නමැති පුවරුවෙහි ඒවා සටහන්
කරගන්න.
4 ප්‍රඥාව ඔබේ සොහොයුරිය මෙන් ද නැණනුවණ
ඔබේ මිතුරිය මෙන් ද සලකන්න.
5 එවිට ඔබ දුරාචාර කාන්තාවගෙන් ද ඉච්චා බස්
දොඩන වෙසඟනගෙන් ද ආරක්ෂා වනු ඇත.

## දුරාචාර ස්ත්‍රියගේ මායා

6 එක දිනක්, මාගේ ගෙයි කවුළුවේ ගරාදි
අස්සෙන් පිටත බැලුවෙමි.
7 එවිට අනුවණයන් අතර මෝඩ තරුණයෙකු සිටිනු
දුටිමි.
8 ඔහු, අඳුර වැටදේදී, ගොම්මං වේලාවේ දී,
මැදියම් රෑ කළුවරෙහි දී,
9 ඇගේ ගේ අද්දර වීදිය පසු කොට ඇගේ ගෙට
යන මාවතෙහි ගමන් කළේ ය.
10 එවිට ඈ වෙසඟනකගේ වස්ත්‍ර හැඳ,
රැවටිලිකාර ස්ත්‍රියක මෙන් ඔහුට මුණගැසුණා ය.
11 ඈ අඟරදඟර කරන චපල ස්ත්‍රියකි, ඈ කොයි
වේලාවත් ගෙදර නැත.

12 විටක ඈ වීදිවල ද විටක ඈ වෙළෙඳ පොලේ ද
සෑම මංසන්දියක ද සෝදිසියෙනේ බලා සිටියි.
13 මෙසේ ඈ ඔහු අල්ලා සිඹගෙන, විළි ලජ්ජා
කිසිත් නැති ව ඔහුට මෙසේ කීවා ය:
14 “මම අද මාගේ පුද පූජා පැවැත්වීමි;
q2 14 බාරහාර ඉෂ්ට කළෙමේ.
15 ඔබ හමු වන පිණිස ආශාවෙනේ ඔබ සොයා
ආයේ ඒ නිසා ය.
q2 15 දැන් ඉතින් ඔබ මට හමු වීය.
16 මිසරයේ පාට පාට නූල්වලින් කළ විසිතුරු
ඇතිරිලි මා යහනහි අතුරා ඇත.
17 සුවඳලාටුවලින් ද අගිල්වලින් ද කුරුඳුවලින් ද
මාගේ යහනට සුවඳ කැවීමි.
18 එන්න, උදය වන තුරු පමේ බඳුනනේ බොමු;
q2 18 ආදරය බී මත්වමු.
19 අද මාගේ පුරුෂයා ගදෙර නැත;
q2 19 ඔහු ඈත දුර ගමනක් ගොස් ඇත.
20 ඔහු බොහෝ මුදල් රුගෙන ගියේ ය;
q2 20 මහ පෝය වන තුරු ඔහු ගදෙර එන්නේ නැත.”
21 ඇගේ මේ රුවටිලි වදනින්, ඈ ඔහු කැමැති
කරවා, ඉච්චා තපුෙලින් ඈ ඔහු වශී කරගන්නී ය.
22 එකණෙහි ම ඔහු, ඝාතනයට ගෙන යන
ගොනකු මෙනේ ද මලපුඩුවට දුවන මුවකු මෙනේ ද
23 උගුලට වහා පියාඹා යන පක්ෂියකු මෙනේ ද
ඇය කැටුව ගියේ ය.
q2 23 ඊගස ඔහුගේ අක්මාව විදගෙන යන තුරු,
තමන් අනතුරෙහි සිටින බව ඔහු නොදත්තේ ය.
24 එබැවින් මාගේ පුත්රය, මට සවන් දෙන්න, මා
පවසන ඔවා බසට අවධානය යොමු කරන්න.
25 ඇගේ මාවත්වල යාමට ඔබේ සිත නොපෙළඹේ
වා!
q2 25 ඇගේ මාර්ගවල මං මුළා නොවන්න.
26 බොහෝ දෙනෙකේ ඇගෙනේ නාස්තියට පත් වූ හ;
q2 26 ඈ නිසා විපතට පත් වූ අයගේ ගණන් විශාල
ය.
27 ඇගේ නිවස පාතාලයට යන මඟ ය, මරුගේ
මැදිරිවලට බැස යන මාවත ය.

### ප්රඥාවේ අනුහස

8 හිතෝ 1:20-21 ප්රඥා තුමීගේ මොරගැසීම
අසන්න;
q2
8 ඥානාංගනාවගේ හඬගැසීමට සවන් දෙන්න.
2 ඕ තොමෝ කඳු මුඳුන්හි ද පාර අද්දර ද
මංසන්දිවල ද සිටින්නී ය.
3 නගරයට පිවිසෙන වාසල් දොරටු ළඟ ඈ හඬ
නඟා මෙසේ කියන්නී ය:
4 “සෙනඟෙනි, මාගේ ආයාචනය ඔබට ය, මම
හැම මිනිසාට ම කතා කරමි.
5 අනුවණයෙනි, නුවණ ලබාගන්න, දැනුම්තේරුම්
ඇති අය වන්න;
q2 5 මෝඩයෙනි, කල්පනාකාරී වන්න.
6 අසන්න, මම උදාර දේ පවසමි.
q2 6 මා මුවින් පවසන හැම දයෙ ම සැබෑ ය.
7 මම සත්යය මිස අන් කිසිවක් නොකියමි.
q2 7 දුෂ්ට කතා මට පිළිකුලකි.
8 මා කියන කවර දේත් සාධාරණ ය, ඒවායෙහි
ඇදකුද, හොරබොරු කිසිත් නැත.
9 නුවණැත්තන්ට ඒ සියල්ල සක්සුදක් සේ පැහැදිලි
ය;
q2 9 දැනුම ඇත්තන්ට ඒවා හරි බව වැටහේ.
10 රිදීයට වඩා මාගේ ගුරුහරුකම් ද පරේ රනට
වඩා දැනගැන්ම ද පිළිගන්න.
11 මන්ද, ප්රඥාව රතු කැටවලට වඩා අගනේ ය;
q2 11 ඊට සම කළ හැකි මිණිමුතු කිසිත් නැත.
12 මාගේ නාමය ප්රඥා තොමෝ ය.
q2 12 මම තීක්ෂණ බුද්ධිය ප්රදානය කරමි.
q2 12 දැනුම හා විමංසන බුද්ධිය මම පහදා දමේ.
13 දේව ගරුබිය පෑම නපුරට ද්වේෂ කිරීම ය.
q2 13 මම උඩඟුකමට ද අහංකාරකමට ද නපුරු
කල්ක්රියාවට ද මුසාවාදයට ද තදින් වරෙ කරමි.
14 මන්ත්රණයෙහි දක්ෂතාව හා විමංසන බුද්ධිය
මට ඇත;
q2 14 ස්ථානෝචිත ප්රඥාව හා බල මහිමය ද මා
සතු ය.
15 මාගේ පිහිටනේ භූපතීහු රජකම් කරති;
q2 15 අධිපතීහු සාධාරණ නීති පණවති;
16 මාගේ වරමින් අධිපතීහු රට පාලනය කරති;
q2 16 ලොව සියලු මැති ඇමතිවරු රට ආණ්ඩු කරති.
17 මට පමේ කරන්නන්ට මමත් පමේ කරමි, මා
සොයන්නන්ට මා සම්බ වනු ඇත.
18 වස්තුව ද ගෞරවය ද අසීමිත සම්පත් ද දැහැමි
ජීවිතයේ ආසිරි ද මා වෙත ඇත.
19 මාගේ අස්වැන්න රනට, පරේ රනට වඩා අගනේ
ය;
q2 19 මාගෙනේ ලැබෙන සම්පත් හොඳ ම රිදීයට වඩා
ශ්රේෂ්ඨ ය.
20 මට පමේ කරන්නන්ට වස්තුව හිමි කර දීමෙනේ
21 ඔවුන්ගේ ගබඩා පුරවා දමිටු මඟෙහි ද
යුක්තියේ මංවල ද මම සැරිසරමි.
22 එළිද 3:14 සමිඳාණෝ තමන් මැවූ හැම දයෙට ම
පරෙ සියලු මැවිලිවල පළමුවැන්නා මෙනේ මා මැවූ
සේක.
23 දුරාතීතයෙහි, මහ පොළොව ඇති වන්නට පරෙ,
ආරම්භයේ දී, මම මවනු ලැබුවමේ.
24 සත් සමුදුර ඇති වන්නට පරෙ ජලය පිරුණු
උල්පත් නොවූ සමයෙහි මම ජනිත වූයමේ.
25 ගිරිකුළු හා කඳුවැටි නියම තැන්වල පිහිටනේනට
පරෙ, මාගේ උපත වීය.
26 සමිඳාණන් මහ පොළොව හා කතේ වතු
මවන්නට පරෙ, ප්රථම පස් පිඩැල්ල සාදන්නට පරෙ,
මම ඉපිද සිටියමේ.
27 සමිඳාණන් අහස් කුස පිහිටවූ කල ද, මම එහි
සිටියමේ.
q2 27 එතුමන් මුහුද මත නිම් වළල්ල තබන විට,
28 ඉහළ අහසෙහි වලාකුළු පිහිටුවන විට, සත්
සමුදුර උල්පත් සවි කරන විට,

29 මුහුදු ජලය එහි සීමා පසු කර නොබිඳී යන සේ,
මායිම් තබන විට, පොළොවේ පදනම් සලකුණු
කරන විට මම එහි සිටියෙමි.
30 මම එතුමන්ගේ නිර්මාණ ශිල්පියකු මෙන් ළඟ
සිටියෙමි.
q230 නිරතුරු එතුමන් අබිමුව ප්‍රමුදිත වෙමින්,
දිනෙන් දින එතුමන්ගේ ප්‍රීතිය වූයෙමි.
31 එතුමන් මවා නිම කළ ලොවෙහි ලෝවැසියන්
සමග සන්තෝෂ වූයෙමි.
32 ඒ නිසා, මාගේ පුත්‍රයෙනි, මට සවන් දෙන්න;
q232 මාගේ මාර්ග රක්නා අය භාග්‍යවන්තයෝ ය.
33 මාගේ උපදෙස් ප්‍රතික්ෂේප නොකරන්න;
q233 ඊට කන් දී නැණවත් වන්න.
34 දිනෙන් දින මාගේ වාසල් දොරටු ළඟ සිට,
මාගේ ද්වාර මණ්ඩප රැකවල් කොට, ඔවදන් අසන
මිනිසා භාග්‍යවන්තයෙකි.
35 මා සොයාගන්නා ජීවනය සොයාගනියි.
q235 සමිඳුන්ගේ අනුග්‍රහය ද ඔහු සතු වේ.
36 එහෙත් මා සොයා නොඑන්නා තමාට ම අනතුරු
කරගනියි.
q236 මට වෛර වන සියල්ලෝ මරණයට පෙමේ
කරති.”

## ප්‍රඥාව හා අඥානකම

9 ප්‍රඥාව ඇගේ මන්දිරය ඉදි කර ඇත, එහි
කුළුණු සතක් සාදා ඇත.
2 සතුන්ගේ මසින් ද රස කැවූ මිදිරසයෙන් ද ඇගේ
මඟුල් මේසය පිළියෙළ කොට ඇත.
3 තමන් පිටත් කර යැවූ සේවිකාවන් ලවා,
නගරයේ ඉහළ ම තැන සිට ඈ මෙසේ ආරාධනා
කරන්නී ය:
4 “අනුවණ ජනතාවෙනි, මෙහි පිවිසෙන්න.”
q24 මෝඩ මිනිසුන්ට ඈ මෙසේ කියන්නී ය:
5 “එන්න මාගේ බොජුන් අනුභව කොට, රස කැවූ
මිදිරස පානය කරන්න.
6 අනුවණකම හැරදමා ජීවත් වන්න;
q26 නැණනුවණ මාවතෙහි ගමන් කරන්න.”
7 ගරහන්නකුට ඔවා බස් දෙන්නා හට ඇති
වන්නේ ලජ්ජාව පමණ ය;
q27 දුදනකුට තරවටු කරන්නා හට ඇති වන්නේ
සිත් වේදනාව පමණ ය.
8 ගරහන්නකුට කිසිදාක අවවාද නොකරන්න;
q28 අවවාද කළොත්, ඔහු ඔබට සතුරකු වනු ඇත.
q28 නුවණැත්තකුට අවවාද කරන්න, ඔහු ඔබට
මිතුරකු වනු ඇත.
9 බුද්ධිමතකුට අනුශාසනා කරන්න, ඔහු තවත්
බුද්ධිමත් වෙයි.
q29 දැහැමියකුට උගන්වන්න, ඔහුගේ දැනුම තවත්
දියුණු වෙයි.
10 ජෝබ් 28:28; ගීතා 111:10; හිතෝ 1:7 දේව
ගරුබිය ප්‍රඥාවේ මුල් පියවර වේ, ශුද්ධ දෙවිඳුන්
ගැන දැනුම නැණනුවණ වේ.
11 ප්‍රඥා වෙමින් ඔබේ කාලය දික් වී, ඔබ දිගායු
වළඳනු ඇත.
12 ඔබ නැණවත් වුවහොත්, එහි වාසිය ඔබට ම
ය;
q212 ඔබ ඥානය ප්‍රතික්ෂේප කළොත්, ඉන් වන
අවාසියත් ඔබට ම ය.
13 අමනකම වූ කලී, කටකාර, අනුවණ, විලිබිය
නැති ගැහැණියක වැනි ය.
14 ඇගේ ම ගෙදර දොරකඩ හෝ නගරයේ ඉහළ
ම තැන්වල හෝ ඈ අසුන්ගන්නී ය.
15 තමාගේ පාඩුවේ වැඩට යන මඟීන් මුළා කරනු
වස්
16 ඈ මෙසේ කියන්නී ය:
q216 “අනුවණ ජනයෙනි, මෙහි පිවිසෙන්න.”
q216 ඈ මෝඩ මිනිසුන්ට මෙසේ කියන්නී ය:
17 “සොරාගත් වතුර ඉමිහිරි ය, සොරාගත් කෑම
වඩා රස ය.”
18 ඈ කැඳවන අය, මරණය එහි ඇති බව ද
පාතාලයෙහි ගැඹුරු තැන වැටී ඇති බව ද නොදනිති.

## දමිටු හා අදමිටු සමාජය

10 සලමොන් නිරිඳුන්ගේ හිතෝපදේශ මේ ය:
q2
10 නැණවත් පුතා පියා හට ප්‍රීතියකි, අනුවණ
පුතා මවට ශෝකයකි.
2 වංකකමින් ලබන වස්තුව නිෂ්ඵල වෙයි;
q22 එහෙත් අවංකකම මරණින් මුදයි.
3 සමිඳාණෝ දැහැමි දනා හාමතට නොහරින
සේක;
q23 එහෙත් දුදනන්ගේ මන දොළ නිෂ්ඵල කරන
සේක.
4 අලසකමින් දිළිඳුකම උපදියි;
q24 කඩිසරකමින් ධනය උපදියි.
5 ගිම්හානයෙහි අස්වැන්න රුස් කරන්නා නැණවත්
පුතකෙි;
q25 අස්වැන්න කාලයෙහි නිදන්නා නින්දිත පුතකෙි.
6 දැහැමියන්ගේ හිස මත ආසිරි පැතිරෙයි;
q26 දුදනන්ගේ වචනවල සැහැසිකම සැඟවෙයි.
7 දැහැමි දනා සැමරීම වාසනාවකි;
q27 එහෙත් දුදනන්ගේ නාමය පිළිකුලකි.
8 පැණවතා අණපණත් පිළිගනියි;
q28 නන්දොඩන මෝඩයා වැනසී යයි.
9 අවංක ව හැසිරෙන්නා සුව සේ වසයි;
q29 වංක මඟෙහි යන්නාගේ ක්‍රියා එළි වෙයි.
10 වපර ඇසින් වරද දෙස බලන්නා කරදර උපදවයි;
q210 එහෙත් නිර්භය විවේචනය කරන්නා සාමය
ගෙන දෙයි.
11 සුදනන්ගේ කතාව ජීවන උල්පතකි;
q211 දුදනන්ගේ වචනවල සැහැසිකම සැඟවී ඇත.
12 ජාකො 5:20; 1 පේද්‍රු 4:8 වෛරය කලහ
උපදවයි;
q212 ප්‍රේමය වැරදි නොතකයි.
13 නුවණැත්තා සිහිනුවණින් කතා කරයි;

q2 13 අනුවණයා කස පහර ලැබිය යුතුයි.
14 නැණවත්හු දැනුම රුස් කරගනිති;
q2 14 එහෙත් මෝඩයන්ගේ කතාව විනාශය ළං කරගනියි.
15 ධනවතාගේ ධනසම්පත ඔහුට බලකොටුවකි;
q2 15 දිළින්දාගේ දිළිඳුකම ඔහුට විනාශයකි.
16 දමිටුන්ගේ විපාකය ජීවනය වේ;
q2 16 අදමිටුන්ගේ විපාකය විනාශය වේ.
17 ශික්ෂා පිළිපදින්නා ජීවන මඟ යයි;
q2 17 අවවාදයට පිටු පාන්නා මුළා වී යයි.
18 බොරු කියන්නා වෛරය උපදවන්නකේ;
q2 18 කේලාම් පතළ කරන්නා අඥානයකේ.
19 කතාව වැඩි තැන වරදට ඉඩ ඇත;
q2 19 සිය මුව රැකගන්නා නුවණැත්තකේ.
20 සුදනන්ගේ තපෙුල් පිරිසිදු රිදී මනේ;
q2 20 දුදනන්ගේ බසහෙි කිසි හරයක් නැත.
21 දැහැමියන්ගේ බස් බහු ජන හිත සුව පිණිස වේ;
q2 21 එහෙත් අනුවණයෝ අනුවණකමින් වැනසති.
22 සමිඳුන්ගේ ආසිරි සෞභාග්යය සලසයි;
q2 22 දැඩි ශ්රමයනේ එය වැඩි කළ නොහැක.
23 අනුවණයාගේ විනෝදය නපුරු ක්රියා කිරීම ය;
q2 23 නුවණැත්තාගේ ප්රීතිය ප්රඥාව ලැබීම ය.
24 දුෂ්ටයා බිය වන දේ ම ඔහු පිටට එයි;
q2 24 ධර්මිෂ්ඨයා කැමැති වන දේ ම ඔහුට දනෙු ලැබයෙි.
25 සැඩ සුළඟ පහවතේ ම දුදනෝ ද පහ වී යති;
q2 25 එහෙත් සුදනන්ගේ අත්තිවාරම් සදා පවතිනු ඇත.
26 අලසයාගනේ කිසි වැඩක් නොගන්න;
q2 26 ඔහු, දත්වලට විනාකිරි ද ඇස්වලට දුම ද මනේ වනු ඇත.
27 සමිඳුන් කරෙහෙි ගෞරවය දිගාසිරි දයෙි;
q2 27 එහෙත් දුෂ්ටයෝ අඩු වයසින් මිය යන්නහු ය.
28 දමිටුන්ගේ පැතුම සොම්නස ගනෙ දයෙි;
q2 28 අදමිටුන්ගේ පැතුම නිෂ්ඵල වයෙි.
29 සමිඳුන්ගේ මඟ අවංක අයට බලකොටුවකි;
q2 29 අයුතුකම් කරන්නන්ට එය මහ විපතකි.
30 දැහැමියා සිය තැනින් කිසිදා නොසලේ වයෙි;
q2 30 එහෙත් දුෂ්ටයාට දේශයහෙි තැනක් නැති වයෙි.
31 දැහැමියාගේ මුවින් ප්රඥාව ගලා යයි;
q2 31 එහෙත් ප්රයෝගකාරී දිව සිඳදමනු ලැබයෙි.
32 දැහැමියා සිය මුවින් ප්රස්තාවෝචිත දේ කියයි;
q2 32 එහෙත් දුෂ්ටයා කතාවනේ කැරලිකාර දේ පවසයි.

11 හොර තරාදිය සමිඳුන්ට පිළිකුලකි;
q2
11 හරි පඩි සමිඳුන්ට ප්රීතියකි.
2 අහංකාරය සමඟ නින්දාව එයි;
q2 2 එහෙත් යටහතුන් වතෙ ප්රඥාව ඇත.
3 අවංක අයට අවංකකම මඟපනේවයි.
q2 3 ද්රෝහියා සිය ද්රෝහිකමින් විනාශ වයෙි.
4 මැරනෙ දිනයේ දී සම්පතින් වැඩක් නැත;
q2 4 එහෙත් දැහැමි ජීවිතය මරණින් මුදයි.
5 දැහැමිකමින් නිදොස් මිනිසාගේ ජීවිත ගමන පහසු වේ;
q2 5 අදමිටුකමින් අදමිටුන්ගේ ම වැටීම සිදු වේ.
6 අවංක අය සිය දැහැමිකමින් ගැළවති;
q2 6 එහෙත් ද්රෝහියෝ සිය කූටෝපායවලට අසු වති.
7 දුදනාගේ මරණය සමඟ ඔහුගේ පැතුම ද නැසයෙි;
q2 7 අභක්තිකයන්ගේ ප්රාර්ථනා ද එසේ ම නැසයෙි.
8 ධර්මිෂ්ඨයා විපතනේ මිදනෙු ඇත;
q2 8 දුෂ්ටයා මිදනෙු වනෙුවට විපතට පත් වනෙු ඇත.
9 අභක්තිකයාගේ බසින් මිනිස්සු විනාශ වති;
q2 9 එහෙත් දමිටු අය ප්රඥාවනේ ගැළවති.
10 දැහැමි අයට සතෙ සැලසනෙ විට නගරය ප්රීති වයෙි;
q2 10 නොදැහැමියන් නසින විට නගරය ඔල්වර හඬ නඟයි.
11 අවංක අයගේ ආශීර්වාදයනේ නගරය උසස් වයෙි;
q2 11 එහෙත් දුදනන්ගේ වදනින් එය බිඳ වැටයෙි.
12 සිය අසල්වැසියා හළො දකින්නා අනුවණයකේ;
q2 12 එහෙත් නුවණැත්තා නිහඬ ව සිටියි.
13 කේලාම් පතුරන්නා රහස් හළෙි කරයි.
q2 13 එහෙත් විශ්වාසවන්තයා රහස් සඟවා තබාගනියි.
14 දක්ෂ නායකත්වය නැති තැන සනෙඟ පිරිහති;
q2 14 එහෙත් අනුශාසකයන් රැසක් සිටියොත් රට සුරැකේ.
15 නොදන්න කනෙකුෙට ඇප වනේනා විපතට පැමිණයෙි;
q2 15 එසේ ඇප නොවනේනා සුරැකි ව සිටියි.
16 විනීත වනිතාව ආත්ම ගෞරවය දිනාගනියි;
q2 16 එහෙත් අවිනීත ස්ත්රිය නින්දාවකි.
q2 16 අලසයා අත කිසි විටකෙ මුදල් නැත;
q2 16 උත්සාහවන්තයා ධනවත් වයෙි.
17 කාරුණික මිනිසා තමාගේ ම මිතුරා ය;
q2 17 ක්රෑර මිනිසා තමාගේ ම සතුරා ය.
18 දුෂ්ටයා වංචාවනේ ලබන දේ මායාවකි.
q2 18 එහෙත් යහපත වපුරන්නාට අස්වැන්නක් නියත ය.
19 දැහැමි ජීවිතයහෙි පිහිටි අය ජීවනය ලබති;
q2 19 නපුරු මඟ යන්නෝ මරණය ළඟා කර ගනිති.
20 වංක අය සමිඳුන් හට පිළිකුලකි;
q2 20 අවංක අය එතුමන්ට සතුටකි.
21 දුෂ්ටයා දඬුවම් ලබනු සහතික ය;
q2 21 එහෙත් සුදනන්ගේ පරපුර ඉන් නිදහස් වනු ඇත.
22 ඌරකුෙගේ හොම්බහෙි ලූ රන් මුදුව යම් සේ ද අනුවණ කාන්තාවගේ රූ සපුව ද එසේ ම ය.
23 දමිටුන්ගේ මන දොළ හුදකේ යහපත සඳහා වේ;
q2 23 දුදනන්ගේ පැතුමනේ කිසි වැඩක් නැත.
24 කනෙකේ අත මිට දිගහැර දතෙත් පොහොසත් වති;

q2 24 තව කනෙකේ දැඩි මසුරුකමින් දතෙත් දිළිඳු
වතේ.
25 ත්‍යාගශීලී වන්න, එවිට ඔබ පරොහරොසතකේ
වන්නහෙි ය;
q2 25 අන්‍යයන්ට ආධාර කරන්න, අන්‍යයෝ ඔබට
ආධාර කරති.
26 අනුන්ට නොදී ධාන්‍ය රැස් කරන්නාට සනෙඟ
සාප කරනු ඇත;
q2 26 එහතේ එය විකුණන්නා හට ආසිරි ලැබනෙු
ඇත.
27 යහපත ගැන වීර්ය කරන්නා කරුණාව ලබයි;
q2 27 එහතේ නපුර සයොන්නා නපුර ම ලබයි.
28 වස්තුව කරෙේ විශ්වාසය තබන්නා වියළි
කොළයක් මනේ වැටයි;
q2 28 එහතේ ධර්මිෂ්ඨයා අමු කොළයක් මනේ
සශ්‍රීක වයේ.
29 සිය පවුල අවුල් කරන්නාට හුළං බොන්න වයේ;
q2 29 මෝඩයා පැණවතා හට වහලකෙු වනු ඇත.
30 ධර්මිෂ්ඨයා ජීවන වෘක්ෂයක් මනේ පල දරයි;
q2 30 එහතේ සැහැසි අයට එය නැති වී යයි.
31 1 පේදු 4:18 බලන්න, ධර්මිෂ්ඨයා මලොලොව දී
හොඳ ප්‍රතිඵල ලබයි;
q2 31 ඊට කොතරම් වැඩියනේ දුෂ්ටයා හා පාපිෂ්ඨයා
දුර්විපාක නොලබත් ද?

12 අවවාදය පිළිගන්නා දැනුමට පමේ
කරන්නකේ;
q2
12 එහතේ තරවටුව නොඉවසන්නා මෝඩයකේ.
2 සත්පුරුෂයා සමිඳුන්ගනේ ප්‍රසාදය ලබයි;
q2 2 එහතේ දුෂ්ට උපා යොදන්නා එතුමාණෝ වරදට
පත් කරන සේක.
3 දුෂ්ටකමින් මිනිසකෙුට ස්ථිර ජීවිතයක් නැත;
q2 3 එහතේ දැහැමියාගේ ගුණ කිසිදා මුලින්
උදුරාදැමිය නොහැකි ය.
4 ගුණසම්පන්න වනිතාව ඇගේ ස්වාමි පුරුෂයාට
කිරුළකි;
q2 4 එහතේ ඔහුට අවමන් ගනෙ දනෙ කාන්තාව
ඔහුගේ ඇටකටුවලට පිළිකාවකි.
5 දැහැමියන්ගේ අදහස් යුක්ති සහගත ය;
q2 5 දුෂ්ටයන්ගේ කුමන්ත්‍රණ වංචනික ය.
6 දුෂ්ටයන්ගේ වචන මරණ උගුලකි;
q2 6 එහතේ අවංක අයගේ බස් ගැළවීමකි.
7 දුෂ්ටයෝ වැටී නැත්තට ම නැති වතේ;
q2 7 එහතේ දැහැමියන්ගේ පරපුර සදහට ම පවතියි.
8 මිනිසකෙුගේ ප්‍රඥාවේ තරමට ඔහු කීර්තිය
ලබයි;
q2 8 එහතේ වංක සිත අපකීර්තියට ලක් වයේ.
9 පුහු මානය සයොමින් කුසගින්නනේ පළෙීමට වඩා
චාම් ගතියනේ ජීවිකාව ගනෙ යෑම යහෙකේ.
10 දැහැමි අය සිය තිරිසන් සතුන්ගේ ප්‍රාණය ගැන
සලකති;
q2 10 අදමිටු අය උන්ට ක්‍රෑරතර ය.
11 වැර වීරියනේ වගා කරන්නාට බතබුලත බහුල
ය;
q2 11 නිෂ්ඵල ව්‍යාපාරවල යදෙනේනා මෝඩයකේ.
12 දුෂ්ටයාගේ බලකොටුව මැටි පවුරක් මනේ බිඳ
වැටයි;
q2 12 එහතේ දැහැමියන්ගේ පදනම් සදහට ම
පවතියි.
13 දුෂ්ටයාගේ මුසා බස් ඔහුට ම මලපතක් වයේ;
q2 13 එහතේ ධර්මිෂ්ඨයා විපතනේ ජය ගනියි.
14 එක් මිනිසකේ සිය වදනින් සඵලවත් වයේ;
q2 14 තව මිනිසකේ තම ශ්‍රමයනේ ප්‍රතිඵල
ලබාගනියි.
15 අනුවණයා තමා හරි යයි සැම විට ම සිතාගනියි;
q2 15 නුවණැත්තා ඔවා බසට සවන් දයේ.
16 මෝඩයා සිය කෝපය වහා පනේවයි;
q2 16 බුද්ධිමතා අපහාසය නොතකා හරියි.
17 ඇත්ත කියන්නා සත්‍යය දක්වයි;
q2 17 බොරු සාක්ෂිකරු වංචාව ද දක්වයි.
18 කේලාම් බස් කඩුපතක් මනේ තුවාළ කරයි;
q2 18 නැණවතාගේ බස් සුව සතෙ ගනෙ දයේ.
19 ඇත්ත කියන කට සදහට ම ස්ථිර ව ඇත;
q2 19 බොරු කියන දිව එක මොහොතකට පමණි.
20 නපුරට මාන බලන්නාගේ සිතහෙි වංචාව ඇත;
q2 20 සාම සම්මන්ත්‍රණ කරන්නන්ට ප්‍රීතිය ඇත.
21 දැහැමි අයට කිසිදු අනතුරක් සිදු නොවේ ම ය;
q2 21 දුෂ්ටයන්ට සතර දිගින් විපත ගලා එයි.
22 බොරුකාර තොල් සමිඳුන් හට පිළිකුලකි;
q2 22 අවංක අය සමිඳුන් හට ප්‍රියමනාප ය.
23 බුද්ධිමතා තම දැනුම ගැන පුරසාරම්
නොදොඩයි;
q2 23 අනුවණයෝ තම අනුවණකම් පතුරුවා හරිති.
24 කාර්යක්ෂම අත රට පාලනය කරයි;
q2 24 අලසයෝ වහල් සේවයට යට වතේ.
25 සිත්තැවුල මිනිස් සිතට පීඩා කරයි;
q2 25 කාරුණික වචනය සිතට ප්‍රීතිය දයේ.
26 ධර්මිෂ්ඨයා සිය අසල්වැසියා හට මඟපනේවයි;
q2 26 දුෂ්ටයන්ගේ මාර්ගය ඔවුන් මුළා කරයි.
27 අලසයා දඩයමේ ගියත් කෑමට මස් නොලබයි;
q2 27 එහතේ කඩිසර මිනිසා සාර අස්වැන්නක් ලබයි.
28 දැහැමි මාවතහෙි ජීවනය ඇත;
q2 28 අදමිටු මඟහෙි මරණය ඇත.

13 පැණවත් පුතා පියාගේ අවවාදයට සවන්
දයේ;
q2
13 උඩඟු මිනිසා තරවටුව නොසලකයි.
2 සුදනෝ සිය වදනින් යසඉසුරු වළඳති;
q2 2 කපටියෝ අපරාධය ම සොයා යති.
3 දිව රැකගන්නා දිවි රැකගනියි;
q2 3 දොඩමළුවා විනාශයට පැමිණයේ.
4 අලස අය ආසා වුවත් කිසිත් නොලබති;
q2 4 ක්‍රියාශීලී අය සව් සැපත ම භුක්ති විඳිති.
5 දැහැමියා මුසාවාද පිළිකුල් කරයි;
q2 5 දුදන බස තුච්ඡ ය, වංචනික ය.
6 දැමිටුකම සුදනන්ට ආරක්ෂාව දයේ;
q2 6 අදමිටුකම දුදනන් ප්‍රපාතයට හළෙයි.

7 පොහොසත් යයි පෙනේවතත් ඇතැමෙක් දුප්පත්
ය;
q27 දුප්පත් යයි පෙනේවතත් ඇතැමෙක් පොහොසත්
ය.
8 ධනවතා සිය ධනය ගවො දිවි බේරොගත යුතුයි;
q28 දිළිඳාට එවැනි තර්ජනයක් නැත.
9 දමිටුන්ගේ එළිය දීප්තිමත් ව බබළයි;
q29 එහතේ අදමිටුන්ගේ පහන නිවීගනෙ යයි.
10 උඩඟුකම වාද විවාද ඇති කරයි;
q210 ඔවා බස් පිළිගන්නන් වතෙ ප්‍රඥාව ඇත.
11 නිරායාසයනේ ලබන සම්පත වහා නැති වී යයි;
q211 වැර වීරියනේ ලබන වස්තුව තව තව වැඩී
වයෙි.
12 පැතූ දයෙ පමා වීමනේ සිත කලකිරයෙි;
q212 පැතුම ඉටු වීම ජීවන වෘක්ෂයකි.
13 ඔවා බස් නොතෙකීම කරදරයට පාර කැපීමකි;
q213 ඔවා බස් තැකීම වාසනාව ගනෙ එයි.
14 පැණවතාගේ උපදසේ ජීවන උල්පතකි;
q214 එය මරණයේ මලපත්වලින් ඔබ මුදයි.
15 හොඳ නැණනුවණ නිසා කරුණාව ලැබයෙි;
q215 ද්‍රෝහීන්ගේ මාර්ගය විනාශය බලා යයි.
16 බුද්ධිමතා හිතාමතා ක්‍රියා කරයි;
q216 අඥානයා සිය අනුවණකම ගැන පාරට්ටු කරයි.
17 අදක්ෂ නියෝජිතයා නිසා රට කරදරයට
පත්වයෙි;
q217 එහතේ විශ්වාසී තානාපතියා දියුණුව ගනෙ
දයෙි.
18 අවවාද නොපිළිගන්නා හට දිළිඳුකම හා නින්දාව
ඇත;
q218 උපදසේ පිළිගන්නා හට ගෞරවය ඇත.
19 මන දොළ සපුරාගැන්ම මිනිසාට සුමිහිරි ය.
q219 නපුරනේ ඈත් වීම අනුවණයන්ට අමිහිරි ය.
20 නැණවතුන් ඇසුරු කරන්න, ඔබත් නැණවත් වනු
ඇත;
q220 අනුවණයන් ඇසුරු කරන්න, ඔබ විනාශ වනු
ඇත.
21 විපත පව්ටුන් ලුහුබැඳ එයි;
q221 සැපත දමිටුන්ගේ විපාකය වයෙි.
22 සුදනන්ගේ වස්තුව සිය පරපුරට උරුම වයෙි:
q222 දුදනන්ගේ වස්තුව සුදනන්ට හිමි වයෙි.
23 වගා නොකළ කතේවල දිළිඳුන්ට කෑම තිබිය
හැකි ය,
q223 එහතේ අයුක්තිය නිසා ඒවා පවා රුස්
කරගැනීමට ඉඩක් නැත.
24 වේවැල නොගන්න පියා පුතාට සතුරකේ;
q224 වේවැල ගන්න පියා පුතාට මිතුරකේ.
25 දමිටු අයට කෑම හිඟයක් නැත;
q225 අදමිටු අයට කවදත් කුසගිනි ඇත.

14 නැණවත් වනිතාව සිය පවුල ගොඩනඟන්නී
ය;
q2
14 අනුවණ වනිතාව සිය අතින් ම එය බිඳදමන්නී
ය.
2 අවංක මිනිසා සමිඳුන් කරෙහෙි ගරුබිය ඇත්තකේ;
q22 වංක මිනිසා එතුමන් හළෝ දකියි.
3 මෝඩයාගේ දොඩමළු කතා තමාට ම පහර දනෙ
ඉපලකි;
q23 ප්‍රාඥයාගේ කියුම් ඔහුට රැකවරණය දනේනකි.
4 ගවයන් නැති විට අටුකොටු හිස් ව ඇත;
q24 ගවයන් ඇති විට අටුකොටු පිරී ඇත.
5 විශ්වාසී සාක්ෂිකරු බොරු නොකියයි:
q25 බොරු සාක්ෂිකරුවකේ බොරුව ම කියයි.
6 උඩඟු මිනිසා ප්‍රඥාව සොයතත්, එය නොලබයි;
q26 බුද්ධිමතා පහසුවනේ ම දැනුම ලබයි.
7 අඥානයා කරෙනේ ඈත් වන්න;
q27 ඔහුට කලඳක් වත් දැනුම නැති බව ඔබට
පනෙේ.
8 නැණනුවණ ඇති අය ජීවන මඟ තේරුම්ගනිති;
q28 අනුවණ අය සිය මෝඩකමින් මංමුළා වති.
9 අනුවණයාට පාපය සලේලමකි;
q29 අවංක අයට පාප කමාව අවශ්‍ය දයෙකි.
10 ඔබේ දුක සැප දන්නේ ඔබ ම ය;
q210 අන් කනෙකුෙට එය ඔබ සමඟ විඳිය නොහැකි
ය.
11 දුෂ්ටයන්ගේ නිවසෙ විනාශ වනු ඇත;
q211 අවංක අයගේ නිවසෙ පවතිනු ඇත.
12 හිතෝ 16:25 මිනිසකුෙට හරි යයි පනෙනෙ මඟ
අවසානයේ දී මරණය විය හැක.
13 සිනාවේ පවා සිත් තැවුලක් විය හැක;
q213 ප්‍රීතියේ කළෙවර ශෝකය විය හැක.
14 දුදනා සිය ක්‍රියාවල විපාකය ලබයි;
q214 සුදනා තම ක්‍රියාවල ප්‍රතිඵල ලබයි.
15 නුගතා තමාට ඇසනෙ සැම දයෙ ම විශ්වාස
කරයි;
q215 උගතා තම පියවර හොඳින් විමසා බලයි.
16 ප්‍රඥාවන්තයා නපුරට බිය වී ඉන් ප්‍රවේසම්
වයෙි;
q216 අඥානයා උඩඟු වී දුර දිග නොබලා, ක්‍රියා
කරයි.
17 වහා කිපනේනා අනුවණ ලසෙ ක්‍රියා කරයි.
q217 එහතේ නුවණැතියා ශාන්ත ව සිටියි.
18 අනුවණයන්ට මෝඩකමේ පල විපාක උරුම
වයෙි;
q218 එහතේ නුවණැත්තෝ දැනුම නමැති කිරුළ
පැළඳගනිති.
19 නපුරෝ යහපතුන් අබිමුව වැඳ වැටති;
q219 දුදනෝ දැහැමියන්ගේ දොරටු ළඟ වැඳ
වැටති.
20 දිළින්දාට කිසි ම හිතවතකේ නැත;
q220 පොහොසතාට නම් බොහෝ මිතුරෝ ඇත.
21 කනෙකුෙ හළෝ දැකීම පාපයකි;
q221 දිළිඳුන්ට අනුකම්පා කිරීම වාසනාවකි.
22 නපුරු උපා යොදන්නා බරපතල වරදක් කරයි;
q222 යහපත කරන්නා කරුණාව ද විශ්වාසය ද
ලබයි.
23 වැඩක යදෙුණොත් ජීවිකාව ලැබේ;
q223 කතාවට ම වැටුණොත් දිළිඳුකම ලැබේ.

24 නැණවතුන්ගේ කිරුළ ඔවුන්ගේ නැණනුවණ
වේ;
q2 24 අඥානයන්ගේ ඔටුන්න ඔවුන්ගේ අනුවණකම
වේ.
25 සැබෑ සාක්ෂිකරු ජීවිත ගළවයි;
q2 25 බොරු සාක්ෂිකරු ජීවිත පාවා දෙයි.
26 දේව ගරුබිය ඇත්තා හට ආත්ම විශ්වාසය ඇත;
q2 26 ඔහුගේ දූ දරුවන්ට ආරක්ෂාව ද ඇත.
27 දේව ගරුබිය ජීවන උල්පතකි;
q2 27 එයින් නුඹ මාරක මලපතින් මිදනේනහෙි ය.
28 රජුගේ මහේශාක්යය රඳා ඇත්තේ සෙනඟගේ
සංඛ්යාව පිට ය;
q2 28 සෙනඟ අඩුකම ඔහුට මදිකමකි.
29 කෝපයට පමා වන්නා ඉතා නුවණැති කෙනෙකේ;
q2 29 වහා කිපනේනා සිය මෝඩකම විදහා පාන්නේ
ය.
30 නිසල් සිත, ගතට සුවය දෙයි;
q2 30 ඊර්ෂ්යාව, ඇටකටුවලට පිළිකාවකි.
31 දිළිඳාට පීඩා කරන්නා සිය මැවුම්කරු හට නින්දා
කරයි;
q2 31 දිළිඳාට කරුණාව දක්වන්නා එතුමන්ට ගරු
කරයි.
32 දුෂ්ටයා දුෂ්ට ක්රියාවලින් පිරිහයෙි;
q2 32 ධර්මිෂ්ඨයා සිය දැහැමිකමින් සුරුකයෙි.
33 නුවණැතියාගේ සිතහෙි ප්රඥාව පවතියි;
q2 33 අඥානයා ප්රඥාව ගැන කිසිත් නොදනියි.
34 ධර්මිෂ්ඨකම ජාතියක් උසස් කරයි;
q2 34 කවර ජාතියට වුව ද පාපය නින්දාවකි.
35 කාර්යක්ෂම නිලධාරීන් හට නිරිඳෝ ප්රසන්න
වෙති;
q2 35 යුතුකම් පැහැර හරින අයට ඔව්හු දඬුවම්
දෙති.
15 මුදු මොළොක් පිළිතුර කෝපය පහකරයි;
q2
15 රළු පරුස වදන තරහ අවුස්සයි.
2 පැණවතාගේ බස් දැනුම පතුරුවයි;
q2 2 අනුවණයාගේ මුවින් මෝඩකම ගලා යයි.
3 සමිඳාණෝ දිවැසින් මුළු ලොව නරඹන සේක,
සුදනන් හා දුදදන් පිරික්සා බලන සේක.
4 මුදු මොළොක් වදන් දිවි රුකක් වැනි ය, එහතේ
කටුක වදන් මිනිස් සිත තුවාළ කරයි.
5 මෝඩයා තම පියාගේ ඔවා බස් හෙළා දකියි.
q2 5 ඔහුගේ අවවාදය සලකන්නා නුවණැතියකේ.
6 සුදනන්ගේ නිවසහෙි සම්පත් බොහෝ ය;
q2 6 දුදනන්ගේ වස්තුව කරදර උපදවයි.
7 පැණවතුන්ගේ වචන දැනුම පතුරුවාලයි;
q2 7 අඥානයන්ගේ වචනවලින් එවැන්නක් සිදු
නොවෙයි.
8 දුදනන්ගේ පුද පූජා සමිඳුන්ට පිළිකුලකි;
q2 8 සුදනන්ගේ යැදුම් එතුමන්ට සතුටකි.
9 දුදනන්ගේ ක්රියා කලාපය සමිඳුන්ට පිළිකුලකි;
q2 9 යහ මඟ යන අයට එතුමාණෝ පමේ කරන
සේක.
10 යහ මඟ හැර යන අයට තද දඬුවම් ඇත;
q2 10 අවවාදය නුරුස්සන අය නසිනු ඇත.
11 පාතාලය හා අපාය වුව ද සමිඳුන්ගේ බැල්මනේ
සැඟවී නැත;
q2 11 එසේ නම් මිනිස් හදවත එතුමන්ගේ බැල්මනේ
සැඟවිය හැකි ද?
12 උඩඟු මිනිසා අවවාදය නුරුස්සයි;
q2 12 ඔහු පැණවතුන්ගේ අදහස් නොවිමසයි.
13 සතුටු සිත මුහුණ එළිය කරයි;
q2 13 සෝ දුක සිත දෙදරවයි.
14 නැණැතියෝ දැනුම සොයා යති;
q2 14 අනුවණයෝ මෝඩකමින් තෘප්තියට පත් වෙති.
15 පීඩිතයන්ට හැම දවස ම අසුබ දිනයකි;
q2 15 සතුටු සිත ඇති අයට හැමදා ම මඟුල්
උළලෙකි.
16 කරදර සහිත විපුල සැප සම්පතට වඩා, සමිඳුන්
කෙරේ ගරුබිය ඇති ව හිඟකම හොඳ ය.
17 වෛරය ඇති ව රස මස'වුළු බුදීමට වඩා,
සෙනෙහෙස ඇති ව ලුණු කැඳ බීම හොඳ ය.
18 වහා කිපෙන සුලු මිනිසා කලහ උපදවයි;
q2 18 ඉවසිලිවන්තයා කලහ සංසිඳුවයි.
19 අලසයාට පාර කටු මාවතකි;
q2 19 අවංක අයට එය රජ මාවතකි.
20 නැණවත් පුතා පියා ප්රීතියනේ පිනවයි;
q2 20 එහතේ අනුවණයා මව හෙළා දකියි;
21 අනුවණයා හට මෝඩකම ප්රීතියකි;
q2 21 එහතේ නැණවතා කෙළින් ඉදිරියට ම යයි.
22 උවදෙසේ නැති ව හදන සැලැස්ම නිසරු වයෙි;
q2 22 බොහෝ උවදෙසේ ඇති විට එය සරු වයෙි.
23 සුදුසු පිළිතුරක් දීම මිනිසකුට ප්රීතියකි;
q2 23 තැනට ඔබින වචනය පැවසීම ඊටත් වඩා
ප්රීතියකි.
24 නැණවතා පාතාලය දෙසෙ පහළට නොව, ජීවනය
දෙසෙ ඉහළට ගමන් කරයි.
25 සමිඳාණෝ උඩඟු වූවන්ගේ ගේදොර වනසන
සේක;
q2 25 වැන්දඹුවගේ ගවෙතු සීමා ආරක්ෂා කරන
සේක.
26 දුදනන්ගේ අදහස් සමිඳුන් හට පිළිකුලකි;
q2 26 පිවිතුරු සිත් ඇති අයගේ වචන එතුමන්ට
ප්රීතියකේ.
27 ධන ලෝභී මිනිසා සිය පවුලට කරදර ගනෙ
දෙයි;
q2 27 අල්ලස් නුරුස්සන මිනිසා දිගායු වළඳයි.
28 දැහැමියා පිළිතුරක් දීමට පෙර සිතා බලයි;
q2 28 නොදැහැමියා වහා පිළිතුරු දෙයි;
q2 28 එයින් කරදර ගොඩක් ඇති වයෙි.
29 සමිඳාණෝ දුදනන් වෙතින් ඈත් ව සිටින සේක;
q2 29 එහතේ සුදනන්ගේ යැදුමට සවන් දෙන සේක.
30 සිනහා මුහුණ මන පිනවයි;
q2 30 සුබ පුවත් ඇඟපතට සුව සැප දෙයි.
31 යහපත් අවවාදයට කන් දෙන තැනැත්තේ,
නැණවතුන් අතර නැණවතකේ.
32 අවවාද එපා කරන මිනිසා තමාට ම සතුරකේ
වයෙි.

q2[32] උවදෙස් අසන්නා වැඩි වැඩියෙනේ නැණනුවණ
ලබයි.
33 දේව ගරුබිය ප්‍රඥාවේ පාසලකි;
q2[33] යටහත්පහත්කම ගරු බුහුමන් ලැබීමට මඟකි.
16 සිතුවිලි සැලැස්ම මිනිසා සතු ය;
q2
අවසන් තීරණය සමිඳුන් වතෙ ය.
2 තම ක්‍රියාවලිය හරි යයි මිනිසා සිතයි;
q2[2] එහතේ සමිඳාණෝ ඔහුගේ ඇතුළාන්තය
විමසන සේක.
3 ඔබේ ක්‍රියාවලිය සමිඳුන් හට කැප කරන්න;
q2[3] එවිට ඔබේ අරමුණු ඉටු වනු ඇත.
4 සමිඳුන් මැවූ හැම දයෙට ම ඉරණමක් ඇත;
q2[4] දුදනන්ගේ ඉරණම විනාශය වේ.
5 උඩඟු සිත් ඇති අය සමිඳුන්ට පිළිකුලකි.
q2[5] ඔවුන්ට දඬුවම සිකුරු ය.
6 දවේිඳුන් කරෙේ පක්ෂපාත ව විශ්වාසී ව සිටින්න;
q2[6] දවේතුම ඔබේ පව් කමා කරනු ඇත.
q2[6] සමිඳුන් කරෙේ ගරුබිය දක්වන්න, කිසි නපුරක්
ඔබට නාවෙනු ඇත.
7 මිනිසකුගේ කල්ක්‍රියාවලට සමිඳුන් සතුටු වන
විට, ඔහුගේ සතුරෝ වුවද මිතුරන් වනු ඇත.
8 වංකකමින් ලබන සැප සම්පත් රාශියට වඩා
අවංකකමින් උපයන අල්පයක් වුව ද යහපත.
9 මිනිසා සැලැස්ම සාදයි, සමිඳාණෝ ඔහුගේ ගමන
හසුරුවන සේක.
10 රජ තමෙ දවේ අනුහසින් කතා කරයි.
q2[10] එබැවින් ඔහුගේ තීරණ නිවැරදි ය.
11 තුලා සහ තරාදි හරි ව තිබීම දවේ තුමන්ගේ
කැමැත්ත ය, හරි පඩි භාවිතය එතුමන්ගේ අදහස
ය.
12 පව්කම් නිරිඳුන්ට පිළිකුලකි, සිහසුන රඳන්නේ
දැහැමිකම මත ය.
13 අවංක කතාබහ රාජ ප්‍රසාදය දිනයි;
q2[13] ඇත්ත පවසන අයට රජවරු ප්‍රසන්න ය.
14 රජුගේ උදහස මාර දූතයකු වැන්න, නැණවතා
ඒ උදහස සංසිඳුවයි.
15 රජුගේ මුහුණේ බැබළනෙ එළියහෙි ජීවනය
ඇත;
q2[15] රාජ ප්‍රසාදය වසන්තයේ වැහි වලාකුළක්
වැන්න.
16 රනට වඩා පැණ ද රිදියට වඩා නැණ ද
ප්‍රසන්න ය.
17 නපුරනේ වැළකීම අවංක අයගේ රාජ මාවත ය;
q2[17] ඔබේ ක්‍රියා මාර්ග ගැන ප්‍රවේසම් වී දිවි
රැකගන්න.
18 විපතට පරෙටුවනේ අහංකාරය ද වැටීමට
පරෙටුවනේ උඩඟුව ද යයි.
19 උඩඟු අය සමඟ කොල්ලය බදොගැනීමට වඩා,
යටහත් සිතින් දිළිඳුන් ඇසුරු කිරීම යහපත.
20 දවේ වදන් සලකන අයට සව් සැපත ද සමිඳුන්
අදහන අයට වාසනාව ද ඇත.
21 සිතහෙි ප්‍රඥාව ඇත්තා නැණවතකේ;
q2[21] සිය මියුරු බසින් අන් අය නම්මා ගනියි.
22 නුවණැත්තාගේ ප්‍රඥාව ඔහුට ජීවන උල්පතකි.
q2[22] එහතේ අනුවණයාට ඉගැන්වීමනේ වැඩක් නැත.
23 නැණවතා කතාවට පරෙ සිතා බලයි;
q2[23] ඔහු පවසන දයෙින් දැනුම දියුණු වයෙි.
24 ප්‍රිය වදන මී වදය මනේ කටට රස ය, ඇඟට
ගුණ ය,
25 හිතෝ 14:12 මිනිසකුෙට හරි යයි පනෙනෙ මඟ
වුව ද, මරණයනේ අවසන් විය හැකි ය.
26 සාගින්න කම්කරුවා වැඩට යවයි;
q2[26] සාගින්න නිවාගැනීම ඔහුගේ අරමුණ වයෙි.
27 දුදනා නපුරු කටකතා පතුරුවයි:
q2[27] ඔහුගේ දිව, දැවනෙ ගින්නකි.
28 කලහකාරී අය වාද භේද පතුරුවති;
q2[28] කේළාම් කියන්නෝ මිතුරුදම් බිඳලති.
29 දාමරිකයෝ මිතුරන් මුළා කරති;
q2[29] ඔවුන්ගේ විනාශයට මඟ පාදති.
30 දතෙොල තද කරගන්නා විපත ගනෙ දයෙි;
q2[30] ඇස් කොණකින් ඉඟි කරන්නා නපුර සිතයි.
31 පැසුණු හිස තදෙ කිරුළකි, එය ලැබනේනේ
දැහැමි ජීවිතයකිනි.
32 ඉවසීම, බලතලවලට වඩා ප්‍රශස්ත ය;
q2[32] ආත්මදමනය, නුවරක් යටත් කරගැනීමට වඩා
අගනේ ය.
33 තීරණයක් ගැනීමට පස ඇට දමනු ලැබේ;
q2[33] තීරණය දනේනේ සමිඳාණෝ ය.
17 අඬදබර ඇති ගදෙරක මංගල භෝජන
වැළඳීමට වඩා සාමදානයනේ වියළි පාන්
කැල්ලක් කෑම හොඳ ය.
2 නාස්තිකාර පුතකු සිටින තැන සිහි නුවණ ඇති
දාසයා පාලකයා වයෙි.
q2[2] සහොහොයුරන් අතර උරුමයනේ කොටසක් ද
ඔහු ලබයි.
3 රිදී සෝදිසි කර බැලීමට කෝවය ද රන් සෝදිසි
කර බැලීමට උදුන ද ඇත;
q2[3] මිනිස් සිත සෝදිසි කර බැලීම සමිඳුන් අතේ ය.
4 නපුරා නපුරු කතාවලට කන් දයෙි;
q2[4] බොරුකාරයා බොරු වදනට සවන් දයෙි.
5 දිළිඳාට උසුළු-විසුළු කිරීම මැවුම්කාර දවේිඳුට
අවමන් කිරීමකි.
q2[5] අනුන්ගේ දුක් විපත් ගැන ප්‍රීති වනේනාට
දඬුවම සිකුරු ය.
6 මහලු වියේ ඔටුන්න නම් දරුවන්ගේ දරුවෝ ය.
q2[6] දරුවන්ගේ පාරට්ටුව නම් ඔවුන්ගේ පියවරු ය.
7 හරබර කතාව මෝඩයකුට නොගැළපයෙි;
q2[7] හොරබොරු කතාව උතුමකුට ඊටත් වඩා
නොගැළපයෙි.
8 සමහරු අල්ලස සිතුමිණකැ යි සිතති;
q2[8] හැරනෙ හැරනෙ අතට ඔහුට වාසනාව ඇතැ යි
කල්පනා කරති.
9 අනුන් කළ වරද සිතට නොගන්නා මිතුදම දියුණු
කරයි;
q2[9] එය මතු කර කර බලන්නා මිතුදම බිඳදමයි.
10 අනුවණයාට පහර සියයකට වඩා, නුවණැතියාට
එක අවවාදයක් වැඩදායක වයෙි.

11 නපුරාගේ එක ම අරමුණ කැරලි ගැසීම ය;
q2[11] එබැවින් ඔහු වෙත නපුරු දූතයකු එනු නියත
ය.
12 මෝඩ දයෙක් කරන මෝඩයකු හමු වීමට වඩා,
පැටවුන් නැති වුණු වැලහින්නකට මුහුණ පෑම
යහපත.
13 කළ හොඳට නරකක් කරන මිනිසාගේ නිවසින්
විපත පහ ව යන දවසක් එන්නේ ම නැත.
14 නඩුහබ පටන්ගැනීම අමුණක් බිඳීම වැනි ය;
q2[14] වාද විවාද හටගන්න පෙර ඒවා වැළැක්වීම
හොඳ ය.
15 දුදනන් නිදොස් කරන මිනිසා ද සුදනන් සදොස්
කරන මිනිසා ද සමිඳුන්ට එක සේ පිළිකුලකි.
16 දැනුම් තේරුම් නැති මෝඩයකුට අධ්‍යාපනය
සඳහා වියදම් කිරීමෙන් වැඩක් ඇද් ද?
17 මිතුරුතුමෝ දුක් සැප දකෙහි ම මිතුරෝ ය;
q2[17] සහෝදරයන් සිටින්නේ විපතේ දී අත දීමට
ය.
18 අසල්වැසියාගේ ණයතුරුස්වලට මැදි වී
අත්තිකාරමක් දෙන්නා සිහි නුවණ නැති මිනිසෙකි.
19 දබරයට ප්‍රිය කරන්නා පාපයට ප්‍රිය කරයි;
q2[19] නිතර පුරසාරම් දොඩන්නා කරදරයට දොර
අරියි.
20 වංක සිතට සැපසම්පත් නැත, කපටි අයට දුක්
විපත් ඇත.
21 අනුවණ පුතාගේ පියාට සෝදුක ඇත, මෝඩ
පුතාගේ පියාට ප්‍රීතියක් නැත.
22 සතුටු සිත මහා ඖෂධයකි;
q2[22] බිඳුණු සිතකින් ඇඟපත වැහැරී යයි.
23 දූෂිත විනිසකරුවෝ රහස් අල්ලස් ගනිති;
q2[23] ඉන් යුක්තිය අයුක්තියට පෙරළති.
24 දැනුම්තේරුම් ඇති මිනිසාගේ ඉලක්කය ප්‍රඥාව
ය;
q2[24] එහෙත් මෝඩයා ඉලක්කයක් නැති ව
ඉබාගාතේ යන්නේ ය.
25 අනුවණ පුතා සිය පියා හට ශෝකයකි, වැදූ
මවට දුකකි.
26 දැහැමි අයට දඬ ගැසීම නුසුදුසු ය;
q2[26] උතුමන් හට පහර දීම ඉතා ම නුසුදුසු ය.
27 දිව දමනය කරන්නාට ප්‍රඥාව ඇත;
q2[27] තැන්පත් සිතක් ඇති අයට වැටහීම ඇත.
28 මෝඩයා පවා නිහඬ ව සිටින විට නැණවතකු
මෙන් සැලකේ;
q2[28] කට පියාගෙන සිටින විට බුද්ධිමතකු මෙන්
ගණන් ගැනේ.

18 හුදකලාව වසන මිනිසා තම මතය ම
අනුගමනය කරයි;
q2
18 කවර උවදෙසකට වුව ද කිපයේ.
2 අනුවණයා යමක් තේරුම්ගැනීමට
කැමැත්තක් නොදක්වයි;
q2[2] ඔහුගේ එක ම කැමැත්ත තම පණ්ඩිතකම
හුවා දැක්වීමයි.
3 දුෂ්ටකම ඇති තැන නින්දාව ඇත;
q2[3] ගෞරවය නැති තැන ලජ්ජාව ඇත.
4 මිනිසාගේ කියමන්, මහ සයුර මෙන් ගැඹුරු ය,
ගලා යන දොළක් වැනි ය, නොසිඳෙන උල්පතක්
වැනි ය.
5 විනිශ්චයේ දී, දුදනන්ට වාසිය සැලසීම ද
සුදනන්ගෙන් යුක්තිය පැහැරගැනීම ද හරි නැත.
6 මෝඩයාගේ කතාබහින් වාද විවාද ඇති වෙයි,
ඔහුගේ කට නිසා ගුටි බැට ලබයි.
7 අඥානයාගේ කට ඔහුගේ විනාශය වේ;
q2[7] ඔහුගේ ම වචන ඔහුට ම උගුලක් වේ.
8 කටකතා රසවත් අහරකි, එය ගිලගැනීමට
කවුරුත් කැමැති ය.
9 අලසයා හා නාස්තිකාරයා එක වල්ලේ පොල්
වැනි ය.
10 සමිඳුන්ගේ නාමය මහ බලකොටුවකි;
q2[10] දැහැමියෝ එහි දුව ගොස් සුරුකතෙති.
11 පොහොසතා, තම ධනසම්පත බලවත් නගරයක්
වටා දුවන උස් කොටු පවුරක් ලෙසෙ සිතයි.
12 විනාශයට පෙරටුවෙන් උඩඟුකම ඇත;
q2[12] ගෞරවයට පෙරටුවෙන් යටහත්කම ඇත.
13 පිළිතුරු දීමට පෙර සවන් දෙන්න;
q2[13] නැත්නම් ඔබ මෝඩ නින්දිත කෙනෙකු වනු
ඇත.
14 මිනිසකේ සිය ආත්ම ශක්තියෙන් ලෙඩ දුක්
උසුලයි;
q2[14] එය බිඳ වැටුණොත් කවරකුට එය ඉසිලිය
හැකි ද?
15 බුද්ධිමත් සිත දැනුම ලබාගනියි;
q2[15] නැණවතාගේ අවධානය ප්‍රඥාව දෙසට ය.
16 ඔබ දෙන ත්‍යාගය ඔබට අලුත් දොරවල් ඇර
දෙයි;
q2[16] ප්‍රභූවරයන් වෙත යාමට අවස්ථාව ද සලසයි.
17 උසාවියේ දී විත්තිය හරස් ප්‍රශ්න අසන තුරු
පැමිණිල්ල සාධාරණ යයි පෙනේ.
18 පස ඇට දැමීමෙන් උසාවියේ නඩුවක් විසඳිය
හැකි ය, බලවත් දෙගොල්ලක් අතර සාමය ඇති කළ
හැකි ය.
19 සහෝදරයාට අත දෙන සහෝදරයා
බලකොටුවක් වැනි ය;
q2[19] සහෝදරයා සමඟ දබර කළොත් ඔහු ඔබට
දොර වසනු ඇත.
20 මිනිසකු පවසන දේ ගැන වගකීම ඔහු ම
දැරිය යුතු ය.
q2[20] ඒ පිට ඔහුගේ ප්‍රගතිය රඳා ඇත.
21 ජීවිතය හා මරණය ඔබේ වචන මත රඳා ඇත;
q2[21] ඒවායේ ප්‍රතිවිපාක ඔබේ ම වගකීම ය.
22 බිරිඳක සොයා ගන්නා යහපතක් සොයා ගනී;
q2[22] දෙවිඳුන්ගෙන් ලත් ප්‍රසාදයකි.
23 දිළිඳා නම් බැගෑපත් ව අයැදියි;
q2[23] ධනවතා නම් රළු පිළිතුරක් දෙයි.
24 සමහර මිතුරෝ කලකට පමණ ය.
q2[24] සමහර මිතුරෝ සහෝදරයන්ටත් වඩා
හිතවත් ය.

19 අවංක ගතිගුණ ඇති දිළිඳා වංචා කතා
කියන මෝඩයාට වඩා උතුම් ය.
2 දැනුමනේ තොර උද්යෝගය හොඳ නැත, ඉක්මන්
වීමනේ කරදර ඇති වේ.
3 සමහරු මෝඩකමින් විපතට පත්වෙති;
q2 3 පසු ව සමිඳුන් හට දොස් තබති.
4 සම්පත් ඇති තැන මිතුරෝත් බහුල ය;
q2 4 දුප්පතාට ඇති මිතුරාත් නැති වී යයි.
5 බොරු සාක්කි කියන්නාට දඬුවම් නියත ය;
q2 5 මුසාවාද දසෙන්නාට නිදහස් වීමක් නැත.
6 බොහෝ දනෙ ලොකු ලොක්කන්ගේ හොඳ හිත
සොයති;
q2 6 නොමසුරු ව දනෙ මිනිසාට කාත් කවුරුත්
මිතුරෝ වති.
7 දිළිඳාගේ සියලු සොහොයුරෝ ඔහු අප්රිය කරති,
එසේ නම්, ඔහුගේ මිතුරෝ ඊටත් වැඩියනේ
ඔහුගනේ දුරු නොවදේ ද?
q2 7 ඔහු ඔවුන් පස්සේ දුවතත් ඔවුන්ට ළං විය
නොහැකි ය.
8 ප්රඥාව ලබාගන්නා අර්ථ සිද්ධිය සාදාගනියි;
q2 8 සිහි නුවණින් ක්රියා කරන්නා සෞභාග්යය
සලසාගනියි.
9 බොරු සාක්කිකරුට දඬුවම නියත ය;
q2 9 මුසාවාදය දසෙන්නාට විපත සිකුරු ය.
10 මෝඩයකුට නායකත්වය නොහොබී;
q2 10 අධිපතිකම් කිරීම වහලුන්ට කිසිසේත්
නොහොබී.
11 සිහිකල්පනාව ඇත්තා වහා නොකිපනෙ සුලු ය;
q2 11 අනුන්ගේ වරද නොතකා හැරීම උදාර ගුණයකි.
12 රජුගේ උදහස සිහ රදකුගේ ගර්ජනාව වැනි
ය, ඔහුගේ කරුණාව තණ මත පිනි බිඳු වැනි ය.
13 අනුවණ පුතා පියාගේ විනාශය වේ.
q2 13 බැණ වදින බිරිඳ නොනැවතී වහින වැස්සකි.
14 ගවෙතු හා වස්තුව පියාගනේ ලැබනෙ උරුමයකි;
q2 14 නුවණින් ක්රියා කරන බිරිඳ දවේ තුම දනෙ
දීමනාවකි.
15 කුසීතකම බර නින්දට පමුණුවයි.
q2 15 කම්මැලියා සාගින්නනේ පළෙයි.
16 දේව නීති පිළිපදින අයට දිගායු ඇත, ඒවා
මඟහරින අයට මරණය ඇත.
17 දිළිඳුන්ට දනේනා සමිඳුන්ට ණයට දයි, පසු ව
සමිඳාණෝ ඔහුට වැඩි වැඩියනුත් දනෙ සේක.
18 බාල වියේ දී ම පුතුට දඬුවම් දී හික්මවන්න,
එහතේ මැරනෙ තරම් ඔහුට නොතළන්න.
19 වහා කිපනෙ අය දඬුවම් විඳිනු ඇත;
q2 19 ඔබ ඔහු වරක් මිදුවත් නැවත නැවත එය
කිරීමට සිදු වේ.
20 අවවාදයට සවන් දී උපදසේ පිළිගන්න;
q2 20 එවිට ඔබ මතු දවස නැණවතකේ වන්නහේ ය.
21 මිනිසා සිතින් බොහෝ දේ අරමුණු කරයි;
q2 21 එහතේ ස්ථිරවන්නේ සමිඳුන්ගේ අරමුණ ය.
22 මිනිසකුගේ පැතුම විය යුත්තේ දයා කරුණාව
ය;
q2 22 දිළිඳුකම වංකකමට වඩා යහෙකි.
23 සමිඳුන්ට ගරුබිය, ජීවනයේ මඟ ය;
q2 23 ඒ මඟ යන මිනිසා විපතින් දුරු ව තෘප්තියට
පැමිණයි.
24 අලසයා බත් පිඟ ගන්න බඳුනට අත දමයි,
එහතේ එය කටට ගන්න පවා කම්මැළි ය.
25 උඩඟු මිනිසාට තළන්න, අනුවණයා නැණවත්
වන්නේ එවිට ය.
q2 25 තේරුම් ඇත්තාට ඔවා බස් දනේන, ඔහු දැනුම
ලබන්නේ එවිට ය.
26 පියාට ගරහන, මව ගදෙරින් පිටමං කරන පුතා,
හිරිඔතප් නැති, නින්දිත කනෙකි.
27 අවවාදයට සවන් නොදනෙ පුතා, ප්රඥාවේ
වචනයට පිටුපා යනු නියත ය.
28 නීච සාක්ෂිකරු යුක්තිය පරෙළයි;
q2 28 දුදන බස් වරදට රුකුල් දයි.
29 උඩඟු මිනිහාට දඬුවම සිකුරු ය;
q2 29 මෝඩයාට කස පහර නියත ය.
20 මද්යපානය කේලාම්කරුවකි;
q2
20 සුරාපානය කලහකරුවකි;
q2
20 බීමත්කමින් මුළාවනේනා මෝඩයකි.
2 රාජ කෝපය සිංහ රාජයකුගේ ගර්ජනාව
මනේ බියකරු ය;
q2 2 රජුන් කෝප කරන්නා සිය පණට හානියක්
පමුණුවාගනියි.
3 ඕනෑ ම මෝඩයකුට දබරයක් ඇරඹිය හැකි ය;
q2 3 ඉන් වැළකී සිටීම මිනිසකුට ගෞරවයකි.
4 නියම කන්නයේ දී වැපිරීමට අලස වන
ගොවියාට කපන කාලයේ දී අස්වැන්නක් නැත.
5 මිනිස් සිතේ අදහස් ගැඹුරු ළිඳක වතුර වැනි ය;
q2 5 නැණනුවණ ඇති අය එය ඇදගනිති.
6 සිය පක්ෂපාතකම ගැන පුරසාරම් දොඩන අය
බොහෝ ය,
q2 6 එහතේ සැබෑ විශ්වාසී කනෙකු සවේීම කළුනික
සවේීමකි.
7 සත්ගුණවත් අවංක පියකුගේ දරුවෝ
භාග්යවන්තයෝ ය.
8 සිහසුන් අරා නඩු අසන රජකේ සිය නැණැසින්
හරි වැරදි විසඳයි.
9 “මගේ සිත පිරිසිදු ය;
q2 9 මගේ පව් සේදී ඇතැ”යි කිය හැකි කනෙකේ
මොලොව ඇද් ද?
10 දයොකාර තරාදි ද දයොකාර කලන් පඩි ද ඇත.
q2 10 ඒවා සමිඳුන් හට පිළිකුලකි.
11 ළමයකුගේ ක්රියාවලින් ඔහුගේ චරිතය හළි
වේ, එයින් ඔහුගේ අවංකකම ද පිරිසිදුකම ද
දැනගත හැකි ය.
12 ඇසීමට කණ ද, බැලීමට ඇස ද යන දකෙ ම
මැවුයේ සමිඳාණෝ ය.
13 නින්දට ප්රිය වුවහොත් ඔබට දිළිඳුකම ඇත.
q2 13 නොනිදා අවදි ව සිටියොත් කුස පුරා කෑම
ඇත.

14 පාරිභෝගිකයා ගිනි ගණන් ගැන වළෙඳොට
දොස් නඟයි,
q2[14] එහෙත් එතැනින් ගිය විට තම වාසිය ගැන
කයිවාරු කියයි.
15 ලොවෙහි රන්මුතු කොතරම් ඇතත් නැණවත්
කියමන දුර්ලභ මැණිකකි.
16 අමුත්තකුට ඇප වන විට ඇපවන්නාගේ ඇඳුම
ගන්න;
q2[16] එය ඔහුගේ අත්තිකාරම මෙන් තබාගන්න.
17 සොරාගත් කෑම කටට රස ය, එහෙත් පසු ව
එය කටේ පස් මෙන් ය.
18 හොඳ අවවාද ඇති විට ඔබට සඵලය ඇත;
q2[18] සියුම් සැලසුම නැති ව රණබිමට නොයන්න.
19 වාචාලයා රහස් එළිදරව් කරයි;
q2[19] දොඩමලු අයගෙන් ඈත් වන්න.
20 පියාට හෝ මවට හෝ දොස් කියන අයගේ
ජීවිතය ගන'ඳුරේ නිවී යන පහනක් වැනි ය.
21 මුල දී වහා ගොඩනඟන සම්පතින් අන්තිමේ දී
වැඩි සෙතෙක් නැත.
22 නපුරට නපුර කරමි යි නොකියන්න, සමිඳුන්
කෙරේ විශ්වාසය තබන්න, එතුමාණෝ නුඹ සුරකින
සේක.
23 දයොකාර කලන් පඩි සමිඳුන්ට පිළිකුලකි, හොර
තරාදි සුදුසු නැත.
24 මිනිසකුගේ ගමන් මඟ සමිඳාණෝ මෙහෙයෙ
වන සේක, එසේ නම්, යමකුට තමා යන මඟ
තේරුම්ගත හැකි ද?
25 බාරයක් වන්නේ පරෙ සිතා බලන්න,
q2[25] බාර වීමෙන් පසු ළතැවීමෙන් පලක් නැත.
26 නැණවත් නිරිඳා වරදකරුවන් සොයා බලා, දයා
විරහිත ව දැඩි දඬුවම් දෙයි.
27 මිනිසාගේ හෘදයසාක්ෂිය සමිඳාණන් දැල්වූ
පහනකි;
q2[27] එයින් ඔහුගේ මුළු අභ්‍යන්තරය විනිවිද
පනෙයි.
28 කරුණාව හා අවංකකම රජුට ආරක්ෂාව සලසයි;
q2[28] දැහැමි බව ඔහුගේ සිහසුන තහවුරු කරවයි.
29 යෞවනයන්ගේ අලංකාරය ඔවුන්ගේ කාය
ශක්තිය වේ;
q2[29] වෘද්ධයන්ගේ ගෞරවය ඔවුන්ගේ පැසුණු හිස
වේ.
30 වැරදි මඟ හරි මඟ කරගැනීමට නම් ඇතැම් විට
දුක් බර අත්දැකීම් අවශ්‍ය වේ.

21 රජුගේ සිතුම්පැතුම් සමිඳුන්ගේ පාලනය
යටතේ ය, එතුමාණෝ ඒවා දිය පාරක් මෙන්
රිසි අතට හරවන සේක.
2 මිනිසකුට තමන් කරන කොයි දෙයෙත් හරි යයි
පනේ, එහෙත් සමිඳාණෝ මිනිස් හදවත කිරා
බලන සේක.
3 දැහැමිකම හා යුක්තිය ඉටු කරන්න, එය පුද
පඬුරුවලට වඩා සමිඳුන්ට ප්‍රසන්න ය.
4 උඩඟු බැල්ම ද අහංකාර සිත ද යන මේ පව්
දුදනන්ගේ චරිත ලක්ෂණ වේ.
5 හිතා මතා, ක්‍රියාශීලී ව වැඩ කරන මිනිසාට
සමෘද්ධිය නියත ය;
q2[5] ඉක්මන්කාර මිනිසාට දිළිඳුකම සිකුරු ය.
6 වංචාවෙන් පොහොසත් වන මිනිසාගේ වස්තුව
මීදුමක් මෙන් පහ ව යයි, ඔහු මරණයේ මලපත්වල
ද පැටලේ.
7 යුක්තිය කරන්න අකමැති නිසා දුෂ්ටයෝ
තමන්ගේ ම අපරාධවලින් වැනසෙති.
8 වරදකරුවන්ගේ මඟ ඇද ය;
q2[8] නිදොස් අයගේ ක්‍රියා කළෙින් ය.
9 කලහකාරී බිරිඳක සමඟ ගෙදර විසීමට වඩා
අටුවේ මුල්ලක විසීම හොඳ ය.
10 දුදනන්ගේ සිත නැමෙන්නේ නපුරට ම ය;
q2[10] ඔවුන්ගෙන් කිසිවකුට කරුණාවක් නැත.
11 උඩඟු මිනිසාට තළන්න, එවිට නූගතා ගුරුකම්
ලබයි.
q2[11] නැණවතාට ඔවා බස් දෙන්න, එවිට ඔහු
වැඩියනෙුත් දැනුම ලබයි.
12 දැහැමි දෙවිඳාණෝ දුදනන්ගේ පරපුර අවසන්
කරන සේක;
q2[12] දුදනන් විනාශ කර දමන සේක.
13 දිළිඳා මොරගසන කල, සවන් නොදෙන්නාගේ
කන්නලව්වට සවන් දෙන කෙනෙක් නැත.
14 රහසින් දෙන තිළිණය කෝපය සංසිඳුවයි;
q2[14] හොරෙන් දෙන අල්ලස කෝපාග්නිය නිවයි.
15 යුක්තිය ඉටු වන විට සුදනන්ට සතුට ද දුදනන්ට
විපත ද පැමිණේ.
16 ප්‍රඥා මාවතෙන් මුළා ව යන මිනිසා මළවුන්ගේ
ලෝකයෙහි වසයි.
17 සැප සල්ලෙලමට ඇලුම් වන්නා හිඟමනට බසියි;
q2[17] මත්පැනට හා සැප දිවියට ඇලුම් වන්නා කිසි
කලෙක පොහොසත් නොවෙයි.
18 දුදනන් සුදනන් හට දෙන වද දුදනන් පිටට ම
ආපසු පැමිණෙයි.
19 බැණ වදින, දබරකාරී බිරිඳක සමඟ විසීමට
වඩා මරු කතරක තනියම විසීම හොඳ ය.
20 නැණවතාගේ නිවසෙ සැපසම්පතින් පිරී ඇත.
q2[20] එහෙත් අනුවණයා නාස්තිකාරයෙකි.
21 දැහැමි, කාරුණික ජීවිතයක් ගත කරන්න;
q2[21] එවිට ඔබ ජීවනය ද යුක්තිය ද ගෞරවය ද
ලබන්නෙහි ය.
22 උපායෙහි දක්ෂ සෙනෙවියා අවි ගත් බළ
සෙබළුන් රකින නුවරකට නගියි.
q2[22] ඔවුන් විශ්වාසය තැබූ කොටු පවුරු බිඳ හෙළෙයි.
23 විපතට නොවැටී සුරැකි ව ඉන්න නම් කට
රැකගන්න.
24 ගර්විත උඩඟු මිනිසාගේ නම 'ගරහන්නා' යනුයි.
q2[24] ඔහු උද්ධච්ඡ ව අහංකාරයෙන් ක්‍රියා කරයි.
25 දෑත වෙහෙසා වැඩ නොකරන අලසයා ඔහුගේ
ම මරණයට මඟ පාදයි.
26 දවස පුරා ඔහු ආශා වන දෙය ඔහුට
ලැබෙන්නේ නැත;
q2[26] එහෙත් දැහැමි මිනිසා දෙයි, නොමසුරු ව ම
දෙයි.

27 දුදනන් පුදන යාග පූජා සමිඳුන්ට පිළිකුලකි,
වැරදි චේතනාවෙන් පුදන විට වැඩියෙනුත් පිළිකුලකි.
28 බොරු සාක්කිකරු වැනසී යයි;
q2 28 සාවධාන ව සවන් දෙන්නාගේ වදන් සුරැකී
පවතියි.
29 දුෂ්ටයා කපටි මුහුණක් පෙන්වයි;
q2 29 අවංක මිනිසා තමා යන මඟ ගැන
කල්පනාකාරී වෙයි.
30 ප්‍රඥාව, තීක්ෂණ ඥානය, අනුශාසනය,
සමිඳුන්ට විරුද්ධ නම්, මේවායින් වැඩක් නැත.
31 යුද බිමෙහි අශ්ව සේනාව සැරසී සිටියත්,
ජයශ්‍රීය එන්නේ සමිඳුන්ගෙනි.
22 ධන සම්භාරයට වඩා හොඳ නාමය ද රන්
රිදීවලට වඩා ගෞරවය ද අගනේ ය.
2 සමිඳුන් අබියස පොහොසතා හා දුප්පතා අතර
වෙනසක් නැත, සමිඳාණන් ඒ දෙදෙනා ම මැවූ බැවිනි.
3 නුවණැතියා විපත දුර තියා දැක අයින් වෙයි.
q2 3 එහෙත් අනුවණයා කෙළින් ම ඊට ගොදුරු වී දුක්
විඳියි.
4 යටහත්කම ද සමිඳුන් කෙරේ ගරුබිය ද ඇති
තැන, සම්පත, ගෞරවය හා දිගායු ඇත.
5 වංක අයගේ මාවතෙහි කටු පඳුරු හා මලපත්
ඇත;
q2 5 සිය දිවිය ගැන සලකන්නා ඒවායෙන් දුරු ව
සිටියි.
6 දරුවා බාල වියේ දී ම යහ මඟ යවන්න, එවිට
ඔහු මහලු වියේදීත් ඉන් ඉවත් ව නොයයි.
7 පොහොසත්තු දිළිඳුන් කෙරෙහි බල පාති;
q2 7 ණය ගන්නෝ ණය දෙන්නාට වහල් වෙති.
8 අයුක්තිය වපුරන්නා විපත්තිය කපා ගනියි.
q2 8 ඔහුගේ කටයුතුවල අවසානය විනාශය ය.
9 කුළුණු ගුණෙන් දිළිඳුන් හට කෑම දෙන අය සතේ
සිරි ලබනු ඇත.
10 අහංකාර මිනිසා දුරින් දුරු කරන්න;
q2 10 එවිට තරඟය, විවාද හා අවලාද නවතිනු ඇත.
11 සුමිහිරි බස රාජ ප්‍රසාදය දිනයි;
q2 11 එහෙත් සමිඳුන් කැමැති නිර්මල සිත් ඇති අයට
ය.
12 සමිඳාණෝ මුසාවාදීන්ගේ වදන්හි අසත්‍යය
පෙන්වන සේක;
q2 12 සත්‍යය රැකීමට කරුණු යොදන සේක.
13 “පිටත සිංහයෙක් සිටියි, වීදියට ගියොත් මා
මැරෙනු ඇතැ”යි අලසයා කියයි.
14 වෙසඟනකගේ කට ගැඹුරු වළක් වැන්න;
q2 14 සමිඳුන්ගේ කෝපයට පාත්‍රවන්නෝ ඒ වළේ
වැටෙති.
15 ළාමක වැඩ කිරීම ළමයින්ගේ සහජ ගතියකි.
q2 15 වේවැල භාවිතයෙන් එය දුරු කළ හැකි ය.
16 කෙනෙකේ දිළිඳුන් පෑළීමෙන් පොහොසත් වෙති.
q2 16 පොහොසතුන්ට තෑගිබෝග දීමෙන් කෙනෙකේ
දිළිඳු වෙති.

## ආප්තෝපදේශ තිහ

17 මාගේ උපදේශයන්ට සවන් දෙන්න;
q2 17 මාගේ අනුශාසනාවන්ට හිත යොමන්න.
18 ඒවා සිතෙහි නිදන් කරගන්න;
q2 18 කතාබහේ දී උපුටා දක්වන්න;
q2 18 එවිට ප්‍රීතිය ඔබ සතු වනු ඇත.
19 ඔබේ විශ්වාසය සමිඳුන් කෙරේ තබන්න;
q2 19 මා අද පවසන මේ ඔවා බස් ඒ සඳහා ය.
20 දැනුම හා නැණවත් උපදෙස් සහිත කියුම් තිහක්
මම මෙහි ලියා තබමි.
21 එසේ කර ඇත්තේ, ඔබ එවූ අය වෙත හරි
පිළිතුරක් ගෙන යන පිණිස ය.
q2 21 ඔබට සත්‍යය පිළිබඳ ඥානය දෙන අදහසිනි.

- 1 -

22 දිළිඳා දිළිඳු නිසා ඔහුගෙන් අයුතු වාසියක්
නොගන්න;
q2 22 අසරණයා අසරණ නිසා උසාවියේ දී ඔහුට පීඩා
නොකරන්න.
23 මන්ද, සමිඳුන් ඔවුන් වෙනුවෙන් පෙනී සිටිනු
ඇත.
q2 23 ඔවුන්ගෙන් පැහැරගන්න අයගෙන් පැහැරගනු
ඇත.

- 2 -

24 වහා කිපෙන අයකු සමඟ මිත්‍ර නොවන්න;
q2 24 කෝපයෙන් පුපුරන කෙනෙකු ඇසුරු
නොකරන්න.
25 එසේ කළොත් ඔබත් ඒ නරක ගතිවලට
ඇබ්බැහි වනු ඇත.
q2 25 ඔබ මලපතකට ද අසුවනු ඇත.

- 3 -

26 උකස් දෙන්නන්ගේ ගණනට එකතු නොවන්න;
q2 26 අන් කෙනෙකුගේ ණයතුරුස්වලට ඇප
නොවන්න.
27 ඇපය ගෙවීමට ඔබට නොහැකි වූවොත් ඔවුන්
ඔබේ නිදන යහන පවා ගෙන යන්නට බැරි නැත.

- 4 -

28 ඔබේ මුතුන්මිත්තන් පිහිටවූ පැරණි මායිම් ගල්
කිසි විටෙක වෙනස් නොකරන්න.

- 5 -

29 තම කටයුතු ගැන දස්කම් පාන මනුෂ්‍යයෙක් සිටී
නම්, ඔහු පොදු ජනයා අතර නොව රජුන් අබියස
වැජඹෙනු ඇත.

- 6 -

23 ඔබ රජ කුමරකු සමඟ කෑමට හිඳින කල
අබිමුවෙහි ඇති දේ ගැන කල්පනාකාරී වන්න.

2 ඔබ කෑදර නම් කෑදරකම දමනය කරගන්න.
3 ඔහුගේ රසවත් කෑමට ගිජු නොවන්න, මයෙ ඔබ
රැවටීමේ උපායක් වන්නට බැරි නැත.

- 7 -

4 පොහොසත් වන්නට නොවෙහෙසෙන්න, ඒ
අදහස ඔබේ සිතින් අත්හරින්න.
5 වස්තුව දෙස බලන විට ම එය පියාපත්
මවාගෙන, රාජාලියකු මෙන් අහසට පියාඹා යනු
ඇත.

- 8 -

6 මසුරකු සමඟ කෑමට නොයන්න, ඔහුගේ
ප්‍රණීත ආහාර වැළඳීමට ලොල් නොවන්න.
q2[6] ඒ කෑම කසේ රොදක් මනේ උගුරේ හිර වනු
ඇත.
7 “තව බදොගන්න, හොඳට කන්නැ”යි ඔහු
කියතත්, ඔහුගේ සිත අවංක නැත.
8 එවිට ඔබ කෑ දයෙ වමාරාලීමට ඔබට සිදු වනු
ඇත.
q2[8] ඔබ කළ ප්‍රශංසාවනේ වැඩක් නොවනු ඇත.

- 9 -

9 අනුවණයාට නුවණින් කතා කිරීමනේ වැඩක්
නැත;
q2[9] ඔබේ කීම්වල අගය තේරුම්ගන්න ඔහු
අපොහොසත් ය.

- 10 -

10 පැරණි මායිම් ගල් කිසි දා වනෙස් නොකරන්න;
q2[10] අනාථයන්ගේ වතුපිටි අල්ලා නොගන්න.
11 මන්ද, ඔවුන්ගේ මිදුම්කාරයාණෝ බලසම්පන්න
ය;
q2[11] එතුමාණන් උසාවියේ දී ඔබට විරුද්ධ ව පනේී
සිටිනු ඇත.

- 11 -

12 ඔබේ සිත විනයට ද ඔබේ කන් ප්‍රඥාවට ද
යොමු කරන්න.

- 12 -

13 දරුවාට දඬුවම් කිරීමට අදිමදි නොකරන්න,
කෝටු පාර දුන්නාට ඔහු මැරනෙ එකක් නැත.
14 කෝටුවනේ ඔහුට තළන්න, එයින් ඔහුගේ
ජීවිතය රැකනෙු ඇත.

- 13 -

15 මාගේ පුත්‍රය, ඔබ නැණවතකු වුණොත් මටත්
කොතරම් ප්‍රීතියක් ද?
16 ඔබ නැණවත් දේ පවසන විට මාගේ හදවත
පිනා යයි.

- 14 -

17 පව්ටුන් ආදර්ශයට නොගන්න, දිවා රෑ දකේහි
සමිඳුන්ට ගරුබිය දක්වන්න.
18 එසේ කළොත්, ඔබට අනාගතයක් ඇත, එය
දීප්තිමත් අනාගතයක් වනු ඇත.

- 15 -

19 මාගේ පුත්‍රය, ම වදන් අසා නැණවත් වන්න;
q2[19] හරි මඟ ගමන් කරන්න.
20 සුරා සොඬුන් ද මස් මාංසයට කෑදර වූවන් ද
ඇසුරු නොකරන්න.
21 මන්ද, බේබද්දාත්, කෑදරයාත් දිළිඳු බවට
පැමිණතේ.
q2[21] ඔබත් වරේමතින් හිඟමනට බසිනු ඇත.

- 16 -

22 ඔබට ජීවය දුන් පියාගේ බස් අසන්න;
q2[22] මහලු වියට පත් ඔබේ මව සුළු නොකරන්න.
23 සත්‍යය ද ප්‍රඥාව ද උගත්කම ද නැණනුවණ ද
මිල දී ගන්න, ගත් පසු, ඒවා කිසි ම දාක
නොවිකුණන්න.
24 දැහැමි පුතකුගනේ පියාට ප්‍රීතිය ඇත;
q2[24] නැණවත් පුතකු ඇති පියා සතුටින් පිනා යයි.
25 ඔබේ පියාට ද මවට ද ආඩම්බරයක් වන්න;
q2[25] ඔබගේ වැදූ මවට ඒ ප්‍රීතිය දනේන.

- 17 -

26 මාගේ පුත්‍රය, ම වදන් සිතට ගන්න, මා දනෙ
ඔවාබස් පිළිගන්න.
27 වසෙඟන ගැඹුරු වළකි;
q2[27] සලලෙු ලිය පටු ළිඳකි.
28 මොවුහු හොරුන් මනේ සැඟවී බලා සිටිති,
බොහෝ දනෙ පරදාර සේවනයට පොළඹවති.

**බීමත්කමේ දුර්විපාක**

- 18 -

29 දුක කාට ද?
q2[29] කාලකණ්ණිකම කාට ද?
q2[29] අඬදබර කාට ද?
q2[29] මැසිවිලි කාට ද?
q2[29] නිකරුණේ තුවාළ කාට ද?
q2[29] රතු ඇස් කාට ද?
30 සුරා බෝතලය ළඟ පමා වන මිනිසාට ය.
q2[30] තව තවත් මත්පැන් බොන්න යන මිනිසාට ය.
31 මද්‍යසාරය රතට රතේ දිළිසනෙ විට, වීදුරුවහේි
පණෙ දමන විට, ලස්සනට වැක්කරෙනෙ විට, ඒ
දසෙ නොබලන්න.
32 අන්තිමේ දී එය, නයකු මනේ සපා කයි;
q2[32] පොළඟකු මනේ දෂ්ට කරයි.
33 එවිට ඔබේ ඇස අද්භූත දේ දකියි;

q2 33 ඔබේ කට විලම්බිත දොඩවයි.
34 එවිට ඔබ මුහුද මැද ඒ මේ අත පෙරළෙන
කෙනෙකු මෙන් ද කුඹ ගස මුදුනේ නිදන්න හදන
කෙනෙකු මෙන් ද වනු ඇත.
35 එවිට ඔබ මෙසේ කොඳුරනු ඇත:
q2 35 " 'ඔවුන් මට පහර දුන්නේය, නමුත් මට
රිදුණේ නැත.
q2 35 ඔවුන් මට ගැසුවෝය, නමුත් මට දැනුණේ
නැත.
q2 35 කොයි වේලේ මා අවදි වේ ද?
q2 35 එවිට මම තව උගුරක් බොමි.' "

- 19 -

24 පව්කරුවන් ආදර්ශයට නොගන්න, ඔවුන් ඇසුරට
ආශා නොවන්න.
2 ඔවුන්ගේ සිතේ එක ම අරමුණ සැහැසිකමක්
කිරීම ය;
q2 2 ඔවුන්ගේ එක ම කතාව නපුරක් කිරීම ය.

- 20 -

3 ගෙදරක පදනම් දැමිය යුත්තේ ප්‍රඥාවෙනි, එය
ගොඩනැඟිය යුත්තේ ඥානයෙනි.
4 එහි කාමර අගනා සැරසිලිවලින් විසිතුරු කළ
යුත්තේ බුද්ධියෙනි.

- 21 -

5 පැණවතා බලවතාට වඩා උදාර ය.
q2 5 බුද්ධිමතා ශක්තිමතාට වඩා ශ්‍රේෂ්ඨ ය.
6 රණ බිමෙහි විජය සඳහා දක්ෂ උපා අවශ්‍ය ය;
q2 6 උපදේශකයන් වැඩි වූ තරමට විජය සිකුරු ය.

- 22 -

7 මෝඩයකුට ප්‍රඥාව ඔරොත්තු නොදෙයි;
q2 7 උසාවියේ දී ඔහුට එක වචනයක් වත් නොකිය
හැකි ය.

- 23 -

8 කොයි වේලෙත් හොර මැරකම් කිරීමේ අදහස
ඇති මිනිස්සු "ඉහළ පෙළේ තක්කඩි"යයි කියනු
ලබති.
9 මෝඩයාගේ කොයි යෝජනාවත් පාපී ය.
q2 9 උඩඟු මිනිසා සෙසු අයට පිළිකුලකි.

- 24 -

10 අර්බුදයක් ඉදිරියෙහි දුබල වන මිනිසා, සැබැවින්
ම දුබල මිනිසෙකි.

- 25 -

11 මරණයට ගෙනයනු ලබන අය මුදාගන්න;
q2 11 ඝාතනයට ගෙනයනු ලබන අය ගළවාගන්න.
12 "මම මේ ගැන කිසිත් නොදනිමි"යි ඔබ කියතත්,
යටි හිත විමසන දෙවි තුමාණෝ එය නොදකිත් ද?
q2 12 ඔබ පිරික්සා බලන උතුමා එය නොදන්නේ ද?
q2 12 එක එක මිනිසාගේ එක එක ක්‍රියාවට විපාක
නොදෙන්නේ ද?

- 26 -

13 මාගේ පුත්‍රය, මී පැණි ඇඟට ගුණ ය;
q2 13 කටට රස ය;
q2 13 එය පානය කරන්න.
14 ඔබේ ජීවිතයට ප්‍රඥාව ද එසේ ම ය;
q2 14 එය ලදහොත් හොඳ අනාගතයක් උදා වෙයි.
q2 14 ඔබේ පණ කෙන්ද නොකැඩී පවතියි.

- 27 -

15 දැහැමියාගේ නිවස වටා නපුරකු මෙන් සැඟවී
නොසිටින්න;
q2 15 ඔහුගේ වස්තුව කොල්ල නොකන්න.
16 දැහැමියා සත් වරක් වැටුණත් ඔහු යළි නැඟිටියි;
q2 16 එහෙත් දුෂ්ටයා විපතට වැටුණොත් වැටුණා ම
ය.

- 28 -

17 ඔබේ සතුරාගේ විපත ගැන සතුටු නොවන්න;
q2 17 ඔහුගේ වැටීම ගැන ප්‍රීති නොවන්න.
18 ඔබේ ඒ ප්‍රීතිය දක්නා සමිඳාණන් අසතුටු වනු
ඇත.
q2 18 සිය උදහස සතුරා කෙරෙන් පහකරනු ඇත.

- 29 -

19 නපුරන් ගැන නොකිපෙන්න;
q2 19 දුදනන් ආදර්ශයට නොගන්න.
20 නපුරන්ට අනාගතයක් නැත;
q2 20 නිවී යන පහනක් මෙන් ඔවුන් පහවනු ඇත.

- 30 -

21 මාගේ පුත්‍රය, සමිඳුන්ට ද රජුට ද ගරුබිය
දක්වන්න;
q2 21 ඔවුන්ට විරුද්ධ ව කැරලි නොගසන්න.
22 මන්ද, හිටිහැටියේ ඔවුන්ගෙන් විපත පැමිණෙනු
ඇත.
q2 22 ඒ දෙදෙනාගෙන් එන විපත්තිය කවරෙක් දනිද්
ද?

## තවත් උපදේශ

23 මේවාත් ප්‍රාඥයින්ගේ කියමන් ය:
q2 23 අධිකරණයේ දී පක්ෂපාත ව ක්‍රියා කිරීම යුතු
නැත.
24 "වැරදිකරු නිවැරදි ය"යි තීන්දු දෙන විනිසකරුට
ජනතාව සාප කරනු ඇත.
q2 24 ජාතීන් ඔහු හෙළා දකිනු ඇත.
25 එහෙත් වැරදිකරුට දඬුවම දෙන අය කීර්තිය
දිනාගනියි;
q2 25 ජනතාව ඔහුට සතේ සිරි පතති.

26 අවංක පිළිතුර සුහදතාවේ ලකුණකි.
27 කලින් වැඩකටයුතු පිළියෙළකොට කෙතෙක් වවා
සරු වන තුරු, ගෙයක් දොරක් තනා පවුලක් වීමට
නොසිතන්න.
28 හේතුවක් නැති ව අසල්වැසියාට විරුද්ධ ව
සාක්ෂි නොදෙන්න;
q2 28 ඔහු ගැන බොරු සාක්ෂි නොකියන්න.
29 “ඔහු මට කළ දේ ම මමත් ඔහුට කරමි;
q2 29 ඔහු කළ දයෙට සෑහෙන පළියක් ගනිමි”යි
නොකියන්න.
30 මම අලසයාගේ කෙත ළඟින් ද අනුවණයාගේ
මිදි වත්ත අසලින් ද ගියෙමි.
31 එහි හැම තැන ම කටු පඳුරු වැවී තිබිණි, මුළු
ඉඩම කහඹිලියාවලින් වල් බිහි වී තිබිණි, ගල්
තාප්පය බිඳ වැටී තිබිණි.
32 මම එය හොඳින් බලා, තේරුම්ගතිමි.
q2 32 මේ පාඩම ඉගෙනගතිමි:
33 හිතෝ 6:10-11 තව ටිකක් නිදාගන්න, ටිකක්
සැතපෙන්න, අත් දෙක පොරවාගෙන නිකම් ඉන්න,
34 එවිට ඔබ වෙත දිළිඳුකම සොරකු මෙන් ද
හිඟකම අවි ගත් කෙනකු මෙන් ද පැමිණෙනු
නියත ය.

### සලමොන් රජුගෙන් තවත් උපදේශ

25 ජුදාහි රජ වූ හෙසකියාගේ ලේකම්වරුන්
විසින් පිටපත් කරන ලද සලමොන්
නිරිඳුන්ගේ තවත් උපදේශ පහත දක්වනු ලැබේ.
2 අබිරහස් ගැන අපි දෙවිඳුන්ට ගරු කරමු;
q2 2 අර්ථය පහදා දීම ගැන අපි රජුට පැසසුම් දෙමු.
3 රජුගේ හිතුම් පැතුම් අහස මෙන් උස ය, මුහුද
මෙන් ගැඹුරු ය, අචින්ත්‍ය ය.
4 රිදීයෙන් බොර පහකරන්න, එවිට විසිතුරු බඳුනක්
තැනීමට රිදීකරුවාට හැකි වේ.
5 රජු වෙතින් දුදනන් පහකරන්න;
q2 5 එවිට රාජ සිහසුන දැහැමිකමෙහි තිරසර වේ.
6 ලූක් 14:8-10 රජු අබිමුවෙහි මහන්තත්ත්වය
නොපාන්න;
q2 6 ප්‍රභූන්ගේ තත්ත්වය නොපතන්න.
7 රජ කුමරකු ඉදිරියෙහි පහත්කරනු ලැබීමට වඩා
“ඉහළ තැනට එන්නැ”යි කියා කැඳවනු ලැබීම
කොතරම් හොඳ ද?
8 ඔබ දුටු යමක් ගැන ඉක්මන් වී උසාවි නොයන්න;
q2 8 වෙන සාක්ෂිකරුවකු ඔබ නිරුත්තර කළොත්
කුමක් කරන්න ද?
9 අසල්වැසියා සමඟ ම ආරාවුල බේරාගන්න;
q2 9 අනුන්ගේ රහස් අන් අයට හෙළි නොකරන්න.
10 එසේ කළොත් ඔවුන් ඔබට අවලාද කියනු ඇත.
q2 10 ඔබේ අපවාද පහනොවෙනු ඇත.
11 තැනට කැපෙන වචනය රිදී තැටියක තැබූ රන්
කැටයමක් වැන්න.
12 මැනවින් සවන් දෙන අයට නැණවතාගේ ඔවා
බස් රන් අරුංගල් ජෝඩුවක් ද තනි රන් මාලයක් ද
වැන්න.
13 විශ්වාසවන්ත පණිවුඩකරු තම හිමියාට
ගිම්හානයේ රස්නය නිවන සිහිල් හිම මෙන් සතුට
ගෙන දෙයි.
14 දීමට පොරොන්දු වී නො දී සිටින අය වැහි
නොදෙන සුළං හා වලාකුළු මෙනි.
15 ඉවසීමෙන් අධිපතියකු වුව ද නම්මාගත හැක;
q2 15 මුදු මොළොක් බසින් දැඩි ආධිපත්‍යය බිඳිය
හැක.
16 මී පැණි ලදහොත් තරමට පමණක් කන්න;
q2 16 වැඩියෙන් කෑවොත් වමනය ඇති වේ.
17 අසල්වැසියාගේ ගෙදරට නිතර නිතර නොයන්න;
q2 17 ගියොත් ඔහුට ඔබ එපා වී ඔහු ඔබ නුරුස්සයි.
18 අනුන්ට විරුද්ධ ව බොරු සාක්ෂි කියන්නා මුගුරක්
ද කඩුවක් ද තියුණු ඊගසක් ද මෙන් නපුරු ය.
19 විපත්ති දවසේ දී චපල මිනිසකු කෙරේ
විශ්වාසය තැබීම, දිරා ගිය දතක් ද කොර කකුලක්
ද ඇති ව සිටීම මෙනි.
20 දුකින් පෙළෙන කෙනෙකුට මියුරු ගීයක් ගැයීම
තුවාළයක් මත විනාකිරි දැමීමත් සීත දවසක
ඔහුගේ කබාය ගැලවීමත් සමාන ය.
21 රෝම 12:20 ඔබේ සතුරාට සාගිනි නම් කන්න
දෙන්න;
q2 21 පිපාසා නම් බොන්න වතුර ටිකක් දෙන්න;
22 මෙසේ හිස ගිනිගත් කෙනකු මෙන් ඔහුට දැරිය
නොහැකි ලජ්ජාවකින් දැවීමට සලසනු ඇත.
q2 22 සමිඳුන් ඔබට විපාක දෙනු ඇත.
23 උතුරු සුළඟ වැස්ස ගෙනෙයි, එලෙස ම කේළාම්
කීම කෝපය අවුස්සයි.
24 කලහකාරී බිරිඳක සමඟ ගෙයි විසීමට වඩා එහි
අටුවේ මුල්ලක විසීම හොඳ ය.
25 දුර රටකින් එන හොඳ ආරංචිය, පිපාසයෙන්
වේළුණු උගුරට ඇල් වතුර මෙනි.
26 දුදනා අබිමුව බියෙන් ගැහෙන සුදනා බොර දිය
නඟින උල්පතක් ද පල් වතුර ඇති ළිඳක් ද වැනි ය.
27 මී පැණි ගොඩක් බීම හොඳ නැත;
q2 27 තම ගෞරවය ම වැඩියෙන් සෙවීම ද හොඳ
නැත.
28 අසංවර මිනිසා කොටු පවුරු නැති බිඳ වැටුණු
නුවරක් වැන්න.

26 ගිම්හානයේ දී හිම ද, ගොයම් නෙළෙන
කාලයේ දී වැස්ස ද, අනුවණයකුට ගරු
සම්මාන ද හරි නැත.
2 ඔබමොබ පියාඹන ගේ කුරුල්ලා මෙන් ද ඉගිළී
යන වැහිලිහිණියා මෙන් ද හේතුවක් නැති ව කරන
සාපය නොරුඳී පලා යයි.
3 අශ්වයාට කසය ඇත;
q2 3 බූරුවාට කටකලියාව ඇත;
q2 3 අනුවණයාට කවේට ඇත.
4 මෝඩයාගේ මෝඩ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න
යාමෙන් ඔබත් මෝඩයකු වෙයි.
5 මෝඩයාගේ මෝඩ ප්‍රශ්නයට දිය යුත්තේ
මෝඩ පිළිතුරකි.
q2 5 නැත්නම් ඔහු, ‘තමා නැණවතකෙ’යි සිතනු ඇත.

6 අනුවණයා අත පණිවුඩයක් යවන්නා, සිය දපා
කපාගනෙ දුකට පත් වයේ.
7 අනුවණයාගේ මුවින් නික්මනෙ පැණ පිරුළ
කොරාගේ කකුල් මනේ පණ නැත.
8 අනුවණයාට ගෞරවය දීම ගල පටියේ බැඳ විදීම
මනේ නිෂ්ඵල ය.
9 අනුවණයාගේ මුවින් නික්මනෙ පැණ පිරුළ,
බේබද්දා අතින් වනන කටු අත්තක් වැනි ය.
10 මඟ යන අඥානයකු කුළී වැඩට ගන්නා, පාරේ
යන හැම අයට ම තුවාළ කරන දුනුවායකු මනේ.
11 2 පේදු 2:22 එම මෝඩකම යළිත් කරන
මෝඩයා, උගේ වමනයට හැරී යන බල්ලකු වැනි
ය.
12 මෝඩයා වුව ද 'තමා නැණවතකෙ'යි කියා
සිතන අනුවණයාට වඩා හොඳ ය.
13 අලසයා වැඩට නොයන පිණිස මසේ කියයි:
q2 13 "පාරේ සිංහයකේ ඇත, වීදියේ නිදැල්ලේ දුවන
සිංහයකේ ඇත."
14 දොර, අසව්ව පිට ඒ මේ අත හැරයේ, අලසයා
ද තම යහනේ ඒ මේ අත පරෙළයේ.
15 අලසයා බත් පිඟ ගන්න බඳුනට අත දමයි;
එහතේ එය කටට ගන්න වත් කම්මැළි ය.
16 නුවණැති ව පිළිතුරු දනෙ සත්දනෙකුට වඩා
'තමා නැණවතකෙ'යි අලසයා සිතයි.
17 අනුන්ගේ දබරයකට ඇඟිලි ගසන්නා, පාරේ යන
බල්ලකු උගේ කන් දකෙින් අල්ලාගන්නකු හා
සමාන ය.
18 තමාගේ අසල්වැසියා රවටමින්,
19 "මම සලේලමට එය කළෙමේ"යි කියන මිනිසා,
තමා වටකර බියකරු ගිනි පනෙලේි ද මාරක ඊගස් ද
විසි කරන පිස්සකු වැනි ය.
20 දර නැති තැන ගින්න නිවයේ;
q2 20 කේළාම් නැති තැන දබර නවතියි.
21 ගිනි අඟුරුවලට මයිනහමත්, ගින්නට දරත් යම්
සේ ද දබරයක් ඇවිස්සීමට කලහකාරී මිනිසාත්
එසේ ම ය.
22 කටකතා රසවත් අහරකි, එය ගිලගැනීමට
කවුරුත් කැමැති ය.
23 නපුරු හදවත් සඟවාගනෙ කරන සිනිඳු කතාව
රිදී ගෑ මැටි බඳුනක් වැන්න.
24 කපටියා චාටු බස් මුවාවනේ වරෛය වසාගනියි.
q2 24 සතුරා මිහිරි බස් දොඩයි, එහතේ හිත තුළ
වරෛය තබාගනියි.
25 ඔහුගේ හදවත උතුරා යන තරම් නපුරනේ පිරී
ඇත, මිතුරු වචන කීවත් ඔහු විශ්වාස නොකරන්න.
26 තම නපුරුකම ව්යාජයනේ වසාගත්තත්, ඔහුගේ
දුෂ්ටකම සියල්ලන් හට හළෙි වනු ඇත.
27 ඔහු කණින වළහෙි ඔහු ම වැටනේනේ ය;
q2 27 ඔහු පරෙළා හරින ගලට ඔහු ම යට වන්නේ
ය.
28 මුසා බස් දොඩන්නා ඉන් හානි වූවන්ට වරෛ
කරයි, ඉච්චා බස් දොඩන්නා විනාශය ගනෙ දයේ.

27 ජාකොබ 4:13-16 "අද කුමක් වේ දැ"යි කියා
වත් නොදන්න ඔබ, හටෙ ගැන පාරට්ටු
නොකරන්න.
2 අන්යයෝ ඔබට ප්රශංසා කරත් වා;
q2 2 අමුත්තෝ වුව ද ඔබට ප්රශංසා කරත් වා,
එහතේ ඔබ ඔබට ම ප්රශංසා කර නොගන්න.
3 ගල් බර ය, වැලිත් බර ය, අනුවණයාගනේ ඇති
වන දුක් ගැහැට ඒ දකෙට ම වඩා බර ය.
4 කෝපය කුරිරු ය;
q2 4 ක්රෝධය රුදුරු ය;
q2 4 එහතේ ඊර්ෂ්යාව ඉවසිය හැක්කේ කාට ද?
5 කළෙින් තරවටු කිරීම ක්රියාවනේ නොපනේවන
ප්රමේයට වඩා අගනේ ය.
6 මිතුරාගනේ වන රිදුම හිතවත්කමේ ලකුණකි.
q2 6 සතුරාගනේ ලැබනෙ සිඹීම විපතේ පරෙ
නිමිත්තකි.
7 කුස පුරා කෑ අයට මී වදයත් එපා වේ;
q2 7 සාගිනි ඇති අයට තිත්ත කදුරුත් මිහිරි වේ.
8 සිය රට හැර යන මනුෂ්යයා කැදැල්ල හැර
පියාඹන කුරුල්ලා වැනි ය.
9 සඳුන්, කපුරු, සුවඳ විලවුන් මන පිනවයි;
q2 9 හිරිහැර, කරදර සිත දදෙරවයි.
10 ඔබේ ම මිත්රයා ද පියාගේ මිත්රයා ද අත්
නාරින්න.
q2 10 විපතේ දී නෑයින් වතෙ නොයන්න.
q2 10 ළඟ සිටින මිතුරා දුර සිටින නෑයාට වඩා
අගනේ ය.
11 මාගේ පුත්රය, මට ගරහන අයට උත්තර දනෙ
පිණිස නැණවත් ව ම සිතට සතුට දනේන.
12 නුවණැතියා විපත දුර තියා දැක අයින් වයේ;
q2 12 අනුවණයා එය ඉදිරියට ගොස් දුක් විඳියි.
13 අමුත්තකුට ඇප වන විට ඇප වන්නාගේ ඇඳුම
ඇපයට ගන්න, එය ඔහුගේ අත්තිකාරම මනේ
තබාගන්න.
14 ආචාර කිරීමට සිය මිතුරා අලුයම අවදි කිරීම
ඔහුට සාප කිරීමක් වැනි ය.
15 කලහකාරී කතගේ කන්දොස්කිරියාව
නොනැවතී වසින වැස්සක් වැන්න.
16 ඇය නැවැත්වීමට තැත් කිරීම සුළඟ අල්ලාගැනීම
වැනි ය.
q2 16 තලේ අහුරක් ගැනීම වැනි ය.
17 යකඩින් යකඩ මුවහත් වයේ;
q2 17 එසේ ම මනසින් මනස දියුණු තියුණු වයේ.
18 අත්තික්කා ගස බලාගන්නා එහි ගඩේ කයි;
q2 18 තම හිමියාට සලකන්නා ගෞරවය ලබයි.
19 වතුරහෙි පිළිබිඹු වන්නේ ඔබේ ම මුහුණ ය;
q2 19 සිතහෙි පිළිබිඹු වන්නේ ඔබේ ම චරිතය ය.
20 පාතාලය හා අවීචිය කවදාවත් තෘප්තියට
නොපැමිණයේ;
q2 20 මිනිසාගේ තෘෂ්ණාව ද කවදාවත් සෑහීමට පත්
නොවයේ.
21 රිදී, කෝවයනේ දැනගනිති;
q2 21 රන්, ගිනි උදුනනේ දැනගනිති;
q2 21 මිනිසා, පැසසුමනේ දැනගනිති.

22 මෝඩයකු වංගඩේියක දමා මෝල් ගහනේ
කටෙුවත් මෝඩයාගනේ මෝඩකම වනේ කළ හැකි
ද?
23 ඔබේ ගව පට්ටිවල තත්ත්වය මැනවින්
දැනගන්න;
q2 23 ඔබේ ගව රැළට මුළු සිත දනේන.
24 ධන සම්පත් සදහට ම පවතින්නනේ නැත.
q2 24 රජකම ද පරපුරනේ පරපුරට පවතින්නනේ නැත.
25 තණපත් මැලවුණ විට ළා තණ නැගයේ.
q2 25 කඳු මත පලා ජාති එක්රැස් කරනු ලැබයේ.
26 ඔබේ රදෙිපිළි පිණිස බැටළු පැටවුන් ද කතෙේ
සම්පත පිණිස එළුවන් ද ඇත.
27 ඔබේ ද ඔබේ ගයෙි වැසියන්ගේ ද කෑම
පිණිසත්, ඔබේ සේවිකාවන්ගේ නඩත්තුව පිණිසත්,
සෑහනෙ තරම් එළු කිරි ලැබනෙු ඇත.

28 කිසිවකු ලුහුබැඳ නාවත් දුෂ්ටයා පලා යයි;
q2

28 එහතේ ධර්මිෂ්ඨයා සිංහයකු මනේ වැජඹයේ.
2 කැරලිකාර රාජ්‍යයක නායකයෝ බොහෝ
දනෙකේ, එහතේ නැණවත් පැණසර අයගනේ යුත්
රාජ්‍යයක් තිරසර ව පවතියි.
3 දිළිඳුන් පළෙන දුෂ්ටයා අස්වැන්න වනසන මහ
වැස්සක් වැන්න.
4 නීති රීති කඩන්නෝ දුෂ්ටයන්ට පැසසුම් කරති;
q2 4 නීති රීති රකින්නෝ ඔවුන්ට විරුද්ධ ව සිටිති.
5 නපුරු මිනිස්සු යුක්තිය තේරුම් නොගනිති;
q2 5 සමිඳුන් සොයා යන්නෝ එය මුළුමනින් ම
තේරුම්ගනිති.
6 වැරදි මඟ යන ධනවතාට වඩා හරි මඟ යන
දිළින්දා අගනේ ය.
7 නීතිය රකින්නා නැණවත් පුත්‍රයකේ;
q2 7 දාමරිකයන් ඇසුරු කරන්නා තම පියාට නිගාවකි.
8 වැඩි පොළියනේ හා අයුතු ලාභයනේ උපයන
ඔබේ ධනය දිළිඳුන්ට දයාව දක්වන කනෙකුෙට හිමි
වේ.
9 දේව නීතියට කන් නොදනේනාගේ යැදුම සමිඳුන්
හට පිළිකුලකි.
10 අවංක අය නපුරු මඟට හරවන්නා තමා කැපූ
වළේ ම වැටනෙු නියත ය;
q2 10 එහතේ සත්පුරුෂයා ආසිරි ලබනු ඇත.
11 ධනවතා තමන් නැණවතකෙු යි සිතයි;
q2 11 එහතේ ඔහුගේ නියම තත්ත්වය දත් දිළිඳා එය
වටහාගනියි.
12 දැමිටු අය බලය ලබන කල සියල්ලෝ උත්සව
පවත්වති.
q2 12 දුෂ්ට අය උසස් වන කල ඔව්හු බියනේ
සැඟවතේ.
13 තම වරද සඟවන්නා සෞභාග්‍යය නොදනියි;
q2 13 වරද පිළිගනෙ, එය දුරලන අයට දයාව ලැබයේ.
14 දේව ගරුබිය ඇත්නම් ඔබට වාසනාව ඇත;
q2 14 මුරණ්ඩුකම ඇත්නම් ඔබට විපත ඇත.
15 දුබල සනෙඟක් ආණ්ඩු කරන දුෂ්ටයා ගොරවන
සිංහයකේ, ගොදුරු සොයා යන වලසකේ.
16 නැණ හීන අධිපතියා දරුණු පාලකයකේ වයේ;
q2 16 අයුතු ලාභයට ද්වේෂ කරන්නා දිගායු වළඳයි.
17 මිනීමැරීමේ වරදින් පළෙනේනා යුහුයුහු ව වළ
පල්ලට යයි;
q2 17 කිසිවකු එය නොවළක්වත්වා.
18 අවංක ලසෙ ජීවත් වනේනා ගැළවයේ;
q2 18 වංක ලසෙ ජීවත් වනේනා විපතට වැටයේ.
19 වැර වීරියනේ වගාකරන්නාට බතබුලත බහුල ය;
q2 19 නිෂ්ඵල ව්‍යාපාරවල යදෙනේනාගේ දිළිඳු බව
ඉමහත් ය.
20 විශ්වාස කටයුතු මිනිසාට ආසිරි විපුල ය;
q2 20 ධනය ඉපැයීමට ඉක්මන් වන්නා දඬුවම් ලබනු
නියත ය.
21 තරාතිරම් බැලීම හරි නැත;
q2 21 බත් කටක් තකා අපරාධයක් කරන්නෝ වති.
22 වස්තු ලෝභියා වස්තුව සොය සොයා
වේගයනේ දුවයි;
q2 22 කවදා හරි හිඟකමට පැමිණනෙ බව ඔහු
නොදනියි.
23 කපටි ඉච්චාවට වඩා අවංක විවේචනය
ප්‍රශංසනීය ය.
24 දමෙවුපියන්ගනේ සොරාගනෙ එහි වරදක් නැතැ
යි කියන්නා අන්ත හොරකේ.
25 තණ්හාව ඇත්තා කලහ අවුස්සයි;
q2 25 සමිඳුන් කරේ විශ්වාසය තබන්නාට
සෞභාග්‍යය ඇත.
26 හුදකේ සිය නුවණහෙි රැඳනේනා මෝඩයකේ;
q2 26 නැණවත් ලසෙ හැසිරනේනා සුරුකි ව
වසන්නකේ.
27 දිළිඳුන්ට දනෙ අයට කිසි හිඟයක් නැත;
q2 27 දිළිඳුන් දසෙ නොබලන අයට අධික සාපය ඇත.
28 නොදැහැමි අය බලයට පත් වන විට වැසියෝ
බියනේ සැඟවතේ;
q2 28 ඔවුන් වැනසනෙ විට දැහැමියෝ බලයට පත්
වතේ.

29 බොහෝ තරවටු ලැබ ලැබත් මුරණ්ඩු
මිනිසාට ගැළවීමක් නැත;
q2

29 එයින් ඔහුට හිටිහැටියේ විනාශය පැමිණයේ.
2 දැමිටු අය පාලකයන් වන විට රට වැසියෝ
ප්‍රීති වතේ.
q2 2 අදැමිටු අය පාලනය කරන විට රට වැසියෝ
දුකින් සුසුම්ලති.
3 ප්‍රඥාවට ගරු කරන්නා සිය පියාට ප්‍රීතිය ගනෙ
දයේ;
q2 3 වසෙඟනන් ඇසුරු කරන්නා ඔහුගේ ධනය
කාදමයි.
4 යුක්තියනේ පාලනය කරන රජකේ රටට
චිරස්ථිතිය ගනෙ දයේ, එහතේ වැසියන් පළො අයබදු
ගන්නා රට වනසයි.
5 අනුන්ට ඉච්චා බස් දොඩන තැනැත්තේ තමාගේ
ම පාදවලට උගුලක් අටවයි.
6 දුදනාගේ අයුතු වැඩ ඔහුට ම මලපතකි;
q2 6 සුදනා ගී ගයමින් තුටු පහටු වයේ.
7 දැහැමියා දිළිඳාගේ හිමිකම් සලකයි;

q2[7] දුදනා එවැනි අවබෝධයක් නොදක්වයි.
8 අනුන්ට ගරහන මිනිස්සු නගරයට ගිනි තබති.
q2[8] එහෙත් නැණවත්හු උදහස් ගින්න නිවාදමති.
9 නුවණැතියා මෝඩයකු උසාවියට ගෙන ගියොත්
තමා ම නින්දා අපහාස ලබනු මිස ඉන් වන වැඩක්
නැත.
10 මිනීමරුවෝ නිදොස් අයට වෛර බඳිති;
q2[10] එහෙත් දැහැමියෝ නිදොස් අය රැකගනිති.
11 අනුවණයා සිය උදහස නොවළහා හෙළි කරයි;
q2[11] නැණවතා සිය උදහස වළකාගනියි.
12 පාලකයෙක් බොරු ප්‍රචාරවලට කන් දෙයි නම්
ඔහුගේ නිලධාරීහු කුහකයෝ වෙති.
13 දිළින්දා හා ඔහු පෙළෙන අය අතර එක පොදු
දයෙක් ඇත, ඒ දදෙනොට ම සතෙ උදාවන්නේ
සමිඳුන්ගෙනි.
14 සාධාරණකමින් දිළිඳුන් රක්නා රජුගේ සිහසුන
සදහට ම තිරසර ය.
15 කෝටුව හා තරවටුව බුද්ධි වර්ධනය සලසයි;
q2[15] හිතු හිතූ දේ කරන දරුවා මවට ලජ්ජාවකි.
16 දුදනන් පාලනයට පත් වන විට අපරාධ වැඩි
වෙයි;
q2[16] එහෙත් සුදනෝ දුදනන්ගේ වැටීම දකිති.
17 පුතු හික්මවන්න;
q2[17] එවිට ඔබේ සිතට සහනය ද ප්‍රීතිය ද
ලැබෙයි.
18 ජීවිත දර්ශනයක් නැති තැන විනයක් නැත.
q2[18] විනය රක්නා අය වාසනාවන්ත ය.
19 මෙහෙකරුවා අවවාදයෙන් පමණක්
නොහික්මෙයි;
q2[19] අවවාදය තේරුම් ගියත් ඔහු එය නොපිළිගනියි.
20 හිතා මතා කතා නොකරන මිනිසකේ ඇද් ද?
q2[20] එවැන්නකුට වඩා අනුවණයකුට අනාගතයක්
ඇත.
21 මෙහෙකරුවකු බාලවියේ සිට ම සව් සැප දී
ඇති කළත්, අන්තිමේ දී ඔහු තුළ කළගුණ
සැලකීමක් නැත.
22 කෝපාවිෂ්ට මිනිසා දබර උපදවයි;
q2[22] උදහසට පළෙඹෙන මිනිසා හැමවිට ම වරදට
වැටෙයි.
23 අහංකාරය මිනිසකුගේ පරිහානියට හේතු වේ;
q2[23] එහෙත් නිහතමානී තැනැත්තා ගරු බුහුමන්
ලබයි.
24 හොරෙකුට හවුල් වන්නා තමාගේ ම පරම
සතුරෙකි;
q2[24] දිවුරුම් දුන්නත්, හොරා ඇත්ත නොපවසයි.
25 මිනිසුන්ට බිය වීම ඔහුට මලපතක් වෙයි;
q2[25] සමිඳුන් කෙරේ විශ්වාසය තැබීම ඔහුට
රැකවරණය වෙයි.
26 පාලකයන්ගේ අනුග්‍රහය පතන්නෝ බොහෝ
ය;
q2[26] එහෙත් යුක්තිය පැමිණෙන්නේ සමිඳුන්ගෙනි.
27 අදැමිටු අය දැමිටුන්ට පිළිකුලකි;
q2[27] දැමිටු අය අදැමිටුන්ට පිළිකුලකි.

## ආගුර්ගේ ඔවදන්

30 පහත දැක්වෙන්නේ, ජාකේගේ පුත්
ආගුර්ගේ විශිෂ්ට අවවාදානුශාසනා ය:
q2
30 දෙවිඳුන් මා සමඟ නැත.
q2
30 මා සමඟ නැත.
q2
30 මම අසරණයෙක්මි.
2 මම මිනිසකු නොව, තිරිසනකු ව සිටිමි.
q2[2] මිනිසකුට හිමි, මිනිස් ප්‍රඥාව මට නැත.
3 මම කවදාවත් ප්‍රඥාව දැන නොගතිමි;
q2[3] දෙවිඳුන් පිළිබඳ දැනුමක් මට නැත.
4 සගලොවට නැඟී බැස ආවේ කවරෙක් ද?
q2[4] සිය දෑතින් සුළඟ අල්ලාගත්තේ කවරෙක් ද?
q2[4] සිය සළුවෙහි ජලය ඔතාගත්තේ කවරෙක් ද?
q2[4] මහ පොළොවේ සීමා පිහිටවේවේ කවරෙක් ද?
q2[4] ඔහුගේ නම කුමක් ද?
q2[4] ඔහුගේ පුත්‍රයාගේ නම කුමක් ද?
q2[4] නුඹ එවැනි කෙනෙකු දන්නෙහි ද?
5 දෙවිඳුන්ගේ හැම කියමනක් ම අත්දුටු සත්‍යය
වේ;
q2[5] දෙවි සරණ පතන අයට එතුමාණෝ පලිහක්
වැනි ය.
6 එතුමන්ගේ වචනවලට කිසිවක් එක්
නොකරන්න;
q2[6] එසේ කළොත්, එතුමන් ඔබට තර්ජනය කරනු
ඇත.
q2[6] ඔබ බොරුකාරයකු බව පෙන්වනු ඇත.
7 මා ඔබ වෙතෙ ගෙනෙ අයැදුම් දෙකෙක් ඇත;
q2[7] මගේ දිවි ඇති තාක්, ඒවා ප්‍රතික්ෂේප
නොකළ මැනව.
8 වංචාවත් මුසාවත් මා කෙරෙන් දුරු කළ මැනව.
q2[8] මට දිළිඳුකම වත් පොහොසත්කම වත් නුදුන
මැනව.
q2[8] මට වුවමනා පමණට ආහාර දුන මැනව.
9 එසේ දිය යුත්තේ, මා සැප සම්පතින් පිරී, ඔබ
හැරදමා, "ඔය කියන සමිඳාණෝ කවරෙක් දැ"යි
නොකියන පිණිසත්, මා දිළිඳකු වී, සොරකමට වැටී,
දෙවිඳුන්ගේ නාමයට අගෞරව නොකරන පිණිසත්
ය.
10 මෙහෙකරුවකු ගැන හාම්පුතුට කේළාම්
නොකියන්න, එසේ කළොත් සමහර විට ඔබ
මෙහෙකරුගේ සාපය ලැබ දුක් විඳිනු ඇත.
11 සිය මුතුන්මිත්තන්ට දසේ කියන, සිය මවුවරුන්ට
සතේ නොපතන, මිනිසුන් ඇත.
12 තමන්ගේ කිළිටි ගති සෝදා නොදමා, තමන්
පවිත්‍ර යයි සිතන, මිනිසුන් ඇත.
13 අහංකාර, උඩඟු බැල්මක් ඇති මිනිසුන් ඇත.
14 මිහි පිට දිළිඳුන් ද ජනතාව අතරෙන් දුගීන් ද
ගිලදැමීමට, කඩුපත් වැනි දත් හා පිහියා වැනි හකු ද
ඇති මිනිසුන් ඇත.

15 “දනේන, දනේනැ”යි කියන, දූවරුන් දදෙනෙකේ
කූඩැල්ලාට ඇත.
q215 “ඇති, ඇති” කියන, තෘප්තියට නොපැමිණෙන
දේවල් තුන හතරක් ඇත.
16 එනම්, පාතාලය ද වඳ ගැබ ද පිපාසයෙන්
පළෙනෙ මහ පොළොව ද දැවෙන ගින්න ද යන
මේවා ය.
17 පියාට ගරහන, මහලු මව හෙළා දකින අයගේ
දෑස දණේයේ කපුටන් කනු ඇත, ගිජු ලිහිණියන්ට
ගොදුරු වනු ඇත.
18 මට තේරුම්ගත නොහැකි කාරණා තුන හතරක්
ඇත.
19 එනම්, අහස් කුසහෙි රාජාලියා පියාඹන මාවත ද
කඳු මත සර්පයා යන පාර ද මහ සයුරේ නැව් යන
මඟ ද ළඳක සමඟ මිනිසකුගේ පමේ මාවත ද යන
මේවා ය.
20 වසෙඟනකගේ කල්ක්‍රියාව මසෙේ ය:
q220 ඈ කම්සැපහෙි යදෙුණු පසු ඇඟපත
සෝදාගනෙ, “මා කළ වරදක් නැතැ”යි කියන්නී ය.
21 මහ පොළොව කම්පා කරවන, ඊට ඉසිලිය
නොහැකි කරුණු තුන සතරක් ඇත.
22 එනම්, සේවකයකු රජ වීම ද මෝඩයකුට
කෑම බීම බහුල වීම ද
23 පමේ විරහිත කතක් විවාහ වීම ද ස්වාමිදූවගේ
තැන සේවිකාව ගැනීම ද යන මේවා ය.
24 කුඩා වුව ද ඉතා නැණවත් ජාති සතරක් ලොව
සිටිති.
25 කුරාකුහුඹුවෝ දුබල සත්තු ය;
q225 එහතේ ගිම්හානයේ දී උන් කෑම රැස් කර
තබති.
26 බනේ හාවෝ බලෙහීන සත්තු ය;
q226 එහතේ උන් සියල්ලෝ පර්වතවල සිය ගවෙල්
තනාගනිති.
27 පළඟැටියන්ට රජකේ නැත;
q227 එහතේ උන් සියල්ලෝ පළෙ ගැසී ගමන් කරති.
28 හූනා අතින් අල්ලාගත හැකි සතකේ;
q228 එහතේ ඌ රජ මැදුරුවල සැරිසරයි.
29 අභිමාන ලසෙ පියවර තබන තුන් වර්ගයක්
සිටිති.
q229 අලංකාර ලසෙ ඇවිදින තුන් හතර වර්ගයක්
වතේ.
30 එනම්, මෘගයන් අතර ඉතා බලවත්, කිසිවකු
වතේින් අහකට හැරී නොයන සිංහ රාජයා ද
31 කික්ළියන් මැද නටන කුකුළා ද රැළට පරෙටු ව
යන එළුවා ද සිව්රඟ සනෙඟ පිරිවරා යන රජ ද යන
මොවුහු ය.
32 නුඹ මෝඩකමින් උඩඟු වී නපුරු බස් දොඩන්න
පළෙඹනෙ විට කට පියාගනෙ නිහඬ වන්න.
33 කිරි කැලැත්තීමනේ වඬෙරු සෑදයෙි, නහය
මිරිකීමනේ ලේ ගලා එයි, උදහස ඇවිස්සීමනේ
අඬදබර හටගනියි.

## මවගනේ රජුට ඔවාබස්

31 මස්සාහි ලමෙුවලේ රජුගේ මව ඔහුට දුන්
උපදේශ මේ ය:
2 මාගේ ප්‍රියාදර පුත්‍ර රත්නය, මාගේ යැදුම්
නිසා, මාගේ කුසනේ බිහි වූ පුත් රුවන, මට සවන්
දනේන.
3 ඔබේ මුළු කාය ශක්තිය කම්සැපට ම කැප
නොකරන්න;
q23 ඔබේ සම්පත රජුන් වනසන කතුන් උදසො
නාස්ති නොකරන්න.
4 ලමෙුවලේ, මයෙ අසන්න:
q24 රජුන්ට මද්‍යපානය ද රජ කුමරුන්ට සුරා ලෝලය
ද නොහොබියි.
5 සුරාමතින් වරෙි වී ඔව්හු සමහර විට නීතිය
අමතක කරති:
q25 පීඩිතයන්ගේ නඩු අවනඩු කරති.
6 මත්පැන් දිය යුත්තේ මරණාසන්න අයට ය;
q26 සුරාව දිය යුත්තේ ජීවිතය තිත්ත වූ අයට ය.
7 එවැනි අය මත්පැන් බී සිය දිළිඳුකම හා
අවාසනාව අමතක කරෙතේ වා.
8 තමන් උදසො කතා කළ නොහැකි අය වනෙුවනේ
කතා කරන්න;
q28 අනාථ වූවන්ගේ අයිතිවාසිකම් උදසො ඉදිරිපත්
වන්න.
9 ඔවුන් උදසො කතා කොට සාධාරණ විනිශ්චයක්
දනේන;
q29 අසරණයින්ට හා දිළිඳුන්ට යුක්තිය ඉටු කරන්න.

## සත්ගුණවත් බිරිඳ

10 කාර්යක්ෂ ම බිරිඳක කොහනේ සොයාගත
හැකි ද?
q210 ඇගේ අගය මුතුමැණික්වලට වැඩි ය.
11 සිය සැමියා ඇය කරෙහෙි මුළු විශ්වාසය තබයි.
q211 ඔහුට සැප සම්පතින් අඩුවක් නැත.
12 දිවි ඇති තාක් ම ඈ ඔහුට අයහපත නොව
යහපත කරන්නී ය.
13 ඈ ලොම් හා හණ සපයාගනෙ සතොසින්
අත්කම්වල යදෙයෙි.
14 ඈ වළෙඳ නැවක් මනේ, ඇගේ ආහාර
දුරකතරින් ගනේවාගනියි.
15 ඈ හිරු උදාවට පරෙ නැඟිට පවුලේ උදවියට
කෑම පිළියළෙ කරයි;
q215 දාසීන්ට වැඩ නියම කරයි.
16 ඈ කතෙක් ගැන සොයා බලා, එය මිලට ගනියි;
q216 ඇගේ ශ්‍රමයනේ ලත් ආදායමින් ඈ මිදි
වත්තක් වවයි.
17 ඈ කඩිසර ව වැඩ කරන්නී ය;
q217 වැඩට මුළු හිත යොදන්නී ය;
q217 ඇගේ දෑත සවිමත් කරගනියි.
18 සිය වළෙඳ ව්‍යාපාරවලින් ලාභ ඇති බව ඈ
දනියි;
q218 රෑ යාමවල ඇගේ පහන නොනිවී දැල්වයෙි.

19 ඈ ඉද්දට ඇගේ අත් පාවා, දෑතින් වවුන්න
අල්ලයි.
20 ඇගේ නාමෙසුරු අත දිළිඳුන් වෙත දිගු කර ඇත;
q220 එය යාචකාදීන් වෙත විදහා ඇත.
21 හිම වැටෙන කල එන විට පවුල ගැන ඇයට
බියක් නැත;
q221 පවුලේ හැම අයට ම උණුසුම් වස්ත්‍ර ඇත.
22 ඈ ඇඳ ඇතිරිලි සාදාගනියි;
q222 ඇගේ ඇඳුම් සිහින් හණ හා රත්නිල් රෙද්දෙනේ
මසා ඇත.
23 ඇගේ සැමියා ප්‍රජා මූලිකයන් අතර අසුන්ගනියි;
q223 නගර වැසියන්ගනේ ගරු බුහුමන් ලබයි.
24 ඈ සිහින් හණ රෙදි වියා ඒවා විකුණයි;
q224 වෙළෙඳුන්ට බඳපටි සපයා දෙයි.
25 ගෞරවයෙනේ හා ශක්තියෙනේ ඈ සමලංකෘත වී
සිටියි.
q225 අනාගතය ගැන ඈට බිය සැක නැත.
26 ඈ නැණනුවණින් කතා බස් කරයි;
q226 කාරුණික ලෙසෙ ගුරුහරුකම් දෙයි.
27 ඈ අලසකමින් තොර ව ක්‍රියා කරයි;
q227 පවුලේ කටයුතු මැනවින් සංවිධාන කරයි.
28 ඇගේ දූදරුවෝ ඇයට ආසිරි පතති.
q228 ඇගේ සැමියා ද ඇය පසසයි.
29 “අති ප්‍රශංසනීය කාන්තාවෝ තවත් ඇත;
q229 එහෙත් ඔවුන් අතර මුදුන් මල්කඩ ඔබ ය”යි
ඔහු කියයි.
30 රූසිරිය මායාවකි, රූසපුව පහවන්නකි;
q230 එහෙත් දෙව ගරුබිය ඇති කතට ගරු පැසසුම්
ඇත.
31 ඇගේ වැඩ කටයුතුවල සඵලය වර්ණනා
කරන්න;
q231 ඇගේ වැර වීරිය ජනතාවගේ පැසසුමට ලක්
කරන්න.

# ධර්මදේශකයා

### ජීවිතයේ නිස්සාරකම

1 ජෙරුසලමෙහි දාවිත් නිරිඳාණන් පුත්
ධර්මදේශකයාගේ අනුශාසනාව මේ ය:
2 "සියල්ල නිස්සාර ය; සියල්ල නිස්සාර ය. හැම දයෙ
ම නිස්සාර ය"යි ධර්මදේශකයා පවසයි. 3 මිනිසාගේ
ශ්‍රමයෙන්, මුළු මිනිස් ලොවේ ශ්‍රමයෙන් කිසි
වැඩක් ඇද් ද? 4 එක පරපුරක් පහ ව යයි; තව
පරපුරක් මතු වයි; එහෙත්, මහ පොළොව සදහට
ම පවතියි. 5 හිරු උදා වයි, හිරු බැස යයි; එය උදා
වූ තැනට ම යළිදු වහා පැමිණයයි. 6 සුළඟ දකුණ
බලා හමයි, සුළඟ උතුර බලා හමයි; එය කැරකි
කැරකී හමයි. වටරවුමෙහි හමා ගොස් නැවත මුල්
තැනට ම පැමිණයයි. 7 සියලු ගංගා මුහුදට ගලා
බසියි. එහෙත්, මුහුද පිරෙන්නේ නැත; ගංගා නික්ම
ආ තැනට ම නැවත වතුර යයි. 8 හැම දයෙ ම
වෙහෙස ගෙන දෙන සුළු ය. එය කියා නිම කළ
නොහැකි වෙහෙසෙකි. දැකීමෙන් ඇස තෘප්තියට
නොපැමිණයයි; ඇසීමෙන් කන තෘප්තියට
නොපැමිණයයි. 9 මතු ඇති වන්නේ පෙර තිබුණු දේ
ම ය; මතු කරන්න තිබෙන්නේත් පෙර කළ දේ ම
ය. මේ මුළු මිනිස් ලොවෙහි කිසි ම අමුතු දයෙක්
නැත. 10 "මෙන්න, මයෙ අමුතු දයෙකැ"යි මිනිස්සු
කියති. එහෙත්, එය අප උපදින්නටත් පෙර සිදු
වූවකි. 11 යටගිය දවස සිදු වූ දයෙ ගැන මතකයක්
නැත; මතෙන් සිට සිදු වන දයෙ ගැන ද මතු දවසේ
දී මතකයක් නොවෙනු ඇත.

### ධර්මදේශකයාගේ අත්දැකීම

12 ධර්මදේශකයා වන මම ජෙරුසලමෙහි සිහසුන්
අරා ඉශ්රායලේ ජනතාව පාලනය කළෙමි. 13 මේ
මිනිස් ලොවෙහි සිදු වන හැම දයෙ ම ප්‍රඥා ඇසින්
විමසා බැලීමට මාගේ සිත යොමු කළෙමි.
13 දවියන් වහන්සේ මිනිසාට පවරා ඇති ඒ
කටයුත්ත කෙතරම් කරදර සහිත ද? 14 මේ මුළු
මිනිස් ලොවේ කෙරෙන හැම දයෙ මම දිටිමි; ඒ
හැම දයෙ ම නිස්සාර ය; සුළං රොදක් ඇල්ලීමට
කරන වෑයමක් වැන්න. 15 ඇද දේවල ඇද අරින්නට
නොහැකි ය; නැති දේ ගණින්නට නොහැකි ය.
16 1 රාජා 4:29-31 "මට පළමු ව ජෙරුසලමෙහි රජ
කළ සියල්ලන්ට වඩා ගාම්භීර ප්‍රඥාව මට ඇත.
එසේ ය, ප්‍රඥාව හා අවබෝධය හොඳට හුරු පුරුදු
යැ"යි මම මට ම කියාගතිමි. 17 මෙසේ එක අතකින්
ප්‍රඥාව හා අවබෝධය ද අනික් අතින් මෝහය හා
අඥානකම ද තේරුම් ගැනීමට අවධානය යදෙවුමෙි.
එය ද සුළං රොදක් ඇල්ලීමට කරන වෑයමක් මෙන්
විය. 18 මන්ද, ප්‍රඥාව වැඩි වතේම කරදර ද වැඩි
වේ; දැනුම වැඩි වතේම ශෝකය වැඩි වේ.

### සැප සම්පත්වල නිස්සාර බව

2 මම විනෝදය සොයා, එයින් ප්‍රමුදිත වීමට
සිතා ගතිමි. එය ද නිස්සාර දයෙක් විය.
2 සිනාව පිස්සුවක් බව ද විනෝදයෙන් සතෙක්
නොවෙන බව ද මට පෙනිණ. 3 ප්‍රඥාව සවේමේ
අදහස තිබිය දී ම මුළු මිනිස් ලොවෙහි මනුෂ්‍යයා
යා යුතු යහ මඟ කුමක් ද කියාත්, මිනිස් වර්ගයාට
ප්‍රීතිය දෙන්නේ කුමක් ද කියාත් දැනගන්න පිණිස
මාගේ සිත ගත පිනවීමට මම තීරණය කර ගතිමි.
4 1 රාජා 10:23-27; 2 වංශා 9:22-27 මම උදාර දේ
කළෙමි; මම මන්දිර ගොඩනඟා, මිදිවතු
වවාගත්තමේ; 5 මම ගවුෙයන් තනා නානාප්‍රකාර
පලතුරු ඒවායෙහි වගා කළෙමි. 6 ගස් වැවෙන
ගවෙතුවලට වතුර සපයන පිණිස මම දිය පොකුණු
සාදා ගතිමි. 7 1 රාජා 4:23මම දාසදාසීන් මිලේට
ගතිමි. මාගේ ගයෙි ම උපන් වැඩකරුවෝත් සිටියෝ
ය. මින් පෙර ජෙරුසලමෙහි විසූ අන් කිසිවකුෙට වඩා
ගව පට්ටි හා එළු බැටළු පට්ටි මට වූ හ. 8 1 රාජා
10:10,14-22මාගේ විජිතයෙහි වූ රාජකීය
භාණ්ඩාගාරවලින් රන් රිදී ද වනෙ සම්පත් ද රැස්
කරගතිමි. ගායක ගායිකාවෝ මට ගී ගැයූ හ.
මිනිසකුෙගේ ප්‍රීතිය සපුරාලීමට ඇති පමණ
වනිතාවන් මම සපයාගතිමි.
9 1 වංශා 29:25 මෙසේ ජෙරුසලමෙහි මට
පළමුවෙන් සිටි අන් හැමට වඩා ඉහළින් මම
වැජඹුණෙමි. ප්‍රඥා මහිමය මා තුළ අඩු නො වී ය.
10 මා සිතූපැතූ කවර දයෙක් වුව ද මම ලබාගතිමි.
මට රිසි වූ කිසි දයෙකින් මට අඩුවක් නො වී ය. ම
සිත යොදා මා සාදාගත් හැම දයෙ ගැන ම මම
ආඩම්බර වීමි. ඒ හැම දයෙ මාගේ සැපත විය.
11 එහෙත්, මා කළ හැම කාර්යයක් ම, වෙහෙස දරා
කළ මාගේ හැම කටයුත්තක් ම දසෙ මා බැලූ විට,
ඒ සියල්ල නිස්සාර, හිස් ප්‍රයත්න බව ද සුළං
රොදක් ඇල්ලීමට කරන වෑයමක් බව ද දුටුවමේ.

### ඥානය පවා නිෂ්ඵල ය

12 එවිට මම ප්‍රඥාව, මෝහය හා අඥානකම
කවරේ දැ යි සිතන්නට පටන් ගතිමි. මන්ද, එක
රජකුෙ කරන්නේ පෙර රජවරුන් කළ දේ ම ය.
13 අන්ධකාරයට වඩා ආලෝකය උතුම් සේ
අඥානකමට වඩා ප්‍රඥාව උතුම් බව දැන් මට

පෙනේ. 14 නුවණැති අය නුවණැසින් බලා ගමන්
කරති. අනුවණ අය අඳුරෙහි ඇවිදිති. එහෙත්, ඒ
දෙගොල්ලගේ ම ඉරණම එක ය. 15 එකල,
“අනුවණයාට සිදු වූ දේ ම මටත් සිදු වන්නේ ය;
ඉතින් මාගේ නුවණින් කුමන වැඩක් සිදු වී දැ”යි
මම කල්පනා කළෙමි. එවිට, “මාගේ ප්‍රඥාවත්
නිස්සාර දෙයකැ”යි මට පෙනිණි. 16 මන්ද, මතු
පැමිණෙන දවස්වල සියල්ලන් ගැන මුළුමනින් ම
අමතක වී යන බැවින්, අඥානයා ගැන මෙන් ම
ප්‍රඥාවන්තයා ගැනත් මතකයක් නොතිබෙනු ඇත.
අඥානයා මෙන් ම ප්‍රඥාවන්තයාත් නසිනු නියත ය.
17 මෙසේ මුළු මිනිස් ලොවෙහි හැම කටයුත්තක් ම
අයහපත් බව මට පෙනිණි. මම ජීවිතයට අප්‍රිය
කළෙමි. හැම දෙය ම සුළං රොදක් ඇල්ලීමට කරන
වෑයමක් මෙන් නිසරු බව දිටිමි.
18 මුළු මිනිස් ලොවෙහි මා ගත් සියලු
ප්‍රයත්නයන්, මාගේ ඇවෑමෙන් පහළ වන
කෙනෙකුට තබා යා යුතු බැවින්, හැම දෙයක් ගැන
ම මම කලකිරුණෙමි. 19 ඔහු ප්‍රඥාවන්තයෙක් වේ
ද අඥානයෙක් වේ දැ යි කියන්නට දන්නේ කවරෙක්
ද? මුළු මිනිස් ලොවෙහි වීර්යයෙන් හා ප්‍රඥාවෙන්
මා ඉටු කළ හැම දෙය ම ඔහු සන්තක වනු ඇත.
මෙය ද නිස්සාර දෙයකි. 20 එබැවින් මා මුළු මිනිස්
ලොවෙහි කළ මාගේ මුළු කාර්යය ගැන මාගේ සිත
කලකිරෙන්නට වන. 21 මනුෂ්‍යයෙක් ප්‍රඥාව,
අවබෝධය හා දක්ෂතාව ඇති ව සිය කාර්ය ඉටු
කරයි. එහෙත්, කිසි වෙහෙසක් නොදැරූ වෙන
කෙනෙකුට ඒවායේ ප්‍රතිඵල තබා යන්නට ඔහුට
සිදු වෙයි. මෙය ද නිෂ්ඵල, අසාධාරණ දෙයකි.
22 මනුෂ්‍යයා මුළු මහත් පොළොවෙහි වෙහෙස දරා
කරන කටයුතුවලින් හා මානසික ශ්‍රමයෙන් ඔහුට
කුමන වැඩක් වේ ද? 23 ජෝබ් 5:7; 14:1ජීවිතය
මුළුල්ලේ ම ඔහුට ඇත්තේ කරදර හා සිත්
වේදනාව පමණ ය. රාත්‍රියේ දී පවා ඔහුගේ සිතට
නිස්කලංකයක් නැත. මෙය ද නිෂ්ඵල දෙයකි.
24 ධර්ම 3:13; 5:18; 9:7; යෙසා 56:12; ලූක් 12:19;
1 කොරි 15:32 මිනිසකුට ඇති හොඳ ම දෙය නම්,
තමා උපයාගත් දෙයින් සෑහීමට පත් ව, කා බී සැප
සෙල්ලම් කිරීම ය. එහෙත්, එය ද දෙවියන්
වහන්සේගෙන් එන වරමක් බව දිටිමි. 25 මන්ද, උන්
වහන්සේගෙන් වෙන් ව කෑම අනුභව කරන්නටත්,
සැප භුක්ති විඳින්නටත් පුළුවන් කෙනෙක් සිටිත් ද?
26 ජෝබ් 32:8; හිතෝ 2:6දෙවියන් වහන්සේ
ඉදිරියෙහි යහපත් ව සිටින මනුෂ්‍යයාට උන්
වහන්සේ ප්‍රඥාවත්, අවබෝධයත්, ප්‍රීතියත් දෙන
සේක. එහෙත්, දෙවියන් වහන්සේ ඉදිරියෙහි යහපත්
ව සිටින අයට හිමි වන පිණිස, උන් වහන්සේ
පව්කාරයාට වෙහෙස දරා වස්තු රුස්කර තැබීමට
සලස්වන සේක. මෙය ද නිෂ්ඵල දෙයකි. සුළං
රොදක් ඇල්ලීමට කරන වෑයමකි.

## හැම දෙයට ම නියම කාලයක් හා වේලාවක් ඇත

3 හැම දෙයට ම ප්‍රස්තාවක් ද මේ මහ
පොළොවෙහි හැම කාරණයට ම නිසි කාලයක්
ද ඇත.
2 උපදින්නට කාලයක් සහ නසින්නට කාලයක්
ඇත; සිටුවන්නට කාලයක් සහ උදුරා දමන්නට
කාලයක් ඇත;
3 මරන්නට කාලයක් සහ සුව කරන්නට කාලයක්
ඇත; කඩා දමන්නට කාලයක් සහ ගොඩනඟන්නට
කාලයක් ඇත;
4 අඬන්නට කාලයක් සහ සිනාසෙන්නට කාලයක්
ඇත; වැලපෙන්නට කාලයක් සහ නටන්නට කාලයක්
ඇත;
5 පෙම්වතුන්ට එක් වීමට කාලයක් සහ එයින්
වැළකීමට කාලයක් ඇත. වැළඳගන්නට කාලයක් සහ
වැළඳගැනීමෙන් වළකින්නට කාලයක් ඇත;
6 සොයාගන්නට කාලයක් සහ නැති වී යන්නට
කාලයක් ඇත; තබාගන්නට කාලයක් සහ ඉවත
දමන්නට කාලයක් ඇත;
7 ඉරාදමන්නට කාලයක් සහ එලලන්නට කාලයක්
ඇත; නිශ්ශබ්ද ව සිටින්නට කාලයක් සහ කතා
කරන්නට කාලයක් ඇත;
8 ප්‍රේම කරන්නට කාලයක් සහ ද්වේෂ කරන්නට
කාලයක් ඇත; යුද්ධයට කාලයක් සහ සාමයට
කාලයක් ඇත.
9 අපේ සියලු වැඩකටයුතුවලින් කවර
ප්‍රයෝජනයක් ඇද් ද? 10 දෙවියන් වහන්සේ මනුෂ්‍ය
වර්ගයා පිට තබා ඇති කාර්යය මම දනිමි. 11 උන්
වහන්සේ සියලු දේ ම ඒ ඒ කාලයට සුදුසු ලෙස
සකසා තිබේ. උන් වහන්සේ අතීතය හා අනාගතය
පිළිබඳ හැඟීම් මිනිසුන්ගේ සිත්හි තබා ඇත. එසේ
වුවත්, දෙවියන් වහන්සේ මුල සිට අග දක්වා කළ
කාරණා දැනගන්නට මනුෂ්‍යයාට බැරි ය. 12 එබැවින්
සිය ජීවිත කාලයේ දී ප්‍රීති වී හරි දෙය කිරීමට
වඩා හොඳ දෙයක් ඔවුන්ට නැති බව මම
තේරුම්ගතිමි. 13 අප කළ යුත්තේ, අප උපයාගත්
දෙයින් කා බී ප්‍රීති වීම ය; එය දෙවියන්
වහන්සේගේ දීමනාවකි.
14 දෙවියන් වහන්සේ කරන සියල්ල සදහට ම
පවතින බව දනිමි. ඊට එක් කළ හැකි කිසිවක් නැත;
ඉන් අඩු කළ හැකි කිසිවක් ද නැත. දෙවියන්
වහන්සේ එය කර ඇත්තේ, මනුෂ්‍යයන් තමන්
වහන්සේ ඉදිරියෙහි ගරුබිය දක්වන පිණිස ය.
15 දැන් තිබෙන දේ මින් පෙර ද තිබුණේ ය. මතු
සිදු වන්නට යන දෙය මින් පෙර ද සිදු විය. දෙවියන්
වහන්සේ එම දේ ම නැවත නැවත සිදු කරන
සේක.

## ලොවේ ඇති අයුක්තිය

16 මේ මිනිස් ලොවෙහි යුක්තිය තිබිය යුතු තැන
අයුක්තිය ද සාධාරණකම තිබිය යුතු තැන
අසාධාරණකම ද තිබෙන බව මම දිටිමි. 17 එවිට,

“දෙවියන් වහන්සේ ධර්මිෂ්ඨයාත්, දුෂ්ටයාත් එක
සේ විනිශ්චය කරනු ඇත; සියලු කාරණාවලටත්,
සියලු වැඩවලටත් නියමිත කාලයක් පැමිණේ යැ”යි
මම සිතාගත්තෙමි. 18 “මනුෂ්‍යයන් මෙසේ ක්‍රියා
කරන්නේ, දෙවියන් වහන්සේ ඔවුන් සෝදිසි කොට
ඔවුන් තිරිසනුන්ට වඩා උසස් නොවන බව ඔවුන්ට
දන්වන පිණිස ය”යි මම සිතින් සිතාගත්තෙමි.
19 ඉතින්, මනුෂ්‍යයන්ට හා තිරිසනුන්ට ඇත්තේ එක
ම ඉරණමකි. තිරිසනා මෙන් ම මිනිසාත් මරණයට
පත් වෙයි. මේ දෙගොල්ල ම මවා ඇත්තේ එක
අයුරිනි. මෙසේ තිරිසනාට වඩා විශේෂ වාසියක්
මිනිසාට නැත. හැම දෙය ම නිස්සාර ය. 20 සියල්ලෝ
ම එක තැනකට යන්නෝ ය; සියල්ලෝ ම පස්වලින්
වූ හ; සියල්ලෝ ම නැවත පස්වලට හැරී යන්නෝ
ය. 21 මනුෂ්‍යයන්ගේ පණ ඉහළට නැඟී යනු ඇද්ද
කියාත්, තිරිසනාගේ පණ පොළොවේ පස යටට
බසිනු ඇද්ද කියාත් දන්නේ කවරෙක් ද? 22 මෙසේ
මනුෂ්‍යයා තම කටයුතුවලින් ප්‍රීතිය ලබනවාට වඩා
සැපතක් නැති බව දිටිමි; එය ඔහුගේ ඉරණම ය.
මන්ද, මරණින් පසු තමාට සිදු වන දේ දකින්න ඔහු
ආපසු ගෙනෙන්නේ කවරෙක් ද?

## දුක් පීඩාවලට සමහර හේතු

4 මේ මහ පොළොවෙහි කෙරෙන සියලු
අයුක්තිය දෙස බැලූ විට පීඩා ලබන්නන්ගේ
කඳුළු මම දිටිමි; ඔවුන්ට සනසන්නෙක් ද නො වී ය;
ඔවුන්ට පීඩා කරන්නන්ගේ පක්ෂයට බලය තිබුණේ
ය. එහෙත්, සනසන්නෙක් නො වී ය. 2 එබැවින්,
“තව ම ජීවත් ව සිටින්නන්ට වඩා මළගිය
ඇත්තන්ගේ තත්ත්වය යහෙකැ”යි මම කීයෙමි.
3 තවද, “ඒ දෙගොල්ලට ම වඩා මිහි පිට කෙරෙන
නපුරු ක්‍රියා නොදුටු, තව ම නූපන් මිනිසා
වාසනාවන්ත යැ”යි කල්පනා කළෙමි.
4 තවද, මිනිසකු අධික වීර්යයෙන් දක්ෂ ලෙස
කටයුතු කරන්නේ, සිය අසල්වැසියා කෙරේ ඇති
ඊර්ෂ්‍යාව නිසා බව මම දිටිමි. මෙය ද නිසරු
කාර්යයකි. සුළං රොදක් ඇල්ලීමට කරන වෑයමකි.
5 “තමාගේ අත් දෙක අකුළාගෙන, වැඩක්
නොකොට සාගින්නෙන් මැරෙන්නේ මෝඩයකැ”යි
මිනිස්සු කියති. 6 එහෙත්, නිෂ්ඵල උත්සාහයෙන් දෑත
පුරවා ගැනීමට වඩා, හිතේ කරදරයක් නැති ව එක
මිටක් පුරවාගැනීම හොඳ ය.
7 එකල මම තවත් නිසරු දෙයක් මිහි පිට ඇති බව
දිටිමි. 8 කාත් කවුරුත් නැති ව, හුදකලා ව වසන
කෙනෙක් ඇත. ඔහුට පුත්‍රයෙක් වත්, සහෝදරයෙක්
වත් නැත; එහෙත්, ඔහුගේ සියලු ම වැඩකටයුතුවල
නිමාවක් නැත; ඔහු තමා උපයන වස්තුවෙන්
තෘප්තියට නොපැමිණෙයි. “මම මෙසේ පණ
නොතකා, වෙහෙස වී, සැපක් නැති ව වැඩ
කරන්නේ කා උදෙසා දැ”යි ඔහු නොඅසයි. මෙය ද
නිසරු දෙයකි, කාලකණ්ණි ජීවිතයකි.
9 එක් කෙනෙකුට වඩා දෙදෙනෙක් හොඳ ය;
දෙදෙනෙකු එක් ව වැඩ කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල
ලබාගනු ඇත. 10 ඔවුන්ගෙන් කෙනෙකු වැටුණොත්
අනික් තැනැත්තා සිය යහළුවා නැඟුටුවනු ඇත.
එහෙත්, තමා නැඟුටුවන්න එවැනි කෙනෙකු නැති ව
තනි ව සිට වැටෙන්නාට වන විපතක මහත! 11 තව
ද, ශීත කාලයේ දී දෙදෙනෙකු එක් ව සැතපුණොත්
ඔවුන්ට උණුසුම ලැබෙන්නේ ය. එහෙත්, කෙනෙකු
තනියම උණුසුම් වන්නේ කොහොම ද? 12 තනි ව
සිටින කෙනෙකු පරාජය විය හැකි ය. එහෙත්,
සතුරාට විරුද්ධ ව සිටින්නට දෙදෙනෙකුට හැකි වෙයි.
තුන් පොටේ ලණුවක් පහසුවෙන් නොකැඩෙන්නේ
ය.
13 අවවාදයක් පිළිගන්න අකමැති අඥාන මහලු
රජකුට වඩා දිළිඳු, නැණවත් යෞවනයෙක් හොඳ
ය. 14 ඔහු හිරගෙදරින් රජ ගෙදරට ගිය, දිළිඳුකමින්
රජකමට ගිය කෙනෙකු වුවත් එය සැබෑ ය. 15 “මිහි
පිට ඇවිදින ජීවමාන මිනිසුන් අතර රජකමට සුදුසු
එවැනි යෞවනයෝ ඇතැ”යි මට කල්පනා වේ.
16 ඔහු ගණන් කළ නොහැකි තරම් සෙනඟකට
අධිපති ව රජකම් කරනු ඇත. එහෙත්, ඔහුගේ
ඇවෑමෙන් පසු, ඔහු කළ දේ ගැන කෘතඥතාව
දක්වන කිසිවෙක් නැත. මෙය ද නිසරු දෙයකි. සුළං
රොදක් ඇල්ලීමට කරන වෑයමකි.

## බාරහාර ගැන උපදේශ

5 ඔබ දෙවියන් වහන්සේගේ ගෘහයට යන විට
ප්‍රවේසම් වන්න; අඥානයන් මෙන් පූජා ඔප්පු
කිරීමට වඩා කීකරු වමින් ළං වීම හොඳ ය. මන්ද,
තමන් නපුර කරන බව ඔව්හු නොදනිති. 2 කතා
කිරීමට පෙර හොඳින් සිතා බලන්න; දෙවියන්
වහන්සේ ඉදිරියෙහි ඉක්මන්කාරකමින් බාරහාර
නොවන්න. මන්ද, දෙවියන් වහන්සේ ස්වර්ගයෙහි ය.
ඔබ පොළොවෙහි ය. ඒ නිසා ඔබේ වචන ස්වල්ප
වේ වා! 3 කටයුතු බහුල වීමෙන් කරදර වූ සිතට
සිහින පෙනේ. වචන රාශියක් කියන විට
අඥානයාගේ අනුවණකම මතු වෙයි. 4 ගීතා
66:13-14ඔබ දෙවියන් වහන්සේට බාරහාර වන විට
එය ගෙවන්නට පමා නොවන්න. මන්ද, උන්
වහන්සේ අඥානයන්ට කැමැති නැත. 5 ඔබේ
බාරහාර ගෙවන්න. බාරයක් වී නොගෙවා සිටීමට
වඩා බාරයක් නොවී සිටීම හොඳ ය. 6 ඔබේ
වචනවලින් පව් කිරීමට ඉඩ නොතබන්න. ‘මා අදහස්
නොකළ දෙයකැ’යි පූජකයාට නොකියන්න. දෙවියන්
වහන්සේ ඔබ කෙරේ උදහස් වී ඔබේ ව්‍යාපාර
නාස්ති කරදමන්න උන් වහන්සේට ඉඩ තබන්නේ
මන් ද? 7 හිස් වූ ස්වප්න රාශියකින් මෙන් ම, වචන
රාශියකින් ද වැඩක් නැත. එබැවින් ඔබ දෙවියන්
වහන්සේට ගරුබිය දක්වන්න.

### දිළින්දාගේ පීඩාව

8 දිළිඳුන්ට පීඩා කිරීම ද යුක්තිය හා සාධාරණකම
පෙරළීම ද රටේ ඇති වන බව ඔබ දකින විට ඒ
ගැන පුදුම නොවන්න. හැම නිලධාරියාට ම ඉහළින්
ඊට වඩා උසස්, වෙන නිලධාරියෙක් ඇත.
9 මහ රජුගේ පවා ජීවිතය රඳා ඇත්තේ, කෙතේ
අස්වනු පිට ය.

### ලෞකික සම්පත්වල නිෂ්ප්‍රයෝජනකම

10 ධනසම්පතට ඇලුම් වන්නා ධනසම්පතින් වත්,
වස්තුවට ඇලුම් වන්නා වස්තුවෙන් වත් තෘප්තියට
නොපැමිණෙයි. මෙය ද නිසරු දෙයකි. 11 වස්තුව
වැඩි වන්න, වැඩි වන්න එයින් නඩත්තු කළ යුතු අය
ද වැඩි වෙති. ධනවතාට ඇති එක ම ප්‍රයෝජනය
නම්, තමා ධනවතෙකු බව දැකීම ය. 12 කම්කරුවා
ටිකක් කෑවත්, හුඟක් කෑවත් ඔහුට සුව සේ
සැතපිය හැකි ය; එහෙත්, පොහොසතාට තමාගේ
වස්තු සම්භාරය නිසා නින්දක් නැත.
13 මේ මිනිස් ලොවෙහි මහා අසාධාරණ දෙයක්
ඇත. 14 එනම්, දුෂ්කර කාලයක දී ප්‍රයෝජනයට
ගැනීමට මිනිසෙකු රැස්කර තබන වස්තුව යම්
අභාග්‍යයකින් නැති වී, ඔහුගේ දූදරුවන්ට කිසිවක්
නැති වී යාම ය. 15 ජෝබ් 1:21; ගීතා 49:17; 1
තිමෝ 6:7ඔහු මවු කුසෙන් මෙලොවට නික්ම ආ
ලෙස ම කිසිත් නැති ව ලොවින් තුරන් වන්නේ ය.
තමාගේ අතින් උපයාගත් කිසිවක් ඔහු ගෙනයන්නේ
නැත. 16 මෙය ද අයුක්තියකි; ඔහු ආ ලෙස ම ඔහු
යන්නේ ය. සුළං රොදක් ඇල්ලීමට ඔහු ගන්න
වෙහෙසින් ඔහුට ඇති ප්‍රයෝජනය කවරේ ද?
17 ඔහුගේ ජීවිතයේ සියලු දවස්වල ඔහුට
අන්ධකාරය හා දුක ඇත. දැඩි සිත් වේදනාව හා
කෝපය ඇත.
18 මට අවබෝධ වූ එක දෙයක් තිබේ. එනම්,
දෙවියන් වහන්සේ මිනිසෙකුට දෙන ජීවිතයේ සියලු
දවස්වල මිහි පිට ඔහුගේ සියලු වැඩකටයුතුවලින්
උපයාගත් දෙයින් ඔහු සෑහීමට පැමිණ, කා බී
විනෝද වීම ය. ඔහුගේ ඉරණම එය වේ. 19 තවද,
දෙවියන් වහන්සේ මනුෂ්‍යයෙකුට සැප සම්පත් දී,
ඒවා භුක්ති විඳින්නටත්, තමාගේ කොටස රැගෙන
එයින් ප්‍රීතිවන්නටත් සලසා තිබේ නම්, ඔහු ඒ
ගැන කෘතඥ විය යුතු ය. එය දෙවියන්
වහන්සේගෙන් එන දීමනාවකි. 20 මන්ද, දෙවියන්
වහන්සේ ඔහුට ප්‍රීතිය දී ඇති බැවින්, කෙටි
ජීවිතයක් ගැන ඔහුට කරදරයක් නැත.

### ලද දෙයින් සතුටු වීම

6 මිනිස් ලොවෙහි මා දුටු අයුක්තියක් ඇත. එය
ඉතා බරපතල ය. 2 මිනිසෙකු ආසා වන හැම
දෙයක් ම, වස්තුව, ධනසම්පත, ගෞරවය යන
සියල්ල ම දෙවියන් වහන්සේ ඔහුට දුන්නත්, ඒවා
භුක්ති විඳීමට ඔහුට ඉඩ නොදෙන බැවින් ඒවා
අන්‍යයෙකු සතු වෙයි. මෙය නිසරු දෙයකි; තදබල
වරදකි. 3 මනුෂ්‍යයෙකුට දාව දූදරුවන් සියයක්
උපන්නත්, ඔහු දිගායු වැළඳුවත්, ඔහු සැපසම්පතින්
තෘප්තියට පැමිණෙන්නේ වත්, ඔහුට සුදුසු
භූමදානයක් ලැබෙන්නේ වත් නැත්නම්, උපන් ගෙයි
දී මළ දරුවෙකු ඔහුට වඩා හොඳ යයි කීමි. 4 ඒ
දරුවාගේ ඉපදීම නිෂ්ඵල ය. ඔහු අන්ධකාරයට පහ
ව යයි. ඔහුගේ නම ද අමතක වනු ඇත. 5 ඔහු හිරු
එළිය දුටුවේ වත්, කිසිවක් දැනගත්තේ වත් නැත.
6 එහෙත්, ඔහුට සහනයක් ඇත. අන්තිමේ දී ඒ
දෙගොල්ල ම යන්නේ එක ම තැනට නොවේ ද?
7 මිනිසෙකු කොයි දෙය කරන්නේත් බඩවියත
පුරවාගැනීමට ය. එහෙත්, ඔහුගේ සාගින්න
කවදාවත් නොනිවෙයි. 8 ප්‍රඥාවන්තයෙකු
අඥානයෙකුට වඩා හොඳ යයි කියන්නේ කොහොම
ද? ජීවිතයට මුහුණ පා දැනුම ලැබීමෙන් දුප්පතාට
ඇති වාසිය කුමක් ද? 9 එයින් කිසි වැඩක් නැත. එය
සුළං රොදක් ඇල්ලීමට කරන වෑයමක් මෙන් නිෂ්ඵල
ය. තව තවත් අමුතු දේ ලබන්න ආසා වීමට වඩා
ලද දෙයින් සතුටු වී ජීවත් වීම හොඳ ය.

### ජීවිතයේ අබිරහස

10 කොයි කවර දෙයක් වුව ද සිදු වන්නේ පූර්ව
නියමයක් අනුව ය. තමාට වඩා බලවත් උතුමෙකු
සමඟ විවාද කරන්න මනුෂ්‍යයෙකුට බැරි ය. 11 ඒ
විවාදය වැඩිවන්න වැඩිවන්න එය තව තවත් නිෂ්ඵල
වේ. එයින් ඔහුට කිසි වාසියක් නැත.
12 මනුෂ්‍යයාගේ ජීවිතයේ එනම්, සෙවණැල්ලක්
මෙන් ඔහු ගතකරන ඔහුගේ නිෂ්ඵල ජීවිත කාලයේ
පරම සම්පත කිමෙකු දැ යි දන්නේ කවරෙකු ද?
නොහොත් මිහි පිට වසන මනුෂ්‍යයෙකුට මරණින්
පසු කුමක් ඇද්දැ යි දන්නෝ කවුරු ද?

### ජීවිතය පිළිබඳ ගැඹුරු අදහස්

7 හිතෝ 22:1 හොඳ නාමය සුවඳ විලවුන්වලට
වඩා මිහිරි ය. උපත ලබන දවසට වඩා
මියයන දවස හොඳ ය.
2 අවමඟුල් ගෙදරකට යාම මඟුල් ගෙදරකට යාමට
වඩා හොඳ ය. මන්ද, මරණය හැම මිනිසාගේ
ඉරණම වේ. ජීවත් ව සිටින කවුරුනුත් එය සිතට
ගත යුතු ය.
3 සිනාවට වඩා ශෝකය හොඳ ය. මන්ද, එයින්
මුහුණ මැලවී ගියත් නුවණ තියුණු වෙයි.
4 පැණවතාගේ සිත යොමු වන්නේ මරණය දෙසට
ය; අඥානයන්ගේ සිත යොමුවන්නේ විනෝදය
දෙසට ය.
5 අඥානයන්ගේ පැසසුමට සවන් දීමට වඩා
ප්‍රඥාවන්තයාගේ තරවටුවට සවන් දීම හොඳ ය.
6 මන්ද, සැළිය යට උදුනෙහි දරකෝටු පුපුරන
ශබ්දය යම්සේ ද අඥානයාගේ සිනාවත් එසේ ම ය.
එහි කිසි ම තේරුමක් නැත.
7 බලහත්කාරකම් කිරීමෙන් නුවණැත්තා
අනුවණයෙකු වෙයි. අල්ලස් ගැනීමෙන් චරිතය
දූෂණය වෙයි.

8 යම් දෙයක අවසානය එහි ආරම්භයට වඩා
හොඳ ය. අහංකාරයට වඩා ඉවසීම උතුම් ය.
9 ජාකො 1:19 කෝප වීමට ඉක්මන් නොවන්න.
මන්ද, කෝපය සිතේ තබාගැනීම අනුවණකමකි.
10 "අතීතය වර්තමානයට වඩා හොඳ ව තිබුණේ
මන්දැ"යි ප්‍රශ්න නොකරන්න. එය බුද්ධිමත්
ප්‍රශ්නයක් නොවේ.
11 ජීවත් ව සිටින කවරකු වුව ද ප්‍රඥාවන්ත විය
යුතු ය. 12 ධනසම්පතින් ඇති වන ආරක්ෂාව හා සම
ආරක්ෂාවක් ප්‍රඥාවෙන් ලැබෙනු ඇත. ප්‍රඥාව
ඔබේ ජීවිතය සුරක්ෂිත ව තබයි. දැනුමෙන් ඇති
වන වාසිය එය වේ.
13 දෙවියන් වහන්සේගේ ක්‍රියාවලිය මෙනෙහි
කරන්න; උන් වහන්සේ ඇද කළ දේ ඇද අරින්න
පුළුවන් කාට ද?
14 සැප සම්පත් ඇති කල ප්‍රීති වන්න; විපත ඇති
කල මෙය කල්පනාවට ගන්න; සැපත හා විපත යන
දෙක ම එවන්නේ දෙවියන් වහන්සේ ය. ඉන්පසු
කුමක් වේ දැ යි කිසිවෙක් නොදනිති.
15 නිස්සාර ව ගෙවී ගිය මාගේ ජීවිතයේ දී මම
හැම දෙය ම දැනගතිමි. සමහර විට දැහැමි
කෙනෙක් මරණයට පත් වේ. දුෂ්ටයෙක් නපුරුකම්
කළත්, දිගුකල් ජීවත් වේ. 16 පමණට වඩා
ධර්මිෂ්ඨයෙක් නොවන්න. පමණට වඩා
ඥානවන්තයෙක් නොවන්න. එසේ වීමෙන් ඔබ නැසී
යන්නේ කුමට ද? 17 අධික ලෙස දුෂ්ට ව නො
සිටින්න. අධික ලෙස අඥානයෙක් ද නොවන්න.
අකාලයේ දී නැසී යන්නේ කුමට ද? 18 මෙහි දී මැද
පිළිවෙත අනුගමනය කරන්න. කෙසේ වෙතත්, දේව
ගරුබිය ඇති තැනැත්තේ සඵලවනු ඇත.
19 ප්‍රඥාව වූ කලී, අධිපතීන් දසදෙනෙකු
නගරයකට කරන සේවයට වඩා උසස් සේවයක්
කිරීමට මිනිසකුට ඇති ශක්තියකි.
20 කිසි ම වරදක් නොකොට, නිරතුරු යහපත ම
කරන දැහැමි මිනිසෙක් ලොව කිසි තැනක නැත.
21 මිනිසුන් කරන හැම දෙයට ම ඔබේ සිත යොමු
නොකරන්න. එසේ කළොත් සමහර විට ඔබේ
වැඩකරුවා ඔබට දොස් තබන බව ඔබ අසනු ඇත.
22 මන්ද, ඔබත් නොයෙක් වර අනුන්ට එසේ ම
දොස් තැබූ බව ඔබේ සිත දැනගනු ඇත.
23 මේ සියල්ල මම ප්‍රඥාවෙන් සෝදිසි කර
බැලීමි. "මම ප්‍රඥාවන්ත වන්නෙමි"යි කීමි; එහෙත්,
එය මා ඉක්මවා තිබුණේ ය. 24 ජීවිතයේ තේරුම
දත හැකි කාට ද? එය අපට තේරුම්ගත නොහැකි
තරම් ගැඹුරු ය; අචින්ත්‍යය ද වේ. 25 මම ප්‍රඥාව
ද කාරණාවලට හේතුව ද දැනගැනීමටත්, සෙවීමටත්
ගවේෂණය කිරීමටත් සිත යොමු කළෙමි. එවිට
නපුරුකම අඥානකම බව ද මෝහය උතුම්කම බව
ද සනිටුහන් කර ගතිමි.
26 ස්ත්‍රිය මරණයටත් වඩා භයංකර ය. ඈ
මලපතක් වැන්න; ඇගේ සිත දැලක් වැන්න; ඇගේ
අත විලංගුවක් වැන්න. දෙවියන් වහන්සේ ඉදිරියෙහි
යහපත් වන තැනැත්තේ ඇගෙන් මිදෙයි; එහෙත්,
පව්ටු අය ඈට අසුවෙති. 27 කරුණු වටහාගැනීම
පිණිස එකක් පාසා විමසමින්, "මම මෙය
දැනගතිමි"යි ධර්මදේශකයා කියන්නේ ය. 28 මට
තවමත් සොයාගත නොහැකි වූ, මාගේ බුද්ධිය
තවමත් විමසමින් සිටින කාරණයක් ඇත. දහසක්
අතර ගරු කටයුතු එක මිනිසෙකු මට සම්බ වූ
නමුත්, දහසක් අතර එවැනි ස්ත්‍රියක් නම්, මට
සම්බ නොවූවා ය. 29 මම එක දෙයක් තේරුම්
ගතිමි: එනම්, දෙවියන් වහන්සේ මනුෂ්‍යයා චාම්,
අවංක කෙනෙකු ලෙසෙ මැවූ සේක; එහෙත්, ඔහු ම
තමා අවුල් වියවුල් කෙනෙකු බවට පත් කරගෙන
ඇත.

## රාජාඥා සැලකීම

8 ප්‍රඥාවන්තයාට සම කළ හැකි කෙනෙක් ඇද්
ද? කාරණයක අර්ථය දන්නේ කවරෙක් ද?
මිනිසෙකුගේ මුහුණ ඔහුගේ ප්‍රඥාවෙන් පැහැපත්
වෙයි; එහි රළුකම පහවී යයි.
2 රජුගේ ආඥා රක්ෂා කරන්න; ඔබ දෙවියන්
වහන්සේට දිවුරුම් දුන් නිසා එසේ කරන්න. 3 රජු
ඉදිරියෙහි රැඳී නොසිටින්න; නපුරු දෙයක
නොපවතින්න; මන්ද රජු කැමැති ඕනෑම දෙයක්
ඔහුට කළ හැකි ය. 4 රජු සිය ආධිපත්‍යය ඇති ව
ක්‍රියා කරයි. ඔහු කුමක් කරන්නේ දැ යි ප්‍රශ්න
කිරීමට කෙනෙක් නැත. 5 රජුගේ ආඥා රක්ෂා
කරන්නාට අනතුරක් නැත. එසේ කළ යුතු කාල
වේලාව හා අවස්ථාව ප්‍රඥාවන්තයා දනියි. 6 මන්ද,
හැම කාරණයට ම වේලාවක් හා පිළිවෙළෙක් ඇත.
එහෙත්, අපේ දැනුම ඉතා ස්වල්ප ය. 7 මතු දවස
කුමක් සිදු වනු ඇද්දැ යි අපි නොදනිමු. එය අපට
දැන්වීමට හැකි කෙනෙක් ද නැත. 8 මරණයෙන්
වැළකීමට වත්, මරණය කල් දැමීමට වත් කෙනෙකුට
නොහැකි ය. සටනෙන් මිදීමකුත් නැත; දුෂ්ටයාට,
දුෂ්ටකම නිසා නිදහස්වීමක් නැත.
9 මේ සියල්ල ම දැක මම මිහි මත කෙරෙන
සියලු වැඩවලට මාගේ සිත යොමු කළෙමි. වෙන
අයට වද දීමේ බලය මනුෂ්‍යයෙකුට ලබාගත හැකි
ය. 10 දුෂ්ටයන් සිය සොහොන්වල තැන්පත් කරනු
ලබන හැටි ද එය බලා ආපසු එන විට, ඔවුන්
දුෂ්ටකම් කළ නුවරෙහි වැසියන් ඔවුන්ට ප්‍රශංසා
කළ හැටි ද මම දිටිමි. මෙය ද නිසරු දෙයෙකි.

## දුදනා සහ සුදනා

11 නපුරු ක්‍රියාවකට විරුද්ධ ව නඩු තීන්දුව
ඉක්මනින් ඉටු නොවන නිසා මිනිසුන්ගේ සිත් නපුර
කිරීමට ඇදී යන්නේ ය. 12 පව්කාරයෙකු සිය වරක්
නපුර කර බොහෝ කල් ජීවත් වුවත්, දෙවියන්
වහන්සේට ගරුබිය පාන අයට එනම්, උන් වහන්සේ
ඉදිරියෙහි ගරුබිය පාන අයට යහපත සිදුවන බව
මම සැබැවින් ම දනිමි. 13 එහෙත්, දුෂ්ටයා දෙවියන්
වහන්සේට ගරුබිය නොපාන බැවින් ඔහුට යහපත
සිදු වන්නේ වත්, සෙවණැල්ලක් වැනි ඔහුගේ දවස
දීර්ඝ වන්නේ වත් නැත. 14 මිහි මත දක්නට ඇති
නිසරු දෙයෙක් වේ. එනම්, පව්ටුන්ට සිදු විය යුතු දෙය

දමිටුන්ට ද දමිටුන්ට සිදු විය යුතු දෙය පවිටුන්ට ද
සිදු වීම ය. මෙය ද නිසරු දෙයකි.
15 දෙවිඳාණන් මිහි පිට මිනිසෙකුට දෙන ලුහුඬු
ජීවිතයේ දී, කා බී විනෝද වීමට වැඩි අන් කිසි
සැපතක් ඔහුගේ ජීවන සටනේ දී ඔහුට ඇද් ද?
දෙවියන් වහන්සේ ඔහුට මිහි පිට දෙන ජීවිත
කාලයේ දී ඔහුගේ ශ්‍රමයෙන් ඔහුට ඉතිරි වන්නේ
මෙපමණ ය.
16 දිවා රෑ දෙකෙහි මිහි මත සිදු වන දේ බලා,
ප්‍රඥාව රැස්කර ගැනීමට මාගේ සිත යොමු
කෙළෙමි. 17 එහෙත්, මිනිස් ලොවෙහි දෙවිඳාණන්
සිදු කරන දෙය තේරුම්ගැනීමට පුළුවන් කමක් නැත;
කොතරම් උත්සාහ කළත් තේරුම්ගත නොහැකි ය.
ප්‍රඥාවන්තයා එය දැනගත්තේ යයි කියතත්, ඔහු
පවා මුළු සත්‍යය නොදනියි.

## මිනිසාගේ පොදු ඉරණම

9 මෙකී සියල්ල ම සිතෙහි තබාගෙන, ඒ සියල්ල
විමසා බැලීමි. ධර්මිෂ්ඨයන් හා ප්‍රඥාවන්තයන්
ද ඔවුන්ගේ ප්‍රේමය හා වෛරය ද දෙවියන්
වහන්සේ පාලනය කරන බව දිටිමි. යමෙකුට
අනාගතයේ දී සිදු වන්නේ කුමක් ද කියා කිසිවෙක්
නොදනිති. 2 සියලු දේ සියල්ලන්ට එක සේ සිදු
වන්නේ ය. ධර්මිෂ්ඨයාට හා දුෂ්ටයාටත්, යහපත්
අයට සහ අයහපත් අයටත්, පවිත්‍ර අයට හා
අපවිත්‍ර අයටත්, පූජා කරන්නාට සහ පූජා
නොකරන්නාටත් සිද්ධ වන්නේ එක ම දෙයක් වේ.
පව්කාරයා හා යහපත් මනුෂ්‍යයා අතර වෙනසක්
නැත. දිවුරුම් දෙන්නා සහ දිවුරුම් නොදෙන්නා අතර
වෙනසක් නැත. 3 මිනිස් ලොවෙහි කෙරෙන සියල්ල
අතර ඇති එක් වරදක් නම්, සියල්ලන්ට ම එක
ඉරණමක් ඇති වීම ය. එනම්, මනුෂ්‍යයන්ගේ සිත්
නපුරෙන් පිරී ඔවුන්ගේ මුළු ජීවිත කාලයෙහි
මෝහය ඔවුන්ගේ සිත්වල තිබීම ය, ඉන්පසු ඔව්හු
මියයන්නෝ ය. 4 ජීවත් වන සියල්ලන්ට යම්කිසි
බලාපොරොත්තුවක් ඇත. මළ සිංහයෙකුට වඩා
පණ ඇති බල්ලෙක් හොඳ ය. 5 මන්ද, ජීවත් ව
සිටින අය තමන් මියයා යුතු බව දනිති; මියගිය අය
කිසිවක් නොදනිති; ඔවුන්ට තවත් කිසි විපාකයක්
නැත. ඔවුන් සහමුලින් ම මතකයෙන් ඉවත් ව යනු
ඇත. 6 ප්‍රේමය ද වෛරය ද ඊර්ෂ්‍යාව ද යන
කිසිවක් ඉතිරි වී නැත. මින්පසු මිනිස් ලොවෙහි සිදු
වන කිසි දෙයකට ඔවුන් සහභාගි නොවනු ඇත.

## කාලික සැප භුක්ති විඳීම

7 ඔබ ගොස් ප්‍රීතියෙන් ඔබේ කෑම කා,
තෘප්තිමත් සිතින් ඔබේ මුද්‍රික පානය බොන්න.
මන්ද, දෙවියන් වහන්සේ ඔබේ කටයුතු ගැන සතුට
ප්‍රකාශ කර ඇත. 8 නිතර ම සුදු වස්ත්‍ර හැඳ,
හිසේ තෙල් ගා ප්‍රීතියෙන් ඉන්න. 9 උන් වහන්සේ
මිහි පිට ඔබට දී තිබෙන ඔබේ නිෂ්ඵල ජීවිතයේ
සියලු දවස්වල ඔබ ප්‍රේම කරන ඔබේ භාර්යාව
සමඟ ජීවිතයේ ප්‍රීතිය භුක්ති විඳින්න. මන්ද,
ජීවිතයෙන් ද මිහි පිට ඔබ ගන්න වෙහෙසෙන් ද
ඔබට ලැබෙන එක ම කොටස එය වේ. 10 ඔබ අත
තබන හැම කටයුත්තක් ම මුළු වීර්යයෙන් ඉටු
කරන්න; ඔබ යන පාතාල ලෝකයෙහි කිසි වැඩක්
වත්, යෝජනාවක් වත්, දැනගැන්ම වත්, ප්‍රඥාව වත්
නැත.

## ශක්තියට වඩා ඥානය හොඳය

11 මිනිස් ලොවෙහි තව දෙයක් මම තේරුම්ගතිමි.
ශීඝ්‍ර ධාවකයාට නිතර ම දිනුම නොලැබේ. යුද
බිමෙහි විකුම් පාන අයට නිතර ම ජය නොලැබේ.
ප්‍රඥාවන්තයාට නිතර ම තම ජීවිකාව කරගත
නොහැකි ය. බුද්ධිමත් අය නිතර ම ධනවත් අය
නොවෙති. දක්ෂ විචක්ෂණ අය නිතර ම ඉහළ
තනතුරු නොලබති. ඕය කාටත් අවසානය එළඹිය
හැකි ය. 12 තමාගේ විපත්ති කාලය කවදා එයි දැ යි
මිනිසා නොදනියි. හදිසියේ දැලකට අසු වන මසුන්
මෙන් ද මලපතකට අසු වන පක්ෂීන් මෙන් ද ඔහු
බලාපොරොත්තු නොවන වේලාවක දුර්භාග්‍යයකට
අසු වේ.
13 මිහි පිට මෙවැනි ප්‍රඥාවක් ද දිටිමි. එය
වැදගත් බව මට පෙනිණි. 14 මනුෂ්‍යයන් ස්වල්ප
දෙනෙකු සිටි කුඩා නුවරක් විය; බලවත් රජෙක්
අවුත් එය වටලා, ඊට විරුද්ධ ව මහ බලකොටු
ගොඩනැඟුවේ ය. 15 එහි දිළිඳු ප්‍රඥාවන්ත
මනුෂ්‍යයෙක් විය. ඔහුට සිය ප්‍රඥාවෙන් ඒ නුවර
ගැළවිය හැකි විය. එහෙත්, කිසිවෙකු ඒ දිළිඳු
මනුෂ්‍යයා ගැන සිතුවේ නැත. 16 “බලවන්තකමට
වඩා ප්‍රඥාව හොඳ ය”යි මම කීවෙමි. එහෙත්,
දිළිඳාගේ ප්‍රඥාව සුළු කරනු ලැබේ. ඔහුගේ
වචනයට සවන් දීමක් නැත. 17 අඥානයන් අතර
මොරහඬ දෙන ආණ්ඩුකාරයෙකුට සවන් දීමට වඩා
නිශ්චලකමෙන් කතා කරන ප්‍රඥාවන්තයෙකුට
සවන් දීම හොඳ ය. 18 යුද්ධායුධවලට වඩා ප්‍රඥාව
අගනේ ය. එහෙත්, එක පව්කාරයෙකුට හොඳ
දේවල් රැසක් බිඳදැමිය හැකි ය.

## අධිපතියන් හා යටත් වැසියෝ

10 මළ මැස්සෙකු නිසා සුගන්ධ විලේපනයක්
නාස්ති වී යයි. එසේ ම ප්‍රඥා සම්භාරයක්
එක මෝඩකමකින් වැනසී යයි.
2 ප්‍රඥාවන්තයාගේ සිත හරි දේට ද
අඥානයාගේ සිත වැරදි දේට ද යොමු වෙයි.
3 එසේ ය, මෝඩයා මාර්ගයෙහි යන විට ඔහුගේ
බුද්ධි හීනත්වයෙන් තමා මෝඩයෙකැ යි සියල්ලන්ට
හෙළි කරයි.
4 ආණ්ඩුකාරයාගේ සිත ඔබට විරුද්ධ ව ඇවිළී
ගියොත්, ඔබේ රක්ෂාවෙන් ඉවත් වී නොයන්න;
මන්ද, සන්සුන්කමින් බරපතල වරදකට වුව ද සමාව
ලැබිය හැකි ය, 5 අධිපතීන් අතින් සිදු වන වරදක්
මේ මිහි පිට මා දැක ඇත. 6 එනම්, අඥානයන්
බොහෝ උසස් තනතුරුවලට පත් ව සිටිද්දී,
උත්තමයන් පහත් තැන්වල සිටින බව ය. 7 වහලුන්

අසුන් පිට නැඟී යන අතර, අධිපතීන් වහලුන් මෙන්
පයින් ගමන් කරනු දිටිමි.

### ඥානය පිළිබඳ හිතෝපදේශ

8 ගීතා 7:15; හිතෝ 26:27 වළක් හාරා තබන්නා
එහි වැටෙන්නේ ය; තාප්පයක් කඩන්නාට සර්පයෙකු
දෂ්ට කරයි. 9 ගල් වළක වැඩ කරන්නාට එයින්
තුවාළ වෙයි; දර පළන්නාට එයින් අන්තරාය සිදු
වෙයි. 10 පොරොව මොට්ට වූ විට එය මුවහත්
නොකළොත් වඩා ශක්තිය යොදවන්න ඕනෑ වෙයි.
ප්‍රඥාවන්තයාට සඵලය ළඟා වෙයි. 11 මතුරන්න
පළමුවෙන් සර්පයා දෂ්ට කළොත් මතුරන්නාගෙන්
පලක් නැත. 12 ප්‍රඥාවන්තයාගේ මුවින් නික්මෙන
වචන ඔහුට ගෞරවය දෙයි; අඥානයාගේ වචන
ඔහුට විනාශය ගෙනෙයි. 13 ඔහු කතාව අරඹන්නේ
අනුවණකමිනි. ඔහු එය අවසන් කරන්නේ උමතු
වූවකු ලෙසිනි.
14 අඥානයා දිගින් දිගට කතා කරයි; මතු සිදු වන
දේ නොදනියි; ඔහුගේ ඇවෑමෙන් කුමක් සිදු වනු
ඇද්දැ යි කාට කිව හැකි ද?
15 අඥානයා සිය වැඩ කටයුතුවලින් අධික
වෙහෙසට පත්වනු ඇත; ඔහු ගෙදරට යන පාර වත්
දන්නේ නැත.
16 එම්බා දේශය, ඔබේ රජු කටින් කිරි සුවඳ
හමන දරුවකු ව සිටින විට ද ඔබේ අධිපතීන් රෑ
පුරා කා බී ප්‍රීති වන විට ද ඔබේ විපත ළඟ ය.
17 එම්බා දේශය, ඔබේ රජු වංශවත් උසස් කුලයක
දරුවකු වන විට ද ඔබේ අධිපතීන් ගිජුකමින්
නොකා සනීප ශක්තිය පිණිස නිසි වේලාවට
පමණක් කෑම කන විට ද ඔබ වාසනාවන්ත ය!
18 කම්මැලිකම නිසා මිනිසකුගේ වහල දිරා
වැටෙන්නේ ය; ඔහුගේ අලසකම නිසා ගෙය බිඳ
වැටෙන්නේ ය.
19 මංගල භෝජනයෙන් සන්තුෂ්ටිය ඇත; මුද්රික
පානය ජීවිතය ප්‍රීතිමත් කරයි. ඒ කොයි දෙයටත්
මුදල් අවශ්‍ය ය.
20 ඔබේ සිතෙන් වත් රජුට දෙස් නොකියන්න;
ඔබේ යහන් ගබඩාවේ දී වත් වස්තුකාරයන්ට දොස්
නොකියන්න. අහසේ පියාඹන සක්වාලිහිණියකු ඒ
දන්වනු ඇත.

### පැණවතාගේ ක්‍රියා කලාපය

11 නුඹේ ආහාර ජලය මතුපිට තබන්න. කුමක්
හෙයින් ද බොහෝ දවසකට පසු ඒවා නුඹට
නැවත සම්බවෙයි. 2 සත්දෙනෙකු හෝ අටදෙනෙකු
හෝ සමඟ කොටස් බෙදාගන්න. මන්ද, ලොවෙහි
කුමන විපත්ති කාලයක් උදා වනු ඇද්දැ යි කාට කිව
හැකි ද?
3 වැහි වලාකුළු පිරී තිබෙන විට පොළොවට වැසි
වසියි; ගසක් දකුණට වැටුණත්, උතුරට වැටුණත් එය
වැටුණු තැන ම තිබෙයි. 4 සුළඟ ගැන බලා සිටින්නා
වපුරන්නේ නැත. වලාකුළු ගැන බලා සිටින්නා
අස්වැන්න කපා ගන්නේ නැත. 5 ගර්භණියකගේ
කුසෙහි නව ජීවයක් සෑදෙන්නේ කෙසේ ද කියා ඔබ
නොදන්නෙහි ය; එමෙන් ම හැම දෙය පිළියෙළ
කරන දෙවියන් වහන්සේගේ වැඩ කටයුතු ඔබ
නොදන්නෙහි ය. 6 උදේ වරුවේ බීජ වපුරන්න, සවස්
වරුවේත් වපුරන්න. ඉන් කොයි ඒවා සඵල වේ ද
කියා වත්, දෙවගේ ම එක සේ සරු වේ ද කියා වත්
ඔබ නොදන්නෙහි ය.
7 සැබැවින් එළිය මිහිරි දෙයකි, ඉරු එළිය දැකීම
ඇසට ප්‍රසන්න දෙයකි. 8 එසේ ය, මනුෂ්‍යයෙකු
චිරාත් කාලයක් ජීවත් ව සිට ඔහු ඒ සියල්ලෙහි
ප්‍රීති වේ වා! එහෙත්, අඳුරු දවස් එන බව ද ඒවා
බොහෝ බව ද සිදු වන හැම දෙය ම නිසරු බව ද
ඔහු අමතක නොකෙරාවා.

### තරුණයන්ට අවවාද

9 තරුණය, ඔබේ යොවුන් වියේ දී ප්‍රීති වන්න;
ඔබේ යෞවන දවස්වල ඔබට සිත් සතොස ලැබේ
වා! ඔබට රිසි යයි පෙනෙන පරිද්දෙන් ඔබ
හැසිරෙන්න. එහෙත්, මේ සියල්ල ගැන දෙවියන්
වහන්සේ ඔබ විනිශ්චයයට පමුණුවන බව
දැනගන්න.
10 ඔබේ සිතෙන් දුක් කරදර ඉවත ලා ජීවත්වන්න.
මන්ද, යෞවන කාලයත්, වැඩි මහලු කාලයත්
නිෂ්ඵල ය.

12 විපත්ති දවස් පැමිණෙන්නට පෙර ඔබේ
යොවුන් වියේ දී ඔබේ මැවුම්කාර දෙවියන්
වහන්සේ සිහි කරන්න. මන්ද, ඒවා ප්‍රිය නැතැ යි
ඔබ කියන දවස් උදා වන්නේ ය. 2 ඒ කාලයේ දී
ඉර, හඳ, තාරකාවල එළිය අඳුරු වන්නේ ය. වැහි
වලාකුළු නොනැවතී එන්නේ ය. 3 ඒ කාලයේ දී
ගෙයි රැකවල්ලු වෙවුලන්නෝ ය; බලවන්තයෝ දුබල
ව කුදු වන්නෝ ය; අඹරන්නෝ ස්වල්ප බැවින්
ඇඹරීම නවතින්නේ ය; කවුළුවලින් බලන්නන්ගේ
ඇස් අඳුරු වන්නේ ය. 4 වීදියේ දොරවල් වසනු
ලබන්නේ ය. ඇඹරීමේ ශබ්දය හීන වන්නේ ය.
කුරුල්ලාගේ හඬට ද ඔහු අවදි වන්නේ ය.
ගායිකාවන්ගේ ගී හඬ දුබල වන්නේ ය. 5 ඔව්හු
උස් දෙයට භය වන්නෝ ය. මාර්ගයෙහි ද බියජනක
දේ වන්නේ ය. ඔබේ හිසකේ කොට්ටම්බා ගසේ
මල් මෙන් සුදු වන්නේ ය. ඔබ පළඟැටියා මෙන්
ගාටමින් යන්නෙහි ය. ඔබේ කායික ආසා පහ ව
යන්නේ ය. මන්ද, මනුෂ්‍යයා තමාගේ සදාතන
නිවසෙට යන්නේ ය. විලාප කියන්නෝ ද වීදිවල
ඇවිදින්නෝ ය.
6 එසේ වන්නේ, රිදී දාමය හා රන් බඳුන වැටී
කැඩෙන්නටත්, දිය කඩිත්තේ කළය බිඳෙන්නටත්,
ළිඳේ රෝදය කැඩෙන්නටත්, 7 අපේ ශරීර වරක්
තිබුණු ලෙස පොළොවේ දූවිල්ලට හැරී යන්නටත්,
මිනිස් හුස්ම එය දුන් දෙවියන් වහන්සේ වෙත හැරී
යන්නටත් පළමුවෙන් ය.
8 සියල්ල නිසරු ය; සෑම දෙය නිසරු ය යි
ධර්මදේශකයා පවසයි.

### අවසානය

9 තවද, ධර්මදේශකයා ප්‍රඥාවත් ව සිටි නිසා
ඔහු සෙනඟට වැඩි වැඩියෙන් දැනීම දුන්නේ ය.
එසේ ය, ඔහු බොහෝ අවවාදානුශාසනා විමසා
සොයාගෙන, ඒවා සම්පාදනය කළේ ය. 10 දේශනා
කරන පිණිස සාරගර්භ වචන සොයන්නට උත්සාහ
කළේ ය. මෙහි ග්‍රන්ථාරූඪ කොට ඇති සියල්ල
හරි වූ සත්‍ය වූ කරුණු ය. 11 නැණවතුන්ගේ බස්
එඬේරුන්ගේ තියුණු උල් සහිත කෙවිටිවලට ද
ඔවුන්ගේ හිතෝපදේශ ලීයට තදින් ගැසූ ඇණවලට
ද සමාන ය. එය එන්නේ, සකල ලෝක වාසීන්ගේ
අසහාය නායකයාණන්ගෙනි.
12 තවද, මාගේ පුත්‍රය, මයෙන් දැනුමැතිකම්
ලබන්න, පොත් ලිවීමෙහි නිමාවක් නැත. තවද, වැඩි
උගත්කමෙන් වෙහෙසීම ඇති වේ.
13 මේ සියල්ල විමසා බැලීමෙන් පසු, අවසාන
වචනයක් කිව යුතු ව ඇත: දෙවියන්ට ගරුබිය
දක්වා, එතුමන්ගේ ආඥා පිළිපදින්න. මිනිසා මවන
ලද්දේ ඒ සඳහා ය. 14 අපේ සියලු රහස් හොඳ
හෝ නරක හෝ වේ වා දෙවියන් වහන්සේගේ
විනිශ්චයයට භාජනය වනු ඇත.

io1 පරිච්ඡේද 1:1; 2:7 පළමු වන ප්‍රේම ගීය.
io1 පරිච්ඡේද 2:8; 3:5 දෙ වන ප්‍රේම ගීය.
io1 පරිච්ඡේද 3:6; 5:1 තුන් වන ප්‍රේම ගීය.
io1 පරිච්ඡේද 5:2; 6:3 සතර වන ප්‍රේම ගීය.
io1 පරිච්ඡේද 6:4; 8:4 පස් වන ප්‍රේම ගීය.
io1 පරිච්ඡේද 8:5-14 සය වන ප්‍රේම ගීය.

# ප්‍රේම ගී

## හැඳින්වීම

ප්‍රේම ගී හවෙත් සලමොන්ගේ ගී යන පොතේ මනාලයකු හා මනාලියක අතරේ ඇති ප්‍රේමය සම්බන්ධයනේ ගීත රුසක් ඇත. දවේයන් වහන්සේගේ අමරණීය ප්‍රේමයේ ප්‍රකාශනයක් වශයනේ මේ පොත, ජුදවේ පාස්කු මංගලෝත්සවවල දී ප්‍රසිද්ධියේ කියවන ලදී. පිරිසිදු අඹු-සැමි ප්‍රේමයත්, අමරණීය දවේ-මිනිස් ප්‍රේමයත් සම්බන්ධ බව මේ ගීවලින් ප්‍රකාශ වේ.
අඩංගු කරුණු:
පරිච්ඡේද 1:1; 2:7 පළමු වන ප්‍රේම ගීය.
පරිච්ඡේද 2:8; 3:5 දව වන ප්‍රේම ගීය.
පරිච්ඡේද 3:6; 5:1 තුන් වන ප්‍රේම ගීය.
පරිච්ඡේද 5:2; 6:3 සතර වන ප්‍රේම ගීය.
පරිච්ඡේද 6:4; 8:4 පස් වන ප්‍රේම ගීය.
පරිච්ඡේද 8:5-14 සය වන ප්‍රේම ගීය.

1 1 රාජා 4:32 සලමොන්ගේ ගීතවලින් ඉතා උතුම් ගීතය ය.

### පළමු වන ගීතය

*පමේවතී*
2 ඔබේ සිඹීම්වලින් මා නැවී ඇත.
q22 ඔබේ ප්‍රේමය මිදියුසට වඩා සුමිහිරි ය.
3 ඔබේ සුවඳ විලවුන් සුමිහිරි ය.
q23 ඔබේ නම වෑහනෙ සුවඳ විලවුන් වැනි ය.
q23 එබැවින් මුවැත්තියෝ ඔබට පමේ වඩති.
4 මා ඔබ සමඟ ගනෙ යන්න;
q24 අපි එකට දුවමු.
q24 මාගේ රජ තුමනේ, ඔබේ විමනට මා ගනෙ යන්න.
q24 එකට සිටීම අපට මහා ප්‍රීතියක් වනු ඇත.
q24 අපි ප්‍රේමයහෙි ඇලී ගැලී නැවී සිටිමු.
q24 සියලු කාන්තාවන් ඔබට පමේ කිරීම පුදුමයක් ද?
5 ජරෙුසලම් වනිතාවනේ, මා කේදාර් කූඩාරම් මනේ කළු නමුත් රූප සම්පන්න ය;
q25 සලමොන්ගේ මාලිගාවේ තිර මනේ ශෝභන ය.
6 අව්ව මා පිට වැටීමනේ මා මඳක් කළු වී සිටින නිසා මා හළෝ නොදකින්න.
q26 මාගේ සොහොයුරෝ මා සමඟ කෝප වී මිදි වත්තේ වැඩ කරන්න මට නියම කළහ;
q26 මා ගැන සලකන්න මට වලේාවක් නො වී ය;
7 මාගේ ප්‍රියාදර සොඳුර, මට මේ දේ කියන්න:
q27 ඔබේ බැටළු රැළ කවන්න ගනෙයන්නේ කොතැනට ද?
q27 ඉර මුදුන් වලේේ උන් ලග්ගන්නේ කොහේ ද?
q27 අන් එඬේරුන්ගේ පට්ටි අතරේ ඔබ සොයන්න මට ඇති උවමනාව කුමක් ද?
*පමේවතා*
8 කාන්තාවන්ගනේ ඉතා රුවැති සොඳුරිය, ඔබ මයෙ නොදන්නහෙි නම්, රැළේ අඩි පාරේ ම ගමන් කර එඬේරුන්ගේ කූඩාරම් ළඟ ඔබේ එළු පැටවුන්ට කවන්න.
9 මාගේ සුන්දරිය, අශ්ව ධේනුවක පාරාවෝගේ රථවල අශ්වයන් කුල්මත් කරන සේ ඔබ මිනිසුන් කුල්මත් කරන්නහෙි ය.
10 ඔබේ කපොලු තලහෙි ඇති කසේ රොදින් ද ඔබේ ගලෙ වට ඇති මැණික් මාලාවලින් ද ඔබ අලංකාර වී ඇත.
11 රිදී පබුළු ඇති රන් මාලා ඔබට සාදා දනේනමේ.
*පමේවතී*
12 රජ සිය යහනේ සිටිය දී මාගේ සුවඳ විලවුන් විහිදී ගියේ ය.
13 මා පමේවතා මා පියයුරු අතරේ හවේ සිටින විට සුවඳලාටුවල සුවඳ ඇත්තේ ය.
14 මා පමේවතා මට එන්ගදෙියේ මිදි වතුවල වැවුණු වන මල් පියුම් පොකුරක් වැනි ය.
*පමේවතා*
15 මාගේ සොඳුරිය, ඔබ කොතරම් ශෝභා සම්පන්න ද?
q215 ප්‍රේමයනේ ඔබේ ඇස් බැබළනෙ රඟ!
*පමේවතී*
16 මාගේ ප්‍රියය, ඔබ කොතරම් ශෝභන ද!
q216 කොතරම් පියකරු ද!

q2 16 අපගේ යහන නිල් තණකොළ ය.
17 අපගේ ගයෙි බාල්ක කිහිරි ගස් ය;
q2 17 එහි පරාළ දේවදාර ගස් ය.
2 මම ශාරොන්හි සවේවන්දියක් ය;
q2
2 මිටියාවත්වල මානලේ මලක් ය.
*පමේවතා*
2 කටු ගස් අතරේ මානලේ මලක් යම් සේ ද
යුවතියන් අතරේ මාගේ සොඳුරියත් එසේ ම ය.
*පමේවතී*
3 වනයේ ගස් අතරේ ජම්බු ගස් යම් සේ ද
තරුණයන් අතරේ මාගේ පමේවතාත් එසේ ම ය.
q2 3 ඒ රුක් සවෙණහෙි හිඳීමට මම ප්‍රිය කරමි;
q2 3 එහි එල මා මුවට ඉමිහිරි ය.
4 ඔහු බොදුන් හලට මා ගනෙයේ ය.
q2 4 මට උඩින් එසවෙූ කොඩිය ප්‍රේමය ය.
5 වියළි මිදි පලවලින් මා ශක්තිමත් කරන්න;
q2 5 ජම්බුවලින් මා පණ ගන්වන්න.
q2 5 මන්ද, මම අනුරාගයනේ ගිලන් වී සිටිමි.
6 ඔහුගේ වමත මාගේ හිස යට ඇත;
q2 6 දකුණතින් ඔහු මා වැළඳගනෙ ඇත.
7 ජරෙුසලම් වනිතාවනෙි, ඔබ අප දදෙනො අතර
ඇති ප්‍රේමයට බාධා නොකරන බවට කුඹුරේ දවේ
දේවතාවන්ගේ නාමයනේ දිවුරන්න.

### දෙ වන ගීතය

*පමේවතී*
8 අන්න, මා පමේවතාගේ කට හඬ;
q2 8 කඳු මත පනිමින්, හලේ පිට නඟිමින් බලන්න
එන හැටි විගසින්.
9 මා පමේවතා මුවකෙු වැනි ය.
q2 9 ඔහු මුව පැටවකෙු වැනි ය;
q2 9 බිත්තිය අයිනේ සිටගනෙ, කවුළුව දසෙ බලමින්
ඔහු සිටියි, ගරාදි අතරනේ එබිකම් කරමින්;
10 මා පමේවතා මා අමතමින් මට මසෙේ කී ය:
q2 10 "මා සුරතලිය, නැඟිටින්න;
q2 10 මා සොඳුරිය, දැන් එන්න.
11 සිසිර කාලය දැන් පසු වී ඇත;
q2 11 වැසි වරුසා නතර වී ඇත.
12 මිහි පිට මල් පිපී ඇත;
q2 12 ගී ගයනා කාලය පැමිණ ඇත;
q2 12 කොවුල් හඬ දසත පැතිර යත.
13 පැසුණු දිඹුල් පල ඉදනෙ විට, මිදිවැල් සුවඳ
හමන විට, මා සුරතලිය, නැඟිට එන්න;
q2 13 මා සොඳුරිය, දැන් එන්න.
14 කඳු විවරවල, හලේ කුහර තුළ මා පරවේ දනෙ,
ඔබේ මුහුණ මට දකින්න දනේන;
q2 14 ඔබේ කට හඬ මට ඇසනේනට දනේන;
q2 14 ඔබේ කට හඬ මිහිරි ය;
q2 14 ඔබේ මුහුණ සෝබන ය."
15 මිදිවැල්වල මල් පිපී ඇති විට ඒවා වනසන
සිවලුන්, කුඩා සිවලුන් අල්ලා ගන්න.
16 මාගේ පමේවතා මාගේ ය;
q2 16 මම ඔහුගේ ය.
q2 16 ඔහු මානලේ අතරේ බැටළු රැළ කවයි.
17 මාගේ පමේවත, උදේ සුළං හමන තුරු,
සවෙණැලි පහ වන තුරු බතෙලේ කඳු පිට යන
මුවකෙු නොහොත් මුව පැටියකෙු මනේ හැරී එන්න.
3 රාත්‍රියහෙි මා යහනේ දී මා සිතින් ප්‍රේම
කරන තැනැත්තා මම සවේමි.
q2
3 ඔහු සවෙූ නමුත්, ඔහු මට සම්බ නො වී ය.
2 ඉතින් මම නැඟිට නුවර වීදිවල ද
මංහන්දිවල ද ඇවිද මා සිතින් ප්‍රේම කරන
තැනැත්තා සොයන්නමේ.
q2 2 ඔහු සවෙූ නමුත්, මට ඔහු සම්බ නො වී ය.
3 නුවර ඇවිදින මුර සබෙළුන් මට හමු වී "මා
සිතින් ප්‍රේම කරන තැනැත්තා ඔබ දුටුවහු දැ"යි
මම ඇසීමි.
4 මා මඳක් දුර ඔවුන් පසු කර ගිය විට මා සිතින්
ප්‍රේම කරන තැනැත්තා මට සම්බ විය.
q2 4 මම ඔහු අල්ලාගනෙ, මාගේ මවුගේ ගදෙරටත්,
මා උපන් කාමරයටත් ඔහු පමුණුවන තකේ ඔහුට
යන්න ඉඩ නුදුනිමි.
*පමේවතා*
5 "ජරෙුසලම් වනිතාවනෙි, ඔබ අප දදෙනෙ අතර
ඇති ප්‍රේමයට බාධා නොකරන බවට කතෙේ දවේ
දේවතාවන්ගේ නාමයනේ දිවුරා මට පොරොන්දු
වන්න."

### තුන් වන ගීතය

*ගායක පිරිස*
6 ගන්ධ රස හා තුවරලාත්, වළෙනේදාගේ සියලු
සුවඳ විලවුනුත් රුගනෙ, දුම් කණු මනේ
කාන්තාරයනේ නැඟී එන මේ තැනැත්තිය කවරකේ
ද?
7 බලන්න;
q2 7 ඒ දෝලාවක නැඟී එන සලමොන් රජු ය.
q2 7 ඉශ්‍රායලේ බලවතුන්ගේ බලවත්තු සැටදනෙකේ
එය පිරිවරා සිටිති.
8 ඔව්හු සියල්ලෝ කඩු හරඹයහෙි දක්ෂයෝ ය.
q2 8 සටනහෙි පළ පුරුද්ද ඇත්තෝ ය.
q2 8 රුයේ ඇති විය හැකි ප්‍රහාර නිසා එකිනකො
තම තමාගේ කඩුව කලවයේ බැඳගනෙ සිටිති.
9 සලමොන් රජු තමන්ට සාදාගත් දෝලාව
ලබෙනොන්හි ලීවලින් සාදන ලදී.
10 එහි කණු රිදීයනේ ද එහි වහල රනින් ද සාදන
ලදී.
q2 10 එහි ආසන ජරෙුසලම් කාන්තාවන් විසින්
ආදරයනේ වියන ලද රත්නිල් රදෙිවලින් වසා ඇත.
11 සියොන් වනිතාවනෙි, පිටතට අවුත්, සලමොන්
රජුගේ මඟුල් දිනයේ දී, ඔහුගේ සිතේ ප්‍රීතියේ
දවසේ දී, ඔහුගේ මෑණියන් ඔහුගේ හිස මත තැබූ
කිරුළ පැළඳ සිටින රඟ නරඹන්න.
*පමේවතා*

4 මාගේ ප්‍රිය සොඳුරිය, ඔබ රුව ඇත්තී ය;
q2
4 එසේ ය, ඔබ රුව ඇත්තී ය.
q2
4 ඔබේ මුහුණ වැස්මට ඇතුළතේ තිබෙන ඔබේ
ඇස් පරෙවියන්ගේ ඇස් වැනි ය.
q2
4 ඔබේ වරලස ගිලියද් කඳු බෑවුමහි ලැග සිටින
එළු රැළක් වැනි ය.
2 ලොම් කපා නාවන ලද බැටළුවන් මෙන් ඔබේ
දත් සුදු ය.
q2[2] එකක්වත් අඩු නැත, මනා සේ ගැළපී ඇත.
3 ඔබේ තොල් රතු නූල් මෙන් ය.
q2[3] ඔබේ මුඛය ශෝභමාන ය.
q2[3] ඔබේ මුහුණු වැස්මට ඇතුළතේ තිබෙන ඔබේ
දකෙපොල දළෙළුම් මෙන් ය.
4 ඔබේ ගෙලෙ බලවතුන්ගේ පලිස් දහසක් එල්ලා
තිබෙන ආයුධ තැබීමට ගොඩනැඟුවා වූ දාවිත්
රජුගේ කොත මෙන් ය.
5 ඔබේ දතෙන මානලේ අතරේ ගොදුරු කන මුව
දනෙකගේ නිවුන් පැටවුන් දදෙනෙකු වැනි ය.
6 දවාල සිසිල් වී සවෙණැලි පහ ව යන තුරු, මම
ගන්ධ රස කන්දටත්, තුවරලා හලෙටත් යන්නමේ.
7 මාගේ සොඳුරිය, ඔබ මුළුමනින් ම රුව ඇත්තී ය;
q2[7] කැළලක් නැත්තී ය.
8 මාගේ මනාලිය, ලබෙනොන් සිට, එසේ ය,
ලබෙනොන් සිට මා සමඟ එන්න සිංහයන්ගේ ගුහා
වන, අඳුන් දිවියන්ගේ කඳු වන සනේර් සහ
හරේමොන් කඳු මුදුනතේ ද අමානා කඳු මුදුනතේ ද
බලන්න.
9 මාගේ සොහොයුරිය, මාගේ මනාලිය, ඔබ
මාගේ සිත දිනාගත්තහෙි ය.
q2[9] ඔබේ නතෙගින්, ඔබේ ගලෙේ එක මාලාවකින්
ඔබ මාගේ සිත දිනාගත්තහෙි ය.
10 මාගේ සොහොයුරිය, මාගේ මනාලිය, ඔබේ
ප්‍රේමය කොපමණ මිහිරි ද?
q2[10] ඔබේ ප්‍රේමය මිදියුසටත්, ඔබේ විලවුන්වල
සුවඳ සියලු සුවඳ ද්‍රව්‍යවලටත් වඩා කොපමණ
අගනේ ද?
11 මාගේ මනාලිය, ඔබේ තොල්වලින් මී වදයකින්
මෙන් පැණි වැගිරයෙි.
q2[11] ඔබේ දිව යට මී පැණිත්, කිරිත් තිබේ.
q2[11] ඔබේ වස්ත්‍රවල සුගන්ධය ලබෙනොන්හි සුවඳ
මෙන් ය.
12 මාගේ සොහොයුරිය, මාගේ මනාලිය, ඔබ
වැටකින් වට කළ උයනක් ය;
q2[12] වසා තිබෙන ළිඳක් ය;
q2[12] මුද්‍රා කර තිබෙන උල්පතක් ය.
13 එහි ගස් වැඩනේනේ ය;
q2[13] ඒවා දළෙම් උයනක් වැනි ය;
q2[13] එහි ඉතා හොඳ එල හටගන්නේ ය.
14 ජටාමාංශ හා කුංකුමත්, වදකහ සහ කුරුඳුත්,
සෑම තුවරලා ගසුත්, ගන්ධරස හා අගිල් ද සෑම
ප්‍රධාන සුවඳ ද්‍රව්‍ය ද දරන ගසුත් එහි වැඩනේනේ
ය.
15 දිය උල්පත්වලින් ද ගලා බසින දිය දහරින් ද
ලබෙනොන් කඳුවලින් ගලා බසින ඇල දොළින් ද ඒ
උයනට වතුර ලැබේ.
පමේවතී
16 එම්බා උතුරු සුළඟ, පිබිදනේන;
q2[16] දකුණු සුළඟ, එන්න.
q2[16] මාගේ උයනේ සුවඳ විහිද යන පිණිස ඊට
උඩින් හමා යන්න.
q2[16] මාගේ පමේවතා තමාගේ උයනට අවුත්
තමාගේ අනර්ඝ එල අනුභව කරා වා!
පමේවතා
5 මා සොහොයුරිය, මා මනාලිය, මම මාගේ
උයනට අවුත්, මාගේ ගන්ධරස හා සුවඳ ද්‍රව්‍ය
රුස් කරගතිමි.
q2
5 මී වදේ සමඟ මී පැණි කෑවමේ.
q2
5 කිරි සමඟ මුද්‍රික පානය බීවමේ.
q2
5 මිත්‍රයනෙි, කන්න;
q2
5 ප්‍රිය තැනැත්තනෙි, බොන්න.
q2
5 එසේ ය, ප්‍රේමයනේ මත් වන තකේ බොන්න.

### හතර වන ගීතය

පමේවතී
2 මම නිදාගනෙ සිටියමේ.
q2[2] එහතේ, මාගේ සිත පිබිද තිබිණි.
q2[2] අන්න, මාගේ පමේවතා දොරට තට්ටු කරන
හඬ මට ඇසේ.
q2[2] ඔහු මා අමතමින් මසෙේ කී ය;
q2[2] මා සොහොයුරිය, මා සොඳුරිය, මා පරවේ දනෙ,
මා නිර්මල තැනැත්ති ය, මට දොර අරින්න.
q2[2] මන්ද, මාගේ හිස පින්නනෙුත්, මාගේ වරලස රෑ
පිණිබිංදු වලිනුත් පගේී තිබේ.
3 මාගේ හැට්ටය ගලවා තැබීමි.
q2[3] මා එය යළිත් අඳින්න ද?
q2[3] මා පාද සේදීමි;
q2[3] ඒවා මා කසෙේ කිළුටු කරම් ද?
4 මා පමේවතා දොර සිදුරතේ අත දැමූ විට මාගේ
හදවත ප්‍රීතියනේ ඉපිලී ගියේ ය.
5 මා පමේවතාට දොර අරින්න මම නැඟිට්ටමේ.
q2[5] දොරේ අගුල ඇල්ලූ විට ගන්ධරසය මාගේ
අත්වල ද දියර ගන්ධරස මාගේ ඇඟිලිවල ද
තැවරිණි.
6 මා පමේවතාට මම දොර ඇරියමේ.
q2[6] එහතේ, මා පමේවතා නික්ම ගොස් තිබිණි.
q2[6] ඔහු කතා කළ විට මට සිහි නැති විය.

q2 6 මම ඔහු සෙවීමි;
q2 6 එහෙත්, සම්බ නොවී ය.
q2 6 මා ඔහුට අඬගැසූ නමුත්, ඔහු මට පිළිතුරු
නොදිනි.
7 නුවර මුර සබෙළු මට හමු වී මට පහර දී තුවාළ
කළහ.
q2 7 පවුරුවල රැකවල්ලු මාගේ පොරෝණය මාගනේ
පැහැරගත්හ.
8 ජරුසලම් වනිතාවනෙි, මාගේ පමේවතා ඔබට
හමු වුවොත්, මා ප්රේමාතුර ව සිටින බව ඔහුට
දන්වන බවට මට දිවුරා කියන්න.
*ගායක පිරිස*
9 කාන්තාවන්ගනේ ඉතා ශෝභන තැනැත්තිය, අන්
පමේවතකුෙට වඩා ඔබේ පමේවතාට ඇති අමුතු
දයෙ කුමක් ද?
q2 9 ඔබ මසෙේ අපට දිවුරන්න කියන්නේ අන්
පමේවතකුෙට වඩා ඔබේ පමේවතාට ඇති කුමන
අමුතු දේ නිසා ද?
*පමේවතී*
10 මා පමේවතා කඩවසම් ය;
q2 10 දස දහසක් අතරේ සොයාගත හැකි ඔහු
උත්තමයකේ.
11 ඔහුගේ හිස ඉතා පිවිතුරු රත්රන් මනේ ය.
q2 11 ඔහුගේ කසේ රොද රැලි සහිත ය;
q2 11 කපුටුවකුෙගේ මනේ කාලවර්ණ ය.
12 ඔහුගේ දනෙතේ කිරනේ සේදී, හොබනා ලසෙ
ඇල දොළ ළඟ සිටින පරවේයන් වැනි ය.
13 ඔහුගේ දකෙොපුල් සුවඳ ගස් පාත්තියක් ද
සුවඳ පැළ ඇති පස් කඳු ද මනේ ය.
q2 13 ඔහුගේ දතෙොල් මානලේ මනෙි;
q2 13 දියර ගන්ධරස එයින් වෑස්සනේනේ ය.
14 ඔහුගේ දෑත පුෂ්ටිමත් ය;
q2 14 ලශුණිය මැණික් ඇල්ලූ රන් මුදු පැළඳ ඇත.
q2 14 ඔහුගේ ගත නිල්මිණියනේ සැරසුණු ඇත්දත්
කර්මාන්තයක් වැනි ය.
15 ඔහුගේ කණේඩා අමිශ්ර රන් අඩි පිට පිහිටා
තිබනෙ සුදු ගල් කණු වැනි ය.
q2 15 ඔහුගේ ස්වරූපය ලබෙනොන් කඳු මනේ
තේජාන්විත ය.
q2 15 කිහිරි ගස් මනේ අසමසම ය.
16 ඔහුගේ මුඛය ඉතා මිහිරි ය.
q2 16 එසේ ය, ඔහු මුළුමනින් ම පියකරු ය.
q2 16 ජරුසලම් වනිතාවනෙි, මාගේ පමේවතා මේ
ආකාර ය;
q2 16 මාගේ මිත්රයා මබෙන්දකේ ය.
*ගායක පිරිස*
6 වනිතාවන්ගනේ ඉතා රූමත් තැනැත්තිය, ඔබේ
පමේවතා කොතැනට ගියේ ද?
q2
6 ඔබේ පමේවතා කොයි දසෙට හැරී ගියේ ද?
q2
6 අපි ඔබ සමඟ ඔහු සොයන්නමෙු.
*පමේවතී*
2 මා පමේවතා උයන්වල බැටළු රැළ කවන
පිණිසත්, මානලේ මල් නළො ගන්න පිණිසත් තම
උයනහෙි සුවඳ පැළ ඇති පාත්තිවලට ගියේ ය.
3 මම මා පමේවතාගේ ය;
q2 3 මා පමේවතා මාගේ ය.
q2 3 ඔහු මානලේ අතරේ තම රැළ කවයි.

**පස් වන ගීතය**

*පමේවතා*
4 මාගේ සොඳුරිය, ඔබ තිර්සා නගරය මනේ
අලංකාර ය.
q2 4 ජරුසලම මනේ ශෝභන ය.
q2 4 කොඩිගත් සේනාවක් මනේ බලසම්පන්න ව
සිටින්නහෙි ය.
5 ඔබේ දනෙතෙ මා වතෙින් ඉවතට හරවාගන්න;
q2 5 මන්ද, ඒවා මා වසඟ කරයි.
q2 5 ඔබේ වරලස ගිලියද්හි ලැග ඉන්න එළු රැළක්
වැනි ය.
6 ලොම් කපා නාවන ලද බැටළුවන් මනේ ඔබේ
දත් සුදෝ සුදු ය.
q2 6 එකක්වත් අඩු නැත;
q2 6 මනා සේ ගැළපී ඇත.
7 ඔබේ මුහුණු වැස්මට ඇතුළනේ තිබනෙ ඔබේ
දකෙපොල දළෙම් පළු වැනි ය.
8 බිසෝවරුන් සැටක් ද උපභාර්යාවන් අසූවක් ද
ගණන් කළ නොහැකි තරුණියන් ද සිටියත්,
9 මාගේ පරවේ දනෙට, මාගේ නිර්මල
තැනැත්තියට සම වූ අන් කනෙකේ නැත.
9 ඈ ඇගේ මවගේ එක ම දැරිය ය;
q2 9 ඈ බිහි කළ මවගේ ප්රියතම තැනැත්තී ය.
q2 9 වනිතාවෝ ඈ දැක ‘ඈ වාසනාවන්තී ය’යි කී හ.
q2 9 එසේ ය, බිසෝවරු ද උපභාර්යාවෝ ද ඇය දැක
ඇය වර්ණනා කළහ.
10 අරුණාලෝකය මනේ නැඟී එන, සඳ මනේ රුව
ඇති, ඉර මනේ දිළිසනෙ, කොඩිගත් සේනාවක් මනේ
බලසම්පන්න මේ තැනැත්තී කවරකේ ද?
11 මම මිටියාවතේ ගස් කොළන් බලන පිණිසත්,
මිදි වැල් දලු ලෑවේ ද කියාත්, දළෙම් ගස්වල මල්
පිපුණේ ද කියාත් බලන පිණිසත් කොට්ටම්බා
උයනට බැස ගියමේ.
12 මම වවෙුලමින් සිටිමි;
q2 12 යුද රියේ නියමුවා සටන පතන සේ ඔබේ
ප්රේමය පතන්නට ඔබ මා උනන්දු කරවා ඇත.
*ගායක පිරිස*
13 ෂුලම්මිය කාන්තාව, හැරී එන්න, හැරී එන්න, අප
ඔබ නරඹන පිණිස හැරී එන්න, හැරී එන්න.
*පමේවතී*
q2 13 නරඹන්නන් අතර මා නටන විට ඔබ මා
බලන්න කැමැති වන්නේ මන් ද?
*පමේවතා*
7 රාජ කුමරුවාණන්ගේ දියණියනි, වහන් ලා ගත්
ඔබේ පා සඟළ කතෙරම් මනහර ද?
q2

7 ඔබගේ කලවා සන්ධි කලා ශිල්පියකුගේ
කෘතියක් වැනි ය.
2 ඔබගේ නාභිය මිදියුස පිරුණු, වටකුරු පාත්‍රයක්
වැනි ය.
q22 ඔබගේ උදරය මානලේ මලින් වට වූ තිරිඟු
ගොඩක් වැනි ය.
3 ඔබගේ පියයුරු නිවුන් මුව පැටවුන් දදෙනෙකු
වැනි ය.
4 ඔබගේ ගලෙ ඇත්දත් කුළුණක් වැනි ය.
q24 ඔබගේ ඇස් හෙෂ්බොන් නුවරහි බැත්-රබ්බීම්
දොරටුව ළඟ තිබෙන පොකුණ වැනි ය.
q24 ඔබගේ නාසය දමස්කය මුර කරන ලෙබනොන්
කොත වැනි ය.
5 ඔබ ඔසවාගෙන සිටින හිස කර්මලේ කන්ද වැනි
ය.
q25 ඔබගේ ගොතන ලද වරලස රත්නිල් කෙඳි වැනි
ය.
q25 රජ තමෙගේ ඒ කෙසේ කළඹින් වසඟ වී සිටියි.
6 එම්බා සොඳුරිය, ප්‍රීතිය වඩවන්න ඔබ
කොපමණ ශෝභන ද?
q26 ඔබගේ ප්‍රේමය ප්‍රියජනක ය.
7 මගේ ඔබගේ උස ප්‍රමාණය තල් ගසකටත්, ඔබගේ
පියයුරු මිදි පොකුරුවලටත් සමාන ය.
8 ‘මම තල් ගසට නැඟී එහි අතු අල්ලන්නමේ’යි
කීමි.
q28 ඔබගේ පියයුරු මිදි පොකුරු මෙන් ද ඔබගේ
හුස්මගේ සුවඳ ජම්බු මෙන් ද
9 ඔබගේ මුඛය ඉතා අනගි මිදියුස මෙන් ද වේ වා!
q29 ඒ මිදියුස මා පෙම්වතා වෙත ඔහුගේ දතොල්
පිටත්, දත් පිටත් ගලා යේ වා!
*පෙම්වතී*
10 මම මාගේ පෙම්වතාගේ ය;
q210 ඔහුගේ ආශාව ද මා කෙරෙහි ය.
11 මාගේ පෙම්වත, එන්න, අපි පිටිසරට ගොස්,
ගම්වල නැවතී සිටිමු.
12 අපි අලුයම නැඟිට මිදි වතුවලට ගොස්, මිදි
වැල් දලු ලා මල් පිපුණේ ද දළෙම් ගස්වල මල් පිපී
තිබේ ද කියා බලමු.
q212 එහි දී මාගේ ප්‍රේමය ඔබට පිරිනමන්නමේ.
13 දූදා එල සුවඳක් විහිදුවයි.
q213 අපගේ දොරටු ළඟ අලුත් ද පරණ ද සියලු
ආකාර අනර්ඝ පලතුරු ඇත.
q213 මාගේ පෙම්වත, ඒවා ඔබ උදසො තබාගතිමි.
8 අනේ!
q2
8 ඔබ මාගේ මවුගේ පියයුරුවලින් කිරි බීවා වූ
මාගේ සොහොයුරා මෙන් වී නම් මම
කැමැත්තමේ.
q2
8 එවිට පිටත දී ඔබ මට හමු වූ කල ඔබ මා
සිඹගත්තත් කිසිවකේ මා හෙළා නො දක්නේ ය.
2 මම ඔබ ගෙනෙගොස් මාගේ මවුගේ ගෙට
පමුණුවන්නමේ.
q22 ඔබ මට උගන්වන්නහෙි ය.
q22 මිශ්‍ර කළ මුද්‍රික පානය ද දළෙම් යුස ද මම
ඔබට බොන්න දනේනමේ.
3 ඔබගේ වමත මාගේ හිස යට තිබේ.
q23 ඔබගේ දකුණත මා වැළඳගෙනෙ ඇත.
*පෙම්වතා*
4 ජරෙුසලම් වනිතාවනෙි, ඔබ අප අතර ඇති
ප්‍රේමයට බාධා නොකරන බවට දිවුරුම් දෙන්න.

### හය වන ගීතය

*ගායක පිරිස*
5 තම පෙම්වතා අතින් අත ගෙනෙ කාන්තාරයෙන්
නැඟී එන මේ තැනැත්තිය කවරෙක් ද?
q25 ජම්බු ගස යට දී මම ඔබ පිබිදවූවමේ.
q25 ඔබ උපන්නේ එහි දී ය;
q25 ඔබගේ මව ප්‍රසව වේදනාව වින්දේ එහි දී ය.
*පෙම්වතා*
6 ඔබගේ හිතේ මා හැර අන් කිසිවකුට ඉඩ
නොදෙන්න;
q26 ඔබගේ අතින් අන් කිසිවකු වැළඳ නොගන්න.
q26 මන්ද, ප්‍රේමය මරණය මෙන් බලවන්ත ය;
q26 රාගය මිනීවළ මෙන් කෲරතර ය.
q26 එය ගිනි දලුවක් මෙන් දැල්වෙයි.
q26 එය බුර බුරා ඉහළ නඟියි.
7 මහා දිය දහරින් ප්‍රේමය නිවිය නොහැකි ය;
q27 මහා ගංවතුරට එය යට කළ නොහැකි ය.
q27 මිනිසකු ප්‍රේමය දිනාගන්නට තමාගේ ගයෙි
සියලු සම්පත දුන්නත්, ඔහුට ලැබෙන්නේ අවමානය
පමණකි.

### පෙම්වතියගේ සහෝදරයෝ

8 අපට කුඩා සහෝදරියක් සිටින්නී ය;
q28 තවමත් ඇයට පියයුරු නැත.
q28 අපගේ සහෝදරිට මංගල යෝජනාවක් කරන
දවසේ දී අපි ඈ ගැන කුමක් කරමු ද?
9 ඈ පවුරක් නම්, ඈ පිට රිදී කොතක් ගොඩ
නඟන්නමු.
q29 ඈ දොරක් නම්, කිහිරි ලීවලින් ඈ වට
කරන්නමු.
*පෙම්වතී*
10 මම පවුරක් මෙන් සිටිමි.
q210 මාගේ පියයුරු එහි කොත් කුළුණු ය.
q210 ඒ නිසා මා පෙම්වතා අබිමුව ලත් දයෙන් තුටු
වී සාමයෙන් සිටිමි.
*පෙම්වතා*
11 බාල්-හාමොන්හි සලමොන්ට මිදි වත්තක්
තිබුණේ ය.
q211 ඔහු ඒ මිදි වත්ත බලන්නන්ට බාර දුන්නේ ය.
q211 එහි එල වනෙුවට රිදී දහසක් බැගින්
ගෙනෙන්නට එකිනකොට නියම වීය.
12 මට ම අයිති මිදි වත්තක් තිබේ.
q212 සලමොන්, ඔබට දහසක් ද එහි එල
බලාගන්නන්ට දසියයක් ද දෙනු ලැබේ වා!

13 උයන්වල සිටින තැනැත්තිය, මාගේ මිතුරෝ ඔබේ හඬට සවන් දෙති.
q213 එය මට අසන්න ලැබේ වා!
*පෙම්වතී*

14 මා පෙම්වත, ඉක්මන් කොට, සුවඳ ගස් ඇති කඳු පිට, තිත් මුවකු නොහොත් මුව පැටියකු මෙන් යුහුසුලු ව එන්න.

# යසොයා

### ජුදා ගැන සමිඳාණන් වහන්සේගේ පැමිණිල්ල

1 2 රාජා 15:1-7,32-38; 16:1-20; 18:1—20:21; 2
වංශා 26:1-23; 27:1-9; 28:1-27; 29:1—32:33
ජුදාහි රජවරුන් වූ උශ්ශියාගේ ද ජෝතාම්ගේ ද
ආහාස්ගේ ද හසෙකියාගේ ද කාලයන්හි දී ජුදා
දේශය හා ජරූසලම පිළිබඳ ව ආමොස්ගේ පුත්
යසොයාට දෙවියන් වහන්සේ එළිදරව් කළ පණිවුඩ
මේ පොතේ සටහන් කර ඇත.
2 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
q2 2 “සමිඳුන් වන මා කියන දේට අහස සවන්
දෙන්න;
q2 2 පොළොව කන් දෙන්න.
q2 2 මා විසින් හදාවඩා, ඇතිදැඩි කරගන්නා ලද
දරුවෝ ම මට විරුද්ධ ව කැරලි ගැසූ හ.
3 ගවයාට උගේ අයිතිකාරයා ගැන දැනුමක් ඇත;
q2 3 කොටළුවාට උගේ ස්වාමියාගේ පට්ටිය ගැන
තේරුමක් ඇත.
q2 3 එහෙත්, මාගේ ඉශ්රායලේ සෙනඟට එවැනි
දැනුමක් නැත.
q2 3 මාගේ සෙනඟට තේරුම්ගැන්මක් කොහෙත්ම
නැත.”
4 අනේ!
q2 4 පාපිෂ්ඨ ජාතියක් ද අපරාධයෙන් බර සෙනඟක්
ද නපුර කරන වංශයක් ද දුෂ්ට ලෙස ක්රියාකරන
දරුවන් ද වන ඔවුන් සමිඳුන් අත්හැර, ඉශ්රායලේහි
ශුද්ධ තැනැන් වහන්සේ හෙළා දැක, එතුමන්ට පිටුපා
ඇත.
5 ඔබ වඩ වඩා කැරලි ගසන්නේ වැඩි වැඩියෙන්
දඬුවම් ලබන පිණිස ද?
q2 5 ඉශ්රායලේ ජාතිය, ඔබේ හිස වණ වී ඇත.
q2 5 ඔබේ සිත මුළුමනින් ම දුර්වල ය.
6 හිස් මුදුන සිට යටි පතුල දක්වා කිසිම නිරෝගී
තැනක් ඔබට නැත.
q2 6 තුවාළවලින් ද තැළීම්වලින් ද පැසවන වණවලින්
ද ඔබේ සිරුර පිරී ඇත.
q2 6 ඔබේ තුවාළ සෝදා බැඳ නැත;
q2 6 ඒවාට බෙහෙත් තලේ දමා නැත.
7 ඔබේ දේශය පාළු වී ඇත;
q2 7 නගර ගිනිබත් වී ඇත.
q2 7 ඔබ බලා සිටිය දී විදේශිකයෝ ඔබේ දේශය
නැතිනාස්ති කරති.
q2 7 එය සොදොම් මෙන් පාළු වී ඇත.
8 ජරූසලම වනාහි මිදි වත්තක මඩුවක් මෙන් ද
කැකිරි වත්තක පැල්පතක් මෙන් ද ආරක්ෂා රහිත වූ
වටලනු ලැබූ නගරයක් මෙන් ද යන්තමින් ඉතිරි වී
ඇත.
9 උත් 19:24; රෝම 9:29 සව් බලැති සමිඳාණෝ
මෙසේ ටික දෙනෙකුට ඉතිරි වන්න ඉඩ නුදුන් සේක්
නම්, ජරූසලම ද සොදොම් හා ගොමෝරා මෙන්
සහමුලින් ම විනාශ වන්න ඉඩ තිබිණි.

### වැදගැම්මක් නැති පුද පූජා

10 එම්බා ජරූසලම!
q2 10 ඔබේ ප්රධානීහු ද සෙනඟ ද සොදොමේ හා
ගොමෝරාවේ සිටි අය වැනි ය.
q2 10 සමිඳුන් වදාරන දේට සවන් දෙන්න.
q2 10 දෙවිඳුන් උගන්වන දේ සිතට ගන්න.
11 ආමො 5:21-22 එතුමාණෝ මෙසේ වදාරන
සේක:
q2 11 “නුඹලාගේ නිමක් නැති පූජාවලින් මට වැඩක්
ඇද් ද?
q2 11 බැටළුවන් දවන පූජා ද තර සතුන්ගේ තලේ ද
මට තිත්ත වී ඇත.
q2 11 එළු, බැටළු, ගව ලේ මට රුස්සන්නේ නැත.
12 නුඹලා මා නමදින්න පැමිණෙන විට මේවා
ගෙනෙන්නේ කීවේ කවරෙක් ද?
q2 12 එසේ මාගේ මළුවෙහි පා තබන්න නුඹලාට
කීවේ කවරෙක් ද?
13 ඔය නිෂ්ඵල පූජා තවත් නොගෙනෙන්න;
q2 13 දුම් පූජා මට ඉවසිය නොහැකි ය.
q2 13 අමාවක් උත්සව ද සබත් දවස් ද ආගමික
රැස්වීම් ද මට රිසි නැත.
q2 13 නුඹලාගේ පාපවලින් ඒවා දූෂණය වී ඇත.
14 නුඹලාගේ අමාවක් උත්සව හා වන්දනා ගමන්
මාගේ හද පත්ලෙන් මම හෙළා දකිමි.
q2 14 තවත් උසුලන්න බැරි තරමට ඒවා මට මහා
බරකි.
15 මට අයැදින පිණිස නුඹලා අත් ඔසවන කල එය
නොදකින ලෙස මම මාගේ ඇස් වසාගන්නෙමි.
q2 15 නොකඩවා යාච්ඤා කළත් කිසිසේත් සවන්
නොදෙන්නෙමි.
q2 15 නුඹලාගේ අත් ලෙයින් පිරී ඇත.
16 ස්නානය කොට පිරිසිදු වන්න;
q2 16 මා ඇස් හමුයෙන් ඔය පව් දුරු කරන්න.
q2 16 නපුරුකම් තවත් නොකරන්න.
17 යහපත කරන්න ඉගෙන ගන්න;
q2 17 පීඩා විඳින්නන්ට පිහිට වන්න;

q2 17 අනාථයන්ගේ හිමිකම් රැක දෙන්න;
q2 17 වැන්දඹුවන් උදෙසා ඉදිරිපත් වන්න.
q2 17 මෙසේ යුක්තිය ඉටු කරන්න.
18 'එන්න, අපි මේ ගැන සාකච්ඡා කරමු'යි
සමිඳාණෝ වදාරන සේක.
q2 18 "නුඹලාගේ පව් රතට රතේ තිබෙන නමුත්,
ඒවා හිම මෙන් සුදු වන්නේ ය;
q2 18 තද රතු පැහැයෙන් තිබෙන නමුත්, සුදු ලොම්
මෙන් වන්නේ ය.
19 නුඹලා සිය කැමැත්තෙන් කීකරු වන්නහු නම්,
දේශයේ සාරවත්කම භුක්ති විඳින්නහු ය.
20 අකීකරු වී කැරලි ගසන්නහු නම් කඩුවෙන්
මැරුම් කන්නහු ය."
q2 20 සමිඳාණෝ සිය සිරි මුවෙන් මෙය වදාළ සේක.

## දූෂිත නුවර පිළිබඳ තීන්දුව

21 අහෝ, විශ්වාසවන්ත ව සිටි නුවර දැන්
වෙසඟනක වී සිටින හැටි!
q2 21 එදා එහි සිටියෝ යුක්තිය ඉටුකළ දැහැමියෝ
ය;
q2 21 අද සිටින්නෝ මිනීමරුවෝ ය.
22 එම්බා ජෙරුසලම!
q2 22 එක් කලක ඔබ රිදී මෙන් වූ නමුත්, දැන් ඔබේ
වටිනාකමක් නැත.
q2 22 එක කලක ඔබ හොඳ මිදියුස මෙන් වූ නමුත්,
දැන් වතුර සමඟ මිශ්‍ර වී ඇත.
23 ඔබේ මූලිකයෝ කැරලිකාරයෝ ය, සොරුන්ගේ
මිතුරෝ ය.
q2 23 සියලු දෙන ම අල්ලසට ඇලුම් කරති.
q2 23 තම වාසිය සොයා යති;
q2 23 අනාථයන්ට යුක්තිය ඉටුකර නොදෙති;
q2 23 වැන්දඹුවන්ගේ නඩුවලට සවන් නොදෙති.
24 එබැවින්, ඉශ්‍රායෙල්වරුන්ගේ සව් බලැති
සමිඳාණන් වදාරන මේ දේට සවන් දෙන්න;
q2 24 "මම මාගේ එදිරිකාරයන් අබිබවා මාගේ
සතුරන්ගෙන් පළිගන්නෙමි;
25 මම නුඹලාට විරුද්ධ ව ක්‍රියාකර, ගිනි උදුනෙහි
ලෝහ පිරිසිදු කරන්නාක් මෙන් නුඹලා පිරිසිදු
කරන්නෙමි;
q2 25 නුඹලාගේ සියලු බොර රොඩු ආදිය ඉවත්
කරන්නෙමි;
26 පෙර සිටියාක් මෙන් විනිශ්චයකාරයන් ද
අනුශාසකයන් ද මම නුඹලාට නැවත දෙන්නෙමි.
q2 26 එවිට, 'ජෙරුසලම ධර්මිෂ්ඨ නුවර ය,
විශ්වාසවන්ත නුවර ය'යි කියනු ලැබේ."
27 සමිඳුන් දමිටු වන බැවින් එතුමාණෝ ජෙරුසලම
ද එහි සිටින එතුමන් වෙත හැරෙන සියල්ලන් ද
ගළවන සේක.
28 එහෙත්, ද්‍රෝහිකම් කරන්නෝ ද පව්කාරයෝ ද
එකට විනාශ කරනු ලබන්නෝ ය;
q2 28 සමිඳුන් අත්හරින්නෝ ද විනාශ වෙති.
29 නුඹලා කලින් රුක් වන්දනාවේ යෙදුණු බැවින් ද
ශුද්ධ වූ උද්‍යාන පිහිටවූ බැවින් ද ඒවා ගැන ලජ්ජා
වන්නහු ය.
30 නුඹලා කොළ මැලවී යන ආලෝන ගසක් මෙන්
ද වතුර නැති උයනක් මෙන් ද වන්නහු ය.
31 ගින්නෙන් පිදුරු දැවී යන්නාක් මෙන් බලවත් අය
තමන්ගේ ම පව්වුටු ක්‍රියාවලින් විනාශවන්නෝ ය.
q2 31 එය නැවැත්වීම කිසිවකුට වත් නොහැකි වේ.

## සදාකාලික සාමය

2 ජුදා සහ ජෙරුසලම පිළිබඳ ව ආමොස්ගේ
පුත් යෙසායාට දෙවියන් වහන්සේ දුන්
පණිවුඩය මෙසේ ය:
2 මතු කාලයේ දී සමිඳුන්ගේ දේව මැඳුර පිහිටා
ඇති කන්ද, උතුම් ලෙසෙ ද සියලු කඳුවලට ඉහළින්
තිබෙන ලෙසෙ ද පිහිටුවනු ලබන්නේ ය.
q2 2 සියලු ජාතීහු එතැනට ගලා එන්නෝ ය.
3 බොහෝ දෙනෙක් පැමිණ මෙසේ කියනු ඇත:
q2 3 'එන්න, අපි යමු;
q2 3 සමිඳුන්ගේ කන්දට නඟිමු;
q2 3 ඉශ්‍රායෙලේ දෙවිඳුන්ගේ මැඳුරට පිවිසමු;
q2 3 එතුමාණන් පෙන්වන මාර්ගය ගැන ඉගෙන එහි
ගමන්ගන්න අපට හැකි වනු ඇත.'
q2 3 මන්ද, සමිඳුන්ගේ පණිවුඩය පැමිණෙන්නේ
සියොන් කන්දෙන් ය;
q2 3 එතුමන් සෙනඟට කතා කරන්නේ ජෙරුසලමෙන්
ය.
4 ජෝවෙ 3:10 මහා ජාතීන් අතර භේද
එතුමාණෝ නිරවුල් කරන සේක;
q2 4 එතුමාණෝ ජාතීන්ගේ කාරණා තීන්දු කරන
සේක.
q2 4 තමන්ගේ කඩුවලින් නගුල් ද තමන්ගේ
හෙල්ලවලින් දෑකැති ද ඔව්හු සාදාගන්නෝ ය.
q2 4 ජාතියක් ජාතියකට විරුද්ධ ව කඩු ගන්නේ
නැත.
q2 4 ඔවුන් යුද්ධයට පුහුණු වන්නේ නැත.
5 අහෝ!
q2 5 ජාකොබ්ගේ වංශය එන්න, සමිඳුන්ගේ
ආලෝකයෙහි අපි ඇවිදිමු.

## සමිඳාණන් වහන්සේගේ ආගමන දවස

6 සමිඳුනි, ඔබ තුමාණෝ ජාකොබ්ගේ වංශය වන
තමන් සෙනඟ අත්හළ සේක.
q2 6 මන්ද, පෙරදිගින් පැමිණි යන්ත්‍ර
මන්ත්‍රකාරයන්ගෙන් ද පිලිස්තිවරුන් මෙන් පේන
කියන්නන්ගෙන් ද දේශය පිරී ඇත.
q2 6 සෙනඟ විදේශීන් සමඟ අත්වැල් බැඳගෙන
සිටිති.
7 ඔවුන්ගේ දේශය රන් රිදීවලින් පිරී ඇත.
q2 7 වස්තුවට නිමක් නැත.
q2 7 ඔවුන්ගේ දේශය අශ්වයන්ගෙන් පිරී ඇත.
q2 7 ඒ රථවාහනවල නිමක් නැත.
8 ඔවුන්ගේ දේශය පිළිමවලින් පිරී ඇත.

q2[8] ඔව්හු සිය අත්වලින් තැනූ දේ නමදිති.
9 මේ නිසා සියලුදනො නින්දාවටත්, ලජ්ජාවටත්
පත් වනු ඇත.
q2[9] සමිඳුනි, ඔවුන්ට කමා නොවුව මැනව.
10 එළිද 6:15; 2 තසෙ 1:9 සමිඳුන් උදහසින් ද
එතුමන්ගේ බලයේ තේජාලංකාරයෙනේ ද පලා යන
පිණිස ඔව්හු ගල්ගුහාවල, නැතහොත්, බිංගවෙල්
සාදාගනෙ ඒවායෙහි සැඟවෙන්නෝ ය.
11 මිනිසාගේ අහංකාරය බිඳී යන, අභිමානය සිඳී
යන දවසක් පැමිණෙන්නේ ය.
q2[11] ඒ දවසේ දී සමිඳාණෝ පමණක් උසස් කරනු
ලබන සේක.
12 ඒ දවසේ දී සව් බලැති සමිඳාණෝ බලවත් වූ,
අහංකාර වූ, උඩඟු වූ, හැම කනෙකෙු ම පහත්
කරන සේක;
13 ලබෙනොන්හි ඇති උස් කිහිරි ගස් සියල්ල ද
විනාශ කරන සේක;
q2[13] බාෂාන්හි ඇති ආලෝන ගස් ද
14+ISA උස් කඳු හලේ සියල්ල ද උස් කොත් හා
සුරුකි පවුරු ද සමතලා කරන සේක;
16 තර්ෂිෂ්හි සියලු නෞකාවලට විරුද්ධ ව සහ
සියලු අලංකාර නෞකාවලට විරුද්ධ වන සේක.
17 ඒ දවස පැමිණි විට මිනිසාගේ අහංකාරය බිඳී
යන්නේ ය;
q2[17] අභිමානය සිඳී යන්නේ ය;
q2[17] සමිඳාණෝ පමණක් උසස් කරනු ලබන සේක.
18 සියලු පිළිම සහමුලින් ම පහකරනු ලබන්නේ
ය.
19 සමිඳුන් පොළොව කම්පා කරවීමට පැමිණෙන
විට එතුමන්ගේ උදහසින් ද එතුමන්ගේ බලයේ
තේජාලංකාරයෙනේ ද පලා යන පිණිස සෙනඟ
ගල්ගුහාවල, නැතහොත්, බිංගවෙල් සාදාගනෙ
ඒවායෙහි සැඟවෙන්නෝ ය.
20 ඒ දවස පැමිණි විට, රන් රිදීවලින් සාදාගත්
පිළිම ඔව්හු මීයන්ට හා වවුලන්ට අත්හැරදමති.
21 සමිඳුන් පොළොව කම්පා කරවීමට පැමිණෙන
විට එතුමන්ගේ උදහසින් ද එතුමන්ගේ බලයේ
තේජාලංකාරයෙනේ ද බේරෙන පිණිස සෙනඟ
ගල්ගුහා, නැතහොත්, බිංගවෙල්
q2[21] සාදාගනෙ ඒවායෙහි සැඟවෙන්නෝ ය.
22 හුස්ම ටික පමණක් වන මිනිසා කෙරෙහි
විශ්වාස නොකරන්න.
q2[22] ඔහුගේ වටිනාකම කුමක් ද?

### ජෙරුසලමේ අවුල් වියවුල්

3 සමිඳාණෝ එනම්, සව් බලැති සමිඳාණෝ
ජෙරුසලමේ හා ජුදාවේ සෙනඟගේ
පිහිටාධාරය වන සියලු දේ ඔවුන්ගේ ආහාර පාන ද
ඉවත් කරන සේක.
2 වීරවරයන් ද භේවායන් ද විනිශ්චයකාරයන් හා
දිවැසිවරයන් ද පේන කියන්නන් හා ප්‍රජා මූලිකයන්
ද
3 හමුදාවේ හා රටවැසියන්ගේ නායකයන් ද
මන්ත්‍රීවරුන් හා දක්ෂ යන්ත්‍ර මන්ත්‍රකරුවන් ද
එතුමාණෝ පහකරන සේක.
4 සෙනඟගේ අධිපතීන් වශයෙනේ ළා බාල අය
සමිඳාණෝ පත් කරන සේක.
5 සෙනඟ එකිනෙකොට හා තම අසල්වැසියාට
හිරිහැර කරන්නෝ ය.
q2[5] ගැටවරයෝ වැඩිහිටියන්ටත්, පහත් අය උසස්
අයටත් ගෞරව නොකරති.
6 එක් වංශයකට අයිති අය තමන් අතරෙනේ
කනෙකෙු තෝරාගනෙ, "ඔබට අඳින්න අඩු තරමින්
වස්ත්‍රයක් ඇත;
q2[6] ඒ නිසා මේ අවුල් වියවුල් ඇති අවදියේ අපේ
නායකයා වන්නැ"යි කියන කාලයක් පැමිණෙන්නේ
ය.
7 එහෙත්, ඔහු පිළිතුරු දමේින්, "ඔබ හැමට උදව්
කරන්න මට නොහැකි ය.
q2[7] කෑම වත්, ඇඳුම් වත් මට නැත;
q2[7] ඔබේ නායකයා වශයෙනේ මා පත්
නොකරන්නැ"යි කියනු ඇත.
8 සැබැවින් ම ජෙරුසලම නැති නාස්ති වී ඇත.
q2[8] ජුදා වැටී ඇත.
q2[8] කුමක් නිසා ද ඔවුන් කරන කියන හැම දේ
සමිඳුන්ට විරුද්ධ වේ.
q2[8] ඔව්හු දවේිඳුන්ගේ මහිමය හෙළා දකිති.
9 ඔවුන්ගේ අහංකාර පනේීම ඔවුන්ට විරුද්ධ ව
සාක්ෂි දෙයි;
q2[9] සොදොම් වැසියන් මනේ ඔව්හු එළිපිට ම පව්
කරති;
q2[9] ඔවුන්ට වන විපතක මහත!
q2[9] එය ඔවුන් තමන් විසින් තමන් පිට ම
පමුණුවාගනෙ ඇත.
10 ධර්මිෂ්ඨයන්ට යහපත වන්නේ ය;
q2[10] ඔව්හු තමන්ගේ ක්‍රියාවල ඵල භුක්ති
විඳින්නෝ ය.
11 එහෙත්, දුෂ්ටයන්ට වන විපතක මහත!
q2[11] ඔවුන්ගේ ක්‍රියාවල ඵල විපාක ඔවුන් පිට ම
වැටෙනු ඇත.
12 මුදල්ණයට දනේනෝ මාගේ සෙනඟට හිරිහැර
කරති;
q2[12] අයුතු පොළී ගන්නෝ ඔවුන් රවටති;
q2[12] දරුවෝ වැඩිහිටියන්ට හිරිහැර කරති;
q2[12] ස්ත්‍රීහු පාලනය තම අතට ගනිති.
q2[12] මාගේ ජනයෙනි, ඔබේ නායකයෝ ඔබ මුළා
කරති;
q2[12] යා යුතු මඟ අවුල් කරති.

### ජුදාවේ විනාශය

13 කරුණු ප්‍රකාශ කරන්නත්, ජාතීන් විනිශ්චය
කරන්නත් සමිඳාණෝ අසුන් අරා සිටින සේක.
14 සමිඳාණෝ ප්‍රජා මූලිකයන් ද නායකයන් ද
විනිශ්චය කරන්න පැමිණෙන සේක.
q2[14] එතුමාණෝ මසෙේ පැමිණිලි කරන සේක:

q2[14] “නුඹලා මිදි වතු සූරා කා දුප්පතුන්ගෙනේ
කොල්ලකාගත් දයෙන් නුඹලාගේ ගවෙල්
පුරවාගන්නහු ය.
15 මාගේ සෙනඟ පාගාදමන්නත්, දුප්පතුන්ට
අසාධාරණ දේ කරන්නත් නුඹලාට යුතු නැත.
q2[15] මෙසේ පවසන්නේ මහෝත්තම දෙවී ස්වාමීන්
වන මම ය.”

### ජෙරුසලමේ ස්ත්‍රීන්ගේ ඉරණම

16 සමිඳාණෝ මෙසේ වදාරන සේක;
q2[16] “ජෙරුසලම් ස්ත්‍රීහු කතෙරම් ආඩම්බර ද කියා
බලන්න.
q2[16] ඔව්හු අහංකාරකමින් හිස ඔසවාගෙන,
නුවන'ග බැලුම් හළෙමින්, පා සළඹ හඬ නංවමින්
ඇවිදිති.
17 මම ඔවුන්ගේ හිස මුඩුකර, ඔවුන්ගේ රහස'ඟ
නග්න කරන්නමේ.”
18 සමිඳාණන් වහන්සේ ජෙරුසලමේ ස්ත්‍රීන්
කෙරෙනේ, ඔවුන්ගේ උඩඟුකමට හේතු වන දේවල්
එනම්, පාදවලත්, බලේලේත්, හිසේත් පළඳින
ආභරණ ද; 19 අත් වළලු ද මුවවස්නා ද; 20 මකුට ද
පාදදාම ද ඉඟපටි ද සුවඳ හපේපු ද සුර ද; 21 මුදු ද
නාසාභරණ ද; 22 මංගල වස්ත්‍ර ද සළු ද උතුරු සළු
ද පසුම්බි ද; 23 අත් කැටපත් ද සිහින් හණ රෙදි ද
ලේන්සු ද ඇඟ වැසුම් ද පහකර දමන සේක.
24 එවිට සුවඳ ද්‍රව්‍ය වෙනුවට දුගඳ ද බඳ පටි
වෙනුවට ලණුවක් ද මනා ලෙස ගතෙූ වරලස
වෙනුවට හිස් මුඩුකම ද ශෝභමාන ඇඳුම් වෙනුවට
දළ රෙදි ද රූපශ්‍රීය වෙනුවට විළිලජ්ජාව ද ඔවුන්ට
ඇති වන්නේ ය.
25 නගරයේ සිටින පුරුෂයෝ ඉතා ශක්තිමත් අය
වුව ද යුද්ධයේ දී මැරුම් කන්නෝ ය. 26 නගරයේ
දොරටු අසලින් හැඬීමත්, වැළපීමත් නික්මෙනු ඇත.
නගරය ද නග්න ව බිම වැතිර සිටින ස්ත්‍රියක මෙනේ
වන්නී ය.

4 ඒ කාලයේ දී, ස්ත්‍රීන් හත්දෙනෙකේ එක
මිනිසකුෙ අල්ලාගෙන, “තනිව සිටීමේ නින්දාව
පහ කරගන්න පිණිස නුඹ අපේ ස්වාමි පුරුෂයා යයි
කියන්න අපට ඉඩ දුන මැනව; අපේ කෑම බීම හා
ඇඳුම්පැළඳුම් අපට ම සපයාගත හැකි යැ”යි
කියන්නෝ ය.

### අනාගත සෞභාග්‍යය

2 සමිඳාණන් වහන්සේගේ අංකුරය අලංකාර ව හා
සරුසාර ව වැඩෙන කාලයක් පැමිණෙනේනේ ය.
ඉශ්‍රායලේහි ඉතිරි ව සිටින සෙනඟ භූමියෙනේ
හටගන්න අස්වැන්න ගැන ආඩම්බර වෙති. ප්‍රීති
වෙති. 3 ජෙරුසලමේ ඉතිරි ව සිටින අය එනම්,
විනාශ නොවී ජීවත් ව සිටින පිණිස දෙවියන්
වහන්සේ විසින් තෝරා ගනු ලැබූ අය,
‘ශුද්ධවන්තයෝ යැ’යි කියනු ලබන්නෝ ය.
4 සමිඳාණන් වහන්සේ ස්වකීය බලයෙනේ සියොන්හි
ස්ත්‍රීන් විනිශ්චයකර, පිරිසිදුකර ජෙරුසලමේ
අපරාධය ද එහි වගුරුවනු ලැබූ ලේ ද සෝදා හරින
සේක. 5 නික්ම 13:21; 24:16එවිට උන් වහන්සේ
සියොන් කන්දට හා එහි සිටින සියල්ලන්ට ඉහළින්
දවාලේ වලාකුළක් ද රාත්‍රියේ දුමාරයක් හා
දීප්තිමත් ගින්නක් ද මවා එවන සේක. දෙවියන්
වහන්සේගේ තේජාලංකාරය මුළු නගරය වසා
ගෙන එය ආරක්ෂා කරන ආවරණයක් මෙනේ වන්නේ
ය. 6 එය දාවල් ග්‍රීෂ්මයෙනේ මුවා වීමට සෙවෙණක්
පිණිසත්, රක්ෂා ස්ථානයක් පිණිසත් කුණාටුවෙනේ හා
වර්ෂාවෙනේ ආරක්ෂා වීමට ස්ථානයක් පිණිසත්
වන්නේ ය.

### මිදි වත්ත පිළිබඳ ගීය

5 මතෙ 21:33; මාක් 12:1; ලූක් 20:9 මාගේ
පෙමේවතාට ඔහුගේ මිදි වත්ත ගැන මම ගී
ගයමි.
q2
5 මා පෙමේවතාට මිදි වත්තක් සරුසාරවත් කඳු
බෑවුමක තිබිණි.
2 ඔහු බිම හාරා ගල් ඉවත්කර, ඉතා හොඳ මිදි
වැල් පැළකර, ඒ මැද මුරකොටුවක් ගොඩ නඟා,
මිදියුසට තටාකයක් සාදා, හොඳ මිදි පල ලබන්න
බලා සිටියේ ය.
q2[2] අහෝ! එහතේ, එහි හටගත්තේ වල් මිදි
පමණකි.
3 ඒ නිසා මාගේ පෙමේවතා මෙසේ කියයි;
“ජෙරුසලමේ හා ජුදාවේ වැසියෙනි, මා හා මාගේ
මිදි වත්ත අතරේ විනිශ්චය කරන්න.
4 මාගේ මිදි වත්ත උදෙසා මා කළ දේට අමතර ව
තවත් කිසිවක් කරන්නට තිබුණේ ද?
q2[4] එසේ නම්, හොඳ මිදි පල මා බලාපොරොත්තු
වන නමුත්, එහි වල් මිදි පල හට ගන්නේ මන් ද?
5 මෙනේ, මාගේ මිදි වත්තට කරන්න යන දේ
මම නුඹලාට කියමි.
q2[5] මම එහි වටේට ඇති වැට ඉවත්කර, ආරක්ෂා
පිණිස ඇති තාප්පය බිඳදමා, වන මෘගයන්ට මිදි
වත්ත පාගා කා දමන්න ඉඩ හරින්නමේ.
6 එය පාළු වන්න හරින්නමේ.
q2[6] මා එහි අතු පාහින්නේ වත්, පස් බුරුල්
කරන්නේ වත් නැත.
q2[6] එහි කටු ගස් හා ගොකටු හටගන්න
හැරදමන්නමේ.
q2[6] එහි වැසි නොවෙසින පිණිස වලාකුළුවලට මම
අණ කරන්නමේ.”
7 සව් බලැති සමිඳුන්ගේ මිදි වත්ත නම්,
ඉශ්‍රායලේ වංශය ය.
q2[7] එතුමාණන් ප්‍රිය කළ මිදි වැල් නම්, ජුදාහි
සෙනඟ ය.
q2[7] ඔවුන් යුක්තිය ඉටු කරනු ඇතැ යි එතුමන් බලා
සිටි නමුත්, ඔවුන් කළෙේ මිනී මැරීම ය;
q2[7] ඔවුන් දැහැමිකම් කරනු ඇතැ යි එතුමන් බලා
සිටි නමුත්, ඇති වූයේ විලාප නැඟීම ය.

### සනෙඟට ඇතිවන සාප

8 තමන් පමණක් දේශයයේ වාසය කරන පිණිස,
අනුන්ට ඉඩකඩ නැති වන තරමට ගයෙකට ගයෙක්
එකතු කරගන්න,
q2[8] කතෙකට කතෙක් යා කරගන්න අයට වන
විපතක මහත!
9 සව් බලැති සමිඳුන් මසෙේ වදාරනු මා අසා ඇත.
q2[9] “මේ විශාල අලංකාර ගවෙල් සියල්ල පාළු
නටබුන් වන්නේ ය.
10 හක්ටාර් දහයක මිදි වත්තකින් ලැබනේනේ
මිදියුස ලීටර් අටක් පමණකි.
q2[10] බිත්තර වී ලීටර් එකසිය අසූවකින් ලැබනේනේ
ධාන්ය ලීටර් දහඅටකි.”
11 මත්පැන් බීමට පාන්දරින් ම නැඟිටින,
වරෙමත්කමින් රූ වන තුරු පමා වන ඔබට වන
විපතක මහත!
12 ඔබේ උත්සවවල වීණා ද කුඩා වීණා ද රබන් ද
නළා ද මත්පැන් ද ඇත;
q2[12] එහතේ, සමිඳුන් කරන දේ ඔබ ගණන් ගන්නේ
නැත;
q2[12] එතුමන්ගේ ක්රියා ගැන කල්පනා කරන්නේ
වත් නැත.
13 ඔබ අනුවණයන් වන නිසා සිරකරුවන් මනේ
ගනෙයනු ලබන්නහු ය.
q2[13] ඔබේ නායකයෝ බඩගින්නේ මැරතේ;
q2[13] පොදු ජනයා පිපාසයනේ පළෙතේ.
14 පාතාල ලෝකය ඔවුන් ගිලින්න කට අයාගනෙ
සිටියි.
q2[14] එය ජරෙුසලමේ ප්රභූවරුන් ද කෑ කෝ ගසන
කලබලකාරී පොදු සමූහයා ද ගිලගනියි.
15 මසෙේ සියලු දනෙ නින්දාවට පමුණුවනු ලබති;
q2[15] උඩඟු සියලු දනෙ පහත් කරනු ලබති.
16 එහතේ, සව් බලැති සමිඳාණෝ යුක්තිය ඉටු
කරමින් තමන්ගේ ශ්රේෂ්ඨකම ද විනිශ්චයයේ
සාධාරණත්වයනේ තමන්ගේ ශුද්ධවන්තකම ද
එළිදරව් කරන සේක.
17 නගරවල නටබුන් අතරේ බැටළු පැටව් තණ
කන්නෝ ය;
q2[17] එළු පැටව් ද ගොදුරු සොයන්නෝ ය.
18 වංචාවේ රැහැනින් වළේී, අපරාධයට වැටමේින්,
පාප දිවියට පා තබන ඔබට වන විපතක මහත!
19 එය සිදු වූ විට, සමිඳාණෝ, “තමන් වහන්සේ
කරන සේකැ”යි කියන දේ ඉක්මනින් කරන සේක්
වා!
q2[19] එවිට එය අපට බැලිය හැකි ය.
q2[19] ඉශ්රායලේවරුන්ගේ සුවිශුද්ධ දවේිඳාණෝ
තමන්ගේ අදහස් ඉටු කරන සේක් වා!
q2[19] “එය සිදු වූ විට, එතුමන්ගේ අදහස් කවරේ ද
කියා අපි දැනගනිමු”යි ඔබ කියන්නහු ය.

20 නපුරට යහපත කියා ද යහපතට නපුර කියා ද
කියන, එළිය අඳුරු බවටත් අඳුර එළිය බවටත්
හරවන මිහිර තිත්ත බවටත් තිත්ත මිහිර බවටත්
හරවන ඔබට වන විපතක මහත!
21 ‘අපි ඥානවන්තයෝ ය’යි සිතාගනෙ ‘අපි
නුවණැත්තෝ ය’යි කල්පනා කරන ඔබට වන
විපතක මහත!
22 සුරාපානයට ශූර වූ, සුරා මිශ්ර කිරීමට සමත් වූ,
23 අල්ලස් ගනෙ දුෂ්ටයා නිදොස් කර,
ධර්මිෂ්ඨයන්ගේ අයිතිවාසිකම් පැහැරගත් ඔබට වන
විපතක මහත!
24 ශුද්ධ දවේිඳුන්ගේ වචනය හළො දුටු නිසාත්,
සව් බලැති සමිඳුන්ගේ අණපණත් ප්රතික්ෂේප කළ
නිසාත්, ගිනි දැල්ලට ඉපනැලි හා පිදුරු දැවී යන්නාක්
මනේ ඔබට සමාන ඒ ගස්වල
q2[24] මුල් දිරාපත් වී, මල් වියළී පහ වී යන්නේ ය.
25 සමිඳුන්ගේ උදහස සනෙඟට විරුද්ධ ව ඇවිළී
ඇත.
q2[25] ඔවුන්ට දඬුවම් කිරීමට එතුමාණෝ අත ඔසවා
ඔවුන්ට පහර දුන් සේක.
q2[25] එවිට කඳු කම්පා වනු ඇත;
q2[25] මැරනෙ අයගේ මළකඳන් කුණු කසළ මනේ
වීථිවල දමා තිබනෙු ඇත.
q2[25] මේ සියල්ල සිදු වුවත් සමිඳුන්ගේ උදහස නිවී
නැත.
q2[25] ඔවුන්ට දඬුවම් කරන පිණිස එතුමන්
ඔසවාගත් තම හස්තය එසේ ම තිබනෙු ඇත.
26 සමිඳාණෝ දුර සිටින ජාතීන් පොළෙවෝ
සීමාන්තයේ සිට පැමිණනෙ පිණිස සංඥාවකින්
කැඳවන සේක.
q2[26] ඔව්හු ඉක්මනින්, වේගයනේ පැමිණනේනෝ ය.
27 ඔවුන්ගනේ කිසිවකෙු විඩාවට පත් වන්නේ වත්,
පැකිළනේනේ වත් නැත;
q2[27] නිදි කිරා වැටනේනේ වත්, නිදාගන්නේ වත්
නැත;
q2[27] ඔවුන්ගේ ඉඟපටි බුරුල්වන්නේ වත්, පා
වහන්වල පටි කැඩනේනේ වත් නැත.
28 ඔවුන්ගේ ඊතල තියුණු කර තිබේ;
q2[28] දුනු සියල්ල තැත් කවා තිබේ.
q2[28] ඔවුන්ගේ අශ්වයන්ගේ කුර ගිනිගල් මනේ
ශක්තිමත් ය;
q2[28] රථවල රෝද සුළි සුළඟ මනේ වේගවත් ව
කැරකයෙි.
29 ඔවුන්ගේ හේවායෝ ගොදුර අල්ලා සුරුකි ව
ගනෙ යන සිංහයන් මනේ ගර්ජනා කරන්නෝ ය.
q2[29] ඔවුන්ගනේ ඒවා ගළවාගන්න හැකි කිසිවකේ
නොමැත.
30 ඒ දවස පැමිණි විට ඔව්හු ඉශ්රායලේවරුන්ට
විරුද්ධ ව, මුහුද ගිගුරුම් දනේනාක් මනේ ගිගුරුම්
දනේනෝ ය.
q2[30] දේශය දසෙ බැලූ විට දක්නට ලැබනේනේ
අන්ධකාරය හා විපත්තිය ය.
q2[30] වලාකුළුවලින් එළිය අඳුරු වී ඇත.

### දිවැසිවර යසොයා කැඳවනු ලැබීම

6 2 රාජා 15:7; 2 වංශා 26:23 උශ්ශියා රජු
මරණයට පත් වූ අවුරුද්දේ දී සමිඳාණන්
වහන්සේ උස් වූ උදාර වූ සිංහාසනයක් මත වැඩ
හිඳිනු මම දිටිමි. උන් වහන්සේගේ සළුවනේ දේව
මාලිගාව පිරී තිබුණේ ය. 2 සරොප්වරු උන්
වහන්සේ සිසාරා සිටියෝ ය, එක් එක් කනොට
පියාපත් සය බැගින් තිබුණේ ය; දකෙකින් මුහුණු
වසා ගත්තෝ ය, දකෙකින් ඇඟ වසා ගත්තෝ ය;
දකෙකින් පියාසර කළෝ ය. 3 එළිද 4:8එක් කනෙකේ
අනිකකෙුට හඬගසමින් මසෙේ කී ය:
q2 3 "සුවිශුද්ධ ය, සුවිශුද්ධ ය, සුවිශුද්ධ ය.
q2 3 සව් බලැති සමිඳාණන් වහන්සේ සුවිශුද්ධ ය.
q2 3 උන් වහන්සේගේ තේජසින් මුළු ලාෝව පිරී
ගියේ ය."
4 එළිද 15:8 ඔවුන්ගේ මොරගැසීමේ හඬට දේව
මාලිගාවේ අත්තිවාරම සලෙවුණේ ය; දේව
මාලිගාව ද දුමනේ පිරුණේ ය.
5 එවිට මම මසෙේ කීමි: "අහෝ! මා වැනි
කාලකණ්ණියකේ; මට කිසි බලාපොරොත්තුවක්
නැත. මන්ද, අපවිත්‍ර තොල් ඇති මිනිසකෙු වන,
අපවිත්‍ර තොල් ඇති සනෙඟක් අතරේ ජීවත් වන,
මම සියලු බලැති ස්වාමීන් වන රජාණන් වහන්සේ
මාගේ දෑසින් ම දිටිමි."
6 එවිට සරොප්වරුන්ගනේ එක් කනෙකේ අඬුවකින්
පූජාසනය මත්තනේ ගත් ගිනි අඟුරක් රැගනෙ මා
ළඟට පියාසර කර අවුත්, 7 එය මාගේ මුඛයහෙි
තවරා, "මයෙ නුඹේ තොල්වල තැවරුණේ ය;
මසෙේ නුඹේ අපරාධය පහ කරන ලද්දේ ය; නුඹේ
පාපය කමා කරන ලද්දේ ය"යි කී ය. 8 එවිට, "මම
කවරකෙු යවම් ද? අප වනෙුවනේ යන්නේ කවරකේ
දැ"යි කියන සමිඳාණන් වහන්සේගේ හඬ මට
ඇසුණේ ය. මම ද, "මනේන, මම මහෙි ය, මා යැව්ව
මැනවැ"යි කීමි.
9 මත 13:14-15; මාක් 4:12; ලූක් 8:10; ජොහ
12:40; ක්‍රියා 28:26-27 උන් වහන්සේ මට යන්න
කියා සනෙඟට මේ පණිවුඩය දනේන යයි මට වදාළ
සේක:
q2 9 "නුඹලා කොතකේ සවන් දුන්නත් තේරුම්
නොගන්නහු ය;
q2 9 කොතකේ දුටුවත් වටහා නොගන්නහු ය.
10 මේ සනෙඟගේ සිත් අඳුරු වනු ඇත;
q2 10 කන් බිහිරි වනු ඇත, ඇස් අන්ධ වනු ඇත.
q2 10 ඒ නිසා ඔවුන්ට සුවය නොලැබනෙ ලසෙ
ඔවුන්ගේ ඇස්වලින් ඔවුන්ට නොපනෙේ;
q2 10 කන්වලින් ඔවුන්ට නො ඇසේ;
q2 10 සිත්වලින් ඔවුන්ට නොවැටහේ."
11 එවිට මම, "සමිඳුනි, මසෙේ වන්නේ කොපමණ
කලකට දැ"යි ඇසීමි.
q2 11 එතුමාණෝ මසෙේ පිළිතුරු දුන් සේක:
q2 11 "වැසියකෙු නැති ව නගර ද මිනිසකෙු නැති ව
ගවෙල් ද පාළු වන තුරුත්, දේශය සහමුලින් ම
ජනශූන්‍ය වන තුරුත් ය.
12 මම ජනයා ඈතට පහකර දමා මුළු දේශය පාළු
කරන්නමේ.
13 දේශයේ දසදනෙකෙුගනේ එක් කනෙකෙු වත්
ඉතිරි වූවොත් ඔහු ද විනාශ කරනු ලැබේ.
q2 13 ඔහු සිඳ දමනු ලැබූ ආලෝන ගසක ඉතිරි වන
කොටස හා සමාන වේ."
13 මේ කොටසනේ ඉශ්රායලේ සනෙඟගේ
නවෝදය නිරූපණය කරේ.

### ආහාස් රජුට පණිවුඩය

7 2 රාජා 16:5; 2 වංශා 28:5-6 උශ්ශියාගේ
මුණුබුරා වූ ද ජෝතාම්ගේ පුත්‍රයා වූ ද
ආහාස් ජුදාහි රජකම් කරන කාලයේ දී යුද්ධයක්
හටගත්තේ ය. සිරියාවේ රජ වූ රශේන් ද
රමෙලියාගේ පුත්‍ර වූ ඉශ්රායලේහි රජ වූ පකො ද
ජරෙුසලමට විරුද්ධ ව යුද්ධ කළ නමුත් ජයගන්න
නොහැකි විය.
2 සිරියාවේ හමුදා ඉශ්රායලේ දේශයට පිවිස
සිටින බව ජුදාවේ රජුට දන්වන ලදී. එවිට රජ ද
සනෙඟ ද සුළඟට සැලනෙ ගස් මනේ චංචල වූ හ.
3 එකල සමිඳාණන් වහන්සේ යසොයාට මසෙේ
වදාළ සේක: "නුඹේ පුත්‍ර ෂයොර්-යාෂුබ් සමඟ
ආහාස් රජු හමු වන්න යන්න. ඉහළ පොකුණනේ
වතුර ගනෙනෙ කාණුවේ කළෙවර ඇති
අපුල්ලන්නන්ගේ පිටියේ පිහිටි මාවතේ දී ඔහු
නුඹට හමුවනු ඇත. 4 පරීක්ෂාකාරී ව, සන්සුන් ව,
නිර්භය ව, නොකැළඹී සිටින්න ඔහුට කියන්න.
රශේන් සහ සිරියන්වරුන්ගේත්, රමෙලියාගේ
පුත්‍රයාගේත් කෝපාග්නිය දුම් නඟින ගිනිපනෙලේ
දකෙක් වැනි ය. එහි භය වන්න කිසි දයෙක් නැත.
5 සිරියන්වරුන් ඉශ්රායලේ හා එහි රජු සමඟ ඔබට
විරුද්ධ ව කුමන්ත්‍රණය කර ඇත. 6 ඔව්හු ජුදාට
විරුද්ධ ව ආක්‍රමණය කොට, සනෙඟ බියගන්වා
ඔවුන්ගේ පක්ෂයට බඳවාගනෙ, ටාබයෙලේගේ
පුත්‍රයා රජකමට පත් කරන්න අදහස් කරති.
7 එහතේ, එය කිසි කලකෙ සිදු නොවන බව
ස්වාමීන් වන මම කියමි. 8 මන්ද, සිරියාව දමස්කයට
වඩා බලවත් නොවේ; දමස්කය රශේන් රජුට වඩා
බලවත් නොවේ. ඉශ්රායලේ සම්බන්ධයනේ කිව
යුත්තේ, හැටපස් වසරකින් ජාතියක් වශයනේ එයට
පවතින්නට නොහැකි වන ලසෙ සුණු විසුණු කරනු
ලබන බව ය. 9 ඉශ්රායලේ සමාරිය නම් නගරයට
වඩා බලවත් නොවේ; සමාරිය පකො රජුට වඩා
බලවත් නොවේ. නුඹේ විශ්වාසය ස්ථිර නොවේ
නම්, නුඹේ පැවැත්ම ස්ථිර වන්නේ නැත."

### එම්මානුවලේ නම් ලකුණ

10 සමිඳාණන් වහන්සේ ආහාස්ට තවත්
පණිවුඩයක් යවමින්, 11 "නුඹට ලකුණක් දනෙ ලසෙ
නුඹේ දවේ සමිඳාණන් වහන්සේගනේ ඉල්ලන්න;

ගැඹුරු පාතාලයෙන් හෝ ඉහළ අහසෙන් හෝ එය
පැමිණෙන ලෙස ඉල්ලන්නැ”යි වදාළ සේක.
12 එහෙත්, ආහාස් උත්තර දෙමින්, “මම
නොඉල්ලමි; සමිඳාණන් වහන්සේ පරීක්ෂා
නොකරමි”යි කී ය.
13 එයට යෙසායා මෙසේ පිළිතුරු දුන්නේ ය:
“එම්බා දාවිත්ගේ වංශය, දැන් සවන් දෙන්න; නුඹලා
මාගේ දෙවියන් වහන්සේගේ ඉවසීම වෙහෙසෙන්නේ,
නුඹලා මනුෂ්‍යයන්ගේ ඉවසීම වෙහෙසෙනවා මදිවාට
ද? 14 මතෙ 1:23සමිඳාණන් වහන්සේ ම නුඹලාට
ලකුණක් දෙන සේක. බලන්න, කන්‍යාවක්
පිළිසිඳගෙන පුත්‍රයකු බිහි කරන්නී ය;
එම්මානුවෙල් යන නම ඔහුට තබන්නී ය. 15 නපුර
එපාකර යහපත තෝරාගැනීමට තරම් ඔහුට තේරුම්
පැහැදුම් ඇති වූ කල ඔහු දීකිරිත් මී පැණිත්
වළඳන්නේ ය. 16 ඒ කාලය පැමිණෙන්නේ පෙර නුඹව
තැති ගන්වන ඒ රජවරුන් දෙදෙනාගේ දේශයෝ
පාළු වන්නෝ ය.
17 “ඉශ්‍රායෙලේ රාජ්‍යය ජුදාවෙන් වෙන් වූ කාලයේ
පටන් නුවූ විරූ අන්දමේ දුක් කරදර සමිඳාණන්
වහන්සේ නුඹ පිටත්, නුඹේ සෙනඟ පිටත්, මුළු රජ
පවුල පිටත් පමුණුවන සේක. උන් වහන්සේ
අසිරියාවේ රජු නුඹට විරුද්ධ ව එවන සේක.”

## අසිරියාව විසින් වටලනු ලැබීම

18 “ඒ කාලය පැමිණි විට සමිඳාණන් වහන්සේ
නයිල් ගඟ අසබඩ සිටින මිසර වාසීන්ට මැස්සන්
සේ පැමිණීමටත්, අසිරියන්වරුන්ට තමන්ගේ
දේශයෙන් මීමැස්සන් සේ පැමිණීමටත් සංඥාකර
හඬගසනවා ඇත. 19 ඔව්හු සියල්ලෝ ම අවුත්, පාළු
මිටියාවත්වල ද පර්වත විවරවල ද සියලු කටු
ගස්වල ද සෑම තණ බිම්වල ද රැඳෙන්නෝ ය.
20 “ඒ කාලය පැමිණි විට සමිඳාණන් වහන්සේ
විසින් යුප්‍රටීස් ගඟට එගොඩින් කරණවෑමියකු
එනම්, අසිරියාවේ රජු කුලියට ගෙන්වා ගෙන, ඔහු
ලවා නුඹේ හිසේ ද සිරුරේ ද කෙස් හා රැවුල්
බූගාවනු ලබන්නේ ය.
21 “ඒ කාලය පැමිණි විට ගොවියෙකු එළ
නැම්බියකුත්, බැටළුවන් දෙදෙනෙකුත් පමණක්
තබාගෙන 22 උන් දෙන කිරි බොහෝ නිසා දීකිරි
කන්නේ ය. දේශයේ ඉතිරි ව සිටින සියල්ලෝ ද
දීකිරි සහ මී පැණි කන්නෝ ය.
23 “ඒ කාලය පැමිණි විට රිදී මිළ දහසක් වටින
මිදි වැල් දහසක් ඇති සෑම මිදි වතුවල කටු ගස් ද
ගොකටු ද හටගැනෙනු ඇත. 24 ඊගස් හා දුනු ඇති
ව මිස එහි යන්නට කිසිවකුට ධෛර්‍යය ඇති
නොවේ. මන්ද, දේශය මුළුල්ලේ කටු ගස් ද
ගොකටු ද ඇති වන්නේ ය. 25 කලින් වගා කරන
ලද කඳු වුවත් කටු ගස් සහ ඉබාගාතේ යන
ගොකටුවලින් වැසී යන්නේ ය. ඒවාට බිය නිසා
කිසිවෙකු එහි නොයෙති. එය ඉබාගාතේ යන ගවයන්
හා බැටළුවන් ගොදුරු කන ස්ථානයක් වන්නේ ය.”

## සිරියාවේ විනාශය දැන්වීම

8 සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ
සේක; “නුඹ මහත් පුවරුවක් ගෙන එහි ලොකු
අකුරෙන් ‘කොල්ලය ශීඝ්‍රයෙන් සිදුවේ’ යන අරුත
ඇති ‘මහරේ-ෂාලාල්-හාෂ්-බශ්’ යන වචන ලියන්න.
2 විශ්වාසවන්ත සාක්ෂිකාරයන් වන උරියා නමැති
පූජකයාත් ජබෙරෙකියාගේ පුත්‍ර වූ සකෙරියාත්
සාක්ෂි පිණිස ගන්න.”
3 ටික දිනකට පසු මම මාගේ භාර්යාව සමඟ
සහවාසයේ යෙදුණෙමි. ඈ පිළිසිඳගෙන දරුවෙකු බිහි
කළා ය. සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ
සේක: “ඔහුට, ‘මහරේ-ෂාලාල්-හාෂ්-බශ්’ කියා නම්
තබන්න. 4 මන්ද, ‘අම්මේ, තාත්තේ’ කියා කියන්න
දරුවාට හැකි වන්න පෙර දමස්කයේ සකල
වස්තුවත්, සමාරියේ මුළු කොල්ලයත් අසිරියාවේ
රජු විසින් ගෙනයනු ලබන්නේ ය.”

## අසිරියා රජුගේ පැමිණීම

5 සමිඳාණන් වහන්සේ යළිත් මට කතා කොට
මෙසේ වදාළ සේක: 6 “මේ සෙනඟ හෙමින් ගලා
බැස යන ෂිලොවාහි දිය ඇල එපා කොට, රශීන් ද
පෙකා රජු ද ඉදිරියේ වෙව්ළන බැවින්, 7 ස්වාමීන්
වන මම අසිරියාවේ රජු ද ඔහුගේ මුළු සේනාව ද
ජුදා රටට පහර දෙන පිණිස ගෙනෙන්නෙමි. යුප්‍රටීස්
ගඟේ ඉවුරු තලා යන ජලගැලීම සේ ඔවුන් ඉදිරියට
එනු ඇත. 8 ඔව්හු ගලෙ දක්වා ඉහළට නැඟ සෑම
තැනම පැතිරී යන ජල ගැල්මක් සේ ජුදා පුරා පැතිරී
යන්නෝ ය.”
8 දෙවියන් වහන්සේ අප සමඟ ය. විහිදී ඇති
පියාපත්වලින් උන් වහන්සේ රට ආරක්ෂා කරන
සේක.
9 ජාතීනි, බියෙන් ඇලළී යන්න; පොළොවේ දුර
බැහැර ප්‍රදේශවල ජනයෙනි, සවන් දෙන්න; සටනට
සැරසෙන්න; එහෙත්, භයපත් වන්න. එසේ ය,
සැරසෙන්න. එහෙත්, භයපත් වන්න. 10 එක් ව
මන්ත්‍රණය කරන්න; එහෙත්, ඒවා නිෂ්ඵල වන්නේ
ය. ඇති තරම් කතා කරන්න. එහෙත්, ඒවා නිෂ්ඵල
වන්නේ ය. මන්ද, දෙවියන් වහන්සේ අප සමඟ ය.

## දිවැසිවරයාට අනතුරු ඇඟවීම

11 සෙනඟ යන මාර්ගයෙහි නොයෙන ලෙස
සමිඳාණන් වහන්සේ තමන් මහත් බලයෙන් මට
දැනුමැතිකම් දෙමින් මෙසේ වදාළ සේක: 12 1 පේදු
3:14-15“සෙනඟ කුමන්ත්‍රණය යි කියන සියල්ලට
නුඹ කුමන්ත්‍රණය යි නොකියන්න. ඔවුන් භය වන
දේට භය නොවන්න. 13 සියලු බලැති සමිඳාණන්
වහන්සේ වන මා ශුද්ධ තැනැත් වහන්සේ බව
මතක තබාගන්න. නුඹ භය විය යුත්තේ මට
පමණකි. 14 1 පේදු 2:8මම ශුද්ධස්ථානයකට ද
මිනිසුන්ගේ පැකිළීමට හේතු වන ගලකට ද සමාන
වෙමි; ජුදා හා ඉශ්‍රායෙලේ රාජ්‍යවල සෙනඟ ද
ජෙරුසලමේ වැසියන් ද අසු කරගන්න මලපතක් හා

සමාන වේ. 15 බොහෝ දෙනෙක් පැකිළී වැටෙති.
ඔව්හු වැටී පොඩී වී යති. ඔවුන් මලපතට අසු වනු
ඇත.”

## දිව්‍යවරයා යෙසායා ගෝලයන් ඇමතීම

16 මාගේ ගෝලයන් දෙවියන් වහන්සේ මට දුන්
පණිවුඩය ආරක්ෂා කොට සිතේ තැන්පත් කරගත
යුතු ය. 17 හෙබ්‍රෙව් 2:13සමිඳාණන් වහන්සේ සිය
සෙනඟ වෙතින් සැඟවී සිටින නමුත්, මම උන්
වහන්සේ අදහා මාගේ බලාපොරොත්තුව උන්
වහන්සේ කෙරෙහි තබමි.
18 හෙබ්‍රෙව් 2:13 සමිඳාණන් වහන්සේ මට දුන්
දරුවන් සමඟ මම මෙහි සිටිමි. සියොන් කන්දේ සිය
සිහසුන ඇති සියලු බලැති සමිඳාණන් වහන්සේ
ඉශ්‍රායෙල් ජනයා හට ජීවමාන පණිවුඩ ලෙස අප
එවා ඇත.
19 පල්හෑලි දොඩන, තොල් මතුරන
අනාවැකිකාරයන්ගෙන් ද දෛවඥයන්ගෙන් ද ශාස්ත්‍ර
අසන්න කියා සෙනඟ නුඹලාට කියනු ඇත. “ජීවතුන්
උදෙසා මළවුන්ගෙන් ද දෙවි දේවතාවන්ගෙන් ද
විචාරන්න යුතු ය”යි ඔවුන් කියනු ඇත.
20 එහෙත්, නුඹලා මෙසේ පිළිතුරු දිය යුතු ය:
“සමිඳාණන් වහන්සේ නුඹලාට උගන්වන දේට සවන්
දෙන්න, අනාවැකිකාරයන්ට සවන් නොදෙන්න. ඔවුන්
නුඹලාට කියන දෙයින් කිසි යහපතක් සිදු නොවේ.”

## කරදර සහිත කාලයක්

21 සෙනඟ අමාරුවට වැටී සාගින්න නිසා රටෙහි
ඔබමොබ ඉබාගාතේ යනු ඇත. ඔව්හු සාගින්නෙන්
හා කෝපයෙන් තමන්ගේ රජුට හා තමන්ගේ
දෙවියන්ට දෙස් කියති. ඔව්හු අහස දෙස බැලුවත්,
22 පොළොව දෙස බැලුවත් විපත හා අන්ධකාරය
මිස වෙන කිසිවක් නොදකිති. ඒ භයානක
අන්ධකාරයට ඔව්හු පන්නා දමනු ලබන්නෝ ය. මේ
කරදර සහිත කාලයෙන් බේරෙන්නට මඟක් ඔවුන්ට
කිසිසේත් ඇති නොවේ.

## අනාගත සාම රජයාණෝ

9 මතෙ 4:15 එක් කාලයක දී සාබුලොන් රට ද
නප්තලී රට ද අපකීර්තියට පත් වූ නමුත්,
අනාගතයේ දී, මධ්‍යධරණී මුහුදේ සිට නැගෙනහිර
දෙසට ජොර්දාන් ගඟෙන් එගොඩ පිහිටි පළාතට
එනම්, විදේශීන් වාසය කරන ගලීලය දේශයට
ගෞරව පැමිණෙන්නේ ය.
2 මතෙ 4:16; ලූක් 1:79 අන්ධකාරයෙහි ඇවිද්ද
සෙනඟ මහත් ආලෝකයක් දුටුවෝ ය, ගන’ඳුරු
දේශයෙහි විසූ අය කෙරෙහි එළියක් දැන්
බැබළෙන්නේ ය.
3 ඉමහත් ප්‍රීතියක් ඔබ ඔවුන්ට දුන් සේක;
q2 3 ඔවුන්ගේ ප්‍රීති ප්‍රමෝදය වර්ධනය කළ සේක.
q2 3 අස්වැන්න කපන කාලයෙහි සෙනඟ, කොල්ලය
බෙදා ගන්නා කල ප්‍රීති වන්නාක් මෙන් ඔබ
ඉදිරියෙහි ඔව්හු ප්‍රීති ප්‍රමෝද වෙති.
4 මන්ද යත්, ඔවුන්ට බරක් වූ වියගහ ද කර මත
තැබූ වියදණ්ඩ ද ඔබ කඩාදැමූ සේක.
q2 4 පෙර කලක ඔබ මිදියන් හමුදා පරාජය කළාක්
මෙන් ඔවුන්ට පීඩා කළ ජාතිය ඔබ විසින් පරාජය
කරනු ලැබී ය.
5 ආක්‍රමණය කරන හමුදාවේ පාවහන් ද ලෙයින්
තැවරුණු ඔවුන්ගේ ඇඳුම් සියල්ල ද ගින්නෙන්
දවාලනු ලැබේ.
6 අපට ළදරුවෙක් උපන්නේ ය;
q2 6 අපට පුත්‍රයෙක් දෙන ලද්දේ ය;
q2 6 එතුමාණෝ අපේ රජු වන සේක.
q2 6 ‘එතුමාණෝ, අසිරිමත් උපදේශකයාණෝ ය;
q2 6 ප්‍රතාපවත් දෙවි තුමාණෝ ය;
q2 6 සදාතන පියාණෝ ය;
q2 6 සාමයේ කුමාරයාණෝ ය’යි කියනු ලබන සේක.
7 ලූක් 1:32-33 එතුමන්ගේ රාජ බලය වැඩී
වර්ධනය වන්නේ ය;
q2 7 එම රාජ්‍යයේ සාමයට කෙළෙවරක් නොවන්නේ
ය;
q2 7 මෙතැන් සිට සදහට ම දාවිත් රජුගේ සිහසුනේ
වැඩ හිඳින එතුමන්ගේ රාජ්‍යය ස්ථිරව පිහිටුවන
ලෙස එතුමාණෝ යුක්තියෙන් ද ධර්මිෂ්ඨකමින් ද
රජකම් කරන සේක.
q2 7 සව් බලැති සමිඳුන්ගේ උද්‍යෝගයෙන් මෙය
අධිෂ්ඨාන කළ සේක.”

## ඉශ්‍රායෙල්වරුන්ට දඬුවම් කිරීම

8 සමිඳුන් ඉශ්‍රායෙල් රාජ්‍යයේ ජාකොබ් වංශය
කෙරෙහි විනිශ්චය ප්‍රකාශ කර ඇත.
9 සමිඳුන් මෙසේ කර ඇති බව ඉශ්‍රායෙල්හි සකල
ජනයා ද සමාරියේ සිටින සියලු දෙනා ද දැන
ගන්නෝ ය.
q2 9 ඔව්හු එඩිතරකමෙන් ද අහංකාරයෙන් ද මෙසේ
කියති:
10 “ගඩොල්වලින් තැනූ ගොඩනැඟිලි ගරාවැටී
ඇතත්, ඒ වෙනුවට කැපූ ගලින් අපි ගොඩනැඟිලි
තනන්නෙමු.
q2 10 අත්තික්කා ලී බාල්ක කපාදමා ඇතත්, ඒ
වෙනුවට අපි ඉස්තරම් කිහිරි ලී බාල්ක
යොදන්නෙමු.”
11 සමිඳුන් රෙශීන්ගේ සතුරන් ඔවුන්ට පහර දෙනු
පිණිස පොළඹවා ඇත.
12 නැගෙනහිරෙන් සිරියාව ද බටහිරෙන්
පලස්තීනය ද ඉශ්‍රායෙල් ගිලගන්න කට අයාගෙන
සිටියි.
q2 12 එසේ වුවත්, සමිඳුන්ගේ උදහස සන්සිඳී නැත.
q2 12 ඔවුන්ට දඬුවම් කරන්න එතුමන් හස්තය තවම
දිගු කර ඇත.
13 ඉශ්‍රායෙල් සෙනඟ ඔවුන්ට දඬුවම් කළ සමිඳුන්
වෙත හැරී නැත.
q2 13 ඔවුන් සව් බලැති සමිඳුන් සොයන්නේ නැත.

14 එබැවින් එක දවසක දී සමිඳාණෝ ඉශ්රායලේහි
ඔලීව අතු වැනි නායකයන්ට ද බට ගස් වැනි
සෙනඟට ද පහර දී එහි හිසත් වල්ගයත් ගසාදමන
සේක.
15 හිස යන්නෙනේ අදහස් කරන්නේ වයස්ගත
ගරුකටයුතු අය ය;
q2 15 වල්ගය යන්නෙනේ අදහස් කරන්නේ මුසාවාදී
දිවැසිවරු ය.
16 සෙනඟට මඟපෙන්වන්නන් ඔවුන් නොමඟ යවා
වියවුල් කර ඇත.
17 එබැවින් සමිඳාණෝ තරුණයන් කිසිවකුට
ගැළවී යන්න ඉඩ නොදෙන සේක;
q2 17 වැන්දඹුවන්ටත්, අනාථයන්ටත් අනුකම්පා
නොකරන සේක.
q2 17 මන්ද, ඔව්හු සියල්ලෝ අභක්තිකයෝ ද නපුර
කරන්නෝ ද වෙති.
q2 17 ඔවුන් කියන සියලු දේ බොරු ය.
q2 17 මේ සියල්ල සිදු වුවත් සමිඳුන්ගේ උදහස
සන්සිඳී නැත.
q2 17 ඔවුන්ට දඬුවම් කරන පිණිස එතුමන්ගේ
හස්තය තවමත් දිගු කර ඇත.

### සමාජයේ අසාධාරණකම

18 සෙනඟගේ දුෂ්ටකම කටු පඳුරු හා ගොකටු
දවාලන ගින්නක් වැනි ය;
q2 18 දුම් කඳ ඉහළට නංවන ලැව් ගින්නක් වැනි ය.
19 සව් බලැති සමිඳුන්ගේ උදහසින් දේශය දැවී
යන්නේ ය;
q2 19 සෙනඟ ද ගින්දරට දර මෙන් වන්නෝ ය.
q2 19 කිසිවකු තමා හැර තම සහෝදරයා ගැන
සලකන්නේ නැත.
20 දේශයේ සෑම තැනම සෙනඟට සොයාගත
හැකි කෑම සියල්ලක්ම ඔවුන් කන නමුත්, ඒවා
පැහැරගෙන කන නමුත්, ඔවුන්ගේ කුසගින්න
නොනිවෙන්නේ ය.
q2 20 ඔවුහු තම දරුවන්ගේ මාංසය වුව ද කන්නෝ
ය.
21 මනස්සේ රටේ සෙනඟ ද එප්රායිම් රටේ
සෙනඟ ද එකිනෙකට විරුද්ධ ව සටන් කරති.
q2 21 දෙගොල්ලෝ ම එකතු වී ජුදාවට පහර දෙති.
q2 21 මේ සියල්ල සිදු වුවත්, සමිඳුන්ගේ උදහස
සන්සිඳී නැත.
q2 21 දඬුවම් කරන පිණිස එතුමන්ගේ හස්තය තව
ම දිගු කර ඇත.

10 මාගේ සෙනඟ පීඩනයට පමුණුවන
නියමයන් නිකුත් කරන පිණිස අයුතු නීති
පනවන නුඹලාට වන විපතක මහත!
2 එසේ කිරීමෙනේ නුඹලා දුප්පතුන්ට ඔවුන්ගේ
අයිතිවාසිකම් ද යුක්තිය ද ලබාගැනීමට ඉඩ
නොදෙන්නෙහු ය.
q2 2 වැන්දඹුවන්ගේත්, අනාථයන්ගේත් දේපළ
පැහැරගන්නහු ය.
3 දෙවිඳුන් නුඹලාට දඬුවම් කරන විට නුඹලා
කුමක් කරන්නහු ද?
q2 3 දුර බැහැර රටකින් නුඹලා පිට විනාශය
පැමුණුණ විට නුඹලා කුමක් කරන්නහු ද?
q2 3 උපකාර ලබාගන්න පිණිස කා වෙත යන්නහු ද?
q2 3 නුඹලාගේ වස්තුව කොතැන සඟවන්නහු ද?
4 නුඹලා යුද්ධයේ දී මැරුම් කන්නහු ය.
q2 4 නැත්නම්, සිරකරුවන් මෙන් ගෙනයනු ලබන්නහු
ය.
q2 4 මේ සියල්ල ම සිදු වුවත් සමිඳුන්ගේ උදහස
සංසිඳී නැත.
q2 4 දඬුවම් කරන පිණිස එතුමන්ගේ හස්තය
තවමත් දිගු කර ඇත.

### අසිරියාව ලවා ඉශ්රායලයට දඬුවම්

5 යසො 14:24-27; නාහුම් 1:1; 3:19; ශෙප 2:13-15
මාගේ උදහසට ලක් වූ ජාතියට දඬුවම් කරන
පිණිස මම අසිරියාව මුගුරක් හවෙත් සැරයටියක්
සේ පාවිච්චි කරමි.
6 මාගේ උදහස ඇවිස්සූ ජාතියට පහර දෙන
පිණිස ඒ ජාතිය කොල්ලකන්නත්, එහි සම්පත්
උදුරාගන්නත්, වීථිවල මඩ මෙන් පාගන්නත් මම
අසිරියාව එවමි.
7 එහෙත්, අසිරියාවේ රජුගේ සිතේ වෙන ම
සාහසික අදහසක් ඇත.
q2 7 බොහෝ ජාතීන් විනාශ කිරීමට ඔහු අධිෂ්ඨාන
කර ඇත.
8 ඔහු පාරට්ටු කරගනිමින් මෙසේ කියයි:
q2 8 "මාගේ හැම සෙන්පතියෙකු ම රජ කෙනෙකි.
9 කල්නෝ හා කර්කමේෂ් නගර, හමාත් හා අර්පත්
නගර මම ජය ගතිමි.
q2 9 සමාරිය හා දමස්කය මම ජය ගතිමි.
10 ජෙරුසලමේ හා සමාරියේ පිළිමවලට වඩා
පිළිමවලින් ගහණ, පිළිම නමස්කාරයේ යෙදෙන
රාජ්යයන්ට පහර දෙන්න මම අත දිගු කළෙමි.
11 සමාරිය හා එහි ඇති පිළිම මම විනාශ
කළෙමි.
q2 11 එසේ ම ජෙරුසලම ද එහි ඇති පිළිම ද මම
විනාශ කරමි."

### අසිරියාව වෙත මතු එළඹෙන විනිශ්චය

12 එහෙත්, සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන
සේක: "සියොන් කන්දෙහි හා ජෙරුසලමෙහි මා
කරන දේ නිම කළ පසු අසිරියාවේ රජුගේ
පාරට්ටුවත්, අහංකාරයත් නිසා මම ඔහුට දඬුවම්
කරමි."
13 ඔහු මෙසේ කියයි:
q2 13 "මා මේ සියල්ල කළේ, මාගේ ම බලයෙනුත්,
ප්රඥාවෙනුත්, දක්ෂකමෙනුත් ය.
q2 13 මම ජාතීන් වෙන් කරන සීමා මකා හැරියෙමි.
q2 13 ඔවුන්ගේ සම්පත් ද පැහැරගෙන බලවතෙකු
මෙන් මම ඒවායේ වැසියන් පාගාදැමීමි.

14 ජනයන්ගේ වස්තුව, පක්ෂි කැදැල්ලක් මෙන්
මාගේ අතට අසු විය.
q2 14 අත්හැර දැමූ බිජු එකතු කරන්නාක් මෙන්
ලොවේ ජාතීන් එකතු කරගත්තෙමි.
q2 14 මා බිය ගන්වන පිණිස තටු ගැසීමක් වත්,
හොට ඇරීමක් වත්, කෑගැසීමක් වත් නො වී ය.”
15 එහෙත්, සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන
සේක:
q2 15 “පොරොව පාවිච්චි කරන්නාට වඩා පොරොව
උතුම් ය යි එයට කිය හැකි ද?
q2 15 කියත පාවිච්චි කරන්නාට වඩා කියත උතුම් ය
යි එයට කිය හැකි ද?
q2 15 මුගුරකට හවෙත් සැරයටියකට මිනිසකු
එසවිය නොහැකි ය.
q2 15 මුගුර හවෙත් සැරයටිය ඔසවන්නේ මිනිසා ය.
16 සව් බලැති සමිඳුන් බලසම්පන්න සෙබළුන්ට
දඬුවම් කරන පිණිස රෝග එවන්න අදහස් කර
ඇත.
q2 16 ඔවුන්ගේ සිරුර තුළ නොනිවී ඇවිලෙන
ගින්නක් හටගන්නේ ය.
17 ඉශ්‍රායෙල්ගේ ආලෝකය වන දෙවිඳාණෝ
ගින්නක් වන සේක.
q2 17 ඉශ්‍රායෙල්ගේ ශුද්ධ දෙවිඳාණෝ ගිනි දැල්ලක්
මෙන් වී කටු ගස් ද ගොකටු ද එක දවසක දී ම
විනාශ කර දමන සේක.
18 මාරක රෝගයක් මිනිසකු විනාශ කරදමන්නා
සේ වන ලැහැබ ද පල බර වූ වතු ද සහමුලින් ම
විනාශ කරදමනු ලබන්නේ ය.
19 ඉතිරි වන්නේ, ළමයකුට වුව ද ගණන් කළ
හැකි ගස් ස්වල්පයක් පමණකි.”

### ස්වල්ප දෙනෙකු ඉතිරි වීම

20 ඉශ්‍රායෙල්හි ගැළවී ඉතිරි වූ කුඩා පිරිස තමන්
විනාශ කරන්න උත්සාහ කළ ජාතිය කෙරෙහි තවත්
විශ්වාසය නොතබන කාලයක් පැමිණෙන්නේ ය.
ඔව්හු ඉශ්‍රායෙල්හි ශුද්ධ තැනැන් වහන්සේ වන
සමිඳාණන් වහන්සේ කෙරෙහි තමන්ගේ විශ්වාසය
සැබෑ ලෙස තබන්නෝ ය. 21 ඉශ්‍රායෙල්හි ඉතිරි
කුඩා පිරිස ඔවුන්ගේ පරාක්‍රමවත් දෙවියන්
වහන්සේ වෙත හැරී එනු ඇත. 22 රෝම 9:27දැනට
ඉශ්‍රායෙල්හි සෙනඟ මුහුදේ වැලි මෙන් වන නමුත්,
ආපසු එන්නේ ඉතිරි කුඩා පිරිසක් පමණකි.
සාධාරණ විනිශ්චය ලෙස සෙනඟට විනාශය නියම වී
ඇත. 23 සැබැවින් ම සියලු බලැති මහෝත්තම දෙවි
ස්වාමීන් වහන්සේ වදාළ පරිදි දේශය මුළුල්ලේ උන්
වහන්සේ විනාශයක් ඇති කරන සේක.

### සමිඳාණන් වහන්සේ අසිරියාවට කරන දඬුවම

24 සියොන්හි ජීවත් වන තමන් සෙනඟට සියලු
බලැති මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක: “මිසර වැසියන් නුඹලාට පීඩා කළාක්
මෙන් අසිරියන්වරුන් පොලු මුගුරුවලින් තැළුවත්
ඔවුන්ට භය නොවන්න. 25 තව ටික කලකින් මම
නුඹලාට දඬුවම් කර නිම කරමි. ඉන්පසු මාගේ
උදහස අසිරියන්වරුන්ගේ විනාශයට එල්ල
කරන්නෙමි. 26 සියලු බලැති ස්වාමීන් වන මම
ඔරෙබ් පර්වතය ළඟ දී මිදියන්වරුන්ට පහර දුන්නාක්
මෙන් කසයකින් අසිරියන්වරුන්ට තළන්නෙමි. මිසර
වැසියන්ට මා පහර දුන්නාක් මෙන් මම අසිරියාවට ද
පහර දෙමි. 27 ඒ කාලය පැමිණි විට අසිරියාවේ
බලයෙන් මම නුඹලා නිදහස් කරන්නෙමි. නුඹලාගේ
කාය බලය නිසා අසිරියාවේ වියගහ ඉන්පසු
නුඹලාගේ කරට බරක් නොවන්නේ ය.”

### සතුරා පහර දෙයි

28 “සතුරෝ අයාත් නගරයට පැමිණ මිග්‍රෝන්
මැදින් ගියෝ ය.
q2 28 ඔවුහු තමන්ගේ බඩුමුට්ටු මික්මාෂ්හි තැබුවෝ
ය.
29 ඔව්හු කඳු මාවත පසුකර, රෑ ගෙබෝහි නවාතැන්
ගෙන සිටිති.
q2 29 රාමා නගරයේ සෙනඟ කම්පා වී ඇත.
q2 29 සාවුල් රජුගේ නගරය වන ගිබියාවේ සෙනඟ
පලා ගොස් ඇත.
30 ගල්ලිම් වැසියෙනි, හඬ නඟා මොරගසන්න.
q2 30 ලයිෂා වැසියෙනි, සවන් දෙන්න.
q2 30 අනාතොත් වැසියෙනි, පිළිතුරු දෙන්න.
31 මද්මේනාහි සෙනඟ ද ගේබිම් වැසියෝ ද පණ
බේරාගන්න පිණිස පලා යන්නෝ ය.
32 සතුරෝ අද නොබ් නගරයට පැමිණ සිටිති.
q2 32 එහි සිටිමින් ඔව්හු සියොන් කන්දටත්,
ජෙරුසලම් නුවරටත් විරුද්ධ ව අත් අමෝරාගෙන
සිටිති.
33 ගස්වලින් කපාදමන අතු සේ සව් බලැති
සමිඳාණෝ ඔවුන් බිඳදමන සේක.
q2 33 ඔවුන් අතරෙන් ඉතා අසහනකාරී අය සිඳදමනු
ලබන්නෝ ය.
q2 33 උසස් අය පහත් කරනු ලබන්නෝ ය.
34 වනය මැද ඇති ගස් පොරොවෙකින් කපාදමනු
ලබන සේ සමිඳාණෝ ඔවුන් සිඳදමන සේක.
q2 34 ලෙබනොන්හි අනගි ගස් ඇද වැටෙන්නා සේ
ඔව්හු ඇද වැටෙති.”

### සාම රාජ්‍යය

**11** එළිද 5:5; 22:16 “දාවිත්ගේ රජ පෙළෙපත
නමැති වෘක්ෂයෙන් රාජාංකුරයක් හටගන්නේ
ය.
q2
**11** එහි මුල්වලින් අලුත් පැළයක් නැඟී එන්නේ
ය.
2 සමිඳුන්ගේ ආත්මානුභාවය වන ප්‍රඥාව හා
නුවණ ද අනුශාසනා බුද්ධිය හා බලය ද දැනගැනීම
හා දේව ගරුබිය ද එතුමාණන් කෙරෙහි පිහිටන්නේ
ය.
3 එතුමන්ට ගරුබිය පෑම එතුමාණන්ගේ ප්‍රීතිය
වන්නේ ය.

q2[3] එතුමාණන් තමන් ඇසට පෙනෙන හැටියට
විනිශ්චය කරන්නේ වත්, කනට ඇසෙන හැටියට
විනිශ්චය කරන්නේ වත් නැත.
4 2 තෙස 2:8 එතුමාණෝ යුක්ති සහගත ලෙස
දුප්පතුන් විනිශ්චය කොට, යටහත් පහත් අයට
තමන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන සේක.
q2[4] එතුමාණෝ තමන්ගේ ආඥා යෂ්ටියෙන්
දේශයට පහර දෙන සේක.
q2[4] වචනයකින් දුෂ්ටයෝ මිය යන්නෝ ය.
5 එෆී 6:14 යුක්තිය එතුමාණන්ගේ ඉඟපටිය ද
විශ්වාසවන්තකම බඳපටිය ද වනු ඇත.
6 යෙසා 65:25 වෘකයා බැටළුවා සමඟ වාසය
කරන්නේ ය;
q2[6] දිවියා එළු පැටවා සමඟ ලගින්නේ ය.
q2[6] සිංහ පැටියා ද වහු පැටියා ද එකට කෑම
කන්නෝ ය;
q2[6] කුඩා දරුවෙක් උන් ගෙන යන්නේ ය.
7 එළදෙන හා වළසා එක්ව තණ කන්නෝ ය;
q2[7] උන්ගේ පැටව් එකට ලගින්නෝ ය.
q2[7] සිංහයා හරකා මෙන් පිදුරු කන්නේ ය.
8 කිරි දරුවා නාගයාගේ තුඹස පිට සෙල්ලම්
කරන්නේ ය.
q2[8] සිඟිති දරුවා පොළඟාගේ ගුල පිට අත
තබන්නේ ය.
9 හබ 2:14 සමිඳාණන් වහන්සේගේ ශුද්ධ කන්දේ
සීමාව තුළ කිසි නපුරක් වත්, අනතුරක් වත්
නොවන්නේ ය.
q2[9] මුහුද, ජලයෙන් පිරී තිබෙන්නාක් මෙන්
සමිඳාණන් වහන්සේ පිළිබඳ දැනගැන්මෙන්
පොළොව පිරී යන්නේ ය."

## වහල්කමට ගෙන ගිය අය ආපසු පැමිණීම

10 රෝම 15:12 දාවිත් රජුගේ වංශයෙන් උද්ගත
වන රජතුමා ජාතීන් හට සංඥාවක් වන කාලය
පැමිණෙන්නේ ය. ජාතීහු එතුමන් සොයා යන්නෝ ය;
එතුමන්ගේ වාසභවනය මහිමයෙන් පිරී යන්නේ ය.
11 ඒ කාලය පැමිණි විට සමිඳාණන් වහන්සේ
අසිරියාවේ ද මිසරයේ ද පත්රෝසේ ද
එතියෝපියාවේ ද ඒලාමේ ද ෂීනාරේ ද හමාතේ ද
මුහුදේ දිවයින්වල ද ඉතිරි වූ සිය පිරිස ආපසු
ගෙනෙන්නට සිය බලය නැවත මෙහෙයවන සේක.
12 සමිඳාණෝ, විසිරී ගොස් සිටින ඉශ්රායලේ හා
ජුදා සෙනඟ පොළොවේ සතර කොණින් ආපසු එක්
රැස් කරන බවට ජාතීන් ඉදිරියෙහි සංඥාවක්
ඔසවන සේක.
13 ඉශ්රායලේ ජුදාට ඊර්ෂ්යා කරන්නේ වත්, ජුදා
ඉශ්රායලේට සතුරුකම් කරන්නේ වත් නැත.
q2[13] ඉශ්රායලේහි ඊර්ෂ්යාව පහ ව යන්නේ ය.
q2[13] ජුදාට පීඩා කරන්නෝ විනාශ කරනු ලබන්නෝ
ය.
14 ඔව්හු එකතු වී බටහිර වසන පිලිස්තිවරුන්ට
පහර දෙන්නෝ ය;
q2[14] නැගෙනහිර වසන සෙනඟ කොල්ල කන්නෝ
ය.
q2[14] ඔව්හු ඒදොම් සහ මෝවබ් ජාතීන් ජයගන්නෝ
ය.
14 අම්මොන් වැසියොත් ඔවුන්ට කීකරු වන්නෝ ය.
15 එළිද 16:12 සමිඳාණෝ නයිල් ගඟේ වරාය
සහමුලින් ම වියළී යන්න සලස්වන සේක.
q2[15] එතුමාණෝ යුප්රටීස් ගඟ හරහා සිය අත
ඔසවා, වියළි සුළඟක් එවා, එය කුඩා දිය පාරවල්
හතකට බෙදෙන සේක.
q2[15] එවිට සෙනඟ ගොඩබිම යන්නාක් මෙන් එයින්
එගොඩ වන්නෝ ය.
16 ඉශ්රායලේ සෙනඟට මිසරයෙන් පිට වන්න මඟ
සැලසුණාක් මෙන් අසිරියාවේ ඉතිරි පිරිසටත් ඒ
රටෙන් පිට වන්න මහා මාවත් ඇති වන්නේ ය.

## සමිඳාණන් වහන්සේට පැසසුම් ගීය

12 ඒ දවසේ දී සෙනඟ මෙසේ පැසසුම් ගී
ගයන්නෝ ය:
q2
12 "සමිඳුනි, ඔබට මම ප්රශංසා කරමි.
q2
12 මා කෙරෙහි ඔබ උදහස් ව සිටි නමුත්, දැන් ඒ
උදහස නිවී ගොස් ඇත.
q2
12 ඔබ මට සැනසීම දී ඇත.
2 නික්ම 15:2; ගීතා 118:14 බලන්න,
දෙවිඳාණෝ මාගේ ගැළවීම ය.
q2[2] මම එතුමාණන් කෙරෙහි විශ්වාසය තබමි;
q2[2] එතුමන් කෙරෙහි මට බියක් නැත.
q2[2] මන්ද, සමිඳාණෝ මාගේ ශක්තියත්, ගීතිකාවත්
ය.
q2[2] එතුමාණෝ මාගේ ගැළවීම ය."
3 ඔබ ගැළවීමේ ළිංවලින් ප්රීතියෙන් දිය
ඇදගන්නහු ය.
4 ඒ දවසේ දී සෙනඟ මෙසේ පැසසුම් ගී යන්නෝ
ය:
q2[4] "සමිඳුන්ට තුති පුදන්න;
q2[4] එතුමන්ගේ නම පවසා අයැදින්න.
q2[4] එතුමන්ගේ ක්රියා ජාතීන් අතර පවසන්න.
q2[4] එතුමන්ගේ නාමයේ ශ්රේෂ්ඨත්වය ප්රකාශ
කරන්න.
5 "සමිඳුන් කළ අරුමපුදුම දේ නිසා පසස් ගී
ගයන්න;
q2[5] මුළු ලොවට ම ඒ ගැන දන්වන්න.
6 සියොන් වැසි සියල්ලෙනි, මොරගසා ගී ගයන්න;
q2[6] ඉශ්රායලේ ශුද්ධ දෙවිඳාණන් උතුම් වන බැවින්
ද සිය සෙනඟ අතරේ වැඩ සිටින බැවින් ද සතුටින්
හඬ නඟා ගී ගයන්න."

### බබිලෝනියේ විනාශය

13 යසො 47:1-15; ජරෙ 50:1—51:64 මේ වනාහි
ආමොස්ගේ පුත් යසොයාට බබිලෝනිය ගැන
එළිදරව් වූ දෙවියන් වහන්සේගේ පණිවුඩය ය:
2 "පාළු කඳු මුදුනක කොඩියක් ඔසවන්න;
q2[2] රණ හොරණෑව පිඹින්න;
q2[2] ලකුණක් දෙන්න;
q2[2] ප්‍රභූවරුන්ගේ දොරටුවට පැමිණෙනෙ ලෙස
භටයින්ට අණ දෙන්න.
3 සමිඳුන්ගේ උදහසට ලක් ව සිටින අයට විරුද්ධ ව
සටන් කරන පිණිස එතුමන්ට කැප වූ භටයින්ට ද
බලධාරීන්ට ද පැමිණෙනෙ ලෙස අණ කර ඇත.
4 "සවන් දෙන්න;
q2[4] කඳු මුදුනෙහි මහා ඝෝෂාවක් ඇසේ.
q2[4] එය වනාහි ජාතීන්ගෙනුත්, රට රාජ්‍යවලිනුත්
එක් රැස් වන මහා ජනකායකගේ ඝෝෂාව ය.
q2[4] මම යුද්ධ සඳහා මාගේ හමුදා සූදානම්
කරන්නෙමි.
5 පොළොවේ සීමාන්තවල ඇති දුර බැහැර
රටවලින් ඔව්හු පැමිණෙති.
q2[5] මුළු දේශය වනසන පිණිස තමන් වහන්සේගේ
උදහසේ ආයුධ වන ඔවුන් සමඟ මම
පැමිණෙන්නෙමි.
6 ජෝවෙ 1:15 "මොරගසා වැලපෙන්න.
q2[6] සමිඳුන්ගේ දවස එනම්, සර්වපරාක්‍රමයාණන්
විනාශය පමුණුවන දවස ආසන්න ය.
7 සෑම අතක්ම බලහීන වනු ඇත.
q2[7] සෑම සිතක්ම අධෛර්ය වනු ඇත.
8 ඔව්හු භීතියට පත් වී ස්ත්‍රියක විඳින ප්‍රසව
වේදනාව මෙන් මහා වේදනාවෙන් පෙළෙන්නෝ ය.
q2[8] ඔව්හු එකිනෙකා දෙස භීතියෙන් බලන්නෝ ය.
ඔවුන්ගේ මුහුණු ගිනිදැළු මෙන් වන්නේ ය.
9 දේශය පාළු කරදමා, එහි වසන පව්කාරයන්
එයින් මුලිනුපුටා දමන පිණිස සමිඳුන්ගේ ඒ දවස
රෞද්‍ර ව, කෝපයෙන් හා බලවත් උදහසින් එන්නේ
ය.
10 එසකි 32:7; මතෙ 24:29; මාක් 13:24-25; ලූක්
21:25; එළිද 6:12-13; 8:12 අහසේ තාරකා ද ග්‍රහ
මණ්ඩලය ද නො බැබළෙන්නේ ය.
q2[10] ඉර උදාවන විට ම අඳුරු වන්නේ ය.
q2[10] සඳ ද එළිය නොදෙන්නේ ය.
11 මම ලෝකයාට ඔවුන්ගේ නපුරුකම් නිසාත්,
දුෂ්ටයන්ට ඔවුන්ගේ අයුතුකම් නිසාත් දඬුවම් කරමි.
q2[11] උඩඟු අයගේ අහංකාරය නවත්වා,
බලහත්කාරකම් කරන්නන්ගේ ආඩම්බරය
පහකරන්නෙමි.
12 මිනිසුන් අගනා රනටත් වඩා දුර්ලභ වන්නෝ ය.
q2[12] ඔව්හු ඕෆීර් රනට වඩා දුර්ලභ වන්නෝ ය.
13 සව් බලැති සමිඳුන් වන මම, මාගේ උදහස
දක්වන දවසේ දී අහස චංචල කරන්නෙමි;
q2[13] පොළොව ද නියම තැනින් විසි වී යන්නේ ය.
14 එවිට, ලුහුබඳනා ලද මුවන් මෙන් ද එඬේරෙකු
නැති ව විසිරී යන බැටළුවන් මෙන් ද බබිලෝනියේ
සිටින විදේශිකයෝ සිය මව් බිම කරා තම තමාගේ
සෙනඟ වෙත පලා යන්නෝ ය.
15 හමු වන හැම කෙනෙකේ ම ඇනුම් කන්නෝ ය;
q2[15] අසු වන හැම කෙනෙකේ ම කඩුවෙන් මැරුම්
කන්නෝ ය.
16 ඔවුන් බලා සිටිය දී ඔවුන්ගේ ළදරුවෝ බිම
ගසා මරනු ලබන්නෝ ය.
q2[16] ඔවුන්ගේ ගෙවල් කොල්ලකනු ලබන්නේ ය.
q2[16] ඔවුන්ගේ භාර්යාවෝ දූෂණය කරනු ලබන්නෝ
ය.
17 බබිලෝනියට පහර දෙනෙ පිණිස මම මේදවරුන්
පොළඹවන්නෙමි.
q2[17] ඔවුන් රිදී අගය කරන්නේ වත්, රනට ප්‍රිය
වන්නේ වත් නැත.
18 ඔව්හු දුනුවලින් යෞවනයන් කැබලි කරන්නෝ
ය;
q2[18] දරුවන්ට අනුකම්පා නොකරන්නෝ ය;
q2[18] ළමුන්ට කරුණාව නොදක්වන්නෝ ය.
19 උත් 19:24 මෙසේ සියලු රාජ්‍යවලට වඩා
අලංකාර, ජනයාගේ ආඩම්බරයට තුඩු දෙනෙ
බබිලෝනිය මම සොදොම් හා ගොමෝරා විනාශ
කළාක් මෙන් විනාශ කරන්නෙමි.
20 මින් මතු කවදාවත් එහි කිසිවකේ
නොවෙසන්නෝ ය.
q2[20] කිසිම අරාබි ජාතිකයෙකු තමාගේ කූඩාරම
එහි ගසන්නේ වත්, කිසිම එඬේරෙකු තමාගේ
බැටළුවන් එහි ලග්ගවන්නේ වත් නැත.
21 යසො 34:14; ශපෙ 2:14; එළිද 18:2 වන මෘගයන්
එහි ලගිනු ඇත;
q2[21] බකමූණන් උන්ගේ කැදලි එහි සාදනු ඇත;
q2[21] පැස්බරුන් එහි වසනු ඇත;
q2[21] වල් එළුවන් ද එහි නටනු ඇත.
22 එහි ඇති කොත්වලත්, මාලිගාවලත් නරියන් හා
සිවලුන් කෑගසනු ඇත.
q2[22] බබිලෝනියේ විනාශයේ දවස දැන් පැමිණ
ඇත. එය වැඩි කල් පවතින්නේ නැත."

### ඉශ්‍රායලේ ජාතියේ පුනරුත්ථාපනය

14 සමිඳාණන් වහන්සේ ඉශ්‍රායලේ සෙනඟට
නැවත වරක් අනුකම්පා කොට, ඔවුන්
තමන්ගේ ම සෙනඟ වශයෙන් තෝරාගෙන
ඔවුන්ගේ ම දේශයෙහි ඔවුන් පිහිටුවන සේක.
විදේශිකයෝ එහි පැමිණ ඔවුන් සමඟ වාසය
කරන්නෝ ය. 2 සමිඳාණන් වහන්සේ ඔවුන්ට දූන්
දේශයට ආපසු පැමිණෙනෙ පිණිස බොහෝ ජාතීන්
ඉශ්‍රායලේවරුන්ට උදව් දෙනු ඇත. ඒ ජාතීන් වහලුන්
වශයෙන් ඉශ්‍රායලේවරුන්ට සේවය කරනු ඇත.
වරක් ඉශ්‍රායලේවරුන් යටත් කරගෙන සිටි ජාතීහු
දැන් ඉශ්‍රායලේවරුන් විසින් යටත් කරනු ලබති. දැන්
ඉශ්‍රායලේවරු වරක් තමන්ට පීඩා කළ ජාතීන්
පාලනය කරති.

### බබිලෝනියේ රජුගේ වැටීම

3 සමිඳාණන් වහන්සේ ඉශ්රායලේ සෙනඟට
ඔවුන්ගේ දුක් වේදනාවලින් ද ඔවුන් පිට බලයෙන්
පමුණුවන ලද බර වැඩවලින් ද නිදහස දෙන සේක.
4 උන් වහන්සේ එසේ කළ විට ඉශ්රායලේ සෙනඟ
බබිලෝනියේ රජුට මෙසේ සරදම් කරනු ඇත:
q24 “කුරිරු නිරිඳු වැටී ඇත;
q24 අනුන්ට පීඩා කිරීමේ ශක්තිය ඔහුට තවත්
නැත.
5 සමිඳුන් දුෂ්ටයන්ගේ යෂ්ටියත්, නපුරු
පාලකයන්ගේ බලයත් කළෙවර කර ඇත.
6 මන්ද, ඔව්හු යටත් කරගත් ජාතීන්ට ඉමහත්
කෝපයෙන් නොනැවතී තළා පෙළා පීඩා කළෝ ය.
7 මුළු පොළොව නිස්කලංක ව, නිශ්චල ව ඇත.
q27 මනුෂ්යයෝ ප්රීතියෙන් ගී ගයති.
8 ලෙබනොන්හි දේවදාර හා කිහිරි ගස් රජුගේ
වැටීම ගැන ප්රීති ප්රමෝද වෙයි.
q28 මන්ද, රජුගේ ඇවෑමෙන් පසු ඒවා කපා දැමීමට
කිසිවෙක් නැත.
9 බබිලෝනියේ රජු පිළිගැනීමට පාතාල ලෝකය
කට අයා සිටියි.
q29 පොළොවේ සිටි බලවතුන්ගේ අවතාර ඔහු හමු
වීමට අවදි වෙති.
q29 රජවරුන්ගේ අවතාර සිහසුන්වලින් නැඟිට්ටි.
10 ඔව්හු ඔහුට කතා කොට, ‘දැන් ඔබත් අප මෙන්
බලහීන ය;
q210 අප හා සමාන ය’යි කියති.
11 වීණාවල වාදනයෙන් එක් කලක් ඔබ ගරු කරනු
ලැබුවෙහි ය.
q211 එහෙත් දැන්, ඔබ සිටින්නේ පාතාල ලෝකයේ
ය.
q211 ඔබ වැතිර සිටින යහන ඉහඳ පණුවන්ගෙන්
පිරී ඇත;
q211 ඔබේ පොරෝණය ද පණුවන්ගෙන් ගහණ ය.
12 එළිද 8:10; 9:1 “දීප්තිමත් පහන් තාරකාවෙනි,
අරුණෝදයේ පුත්රයාණෙනි, ඔබ ස්වර්ගයෙන් වැටී
සිටින හැටි!
q212 පෙරෙ ඔබ ජාති ජාතීන් පරාජය කළෙහි ය.
q212 දැන් ඔබ බිමට හෙළා වැටී සිටින හැටි!
13 මතෙ 11:23; ලූක් 10:15 ඔබ මෙසේ සිතා
ගත්තෙහි ය:
q213 ‘මම ස්වර්ගයට නැඟී, මාගේ සිංහාසනය
අහසේ තාරකාවලට ඉහළින් පිහිටුවා උතුරේ ඇති,
දෙවිවරුන් රැස් වන කන්ද මුදුනේ රජකෙනු මෙන්
අසුන් ගන්නෙමි.
14 වලාකුළු පසු කොට ඉහළට නැඟී සර්ව
පරාක්රමයාණන්ට සමාන වන්නෙමි.
15 අනේ! එහෙත්, ඔබ පාතාල ලෝකයේ පතුලට
ම වැටී සිටින හැටි!
16 එහි සිටින අය ඔබ දෙස රවා බලා, ‘පොළොව
කම්පා කොට රාජ්යයන් බියෙන් ඇලළී යන්න
සැලැස්සූ බලවතා ඔබ ද?
17 නගර නැති නාස්ති කොට, ලෝකය පාළුකරයක්
බවට පත් කළ තැනැත්තා මොහු ද?
q217 සිරකරුවන්ට කිසි කලෙක නිදහස නුදුන්
ඔවුන්ට ආපසු ගෙදර යන්න ඉඩ නුදුන් තැනැත්තා
මොහු දැ’යි අසති.
18 ලෝකයේ සියලු රජවරුන්ගේ මළසිරුරු අනර්ඝ
සොහොන්වල තබා ඇත;
19 එහෙත්, දුගඳ හමන ඔබේ මළසිරුර පිටතට
ඇදදමා ඇත.
q219 එය යුද්ධයේ දී මළ භේවායන්ගේ
මළකඳන්වලට යට වී ඇත.
q219 ඒවා සමඟ ඔබේ මළකඳත් ගල් වළකට
විසිකරදමනු ලැබ පාගාදමා ඇත.
20 ඔබ ඔබේ දේශය නාස්ති කොට, ඔබේ සෙනඟ
මරාදැමූ බැවින්, අන් රජවරුන් භූමදාන කරනු
ලබන්නාක් මෙන් ඔබ භූමදාන කරනු නොලබන්නෙහි
ය.
q220 ඔබේ දුෂ්ට පවුලේ කිසිවකුත් සිහියට පවා
නොගැනෙති!
21 ඝාතනය ආරම්භ වේ වා!
q221 මේ රජ්ජුරුවන්ගේ දරුවෝ සිය
මුතුන්මිත්තන්ගේ පව් නිසා මරනු ලබන්නෝ ය.
q221 ඔවුන්ගෙන් කිසිවකුත් ලෝකය පාලනය
කරන්නේ වත්,
q221 ලොව පුරා නගර පිහිටුවන්නේ වත් නැත.”

### බබිලෝනියේ විනාශය

22 සියලු බලැති සමිඳාණන් වහන්සේ මෙසේ
වදාරන සේක: “මම බබිලෝනියට පහර දී එය
විනාශ කරන්නෙමි. බබිලෝනිය යන නාම මාත්රය ද
එහි ඉතිරි ව සිටින අය සහ දරු මුණුබුරන් ද මම
නැත්තට ම නැති කරන්නෙමි. මෙසේ පවසන්නේ
ස්වාමීන් වන මම ය. 23 මම බබිලෝනිය ගොහොරු
බිමක් කරන්නෙමි. ඉත්තෑවුන් එහි වාසය කරනු ඇත.
විනාශය නමැති කොස්සෙන් මම බබිලෝනිය
සහමුලින් ම අතුගාදමන්නෙමි. මෙසේ පවසන්නේ
ස්වාමීන් වන මම ය.”

### අසිරියාවේ විනාශය

24 යෙසා 10:5-34; නාහුම් 1:1—3:19; ශෙප 2:13-15
සියලු බලැති සමිඳාණන් වහන්සේ මෙසේ දිවුරා
ඇත:
q224 “මා අදහස් කළ ලෙසෙ සිදු වන්නේ ය.
q224 මා කරන්න අධිෂ්ඨාන කළ දේ කරනු
ලබන්නේ ම ය.
25 මාගේ ඉශ්රායලේ දේශයේ මම අසිරියන්වරුන්
විනාශ කොට මාගේ කඳු පිට ඔවුන් පයින්
පාගාදමන්නෙමි.
q225 මාගේ සෙනඟ අසිරියාවේ වහල්කමෙන් ද
ඔවුන් පිට පටවන ලද බරෙන් ද නිදහස් කරන්නෙමි.
26 මුළු පොළොව පිළිබඳ මාගේ තීරණය මෙයෙ වේ.
q226 ජාතීන්ට දඬුවම් කරන පිණිස මම මාගේ අත
ඔසවාගෙනෙ යමි.”

27 සව් බලැති සමිඳුන් මෙසේ කිරීමට අධිෂ්ඨාන
කර ඇත.
q2 27 එය නිෂ්ප්‍රභා කරන්නේ කවරෙක් ද?
q2 27 දඬුවම් කිරීමට එතුමන් ස්වකීය හස්තය ඔසවා
ඇත.
q2 27 එය නැවැත්විය හැක්කේ කාට ද?

## පිලිස්තිවරුන්ගේ විනාශය

28 2 රාජා 16:20; 2 වංශා 28:27 ආහාස් රජු
මරණයට පත් වූ අවුරුද්දේ දී ප්‍රකාශ කරන ලද
පණිවුඩය මෙය ය:
29 ජරෙ 47:1-7; එසකි 25:15-17; ජෝවෙ 3:4-8;
ආමො 1:6-8; ශපෙ 2:4-7; සකෙරි 9:5-7 “අහෝ
පිලිස්තියේ ජනයෙනි, නුඹලාට පහර දුන් යෂ්ටිය
දැන් කැඩී ඇත.
q2 29 එහෙත්, ප්‍රීති නොවන්න.
q2 29 මන්ද, එක සර්පයකු මළ විට ඊට වඩා
විසකුරු සර්පයෙක් එන්නේ ය.
q2 29 උගේ බිජුවනේ ඉගිලෙන ගිනි සර්පයෙක් ඇති
වන්නේ ය.
30 සමිඳුන් තමන් සෙනඟ අතරෙන් දුප්පත් අය
පෝෂණය කොට, ඔවුන්ට සුරැකි ව ජීවත් වීමට
සලසන සේක.
q2 30 එහෙත්, පිලිස්තිවරුන් වන නුඹලාගෙන් එකෙකු
වත් ඉතිරි නොවන සේ එතුමාණෝ නුඹලා පිට
භයානක සාගතයක් එවන සේක.
31 පිලිස්ති ජනයෙනි, උදව් උපකාර ඉල්ලා කෑමොර
ගසන්න;
q2 31 භීතියෙන් ඇලළී යන්න.
q2 31 උතුරෙන් දූවිලි වලාකුළක් මෙන් හමුදාවක්
පැමිණෙන්නේ ය.
q2 31 එය වනාහි බිය සුලු ව ආ අය කිසිවකු නැති
යුද හමුදාවකි.
32 පිලිස්තියෙන් අප වෙත පැමිණෙන
පණිවුඩකාරයන්ට අප කුමන පිළිතුරක් දිය යුතු ද?
q2 32 ‘සමිඳුන් සියොන් පිහිටුවා ඇත.
q2 32 එතුමන්ගේ දුක් විඳින සෙනඟට එහි සුරැකි ව
විසිය හැකි යැ’යි කියන්නමු.”

## මෝවබ් රටේ විනාශය

15 යෙසා 25:10-12; ජරෙ 48:1-47; එසකි
25:8-11; ආමො 2:1-3; ශපෙ 2:8-11 මෝවබ්
රට පිළිබඳ පණිවුඩය මෙය ය:
q2
15 “එක රාත්‍රියක දී මෝවබ් දේශයෙහි ආර් හා
කීර් පාළු කොට වනසන ලදී;
q2
15 මෝවබ් දේශය පුරා විනාශය ඇත.
2 දීබොන් දේශයේ සෙනඟ ගිරිකුළු
දේවාලවලට ගොස් හඬා වැලපෙන්නෝ ය.
q2 2 නබෝ සහ මේදබා ගැන මෝවබ්
වැලපෙන්නේ ය.
q2 2 දුක් බරින් ඔවුන් තමන්ගේ හිස් මුඩු කර රැවුල්
කපා ඇත.
3 වීථිවල සිටින සෙනඟ ගෝණි රෙදි ඇඳ සිටිති;
q2 3 ඔව්හු සැම දෙන ම තමන්ගේ පියසි උඩ ද
එළිමහන් ඉඩම්වල ද කඳුළු හළමින්, කෑමොරගසා
විලාප කියති.
4 හෙෂ්බොන් හා එලෙයොලේ නගරවල සෙනඟ
කෑගසති;
q2 4 ඔවුන්ගේ හඬ ජහශ් දක්වා ඇසෙයි.
q2 4 හේවායෝ පවා වෙව්ලති.
q2 4 ඔවුන්ගේ ධෛර්යය පහ වී ගොස් ඇත.
5 මාගේ සිත මෝවබ් නිසා කම්පා වෙයි.
q2 5 එහි සෙනඟ ශෝවාර් හවෙත් එග්ලත්-ෂලෙෂිය
නගරයට පලා යති.
q2 5 ඇතැමෙක් හඬ හඬා ලුහිත්හි ගොඩැල්ලේ
නැඟී යති.
q2 5 හොරොනායිම් මාර්ගයෙහි දී සමහරු මරහඬ
දමමින් කෑගසති.
6 නිම්රිම්හි ඔය සිඳී ගොස් පාළුකරයක් වී ඇත.
q2 6 ඒ අසල තණ මැලවී ගොස් ඇත.
q2 6 අමු කොළයක් දකින්න වත් නැත.
7 තමන් රැස් කරගත් දේපළ රුගෙන බට පඳුරු
ඇති ඔය හරහා පලා යන්න සෙනඟ උත්සාහ කරති.
8 මුළු මෝවබ් දේශය පුරා කෑගැසීමේ හඬ ඇසේ;
q2 8 එහි විලාප හඬ එග්ලයිම් හා බයෙරේ-එලීම්
නගර දක්වා ඇසේ.
9 දීමොන් නගරයේ ගඟ ලෙයින් පිරී ඇත.
q2 9 ඊටත් වඩා භයානක දෙයක් එහි සෙනඟට
කරන්න දෙවිඳුන් අදහස් කර ඇත.
q2 9 මෝවබ් දේශයෙන් පලා යන අයත්, ඉතිරි ව
සිටින සියලු දෙනොත් සිංහයන්ට ගොදුරු වෙති.”

## මෝවබ්වරුන් ජුදාවේ පිහිට සොයා යෑම

16 මෝවබ්හි සෙනඟ කාන්තාරයේ පිහිටි
සේලා නගරයේ සිට ජෙරුසලමේ
ආණ්ඩුකාරයා වෙත තෑග්ගක් ලෙස බැටළු පැටවුන්
යවන්නෝ ය.
2 ඔව්හු කැදැල්ලෙන් පලවා හරින ලද කුරුල්ලන්
මෙන් අර්ණොන්හි තොටුපළවල ඉවක් බවක් නැති
ව ඒ මේ අත යති.
3 ජුදාවේ සෙනඟට ඔව්හු මෙසේ කියති:
q2 3 “අපට උපදෙස් දෙන්න;
q2 3 යුක්තිය ඉටු කරන්න;
q2 3 ඉර මුදුන් වේලේ ගසකින් වැටෙන සිසිල්
සෙවණ යට මෙන් අප ආරක්ෂා කරන්න;
q2 3 ඔබේ පිහිට අපට දෙන්න;
q2 3 ගෙයක් දොරක් නැති අප සඟවාගන්න;
q2 3 පලා එන අය පාවා නොදෙන්න.
4 නුඹලාගේ දේශයේ වාසය කරන්න අපට ඉඩ
දෙන්න.
q2 4 අප විනාශ කරන්න මාන බලන අයගෙන් අප
ආරක්ෂා කරගන්න.
q2 4 පීඩාව ද විනාශය ද කෙළෙවර වන්නේ ය.

q2[4] දේශය නැති නාස්ති කරන අය පහ වී යන්නෝ
ය.
5 එවිට දාවිත්ගේ පරපුරනේ කනෙකෙු රජ වී
අවංක ලසෙ ද ප්රේමයනේ ද ආණ්ඩු කරනු ඇත;
q2[5] හරි දේ කිරීමටත්, යුක්තිය ඉටු කිරීමටත්
යුහුසුලු වනු ඇත.”
6 ජුදාවේ සනෙඟ කතා කරමින්, “මෝවබ්
සනෙඟගේ උඩඟුව ද දර්පය ද අහංකාරය ද ගැන
අසා ඇත.
q2[6] එහතේ, ඔවුන්ගේ පාරට්ටුව හිස් ය”යි කියති.
7 එක් කනෙකෙු වත් නැර, මෝවබ්වරු තමන්ට ඇති
දුක් විපත් නිසා වැලපතේ.
q2[7] ඔව්හු කීර්-හරසෙතේ කරෙහෙි බලාපොරොත්තු
සුන් වී වැලපතේ.
8 හෙෂ්බොන්හි කතේ ද සිබ්මාහි මිදි වැල් ද මැලවී
ගොස් ඇත.
q2[8] ජාතීන්ගේ පාලකයන් මත් වූයේ ඒ මිදි
වැල්වලින් ලබාගත් මිදියුස බීමනේ ය.
q2[8] එක් කාලයක දී ඒ මිදි වතු නැගනෙහිර ජාශර්
නගරය හා කාන්තාරය දක්වා ද බස්නාහිර මළ
මුහුදනේ එහා පැත්ත දක්වා ද විහිදී ගොස් තිබිණි.
9 දැන් මම ජාශර්හි වූ මිදි වැල් ගැන වැලපනේනාක්
මනේ, සිබ්මාහි මිදි වැල් ගැන ද වැලපනේනමේ.
q2[9] හෙෂ්බොන් හා එලයොලේ ගැන මම කඳුළු
වගුරුවන්නමේ.
q2[9] යුද හඬ නුඹේ කතේ වතු පවා විනාශ කිරීමට
එන්නේ ය.
10 සාරවත් කතේවල කිසිවකෙුට ප්රීතියක් නැත.
q2[10] මිදි වතුවල කිසිවකෙු ගී ගයන්නේ නැත.
q2[10] මිදියුස ලැබීමට කිසිවකෙු මිදි වලු පාගා
මිරිකන්නේ නැත.
q2[10] ප්රීති නාදය දැන් ඇසනේනේ නැත.
11 මෝවබ් ගැන දුකනේ ද කීර්-හරෙසේ ගැන
දොම්නසින් ද මම කඳේරිගාන්නමේ.
12 මෝවබ්හි සනෙඟ යාච්ඤා කරන පිණිස කඳු
මුදුන්හි ඇති ශුද්ධස්ථානවලටත්, ගිරිකුළු
දේවාලවලටත් යමින් වහෙසෙතේ. එයින් ඔවුන්ට
කිසි වැඩක් වන්නේ නැත.
13 මෝවබ් ගැන සමිඳාණන් වහන්සේ මුලින්
ප්රකාශ කළ පණිවුඩය එය වේ. 14 එහතේ, දැන්
සමිඳාණන් වහන්සේ මසෙේ වදාරන සේක:
“කුලීකරුවාගේ සේවා කාලය අවසාන වන්නා සේ
අවුරුදු තුනක් ඇතුළත දී මෝවබ්හි සියලු යසඉසුරු
නැති වී යන්නේ ය. විශාල සමූහයක් අතරනේ ඉතිරි
වන්නේ ස්වල්ප දනෙකේ පමණ ය. ඔව්හු ද දුර්වල
අය වතේ.”

## සිරියාව හා ඉශ්රායලේ දඬුවම් කරනු ලැබීම

17 ජරෙ 49:23-27; ආමො 1:3-5; සකෙරි 9:1
දමස්කය පිළිබඳ දේව ප්රකාශනය මයෙ ය:
q2
17 සව් බලැති දවේ සමිඳාණෝ මසෙේ වදාරන
සේක:
q2
17 “දමස්කය මින් මතු නුවරක් ව
නොපවතින්නේ ය.
q2
17 එය නටබුන් ගොඩක් වන්නේ ය.
2 සිරියාවේ නගර සදහට ම පාළු වන්නේ ය.
q2[2] ඒවා බැටළුවන්ට හා ගවයන්ට ලැගුම් බිම්
වන්නේ ය.
q2[2] උන් එලවාදමන්න කිසිවකේ එහි නොවන්නෝ
ය.
3 ඉශ්රායලේ බලකොටු බිඳ වැටනේනේ ය;
q2[3] දමස්ක ආධිපත්යය නැති වන්නේ ය.
q2[3] ඉශ්රායලේ සනෙඟට වූවාක් මනේ ඉතිරි වන
සිරියන්වරුන්ගේත් යසඉසුරු පහ වී යන්නේ ය.
4 “ඉශ්රායලේහි තේජස හීන වන එහි වස්තුව
පහවන කාලයක් පැමිණනේනේ ය.
5 ඉශ්රායලේ ගොයම් කපන ලද කතෙක් මනේ
වන්නේ ය.
q2[5] එය රපොවරුන්ගේ මිටියාවතේ අන්තිම කරල
පවා අහුලාගත් පසු පාළු වී ඇති කතෙක් මනේ
වන්නේ ය.
6 ඔලීව ගසක් සලෙවූ කල මුදුන් අත්තේ ගඩේ
දකෙ තුනක් ද අන් අතුවල ගඩේ හතරක් පහක් ද
ඉතිරි වන්නාක් මනේ ඉශ්රායලේහි සනෙඟ ස්වල්ප
දනෙකේ පමණක් ඉතිරි වන්නෝ ය.
q2[6] මසෙේ පවසන්නේ ඉශ්රායලේවරුන්ගේ දවේ
සමිඳුන් වන මම ය.”
7 ඒ දවස පැමිණි විට සනෙඟ තමන්ගේ
මැවුම්කාරයාණන් වන ඉශ්රායලේවරුන්ගේ ශුද්ධ
දවේයන් වහන්සේ වතෙ පිහිට සොයා හැරනේනෝ
ය. 8 ඔවුන් තමන්ගේ අත්වලින් තනාගත් පූජාසන
සලකන්නේ වත්, අෂේරා දේවිය නැමදීමට සිය'තින්
සාදාගත් කප් කණු හා දුම් පූජාසන කරෙහෙි
විශ්වාසය තබන්නේ වත් නැත.
9 ඒ දවස පැමිණි විට මනා සේ ආරක්ෂා කරන ලද
ඒ නගර පාළු වී ඉශ්රායලේවරුන් කරෙනේ හිව්වරුන්
ද අමෝරිවරුන් ද පාළුවට හැර පලා ගිය නගර මනේ
නටබුන් වන්නේ ය.
10 ඉශ්රායලේවරුනි, ඔබේ විමුක්තිය හා
රැකවරණය වන, පර්වතය මනේ වැඩ සිටින දවේඳුන්
අමතක කර, ඔබ අඩොනිස් දවේයාට ද අන්ය
දවේවරුන්ට ද වෘක්ෂාරාම කැප කළහු ය.
11 එහතේ, ඒවා පැළ කළ දවසේ දී ම ඒවායේ දලු
ලා මල් ද හටගන්න නමුත්, පල නළොගැනීමට හැකි
වන්නේ නැත.
q2[11] ශෝකය හා තද දුක පමණක් ඇති වන්නේ ය.

## සතුරු ජාතීන් පරාජය කරනු ලැබීම

12 අන්න, බොහෝ ජන සමූහයන්ගේ ඝෝෂාවක්!
q2[12] මුහුදු ඝෝෂාවක් මනේ ද මහා රළ පතර
ගර්ජනාවක් මනේ ද ඔව්හු ගිගුරුම් දතේ.
13 වේගවත් රළ පතර මනේ ඔවුන් ඉදිරියට ආවත්,
දවේඳාණෝ ඔවුන්ට තරවටු කරන සේක.

q2 13 එවිට කඳු බෑවුම්වල තිබෙන ධූලි සුළඟටත්,
බොල් වී, සුළි සුළඟටත් ගසාගෙන යන්නාක් මෙන්
ඔව්හු පසු බසින්නෝ ය.
14 සවස ඔවුන් අන් අය බිය ගන්වන නමුත්, උදේ
වන විට ඔවුන් දකින්න වත් නැත.
q2 14 අපේ දේශය කොල්ල කන අයගේ ඉරණම
එය ය.

### එතියෝපියාව දඬුවම් කරනු ලැබීම

18 ශපෙ 2:12 එතියෝපියාවේ ගංගාවලට
එගොඩින් පියාපත් ගසන හඬක් ඇසෙන
රටක් ඇත.
2 ඒ රටින් බට පතුරුවලින් සාදාගත් නැව්වල නයිල්
ගඟ දිගේ තානාපතීහු පැමිණෙති.
q2 2 ශීඝ්‍ර පණිවුඩකාරයන් වන ඔබ ආපසු ගෙදර
යන්න.
q2 2 නයිල් ගඟේ අතුවලින් බෙදී ගිය රටේ වසන
ඔබේ ශක්තිමත් බලසම්පන්න ජාතියට, සියලු දෙනා
භීතියට පත් කර ඇති සෙනඟ වෙත පණිවුඩයක්
රැගෙන යන්න.
3 ලෝ වැසි සියල්ලෙනි, දරණ වැසි සියල්ලෙනි,
සවන් දෙන්න.
q2 3 කඳු පිට සංඥාව ඔසවන විට බලන්න;
q2 3 හොරණෑව පිඹින විට සවන් දෙන්න.
4 සමිඳුන් මට කතා කොට මෙසේ වදාළ සේක:
q2 4 "දාවල් ග්‍රීෂ්ම වේලාවේ පායන හිරු මෙන්
සන්සුන් ව ද ගොයම් කපන කාලයේ උණුසුම් රැයේ
පිනි වලාකුළක් මෙන් නිශ්චල ව ද මම ස්වර්ගයේ
සිට බලන්නෙමි.
5 මල් වැටී, ඉදීගෙන එන මිදි පල නෙළාගන්න පෙර
මිදි වැලක විසිරී ගිය මිදි රිකිලි කැතිවලින් පාහින්නා
සේ ඉතා පහසුවෙන් සතුරෝ එතියෝපියන්වරුන්
විනාශ කරති.
6 ඔවුන්ගේ භටයන්ගේ මළකඳන් පක්ෂීන්ටත්,
මෘගයන්ටත් ගොදුරු වන පිණිස අත්හැරදමනු
ලබන්නේ ය.
q2 6 ග්‍රීෂ්ම කාලයෙහි පක්ෂීහු ද ශීත කාලයෙහි
මෘගයෝ ද ඒවා කාදමන්නෝ ය.
7 නයිල් ගඟේ අතුවලින් බෙදී ගිය රටේ පිහිටි උස්
වූ සිනිඳු වූ හමක් ඇති, ලෝකයේ සියලු දෙනා
භීතියට පත් කර ඇති මේ ශක්තිමත් බලසම්පන්න
ජාතියෙන් සව් බලැති සමිඳුන් පුද පූජා ලබන
කාලයක් පැමිණෙන්නේ ය.
q2 7 සව් බලැති දෙවිඳුන් නමස්කාර කරනු ලබන
සියොන් කන්ද වෙත ඔව්හු පැමිණෙන්නෝ ය.

### මිසරය දඬුවම් කරනු ලැබීම

19 ජරෙ 46:2-26; එසකි 29:1—32:32 මිසරය
පිළිබඳ දේව ප්‍රකාශනය මෙසේ ය:
q2
19 සමිඳාණෝ ශීඝ්‍ර වලාකුළක් පිට නැඟී මිසර
දේශයට වඩින සේක.
q2
19 මිසරයේ දේවතා රූප එතුමන් ඉදිරියෙහි
චංචල වන්නේ ය.
q2
19 එහි සෙනඟ අධෛර්යයට පත් වන්නෝ ය.
2 සමිඳාණෝ මෙසේ වදාරන සේක:
q2 2 "මම මිසර දේශය තුළම රටවැසියන් අතර ම
යුද්ධයක් හටගන්වන්නෙමි.
q2 2 එකිනෙකා තම තමාගේ සහෝදරයාටත්, තම
තමාගේ අසල්වැසියාටත් විරුද්ධ ව පොළඹවන්නෙමි.
q2 2 නුවරක් නුවරකටත්, රජකු රජකුටත් විරුද්ධ ව
සටන් කරනු ඇත.
3 මිසර වැසියන්ගේ උපායයන් මම ව්‍යර්ථ
කරන්නෙමි;
q2 3 ඔවුන්ගේ චිත්ත ධෛර්යය බිඳදමන්නෙමි.
q2 3 ඔවුන් දේවතා රූපවලින් උපකාර ඉල්ලනු ඇත;
q2 3 මතුරන්නන්ගෙන් ද කට්ටඩියන්ගෙන් ද
අනවිනකාරයන්ගෙන් ද ආත්මබන්ධනකාරයන්ගෙන් ද
ගුරුකම් සොයනු ඇත.
4 මම මිසරවරුන් කෲර පාලකයකුගේ අතට පාවා
දෙන්නෙමි;
q2 4 නපුරු රජකු ඔවුන් කෙරෙහි රජකම් කරනු
ඇත.
q2 4 මෙසේ වදාරන්නේ සව් බලැති සමිඳුන් වන මම
ය."
5 නයිල් ගඟේ ජලය සිඳී, ක්‍රමයෙන් වියළී යන්නේ
ය.
6 ඒ ගංගාවේ අතු ගංගා සිඳී වියළී යන අතර දුගඳ
හමනු ඇත;
q2 6 බට ගස් ද පන් ගස් ද මැලවී යයි.
7 නයිල් ගං තෙරේ තිබෙන පැළෑටි ද ගඟ අසබඩ
වපුරන සියල්ල ද වේළී වැනසී යන්නේ ය.
8 නයිල් ගඟේ මසුන් අල්ලන්නෝ සුසුම් ලන්නෝ
ය;
q2 8 එහි බිළී බාන්නෝ වැලපෙන්නෝ ය;
q2 8 දැල් හෙළන්නෝ විලාප කියන්නෝ ය.
9 හණ පීරන්නෝ ද හෙළෙ පුළුන් ගෙන රෙදි
වියන්නෝ ද කලකිරෙන්නෝ ය;
10 රෙදි වියන්නෝ ද වියවුල් වන්නෝ ය;
q2 10 දක්ෂ ශිල්පීහු ද ඉමහත් ශෝකයට පත්
වන්නෝ ය.
11 ශෝවන් නගරයේ අධිපතීහු අන්ත මෝඩයෝ ය.
q2 11 මිසරයේ නැණවත් උපදේශකයෝ අමන
උපදෙස් දෙති.
q2 11 පුරාණ පණ්ඩිතයන්ගෙන් ද රජවරුන්ගෙන් ද
තමන් පැවත එති යි ඔවුන් රජතුමාට කියන්නේ
කෙසේ ද?
12 මිසරයේ රජතුමනි, ඔබේ දක්ෂ උපදේශකයෝ
කොහේ ද?
q2 12 සමහර විට සව් බලැති සමිඳුන් මිසරයට
විරුද්ධ ව අදහස් කර ඇති දේ ඔබට දන්වන්නට
ඔවුන්ට හැකි වනු ඇත.
13 ශෝවන් හා මෙම්පිස් නගරවල අධිපතියෝ
අඥානයෝ ය.

q213 තමන් ජාතියට මඟ පෙන්වනු ඇතැ යි සිතූ
ඔවුන් ජාතිය නොමඟ යවා ඇත.
14 සමිඳුන් ඔවුන් වියවුල් කරවන ව්‍යාකූලත්වයක්
නගරය තුළ බිහිකර ඇත.
q214 ඒ හේතුවෙන් මිසරය හැම වැරදි දෙයක් ම
කරයි.
q214 සුරා සොඬකු තමාගේ ම වමනය මත ලිස්සා
යන්නාක් මෙන් මිසරය ඒ මේ අත වැනි වැනී යයි,
15 මිසරයේ සිටින දුප්පත් පොහොසත්, උසස්
පහත් කිසිවකුට උපකාර දීමට එයට නොහැකි ය.

### මිසරය දෙවිඳුන් වෙත හැරීම

16 සියලු බලැති සමිඳාණන් වහන්සේ ඔවුන්ට
දඬුවම් කරන්න අත ඔසවා ඇති බව ඔවුන් දුටු විට,
මිසරයේ සෙනඟ ස්ත්‍රියක මෙන් බියාදුකමින් තැති
ගැනී වෙවුළන්නෝ ය. 17 සියලු බලැති සමිඳාණන්
වහන්සේ ඔවුන්ට විරුද්ධ ව කර ඇති නියමය
ඔවුන්ට සිහිකර දෙන හැම වේලේ ම ජුදා දේශය
ඔවුන්ට භීතියක් වන්නේ ය.
18 ඒ දවස පැමිණි විට හෙබ්‍රෙව් භාෂාව මිසරයේ
නගර පහක ව්‍යවහාර කරනු ලැබේ. එහි සිටින
සෙනඟ සියලු බලැති සමිඳාණන් වහන්සේගේ
නාමයෙන් දිවුරුම් දෙනු ඇත. එක නගරයක් ‘සූර්ය
නගරය’ යයි කියනු ලබන්නේ ය.
19 ඒ දවස පැමිණි විට සමිඳාණන් වහන්සේට
මිසරයේ පූජාසනයක් ද එහි සීමාව ළඟ ගල්
කණුවක් ද පිහිටුවනු ලබන්නේ ය. 20 සියලු බලැති
සමිඳාණන් වහන්සේ මිසරයේ වැඩ සිටින බවට
ඒවා සලකුණු වන්නේ ය. එහි සිටින සෙනඟ පීඩා
කරනු ලබන කල, ඔවුන් සමිඳාණන් වහන්සේට
යාච්ඤා කළ විට, උන් වහන්සේ ඔවුන් ගළවන
පිණිස කෙනෙකු ඔවුන් වෙත එවන සේක.
21 සමිඳාණන් වහන්සේ මිසරයේ සෙනඟට ප්‍රකාශ
වන සේක. එසේ කළ විට ඔව්හු උන් වහන්සේ
පිළිගෙන පුද පූජා උන් වහන්සේ වෙත ගෙන අවුත්
නමස්කාර කරන්නෝ ය. ඔව්හු සමිඳාණන්
වහන්සේට පොරොන්දු දී ඒවා ඉෂ්ට කරන්නෝ ය.
22 සමිඳාණන් වහන්සේ මිසරයේ සෙනඟට දඬුවම්
දෙන සේක; දඬුවම් කර සුව කරන සේක. ඔවුන්
සමිඳාණන් වහන්සේ වෙත හැරෙනු ඇත. උන්
වහන්සේ ද ඔවුන්ගේ කන්නලවු පිළිගෙන ඔවුන්
සුවපත් කරනු ඇත.
23 ඒ දවස පැමිණි විට මිසරයේ සිට ඇසිරියාව
දක්වා මහා මාවතක් වන්නේ ය. එහි සිටින සෙනඟ
මේ දෙරට අතරේ ඔබමොබ ගමන් කරනු ඇත.
මිසරවරුන් ද ඇසිරියන්වරුන් ද එකට නමස්කාර කරනු
ඇත. 24 ඒ දවස පැමිණි විට ඉශ්‍රායෙලේ දේශය
මිසරය හා ඇසිරියාව සමඟ උරෙන් උර ගැටෙන්නේ
ය. ඒ ජාති තුන ම මුළු ලොවට ආශීර්වාදයක්
වන්නෝය. 25 සියලු බලැති සමිඳාණන් වහන්සේ
ඔවුන්ට ආශීර්වාද කොට, “මාගේ සෙනඟ වන
මිසරයටත්, මාගේ මැවිල්ල වන ඇසිරියාවටත්,
මාගේ තෝරාගත් සෙනඟ වන ඉශ්‍රායෙලේටත් මම
ආශීර්වාද කරන්නෙමි”යි කියන සේක.

### මිසරයේ විනාශය පිළිබඳ ලකුණ

20 ඇසිරියාවේ රජ වූ සර්ගොන්ගේ අණ පරිදි
ඇසිරියන් හමුදාවේ අණ දෙන නිලධාරියා වන
තර්තාන් අෂ්දොද් නම් පිලිස්තියේ නගරයට පහර දී
එය අත්පත් කරගත්තේ ය. 2 එයට තුන් අවුරුද්දකට
පෙර සමිඳාණන් වහන්සේ ආමොස්ගේ පුත්‍ර වූ
යෙසායාට කතා කොට, ඔහු ඉඟ වටා ඇඳ සිටි
ගෝණි රෙද්ද හා ලා ගෙන සිටි පාවහන් ඉවත
දමන්න අණකළ සේක. ඔහු එසේ කොට වස්ත්‍ර ද
පාවහන් ද නැති ව ඇවිද්දේ ය. 3 අෂ්දොද් නගරය
අල්ලා ගනු ලැබූ කල සමිඳාණන් වහන්සේ මෙසේ
වදාළ සේක: “මාගේ මෙහෙකරු වන යෙසායා තුන්
අවුරුද්දක් මුළුල්ලේ වස්ත්‍ර ද පාවහන් ද නැති ව
තැන් තැන්වල ඇවිද්දේ ය. මේ වනාහී මිසරයටත්,
ඉතියෝපියාවටත්, සිදු වන්න යන දේ පිළිබඳ පෙර
නිමිත්තකි. 4 ඇසිරියාවේ රජ මේ දෙරටින් අල්ලාගත්
සිරකරුවන් නග්නකර, වහල්කමට ගෙන යන්නේ ය.
මිසරයට නින්දාවක් පමුණුවමින් බාල මහලු සියලු
දෙනා පාවහන් නැති ව නග්න ව, ඉණ ඉහ නැති ව
ගමන් ගන්නෝ ය. 5 ඉතියෝපියාව කෙරෙහි
තමන්ගේ විශ්වාසය තැබූ මිසරය ගැන පාරට්ටු කළ
අය වියවුල් වී ලජ්ජාවට පැමිණෙන්නෝ ය. 6 ඒ
කාලය පැමිණි විට පිලිස්තියේ මුහුදුබඩ වැසියෝ
කතා කොට, ඇසිරියාවේ රජුගෙන් අප ආරක්ෂා
කරනු ඇතැ යි මහත් අපේක්ෂාවෙන් විශ්වාස කළ
සෙනඟට සිදුවී තිබෙන දේ බලන්න. අපේ
අපේක්ෂාවට මෙසේ සිදු වූයේ නම්, අප
ගැළවෙන්නේ කෙසේ දැ යි කියනු ඇත.”

### බබිලෝනියේ වැටීම

21 බබිලෝනිය පිළිබඳ දේව ප්‍රකාශනය
මෙසේ ය:
q2
21 කාන්තාරය හරහා හමන සුළි සුළඟක් සේ
භයානක දේශයකින් විනාශය පැමිණෙන්නේ
ය.
2 කෲරතර සිද්ධීන් පිළිබඳ දර්ශනයක් මට ප්‍රකාශ
කරන ලද්දේ ය.
q22 එය කොල්ලයත්, විනාශයත් පිළිබඳ දර්ශනයකි.
q22 ඒලාම් හමුදාවෙනි, පහර දෙව්!
q22 මේදිය හමුදාවෙනි, නගර වටලාගනිව්!
q22 බබිලෝනිය විසින් ඇති කරන ලද දුක් වේදනා
දෙවිඳාණෝ කෙළෙවර කරන සේක.
3 මා දුටු සිහිනය මාගේ සිතෙහි ඉමහත් භීතියක් ද
ස්ත්‍රියකට ඇතිවන ප්‍රසව වේදනාව වැනි
වේදනාවක් ද ඇති කර තිබේ.
q23 මම කන් නෑසෙන තරම් වේදනාවෙන් මිරිකී
සිටිමි;
q23 ඇස් නොපෙනෙන තරම් කැළඹී සිටිමි.
4 මාගේ හිස කරකැවේ;

q2 4 භීතියෙන් මම වෙවුළමි;
q2 4 සවස් වන තුරු මම බලාපොරොත්තුවෙන් බලා සිටිමි.
q2 4 එහෙත්, සවස් වූ විට ඇති වූයේ භීතිය පමණකි.
5 භෝජන උත්සවයක් පිළියෙළ කරනු ලබන බවත්,
අමුත්තන්ට අසුන් ගැනීමට බුමුතුරුණු තබන බවත්,
ඔවුන් කමින් බොමින් සිටින බවත් ඒ දර්ශනයෙන්
පෙනේ.
q2 5 එවිට හදිසියේ ම, “නිලධාරියෙනි නැඟිටින්න, නුඹලාගේ පලිස් සූදානම් කරන්නැ”යි ආඥාවක් නික්මේ.
6 එවිට සමිඳාණෝ මට මෙසේ වදාළ සේක:
q2 6 “නුඹ ගොස් මුරකාරයකු තබා, ඔහු දකින දේ දන්වන්න කියා ඔහුට කියන්න.
7 අසරුවන් දදෙනෙ දදෙනෙ බැගින් ද කොටළුවන්
හා ඔටුවන් පිට යන මිනිසුන් ද ඔහු දුටුවොත්, එය
සුපරීක්ෂාකාරීව නරඹන්න කියා ඔහුට කියන්න.”
8 මුරකරුවා ද, “ස්වාමීනි, මම රෑ දාවල් දකේහි මුර
පළේ සිටියෙමි”යි කෑ ගසා කියන්නේ ය.
9 එළිද 14:8; 18:2 හදිසියේම අසරුවන් දදෙනෙ
දදෙනෙ පිට සෙනඟ පැමිණෙති;
q2 9 මුරකරුවා ඒ පුවත පළ කරමින්, “බබිලෝනිය වැටිණි!
q2 9 බබිලෝනිය වැටිණි!
q2 9 ඇගේ දෙවිවරුන් වන කැපූ රූප සියල්ල ම කඩා බිඳදමන ලද්දේ ය”යි කියන්නේ ය.
10 මාගේ ඉශ්රායලේ සෙනඟෙනි, නුඹලා කමතේ
ගොයම් මෙන් මඩිනු ලැබුවහු ය.
q2 10 එහෙත් දැන්, ඉශ්රායලේවරුන්ගේ දෙවි වන සව් බලැති සමිඳුන්ගෙන් මා ඇසූ ශුභ අස්න මම නුඹලාට දැනුම් දෙන්නෙමි.

## ඒදොම් ගැන දේව ප්‍රකාශනය

11 ඒදොම් ගැන දේව ප්‍රකාශනය මෙසේ ය:
q2 11 සේයිර් සිට කෙනෙක් මට හඬගසා, “මුරකරුව, රාත්රිය ගෙවී යන්න තව කොතෙක් වේලා ඇද් ද?
q2 11 එය ඉක්මනින් ගෙවී යනු ඇද්දැ”යි අසන්නේ ය.
12 “පහන් වේලාව එන්නේ ය;
q2 12 රාත්රිය ද එන්නේ ය;
q2 12 ඔබ අසන්න කැමැති නම්, යළි අවුත් අසන්නැ”යි ඔහු පිළිතුරු දෙන්නේ ය.

## අරාබිය ගැන දේව ප්‍රකාශනය

13 අරාබිය ගැන දේව ප්‍රකාශනය මෙසේ ය:
q2 13 තවලම් කණ්ඩායම් වශයෙන් ගමන් කරන දදොන්වරුනි, අරාබියේ පාළු ප්‍රදේශයේ නුඹලා කඳවුරු බැඳගෙන සිටින්නහු ය.
14 නුඹලා වෙත පැමිණෙන පිපාසිත සෙනඟට
බොන්න වතුර දෙන්න;
q2 14 තේමා රටේ වැසියෙනි, නුඹලාගේ පිහිට සොයා පලා එන්නන්ට කන්න දෙන්න.
15 ඔව්හු කොපුවෙන් ඇදගත් කඩුවලින් ද තැත්
කැවූ දුන්නෙන් ද යුද්ධයෙන් ඇති වන විනාශයෙන් ද
ගැළවෙන පිණිස පලා යති.
16 එවිට සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ
සේක: “හරියට තව අවුරුද්දකින් කේදාර්හි
ගෝත්රවල බලය නැතිවී යන්නේ ය. 17 දුනුවායෝ
කේදාර්හි සිටින සෙනඟ අතරෙන් ඉතා නිර්භීත අය
වෙති. එහෙත්, ඔවුන්ගෙන් ඉතිරි වන්නෝ ඉතා
ස්වල්ප දෙනෙකේ පමණි. ඉශ්රායලේවරුන්ගේ දෙවි
ස්වාමීන් වන මම මෙසේ පවසන්නෙමි.”

## ජෙරුසලම පිළිබඳ දේව ප්‍රකාශනය

22 දර්ශන මිටියාවත පිළිබඳ දේව ප්‍රකාශනය මෙසේ ය:
q2
22 වැරදී ඇත්තේ කුමක් ද?
q2
22 නගරයේ සියලු සෙනඟ පියසි උඩට නැඟී උත්සව පවත්වන්නේ මන් ද?
2 මුළු නගරය ඔල්වර හඬින් ද ඝෝෂාවෙන් ද
කලබලයෙන් ද පිරී ඇත.
q2 2 මේ යුද්ධයේ දී මැරුම් කෑ අය මැරුණේ කඩුවෙන් හෝ සටනේ දී හෝ නොවේ.
3 නුඹලාගේ නායකයෝ සියල්ලෝ ම පලා ගියහ.
q2 3 ඔව්හු එක ඊතලයක් වත් විදින්න පෙර අල්ලාගනු ලැබූ හ.
q2 3 එඩිතර ම අය දුර පලා ගිය නමුත්, සියල්ලෝ ම සිරකරුවන් මෙන් අල්ලාගන්නා ලදහ.
4 මාගේ සෙනඟ මපෙමණ ගණනක් විනාශ වී ඇති
බැවින් දැන් මට තනි ව ම හඬා වැලපෙන්න ඉඩ
හරින්න.
q2 4 මා සනසන්න උත්සාහ නොකරන්න.
5 මේ වනාහි සව් බලැති මහෝත්තම දෙවි
ස්වාමීන් විසින් අප පිට පමුණුවන ලද දර්ශන
මිටියාවතෙහි කැළඹීම් ද පරාජය ද වියවුල් ද
q2 5 ඇති වන කාලයක් ය.
q2 5 නගරයේ පවුරු බිඳදමා ඇත.
q2 5 පිහිට පතා මොරගැසීම් දෝංකාරය කඳු අතරින් ඇසේ.
6 ඒලාම් රටේ භේවායෝ දුනු හී ඇති ව, රථ හා
අසුන් පිට නැඟී ආහ.
q2 6 කීර් රටේ භේවායෝ තමන්ගේ පලිස් සූදානම් කරගත්හ.
7 ජුදාවේ ඉතා සාරවත් මිටියාවත් යුද්ධ රථවලින්
පිරී තිබිණි.
q2 7 අසරුවෝ ජෙරුසලමේ දොරටුව ඉදිරියෙහි සිටියහ.
8 ජුදාවේ බලකොටු සියල්ල වැටිණි. එසේ වූ විට
නුඹලා ‘ආරණ්ය ගෘහය’ නම් ගබඩාවෙන් අවි ආයුධ
ගෙනොවහු ය. 9 ජෙරුසලමේ පවුරු කැඩී බිඳී තිබූ
තැන් නුඹලා සටහන් කරගත්තහු ය. පහළ
පොකුණෙන් වතුර රැස් කරගත්තහු ය. 10 නුඹලා
ජෙරුසලමේ තිබූ සියලු ගෙවල් ගණන් කොට

නගරයේ පවුරු අලුත් වැඩියා කිරීමට ඒ ගවෙල්
සමහරකින් ගල් ලබාගන්න පිණිස ඒවා බිඳදැමුවහු
ය. 11 පරණ පොකුණනේ ගලා එන වතුර රඳවා
ගැනීමට නුඹලා බිත්ති දකෙ අතර ජලාශයක්
තනාගත්තහු ය. එහතේ, නුඹලා මේ සියල්ල මීට
බොහෝ කලකට පරෙ සකස්කර, ඒ අයුරින් සිදු
වන්න සැලැස්වූ දවේයන් වහන්සේ සැලකුවේ නැත.
12 ඒ නිසා සව් බලැති දවේ සමිඳාණෝ හැඬීමටත්,
වැලපීමටත්, ගෝණි රදෙි ඇඳීමටත්, හිස බූගෑමටත්
නුඹලා කැඳවූෙ සේක.
13 1 කොරි 15:32 ඒ වනෙුවට නුඹලා ප්‍රීති
සන්තෝෂ වූවහු ය.
q2[13] කෑම සඳහා ගව බැටළු සතුන් මරා, මිදියුස
පානය කළහු ය.
q2[13] "අපි කමු, බොමු.
q2[13] මන්ද, හටෙ අපි මැරනේනමු"යි නුඹලා කීවහු
ය.
14 සව් බලැති දවේ සමිඳාණෝ මට කතා කොට,
"ජීවිතාන්තය දක්වා නුඹේ මේ අපරාධ කමා
නොකරන බව සව් බලැති දවේ සමිඳාණන් වන මම
නුඹලාට කියමි"යි වදාළ සේක.

## ෂබේනාට අනතුරු ඇඟවීමක්

15 සියලු බලැති දවේ ස්වාමීන් වහන්සේ මට කතා
කොට, "රාජගෘහාධිකාරී ෂබේනා වතෙ ගොස්
මසෙේ කියන්න මට නියම කළ සේකැ"යි දන්වන්න.
16 "නුඹ කවරකේ දැ යි සිතාගන්නහෙි ද? මෙහි
නුඹට ගල් පර්වත බෑවුමක සොහොනක් කපා
ගැනීමට ද නුඹට ම තැනක් සූදානම් කර ගැනීමට ද
නුඹට ඇති අයිතිය කුමක් ද? 17 නුඹ වැදගත්
කනෙකු වුවත් සමිඳාණන් වහන්සේ නුඹ තදින්
අල්ලාගනෙ එක වර ම පහතට හළෙන සේක.
18 උන් වහන්සේ නුඹ ගුලිකර බෝලයක් මනේ
විශාල දේශයකට විසිකර දමන සේක. එහි දී නුඹ
මහා ආඩම්බරයනේ තැකූ යුද්ධ රථ අසල
නසින්නහෙි ය. නුඹේ ස්වාමියාගේ වංශයට නුඹ
නින්දාවකි. 19 සමිඳාණන් වහන්සේ නුඹේ නිලයනේ
නුඹ පහකර නුඹේ උසස් තත්ත්වයනේ නුඹ පහතට
හළොදමන සේක."
20 සමිඳාණන් වහන්සේ ෂබේනාට මසෙේ වදාළ
සේක: "එසේ සිදු වූ විට හිල්කියාගේ පුත්‍ර වූ
මාගේ මහෙකෙරු වන එලියාකිම්ට මම
අඬගසන්නමේ. 21 නුඹේ නිල සළුව ඔහුට හඳවා,
නුඹේ පටිය ඔහුගේ ඉඟටියේ බැඳ නුඹේ
ආධිපත්‍යය මම ඔහුට පවරා දමේ. ඔහු ජරෙුසලමේ
සනෙඟටත්, ජුදාවේ වංශයටත් පියකු මනේ වනු
ඇත. 22 එළිද 3:7දාවිත්ගේ වංශයේ නිල යතුරු
ඔහුට දනෙු ලබන්නේ ය. ඔහු අරින දේ කිසිවකේ
නොවසන්නේ ය. ඔහු වසන දේ කිසිවකේ
නාරින්නේ ය. 23 මම සවිකළ ඇණයක් මනේ ඔහු
සිය තනතුරහෙි තිරසර ලසෙ පිහිටුවන්නමේ.
ඔහුගේ මුළු වංශයට ඔහු ගෞරවයක් වන්නේ ය.
24 "ඔහුගේ ඥාතීහු ද ඔහුගේ භාරය යටතේ
සිටින සියලු දනො ද ඔහුට බරක් වන්නෝ ය.
ඇණයක එල්ලා ඇති හැලි වළං මනේ ඔවුන් ඔහුගේ
ඇඟේ එල්ලනෙු ඇත. 25 එසේ වූ විට ස්ථිර ව
සවිකළ ඇණය බුරුල් වී වැටනේනේ ය. එහි එල්ලා
තිබුණු සියල්ල ගැළවී වැටී යන්නේ ය. එහි
අවසානයත් එය ම වන්නේ ය. මසෙේ වදාළේ
සමිඳාණන් වහන්සේ ය."

## පිනීසියට දඬුවම් දීම

23 එසකි 26:1—28:19; ජෝවෙ 3:4-8; ආමො
1:9-10; සකෙරි 9:1-4; මතෙ 11:21-22; ලූක්
10:13-14 තීර් පිළිබඳ දේව ප්‍රකාශනය මසෙේ ය:
q2
23 අහෝ! තර්ෂිෂ්හි නාවිකයනෙි,
කෑමොරගසන්න.
q2
23 මන්ද, තීර් නම් තොටුපළ විනාශකර ඇත.
q2
23 එහි ගවෙල් හා වරාය සුන්බුන් වී ඇත.
q2
23 සයිප්‍රසයනේ නුඹලාගේ නැව් ආපසු
පැමිණනෙ විට නුඹලාට ආරංචි වනු ඇත.
2 සීදොන්හි වළෙඳුෙනි, මුහුදුබඩ වැසියනෙි, නිහඬ
වන්න.
q2[2] ඔබේ දූතයෝ මුහුද තරණය කළහ.
3 මිසර වැසියෝ නයිල් ගඟ අසල අස්වැන්නනේ ද
ධාන්‍යයනේ ද ජාතීන් අතර වළෙඳාම් කිරීමනේ
ආදායම උපයාගත්තෝ ය.
q2[3] මුහුදනේ එතරෙ සියලු රටවලට නුඹලාගේ
භාණ්ඩ යවන ලදී.
4 එම්බා සීදොන් නගරය, නුඹ ලජ්ජා වන්න.
q2[4] මන්ද, සත් සමුදුරු පත්ලත් නුඹ ප්‍රතික්ෂේප
කර, "මම ප්‍රසව වේදනා නොවින්දමේ;
q2[4] දරුවන් උත්පාද නොකළෙමේ;
q2[4] තරුණ තරුණියන් ඇතිදැඩි නොකළෙමේ"යි
කියන්නේ ය.
5 තීර් විනාශ කරනු ලැබූ බව මිසර වාසීන්ට ආරංචි
වූ විට ඔවිහු තිගැස්සී ශෝක වන්නෝ ය.
6 පිනීසියේ සනෙඟනෙි, ශෝකයනේ
කෑමොරගසන්න.
q2[6] නුඹලා තර්ෂිෂ් වරායට පලා යන්න උත්සාහ
කරන්නහු ද?
7 මයෙ මීට බොහෝ ඈත කාලයක දී පිහිටුවන ලද
ප්‍රීතිමත් නගරය විය හැකි ද?
q2[7] යටත් විජිත පිහිටුවන පිණිස මුහුදින් එතරෙ
පදිංචිකාරයන් යවන ලද්දේ මේ නගරයනේ ද?
8 ලෝ වැසි සියල්ලන්ගේ ගෞරවයට පාත්‍ර වූ
රාජකීය වළෙඳුෙන් විසූ, අධිරාජ නගරයක් වූ තීර්ට
විරුද්ධ ව මයෙ යෝජනා කළෙේ කවරකේ ද?

9 ඔවුන් කළ දේ නිසා ඔවුන්ගේ අහංකාරය
නැත්තටම නැති කරන පිණිසත්, ගරුබුහුමන් ලත්
සෙනඟ නින්දාවට පමුණුවන පිණිසත් මෙසේ
යෝජනා කළේ සව් බලැති සමිඳාණෝ ය.
10 තර්ෂිෂ්හි වැසියෙනි, ගඞ්ගා දේශය වගා කරන්න,
නුඹලා ආරක්ෂා කරන්න දැන් කිසිවෙකේ නැත.
11 සමිඳුන් ස්වකීය හස්තය මුහුද හරහා දිගු කොට
රට රාජ්‍යයන් බිඳ හෙළා ඇත.
q2[11] කානාන්හි සවිමත් පවුරු විනාශ කරන ලෙස
එතුමන් අණකර ඇත.
12 "සීදොන් පුරංගනාවෙනි, නුඹේ ප්‍රීතිය දැන් ඉවර
ය.
q2[12] නුඹේ සෙනඟ පීඩා කරනු ලබති.
q2[12] ඔවුන් සයිප්‍රසයට පලා ගියත් එහි දී ඔවුන්ට
ආරක්ෂාවක් ඇති වන්නේ නැතැ"යි සමිඳාණෝ
වදාරන සේක.
13 තීර් දේශය වන සතුන් විසින් වනසනු ලබන
පිණිස මඟ පෑදුවෝ අසිරියන්වරු නොවෙති;
වැටලීමේ කොත් ගොඩනඟා තීර්හි බලකොටු
බිඳදමා නගරය සුන්බුන් කළෝ බබිලෝනිවරු ය.
14 තර්ෂිෂ්හි නාවිකයෙනි, කෑමොරගසන්න.
q2[14] මන්ද, නුඹලා විශ්වාසය තැබූ නගරය
විනාශකර ඇත.
15 රජ කෙනෙකුගේ ආයු කාලය වන අවුරුදු
හැත්තෑවක් තුළ තීර් අමතක කරනු ලැබේ. ඒ කාලය
අවසන් වූ විට තීර් මෙසේ ගයන වෙසඟනක මෙන්
වන්නී ය:
16 "අමතක වී ගිය කාලකණ්ණි වෙසඟන, නුඹේ
වීණාව රැගෙන නගරය තුළ සැරිසරන්න.
q2[16] නුඹේ පෙම්වතුන් ආපසු ඇදගන්න පිණිස
බොහෝ මිහිරි ගී ගයන්න."
17 අවුරුදු හැත්තෑව ගත වූ පසු සමිඳාණන්
වහන්සේ තීර් වැසියන්ට සිය පරණ වෙළෙඳාමට
යන්න ඉඩ හරින සේක. ඈ ලෝකයේ රට රාජ්‍යයන්
සමඟ ගනුදෙනු කරනු ඇත. 18 ඈ වෙළෙඳාමෙන්
උපයන මුදල සමිඳාණන් වහන්සේට කැප කරනු
ඇත. ඈ ඒ මුදල් රැස්කර තබා ගන්නේ නැත.
සමිඳාණන් වහන්සේ නමදින අය කෑම හා තමන්ට
වුවමනා ඇඳුම් මිලයට ගැනීමට ඒ මුදල වැය කරනු
ඇත.

### ලෝකය කෙරෙහි දේව විනිශ්චයය

24 සමිඳාණෝ පොළොව විනාශ කොට, එය
මරුකතරක් කරන සේක.
q2
24 පොළොව පෙරළාදමා, එහි වැසියන් විසුරුවා
හරින සේක.
2 සෙනඟට මෙන් පූජකයාටත්, වැඩකාරයාට මෙන්
ඔහුගේ ස්වාමියාටත්, වැඩකාරිට මෙන් ඇගේ ස්වාමි
දූටත් මිලයට ගන්නාට මෙන් විකුණන්නාටත්, ණය
දෙන්නාට මෙන් ණය ගන්නාටත්, පොළියට දෙන්නාට
මෙන් පොළියට ගන්නාටත් එසේ සිදු වන්නේ ය.
3 පොළොව සුණු විසුණු වී සහමුලින් ම පාළු
වන්නේ ය.
q2[3] මෙසේ වදාළේ සමිඳාණෝ ය.
4 මුළු පොළොව මැලවී, වියළී යන්නේ ය;
q2[4] මුළු ලෝකය අබල දුබල වන්නේ ය;
q2[4] අහසත්, පොළොවත් ජරාවාසයක් වන්නේ ය.
5 සෙනඟ විසින් දෙවිඳුන්ගේ නීති නියෝග හා
අණපණත් ද ගිවිසුම ද කඩ කරන ලද බැවින්
පොළොව දූෂණය වී ඇත.
6 එබැවින් දෙවිඳුන් පොළොව විනාශ කිරීමට
සාපයක් එවා ඇත.
q2[6] ඔව්හු තමන් කළ දේට දැන් වන්දි ගෙවෙති.
q2[6] ජීවත් වී සිටින සෙනඟගේ ගණන එන්න එන්න
අඩුවේගෙන යයි.
q2[6] ඉතිරි වන්නේ ටික දෙනෙකි.
7 මිදිවැල වියළී යයි;
q2[7] මිදියුස එන්න එන්න හීන වේ;
q2[7] කලින් ප්‍රීතියෙන් සිටි අය දැන් දුකින් කල්
යවති.
8 ඔවුන්ගේ ද වීණා හා බට නළාවල ද ප්‍රීති නාදය
දැන් නැවතී ඇත.
9 ගී ගයමින් මිදිරස බීමක් තවත් නැත.
q2[9] මද්‍යපානය බොන්නන්ට එය දැන් තිත්ත වී ඇත.
10 නගරයේ සියලු දේ අවුල් ජාලාවකි.
q2[10] කිසිවකු ඇතුළු නොවන පිණිස සියලු ගෙවල්
වසාදමා තිබේ.
11 මිනිස්සු වීථිවල මුද්‍රික පානය ඉල්ලා කෑගසති.
q2[11] ප්‍රීතිය සඳහට ම අතුරුදහන් වී ඇත.
q2[11] දේශයෙන් සන්තෝෂය පහ වී ගොස් ඇත.
12 නගරයේ ඉතිරි ව ඇත්තේ නටබුන් පමණකි.
q2[12] එහි දොරටු කඩා වැටී ඇත.
13 මුළු ලොවේ සෑම ජාතීන් අතර මෙසේ සිදු
වන්නේ ය.
q2[13] එය හරියට ඔලීව ගස්වල ද මිදි වැල්වල ද පල
කඩා නිමකළ පසු අවසාන වූ කාලය වැනි ය.
14 ඉතිරි වන අය ප්‍රීතියෙන් ගී ගයන්නෝ ය.
q2[14] බටහිර සිටින අය සමිඳුන්ගේ මහිමතාව
ප්‍රකාශ කරති.
15 මුහුදු දිවයින්වල වෙසෙන සෙනඟ
ඉශ්‍රායලේවරුන්ගේ දෙවි සමිඳුන්ට ප්‍රශංසා කරති.
16 පොළොවේ සීමාන්තවලින් ධර්මිෂ්ඨ දේශය වන
ඉශ්‍රායලේ සම්බන්ධයෙන් නඟන ප්‍රශංසා ගී අපට
ඇසෙන්නේ ය.
q2[16] එහෙත්, මම කතා කොට, "මට
බලාපොරොත්තුවක් නැත;
q2[16] මම ක්ෂය වෙමි;
q2[16] ද්‍රෝහියෝ මා පාවා දෙති.
q2[16] ඔවුන්ගේ ද්‍රෝහිකම දඟුණ තඟුණ වේ
ය"යි කියමි.
17 මිහි පිට ජනයෙනි, භයානක දේ ද බොරුවළවල්
ද මලපත් ද නුඹලා අසුකරගන්න බලා සිටියි.
18 භයානක දයෙන් බේරෙන්නේ සොයෙන තැනැත්තා
බොරු වළක වැටෙන්නේ ය.

q2[18] බෙරෙුු වළනේ ගොඩවන්නා මලපතට
අසුවන්නේ ය.
q2[18] මන්ද අහසේ කවුළු විවෘත ව ඇත.
q2[18] පොළොවේ අත්තිවාරම කම්පා වන්නේ ය.
19 පොළොව දදෙරා, සිඳී, බිඳී යන්නේ ය;
q2[19] පොළොව පැළී යන්නේ ය;
q2[19] පොළොව කම්පා වමේන් චලනය වන්නේ ය;
20 පොළොව බේබද්දකෙු මනේ වැනමේන්,
කුණාටුවකට අසු වූ පැල්පතක් මනේ සැලමේන්
පවතින්නේ ය.
q2[20] පොළොව පාපයනේ බර වී ඇත.
q2[20] එය කිසි කලක ගොඩගන්නට බැරි වන ලසෙ
බිඳී වැටනේනේ ය.
21 උඩ සිටින, ඉහළ අහසේ බල මණ්ඩලවලටත්,
පොළොවේ සිටින පාලකයන්ටත්, සමිඳුන් දඬුවම්
කරන කාලයක් පැමිණනේනේ ය.
22 හිරකාරයන් වළක හිරකොට තබන්නාක් මනේ
දවේඳාණෝ රජවරුන් සිරගත ව තබන සේක.
q2[22] දීර්ඝ කාලයකට පසු ඔවුන්ට දඬුවම් කරන්න
එන සේක.
23 එවිට, හඳ අඳුරු වන්නේ ය;
q2[23] ඉර නොබැබළනේනේ ය.
q2[23] මන්ද, සව් බලැති සමිඳුන් රජ වන බැවිනි.
q2[23] එතුමාණෝ ජරේුසලමේ සියොන් කන්ද
මුදුනේ, රජකම් කරන සේක.
q2[23] එතුමන්ගේ තේජාලංකාරය ප්‍රජා මූලිකයන්
අබිමුව ප්‍රකාශ වන්නේ ය.

## ප්‍රශස්ති ගීයක්

25 සමිඳුනි, ඔබ මා දවේඳාණෝ ය.
q2
25 ඔබේ නම ගෞරවයනේ උසස් කොට
පසසන්නමේ.
q2
25 ඔබ පුදුම දේ කර ඇත.
q2
25 පරෙ ඔබ අදහස් කළ දේ විශ්වාස ලසෙ ද
සැබෑ ලසෙ ද ඔබ ඉටු කරන සේක.
2 ඔබ නගරය සුණු විසුණු කර බලකොටු නටබුන්
ගොඩක් කළ සේක.
q2[2] අපේ සතුරන් ගොඩනැඟුවා වූ මාලිගා සඳහට
ම විනාශ වී ගොස් ඇත.
q2[2] ඒවා කවදාවත් යළි ඉදි නොකරනු ලැබේ.
3 බලවත් ජාතීන්ගේ සනෙඟ ඔබට ගෞරව කරති.
q2[3] කුරිරු ජාතීන්ගේ නගර ඔබට බිය වයේි.
4 දුගී අසරණ අයට ඔබ රැකවරණය වූ සේක;
q2[4] කම්කටොලු ඇති කාලවල දී ඔවුන්ට
බලකොටුවක් වූ සේක;
q2[4] කුණාටුවේ දී ආරක්ෂාවත්, තද ග්‍රීෂ්මයේ දී
සවෙණත් ඔබ ඔවුන්ට දුන් සේක.
5 නපුරු අය ශීත ඍතුවේ කුණාටුවක් මනේ ද වියළි
දේශයක නියඟයක් මනේ ද ඔවුන්ට පහර දති.
q2[5] එහතේ සමිඳුනි, වලාකුළක් තද අවු රශ්මිය පහ
කරන්නාක් මනේ ඔබ අපේ සතුරන් ද නපුරු
සනෙඟගේ කෑමොරගැසීම් ද නිහඬ කළ සේක.

## ජාතීන්ට මංගල භෝජනයක්

6 සියලු බලැති සමිඳාණන් වහන්සේ මේ සියොන්
කන්ද මත සියලු ජාතීන් හට ඉස්තරම් මුද්රික
පානයනේ හා රසමසවුලින් යුත් මංගල භෝජනයක්
සූදානම් කරන සේක. 7 මහෙි දී උන් වහන්සේ සියලු
ජාතීන් වසාගනෙ පැවති දුක නමැති වලාකුළ
පහකරන සේක. 8 1 කොරි 15:54; එළිද 7:17;
21:4මහෝත්තම දවේ ස්වාමීන් වහන්සේ මරණය
සදහට ම විනාශ කරදමන සේක. සියලු මුහුණුවලින්
කඳුළු පිසදමන සේක. ලොව මුළුල්ලේ තමන්ගේ
සනෙඟට ඇති වී තිබනෙ නින්දාව පහකරන සේක.
මසෙේ වදාරන්නේ සමිඳාණන් වහන්සේ ම ය.
9 එසේ සිදු වූ විට සියලු දනෝ මසෙේ කියනු
ඇත. “බලන්න, මේ අපේ දවේයන් වහන්සේ ය; උන්
වහන්සේ අප ගළවා ගන්න සේකැ යි
බලාපොරොත්තුවනේ සිටියමෙු. උන් වහන්සේ අපේ
සමිඳාණන් වහන්සේ ය. උන් වහන්සේ අප
ගළවාගත් බැවින් අපි ප්‍රීති සන්තෝෂ වන්නමෙු.”

## මෝවබ් දේශය දඬුවම් කරනු ලැබීම

10 සමිඳාණන් වහන්සේ සියොන් කන්ද ආරක්ෂා
කරන සේක. එහතේ, මෝවබ් සනෙඟ කසළ
ගොඩේ පිදුරු මනේ මඩිනු ලබන්නෝ ය. 11 යසො
15:1—16:14; ජරෙ 48:1-47; එසකි 25:8-11; ආමො
2:1-3; ශපෙ 2:8-11පීනන්නකෙු පිනන්නට අත්
විදහන්නාක් මනේ ඔව්හු තමන්ගේ අත් විදහා
පාන්නෝ ය. එහතේ, දවේයන් වහන්සේ ඔවුන්ගේ
උඩඟුකම නිසා දක්ෂතාව පහත් කරන සේක.
එබැවින් ඔවුන්ගේ ප්‍රයත්න නිෂ්ඵල වනු ඇත.
12 සමිඳාණන් වහන්සේ උස් පවුරු සමඟ මෝවබ්හි
බලකොටු සිඳ බිඳදමන සේක. ඒවා දූවිල්ලහෙි
හළොදමන සේක.

## දවේයන් වහන්සේගේ සනෙඟට ජය

26 ජුදා දේශයහෙි සනෙඟ මේ ගීය ගයන
කාලයක් පැමිණනේනේ ය.
q2
26 අපට බලවත් නුවරක් ඇත.
q2
26 කොටු පවුරු බැඳ අප රැකගන්නේ
දවේඳාණෝ ම ය.
2 හරි දේ කරන සනෙඟක් වන විශ්වාසවන්ත
ජනතාවට දේශයට ඇතුළු වීමට හැකි වන ලසෙ
වාසල් දොරටු හරිනු මැනව.
3 තිරසර අරමුණු ඇති ව, ඔබ කරෙහෙි විශ්වාසය
තබන සියලු දනො හට ම සමිඳුනි, ඔබ සදා
ශාන්තිය දනෙ සේක.
4 සදහට ම සමිඳුන් කරෙේ විශ්වාසය තබන්න.
q2[4] එතුමාණෝ ඔබ හැමදා ආරක්ෂා කරන සේක.

5 එතුමාණෝ උඩඟු අය පහත් කළ සේක;
q2[5] ඔවුන් විසූ බලවත් නගර බිඳ හළේ සේක.
q2[5] එහි පවුරු පාඩිපට්ටම් කොට දූවිල්ලට ඇද
දැමූ සේක.
6 පීඩිත වූවෝ ඒ මත දැන් ඇවිදිති.
q2[6] ඔවුන්ගේ පාදවලින් ඔව්හු ඒවා පාගාදමති.

## දෙවිඳුන්ගේ යුක්තිය ගැන පැසසුම්

7 සමිඳුනි, ඔබ දමිටුන්ගේ මාර්ගය සූදානම් කර
ඇත;
q2[7] ඔවුන් යන මඟ සමතලා කර ඇත.
8 අපි ඔබ කැමැත්ත අනුව යමු;
q2[8] අපගේ බලාපොරොත්තුව ඔබ කෙරෙහි ය.
q2[8] අපගේ මුළු ආසාව ඔබගේ නම පැසසුම ය.
9 රාත්‍රියේ දී මාගේ මුළු සිතින් මම ඔබට ආසා
කරමි.
q2[9] ඉතා ආශාවෙන් අලුයම් වේලේ මම ඔබ
සොයන්නෙමි.
q2[9] ඔබ පොළොව සහ එහි සෙනඟ විනිශ්චය
කරන කල යුක්තිය කුමක් දැ යි ඔව්හු දැනගන්නෝ
ය.
10 දුෂ්ටයන්ට ඔබ කරුණාව පෑවත්, යුක්තිය කුමක්
දැ යි ඔව්හු කිසි කලෙක ඉගෙන නොගනිති.
q2[10] දමිටු අය සිටින මේ දේශයෙහි වුව ද තවමත්
ඔව්හු වැරදි කරන්නෝ ය.
q2[10] ඔබගේ මහිමතාව ඔව්හු නොපිළිගන්නෝ ය.
11 හබේරු 10:27 ඔවුන්ට දඬුවම් කිරීමට ඔබගේ
හස්තය එසවී ඇත.
q2[11] එහෙත්, ඔව්හු ඒ බව නොදනිති.
q2[11] සමිඳුනි, ඔවුන් ලජ්ජාවට පමුණුවා ඔවුන් දුකට
පත් කළ මැනව.
q2[11] ඔබ අදහස් කළ දඬුවමින් ඔව්හු දුක් විඳිත් වා!
q2[11] ඔබගේ සෙනඟට ඔබ කෙතරම් ප්‍රේම කරන
සේක් දැ යි ඔවුන්ට පෙන්වුව මැනව.
12 සමිඳුනි, ඔබ අපට සෞභාග්‍යය දෙන සේක.
q2[12] අප ඉෂ්ට කරන හැම දේ ඔබගේ ක්‍රියාවේ
ප්‍රතිඵලයකි.
13 අපගේ දේව ස්වාමීනි, ඔබ හැර අන් ස්වාමිවරු ද
අප පාලනය කළෝ ය.
q2[13] එහෙත්, ඔබ පමණක් ස්වාමිහු ය.
q2[13] ඔබගේ නාමය පමණක් අපි පිළිගනිමු.
14 දැන් ඔවුන් මිය ගොස් ඇත;
q2[14] නැවත ජීවත් වන්නේ නැත.
q2[14] ඔවුන්ගේ අවතාර වත් නැඟිට එන්නේ නැත.
q2[14] ඔවුන්ගේ නාමය සිතින් මැකී ගොස් ඇත.
15 සමිඳුනි, ඔබ අපගේ ජාතිය වර්ධනය කළ සේක;
q2[15] දේශයේ සීමා විශාල කළ සේක.
q2[15] මේ නිසා ඔබට ගෞරවය ලැබී ඇත.
16 සමිඳුනි, ඔබ සිය සෙනඟට දඬුවම් කළ විට,
ඔව්හු දුක් බරින් ඔබ සොයමින් ඔබට යාච්ඤා
කළහ.
17 එසේ ය සමිඳුනි, වේලාව පැමිණි විට,
ගර්භණියක ප්‍රසව වේදනාවෙන් කෑගසන්නාක්
මෙන් කෑගැසීමට ඔබ අපට සැලැසූ සේක.
18 ගර්භණියක මෙන් කටුක වේදනා වින්ද නමුත්,
අපි කිසිවක් බිහි නොකෙළෙමු;
q2[18] අපගේ මවුබිම උදෙසා කිසිදු ජයක් නොලැබීමු.
q2[18] කිසි ම දෙයක් ඉෂ්ට නොකෙළෙමු.
19 දානි 12:2 අපගේ මළ ගිය අය නැවත ජීවත් වනු
ඇත;
q2[19] ඔවුන්ගේ මළ සිරුරු නැවත පණ ගැන්වෙනු
ඇත.
q2[19] සොහොන්වල සැතපී සිටින සියලු දෙන පිබිද
ප්‍රීතියෙන් ගී ගයත් වා!
q2[19] බැබළෙන පිනි පොළොව ප්‍රාණවත් කරන සේ
බොහෝ කලක් මැරී සිටින අය සමිඳාණෝ නැවත
පණ ගන්වන සේක.

## විනිශ්චයය හා පුනරුත්ථාපනය

20 මාගේ සෙනඟෙනි, නුඹලාගේ ගෙවලට ඇතුළු
වී, දොරවල් වසාගෙන, දෙවිඳුන්ගේ කෝපය
සංසිඳෙන තුරු ස්වල්ප කලක් සැඟවී සිටින්න!
21 ලෝ වැසි සියලු දෙනාට ඔවුන්ගේ පව් නිසා
දඬුවම් කරන පිණිස සමිඳාණෝ වඩින සේක;
q2[21] රහසින් කරන ලද මිනීමැරුම් එළි කරනු
ලබන්නේ ය.
q2[21] පොළොව, මැරුම් කෑ අය තවත්
නොසඟවන්නේ ය.

## දේව විනිශ්චයය පිළිබඳ උපමා

27 ජොබ් 41:1; ගීතා 74:14; 104:26 ඒ දවසේ දී
සමිඳාණන් වහන්සේ තමන්ගේ දැඩි, බලවත්,
භයානක කඩුවෙන් ශීඝ්‍රයෙන් වක් වෙමින් යන
ලෙවියාතන් නම් මුහුදු සර්පයාට දඬුවම් කර, මුහුදේ
සිටින දිය රකුසා මරාදමන සේක.
2 ඒ දවසේ දී සමිඳුන්ගේ පියකරු මිදි වත්ත ගැන
මෙසේ කියනු ඇත:
3 “එහි රැකවරණයාණෝ සමිඳාණන් වන මම ය.
q2[3] මම එය ජලයෙන් නිතර සාරවත් කරන්නෙමි.
q2[3] කිසිවකු එයට හානි නොකරන පිණිස මම එය
මුර කරන්නෙමි.
4 කෝප වීමට ඉඩක් නැත;
q2[4] කටු ගොකටු පිරිණි නම්, ඒවා උගුලා, ගිනි තබා
විනාශ කරන්න තිබිණි.
5 එයට දෙන ආරක්ෂාවට ගරුකර, මා සමඟ සාමය
ඇති කරගනිත් වා!
q2[5] මා සමඟ සාමය ඇති කරගනිත් වා!”
6 ඒ දවසේ දී ජාකොබ්ගේ පරම්පරාව වන
ඉශ්‍රායලේ සෙනඟ දලු ලා මල් හටගන්න ගසක්
මෙන් මුල් ඇදගන්නේ ය.
q2[6] පොළොව පලදාවෙන් පිරී යන්නේ ය.
7 ඉශ්‍රායලේවරුන්ගේ සතුරන්ට සමිඳුන් දැඩි ලෙස
දඬුවම් කළාක් මෙන් ඉශ්‍රායලේටත් දඬුවම් කර ඇද්
ද?

q2 7 ඔවුන් මරණයට පත් කළ සතුරන් විනාශ කළාක්
මෙන් ඔවුනුත් විනාශ කර ඇද් ද?
8 සමිඳාණෝ සිය සෙනග වහල්කමට යවමින්
ඔවුන්ට දඬුවම් කළ සේක;
q2 8 නැගෙනහිරින් හැමූ අකුණු සුළඟකින් ඔවුන්
පහකර දැමූ සේක.
9 විජාතීන්ගේ පූජාසනවල සියලු ගල් රටහුණු මෙන්
අඹරාදැමූ පසු ද අෂේරා කප් කණු, දුම් පූජාසන හා
හිරු දෙවි රූප තවත් ඉතුරු නොවූ පසු ද
ඉශ්රායලේගේ පව් කමා කරනු ලබන්නේ ය.
10 බලකොටුවලින් ආරක්ෂා කරන ලද නුවර
නටබුන් වී ඇත;
q2 10 පාළු කාන්තාරයක් මෙන් එය ජනහීන වී ඇත.
q2 10 වස්සා එහි තණ කනු ඇත;
q2 10 එහි ලැග අතු බුදිනු ඇත.
11 ගස්වල අතු වියළී කැඩී ගොස් ඇත.
q2 11 ස්ත්රීහු ඒවා දරට එකතු කරති.
q2 11 සෙනග කිසිවක් තේරුම්ගෙන නැති නිසා,
ඔවුන්ගේ මැවුම්කාර දෙවිඳුන් ඔවුන්ට අනුකම්පා
කරන්නේ වත්, දයාවපාන්නේ වත් නැත.
12 ඒ දවසේ දී සමිඳාණන් වහන්සේ ම රටේ එක
කොණක සිට අනික් කොණ දක්වා, යුප්රටීස් සිට
නයිල් ගඟ දක්වා උන් වහන්සේගේ ඉශ්රායලේ
සෙනග රැස් කොට විනිශ්චයය කරන සේක. උන්
වහන්සේ හොඳ ධාන්ය බොල්වලින් වෙන්
කරන්නාක් මෙන් සුදනන් දුදනන්ගෙන් වෙන් කරන
සේක.
13 ඒ දවස පැමිණි විට අසිරියාවේ හා මිසරයේ
වහල්කමට ගෙන යන ලද සියලු ඉශ්රායලේ සෙනග
ආපසු ගෙනෙනු ලබන පිණිස හොරණෑවක් පිඹිනු
ලබන්නේ ය. ඔවුන් ජෙරුසලමට අවුත් උන්
වහන්සේගේ මේ ශුද්ධ කන්දේ දී උන් වහන්සේට
නමස්කාර කරනු ඇත.

## උතුරේ පිහිටි රාජ්යයට තර්ජනයක්

28 ඉශ්රායලේ රාජ්යයට වන විපතක මහත!
q2
28 ඔවුන්ගේ උඩඟු හිස්වල තේජාලංකාරය මල්
කිරුළු මෙන් පරවී යන්නේ ය.
q2
28 එහතේ, ඔව්හු හොඳට ම වෙරි වී වැතිර
සිටිති.
2 ඔවුන්ට පහර දෙන පිණිස සමිඳුන් ශක්තිමත්,
බලවත් කෙනෙකු සූදානම් කර ඇත.
q2 2 ඔහු, ගල් වැස්සක් මෙන් ද වැහි කුණාටුවක්
මෙන් ද ගසාගෙන යන මහා ජල ගැලීමක් මෙන් ද
මුළු දේශය සම්පූර්ණයෙන් යටත් කරන්නේ ය.
3 බේබදු නායකයන්ගේ අහංකාරය පයින් පාගනු
ලබන්නේ ය.
4 ඒ අහංකාර නායකයන්ගේ තේජස පරවී යන
මලක් මෙන් මැලවී යන්නේ ය;
q2 4 අත්තික්කා වාරයේ පළමුවෙන් හටගෙන ඉදුණු
පල නළොගත් වහා ම කාදමනු ලබන්නාක් මෙන්
පහ ව යන්නේ ය.
5 සව් බලැති සමිඳුන් ඉතිරි ව සිටින තමන්ගේ
සෙනගට තේජාලංකාර මල් කිරුළක් ද දීප්තිමත්
කිරීටයක් ද මෙන් වන කාලයක් පැමිණෙන්නේ ය.
6 එතුමාණෝ විනිශ්චයකාරයන්ට යුක්තිය පිළිබඳ
හැඟීමක් ද නගරයේ දොරටුවලට පහර දෙන
සතුරන් පලවා හරින අයට ධෛර්යය ද දෙන සේක.

## ජුදාවේ බොරු දිවැසිවරයන් හා පූජකයන්

7 දිවැසිවරුන් හා පූජකයෝ පවා කළෙන් සිටින්න
බැරි තරම් වෙරිමත් වී වැනෙති.
q2 7 ඔවුන් මුද්රික පානය හා සුරා පානය කොතරම්
බී ඇද්ද යි කීවොත්, ඔව්හු වියවුල් වී පැකිළෙන්නෝ
ය.
q2 7 දෙවිඳුන් එවන දර්ශන තේරුම්ගන්න නොහැකි
තරමට දිවැසිවරු වෙරි වී සිටිති.
q2 7 පූජකයන් වෙත ගෙනෙන නඩු විභාග කිරීමට
නොහැකි තරමට පූජකයෝ වෙරි වී සිටිති.
8 ඔවුන් වාඩි වී සිටින මේස වමනයෙන් පිරී ඇත;
q2 8 පිරිසිදු එක ම තැනක් වත් නැත.
9 ඔව්හු මට චෝදනා කරමින් මෙසේ කියති:
q2 9 "ඔහු දහම උගන්වන්න එන්නේ කාට ද?
q2 9 ඔහුගේ පණිවුඩය වුවමනා කාට ද?
q2 9 එය සුදුසු වන්නේ කිරි වැරූ දරුවන්ට පමණ යි.
10 ඔහු උත්සාහ කරන්නේ දරුවන්ට මෙන් අපට
පේළියෙන් පේළියට පාඩමෙන් පාඩම උගන්වන්න
යි."
11 1 කොරි 14:21 මේ සෙනග මට සවන් දෙන්නේ
නැත්නම්, ඔවුන්ට පාඩමක් උගන්වන පිණිස අමුතු
භාෂාවක් කතා කරන විදේශිකයන් දෙවිඳුන් පාවිච්චි
කරනු ඇත.
12 වෙහෙස වූ ඔබට විවේකයත්, සැප පහසුවත්
දෙන්න එතුමන් පොරොන්දු වූ නමුත්, එතුමන්ට
සවන් දෙන්න ඔබ කැමැති නොවූවහු ය.
13 ඒ නිසා සමිඳාණෝ, ඔබට අකුරෙන් අකුර,
පේළියෙන් පේළිය, පාඩමෙන් පාඩම, උගන්වන්න
යන සේක.
q2 13 එවිට ඔබ ගන්න පියවරෙන් පියවර
පැකිළෙන්නහු ය.
q2 13 ඔබ තුවාළ ලබන්නහු ය;
q2 13 මලපතකට අසු වී හිරකරුවන් මෙන් ගෙනයනු
ලබන්නහු ය.

## සියොන් නගරයට අත්තිවාරම් ගලක්

14 ජෙරුසලමේ සිටින, එහි සෙනග පාලනය කරන
අහංකාර මනුෂ්යයෙනි, සමිඳුන් වදාරන වචනයට
සවන් දෙන්න.
15 ඔබ මරණය සමඟ ගිවිසුමක් කර ඇතැ යි ද
පාතාල ලෝකය සමඟ එකඟත්වයකට පත්වී ඇතැ
යි ද පාරට්ටු කරගන්නහු ය.

q215 ඔබගේ ආරක්ෂාව සඳහා ඔබ බොරුවත්,
වංචාවත් කරෙහෙි විශ්වාසය තබා ඇති බැවින්
විපත්ති පැමිණෙනෙ විට එයින් ඔබ බේරෙනෙු ඇතැ යි
ඔබ සිතන්නහු ය.
16 ගීතා 118:22-23; රෝම 9:33; 10:11; 1 පේදු 2:6
ඒ නිසා මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ ඔබට
මෙසේ වදාරන සේක:
q216 "තිරසර සවි ශක්ති ඇති අත්තිවාරමක් මම
සියොන්හි තබන්නමේ.
q216 එහි මම අනගි කොන් ගලක් තබන්නමේ.
q216 එහි මගේ වචන කොටා ඇත:
q216 'තිර ඇදහිල්ල ඇත්තෝ නොසැලතේ.'
17 අත්තිවාරම මනින ලණුව යුක්තිය නම් වේ.
q217 ලඹ ලණුව අවංකකම නම් වේ.
q217 නුඹලා විශ්වාසය තබා ඇති බොරු සියල්ල ගල්
වර්ෂාවට ගසාගෙනෙ යන්නේ ය;
q217 නුඹලාගේ ආරක්ෂාව ජල ගැල්මනේ විනාශ
වන්නේ ය."
18 එවිට ඔබ මරණය සමඟ කරගත් ගිවිසුම කඩ
කරන්නහු ය;
q218 පාතාල ලෝකය සමඟ කරගත් එකඟත්වය
අවලංගු කරන්නහු ය.
q218 කඩාගෙනෙ, බිඳගෙනෙ එන විපත්තිය පැමිණි විට
ඔබ එයින් ගසාගෙනෙ යනු ලබන්නහු ය.
19 එයින් ඔබට නැවත නැවත, උදයක් උදයක් පාසා
පහර වදින්නේ ය.
q219 රූ දාවල් දෙකේහි එය විඳින්න ඔබට සිදු
වන්නේ ය.
q219 මගේ ගැන දෙවිඳුන්ගනේ පණිවුඩයක් ලැබනෙ
සැම විට ම ඔබ භීතියනේ ඇලළී යන්නහු ය.
20 ඔබ වනාහි දිගා වන්න බැරි ඇඳේ දිගා වීමට
හදන, පටු ඇතිරිල්ල පොරොවා ගන්න යන මිනිසා හා
සමාන ය.
21 ජෝෂු 10:10-12; 2 සාමු 5:20; 1 වංශා 14:11
සමිඳාණෝ තමන් කරන්න අදහස් කළ පුදුම ක්රියා
මනේ පනෙනෙ දේ ඉෂ්ට කරන පිණිස,
q221 පෙරොසිම් කන්දේ දී හා ගිබියොන් මිටියාවතේ
දී සටන් කළාක් මනේ සටන් කරන සේක.
q221 එය අබිරහස් ක්රියාවකි.
22 මා ඔබට දනෙ අනතුරු ඇඟවීම් ගැන ඉතින්
සරදම් නොකරන්න.
q222 ඔබගේ අත්අඩංගු තවත් තද වනු ඇත.
q222 මුළු දේශය විනාශ කිරීමට සවි බලැති සමිඳුන්
කර ඇති තීරණය මා අසා ඇත.

## දෙවියන් වහන්සේගේ ප්රඥාව

23 ඔබ කන් යොමුකර මා කියන දේට සවන්
දනේන;
q223 මාගේ පණිවුඩය අසන්න.
24 කිසි ම ගොවියකේ වපුරන පිණිස සෑම දා ම
කතෙ හාමින්, සූදානම් කරමින් කල් නොයවන්නේ
ය.
25 කතෙ සූදානම් කරගත් විට, ඔහු කොල්ලු හා දුරු
එහි වපුරන්නේ ය.
q225 තිරිඟු හා බාර්ලි පේළි වශයනේ එහි
සිටුවන්නේ ය.
q225 කතෙේ මායිම්හි සෙසු වර්ගවල බීජ පැළ
කරන්නේ ය.
26 දෙවිඳුන් ඔහුට උගන්වා ඇති බැවින් තමාගේ
වැඩය කිරීමට ඔහු දනියි.
27 උළුහාල් සුද්ද කරන පිණිස බර මුගුරක් වත්,
කරත්ත රෝදයක් වත් පාවිච්චි කරන්නේ නැත.
q227 ඒ වනෙුවට සුදුසු ප්රමාණයේ සැහැල්ලු කෝටු
පාවිච්චි කරයි.
28 ඔහු තිරිඟු පමණට වඩා පාගා ඒවා නාස්ති
කරන්නේ නැත.
q228 ධාන්ය කුඩු නොවන ලසෙ රථයකින් ඒවා
පාගන්න ඔහු දනියි.
29 මගේ සියලු ප්රඥාව පැමිණනේනේ සවි බලැති
දෙවිඳුන්ගනේ ය.
q229 එතුමන්ගේ සැලසුම් ප්රඥාවන්ත ය.
q229 ඒවා නිරතුරු සාර්ථක වනු ඇත.

## ජරෙුසලමේ ඉරණම

29 දෙවිඳුන්ගේ පූජාසනය වන ජරෙුසලම, ඔබට
වන විපතක මහත!
q2
29 දාවිත් රජු කඳවුරු බැඳගනෙ සිටි නගරයට
වන විපතක මහත!
q2
29 මංගල්යයන් හා පූජා උත්සවයන් සමඟ තවත්
අවුරුද්දක් දකෙක් ගත වුණාවේ.
2 ඉන්පසු දෙවිඳුන්ගේ පූජාසනය ලසෙ හැඳින්වනෙ
ජරෙුසලම පිට එතුමාණෝ විපත්තිය පමුණුවන
සේක.
q22 එකල හැඬීමත් වැලපීමත් ඇති වන්නේ ය.
q22 නගරය වුව ද, පූජාසනයක් බවට හරවනු ලැබ
එය ගල්වලින් වැසී යන්නේ ය.
3 දෙවිඳාණෝ නගරයට පහර දී බලකොටු සමඟ
එය වටලන සේක.
4 ජරෙුසලම, පොළොව යට සිට කතා කරන්න
දඟලන අවතාරයක් මනේ ද දූවිල්ලනේ නැඟී එන
මුකවාඩමක් දමන ලද හඬක් මනේ ද වන්නේ ය.
q24 ගැඹුරු පොළෝ තලයනේ ඔබගේ හඬ
ඇසනේනේ ය;
q24 දූවිල්ල යටින් ඔබගේ වචන නික්මනේනේ ය.
5 එහතේ, එම්බා ජරෙුසලම!
q25 ඔබට පහර දනෙ විදේශීන් සියලු දනෙ දූවිල්ල
මනේ ගසාගෙනෙ යනු ඇත;
q25 ඔවුන්ගේ භයානක හමුදා පිදුරු මනේ පහ වී
යනු ඇත.
6 සවි බලැති සමිඳාණෝ ගර්ජනාවනේ ද මහත්
ශබ්දයකින් ද සුළි සුළඟකින් ද කුණාටුවකින් ද
විනාශකාරී ගින්නකින් ද ප්රකාශ වන සේක.

7 එවිට දෙවියන්ගේ පූජාසනය වන නුවරට පහර
දෙන ජාතීන්ගේ සියලු හමුදා ද ඔවුන්ගේ අවි ආයුධ
හා උපකරණ සියල්ල ද සිහිනයක් මෙන්, රාත්‍රියේ
මවාගත් සිතිවිලි මාත්‍රයක් මෙන්, පහ වී යනු ඇත.
8 ජෙරුසලමට පහර දෙන්නේ රුස්වන සියලු ජාතීහු
සිහිනයේ කෑම කා, බඩගින්නෙන් ඇවිදින,
සාගින්නෙන් පෙළෙන, මිනිසකු හා සමාන වෙති.
q2 8 නැතහොත්, සිහිනයේ වතුර බී, වියළි උගුරක්
ඇති ව ඇවිදින, පිපාසයෙන් මිය ඇදෙන, මිනිසකු
හා සමාන වෙති.

### අනතුරු හැඟවීම නොතැකීම

9 ඉබාගාතේ ඇවිද ක්ලාන්ත වන්න;
q2 9 සැප විඳ අන්ධ වන්න;
q2 9 මඳක් වත් මිදියුස නොබී මත් වන්න;
q2 9 බීඳක් වත් නොබී වැනි වැනී යන්න.
10 රෝම 11:8 සමිඳුන් ඔබ තද නින්දට වැටෙන
ලෙස ඔබ කෙරෙහි නිදිබර ගතිය ඇතිකර තිබේ.
q2 10 දිවැසිවරුන් සෙනඟගේ දෙනෙත් මෙන්, විය යුතු
නමුත්, දෙවියන් ඔවුන්ගේ ඇස් බැඳ ඇත.
q2 10 බොරු දිවැසිවරුන්ගේ මොළය අවුල්කර ඇත.
11 හැම දිවැස් දර්ශනයක ම තේරුම ඔබෙන්
සඟවා ඇත. එය බැඳ මුද්‍රා කරන ලද පොතක් හා
සමාන ය. එය අකුරු දන්න කෙනෙකු වෙත ගෙන
ගොස්, එය කියවන ලෙස ඔහුගෙන් ඉල්ලූ විට, එය
මුද්‍රාකර ඇති නිසා කියවිය නොහැකි යයි ඔහු
කියනු ඇත. 12 අකුරු නොදන්න කෙනෙකු වෙත
ගෙන ගොස් එය කියවන ලෙස ඔහුගෙන් ඉල්ලූ විට
එය කියවන්න ඔහු නොදනිති යි ඔහු කියනු ඇත.
13 මතෙ 15:8-9; මාක් 7:6-7 සමිඳාණෝ මෙසේ
වදාළ සේක:
q2 13 “මේ සෙනඟ මට නමස්කාර කරන්නේ
වචනයෙන් පමණකි.
q2 13 ඔවුන්ගේ සිත් මා වෙත යොමු වී නැත.
q2 13 ඔවුන්ගේ ආගම වනාහි කටපාඩම් කරගත්
මනුෂ්‍ය නීතිරීති හා පාරම්පරික සම්ප්‍රදායයෝ
පමණකි.
14 1 කොරි 1:19 එබැවින් ඔවුන් නොපෙනූ අරුමපුදුම
දේ මම කරන්නෙමි;
q2 14 ඔවුන්ගේ ඥානවන්තයන්ගේ තේරුම්ගැනීමේ
ශක්තිය නැති වී යන්නේ ය;
q2 14 ඔවුන්ගේ උගත්තු නූගත්තු වන්නෝ ය.”

### ව්‍යාජ උපදේශකයෝ

15 තමන්ගේ අදහස් සඟවාගන්න උත්සාහ කරන
අයට වන විපතක මහත!
q2 15 ඔව්හු රහසේ තමන්ගේ උපායයන් යොදමින්,
කිසිවකු ඔවුන් දකින්නේ වත්, ඔවුන් කරන දේ
දැන ගන්නේ වත් නැතැ යි සිතති.
16 යෙසා 45:9 ඔව්හු කාරණා නොපිට පෙරළති.
q2 16 වඩා වැදගත් වන්නේ කුම්භකාරයා ද මැටි ද?
q2 16 මිනිසකු සෑදූ දෙයකට, ‘නුඹ මා සෑදුවේ නැත’
කියා හෝ ‘නුඹ කරන දේ නුඹ නොදන්නෙහි ය’
කියා හෝ මිනිසා අමතමින් කිව හැකි ද?
17 එසේ කීම, ‘වනයක් උයනක් බවට ද උයනක්
වනයක් බවට ද පත්වීම වැනි ය’ යන කියමනට
සමාන ය.
18 ඒ දවස පැමිණි විට පොතකින් කියවන විට
බිහිරන්ට ඇසෙනු ඇත.
q2 18 අඳුරෙහි ජීවත් වූ අන්ධයින්ට ඇස් පෙනීම
ලැබෙනු ඇත.
19 දුප්පත් සහ යටහත් පහත් අය ඉශ්‍රායලේහි
ස්වාමීන් වන ශුද්ධ තැනැන් වහන්සේ දෙන ප්‍රීතිය
නැවත ලබන්නෝ ය.
20 ඒ දවස වනාහි බලහත්කාරකම් කරන,
දෙවියන්ට අපහාස කරන අයගේ අවසානය වේ.
q2 20 හැම පව්කාරයෙකු ම විනාශ කරනු ලබයි.
21 අනුන්ට වචනයෙන් නින්දා කරන අය ද
අපරාධකාරයන් ලැබිය යුතු දඬුවමින් ඔවුන්
වළක්වන අය ද අවංක අයට යුක්තිය නොලැබෙන
සේ බොරු කියන අය ද දෙවිඳාණෝ විනාශ කරන
සේක.
22 ආබ්‍රහම් විපතින් මුදාගත් ඉශ්‍රායලේවරුන්ගේ
දෙවියන් වන සමිඳාණෝ දැන් මෙසේ වදාරන සේක:
q2 22 “මාගේ සෙනඟෙනි, තවත් නුඹලා ලජ්ජාවට
පත් කරනු නොලබන්නහු ය.
q2 22 නුඹලාගේ මුහුණ ලජ්ජාවෙන් සුදුමැළි
නොවන්නේ ය.
23 මා නුඹලාට දෙන දරුවන් නුඹලා දකින්නහු ය.
q2 23 එවිට මා, ඉශ්‍රායලේහි ශුද්ධ තැනැන් වහන්සේ
බව නුඹලා දැනගන්නහු ය.
q2 23 නුඹලා මට ගෞරව කොට මා කෙරෙහි
ගරුබියෙන් සිටින්නහු ය.
24 වියවුල් ව සිටින අයට තේරුම්පැහැදුම් ඇති
වන්නේ ය.
q2 24 මැසිවිලි කියන අය ඉගෙනගන්න සතුටු
වන්නෝ ය.”

### මිසරය සමඟ කළ, වැඩකට නැති ගිවිසුම

30 සමිඳාණෝ මෙසේ වදාළ සේක: “ජුදා
දේශය පාලනය කරන අය මට විරුද්ධ ව
කැරලි ගසන බැවින් ඔවුන්ට වන විපතක මහත!
q2
30 ඔව්හු පව් පිට පව් කරමින් මා නොකළ
සැලසුම අනුගමනය කරති.
q2
30 මාගේ කැමැත්තට විරුද්ධ ව ගිවිසුම්වලට
අත්සන් කරති.
2 මාගෙන් උපදෙස් නොගෙන ඔව්හු උපකාර ලබන
පිණිස මිසරයට යති.
q2 2 ඔවුන් මිසරයේ ආරක්ෂාව පතන නිසා එහි
රජවරුන්ගේ රැකවරණය කෙරෙහි ඔව්හු විශ්වාසය
තබති.

3 එහතේ, ඔවුන් උදව් පතන රජු ද රුකවරණය
පතන මිසරය ද ඔවුන් නින්දාවට හා විපතට පත්
කරනු ඇත.
4 ඔවුන්ගේ තානාපතීන් දැනටමත් ශාොවන් හා
හානේස් නම් මිසරයේ නගරවලට පැමිණ ඇත.
5 එහතේ, ජුදාවේ සනෙඟ විශ්වාස කළ නාොහැකි
පිහිට උපකාර බලාපාොරාොත්තු වූ නමුත්, එය දීමට
නාොහැකි ජාතියක් කරෙහෙි විශ්වාසය තැබූ නිසා
ඔව්හු ශාෝකයට හා විපතට පත් වන්නාෝ ය."
6 දකුණු දිග පාළුකරයේ මෘගයන් ගැන දවේඳුන්ගේ
පණිවුඩය මසෙේ ය:
q2 6 "සිංහයන් ද විසකුරු සර්පයන් ද ඉගිලනෙ ගිනි
සර්පයන් ද සිටින භයානක දේශයක් මැදින්
තානාපතීහු ගමන් කරති.
q2 6 ඔව්හු කාොටළුවන් ද ඔටුවන් ද පිට අනර්ඝ
වටිනා තෑගි බාෝග පටවාගනෙ ඔවුන්ට පිහිට
උපකාර දිය නාොහැකි ජාතියක් වතෙ යති.
7 මිසරය දනෙ උපකාරයනේ වැඩක් නැත.
q2 7 ඒ නිසා මා මිසරයට, 'පඹ මකරා ය'යි කවට
නමක් දී ඇත."

## අකීකරු සනෙඟ

8 සනෙඟගේ ස්වභාවය සම්බන්ධයනේ ඔවුන්ට
විරුද්ධ ව ගල් පුවරුවක සටහන් කරන්න.
q2 8 ඔවුන් ගැන විස්තරයක් අනාගතයට සදා
සාක්ෂියක් මනේ පවතින ලසෙ පාොතක ලියා
තබන්න කියා දවේඳාණාෝ මට වදාළ සේක.
9 ඔව්හු හැම වේලේ ම දවේඳුන්ට විරුද්ධ ව කැරලි
ගසති;
q2 9 හැම වේලේ ම බාොරු කියති;
q2 9 හැම වේලේ ම සමිඳුන්ගේ ඉගැන්වීම්වලට
සවන් දනේන අකමැති වති.
10 ඔව්හු දිවැසිවරුන්ට නිහඬ වන්න කියමින් මසෙේ
කියති:
q2 10 "හරි දේ ගැන අපට කතා නාොකරන්න;
q2 10 අපට අසන්න ආසා දේ ගැන පමණක් කතා
කරන්න;
q2 10 අපේ සිහින සිතුම්පැතුම් තබාගන්න අපට ඉඩ
දනේන.
11 අපේ මාර්ගයනේ ඉවත් ව අපේ ගමනට බාධා
නාොකරන්න.
q2 11 ඉශ්රායලේහි සුවිශුද්ධ දවේඳුන්, ගැන ඇසීමට
අපට වුවමනාවක් නැත."
12 එහතේ, ඉශ්රායලේහි සුවිශුද්ධ දවේඳුන් වදාරන
දේ මසෙේ ය:
q2 12 "නුඹලා මා කියන දේ නාොසලකා
බලහත්කාරයත්, වංචාවත් කරෙහෙි විශ්වාසය
තබන්නහු ය.
13 නුඹලා වරදකාරයාෝ ය;
q2 13 නුඹලා උඩ සිට පහළට පුපුරා, ඉදිරියට නරො
ඇති, හදිසියේ බිඳ වැටීමට ළඟා වූ බිත්තියක් හා
සමාන ය.
14 නුඹලා ලිපකින් ගිනි අඟුරු ගන්න වත්,
පාොකුණකින් වතුර බිඳක් ගන්න වත් සෑහනෙ
තරමට කැබැල්ලක් ඉතිරි නාොවන ලසෙ පාොඩිකරන
ලද මැටි භාජනයක් හා සමාන ය."
15 ඉශ්රායලේහි සුවිශුද්ධ මහාෝත්තම දවේ
ස්වාමීන් සිය සනෙඟට කතා කාොට,
q2 15 "ආපසු හැරී අවුත් සන්සුන් ව මා කරෙහෙි
අදහාගන්න.
q2 15 එවිට නුඹලා ගැළවී, සුරක්ෂිත ව සිටින්නහු
ය"යි වදාරන සේක.
q2 15 එහතේ, නුඹලා එය ප්රතික්ෂේප කළහු ය.
16 ඒ වනුෙවට ශීඝ්රයනේ දුවන අශ්වයන් පිට නැඟී,
සතුරන්ගනේ බේරී යමු යි කියමින්, නුඹලා
ගැළවනේන උත්සාහ කරන්නහු ය.
q2 16 නුඹලා බේරී පලා යා යුතු බව නම් සැබෑ ය.
q2 16 නුඹලාගේ අශ්වයන් වේගයනේ දුවති යි
නුඹලා සිතන නමුත්, නුඹලා ලුහුබැඳ එන්නාෝ ඊට
වඩා වේගයනේ එන්නාෝ ය.
17 එක සතුරකුෙ දුටු විට නුඹලාගනේ දහසක්දනො
පලා යන්නාෝ ය.
q2 17 කන්දක් උඩ හුදකලා ව තිබනෙ ධජ
සංකේතයක් හැර නුඹලාගේ හමුදාවනේ කිසිවක්
ඉතිරි වන්නේ නැත.
18 සමිඳාණාෝ නුඹලාට කරුණාව පාන්නට බලා
සිටින සේක.
q2 18 එතුමාණාෝ සෑම වේලේ ම හරි දේ කරන
බැවින් නුඹලාට දයාව දක්වන්න සූදානම් ව සිටින
සේක.
q2 18 එතුමන් අදහන්නාෝ භාග්යවන්තයාෝ ය.

## දවේයන් වහන්සේ සිය සනෙඟට ආශීර්වාද කිරීම

19 ජරෙුසලමේ සිටින සනෙඟනෙි, ඔබ තවත්
අඬන්නේ නැත. සමිඳාණන් වහන්සේ දයාන්විත ය.
ඔබේ මාොරගැසීමට උන් වහන්සේ සවන් දී ඔබට
පිළිතුරු දනෙ සේක. 20 සමිඳාණන් වහන්සේ විපත
නමැති කෑම ද, පීඩා නමැති වතුර ද ඔබට දනෙ
නමුත්, ඔබට උගන්වන පිණිස උන් වහන්සේ ම ඔබ
සමඟ වැඩ සිටින සේක. උන් වහන්සේ සාොයා
යාමට ඔබට වුවමනාවක් ඇති නාොවේ. 21 ඔබ
මාර්ගයනේ දකුණට හාෝ වමට හාෝ හැරී නාොමඟ
යන විට, "මනේන හරි මාර්ගය, මහෙි ඇවිදින්න"යි
කියන හඬක් ඔබට පිටුපසින් ඇසනෙු ඇත.
22 රිදීයනේ ද රනින් ද ඔප දමන ලද දේව රූප
ගනෙ, "නුඹලා අපනේ ඉවත් වතේවා"යි කියමින් ඔබ
ඒවා කුණු කසළ මනේ විසිකර දමන්නහු ය. 23 ඔබ
බීජ වැපුරූ කල ඒවා වැඩනෙ පිණිස සමිඳාණන්
වහන්සේ වර්ෂාව එවන සේක. උන් වහන්සේ ඔබට
සාරවත් මහා අස්වැන්නක් දනෙ සේක. ඔබේ
ගවයන්ට ගාොදුරු පිණිස විශාල තණ බිම් ඇති
වන්නේ ය. 24 බිම් හාන ගවයාෝ ද කාොටළුවාෝ ද
ඉතාමත් පාෝෂ්යදායක ආහාර කන්නාෝ ය. 25 ඔබේ
සතුරන්ගේ බලකාොටු වැටී, සතුරන් මරාදමන
දවසේ දී, පර්වත හා කඳු මුදුන්වලින් ජලධාරා ගලා

එන්නේ ය. 26 සමිඳාණන් වහන්සේ තමන් සෙනඟට
පහර දීමෙන් ඇතිකළ තුවාළ බැඳ සුව කරන දවසේ
දී හඳ එළිය ඉර එළිය මෙන් ද, ඉර එළිය සත්
ගුණයකින් වැඩි වී සත් දවසක එළිය එක් වූවාක්
මෙන් ද බැබළෙන්නේ ය.

### සමිඳාණන් වහන්සේ අසිරියාවට දඬුවම් කිරීම

27 සමිඳුන්ගේ බලය හා තේජස දුර තියා ම
පෙනෙන්නේ ය.
q2 27 ගින්න හා ඉන් නඟින දුම් එතුමන්ගේ උදහස
දක්වන්නේ ය.
q2 27 කතා කළ විට එතුමන්ගේ වචන දැවෙන
ගින්නක් හා සමාන වන්නේ ය.
28 සියල්ල ගසාගෙන යන ජලගැල්මක් මෙන්
එතුමාණෝ තමන්ට පරෙවුවෙන් සුළඟක් එවන
සේක.
q2 28 ඒ සුළඟින් ජාතීන් විනාශ වී ඔවුන්ගේ නපුරු
උපායයෝ කළෙවර වන්නෝ ය.
29 එහෙත්, දෙවිඳුන්ගේ සෙනඟ වන ඔබ,
ප්‍රීතියෙන් පිනා යන්නහු ය;
q2 29 ශුද්ධ මංගල්‍ය පවත්වන රාත්‍රියේ දී මෙන් ගී
ගයන්නහු ය;
q2 29 ඉශ්‍රායලේහි ආරක්ෂකයාණන් වන සමිඳුන්ගේ
මාලිගාවට යන මාර්ගයේ නළා තාලයට පියවර
නඟන අය මෙන් ප්‍රීති වන්නහු ය.
30 සමිඳාණන් වහන්සේ තමන්ගේ මහිමාන්විත
හඬ සියල්ලන්ට ඇසෙන්නට සලස්වා තමන්ගේ
උදහසේ තද පරුෂකම සියල්ලන්ට දැනෙන්නට
සලස්වන සේක. එවිට ගිනි දලු ද ධාරානිපාත
වර්ෂාව ද වැහි කුණාටු ද ගල් වර්ෂා ද ඇති වන්නේ
ය. 31 දෙවියන් වහන්සේගේ හඬ අසා, උන්
වහන්සේගේ දඬුවමේ පහරට ගොදුරු වන විට
අසිරියන්වරු භීතියෙන් ඇලළී යන්නෝ ය.
32 සමිඳාණන් වහන්සේ නැවත නැවත
අසිරියන්වරුන්ට පහර දෙන අතර, උන් වහන්සේගේ
සෙනඟ රබන් හා වීණා නාදය අනුව ප්‍රීති වන්නෝ
ය. දෙවියන් වහන්සේ සිය බලය මෙහෙයවමින්
අසිරියන්වරුන්ට විරුද්ධ ව සටන් කරන සේක. 33 මීට
කලකට පෙර අසිරියාවේ රජ්ජුරුවන් පුළුස්සාදමන
මහා ගින්නක් ඇති තැනක් සූදානම්කර තිබුණේ ය.
එය ඉතා ගැඹුරු ය, පළල් ය. එහි උසට දර ගොඩ
ගසා ඇත. එහි ගිනි දල්වන පිණිස සමිඳාණන්
වහන්සේ ගිනි වැනි හුස්මක් ඒ පිට හෙළන සේක.

### දෙවියන් වහන්සේ ජෙරුසලම ආරක්ෂා කිරීම

31 උපකාර ලබන පිණිස මිසරයට යන අයට
වන විපතක මහත!
q2
31 ඔව්හු අශ්වයන්, අශ්ව රථ සහ භේවායන්
ඇති, සිව්රඟ හමුදා බලය කෙරෙහි විශ්වාසය
තබති.
q2
31 එහෙත්, ඉශ්‍රායලේවරුන්ගේ දෙවියන් වන
සමිඳුන් කෙරෙහි ඔව්හු තමන්ගේ විශ්වාසය
නොතබති;
q2
31 සමිඳුන්ගේ උපදෙස් නොසොයති.
2 එතුමාණන් කරන දේ, එතුමාණෝ හොඳින්
දන්න සේක.
q2 2 එතුමාණෝ විනාශය එවන සේක.
q2 2 දුෂ්ටයන්ට ද ඔවුන් ආරක්ෂා කරන අයට ද
දඬුවම් කරන බවට එතුමන් කරන තර්ජන ඉටුකරන
සේක.
3 මිසරවාසීහු දෙවිවරු නොවෙති.
q2 3 ඔව්හු මනුෂ්‍යයෝ ය.
q2 3 ඔවුන්ගේ අශ්වයන්ට අලෞකික බලයක් නැත;
q2 3 ඔව්හු ඇට මස්වලින් යුක්ත ය.
q2 3 සමිඳුන් ක්‍රියා කරන විට බලවත් ජාතිය විනාශ
වන්නේ ය.
q2 3 එයින් උදව් ලැබූ බලෙහීන ජාතිය ද වැටෙන්නේ
ය.
q2 3 ඒ ජාති දෙක ම විනාශ කරනු ලබන්නෝ ය.
4 සමිඳාණෝ මට මෙසේ වදාළ සේක:
q2 4 "සතකු ගොදුරු කරගත් සිංහයකු හෝ සිංහ
පොව්වකු හෝ එඬේරුන් කොතරම්
කෑමොරගැසුවත් බියගන්වා එළවාදමන්නට ඔවුන්ට
නොහැකි ය.
q2 4 එමෙන් ම සියොන් කන්ද ආරක්ෂා කිරීමෙන් සව්
බලැති සමිඳුන් වන මා වැළැක්විය හැකි කිසිවෙක්
නැත.
5 කුරුලු පැටවුන් ආරක්ෂා කරන පිණිස කුරුල්ලකු
ඉහළින් පියාසර කරන්නාක් මෙන් සව් බලැති
සමිඳාණන් වන මම ජෙරුසලමට රැකවරණය දී, එය
රැක බලා, ආරක්ෂාකර මුදාගන්නෙමි.
6 "ඉශ්‍රායලේ වැසියෙනි, නුඹලා මට විරුද්ධ ව පව්
කොට මා ප්‍රතික්ෂේප කළහු ය. දැන් ඉතින් මා
වෙත හැරී එන්න. 7 පාපයට පෙළඹී, රන් රිදීයෙන්
සාදාගත් දේව රූප නුඹලා ඉවත ලන කාලය
පැමිණෙන්නේ ය.
8 "එකල අසිරියන්වරු යුද්ධයේ දී මනුෂ්‍ය බලයකින්
නොව, ඊට වඩා අධික බලයකින් විනාශ වන්නෝ ය.
q2 8 ඔව්හු යුද්ධයෙන් පලා යන්නෝ ය.
q2 8 ඔවුන්ගේ තරුණයෝ වහල්ලු වන්නෝ ය.
9 ඔවුන්ගේ රජ භීතියෙන් පලා යන්නේ ය.
q2 9 නිලධාරීහු තැතිගෙන ඔවුන්ගේ ධජ සංකේතය
ඉවත දමන්නෝ ය.
q2 9 මෙසේ පවසන්නේ ඉශ්‍රායලේහි නමස්කාරය
ලබන,
q2 9 එහි දවන යාග පූජා ලබන සමිඳාණෝ ය."

### අවංක රජ කෙනෙක්

32 අවංක රජ කෙනෙකු ද යුක්තියෙන් පාලනය
කරන අධිපතීන් ද ඇති වන කාලයක්
පැමිණෙන්නේ ය.

2 ඔව්හු, සුළඟින් වැළකනේන රුකවරණයක් මනේ
ද කුණාටුවනේ සැඟවනේන ස්ථානයක් මනේ ද වියළි
බිමේ ගලා යන දිය පාරවල් මනේ ද පාළු පදෙසෙක
සවෙණ ගනෙ දනෙ විශාල පර්වතයක් මනේ ද
වන්නෝ ය.
3 පනේීම ඇති අයගේ ඇස් අඳුරු නොවෙයි;
q2[3] කන් ඇසනෙ අයගේ කන් ඇහුම්කන් දයි.
4 ඔව්හු ඉක්මන්කාර ගතියනේ තොර ව,
ඥානවන්ත ලසෙ ක්රියා කරමින්, තේරුම්පැහැදුම්
ඇති ව කතා කරන්නෝ ය.
5 'අධමයා උත්තමයකේ ය' කියාවත්, කපටියා
ගුණවන්තයකේ ය' කියාවත් තවත් කියනු
නොලබන්නේ ය.
6 අඥානයා මෝඩ ලසෙ කතා කරමින් නපුරු දේ
කරන්න සිතයි;
q2[6] ඔහු කරන දේත්, සිතන දේත් දවේඳුන්ට
අපහාසයකි.
q2[6] ඔහු කිසි කලක බඩගිනි අයට කන්න දනේනේ
වත්, පිපාසිත අයට බොන්න දනේනේ වත් නැත.
7 ඔහු දුෂ්ට උපා යොදයි;
q2[7] බොරුවනේ දුප්පත් අය විනාශ කරන්නත්, ඒ
අයගේ අයිතිවාසිකම් ඔවුන්ගනේ වළක්වන්නත් ඔහු
උපා යොදයි.
8 එහතේ, යුක්ති ගරුක මිනිසා යුක්තිය අනුව
ක්රියාකර යුක්තිය වනුෙවනේ ස්ථිර ව සිටින්නේ ය.
විනිශ්චයය හා පුනරුත්ථාපනය
9 සැප විහරණයනේ කල් යවන ස්ත්රියනි, මා කියන
දේට සවන් දනේන, වගකීමක් නැති තරුණියනි, මා
කියන දේ අසන්න.
10 ඔබ දැන් තෘප්තිමත් ව සිටින නමුත්, තව
අවුරුද්දකින් පමණ නළොගැනීමට මුද්රික පල
කිසිවක් නොවන නිසා ඔබේ බලාපොරොත්තු ශුන්ය
වන්නේ ය.
11 කරදරවලින් නිදහස් ව සැප විහරණයනේ කල්
යවන ස්ත්රියනි, දැන් භීතියනේ වවෙුළන්න;
q2[11] ඔබේ වස්ත්ර ගලවාදමන්න;
q2[11] ඉඟ වටා ගෝණි රදෙි ඇඳගන්න.
12 සාරවත් කතේ හා මිදි වතු විනාශ වී ඇති නිසා
ශෝකයනේ ඔබේ පපුවට ගසාගන්න.
13 මාගේ සනෙඟගේ ඉඩම්වල කටු පඳුරු ද
ගොකටු ද හටගන්නේ ය.
q2[13] සොම්නසින් පිනා ගිය සියලු ම ප්රීතිය ඇති
නගරයේ ගවෙල එසේ වන්නේ ය.
14 රජමැදුර පවා හිස් වන්නේ ය, අගනුවර ද
සම්පූර්ණයනේ පාළු වන්නේ ය;
q2[14] ගවෙල් ද මුරකොටු ද සදහට ම නටබුන්
වන්නේ ය;
q2[14] වල් කොටළුවන් එහි ලගිනු ඇත;
q2[14] ඒවා බැටළුවන්ට තණ බිම් වන්නේ ය.
15 එහතේ, දවේඳාණෝ සිය ආත්මානුභාවය අප
වතෙ නැවත වරක් එවන සේක;
q2[15] එවිට පාළු ඉඩම් සාරවත් වන්නේ ය.
q2[15] සාරවත් ඉඩම් පාළු වන්නේ ය.
16 දේශයේ සෑම තැන ම පාළුකරයේ යුක්තියත්,
q2[16] සාරවත් භූමියේ ධර්මිෂ්ඨකමත් පවතින්නේ ය.
17 සියලු දනො ම හරි දේ කරන බැවින් සාමයත්,
ආරක්ෂාවත්, සදහට ම පවතින්නේ ය.
18 දවේඳුන්ගේ සනෙඟගේ ගවෙල සාමයත්,
ආරක්ෂාවත්, කරදරවලින් නිදහස්කමත් ඇති වන්නේ
ය.
19 ගල් වර්ෂාවනේ වනය ඇද වැටී නගරය ද
සමතලා වූවත්;
20 වැපිරීම සඳහා බොහෝ සේ වතුර ද ගවයන්ට
හා කොටළුවන්ට නිදහසේ කෑමට සෑම තැන ම
තණ බිම් ද ඇති වන නිසා නුඹලා වාසනාවන්තයෝ
ය.

### උපකාර සඳහා යැදීමක්

33 කිසිවකු විසින් කොල්ලකනු නොලැබූ නමුත්,
කොල්ලකන, ද්රෝහිකම් කරනු නොලැබූ
නමුත්, ද්රෝහිකම් කරන අපේ සතුරන්ට වන
විපතක මහත!
q2
33 ඔවුන්ගේ කොල්ලකෑම හා ද්රෝහිකම්
කිරීමේ කාලය අවසාන වේ.
q2
33 එවිට ඔවුන් ම කොල්ලකෑමටත්,
ද්රෝහිකමටත් භාජනය වනු ඇත.
2 සමිඳුනි, අපට දයා වුව මැනව.
q2[2] අප අපේ බලාපොරොත්තුව ඔබ කරෙහෙි තබා
ඇත.
q2[2] දිනනේ දින අප ආරක්ෂාකර ඔබේ බාහු
බලයනේ අප රැකගත මැනව.
q2[2] කරදර ඇති කාලවල දී අප මුදාගත මැනව.
3 ඔබ අප වනුෙවනේ සටන් කරන විට යුද්ධ
ඝෝෂාව නිසා ජාතීහු පලා යන්නෝ ය.
4 දළඹුවා රුස් කරන්නාක් මනේ ඔවුන් කොල්ලකෑ
වස්තුව රුස් කරේ.
q2[4] පළඟැටියන් මනේ මිනිසුන් එය පිට කඩා වදිනු
ඇත.
5 සමිඳාණෝ මහෝත්තම වන සේක.
q2[5] සියල්ල කරෙහෙි එතුමාණෝ ආණ්ඩු කරන
සේක.
q2[5] එතුමාණෝ ජරුෙසලම පුරා යුක්තියත්,
ධර්මිෂ්ඨකමත් පිහිටුවන සේක.
6 එතුමාණෝ ජාතීන්ට ස්ථාවරතාව දනෙ සේක.
q2[6] එතුමාණෝ නිරන්තරයනේ සිය සනෙඟ ආරක්ෂා
කොට ප්රඥාවත්, දැනගැන්මත් ඔවුන්ට දනෙ සේක.
q2[6] සමිඳුන්ට ගරුබිය දැක්වීම ඔව්හු උසස් වස්තුවක්
සේ අගය කරති.
7 නිර්භීත සනෙඟ පිහිට ඉල්ලා මොරගසති;
q2[7] සාමයේ තානාපතීහු මහා දුකින් හඬති.
8 මහා මාවත් අන්තරායදායක බැවින් කිසිවකේ එහි
ගමන් නොකරති.
q2[8] ඔවුන් ගිවිසුම අවලංගුකර ඇත;
q2[8] පොරොන්දු කඩකර ඇත;
q2[8] කිසිවකුෙට තවත් ගරු නොකරනු ඇත.

9 දේශය පාළු වී හිස් වී ඇත.
q2[9] ලෙබනොනය වියළී ගොස් ඇත.
q2[9] ශාරොන් කාන්තාරයක් වී ඇත.
q2[9] බාෂාන් හා කර්මලේ ගස්වලින් කොළ හැළේ.

## සතුරන්ට තරවටු කිරීම

10 සමිඳාණෝ ජාතීන් හට මෙසේ වදාරන සේක:
q2[10] “දැන් මම ක්‍රියා කරන්නෙමි;
q2[10] මා කොතරම් බලවත් ද කියා පෙන්වන්නෙමි.
11 නුඹලා කිසිම තේරුමක් නැති යෝජනා
කරන්නහු ය.
q2[11] නුඹලා කරන සියලු දේ නිෂ්ඵල ය.
q2[11] ගින්නක් වැනි හුස්මක් නුඹලා දවාලන්නේ ය.
12 නුඹලා පුළුස්සනු ලබන හුණු ගල් මෙන් ද කපා
ගින්නෙහි දවාලනු ලබන කටු පඳුරු මෙන් ද වන්නහු
ය.
13 දුර සිටින නුඹලා මා කළ දේ බලන්න;
q2[13] ළඟ සිටින නුඹලා මාගේ බලපරාක්‍රමය
තේරුම්ගන්න.”
14 සියොන්හි පව්කාරයෝ බියෙන් වෙව්ලති;
q2[14] අභක්තිකයෝ භීතියෙන් ඇලළී යති.
q2[14] මේ දැවෙන ගින්නෙහි අප අතරෙන් කවරෙකුට
ජීවත් විය හැකි ද?
q2[14] මේ සදා ගින්නෙන් කෙසේ ගැළවෙන්නේ ද?
15 නුඹලා අවංක ව කතා කරන්නහු නම්, හරි දේ
කරන්නහු නම්, දුප්පතුන් රවටන්න නුඹලාගේ බලය
පාවිච්චි නොකරන්නහු නම්, අල්ලස් නොගන්නහු
නම්, මිනී මරන්න හා අනිකුත් අපරාධ කරන්න උපා
යොදන අය සමඟ හවුල් නොවන්නහු නම්,
16 නුඹලාට ජය අත් වී ශක්තිමත් බලකොටුවක
සිටින්නන් සේ සුරක්ෂිත වන්නහු ය.
q2[16] කෑමට ආහාර ද බීමට වතුර ද නුඹලාට ඇති
වන්නේ ය.

## තේජාන්විත අනාගතයක්

17 සියලු දිශාවල පැතිර ඇති දේශයක් කෙරෙහි
තේජසින් පාලනය කරන රජ කෙනෙක් නුඹලාට
නැවත දකින්න ලැබෙන්නේ ය.
18 විදේශීය බදු අය කරන්නා ද කප්පම් ගන්නා ද
වස්තු රැස් කරන්නා ද ගැන පෙර තිබූ නුඹේ බිය
මතක මාත්‍රයක් පමණක් වන්නේ ය.
19 නුඹලාට නොතේරෙන විදේශීය භාෂාවකින්
කතා කරන විදේශිකයන් තවත් නුඹලාගේ
ඇස්වලින් දකින්න ලැබෙන්නේ නැත.
20 අපේ ආගමික මංගල්‍යයන් පවත්වන ස්ථානයක්
වන සියොන් දෙස බලන්න;
q2[20] ජෙරුසලම දෙස බලන්න.
q2[20] ජීවත් වීමට එය කොතරම් සුරක්ෂිත
වාසභවනයක් වන්නේ ද?
q2[20] එය, කිසි කලක නොසෙලවෙන, ඇඹ ගලවනු
නොලබන, ලණු නොකැඩෙන, කූඩාරමක් හා සමාන
වන්නේ ය.
21 සමිඳාණෝ සිය තේජෝලංකාරය අපට පෙන්වන
සේක.
q2[21] එතුමාණෝ ගංගා හා දිය ඇලවල් අසල වැඩ
සිටින සේක.
q2[21] සතුරු නැව් එහි යාත්‍රා නොකරන්නේ ය.
22 ඒ නැව්වල ආම්පන්නවලින් වැඩක් නැත.
23 රුවල් විදහන්න බැරි ය;
q2[23] කුඹගහ කෙළින් තබන්න බැරි ය.
q2[23] සතුරු සේනාවේ සකල වස්තුව අප විසින්
පැහැරගෙන යනු ලබන්නේ ය.
q2[23] කොරුන්ට පවා ගන්න පුළුවන් තරමට විශාල
කොල්ලයක් ඇති වන්නේ ය.
q2[23] සමිඳාණෝ ම අප පාලනය කරන රජාණන් වන
සේක;
q2[23] අප විනිශ්චයකරුවාණන් වන සේක;
q2[23] එතුමාණෝ අප පාලනයකර අප ආරක්ෂා
කරන සේක.
24 අපේ දේශයේ සිටින කිසිවකු මින්පසු ලෙඩෙක්
දුකක් ගැන පැමිණිලි කරන්නේ නැත.
q2[24] එහි වාසය කරන සියලු දෙනාගේ පව් කමා
කරනු ලබන්නේ ය.

## සතුරන්ට දඬුවම් කිරීම

34 ජාතීනි, ළං වන්න;
q2
34 ජනයෙනි, සවන් දෙන්න.
q2
34 මුළු පොළොව ද එහි වැසි සියල්ලන් ද පැමිණ
සවන් දෙන්න.
2 සමිඳුන් සෑම ජාතීන් කෙරෙහි උදහස් වී, ඔවුන්ගේ
සියලු සේනාවන් කෙරෙහි කෝප වී විනාශයටත්,
මැරුම්කෑමටත් ඔවුන් තීන්දුකර ඇත.
3 ඔවුන් අතරෙන් මැරුම් කෑ අය ඉවත දමනු
ලබන්නෝ ය.
q2[3] ඔවුන්ගේ මළකඳන් ගඳ ගසන්නේ ය.
q2[3] කඳුවලින් ඔවුන්ගේ ලේ වෑස්සෙන්නේ ය.
4 මතෙ 24:29; මාක් 13:25; ලූක් 21:26; එළිද
6:13-14 ඉර, හඳ හා තාරකා මැලවී යන්නේ ය.
q2[4] අහස, අකුළන පොතක් මෙන් ඇකිළී, එහි
තාරකා, මිදි වැලකින් හෝ අත්තික්කා ගසකින් හෝ
වැටෙන කොළ මෙන් වැටෙන්නේ ය.
5 යෙසා 63:1-6; ජෙරෙ 49:7-22; එසකි 25:12-14;
35:1-15; ආමො 1:11-12; ඔබදි 1:14; මලාකි 1:2-5
සමිඳුන් සිය කඩුව සගයෙහි සූදානම්කර ඇත.
q2[5] එයින් එතුමාණෝ, ඒදොම්හි සිටින, විනාශයට
තීන්දු කරන ලද සෙනඟට පහර දෙන සේක.
6 පූජා කරනු ලබන එළු බැටළුවන්ගේ ලේ හා
තෙල් ද බැටළුවන්ගේ වකුගඩු තෙලෙන් ද
සමිඳාණන් වහන්සේගේ කඩුව තෙත් වී ඇත.
q2[6] සමිඳාණෝ මේ මහා පූජාව බොශ්රා නගරයෙහි
කරන සේක.
q2[6] මෙයෙ ඒදොම් දේශයෙහි මහා ඝාතනයක් වන්න
සලසන සේක.

7 වල් මීහරකුන් හා ගොන් නාම්බන් සමඟ ඔව්හු
ඇද වැටෙන්නෝ ය.
q27 ඔවුන්ගේ ලයින් දේශය රතු වන්නේ ය;
q27 ඔවුන්ගේ තෙලින් භූමිය වැසී යන්නේ ය.
8 සමිඳාණන් සියොන් බේරාගනෙ ඇගේ
සතුරන්ගෙන් පළිගන්න කාලය මෙය වේ.
9 ඒදොම්හි ගංගා තාර බවටත්, එහි භූමිය
ගන්දගම් බවටත් හැරෙන්නේ ය.
q29 මුළු දේශය දැවෙන තාර බිමක් වන්නේ ය.
10 එළිද 14:11; 19:3 එහි ඇවිලෙන ගින්න රෑ දාවල්
දකේහි නොනිවී තිබෙන්නේ ය.
q210 එයින් නඟින දුම සදහට ම පවතින්නේ ය.
q210 පරපුරෙන් පරපුරට එය පාළු වන්නේ ය.
q210 කිසිවකේ ඒ මැදින් ගමන් නොකරන්නෝ ය.
11 උකුස්සන්ටත්, ඉත්තෑවන්ටත් දේශය උරුම
වන්නේ ය.
q211 බකමූණෝ ද කපුටෝ ද එහි වාසය කරන්නෝ
ය.
q211 සමිඳාණෝ එය මැවීමට පරෙ තිබුණාක් මනේ
පාළු, හිස් දේශයක් කරන සේක.
12 රට පාලනය කිරීමට රජ කනෙකේ නොවන්නේ
ය;
q212 අධිපතියෝ කිසිවකේ ද නොවන්නෝ ය.
13 එහි මාලිගාවල කටු පඳුරු ද බලකොටුවල
කහඹිලියා හා ගොකටු ද හටගන්නේ ය.
q213 ඒවා හිවලුන්ටත්, පැස්බරුන්ටත් වාසස්ථාන
වන්නේ ය.
14 වනයේ වල් මෘගයෝ ද වෘකයෝ ද එකට හමු
වන්නෝ ය.
q214 වල් එළුවෝ ඔවුන් එකිනකොට කෑගසන්නෝ
ය.
q214 උලමාත් එහි ලගින්න නිශ්චල තැනක්
ලබාගන්නේ ය.
15 එහි සර්පයා බනෙය සාදා, බිජු දමා, රුක,
පැටවුන් ඇගේ සවෙණෙහි තුරුලු කරගන්නී ය.
q215 උකුස්සෝ එකකේ පාසා එකකේ එහි එකතු
වන්නෝ ය.
16 සමිඳුන්ගේ පොත කියවා බලන්න;
q216 එහි සඳහන් වී ඇති සතුන්ගෙන් එකකේ වත්
මෙහි අඩු නොවන්නේ ය.
q216 හැම එකකුෙට ම ගෑණු සතකේ ද වන්නේ ය.
q216 එය නියම කළේ සමිඳාණෝ ම ය.
q216 සමිඳාණෝ ම ඔවුන් එක් රැස් කරන සේක.
17 දාදු දමා, දේශය ඔවුන් අතරේ බදො
එකිනකොට කොටසක් දුන්නේ සමිඳාණෝ ය.
q217 ඔවුන් එය සදාකාලයට ම උරුම කරගනෙ
පරම්පරාවනේ පරම්පරාවට එහි වාසය කරනු ඇත.

## ගුණවත්කමේ මාර්ගය

35 වනය ද වියළි දේශය ද ප්‍රීති වන්නෝ ය;
q2
35 කාන්තාරය ප්‍රීතිමත් වී සවේවන්දි මනේ මල්
දරන්නේ ය.
2 එය ප්‍රීතියෙන් ගී හඬ නඟන්නේ ය.
q22 ලබෙනොන් කන්ද මනේ එය පියකරු වන්නේ ය;
q22 කර්මලේ හා ශාරොන් කතේ මනේ සාරවත්
වන්නේ ය;
q22 සමිඳුන්ගේ තේජෝලංකාරය ද එතුමන්ගේ මහ
බල මහිමය ද සියල්ලෝ දකින්නෝ ය.
3 හබේ්‍ර 12:12 බලෙහීන අත් බලවත්කර,
වවුෙළන දණ හිස් ශක්තිමත් කරන්න;
4 බියසුලු සිත් ඇත්තන්ට මසෙේ කියන්න;
q24 "බිය නොවී දිරි ගන්න;
q24 දවේිඳාණෝ ඔබ මුදන පිණිසත් ඔබේ
සතුරන්ගෙන් පළිගන්න පිණිසත් වඩින සේක."
5 මතෙ 11:5; ලූක් 7:22 අන්ධයන්ගේ ඇස්
පැහැදන්නේ ය.
q25 බිහිරන්ගේ කන් ඇරෙන්නේ ය.
6 කොර අය මුවන් මනේ දුව පනින්නෝ ය.
q26 ගොළු අය ප්‍රීතියෙන් ගී ගයන්නෝ ය.
q26 කාන්තාරයෙන් ජලධාරා ගලා එන්නේ ය.
q26 මරුකතරෙන් ඇල දොළවල් බිඳී එන්නේ ය.
7 මිරිඟුව ජල පොකුණක් වයෙි.
q27 වියළි බිම උල්පත්වලින් පිරයෙි.
q27 සිවලුන් ලැගුම් ගත් පාළු පදෙසේවල බට පඳුරු
හා පන්ගස් හටගන්නේ ය.
8 ශුද්ධවන්තකමේ මාර්ගය යන නමින් මහා
මාවතක් එහි ඇති වේ.
q28 පව්ටුන්ට එහි ගමන් කළ නොහැකි ය.
q28 අනුවණයන් ද එහි මුළා නොවේ.
9 සිංහයෝ එහි නොවෙති, දරුණු මෘගයෝ
එමඟෙහි හමු නොවෙති,
q29 සමිඳුන් විසින් මුදාගනු ලැබූ අය පමණක් එහි
ගමන් ගනිති.
10 ගැළවීම ලැබූ ඔව්හු ප්‍රීති ඝෝෂා පවත්වමින්
සතුටු සිතින් ගිනා යමින් ජරුසෙලමට පැමිණෙති.
q210 දුකින් හා දොම්නසින් මිදී සදහට ම ප්‍රීති
වමේින් ඔව්හු එහි වසෙති.

## අසිරියාවනේ ජරුසෙලමට තර්ජනයක්

(2 රාජා 18:13-27;2 වංශා 32:1-19)

36 හසෙකියා රජුගේ දහහතර වන අවුරුද්දේ දී
අසිරියාවේ අධිරාජයා වූ සනෙකරේබ්
පවුරුවලින් ආරක්ෂා කරන ලද ජුදාහි නගරවලට
පහර දී ඒවා අල්ලාගත්තේ ය. 2 ඉන්පසු ඔහු
තමාගේ ප්‍රධාන නිලධාරියා වන රබ්-ෂාකේ මහත්
සේනාවක් සමඟ ලාකීෂ් සිට ජරුසෙලමට යවා
හසෙකියා රජුට යටත් වන ලසෙ බලකරන්නට යයි
නියම කළේ ය. ඔහු ගොස් අපුල්ලන්නාගේ
පිට්ටනියේ මාවත තිබෙන ඉහළ පොකුණේ කාණුව
ළඟ සිටියේ ය. 3 එවිට රජ ගදෙර ප්‍රධානියා වූ
හිල්කියාගේ පුත් එලියාකිම් ද ලේකම් වූ ෂබේනා ද
වාර්තාකරු වූ ආසප්ගේ පුත් ජෝවා ද ඔහු වෙත
ගියහ. 4 එවිට අසිරියානු නිලධාරියා ඔවුන්ට මසෙේ
කී ය: "අසිරියාවේ අධිරාජයා මසෙේ ප්‍රශ්න
කරන්නේ යයි හසෙකියා රජුට කියන්න. ඔබට
මතරම් විශ්වාසයක් තිබෙන්නේ කොහොම ද?

5 යුද්ධයෙහි බලයත්, දක්ෂකමත්, උපායත් වෙනුවට
කතාව පමණක් සෑහේ යයි ඔබ සිතන්නෙහි ද? මට
විරුද්ධ ව කැරලි ගසන්න ඔබට උපකාර වන්නේ
කවුරු ද කියා ඔබ සිතන්නෙහි ද? 6 එසකි
29:6-7මිසරය ඔබට උපකාර කරනු ඇතැ යි ඔබ
සිතන්නෙහි ය. එහෙත්, එය හැරමිටිය සඳහා තැළුණු
බට දණ්ඩක් අතට ගැනීම හා සමාන ය. එයට බර
වුවහොත් එය ඇනී එයින් අත සිදුරු වන්නේ ය.
මිසරයේ පාරාවෝ රජු කෙරෙහි විශ්වාස කරන අය
එවැනි බට දඬු හා සමාන ය.”
7 ඔහු තවදුරටත් කතා කරමින් මෙසේ කී ය: “ඔබ
සමහරවිට, ‘අපේ දෙවි වන සමිඳාණන් වහන්සේ
කෙරෙහි අපි විශ්වාස කරමු’යි මට කියනවා ඇත.
එහෙත්, එම දෙවි සමිඳාණන් වහන්සේගේ
සිද්ධස්ථාන හා පූජාසන කඩා දැමුවේත්, එක ම
පූජාසනයක් ඉදිරියේ නමස්කාර කරන්න ජුදාවේ හා
ජෙරුසලමේ වැසියන්ට නියම කළේත් හෙසෙකියා
රජු ම නොවේ ද? 8 මාගේ ස්වාමියා වන
අසිරියාවේ රජුගේ නාමයෙන් මම ඔබ හැම සමඟ
ඔට්ටුවක් අල්ලන්නෙමි. මම ඔබට අශ්වයන්
දෙදහසක් දෙන්නෙමි. උන් පිට නැඟී යන්න ඔබට
අසරුවන් සොයා ගත හැකි ද? 9 එතරම් බැරි නම්
රථ ද අසරුවන් ද ගැන මිසරය කෙරෙහි විශ්වාස
කරගෙන ඔබ මාගේ ස්වාමියාගේ සුළු
සේවකයන්ගෙන් එක මුලාදෑනියකු වුව ද පලවා
හරින්නේ කෙසේ ද? 10 ඔබේ රටට මා පහර දී එය
විනාශ කළේ සමිඳාණන් වහන්සේගේ උපකාරය
නැති ව ය කියා ඔබ සිතන්නෙහි ද? ඔබේ රටට
පහර දී එය විනාශ කරන්න කියා මට කීවේ
සමිඳාණන් වහන්සේ ම ය.”
11 එවිට එලියාකිම් ද ෂෙබ්නා ද ජෝවා ද රබ්-
ෂාකේට කතා කොට, “අරමීය භාෂාවෙන් අපට කතා
කරන්න, එය අපට තේරේ. පවුර පිට සෙනඟට
ඇසෙන පිණිස හෙබ්රෙව් භාෂාවෙන් කතා
නොකරන්නැ”යි කී හ.
12 ඔහු පිළිතුරු දෙමින් මෙසේ කී ය: “අධිරාජයා මා
එව්වේ, ඔබටත්, ඔබේ රජ්ජුරුවන්ටත් මේ දේ
කියන්න යැයි ඔබ සිතන්නහු ද? එසේ නොවේ, මා
කතා කරන්නේ ඔබට මෙන් ම තමන්ගේ ම අශූචි
කන්නත් තමන්ගේ ම මුත්‍රා බොන්නත් නියම වී
පවුර පිට සිටින මේ සෙනඟට ය.”
13 ප්‍රධාන නිලධාරියා එසේ කියා නැඟිට සිට,
ශබ්ද නඟා හෙබ්රෙව් භාෂාවෙන් කතා කරමින්
මෙසේ කී ය: “අසිරියාවේ අධිරාජයා ඔබට කියන
දේට සවන් දෙන්න. 14 ඔබ හැම රවටන්න
හෙසෙකියාට ඉඩ නොදෙන්නැ යි එතුමා ඔබට අවවාද
කරයි. මන්ද, ඔබ හැම ගළවාගන්න හෙසෙකියාට බැරි
ය. 15 ‘සමිඳාණන් වහන්සේ සැබැවින් ම අප
ගළවාගන්නා සේක’ කියා ද, ‘ඒ නිසා ඔබ හැමගේ
නුවර අල්ලාගන්න උන් වහන්සේ අසිරියාවට
නොදෙන සේක’ කියා ද සමිඳාණන් වහන්සේ
කෙරෙහි විශ්වාස කරන්න ඔබ හැම කැමැති කරවා
ගැනීමට හෙසෙකියා රජුට ඉඩ නොදෙන්න.
16 හෙසෙකියා රජුට සවන් නොදෙනු. අසිරියාවේ
අධිරාජයා ඔබ හැමට මෙසේ අණ කරයි. 17 නුවරින්
පිටත මා සමඟ සාමය පිහිටුවන්න. එවිට එතුමා
ධාන්‍ය හා මුද්‍රික පානය ද කෑම හා මිදි වතු ද ඇති
ඔබේ දේශයට සමාන වූ දේශයකට ගෙන ගොස්
ඔබ පදිංචි කරවන තුරු ඔබ කාටත් තම තමාගේ
මුද්‍රික වැලෙන් ද තම තමාගේ අත්තික්කා ගසෙන් ද
කන්නත්, තම තමන්ගේ ළිඳෙන් බොන්නත් ඉඩ
දෙන්නේ ය. 18 සමිඳාණන් වහන්සේ ඔබ හැම
ගළවාගන්න සේකැ යි කියමින් ඔබ හැම රවටන්න
හෙසෙකියාට ඉඩ නොදෙන්න. අන් ජාතීන්ගේ දෙවිවරු
අසිරියාවේ අධිරාජයාගෙන් ඒ ජාතීන් බේරා ගත්තෝ
ද? 19 හමාත්හි හා අර්පාද්හි දෙවිවරු දැන් කොහි ද?
සෙපර්වායිම්හි දෙවිවරු කොහි ද? කිසි ම දෙවි
කෙනෙකේ සමාරිය බේරා ගත්තේ ද? කොහෙත් ම
නැත. 20 අපේ අධිරාජයාගේ අතින් මේ ජාතීන්
මුදාගැනීමට එහි දෙවිවරුන්ගෙන් සමත් වූයේ
කවරෙකේ ද? එසේ නුවූයේ නම්, ‘සමිඳාණන්
වහන්සේ ජෙරුසලම ගළවාගන්න සේකැ’යි ඔබ
සිතන්නේ කුමට ද?”
21 හෙසෙකියා රජු ‘පිළිතුරු නොදෙන්නැ’යි අණකළ
පරිදි සෙනඟ නිශ්ශබ්ද ව සිට කිසි පිළිතුරක්
නුදුන්නෝ ය. 22 එවිට හිල්කියාගේ පුත් එලියාකිම් ද
ලේකම් ව සිටි ෂෙබ්නා ද ජෝවා ද තම තමන්ගේ
ඇඳුම් ශෝකයෙන් ඉරාගෙන හෙසෙකියා රජු වෙත
ගොස් රබ්-ෂාකේ කී දේ ඔහුට සැළ කළෝ ය.

## හෙසෙකියා රජ යෙසායාගේ අවවාද සෙවීම

(2 රාජා 19:1-7)

37 හෙසෙකියා රජ ඒ අසා ශෝකයෙන් තමාගේ
ඇඳුම් ඉරාගෙන, ගෝණි රෙදි පොරවාගෙන
සමිඳාණන් වහන්සේගේ මාළිගාවට පිවිසියේ ය.
2 ඔහු ගෝණි රෙදි ඇඳගෙන සිටි රජ ගෙදර
ප්‍රධානියා වන එලියාකිම් ද ලේකම් වන ෂෙබ්නා ද
ජ්‍යෙෂ්ඨ පූජකයන් ද ආමොස්ගේ පුත්‍ර වූ යෙසායා
දිවැසිවරයා වෙත යැව්වේ ය. 3 ඔවුන් අතේ රජතුමා
යෙසායා වෙත යැවූ පණිවුඩය මෙසේ ය: “අද දුක ද
තර්ජනය ද අපහාසය ද ඇති දවසක් ය. අපි දරුවකු
බිහි කරන්න සිටින නමුත්, එසේ කිරීමට නොහැකි
තරමට දුර්වල වන ස්ත්‍රියක හා සමාන ය.
4 අසිරියාවේ අධිරාජයා ජීවමාන දෙවියන්
වහන්සේට අපහාස කරන පිණිස ඔහුගේ ප්‍රධාන
නිලධාරියා වන රබ්-ෂාකේ ලවා කියවූ වචන අපේ
දෙවි වන සමිඳාණන් වහන්සේට ඇසෙන්නේ ඇත.
ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ මේ අපහාසයන්
අසා ඒවා කී අයට දඬුවම් කරන සේක්වා. එබැවින්
ඉතිරි ව සිටින සෙනඟ උදෙසා දෙවියන් වහන්සේට
යාච්ඤා කරන්න.”
5 යෙසායා හෙසෙකියා රජුගේ පණිවුඩය ලැබූ විට
6 ඔහු වෙත මේ පිළිතුර යැවී ය: “අසිරියාවේ
රජුගේ සේවකයන් සමිඳාණන් වහන්සේට විරුද්ධ ව
කිවූ මේ අපහාස වචන ඇසූ විට ඒ ගැන බිය
නොවන්න. 7 මම, තම දේශයට හැරී යාමට
ආරංචියක් ඇසෙන පිණිස අධිරාජයා පිට ආත්මයක්
පමුණුවන්නෙමි. ඔහු තම දේශයේ දී කඩුවෙන් වැටී

යාමට සලස්වන්නෙමි යි සමිඳාණන් වහන්සේ
වදාරන සේක.”

### අසිරියාවෙන් තවත් තර්ජනයක්

(2 රාජා 19:8-19)

8 අසිරියාවේ අධිරාජයා ලාකීෂ් හැර ගොස් ලිබ්නා
නුවරට විරුද්ධ ව සටන් කරන බව අසා ඔහු හමුවන
පිණිස ප්‍රධාන නිලධාරියා එතැනට ගියේ ය.
9 ඉතියෝපියාවේ රජ වූ තිර්හාකා මිසරයේ
හමුදාවන් සමඟ අසිරියන්වරුන්ට පහර දෙන පිණිස
එති යි ඔවුන්ට ආරංචියක් ලැබිණ. අධිරාජයා මෙය
ඇසූ විට හෙසකියා රජු වෙත පණිවුඩකාරයන්
යවමින්, 10 ජුදාවේ රජ වූ හෙසකියාට මෙසේ
කියන්න කීවේ ය: “මාගේ අතට ජෙරුසලම අසු
නොවන්නේ යයි කියන, ඔබ විශ්වාසය තබන
දෙවියන් වහන්සේගේ වචනයට නොරැවටෙන්න.
11 අසිරියාවේ රජවරුන් සියලු දේශයන් සහමුලින් ම
විනාශ කළ හැටි ඔබ අසා ඇත. එසේනම්, ඔබට
ගැළවෙන්න පුළුවන් යයි ඔබ සිතන්නෙහි ද?
12 මගේ මුතුන්මිත්තෝ ගෝෂාන්, හාරාන් හා
රෙශෙප් යන නගර විනාශකර තෙලස්සාර්හි සිටි
ඒදෙන් ජාතිකයන් මරා දැමුවෝ ය. ඒ ජාතීන්ගේ
දෙවිවරුන්ගෙන් කිසිවකුට ඔවුන් ගළවාගත
නොහැකි විය. 13 හමාත්, අර්පාද්, සෙපර්වායිම්,
හේනා, ඉව්වා යන නුවරවල සිටි රජවරු දැන්
කොහේ ද?”
14 හෙසකියා පණිවුඩකාරයන්ගේ අතින් ලියුම
ගෙන එය කියවා දේව මාලිගාවට ගොස් සමිඳාණන්
වහන්සේ ඉදිරියේ ලියුම තබමින්, 15 මෙසේ
යාච්ඤා කළේ ය. 16 නික්ම 25:22“කෙරුබ්වරුන්ට
ඉහළින් සිංහාසනාරූඪ ව සිටින ඉශ්රායලේවරුන්ගේ
දෙවි වන සියලු බලැති සමිඳුනි, ඔබ පමණක්
ලොවේ සියලු රාජ්‍යයන් පාලනය කරන දෙවියන්
වහන්සේ ය. අහසත් පොළොවත් මැව්වේ ඔබ
වහන්සේ ය. 17 දැන් සමිඳාණන් වහන්ස, කන්
යොමා අපට සවන් දුන මැනව. නෙත් යොමා අප
දෙස බැලුව මැනව. ජීවමාන දෙවියන් වන ඔබට
අපහාස කරන පිණිස සෙනකෙරිබ් කියන සියලු දේට
සවන් දුන මැනව. 18 සමිඳාණන් වහන්ස, අසිරියාවේ
අධිරාජවරුන් බොහෝ රාජ්‍යයන් විනාශකර, ඒ
දේශයන් පාළුකර 19 ඔවුන්ගේ දෙවිවරුන් ගින්නෙහි
දවා ලූ බව අපි දනිමු. ඒ දෙවිවරුන් ඇත්ත වශයෙන්
දෙවිවරුන් නොව, මිනිසුන්ගේ අත්වලින් සාදන ලද ලී
හා ගල් පිළිම පමණකි. එබැවින් ඒවා විනාශ විය.
20 දැන් ඉතින් අපගේ දෙවි සමිඳාණන් වහන්ස, ඔබ
පමණක් දෙවියන් වහන්සේ වන බව ලෝකයේ
සියලු ජාතීන් දැනගන්න පිණිස අසිරියන්වරුන්ගේ
අතින් අප ගැළවේව මැනව!”

### රජතුමාට යසොයාගේ පණිවුඩය

(2 රාජා 19:20-37)

21 එවිට අසිරියාවේ රජු වන සෙනකෙරිබ් පිළිබඳ
ව කළ යාච්ඤාවට ඉශ්රායලේවරුන්ගේ දෙවි වන
සමිඳාණන් වහන්සේ විසින් දෙන ලද පිළිතුර මේ
යැයි ආමොස්ගේ පුත්‍ර වූ යසොයා තමේ
හෙසකියා රජ වෙත පණිවුඩයක් යැව්වේ ය. 22 ඔහු
ගැන සමිඳාණන් වහන්සේ වදාරන වචනය මෙසේ
ය;
q222 “සියොන් කන්‍යා දියණිය, නුඹට අවඥාවෙන්
සරදම් කරන්නී ය.
q222 ජෙරුසලම් දියණිය, නුඹට සමච්චල් කරමින්
සිනාසෙන්නී ය.
23 නුඹ නින්දා කළේත්, අපහාස කළේත්
කවරකුට ද කියා නුඹ සිතන්නෙහි ද?
q223 නුඹ නින්දා අපහාස කළේ වෙන කිසිවකුට
නොව, ඉශ්රායලේවරුන්ගේ ශුද්ධ දෙවිඳුන් වන මට
ය.
24 නුඹේ රථ වාහන මඟින් නුඹ උස් කඳු,
ලෙබනොන් කන්ද, ලෙබනොන් කන්දේ මුදුන පවා,
අල්ලාගත්තෙහි යයි මා ඉදිරියේ නුඹේ සේවකයන්
ලවා පුරසාරම් දෙඩෙව්වෙහි ය.
q224 එහි උස් වූ කිහිරි ගස් හා අනගි දේවදාර ගස්
නුඹ කපාදැම්මෙහි යයි ද කඳු මුදුන්වලට හා
වනාන්තරවල ඉතා දුර තැන්වලට නුඹ ගියෙහි යයි ද
ආඩම්බරයෙන් කීවෙහි ය.
25 නුඹ විදේශීය රටවල ළිං හාරා, වතුර බිව්වෙහි ය
කියා ද නුඹේ භේවායෝ නයිල් ගඟ වේළෙන තුරු
එය පයින් පෑගුවෝ ය කියා ද කීවෙහි ය.
26 මේ සියල්ල කරන්න මා පුරාණයේ සිට ම
අදහස් කර අධිෂ්ඨාන කළ බව නුඹ නොදන්නෙහි ද?
q226 ඒවා දැන් මම ඉටු කළෙමි.
q226 පවුරු ඇති නගර නාස්ති කොට ඒවා නටබුන්
ගොඩවල් කරන්න නුඹට බලය දුන්නේ මම ය.
27 එහි සිටි සෙනඟ බලෙහීන ය;
q227 ඔව්හු කැළඹී වියවුල් වූවෝ ය.
q227 ඔව්හු කෙතේ තණ කොළ ද අමු පලා ද පියසි
උඩ තණ කොළ ද වැඩෙන්න පළමුවෙන් වියළී ගිය
ගොයම් ද මෙන් වූ හ.
28 එහෙත්, නුඹේ ඉඳුම්හිටුම් ද නුඹේ යාම්ඊම් ද
මට විරුද්ධ ව නුඹේ කැරලිකාරකම් ද දැන් මම
දනිමි.
29 මට විරුද්ධ ව තිබෙන නුඹේ කැරලිකාරකම නිසා
ද නුඹේ අහංකාර වචන මාගේ කන්වල වැකුණ
නිසා ද නුඹේ නාසයේ කොක්කක් අමුණා, කටේ
කටකලියාවක් දමා නුඹ පැමිණි මාර්ගයේ ම නුඹ
ගෙන යන්නෙමි.”
30 එවිට යසොයා හෙසකියා රජුට මෙසේ කී ය:
“සිදු වන්න යන දේ පිළිබඳ ව මෙන්න ඔබට
ලකුණක්: මේ අවුරුද්දේ ඉබේ හටගත් දයෙන් ඔබ
කන්නෙහි ය; දෙ වන අවුරුද්දේ ඔබට කන්න
ලැබෙන්නේ එයින් ඇති වන දයෙයි. තුන් වන
අවුරුද්දේ දී ඔබට ධාන්‍ය වපුරා අස්වැන්න

කපාගන්නත්, මිදි වතු වවා මිදි පල කන්නත් හැකි
වන්නේ ය. 31 ජුදා දේශයේ නොමැරී ඉතිරි වන අය
ගැඹුරට මුල් ඇදගෙන පල දරන ගස් මෙන්
සමෘද්ධිමත් වන්නෝ ය. 32 සියලු බලැති සමිඳාණන්
වහන්සේ අධිෂ්ඨානකර ඇති පරිදි ජෙරුසලමේ හා
සියොන් කන්දේ නොමැරී ඉතිරි වන කොටසක්
වන්නෝ ය.
33 “අසිරියාවේ අධිරාජයා ගැන සමිඳාණන්
වහන්සේ වදාරා ඇති දේ මෙසේ ය: ‘ඔහු මේ
නුවරට ඇතුළු වන්නේ වත්, ඊගසක් ඊට විදින්නේ
වත්, ඒ ඉදිරිපිට පලිහක් රුගෙන එන්නේ වත්, එය
වටලෑම සඳහා පවුරු බඳින්නේ වත් නැත. 34 ඔහු
පැමිණි පාරෙන් ම ආපසු යනවා ඇත. ඔහු නුවරට
ඇතුළු වන්නේ නැත. මෙසේ පවසන්නේ ස්වාමීන්
වන මම ය. 35 මාගේ ගෞරවය සඳහාත්, මාගේ
සේවක දාවිත්ට කළ පොරොන්දුව නිසාත් මේ
නගරය රැක බලා ගළවාගන්නෙමි.”
36 ඒ රාත්‍රියේ දී සමිඳාණන් වහන්සේගේ දූතයා
පිටත් ව ගොස් අසිරියන්වරුන්ගේ කඳවුරෙහි
එක්ලක්ෂ අසූපන්දහස් දෙනෙකුට පහර දුන්නේ ය.
එළිවන විට ඔව්හු සියල්ලෝ ම මළකඳන් වූ හ.
37 එවිට අසිරියාවේ අධිරාජයා වූ සෙනෙකෙරිබ්
තමෙේ පසු බැස නිනිවයට ආපසු ගියේ ය. 38 දිනක්
ඔහු තමාගේ දෙවි වූ නිස්රොක්ගේ දේවාලයේ
නමස්කාර කරමින් සිටිය දී, ඔහුගේ පුත්‍රයන් වූ
අදුම්මලෙක් හා ෂරශෙරේ ඔහු කඩුවෙන් මරාදමා
අරාරාත් රටට පලා ගියෝ ය. ඒසර්-හද්දොන් නම්
ඔහුගේ තවත් පුත්‍රයෙක් ඔහු වෙනුවට අධිරාජයා
වශයෙන් පත් විය.

### හෙසකියා රජුගේ රෝගය සහ සුවය
(2 රාජා 20:1-11;2 වංශා 32:24-26)

38 ඒ කාලයේ දී හෙසකියා රජු මරණාසන්න
වන තරම් රෝගාතුර විය. ආමොස්ගේ පුත්‍ර
වූ යසොයා දිවැසිවරයා ඔහු ළඟට අවුත්, “ඔබ සනීප
නොවී මැරෙන බැවින් සියලු දේ පිළියෙළ කොට
තැබිය යුතු යයි සමිඳාණන් වහන්සේ වදාරන
සේකැ”යි කීවේ ය.
2 එවිට හෙසකියා සිය මුහුණ බිත්තිය දෙසට
හරවාගෙන සමිඳාණන් වහන්සේට යාච්ඤා කරමින්,
3 “අහෝ සමිඳාණන් වහන්ස! මා විශ්වාසී ලෙසත්,
අවංක සිතකිනුත් ඔබට සේවයකර, ඔබේ ඇස්
හමුවෙහි හරි ව තිබෙන දේ කළ බව සිහිකළ
මැනව” කියා තදින් හැඬුවේ ය.
4 එවිට සමිඳාණන් වහන්සේ යසොයාට අණ
කරමින්, 5 හෙසකියා වෙත ආපසු ගොස් මෙසේ
කියන ලෙස වදාළ සේක: “නුඹේ ආදි පියා වූ දාවිත්
රජුගේ දෙවි ස්වාමීන් වන මම නුඹේ යාච්ඤාව
ඇසීමි; නුඹේ කඳුළු දිටිමි. තව අවුරුදු පහළොවක්
ජීවත් වීමට මම නුඹට වරම් දෙමි. 6 මම අසිරියන්
අධිරාජයාගේ අතින් නුඹ සහ මේ නුවර ගළවා
තවදුරටත් ආරක්ෂා කරමි.”
21 යසොයාකතා කොට, “අත්තික්කා පලවලින්
සාදාගත් විලේපනයක් වණය පිට තබන්නැ”යි ද,
“එවිට සුවය ලැබෙන්නේ ය”යි ද රජුට කීවේ ය.
22 හෙසකියා කතා කොට, “මා සමිඳාණන්
වහන්සේගේ මාලිගාවට යන බවට ඇති ලකුණ
කුමක් දැ”යි ඇසී ය.
7 යසොයා පිළිතුරු දෙමින්, “සමිඳාණන් වහන්සේ
සිය පොරොන්දුව ඉටුකරන බවට ඔබට ලකුණක්
දෙන සේක. 8 එනම්, ආහාස්ගේ සූර්ය හෝරා
යන්ත්‍රයේ මණ්ඩලය පිට වැටෙන බැස යන
දිනිසුරුගේ සවෙණැල්ල අංශක දහයක් පස්සට යන්න
උන් වහන්සේ සලස්වන සේකැ”යි කී ය. එකී පරිදි
සූර්ය හෝරා යන්ත්‍රයේ මණ්ඩලය පිට වැටුණු
සවෙණැල්ල අංශක දහයක් පස්සට ගියේ ය.
9 ජුදාහි රජ වූ හෙසකියා රෝගී ව සිට සුවපත් වූ
පසු හෙතෙමෙ මේ ප්‍රශංසා ගීතය ලිව්වේ ය:
10 “මාගේ ජීවිතයේ මේ උපරිම කාලයේ දී
ජීවිතයේ ඉතිරි කොටස ගවෙන පිණිස පාතාල
ලෝකයට යන්න මට සිදුවේ ය කියා මම සිතුවෙමි.
11 ජීවතුන් සිටින මේ ලෝකයේ සමිඳුන් වත්,
අන්කිසි දිවි ඇත්තෙකු වත් කිසි කලෙක දකින්න මට
නොලැබේ ය කියා මම සිතුවෙමි.
12 ගලවා, ඉවතදැමූ එඬේර කූඩාරමක් සේ මාගේ
ජීවිතය අවසන් වේ යැයි මම සිතුවෙමි.
q212 වියන්නා, යන්ත්‍රයේ වියන රෙද්ද අකුළා,
කපාදමන සේ දවේඳාණෝ මාගේ ජීවිතය එක
දවසින් අවසාන කරන සේකැ යි මම සිතුවෙමි.
13 සිංහයෙකු මාගේ ඇටකටු බිඳින සේ මට දැනී,
මම මුළු රෑ ම වේදනාවෙන් හැඬුවෙමි.
q213 දවේඳාණෝ මාගේ ජීවිතය එක දවසින්
අවසාන කරන සේකැ යි මම සිතුවෙමි.
14 මාගේ කට හඬ සිහින් ය, දුර්වල ය;
q214 වැහි ලිහිණියෙකු මෙන් මම කඳෙිරිගෑමි;
q214 පරවියෙකු මෙන් වැලපුණෙමි.
q214 උඩ බැලීමෙන් මාගේ ඇස් දුර්වල විය.
q214 අහෝ, සමිඳුනි!
q214 මේ සියලු දුකින් මා මිදුව මැනව.
15 මම කුමක් කියම් ද?
q215 මා මැසිවිලි කියන්නේ කෙසේ ද?
q215 මයෙ කළෙේ සමිඳාණෝ ම ය.
q215 ජීවිතය මට තිත්ත වී ඇත;
q215 මට නිදාගත නොහැක.
16 අහෝ, සමිඳුනි!
q216 මිනිසාගේ ජීවිතය මබෙඳු වන්නේ ය.
q216 මා සුවපත්කර, මා ජීවත් කළ මැනව.
17 එවිට මාගේ දොම්නස සොම්නසට හැරුණෙ
ඇත.
q217 ඔබ තුමාණෝ, සියලු අනතුරෙන් මා මුදන
සේක;
q217 මාගේ සියලු පව් කමා කරන සේක.
18 ඔබට තුති පිදීමට පාතාලයට නොහැක;
q218 ඔබට ප්‍රශංසා කිරීමට මරණයට නොහැක.
q218 ඔබ කෙරෙහි විශ්වාස කරන්න මළගියවුන්ට
නොහැක.

19 මා ඔබට දැන් ප්‍රශංසා කරන්නාක් මෙන් ඔබට
ප්‍රශංසා කරන්නේ ජීවතුන් අතර සිටින අය ම ය.
q2 19 ඔබේ විශ්වාසවන්තකම ගැන පියවරු සිය
දරුවන්ට කියති.
20 "සමිඳාණනි, ඔබ මා සුවපත් කළ සේක.
q2 20 එබැවින් අපි දිවි හිමියෙන් වීණා වාදනය
කරමින්, ඔබට ප්‍රශංසා කරමු;
q2 20 ඔබේ මාලිගාවේ දී ඔබට ප්‍රසංසා කරමු."

### බබිලෝනියෙන් රාජ දූතයන් පැමිණීම

(2 රාජා 20:12-19)

39 ඒ කාලයේ දී බලදාන්ගේ පුත්‍ර වූ
බබිලෝනියේ රජ වූ මරෙරොදක්බලදාන්
තමේ හසෙකියා ලඩේන් සිට සුවපත් වූ බව අසා
ලියුමක් සහ තෑග්ගක් ඔහු වෙත එව්වේ ය.
2 හසෙකියා රාජ දූතයන් පිළිගෙන තමන් සතුරන් රිදී
ද සුවඳ ද්‍රව්‍ය ද අනර්ඝ තලේ ද තමාගේ මුළු
යුද්ධායුධ ද තම ගබඩාවේ තිබුණු සියල්ල ද ඔවුන්ට
පෙන්නුවේ ය. හසෙකියා තමාගේ මාලිගාවේ වත්,
මුළු රාජ්‍යයෙහි වත් ඔවුන්ට නොපෙන්වූ කිසිවක්
නොතිබුණේ ය. 3 එවිට දිවැසිවර යෙසායා,
හසෙකියා වෙත ගොස්, "ඒ අය ආවේ කොහෙන් ද?
ඔබට ඔවුන් කීවේ කුමක් දැ"යි ඇසී ය. "ඔව්හු දුර
රටක් වන බබිලෝනියේ සිට ආවෝ ය"යි හසෙකියා
පිළිතුරු දුන්නේ ය.
4 "ඔව්හු රජ මැදුරේ කුමක් දුටුවෝ දැ"යි යෙසායා
ඇසී ය. "ඔව්හු සියල්ල ම දුටුවෝ ය. මාගේ
ගබඩාවල ඔවුන්ට නොපෙන්වූ දයෙක් නැතැ"යි
හසෙකියා පිළිතුරු දුන්නේ ය.
5 එවිට යෙසායාතුමා රජුට මෙසේ කී ය: සියලු
බලැති සමිඳාණන් වහන්සේගේ මේ වචනය
අසන්න. 6 ඔබේ රජ මැදුරේ ඇති සියල්ලත්, මේ
දවස දක්වා ඇති ඔබේ මුතුන්මිත්තන් රැස් කළ
සියලු දේත් කිසිවක් ඉතිරි නොකොට, බබිලෝනියට
ගෙනයනු ලබන කාලයක් පැමිණෙන්නේ ය. 7 දානි
1:1-7; 2 රාජා 24:10-16; 2 වංශා 36:10ඔබේ ම
පළෙපතනේ පැවත එන දරුවන්ගෙන් සමහරෙක් ද
ගෙනයනු ලබන්නෝ ය. ඔවුන් නපුංසකයන් මෙන්
බබිලෝනියේ රජුට සේවය කරනු ඇතැ යි
සමිඳාණන් වහන්සේ වදාරන සේක."
8 මේ කී දේ හසෙකියා තේරුම්ගත්තේ, තමාගේ
ම ජීවිත කාලයේ දී සාමයත්, සුරක්ෂිතතාවත් ඇති
වේ ය කියා ය. ඒ නිසා, "සමිඳාණන් වහන්සේගේ
පණිවුඩය යහපත් ය"යි ඔහු යෙසායාට කීවේ ය.

### බලාපොරොත්තුවේ වදන්

40 " සනසන්න, මාගේ සෙනඟ සනසන්නැ"යි
ඔබේ දෙවිඳාණෝ වදාරන සේක.
2 "කරුණාවෙන් ජෙරුසලම් වැසියන්ට කතා කරන්න;
q2 2 හඬ නඟා ඔවුන්ට මෙසේ කියන්න: ඔවුන්ගේ
වහල්කමේ කාලය දැන් ඉවර වී ඇත;
q2 2 පව් කමාව ඔවුන්ට ලැබී ඇත.
q2 2 සියලු පව්වලට දඬුවම දෙගුණය බැගින්
සමිඳුන්ගේ හස්තයෙන් ම ඔවුන්ට ලැබී ඇත."
3 මතෙ 3:3; මාක් 1:3; ජොහ 1:23 ලූක් 3:4-6
මෙසේ කියන හඬට සවන් දෙන්න:
q2 3 "වනාන්තරයේ සමිඳුන් හට මාවතක් එළි
කරන්න;
q2 3 පාළුකරයේ අපේ දෙවිඳුන් හට මහ පාරක්
සාදන්න.
4 සියලු මිටියාවත් පුරවනු ලබන්නේ ය;
q2 4 සියලු කඳු හලේ කපා පහත් කරනු ලබන්නේ
ය;
q2 4 සියලු හලේ සමතලා කරනු ලබන්නේ ය;
q2 4 රළු තැන් සුමුදු කරනු ලබන්නේ ය;
5 සමිඳුන්ගේ තේජාලංකාරය එවිට එළිදරව්
වන්නේ ය.
q2 5 සකල මිනිස් වර්ගයා එය නරඹන්නෝ ය.
q2 5 මෙසේ වදාළේ සමිඳාණෝ ම ය."
6 ජාකො 1:10-11; 1 පේදු 2:24-25 "පණිවුඩයක්
ප්‍රකාශ කරන්නැ"යි හඬක් කී ය.
q2 6 "කුමන පණිවුඩයක් ප්‍රකාශ කරම් දැ"යි මම
ඇසීමි.
q2 6 "සකල මිනිස් වර්ගයා තණ කොළ හා සමාන
වෙති;
q2 6 ඔහුගේ සුන්දරතාව වන මල් මෙන් පහ වී යයි.
7 සමිඳුන්ගේ හුස්ම වැදුණ විට තණ කොළ වියළී
යයි;
q2 7 මල් පර වෙයි.
q2 7 මිනිස් වර්ගයා ඒ තණ කොළ හා සමාන ය.
8 තණ කොළ වියළයි;
q2 8 මල් පර වෙයි.
q2 8 එහෙත්, අපේ දෙවිඳුන්ගේ වචනය සදහට ම
පවතියි."
9 සියොන්ට සුබ ආරංචිය ගෙනෙන දූතයාණෙනි,
උස් කන්දට නඟින්න;
q2 9 සියොන්ට සුබ ආරංචිය දන්වන්න.
q2 9 ජෙරුසලමට සුබ ආරංචිය ගෙනෙන දූතයාණෙනි,
හඬ නඟා ප්‍රකාශ කරන්න;
q2 9 බිය නොවී උස් හඬින්, "ඔබේ දෙවිඳාණෝ
වඩින සේකැ"යි ජුදාහි නගරවලට ප්‍රකාශ කරන්න.
10 යෙසා 62:11; එළිද 22:12 මහෝත්තම දෙවි
ස්වාමීන් වහන්සේ බලපරාක්‍රමයෙන් වඩින සේක.
10 වික්‍රමයෙන් පාලනය කරන්න වඩින සේක.
q2 10 ත්‍යාගයන් එතුමාණෝ තමන් සමඟ ගෙන එන
සේක.
q2 10 තම සෙනඟට විපාකයන් ප්‍රදානය කරන
සේක.
11 එසකි 34:15; ජොහ 10:11 එඬේරෙකු සේ
එතුමාණෝ, තම රැළ පෝෂණය කරන සේක;
q2 11 දෑතින් බැටළු පැටවුන් වඩාගෙන, ළයෙහි උන්
හොවාගෙන යන සේක;
q2 11 කිරි දෙන බැටළුදෙනුන්ට මඟපෙන්වන සේක.

### අසමසම මැවුම්කාරයාණෝ

12 මුහුදේ ජලය අල්ලට ගන්නත්, අහසේ දිග
වියතකින් මනින්නත් කිසිවකුට හැකි ද?
q2[12] පොළොවේ පස් හුණ්ඩුවක දමන්නත්, කඳු
හලේවල බර තරාදියකින් කිරන්නත් කිසිවකුට
හැකි ද?
13 රෝම 11:34; 1 කොරි 2:16 කළ යුතු දේ
සමිඳුන්ට කියා දන්නේත්, එතුමන්ට ගුරුකම් හා
අවවාද දෙන්නේත්, කිසිවකුට හැකි ද?
14 දැනගැන්මත්, අවබෝධයත් ලබාගැනුමටත්, යුතු
අයුතු ක්‍රියා මාර්ගය වටහාගැනුමටත් එතුමාණන්
සාකච්ඡා කරන්නේ කවරකු සමඟ ද?
15 ජාතීහු සමිඳුන් හට කළයනේ හැළෙන දිය
පොදක් ද තරාදියේ ඇති ධූලි බිඳක් ද හා සමාන ය.
q2[15] දූර පිහිටි දිවයින් තරාදියේ කිරා බලන ධූලි
පිඩක් හා සමාන ය.
16 සමිඳුන් හට දවන යාග පූජාවක් කරන පිණිස
ලබෙනොන් වනයේ සියලු ගස් වත් දරට
නොසෑහේ.
q2[16] එහි සියලු සත්තු පූජාවට නොසෑහතේ.
17 සමිඳුන් ඉදිරියේ, සියලු ජාතීහු කිසි වටිනාකමක්
නැත.
q2[17] ඔව්හු හිස් ය;
q2[17] ඔවුන්ගේ කිසි වැදගැම්මක් නැත.
18 ක්‍රියා 17:29 දෙවිඳාණන් කවරකුට සමකළ
හැකි ද?
q2[18] එතුමන්ගේ හැඩ රුව කසෙේ විස්තර කළ
හැකි ද?
19 කම්කරුවකු වාත්තු කළ, රන්කරුවකු රන්
ආලේප කළ රිදී දාමයනේ සරසන ලද පිළිමයකට
එතුමන් සමාන නැත.
20 වත්කම් ඇති මිනිසකු නොදිරන ලීයක් සපයා
ගෙන, නිපුණ කම්කරුවකු යොදවා ගෙන, තිරසර
ලසෙ තනාගත් පිළිමයට එතුමන් සමාන නැත.
21 ලෝකය ආරම්භ වූ අන්දම ගැන ඔබ දන්නේ
නැද් ද?
q2[21] අසා නැද් ද? මුල සිට ම ඔබට දන්වා නැද් ද?
22 ලෝකය මැවුයේ, පොළොවනේ ඉහළ අහසින්
එපිට සිංහාසනයේ වැඩ සිටින තැනැන් වහන්සේ ය.
q2[22] එතුමන්ට ලෝ වැසියන් පනෙනේනේ කුරා
කුහුඹුවන් සේ ය.
q2[22] මිහිමත වාසය කරන පිණිස එතුමාණෝ අහස
ඇතිරිල්ලක් මනේ විහිදුවා, කූඩාරමක් මනේ දිගහැර
දුන් සේක.
23 අධිපතීන් නැති නාස්ති කරන්නේත්, ලොවේ
පාලකයන් සුණු විසුණු කරන්නේත්, එතුමාණෝ ය.
24 ඔව්හු වනාහි සිටුවා වැඩි කල් නොගිය,
පොළොවේ මුල් ඇද නොගත් ළා පැළෑටි හා සමාන
ය.
q2[24] සමිඳාණන් සුළඟක් එවූ විට පිදුරු මනේ ඒවා
වියළී යනු ඇත;
q2[24] ඉපනැලි මනේ ගසාගනෙ යනු ඇත.
25 සුවිශුද්ධ දෙවිඳුන් සමාන කළ හැක්කේ
කවරකුට ද?
q2[25] එතුමන්ට සමාන අන් කිසිවකේ සිටින්නේ ද?
26 අහස දසෙ බලන්න, ඔබට පනෙනෙ ග්‍රහ
තාරකා මැවුවේ කවරකේ ද?
q2[26] හමුදාවන් මනේ ඒවා ගනෙ යන්නේ, ඒවායේ
ගණන දැන සිටින්නේ, නම් වශයනේ ඒවා
හඳුනන්නේ දෙවිඳාණෝ ය.
q2[26] එතුමන්ගේ බලයේ මහත්කම නිසා ද
එතුමන්ගේ ශක්තියේ බලවත්කම නිසා ද එයින්
එකක් වත් නැති නොවේ.
27 අහෝ, ඉශ්රායලේ සනෙඟනේ!
q2[27] අහෝ, ජාකොබ්ගේ සනෙඟනේ!
q2[27] සමිඳාණෝ ඔබේ දුක් නොදන්න සේක කියාත්,
ඔබේ අයිතිවාසිකම් නොසලකන සේක කියාත් ඔබ
මැසිවිලි කියන්නේ මන් ද?
28 සමිඳුන්, සදාතන දෙවිඳුන් බවත්, සකල ලෝකය
මැවූ බවත්, එතුමන්ට වහෙසෙ මහන්සි නොදැනනෙ
බවත්, එතුමන්ගේ ප්‍රඥාව අචින්ත්‍ය බවත් ඔබ
දන්නේ නැද් ද?
q2[28] අසා නැද් ද?
29 එතුමාණෝ, ක්ලාන්ත වන අයට ශක්තියත්,
බලහීනයන්ට සවියත් දනෙ සේක.
30 තරුණයෝ පවා දුබල වතේ;
q2[30] යෞවනයෝ පවා වහෙසෙ වී වැටතේ.
31 එහතේ, සමිඳුන් සරණ යන්නෝ සිය සවිය අලුත්
කරගන්නෝ ය;
q2[31] රාජාලීන් මනේ පියාපත් විදහා යන්නෝ ය;
q2[31] ඔව්හු දුවන්නෝ ය;
q2[31] එහතේ, වහෙසෙ නොවන්නෝ ය;
q2[31] ඇවිදින්නෝ ය;
q2[31] එහතේ, ක්ලාන්ත නොවන්නෝ ය.

### ඉශ්රායලේට දෙවියන් වහන්සේගේ පොරොන්දුව

41 දෙවියන් වහන්සේ මසෙේ වදාරන සේක:
q2
41 "ද්වීපවල හා මුහුදුබඩ වැසියනේ, මා ඉදිරියේ
නිශ්ශබ්ද ව මට සවන් දනේන.
q2
41 අධිකරණය ඉදිරියේ නුඹේ නඩුව තබන්න
සූදානම් වන්න.
q2
41 කතා කිරීමට අවස්ථාවක් ලැබනෙු ඇත.
q2
41 නිවැරදිකරු කවරකේ දැ යි විනිශ්චය කිරීමට
අපි එක් රැස් වමු.
2 පරෙදිගින් ජයග්‍රාහකයකු කැඳවා, දිරි ගන්වා, යන
යන තැන ඔහුට ජය අත්පත් කර දුන්නේ කවරකේ
ද?
q2[2] ඔහුට රට රාජ්‍යයන් පාවා දී රජවරුන් ඔහුට
යටත් කර දුන්නේ කවරකේ ද?

q2 2 ඔහු සිය කඩුවෙන් ඔවුන් ධූලි බවටත්, සිය
දුන්නෙන් ඔවුන් සුළඟට ගසා යන පිදුරු බවටත්
පමුණුවන්නේ ය.
3 ඔහු, කිසිවකු පා නොතැබූ මාවත්වල ඔවුන්
ලුහුබැඳ සුරැකි ව ඉදිරියට යන්නේ ය.
4 මුල සිට ම ඉතිහාසය යන මාර්ගය නියම කොට
මේ සියල්ල සිදු වන්න සැලසුවේ කවරෙක් ද?
q2 4 සමිඳාණන් වන මම ය.
q2 4 ආරම්භයත්, අවසානයත් වන සමිඳාණෝ මම ය.
5 මා කර ඇති දේ දැක ද්වීප හා මුහුදුබඩ වාසීහු
බියෙන් වෙව්ලුවෝ ය.
q2 5 ඒ නිසා ඔව්හු එක් රැස් වූ හ.
6 එක එකා තම තමාගේ අසල්වැසියාට උපකාර
කොට, තම තමාගේ සහෝදරයන්ට 'ධෛර්යවත්
වන්නැ'යි කියති.
7 කම්කරුවා රන්කරුවාට ද මිටියෙන් පිළිමය මට්ටම්
කරන්නා කිණිහිරය පිට තළන්නාට ද ධෛර්යය
දෙන්නෝ ය.
q2 7 'පෑස්සීම හොඳ ය'යි කෙනෙක් කියති. ඔව්හු
පිළිමය නොසෙල්වෙන සේ ඇණවලින් සවි කරති.
8 2 වංශා 20:7; ජාකො 2:23 එහෙත්, මාගේ
සේවකයා වන ඉශ්‍රායලේ ජාතිය, මාගේ මිත්‍රයා වූ
ආබ්‍රහම්ගෙන් පැවත එන නුඹ මා තෝරාගත්
සෙනඟක් ය.
9 පොළොවේ කෙළවරින් මම නුඹ ගෙනාවෙමි.
q2 9 එහි සීමාවලින් නුඹ කැඳවා, 'නුඹ මාගේ
සේවකයා ය'යි මම කීවෙමි.
q2 9 මම නුඹ ප්‍රතික්ෂේප නොකෙළෙමි.
q2 9 නුඹ තෝරාගත්තෙමි.
10 බිය නොවන්න;
q2 10 මම නුඹ සමඟ ය.
q2 10 මා නුඹේ දෙවිඳාණන් වන බැවින් තැති
නොගෙන සිටින්න.
q2 10 මම නුඹ ශක්තිමත් කර නුඹට උපකාර
කරන්නෙමි.
q2 10 මාගේ ජය හස්තයෙන් නුඹ ආරක්ෂා කර නුඹ
ගළවන්නෙමි.
11 "නුඹ සමඟ වෛර ව සිටි සියල්ලෝ ලජ්ජා වී
වියවුල් වන්නෝ ය.
q2 11 නුඹට විරුද්ධ වන්නෝ නැති නාස්ති වී විනාශ
වන්නෝ ය.
12 නුඹ සමඟ විවාදයට එළඹෙන මනුෂ්‍යයකු නුඹ
සොයන නමුත්, ඔවුන් හමු වන්නේ නැත.
q2 12 නුඹ සමඟ යුද්ධ කරන්නෝ විනාශ වී
පොළොවෙන් අතුරුදහන් වන්නෝ ය.
13 මම නුඹේ දෙවිඳාණෝ ය, 'බිය නොවන්න,
නුඹට පිහිට වන්නෙමි'යි කියමින් මම නුඹ ශක්තිමත්
කරන්නෙමි."
14 සමිඳාණෝ නුඹේ දකුණත අල්ලාගනිමින් මෙසේ
වදාරන සේක:
q2 14 "ඉශ්‍රායලේවරුනි, පණුවකු වැනි නුඹලා කුඩා
ව, දුර්වල ව සිටියත් බිය නොවන්න.
q2 14 මම නුඹලාට පිහිට වන්නෙමි.
q2 14 නුඹලා ගළවාගන්න, ඉශ්‍රායලේවරුන්ගේ
සුවිශුද්ධ දෙවිඳාණෝ මම ය.
15 මම නුඹලා මුවහත්, අලුත් දැති ඇති මඬින
යන්ත්‍රයක් මෙන් කරන්නෙමි.
q2 15 නුඹලා කඳු මැඩ, පොඩිකර, හලේ බොල් වී
මෙන් කරන්නහු ය.
16 නුඹලා ඒවා පොළන්නහු ය.
q2 16 එවිට ඒවා, සුළඟට ගසාගෙන යන්නේ ය.
q2 16 සුළි සුළඟින් විසිරී යන්නේ ය.
q2 16 එහෙත්, මම නුඹලාගේ දෙවිඳාණන් වන බැවින්
නුඹලා ප්‍රීති වන්නහු ය.
q2 16 ඉශ්‍රායලේවරුන්ගේ සුවිශුද්ධ දෙවිඳාණන් වන
මට නුඹලා ප්‍රශංසා කරන්නහු ය.
17 අසරණ දිළිඳු අය වතුර සොයා එය නො ලැබ,
උගුර කට වේළී පිපාසයෙන් සිටින විට සමිඳාණන්
වන මම ඔවුන්ගේ යැදුම්වලට පිළිතුරු දෙන්නෙමි.
q2 17 ඉශ්‍රායලේහි දෙවිඳාණන් වන මම ඔවුන්
අත්නොහරින්නෙමි.
18 මම මුඩු කඳු මුදුන්වල ගංගා ගලා යන්න ද
මිටියාවත් මැද උල්පත් ඇති වන්න ද සලස්වන්නෙමි.
q2 18 කාන්තාරය මැද දිය පොකුණක් ද වියළි
දේශයෙන් උල්පත් ද ඇති කරන්නෙමි.
19 මම කාන්තාරයෙහි කිහිරි, ෂිටිම්, මරඳ හා ඔලීව
හටගන්වන්නෙමි.
q2 19 වනයෙහි දේවදාර, හල් හා සයිප්‍රස් එකට
හටගන්වන්නෙමි.
20 සෙනඟ මයෙ දැක, සමිඳුන් වන මා එය කළ බව
දැනගන්නෝ ය.
q2 20 ඉශ්‍රායලේහි සුවිශුද්ධ දෙවිඳුන් මේ දේ සිදු
කළ බව ඔව්හු තේරුම් ගන්නෝ ය."

## බොරු දෙවිවරුන්ට අභියෝගයක්

21 ඉශ්‍රායලේහි නිරිඳාණන් වන සමිඳාණෝ මෙසේ
වදාරන සේක:
q2 21 "ජාතීන්ගේ දෙවිවරුනි, නුඹලාගේ නඩුව
ඉදිරිපත් කරන්න.
q2 21 නුඹලාගේ බලවත් තර්කයන් ගෙනහැර පාන්න.
22 මෙහි පැමිණ සිදුවන්න යන දේ ගැන අපට
කියන්න.
q2 22 ඒවා සිදු වූ විට අපට දැනගන්න පුළුවන.
q2 22 සිතා බලන පිණිස පසු ගිය දේවල තේරුම
අපට කියා දෙන්න.
23 මතු සිදු වන්න යන දේවල් අපට ප්‍රකාශ
කරන්න.
q2 23 එවිට නුඹලා දෙවිවරුන් බව අපට දැනගන්න
ලැබෙනු ඇත.
q2 23 අප බිය වී තැතිගන්න පිණිස හොඳක් හෝ
නපුරක් හෝ අපට කරන්න.
24 එහෙත්, නුඹලා නිකම්මු ය;
q2 24 නුඹලාගේ ක්‍රියා බොල් ය.
q2 24 නුඹලා පිළිගන්නෝ පිළිකුලට පත්වෙති.
25 මම නැඟෙනහිරෙන් කෙනෙකු තෝරාගතිමි.

q2 25 පහර දෙන පිණිස උතුරේ සිට මම ඔහු ගෙන එන්නෙමි.
q2 25 කුම්භකාරයා මැටි පාගන්නාක් මෙන් ඔහු මැටි මෙන් පාලකයන් මැඩදමනු ඇත.
26 අප දැනගන්නා පිණිසත්, 'නුඹ හරි ය'යි කියන්න පුළුවන් වන පිණිසත්,
q2 26 නුඹලා අතරෙන්, 'මෙසේ සිදු වේ ය' කියා කල් මත්තෙන් කීවේ කවරෙක් ද?
q2 26 නුඹලාගෙන් කිසිවෙක් ඒ ගැන වචනයක් වත් නොකීවේ ය.
q2 26 නුඹලා කී දෙයක් ඇසූ කෙනෙක් වත් නැත.
27 සියොන්ට සුබ ආරංචිය පළමු වරට ප්‍රකාශ කළේ මම ය.
q2 27 'නුඹලාගේ සෙනඟ එති, ඔව්හු ගෙදර එති'යි ප්‍රකාශ කරන පිණිස ජෙරුසලමට දූතයකු යැව්වේ මම ය.
28 දෙවිවරුන් අතරේ මා සෝදිසි කළ විට ඔවුන්ගෙන් කිසිවකුට කියන්න දෙයක් නුවූ බව මට පෙනුණේ ය.
q2 28 මා ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු දීමට ඔවුන්ගෙන් කිසිවකුට නොහැකි විය.
29 මේ දෙවිවරුන් සියලු දෙනාගෙන් වැඩක් නැත.
q2 29 ඔවුන්ට කිසිවක් කළ නොහැකි ය.
q2 29 ඔවුන්ගේ පිළිම හිස් රූකඩ ය."

### සමිඳාණන් වහන්සේගේ සේවකයා

42 මතෙ 3:17; 17:5; මාක් 1:11; ලූක් 3:22; 9:35 මතෙ 12:18-21 "මා සහාය දෙන මාගේ සේවකයා මෙන්න.
q2
42 මට ප්‍රිය වූ මාගේ තෝරාගත් තැනැත්තා මෙන්න.
q2
42 මාගේ ආත්මානුභාවය මා එතුමාට ප්‍රදානය කර ඇත.
q2
42 සියලු ජාතීන්ට එතුමා යුක්තිය ගෙන දෙනු ඇත.
2 එතුමා උස් හඬින් කතා කරන්නේ වත්, මොරගසන්නේ වත් නැත;
q2 2 වීථිවල ඇසෙන පරිදි හඬ නඟන්නේ නැත;
3 තැළුණු බට දණ්ඩක් කඩාදමන්නේ නැත;
q2 3 නිවී ගෙන යන පහන් තිරයක් නිවාදමන්නේ නැත.
4 සැබැවින් ම යුක්තිය ඉටු කරන්නේ ය;
q2 4 එතුමා කලකිරෙන්නේ වත්, අධෛර්ය වන්නේ වත් නැත;
q2 4 මිහි පිට යුක්තිය පිහිටුවන තුරු එතුමාගේ දහම් මඟ උදාවන තුරු දිවයින් බලා සිටිනු ඇත."
5 ක්‍රියා 17:24-25 අහස් තලය මවා, එය පිහිටෙ වූ ද පොළෝ තලයත් එහි හටගන්න සියල්ලත් නිර්මාණය කළා වූ ද එහි වැසියන් හට පණ නළ දුන්නා වූ ද එහි යන එන සතුන්ට ජීවය දුන්නා වූ ද දෙවි සමිඳාණෝ මෙසේ වදාරන සේක:
6 යෙසා 49:6; ලූක් 2:32; ක්‍රියා 13:47; 26:23 "යුක්තිය පිහිටුවන පිණිස සමිඳාණන් වන මම නුඹ කැඳවාගතිමි.
q2 6 මම නුඹ අතින් ගෙන නුඹ හැඩගැසීමි.
q2 6 සෙනඟ හා මා අතර ගිවිසුමක් වන පිණිසත්, සියලු ජාතීන් අතර ආලෝකයක් වන පිණිසත් මම නුඹ පත් කළෙමි.
7 මා එසේ කළේ, නුඹ අන්ධයන්ගේ ඇස් පහදන පිණිසත්, සිරගෙයි සිරකරුවන් ද අඟගෙයි අඳුරෙහි වසන්නන් ද මුදන පිණිසත් ය.
8 මම සමිඳාණෝ ය;
q2 8 එය යි මාගේ නාමය.
q2 8 මාගේ තේද මහිමය අන් දෙවි කෙනෙකුට වත්, මාගේ ප්‍රශංසාව කිසි පිළිමයකට වත් මම නොදෙමි.
9 බලන්න, පෙර මා කී දේ දැන් සිදු වී ඇත;
q2 9 මතු සිදුවන අලුත් දේ සිදුවන්නත් පෙර මම ඔබට ප්‍රකාශ කරමි."

### ප්‍රශංසා ගීයක්

10 සමිඳුන් හට නව ගීයක් ගයන්න.
q2 10 මුළු ලොව පුරා පැසසුම් පතුරුවා හරින්න.
q2 10 මුහුදේ යාත්‍රා කරන, එහි ජීවත් ව සිටින, ද්වීප හා මුහුදුබඩ වැසියනි, සමිඳුන් හට පැසසුම් කරන්න.
11 කාන්තාරය හා එහි නගර ද කේදාර්හි සිටින සෙනඟ ද සේලා නගර වැසි සියල්ලෝ ද කඳු මුදුන්වල සිට ප්‍රීති ඝෝෂා නඟත් වා!
12 ද්වීප හා මුහුදුබඩ වැසියනි, සමිඳුන් හට පැසසුමත්, එතුමන් හට මහිමයත් පිරිනමත් වා!
13 සමිඳාණෝ බලවතකු සේ නික්ම එන සේක;
q2 13 එතුමාණෝ, රණ වීරයකු සේ දිරිගන්වන සේක.
q2 13 රණ හඬ පතුරා, සිහ නද නඟා, සතුරන් අබිබවා සිය බලය පෙන්වන සේක.

### සෙනඟට පිහිට දීමට පොරොන්දුව

14 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
q2 14 "මම බොහෝ කල් නිශ්ශබ්ද ව මාගේ සෙනඟට පිළිතුරු නොදී සිටියෙමි.
q2 14 ප්‍රසව වේදනා ඇති ස්ත්‍රියක මෙන් හතිදමමින්, සුසුම්ලමින් දැන් මහා හඬින් කෑගසමි.
15 මම කඳු හා හලේ පාළු කර, එහි සියලු පලා ජාති වේළී යන්න සලස්වන්නෙමි.
q2 15 ගංගා වැලිකතර කරන්නෙමි.
q2 15 සියලු පොකුණු හිඳී යන්න සලස්වන්නෙමි.
16 අන්ධයන් ඔවුන් නොදත් මාර්ගයකින් ගෙන යන්නෙමි:
q2 16 ඔවුන් නොදත් මාර්ගවලින් යන්න මම සලස්වන්නෙමි.

q2[16] ඔවුන් ඉදිරියේ අන්ධකාරය ආලෝකයට හරවා,
ඇද තැන් ඇද හරින්නෙමි.
q2[16] මම මේ දේවල් නොවරදවා ම කරන්නෙමි.
q2[16] මම ඔවුන් අත් නොහරින්නෙමි.
17 රූප කරෙහි විශ්වාසය තබන, පිළිම දෙවිවරුන්
මනේ සලකන සියලු දෙනා නින්දාවටත්, අධික
ලජ්ජාවටත් පත් වන්නෝ ය.”

### සේවක ඉශ්රායලේවරුන්ගේ අඩු ලුහුඬුකම්

18 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
q2[18] “බීහිරෙනි, අසන්න;
q2[18] අන්ධයෙනි, හොඳින් බලන්න.
19 මාගේ සේවකයාට වඩා බීහිරි වූ වෙන
කිසිවෙක් සිටීත් ද?
q2[19] මට කැප වූ, සමිඳුන්ගේ මෙහෙකරුවා තරම්
අන්ධ කිසිවෙක් ඇද් ද?
20 ඉශ්රායලේවරුනි, නුඹලා බොහෝ දේ දැක
ඇතත් තේරුම් ගෙන නැත.
q2[20] නුඹලාගේ කන් ඇරී ඇතත් නුඹලා සවන් දී
නැත.”
21 සමිඳාණන් සාධාරණ බැවින් එතුමන්ගේ
අණපණත් උසස් කොට ගෞරවයට පත් කිරීමට
එතුමාණෝ ප්රසන්න වූ සේක.
22 එහෙත්, එතුමන්ගේ සෙනඟ කොල්ලකෑමට
ගොදුරු වූ හ.
q2[22] ඔවුන් ඇදිරි ගවෙල්හි වසනු ලැබ, හිරගවෙල්හි
සඟවා තබනු ඇත.
q2[22] ඔව්හු ගළවන්න කිසිවෙකු නැති ව
කොල්ලකෑමට ගොදුරු වී සිටිති.
q2[22] ඔව්හු නිදහස් කරන්න කිසිවෙකු නැති ව
සොරා කෑමට ගොදුරු වී සිටිති.
23 මේ දේ අසා, මින්මතු ඊට මැනවින් සවන් දෙන
කිසිවෙක් නුඹලා අතරේ සිටීත් ද?
24 කොල්ලකාරයන් අතට ඉශ්රායලේවරුන් භාර
දුන්නේ කවරෙක් ද?
q2[24] සමිඳාණෝ නොවන සේක් ද?
q2[24] අප පව් කළේ එතුමන්ට විරුද්ධ ව ය.
q2[24] එතුමන්ගේ මාර්ගයෙහි අපි ගමන්
නොකළෙමු.
q2[24] එතුමන්ගේ අණපණත්වලට අපි කීකරු
නොවීමු.
25 ඒ නිසා එතුමාණෝ සිය කෝපාග්නිය අපට
දැනනේනත්, යුද්ධයේ දරුණුකම විඳින්නත් සැලැසූ
සේක.
q2[25] ගින්නක් මෙන් එතුමන්ගේ උදහස ඉශ්රායලේ
පුරා ඇවිළී ගියේ ය.
q2[25] එහෙත්, ඉශ්රායලේ එයින් කිසිවක් තේරුම්
නොගත්තේ ය.
q2[25] දැවුණු නමුත් එය සිතට නොගත්තේ ය.

### සමිඳුන් සිය සෙනඟ මුදාගැනීම

43 එම්බා ඉශ්රායලේ ජනයෙනි, ජාකොබ්
වංශයෙනි, නුඹ නිර්මාණය කොට, මවා වදාළ
සමිඳාණෝ මෙසේ වදාරන සේක:
q2
43 “බිය නොවන්න;
q2
43 මම නුඹලා මුදාගතිමි.
q2
43 නුඹලාගේ නම කියා මම හඬගැසීමි.
q2
43 නුඹලා මාගේ ය.
2 නුඹලා ගැඹුරු ජලය මැදින් යන විට මම
නුඹලා සමඟ සිටින්නෙමි.
q2[2] නුඹලා ගංගා මැදින් එතරෙ වන විට ජලය
නුඹලා යට නොකරන්නේ ය.
q2[2] නුඹලා ගිනි මැදින් යන විට දැවී යන්නේ නැත.
3 මන්ද, මම නුඹලාගේ දෙවිඳාණෝ ය.
q2[3] නුඹලාගේ ගැළවුම්කාරයාණෝ
ඉශ්රායලේවරුන්ගේ සුවිශුද්ධ තැනැන් වහන්සේ ය.
q2[3] නුඹලා මුදන පිණිස වන්දියක් වශයෙන් මිසරය
ද එතියෝපියාව හා ශබො ද මම දුනිමි.
4 නුඹලා මාගේ ඇස් හමුයෙහි වටිනා වස්තුවක්
වන බැවින් ද ගරු කටයුතු ව සිටින බැවින් ද මා
නුඹලාට පමේ කරන බැවින් ද නුඹලා මුදන පිණිස
දේශයන් හා එහි වැසියන් මම වන්දියක් වශයෙන්
දෙන්නෙමි.
5 බිය නොවන්න;
q2[5] මම නුඹලා සමඟ සිටිමි.
q2[5] දුර නැගෙනහිරෙන් ද ඈත බස්නාහිරෙන් ද
නුඹලාගේ සෙනඟ මම රැස් කර ගෙනෙන්නෙමි.
6 ‘මාගේ සෙනඟට යන්න ඉඩ දෙන්නැ’යි උතුරටත්,
‘ඔවුන් නවත්වා නොගන්නැ’යි දකුණටත් මම
කියන්නෙමි.
q2[6] මාගේ දූ පුතුන් නමින් කැඳවා, පොළොවේ දුර
බැහැර සිට සෑම දිශාවෙන් ඔවුන් ගෙන එන්නෙමි.
7 ඔව්හු මාගේ ම සෙනඟ ය;
q2[7] මාගේ මහිමය සඳහා නිර්මාණය කොට, මවා
වදාළෙමි.”

### සමිඳුන්ගේ සාක්ෂිකාරයෝ

8 දෙවියන් වහන්සේ මෙසේ වදාරන සේක:
q2[8] “අධිකරණය ඉදිරියට මාගේ සෙනඟ කැඳවන්න.
q2[8] ඔවුන්ට ඇස් ඇති නමුත් ඔව්හු අන්ධ ය;
q2[8] ඔවුන්ට කන් ඇති නමුත් බීහිරි ය.
9 සියලු සෙනඟ එක් රැස් කරන්න.
q2[9] ඔවුන් අතර අනාගතය ගැන කියන්න හැක්කේ
කවරෙකුට ද?
q2[9] ඔවුන්ගෙන් කවරෙක් දැන් සිදු වන දේ ගැන
කලින් කීවෝ ද?

q2[9] මේ අය තමන් නිවැරදි බවත්, ඔවුන් කියන දේ
සත්‍ය බවත් ඔප්පු කරන පිණිස සාක්ෂිකාරයන්
ඉදිරිපත් කරත් වා!
10 ඉශ්‍රායලේ ජනයනි, නුඹලා මාගේ
සාක්ෂිකාරයෝ ය.
q2[10] නුඹලා මාගේ සේවක ජාතිය වශයෙන් මම
තෝරාගතිමි.
q2[10] එසේ කළේ, නුඹලා මා හඳුනා, අදහාගෙන,
තේරුම්ගන්න පිණිසත්, එක ම දෙවියන් වහන්සේ
මා බව දැනගන්න පිණිසත් ය.
q2[10] මාගෙන් බැහැර අන් දෙවි කෙනෙක් ඇත්තේ
නැත, සිටියේත් නැත, සිටින්නේත් නැත.
11 එසේ ය, මම පමණක් සමිඳාණන් වහන්සේ ය;
q2[11] මා හැර අන් ගැළවුම්කාරයෙක් නැත.
12 සිදු වන්න යන දේ මම කලින් දැන්වීමි;
q2[12] ඉන්පසු නුඹලාට පිහිට වන්න මම පැමිණියෙමි.
q2[12] කිසිම විදේශීය දෙවියෙක් ඔබ සමඟ
නොසිටියේ ය.
q2[12] මේ බවට නුඹලා මාගේ සාක්ෂිකාරයෝ ය.
13 මම දෙවියන් වහන්සේ ය;
q2[13] සදහට ම එසේ වෙමි;
q2[13] මාගේ බලයෙන් මිදී යන්න කිසිවකුට
නොහැකි ය.
q2[13] මා කරන දේ වෙනස් කරන්න කිසිවකුට
නොහැකි ය."

## බබිලෝනියෙන් මිදී යාම

14 ඔබේ මිදුම්කාරයාණන් ද ඉශ්‍රායලේවරුන්ගේ
සුවිශුද්ධ දෙවිඳාණන් ද වන සමිඳාණෝ මෙසේ
වදාරන සේක:
q2[14] "නුඹලා ගළවන පිණිස මම බබිලෝනියට
විරුද්ධ ව හමුදාවක් යවන්නෙමි.
q2[14] ඔවුන්ගේ නගරයේ දොරටු මම බිඳ
හෙළන්නෙමි.
q2[14] බබිලෝනිවරුන්ගේ කෑගැසීම වැලපීමට
හැරෙන්නේ ය.
15 මම සමිඳාණන් වහන්සේ ය;
q2[15] නුඹලාගේ සුවිශුද්ධ දෙවිඳාණෝ ය;
q2[15] ඉශ්‍රායලේවරුනි, නුඹලා මැව්වේ මම ය.
q2[15] මම නුඹලාගේ රජාණෝ ය."
16 බොහෝ ඉහත දී සමිඳාණෝ මුහුද මැදින්, මහා
ජලය මැදින් පාරක් සෑදූ සේක.
17 එහි බලවත් හමුදාවක් ද රථවාහන හා අශ්වයන්
ද එතුමාණෝ විනාශකළ සේක.
q2[17] ඔව්හු නැඟිටිය නොහැකි සේ එහි වැටුණෝ
ය.
q2[17] පහන් තිරයක දැල්ල නිවී යන්නාක් මෙන් ඔව්හු
නැතිවී ගියෝ ය.
18 එහෙත්, සමිඳාණෝ මෙසේ වදාරන සේක:
q2[18] "පසුගිය දේ සිහි නොකරන්න;
q2[18] පෙරෙ වූ දේ ගැන කල්පනා නොකරන්න.
19 බලන්න, මම අලුත් දෙයක් කරන්නෙමි.
q2[19] එය දැනුදු ඉටු වේ;
q2[19] නුඹලාට එය නොපෙනේ ද?
q2[19] මම කාන්තාරයෙහි පවා මාර්ගයක් සාදා, එහි
ජලධාරා ඇති වන්න සලස්වන්නෙමි.
20 මා විසින් තෝරාගනු ලැබූ මාගේ සෙනඟට
වතුර දෙන පිණිස මා කාන්තාරයෙහි ගංගා ගලා
යන්න සැලැසූ නිසා හිවලුන් ද පැස්බරුන් ද ඇතුළු
වන සත්ත්වයෝ මට ගෞරව කරන්නෝ ය.
21 ඔව්හු, මා උදෙසා ම, මා විසින් මවන ලද
සෙනඟ ය.
q2[21] ඔවුන් මට ප්‍රශංසා කරනු ඇත."

## ඉශ්‍රායලේවරුන්ගේ පාපය

22 සමිඳාණෝ මෙසේ වදාරන සේක:
q2[22] "එහෙත්, ඉශ්‍රායලේවරුනි, ජාකොබ් වංශයෙනි,
නුඹලා යාච්ඤා කළේ මට නොවේ.
q2[22] නුඹලා මා ගැන කලකිරුණාහු ය.
23 නුඹලා දවන යාග පූජා පිණිස බැටළුවන් මා
වෙත ගෙනාවේ වත්, නුඹලාගේ යාගවලින් මට
ගෞරව කළේ වත් නැත.
q2[23] මා ආහාර පූජා ඉල්ලා නුඹලා පිට බරක්
තැබුවේ වත්, සුවඳ දුම් පූජා ඉල්ලා, නුඹලා
වෙහෙසුවේ වත් නැත.
24 නුඹලා මා උදෙසා කට්ටකුමංජල් මිලේට
ගත්තේ වත්, සත්ත්ව පූජා තෙලෙන් මා තෘප්තිමත්
කළේ වත් නැත.
q2[24] ඒ වෙනුවට නුඹලාගේ පව්වලින් නුඹලා මට
බරක් වී, නුඹලාගේ අයුතුකම්වලින් මා වෙහෙසට
පත් කළහු ය.
25 එහෙත් නුඹලාගේ පව් සිහි නොකොට,
නුඹලාගේ වරද කමා කරන දෙවිඳාණෝ මම ය.
q2[25] එසේ කරන්නේ, මම දෙවිඳාණන් වන නිසා ය.
26 අපි අධිකරණය ඉදිරියට යමු. නුඹලාගේ
පැමිණිල්ල ඉදිරිපත් කරන්න.
q2[26] නුඹලා නිවැරදි බව ඔප්පු කරන්න නුඹලාගේ
විත්තිය කියන්න.
27 නුඹලාගේ මුල් පියා පව් කළේ ය;
q2[27] නුඹලාගේ නායකයෝ ද මට විරුද්ධ ව පව්
කළෝ ය.
28 නුඹලාගේ පාලකයෝ මාගේ ශුද්ධස්ථානය
කෙලෙසූ හ.
q2[28] ඒ නිසා ඉශ්‍රායලේ ජාතිය විනාශයටත්,
ජාකොබ්ගේ වංශය නින්දාවටත් පාවා දුන්නෙමි."

## සමිඳාණන් වහන්සේ එක ම දෙවියන් වහන්සේ ය

44 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
q2
44 "මාගේ තෝරාගත් සෙනඟ වන, ජාකොබ්ගේ
පරපුරෙන් පැවත එන, මාගේ සේවක
ඉශ්‍රායලේ ජනයෙනි, දැන් සවන් දෙන්න.
2 නුඹලා මැවූ සමිඳාණන් වහන්සේ මම ය.
q2[2] උපන් දා සිට ම මම නුඹලාට උපකාර කළෙමි.
q2[2] බිය නොවන්න.
q2[2] නුඹලා මාගේ සේවකයෝ ය.

q2[2] මා තෝරාගත්, මා ප්‍රේම කරන, මාගේ
සෙනඟ ය.
[3] වියළි දේශයට මම වතුර දෙන්නෙමි;
q2[3] කාන්තාරයේ ඇල දොළවල් ගලා යන්න
සලස්වන්නෙමි.
q2[3] නුඹලාගේ දරුවන් කෙරෙහි මාගේ
ආත්මානුභාවය ද නුඹලාගේ වංශය කෙරෙහි මාගේ
ආශීර්වාදය ද මම වගුරුවන්නෙමි.
[4] ඔව්හු වතුර අසල වැඩෙන තණ කොළ මෙන් ද
දිය ඔයවල් ළඟ වැඩෙන බට ගස් මෙන් ද සඵල
වන්නෝ ය.
[5] සෙනඟ අතරෙන් එක් කෙනෙක්, 'මා සමිඳාණන්
ය'යි කියනු ඇත.
q2[5] තව කෙනෙක්, 'මා ඉශ්රායලේ සෙනඟට
සම්බන්ධ ය'යි කියනු ඇත.
q2[5] තව කෙනෙක්, තමාගේ අතේ සමිඳුන්ගේ නම
කොටාගෙන,
q2[5] තමාත් 'දෙවිඳුන්ගේ සෙනඟට අයිති ය'යි කියනු
ඇත.
[6] යෙසා 48:12; එළිද 1:17; 22:13 ඉශ්රායලේ රජු ද
එහි මිඳුම්කාරයාණන් ද වන සව් බලැති සමිඳාණෝ
මෙසේ වදාරන සේක:
q2[6] "මම ආරම්භයත්, අවසානයත් වන්නෙමි;
q2[6] මා හැර අන් දෙවි කෙනෙක් නැත.
[7] මා හා සමාන කෙනෙක් ඇත්නම්, මා හමුවේ එය
කියත් වා!
q2[7] පටන්ගැන්මේ සිට අග දක්වා සිදු වන දේ
පැහැදිලි ලෙස කියන්න හැකි කිසිවෙක් සිටිත් ද?
[8] මාගේ සෙනඟෙනි, බිය නොවන්න;
q2[8] තැති නොගන්න.
q2[8] පුරාණයේ සිට අද දක්වා සිදු වන්නට යන දේ
කල්තියා මා ප්‍රකාශ කළ බව නුඹලා දන්නහු ය.
q2[8] නුඹලා මාගේ සාක්ෂිකාරයෝ ය;
q2[8] වෙන දෙවි කෙනෙක් සිටිත් ද?
q2[8] පර්වතයක් වන බලවත් අන් දෙවි කෙනෙකු
ගැන අසා ඇද් ද? නැත."

## රූප වන්දනාවේ නිෂ්ඵල බව

[9] පිළිම සාදන සියල්ලෝ චපලයෝ ය. ඔවුන් උසස්
කොට සලකන දෙවිවරු වැදගැම්මකට නැත. ඒ
දෙවිවරුන් නමදින සියල්ලෝ අන්ධ ය, අඥාන ය.
ඔව්හු නින්දාවට පැමිණෙන්නෝ ය. [10] දෙවි කෙනෙකු
වශයෙන් නැමදීමට ලෝහ පිළිමයක් වාත්තු කිරීම
නිෂ්ඵල ය. [11] එයට නමස්කාර කරන සියල්ලෝ
නින්දාවට පැමිණෙන්නෝ ය. පිළිම සාදන
කම්කරුවෝ සාමාන්‍ය මනුෂ්‍යයෝ ය. ඊට වැඩි
දයෙක් ඔවුන්ට නැත. ඔව්හු නඩු විනිශ්චයය සඳහා
ඉදිරිපත් වෙත් වා. ඔව්හු බිය වී, නින්දා ලබති.
[12] ආචාරියා ලෝහයක් ගෙන එය ගිනියම් කොට
තමාගේ බලවත් අතින් මිටියක් ගෙන, එය තළා
හැඩගසන්නේ ය. එසේ කිරීමෙන්, සාපිපාසයටත්,
වෙහෙසටත් පත් වී ඔහු දුර්වල වන්නේ ය.
[13] වඩුවා නූලක් ගසා, අඳින කටුවකින් ඒක
සලකුණු කර, යතුවලින් යතුගා, කවකටුවෙන්
සලකුණු කොට, ගෙදර වාසය කරන පිණිස
මනුෂ්‍යයකුගේ රූපයේ හැටියටත්, මනුෂ්‍යයකුගේ
ශෝභනකමේ ප්‍රකාරයටත් ඒක සාදන්නේ ය.
[14] මේ රූපය නෙළීම සඳහා ඔහු කිහිරි ගසක් කපා
ගන්නේ ය. එසේ නැත්නම්, වනයෙන් තීර්සා ගසක්
හෝ ආලෝන ගසක් හෝ තෝරාගෙන එය වනයේ
වැඩෙන්න ඉඩ හරින්නේ ය. එසේත් නැත්නම්,
දේවදාර ගසක් සිටුවා එය ජලයෙන් පෝෂණය
කරන්නේ ය. [15] එය වැඩුණු විට ගසෙන් කොටසක්
ගිනි දැල්වීම පිණිස යොදාගන්නේ ය. ඒ කොටසෙන්
ගිනි තපින්නේ ය; එය පත්තු කොට රොටි ද
පුළුස්සන්නේ ය. ඉතිරි කොටසින් ඔහු දේව රූපයක්
නෙළා ගෙන ඊට නමස්කාර කරන්නේ ය; ඊට වැඳ
වැටෙන්නේ ය. [16] ලී කොටයකින් ඔහු ගින්නක්
දල්වාගෙන, කෑම උයාගෙන වළඳා තෘප්තියට
පැමිණෙන්නේ ය. ඔහු ගිනි තපිමින්, "මට හරි සනීප
යි, මේක කදිම ගින්නකැ"යි කියන්නේ ය. [17] ඉතිරි
ලී කෑල්ලෙන් ඔහු දේව රූපයක් නෙළාගන්නේ ය.
ඔහු වැඳ වැටී එයට නමස්කාර කරන්නේ ය. ඔහු
එයට යාච්ඤා කරමින්, "ඔබ මාගේ දෙවි තුමා ය.
මා ගැළවේව මැනව"යි කියන්නේ ය.
[18] එවැනි අයට ඔවුන් කරන අමන ක්‍රියාව
දැනගන්නට තරම් සිහි කල්පනාවක් නැත. සැබෑ දේ
කුමක් දැ යි දැනගැනීමට වත්, තේරුම්ගැනීමට වත්
නොහැකි වන පරිදි ඔවුන්ගේ ඇස් ද සිත් ද වැසී
ඇත. [19] තමා එක ම ලීයක කොටසකින් දර
ලබාගෙන, රොටි පුළුස්සා, මස් බැද කන බවත්,
ඉතිරි කොටසින් පිළිකුල් දේව රූපයක් කපාගෙන ලී
කඳකට නමස්කාර කරන බවත් දැනගන්නට ඔවුන්ට
තේරුමක් නැත.
[20] ඔහු කරන දේ ගඟට ඉණි කැපීමක් වැන්න.
ඔහු රුවටී, මුළා වී සිටින බැවින්, ඔහු අතින්
අල්ලාගෙන සිටි දේව රූපය කිසි සේත් දෙවි
කෙනෙකු නොවන බව ඔහුට තේරුම්ගත නොහැකි
ය.

## මැවුම්කාර ගැළවුම්කාර සමිඳාණන් වහන්සේ

[21] සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
q2[21] "යාකොබ් වංශයෙනි, ඉශ්රායලේවරුනි, මේ
දේවල් සිහි කරන්න.
q2[21] නුඹලා මාගේ සේවකයා බව මතක
තබාගන්න.
q2[21] මා නුඹලා මැව්වේ මාගේ සේවකයා වන
පිණිස ය.
q2[21] කිසි කලෙක මම නුඹලා අමතක
නොකරන්නෙමි.
[22] මම නුඹලාගේ වැරදි වලාකුළක් මෙන් ද,
නුඹලාගේ පව් මීදුමක් මෙන් ද පහකර දැමුවෙමි.
q2[22] නුඹලා ගළවන දෙවිඳුන් මා වන බැවින් මා
වෙත හැරී එන්න.
[23] ස්වර්ගයෙනි, ගී ගයන්න;

q2 23 පොළොවේ ගැඹුරු තැන්, හඬ නඟන්න.
q2 23 කඳු ද වනය ද එහි සියලු දේ ද ප්‍රීති ශබ්ද නඟන්න.
q2 23 මන්ද, සමිඳාණෝ, ඉශ්රායලේ නම් සිය සෙනඟ ගළවාගෙන, සිය මහිමතාව ප්‍රකාශ කළ සේක.
24 නුඹේ මැවුම්කාරයාත්, ගැළවුම්කාරයාත් වන සමිඳාණෝ මම ය.
q2 24 සියල්ලේ මැවුම්කාරයාණන් වන සමිඳාණෝ මම ය.
q2 24 අහස විදහා මැව්වේත්, මම ය.
q2 24 මා පොළොව මැවූ විට කිසිවකුගේ උදව්වක් මට වුවමනා නො වී ය.
25 1 කොරි 1:20 ශාස්ත්‍රකාරයන් මෝඩයන් කරවන්නේත්, පේන කියන්නන් උමතු කරවන්නේත් මම ය.
q2 25 පණ්ඩිතයන්ගේ වදන් ප්‍රතික්ෂේප කරන්නේත්, ඔවුන්ගේ දැනුම මෝඩකම බව පෙන්වා දෙන්නේත් මම ය.
26 මාගේ සේවකයා ප්‍රකාශයක් කළ විට, මාගේ අදහස් දන්වන පිණිස දූතයකු එවූ විට ඒවා ඉෂ්ට වන්න සලස්වන්නේත් මම ය.
q2 26 ජෙරුසලමට කතා කොට එහි සෙනඟ නැවතත් ප්‍රාණවත් කරන බවත්, ජුදා නගරවලට කතා කොට, නටබුන් වූ නගර නැවත ගොඩනඟන බවත් කියන්නේ මම ය.
27 මාගේ වචනයේ බලයෙන් මුහුද වියළී යන්නේ ය.
q2 27 ‘වියළී යව’යි මුහුදට අණ කරන්නේත් මම ය.
28 2 වංශා 36:23; එස්රා 1:2 සයිරස්ට කතා කොට, ‘නුඹ මාගේ එඬේරා වන්නෙහි ය;
q2 28 මාගේ අදහස් නුඹ ඉටු කරන්නෙහි ය.
q2 28 ජෙරුසලම නැවත ගොඩනඟන්නත්, දේව මාලිගාවේ අත්තිවාරම් දමන්නත් නුඹ නියම කරන්නෙහි ය’යි කියන්නේත් මම ය.”

### සයිරස් රජකමට පත් කිරීම

45 සමිඳුන්ගේ අභිෂේක ලත් රජ්ජුරුවෝ සයිරස් ය.
q2
45 ජාතීන් යටත් කිරීමටත්, රජවරුන්ගේ බලය බිඳලීමටත්, සමිඳාණෝ ඔහු සහායට ගත් සේක.
q2
45 නැවත නොවැසෙන පිණිස නගරවල දොරටු සමිඳාණෝ විවෘත ව තබන සේක.
q2
45 එතුමාණෝ සයිරස්ට මෙසේ වදාරන සේක:
2 “මම නුඹට පෙරටුවෙන් ගොස් කඳු සමතලා කොට, ලෝකඩ දොරටු බිඳදමා, යකඩ අගුල් කඩාදමන්නෙමි.
3 නුඹේ නම කියා කැඳවන්නේ ඉශ්රායලේවරුන්ගේ දෙවි සමිඳුන් වන මා බව නුඹ දැනගන්න පිණිස සඟවා ඇති වස්තු ද රහස් තැන්වල නිධාන ද නුඹට දෙන්නෙමි.
4 මා තෝරාගත් සෙනඟක් වන මාගේ සේවක ඉශ්රායලේවරුන්ට උපකාර කරන පිණිස මම නුඹ පත් කළෙමි.
5 මම සමිඳාණන් වහන්සේ ය;
q2 5 අන් කෙනෙකේ නැත.
q2 5 මා හැර අන් දෙවි කෙනෙකේ නැත.
q2 5 නුඹ මා නොදන්න නමුත්, මම නුඹ ශක්තිමත් කරන්නෙමි.
6 මා එසේ කරන්නේ, මා හැර අන් දෙවි කෙනෙකු නැති බව නැගෙනෙහිර සිට බස්නාහිර දක්වා සිටින සියලු දෙනා දැනගන්න පිණිස ය.
q2 6 මම සමිඳාණන් වහන්සේ ය, මා හැර අන් දෙවි කෙනෙකේ නැත.
7 ආලෝකය දෙන්නේ මම ය;
q2 7 අන්ධකාරය දෙන්නේත් මම ය;
q2 7 සැපත දෙන්නේ මම ය;
q2 7 විපත දෙන්නේත් මම ය.
q2 7 මේ සියල්ල කරන්නේ ස්වාමීන් වන මම ය.
8 එම්බා අහස් තලය!
q2 8 වැසි වලාකුළක් මෙන් දැහැමිකම වස්වන්න.
q2 8 ගැළවීම හටගන්න පිණිස පොළොව විවර වේ වා!
q2 8 විමුක්තියේ මල් ද එහි පිබිදේ වා!
q2 8 ස්වාමීන් වන මම මෙය සිදු වන්න සලස්වන්නෙමි.”

### මැවීමේ හා ඉතිහාසයේ සමිඳාණන් වහන්සේ

9 රෝම 9:20 මැවුම්කරුන් සමඟ වාද කරන්නාට වන විපතක මහත!
q2 9 කුඹල්කරුවා සමඟ බඳුන වාද කරයි ද?
q2 9 නුඹ කරන්නේ කුමක් ද කියමින්, මැටි පිඬ එය අඹන්නාගෙන් විමසමින් පෙරට සිට ඔහුගේ දක්ෂකම ගැන චෝදනා කරයි ද?
10 නුඹ ජනිත කරන්නේ කුමක් ද කියා පියාට කියන දරුවෙකුට ද නුඹ බිහි කරන්නේ කුමක් ද කියා මවට කියන බිළිඳෙකුට ද වන විපතක මහත!
11 ඉශ්රායලේවරුන්ගේ මැවුම්කාර සුවිශුද්ධ සමිඳාණෝ මෙසේ වදාරන සේක:
q2 11 “මාගේ දරුවන් ගැන මාගෙන් ප්‍රශ්න කරන්න වත්, මා කළ යුතු දේ ගැන මට කියා දෙන්න වත් නුඹලාට අයිතියක් කොහෙන් ද?
12 පොළොව නිර්මාණය කළේ මම ය;
q2 12 ඒ පිට මිනිසුන් මැව්වේ මම ය;
q2 12 අහස විදහා පෑවේ මම ය;
q2 12 ආකාශ වස්තූන් හසුරුවන්නේත් මම ය,
13 මාගේ අරමුණ ඉටු කරන පිණිසත්, සියල්ල මනා සේ සකස් කරන පිණිසත් මම සයිරස් උනන්දු කරවීමි.
q2 13 ඔහු යන මාර්ගය සමතලා කරන්නෙමි;

q2[13] මගේ නගරය ඔහු ගොඩනඟා වස්තුවක් හෝ අල්ලසක් හෝ නොගෙන වහල් වූවන් මුදාගෙන එනු ඇත.”

## ජාතීහු සමිඳුන් පිළිගනිති

14 සමිඳාණෝ ඉශ්රායලේවරුන්ට මෙසේ වදාරන සේක:
q2[14] “මිසරයේ හා එතියෝපියාවේ වස්තු සම්භාරය නුඹලාට අයිති වනු ඇත.
q2[14] උස මිනිසුන් වන ෂබෝවරු නුඹලා වෙත පැමිණ නුඹලාගේ වහල්លු වන්නෝ ය.
q2[14] ඔව්හු නුඹලා පසුපස්සේ දම්වැල්වලින් බඳිනු ලැබ නුඹලා වෙත පැමිණ වැඳ වැටී, ‘සැබැවින් ම ඔබ වෙත දෙවිඳාණෝ වැඩ සිටින සේක.
q2[14] එතුමාණන් හැර වෙන දෙවි කෙනෙක් නැතැ යි කන්නලව් කරන්නෝ ය.
15 සිය සෙනඟ ගළවන ඉශ්රායලේවරුන්ගේ දෙවිඳාණෝ සැබැවින් ම නොපෙනී සිටින දෙවි කෙනෙකැ’යි කියන්නෝ ය.
16 දේව රූප සාදන සියල්ලෝ ම ලජ්ජාවටත්, නින්දාවටත් පත් ව වියවුල් බවට පැමිණෙන්නෝ ය.
17 එහෙත්, ඉශ්රායලේවරු සමිඳුන් විසින් ගළවනු ලැබූ හ.
q2[17] ඔවුන්ගේ ජයග්රහණය සදහට ම පවතින්නේ ය.
q2[17] සෙනඟ ලජ්ජාවටත්, නින්දාවටත් කිසි කලක නොපැමිණෙති.
18 සගලෝ මැවූ, පොළොව සාදා එය නිම කළ, පාළු ඉඩමක් ලෙස නොව, විසුමට තැනක් ලෙස පොළොව මැවූ එක ම දෙවි වන සමිඳාණෝ මෙලෙසෙ වදාරන සේක:
q2[18] “මම සමිඳුන් වෙමි;
q2[18] හුදකෝ මා හැර අන් දෙවි කෙනෙක් නැත.
19 මා කතා කළේ රහසින් නොවේ;
q2[19] ලොවේ අඳුරු තැනක දී නොවේ.
q2[19] අවුල් වියවුල් ඇති තැනක දී මා සොයන්න ඉශ්රායලේවරුන්ට නොකීවෙමි.
q2[19] මම සමිඳු වෙමි;
q2[19] මම සත්යය වදාරමි;
q2[19] මම යුක්තිය ප්රකාශ කරමි.”

## සමිඳාණන් වහන්සේ හා බබිලෝනියේ පිළිම

20 සමිඳාණෝ මෙසේ වදාරන සේක:
q2[20] “ජාතීන් අතරේ ගැළවී සිටින සියල්ලෙනි, එක් රැස් ව ළඟා වෙත් වා!
q2[20] ලී රූප උසුලාගෙන යන, ගැළවීම ගෙන දෙන්න නොහැකි, දෙවිවරුන් යදින අයට නැණ නුවණ නැත.
21 ඉදිරියට අවුත් නුඹලාගේ නඩුව දන්වා එකිනෙකා සමඟ මන්ත්රණය කරගනිත් වා!
q2[21] සිදුවන්න යන දේ බොහෝ ඉහත දී කීවේ කවරෙක් ද?
q2[21] එසේ කළේ සමිඳාණන් වන මම නොවෙමේ ද?
q2[21] මා හැර අන් දෙවි කෙනෙක් නැත.
q2[21] මම ධර්මිෂ්ඨ ගැළවුම්කාර දෙවිඳාණෝ ය;
q2[21] වෙන දෙවි කෙනෙක් ඇත්තේ ම නැත,
22 ලෝ වැසි සියල්ලෙනි, මා වෙත එන්න;
q2[22] දැන් මාගේ ගැළවීම ලබාගන්න.
q2[22] මා හැර අන් දෙවි කෙනෙක් නොමැත.
23 රෝම 14:11; පිලිප් 2:10-11 මාගේ මුවින් ගිලිහෙන කිසිදු වචනයක් වෙනස් නොවේ;
q2[23] එය සත්යයකි.
q2[23] ‘සියලු දණ හිස් මට නැමෙන බව, සියලු දිව් මා ගැන දිවුරන බව සහතික ලෙස දිවුරා කියමි.’
24 මා තුළින් පමණක් ශක්තිය හා දැහැමිකම ඇති වේ යයි ඔවුන් කියනු ඇත.
q2[24] මට විරුද්ධ ව නැඟිටින අය නින්දා දුක් විඳිනු ඇත.
25 ඉශ්රායලේවරුන්ගේ සකල පරපුර මා තුළින් දමිටු කරනු ලැබ මා හට පැසසුම් දෙනු ඇත.”

## පිළිමවල බලහීනකම

46 “බේල් හා නබෝ යන දෙවිවරුන් දැන් පහතට වැටී ඇත.
q2
46 වහෙසෙ වී සිටින ගවයන් පිට පටවා ඇති ඒවා බරක් ය.
2 මේ දෙවිවරුන් දැන් පහතට වැටී ඇත.
q2[2] ගැළවීම ගෙන දෙන්න ඔවුන්ට නොහැකි ය.
q2[2] ඔවුන් ම වහල්කමට ගොස් ඇත.
3 උපන් දා සිට මා විසින් උසුලාගෙන යන ලද ජාකොබ්ගේ වැසියෙනි!
q2[3] ඉශ්රායලේ පරපුරේ ඉතා කුඩා පිරිස ව සිටින ඉශ්රායලේ ජනයෙනි!
q2[3] මට සවන් දෙන්න.
4 නුඹලා මහලු වී හිස කෙස් පැසී යන තෙක් මම නුඹලා රැක බලාගන්නෙමි;
q2[4] මම නුඹලා මැව්වෙමි;
q2[4] මම නුඹලා රැක බලා උපකාර කොට නුඹලා ගළවන්නෙමි.
5 නුඹලා මා සමාන කරන්නේ කවරකුට ද සසඳා බලන්න:
q2[5] මා හා සම කිසිවකේ ඇද් ද?
6 වස්තුකාරයෝ තමන්ගේ පසුම්බි හැර, රන් රිදී ගෙන තරාදියෙන් කිරා, රන් කරුවකු කුලියට ගෙන, දෙවි රූපයක් ඔහු ලවා සාදවා, වැඳ වැටී ඊට නමස්කාර කරති.
7 ඔව්හු එය කර පිට තබා, උසුලාගෙන ගොස් ඊට නියම තැනක තබති.
q2[7] ඒ රූපයට සෙලවෙන්න වත් නොහැකි ව එතැන ම රැඳී තිබේ.
q2[7] යාච්ඤා කළත් පිළිතුරු දෙන්න වත්, විපතින් යමකු ගළවන්න වත් එයට බැරි ය.
8 ද්රෝහී ජනයෙනි, මේ දේ සිහි කොට මා කර ඇති දේ සිතට ගන්න.

9 පුරාණයේ සිදු වූ දේ සිහි කරගෙන මා පමණක්
දෙවිඳාණන් බව, මා හා සමාන අන් කිසිවකු නැති
බව පිළිගන්න.
10 අවසානය තකේ කුමක් වන්නේ දැ යි
පටන්ගැන්මේ සිට ම මම කීවමේ.
q2 10 සිදු වන්න යන දේ පුරාණයේ සිට ම මම
ප්‍රකාශ කළෙමේ.
q2 10 මා අදහස් කළ දේ නොවරදින බවත්, මා
ඉටාගත් හැම දේ ඉටු කරන බවත් මම කීවමේ.
11 මම නැගනෙහිරනේ මිනිසකු කැඳවන්නමේ.
q2 11 ඔහු ගිජු උකුස්සකු සේ කඩා වැදී මා අදහස්
කළ දේ ඉටු කරන්නේ ය.
q2 11 මා කියා ඇති දේ මා යෝජනා කළ දේ එසේ
ම සිදු වන්නේ ය.
12 ගැළවීමනේ ඉතා ඈත් ව සිටින දැඩි සිත්
ඇත්තනේ, මට සවන් දනේන.
13 ගැළවීමේ දවස මම ළඟා කරන්නමේ.
q2 13 එය වැඩිදුර නොවේ;
q2 13 මාගේ ජය ප්‍රමාද නොවේ.
q2 13 මම ජෙරුසලමට ගැළවීම ගනෙ දී මාගේ
ගෞරවය ඉශ්රායලේවරුන්ට පවරන්නමේ."

### බබිලෝනිය කෙරේ විනිශ්චයය

47 යසො 13:1—14:23; ජෙර 50:1—51:64
සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
q2
47 "කන්‍යාවක වැනි බබිලොන් දුව බැස අවුත්
බිම දූවිල්ලේ හිඳගන්න.
q2
47 බබිලොන් අඟන!
q2
47 සිංහාසනයනේ බැස අවුත් බිම හිඳගන්න.
q2
47 තවත් නුඹ 'සුමුදු සුවිනීත ලතාවකැ'යි කියනු
නොලබන්නෙහි ය.
2 ඇඹරුම් ගල් ගනෙ පිටි අඹරන්න.
q2 2 මුහුණු වැස්ම ඉවත දමන්න.
q2 2 උඩ සළුව ගලවාදමා, කකුල් නග්න ව
තබාගනෙ, ගංගාවලින් එගොඩ වී යන්න.
3 නුඹේ නග්න භාවය පනෙනේනේ ය;
q2 3 නුඹේ ලජ්ජාව එළි වන්නේ ය.
q2 3 මම පළිගන්නමේ.
q2 3 කිසිවකුට මා නතර කළ නොහැකි ය.
4 ඉශ්රායලේවරුන්ගේ සුවිශුද්ධ තැනැන් වහන්සේ
අප නිදහස් කරන සේක.
q2 4 එතුමාණන්ගේ නාමය සර්ව බලැති සමිඳාණෝ ය.
5 බබිලොන් අඟන නිශ්ශබ්ද ව අන්ධකාරයට ඇතුළු
වන්න.
q2 5 තවත් 'නුඹ ජාතීන්ගේ රැජින ය'යි නොකියනු
ලබන්නෙහි ය.
6 මම මාගේ සනෙඟ කෙරෙහි උදහස් වී, ඔවුන්
මට අයිති නැති හැටියට සලකා නුඹ අතට පාවා
දිනිමි.
q2 6 නුඹ ඔවුන්ට කිසි ම අනුකම්පාවක් නොපෙන්වා,
මහල්ලන්ට පවා ඉසිලිය නොහැකි බර පැටවේවෙහි
ය.
7 නුඹ සැම කල්හි ම රැජිනක ව සිටිනු ඇතැ යි
සිතා, මේ දේවල් සිතට ගත්තේ වත්, ඒවායේ
ප්‍රතිඵල සිහි කළේ වත් නැත.
8 එළිද 18:7-8 'සැප ජීවිකාවට ඇලුම් ව සුරක්ෂිත ව
සිටිමි.
q2 8 මට වඩා මහේශාක්‍ය කෙනෙකේ නැත;
q2 8 කිසි කලක දරුවන් නැති වී වියෝ දුකට පත් වූ
කෙනෙකේ හෝ වැන්දඹුවක් හෝ නොවන්නමේ'යි
තමන් තුළ සිතූ බබිලෝනිය, මෙයට සවන් දනේන.
9 මේ කරුණු දකෙ ම එනම්, දරුවන් නැති වීම ද
වැන්දඹුවක වීම ද එක දවසේ හදිසියේ ම නුඹට
පැමිණනේනේ ය.
q2 9 එය වැළැක්වීමට නුඹේ යන්ත්‍ර මන්ත්‍රවලින්
හා සිව් සැට මායම්වලින් වැඩක් වන්නේ නැත.
10 නුඹ දුෂ්ටකමහෙි නිරත වී සිට කිසිවකු නුඹ
නොදකිති යි සිතුවෙහි ය.
q2 10 නුඹේ ප්‍රඥාව හා දැනුම නිසා නුඹ මුළා වී,
'මට වඩා මහේශාක්‍ය කෙනෙකේ නැතැ'යි
කියාගත්තෙහි ය.
11 ඒ නිසා විපත්ති නුඹ පිට පැමිණනේනේ ය.
q2 11 එය මන්ත්‍රයකින් නවත්වන්න නොහැකි ය.
q2 11 නුඹට වළක්වන්න බැරි නාස්තියක් නුඹ පිට
පැමිණනේනේ ය.
q2 11 නුඹ නොසිතූ විරූ විනාශයක් හදිසියනේ නුඹ
පිට වැටනේනේ ය.
12 නුඹ තරුණ කාලයේ සිට ම වෙහෙස මහන්සි
දරා, පුරුදුපුහුණු කළ නුඹේ මන්ත්‍ර හා මායම්
භාවිත කරන්න.
q2 12 සමහරවිට ඒවායින් නුඹට යම් වාසියක්
ලැබෙනු ඇත.
q2 12 සමහරවිට ඒවායින් නුඹේ සතුරන් බිය
ගැන්විය හැක.
13 ඉතින් නක්ෂත්‍රකාරයෝ ද නැකත් බලන්නෝ ද
අමාවක් දවස්වල දී ශුභ අශුභ කියන්නෝ ද ඉදිරියට
පැමිණ නුඹට සිදු වන්න යන දයෙින් නුඹ ගළවා
ගනිත් වා!
q2 13 ඔවුන්ගේ අවවාද නුඹ ලැබූ නමුත්, ඒවායින්
නුඹ වෙහෙසට පත් වී ඇත.
14 ඔව්හු ඉපනැලි මනේ වන්නෝ ය;
q2 14 ගින්න ඔවුන් දවන්නේ ය.
q2 14 ගිනි දැල්ලේ බලයනේ තමන් ම ගළවාගන්න
ඔවුන්ට නොහැකි ය.
q2 14 ඒ ගින්න වනාහි තපින පිණිස අඟුරු ගොඩක්
වත්, ළං වී සිට උණුසුම ලබන පිණිස ගින්නක් වත්
නොවන්නේ ය.
15 තරුණ කාලයේ සිට නුඹ පුහුණු වීමට වෙහෙස
ගනිමින් ඇසුරු කළ මේ දවෙඥයන්ගේ
අවවාදවලින් නුඹට කිසි වැඩක් සිදු නොවේ.
q2 15 ඔව්හු නුඹ අත්හැරදමා වනෙ අතක් බලා
යන්නෝ ය.
q2 15 නුඹ ගළවන්න කිසිවකේ නොවෙතේ."

## අනාගතය අනාවරණය කිරීම

48 ජුදා වංශයනේ පැවත එන, ඉශ්රායලේ යන
නම දරන ජාකොබ් පුත්රයනේ, මයෙට සවන්
දනේන.
q2
48 නුඹලා සමිඳුන්ගේ නාමයනේ දිවුරන නමුත්,
එසේ කරන්නේ අවංක සිතින් වත්,
දැහැමිකමින් වත් නොවේ.
2 එසේ වුවත්, නුඹලා ශුද්ධ නුවරට අයිති යයි ද
'සව් බලැති සමිඳාණෝ' යන නම දරන
ඉශ්රායලේවරුන්ගේ දවේඳුන් සරණ ගනෙ ඇතැ යි ද
කියමින් පාරට්ටු කරගන්නහු ය.
3 සමිඳාණෝ ඉශ්රායලේවරුන්ට මසේ වදාරන
සේක:
q2[3] "අතීතයේ සිට සිදු වූ සෑම දයෙක් ම මා මුවින්
නුඹලාට ප්රකාශ කළෙමේ.
q2[3] මා ක්රියා කළ විගස ම ඒවා සිදු විය.
4 යකඩ මනේ දැඩි සිතක් ඇති, ලෝකඩ මනේ
බොරු ආටෝපයක් ඇති නුඹලා, මුරණ්ඩු සනෙඟක්
බව දැන සිටියමේ.
5 නුඹට සිදු වන්න යන දේ, සිදු වන්න බොහෝ
කල් තියා, පුරාණයේ සිට ම මම නුඹට දැන්වීමි.
q2[5] මා එසේ දැන්වූයේ, 'නුඹලාගේ දවේ රූප ඒවා
සිදු කළෙේ ය' කියා ද, 'නුඹලාගේ කැටයම් රූප සහ
වාත්තු කළ පිළිම ඒවා කළෙේ ය' කියා ද නුඹට
කියන්න බැරි වන පිණිස ය.
6 මා පරෙ කී සියලු දේ දැන් සිදු වී ඇත.
q2[6] මාගේ අනාවැකි සිදු වී ඇති බව නුඹ පිළිගත
යුතු ය.
q2[6] දැන්, මම කලින් නුඹට ප්රකාශ නොකළ මතු
සිදු වන්න යන අලුත් දේවල් ප්රකාශ කරමි.
7 ඒවා සිදු වන්න මා සලස්වන්නේ දැන් ය.
q2[7] පරෙ එවැන්නක් සිදු නො වී ය.
q2[7] සිදුවීණි නම්, නුඹලා ඒ ගැන දැන සිටියහු යයි
කියනු ඇත.
8 මේ ගැන කිසිවක් නුඹ ඇසුවේ වත්, ඒ ගැන
දැනගත්තේ වත්, ඒ ගැන කිසිදු වචනයක් නුඹේ
කනේ වැකුණේ වත් නැත්තේ,
q2[8] නුඹ විශ්වාස කළ නොහැකි බවත්, උපන් දා සිට
නුඹ ද්රෝහියකු ව සිටි බවත් මා දැන සිටි නිසා ය.
9 මාගේ නමට සනෙඟ ප්රශංසා කරන පිණිස,
මාගේ කෝපයට ඉඩ නො දී එය වළලවා මම නුඹ
විනාශ නොකළෙමේ.
10 ගිනි උදුනක රිදී මනේ නොව ශෝකය නමැති
ගින්නනේ මම නුඹ සෝදිසිකර බැලුවමේ.
11 මා කරන දේ මා කරන්නේ මා උදසො ම ය.
q2[11] මාගේ නාමය කලෙසෙන්නට වත්, මට ම
අයිති, මට පමණක් හිමි, මාගේ ගෞරවය වනෙ
කිසිවකුෙට ගන්න වත් මම ඉඩ නොදමේ."

## සමිඳාණන් වහන්සේ තෝරාගත් සයිරස් රජ

12 යසො 44:6; එළිද 1:17; 22:13 "මා කැඳවාගත්
ඉශ්රායලේ ජනයනේ, ජාකොබ් පුත්රයනේ, මට
සවන් දනේන.
q2[12] පටන්ගැන්ම මම ය;
q2[12] අවසානය ද මම ය;
q2[12] දවේඳාණෝ මම ය.
13 පොළොවේ අත්තිවාරම් මාගේ අතින් ම මම
දැමුවමේ.
q2[13] මාගේ දකුණතින් අහස විහිදුවා පිහිටුවමේ.
q2[13] මා ඒවාට අඬගැසූ විට ඒවා මා ඉදිරියට
පැමිණේ.
14 නුඹලා සියලු දනො රැස් ව සවන් දනේන.
q2[14] මා තෝරාගත් තැනැත්තා බබිලෝනියට පහර
දී, මා කියන දේ කරන බවට නුඹලාගේ
දවේවරුන්ගනේ කිසිවකේ වත් අනාවැකියක් කීවෝ
ද?
15 ඔහුට කතා කොට, ඔහු කැඳවූ තැනැත්
වහන්සේ මම ය.
q2[15] ඔහුට මඟපනේවා ජය අත්කර දුන්නේ මම ය.
16 දැන් මා ළඟට පැමිණ මා කියන දේට සවන්
දනේන.
q2[16] මම කිසිවක් නොසඟවා මුල සිට ම ප්රකාශ
කළෙමේ, මුල සිට ම මැවීම සමඟ මම සිටියමේ."
q2[16] 'දවේ සමිඳාණෝ සිය බලය මට දී මා එවූ
සේකැ'යි සයිරස් කීවේ ය.
17 නුඹලාගේ මිදුම්කාරයාණන් ද
ඉශ්රායලේවරුන්ගේ සුවිශුද්ධ තැනැන් වහන්සේ ද
වන සමිඳාණෝ මසේ වදාරන සේක:
q2[17] "නුඹලාගේ යහපත පිණිස නුඹලාට උගන්වන,
යා යුතු හරි මඟ නුඹලාට පනේවන, නුඹලාගේ දවේ
සමිඳාණෝ මම ය.
18 නුඹලා මාගේ ආඥාවලට සවන් දුන්නහු නම්,
මාගේ ආශීර්වාද නොසිඳී ගලන ගඟක් සේ නුඹලා
කරා ගලා එන්නේ ය.
q2[18] මුහුදේ රළ පතර මනේ දැහැමිකම නුඹලා
වතෙ පැමිණනේනේ ය.
19 නුඹලාගේ දරු පරම්පරාව වැලි ඇට මනේ බහුල
වන්නෝ ය.
q2[19] ඔවුන්ගේ නම මැකී යන්නේ වත්, මා
ඉදිරියනේ ඔවුන් කිසි කලක විනාශ වන්නේ වත්
නැත."
20 එළිද 18:4 නිදහස ලබා, බබිලෝනියනේ පිට වී
යන්න.
q2[20] බබිලෝනිවරුන් වතෙින් බේරී යන්න.
q2[20] "සමිඳාණෝ සිය සේවක ඉශ්රායලේ මුදාගත්
සේකැ"යි කියමින් ප්රීති ඝෝෂා පවත්වා ලොව පුරා
පතුරුවන්න.
21 සමිඳාණන් වහන්සේ සිය සනෙඟ පාළුකරය
මැදින් ගනෙ ගිය විට ඔවුන්ට පිපාසයක් නො වී ය.
q2[21] එතුමාණෝ ඔවුන් උදසො පර්වතයකින් වතුර
ගලන්න සැලැස්සූ සේක.

q2 21 එතුමන් පර්වතය විවර කළ විට වතුර ගලා
ආයේ ය.
22 යසො 57:21 “අදමිටුවන්ට සාමය අහිමි වේ ය”යි
සමිඳාණෝ වදාරන සේක.

## ඉශ්රායලෙය ජාතීන් හට ආලෝකයක් වීමේ දූතික මෙහෙවර

49 ජරෙ 1:5 මුහුදුබඩ වැසියනෙි, මාගේ බස්
අසන්න. ඈත සිටින ජනයනෙි, මට සවන්
දනේන.
q2
49 මා උපදින්නත් පරෙ මවුකුසහෙි සිටිය දී
සමිඳාණෝ මා තෝරාගනෙ එතුමන්ගේ
සේවකයා වන පිණිස මා පත්කළ සේක.
2 හබේරෙ 4:12; එළිද 1:16 එතුමාණෝ මාගේ
වචන තියුණු කඩුවක් මනේ කළ සේක.
q2 2 සිය අතේ සවෙණැල්ලහෙි මා ආරක්ෂා කළ
සේක.
q2 2 එතුමාණෝ මා මුවහත් කළ ඊගසක් මනේ කළ
සේක.
q2 2 සිය කොපුවේ මා සඟවා තැබූ සේක.
3 එතුමාණෝ කතා කොට, “ඉශ්රායලේ, නුඹ මාගේ
සේවකයා ය, නුඹ මඟින් සනෙඟ මාගේ මහිමය
ප්රකාශ කරනු ඇතැ”යි වදාළ සේක.
4 මම කතා කරමින්, “මම නිකරුණේ
වහෙසුෙණමේ;
q2 4 මාගේ මුළු ශක්තිය යදෙූ නමුත්, කිසිවක්
අත්පත් කර නොගතිමි”යි කීවමේ.
q2 4 එසේ වුව ද, මාගේ විනිශ්චයය සමිඳුන් අතේ
ඇති බවත්, මාගේ විපාකය දවේිඳුන් අතේ ඇති
බවත් මට සහතික ය.
5 මා උපදින්නටත් පරෙ තමන්ගේ සනෙඟ ආපසු
ගනෙනෙ පිණිසත්, විසිර සිටින ඉශ්රායලේ ජනයා,
ජාකොබ්ගේ වංශය එක් රැස් කරන පිණිසත්
සේවකයකෙු වශයනේ සමිඳාණෝ මා පත් කළ
සේක.
q2 5 සමිඳාණෝ මට ගෞරවය දනෙ සේක.
q2 5 එතුමාණෝ මාගේ ශක්තිය වන සේක.
6 යසො 42:6; ලූක් 2:32; ක්රියා 13:47; 26:23
එතුමාණෝ මට මසෙේ වදාළ සේක:
q2 6 “ඉතිරි ව සිටින ඉශ්රායලේවරුන් එනම්, ජාකොබ්
වංශයේ ජනයා නැඟිටුවා පුනරුත්ථාපනය කිරීමට
මාගේ සේවකයා ලසෙ නුඹ පත් කිරීම සුළුපටු
දයෙක් නොවනු ඇත.
q2 6 එනම්, මුළු ලොව ගළවනු පිණිස සියලු ජාතීන්
හට නුඹ ආලෝකයක් වන්න මම සලස්වන්නමේ.”
7 ඉශ්රායලේවරුන්ගේ මිදුම්කාරයා ද ඔවුන්ගේ
සුවිශුද්ධ තැනැන් වහන්සේ ද වන සමිඳාණෝ
මිනිසුන් විසින් සුළු කරනු ලැබූ, ජාතීන් විසින් පිළිකුල්
කරනු ලැබූ, ආණ්ඩුකාරයන්ගේ සේවකයකෙු වූ
තැනැත්තාට මසෙේ වදාළ සේක:
q2 7 “ඉශ්රායලේවරුන්ගේ සුවිශුද්ධ දවේ සමිඳාණන්
සිය සේවකයා වන නුඹ තෝරාගත් බව දකින
රජවරුන් විශ්වාසවන්ත ඒ සමිඳාණන් නිසා නුඹට
ගරු කරන්න නැඟිටිනු ඇත;
q2 7 අධිපතීන් නුඹට නමදිනු ඇත.”

## ජරෙුසලමේ පුනරුත්ථාපනය

8 2 කොරි 6:2 සමිඳාණෝ මසෙේ වදාළ සේක:
q2 8 “සුදුසු කාලයේ දී මම නුඹට පිළිතුරු දී,
ගැළවීමේ දවසේ දී නුඹට උපකාර කරන්නමේ.
q2 8 මම නුඹ ආරක්ෂාකර, නුඹ මඟින් සියලු මිනිසුන්
සමඟ ගිවිසුමක් කරන්නමේ.
q2 8 දැනට පාළු වී ඇති නුඹේ දේශය නැවත උරුම
කරගන්න මම නුඹට දනේනමේ.
9 හිරකරුවන්ට, ‘නිදහස් ව යන්න’ කියා ද අඳුරේ
සිටින්නන්ට, ‘ආලෝකයට එන්න’ කියා ද මම
කියන්නමේ.
q2 9 හැම මාර්ගයක දී ම ඔවුන්ට කෑම ලැබයෙි.
q2 9 ඔවුන් යන කවර මාවතක දී වුව ද පාළු වී ගිය
කඳු මුදුන් පිට ඔවුන්ට ආහාර ඇති වේ.
10 එළිද 7:16-17 ඔවුන්ට සාපිපාසා නොවන්නේ ය.
q2 10 ගිනි අව්වනේ වත්, මරුකතරනේ වත් ඔවුන්ට
පීඩාවක් නොවන්නේ ය.
q2 10 මන්ද, ඔවුන්ට අනුකම්පා කරන තැනැන්
වහන්සේ ඔවුන්ට මඟපනේවන සේක.
q2 10 දිය උල්පත් අසලින් ඔවුන් කැඳවාගනෙ යන
සේක.
11 මම කඳු හරහා මහා මාවත් සාදා මාගේ
සනෙඟ ගමන් කරන පිණිස මාර්ගයක් සූදානම්
කරන්නමේ.
12 මාගේ සනෙඟගනේ සමහරකේ දුර බැහැර සිට
පැමිණතෙි;
q2 12 සමහරකේ උතුරනේ හා බස්නාහිරනේ ද
සමහරකේ සීන්වරුන්ගේ දේශයනේ ද පැමිණතෙි.”
13 සගලෝ ගී ගයා වා!
q2 13 පොළොව ප්රීති වේ වා!
q2 13 කඳු ප්රීතියනේ පිනා යේ වා!
q2 13 මන්ද, සමිඳාණෝ සිය සනෙඟ සනසන සේක;
q2 13 දුක් විඳින සනෙඟට අනුකම්පා කරන සේක.
14 එහතේ, ජරෙුසලම් වැසියෝ, “සමිඳාණෝ අප
අත්හළ සේක;
q2 14 අප මතක නැති කළ සේකැ”යි කී හ.
15 සමිඳාණෝ පිළිතුරු දමෙින් මසෙේ වදාළ සේක:
q2 15 “මවකට හැකි ද, කුසේ දැරූ බිළිඳා අමතක
කරන්න?
q2 15 හැකි ද ඈට ඇගේ ම කිරි දරුවාට පමේ
නොකරන්න?
q2 15 මවක ඇගේ දරුවා අමතක කළත්, මම නම්,
කිසිදා නුඹ අමතක නොකරමි.
16 එම්බා ජරෙුසලම, නුඹේ නම මාගේ අත්වල
අල්ලහෙි කොටා ගනෙ ඇත.
q2 16 නුඹේ පවුරු මා ඉදිරියහෙි නිතර ම ඇත.

17 නැවත නුඹ ගොඩනඟන අය කැඩූ අයට වඩා
ඉක්මනින් ඉදි කරති.
q2 17 නුඹව විනාශ කළ අය පලා යති.
18 නෙතේ විදහා වට පිට බලන්න.
q2 18 මොවුහු සියල්ලෝ ම එකතු ව නුඹ ළඟට එති.
q2 18 මම ජීවමාන දෙවිඳාණන්ගේ නාමයෙන් දිවුරා
කියමි:
q2 18 ‘මනාලියක ඇගේ ආභරණ පළඳින්නාක් මෙන්
නුඹේ සෙනඟ නුඹට අලංකාරයක් වන්නෝ ය.’
19 විනාශ කරන ලද නුඹේ දේශය නටබුන් වී පාළු
වී ඇතත්, දැන් එහි පදිංචියට පැමිණෙන අයට එහි
ඉඩ මදි වන්නේ ය.
q2 19 නුඹ විනාශ කර දැමූ අය නුඹෙන් ඉවත් කරනු
ලබන්නෝ ය.
20 පිටුවහල් ව සිටි කාලයේ දී උපන් අය ‘මේ
දේශය අපට ජීවත් වීමට මදි ය.
q2 20 අපට වාසය කිරීමට තව ඉඩකඩ වුවමනා ය’යි
නුඹට යම් දවසක දී කියනු ඇත.
21 එවිට නුඹ නුඹට ම මෙසේ කියා ගනු ඇත:
q2 21 ‘මොවුන් මා හට ඉපදවූවේ කවරෙක් ද?
q2 21 මම දරුවන් නැති ව වඳ ව, රටෙන් පිටුවහල් වී
ඔබමොබ ගියෙමි.
q2 21 මොවුන් ඇති කළේ කවරෙක් ද?
q2 21 මම තනි ව සිටියෙමි.
q2 21 මොවුන් ආවේ කොතැනින් ද?”
22 මහෝත්තම දෙවි සමිඳාණෝ සිය සෙනඟට
මෙසේ වදාරන සේක:
q2 22 “මම මාගේ හස්තය ජාතීන් මත ඔසවා
සලකුණකින් සෙනඟට සංඥා කරන්නෙමි.
q2 22 ඔව්හු නුඹේ පුත්‍රයන් වඩාගෙන එන්නෝ ය.
q2 22 නුඹේ දූවරු ද ඔවුන්ගේ කරපිට ගෙනෙනු
ලබන්නෝ ය.
23 රජවරු නුඹ ඇතිදැඩි කරන පියවරුන් මෙන් වෙති.
q2 23 බිසෝවරු නුඹේ කිරි මවුවරුන් මෙන් වෙති.
q2 23 ඔව්හු මුණින්තලා වී නුඹට වැඳ නුඹේ පාදවල
ධූලි ලෙව කන්නෝ ය.
q2 23 එවිට මා සමිඳාණන් බව නුඹලා දැනගන්නහු
ය.
q2 23 මා කෙරෙහි විශ්වාස කරන අයගේ
බලාපොරොත්තු කඩ නොවන්නේ ය.”
24 බලවන්තයකුගෙන් කොල්ලය ගන්න
නොහොත් කෲරතර රජකුගෙන් හිරකරුවන්
මුදාගන්න කිසිවකුට හැකි ද?
25 සමිඳාණෝ මෙසේ පිළිතුරු දෙන සේක:
q2 25 “සැබැවින් ම බලවන්තයාගේ අතින් වහල්ලු
මුදාගනු ලබන්නෝ ය.
q2 25 කෲරතර රජුගෙන් හිරකරුවෝ මුදාගනු
ලබන්නෝ ය.
q2 25 නුඹට එදිරිවාදිකම් කරන අයට විරුද්ධ ව
නුඹේ දරුවන් මුදාගන්නෙමි.
26 නුඹට පීඩා කරන්නන්ට ඔවුන්ගේ ම මාංසය
කන්න සලස්වන්නෙමි.
q2 26 මත්පැන් බී මත් වන සේ, ඔව්හු තමන්ගේ ම
ලේ බී, මත් වන්නෝ ය.
q2 26 එවිට මා සමිඳාණන් වන බවත්, නුඹලා මුදා
නිදහස් කරන තැනැන් වහන්සේ බවත්,
ඉශ්‍රායලේවරුන්ගේ දෙවිඳාණන් බලවත් බවත් මුළු
මිනිස් වර්ගයා දැනගනු ඇත.”

### සෙනඟ නොමඟ යාම

50 සමිඳාණෝ මෙසේ වදාරන සේක:
q2
50 “මම නුඹලාගේ මව අත්හැරියේ නම්, ඒ
දික්කසාදයේ සහතිකය කොහේ ද?
q2
50 එසේ නැත්නම්, ණය හිමියකුට ණය
ගෙවීමක් වශයෙන් මම නුඹලා පාවා දිනිම් ද?
q2
50 නැත.
q2
50 නුඹලා පාවා දෙනු ලැබුවේ නුඹලාගේ ම
අපරාධ නිසා ය.
q2
50 නුඹලා අත්හරිනු ලැබුවේ නුඹලාගේ ම වරද
නිසා ය.
2 ගළවන්න මා ආ විට, කිසිවකු නොසිටියේත්, මා
අඬගැසූ විට කිසිවකු පිළිතුරු නුදුන්නේත් මන් ද?
q2 2 ඔවුන් ගළවා ගැනීමට මට ශක්තිය නැද් ද?
q2 2 ඔවුන් මිදීමට මා තුළ බලය නැද් ද?
q2 2 මෙය සිතට ගන්න.
q2 2 මාගේ ආඥාවකින් මුහුද වියළවා යවන්නත්,
ගංගාව කාන්තාරයක් බවට හරවන්නත් මට හැකි ය.
q2 2 වතුර නැති නිසා එහි සිටින මසුන් පිපාසයෙන්
මැරී ගඳ ගසනු ඇත.
3 මම අහස අඳුරු කරන්නෙමි.
q2 3 එය ගෝණි රෙදි හැඳගත් ශෝක වන්නකු
මෙන් කරන්නෙමි.”

### සමිඳාණන් වහන්සේගේ සේවකයාගේ කීකරුකම

4 විඩාවට පත්වූවන් ශක්තිමත් කරන පිණිස
ගුරුවරයකු මෙන් මා කිව යුතු දේ ගැන සිසුවකු
මෙන් එතුමන්ට සවන් දෙන පිණිස මහෝත්තම දෙවි
සමිඳාණෝ හැම උදයක ම මා තුළ උනන්දුවක් ඇති
කරවන සේක.
5 දෙවි සමිඳුන් මාගේ කන් පහදා ඇත.
q2 5 මා එතුමන්ට විරුද්ධ ව කැරලි ගැසුවේ වත්,
එතුමන්ට පිටුපා ගියේ වත් නැත.
6 මතෙ 26:67; මාක් 14:65 මට පහර දෙන්නන්ට
මම මාගේ පිට පෑවෙමි.
q2 6 මාගේ රැවුල් ගස් උදුරන්නන්ට මම මුහුණ
දුන්නෙමි.
q2 6 මාගේ මුහුණ නින්දාවෙනුත්, කෙළ ගැසීමෙනුත්
හරවා නොගතිමි.
7 මහෝත්තම දෙවි සමිඳාණන් මට උපකාර කරන
බැවින් මම වියවුල් නොවන්නෙමි.
q2 7 මම නිර්භීත ලෙස මුහුණ පාන්නෙමි.
q2 7 මා ලජ්ජාවට නොපැමිණෙන බව දනිමි.

8 රෝම 8:33-34 මන්ද, දෙවිඳාණෝ මා ළඟ ය;
q2 8 එතුමාණෝ මා නිදොස් බව පනේවන සේක.
q2 8 මට විරුද්ධ ව චෝදනා කරන්නේ කවරකේ ද?
q2 8 අපි දදෙනො ම විනිශ්චයයට යමු;
q2 8 ඔහු මට විරුද්ධ ව චෝදනාව ඉදිරිපත් කරා වා!
9 මහෝත්තම දෙවි සමිඳාණෝ මට උපකාර කරන
සේක.
q2 9 'මා වැරදිකරු ය'යි ඔප්පු කළ හැක්කේ
කවරකුෙට ද?
q2 9 කාවුන් කාදමන පරණ වස්ත්රයක් මනේ මාගේ
විරුද්ධකාරයෝ සියලු දනෙ ම අතුරුදහන් වන්නෝ ය.
10 ඔබ අතරනේ සමිඳුන් කරෙහෙි ගරුබිය ඇති අය
එතුමන්ගේ සේවකයා කියන දේට සවන් දනේන.
q2 10 තමන්ට ආලෝකයක් නැති ව, අන්ධකාරයහෙි
ඇවිදින අය සමිඳුන් කරෙහෙි විශ්වාසය තබන්න:
q2 10 එතුමන් කරෙහෙි බලාපොරොත්තුව තබන්න!
11 ගින්නක් දල්වන, ගිනි අඟුරු මොළවන
සියල්ලනෙි, අනුන් විනාශ කරන්න උපා යොදන ඔබ
ඔබේ ම උපායවලින් විනාශ වන්නහු ය.
q2 11 සමිඳුන් අතින් ම එය සැලසනෙු ඇත.
q2 11 ඔබ භයංකර විපතකට පත්වන්නහු ය.

### සමිඳුන්ගේ සැනසිලි වචන

51 සමිඳාණෝ මසෙේ වදාරන සේක:
q2
51 "දැහැමි ලසෙ ජීවත්වමෙන් සමිඳුන් සොයා
යන්නනෙි, නුඹලා නළොගනු ලැබුවේ කුමන
පර්වතයකින් ද කියාත්, නුඹලා හාරා ගනු ලැබුවේ
කුමන ගල්වළකින් ද කියාත් සිතා බලන්න.
2 නුඹලාගේ ආදි පිය වූ ආබ්රහම් ද නුඹලා ප්රසූත
කළ සාරා ද ගැන සිතා බලන්න.
q2 2 මා ආබ්රහම් කැඳවූෙ විට ඔහුට දරු සම්පතක්
නො වී ය.
q2 2 එහතේ, මම ඔහුට ආශීර්වාද කර දරු පරපුරක්
දිනිමි.
3 සමිඳාණෝ සියොන්ටත්, එහි නටබුන්වලටත්
අනුකම්පා කරන සේක.
q2 3 ඇගේ වනාන්තරය, ඒදන් උයන මනේ ද ඇගේ
කාන්තාරය සමිඳුන්ගේ උයන මනේ ද කරන සේක.
q2 3 ප්රීතිය ද සන්තෝෂය ද ස්තුති දීම ද ගීතිකා
හඬ ද එහි වන්නේ ය.
4 මාගේ සනෙඟනෙි, මට සවන් දනේන.
q2 4 මාගේ ජනයනෙි, මා කරෙහෙි කන් යොමු
කරන්න.
q2 4 ව්යවස්ථාවක් මා වතෙින් නිකුත් වන්නේ ය.
q2 4 මාගේ සාධාරණකම ජාතීන්ට එළියක් වන්නේ
ය.
5 ඔවුන් ගැළවීමට මම ඉක්මනින් පැමිණනේනමේ.
q2 5 මාගේ ජයග්රහණය ආසන්න ය.
q2 5 මම ම ජාතීන් පාලනය කරන්නමේ.
q2 5 ඈත රටවල් මා එන තකේ බලා සිටියි.
q2 5 මා ඔවුන්ට ගැළවීම ගනෙ දීමේ
බලාපොරොත්තුවනේ ඔව්හු සිටිති.
6 නුඹලාගේ ඇස් ඔසවා ඉහළ අහස දසෙ බලන්න.
q2 6 පහළ පොළොව දසෙ බලන්න.
q2 6 අහස දුම මනේ පහ වී යන්නේ ය;
q2 6 පොළොව පරණ වස්ත්රයක් මනේ දිරාපත්
වන්නේ ය.
q2 6 එහි සිටින සියලු දනො ම පණුවන් මනේ විනාශ
වන්නෝ ය.
q2 6 එහතේ, මා ගනෙ දනෙ ගැළවීම සදහට ම
පවතින්නේ ය.
q2 6 මාගේ යුක්තියට කළෙවරක් නොවන්නේ ය.
7 දැහැමිකම දන්න, සිය සිත්වල මාගේ අණපනත්
නිදන් කර ඇති ජනයනෙි, මට සවන් දනේන.
q2 7 මිනිසුන් නුඹලාට නින්දා කරන විට බිය
නොවන්න.
q2 7 ඔවුන්ගේ අපහාසවලට නොකැළඹනේන.
8 කාවන් විසින් කාදමන ලද වස්ත්රයක් මනේ ද
පණුවන් විසින් කාදමන ලද ලොම් රොදක් මනේ ද
ඔව්හු විනාශ වන්නෝ ය.
q2 8 එහතේ, මාගේ ගැළවීම සදහටත්, මාගේ
ජයග්රහණය සියලු පරම්පරාවලටත් පවතින්නේ ය."

### දෙවි පිහිට ඉල්ලා අයැදීම

9 සමිඳුනි, පිබිදනේන;
q2 9 අපට පිහිට වන්න.
q2 9 අතීත පරපුරේ සමයයන්හි මනේ අවදි වන්න.
q2 9 පුරාණයේ දී ඔබ කළාක් මනේ ඔබේ බලවත්
හස්තයනේ අප ගළවාගන්න.
q2 9 රාහාබ් නම් දිය රකුසා ද මකරා ද කෑලිවලට
කැපුවේ ඔබ නොවන සේක් ද?
10 ඉතා ගැඹුරු මහ මුහුද හින්දවා, මිදීම ලත්
සනෙඟට එතරෙ වීමට ගැඹුරු මුහුදේ මාර්ගයක්
සැදුවේත් ඔබ නොවන සේක් ද?
11 සමිඳුන් විසින් මුදන ලද්දෝ ගී කියමින්
සියොනට පැමිණනේනෝ ය.
q2 11 ඔවුන්ගේ ප්රීතිය සදහට ම පවතින්නේ ය.
q2 11 ඔව්හු ප්රීති ප්රමෝදයනේ පිනා යන්නෝ ය.
q2 11 දුක ද සුසුම්ලෑම ද ඔවුන්ගනේ පහ ව යන්නේ
ය.
12 සමිඳාණෝ මසෙේ වදාරන සේක.
q2 12 "නුඹලා සනසන්නේ මම ය.
q2 12 මැරී යන තණ මනේ පහ ව යන මිහි පිට
මිනිසාට නුඹ බිය විය යුත්තේ කුමකට ද?
13 අහස විහිදුවා පොළොවේ අත්තිවාරම දැමූ
නුඹලාගේ මැවුම්කාරයා අමතක කළහු ද?
q2 13 නුඹලා විනාශ කිරීමට අරමුණු කරගත් පීඩා
කරන්නන්ගේ කෝපය නිසා නුඹලා දවස මුළුල්ලේ
ම වවෙුළන්නේ කුමට ද?
q2 13 පීඩා කරන්නන්ගේ කෝපයනේ නුඹලාට කිසි
හානියක් නොවන්නේ ය.
14 රටින් පිටුවහල් වී සිටින්නෝ ඉක්මනට මුදනු
ලබන්නෝ ය.
q2 14 ඔවුන් පාතාල ලෝකයට වැටනේනේ වත්,
ඔවුන්ට ආහාර හිඟවන්නේ වත් නැත.

15 මම නුඹලාගේ දෙවි සමිඳාණෝ ය.
q2[15] මුහුද කළඹා එහි රළ පතර ඝෝෂා කරන්න සලස්වන්නේ මම ය.
q2[15] මාගේ නම සව් බලැති සමිඳාණෝ ය.
16 අහස විහිදුවා, පොළොවේ අත්තිවාරම් දැමුවේ මම ය.
q2[16] මම සියොන් අමතා, 'නුඹලා මාගේ සෙනඟ ය;
q2[16] නුඹලාට මාගේ ඉගැන්වීම දිනිම්;
q2[16] මාගේ හස්තයෙන් නුඹලා ආරක්ෂා කරන්නෙමි'යි කීමි."

## ජෙරුසලමේ දුක් විඳීමේ අවසානය

17 එළිද 14:10; 16:19 එම්බා ජෙරුසලම පිබිදෙනේන.
q2[17] පිබිදෙනේන.
q2[17] නැඟිට සිටින්න.
q2[17] සමිඳුන් සිය උදහසින් නුඹලාට බොන්න දුන් කෝපය නමැති කුසලානේ අඩියට ම උරා බීමෙනේ නුඹ වැනෙනේන වූයෙහි ය.
18 නුඹේ සෙනඟ අතරෙනේ, නුඹ ඇතිදැඩි කළ නුඹේ ම පුත්‍රයන් අතරෙනේ නුඹේ අත අල්ලාගෙන නුඹට මඟපෙනේවන්නට කිසිවකේ නැත.
19 නුඹ පිට ආපදාවක් දෙකෙක් පැමිණ ඇත.
q2[19] එනම්, පාළුව හා විනාශයත්, සාගතය හා යුද්ධයත් ය.
q2[19] නුඹ සනසන්නේ කවරකේ ද?
20 නුඹේ පුත්‍රයෝ සමිඳුන්ගේ කෝපයෙනේ, නුඹේ දෙවිඳුන්ගේ තරවටුවෙනේ මිරිකී, ක්ලාන්ත වී දැලක අසු වූ ගෝනකු මෙනේ සියලු වීථි සන්ධිවල වැටී සිටිති.
21 එබැවින් මත්පැනින් මත් වූ අය මෙනේ වැනෙන දුක් විඳින ජෙරුසලම් ජනයෙනි, මෙය අසන්න.
22 නුඹලාගේ දෙවි සමිඳාණෝ නුඹලා ආරක්ෂා කරන සේක.
q2[22] එතුමාණෝ මෙසේ වදාරන සේක:
q2[22] "මාගේ උදහසින් නුඹලාට බොන්න දුන් මාගේ කුසලාන නුඹලා අතින් ඉවත් කරන්නෙමි.
q2[22] මින්පසු නුඹලා වැනෙන පමණට මාගේ කෝපය නමැති කුසලානෙනේ නොබොන්නහු ය.
23 ඒ කුසලාන නුඹලාට පීඩා කළ අයට එනම්, 'අප විසින් නුඹලා පාගාගෙන යනු පිණිස බිම වැටී සිටින්නැ'යි කියමින් නුඹලාගේ පිටවල් පාරක් මෙනේ සලකා ඒවා උඩින් ගිය අයට එය දෙන්නෙමි."

## ජෙරුසලම මුදාගැනීම

52 එළිද 21:2,27 එම්බා සියොන්, පිබිදෙනේන, පිබිදෙනේන, ශක්තිමත් වන්න, ශුද්ධ නුවර වන ජෙරුසලම, ඔබේ අලංකාර වස්ත්‍ර පැළඳගන්න.
q2
52 මින්පසු අචර්මඡේදිතයකේ වත්, අපවිත්‍ර වූවකේ වත්, මේ නගරයට ඇතුළු නොවන්නේ ය.

2 ජෙරුසලම, ඔබ ධූලි ගසාදමා නැඟිට සිටින්න,
වහලියක වූ සියොන් පුරඟන, ඔබේ ගලෙ වටා ඇති
විලංගු ගලවාදමන්න.
3 මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ මෙසේ
වදාරන සේක: "නුඹලා වහල්කමට විකුණනු
ලැබුවේ මුදල් වන්දියකින් නොවේ; එසේ ම නුඹලා
මුදනු ලබන්නේත් මුදල් වන්දියකින් නොවේ. 4 මුල
දී නුඹලා මිසරයේ විදේශී ව සිටින්න ගියහු ය. පසු
ව අසිරියාව කිසි හේතුවක් නැති ව නුඹලාට පීඩා
කළේ ය. 5 රෝම 2:24දැන් මෙහි බබිලෝනියෙහි
මට කුමක් දක්නට ලැබේ ද? කිසි හේතුවක් නැති ව
මාගේ සෙනඟ මෙහි වහල් ව සිටිති. ඔවුන්ගේ
පාලකයෝ ජය හඬ නඟති; දවස දවේලේ මාගේ
නාමයට අපහාස කරති. 6 එබැවින්, මාගේ සෙනඟ
මාගේ නාමය දැනගනු ඇත. ඒ දවසේ දී කතා
කරන්නේ මා බවත්, මා දෙවියන් වහන්සේ බවත්
ඔවුන් දැනගනු ඇත."

## සියොන්ට සුබ ආරංචි

7 නාහුම් 1:15; රෝම 10:15; එෆී 6:15 සුබ ආරංචි ගෙන එන, සාමය ප්‍රකාශ කරන, යහපත ගැන සුබසුන් පළ කරන ගැළවීම ගැන ලොවට දන්වන, "නුඹේ දෙවි තුමාණෝ රජකම් කරන සේකැ"යි සියොනට කියන, කඳු මුඳුන්හි පෙනෙන දූතයාගේ පාද කොපමණ අලංකාර වන්නේ ද?
8 නගරය මුර කරන්නන්, හඬ නඟා එක් ව ගී කියනු ඇත.
q2[8] සියොනට සමිඳාණන් වඩින බව ඔවුන් සියැසින් දකිනු ඇත.
9 ජෙරුසලමේ නටබුන්, එක් ව ගී ගයන්න;
q2[9] ඝෝෂා කරමින් හඬ නඟන්න.
q2[9] සමිඳාණෝ සිය සෙනඟ සැනසූ සේක.
10 සමිඳාණෝ ජාතීන් ඉදිරියේ සියොනට ශුද්ධ බලය පෑ සේක.
q2[10] අපේ දෙවිඳුන්ගේ ගැළවීම ලොවේ සීමාන්තයෝ දකිති.
11 2 කොරි 6:17 යන්න, බබිලෝනියෙනේ පිට වී යන්න, අපිරිසිදු දේකට අත නොපාන්න.
q2[11] නොනැවතී පිට වී යන්න, සමිඳුන්ගේ භාණ්ඩ උසුලාගෙන යන නුඹලා පිරිසිදු වන්න.
12 හදිසියෙනේ පිට වී යන්න නුඹලාට සිදු නොවේ;
q2[12] බේරී පලා යන්න නුඹලාට සිදු නොවේ;
q2[12] සමිඳාණෝ නුඹලාට පෙරටු ව යන සේක.
q2[12] සමිඳාණෝ නුඹලා පසුපස්සෙනේ එන සේක.

## දුක් උසුලන සේවකයාණෝ

13 බලන්න, මාගේ සේවකයාණන්ට ජය අත් වේ.
q2[13] එතුමාණෝ, උසස් වී, උතුම් වී, අත්‍යුත්කෘෂ්ට වෙති.
14 පෙනුමෙනේ එතුමාණෝ බොහෝ සේ අවලක්ෂණ ය.
q2[14] මිනිසකුට සමානකමක් නැත.

q2[14] මිනිස් රූපය නැති වී යන පමණට විරූප වීමෙනේ
එය සියල්ලන්ට ම පුදුමයක් වී ඇත.
15 රෝම 15:21 දැන් නම්, ජාතීහු එතුමාණන් දැක
මවිතයට පත් වෙති.
q2[15] රජවරු විස්මයෙනේ විස්මයට පත් ව නිහඬ ව
සිටිති.
q2[15] ඉහත දී ඔවුන්ට නොදැන්වූ දයෙක් දැන් ඔව්හු
දනිති.
q2[15] කිසි කලක නොඇසූ දයෙක් දැන් ඔව්හු
තේරුම්ගනිති.

53 ජොහ 12:38; රෝම 10:16 අප සැළ කළ දේ
විශ්වාස කළෙේ කවරකේ ද?
q2
53 සමිඳුන්ගේ බලය එළිදරව් වී ඇත්තේ
කවරකුෙට ද?
2 මාගේ සේවකයාණෝ වැඩනෙ පැළෑටියක් සේ ද
වියළි බිමනේ මතු වන අංකුරයක් සේ ද සමිඳුන්
අබියස වැඩුණෝ ය.
q2[2] එතුමන්ට රූපවත්කමක් හෝ පැහැපත්කමක්
හෝ නැත;
q2[2] මන පිනවන ශෝභමානකමක් ද නැත;
3 මිනිසුන් විසින් පිළිකුල් කොට එපා කරනු ලැබූ හ;
q2[3] දුක හා වද වේදනා දැරූ මිනිස් කනෙකේ වූ හ.
q2[3] එතුමන් දුටු විට මිනිස්සු ඉවත බලාගත්හ;
q2[3] එතුමාණෝ නරෙපෙනු ලැබූ හ.
q2[3] අපි එතුමන් ගැන සැලකිල්ලක් නොදැක්වූවමෙු.
4 මතෙ 8:17 එබැවින් එතුමාණන් ඉසුළුවේ අපේ
දුක ය;
q2[4] දරාගත්තේ අපේ පීඩා ය.
q2[4] මේවා දඬුවම් යයි අපට සිතුණේ ය.
q2[4] දවේ තුමන් දුන් පහර යයි අපට හැඟුණේ ය.
5 1 පේදු 2:24 එහතේ, එතුමන් තුවාළ ලැබුවේ
අපේ අපරාධ නිසා ය;
q2[5] පොඩි කරනු ලැබුවේ අපේ පව් නිසා ය.
q2[5] එතුමන් ලත් දඬුවමින් අපට සාමදානය ලැබී
ඇත;
q2[5] එතුමන් ලැබූ පහරවලින් අපට සුවය ලැබී ඇත.
6 1 පේදු 2:25 අපි සියල්ලෝ ම බැටළුවන් මනේ
මුළා වී තම තමා සිතූ මඟට හැරී ගියමෙු.
q2[6] සමිඳාණෝ අප සියල්ලන්ගේ පව් එතුමන් පිට
තැබූ සේක.
7 එළිද 5:6 ක්‍රියා 8:32-33 සේවකයාණන්ට පීඩා
කළ විට එතුමෝ මුඛය නෑර සිටිය හ;
q2[7] නිහතමානී ලසෙ එය දැරූ හ.
q2[7] මරන්න ගනෙ යන බැටළු පොව්වකු සේ ද
බැටළු දනෙක ලොම් කපන්නා ඉදිරියේ නිහඬ ව
සිටින සේ ද එතුමෝ මුඛය නෑර සිටිය හ.
8 බලහත්කාරකමින් ද යුක්ති විරෝධී ලසෙ ද
එතුමෝ ගනෙයනු ලැබූ හ;
q2[8] මනු ලොවින් සිඳදමනු ලැබූ හ;
q2[8] සනෙඟගේ පව් උදසො මරනු ලැබූ හ.
9 1 පේදු 2:22 මේ කරුණු ගැන, එතුමන් උදසො
පනේ සිටින්නේ කවරකේ ද?
q2[9] එතුමන් කිසි වරදක් නොකළ නමුත්, කිසි
බොරුවක් නොකී නමුත්, ඔවුන් එතුමන් මිහිදන්
කළෙේ අදමිටුවන් සමඟ එක මිනී වළේ ය.
q2[9] ධනවතුන් සමඟ එක සොහොන් බිමේ ය.
10 එහතේ, එතුමන් පළෙනු ලැබුවේත්, දුකට පත්
කරනු ලැබුවේත් සමිඳාණන්ගේ කැමැත්ත ලසෙ ය.
q2[10] මසේ එතුමන්ගේ මරණය පව් කමා කරන
පූජාවක් වේ.
q2[10] එබැවින් එතුමෝ සිය පරපුර දැක, දීර්ඝායු ලැබ
ජීවත් වන්නා හ.
q2[10] එතුමන් මඟින් සමිඳුන්ගේ කැමැත්ත මැනවින්
සඵල වේ.
11 එතුමන් සිය දුක් වේදනාවේ ප්‍රතිඵල දැක,
තෘප්තියට පැමිණනෙු ඇත.
q2[11] බොහෝ දනොගේ පව් තමන් පිට ගැනීමනේ,
එතුමන් දුක් වේදනාවනේ ලත් දැනගැන්මනේ දමිටු
කමට ඔවුන් පත් කරනු ලබනු ඇත.
12 මාක් 15:28; ලූක් 22:37 එබැවින් මම එතුමන්ට
උදාරතර සම්පත් දනේනමේ.
q2[12] එතුමෝ එය බලවතුන් සමඟ බදොගන්නා හ.
q2[12] මසේ වන්නේ, එතුමන්, වරදකරුවන් සමඟ
ගණන් ගනු ලැබ, සිය දිවි පුදමින්, බොහෝ
දනොගේ පව් උසුලාගනිමින් පව්කරුවන් සඳහා
මැදහත් යැදුම් කරන බැවිනි.

## ඉශ්‍රායලේවරුන්ට සමිඳුන්ගේ ප්‍රේමය

54 ගලා 4:27 “දරුවන් නොලැබූ වඳ ස්ත්‍රියක
වැනි ජරෙුසලම, ගී ගයන්න.
q2
54 ප්‍රසව වේදනාව නොවින්ද නුඹ ගී හඬ නඟා
මොරගසන්න.
q2
54 මන්ද, විවාහක ස්ත්‍රියගේ දරුවන්ට වඩා,
අත්හරිනු ලැබූ ගැහැණියක වැනි නුඹට දරු
සම්පත් බොහෝ වතේ”යි සමිඳාණෝ වදාරන සේක.
2 “නුඹේ කූඩාරම පිහිටා ඇති ස්ථානය විශාල
කරන්න.
q2[2] එහි සීමා පළල් කරන්න;
q2[2] පසු නොබසින්න;
q2[2] ලණු දික් කරගනෙ ඇඹ සවි කරන්න.
3 මන්ද, නුඹේ සීමා වමටත් දකුණටත් පැතිරී යනු
ඇත.
q2[3] නුඹේ දරු පරපුර ජාතීන්ගේ දේශ හිමි
කරගනෙ පාළු වී ඇති නගර වැසියන්ගනේ පුරවනු
ඇත.
4 බිය නොවන්න;
q2[4] නුඹ නැවත ලජ්ජාවට පැමිණනේනේ නැත.
q2[4] නොකැළඹනේන, නුඹ නින්දාවට පත් වන්නේ
නැත.
q2[4] නුඹේ යොවුන් වියෙහි ලජ්ජාව නුඹ අමතක
කරන්නෙහි ය.
q2[4] නුඹේ වැන්දඹුකමේ නින්දාව තවත් සිහි
නොකරන්නෙහි ය.

5 නුඹේ මැවුම්කාරයාණෝ නුඹේ ස්වාමි පුරුෂයා
මෙන් වන සේක.
q2[5] එතුමන්ගේ නාමය සව් බලැති සමිඳාණෝ ය.
q2[5] ඉශ්රායලේවරුන්ගේ ශුද්ධ තැනැන් වහන්සේ
නුඹේ මිදුම්කාරයාණෝ ය.
q2[5] 'මුළු පොළොවේ දෙවිඳාණෝ ය'යි එතුමන්ට
කියනු ලබන්නේ ය.
6 ඉශ්රායලේ, නුඹ සිය පුරුෂයා විසින් අත්හරිනු
ලැබූ අතිශයනේ ශෝකයට පත් වී සිටින තරුණ
භාර්යාවක වැන්න.
q2[6] එහෙත්, සමිඳාණන් එතුමන් වෙත නුඹ කැඳවා
ඇත."
q2[6] නුඹේ දෙවිඳාණෝ නුඹට මෙසේ වදාරන සේක:
7 "මම ස්වල්ප කලකට නුඹ අත්හළෙමි.
q2[7] එහෙත් මහා දයානුකම්පාවෙන් නැවත නුඹ
කැඳවාගන්නෙමි.
8 ඉමහත් උදහසින් මොහොතකට මාගේ මුහුණ
නුඹ කෙරෙන් සඟවාගතිමි.
q2[8] එහෙත්, නොමියෙන සුලු ප්රේමයකින් මම
නුඹට අනුකම්පා කරන්නෙමි."
q2[8] නුඹේ මිදුම්කාරයාණන් වන සමිඳාණෝ මෙසේ
වදාරන සේක:
9 උත් 9:8-17 "නෝවාගේ කාලයේ ඇති වූ
ජලගැල්ම මට සිහි වේ.
q2[9] ඒ කාලයේ ඇති වූවාක් මෙන් නුඹ කෙරෙහි
උදහස් නොවන බවටත්, නුඹට තරවටු නොකරන
බවටත් මම දිවුරුම් දුන්නෙමි.
10 කඳු පහ ව ගියත්, හලේ සලෙවුණත්, නුඹට ඇති
මාගේ තිර පෙම පහ වන්නේ වත්, මාගේ ගිවිසුම
සලෙවන්නේ වත් නැත.
q2[10] මෙසේ වදාරන්නේ නුඹට අනුකම්පා කරන
සමිඳාණන් වන මම ය."

### අලුත් ජෙරුසලම

11 එළිද 21:18-21 සමිඳාණෝ මෙසේ වදාරන
සේක:
q2[11] "අහෝ අසරණ කුණාටුවකින් මෙන් කැළඹී
සිටින සැනසිල්ලක් නැති තැනැත්තියක වැනි
ජෙරුසලම!
q2[11] මම නුඹේ ගඩොල් මරකතවලින් සාදා, නුඹේ
අත්තිවාරම් නිල් මාණික්යවලින් ඉදි කරන්නෙමි.
12 නුඹේ කොත් රතුකැටවලින් ද නුඹේ දොරටු
පද්මරාගවලින් ද නුඹ වටේ ඇති තාප්පය
මැණික්වලින් ද මම තනන්නෙමි.
13 ජොහ 6:45 නුඹේ දරුවන්ට ස්වාමීන් වන මම
උගන්වන්නෙමි.
q2[13] ඔවුන්ගේ සෞභාග්යය අධික වන්නේ ය.
14 නුඹ ධර්මිෂ්ඨකමෙහි පිහිටුවනු ලබන්නෙහි ය.
q2[14] නුඹ පීඩාවෙන් දුරු ව බිය නැති ව සිටින්නෙහි
ය.
q2[14] භීතියක් නුඹට ළං වන්නේ නැත.
15 කිසිදාක නුඹට පහර දීමට කිසිවකුට මම
අනුමැතිය නොදෙන්නෙමි.
q2[15] නුඹට විරුද්ධ ව සටන් කරන අය වැටෙන්නෝ
ය.
16 ගිනි අඟුරු පිඹ නියම වැඩට ආයුධයක්
තළාගන්නා වූ කම්මල්කරුවා මැව්වේ මම ය.
q2[16] ඒ ආයුධවලින් විනසාදැමීම සඳහා යුද්ධ භටයා
මැව්වේත් මම ය.
17 නුඹට විරුද්ධ ව සාදන කිසි ම ආයුධයකින්
වැඩක් නොවේ.
q2[17] නුඹට විරුද්ධ ව නඟන සියලු චෝදනා නුඹ
නිෂ්ප්රභා කරන්නෙහි ය.
q2[17] මාගේ මෙහෙකරුවන්ගේ උරුමය මෙයෙ වන්නේ
ය.
q2[17] මම ඔවුන්ට ජය අත්කර දෙමි."

### සාපිපාසා ඇත්තන් කැඳවීම

55 එළිද 21:6; 22:17 "පිපාසා ඇති සියල්ලනේ,
ඇල දොළ වෙත පැමිණෙන්න;
q2
55 මුදල් නැති තැනැත්තනේ, එන්න, අරගන්න,
වළඳන්න.
q2
55 එන්න, මිදියුස හා කිරි ගන්න, නොමිලේ ම
ලබාගන්න.
2 කෑමක් නොවන දේට මුදල් ගවෙන්නේ කුමට ද?
q2[2] තෘප්තිය නොදෙන දේට වෙහෙස වන්නේ මන්
ද?
q2[2] මා හට සවන් දී, මා කී දේ කර, හොඳ ම
ආහාර වළඳා පෝෂණය වී ප්රීති වන්න."

### සනෙඟ සමඟ ගිවිසුම

3 ක්රියා 13:34 "මට සවන් දී, මා වෙත එන්න;
q2[3] අවුත් ජීවනය ලබාගන්න;
q2[3] දාවිත්ට මා ප්රේම කළාක් මෙන් ම නුඹටත්
ප්රේම කරන ලෙසට සදහට ම පවතින ගිවිසුමක්
නුඹ සමඟ කරන්නෙමි.
4 දාවිත්, ජාතීන්ගේ ප්රධානියකු ද ආඥාපතියකු
ද කළෙමි.
q2[4] මාගේ සනෙඟට ඔහු මාගේ සාක්ෂිකාරයකු
කරමි.
5 නුඹේ සමිඳුන් හා දෙවිඳුන් වන,
ඉශ්රායලේවරුන්ගේ සුවිශුද්ධ තැනැන් වහන්සේ වන
මා නුඹ ගෞරවයට පත් කළ බැවින්, නුඹ
නොහැඳින සිටි ජාතීන් කැඳවා, නුඹ අණ කළ
පමණින් නුඹ වෙත විගසින් ඇදී එනු ඇත."

### පසුතැවී සිත් හරවා ගැනීමට ආරාධනාව

6 හමු විය හැකි බැවින් සමිඳුන් සොයා යන්න;
q2[6] ළඟ ම සිටිය දී එතුමන් අයැදින්න.
7 දුෂ්ටයා සිය මාර්ගයෙන් හැරී, අදමිටු මිනිසා තම
සිතුවිලි දුරලා, සමිඳුන් වෙත ඇදී ඒවා!
q2[7] එතුමන් ඔහුට අනුකම්පා කරනු ඇත.
q2[7] දෙවිඳුන් වෙත ඔහු හැරී ඒවා;
q2[7] එතුමන් ඔහුට බොහෝ සේ කමා කරනු ඇත.

8 සමිඳාණන් වන මම මසෙේ පවසමි.
q2[8] "මාගේ සිතුවිලි නුඹේ සිතුවිලි මනේ නාොවේ;
මාගේ මාර්ග නුඹේ මාර්ග මනේ නාොවේ.
9 අහස පාොළාොවට වඩා බාොහාෝ ඉහළින් ඇති
සේ නුඹේ මාර්ගවලට වඩා මාගේ මාර්ග උසස් ය.
q2[9] නුඹේ සිතුවිලිවලට වඩා මාගේ සිතුවිලි
බාොහාෝ සේ උසස් ය."

## දවේඳුන්ගේ නාොවරදින වචනය

10 2 කාොරි 9:10 "අහසින් වැටනෙ හිම හා වසින
වැස්ස නැවත හැරී නාොගාොස් පාොළාොව සරුසාර
කර, පැළ නංවා, කරල් හටගන්වා වපුරන්නාට ධාන්ය
ද මිනිසාට ආහාර ද ගනෙ දයේි.
11 එලසෙ මා මුවින් නික්මනෙ වචන මා වතෙ ම
හිස් ව නාොපැමිණ මාගේ අදහස් සඵල කර
නියමයන් සිතුරට ම ඉටු කරයි."

## වහල්කමින් නික්ම යාම

12 "නුඹලා ප්රීතියනේ බබිලාෝනියනේ නික්ම
යන්නහු ය.
q2[12] සාමදානයනේ නගරයනේ ගනෙයනු ලබන්නහු
ය.
q2[12] කඳු හලේ නුඹලා ඉදිරියේ බියනේ ඉපිළයේි.
q2[12] වනයේ සියලු ගස් කාොළන් අත් පාොළසන්
දයේි.
13 කටු ගස් වනෙුවට දේවදාර ගස් ද ගාොකටු
වනෙුවට මරඳ ගස් ද හටගනියි.
q2[13] මයෙ සමිඳුන්ගේ නමට සදහට පවතින
සලකුණක් වන්නේ ය.
q2[13] එතුමන්ට මැකී නාොයන සිහිවටනයක් වන්නේ
ය."

## සියලු ජාතීන්ට කැඳවීමක්

56 සමිඳාණාෝ සිය සනෙඟට මසෙේ වදාරන
සේක.
q2
56 "යුක්තිය ඉටු කර හරි දේ කරන්න.
q2
56 මම නුඹලා නාොපමා ව මුදන්නමේ.
q2
56 මාගේ විමුක්තිය එළිදරව් වනු ඇත.
2 මේ දේ කරන, එහි නිරත ව සිටින, සබත්
දවස පවත්වන, එය නාොකලෙසන, නපුර කිරීමනේ
වැළකී සිටින මිනිසා, මැරනෙ සුලු මිනිසා,
භාග්යවන්ත ය."
3 සමිඳුන් සමඟ බැඳුණ විදශේිකයා, 'සමිඳාණාෝ
සිය සනෙඟගනේ මා වනේ කරන සේකැ'යි නාොකියා
වා!
q2[3] නපුංසකයකේ, 'මම වියළි ගසක් වැන්නැ'යි
නාොකියා වා!
4 සමිඳාණාෝ මසෙේ පවසන සේක:
q2[4] "මාගේ සබත් දවස රක්ෂා කර, මා ප්රිය කරන
දේ තාෝරාගනෙ, මාගේ ගිවිසුමහෙි ස්ථිර ව පිහිටා
සිටින නපුංසකයාෝ
5 මාගේ මාලිගාවේ ප්රාකාරය ඇතුළේ දූදරුවන්ට
වඩා උසස් නමක් ලබන්නාෝ ය.
q2[5] එය කිසි කලක නාොමැකනෙ, සදහට ම පවතින
නමක් වන්නේ ය.
6 සමිඳුන්ට සවේය කර, එතුමන්ට ප්රමේ කර,
එතුමන්ගේ මහෙකෙරුවන් වන පිණිස එතුමන් සරණ
ගිය, සබත් දවස පවත්වා එය නාොකලෙසන මාගේ
ගිවිසුම ස්ථිර ව පවත්වන විදශේිකයන් ද මාගේ
ශුද්ධ කන්දට පමුණුවා, මාගේ යාච්ඤා ගෘහයහෙි
ප්රීති කරවන්නමේ.
7 මතෙ 21:13; මාක් 11:17; ලූක් 19:46 ඔවුන්ගේ
දවන යාග පූජා හා පුද පූජා මාගේ පූජාසනය පිට
පිළිගනු ලබන්නේ ය.
q2[7] මන්ද, 'මාගේ දේව මාලිගාව සියලු ජාතීන් හට
යාච්ඤා ගෘහය'ය යි කියනු ලබන්නේ ය.
8 පිට කරනු ලැබූ ඉශ්රායලේවරුන් එකතු කරන
මහාෝත්තම දවේ සමිඳාණාෝ, 'ඔවුන් වතෙ එකතු වී
සිටින්නන් හැර මම තවත් අය ඔවුන් වතෙ එකතු
කරන්නමේ'යි වදාරන සේක."

## ඉශ්රායලේවරුන්ගේ මූලිකයන්ගේ විනාශය

9 වනයේ සියලු සත්ත්වයනෙි, කැළෑවේ සියලු
සත්ත්වයනෙි, එන්න;
q2[9] ඔබේ ගාොදුරු කාදමන්න.
10 සනෙඟගේ මුරකාරයන් සියල්ලාෝ ම අන්ධ ය.
q2[10] කිසිවක් දන්නේ නැති ඔව්හු බුරන්න බැරි
ගාොළු බල්ලන් වැනි ය.
q2[10] බල්ලන් මනේ ලැග හිඳිමින් හීන දකිති.
q2[10] නිදාගන්න ඉතා කැමැති ය.
11 ඔව්හු කිසිසේත් තෘප්තියට නාොපැමිණනෙ කෑදර
බල්ලන් වැනි ය.
q2[11] ඔව්හු තේරුම්පැහැදුම් කිසිත් නැති එඬරේු
වතෙි.
q2[11] ඔව්හු එකිනකො තම තමාගේ වාසිය තකා
හිතුමනාපයට ක්රියා කරති.
12 ඔව්හු කතා කාොට, "එන්න, අපි මීදියුස
ලබාගනෙ, සුරාපානය උගුරට ම එන තකේ බී
තෘප්තියට පැමිණමෙු.
q2[12] හටෙ දවස අදටත් වඩා හාොඳ දවසක් වනු
ඇතැ"යි කියති.

## පිළිම වන්දනාව හළො දැකීම

57 ධර්මිෂ්ඨයා මිය යන්නේ ය, එහතේ
කිසිවකේ එය සිතට නාොගන්නේ ය.
q2
57 බැතිමත්හු අභාවයට යති.
q2
57 එහතේ කිසිවකේ එය තේරුම් නාොගනිති.
q2

57 මන්ද, විපත පැමිණෙනේන පරෙ ඔව්හු
ගනෙයනු ලබති.
2 අවංකකමින් ජීවත් වන අය මරණයේ දී
ශාන්තියට පිවිස විවේක සුවයනේ පසු වතෙි.
3 එහතේ, මායාකාරියගේ පුත්‍රයන් වන,
පාරදාරිකයන්ගේත්, වේශ්‍යාවන්ගේත් වංශය වන
නුඹලා, මෙහි පැමිණෙනේන.
4 නුඹලා කට අයා, දිව දික්කර, කවටකම් කරන්නේ
කාට විරුද්ධ ව ද?
q2[4] නුඹලා කැරලිකාරකමේ දරුවන් ද වංචනික
වංශයක් ද නොවෙන්නහු ද?
5 ආලෝන ගස් අතරේත්, සියලුම අතු පතර ඇති
ගස් යටත් නුඹලා කම් සැපහෙි යදෙනේනහු ය.
q2[5] මිටියාවත්හි හා පර්වත විවරයන්හි නුඹලා
දරුවන් පූජා කරන්නහු ය.
6 නමස්කාර කරන පිණිස නුඹලා මිටියාවතේ ගල්
ගනෙ ඒවාට පාන පූජා වගුරුවා, ආහාර පූජා
කරන්නහු ය.
q2[6] නුඹලා මේ දේවල් කරද්දී මම සතුටු වන්නමේ
ද?
7 නුඹලා පූජා ඔප්පු කරනු පිණිස උස් කඳුවලට
ගොස් එහි කම් සැපහෙි යදෙනෙ පිණිස යහන්
පිළියළෙ කරන්නහු ය.
8 දොරටත්, උළුවස්සටත් පිටුපසින් නුඹලාගේ දේව
පිළිම නුඹලා තබාගන්නහු ය.
q2[8] නුඹලා මා අත් හැර, නුඹලාගේ ඇඳුම් ගලවා,
කුලියට ලබා ගත් පමේවත් අය සමඟ විශාල
යහන්වලට වී කම් සැපහෙි යදෙනේනහු ය.
9 නුඹලා සුවඳ ද්‍රව්‍ය ගාගනෙ මොලෙක් දවේයාට
නමස්කාර කරන පිණිස යන්නහු ය.
q2[9] නමස්කාර කිරීමට දවේවරුන් සොයාගන්න
පිණිස නුඹලා පණිවුඩකාරයන් දස දසෙ, පාතාල
ලෝකයට පවා යවන්නහු ය.
10 අන් දවේවරුන් සොයාගැනීමටත් නුඹලා වහෙසෙ
වන්නහු ය.
q2[10] එහතේ, නුඹලාගේ සවේම අත්නාරින්නහු ය.
q2[10] නුඹලා නව පණක් ලබාගත් බැවින් නුඹලා
දුර්වල නොවෙන්නහු යයි සිතන්නහු ය.
11 සමිඳාණෝ මසෙේ වදාරන සේක:
q2[11] "නුඹලා බොරු කීවේත්, මා සහමුලින් ම
අමතක කළේත් කවරකුටෙ බියනේ ද?
q2[11] නුඹලා මට බිය නොවන්නේ මා බොහෝ
කලක් නිශ්ශබ්ද ව සිටි නිසා ද?
12 නුඹලාගේ ඔය දැහැමිකමත්, නුඹලාගේ ක්‍රියාත්
මම හළෙි කරන්නමේ.
q2[12] නුඹලාගේ දේව රූපවලින් නුඹලාට පිහිටක්
නොවේ.
13 නුඹලා මොරගසන විට නුඹලා රැස්කරගත් ඒ
දේව රූප නුඹලාට පිහිට වේ වා!
q2[13] ඔව්හු සුළඟට ගසාගනෙ යනු ලබති.
q2[13] හුස්මකින් පහ ව යන්නෝ ය.
q2[13] එහතේ, මා කරෙහෙි විශ්වාස කරන අය
දේශය අත් කරගනෙ, මාගේ ශුද්ධ කන්ද උරුම
කරගන්නෝ ය."

### සුවසතෙ දීමට දේව පොරොන්දුව

14 "මහා මඟක් සාදන්න;
q2[14] මාගේ සනෙඟගේ බාධා ඉවත් කොට, මාර්ගය
පහදා, සමතලා කර සූදානම් කරන්නැ"යි කියන
හඬක් ඇසනේනේ ය.
15 උසස්, උදාර, සදාකාලික ශුද්ධ නාමය දරන
තැනැත් වහන්සේ මසෙේ වදාරන සේක:
q2[15] "යටහත් පහත් අය පණ ගන්වන පිණිසත්,
තැළුණු බිඳුණු අයගේ සිත් ධරෛයවත් කරන
පිණිසත් මම උසස්, ශුද්ධස්ථානයේ වාසය කරන
අතර, යටහත් පහත්, තැළුණු බිඳුණු සිත් ඇති අය
සමඟ ද වාසය කරමි.
16 මා කරෙනේ ජීවනදායක ආත්මය නික්මනෙ
බැවින්, මා ජීවන හුස්ම මවා ඇති බැවින් මා
තවදුරටත් මාගේ සනෙඟ සමඟ විවාද කරන්නේ
වත්, සැම කල් ම උදහස් වී සිටින්නේ වත් නැත.
17 ඔවුන්ගේ තණ්හාව හා වරද නිසා මම උදහස්
වීමි.
q2[17] ඒ නිසා මාගේ කෝපයනේ මම ඔවුන්ට දඬුවම්
කොට, ඔවුන් අත්හළමේ.
q2[17] එහතේ, ඔව්හු මුරණ්ඩු ව, හිතුමතේ ජීවත් වූ
හ.
18 ඔවුන් ක්‍රියා කර ඇති අන්දම මම දිටිමි.
q2[18] එහතේ, මම ඔවුන්ට සුවය දමේි.
q2[18] මම ඔවුන්ට මඟපනේවා, පිහිට වී, ශෝක
වන්නන් සිනා රැල්ලනේ සනසන්නමේ.
19 එෆී 2:17 ළඟ හෝ දුර හෝ වේ වා, සියලු
දනොට, 'ශාන්ති වේ වා! ශාන්ති වේ වා!
q2[19] මම ඔවුන්ට සුවය දමේ'යි සමිඳාණන් වන මම
කියමි.
20 එහතේ, දුෂ්ටයෝ වනාහි කැළඹී ඇති කුණු
කසළ සෝදාගනෙ, ගොඩට නොනැවතී ගලා එන,
රළ පතර ඇති මුහුද හා සමාන වතෙි.
21 යසො 48:22 'දුෂ්ටයන්ට ශාන්තියක් නැතැ'යි
මාගේ දවේඳාණෝ වදාරන සේක."

### සැබෑ උපවාසය

58 සමිඳාණෝ මසෙේ වදාරන සේක:
q2
58 "නොනැවතී මහ හඬින් මොරගසා,
හොරණෑවක් මනේ නුඹේ හඬ නඟා, මාගේ
ඉශ්‍රායලේ සනෙඟට ද ජාකොබ්ගේ වංශයට ද
ඔවුන්ගේ වැරදි හා පව් දන්වන්න.
2 ඔව්හු දැහැමි ක්‍රියා කරන, දවේඳුන්ගේ නියෝග
අත්නැර සිටින ජාතියක් යයි සිතාගනෙ, දවස් පතා
මා සොයති;
q2[2] මාගේ මාර්ගයන් දැනගන්න ප්‍රසන්න වතෙි;
q2[2] සාධාරණ විනිශ්චයයන් මාගනේ ඉල්ලති;
q2[2] දවේඳුන් වතෙ ළඟා වීමට ප්‍රසන්න වතෙි."
3 "සමිඳුන් සලකන්නේ නැත්නම්, අප උපවාස
කරන්නේ කුමට ද?

q2 3 එතුමන් සිතට ගන්නේ නැත්නම්, අප වද
විඳින්නේ කුමට දැ”යි සෙනඟ අසති.
q2 3 සමිඳාණෝ ඔවුන්ට මෙසේ වදාරන සේක:
q2 3 “නුඹලා උපවාසයේ යෙදී සිටින අතර නුඹලාගේ
ම සැප පහසුව සොයමින් නුඹලාගේ සේවකයන්ට
හිරිහැර කරන්නහු ය.
4 නුඹලා උපවාසයේ යෙදී සිටින අතර, විවාදයටත්,
තරඟයටත්, දුෂ්ට පහර දීමටත් පෙළඹෙන්නෙහු ය.
q2 4 මෙලෙස මෙදින උපවාස කිරීමෙන් නුඹලාගේ
යැදුම් සගයට නොනැඟේ.
5 නුඹලා උපවාස කරන දවසේ දී නුඹලාට ම වද
වේදනා කරගෙන පන් ගසක් මෙන් හිස නමාගෙන,
ගෝනි රෙදි සහ අළු අතුරා ඒ පිට හිඳගන්නහු ය.
q2 5 උපවාසයෙන් නුඹලා අදහස් කරන්නේ එය ද?
q2 5 එවැනි උපවාස දවසක් සමිඳුන්ට ප්‍රසන්න යයි
නුඹලා සිතන්නහු ද?
6 මට ප්‍රියමනාප උපවාසය මෙය වේ, දුෂ්ටකමේ
විලංගු මුදා හැර, අයුක්තියේ බැඳුම් ලිහා හැර,
පීඩිතයන් නිදහස් කර හැර, සියලු වියගස් බිඳදැමීම
ය.
7 මතෙ 25:35 සාගින්නෙන් පෙළෙන අය සමඟ
ආහාර බෙදාගැනීම ද ගේදොර නැති අසරණයන්
ඔබේ ගෙදරට කැඳවීම ද ඇඳුම් නැති අය දුටු විට
ඇඳුම් සපයා දීම ද සැබෑ මිතුරන් මඟ නොහැර
යුතුකම් ඉටු කිරීම ද නියම උපවාසය වේ.
8 එවිට අරුණෝදය මෙන් මාගේ එළිය උදා වී,
ඉක්මනින් නුඹලාට සුවසෙත ගෙන දේවී.
q2 8 ඔබේ දැහැමි සිරිය ඔබ පෙරටුවෙන් ද
සමිඳුන්ගේ තෙද සිරිය ඔබ පසුපස ද ඔබේ
සුරැකියාව සඳහා ගමන් ගන්නේ ය.
9 එකල නුඹලා යාච්ඤා කරන විට මම පිළිතුරු
දෙන්නෙමි.
q2 9 මට නුඹලා හඬ නඟන විට ‘මම මෙහි ය’යි
පිළිතුරු දෙන්නෙමි.
q2 9 නුඹලා අනුන්ට කරන බලහත්කාරකම් ද අනුන්
හෙළා දැකීම ද නපුරු ලෙස කතා කිරීම ද නුඹලා
වෙතින් පහ කරන්නහු නම්,
10 සාගිනි ඇත්තාට අනුකම්පා කර, අසරණයන්
තෘප්තියට පමුණුවන්නහු නම්, නුඹේ අඳුර එළිය
වන්නේ ය;
q2 10 ඝනාන්ධකාරය මද්දහන මෙන් එළිය වන්නේ ය.
11 මම නිතර ම නුඹලාට මඟපෙන්වා, යහපත්
දයෙන් තෘප්තියට පමුණුවා සනීප ශක්තිය නුඹලාට
ගෙන දෙන්නෙමි.
q2 11 නුඹලා ජලයෙන් සාරවත් උයනක් මෙන් ද දිය
නොසිඳී යන උල්පතක් මෙන් ද වන්නහු ය.
12 නුඹලාගේ බොහෝ කලක සිට පැවත එන
නටබුන් ව තිබුණු තැන් ගොඩනඟනු ලබන්නේ ය.
q2 12 පැරණි අත්තිවාරම් පිට ගොඩනැඟිලි නැවත
ඉදි කරනු ලබන්නේ ය.
q2 12 කැඩුම්බිඳුම් සෑදූ, වාසය පිණිස නටබුන් නැවත
අලුත්වැඩියා කළ අය වශයෙන් නුඹලා හඳුන්වනු
ලබන්නහු ය.”

## සබත් දවස පැවැත්වීමේ ප්‍රතිඵල

13 සමිඳාණෝ මෙසේ වදාරන සේක:
q2 13 “නුඹලා සබත් දවස ශුද්ධ ලෙස පවත්වා, ඒ
දවසේ දී නුඹගේ කැමැත්ත නොකර, සමිඳුන්ගේ
සබත ප්‍රිය වන ගෞරවණීය දවසක් යයි කියන්නහු
නම්, ඒ දවසේ දී ගමන් බිමන් නොගොස්, ගනුදෙනු
නොකර, අල්ලාප සල්ලාප නොදොඩා ඒ දවසට
ගෞරව කරන්නහු නම්,
14 මට සේවය කිරීමෙන් ඇති වන ප්‍රීතිය නුඹලා
භුක්ති විඳින්නහු ය.
q2 14 ලොවෙහි උසස් ම ගෞරවය නුඹලාට අත් කර
දෙන්නෙමි.
q2 14 නුඹලාගේ පිය වූ ජාකොබ්ට උරුමයක්
වශයෙන් දුන් දේශය නුඹලා භුක්ති විඳින්නහු ය.
q2 14 මෙසේ වදාරන්නේ සමිඳුන් වන මම ය.”

## පාප ගැන චෝදනා

59 ගළවන්න බැරි වන ලෙස සමිඳුන්ගේ බලය
දුබල වී නැත, නෑසෙන ලෙස එතුමන්ගේ
කන බිහිරි වී නැත.
2 නුඹලා දෙවිඳුන්ගෙන් වෙන් ව සිටින්නේ
නුඹලාගේ ම අපරාධ නිසා ය.
q2 2 නුඹලා අයැදින විට එතුමන්ට නෑසෙන්නේ
නුඹලාගේ පාප නිසා ය.
3 නුඹලාගේ අත්වල ලේ තැවරී ඇත.
q2 3 නුඹලාගේ ඇඟිලි අපරාධවලින් කිළුටු වී ඇත;
q2 3 තොල්වලින් නුඹලා බොරු කියා ඇත;
q2 3 දිවෙන් නුඹලා නපුරු දේ පවසා ඇත.
4 යුක්ති සහගත නඩු කියන, අවංක සිතින්
උසාවියට යන කෙනෙක් නැත.
q2 4 ඔව්හු නිරර්ථක පැමිණිලි විශ්වාස කොට බොරු
කියන්නෝ ය.
q2 4 නපුර පිළිසිඳගෙන අයුක්තිය බිහි කරන්නෝ ය.
q2 4 පොළොං බිජු රකින සේ,
5 මකුළු දැල් වියන සේ උපායයන් යොදන්නෝ ය.
q2 5 පොළොං බිජු අනුභව කරන්නෝ නසින්නෝ ය.
q2 5 බිජුවක් බිඳින විට එයින් තවත් පොළඟෙක්
නික්ම එයි.
6 එහෙත්, ඒ උපායයන් ඇඳුම් සඳහා මකුළු දැල්
වියාගැනීමක් මෙන් නිෂ්ඵල ය.
q2 6 නුඹලාගේ වැඩ අපරාධ වැඩ ය.
q2 6 නුඹලාගේ අත්වලින් නිතර බලහත්කාරකම්
කරන්නහු ය.
7 රෝම 3:15-17 නපුරුකම් කිරීමට නුඹලා යුහුසුළු
වන්නහු ය.
q2 7 නිදොස් අයගේ ලේ වැගිරීමට ඉක්මන් වන්නහු
ය.
q2 7 නුඹලාගේ සිතුවිලි පාපතර සිතුවිලි ය.
q2 7 නුඹලා යන යන තැන නාස්තිය හා විනාශය ඇති
වේ.
8 සාම මාර්ගය නුඹලා නොදන්නහු ය.
q2 8 නුඹලාගේ මාර්ගයේ යුක්තිය නැත.

q2[8] නුඹලා ඇද මාවත් සාදාගෙන ඇත.
q2[8] එහි ගමන් ගත් කිසිවකේ සාමය නොදනිති.

### සෙනඟගේ පාපෝච්චාරණය

9 සෙනග මෙසේ කියති:
q2[9] “යුක්තියත් දැහැමිකමත් අපෙන් දුරු ව
තිබෙන්නේ මන්දැ යි අපි දනිමු.
q2[9] අප එළිය සොයන නමුත්, ඇත්තේ අන්ධකාරය
ය;
q2[9] දීප්තිය සොයන නමුත්, අප යන්නේ කළුවරෙහි
ය.
10 අන්ධයන් මෙන් අපි බිත්ති අත පත ගාමින් මඟ
සොයමු.
q2[10] ඉර මුදුන් වේලාවේ අපි අඳුරේ මෙන් පැකිළී,
ජීවතුන් මැද මළවුන් මෙන් සිටිමු.
11 අපි සියල්ලෝ ම වලසුන් මෙන් ගොරවමු;
q2[11] කොබෙයියන් මෙන් කඳිරි ගාමු.
q2[11] අප යුක්තිය සවේවත් එය දක්නට නැත;
q2[11] ගැළවීම ගැන බලා සිටියත් එය අපෙන් ඈත් ව
තිබේ.
12 සමිඳුනි, ඔබට විරුද්ධ ව අපේ අපරාධ බොහෝ
ය;
q2[12] අපේ අපරාධ අපට විරුද්ධ ව සාක්ෂි දෙයි.
q2[12] ඒවා අප සමඟ ය, අපේ පව් අපි දනිමු.
13 අපි ඔබට විරුද්ධ ව කැරලි ගසා, ඔබ
ප්‍රතික්ෂේප කර අපේ දෙවිඳුන්ගේ මාර්ගයෙන් හැරී
ගියෙමු.
q2[13] අපි අනුන්ට පීඩා කර ඔබට විරුද්ධ ව කැරලි
ගැසීමු.
q2[13] අපේ සිතුවිලි වංක ය;
q2[13] අපේ වචන බොරු ය.
14 යුක්තිය බැහැර කොට ඇත;
q2[14] දැහැමිකම දුරින් දුරු වී ඇත.
q2[14] සත්‍යය ප්‍රසිද්ධ තැන්වල වැටී බිඳී ඇත.
q2[14] ඇත්තට තැනක් නැත.
15 සැබෑකම දක්නට නැත;
q2[15] නපුර හළෝ දකින තැනැත්තා සොර මුළට
ගොදුරක් වේ.
q2[15] සමිඳාණෝ මේ දේ දැක, යුක්තිය නුවූ බැවින්
අප්‍රසන්න වූ සේක.”

### සමිඳුන්ගේ පිහිට

16 යසා 63:5 පීඩිතයන්ට උපකාර කිරීමට
කිසිවකු නැති බව දැක එතුමාණෝ පුදුම වූ සේක.
q2[16] එබැවින් එතුමාණෝ ඔවුන් ගැළවීමටත්,
ඔවුන්ට ජය අත්පත් කර දීමටත් සිය බලය
මෙහෙයවන සේක.
17 එපී 6:14,17; 1 තෙස 5:8 එතුමාණෝ, යුක්තිය
සන්නාහයක් මෙන් ද ජයග්‍රහණය යුද්ධ තොප්පිය
මෙන් ද පළඳින සේක.
q2[17] පළිගැනීම නමැති වස්ත්‍රයෙන් ද උදහස නමැති
සළුවෙන් ද සැරසෙන සේක.
18 එතුමාණෝ ඔවුන්ගේ ක්‍රියා අනුව දඬුවම්
කරන සේක.
q2[18] විරෝධකරුවන්ට උදහස ද සතුරන්ට විපාක ද
පමුණුවන සේක.
q2[18] මුහුදුබඩ වසන්නන්ටත් එසේ ම කරන සේක.
19 එවිට නැගෙනෙහිර සිට බස්නාහිර දක්වා සියලු
දෙන එතුමන්ගේ නමටත් බිය වන්නෝ ය.
q2[19] එතුමන්ගේ තේජාලංකාරය දකින්නෝ ය;
q2[19] එතුමාණෝ තද සුළඟක් මෙන් නැඟී
වේගයෙන් ගලා යන දිය පාරක් මෙන් වඩින සේක.
20 රෝම 11:26 සමිඳාණෝ සෙනඟට මෙසේ
වදාරන සේක:
q2[20] “පාපයෙන් හැරෙන ජාකොබ්ගේ වංශයේ සියලු
දෙනා ගළවන්නත්, ජෙරුසලමේ සිටින නුඹලා
ආරක්ෂා කරන්නත් මම එන්නෙමි.
21 නුඹලා සමඟ මම ගිවිසුමක් කරන්නෙමි. එය
මෙසේ ය. නුඹලා කෙරෙහි පවරා ඇති මාගේ
ආත්මානුභාවය ද නුඹලාගේ මුවෙහි තබන ලද
මාගේ වචන ද නුඹලාගේ මුඛයෙන් වත්, නුඹලාගේ
දරුවන්ගේ මුඛයෙන් වත්, ඔවුන්ගේ දරුවන්ගේ
මුඛයෙන් වත් මතැන් සිට සදාකාලයට ම පහ
නොවන්නේ ය.”

### ජෙරුසලමේ නවෝදය

60 ජෙරුසලම, නැඟිටින්න, බැබළෙන්න.
q2
60 ඔබේ ආලෝකය දැන් උදා වී ඇත.
q2
60 සමිඳුන්ගේ තේජාලංකාරය ඔබ කෙරෙහි
බැබළේ.
2 පොළොව අඳුරෙන් ද ජාතීන් ගන'ඳුරෙන් ද වසනු
ලබන නමුත්, සමිඳාණෝ ඔබ මත බබළන සේක.
q2[2] එතුමන්ගේ තේජාලංකාරය ඔබ කෙරෙහි දිස්
වන්නේ ය.
3 ජාතීන් ඔබේ ආලෝකය වෙතටත්, රජවරුන් උදා
වන ඔබේ දීප්තිය දෙසටත් පැමිණෙනු ඇත.
4 ඔබේ ඇස් ඔසවා අවට බලන්න;
q2[4] ඔව්හු සියල්ලෝ රැස් ව ඔබ වෙත එති.
q2[4] ඔබේ පුත්‍රයන් දුර සිට පැමිණෙනු ඇත.
q2[4] ඔබේ දූවරු උකුලේ හොවාගෙන ගෙනෙනු
ලබති.
5 මෙය දැක ඔබ ප්‍රීති වන්නහු ය.
q2[5] ඔබේ සිත ප්‍රීති ප්‍රමෝදයෙන් පිනා යන්නේ ය.
q2[5] මන්ද, මුහුදු මඟින් ගෙනෙන යසඉසුරු ඔබ වෙත
ගලා එන්නේ ය.
q2[5] ජාතීන්ගේ වස්තුව ඔබ වෙත පැමිණෙන්නේ ය.
6 ඔටුවන් සමූහයකින් යුත් තවලම් මිදියන් හා ඒපා
දේශවලින් නුඹ වෙත රොක් වෙයි.
q2[6] ඔවුන් ෂෙබා දේශයෙන් රන් ද සුවඳ ද්‍රව්‍ය ද
රැගෙන අවුත්, සමිඳුන්ගේ ප්‍රශංසාව ප්‍රකාශ කරනු
ඇත.
7 කේදාර් හා නබොයොත්හි සියලු එළු බැටළු පට්ටි
පූජා කරනු සඳහා නුඹ වෙත ගෙනෙනු ලබති;

q2 7 උන් සමිඳුන්ගේ පූජාසනය පිට ඔප්පු කරනු
ලබති.
q2 7 සමිඳාණෝ සිය තේජාන්විත දේව මාලිගාව
අලංකාරවත් කරන සේක.
8 වලාකුළු ගසාගෙන යන්නාක් මෙන් ද පරවියන්
උන්ගේ කූඩුවලට ඉගිලෙන්නාක් මෙන් ද වේගයෙන්
ගමන් කරන්නෝ මොනවා ද?
9 මුහුදුබඩ වසන්නෝ මාගේ පැමිණීම බලා සිටිති.
q2 9 නැව් තර්ෂිෂ්හි සිට පැමිණෙනු ඇත.
q2 9 දුර සිට නුඹේ පුත්‍රයන් ද ඔවුන් සමඟ රන් රිදී
ද ඒ නැව් ගෙනෙනු ඇත.
q2 9 නුඹේ දෙවි සමිඳුන්ට එනම්, ඉශ්‍රායලේවරුන්ගේ
සුවිශුද්ධ තැනැන් වහන්සේට ගරු කරන පිණිස ඒ
නැව් පැමිණයෙයි.
q2 9 මන්ද, එතුමාණන් නුඹ මහිමයට පත් කර
තිබෙන බැවිනි.
10 සමිඳාණෝ ජෙරුසලමට මෙසේ වදාරන සේක:
q2 10 "විදේශීහු නුඹේ පවුරු ගොඩනඟන්නෝ ය.
q2 10 ඔවුන්ගේ රජවරු ද නුඹට සේවය කරන්නෝ
ය.
11 එළිද 21:25-26 ජාතීන්ගේ සම්පත් ඔවුන්ගේ
රජවරුන් පෙරටු කොටගෙන නුඹ වෙත ගෙනෙන
පිණිස නුඹේ දොරටු රෑ දාවල් දෙකේහි නොවසා,
නිතර ම ඇර තබනු ලැබේ.
12 ඔබ වහන්සේට සේවය නොකරන ජාතීන් ද
රාජ්‍යය ද වැනසෙන්නේ ය.
q2 12 එසේ ම ඒ ජාතීහු සහමුලින් ම විනාශ
වන්නෝ ය.
13 මාගේ ශුද්ධස්ථානය අලංකාර කිරීමටත්, මා
වැඩවසන ශුද්ධ මන්දිරය තේජවන්ත කිරීමටත්,
ලෙබනොන්හි අනර්ඝ දේවදාර ගස් ද හල් ගස් ද
නුඹ වෙත ගෙනෙනු ඇත.
14 එළිද 3:9 නුඹට පීඩා කළ අයගේ පුත්‍රයන්
දණින් වැටී නුඹ වෙත පැමිණෙනු ඇත.
q2 14 නුඹ හෙළා දැක්ක සියල්ලන් ද නුඹේ පාමුල
වැඳ වැටෙනු ඇත.
q2 14 ඔවුන් නුඹට, 'සමිඳුන්ගේ නගරය' කියාත්,
'සියොන් නම් ඉශ්‍රායලේවරුන්ගේ සුවිශුද්ධ තැනැන්
වහන්සේගේ නුවර ය' කියාත් කියනු ඇත.
15 එපා කරන ලද, ද්වේෂයට භාජනය වූ, පාළු වූ,
නුවරක් වූ නමුත්, මම නුඹ උතුම්, අලංකාර, සදහට
ම ප්‍රීතිය ඇති ස්ථානයක් කරන්නෙමි.
16 මව දෙනෙක ඇගේ කිරි දරුවාට කිරි පොවා රැක
බලන්නාක් මෙන් ජාතීහු ද රජවරු ද නුඹ රැක
බලාගනිති.
q2 16 ස්වාමීන් වන මම නුඹේ ගැළවුම්කාරයාණන්
බවත්, ඉශ්‍රායලේවරුන්ගේ බලවන්තයාණන් නුඹේ
මිදුම්කාරයාණන් බවත් නුඹ දැනගනු ඇත.
17 මම ලෝකඩ වෙනුවට රත්‍රන් ද යකඩ වෙනුවට
රිදී ද ලී වෙනුවට ලෝකඩ ද ගල් වෙනුවට යකඩ ද
ගෙනෙන්නෙමි.
q2 17 නුඹේ නායකයන් විසින් යුක්තියෙන් හා
සාමයෙන් නුඹ පාලනය කරනු ලැබීමට මම
සලස්වන්නෙමි.
18 නුඹේ දේශ සීමා තුළ බලහත්කාරකම ද
නාස්තිය හා විනාශය ද ගැන තවත් අසන්න
නොලැබෙන්නේ ය.
q2 18 නුඹේ පවුරුවලට 'ගැළවීම' කියා ද නුඹේ
දොරටුවලට 'ප්‍රශංසාව' කියා ද නුඹ කියන්නෙහි ය.
19 එළිද 21:23; 22:5 මින්පසු, දවල් කාලේ හිරු
තවත් ඔබේ එළිය නොවන්නේ ය;
q2 19 රෑ කාලේ සඳ, එළිය දෙන්න ඔබ කරේ
නොබබළන්නේ ය;
q2 19 සමිඳාණෝ ඔබේ සදාතන ආලෝකය වන
සේක.
q2 19 ඔබේ දෙවිඳාණෝ ඔබේ තේජාලංකාරය වන
සේක.
20 ඔබේ හිරු තවත් බැස යන්නේ නැත;
q2 20 ඔබේ සඳ බැස යන්නේත් නැත.
q2 20 සමිඳාණෝ ඔබේ සදාතන එළිය වන සේක.
q2 20 ඔබේ වැලපීමේ දවස් කෙළවර වන්නේ ය.
21 ඔබේ සෙනඟ සියල්ලෝ ම දැහැමි ව, සදහට ම
දේශය උරුම කරගන්නෝ ය;
q2 21 ඔව්හු මා විසින් පැළ කරන ලද මාගේ
පැළෑටියක් හා සමාන ය;
q2 21 මාගේ මහිමය ප්‍රකාශ කරන පිණිස මා විසින්
මවන ලද්දෝ වෙති.
22 කුඩා තැනැත්තා වංශයක් ද සුළු තැනැත්තා
බලවත් ජාතියක් ද වන්නේ ය.
q2 22 නියම කාලය පැමිණි විට මෙය ඉක්මනින් සිදු
වීමට මම සලස්වන්නෙමි.
q2 22 මම සමිඳු වෙමි."

### ගැළවීමේ ශුභ ආරංචිය

61 මතෙ 11:5; ලූක් 7:22 ලූක් 4:18-19
මහෝත්තම දෙවි සමිඳුන්ගේ ආත්මානුභාවය
මා කෙරෙහි පිහිටා ඇත.
q2
61 දිළිඳුන්ට සුබ අස්න දෙසීමට ද බිඳුණු සිත්
ඇත්තන්ට සුව සෙත දීමට ද වහලුන්ට මිදීම
දානය කරන්න ද සිරකරුවන්ට නිදහස දන්වන්න ද
එතුමාණෝ මා ආලේප කළ සේක.
2 මතෙ 5:4 සමිඳුන්ගේ කරුණාවේ දවස, සතුරන්ට
දඬුවම් දීමේ දවස පළ කරන පිණිස ද වැලපෙන
සියල්ලන් සනසන පිණිස ද එතුමා මා ආලේප කළ
සේක.
3 සියොන්හි දුක් වන සෑම දෙනාට අළු වෙනුවට
මල්මාලා ද දුක් කඳුළු වෙනුවට ප්‍රීතිය නමැති
තලෙලය ද කලකිරී සිටින්නන්ට පැසසුම් නමැති
වස්ත්‍රය ද ප්‍රදානය කරන පිණිස එතුමාණෝ මා
ආලේප කළ සේක.
q2 3 ඔවුන්ගේ දැහැමිතාව සමිඳුන් රෝපණය කළ
කිහිරි ගස් මෙන් ස්ථිර යයි කියනු ලැබේ.
q2 3 එයින් එතුමන්ට ම මහිමය හිමි වන්නේ ය.
4 ඔව්හු පැරණි නටබුන් ගොඩනඟති;
q2 4 නැති නාස්ති වූ තැන් අලුත්වැඩියා කරති;

q2[4] පරම්පරා ගණනාවක් තුළ නටබුන් ව පාළු ව
තිබුණ නගර ප්‍රතිසංස්කරණය කරති.
5 විදේශිකයන් නුඹලාගේ බැටළු රැළවල් පෝෂණය
කරනු ඇත.
q2[5] ඔව්හු නුඹලාගේ ගොවියෝ ද මිදි වතු
වවන්නෝ ද වන්නෝ ය.
6 එහෙත් නුඹලා, 'සමිඳුන්ගේ පූජකයෝ ය'යි කියනු
ලබන්නහු ය.
q2[6] මිනිසුන් නුඹලාට, 'අපේ දේව සේවකයෝ ය'යි
කියනු ඇත.
q2[6] නුඹලා ජාතීන්ගේ සම්පත් භුක්ති විඳ, ඔවුන්ගේ
වස්තු හිමි කරගනු ඇත.
7 නුඹලාගේ ලජ්ජාව වෙනුවට නුඹලා දෙගුණයක්
ගෞරවය ලබන්නහු ය.
q2[7] නින්දාව වෙනුවට ලැබී ඇති කොටස ගැන ප්‍රීති
වන්නහු ය.
q2[7] නුඹලාගේ දේශයෙහි නුඹලා දෙපංගුවක් භුක්ති
විඳින්නහු ය.
q2[7] නුඹලාට සදා ප්‍රීතිය හිමි වන්නේ ය.
8 සමිඳාණෝ මෙසේ වදාරන සේක:
q2[8] "මම යුක්තියට ප්‍රිය කරමි; අදමිටුකමටත්,
කොල්ලකෑමටත් ද්වේෂ කරමි.
q2[8] එබැවින් මම අවංක ලෙස ඔවුන්ට විපාක දෙමි.
q2[8] සදාකාල ගිවිසුමක් ද ඔවුන් සමඟ කරගන්නෙමි.
9 ඔවුන්ගේ වංශය ජාතීන් අතරේ ද ඔවුන්ගේ
පරම්පරාව ජනයන් අතර ද ප්‍රසිද්ධ වන්නේ ය.
q2[9] ඔවුන් හැඳිනගන්න සියල්ලෝ ඔවුන් සමිඳුන්ගේ
ආසිරි ලත් සෙනඟ බව දැනගන්නෝ ය."
10 එළිද 21:2 මම සමිඳුන් කෙරෙහි බොහෝ ප්‍රීති
වන්නෙමි;
q2[10] මාගේ දෙවිඳුන් කෙරෙහි මම ප්‍රීතියෙන් පිනා
යන්නෙමි.
q2[10] මනාලයකු මල් මාලාවක් දමාගන්නාක් මෙන්
ද මනාලිය ඇගේ ආභරණ පැළඳගන්නාක් මෙන් ද
එතුමාණෝ ගැළවීම නමැති වස්ත්‍රය මට පළඳවන
සේක.
q2[10] ධර්මිෂ්ඨකම නමැති සළුව මට හඳවන සේක.
11 පොළොව අලුත් පැළෑටි උපදවන්නාක් මෙන් ද
උයන එහි වපුළ දේ ලියලවන්නාක් මෙන් ද
මහෝත්තම සමිඳුන් වන දෙවිඳාණෝ ධර්මිෂ්ඨකම
හා ප්‍රශංසාව සියලු ජාතීන් ඉදිරියෙහි හට ගන්වන
සේක.

## ජෙරුසලම උදෙසා යැදුමක්

62 මම සියොන් උදෙසාත්, ජෙරුසලම උදෙසාත්
නිහඬ ව නොසිටින්නෙමි.
q2
62 එහි දැහැමි බව දීපකයක් මෙන් ද එහි
ගැළවීම ඇවිලෙන පහනක් මෙන් ද බැබළෙන
තෙක් නිශ්ශබ්ද ව නොසිටින්නෙමි.
2 එම්බා ජෙරුසලම!
q2[2] ජාතීන් නුඹේ දැහැමි බවත්, සියලු රජවරුන්
නුඹේ තේජසත් දකිනු ඇත.
q2[2] සමිඳුන්ගේ ම මුඛයෙන් පැවසෙන අලුත් නමක්
නුඹට දෙනු ලබන්නේ ය.
3 නුඹ සමිඳුන්ගේ අතෙහි අලංකාර ඔටුන්නක් ද
නුඹේ දෙවිඳුන්ගේ අතෙහි රාජ කිරීටයක් ද මෙන්
වන්නෙහි ය.
4 නුඹ, 'අත්හරින ලද්දා' කියා ද නුඹේ දේශය
'අත්හරින ලද භාර්යාවක' කියා ද තවත් නොකියනු
ලබන්නේ ය.
q2[4] 'මාගේ ප්‍රීතිය' යන අරුත ඇති 'හෙප්සිබා'
නුඹේ අලුත් නම වන්නේ ය.
q2[4] සමිඳාණන් නුඹ කෙරෙහි ප්‍රසන්න බැවින්,
නුඹේ දේශය 'ප්‍රීති කරන ගීය' යන අරුත ඇති
'බෙයුලා' කියා කියනු ලබන්නේ ය.
q2[4] එතුමාණෝ නුඹේ දේශය සරණ කොට ගන්න
සේක.
5 තරුණයකු කන්යාවක සරණ කොට ගන්න සේ
නුඹේ පුත්‍රයෝ නුඹ සරණ කොට ගන්නෝ ය.
q2[5] මනාලයා මනාලිය කෙරෙහි ප්‍රීති වන්නාක්
මෙන් නුඹේ දෙවිඳාණෝ නුඹ ගැන ප්‍රීති ප්‍රමෝද
වන සේක.
6 එම්බා ජෙරුසලම!
q2[6] නුඹේ පවුරු පිට මම මුරකරුවන් සිටෙව්වෙමි.
q2[6] ඔව්හු රෑ වත්, දවල් වත් කිසිසේත් නිශ්ශබ්ද
නොවන්නෝ ය.
q2[6] සමිඳුන් අයැදින ඔබ විවේක නොගන්න.
7 එතුමන් ජෙරුසලම ප්‍රතිසංස්කරණය කොට එය
මුළු ලොවෙහි වර්ණනාවට ලක් වන නගරයක් වන
තුරු ඔව්හු එතුමන්ට විවේකයක් නොදෙති.

## දෙවියන් වහන්සේගේ ප්‍රකාශනය

8 සමිඳාණෝ, සුරත තබා, බාහු බලය මෙහෙයවා,
පොරොන්දුවක් දෙමින්,
q2[8] "සැබැවින් නුඹේ ධාන්ය නුඹේ සතුරන්ට කෑම
පිණිස මම තවත් නොදෙන්නෙමි.
q2[8] නුඹ දහඩිය මහන්සියෙන් ලබාගත් මිදියුස
විදේශීහු නොලබන්නෝ ය.
9 ධාන්ය එකතු කළ නුඹලා ඒවා වළඳා සමිඳුන්ට
ප්‍රශංසා කරන්නහු ය.
q2[9] මිදියුස රැස් කළ නුඹලා මාගේ මාලිගාවේ
මළුවල දී ඒවා පානය කරන්නහු ය"යි වදාළ සේක.
10 ජෙරුසලම් ජනයෙනි, පිට වී යන්න;
q2[10] දොරටුවලින් පිට වී ගොස් ආපසු එන
සෙනඟට මාර්ගයක් පිළියෙළ කරන්න.
q2[10] මහා මාවත් ඉදිකරන්න;
q2[10] ගල් ඉවත් කරන්න.
q2[10] ජනයන්ට ධජ සංකේතය ඔසවන්න.
11 යසො 40:10; එළිද 22:12 සමිඳුන් පොළොවේ
සීමා දක්වා මෙසේ ප්‍රකාශ කර ඇත:
q2[11] "අන්න, නුඹේ ගැළවුම්කාරයාණෝ, එතුමාණෝ
විපාක දෙන සේක.
q2[11] දිනාගත් දීමනාව ගෙනෙන සේකැ යි ජෙරුසලම්
වැසියන්ට ප්‍රකාශ කරන්න."

12 ඔව්හු 'ශුද්ධ සෙනඟ' කියාත්, 'සමිඳුන්ගේ
මුදාගත් ජනතාව' කියාත් කියනු ලබන්නෝ ය.
q2[12] 'දෙවිඳුන්ගේ තෝරාගත් නගරය' කියාත් කියනු
ලබන්නේ ය.

### සමිඳාණන් වහන්සේගේ ජයග්‍රහණය

63 යසො 34:5-17; ජරෙ 49:7-22; එසකි
25:12-14; 35:1-15; ආමො 1:11-12; ඔබදි 1:14;
මලාකි 1:2-5 ඒදොමෙහි සිට රතු ලේ පැහැති ඇඳුම්
ඇඳ, අලංකාර වස්ත්‍රවලින් සැරසී, මහා
බලසම්පන්න ව ගමන් කරමින් බොශ්රාවෙන් එන
මේ තැනැත්තා කවරකේ ද?
q2

63 ඒ වනාහි, ජයග්‍රහණය ප්‍රකාශ කරන පිණිස
ගැළවීම ගෙන දෙන්න බලවත් වන සමිඳාණෝ
ය.
2 ඔබේ ඇඳුම් රතු ව තිබෙන්නේ කුමක් නිසා ද?
q2[2] ඔබේ වස්ත්‍ර මිදි පැසේ මිදි පාගන්නකුගේ
ඇඳුම් මෙන් තිබෙන්නේ කුමක් නිසා ද?
3 එළිද 14:20; 19:13-15 සමිඳාණෝ මෙසේ පිළිතුරු
දෙන සේක:
q2[3] "මම මිදි යන්ත්‍රයක මිදි පල මෙන් ජාතීන්
තනියම පෑගුවෙමි.
q2[3] මාගේ උදව්වට සෙනඟගෙන් කිසිවකේ
නොසිටියේ ය.
q2[3] එමෙන් මාගේ උදහසින් ඔවුන් පෑගුවෙමි.
q2[3] මාගේ කෝපයෙන් ඔවුන් පොඩි කෙළෙමි.
q2[3] ඔවුන්ගේ රුධිරය මාගේ ඇඳුම්වල ඉසී තිබේ;
q2[3] එයින් මාගේ සියලු ඇඳුම් කැළැල් වී ඇත.
4 මාගේ සෙනඟ ගළවාගත යුතු කාලය පැමිණ
ඇති බවත්, ඔවුන්ගේ සතුරන්ට දඬුවම් දිය යුතු
දවස පැමිණ ඇති බවත් මම සිතට ගතිමි.
5 යසො 59:16 මා බැලූ කල මට උදව් වන්න
කිසිවකු නොසිටි බව දුටු විට මම පුදුම වීමි.
q2[5] එහෙත්, මාගේ කෝපයෙන් මම වේගවත් ව
මාගේ ම ශක්තියෙන් ජය අත්කර ගතිමි.
6 මාගේ උදහසින් ජාතීන් පාගාදමා, මාගේ
කෝපයෙන් ඔවුන් මත් කරවා, ඔවුන්ගේ රුධිරය බිම
වැගිරවේවමේ."

### පසුගිය කරුණාවන් සිහි කිරීම

7 සමිඳුන්ගේ ස්ථිර ප්‍රේමය ගැන ද එතුමාණන්
අපට කර ඇති සියල්ල ගැන ද එතුමාණන්ගේ
දයානුකම්පාවත්, සීමා රහිත දයාවත් අනුව
ඉශ්රායලේ සෙනඟට දුන් සියලු ආසිරි ගැන ද සිහි
කොට මම එතුමන් පසසමි.
8 'ඔව්හු මාගේ සෙනඟ ය, ඔව්හු වංචා
නොකරති'යි සමිඳාණෝ වදාළ සේක.
q2[8] ඒ නිසා එතුමාණෝ ඔවුන්ගේ
ගැළවුම්කාරයාණෝ වූ සේක.
9 ඔවුන්ගේ සියලු දුක් කරදරවල දී දුක් වූ සේක.
q2[9] ඔවුන් ගැළවේවේ දේව දූතයකු නොව
සමිඳාණෝ ම ය.
q2[9] එතුමාණෝ ස්වකීය ප්‍රේමයෙන් හා දයාවෙන්
ඔවුන් මුදාගත් සේක.
q2[9] පසුගිය කාලයේ දී නොකඩවා ඔවුන් නැඟිටුවා,
එතුමාණෝ ආරක්ෂා කළ සේක.
10 එහෙත්, ඔව්හු කැරලි ගසා, උන් වහන්සේගේ
ශුද්ධාත්මයට දුක් දුන්නෝ ය.
q2[10] ඒ නිසා, එතුමාණෝ ඔවුන්ට සතුරු වී ඔවුන්ට
විරුද්ධ ව සටන් කළ සේක.
11 එහෙත්, ඔව්හු සමිඳුන්ගේ සේවක මෝසෙස් සිටි
අතීත කාලය සිහි කර මෙසේ ප්‍රශ්න කළහ.
q2[11] එතුමන්ගේ සෙනඟගේ නායකයන් මුහුදෙන්
ගළවාගත් සමිඳාණෝ දැන් කොහේ ද?
q2[11] තමන්ගේ ශුද්ධ ආත්මානුභාවය ඔහුට දුන්
තැනැන් වහන්සේ කොහේ ද?
12 නික්ම 14:21 සදාකාල කීර්තිය තමන්ට
ලබාගන්න පිණිස ස්වකීය බලය මෙහෙයවා
මෝසෙස් ලවා බලවත් දේ කළ,
13 කාන්තාරයේ යන අශ්වයන් මෙන් නොපැකිළෙන
හැටියට ඔවුන් ගැඹුර මැදින් ගෙන ගිය තැනැන්
වහන්සේ කොහේ ද?
14 ගව රැළ මිටියාවතට බසින්නාක් මෙන්
සමිඳුන්ගේ ආත්මානුභාව ඔවුන් විශ්රාමයට ගෙන
ගියේ ය.
q2[14] ඔබට තෙදවත් නමක් දිනාගන්න පිණිස
සමිඳාණෝ ඔබේ සෙනඟ කැඳවාගෙන ගිය සේක.

### කරුණාව සහ උපකාරය සඳහා අයැදීමක්

15 සමිඳුනි, ස්වර්ගයේ සිට ඇස් යොමා, ඔබේ
ශුද්ධ තේජාන්විත භවනයේ සිට බැලුව මැනව.
q2[15] අප කෙරේ සැලකිල්ල කොයි ද?
q2[15] ඔබේ බලය කොහි ද?
q2[15] ඔබේ ප්‍රේමයත්, අනුකම්පාවත් අපෙන් ඉවත්
නොකළ මැනව.
16 ඔබ අපේ පියාණෝ ය;
q2[16] ආබ්‍රහම් අප නොදන්න නමුත්, ඉශ්රායලේ අප
නාඳුනන නමුත්, සමිඳාණෙනි, ඔබ අපේ පියාණෝ ය,
අපේ මිදුම්කාරයාණෝ ය.
q2[16] එය අතීතයේ සිට ඔබේ නාමය වේ.
17 සමිඳුනි, ඔබේ මාර්ගවලින් අප මුළාව යන්නත්,
ඔබ කෙරෙහි බිය නොවන සේ අපේ සිත් දැඩි
වන්නත් හරින්නේ කුමක් නිසා ද?
q2[17] ඔබේ සේවකයන් නිසාත්, ඔබේ උරුමයට
අයිති ගෝත්‍ර නිසාත් අප වෙත හැරී එනු මැනව.
18 ටික කලකට ඔබ වහන්සේගේ ශුද්ධ සෙනඟ
ශුද්ධස්ථානය අත්කර ගත්හ.
q2[18] එහෙත් අපේ සතුරෝ එය පාගා දැමූහ.
19 අපි ඔබ විසින් කිසි කලක පාලනය නොකෙරන
ලද්දවුන් මෙන් ද ඔබේ නාමය නොදරන ලද අය
මෙන් ද වී සිටියෙමු.
64 ඔබ අහස පළාගෙන නොබසින්නේ මන් ද?
q2

64 එවිට කඳු ඔබ තුමාණන් දැක බියෙන් කම්පා
වනු ඇත.

2 ලැව් ගින්න කැළෑව දල්වන්නාක් මෙන් ද ගින්න
වතුර උතුරවන්නාක් මෙන් ද ඔබ ඉදිරියෙහි ජාතීන්
කම්පා වන පිණිස ඔබේ බලය සතුරන්ට පෙන්වනු
මැනව.
3 අප බලාපොරොත්තු නොවූ භයානක දේ එක්
කලක ඔබ කළ විට කඳු ඔබ ඉදිරියේ බියෙන්
කම්පා වුණේ ය.
4 1 කොරි 2:9 තමන් කෙරෙහි විශ්වාසය තබන අය
උදෙසා මෙවැනි ක්‍රියා කරන දෙවි කෙනෙකු ගැන
කනින් අසා තේරුම්ගත්, ඇසින් දුටු කෙනෙක් කිසි
කලක නොසිටියේ ය.
5 දැහැමි ක්‍රියාවන් ප්‍රිය කරන, ඔබේ මාර්ගය
මෙනෙහි කරන අයට ඔබ මඟපෙන්වන සේක;
q2[5] අප පව් කළ විට ඔබ අප සමඟ කෝප වී සිටි
සේක;
q2[5] ඔබ කෝප වූ බැවින් අපි පුරාණයේ සිට
පාපයෙහි ඇලී ගැලී සිටියෙමු.
q2[5] අපට ගැළවීම ලැබේ ද?
6 අපි සියල්ලෝ ම අපවිත්‍ර ව සිටියෙමු;
q2[6] අපේ සියලු දැහැමි ක්‍රියා කිළුටු වස්ත්‍ර වැනි
ය.
q2[6] අපි සියල්ලෝ ම ගහක කොළයක් මෙන් පර වී
යන්නෙමු.
q2[6] අප කරන අපරාධ නිසා සුළඟකින් මෙන් අප
ගසාගෙන යයි.
7 ඔබට යාච්ඤා කරන කිසිවෙක් නැත.
q2[7] ඔබේ පිහිට සොයන කිසිවෙක් නැත;
q2[7] මන්ද, ඔබේ වත සඟවාගෙන අපේ පව් නිසා
අපට අපරාධයන්ට ගොදුරු වීමට ඔබ ඉඩ හැර ඇත.
8 එහෙත් සමිඳුනි, ඔබ අපේ පියාණෝ ය.
q2[8] අපි මැටි ය;
q2[8] ඔබ අපේ කුඹල්කාරයාණෝ ය.
q2[8] ඔබ අප නිර්මාණය කළ සේක.
9 සමිඳුනි, අප කෙරේ අධික ලෙස උදහස් නුවුව
මැනව.
q2[9] අපේ අපරාධ සදහට ම අමතක කළ මැනව.
q2[9] අනේ බැලුව මැනව!
q2[9] අපි සියල්ලෝ ම ඔබේ සෙනඟ ය.
10 ඔබේ ශුද්ධ නගරය පාළුකරයක් මෙන් වී ඇත.
q2[10] ජෙරුසලම පාළු නටබුන් නගරයක් වී ඇත.
11 අපේ මුතුන්මිත්තන් ඔබට පැසසුම් පැවැත්වූ
ස්ථානය වන අපේ අලංකාර දේව මාලිගාව ගිනිබත්
වී ඇත.
11 සියලු සුන්දර තැන් නටබුන් වී ඇත.
12 සමිඳුනි, මේ ගැන ඔබ කම්පා වන්නේ නැද් ද?
q2[12] ඔබ නිශ්ශබ්ද ව සිට අප තද දුකට පමුණුවන
සේක් ද?

## කැරලිකරුවන්ට දේව විනිශ්චය

65 රෝම 10:20 සමිඳාණෝ මෙසේ වදාරන
සේක:
q2

65 “මාගේ සෙනඟට පිළිතුරු දෙන්න මා සූදානම්
ව සිටි නමුත්, ඔව්හු මට යාච්ඤා නොකළහ.
q2

65 ඔවුන් හමුවීමට මා සූදානම් ව සිටි නමුත්
ඔව්හු මා නොසෙව්වෝ හ.
q2

65 ‘මම මෙහි ය, මම මෙහි ය’ කියා පිළිතුරු
දෙන්න මා සූදානම් ව සිටි නමුත්, මේ ජාතිය
මට යාච්ඤා නොකළහ.
2 රෝම 10:21 කැරලිකාරයන් වන, හිතූ මනාපේ
අයහපත් මාර්ගයක ගමන් කරන සෙනඟක් දෙසට
දවස මුළුල්ලේ ම මාගේ අත් විදහාගෙන සිටියෙමි.
3 ඒ සෙනඟ මා ඉදිරියෙහි දී නිතරම මා කෝප
කරති;
q2[3] උයන්වල පූජා ඔප්පු කරති;
q2[3] ගඩොල් පිට සුවඳ දුම් ඔප්පු කරති.
q2[3] රහස් ස්ථානවල රාත්‍රිය ගත කරති;
4 ඔව්හු සොහොන්වල වාසය කරති;
q2[4] ඔව්හු ඌරු මස් කති;
q2[4] පිළිකුල් කෑම ඔවුන්ගේ භාජනවල තිබේ.
5 ‘මා ශුද්ධ බැවින් මට ළං නොවී ඈතින් සිටින්නැ’යි
ඔව්හු කියති.
q2[5] ඔවුන් කෙරෙහි මාගේ කෝපය නාසයට වැදෙන
දුමක් ද නොනිවෙන ගින්නක් ද හා සමාන ය.
6 ඔවුන්ට දෙන දඬුවම් මා දැනට ම කටයුත්පත් කර
ඇත.
q2[6] ඔවුන් කර ඇති දේ ගැන නිහඬ ව
නොසිටියෙමි.
7 ඔවුන්ගේත්, ඔවුන්ගේ මුතුන්මිත්තන්ගේත්
අයුතුකම්වලට මම ප්‍රතිවිපාක දෙන්නෙමි.
q2[7] ඔවුන් කඳු උඩ සුවඳ දුම් පූජා ඔප්පු කර, මට
අපහාස කර ඇත.
q2[7] ඒ නිසා මම නිසි ලෙස මැන ඔවුන්ට දඬුවම්
දෙන්නෙමි.”
8 සමිඳාණෝ මෙසේ වදාරන සේක:
q2[8] “මිදි වල්ලෙහි යුස තිබෙන බව දැක, ‘එහි
ආශීර්වාදයක් තිබෙන බැවින් එය විනාශ
නොකරන්නැ’යි යමෙකු කියන සේ, මාගේ සෙනඟ
මම විනාශ නොකරන්නෙමි:
q2[8] මට සේවය කරන්නන් මම ගළවන්නෙමි.
9 ජුදාගේ වංශයට අයත් ඉශ්රායලේවරුන් මම
කැඳවන්නෙමි.
q2[9] ඔවුන්ගේ පරම්පරාව මාගේ දේශයත්, කඳුත්
උරුම කරගන්නෝ ය.
q2[9] මට සේවය කරන්නන් එහි වාසය කරනු ඇත.
10 ජෝෂු 7:24-26 මා නමදින මාගේ සෙනඟ උදෙසා
ෂාරොන් පදෙසෙ, එළු බැටළු රැළවලට තණ බිමක් ද
ආකෝර් මිටියාවත, ගව රැළවලට ලැගුම් පළක් ද
වන්නේ ය.
11 එහෙත්,
q2[11] සමිඳාණන් වන මා අත්හැර, මාගේ ශුද්ධ කන්ද
අමතක කර, වාසනාවේ දේවතාවී වන ගාද්ට
මේසයක් පිළියෙළ කර, දෛවයේ දේවතාවී වන
මේනීට බඳුන් පුරවා, මිදියුස ඔප්පු කරන නුඹලා,

12 මම කඩුවෙන් මරණයට පත් වීමට ඉරණමට
නියම කරන්නෙමි.
q2[12] නුඹලා සියල්ලෝ ම ඝාතනයට අවනත වන්නහු
ය.
q2[12] මන්ද, හඬගැසූ විට නුඹලා උත්තර නුදුන්නහු
ය.
q2[12] මා කතා කළ විට නුඹලා සවන් නුදුන්නහු ය.
q2[12] මාගේ ඇස් හමුයෙහි නපුරු දේ කර, මා ප්‍රිය
නොකරන දේ තෝරාගත්තහු ය.”
13 එබැවින් සමිඳාණන් වන දෙවිඳාණෝ මෙසේ
වදාරන සේක:
q2[13] “මට සේවය කරන්නන්ට කන්න තිබිය දී
නුඹලාට බඩගිනි වන්නේ ය;
q2[13] ඔවුන්ට බොන්න තිබිය දී නුඹලාට පිපාසා
වන්නේ ය;
q2[13] ඔවුන් ප්‍රීති ප්‍රමෝද වෙද්දී නුඹලාට ලජ්ජාව
ඇති වන්නේ ය.
14 ඔවුන් සිතේ ප්‍රීතියෙන් ගී ගයද්දී නුඹලා
වේදනාවෙන් හා අධික ශෝකයෙන් කෑමොරගසමින්
ළතෝනි කියන්නහු ය.
15 මා තෝරා ගත්තවුන්ට නුඹලාගේ නාමය
සාපයක් මෙන් වන්නේ ය.
q2[15] එහෙත්, එතුමන්ගේ දාසයෝ නව නාමයකින්
අමතනු ලබති.
q2[15] මහෝත්තම ස්වාමීන් වන දෙවිඳාණෝ නුඹලා
වනසන සේක.
16 දේශයේ යම් කිසිවකු තමාට ආශීර්වාදයක්
අයැදින්නේ ද, සත්‍යතාවේ දෙවිඳුන්ගෙන් එය
අයැදින්නේ ය.
q2[16] දේශයේ යම් කිසිවකු දිවුරන්නේ ද, ඔහු
සත්‍යතාවේ දෙවිඳුන්ගේ නමින් දිවුරන්නේ ය.
q2[16] පසුගිය දුක් කරදර අමතක කරනු ලබන්නේ ය.
q2[16] ඒවා මාගේ ඇස් ඉදිරියෙන් පහකරනු
ලබන්නේ ය.”

## අලුත් මැවිල්ලක්

17 යෙසා 66:22; 2 පේදු 3:13; එළිද 21:1
සමිඳාණෝ මෙසේ වදාරන සේක:
q2[17] “මම අලුත් අහසක් ද අලුත් පොළොවක් ද
මවමි;
q2[17] පසුගිය දේ මතක් කරන්නේ වත්, සිහි කරනු
ලබන්නේ වත් නැත.
18 මා මවන දේ ගැන සදහට ම ප්‍රීති සන්තෝෂ
වන්න.
q2[18] මා මවන අලුත් ජෙරුසලම ප්‍රීතියෙන් පූර්ණ
වන්නේ ය;
q2[18] එහි වැසියෝ සොම්නසින් වසෙති.
19 එළිද 21:4 මම ජෙරුසලම කෙරෙහිත්, මාගේ
සෙනඟ කෙරෙහිත් ප්‍රසන්න වෙමි.
q2[19] ඇඬීමේ ශබ්දයක් වත්, පීඩිත වේදනාවේ
ශබ්දයක් වත් එහි තවත් නොඇසෙන්නේ ය.
20 ස්වල්ප දවසකින් මැරෙන බිළින්දෝ තවත් එහි
නොවෙති;
q2[20] පූර්ණ ආයු නොවළඳා මැරෙන මහල්ලෝ
නොසිටිති.
q2[20] සිය වසක් ජීවත් වන්නා ‘තරුණයෙකැ’යි ගණන්
ගනු ලැබේ.
q2[20] ඒ වයසට පෙර නැසී යන්නා ‘සාප ලද්දෙකැ’යි
ගණන් ගනු ලැබේ.
21 ඔව්හු ගෙවල් ගොඩනඟාගෙන එහි වාසය
කරන්නෝ ය.
q2[21] මිදි වතු වවාගෙන එහි පලදාව කන්නෝ ය.
22 ඔවුන් ගෙවල් ගොඩනඟා ගත් විට, අන් අය
ඒවායේ වාසය කරන්නේ වත්, මිදි වතු වවා ගත්
විට, අන් අය ඒවායේ පලදාව භුක්ති විඳින්නේ වත්
නැත.
q2[22] වෘක්ෂයන් බොහෝ කල් පවතින්නාක් මෙන්
මාගේ සෙනඟ බොහෝ කල් ජීවත් වෙති.
q2[22] මාගේ තෝරාගත් සෙනඟ තමන්ගේ අත්වලින්
උපයාගත් දේ භුක්ති විඳින්නෝ ය.
23 ඔවුන්ගේ වැඩ නිරර්ථක නොවන්නේ ය.
q2[23] ඔවුන්ගේ දරුවෝ විපත්තියට පත් නොවන්නෝ
ය.
q2[23] මන්ද, ඔව්හු සමිඳුන්ගෙන් ආශීර්වාද ලත්
වංශය වෙති.
q2[23] ඔවුන්ගේ දරුවෝ ද එසේ ම වෙති.
24 ඔවුන් අයැදින්න පෙර මම උත්තර දෙමි;
q2[24] ඔවුන් කතා කරද්දී ම මම සවන් දෙන්නෙමි.
25 යෙසා 11:6-9 වෘකයා ද බැටළු පැටවා ද එකට
තණ බුදිති;
q2[25] හරකා මෙන් සිංහයා පිදුරු කයි;
q2[25] ධූලි සර්පයාට කෑම වෙයි.
q2[25] මාගේ ශුද්ධ කන්දේ සීමා ඇතුළත කිසි
අනතුරක් වත්, විනාශයක් වත් නොවන්නේ ය.”

## අප්‍රසන්නකර පූජා විධි

66 මතෙ 5:34-35; 23:22 ක්‍රියා 7:49-50
සමිඳාණෝ මෙසේ වදාරන සේක;
q2
66 “අහස මාගේ සිංහාසනය ය;
q2
66 පොළොව මාගේ පා පුටුව ය.
q2
66 මා සඳහා නුඹලාට කබෙඳු ගෘහයක් සෑදිය
හැකි ද?
q2
66 මාගේ වාසස්ථානය කොතැන විය හැකි ද?
2 මුළු විශ්වය මැව්වේ මම ය.
q2[2] එබැවින් සියලු දේ මාගේ ය.
q2[2] යටහත්, තැළුණු සිත් ඇති මාගේ වචනයට
කීකරු වන මිනිසා මට ප්‍රිය මනාප වේ.
3 සෙනඟ තමන් කැමැති සේ ක්‍රියා කරති.
q2[3] පූජා කරන පිණිස ගොනෙකු මරන සේ ඔව්හු
මිනිසුන් මරති.
q2[3] බැටළු පැටවෙකු

q2 3 පූජා කරන්න මරන සෝ බල්ලකුගේ බෙල්ල කඩති.
q2 3 ආහාර පූජාවක් ඔප්පු කරන්නා ඌරු ලේ පුදන්නා වැනි ය.
q2 3 තුවරලා දවමින් සිහි කිරීමේ පූජාවක් පිදීම පිළිමයකට බුහුමන් කිරීමක් වැනි ය.
q2 3 ඔව්හු හිතුමතයේ කරන පිළිකුල් සහිත පූජාවලට ප්‍රිය වෙති.
4 එබැවින් මම ඔවුන්ට නිසි විපත්ති නියම කොට, ඔවුන් බිය වන දේ ඔවුන් පිට පමුණුවන්නෙමි.
q2 4 මන්ද, මා අඬගැසූ විට කිසිවකු පිළිතුරු දුන්නේ නැත.
q2 4 මා කතා කළ විට කිසිවකු සවන් දුන්නේ නැත.
q2 4 ඔව්හු මා ඇස් හමුයෙහි නපුරු දේ කර, මට අප්‍රසන්න දේ තෝරාගත්හ.”
5 සමිඳුන්ගේ වචනයට කීකරු වන අය එතුමන් කියන දේට සවන් දෙන්න:
q2 5 “මා නිසා සමහර අය නුඹලාට වෛර කොට, නුඹලා කොන් කර ඇත.
q2 5 ‘සමිඳු සිය මහිමය ප්‍රකාශ කළා වේ.
q2 5 එවිට නුඹලාගේ ප්‍රීතිය අපට දැක හැකි ය’යි ඔව්හු කියති.
q2 5 එහෙත්, ලජ්ජාවට පමුණුවනු ලබන්නෝ ඔව්හු ම ය.
6 අන්න, සවන් දෙන්න;
q2 6 ඝෝෂාව නුවරින් පැමිණෙන්නේ ය.
q2 6 දේව මාලිගාවෙන් හඬක් නික්මෙන්නේ ය.
q2 6 ඒ වනාහි, සමිඳුන් සතුරන්ට දඬුවම් දීමේ හඬ ය.”

## ජෙරුසලම් මාතාව

7 එළිද 12:5 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
q2 7 “මාගේ ශුද්ධ නගරය වනාහි, ප්‍රසව වේදනාව ඇති වන්න පෙර පිරිමි දරුවකු බිහි කළ මාතාවක වැනි ය.
8 මෙබඳු දෙයක් ඇසූ දුටු කෙනෙක් සිටිත් ද?
q2 8 කිසි කලක එක දවසකින් රටක් බිහි වී ඇද් ද?
q2 8 එක මොහොතකින් ජාතියක් බිහි වේ ද?
q2 8 සියොන් අඟන, ප්‍රසව වේදනාව විඳ ඇසිල්ලෙහි ම ඇගේ දරුවා බිහි කළා ය.
9 බිහි වීම ළං කරන මම ඉපදීම නොසලස්වන්නෙමි ද?
q2 9 නොහොත් ඉපදීම සලස්වන මම ගර්භය පියවන්නෙමි ද?
q2 9 මෙසේ පවසන්නේ සමිඳාණන් වන මම ය.”
10 ජෙරුසලමට ප්‍රේම කරන සියල්ලෙනි, ඈ උදෙසා ප්‍රීති සන්තෝෂ වන්න.
q2 10 ඈ ගැන වැලපෙන සියල්ලෙනි, ප්‍රීතියෙන් ඈ සමඟ ප්‍රීති වන්න.
11 මෙසේ නුඹලා ඇගේ සැනසිලි ගෙන දෙන පියයුරු උරා, තෘප්තියට පැමිණෙන්නහු ය.
q2 11 ඇගේ බහුල ව ඇති කිරිවලින් ප්‍රීති වන්නහු ය.
q2 11 ඇගේ මහිමය පූර්ණතාවෙන් නොමඳ සොම්නසින් පානය කරන්න.
12 සමිඳාණෝ මෙසේ වදාරන සේක:
q2 12 “මම සෞභාග්‍යය ගංගාවක් මෙන් ද ජාතීන්ගේ යසඉසුරු දගෙොඩ තළා යන ඔයක් මෙන් ද ඈ වෙත හරවමි.
q2 12 නුඹලා එයින් උරා බොන්නහු ය.
q2 12 මවකගේ මෙන් ඇගේ උකුලේ නුඹලා ගෙනෙයනු ලබන්නහු ය.
q2 12 ඇගේ දෙදණ පිට සුරතල් කරනු ලබන්නහු ය.
13 මවක ඇගේ දරුවා සනසන්නාක් මෙන් මම නුඹලා සනසන්නෙමි.
q2 13 නුඹලා ජෙරුසලම තුළ සනසනු ලබන්නහු ය.
14 මෙය දුටු විට නුඹලාගේ සිත් ප්‍රීතියෙන් පිනා යන්නේ ය.
q2 14 එසේ නුඹලා සනීප ශක්තිය ලබන්නහු ය.
q2 14 එවිට සමිඳුන් වන මම මට කීකරු වන්නන්ට ආශීර්වාද කරන බවත්,
q2 14 මාගේ සතුරන්ට උදහස දක්වන බවත් නුඹලා දැනගන්නහු ය.”
15 සමිඳාණෝ ගිනිදලු සහිත ව වඩින සේක.
q2 15 එතුමන්ගේ රථ වාහන සුළිසුළඟ මෙන් වන්නේ ය.
q2 15 සතුරන් වෙත එතුමන්ගේ ඉමහත් කෝපය විදහා පාන සේක.
q2 15 ගිනිදැල් මෙන් චෝදනා නඟන සේක.
16 එසේ ය, එතුමාණෝ පොළෝ වැසි සියලු දෙන ගින්නෙන් ද කඩුවෙන් ද විනිශ්චය කරන සේක.
q2 16 මරණු ලබන්නෝ බොහෝ වෙති.
17 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
“උයන්වල පුද පූජා ඔප්පු කරන පිණිස තමන් ම පිරිසිදු කරගනිමින්, පළෙට ගමන් කරමින්, ඌරු මස්
ද උරගයන් ද මීයන් ද කන අයගේ අවසානය ළඟ
ය. 18 ඔවුන්ගේ ක්‍රියා හා සිතුවිලි මම දනිමි. විවිධ
භාෂා කතා කරන සියලු ජාතීන් එක් රැස් කිරීමට
මම පැමිණෙන්නෙමි. ඔවුන් රැස් වූ කල මාගේ
තේජාලංකාරය කුමක් දැ යි ඔවුන්ට පෙනෙනු ඇත.
19 මම ඔවුන් අතරේ සලකුණක් තබන්නෙමි. ඔවුන්
අතරෙන් ගැළවී සිටින අය, මාගේ කීර්තිය ගැන
නොඇසූ, මාගේ තේජස නොදුටු දුර බැහැර
ද්වීපයන් වන තර්ෂීෂ්හි ද පුල්හි ද දුනුවායන් සිටින
ලුද්හි ද තුබල්හි ද ජාවාන්හි ද සිටින ජාතීන් වෙත
යවන්නෙමි. ඔවුන් ජාතීන් අතරෙහි මාගේ තේජස
ප්‍රකාශ කරනු ඇත. 20 ඔව්හු ඉශ්රායලේ පුත්‍රයන්
සියලු දෙනා ජාතීන් අතරෙන් මට පඬුරක් මෙන්
ගෙනෙන්නෝ ය. ඔව්හු, අශ්වයන් පිටින් ද රථවලින්
දෝලාවලින් ද අශ්වතරයන් පිටින් ද ඔටුවන් පිටින් ද
මාගේ ශුද්ධ කන්ද වන ජෙරුසලමට පිරිසිදු
භාජනයක ධාන්‍ය පූජා ගෙනෙනු ලබන සේ
ගෙනෙන්නෝ ය. 21 ඔවුන්ගෙන් සමහරු පූජකයන් ද
ලෙවීවරුන් ද වශයෙන් මම පත් කරමි.

22 “මා විසින් සාදනු ලබන අලුත් අහසත්, අලුත්
පොළොවත් මා ඉදිරියෙහි පවතින්නාක් මෙනේ
නුඹලාගේ වංශය සහ නුඹලාගේ නාමය පවතින්නේ
ය.
23 යෙසා 65:17; 2 පේදු 3:13; එළිද 21:1 හැම
අමාවක් දිනක් හා සබත් දිනක් පාසා ම මට
නමස්කාර කරන්න සියලු මනුෂ්‍යයෝ පැමිණෙන්නෝ
ය.
24 මාක් 9:48 ඔවුන් පිට වී යන විට මට විරුද්ධ ව
වරද කළ අයගේ මළකඳන් දකිනු ඇත. ඔවුන්
කාදමන පණුවෝ කිසි කලක නොමැරෙති. ඔවුන්
දවාලන ගින්න කිසි කලක නොනිවේ. ඔව්හු සියලු
දනොට පිළිකුලක් වන්නෝ ය. මෙසේ වදාළේ
සමිඳාණන් වන මම ය.”

# ජරෙමියා

## ජරෙමියා කැඳවනු ලැබීම

1 මගේ වනාහි බෙන්ජමින් වංශයට අයිති
අනාතොත්හි විසූ පූජකයන්ගෙන් එක් කෙනෙකු
වූ හිල්කියාගේ පුත් ජරෙමියාගේ පණිවුඩය ය. 2 2
රාජා 22:3; 23:27; 2 වංශා 34:8; 35:19ආමොන්ගේ
පුත් ජුදාහි රජ වූ ජොෂියාගේ රාජ්ය කාලයේ
දහතුන් වන අවුරුද්දේ දී සමිඳාණන් වහන්සේගේ
පණිවුඩය ජරෙමියා වෙත පැමිණියේ ය. 3 2 රාජා
23:26; 24:7; 24:18; 25:21; 2 වංශා
36:5,8-11-21ජොෂියාගේ පුත් ජෙහෝයාකිම් ජුදාහි
රජ ව සිටි කාලයේ දී ද ජොෂියාගේ පුත්, ජුදාහි රජ
වූ ශෙදෙකියාගේ එකොළොස් වන අවුරුද්දේ පස්
වන මාසයේ ජෙරුසලමේ වැසියන් විප්රවාසයට
ගෙනයනු ලැබූ දවස දක්වා ද සමිඳාණන්
වහන්සේගේ පණිවුඩය ජරෙමියා වෙත පැමිණියේ
ය.
4 සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ සේක:
5 “මා නුඹ කුසෙහි පිළිසිඳගැනීම ඇති කරන්නටත්
පෙර පටන් මම නුඹ හඳුනාගතිමි.
q25 නුඹේ උපතට පෙර, මම නුඹ කැප කළෙමි;
q25 ජාතීන් හට දිවැසිවරයකු ලෙස මම නුඹ පත්
කළෙමි.”
6 එවිට මම, “මහෝත්තම ස්වාමීන් වන දෙවියන්
වහන්ස, මා ළා බාලයකු වන බැවින් මම කතා
කරන්නට නොදනිමි”යි කීවෙමි.
7 එහෙත්, සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ
සේක:
q27 “නුඹ බාලයකේ යයි නොකියන්න.
q27 මා නුඹ යවන සියල්ලන් වෙත යන්න.
q27 මා නුඹට අණ කරන සියල්ල පවසන්න.
8 ඔවුන්ට බිය නොවන්න.
q28 මන්ද, නුඹ ගළවන්නට මම නුඹ සමඟ සිටිමි.
q28 මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය.”
9 එවිට සමිඳාණන් වහන්සේ සිය අත දිගු කොට,
මාගේ මුඛය ස්පර්ශ කරමින් මට මෙසේ වදාළ
සේක:
q29 “මෙන්න, මාගේ පණිවුඩය නුඹේ මුඛයෙහි
තැබීමි.
10 උදුරන්නට හා කඩාදමන්නටත්, නැති කරන්නට
හා හළොදමන්නටත්, ගොඩනඟන්නට හා
සිටුවන්නටත් ජාතීන් හා රාජ්යයන් කෙරෙහි නුඹට
බලය දී අද මම නුඹ පත් කළෙමි.”

## දර්ශන දෙකෙක්

11 එවිට සමිඳාණන් වහන්සේ මට කතා කොට,
“ජරෙමියා, නුඹට පෙනෙන්නේ කුමක් දැ”යි ඇසූ
සේක. “කලින් පිබිදෙන කොට්ටම්බා ගසක් මට
පෙනේ ය”යි මම පිළිතුරු දිනිමි.
12 සමිඳාණන් වහන්සේ කතා කරමින්, “නුඹ දුටු
දේ හරි ය. මන්ද, මාගේ වචනය ඉටු කරන පිණිස
මම කලින් බලා සිටිමි”යි වදාළ සේක.
13 එවිට සමිඳාණන් වහන්සේ දෙ වන වරටත් මට
කතා කොට, “නුඹට පෙනෙන්නේ කුමක් දැ”යි ඇසූ
සේක. “උතුරු දෙසින් මේ දෙසට කට හැරී ඇති
උතුරන හැළියක් මට පෙනේ”යයි මම පිළිතුරු දිනිමි.
14 එවිට සමිඳාණන් වහන්සේ කතා කොට මට
මෙසේ වදාළ සේක: “මේ දේශයේ සියලු වැසියන්
පිට උතුරු දෙසින් විපාක කඩා වැටෙන්නේ ය. 15 මා
කියන දේට සවන් දෙන්න. උතුරු දිග රට රාජ්යවල
සියලු වංශවලට මම අඬගසන්නෙමි. ඔවුන්ගේ
රජවරු පැමිණ ජෙරුසලමේ දොරටු අසල ද නගරය
වට කළ පවුර අවට ද ජුදාහි සෙසු නගර තුළ ද
සිහසුන් පිහිටුවා ගන්නෝ ය. 16 ඔවුන් මා අත්හැර,
අන් දෙවිවරුන්ට සුවඳ දුම් ඔප්පු කර, සිය අත්වලින්
සාදාගත් දේව රූපවලට නමස්කාර කළ බැවින්,
ඔවුන්ගේ සියලු පාපවලට විරුද්ධ ව මාගේ
විනිශ්චයයන් ප්රකාශ කරන්නෙමි. 17 ඒ නිසා, නුඹ
ධෛර්යවත් වී ගොස් මා නුඹට අණ කරන සියල්ල
ඔවුන්ට කියන්න. ඔවුන් ඉදිරියෙහි දී මා නුඹ
නොකලඹන පිණිස දැන් ඔවුන් ගැන නොකැළඹී
සිටින්න. 18 මෙන්න, මුළු දේශයට විරුද්ධ ව ද ජුදාහි
රජවරුන්ටත්, අධිපතීන්ටත්, පූජකයන්ටත්, දේශයෙහි
සෙනඟටත් විරුද්ධ ව ද අද නුඹ සුරක්ෂිත නගරයක්
ද යකඩ කුළුණක් ද ලෝකඩ පවුරක් ද මෙන්
ශක්තිමත් කළෙමි. මන්ද, මම නුඹ සමඟ
සිටින්නේමි. 19 නුඹට විරුද්ධ ව ඔව්හු සටන්
කරන්නෝ ය. එහෙත්, නුඹ පරාජය කරන්නට
ඔවුන්ට නොහැකි ය. මෙසේ වදාරන්නේ ස්වාමීන්
වන මම ය.”

## ඉශ්රායලේවරුන්ගේ අවිශ්වාසවන්තකම

2 සමිඳාණන් වහන්සේ මට කතා කොට,
මෙසේ වදාළ සේක: 2 “ගොස්, ජෙරුසලමේ
වැසියන්ට ඇසෙන ලෙස සමිඳාණන් වහන්සේගේ
මේ පණිවුඩය ප්රකාශ කරන්න. යොවුන් වියෙහි
නුඹ විශ්වාසවන්ත ව සිටි හැටිත්, භාර්යාවකට මෙන්
මා නුඹට ප්රේම කළ හැටිත්, නොවපුළ දේශයක් වූ

පාළුකරයෙහි නුඹ මා පසුපස්සේ ආ හැටිත් මම සිහි
කරමි. 3 එම්බා ඉශ්රායලෙය! නුඹ මට පමණක්
අයිති ව සිටියෙහි ය. නුඹ මට අස්වැන්නේ නාඹුල්
ඵලය මෙන් විය. එයින් කෑ සියල්ලෝ වරදකරුවෝ වූ
හ. ඒ නිසා ඔව්හු විපතට පත් වූ හ. මෙසේ
වදාරන්නේ ස්වාමීන් වන මම ය.”

### ඉශ්රායලේවරුන්ගේ මුතුන්මිත්තන්ගේ පාප

4 “ජාකොබ්ගේ වංශයේ හා ඉශ්රායලේ වංශයේ
හැම පවුලක් ම සමිඳාණන් වහන්සේගේ
පණිවුඩයට සවන් දෙන්න. 5 සමිඳාණන් වහන්සේ
මෙසේ වදාරන සේක: නුඹලාගේ පියවරුන් මා
වෙතින් ඈත් වී, නිවට දේව රූපවලට ඇදී ගොස්,
නිවට බවට පත් වූයේ, මා කළ කුමන වරදක් නිසා
ද? 6 ‘මිසරයේ වහල්කමින් අප මුදා, වළවල් ගහණ
වූ, නියඟ හා ගන’ඳුර ඇති, කිසිවකු ගමන්බිමන්
නොයෙන, මිනිසුන් නොගැවසෙන දේශයක් වන,
පාළුකරය මැදින් ගෙන ගිය සමිඳාණන් වහන්සේ
කොහි දැ’යි ඔව්හු නොඇසූ හ. 7 පල අනුභව කිරීම
පිණිස ද යහපත් දේ භුක්ති විඳීම පිණිස ද මා
නුඹලා සාරවත් දේශයකට පැමිණෙවූ නමුත්, නුඹලා
ඒ දේශයට ඇතුළු වී, එය කෙලෙසා මාගේ උරුමය
පිළිකුලක් කළහු ය. 8 පූජකයෝ, ‘සමිඳාණන්
වහන්සේ කොහි දැ’යි කිසි විටක නොඇසූ හ.
ව්යවස්ථාව සම්බන්ධ කටයුතුවල යෙදී සිටින්නෝ මා
නොහැඳින සිටියෝ ය. පාලකයෝ ද මට විරුද්ධ ව
කැරලි ගැසුවෝ ය. දිවැසිවරු බාල්ගේ නමින් කතා
කරමින් වැඩක් නැති දේව රූපවලට නමස්කාර
කළහ.”

### සිය සෙනඟට විරුද්ධ ව පැමිණිල්ල

9 “එබැවින් මාගේ සෙනඟට හා ඔවුන්ගේ
දරුවන්ගේ දරුවන්ටත් විරුද්ධ ව මම නැවතත්
පැමිණිල්ලක් කරමි. 10 බස්නාහිරින් පිහිටි
සයිප්රසයට ගොස් බලා, නැත්නම්, නැගෙනහිරින්
පිහිටි කේදාර්ට කෙනෙකු යවා, හොඳට සෝදිසි කර
මෙවැන්නක් මීට පෙර වී තිබේ දැ යි කියා බලන්න.
11 කිසි ජාතියක් සිය දෙවිවරුන්, ඇත්තට ම
දෙවිවරුන් නොවෙතොත් ඒ දෙවිවරුන් වෙනස් කරගෙන
ඇද් ද? එහෙත්, මාගේ සෙනඟ ඔවුන්ගේ
මහිමාන්විතයාණන් නිසරු දේවලට මාරු කරගෙන
ඇත. 12 අහෝ අහස! මේ ගැන බියට පත් වී,
ත්රස්ත වී මවිත වන්න. සමිඳාණන් වහන්සේ
මෙසේ වදාරන සේක. 13 මාගේ සෙනඟ දෙවිධියක
පව් කර ඇත. ඔව්හු ජීවන වතුර උල්පත වන මා
අත්හැර දමා, තමන්ට ම කටාරම්, වතුර නාල්ලන
බිඳුණු කටාරම් කපාගත්හ.”

### ඉශ්රායලේවරුන්ගේ පාපයේ විපාකය

14 “ඉශ්රායලේ දාසයෙක් ද? නොහොත් ගෙයි
උපන් වහලෙක් ද? සිය සතුරන්ට ඉශ්රායලේ ගොදුරු
වී සිටින්නේ මන් ද? 15 ඔවුන් ඉශ්රායලේවරුන්ට
විරුද්ධ ව සිංහයන් මෙන් ගොරවා ඇත; මහා හඬින්
ගොරවා ඇත. ඔවුන් දේශය පාළු කර ඇත. එහි
නගර දැන් නටබුන් ය. කිසිවෙකු එහි ජීවත්
නොවෙති. 16 මෙම්පිස් හා තාපන්හේස්හි සෙනඟ
ඉශ්රායලේවරුන්ගේ බලය බිඳදමා ඇත. 17 එම්බා
ඉශ්රායලෙය! නුඹේ දෙවි ස්වාමීන් වන මා නුඹ
මාර්ගයෙහි ගෙන යන විට පවා නුඹ මා අත්හළ
නිසා මේ දේ නුඹ පිට, නුඹ පිට ම, පමුණුවාගත්තා
නොවේ ද? 18 ඉදින්, මිසරයට යෑමෙන් නුඹ කුමක්
අත්කරගන්නට බලාපොරොත්තු වන්නෙහි ද? නුඹ
අදහස් කරන්නේ එහි නයිල් ගඟෙන් වතුර
බොන්නට ද? අසිරියාවට යෑමෙන් නුඹ කුමක්
අත්කරගන්නට බලාපොරොත්තු වන්නෙහි ද? නුඹ
අදහස් කරන්නේ යුප්රටීස් ගඟෙන් වතුර බොන්නට
ද? 19 නුඹේ නපුරුකම නුඹට පඩිසන් දෙයි; මට
ද්රෝහි වීම නුඹට දොස් පවරයි. නුඹේ මහෝත්තම
දෙවි ස්වාමීන් වහන්සේ අත්හැරදමා යාමත්, මා
කෙරෙහි තවත් ගරුබිය නොදැක්වීමත් කොතරම්
නපුරු අප්රිය දෙයක් දැ යි හොඳින් සලකා බලන්න.
මෙසේ වදාරන්නේ සියලු බලැති දෙවි සමිඳාණන්
වහන්සේ ය.”

### සමිඳුන් නැමදීම ප්රතික්ෂේප කිරීම

20 සියලු බලැති මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේක: “එම්බා
ඉශ්රායලෙය, අතීතයේ දී නුඹ මාගේ වියගහ
නමැති පාලනයත් මට කීකරුවීමත් ප්රතික්ෂේප කර,
‘මම සේවය නොකරන්නෙමි’යි කීවෙහි ය. එහෙත්,
උස් වූ හැම හෙලෙක් පිට ද අතුපතර ඇති හැම
ගසක් යට ද නුඹ වැතිර වෙසඟනක මෙන් අන්
දෙවිවරුන්ට නමස්කාර කළෙහි ය. 21 මම නුඹ
හොඳ වර්ගයේ මිදි වැලක් ද ඉතා ම හොඳ බීජයක්
ද මෙන් සිටෙව්වෙමි. එහෙත්, නුඹ නරක් වූ වල් මිදි
වැලක් බවට පත් වූයේ කෙසේ ද? 22 නුඹ ලුණු මුසු
දියෙන් නුඹ ම සෝදා ගත්තත්, බොහෝ සේ සබන්
ගාගත්තත්, නුඹේ පාප මා ඉදිරියෙහි නොමැකී
පෙනේ. මෙසේ පවසන්නේ දෙවි සමිඳාණන්
වහන්සේ වන මම ය. 23 ‘මම අපවිත්ර නොවෙමි’යි
ද, ‘බාල් දෙවියන්ට නමස්කාර නොකළෙමි’යි ද නුඹ
කියන්නේ කෙසේ ද? මිටියාවතේ නුඹ පව් කළ
අන්දමත්, එහි නුඹ කළ දේත් දෙස බලන්න. නුඹ ඒ
මේ අත දුවන ඔටු දෙනෙක හා සමාන ය. 24 නුඹ
තෘෂ්ණාවෙන් දැවමෙන් ඉව අල්ලන කාන්තාරයේ වල්
කොටළු දෙනෙක හා සමාන ය. ඈ කුල්මත් වී සිටින
විට ඈ දමනය කළ හැක්කේ කාට ද? ඈ සොයන
පිරිමි සතාට වෙහෙස වීමට වුවමනාවක් නැත.
පට්ටිගසන කාලයේ දී ඈ පහසුවෙන් සොයාගත
හැකි ය. 25 එම්බා ඉශ්රායලෙය! නුඹේ පාදවල
වහන් නැති වන්නේට වත්, නුඹේ උගුර පිපාසයෙන්
වේළෙන්නට වත්, ඉඩ නොදෙන්න. එහෙත්, නුඹ,
‘එය නිෂ්ඵල ය, එසේ නොව මම අමුත්තන්ට ආලය
කළෙමි, ඔවුන් පසුපස්සේ යම්’යි කියන්නෙහි ය.”

### ඉශ්රායලේට දඬුවම් දීම යුතු ය

26 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
“සොරකු අසු වූ විට ලජ්ජාවට පැමිණෙන්නාක්
මෙන්, ඉශ්රායලේ ජනයෙනි, නුඹලාගේ රජවරු ද
අධිපතියෝ ද පූජකවරු ද දිවැසිවරු ද ඇතුළු සියලු
දෙනා ලජ්ජාවට පැමිණෙති. 27 ගසකට, ‘නුඹ මාගේ
පියා ය’ කියා ද ගලකට ‘නුඹ මාගේ මව ය’ කියා ද
කියන නුඹලා සියලු දෙනා ලජ්ජාවට පත් වනු ඇත.
මෙසේ වන්නේ, නුඹලා මා වෙත නොහැරී මට පිටු
පෑ බැවිනි. එහෙත්, නුඹලා විපතට පත් වූ විට
‘නැඟිට අප ගැළවෙව මැනවැ’යි මට කන්නලව්
කරන්නහු ය.
28 “නුඹලා උදෙසා සාදාගත් දේවවරු කොයි ද?
නුඹලා විපතට පත් වී සිටින විට ඔවුන්ට හැකි නම්,
ඔව්හු නුඹලා ගළවා ගනිත් වා! එම්බා ජුදාව! නුඹට
නගර ඇති පමණට නුඹට දේවවරු ද සිටිති. 29 මට
විරුද්ධ ව ඇති නුඹලාගේ පැමිණිල්ල කුමක් ද? මට
විරුද්ධ ව නුඹලා කැරලි ගසන්නේ මන්දැ යි ස්වාමීන්
වන මම අසමි. 30 මා නුඹලාගේ දරුවන්ට දඬුවම්
කළ නමුත්, එයින් යහපතක් නො වී ය. නුඹලා
දැනුමැතිකම් පිළිගන්නේත් නැත. වනසාදමන
සිංහයකු සේ ඔව්හු කඩුවෙන් දිවැසිවරුන් මරාදැමූ
හ. 31 මුළු ඉශ්රායලේ ජනයෙනි, මා නුඹලාට කියන
මේ දේට සවන් දෙන්න. මම ඉශ්රායලේවරුන්ට
කාන්තාරයක් නොහොත් අන්ධකාර දේශයක් මෙන්
වූයෙමි ද? එසේ නොවේ නම්, ‘අප නිදහස් ව ඇත;
අපි ඔබ වෙත නොපැමිණෙන්නෙමු’යි මාගේ සෙනඟ
කියන්නේ මන් ද? 32 තරුණ කාන්තාවක ඇගේ
ආභරණ ද මනමාලියක ඇගේ මඟුල් ඇඳුම ද
අමතක කරනු ඇද් ද? එහෙත්, මාගේ සෙනඟ
ගණන් කළ නොහැකි තරම් දවස් ගණනාවක් මා
අමතක කළහ. 33 පෙම්වතුන් ලුහුබැඳ යන්නට
නුඹලා හොඳ හැටි දන්නහු ය. නුඹලා නපුරු
ස්ත්රීන්ට පවා නුඹලාගේ මාර්ග උගන්වා ඇත.
34 අසරණයන්ගේ නිදොස් ලයෙ නුඹලාගේ
ඇඳුම්වල තැවරී ඇත. ඔවුන් නුඹලාගේ ගෙවල්
බින්දේ නැත. 35 එසේ වුව ද, නුඹලා, ‘මම නිදොස්
ය; ඇත්තෙන් ම අප සමිඳාණන් වහන්සේ මා සමඟ
උදහස් වී නැතැ’යි කියන්නහු ය. ‘අප පව් කර
නැතැ’යි නුඹලා කියන නිසා ස්වාමීන් වන මම
නුඹලාට දඬුවම් කරන්නෙමි. 36 නුඹලා මාර්ග
වෙනස් කරගනිමින් වගකීමෙන් තොර ව තැනින්
තැන යන එන රඟ! අසිරියාව මඟින් නුඹලා
ලජ්ජාවට පත් වූවාක් මෙන් මිසරය මඟින් ද නුඹලා
ලජ්ජාවට පත් වන්නහු ය. 37 නුඹලා ලජ්ජාවෙන්
ඔලුව බදාගෙන මිසරයෙන් ද පිටතට යන්නහු ය.
ස්වාමීන් වන මම නුඹලා විශ්වාස කළ අය
ප්රතික්ෂේප කළෙමි. ඔවුන් නුඹලාට සව් සැප
අත්කර දෙන්නේ නැත.”

### ඉශ්රායලේගේ අවිශ්වාසකම

3 සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළසේක:
“මිනිසකු සිය භාර්යාව දික්කසාද කළ පසු, ඈ
ඔහුගෙන් වෙන් වී ගොස් වෙන මිනිසකුගේ
භාර්යාව වූවොත්, පළමු පුරුෂයා නැවත ඈ වෙත
හැරී යනු ඇද් ද? එසේ කිරීමෙන් සහමුලින් ම
දේශය අපවිත්ර නොවන්නේ ද? එහෙත්,
ඉශ්රායලය, නුඹ පෙම්වතුන් බොහෝ දෙනකු
සමඟ වේශ්යාකම් කළෙහි ය. එහෙයින් මා වෙත
හැරී එන්නට නුඹට පුළුවන් ද? මෙසේ පවසන්නේ
දෙවි සමිඳාණන් වහන්සේ ය. 2 පාළු කඳු දෙසට ඇස්
ඔසවා බලා, නුඹ වේශ්යාකම් නොකළ තැනක් ඇද්දැ
යි බලන්න. කාන්තාරයේ බලා සිටින අරාබියකු සේ
පෙම්වතුන් එන තෙක් නුඹ පාර අයිනේ බලා
සිටියෙහි ය. නුඹේ දූෂිත වේශ්යාකම් නිසා නුඹ
දේශය අපවිත්ර කළෙහි ය. 3 වැහිවලා වළක්වනු
ලැබුවේත්, වසන්ත කාලයේ වැසි නොවැස්සේත් ඒ
නිසා ය. වේශ්යාවකගේ පෙනුම නුඹට ඇත; එහෙත්,
නුඹට කිසි ලජ්ජාවක් නැත.
4 “දැන් පවා නුඹ මට මෙසේ හඬ නොගැසුවෙහි
ද? ‘පියාණෙනි, මාගේ තරුණ වියෙහි දී ඔබ
වහන්සේ මට ප්රේම කළ සේක. 5 ඔබ වහන්සේ
මා සමඟ කෝප වන්නේ නැත; සදහට ම මා සමඟ
උරණවන සේක් ද?’ ඉශ්රායලය, නුඹ එසේ කී
නමුත් නුඹට හැකි නපුරුකම් සියල්ල ම නුඹ කර
ඇත.”

### පසුතැවී සිත හරවා ගැනීමේ අවශ්යතාව

6 2 රාජා 22:1—23:30; 2 වංශා 34:1—35:27
ජොෂියා රජු දවස සමිඳාණන් වහන්සේ මට මෙසේ
වදාළ සේක: “අර ඉශ්රායලේ අඟන, මට ද්රෝහි ව
කළ දේ නුඹ දුටුවෙහි ද? ඈ උස් වූ සියලු කඳු
උඩටත්, සියලු අතුපතර ඇති ගස් යටටත් ගොස් එහි
දී වේශ්යාකම් කළා ය. 7 ‘ඈ ඒ සියල්ල කළ පසු මා
වෙත හැරී එනු ඇතැ’යි ස්වාමීන් වන මම සිතුවෙමි.
එහෙත්, ඈ හැරී ආවේ නැත. ඇගේ ද්රෝහිකාර
සොහොයුරී වන ජුදා අඟන එය දුටුවා ය.
8 ඉශ්රායලය මට පක්ෂපාතකම අත්හැර
වේශ්යාවක වූ බැවින් මා ඈ දික්කසාද කර පලවා
හැරිය බව ජුදා අඟන දුටුවා ය. එහෙත්,
ඉශ්රායලේගේ ද්රෝහිකාර සොහොයුරිය වන ජුදා
බිය නොවී ගොස් වේශ්යාකම් කළා ය.
9 වේශ්යාකම සුළු දෙයක් කොට සලකා ගල් හා
ගස්වලට නමස්කාර කිරීමේ වේශ්යාකමින් ඈ
දේශය පිළිකුල් කළා ය. 10 මේ සියල්ල කළ පසු
ඉශ්රායලේගේ ද්රෝහිකාර සොහොයුරිය වන ජුදා
සැබෑ සිතින් නොව ව්යාජ සිතින් මා වෙත හැරී ආවා
ය. මෙසේ වදාරන්නේ ස්වාමීන් වන මම ය.”
11 එවිට සමිඳාණන් වහන්සේ මට කතා කොට,
“ඉශ්රායලේ උන් වහන්සේට ඇති පක්ෂපාතකමින්
ඉවත් ව ගිය නමුත්, ද්රෝහිකාර ජුදාව තරම්
වරදකාරියක් නොවූවා යැ”යි වදාළ සේක. 12 උතුරු

දසෙට ගොස් ඉශ්රායලේට මෙසේ පවසන්නට යයි
උන් වහන්සේ මට වදාළ සේක: “ඉවත් ව ගිය
ඉශ්රායලේ ආපසු හැරී එන්න. ස්වාමීන් වන දෙවියන්
වහන්සේ මෙසේ වදාරන සේක. මම කරුණාවන්ත
බැවින් නුඹ දෙස කෝපයෙන් නොබලන්නෙමි; සදහට
ම උදහස තබා නොගන්නෙමි. 13 වරද කළ නුඹ
නුඹේ දෙවි සමිඳාණන් වහන්සේට විරුද්ධ ව කැරලි
ගැසූ බව පිළිගන්න. මාගේ හඬට කීකරු නොවී,
හැම අතුපතර ඇති ගස් යට විදේශීය දෙවිවරුන්ට
නුඹේ ආදරය දුන් බව පිළිගන්න. මෙසේ වදාරන්නේ
ස්වාමීන් වන මම ය.
14 “මා කරෙන් වෙන් ව ගිය දරුවෙනි, මා
නුඹලාගේ ස්වාමීන් වන බැවින් මා වෙත හැරී
එන්න. මම නගරයකින් එක් කෙනෙකු ද වංශයකින්
දෙදෙනෙකු ද නුඹලා අතරෙන් පිළිගෙන සියොන්
කන්දට පමුණුවන්නෙමි. 15 මට හිතවත් පාලකයන්
නුඹලාට දෙන්නෙමි. ඔවුන් ප්රඥාවෙන් ද සිහි
නුවණින් ද නුඹලා පෝෂණය කරනු ඇත. 16 මෙසේ
නුඹලා දේශයේ වැඩි වී බහුල වූ විට, ගිවිසුම්
කරඬුව ගැන සෙනඟ තවත් කතා කරන්නේ වත්, ඒ
ගැන සිහි කරන්නේ වත් නැත; තවත් ගිවිසුම්
කරඬුවක් ඔවුන් සාදාගන්නේ වත් නැත. 17 ඒ
කාලය පැමිණි විට ජෙරුසලම සමිඳාණන්
වහන්සේගේ සිංහාසනය යයි කියනු ලබන්නේ ය.
සියලු ජාතීන් සමිඳාණන් වහන්සේ වැඩ සිටින
ජෙරුසලමේ රැස් වනු ඇත. ඔව්හු තමන්ගේ නපුරු
සිතිවිලි අනුව මුරණ්ඩුකමින් තවත්
නොහැසිරෙන්නෝ ය. 18 ඒ කාලයේ දී ජුදා වංශය
ඉශ්රායලේ වංශය සමඟ එක් වී උතුරු දේශයේ සිට
මා විසින් නුඹලාගේ පියවරුන්ට උරුම කර දෙන ලද
දේශයට එක් ව එනු ඇත.”

### දේව රූප නමස්කාරය

19 “ඉශ්රායලෙය, නුඹ මාගේ දරුවා වශයෙන්
පිළිගෙන, ලොවේ ඇති ඉතා ම අලංකාර, ප්රියංකර
දේශය නුඹට උරුම කොට දෙන්නෙමි. නුඹ මට
‘පියාණෙනි’යි අමතමින් මා වෙතින් ඉවත් ව නොයෙනු
ඇතැ යි මම සිතුවෙමි. 20 එහෙත්, ඉශ්රායලේ
වංශය, භාර්යාවක ඇගේ පුරුෂයාට ද්රෝහිකම් කර
වෙන් වී යන ලෙස නුඹලා මට විරුද්ධ ව ද්රෝහිකම්
කළහු ය. සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන
සේක.
21 “පාළු කඳු මුදුනෙහි හඬක් ඇසෙයි. ඒ වනාහි,
ඉශ්රායලේ සෙනඟ පව්වුටු මඟ ගිය නිසාත්,
තමන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ අමතක කළ
නිසාත් නැඟෙන ඔවුන්ගේ විලාපයේ හා
කන්නලව්වේ හඬ ය. 22 සමිඳාණන් වහන්සේට
විපක්ෂ ව ගිය දරුවෙනි, ආපසු හැරී එන්න. මම
නුඹලාගේ ද්රෝහිකම නවත්වා නුඹලා සුව
කරන්නෙමි. එවිට නුඹලා මෙසේ පිළිතුරු දෙන්නහු
ය: ‘මෙන්න අපි ඔබ වහන්සේ වෙත පැමිණ සිටිමු;
මන්ද, ඔබ වහන්සේ අපේ දෙවි සමිඳාණන්
වහන්සේ ය. 23 සැබැවින් ම හලේ මුදුන්හි මායාව ද
කඳු මුදුන්හි මධුපානෝත්සවය ද කරන සෙනඟගෙන්
වත් අපට පිහිටක් නැත. ඉශ්රායලේට සැබැවින් ම
ගැළවීම ලැබෙන්නේ ස්වාමීන් වන දෙවියන්
වහන්සේගෙන් ය. 24 බාල් නම් නින්දිතකමේ දෙවියා
අපේ බාල වයසේ පටන් අපේ පියවරුන්ගේ වස්තු
ද ඔවුන්ගේ බැටළුවන් සහ ගවයන් ද ඔවුන්ගේ
පුත්රයන් සහ දූවරුන් ද කාදැමුවේ ය. 25 අපි
ලජ්ජාවෙන් වැතිර සිටියෙමු. අපේ නින්දාව අප
වසාගනී වා. මන්ද, අපේ බාල වයසේ පටන් අද
දවස දක්වා අපි ද අපේ පියවරු ද අපේ දෙවි
සමිඳාණන් වහන්සේගේ හඬට කීකරු නොවී උන්
වහන්සේට විරුද්ධ ව පව් කළෙමු.’ ”

### පසුතැවී සිත හරවා ගැනීමට කැඳවීම

4 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
“ඉතින් ඉශ්රායලේ, නුඹ හැරී ආ යුත්තේ මා
වෙත ය. මා පිළිකුල් කරන දේවරූප ස්ථිර ව පහකර
දමා නුඹ මට පක්ෂපාත වන්නෙහි නම්, 2 සැබෑ
ලෙසත්, යුතු ලෙසත්, අවංක ලෙසත් ජීවමාන
සමිඳාණන් වහන්සේගේ නාමයෙන් දිවුරන්නෙහි
නම්, සියලු ජාතීහු නුඹ ආසිරිලත් අයුරින් ආසිරි පතා
මට ප්රශංසා කරන්නෝ ය.”
3 සමිඳාණන් වහන්සේ ජුදාහි ද ජෙරුසලමෙහි ද
වැසියන්ට මෙසේ වදාරන සේක: “කටු අතරේ
නොවපුරා පුරන් බිම් කොටා ගන්න.හොසි 10:12
4 ජුදාහි වැසියෙනි, ජෙරුසලමේ වැසියෙනි, නුඹලාගේ
සිතෙන් පාප මල කපා හරින්න. එසේ නොකළොත්,
නුඹලාගේ ක්රියාවල නපුරුකම නිසා මාගේ කෝපය
ගිනි මෙන් නික්ම කිසිවකුට නිවන්නට බැරි ලෙස
ඇවිලෙනු ඇත.”

### ආක්රමණය ගැන තර්ජනයක්

5 “දේශය මුළුල්ලේ හොරණෑව පිඹ මොරගසා,
‘අපි එක්රැස් වී බලකොටු සහිත නගරවලට යමු’
කියා ජුදාව පුරා පතුරුවන්න; ජෙරුසලමේ ප්රකාශ
කරන්න. 6 සියොන් දෙසට සංඥාවක් දෙන
සංකේතයක් නඟන්න; ගැළවෙන පිණිස නොනැවතී
දුවන්න. මන්ද, සමිඳාණන් වහන්සේ උතුරෙන්
විපත්තියක් ද මහා විනාශයක් ද පමුණුවන සේක;
7 සිංහයෙක් සිය වනයෙන් නික්මුණේ ය. ජාතීන්
වනසන්නෙක් නික්ම ගියේ ය. නුඹේ දේශය පාළු
කරන පිණිස ඔහු තමාගේ ස්ථානයෙන් පිටත් වී
ගමන් කරන්නේ ය; වැසියකු ඉතිරි නොවන
හැටියට නුඹේ නගර විනාශ වන්නේ ය. 8 එබැවින්
ගෝණි රෙදි ඇඳගෙන, විලාප කියමින්,
කෑමොරගසන්න. මන්ද, සමිඳාණන් වහන්සේගේ
බලවත් උදහස ජුදාවෙන් පහ ව නොගියේ ය.”
9 සමිඳාණන් වහන්සේ කතා කොට, “ඒ දවසේ දී
රජුගේ සිත ද අධිපතීන්ගේ සිත් ද අධෛර්ය
වන්නේ ය; පූජකයෝ බියපත් වන්නෝ ය. දිවැසිවරු
ත්රස්ත වන්නෝ ය”යි වදාළ සේක.

10 එවිට මම කතා කොට, “මහෝත්තම දෙවි
ස්වාමීන් වහන්ස! ඔබ වහන්සේ ජෙරුසලම් ජනයා
සහමුලින් ම රැවටූ සේක: මන්ද, ‘සාමය ඇති
වන්නේ ය’යි ඔබ වදාළ නමුත්, දැන් ඔවුන්ගේ
ගලෙට කඩුව එල්ල වී ඇතැ”යි කීවෙමි.
11 සමිඳාණන් වහන්සේගෙනේ මාගේ සෙනඟ
දසෙට කඳු මුදුන්වලින් හමන සුළඟ පොළනු
ලබන්නට වත්, ශුද්ධ කරනු ලබන්නට වත් හමන
සුළඟක් නොව, ඊට වඩා දවාලන සුළඟක් බව
ජෙරුසලමට සහ එහි වැසියන්ට කියන කාලය
පැමිණෙන්නේ ය. එය පළේමට වත් ශුද්ධ කිරීමට
වත් නොවන්නේ ය. 12 සමිඳාණන් වහන්සේගේ
නියමයෙනේ ඇති වන ඒ සුළඟ එයට වඩා දරුණු ය.
දැන් සමිඳාණන් වහන්සේ ම සිය සෙනෙඟට විරුද්ධ ව
විනිශ්වය ප්‍රකාශ කරන සේක.

### ජුදා වටලනු ලැබීම

13 “බලන්න, සතුරා වලාකුළු මෙනේ ද ඔහුගේ රථ
සුළි සුළඟක් මෙනේ ද නැඟී එන්නේ ය. ඔහුගේ
අශ්වයෝ රාජාලීන්ට වඩා ශීඝ්‍ර ය. අහෝ, අපට වන
විපතක මහත! අපි විනාශයි!
14 “එම්බා ජෙරුසලම! නුඹ ගැළවෙනෙ පිණිස නුඹේ
සිත සෝදාගෙනෙ එහි ඇති නපුරුකම් පහ කරන්න.
නුඹේ නපුරු සිතිවිලි නුඹ තුළ කොපමණ කල්
පවතිනු ඇද් ද?
15 “දාන් සිට ද එප්රායිම් කන්ද කරෙනේ ද නුඹට
වන විපත ගැන කතාව පැතිරී යන්නේය. 16 ජුදා
නගරවලට විරුද්ධ ව ද හඬ නඟමින් දුර රටක සිට
ඒවා වටකරින් එන බවට අනතුරු අඟවන්න;
ජෙරුසලමේ එය ප්‍රකාශ කරන්න. 17 ජුදා මට
විරුද්ධ ව කැරලි ගසා ඇති බැවින්, මුරකරුවන්
කතෙක් වටකර සිටින්නාක් මෙනේ සතුරන් ජෙරුසලම
වටලනු ඇත. මසෙේ පවසන්නේ සමිඳාණන්
වහන්සේ ය.
18 “නුඹේ කල්ක්‍රියාවනෙේ හා නුඹ කළ කී දයෙන්
නුඹ ම මේ විපත නුඹ පිට පමුණුවාගෙන ඇත.
මයෙ නුඹේ ඉරණම වේ. එය ඉතා දරුණු ය, එය
නුඹේ හදවත සිදුරු කර ඇත.”

### සිය සෙනෙඟ ගැන ජෙරමියාගේ ශෝකය

19 අනේ! මාගේ දරුණු වේදනාව, මාගේ දරුණු
වේදනාව. ඒ වේදනාවනේ මම ඇඹරෙන්නෙමි.
අහෝ මාගේ පපුව! මාගේ පපුව තදින් ගැහයෙි.
මට නිශ්ශබ්ද ව සිටින්නට බැරි ය. මන්ද, හොරණෑ
හඬත්, රණ හඬත් මට ඇසුණේ ය. 20 විපත පිට
විපත පැමිණ ඇත; මුළු රට ම නාස්ති වී ඇත.
හදිසියේ ම මාගේ කූඩාරම විනාශ වීය; එහි තිර
වැසුම් ඉරී ගියේ ය. 21 කොපමණ කල් මම ධජ
සංකේතය දසෙ බලා සිටිම් ද? කොපමණ කල් යුද්ධ
හොරණෑ හඬ අසම් ද? 22 සමිඳාණන් වහන්සේ
කතා කොට, “මාගේ සෙනෙඟ අඥාන ය; ඔව්හු මා
නොහඳුනති; ඔව්හු මෝඩ දරුවන් වැනි ය; ඔවුන්ට
කිසි තේරුමක් නැත; නපුරු දේ කිරීමට ඔව්හු දක්ෂ
ය, එහතේ, යහපත කිරීමට ඔව්හු නොදනිති”යි
වදාළ සේක.

### පැමිණෙනෙ විනාශය ගැන දර්ශනය

23 පොළොව දසෙ බැලූ විට එය පාළු ව, හිස් ව
තිබෙනෙ බවත්, අහස දසෙ බැලූ විට එහි එළිය නැති
බවත් මම දිටිමි. 24 කඳු දසෙ බැලූ විට ඒවා කම්පා
වන බවත්, සියලු හලේ වැනෙනෙ බවත් දිටිමි. 25 මා
බැලූ විට, කිසි ම මිනිසකු නොසිටි බවත්, අහසේ
සියලු පක්ෂීන් පලා ගොස් ඇති බවත් දිටිමි. 26 මා
බැලූ විට, සමිඳාණන් වහන්සේ ඉදිරියහෙි උන්
වහන්සේගේ බලවත් උදහස නිසා සාරවත් දේශය
කාන්තාරයක් වූ බවත්, එහි සියලු නගර නටබුන් වී
තිබෙනෙ බවත් දිටිමි. 27 මුළු පොළොව ම පාළු වන
බවත්, ඒ නමුත් තීන්දුවට ම උන් වහන්සේ එය
විනාශ නොකරන බවත් සමිඳාණන් වහන්සේ වදාරා
ඇත. 28 මිහි කත වැලපෙනේනී ය; අහස අඳුරු
වන්නේ ය. මන්ද, සමිඳාණන් වහන්සේ එය අදහස්
කර ඇත; උන් වහන්සේ ආපසු බලන්නේ වත්, සිය
අදහස වනෙස් කරන්නේ වත් නැත. 29 සියලු
නගරවල වැසියෝ අසරුවන්ගේ ද දුනුවායින්ගේ ද
ඝෝෂාවට පලා ගොස් බැදිවලට ඇතුළු වති;
පර්වතවලට නඟිති. සියලු ම නගර අත්හරිනු ලැබ
ඇත. කිසිවකේ එහි වාසය නොකරති. 30 පාළුවට
ගිය ජෙරුසලම, නුඹ රතු වස්ත්‍ර පැළඳගත්තත්,
ස්වර්ණාභරණවලින් සැරසුණත්, නුඹේ ඇස්වල අඳුන්
ගාගත්තත්, නුඹේ අලංකාර වීම නිෂ්ඵල වන්නේ ය.
නුඹේ ප්‍රේම වන්තයෝ නුඹ ප්‍රතික්ෂේප කරති;
ඔව්හු නුඹේ ප්‍රාණය හානි කරන්නට සොයති.
31 විළිරුජා ඇති ස්ත්‍රියකගේ හැඬීම මෙනේ ද
කුලුඳුලා බිහි කරන ස්ත්‍රියකගේ ප්‍රසව වේදනාව
මෙනේ ද සියොන් දුවගේ හඬ මට ඇසුණේ ය. ඈ
හතිදමමින් කෙඳිරිගාමින්, ඇගේ අත් විදහාගෙන,
“අහෝ! මට විපත ය; මා මරන්නට එන අය ඉදිරියේ
මම ක්ලාන්ත වෙමි”යි කියන්නී ය.

### ජෙරුසලමේ පාපය

5 ජෙරුසලම් ජනයනෙි, වීදිවල ඔබමොබ දුව
ගොස් බලන්න; ප්‍රසිද්ධ තැන්වල සොයා
දැනගන්න. යුක්තිය කරන, සත්‍යය සොයන එක ද
මිනිසකේ වත් ඇද්දැ යි සොයා බලන්න. එවැන්නකේ
ඇත්නම්, සමිඳාණන් වහන්සේ ජෙරුසලමට කමා වනු
ඇත. 2 ඔවුන්, ජීවමාන සමිඳාණන් වහන්සේගේ
නාමයනෙේ දිවුරන නමුත්, ඇත්තනෙේ ම ඔවුන්
දිවුරන්නේ බොරුවට ය. 3 අහෝ සමිඳුනි, ඔබේ ඇස්
සත්‍යය දසෙ යොමු කරන සේක් ද? ඔබ ඔවුන්ට
පහර දුන් සේක; එහතේ, වේදනාව දැනුණේ නැත.
ඔබ ඔවුන් තළා පළොදැමූ සේක. එහතේ, ඔව්හු
වැරදි නිවැරදි කරගත්තේ නැත. ඔව්හු තමන්ගේ
සිත් පර්වතයකට වඩා දැඩි කරගෙන හැරී එන්නට
අකමැති වූවෝ ය. 4 එවිට මම මසෙේ කීවෙමි:
“සැබැවින් ම මොවුහු අඥානයෝ ය. සමිඳාණන්
වහන්සේගේ මාර්ගය ද තමන්ගේ දවෙියන්

වහන්සේගේ ආඥා ද නොදන්න බැවින් මෝඩවුහු
මෝඩ ලෙස හැසිරෙති. 5 මම උත්තමයන් වෙත
ගොස් ඔවුන්ට කතා කරන්නෙමි. මන්ද, ඔව්හු
සමිඳාණන් වහන්සේගේ මාර්ගය ද තමන්ගේ
දෙවියන් වහන්සේගේ ආඥා ද දනිති.” එහෙත්,
ඔව්හු සියල්ලෝ ම සමිඳාණන් වහන්සේගේ
ආධිපත්‍යය ප්‍රතික්ෂේප කර උන් වහන්සේට කීකරු
වීමට අකමැති වූ හ. 6 මේ නිසා කැළෑවෙන් එන
සිංහයෙක් ඔවුන් මරන්නේ ය; සැන්දෑ කාලයෙහි එන
වෘකයෙක් ඔවුන් නාස්ති කරන්නේ ය; දිවියෙක්
ඔවුන්ගේ නගර ළඟ රැක ඉන්නේ ය; එයින් පිටත
යන සියල්ලෝ ඉරාදමනු ලබන්නෝ ය. මන්ද,
ඔවුන්ගේ වැරදි බහුල වී ඇත; ඔවුන්ගේ මිසදිටුකම
වැඩි වී ඇත. 7 සමිඳාණන් වහන්සේ මෙසේ වදාළ
සේක: “මා නුඹට කමා වන්නේ කෙසේ ද? නුඹේ
දරුවෝ මා අත්හැර, බොරු දෙවිවරුන්ගේ නමින්
දිවුළෝ ය. මා ඔවුන්ට කන්නට දී තෘප්තියට
පැමිණවූ පසුත් ඔව්හු කාමමිථ්‍යාචාරය කළෝ ය.
ඔව්හු රංචු ගැසී වේශ්‍යාවන්ගේ ගෙවලට ඇතුළු
වුණෝ ය. 8 ඔව්හු හොඳට පෝෂ්‍ය වී සිටින
අශ්වයන් මෙන් එකිනෙකා තම තමාගේ
අසල්වැසියාගේ භාර්යාවට හේෂාරව කළහ. 9 මේ
කාරණා නිසා මම ඔවුන්ට දඬුවම් නොකර සිටිම් ද?
මෙවැනි ජාතියකින් මම පළි නොගෙන සිටිම් ද?
මෙසේ වදාරන්නේ සමිඳාණන් වහන්සේ ය.
10 දේශය සහමුලින් ම විනාශ නොකර මිදි අතු
කපා දමන්නට කියා ද අතු සමිඳාණන් වහන්සේට
අයිති නැති නිසා ඒවා කපා දමන්නට කියා ද මම
නියම කරමි. 11 ඉශ්‍රායලේ වංශය හා ජුදා වංශය
මට විරුද්ධ ව බොහෝ සේ ද්‍රෝහිකම් කර ඇත.
මෙසේ වදාරන්නේ සමිඳාණන් වහන්සේ වන මම
ය.”

## ඉශ්‍රායලේ ප්‍රතික්ෂේප කරනු ලැබීම

12 සෙනඟ සමිඳාණන් වහන්සේ ගැන බොරු කියා,
“උන් වහන්සේ ක්‍රියා නොකර සිටින සේක; අප
පිට කිසි විපතක් නොපැමිණෙයි; කඩුව වත්,
සාගතය වත් දකින්නට අපට සිදු නොවෙයි;
13 දිවැසිවරු සුළඟ හා සමාන ය; දේව වචනය ඔවුන්
තුළ නැතැ”යි පවසති. 14 ඔවුන්ට මෙසේ සිදු වනු
ඇත. නුඹලා මෙසේ කියන බැවින් සියලු බලැති
දෙවියන් වහන්සේ මට වදාරන වචන මෙසේ ය:
“මාගේ වචන නුඹේ මුඛයෙහි ගින්නක් මෙන් ද
සෙනඟ දර මෙන් ද කරන්නෙමි. එයින් ඔවුන් දැවී
යනු ඇත.”
15 ඉශ්‍රායලේ ජනයෙනි, සමිඳාණන් වහන්සේ
ඔබට විරුද්ධ ව දුර සිට ජාතියක් ගෙනෙන සේක.
ඔව්හු බලවත් පැරණි ජාතියක් ය. ඔව්හු ඔබ
නොදන්න භාෂාවක් කතා කරති. ඔවුන් කියන දේ
ඔබට තේරෙන්නේ නැත. 16 ඔවුන්ගේ ඊ කොපු
ඇරී තිබෙන මිනීවළක් වැනි ය; ඔව්හු සියල්ලෝ ම
වීරයෝ ය. 17 ඔවුන් ඔබේ පුත්‍රයන් ද දූවරුන් ද
ඔබේ අස්වැන්න ද ඔබේ ආහාර ද කාදමනු ඇත;
ඔබේ බැටළුවන් ද ගවයන් ද කාදමනු ඇත; ඔබේ
මිදි වැල් ද අත්තික්කා ගස් ද කාදමනු ඇත. ඔබේ
විශ්වාසය තබා ඇති ඔබේ බලකොටු නගර ඔවුන්
කඩුවෙන් නටබුන් කරනු ඇත.
18 “එසේ වී නමුත් ඒ දවස්වල දී වුව ද සහමුලින්
ම නුඹලා නැති කරන්නෙමි”යි සමිඳාණන් වහන්සේ
වදාරන සේක. 19 තවද, “අපේ දෙවි සමිඳාණන්
වහන්සේ මේ සියල්ල අපට කළේ මන්දැ”යි
සෙනඟ අසන කල, “ ‘නුඹලා මා අත්හැර නුඹලාගේ
දේශයේ දී විජාතීන්ගේ දෙවිවරුන්ට සේවය කළ
ලෙස ම, නුඹලාට අයිති නැති දේශයක දී විජාතීන්ට
නුඹලා සේවය කරන්නහු යැ’යි ඔවුන්ට කියන්නැ”යි
සමිඳාණන් වහන්සේ වදාළ සේක.

## සෙනඟට අනතුරු ඇඟවීම

20 යෙසා 6:9-10; එසකි 12:2; මාක් 8:18 සමිඳාණන්
වහන්සේ මෙසේ වදාරන සේක: “ජාකොබ්ගේ
වංශයටත්, ජුදාහි සෙනඟටත් මෙසේ කියන්න:
21 මෝඩ, තේරුම් නැති, ඇස් තිබෙන නමුත්
නොදකින, කන් තිබෙන නමුත් නොඅසන ජනයෙනි,
22 ජෝබ් 38:8-11ස්වාමීන් වන මම මෙසේ අසමි:
නුඹලා මට බිය වන්නේ නැද් ද? මා ඉදිරියේ
වෙවුළන්නේ නැද් ද? මුහුදේ මායිමක් වශයෙන් මම
වෙරළ තැබුවෙමි. එය වනාහි පසු කර නොයා හැකි
ස්ථිර මායිමකි. රැළ ගසන නමුත්, ඒ මායිම ඉක්මවා
යන්නට එයට නොහැකි ය. රැළ ඝෝෂා කරන
නමුත්, එය පසු කර යන්නට එයට බැරි ය.
23 එහෙත් ජනයෙනි, මේ සෙනඟට මුරණ්ඩු
කැරලිකාර සිතක් ඇත. සෙනඟ ඉවතට හැරී මා
අත්හැර ගොස් ඇත. 24 ‘සරත් කාලයේ දී ද වසන්ත
කාලයේ දී ද නියම කලට වැසි දෙන, ගොයම්
කැපීමට නියම සති අපට සලසා දෙන අපේ දෙවි
සමිඳාණන් වහන්සේ කෙරෙහි බිය ඇති ව සිටිමු’යි
මේ සෙනඟ වන නුඹලා තමන් සිත් තුළ නොකීවහු
ය. 25 නුඹලාගේ අපරාධ නිසා ඒවා පහ ව ගියේ ය;
නුඹලාගේ පාපය නිසා ශුභසිද්ධිය නුඹලාට නොලැබී
ගියේ ය.
26 “මාගේ සෙනඟ අතරේ දුෂ්ටයෝ සිටිති. එබී,
නැමී බලා සිටින පක්ෂි වැද්දන් මෙන් ඔව්හු රැක
සිටිති. ඔව්හු මලපතක් තබා මිනිසුන් අසු කරගනිති.
27 පක්ෂීන්ගෙන් පිරී තිබෙන කූඩුවක් මෙන්
ඔවුන්ගේ ගෙවල් කොල්ලකෑ දැයෙන් පිරී තිබේ. ඒ
නිසා ඔව්හු බලවත් වී, පොහොසත් වී සිටිති.
28 තරබාරු සතුන් මෙන් වී වසති. ඔවුන්ගේ
දුෂ්ටකම්වලට ඉමක්කොනක් නැත. ඔව්හු
අනාථයන්ගේ අයිතිවාසිකම් සාධාරණ ලෙස
නොවිසඳා ඔවුන්ගේ සැහැසිකම් නොසලකා හරිති.
දිළිඳුන්ට යුක්තිය ඉටු කර නොදෙති. 29 එහයින්,
මේ කාරණා නිසා මම ඔවුන්ට දඬුවම් කරමි; මේ
ජාතියෙන් මම පළිගන්නෙමි. මෙසේ පවසන්නේ
ස්වාමීන් වන මම ය. 30 පුදුම, භයංකර සිද්ධියක්
දේශයෙහි සිදු වී ඇත. 31 දිවැසිවරු සත්‍යය කතා
නොකරති; පූජකයෝ සිය මතයෙන් ආණ්ඩු කරති;

මාගේ සෙනඟ මේවාට ප්‍රිය කරති. එහෙත්, මේ
සියල්ල අවසානයේ දී ඔව්හු කුමක් කරත් ද?”

### ජෙරුසලම වටලනු ලැබීම

6 “බෙන්ජමින් වංශයේ ජනයෙනි, ආරක්ෂාව
පිණිස ජෙරුසලමෙන් පලා යන්න. තකෝවාහි
හොරණෑ පිඹින්න; බෙත්හක්කෙරෙමේ මත සලකුණක්
නඟන්න. මන්ද, විපත්තියක් ද මහා විනාශයක් ද
උතුරෙන් ළඟා වන ලකුණු ඇත. 2 ශෝභන, සිව්මැලි
තැනැත්තියක වන සියොන් පුරඟන වනසනු ලබන්නී
ය. 3 එඬේරු සිය පට්ටි රැගෙන ඈට විරුද්ධ ව
පැමිණෙති. ඔව්හු ඈ වටලා, සිය කූඩාරම් පිහිටුවා,
තමන් රිසි සේ නිල් තණ කවන්නෝ ය. 4 තවද,
ඔවුන් කතා කොට, ‘ජෙරුසලමට විරුද්ධ ව සටනට
සැරසෙන්න; නැඟිටින්න, ඉර මුදුන් වේලාවේ දී අපි
පහර දෙමු’යි කියනු ඇත. එසේ වුව ද, ‘දැන් කල්
වේලා ගත වී ඇත; දවාල පහ වී සවස සෙවණැලි
වැටීගෙන එයි; 5 සැරසෙන්න, අද රෑ අපි පහර දී
ජෙරුසලම් වාසල් බිඳලමු’යි ඔව්හු කියති.
6 “සියලු බලැති සමිඳාණන් වහන්සේ මෙසේ
වදාරන සේක. ජෙරුසලම වටලන පිණිස ගස්
කපාගෙන බලකොටු සාදාගන්න. දඬුවම ලැබිය යුතු
නගරය මයෙ වේ. තාඩන පීඩන හැර අන් කිසිවක්
එහි නැත. 7 ළිඳකින් වතුර උනන සේ ජෙරුසලමෙන්
නපුරුකම උනන්නේ ය. තාඩන පීඩන ගැන ආරංචි
ඇසෙන්නේ ය; රෝගත්, තුවාළත් මට නිතර ම
දක්නට ලැබේ. 8 එම්බා ජෙරුසලම! මා නුඹෙන්
වෙන් වී නොයෙන පිණිසත්, මා විසින් නුඹ පාළු,
වැසියන් නැති දේශයක් කරනු නොලබන පිණිසත්
මේ අනතුරු ඇඟවීම සිතට ගන්න.”

### කැරලිකාර ඉශ්රායලෙය

9 සියලු බලැති සමිඳාණන් වහන්සේ මට මෙසේ
වදාරන සේක: “කිසිත් ඉතිරි නොවන ලෙස
ගොවියකු අතු සූරා මිදි පල එකතු කරන සේ,
ඉශ්රායලේහි කිසිවක් ඉතිරි නොවන පරිදි ඔව්හු
රැස් කරගනිති.”
10 මම මෙසේ පිළිතුරු දිනිමි: “සවන් දෙන හැටියට
මම කාට කතා කර අවවාද කරම් ද? ඔවුන් මුරණ්ඩු
වී ඔවුන්ගේ කන් වසාගෙන ඇති බැවින් සවන්
දෙන්නට ඔවුන්ට බැරි ය. සමිඳාණන් වහන්සේගේ
වචනය ඔවුන්ට නින්දාවක් වී ඇත. ඔව්හු එයට ප්‍රිය
නොවෙති. 11 ඒ නිසා සමිඳුනි, මම ඔබේ
කෝපයෙන් පිරී සිටිමි. එයින් මම වෙහෙසට පත් වී
සිටිමි.” එවිට සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ
සේක: “වීදිවල සිටින ළමයින් පිටත්, තරුණයන්ගේ
රැස්වීම් පිටත් මාගේ කෝපය වගුරන්න. පුරුෂයා
භාර්යාව සමඟ ද මහලු අය ඉතා වයස්ගත අය
සමඟ ද ගෙනෙයනු ලබන්නෝ ය. 12 ජෙරෙ
8:10-12ඔවුන්ගේ ගෙවල් ද වතුපිටි ද භාර්යාවන් ද
අන්‍යයන්ට අයිති වනු ඇත. මේ දේශයේ සිටින
සෙනඟට මම දඬුවම් කරන්නෙමි. මෙසේ
පවසන්නේ ස්වාමීන් වන මම ය. 13 ඔවුන්ගෙන්
කුඩා අය සිට ලොකු අය දක්වා සියල්ලෝ ම අයුතු
ලාභ උපයා ගනිති: දිවැසිවරයා පටන් පූජකයා දක්වා
සියල්ලෝ ම වංචාකම් කරති. 14 එසකි
13:10තුවාළයකට මතුපිටින් පිළියම් කරන සේ සාමය
නැති විට පවා ඔව්හු, ‘සාමය, සාමය’ කියමින් මාගේ
සෙනඟ සනසති. 15 ඔවුන් කළ පිළිකුල් දේ ගැන
ඔව්හු ලජ්ජා වූවෝ ද? නැත. ඔවුන්ට කොහෙත් ම
ලජ්ජාවක් හෝ නින්දාවක් හෝ දැනුණේ වත් නැත.
එබැවින්, වැටෙන්නන් අතරේ ඔවුන් වැටෙනු ඇත. මා
ඔවුන්ට දඬුවම් කරන කාලයෙහි ඔව්හු නැත්තට ම
නැති වන්නෝ ය. මෙසේ වදාරන්නේ ස්වාමීන් වන
මම ය.”

### සිය සෙනඟ ප්‍රතික්ෂේප කරනු ලැබීම

16 මතෙ 11:29 සමිඳාණන් වහන්සේ සිය සෙනඟට
මෙසේ වදාරන සේක: “මං සන්ධිවල සිට බලා,
පුරාණ මාර්ග මොනවා දැ යි ද යහපත් මාර්ගය
කුමක් දැ යි ද අසා ඒ මඟ ඇවිදින්න; එවිට නුඹලාට
සහනය ලැබෙන්නේ ය.” 17 මම ඔවුන් වෙත
මුරකරුවන් සිටුවා, “හොරණෑ ශබ්දයට සවන්
දෙන්නැ”යි කීවෙමි. එහෙත්, ඔව්හු, “අපි සවන්
නොදෙන්නෙමු”යි කී හ.
18 එබැවින් සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන
සේක: “ජාතීනි, සවන් දී මාගේ සෙනඟට සිදු
වන්නට යන දේ ගැන දැනගන්න. 19 එම්බා
පොළොව! සවන් දෙන්න. මේ සෙනඟ මාගේ
වචනවලට කීකරු නොවී, මාගේ ආඥා ප්‍රතික්ෂේප
කළ නිසා, ඔවුන්ගේ උපායවලට නියම විපාකය වන
විපත්තිය ඔවුන් පිට පමුණුවන්නෙමි. 20 ෂෙබායෙන්
කට්ටකුමංජල් ද දුර දේශයකින් හඳුන්කූරු ද මට
ගෙනෙන්නේ කුමට ද? නුඹලාගේ දවන යාග පූජා
මට ප්‍රසන්න නැත. නුඹලාගේ යාග ද මට ප්‍රිය
නැත. 21 එබැවින් නුඹලාගේ ස්වාමීන් වන මම, මේ
සෙනඟ පැකිළී වැටෙන්නට සලස්වන බාධා
පමුණුවන්නෙමි. පියවරුන් ද පුත්‍රයන් ද අසල්වැසියන්
හා ඔවුන්ගේ මිතුරන් ද විනාශ වී යනු ඇත.”

### උතුරෙන් ආක්‍රමණයක්

22 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
“අන්න, උතුරු දේශයෙන් සෙනඟක් එති; මහා
බලවත් ජාතියක් ද පොළොවේ ඉතා දුර තැන්වලින්
නැඟිට එනු ඇත. 23 ඔව්හු දුනු හා හෙල්ල දරති;
ඔව්හු කෲර ය, නිර්දය වෙති. ඔවුන්ගේ හඬ සමුද්‍ර
ඝෝෂාව වැනි ය. එම්බා සියොන් පුරඟන, නුඹට
විරුද්ධ ව යුද්ධ කරන්නට ඔව්හු සියලුදෙන එක්
කෙනෙකු මෙන් පෙළේ ගැසී අශ්වයන් පිට නැඟී එති.”
24 ජෙරුසලම් වැසියෝ මෙසේ කියති: “ඒ පුවත
අප අසා ඇත; අපේ අත් දුර්වල වී තිබේ; ස්ත්‍රියට
ඇති වන විළිරුජාව සේ දුක් වේදනාව අප පිට
පැමිණ ඇත. 25 එළිමහනට නොයෙන්න; වීදිවල
නොඇවිදින්න; කඩු ගත් සතුරන් හැම අතින් ම යන
එන බැවින් භයානක ය.”

26 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
“මාගේ සෙනඟනි, ගෝණි රෙදි හැඳගෙන, අළුවල
පෙරළී පෙරළී, මියගිය එක ම පුතකු උදෙසා මෙන්
ඉතා දුක් බර ව වැලපෙන්න. මන්ද, විනාශ කරන්නා
හදිසියේ නුඹට පහර දෙන්නේ ය. 27 ජෙරමියා,
නුඹ මාගේ සෙනඟගේ මාර්ගය දැනගන්න පිණිසත්,
ඔවුන් අතරේ ඔවුන් පරීක්ෂා කර බලන පිණිසත්
පරීක්ෂකයකු කොට මම නුඹ පත් කළෙමි.
28 ඔව්හු සියල්ලෝ ම මුරණ්ඩු කැරලිකාරයෝ ය.
කේළාම් කියමින් ඇවිදින්නෝ ය. ඔව්හු ලෝකඩ හා
යකඩ මෙන් දැඩි ව සිටිති; ඔව්හු දූෂ්‍යකම් කරති.
29 උදුන තද ගින්නෙන් ඇවිලීමෙන් වානේ උණු වේ.
එහෙත්, ගින්නෙන් කොතරම් පිරිසිදු කළත් දුෂ්ටයෝ
පිරිසිදු නොවෙති. 30 ස්වාමීන් වන මා එපා කළ
නිසා, ‘වටේට රිදී ය’යි ඔව්හු කියනු ලබන්නෝ ය.”

### ජෙරමියා දේව මාලිගාවේ දේශනා කිරීම

7 සමිඳාණන් වහන්සේගෙන් ජෙරමියා වෙත
පැමිණි පණිවුඩය මෙයෙ ය: 2 “නුඹ සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ දොරටුව ළඟ සිට, මෙසේ
ප්‍රකාශ කරන්න: සමිඳාණන් වහන්සේට නමස්කාර
කරන්නට මේ දොරටුවලින් ඇතුළු වන ජුදාහි
සියල්ලෙනි, සමිඳාණන් වහන්සේගේ වචනය
අසන්න. 3 ඉශ්‍රායලේවරුන්ගේ සියලු බලැති දෙවි
ස්වාමීන් වහන්සේ තවදුරටත් මෙසේ වදාරන සේක:
නුඹලාගේ කල්ක්‍රියාව සහ නුඹලා කරන දේ
හරිගස්සාගන්න. එවිට මම නුඹලාට මේ ස්ථානයෙහි
වාසය කරන්නට ඉඩ සලසන්නෙමි. 4 ‘මෙයෙ
සමිඳාණන් වහන්සේගේ මාලිගාව ය, සමිඳාණන්
වහන්සේගේ මාලිගාව ය, සමිඳාණන් වහන්සේගේ
මාලිගාව ය’යි කියන රැවටිලි වචන විශ්වාස
නොකරන්න.
5 “නුඹලාගේ ම කල්ක්‍රියා ද නුඹලා කරන කියන
දේ ද සැබැවින් ම හරිගස්සාගන්න. එකිනෙකා
සම්බන්ධයෙන් සාධාරණ ලෙස ක්‍රියා කරන්න.
6 විදේශිකයාට ද අනාථයාට ද වැන්දඹුවට ද පීඩා
නොකරන්න. මේ ශුද්ධස්ථානයේ නිදොස් ලේ
නොවගුරන්න. අන් දෙවිවරුන්ට නමස්කාර කිරීම
නුඹලාට අන්තරායදායක බැවින් එසේ නොකරන්න.
7 එවිට නුඹලාගේ පියවරුන්ට ආදියේ සිට
සදාකාලයට ම මා දුන් මේ දේශයේ, මේ
ස්ථානයේ, වාසය කිරීමට මම නුඹලාට ඉඩ දෙමි.
8 “බලන්න, නුඹලා වැඩකට නැති රැවටිලි වචන
විශ්වාස කර ඇත. 9 නුඹලා සොරකම් කර, මිනීමරා,
කාමමිථ්‍යාචාරය කර, බොරුවට දිවුරා, බාල්
දෙවියන්ට සුවඳ දුම් ඔප්පු කර, නුඹලා නොදන්න
අන්‍ය දෙවිවරුන් පස්සේ ගියහු ය. 10 ඉන්පසු නුඹලා
අවුත්, මාගේ නාමය දරන මේ මාලිගාවේ දී මා
ඉදිරියේ සිට, ‘අපි ගැළවී සිටිමු’යි කියන්නේ, මේ
සියලු පිළිකුල්කම් කරගෙන යන පිණිස ද? 11 මතෙ
21:13; මාක් 11:17; ලූක් 19:46මාගේ නාමය දරන
මේ මාලිගාව සොරුන්ගේ ගුහාවකැ යි නුඹලා
සිතන්නහු ද? නුඹලා කරන දේ සැබැවින් ම මට
පෙනේ. මෙසේ පවසන්නේ සමිඳාණන් වහන්සේ
වන මම ය. 12 ජෝෂු 18:1; ගීතා 78:60; ජෙරෙ 26:6මා
නමස්කාරය ලබන පිණිස මා මුලින් ම තෝරාගත්
ස්ථානය වන ෂිලෝවට ගොස්, මාගේ සෙනඟ වන
ඉශ්‍රායලේවරුන්ගේ දුෂ්ටකම නිසා මා ඊට කළ දේ
බලන්න. 13 මා සඳහන් කළ සියලු පව් නුඹලා කර
ඇත. මා නුඹලාට නැවත නැවත ඕනෑකමින් කතා
කළ නමුත්, නුඹලා මට සවන් නොදුන්නහු ය. මා
නුඹලාට අඬගැසූ නමුත්, නුඹලා මට පිළිතුරු
නුදුන්නහු ය. 14 ඒ නිසා මාගේ නාමය දරන,
නුඹලාගේ විශ්වාසය තබා ඇති මේ මාලිගාවටත්,
මා නුඹලාට හා නුඹලාගේ පියවරුන්ට දුන් මේ
ස්ථානයටත් ෂිලෝවට කළ දේ මම කරන්නෙමි.
15 මා නුඹලාගේ සහෝදරයන් වන මුළු එෆ්‍රායිම්
වංශය නෙරපාදැමූ පරිදි නුඹලාත් මා ඉදිරියෙන් මම
නෙරපා දමන්නෙමි.”

### සෙනඟගේ අකීකරුකම

16 “ජෙරමියා, නුඹ මේ සෙනඟ උදෙසා යාච්ඤා
නොකරන්න. ඔවුන් උදෙසා මොරනොගසන්න.
යාච්ඤා නොකරන්න. මා නුඹේ බසට සවන්
නොදෙන බැවින් මට කන්නලව් නොකරන්න.
17 ජුදාහි නගරවලත්, ජෙරුසලමේ වීදිවලත් ඔවුන්
කරන දේ නුඹට පෙනෙනවා නොවේ ද? 18 ජෙරෙ
44:17-19මා කෝප කරවන ලෙස අහස් දේවියට රස
කැවිලි සෑදීමටත්, අන් දෙවිවරුන්ට පානීය පූජා පුද
කිරීමටත්, දරුවෝ දර එකතු කරති; පියවරු ගිනි
මොළවති; ස්ත්‍රීහු පිටි අනති. 19 එහෙත්, සැබැවට
ම ඔවුන් කෝප කරවන්නේ මා ද? නැත; ඔවුන්
එසේ කරගන්නේ ඔවුන්ට ම ය. තමන් පිට ම ඔව්හු
ලජ්ජාව පමුණුවාගන්නෝ ය. 20 ඒ නිසා මහෝත්තම
දෙවි ස්වාමීන් වන මම මේ ස්ථානය පිට මාගේ
කෝපය හා උදහස වගුරුවන්නෙමි. මිනිසුන් පිට
මෙන් ම, මෘගයන්, කෙතේ ගස් සහ භූමියේ පල
කරෙහි ද මම එය වගුරුවමි. මාගේ කෝපය
නොනිවෙන ගින්නක් වැනි ය.
21 “මාගේ සෙනඟනි, ඉශ්‍රායලේවරුන්ගේ
දෙවිඳුන් වන සියලු බලැති ස්වාමීන් වන මම
නුඹලාට මෙසේ වදාරමි: නුඹලාගේ පූජාවලට
නුඹලාගේ දවන යාග පූජාත් එක් කොට ඒවායේ
මස් මාංස අනුභව කරන්න. 22 මා නුඹලාගේ
පියවරුන් මිසර දේශයෙන් පිටතට ගෙනා කාලයේ දී
දවන යාග පූජා ගැන වත්, යාග ගැන වත් මම
ඔවුන්ට කතා නොකළෙමි; අණ නොකළෙමි.
23 එහෙත්, මා ඔවුන්ට අණ කළේ, ‘මාගේ හඬට
කීකරු වන්න, එවිට මම නුඹලාගේ දෙවියන්
වහන්සේ වන්නෙමි. නුඹලා ද මාගේ සෙනඟ
වන්නහු ය; නුඹලාට ශුභසිද්ධ වන පිණිස මා
නුඹලාට අණ කරන මාර්ගය අනුව හැසිරෙන්න, කියා
ය. 24 එහෙත්, ඔව්හු සවන් දුන්නේ වත්, කීකරු
වන්නේ වත් නැති ව, හිතුමතේ ද මුරණ්ඩු සිත්වල
දුෂ්ට අදහස් අනුව ද හැසිරෙමින් ඉදිරියට යෑම
වෙනුවට පසුබැස ගියහ. 25 නුඹලාගේ පියවරුන්

මිසර දේශයෙන් පිටත් ව පැමිණි දා සිට අද දක්වා,
නොකඩවා මම මාගේ සේවකයන් වූ දිවැසිවරුන්
ඔවුන් වෙත එවීමි. 26 එහෙත්, ඔවුන් සවන් දුන්නේ
වත්, කන් යොමු කළේ වත් නැත. ඒ වෙනුවට
ඔව්හු මුරණ්ඩු වී ඔවුන්ගේ පියවරුන්ටත් වඩා
නපුරුකම් කළෝ ය.
27 'ජෙරමියා, නුඹ මේ සියලු වචන ඔවුන්ට කතා
කර කියන නමුත්, ඔව්හු නුඹලාට සවන්
නොදෙන්නෝ ය. නුඹ ඔවුන්ට අඬගසන නමුත්,
ඔව්හු නුඹට උත්තර නොදෙන්නෝ ය. 28 එබැවින්
ඔව්හු තමන්ගේ දෙවි ස්වාමීන් වහන්සේගේ හඬට
කන් නුදුන්, දැනුමැතිකම නොපිළිගත් ජාතියකි;
සත්‍යය ඔවුන් තුළ නැත. ඒ සියල්ල ම ඔවුන්ගේ
මුඛයෙන් අතුරුදහන් වී ඇතැ'යි කියන්න."

### හින්නොම් මිටියාවතේ පාපී ක්‍රියා

29 "ජෙරුසලම් ජනයෙනි, නුඹලාගේ හිසකෙස් කපා
ඉවත දමා, පාළු කඳු උඩ විලාපයක් නඟන්න. මන්ද,
ස්වාමීන් වන මම, මාගේ කෝපයට ලක් වූ මේ
පරම්පරාව ප්‍රතික්ෂේප කර අත්හළෙමි. 30 ජුදාවේ
සෙනඟ මාගේ ඇස් හමුයෙහි නපුරු දේ කර ඇත.
ඔවුන් මාගේ නාමය දරන මාලිගාවේ මා පිළිකුල්
කරන ඔවුන්ගේ දේව රූප තබා එය දූෂ්‍ය කර ඇත.
මෙසේ කියන්නේ ස්වාමීන් වන මම ය. 31 ලෙවී
18:21; 2 රාජා 23:10; ජෙරෙ 32:25ඔවුන් තමන්ගේ
දරුදැරියන් හින්නොම් දෙවියාට පූජා කරන පිණිස,
බෙන්-හින්නොම් මිටියාවතේ තෝපෙතේහි ගිරිකුළු
දේවාලයක් ගොඩනඟා ඇත. එසේ කරන්නට මා
ඔවුන්ට අණ කළේ නැත; ඒ ගැන මා සිතුවේ වත්
නැත. 32 ඒ නිසා, එයට තෝපෙතේ කියා වත්, බෙන්-
හින්නොම් මිටියාවත කියා වත් නොකියන කාලය
පැමිණෙන්නේ ය. එයට 'ඝාතනයේ මිටියාවත ය'යි
කියනු ලැබේ. මන්ද, වළලන්නට ඉඩ නැති වන තරම්
තෝපෙතේහි මිනී වළලනු ලබන බැවිනි. 33 මේ
සෙනඟගේ මළකඳන් අහසේ පක්ෂීන්ටත්,
පොළොවේ මෘගයන්ටත් ගොදුරු වන්නේ ය. උන්
එළවාදමන්නට කිසිවෙක් නොසිටිති. 34 ජෙරෙ 16:9;
25:10; එළිද 18:23එවිට මම ජුදා නගරවලිනුත්,
ජෙරුසලමේ වීදිවලිනුත් ප්‍රීති ප්‍රමෝද හඬ ද
මනාල මනාලියන්ගේ කටහඬ ද නතර කරන්නෙමි.
දේශය පාළුකරයක් වන්නේ ය.
8 "ඒ කාලයේ දී ජුදා රජවරුන්ගේත්,
අධිපතීන්ගේත්, පූජකයන්ගේත්,
දිවැසිවරුන්ගේත්, ජෙරුසලම් වැසියන්ගේත් ඇටකටු
සොහොන් ගෙවලින් එළියට ගෙනෙනු ලබන්නේ ය.
මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය. 2 ඒ
ඇටකටු, ඒ අය ප්‍රේම කොට සේවය කළ, පසුපස
ගොස් පේන අසා නමස්කාර කළ, ඉරත් සඳත්
අහසේ සෙසු ආකාශ වස්තූත් ඉදිරියේ අතුරා තබනු
ඇත. ඒවා එකතු කොට වළලනු වෙනුවට, පොළොව
මතුපිට කසළ වන්නේ ය. 3 මේ නපුරු
පරම්පරාවෙන් ඉතිරි වන මා විසින් විසුරුවා හරින
ලද තැන්වල ඉතිරි ව සිටින අය, ජීවත් වීමට වඩා
මැරෙන්නට කැමැති වනු ඇත. මෙසේ පවසන්නේ
සියලු බලැති ස්වාමීන් වන මම ය."

### පාපය හා ඊට දඬුවම

4 සෙනඟට කියන ලෙසෙ සමිඳාණන් වහන්සේ මට
මෙසේ වදාළ සේක: "වැටෙන අය නැඟිටින්නේ නැද්
ද? නොමඟ ගිය අය හැරී එන්නේ නැද් ද? 5 එසේ
නම් ජෙරුසලම් ජනයෙනි, නුඹලා මා කෙරෙන් ඉවත්
ව ගියේ මන් ද? නිරන්තරයෙන් ම ඉවත් ව යන්නේ
මන් ද? මායාවට වසඟ වී; 'අප ආපසු හැරී එන්නේ
නැතැ'යි නුඹලා කියන්නහු ය. 6 මම සාවධාන ව
සවන් දිනිමි. එහෙත්, නුඹලා සැබෑව කතා නොකළහු
ය. 'මා කළේ කුමක් ද' කියා අසමින්, තමාගේ
දුෂ්ටකම ගැන පසුතැවිලි වන කිසිවෙකේ මෙහි නැත.
අශ්වයා යුද්ධයට වේගයෙන් දුවන සේ ඔව්හු
සියල්ලෝ ම තමන් රිසි මඟට හැරී දුවති. 7 අහසේ
ඉගිලෙන මානකොකා ඔබමොබ යනෙන කාලය
දනියි; කොබෙයියා ද වැහිලිහිණියා ද කොකා ද
ආපසු පැමිණීමේ කාලය දැන සිටිති. එහෙත් මාගේ
සෙනඟ, නුඹලා මාගේ අණපණත් නොදන්නහු ය.
8 'අපි ප්‍රඥාවන්තයෝ ය; සමිඳාණන් වහන්සේගේ
ව්‍යවස්ථාව අප වෙත ඇත්තේ ය'යි නුඹලා
කියන්නේ කොහොමෙ ද? බලන්න, වංක
විනයධරයන් ව්‍යවස්ථාව බොරු කර ඇත.
9 නුඹලාගේ ප්‍රඥාවන්තයෝ ලජ්ජාවට පැමිණ අසු
වී කැළඹී සිටිති. ඔව්හු මාගේ වචන එපා කළෝ ය.
ඔවුන් තුළ ඇති ප්‍රඥාව කුමක් ද? 10 ජෙරෙ
6:12-15එබැවින් ඔවුන්ගේ භාර්යාවන් අන්‍යයන්ට ද
ඔවුන්ගේ කෙතේ ඒවා අල්ලාගන්න අයට ද දෙන්නෙමි.
මන්ද, ලොකු කුඩා අය සැවොම අයුතු ලාභ ගැනීමට
කෑදර වෙති; දිවැසිවරුන් පටන් පූජකයන් දක්වා
සියල්ලෝ ම වංචාකම් කරති. 11 එසකි 13:10සාමය
නැති විටත්, 'සාමය, සාමය' කියමින් ඔව්හු මාගේ
සෙනඟගේ තුවාළයට මතුපිටින් පිළියම් කරති.
12 මාගේ සෙනඟෙනි, මා පිළිකුල් කරන දේ නුඹලා
කළ නිසා ලජ්ජා වූවහු ද? නැත. නුඹලා කොහෙත් ම
ලජ්ජා වුණේ වත්, නුඹලාට නින්දාව දැනුණේ වත්
නැත. ඒ නිසා, නුඹලා වැටෙන්නන් අතරෙහි වැටෙනු
ඇත; නුඹලාට දඬුවම් පැමිණෙන කාලයේ දී නුඹලා
පැකිළ වැටෙනු ඇත. මෙසේ පවසන්නේ ස්වාමීන්
වන මම ය.
13 "මිදි වැලේ මිදි පල නැති, අත්තික්කා ගසේ
ගෙඩි නැති, කොළ පවා වියළී ඇති, ඔවුන්ට දුන් දේ
පහ ව ගොස් ඇති සමයේ මම ඔවුන් රුස්
කරන්නෙමි."
14 සෙනඟ මෙසේ අසති. "අපි කුමට නිකම් හිඳිමු
ද? අපි එක්රැස් වී, පවුරු ඇති නගරවලට වැද එහි
මැරෙමු. අප සමිඳාණන් වහන්සේට විරුද්ධ ව පව්
කළ නිසා, අපේ දෙවි ස්වාමීන් වහන්සේ අප
විනාශයට පත් කොට, අපට බීමට වස දිය දී ඇත.
15 අපි සාමය පැතුවෙමු; එහෙත්, එයින් කිසි වැඩක්
නො වී ය. සුව වීමේ කාලයක් ගැන බලා සිටියෙමු.
එහෙත්, පැමිණ ඇත්තේ භීතිය පමණි. 16 දාන්හි සිට

අප සතුරන්ගේ අශ්වයන්ගේ හුංකාරය අපට
ඇසුණේ ය; උන්ගේ හේෂාරවයට මුළු දේශය
වෙව්ළයි. ඔවුන් ඇවිත් සිටින්නේ දේශය සහ එහි
තිබෙන සියල්ල ද නගර සහ එහි වසන වැසියන් ද
විනාශ කරන පිණිස ය."
17 සමිඳාණන් වහන්සේ කතා කොට, "මෙන්න,
මම කිසි මන්ත්‍රයකට වශී නොවන සර්පයන් ද
පොළඟුන් ද නුඹලා අතරට එවන්නෙමි, උන් නුඹලාට
දෂ්ට කරනු ඇතැ"යි වදාළ සේක.

### සෙනඟ ගැන ජෙරමියා තැවීම

18 අහෝ! මාගේ දුක සංසිඳුවන්නට බැරි තරම් ය;
මාගේ සිත කම්පා වී ඇත. 19 සවන් දෙන්න, දේශය
මුළුල්ලේ මාගේ සෙනඟ මොරගසමින්, "සමිඳාණන්
වහන්සේ සියොන්හි නැද් ද? සියොන්හි රජතුමා එහි
නැද්දැ"යි අසන හඬ දස දෙසින් මට ඇසේ.
ඔවුන්ගේ රජ්ජුරුවන් වන සමිඳාණන් වහන්සේ
පිළිතුරු දෙමින්, "නුඹලා තමන් කැපූ පිළිමවලින් ද
විදේශිකයන්ගේ නිෂ්ඵල රූපවලින් ද කුමට මා
කෝප කළහු දැ"යි අසන සේක. 20 සෙනඟ පිළිතුරු
දෙමින්, "අස්වැන්න නෙළෙන කාලය පසු විය; ග්‍රීෂ්ම
කාලය කෙළවර විය; එහෙත්, අපට ගැළවීම ලැබී
නැතැ"යි කියන්නෝ ය.
21 "මාගේ සෙනඟගේ තුවාළය නිසා මම තුවාළ
ලැබ ශෝකයට පත් ව සිටිමි. මම අන්ත
වියවුල්කමට ලක් වී සිටිමි. 22 ගිලියද්හි ගුගුල් නැද්
ද? එහි වෙදෙක් නැද් ද? මාගේ සෙනඟ සුවය ලබා
නැත්තේ මන්දැ"යි සමිඳාණන් වහන්සේ අසන
සේක.

### වංචාව හා ද්‍රෝහිකම

9 අහෝ! මැරුම් කෑ මාගේ සෙනඟ ගැන දිවා රෑ
දෙකේහි හැඬීමට මාගේ හිස පොකුණක් ද
මාගේ ඇස් කඳුළු උල්පතක් ද වූවොත් මම කැමැති
ය. 2 අහෝ! මාගේ සෙනඟ අත්හැර මා ඔවුන්ගෙන්
ඈත් වී සිටින්නට මට පාළුකරයෙහි වාසස්ථානයක්
ඇත්නම්! මාගේ සෙනඟ කාමමිථ්‍යාචාරිකයෝ ය;
ද්‍රෝහිකාර පිරිසක් ය. 3 සත්‍යය වෙනුවට, දේශය
පුරා වේගයෙන් පැතිර යන බොරුවට ඔවුන්ගේ දිව්
දුන්නක් මෙන් නැමී යයි. සමිඳාණන් වහන්සේ කතා
කොට, "ඔව්හු නපුර පිට නපුර කර මා
නොහඳුනති"යි වදාරන සේක. 4 ඔබ එකිනෙකා තම
තමාගේ අසල්වැසියාගෙන් ප්‍රවේසම් වන්න; කිසි
සහෝදරයකු ද විශ්වාස නොකරන්න. මන්ද, හැම
සහෝදරයෙක් ම ප්‍රයෝගකාරයෙකි; හැම
අසල්වැසියකු ම කේළාම් කියමින් ඇවිදිනු ඇත.
5 ඔවුන් එකිනෙකා තම තමාගේ අසල්වැසියා රවටනු
ඇත. කිසිවෙක් ඇත්ත කතා නොකරති. බොරු කීමට
ඔව්හු පුරුදු වී සිටිති; ඔව්හු අපරාධ කරති. එහෙත්,
පසුතැවී සිත් හරවා ගැනීමට නොවෙහෙසෙති.
6 ඔව්හු අපරාධය පිට අපරාධය ද වංචාව පිට
වංචාව ද කරති. "මාගේ සෙනඟ මා
නොපිළිගනිති"යි සමිඳාණන් වහන්සේ වදාරන
සේක.
7 මේ නිසා සියලු බලැති සමිඳාණන් වහන්සේ
මෙසේ වදාරන සේක: "මම ඔවුන් ලෝහ මෙන් උණු
කර, පිරිසිදු කර පරීක්ෂා කර බලන්නෙමි. මාගේ
සෙනඟ සම්බන්ධයෙන් මම වෙන කුමක් කරම් ද?
8 ඔවුන්ගේ දිව් මාරක ඊගස් වැනි ය. ඒවා
කියන්නේ බොරු ම ය. ඔවුන්ගේ මුව අසල්වැසියාට
සාමයෙන් කතා කරන නමුත්, තමන්ගේ සිත් තුළ
සතුරු උපායයන් යොදයි. 9 මේ කරුණු නිසා ඔවුන්ට
දඬුවම් නොකර මට සිටිය හැකි ද? මෙවැනි
ජාතියකින් පළි නොගෙන මට, සිටිය හැකි ද? මෙසේ
පවසන්නේ ස්වාමීන් වන මම ය."
10 ජෙරමියා මෙසේ කී ය: "කඳු ගැන ඇඬීමක් ද
විලාපයක් ද පාළුකරයේ තණ බිම් ගැන ළතෝනියක්
ද ගයන්නෙමි. කිසිවකුට එහි ගමන් කළ නොහැකි
වන ලෙස ඒවා වියළී ගොස් ඇත. එහි සිවුපාවුන්ගේ
හඬ නෑසෙන්නේ ය. අහසේ පක්ෂීන් ද මෘගයන් ද
පලා ගොස් ඇත." 11 සමිඳාණන් වහන්සේ කතා
කොට, "මම ජෙරුසලම නටබුන් ගොඩක් ද
සිවලුන්ගේ වාසයක් ද කරන්නෙමි; කිසිවකුට
වාසය නොකළ හැකි ලෙස මම ජුදාහි නගර පාළු
කරන්නෙමි"යි වදාළ සේක.
12 ජෙරමියා කතා කරමින්, "ස්වාමීනි, දේශය
නටබුන් ගොඩක් වී තිබෙන්නේත්, කිසිවකුට ඒ
මැදින් ගමන් නොකළ හැකි ලෙස කාන්තාරයක් මෙන්
පාළු වී ගොස් ඇත්තේත් මන් ද? මෙය
තේරුම්ගන්නට පුළුවන් ප්‍රඥාවන්තයා කවරෙක් ද?
අනුන්ට එය කියන්නට පුළුවන් වන පිණිස ඔබ
වහන්සේ එය ප්‍රකාශ කළේ කාට දැ"යි ඇසුවේ
ය.
13 සමිඳාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන් සේක:
"මෙය සිදු වූයේ, මා ඔවුන්ට දුන් මාගේ ආඥාව
ඔවුන් ප්‍රතික්ෂේප කර මාගේ හඬට කීකරු නොවූ
නිසාත්, 14 ඒ අනුව නොහැසිර මුරණ්ඩුකමින්
තමන්ගේ හිතුමතය අනුව ගමන් කළ නිසාත්,
ඔවුන්ගේ පියවරුන් ඔවුන්ට ඉගැන්වූ ලෙස බාල්
දෙවියන් පසුපස්සේ ගිය නිසාත් ය. 15 එබැවින්
ඉශ්‍රායලේවරුන්ගේ දෙවිඳුන් වන, සියලු බලැති
ස්වාමීන් වන මම මෙසේ පවසමි. මම මේ සෙනඟට
කොසඹ පල කවන්නෙමි; විස දිය පොවන්නෙමි.
16 ඔවුන් වත්, ඔවුන්ගේ පියවරුන් වත් දැන
නොගත් ජාතීන් අතරට ඔවුන් විසුරුවා හැර, ඔවුන්
සහමුලින් ම නැති කරදමන තුරු මම ඔවුන්
පසුපස්සේ යුද්ධ සේනා යවමි."

### සෙනඟ පිහිට ඉල්ලා මොරගැසීම

17 "නුඹලා කල්පනා කොට අවමඟුල් ගී ගයන්න
දක්ෂ, විලාප කියන ස්ත්‍රීන්ට එන්න කියා
යවන්නැ"යි සියලු බලැති දෙවියන් වහන්සේ වදාරන
සේක. 18 සෙනඟ පිළිතුරු දෙමින්, "අපේ ඇස්වලින්
කඳුළු වැගිරෙන පිණිසත්, ඇසිපියවලින් වතුර ගලන
පිණිසත් අප ගැන ළතෝනියක් පවත්වන ලෙස

ඔවුන්ට කියන්නැ”යි කියති. 19 මන්ද, “අපි විනාශ
වුණාමෙු; අප දේශය අත්හැර ගිය නිසා ද ඔවුන්
අපගේ වාසස්ථාන හළොදැමූ නිසා ද අපි නින්දාවට
පත් ව සිටිමු” යන ළතෝනිය සියොන් කරෙනේ
ඇසුණේ ය. 20 ජරෙමියා මසෙේ කී ය: “ස්ත්‍රීවරුනි,
සමිඳාණන් වහන්සේගේ බසට සවන් දී උන්
වහන්සේගේ වචන සිතට ගනෙ, නුඹලාගේ
දූවරුන්ට ළතෝනි කීමත්, එකිනකොට තම තමාගේ
අසල්වැසි ස්ත්‍රියට විලාප කීමත් උගන්වන්න.
21 මන්ද, වීදිවල ළමයින් ද කඩ මණ්ඩිවල තරුණයන්
ද වනසමින් මරුවා අපගේ ජනේල සමීපයට ද
නිවාසවලට ද ඇතුළු වී ඇත. 22 මළසිරුරු පොහොර
ගොඩවල් මනේ ද ගොයම් කපන්නන් ඉතිරි කර ගිය
ගොයම් මිටි මනේ ද විසුරුවනු ලබන විට කිසිවකු
ඒවා එකතු කරන්නේ නැත. සමිඳාණන් වහන්සේ
මට ප්‍රකාශ කරන්නට කී දේ මේ ය.”
23 සමිඳාණන් වහන්සේ මසෙේ වදාරන සේක:
q2 23 “නැණවතා තමාගේ නුවණ ගැන වත්, බලවතා
තමාගේ බලය ගැන වත්, ධනවතා තමාගේ ධනය
ගැන වත් පාරට්ටු කර නොගනී වා!
24 1 කොරි 1:31; 2 කොරි 10:17 පාරට්ටු
කරගන්නට යමකේ කැමැති නම්, ඔහු, මා
දැනහැඳිනීම ගැන පාරට්ටු කරගනී වා.
q2 24 මන්ද, පොළොව කරුණාවනේ ද යුක්තියනේ ද
දැමිටුකමනේ ද පාලනය කරන සමිඳාණන් වහන්සේ
මා බව ඔව්හු දැනගනිත් වා!
q2 24 මන්ද, මා ප්‍රිය කරන දේ මේ ය.
q2 24 මසෙේ පවසන්නේ ස්වාමීන් වන මම ය.”
25 “ගතහෙි චර්මඡේදනය කරනු ලැබූ නමුත්,
සිතහෙි පාප මල ඡේදනය නොකර සිටින සියලු
දනොට මා දඬුවම් කරන කාලය පැමිණනේනේ ය.
26 ඒ අය නම්: මිසරය, ජුදාව, ඒදොමේ, අම්මොන්,
මෝවබ් යන රටවල සිටින අය ද කාන්තාරයේ
වාසය කරන හිසකේ කොටට කැපූ අය ද වෙති.
මේ සියලු දනො ද ඉශ්රායලේ වැසියන් සියලු දනො
ද සිතහෙි පාප මල ඡේදනය නොකළ අය ය.”

## රූප වන්දනාව හා සැබෑ නමස්කාරය

10 එම්බා ඉශ්රායලේ වංශය, සමිඳාණන්
වහන්සේ ඔබ හැමට වදාරන වචන අසන්න.
2 සමිඳාණන් වහන්සේ මසෙේ වදාරන සේක:
“විජාතීන්ගේ මාර්ගය අනුගමනය නොකරන්න;
අහසේ ලකුණුවලට ජාතීන් කැළඹනෙ නමුත්, නුඹලා
ඒවාට නොකැළඹනේන. 3 ජාතීන්ගේ චාරිත්‍ර
නිෂ්ඵල ය. විජාතීන්ගේ කැපූ රූප පුහු දේවල් ය.
ඒවා වනයේ ගසකින් කපාගත් ලී පමණකි. ලී
කැටයම් කරුවකේ ඒවා සිය ආයුධවලින් නළෙයි.
4 ඔහු ඒවා රන් රිදීයනේ සරසා මිටියනේ ඇණ ගසා,
නොසලේවනෙ ලසෙ සවි කරයි. 5 ඒවා වනාහි
කැකිරි වත්තක සිටුවා ඇති, කතා කරන්නට බැරි
පඹයන් වැනි ය. ඒවාට ඇවිදින්නට බැරි නිසා
ඔසවාගනෙ යා යුතු ය. ඒවාට බිය නොවන්න; මන්ද,
නුඹලාට අනතුරක් කරන්න වත් යහපතක් කරන්න
වත් ඒවාට බැරි ය.”
6 සමිඳුනි, ඔබට සම කිසිවකේ නැත.
q2 6 ඔබ පරාක්‍රමවත් ය.
q2 6 ප්‍රබලතාවනේ ඔබගේ නම උතුම් ය.
7 එළිද 15:4 ජාතීන්ගේ නිරිඳාණනි, ඔබට බිය
නොවන්නේ කවරේ ද?
q2 7 බිය විය යුත්තේ ඔබට පමණ ය.
q2 7 ජාතීන් අතර ද සියලු රාජ්‍යයන්හි ද සියලු
පැණවතුන් අතර ද ඔබට සම කිසිවකේ නැත.
8 ඔව්හු හැම දනෙ අඥාන ය, මෝඩ ය.
q2 8 ඒ ලී පිළිමවලින් උගත හැකි දයෙක් ඇද් ද?
9 තර්ෂිෂ් රටනේ ගනො රිදී තහඩුවලින් ද ඕෆීර්
රටනේ ගනො රත්‍රන්වලින් ද ඒ රූප සාදා ඇත.
q2 9 ඒවා සාදා ඇත්තේ, කැටයම්කරුවන්ගේ හා
රන්කරුවන්ගේ අතින් ය.
q2 9 ඒවා දක්ෂ කම්කරුවන් විසින් නිල් හා දම්
පැහැති රාජකීය ඇඳුමනේ පළඳවනු ලැබ ඇත.
10 එහතේ, සමිඳාණෝ සැබෑ දවේඳාණෝ ය;
q2 10 ජීවමාන දවේ තුමාණෝ ය;
q2 10 සදාකාල රජ තුමාණෝ ය.
q2 10 එතුමන්ගේ උදහසට පොළොව වවුෙළයි.
q2 10 එය දරන්නට හැකි ජාතියක් මිහි පිට
නොවයෙි.
11 අහසත්, පොළොවත් නොමැවූ මේ දවේවරු මිහි
පිටින් ද අහස යටින් ද විනාශ කරනු ලබති යි
මාගේ සනෙඟ වන ඔබ ජාතීන්ට කිව යුතු ය.
12 සමිඳාණෝ සිය බලයනේ පොළොව මැවූ සේක;
q2 12 සිය ඥානයනේ ලෝකය පිහිටවූ සේක;
q2 12 සිය නුවණින් අහස පැතිරවූ සේක.
13 සමිඳුන්ගේ අණින් අහස් ජලය ගිගුරුම් දයෙි;
q2 13 පොළෝ සීමාවලින් මීදුම සෑදී නැඟී එයි;
q2 13 එතුමාණෝ, වර්ෂාව සඳහා විදිලි කටේම් ඇති
කරන සේක;
q2 13 එතුමාණෝ සිය ගබඩාවලින් සුළඟ ගනෙනෙ
සේක.
14 මේ නිසා සියලු මනුෂ්‍යයෝ අනුවණ මෝඩයෝ
වෙති.
q2 14 සියලු රන්කරුවෝ තමන් නළෙූ රූප නිසා
ලජ්ජාවට පැමිණ සිටිති.
q2 14 ඒවා පණ නැති හිස් පිළිම වන බැවිනි.
15 ඒවා නොවටින නිසරු වැඩ වයෙි.
q2 15 දඬුවම් කිරීමට සමිඳුන් පැමිණි විට ඒවා විනාශ
කරදමනු ඇත.
16 ජාකොබ්ගේ දවේඳාණෝ ඒවාට සමාන නැත;
q2 16 සියලු දේ මවා ඇත්තේ එතුමාණෝ ය;
q2 16 ඉශ්රායලේ සනෙඟ එතුමාණන් තෝරාගත්
සනෙඟ ය.
q2 16 සව් බලැති සමිඳාණෝ යනු එතුමාණන්ගේ
නාමය වේ.

## පැමිණෙන විප්‍රවාසය

17 "වටලනු ලැබ සිටින ජෙරුසලම් ජනයෙනි,
නුඹලාගේ බඩු පොදි බැඳගන්න. 18 මන්ද,
සමිඳාණන් වහන්සේ මේ දේශයෙහි වැසියන් පිටමං
කරන්න යන සේක. නුඹලාට දැනෙන ලෙස උන්
වහන්සේ නුඹලා විනාශ කරන්න යන සේක. මෙසේ
පැවසුවේ සමිඳාණන් වහන්සේ ය." 19 ජෙරුසලම්
සෙනඟ කෑගසමින් මෙසේ කියති: "අහෝ! අපේ
පීඩාව කොපමණ බරපතල ද? අපේ තුවාළ සුව කළ
නොහැකි ලෙස දරුණු ය. එහෙත්, 'අප ඒවා ඉවසිය
යුතු යැ'යි අපි කීවෙමු. 20 අපේ කූඩාරම් නාස්ති විය:
ඒවායේ ලණු සියල්ල ද කඩාදමනු ලැබී ය. අපේ
දරුවන් අප අත්හැර, අප කරෙන් වෙන් වී ගොස්
ඇත. දැන් අපේ කූඩාරම් දිගහැර තිර එල්ලන්න
කිසිවෙක් නැත."
21 ජෙරමියා පිළිතුරු දෙමින් මෙසේ කී ය: "ඔබේ
නායකයෝ මෝඩයෝ ය. ඔව්හු සමිඳාණන්
වහන්සේගෙන් කරුණු නොවිමසති. ඔවුන් දියුණු
නොවුණේ එබැවිනි. ඔවුන්ගේ බාරයේ සිටි සෙනඟ
ද විසිර ගොස් ඇත. 22 සවන් දෙන්න, අන්න, ජුදා
නගර පාළුවක් ද සිවලුන්ගේ වාසයක් ද කිරීමට යන
බවට දූසමාන කතාවක හඬක් ද මහා ඝෝෂාවක් ද
උතුරු දේශයෙන් ඇසෙන්නේ ය. 23 සමිඳුනි,
මිනිසාගේ සරණ මිනිසා ම නොවන බවත්, ඔහු යා
යුතු මඟ නියම කිරීම ඔහුට ම අයිති නැති බවත්
ඔබ දන්න සේක. 24 සමිඳුනි අප විනාශ නොවන
පිණිස, ඔබේ උදහසින් නොව, නිසි ප්‍රමාණයෙන්
අපට දඬුවම් කළ මැනව. 25 ඔබ නොපිළිගන්න
ජාතීන් කෙරෙහි ද ඔබට යාච්ඤා නොකරන මිනිසුන්
කෙරෙහි ද ඔබේ කෝපය වැගිරෙව්ව මැනව. මන්ද,
ඔව්හු යාකොබ්ගේ වංශය මරාදැමූ හ; ඔවුන්
සහමුලින් ම විනාශ කළහ. ඔවුන්ගේ දේශය
නැතිනාස්ති කළහ."

## කඩන ලද ගිවිසුම

11 සමිඳාණන් වහන්සේගෙන් ජෙරමියා වෙත
පැමිණි පණිවුඩය මෙසේ ය: 2 "මේ
ගිවිසුමේ නියමයන්ට සවන් දෙන්න. ජුදාහි
මිනිසුන්ටත්, ජෙරුසලමේ වැසියන්ටත් කතා කරන්න.
'මේ ගිවිසුමේ නියමයන්ට කීකරු නොවන අයට
3 ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවි ස්වාමීන් වහන්සේ සාප
කර ඇතැ යි සමිඳාණන් වහන්සේ වදාරන සේකැ'යි
කියන්න. 4 මා ඔවුන්ගේ පියවරුන්, යකඩ ගිනි
උදුනක් වැනි මිසර දේශයෙන් පිටත ගෙනා කල,
ඔවුන් සමඟ කළ ගිවිසුම මෙය වේ. 'මාගේ
වචනයට කීකරු වී මා අණ කරන සියල්ල ඉටු
කරන්න; එවිට නුඹලා මාගේ සෙනඟ වන්නහු ය.
මම නුඹලාගේ දෙවියන් වහන්සේ ද වන්නෙමි'යි මම
ඔවුන්ට කීවෙමි. 5 එවිට ඔවුන්ගේ පියවරුන්ට කිරි
හා පැණි ගලා යන දේශය දැන් තිබෙන පරිදි දීමට
මා දිවුරා කළ පොරොන්දුව ඉටු කරන්නෙමි."
ජෙරමියා, "එසේ ය, ස්වාමීනි"යි පිළිතුරු දුන්නේ ය.
6 එවිට සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ
සේක: "ජුදා නගරවලටත්, ජෙරුසලමේ වීදිවලටත්
ගොස් මාගේ පණිවුඩය එහි ප්‍රකාශ කරන්න.
එනම්, මාගේ ගිවිසුමේ නියමයන්ට සවන් දී ඒවාට
කීකරු වන්න සෙනඟට කියන්න. 7 මා ඔවුන්ගේ
පියවරුන් මිසර දේශයෙන් ගෙනා දින පටන් අද
දක්වා නොකඩවා මම ඔවුන්ට අවවාද කර, මාගේ
හඬට කීකරු වන්නැ යි සැබැවින් ම වදාළෙමි.
8 එහෙත්, ඔවුන් කීකරු වුණේ වත්, සවන් දුන්නේ
වත් නැත. ඒ වෙනුවට ඔව්හු තමන්ගේ නපුරු
සිත්වල මුරණ්ඩුකමේ හැටියට හැසුරුණෝ ය.
'මාගේ ගිවිසුමට කීකරු වන්නැ'යි මා ඔවුන්ට අණ
කළ නමුත්, ඔවුන් ඊට කීකරු වුණේ නැත. ඒ නිසා
ගිවිසුමේ විස්තර කොට ඇති දඬුවම් මම ඔවුන් පිට
පැමිණෙව්වෙමි."
9 තවද, සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ
සේක: "ජුදාවේ සෙනඟ හා ජෙරුසලමේ වැසියෝ මට
විරුද්ධ ව කැරලි ගසති. 10 මාගේ වචනවලට කීකරු
නොවූ ඔවුන්ගේ පියවරුන්ගේ පාපවලට ඔව්හු ද
වැටී සිටිති. ඔවුන් අන් දෙවිවරුන් අනුගමනය කර,
ඔවුන්ට නමස්කාර කර ඇත. ඉශ්‍රායෙලේ වංශය හා
ජුදා වංශය මා ඔවුන්ගේ පියවරුන් හා සමඟ කළ
ගිවිසුම කඩ කර ඇත. 11 එබැවින් සමිඳාණන්
වහන්සේ මෙසේ වදාරන සේක: මම ඔවුන්ට
ගැළවෙන්න බැරි විපතක් ඔවුන් පිට පමුණුවන්නෙමි.
ඔවුන් මට මොරගැසුවත්, මම ඔවුන්ට සවන්
නොදෙමි. 12 එවිට ජුදා සෙනඟ ද ජෙරුසලමේ
වැසියන් ද ඔවුන් සුගන්ධ ද්‍රව්‍ය ඔප්පු කරන
දෙවිවරුන් වෙත ගොස් මොරගසනු ඇත. එහෙත්,
මේ විපත පැමිණිවිට ඒ දෙවිවරුන්ට ඔවුන්
ගළවන්නට කොහෙත් ම නොහැකි ය. 13 ජුදාවේ
සෙනඟට, නගර ඇති තරමට දෙවිවරුත් සිටිති;
නින්දිතයා නම් වූ බාල් දෙවියාට නමස්කාරය සඳහා
ජෙරුසලමේ වැසියන් ඔවුන්ට ඇති වීදි තරමට,
පූජාසන ද පිහිටුවා ඇත. 14 ඒ නිසා ජෙරමියා, නුඹ
මේ සෙනඟ උදෙසා යාච්ඤා නොකරන්න; ඔවුන්
වෙනුවෙන් කන්නලව් ද යැදුම් ද ඔප්පු නොකරන්න.
ඔවුන් විපත්ති කාලයේ දී මට යාච්ඤා කරන විට
මම ඔවුන්ගේ වචන නොඅසන්නෙමි.
15 "මා ප්‍රේම කරන සෙනඟ නපුරු ක්‍රියා කරති.
මාගේ මාලිගාවේ සිටීමට ඔවුන්ට ඇති අයිතිය
කුමක් ද? බාරහාර ඔප්පු කිරීමෙන් හා සතුන් පූජා
කිරීමෙන් විපතෙන් බේරෙන්න පුළුවනැ යි ඔව්හු
සිතත් ද? ඒ මඟින් තමන්ට පවිත්‍ර විය හැකි යැ යි
ඔව්හු සිතත් ද? 16 කදිම පල ඇති, අලංකාර, සරු
ඔලීව ගසක් යයි මම ඔවුන් නම් කළෙමි. එහෙත්,
දැන් මම මේඝ ගර්ජනාවක් සේ ගොරවා ඒ ගසේ
කොළවලට ගිනි ලා දවාලමි. 17 ඉශ්‍රායෙලේ හා
ජුදාව ඉදි කළේ, සියලු බලැති ස්වාමීන් වන මම ය.
එහෙත්, මා දැන් ඔවුන්ට විපත්තිය නියම කර ඇත.
ඔවුන් බාල් දෙවියාට සුවඳ දුම් ඔප්පු කිරීමෙන් වැරදි
දේ කර තිබෙන නිසා, ඔවුන් මා කෝප කරවා ඇත."

### ජරෙමියා මැරීමට කුමන්ත්‍රණයක්

18 මාගේ සතුරන් මට විරුද්ධ ව කරන්න අදහස්
කළ නපුරු දේ ගැන සමිඳාණන් වහන්සේ මට දැන්වූ
බැවින් මම එය දැනගත්තෙමි. 19 මම, මරණයට
ගෙනයන හීලෑ බැටළු පැටවෙකු මෙන් සිටියෙමි; 'අපි
පල සමඟ ගස සිඳදමන ලෙස ඔහුගේ නම තවත්
ඉතිරි නොවන පිණිස ජීවත් ව සිටින්නන්ගේ
දේශයෙන් ඔහු නැති කර දමමු'යි ඔවුන් මට විරුද්ධ
ව උපා යෙදූ බව මම නොදැන සිටියෙමි.
20 ජරෙමියා යාච්ඤා කරමින්, "යුක්ති සහගත
ලෙස විනිශ්චය කරන, හෘදයත්, සිතත් විමසන සියලු
බලැති සමිඳුනි, මාගේ නඩුව මා ඔබ ඉදිරියේ තබා
ඇති බැවින් ඔවුන්ගෙන් ඔබ පළි ගනු දැකීමට මට
ඉඩ ලැබේ වා!"යි කී ය.
21 "ඔබ අප අතින් මරුමුවට පත් නොවන පිණිස
නම්, සමිඳාණන් වහන්සේගේ නාමයෙන් අපට දිවැස්
වැකි නොකියන්නැ"යි කියමින් ජරෙමියාගේ ප්‍රාණය
හානිකරන්නට සොයන අනාතොත්හි මිනිසුන් ගැන
සියලු බලැති සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන
සේක: 22 "මම ඔවුන්ට දඬුවම් කරන්නෙමි.
යෞවනයෝ කඩුවෙන් මැරුම් කන්නෝ ය; ඔවුන්ගේ
පුත්‍රයෝ ද දූවරු ද සාගතයෙන් මැරෙන්නෝ ය.
23 ඔවුන්ගෙන් කිසිවෙක් ද ඉතිරි නොවන්නේ ය.
මන්ද, මම අනාතොත්හි වසන මිනිසුන් පිට
විපත්තිය එනම්, ඔවුන් පිට දඬුවම් කිරීමේ අවුරුද්ද
පමුණුවන්නෙමි."

### දුදනන්ගේ සමෘද්ධිය ගැන ප්‍රශ්නය

12 ඔබට මාගේ නඩුව ඉදිරිපත් කරන විට,
සමිඳුනි, ඔබ සාධාරණය, යුක්තිය පිළිබඳ
කරුණු ගැන ඔබෙන් ප්‍රශ්න කරන්නට කැමැත්තෙමි.
q2
12 දුදනන්ට සැප සම්පත් අත්වන්නේ මන් ද?
q2
12 ද්‍රෝහීන් සඵල වන්නේ මන් ද?
2 ගසක් මෙන් ඔබ ඔවුන් හිටවූ සේක;
q2 2 ඔව්හු මුල් ඇද, වැඩී, සඵල වන්නෝ ය.
q2 2 මුවින් ඔව්හු ඔබ පසසති;
q2 2 සිතින් නම් ඔබෙන්, දුරු ව සිටිති.
3 එහෙත් සමිඳුනි, ඔබ මා දන්න සේක;
q2 3 ඔබ මා දකින සේක.
q2 3 ඔබට ඇති මාගේ ලැදිකම ද ඔබ විමසන
සේක.
q2 3 මරණයට නියමිත බැටළුවන් මෙන් මේ සෙනඟ
වෙන් කර, ඝාතන දවසට ඔවුන් සූදානම් කළ මැනව.
4 දේශය වේළී තිබෙන්නේත්, මුළු රටේ තණ
කොළ මැලවී යන්නේත් කොපමණ කාලයකට ද?
q2 4 එහි වැසියන්ගේ දුෂ්ටකම නිසා මෘගයෝ ද
පක්ෂීහු ද මිය යති.
q2 4 "ඔබ අපගේ අවසානය නොදකින සේකැ"යි ඔව්හු
කියති.
5 සමිඳාණෝ මෙසේ පිළිතුරු දුන් සේක:
q2 5 "නුඹ පයින් යන මිනිසුන් සමඟ තරඟයට දුවන
කල, ඔව්හු නුඹ වෙහෙසට පත් කළෝ නම්, නුඹ
අශ්වයන් සමඟ දුවන්නේ කෙසේ ද?
q2 5 අකුල් නැති දේශයක නුඹ වැටෙන්නෙහි නම්,
ජොර්දාන් වන ලැහැබෙහි නුඹට කුමක් සිදු වේ ද?
6 නුඹේ සහෝදරයෝ, නුඹේ ම පවුලේ අය, නුඹට
විරුද්ධ ව ද්‍රෝහිකම් කළෝ ය.
q2 6 ඔව්හු නුඹ ප්‍රසිද්ධියේ විවේචනය කළෝ ය.
q2 6 ඔවුන් නුඹ සමඟ හොඳින් කතා කළත් ඔවුන්
විශ්වාස නොකරන්න."

### සෙනඟ ගැන සමිඳුන්ගේ ශෝකය

7 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
q2 7 "මම මාගේ සෙනඟ අත්හැරියෙමි;
q2 7 මා තෝරාගත් දේශය මම ප්‍රතික්ෂේප
කළෙමි;
q2 7 මා ප්‍රේම කරන සෙනඟ මම සතුරන් අතට
පාවා දුන්නෙමි;
8 මා තෝරාගත් සෙනඟ වනගත සිංහයකු මෙන්
මට විරුද්ධ ව හැරී ඇත;
q2 8 කුරිරු ලෙස මට ගොරවා ඇත.
q2 8 එබැවින් මම ඔවුන්ට ද්වේෂ කළෙමි.
9 මා තෝරාගත් සෙනඟ වනාහි සතුරු ගිජු
පක්ෂීන්ගෙන් වට වූ උකුස්සෙකු වැන්න.
q2 9 වනයේ සියලු සතුනි, ගොදුරට රැස් වන්න.
10 එඬේරු බොහෝ දෙනෙක් මාගේ මිදි වත්ත
නාස්ති කළෝ ය;
q2 10 මාගේ කෙතේ පාගාදැමුවෝ ය;
q2 10 මාගේ ප්‍රියංකර දේශය පාළුකරයක් කළෝ ය.
11 එය පාළුකරයක් වී ඇත.
q2 11 එය පාළු වී මට මොරගසයි;
q2 11 එය කාන්තාරයක් වී ඇත.
q2 11 එහෙත්, කිසිවෙකු එය ගණන්ගන්නේ නැත.
12 නාස්තිකාරයෝ පාළුකරයේ ගස්කොළන් නැති
සියලු ම කඳුවලට පැමිණ සිටිති.
q2 12 සමිඳුන්ගේ කඩුවෙන් දේශය එක් කෙළවරක
පටන් අනෙක් කෙළවර දක්වා විනාශ කරනු
ලබන්නේ ය.
q2 12 එහි කිසිවෙක් සාමය නොදකිති;
q2 12 එහි ජීවත් විය නොහැකි ය.
13 මාගේ සෙනඟ තිරිඟු වපුළ නමුත්, කටු ගස්
කපාගත්හ;
q2 13 බොහෝ වෙහෙස වූ නමුත්, ඔව්හු ප්‍රතිඵල
නොලැබූ හ.
q2 13 සමිඳුන්ගේ බලවත් උදහස නිසා ඔවුන්ගේ
අස්වැන්න නිෂ්ඵල වී ඇත."

### අසල්වාසීන්ට සමිඳුන්ගේ පොරොන්දු

14 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
"මාගේ සෙනඟ වන ඉශ්රායලේට මා හිමි කර දුන්
දේශය නැතිනාස්ති කළ සියලු ම නපුරු
අසල්වැසියන්ට විරුද්ධ ව මට කරුණක් කියන්න ඇත.
මම ඔවුන්ගේ දේශයෙන් ඔවුන් උදුරාදමන්නෙමි.

ඔවුන්ගේ අතින් ජුදා දේශය බේරාගන්නෙමි.
15 තවද, මා ඔවුන් බේරාගත් පසු, මම යළිත්
ඔවුන්ට අනුකම්පා කොට, ඔවුන් එකිනෙකා
තමතමාගේ උරුමයටත්, තමතමාගේ දේශයටත්
පමුණුවන්නෙමි. 16 ඔව්හු මාගේ සෙනඟට බාල්
දෙවියා ගැන දිවුරන්නට ඉගැන්වූ පරිදි, මාගේ
සෙනඟගේ දහම් මඟ මුළු සිතින් පිළිගෙන, 'ජීවමාන
සමිඳාණන් වහන්සේගේ නාමයෙන් ය' කියා මාගේ
නමින් දිවුරන්නට ඉගෙනගන්නෝ නම්, ඔව්හු ද
මාගේ සෙනඟගේ කොටසක් වී සමෘද්ධිමත්
වන්නෝ ය. 17 එහෙත්, යම් ජාතියක් කීකරු
නොවන්නේ නම්, මම ඒ ජාතිය උදුරාදමා විනාශ
කරදමමි. මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය."

## හණ රෙද්ද ගැන උපමාව

13 සමිඳාණන් වහන්සේ මට කතා කොට, "නුඹ
ගොස් හණ රෙද්දක් මිලේට ගෙන නුඹේ
ඉඟටිය වටා එය ඇඳගන්න; එය වතුරේ
නොදමන්නැ"යි වදාළ සේක. 2 මම ද සමිඳාණන්
වහන්සේ මට වදාළ පරිදි හණ රෙද්දක් මිලේට
ගෙන එය ඉඟටිය වටා ඇඳගත්තෙමි. 3 එවිට
සමිඳාණන් වහන්සේ යළිත් මට කතා කරමින්,
4 "නුඹ මිලේට ගත්, නුඹේ ඉඟටිය වටා ඇඳගෙන
සිටින හණ රෙද්ද රැගෙන යුප්‍රටීස් ගඟ ළඟට
ගොස් එහි පර්වත විවරයක එය සඟවා තබන්නැ"යි
වදාළ සේක.
5 මම ද සමිඳාණන් වහන්සේ මට අණ කළ ලෙස
ගොස් යුප්‍රටීස් ගඟ ළඟ එය සඟවා තැබීමි.
6 කීප දවසකට පසු සමිඳාණන් වහන්සේ මට
කතා කොට, "යුප්‍රටීස් ගඟ ළඟට යළිත් ගොස්, එහි
සඟවා තබන්නට මා නුඹට අණ කළ හණ රෙද්ද
එතැනින් ගන්නැ"යි වදාළ සේක. 7 මම ද යුප්‍රටීස්
ගඟ ළඟට ගොස් හණ රෙද්ද සඟවා තැබූ තැනින්
එය සොයාගතිමි. එය නාස්ති වී වැදගැම්මකට නැති
වී තිබිණි.
8 එවිට සමිඳාණන් වහන්සේ මට කතා කරමින්
මෙසේ වදාළ සේක: 9 "මා ජුදා රටේ උඩඟුකම ද
ජෙරුසලමේ මහා උඩඟුකම ද විනාශ කරන්නේ මේ
අයුරින් ය. 10 මාගේ වචනයට සවන් නොදෙන,
තමන්ගේ සිතුමතේට මුරණ්ඩුකමින් හැසිරෙන, අන්
දෙවිවරුන්ට සේවය කරමින් නමස්කාර කරන පිණිස
ඔවුන් පසුපස දුවන, මේ දුෂ්ට සෙනඟ වැදගැම්මකට
නැති මේ හණ රෙද්ද හා සමාන වනු ඇත. 11 හණ
රෙද්ද ඉඟටිය වටා බැඳ ඇත්තකු මෙන්
ඉශ්‍රායලේහි සියලු සෙනඟ ද ජුදාහි සියලු සෙනඟ ද
මට බැඳී සිටින්න මම කරුණු සැලසීමි. මා එසේ
කළේ, ඔවුන් මාගේ සෙනඟ වී, මාගේ නාමයට
ප්‍රශංසාවක් ද ගෞරවයක් ද වන පිණිස ය. එහෙත්,
ඔව්හු මට කීකරු නොවූ හ."

## මිදියුස භාජනය ගැන උපමාව

12 "තවද ජෙරමියා, ඉශ්‍රායලේ සෙනඟට කතා
කොට, 'සියලු භාජන මුද්‍රික පානයෙන් පිරවිය යුතු
යයි නුඹලාගේ දෙවි ස්වාමීන් වහන්සේ වදාරන
සේකැ'යි කියන්න. ඔවුන් නුඹට කතා කොට, 'හැම
භාජනයක් ම මුද්‍රික පානයෙන් පුරවා තැබිය යුතු
බව අපි දනිමු'යි කියනු ඇත. 13 එවිට ස්වාමීන් වන
මා මේ දේශයේ සියලු ජනයාට එනම්, පූජකයන්ට
ද දිවැසිවරුන්ට ද දාවිත්ගේ පරපුරෙහි සියලු
රජවරුන්ට ද ජෙරුසලමෙහි සියලු වැසියන්ට ද වෙරි
වන තුරු මුද්‍රික පානය පොවන බව ඔවුන්ට
කියන්න. 14 ඉන්පසු මම ඔවුන්ගේ පියවරුන් ද
පුත්‍රයන් ද සියලු සෙනඟ ද එකිනෙකා සට්ටනය
කොට විනාශ කරන්නෙමි. ඔවුන් විනාශ නොවන
හැටියට මා ඔවුන්ට දයා වන්නේ වත්, කරුණා
කරන්නේ වත්, අනුකම්පා කරන්නේ වත් නැත."

## අහංකාරයට විරුද්ධ ව අවවාද

15 ඉශ්‍රායලේ ජනයෙනි, සමිඳාණෝ කතා කළ
සේක.
q215 අහංකාර නොවී එතුමාණන්ට සවන් දෙන්න.
16 ඔබ හැමගේ දෙවි සමිඳුන් අන්ධකාරය
පමුණුවන්න පෙර,
q216 ඔබ හැමගේ පාද අඳුරු කඳුවල පැකිළෙන්න
පෙර, ඔබ බලා සිටින ආලෝකය එතුමාණන්
ඝනාන්ධකාරය කරන්න පෙර, එතුමාණන්ට ගෞරව
කරන්න.
17 ඔබ සවන් නොදෙන්නෙහු නම්, ඔබේ අහංකාරය
නිසා මම රහසිගත ව හඬමි.
q217 සමිඳුන්ගේ සෙනඟ වහල්කමට ගෙනයනු ලැබූ
නිසා මම හඬා වැලපෙමි.
q217 බොහෝ සයින් කඳුළු වගුරන්නෙමි.
18 රජුට හා මවු බිසවට කතා කරමින්, "කිරුළු
හිසින් ගිලිහී වැටී ඇති නිසා සිහසුනින් බැස පහතට
එන්නැ"යි සමිඳාණෝ වදාළ සේක.
19 දකුණු දිශාවේ නගර වටලා ඇත;
q219 ඒවාට පිවිසෙන්නට කිසිවකුට නොහැකි ය.
q219 මුළු ජුදා රට වහල්කමට ගෙන ගොස් ඇත;
q219 සහමුලින් ම එසේ ගෙන ගොස් ඇත.
20 ජෙරුසලම් ජනයෙනි, ඇස් ඔසවා බලන්න;
q220 උතුරු දෙසින් එන්නේ කවරෙක් ද කියා
බලන්න.
q220 ඔබට භාර දුන් කදිම රැළක් වැනි වූ ඔබේ
සෙනඟ කොහේ ද?
21 ඔබේ මිතුරෝ යයි ඔබ සිතූ සෙනඟ, ඔබේ
නායකයන් වශයෙන් පත් කරනු ලැබූ විට ඔබ කුමක්
කියන්නෙහු ද?
q221 විළිරුජාවෙන් පෙළෙන ස්ත්‍රියක සේ
වේදනාවෙන් ඔබ පෙළෙන්නේ නැද් ද?

22 ඔබට මෙසේ සිදු වන්නේ මන්දැ යි, ඔබේ ඇඳුම්
ගලවාදැමූ විට ඔබට නින්දාවක් නැත්තේ මන්දැ යි
ඔබ මෙනෙහි කර බැලූ විට ඔබේ අපරාධ ඉමහත්
නිසා යයි ඔබට පෙනී යනු ඇත.
23 එතියෝපිය මිනිසකුට සිය හමේ පාට වත්,
කොටියකුට උගේ ඇඟේ ලප වත් කොයි ලෙසින්
වත් වෙනස් කළ හැකි ද?
q2[23] එසේ කළ හැකි නම්, නපුර කරන්න හුරුපුරුදු
ඔබ හැමටත් යහපත කරන්න හැකි වෙයි.
24 "මරුකතරේ සුළඟට ගසා යන පිදුරු මෙන්
සමිඳුන් වන මා ඔබ හැම විසුරුවාදමනු ඇත.
25 ඔබ සමිඳුන් අමතක කළ බැවින්, අන් දෙවිවරුන්
විශ්වාස කළ හෙයින් ඔබ හැමට මැන තිබෙන
උරුමයත්, ඉරණමත් මෙසේ වන්නේ යයි සමිඳාණෝ
වදාරන සේක.
26 සමිඳාණෝ ම ඔබේ ඇඳුම් ගලවාදමා ඔබේ
ලජ්ජාව හෙළි කරන සේක.
27 හෙලේ පිටත්, එළිමහනේත් ඔබේ පරදාරකම් ද
වෙළෙඹකගේ මෙන් හේෂාරවය කිරීම් ද ඔබේ
දුරාචාර ද සල්ලාලකම් ද සමිඳාණන් දැක ඇති
බැවින් ඉශ්රායලේ ජනයෙනි, ඔබට වන විපතක
මහත!
q2[27] කවදා ඔබ පිරිසිදු වන්නහු ද?"

## බියකරු නියඟය

14 නියඟය ගැන සමිඳාණන් වහන්සේ
ජෙරෙමියාට මෙසේ වදාළ සේක:
2 "ජුදාව වැලපෙයි;
q2[2] එහි නගර මලානික වෙයි;
q2[2] එහි සෙනඟ පොළොව මත දුකින් වැතිර
ළතෝනි කියති.
q2[2] ජෙරුසලමේ විලාප ද නැඟී යයි.
3 ඔවුන්ගේ උත්තමයෝ වතුර ගෙනෙන පිණිස සිය
සේවකයන් යවති.
q2[3] ඔව්හු ළිං ළඟට ගොස් වතුර නොලැබ, හිස්
භාජන ඇති ව ආපසු හැරී එති.
q2[3] ඔව්හු වියවුලටත්, ලජ්ජාවටත් පැමිණ තමන්ගේ
මුහුණු වසා සඟවාගනිති.
4 දේශයට වැසි නොලැබුණ නිසා බිම වියළී
තිබෙන බැවින් ගොවියෝ කැළඹී දුකින් තමන්ගේ
මුහුණු සඟවාගනිති.
5 ඒ පිට්ටනියේ සිටින මුව දෙන පවා තණ කොළ
නැති නිසා අලුත උපන් ඇගේ පැටවා අත්හැර යන්නී
ය.
6 වල් කොටළුවෝ ද ගස්කොළන් නැති කඳු මත
සිට සිවලුන් මෙන් සුළඟට ඉව අල්ලති.
q2[6] තණ කොළ නැති නිසා උන්ගේ ඇස් ද
නොපෙනී යයි.
7 මාගේ සෙනඟ මොරගසමින් මෙසේ යාච්ඤා
කරති:
q2[7] 'සමිඳුනි, අපි ඔබට විරුද්ධ ව පව් කළෙමු.
q2[7] අපේ අයුතුකම්, අපේ අපරාධ, අපට විරුද්ධ ව
සාක්ෂි දෙන නමුත්, ඔබේ නාමය වෙනුවෙන් අපට
පිහිට වුව මැනව.
q2[7] අපි බොහෝ වර ඔබ වෙතින් හැරී ගියෙමු.
q2[7] ඔබට විරුද්ධ ව පව් කළෙමු.
8 සමිඳුනි, ඔබ ඉශ්රායලේවරුන්ගේ
බලාපොරොත්තුව ද විපත් සමයේ
ගැළවුම්කාරයාණෝ ද වන සේක.
q2[8] එසේ වුව ද, එක රැයකට නවාතැන් ගත්
මඟියකු මෙන් අපේ දේශයේ ආගන්තුක ව
සිටින්නේ මන් ද?
9 ඔබ සිත් වියවුල් වූ මිනිසකු මෙන් ද යමකු
ගළවන්නට බැරි බලවතකු මෙන් ද වී සිටින්නේ
මන් ද?
q2[9] එහෙත් සමිඳුනි, ඔබ අප මධ්යයෙහි සිටින
සේක. ඔබේ නාමයෙන් හැඳින්වෙන අපි ඔබේ
සෙනඟ වමු;
q2[9] අප අත් නොහළ මැනව.' "
10 මේ සෙනඟ ගැන සමිඳාණන් වහන්සේ මෙසේ
වදාරන සේක: "ඔවුන් තමන්ගේ පාද හසුරුවා
නොගෙන මුළා වී යන්න මෙපමණ ප්රිය වූ බැවින්
මම ඔවුන් කෙරෙහි අප්රසන්න ව සිටිමි. මම
ඔවුන්ගේ අපරාධ සිහි කොට ඔවුන්ගේ පාපවලට
දඬුවම් කරන්නෙමි."
11 සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ සේක:
"මේ සෙනඟගේ යහපත උදෙසා මට යාච්ඤා
නොකරන්න. ඔවුන් උපවාසයේ යෙදුණත්, ඔවුන්ගේ
කන්නලව්වලට මම සවන් නොදෙන්නෙමි; ඔවුන්
දවන යාග පූජා ද ධාන්ය පූජා ද ඔප්පු කරතත්, මම
ඒවා නොපිළිගනිමි. 12 ඒ වෙනුවට කඩුවෙන් ද
සාගතයෙන් ද වසංගතයෙන් ද මම ඔවුන් විනාශ
කරන්නෙමි."
13 එවිට මම මෙසේ කීවෙමි: "අහෝ දෙවි ස්වාමීන්
වහන්ස, දිවැසිවරු සෙනඟ අමතා, ඔබ වහන්සේ
ඔවුන්ට මේ ස්ථානයේ දී තිර සාමදානය දෙන
බැවින්, ඔවුන් කඩුව දකින්නේ වත්, සාගතයෙන්
පෙළෙන්නේ වත් නැතැ යි කියති."
14 සමිඳාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන් සේක:
"දිවැසිවරු මාගේ නාමයෙන් බොරු දිවැස් වැකි
කියති. මා ඔවුන් එව්වේ වත්, ඔවුන්ට අණ කළේ
වත්, ඔවුන්ට කතා කළේ වත් නැත. ඔවුන් ප්රකාශ
කරන්නේ බොරු දර්ශන ය. වැඩකට නැති පේන
කීම් ය; සිතින් මවාගත් වංචනික දේ ය. 15 මා
නොඑවූ නමුත්, මාගේ නාමයෙන් දිවැස් වැකි කියන,
'කඩුව වත්, සාගතය වත්, මේ දේශයට
නොපැමිණෙන්නේ ය'යි කියන මේ දිවැසිවරුන් ගැන
ස්වාමීන් වන මා කියන දේ මෙය වේ: ඔව්හු
කඩුවෙන් ද සාගතයෙන් ද විනාශ වන්නෝ ය.
16 ඔවුන්ගේ දිවැස් වැකි අසන සෙනඟ ද සාගතයට
හා කඩුවට ගොදුරු වී ජෙරුසලමේ වීදිවල හෙළා
දමනු ලබන්නෝ ය; ඔවුන් ද ඔවුන්ගේ භාර්යාවන් ද
දරුදැරියන් ද වළලන්නට කිසිවෙක් නොවන්නාහ.
ඔවුන්ගේ දුෂ්ටකමේ පල විපාකය ඔවුන්ට ම
විඳගන්නට මම සලස්වන්නෙමි.

17 "ජෙරමියා, ඔබ සෙනඟට මෙසේ කියන්න: 'රෑ
දාවල් දෙක්හි මාගේ ඇස්වලින් කඳුළු නොනැවතී
ගලායන්නේ ය. මන්ද, මාගේ සෙනඟ බරපතල
තුවාළයකින් ද ඉතා දරුණු පහරකින් ද පීඩිත ව
සිටිති. 18 මා පිටතට ගිය විට කඩුවෙන් මැරුම් කෑ
අය මට පෙනේ; මා නගරයට ඇතුළු වූ විට
සාගතයෙන් ලෙඩ වී සිටින අය මට පෙනේ.
දිවැසිවරු ද පූජකයෝ ද කිසිවක් නොදැන දේශයේ
ඔබමොබ යති.' "

## සෙනඟ සමිඳුන්ට කන්නලව් කිරීම

19 "සමිඳුනි, ඔබ මුළුමනින් ම ජුදා ප්‍රතික්ෂේප
කළ සේක් ද? සියොන් වැසියෝ ඔබට පිළිකුල් වී
සිටිත් ද? අපට සුවයක් ලැබීමට නොහැකි වන පරිදි
ඔබ අපට පහර දුන්නේ මන් ද? අපි ද සාමදානය
ගැන බලා සිටියෙමු; එහෙත්, කිසි හොඳක් නො වී
ය; සුව වීමේ කාලයක් ගැන බලා සිටියෙමු. එහෙත්
මෙන්න, භීතිය පමණක් ඇති වී තිබේ. 20 සමිඳුනි,
අපේ දුෂ්ටකමත්, අපේ පියවරුන්ගේ අපරාධයත් අපි
පිළිගනිමු. අපි ඔබට විරුද්ධ ව පව් කළෙමු.
21 ඔබේ නාමය නිසා අප ඉවත නොදැමුව මැනව.
ඔබේ තේජසේ සිංහාසනය පිහිටි ජෙරුසලමට
අගෞරව නොකළ මැනව. අප සමඟ තිබෙන ඔබේ
ගිවිසුම සිහි කර එය කඩ නොකළ මැනව. 22 වැසි
වස්වන්නට හැකි කෙනෙක් විජාතීන්ගේ බොරු
දෙවිවරුන් අතරේ සිටිත් ද? වැහිවලා දෙන්නට
අහසට පුළුවන් ද? නොහැකි ය. අපේ දෙවි ස්වාමීන්
වහන්සේ ඔබ නොවන සේක් ද? මේ දේ කළ
හැක්කේ ඔබට පමණක් බැවින් අපි ඔබ කෙරෙහි
බලාපොරොත්තු ව සිටිමු."

## ජුදා සෙනඟගේ විනාශය

15 නික්ම 32:11-14; ගණන් 14:13-19; 1 සාමු
7:5-9 එකල සමිඳාණන් වහන්සේ මට මෙසේ
වදාළ සේක: "මෝසෙස් හා සාමුවෙල් මා ඉදිරියෙහි
සිට කන්නලව් කළත්, මේ සෙනඟට මම අනුකම්පා
නොකරමි. මා ඉදිරියෙන් ඔවුන් පහ කරන්න; ඔවුන්
පලවා හරින්න. 2 එළිද 13:10'අප කොතැනට යා යුතු
දැ'යි නුඹෙන් ඇසූ විට, ඔවුන්ට මා මෙසේ වදාළ බව
කියන්න. 'වසංගතයට නියම වූ අය වසංගතයටත්,
කඩුවට නියම වූ අය කඩුවටත්, සාගතයට නියම වූ
අය සාගතයටත්, වහල්කමට නියම වූ අය
වහල්කමටත් යා යුතු ය.' 3 ඔවුන් විනාශ කිරීමට
මාරක සතරක් ස්වාමීන් වන මා නියම කර ඇත.
එනම්, මරාදමන පිණිස කඩුව ද ඉරාදමන පිණිස
බල්ලෝ ද කාදමා නැති කරන පිණිස අහසේ
පක්ෂීහු හා පොළොවේ මෘගයෝ ද යන සතර ය.
4 2 රාජා 21:1-16; 2 වංශා 33:1-9ජුදාහි රජ වූ
හෙසෙකියාගේ පුත් මනස්සේ ජෙරුසලමේ කළ දේ
නිසා, ලොවේ සියලු ජාතීන්ගේ පිළිකුලට ඔවුන්
භාජන කරන්නෙමි. 5 එම්බා ජෙරුසලම! නුඹට
අනුකම්පා කරන්නේ කවරෙක් ද? නුඹ ගැන
වැලපෙන්නේ කවරෙක් ද? නුඹේ සුව දුක් අහන්නට
නුඹ ළඟට එන්නේ කවරෙක් ද? 6 නුඹලා මා
ප්‍රතික්ෂේප කර මට පිටුපා ගොස් ඇත. මෙසේ
කියන්නේ ස්වාමීන් වන මම ය. ළතැවීමෙන් මා
වෙහෙසට පත් වී සිටින බැවින් මම මාගේ අත
නුඹලාට විරුද්ධ ව ඔසවා නුඹලා විනාශ කළෙමි.
7 මම කුල්ලකින් පොළන්නාක් මෙන් දේශයේ හැම
නගරයක දී ඔවුන් පොළාදැමුවෙමි. ඔවුන් කෙරේ
වියෝ දුක පැමිණෙව්වෙමි. මාගේ සෙනඟ වන
නුඹලා නුඹලාගේ නපුරු මාර්ගවලින් හැරී
නොපැමිණි බැවින් මම නුඹලා අත්හැර විනාශ
කළෙමි. 8 මම වැන්දඹුවන්ගේ ගණන මුහුදේ
වැලිවලටත් වඩා වැඩි කළෙමි. ජීවිතයේ ඉර මුදුන්
වේලාවේ මම නුඹලාගේ තරුණයන්ගේ මවුවරුන්ට
සිත් වේදනාව ද භීතිය ද හදිසියේ ඇති වන්නට
සැලසුවෙමි. 9 දරුවන් හත්දෙනෙකු වැදූ මව දුර්වල වී
ක්ලාන්ත වූවා ය. ඇගේ එළිය දවාලෙහි ම අඳුරට
හැරී ඇත. ඈ ලජ්ජාවටත්, නින්දාවටත් පත් වූවා ය.
ඔවුන්ගෙන් ඉතිරි අය ඔවුන්ගේ සතුරන් ඉදිරියේ දී
කඩුවට භාර දෙන්නෙමි. මෙසේ වදාරන්නේ ස්වාමීන්
වන මම ය."

## දුක් ගැන ළතෝනි කීම

10 අහෝ මාගේ මෑණියෙනි! මුළු දේශය සමඟ
තරඟ ද විවාද ද කරන මිනිසෙකු වීමට ඔබ මා වැදූ
නිසා මට සිදු වී ඇති විපතක මහත! මා කිසිවකුට
ණයට දුන්නේ වත්, කිසිවකුගෙන් ණයට ගත්තේ
වත් නැත. එහෙත්, සියල්ලෝ ම මට සාප කරති.
11 සමිඳුනි! ඔවුන්ගේ යහපත පිණිස මම යාච්ඤා
නොකළෙම් නම්, කරදර කාලයෙහිත්, විපත්
කාලයෙහිත් සතුරා උදෙසා ඔබ වහන්සේට
කන්නලව් නොකළෙම් නම්, මේ සාප මා පිට
පැමිණේ වා! 12 යකඩ කඩන්නට පුළුවන් කවරකුට
ද? විශේෂයෙන් ම උතුරු දිශාවේ ලෝකඩ මිශ්‍ර
යකඩ කඩන්නට පුළුවන් කවරකුට ද?
13 සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ සේක:
"දේශයේ හැම තැන ම ඔවුන් කර ඇති ඔවුන්ගේ
පව් නිසා, මාගේ සෙනඟගේ සම්පත හා වස්තුව
කොල්ලයක් මෙන් පැහැරගෙන යන්නට මම
සලස්වන්නෙමි. 14 මාගේ උදහසින් සදහට ම
ඇවිලෙන ගින්නක් දැල්වී තිබෙන බැවින් මම ඔවුන්
තමන් නොදන්න දේශයක සතුරන්ට සේවය
කරන්නට සලස්වන්නෙමි."
15 එවිට ජෙරමියා මෙසේ පිළිතුරු දුන්නේ ය:
"සමිඳුනි, ඔබ සියල්ල දන්න සේක, මා සිහි කොට,
මා දෙස බලා මට පීඩා කරන්නන්ගෙන් මා
වෙනුවෙන් පළිගත මැනව. ඔවුන් කෙරේ ඇති ඔබේ
ඉවසිලිවන්තකම නිසා මා තුරන් නොකළ මැනව.
ඔබ නිසා මා නින්දාව ඉසිලූ බව සිහි කළ මැනව.
16 ඔබ මට කතා කළ විට, මම ඒවාට සවන්
දුන්නෙමි. ඒවා මට ප්‍රීතියක් ද මාගේ සිතට සතුටක්
ද වේ. මන්ද, සියලු බලැති දෙවි ස්වාමීන් වහන්ස,
මම ඔබේ නාමය දරමි. 17 විනෝදකාමීන්ගේ
සමාගමෙහි හිඳගෙන මම ප්‍රීති නොවීමි. මට විරුද්ධ

ව අත එසවූ බැවින් ඔවුන්ගෙන් වෙන් වී මම
කෝපයෙන් පිරී සිටියෙමි. 18 මාගේ වේදනාවට
කෙළවරක් නැත්තේ මන් ද? මාගේ තුවාළ අසාධ්‍ය
ව තිබෙන්නේ මන් ද? ඒවා සුව නොවන්නේ මන් ද?
ඔබ දිය සිඳී යන රුවටලිකාර දිය පාරක් මෙන් වන
සේක් ද?”
19 මෙයට සමිඳාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්
සේක: “නුඹ ආපසු ආවොත් මම නුඹ නැවත
පිළිගන්නෙමි. නුඹ ද මා ඉදිරියේ සිටින්නෙහි ය. නුඹ
නොවටිනා දේ නොව, අගනා දේ කතා කරන්නෙහි
නම්, නුඹ මාගේ මුඛය මෙන් වන්නෙහි ය. එවිට
සෙනඟ නුඹ වෙත හැරී එනු ඇත. ඔවුන් වෙත
යන්න නුඹට වුවමනාවක් නොවෙනු ඇත. 20 මම මේ
සෙනඟට විරුද්ධ ව නුඹ බලවත් ලෝකඩ පවුරක්
මෙන් කරන්නෙමි. ඔව්හු නුඹට විරුද්ධ ව යුද්ධ
කරතත් නුඹෙන් ජය නොගනිති. මන්ද, නුඹ
ගළවන්නත්, නිදහස් කරන්නත් මම නුඹ සමඟ
සිටිමි. 21 මම නපුරන්ගේ අතින් නුඹ නිදහස්
කරන්නෙමි. බලහත්කාරකම් කරන්නන්ගේ බලයෙන්
නුඹ මුදන්නෙමි. මෙසේ පවසන්නේ ස්වාමීන් වන
මම ය.”

## ජුදාට පැමිණෙන විපත්ති

16 සමිඳාණන් වහන්සේ යළිත් මට කතා කොට
මෙසේ වදාළ සේක: 2 “මේ ස්ථානයෙහි නුඹ
ස්ත්‍රියක සරණ පාවා නොගන්න. දරුදැරියෝ ද
නුඹට නොසිටිත් වා! 3 මෙහි උපදින දරුදැරියන්ටත්,
ඔවුන් දැරූ මවුවරුන්ටත්, ඔවුන් ජනිත කළ
පියවරුන්ටත් සිදු වන්න යන දේ මම නුඹට කීවෙමි.
4 ඔව්හු බලවත් රෝගවලින් මැරෙන්නෝ ය;
කිසිවෙක් ඔවුන් ගැන නොවැලපෙන්නෝ ය; ඔව්හු
වළලනු නොලබති; බිම ඇති කසළ මෙන් වන්නෝ
ය. ඔව්හු කඩුවෙන් ද සාගතයෙන් ද විනාශ වන්නෝ
ය; ඔවුන්ගේ මළකඳන් ආකාශයේ පක්ෂීන්ටත්,
පොළොවේ මෘගයන්ටත් ගොදුරු වන්නේ ය.
5 “වැලපීම ඇති නිවසෙට ඇතුළු නොවන්න;
ළතෝනි කියන්නට නොයන්න; ඔවුන් ගැන ශෝක
නොවන්න. මාගේ සාමදානයත්, ස්ථිර ප්‍රේමයත්,
අනුකම්පාවත් මේ සෙනඟගෙන් ඉවත් කරගතිමි.
මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය. 6 මේ
දේශයේ ලොකු කුඩා අය මැරෙනු ඇත. ඔවුන්
වළලනු ලබන්නේ වත්, කිසිවෙකු ඔවුන් ගැන
විලාපයක් කියන්නේ වත් නැත. කිසිවෙකු
ශෝකයෙන් සිය ශරීරය කපාගන්නේ වත්, හිස මුඩු
කරගන්නේ වත් නැත. 7 මළවුන් නිසා වියෝ දුක
ඇති අයකුගේ සැනසීම සඳහා ඔහු සමඟ දානයක්
වළඳන කෙනෙක් නොවන්නෝ ය; දෙමවුපියන් නිසා
ඔහුට සැනසීමේ කුසලාන දෙන කෙනෙක් ද
නොවන්නෝ ය.
8 “මංගල භෝජනයක් පවත්වන ගෙදරකට ඇතුළු
නොවන්න. එහි සිටින්නන් සමඟ කන බොන පිණිස
වාඩි නොවන්න. 9 ඉශ්රායලේවරුන්ගේ දෙවිඳුන් වන,
සියලු බලැති ස්වාමීන් වන මා කියන දේට සවන්
දෙන්න. ඔවුන්ගේ ඇස් හමුයෙහි ම, ඔවුන් ජීවත් ව
සිටින කාලයේ දී ම ප්‍රීති ප්‍රමෝද නාදය ද
මනාලයා සහ මනාලියගේ හඬ ද මේ ස්ථානයෙන්
මම තුරන් කරන්නෙමි.ජරෙ 7:34; 25:10; එළිද 18:23
10 “නුඹ මේ කරුණු මේ සෙනඟට දැන්වූ විට
ඔවුන් නුඹෙන් මෙසේ අසනු ඇත: ‘මේ සියලු
බරපතල විපත්ති සමිඳාණන් වහන්සේ අප පිට
පැමිණෙව්වේ මන් ද? අපේ අපරාධය කුමක් ද?
අපේ දෙවි ස්වාමීන් වහන්සේට විරුද්ධ ව අප කළ
පාපය කුමක් ද?’ ” 11 එවිට සමිඳාණන් වහන්සේ
මෙසේ කියනු ඇතැ යි ඔවුන්ට කියන්න. ‘නුඹලාගේ
පියවරු මා අත්හැර අන් දෙවිවරුන් පස්සේ ගොස්,
ඔවුන්ට සේවය කර, නමස්කාර කර, මා අත්හැර
දමා මාගේ ව්‍යවස්ථාව ද නොපැවැත්වූ හ.
12 නුඹලා නුඹලාගේ පියවරුන්ටත් වඩා නපුරු ලෙස
ක්‍රියා කර ඇත. නුඹලා මට සවන් නො දී,
නුඹලාගේ මුරණ්ඩු නපුරු සිතුවිලි අනුව
හැසිරෙන්නෙහු ය. 13 එබැවින්, නුඹලා වත්, නුඹලාගේ
පියවරුන් වත් දැන නොගත් දේශයකට මම නුඹලා
නෙරපාදමන්නෙමි. එහි නුඹලා රෑ දහවල් අන්
දෙවිවරුන්ට සේවය කරනු ඇත. මම නුඹලාට කිසි
අනුකම්පාවක් නොදක්වමි.’
14 “ ‘ඉශ්රායලේ සෙනඟ මිසර දේශයෙන් ගෙනා
ජීවමාන සමිඳාණන් වහන්සේගේ නාමය’ කියා
තවත් දිවුරන්නට නොහැකි කාලය පැමිණෙන්නේ ය.
15 ඒ වෙනුවට, ‘ඉශ්රායලේ සෙනඟ උතුරු දේශයෙන්
ද ඔවුන් විසුරුවා හැරි දේශවලින් ද ගෙනා ජීවමාන
සමිඳාණන් වහන්සේගේ නාමය’ කියා දිවුරන කාලය
පැමිණෙන්නේ ය. මා ඔවුන්ගේ පියවරුන්ට දුන්
ඔවුන්ගේ දේශයට ඔවුන් නැවත පමුණුවන්නෙමි.
මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය.
16 “මේ සෙනඟ අල්ලන පිණිස මම මසුන්
අල්ලන්නන් බොහෝ දෙනෙකු එවන්නෙමි. ඉන්පසු
සියලු කඳුවල ද සියලු හලේවල ද පර්වත විවරවල
ද දඩයමින් මෙන් ඔවුන් ගෙනෙන පිණිස
දඩයම්කාරයන් මම එවන්නෙමි. මෙසේ පවසන්නේ
ස්වාමීන් වන මම ය. 17 ඔවුන් කරන සියලු දේ මට
පෙනේ; කිසිවක් මාගෙන් සැඟවී නැත; ඔවුන්ගේ
අයුතුකම් මාගේ ඇස් ඉදිරියෙන් සැඟවී නැත.
18 මළකඳන් වැනි අශික්ෂිත පිළිමවලින් ඔවුන් මාගේ
දේශය දූෂණය කර, දේශය පිළිකුල් කටයුතු
දෙවිවරුන්ගෙන් පුරවා ඇති නිසා මම ඔවුන්ගේ
අයුතුකමටත්, පාපයටත් දෙගුණයක් ප්‍රතිවිපාක
ගෙන දෙන්නෙමි.”

## ජෙරමියාගේ යැදීම

19 සමිඳුනි, ඔබ වහන්සේ මාගේ බලය ද
බලකොටුව ද විපත්ති දවසේ දී මාගේ රැකවරණය
ද වන සේක. විජාතීහු පොළොවේ සීමාවලින් ඔබ
වෙත අවුත් කතා කොට, “අපේ පියවරු වැඩකට
නැති බොරු දෙවිවරුන්ට ගැති ව සිටියහ.
20 මිනිසකුට තමා උදෙසා ම දෙවිවරුන් සාදාගත

හැකි ද? නැත. ඒවා ඇත්තට ම දෙවිවරු නොවෙති”යි
කියති.
21 “එබැවින් මාගේ බලයත්, මාගේ පරාක්‍රමයත්
මේ වතාවේ නිශ්චය වශයෙන් ඔවුන්ට දැනගන්නට
සලස්වන්නෙමි. එවිට මා සමිඳාණන් වහන්සේ බව
ඔවුන් දැනගනු ඇතැ”යි සමිඳාණන් වහන්සේ වදාරන
සේක.

### ජුදා දේශයේ පාපය හා ඊට දඬුවම

17 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
“ජුදා වැසියෙනි, නුඹලාගේ පාපය යකඩ
පෑනකින් ලියා තිබේ. වජ්‍ර තුඩකින් එය නුඹලාගේ
සිත නමැති පුවරුවේ ද පූජාසනයේ නෙරා ඇති අං
වැනි කොන්වල ද කොටා තිබේ. 2 නුඹලාගේ
දරුවෝ අතුපතර ඇති ගස් ළඟ ද උස් හලේ උඩ ද
3 ගම්බද පළාත්වල ගිරිකුළු මත ද අෂේරා
දේවතාවිය උදෙසා තනාගත් ඔවුන්ගේ පූජාසන සිහි
කරති. දේශයේ සෑම තැන ම නුඹලා කර ඇති පාප
නිසා නුඹලාගේ සම්පත ද සකල වස්තුව ද සතුරන්
විසින් පැහැරගෙන යනු ලබන්නට සලස්වන්නෙමි.
4 මා නුඹලාට දුන් දේශය අත්හරින්නට නුඹලාට
සිදුවන්නේ ය; නුඹලා නොදන්න දේශයක දී
නුඹලාගේ සතුරන්ට සේවය කරන්නට නුඹලාට
සලස්වන්නෙමි. මන්ද, මාගේ කෝපය
කරණකොටගෙන සදහට ම ඇවිලෙන ගින්නක්
දැල්වී තිබේ.”

### ආප්තෝපදේශ

5 සමිඳාණෝ මෙසේ වදාරන සේක:
q2[5] “මිනිසුන් කෙරෙහි විශ්වාසය තබන, මියයන සුලු
සිරුර ශක්තිය කරගෙන, සමිඳුන් කෙරෙන් හැරී ඉවත්
ව යන මිනිසා සාප ලද්දෙකි.
6 ඔහු පාළුකරයෙහි ඇති පඳුරකට සමාන වේ.
q2[6] යහපත පැමිණි විට එය ඔහුට නොපෙනේ.
q2[6] පාළුකරයෙහි වියළි තැන්හි, මිනිසුන් නොවසන
ලුණු බිම්හි ඔහු වාසය කරයි.
7 සමිඳුන් කෙරෙහි විශ්වාසය තබන, සමිඳුන්
තරයේ විශ්වාස කරන මිනිසා භාග්‍යවන්තයෙකි.
8 ගීතා 1:3 ඔහු, ගං ඉවුරේ සිටුවා ඇති, ගඟට ම
මුල් ඇද ඇති;
q2[8] ගිම්හානයට කිසි බියක් නැති;
q2[8] කොළ පර වී යාමක් නැති;
q2[8] නියඟ කාලය ගැන කරදර නැති;
q2[8] නොනැවතී දිගට ම පලදාවක් ඇති ගසක් හා
සමාන වේ.
9 අන් කිසිවකට වඩා සිත කපටි ය, හැම අතින් ම
එය දූෂණය වී ඇත;
q2[9] එය තේරුම්ගත හැක්කේ කාට ද?
10 ගීතා 62:12; එළිද 2:23 සමිඳුන් වන මම,
මිනිසාගේ සිත සෝදිසි කර බලමි;
q2[10] මිනිසාගේ හදවත පරීක්ෂා කර බලමි.
q2[10] එසේ කරන්නේ, මිනිසාගේ හැසිරීම අනුව ඔහු
ජීවත් වන පිළිවෙළෙ ලෙස ඔහුට විපාක දෙන පිණිස
ය.”
11 වංචාවෙන් මුදල් උපයන මිනිසා, ඈ නොදැමූ
බිජු රකින කපුටියක වැනි ය;
q2[11] පසු ව පැටවුන් ඈගෙන් ඉගිලී යන ලෙස
ජීවිතයේ ඉර මුදුන් වේලේ ඒ සම්පත ඔහුගෙන්
නැති වී යයි.
q2[11] මෙසේ ඔහු අන්තිමයේ දී මෝඩයකු බවට
පත් වෙයි.
12 කන්දක් මත මුල සිට ම පිහිටා ඇති අපේ දේව
මාලිගය තේජාන්විත සිහසුනකි.
13 ඉශ්රායෙල්වරුන්ගේ බලාපොරොත්තුව වන
සමිඳුනි, ඔබ අත්හරින සියල්ලෝ ලජ්ජාවට
පැමිණෙති.
q2[13] ඔබ ජීවමාන උල්පත වන බැවින් ඔබ අත්හැර
යන සියල්ලන් ධූලි මත ලියූ නම් ලෙසින් නියතින්
පහ වී යනු ඇත.

### ජරෙමියා දේව පිහිට යැදීම

14 සමිඳුනි, මා සුව කළ මැනව.
q2[14] එවිට මම සුවපත් වන්නෙමි.
q2[14] මා ගළවාගත මැනව.
q2[14] එවිට මම ගැළවෙන්නෙමි.
q2[14] මම ඔබ පමණක් පසසන්නෙමි.
15 “සමිඳුන් කළ ප්‍රකාශනය කොහේ ද?
q2[15] ඒවා ඉටු නොවන්නෙ මන් දැ”යි සෙනඟ මට
කියති.
16 එහෙත් සමිඳුනි, ඔබ දන්න පරිදි ඔවුන් පිට
විනාශය පමුණුවන්නට වත්, නපුරු කාලයක් ඔවුන්ට
ගෙනෙදෙන්නට වත් මම ඔබෙන් නොඉල්ලුවෙමි.
q2[16] මා මුවින් නික්මුණු වචන ඔබ දන්න සේක.
17 ඔබ මට බියට කරුණක් නොවන සේක.
q2[17] විපත්ති දවසේ දී ඔබ මාගේ රැකවරණය වන
සේක.
18 මට පීඩා කරන්නෝ ලජ්ජාවට පැමිණෙත්වා!
q2[18] මම ලජ්ජාවට නොපැමිණෙම්වා!
q2[18] ඔව්හු භීතියට පැමිණෙත්වා!
q2[18] මම භීතියට නොපැමිණෙම්වා!
q2[18] විපත් දවස ඔවුන් පිට පමුණුවා ඔවුන්
සහමුලින් ම වනසාලුව මැනව.

### සබත් දවස පැවැත්වීම

19 සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ සේක:
“නුඹ ගොස් ජුදාහි රජවරුන් යන එන බෙන්ජමින්ගේ
දොරටුවේ ද ජෙරුසලමේ සියලු දොරටුවල ද සිට
මෙසේ කියන්න. 20 ජුදාහි රජවරුන්ටත්, ජුදා
ජනයාටත්, මේ දොරටුවලින් ඇතුළු වන ජෙරුසලමේ
සියලු වැසියන්ටත් සමිඳාණන් වහන්සේගේ වචනයට
සවන් දෙන ලෙස දන්වා සිටින්න. 21 නෙහෙ
13:15-22නුඹලාගේ ප්‍රාණයට නුඹලා ආදරේ නම්,
සබත් දවසේ දී නුඹලා කිසි බරක් උසුලාගෙන
නොයා යුතු ය. ජෙරුසලමේ දොරටුවලින් නුඹලා

කිසි බරක් උසුලාගෙන නොගෙනො යුතු ය. 22 නික්ම
20:8-10; ද්වි.නී. 5:12-14සබත් දවසේ දී නුඹලාගේ
ගෙවලින් බරක් ගෙන නොගිය යුතු ය. කිසි ම බර
වැඩක් නොකළ යුතු ය. නුඹලාගේ පියවරුන්ට මා
අණ කළ ප්‍රකාරයට නුඹලා සබත් දවස ශුද්ධ ලෙස
පැවැත්විය යුතු ය. 23 නුඹලාගේ පියවරු මා දෙසට
කන් යොමු කර මට සවන් නුදුන්නෝ ය. ඒ වෙනුවට
නුඹලා සිත් දැඩි කරගෙන, මට කීකරු වුණේ වත්,
මාගේ අවවාද පිළිගත්තේ වත් නැත. 24 මේ
සෙනඟ මට සහමුලින් ම කීකරු විය යුතු ය. සබත්
දවසේ දී නුඹලා කිසි බරක් උසුලාගෙන දොරටුවලින්
නොයා යුතු ය. නුඹලා සබත් දවස ශුද්ධ දවසක්
ලෙස පවත්වා, එදින කිසි බර වැඩක් නොකළ යුතු
ය. 25 නුඹලා මෙසේ කළොත්, දාවිත්ගේ
සිංහාසනයේ වැඩ හිඳින, රථවල හා අශ්වයන් පිට
නැඟී යන රජවරුන් සහ ඔවුන්ගේ අධිපතීහු ද ජුදාහි
ජනයා ද ජෙරුසලමේ වැසියෝ ද මේ නගරයේ
දොරටුවලින් ඇතුළු වන්නෝ ය. මේ නගරය සදහට
ම පවතිනු ඇත. 26 තවද, ජුදා නගරවලින් ද
ජෙරුසලම අවට පෙදෙස්වලින් ද බෙන්ජමින්ගේ
දේශයෙන් ද පාත රටින් ද කඳුකරයෙන් ද දකුණු
දෙසින් ද මනුෂ්‍යයෝ දවන පූජා ද යාග පූජා ද
ආහාර පූජා ද කට්ටකුමංජල් ද ස්තුති පූජා ද රැගෙන
සමිඳාණන් වහන්සේගේ මාලිගාවට පැමිණෙන්නෝ
ය. 27 එහෙත්, සබත් දවස ශුද්ධ ලෙස පවත්වන
හැටියටත්, සබත් දවසේ දී බරක් උසුලාගෙන
ජෙරුසලමේ දොරටුවලින් ඇතුළු නොවන හැටියටත්
මා කී දේට ඔවුන් සවන් නුදුන්නොත්, මම එහි
දොරටුවල ගින්නක් අවුළුවන්නෙමි; ඒ ගින්න
ජෙරුසලමේ මාලිගා දවාලන්නේ ය. එය කිසි සේත්
නොනිවිය හැකි ය.”

### ජෙරමියා හා කුම්භකාරයා

18 සමිඳාණන් වහන්සේ මෙසේ වදාළ සේක:
2 “නුඹ නැඟී කුම්භකාරයාගේ ගෙට යන්න;
එහි දී මාගේ පණිවුඩය නුඹට ප්‍රකාශ කරන්නෙමි.”
3 එකල මම කුම්භකාරයාගේ ගෙදරට ගියෙමි; ඔහු
සකපෝරුවෙන් වැඩ කරමින් සිටියේ ය. 4 යම්කිසි
විටක ඔහු අඹමින් සිටි මැටි බඳුනක් නරක් වූ කල,
ඔහු යළිත් ඒ මැටි ගෙන එයින් වෙන බඳුනක් තමා
රිසි සේ සෑදුවේ ය.
5 එකල සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ
සේක: 6 “එම්බා ඉශ්‍රායලේ ජනයෙනි, මේ
කුම්භකාරයා කරන ලෙස නුඹලාට කරන්නට මටත්
බැරි ද? මෙසේ වදාරන්නේ ස්වාමීන් වන මම ය.
ඉශ්‍රායලේ ජනයෙනි, කුම්භකාරයාගේ අතේ තිබෙන
මැටි පිඩක් මෙන් නුඹලා මාගේ අතේ සිටින්නහු ය.
7 යම්කිසි ජාතියක් හෝ රාජ්‍යයක් හෝ ගැන, ‘මම
එය උදුරා කඩාදමා නැති කරන්නෙමි’යි කී කල, 8 ඒ
ජාතිය තමන්ගේ අදම්ටුකමින් හැරුණොත්, මා එයට
කරන්නට අදහස් කළ විපත ගැන මාගේ සිත
වෙනස් කරගන්නෙමි. 9 එමෙන් ම, යම්කිසි ජාතියක්
හෝ රාජ්‍යයක් හෝ ගැන ‘මම එය ගොඩනඟා
වර්ධනය කරන්නෙමි’යි කී කල, 10 ඒ ජාතිය මාගේ
හඬට කීකරු නොවී, මාගේ ඇස් හමුයෙහි නපුරු දේ
කළහොත්, මා එයට කරන්න අදහස් කළ යහපත
ගැන මාගේ සිත වෙනස් කරගන්නෙමි. 11 එබැවින්
නුඹ ජුදා ජනයාටත්, ජෙරුසලම් වැසියන්ටත් කතා
කොට, මා ඔවුන්ට විරුද්ධ ව යම් යම් යෝජනා
කරන බවත්, ඔවුන්ට දඬුවම් කරන්නට යන බවත්
කියන්න. ඔවුන්ගේ පාප මාර්ගයෙන් හැරී එන්න
කියා ඔවුන්ට කියන්න. ඔවුන්ගේ හැසිරීම ද ක්‍රියා
මාර්ගය ද ඔවුන්ට කියන්න. 12 එහෙත් ඔවුන්, ‘එයින්
වැඩක් නැත; අපේ ම අභිප්‍රායයන් ලෙස අපි
හැසිරෙමු, අපි එකිනෙකො අපේ නපුරු සිත්වල
මුරණ්ඩුකම ලෙස ක්‍රියා කරන්නෙමු’යි පිළිතුරු දෙනු
ඇත.

### ඉශ්‍රායලේ ජනතාව සමිඳාණන් ප්‍රතික්ෂේප කිරීම

13 “එබැවින් ස්වාමීන් වන මම මෙසේ වදාරමි.
q213 ‘මෙවැන්නක් මීට පෙර සිදු වුණ බව අසා
ඇද්දැ’යි සියලු විජාතීන්ගෙන් අසන්න.
q213 ඉශ්‍රායලේ සෙනඟ භයානක දේ කර ඇත.
14 ලෙබනොන්හි උස් කඳුවල හිම නැති වන කලක්
ඇද් ද?
q214 කඳුකරේ ගලා එන සිසිල් දිය දහර සිඳී යන
කලක් ඇද් ද?
15 එහෙත්, මාගේ සෙනඟ මා අමතක කර ඇත.
q215 ඔව්හු දේව රූපවලට සුවඳ දුම් අල්ලති;
q215 ඔවුන්ගේ පැරණි ගමන් මාර්ගයෙහි ඔව්හු
පැකිළී වැටෙති;
q215 මහ මඟ නොව, අතු පාරවල ගමන් කරති.
16 මෙසේ ඔවුන් මේ දේශය මහා භීතියට
කරුණක් ද සදහට ම පිළිකුලක් ද කර ඇත.
q216 ඒ ළඟින් යන අය බියෙන් බියට පත් ව
විස්මයෙන් හිස වන වනා යති.
17 පෙරදිග සුළඟකින් මෙන් සතුරන් ඉදිරියෙහි මම
ඔවුන් විසුරුවා හරින්නෙමි.
q217 මාගේ මුහුණ හරවාගෙන ඔවුන්ගේ විපත්
සමයෙහි ඔවුන්ට පිටුපා යන්නෙමි.”

### ජනතාව ජෙරමියාට එරෙහි වීම

18 එකල සෙනඟ පිළිතුරු දෙමින්, “එන්න, අපි
ජෙරමියාට විරුද්ධ ව උපා යොදමු; අපට අනුශාසනා
කිරීමට පූජකයන් ද උපදෙස් දීමට ප්‍රඥාවන්තයන් ද
පණිවුඩ ප්‍රකාශ කිරීමට දිවැසිවරුන් ද නිතර ම
සිටිනු ඇත. ඒ නිසා ජෙරමියා කියන දේට සවන්
නොදී ඔහුට විරුද්ධ ව චෝදනා ඉදිරිපත් කරමු”යි කී
හ.
19 එවිට ජෙරමියා සමිඳාණන් වහන්සේට මෙසේ
යාච්ඤා කළේ ය: “සමිඳුනි, මාගේ සතුරන්ට විරුද්ධ
ව කියන දේට සවන් දෙන්න. මාගේ පැමිණිල්ල
අසන්න; 20 යහපතට පල විපාකය අයහපත ද?
මාගේ සතුරන් මා නසන්නට බොරු වළක් හාරා
ඇත. ඔවුන් වෙනුවෙන් ඔබේ කෝපය පහකරන
පිණිස ඔවුන්ගේ යහපත උදෙසා කතා කරන්නට මා

ඔබ ඉදිරියෙහි සිටි බව සිහි කළ මැනව. 21 එහෙත්,
දැන් ඔවුන්ගේ දරුවන් හාමතේ මැරෙන්නට හැරිය
මැනව. යුද්ධයනේ මැරෙන්නට සැලසුව මැනව;
ඔවුන්ගේ භාර්යාවන්ගේ දරුවෝ ද පුරුෂයෝ ද නැති
වතේ වා! ඔවුන්ගේ පුරුෂයෝ වසංගතයනේ මැරතේ
වා! ඔවුන්ගේ තරුණයෝ යුද්ධයේ දී කඩුවනේ
මැරුම්කත් වා! 22 ඔබ හදිසියනේ සතුරු සේනාවක්
ඔවුන්ට විරුද්ධ ව පමුණුවන කල ඔවුන්ගේ
නිවසේවලින් කෑගැසීමක් ඇසේ වා! මන්ද, ඔවුන් මා
අසුකරන්නට වළක් හාරා, මාගේ පාදවලට මලපත්
සඟවා තබා ඇත. 23 එහෙත්, සමිඳුනි, මා මරන
පිණිස මට විරුද්ධ ව ඔවුන් යොදන සියලු
කුමන්ත්‍රණ ඔබ ම දන්න සේක. ඔවුන්ගේ දුෂ්ටකම්
කමා නොකළ මැනව. ඔවුන්ගේ පාපය ද ඔබේ
දර්ශනයනේ නොමැකුව මැනව. ඔබ ඉදිරියෙහි ඔව්හු
පැකිළ වැටතේ වා! ඔබේ උදහසේ කාලයේ දී
ඔවුන්ට ප්‍රතිවිපාක දුන මැනව."

## මැටි බඳුන බිඳීම ගැන ලකුණ

19 සමිඳාණන් වහන්සේ මට කතා කොට, "නුඹ
ගොස් කුම්භකාරයාගනේ මැටි බඳුනක්
මිලේට ගන්න. ප්‍රජා මූලිකයන්ගනේ ද ශ්‍රේෂ්ඨ
පූජකයන්ගනේ ද සමහරදනෙකු කැටුව, 2 2 රාජා
23:10; ජරෙ 7:30-32; 32:34-35කුඹල් දොරටුව ළඟ
තිබනෙ බනේ-හින්නොම් මිටියාවතට පැමිණ, මා
නුඹට කියන වචන එහි දී ප්‍රකාශ කරන්නැ"යි වදාළ
සේක. 3 "නුඹ මසෙේ කියන්න: ජුදාහි රජවරුනි,
ජරුසෙලමේ වැසියනේ, ඉශ්රායලේවරුන්ගේ සියලු
බලැති දවේ ස්වාමීන් වන මා කියන දේට සවන්
දනේන. අසන සියල්ලන්ගේ කන් දදෙරන තරමට
මේ ස්ථානය පිට මම විපත්ති පමුණුවන්නමේ. 4 මා
මසෙේ කරන්නේ, සනෙඟ මා අත්හැර, මේ ස්ථානය
දූෂණය කර, ඔවුන් වත්, ඔවුන්ගේ පියවරුන් වත්,
ජුදාහි රජවරුන් වත් දැනහැඳින නොසිටි දවේවරුන්ට
මෙහි සුවඳ දුම් ඔප්පු කරන නිසාත්, නිදොස් ලයෙින්
මේ ස්ථානය පුරවා තිබනෙ නිසාත් ය. 5 ලවේ
18:21තවද, ඔවුන් තමන්ගේ පුත්‍රයන් ගින්නනේ
දවා, බාල් දවේයාට දවන යාග පූජා කරන පිණිස,
බාල් දවේයාට ගිරිකුළු දේවාල ගොඩනඟා තිබේ.
එසේ කරන්නට කියා මා අණ කළෙේ වත්, කීවේ
වත් නැත. එවැන්නක් මාගේ සිතට නැඟුණේ වත්
නැත. 6 ඒ නිසා, මේ ස්ථානයට තොපෙතේ කියා වත්,
බනේ-හින්නොම් මිටියාවත කියා වත් නොකියා,
ඝාතන මිටියාවත කියා කියන කාලය පැමිණනේනේ
යයි ස්වාමීන් වන මම කියන්නමේ. 7 මේ ස්ථානයේ
දී මම ජුදාහි හා ජරුසෙලමේ වැසියන්ගේ යෝජනා
කඩාකප්පල් කර දමා, ඔවුන්ගේ සතුරන් ඉදිරියෙහි
කඩුවනේ ද ඔවුන්ගේ දිවි නසන්නට සොයන්නන්ගේ
අත්වලින් ද ඔවුන් විනාශ වන්නට සලස්වා,
ඔවුන්ගේ මළකඳන් අහසේ පක්ෂීන්ටත්, පොළොවේ
මෘගයන්ටත් ගොදුරු කොට දනේනමේ. 8 මේ දේශය
මහා භීතියකට කරුණක් ද පිළිකුලක් ද කරන්නමේ.
ඒ ළඟින් යන අය බියනේ බියට පත් වී ඔවුන්ට සිදු
වූ විපත ගැන සරදම් කරන්නෝ ය. 9 එහි සිටින
සනෙඟට ඔවුන්ගේ ම දරුදැරියන්ගේ මාංස කන්නට
මම සලස්වන්නමේ. ඔවුන්ගේ සතුරන් ද ඔවුන්ගේ
දිවි නසන්නට සොයන්නන් ද ඔවුන්ට පීඩා කරන විට
වටලනු ලැබූ ඔවුන් තම අසල්වැසියන්ගේ මාංස කනු
ඇත."
10 එවිට සමිඳාණන් වහන්සේ මා සමඟ ගිය අය
ඉදිරියේ මැටි බඳුන බිඳදමා, 11 "සියලු බලැති
සමිඳාණන් වහන්සේ ඔවුන්ට මසෙේ වදාරන සේකැ
යි ඔවුන්ට කියන්නැ"යි මට වදාළ සේක. "මේ
කුම්භකාරයාට මැටි බඳුන පිළියම් කරන්නට බැරි
විදියට නුඹ එය බිඳින පරිදි මම මේ නගරයෙහි
සිටින සනෙඟ සිඳබිඳ දමමි. වළලන්නට ඉඩක් නැති
නිසා ඔවුන් තොපෙතේහි මළමිනී වළලනු ඇත. 12 මම
මේ ස්ථානයටත්, මෙහි වැසියන්ටත් එසේ කර, මේ
නගරය තොපෙතේ මනේ කරන්නමේ. 13 යම් යම්
ගෙවල්වල පියසි උඩ ග්‍රහ තාරකාවන්ට සුවඳ දුම්
ඔප්පු කරන්නටත්, අන් දවේවරුන්ට පානීය පූජා
වගුරන්නටත් යදෙුණේ ද, අපවිත්‍ර වූ ඒ සියලු
ගෙවල් එනම්, ජරුසෙලමේ ගෙවල් ද ජුදාහි
රජවරුන්ගේ ගෙවල් ද තොපෙතේ මනේ අපිරිසිදු
වන්නේ ය."
14 ඉක්බිති ජරෙමියා දිවැස් වැකි කියන පිණිස
සමිඳාණන් වහන්සේ විසින් යවනු ලැබූ තොපෙතේ
සිට අවුත්, සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ
මළුවේ සිටිමින්, මුළු සනෙඟට කතා කොට,
15 "ඉශ්රායලේවරුන්ගේ සියලු බලැති දවේ ස්වාමීන්
වහන්සේ මසෙේ වදාරන සේකැ"යි කී ය. "ඔවුන්
මාගේ වචනය නොඅසන පිණිස මුරණ්ඩු ව සිටින
බැවින් මම මේ නගරයටත්, ඊට යාබද
උපනගරවලටත් විරුද්ධ ව මා කී සියලු විපත්
පමුණුවන්නමේ."

## පෂ්හූර් නම් පූජකයා හා ගැටුම

20 ඉම්මරේගේ පුත් පෂ්හූර් නම් පූජකයකේ
දේව මාලිගාවේ ප්‍රධාන නිලධාරියා විය.
දිවැසිවර ජරෙමියා ප්‍රකාශ කළ මේ දේ ඔහුට
ඇසිණි. 2 එබැවින් පෂ්හූර් ජරෙමියාට තළා, දේව
මාලිගාවේ බනේජමින් නමැති ඉහළ දොරටුවේ
තිබනෙ දඬු කඳේ ඔහු දැම්මේ ය. 3 පසු දින
පෂ්හූර් ජරෙමියා දඬු කඳනේ නිදහස් කළ විට
ජරෙමියා ඔහුට මසෙේ කී ය: "සමිඳාණන් වහන්සේ
ඔබට, 'අවට සැපත' යන අරුත ඇති පෂ්හූර් නොව,
'අවට භීතිය' යන අරුත ඇති මාගොර්-මිස්සාබිබ්
කියා නම් තබා ඇත. 4 සමිඳාණන් වහන්සේ මසෙේ
වදාරා ඇත: මම නුඹත්, නුඹේ මිත්‍රයනුත් අධික
භීතියකට පත්වන්නට සලස්වන්නමේ. ඔව්හු
තමන්ගේ සතුරන්ගේ කඩුවනේ මැරුම් කන්නෝ ය.
නුඹ එය නුඹේ ම ඇස්වලින් දකින්නෙහි ය. මම මුළු
ජුදා දේශය බබිලෝනි රජුගේ අතට පාවා
දනේනමේ. ඔහු ඔවුන් බබිලෝනියට ගනෙ ගොස්
කඩුවනේ මරන්නේ ය. 5 තවද, මම මේ මුළු
නගරයේ සම්පත ද එහි ධනය ද එහි ඇති සියලු

වටිනා දේ ද ජුදා රජවරුන්ගේ සකල වස්තුව ද
ඔවුන්ගේ සතුරන් අතට දෙන්නෙමි; ඔවුන් ඒවා
කොල්ලකා බබිලෝනියට ගෙනයනු ඇත. 6 එම්බා
පෂ්හුර්! නුඹේ ගෙවැසි සියල්ලෝ ද නුඹ ද
වහල්කමට ගෙනයනු ලබන්නහු ය. නුඹේ බොරු
දිවැස් වැකි ඇසූ නුඹේ සියලු මිත්‍රයෝත්, නුඹත්
වහල්කමට බබිලෝනියට ගෙනයනු ලබන්නහු ය.
එහි දී නුඹලා මැරී වළලනු ලබන්නහු ය."

## ජරෙමියාගේ පැමිණිල්ල

7 අහෝ සමිඳුනි!
q27 ඔබ තුමාණෝ මා මුළා කළ සේක.
q27 මම ද මුළා වීමි.
q27 ඔබ තුමාණෝ මට වඩා බලවන්ත ය.
q27 ඔබ තුමාණෝ මා පරාජයට පත් කළ සේක.
q27 දවස පුරා සියල්ලෝ මට කවටකම් කරති.
q27 ඔව්හු මට උසුළු-විසුළු කරති.
8 මා කතා කරන සෑම විට ම මොරගසමින්,
'සැහැසිකම', 'විනාශය' කියා මම කියමි.
q28 ඔබ තුමාණන්ගේ වචනය දවස පුරා ප්‍රකාශ
කිරීම මා නින්දාවටත්, සරදමටත් හේතුව වී තිබේ.
9 'මම සමිඳාණෝ අමතක කර එතුමාණන්ගේ
නාමයෙන් තවත් කතා නොකරන්නෙමි'යි කී විට,
ඔබ තුමාණන්ගේ වචනය මාගේ සිතේ ගින්නක්
මෙන් ඇවිලයෙයි.
q29 එය මාගේ ඇටකටු තුළ සැඟවී ඇත.
q29 එය සඟවා තබාගැනීමෙන් මම බොහෝ
වෙහෙසට පත් වීමි.
q29 එහෙත්, තවත් එය තබාගැනීම මට නොකළ
හැකි ය.
10 කසුකුසුව මට ඇසේ, අවට ඇත්තේ භීතියකි;
q210 'අපි ඔහු ප්‍රතික්ෂේප කරමු.
q210 ප්‍රතික්ෂේප කරමු' කියා මාගේ හිත මිතුරෝ
පවා කියති.
q210 මාගේ වැටීම ද ඔව්හු බලා සිටිති.
q210 'සමහර විට ඔහු රැවටෙනු ඇත;
q210 එවිට ඔහු පරාජය කොට ඔහුගෙන් පළිගන්නට
අපට පුළුවනැ'යි ඔව්හු කියති.
11 එහෙත් සමිඳුනි, ඔබ තුමාණෝ මහා යුද
වීරයකු සේ මා සමඟ සිටින සේක.
q211 එබැවින් මාගේ පීඩාකාරයෝ පැකිළෙන්නෝ ය;
q211 ඔව්හු ජය නොගන්නෝ ය;
q211 ඔවුන්ට ජය ගැනීමට බැරි නිසා ඔව්හු
ලජ්ජාවට පත් වන්නෝ ය.
q211 එය කවදාවත් අමතක නොවන සදාකාල
අවනම්බුවක් වන්නේ ය.
12 සව් බලැති සමිඳුනි, සැදැහැවතුන් පිරික්සන,
මාගේ සතුරන්ගේ සිත හද විනිවිද දකින ඔබ
තුමාණන් මාගේ සතුරන්ගෙන් පළිගනු දැකීමට මට
වර දුන මැනව.
q212 මම මාගේ විනිශ්චය ඔබ අතට පවරන්නෙමි.
13 සමිඳුන්ට ගී ගයන්න;
q213 එතුමාණන් පසසන්න.
q213 මන්ද, එතුමාණෝ නපුරු මිනිසුන්ගේ අතින්
පීඩිත වූවන් මුදාලන සේක.
14 ජෝබ් 3:1-19 මා උපන් දවසට සාප වේ වා!
q214 මාගේ මවු මා වැදූ දවසට ද ආසිරි නො වේ
වා!
15 "ඔබට පිරිමි දරුවෙකු උපන්නේ ය" කියා මාගේ
පියාට දන්වා ඔහු ප්‍රීතිමත් කළ මිනිසාට සාප වේ
වා!
16 ඒ මිනිසා, සමිඳුන් නිර්දය ලෙස විනාශ කළ
නගර මෙන් වේ වා!
q216 උදෑසන අනතුරු ඇඟවීම ද මද්දහනේ යුද
ගොස ද ඔහුට ඇසේ වා!
17 එසේ සිදු වන්නේ, එතුමාණන් මා මවු කුසේ
නොමැරූ නිසා ය.
q217 මට මවු ගැබ සොහොන් ගැබ විණි නම්, එය
සදහට ම උතුම් වන්නට තිබිණි.
18 දුකත්, ශෝකයත් දැකීමට ද මාගේ දවස්
ලජ්ජාවෙන් පසු කරන්නට ද මවු කුසෙන් මා නික්ම
ආවේ මන් ද?

## ජෙරුසලමේ පරාජය දැන්වීම

21 ශෙදෙකියා රජු මල්කියාගේ පුත් පෂ්හුර් සහ
පූජකයා වන මයසේයාගේ පුත් පූජක
ශෙපෙනියා ද ජරෙමියා වෙත යවා මෙසේ ඇසුවේ ය.
එවිට සමිඳාණන් වහන්සේගෙන් ඔහුට මේ
පණිවුඩය ලැබුණේ ය. 2 2 රාජා 25:1-11; 2 වංශා
36:17-21ඔව්හු ජරෙමියා අමතා, "අනේ! අප උදෙසා
සමිඳාණන් වහන්සේගෙන් විමසන්න. මන්ද,
බබිලෝනියේ රජු වන නබෙකද්නෙශර් අපට විරුද්ධ
ව යුද්ධ කරන්නේ ය; සමහර විට සමිඳාණන්
වහන්සේ අප උදෙසා කළ පුදුම ක්‍රියා අනුව අප
ගැන ක්‍රියා කරමින් නබෙකද්නෙශර් අප කෙරෙන්
ඉවත් වී යාමට සලස්වනු ඇතැ"යි කී හ.
3 එවිට ජරෙමියා ඔවුන් අමතා, "ඔබ ශෙදෙකියාට
මෙසේ කියන්න: 4 'ඉශ්‍රායලේවරුන්ගේ දෙවි
ස්වාමීන් වහන්සේ මෙසේ වදාරන සේක: පවුරට
පිටතින් ඔබ හැම වටලාගෙන සිටින බබිලෝනියේ
රජුටත්, කල්දිවරුන්ටත් විරුද්ධ ව යුද්ධ කිරීමට ගෙන
ඇති, ඔබේ අත්වල තිබෙන, යුද්ධායුධ මම ඔබට ම
විරුද්ධ ව හරවන්නෙමි. මේ නගරය මැදට මම ඔවුන්
රැස් කරන්නෙමි. 5 මම ද, මාගේ මහ බලය
මෙහෙයවමින් කෝපයෙන් ද උදහසින් ද තද
අමනාපයෙන් ද ඔබට විරුද්ධ ව යුද්ධ කරන්නෙමි.
6 මේ නගරයේ ජීවත් වන මිනිසුන් හා මෘගයන්
සියලු දෙනාට මම පහර දෙන්නෙමි. 7 ජුදාහි රජු වන
ශෙදෙකියා ද ඔහුගේ සේවකයෝ ද මහා
වසංගතයකින් මරනු ලබති. මහා වසංගතයෙන් ද
කඩුවෙන් ද සාගතයෙන් ද ගැළවෙන සෙනඟත්,
නගරයේ ඉතිරි වන සෙනඟත්, මම බබිලෝනියේ
රජු වන නබෙකද්නෙශර් අතටත්, ඔවුන්ගේ සතුරන්
අතටත්, ඔවුන් ඝාතනය කරන්නට සොයන අය
අතටත් පාවා දෙන්නෙමි. නබෙකද්නෙශර් ඔවුන්
මරාදමනු ඇත; ඔවුන් එකකු වත් ඉතිරි කරන්නේ

නැත. ඔවුන්ට කරුණා කරන්නේ වත්, අනුකම්පා
කරන්නේ වත් නැත. මෙසේ පවසන්නේ ස්වාමීන්
වන මම ය.' "
8 එවිට සමිඳාණන් වහන්සේ ජෙරෙමියාට කතා කර,
සෙනඟට මෙසේ කියන්නැ යි වදාළ සේක: "සවන්
දෙන්න; ජීවත්වීමේ මාර්ගයත්, මරණයේ මාර්ගයත්
මම නුඹලා ඉදිරියේ තබමි. 9 මේ නගරයේ සිටින
අය කඩුවෙන් ද සාගතයෙන් ද වසංගතයෙන් ද
මැරෙන්නෝ ය. එහෙත්, ඔබ වටලාගෙන සිටින
බබිලෝනිවරුන් වෙත ගොස් ඔවුන්ට යටත් වන්නෝ
ජීවත් වන්නෝ ය. ඔව්හු පණ ගළවාගෙන බේරී
යන්නෝ ය. 10 මේ නගරයේ ශුභසිද්ධිය පිණිස
නොව, විපත්තිය පිණිස මාගේ මුහුණ ඒ දෙසට
යොමා ඇත. එය බබිලෝනියේ රජු අතට පාවා දෙනු
ලබන්නේ ය. ඔහු එය ගින්නෙන් දවාදමන්නේ ය.
මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය."

## ජුදා රාජ වංශය විනිශ්චය කිරීම

11 ජුදා රජුගේ වංශයට ජෙරෙමියා කතා කොට
මෙසේ කීවේ ය: "සමිඳාණන් වහන්සේ වදාළ මේ
දේට සවන් දෙන්න. 12 දාවිත්ගේ පෙළපතේ
වැසියෙනි, සෑමදා ම යුක්තිය ඉටු කරන්නට වග
බලාගන්න. කොල්ලකනු ලැබූ අය පීඩාකාරයන්ගේ
අතින් නිදහස් කරන්න. එසේ නොකළොත්,
නුඹලාගේ ක්‍රියාවල දුෂ්ටකම නිසා මාගේ කෝපය
කිසිවකුට නිවන්නට බැරි ගින්නක් මෙන් ඇවිලෙනු
ඇත. 13 තැනිතලාවට ඉහළින් නැඟෙන පර්වතයේ
වාසය කරන්නන්ට විරුද්ධ ව මම සටන් කරමි.
'නුඹලාට විරුද්ධ ව කිසිවකු බැස එන්නේ වත්,
නුඹලාගේ වාසස්ථානවලට ඇතුළු වන්නේ වත්
නැතැ'යි නුඹලා කියන්නහු ය. 14 එහෙත්, මම
නුඹලාගේ ක්‍රියාවල විපාකය හැටියට නුඹලාට
දඬුවම් කරන්නෙමි. මම එහි ඇති කැළෑ රොදට
ගිනිලන්නෙමි. ඊට හාත්පසින් ඇති සියලු තැන් එයින්
දැවී යන්නේ ය. මෙසේ පවසන්නේ ස්වාමීන් වන
මම ය."

## ජුදාහි රජවරුන් ගැන දිවැස් වැකි

22 සමිඳාණන් වහන්සේ මට කතා කොට, "ජුදා
රජුගේ මාලිගාවට ගොස් මේ වචන
පවසන්න. 2 දාවිත්ගේ සිංහාසනයේ හිඳින ජුදාවේ
රජුටත්, ඔහුගේ සේවකයන්ටත්, මේ දොරටුවලින්
ඇතුළු වන වැසියන්ටත් සමිඳාණන් වහන්සේගේ
වචනයට සවන් දෙන්න කියන්නැ"යි වදාළ සේක.
3 "සාධාරණ ලෙස ද අවංක ලෙස ද ක්‍රියා කරන්න.
කොල්ලකනු ලැබූ අය පීඩාකාරයන්ගේ අතින්
නිදහස් කරන්න. විදේශිකයාටත්, අනාථයාටත්,
වැන්දඹුවටත් අයුක්තියක් හෝ සැහැසිකමක් හෝ
නොකරන්න. මේ ස්ථානයේ අහිංසක ලේ
නොහෙළන්න. 4 නුඹලා මාගේ වචනයට කීකරු
වන්නහු නම්, දාවිත්ගේ පරපුරෙන් පැවත එන රජ
පරපුර නොකැඩී පවතියි; ඔව්හු ද ඔවුන්ගේ
සේවකයෝ ද සෙනඟ ද රථවල හා අශ්වයන් පිට
නැඟී, මේ මාලිගාවේ දොරටුවලින් ඇතුළු වන්නෝ
ය. 5 මතෙ 23:28; ලූක් 13:35එහෙත්, නුඹලා මේ
වචන සිතට නොගත්තොත්, මේ මාලිගාව නටබුන්
ගොඩක් වන්නේ යයි මම ම නුඹලාට දිවුරා කියමි.
මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය.
6 "ජුදා රජ මැඳුර ගැන සමිඳාණන් වහන්සේ
මෙසේ පවසන සේක: ගිලියද් දේශය මෙන් ද
ලෙබනොන් කඳු මුදුන මෙන් ද එය මට පියකරු ය.
එහෙත්, මම එය කාන්තාරයක් ද වැසියන් නැති
නගරයක් ද කරන්නෙමි. 7 එය විනාශ කිරීමට මම
අවිගත් සෙනඟක් සූදානම් කරමි. ඔව්හු අනර්ඝ
කිහිරි ගස් කපා ගින්නෙහි දමන්නෝ ය.
8 "බොහෝ විජාතීන් මේ නගරය ළඟින් යමින්,
ස්වාමීන් වන මා මේ උදාර නගරයට මෙසේ කළේ
මන්දැ යි එකිනෙකාගෙන් අසනු ඇත. 9 එවිට ඔවුන්
පිළිතුරු දෙමින්, 'ඔවුන් තමන්ගේ සමිඳාණන්
වහන්සේගේ ගිවිසුම අත්හැර අන් දෙවිවරුන්ට
නමස්කාර කොට, ඔවුන්ට සේවය කළ නිසා ය'යි
කියනු ඇත."

## ජෝවාහාස් ගැන ජෙරෙමියාගේ පණිවුඩය

10 එම්බා ජුදා ජනයෙනි, මියගිය ජොෂියා රජු ගැන
ශෝක නොවන්න; ඔහුගේ මරණය ගැන
නොවැලපෙන්න. එහෙත්, ඔහුගේ පුත් ජෝවාහාස්
ගැන කෑගසා අඬන්න. මන්ද, ඔවුන් ඔහු ගෙන යන
බැවිනි. ඔහු හැරී එන්නේ නැත. තමන් උපන් දේශය
ඔහු තවත් නොදකින්නේ ය.
11 2 රාජා 23:31-34; 2 වංශා 36:1-4 ජොෂියා
රජුගේ ඇවෑමෙන් ජුදාහි රජකමට පත් වූ එතැනින්
පලා ගිය ඔහුගේ පුත් ජෝවාහාස් ගැන සමිඳාණන්
වහන්සේ කතා කොට, 12 "ඔහු වහල්කමට
ගෙනයනු ලැබූ තැන ම නසින්නේ ය. ඔහුගේ මේ
දේශය කවදාවත් ඔහු නැවත නොදකින්නේ යැ"යි
වදාළ සේක.

## ජෙහෝයාකීම් රජ ගැන ජෙරෙමියාගේ පණිවුඩය

13 "අසාධාරණ ලෙස තමාගේ නිවසෙ තනාගන්නා
වූ වංචාවෙන් උඩුමහල සාදාගන්නා වූ කුලී නොදී
මිනිසුන්ගෙන් නිකමට වැඩ ගන්නා වූ මිනිසාට වන
විපතක මහත!
14 'විශාල උඩුමහල් මැඳුරු ඇති මහා වලව්වක් මම
ම සාදාගනිමි'යි කියමින්, කිහිරි ලීවලින් පනේල
අල්ලා කවුළු දමා රතු සායම් ගාන මිනිසාට වන
විපතක මහත!
15 කිසිවකට දෙ වන නොවන කිහිරි ලීයෙන්
නිවාසයක් තනා ගැනීමෙන් නුඹ රජ කෙනෙකු කියා
සිතන්නෙහි ද?
q215 නුඹේ පියා සැපට කා බී යුතු දේත්, සාධාරණ
දේත් කර හැම අතින් ම සමෘද්ධ වුණා නොවේ ද?
16 ඔහු දිළිඳු අසරණයන්ට යුක්තිය ඉටු කළේ ය.
q216 ඒ නිසා ඔහු කළ හැම දේ සඵලවත් විය.
q216 සමිඳුන් අදහාගැන්ම යන්නෙන් අදහස්
කරන්නේ එය යි.

17 එහතේ, නුඹේ නතෙත්, සිතත් ආත්මාර්ථයට
පමණක් යොමු වී ඇත.
q2[17] නුඹ අහිංසකයන් මරන්නහෙි ය;
q2[17] සනෙඟට සැහැසිකම් හා පීඩා කරන්නහෙි ය.
q2[17] මසෙේ පවසන්නේ සමිඳාණන් වහන්සේ ය.”
18 2 රාජා 23:36—24:6; 2 වංශා 36:5-7 එබැවින්
ජොෂියාගේ පුත් ජුදාහි රජු වන ජහෙෝයාකිම් ගැන
සමිඳාණන් වහන්සේ මසෙේ වදාරන සේක: “
‘අනේ! මාගේ සහෝදරය, අනේ! මාගේ සහෝදරිය’
කියා ඔහු ගැන කිසිවකේ නොවැලපතේ. ‘අනේ!
ස්වාමීනි, අනේ රජිඳුනි,’ කියා ද කිසිවකේ
නොවැලපතේ. 19 කොටළුවකෙු වළලන පරිදි ඔහු
ජරෙුසලමේ දොරටුවලින් එපිටට ඇදගනෙ ගොස්
වළට විසි කොට වළලනු ලබනු ඇත.”

## ජරෙුසලමේ ඉරණම

20 ජරෙුසලමේ ජනයනෙි, ඔබේ සියලු ම
පමේවතුන් පරාජය වී සිටින නිසා ලබෙනොන්
කන්දට නැඟී ගොස් මොරගසන්න. බාෂාන් දේශයට
ගොස් හඬන්න; අබාරිම් කඳු වැටියනේ මොරහඬ
දනේන. 21 ඔබ යහෙනේ සුවනේ සිටිය දී සමිඳාණන්
වහන්සේ ඔබට කතා කළ සේක. එහතේ, ඔබ
සවන් දුන්නේ නැත. උන් වහන්සේගේ හඬට කීකරු
නොවීම යොවුන් වියේ සිට ම ඔබේ පුරුද්දකි.
22 ඔබේ මුලිකයෝ සුළඟට ගසාගනෙ යන්නෝ ය.
ඔබේ පමේවත්හු හිරකරුවන් මනේ ගනෙයනු
ලබන්නෝ ය. එවිට ඔබේ සියලු නපුරුකම් ගැන ඔබ
ලජ්ජාවටත්, නින්දාවටත් පැමිණනේනහෙි ය.
23 අහෝ! ලබෙනොන් වැසියනෙි, කිහිරි ගස් අතර
සුරක්ෂිත ව සිටින ඔබට විළිරුදාවනේ පළෙනෙ
ස්ත්‍රියක මනේ දුක් වේදනාව ඇති වූ විට ඔබ
කඳෙිරි ගාන්නහෙි ය.

## ජකෙොනියා රජ කරෙේ දේව විනිශ්චය

24 2 රාජා 24:8-15; 2 වංශා 36:9-10
ජහෙෝයාකිම්ගේ පුත් ජුදාහි රජ වූ ජකෙොනියාට
සමිඳාණන් වහන්සේ මසෙේ වදාළ සේක: “නුඹ
මාගේ දකුණතේ මුද්‍රාව මනේ සිටි නමුත්, මම නුඹ
උදුරාදමන්නමේ යි සහතික කොට කියමි. 25 නුඹේ
ප්‍රාණය හානි කරන්නට සොයන්නන් අතටත්, නුඹ
බියනේ සිටි අයගේ අතටත් එනම්, බබිලෝනියේ
රජු වන නබෙුකද්නසෙර් අතටත්, ඔවුන්ගේ
හේවායින් අතටත් මම නුඹ පාවා දමේ. 26 නුඹත්,
නුඹ වැදූ නුඹේ මවුත් නුඹලා නූපන් අන් දේශයකට
හළෙදමන්නමේ. එහි දී නුඹලා මැරනෙු ඇත.
27 නුඹලා ආපසු එන්නට ආශා කරන දේශයට
නුඹලා පරෙළා නොඑන්නහු ය.”
28 ජරෙමියා මසෙේ කී ය: “ජකෙොනියා කමකට
නැති, බිඳුණු බඳුනක් ද? ඔහු කිසිවකෙුට පලක් නැති
බඳුනක් ද? ඔහු සහ ඔහුගේ වංශය ප්‍රතික්ෂේප
කරනු ලැබ, ඔවුන් නොදන්න දේශයකට නරෙපා
දමනු ලබන්නේ කුමක්නිසා ද? 29 එම්බා දේශය,
දේශය, දේශය, සමිඳාණන් වහන්සේ කියන මේ
වචනයට සවන් දනේන. 30 ‘මේ මිනිසා දරුවන් නැති,
තම ජීවිත කාලයේ දී කිසි සඵලයක් නොලැබූ
මිනිසකෙු’යි කියන්න. මන්ද, ඔහුගේ වංශයේ
කිසිවකෙුට තවත් දාවිත්ගේ සිංහාසනයේ හිඳ ජුදා
දේශයහෙි රජකම් කිරීමට නොලැබනේනේ ය.
මසෙේ පවසන්නේ ස්වාමීන් වන මම ය.”

## අනාගත බලාපොරොත්තුව

23 “මාගේ තණ බිමේ පෝෂණය වන
බැටළුවන් වනසා විසුරුවා හරින එඬේරුන්
පිට සමිඳාණන් වහන්සේගනේ පැමිණනෙ විපතක
මහත! 2 මාගේ සනෙඟ පෝෂණය කළ යුතු මේ
එඬේරුන් ගැන ඉශ්‍රායලේවරුන්ගේ දවේ ස්වාමීන්
වහන්සේ වදාරන දේට සවන් දනේන, ‘නුඹලා
මාගේ බැටළුවන් රැක බලා නොගනෙ, ඔවුන්
විසුරුවා පන්නාදැමුවහු ය. දැන් මම නුඹලාගේ නපුරු
ක්‍රියා නිසා නුඹලාට දඬුවම් කරන්නමේ. මසෙේ
පවසන්නේ ස්වාමීන් වන මම ය. 3 එහතේ, මාගේ
රැළනේ ඉතිරි වන්නන් මා විසින් ඔවුන් පන්නාදමනු
ලැබූ සියලු දේශවලින් මම ම රැස් කර නැවත
ඔවුන්ගේ ගාලට ගනෙනේනමේ; ඔව්හු බෝ වී වැඩි
වන්නෝ ය. 4 ඔවුන් පෝෂණය කරන පිණිස මම
එඬේරුන් පත් කරන්නමේ. ඔව්හු තවත් බිය
නොවන්නෝ ය; නොකැළඹනේනෝ ය. ඔවුන්ගනේ
එකකේ වත් නැති නොවන්නේ ය. මසෙේ
පවසන්නේ ස්වාමීන් වන මම ය.
5 ජරෙ 33:14-16 “ස්වාමීන් වන මම මසෙේ
වදාරමි: දාවිත්ගේ පළෙපතින් දැහැමි රජ කනෙකෙු
නැඟී එන කාලය පැමිණනේනේ ය. එතුමාණන්
නැණනුවණින් රජකම් කරමින්, දැහැමිකමත්
යුක්තියත් දේශය මුළුල්ලේ ඉටු කරනු ඇත.
6 එතුමන්ගේ රජ දවස, ජුදා ගළවනු ලබන්නෝ ය.
ඉශ්‍රායලේවරු සුරැකි ව වසන්නෝ ය. ‘අපේ
දැහැමිතාව’ යන්නනේ එතුමාණෝ නම් කරනු
ලබන්නාහ.
7 “ස්වාමීන් වන මම මසෙේ වදාරන්නමේ:
‘ඉශ්‍රායලේ සනෙඟ මිසර දේශයනේ ගනො ජීවමාන
සමිඳාණන් වහන්සේ නමින් අපි දිවුරමු’යි නොකියන
කාලය පැමිණනේනේ ය. 8 ඒ වනෙුවට ‘ඉශ්‍රායලේ
සනෙඟ උතුරු දේශයනේ ද ඔවුන් පන්නාදමනු ලැබූ
සියලු දේශවලින් ද ගනො සමිඳාණන් වහන්සේගේ
නමින් අපි දිවුරමු’යි කියන කාලය පැමිණනේනේ ය.
ඔව්හු තමන්ගේ ම දේශයේ වාසය කරන්නෝ ය.”

## දිවැසිවරුන් ගැන ජරෙමියාගේ පණිවුඩය

9 මේ දිවැසිවරුන් පිළිබඳ ව මාගේ සිත බිඳී මාගේ
ඇටකටු සැලනෙු ඇත. සමිඳාණන් වහන්සේ නිසාත්,
උන් වහන්සේගේ ශුද්ධ වචනය නිසාත් මම මත් වී
සිටින්නකෙු වැනි ය; මුද්‍රික පානයනේ වරෙිමත් වී
සිටින්නකෙු වැනි ය. 10 මන්ද, දේශය
කාමමිථ්‍යාචාරිකයන්ගනේ පිරී ඇත; සාපයක් නිසා
දේශය වැලපයෙි; පාළුකරයේ තණ බිම් වියළී ඇත;

ඔවුන්ගේ හැසිරීම නපුරු ය. ඔව්හු සිය බලය වැරදි
ලෙස භාවිත කරති.
11 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
“දිවැසිවරයා හා පූජකයා දූෂ්‍ය වී සිටිති. මාගේ
මැඳුරෙහි ඔවුන්ගේ නපුරුකම මට දක්නට ලැබී ඇත.
12 ඔවුන්ගේ මාර්ග අඳුරේ දී ලිස්සන සුළු ඒවා මෙන්
වේ. ඔව්හු ඒවාට පන්නාදමනු ලැබ එහි වැටෙන්නෝ
ය. ඔවුන්ට දඬුවම් කිරීමේ කාලය පැමිණි විට මම
ඔවුන් පිට විපත් පමුණුවන්නෙමි. මෙසේ පවසන්නේ
ස්වාමීන් වන මම ය. 13 සමාරියේ දිවැසිවරුන්
අතරේ පිළිකුල් කටයුතු දේ මා දැක ඇත. ඔව්හු
බාල් දෙවියාගේ නාමයෙන් දිවැස් වැකි කියා මාගේ
ම ඉශ්රායලේ සෙනඟ මුළා කළහ. 14 උත් 18:20;
එසකි 16:49ජෙරුසලමේ දිවැසිවරුන් අතරේ ඉතා
භයානක දේ මා දැක ඇත. ඔව්හු කාමමිථ්‍යාචාරය
කරති; බොරු කියති; නපුර කිරීමෙන් වැළකෙන්නේනට
බැරි පමණට වැරදි කරන්නට සෙනඟ පොළඹවති.
ඔවුන් සියල්ලන් ම මට පෙනෙන්නේ සොදොම් හා
ගොමොරා වැසියන් මෙනි.
15 “එබැවින් සියලු බලැති ස්වාමීන් වන මම,
ජෙරුසලමේ දිවැසිවරුන් ගැන මෙසේ කියමි: මම
ඔවුන්ට තිත්ත කදුරු කවන්නෙමි. වස දිය
පොවන්නෙමි. මන්ද, දේශය මුළුල්ලේ ම
ජෙරුසලමේ දිවැසිවරුන්ගෙන් දූෂණ පැතිර ගොස්
ඇත.
16 “සියලු බලැති සමිඳාණන් වහන්සේ ජෙරුසලමේ
සෙනඟට මෙසේ වදාරන සේක: දිවැසිවරුන් බොරු
බලාපොරොත්තුවලින් නුඹලා පුරවා ඇති නිසා
ඔවුන්ට සවන් නොදෙන්න. ඔවුන් නුඹලාට
කියන්නේ, තමන්ගේ සිතෙන් මවාගත් දේ මිස මා
ඔවුන්ට කී දේ නොවේ. 17 මාගේ වචනය හෙළා
දකින අයට ඔව්හු, ‘නුඹලාට ශුභසිද්ධ වේ වා!’යි
කියති. මුරණ්ඩු සිතින් සිය කැමැත්ත අනුව යන
අයට ඔව්හු, ‘නුඹලාට කිසි විපතක් නොවේ ය’යි
කියති.
18 “මේ දිවැසිවරුන් අතරේ සමිඳාණන්
වහන්සේගේ අභ්‍යන්තර අදහස් දැනගත්, උන්
වහන්සේගේ පණිවුඩය තේරුම්ගත්, උන්
වහන්සේගේ වචනයට සවන් දී එය සිතට ගත්
කිසිවෙකේ සිටිත් දැ”යි ජෙරමියා ඇසී ය. 19 “බලන්න,
සමිඳාණන් වහන්සේගේ උදහස දරුණු සුළි සුළඟක්
මෙන් හමමින්, දුෂ්ටයන්ගේ හිස මත කඩා වැටෙයි.
20 සමිඳාණන් වහන්සේ සිය අභිප්‍රායයන් ඉටු කර
සම්පූර්ණ කරන තුරු උන් වහන්සේගේ කෝපය
නොනිවෙන්නේ ය. මතු කාලයේ දී උන්
වහන්සේගේ සෙනඟ එය මැනවින් තේරුම්ගනු
ඇතැ”යි ඔහු කීවේ ය.
21 සමිඳාණන් වහන්සේ මෙසේ වදාළ සේක: “මා
මේ දිවැසිවරුන් නොයැවූ නමුත්, ඔව්හු සැණෙන් පලා
ගියහ. මා ඔවුන්ට කතා නොකළ නමුත්, ඔව්හු දිවැස්
දෙසූ හ. 22 ඔව්හු මාගේ උවදෙසේ දැන සිටියෝ නම්,
මාගේ පණිවුඩය මාගේ සෙනඟට ප්‍රකාශ කර,
ඔවුන්ගේ නපුරු ගතිපැවතුම්වලින් ඔවුන් හරවන්නට
ඔවුන්ට ඉඩ තිබිණි.
23 “මම දුර සිටින දෙවි කෙනෙකු මෙන් ම, ළඟ
සිටින දෙවි කෙනෙක් ද වෙමි. මෙසේ පවසන්නේ
ස්වාමීන් වන මම ය. 24 මට නොපෙනෙන තැනක
සැඟවීමට කිසිවෙකුට නොහැකි ය. මා ස්වර්ගයේත්,
පොළොවේත් සෑම තැන ම වැඩ සිටින බව නුඹලා
නොදන්නහු ද? 25 ‘මම සිහිනයක් දිටිමි, සිහිනයක්
දිටිමි’ කියමින් මාගේ නාමයෙන් බොරුවට දිවැස්
වැකි කියන දිවැසිවරුන්ගේ කියුම් මා අසා ඇත.
26 බොරුවට දිවැස් වැකි කියන, තමන්ගේ සිත්හි
මවාගත් දේ දිවැස් වැකි වශයෙන් පවසන,
දිවැසිවරුන්ගේ සිත්වල මුසාව කොතෙක් කල් පවතී
ද? 27 මේ සෙනඟගේ පියවරුන් මා අමතක කර
බාල් දෙවියා වෙත හැරුණාක් මෙන්, දිවැසිවරු තමන්
එකිනෙකාට කියන සිහින කරණකොටගෙන මාගේ
සෙනඟට මා අමතක කරන්න සැලැස්වීමට අභිප්‍රාය
කරති. 28 සිහිනයක් දුටු දිවැසිවරයා එය තමාගේ
ස්වප්නයක් බව කිව යුතු ය. මාගේ පණිවුඩයක් ලත්
තැනැත්තා එය විශ්වාසවන්ත ලෙස ප්‍රකාශ කළ යුතු
ය. පිදුරුත්, ධාන්‍යත් අතර ඇති සමානකම කුමක් ද?
29 මාගේ පණිවුඩය වූකලී ගින්නක් වැනි ය; පර්වත
පොඩි කරන කුළුගෙඩියක් වැනි ය. මෙසේ
පවසන්නේ ස්වාමීන් වන මම ය. 30 මාගෙන් ලැබූ
වචනය යයි කියමින් එකිනෙකාගෙන් හොරා ගත්
වචන ප්‍රකාශ කරන මේ දිවැසිවරුන්ට මම විරුද්ධ
වෙමි. 31 තවද, ‘සමිඳාණන් වහන්සේ වදාළ සේකැ’යි
කියමින් තමන්ගේ ම වචන පවසන දිවැසිවරුන්ටත්
මම විරුද්ධ වෙමි. 32 ස්වාමීන් වන මා වදාරන දේට
සවන් දෙන්න. බොරු සිහින දිවැස් කීම් වශයෙන්
ප්‍රකාශ කරමින්, තමන්ගේ බොරුවලින් ද හිස්
පාරට්ටුවෙන් ද මාගේ සෙනඟ මුළා කරන
දිවැසිවරුන්ට මම විරුද්ධ වෙමි. මම ඔවුන්
නොයැව්වෙමි. ඔවුන්ට අණ නොකෙළෙමි. ඔවුන්ගෙන්
මේ සෙනඟට කිසි ප්‍රයෝජනයක් නොවන්නේ ය.
මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය.”

### සමිඳාණන් වහන්සේගේ පණිවුඩය

33 “ජෙරමියා, මාගේ සෙනඟගෙන් කෙනෙකු වත්,
දිවැසිවරයෙකු වත්, පූජකයෙකු වත් නුඹ අමතා,
‘සමිඳාණන් වහන්සේගේ පණිවුඩය කුමක් දැ’යි
නුඹෙන් ඇසුවොත්, ‘නුඹලා උන් වහන්සේට බරක් වී
ඇතැ’යි ද ‘උන් වහන්සේ නුඹලා ඉවතදමන
සේකැ’යි ද ඔවුන්ට කියන්න. 34 එහෙත්,
දිවැසිවරයෙකු හෝ පූජකයෙකු හෝ සෙනඟගෙන්
කෙනෙකු හෝ, ‘සමිඳාණන් වහන්සේගේ වචනය
සිතට බරක් ය’යි කීවොත්, මම ඔහුටත්, ඔහුගේ
පවුලටත් දඬුවම් කරමි. 35 ඒ වෙනුවට, නුඹලා
එකිනෙකා, ‘සමිඳාණන් වහන්සේ දී ඇති පිළිතුර
කුමක් ද, සමිඳාණන් වහන්සේ කුමක් වදාළ සේක්
ද’ කියා තමන්ගේ අසල්වැසියන්ගෙන් හා
ඥාතීන්ගෙන් ඇසිය යුතු ය. 36 ‘සමිඳාණන්
වහන්සේගේ පණිවුඩය සිතට බරක් ය’යි ඔවුන්
තවත් නොකිය යුතු ය. ‘සිතට බරක්’ වන්නේ නුඹලා
එකිනෙකාගේ වචන ය. නුඹලා ජීවමාන දෙවියන්

වන, සියලු බලැති ස්වාමීන් වන තමන්ගේ දෙවියන්
වහන්සේගේ වචන දූෂණ කළහු ය. 37 ජෙරමියා,
දිවැසිවරුන් අමතා, 'සමිඳාණන් වහන්සේ දුන් පිළිතුර
කුමක් ද, උන් වහන්සේ කුමක් වදාළ සේක් ද' කියා
අසන්න. 38 ඔවුන් පිළිතුරු දෙමින්, 'සමිඳාණන්
වහන්සේගේ පණිවුඩය බරක් යැ'යි කීවොත්, 'එසේ
නොකියන්නැ'යි මා ඔවුන්ට කී නමුත්, ඔවුන් එසේ
කී බැවින්, 39 'මම ඔවුන්ටත්, ඔවුන්ගේ පියවරුන්ටත්
දුන් නගරය ද ඔවුන් ද සහමුලින් ම උදුරාදමා මා
කරෙන් ඉවතට විසි කරන්නෙමි'යි ඔවුන්ට කියන්න.
40 කවදාවත් අමතක නොවන සදාකාල නින්දාවක් ද
නිරන්තර අපකීර්තියක් ද ඔවුන් පිට මම
පමුණුවන්නෙමි."

## අත්තික්කා කූඩ දෙක

24 2 රාජා 24:12-16; 2 වංශා 36:10 දේව
මාලිගාව ඉදිරිපිට තබා තිබෙන අත්තික්කා
ගෙඩි පුරවන ලද කූඩ දෙකක් සමිඳාණන් වහන්සේ
මට පෙන්වූ සේක. මේ දර්ශනය සමිඳාණන්
වහන්සේ පෙන්වූයේ, බබිලෝනියේ රජු වූ
නබුකද්නෙසර් විසින් ජෙහෝයාකිම්ගේ පුත් ජුදාහි
රජු වූ ජෙකොනියා ද ජුදාහි අධිපතීන් ද
කම්හල්කරුවන් ද ලෝහකරුවන් ද ජෙරුසලමෙන්
අල්ලාගෙන බබිලෝනියට ගෙනයනු ලැබුවාට පසුව
ය. 2 එක කූඩයක කලින් ඉදෙන, හොඳ අත්තික්කා
පල තිබුණේ ය. අනික් කූඩයේ කන්නට බැරි තරම්
ඉතා නරක අත්තික්කා තිබුණේ ය. 3 එවිට
සමිඳාණන් වහන්සේ "ජෙරමියා, නුඹට කුමක්
පෙනේ දැ"යි මාගෙන් ඇසූ සේක. මම පිළිතුරු
දෙමින්, "අත්තික්කා ය; හොඳ අත්තික්කා ඉතා හොඳ
ය; නරක ඒවා කන්න බැරි තරම් ඉතා නරක ය"යි
කීවෙමි.
4 සමිඳාණන් වහන්සේ මා අමතා මෙසේ වදාළ
සේක: 5 "ඉශ්රායෙල්හි දෙවි ස්වාමීන් වන මම
බබිලෝනියට යවනු ලැබූ යහපත් ජුදෙව්වරුන් මේ
හොඳ අත්තික්කා මෙන් වන්නට සලසමි. 6 මම
ඔවුන් මැනවින් රැකබලාගෙන ආපසු මේ දේශයට
ගෙනෙන්නෙමි; ඔවුන් හෙළා නොදමා වර්ධනය
කරන්නෙමි. ඔවුන් උදුරා නොදමා පිහිටුවන්නෙමි.
7 මා සමිඳාණන් වහන්සේ බව දැනගන්න පිණිස
ඔවුන්ගේ සිත් පහදන්නෙමි. එවිට ඔවුන් මුළු සිතින්
ම මා වෙත හැරෙන බැවින් ඔව්හු මාගේ සෙනඟ
වන්නෝ ය. මම ඔවුන්ගේ සමිඳාණන් වහන්සේ
වන්නෙමි.
8 "එහෙත්, ජුදාහි රජු වන ශෙදෙකියා ද ඔහුගේ
අධිපතීන් ද මේ දේශයේ ඉතිරි ව සිටින
ජෙරුසලමේ සෙසු අය ද මිසර දේශයේ වාසය
කරන්නන් ද ස්වාමීන් වන මම, කන්නට බැරි අර
නරක අත්තික්කා මෙන් වන්නට සලසමි. 9 ලොවේ
සියලු ජාතීන් තැති ගන්වන සුළු විනාශයක් මම
ඔවුන් පිට පමුණුවන්නෙමි. විජාතීන් ඉදිරියෙහි
ඔවුන්ට නින්දාව ද සමච්චලය ද සරදම ද ඇත; මා
ඔවුන් විසුරුවා හරින සෑම තැන්හි ම ඔවුන් සාපයක්
වනු ඇත. 10 ජෙරෙ 7:34; 16:9; එළිද 18:22-23මා
ඔවුන්ටත්, ඔවුන්ගේ පියවරුන්ටත් දුන් දේශයේ
කිසිවකු ඉතිරි නොවන ලෙස යුද්ධයත්, සාගතයත්,
වසංගතයත් ඔවුන් කෙරෙහි පමුණුවන්නෙමි."

## බබිලෝනිය දඬුවම් දීමේ ආයුධයක්

25 2 රාජා 24:1; 2 වංශා 36:5-7; දානි 1:1-2
ජොෂියාගේ පුත් ජුදාහි රජු වූ
ජෙහෝයාකිම්ගේ සතර වන අවුරුද්දේ ජුදාහි
සෙනඟ සම්බන්ධයෙන් ජෙරමියා වෙත සමිඳාණන්
වහන්සේගෙන් පැමුණුණ පණිවුඩය මෙය වේ. එය
බබිලෝනියේ රජු වූ නබුකද්නෙසර්ගේ පළමු වන
අවුරුද්ද විය. 2 දිවැසිවර ජෙරමියා ඒ පණිවුඩය ජුදාහි
මුළු සෙනඟටත්, ජෙරුසලමේ සියලු වැසියන්ටත්
මෙසේ ප්රකාශ කෙළේ ය: 3 "ආමොන්ගේ පුත්
ජුදාහි රජු වූ ජොෂියාගේ දහතුන් වන අවුරුද්දේ
පටන් අද දක්වා මේ අවුරුදු විසිතුනේ ම සමිඳාණන්
වහන්සේගේ වචනය මා වෙත පැමිණියේ ය. මම ද
නිරන්තරයෙන් එය ඔබට ප්රකාශ කෙළෙමි. එහෙත්,
ඔබ සවන් දුන්නේ නැත. 4 තවද, සමිඳාණන්
වහන්සේ තමන්ගේ සියලු සේවකයන් වූ දිවැසිවරුන්
නිරන්තරයෙන් ඔබ වෙත එවූ නමුත්, ඔබ ඔවුන්ට
සවන් දුන්නේ වත්, ඔවුන් කී දේ සිතට ගත්තේ වත්
නැත. 5 ඔව්හු ඔබ අමතා, 'සමිඳාණන් වහන්සේ
ඔබටත්, ඔබේ පියවරුන්ටත් පුරාණයේ සිට
සදාකාලයට ම දුන් දේශයෙහි ඔබ වාසය කරන
පිණිස ඔබ හැම දෙනා ම ඔබේ අධම ජීවිතයෙන් ද
නපුරු ක්රියාවලින් ද හැරී ආ යුතු ය'යි ද 6 'අන්
දෙවිවරුන්ට වැඳුම්පිදුම් නොකරන්න. ඔවුන්ට
නමස්කාර නොකරන්න; ඔබේ අත්වලින් සාදාගත්
දේව රූප නැමදීමෙන් දෙවියන් වහන්සේ ප්රකෝප
නොකරන්න. එවිට මම නුඹලාට අනතුරක්
නොකරමි'යි සමිඳාණන් වහන්සේ වදාරන සේකැ යි
ද කී හ. 7 'එහෙත්, නුඹලා මට සවන් නොදී, ඒ
වෙනුවට නුඹලාගේ අත්වලින් තනාගත් රූප
කරණකොටගෙන මා කෝප කරවා, නුඹලා ම තමන්
පිට මේ දඬුවම පමුණුවා ගත්තහු ය'යි සමිඳාණන්
වහන්සේ වදාරන සේක.
8 "ඔබ සමිඳාණන් වහන්සේගේ වචනයට සවන්
නොදෙන නිසා සියලු බලැති සමිඳාණන් වහන්සේ
මෙසේ වදාරන සේක: 9 මම උතුරු දිශාවේ සියලු
ජාතීන් ද බබිලෝනියේ රජු වන මාගේ සේවක
නබුකද්නෙසර් ද ගෙන්වන්නෙමි. මා ඔවුන්
ගෙන්වන්නේ, මේ දේශයට හා මෙහි වැසියන්ටත්,
අවට ජාතීන්ටත් විරුද්ධ ව සටන් කරන පිණිස ය.
මම සහමුලින් ම ඔවුන් විනාශ කරන්නෙමි. ඔව්හු
නින්දාවට ද සමච්චලයට ද සදා අපවාදයට ද භාජන
වන්නෝ ය. 10 ජෙරෙ 7:34; 16:9; එළිද 18:22-23ඇරත්
මම ඔවුන්ගේ ප්රීති ප්රමෝදයේ හඬ ද මනාලයා
හා මනාලියගේ හඬ ද ඇඹරුම් ගල්වල ශබ්දය සහ
පහනේ එළිය ද ඔවුන් අතරෙන් නැති කරන්නෙමි.
11 මේ මුළු දේශය විනාශ වී නටබුන් ගොඩක්
වන්නේ ය. මේ ජාතීහු බබිලෝනියේ රජුට සැත්තෑ

අවුරුද්දක් සේවය කරන්නෝ ය.
12 2 වංශා 36:21;
ජෙරෙ 29:10; දානි 9:2තවද, සැත්තෑ අවුරුද්දක් ගත වූ
පසු, බබිලෝනියේ රජුටත්, ඒ ජාතියටත් ඔවුන්ගේ
අයුතුකම් නිසා මම දඬුවම් කරන්නෙමි. ඒ දේශය
සදාකාල පාළු තැනක් කරන්නෙමි.
13 මා ඒ දේශයට
විරුද්ධ ව ප්‍රකාශ කළ සියලු දේ එනම්, මේ
පොතේ සඳහන් කර ඇති, ජෙරමියා කී සියලු දේ ඒ
දේශය පිට පමුණුවන්නෙමි.
14 බොහෝ ජාතීහු ද
බලසම්පන්න රජවරු ද ඔවුන් වහල්කමට ගන්නෝ
ය. මම ද ඔවුන්ගේ හැසිරීම හා ක්‍රියා අනුව
ඔවුන්ට ප්‍රතිවිපාක දෙන්නෙමි.”

### ජාතීන් කෙරෙහි දේව විනිශ්චය

15 ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවි ස්වාමීන් වහන්සේ
මට කතා කොට, “කෝපය නමැති මිදියුස කුසලාන
නුඹ මාගේ අතින් රැගෙන මා නුඹ පිටත් කර යවන
සියලු ජාතීන්ට එයින් පොවන්න.
16 ඔව්හු එයින් බී
වැනි වැනී ගමන් කරන්නෝ ය. මා ඔවුන් පිට
පමුණුවන යුද්ධය නිසා, ඔව්හු උමතු වන්නෝ ය”යි
වදාළ සේක.
17 එවිට මම සමිඳාණන් වහන්සේගේ අතින්
කුසලාන රැගෙන සමිඳාණන් වහන්සේ මා යැවූ
සියලු ජාතීන්ට එයින් පෙව්වෙමි.
18 එයින්
ජෙරුසලමේ සහ ජුදා නගරවල රජවරුන් ද අධිපතීන්
ද අද පවා දකින්නට ලැබෙන ලෙස පාළුවට හා
විනාශයට ද සාපයට හා සරදමට ද භාජන වනු ඇත.
සිදු වී ඇති දේ අද දක්වා දක්නට ඇත.
19 මිසරයේ රජු වන පාරාවෝටත්, ඔහුගේ
සේවකයන්ටත්, අධිපතීන්ටත්, ඔහුගේ මුළු
සෙනඟටත්,
20 අන්‍ය ජාතික මුළු සේනාවටත්, ඌස්
දේශයේ සියලු රජවරුන්ටත්, පිලිස්තිවරුන්ගේ
දේශයේ සියලු රජවරුන්ටත්, අෂ්කලෝන්, ගාසා
සහ එක්‍රෝන් යන නගරවලටත්, අෂ්දොද්හි ඉතිරි
අයටත්,
21 ඒදොම් සහ මෝවබ්ටත්, අම්මොන්
පුත්‍රයන්ටත්,
22 තීර්හි හා සීදොන්හි සියලු
රජුන්ටත්, මුහුදුබඩ පළාත්වල රජවරුන්ටත්,
23 දදොන්, තෙමොන් හා බුස් යන නගරවලටත්,
තමන්ගේ ඉසකේ කොටට කපන සියල්ලන්ටත්,
24 අරාබියේ සියලු රජවරුන්ටත්, කාන්තාරයෙහි
වාසය කරන අන් ජාතික සියලු රජවරුන්ටත්,
25 සිම්රිහි, ඒලාම්හි සහ මේදියාවේ සියලු රජුන්ටත්,
26 එකිනෙකොට සමීප ව සිටින්නන් සහ දුර ව
සිටින්නන් වන උතුරු දිශාවේ සියලු රජුන්ටත්,
පොළොව මතුපිට තිබෙන ලෝකයේ සියලු
රාජ්‍යවලටත්, මේ කුසලානෙන් පෙව්වෙමි; මොවුන්ට
පසු ව බබිලෝනියේ රජු එයින් පානය කරනු ඇත.
27 එවිට සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ
සේක: “නුඹ ඔවුන්ට කතා කොට, ‘නුඹලා බීමත් වී
වමනය කොට, මා විසින් නුඹලා අතරට එවනු ලබන
යුද්ධය නිසා වැටී නොනැඟිට සිටින්නැ යි
ඉශ්‍රායෙල්වරුන්ගේ සියලු බලැති දෙවි ස්වාමීන්
වහන්සේ වදාරන සේකැ’යි කියන්න.
28 එවිට ඔව්හු
බොන පිණිස නුඹේ අතින් කුසලාන ගන්නට
අකමැති වන්නෝ නම්, ‘ඔවුන් බොන්නට ම ඕනෑ
යයි සියලු බලැති සමිඳාණන් වහන්සේ වදාරන
සේකැ’යි ඔවුන්ට කියන්න.
29 ‘මෙන්න මාගේ නාමය
තබා තිබෙන නගරයට විපත්ති පමුණුවන්ට මම
පටන්ගනිමි; එසේ නම්, නුඹලා දඬුවම් නොලැබ
සිටිනු ඇතැ යි නුඹ සිතන්නෙහි ද? නැත.
පොළොවේ සියලු වැසියන්ට විරුද්ධ ව මා යුද්ධයක්
හටගන්වන නිසා නුඹලා දඬුවම් නොලැබ
නොසිටින්නෝ ය. මෙසේ පවසන්නේ, සියලු බලැති
ස්වාමීන් වන මම ය.
30 “ජෙරමියා, මා නුඹට කී සියලු දේ නුඹ ඔවුන්ට
ප්‍රකාශ කළ යුතු ය. ඔවුන්ට මෙසේ දිවැස් වැකි
කියන්න: ‘සමිඳාණන් වහන්සේ උසස් ස්ථානයේ සිට
ගර්ජනා කොට, තමන්ගේ ශුද්ධ වාසස්ථානයේ සිට
හඬ නඟන සේක. උන් වහන්සේ තමන් සෙනඟට
විරුද්ධ ව බලවත් ලෙස ගර්ජනා කරන සේක.
මුද්‍රික පල මඬින්නන් මෙන් සියලු පොළෝ
වැසියන්ට විරුද්ධ ව ඝෝෂාවක් කරන සේක;
31 මහා ශබ්දයක් පොළොවේ සීමාන්තයන් දක්වා
පැමිණෙන්නේ ය; උන් වහන්සේ ජාතීන්ට විරුද්ධ ව
පැමිණිල්ලක් කර ඇත. ජීවත් ව සිටින සියල්ලන් උන්
වහන්සේ විනිශ්චයයට පමුණුවන සේක. දුෂ්ටයන්
මරණයට පාවා දෙන සේක. මෙසේ පවසන්නේ,
ස්වාමීන් වන මම ය.’
32 “ ‘ජාතියක් ජාතියක් පාසා විපතට
පැමිණෙන්නේ ය’යි ද ‘ඉමහත් කුණාටුවක්
පොළොවේ ඉතා දුර තැන්වලින් නඟින්නේ ය’යි ද
සියලු බලැති සමිඳාණන් වහන්සේ වදාරන සේක.
33 සමිඳාණන් වහන්සේ විසින් මරනු ලබන අය ඒ
දවසේ දී පොළොවේ එක් කෙළවරක සිට අනික්
කෙළවර දක්වා වැටී සිටිනු ඇත. ඔවුන් ගැන
වැලපෙන්නට කිසිවෙක් නොවෙති; වළලනු පිණිස
ඔවුන්ගේ මළ සිරුරු රැගෙන යාමට කිසිවෙක්
නොසිටිති. ඒවා භූමිය මතු පිට කසළ මෙන් විසිරී
තිබෙනු ඇත.
34 “නායකයෙනි, කෑ මොරගසන්න; සෙනඟගේ
ප්‍රධානියෙනි, අළුවල පෙරළී හඬන්න. මාරක විපත්
කාලය ද විසිර යෑමේ කාලය ද ළඟා වී ඇත.
තෝරාගත් බැටළුවන් මෙන් නුඹලා ඝාතනය කරනු
ලබන්නහු ය.
35 නායකයන්ට රැකවරණය
සොයන්නට වත්, පලා යන්නට වත්, ප්‍රධානීන්ට
ගැළවී යන්නට වත් නොලැබෙන්නේ ය.
36 නායකයන්ගේ කෑ මොරගැසීම ද සෙනඟගේ
ප්‍රධානීන්ගේ හැඬීම ද ඇසෙන්නේ ය. මන්ද,
සමිඳාණන් වහන්සේ ඔවුන්ගේ දේශය විනාශ කර
ඇත.
37 සාමයෙන් පැවති ඔවුන්ගේ දේශය
සමිඳාණන් වහන්සේගේ කෝපය කරණකොටගෙන
විනාශයට පත් වී ඇත.
38 සිංහයා සිය ගුහාව
අත්හැර යන්නාක් මෙන් සමිඳාණන් වහන්සේ සිය
දේශය අත්හැරදමන සේක. භයානක යුද්ධය නිසා ද
සමිඳාණන් වහන්සේගේ දැඩි කෝපය නිසා ද
ඔවුන්ගේ දේශය පාළුකරයක් වී ඇත.”

## ජරෙමියාගේ දේශනාව

26 2 රාජා 23:36—24:6; 2 වංශා 36:5-7
ජොෂියාගේ පුත් ජුදාහි රජු වූ
ජෙහෝයාකිම්ගේ රජ සමය මුල දී, සමිඳාණන්
වහන්සේගේ වචනය ජරෙමියා වෙත පැමිණියේ ය.
2 සමිඳාණන් වහන්සේ මෙසේ වදාළ සේක: “නුඹ
සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ මළුවේ සිට,
ජුදාහි නගරවලින් නමස්කාර කරන්නට එන සියලු
දෙනාට මා නුඹට අණ කළ සියලු වචන කියන්න;
වචන මාත්‍රයක් වත් අඩු නොකර කියන්න.
3 සමහර විට ඔවුන් එය අසා එකිනකො තම
තමාගේ නපුරු මාර්ගයෙන් හැරෙනු ඇත. එවිට මම
ඔවුන්ගේ නපුරු ක්‍රියා නිසා ඔවුන්ට පමුණුවන්නට
අදහස් කළ විපත්ති ගැන මාගේ සිත වෙනස්
කරගන්නෙමි.
4 “සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක
කියා ඔවුන්ට කියන්න. ‘මාගේ වචනයට සවන්
නොදී, මා නුඹලා ඉදිරියෙහි තබා තිබෙන
ව්‍යවස්ථාවට අනුකූල ව නුඹලා නොහැසිරෙන්නෙහු
නම්, 5 නිරන්තරයෙන් ම මා නුඹලා වෙත එවූ මාගේ
සේවකයන් වන දිවැසිවරුන්ගේ පණිවුඩය
නොසලකන්නහු නම්, 6 ජෝෂු 18:1; ගීතා 78:60;
ජරෙ 7:12-14එවිට, මම ෂිලෝවට කළ දේ මගේ දේව
මාලිගාවටත් කරන්නෙමි. ලොවේ සියලු ජාතීන් මගේ
නගරයේ නම සාපවචනයක් වශයෙන් ව්‍යවහාර
කිරීමට සලසන්නෙමි.’ ”
7 ජරෙමියා දේව මාලිගාවේ දී කී මේ වචන
පූජකයෝ ද දිවැසිවරු ද සියලු සෙනඟ ද ඇසුවෝ ය.
8 මුළු සෙනඟට කියන්නට සමිඳාණන් වහන්සේ අණ
කළ සියල්ල ජරෙමියා කියා නිම කළ විට, පූජකයෝ
ද දිවැසිවරු ද මුළු සෙනඟ ද ඔහු අල්ලාගෙන, “ඔබ
මරණයට පත් කළ යුතු ය. 9 ‘මේ දේව මාලිගාව
ෂිලෝ මෙන් වන්නේ ය’ කියාත්, ‘මේ නුවර වැසියන්
නොසිටින හැටියට පාළු වන්නේ ය’ කියාත්
සමිඳාණන් වහන්සේගේ නාමයෙන් ඔබ දිවැස් වැකි
කීවේ මන්දැ”යි ඇසූ හ. එවිට මුළු සෙනඟ
ජරෙමියාට විරුද්ධ ව ඔහු වටකරගෙන දේව
මාලිගාවේ රොක් වූ හ.
10 ජුදාහි අධිපතීහු ඒ කාරණය අසා, රජ ගෙදර
සිට සමිඳාණන් වහන්සේගේ මාලිගාවට අවුත්,
සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ අලුත්
දොරටුවෙහි ඇතුළු වන තැන අසුන්ගත්හ. 11 එවිට
පූජකයෝ ද දිවැසිවරු ද අධිපතීන්ටත්, මුළු
සෙනඟටත් කතා කොට, “මේ මිනිසා මරණීය
තීන්දුව ලැබිය යුතු ය. මන්ද, ඔබ හැමගේ
කන්වලින් ඔබ ඇසූ පරිදි මොහු මේ නගරයට
විරුද්ධ ව දිවැස් වැකි කීවේ ය”යි කී හ.
12 එවිට ජරෙමියා සියලු ම අධිපතීන් හා මුළු
සෙනඟ අමතා මෙසේ කී ය: “ඔබ ඇසූ සියලු වචන
දිවැස් වැකි වශයෙන් මේ දේව මාලිගාවටත්,
නගරයටත්, ඔබ හැමටත් විරුද්ධ ව කියන්නට
සමිඳාණන් වහන්සේ මා එවූ සේක. 13 එබැවින් දැන්
ඔබ හැමගේ හැසිරීම හා ක්‍රියා කලාපය
හැඩගස්වාගෙන ඔබේ දෙවි ස්වාමින් වහන්සේගේ
හඬට කීකරු වන්න. එවිට සමිඳාණන් වහන්සේ
ඔබට විරුද්ධ ව ප්‍රකාශ කර තිබෙන විපත්ති ගැන
සිය අදහස වෙනස් කරගන්න සේක. 14 මම දැන්
ඔබේ අතෙහි ය. ඔබට සුදුසු යැ යි පෙනෙන හැටි
මට කරන්න. 15 මේ දේ නම් සහතික ය. ඔබ මා
මැරුවොත්, ඔබ හැම ද මේ නුවර සියලු ජනයා ද
නිදොස් ලේ වැගිරීම ගැන වරදකාරයෝ වන්නෝ ය.
මක්නිසා ද, සැබැවින් ම මේ සියලු දේ ඔබට කියන
පිණිස සමිඳාණන් වහන්සේ මා එවූ බැවිනි.”
16 එවිට අධිපතීහු ද සෙනඟ ද පූජකයන් හා
දිවැසිවරුන් අමතා, “මේ මිනිසාට මරණීය තීන්දුව දිය
යුතු නැත. මන්ද, ඔහු අපට කතා කළේ, අපේ දෙවි
ස්වාමින් වහන්සේගේ නාමයෙන් ය”යි කී හ.
17 එකල දේශයේ ප්‍රජා මූලිකයෝ නැඟිට රැස්ව
සිටි සෙනඟ අමතා මෙසේ කී හ: 18 මීකා
3:12“ජුදාහි රජු වූ හෙසකියාගේ කාලයේ දී
මොරෙෂ්තියේ දිවැසිවර මීකා ජුදාහි මුළු සෙනඟට
කතා කොට, ‘සියොන් කෙතක් මෙන් හානු ලබන්නේ
ය; ජෙරුසලම නටබුන් ගොඩක් වන්නේ ය; දේව
මාලිගාව ඇති කන්ද කැළෑවක් වන්නේ යයි
සමිඳාණන් වහන්සේ වදාළ සේකැ’යි කී ය.
19 එහෙත්, ජුදාවේ රජු වූ හෙසකියා සහ සියලු
ජුදාවරු ඔහු මැරුවෝ ද? ඒ වෙනුවට හෙසකියා
සමිඳාණන් වහන්සේට බිය වී උන් වහන්සේට
කන්නලව් කළේ නැද් ද? සමිඳාණන් වහන්සේ ද
ඔවුන්ට විරුද්ධ ව ප්‍රකාශ කළ විපත ගැන සිය
අදහස් වෙනස් කළ සේක. දැන් අප, අප පිට ම
දරුණු විපතක් පමුණුවාගන්නට ළඟ ය.
20 “තවද, සමිඳාණන් වහන්සේගේ නාමයෙන්
දිවැස් වැකි පැවසූ කිරියත්-ජයොරිම්හි ෂෙමායාගේ
පුත් උරියා නම් මිනිසෙක් විය. ඔහු ජරෙමියාගේ
සියලු වචනවලට අනුකූල ව මේ නගරයටත්, මේ
දේශයටත් විරුද්ධ ව දිවැස් වැකි කීවේ ය.
21 ජෙහෝයාකිම් රජු සහ ඔහුගේ සියලු
බලවන්තයන් ද සියලු අධිපතීන් ද ඔහුගේ වචනය
ඇසූ විට, රජ තෙමේ ඔහු මරන්නට සෙව්වේ ය. උරියා
ඒ අසා බිය ව පලා ගොස් මිසරයට පැමිණියේ ය.
22 එහෙත්, ජෙහෝයාකිම් රජ අක්බොර්ගේ පුත්
එල්නාතාන් ද ඔහු සමඟ තවත් මිනිසුන් ද මිසරයට
යැවී ය. 23 ඔව්හු උරියා මිසරයෙන් ආපසු ගෙනවුත්
ජෙහෝයාකිම් රජු ළඟට පැමිණෙවුවෝ ය. රජ ද
ඔහු කඩුවෙන් ගසා මරා, ඔහුගේ මළකඳ පොදු
ජනයන්ගේ සොහොනක දැමුවේ ය.”
24 ජරෙමියා මරන පිණිස සෙනඟගේ අතට පාවා
දෙනු නොලැබුවේ, ෂාපාන්ගේ පුත් අහිකාම්ගේ
සහය ඔහුට තිබුණු බැවිනි.

## බබිලෝනියේ වියගහ

27 2 රාජා 24:18-20; 2 වංශා 36:11-13
ජොෂියාගේ පුත් ජුදාහි රජ වූ ශෙදෙකියා
රජකම් කරන්නට පටන්ගත් කාලයේ ද සමිඳාණන්

වහන්සේගේ පණිවුඩය ජෙරෙමියා වෙත පැමිණියේ
ය. 2 සමිඳාණන් වහන්සේ ඔහුට කතා කොට,
“වියබාන් හා වියගස් සාදාගෙන ඔහුගේ ගෙලෙ වටේ
දමාගන්නැ”යි වදාළ සේක. 3 තවද, ජුදාහි රජු වූ
ශෙදෙකියා බැහැදැක්ම පිණිස ජෙරුසලමට පැමිණි
තානාපතිවරුන් අත ඒදොම්, මෝවබ්, අම්මොන්, තීර්,
සීදොන් යන රටවල රජවරුන් වෙත පණිවුඩයක්
යවන්නට සමිඳාණන් වහන්සේ ජෙරෙමියාට වදාළ
සේක. 4 “ඉශ්රායලේහි සියලු බලැති දෙවි ස්වාමීන්
වහන්සේ ඒ රජවරුන්ට මෙසේ වදාරන සේකැ”යි ඒ
තානාපතිවරුන්ට කියන ලෙස සමිඳාණන් වහන්සේ
ජෙරෙමියාට වදාළ සේක. 5 ඒ කෙසේ ද යත්: “මම
මාගේ ඉමහත් බලයෙන් ද පරාක්රමවත් බාහුවෙන්
ද පොළොව සහ පොළොව මතුපිට සිටින මිනිසුන් ද
තිරිසනුන් ද මැව්මි. මා කැමැති කෙනෙකුට මට ඒවා
දිය හැකි ය. 6 මම මේ සියලු රටවල් මාගේ
සේවක වන නබුකද්නෙසර්ගේ අතට පාවා දිනිමි.
ඔහුට සේවය කරන පිණිස ගවමහිෂයන් පවා ඔහුට
දිනිමි. 7 ඔහුගේ රටේ වැටීම ඇති වන තෙක්, සියලු
ජාතීන් ඔහුටත්, ඔහුගේ පුත්රයන්ටත්, පුත්රයන්ගේ
පුත්රයන්ටත් සේවය කරනු ඇත. ඉන්පසු ඔහුගේ
රාජ්යය, බලවත් අන් රාජ්යයන්ටත්, උසස්
රජවරුන්ටත් සේවය කරනු ඇත.
8 “යම් ජාතියක් හෝ රාජ්යයක් හෝ බබිලෝනියේ
රජු වන නබුකද්නෙසර්ට සේවය නොකරන්නේ
නම්, ඔහුගේ පාලනය නමැති වියගහට කර
තබන්නේ නැත්නම්, මා ඒ ජාතිය හෝ රාජ්යය හෝ
නබුකද්නෙසර් ලවා වනසාදම්මන තුරු, මම එයට
කඩුවෙන් ද සාගතයෙන් ද වසංගතයෙන් ද දඬුවම්
කරන්නෙමි. මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය.
9 එබැවින්, ‘නුඹලා බබිලෝනියේ රජුට සේවය
නොකරන්නැ’යි කියන නුඹලාගේ දිවැසිවරුන්ට ද
පේන කියන්නන්ට ද සිහින දකින්නන්ට ද
මායම්කාරයන්ට ද අනවිනකාරයන්ට ද සවන්
නොදෙන්න. 10 එයින් සිදු වන්නේ, මුසාවෙන් ඔවුන්
නුඹලා මුළා කිරීම වේ. නුඹලා මා විසින් නුඹලාගේ
දේශයෙන් නෙරපා, පන්නා දමනු ලැබ විනාශයට පත්
වන්නහු ය. 11 එහෙත්, බබිලෝනියේ රජුගේ
පාලනය නමැති වියගහ කර තබාගෙන ඔහුට
සේවය කරන ඕනෑ ම ජාතියකට සිය රටෙහි නැවතී,
එය වගා කර, එහි වාසය කරන්නට මම ඉඩ
හරින්නෙමි. මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම
ය.”
12 ජුදාහි රජු වූ ශෙදෙකියාට ද ජෙරෙමියා එම දේ
කීවේ ය. කෙසේ ද යත්, “බබිලෝනියේ රජුගේ
පාලනය නමැති වියගහ ඔබේ කරට ගෙන ඔහුට
සහ ඔහුගේ සෙනඟට සේවය කරන්න. එවිට ඔබ
ජීවත් වන්නෙහි ය. 13 බබිලෝනියේ රජුට සේවය
නොකරන ඕනෑ ම ජාතියක් සම්බන්ධයෙන්
සමිඳාණන් වහන්සේ කියා ඇති පරිදි ඔබ සහ ඔබේ
සෙනඟ කඩුවෙන් ද සාගතයෙන් ද වසංගතයෙන් ද
මැරෙන්නේ කුමට ද? 14 බබිලෝනියේ රජුට සේවය
නොකරන්නැ යි කියන දිවැසිවරුන්ට සවන්
නොදෙන්න. ඔව්හු ඔබට බොරු දිවැස් වැකි කියති.
15 සමිඳාණන් වහන්සේ ඒ දිවැසිවරුන් නොඑවූ
බවත්, උන් වහන්සේගේ නමින් ඔවුන් බොරු කියන
බවත් සමිඳාණන් වහන්සේ ම වදාළ සේක. ඒ නිසා,
උන් වහන්සේ ඔබ ද ඔබට දිවැස් වැකි පවසන
දිවැසිවරුන් ද පලවා හරින සේක. ඔබ සියල්ලන් ම
මරු මුවට පත් වනු ඇත.”
16 එවිට ජෙරෙමියා, පූජකවරුන්ටත්, දිවැසිවරුන්ටත්
කතා කරමින් මෙසේ කී ය: “සමිඳාණන් වහන්සේ
මෙසේ වදාරන සේක. දේව මාලිගාවේ භාණ්ඩ
ඉක්මනින් ම බබිලෝනියෙන් නැවත ගෙනෙනු ලැබේ
යයි නුඹලාට දිවැස් වැකි කියන නුඹලාගේ
දිවැසිවරුන්ගේ වචනවලට සවන් නොදෙන්න. ඔව්හු
නුඹලාට බොරු දිවැස් වැකි පවසති. 17 ඔවුන්ට සවන්
නොදෙන්න. බබිලෝනියේ රජුට සේවය කර ජීවත්
වන්න. මේ නගරය පාළුකරයක් කරන්නට ඉඩ
තබන්නේ කුමට ද? 18 ඔව්හු සැබෑවට ම මාගේ
වචනය පවසන දිවැසිවරු නම්, දේව මාලිගාවේත්,
ජුදා රජුගේ මාලිගාවේත්, ජෙරුසලමේත් ඉතිරි ව
ඇති භාණ්ඩ බබිලෝනියට ගෙන නොයන ලෙස
සියලු බලැති ස්වාමීන් වන මට කන්නලව් කරත් වා.
19+JER “බබිලෝනියේ රජු වූ නබුකද්නෙසර්,
ජෙහෝයාකිම්ගේ පුත් ජුදාහි රජු වූ ජෙකොනියා ද
ජුදාහි හා ජෙරුසලමේ ප්රධානීන් ද අල්ලාගෙන
බබිලෝනියට යද්දී, ඔහු කුළුණු, ලෝකඩ තටාකය,
මැසි හා දේව මාලිගාවේ අනික් භාණ්ඩ ගෙන ගියේ
නැත.
21 “ඉන්පසු ජෙරුසලමෙහි සමිඳාණන් වහන්සේගේ
මාලිගාවේ ද ජුදාහි රජ මැඳුරෙහි ද ඉතිරි ව ඇති ඒ
භාණ්ඩ ගැන ස්වාමීන් වන මා වදාරන දේට සවන්
දෙන්න. 22 ඒවා බබිලෝනියට ගෙනයනු ලබන්නේ
ය; මා ඒවා සලකා බලන දවස දක්වා ඒවා එහි
තිබෙන්නේ ය. එවිට මම ඒවා ගෙනවුත් නැවත මේ
ස්ථානයට පමුණුවන්නෙමි. මෙසේ පවසන්නේ
ස්වාමීන් වන මම ය.”

### ජෙරෙමියා හා හනනියා

28 2 රාජා 24:18-20; 2 වංශා 36:11-13 එම
අවුරුද්දේ ම එනම්, ජුදාහි රජු වූ
ශෙදෙකියාගේ රාජ්ය කාලයේ සතර වන අවුරුද්දේ
පස් වන මාසයේ දී, අස්සුර්ගේ පුත් ගිබියොන්හි
පදිංචි දිවැසිවර හනනියා දේව මාලිගාවේ දී
පූජකයන් සහ මුළු සෙනඟ ඉදිරියේ ජෙරෙමියාට කතා
කළේ ය. 2 “ඉශ්රායලේහි සියලු බලැති දෙවි
ස්වාමීන් වහන්සේ මෙසේ වදාරන සේකැ”යි ඔහු කී
ය: “බබිලෝනියේ රජුගේ බලය මම බිඳදැමීමි.
3 බබිලෝනියේ රජු වූ නබුකද්නෙසර් මේ
ස්ථානයෙන් රැගෙන බබිලෝනියට ගෙන ගිය දේව
මාලිගාවේ සියලු ම භාණ්ඩ අවුරුදු දෙකෙක් ඇතුළත
දී නැවත මේ ස්ථානයට ගෙනෙන්නෙමි.
4 ජෙහෝයාකිම්ගේ පුත් ජුදාහි රජු වූ ජෙකොනියා ද
බබිලෝනියට ගෙනයනු ලැබූ සියලු ම ජුදෙව්වරුන් ද
මම නැවත මේ ස්ථානයට ගෙනෙන්නෙමි.

බබිලෝනියේ රජුගේ බලය මම සිඳදමන්නෙමි.
මෙසේ පවසන්නේ ස්වාමින් වන මම ය.”
5 එවිට දිවැසිවර ජරෙමියා පූජකයන් ද දේව
මාලිගාවේ සිටි සියලු සෙනඟ ද ඉදිරියෙහි සිට
දිවැසිවර හනනියාට කතා කොට මෙසේ කී ය:
6 “එසේ ම වේ වා! සමිඳාණන් වහන්සේ එසේ
කරන සේක් වා! ‘දේව මාලිගාවේ භාණ්ඩ ද
අල්ලාගෙන යනු ලැබූ සියල්ලන් ද නැවත
බබිලෝනියෙන් මේ ස්ථානයට ගෙනෙතේ වා!’යි ඔබ
කී දිවැස් වැකි සමිඳාණන් වහන්සේ ඉටු කරන
සේක් වා! 7 එසේ වුවත්, ඔබ ඉදිරියේත්, මේ
සෙනඟ ඉදිරියේත් සියල්ලන්ට ඇසෙන පරිදි මා
කියන මේ වචනය අසන්න. 8 මටත්, ඔබටත් පෙර,
පුරාණයේ පටන් සිටි දිවැසිවරුත්, ‘බොහෝ රටවලට
සහ බලවත් රාජ්‍යවලට විරුද්ධ ව යුද්ධය ද
විපත්තිය ද වසංගතය ද ඇති වේ’ යයි දිවැස් වැකි
පැවසූ හ. 9 ‘සාමය ඇති වේ’ යයි දිවැස් වැකි
පවසන ලද දිවැසිවරයා, සැබැවින් ම සමිඳාණන්
වහන්සේ විසින් එවන ලද දිවැසිවරයෙක් යයි
හඳුනාගත හැක්කේ ඔහුගේ වචන ඉෂ්ට වූ විට ය.”
10 එවිට හනනියා, ජරෙමියාගේ බෙල්ලෙන් වියගහ
හැරගෙන එය කැඩුවේ ය. 11 මුළු සෙනඟ ඉදිරියේ
හනනියා කතා කොට, “බබිලෝනියේ රජු වූ
නෙබුකද්නෙසර් ජාතීන්ගේ ගෙලෙ මත තබා ඇති
වියගහ අවුරුදු දෙකෙක් ඇතුළත දී සමිඳාණන්
වහන්සේ කඩාදමන්නේ මෙසේ ය”යි කී ය.
ජරෙමියා එතැනින් යන්නට ගියේ ය.
12 තවද, ජරෙමියාගේ ගෙලෙ මත තිබූ වියගහ
හනනියා කඩාදැමූ පසු, සමිඳාණන් වහන්සේ
ජරෙමියාට කතා කොට, 13 හනනියාට මෙසේ
කියන්න යයි වදාළ සේක: “නුඹ ලී වියගහක්
කඩාදැමුවෙහි ය. එහෙත්, ඒ වෙනුවට යකඩ
වියගහක් සාදන්නෙමි යි සමිඳාණන් වහන්සේ
වදාරන සේක. 14 බබිලෝනියේ රජු වන
නෙබුකද්නෙසර්ට සේවය කරන පිණිස යකඩ
වියගහක් සියලු ජාතීන්ගේ ගෙලෙ මත තබන්නෙමි යි
ඉශ්රායලේවරුන්ගේ සියලු බලැති දෙවි ස්වාමින්
වහන්සේ වදාරා ඇත. ගවමහිෂයන් පවා
නෙබුකද්නෙසර්ට සේවය කරන්නට සලස්වන්නෙමි යි
සමිඳාණන් වහන්සේ වදාරා ඇත.”
15 තවද, ජරෙමියා හනනියාට මෙසේ කීවේ ය:
“හනනියා, සවන් දෙන්න. සමිඳාණන් වහන්සේ ඔබ
එවා වදාළේ නැත. මිථ්‍යා මතයන් කෙරෙහි
විශ්වාසය තබන්නට ඔබ මේ සෙනඟට සැලැසුවෙහි
ය. 16 ‘නුඹ පොළොව මතුපිටින් මම
පහකරන්නෙමි’යි සමිඳාණන් වහන්සේ ම වදාරන
සේක. ඔබ සමිඳාණන් වහන්සේට විරුද්ධ ව
කැරලිකාර වචන ප්‍රකාශ කළ නිසා ඔබ මේ
අවුරුද්දේ මැරෙන්නෙහි ය.”
17 ඒ කී ලෙසෙ හනනියා එම අවුරුද්දේ සත් වන
මාසයේ දී මළේ ය.

### බබිලෝනියේ ජුදෙව්වරුන්ට ජරෙමියාගේ හසුන

29 2 රාජා 24:12-16; 2 වංශා 36:10 අල්ලාගෙන
යනු ලැබූ සෙසු නායකයන්ට ද පූජකයන්ට ද
දිවැසිවරුන්ට ද නෙබුකද්නෙසර් විසින් ජෙරුසලමෙන්
බබිලෝනියට හිරකරුවන් වශයෙන් ගෙනෙයනු ලැබූ
සෙනඟට ද දිවැසිවර ජරෙමියා විසින් ලියා යවන ලද
හසුන මෙයෙ වේ. 2 ඔහු එය ලියුවේ ජකොනියා
රජු ද මවු බිසව ද නපුංසකයන් ද ජුදා හා
ජෙරුසලමේ අධිපතීන් ද කම්මල්කාරයන් ද
ලෝහකරුවන් ද ජෙරුසලමෙන් පිටත් ව ගිය පසු ය.
3 මේ හසුන ජුදාහි රජු වූ ශෙදෙකියා, ෂාපාන්ගේ
පුත් එලාසා සහ හිල්කියාගේ පුත් ගමරියා අතින්
බබිලෝනියේ රජු වන නෙබුකද්නෙසර් වෙත යවන
ලදී. එහි මෙසේ ලියා තිබිණි: 4 “ඉශ්රායලේවරුන්ගේ
සියලු බලැති දෙවි ස්වාමින් වහන්සේ හිරකරුවන්
වශයෙන් ජෙරුසලමෙන් බබිලෝනියට ගෙන යන්නට
ඉඩ හැරිය සියල්ලන්ට උන් වහන්සේ මෙසේ වදාරන
සේක: 5 ‘නුඹලා ගෙවල් ගොඩනඟා, එහි වාසය
කරන්න; වතු වවා ඒවායින් ලැබෙන පල කන්න;
6 විවාහ වී දරුදැරියන් ලබාගන්න; නුඹලාගේ
පුත්‍රයන්ට භාර්යාවන් ද දූවරුන්ට පුරුෂයන් ද ලබා දී
දරුදැරියන් ලැබීමට ඔවුන්ට ඉඩ සලසා දෙන්න.
මෙසේ නුඹලාගේ සංඛ්‍යාව අඩුවන්නට ඉඩ නොදී
වැඩි කරන්න. 7 මම නුඹලා හිරකරුවන් වශයෙන්
යම් නගරයකට පැමිණවූවෙමේ ද එහි යහපත පිණිස
වැඩ කරන්න. ඒ උදෙසා මට යාච්ඤා කරන්න. ඒ
නගරයේ සෞභාග්‍යය ඇති වුවහොත්, නුඹලාගේ
සෞභාග්‍යයත් ඇති වන්නේ ය.’
8 ඉශ්රායලේවරුන්ගේ සියලු බලැති දෙවි ස්වාමින්
වහන්සේ මෙසේ වදාරන සේක: ‘නුඹලා අතරෙහි
සිටින නුඹලාගේ දිවැසිවරුන්ට ද පේන කියන්නන්ට
ද නොරැවටෙන්න; ඔවුන් දකින සිහින ගණනකට
නොගන්න. 9 මන්ද, ඔව්හු මාගේ නාමයෙන් නුඹලාට
බොරු දිවැස් වැකි පවසති. මම ඔවුන් නොඑව්වෙමි.
මෙසේ පවසන්නේ ස්වාමින් වන මම ය.’
10 2 වංශා 36:21; ජරෙ 25:11; දානි 9:2 “තවද,
සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
‘බබිලෝනියේ අවුරුදු සැත්තෑව සම්පූර්ණ වූ පසු මම
නුඹලා ගැන සලකා ආපසු නුඹලාගේ මවුබිමට
නුඹලා පැමිණවීමට මා කළ පොරොන්දුව ඉෂ්ට
කරන්නෙමි. 11 නුඹලාගේ සෞභාග්‍යය පිණිස මිස
විපත්තිය පිණිස නොවන, නුඹලාගේ අනාගත
බලාපොරොත්තු මුදුන් පමුණුවා දෙන මාගේ
යෝජනා මම හොඳින් දනිමි. මෙසේ පවසන්නේ
ස්වාමින් වන මම ය. 12 එවිට නුඹලා මට කන්නලව්
කරන්නහු ය; අවුත් මට යාච්ඤා කරන්නහු ය; මම ද
නුඹලාට ඇහුම්කන් දෙන්නෙමි. 13 ද්වි.නී. 4:29නුඹලා
මා සොයන්නහු ය. නුඹලා මුළු සිතින් මා සොයන
කල මා නුඹලාට සම්බ වනු ඇත. 14 සැබැවින් ම මා
නුඹලාට සම්බ වනු ඇත. නුඹලාගේ මවුබිමට මම
නුඹලා ආපසු ගෙනෙන්නෙමි. මා විසින් නුඹලා
විසුරුවා හරිනු ලැබූ සෑම රටකින් ම, සෑම තැන්වලින්

ම නුඹලා එක්රැස් කරන්නෙමි; නුඹලා හිරකරුවන්
වශයෙන් මා විසින් ගෙනයනු ලැබූ රටින් මම නුඹලා
ආපසු ගෙනෙන්නෙමි. මෙසේ පවසන්නේ ස්වාමීන්
වන මම ය.'
15 "බබිලෝනියේ දී සමිඳාණන් වහන්සේ ඔබට
දිවැසිවරුන් දුන් සේකැ යි ඔබ කියන්නහු ය.
16 දාවිත්ගේ සිංහාසනයේ වැඩ හිඳින රජු ගැන ද
ඔබ සමඟ හිරකරුවන් වශයෙන් ගෙනයනු නොලැබූ
ඔබේ සහෝදරයන් වන මේ නගරයේ වාසය කරන
මුළු සෙනඟ ගැන ද සියලු බලැති සමිඳාණන්
වහන්සේ වදාරන දේට සවන් දෙන්න. 17 සියලු
බලැති සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
'මම ඔවුන් අතරට යුද්ධය ද සාගතය ද වසංගතය ද
පමුණුවා ඔවුන් කන්නට බැරි තරම් නරක් වී තිබෙන
පිළිකුල් අත්තික්කා මෙන් කරන්නෙමි. 18 මම යුද්ධය
ද සාගතය ද වසංගතය ද උපකරණ කරගෙන ඔවුන්
ලුහුබැඳ ගොස්, පොළොවේ සියලු රාජ්‍යයන්ට ද
භීතියක් වන සේ සලසා, මා විසින් ඔවුන්
පන්නාදමන ලද සියලු ජාතීන් අතර ඔවුන් සාපයක් ද
සියල්ලන්ට භීතියක් ද සරදමක් ද නින්දාවක් ද
වන්නට සලස්වන්නෙමි. 19 මෙසේ කරන්නේ, මා
නිරන්තරයෙන් මාගේ සේවකයන් වූ දිවැසිවරුන්
ඔවුන් වෙත යැවූ නමුත්, ඔවුන් මාගේ වචනය
නොඇසූ නිසා ය. මෙසේ පවසන්නේ ස්වාමීන් වන
මම ය. 20 එබැවින්, මා විසින් ජෙරුසලමෙන්
බබිලෝනියට පලවා හරිනු ලැබූ විප්‍රවාසීන්
සියල්ලෙනි, නුඹලාගේ සමිඳාණන් වහන්සේ වන
මාගේ වචනයට සවන් දෙන්න.'
21 "සියලු බලැති සමිඳාණන් වන
ඉශ්‍රායලේවරුන්ගේ දෙවියන් වහන්සේගේ
නාමයෙන් බොරු දිවැස් වැකි ඔබ හැමට කියන
කෝලායාගේ පුත් ආහබ් ද මයසේයාගේ පුත්
සෙදෙකියා ද ගැන උන් වහන්සේ මෙසේ වදාරන
සේක: 'මම ඔවුන් බබිලෝනියේ රජු වන
නබුකද්නෙසර් අතට පාවා දෙන්නෙමි; ඔහු
නුඹලාගේ ඇස් හමුයෙහි ම ඔවුන් මරන්නේ ය.
22 බබිලෝනියේ විප්‍රවාසීන් ව සිටින සියලු ම
ජුදාවේවරුන්ට සාප වචනයක් මෙන් භාවිත කරන්නට
වුවමනා වූ විට, බබිලෝනියේ රජු විසින් ගින්නෙන්
දවනු ලැබූ සෙදෙකියාටත්, ආහබ්ටත් කළාක් මෙන්,
සමිඳාණන් වහන්සේ නුඹලාටත් කරන සේක් වා යි
කියනු ඇත. 23 මන්ද, ඔව්හු ඉශ්‍රායලේහි දුෂ්ටකම්
කොට තමන්ගේ අසල්වාසීන්ගේ භාර්යාවන් සමඟ
කාමමිථ්‍යාචාරය කළෝ ය. මාගේ නාමයෙන් බොරු
කියන්න මම ඔවුන්ට අණ නොකළෙමි. ඔවුන් කළ
දේ මම දනිමි. ඒ ගැන මම ඔවුන්ට විරුද්ධ ව සාක්ෂි
දරන්නෙමි. මෙසේ වදාරන්නේ සමිඳාණන් වහන්සේ
ය.' "

### ෂෙමායාගේ හසුන

24+JER ඉශ්‍රායලේවරුන්ගේ සියලු බලැති දෙවි
ස්වාමීන් වහන්සේ ජෙරමියාට කතා කොට
නෙහෙලොමියේ ෂෙමායාට මෙසේ කියන්නට වදාළ
සේක: "නුඹ නුඹේ නාමයෙන් ජෙරුසලමෙහි සිටින
මුළු සෙනඟටත්, මයසේයාගේ පූජක තනතුර දැරූ
සෙපනියාටත්, සියලු පූජකයන්ටත් ලියුම් ලියා මෙසේ
දැන්වූයෙහි ය. 26 'සමිඳාණන් වහන්සේ ජෙහෝයාදා
පූජකයා වෙනුවට පූජකවරයා වශයෙන් ඔබ පත් කළ
සේක. දැන් ඔබ දේව මාලිගාවේ ප්‍රධාන
නිලධාරියා වන්නෙහි ය. දිවැස් වැකි කියන හැම
පිස්සකු ම දඬුකඳේ ද විලංගුවල ද දැමීම ඔබේ
යුතුකම ය.' 27 එසේ නම්, දිවැස් වැකි කියන
අනාතොත්හි ජෙරමියාට නුඹ තරවටු නොකෙළේ
මන් ද? 28 කුමක් නිසා ද, ඔහු බබිලෝනියේ සිටින
සෙනඟ දීර්ඝ කාලයක් වහල්කමේ සිටින බවත්,
ඔවුන් ගෙවල් ගොඩනඟා එහි වාසය කළ යුතු
බවත්, වතු වවා ඒවායේ පල අනුභව කළ යුතු
බවත් අපට ලියා එවූ නිසා ය."
29 දිවැසිවර ජෙරමියාට ඇසෙන ලෙස පූජක
සෙපනියා මේ ලියුම් කියෙව්වේ ය. 30 එවිට
සමිඳාණන් වහන්සේ ජෙරමියාට කතා කොට,
31 "බබිලෝනියේ සිටින සියලු හිරකරුවන්ට
පණිවුඩයක් යවමින්, ෂෙමායා පිළිබඳ ව සමිඳාණන්
වහන්සේ වදාළ මේ දේ ද දන්වන්නැ"යි වදාළ
සේක. 32 කෙසේ ද යත්: "ස්වාමීන් වන මම
නෙහෙලොමියේ ෂෙමායාටත්, ඔහුගේ වංශයටත්
දඬුවම් කරන්නෙමි. මන්ද ඔහු දිවැසිවරයකු මෙන්
ඔබට කතා කරමින්, ඔහු පැවසූ අසත්‍ය දේ විශ්වාස
කිරීමට ඔබට සැලැස්සුවේ ය. එහෙත් මම ඔහු
නොඑව්වෙමි. ඔහු මට විරුද්ධ ව කැරලිකාර වචන
කතා කළ නිසා මේ සෙනඟ අතර වාසය කරන
කිසිවකු ඔහුගේ පරම්පරාවේ ඉතිරි වන්නේ නැත.
මා විසින් මාගේ සෙනඟට කරනු ලබන යහපත
ඔහුට දකින්නට නොලැබේ. ඔහුගේ වංශයේ
කිසිවෙක් මේ සෙනඟ අතර ජීවත් වන්නේත් නැත.
මෙසේ වදාරන්නේ ස්වාමීන් වන මම ය" යනු යි.

### සමිඳුන්ගේ පොරොන්දු

30 සමිඳාණන් වහන්සේගෙන් ජෙරමියාට
පණිවුඩයක් පැමිණියේ ය.
2 ඉශ්‍රායලේවරුන්ගේ දෙවි ස්වාමීන් වහන්සේ
මෙසේ වදාරන සේක: "මා නුඹට කී සියලු වචන
පොතක ලියන්න. 3 මන්ද, මාගේ සෙනඟ වන
ඉශ්‍රායලේවරුන්ගේත්, ජුදාවරුන්ගේත් සෞභාග්‍යය
ප්‍රදානය කරන දින ළඟා වන්නේ ය. මම ඔවුන්ගේ
පියවරුන්ට දුන් දේශයට ඔවුන් නැවත ගෙනෙන්නෙමි.
ඔව්හු එය භුක්ති විඳින්නෝ ය. මෙසේ වදාරන්නේ
ස්වාමීන් වන මම ය."
4 ඉශ්‍රායලේවරුන් සහ ජුදාවරුන් ගැන සමිඳාණන්
වහන්සේ වදාරන වචන මෙසේ ය: 5 "තැතිගන්වන
හඬක් මට ඇසුණේ ය. එය සාමයේ නොව,
භීතියේ හඬක් ය. 6 පුරුෂයකුට ප්‍රසව වේදනාව
ඇති විය හැකි ද කියා සිතා බලන්න. එසේ නොවේ
නම්, ප්‍රසව වේදනාව ඇති ස්ත්‍රියක මෙන් හැම
පුරුෂයකු ම ඉඟටියේ අත් තබාගෙන සිටිනවාත්,
මුහුණ සුදුමැලි වී තිබෙනවාත් මට පෙනෙන්නේ

කුමක් නිසා ද? 7 අහෝ! භයානක දවසක්
පැමිණෙන්නේ ය; ඊට සම කළ හැකි අන් දවසක්
නොවන්නේ ය. එය ජාකොබ්ගේ පරපුරට විපත්
දවසක් වන්නේ ය. එහෙත්, ඔවුන් එයින් ද ගළවනු
ලබනු ඇත.”
8 සියලු බලැති සමිඳාණන් වහන්සේ මෙසේ
වදාරන සේක: “ඒ දවස පැමිණි විට මම ඔවුන්ගේ
ගෙලෙ මත ඇති වියගහ කඩාදමමි. ඔවුන්ගේ විලංගු
බිඳදමන්නෙමි. ඔව්හු තවත් විදේශීන්ට වහල්
නොවන්නෝ ය. 9 ඒ වෙනුවට ඔවුන් තමන්ගේ දෙවි
ස්වාමීන් වන මට ද ඔවුන්ගේ රජු වශයෙන් මා
ඔවුන්ට දෙන දාවිත්ට ද සේවය කරනු ඇත.
10 ජෙරෙ 46:27-28 “ඒ නිසා, මාගේ මෙහෙකෙරු වූ
ජාකොබ්ගෙන් පැවත එන සියල්ලෙනි, බිය
නොවන්න. ඉශ්‍රායලේ ජනයෙනි, නොකැළඹෙන්න.
නුඹලා විප්‍රවාසී වී සිටින ඒ දුර රටින් මම නුඹලා
ගළවාගන්නෙමි. ජාකොබ්ගේ පරපුර වහල්කමෙන්
හැරී අවුත්, කිසිවකුට බිය නොවී, නිසංසල ව, සුව
සේ සිටිනු ඇත. මෙසේ වදාරන්නේ ස්වාමීන් වන
මම ය. 11 නුඹලා ගළවන පිණිස මම නුඹලා සමඟ
සිටිමි. මම නුඹලා යම් යම් දේශවලට විසුරුවා
හැරියෙම් ද, ඒ සියලු දේශ මම සහමුලින් ම විනාශ
කරදමමි. එහෙත්, මම නුඹලා විනාශ නොකරතත්,
නුඹලාට දඬුවම් නොකර නොසිටින්නෙමි. නිසි
ප්‍රමාණයට මම නුඹලාට දඬුවම් කරමි. මෙසේ
පවසන්නේ ස්වාමීන් වන මම ය.”
12 සමිඳාණන් වහන්සේ සිය සෙනඟට මෙසේ
වදාරන සේක: “නුඹලාගේ තුවාළ අසාධ්‍ය ය; නුඹලා
විඳින වේදනාව ඉතා දරුණු ය.
13 “ඔබ වෙනුවෙන් ඉදිරිපත් වීමට කිසිවකු නැත.
නුඹලාට සාත්තු කිරීමට කිසිවකු නැත.
14 “නුඹලාගේ සියලු ප්‍රේමවන්තයෝ නුඹලා
අමතක කළහ. ඔව්හු තවත් නුඹලා ගැන
නොසලකති. නුඹලාගේ අයුතුකම් බරපතල නිසා ද
පාප ක්‍රියා බහුල නිසා ද කිසි දයාවක් නැති ව
සතුරකුට පහර දෙන පරිදි මම කෲර ලෙස නුඹලාට
පහර දිනිමි.
15 උත් 35:16-19; මතෙ 2:18 “නුඹලාගේ තුවාළ
ගැන කොඳුරන්නේ කුමට ද? නුඹලාගේ වේදනාව
සුව කළ නොහැකි ය. මා නුඹලාට මෙසේ දඬුවම්
කළේ, නුඹලාගේ අපරාධයේ බරපතලකම නිසාත්,
පාප ක්‍රියා බහුල නිසාත් ය.
16 “නුඹලා වනසන සියල්ලෝ ම වැනසෙති.
නුඹලාගේ එදිරිකාර සියල්ලෝ ම හිරකරුවන්
වශයෙන් ගෙනෙයනු ලබන්නෝ ය. නුඹලාගෙන්
කොල්ලකන්නෝ කොල්ලකනු ලබන්නෝ ය. නුඹලා
සතු දේ පැහැරගන්නන්ගෙන් ඔවුන් සතු දේ ද
පැහැරගනු ලබන්නේ ය.
17 “සියොන පිටුවහල් කරනු ලැබුවා ය; ඈ ගැන
සලකන කිසිවකේ නැතැ යි නුඹලාගේ සතුරන් කියන
නමුත්, මම නුඹලාගේ තුවාළ සුව කර නුඹලාට සුව
සෙත යළිත් ගෙන දෙන්නෙමි. මෙසේ පවසන්නේ
ස්වාමීන් වන මම ය.”
18 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
“මම ජාකොබ්ගේ පරපුර සිය දේශයට ආපසු
පමුණුවා හැම පවුලකට ම වාසස්ථානයක් ලැබීමේ
භාග්‍යය නැවත දෙන්නෙමි. නගරය ද එහි කන්ද පිට
ගොඩනඟනු ලැබ, මාලිගාව තිබුණු හැටියට ම
පිහිටුවනු ලබන්නේ ය. 19 එහි වසන සෙනඟ ප්‍රීති
ගී ගයන්නෝ ය. ඔව්හු ප්‍රීතියෙන් හඬ නඟන්නෝ
ය. ඔවුන්ගේ සංඛ්‍යාව අඩු නොකර වැඩි වන්නට
සලස්වා, ඔවුන්ගේ අගෞරවය පහකර මම ඔවුන්
උසස් කරන්නෙමි. 20 ඔවුන්ගේ දරුවෝ කලින් සිටි
ලෙස වන්නෝ ය; ඔවුන්ගේ සභාව මා ඉදිරියෙහි
ස්ථිර ව පවතිනු ඇත. ඔවුන්ට පීඩා කරන
සියල්ලන්ට මම දඬුවම් කරන්නෙමි. 21 ඔවුන්ගේ
අධිපතියා ඔවුන්ගේ ම කෙනෙකේ වන්නේ ය;
ඔවුන්ගේ ආණ්ඩුකාරයා ද ඔවුන් අතරෙන් ම නැඟී
එන්නේ ය. මා වෙත එන්නට මම ඔහුට අවසර
දෙන්නෙමි. එවිට ඔහු මා වෙත ළඟා වන්නේ ය.
කැඳවීමක් නැති ව ම මා වෙත පැමිණෙන්නට බිය
නොවන්නේ කවරකේ ද? මෙසේ පවසන්නේ
සමිඳාණන් වහන්සේ වන මම ය. 22 නුඹලා මාගේ
සෙනඟ වන්නහු ය. මම ද නුඹලාගේ දෙවියන්
වහන්සේ වන්නෙමි.”
23 සමිඳාණන් වහන්සේගේ කෝපය ගසාගෙන
එන කුණාටුවක් මෙන් ළඟා වයි; එය දුෂ්ටයන්ගේ
හිස පිට සුළි සුළඟක් මෙන් කඩා වැටයි.
24 සමිඳාණන් වහන්සේ තමන්ගේ සිතේ අදහස්
ඉෂ්ට කරන තෙක් ද සම්පූර්ණ කරන තෙක් ද උන්
වහන්සේගේ බලවත් උදහස පහ ව යන්නේ නැත.
මතු දවස්වල දී සෙනඟ එය තේරුම්ගනු ඇත.

### ඉශ්‍රායලේ සෙනඟ ආපසු පැමිණීම

31 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
“ඉශ්‍රායලේහි හැම ගෝත්‍රයකම මා දෙවියන්
වහන්සේ ද ඔවුන් මාගේ සෙනඟ ද වන කාලය
පැමිණෙන්නේ ය. 2 කඩු පහරින් ගැළවුණු සෙනඟට
පාළුකරයේ දී මම කරුණාව දැක්වීමි. ඉශ්‍රායලේ
සෙනඟ විවේක සුවය පැතූවිට, 3 ස්වාමීන් වන මම
දුර සිට ඔවුන්ට ප්‍රකාශ වුණෙමි. ඉශ්‍රායලේ
ජනයෙනි, මම නුඹලාට නිරන්තරයෙන් ප්‍රේම
කළෙමි; නුඹලාට මාගේ විශ්වාසකම තවදුරටත්
ප්‍රකාශ කරමි. 4 එම්බා ඉශ්‍රායලේ ජාතිය! මම
නැවත නුඹ ගොඩනඟන්නෙමි. එවිට නුඹලා
ගොඩනඟනු ලබන්නහු ය. නුඹලා නැවත නුඹලාගේ
කිකිණි රබන් රැගෙන විනෝද වන්නන් සමඟ
ප්‍රීතියෙන් නටන්නහු ය. 5 නැවත නුඹලා සමාරියේ
කඳුවල මිදි වැල් වවනු ඇත. වවන්නෝ ඒවා හිටවා
ඒවායේ පල භුක්ති විඳින්නෝ ය. 6 මන්ද,
‘නැඟිටින්න, සියොන් කන්දට අපේ දෙවි ස්වාමීන්
වහන්සේ වෙත නැඟී යමු’යි එප්‍රායිම් කඳුවල
රැකවලුන් හඬ නඟන දවසක් පැමිණෙන්නේ ය.”
7 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
q27 “ජාතීන් අතර අගතැන්පත් ඉශ්‍රායලේ ගැන
ප්‍රීතියෙන් ගී ගයන්න.

q2[7] 'සමිඳාණෝ සිය සෙනඟ ගැළවූ සේක;
q2[7] ඉතිරි ව සිටින සෙනඟ මුදාගත් සේක' කියමින්
හඬ නගා පැසසුම් ගී ගයමින් ප්‍රශංසා කරන්න.
[8] බලන්න, උතුරු දේශයෙන් මම ඔවුන්
ගෙනෙන්නෙමි;
q2[8] පොළොවේ ඉතා දුර තැන්වලින් ඔවුන් රැස්
කරන්නෙමි;
q2[8] අන්ධයන් හා කොරුන් ද ගර්භණීන් හා ප්‍රසව
වේදනාව විඳින කාන්තාවන් ද ඔවුන් සමඟ
පැමිණෙනු ඇත.
q2[8] ඔවුන් මහත් සමූහයක් ව හැරී එනු ඇත.
[9] ඔවුන් අඬමින් ද කන්නලව් කරමින් ද ගිය නමුත්,
මම ඔවුන් සනසමින් ආපසු ගෙනෙන්නෙමි.
q2[9] දිය ඔයවල් අසලින්, නොපැකිළෙන, ඇද නැති
මාවත් ඔස්සේ ඔවුන් ගෙන යන්නෙමි.
q2[9] මම ඉශ්‍රායලේවරුන්ගේ පියා වෙමි;
q2[9] එප්‍රායිම් මාගේ කුළුඳුල් පුත්‍රයා වන්නේ ය.
[10] එම්බා ජාතීනි, සමිඳුන්ගේ වචනයට සවන් දී දුර
බැහැර දිවයින්වල එය ප්‍රකාශ කරන්න.
q2[10] 'ඉශ්‍රායලේ සෙනඟ විසිරවූ මම ඔවුන් රැස්
කරන්නෙමි;
q2[10] එඬේරා තම රැළ රැකගන්න පරිදි මම ඔවුන්
රැකගන්නෙමි'යි කියන්න.
[11] ඉශ්‍රායලේ සෙනඟට නිදහස දී, බලවත්
ජාතීන්ගේ හස්තයෙන් මම ඔවුන් ගළවාගනිමි.
[12] ඔව්හු පැමිණ සියොන් කන්ද මත ප්‍රීතියෙන් ගී
ගයති,
q2[12] මාගේ යහපත්කම නිසා තමන් ලත් දීමනා වන
ධාන්‍ය, මිදියුස හා තෙල් ද බැටළු පැටවුන් හා
ගවවස්සන් ද ගැන සතුටු වන්නෝ ය.
q2[12] ඔවුන්ගේ ජීවිතය ජලයෙන් සාරවත් වූ උයනක්
මෙන් වන්නේ ය.
q2[12] ඔව්හු තවත් කිසි සේත් දුක් නොවන්නෝ ය.
[13] එවිට තරුණියෝ ප්‍රීතියෙන් නටන්නෝ ය.
q2[13] තරුණයෝ ද මහල්ලෝ ද එක් ව ප්‍රීති
වන්නෝ ය.
q2[13] මම ඔවුන්ගේ වැලපීම ප්‍රීතියට හරවන්නෙමි.
q2[13] ඔවුන් සනසා ඔවුන්ගේ දොම්නස සොම්නසට
හරවන්නෙමි.
[14] පූජකයන්ගේ සිත ද හද ද පිරියෙන්
පුරවන්නෙමි.
q2[14] සමිඳුන්ගේ යහපත්කමින් සෙනඟ තෘප්තියට
පමුණුවන්නෙමි.
q2[14] මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය."

## ඉශ්‍රායලේ කරෙහි සමිඳුන්ගේ දයාව

[15] සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
q2[15] "හැඬීමේ ද දැඩි වැලපීමේ ද හඬක් රාමාහි
ඇසිණි.
q2[15] රාකෙල් ඇගේ දරුවන් ගැන අඬමින් ඔවුන්
නැති නිසා අස්වැසිල්ලක් නැති ව සිටියා ය.
[16] නුඹේ හැඬීම නවත්වා, නෙත්වලින් කඳුළු
පිසදමන්න.
q2[16] නුඹේ ක්‍රියාවලට විපාකය නුඹට ලැබෙන්නේ
ය;
q2[16] ඔවුන් සතුරන්ගේ දේශයෙන් හැරී එනු ඇත.
q2[16] මෙසේ පවසන්නේ සමිඳාණෝ ය.
[17] නුඹේ මතු කාලය ගැන බලාපොරොත්තුවක්
ඇත.
q2[17] නුඹේ දරුවන් සිය මව්බිමට ආපසු එනු ඇත.
[18] ඉශ්‍රායලේ සෙනඟගේ කන්නලව්ව මම ඇසීමි;
q2[18] 'සමිඳුනි, අපි කුළෑටි ගොන්වස්සකු මෙන්
සිටියෙමු.
q2[18] ඔබ අපට දඬුවම් කළ සේක;
q2[18] එයින් අපි හැඩගැසුණෙමු.
q2[18] ඔබ අපට ඉගැන්වූ සේක.
q2[18] අප හැරී එන පිණිස ආපසු අප ගෙනෙනු
මැනව.
q2[18] ඔබ අපගේ දෙවි සමිඳාණන් වහන්සේ ය.
[19] අපි ඔබ වෙතින් හැරී ගියෙමු, එහෙත්, අපි
පසුතැවිලි වූයෙමු.
q2[19] ඒ වරද තේරුම්ගත් පසු අපි දුක ප්‍රකාශ
කළෙමු.
q2[19] තරුණ කාලයේ දී අප පව් කළ බැවින්
ලජ්ජාවටත්, නින්දාවටත් අපි පත් වූයෙමු.'
[20] ඉශ්‍රායලෙය, නුඹ මාගේ පුත්‍රයා ය;
q2[20] මා ඉතා ප්‍රේම කරන දරුවා ය.
q2[20] නුඹේ නම මා සඳහන් කරන සෑම විට ම
ප්‍රේමයෙන් මම නුඹ සිහි කරමි.
q2[20] නුඹ ගැන මාගේ සිත කකියනු ඇත.
q2[20] මම නුඹට නිසැක ව අනුකම්පා කරමි.
q2[20] මෙසේ පවසන්නේ සමිඳුන් වන මම ය.
[21] මං සලකුණු වන මාර්ග කණු සිටුවාගන්න.
q2[21] එසේ නුඹේ මාර්ගය නැවත සොයාගෙන,
ඉශ්‍රායලේ ජනයෙනි, ආපසු හැරී එන්න.
q2[21] නුඹලාගේ නගරවලට හැරී එන්න.
[22] අහෝ! අකීකරු ජනයෙනි, නුඹලා කොතෙක් කල්
සැකෙන් සැලෙන්නෙහු ද?
q2[22] සමිඳුන් වන මා පොළොවේ අලුත් දෙයක් මවා
ඇත.
q2[22] කාන්තාවක් ඇගේ පුරුෂයා යළි සොයමින්
යන්නී ය."

## ඉශ්‍රායලේ සෙනඟගේ අනාගත සෞභාග්‍යය

[23] ඉශ්‍රායලේවරුන්ගේ සියලු බලැති දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේක: "සෙනඟගේ
උරුමය මා ඔවුන්ට යළි ලබා දුන් විට, 'එම්බා
ධර්මිෂ්ඨකමේ වාසභූමිය! එම්බා ශුද්ධ කන්ද!
සමිඳාණන් වහන්සේ ඔබට ආශීර්වාද කරන සේක්
වා!' යන කීම ඔවුන් ජුදා දේශයෙහි ද එහි නගරවල
ද නැවත භාවිතා කරනු ඇත. [24] ජුදාවේ ද එහි
සියලු නගරවල ද සෙනඟ ජීවත් වන්නෝ ය. එහි
ගොවියෝ ද ගව රැළ කැටුව යන්නෝ ද එක් ව
වාසය කරන්නෝ ය. [25] එවිට මම පීඩාවට පත්
වූවන් ප්‍රාණවත් කරන්නෙමි; සාගින්නෙන්
පෙළෙනවුන් තෘප්තියට පමුණුවන්නෙමි. [26] එවිට මම

අවදි ව වටපිට බැලුවෙමි. මගේ නින්ද සතුටුදායක
විය.
27 “ඉශ්රායලේ දේශය හා ජුදා දේශය
සෙනඟගෙන් ද ගවයන්ගෙන් ද පුරවන කාලය
පැමිණෙන්නේ යයි ස්වාමීන් වන මම කියන්නෙමි.
28 උදුරන්නටත්, කඩා දමන්නටත්, හළොදමන්නටත්,
නැති කරන්නටත්, විපත්ති පමුණුවන්නටත් මා
සැලැසූ පරිදි, ගොඩනඟන්නටත් හිටවන්නටත් මම
සලස්වන්නෙමි. මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම
ය. 29 එසකි 18:2ඒ කාලය පැමිණි විට, ‘පියවරු
ඇඹුල් මිදි පල කෑවෝ ය. දරුවන්ගේ දත්
හිරිවැටුණේ ය’යි තවත් කියනු නොලැබෙන්නේ ය.
30 එහෙත්, එකිනෙකා නසින්නේ තමන්ගේ පව් නිසා
ය. දත් හිරි වැටෙන්නේ ඇඹුල් මිදි පල කෑ
තැනැත්තාගේ ම ය.”

### සමිඳුන්ගේ අලුත් ගිවිසුම

31 මතෙ 26:28; මාක් 14:24; ලූක් 22:20; 1 කොරි
11:25; 2 කොරි 3:6 හෙබ්රෙ 8:8-12සමිඳාණන්
වහන්සේ මෙසේ වදාරන සේක: “ඉශ්රායලේ
සෙනඟ හා ජුදා සෙනඟ සමඟ ද මා අලුත් ගිවිසුමක්
කරන කාලය පැමිණෙන්නේ ය. 32 ඒ විනාහි
ඔවුන්ගේ පියවරුන් මා අතින් අල්ලාගෙන මිසර
දේශයෙන් පිටතට ගෙන එන්නට පියවර ගත්
කාලයේ දී ඔවුන් සමඟ මා කළ ගිවිසුම ඔව්හු කඩ
කළෝ ය. මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය.
33 හෙබ්රෙ 10:16එහෙත්, ඒ කාලය පැමිණි විට,
ඉශ්රායලේ සෙනඟ සමඟ මා කරන ගිවිසුම මෙයෙ
වේ. මම මාගේ අණපණත් ඔවුන් තුළ පිහිටුවා එය
ඔවුන්ගේ සිත්වල ලියන්නෙමි. මම ඔවුන්ගේ
දෙවියන් වහන්සේ වන්නෙමි, ඔව්හු මාගේ සෙනඟ
වන්නෝ ය. මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය.
34 හෙබ්රෙ 10:17‘සමිඳාණන් වහන්සේ
හඳුනාගන්න’කියා, එකිනෙකා තම තමාගේ
අසල්වැසියාට ද සහෝදරයාට ද උගන්වන්නට
වුවමනා වන්නේ නැත. මන්ද, ඔවුන්ගෙන් කුඩා අය
පටන් ලොකු අය දක්වා සියල්ලන් ම මා හැඳින ගනු
ඇත. මම ඔවුන්ගේ අපරාධ කමා කරන්නෙමි;
ඔවුන්ගේ පාප තවත් සිහි නොකරන්නෙමි. මෙසේ
පවසන්නේ ස්වාමීන් වන මම ය.”
35 දිවා කල එළිය පිණිස ඉර ද රෑ කල එළිය පිණිස
සඳ හා තරු ද සම්දාණෝ දෙන සේක;
q2 35 රළ ගොස ඇති වන සේ මුහුද කළඹන සේක;
q2 35 එතුමන්ගේ නාමය සව් බලැති සමිඳාණෝ ය.
36 සොබා දහම පහ ව ගියොත් මිස, ඉශ්රායලේ
සෙනඟ ජාතියක් ව නොපවතින බවට එතුමාණෝ
පොරොන්දු වන සේක.
37 ඉහළ අහස මනින්නටත්, පහත පොළොවේ
අත්තිවාරම් සොයා දැනගන්නටත් යමකුට පුළුවන්
නම් පමණක්,
q2 37 ඉශ්රායලේ සෙනඟ කළ සියල්ල නිසා
එතුමාණෝ ඔවුන් පහකරන සේක.
q2 37 මෙසේ පවසන්නේ සමිඳුන් වන මම ය.
38 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
“හනනලේගේ කොත පටන් කොනේ දොරටුව
දක්වා සමිඳාණන් වහන්සේ උදෙසා නගරයක්
ගොඩනඟනු ලබන දවස් පැමිණෙන්නේ ය.
39 එතැන් සිට මායිම, බටහිර ගාරබේ හලෙ දක්වා ද
ගොවාය වටේට ද පැමිණයි. 40 මළකඳන් හා අළු
දමන මුළු මිටියාවත ද කිද්රොන් මිටියාවත දක්වා ද
නැඟෙනහිර තිබෙන අශ්ව දොරටුවේ කොන දක්වා
ද සියලු පිට්ටනි ස්වාමීන් වන මට ශුද්ධ වන්නේ ය.
නගරය කිසි කලෙක උදුරනු නොලැබෙන්නේ ය.
හළොදමනු නොලැබෙන්නේ ය.”

### ජෙරෙමියා කෙතෙක් මිලේට ගැනීම

32 2 රාජා 25:1-7 ජුදාහි රජු වූ ශෙදෙකියාගේ
දස වන අවුරුද්දේ දී එනම්,
නබෙකද්නෙශර්ගේ දසඅට වන අවුරුද්දේ දී,
සමිඳාණන් වහන්සේ ජෙරෙමියාට කතා කළ සේක.
2 ඒ කාලයේ දී බබිලෝනියේ රජුගේ සේනාව
ජෙරුසලම වටලාගෙන සිටියේ ය. දිවැසිවර ජෙරෙමියා
ජුදා රජුගේ ගෙදර පිහිටි හිරගෙයි මළුවේ
හිරඅඩස්සි වී සිටියේ ය. 3 ශෙදෙකියා රජු ඔහු
හිරඅඩස්සි කළේ, ඔහු ‘සමිඳාණන් වහන්සේ වදාළ
සේකැ’යි මෙසේ කී බැවිනි. “බලන්න, මම මේ
නුවර බබිලෝනියේ රජුගේ අතට පාවා දෙන්නෙමි.
ඔහු එය අල්ලාගන්නේ ය. 4 ජුදාහි රජු වන
ශෙදෙකියා බබිලෝනිවරුන්ගේ අතින්
නොගැළවෙන්නේ ය. සැබැවින් ම ඔහු බබිලෝනියේ
රජුගේ අතට පාවා දෙනු ලැබ ඔහු ඉදිරියේ මුහුණට
මුහුණ ලා කතා කරන්නේ ය. 5 ශෙදෙකියා
බබිලෝනියට ගෙනෙයනු ලබන්නේ ය. ඔහු ගැන මා
කරුණු විමසන තුරු ඔහු එහි සිටිනු ඇත.
බබිලෝනිවරුන්ට විරුද්ධ ව ඔහු යුද්ධ කළත් ඔහු
ජය නොලැබෙන්නේ ය. මෙසේ පවසන්නේ ස්වාමීන්
වන මම ය.”
6 තවද, ජෙරෙමියා කතා කොට, “සමිඳාණන්
වහන්සේ මෙසේ වදාළ සේකැ”යි කී ය. 7 “නුඹේ
පියාගේ සොහොයුරු වන ෂල්ලුම්ගේ පුත් හනමලේ
නුඹ ළඟට අවුත්, ‘අනාතොත්හි තිබෙන කෙත
මිලේට ගන්න; මන්ද, එය මිලේට ගැනීමට අයිතිය
ඇති කිට්ටු ම ඥාතිවරයා නුඹ ය’යි කියනු ඇත.”
8 සමිඳාණන් වහන්සේ වදාළ පරිදි, මාගේ පියාගේ
සහෝදරයාගේ පුත් හනමලේ හිරගෙයි මළුවට මා
ළඟට අවුත්, “අනේ! බෙන්ජමින් දේශයෙහි
අනාතොත්හි තිබෙන මාගේ කෙත මිලේට ගන්න;
මන්ද, එහි උරුමයේ අයිතිය ඇත්තේ ඔබට ය; එය
මිල දී ගන්නැ”යි කී ය. එවිට මෙය සමිඳාණන්
වහන්සේගේ වචනය බව මම දැනගතිමි. 9 එබැවින්
මම, අනාතොත්හි තිබෙන කෙත මාගේ පියාගේ
සහෝදරයාගෙන් මිලේට ගෙන, එහි මිල වන රිදී
කාසි දහහතක් ඔහුට කිරා දිනිමි. 10 මම ඔප්පුව
අත්සන් කර, මුද්රාකොට, සාක්ෂිකාරයන්
කැඳවාගෙන තරාදියෙන් කිරා ඔහුට මිල දිනිමි.
11 මම නියමයන් හා කොන්දේසි සටහන් කර

තිබුණු මුද්‍රාව තැබූ ඔප්පුව ද විවෘත පිටපත ද
රැගෙන, 12 මාගේ පියාගේ සහෝදරයාගේ පුත්
හනමලේ ඉදිරියේ දී ද ඔප්පුවට අත්සන් තැබූ
සාක්ෂිකරුවන් ඉදිරියේ දී ද හිරගෙයි මළුවේ
හිඳගෙන උන් සියලු ජුදෙව්වරුන් ඉදිරියේ දී ද
මිලේට ගැනීමේ ඔප්පුව මයසේයාගේ පුත් වන
නේරියාගේ පුත් බාරුක්ට මම දිනිමි. 13 ඔවුන්
සියල්ලන් ඉදිරියේ මම බාරුක්ට අණ කරමින්,
14 'ඉශ්‍රායලේවරුන්ගේ දෙවි ස්වාමින් වහන්සේ මේ
ඔප්පු එනම්, මුද්‍රාව තැබූ මිලේට ගැනීමේ
ඔප්පුවත්, විවෘත ඔප්පුවත් රැගෙන, බොහෝ කල්
පවතින පිණිස මැටි භාජනයක තබන්නට නියම කර
ඇත. 15 මන්ද, ගෙවල් ද කෙත් ද මිදි වතු ද නැවත
මේ දේශයෙහි මිලේට ගනු ඇතැ යි
ඉශ්‍රායලේවරුන්ගේ සියලු බලැති දෙවි ස්වාමින්
වහන්සේ පවසන සේකැ'යි කීවෙමි.

### ජෙරෙමියාගේ යාච්ඤාව

16 මිලේට ගැනීමේ මේ ඔප්පුව නේරියාගේ පුත්
බාරුක්ට මා භාර දුන් පසු, මම සමිඳාණන්
වහන්සේට මෙසේ යාච්ඤා කළෙමි:
17 "මහෝත්තම දෙවි ස්වාමිනි! ඔබේ මහත්
බලයෙන් ද පරාක්‍රමයෙන් ද ඔබ අහසත්
පොළොවත් මැවූ සේක. ඔබට බැරි කිසි දෙයක්
නැත්තේ ය. 18 ඔබ වහන්සේ දහස් ගණන්
මිනිසුන්ට කරුණාව පෙන්වන සේක; පියවරුන්ගේ
දුෂ්ටකම නිසා ඔවුන්ට පසු ඔවුන්ගේ දරුවන්ට
ප්‍රතිවිපාක දෙන සේක. ඔබ වහන්සේ මහෝත්තම
පරාක්‍රමවත් දෙවියන් වහන්සේ ය, ඔබ
වහන්සේගේ නාමය සියලු බලැති සමිඳාණන්
වහන්සේ ය. 19 ඔබේ අදහස් උදාර ය; ඔබේ ක්‍රියා
බලසම්පන්න ය; මිනිසුන් කරන සියලු දේ ඔබට
පෙනෙන්නේ ය; ඔවුන්ගේ ක්‍රියාවල ප්‍රතිඵල අනුව
ඔවුන්ට ප්‍රතිවිපාක දෙන සේක. 20 මිසර දේශයේ
දී, ඔබ වහන්සේ හාස්කම් ද අරුමපුදුම දේ ද කළ
සේක. එදින මෙන් මේ දවස දක්වා ද ඔබ
ඉශ්‍රායලේහිත්, අන් සියලු ජාතීන් අතරේත් එසේ ම
කරන සේක. ඒ නිසා ඔබේ නාමය ඔවුන් අතර
මහිමාන්විත ය. 21 අපේ සතුරන් බිය ගැන්වූ
හාස්කම් ද අරුමපුදුම දේ ද කර ඔබේ බලයත්,
පරාක්‍රමයත් මෙහෙයවා ඔබේ සෙනඟ මිසර
දේශයෙන් පිටතට ගෙනා සේක. 22 ඔවුන්ගේ
පියවරුන්ට ඔබ දිවුරුම් දී පොරොන්දු වූ ලෙස කිරි ද
මී පැණි ද උතුරා යන දේශයක් වන මේ දේශය
ඔබ ඔවුන්ට දුන් සේක. 23 ඔව්හු ද ඇතුළු වී ඒ
දේශය හිමි කරගත්හ. එහෙත්, ඔවුන් ඔබේ හඬට
කීකරු වුණේ වත්, අණපණත් අනුව හැසුරුණේ වත්,
ඔවුන්ට කරන්නට ඔබ අණ කල සියල්ල කළේ වත්
නැත. ඒ නිසා ඔබ මේ සියලු විපත්ති ඔවුන් පිට
පැමිණෙව්වූ සේක.
24 "මෙන්න, නගරය අල්ලාගන්න පිණිස ඒ වටා
පස් කඳු සාදා ඇත. බබිලෝනිවරු නගරයට පහර
දෙන්නෝ ය. යුද්ධයත්, සාගතයත්, වසංගතයත්
කරණකොටගෙන නගරය ඔවුන්ට අත්පත් වන්නේ
ය. ස්වාමිනි, ඔබ වදාළ දේ සිද්ධ වී තිබෙන බව
ඔබට පෙනෙන්නේ ය. 25 අහෝ! දෙවි ස්වාමිනි,
නගරය බබිලෝනිවරුන්ගේ අතට භාර දී තිබෙන
නමුත්, 'සාක්ෂිකාරයන් ඉදිරියෙහි කෙත මිලේට
ගන්නැ'යි මට වදාළේ ඔබ ම ය."
26 එවිට සමිඳාණන් වහන්සේ ජෙරෙමියාට මෙසේ
වදාළ සේක: 27 "මම සකල මිනිසුන්ගේ දෙවියන්
වහන්සේ වන සමිඳාණන් වහන්සේ ය. මට කිරීමට
දුෂ්කර කිසි දෙයක් ඇද් ද? 28 2 රාජා 25:1-11; 2
වංශා 36:17-21එබැවින් සමිඳාණන් වහන්සේ මෙසේ
වදාරන සේක. බලව, මම මේ නගරය
බබිලෝනිවරුන්ගේ අතටත්, බබිලෝනියේ රජු වන
නබුකද්නෙශර් අතටත් පවරා දෙමි. ඔහු මේ
නගරය අල්ලාගන්නේ ය. 29 මේ නගරයට විරුද්ධ ව
යුද්ධ කරන බබිලෝනිවරු අවුත් එය ගිනි ලන්නෝ
ය. ඒ සමඟ ම මා කෝප කරන පිණිස යම් ගෙවල
පියසි උඩ බාල් දෙවියාට සුවඳ දුම් ඔප්පු කරන්නටත්,
අන් දෙවිවරුන්ට පානීය පූජා වගුරුවන්නටත් යෙදුණේ
ද, ඒ ගෙවලුත් දවා දමන්නෝ ය. 30 ඉශ්‍රායලේ
සෙනඟ ද ජුදාවේ සෙනඟ ද ඔවුන්ගේ ඉතිහාසයේ
පටන්ගැන්මේ සිට ම කළේ, මා ඇස් හමුයෙහි
නපුරු දේ පමණකි. එසේ ය, ඔවුන්ගේ ක්‍රියාවලින්
ඔවුන් කළේ, මා ප්‍රකෝප කරවන දේ පමණක් ය.
මෙසේ පවසන්නේ ස්වාමින් වන මම ය. 31 මේ
නගරය ගොඩනැඟුව දා පටන් අද දක්වා මාගේ
උදහසත්, මාගේ කෝපයත් ඉපදවීමට එය හේතුවක්
විය. ඒ නිසා මා ඉදිරියෙන් එය නැති කිරීමට මම
තීරණය කළෙමි. 32 එසේ වන්නේ, මා කෝප
කරවන හැටියට ඉශ්‍රායලේ සෙනඟ ද ජුදා සෙනඟ
ද ඔවුන්ගේ රජවරුන් ද ඔවුන්ගේ අධිපතීන් ද
ඔවුන්ගේ පූජකයන් ද ඔවුන්ගේ දිවැසිවරුන් ද ජුදාහි
මනුෂ්‍යයන් ද ජෙරුසලමේ වැසියන් ද කළ ඔවුන්ගේ
සියලු නපුරුකම් නිසා ය. 33 ඔව්හු මට මුණ නොව දී
පිටු පා ගියෝ ය. මා නොකඩවා ම ඔවුන්ට ඉගැන්වූ
නමුත්, ඔව්හු මාගේ දැනුමැතිකම නොපිළිගත්තෝ
ය. 34 2 රාජා 23:10; ජෙරෙ 7:30-31; 19:1-6මාගේ
නාමයෙන් හැඳින්වෙන මාලිගාව කෙලෙසෙන පිණිස
ඔව්හු පිළිකුල් ලෙස හැසුරුණෝ ය. 35 ලෙවී 18:21; 2
රාජා 23:10; ජෙරෙ 7:31ඔව්හු තමන්ගේ දූ පුතුන්
මොලෙක් දෙවියා ඉදිරියෙහි දවා කැප කරන්නට
හින්නොම් පුත්‍රයාගේ මිටියාවතෙහි බාල් දෙවියාට
ගිරිකුළු දේවාල ගොඩනැඟුවෝ ය. ඔවුන් ඒ දේ
කළේ, මාගේ අණට විරුද්ධ ව ය. එබඳු පිළිකුල්
මඟින් ඔවුන් පාපයට පෙළඹවීමට මට අදහසක්
පහළ වුණේ වත් මා ඔවුන්ට අණ කළේ වත් නැත.

### බලාපොරොත්තුවේ දේව පොරොන්දුව

36 "එහෙත් දැන්, කඩුවෙන් ද සාගතයෙන් ද
වසංගතයෙන් ද බබිලෝනියේ රජු අතට පාවා දී
තිබේ යයි නුඹලා කියන මේ නගරය ගැන
ඉශ්‍රායලේවරුන්ගේ දෙවි ස්වාමින් වහන්සේ මෙසේ
වදාරන සේක: 37 'බලන්න, මාගේ උදහසින් ද

මාගේ කෝපයනේ ද තද අමනාපයනේ ද මා විසින්
ඔවුන් පන්නාදමනු ලැබූ සියලු රටවලින් ඔවුන්
රැස්කරගනෙ නැවත මේ ස්ථානයට පමුණුවා, සුව
සේ වාසය කරන්නට සලස්වන්නමේ. 38 ඔව්හු
මාගේ සනෙඟ වන්නෝ ය. මම ද ඔවුන්ගේ
දවේියන් වහන්සේ වන්නමේ. 39 ඔවුන්ටත්, ඔවුන්ට
පසු ඔවුන්ගේ දරුවන්ටත් ශුභසිද්ධ වන පිණිස හැම
කල්හි ම මා කරෙහෙි ගරුබිය දැක්වීමට එක ම
හිතක් හා එක ම මඟක් ඔවුන්ට දනේනමේ. 40 මම
ඔවුන් වතෙින් ඉවතට නාොහැරී, ඔවුන්ට යහපත
කරන හැටියට ඔවුන් සමඟ සදාකාල ගිවිසුමක්
කාොට, ඔවුන් මා වතෙින් ඉවත් ව නාොයන ලසෙ මා
කරෙහෙි ගරුබිය දැක්වීම ඔවුන්ගේ සිත්හි උපද
වන්නමේ. 41 එසේ ය, ඔවුන්ට යහපත කිරීම මට
ඉමහත් ප්‍රීතියක් වනු ඇත. සැබැවින් මාගේ මුළු
හෘදයනේ ද මුළු සිතින් ද මේ දේශයහෙි ඔවුන්
ස්ථිර ලසෙ පදිංචි කරවන්නමේ.
42 " 'මක්නිසා ද සමිඳාණන් වහන්සේ මසෙේ
වදාරන සේක: මා විසින් මේ සනෙඟ පිට මේ මුළු
මහත් විපත පමුණුවනු ලැබ තිබනෙ ලසෙ මම
ඔවුන්ට පාොරාොන්දු වූ සියලු යහපතත් ඔවුන් පිට
පමුණුවන්නමේ. 43 මනුෂ්‍යයකු වත්, මෘගයකු වත්
නැති ව එය පාළුවක් වී බබිලෝනිවරුන්ගේ අතට
පාවා දී තිබේ යයි නුඹලා කියන මේ දේශයහෙි
යළිත් කතේ මිලට ගනු ලබන්නේ ය.
44 බනේජමින්ගේ දේශයහෙිත්, ජරෙුසලම අසල
ස්ථානවලත්, ජුදාහි නගරවලත් කඳු රටේ
නගරවලත්, පහත රටේ නගරවලත්, දකුණු දිශාවේ
නගරවලත් කතේ මිලට ගනෙ, සාක්ෂිකාරයන්
ඉදිරියහෙි ඔප්පු අත්සන් කාොට මුද්‍රා කරනු
ලබන්නේ ය. මක්නිසා ද, මම ඔවුන්ගේ
සෞභාග්‍යය යළි උදා කරන්නමේ'යි සමිඳාණන්
වහන්සේ වදාළ සේක."

## තවත් පාොරාොන්දුවක්

33 ජරෙමියා හිර ගදෙර මළුවේ හිරඅඩස්සියේ
සිටිද්දී සමිඳාණන් වහන්සේගේ පණිවුඩය දෙ
වන වරටත් ඔහු වතෙ පැමිණියේ ය. 2 පාොළාොව
මවා, එය පිහිටුවන පිණිස එය සකස් කළ ස්වාමීන්
යන නාමය ඇති තැනැන් වහන්සේ ජරෙමියාට කතා
කාොට මසෙේ වදාළ සේක: 3 "මට යාච්ඤා කරන්න;
එවිට මම නුඹට පිළිතුරු දී නුඹ නාොදන්න, සැඟවී
ඇති, වැදගත් සත්‍යයන් නුඹට දන්වන්නමේ.
4+JER ඉශ්‍රායලේවරුන්ගේ දවේ ස්වාමීන් වහන්සේ
වන මම ජරෙුසලමේ ඇති ගවෙල් ද ජුදාවේ රාජ
මාලිගාව ද බිඳ හළො ගාොඩනඟන ලද පස්
කඳුවලට විරුද්ධ ව බබිලෝනිවරුන් සමඟ සටන්
කරන්නට ගියාොත්, මාගේ උදහසින් ද කෝපයනේ ද
ගසා දමන අයගේ මළකඳන්වලින් නගරය පිරී යනු
ඇත. සනෙඟ කර ඇති දුෂ්ට ක්‍රියා නිසා මම මේ
නගරයනේ ඉවතට හැරී සිටිමි. 6 එහතේ, මේ
නගරයට මම සුව සතෙ ගනෙ දනේනමේ. මම
සනෙඟ සුවපත් කාොට, සාමයනේ, සුරක්ෂිතතාවනේ
ඔවුන්ට ප්‍රීතිය පනේවන්නමේ. 7 ජුදාව ද
ඉශ්‍රායලෙය ද මම මුල දී මනේ යළිත් ගාොඩනඟා,
ඒ දරෙටට සෞභාග්‍යය දනේනමේ. 8 ඔවුන් මට
විරුද්ධ ව කළ ඔවුන්ගේ සියලු පාපයනේ මම ඔවුන්
පිරිසිදු කරන්නමේ; මට විරුද්ධ ව පව් කිරීමනේ ද
මට විරුද්ධ ව ද්‍රෝහිකම් කිරීමනේ ද කළ ඔවුන්ගේ
සියලු ම අයුතුකම් ඔවුන්ට කමා කරන්නමේ. 9 මා
විසින් ඔවුන්ට කරනු ලබන සියලු යහපත ගැන
අසන පාොළාොවේ සියලු ජාතීන් අතරේ, මේ නගරය
මට ප්‍රීතියක් ද ප්‍රශංසාවක් ද ගෞරවයක් ද
වන්නේ ය; මා ඊට කර දනෙ සියලු යහපත හා
සමගිය නිසා ඔව්හු බිය වී වවෙුළන්නෝ ය."
10 සමිඳාණන් වහන්සේ මසෙේ වදාරන සේක:
"එය සනෙඟ වත්, මෘගයන් වත් වාසය නාොකරන
කාන්තාරයක් වන්නේ යයි සනෙඟ කියති. ජුදාවේ
නගර ද ජරෙුසලමේ වීදි ද හිස් බව සැබෑ ය; එහි
සනෙඟ වත්, මෘගයෝ වත් නැත. එහතේ, මේ
තැන්වල යළිත්, 11 1 වංශා 16:34; 2 වංශා 5:13; 7:3;
එස්රා 3:11; ගීතා 100:5; 106:1; 107:1; 118:1;
136:1ප්‍රීති ප්‍රමෝද ශබ්ද ද මනාල මනාලියන්ගේ
ප්‍රිය තපෙුල් ද මාගේ දවේ මාලිගාවට තුති පඬුරු
රුගනෙ එන ගායකයින්ගේ ගී හඬ ද ඇසනේනේ ය.
ඔවුන් මසෙේ ගයනු ඇත;
q211 'සව් බලැති සමිඳුන්ට තුති පුදන්න;
q211 එතුමාණෝ යහපත් ය;
q211 එතුමන්ගේ පමෙ සදාකාලික ය.'
11 කලින් තිබූ ලසෙ මේ දේශය මම යළිත්
සෞභාග්‍යවත් කරන්නමේ. මසෙේ පවසන්නේ
ස්වාමීන් වන මම ය."
12 සියලු බලැති සමිඳාණන් වහන්සේ මසෙේ වදාළ
සේක: "මිනිහකු වත්, මෘගයකු වත් නැති ව පාළු
වී ගිය මේ ස්ථානයහෙි ද මහෙි සියලු නගරවල ද
තමන්ගේ රැළ ලග්ගවන එඬරේුන්ගේ වාසයක්
නැවත වන්නේ ය. 13 කඳු රටේ නගරවල ද පහත
රටේ නගරවල ද දකුණු දිශාවේ නගරවල ද
බනේජමින්ගේ දේශයහෙි ද ජරෙුසලම අසල
ස්ථානවල ද ජුදාහි නගරවල ද එඬරේු රැළවල
සිටින බැටළුවන් ගණන් කරන්නෝ ය. මසෙේ
පවසන්නේ ස්වාමීන් වන මම ය."
14 ජරෙ 23:5-6 සමිඳාණන් වහන්සේ මසෙේ
වදාරන සේක: "ඉශ්‍රායලේ සනෙඟටත් ජුදා
සනෙඟටත් මා කළ පාොරාොන්දුව ඉෂ්ට කරන කාලය
පැමිණනේනේ ය. 15 ඒ දවස, ඒ අවදිය පැමිණි විට
සැබෑ ලසෙ දාවිත්ගේ පරපුරනේ පැවත එන දැහැමි
උතුමකු මම නැඟුටුවන්නමේ. එතුමාණෝ දේශය
මුළුල්ලේ සාධාරණ ව, යුක්තිසහගත ව කටයුතු
කරන සේක. 16 ඒ කාලය පැමිණි විට ජුදාහි
වැසියෝ ගළවනු ලබන්නෝ ය; ජරෙුසලමේ වැසියෝ
ද සුව සේ වාසය කරන්නෝ ය. ඔවුන් සිය දේශයට
දනෙ නාමය, 'සමිඳාණන් වහන්සේ අපේ
මිදුම්කාරයාණෝ ය' යනුයි. 17 2 සාමු 7:12-16; 1
රාජා 2:4; 1 වංශා 17:11-14ඉශ්‍රායලේහි රජ වන
පිණිස සෑම කල්හි ම දාවිත්ගේ පරපුරනේ කනෙකු
නැඟී එන බවට මම පාොරාොන්දු වමේ. 18 ගණන්

3:5-10එසේ ම, මා ඉදිරියෙහි දවන යාග පූජා, ධාන්‍ය
පූජා හා නිරතුරු යාග පූජා ඔප්පු කිරීමටත් ලෙවී
පූජක වංශයේ පූජකයන්ගේ අඩුවක් නොවන්නේ
ය. මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය.”
19 සමිඳාණන් වහන්සේ ජෙරමියාට මෙසේ වදාළ
සේක: 20 “දවාලත්, රාත්‍රියත් නියම වේලාවට
නොපැමිණෙන ලෙස දවාලත්, රාත්‍රියත් සමඟ මා
කර ඇති ගිවිසුම අවලංගු කිරීමට නුඹලාට
පුළුවන්කමක් නැත. 21 එලෙස ම ඉශ්‍රායෙලේහි
රජකම් කරන පිණිස සෑම කල්හි ම දාවිත්ගේ
පරපුරෙන් කෙනෙකු නැඟී එන බවට මාගේ
මෙහෙකරු වූ දාවිත් සමඟ මා කළ ගිවිසුමත්, මාගේ
සේවක පූජකයන් වන ලෙවීවරුන් සමඟ මා කළ
ගිවිසුමත් අවලංගු කිරීමට පුළුවන්කමක් නැත.
22 ගණන් නොකළ හැකි තරම් අහසේ තරු ද
මුහුදේ වැලි ද මෙන් මාගේ මෙහෙකරු වූ දාවිත්ගේ
වංශය ද මට සේවය කරන ලෙවීවරුන් ද මම වැඩි
කරන්නෙමි.”
23 සමිඳාණන් වහන්සේ ජෙරමියාට මෙසේ වදාළ
සේක: 24 “සමිඳාණන් වහන්සේ තෝරාගත් වංශ
දෙක උන් වහන්සේ ප්‍රතික්ෂේප කළ සේකැ”යි මේ
සෙනඟ කියනු නුඹ නොදන්නෙහි ද? එබැවින් ඔව්හු
මාගේ සෙනඟ හෑළෝ දකිමින් ඔවුන් ජාතියක්
වශයෙන් නොසලකති. 25 එහෙත්, ස්වාමීන් වන මම
දවාලත්, රාත්‍රියත් සමඟ ද අහසත්, පොළොවත්
මෙහෙයවන නීති රීති සමඟ ද ගිවිසුමක්
පිහිටෙව්වෙමි.
26 “මා එය ස්ථිර ලෙස කළාක් මෙන් ජාකොබ්ගේ
පරපුර සමඟත්, මාගේ මෙහෙකරු වූ දාවිත් සමඟත්
මා කළ ගිවිසුම මම නොකඩවා ස්ථිරව ම
පවත්වන්නෙමි. ආබ්‍රහම්ගෙන් ද ඊසාක්ගෙන් ද
ජාකොබ්ගෙන් ද පැවත එන්නන් කෙරෙහි රජකම්
කරන පිණිස දාවිත්ගේ පරපුරෙන් කෙනෙකු මම
තෝරාගනිමි. මාගේ සෙනඟ මම යළිත්
සෞභාග්‍යවත් කරන්නෙමි. මම ඔවුන්ට අනුකම්පා
කරන්නෙමි.”

## ශෙදෙකියා රජුට පණිවුඩයක්

34 2 රාජා 25:1-11; 2 වංශා 36:17-21
බබිලෝනියේ රජ වූ නෙබුකද්නෙශර් ද
ඔහුගේ මුළු සේනාව ද ඔහුගේ පාලනය යටතේ
තිබුණු සියලු රට රාජ්‍යයන් ද සියලු ජනයන් ද
ජෙරුසලමටත්, ඊට අයිති සියලු නගරවලටත් විරුද්ධ
ව යුද්ධ කරද්දී සමිඳාණන් වහන්සේ ජෙරමියාට
කතා කළ සේක. 2 ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවි
ස්වාමීන් වහන්සේ ජෙරමියා අමතා ජුදාහි රජු වූ
ශෙදෙකියා වෙත ගොස් ඔහුට මෙසේ කියන්නැ යි
වදාළ සේක: “ස්වාමීන් වන මම මෙසේ වදාරමි.
බලන්න, මම මේ නගරය බබිලෝනියේ රජු අතට,
පාවා දෙමි. ඔහු එය ගින්නෙන් දවාලන්නේ ය. 3 නුඹ
ද ඔහුගේ අතින් නො ගැළවී, සැබැවින් අසු වී, ඔහු
අතට පාවා දෙනු ලබන්නෙහි ය. නුඹ බබිලෝනියේ
රජු සමඟ මුහුණට මුහුණ ලා සිට ඔහු සමඟ
පෞද්ගලික වශයෙන් කතා කරන්නෙහි ය. ඉන්පසු
නුඹ බබිලෝනියට යනු ඇත. 4 එහෙත්, ජුදාහි රජු
වන ශෙදෙකියා, ස්වාමීන් වන මම නුඹ ගැන කියන
දේට සවන් දෙන්න. නුඹ යුද්ධයේ දී
නොමැරෙන්නෙහි ය. 5 නුඹ සාමදානයෙන්
මැරෙන්නෙහි ය; නුඹට කලින් සිටි නුඹේ
මුතුන්මිත්තන් වූ රජවරුන් භූමදාන කොට, සෙනඟ
සුවඳ දුම් ඇල්ලුවාක් මෙන් නුඹටත් එසේ ම කර,
‘අහෝ ස්වාමීනි’ කියා විලාප කියනු ඇත. මෙසේ
පවසන්නේ සමිඳාණන් වහන්සේ වන මම ය.”
6 දිවැසිවර ජෙරමියා මේ සියලු දේ ජෙරුසලමේ දී
ජුදාවේ රජු වූ ශෙදෙකියාට කීවේ ය. 7 ඒ
අවස්ථාවේ දී බබිලෝනියේ රජුගේ සේනාව
ජෙරුසලම් නගරයට පහර දෙමින් සිටියෝ ය.
ජුදාවේ බලකොටු අතරෙන් අල්ලා නොගෙන තිබූ
නගරවලින් ඉතිරි වූ ලාකීෂ්ට හා අසේකාට ද ඔව්හු
පහර දෙමින් සිටියෝ ය.

## වහලුන් නිදහස් කිරීමේ ගිවිසුම කඩ කිරීම

8 ඔවුන්ගේ වහලුන් නිදහස් කර හැරීමට
ජෙරුසලමේ සියලු සෙනඟ සමඟ ශෙදෙකියා රජ
ගිවිසුමක් කළ පසු සමිඳාණන් වහන්සේ ජෙරමියාට
කතා කළ සේක. 9 කිසිවකු තමාගේ සහෝදර
ජුදෙව්වකු තමාට යටත් කර නොගන්න පිණිස,
හැම කෙනෙකු ම තමාගේ ගැහැණු හෝ පිරිමි හෝ
ජුදෙව් වහලුන් නිදහස් කර හැරිය යුතු යයි ඔව්හු
ගිවිසුමක් කරගත්හ. 10 තම තමන්ගේ ගැහැණු-පිරිමි
වහලුන් යටත් කර තබා නොගෙන ඔවුන් නිදහස්
කර හරින හැටියට කරගත් ගිවිසුමට සියලු
අධිපතීහු ද මුළු සෙනඟ ද එකඟ වී ඔවුන් නිදහස්
කොට යන්නට හැරියෝ ය. 11 එහෙත්, පසු ව ඔව්හු
සිත වෙනස් කරගෙන නිදහස් කර හැරිය ගැහැණු-
පිරිමි වහලුන් නැවත ගෙනවුත් වහලුන් වශයෙන්
බලහත්කාරයෙන් යටත් කරගත්තෝ ය.
12 එබැවින් සමිඳාණන් වහන්සේ ජෙරමියාට
මෙසේ වදාළ සේක. 13 “ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවි
ස්වාමීන් වහන්සේ මෙසේ වදාරන සේක: ‘මම
නුඹේ ආදි පියවරුන් වහල්කමින් නිදහස් කර, මිසර
දේශයෙන් ගෙනා විට මම ඔවුන් සමඟ ගිවිසුමක්
කළෙමි. 14 නික්ම 21:2; ද්වි.නී. 15:12නුඹලාට
විකුණනු ලැබ, හය වසක් නුඹලාට සේවය කළ පසු
නුඹලාගේ සහෝදර හෙබ්‍රෙව්වරුන් එකිනෙකා
නිදහස් කර හැරිය යුතු යයි මම කීවෙමි. එහෙත්,
නුඹලාගේ ආදි පියවරුන් මට සවන් දුන්නේ වත්, මා
කී දේ සිතට ගත්තේ වත් නැත. 15 මෑතක දී නුඹලා
නුඹලාගේ සිත් වෙනස් කරගෙන මා ප්‍රසන්න දේ
කළහු ය. නුඹලාගේ සහෝදර හෙබ්‍රෙව්වරුන්ට
නිදහස ප්‍රකාශ කිරීමට මාගේ නමින් සාදන ලද
දේව මාලිගාවේ දී මා ඉදිරියෙහි නුඹලා ගිවිසුමක්
කළහු ය. 16 එහෙත්, නුඹලා ඒ අදහස වෙනස්
කරගෙන මාගේ නාමයට අගෞරව කළහු ය.
ඔවුන්ගේ කැමැත්ත පරිදි නුඹලා නිදහස් කර යැවූ
ස්ත්‍රී-පුරුෂ වහලුන් නුඹලා එකිනෙකා නැවත

ගෙනෙවුත් නුඹලාගේ වහල් සේවයට බල කළහු ය.
17 එබැවින් ස්වාමීන් වන මම මෙසේ කියමි. නුඹලා
මට අකීකරු වී, නුඹලාගේ සහෝදර අසල්වැසි
හෙබ්‍රෙව්වරුන්ට නිදහස ප්‍රකාශ නොකළහු ය. ඒ
නිසා කඩුවට ද වසංගතයට ද සාගතයට ද මම
නුඹලා පාවා දෙන්නෙමි. මා නුඹලාට කරන දේ ගැන
පොළොවේ සියලු ජාතීන් තැති ගැනීමට මම
සලස්වන්නෙමි. මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම
ය. 18+JER ජුදාහි අධිපතීහු ද ජෙරුසලමේ අධිපතීහු ද
නපුංසකයෝ ද පූජකයෝ ද දේශයේ සියලු සෙනඟ
ද ඔවුන් විසින් දෙපළු කරන ලද වස්සකුගේ පළු
දෙක මැදින් ගමන් කර මා සමඟ ගිවිසුමක් කළෝ
ය. එහෙත්, ඔව්හු මා ඉදිරියේ කළ ගිවිසුම කඩ කර
එහි කොන්දේසි ඉටු නොකළෝ ය. ඒ නිසා ඔවුන්
වස්සාට කළ දේ මම ඔවුන්ට කරමි. 20 මම
ඔවුන්ගේ සතුරන්ට ඔවුන් පාවා දෙන්නෙමි,
ඔවුන්ගේ ප්‍රාණ හානි කරන්නට සොයන්නන් අතට
මම ඔවුන් පාවා දෙන්නෙමි. ඔවුන්ගේ මළකඳන්
ආකාශයේ පක්ෂීන්ටත්, පොළොවේ මෘගයන්ටත්
ගොදුරුවන්නේ ය. 21 මම ජුදා රජු වූ ශෙදෙකියා ද
ඔහුගේ අධිපතීන් ද ඔවුන්ගේ සතුරන් අතටත්,
ඔවුන්ගේ ප්‍රාණ හානි කරන්නට සොයන්නන්
අතටත්, නුඹලා වෙතින් ඈත් ව ගිය බබිලෝනියේ
රජුගේ සේනාව අතටත් පාවා දෙන්නෙමි. 22 මම
අණ කොට මේ නගරය කරා ඔවුන් නැවත
ගෙනෙන්නෙමි; ඔව්හු ඊට විරුද්ධ ව යුද්ධ කොට,
ඒක අල්ලා ගින්නෙන් දවාදමන්නෝ ය. එහි
වැසියකු නොසිටින ලෙස මම ජුදාහි නගර පාළු
කරන්නෙමි. මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම
ය."

## ජෙරමියා හා රේකාබ්වරු

35 2 රාජා 23:36—24:6; 2 වංශා 36:5-7
ජොෂියාගේ පුත් ජුදාහි රජු වන
ජෙහෝයාකිම් රජුගේ දවසේ සමිඳාණන් වහන්සේ
ජෙරමියාට කතා කොට, 2 "නුඹ රේකාබ්වරුන්ගේ
වංශය වෙත ගොස්, ඔවුන් සමඟ කතා කොට,
සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ ඇතුළු
කාමරයට ඔවුන් කැඳවාගෙන අවුත් ඔවුන්ට මුද්‍රික
පානය බොන්නට දෙන්නැ"යි වදාළ සේක. 3 එකල
මම හබශ්ශිනියාගේ පුත්‍රයා වන ජෙරමියාගේ පුත්
ජාශනියා ද ඔහුගේ සහෝදරයන් ද ඔහුගේ සියලු
පුත්‍රයන් ද රේකාබ්වරුන්ගේ මුළු වංශය ද
අඬගසාගෙන, 4 සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ
ෂල්ලුම්ගේ පුත් දොරටු පාලකයා වන මයසේයාගේ
ඇතුළු ගෙට ඉහළින් තිබූ අධිපතීන්ගේ ඇතුළු ගෙට
යාව තිබුණු දෙවියන් වහන්සේට කැප වූ මනුෂ්‍යයා
වන ඉග්දලියාගේ පුත් හානාන්ගේ පුත්‍රයන්ගේ
ඇතුළු ගෙට පැමිණියෙමි. 5 මම මුද්‍රික පානය පුරවා
තිබුණු භාජන සහ කුසලාන් රේකාබ් වංශයේ
පුත්‍රයන් ඉදිරියෙහි තබා, "මුද්‍රික පානය
බොන්නැ"යි කීමි.

6 එහෙත්, ඔව්හු මෙසේ කීවෝ ය: "අපි මුද්‍රික
පානය නොබොමහ. මක්නිසා ද, අපේ පිය වූ
රේකාබ්ගේ පුත්‍ර වූ ජෝනාදාබ් අපට අණ කරමින්,
'නුඹලා වත්, නුඹලාගේ පුත්‍රයන් වත් සදහට ම
මුද්‍රික පානය නොබී සිටින්න: 7 ගෙයක්
ගොඩනැගීම වත්, බීජ වැපිරීම වත්, මිදි වත්තක්
වැවීම වත්, යමක් අයිති කරගැනීම වත් නොකළ
යුතු ය. නුඹලා තාවකාලික ව සිටින දේශයෙහි
බොහෝ දවස් ජීවත් වන පිණිස නුඹලාගේ මුළු
ජීවිත කාලය කූඩාරම්වල වාසය කරන්නැ'යි කීවේ
ය. 8 අපි වනාහි අපේ පිය වූ රේකාබ්ගේ පුත්‍ර වූ
ජෝනාදාබ් අපට අණ කළ සියල්ල නොපිරිහෙළා
පිළිපදිමින් ඔහුගේ හඬට කීකරු වීමු; කිසි කලක
අපි වත්, අපේ භාර්යාවෝ වත්, අපේ පුත්‍රයෝ
වත්, අපේ දූවරු වත් මුද්‍රික පානය නොබීවෙමු.
9 අපට වාසය කිරීමට ගෙවල් අපි නොතැනුවෙමු.
අපට මිදි වත්තක් වත්, කෙතක් වත්, බීජ වත් නැත.
10 අපි කූඩාරම්වල වාසය කොට, අපේ පිය වූ
ජෝනාදාබ්ට කීකරු ව, ඔහු අපට අණ කළ සියල්ල
ඉටු කළෙමු. 11 එහෙත්, බබිලෝනියේ රජු වූ
නබුකද්නෙශර් අප දේශයට විරුද්ධ ව ආ කල අපි
කතා කොට, 'එන්න, අපි බබිලෝනිවරුන්ගේ
සේනාව ද සිරියන්වරුන්ගේ සේනාව ද නිසා
ජෙරුසලමට ඇතුළු වමු'යි කීවෙමු. මෙසේ අපි
ජෙරුසලමෙහි වාසය කරමු."
12 එකල සමිඳාණන් වහන්සේගේ පණිවුඩය
ජෙරමියා වෙත පැමිණියේ ය. 13 ඉශ්‍රායෙල්වරුන්ගේ
සියලු බලැති දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක: "නුඹ ගොස් ජුදාහි මිනිසුන්ටත්,
ජෙරුසලමේ වැසියන්ටත් මෙසේ කියන්න: 'මාගේ
වචනවලට නුඹලා කීකරු වන්නේ වත්, මාගේ
අනුශාසනා නුඹලා පිළිගන්නේ වත් නැද්දැ යි
ස්වාමීන් වන මම අසමි. 14 රේකාබ්ගේ පුත්‍ර වූ
ජෝනාදාබ් මුද්‍රික පානය බොන්නට එපා ය කියා
තමාගේ පුත්‍රයන්ට දුන් අණ ඔවුන් විසින් පිළිපදින
ලද්දේ ය. ඔව්හු අද දක්වා ඒවා නොබී තමන්ගේ
පියාගේ අණට කීකරු වෙති. එහෙත්, මුල සිට ම මා
නුඹලාට කතා කළ නමුත්, නුඹලා මට ඇහුම්කන්
නුදුන්නහු ය. 15 මාගේ සියලු සේවක දිවැසිවරුන්
නොකඩවා නුඹලා ළඟට ගොස් මෙසේ ප්‍රකාශ
කිරීමට නැවත නැවත එව්වෙමි. 'නුඹලා එකිනෙකා තම
තමාගේ පාප මාර්ගයෙන් හැරී එන්න; නුඹලාගේ
ක්‍රියා මාර්ගය හැඩගස්වා ගන්න; අන් දෙවිවරුන්ට
සේවය කරන්නට ඔවුන් පස්සේ නොයන්න; එවිට
නුඹලාටත්, නුඹලාගේ පියවරුන්ටත් මා විසින් දෙන
ලද දේශයෙහි නුඹලා වාසය කරන්නහු ය'යි කීවෙමි.
එහෙත්, නුඹලා කන්යොමු කර සවන් නුදුන්නහු ය;
කී දේ සිතට ගත්තේ නැත. 16 රේකාබ්ගේ පුත්
ජෝනාදාබ්ගේ පුත්‍රයෝ ඔවුන්ගේ පියා ඔවුන්ට දුන්
අණ ඉෂ්ට කළෝ ය. එහෙත්, මේ සෙනඟ මට සවන්
නුදුන්නෝ ය. 17 එබැවින්, ඉශ්‍රායෙල්වරුන්ගේ සියලු
බලැති දෙවි ස්වාමීන් වන මම ජුදාවරුන්ටත්,
ජෙරුසලමේ සියලු වැසියන්ටත් විරුද්ධ ව මා කී
සියලු විපත් ඔවුන් පිට පමුණුවන්නෙමි. මන්ද, මා

ඔවුන්ට කතා කළ නමුත්, ඔව්හු සවන් නුදුන්නෝ ය.
මා ඔවුන්ට අඬගැසූ නමුත්, ඔව්හු උත්තර නුදුන්නෝ
ය.' "
18 එවිට ජරෙමියා රේකාබ්වරුන්ගේ වංශයට කතා
කොට, මෙසේ කීවේ ය: "ඉශ්රායලේවරුන්ගේ සියලු
බලැති දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ වදාරන
සේක. නුඹලාගේ පිය වූ ජෝනාදාබ්ගේ අණට
නුඹලා කීකරු ව, ඔහුගේ සෑම ශික්ෂා රක්ෂා කර,
ඔහු නුඹලාට අණ කළ සියල්ල ඉටු කළහු ය.
19 සෑම කල්හි ම මා ඉදිරියෙහි සිටින්නට
රේකාබ්ගේ පුත්ර වූ ජෝනාදාබ්ගනේ පැවත එන
කනෙකේ නැති ව නොයන්නේ ය.
ඉශ්රායලේවරුන්ගේ සියලු බලැති දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේක."

### බාරුක් දේව මාලිගාවේ දී පොත කියවීම

36 2 රාජා 24:1; 2 වංශා 36:5-7; දානි 1:1-2
ජොෂියාගේ පුත් ජුදාහි රජ වූ
ජහෙෝයාකිම්ගේ සතර වන අවුරුද්දේ දී සමිඳාණන්
වහන්සේ ජරෙමියාට මෙසේ වදාළ සේක: 2 "නුඹ
අකුළන පොතක් රැගනෙ, ජොෂියාගේ දවස්වල දී
මා නුඹට වදාළ දින පටන් අද දවස දක්වා
ඉශ්රායලේවරුන් ද ජුදාවරුන් ද සියලු ජාතීන් ද ගැන
මා නුඹට කී සියලු ම වචන එහි ලියන්න. 3 මා ජුදා
වංශයට කරන්නට අදහස් කරන සියලු විපත්ති ගැන
සමහර විට ඔවුන් අසා, ඔවුන්ගේ නපුරු මාර්ගයනේ
හැරනෙු ඇත. එවිට මම ඔවුන්ගේ අපරාධයත්,
පාපයත් කමා කරන්නමේ."
4 එවිට ජරෙමියා නේරියාගේ පුත් බාරුක්
කැඳවාගත්තේ ය; බාරුක් ද සමිඳාණන් වහන්සේ
ජරෙමියාට කියා තිබුණ, උන් වහන්සේගේ සියලු ම
වචන ඔහුගේ මුඛයනේ අසා අකුළන පොතක
ලියුවේ ය. 5 ජරෙමියා බාරුක්ට අණ කරමින් මෙසේ
කීවේ ය: "මා හිරඅඩස්සි වී සිටින බැවින් සමිඳාණන්
වහන්සේගේ මාලිගාවට ඇතුළු වීමට මට නොහැකි
ය. 6 එබැවින් ඔබ ඇතුළු වී, ඔබ මාගේ මුඛයනේ
අසා ලියා තිබනෙ පොතනේ, සමිඳාණන්
වහන්සේගේ වචන, උපවාස දවසේ දී සනෙඟ අසන
පිණිස, සමිඳාණන් වහන්සේගේ මාලිගාවෙහි දී
කියවන්න. තම තමන්ගේ නගරවලින් එන සියලු ජුදා
මිනිසුන්ට ඇසනෙ පිණිස ඒවා ඔවුන්ට කියවන්න.
7 සමහර විට ඔවුන් සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි
කන්නලව් කොට, යාච්ඤා කොට, එක එකා තම
තමාගේ නපුරු මාර්ගයනේ හැරනෙු ඇත. මන්ද,
සමිඳාණන් වහන්සේ මේ සනෙඟට විරුද්ධ ව
ප්රකාශ කර තිබනෙ උදහස සහ කෝපය ඉමහත්
ය." 8 නේරියාගේ පුත් බාරුක් ද දිවැසිවරයා වූ
ජරෙමියා තමාට අණ කළ සියල්ල ලසෙ කරමින්,
සමිඳාණන් වහන්සේගේ වචන සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ දී පොතනේ කියවේවේ ය.
9 තවද, ජොෂියාගේ පුත් ජුදාහි රජු වූ
ජහෙෝයාකිම්ගේ පස් වන අවුරුද්දේ නව වන
මාසයේ දී ජරෙුසලමේ මුළු සනෙඟ ද ජුදාහි
නගරවලින් ජරෙුසලමට ආ මුළු සනෙඟ ද සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි උපවාසයක් පැවැත්වූ හ.
10 එවිට බාරුක් සමිඳාණන් වහන්සේගේ
මාලිගාවෙහි ඉහළ මළුවේ, සමිඳාණන් වහන්සේගේ
මාලිගාවේ අලුත් දොරටුව ළඟ තිබුණ, ලේකම් වන
ෂාපාන්ගේ පුත් ගමෙරියාගේ ඇතුළු ගයෙි සිට
ජරෙමියාගේ වචන සනෙඟට ඇසනෙ පිණිස
පොතනේ කියවේවේ ය.

### නිලධාරීන්ට ඇසනෙ පරිදි පොත කියවීම

11 ෂාපාන්ගේ පුත් ගමෙරියාගේ පුත් මීකායා
සමිඳාණන් වහන්සේගේ සියලු වචන පොතනේ
කියවනු ඇසූ කල, 12 ඔහු ලේකම්ගේ ඇතුළු ගටෙ
බැස රජ ගදෙරට ගියේ ය. එහි සියලු අධිපතියන්
වන එලිෂාමා ලේකම් ද ෂමොයාගේ පුත් දලොයා ද
අක්බෝර්ගේ පුත් එල්නාතාන් ද ෂාපාන්ගේ පුත්
ගමෙරියා ද හනනියාගේ පුත් ශදෙකියා ද අනික්
සියලු අධිපතියෝ ද වාඩි වී සිටියහ. 13 එවිට
සනෙඟට ඇසනෙ පිණිස බාරුක් පොත කියවන විට
තමා ඇසූ සියලු වචන මීකායා ඔවුන්ට දැන්වී ය.
14 එවිට සියලු අධිපතීහු ද කුෂීගේ පුත්
ෂලෙමේයාගේ පුත් නතෙනියාගේ පුත් ජහෙුදී, බාරුක්
ළඟට යවමින්, සනෙඟට ඇසනෙ පිණිස ඔහු කියවූ
පොත රැගනෙ එන ලසෙ කියා යැව්වෝ ය.
නේරියාගේ පුත් බාරුක් පොත අතින් ගනෙ ඔවුන්
වතෙ පැමිණියේ ය. 15 ඔව්හු බාරුක් අමතා,
"කරුණාකර වාඩි වී අපට ඇසනෙ පිණිස ඔය පොත
කියවන්නැ"යි කී හ. බාරුක් ඔවුන්ට ඇසනෙ පරිදි එය
කියවුවේ ය. 16 තවද, ඔව්හු ඒ සියලු වචන අසා,
බියපත් වී, එකිනකො දසෙට හැරී, "අප ඇසූ මේ
සියලු වචන අපි සැබැවින් රජුට දන්වන්නමෙු"යි
බාරුක්ට කීවෝ ය. 17 තවද, ඔව්හු බාරුක් අමතා,
"ඔබ මේ සියලු වචන ලියුවේ කසෙේ දැ යි අපට
කියන්න; ඒවා ජරෙමියාගේ මුවින් ම ඔබ ඇසුවෙහි
දැ"යි විමසූ හ.
18 බාරුක් පිළිතුරු දමේන්, "ජරෙමියා මේ සියලු
වචන සිය මුවින් මට කියන විට මම ඒවා පොතෙහි
තීන්තනේ ලිවීමි"යි කීවේ ය.
19 එවිට අධිපතීහු කතා කරමින්, "ඔබ දදෙනො
කොතැන සිටිත් ද කියා කිසිවකෙු දැන නොගන්න
ලසෙ ඔබත්, ජරෙමියාත් ගොස් සැඟවී සිටින්නැ"යි
බාරුක්ට කීවෝ ය.

### රජතුමා පොත පිළිස්සීම

20 එවිට නිලධාරීහු එලිෂාමා ලේකම්ගේ ඇතුළු
ගයෙි පොත තබා රජු ළඟට මළුවට ගොස් රජු අසා
සිටිය දී ඒ සියලු වචන කීවෝ ය. 21 රජතුමා පොත
ගනෙනේන්නට ජහෙුදී යැවී ය. ඔහු එලිෂාමා
ලේකම්ගේ ඇතුළු ගයෙන් එය ගනෙවුත් රජුටත්, රජු
ළඟ සිටි සියලු අධිපතීන්ටත් ඇසනෙ ලසෙ එය
කියවේවේ ය. 22 එය නව වන මාසය විය; රජ සිසිර
විමානයේ සිටියේ ය. ඔහු ඉදිරියේ ගිනි භාජනයෙහි
ගිනි දැල්වමේන් තිබිණි. 23 ජහෙුදී පොතනේ තීරු

තුන හතරක් කියවූ කල රජ තමමේ ලියන්නාගේ
පිහියෙන් ඒක කපා භාජනයෙහි තිබුණු ගින්නට
දැමුවේ ය. එවිට භාජනයෙහි තිබුණු ගින්නෙන් මුළු
පොත දැවී ගියේ ය. 24 එහෙත්, රජ වත්, මේ සියලු
වචන ඇසූ ඔහුගේ සියලු සේවකයෝ වත් බියපත්
නොවූ හ; දුකින් තමන්ගේ වස්ත්‍ර ඉරා
නොගත්තෝ ය. 25 තවද, එල්නාතන් ද දලොයා ද
ගමෙරියා ද පොත නොදවන ලෙස රජුගෙන් ඉල්ලා
සිටියෝ ය. එහෙත්, ඔහු ඔවුන්ට සවන් නුදුන්නේ ය.
26 රජ වනාහි ලේකම් තැන වන බාරුක් සහ
දිවැසිවරයා වන ජරෙමියා අල්ලාගෙන එන ලෙස රාජ
පුත් ජරොමයෙල්ටත්, අශ්‍රීයෙල්ගේ පුත්
සරොයාටත්, අබ්දයෙල්ගේ පුත් ෂෙලෙමියාටත් අණ
කළේ ය. එහෙත්, සමිඳාණන් වහන්සේ ඔවුන්
සඟවා ලූ සේක.

## ජරෙමියා තවත් පොතක් ලිවීම

27 බාරුක් ජරෙමියාගේ මුවින් ඇසූ වචන සටහන්
කළ පොත රජතුමා පුළුස්සාදැමූ පසු, සමිඳාණන්
වහන්සේ යළිත් ජරෙමියාට කතා කොට, 28 "තවත්
පොතක් ගෙන, ජුදාහි රජු වූ ජහෙයෝයාකිම් දවා ලූ
පළමු පොතේ තිබූ සියලු වචන එහි ලියන්නැ"යි
වදාළ සේක. 29 "ජුදාහි ජහෙයෝයාකිම් රජු ගැන
මෙසේ කියන්නැ"යි ද සමිඳාණන් වහන්සේ
ජරෙමියාට වදාළ සේක. "බබිලෝනියේ රජ අවුත්
මේ දේශය විනාශ කර, මතුෙනින් මනුෂ්‍යයන් ද
මෘගයන් ද පහ කරදමන්නේ ය කියා නුඹ මේ
පොතෙහි ලියුවේ කුමක් නිසා දැ යි අසමින් නුඹ ඒ
පොත පුළුස්සා දැමුවෙහි ය. 30 එබැවින් ස්වාමීන්
වන මම ජුදාහි රජු වන ජහෙයෝයාකිම් වන නුඹට
මෙසේ කියමි. දාවිත්ගේ සිංහාසනයෙහි හිඳගැනීමට
කිසි ම කෙනෙක් නුඹේ මතුපරම්පරාවෙන්
නොපැමිණෙන්නේ ය. නුඹේ මළකඳ දවාලේ
ග්‍රීෂ්මයටත්, රාත්‍රියේ ශීතලයටත් පිටත හෙළාදමනු
ලබන්නේ ය. 31 මම නුඹටත්, නුඹේ වංශයටත්,
නුඹේ සේවකයන්ටත් නුඹලා සියලු දෙනාගේ
අපරාධ නිසා දඬුවම් කරන්නෙමි. නුඹ වත්,
ජෙරුසලමේ හා ජුදාවේ වැසියන් වත් මට සවන්
නුදුන් නිසා මම නුඹලාට විරුද්ධ ව ප්‍රකාශ කළ
සියලු විපත්ති නුඹලා පිට පමුණුවන්නෙමි."
32 එවිට ජරෙමියා වෙන පොතක් ගෙන
නේරියාගේ පුත් බාරුක් නම් ඔහුගේ ලේකම්ට
දුන්නේ ය. ඔහු ද ජුදාහි රජු වූ ජහෙයෝයාකිම්
ගින්නෙන් දවාදැමූ පොතේ සියලු වචන ජරෙමියාගේ
මුවින් අසාගෙන එහි ලිව්වේ ය. ඒ පොතට තවත්
බොහෝ වචන ද එකතු කරන ලද්දේ ය.

## ජෙරුසලමේ විනාශය දැන්වීම

37 2 රාජා 24:17; 2 වංශා 36:10
ජහෙයෝයාකිම්ගේ පුත් කෝනියා වෙනුවට
බබිලෝනියේ රජු වූ නබුකද්නෙසර් විසින් ජුදා
දේශයෙහි ජොෂියාගේ පුත් ශෙදෙකියා රජකමට
පත් කරනු ලැබ ඔහු රජකම් කළේ ය. 2 එහෙත්,
ඔහු වත්, ඔහුගේ සේවකයෝ වත්, දේශයේ
සෙනඟ වත් සමිඳාණන් වහන්සේගේ දිවැසිවරයා
වන ජරෙමියා මඟින් ප්‍රකාශ කරන ලද උන්
වහන්සේගේ වචනවලට සවන් නුදුන්නෝ ය.
3 එහෙත්, ශෙදෙකියා රජු ෂෙලෙමියාගේ පුත්
ජෙහුකල් ද පූජක වූ මයසේයාගේ පුත් ශෙපෙනියා ද
අත, "අනේ! අප උදෙසා අපේ දෙවි ස්වාමීන්
වහන්සේට යාච්ඤා කරන්නැ"යි දිවැසිවරයා වන
ජරෙමියාට කියා යැවී ය. 4 සෙනඟ අතරේ නිදහසේ
යමින් එමින් ජරෙමියා සිටියේ ය. මන්ද, ඒතාක් කල්
ඔවුන් ඔහු හිරගෙයි දමා තිබුණේ නැත. 5 ඒ
අතරතුරේ දී පාරාවෝගේ සේනාව මිසරයෙන් පිටත්
ව ආවෝ ය. ජෙරුසලම වටලාගෙන සිටි
බබිලෝනිවරු ඒ ආරංචිය අසා ජෙරුසලමෙන් ඉවත් ව
ගියෝ ය.
6 එවිට ඉශ්‍රායලේහි දෙවි ස්වාමීන් වහන්සේ
දිවැසිවර ජරෙමියාට මෙසේ වදාළ සේක: 7 "මාගෙන්
විමසන පිණිස නුඹලා මා වෙත එවූ ජුදාහි රජුට
මෙසේ කියන්න: 'මෙන්න, නුඹලාට සහායට පැමිණි
පාරාවෝගේ සේනාව තමන්ගේ දේශය වන
මිසරයට හැරී යනු ඇත. 8 බබිලෝනිවරුන් හැරී
අවුත් මේ නුවරට විරුද්ධ ව යුද්ධ කොට, මේක
අල්ලා ගින්නෙන් දවාදමනු ඇත. 9 බබිලෝනිවරුන්
ආපසු නොඑති යි සිතමින් නොරැවටෙන ලෙස
ස්වාමීන් වන මම නුඹලාට අවවාද කරමි. ඔවුන්
ආපසු එනු ඇත. 10 නුඹලාට විරුද්ධ ව යුද්ධ කරන
බබිලෝනිවරුන්ගේ මුළු සේනාවට නුඹලා පහර දී
ඔවුන් අතරෙන් දරුණු තුවාළ ලත් අය පමණක්
ඔවුන්ගේ කූඩාරම් වල ඉතිරි කරන නමුත්, ඔවුන්
නැඟිට මේ නගරය ගින්නෙන් දවා දමනු ඇත.' "

## ජරෙමියා අත්අඩංගුවට ගනු ලැබීම

11 තවද, පාරාවෝගේ සේනාවට බියෙන්
බබිලෝනිවරුන්ගේ සේනාව ජෙරුසලම කරෙන් ගිය
කල, 12 ජරෙමියා බෙන්ජමින් දේශයේ සෙනඟ
අතරේ තමාගේ උරුම කොටස ලබාගන්න පිණිස
ජෙරුසලමෙන් පිටත් ව ගියේ ය. 13 ඔහු බෙන්ජමින්
දේශයේ දොරටුවට පැමිණි කල, හනනියාගේ පුත්
ෂෙලෙමියාගේ පුත් වන ඉරියා නම් මුරපළේ
මුලාදෑනියෙක් එහි සිටියේ ය. ඔහු දිවැසිවර
ජරෙමියා අල්ලාගෙන, "ඔබ බබිලෝනිවරුන්ට එකතු
වන්නට යන්නෙහි ය"යි කී ය.
14 "එය බොරුවක් ය; මම බබිලෝනිවරුන්ට එකතු
වන්නට නොයමි"යි ජරෙමියා කී ය. එහෙත්, ඉරියා
ජරෙමියාට සවන් නො දී, ඔහු අල්ලාගෙන, අධිපතීන්
ළඟට ගෙන ගියේ ය. 15 එවිට අධිපතීහු ජරෙමියාට
විරුද්ධ ව කිපී, ඔහුට තළා හිර නිවසක් මෙන්
සැලකුණ ජොනතන් ලේකම්ගේ ගෙයි ඔහු හිර
අඩස්සි කළෝ ය. 16 ජරෙමියා හිරගෙයි බිම්ගෙවලට
පැමිණ එහි බොහෝ දවස් නැවතී සිටි පසු,
ශෙදෙකියා රජු ඔහු කැඳවා ඔහු පිළිගෙන,

17 “සමිඳාණන් වහන්සේගෙන් පණිවුඩයක් තිබේ
දැ”යි තමාගේ මාලිගාවේ දී රහසින් ඔහුගෙන්
ඇසුවේ ය. ජෙරමියා ද, “පණිවුඩයක් තිබේ. ඔබ
බබිලෝනියේ රජුගේ අතට අසු වන්නෙහි ය”යි
කීවේ ය. 18 තවද, ජෙරමියා ශෙදෙකියා රජුට කතා
කොට, “මා හිරගෙයි දැමීමට ඔබට වත්, ඔබේ
සේවකයන්ට වත්, මේ සෙනඟට වත් විරුද්ධ ව මා
කළ වරද කුමක් ද? 19 ‘බබිලෝනියේ රජ ඔබට
වත්, මේ දේශයට වත් විරුද්ධ ව නොඑන්නේ යැ’යි
ඔබට දිවුරා කීවාවූ ඔබේ දිවැසිවරයා ඉතින්
කොයි ද? 20 එබැවින් මාගේ ස්වාමීන් වන රජතුමනි,
අනේ! මාගේ බස් අසා, මාගේ කන්නලව්ව
පිළිගෙන, මා එහි නොනසින පිණිස ජොනතන්
ලේකම්ගේ ගෙට මා නැවත නොහැරිය මැනව”යි
කීවේ ය.
21 ශෙදෙකියා රජ ද ජෙරමියා හිරගෙයි රැකවල්
මළුවට යවන්නටත්, රොටි සියල්ල ම නගරයෙන්
ඉවර වී යන තුරු දවස්පතා රොටියක් බැගින් රොටි
සාදන්නන්ගේ වීදියෙන් ඔහුට ගෙන දෙන්නටත් අණ
දුන්නේ ය. මෙසේ ජෙරමියා රැකවල් මළුවෙහි
නැවතී සිටියේ ය.

## ජෙරමියා ළිඳකට දමනු ලැබීම

38 එකල මත්තාන්ගේ පුත් ෂෙපෙතියා ද
පෂ්හූර්ගේ පුත් ගෙදලියා ද ෂෙලෙමියාගේ
පුත් ජුකල් ද මල්කියාගේ පුත් පෂ්හූර් ද ජෙරමියා
සියලු සෙනඟට කී වචන ඇසූ හ. 2 “සමිඳාණන්
වහන්සේ මෙසේ වදාළ සේකැ”යි ජෙරමියා කීවේ
ය: “මේ නගරයේ නවතින යමෙක් වේ ද, ඔහු
කඩුවෙන් ද සාගතයෙන් ද වසංගතයෙන් ද
මැරෙන්නේ ය. එහෙත්, බබිලෝනිවරුන් වෙත ගොස්
ඔවුන්ට භාර වන තැනැත්තා ජීවත් වන්නේ ය. ඔහුට
අභය ලැබෙන්නේ ය. 3 සැබැවින් මේ නගරය
බබිලෝනියේ රජුගේ සේනා අතට අසු වී ඔහු ඒක
අල්ලාගන්නේ යයි සමිඳාණන් වහන්සේ වදාරන
සේක.”
4 එවිට අධිපතිහු කතා කොට, “මේ මනුෂ්‍යයා
මරනු ලැබේ වා! මන්ද, මෙසේ මෙබඳු වචන
කීමෙන්, මොහු නගරයේ ඉතුරු ව සිටින යුද්ධ
භටයන් ද සියලු සෙනඟ ද අධෛර්ය කරන්නේ ය.
මේ මිනිසා සෙනඟගේ යහපත නොව ඔවුන්ගේ
විනාශය පතන්නේ යැ”යි කී හ.
5 ශෙදෙකියා රජ ද, “මෙන්න, ඔහු ඔබේ අතෙහි
ය. ඔබට විරුද්ධ ව කිසිවක් කරන්නට රජුට බැරි
ය”යි කීවේ ය. 6 එකල ඔව්හු ජෙරමියා ගෙන
හිරගෙයි මළුවෙහි තිබුණු මල්කියා රජ කුමරුගේ
ළිඳට ඔහු ලණුවලින් බැස්සෙවුවෝ ය. ඒ ළිඳේ වතුර
නොව මඩ තිබිණි. ජෙරමියා එහි මඩේ එරුණේ ය.
7 ජෙරමියා ළිඳේ දැමූ බව ඇසූ රජ ගෙදර සිටි
නපුංසකයෙකු වූ කුෂිය ජාතික එබදේ-මලෙකේ රජ
ගෙදරින් නික්ම, බෙන්ජමින් දොරටුවේ ඉඳගෙන හුන්
රජු වෙත ගොස්, 8+JER රජුට කතා කොට, “මාගේ
ස්වාමීන් වන රජතුමනි, මේ මනුෂ්‍යයන් විසින් ළිඳේ
දමන ලද දිවැසිවර ජෙරමියාට ඔවුන් කළ සියල්ල
කෲරතර ය. ඔහු එහි බඩගින්නෙන් මැරෙනු ඇත.
මන්ද, නගරයෙහි තවත් කෑමට රොටි නැතැ”යි කී ය.
10 එවිට රජ කුෂිය ජාතික එබදේ-මලෙකේට අණ
කරමින්, “ඔබ, සමඟ මෙතැනින් මනුෂ්‍යයන්
තුන්දෙනෙකු කැඳවාගෙන ගොස්, දිවැසිවර ජෙරමියා
මැරෙන්නට පෙර ඔහු ළිඳෙන් ගොඩට ගන්නැ”යි
කීවේ ය. 11 එබදේ-මලෙකේ ද ඒ මිනිසුන් තමා
සමඟ කැඳවාගෙන රජ ගෙදර ගබඩාවට වැද,
අල්මාරියකින් පරණ රෙදි කෑලි ද පරණ වැරහැලි ද
ගෙන, ඒවා ළිඳ ඇතුළට ජෙරමියා ළඟට ලණුවලින්
බැවූවේ ය. 12 කුෂිය ජාතික එබදේ-මලෙකේ, “මේ
පරණ රෙදි කෑලි සහ වැරහැලි ඔබේ කිහිලිවල ලණු
යට තබාගන්නැ”යි ජෙරමියාට කීවේ ය. ජෙරමියා
එසේ කළේ ය. 13 එවිට ඔව්හු ජෙරමියා ලණුවලින්
ඇද ළිඳෙන් ගොඩට ගත්හ. ජෙරමියා රැකවල්
මළුවේ සිටියේ ය.

## ශෙදෙකියා රජ ජෙරමියාගේ අවවාද පැතීම

14 එවිට ශෙදෙකියා රජ දිවැසිවර ජෙරමියා කැඳවා,
සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ තුන් වන
දොරටුවට පිළිගෙන, ඔහුට කතා කොට, “මම
ඔබෙන් කාරණයක් අසමි. කිසිවක් මාගෙන්
නොසඟවන්නැ”යි කී ය.
15 ජෙරමියා පිළිතුරු දෙමින්, “මම ඔබට
දැන්නුවොත් සැබැවින් ඔබ මා නොමරන්නෙහි ද? මා
ඔබට දැනුමැතිකම් දුන්නත් ඔබ මට සවන් දෙන්නේ
නැතැ”යි ශෙදෙකියාට කීවේ ය.
16 එවිට ශෙදෙකියා රජ, “මා ඔබ මරන්නේ වත්,
ඔබේ ප්‍රාණය හානි කරන්නට සොයන ඒ
මනුෂ්‍යයන් අතට ඔබ පාවා දෙන්නේ වත් නැතැ යි
අපට දිවි දුන් ජීවමාන සමිඳාණන් වහන්සේගේ
නාමයෙන් දිවුරමි”යි ජෙරමියාට රහසින් දිවුරුම්
දුන්නේ ය.
17 එකල ජෙරමියා ශෙදෙකියා අමතමින්, “සියලු
බලැති දෙවියන් වහන්සේ වන ඉශ්‍රායෙල්වරුන්ගේ
දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ වදාරන සේකැ”යි
කීවේ ය. “නුඹ ඇත්තට ම බබිලෝනියේ රජුගේ
අධිපතීන්ගේ අතට භාර වූවොත්, නුඹේ පණ බේරා
ගන්නෙහි ය. මේ නගරය ද ගින්නෙන් දවනු
නොලැබෙන්නේ ය. නුඹත්, නුඹේ වංශයත්
ජීවත්වන්නෝ ය. 18 එහෙත්, නුඹ බබිලෝනියේ
රජුගේ අධිපතීන්ගේ අතට භාර නුවූවොත්, මේ
නුවර බබිලෝනිවරුන් අතට පාවා දෙනු ලබන්නේ ය.
ඔවුන් එය ගිනිබත් කරනු ඇත. නුඹ ද ඔවුන්ගේ
අතින් ගැළවෙන්නේ නැතැ”යි කී ය.
19 එවිට ශෙදෙකියා කතා කරමින්,
“බබිලෝනිවරුන්ට එකතු වූ ජුදෙව්වරුන් ගැන මම
බිය වෙමි. මට වද වේදනා කරන පිණිස ඔවුන්
අතට මා පාවා දෙනු ලැබේ දැ යි මට සැක ය”යි කී
ය.

20 ජෙරෙමියා මෙසේ පිළිතුරු දුන්නේ ය: “ඔවුන් ඔබ
පාවා දෙන්නේ නැත. මා ඔබට කියන හැටියට
සමිඳාණන් වහන්සේගේ හඬට කීකරු වුව මැනව.
එයින් ඔබට ශුභසිද්ධ වී ඔබ ජීවත් වන්නෙහි ය.
21 එහෙත්, ඔබ ඔවුන්ගේ අතට භාර වන්නේ නැතැ
යි කියන්නෙහි නම්, ඔබට වන මේ දේ සමිඳාණන්
වහන්සේ මට දර්ශනයකින් පෙනේ වූ සේක.
22 බලන්න, ජුදාහි රජුගේ ගෙදර ඉතිරි ව සිටින
සියලු ස්ත්‍රීහු බබිලෝනියේ රජුගේ අධිපතීන් වෙත
ගෙනයනු ලබති. ඔව්හු කතා කරමින්, ‘ඔබේ
හිතමිතුරෝ ඔබ රවටා ඔබෙන් ජය ගත්තෝ ය.
ඔබේ පාද දැන් මඩෙහි එරී ඇති බැවින් ඔබේ
මිතුරන් ඔබ කෙරෙන් වෙන් ව ගොස් ඇතැ’යි ද
කියති.”
23 තවදුරටත් ජෙරෙමියා කතා කරමින්, “ඔබේ සියලු
භාර්යාවෝ ද දරුවෝ ද බබිලෝනිවරුන් වෙත
ගෙනයනු ලබන්නෝ ය. ඔබත් ඔවුන්ගේ අතින්
බේරෙන්නේ නැත. බබිලෝනියේ රජු විසින් ඔබ
හිර අඩස්සි කරනු ලබන්නෙහි ය. මේ නගරයත්
ගින්නෙන් දවාලනු ලබන්නේ ය”යි කී ය.
24 ශෙදෙකියා පිළිතුරු දෙමින්, “මේ වචන කිසිවකේ
දැන නොගනිත් වා! එවිට ඔබ මරණයට පත්
වන්නේ නැත. 25 එහෙත්, මා ඔබ සමඟ කතා කළ
බව අධිපතීන් අසා, ඔබ ළඟට අවුත්, ‘ඔබ රජුට
කීවේ කුමක් ද’ කියාත්, ‘අපෙන් නොසඟවා අපට
දන්වන්න. එවිට අපි ඔබ නොමරන්නෙමු’යි කියාත්
ඔබට කීවොත්, 26 ‘මා ජොනතන්ගේ ගෙයි
නසින්නට එහි මා නැවත නොඅරින ලෙසෙ මාගේ
බැගෑපත් කන්නලව්ව රජු ඉදිරියෙහි ඔප්පු කළෙමේ’යි
කියන්නැ”යි ජෙරෙමියාට කීවේ ය. 27 එවිට සියලු
අධිපතීහු ජෙරෙමියා ළඟට අවුත් ඔහුගෙන් ඒ ගැන
විචාළෝ ය. රජු ඔහුට අණ කළ ලෙසෙ ජෙරෙමියා
ඔවුන්ට පිළිතුරු දුන්නේ ය. ඔව්හු නිශ්ශබ්ද වී
යන්නට ගියෝ ය. මන්ද, රජු සමඟ කෙරුණු කතාව
කිසිවකුට නොඇසුණේ ය. 28 එසකි 33:21මෙසේ
ජෙරුසලම සතුරන්ගේ අතට අසු වූ දවස දක්වා
ජෙරෙමියා රැකවල් මළුවේ තබන ලදී.

### ජෙරුසලමේ වැටීම

39 ජුදාහි රජ වූ ශෙදෙකියාගේ රජකමේ නව
වන අවුරුද්දේ දස වන මාසයේ දී
බබිලෝනියේ රජ වූ නබෙකද්නෙශර් තමේ
තමාගේ මුළු සේනාව සමඟ ජෙරුසලමට විරුද්ධ ව
අවුත් එය වටලාගත්තේ ය. 2 ශෙදෙකියාගේ
එකොළොස් වන අවුරුද්දේ සතර වන මාසයේ නව
වන දින නගර පවුර බිඳින ලද්දේ ය.
3 ජෙරුසලම අල්ලාගනු ලැබූ පසු, බබිලෝනියේ
රජුගේ සියලු අධිපතීහු එනම්, නේර්ගල්-ෂරෙශෙරේ ද
සම්ගර්-නබෝ ද සර්සකීම් ද රබ්-සාරිස් ද තවත්
නේර්ගල්-ෂරෙශෙරේ නමැත්තකේ ද රබ්-මග් ද
බබිලෝනියේ රජුගේ අනික් සියලු අධිපතීහු ද අවුත්
මැද දොරටුවේ හිඳගත්තෝ ය.
4 තවද, ජුදාහි රජු වූ ශෙදෙකියා ද සියලු
භටයෝ ද ඔවුන් දුටු විට, පවුරු දෙකෙ අතරේ
තිබෙන දොරටුවෙන් රජ උයන මැදින් යන පාරෙන්
නගරයෙන් පිටත් ව රාත්‍රියේ පලා ගියෝ ය. ඔව්හු
අරබා සමභූමියේ මාර්ගය බලා නික්ම ගියෝ ය.
5 එහෙත්, බබිලෝනිවරුන්ගේ සේනාව ඔවුන්
ලුහුබැඳ ගොස්, ජෙරිකෝවේ සමභූමිවල දී
ශෙදෙකියාට ළං වී ඔහු අල්ලා, හමාත් දේශයේ
රිබ්ලාහි සිටි බබිලෝනියේ රජු වූ නබෙකද්නෙශර්
වෙත ඔහු ගෙන ගියෝ ය. ඔහු ද ඔහු ගැන තීන්දුව
දුන්නේ ය. 6 බබිලෝනියේ රජ ශෙදෙකියාගේ
පුත්‍රයන් රිබ්ලාහි දී ඔහුගේ ඇස් ඉදිරිපිට මැරී ය.
බබිලෝනියේ රජ ජුදාහි සියලු උත්තමයන් ද මැරවී
ය. 7 තවද, ඔහු ශෙදෙකියාගේ ඇස් උගුලාදමා, ඔහු
බබිලෝනියට ගෙන යන පිණිස විලංගු දැමවී ය.
8 බබිලෝනිවරු රජ මැඳුර සහ සෙනඟගේ ගෙවල්
ගිනි ලා, ජෙරුසලමේ පවුරු කඩාදැමුවෝ ය. 9 තවද,
රැකවල් සේනාවේ අධිපතියා වූ නබෙසරදාන්, නුවර
ඉතිරි ව සිටි සෙනඟ ද පලා අවුත් තමාගේ
සෙනඟට එකතු වූ අය ද සෙනඟගෙන් ඉතිරි වූ
අනෙක් අය ද අල්ලා බබිලෝනියට ගෙන ගියේ ය.
10 එහෙත්, රැකවලුන්ගේ අධිපතියා වූ නබෙසරදාන්
කිසිත් නැති දිළිඳු සෙනඟගෙන් සමහරකු ජුදා
දේශයෙහි ඉතිරි කර තබා, ඔවුන්ට මිදි වතු සහ
ඉඩම් ද දුන්නේ ය.

### ජෙරෙමියා නිදහස් වීම

11 ඉන්පසු බබිලෝනියේ රජ වූ නබෙකද්නෙශර්
රජ තමේ ජෙරෙමියා ගැන රැකවල් සේනාවේ
අධිපතියා වූ නබෙසරදාන්ට අණ කරමින්, 12 “ඔබ
ඔහු රැගෙන, ඔහු හොඳට රැක බලාගෙන, ඔහුට
කිසි අනතුරක් නොකොට, ඔහු ඔබට කියන හැටියට
ම ඔහුට කටයුතු කරන්නැ”යි කීවේ ය. 13 මෙසේ
රැකවලුන්ගේ අධිපතියා වූ නබෙසරදාන් ද
නබෙෂශ්බාන් ද රබ්-සාරිස් ද නේර්ගල්-ෂරෙශෙරේ ද
රබ්-මග් ද බබිලෝනියේ රජුගේ සියලු අධිපතීහු ද
14 ජෙරෙමියා රැකවල් මළුවෙන් ගෙන්වාගෙන ඔහු
ගෙදරට ගෙන යන පිණිස ෂාපාන්ගේ පුත්‍රයා වන
අහිකාම්ගේ පුත් ගෙදලියාට භාර කළෝ ය.
ජෙරෙමියා සෙනඟ අතරේ වාසය කළේ ය.

### එතියෝපීය එබෙද්-මෙලෙකේට සමිඳුන්ගේ පොරොන්දුව

15 ජෙරෙමියා රැකවල් මළුවේ හිර අඩස්සියේ
සිටිද්දී, සමිඳාණන් වහන්සේ ඔහුට කතා කරමින්,
එතියෝපීය එබෙද්-මෙලෙකේට මෙසේ කියන්නට
වදාළ සේක: 16 “බලන්න, මා කී පරිදි මම මේ
නගරය පිට සැපත නොව විපත පමුණුවන්නෙමි. ඒ
දවසේ දී මේවා නුඹ ඉදිරියෙහි ම සිදු වනු ඇත.
17 එහෙත්, ස්වාමීන් වන මම ඒ දවසේ දී නුඹ
ගළවන්නෙමි. නුඹ බිය ව සිටින මිනිසුන්ගේ අතට
නුඹ පාවා නොදෙනු ලැබේ. 18 සැබැවින් ම මම නුඹ
මුදාගන්නෙමි. නුඹ කඩුවෙන් මරනු නොලබන්නෙහි

ය. නුඹ මා කෙරෙහි විශ්වාස කළ බැවින් නුඹ පණ
බේරාගෙන ගැළවෙන්නෙහි ය. මෙසේ පවසන්නේ
ස්වාමීන් වන මම ය.”

### ජෙරමියා ගෙදලියා හමු වීමට යෑම

40 රැකවල් සේනාවේ අධිපතියා වූ
නෙබුසරදාන් ජෙරමියා අල්ලා රාමායෙන්
නිදහස් කර හරිනු ලැබූ පසු සමිඳාණන් වහන්සේ
ජෙරමියාට කතා කළ සේක. බබිලෝනියට ගෙන
යන පිණිස ජෙරුසලමෙන් ද ජුදා රටෙන් ද අල්ලාගනු
ලැබූ සියල්ලන් අතරෙහි ජෙරමියා ද දම්වැල්වලින්
බැඳ තබන ලදී.
2 රැකවල් සේනාවේ අධිපතියා ජෙරමියා තමා
වෙත ගෙන්වාගෙන ඔහුට මෙසේ කීවේ ය: “ඔබේ
දෙවි ස්වාමීන් වහන්සේ මේ දේශයට විරුද්ධ ව මේ
විපත්තිය ප්‍රකාශ කළ සේක. 3 සමිඳාණන්
වහන්සේ ඒ ප්‍රකාශය ඉටු කරමින් උන් වහන්සේ
වදාළ ලෙස කළ සේක; නුඹලා සමිඳාණන්
වහන්සේට විරුද්ධ ව පව් කොට, උන් වහන්සේගේ
හඬට කීකරු නොවී සිටි නිසා, මේ දෙය නුඹලා
වෙත පැමිණියේ ය. 4 ඉතින් ඔබේ අත් බැඳ තිබෙන
දම්වැල්වලින් මම අද ඔබ මුදමි. මා සමඟ
බබිලෝනියට එන්න ඔබ කැමැති නම් එන්න. මම
ඔබ හොඳට බලාගන්නෙමි. එහෙත්, මා සමඟ
බබිලෝනියට එන්න ඔබ කැමැති තැන්නම්,
නවතින්න. මුළු දේශය ඔබ ඉදිරියෙහි ය. ඔබ යන්න
කැමැති ලෙස හොඳ යයි පෙනෙන ඕනෑ තැනකට
යන්න.”
5 ඔහු තවත් හැරී ආපසු නොගොස් සිටිය දී,
නෙබුසරදාන් ඔහු අමතා “බබිලෝනියේ රජු ජුදා
නගරයේ ආණ්ඩුකාරකමට පත් කළ, ෂාපාන්ගේ පුත්
වන අහිකාම්ගේ පුත් ගෙදලියා ළඟට හැරී ගොස්,
ඔබ ඔහු සමඟ සෙනඟ අතරෙහි වාසය කරන්න.
නැත්නම් ඔබට යන්න පහසු යයි පෙනෙන
කොතැනට නමුත් යන්නැ”යි කීවේ ය. තවද,
රැකවලුන්ගේ අධිපතියා ඔහුට සැහෙන ආහාරත්,
තෑග්ගකුත් දී ඔහු යන්නට හැරියේ ය. 6 ජෙරමියා
මිශ්පා නගරයේ සිටි අහිකාම්ගේ පුත් ගෙදලියා
ළඟට ගොස්, දේශයේ ඉතිරි ව සිටි සෙනඟ අතරේ
ඔහු සමඟ වාසය කළේ ය.

### ගෙදලියා මැරීමට කුමන්ත්‍රණයක්
(2 රාජා 25:22-26)

7 2 රාජා 25:22-24 පිටිසර සිටි සේනාවල අධිපතීහු
ද ඔවුන්ගේ සෙනඟ ද බබිලෝනියේ රජ
අහිකාම්ගේ පුත් ගෙදලියා දේශයේ ආණ්ඩුකාරයා
කොට පත් කළ බවත්, බබිලෝනියට ගෙන නොගිය
දේශයේ ඉතා දිළිඳු වූවන්ගෙන් පුරුෂයන් ද ස්ත්‍රීන්
ද දරුවන් ද ඔහුට භාර කළ බවත් ඇසූ විට
8 නෙතනියාගේ පුත් ඉෂ්මායෙල් ද කාරේයාගේ පුත්
ජොහානාන් හා ජොනතන් ද තන්හුමෙත්ගේ පුත්
සෙරායා ද නෙටොපාතියා ඒපයිගේ පුත්‍රයෝ ද
මයකාතියයාගේ පුත් ජෙසනියා ද ඔවුන්ගේ සෙනඟ
ද මිශ්පා නගරයේ සිටි ගෙදලියා වෙත ආහ. 9 එවිට
ෂාපාන්ගේ පුත් වන අහිකාම්ගේ පුත් ගෙදලියා
ඔවුන්ටත්, ඔවුන්ගේ සෙනඟටත් දිවුරුම් දෙමින් කතා
කොට, “බබිලෝනිවරුන්ට සේවය කරන්නට බිය
නොවන්න. දේශයෙහි වසමින් බබිලෝනියේ රජුට
සේවය කරන්න. එවිට ඔබට ශුභසිද්ධ වන්නේ ය.
10 මම, අප ළඟට එන බබිලෝනිවරුන් ඉදිරිපිට ඔබ
වෙනුවෙන් පෙනී සිටින්නට මිශ්පාහි වාසය කරමි.
ඔබ මුද්‍රික පානය ද ඉදුණු පල ද තෙල් ද එකතු
කොට ඔබේ භාජනවල තබා ඔබ ලබාගත් නගරවල
වාසය කරන්නැ”යි කීවේ ය. 11 එසේ ම මෝවබ්හි
ද අම්මොන් පුත්‍රයන් අතරේ ද ඒදොම්හි ද අනිකුත්
සෑම රටවල ද සිටි සියලු ජුදෙව්වරුන්ට බබිලෝනියේ
රජු ජුදෙව්වරුන්ගෙන් සමහරෙකු ඉතිරිකර ගිය බව ද
ඔවුන් කෙරෙහි ෂාපාන්ගේ පුත්‍රයා වූ අහිකාම්ගේ
පුත් ගෙදලියා පත් කළ බව ද ආරංචි විය. 12 එවිට
ඒ සියලු ජුදෙව්වරු තමන් පන්නනු ලැබූ සියලු
තැන්වලින් හැරී ජුදා දේශයේ මිශ්පාහි සිටි ගෙදලියා
ළඟට අවුත්, මුද්‍රික පානය ද ඉදුණු පල ද
බොහොමයක් එකතු කර ගත්තෝ ය.
13 ඉන්පසු කාරේයාගේ පුත් ජොහානාන් ද පිටිසර
සිටි සේනාවල සියලු අධිපතීහු ද මිශ්පාහි ගෙදලියා
ළඟට අවුත්, 14 “අම්මොන් පුත්‍රයන්ගේ රජ වූ
බයලිස් ඔබ මරන්නට නෙතනියාගේ පුත් ඉෂ්මායෙල්
එවූ බව ඔබ දන්නෙහි දැ”යි ඇසූ හ. එහෙත්,
අහිකාම්ගේ පුත් ගෙදලියා ඔවුන් විශ්වාස කළේ
නැත. 15 එකල කාරේයාගේ පුත් ජොහානාන්
මිශ්පාහි දී ගෙදලියාට රහසින් කතා කොට, “මා
ගොස් කිසිවෙකු නොදැනුවත් ව නෙතනියාගේ පුත්
ඉෂ්මායෙල් මරන පිණිස මට අවසර ලැබේ වා.
ඔබව මරන්නට ඉඩ දෙන්නේ කුමට ද? එසේ
වුවහොත්, ඔබ වෙත රැස් ව සිටින සියලු
ජුදෙව්වරුන් විසිර යනු ඇත. ජුදාහි ඉතිරි ව සිටින
සියලු දෙනා විනාශ වනු ඇතැ”යි කීවේ ය.
16 එහෙත්, අහිකාම්ගේ පුත් ගෙදලියා කාරේයාගේ
පුත් ජොහානාන් අමතා, “ඔබ මේ දේ නොකළ යුතු
ය. ඉෂ්මායෙල් ගැන ඔබ කියන දේ සැබෑවක්
නොවේ ය”යි කී ය.

### ගෙදලියා මරනු ලැබීම

41 2 රාජා 25:25 සත් වන මාසයේ දී රාජ
වංශයට අයිති වූ, රජුගේ අධිපතියන්ගෙන්
කෙනෙකු වන එලිෂාමාගේ පුත් නෙතනියාගේ පුත්
ඉෂ්මායෙල් ද ඔහු සමඟ මිනිසුන් දසදෙනෙක් ද
මිශ්පාහි සිටි අහිකාම්ගේ පුත් ගෙදලියා වෙත
පැමිණියෝ ය. එහි ඔව්හු මිශ්පාහි දී එක් ව කෑම
කෑවෝ ය. 2 එවිට නෙතනියාගේ පුත් ඉෂ්මායෙල්
සහ ඔහු සමඟ සිටි මිනිසුන් දසදෙනා බබිලෝනියේ
රජු විසින් දේශයේ ආණ්ඩුකාරකමට පත් කළා වූ
ෂාපාන්ගේ පුත් වන අහිකාම්ගේ පුත් ගෙදලියාට
කඩුවෙන් පහර දී ඔහු මැරුවෝ ය. 3 තවද,
ඉෂ්මායෙල් තමේ ගෙදලියා සමඟ මිශ්පාහි සිටි

සියලු යුදෙව්වරුන් ද එහි ඒ අවස්ථාවේ සිටි
බබිලෝනීය යුද්ධ භටයන් ද මැරුවේ ය.
4 ගෙදලියා මරනු ලැබූ දිනට පසු දින කිසිවෙකු ඒ
ගැන දැනගන්නට පෙර, 5 ෂෙකෙම්හි ද ෂිලෝහි ද
සමාරියේ ද සිටි මිනිසුන් අසූදෙනෙක් රැවුල්
කපාගෙන, ඇඳුම් ඉරාගෙන, ශරීර කපාගෙන,
සමිඳාණන් වහන්සේගේ මාලිගාවට පුද කරන
පිණිස ආහාර පූජා ද ගන්ධරස ද රැගෙන ආහ.
6 නෙතනියාගේ පුත් ඉශ්මායෙල් මිශ්පා සිට පිටත් වී
අඬ අඬා ඔවුන් පෙරමඟට ගියේ ය. ඔවුන්
මුණගැසුණු විට, "අහිකාම්ගේ පුත් ගෙදලියා ළඟට
පැමිණෙන්නැ"යි ඔහු ඔවුන්ට කීවේ ය. 7 ඔවුන්
නගරය මැදට පැමිණි විට, නෙතනියාගේ පුත්
ඉශ්මායෙල් සහ ඔහු සමඟ සිටි මිනිස්සු ඔවුන් මරා
වළකට හෙළූ හ.
8 එහෙත්, ඔවුන් අතරෙහි සිටි මිනිසුන් දසදෙනෙක්
ඉශ්මායෙල්ට කතා කොට, "අප නොමරන්න. මන්ද,
කෙතෙහි සඟවා තිබෙන තිරිඟු ද යව ද මී පැණි ද
තෙල් ද අප ළඟ තිබේ ය"යි කී හ. එවිට ඔහු ඔවුන්
ද ඔවුන්ගේ සහකාරයන් ද නොමරා ඉතුරු කෙළේ
ය. 9 ඉශ්මායෙල් තමා විසින් මරන ලද මිනිසුන්
හෙළාදැමූ වළ විශාල එකකි. එය ආසා රජු විසින්
ඉශ්රායෙල්වරුන්ගේ රජු වූ බයෂාගෙන් ආරක්ෂා
වන පිණිස සාදන ලද වළ ය. නෙතනියාගේ පුත්
ඉශ්මායෙල් තමා මැරූ අයගේ මළකඳන්වලින් ඒ වළ
පිරෙව්වේ ය. 10 තවද ඉශ්මායෙල්, සෙනඟගෙන්
ඉතිරි වී මිශ්පාහි සිටි සියල්ලන් එනම්, රැකවලුන්ගේ
අධිපතියා වූ නෙබුසරදාන් විසින් අහිකාම්ගේ පුත්
ගෙදලියාට භාර දෙන ලද රාජ කුමරිකාවන් ද
මිශ්පාහි ඉතිරි ව සිටි මුළු සෙනඟ ද සිරබාරයට
ගත්තේ ය. නෙතනියාගේ පුත් ඉශ්මායෙල් ඔවුන්
ගෙන අම්මොන්වරුන්ගේ දේශයට යන්නට පිටත්
විය.
11 එහෙත්, කාරේයාගේ පුත් ජොහානාන් සහ ඔහු
සමඟ සිටි සේනාවල සියලු අධිපතීහු ද
නෙතනියාගේ පුත් ඉශ්මායෙල් කළ සියලු අපරාධ
ගැන අසා, 12 සියලු මිනිසුන් රැස් කරගෙන
නෙතනියාගේ පුත් ඉශ්මායෙල්ට විරුද්ධ ව යුද්ධ
කරන්න පිටත් වූ හ. ඔහු ගිබියොන්හි තිබෙන මහා
ජලාශය ළඟ දී ඔවුන්ට මුණගැසුණේ ය. 13 එවිට
ඉශ්මායෙල් සමඟ සිටි මුළු සෙනඟ කාරේයාගේ පුත්
ජොහානාන් සහ ඔහු සමඟ සිටි සේනාවල සියලු
අධිපතීන් ද දුටු විට සන්තෝෂ වූ හ. 14 මිශ්පාහි
සිට ඉශ්මායෙල් අල්ලාගෙන ගිය මුළු සෙනඟ නැවත
හැරී කාරේයාගේ පුත් ජොහානාන්ට එකතු වූ හ.
15 එහෙත්, නෙතනියාගේ පුත් ඉශ්මායෙල් මිනිසුන්
අටදෙනෙකු සමඟ ජොහානාන්ගෙන් ගැළවී
අම්මොන්වරුන්ගේ දේශයට පලා ගියේ ය.
16 කාරේයාගේ පුත් ජොහානාන් ද ඔහු සමඟ සිටි
සේනාවල සියලු අධිපතියෝ ද නෙතනියාගේ පුත්
ඉශ්මායෙල් විසින් අහිකාම්ගේ පුත් ගෙදලියා මරනු
ලැබූ පසු, මිශ්පාහි ඉතිරි ව සිටි, ඔහු කෙරෙන් ආපසු
ගෙන යන ලද ඉතිරි ව සිටි මුළු සෙනඟ වන යුද්ධ
භටයන් ද ස්ත්‍රීන් ද දරුවන් ද නපුංසකයන් ද
ගිබියොන් නගරයෙන් කැඳවාගෙන ගොස්,
17 බබිලෝනිවරුන්ගෙන් ඈත් වී මීසරයට ඇතුළු
වන්නට යන පිණිස බෙත්ලෙහෙම අසල තිබෙන
ගෙරුත් කිම්හාම්ගේ නවාතැනෙහි නවාතැන් ගත්හ.
18 එසේ කෙළේ, නෙතනියාගේ පුත් ඉශ්මායෙල්
බබිලෝනියේ රජු විසින් දේශයේ ආණ්ඩුකාරකමට
පත් කරන ලද අහිකාම්ගේ පුත් ගෙදලියාව මැරූ
බැවින් ඔවුන්ට බිය වූ නිසා ය.

## සෙනඟ ජෙරමියාට කන්නලව් කිරීම

42 එවිට සේනාවල සියලු අධිපතියෝ ද
කාරේයාගේ පුත් ජොහානාන් ද
හෝෂායාගේ පුත් ජෙසනියා ද ලොකු කුඩා
සියල්ලෝ ද 2 දිවැසිවර ජෙරමියා වෙත පැමිණ,
"අනේ! අපේ කන්නලව්ව ඇසුව මැනව. අප උදෙසා
ඔබේ දෙවි ස්වාමීන් වහන්සේට යාච්ඤා කරන්න.
ඉතිරි ව සිටින අප සියල්ලන් උදෙසා යාච්ඤා
කරන්න. වරක් අපි බොහෝ දෙනෙක් සිටියෙමු;
එහෙත්, ඔබට පෙනෙන පරිදි ඉතිරි ව සිටින්නේ අපි
ස්වල්ප දෙනෙක් පමණි. 3 අප යා යුතු මාර්ගයත්,
කළ යුතු දේත් පෙන්වන ලෙස ඔබේ ස්වාමීන් වන
දෙවියන් වහන්සේට යාච්ඤා කරන්නැ"යි කී හ.
4 එවිට දිවැසිවර ජෙරමියා, "ඔබ හැම කී දේ
ඇසීම්; ඔබේ ඉල්ලීම අනුව ඔබේ දෙවි ස්වාමීන්
වහන්සේට යාච්ඤා කොට, සමිඳාණන් වහන්සේ
ඔබට දෙන පිළිතුර කිසිවක් නොසඟවා ඔබට
දන්වන්නෙමි"යි ඔවුන්ට කීවේ ය.
5 එවිට ඔව්හු ජෙරමියා අමතා, "ඔබේ දෙවි
ස්වාමීන් වහන්සේ ඔබ මඟින් අපට අණ කරන
සියල්ල අප නොපිළිපැද්දොත් සමිඳාණන් වහන්සේ
අපට විරුද්ධ ව සැබෑ විශ්වාසී සාක්ෂිකාරයෙක් වන
සේක් වා! 6 අපේ දෙවි ස්වාමීන් වහන්සේගේ
හඬට කීකරු වීමෙන් අපට යහපත සිද්ධ වන පිණිස
උන් වහන්සේ වෙත අපි ඔබ යවම්හ. හොඳක්
වුවත්, නොහොඳක් වුවත් අපේ දෙවි ස්වාමීන්
වහන්සේගේ හඬට අපි කීකරු වන්නෙමු"යි
ජෙරමියාට කී හ.

## සමිඳුන්ගේ පිළිතුර

7 දස දිනකට පසු සමිඳාණන් වහන්සේ ජෙරමියාට
කතා කළ සේක. 8 එවිට ඔහු කාරේයාගේ පුත්
ජොහානාන් ද ඔහු සමඟ සිටි සේනාවල සියලු
අධිපතීන් ද ලොකු කුඩා සියලු දෙනා ද කැඳවා
ඔවුන්ට කතා කොට මෙසේ කී ය:
9 "ඉශ්රායෙල්වරුන්ගේ දෙවි ස්වාමීන් වහන්සේට
ඔබේ කන්නලව්ව ඔප්පු කරන පිණිස ඔබ මා
යැවූවහු ය. උන් වහන්සේ මෙසේ වදාරන සේක:
10 'නුඹලා මේ දේශයේ ම සිටින්නට කැමැත්තහු
නම්, මම නුඹලා නොවනසා පිහිටුවන්නෙමි. නුඹලා
උදුරා නොදමා හිටවන්නෙමි. මන්ද, මා නුඹලාට
පැමිණෙවූ විපත්ති ගැන කණගාටු වෙමි. 11 නුඹලා
බියෙන් සිටින බබිලෝනියේ රජුට බිය නොවන්න.
නුඹලා ගළවා, ඔහුගේ අතින් මුදන්නට මා නුඹලා

සමඟ සිටින බැවින් ඔහුට බිය නොවෙන්න. 12 ඔහු
නුඹලාට අනුකම්පා කොට නුඹලාගේ දේශයෙහි
වාසය කිරීමට ඉඩ දෙනු පිණිස නුඹලා කෙරෙහි
දයාව පෑමට මම සලස්වන්නෙමි.
13 “එහෙත් නුඹලා, අපි මේ දේශයේ
නොසිටින්නෙමු යි කියමින් නුඹලාගේ දෙවි ස්වාමීන්
වහන්සේගේ හඬට කීකරු නොවී, කතා කොට,
14 ‘නැත, අපි මිසර දේශයට යන්නෙමු; එහි දී
යුද්ධයක් දකින්නට වත්, හොරණෑ ශබ්දය අසන්නට
වත්, කෑම නැති ව බඩගින්නේ ඉන්නට වත් සිදු
වන්නේ නැත; අපි එහි සිටින්නෙමු’යි කියන්නහු නම්,
15 එම්බා, ජුදාහි ඉතිරි ව සිටින කුඩා පිරිස,
සමිඳාණන් වහන්සේගේ වචනය අහන්න. මෙසේ
වදාරන්නේ ඉශ්රායලේවරුන්ගේ සියලු බලැති දෙවි
ස්වාමීන් වහන්සේ ය. නුඹලා මිසර දේශයට පා
තබා එහි ගොස් ජීවත් වන්නට ඉටාගන්නහු නම්,
16 නුඹලා බියගන්වන කඩුව මිසර දේශයේ දී
නුඹලා පිට පැමිණෙන්නේ ය. නුඹලා බියපත් කරවන
සාගතය මිසර දේශයට ම නුඹලා ලුහුබැඳ යන්නේ
ය. එහි දී නුඹලා මැරෙන්නෙහු ය. 17 මිසරයෙහි ජීවත්
ව සිටින පිණිස එහි යන්නට අදිටන් කරගන්න සියලු
ම මිනිස්සු කඩුවෙනුත්, සාගතයෙනුත්,
වසංගතයෙනුත් නසින්නෝ ය. මා ඔවුන් පිට
පමුණුවන විපත්තියෙන් ඔවුන්ගෙන් කිසිවෙක් ගැළවී
ඉතිරි නොවෙන්නෝ ය.
18 “ ‘ඉශ්රායලේවරුන්ගේ දෙවි වන සියලු බලැති
සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක: මාගේ
උදහසත්, කෝපයත් ජෙරුසලමේ වැසියන් පිට
වැගුරුණු ලෙස, නුඹලා මිසරයට පැමිණි විට නුඹලා
පිට ද මාගේ කෝපය වැගිරෙනු ඇත. අනුන්ගේ
පිළිකුලට හා සමච්චලයට ද භීතියට හා සාපයට ද
භාජන වන්නහු ය. කිසි කලක මේ ස්ථානය නුඹලා
නොදකින්නහු ය.’ ”
19 ජරෙමියා තවදුරටත් කතා කරමින් මෙසේ කී ය:
“ජුදාහි ඉතිරි ව සිටින ජනයෙනි මිසරයට නොයෙන්නැ
යි සමිඳාණන් වහන්සේ ඔබ හැමට කියා ඇත. මා
අද ඔබට අවවාද කළ බව හොඳට සිතට ගන්න.
20 ඔබේ ප්රාණවලට හානිවන විධියට ඔබ නොමඟ
ගොස් ඇත. ‘අපේ දෙවි ස්වාමීන් වහන්සේ වදාරන
සියල්ල ඒ හැටියට අපට දන්වන්න. අපි එය
කරන්නෙමු’යි ඔබේ දෙවි ස්වාමීන් වහන්සේට
කන්නලව් කිරීමට ඔබ මා යැවුවහු ය. 21 එය මම
අද ඔබට දැන්වූයෙමි. එහෙත්, ඔබේ දෙවි ස්වාමීන්
වහන්සේගේ හඬට වත්, උන් වහන්සේ මා ලවා
ඔබට කියා එවූ කිසිවකට වත් ඔබ කීකරු වුණේ
නැත. 22 ඉතින් ඔබ කලක් නවතින්නට යන්න ආශා
වන ස්ථානයේ දී ඔබ සැම කඩුවෙනුත්,
සාගතයෙනුත්, වසංගතයෙනුත් නසින බව සැබැවින්
ම දැන ගන්නැ”යි කීවේ ය.

## ජරෙමියා මිසරයට ගෙනයනු ලැබීම

43 සෙනඟගේ දෙවි ස්වාමීන් වහන්සේ වදාළ
සියලු වචන උන් වහන්සේගේ සෙනඟට
කියන පිණිස යවනු ලැබූ ජරෙමියා, ඒ සියලු වචන
මුළු සෙනඟට ප්රකාශ කර නිම කළේ ය. 2 එකල
හෝෂායාගේ පුත් අසරියා ද කාරේයාගේ පුත්
ජොහානාන් ද උඩඟු වූ අනෙක් සියලු මනුෂ්යයෝ ද
ජරෙමියාට කතා කොට, “ඔබ බොරු කියන්නෙහි ය.
මිසරයෙහි ජීවත් වන්නට එහි නොයෙන්නැ යි කියන
පිණිස අපේ දෙවි ස්වාමීන් වහන්සේ අප වෙත ඔබ
එව්වේ නැත. 3 බබිලෝනිවරුන් අප මරන්නට හෝ
බබිලෝනියට අප අල්ලාගෙන යන්නට හෝ
ඔවුන්ගේ අතට අප පාවා දෙන පිණිස නේරියාගේ
පුත් බාරුක් අපට විරුද්ධ ව ඔබ පොළඹා වන්නේ
ය”යි කී හ. 4 මෙසේ කාරේයාගේ පුත් ජොහානාන්
ද සේනාවල සියලු අධිපතීහු ද මුළු සෙනඟ ද ජුදා
දේශයෙහි නැවතී සිටින පිණිස සමිඳාණන්
වහන්සේගේ හඬට කීකරු නො වූ හ. 5 2 රාජා
25:26එහෙත්, කාරේයාගේ පුත් ජොහානාන් සහ
සේනාවල අධිපතීහු ද විජාතීන් අතරට පන්නනු ලැබූ
නමුත්, ජුදා දේශයෙහි සිටීමට ඒ සියලු ජාතීන්
අතරෙන් හැරී ආ ඉතිරි ව සිටි සියලු ජුදවේවරුන්
වන, 6 පුරුෂයෝ ද ස්ත්රීහු ද දරුවෝ ද රාජ
කුමාරිකාවෝ ද රැකවලුන්ගේ අධිපතියා වූ
නබුසරදාන් විසින් ෂාපාන්ගේ පුත් වූ අහිකාම්ගේ
පුත් ගෙදලියා වෙත නවත්වනු ලැබූ සියලු දෙනා ද
යන මොවුහු දිවැසිවර ජරෙමියා ද නේරියාගේ පුත්
බාරුක් ද රැගෙන, 7 සමිඳාණන් වහන්සේගේ හඬට
කීකරු නොවී මිසර දේශයට පැමිණියහ. තවද,
ඔව්හු තාපන්හේස් දක්වා ගියහ.
8 එකල තාපන්හේස්හි දී සමිඳාණන් වහන්සේ
ජරෙමියාට කතා කොට මෙසේ වදාළ සේක:
9 “නුඹේ අතින් ලොකු ගල් රැගෙන ජුදවේවරුන්
බලා සිටිය දී තාපන්හේස්හි පාරාවෝගේ මාලිගාවේ
දොරටුවෙහි තිබෙන ගඩොල් වේදිකාවේ බදාම තුළ
සඟවා තබන්න. 10 ඉන්පසු ඔවුන්ට කතා කොට
ඉශ්රායලේවරුන්ගේ සියලු බලැති දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේකැ යි ඔවුන්ට
කියන්න. ‘බලන්න, මම මිනිසුන් යවා මාගේ සේවක,
බබිලෝනියේ රජු වන, නබුකද්නෙශර් ගෙන්වා, මා
සඟවා තැබූ මේ ගල් මත ඔහුගේ සිංහාසනය
පිහිටුවන්නෙමි. ඔහු ද තමාගේ රාජකීය සේසත
එයට ඉහළින් තබනු ඇත. 11 ඔහු අවුත් මිසර
දේශයට පහර දෙනු ඇත. වසංගතයට නියම වූ අය
වසංගතයටත්, වහල්කමට නියම වූ අය
වහල්කමටත්, කඩුවට නියම වූ අය කඩුවටත්
ගොදුරු වනු ඇත. 12 මම ද මිසරයේ දේවාල
ගිනිබත් කරන්නෙමි. බබිලෝනියේ රජු ලවා ඒ
දෙවිවරුන් පුළුස්සාදැමීමට හෝ ඔවුන් පැහැරගෙන
යාමට හෝ සලස්වන්නෙමි. එඬේරෙකු තමාගේ
ඇඳුමේ ඇති කිනිතුල්ලන් පිස දමා පවිත්ර
කරන්නාක් මෙන් බබිලෝනියේ රජ මිසර දේශය

පවිත්‍ර කර ජයාන්විත ව එතැනින් පිටත් ව යන්නේ
ය. 13 ඔහු මිසර දේශයේ තිබෙන බෙත්-ෂෙමෙෂ්හි
කුළුණු බිඳදමා, මිසරයේ දේවාල ගින්නෙන්
දවාලන්නේ ය.' "

### මිසරයේ ජුදෙව්වරුන්ට පණිවුඩය

44 මිසර දේශයේ මිග්දොල්හි ද තාපන්හේස්හි
ද නොප්හි ද පත්‍රෝස්හි ද වාසය කළ සියලු
ජුදෙව්වරුන් සම්බන්ධයෙන් සමිඳාණන් වහන්සේ
ජෙරමියාට කතා කළ සේක. 2 "ඉශ්‍රායෙල්වරුන්ගේ
සියලු බලැති දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක: මා ජෙරුසලමටත්, ජුදාහි සියලු
නගරවලටත් පැමිණවූ සියලු විපත්ති නුඹලා දුටුවහු
ය. බලන්න, අද ඒවා නටබුන් වී තිබේ. කිසිවෙක්
එහි නොවසති. 3 එසේ වූයේ, ඔවුන් වත්, නුඹලා
වත්, නුඹලාගේ පියවරුන් වත් නොඇඳිනූ අන්
දෙවිවරුන්ට සේවය කිරීමෙන් හා සුවඳ දුම් පිදීමට
යාමෙන්, මා කෝප කරවන ලෙස නුඹලා කළ
නුඹලාගේ අධර්මිෂ්ඨකම් නිසා ය. 4 මම ද, අහෝ,
මා ද්වේෂ කරන ඔය පිළිකුල් දෙය නොකරන්නැ යි
කියන්නට දිවැසිවරුන් වන මාගේ සියලු සේවකයන්
වැළ නොකැඩී නුඹලා වෙත එවූවෙමි. 5 එහෙත්,
නුඹලා සවන් දුන්නේ වත්, සිතට ගත්තේ වත් නැත.
අන් දෙවිවරුන්ට පූජා කිරීමේ දුෂ්ට පිළිවෙත නුඹලා
අත්හැරියේ නැත. 6 ඒ නිසා මාගේ උදහස ද
කෝපය ද ජුදාහි නගර පිටත්, ජෙරුසලමේ වීදිවලත්
වගුරුවා මම ඒවා ගිනි ලෑවෙමි. ඒවා නැතිනාස්ති වී
තිබෙන අයුරු අද වුව ද දක්නට ලැබේ.
7 "එබැවින් ඉශ්‍රායෙල්වරුන්ගේ සියලු බලැති
දෙවියන් වහන්සේ වන මම නුඹලාගෙන් මෙසේ
ප්‍රශ්න කරමි: නුඹලාගෙන් කිසිවෙකු ඉතුරු නොවන
ලෙස, නුඹලාගේ පුරුෂයන් ද ස්ත්‍රීන් ද ළදරුවන් ද
කිරි දරුවන් ද ජුදෙව්වරුන් අතරෙන් සිඳදැමීමට
කාරණය වන මේ මහත් නපුර කළේ මන් ද?
8 නුඹලා පදිංචි වන පිණිස පැමිණි මිසර දේශයේ දී,
නුඹලාගේ පිළිමවලට හා අන් දෙවිවරුන්ට කරන
පූජා කරණකොටගෙන මා කෝප කරවන්නේ මන්
ද? මේ හේතුවෙන් සියල්ලන් විසින් නුඹලා අත්හරිනු
ලැබ, මිහි පිට හැම ජාතීන් ඉදිරියෙහි නුඹලා
නින්දාවටත්, සාපයටත් ගොදුරු වන්නහු ය. 9 ජුදා
දේශයෙහිත්, ජෙරුසලමේ වීදිවලත් කරන ලද
නුඹලාගේ පියවරුන්ගේ දුෂ්ටකම් ද ජුදාහි
රජවරුන්ගේ දුෂ්ටකම් ද ඔවුන්ගේ භාර්යාවන්ගේ
දුෂ්ටකම් ද නුඹලාගේ ම දුෂ්ටකම් ද නුඹලාගේ
භාර්යාවන්ගේ දුෂ්ටකම් ද නුඹලාට අමතක වී තිබේ
ද? 10 නුඹලා අද දවස දක්වා ම යටත් වුණේ වත්,
ගරුබිය පෑවේ වත්, මා නුඹලා සහ නුඹලාගේ
පියවරුන් ඉදිරියෙහි තබන ලද මාගේ අණපණත් ද
නියෝග ද ප්‍රකාරයට හැසුරුණේ වත් නැත.
11 "එබැවින් ඉශ්‍රායෙල්වරුන්ගේ සියලු බලැති දෙවි
ස්වාමීන් වහන්සේ වන මම මෙසේ කියමි. ජුදා
දේශය විනාශ වන ලෙස විපත් පැමිණවීමට මම
තීරණය කරගතිමි. 12 මිසර දේශයෙහි පදිංචි වන
පිණිස එහි පැමිණි ජුදාහි ඉතිරි ව සිටින සෙනඟ
සියල්ලන් ම රැගෙන මම විනාශ කරන්නෙමි. ඔව්හු
සියල්ලෝ ම මිසර දේශයේ දී කඩුවෙන් ද
සාගතයෙන් ද විනාශ වී යන්නෝ ය; ලොකු කුඩා
සියල්ලෝ ම කඩුවෙන් ද සාගතයෙන් ද මැරෙන්නෝ
ය. ඔව්හු සියල්ලන් ඉදිරියෙහි පිළිකුලක් ද සාපයක් ද
භීතියක් ද සමච්චලයක් ද වන්නෝ ය. 13 මම
ජෙරුසලමට දඬුවම් කළ පරිදි මිසර දේශයෙහි
වාසය කරන්නන්ටත් කඩුවෙන් ද සාගතයෙන් ද
වසංගතයෙන් ද දඬුවම් කරන්නෙමි. 14 මිසර
දේශයෙහි පදිංචි වන පිණිස පැමිණි ජුදාහි ඉතිරි වූ
සෙනඟගෙන් කිසිවෙක් ගැළවෙන්නේ වත්,
ඉතිරිවන්නේ වත් නැත. කෙතරම් ආශා වෙතත්,
කිසිවෙකුට ආපසු ජුදා දේශයට පැමිණෙන්නට හැකි
වන්නේ නැත. පලා යන සමහරුන් හැර අන්
කිසිවෙක් හැරී නොඑන්නෝ ය."
15 එවිට තමන්ගේ භාර්යාවන් අන් දෙවිවරුන්ට
සුවඳ දුම් ඔප්පු කරන බව දත් සියලු පුරුෂයෝ ද
මහා ජනකායක් ව ළඟ සිටි සියලු ස්ත්‍රීහු ද මිසර
දේශයේ පත්‍රෝස්හි විසූ මුළු සෙනඟ ද ජෙරමියාට
මෙසේ කී හ: 16 "ඔබ සමිඳාණන් වහන්සේගේ
නාමයෙන් අපට කී වචනය ගැන අපි ඔබට කන්
නොදෙන්නෙමු. 17 අප ගත් තීරණය ලෙස ම, අප ද
අපේ පියවරුන් ද අපේ රජවරුන් ද අපේ අධිපතීන් ද
ජුදා නගරවලත්, ජෙරුසලමේ වීදිවලත් කළාක් මෙන්,
අපි 'අහස් රැජින' නම් දේවතාවියට සුවඳ දුම් ඔප්පු
කොට, ඈට පානීය පූජාවන් පුද කරන්නෙමු. මන්ද, ඒ
කාලයේ අපි ආහාර බහුල ව ලබාගත්තෙමු. කිසි
විපතක් නැති ව සැපසේ සිටියෙමු. 18 එහෙත්, අප
අහස් රැජින නම් දේවතාවියට සුවඳ දුම් ඔප්පු
කිරීමත්, ඈට පානීය පූජා වැගිරවීමත් අත්හැරිය දින
සිට සෑම දේ ම අපට හිඟ වී, අපි කඩුවෙන් ද
සාගතයෙන් ද නැති වුණෙමු."
19 ස්ත්‍රීවරු තවදුරටත් කතා කරමින්, "අප අහස්
රැජින නම් දේවතාවියගේ ස්වරූපය අනුව රසකැවිලි
සාදා ඈට පූජා කර, සුවඳ දුම් ඔප්පු කර, පානීය පූජා
වැගිරවූ විට, එසේ කිරීමට අපේ පුරුෂයන්ගේ
අනුමතය අපට නොලැබිණි දැ"යි ප්‍රශ්න කළහ.
20 එවිට ජෙරමියා මුළු සෙනඟ වන පුරුෂයන්ටත්,
ස්ත්‍රීන්ටත් එනම්, ඔහුට ඒ උත්තර දුන් මුළු
ජනතාවට කතා කොට, 21 "ඔබ ද ඔබේ පියවරුන් ද
ඔබේ රජවරුන් ද ඔබේ අධිපතීන් ද දේශයෙහි
සෙනඟ ද ජුදාහි නගරවලත්, ජෙරුසලමේ වීදිවලත්
කළ සුවඳ දුම් පූජා සමිඳාණන් වහන්සේ අමතක
කළ සේක් ද? 22 එසේ ඔබේ දුෂ්ටකම් ද ඔබ කළ
පිළිකුල් ක්‍රියා ද සමිඳාණන් වහන්සේට තවත්
ඉවසන්නට නොහැකි විය. එබැවින් ඔබේ දේශය අද
තිබෙන හැටියට වැසියකු නැති ව, පාළු වී, සාප
ලද්දක් ව තිබේ; 23 ඔබ සමිඳාණන් වහන්සේගේ
හඬට කීකරු නොවී, උන් වහන්සේගේ අණපණත් ද
නියෝග ද ශික්ෂා පද ද අනුව නොහැසිර, සුවඳ දුම්
පුද කළ නිසාත්, සමිඳාණන් වහන්සේට විරුද්ධ ව
පව් කළ නිසාත් අද දකින්නට ලැබෙන මේ මුළු
විපත්තිය ඔබට පැමිණ තිබේ යැ"යි කීවේ ය.

24 තවද, ජරෙමියා මුළු සෙනඟටත්, සියලු
ස්ත්‍රීන්ටත් කතා කොට, “මිසර දේශයේ සිටින
ජුදාවරුනි, සමිඳාණන් වහන්සේගේ වචන අසන්න.
25 ඉශ්‍රායලේවරුන්ගේ සියලු බලැති දෙවි ස්වාමින්
වහන්සේ මෙසේ වදාරන සේකැ”යි කී ය. “ ‘අහස්
රැජින නම් දේවතාවියට අප බාර හාර වූ ප්‍රකාර
සුවඳ දුම් ඔප්පු කොට ඈට පානීය පූජා අපි පුද
කරමු’යි කියමින් නුඹලා ද නුඹලාගේ භාර්යාවෝ ද
පොරොන්දු වූ ලෙස ඒවා ඉෂ්ට කළහ. හොඳයි, ඒවා
ස්ථිර කර ඉෂ්ට කරන්න. 26 එබැවින් මිසර
දේශයෙහි වසන සියලු ජුදාවරුනි, ස්වාමින් වන මා
මාගේ පරාක්‍රමවත් නාමයෙන් මිසර දේශයේ වසන
සියලු ජුදෙව්වරුන්ට කියන දේට සවන් දෙන්න.
මින්පසු, කිසි කලෙක නුඹලාගෙන් කිසිවෙකුට ‘මම
ජීවමාන මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේගේ
නාමයෙන් දිවුරමි’ යන දිවුරුම් පාඨය කියා දිවිරීමට
මම ඉඩ නොදෙන්නෙමි. 27 නුඹලාට සැපත නොව,
විපත පැමිණෙන ලෙස මම වගබලාගන්නෙමි. මිසර
දේශයෙහි සිටින සියලු ම ජුදෙව්වරු නැත්තට ම
නැති වන තුරු කඩුවෙන් ද සාගතයෙන් ද විනාශ වී
යන්නෝ ය. 28 එහෙත්, නුඹලාගෙන් ස්වල්ප දෙනෙකේ
මරණයෙන් ගැළවී, මිසරයෙන් හැරී ආපසු ජුදාවට
පැමිණෙති. එවිට ජුදාවෙන් මිසර දේශයට පැමිණි
සෙනඟගෙන් ඉතිරි ව සිටින අය, ස්ථිර වූයේ ඔවුන්
කී දේ ද මා කී දේ ද කියා දැනගනු ඇත.
29 නුඹලාගේ විපත ප්‍රකාශ කළ මාගේ වචනය
සැබැවින් ම ස්ථිර වන බව නුඹලා දැනගන්න පිණිස
මේ ස්ථානයේ දී මා නුඹලාට දඬුවම් කරන බවට
ලකුණ මෙය වේ. ස්වාමින් වන මම නුඹලාට කියමි.
30 මා විසින් ජුදාහි රජු වූ ශෙදෙකියා ඔහුගේ
ප්‍රාණය හානි කරන්නට සෙවූ ඔහුගේ සතුරා වූ
බබිලෝනියේ රජ වූ නබෙකද්නෙශර් අතට පාවා දුන්
ලෙස,2 රාජා 25:1-7මිසරයේ රජ වූ පාරාවෝ-
හොප්රාත් ඔහුගේ සතුරන් අතට ද ඔහුගේ
ප්‍රාණය හානි කරන්නට සොයන්නන් අතට ද පාවා
දෙන්නෙමි. මෙසේ පවසන්නේ ස්වාමින් වන මම ය.”

### බාරුක්ට දෙවියන් වහන්සේගේ පොරොන්දුව

45 2 රාජා 24:1; 2 වංශා 36:5-7; දානි 1:1-2
ජොෂියාගේ පුත් ජුදාහි රජ වූ
ජෙහෝයාකිම්ගේ සතර වන අවුරුද්දේ දී
නේරියාගේ පුත් බාරුක් දිවැසිවර ජරෙමියාගේ
මුඛයෙන් අසා මේ වචන පොතක ලියුවේ ය.
2 ජරෙමියා බාරුක් අමතා, “ඉශ්‍රායලේවරුන්ගේ, දෙවි
ස්වාමින් වහන්සේ මෙසේ වදාළ සේකැ”යි කී ය. 3 “
‘අහෝ මට වන විපතක මහත! සමිඳාණන්
වහන්සේ මාගේ වේදනාවට ශෝකය එකතු කළ
සේක. මම මාගේ සුසුම්ලෑමෙන් වෙහෙසෙ ව සිටිමි.
සහනයක් මට ලැබී නැතැ’යි නුඹ කීයෙහි ය.”
4 සමිඳාණන් වහන්සේ ජරෙමියාට කතා කොට,
“බාරුක්ට මෙසේ කියන්නැ”යි වදාළ සේක. “බලන්න,
මම ගොඩනැඟුවා වූ දෙය කඩාදමමි. මම සිටවූ
දෙය උදුරාදමමි. මුළු දේශයට ම මෙසේ වන්නේ ය.
5 නුඹ නුඹේ ම වාසිය තකා ලොකු දේවල්
සොයන්නෙහි ද? එසේ නොසොයන්න. මන්ද, සකල
මනුෂ්‍ය වර්ගයා පිට මම විපත්තිය පමුණුවන්නෙමි.
එහෙත්, නුඹ පමණක් යන යන තැන පණ
රැකගන්නෙහි ය. මෙසේ පවසන්නේ ස්වාමින් වන
මම ය.”

### මිසරයේ පරාජය

46 ජාතීන් සම්බන්ධයෙන් සමිඳාණන් වහන්සේ
ජරෙමියාට කතා කළ සේක. 2 යෙසා 19:1-25;
එසකි 29:1—32:32මිසර දේශය ගැන උන් වහන්සේ
වදාළ දේ මෙය යි. ජොෂියාගේ පුත් ජුදාහි රජු වූ
ජෙහෝයාකිම්ගේ සතර වන අවුරුද්දේ දී යුප්‍රටීස්
ගංගාව ළඟ කර්කමේෂ්හි සිටියා වූ බබිලෝනියේ
රජු වූ නබෙකද්නෙශර් විසින් පහර දෙන ලද
මිසරයේ රජ වූ පාරාවෝ-නකෝගේ සේනාව ගැන
මෙසේ වදාළ සේක:
3 “කුඩා පලිහ සහ මහා පලිහ සූදානම් කරගෙන
සටනට යන්න;
4 රථවල අසුන් බැඳගන්න;
q24 අසරුවෙනි, යුද හිස් වැසුම් දමාගෙන පෙළ ගැසී
සිටින්න;
q24 හෙල්ල තියුණු කරගන්න;
q24 යුද සැට්ට හැඳගන්න.
5 ඔවුන් කැළඹී ආපසු හැරෙනු ඇත.
q25 එබන්දක් මට දකින්නට ලැබුණේ මන් ද?
q25 ඔවුන්ගේ බලවන්තයෝ පැරදී ආපසු නොබලා,
හදිසියේ පලා ගියෝ ය.
q25 සතර දිගින් ම භීතිය ඇත.
q25 සමිඳාණෝ මෙසේ වදාරන සේක.
6 ශීඝ්‍ර ලෙස දුවන්නන්ට බේරී යන්න බැරි ය;
q26 භේවායන්ට ගැළවී යන්න බැරි ය;
q26 ඔව්හු උතුරු දිශාවේ යුප්‍රටීස් ගංගාව ළඟ දී
පැකිළී වැටුණෝ ය.
7 නයිල් ගංගාව මෙන් ද රැළ ගසන ගංගාවල් මෙන්
ද නැඟී එන මොහු කවු ද?
8 මොහු වනාහි නයිල් ගඟ මෙන් ගලන, එහි
ජලධාරාවන් මෙන් රැළ ගසන මිසරය ය.
q28 ‘මම නැඟිට ගොස් දේශය යට කර එහි
නගරවලට ද වැසියන්ට ද පහර දෙමි’යි මිසරය
කියන්නේ ය.
9 අශ්වයෙනි, නැඟිටින්න;
q29 රථයෙනි, වේගයෙන් දුවන්න;
q29 භේවායෙනි, ඉදිරියට යන්න.
q29 පලිහ හුරු පුරුදු එතියෝපියවරුනි, පූට්වරුනි, දුනු
තැත් කවන ලුද්වරුනි, ඉදිරියට එන්න.”
10 ඒ දවස වනාහි ස්වාමින් වන සව් බලැති
දෙවිඳුන්ගේ දවස ය.
q210 එතුමන්ගේ සතුරන්ට දඬුවම් දීමේ දවස ය.
q210 එතුමන්ගේ කඩුව ඔවුන් නසා වනසා සෑහීමට
පැමිණෙන්නේ ය;
q210 ඔවුන්ගේ ලේවලින් මත් වන්නේ ය.

q210 මන්ද, එය වනාහි උතුරු දේශයේ යුප්‍රටීස්
ගංගාව ළඟ ස්වාමීන් වන සව් බලැති දෙවිඳුන් වෙත
කළ යාගයකි.
11 එම්බා, මිසර වැසියෙනි, ගිලියද්ට ගොස්, ගුගුල්
නම් ඖෂධය ලබාගන්න.
q211 නුඹ බොහෝ බෙහෙත් පාවිච්චි කිරීම නිෂ්ඵල
ය.
q211 නුඹට සුවයක් නැත.
12 විජාතීන් නුඹට පත් නින්දාව ගැන අසා තිබේ.
q212 ඔබේ කෑගැසීමනේ පොළොව පිරී තිබේ.
q212 මන්ද, සබෙළු එකිනකො සමඟ ගැටී දදෙනෙ ම
එකට ඇද වැටනේනෝ ය.

### නබෙුකද්නශෙර්ගේ පැමිණීම

13 ජරෙ 43:10-13 මිසර දේශයට පහර දීමට
බබිලෝනියේ රජු වූ නබුකද්නශෙර්ගේ පැමිණීම
ගැන සමිඳාණන් වහන්සේ දිවැසිවරයාට මෙසේ
වදාළ සේක:
14 "මිසරයෙහි ආරංචි කරමින් ද මිග්දොල්හි
ප්‍රකාශ කරමින් ද නොප්හි හා තාපන්හේස්හි
ප්‍රසිද්ධ කරමින් ද මෙසේ කියන්න, 'නුඹලා ආරක්ෂා
වන පිණිස සූදානම් වන්න;
q214 මන්ද, නුඹලාට ඇති සියලු දේ යුද්ධයනේ
විනාශ වී යන්නේ ය.'
15 නුඹලාගේ බලසම්පන්න ගව දෙවියා පලා ගියේ
ය.
q215 ඔහුට ස්ථිර ව සිටීමට නොහැකි වී ද?
q215 සමිඳාණෝ ඔහුට පහර දුන් සේක.
16 නුඹලාගේ හේවායෝ පැකිළී වැටනේනෝ ය.
q216 ඔව්හු එකිනකො අමතා 'නැඟිටින්න, අපේ
සතුරන්ගේ කඩුවනේ මිදී, අපේ දේශයේ අපේ
සනෙඟ වෙත යමු'යි කියන්නෝ ය.
17 මිසරයේ රජු වන පාරාවෝ ද, 'අවස්ථාව පැහැර
හැරිය ඝෝෂකයා ය'යි නම් කරන්න.
18 සව් බලැති සමිඳාණෝ යැයි නම් දරන
රජතුමාණෝ දිවුරා මෙසේ පවසන්නාහ:
q218 ජීවමාන දෙවිඳා මම වෙමි;
q218 නුඹලාට පහර දනෙ තැනැත්තාගේ ශක්තිය
කඳු අතරේ තාබෝර් කන්ද මනේ ද මුහුද ළඟ
තිබනෙ කර්මලේ කන්ද මනේ ද වන්නේ ය.
19 අහෝ මිසර දේශ වැසියෙනි, වහල්කමට යාමට
බඩු භාණ්ඩ සූදානම් කරගන්න.
q219 මන්ද, මම්ෆිස් නගරය ජනහීන, පාළු, නටබුන්
ගොඩක් වන්නේ ය.
20 මිසරය වූකලී, උතුරු දේශයනේ පැමිණි
ඇටමැස්සන් රොක් වන ශෝභමාන එළ නැම්බියක
වැනි ය.
21 මිසරයේ සිටින කුලී හේවායෝ තර කරන ලද
වස්සන් වැනි ය.
q221 ඔවුන්ගේ විපත්ති දවස, ඔවුන්ගේ
විනිශ්චයයේ දවස, එනම්, ඔවුන්ට දඬුවම් කිරීමේ
දවස ඔවුන් වෙත ළඟා වූ නිසා ඔවුන්ට කළෙින්
සිටීමට නොහැකි ව, ඔව්හු පසු බැස හැරී එක් ව
පලා ගියෝ ය.
22 පාරොරෝ අතට ගත් ගස් හළෙන්නන් මනේ සතුරු
සේනා එන බැවින්, මිසරය සර්පයකු මනේ සූ, සූ,
ගාමින් පලා යන්නේ ය.
23 ඇතුළු වී ගමන් කිරීමට දුෂ්කර වූ කැළෑ ඔව්හු
කපා දමන්නෝ ය.
q223 ඔවුන්ගේ හේවායන්ගේ සංඛ්‍යාව
පළඟැටියන්ට වැඩි ය;
q223 සනෙඟ ගණන් නොකළ හැකි ය.
24 මිසර වැස්සෝ ලජ්ජාවට පත් කරන ලද්දෝ ය.
q224 ඔව්හු උතුරු දේශයේ සනෙඟට යටත් වන්නෝ
ය.
q224 මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය."
25 සියලු බලැති ස්වාමීන් වන ඉශ්රායලේවරුන්ගේ
දෙවියන් වහන්සේ මෙසේ වදාරන සේක; "මනේන,
මම තීබ්ස්හි දෙවියා වන ආමොන්ටත්, පාරාවෝටත්,
මිසරයටත්, එහි දෙවිවරුන්ටත්, එහි රජවරුන්ටත්,
පාරාවෝ කෙරේ විශ්වාසය තබන්නන්ටත් දඬුවම්
කරමින්, 26 ඔවුන්ගේ ප්‍රාණ හානි කරන්නට
සොයන්නන් අතටත්, බබිලෝනියේ නබෙුකද්නශෙර්
අතටත්, ඔහුගේ සේවකයන් අතටත් ඔවුන් පාවා
දනේනමේ. එහතේ, ඉන්පසු පරෙ කාලයේ මනේ
ජනයා මිසරයෙහි ජීවත් වනු ඇත. මෙසේ
පවසන්නේ ස්වාමීන් වන මම ය."

### සමිඳුන් සිය සනෙඟ මුදාගැනීම

27 ජරෙ 30:10-11 "මාගේ සේවක යාකොබ්ගනේ
පැවත එන ජනයනෙි, බිය නොවන්න; ඉශ්රායලේ
වැසියෙනි, නොකැළඹනේන. මන්ද, නුඹලා වහල් වී
සිටින ඒ දුර බැහැර දේශයනේ මම නුඹලා සහ
නුඹලාගේ පරපුර මුදන්නමේ. නුඹලා පරෙළා අවුත්,
සුරැකි ව සුව සේ ජීවත් වන්නහු ය. කිසිවකෙුගනේ
නුඹලාට බියක් ඇති වන්නේ නැත. 28 මාගේ
සේවක ජනයනෙි, මා නුඹලා සමඟ සිටින බැවින්
බිය නොවන්න. මම නුඹලා යම් ජාතීන් අතරට
විසුරුවා හැරියමේ ද, ඒ ජාතීන් තීන්දුවට ම නැති
කරන නමුත්, නුඹලා විනාශ නොකරමි. එහතේ,
නුඹලා දඬුවමින් නිදහස් නොකරමි. යුතු පමණට
නුඹලාට දඬුවම් කරන්නමේ. මෙසේ පවසන්නේ
ස්වාමීන් වන මම ය."

### පිලිස්තිවරුන්ගේ විනාශය

47 පාරාවෝ රජු ගාසා නගරයට පහර දනේනට
පරෙ පිලිස්තිවරුන් ගැන දිවැසිවර ජරෙමියාට
කතා කර සමිඳාණන් වහන්සේ මෙසේ වදාළ
සේක:යසො 14:29-31; එසකි 25:15-17; ජෝවෙ 3:4-8;
ආමො 1:6-8; ශපෙ 2:4-7; සකෙරි 9:5-7
2 "බලන්න, වතුර උතුරනේ ගලා අවුත්, උතුරා යන
ගඟක් වී, දේශය සහ එහි ඇති සෑම දයෙක් ද
නගරය සහ එහි වැසියන් ද උඩින් ගලා යන්නේ ය.
මනුෂ්‍යයෝ ද කෑගසන්නෝ ය. දේශයේ සියලු
වැසියෝ කෑමොරගසන්නෝ ය.

3 “අශ්වයන්ගේ කුර ගැටීමේ ශබ්දයත්, රථවල
සට සට යන ශබ්දයත්, රෝදවල ගිගුරුම් ශබ්දයත්
ඔවුන්ට ඇසෙන්නේ ය. තමන්ගේ අත් දුබල වී ඇති
බැවින් පියවරු තමන්ගේ දරුවන් දෙස ආපසු හැරී
නොබලන්නෝ ය.
4 “ඒ ඉතිරි වූ සියලු ආධාරකරුවන් තීර් සහ
සීදොන් කෙරෙන් වනසාලීම පිණිස, සියලු
පිලිස්තිවරුන් නාස්ති කිරීමට පැමිණෙන දවස නිසා
ය. මන්ද, ස්වාමීන් වන මා ක්රීත් මුහුදුබඩ
දේශයෙහි ඉතිරි ව සිටින පිලිස්තිවරුන් නාස්ති කරන
නිසා ය.
5 “ගාසාහි ජනයා පිට මහා පීඩනයක් පැමිණ ඇත.
අෂ්කලෝන්හි සෙනඟ විපතට පත් වී සිටිති.
පිලිස්තියේ ඉතිරි සෙනඟ තව කොපමණ කල්
තමන්ගේ ශරීර කපා කොටාගන්නෝ ද?
6 “එම්බා සමිඳාණන් වහන්සේගේ කඩුව! නුඹ
නිසොල්මන් වන්නේ කවදා ද? ‘නුඹේ කොපුවට
ඇතුළු වී නැවතී නිසල ව සිටින්න’ කියා නුඹලා
කියන්නහු ය.
7 “ස්වාමීන් වන මා එයට කාර්යයක් භාර කර
තිබෙන නිසා එය නිසල ව සිටින්නේ කෙසේ ද?
අෂ්කලෝන්ටත්, මුහුදුබඩ වසෙන සෙනඟටත්
පහර දෙන ලෙස මා එයට අණ කර ඇත.”

## මෝවබ්වරුන්ගේ විනාශය

48 යෙසා 15:1—16:14; 25:10-12; එසකි 25:8-11; ආමො 2:1-3; ශෙප 2:8-11
ඉශ්රායලේවරුන්ගේ සියලු බලැති දෙවි ස්වාමීන්
වහන්සේ මෝවබ් ගැන වදාළ දේ මෙසේ ය:
“අහෝ, නබෝ වැසියන්ට වන විපතක මහත!
මන්ද, එය පාළු වී ඇත. කිරියාතයිම් ලජ්ජාවට පත්
වී ඇත. සතුරා එය අල්ලාගෙන ඇත. එහි බලකොටු
නින්දිත ලෙස බිඳදමා ඇත. මිස්ගාබ් ලජ්ජාවටත්,
කැළඹීමටත් පැමිණියේ ය. 2 මෝවබ්හි කීර්තිය පහ
වී ගොස් ඇත. ‘අපි මෝවබ් ජාතිය නැත්තට ම
විනාශ කරමු’යි කියමින් හෙෂ්බොන්හි දී සතුරෝ
කුමන්ත්රණ කරති. මද්මේන් නගරය නිහඬ වන්නේ
ය. සතුරු සේනා ඊට පහර දෙන්නෝ ය.
3 නාස්තියත්, මහා විනාශයත් නිසා කෑමොරගැසීමේ
හඬක් හොරොනයිම් කෙරෙන් නික්මෙන්නේ ය.
4 “මෝවබ් විනාශ කරනු ලැබී ය. එහි කුඩා
දරුවන්ගේ බෙරිහන් දීම සෝයර් දක්වා ඇසේ.
5 “ලුහිත්ට යන උඩහ පාරේ හැඬුම් පිට හැඬුම්
නඟින්නේ ය. එසේ ය, හොරොනයිම්ට බැස යන
පාරේ විනාශයේ දුක්බිත අඳෝනාව ඇසෙන්නේ ය.
6 “ ‘හනික, පණ බේරාගන්න පිණිස කාන්තාරයේ
වල් බූරුවන් මෙන් දුවන්නැ’යි ඔව්හු කියති.
7 “එම්බා මෝවබ්! නුඹ නුඹේ බලකොටු හා
සම්පත කෙරෙහි නුඹේ විශ්වාසය තැබූ බැවින්
නුඹත් ගෙනයනු ලබන්නෙහි ය. කෙමොෂ් දෙවියා ද
ඔහුගේ පූජකයෝ ද අධිපතීහු ද එකට වහල්කමට
ගෙනයනු ලබන්නෝ ය.
8 “සියලු නගරවලට විනාශකයා පැමිණෙන්නේ ය.
කිසි ම නගරයක් නොගැළවෙන්නේ ය. ස්වාමීන් වන
මා කී ලෙස මිටියාවත ද තැනිතලාව ද නැතිනාස්ති
වන්නේ ය.
9 “මෝවබ්ට සොහොනක් සකස් කරන්න. එය
විගසින් විනාශ වන්නේ ය. එහි නගර පාළුවට
යන්නේ ය. කිසිවෙකේ එහි වාසය නොකෙරති.”
10 සමිඳාණන් වහන්සේගේ කාර්යයන් මුළු
ධෛර්යය යොදා නොකරන්නන්ට සාප වේ වා!
කඩුවෙන් ගසා නොමරන්නාටත් සාප වේ වා!

## මෝවබ් නගර විනාශ කරනු ලැබීම

11 සමිඳාණන් වහන්සේ මෙසේ වදාළ සේක:
“මෝවබ් ජාතිය මුල් කාලයේ සිට සුරක්ෂිත ව
පැවතිණි. කිසි කලක ඒ ජාතිය වහල්කමට ගෙනයනු
නොලැබී ය. මෝවබ් වනාහි, භාජනයෙන් භාජනයට
වත් නොකරනු ලැබූ, යටට මණ්ඩි බසින තකේ
භාජනයක නිශ්චල ව ඇති මිදියුස වැනි ය. එහි රස
අඩු නොවී ඒ තුළ ම පැවැතේ. එහි සුවඳ වෙනස් වී
නැත.
12 “එබැවින් මෝවබ් ජාතිය මිදියුස මෙන් වත් කර,
හළාදමන පිණිස සෙනඟක් එවන කාලය
පැමිණෙන්නේ ය. ඔව්හු මිදියුස බඳුන් හිස් කොට
ඒවා කැබලි කොට දමන්නෝ ය. 13 ඉශ්රායලේ
වංශය තමන් විශ්වාස කළ බෙතෙල් නම් දෙවියා
නිසා ලජ්ජාවට පත් වූවා සේ මෝවබ් ජනයා තමන්
විශ්වාස කළ කෙමොෂ් දෙවියා නිසා ලජ්ජාවට පත්
වෙති.
14 “මෝවබ් ජනයෙනි, නුඹලා ‘වීරයෝ ය’යි ද
‘යුද්ධයෙහි දක්ෂ භටයෝ ය’යි ද තමන් ගැන ම
පුරසාරම් දොඩන්නේ මන් ද?
15 “මෝවබ් සහ එහි නගරවල විනාශකයා
පැමිණියේ. එහි කදිම තරුණයෝ මැරුම් කෑමට බැස
ගියෝ ය. මෙසේ පවසන්නේ සියලු බලැති
සමිඳාණන් වහන්සේ නම් රජ තුමාණන් වන මම ය.
16 “මෝවබ් රටේ විනාශය ළඟ ය. එහි විපත්තිය
විගස පැමිණෙන්නේ ය.
17 “මෝවබ් වට කර සිටින සියල්ලනේ, එහි නාමය
දන්න සියල්ලනේ, ඒ රට ගැන විලාප කියන්න.
‘අහෝ! බලවත් ජයකොන්තය, අලංකාර සැරයටිය
කැඩුණු හැටි ය’යි කියන්න.
18 “අහෝ; දීබොන්හි වැසියනේ! නුඹලාගේ
තේජසින් බැස අවුත් බිම දූවිල්ලෙහි හිඳ ගන්න.
මන්ද, මෝවබ් විනාශ කළ සතුරා නුඹලාට විරුද්ධ ව
පැමිණ නුඹලාගේ බලකොටු විනාශ කරනු ඇත.
19 “අහෝ, අරෝයෙරේහි වැසියනේ! මඟ රැක
බලා සිට, කුමක් සිදු වුණා දැ යි ගැළවී පලා යන
ස්ත්රී පුරුෂයන්ගෙන් අසන්න.
20 “ඔවුන් පිළිතුරු දෙමින්, ‘මෝවබ් බිඳ හෙළනු
ලැබූ බැවින් එය ලජ්ජාවට පත් වී ඇත; ඒ ගැන
හඬා වැලපෙන්න. මෝවබ් විනාශ කරනු ලැබී යයි
අර්නොන් ගං ඉවුරු දිගේ ප්රකාශ කරන්නැ’යි කියනු
ඇත.

21 "තැනිතලාවේ පිහිටි, හොලොන් ද ජහශා ද
මෙෆායත් ද 22 දීබොන් ද නබෝ ද බෙත්-
දිබ්ලාතයිම් ද 23 කිරියාතයිම් ද බෙත්-ගාමුල් ද
බෙත්-මෙයොන් ද 24 කෙරියොත් ද බොස්රා ද යන
නගර පිටත්, ළඟපාත හා ඈත ඇති මෝවබ්
දේශයේ සියලු ම නගර පිටත් විනිශ්චය පැමිණ
තිබේ. 25 මෝවබ්හි තදෙ බලය බිඳ දමා ඇත; එහි
පරාක්‍රමය විනාශ කර ඇත. මෙසේ පවසන්නේ
ස්වාමීන් වන මම ය."

## මෝවබ් නින්දාවට පත්වීම

26 සමිඳාණන් වහන්සේ මෙසේ වදාළ සේක:
"ස්වාමීන් වන මට විරුද්ධ ව මෝවබ් තමන් උසස්
ලෙස සිතූ නිසා, ඔහු වෙරිමත් වූ මිනිසකු මෙන්
වේ වා! ඔහු සිය වමනයෙහි පෙරළෙමින් සරදමට
ලක් වේ වා! 27 මෝවබ්, නුඹට ඉශ්‍රායලේ සරදමක්
වුණා නොවේ ද? ඉශ්‍රායලේ සොරුන් අතරේ සම්බ
වී ද? නුඹ ඉශ්‍රායලේ ගැන කතා කරන සෑම විට ම
අවඥාවෙන් හිස වැනුවෙහි ය.
28 අහෝ මෝවබ් වැසියෙනි!
q2 28 නගර අත්හැර පර්වතවල වාසය කරන්න.
q2 28 ගුහා විවර පැතිවල කැදලි සාදන පරෙවියා
මෙන් වන්න.
29 මෝවබ් ඉතා අහංකාරී ය.
q2 29 එහි වැසියන්ගේ උඩඟුකමත්, ආඩම්බරයත්,
උදාරකමත්, අහංකාරයත් ගැන මා අසා ඇත.
30 ඔවුන්ගේ අභිමානය ගැන සමිඳුන් වන මම අසා
ඇත්තෙමි.
q2 30 ඔවුන්ගේ පාරට්ටුවත්, ඔවුන්ගේ ක්‍රියාවලියත්
නිෂ්ඵල ය.
31 එබැවින් මෝවබ් ගැන මුළු මෝවබ් ගැන
වැලපෙන්නෙමි.
q2 31 කීර්-හරෙසෙහි මිනිසුන් ගැන වැලපෙන්නෙමි.
32 ජාසෙර්හි සෙනඟ ගැන වැලපෙනවාට වඩා මිදි
වැලක් වැනි සිබ්මාහි සෙනඟ ගැන වැලපෙන්නෙමි.
q2 32 එහි අතු මළ මුහුදෙන් එපිට විහිදී ජාසෙරේ
දක්වා පැතිර ගොස් ඇත.
q2 32 එහෙත්, දැන් එහි ග්‍රීෂ්ම කාලයේ පල හා
මුද්‍රික වලු පිට විනාශය පැමිණ ඇත.
33 මෝවබ් දේශයේ සරු කෙතේවලින් ප්‍රීති
සන්තෝෂය පහ වී ගොස් ඇත.
q2 33 මිදි මිරිකන යන්ත්‍රවල මිදියුස සිඳී යන්නට
මම සැලැස්වීමි.
q2 33 මිදි පල මිරිකා, මිදියුස සාදන්නන් නඟන
සෝෂාව ප්‍රීති නාදයක් නොවේ.
34 "හෙෂ්බොන්හි හා එලයොලේහි සෙනඟ
මොරගසති. ඔවුන්ගේ මොරහඬ ජහශ් දක්වා
ඇසේ; සෝවර්හි ජනයාට එය ඇසේ. හොරොනායිම්
හා එග්ලත්-ෂලිෂිය ද දක්වාත් ඇසේ. නිම්රිම්හි
ජලය පවා හිඳී ගොස් ඇත. 35 මෝවබ්හි ගිරිකුළු
දේවාලයන්හි පූජා කරන්නා ද තමාගේ දෙවිවරුන්ට
සුවඳ දුම් ඔප්පු කරන්නා ද මම නැති කරන්නෙමි.
මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය.
36 "ඒ නිසා මාගේ සිත මෝවබ් ගැන ද කීර්-
හරෙසේ ගැන ද නළාවක් මෙන් දුක් හඬ නඟයි.
මන්ද, ඔවුන් උපදවාගත් සම්පත් නැති වී ගොස්
ඇත. 37 සියලු දෙනා ම හිස් මුඩු කරගෙන රැවුල්
කපා දමා ඇත. ඔවුන් සිය අත් කපාකොටාගෙන
ඉඟටිවල ගෝණි රෙදි බැඳගෙන ඇත. 38 මෝවබ්හි
සියලු පියසි උඩ ද එහි සියලු චතුරශ්‍රවල ද
ඇසෙන්නේ වැලපීම පමණකි. මන්ද, කිසිවකුට
වුවමනා නැති භාජනයක් පොඩි කරන්නාක් මෙන් මා
මෝවබ් පොඩි කරදමා ඇත. මෙසේ පවසන්නේ
ස්වාමීන් වන මම ය. 39 බලන්න, මෝවබ් සුණු
විසුණු වී තිබෙන හැටි! අහෝ! එහි සෙනඟ
වැලපෙන හැටි! මෝවබ් ලජ්ජාවෙන් පිටුපා සිටින
හැටි! මෙසේ මෝවබ් එය වටකර සිටි සියල්ලන්ට
සරදමට හා භීතියට කරුණක් වී ඇත."

## මෝවබ්ට ගැළවීමක් නැති වීම

40 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
"යම් ජාතියක් රාජාලියකු මෙන් වේගයෙන් ඉගිලී
අවුත් මෝවබ්ට විරුද්ධ ව පියාපත් විහිදුවනු ඇතැ යි
ස්වාමීන් වන මම කීවෙමි. 41 නගර සතුරාට අසු වනු
ඇත; බලකොටු අල්ලා ගනු ලැබේ; මෝවබ්හි
භටයන්ගේ සිත ප්‍රසව වේදනාව විඳින
ස්ත්‍රියකගේ සිත මෙන් වන්නේ ය. 42 මෝවබ්
තමන් උසස් ලෙස සැලකූ බැවින්, මින්පසු ජාතියක් ව
නොසිටින ලෙස විනාශ කරනු ලබන්නේ ය.
43 අහෝ, මෝවබ් වැසියෙනි! භීතියත්, බොරු වළත්,
මලපතත් නුඹලා ඉදිරියේ ඇත. මෙසේ පවසන්නේ
ස්වාමීන් වන මම ය. 44 භීතිය කරෙනේ පලා යන්නා
බොරු වළේ වැටේ; බොරු වළෙන් ගොඩ වන්නා
මලපතට අසු වේ. මන්ද, මෝවබ්ට දඬුවම් දෙන
අවුරුද්ද තුළ මේ සියලු විපත් ඔවුන්ට පමුණුවනු
ඇත. මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය.
45 පලා ගිය අය ආරක්ෂාව සොයා හෙෂ්බොන්හි
නතර වී දුබල ව සිටිති. මන්ද, හෙෂ්බොන් සිට
ගින්නක් නැඟී ඇත. සිහොන් මාලිගාවෙන් ගිනි
දලුවක් පිට වී ඇත. එයින් මෝවබ් රටේ හා
සෝෂාකාරී පුත්‍රයන්ගේ පළාතේ දේශ සීමා
දවාලනු ඇත. 46 අහෝ, මෝවබ්! නුඹට වන විපතක
මහත! කෙමොෂ්හි සෙනඟ විනාශ වී ඇත. නුඹේ
දරුදැරියෝ වහල්කමට ගෙනයනු ලැබූ හ. 47 එහෙත්,
මතු දවස්වල දී මම මෝවබ්ට සමෘද්ධිය යළි ඇති
කරන්නෙමි. මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය.
මෝවබ් ගැන විනිශ්චය මෙයෙ වේ."

## අම්මොන් පිළිබඳ විනිශ්චය

49 එසකි 21:28-32; 25:1-7; ආමොස් 1:13-15;
ශපෙ 2:8-11 අම්මොන්වරුන් ගැන සමිඳාණන්
වහන්සේ මෙසේ වදාළ සේක: "ඉශ්‍රායලේ
දේශයේ වැසියෝ නැද් ද? එයට උරුමක්කාරයෝ
නැද් ද? ඇත්නම්, මල්කාම් දෙවියාට නමස්කාර
කරමින් සෙනඟ ගාද් රට හිමි කරගෙන නගරවල
වාසය කරන්නේ මන් ද? 2 මෙසේ වී තිබෙන බැවින්,

රබ්බා නගරයෙහි වසෙනෙ සනෙඟට යුද්ධ සෝෂාව
ඇසනෙ කාලයක් පැමිණෙන්නේ ය. අම්මොන්වරුන්
සිටින ඒ නගරය නටබුන් ගොඩක් වන්නේ ය. ඊට
අයිති ගම් ද ගින්නනේ දවාලනු ලබන්නේ ය. එවිට
සිය දේශයනේ පන්නාදමන ලද ඉශ්රායලේ ජනතාව
සිය දේශය හිමි තමන් පැන්නුවන් ඔවුන්ගේ
දේශයනේ පන්නාදමති. මසෙේ පවසන්නේ ස්වාමීන්
වන මම ය. 3 අහෝ, හෙෂ්බොන් වැසියනෙි!
කෑමොරගසන්න; මන්ද, හායි නටබුන් ගොඩක් විය.
එම්බා, රබ්බා වනිතාවනෙි! කෑගසමින්, ගෝණි රදෙි
හැඳගනෙ, විලාප කියමින් වැටකොටු අතරේ
ඔබමොබ දුවන්න. මන්ද, මල්කාම් දවේයා ද ඔහුගේ
පූජකයෝ ද අධිපතීහු ද එක් ව වහල්කමට යන්නෝ
ය. 4 අවිශ්වාසී ජනයනෙි, නුඹලා සාරවත් මිටියාවත්
ගැන පාරට්ටු කරගන්නේ කුමට ද? අපට විරුද්ධ ව
පැමිණෙන්නෝ කවුරු දැ යි කියමින්, නුඹලාගේ
වස්තු කරෙහෙි නුඹලා විශ්වාසය තබන්නහු ය.
5 නුඹලා වටකර සිටින සියල්ලන්ගනේ නුඹලා පිට
භීතියක් මම පමුණුවන්නමේ. නුඹලා එකිනකො
පන්නනු ලබන්නහු ය. පලා යන අය පිළිගැනීමට ද
කිසිවකේ නොවෙන්නෝ ය. මසෙේ පවසන්නේ සියලු
බලැති ස්වාමීන් වන මම ය.
6 "එහතේ, පසු ව අම්මොන්වරුන්ගේ වහල්කම
මම පහකරන්නමේ. මසෙේ පවසන්නේ ස්වාමීන් වන
මම ය."

## ඒදොම් පිළිබඳ විනිශ්චය

7 යසො 34:5-17; 63:1-6; එසකි 25:12-14; 35:1-15;
ආමො 1:11-12; ඔබදි 1-14; මලාකි 1:2-5 ඒදොම්
ගැන සියලු බලැති සමිඳාණන් වහන්සේ මසෙේ
වදාරන සේක:
q27 "ඒදොමෙහි නැණනුවණ තවත් නැද් ද?
q27 දැනුමැතිකම් දීමේ ශක්තිය නැණවතුන්ට තවත්
නැද් ද?
q27 ප්රඥාව ඔවුන්ගනේ පහ ව ගොස් ඇද් ද?
8 දදොන් වැසියනෙි, දුවන්න;
q28 හැරී දුර බැහැරට ම ගොස් වාසය කරන්න.
q28 මන්ද, මා විසින් ඒසව්ගේ පරපුරට දඬුවම්
කරනු ලබන කාලය පැමිණ තිබනෙ බැවින් මම
ඔවුන් විනාශ කරදමමි.
9 මිදි පල නළෙන්නන් මිදි පල නළෙන්නට ආ විට
ඔවුන්ගනේ හැළනෙ ඉතිරි මිදි පල ඇහිඳගන්නට ඉඩ
හැරියේ නැද් ද?
q29 රාත්රියේ සොරුන් ආවොත් ඔව්හු ඇති පමණට
වඩා සොරකම් කරන්නෝ ද?
10 එහතේ, මම කිසිත් ඉතිරි නොකොට, ඒසව්ගේ
පරපුර වනසන්නමේ.
q210 ඔවුන්ට තවත් සැඟවනේනට බැරි වන ලසෙ
ඔවුන් සැඟවී සිටින තැන් එළිදරව් කරන්නමේ.
q210 ඒදොමෙහි ජනයා ද ඔවුන්ගේ ඥාතීහු ද
අසල්වාසීහු ද විනාශ කරන ලදහ.
q210 කිසිවකේ ඉතිරි වන්නේ නැත.
11 නුඹලාගේ අනාථ දරුවන් මා සමඟ තබා යන්න,
මම ඔවුන් රැකබලාගන්නමේ.
q211 නුඹලාගේ වැන්දඹුවෝ ද මා කරෙහෙි විශ්වාස
කරත් වා."
12 සමිඳාණන් වහන්සේ මසෙේ වදාරන සේක:
"දඬුවම නමැති කුසලානනේ පානය කිරීමට නුසුදුසු
අය පවා පානය කළෝ නම්, නුඹලා දඬුවම්
නොලබන්නහු ද? නැත. නුඹලා එය පානය කළ යුතු
ම ය. 13 බොශ්රා නගරය භීතියට ද සරදමට ද
පාළුවට ද සාපයට ද ලක් වන බව මම දිවුරා කියමි.
එහි අසල නගර සදහට ම පාළු වී යනු ඇත. මසෙේ
පවසන්නේ ස්වාමීන් වන මම ය."
14 ජරෙමියා පිළිතුරු දමේින් මසෙේ කීවේ ය:
"ඒදොමේට විරුද්ධ ව පහර දනෙ පිණිස සේනාවක්
සූදානම් කරගන්නැ යි කියන පිණිස විජාතීන් අතරට
තානාපතියකේ යවන ලද්දේ ය යන ආරංචිය
සමිඳාණන් වහන්සේගනේ මම ලදිමි. 15 නුඹලා
විජාතීන් අතර දුබල ජාතියක් ද මිනිසුන් ඉදිරියහෙි
නිවටකමට පත් වූ ජාතියක් ද කිරීමට සමිඳාණන්
වහන්සේ සූදානම් වන සේක. 16 පර්වත ගුහාවල
හා හලේ මුදුන්වල වාසය කරන නුඹලා අනුන්
බියගන්වන සුලු නුඹලාගේ සිත්හි උඩඟුකමනේ
රැවටී සිටින්නහු ය. නුඹලාගේ වාසස්ථානය
රාජාලියකුගේ කූඩුව මනේ ඉතා ඉහළින් පිහිටා
ඇතත්, සමිඳාණන් වහන්සේ නුඹලා පහළට හළෙන
සේක. සමිඳාණන් වහන්සේ මසෙේ වදාළ සේක."
17 සමිඳාණන් වහන්සේ මසෙේ වදාරන සේක:
"ඒදොම් භීතියට හේතුවක් වන්නේ ය. ඒ අසලින්
යන සියල්ලෝ විස්මයට පත් වී ඊට පැමිණ තිබනෙ
විපත්ති ගැන දොඩන්නෝ ය. 18 උත්
19:24-25සොදොමෙහි සහ ගොමොරාවේ ද එහි අසල
නගරවල ද ඇති වූ විනාශය ඒදොමේටත් සිදු වන්නේ
ය. කිසි මිනිසකේ එහි වාසය නොකරන්නේ ය.
කිසිවකේ එහි පදිංචි නොවෙන්නේ ය.
19 ජොර්දානයේ වන ලැහැබින් නික්ම සරු ගොදුරු
බිම් කරා පැමිණනෙ සිංහයකු මනේ මම අවුත්
ඒදොම් වැසියන්ට සිය දේශයනේ පලා යන්නට
සලස්වන්නමේ. එවිට මා සතුටු කනෙකු
තෝරාගනෙ රට පාලනය කිරීමට පත් කරනු ඇත.
මට සමාන වන්නේ කවරකේ ද? මට අභියෝග
කරන්නේ කවරකේ ද? කවර නම් නායකයකේ මට
එදිරි වන්නේ ද? 20 ඒ නිසා, ඒදොම් වැසියන්ට
විරුද්ධ ව කර ඇති යෝජනා ද තේමාන් නගර
වැසියන්ට විරුද්ධ ව මා සූදානම් කර ඇති සැලසුම් ද
ගැන සවන් දනේන. ඔවුන් කුඩා දරුවෝ පවා
ඇදගනෙ යනු ලබති. සියල්ලෝ ඔවුන්ගේ ඉරණම
ගැන බියට පත් වන්නෝ ය. 21 ඒදොම් වැටනෙ විට,
ඒ ශබ්දයනේ පොළොව කම්පා වී යන්නේ ය.
ඔවුන්ගේ කෑගැසීමේ හඬ රතු මුහුද දක්වා ඇසනෙු
ඇත. 22 සතුරා රාජාලියකු මනේ නැඟී ඉගිලී අවුත්,
බොශ්රා පිට සිය පියාපත් විදහා පානු ඇත. ඒ
දවසේ දී ඒදොමෙහි හේවායන්ගේ සිත් ප්රසව
වේදනාව විඳින ස්ත්රියකගේ සිත මනේ භීතියට
පත් වන්නේ ය."

### දමස්කය පිළිබඳ විනිශ්චය

23 යසො 17:1-3; ආමො 1:3-5; සකෙරි 9:1 දමස්කය
ගැන සමිඳාණන් වහන්සේ වදාළ දේ මෙසේ ය:
q223 “හමාත් හා අර්පාද් යන නගරවල වැසියන්ට
නරක ආරංචියක් ලැබී ඇති බැවින් ඔව්හු කැළඹීමට
පත් වී සිටිති.
q223 චංචලය ඇති නිශ්චලයක් නැති මුහුද මෙන්
ඔව්හු භීතියෙන් ඇලළී යති.
24 දමස්කයේ වැසියෝ බලෙහීන ව භීතියෙන් පලා
යන්නට හැරී සිටිති.
q224 ප්‍රසව වේදනාවෙන් සිටින ස්ත්‍රියක මෙන්
ඔව්හු වේදනාවෙන් හා දුකෙන් මිරිකෙති.
25 කීර්තිමත්, ප්‍රීතිමත් නුවර දැන් පාළුවට ගොස්
තිබෙන හැටි!
26 එබැවින් එහි තරුණයෝ චතුරශ්‍රයන්හි
වැටෙන්නෝ ය.
q226 ඒ දවසේ දී ඇගේ භටයෝ විනාශයට පත්
වන්නෝ ය.
q226 මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය.
27 මම දමස්කයේ පවුරු ඇතුළත ගින්නක් දල්වා
එයින් බෙන්-හදද්ගේ මාලිගා දවාදමන්නෙමි.”

### කේදාර් හා හාශෝර් පිළිබඳ විනිශ්චය

28 බබිලෝනියේ රජු වූ නබුකද්නෙසර් විසින්
පහර දෙන ලද කේදාර් ගැනත්, හාශෝර්හි රාජ්‍යයන්
ගැනත් සමිඳාණන් වහන්සේ මෙසේ වදාළ සේක:
q228 “නුඹලා නැඟිට කේදාර්ට විරුද්ධ ව ඉදිරියට
ගමන් කරන්න;
q228 පෙරදිග වසන ජනයා විනාශ කරදමන්න.
29 ඔවුන්ගේ කූඩාරම් ද බැටළු පට්ටි ද කූඩාරම්වල
තිර ද සියලු භාණ්ඩ ද සතු කරගන්න.
q229 ඔවුන්ගේ ඔටුවන් ද අයිති කරගන්න;
q229 එවිට, ‘අවට භීතියෙන් පිරී ඇතැ’යි සෙනඟ
මොරගසනු ඇත.
30 ‘හාශෝර් වැසියෙනි, පැන දුවන්න.
q230 ඈතට පලා ගොස්, එපිට තැනක වාසය
කරන්නැ’යි ස්වාමීන් වන මම කියමි.
q230 මන්ද, බබිලෝනියේ රජු වන නබුකද්නෙසර්
නුඹලාට විරුද්ධ ව උපක්‍රම යොදා ඇත;
31 දොරටු හෝ අගුල් හෝ නොමැති ව, සුරැකි ව
සුව සේ වසන සෙනඟට පහර දීමට ඉදිරියට යන්න.
q231 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක.
32 ඔවුන්ගේ ඔටුවන් ද ගව පට්ටි ද කොල්ලයට
ගන්න.
q232 හිස බූගාගන්න අය මම හැම අතට ම
විසුරුවාදමන්නෙමි.
q232 හැම දිශාවකින් ම ඔවුන් පිට විනාශය
පමුණුවන්නෙමි.
q232 මෙසේ පවසන්නේ සමිඳාණන් වහන්සේ ය.
33 හාශෝර්, හිවලුන්ගේ ගුහාවක් ද සදාකාල
පාළුකරයක් ද වන්නේ ය.
q233 කිසි ම මිනිසකේ එහි වාසය කරන්නේ වත්
එහි ජීවත් වන්නේ වත් නැත.”

### ඒලාම් පිළිබඳ විනිශ්චය

34 ශෙදෙකියා රජු ජුදාහි රජකමට පත්වීමේ
පටන්ගැන්මේ දී, ඒලාම් රට ගැන සමිඳාණන්
වහන්සේ ජෙරමියාට මෙසේ වදාළ සේක:
35 “ඒලාම් බලවත් රටක් කළ දුනුවායන් මම
මරාදමමි. 36 මම ඒලාම්ට විරුද්ධ ව සතර කොනෙන්
සුළං සතරක් හමන්න සලස්වා ඒ සුළඟින් එහි
වැසියන් හැම අතට ම විසුරුවා දමන්නෙමි. ඒලාම්
රටෙන් පන්නනු ලබන අය පලා නොයන රටක්
නොවන්නේ ය. 37 එසේ ය, මම ඒලාම්වරුන්,
ඔවුන්ගේ සතුරන් ද ඔවුන්ගේ ප්‍රාණය හානි
කරන්න සොයන්නන් ද ඉදිරියෙහි බියගන්වා, මාගේ
රුදුරු කෝපයෙන් ඔවුන් විනාශ කර, ඔවුන්
සම්පූර්ණයෙන් වනසාලන තුරු මරණය ඔවුන්
ලුහුබඳවා යන්න සලස්වන්නෙමි. මෙසේ පවසන්නේ
ස්වාමීන් වන මම ය. 38 ඒලාම්හි රජවරුන් ද
අධිපතීන් ද විනාශ කරදමා මම මාගේ සිහසුන එහි
පිහිටුවන්නෙමි. 39 එහෙත්, මතු දවස්වල දී ඒලාම්
යළිත් සමෘද්ධිමත් කරන්නෙමි. මෙසේ පවසන්නේ
ස්වාමීන් වන මම ය.”

### බබිලෝනියේ වැටීම

50 යසො 13:1—14:23; 47:1-15 කල්දිවරුන්ගේ
දේශය වන බබිලෝනිය ගැන සමිඳාණන්
වහන්සේ දිවැසිවර ජෙරමියාට දුන් පණිවුඩය මෙයෙ
වේ:
2 “ ‘බබිලෝනිය වැටී ඇත;
q22 බේල් ලජ්ජාවට පත් වී ඇත;
q22 මෙරොදක් කැළඹී සිටියි;
q22 ඇගේ දේව රූප නින්දාවට ලක් වී ඇත.
q22 ඇගේ රූප කැළඹීමට පත් වී ඇත’ යන ආරංචිය
ජාතීන් අතරේ පතුරුවන්න.
q22 එය ප්‍රකාශ කරන්න;
q22 ධජ සංකේතයක් නංවා එය නොසඟවා
ප්‍රසිද්ධ කරන්න.
3 මන්ද, බබිලෝනියට පහර දෙන පිණිස උතුරු
දිගින් ජාතියක් පැමිණෙන්නේ ය.
q23 ඔව්හු බබිලෝනිය පාළු කර දමන්නෝ ය.
q23 කිසිවකේ එහි නොවසන්නෝ ය.
q23 මනුෂ්‍යයෝ ද මෘගයෝ ද පලා යන්නෝ ය.”

### ඉශ්රායලේ දරුවන් ආපසු පැමිණීම

4 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක: “ඒ
දවස්වල දීත් ඒ කාලවල දීත් ඉශ්රායලේහි හා
ජුදාවේ සෙනඟ එක් ව තමන්ගේ දෙවි ස්වාමීන්
වහන්සේ වන මා සොයමින් අඬ අඬා
පැමිණෙන්නෝ ය. 5 ඔව්හු සියොන් කන්දට යන
මාර්ගය කුමක් දැ යි අසමින් ඒ දෙසට ගමන්
කරන්නෝ ය. ‘එන්න අපි සමිඳාණන් වහන්සේ

සමඟ අමතක නොවෙන සදාතනික ගිවිසුමක්
කරගනිමු'යි ඔව්හු කියන්නෝ ය.
6 "මාගේ සෙනඟ නැති වූ බැටළුවන් මෙන් වෙති.
ඔවුන්ගේ එඬේරු ඔවුන් මුළා කර කඳුවල නැති වී
යන්නට සැලැස්සුවෝ ය. ඔව්හු කන්දෙන් කන්දට ඇදී
යමින් ඔවුන්ගේ ලැගුම් ගාල මතක නැති කළෝ ය.
7 ඔවුන්ට මුණගැසුණු සියල්ලෝ ම ඔවුන් ගොදුරු
කොට ගත්තෝ ය. ඔවුන්ගේ එදිරිකාරයෝ කතා
කොට, 'ඔව්හු තමන්ගේ සරණය වන සමිඳාණන්
වහන්සේට, එනම්, තමන්ගේ පියවරුන්ගේ
බලාපොරොත්තුව වූ සමිඳාණන් වහන්සේට විරුද්ධ
ව පව් කළෝ ය. අපි වැරදිකාරයෝ නොවෙමු'යි
කීවෝ ය.
8 එළිද 18:4 "කල්දිවරුන්ගේ දේශය වන
බබිලෝනියේ සිටින ඉශ්රායලේ ජනයනි, රැළට
පෙරටුවෙන් යන එළුවන් මෙන් පලා යන්න. 9 මන්ද,
මම උතුරු දේශයෙන් බලවත් ජාතීන් රැසක්
බබිලෝනියට විරුද්ධ ව පොළඹවා ගෙනෙන්නෙමි.
ඔවුන් බබිලෝනියට විරුද්ධ ව සැරසී සිට එය
අල්ලාගනු ඇත. ඔවුන් විදින ඊගස කවදාවත් හිස්
අතින් ආපසු නොඑන දක්ෂ වීරයන් මෙන් ඒවායේ
ඉලක්කය නොවරදවන්නේ ය. 10 බබිලෝනිය
කොල්ලකනු ලැබේ. ඒ දේශයෙන් කොල්ලකන
සියල්ලෝ ම තෘප්තියට පැමිණෙන්නෝ ය."

## බබිලෝනියේ විනාශය

11 "බබිලෝනියේ වැසියෙනි, නුඹලා මාගේ දේශය
කොල්ලකෑවහු ය.
q2 11 ගොයම් මඩින එළ නැම්බියක මෙන් නුඹලා
පැන පැන සිටිමින්, ශක්තිමත් අශ්වයන් මෙන්
හේෂාරවය කරමින් ප්රීති වන්නහු ය.
12 නුඹලාගේ මවුබිම දැරිය නොහැකි නින්දාවටත්,
අපවාදයටත් පාත්ර වී ඇත.
q2 12 ජාතීන් අතරෙන් බබිලෝනිය ඉතා පහත් ජාතිය
වන්නේ ය.
q2 12 එය වතුර නැති වියළි බිමක් ද පාළුකරයක් ද
මරුකතරක් ද වන්නේ ය.
13 මාගේ කෝපය නිසා කිසිවකේ බබිලෝනියේ
ජීවත් නොවෙති.
q2 13 එය නටබුන් ගොඩක් වන්නේ ය.
q2 13 බබිලෝනිය ළඟින් යන සියල්ලෝ ම එයට සිදු
වී තිබෙන දේ ගැන විස්මයට පත් ව, ඊට වූ විපත්ති
ගැන ඊට නින්දා කරන්නෝ ය.
14 දුනුවායෙනි, බබිලෝනියට විරුද්ධ ව එය වටකර
යුද්ධයට සැරසී අන්තිම ඊගස දක්වා එයට විදින්න.
q2 14 මන්ද, එය සමිඳාණන් වහන්සේට විරුද්ධ ව
පව් කර ඇත.
15 බබිලෝනියට විරුද්ධ ව එය වටකර රණ ඝෝෂා
කරන්න.
q2 15 බබිලෝනිය දැන් යටත් වී ඇත.
q2 15 එහි ප්රාකාර වැටී ඇත;
q2 15 පවුරු කඩාදමා ඇත.
q2 15 මයෙ සමිඳුන්ගෙන් ලත් දඬුවම ය.
q2 15 බබිලෝනියෙන් පළිගැනීමට ඒ දේශය කළ
ලෙසෙ ම එයටත් කරන්න.
16 වපුරන්නන් ද දෑකැත්ත අතින් ගත් ගොයම්
කපන්නන් ද බබිලෝනියෙන් වනසාලන්න.
q2 16 පීඩා කරන කඩුවට බියෙන් සියලු දෙනා ම තම
තමන්ගේ සෙනඟ වෙත හැරී සිය මවුබිම බලා පලා
යන්නෝ ය."

## ඉශ්රායලේ ආපසු පැමිණීම

17 "ඉශ්රායලේ වනාහි සිංහයන් විසින් ලුහුබඳිනු
ලැබ පන්නාදමනු ලැබූ බැටළුවන් වැනි ය.
පළමුකොට අසිරියාවේ රජ ඉශ්රායලේ ගොදුරට
ගත්තේ ය. අවසානයේ දී බබිලෝනියේ රජු වූ
නබුකද්නෙසර් ඉශ්රායලේගේ ඇටකටු
පොඩිකරදැම්මේ ය. 18 එබැවින් ඉශ්රායලේවරුන්ගේ
සියලු බලැති දෙවි ස්වාමීන් වහන්සේ වන මම
අසිරියාවේ රජුට දඬුවම් කළාක් මෙන් බබිලෝනියේ
රජුටත්, ඔහුගේ දේශයටත් දඬුවම් කරන්නෙමි.
19 ඉශ්රායලේ ජනයා යළිත් ඔවුන්ගේ දේශයට
පමුණුවන්නෙමි. ඔව්හු කර්මලේහි ද බාෂාන්හි ද
වැවෙන ආහාරයෙන් පෝෂණ වන්නෝ ය. එප්රායිම්
හලේ පිට ද ගිලියද්හි ද වැවෙන සියලු දේ අනුභව
කොට තෘප්තියට පැමිණෙන්නෝ ය. 20 ඒ දවස්වල දී
හා ඒ කාලවල දී ඉශ්රායලේවරුන්ගේ අපරාධ
සොයන නමුත්, එහි කිසිවක් සම්බ නොවන්නේ ය.
ජුදාගේ පාපයන් සොයන නමුත්, ඒ කිසිවක් ද සම්බ
නොවන්නේ ය. කුමක් නිසා ද, මා ඉතිරි වන්නට
හරින සෙනඟ කමාව ලබන බැවිනි. මෙසේ
පවසන්නේ සමිඳාණන් වහන්සේ වන මම ය.
21 "මෙරොතයිම් දේශයටත්, පකෝඩ්හි
වැසියන්ටත් විරුද්ධ ව නැඟී ගොස් ඔවුන් ලුහුබැඳ,
ඔවුන් සහමුලින් ම විනාශ කර දමන්න;
q2 21 මා නුඹලාට අණ කළ සියල්ල කරන්න.
q2 21 මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය.
22 යුද්ධ කිරීමේ ද මහත් විනාශයේ ද ඝෝෂාව
දේශය පුරා ඇසෙයි.
23 බබිලෝනිය කුළුගඩේයක් මෙන් මුළු ලොවට
පහර දුන්නේ ය.
q2 23 දැන් ඒ කුළුගඩේය කැඩී බිඳී ගොස් තිබෙනෙ
හැටි!
q2 23 ජාතීන් අතර බබිලෝනිය භයානක දර්ශනයක්
වී තිබෙනෙ හැටි!
24 අහෝ බබිලෝනිය!
q2 24 මම නුඹට මලපතක් තැබීමි, නුඹ ද
නොදැනුවත් ව ම එයට අසුවුණාහෙ ය.
q2 24 නුඹ මට විරුද්ධ ව යුද්ධ කළ නිසා අසු වී
අල්ලන ලද්දහෙ ය.
25 මහෝත්තම දෙවි ස්වාමීන් වන මම ම මාගේ
ගබඩා හැර මාගේ කෝපය නමැති ආයුධ එළියට
ගත්තෙමි.
q2 25 මන්ද, සව් බලැති දෙවි ස්වාමීන් වන මට
බබිලෝනිය සම්බන්ධයෙන් යම් කාර්යයක් කරන්නට
තිබේ.

26 සෑම දසෙින් ම ඇට විරුද්ධ ව නැඟී එන්න;
q226 ඇගේ ධාන්‍ය ගබඩා අරින්න;
q226 ධාන්‍ය ගාඩෙක් මනේ ඇය රුස්කාටෙ
වනසන්න;
q226 කිසිවක් ඉතිරි නාකෙරන්න.
27 ඇගේ සියලු හවේායන් මරාදමන්න;
q227 ඔවුන් ඝාතනය කරන්න;
q227 ඔවුන්ට වන විපතක මහත!
q227 ඔවුන්ට දඬුවම් දීමේ දවස දැන් ළඟා වී
තිබේ.”
28 බබිලානේියනේ ගැළවී පලා ගිය සනෙඟ
සියාන්ට පැමිණ, අපේ දවේ ස්වාමීන් වහන්සේ
දවේ මාලිගාවට කළ විනාශය නිසා
බබිලානේිවරුන්ගනේ පළිගත් අයුරු ප්‍රකාශ කළාෝ
ය.
29 එළිද 18:6 “බබිලානේියට විරුද්ධ ව දුනු තැත්
කවන දුනුවායන් සියල්ලන් කැඳවන්න; ඇට විරුද්ධ ව
වටකරින් කඳවුරු බැඳ, කිසිවකුෙට ගැළවී යන්නට
ඉඩ නෑර, ඇගේ ක්‍රියාවන්ට සරිලන සේ ඈට
ප්‍රතිවිපාක දී ඈ අනුන්ට කළ ලසෙ ම ඈටත්
කරන්න. මන්ද ඈ ඉශ්‍රායලේවරුන්ගේ ශුද්ධ දවේ
ස්වාමීන් වහන්සේ වන මට විරුද්ධ ව නැඟී සිටියා
ය. 30 එබැවින් ඒ දවසේ දී බබිලානේියේ තරුණයන්
වීදිවල වැටනෙු ඇත; එහි සියලු හවේායෝ විනාශ
කරනු ලබති. මසෙේ පවසන්නේ ස්වාමීන් වන මම
ය.
31 “බබිලානේිය, එම්බා අහංකාර ජාතිය! ඒ නිසා
සියලු බලැති මහාත්තම දවේ ස්වාමීන් වන මම
නුඹට විරුද්ධ ව සිටිමි. නුඹට දඬුවම් කිරීමේ කාලය
දැන් පැමිණ තිබේ. 32 උඩඟු ජාතියක් වන නුඹ
පැකිළ වැටනේනහේ ය. නුඹ නඟා සිටුවන්න
කිසිවකේ නාවෙන්නේ ය. මම නුඹේ නගරවල
ගින්නක් දල්වන්නමේ; එයින් නුඹ අවට තිබනෙ සියලු
දේ දැවී යනු ඇත.”
33 සියලු බලැති සමිඳාණන් වහන්සේ මසෙේ
වදාරන සේක: “ඉශ්‍රායලේහි සනෙඟ ද ජුදාහි
සනෙඟ ද එකට පීඩා විඳින්නෝ ය. ඔවුන්
වහල්කමට ගත් සියල්ලෝ ඔවුන්ට යන්නට
ඉඩහරින්න අකමැති වී ඔවුන් අල්ලාගනෙ ම සිටිති.
34 එහතේ, ඔවුන්ගේ මිදුම්කාරයාණෝ බලසම්පන්න
වන සේක, උන් වහන්සේගේ නාමය සියලු බලැති
සමිඳාණන් වහන්සේ ය. ඔවුන්ගේ පැමිණිල්ල
සාධාරණ ලසෙ විසඳන සේක; ලාවෙට සාමය දනෙ
සේක; එහතේ, බබිලානේියේ වැසියන්ට කැළඹීම
ඇති කරන සේක.
35 “සමිඳාණන් වහන්සේ මසෙේ වදාරන සේක:
q235 කඩුව බබිලානේියේ වැසියන් ද ඇගේ
අධිපතීන් ද ඇගේ ප්‍රඥාවන්තයන් ද පිට
පැමිණනේනේ ය.
36 කඩුව පනේ කියන්නන් පිටට පැමිණ ඔවුන්
මාඩෝයන් බවට පත් කරනු ඇත.
q236 කඩුවක් ඇගේ හවේායන් පිට පැමිණ ඔවුන්
විනාශ කරනු ඇත.
37 කඩුවක් ඔවුන්ගේ අශ්වයන් පිටත්, රථ පිටත්,
එහි සිටින විදශේීය සනේාවන් පිටත් පැමිණ ඔවුන්
ස්ත්‍රීන් මනේ දුබල වී යනු ඇත.
q237 කඩුවක් ඇගේ වස්තු පිට පැමිණ ඒවා
කාල්ලයට යනු ඇත.
38 නියඟයක් පැමිණ එහි ජලය සිඳී යන්නට
සලසනු ඇත.
q238 මන්ද, බබිලානේිය දවේ පිළිමයන්ගනේ පිරී
ගිය දශේයකි;
38 ඒවා ගැන එහි සනෙඟ උමතු වී සිටිති.
39 එළිද 18:2 “එබැවින් වන සතුන් ද සිවලුන් ද
බබිලානේියේ වාසය කරනු ඇත. පැස්බරුන් ද එහි
වාසය කරනු ඇත. මින්පසු කිසි කලකෙ එහි
මනුෂ්‍යයෝ වාසය නාකෙරති. පරම්පරාවන්
ගණනාවක් ඉක්ම ගියත් එහි කිසිවකේ නාවෙන්නෝ
ය. 40 උත් 19:24-25දවේියන් වහන්සේ සාදෙමේ හා
ගාමෙරා ද ඒ අසල නගර ද විනාශ කළ කාලයේ
දී මනේ, කිසි ම මිනිසකේ එහි වාසය නාකෙරන්නේ
ය. කිසිවකේ ජීවත් වන්නේ නැත. මසෙේ
පවසන්නේ ස්වාමීන් වන මම ය.
41 “අන්න, උතුරු දශේයනේ සනෙඟක් එති. බලවත්
ජාතියක් ද බාහෙෝ රජවරු ද පාළොවේ ඉතා දුර
සීමාවලින් නැඟී එති. 42 ඔව්හු දුනු ද හලේල ද
දරන්නෝ ය. ඔව්හු කෲර ය, නපුරු ය; ඔවුන්ගේ
හඬ මුහුදු ඝාෂෝව හා සමාන ය. ඔව්හු අසුන් පිට
නැඟී එති. එම්බා බබිලානේිය! ඔව්හු එකකෙු මනේ
නුඹට විරුද්ධ ව යුද්ධ කරන්නට පළෙගැසී සිටිති.
43 බබිලානේියේ රජු ඔවුන්ගේ කීර්තිය ගැන ඇසූ
විට ඔහුගේ අත් පණ නැති විය. දුක ද ප්‍රසව
වදේනාව විඳින ස්ත්‍රියකට මනේ පීඩනය ද
වදේනාව ද ඔහුට ඇති වී තිබේ.
44 “බලන්න, ජාර්දෙන් වනයේ සිට ගාඩෙුරු බිම්
කරා නික්ම එන සිංහයකෙු මනේ ස්වාමීන් වන මම
ඔවුන්ට විරුද්ධ ව නැඟී එන්නමේ. බබිලානේිවරුන්ට
ඔවුන්ගේ නගරයනේ හදිසියේ ම පලා යන්නට
සලස්වන්නමේ. එවිට මා විසින් තෝරාගනු ලබන
කනෙකෙු රට පාලනය කරන්නට පත් කරන්නමේ.
මන්ද, මට සමාන වන්නේ කවරකේ ද? මට
අභියාගෝ කරන්නේ කවරකේ ද? මට විරුද්ධ ව
නැඟී සිටින්නට පුළුවන් නායකයා කවරකේ ද? 45 ඒ
නිසා කල්දිවරුන්ගේ දශේය වන බබිලානේියට
විරුද්ධ ව මා යාදොගත් උපක්‍රම ද අදහස් කරගත්
අරමුණු ද ගැන සවන් දනේන. සැබැවින් ම එහි
සිටින කුඩා දරුවෝ පවා ඇදගනෙ යනු ලබති.
ඔවුන්ගේ ඉරණම ගැන සියලු දනො ම බියට පත්
වනු ඇත. 46 බබිලානේියේ වැටීමේ ශබ්දයට
පාළොව කම්පා වනු ඇත. ඔවුන්ගේ කෑගැසීමේ
හඬ අවට ජාතීන් අතරේ ඇසනේනේ ය.”

### බබිලානේිය පිළිබඳ තවත් විනිශ්චයයක්

**51** සමිඳාණන් වහන්සේ මසෙේ වදාරන සේක:
q2

51 “බලන්න!
q2
51 මම බබිලෝනියට ද එහි වැසියන් වන
කල්දිවරුන්ට ද විරුද්ධ ව යාමට
විනාශකාරයකු පොළඹවන්නෙමි.
2 මම බබිලෝනියට පොළන්නන් යවන්නෙමි.
q2[2] විපත් දවසේ දී ඔව්හු හැම පදෙසේ ආක්‍රමණය
කර, එහි වැසියන් පොළාදමා දේශය හිස් කරති.
3 තමන්ගේ ඊතල විදින්නට වත්, යුද ඇඳුමෙන්
සැරසී සිටින්නට වත් බබිලෝනියේ හේවායන්ට ඉඩ
නොදෙන්න.
q2[3] ඇගේ තරුණයන්ට අනුකම්පා නොකොට ඇගේ
මුළු සේනාව වනසාලන්න.
4 කඩුවෙන් නැසුණු අය බබිලෝනියාවේ වීදිවල
වැටී සිටින්නෝ ය.
q2[4] තුවාළ වූවෝ ද වීදිවල වැටී සිටින්නෝ ය.
5 සව් බලැති දෙවි සමිඳාණන් වහන්සේ ඉශ්රායලේ
හා ජුදා සෙනඟ අත්හැරදමා නැත.
q2[5] එහෙත්, බබිලෝනි දේශය ඉශ්රායලේහි
සුවිශුද්ධ තැනැන් වහන්සේට විරුද්ධ ව වරදින් පිරී
තිබේ.
q2[5] ඔවුන් අත්හැරදමා ඇත.
6 ඇගේ දඬුවමට නුඹ ගොදුරු නොවී යන්න.
q2[6] ඇයට නියම විපාකය දෙන සමිඳාණන්ගේ
දඬුවම් දීමේ දවස දැන් පැමිණ තිබේ.
7 එළිද 17:2-4; 18:3 බබිලෝනිය වනාහි මාගේ
අතේ තිබුණු, මුළු පොළොව වෙරිමත් කළ රන්
කුසලානක් වැනි ය.
q2[7] ඇගේ මිදියුසින් ජාතීහු බීවෝ ය.
q2[7] එබැවින් ජාතීහු මත් වී සිටිති.
8 බබිලෝනිය හදිසියේ වැටී විනාශ වූවා ය.
q2[8] ඈ ගැන වැලපෙන්න;
q2[8] ඇයට සුව වේ දැ යි බලන පිණිස ඇගේ තුවාළ
ගුගුල් ඖෂධයෙන් ආලේප කරන්න.
9 එළිද 18:5 විදේශීහු කතා කරමින්, ‘අපි
බබිලෝනිය සුව කරන්නට උත්සාහ කළෙමු;
q2[9] එහෙත්, ඈට සුවය ලැබී නැත.
q2[9] අපි ඇය අත්හැර ආපසු අපේ ම රටවලට යමු.
q2[9] මන්ද, බබිලෝනියේ විනාශය අහස උසට,
වලාකුළු දක්වා නැඟුණේ ය’යි කී හ.
10 අප නිවැරැදි බව සමිඳාණෝ එළිදරව් කළ සේක:
q2[10] එන්න, අපි අපේ දෙවි සමිඳුන්ගේ ක්‍රියා
සියොන්හි ප්‍රකාශ කරමු.
11 “සමිඳාණෝ බබිලෝනිය විනාශ කරන්නට
අදහස් කර තිබෙන නිසා, මේදිය රටේ රජවරුන්ගේ
සිත් එයට පෙළඹවූ සේක.
q2[11] මේ වනාහි එතුමන්ගේ මාලිගාවේ විනාශයට
සමිඳුන්ගේ පළිගැනීමකි.
q2[11] පහර දෙන නිලධාරීහු අණ දෙමින්, ‘නුඹලාගේ
ඊතල මුවහත් කරගන්න;
q2[11] පලිස් සූදානම් කරගන්න.
12 බබිලෝනියේ පවුරුවලට පහර දෙන පිණිස ධජ
සංකේතයක් ඔසවා සංඥා කරන්න.
q2[12] මුරපොළ සවි කර, මුරකාරයන් සිටුවා;
q2[12] රහස් රැකවල් සේනා පිහිටුවන්නැ’යි කී හ.
q2[12] සමිඳාණෝ බබිලෝනියේ වැසියන් ගැන වදාළ
දේ එතුමන් යෝජනා කළ ලෙසෙ ම කළ සේක.
13 එළිද 17:1 “එම්බා! බොහෝ ජලයෙන් සාරවත්,
වස්තු සම්භාරයෙන් ධනවත් බබිලෝනි වැසිය, නුඹේ
අවසානය දැන් ළඟා වී තිබේ.
q2[13] නුඹේ පණ කෙන්ද කපනු ඇත.
14 බබිලෝනියට පහර දෙන පිණිස පළඟැටි
සමූහයක් මෙන් විශාල සෙනඟක් ගෙනෙන බවට
සව් බලැති සමිඳුන් සිය නාමයෙන් දිවුරා ඇත.
q2[14] ඔවුන් ඝෝෂා නඟනු ඇත.”

## දෙවියන් වහන්සේට ප්‍රශංසා ගීයක්

15 “සමිඳාණෝ සිය බලයෙන් පොළොව සෑදූ
සේක;
q2[15] සිය ප්‍රඥාවෙන් ලෝකය මැවූ සේක.
q2[15] සිය බුද්ධියෙන් අහස විදහා ලූ සේක.
16 එතුමන්ගේ අණින් අහසේ ජල ඝෝෂාවක් ඇති
වන්නේ ය.
q2[16] එතුමාණෝ පොළොවේ සීමාවලින් වලාකුළු
නැඟී එන්නට සලසන සේක;
q2[16] වර්ෂාව සඳහා විදිලි කෙටීම් ඇති කරන සේක;
q2[16] සිය ගබඩාවලින් සුළඟ හමවන සේක.
17 මේ හේතුව නිසා, සියලු මනුෂ්‍යයෝ කිසි
දැනගැන්මක් නැති අනුවණයන් මෙන් වෙති.
q2[17] සියලු රන්කරුවෝ තමන්ගේ කැපූ රූප ගැන
ලජ්ජාවට පැමිණ සිටිති.
q2[17] මන්ද, ඔවුන් තැනූ රූප සත්‍යයක් පිළිබිඹු
නොකරයි.
q2[17] ඒවා ජීවමාන නොවෙයි.
18 ඒවා නිෂ්ඵල, රවටන සුලු කෘතීහු ය.
q2[18] ඒවාට දඬුවම් කරන කාලය පැමිණි විට ඒවා
විනාශ වී යනු ඇත.
19 ජාකොබ්ගේ දෙවිඳාණෝ ඒවාට සමාන නොවෙන
සේක.
q2[19] එතුමාණෝ වනාහි සියලු දේ මැවූ තැනැන්
වහන්සේ ය.
q2[19] ඉශ්රායලේ වනාහි එතුමන් තෝරාගත්
ගෝත්‍රය ය.
q2[19] එතුමන්ගේ නාමය සව් බලැති සමිඳාණෝ ය.”

## සමිඳුන්ගෙන් වන විනාශය

20 “සමිඳාණෝ මෙසේ වදාරන සේක:
q2[20] ‘එම්බා බබිලෝනිය!
q2[20] නුඹ මාගේ කුළුගඩේය හා යුද්ධ ආයුධය
වන්නෙහි ය.
q2[20] මම නුඹ උපයෝගී කරගෙන ජාතීන් බිඳ
හෙළන්නෙමි;
q2[20] රාජ්‍යයන් විනාශ කරන්නෙමි.
21 අශ්වයාත්, අශ්වාරෝහකයාත් මම විනාශ
කරන්නෙමි.
q2[21] රිය සහ රිය සබෙළුන් විනාශ කරමි.

22 ස්ත්‍රීන් හා පුරුෂයන් ද බාල හා මහලු සියල්ලන්
ද විනාශ කරමි.
q2 22 තරුණ තරුණියන් ද නැති කරදමමි.
23 එඬේරා සහ ඔහුගේ රැළත් පොඩි කරදමමි.
q2 23 ගොවියා සහ ඔහුගේ ගොන් බානත් පොඩි
කරදමමි.
q2 23 ආණ්ඩුකාරයන් සහ ඔවුන්ගේ ප්‍රධානීන් ද
පොඩි කරදමමි.' "

## බබිලෝනියට දඬුවම

24 "සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
'බබිලෝනිය සහ එහි සෙනඟ සියොන්ට විරුද්ධ ව
කළ සියලු අපරාධ නිසා ඔවුන්ට මා ප්‍රතිවිපාක දෙන
බව නුඹලාට පෙනෙනු ඇත. 25 එම්බා බබිලෝනිය!
q2 25 නුඹ මුළු පොළොව විනාශ කරන කන්දක් හා
සමාන ය.
q2 25 එහෙත්, ස්වාමීන් වන මම නුඹේ සතුරා වෙමි.
q2 25 මාගේ බාහුව නුඹට විරුද්ධ ව ඔසවා
පර්වතවලින් නුඹ පෙරළා දමා පිළිස්සී ගිය කන්දක්
මෙන් කරන්නෙමි.
26 ගොඩනැඟිල්ලක කොණකට ගලක් වත්,
අත්තිවාරම්වලට ගලක් වත් නුඹෙන් ගනු
නොලැබේ.
q2 26 නුඹ සදාකාලයට ම පාළුකරයක් වන්නෙහි ය.
q2 26 මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය.
27 "දේශයෙහි ධජ සංකේතයක් ඔසවා, ජාතීන්
අතරෙහි හොරණෑවක් පිඹ බබිලෝනියට පහර දෙන
පිණිස ජාතීන් සූදානම් කරන්න.
q2 27 ආරාරත්, මින්නි, අස්කෙනෙස් යන රාජ්‍යයන්
කැඳවන්න.
q2 27 ප්‍රහාර මෙහෙයවන්නට සේනාධිපතියෙකු පත්
කරන්න.
q2 27 කෙඳි පළඟැටියන් රැසක් මෙන් අශ්ව
සේනාවක් නැඟී එන්නට සලස්වන්න.
28 බබිලෝනියට විරුද්ධ ව සටන් කරන පිණිස
ජාතීන් ද මේදයේ රජවරුන් ද එහි ආණ්ඩුකාරයන් ද
එහි නියෝජ්‍ය ප්‍රධානීන් ද ඔවුන් යටතේ ඇති
සියලු දේශයන් ද සූදානම් කරන්න.
29 පොළොව කම්පා වෙයි;
q2 29 වේදනාවෙන් මෙන් ඇඹරෙයි.
q2 29 මන්ද, බබිලෝනිය වැසියන් විරහිත පාළුකරයක්
කිරීමට සමිඳාණන් ගත් අරමුණ ඉටු වන්නේ ය.
30 බබිලෝනියේ භටයෝ සටනින් පසු බැස
තමන්ගේ බලකොටුවල රැඳී සිටිති.
q2 30 ඔවුන්ගේ බලය හීන වී ඔව්හු ස්ත්‍රීන් මෙන්
දුබල වී සිටිති.
q2 30 බබිලෝනියේ වාසස්ථාන ගිනි ලා තිබේ.
q2 30 නගරයේ දොරටු කඩාදමා තිබේ.
31 නගරය හැම පැත්තෙන් ම අසු වී තිබෙන බව
බබිලෝනියේ රජුට දන්වන පිණිස පණිවුඩකාරයන්
පිට පණිවුඩකාරයන් යවනු ඇත.
32 එහි වරායයන් අල්ලාගනු ඇත;
q2 32 පවුරු ගින්නෙන් දැවී ඇත;
q2 32 භටයෝ බියෙන් වෙවුළති.
33 බබිලෝනිය ගොයම් පාගන කාලයෙහි දී
දකින්නට ලැබෙන කමතක් වැනි ය.
q2 33 තව ස්වල්ප කාලයකින් ගොයම් කපන කාලය
පැමිණෙනු ඇත.
q2 33 ඉශ්‍රායලේවරුන්ගේ සව් බලැති දෙවි
සමිඳාණෝ මෙසේ පවසන සේක.
34 "බබිලෝනියේ රජු වන නබුකද්නෙශර් තමේ
ජෙරුසලම විනාශ කර,
q2 34 පාගා, පොඩි කරදමා එය හිස් භාජනයක් මෙන්
කරනු ඇත.
q2 34 ඔහු රකුසෙකු මෙන් ජෙරුසලම ගිලදමා, එහි
ප්‍රිය වූ දේවලින් තමාගේ කුස පුරවාගෙන ඉතිරි
හරිය ඉවතට විසි කළේ ය.
35 'අපටත් අපේ වංශයටත් කළ සැහැසිකම්
බබිලෝනිය පිට වැටේ වා'යි සියොන්හි සෙනඟ
කියත් වා!
q2 35 ජෙරුසලමෙහි සිඳ හෙළුණු ලයෙ කල්දිවරුන් පිට
වැටේ වා'යි ජෙරුසලම් වැසියෝ කියත් වා."

## ඉශ්‍රායලේට සමිඳුන්ගේ උපකාරය

36 එබැවින් සමිඳාණන් වහන්සේ ජෙරුසලමේ
ජනයාට මෙසේ වදාළ සේක:
q2 36 "මම නුඹලාට යුක්තිය ඉටු කරමි.
q2 36 නුඹලා උදෙසා පළිගන්නෙමි.
q2 36 මම බබිලෝනියේ මුහුද හිඳී යන්නට සලස්වා,
ඇගේ උල්පත් වියළී යන්නට සලස්වන්නෙමි.
37 එවිට බබිලෝනිය කිසි වැසියෙකු නැති,
ජරාවාසයක් වන්නී ය;
q2 37 සිවලුන් වසන ගුහාවලට හැරෙන්නී ය;
q2 37 භීතියට හා සරදමට කරුණක් වන්නී ය.
38 බබිලෝනි ජනයා එක් ව සිංහයන් මෙන් නාද
කරනු ඇත;
q2 38 සිංහ පැටියන් මෙන් ගොරවනු ඇත,
39 ඔවුන් කෑදර වූ විට මම ඔවුන්ට මංගල
භෝජනයක් පිළියෙළ කර දී, වෙරි මත් වන තෙක්
බොන්නට දී ඔවුන් ක්ලාන්ත වූ විට, නොපිබිදෙන
හැටියට ඔවුන් සදා නින්දට පත් කරවන්නෙමි.
40 බැටළු පැටවුන් ද බැටළුවන් සහ එළුවන් ද මෙන්
ඝාතනය පිණිස මම ඔවුන් ගෙනෙන්නෙමි.
q2 40 මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය."

## බබිලෝනියේ ඉරණම

41 සමිඳාණන් වහන්සේ මෙසේ වදාළ සේක:
q2 41 "බබිලෝනිය අල්ලාගනු ලැබූ හැටි!
q2 41 මුළු පොළොවේ කීර්තිය දැරූ නගරය අසු වූ
හැටි!
q2 41 බබිලෝනිය ජාතීන් අතරේ ත්‍රාසයක් වූ හැටි!
42 මුහුද බබිලෝනිය පිට ගලා ආවේ ය.
q2 42 එහි රැළ රාශියෙන් බබිලෝනිය යට වී ගියේ
ය.

43 බබිලෝනියේ නගර බියකරු ඉඩමක් ද වියළි
බිමක් ද මරුකතරක් ද කිසි මිනිසකු වාසය
නොකරන,
q2 43 කිසිවකු එහි ගමන් නොකරන දේශයක් ද වී
තිබේ.
44 මම බබිලෝනියේ දෙවියා වන බේල්ට දඬුවම්
කොට, ඔහු ගිලගත් දේ ඔහුගේ මුඛයෙන් එළියට
අදින්නෙමි.
q2 44 ජාතීහු ඔහුට තවත් නමස්කාර නොකරන්නෝ
ය.
q2 44 එසේ ය, බබිලෝනියේ පවුරු ඇද වැටෙන්නේ
ය.
45 ඉශ්රායලේ ජනයෙනි, බබිලෝනියෙන් පිට වී
ගොස් මාගේ බලවත් උදහසින් එකිනෙකා තම
තමාගේ ප්රාණය ගළවාගන්න.
46 දේශයේ දී නුඹලා අසන ආරංචි නිසා නුඹලාගේ
සිත් අධෛර්යයට හා බියට ඉඩ නොදෙන්න.
q2 46 මන්ද, දේශයෙහි සැහැසිකම ගැන ද රජ
කෙනෙකු රජ කෙනෙකුට විරුද්ධ ව සටන් කිරීම ගැන
ද එක අවුරුද්දක එක ආරංචියක් ද ඊට පසු
අවුරුද්දේ තවත් ආරංචියක් ද පැතිර යන්නේ ය.
47 එබැවින් බබිලෝනියේ තිබෙන කැපූ රූපවලට මා
දඬුවම් කරන දවස් පැමිණෙන්නේ ය.
q2 47 මුළු දේශය ලජ්ජාවට පමුණුවනු ලබන්නේ ය.
q2 47 මරනු ලබන සියල්ලෝ එහි ම වැටී සිටින්නෝ
ය.
48 එළිද 18:20 එවිට ස්වර්ගය ද පොළොව ද එහි
සිටින සියල්ලෝ ද බබිලෝනිය ගැන ප්රීතියෙන් ගී
ගයන්නෝ ය.
q2 48 මන්ද, බබිලෝනිය විනාශ කරන්නට උතුරෙන්
සතුරා පැමිණෙයි.
q2 48 ඈ අසුවන්නී ය.
q2 48 මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය.
49 මරණයට පත් ඉශ්රායලේ සෙනඟ නිසා
බබිලෝනිය විපතට පත් වූවාක් මෙන්, මුළු
පොළොවේ මරණයට පත් වූවන් බබිලෝනිය
හමුවේ වැටෙනවා ඇත."

## බබිලෝනියේ ජුදෙව්වරුන්ට පණිවුඩය note xlabel # body එළිද 18:24

50 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
q2 50 "කඩුවෙන් ගැළවුණු මාගේ සෙනඟෙනි, දැන්
නැවතී නොසිට පලා යන්න.
50 දුර දේශයන්හි නුඹලාගේ සමිඳාණන් සිහිකර
ජෙරුසලම අමතක නොකරන්න.
51 'අපි නින්දා බස් ඇසූ බැවින් ලජ්ජාවට
පැමිණියෙමු.
q2 51 විදේශීන් සමිඳුන්ගේ මාලිගාවේ
ශුද්ධස්ථානයට ඇතුළු වූ බැවින් අපි වියවුලට පත් වී
සිටිමු'යි නුඹලා කියන්නහු ය.
52 එබැවින් මා බබිලෝනියේ දේව රූපවලට දඬුවම්
කරන දවස් පැමිණෙන්නේ ය.
q2 52 'දේශය මුළුල්ලෙහි තුවාළ ලැබූ අය කෙඳිරිගානු
ඇතැ'යි මම කියමි.
53 බබිලෝනිය අහස උසට නැගුණත්, එහි
ශක්තිමත් බලකොටු සාදාගත්තත් මා යවන
විනාශකයන් ඈ කරා පැමිණෙනු ඇත.
q2 53 මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය."

## බබිලෝනිය තවදුරටත් විනාශ කරනු ලැබීම

54 "සවන් දෙන්න.
q2 54 බබිලෝනියෙන් මොරගැසීමේ ශබ්දයක්,
කල්දිවරුන්ගේ ඒ දේශයෙන් මහත් විනාශයේ
ශබ්දයක් ඇසෙයි.
55 සමිඳාණන් වහන්සේ බබිලෝනිය විනාශ කරන
සේක.
q2 55 ඇගේ උස් කටහඬ නිශ්ශබ්ද කරන සේක.
q2 55 නඟින රළපතර මෙන් ඔවුන්ගේ ඝෝෂාව
නැඟෙයි.
56 විනාශකාරයා බබිලෝනිය විනාශ කරන්නට
පැමිණ සිටියි.
q2 56 බබිලෝනියේ භටයන් අසු වී ඇත.
q2 56 ඔවුන්ගේ දුනු කඩා කැබලි කරනු ලැබී ය.
q2 56 සමිඳාණන් වහන්සේ නපුරට විපාකය දෙන
දෙවියන් වහන්සේ ය.
q2 56 උන් වහන්සේ බබිලෝනියට යුතු ලෙස විපාක
දෙන සේක.
57 මම ඇගේ අධිපතීන් ද ඇගේ ප්රඥාවන්තයන් ද
ඇගේ ආණ්ඩුකාරයන් ද ඇගේ සේනාධිපතීන් ද
ඇගේ භටයන් ද මත් කරන්නෙමි.
q2 57 ඔව්හු ද නොපිබිදෙන හැටියට සදාකාල
නින්දකට පැමිණෙන්නෝ ය.
q2 57 මෙසේ පවසන්නේ සව් බලැති සමිඳුන් වන
රජාණන් වහන්සේ ය.
58 බබිලෝනියේ පළල් පවුරු සහමුලින් ම
හළොදමනු ලබන්නේ ය.
q2 58 ඇගේ උස් දොරටු ද ගින්නෙන් දවනු ලබයි.
q2 58 සෙනඟගේ වෙහෙසීම් නිෂ්ඵල ය.
q2 58 ජාතීන්ගේ වීර්යයන් ගින්නෙන් දැවී ගොස්
ඇත."

## ජෙරමියාගේ පණිවුඩය බබිලෝනියට යවනු ලැබීම

59 මයසේයාගේ පුත් වූ නේරියාගේ පුත් වන
සෙරොයා ජුදාහි රජු වූ ශෙදෙකියාගේ රජ දවසේ
සතර වන අවුරුද්දේ දී ඔහු සමඟ බබිලෝනියට යන
විට දිවැසිවර ජෙරමියා සෙරොයාට මේ ආඥාව
දුන්නේ ය. සෙරොයා වනාහි රජුගේ ගබඩා නිලමේ
විය. 60 බබිලෝනියට පැමිණෙන සියලු විපත්ති ගැන
ද බබිලෝනියට විරුද්ධ ව ලියා තිබෙන සියලු දේ
ගැන ද ජෙරමියා පොතක ලිව්වේ ය. 61 ජෙරමියා
සෙරොයාට කතා කරමින්, "ඔබ බබිලෝනියට පැමිණි
විට මේ සියලු වචන සෙනඟට ඇසෙන ලෙස
කියවන්න. 62 මෙසේ යාච්ඤා කරන්න, 'අහෝ
සමිඳුනි, මේ ස්ථානයෙහි මිනිසකු වත්, මෘගයකු
වත් නැති වන ලෙස ඔබ වහන්සේ මේ ස්ථානය

විනාශ කරන සේක. එවිට එය සදහට ම
මරුකතරක් වනු ඇත,' 63 එළිද 18:21තවද, ඔබ මේ
පොත කියවා නිම වූ විට, එයට ගලක් බැඳ,
යුප්රටීස් ගංගාව මැදට එය හළො, 64 'බබිලෝනිය
මෙසේ ම කිඳා බැස මා ඈ පිට පමුණුවන
විපත්තියෙන් ගොඩ නොඑන්නී යැ'යි කියන්න."
64 ජෙරමියාගේ පණිවුඩය මතෙනින් අවසන් වේ.

## ජෙරුසලමේ වැටීම

(2 රාජා 24:18—25:7)

52 ශෙදෙකියා විසිඑක් වයසේ දී රජකමට
පැමිණ එකොළොස් අවුරුද්දක් ජෙරුසලමේ
රජකම් කළේ ය. ඔහුගේ මවගේ නම හමුටල් ය.
ඈ ලිබ්නාහි ජෙරමියාගේ දුව ය. 2 ශෙදෙකියා රජු,
ජෙහෝයාකිම් රජු කළාක් මෙන් සමිඳාණන්
වහන්සේ අබිමුවෙහි නපුරු දේ කළේ ය.
3 ජෙරුසලම හා ජුදාව සමිඳාණන් වහන්සේ
බොහෝ සේ කෝප කළ බැවින් උන් වහන්සේ
ඔවුන් තමන් අබිමුවෙන් පන්නා දැමූ සේක.
ශෙදෙකියා ද බබිලෝනියාවේ රජුට විරුද්ධ ව කැරලි
ගැසුවේ ය. 4 එසකි 24:2ඔහුගේ රාජ්ය කාලයේ
නව වන අවුරුද්දේ දස වන මස දස වන දින
බබිලෝනියේ රජු වූ නබුකද්නෙශර් තමාගේ මුළු
සේනාව සමඟ ජෙරුසලමට විරුද්ධ ව අවුත්, කඳවුරු
බැඳ, එයට වටකරින් බලකොටු ද ගොඩනැඟුවේ ය.
5 එසේ ශෙදෙකියා රජුගේ එකොළොස් වන අවුරුද්ද
දක්වා නගරය වටලන ලදුව තිබිණි. 6 හතර වන
මස නව වන දින දේශයේ සෙනඟට කිසි ආහාරයක්
නැති වන තරමට සාගතය නුවර තුළ බලවත් විය.
7 එසකි 33:21එවිට නගරයේ පවුරු බිඳිනු ලැබී ය.
බබිලෝනිවරුන් නගරය වටලාගෙන සිටිය දී
භේවායෝ සියලු දෙන රාත්රි කාලයේ ගැළවී
යන්නට උත්සාහ කළෝ ය. ඔව්හු රජ උයන ළඟ
පවුරු දෙකෙට අතරේ තිබෙන දොරටුවෙන් පිටත් වී
අරබා සමභූමි මාර්ගයෙන් ජොර්දාන් මිටියාවත
දෙසට පලා ගියෝ ය. 8 එහෙත්, බබිලෝනිවරුන්ගේ
සේනාව ශෙදෙකියා රජු ලුහුබැඳ ගොස් ජෙරිකෝවේ
සමභූමිවල දී ඔහු අල්ලාගත්තේ ය. එවිට ඔහුගේ
මුළු සේනාව ඔහු වෙතින් විසිර ගියෝ ය. 9 එකල
ඔව්හු රජු අල්ලාගෙන හමාත් දේශයේ රිබ්ලාහි සිටි
බබිලෝනියේ රජු වෙත ගෙන ගියෝ ය. ඔහු ද
ශෙදෙකියා රජු පිළිබඳ නඩු තීන්දුව දුන්නේ ය.
10 බබිලෝනියේ රජ ශෙදෙකියාගේ පුත්රයන්
ඔහුගේ ම ඇස් ඉදිරිපිට මැරවේවේ ය. ඔහු ජුදාහි
සියලු අධිපතීන් ද රිබ්ලාහි දී මැරවේවේ ය. 11 එසකි
12:13තවද බබිලෝනියේ රජ ශෙදෙකියාගේ ඇස්
උගුලා, අතට විලංගු ලා, බබිලෝනියට ගෙන ගොස්,
ඔහුගේ මරණය දක්වා ඔහු හිර ගෙයි දමා තැබී ය.

## දේව මාලිගාවේ විනාශය

(2 රාජා 25:8-17)

12 තවද, බබිලෝනියේ රජු වූ නබුකද්නෙශර්
රජුගේ දහනව වන අවුරුද්දේ පස් වන මස දස වන
දින රජුගේ උපදේශකයා වූ ද රැකවලුන්ගේ
අධිපතියා වූ ද නබුසරදාන් ජෙරුසලමට පිවිසියේ
ය. 13 1 රාජා 9:8ඔහු සමිඳාණන් වහන්සේගේ
මාලිගාව ද රජ මාලිගාව ද ජෙරුසලමේ සියලු
ගෙවල් ද ප්රභූවරුන්ගේ මන්දිර ද පුළුස්සාදැමුවේ ය.
14 හමුදාවේ සේනාධිපතියා සමඟ සිටි
බබිලෝනිවරුන්ගේ මුළු සේනාව ජෙරුසලම හාත්පස
තිබුණ පවුරු සියල්ල බිඳදැමුවෝ ය. 15 තවද,
රැකවලුන්ගේ අධිපතියා වූ නබුසරදාන් ඉතා දිළිඳු
සෙනඟගෙන් සමහරකු ද නගරයේ ඉතිරි ව සිටි
සෙනඟ ද සැඟවී ගොස් බබිලෝනියේ රජුගේ
පක්ෂයට බැඳුණු අය ද සෙසු දක්ෂ ශිල්පීන් ද
අල්ලාගෙන ගියේ ය. 16 එහෙත්, මිදි වතු
වවන්නටත්, ගොවිතැන් කරන්නටත් රැකවල්
සේනාධිපතියා වූ නබුසරදාන් දේශයේ දිළිඳුන්
සමහරකු ඉතිරි කර ගියේ ය.
17 1 රාජා 7:15-47 තවද, සමිඳාණන් වහන්සේගේ
මාලිගාවට අයිති ලෝකඩ කුළුණු ද එහි තිබුණු මැසි
ද මහ ලෝකඩ භාජනය ද කඩාදමා, බබිලෝනිවරු
ඒවායේ ලෝකඩ සියල්ල ම බබිලෝනියට ගෙන
ගියෝ ය. 18 ඇරත්, ඇතිළි ද හැඳි ද පහන් කතුරු ද
තලි ද දුම් භාජන ද පූජාව සඳහා පාවිච්චි කළ
ලෝකඩ බඩු සියල්ල ද ඔව්හු ගෙන ගියෝ ය.
19 තලි, ගිනි භාජන, කුසලාන, ඇතිළි, පහන් රුක්,
දුම් භාජන සහ කෙණ්ඩි යන රන් බඩුවල රන් ද රිදී
බඩුවල රිදී ද හමුදාවේ සේනාධිපතියා ගෙන ගියේ
ය. 20 සලමොන් රජ සමිඳාණන් වහන්සේගේ
මාලිගාවට සෑදූ කුළුණු දෙක ද ලෝකඩ තටාකය ද
මැසි ද මැසි යට තිබුණු ලෝකඩ ගව රූප දොළොස
ද යන භාණ්ඩ වල ලෝකඩ කිරන්නට බැරි තරම්
බර ය. 21 ඒ එක් එක් කුළුණේ උස මීටර් අටකි. ඒ
වටේට මීටර් පහයි දශම තුනක පටියක් තිබුණේ
ය. එහි ඝනකම මිලි මීටර් හැත්තෑපහක් ය. එහි
ඇතුළ කුහරයක් විය. 22 එය මත ලෝකඩ
පේකඩයක් විය. එක එක පේකඩය මීටර් දෙකෙයි
දශම දෙකෙක් උස විය. පේකඩය වටේට දළෙම්
ගඩීවලින් සරසන ලද කැටයම් රාමුවක් තිබුණේ ය.
ඒ සියල්ල කරන ලද්දේ ලෝකඩින් ය. දෙ වන
කුළුණත් ඒ අයුරින් ම දළෙම් ගඩීවලින් සරසන ලදී.
23 දළෙම් ගඩී අනූහයක් පැතිවල තිබිණි. කැටයම්
පිට වටේට තිබුණු දළෙම් ගඩී සියයක් විය.

## ජුදාවරුන් බබිලෝනියට ගෙන යෑම

(2 රාජා 25:18-21-27-30)

24 තවද, රැකවල් සේනාවේ අධිපතියා, උත්තම
පූජකයා වූ සෙරායා ද දෙ වන පූජකයා වූ ශෙපෙනියා
ද දොරටු පාලකයන් තුන් දෙනා ද අල්ලාගත්තේ ය.
25 ඉක්බිති ඔහු යුද්ධ සේනාවේ සේනාධිපතියා ද

නගරයෙහි සිටි රාජ සභාවෙහි සභිකයන්
සත්දෙනෙකු ද දේශයෙහි සෙනඟ රැස් කළ
සේනාධිපතියාගේ ලේකම් ද දේශවාසීන්ගෙන්
නගරය තුළ සිටි හැටදෙනෙකු ද අල්ලාගෙන ගියේ
ය. 26 රැකවලුන්ට අධිපතියා වූ නබුසරදාන් මොවුන්
රිබ්ලාහි සිටි බබිලෝනියේ රජු වෙත ගෙන ගියේ
ය. 27 බබිලෝනියේ රජ හමාත් දේශයේ රිබ්ලාහි දී
ඔවුන්ට පහර දී ඔවුන් මැරවේවේ ය. මෙසේ ජුදාවරු
සිය දේශයෙන් වහල්කමට ගෙන යන ලදහ.
28 නබුකද්නෙශර් අල්ලාගෙන ගිය සෙනඟගේ
ගණන මෙසේ ය: හත් වන අවුරුද්දේ දී ජුදවේවරු
තුන්දහස් විසිතුන්දෙනෙකි. 29 නබුකද්නෙශර්ගේ
දහඅට වන අවුරුද්දේ දී, ඔහු ජෙරුසලමේ සිටි
අටසිය තිස්දදෙනෙකු අල්ලාගෙන ගියේ ය.
30 එනබුකද්නෙශර්ගේ විසිතුන් වන අවුරුද්දේ දී
රැකවල් සේනාධිපතියා වූ නබුසරදාන් ජුදවේවරුන්
හත්සිය හතළිස්පස්දෙනෙකු අල්ලාගෙන ගියේ ය. ඒ
සියල්ලෝ ම හාරදහස් හයසියයක් වූ හ.

### ජෙහෝයාකින් රජුගේ අන්තිම කාලය

31 තවද, එවිල්-මෙරොදක් බබිලෝනියේ රජකමට
පත් වූ අවුරුද්දේ දී ඔහු ජුදාහි රජු වූ
ජෙහෝයාකින්ට අනුකම්පා කොට හිරගෙයින් නිදහස්
කළේ ය. මෙය සිදු වූයේ ජුදාහි රජු වූ
ජෙහෝයාකින් ගෙනෙයනු ලැබූ තිස්හත් වන අවුරුද්දේ
දොළොස් වන මාසයේ විසිපස් වන දා ය. 32 එවිල්-
මෙරොදක් රජ ජෙහෝයාකින්ට කරුණාවෙන් කතා
කොට, බබිලෝනියේ ඔහු සමඟ සිටි රජවරුන්ට
වඩා උසස් ස්ථානයක් ඔහුට දුන්නේ ය. 33 එබැවින්
ජෙහෝයාකින්ට ඔහුගේ හිරඇඳුම් මාරුකරගෙන,
ඔහුගේ ජීවිතාන්තය දක්වා, එවිල්-මෙරොදක් රජු
සමඟ නිතර ම මේසයේ එකට කන්නට අවසර
ලැබුණේ ය. 34 ඔහුගේ කෑම කොටස බබිලෝනියේ
රජු වෙතින් නියම ලෙස දවස් පතා ම ජීවිතයේ මුළු
කාලය තුළ ඔහුගේ මරණය දක්වා ඔහුට දෙන
ලද්දේ ය.

io1 පරිච්ඡේද 1:1-22 ජෙරුසලමේ වැටීම.
io1 පරිච්ඡේද 2:1-22 ජෙරුසලමට දඬුවම් කිරීම.
io1 පරිච්ඡේද 3:1-66 දඬුවම හා බලාපොරොත්තුව.
io1 පරිච්ඡේද 4:1-22 ජෙරුසලමේ වැටීමෙන් පසු
තත්ත්වය.
io1 පරිච්ඡේද 5:1-22 දයාව සඳහා අයැදීමක්.

# විලාප ගී

### හැඳින්වීම

ක්රි.පූ. 586 දී ඇති වූ ජරුසලමේ විනාශයත්, විපත්ති හා විප්රවාසගතවීමත් පිළිබඳ විලාප ගී පහකින් මේ පොත සමන්විත ය. මේ පොත දුක් විලාපයක ස්වරූපය ගන්න නමුදු, එහි දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලත්, අනාගත බලාපොරොත්තුවත් පිළිබඳ හැඟීම් දනවන පාඨ ද ඇත. ක්රි.පූ. 586 දී ඇති වූ ජාතික විනාශය සැමරීම හා සම්බන්ධ වාර්ෂික උපවාස හා ශෝකප්රකාශ දිනවල ජුදෙව්වෝ මේ විලාප ගී ඔවුන්ගේ නමස්කාරයේ දී භාවිත කරති.

මෙහි අඩංගු කරුණු:

පරිච්ඡේද 1:1-22 ජරුසලමේ වැටීම.
පරිච්ඡේද 2:1-22 ජරුසලමට දඬුවම් කිරීම.
පරිච්ඡේද 3:1-66 දඬුවම හා බලාපොරොත්තුව.
පරිච්ඡේද 4:1-22 ජරුසලමේ වැටීමෙන් පසු තත්ත්වය.
පරිච්ඡේද 5:1-22 දයාව සඳහා අයැදීමක්.

### ජරුසලම වැටීම

1 සෙනඟගෙන් පිරී තිබුණ නුවර දැන් පාළු වී තිබෙන හැටි!
q2
1 ජාතීන් අතර උතුම් වී සිටි ඈ කණවැන්දුම්යක මෙන් වී දේශාධිපතිනියක් වූ ඇය දාසියක් වී සිටින හැටි!
2 ඈ රාත්රියෙහි අතිශයෙන් වැලපෙයි.
q2 2 කඳුළු ඇගේ දෙකොපොල දිගේ ගලා යයි, ඇගේ පෙම්වතුන් අතර ඇය සනසන්නට කිසිවෙක් නැත.
q2 2 ඇගේ සියලු මිතුරෝ ද්රෝහිකම් කර, ඇගේ සතුරන් වී සිටිති.
3 පීඩාව නිසා ද අධික දාසකම නිසා ද ජුදා විප්රවාසයට ගොස් ඇත.
q2 3 ඈ විජාතීන් අතර දැන් වාසය කරයි.
q2 3 එහි ඈ කිසි සහනයක් නොලබයි.
q2 3 ඈ ලුහුබැඳ ගිය හැම දෙන ඇගේ විපතේ දී ඈ අසු කරගත්හ.
4 මංගල්ය රැස්වීමට එන කෙනෙකු නැති බැවින් සියොන් වැසියෝ වැලපෙන්නාහ.
q2 4 ඇගේ සියලු දොරටු පාළු වී තිබේ.
q2 4 ඇගේ පූජකයෝ සුසුම්ලති.
q2 4 ඇගේ කාන්තාවෝ ශෝකයෙන් පෙළෙති.
q2 4 ඈ බොහෝ සේ දුක් විඳියි.
5 ඇගේ එදිරිකාරයෝ දැන් ඇගේ ස්වාමිවරුන් වී සිටිති.
q2 5 ඇගේ සතුරෝ සෞභාග්යය භුක්ති විඳිති.
q2 5 එසේ වූයේ, ඇගේ අපරාධ රාශිය නිසා සමිඳාණන් ඈට පීඩා කළ බැවිනි.
q2 5 පීඩා කරන්නා විසින් පලවා හරිනු ලැබූ ඇගේ දරුවන් ඈ අත්හැර ගොස් ඇත.
6 සියොන් පුරඟනගේ මුළු මහිමශ්රීය ඇගෙන් පහ ව ගොස් ඇත.
q2 6 ඇගේ අධිපතීහු ගොදුරු නැති මුවන්ට සමාන ය.
q2 6 ලුහුබැඳ එන්නා කෙරෙන් පලා යමින් ඔවුහු බලහීන වී සිටිති.
7 ජරුසලම ඇගේ පීඩා සහ දුක් දවස්වල දී පෙර කල පටන් ඈට තිබුණු ඇගේ සියලු ප්රිය දේ සිහි කරයි.
q2 7 ඈට උපකාර කරන්නෙකු නැති ව, ඇගේ සෙනඟ සතුරාගේ අතට අසු වූ විට,
q2 7 උදව් කරන්න කිසිවෙක් නො වී ය.
q2 7 සතුරෝ ඈ දෙස බලා, ඇගේ වැටීම ගැන ඈට සරදම් කළෝ ය.
8 ජරුසලම බලවත් ලෙස පව් කළ බැවින් ඈ අපිරිසිදු වී සිටින්නී ය.
q2 8 ඈට ගෞරව කළ සියල්ලෝ ම ඇගේ නග්නකම දුටු නිසා ඈ හෙළා දකිති.
q2 8 එසේ ය, ඈ සුසුම් ලා ඇගේ මුහුණ අන් අතකට හරවාගනියි.
9 ඇගේ අපවිත්රකම ඇගේ වස්ත්ර පිට තිබුණේ ය, තමාගේ ඉරණම ගැන ඈ කිසි දා නොසිතුවා ය.
q2 9 ඇගේ වැටීම භයංකර ය.
q2 9 ඈට සැනසිලිකාරයෙක් නැත.
q2 9 සමිඳුනි, මාගේ දුක බැලුව මැනව.
q2 9 මන්ද, සතුරා ජය ගෙන ඇත.

10 ඇගේ එදිරිකාරයා සිය අත පාමින්, ඇගේ සියලු
වස්තුව පැහැරගෙන ඇත.
q2[10] සභාවට පිවිසීමට ඔබ තහනම් කළ විදේශීන්
ශුද්ධස්ථානයට ඇතුළු වී ඇත.
11 ඇගේ මුළු සෙනඟ කෑම සොයමින් සුසුම්ලති.
q2[11] පණ රැකගන්න පිණිස ඔව්හු ආහාර වෙනුවට
තමන්ගේ වටිනා දේ දුන්නෝ ය.
q2[11] සමිඳුනි, මා නීච වී සිටින බව බලා මා සැලකුව
මැනව.
12 අනේ!
q2[12] මේ මඟ යන සියල්ලෙනි, නෙත් යොමා
බලන්න.
q2[12] සමිඳුන්ගේ උදහස ඇවිළී ගිය දවසේ දී
එතුමාණන් මට පහර දීමේ දී මට ඇති වූ දුක තරම්
දුකක් තවත් ඇද් ද?
13 එතුමාණෝ මාගේ ඇටකටු තුළට ඉහළින්
ගින්නක් එවූ සේක.
q2[13] එතුමාණෝ මාගේ පාදවලට දැලක් දැමූ සේක.
q2[13] මා පහතට හෙළූ සේක.
q2[13] මා තනිවන්න සලසා, දවස මුළුල්ලේ
බෙලහීනයෙකු ද කළ සේක.
14 මාගේ අපරාධ වියගහක් මෙන් මා පිට බර ව
තිබේ.
q2[14] එතුමාණෝ ම මාගේ ගෙලෙ පිට එය තැබූ
සේක.
q2[14] ඒ නිසා, මාගේ ශක්තිය හීන විය.
q2[14] විරුද්ධ ව සිටින්න මට බැරි ලෙස සමිඳාණෝ
සතුරන් අතට මා පාවා දුන් සේක.
15 මට සිටි මාගේ සියලු බලවත් සෙබළුන්
සමිඳාණෝ හෙළාදැමූ සේක.
q2[15] මාගේ යෞවනයන් වනසන පිණිස එතුමාණෝ
මට විරුද්ධ ව සේනාවක් කැඳවූ සේක.
q2[15] මිදි යන්ත්‍රයක මිදි පොඩි කරන්නාක් මෙන්
සමිඳාණෝ ජුදා සෙනඟ පොඩි කරදැමූ සේක.
16 මේ දේවල් නිසා මම හඬමි, මාගේ ඇසින්,
එසේ ය, මාගේ ඇසින් කඳුළු ගලා යයි.
q2[16] මන්ද, මා ප්‍රාණවත් කළ හැකි, මා සැනසිය
හැකි කිසිවෙක් ළඟ නැත.
q2[16] සතුරා ජය ගත් බැවින් මාගේ දරුවෝ අසරණ
ව සිටිති.
17 සියොන් ඇගේ දෑත විදහාගෙන සිටියි.
q2[17] ඈ සනසන්නට එහි කිසිවෙක් නැත.
q2[17] ජාකොබ් අවට සිටින්නන් ඔහුගේ සතුරන් වන
ලෙස සමිඳාණෝ ඔවුන් දස’තින් කැඳවූ සේක.
q2[17] ජාතීන් අතර ජෙරුසලම පිළිකුලක් වී ඇත.
18 සමිඳාණෝ දැහැමි ය;
q2[18] එතුමන්ගේ අණසකට එරෙහි ව කැරලි
ගැසුවේ මම ය.
q2[18] අනේ! සියලු ජාතිනි, සවන් දී මාගේ දුක
බලන්න.
q2[18] මාගේ කන්‍යාවන් ද මාගේ තරුණයන් ද
වහල්කමට ගෙන ගොස් ඇත.
19 මාගේ පෙම්වතුන්ට අඬගැසීමි, එහෙත්, ඔව්හු
මා රැවටුවෝ ය.
q2[19] මාගේ පූජකයෝ ද මාගේ නායකයෝ ද
තමන්ගේ ප්‍රාණ රැකගන්න පිණිස තමන්ට කෑම
සොයන අතර නුවර තුළ නැසී ගියෝ ය.
20 සමිඳුනි, බැලුව මැනව.
q2[20] මම විපතට පත් ව සිටිමි.
q2[20] මාගේ සිත කැළඹී තිබේ.
q2[20] මාගේ හදවත දෙදරා ගොස් තිබේ.
q2[20] මම බලවත් ලෙස කැරලි ගැසීමි.
q2[20] පිටත දී මාගේ දරුවෝ කඩුවෙන් නැසී ගියෝ
ය.
q2[20] ඇතුළත ද මරණය ඇත්තේ ය.
21 මා සුසුම්ලන රඟ ඇසුව මැනව.
q2[21] මා සනසන්න කිසිවෙක් නැත.
q2[21] මාගේ සියලු සතුරෝ මාගේ විපත්තිය ගැන
ඇසුවෝ ය.
q2[21] ඔබ එය කළ නිසා ඔව්හු සතුටු වෙති.
q2[21] ඔබ ප්‍රකාශ කළ දවස පැමිණවේවා මැනව.
q2[21] එවිට ඔව්හු ද මා හා සමාන වන්නෝ ය.
22 ඔවුන්ගේ සියලු දුෂ්ටකම් ඔබ ඉදිරියට පැමිණේ
වා!
q2[22] මාගේ සියලු අපරාධ නිසා ඔබ මට කළාක්
මෙන් ඔවුන්ටත් කළ මැනව.
q2[22] මන්ද, මාගේ සුසුම්ලෑම් බොහෝ ය;
q2[22] මාගේ සිත ද ක්ලාන්ත වී තිබේ.
q2[22] මම කලකිරී සිටිමි.

## ජෙරුසලමට දඬුවම් කිරීම

2 සමිඳාණන් සිය උදහසින් සියොන් පුරඟන පිට
අඳුර ගෙනා හැටි!
q2
2 එතුමාණෝ ඉශ්‍රායලේගේ තේජෝමහිමය
ස්වර්ගයෙන් පොළොවට හෙළූ සේක.
q2
2 තමන් උදහස් දවසේ දී සියොන් තමන් පාපුටුව
බව සිහි නොකළ සේක.
2 සමිඳාණෝ කිසි අනුකම්පාවක් නැති ව,
ජාකොබ්ගේ සියලු නිවෙස් විනාශ කළ සේක.
q2[2] එතුමාණෝ සිය කෝපයෙන් ජුදා රටේ
බලකොටු බිඳ හෙළූ සේක.
q2[2] ඒවා බිමට ම දැමූ සේක.
q2[2] එතුමාණෝ රාජ්‍යය පිට ද එහි අධිපතීන් පිට ද
නින්දාව පැමිණවූ සේක.
3 එතුමාණෝ නොනිවෙන උදහසින් ඉශ්‍රායලේගේ
බලය සහමුලින් ම සිඳදැමූ සේක.
q2[3] සතුරන් පැමිණි විට අපට උදව් නුදුන් සේක.
q2[3] වටකරින් නාස්ති කරන ඇවිලෙන ගින්නක් මෙන්
එතුමාණෝ ජාකොබ් දවා ලූ සේක.
4 එතුමාණෝ සතුරකු මෙන් තමන් දුන්න තැත්
කැවූ සේක.
q2[4] එදිරිකාරයකු මෙන් සිය දකුණ’ත ඔසවා, ඇසට
ප්‍රිය වූ සියල්ලන් නැසූ සේක.
q2[4] සියොන් පුරඟනගේ කූඩාරමෙහි ගින්නක් මෙන්
තමන් කෝපය දැල්වූ සේක.

5 සමිඳාණෝ සතුරකු මෙන් වූ සේක.
q2[5] ඉශ්රායලේ නටබුන් ගොඩක් කළ සේක.
q2[5] එතුමාණෝ ඇගේ සියලු මාලිගා නටබුන්
ගොඩක් කොට, ඇගේ බලකොටු විනාශ කළ
සේක.
q2[5] ජුදා පුරඟන කරෙහි ශෝකය දගුණ තගුණ
කළ සේක.
6 එතුමාණෝ තම මණ්ඩපය වත්තක් මෙන් පාළු
කරදැමූ සේක.
q2[6] ස්වකීය රැස්වීම් ස්ථානය විනාශ කළ සේක.
q2[6] සමිඳාණෝ සියොන්හි මංගල්ය සහ සබත් දවස
මතක නැති කරවූ සේක.
q2[6] තම බලවත් කෝපයෙන් රජු සහ පූජකයා ඉවත්
කළ සේක.
7 සමිඳාණෝ තමන් පූජාසනය ප්රතික්ෂේප කළ
සේක.
q2[7] තමන් ශුද්ධස්ථානය අත්හැරදැමූ සේක.
q2[7] ඇගේ මාලිගාවල පවුරු සතුරා අතට පවරා දුන්
සේක.
q2[7] මංගල්ය දවසක දී මෙන් සමිඳාණන්ගේ
මාලිගාවෙහි ඔව්හු ඝෝෂා කළෝ ය.
8 සමිඳාණෝ සියොන් පුරඟනගේ පවුර නාස්ති
කරන්න අදහස් කළ සේක.
q2[8] ලණුවක් ඇද එය මැන්න සේක.
q2[8] එය සහමුලින් ම කඩාදමන තුරු සිය'ත ඉවත්
නොකළ සේක.
q2[8] එතුමාණෝ එහි කොටු තාප්පය සහ පවුර පිට
වැලපීම ඇති කළ සේක.
q2[8] ඒවා එකට ගරා වැටී ඇත.
9 ඇගේ දොරටු පොළොවට කිඳා බැස ඇත.
q2[9] එතුමාණෝ ඇගේ අගුල් නාස්තිකර කඩාදැමූ
සේක.
q2[9] ඇගේ රජ ද අධිපතීහු ද ජාතීන් අතරේ සිටිති.
q2[9] ව්යවස්ථාවක් දැන් නැත.
q2[9] එසේ ය, ඇගේ දිවැසිවරු සමිඳුන්ගෙන්
දර්ශනයක් තවත් නොලබති.
10 සියොන් පුරඟනගේ මහලු අය හිඳගෙන
නිශ්ශබ්ද ව සිටිති.
q2[10] ඔව්හු තමන්ගේ හිස් පිට ධූලි දමාගෙන,
ගෝණි රෙදි ඇඳගෙන සිටිති.
q2[10] ජෙරුසලමේ කන්යාවෝ තමන්ගේ හිස බිමට
නමාගෙන හිඳිති.
11 මාගේ සෙනඟගේ විනාශය නිසා මාගේ ඇස්,
කඳුළු වැගිරීමෙන් වෙහෙසට ද, ළමයින් ද කිරි දරුවන්
ද නුවර වීදිවල ක්ලාන්ත වන බැවින් මාගේ සිත
ශෝකයෙන් ඇලළී ගොස් ඇත.
12 තුවාළ වූවන් මෙන් නුවර වීදිවල ඔවුන් ක්ලාන්ත
වන විට, තමන්ගේ මවුවරුන්ගේ ළයෙහි පණ අදින
විට, 'ධාන්ය සහ මිදියුස කොයි දැ'යි ඔව්හු තම
මවුවරුන්ගෙන් කෑගසා අසති.
13 ජෙරුසලම් පුරඟන, මම ඔබට කුමක් කියම් ද?
q2[13] ඔබ කුමකට සමාන කරම් ද?
q2[13] අනේ සියොන් කන්යා පුරඟන, මම ඔබ
සනසන පිණිස ඔබට කුමක් කරම් ද?
q2[13] ඔබේ විපත මුහුද මෙන් විශාල ය;
q2[13] ඔබට සුවය දෙන්නේ කවරෙක් ද?
14 ඔබේ දිවැසිවරු බොරු නිෂ්ඵල දර්ශන ඔබට
දැක්වූ හ;
q2[14] ඔව්හු ඔබේ වහල්කම පහ කිරීමට ඔබේ
අපරාධ කිසි දා එළිදරව් නොකළහ.
q2[14] ඔබ උදෙසා ඔවුන් දුටු දර්ශන බොරු ය, රැවටිලි
සහිත ය, වංචනික ය.
15 මඟ යන සියල්ලෝ නුවර හෑලො දකිති.
q2[15] ඔව්හු සියුරුහන් බාමින් ජෙරුසලම් පුරඟනට
විරුද්ධ ව හිස් වනමින්, " 'ලෝකයේ අභිමානය ය;
q2[15] මුළු පොළොවේ ප්රීතිය ය'යි කියනු ලැබූ නුවර
මයෙ දැ"යි අසති.
16 ඔබේ සියලු සතුරෝ ඔබට සරදම් කරති.
q2[16] ඔව්හු සියුරුහන් බාමින්, දත්මිටි කති.
q2[16] "අපි ඈ විනාශ කළෙමු;
q2[16] සැබැවින් ම අප බලා සිටි දවස මේ ය;
q2[16] එය දැන් පැමිණ ඇතැ"යි කියති.
17 සමිඳාණෝ තමන් යෝජනා කළ දේ ඉටු කළ
සේක.
q2[17] එතුමාණෝ පුරාණයේ සිට නියම කර තිබුණු
තර්ජන ක්රියාත්මක කළ සේක.
q2[17] එතුමාණෝ අනුකම්පා විරහිත ව ඔබ විනාශ
කළ සේක.
q2[17] සතුරා ඔබට විරුද්ධ ව සන්තෝෂ වන්න
සලස්වා, ඔබේ එදිරිකාරයන්ගේ බලය වැඩි කළ
සේක.
18 අනේ සියොන් පුරඟන, සමිඳුන්ට මොරගසන්න;
q2[18] මහා ප්රවාහයක් සේ රෑ දාවල් දකේහි කඳුළු
ගලා යා වා!
q2[18] ඔබට කිසි සහනයක් නොලැබේ වා!
q2[18] ඔබේ දෙනෙතට විවේකයක් නො වේ වා!
19 රෑ යාම්වල නැඟිට උදේ අලුයම ඝෝෂා කරන්න.
q2[19] ඔබේ සිත සමිඳුන් ඉදිරිපිට ජලය මෙන්
වගුරුවන්න.
q2[19] සියලු වීදි සන්ධිවල දී බඩගින්නෙන් ක්ලාන්ත
වන ඔබේ ළමයින්ගේ ප්රාණ උදෙසා ඔබේ අත්
එතුමාණන් දෙසට ඔසවන්න.
20 සමිඳුනි, ඔබ මෙසේ කළේ කවරකුට දැ යි
බලා කල්පනා කළ මැනව.
q2[20] ස්ත්රීන් තමන් කුසෙහි ඵලය වන, සුව සේ
ප්රසූත කළ අත දරුවන් කෑ යුතු ද?
q2[20] පූජකයා සහ දිවැසිවරයා සමිඳුන්ගේ
ශුද්ධස්ථානයේ මරනු ලැබිය යුතු ද?
21 බාලයා ද මහල්ලා ද වීදිවල බිම වැතිර සිටිති;
q2[21] මාගේ තරුණ තරුණියෝ කඩු පහරින් වැටුණෝ
ය.
q2[21] ඔබේ උදහසේ දවසේ දී ඔබ ඔවුන් නැසූ
සේක;
q2[21] නිර්දය ලෙසෙ ඔවුන් ඝාතනය කළ සේක.
22 මංගල්යයකට සෙනඟ රැස් කරන්නාක් මෙන් මට
විරුද්ධ ව හැම අතින් ම සතුරන් රැස් කළ සේක.
q2[22] සමිඳුන්ගේ උදහසේ දවසේ දී කිසිවකේ ගැළවී
ඉතිරි නො වී ය.

q2[22] මා සුව සේ උපදවා, ඇතිදැඩි කළ සියලු දනෙ
සතුරන් විසින් විනාශ කරනු ලැබූ හ.

## දඬුවම

3 එතුමන්ගේ කෝපය නමැති දණ්ඩනේ දුක
අත්දුටු මිනිසා නම් මම ය.
2 එතුමාණන් මා ගනෙ ගොස් එළියහෙි නොව
අන්ධකාරයහෙි ඇවිදින්නට සැලැසූ සේක.
3 සැබැවින් ම එතුමාණෝ දවස මුළුල්ලේ මට යළි
යළි නිර්දය ලසෙ පහර දුන් සේක.
4 එතුමාණෝ මාගේ මාංසයත්, හමත් ජරාවට
පමුණුවා මාගේ ඇටකටු පොඩි කළ සේක.
5 එතුමාණෝ මට වියගහක් සාදා විඩාවනේ මාගේ
හිස වට කළ සේක.
6 පුරාණයහෙි නැසී ගියවුන් මනේ එතුමාණෝ අඳුරු
තැන්වල විසීමට මට සැලැසූ සේක.
7 බේරී යන්න බැරි වන ලසෙ එතුමාණෝ මා
කොටු කළ සේක.
q2[7] බර විලංගු මට දැමූ සේක.
8 මා කෑගසා පිහිට ඉල්ලන නමුත්, එතුමාණෝ
මාගේ යැදුමට සවන් නොදනෙ සේක.
9 එතුමාණෝ මාගේ මාර්ග කැපූ ගල්වලින් අහුරා
මාගේ මාවත් අවහිර කළ සේක.
10 එතුමාණෝ මා හට, මඟ රැක සිටින වලසකු ද
රහස් තැන්වල සැඟවී සිටින සිංහයකු ද මනේ වන
සේක.
11 එතුමාණෝ මාගේ මාර්ගයනේ මා ඉවත් කොට
මා කෑලිවලට ඉරාදැමූ සේක.
q2[11] මා පිළිකුලක් කළ සේක.
12 එතුමාණෝ තම දුන්න තැත් කවා, ඊගසට
ඉලක්කයක් කොට මා තැබූ සේක.
13 එතුමාණෝ තම කොපුවේ ඊගස් මාගේ
හදවතට විද්ද සේක.
14 මම මාගේ මුළු සනෙඟට හිනාවක් ද දවස
මුළුල්ලේ ඔවුන්ට කවටකමක් ද වී සිටිමි.
15 එතුමාණෝ තිත්ත වේදනාවනේ මා පුරවා මට
කොසඹ පෙවූ සේක.
16 එතුමාණෝ බොරළුවලින් මාගේ දත් බින්ද
සේක;
q2[16] කෑම සඳහා මට අළු දුන් සේක.
17 සාමය මාගනේ තුරන් වී ඇත.
q2[17] සැපත යනු කුමක් දැ යි මට අමතක වී ඇත.
18 දැන් මම මසෙේ කියමි:
q2[18] “මාගේ ශක්තිය පහ වී ගොස් ඇත.
q2[18] සමිඳුන් කරෙහෙි මාගේ බලාපොරොත්තුව
තුරන් වී ඇත.”

## බලාපොරොත්තුව

19 මාගේ ශෝකයත්, මාගේ පීඩාවත් මට සිහි වීම
කොසඹ හා වස දිය වැනි ය.
20 මම ඒ ගැන නිතර ම සිහි කරමි;
q2[20] මාගේ සිත අධෛර්යයට පත් වී ඇත.
21 එහතේ, මේ දේ මා සිහි කළ විට
බලාපොරොත්තුව මට ඇති වන්නේ ය.
22 “සමිඳුන්ගේ තිර පමෙ කිසි කලකෙ පහ
නොවන්නේ ය;
q2[22] එතුමන්ගේ දයාව කළෙවර නොවන්නේ ය.
23 ඒවා උදයනේ උදය අලුත් වී තිබේ;
q2[23] ඔබේ විශ්වාසවන්තකම ඉමහත් ය.”
24 මට ඇත්තේ සමිඳාණෝ පමණකැ යි මාගේ සිත
කියයි.
q2[24] එබැවින් එතුමාණන් කරෙහෙි මම
බලාපොරොත්තු වන්නමේ.
25 සමිඳාණන් ගැන බලා සිටින්නන්ටත්, එතුමාණන්
සොයා යන අයටත් එතුමාණෝ යහපත් ය.
26 සමිඳුන්ගනේ වන ගැළවීම නිශ්චල ව බලා සිටීම
මිනිසාට හොඳ ය.
27 තමාගේ බාල වියහෙි දී ඉවසීම නමැති වියගහ
දැරීම මිනිසාට යහපත් ය.
28 එතුමාණන් එය ඔහු පිට තැබූ නිසා ඔහු තනියම
හිඳ නිශ්ශබ්ද ව සිටී වා!
29 සමහර විට බලාපොරොත්තුවක් තිබිය හැකි
බැවින් අප නැමී අවනත විය යුතු යි.
30 ඔහු තමාට පහර දනෙ අයට කම්මුල පෑවා වේ!
q2[30] නින්දාවනේ පිරුණා වේ!
31 මන්ද, සමිඳාණන් සදහට ම සිය සේවකයන්
ඉවත දමන්නේ නැත.
32 එතුමාණන් ශෝකය පමුණුවන නමුත්, තමන්ගේ
ඉමහත් කරුණාව ලසෙ අනුකම්පා ද කරන සේක.
33 මන්ද, එතුමාණෝ මිනිසුන්ට ඕනෑකමින් පීඩා
නොකරන සේක. ඔවුන් ශෝකයට නොපමුණුවන
සේක.

## පසුතැවී සිත් හරවා ගැනීම

34 දේශයේ සෑම හිරකාරයන් තළා පළො පොඩි
කිරීම ද
35 මහෝත්තමයාණන්ගේ මුහුණ ඉදිරියේ දී
මිනිසුන්ගේ යුක්තිය පරෙළොදැමීම ද
36 මිනිසකුට ඔහුගේ නඩුවේ දී අයුක්තිය කිරීම ද
සමිඳාණෝ අනුමත නොකරන සේක.
37 සමිඳාණෝ කැමැති නොවන සේක් නම්,
කිසිවකුට කිසිවක් නොකළ හැකි ය.
38 සැපතත් විපතත් ඇති වන්නේ,
මහෝත්තමයාණන්ගේ නියමයනේ නොවේ ද?
39 අපේ පව් ගැන දඬුවම ලබන නිසා අප
කොඳුරන්නේ කුමට ද?
40 අපේ මාර්ග සෝදිසි කර විමසා සමිඳාණන් වතෙ
නැවත හැරමේු.
41 ස්වර්ගයහෙි සිටින දවේිඳාණන් වතෙ අපේ අතත්
සිතත් ඔසවමු.
42 “අපි වනාහි වරද කොට කැරලි ගැසීමු;
q2[42] ඔබ කමා නොකළ සේක.
43 ඔබ වහන්සේ උදහසින් සැඟවී සිට අප පසුපස
ලුහුබැඳ ආ සේක.
q2[43] අනුකම්පා නොකොට අප මරාදැමූ සේක.

44 අපගේ යැදුම ඔබ වෙත නොපැමිණෙන ලෙස ඔබ
වලාකුළකින් ඔබ ම වසාගෙන සිටින සේක.
45 ඔබ විජාතීන් අතරෙහි අප කසළ ගොඩක් මෙන්
කළ සේක.
46 අපගේ සියලු සතුරෝ අපට විරුද්ධ ව බොහෝ
සේ දොස් කී හ.
47 භීතිය සහ පාතාලයත්, නාස්තිය සහ විනාශයත්
අපට පැමිණ තිබේ.
48 මාගේ සෙනඟගේ විනාශය නිසා මාගේ
ඇස්වලින් කඳුළු ගංගා ගලා යයි.
49 සමිඳාණන් ස්වර්ගයේ සිට බලා සලකන තුරු,
50 මාගේ ඇස්වලින් නොනැවතී කඳුළු වැගිරෙයි.
51 නගරයේ කාන්තාවන්ට සිදු වී ඇති දේ මා දකින
විට මාගේ සිත කම්පා වෙයි.
52 නිකරුණේ මට සතුරු ව සිටින අය කුරුල්ලකු
මෙන් මා උගුලට අසු කරගත්හ.
53 ඔව්හු පණපිටින් මා වළට හෙළාදමා මා පිට ගල්
ද පැටවූ හ.
54 වතුර මාගේ හිසට උඩින් ගලා ගියේ ය;
q254 "මාගේ අවසානය පැමිණ ඇතැ"යි මම කීමි.
55 සමිඳුනි, මම ගැඹුරු පාතාලයේ සිට ඔබේ නාමය
කියා යැදිමි.
56 මාගේ මොරගැසීමට සවන් දෙන ලෙස මා
බැගෑපත් ව ඉල්ලා සිටි විට ඔබ මට සවන් දුන්
සේක.
57 මා ඔබට යාච්ඤා කළ විට, ඔබ මට ළං වී, "බිය
නොවන්නැ"යි මට වදාළ සේක.
58 සමිඳුනි, ඔබ මා වෙනුවෙන් කරුණු වදාළ සේක.
මාගේ ප්‍රාණය මිදූ සේක.
59 සමිඳුනි, ඔබ මාගේ පීඩාව දුටු සේක; මට
යුක්තිය ඉටු කර දුන මැනව.
60 ඔවුන්ගේ සියලු ම පළිගැනීම් සහ මට විරුද්ධ ව
තිබෙන ඔවුන්ගේ සියලු උපා ඔබ දුටු සේක.
61 සමිඳුනි, ඔවුන්ගේ නින්දා කිරීම සහ මට විරුද්ධ
ව තිබෙන ඔවුන්ගේ සියලු උපා ඔබ ඇසූ සේක.
62 මට විරුද්ධ ව නඟන වචන ද දවස මුළුල්ලේ
මට විරුද්ධ ව යොදන ඔවුන්ගේ උපායයන් ද ඔබ
ඇසූ සේක.
63 ඔවුන් වාඩි වී සිටියත්, සිටගෙන සිටියත්
ඔවුන්ගේ උපහාසයට මම ලක් වී සිටිමි.
64 සමිඳුනි, ඔවුන්ගේ ක්‍රියා අනුව ඔබ ඔවුන්ට
විපාක දුන මැනව.
65 සිත් දැඩිකම වන සාපය ඔබ ඔවුන්ට දුන මැනව.
66 ඔබ, උදහසින් ඔවුන් ලුහුබැඳ ගොස්, මිහි පිටින්
ඔවුන් අතුගාදැමුව මැනව."

## ජෙරුසලමේ වැටීමෙන් පසු තත්ත්වය

4 පරණ රත්රන් අඳුරු වී තිබෙන හැටි!
q2
4 පශ්‍රේ රත්රන් වෙනස් වී තිබෙන හැටි!
q2
4 ශුද්ධස්ථානයේ ගල් සියලු මංසන්ධිවල විසුරුවා
තිබේ.
2 අගනා රන් මෙන් වටිනා සියොන්හි තරුණයන්
කුම්භකාරයාගේ අත්වලින් සාදන ලද භාජන මෙන්
සලකනු ලබන හැටි!
3 සිවල් දෙනෙන්නු පවා උන්ගේ පැටවුන්ට කිරි
පොවති.
q23 එහෙත්, මාගේ සෙනඟගේ දූවරු කාන්තාරයේ
පැස්බරුන් මෙන් කෲර වී සිටිති.
4 කිරි දරුවාගේ දිව පිපාසය නිසා තල්ලේ ඇලෙයි.
q24 කුඩා දරුවෝ කෑම ඉල්ලති, කිසිවෙක් ඔවුන්ට
කෑම නොදෙති.
5 රස කෑම කෑ අය අසරණ ව වීදිවල හිඳිති.
q25 රතු ඇතිරිලි පිට ඇතිදැඩි වූ අය කසළ
ගොඩවල් වැළඳගෙන හිඳිති.
6 උත් 19:24 කිසිවකුගෙන් පහර නොලබා
ඇසිල්ලකින් මෙන් විනාශ වූ සොදොම් නගරයේ
පාපයට වඩා මාගේ සෙනඟගේ අයුතුකම් මහත් ය.
7 ඇගේ වංශාධිපතීහු හිමවලට වඩා පිරිසිදු ව,
කිරිවලට වඩා සුදු ව සිටියෝ ය.
q27 රතු කැටවලට වඩා ඔවුන්ගේ සිරුර රතු ව
තිබුණේ ය.
q27 ඔවුන්ගේ ඔපය නීලමාණික්‍ය මෙන් විය.
8 දැන් ඔවුන්ගේ පෙනීම අඟුරුවලට වඩා කළු ය.
q28 ඔවුන් වීදිවල දී ඇඳිනගන්න වත් බැරි ය.
q28 ඔවුන්ගේ හම ලී මෙන් වියළී ඔවුන්ගේ
ඇටවලට ඇලී ඇත.
9 සාගින්නෙන් මැරුම්කන්නන්ට වඩා කඩුවෙන්
මැරුම්කන්නන්ට පහසුව ඇත්තේ ය.
q29 මන්ද, මොවුහු කෙතේ අස්වැන්න නැති බැවින්
ක්‍රමෙන් පීඩිත වී, ක්ෂය වී යති.
10 ද්වි.නී. 28:57; එසකි 5:10 දයාවන්ත ස්ත්‍රීහු
තමන්ගේ අත්වලින් සිය දරුවන් තම්බා පිසුවෝ ය.
q210 මාගේ සෙනඟ පිට පැමිණි විනාශයේ දී ඒ
දරුවෝ ඔවුන්ට ආහාර වූ හ.
11 සමිඳාණෝ තම කෝපය නොවළක්වා තමන්ගේ
බලවත් උදහස වැගිරවූ සේක.
q211 සියොන්හි ගින්නක් ඇවිළූ සේක.
q211 එයින් එහි අත්තිවාරම් දැවී ගියේ ය.
12 'එදිරිකාරයා සහ සතුරා ජෙරුසලමේ දොරටුවලට
ඇතුළු වන්නේ ය'යි පොළොවේ රජවරු ද ලෝකයේ
සියලු වැසියෝ ද විශ්වාස නොකළෝ ය.
13 මෙසේ වනුයේ, දමිටු ලේ නගරය තුළ වැගිරවූ
දිවැසිවරුන්ගේ පව් නිසාත්, පූජකයන්ගේ අපරාධ
නිසාත් ය.
14 ඔව්හු අන්ධයන් මෙන් වීදිවල ඔබමොබ යති.
q214 මනුෂ්‍යයන්ට ඔවුන්ගේ වස්ත්‍රවල
තැවරෙන්නට බැරි තරමට ඔව්හු ලෙයින් කිළුටු වී
සිටිති.
15 "ඉවත් වන්න, අපවිත්‍ර ය.
q215 ඉවත් වන්න, ඉවත් වන්න, අපට අත නො
ගසන්නැ"යි ඔව්හු ඔවුන්ට මොරගසා කී හ.
q215 ඔවුන් පලා ගොස් ඔබමොබ ගිය විට, "ඔව්හු
තවත් මෙහි නොසිටිතී"යි විජාතීන් අතරේ කියන
ලද්දේ ය.
16 සමිඳාණෝ ම ඔවුන් විසුරුවා හැරිය සේක.

q2 16 එතුමාණෝ තවත් ඔවුන් නොසලකන සේක.
q2 16 සෙනඟ පූජකයන්ට ගරු නොකළ හ.
q2 16 වැඩිහිටියන්ට කරුණාව නොදැක්වූ හ.
17 නොලැබෙන උපකාර ගැන බලා සිටීමෙන් අපේ
ඇස් තවත් අඳුරු වී යන්නේ ය.
q2 17 ගළවන්න බැරි ජාතියක් ගැන මුර කුළුණු උඩ
අපි බලා සිටියෙමු.
18 අපේ වීදිවල අපට යන්න බැරි වන ලෙස අපේ
සතුරෝ අපේ යාම් ඊම් සෝදිසියෙන් බලා සිටියහ.
q2 18 අපේ අන්තිමය ආසන්න ය;
q2 18 අපේ ඉරණම තීන්දු ය;
q2 18 මන්ද, අපේ අන්තිමය පැමිණ ඇත.
19 අප පසුපස ලුහුබැඳ ආ තැනැත්තෝ අහසේ
රාජාලීන්ට වඩා වේගවත් වූ හ.
q2 19 ඔව්හු කඳුවල අප ලුහුබැඳ ආවෝ ය.
q2 19 අප අල්ලන්න පාළුකරයේ රැක සිටියෝ ය.
20 “ඔහුගේ ආරක්ෂා සෙවණෙහි ජාතීන් අතර අපට
ජීවත් වන්න ලැබේ ය”යි අප කීවා වූ අපේ නාසයේ
හුස්ම වැනි වූ සමිඳාණන්ගේ අභිෂේක ලත්
තැනැත්තේ ඔවුන්ගේ බොරු වළේ අසුවුණේ ය.
21 ඌශ් දේශයෙහි වාසය කරන ඒදොම් ජාතිය,
ප්‍රීති සන්තෝෂ වන්න. විනාශය ඔබ වෙතත්
පැමිණෙන්නේ ය.
q2 21 ඔබ මත් වී නිරුවතින් සිටින්නෙහි ය.
22 එම්බා සියොන් පුරඟන, ඔබේ අයුතුකමේ
දඬුවම ඉටු විය.
q2 22 එතුමාණෝ තවත් ඔබ විප්‍රවාසයට ගෙන
නොයන සේක.
q2 22 එම්බා ඒදොම් පුරඟන, එතුමාණෝ ඔබේ
අයුතුකමට දඬුවම් කරන සේක.
q2 22 ඔබේ පව් එළිදරව් කරන සේක.

## දයාව සඳහා යැදීමක්

5 සමිඳුනි, අපට සිදු වී තිබෙන දේ සිහි කළ
මැනව.
q2
5 අපේ නින්දාව බලා සැලකුව මැනව.
2 අපේ උරුමය අන්‍යයන්ටත්, අපේ ගෙවල්
විදේශීන්ටත් අයිති වී තිබේ.
3 අපි අනාථයෝ ය, පියා නැති දරුවෝ ය.
q2 3 අපේ මවුවරු වැන්දඹුවන් මෙන් ය.
4 අප අපේ ම වතුර මිල දී ගත යුතු ය.
q2 4 අපේ ම දර අපට විකුණනු ලැබේ.
5 වියගහ අපේ කර පිට ය.
q2 5 මැරෙන තෙක් අපි වෙහෙසෙන්නෙමු.
q2 5 එහෙත්, අපට සහනයක් නැත.
6 සෑහෙන පමණ කෑම ලබන පිණිස, මිසරයටත්,
අසිරියාවටත් අපි සිඟමින් ගියෙමු.
7 අපේ පියවරු පව් කළෝ ය;
q2 7 ඔව්හු දැන් නැත.
q2 7 ඔවුන්ගේ අයුතුකම් නිසා අපි දුක් විඳිමු.
8 වහල්ලු අප ආණ්ඩු කරති.
q2 8 ඔවුන් අතින් අප ගළවාගන්නට කෙනෙක් නැත.
9 පාළුකරයේ මිනීමරුවන් සැරිසරන බැවින් කෑම
සෙවීමේ දී අපි අන්තරාවට මුණ පාමු.
10 සාගින්නේ තද උෂ්ණය නිසා අපේ හම උදුනක්
මෙන් රත් වී තිබේ.
11 සියොන්හි ස්ත්‍රීහුත්, ජුදාහි නගරවල
කන්‍යාවෝත් බලහත්කාරකම් කරනු ලැබූ හ.
12 අධිපතීහු තමන්ගේ අත්වලින් එල්ලනු ලැබූ හ.
q2 12 වැඩිහිටි අය ගරු නොකරන ලදහ.
13 වහලුන් මෙන් ධාන්‍ය ඇඹරීමට අපේ තරුණයෝ
බල කරනු ලැබූ හ.
q2 13 ළමයි දරමිටිවල බරින් යට වී වැටී වැටී යති.
14 මහලු අය දොරටුවෙන් පහ ව ගියෝ ය.
q2 14 යෞවනයෝ ගීතිකා කිරීමෙන් වැළකුණෝ ය.
15 අපේ සිත්වලින් ප්‍රීතිය තුරන් විය.
q2 15 අපේ නැටීම වැලපීමට පෙරළුණේ ය.
16 අපේ හිසින් මල්දම් වැටුණේ ය.
q2 16 අප පව් කළ බැවින් අනේ! අපට වන දුකක
මහත!
17 මේ නිසා අපේ සිත ක්ලාන්ත වී තිබේ.
q2 17 මේ දේවල් නිසා අපේ ඇස් අඳුරු වී තිබේ.
18 එසේ වන්නේ, සියොන් කන්ද පාළු වී තිබෙන
බැවිනි.
q2 18 සිවලුන් සැරිසරන බැවිනි.
19 එහෙත් සමිඳුනි, ඔබ සදහට ම රජ ව සිටින
සේක.
q2 19 ඔබේ සිහසුන පරපුරෙන් පරපුරට පවත්නේ ය.
20 මෙතෙක් කල් ඔබ අප අත් හළේ මන් ද?
q2 20 කවර දා නමුත්, ඔබ අප යළි සිහි කරන සේක්
ද?
21 සමිඳුනි, අප ඔබ වෙත හරවාගත මැනව.
q2 21 අපේ පෙර වූ තේජස අපට යළි දුන මැනව.
22 ඔබ අප සහමුලින් පහ කරදැමූ සේක් ද?
q2 22 ඔබේ කෝපයට සීමාවක් නැද් ද?
io1 පරිච්ඡේද 1-3 එසකියලේගේ කැඳවීම
io1 පරිච්ඡේද 4-24 ජෙරුසලමේ විනාශය ගැන
පණිවුඩ
io1 පරිච්ඡේද 25-32 ජාතීන් කෙරෙහි දේව විනිශ්චය
io1 පරිච්ඡේද 33-37 සිය සෙනඟට දෙවියන්
වහන්සේගේ පොරොන්දුව
io1 පරිච්ඡේද 38-39 ගොග්ට විරුද්ධ දිවැස් වැකි
io1 පරිච්ඡේද 40-48 අනාගත දේව මාලිගාව හා
දේශය පිළිබඳ දර්ශනයක්

# එසකියලේගේ

### හැඳින්වීම

ක්රි.පූ. 586 දී ජරුසලමේ වැටීමට පෙරත් ඊට පසුත් අතර කාලයේ දී, දිවැසිවර එසකියලේ බබිලෝනියේ විප්රවාසගත ව විසී ය. ඔහු දෙවියන් වහන්සේගේ විශේෂ සංකේතාත්මක දර්ශනයක් තුළින් කැඳවනු ලැබ, දිවැසිවර සේවයට කැප වූවෙකි. ඔහුගේ පණිවුඩය විශේෂයෙන් යොමු කරන ලද්දේ බබිලෝනියේ විප්රවාසගත ව සිටි සෙනඟටත්, ජරුසලමේ වැසියන්ටත් ය.
එසකියලේ ගැඹුරු ඇදහිල්ලක් හා උදාර චින්තන ශක්තියක් තිබුණු දිවැසිවරයෙකි. පුළුල් දැනුමක් හා තීක්ෂණ බුද්ධියකින් යුත් වූ හෙතෙමෙ විවාදයට භාජනය වූ ප්රධාන ප්රශ්න වහා වටහාගෙන, රූපක හා සංකේත මඟින් ඒවාට විසඳුම් සෙවීමේ දක්ෂතාවක් තිබුණු කෙනෙකු බව පැහැදිලි ය. ඔහුගේ පණිවුඩ බොහොමයක් විචිත්ර සංකේතාත්මක ක්රියා මඟින් දෙන ලද්දේ ය. ආධ්යාත්මික පාරිශුද්ධියේ අවශ්යතාවත් තමාගේ පව් පිළිබඳ පෞද්ගලික වගකීමත් ඔහු අවධාරණයෙන් කියා සිටියේ ය. ජාතියේ පුනර්ජීවනය පිළිබඳ තමාගේ බලාපොරොත්තුව ප්රකාශ කළ ඔහු පූජකයෙකු හා දිවැසිවරයෙකු වශයෙන් දේව මාලිගාව හා ශුද්ධවන්තකමේ අවශ්යතාව ගැන විශේෂ සැලකිල්ලක් දැක්වූයේ ය.
මෙහි අඩංගු කරුණු:

පරිච්ඡේද 1-3 එසකියලේගේ කැඳවීම
පරිච්ඡේද 4-24 ජරුසලමේ විනාශය ගැන පණිවුඩ
පරිච්ඡේද 25-32 ජාතීන් කෙරෙහි දේව විනිශ්චය
පරිච්ඡේද 33-37 සිය සෙනඟට දෙවියන් වහන්සේගේ පොරොන්දුව
පරිච්ඡේද 38-39 ගොග්ට විරුද්ධ දිවැස් වැකි
පරිච්ඡේද 40-48 අනාගත දේව මාලිගාව හා දේශය පිළිබඳ දර්ශනයක්

### දේව දර්ශනය

1 එළිද 19:11 තිස් වන අවුරුද්දේ සතර වන
මාසයේ පස් වන දින කෙබාර් ගං තෙරේ
විප්රවාසයට ගෙනෙයනු ලැබූ අය අතරේ එසකියලේ
නම් මා සිටින කල්හි අහස විවෘත වී දේව දර්ශන
මට පෙනුණේ ය. 2 2 රාජා 24:10-16; 2 වංශා
36:9-10ජෙහෝයාකින් රජු විප්රවාසයට ගෙනෙයනු
ලැබූ පසු, පස් වන අවුරුද්දේ මාසයේ පස් වන දින
3 බබිලෝනියේ කෙබාර් ගං තෙරේ බූසීගේ පුත්
එසකියලේ නම් පූජකයා වෙත සමිඳාණන්
වහන්සේගේ පණිවුඩය පැමිණියේ ය. සමිඳාණන්
වහන්සේගේ ආනුභාවය ද එහි දී ඔහු පිට විය.
4 මා බැලූ විට චණ්ඩ මාරුතයක් උතුරෙන් එනු මම
දිටිමි. ඒ සමඟ දීප්තියෙන් වට වූ මහා වලාපටලයක්
ද දිළිහෙන ලෝකඩ මෙන් ගින්න මැදින් බැබළීමක් ද
ගිනි දලු විහිදෙන ගින්නක් ද වූයේ ය. 5 එළිද
4:6සතුන්ගේ පෙනුම ඇති සතරදෙනෙකේ ඒ මැද
සිටියහ. 6 ඔවුන්ගේ පෙනුම මෙසේ ය: ඔවුන්ට
මනුෂ්ය ස්වරූප තිබුණේ ය. ඔවුන් එකිනෙකාට
මුහුණු සතරක් ද පියාපත් සතරක් ද තිබිණි. ඔවුන්ට
ඇද නැති පාද තිබිණි. 7 ඔවුන්ගේ පාදවල පතුල්
වස්සෙකුගේ පාද පතුල් වැනි ය; ඒවා දීප්තිමත්
ලෝකඩ මෙන් දිළිසුණේ ය. 8 ඔවුන්ගේ පියාපත්
යට සතර පැත්තේ ඔවුන්ට මනුෂ්ය අත් තිබිණි. ඒ
සතරදෙනාගේ මුහුණු හා පියාපත් මෙයාකාර ය:
9 ඔවුන්ගේ පියාපත් එකට එක් වී තිබුණේ ය.
ගමන් කරන විට ඔව්හු නොහැරී කෙළින් ඉදිරියට
ගියහ.
10 එසකි 10:14; එළිද 4:7 ඔවුන්ගේ මුහුණුවල
පෙනීම මෙසේ ය: ඔවුන් සතරදෙනාට ඉදිරියෙන්
මිනිස් මුහුණක් ද දකුණු පැත්තෙන් සිංහ මුහුණක් ද
වම් පැත්තෙන් ගව මුහුණක් ද රාජාලියෙකුගේ
මුහුණක් ද තිබිණි. 11 එළිද 4:5ඔවුන්ගේ පියාපත්
ඉහළට විහිදී තිබිණි. එකිනෙකාගේ පියාපත් දෙකෙක්
තවත් එකෙකුගේ පියාපත් සමඟ එක් වී තිබිණි.
දෙකෙකින් ඔවුන්ගේ ශරීර වැසී තිබිණි. 12 ඔව්හු එක
එකා කෙළින් ඉදිරියට ගියෝ ය. ආත්මානුභාවය
පෙන්වූ මඟ ඔස්සේ ඒ මේ අත නොහැරී ඔව්හු
ගමන් කළහ.
13 ඒ ජීවමාන සත්ත්වයන් මධ්යයෙහි ඇවිලෙන
ගිනි අඟුරු වැනි වූ නැතහොත් ඔබමොබ යන
පන්දම් වැනි වූ පෙනුමක් ඇති යම් කිසිවක් විය. ඒ
ගින්න දීප්තිමත් ය; එයින් විදුලිය නික්මිණි.

14 විදුලිය දහරක් සේ ඒ ජීවමාන සත්ත්වයෝ
ඔබමොබ දිව්වෝ ය.
15 එසකි 10:9-13 මා ජීවමාන සත්ත්වයන් දසෙ
බලා සිටිය දී පොළොව මත ඒ සත්ත්වයන්
සතරදනො ළඟ එකකෙුට එක බැගින් රන් චක්‍ර
තිබනෙු මම දිටිමි. 16 ඒ චක්‍ර රන් කාන්ති මනේ
බැබළුණේ ය. ඒ සතර ම එක හා සමාන ය.
හැඩයනේ ද ක්‍රියාකාරිත්වයනේ ද එක චක්‍රයක්
තවත් චක්‍රයක් තුළ ඇතුවාක් මනේ පනෙුණේ ය.
17 ඒවා ගමන් ගත්විට කිනම් අතකට වත් නොහැරී
ඒවායේ පැති සතරනේ එක දිශාවකට ගමන්
ගත්තේ ය. 18 එළිද 4:8චක්‍රවල වළලු තිබිණි. ඒ
වළලු සතර පුරා ඇස් තිබුණේ ය. 19 ඒ සත්ත්වයන්
ගමන් ගත් විට චක්‍රත් ඔවුන් කැටුව ගියේ ය. ඒ
ජීවමාන සත්ත්වයන් පොළොවනේ නැඟුණු විට
චක්‍රත් නැඟුණේ ය. 20 ආත්මානුභාවය පනේවූ මඟ
ඔස්සේ ඒ සත්ත්වයෝ ගමන් කළහ. ඔවුන් කළ දේ
ම චක්‍රයෝ ද කළහ. මන්ද, සත්ත්වයන්ගේ සිත
චක්‍රවලත් තිබුණේ ය. 21 ඔවුන් යන විට ඒවාත්
ගියේ ය. ඔවුන් නැවතුණ විට ඒවාත් නැවතුණේ ය.
ඔවුන් පොළොවනේ නැඟිටි විට ඔවුන් කැටුව
චක්‍රත් නැඟිට්ටේ ය. මන්ද, ජීවමාන
සත්ත්වයන්ගේ සිත චක්‍රවල තිබුණේ ය.
22 එළිද 4:6 තවද, සත්ත්වයන්ගේ හිසට උඩින්
පළිඟු මනේ බබළන ආකාශයක් තිබුණේ ය. එය
ඔවුන්ගේ හිස්වලට ඉහළින් විහිදී තිබුණේ ය.
23 ආකාශයට යටින් ඔවුන්ගේ පියාපත් එකට එක
කළෙින් ව විහිදී තිබුණේ ය. සිය සිරුර ආවරණය
කරන පියාපත් දකෙක් එක එක සත්ත්වයාට
තිබුණේ ය. 24 එළිද 1:4-15; 19:6ඔවුන් යන විට,
ඔවුන්ගේ පියාපත්වල ශබ්දය බොහෝ ජල
ධාරාවන්ගේ ශබ්දය මනේ ද සර්ව
පරාක්‍රමයාණන්ගේ හඬ මනේ ද මට ඇසිණි. එයින්
නැඟුණු ඝෝෂාව යුද කඳවුරක ඝෝෂාව මනේ විය.
ඔවුන් නැවතී සිටි විට, ඔව්හු සිය පියාපත් පහත්
කරගත්තෝ ය. 25 ඔවුන්ගේ හිස්වලට උඩින් තිබුණු
අහස් ගැබට ඉහළින් හඬක් පැමිණියේ ය. ඔවුන්
නැවතී සිටි විට, ඔව්හු සිය පියාපත් පහත්
කරගත්තෝ ය.
26 එසකි 10:1; එළිද 4:2-3 ඔවුන්ගේ හිස්වලට
උඩින් තිබුණ ආකාශයට ඉහළින් නීලමාණික්‍යයක
පනේම ඇති සිංහාසනයක ස්වරූපයක් තිබුණේ ය.
සිංහාසනය මත මිනිස් පනේමක් වැනි ස්වරූපයක්
තිබිණි. 27 එසකි 8:2ඒ ස්වරූපයේ ඉඟටියේ සිට
ඉහළට ගිනි උදුනක බැබළනෙ ලෝකඩ වැනි
පනෙුමක් මම දිටිමි; ඉඟටියේ සිට පහළට
හාත්පසින් දීප්තියක් ඇති ගින්නක පනෙුමක් දිටිමි.
28 හාත්පසින් තිබුණු දීප්තියේ පනේම වර්ෂා දවසක
වලාකුළේ තිබනෙ දේදුන්නක පනේම මනේ විය.
මේ වනාහි සමිඳාණන් වහන්සේගේ තේජාන්විත
ස්වරූපයේ පනේම ය. එය දුටු කල මම මුණින්තළා
වී වැටුණමේ. එවිට කතා කරන කනෙකුගේ හඬ
මට ඇසිණි.

### එසකියලේ කැඳවනු ලැබීම

2 උන් වහන්සේ මට කතා කරොට, “මනුෂ්‍ය
පුත්‍රය, නැඟිට සිටින්න; මම නුඹ සමඟ කතා
කරන්නමේ”යි වදාළ සේක. 2 උන් වහන්සේ මට
කතා කළ විට, දේවාත්මානුභාවය මා තුළට ඇතුල්
වී මා නැඟිටුවා සිටවේවේ ය. මට කතා කළ තැනැන්
වහන්සේගේ හඬ මට ඇසුණේ ය. 3 උන් වහන්සේ
මසෙේ වදාළ සේක: “මනුෂ්‍ය පුත්‍රය, මට විරුද්ධ ව
කැරලි ගැසූ, කැරලිකාර ජාතියක් වන
ඉශ්රායලේවරුන් වතෙ මම නුඹ යවමි. ඔව්හු ද
ඔවුන්ගේ පියවරු ද අද දවස දක්වා ම මට විරුද්ධ ව
ද්‍රෝහිකම් කළහ. 4 ඒ සනෙඟ මුරණ්ඩු දැඩි සිත්
ඇත්තෝ වති. මම ඔවුන් වතෙ නුඹ යවමි. නුඹ ද,
‘මහෝත්තම දවේ ස්වාමීන් වහන්සේ මසෙේ වදාරන
සේකැ’යි ඔවුන්ට කියන්න. 5 ඔවුන් කැරලිකාර
මනුෂ්‍යයන් වන බැවින් සවන් දුන්නත්, නුදුන්නත්
ඔවුන් අතරහෙි දිවැසිවරයකෙු සිටින බව ඔවුන්
දැනගනු ඇත.
6 “මනුෂ්‍ය පුත්‍රය, ඔවුන් නුඹට කහඹිලියා හා කටු
ගස් මනේ වුවත්, නුඹ ගෝනුස්සන් අතරේ වාසය
කරන්නේ වී නමුත්, ඔවුන්ට වත්, ඔවුන්ගේ
වචනවලට වත් බිය නොවන්න. ඔවුන්ගේ මුහුණේ
පනෙුමට නොකැළඹනේන. 7 ඔවුන් ඉතා කැරලිකාර
බැවින් ඔවුන් සවන් දුන්නත් නුදුන්නත් මාගේ
වචනය ඔවුන්ට ප්‍රකාශ කරන්න.
8 “එහතේ මනුෂ්‍ය පුත්‍රය, මා නුඹට කියන දේට
නුඹ සවන් දනේන. ඒ කැරලිකාර වංශය මනේ නුඹ ද
කැරලිකාරයකේ නොවන්න. නුඹ කට ඇර මා නුඹට
දනෙ දේ අනුභව කරන්න.” 9 එළිද 5:1මා බැලූ කල
මා දසෙට අතක් දිගු කර තිබනෙු දිටිමි. ඒ අතහෙි
අකුළන පොතක් තිබුණේ ය. 10 උන් වහන්සේ එය
මා ඉදිරියහෙි දිග හැරිය සේක. එහි ඇතුළත හා
පිටත ලියා තිබුණි. එහි ලියා තිබුණේ විලාප,
වැලපීම් හා ලතෝනි ය.
3 එළිද 10:9-10 උන් වහන්සේ කතා කරමින්,
“මනුෂ්‍ය පුත්‍රය, නුඹට දනෙ ලද දේ අනුභව
කරන්න. මේ පොත අනුභව කර ගොස් ඉශ්රායලේ
වංශයට කතා කරන්නැ”යි වදාළ සේක.
2 එවිට මම මාගේ කට ඇරියමේ; උන් වහන්සේ ද
ඒ පොත අනුභව කරන්න මට දුන් සේක. 3 තවද,
උන් වහන්සේ කතා කරමින්, “මනුෂ්‍ය පුත්‍රය, මා
නුඹට දනෙ මේ පොත අනුභව කර නුඹේ කුස
පුරවා ගන්නැ”යි මට වදාළ සේක. මම එය අනුභව
කළෙමේ; එය මාගේ කටට මී පැණි මනේ මිහිරි ව
තිබිණි.
4 උන් වහන්සේ කතා කරොට මසෙේ වදාළ සේක:
“මනුෂ්‍ය පුත්‍රය, නුඹ ඉශ්රායලේ සනෙඟ වතෙ
ගොස් මා කියන දේ ඔවුන්ට කියන්න. 5 නුඹ යවනු
ලබන්නේ දුෂ්කර, අන් භාෂාවක් කතා කරන
සනෙඟක් වතෙ නොව, ඉශ්රායලේ සනෙඟ වතෙ ය.
6 නුඹ යවනු ලබන්නේ නුඹට තේරුම්ගත නොහැකි,
දුෂ්කර අන් භාෂාවක් කතා කරන උසස් ජාතීන් වතෙ

නොවේ. සැබැවින් ම ඔවුන් වෙත මම නුඹ යැවීම්
නම්, ඔවුන් නුඹට සවන් දෙනු ඇත. 7 එහෙත්,
ඉශ්රායලේ සෙනඟ මට සවන් දෙන්නට අකමැති
බැවින් ඔව්හු නුඹට සවන් දෙන්නට කැමැති
නොවෙති. මන්ද, මුළු ඉශ්රායලේ සෙනඟ මුරණ්ඩු ය.
දැඩි සිත් ද ඇත්තෝ ය. 8 බලන්න, මම ඔවුන් මෙන්
නුඹ ද මුරණ්ඩු කර, දැඩි සිත් ඇත්තකු කරන්නෙමි.
9 මම නුඹේ අධිෂ්ඨානය ගිනිගලට වඩා තද වූ
වජ්‍රය මෙන් ශක්තිමත් කරන්නෙමි. ඔවුන්
කැරලිකාර සෙනඟක් වන නමුත් ඔවුන්ට බිය
නොවන්න. ඔවුන්ගේ රවා බැලීමට
නොකැළඹෙන්න.”
10 තවද, උන් වහන්සේ මට කතා කොට, “මනුෂ්‍ය
පුත්‍රය, නුඹට කියන මාගේ සියලු ම වචනවලට
හොඳින් සවන් දී, නුඹේ සිතේ ඒවා නිදන්
කරගන්න. 11 විප්‍රවාසගත ව සිටින නුඹේ සෙනඟ
වෙත ගොස්, ඔවුන් සවන් දුන්නත් නුදුන්නත් ඔවුන්ට
කතා කොට, ‘මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
මෙසේ වදාරන සේකැ’යි ඔවුන්ට කියන්නැ”යි වදාළ
සේක.
12 එවිට ආත්මයාණෝ මා ඔසවාගත්හ. “ස්වකීය
වාසස්ථානයේ සිටින සමිඳාණන් වහන්සේගේ
මහිමයට ප්‍රශංසා වේ වා!”යි කියන භූමි කම්පාවක්
වැනි ඝෝෂාවක් මා පිටුපසින් මට ඇසුණේ ය.
13 මේ වනාහි එකිනෙකට වැදුණු සත්ත්වයන්ගේ
පියාපත්වල ශබ්දය ද ඒ ළඟ තිබූ රෝදවල භූමි
කම්පාවක ශබ්දය වැනි ශබ්දය ද විය. 14 මෙලෙසෙ
ආත්මානුභාවයාණෝ මා ඔසවාගෙන ගියහ. දුකින්
හා උදහසින් පිරුණු සිතකින් මම පිටත් ව ගියෙමි.
සමිඳාණන් වහන්සේගේ බලය මා කෙරෙහි බලවත්
ලෙස පැමිණියේ ය. 15 එවිට මම කෙබාර් ගංගාව
ළඟ තේල්-ආබිබ් යන ස්ථානයෙහි විසූ
විප්‍රවාසගතවූවන් ළඟට පැමිණ, එහි සත් දවසක්
ඔවුන් සමඟ බිරාන්ත ව නැවතී සිටියෙමි.

### එසකියලේ මුරකාරයකු වශයෙන් පත් කරනු ලැබීම
(එසකි 33:1-9)

16 තවද, සත් දවසකට පසු සමිඳාණන් වහන්සේ
මට කතා කරමින් මෙසේ වදාළ සේක: 17 “මනුෂ්‍ය
පුත්‍රය, ඉශ්රායලේ වංශය කෙරෙහි මම නුඹ
මුරකාරයකු වශයෙන් පත් කළෙමි. මාගෙන් යම්
වචනයක් ඇසෙන සෑම විට ම ඔවුන්ට අවවාද
කරන්න. 18 ‘නුඹ සැබැවින් ම නසින්නෙහි ය’යි මා
දුෂ්ටයාට කියන කල, නුඹ ඔහුට අවවාද
නොකරන්නෙහි නම්, දුෂ්ටයා ජීවත් වන පිණිස
තමාගේ දුෂ්ට මාර්ගයෙන් හැරෙන ලෙස ඔහුට
අවවාද කරන පිණිස ඔහුට කතා නොකරන්නෙහි
නම්, ඒ දුෂ්ටයා සිය පාපය නිසා මැරෙනු ඇත. එවිට
ඔහුගේ මරණය ගැන නුඹ වගකිවයුත්තා වශයෙන්
මම සලකමි. 19 එහෙත්, නුඹ දුෂ්ටයාට අවවාද කළ
විට, ඔහු සිය පාපය හා දුෂ්ට මාර්ගය අත්
නොහරින්නේ නම්, ඔහු සිය පාපය නිසා නසිනු
ඇත. එහෙත්, නුඹ නුඹේ ජීවය රැකගනු ඇත.
20 “තවද, ධර්මිෂ්ඨ මිනිසෙකු තමාගේ
ධර්මිෂ්ඨකම අත්හැර පාපය කළ විට, එය ඔහුගේ
වැටීමට හේතුවක් වන්නට මා ඉඩ හැරියොත්, නුඹ
ඔහුට අවවාද නොකළ නිසා ඔහු සිය පාපයෙහි
නසිනු ඇත. ඔහු කළ ඔහුගේ දැහැමි ක්‍රියා
සිහිකරනු නොලබන්නේ ය. ඔහුගේ මරණය ගැන
නුඹ වගකිවයුත්තා වශයෙන් මම සලකමි.
21 එහෙත්, ධර්මිෂ්ඨයා පව් නොකරන ලෙස නුඹ
ඔහුට අවවාද කළ විට, ඔහු පව් නොකර සිටියොත්,
අවවාද පිළිගත් බැවින් ඔහු සැබැවින් ම ජීවත්
වන්නේ ය. නුඹ ද නුඹේ පණ ගළවා ගන්නෙහි ය.”

### එසකියලේ ගොළු වීම

22 එවිට, සමිඳාණන් වහන්සේගේ බලය එහි දී මා
පිට පැමිණියේ ය. උන් වහන්සේ කතා කොට,
“නැඟිට මිටියාවතට යන්න. එහි දී නුඹ සමඟ කතා
කරන්නෙමි”යි මට වදාළ සේක.
23 මම ද නැඟිට සමභූමියට ගියෙමි. එවිට,
කෙබාර් ගඟ ළඟ දී මා දුටු තේජස මෙන් සමිඳාණන්
වහන්සේගේ තේජාලංකාරය එහි තිබෙනු දිටිමි. මම
මුණින්තළා වී වැටුණෙමි. 24 එහෙත්,
දේවාත්මයාණෝ මට ඇතුළු වී, මා නැඟිට සිටුවා,
මා සමඟ කතා කොට මෙසේ වදාළ සේක: “නුඹේ
ගෙට වැද දොර වසාගෙන සිටින්න. 25 මනුෂ්‍ය
පුත්‍රය, නුඹ කඹවලින් වෙළා බඳිනු ලැබේ. සෙනඟ
අතරට නුඹට යන්නට නොහැකිවනු ඇත. 26 මම
නුඹේ දිව නුඹේ උඩුතල්ලේ ඇලෙන්න
සලස්වන්නෙමි. එවිට නුඹ ගොළු වී, ඔවුන්
කැරලිකාර සෙනඟක් වන බැවින් ඔවුන්ට තරවටු
කරන්න නුඹට නොහැකි වන්නේ ය. 27 එහෙත්, මා
නුඹ සමඟ කතා කරන කල නුඹට කතා ශක්තිය
දෙන්නෙමි. නුඹ ද කතා කරමින්, ‘මහෝත්තම දෙවි
ස්වාමීන් වහන්සේ මෙසේ වදාරන සේකැ’යි ඔවුන්ට
කියන්නෙහි ය, සවන් දෙන්නෝ සවන් දෙත්වා; සවන්
නොදෙන්නෝ සවන් නොදෙත්වා. මන්ද, ඔව්හු
කැරලිකාර සෙනඟකි.”

### ජෙරුසලම වැටලීම ගැන පෙර නිමිති

4 දෙවියන් වහන්සේ මෙසේ වදාළ සේක:
“මනුෂ්‍ය පුත්‍රය, ගඩොලක් ගෙන එය නුඹ
ඉදිරියෙහි තබාගෙන නුවරක් එනම්, ජෙරුසලම් නුවර
සටහනක් අඳින්න. 2 ඉන්පසු ඊට විරුද්ධ ව බලකොටු
ගොඩනඟා, ගොඩැල්ලක් ඉදිකොට, කඳවුරු තබා,
එය සිසාරා යුද්ධ යන්ත්‍ර තබා එය වටලාගන්න.
3 තවද, යකඩ තහඩුවක් ගෙන එය යකඩ පවුරක්
මෙන් නුඹටත්, නුවරටත්, අතර තබන්න. ඉන්පසු ඒ
දෙසට නුඹේ මුහුණ හරවන්න. නගරය වටලනු
ලැබේ. එය වටලන්නේ නුඹ ය. ඉශ්රායලේ ජාතියට
මෙය ලකුණක් ය.
4 “දැන් නුඹ වම් අතට හැරී දිගා වන්න. ඉශ්රායලේ
ජාතියේ වරද මම නුඹ පිට තබන්නෙමි. නුඹ යම්
තාක් කල් දිගා වී සිටින්නෙහි ද ඒ තාක් කල් නුඹ
ඔවුන්ගේ වරදේ විපාකය විඳින්නෙහි ය. 5 මම

නුඹට දවස් ගණනක් නියම කරන්නෙමි. එනම්, දවස්
තුන්සිය අනූවකි. එක එක දවස ඉශ්රායලේ ජාතියේ
එක එක අවුරුද්ද වශයෙනේ ගණන් ගනු ලැබේ.
6 නුඹ මෙසේ කළ පසු නුඹ යළිත් දිගා වන්නෙහි ය.
එහෙත්, දැන් දකුණු අතට ය. මෙසේ නුඹ ඉශ්රායලේ
ජාතියේ වරද දරා ගන්නෙහි ය. මම නුඹට දවස්
සතළිසක් නියම කරන්නෙමි; එක එක දවස එක එක
අවුරුද්ද වශයෙනේ ගණන්ගනු ලැබේ.
7 “නුඹේ මුහුණ ද ජෙරුසලම වැටලීම දෙසට
හරවා හිඳගෙන නුඹේ නොවැසූ අත ඊට විරුද්ධ ව
ඔසවා දිවැස් වැකි කියන්න. 8 බලන්න, වටලෑමේ
දවස් අවසාන වන තුරු නුඹ එක අංශයකින් අනික්
අංශයට නො-හැරෙන පිණිස මම නුඹ කඹවලින්
බැඳ තබමි.
9 “තවද, නුඹ තිරිඟු, යව, මෑ, කොල්ලු, කුරක්කන්
හා තණහාල් රැගෙන, ඒවා භාජනයක තබා එයින්
රොටී සාදාගන්න. නුඹ එක අංශයකට දිගා වී සිටින
දවස් ගණන වන දවස් තුන්සිය අනූව තුළ ඒවා
අනුභව කරන්න. 10 නුඹ දවසකට කන කෑම ද
ග්රෑම් දෙසිය තිහක් පමණ විය යුතු ය. වරින් වර
ඒවා කන්න. 11 වතුරත් දවසකට කෝප්ප දෙකෙක්
මැන වරින් වර බීමට ගත යුතු ය. 12 යව රොටී
මෙනේ ඒ කෑම කන්න. මනුෂ්යයා පහකරන
අශුචිවලින් ඔවුන්ගේ ඇස් හමුයෙහි ඒවා පිසන්න.
13 “මා ඉශ්රායලේවරුන් ජාතීන් අතරට පන්නා දැමූ
කල්හි ඔවුන් එසේ එහි දී තමන්ගේ අපවිත්ර වූ
කෑම කනු ඇත.”
14 එවිට මම පිළිතුරු දෙමින්, “අහෝ දෙවී ස්වාමීන්
වහන්ස! මම කවදාවත් මාව ම අපවිත්ර කර
නොගතිමි. මාගේ බාල වයසේ පටන් මේ දක්වා
කුණප වත්, මෘගයන් විසින් ඉරාදැමුණු සතකු වත්
නොකෑවෙමි. පිළිකුල් මාංස මාගේ කටට ඇතුල්
නො වේ වා”යි කීමි. 15 එවිට උන් වහන්සේ කතා
කොට, “මෙන්න, මනුෂ්ය අශුචි වෙනුවට ගවයින්ගේ
ගොම නුඹට නියම කළෙමි. ඒවා මත නුඹේ රොටී
පිසන්නැ”යි මට වදාළ සේක.
16 තවදුරටත් කතා කරමින්, “මනුෂ්ය පුත්රය, මම
ජෙරුසලමේ කෑම ප්රමාණය අඩු කරන්නෙමි. එවිට
භීතියෙනේ ඔව්හු කෑම කිරා කන්නෝ ය.
කනස්සලුකමින් වතුර මැන බොන්නෝ ය.
17 ඔවුන්ට කෑම ද වතුර ද නැති ව ගොස් එකිනෙකා
දෙස බැලීමෙනේ තැතිගෙන තමන්ගේ වරද නිසා
වැහැරී යන ලෙස මම සලසන්නෙමි”යි වදාළ සේක.

## එසකියලේගේ හිස මුඩු කිරීම

5 සමිඳාණන් වහන්සේ මෙසේ වදාළ සේක:
“මනුෂ්ය පුත්රය, තියුණු කඩුවක් ගන්න. එය
කරණවෑමියන්ගේ දැළිපිහියක් මෙනේ පාවිච්චි කර
නුඹේ හිසකෙසේ ද රැවුල ද එයින් බූගා, තරාදියක්
රැගෙන එය කිරා ඒ කේශ බෙදෙන්න. වටලෑමේ දවස්
සම්පූර්ණ වූ කල්හි 2 එයින් තුනෙනේ පංගුවක් නුවර
මැද ගින්නෙනේ දවාලන්න; තුනෙනේ පංගුවක් රැගෙන
නගරය වටකරින් ඒවාට කඩුවෙනේ ගසන්න; තුනෙනේ
පංගුවක් සුළඟට විසුරුවා දමන්න. මම ද ඒවා
පසුපස්සෙනේ කොපුවෙනේ ඇදගත් කඩුවක් ඇති ව
ලුහුබැඳ එන්නෙමි. 3 එයින් ස්වල්පයක් රැගෙන ඒවා
නුඹේ වස්ත්රයේ වාට්වල කොන්වල බැඳගන්න.
4 නැවත එයින් ස්වල්පයක් රැගෙන, ඒවා ගින්න
මැදට හෙළා, ඒවා ගින්නෙනේ දවාලන්න. එයින් මුළු
ඉශ්රායලේ ජාතියට විරුද්ධ ව ගින්නක් නික්මෙන්නේ
ය.”

## උපමාව විස්තර කිරීම

5 මහෝත්තම දෙවී ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක: “ජෙරුසලම දෙස බලන්න. මම ඈ
ජාතීන් මැද පිහිටුවීමි. ඈ අවට්න් විදෙස් රටවල්
තිබේ. 6 දුෂ්ටකම් කොට ජාතීන්ට වඩා මාගේ
නියෝගයන්ටත් ඈ වටකර තිබෙන රටවලට වඩා
මාගේ පණත්වලටත් විරුද්ධ ව ඈ කැරලි ගැසුවා ය.
මන්ද, ජෙරුසලම් වැසියෝ මාගේ විනිශ්චය එපා
කළෝ ය. මාගේ අණපණත් ප්රකාරයට
නොහැසුරුණෝ ය. 7 එබැවින් මෙසේ වදාරන්නේ
මහෝත්තම දෙවී ස්වාමීන් වහන්සේ ය. නුඹලා
අවට සිටින විජාතීන්ට වඩා නුඹලා කෝලාහල කර,
මාගේ අණපණත් ප්රකාරයට නොහැසිර, මාගේ
නියෝගයන් රක්ෂා නොකර, නුඹලා අවට සිටින
විජාතීන්ගේ නියෝගයන් අනුව ක්රියා කළ බැවින්
8 මහෝත්තම දෙවී ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක. බලන්න ජෙරුසලම, මම-මම වුව ද,
නුඹට විරුද්ධ වෙමි. විජාතීන්ගේ ඇස් හමුයෙහි නුඹ
පිට දඬුවම් පමුණුවන්නෙමි. 9 නුඹේ සියලු පිළිකුල්
ක්රියා නිසා, මා පෙර නොකළ, මතු නොකරන
විධියේ දේවල් නුඹට කරන්නෙමි. 10 විලාප
4:10අහෝ ජෙරුසලම! නුඹ තුළ පියවරු පුත්රයන් ද
පුත්රයෝ තමන්ගේ පියවරුන් ද කන්නාහ; මම
නුඹට දඬුවම් කොට ජෙරුසලමෙහි ඉතිරි වන
සියල්ලන් දස දෙස විසුරුවා දමන්නෙමි.
11 “එබැවින් ජීවමාන මහෝත්තම දෙවී ස්වාමීන්
වහන්සේ වන මම මෙසේ දිවුරා කියමි. නුඹේ සියලු
අශික්ෂිතකම්වලින් ද නුඹේ සියලු පිළිකුල්කම්වලින්
ද නුඹ මාගේ ශුද්ධස්ථානය අපවිත්ර කළ නිසා
සැබැවින් ම මමත් නුඹ නිර්දය ලෙස වනසාලන්නෙමි.
මම ද නුඹට කරුණා නොකරන්නෙමි; අනුකම්පාව
නොපෙන්වන්නෙමි. 12 නුඹේ සෙනඟගෙනේ තුනෙනේ
කොටසක් වසංගතයෙනේ මිය යන්නෝ ය; ඔව්හු
සාගතයෙනේ නුඹ අතරෙනේ නැති වන්නෝ ය. තුනෙනේ
කොටසක් නුඹ අවට්න් කඩු පහරින් වැටෙනු ඇත;
මම තුනෙනේ කොටසක් ද දස දෙස විසුරුවාදමා,
කඩුවක් රැගෙන ඔවුන් පස්සෙනේ ලුහුබැඳ යන්නෙමි.
13 “මෙසේ මාගේ උදහස සෑහීමට පත්වනු ඇත.
ඔවුන් කෙරෙහි මාගේ කෝපය දල්වා තෘප්තියට
පැමිණෙන්නෙමි. මා මාගේ කෝපාග්නිය ඔවුන්
කෙරෙහි දැල් වූ විට, ප්රතිවාදීන් නොඉවසන
ස්වාමීන් වන මා නුඹේ ද්රෝහිකමට විරුද්ධ ව තද
උදහසින් කතා කළ බව නුඹ දැනගනු ඇත. 14 නුඹ
අවට සිටින ජාතීන්ට මම නුඹ නින්දාවක් ද

අවමානයක් ද වන්නට සලසන්නමේ. නුඹ අවටින්
ගමන් කරන සියල්ලන් එය දකිනු ඇත. 15 මා
උදහසින් ද කෝපයෙන් ද රුදුරු දඬුවම්වලින් ද
මාගේ නියෝගයන් නුඹ වෙත ඉෂ්ට කරන කල්හි
නුඹ අවට සිටින සියලු විජාතීන් භීතියෙන් ඇලළී යනු
ඇත. නුඹලා අවට සිටින විජාතීන්ට එය නින්දාවක්
සහ සරදමක් ද යස පාඩමක් හා භීතියක් ද වන්නේ
ය. මෙසේ පවසන්නේ, සමිඳාණන් වහන්සේ වන
මම ය. 16 නුඹට විරුද්ධ ව මා විදින සාගතය නමැති
මාරක ඊගස්, එනම් විනාශ කරන සුලු ඊගස් නුඹ
විනාශ කරන්නට මම විදින්නමේ. මම නුඹලා
කෙරෙහි වඩා දරුණු සාගතයක් පමුණුවා නුඹලාට
ආහාර ලැබීමේ මාර්ග කපා හරින්නමේ. 17 එළිද
6:8මම නුඹලාට විරුද්ධව සාගතයක් ද වන මෘගයන්
ද එවන්නමේ. එයින් නුඹලාගේ දරුදැරියන් නැති වී
යනු ඇත. වසංගතය ද සාගතය ද ජරුසලමේ සෑම
තැන ම පැතිරී යනු ඇත. නුඹලාට විරුද්ධ ව
යුද්ධයක් ඇති කරන්නමේ. ස්වාමීන් වන මා මෙසේ
පවසා ඇත.”

## රූප වන්දනාව හෙළා දැකීම

6 සමිඳාණන් වහන්සේ මට කතා කොට මෙසේ
වදාළ සේක: 2 “මනුෂ්‍ය පුත්‍රය, නුඹේ මුහුණ
ඉශ්රායලේහි කඳු දෙසට හරවාගෙන ඒවාට විරුද්ධ ව
මේ දිවැස් වැකිය කියන්න. 3 ‘එම්බා ඉශ්රායලේහි
කඳු, මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේගේ
පණිවුඩය අසන්නැ’යි කියන්න. කඳුවලටත්,
මිටියාවත්වලටත්, නිම්නවලටත් දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේක. මෙන්න, මම, මම
ම, නුඹලා පිට කඩුවක් පමුණුවා, නුඹලාගේ කඳු
මත පූජාස්ථාන නැති කරන්නමේ. 4 නුඹලාගේ
පූජාසන පාළු වන්නේ ය. නුඹලාගේ ධූම පූජාසන
කඩාදමනු ලබන්නේ ය. නුඹලා අතරනේ මරුමුවට
පත් වූ අය නුඹලාගේ දේව රූප ඉදිරිපිට බිම
හෙළන්නමේ. 5 ඉශ්රායලේවරුන්ගේ මළකඳන්
ඔවුන්ගේ දේව රූප ඉදිරියෙහි දමා, නුඹලාගේ ඇට
කටු නුඹලාගේ පූජාසන අවටින් විසුරුවන්නමේ.
6 නුඹලාගේ පූජාසන පාළු වී, නාස්ති වී, නුඹලාගේ
දේව රූප කඩා දමනු ලැබ, ඒවා විනාශ වී නුඹලාගේ
ධූම පූජාසන කඩාදමනු ලැබ, නුඹලාගේ කර්මාන්ත
නැති වී යන පිණිස නුඹලාගේ සියලු වාසස්ථානවල
නගර නටබුන් ගොඩක් වන්නේ ය. කඳු මත
පූජාස්ථාන ද පාළු වන්නේ ය. 7 මරුමුවට පත් වූ අය
නුඹලා අවට වැටී සිටින විට මා සමිඳාණන්
වහන්සේ බව නුඹලා දැනගනු ඇත.
8 “එසේ වී නමුත්, මම නුඹලාගනේ සමහරකු
ජීවත් ව සිටින්නට ඉඩ හරින්නමේ. ඔවුන් කඩුවනේ
ගැළවී ජාතීන් අතර විසිර යනු ඇත. 9 නුඹලා
අතරනේ ගැළවෙන අය විප්රවාසයට ගෙනයනු ලැබූ
විට ඒ ඒ ජාතීන් අතර මා සිහි කරනු ඇත. එසේ
වන්නේ, මා වෙතින් වෙනේ වී ගිය ඔවුන්ගේ
අවිශ්වාසී සිත මා බිඳදැමූ විට ද මා තුළ විශ්වාසය
නොතබා දේව රූප දෙසට හැරුණු ඔවුන්ගේ ඇස්
අන්ධ කළ විට ද වේ. ඔවුන් කළ නපුරුකම් නිසා ද
ඔවුන්ගේ ද්වේෂ සහගත ක්රියා නිසා ද ඔව්හු
ඔවුන්ගේ ඇස් හමුයෙහි ම පිළිකුලක් වන්නෝ ය.
10 මා සමිඳාණන් වහන්සේ බවත්, මේ විපත්ති
ඔවුන් පිට පමුණුවන්නමේ යි මා වදාළ වචන
නිකරුණේ නොවදාළ බවත් ඔවුන් දැනගනු ඇත.”

## ඉශ්රායලේවරුන්ගේ පාපය

11 මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක: “නුඹේ දෑත මිරිකමින්, පොළොවේ
අඩි හප්පමින්, ‘අහෝ! ඉශ්රායලේ සෙනඟගේ සියලු
නපුරු පිළිකුල් ක්රියා නිසා කඩුවනේ ද සාගතයනේ ද
වසංගතයනේ ද ඔව්හු වැටතේ’යි කියන්න. 12 ඈත
සිටින අය වසංගතයනේ මැරනෙු ඇත; ළඟ සිටින
අය කඩුවනේ මැරනෙු ඇත; ඉතුරු වී සිට වටලනු
ලබන අය සාගතයනේ නසිනු ඇත. මෙසේ මාගේ
කෝපයේ උග්රකම ඔවුන්ට දැනනෙු ඇත. 13 උස් වූ
සියලු හලේවලත්, සියලු කඳු මුදුන්වලත්, සියලු අතු
පතර ඇති ගස් යටත්, අතු ඇති සියලු ආලෝන ගස්
යටත් තමන්ගේ සියලු දේව රූපවලට මිහිරි සුවඳ
ඔප්පු කළ සෑම පූජාසන වටකර මළකඳන් වැටී
තිබනෙ කල, මා සමිඳාණන් වහන්සේ බව නුඹලා
දැනගනු ඇත. 14 මම ඔවුන්ට විරුද්ධ ව මාගේ අත
දිගු කොට පාළුකරය පටන් දිබ්ලා දෙසට පිහිටි
ඔවුන්ගේ වාසස්ථාන ඇති මුළු දේශය පාළු ජරාවාස
පදෙසෙක් කරන්නමේ. මෙසේ මා සමිඳාණන්
වහන්සේ බව ඔවුන් දැනගනු ඇත.”

## සම්පූර්ණ විනාශය ආසන්න ය

7 තවද, සමිඳාණන් වහන්සේ මට කතා කොට
මෙසේ වදාළ සේක: 2 “මනුෂ්‍ය පුත්‍රය,
මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ ඉශ්රායලේ
දේශය ගැන මෙසේ වදාරන සේක. තීන්දුවක් එනම්,
දේශයේ හතර කොණේ ම අවසානය, පැමිණ
තිබේ.
3 ඉශ්රායලේ දේශය, නුඹේ අවසානය දැන් පැමිණ
තිබේ. මාගේ උදහස නුඹලාට විරුද්ධ ව එවා,
නුඹලාගේ කල්ක්රියාව අනුව නුඹලා විනිශ්චය
කොට, නුඹලාගේ සියලු පිළිකුල්කම් අනුව නුඹලාට
දඬුවම් කරන්නමේ. 4 මම නුඹලාට දයාව
නොදක්වමි; අනුකම්පා නොකරමි; පිළිකුල් කටයුතු
දේ නුඹලා තුළ පවතින තුරු නුඹලාගේ කල්ක්රියාව
අනුව මම නුඹලාට දඬුවම් කරන්නමේ. මා
සමිඳාණන් වහන්සේ බව නුඹලා දැනගන්නහු ය.
5 “මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක. බලන්න, විපත පිට විපත නුඹලා පිට
පැමිණයි. 6 අවසානය පැමිණයි, ඇත්තනේ ම
පැමිණයි. එය නුඹලාට විරුද්ධ ව උදා වී ඇත.
බලන්න, එය පැමිණනේනේ ය. 7 එම්බා රට
වැසියනි, නුඹලාගේ දඬුවම් වාරය පැමිණියේ ය.
කාලය පැමිණ තිබේ. දවස ආසන්න ය; එය වනාහි
ප්රීති ඝෝෂා ඇති දවසක් නොව, කඳු මත
කැළඹීමේ ඝෝෂා දවසක් ය.

8 “දැන් ඉක්මනින් මාගේ කෝපය නුඹලා පිට
වගුරුවා, මාගේ උදහස නුඹලා කෙරෙහි
පමුණුවන්නෙමි. නුඹලාගේ කල්ක්‍රියාව අනුව නුඹලා
විනිශ්චය කොට, නුඹලාගේ සියලු පිළිකුල් ක්‍රියා
අනුව නුඹලාට දඬුවම් කරන්නෙමි. 9 මම නුඹලාට
දයාව නොදක්වමි; අනුකම්පා නොකරන්නෙමි.
පිළිකුල් කටයුතු දේ නුඹලා තුළ පවතින තුරු
නුඹලාගේ කල්ක්‍රියාව අනුව මම නුඹලාට දඬුවම්
කරන්නෙමි. පහර දෙන්නේ ස්වාමීන් වන මා බව
මෙසේ නුඹලා දැනගන්නහු ය.
10 “මෙන්න, ඒ දවස! බලන්න, ඒ දවස පැමිණයෙයි.
නුඹලාගේ දඬුවම් කාලය පැමිණ ඇත; අයුක්තිය
වැජඹෙනු ඇත. උඩඟුකම උපරිම තත්ත්වයට පැමිණ
ඇත. 11 බලහත්කාරකම් දරුණු දුෂ්ටකම්වලට හැරී
ඇත. ඔවුන්ගෙන් හෝ ඔවුන්ගේ සමූහයන්ගෙන්
හෝ කිසිවකේ වත්, ඔවුන්ගේ වස්තුවෙන් හෝ
තේජසින් හා අලංකාරයෙන් හෝ කිසිවක් වත් ඉතිරි
නොවන්නෝ ය.
12 “කාලය පැමිණ තිබේ. දවස ළඟා වී තිබේ;
මිලයට ගන්නා ප්‍රීති නොවේවා; විකුණන්නා
නොවැලපේවා. මන්ද, උදහස එහි මුළු සමූහයා පිට
පැමිණ තිබේ. 13 වෙළෙන්දා තමා විකුණන දේ දිවි
ඇති තාක් නැවත නොලබන්නේ ය. මන්ද, දේව
උදහස සකල සමූහයට විරුද්ධ ව තිබේ. නපුර කළ
අයට නපුර නිසා ජීවත් ව සිටිය නොහැකි ය.
14 ඔවුන් යුද්ධ හොරණෑව පිඹ සියල්ල සූදානම් කර
තිබේ. එහෙත්, කිසිවකේ සටනට නොයෙති. මන්ද,
මාගේ කෝපය එහි මුළු සමූහයා කෙරෙහි ඇත්තේ
ය.”

## ඉශ්‍රායලේවරුන්ගේ පාපයට දඬුවම්

15 “පිටත යුද්ධ, ඇතුළත වසංගතය හා සාගත
තිබේ. එළිමහන් තැන්හි සිටින අය කඩුවෙන් මැරෙනු
ඇත; නගරයේ සිටින අය සාගතයෙන් ද
වසංගතයෙන් ද විනාශ වන්නෝ ය. 16 එහෙත්,
ඔවුන්, අතරෙන් ඉතිරි අය බියපත් ව මිටියාවත්වල
පරවියන් මෙන් කඳුවලට පලා යනු ඇත. ඔවුන්
තමන්ගේ පව් ගැන වැලපෙනු ඇත. 17 සියලු අත්
බලහීන වනු ඇත. සියලු දණහිස් ද වෙවුළනු ඇත.
18 ඔව්හු ගෝණි රෙදි ඇඳගන්නෝ ය. භීතියෙන්
ඇලළී යන්නෝ ය. හිස් මුඩු කරනු ලැබූ ඔව්හු
ලජ්ජාවට පත් වන්නෝ ය. 19 ඔවුන් තමන්ගේ රිදී
වීදිවලට විසි කරනු ඇත. ඔවුන්ගේ රන් ද අපවිත්‍ර
දයෙක් මෙන් වන්නේ ය. සමිඳාණන් වහන්සේගේ
උදහස පැමිණෙන දවසේ දී ඔවුන්ගේ රන් රිදී
කරණකොටගෙන ගැළවෙන්න ඔව්හු අපොහොසත්
වන්නෝ ය. එයින් ඔවුන්ගේ ආශාව තෘප්තියට
පැමිණෙන්නේ වත්, ඔවුන්ගේ කුස පිරෙන්නේ වත්
නැත. මන්ද, මේවා ඔවුන්ගේ අපරාධයට හේතු
වන්නේ ය. 20 ඔව්හු තමන්ගේ අලංකාර ආභරණ
අහංකාර වීමට කරුණක් කරගත්හ. එයින් පිළිකුල්
රූප වන අශික්ෂිත දේ සාදාගත්හ. එබැවින් මම
ඔවුන්ගේ වස්තුව ඔවුන්ට ම පිළිකුලක් කළෙමි.
21 මම එය විදේශීන්ට කොල්ලයක් ද පොළොවේ
දුෂ්ටයන්ට කොල්ලකෑමක් ද පිණිස දෙමි; ඔවුන් එය
කෙලෙසෙනු ඇත. 22 මාගේ මුහුණ ඔවුන් වෙතින්
හරවාගනිමි. ඔවුන් මාගේ දේව මාලිගාව කෙලෙසෙනු
ඇත. කොල්ලකාරයන් ද ඊට ඇතුල් වී එය
කෙලෙසෙනු ඇත.
23 “සියල්ල වියවුල් ය. මන්ද, දේශය මිනීමැරීමේ
අපරාධයෙන් පිරී තිබේ. නුවරත්
බලහත්කාරකම්වලින් පිරී තිබේ. 24 එබැවින් මම
ඉතා ම කෲරතර ජාතීන් ගෙන්වන්නෙමි. ඔව්හු
මොවුන්ගේ ගෙවල් උරුම කරගන්නෝ ය. මම
බලවතුන්ගේ උඩඟුකම නවත්වන්නෙමි; මොවුන්ගේ
ශුද්ධස්ථාන ද කෙලෙසෙනු ලබන්නේ ය. 25 විනාශය
පැමිණෙන්නේ ය. ඔව්හු සාමදානය සොයන්නෝ ය.
එහෙත්, එය ලැබෙන්නේ නැත. 26 විපත පිට විපත
ද අසුබ ආරංචියක් පිට අසුබ ආරංචියක් ද
පැමිණෙන්නේ ය; ඔවුන් දිවැසිවරුන්ගේ දර්ශනයක්
සොයනු ඇත; එහෙත්, පූජකයන්ගෙන් ව්‍යවස්ථාව ද
ප්‍රජා මූලිකයන්ගෙන් අවවාද ද පහවන්නේ ය.
27 රජතුමා වැලපෙන්නේ ය. අධිපතියා ශෝකයෙන්
කලකිරෙන්නේ ය. දේශයේ සෙනඟගේ අත් පණ
නැති වන්නේ ය. මම ඔවුන්ගේ කල්ක්‍රියාව අනුව
ඔවුන්ට දඬුවම් කරන්නෙමි. ඔවුන්ගේ ම
විනිශ්චයයන් අනුව ඔවුන් විනිශ්චය කරන්නෙමි.
මෙසේ මා සමිඳාණන් වහන්සේ බව ඔවුන් දැනගනු
ඇත.”

## ජෙරුසලම පිළිබඳ දර්ශනය

8 තවද, හය වන අවුරුද්දේ හය වන මාසයේ
පස් වන දින මා මාගේ ගෙදර ද ජුදාහි ප්‍රජා
මූලිකයන් මා ඉදිරියෙහි හිඳගෙන ද සිටින කල
මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේගේ බලය එහි
දී මා කෙරෙහි පැමිණියේ ය. 2 එසකි 1:27මා බැලූ
විට ගිනිගත් මනුෂ්‍ය රූපයක් වැනි යමක් දිටිමි. එහි
ඉඟටිය මෙන් පෙනුණ කොටස ගින්නෙන් වළේ
තිබිණි. එයින් ඉහළ කොටස කාන්තියෙන් දිළිසෙන
ලෝකඩ මෙන් බැබළෙන පෙනීමක් ද තිබිණි.
3 එතුමා අතක් වැන්නක් දිගු කොට මාගේ හිසේ
කෙස් රොදකින් මා අල්ලාගත්තේ ය.
දේවාත්මානුභාවය ද දෙවියන් වහන්සේගෙන් වූ
දර්ශනය මඟින් පොළොවටත්, අහසටත් අතරේ මා
උසුලාගෙන ගොස්, ජෙරුසලමේ උතුරු දෙස තිබෙන,
දේව උදහස උපදවන ද්වේෂ සහගත රූපයක් ඇති
ඇතුළු දොරටුවට මා පැමිණෙවුවේ ය.
4 එසකි 1:28 එවිට සමභූමියෙහි දුටු පෙනීම වැනි
ඉශ්‍රායලේවරුන්ගේ දෙවියන් වහන්සේගේ තේජස
එහි තිබෙනු මම දිටිමි. 5 උන් වහන්සේ ද කතා
කරමින්, “මනුෂ්‍ය පුත්‍රය, නුඹේ ඇස් දැන් උතුරු
දෙසට ඔසවන්නැ”යි මට වදාළ සේක. උතුරු දෙසට
මාගේ ඇස් එසවූ කල පූජාසනයේ දොරටුවට
උතුරෙන්, ඇතුළු වන තැන, ද්වේෂය උපදවන ඒ
නින්දිත රූපය තිබෙනු මම දිටිමි. 6 උන් වහන්සේ ද
කතා කරමින්, “මනුෂ්‍ය පුත්‍රය, ඔවුන් කරන දේ

එනම්, මාගේ ශුද්ධස්ථානයෙන් මා පලවා හරින
පිණිස ඉශ්රායලේ සෙනඟ මෙහි කරන මහා
පිළිකුල්කම් නුඹට පෙනෙන්නේ නැද් ද? මීටත් වඩා
පිළිකුල් දෙයක් නැවතත් නුඹ දකින්නෙහි ය"යි මට
වදාළ සේක.
7 උන් වහන්සේ මළුවේ දොරකඩට මා ගෙනො
සේක; මම බැලූ විට බිත්තියේ සිදුරක් තිබෙනු
දිටිමි. 8 එකල උන් වහන්සේ කතා කරමින්, "මනුෂ්ය
පුත්රය, බිත්තිය හාරන්නැ"යි මට වදාළ සේක, මම
බිත්තිය හෑරූ කල දොරටුවක් දිටිමි. 9 උන් වහන්සේ
කතා කරමින්, "ඇතුළට ගොස් ඔවුන් මෙහි කරන
නපුරු පිළිකුල්කම් බලන්නැ"යි මට වදාළ සේක.
10 මම ඇතුළු වී බැලූ විට, බඩගා යන සියලු ආකාර
සතුන්ගේත්, පිළිකුල් තිරිසනුන්ගේත් රූප ද
ඉශ්රායලේ වංශයේ සියලු දේව රූප ද බිත්තියේ
වටේට සිතියම් කර තිබෙනු දිටිමි. 11 ඉශ්රායලේ
වංශයේ ප්රජා මූලිකයන්ගෙන් සැත්තෑදෙනෙකු ද
ඔවුන් මැද ෂාපාන්ගේ පුත් ජාසනියා ද සිටිනු දිටිමි.
ඔව්හු තම තමාගේ අතේ තම තමාගේ දුම්
භාජනය ඇති ව සිටියෝ ය. සුවඳ දුම් ඉහළට
නැංගේ ය. 12 එවිට උන් වහන්සේ කතා කොට,
"මනුෂ්ය පුත්රය, ඉශ්රායලේ වංශයේ ප්රජා
මූලිකයන් අන්ධකාරයෙහි එක එකා තම තමාගේ
රූප ඇති ගබඩාවල දී කරන දේ දුටුවෙහි ද? කුමක්
නිසා ද 'සමිඳාණන් වහන්සේ අප දකින්නේ නැත;
සමිඳාණන් වහන්සේ දේශය අත්හැරිය සේකැ'යි
ඔව්හු කියති"යි මට වදාළ සේක.
13 "ඔවුන් කරන තවත් මහා පිළිකුල්කම් නුඹ
නැවත දකින්නෙහි ය"යි උන් වහන්සේ මට වදාළ
සේක. 14 එකල උන් වහන්සේ සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ උතුරට තිබෙන දොරටුවේ
දොරකඩට මා ගෙනො සේක. එවිට ස්ත්රීන් තම්මුස්
දෙවියා ගැන අඬමින් එහි ඉඳගෙන සිටිනු දිටිමි.
15 උන් වහන්සේ මට කතා කරමින්, "මනුෂ්ය
පුත්රය, නුඹ මෙය දුටුවෙහි ද? මීටත් වඩා තවත්
පිළිකුල්කම් නැවත නුඹ දකින්නෙහි ය"යි මට වදාළ
සේක. 16 උන් වහන්සේ සමිඳාණන් වහන්සේගේ
මාලිගාවේ ඇතුළු මළුවට මා ගෙනො සේක. බලන්න,
එහි මනුෂ්යයන් විසිපස්දෙනෙකේ පමණ සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ දොරකඩ ද්වාර මණ්ඩපය
සහ පූජාසනය අතරේ සමිඳාණන් වහන්සේගේ
මාලිගාවට පිටුපා, නැගෙනහිරට තමන්ගේ මුහුණ
හරවාගෙන, නැගෙනහිර දෙස සූර්යයාට නමස්කාර
කළෝ ය.
17 එවිට උන් වහන්සේ කතා කොට, "මනුෂ්ය
පුත්රය, නුඹ මෙය දුටුවෙහි ද? ජුදා සෙනඟ දේශය
පුරා සැහැසිකම් කරමින් ඔවුන් මෙහි කරන නීච
පිළිකුල් ක්රියා සුළු දෙයකැ යි ඔව්හු සිතත් ද? ඔව්හු
මාගේ කෝපය සංසිඳුවන්න උත්සාහ කරන නමුත්,
මා වඩ වඩා ප්රකෝප කරති. 18 එබැවින් මමත්
කෝපයෙන් ක්රියා කරන්නෙමි. මම දයාව
නොදක්වන්නෙමි. මම කරුණා නොකරන්නෙමි. ඔවුන්
මහ හඬකින් මාගේ කන්වලට මොරගැසුවත් මම
ඔවුන්ට සවන් නොදෙන්නෙමි"යි වදාළ සේක.

### ජෙරුසලමේ විනාශය

9 ඉන්පසු උන් වහන්සේ "මේ නගරයට දඬුවම්
කිරීමට පත් කර සිටින සියල්ලෙනි, නුඹලා
එකිනෙකාගේ අතේ මාරක අවි ආයුධ ඇති ව ළං
වන්නැ"යි මහ හඬින් මොරගසනවා මට ඇසිණි.
2 එවිට උතුරු දෙසෙ තිබෙන ඉහළ දොරටුවේ
මාර්ගයෙන් මිනිස්සු හයදෙනෙකේ එකිනෙකා තම
තමාගේ මාරක ආයුධ අතේ ඇති ව ආහ. ඔවුන්
අතරේ ඉඟ පටියේ ලිපි උපකරණ මල්ල එල්ලාගත්,
හණ වස්ත්රයක් හැඳගත් මිනිසකේ සිටියේ ය.
ඔව්හු ඇතුළු වී ලෝකඩ පූජාසනය ළඟ සිට ගත්හ.
3 එවිට ඉශ්රායලේහි දෙවියන් වහන්සේගේ
තේජෝ මහිමය එය නැවතී තිබුණු ස්ථානය වන
කෙරුබ්වරුන් කෙරෙන් නැඟී දේව මාලිගාවේ
එළිපත්ත ළඟට ගොස් ලිපි උපකරණ මල්ල ඇති ව,
හණ වස්ත්රයක් හැඳගත් මිනිසාට මොරගැසී ය.
4 එළිද 7:3; 9:4; 14:1සමිඳාණන් වහන්සේ ඔහුට
කතා කොට, "නගරය මුළුල්ලෙහි එනම්, ජෙරුසලම
මුළුල්ලෙහි ගොස්, ඒ තුළ කෙරෙන සියලු පිළිකුල්කම්
ගැන සුසුම්ලමින්, කඳිරිගාන මිනිසුන්ගේ නළල්වල
ලකුණක් තබන්නැ"යි වදාළ සේක.
5 මා අසා සිටිය දී උන් වහන්සේ සෙසු අයට කතා
කොට, "නුඹලා ඔහු පසුපස නගරය තුළට ගොස්
එයට පහර දෙන්නේ. ඔවුන් දෙස දයාවෙන්
නොබලන්න; ඔවුන්ට කරුණා නොකරන්න. 6 මාගේ
ශුද්ධස්ථානයෙන් පටන්ගෙන මහල්ලන් ද තරුණයන්
ද තරුණියන් ද බාලයන් ද ස්ත්රීන් ද මරා විනාශ කර
දමන්න. එහෙත්, නළලේ ලකුණ ඇති කිසිවකුට
අත නොගසන්නැ"යි වදාළ සේක. එවිට ඔව්හු දේව
මාලිගාවේ සිටි මහලු අයගෙන් එසේ විනාශ කිරීමට
පටන්ගත්තෝ ය.
7 උන් වහන්සේ කතා කරමින්, "නුඹලා දේව
මාලිගාව අපවිත්ර කරමින්, එය මළකඳන්වලින්
පුරවා පිටත යන්නැ"යි ඔවුන්ට වදාළ සේක. ඔව්හු
පිටතට ගොස්, නුවර ඇතුළෙහි සෙනඟට පහර
දුන්නෝ ය.
8 ඔවුන් පහර දෙද්දී මම පමණක් නැවතී සිටියෙමි.
මම ද මුණින්තළා වී, "අහෝ, මහෝත්තම දෙවි
ස්වාමීන් වහන්ස! ඔබේ කෝපය ජෙරුසලම පිට
වගුරුවන අතර, ඉශ්රායලේවරුන්ගේ ඉතිරි ව සිටින
සියල්ලන් ම ඔබ නාස්ති කරන සේක් දැ"යි
මොරගසා ඇසුවෙමි.
9 එවිට උන් වහන්සේ උත්තර දෙමින්, "ඉශ්රායලේ
සහ ජුදා සෙනඟගේ අපරාධ ඉමහත් ය; දේශය
ලයින් පිරී තිබේ. නුවර ද අයුක්තියෙන් පිරී තිබේ.
මන්ද, සමිඳාණන් වහන්සේ දේශය අත්හැරිය සේක'
කියා ද 'උන් වහන්සේ නොදක්නා සේක' කියා ද
ඔව්හු කියති. 10 එබැවින් මම දයාව දක්වන්නේ වත්,
කරුණා කරන්නේ වත් නැති ව, ඔවුන්ගේ
කල්ක්රියාවට විපාකය ඔවුන්ගේ හිස් පිට
පමුණුවන්නෙමි"යි මට වදාළ සේක.

11 එවිට හණ වස්ත්‍ර හැඳගනෙ තමාගේ පැත්තේ
ලිපි උපකරණ මල්ල ඇති ව සිටි මනුෂ්‍යයා හැරී
අවුත්, “ඔබ වහන්සේ අණ කළ ලසෙ කළෙමේ”යි
වාර්තා කළෙේ ය.

### දේව තේජස පහ වී යාම

10 එසකි 1:26; එළිද 4:2 මම බැලූ විට,
කරෙුබ්වරුන්ගේ හිස්වලට ඉහළින්
නීලමාණික්‍යයන් වැනි සිංහාසනයක රූපයක් දිටිමි.
2 එළිද 8:5උන් වහන්සේ හණ වස්ත්‍ර හැඳගනෙ සිටි
මනුෂ්‍යයාට කතා කොට, “නුඹ කරෙුබ්වරුන්ට යටින්
කරකැවනෙ චක්‍ර අතරට ඇතුළු වී, කරෙුබ්වරුන්
අතරේ තිබනෙ ගිනි අඟුරුවලින් නුඹේ දෑත
පුරවාගනෙ නුවර පිට විසුරුවා හරින්නැ”යි වදාළ
සේක.
3 ඔහු මා බලා සිටිය දී ඇතුළු විය. ඒ මනුෂ්‍යයා
ඇතුළු වන විට කරෙුබ්වරු මාලිගාවේ දකුණු
පැත්තහෙි සිටියෝ ය. ඇතුළු මළුව ද වලාකුළනේ
පිරුණේ ය. 4 එවිට සමිඳාණන් වහන්සේගේ තේජස
කරෙුබ්වරුන් කරෙනේ නැඟී එළිපත්ත මතුයහෙි
නැවතුණේ ය. මාලිගාව වලාකුළනේ පිරුණේ ය.
මළුව ද සමිඳාණන් වහන්සේගේ තේජසේ
දීප්තියනේ පිරුණේ ය. 5 කරෙුබ්වරුන්ගේ පියාපත්වල
ශබ්දය ද සර්ව පරාක්‍රම දවේයන් වහන්සේ කතා
කරන හඬ මනේ පිටත මළුව දක්වා ඇසුණේ ය.
6 කරකැවනෙ චක්‍ර අතරනේ ද කරෙුබ්වරුන්
අතරනේ ද ගිනි අරගන්න කියා හණ වස්ත්‍ර
හැඳගනෙ සිටි මනුෂ්‍යයාට උන් වහන්සේ අණ කළ
විට, ඔහු ඇතුළු වී චක්‍රයක් ළඟ සිටගත්තේ ය.
7 කරෙුබ්වරයකේ කරෙුබ්වරුන් අතරේ තිබුණ
ගින්නට කරෙුබ්වරුන් අතරනේ තමාගේ අත දිගු
කොට, එයින් ගිනි රැගනෙ හණ වස්ත්‍ර හැඳගනෙ
සිටි තැනැත්තාගේ දෑතට දුන්නේ ය. ඔහු ද එය
රැගනෙ පිටතට ගියේ ය.
8 කරෙුබ්වරුන්ගේ පියාපත් යට මනුෂ්‍ය අතක
ස්වරූපයක් පනෙුණේ ය. 9 එසකි 1:15-21මම බැලූ
විට මසෙේ දිටිමි. කරෙුබ්වරුන් ළඟ රෝද සතරක්
එනම්, එක කරෙුබ්වරයකෙු ළඟ එක රෝදයක්
බැගින් තිබිණි. රෝදවල පනේම ද රන් කාන්තියක
දිස්නය වැනි ය. 10 ඒ සතරට ම තිබුණේ එකාකාර
ස්වරූපයකි. ඒවායේ පනේම වනාහි රෝදයක් තුළ
රෝදයක් තිබනේනාක් මනේ ය. 11 කරෙුබ්වරුන්
සතර දිශාවනේ එක දිශාවකට ගමන් ගත් විට ඔව්හු
යන මාර්ගයනේ අන් අතකට නොහැරුණෝ ය.
මාර්ගයනේ පිට නොපැන ඔවුන්ගේ හිස් හැරී තිබුණ
දසෙට ඔව්හු කළෙින් ම ගමන් කළහ. 12 එළිද
4:8ඔවුන්ගේ මුළු ශරීරවල ද ඔවුන්ගේ පිටවල ද
අත්වල ද පියාපත්වල ද රෝදවල ද වටකර පුරා ම
ඇස් තිබුණේ ය. ඒ සතර දනොටත්, ඔවුන්ගේ
රෝදවලටත් එසේ ම ඇස් තිබුණේ ය. 13 ඒ
රෝදවලට ‘භ්‍රමණ චක්‍ර’යි නම් තබනු මට
ඇසුණේ ය.
14 එසකි 1:10; එළිද 4:7 එක් එක් කරෙුබ්වරයාට
මුහුණු සතරක් විය. පළමු වන මුහුණ
කරෙුබ්වරයකෙුගේ මුහුණකි, දවෙන මුහුණ මනුෂ්‍ය
මුහුණකි, තුන් වන එක සිංහ මුහුණකි, සතර වන
එක රාජාලි මුහුණකි. 15 කරෙුබ්වරු ද ඉහළට
නැංගෝ ය. ඔව්හු වනාහි කබොර් ගඟ ළඟ දී මා
දුටු ජීවමාන සත්ත්වයෝ ය. 16 තවද, කරෙුබ්වරුන්
යන විට රෝද ද ඔවුන් කැටුව ගියේ ය. පොළොව
මතුපිටින් නඟින්න කරෙුබ්වරුන් තමන්ගේ පියාපත්
විදහාගත් විට රෝද ඔවුන් වතෙින් ඉවත් නොවී ය.
17 ඔවුන් නැවතුණු කල ඒවාත් නැවතුණේ ය. ඔවුන්
නඟින කල ඒවාත් ඔවුන් සමඟ නැංගේ ය. මන්ද,
සත්ත්වයෝ ඒවා පාලනය කළහ.
18 එවිට සමිඳාණන් වහන්සේගේ තේජස
මාලිගාවේ එළිපත්ත මතුපිටින් පිටතට ගොස්
කරෙුබ්වරුන්ට ඉහළින් පිහිටියේ ය. 19 කරෙුබ්වරු
ඉදිරියට යමින් සිය පියාපත් විදහා පා මා බලා සිටිය
දී පොළොවනේ ඉහළට නැංගෝ ය. රෝදත් ඔවුන්
සමඟ ම නැංගේ ය. ඔව්හු සමිඳාණන් වහන්සේගේ
මාලිගාවේ නැගනෙහිර දොරකඩ සිටියෝ ය.
ඉශ්‍රායලේවරුන්ගේ දවේයන් වහන්සේගේ තේජස
ද ඔවුන්ට උඩින් තිබුණේ ය. 20 මොවුහු වනාහි
කබොර් ගංගාව ළඟ දී ඉශ්‍රායලේවරුන්ගේ දවේයන්
වහන්සේට යටින් සිටිනු මා දුටු සත්ත්වයෝ ය.
ඔවුන් කරෙුබ්වරුන් බව මම දැනගතිමි.
21 එක එකාට මුහුණු සතරක් බැගින් ද එක එකාට
පියාපත් සතරක් බැගින් ද ඔවුන්ගේ පියාපත් යට
මනුෂ්‍ය අත් වැනි ස්වරූපයක් ද තිබුණේ ය.
22 ඔවුන්ගේ මුහුණුවල පනේමත් හරියට ම මා
කබොර් ගඟ ළඟ දී දුටු මුහුණුවල පනේමට සමාන
ය. ඔව්හු එකිනකො කළෙින් ම ඉස්සරහට ගියහ.

### දුෂ්ට මූලිකයන්ගේ විනාශය

11 දේවාත්මානුභාවය මා ඔසවාගනෙ ගොස්
නැගනෙහිර දසෙට තිබනෙ සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ නැගනෙහිර දොරටුවට මා
පැමිණවේවේ ය. බලන්න, මනුෂ්‍යයෝ
විසිපස්දනෙකේ දොරකඩ සිටියෝ ය. ඔවුන් අතරේ
සනෙඟගේ අධිපතීන් වන අස්සූර්ගේ පුත් ජාසිනියා
ද බනොයාගේ පුත් පලෙතියා ද සිටිනු දිටිමි.
2 උන් වහන්සේ කතා කොට මසෙේ වදාළ සේක:
“මනුෂ්‍ය පුත්‍රය, මේ නුවර පුරා දුෂ්ටකම් යෝජනා
කරන, නපුරු මන්ත්‍රණ යොදන මනුෂ්‍යයෝ මොවුහු
ය. 3 මොවුහු කතා කොට, ‘ගවෙල් ගොඩනඟන්න
කාලය ළං වී නැද් ද? මේ නුවර කල්දේරමක් වැනි
ය; අපි එහි පිසනෙ මාංසය වැනි ය; එනම් අපට
නුවර තුළ තරමක ආරක්ෂාව ඇතැ’යි කියති.
4 එබැවින් ඔවුන්ට විරුද්ධ ව දිවැස් වැකි කියන්න,
මනුෂ්‍ය පුත්‍රය, දිවැස් වැකි කියන්න.”
5 එවිට සමිඳාණන් වහන්සේගේ ආත්මානුභාවය
මා කරෙහෙි පැමිණ, මට කතා කරමින් මසෙේ වදාළ
සේක: “සමිඳාණන් වහන්සේ මසෙේ වදාරන සේකැ
යි කියන්න: ‘අනේ ඉශ්‍රායලේ වංශය, නුඹලා මසෙේ

සිතන්නහු ය; නුඹලාගේ සිත්වල හටගන්න අදහස්
දනිමි. 6 නුඹලා මේ නුවර තුළ බොහෝ සේ මිනී
මරා එහි වීදි මළකඳන්වලින් පුරවා තිබේ.
7 “ ‘එබැවින් මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
මෙසේ වදාරන සේක. මාංසය වශයෙනේ
හැඳින්වෙනේනේ නගරයෙහි නුඹලා විසින් බාවනු ලැබ
ඇති, නුඹලා අතින් මැරුම්කනු ලැබූ අය ය;
කල්දරේම වශයෙනේ හැඳින්වෙනේනේ නගරය ය.
එහෙත්, නුඹලා මයින් පිටත ගෙනෙනු ලබන්නහු ය.
8 නුඹලා කඩුවට බිය ව සිටියහු ය. මම ද නුඹලා
පිට කඩුව පමුණුවන්නෙමි යි දෙවි ස්වාමීන්
වහන්සේ වදාරන සේක. 9 මම නුඹලා පිටතට
ගෙනවුත් විදේශීන් අතට නුඹලා පාවා දී, මාගේ
විනිශ්චයයන් නුඹලාට විරුද්ධ ව ඉෂ්ට කරන්නෙමි.
10 නුඹලා කඩුවෙනේ නසින්නහු ය. ඉශ්රායලේ දේශ
සීමාවේ දී මම නුඹලා විනිශ්චය කරන්නෙමි; එසේ
මා සමිඳාණන් වහන්සේ බව නුඹලා දැනගන්නහු ය.
11 මේ නුවර නුඹලාගේ කල්දරේම නොවන්නේ ය.
නුඹලා එය තුළ මාංසය ද නොවන්නහු ය.
ඉශ්රායලේ දේශ සීමාවේ දී මම නුඹලා විනිශ්චය
කරන්නෙමි. එවිට මා ස්වාමීන් බව නුඹලා
දැනගන්නහු ය. 12 එසේ මාගේ නියෝග ප්රකාර
නොහැසිර, මාගේ පණත් ඉෂ්ට නොකොට, නුඹලා
අවට සිටින ජාතීන්ගේ පණත් ප්රකාරයට ක්රියා
කළහු ය.’ ”
13 මා විසින් එසේ දිවැස් වැකි කියද්දී බෙනායාගේ
පුත් පලෙතියා මැරී වැටුණේ ය. එවිට මම මුණින්
වැටී, “අනේ! මහෝත්තම දෙවි ස්වාමීන් වහන්ස,
ඉතිරි ව සිටින ඉශ්රායලේවරුන් ඔබ නැත්තට ම
නැතිකරන සේක් දැ”යි මහා හඬින් මොරගසා
ඇසීමි.

### විප්රවාසගත වූ අයට පොරොන්දුව

14 තවද, සමිඳාණන් වහන්සේ මට කතා කොට
මෙසේ වදාළ සේක: 15 “මනුෂ්ය පුත්රය,
ජෙරුසලමේ සිටින අය නුඹ ගැනත්, විප්රවාසගත ව
සිටින නුඹේ ඥාති ඉශ්රායලේ සහෝදරයන් ගැනත්
කතා කරමින්, ‘දෙවියන් වහන්සේ කෙරෙනේ නුඹලා
පිටුවහල් කර ඇත; උරුමයක් වශයෙනේ දේශය දෙනෙ
ලද්දේ අපට යැ’යි කියති.
16 “එබැවින්, ‘දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේකැ යි කියන්න: මා විජාතීන් අතරට
ඔවුන් පලවා හැර, දුර දේශවල ඔවුන් විසිර වූ
නමුත්, ඔවුන් පැමිණ සිටින ඒ දේශයන්හි මම
ස්වල්ප කලකට ඔවුන් සමඟ වැඩ සිටින්නෙමි.’
17 එබැවින් මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
මෙසේ වදාරන සේක: ‘මම ජාතීන් අතරෙනේ නුඹලා
එකතු කර, නුඹලා විසිර සිටින දේශවලින් නුඹලා
රැස් කොට ඉශ්රායලේ රට නුඹලාට දෙන්නෙමි.
18 ඔවුන් එහි පැමිණ එහි සියලු අශික්ෂිත දේ ද
එහි සියලු පිළිකුල්කම් ද එතැනින් පහකරනු ඇත.
19 එසකි 36:26-28මම ඔවුන්ට ඒකමතික සිතක්
දෙන්නෙමි, අලුත් ආධ්යාත්මික බලයක් ද නුඹලා තුළ
තබන්නෙමි. 20 ඔවුන් මාගේ පණත් ප්රකාර හැසිර,
මාගේ නියෝග රක්ෂා කොට පවත්වන පිණිස,
ඔවුන්ගේ ගල් සිත පහකොට මුදු මොළොක් සිතක්
ඔවුන්ට දෙන්නෙමි. මෙසේ ඔව්හු මාගේ සෙනඟ
වන්නෝ ය. මම ද ඔවුන්ගේ දෙවියන් වහන්සේ
වන්නෙමි. 21 එහෙත්, තමන්ගේ අශික්ෂිතකම් ද
තමන්ගේ පිළිකුල්කම් ද කෙරෙහි සිත ඇදී ගොස්
ඇති අයට ඔවුන්ගේ ක්රියාවල විපාක විඳින්නට
සලස්වන්නෙමි’ මෙසේ පවසන්නේ මහෝත්තම දෙවි
ස්වාමීන් වහන්සේ ය.”

### තේජෝ මහිමය අතුරුදහන් වීම

22 එසකි 43:2-5 එකල කෙරුබ්වරු තමන්ගේ
පියාපත් එසවූවෝ ය. රෝදත් ඔවුන් එක් ව ම
තිබුණේ ය. ඉශ්රායලේවරුන්ගේ දෙවියන්
වහන්සේගේ තේජස ඔවුන්ට ඉහළින් තිබුණේ ය.
23 සමිඳාණන් වහන්සේගේ තේජස ඉහළට නැඟී
නගරයෙනේ පිට වී ගොස් නැගෙනෙහිරින් තිබෙනෙ
කන්ද උඩ පිහිටියේ ය. 24 එවිට ආත්මානුභාවය මා
ඔසවා කල්දියාවෙහි විප්රවාසගත ව සිටින අය වෙත
පැමිණවූයේ ය. මේ සියල්ල සිදු වූයේ
දේවාත්මානුභාවය විසින් එවන ලද දර්ශනයක්
මඟිනි. මෙසේ මා දුටු දර්ශනය මා වෙතින් පහ ව
ගියේ ය. 25 මම ද සමිඳාණන් වහන්සේ මට පෙන්වූ
සියලු දේ විප්රවාසගත ව සිටි අයට කීවෙමි.

### පලා යාම හා සාගතය ගැන උපමා ලකුණු

12 සමිඳාණන් වහන්සේගේ පණිවුඩය මා වෙත
පැමිණ මෙසේ කී ය: 2 යෙසා 6:9-10; ජෙරෙ
5:21; මාක් 8:18“මනුෂ්ය පුත්රය, නුඹ වාසය
කරන්නේ කැරලිකාර වංශයක් අතරෙහි ය. දැකීමට
ඇස් තිබෙනෙ නමුත්, ඔවුන්ට පෙනෙන්නේ නැත.
ඇසීමට කන් තිබෙනෙ නමුත්, ඇසෙන්නේ නැත.
මක්නිසා ද ඔව්හු කැරලිකාර වංශයක් ය.
3 “ඒ නිසා, මනුෂ්ය පුත්රය, විප්රවාසයට යන්නෙකු
මෙනේ මාර්ගෝපකරණ සූදානම් කරගෙනෙ, දවාලෙහි
ඔවුන් බලා සිටිය දී පිටත් වන්න; ඔවුන් බලා සිටිය
දී නුඹ සිටින ස්ථානයේ සිට අන් ස්ථානයකට පිටත්
ව යන්න. ඔවුන් කැරලිකාර වංශයක් වන නමුත්,
සමහර විට ඔවුන් එහි තේරුම සිතට ගනු ඇත.
4 නුඹේ බඩු විප්රවාසිකයෙකුගේ මාර්ගෝපකරණ
මෙනේ දවාලෙහි ඔවුන් බලා සිටිය දී පිටතට ගෙනෙ,
මිනිසුන් විප්රවාසයට පිටත් ව යන්නාක් මෙනේ සවස
ඔවුන් බලා සිටිය දී පිටත් වන්න. 5 නුඹ ඔවුන් බලා
සිටිය දී බිත්තිය හාරා, ඒ තුළින් බඩු පිටතට ගෙනෙ
යන්න. 6 නුඹ ඔවුන් බලා සිටිය දී ඒවා කරට ගෙනෙ,
අඳුරු වේලේ පිටතට ගෙනෙ යන්න. යන මඟ
නොපෙනෙනෙ පිණිස නුඹේ මුහුණ වසාගන්න.
මක්නිසා ද මම ඉශ්රායලේ වංශයට නුඹ
සංකේතයක් කර ඇත්තෙමි.”

7 මම ද මට අණ කළ ලෙස කළෙමි. මාගේ බඩු
මාර්ගෝපකරණ මනේ දවාලේ පිටතට ගෙන, සවස
මාගේ අතින් බිත්තිය හාරා, අඳුරු වූ කල්හි ඔවුන්
බලා සිටිය දී ඒවා කරට ගෙන පිටතට ගෙනොවමි.
8 පසු දා උදේ සමිඳාණන් වහන්සේ මට කතා
කොට මෙසේ වදාළ සේක: 9 "මනුෂ්‍ය පුත්‍රය,
කැරලිකාර වංශය වන ඉශ්‍රායලේ වංශය 'නුඹ
කුමක් කරන්නෙහි දැ'යි නුඹට කීවා නොවේ ද?
10 'මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ මෙසේ
වදාරන සේකැ'යි ඔවුන්ට කියන්න. 'මේ දිව්‍ය
ප්‍රකාශනය ජෙරුසලමේ අධිපතියා සහ එහි තුළ
සිටින මුළු ඉශ්‍රායලේ වංශය ගැන ය.' 11 මෙසේ
කියන්න: 'මම නුඹලාට සංකේතයක් වෙමි. මා කළ
ලෙස ඔවුන්ට ද සිද්ධ වන්නේ ය. ඔව්හු ද පිටත් ව
අන් රටක විප්‍රවාසයට යන්නෝ ය.' 12 ඔවුන්
අතරේ සිටින අධිපතියා ද බඩු කරට ගෙන, අඳුරු
වේලේ පිටතට එනු ඇත. ඔවුන් පවුරු හාරා එමඟින්
පිටත යනු අසා ඔහු තමාගේ ඇස්වලින් බිම
නොදකින පිණිස තමාගේ මුහුණ වසාගනු ඇත.
13 2 රාජා 25:7; ජෙරෙ 52:11මාගේ දැල ඔහු පිට
හෙළන්නෙමි. ඔහු මාගේ මලපතට අසු වන්නේ ය.
මම කල්දිවරුන්ගේ දේශය වන බබිලෝනියට ඔහු
ගෙන යන්නෙමි. එහෙත්, ඔහු එය නොදකින්නේ ය.
ඔහු එහි දී මැරෙනු ඇත. 14 ඔහුට උපකාර කරන
පිණිස ඔහු වටකර සිටින සියල්ලන් ද ඔහුගේ හමුදා
ද මම දස දෙස සුළඟෙහි විසුරුවා, කඩුව ගෙන
ඔවුන් ලුහුබැඳ යන්නෙමි.
15 "මා ඔවුන් ජාතීන් අතරට පන්නාදමා විදේශවල
විසුරුවාදැමූ කල්හි, මා සමිඳාණන් වහන්සේ බව
ඔවුන් දැනගනු ඇත. 16 එහෙත්, මම ඔවුන්ගෙන්
ස්වල්ප දෙනෙකු කඩුවෙන් ද සාගතයෙන් ද
වසංගතයෙන් ද ගළවා ඉතිරි කරන්නෙමි. මෙසේ
කරන්නේ, ඔවුන් පැමිණෙන දේශවල සෙනඟට
ඔවුන්ගේ සියලු පිළිකුල්කම් ඔවුන් ප්‍රකාශ කරන
පිණිස ය. එවිට මා සමිඳාණන් වහන්සේ බව ඔවුන්
දැනගනු ඇත."

## 'වෙවුළන දිවැසිවරයා' යන ලකුණ

17 තවද, සමිඳාණන් වහන්සේ මට කතා කොට
මෙසේ වදාළ සේක: 18 "මනුෂ්‍ය පුත්‍රය, නුඹේ
කෑම වෙවුළමින් කා, චංචලකම ද භීතිය ද ඇති ව
වතුර බී, 19 දේශයේ සෙනඟට මෙසේ කියන්න:
'ඉශ්‍රායලේ රටෙහි සිටින ජෙරුසලමේ වැසියන් ගැන
මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ මෙසේ වදාරන
සේක. ඔව්හු තමන්ගේ කෑම භීතියෙන් කා,
තමන්ගේ වතුර කනස්සල්ලෙන් බොන්නෝ ය.
මෙසේ වන්නේ, ඔවුන්ගේ දේශයේ වාසය කරන
සියල්ලන්ගේ සැහැසිකම නිසා ඒ දේශය සහමුලින්
ම පාළු වන පිණිස ය. 20 වැසියන්ගෙන් ගහණ වූ
නගර නාස්ති වී දේශය පාළු වන්නේ ය. මෙසේ මා
සමිඳාණන් බව නුඹලා දැනගන්නහු ය.' "

## වැරදි මත නිවැරැදි කිරීම

21 සමිඳාණන් වහන්සේ මට කතා කොට මෙසේ
වදාළ සේක: 22 "මනුෂ්‍ය පුත්‍රය, 'කාලය ගෙවී
යන්නේ ය; දර්ශන ව්‍යර්ථ වන්නේ ය' කියා
ඉශ්‍රායලේ රටෙහි නුඹලා අතරේ ව්‍යවහාර වන මේ
ප්‍රස්තාව පිරුළේ තේරුම කුමක් ද? 23 'මහෝත්තම
දෙවි ස්වාමින් වහන්සේ මෙසේ වදාරන සේකැ'යි
ඔවුන්ට කියන්න. 'මම මේ ප්‍රස්තාව පිරුළ කීම
නවත්වන්නෙමි; එය ප්‍රස්තාව පිරුළක් වශයෙන්
ඉශ්‍රායලේහි තවත් ව්‍යවහාර නොවන්නේ ය.' එසේ
ය, ඒ දවස ළං වී ඇති බව ද සියලු දර්ශන ඉටු වන
බව ද ඔවුන්ට කියන්න.
24 "මන්ද, තවත් කිසි ව්‍යාජ දර්ශනයක් වත්,
ඉච්චාකාර දිවැස් කීමක් වත් ඉශ්‍රායලේ සෙනඟ
අතරෙහි නොවන්නේ ය. 25 කුමක් නිසා ද, මම
සමිඳාණන් වහන්සේ ය; මා කී දේ කීවා ම ය. එය
තවත් පමා නොවී ඉෂ්ට වනු ඇත. එසේ ය, 'එම්බා
කැරලිකාර වංශය! මම නුඹලාගේ ජීවිත කාලයේ දී
ම මා පැවසූ දේ ඉටු කරන්නෙමි'යි මහෝත්තම දෙවි
ස්වාමින් වහන්සේ වදාරන සේක."
26 නැවත සමිඳාණන් වහන්සේ මට කතා කොට
මෙසේ වදාළ සේක: 27 "මනුෂ්‍ය පුත්‍රය, ඉශ්‍රායලේ
සෙනඟ කතා කොට, 'නුඹ දකින දර්ශන ඉෂ්ටවන්න
බොහෝ දවස් ගත වන්නේ ය' කියා ද 'නුඹ දිවැස්
වැකි කියන්නේ දුර අනාගත කාල ගැන ය' කියා ද
කියති. 28 එබැවින් 'මහෝත්තම දෙවි ස්වාමින්
වහන්සේ මෙසේ වදාරන සේකැ'යි ඔවුන්ට කියන්න.
'මාගේ කිසි වචනයක් තවත් ප්‍රමාද නොවේ; මා කී
දේ කීවා ම ය; එය ඉටු වන්නේ ම යැ'යි
මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ වදාරන සේක."

## බොරු දිවැසිවරුන් හෙළා දැකීම

13 සමිඳාණන් වහන්සේ මට කතා කොට
මෙසේ වදාළ සේක: 2 "මනුෂ්‍ය පුත්‍රය,
දිවැස් වැකි කියන ඉශ්‍රායලේහි දිවැසිවරුන්ට විරුද්ධ
ව නුඹ දිවැස් වැකි කියමින්, සිය සිතින් දිවැස් වැකි
මවා කියන්නන්ට මෙසේ කියන්න: සමිඳාණන්
වහන්සේගේ පණිවුඩය අසන්න.
3 "මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ මෙසේ
කියන සේක. කිසිවක් නොදැක, තමන්ගේ ම හැඟීම්
අනුව දිවැස් කියන මෝඩ දිවැසිවරුන්ට වන විපතක
මහත! 4 අහෝ ඉශ්‍රායලේවරුනි! නුඹලාගේ
දිවැසිවරු පාළු තැන්වල සිටින සිවලුන් හා සමාන වූ
හ. 5 නුඹලා කපොලු මුර කළේ වත්, සමිඳාණන්
වහන්සේගේ දවසේ දී ඇති වන සටනේ දී සවි
සම්පන්න ව සිටීමට නුඹලා ඉශ්‍රායලේ ජාතිය
වටකර පවුරක් ගොඩනැඟුවේ වත් නැත.
6 සමිඳාණන් වහන්සේ ඔවුන් නොඑවූ නමුත්, ඔව්හු,
'සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේකැ'යි
කියති. ඔවුන්ගේ දර්ශන බොරු ය; ඔවුන්ගේ පේන
කීම් මුසාවෝ ය. එහෙත්, ඒවා ඉටු වේ යයි ඔව්හු
බලාපොරොත්තු වෙති. 7 මා කතා නොකළ නමුත්,

සමිඳාණන් වහන්සේ වදාරන සේක' යි නුඹලා
කියන විට නුඹලා දුටුවේ නිෂ්ඵල දර්ශනයක්
නොවේ ද? පැවසුවේ බොරු පේන කීමක් නොවේ
ද?
8 "එබැවින් මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
මෙසේ වදාරන සේක: නුඹලා නිෂ්ඵල දේ
කියන්නටත්, බොරු දර්ශන දකින්නටත් යෙදුණු නිසා,
මනේන, මම නුඹලාට විරුද්ධ ව සිටිමි. 9 මාගේ
බලවත් හස්තය නිෂ්ඵල දර්ශන දකින බොරු දිවැස්
කියන දිවැසිවරුන්ට විරුද්ධ ව ඔසවමි. ඔව්හු මාගේ
සෙනඟගේ සභාවේ නොසිටින්නෝ ය;
ඉශ්රායලේවරුන්ගේ වංශාවලියේ ලියනු
නොලබන්නෝ ය. ඉශ්රායලේ රටට ඇතුළු
නොවන්නෝ ය; මෙසේ මා මහෝත්තම දෙවි
ස්වාමීන් වහන්සේ බව නුඹලා දැනගන්නහු ය.
10 ජරෙ 6:14; 8:11 "මක්නිසා ද සාමය නැති කල්හි
'සාමය'යි ඔව්හු මාගේ සෙනඟ මුළා කරවූවෝ ය;
සෙනඟ තාප්පයක් ගොඩනඟන විට ඔව්හු එහි පදම්
නොකළ බදාම ගාති. 11 පදම් නොකළ බදාම දැමූ
අයට මෙය කියන්න. ධාරානිපාත වැස්සක් එන්නේ ය;
මහා ගල් වර්ෂාවක් කඩා වැටෙනු ඇත; චණ්ඩ
කුණාටුවක් කඩා බිඳ එන්නේ ය; එය වැටෙන්නේ ය.
12 බලන්න, තාප්පය වැටුණු කල, 'නුඹලා ගෑවා වූ
බදාම කොයි දැ'යි මනුෂ්‍යයෝ නුඹලාට නොකියත්
ද?
13 "එබැවින් මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
මෙසේ වදාරන සේක. එය විනාශ කරන පිණිස, මම
උරණ වී චණ්ඩ කුණාටුවක් ද කෝප වී ධාරානිපාත
වැස්සක් ද උදහස් වී ගල් වර්ෂා ද එවන්නෙමි.
14 මෙසේ නුඹලා පදම් නොකළ බදාම ගෑවා වූ
තාප්පය කඩාදමා, මම එහි අත්තිවාරම මතු වන
හැටියට එය බිම හෙළන්නෙමි. එය වැටෙනු ඇත.
නුඹලා ද ඊට යට වී විනාශ වනු ඇත. මෙසේ මා
සමිඳාණන් වහන්සේ බව නුඹලා දැනගන්නහු ය.
15 "මෙසේ මාගේ කෝපය තාප්පය පිටත්, එහි
පදම් නොකළ බදාම ගෑ අය පිටත් වගුරුවා, 'තාප්පය
නැත, එහි බදාම ගෑවා වූ අයත් නැතැ'යි නුඹලාට
කියන්නෙමි. 16 ඔව්හු නම්, ජෙරුසලම ගැන දිවැස්
වැකි කියමින් 'සාමය නැති කල්හි අප උදෙසා සාම
දර්ශන දකින ඉශ්රායලේ දිවැසිවරුය'යි මහෝත්තම
දෙවි ස්වාමීන් වහන්සේ වදාරන සේක."

## බොරු දිවැසිවරියන් හෙළා දැකීම

17 තවද, සමිඳාණන් වහන්සේ මෙසේ වදාළ
සේක: "මනුෂ්‍ය පුත්‍රය, සිය සිතින් දිවැස් වැකි මවා
කියන සෙනඟගේ දූවරුන්ට විරුද්ධ ව නුඹේ මුහුණ
යොමා, ඔවුන්ට විරුද්ධ ව දිවැස් වැකි කියමින්,
18 'මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
කියන සේක: මිනිසුන් තමන් බලයට යටත්
කරගැනීම සඳහා අතේ බඳින පිණිස සියලු දනොට
යන්ත්‍ර මන්ත්‍ර ජප කරන, හිසේ දමාගන්න පිණිස
නන්වැදෑරුම් හිස් වැසුම් මිනිසුන්ට සාදා දෙන
ස්ත්‍රීන්ට වන විපතක මහත! නුඹලා මාගේ
සෙනඟගේ ප්‍රාණ නාස්ති කරමින්, නුඹලාගේ ම
ප්‍රාණ බේරාගන්නට නුඹලාට පුළුවන් ද? 19 බොරු
බස් අසන මාගේ සෙනඟට නුඹලා බොරු කීමෙන් ද
මරණය විඳින්න සුදුසු නැති අය මරමින් ද ජීවත්
වීමට සුදුසු නැති අයට ජීවත් වීමට ඉඩ දෙමින් ද
නුඹලා යව අහුරු හා රොටි කෑලි ලබාගැනීමට
මාගේ සෙනඟ අතරේ මා කෙලෙසුවෙහු ය.
20 " 'එබැවින් මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
මෙසේ වදාරන සේක. මිනිසුන්ගේ ජීවිතයත්,
මරණයත් කරේ බලය පාන පිණිස නුඹලා භාවිත
කරන මන්ත්‍ර නූල්වලට මම ද්වේෂ කරමි. මම ඒවා
නුඹලාගේ අත්වලින් උදුරාදමා, නුඹලා දමනය
කරගෙන සිටින අය නිදහස් කර හරින්නෙමි.
21 නුඹලාගේ හිස් වැසුම් මම ඉරාදමා, මාගේ
සෙනඟ නුඹලාගේ අතින් මුදන්නෙමි. ඔවුන් යටත්
කර ගැනීමට නුඹලාගේ අතට අසුවන්නට ඉඩ
නොදෙමි. මෙසේ මා සමිඳාණන් වහන්සේ බව
නුඹලා දැනගන්නහු ය.
22 " 'ධර්මිෂ්ඨයන් මා අධෛර්ය නොකළ නමුත්,
නුඹලා බොරු කියා ඔවුන් අධෛර්ය කළහු ය. දිවි
ගළවාගන්න පිණිස නපුරු මිනිසුන්ට ඔවුන්ගේ
නපුරුකම් අත්හරින්නට ඉඩ නොදී ඔවුන්ට දිරි
දුන්නහු ය. 23 නුඹලා තවත් නිෂ්ඵල දර්ශන
නොදකින්නහු ය. පේන නොකියන්නහු ය. මම ද
මාගේ සෙනඟ නුඹලාගේ අතින් මුදන්නෙමි. මෙසේ
මා සමිඳාණන් වහන්සේ බව නුඹලා දැනගන්නහු
ය'යි කියන්න."

## රූප වන්දනාව හෙළා දැකීම

14 එකල්හි ඉශ්රායලේවරුන්ගේ ප්‍රජා
මූලිකයන්ගෙන් සමහරු මා ළඟට අවුත් මා
ඉදිරියෙහි හිඳ ගත්තෝ ය. 2 එවිට සමිඳාණන්
වහන්සේ මට කතා කොට මෙසේ වදාළ සේක:
3 "මනුෂ්‍ය පුත්‍රය, මේ මනුෂ්‍යයන් තමන්ගේ දේව
රූපවලට සිය සිත් යොමු කර ඇත; ඔවුන්ගේ
වැටීමට හේතු වන පාපිෂ්ඨ දේ දෙසට නතේ යොමා
ඇත. මාගෙන් විමසන්න ඔවුන්ට කොහෙත් ම ඉඩ
දිය යුතු ද?
4 "එබැවින් ඔවුන් සමඟ කතා කර ඔවුන්ට
කියන්න, 'මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
මෙසේ වදාරන සේක. දේව රූපවලට සිය සිත්
යොමු කරගත්, ඔවුන්ගේ වැටීමට හේතු වන
පාපිෂ්ඨ දෙයට නතේ යොමු කරගත් යම් ඉශ්රායලේ
ජාතිකයකු දිවැසිවරයා වෙත පැමිණියහොත්,
ඔහුගේ දේව රූප බහුල වීම නිසා ස්වාමීන් වන මම
ම ඔහුට පිළිතුරු දෙන්නෙමි. 5 මෙසේ කරන්නේ, මුළු
ඉශ්රායලේ වංශය තමන්ගේ දේව රූප
කරණකොටගෙන මාගෙන් වෙන් ව ගිය බැවින්
ඔවුන් ආපසු මා වෙත දිනාගන්න පිණිස ය.'
6 "එබැවින් ඉශ්රායලේ වංශයට මෙසේ කියන්න:
මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ වදාරන
සේක. හැරී එන්න; නුඹලාගේ දේව රූප

ප්‍රතික්ෂේප කරන්න; නුඹලාගේ සියලු පිළිකුල්
ක්‍රියා අත් හරින්න.
7 "කුමක් නිසා ද, ඉශ්‍රායලේ වංශයෙන් හෝ
ඉශ්‍රායලේවරුන් අතරෙහි වාසය කරන
විදේශීන්ගෙන් හෝ මාගෙන් වෙන් වී තමාගේ දේව
රූපවලට නමස්කාර කරමින්, තමාගේ වැටීමට හේතු
වන දේ කරෙහි සිත් යොමු කරමින් සිටින යම්
කිසිවෙකු දිවැසිවරයෙකු මඟින් මාගෙන් කරුණු
විමසන්න පැමිණි කල්හි සමිඳාණන් වහන්සේ වන
මම ම ඔහුට පෞද්ගලික වශයෙන් පිළිතුරු
දෙන්නෙමි. 8 මම ඒ මනුෂ්‍යයාට විරුද්ධ ව මුහුණ
දෙන්නෙමි. ආදර්ශයක් හා පාඩමක් වශයෙන් මම
ඔහු මාගේ සෙනඟ අතරෙන් නෙරපා දමන්නෙමි.
මෙසේ මා සමිඳාණන් වහන්සේ බව නුඹලා
දැනගන්නහු ය.
9 "දිවැසිවරයා රැවටී කතා කරයි නම්, ඒ
දිවැසිවරයා රවටා ඇත්තේ සමිඳාණෝ වන මම ය.
මම ඔහුට විරුද්ධ ව මාගේ හස්තය දිගු කොට,
මාගේ සෙනඟ වන ඉශ්‍රායලේවරුන් අතරෙන් ඔහු
නෙරපාදමමි. 10 ඔවුන් තමන්ගේ අයුතුකමේ
විපාකය විඳිනු ඇත. දිවැසිවරයාගේ වරදත්,
ඔහුගෙන් විමසන්නාගේ වරදත්, එක හා සමාන ව
බරපතල වන්නේ ය. 11 මෙසේ වන්නේ, ඉශ්‍රායලේ
වංශය මා වෙතින් තවත් මුළා ව නොගොස්,
තමන්ගේ සියලු අපරාධවලින් තවත් නොකෙලෙසී
ඔවුන් මාගේ සෙනඟ වන පිණිසත්, මා ඔවුන්ගේ
දෙවියන් වහන්සේ වන පිණිසත් ය. මෙසේ
පවසන්නේ දෙවියන් වහන්සේ ය."

## ධර්මිෂ්ඨයා පමණක් ජීවත් වීම

12 සමිඳාණන් වහන්සේ තවදුරටත් මට කතා
කොට මෙසේ වදාළ සේක: 13 "මනුෂ්‍ය පුත්‍රය, යම්
දේශයක් ද්‍රෝහිකම් කරමින් මට විරුද්ධ ව පව්
කරන්නේ නම්, මම ඊට විරුද්ධ ව මාගේ අත දිගු
කොට එහි කෑම තොග නැති කරදමා, ඊට විරුද්ධ ව
සාගතය යවා, මනුෂ්‍යයන් සහ මෘගයන් විනාශ
කරදමන්නෙමි. 14 එකල්හි නෝවා ද දානියලේ ද
ජෝබ් ද යන මේ මනුෂ්‍යයන් තිදෙනා එහි සිටියත්,
ඔවුන්ට තමන්ගේ ධර්මිෂ්ඨකමින් ගළවාගත හැකි
වන්නේ ඔවුන්ගේ ම ප්‍රාණ පමණකි. 15 චණ්ඩ
මෘගයන්ට භීතියෙන් කිසිවෙකුට දේශයෙහි ගමන්
කළ නොහැකි වන පරිදි එය පාළුවක් වනතෙක්
නාස්ති කරන පිණිස මා විසින් මෘගයන් එහි යවනු
ලබන විට, 16 ඒ මනුෂ්‍යයන් තිදෙනා එහි සිටියත්,
මාගේ ජීවමාන නාමයෙන් දිවුරා මෙසේ කියමි.
ඔවුන්ට සිය දරුදැරියන් වත් ගළවාගත නොහැකි
වන්නේ ය. ඔවුන්ට ගළවාගත හැකි වන්නේ
ඔවුන්ගේ ම ජීවිත පමණකි. දේශය ද පාළුවක් වනු
ඇත. මෙසේ පවසන්නේ මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ ය.
17 "නොහොත් මා යුද්ධ කඩුවක් ඒ දේශයට
විරුද්ධ ව පමුණුවා, 'කඩුව, දේශය මුළුල්ලෙහි යව'
කියා එතැනින් මනුෂ්‍යයන් සහ මෘගයන් සිඳදමන
විට, 18 ඒ මනුෂ්‍යයන් තුන්දෙනා එහි සිටියත් මාගේ
ජීවමාන නාමයෙන් දිවුරා කියමි. ඔවුන්ට සිය
දරුදැරියන් වත් ගළවාගත නොහැකි වන්නේ ය;
ඔවුන්ට ගළවාගත හැකි වන්නේ ඔවුන්ගේ ම ජීවිත
පමණකැ යි මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
වදාරන සේක.
19 "මා ඒ දේශයට වසංගතය එවා එතැනින්
මනුෂ්‍යයන් ද මෘගයන් ද විනාශ කරදමන පිණිස
මාගේ කෝපය ඒ කරෙහි වගුරුවා බොහෝ දෙනා
විනාශ කරදමන විට, 20 නෝවා ද දානියලේ ද ජෝබ්
ද එහි සිටියත්, මාගේ ජීවමාන නාමයෙන් දිවුරා
කියමි, ඔවුන්ට සිය දරුදැරියන් වත් ගළවාගත
නොහැකි වන්නේ ය; ඔවුන් තමන්ගේ
ධර්මිෂ්ඨකමින් සිය ප්‍රාණය පමණක් ගළවාගනු
ඇත. මෙසේ වදාරන්නේ මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ ය.
21 එළිද 6:8 "තවද, මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේක: 'ජෙරුසලමෙන්
මනුෂ්‍යයන් සහ මෘගයන් ද සිඳදමන පිණිස මා
විසින් ඊට මාගේ තද දඬුවම් සතර වන කඩුව ද
සාගතය ද චණ්ඩ මෘගයන් ද වසංගතය ද යැවූ
කල්හි තව කොපමණ වැඩියෙන් බලාපොරොත්තු
හීන වන්නේ ද? 22 එහෙත්, එහි පුත්‍රයෝ ද දූවරු ද
ස්වල්ප දෙනෙකු ඉතිරි වුණොත් ඔව්හු පිටතට
පමුණුවනු ලබන්නෝ ය. ඔවුන් නුඹලා වෙත
පැමිණෙන විට ඔවුන් දෙස බලන්න. නුඹලා
ඔවුන්ගේ හැසිරීම ද ඔවුන්ගේ ක්‍රියා ද සලකා
බලන්න. එවිට මා ජෙරුසලමට කළ සියලු හානි ද ඒ
පිට පැමිණවූ සියලු විපත්ති ද යුක්ති සහගත බව
නුඹලාට පෙනෙනු ඇත. 23 නුඹලා ඔවුන්ගේ හැසිරීම
ද ක්‍රියා ද දුටු විට නුඹලා සැනසෙනු ඇත. කුමක්
නිසා ද, මා එහි කළ සියල්ල නිකරුණේ නොකළ බව
නුඹලා දැනගනු ඇත. මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේක.' "

## මිදි වැලේ උපමාව

15 සමිඳාණන් වහන්සේ මට කතා කොට
මෙසේ වදාළ සේක: 2 "මනුෂ්‍ය පුත්‍රය,
වනයේ ගසක අත්තක ලීයට වඩා මිදි වැලේ ලීවල
අගයක් තිබේ ද? 3 මිදි වැලේ ලීයෙන් කිසිවක්
තැනිය හැකි ද? නොහොත් යම් භාජනයක් එල්ලා
තබන්න ඇබයක් වත් සාදාගත හැකි ද? 4 බලන්න,
එය දර පිණිස ගින්නට දැමෙයි. එහි කොන් දෙක
ගින්නෙන් දැවී ගොස් මැදත් අඟුරු වී ඇත. එය යම්
වැඩකට සුදුසු ද? 5 එය හොඳින් තිබිය දී වත් කිසි
වැඩකට සුදුසු නො වී ය. එසේ නම්, එය ගින්නෙහි
දැවී අඟුරු වී තිබිය දී කිසිවකට සුදුසු වන්නේ
කෙසේ ද? යම් වැඩකට යොදාගත හැකි ද?
6 "එබැවින් මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
මෙසේ වදාරන සේක: 'මම වනයෙන් මිදි වැලේ ලීය
ගෙන පුළුස්සාදැමුවාක් මෙන් ජෙරුසලම් වැසියන්ට
දඬුවම් කරන්නෙමි. 7 මම ඔවුන්ට විරුද්ධ ව මුහුණ
දෙන්නෙමි. ඔවුන් ගින්නෙන් බේරී ගිය නමුත්, දැන්

ගින්නෙන් ඔවුන් දැවී යනු ඇත. මා ඔවුන්ට විරුද්ධ ව
මාගේ මුහුණ අහකට හරවාගත් විට මා සමිඳාණන්
වහන්සේ බව නුඹලා දැනගන්නහු ය. 8 ඔවුන්
ද්‍රෝහිකම් කළ නිසා මම දේශය මරුකතරක්
කරන්නෙමි.’ ”

## අවිශ්වාසී ජෙරුසලම

16 නැවතත් සමිඳාණන් වහන්සේ මට කතා
කොට මෙසේ වදාළ සේක: 2 “මනුෂ්‍ය
පුත්‍රය, ජෙරුසලමට ඇගේ පිළිකුල් ක්‍රියා දන්වමින්
මෙසේ කියන්න: 3 ‘මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ ජෙරුසලමට මෙසේ වදාරන සේක. ”
3 “ ‘ආරම්භය හා උපත අනුව නුඹ
කානානිවරුන්ගේ දේශයට අයිති ය. නුඹේ පියා
අමෝරිය ජාතිකයෙකි. නුඹේ මව හිත්තීය ජාතික
ස්ත්‍රියකි. 4 නුඹ උපන් දවසේ දී, නුඹ උපන් කල
කිසිවකු නුඹේ පෙකෙනිවැළ කැපුවේ වත්, පිරිසිදු
කිරීමට නුඹ වතුරෙන් නෑවුවේ වත්, නුඹේ ඇඟේ
ලුණු කොහෙත් ම ගෑවේ වත්, නුඹ හාන් රෙදිවලින්
එතුවේ වත් නැත. 5 නුඹට අනුකම්පා කොට
මේවායින් එකක් වත් නුඹට කරන පිණිස කිසිවකේ
නුඹ දෙස දයාවෙන් නොබැලුවේ ය. නුඹ උපන්
දවසේ දී නුඹ පිළිකුල් කරනු ලැබ නුඹ එළිමහනේ
පිටතට විසි කරදමනු ලැබුවෙහි ය.
6 “ ‘මා නුඹ ළඟින් යන විට නුඹ ලේවල වැතිර
සිටිනු දැක, ‘නුඹ ලේවල වැතිර සිටිය දී ජීවත් වී
7 කෙතේ පැළයක් මෙන් වැඩෙන්නැ’යි මම කීවෙමි.
නුඹ ද වැඩී, උස් වී පූර්ණ වියට පැමිණියෙහි ය.
නුඹේ පියයුරු සෑදුණේ ය. නුඹේ ඉසකේ ද වැඩුණේ
ය. එහෙත්, නුඹ නිර්වස්ත්‍ර ව නග්න ව සිටියෙහි ය.
8 “ ‘යළිත් මම නුඹ ළඟින් යන විට නුඹ පෙමේ
බැඳීමේ වයසට පැමිණ සිටි බව දිටිමි. මම මාගේ
වස්ත්‍රය නුඹ පිට අතුරා, නුඹේ නිර්වස්ත්‍රකම වසා,
නුඹට දිවුරුම් දී, නුඹ සමඟ ගිවිසුමක් කර, ‘නුඹ ද
මට අයිති වූවෙහි ය’යි මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ වදාළ සේක.
9 “ ‘එවිට මම නුඹ වතුරෙන් නාවා, නුඹේ සිරුරෙන්
ලේ සෝදා හැර නුඹ තෙලින් ආලේප කළෙමි.
10 විසිතුරු වැඩදැමූ වස්ත්‍ර මම නුඹට පළඳවා, කදිම
හම් පාවහන් නුඹට දමා, සිහින් හණ රෙදි පිළියෙන්
වසා පට රෙදිවලින් නුඹ සැරසුවෙමි. 11 මම
ආභරණවලින් නුඹ සරසමින්, නුඹේ අත්වල වළලු ද
නුඹේ ගෙලෙ වටා මාලයක් ද දැමුවෙමි. 12 නුඹේ
නාසයේ ආභරණයක් ද නුඹේ කන්වල
කුණ්ඩලාභරණ ද නුඹේ හිසේ අලංකාර ඔටුන්නක්
ද තැබුවෙමි. 13 මෙසේ නුඹ රන් රිදීවලින් සැරසී
සිටියෙහි ය; නුඹේ වස්ත්‍ර සිහින් හණ රෙදිවලින් හා
විසිතුරු දුහුල් රෙදිවලින් විය. නුඹ සිහින් පිටි ද මී
පැණි ද තෙලේ ද කෑවෙහි ය. නුඹ අතිශයින් ම
ශෝභමාන වී රැජිනක බවට පත් වූයෙහි ය.
14 නුඹේ ශෝභනකම නිසා නුඹේ යසගොස දස
දෙස පැතිර ගියේ ය. මක්නිසා ද, මා නුඹ කෙරෙහි
තැබූ මාගේ තේජස නිසා නුඹේ ශෝභමානකම
පරිපූර්ණ වී ය. මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
මෙසේ වදාරන සේක.
15 “ ‘මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක. එහෙත්, නුඹේ ශෝභමානකම පිට
නුඹ විශ්වාසය තබා, නුඹේ කීර්තිය වේශ්‍යාකම්
කිරීමට වාසියක් කරගෙන, ළඟින් යන එකිනෙකා
නුඹේ වේශ්‍යාකමට පොළඹවා ගත්තෙහි ය.
16 නුඹේ වස්ත්‍රවලින් සමහරක් නුඹ රැගෙන,
විසිතුරු වර්ණවත් ගිරිකුළු දේවාල සාදාගෙන එහි
වේශ්‍යාකම් කළෙහි ය. එවැන්නක් පෙර සිදු වුණේ
වත්, මතු සිදු වන්නේ වත් නැත. 17 මා නුඹට දුන්
මාගේ රන් රිදීවලින් සෑදූ නුඹේ ලක්ෂණ ආභරණ
රැගෙන, නුඹ පුරුෂයන්ගේ රූප සාදාගෙන ඒවා සමඟ
වේශ්‍යාකම් කළෙහි ය. 18 නුඹේ විසිතුරු
වස්ත්‍රවලින් නුඹ ඒවා වසා, මාගේ තෙලේ ද මාගේ
සුගන්ධ ද්‍රව්‍ය ද ඒවා ඉදිරියෙහි පූජා කළෙහි ය.
19 මා විසින් නුඹට දෙන ලද මාගේ කෑම වන සිහින්
පිටි ද තෙලේ ද මී පැණි ද නුඹ මිහිරි සුවඳ පිණිස
ඒවා ඉදිරියෙහි පූජා කළෙහි ය.
20 “ ‘තවද, මා උදෙසා නුඹ වැදූ නුඹේ දරුදැරියන් ද
රැගෙන නුඹ ඒ පිළිමවලට ආහාර මෙන් පූජා
කළෙහි ය. 21 නුඹ වේශ්‍යාකම් කළා පමණක්
නොව, නුඹ මාගේ දරුවන් ඝාතනය කර ගිනි
පූජාවක් ලෙස ඔප්පු කළෙහි ය. 22 නුඹේ සියලු
පිළිකුල් ක්‍රියාවල දී ද වේශ්‍යාකම්වල දී ද නුඹ
නිර්වස්ත්‍ර ව, නග්න ව, නුඹේ ලේවල වැතිර සිටි
නුඹේ බාල කාලය නුඹ කවදාවත් සිහි නො
කළෙහි ය.’ ”

## වේශ්‍යාකම් කළ ජෙරුසලම

23 “ ‘එම්බා ජෙරුසලම! නුඹට වන දරුණු විපතක
මහතැ’යි මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
වදාරන සේක. මන්ද, නුඹේ සියලු දුෂ්ටකම්වලට
පසු, 24 නුඹ සෑම වීදියක ප්‍රසිද්ධ තැන්වල
වේශ්‍යාකම් කිරීම සඳහා ද දේව රූපවලට නැමදීම
සඳහා ද ස්ථාන සාදාගත්තෙහි ය. 25 නුඹ සියලු
මංසන්ධිවල නුඹේ ගිරිකුළු දේවාල ගොඩනගාගෙන,
නුඹේ ශෝභමානකම පිළිකුල්කමට පමුණුවා, ළඟින්
යන සියල්ලන්ට කම් සැප සඳහා සිරුර භාර දී
වේශ්‍යාකම් පිට වේශ්‍යාකම් කරගත්තෙහි ය.
26 තවද කම් සැපට සුපුරුදු, ශරීරයෙන් තර ව සිටින
නුඹේ අසල්වාසීන් වන මිසර වැසියන් සමඟ නුඹ
වේශ්‍යාකම් කොට මා කෝප කරවන ලෙස නුඹේ
වේශ්‍යාකම් වැඩි කරගත්තෙහි ය.
27 “ ‘එබැවින් මම මාගේ අත නුඹට විරුද්ධ ව දිගු
කොට, නුඹේ කෑම කොටස අඩු කර, නුඹට වෛර
වන, නුඹේ සල්ලාල ජීවිතය ගැන ලජ්ජාවට පත් ව
සිටින, පිලිස්තිවරුන්ගේ කාන්තාවන්ගේ ආශාවට
නුඹ භාර දිනිමි.
28 “ ‘එයින් ද නුඹ සෑහීමට පත් නොවී, නුඹ
අසිරියන්වරුන් සමඟ ද වේශ්‍යාකම් කළෙහි ය.
29 නුඹ කානාන් දේශයෙහි දී කල්දියාව දක්වාත්

නුඹේ වේශ්‍යාකම් වැඩි කරගත්තෙහි ය. එහෙත්,
නුඹ එයිනුත් සෑහීමට නොපැමිණියෙහි ය.
30 “ ‘අසංවර වේශ්‍යා ස්ත්‍රියකගේ ක්‍රියා වන
මේ සියල්ල කරන නුඹ දොළෙදුකින් සිටිනු නොවේ
දැ යි මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ අසන
සේක. 31 එසේ ය, නුඹේ සියලු මාර්ගවල නුඹ
යහන් තනාගෙන සියලු වීදිවල නුඹේ කඳු මත
පූජාස්ථාන සාදාගත්තෙහි ය. එහෙත්, සාමාන්‍ය
වෙසඟනක සේ නුඹට මුදල් ලබාගැනීමේ ආශාවක්
නැත. 32 නුඹ නම්, සිය ස්වාමි පුරුෂයාට ප්‍රේම
කරනු වෙනුවට අමුත්තන් සමඟ කම් සැප විඳින
ස්ත්‍රියක වැනි ය. 33 සියලු වේශ්‍යාවන්ට යම්
මුදලක් ගෙවෙනු ලැබේ. එහෙත්, නුඹ නුඹේ සියලු
පෙම්වතුන්ට නුඹේ මුදල් දී, නුඹ සමඟ වේශ්‍යාකම්
කිරීමට, හැම අතින් ම නුඹ සමඟ කම් සැපෙහි
යෙදෙන්න නුඹ ඔවුන්ට තෑගි බෝග දුන්නෙහි ය.
34 එබැවින් නුඹේ වේශ්‍යාකම්වල දී නුඹේ හැසිරීම
අන් ස්ත්‍රීන්ට වඩා වෙනස් ය. කුමක් නිසා ද,
වේශ්‍යාකමට කිසිවෙක් නුඹ පස්සේ එන්නේ නැත.
නුඹ මුදල් දෙනවා මිස කිසිවෙක් නුඹට මුදල්
දෙන්නේ නැත. මේ නිසා නුඹ අන් වෙසඟනන්ට
වඩා වෙනස් ය.’ ”

## ජෙරුසලම කෙරෙහි දේව විනිශ්චය

35 “ ‘එබැවින්, එම්බා වෙසඟනක වන ජෙරුසලම!
සමිඳාණන් වහන්සේගේ පණිවුඩයට සවන් දෙන්න.
මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ වදාරන
සේක:
36 “ ‘නුඹ විළිබිය නොතකා, නග්න වී, නුඹේ
පෙම්වතුන් හා පිළිකුල් රූප සමඟ වේශ්‍යාකම්
කළෙහි ය. ඒ රූපවලට පූජාවන් මෙන් දරුවන්
මැරුවෙහි ය. 37 එබැවින් නුඹ කම් සැපට
වසඟකරගත් නුඹේ සියලු ප්‍රේමවන්තයන් ද නුඹ
ප්‍රේම කළ සියල්ලන් ද නුඹ වෛර කළ සියල්ලන් ද
මම රැස් කරමි. මම ඔවුන් නුඹට විරුද්ධ ව නුඹ
වටේට රැස් කොට, ඔවුන් නුඹේ නග්න භාවය
දකින පිණිස නුඹ නිරුවත් කොට දක්වාලමි. 38 පර
පුරුෂ සේවනයෙහි යෙදෙන මිනීමරු කාන්තාවන්ට ම
දිය යුතු නිසි විනිශ්චය දී, නුඹට දඬුවම් කොට නුඹ
උදහසට හා කෝපයට ලක් කිරීමට මම
සලසන්නෙමි. 39 මම නුඹ ඔවුන්ට පාවා දෙන්නෙමි.
ඔවුන් නුඹේ උස් තැන් සමතලා කර, ගිරිකුළු දේවාල
කඩාදමා, නුඹේ වස්ත්‍ර ඉරාදමා, නුඹේ අලංකාර
ආභරණ ගලවා නුඹ සහමුලින් ම නිර්වස්ත්‍ර කරනු
ඇත.
40 “ ‘ඔවුන් නුඹට විරුද්ධ ව සෙනඟක් පොළඹවා,
නුඹට ගල් ගසා, ඔවුන් තමන්ගේ කඩුවලින් නුඹ
කපා කැබලි කරනු ඇත. 41 ඔවුන් නුඹේ ගෙවල්
ගිනි ලා, බොහෝ ස්ත්‍රීන් බලා සිටිය දී නුඹ
කෙරෙහි විනිශ්චය ඉෂ්ට කරනු ඇත. වේශ්‍යාකම්
කිරීමෙන් මම නුඹ නවත්වන්නෙමි; පෙම්වතුන්ට
මුදල් දීම ද නවත්වන්නෙමි. 42 මෙසේ නුඹට විරුද්ධ
ව ඇති මාගේ උදහස ද මාගේ ඊර්ෂ්‍යාව ද නුඹ
කෙරෙන් පහ ව යනු ඇත. මම සන්සුන් ව තවත්
උදහස් නොවී සිටින්නෙමි. 43 නුඹ නුඹේ බාල කාලය
අමතක කොට, නුඹ කළ සියල්ලෙන් මා උදහස් කළ
බැවින් එහි දුර්විපාක මම නුඹ පිට පැමිණෙව්වෙමි.
නුඹ ද නුඹේ සියලු පිළිකුල් ක්‍රියා මදිවාට, මේ
නපුරු දුෂ්යකම් කළේ මන්දැ යි මහෝත්තම දෙවි
ස්වාමීන් වහන්සේ පවසන සේක.’ ”

## මව යම් සේ ද දුවත් එසේ ම ය

44 “උපමා කියන අය, ‘මව යම් සේ ද දුවත් එසේ
ම ය’ යන මේ ප්‍රස්තාව පිරුළ නුඹ ගැන කියනු
ඇත. 45 ඇත්තට ම නුඹ පුරුෂයාටත්, දරුවාටත්
ද්වේෂ කළ මවගේ දුව ය; නුඹ පුරුෂයන්ට ද
දරුවන්ට ද ද්වේෂ කළ නුඹේ සහෝදරියන්ගේ
සහෝදරී ය. නුඹේ මව හිත්තීය ජාතික ස්ත්‍රියක් ය.
නුඹේ පියා අමෝරිය ජාතිකයෙකේ ය.
46 “නුඹේ වැඩිමහල් සහෝදරී වූකලී නුඹට උතුරු
පැත්තෙන් සිය දූවරුන් සමඟ වාසය කරන සමාරිය
දේශය වේ. නුඹේ බාල සහෝදරී නුඹට දකුණු
පසින් සිය දූවරුන් සමඟ වාසය කරන සොදොම්
පෙදෙස වේ. 47 එහෙත්, නුඹ ඔවුන් ගිය මාර්ගයෙන්
යෑමෙන් වත්, ඔවුන් කළ පිළිකුල් ක්‍රියා කිරීමෙන්
වත් සෑහීමට නොපැමිණ නොබෝ කලකින්
ඔවුන්ටත් වඩා නුඹේ කල්ක්‍රියාවෙන් දුෂ්ටකම්
කළෙහි ය.
48 “මාගේ ජීවමාන නාමයෙන් මෙසේ දිවුරා කියමි;
නුඹ සහ නුඹේ දූවරුන් කළ ලෙස නුඹේ සහෝදරී වූ
සොදොම සහ ඇගේ දූවරුන් කළේ නැත් මැ යි
මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ වදාරන සේක.
49 නුඹේ සහෝදරී වූ සොදොමේගේ අපරාධ මෙසේ
ය: ඈ සහ ඇගේ දූවරු අහංකාරී ව සිටියහ; අධික
ආහාර ද සැප පහසුකම් ද ඇති ව සිටියහ. එහෙත්,
ඔවුන් අසරණයන් ද දිළිඳුන් ද සැලකුවේ නැත.
50 ඔවුන් උඩඟු ව සිට මා ඉදිරියෙහි පිළිකුල් ක්‍රියා
කළ බැවින්, එය දුටු විට මම ඔවුන් ඉවත් කළෙමි.
51 “සමාරිය නුඹ කළ පව්වලින් අර්ධයක් වත්
නොකළා ය. නුඹ ඔවුන්ට වඩා අධික ලෙස පිළිකුල්
ක්‍රියා කළෙහි ය. ඒ සමඟ සැසඳූ විට නුඹේ
සහෝදරියන් පෙනෙන්නේ ධර්මිෂ්ඨයන් වශයෙනි.
52 නුඹේ සහෝදරියන්ට යුතු ය යි නුඹ සිතූ ලජ්ජාව
දැන් නුඹ දරාගත යුතු ය. ඔවුන්ගේ පාපවලට වඩා
නුඹේ පාප කොතරම් පිළිකුල් සහිත දැ යි කීවොත්,
නුඹ හා සසඳා බැලූ විට ඔවුන් නුඹට වඩා
ධර්මිෂ්ඨයන් සේ පෙනේ. මෙසේ නුඹ නුඹේ
සහෝදරියන් ධර්මිෂ්ඨ ලෙස පෙනෙන්නට සැලැසූ
බැවින් ලජ්ජාවට පැමිණ නුඹේ නින්දාව දරාගන්න.”

## සොදොම් හා සමාරියේ පුනරුත්ථාපනය

53 “සමිඳාණන් වහන්සේ ජෙරුසලම අමතා මෙසේ
වදාළ සේක: ‘සොදොම් සහ එහි ගම් ද සමාරිය
සහ එහි ගම් ද මම යළි සමෘද්ධිමත් කරන්නෙමි.
එසේ ම ජෙරුසලම, මම නුඹ ද ඔවුන් මැද
සමෘද්ධිමත් කරන්නෙමි. 54 නුඹ ගැන ම නුඹ

ලජ්ජාවට පැමිණෙන්නෙහි ය. නුඹේ නින්දාවට සම
කළ විට නුඹේ සහෝදරියන් කොතරම් සමෘද්ධිමත්
දැ යි පෙනී යනු ඇත. 55 නුඹේ සහෝදරියන් වන
සොදොම් සහ එහි ගම් ද තමන්ගේ පළමු
ස්වභාවයට පැමිණෙනු ඇත; සමාරිය සහ එහි ගම් ද
තමන්ගේ පළමු ස්වභාවයට පැමිණෙනු ඇත; නුඹ
සහ නුඹේ ගම් ද නුඹලාගේ පළමු ස්වභාවයට
පැමිණෙනු ඇත. 56+EZK නුඹේ දූෂණ හෙළි කරනු
ලබන්න පෙර, නුඹ අහංකාරී ව සිටි කාලයේ දී නුඹ
සොදොම්ට උසුළු-විසුළු කළා නොවේ ද? දැන් නුඹ
සොදොම් මෙන් ඒදොම්වරුන්ට ද පිලිස්තිවරුන්ට ද
විහිළුවක් වී ඇත. නුඹට ද්වේෂ කළ නුඹේ
අසල්වාසීන්ට ද නුඹ විහිළුවක් වී ඇත. 58 නුඹ කළ
අශික්ෂිත පිළිකුල් කටයුතු ක්‍රියාවල විපාකය නුඹ
දැරිය යුතු ය.' මෙසේ පැවසුවේ සමිඳාණන්
වහන්සේ ය."

## සදහට ම පවතින ගිවිසුමක්

59 "මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක: 'ගිවිසුම කඩ කරමින්, දිවුරුම සුළු
කළ නුඹේ ක්‍රියාවලට සුදුසු ලෙස මම නුඹ ගැන
ක්‍රියා කරන්නෙමි. 60 එහෙත්, මා නුඹේ බාල
කාලයේ දී නුඹ සමඟ කළ මාගේ ගිවිසුම සිහි
කොට, සදහට ම පවතින ගිවිසුමක් නුඹ සමඟ
කරන්නෙමි. 61 නුඹේ වැඩිමහල් වූ ද බාල වූ ද
සහෝදරියන් ආපසු පිළිගත් විට නුඹ නුඹේ
කල්ක්‍රියාව සිහි කොට ලජ්ජාවන්නෙහි ය. නුඹ
සමඟ මා කළ ගිවිසුමේ කොටසක් නොවූවත්, මම
ඔවුන් දූවරුන් කොට නුඹට දෙන්නෙමි. 62 මාගේ
ගිවිසුම නුඹ සමඟ යළි පිහිටුවන්නෙමි. එවිට මා
සමිඳාණන් වහන්සේ බව නුඹ දැනගන්නෙහි ය.
63 නුඹ කළ සියලු වරදට මම නුඹට කමා වන්නෙමි.
එහෙත්, නුඹ ඒවා සිහි කොට ලජ්ජාවෙන් තවත් කට
නෑර සිටින්නෙහි ය. 'මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේක."

## රාජාලීන් හා මිදිවැල ගැන උපමාව

17 සමිඳාණන් වහන්සේ මට කතාකොට
මෙසේ වදාළ සේක: 2 "මනුෂ්‍ය පුත්‍රය, නුඹ
ඉශ්‍රායලේ වංශයට ප්‍රහේලිකාවක් ද උපමාවක් ද
කියමින්, 3 'මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
මෙසේ වදාරන සේකැ'යි පවසන්න. 'විශාල පියාපත්
ද දිග පිහාටු ද නා නා පැහැ ඇති පිහාටු රුසකින් ද
විසිතුරු වූ යෝධ රාජාලියකේ ලෙබනොන්ට අවුත්
කිහිරි ගහේ මුදුන කඩා ගත්තේ ය. 4 ඔහු එහි
මුදුන් රිකිලි කඩා, වෙළෙහෙළෙඳාම් කරන දේශයකට
එය ගෙනවුත් වෙළෙඳුන්ගේ නුවරක එය සිටවේවේ
ය. 5 ඔහු දේශයෙන් පැළෑටියක් රැගෙන සාරවත්
බිමක සිටවේවේ ය. ඔහු එය බොහෝ දිය ඇති
ගඟක් ළඟ පැළෑටියක් මෙන් සිටවේවේ ය. 6 එය
වැඩී පැතිරී යන විට මිදි වැලක් වී ය. එහි අතු
රාජාලියා දෙසට වැඩී ගියේ ය. එහි මුල් ගැඹුරට ඇදී
ගියේ ය. මෙසේ එහි අතු රිකිලි විහිදී මිදි වැලක්
විය.
7 " 'තවද, මහා පියාපත් සහ බොහෝ පිහාටු ඇති
තවත් යෝධ රාජාලියකේ විය. එවිට අර මිදි වැල
සිය මුල් ඔහු දෙසට හරවා, ඔහු එයට වතුර වත්
කරනු ඇතැ යි යන බලාපොරොත්තුවෙන් එහි
පිහිටුවා තිබුණු පාත්තිවලින් එහි අතු ඔහු දෙසට
හැරවේවේ ය. 8 සරු සාර මිදි වැලක් වනු වස්, අතු
ලියලා පල දෙනු පිණිස එය සාරවත් බිමක බොහෝ
දිය ඇති ගඟක් ළඟ හිටවා තිබුණේ ය.
9 " 'මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
අසන සේකැ යි කියන්න. ඒ මිදි වැල සඵල වේ ද?
එය වියළී යන පිණිස පළමු රාජාලියා එහි මුල් උදුරා,
පල කඩාදමා සියලු ළා දලු වියළී යන්නට හරින්නේ
නැද් ද? මුල් පිටින් එය උදුරාදමන්නට ශක්තිසම්පන්න
හස්තයක් වත්, බලවත් සෙනඟ වත් ඕනෑ
නොවන්නේ ය. 10 එය අන් තැනක සිටුවා තිබෙනෙ
නමුත්, එය සශ්‍රීක වේ ද? පෙරදිග සුළඟ ඊට වදින
විට එය සහමුලින් ම වියළී නොයන්නේ ද? එය
වැඩෙනෙ පාත්තිවල ම එය වියළී යන්නේ නැද් ද?' "

## උපමාවේ තේරුම

11 සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ සේක:
12 2 රාජා 24:15-20; 2 වංශා 36:10-13"මේ කරුණු
කවරේ ද කියා නුඹලා දන්නේ නැද්දැ"යි කැරලිකාර
වංශයට කියන්න. බබිලෝනියේ රජ ජෙරුසලමට
අවුත් එහි රජු සහ එහි අධිපතීන් ද රැගෙන තමා
සමඟ බබිලෝනියට ගෙන ගියේ ය.
13 "ඔහු රාජ වංශයේ කෙනෙකු ගෙන, ඔහු සමඟ
ගිවිසුමක් කොට, ඔහු විශ්වාස ව සිටින බවට
දිවුරුම් ගත්තේ ය. ඉක්බිති ඔහු දේශයේ ප්‍රධානීන්
ගෙන ගියේ ය. 14 මෙසේ කළේ, රාජ්‍යය පහත්
තත්ත්වයේ ම සිට උසස් නොවන පිණිසත්, ගිවිසුම
පවත්වන බවට සහතික වන ලෙසත් ය. 15 එහෙත්,
ජුදාවේ රජ කැරලිගසා අශ්වයන් සහ බොහෝ
සෙනඟ ලබාගන්න පිණිස තමාගේ තානාපතියන්
මිසරයට යැව්වේ ය. ඔහු ජය ගනීවි ද? මෙබඳු දේ
කරන්නාට ගැළවෙන්න පුළුවන් ද? ගිවිසුම කඩ
කළායින් පසුත් ඔහුට ගැළවෙන්න හැකි වේ ද?
16 "මහෝත්තම දෙවි ස්වාමීන් වන මම මාගේ
ජීවමාන නාමයෙන් දිවුරා මෙසේ කියමි: 'ඔහු
රජකමට පත් කළ රජුගේ දිවුරුම් ඔහු සුළු කොට
ඔහුගේ ගිවිසුම කඩ කළ නිසා, ඔහු ඒ රජු වාසය
කරන බබිලෝනියේ දී ම ඒ රජු ළඟ ම නසින්නේ
ය. 17 ඔහු බොහෝ දෙනෙකු සිඳදමන පිණිස පස්
කඳු සාදා බලකොටු ගොඩනඟන කල, යුද්ධයෙහි දී
පාරාවෝ තමාගේ බලවත් සේනාව ද මහා සමූහය
ද ඇති ව ඔහු උදෙසා කිසි උදව්වක් කරන්නේ නැත.
18 මන්ද, ඔහු ගිවිසුම කඩ කර දිවුරුම සුළු කළේ
ය. ඔහු අත හිත දී තිබුණ නමුත්, මේ සියල්ල
කළේ ය. ඔහු නොගැළවෙන්නේ ය.' "

19 එබැවින් මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
මසෙේ වදාරන සේක: "මාගේ ජීවමාන නාමයනේ
දිවුරා මසෙේ කියමි: ඔහු සුළු කළෙේ මාගේ දිවුරුම
ය; ඔහු කඩ කළෙේත් මාගේ ගිවිසුම ය; මම ද
ඔහුට දුර්විපාක දනේනමේ. 20 මාගේ දැල ඔහු පිට
හළෙන්නමේ. ඔහු මාගේ මලපතට අසු වන්නේ ය.
මම ඔහු බබිලෝනියට පමුණුවා, මට විරුද්ධ ව කර
තිබනෙ ඔහුගේ ද්රෝහිකම ගැන එහි දී ඔහු
විනිශ්චයයට පමුණුවන්නමේ. 21 ඔහුගේ සියලු
හමුදාවලින් පලා යන සියල්ලන් කඩු පහරින් වැටනෙු
ඇත. ඉතිරි වන අය සියලු දිශාවලට විසුරුවනු ලබනු
ඇත. නුඹලා ද සමිඳාණන් වහන්සේ වන මා එසේ
කී බව දැනගන්නහු ය."

### දවේියන් වහන්සේගේ පරොරොන්දුව

22 මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මසෙේ
වදාරන සේක:
q2 22 "උස් වූ කිහිරි ගස් මුදුනනේ මම ම රිකිල්ලක්
ගනෙ එය සිටුවන්නමේ.
q2 22 එහි මුදුන් රිකිලිවලින් ළපටි රිකිල්ලක්
කඩාගනෙ උසට උසේ ඇති කන්දක් මුදුනේ
සිටුවන්නමේ.
23 මම එය උස් වූ ඉශ්රායලේ කන්ද උඩ
සිටුවන්නමේ.
q2 23 එයින් අතු ලියලන්නේ ය;
q2 23 එහි පලදාව හටගන්නේ ය;
q2 23 එය උතුම් කිහිරි ගසක් වන්නේ ය.
q2 23 පියාපත් ඇති සියලු ආකාර පක්ෂීහු යට
ලගින්නෝ ය.
q2 23 ඒ අතුවල සවෙණහෙි උන් ලගිනු ඇත.
24 එවිට, ස්වාමීන් වන මා උස් ගහ පහත් කළ
බවත්, මිටි ගහ උස් කළ බවත්, සරු ගහ වියළි කළ
බවත්, වියළි ගහ සරුකර ඇති බවත් දේශයේ සියලු
ගස් දැනගනු ඇත.
q2 24 ස්වාමීන් වන මම මසෙේ වදාළමේ;
q2 24 වදාළ ලසෙ ම කරමි."

### පෞද්ගලික වගකීම

18 සමිඳාණන් වහන්සේ මට යළිත් මසෙේ
වදාළ සේක:
2 " 'පියවරු ඇඹුල් මිදි පල කෑවෝ ය; දරුවන්ගේ
දත් හිරි වැටනේනේ ය' යන ප්රස්තාව පිරුළ නුඹලා
ඉශ්රායලේ රටහෙි නැවත නැවත කියන්නේ මන්
ද?ජරෙ 31:29
3 "ඉශ්රායලේහි මේ ප්රස්තාව පිරුළ මින්පසු කියනු
නොලැබේ යයි මහෝත්තම දෙවි ස්වාමීන් වන මම
මාගේ නාමයනේ දිවුරා කියමි. 4 බලන්න, හැම
ජීවිතයක් ම මට අයිති ය; පියාගේ ජීවිතය මනේ
පුත්රයාගේ ජීවිතයත් මට අයිති ය. පාපයේ
ප්රතිවිපාකය විඳින්නේ පව් කළ පුද්ගලයා ම ය.
5 "දැහැමි මිනිසා නීති ගරුක, අහිංසක පුද්ගලයකේ,
6 ඔහු කිසි කලක කඳු මත පූජාස්ථානවල කෑම
කන්නේ නැත; ඉශ්රායලේහි දේව රූප දසෙට නතේ
යොමු කරන්නේ නැත; අන් කනෙකුෙගේ භාර්යාව
දූෂණය කරන්නේ නැත; ඔසප් වී සිටින ස්ත්රියක
වතෙ ළඟා වන්නේ නැත; 7 කිසිවකුෙට පීඩා
කරන්නේ නැත; ඔහු ණයට ගත් තැනැත්තාගේ
උකස ආපසු දනේනේ ය; සොරකම් නොකරන්නේ
ය; සාගින්නේ පළෙනේනාට තමාගේ කෑම දනේනේ
ය, වස්ත්ර නැති අයට වස්ත්ර දනේනේ ය; 8 ඔහු
පොලියට මුදල් නොදයෙි; අයුතු ලාභ නොගනියි;
නපුරනේ වැළකයෙි. එකිනකො අතරේ සාධාරණ
ලසෙ යුක්තිය ඉටු කරයි; 9 ලවේ 18:5මාගේ පණත්
ප්රකාර හැසිරයෙි. මාගේ නියමයන් අවංක ව
පවත්වයි. එවැනි මිනිසකේ ධර්මිෂ්ඨ ය. ඔහු
සැබැවින් ම ජීවත් වන්නේ ය. මහෝත්තම දෙවි
ස්වාමීන් වහන්සේ මසෙේ වදාරන සේක.
10 "මේ මිනිසාට සැහැසිකම් කරන, මිනීමරුවකු
වන, මේ නියමයන්ට පිටුපාන පුත්රයකුෙ සිටින්නට
පුළුවන. පියා කිසි අයුතුකමක් නොකළ නමුත්,
11 මේ පුත්රයා කඳු මත පූජාස්ථානවල කෑම
කන්නේ ය; අන් කනෙකුෙගේ භාර්යාව දූෂණය
කරන්නේ ය. 12 අසරණයාට ද දිළින්දාට ද පීඩා
කොට කොල්ලකන්නේ ය; ණයට ගත්
තැනැත්තාගේ උකස ආපසු නොදනේනේ ය; දේව
රූප දසෙට නතේ යොමා, 13 පිළිකුල් ක්රියා
කරන්නේ ය; පොලියට දී අයුතු ලාභ ද ගන්නේ ය.
ඒ පුත්රයා ජීවත් වන්නේ ද? නැත. ඔහු ජීවත්
වන්නේ නැත. ඔහු මේ සියලු පිළිකුල් ක්රියා කළ
බැවින් ඔහු සැබැවින් ම නසින්නේ ය. ඔහුගේ
විනාශයට ඔහු ම වගකිව යුතු වේ.
14 "එහතේ, ඒ මිනිසාගේ මේ පුත්රයාට, තමාගේ
පියා කළ සියලු පාප දැක, බිය වී, එලසෙ නොකරන
පුතකුෙ සිටින්නට පුළුවන. 15 ඔහු කිසි කලක කඳු
මත පූජාස්ථානවල කෑම කන්නේ නැත; ඉශ්රායලේහි
දේව රූප දසෙට නතේ යොමු කරන්නේ නැත. අන්
කනෙකුෙගේ භාර්යාව දූෂණය කරන්නේ නැත.
16 කිසිවකුෙට පීඩා කරන්නේ නැත; ඔහු ණයට ගත්
තැනැත්තාගේ උකස ආපසු දනේනේ ය; සොරකම්
කරන්නේ නැත; සාගින්නනේ පළෙනේනාට තමාගේ
කෑම දනේනේ ය; වස්ත්ර නැති අයට වස්ත්ර
දනේනේ ය; 17 ඔහු නපුරනේ වැළකී සිටියි.
පොලියට මුදල් නොදයෙි. අයුතු ලාභ නොගනියි.
මාගේ නියෝග පිළිපැද මාගේ පණත් අනුව
හැසිරනේනේ ය. මේ මිනිසා තමාගේ පියාගේ
අයුතුකම නිසා නොනැසී සැබැවින් ම ජීවත් වන්නේ
ය.
18 "අනිත් අතට ඔහුගේ පියා කෲර ලසෙ පීඩා
කොට, තමාගේ සහෝදරයාගනේ කොල්ලකා,
තමාගේ සනෙඟ අතරේ නපුරු දේ කළ හයෙින්
තමාගේ ම අපරාධ නිසා නැසුණේ ය.
19 "එහතේ, පියාගේ අපරාධ නිසා පුත්රයා දඬුවම්
නොලබන්නේ මන්දැ යි නුඹලා අසනු ඇත. පුත්රයා
නීති ගරුක ව අවංක ව සිට මාගේ සියලු පණත්
පිළිපැද, ඒවා ඉටු කර තිබේ නම්, ඔහු සැබැවින් ම
ජීවත් වන්නේ ය. 20 ද්වි.නී. 24:16පව් කරන
පුද්ගලයා ම නසිනු ඇත. පුත්රයා පියාගේ

අදමිටුකමට වගකිවයුත්තකේ නාවෙේ; පියා ද
පුත්‍රයාගේ අයුතුකමට වගකිවයුත්තකේ නාවෙේ.
ධර්මිෂ්ඨයා සිය ධර්මිෂ්ඨකමේ පල විපාකත්, දුෂ්ටයා
සිය දුෂ්ටකමේ ප්‍රතිවිපාකත් විඳින්නේ ය.
21 “එහතේ දුෂ්ටයා තමා කළ සියලු පාපවලින්
හැරී, මාගේ සියලු පණත් පවත්වමින් නීති ගරුක ව
ද අවංක ව ද සිටියහොත්, ඔහු සැබැවින් ම නාොනැසී
ජීවත් වන්නේ ය. 22 ඔහු කළ ඔහුගේ සියලු වරද
ඔහුට විරුද්ධ ව සිහි නාොකරනු ලැබේ. ඔහු කළ
ඔහුගේ ධර්මිෂ්ඨකම නිසා ඔහු ජීවත්වන්නේ ය.
23 දුෂ්ටයා තමාගේ මාර්ගයනේ හැරී ජීවත් වීම මිස
ඔහු නැසී යාම කිසි ලසෙකින් වත් මට සතුටක් වනු
ඇද්දැ යි මහෝත්තම දවේ ස්වාමීන් වහන්සේ අසන
සේක.
24 “එහතේ, ධර්මිෂ්ඨයකේ තමාගේ
ධර්මිෂ්ඨකමනේ හැරී, අධර්මිෂ්ඨකම් කොට, දුෂ්ටයා
කරන සියලු ම පිළිකුල් ක්‍රියා කළහොත්, ඔහු ජීවත්
වේ ද? ඔහු කළ ඔහුගේ ධර්මිෂ්ඨ ක්‍රියාවලින්
කිසිවක් සිහි කරනු නාොලැබේ. ඔහු කළ ඔහුගේ
ද්‍රෝහිකම් නිසාත්, ඔහු කළ ඔහුගේ පාප නිසාත්
ඔහු නසින්නේ ය.
25 “එහතේ, සමිඳාණන් වහන්සේගේ ක්‍රියා
අසාධාරණ ය”යි නුඹලා කියන්නහු ය. අහෝ
ඉශ්‍රායලේවරුනි! අසන්න. මාගේ ක්‍රියා සාධාරණ
නාොවේ ද? සාධාරණ නැත්තේ නුඹලාගේ ක්‍රියා
නාොවේ ද? 26 ධර්මිෂ්ඨයකෙු තමාගේ
ධර්මිෂ්ඨකමනේ හැරී, අධර්මිෂ්ඨකම් කරමින් සිට
නසින කල ඔහු නසින්නේ, තමා කළ තමාගේ
අධර්මිෂ්ඨකම් නිසා ය. 27 යළිත්, දුෂ්ටයා තමා කළ
දුෂ්ටකමනේ හැරී, නීති ගරුක ව ද අවංක ව ද සිටින
කල ඔහු තමාගේ ජීවිතය රැකගන්නේ ය. 28 ඔහු
වරද තේරුම්ගනෙ තමාගේ සියලු ම වැරදිවලින්
හැරනෙ නිසා, ඔහු නාොනැසී ජීවත් වන්නේ ම ය.
29 එහතේ, සමිඳාණන් වහන්සේගේ ක්‍රියා සාධාරණ
නැතැ යි ඉශ්‍රායලේ වංශය කියති. අහෝ ඉශ්‍රායලේ
වංශය! මාගේ ක්‍රියා සාධාරණ නාොවේ ද?
සාධාරණ නැත්තේ නුඹලාගේ ක්‍රියා නාොවේ ද?
30 “එබැවින්, අහෝ ඉශ්‍රායලේවරුනි, මම නුඹලා
එකින් එකා පෞද්ගලික වශයනේ තම තමාගේ
ක්‍රියා අනුව විනිශ්චය කරන්නමේ යි මහෝත්තම
දවේ ස්වාමීන් වහන්සේ වදාරන සේක. පසුතැවී සිත්
හරවා ගනෙ නුඹලා කළ සියලු වරද හැර දමන්න;
එවිට අයුතුකම නුඹලාගේ විනාශයට කාරණයක්
නාොවන්නේ ය. 31 නුඹලා කළ නුඹලාගේ සියලු
වරද නුඹලා වතේින් ඉවතදමා අලුත් සිතක් ද අලුත්
මනසක් ද නුඹලාට ම සලසාගන්න. ඉශ්‍රායලේවරුනි,
නුඹලා නසින්නේ කුමට ද? 32 කිසිවකෙු මැරනෙවාට
මාගේ කැමැත්තක් නැත. එබැවින්, පාපයනේ හැරී
ජීවත් වන්න. මහෝත්තම දවේ ස්වාමීන් වහන්සේ
මසෙේ වදාරන සේක.”

### විලාප ගීයක්

19 ඉශ්‍රායලේ අධිපතීන් ගැන විලාපයක්
පවත්වමින් මසෙේ කියන්නැ යි සමිඳාණන්
වහන්සේ මට වදාළ සේක: 2 “නුඹේ මවු කවරකේ
ද? ඈ සිංහයන් මැද ලැගුම්ගත් සිංහ ධනේුවක් ය.
තරුණ සිංහයන් අතරහෙි ද ඈ තම පැටවුන් ඇති
කළා ය. 3 ඈ ඇති කළ ඇගේ පැටවුන්ගනේ එකකේ
තරුණ සිංහයකේ වී, ගාොදුරු අල්ලන්න ඉගනෙගනෙ
මිනිසුන් කාදැමී ය. 4 ඌ ගැන ජාතීන්ට ද සැළ විය.
ඌ ඔවුන්ගේ බාොරු වළහෙි අසු විය. ඔව්හු උගුලට
කාොකු දමා ඌ මිසර දශේයට ගනෙ ගියෝ ය. 5 ඈ
බලා සිට කලකිරී, ඇගේ බලාපාොරාොත්තුව සුන් ව
තිබනෙ බව දැක, සිය පැටවුන්ගනේ තවත් එකකෙු
ගනෙ ඌ තරුණ සිංහයකෙු වන තකේ ඇතිදැඩි කළා
ය. 6 ඌ ද සිංහයන් අතරේ ගැවසී, තරුණ සිංහයකෙු
වී, ගාොදුරු අල්ලන්න ඉගනෙගනෙ මිනිසුන් කාදැමී ය.
7 ඌ ඔවුන්ගේ මාලිගා කඩාදමා, ඔවුන්ගේ නගර
නාස්ති කළෙේ ය. දශේය ද එහි වැසියෝ ද උගේ
ගර්ජනා හඬට භීතියනේ ත්‍රස්ත වූ හ. 8 එවිට
ජාතීහු ඔහුට විරුද්ධ ව තමන්ගේ දැල ඌ පිට
හළෙුවෝ ය. ඌ ද ඔවුන්ගේ උගුලට අසු විය.
9 ඔව්හු ඌට කාොකු දමා, කූඩුවක ලා,
බබිලෝනියේ රජු ළඟට ගනෙොවෝ ය. උගේ නාදය
ඉශ්‍රායලේ කඳුවල තවත් නෑසනෙ පිණිස ඔව්හු ඌ
බලකාොටුවලට ගනෙොවෝ ය.”

### වියළි මිදි වැල

10 “නුඹේ මව දිය දහර අසල සිටු වන ලද මිදි
වැලක් මනේ වූවා ය. එහි බාොහෝ වතුර තිබූ නිසා
මිදි වැල බාොහෝ පල දරා සරුසාර විය.
11 ආණ්ඩුකාරයන්ගේ ජයකාොන්ත සෑදීමට සුදුසු සවි
ඇති දඬු මිදි වැලට තිබිණි. එය වලාකුළුවල ගෑවනෙ
තරමට උස් විය. එය කාොතරම් උස ද කියාත්,
කාොතරම් කාොළ අතු බහුල ව ඇත් ද කියාත්
සියල්ලන්ට ම පනෙුණේ ය. 12 එහතේ, එය
කෝපයනේ උදුරනු ලැබ, බිමට හළෙනු ලැබුවේ ය.
එහි පල පරෙදිග සුළඟට වියළී ගාොස් වැටී ගියේ ය.
එහි සවි ඇති දඬු කඩනු ලැබී ය. ඒවා වියළී ගාොස්
ගින්නහෙි දවනු ලැබී ය. 13 දැන් ඒ මිදි වැල
කාන්තාරයහෙි දිය සීරා නැති වියළි භූමියක සිටුවා
තිබේ. 14 එහි කඳ ගිනිගත්තේ ය. අතු හා පල
ගින්නනේ දැවී ගියේ ය. ආණ්ඩුකාරයන්ගේ
ජයකාොන්ත සෑදීම පිණිස සවිය ඇති දඬු තවත් එහි
නාො වී ය. මේ වනාහි විලාප ගීයකි. එය යළි යළිත්
ගයනු ලැබී ය.”

### දවේ කැමැත්ත හා මිනිසාගේ විරුද්ධත්වය

20 සත් වන අවුරුද්දේ පස් වන මාසයේ දස
වන දින ඉශ්‍රායලේ ප්‍රජා මූලිකයන්ගනේ
සමහරකේ සමිඳාණන් වහන්සේගේ කැමැත්ත ගැන
විමසන පිණිස අවුත් මා ඉදිරියහෙි හිඳගත්තෝ ය.
2 එවිට සමිඳාණන් වහන්සේ මට කතා කාොට

මෙසේ වදාළ සේක: 3 “මනුෂ්‍ය පුත්‍රය, නුඹ
ඉශ්‍රායෙලේ ප්‍රජා මූලිකයන්ට කතා කොට ඔවුන්ට
මෙසේ කියන්න: ‘මහෝත්තම දෙවි ස්වාමින්
වහන්සේ මෙසේ කියන සේක. නුඹලා පැමිණියේ,
මාගේ කැමැත්ත ගැන මාගෙන් විමසන්න ද? මම
මාගේ ජීවමාන නාමයෙන් දිවුරා කියමි: මාගෙන්
කිසිවක් ප්‍රශ්න කරන්න නුඹලාට ඉඩ නොදෙමි යි
මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ වදාරන සේක.
4 මනුෂ්‍ය පුත්‍රය, නුඹ ඔවුන් විනිශ්චය කරන්න
සූදානම් ද? ඔවුන්ගේ පියවරුන්ගේ පිළිකුල් ක්‍රියා
ඔවුන්ට දන්වමින්, 5 නික්ම 6:2-8ඔවුන්ට මෙසේ
කියන්න: ‘මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ
මෙසේ වදාරන සේක. මා ඉශ්‍රායෙලේ තෝරාගත්
විට, ජාකොබ්ගේ වංශයට මම පොරොන්දුවක් වීමි.
6 මිසර දේශයේ දී මා ඔවුන්ට ප්‍රකාශ වූ දවසේ දී,
මම මෙසේ වදාළෙමි: මම නුඹලාගේ දෙවි ස්වාමින්
වහන්සේ යැයි මිසර දේශයේ දී ඔවුන්ට දිවුරා
කීවෙමි. මා ඔවුන් උදෙසා තෝරාගත්, කිරෙන් ද මී
පැණියෙන් ද ඉතිරෙන, අන් සියලු දේශවලට වඩා
උතුම් දේශයකට මිසර දේශයේ සිට ඔවුන්
පමුණුවන්නෙමි කියා ඒ දවසෙහි මම ඔවුන්ට
පොරොන්දු වුණෙමි. 7 “නුඹලා එකිනෙකා තම
තමාගේ ඇස්වලට ප්‍රිය වූ අවකල්ක්‍රියාව
පහකරදමා, මිසරයේ දේව රූපවලින් අපවිත්‍ර
නොවී සිටින්න; මම නුඹලාගේ දෙවි ස්වාමින්
වහන්සේ ය’යි ඔවුන්ට වදාළෙමි. 8 එහෙත් ඔව්හු
මට සවන් දෙන්න කැමැති නොවී මට විරුද්ධ ව
කැරලි ගැසුවෝ ය. ඔවුන් තම තමන්ගේ ඇස්වලට
ප්‍රිය වූ අවකල්ක්‍රියා පහකරදැමුවේ වත්, මිසරයේ
දේව රූප අත්හැරියේ වත් නැත. ඒ නිසා මම මිසර
දේශයේ දී මාගේ කෝපය ඔවුන් පිට වගුරුවා
මාගේ උදහස ඔවුන් කෙරෙහි පමුණුවන්නට
සිතුවෙමි. 9 එහෙත් ඔවුන් වටකර සිටි ජාතීන්
ඉදිරියෙහි මාගේ නාමය නොකෙලෙසෙන පිණිස මම
ක්‍රියා කළෙමි. මක්නිසා ද, ඔවුන් මිසර දේශයෙන්
පිටතට ගෙනෙන බවට ඒ ජාතීන් ඉදිරියෙහි ඔවුන්ට
මා ප්‍රකාශනයක් කළ බැවිනි.
10 “ ‘එබැවින්, මම ඔවුන් මිසර දේශයෙන් පිටතට
ගෙනවුත් පාළුකරයට පැමිණවූයෙමි. 11 ලෙවී
18:5මාගේ ආඥා ඔවුන්ට දී මාගේ පණත් ඔවුන්ට
දැන්වීමි. එසේ කළේ, ඒවා අනුගමනය කිරීමෙන්
මිනිසුන්ට ජීවනය ලැබෙන පිණිස ය. 12 නික්ම
31:13-17තවද, මම ඔවුන් විශුද්ධ කරන සමිඳාණන්
වහන්සේ බව ඔවුන් දැනගන්න පිණිස, මා සහ
ඔවුන් අතරේ සලකුණක් ව තිබෙන්න මාගේ සබත්
දවස පැවැත්වීමට සැලැස්වීමි. 13 එහෙත්, ඉශ්‍රායෙලේ
වංශය කාන්තාරයේ දී මට විරුද්ධ ව කැරලිගසා,
මාගේ ආඥා අනුව නොහැසිර, මාගේ පණත්
ප්‍රතික්ෂේප කළෝ ය. ඒවා ප්‍රතික්ෂේප නොකර,
ඒවා පිළිපැදීමෙන් මිනිසුන්ට ජීවනය ලැබෙනු ඇත.
ඔව්හු මාගේ සබත් දවස් ද බොහෝ සෙයින්
කෙලෙසුවෝ ය. එවිට ඔවුන් නැති කර දැමීමට
කාන්තාරයේ දී මාගේ කෝපය ඔවුන් පිට
වගුරුවන්නට සිතුවෙමි. 14 එහෙත්, ජාතීන්ට පෙනෙන
ලෙස මා ඔවුන් මිසර දේශයෙන් පිටතට ගෙනා
බැවින්, ඒ ජාතීන් ඉදිරියෙහි මාගේ නාමය
නොකෙලෙසෙන පිණිස මම ක්‍රියා කළෙමි.
15 ගණන් 14:26-35තවද, මා ඔවුන්ට දුන් කිරෙන් හා
මී පැණියෙන් ඉතිරෙන සියලු දේශවලට වඩා උතුම්
දේශයට ඔවුන් නොපමුණුවමි යි කාන්තාරයේ දී
ඔවුන්ට විරුද්ධ ව අත ඔසවමි යි දිවුරා කීවෙමි.
16 මෙසේ කළේ, ඔවුන් මාගේ පණත් එපා කොට,
මාගේ ආඥා ප්‍රකාර නොහැසිර, මාගේ සබත්
කෙලෙසූ නිසා ය. මක්නිසා ද, ඔවුන්ගේ සිත්
ඔවුන්ගේ දේව රූප දෙසට ඇදී ගියේ ය.
17 “ ‘එසේ වූ නමුත්, ඔවුන් විනාශ කර
කාන්තාරයේ දී ඔවුන් තීන්දුවට ම නැති කර
නොදමන ලෙස මම දයාවෙන් ඔවුන් දෙස බැලුවෙමි.
18 මම කාන්තාරයේ දී ඔවුන්ගේ දරුවන්ට කතා
කොට: ‘නුඹලාගේ පියවරුන්ගේ පණත් ප්‍රකාර
නොහැසිර, ඔවුන්ගේ නියෝගයන් නොපවත්වා,
ඔවුන්ගේ දේව රූපවලින් අපවිත්‍ර නොවී සිටින්න.
19 මම නුඹලාගේ දෙවි ස්වාමින් වහන්සේ ය;
මාගේ ආඥා ප්‍රකාර හැසිර, මාගේ පණත්
අනුගමනය කර ඒවා පිළිපදින්න; 20 මාගේ සබත්
දින ශුද්ධ ලෙස පවත්වන්න; එවිට මා නුඹලාගේ
දෙවි ස්වාමින් වහන්සේ බව නුඹලා දැනගන්න
පිණිස ඒවා මා සහ නුඹලා අතරේ සලකුණක්
වන්නේ ය’යි වදාළෙමි.
21 “ ‘එහෙත් ඒ පරම්පරාව මට විරුද්ධ ව කැරලි
ගසා, මාගේ ආඥා අනුගමනය නොකර, මිනිසුන්ට
ජීවනය ගෙනෙ දෙනෙ ආඥාවන් අනුව නොහැසිර
මාගේ සබත් දින කෙලෙසූවෝ ය. එවිට මම
පාළුකරයේ දී මාගේ කෝපය ඔවුන් පිට වගුරුවා
මාගේ උදහස ඔවුන් කෙරෙහි පමුණුවන්නට
සිතුවෙමි. 22 එහෙත්, මා එසේ කිරීමෙන් වැළකී,
ජාතීන්ට පෙනෙන ලෙස මා ඔවුන්, මිසර දේශයෙන්
පිටතට ගෙනා බැවින් ඒ ජාතීන් ඉදිරියෙහි මාගේ
නාමය නොකෙලෙසෙන පිණිස මම එය ක්‍රියාත්මක
නොකළෙමි. 23 ලෙවී 26:33තවද, මම ඔවුන් ජාතීන්
අතරට පන්නා දේශවල විසුරුවමි යි කියා
පාළුකරයේ දී මාගේ අත ඔසවා දිවුරා ඔවුන්ට
කීවෙමි. 24 මා එසේ කළේ ඔවුන් මාගේ පණත්
නොපිළිපැද, මාගේ ආඥා ප්‍රතික්ෂේප කොට,
මාගේ සබත් දවස කෙලෙසූ නිසාත්, ඔවුන්ගේ ඇස්
ද තමන්ගේ පියවරුන්ගේ දේව රූප දෙස යොමු වී
තිබුණ නිසාත් ය.
25 “ ‘එබැවින් මමත් යහපත් නුවූ ආඥා ද ජීවනය
දීමට හැකි නොවන පණත් ද ඔවුන්ට දිනිමි. 26 තවද
දේවරූපවලට පුදන ලද ඔවුන්ගේ ම පඬුරුවලින්
ඔවුන් දූෂණය වන්නට මම ඉඩ හැරියෙමි. ඔවුන්
භීතියෙන් තැති ගන්වන පිණිස ඔවුන්ගේ කුලුඳුල්
පුත්‍රයන් ගිනි පූජා කරන්න ඉඩ හැරියෙමි. එසේ
කළේ, මා සමිඳාණන් වහන්සේ බව ඔවුන්
දැනගන්න පිණිස ය.
27 “ ‘එබැවින් මනුෂ්‍ය පුත්‍රය, ඉශ්‍රායෙලේ වංශයට
කතා කොට මෙසේ කියන්න: මහෝත්තම දෙවි
ස්වාමින් වහන්සේ මෙසේ වදාරන සේක: නුඹලාගේ

පියවරු මට විරුද්ධ ව ද්‍රෝහිකමක් කිරීමනේ මසෙේ
මට තවත් අපහාස කළෝ ය. 28 ඔවුන්ට දනෙ ලසෙ
මා අත ඔසවා දිවුරුම් දුන් දේශයට මා ඔවුන්
පැමිණවූෙ කල, ඔවුන් දුටු සියලු උස් හලේ ද අතු
පතර ඇති සියලු ගස් ද ඉදිරියෙහි ඔව්හු තමන්ගේ
පූජා ඔප්පු කළහ; එසේ පඬුරු පිදීමනේ ඔව්හු මා
උදහසට පත් කළහ. එහි ඔව්හු තමන්ගේ සුගන්ධ
ද්‍රව්‍ය පතුරුවා එහි ම තමන්ගේ පාන පූජා
වැගිරවූෙවෝ ය. 29 මම ඔවුන්ගනේ මසෙේ
ඇසුවමේ: නුඹලා යන ගිරිකුළු දේවාල මොනවා ද?
ඊට උස් වූ ස්ථානය යන අරුත ඇති 'බාමා' යන නම
අද දවස දක්වා කියති. 30 එබැවින් ඉශ්‍රායලේ
සනෙඟට මසෙේ කියන්න: මහෝත්තම දවේ
ස්වාමීන් වහන්සේ මසෙේ වදාරන සේක: නුඹලාගේ
පියවරුන් කළාක් මනේ දවේ දේවතා වැඳීමනේ හා
වශේයාකම් කිරීමනේ නුඹලා තමන් ම අපවිත්‍ර
කරගන්නහු ද? 31 නුඹලාගේ පුත්‍රයන් ගින්නහෙි
පූජා කරමින් නුඹලාගේ පඬුරු ඔප්පු කරන කල,
නුඹලා අද දක්වා නුඹලාගේ සියලු දේව රූප
කරණකොටගනෙ කිළුටු වන්නහු ද? කරුණු මසෙේ
ව තිබිය දී ඉශ්‍රායලේ ජනයනේ, නුඹලා තවමත්
මාගේ කැමැත්ත විමසන පිණිස පැමිණනේනහු ය.
මාගේ ජීවමාන නාමයනේ දිවුරා නුඹලාට මාගනේ
විමසන්න ඉඩ නොදමේ යි මහෝත්තම දවේ
ස්වාමීන් වහන්සේ වදාරන සේක. 32 'අපි විජාතීන්
මනේ ද රටවල ගෝත්‍ර මනේ ද ලීවලටත්,
ගල්වලටත් නමස්කාර කරමු'යි නුඹලාගේ සිත්හි
ඇති අදහස කිසි කලක ඉටු වන්නේ ම නැත." '

### දේව දඬුවම හා කමාව

33 "මම මාගේ ජීවමාන නාමයනේ දිවුරමින්,
ප්‍රබල බාහුවනේ ද මාගේ මුළු බලයනේ ද මාගේ
උදහස වැගිරීමනේ ද නුඹලා කරෙහෙි රජකම්
කරන්නමේ"යි මහෝත්තම දවේ ස්වාමීන් වහන්සේ
වදාරන සේක. 34 "මම ජනයන් අතරනේ නුඹලා
පිටතට පමුණුවා, ප්‍රබල බාහුවනේ ද දිගු කළ
හස්තයනේ ද උදහස වැගිරීමනේ ද නුඹලා විසිරී
සිටින දේශවලින් නුඹලා රැස් කරන්නමේ. 35 'ජන
හීන මරුකතරකට' නුඹලා ගනෙවුත්, එහි දී මුහුණට
මුහුණ ලා නුඹලා විනිශ්චයට පමුණුවන්නමේ.
36 මිසර දේශයේ පාළුකරයේ දී මම නුඹලාගේ
පියවරුන් විනිශ්චය කළාක් මනේ නුඹලා ද
විනිශ්චයට පමුණුවන්නමේ"යි මහෝත්තම දවේ
ස්වාමීන් වහන්සේ වදාරන සේක.

37 "මම නුඹලා දමනය කර මාගේ ගිවිසුමට කීකරු
වන්න සලස්වන්නමේ. 38 තවද, මට විරුද්ධ ව කැරලි
ගසන්නන් ද ද්‍රෝහිකම් කරන්නන් ද මම
නුඹලාගනේ වනේ කොට ඔවුන් පදිංචි වී සිටින
දේශයනේ පිට කරන්නමේ. එහතේ, ඔව්හු
ඉශ්‍රායලේ රටට ඇතුළු නොවන්නෝ ය. මසෙේ මා
සමිඳාණන් වහන්සේ බව නුඹලා දැනගන්නහු ය.

39 එම්බා ඉශ්‍රායලේ වංශය! මහෝත්තම දවේ
ස්වාමීන් වහන්සේ මසෙේ වදාරන සේක: නුඹලා
මට සවන් දනේනේ නැත්නම්, ගොස් එකිනකො තම
තමන්ගේ දේව රූපවලට දැනුත් මතුත් සේවය
කරන්න. එහතේ, මාගේ ශුද්ධ නාමය නුඹලාගේ
පඬුරුවලින් ද නුඹලාගේ දේව රූපවලින් ද තවත්
නොකලෙසෙන්න. 40 මක්නිසා ද, උස් වූ ඉශ්‍රායලේ
කන්ද වන මාගේ ශුද්ධ කන්දේ දී මුළු ඉශ්‍රායලේ
වංශය වසන දේශයහෙි සිටින ඔවුන් සියල්ලන් මට
සේවය කරනු ඇතැ"යි දවේ ස්වාමීන් වහන්සේ
වදාරන සේක. "එහි දී මම ඔවුන් පිළිගන්නමේ. එහි
දී මම නුඹලාගේ පඬුරු ද නුඹලා ඔප්පු කරන
ඉස්තරම් දීමනා ද නුඹලාගේ ශුද්ධ පූජා සමඟ මට
පුදන්න නියම කරන්නමේ. 41 මා ජනයන් අතරනේ
නුඹලා පිටතට පමුණුවා, නුඹලා විසිරී සිටින
දේශවලින් රැස් කළ කල්හි, මිහිරි සුවඳක් කොට
නුඹලා පිළිගනෙ, නුඹලා මඟින් විජාතීන් ඉදිරියහෙි
මා ශුද්ධවන්ත බව පනේවන්නමේ." 42 "නුඹලාගේ
පියවරුන්ට දනෙ හැටියට මාගේ අත ඔසවා දිවූළ
දේශය වන ඉශ්‍රායලේ රටට මා නුඹලා පැමිණවූෙ
කල්හි මා සමිඳාණන් වහන්සේ බව නුඹලා දැනගනු
ඇත. 43 එහි දී නුඹලාගේ සියලු කල්ක්‍රියාවන් ද
නුඹලා ම අපවිත්‍ර කරගත් නුඹලාගේ සියලු ක්‍රියා
ද නුඹලා සිහි කොට, නුඹලා කළ නුඹලාගේ සියලු
ම නපුරු ක්‍රියා නිසා නුඹලාට ම නුඹලා පිළිකුලක්
වනු ඇත. 44 ඉශ්‍රායලේ වංශය, නුඹලාගේ නපුරු
කල්ක්‍රියාවල හැටියට වත්, නුඹලාගේ දූෂ්‍ය
ක්‍රියාවල හැටියට වත් නොව, මාගේ නාමය නිසා
නුඹලා ගැන මා ක්‍රියා කළ කල්හි මා සමිඳාණන්
වහන්සේ බව නුඹලා දැනගන්නහු ය." මහෝත්තම
දවේ ස්වාමීන් වහන්සේ මසෙේ වදාරන සේක.

### දකුණු දිශාවේ ගින්න

45 සමිඳාණන් වහන්සේ මට නැවත කතා කොට
මසෙේ වදාළ සේක: "මනුෂ්‍ය පුත්‍රය, නුඹේ මුහුණ
දකුණු දසෙට හරවා තබාගනෙ, එයට විරුද්ධ ව
දේශනය කර, දකුණු පළාතේ වනයට විරුද්ධ ව
දිවැස් වැකි කියා, 46 දකුණු දිශාවේ වනයට මසෙේ
කියන්න: 47 'සමිඳාණන් වහන්සේගේ වචනය
අසන්න. මහෝත්තම දවේ ස්වාමීන් වහන්සේ
මසෙේ වදාරන සේක. බලන්න, මම නුඹ තුළ
ගින්නක් දල්වන්නමේ. එයින් නුඹ තුළ තිබනෙ සියලු
අමු ගස් ද සියලු වියළි ගස් ද දැවී යන්නේ ය. ඒ
ඇවිලනෙ ගිනි මැලය නොනිවී, එයින් දකුණේ සිට
උතුර දක්වා ඇති සියලු මුහුණු දැවනේනේ ය.
48 සමිඳාණන් වහන්සේ වන මා එය දැල් වූ බවත්,
කිසිවකුෙට එය නොනිවිය හැකි බවත් සියලු දනො
දකිනු ඇත.' "

49 එහතේ, මම කතා කොට, "මහෝත්තම දවේ
ස්වාමීන් වහන්ස, එසේ කරන්න මට නොසැලැස්සුව
මැනව; මා ප්‍රහලේිකා මඟින් කතා කරති යි සියලු
දනො දැනට ම පැමිණිලි කරති"යි කීවමේ.

## සමිඳාණන් වහන්සේගේ විනාශකාරී කඩුව

21 සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ
සේක: 2 “මනුෂ්‍ය පුත්‍රය, නුඹේ මුහුණ
ජෙරුසලම දෙසට හරවාගෙන, ශුද්ධස්ථානවලට
විරුද්ධ ව දේශනා කර, ඉශ්‍රායලේ දේශයට විරුද්ධ
ව දිවැස් වැකි කියන්න. 3 ඉශ්‍රායලේ දේශයට
මෙසේ කියන්න: ‘සමිඳාණන් වහන්සේ මෙසේ
වදාරන සේක. මෙන්න, මම නුඹට විරුද්ධ ය, මම
මාගේ කඩුව කොපුවෙන් ඇද ගන්නෙමි;
ධර්මිෂ්ඨයන් සහ දුෂ්ටයන් සියලු දෙනා විනාශ
කරදමන්නෙමි. 4 මා ධර්මිෂ්ඨයන් සහ දුෂ්ටයන්
සියලු දෙනා විනාශ කරදමන බැවින් දකුණේ සිට
උතුර දක්වා සිටින සියල්ලන්ට විරුද්ධ ව මාගේ
කඩුව කොපුවෙන් ඇදගන්නෙමි. 5 සමිඳාණන්
වහන්සේ වන මා මාගේ කඩුව කොපුවෙන් ඇදගත්
බව මනුෂ්‍ය වර්ගයා දැනගනු ඇත. නැවත එය
කොපුවට දමනු නොලැබේ.’
6 “එබැවින් මනුෂ්‍ය පුත්‍රය, නුඹ සුසුම්ලන්න, හද
දෙදරන තරමට ශෝකයෙන් ඔවුන් ඉදිරියෙහි
කෙඳිරිගාන්න. 7 ‘නුඹ කෙඳිරිගාන්නේ මන්දැ’යි ඔවුන්
නුඹෙන් අසන කල මෙසේ කියන්න: ‘අපට ලැබුණ ඒ
ආරංචිය නිසා ය; මන්ද, එය පැමිණි විට සියලු සිත්
තැවුලට පත් වනු ඇත. සියලු අත් පණ නැති වනු
ඇත; සියලු සිත් කැළඹෙනු ඇත. සියලු දණහිස්
බියෙන් නැමෙනු ඇත. එය පැමිණෙන්නේ ම ය; එය
සිදුවන්නේ ම ය. මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේක.’ ”
8 සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ සේක:
9 “මනුෂ්‍ය පුත්‍රය, දිවැස් වැකි කියමින්, ‘සමිඳාණන්
වහන්සේ මෙසේ කියන සේකැ’යි පවසන්න.
‘කඩුවක්, සැබැවින් ම කඩුවක්, මුවහත් කොට
දිළිසමෙන් තිබේ. 10 එය මුවහත් කර තිබෙන්නේ
ඝාතනය පිණිස ය. එය දිළිසෙන්නේ විදුලිය දහරක්
මෙන් ය. එසේ නම්, අපට ප්‍රීති වීමට ඉඩක් නැත.
මන්ද, මාගේ සෙනඟ හැම අවවාදයක් හා දඬුවමක්
නොසලකා හැර ඇත. 11 ඒ කඩුව අතට ගන්න
පිණිස මුවහත් කිරීමට දී තිබේ. මරාදමන අයගේ
අතට දෙන පිණිස මේ කඩුව දිළිසෙන පරිදි මුවහත්
කර තිබේ. 12 මනුෂ්‍ය පුත්‍රය, හඬ නඟා
මොරගසන්න. මන්ද, එය මාගේ සෙනඟ පිටත්,
සියලු ඉශ්‍රායලේ අධිපතීන් පිටත් පැමිණියේ ය.
ඔව්හු මාගේ සෙනඟ සමඟ කඩු පහරට පාවා දෙනු
ලැබූ හ. එබැවින් ශෝකයෙන් පපුවට ගසාගන්න.
13 මන්ද, මම මාගේ සෙනඟ පරීක්ෂා කර
බලන්නෙමි. ඔවුන් වරද පිළිගෙන පසුතැවිලි
නොවූවොත්, මේ සියලු දේ ඔවුන් පිට පැමිණෙනු
ඇත’ කියා දෙවි ස්වාමීන් වහන්සේ වදාරන සේක.
14 “එබැවින් මනුෂ්‍ය පුත්‍රය, දිවැස් වැකි කියමින්,
අත් දෙක එකට තට්ටු කරන්න. එවිට කඩුව නැවත
නැවත පහර දෙන්නේ ය. එය මාරක කඩුවකි; බිය
ගන්වන කඩුවකි; විනාශ කරන කඩුවකි. 15 එය
මිනිසුන් අධෛර්යයටත්, දොරටු ළඟ පැකිළී
වැටීමටත් සලස්වයි. විදුලිය මෙන් කාන්තිය විහිදුවන,
මරාදැමීමට සුදුසු කඩුවකින් මම නගරයේ සිට
තර්ජනය කරමි. 16 එම්බා තියුණු කඩුව! දකුණට
පහර දෙන්න; වමටත් පහර දෙන්න; හැරෙන හැරෙන
අතට පහර දෙන්න. 17 මමත් මාගේ අත් දෙක
එකට ගසා, මාගේ කෝපය සංසිඳුවාගන්නෙමි.
මෙසේ පවසන්නේ සමිඳාණන් වහන්සේ වන මම
ය.”

## බබිලෝනියේ රජුගේ කඩුව

18 සමිඳාණන් වහන්සේ යළිත් මට කතා කොට
මෙසේ වදාළ සේක: 19 “මනුෂ්‍ය පුත්‍රය, කඩු ගත්
බබිලෝනියේ රජුගේ පැමිණීම සඳහා මාර්ග දෙකක්
නියම කරගන්න; ඒ දෙක ම එක දේශයකින් ආරම්භ
වන්නේ ය. මඟ සලකුණක් තබන්න; නුවරට
පැමිණෙන මංසන්ධියෙහි ඒක පිහිටුවන්න. 20 කඩුව
අම්මොන්වරුන්ගේ නුවර වූ රබ්බාටත්, ජුදාට සහ
පවුරෙන් වට වූ ජෙරුසලමටත් පැමිණෙන පිණිස
මාර්ගයක් නියම කරන්න. 21 බබිලෝනියේ රජ
පේන අසන පිණිස මාර්ග දෙක බෙදේ යන තැන
දෙමංසන්ධියේ සිටිමින් ඊතල සොලවා, තරොපිම්
රූපවලින් විමසා, පූජා කරන ලද සතුන්ගේ අක්මාව
සෝදිසි කර බැලුවේ ය. 22 ‘ජෙරුසලම’ යන නම
සටහන් කර ඇති ඊතලය ඔහුගේ දකුණතට අසු
වුණේ ය. යුද්ධ යන්ත්‍ර තබන්නටත් ඝාතනය
කරන්න අණ කරන්නටත්, රණ හඬ නගන්නටත්,
දොරටුවලට විරුද්ධ ව යුද්ධ යන්ත්‍ර තබන්නටත්,
පස් කඳු ඉදි කරන්නටත්, කොටු පවුරු
ගොඩනඟන්නටත් ඊතලය මඟින් ඔහුට දන්වනු ලැබී
ය. 23 ඔවුන් කරගෙන තිබුණ ගිවිසුම් නිසා, මේ
පේන කීම බොරුවකැ යි ජෙරුසලම් වැසියෝ සිතති.
එහෙත්, ඔවුන් සතුරන්ට අසු වන පිණිස උන්
වහන්සේ ඔවුන්ගේ අයුතුකම සිහිපත් කරන සේක.
24 එබැවින් දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ වදාරන
සේක: ‘නුඹලා නුඹලාගේ වැරදි සිහි කර නැත.
නුඹලාගේ පාප හෙළි කර ඇත. නුඹලාගේ හැම
ක්‍රියාවකින් ම නුඹලාගේ දුෂ්ටකම එළිදරව් වන
බැවින් නුඹලා කවුරු දැ යි අමතක වී නැත. එබැවින්
මම නුඹලාගේ සතුරන්ට නුඹලා පාවා දෙමි.’
25 “නපුරු ද දුෂ්ට ද වන ඉශ්‍රායලේ අධිපතිය,
නුඹට අවසන් දඬුවම් දීමේ කාලය පැමිණ ඇත.
26 ස්වාමීන් වහන්සේ මෙසේ වදාරන සේක:
‘කිරීටය ගලවා දමන්න; ඔටුන්න ඉවත් කරන්න; මෙය
තිබුණ අන්දමට ම නොවන්නේ ය. පහත් දේ උසස්
කරන්න; උසස් දේ පහත් කරන්න. 27 මම නගරය
නටබුන් ගොඩක් කරන්නෙමි; එසේ ය, නටබුන්
ගොඩක් කරන්නෙමි. නටබුන් ගොඩක් ම
කරන්නෙමි. එහෙත්, නගරයට දඬුවම් කරන්න මා
තෝරාගෙන තිබෙන තැනැත්තා එන තෙක් මෙය සිදු
වන්නේ නැත. ඔහු පැමිණි විට එය ඔහුගේ
විනිශ්චයට පාවා දෙන්නෙමි.’

### අම්මොන්වරුන්ට අනතුරු ඇඟවීමක්

28 ජරෙ 49:1-6; එසකි 25:1-7; ආමො 1:3-15; ශපෙ
2:8-11 “මනුෂ්‍ය පුත්‍රය, නුඹ දිවැසි වදන් පවසමින්,
‘මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
ඉශ්‍රායලේවරුන්ට නින්දා කරන අම්මොන්වරුන්ට
මෙසේ කියන සේක’යි කියන්න. ඔවුන්ට මෙසේ
කියන්න: ‘කඩුවක්, සැබැවින් ම ඝාතනය පිණිස වන
කඩුවක් කොපුවෙන් ඇද තිබේ. මරාදමන පිණිස එය
විදුලිය මෙන් දිළිසෙයි. 29 නුඹලා දකින දර්ශන බොරු
ය; නුඹලා පවසන දිවැස් වැකි මුසාවකි; නුඹලා නපුරු
ය; දුෂ්ට ය. නුඹලාට නියම දිනය පැමිණෙන්නේ ය.
එනම්, අන්තිම දඬුවම් දීමේ දවස පැමිණෙන්නේ ය.
30 “ ‘නුඹේ කඩුව කොපුවේ නැවත දමන්න. නුඹ
මවනු ලැබූ ස්ථානයෙහි, නුඹේ උත්පත්තිය ලැබූ
දේශයේ දී මම නුඹලා විනිශ්චය කරන්නෙමි.
31 මාගේ උදහස නුඹලා පිට වගුරුවා, මාගේ
කෝපාග්නිය නුඹලා පිට පිඹ, රෞද්‍ර විනාශ කිරීමට
දක්ෂ මනුෂ්‍යයන් අතට නුඹලා පාවා දෙන්නෙමි.
32 නුඹලා ගින්නට දර පිණිස වන්නාහු ය. නුඹේ ලේ
දේශය මැද වැගිරෙන්නේ ය. නුඹලා තවත් සිහි
කරනු නොලබන්නාහු ය. කුමක් නිසා ද, මෙසේ
පවසන්නේ සමිඳාණන් වහන්සේ වන මම ය.’ ”

### ජෙරුසලමේ අපරාධ

22 තවද, සමිඳාණන් වහන්සේ මට මෙසේ
වදාළ සේක: 2 “මනුෂ්‍ය පුත්‍රය, නුඹ
විනිශ්චය කරන්න සූදානම් ද? ලේයෙන් පිරි නගරය
විනිශ්චය කරන්න, නුඹ සූදානම් ද? එසේ නම් ඇගේ
සෑම පිළිකුල් ක්‍රියා ඈට දන්වමින් මෙසේ කියන්න:
3 ‘මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක: නුඹ ලේ වගුරුවන, නුඹ ම අපවිත්‍ර
වන පිණිස දේව රූපවලට නමදින, නුවරක් නිසා
නුඹට අවසාන දවස පැමිණෙන්නේ ය. 4 නුඹ
වැගිරවූ ලේවලින් නුඹ වරදකාරියක වී, නුඹ
නමස්කාර කළ නුඹේ රූපවලින් නුඹ අපවිත්‍ර වී
සිටින බැවින්, ඒ අවසාන දවස ළං කරගෙන ඇත.
එබැවින්, මම නුඹ ජාතීන්ට නින්දාවක් ද සියලු ම
දේශවලට සරදමක් ද කළෙමි. 5 නුඹට ළඟ පාත
සිටින ජාතීහු ද දුර බැහැර සිටින ජාතීහු ද නුඹේ
අවුල් වියවුල් හා අපකීර්තිය නිසා නුඹට උසුළු-විසුළු
කරති. 6 නුඹ සමඟ විසූ ඉශ්‍රායලේ අධිපතීහු සියලු
දෙන එක් කෙනෙකු වත් නෑර සිය බලය ලේ
වගුරුවන පිණිස පාවිච්චි කළහ. 7 නික්ම 20:12;
22:21-22; ද්වි.නී. 5:16; 24:17නුඹ සමඟ වසන අය
දෙමව්පියන්ට අවමන් කර ඇත. නුඹ සමඟ සිටින
විදේශිකයාට බලහත්කාරයෙන් ක්‍රියා කර ඇත. නුඹ
තුළ පියා නැත්තාටත්, වැන්දඹුවටත් පීඩා කර ඇත.
8 ලෙවී 19:30; 26:2නුඹ මාගේ ශුද්ධ දේ හෙළා දැක
මාගේ සබත් දවස් කෙලෙසුවෙහි ය. 9 ලේ වගුරුවන
පිණිස කේළාම් කියන මනුෂ්‍යයෝ නුඹ තුළ සිටියෝ
ය. සමහරු දේව රූපවලට පිදූ කෑම කෑහ; සමහරු
සල්ලාලකම් කළහ; 10 ලෙවී 18:7-20සමහරු සිය
පියාගේ බිරිඳගේ නිරුවත අනාවරණය කළහ; ඔසප්
ව සිටි ස්ත්‍රීන්ට බලහත්කාරකම් කළහ.
11 ඇතැමෙක් තමාගේ අසල්වාසියාගේ භාර්යාව
සමඟ දුරාචාරයෙහි යෙදුණාහ. අනිකෙක් තමාගේ
ලේලී සල්ලාලකමින් අපවිත්‍ර කළහ. තවත්
කෙනෙක් තම පියාගේ දුව වූ තමාගේ සහෝදරියට
අතවර කළහ. 12 නික්ම 22:25; 23:8; ලෙවී 25:36-37;
ද්වි.නී. 16:19; 23:19සමහරු ලේ වගුරු වන පිණිස
අල්ලස් ගත්හ. නුඹ පොලී සහ ලාභ ගෙනෙ, නුඹේ
අසල්වැසියාගෙන් අයුක්තියෙන් ලාභ උපදවාගෙන මා
අමතක කළෙහි ය. මෙසේ පවසන්නේ මහෝත්තම
දෙවි ස්වාමීන් වහන්සේ ය.
13 “ ‘එබැවින් නුඹ ලබාගත් අයුතු ලාභ නිසාත්,
නුඹ ඇතුළෙහි වූ නුඹේ ලේ වැගිරීම් නිසාත් මාගේ
මිට මොළවා පහර දෙන්නෙමි. 14 නුඹට විරුද්ධ ව
ක්‍රියා කරන දවස්වල දී නුඹට ධෛර්යය ද අත
ඔසවන්න ශක්තිය ද ඇති වේ ද? සමිඳාණන්
වහන්සේ වන මම ඒ දේ කීමි. එලෙසම
කරන්නෙමි. 15 මම නුඹ විජාතීන් අතරට පන්නාදමා,
නුඹ විදේශවලට විසුරුවා හැර නුඹේ අපවිත්‍රකම
නුඹෙන් පහකර දමන්නෙමි. 16 අන්‍ය ජාතීන් නුඹට
නින්දා අපහාස කරනු ඇත. එවිට මා සමිඳාණන්
වහන්සේ බව නුඹ දැනගන්නෙහි ය.’ ”

### දෙවිඳුන්ගේ සුපිරිසිදු කිරීමේ ගිනි උදුන

17 තවද, සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ
සේක: 18 “මනුෂ්‍ය පුත්‍රය, ඉශ්‍රායලේ වංශය
ලෝහවල බොර හා සමාන ය. උදුනක රිදී පිරිසිදු
කළ පසු ඉතිරි වන තඹ, බලෙකේ, යකඩ සහ ඊයම්
බොර හා සමාන ය. 19 එබැවින්, මහෝත්තම දෙවි
ස්වාමීන් වහන්සේ මෙසේ වදාරන සේක. බලන්න,
නුඹලා සියල්ලන් ම ලෝහවල බොර මෙන් වී සිටින
නිසා නුඹලා ජෙරුසලම තුළට එකතු කරන්නෙමි.
20 රිදී ද තඹ ද යකඩ ද ඊයම් ද බලෙකේ ද ගිනි
පිඹ උණු කරන පිණිස උදුන තුළට එකතු කරන්නාක්
මෙන් මම නුඹලා එකතු කර මාගේ උදහසින් ද
කෝපාග්නියෙන් ද උණු කරන්නෙමි. 21 මම නුඹලා
රැස් කර මාගේ කෝපාග්නිය නුඹලා පිට
පිඹින්නෙමි. නුඹලා එය තුළ උණු වන්නාහු ය.
22 උදුන තුළ රිදී උණු වෙන්නාක් මෙන් නුඹලා
නගරය තුළ උණු වන්නාහු ය. එවිට සමිඳාණන්
වහන්සේ වන මා, මාගේ කෝපය නුඹලා කෙරෙහි
වැගිරවූ බව නුඹලා දැනගනු ඇත.”

### ඉශ්‍රායලේ ප්‍රධානීන්ගේ පාප

23 සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ සේක:
24 “මනුෂ්‍ය පුත්‍රය, ඉශ්‍රායලේවරුන්ට මෙසේ
කියන්න: නුඹලාගේ දේශය අපිරිසිදු ය. ඒ නිසා මම
උදහසින් එයට දඬුවම් කරන්නෙමි. 25 එහි වෙසෙන
ප්‍රධානීහු වූකලී, ගොදුරු කොටෙගත් සතුන් ඉරමින්
ගොරවන සිංහයන් වැනි ය. ඔව්හු මිනිසුන් කාදමා
ඔවුන්ගේ වස්තු ද මැණික් ද පැහැරගෙන ඒ තුළ
වැන්දඹුවන්ගේ ගණන වැඩි කර ඇත. 26 ලෙවී

10:10ඇගේ පූජකයෝ මාගේ ව්‍යවස්ථාව කඩ
කොට මාගේ ශුද්ධ දේ කෙලෙසූ හ. ඔවුන් කැප දේ
ද අකැප දේ ද අතරේ වෙනසක් කළේ වත්,
අපවිත්‍ර දේ ද පවිත්‍ර දේ ද අතරේ තිබෙන වෙනස
දැන්නුවේ වත් නැත; මාගේ සබත් දවස් ඔව්හු
නොසලකා හැරියෝ ය. මෙසේ ඔවුන් අතරෙහි මට
අගෞරව පැමිණියේ ය. 27 ඒ නගරය තුළ අධිපතීහු
අයුතු ලාභ ලබාගන්න පිණිස ලේ වැගිරීමටත්,
ප්‍රාණ නැති කිරීමටත් සිටින, ගොදුරු ඉරාදමන
වෘකයන්ට සමාන ය. 28 එහි දිවැසිවරු ද මායම්කාර
දර්ශන දැක, බොරු පේන පවසා, සමිඳාණන්
වහන්සේ කතා නොකළ නමුත්, ‘මහෝත්තම දෙවි
ස්වාමීන් වහන්සේ මෙසේ වදාරන සේක’ කියා
බිත්තියක හුණු ගාන්නාක් මෙන් සිය පාප වසන්
කරගත්හ. 29 දේශයේ සෙනඟ බලහත්කාරකම්
කොට කොල්ලකෑහ; අසරණයාට ද දිළින්දාට ද පීඩා
කළහ; අයුතු ලෙස විදේශිකයාට බලහත්කාරකම්
කළහ. 30 දේශය නාස්ති නොකරන පිණිස පවුරක්
ගොඩනඟා දේශය ආරක්ෂා කරන පිණිස
කපොලුවල සිටිය හැකි මිනිසකු මම ඔවුන් අතරේ
සෙවීමි. එහෙත්, කිසිවෙක් මට සම්බ නො වී ය.
31 එබැවින්, මාගේ කෝපය ඔවුන් කෙරෙහි වගුරුවා,
මාගේ කෝපාග්නියෙන් ඔවුන් විනාශ කරදමා
ඔවුන්ට යුතු දඬුවම ඔවුන් පිට පැමිණවීමි.
මෙසේ පවසන්නේ මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ ය.”

### අනාචාරී සමාරිය හා ජෙරුසලම

23 සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ
සේක: 2 “මනුෂ්‍ය පුත්‍රය, එක කුසේ උපන්
දූවරු දෙදෙනෙක් සිටියහ. 3 ඔවුන්ගේ යොවුන් වියේ
දී ම ඔව්හු මිසරයේ දී වේශ්‍යාකම් කළහ. ඔවුන්ගේ
පියයුරු එහි දී මිරිකනු ලැබී ය; එහි දී ඔවුන්ගේ
කුමරි වියෙහි තනපුඩු පිරිමදිනු ලැබී ය. 4 වැඩිමල්
තැනැත්තිගේ නම ඔහොලා ය; ඇගේ සහෝදරීගේ
නම ඔහොලීබා ය. මම ඔවුන් සරණකොටගතිමි;
ඔව්හු මාගෙන් දරුදැරියන් ලැබූ හ. ඔහොලා යන
නමින් සමාරිය ද ඔහොලීබා නමින් ජෙරුසලම ද
අදහස් කෙරේ. 5 ඔහොලා මට අයිති ව සිටිය දී
වේශ්‍යාකම් කළා ය. ඇගේ පෙම්වතුන් වන
අසිරියන්වරුන්ට ඈ ආලය කළා ය. 6 ඈ, සිත්ගන්න
සුලු තරුණ අශ්වාරෝහකයන් වූ රාජකීය වස්ත්‍ර
හැඳගත් අසිරියන් ජාතික ප්‍රභූවරුන්ට ද නිලධාරීන්ට
ද අධිපතීන්ට ද අධික ආලයෙන් බැඳුණා ය.
7 ඔහොලා අසිරියාවේ උත්තමයන් වූ ඔවුන්
සියල්ලන් සමඟ වේශ්‍යාකම් කළා ය. ඈ ආලය කළ
සියල්ලන්ගේ සියලු දේව රූපවලින් ද ඈ අපවිත්‍ර
වූවා ය. 8 ඈ මිසරයේ දී පටන්ගත් ඇගේ
වේශ්‍යාකම අත්හැරියේ නැත; කුමක්නිසා ද, ඇගේ
යෞවන වියෙහි දී ඔව්හු ඇය සමඟ සේවනයෙහි
යෙදුණාහ. මොවුහු ද ඇගේ කුමරි වියෙහි තනපුඩු
පිරිමැද ඔවුන්ගේ කාමාශාවට තෘප්තිය ඇගෙන්
ලබාගත්තෝ ය. 9 එබැවින් ඇගේ පෙම්වතුන් වන
ඈ ආලය කළ අසිරියන්වරුන් අතට මම ඇය පාවා
දිනිමි. 10 මොවුහු ඇය නග්නකර, ඇගේ දූ පුතුන්
රැගෙන ගොස් ඈ කඩුවෙන් මැරූ හ. ඇය ලත් නිසි
විනිශ්චය ගැන සෑම තැන ම ස්ත්‍රීහු ඕපාදූප කී හ.
11 “ඇගේ සහෝදරී, ඔහොලීබා මෙය දුටු නමුත්,
ඔහොලාට වඩා ඇගේ කාමරාගයත්, වේශ්‍යාකමත්
අතිශයෙන් නින්දිත විය. 12 ඈ ද අලංකාර වස්ත්‍ර
හැඳගත් අසිරියන් ජාතික ප්‍රභූවරුන්ට ද නිලධාරීන්ට
ද යුද ඇඳුමෙන් සැරසුණ අධිපතීන්ට ද එමෙන් ම
අශ්වාරෝහකයන්ට ද අධික ආලයෙන් බැඳුණා ය.
ඔව්හු සියල්ලෝ සිත්ගන්න සුලු තරුණයෝ වූ හ.
13 ඇගේ අනාචාරය මම දිටිමි. සහෝදරියෝ
දෙදෙනා ම එක ම අවකල්ක්‍රියාවේ යෙදුණාහ.
14 “ඈ මිනිසුන්ගේ රූප එනම්, ස්වරූප, තද රතු
පාටින් බිත්තිවල සිතියම් කර තිබෙනු දුටු විට
ඔහොලීබා ඇගේ වේශ්‍යාකමෙහි කිඳා බැස සිටියා
ය. 15 ඔවුන්ගේ ඉඟටිවල ඉඟපටි බැඳ, අලංකාරවත්
තලප්පා ඔවුන්ගේ හිස්වල දවටා තිබුණේ ය. ඔව්හු
සියල්ලෝ ම පෙනීමේ හැටියට බබිලෝනියේ උපන්
වංශාධිපති බබිලෝනිවරු වූ හ. 16 ඈ ඔවුන් දුටු
වහා ම කාමරාගයෙන් පිරී, ඔවුන් වෙත
බබිලෝනියට පණිවුඩකාරයන් යැව්වා ය.
17 බබිලෝනිවරු ද ඇගේ යහනේ ඈ සමඟ
කම්සැපතෙහි යෙදී කාමරාගයෙන් ඈ දූෂණය කළහ.
ඈ ඔවුන් කරණකොටගෙන දූෂණය වූ පසු ඈ ඔවුන්
පිළිකුල් කරමින් ඔවුන්ගෙන් ඈත් වූවා ය. 18 ඈ
මෙසේ ඇගේ වේශ්‍යාකම් ප්‍රසිද්ධියේ කරමින් තම
නිරුවත්කම දැක්වූ විට, මම ඇගේ සහෝදරිය
වෙතින් පිළිකුල් සිතින් හැරුණාක් මෙන් ඈ කෙරෙන්
ද හැරුණෙමි. 19 එහෙත්, ඈ මිසර දේශයේ දී තරුණ
වියේ දී කළ වේශ්‍යාකම් සිහි කරමින් තවතවත්
ඇගේ වේශ්‍යාකම් වැඩි කළා ය. 20 ඈ පෙම්වතුන්
සමඟ ආලයෙන් බැඳී ඇගේ කාමරාගය
කොටළුවන්ගේ ලිංගේන්ද්‍රිය මෙන් ද අසුන්ගේ
ධාතු වැගිරීම මෙන් ද වැගිරීමෙන් වේගවත්
කරගත්තා ය. 21 මෙසේ ඔහොලීබා, නුඹ තරුණ
වියේ මිසර දේශයේ මිනිසුන් නුඹේ පියයුරු
අතගාමින්, පිරි මදිමින් සිටි කාලයේ දී නුඹ කළ
අනාචාරය යළිත් කරන්න ආශා කළෙහි ය.”

### බාල සහෝදරී කෙරේ දේව විනිශ්චය

22 එබැවින් එම්බා ඔහොලීබා! මහෝත්තම
ස්වාමීන් වූ දෙවියන් වහන්සේ මෙසේ වදාරන
සේක: “මෙන්න, නුඹේ සිතෙන් නුඹ පිළිකුල් කළ
නුඹේ ප්‍රේමවන්තයන් මම නුඹට විරුද්ධ ව
පොළඹවා, ඔවුන් නුඹට විරුද්ධ ව හාත්පසින්
පමුණුවන්නෙමි. 23 ඔව්හු නම්, බබිලෝනිවරු සහ
සියලු ම කල්දිවරු ද පෙකොඩ් ද ෂෝවා ද කෝවා ද
ඔවුන් සමඟ අෂූර්වරු ද යන අය ය. ඔව්හු වනාහි
මනා පෙනුමක් ඇති තරුණයෝ ය; ආණ්ඩුකාරයෝත්
මුලාදෑනියෝත් ය; ඔව්හු සියල්ලෝ ම අධිපතියෝ ය;
අසුන් පිට නැඟීයන කීර්තිමත් අශ්වාරෝහකයෝ ය.
24 ඔවුන් නුඹට විරුද්ධ ව උතුරු දේශයෙන් ආයුධ

සහ රථ ද ගැල් ද ජන සමූහයක් ද ඇති ව අවුත්,
පලිහ සහ කුඩා පලිහ ද යුද හිස් වැසුම් ද ඇති ව
නුඹට විරුද්ධ ව හාත්පසින් සිටිනු ඇත. ඔවුන්ගේ
නීති අනුව නුඹ විනිශ්චය කරන පිණිස මම ඔවුන්ට
නුඹ භාර දන්නෙමි. 25 මාගේ කෝපය නුඹට
විරුද්ධ ව යොමු කරමි. ඔව්හු ද නුඹ සමඟ උදහසින්
ක්‍රියා කොට, නුඹේ නාස් හා කන් කපාදමති. නුඹේ
පවුලේ ඉතිරි අය ද කඩු පහරින් හළොදමනු ඇත.
ඔවුන් නුඹේ පුත්‍රයන් ද නුඹේ දූවරුන් ද
පැහැරගනෙ යනු ඇත. නුඹේ ඉතිරි දේ ගින්නනේ
නාස්ති වන්නේ ය. 26 ඔවුන් නුඹේ වස්ත්‍ර නුඹනේ
ගලවාගනෙ, නුඹේ අලංකාර ආභරණත් පැහැරගනු
ඇත. 27 මසේ නුඹේ සල්ලාලකම ද නුඹ මිසර
දේශයේ දී පටන්ගත් නුඹේ වේශ්‍යාකම ද නුඹනේ
නවත්වන්නෙමි. නුඹ ඔවුන් දසෙ තවත්
නොබලන්නහෙි ය. මිසරය තවත් සිහි
නොකරන්නහෙි ය.
28 "කුමක් නිසා ද මහෝත්තම දවෙි ස්වාමීන්
වහන්සේ මසේ වදාරන සේක: 'නුඹ ද්වේෂ කරන,
නුඹේ සිතනේ පහකළ අයගේ අතට මම නුඹ පාවා
දමෙි. 29 ඔවුන් නුඹ ද්වේෂ සහගත ව සලකා, නුඹ
වහෙසෙ මහන්සියනේ ලත් ප්‍රතිඵල සියල්ල
පැහැරගනෙ, නුඹ නග්න කොට, වසෙඟනක සේ
පනෙනේන තබා යනු ඇත. නුඹේ වේශ්‍යාකම ද
නුඹේ සල්ලාලකම ද නිසා මේ දේ නුඹ පිට පැමිණ
ඇත. 30 එසේ වන්නේ, නුඹ ජාතීන් සමඟ
වේශ්‍යාකම් කොට ඔවුන්ගේ රූපවලින් අපවිත්‍ර වූ
නිසා ය. 31 නුඹේ සහෝදරියගේ මාර්ගයහෙි නුඹ ගිය
බැවින් ඇගේ දඬුවම් නමැති කුසලාන නුඹේ අතට
දමෙි.
32 " 'මසේ වදාරන්නේ මහෝත්තම දවෙි
ස්වාමීන් වහන්සේ ය. ගැඹුරු ව පළල් ව තිබනෙ
නුඹේ සහෝදරියගේ කුසලානනේ නුඹ බොන්නහෙි ය.
එය පිරී තිබනෙ බැවින් සියලු දනො නුඹට උසුළු-
විසුළු කරනු ඇත. 33 නුඹ වරෙිමතින් හා සෝදුකින්
පිරනේනහෙි ය. එය බියජනක වනසන සුලු
කුසලානකි. ඒ වනාහි සමාරිය නම් නුඹේ
සහෝදරියගේ කුසලාන ය. 34 නුඹ ඒවා අවසන් පොද
දක්වා උරා බී හිස් කරනු ඇත. ඒ බඳුන කැබලිවලට
කඩා ඒ කැබලිවලින් නුඹේ පියයුරු ඉරාගනෙ ඇත.
කුමක් නිසා ද, එය වදාළේ මහෝත්තම දවෙි
ස්වාමීන් වහන්සේ වන මම ය. 35 නුඹ මා අමතක
කර මට පිටුපා ගිය බැවින් නුඹේ සල්ලාලකමේ සහ
වේශ්‍යාකමේ දුර්විපාකය නුඹ ම දරන්නහෙි ය' කියා
මහෝත්තම දවෙි ස්වාමීන් වහන්සේ වදාරන සේක."

### සොහොයුරියන් දදෙනො කරෙහෙි දේව විනිශ්චය

36 සමිඳාණන් වහන්සේ මට තවදුරට කතා කොට
මසේ වදාළ සේක: "මනුෂ්‍ය පුත්‍රය, නුඹ ඔහොලා
සහ ඔහොලීබා විනිශ්චය කරන්නහෙි ද? එසේ නම්,
ඔවුන්ගේ පිළිකුල් ක්‍රියා ඔවුන්ට දන්වන්න. 37 ඔවුන්
කාමමිථ්‍යාචාරය කර ඇත; මිනී මරා ඇත; ඔවුන්
තමන්ගේ පිළිම සමඟ කාමමිථ්‍යාචාරය කර ඇත;
ඔවුන් මා උදසො ලැබූ පුත්‍රයන් වුව ද ආහාර පිණිස
ඒ පිළිමවලට පූජා කර ඇත. 38 ඔව්හු තවදුරටත්
මට මසේ කළහ. එම දවසේ ඔව්හු මාගේ
ශුද්ධස්ථානය අපවිත්‍ර කොට, මාගේ සබත් දවස
කලෙසෙූ හ. 39 ඔව්හු තමන්ගේ පිළිමවලට
තමන්ගේ පුත්‍රයන් මරා පිදූ පසු මාගේ
ශුද්ධස්ථානය කලෙසෙූ ලසෙ එම දවසේ ම ඊට
ඇතුළු වූ හ. එසේ ය, මාගේ මාලිගාව මැද ඔව්හු
මසේ කළහ.
40 "තවද ඔව්හු දුර බැහැර සිටින මිනිසුන් කැඳවා
ඔවුන් වතෙ පණිවුඩකාරයකෙු යැවූ හ. ඔව්හු ද
පැමිණියෝ ය. නුඹ ඔවුන් නිසා ස්නානය කර, නුඹේ
ඇස්වල අඳුන් ගා ආභරණ පැළඳගනෙ අලංකාර
යහනක ඉඳගත්තහෙි ය. 41 එය ඉදිරිපිට පිළියළෙ
කරන ලද මේසයක් උඩ නුඹ මාගේ සුවඳ ද්‍රව්‍ය ද
මාගේ තලේ ද තැබුවහෙි ය. 42 එවිට නිදැල්ලේ
සිටින සමූහයන්ගේ ප්‍රීති ප්‍රමෝද හඬ ඇසිණි.
සාමාන්‍ය ජනයා හැරුණ විට පාළුකරයනේ ගනෙනෙ
ලද නිදැල්ලේ වසෙනෙ අය ද සිටියෝ ය. ඔව්හු
කාන්තාවන්ගේ අත්වල වළලු දමා, ඔවුන්ගේ හිස්
පිට අලංකාර ඔටුනු තැබූ හ. 43 එවිට 'කම්සැපහෙි
යදෙීමනේ විඩා වී සිටින ඇය වැනි තැනැත්තියක
සමඟ ඔවුන් දැන් වේශ්‍යාකම් කරනු ඇද්ද'යි ඈ
ගැන මම ඇසීමි. 44 වේශ්‍යාවක වතෙ මනේ ඔව්හු
ඈ වතෙ ගියහ. එසේ ඒ සල්ලාල ස්ත්‍රීන් වන
ඔහොලා සහ ඔහොලීබා වතෙ ඔව්හු පැමිණියෝ ය.
45 එබැවින් කාමමිථ්‍යාචාරික ස්ත්‍රීන් විනිශ්චය
කරන ප්‍රකාරයටත්, ලේ වගුරුවන ස්ත්‍රීන් විනිශ්චය
කරන ප්‍රකාරයටත් ධර්මිෂ්ඨ මනුෂ්‍යයෝ ඔවුන්
විනිශ්චය කරන්නෝ ය. කුමක්නිසා ද, ඔව්හු
කාමමිථ්‍යාචාරික ස්ත්‍රීහු ය; ඔවුන්ගේ අත්වල ලේ
තැවරී ඇත.
46 "මහෝත්තම දවෙි ස්වාමීන් වහන්සේ මසේ
වදාරන සේක: 'මම ඔවුන්ට විරුද්ධ ව කලහකාරී
සනෙඟක් පමුණුවා, පීඩා විඳීමටත්, කොල්ලකනු
ලැබීමටත් ඔවුන් පාවා දන්නෙමි. 47 ඒ සනෙඟ
ඔවුන්ට ගල් ගසා, තමන්ගේ කඩුවලින් ඔවුන්
කපාදමා, ඔවුන්ගේ දූ දරුවන් මරාදමා, ඔවුන්ගේ
ගවෙල් ගින්නනේ දවාලන්නෝ ය. 48 මසේ මම
දේශයනේ සල්ලාලකම පහ කරන්නෙමි; ඔවුන්ට
මනේ සසෙු ස්ත්‍රීන්ට සල්ලාලකම් නොකරන්න
උගන්වනු ලැබේ. 49 නුඹලාගේ සල්ලාලකමේ
දුර්විපාකය නුඹලා පිට පමුණුවනු ඇත; පිළිම
නැමදීමේ පාපයට දඬුවම් ලැබනෙු ඇත. එවිට මා
මහෝත්තම දවෙි ස්වාමීන් වහන්සේ බව නුඹලා
දැනගනු ඇත.' "

### ජරෙුසලම වටලෑම

24 නව වන අවුරුද්දේ දස වන මාසයේ දස
වන දා සමිඳාණන් වහන්සේ මට කතා
කොට මසේ වදාළ සේක: 2 2 රාජා 25:1; ජරෙ
52:4"මනුෂ්‍ය පුත්‍රය, මේ දවස එනම්, මේ අද දවස
සටහන් කර තබන්න. බබිලෝනියේ රජ මේ දින ම

ජරුසලම වටලා ඇත. 3 මහෝත්තම දෙවි ස්වාමින්
වහන්සේ මෙසේ වදාරන සේක: ‘කැරලිකාර
වංශයට උපමාවක් කියන්න. හැළිය ලිපයේ
තබාගන්න; ඊට වතුර වත්කරන්න. 4 එයට මස් කෑලි
දමන්න. ඉතා හොඳ කෑලි වන පස්සා ගාතය ද
ඉස්සරහ ගාතය ද ඉතා හොඳ කටු ද එයට
පුරවන්න. 5 ඒක යට දර ගොඩ ගසන්න. වතුර
උතුරුවන්න. එළු බැටළු රැළෙන් ඉතා හොඳ
එකකුගෙන් ගත් කටු හා මස් තම්බන්න.
6 “ ‘මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ මෙසේ
වදාරන සේක. මිනීමරු නුවරට වන විපතක මහත!
එය කිසි කලක ශුද්ධ නොකළ මලකඩ කෑ හැළියක්
වැනි ය. එයින් එක එක කෑල්ල නොතෝරා එළියට
ගන්න. 7 කුමක් නිසා ද, වගුළ ලේ තවමත්
නගරයෙහි ම ඇත. ඈ ඒ ලේ පස්වලින් වැසී යන්න
පොළොව පිට නොවගුරුවා පස් නැති පර්වත උඩ
වැගිරෙව්වා ය. 8 මාගේ කෝපය උතුරා යන
පිණිසත්, පළිගන්න පිණිසත් ඈ වගුළ ලේ සැඟවිය
නොහැකි ලෙස මම පර්වතය උඩ තැබීමි.
9 “ ‘මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ මෙසේ
වදාරන සේක. මිනීමරු නුවරට වන විපතක මහත!
මම මහා දර සෑයක් ගොඩ ගසන්නෙමි. 10 බොහෝ
දර දමා, ගිනි දල්වා, මස් තම්බා, වතුර හිස් කර
රසකාරක මිශ්‍ර කර කටු පුළුස්සාදමන්න. 11 ඉන්පසු
හිස් ලෝකඩ හැළිය රත් වී ගිනියම් වී, එහි
අපවිත්‍රකම ඒ තුළ උණු වී, එහි මලකඩ නැති වී
යන පිණිස ඒක ගිනි අඟුරු මත තබන්න. 12 මම
නිකරුණේ වෙහෙස වීමි. කුමක් නිසා ද, ජරුසලම,
නුඹේ මලකඩ නමැති නුඹේ දූෂිත ක්‍රියා නුඹෙන්
පහ ව නොයෙයි; ඒවා ගින්නෙන් වුව ද පහ ව
නොයෙයි. 13 ජරුසලම, නුඹේ අපවිත්‍රකමෙන් නුඹ
දූෂණය වී ඇත. මා නුඹ පිරිසිදු කරමින් සිටි නමුත්,
නුඹේ අපවිත්‍රකමෙන් නුඹ පිරිසිදු වූයේ නැත;
මාගේ කෝපය සම්පූර්ණයෙන් පහ වන තුරු මම
තවත් නුඹ පිරිසිදු නොකරන්නෙමි; 14 මහෝත්තම
දෙවි ස්වාමින් වහන්සේ වන මම එය කීවෙමි; එය
සිදු වන්නේ ම ය. මම එය කරන්නෙමි. මා පසුබට
වන්නේ වත්, දයාව දක්වන්නේ වත් නැත; නුඹේ
කල්ක්‍රියාවේ හැටියට නුඹ විනිශ්චය කරනු ලබනු
ඇත. මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ මෙයෙ
වදාරන සේක.’ ”

## එසකියලේගේ බිරිඳගේ මරණය

15 සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ සේක:
16 “මනුෂ්‍ය පුත්‍රය, මනේන, නුඹ ඉතා ප්‍රේම කරන
තැනැත්තිය හදිසියේ ම නුඹෙන් ඉවත් කරගනිමි.
එහෙත්, නුඹ විලාප නොකිය යුතු ය; නොහැඬිය
යුතු ය; නුඹේ කඳුළු නොවැගිරිය යුතු ය. 17 නිහඬ
ව සුසුම්ලන්න; මළවුන් ගැන නොවැලපෙන්න; නුඹ
නුඹේ ජටාව හිසේ බැඳ ගන්න; නුඹේ වහන්
පාදවල දමාගන්න. මුහුණ වසා නොගන්න; මළගෙදර
දානය නොකා සිටින්න.”
18 මම උදයේ සෙනඟට කතා කළෙමි; සවස
මාගේ භාර්යාව මළා ය. මට අණ කළ ලෙස පසු දින
උදයේ දී මම කළෙමි. 19 සෙනඟ ද කතා කරමින්,
“නුඹ කරන මේ දේ අපට තේරුම්ගන්න පුළුවන්
හැටියට නුඹ අපට නොකියන්නෙහි දැ”යි මාගෙන්
ඇසූ හ.
20 එවිට මම ඔවුන්ට කතා කෝට මෙසේ කීමි;
“සමිඳාණන් වහන්සේ මට කතාකොට මෙසේ වදාළ
සේක. ‘දෙවි ස්වාමින් වහන්සේ, ඉශ්‍රායලේ වංශයට
මෙසේ වදාරන සේක. 21 බලන්න, මම නුඹලාගේ
උදාර අභිමානය ද නුඹලාගේ නෙත් පිනවන සම්පත
ද නුඹලාගේ මන පිනවන අලංකාරය ද වන
ශුද්ධස්ථානය කලෙසෙන්නෙමි; නුඹලා අත්හැර ආ
නුඹලාගේ දරුදැරියෝ කඩු පහරින් වැටෙන්නෝ ය.
22 මා කළාක් මෙන් නුඹලාත් කරනු ඇත. නුඹලා
මුහුණ වසා නොගෙන, මළ ගෙදර දානය නොකා
සිටිනු ඇත. 23 නුඹලාගේ ජටාව නුඹලාගේ හිස්වල
ද නුඹලාගේ පා වහන් නුඹලාගේ පාදවල ද වන්නේ
ය. නුඹලා විලාප කියන්නේ වත්, අඬන්නේ වත්
නැත; නුඹලාගේ අයුතුකම්වලින් නුඹලා ක්ෂය වී
ගොස්, එකිනෙකා දෙස බලා සුසුම්ලනු ඇත.
24 මෙසේ එසකියලේ නුඹලාට සලකුණක් වන්නේ
ය; ඔහු කළ සියල්ල ලෙස නුඹලා ද කරනු ඇත.
මෙයෙ පැමිණි කළ මා මහෝත්තම දෙවි ස්වාමින්
වහන්සේ බව නුඹලා දැනගනු ඇත.
25 “ ‘ඉතින් මනුෂ්‍ය පුත්‍රය, ඔවුන්ගේ බලය ද
සොමිනස හා කීර්තිය ද ඔවුන්ගේ නෙත් සිත්
පිනවන දෑ හා දරුදැරියන් මා ඔවුන්ගෙන්
පැහැරගන්න දවසේ දී, 26 විනාශයෙන් මිදී පලා
යන්නෙකු ඒ පුවත දන්වන්න නුඹ වෙත එනු ඇත.
27 ඒ දවසේ දී නැති වී ගිය නුඹේ කතා ශක්තිය
නුඹට ලැබී, තවත් ගොළු ව නොසිට නුඹ ඒ
තැනැත්තා සමඟ කතා කරනු ඇත. මෙසේ නුඹ
ඔවුන්ට සලකුණක් වන්නෙහි ය; ඔවුන් මා
සමිඳාණන් වහන්සේ බව දැනගනු ඇත.’ ”

## අම්මොන්ට විරුද්ධ දිවැස් වැකි

25 ජරෙ 49:1-6; එසකි 21:28-32; ආමො
1:13-15; ශපෙ 2:8-11 සමිඳාණන් වහන්සේ
මට කතා කොට මෙසේ වදාළ සේක:
2 “මනුෂ්‍ය පුත්‍රය, නුඹේ මුහුණ අම්මොන්වරුන්
දෙසට හරවාගෙන, ඔවුන්ට විරුද්ධ ව දිවැස් වැකි
කියමින් මෙසේ කියන්න: 3 ‘මහෝත්තම දෙවි
ස්වාමින් වහන්සේගේ වචනය අසන්න; දෙවි
ස්වාමින් වහන්සේ මෙසේ වදාරන සේක. මාගේ
ශුද්ධස්ථානය කලෙසෙනු ලැබූ විට, ඊට විරුද්ධ ව ද
ඉශ්‍රායලේ රට පාළු වී තිබෙන නිසා, ඊට විරුද්ධ ව ද
ජුදා වංශය වහල්කමට ගිය නිසා, ඔවුන්ට විරුද්ධ ව
ද නුඹ ඉතා ප්‍රීති ප්‍රමෝද වූ බැවින්, 4 මම
නැගෙනෙහිර දිශාවේ වැසියන්ට අයිති කරගන්න නුඹ
පාවා දෙන්නෙමි. ඔවුන් නුඹ තුළ තමන්ගේ කඳවුරු
බැඳ, තමන්ගේ වාසස්ථාන නුඹ තුළ පිහිටුවාගනු
ඇත. ඔවුන් නුඹේ පලදාව කා, නුඹේ කිරි බොනු

ඇත. 5 රබ්බා ඔටුවන්ට තණ බිමක් ද අම්මොන්
වැසියන්ගේ රට බැටළුවන් ලගින තැනක් ද
කරන්නෙමි. මෙසේ මා සමිඳාණන් වහන්සේ බව
නුඹලා දැනගන්නහු ය.
6 “ ‘මක්නිසා ද, මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේක. නුඹ අත්පොළසන්
දී, ප්‍රීතියෙන් නටමින් නුඹේ මුළු උඩඟුකමින්
ඉශ්‍රායෙල් දේශයට විරුද්ධ ව සිතෙන් ප්‍රීති වූ
බැවින්, 7 මාගේ අත නුඹට විරුද්ධ ව දිගු කර,
ජාතීන්ට කොල්ලයක් කොට නුඹ පාවා දී, ජනයන්
අතරෙන් නුඹ වනසාදමා, දේශවලින් නුඹ නැති
කොට විනාශ කරන්නෙමි. මා සමිඳාණන් වහන්සේ
බව නුඹ එවිට දැනගන්නෙහි ය.’ “

## මෝවබ්ට විරුද්ධ දිවැස් වැකි

8 යෙසා 15:1; 16:14; 25:10-12; ජෙරෙ 48:1-47;
ආමො 2:1-3; ශෙපෙ 2:8-11 මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේක: “ජුදා දේශය සෙසු
සියලු ජාතීන් හා සමාන යයි මෝවබ් සහ සේයිර් ද
කියන නිසා, 9 මෙන්න, මම මෝවබ් දේශයේ සීමාව
ආරක්ෂා කරන සියලු නගරවලට පහර ලැබීමට
ඉඩහරින්නෙමි. දේශයේ ඇති අලංකාරවත් නගර
වන බෙත්-ජෙෂිමොත් ද බාල්-මෙයොන් ද
කිරියාතයිම් ද වනසාදමමි. 10 අම්මොන්වරුන්ගේ
රටත් සමඟ නැගෙනහිර දිශාවේ වැසියන්ට මෝවබ්
යටත් කරන්න ඉඩහරින්නෙමි. මෙසේ කරන්නේ
ජාතීන් අතරෙහි අම්මොන්වරුන් තවත් සිහි
නොකරන පිණිස ය. 11 මම මෝවබ්වරුන්
විනිශ්චයයට පමුණුවන්නෙමි. මෙසේ මා සමිඳාණන්
වහන්සේ බව ඔව්හු දැනගන්නෝ ය.”

## ඒදොම්ට විරුද්ධ දිවැස් වැකි

12 යෙසා 34:5-17; 63:1-6; ජෙරෙ 49:7-22; එසකි
35:1-15; ආමො 1:11-12; ඔබදි 1:14; මලාකි 1:2-5
මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ වදාරන
සේක: “ඒදොම් ජුදා සෙනඟගෙන් පළිගන්න ලෙස
ක්‍රියා කොට බොහෝ සෙයින් වරදකාරයන් වූ
නිසාත්, ඔවුන්ගෙන් පළිගත් නිසාත් 13 දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේක. මම ඒදොම්ට
විරුද්ධ ව මාගේ අත දිගු කොට, ඒ රටේ
මනුෂ්‍යයන් ද මෘගයන් ද වනසාදමා, තේමාන් පටන්
දදොන් දක්වා එය පාළුකරයක් කරන්නෙමි; ඔවුන්
කඩුවෙන් මැරුම් කනු ඇත. 14 මාගේ සෙනඟ වන
ඉශ්‍රායෙල් ලවා ඒදොම් වැසියන්ගෙන් මම
පළිගන්නෙමි. ඔවුන් මාගේ උදහසේ ද මාගේ
කෝපයේ ද ප්‍රකාරයට ඒදොම්ට කරනු ඇත. ඔවුන්
මාගේ පළිගැනීම දැනගනු ඇත. මහෝත්තම දෙවි
ස්වාමීන් වහන්සේ මෙසේ වදාරන සේක.”

## පිලිස්තියට විරුද්ධ දිවැස් වැකි

15 යෙසා 14:29-31; ජෙරෙ 47:1-7; ජෝවෙ 3:4-8;
ආමො 1:6-8; ශෙපෙ 2:4-7; සකෙරි 9:5-7 මහෝත්තම
දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ වදාරන සේක:
“පිලිස්තිවරුන් පළිගැනීමේ චේතනාව පුරාණ
සතුරුකම් අනුව විනාශ කිරීමට උඩඟු සිතින් පළිගත්
බැවින් 16 මාගේ අත පිලිස්තිවරුන්ට විරුද්ධ ව දිගු
කොට, කරෙතිවරුන් වනසාදමා, මුහුදුබඩ ඉතිරි ව
සිටින්නන් නැති කරන්නෙමි. 17 කෝප සහිත
තර්ජනවලින් ඔවුන්ගෙන් බොහෝ සෙයින්
පළිගන්නෙමි. එසේ ඔවුන්ගෙන් පළිගන්න කල මා
සමිඳාණන් වහන්සේ බව ඔව්හු දැනගන්නෝ ය.
මෙසේ වදාරන්නේ දෙවි ස්වාමීන් වහන්සේ ය.’ “

## තීර්හි විනාශය ගැන දිවැස් වැකි

26 යෙසා 23:1-18; ජෝවෙ 3:4-8; ආමො 1:9-10;
සකෙරි 9:1-4; මතෙ 11:21-22; ලූක් 10:13-14
එකොළොස් වන අවුරුද්දේ මාසේ පළමු වන දවසේ
දී සමිඳාණන් වහන්සේ මට කතා කොට මෙසේ
වදාළ සේක: 2 “මනුෂ්‍ය පුත්‍රය, තීර් ජෙරුසලමට
විරුද්ධ ව කතා කොට, ‘ඔහෝ! ජනයන්ගේ දොරටුව
වන ඈ කඩාදමනු ලැබුවා ය. එය මා දෙසට ඇරී
තිබේ. ඈ පාළු කරනු ලැබ සිටින නිසා මට
පූර්ණකම සෑහීමට ඇති වන්නේ ය’යි සරදම් කරමින්
කීවා ය.
3 “එබැවින් මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
මෙසේ වදාරන සේක: එම්බා තීර්! මම නුඹට විරුද්ධ
ව සිටිමි. මුහුදේ රැළ නැඟී එන්නාක් මෙන් බොහෝ
ජාතීන් නුඹට විරුද්ධ ව පමුණුවන්නෙමි. 4 ඔව්හු
තීර්හි පවුරු විනාශ කොට, එහි කොත් බිඳදමන්නෝ
ය. මම එහි ධූලි එතැනින් අතුගාදමා, එය මුඩු
පර්වතයක් කරන්නෙමි. 5 එය මුහුද මැද දැල් අතුරන
ස්ථානයක් වන්නේ ය; කුමක් නිසා ද, මම ම ඒක
කියමි යි දෙවි ස්වාමීන් වහන්සේ වදාරන සේක. එය
ජාතීන්ට කොල්ලයක් වන්නේ ය. 6 මුල් බිමේ සිටින
ඇගේ දූවරු කඩුවෙන් මැරුම් කන්නෝ ය. මෙසේ මා
සමිඳාණන් වහන්සේ බව සියල්ලන් දැනගනු ඇත.”
7 කුමක් නිසා ද, මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේක. “මෙන්න, මම
රාජාතිරාජ වන බබිලෝනියේ රජ වන
නබුකද්නෙශර් අසුන් සහ රථ ද අසරුවන් සහ
සමූහයන් ද බොහෝ සෙනඟ ද ඇති ව උතුරෙන්
තීර්ට විරුද්ධ ව පමුණුවන්නෙමි. 8 මුල් බිමේ සිටින
නුඹේ දූවරුන් ඔහු කඩුවෙන් මරා, නුඹට විරුද්ධ ව
පවුරු බැඳ නුඹට විරුද්ධ ව පස් කඳු සාදා, නුඹට
විරුද්ධ ව පලිස්වලින් සැදුම්ලත් ආවරණ ඉදිකරනු
ඇත. 9 නුඹේ පවුරුවලට විරුද්ධ ව තමාගේ යුද්ධ
යන්ත්‍ර තබා, තමාගේ පොරෝවලින් නුඹේ කොත්
කඩාදමනු ඇත. 10 ඔහුගේ අශ්වයන්ගේ වැඩිකම්
නිසා උන්ගේ දූවිල්ලට නුඹ වැසී යනු ඇත.
කපොල්ලක් හාරා ඇති නුවරකට මිනිසුන්
ඇතුළුවන්නාක් මෙන් ඔහු නුඹේ දොරටුවලින් ඇතුළු
වන කල, අසරුවන්ගේත්, ගැල්වලත්, රථවලත්
ශබ්දයට පවුරු සලෙවන්නේ ය. 11 ඔව්හු තමාගේ
අශ්වයන්ගේ කුරවලින් නුඹේ වීදි පාගවා, නුඹේ
සෙනඟ කඩුවෙන් මරනු ඇත. නුඹේ විශාල කුළුණු
බිමට වැටෙනු ඇත. 12 ඔවුන් නුඹේ වස්තු

කොල්ලකා, නුඹේ වෙළෙඳාම් බඩු උදුරාගනු ඇත.
නුඹේ පවුරු බිඳදමා, විශාල මන්දිර හළාදමා නුඹේ
ගල් ද ලී ද පස් ද මුහුදට දමනු ඇත. 13 එළිද
18:22නුඹේ ගීතිකාවල ඝෝෂාව නවත්වන්නෙමි;
නුඹේ වීණාවල ශබ්දය ද තවත් නොඇසෙන්නේ ය.
14 මම නුඹ මුඩු පර්වතයක් කරන්නෙමි. නුඹ වනාහි
දැල් ඇතිරීම පිණිස ස්ථානයක් වන්නෙහි ය; නුඹ
යළිත් ගොඩනඟනු නොලබන්නෙහි ය. මක්නිසා ද,
සමිඳාණන් වහන්සේ වන මම එය පැවසුවෙමි."
මෙසේ වදාරන්නේ මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ ය.
15 මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ තීර්ට
මෙසේ වදාරන සේක. "නුඹේ වැටීමේ ශබ්දයටත්,
නුඹ තුළෙහි තුවාළවූවන්ගේ කඳිරිගෑමටත්, මිනිසුන්
මරාදමනු ලබන අන්දමටත් මුහුදුබඩ වාසීහු
භීතියෙන් කම්පා නොවන්නෝ ද? 16 එළිද
18:9-10එකල මුහුදේ සියලු ම අධිපතීහු ද තමන්ගේ
සිංහාසනවලින් බැස, තමන්ගේ සළු ඉවත තබා,
තමන්ගේ විසිතුරු වස්ත්‍ර ගලවා දමා, භීතියෙන්
ඇලළී ගොස් හිඳගෙන මොහොතින් මොහොත
වෙවුළමින්, නුඹේ ඉරණම ගැන බියට පත්වන්නෝ
ය. 17 ඔවුන් නුඹ ගැන විලාපයක් කියමින්, මෙසේ
කියනු ඇත. අහෝ, 'කීර්තිමත් නුවර මුහුදෙනේ
අතුරුදහන් වී ඇත. එහි නාවික බලය මුහුදෙනේ පහ
වී ඇත. නුඹ සහ නුඹේ සෙනඟ මුහුදු පාලනය
කළහු ය; වෙරළෙහි විසූ අය බිය ගැන්වූවහු ය.
18 දැන් ද්වීප වැසියෝ නුඹේ වැටීමේ දවසේ දී
වෙවුළති; එසේ ය, මුහුදේ සිටින ද්වීප වැසියෝ
නුඹේ විනාශය ගැන තැතිගන්නෝ ය'යි නුඹ ගැන
කියනු ඇත."
19 මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක. "වැසියන් නැති නගර මෙන් මා නුඹ
පාළු නුවරක් කර, මහ ජලස්කන්ධයකින් නුඹ වැසී
යන ලෙස සයුර නුඹ පිට පමුණුවන්නෙමි. 20 පාතාල
ලෝකයට බැස ගිය, පෙර විසූ සෙනඟ ළඟට ගලා
බසින්නට මම නුඹට සලස්වන්නෙමි. නුඹ තුළ
වැසියන් නොසිටින පිණිස ද ජීවත් ව සිටින්නන්ගේ
දේශයෙහි තැනක් නො ලබන පිණිස ද පාතාල
ලෝකයට බසින අය සමඟ පොළොවේ පාතාලයෙහි
එනම්, පෙර සිට පාළු වූ තැන්හි නුඹ වාසය
කරවන්නෙමි. 21 එළිද 18:21මම නුඹ භයානක
අවසානයට පත් කරන්නෙමි. නුඹ තවත් ජීවත් ව
නොසිටින්නෙහි ය. නුඹව සොයා ආවත් කිසි කලක
නුඹ සම්බ වන්නේ නැත." මෙසේ වදාරන්නේ
මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ ය.

### තීර් වැටීම ගැන විලාප

27 සමිඳාණන් වහන්සේ කතා කොට මට
මෙසේ වදාළ සේක: 2 "මනුෂ්‍ය පුත්‍රය, නුඹ
තීර් ගැන විලාප ගීයක් නඟමින්, 3 තීර් නගරයට
මෙසේ කියන්න: 'මුහුදට ඇතුළු වන තැන්හි වාසය
කරන, බොහෝ ද්වීපවල ජනයන්ගේ වෙළෙන්දියක
මෙන් වන තැනැත්ති ය, මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේක. එම්බා තීර්! මම
අකලංක අලංකාරයෙන් සිටිමි යි නුඹ කීයෙහි ය.
4 නුඹේ දේශ සීමා මුහුද මැද ඇත්තේ ය. නුඹව
ගොඩනැඟුව අය නුඹේ අලංකාරකම සම්පූර්ණ කර
තිබේ. 5 ඔව්හු නුඹේ නැවේ ලෑලි සියල්ල සෙනීර්හි
දේවදාර ලීවලින් සෑදූ හ. නුඹට කුඹ ගසක් සාදන්න
ඔව්හු ලෙබනොන්හි කිහිරි ගස් ගත්හ, 6 බාෂාන්හි
ආලෝන ලීවලින් නුඹේ හබල් සෑදූ හ. නුඹේ නැවේ
තට්ටුව කිත්තිවරුන්ගේ ද්වීපවලින් ගෙනෙ තසූර්
ලීවලින් සාදා ඇත් දත් ගිල්වූ හ. 7 නුඹේ රුවල්
කොඩිය මිසරයේ සිහින් විසිතුරු රෙදිවලින් සෑදී
තිබේ. නුඹේ වියන එලිෂා නම් ද්වීපවලින් ගෙනෙ
නිල් සහ රත්නිල් රෙදි ය. 8 සීදොන්හි සහ අර්වද්හි
වැසියෝ නුඹේ හබල්කාරයන් ව සිටියෝ ය. එම්බා
තීර්! නුඹ තුළ සිටි නුඹේ ප්‍රඥාවන්තයෝ නුඹේ
නාවිකයෝ වූ හ. 9 ගෙබෙල්හි ප්‍රජා මූලිකයෝ ද
එහි ශිල්පීහු ද නුඹ තුළ නුඹේ කැඩුම්බිඳුම්
හරිගස්සන්නෝ වූ හ. නුඹ සමඟ වෙළෙඳාමේ යෙදී
සිටීමට මුහුදේ සියලු නැව් ද ඒවා යාත්‍රා කරන්නෝ
ද නුඹ තුළ සිටියෝ ය. 10 පාර්සිවරු ද ලුද්වරු ද
පූට්වරු ද යුද සෙබළුන් මෙන් නුඹේ සේනාවෙහි
සිටියෝ ය. ඔව්හු නුඹේ යුද්ධකාරයෝ ය. ඔව්හු
පලිස් ද යුද්ධ තොප්පි ද නුඹ තුළ එල්ලා, නුඹේ
ශෝභනකම දැක්වූ හ. 11 අර්වද්හි පුත්‍රයෝ ද
නුඹේ සේනාව ද නුඹේ පවුරු පිට වටේට සිටියෝ
ය. ගම්මද්හි මනුෂ්‍යයෝ නුඹේ කොත්වල සිටියෝ
ය. ඔව්හු තමන්ගේ පලිස් නුඹේ පවුරුවල වටේට
එල්ලා තැබුවෝ ය; ඔව්හු නුඹේ ශෝභාව පරිපූර්ණ
කළෝ ය. 12 සියලු සම්පත්වල අධිකකම නිසා
තර්ෂිෂ් නුඹ සමඟ වෙළෙඳාම් කළහ. ඔව්හු රිදී ද
යකඩ ද ඊයම් ද බලෙක් ද ගනුදෙනු කළහ.
13 ජාවාන් ද තුබල් ද මෙෂෙක් ද නුඹේ වෙළෙඳුන් ව
සිට නුඹ සමඟ වහලුන් ද ලෝකඩ භාණ්ඩ ද
වෙළෙඳ බඩු මෙන් හුවමාරු කරගත්හ. 14 බෙත්-
තොගර්මා වංශයේ වෙළෙන්දෝ නුඹ සමඟ
අශ්වයන් ද සෙනේධවයන් ද කොටළුවන් ද නුඹේ
වෙළෙඳ බඩු සමඟ හුවමාරු කරගත්හ. 15 දෙදාන්හි
මනුෂ්‍යයෝ නුඹේ වෙළෙන්දන් ව සිටියෝ ය.
බොහෝ මුහුදුබඩ වැසියෝ නුඹ යටතේ වෙළෙඳාම්
කළෝ ය. ඔව්හු ඇත් දළ සහ කළුවර ලී බඩු
හුවමාරුවට නුඹ කරා ගෙනාවෝ ය. 16 නුඹේ
බොහෝ වෙළෙඳ බඩු නිසා සිරිය නුඹේ වෙළෙන්දෝ
වූ හ. ලෝහිතංකවලින් ද රත්නිල් රෙදිවලින් ද ඔව්හු
වැඩදැමූ රෙදිවලින් ද සිහින් රෙදිවලින් ද පබළුවලින්
ද රතුකැටවලින් ද නුඹ සමඟ ගනුදෙනු කළෝ ය.
17 ජුදාවරු ද ඉශ්‍රායෙලේ දේශයේ මනුෂ්‍යයෝ ද
නුඹේ වෙළෙන්දන් ව සිට නුඹ සමඟ මින්නිත්
ප්‍රදේශයේ තිරිඟු ද ඉටි ද මී පැණි ද ගුගුල් ද යන
මේවායින් ගනුදෙනු කළෝ ය. 18 නුඹේ බොහෝ
වෙළෙඳාම් නිසාත්, නුඹේ සියලු සම්පත්වල අධිකකම
නිසාත් දමස්කය නුඹ සමඟ හෙල්බොන්හි මුද්‍රික
පානය ද සහර්හි සුදු ලොම් ද වෙළෙඳාම් කළෝ ය.
19 වදොන් ද ජාවාන් ද නුඹ සමඟ නූල් ගනුදෙනු
කළෝ ය. තැළූ යකඩ සහ ගන්ධරස ද දඬු ද නුඹේ

වළෙඳෙ බඩු අතරේ හුවමාරු විය. 20 දදොන් නුඹ
සමඟ වට්නා සෑදල පිළී හුවමාරු කළහ. 21 අරාබිය
සහ කේදාර්හි සියලු අධිපතීහු නුඹේ හාෙඳ ම
වළෙන්දෙන් මනේ සිට නුඹ සමඟ බැටළු පැටවුන් ද
බැටළුවන් ද එළුවන් ද වළෙඳොම් කළෝ ය. 22 ෂබො
සහ රාමාහි වළෙන්දෙරෝ නුඹේ වළෙන්දෙන් ව සිට
නුඹ සමඟ සියලු ආකාර වට්නා සුවඳ ද්‍රව්‍ය ද සියලු
ආකාර මැණික් ගල් ද රන් ද ගනුදනෙු කළෝ ය.
23 හාරාන්හි ද කන්නෙහි ද එදනේහි ද වැසියන් වන
ෂබොහිත්, අෂූර්හිත්, කිල්මද්හිත් වළෙන්දෙරෝ නුඹ
සමඟ ගනුදනෙු කළෝ ය. 24 ඔව්හු නුඹ සමඟ ඉතා
අලංකාර වස්ත්‍ර ද නිල් සහ විසිතුරු සළු ද
නාෙයකේ පාට ඇති බුමුතුරුණු ද ලණුවලින් වළෙ
කිහිරි ලී පටේටි ද නුඹේ වළෙඳොම් පාෙළෙහි
වළෙඳොම් කළෝ ය. 25 එළිද 18:11-19නුඹේ වළෙඳෙ
බඩු ගනෙ ගියේ තර්ෂිෂ්හි නැව්වලින් ය. මුහුද මැද
නුඹ බඩුබාහිරාදියනේ පිරී සිටියහෙි ය. 26 " 'නුඹේ
හබල්කාරයෝ මුහුදේ ගැඹුරට නුඹ පැමිණවෙුවෝ
ය. නුඹ මුහුද මැද දී පරෙදිග සුළඟට අසු වීමනේ
නුඹේ නැව් මුහුදුබත් වුණා ය. 27 නුඹේ සම්පත් ද
නුඹේ බඩු ද නුඹේ වළෙඳොම් ද නුඹේ
යාන්ත්‍රිකයන් ද නුඹේ නාවිකයන් ද නුඹේ
කැඩුම්බිඳුම් හරිගස්සන්නන් ද නුඹේ වළෙඳොමේ
යදේී සිටින්නන් ද නුඹ තුළ සිටින නුඹේ සියලු
යුද්ධකාරයන් ද නුඹ සමඟ සිටින නුඹේ මුළු සමූහයා
සමඟ නුඹ නුඹේ වැටීමේ දවසේ දී මුහුද මැද
ගිලනේනහෙි ය. 28 නුඹේ නාවිකයන්ගේ කෑගැසීමේ
ශබ්දයට අසබඩ පළාත් සලෙවනේනේ ය. 29 හබල්
අල්ලන සියල්ලෝ ද යාන්ත්‍රිකයෝ ද මුහුදේ සියලු
ම නාවිකයෝ ද තමන්ගේ නැව්වලින් බැස ගාෙඩ
සිටගනෙ, 30 නුඹ ගැන හඬා වැලපී, ශාෝකයනේ
මාෙරගසා, තමන්ගේ හිස් පිට ධූලි තවරාගනෙ
අළුවල පරෙළී සිටින්නෝ ය. 31 ඔව්හු නුඹ නිසා හිස්
මුඩු කරගනෙ, ගාෝණි රදෙි ඇඳගනෙ සිතේ
ශාෝකයනේ මහා විලාප කියමින් නුඹ ගැන
අඬන්නෝ ය. 32 ඔවුන්ගේ ලතාෝනියේ දී ඔවුන්
නුඹ ගැන මසෙේ විලාප ගීයක් නගා නුඹ ගැන
මසෙේ විලාප කියනු ඇත: 'මුහුද මැද තීර් මනේ
විපතට පත් වූ තවත් කවරකේ ඇද් ද? 33 නුඹේ බඩු
මුහුද මඟින් ගනෙයනු ලැබූ කල නුඹ බාෙහාෝ
ජනයන් තෘප්තියට පැමිණවෙුවහෙි ය; නුඹේ බහුල
සම්පතින් ද සාර්ථක වළෙඳොමනේ ද නුඹ
පාෙළාෙවේ රජුන් පාෙහාෙසත් කළෙහෙි ය. 34 දැන්
නුඹ මුහුදින් වට වී රැළ පහරින් බිඳී ගාෙස් ඇත.
නුඹේ වළෙඳොම් බඩු ද නුඹ සමඟ සිටි නුඹේ මුළු
සමූහය ද වැටී ඇත.
35 ද්වීපවල සියලු ම වැසියෝ නුඹේ ඉරණම ගැන
විස්ම පත් වති; ඔවුන්ගේ රජවරු ද අතිශයින් බිය
ව කැළඹුණ මුහුණු ඇති ව සිටිති. 36 ජනයන් අතරේ
සිටින වළෙන්දෙරෝ නුඹට වටකම් කරති; නුඹ
භයානක අවසානයකට පත් වී ඇත. නුඹ සදහට ම
විනාශ වී ඇත.' "

## තීර්හි රජුගේ වැටීම

28 සමිඳාණන් වහන්සේ මට කතා කාෙට
මසෙේ වදාළ සේක: 2 "මනුෂ්‍ය පුත්‍රය,
මහාෝත්තම දවේ ස්වාමීන් වහන්සේ මසෙේ වදාරන
සේකැ යි තීර්ගේ අධිපතියාට කියන්න. නුඹ දවේ
කනෙකෙු නාොව, මනුෂ්‍යයකෙු වන නමුත්, නුඹේ
සිත උඩඟු වී, මම දවේ කනෙකෙම්. මුහුද මැද මම
දවේ කනෙකෙුගේ ආසනයේ වැඩහිඳිමි යි කියමින්,
නුඹ දවේිඳුන්ට සමාන ය යි සිතන්නහෙි ය. 3 නුඹ
දානියලේට වඩා ප්‍රඥාවන්ත ය යි ද නුඹනේ කිසි
රහසක් සඟවන්නට බැරි ය යි ද නුඹ සිතන්නහෙි ය.
4 නුඹේ ප්‍රඥාවනේ ද නුඹේ නුවණින් ද නුඹ
සම්පත් උපදවාගනෙ, රන් රිදී ද ලබා නුඹේ
ගබඩාවල තබා ගත්තහෙි ය. 5 නුඹේ ප්‍රඥාවේ
මහත්කමින් නුඹේ වළෙඳොම කරණකාොටගනෙ
නුඹේ සම්පත් නුඹ වැඩි කරගනෙ සිටින බැවින්,
නුඹේ සම්පත් නිසා නුඹේ සිත උඩඟු වී තිබේ.
6 "එබැවින්, මහාෝත්තම දවේ ස්වාමීන් වහන්සේ
මසෙේ වදාරන සේක: නුඹ දවේ කනෙකෙු මනේ
ඥානවන්ත යයි සිතන බැවින්, 7 බලන්න, මම ජාතීන්
අතරනේ ඉතා භයානක විදශේිකයන් නුඹට විරුද්ධ
ව පමුණුවන්නමේ. ඔව්හු නුඹේ අපූරු ප්‍රඥාවට
විරුද්ධ ව තමන්ගේ කඩු ඇද නුඹේ දීප්තිය කිළුටු
කරනු ඇත. 8 ඔවුන් නුඹ මිනීවළට පමුණුවනු ඇත.
මැරුම්කන අය මරනු ලබන ලසෙ නුඹ මුහුද මැද දී
මැරනෙු ඇත. 9 නුඹ දවේ කනෙකෙු නාොව, නුඹ
සතුරන් අතට අසු වී හුදකේ මිනිසකෙු ව සිටින
නමුත්, නුඹව මරාදමන්නන් ඉදිරියහෙි, 'මම දවේ
කනෙකෙම්'යි එවිටත් නුඹ කියා සිටින්නහෙි ද?
10 අචර්මඡේදිතයන් මනේ නුඹ විදශේිකයන් අතින්
මැරුම්කන්නහෙි ය. මන්ද, මම එසේ කීයමේ. මසෙේ
වදාරන්නේ මහාෝත්තම දවේ ස්වාමීන් වහන්සේ ය."

## තීර්හි රජුගේ වැටීම

11 තවද, සමිඳාණන් වහන්සේ මට කතා කාෙට
මසෙේ වදාරන සේක: 12 "මනුෂ්‍ය පුත්‍රය, තීර්හි
රජු ගැන විලාප ගීයක් ගයමින්, මහාෝත්තම දවේ
ස්වාමීන් වහන්සේ මසෙේ වදාරන සේකැ යි
කියන්න. නුඹ වරක් ප්‍රඥාවනේ පිරී,
අලංකාරකමනේ පූර්ණ වී පරිපූර්ණතාවේ ආදර්ශයක්
වූයහෙි ය. 13 නුඹ දවේයන් වහන්සේගේ උයන වන
ඒදන්හි සිටියහෙි ය; සියලු මැණික් ගල් වන
ලාෝහිතාංක ද පුෂ්පරාග ද දියමන්ති ද රන්කාන්ති ද
නබමාණික්‍ය ද සූර්යකාන්ති ද නීලමාණික්‍ය ද
රතුකැට ද මරකත ද ඔබ්බන ලද රනින් සෑදූ
පළඳනාවනේ සැරසී සිටියහෙි ය. නුඹ මවනු ලැබූ
දවසේ දී ඒවා නුඹට සූදානම් කරන ලද්දේ ය.
14 නුඹ ආරක්ෂා කරන පිණිස බියකරු
කරෙුබ්වරයකෙු මම එහි තැබීමි. නුඹ දවේයන්
වහන්සේගේ ශුද්ධ කන්දහෙි සිටියහෙි ය. නුඹ ගිනි
අඟුරු අතරහෙි ඇවිද්දහෙි ය. 15 නුඹ මවනු ලැබූ දා
පටන් නුඹ තුළ අධර්මිෂ්ඨකම හළේ වනතුරු නුඹේ

හැසිරීමෙන් නුඹ නිදොස් ව සිටියෙහි ය. 16 නුඹේ
වෙළෙඳාම වැඩි වීම හේතුකොටගෙන අදමිටුකමින්
නුඹේ සිත පිරී නුඹ පව් කෙළෙහි ය. එබැවින් නුඹ
කෙලෙසූ දෙයක් මෙන් දෙවියන් වහන්සේගේ
කන්දෙන් මම නුඹ නෙරපාදැමුවෙමි; නුඹ ආරක්ෂක
කෙරුබ්වරයා ද ගිනි අඟුරු අතරෙන් පන්නාදැමුවෙහි
ය. 17 නුඹේ රුව නිසා නුඹේ සිත උඩඟු ව තිබේ.
නුඹේ කීර්තිය නිසා නුඹේ ප්රඥාව කෙලෙසා
ගත්තෙහි ය. මම නුඹ පොළොවට හෙළා, රජවරුන්
නුඹ දැක ප්රීති වන පිණිස නුඹ ඔවුන් ඉදිරියෙහි
හෙළී කෙළෙමි. 18 නුඹේ වෙළෙඳාමේ
අසාධාරණකමෙන් කළ නුඹේ අපරාධ රාශියෙන් නුඹ
නුඹේ ශුද්ධස්ථාන කෙලෙසුවෙහි ය; එහෙයින් මම
නුඹ ඇතුළෙන් ගින්නක් නික්මවීමි; එය නුඹ නාස්ති
කෙළේ ය; නුඹ දකින සියල්ලන්ගේ ඇස් ඉදිරියෙහි
පොළොව පිට නුඹ අළු කෙළෙමි. 19 ජනයා ද නුඹ
අඳුනන සියල්ලෝ ද නුඹ ගැන විස්මපත් වන්නෝ ය.
නුඹ භයානක අවසානයකට පත් වී ඇත. නුඹ
සදහට ම විනාශ වී ඇත."

## සීදොන්ට විරුද්ධ දිවැස් වැකි

20 ජෝවෙ 3:4-8; සෙකරි 9:1-2; මතෙ 11:21-22;
ලූක් 10:13-14 සමිඳාණන් වහන්සේ කතා කොට මට
මෙසේ වදාළ සේක: 21 "මනුෂ්ය පුත්රය, නුඹේ
මුහුණ සීදොන් දෙසට හරවා, ඊට විරුද්ධ ව දිවැස්
වැකි පවසමින් මෙසේ කියන්න: 22 දෙවි ස්වාමින්
වහන්සේ මෙසේ වදාරන සේක. එම්බා සීදොන්,
මම නුඹට විරුද්ධ වෙමි; නුඹ මැද මාගේ තේජස
ප්රකාශ කරමි. මා ඈ කෙරෙහි විනිශ්චයයන් ඉෂ්ට
කොට, මා පිරිසිදු බව ඒ කරණකොටගෙන දැක්වූ
කල, මා සමිඳාණන් වහන්සේ බව ඔවුන් දැනගනු
ඇත. 23 එසේ ය, මම ඈ තුළ වසංගතයත්, ඈගේ
වීදිවල ලේ වැගිරීමත් ඇති කරන්නෙමි. හාත්පසින්
ඈ පිට පැමිණෙන කඩුවෙන් ඈ තුළ මනුෂ්යයෝ
මැරුම් කා වැටෙන්නෝ ය. මෙසේ මා සමිඳාණන්
වහන්සේ බව ඔවුන් දැනගනු ඇත."

## ඉශ්රායෙල් වංශය ආශීර්වාද කරනු ලැබීම

24 "එවිට ඉශ්රායෙල් සෙනඟට ඇනෙන කඩුවක්
වත්, රිද්දවන උලක් වත් ඔවුන් අපවාදයට පත් කළ
ඔවුන් අවට සිටින සියල්ලන්ගෙන් තවත්
නොපැමිණෙන්නේ ය; මෙසේ මා මහෝත්තම දෙවි
ස්වාමින් වහන්සේ බව ඔවුන් දැනගනු ඇත."
25 දෙවි ස්වාමින් වහන්සේ මෙසේ වදාරන සේක.
"මා විජාතීන් අතර විසිරී සිටින ඉශ්රායෙල් සෙනඟ
රැස් කර, මා ශුද්ධවන්ත බව ඔවුන් මඟින්
ජාතීන්ගේ ඇස් හමුයෙහි පෙන්නූ කල්හි, මාගේ
මෙහෙකරු ජාකොබ්ට මා දුන් දේශයෙහි ඔවුන්
වාසය කරනු ඇත. 26 ඔව්හු එහි සුව සේ වාසය
කොට, ගෙවල් ගොඩනඟා මිදි වතු වවන්නෝ ය;
ඔවුන් අවට සිටින, ඔවුන් අපවාදයට පත් කළ,
සියල්ලන් කෙරෙහි මා විනිශ්චයයන් ඉෂ්ට කළ
කල්හි ඔවුන් එසේ සුව සේ වාසය කරනු ඇත.

මෙසේ මා ඔවුන්ගේ දෙවි ස්වාමින් වහන්සේ බව
ඔව්හු දැනගන්නෝ ය."

## මිසරයට විරුද්ධ දිවැස් වැකි කීම

29 දස වන අවුරුද්දේ දස වන මාසයේ
දොළොස් වන දින සමිඳාණන් වහන්සේ මට
කතා කොට මෙසේ වදාළ සේක:යෙසා 19:1-25;
ජෙර 46:2-26 2 "මනුෂ්ය පුත්රය, මිසරයේ රජු වන
පාරාවෝ දෙසෙ බලා ඔහුටත් මුළු මිසරයටත් විරුද්ධ
ව දිවැස් වැකි කියන්න. 3 නුඹ කතා කොට මෙසේ
කියන්න: මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ
මෙසේ වදාරන සේක: නයිල් ගඟ මැද ලගින, නයිල්
ගඟ මාගේ ම ය කියාත්, මම ම ඒක සාදාගත්තෙමි
කියාත් කියන මහ කිඹුලා වන මිසරයේ පාරාවෝ
රජුනි, මෙන්න, මම නුඹට විරුද්ධ වෙමි. 4 මම නුඹේ
හකුවල කොකු දමා, නුඹේ ගංගාවේ මත්ස්යයන්
නුඹේ කොරපොතුවල වද්දවා, එසේ නුඹේ
කොරපොතුවල ම වැදී සිටිය දී නුඹේ ගංගාවේ
සියලු මත්ස්යයන් ඇතුළු ව නුඹ නයිල් ගඟෙන්
ගොඩට අදින්නෙමි. 5 මම නුඹ සහ නුඹේ ගංගාවේ
සියලු මත්ස්යයන් ද කාන්තාරයෙහි හෙළාදමන්නෙමි.
නුඹ වළලනු නොලැබ පොළොව මතුපිට සිටින්නෙහි
ය. මම නුඹ පොළොවේ මෘගයන්ට ද ආකාශ
පක්ෂීන්ට ද කෑම පිණිස දෙන්නෙමි. 6 යෙසා
36:6එවිට මිසරයේ සියලු වැසියෝ මා සමිඳාණන්
වහන්සේ බව දැනගන්නෝ ය.
7 "ඉශ්රායෙල්වරු මිසර වැසියන්ගේ ආධාරය
කෙරෙහි විශ්වාසය තබා සිටියහ. එහෙත්, නුඹ
ඉශ්රායෙල් සෙනඟට බට දණ්ඩක් වැනි විය. ඔවුන්
හේත්තු වූ විට නුඹ කැඩී ගියෙහි ය. ඔවුන්ගේ
කිහිලි සිදුරු විය; ඔවුන්ගේ කොන්ද පණ නැති විය.
8 එබැවින්, මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ
මෙසේ වදාරන සේක. බලන්න, මම නුඹට විරුද්ධ ව
කඩුවක් පමුණුවා, නුඹෙන් මනුෂ්යයන් ද මෘගයන් ද
වනසා දමන්නෙමි. 9 මිසර දේශය නාස්ති වී, පාළු
වනු ඇත. මෙසේ මා සමිඳාණන් වහන්සේ බව
ඔව්හු දැනගන්නෝ ය. මක්නිසා ද, නයිල් ගඟ
මාගේ ය; මම එය සාදාගතිමි යි නුඹ කී බැවිනි.
10 බලන්න, මම නුඹටත්, නුඹේ නයිල් ගඟටත්
විරුද්ධ වෙමි. මම මිග්දොල් පටන් සවේනේ කොටුව
දක්වාත්, එතියෝපියාවේ දේශ සීමාව දක්වාත්,
මිසර දේශය මුළුමනින් ම පාළු කරන්නෙමි.
11 මිනිසෙකු වත්, මෘගයෙකු වත් එහි සැරිසරන්නේ
නැත. එය සතළිස් අවුරුද්දක් වැසියන් නැති ව
තිබෙන්නේ ය. 12 පාළු වී තිබෙන රටවලට වඩා මම
මිසර දේශය පාළු කරන්නෙමි. එහි නගර නටබුන්
ගොඩක් මෙන් තිබෙන නගරවලට වඩා සතළිස්
අවුරුද්දක් එය පාළු දේශයක් ව තිබෙනු ඇත. මම
මිසරවරුන් ජාතීන් අතරට පලවා හැර දේශවල
ඔවුන් විසුරුවන්නෙමි.
13 "එහෙත් මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ
මෙසේ වදාරන සේක. සතළිස් අවුරුද්දකට පසු,
විජාතීන් අතර විසිර ගිය මිසරවරුන් අතරෙන් මම

ඔවුන් රැස් කරන්නමේ. 14 මම මිසරවරුන්ගේ
වහල්කම පහකර ඔවුන්ගේ ජන්ම දේශය වන
පත්රොස් දේශයට ඔවුන් නැවත පමුණුවන්නමේ.
ඔවුන් එහි දුර්වල රාජ්යයක් ව සිටිනු ඇත.
15 මිසරය සියලු රාජ්යයන් අතර පහත් රාජ්යයක්
වන්නේ ය. එය සසෙු ජාතීන්ට වඩා ඉස්මතු
නාොවන්නේ ය; ඔව්හු තවත් පාලනය නාොකරන්නෝ
ය. එය සසෙු ජාතීන් තවත් පාලනය නාොකරන
පිණිස මම මිසරය කුඩා රාජ්යයක් කරන්නමේ.
16 ඉශ්රායලේවරු ආධාර පිණිස මිසරය කරෙහෙි
තවත් විශ්වාසය නාොතබන්නෝ ය. මිසරයට වන
දුර්භාග්යය, එය කරෙේ විශ්වාසය තැබීමේ වරද
ඉශ්රායලේවරුන්ට මතක් කර දනෙු ඇත. එවිට මා
මහෝත්තම දවේ ස්වාමීන් වහන්සේ බව ඔව්හු
දැනගන්නෝ ය.”

## නබෙුකද්නශෙර් රජ මිසරය පරාජය කිරීම

17 තවද, විසිහත් වන අවුරුද්දේ පළමු වන මාසයේ
පළමු වන දා සමිඳාණන් වහන්සේ කතා කාොට
මසෙේ වදාළ සේක: 18 “මනුෂ්ය පුත්රය,
බබිලෝනියේ රජු වන නබෙුකද්නශෙර් තීර්ට විරුද්ධ
ව දරුණු සටනක් ඇරඹුවේ ය. ඔහුගේ භේවායන්
පිට මහා බර උසුලාගනෙ යන්න ඔහු සැලැසූ නිසා
ඔවුන්ගේ හිස් මුඩු විය. උරහිස්වල හම ගියේ ය.
එහතේ, ඔහු තීර්ට විරුද්ධ ව කළ සටනින් ඔහුට
වත්, ඔහුගේ සේනාවට වත් තීර්ගනේ කිසි වාසියක්
ලැබුණේ නැත. 19 එබැවින් මහෝත්තම දවේ
ස්වාමීන් වහන්සේ මසෙේ වදාරන සේක: බලන්න,
මම බබිලෝනියේ රජු වන නබෙුකද්නශෙර්ට මිසර
දේශය පාවා දනේනමේ; ඔහු එහි සමූහයා
අල්ලාගනෙ, එහි තිබනෙ කාොල්ලය රැගනෙ, එහි
තිබනෙ සම්පත් කාොල්ලකාගනෙ යනු ඇත. ඒවා
ඔහුගේ සේනාවට කුලී වශයනේ ගවෙනු ඇත.
20 තීර්ට විරුද්ධ ව ඔහු කළ උත්සාහයට විපාකයක්
වශයනේ මම මිසර දේශය ඔහුට පාවා දනේනමේ.
එසේ කරන්නේ, ඔහු මා උදසාෙ ක්රියා කළ බැවිනි.
මසෙේ වදාරන්නේ මහෝත්තම දවේ ස්වාමීන්
වහන්සේ ය.
21 “ඒ දවසේ දී මම ඉශ්රායලේ සනෙග අඟක්
මනේ ශක්තිමත් කරන්නමේ. තවද එසකියලේ,
සියල්ලන්ට ඇසනෙ සේ කතා කරන්න මම නුඹට
ඉඩ සලසාදනේනමේ. මසෙේ මා සමිඳාණන්
වහන්සේ බව ඔව්හු දැනගන්නෝ ය.”

## මිසරයට දඬුවම් දීම

30 සමිඳාණන් වහන්සේ මට කතා කාොට
මසෙේ වදාළ සේක: 2 “මනුෂ්ය පුත්රය,
දිවැස් වැකි කියමින් මසෙේ කියන්න: මහෝත්තම
දවේ ස්වාමීන් වහන්සේ මසෙේ වදාරන සේක.
වැලපනේන, අහෝ කාලයක හැටි! 3 මක්නිසා ද,
දවස ළඟ ය, සමිඳාණන් වහන්සේගේ දවස ළඟ ය,
එය වලාකුළු සහිත දවසක් වන්නේ ය; ජාතීන්ගේ
විනාශයේ දවසක් වන්නේ ය. 4 යුද්ධයක් මිසරයට
පැමිණනේනේ ය. මිසරයහෙි මිනිසුන් ම මැරුම් කා
වැටනෙ විට ද එහි සමූහයා අල්ලාගන්න විට ද එහි
අත්තිවාරම් පරෙළාදමන විට ද ඉතියෝපියාවේ
භීතියක් හටගන්නේ ය.”
5 “ඉතියෝපිවරු ද පූට්වරු ද ලුද්වරු ද සියලු
අරාබිවරු ද කුබ්වරු ද ගිවිසුමට බැඳුණු දේශයේ
වාසීහු ද ඔවුන් සමඟ කඩු පහරින් වැටනේනෝ ය.”
6 සමිඳාණන් වහන්සේ මසෙේ වදාරන සේක:
“මිසරයට ආධාර කරන අය වැටනේනෝ ය. ඇගේ
බලයේ උඩඟුකම බිඳ වැටනේනේ ය. උතුරේ
මිග්දාොල් පටන් දකුණේ සවේනේ දක්වා මනුෂ්යයෝ
කඩු පහරින් නසින්නෝ ය. මසෙේ වදාරන්නේ
මහෝත්තම දවේ ස්වාමීන් වහන්සේ ය. 7 ඔවුන්ගේ
දේශ පාළු ව තිබනෙ දේශ අතරතේ ඔව්හු ඉතාමත්
පාළු වති. ඔවුන්ගේ නගර නටබුන් වී තිබනෙ
නගර අතරහෙි වන්නේ ය. 8 මා මිසරයහෙි ගින්නක්
දල්වා ඇගේ සියලු ආධාරකරුවන් විනාශ වී ගිය
කල, මා සමිඳාණන් වහන්සේ බව ඔවුන් දැනගනු
ඇත.
9 “ඒ දවසේ දී සැකයනේ තාොර ව දිවි ගවෙන
ඉතියෝපියන්වරුන් බිය ගන්වන පිණිස මා ඉදිරියනේ
පණිවුඩකාරයන් නැව්වලින් පිටත් කර යවන්නමේ.
එවිට මිසරයේ විනාශයේ දවසේ දී භීතිය ඔවුන්
පිට පැමිණනෙු ඇත; එය පැමිණනේනේ ම ය.”
10 මහෝත්තම දවේ ස්වාමීන් වහන්සේ මසෙේ
වදාරන සේක: “මම බබිලෝනියේ රජු වන
නබෙුකද්නශෙර් අතින් මිසරයේ ජනයා නැති
කරවන්නමේ. 11 ජාතීන්ගනේ ඉතා භයානක අය වන
ඔහුත්, ඔහු සමඟ ඔහුගේ සනෙඟත් දේශය නාස්ති
කරන පිණිස ගනේවනු ලබන්නෝ ය. ඔව්හු මිසරයට
විරුද්ධ ව තමන්ගේ කඩු ඇද මැරුම් කන අයගේ
මළකඳන්වලින් දේශය පුරවන්නෝ ය. 12 මම නයිල්
ගඟ වියළවා දේශය දුෂ්ටයන්ගේ අතට විකුණා
දේශය ද එහි ඇති සියල්ල ද විදේශිකයන් ලවා පාළු
කරවන්නමේ. ස්වාමීන් වන මම මසෙේ
වදාරන්නමේ.”
13 මහෝත්තම දවේ ස්වාමීන් වහන්සේ මසෙේ
වදාරන සේක: “මම දේව රූප නැති කාොට, මම්ෆීස්
දේශයේ පිළිම පහකරන්නමේ. අධිපතියකෙු මිසර
දේශයනේ තවත් නාොවනු ඇත. තවද, මම මිසර
දේශයහෙි භීතිය හටගන්වන්නමේ. 14 මම පත්රොස්
පාළු කාොට ශෝවන්හි ගින්නක් අවුළුවා, තීබ්ස්
නගරයට දඬුවම් කරන්නමේ. 15 මම මිසරයේ
සවිමත් බලකාොටුව වන ශීන් පිට මාගේ කෝපය
වගුරුවා තීබ්ස් නගරයහෙි සමූහයා කඩුවනේ
වනසාදමන්නමේ. 16 ගින්නක් ද මිසරයහෙි
දල්වන්නමේ. ශීන් මහ වේදනා විඳින්නටත්, පවුරු
හළාොදමා තීබ්ස් බිඳදමනු ලබන්නටත්, ජලගැල්මනේ
විනාශ වී යන්නටත් සලස්වන්නමේ. 17 ආවනේහි ද
පී-බසෙතේහි ද යෞවනයෝ කඩුවනේ නසින්නෝ ය;
එහි වැසියෝ වහල්කමට ගනෙයනු ලබන්නෝ ය.
18 මා මිසරයේ වියගස් තහෙෆ්නහෙේස්හි දී බිඳින
කල ද ඇගේ බලයේ උඩඟුකම ඇගනේ පහවන
කල ද එහි දවාල අඳුරු වන්නේ ය. ඇ

වලාපටලයකින් වැසනේනී ය. ඇගේ දූවරු
වහල්කමට ගනෙයනු ලබන්නෝ ය. 19 මසෙේ මම
මීසරයට දඬුවම් පමුණුවන්නමේ. එවිට මා
සමිඳාණන් වහන්සේ බව ඔවුන් දැනගනු ඇත.”

## මීසරයේ රජුගේ බලය බිඳදැමීම

20 තවද, එකොළොස් වන අවුරුද්දේ පළමු වන
මාසයේ සත් වන දා සමිඳාණන් වහන්සේ මට කතා
කොට මසෙේ වදාළ සේක: 21 “මනුෂ්‍ය පුත්‍රය,
මීසරයේ රජු වන පාරාවෝගේ හස්තය මම
බිඳදැමුවමේ. කඩුව අල්ලන්න එය ශක්තිමත් වන
සේ කිසිවකු එය පටිවලින් බැඳ එයට පිළියම් කර
නැත. 22 එබැවින් මහෝත්තම දවේ ස්වාමීන්
වහන්සේ මසෙේ වදාරන සේක: ‘බලන්න, මම
මීසරයේ රජු වන පාරාවෝට විරුද්ධ ව සිටිමි. මම
ඔහුගේ කැඩුණු අතත්, නොකැඩුණු අතත් දකෙ ම
කඩන්නමේ. එවිට ඔහුගේ අතින් කඩුව වැටනේනේ
ය. 23 මීසරවරුන් ජාතීන් අතරට එළවා ඔවුන්
දේශවල විසුරුවන්නමේ. 24 මම බබිලෝනියේ
රජුගේ බාහුව බලවත් කොට මාගේ කඩුව ඔහු
අතට දනේනමේ. පාරාවෝගේ බාහුව කඩන්නමේ,
ඔහු මරණීය තුවාළ ලත් කනෙකුගේ
කෙඳිරිගෑම්වලින් ඒ අය ඉදිරියහෙි කෙඳිරිගානු ඇත.
25 මම බබිලෝනියේ රජුගේ බාහු ශක්තිමත්
කරන්නමේ. එහතේ, පාරාවෝගේ බාහු දුර්වල
කරන්නමේ. මසෙේ මා බබිලෝනියේ රජුගේ අතට
මාගේ කඩුව දී, ඔහු එය මීසර දේශයට විරුද්ධ ව
දිගු කරන කල්හි, මා සමිඳාණන් වහන්සේ බව
ඔවුන් දැනගනු ඇත. 26 මම මීසරවරුන් ජාතීන්
අතරට එළවා, ඔවුන් දේශවල විසුරුවන්නමේ. එවිට
මා සමිඳාණන් වහන්සේ බව ඔවුන් දැනගනු ඇත.’ ”

## මහා කිහිරි රුක වන මීසර දේශය

31 තවද, එකොළොස් වන අවුරුද්දේ තුන් වන
මාසයේ පළමු වන දින සමිඳාණන් වහන්සේ
මට කතා කොට මසෙේ වදාළ සේක: 2 “මනුෂ්‍ය
පුත්‍රය, මීසරයේ රජු වන පාරාවෝටත්, ඔහුගේ
සනෙඟටත් මසෙේ කියන්න: නුඹ උසස්කමනේ
කවරකුෙට සමාන ද?
3 “නුඹ වනාහි සවෙණ ගනෙ දනෙ, ශෝභන අතු
ඇති, වලාකුළුවල ගෑවනෙ තරම් උසැති
ලබෙනොන්හි කිහිරි ගසකට සමාන ය.
4 “එය වැඩනෙ පිණිස වතුර ද පෝෂණය කරන
පිණිස පොළොව යට උල්පත් ද තිබුණේ ය. ඒවායින්
ගස වැඩනෙ තැනට ජල ධාරා ගලා එන්නේ ය. එය
වනයේ ඇති ගස්වලට ද දිය දහරා යැව්වේ ය.
5 “ඒ නිසා ඒ ගස වනයේ සියලු ගස්වලට වඩා
උස ය. බොහෝ වතුර ලැබුණු නිසා, එහි අතු වැඩී
වී දිගට ගියේ ය.
6 “ආකාශයේ සියලු පක්ෂීහු එහි අතුවල කූඩු
සාදාගත්හ. එහි අතු යට වනයේ සියලු මෘගයෝ
පැටවුන් ගැසූ හ. එහි සවෙණහෙි සියලු මහා ජාතීහු
ද වාසය කළහ.
7 “එය විහිදී ගිය දිග අතු ඇති, ඉතා අලංකාර,
මහා ගසක් විය. මක්නිසා ද, එහි මුල් බොහෝ
ජලය ඇති තැන්වල ගැඹුරට ඇදී ගියේ ය.
8 උත් 2:9 “දවේයන් වහන්සේගේ උයනේ ඇති
කිසි ම කිහිරි ගසක් එයට සම කළ නොහැකි විය.
දේවදාර ගස් එහි අතුවලට සමාන නො වී ය.
අර්මොන් ගස් එහි රිකිලිවලට සැසඳුව විට ගණනට
ගත නොහැකි විය. දවේයන් වහන්සේගේ උයනහෙි
කිසි ගසක් අලංකාරකමනේ ඊට සමාන නො වී ය.
9 “එහි අතු රාශියනේ මම එය අලංකාර කළෙමේ.
එබැවින් දවේයන් වහන්සේගේ උයනහෙි, ඒදන්හි
සියලු ම ගස්, ඊට ඊර්ෂ්‍යා කළෙේ ය.
10 “එබැවින් මහෝත්තම දවේ ස්වාමීන් වහන්සේ
මසෙේ වදාරන සේක: වලාකුළුවල ගෑවනෙ තරම්
උසට වැඩුණ ඒ ගසට සිදු වන දේ මම නුඹට කියමි.
එය උසට වැඩනේන වැඩනේන උඩඟු විය. 11 ඒ
නිසා ජාතීන් අතරේ බලවන්තයා කැමැති හැටියට
එයට කරන පිණිස ඔහු අතට ඒ ගස පාවා
දනේනමේ. ඔහු ඒ ගසේ දුෂ්ටකමට සරිලන සේ
එයට කළ යුතු දේ කරන්නේ ය. 12 ජාතීන්ගනේ
ඉතා භයානක විදේශිකයෝ එය කපාදමා යන්නෝ
ය. එහි අතු කඳු පිටත්, සියලු මිටියාවත්වලත්
වැටනේනේ ය. එහි අතු කැඩී දේශයේ සියලු දිය
පාරවල තිබනේනේ ය. පොළොවේ සියලු ජනයෝ ද
එහි සවෙණනේ ඉවත් වී එය අත්හැර යන්නෝ ය.
13 වැටී ඇති ගස් මත ආකාශයේ සියලු පක්ෂීහු
ලගින්නෝ ය. එහි අතු උඩ වනයේ සියලු මෘගයෝ
ඇවිදින්නෝ ය. 14 මතෙන් සිට කිසි ම ගසකට
කොපමණ හොඳට වතුර ලැබුණත් ඒ ගස මනේ
උසට වැඩනේනේ නැත; වලාකුළුවල ගෑවනෙ තරම්
උසට වැඩනේනේත් නැත. ඒ සියල්ල පාතාලයේ
සිටින අය සමඟ එක් වන පිණිස මැරනේනට නියම
ව සිටින සුළු මිනිසුන් මනේ මැරී යන්නට නියම වී
ඇත.
15 “මහෝත්තම දවේ ස්වාමීන් වහන්සේ මසෙේ
වදාරන සේක: ඒ ගස පාතාලයට බැස යන දවසේ දී
වැලපීමේ ලකුණක් වශයනේ පොළොව යට වතුර
ඊට නොලැබනේනට සලස්වන්නමේ. මම ගංගාවන්
නවත්වා එහි බොහෝ ජල ධාරාවන්ට ගලා යන්න
ඉඩ නොදනේනමේ. ලබෙනොන් අන්ධකාරයනේ
ආවරණය කරන්නමේ; ගොඩබිම සියලු ගස් ද එයින්
මැලවී යන්නේ ය. 16 මිනී වළට බසින්නන් සමඟ මා
ඒ ගස පාතාලයට හළොදැමූ කල එහි වැටීමේ
ශබ්දයට ජාතීන් වවෙුළවන්නමේ. එවිට ඒදන්හි සියලු
ගස් ද ලබෙනොන්හි ඉතා වටිනා ගස් ද එනම්, වතුර
බොන සියල්ලන් ම, පාතාලයේ දී සැනසනෙු ඇත.
17 ඒ ගස සමඟ එහි සවෙණ යට ජීවත් වූ සියලු
ජාතීන් ද කඩුවනේ මැරුම් කෑ අය ද පාතාලයේ දී
එක්වනු ඇත.
18 “ඒ ගස නම්, මීසර දේශයේ රජු හා ඔහුගේ
සියලු සනෙඟ ය. ඒදන්හි තිබුණු ගස් උසින් ද
තේජසින් ද ඒ ගසට සමාන නො වී ය. එහතේ දැන්
ඒදන්හි ගස් මනේ එය අචර්මඡේදිත වූ, කඩුවනේ
මැරුම් කෑ අය සමඟ එක් වන පිණිස පාතාල

ලාවෙට යන්නේ ය. මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ මසේ වදාරන සේක."

## පාරාවෝ කිඹුලාට සමාන කිරීම

32 තවද, දොළොස් වන අවුරුද්දේ දොළොස්
වන මාසයේ පළමු වන දා සමි්දාණන්
වහන්සේ මට කතා කොට මසේ වදාළ සේක:
2 "මනුෂ්‍ය පුත්‍රය, මිසරයේ රජු වන පාරාවෝ ගැන
විලාපයක් නඟමින් ඔහුට මසේ කියන්න: නුඹ
ජාතීන් අතරෙහි තරුණ සිංහයකුට සමාන කරනු
ලැබුවෙහි ය. නුඹ ජලයෙහි සිටින කිඹුලකු වැනි ය.
නුඹේ ගංගාවල නුඹ පැන පැන ගොස්, නුඹේ
පාදවලින් වතුර කළඹා ගංගා කිළුටු කළෙහි ය.
3 දෙවි ස්වාමීන් වහන්සේ මසේ වදාරන සේක.
රුස්ව සිටින බොහෝ ජනයන් ඇතුළු ව නුඹ පිට
මාගේ දැල හළෙන්නමි. ඔවුන් මාගේ දැලනේ නුඹ
ගොඩට අදිනු ඇත. 4 එවිට මම නුඹ බිම දමා,
පොළෝ තලය මතු පිට හළො ආකාශයේ සියලු
පක්ෂීන් නුඹ පිට වහන්නටත්, මුළු පොළොවේ
සත්ත්වයන් නුඹේ මාංසය කා තෘප්තියට
පැමිණනේනටත් සලස්වන්නමි. 5 මම නුඹේ මාංස
කඳු පිට විසුරුවා මිටියාවත් මළකඳන්වලින්
පුරවන්නමි. 6 නුඹේ ලේ කඳු දක්වා ගලා ගොස්
දිය ඇලවල් එයින් පිරනෙු ඇත. 7 යසො 13:10; මතෙ
24:29; මාක් 13:24-25; ලූක් 21:25; එළිද 6:12-13;
8:12නුඹ විනාශ වන කල, මම අහස මුවා කොට,
එහි තාරකා අඳුරු කර, වලාකුළකින් ඉර වසන්නමි;
සඳත් එහි එළිය නොදෙන්නේ ය. 8 අහසේ බබළන
සියලු ආලෝකයන් නුඹ නිසා මම අඳුරු කොට,
නුඹේ දේශය මත අන්ධකාරය පමුණුවන්නමි යි
මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ වදාරන සේක.
9 "නුඹ නොදත් රටවලට, ජාතීන් අතරට, නුඹ
වහල්කමට ගනෙ යන කල, මම බොහෝ
ජනයන්ගේ සිත් ශෝක කරවන්නමි. 10 එසේ ය,
මම නුඹට කරන දේ ගැන බොහෝ ජනයන්
විස්මයට පමුණුවන්නමි. ඔවුන් ඉදිරිපිට මාගේ
කඩුව ලෙළෙවන කල ඔවුන්ගේ රජවරු නුඹ නිසා
භීතියනේ තැතිගන්නෝ ය. නුඹේ වැටීමේ දවසේ දී
ඔව්හු එක එකා තම තමාගේ ප්‍රාණ ගැන
මොහොතනේ මොහොත වෙව්ළන්නෝ ය.
11 "මක්නිසා ද, මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ මසේ වදාරන සේක. බබිලෝනියේ
රජුගේ කඩුව නුඹ පිට පතිත වන්නේ ය.
12 ජාතීන්ගනේ ඉතා දරුණු අය වන මාගේ
බලවතුන්ගේ කඩු පහරින් නුඹේ සනෙඟ විනාශ
කරන්නට මම සලස්වන්නමි. ඔවුන් මිසරයේ
අභිමානය බිඳදමනු ඇත. එහි මුළු ජනගහනය
විනාශ වනු ඇත. 13 මම එහි සියලු මෘගයන් ජලය
පිරී ඇති තැන්වලින් විනාශ කරන්නමි. මිනිසුන්ගේ
පාදවලට ඒවා තවත් බොරවන්නේ නැත.
මෘගයන්ගේ කුරවලටත් ඒවා බොරවන්නේ නැත.
14 නුඹේ ජලය පෑදනේනටත්, නුඹේ ගංගා තලේ
මනේ ගලා යන්නටත් සලස්වන්නමි. 15 මා මිසර
දේශය නිර්ජන කර, එහි ඇති සියලු දේශ නැති
කර, එහි සියලු වැසියන්ට මා පහර දනෙ කල ද මා
සමි්දාණන් වහන්සේ බව ඔවුන් දැනගනු ඇත.
මසේ වදාරන්නේ මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ ය. 16 මිනිසුන් අතර නඟන විලාපය මේ
ය: 'ජාතීන්ගේ කාන්තාවන් ඒ ගැන විලාප කියනු
ඇත. මිසරය ගැනත්, එහි මුළු සමූහය ගැනත් ඔවුන්
විලාප කියනු ඇත.' මසේ වදාරන්නේ මහෝත්තම
දෙවි ස්වාමීන් වහන්සේ ය."

## පාතාල ලෝකය

17 තවද, දොළොස් වන අවුරුද්දේ පළමු වන
මාසයේ පහළොස් වන දා සමි්දාණන් වහන්සේ මට
කතා කොට මසේ වදාළ සේක: 18 "මනුෂ්‍ය
පුත්‍රය, නුඹ මිසරයේ මුළු ජනගහණය ගැන විලාප
ගීයක් ගයන්න. ඔවුන් සහ බලවත් ජාතීන්ගේ
කාන්තාවන් ද වළ පල්ලට යන අය සමඟ
පොළොවේ යට ඇති පාතාලයට හළෙන්න. 19 නුඹ
කවරකුට වඩා රූපසම්පන්න වන්නෙහි ද? නුඹ බැස
ගොස් අචර්මඡේදිතයන් සමඟ වැටී හිඳින්න.
20 "කඩුවනේ මැරුම් කන අය අතරෙහි ඔවුන්
වැටනෙු ඇත. ඈ සහ ඇගේ සියලු සමූහයන් මැරී
සිටිනු ඇත. 21 බලවතුන්ගේ උත්තමයෝ ඔහුගේ
සහකාරයන් සමඟ පාතාලය මැද සිට ඔහුට කතා
කරති. අචර්මඡේදිත වූ, කඩුවනේ මැරුම් කෑ අය
බැස ගොස් වැටී සිටිති.
22 "අසිරියාව සහ ඇගේ මුළු හමුදාව එහි ය.
ඔවුන්ගේ මිනී වළවල් ඔහු අවටින් ඇත්තේ ය.
ඔව්හු සියල්ලෝ ම කඩුපහරින් වැටී මැරුම් කෑහ.
23 ඔවුන්ගේ මිනී වළවල් පාතාලයේ ඉතා ගැඹුරු
තැන්වල සාදා තිබේ. ඇගේ හමුදාව ඇගේ මිනී වළ
වටකර සිටිති. ජීවත් වනේනවුන්ගේ දේශයෙහි
භීතිය ඉපදවූ ඔව්හු සියල්ලෝ ම කඩු පහරින් වැටී
මැරුම් කෑහ.
24 "එහි ඒලාම් සහ ඇගේ මිනී වළ වටකර ඇගේ
මුළු හමුදාව සිටිති. ඔව්හු සියල්ලෝ ම කඩු පහරින්
වැටී මැරුම් කෑහ. ජීවත්වූවන්ගේ දේශයෙහි භීතිය
ඉපදවූ ඔව්හු අචර්මඡේදිත ව පොළොවේ පාතාල
තැන්වලට බැස ගියෝ ය. ඔව්හු ද වළ පල්ලට යන
අය සමඟ තමන්ගේ නින්දාව දරා සිටිති.
25 මැරුම්කෑ අය කරෙහි ඇගේ මුළු හමුදාව
මධ්‍යයෙහි ඈට යහනක් තබා තිබේ. ඔවුන්ගේ මිනී
වළවල් ඈ වටකර ඇත. ඔව්හු සියල්ලෝ ම
අචර්මඡේදිත වූ, කඩුපහරින් මැරුම්කෑ අය ය. ජීවත්
ව සිටිය දී ඔව්හු භීතිය පතුරුවා හැරියෝ ය. එහතේ,
දැන් ඔව්හු මරණයට ගොදුරු වී පාතාල ලෝකයට
බැස යන්නන් සමඟ නින්දාවට පත් වෙති.
26 "එහි මෙෂෙක් ද තුබල් ද ඇගේ මුළු හමුදාව
සමඟ සිටිති. ඔවුන්ගේ මිනී වළවල් ඈ වටකර
ඇත්තේ ය. ඔව්හු සියල්ලෝ ම අචර්මඡේදිත වූ,
කඩු පහරින් මැරුම්කෑ අය වෙති. එහතේ වරක්
ඔව්හු ජීවත් ව සිටින්නන් භීතියට පත් කළහ.
27 වැටී තමන්ගේ යුද්ධායුධ පිටින් පාතාලයට බැස

ගියාවූ, තමන්ගේ කඩු තමන්ගේ හිස යට තබාගත්,
තමන්ගේ පලිස් තමන්ගේ ඇටකටු මත තබාගත්,
අචර්මඡේදිත බලවතුන් සමඟ ඔව්හු වැටී
නොසිටින්නෝ ය. කුමක්නිසා ද, ජීවත් ව
සිටින්නන්ගේ දේශයෙහි ඔව්හු බලවතුන්ට භීතියක්
ව සිටියෝ ය.
28 “එහෙත්, අචර්මඡේදිතයන් අතරෙහි නුඹ පොඩි
වී නැසුණු අය සමඟ වැටී සිටින්නෙහි ය.
29 “එහි ඒදොම් සහ ඇගේ රජවරු ද ඇගේ සියලු
ම අධිපතීහු ද සිටිති. ඔව්හු බලවන්තයන් ව සිටි
නමුත්, කඩුවෙන් මැරුම්කෑ අය සමඟ තැන්පත් කරනු
ලැබුවෝ ය. ඔවුන් අචර්මඡේදිතයන් ද වළ පල්ලට
යන්නන් ද සමඟ වැටී සිටිනු ඇත.
30 “එහි උතුරු දිශාවේ සියලු උත්තමයෝ ද සියලු
සීදොන්වරු ද සිටිති. ඔව්හු මැරුම්කෑ අය සමඟ බැස
ගියෝ ය. ඔව්හු තමන්ගේ බලවන්තකමෙන් ඉපදවූ
භීතිය ගැන ලජ්ජා වී, කඩුවෙන් මැරුම්කෑ අය සමඟ
වැටී ඉඳ, වළ පල්ලට යන්නන් සමඟ තමන්ගේ
නින්දාව දරති.
31 “පාරාවෝ සහ ඔහුගේ මුළු සේනාව කඩුවෙන්
මැරුම්කෑ අය දැක සතුටුවන්නෝ යයි මහෝත්තම
දෙවි ස්වාමීන් වහන්සේ වදාරන සේක.
32 “වරක් ජීවත් ව සිටින අයගේ දේශය මුළුල්ලේ
භීතිය පැතිරවේවා ය. එහෙත්, පාරාවෝ ද ඔහුගේ
මුළු හමුදාව ද කඩුවෙන් මැරුම්කෑ අය සමඟ
අචර්මඡේදිතයන් අතරෙහි වැටී සිටිති. දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේක.”

### මුර සෙබළකු වැනි දිවැසිවරයා
(එසකි 3:16-21)

33 සමිඳාණන් වහන්සේ මට කතා කොට
මෙසේ වදාළ සේක: 2 “මනුෂ්‍ය පුත්‍රය,
නුඹේ රටවැසි සෙනඟට කතා කොට මෙසේ
කියන්න: මා යම් දේශයකට යුද්ධය පමුණුවන විට
ඒ දේශයේ සෙනඟ තමන් අතරෙන් මනුෂ්‍යයකු
තෝරාගෙන තමන්ට මුර සෙබළා කොට පත් කරනු
ඇත. 3 ඔහු සතුරු සේනා එනු දැක හොරණෑව පිඹ,
ඒ ගැන සෙනඟට දන්වනු ඇත. 4 හොරණෑ ශබ්දය
අසා එය නොසලකා සිටින යම් කෙනෙකු කඩුවෙන්
මරනු ලැබුවොත්, ඔහුගේ මරණයට ඔහු ම වගකිව
යුතු වේ. 5 ඔහු හොරණෑ ශබ්දය අසා නොසලකා
සිටි බැවින් ඔහුගේ මරණය ඔහුගේ ම වරදින් සිදු
වූවකි. එහෙත්, ඔහු අනතුරු ඇඟවීම සැලකුවේ නම්,
තමාගේ ප්‍රාණය ගළවාගන්න ඔහුට ඉඩ තිබිණි.
6 එහෙත්, මුර සෙබළා සතුරු සේනා පැමිණෙනු දැක
සෙනඟට දන්වන ලෙස හොරණෑව නොපිඹ
සිටියොත්, අනතුර නොදත් සෙනඟ අතරෙන් පව්ටු ව
සිටින ඕනෑ ම කෙනෙකු සතුරන් අතින් මරණයට
ගොදුරු වුවහොත් ඒ මරණයට මුර සෙබළා
වගකිවයුත්තා වශයෙන් මම සලකමි.
7 “ ‘එසේ ම මනුෂ්‍ය පුත්‍රය, මම නුඹ ඉශ්‍රායලේ
සෙනඟට මුර සෙබළකු කළෙමි. නුඹ ද මාගේ
මුවින් වචනය අසා මාගේ නාමයෙන් ඔවුන්ට අවවාද
කරන්න. 8 එම්බා දුෂ්ටය, නුඹ නසිනවා ම ඇතැ යි
මා දුෂ්ටයාට කී කල්හි තමාගේ මාර්ගයෙන් හැරෙන
ලෙස දුෂ්ටයාට අවවාද කිරීමට නුඹ කතා නොකර
සිටියොත්, දුෂ්ට වූ ඔහු තමාගේ පාපයෙහි ම නසිනු
ඇත. එහෙත්, නුඹ ඔහුගේ මරණය ගැන
වගකිවයුත්තා වශයෙන් මම සලකමි. 9 එසේ වී
නමුත් තමාගේ මාර්ගයෙන් හැරෙන ලෙස නුඹ ඒ
ගැන දුෂ්ටයාට අවවාද කළ කල්හි ඔහු තමාගේ
මාර්ගයෙන් නොහැරුණොත්, ඔහු තමාගේ අයුතුකම
නිසා නසිනු ඇත. එසේ වූවොත්, නුඹේ ප්‍රාණය
නුඹ ගළවාගනු ඇත.’ ”

### පෞද්ගලික වගකීම

10 සමිඳාණන් වහන්සේ තවදුරටත් මෙසේ වදාළ
සේක: “තවද, මනුෂ්‍ය පුත්‍රය, ඉශ්‍රායලේ වංශයට
මෙසේ කියන්න: ‘අපේ වරද සහ අපේ පාප ද අප
කෙරෙහි තිබී, අප එයින් ක්ෂය වී යද්දී, අප ජීවත්
වන්නේ කොහොම දැ’යි නුඹලා කියන්නහු ය.
11 මාගේ ජීවමාන නාමයෙන් දිවුරා මෙසේ කියමි:
‘දුෂ්ටයා තමාගේ මාර්ගයෙන් හැරී ජීවත්වනවාට
මිස, ඔහු නසිනවාට මම ප්‍රසන්න නොවෙමි යි
මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ වදාරන සේක.
ඉශ්‍රායලේ ජනයෙනි, හැරෙන්න, නුඹලාගේ නපුරු
මාර්ගවලින් හැරෙන්න; නුඹලා නසින්නේ කුමට දැ’යි
ඔවුන්ට කියන්න.
12 “දැහැමි මිනිසකු පව් කළ විට ඔහුගේ පෙර
දැහැමි ක්‍රියා ඔහුට ගැළවීම අත්කර නොදෙයි. දුෂ්ට
මිනිසකු සිය දුෂ්ටකමෙන් හැරුණොත්, ඔහුගේ
පසුගිය දුෂ්ටකම් නිසා ඔහු නසින්නේ නැත. දැහැමි
මිනිසකු පව් කළ විට ඔහුගේ දැහැමිකම නිසා
ගැළවීම ලබන්න ඔහුට පුළුවන් වන්නේ නැත.
13 නුඹ සැබැවින් ජීවත් වන්නෙහි යයි මා දැහැමි
මිනිසාට කී නමුත්, ඔහු තමාගේ දැහැමිකම කෙරෙහි
විශ්වාසය තබමින් අපරාධ කළොත්, ඔහුගේ දැහැමි
ක්‍රියා කිසිවක් සිහි කරනු නොලබන්නේ ය; ඔහු
කළ අපරාධ නිසා ඔහු නසිනු ඇත. 14 නුඹ නසිනු
ඇතැ යි මා දුෂ්ටයාට කී නමුත්, ඔහු තමාගේ
පාපයෙන් හැරී යුක්තිය ද දැහැමි ක්‍රියා ද කළොත්,
15 ඔහු උකසට ගත් දේ නැවත දී, කොල්ලකාගත්
දේ ආපසු දුන්නොත්, අදමිටුකම් නොකර පණත්
අනුව ජීවත් වුවහොත් ඔහු නොමැරී ජීවත් වන්නේ
ය; 16 ඔහුගේ කිසි ම පාපයක් ඔහුට විරුද්ධ ව
සිහිකරනු නොලබන්නේ ය. ඔහු යුක්ති සහගත හරි
දේ කළේ ය; ඔහු සැබැවින් ම ජීවත් වන්නේ ය.
17 “ ‘එහෙත්, සමිඳාණන් වහන්සේගේ ක්‍රියා
අසාධාරණ යැ’යි නුඹේ රටවැසි සෙනඟ කියති.
එහෙත්, අසාධාරණ වන්නේ ඔවුන්ගේ ක්‍රියා ය.
18 දැහැමි මිනිසා තමාගේ දැහැමි ක්‍රියා අත්හැර
අයුතුකම් කළොත්, ඔහු ඒ නිසා නසිනු ඇත.
19 දුෂ්ටයා ද තමාගේ දුෂ්ටකමෙන් හැරී යුක්ති
සහගත හරි දේ කළොත්, ඔහු ඒ නිසා ජීවත් වනු
ඇත. 20 එහෙත්, ‘සමිඳාණන් වහන්සේගේ ක්‍රියා
අසාධාරණ යැ’යි නුඹලා කියන්නහු ය. එම්බා

ඉශ්රායලේ ජනයනේ! මම නුඹලා එකිනකො තම
තමාගේ ම ක්රියා ලසෙ විනිශ්චය කරන්නමේ."

### ජනතාවගේ පාපය හා දේව විනිශ්චය

21 2 රාජා 25:3-10; ජරෙ 39:2-8; 52:4-14 අපේ
වහල්කමේ දොළොස් වන අවුරුද්දේ දස වන
මාසයේ පස් වන දින ජරෙුසලමනේ ගැළවී ආ
කනෙකේ මා ළඟට අවුත්, "නුවර සතුරන්ට අත්පත්
වී ය"යි කී ය. 22 ගැළවී ආ තැනැත්තා එන්නට පරෙ
දා සවස සමිඳාණන් වහන්සේගේ බලය මා පිට
පැමිණ තිබුණේ ය. ඒ මිනිසා පසු දින උදේ මා වතෙ
එන විට උන් වහන්සේ කතා ශක්තිය මට දී
තිබුණේ ය. මාගේ මුඛය ඇරී, මම තවත් ගොළු ව
නොසිටියමේ.
23 සමිඳාණන් වහන්සේ මට කතා කොට මසෙේ
වදාළ සේක: 24 "මනුෂ්ය පුත්රය, ඉශ්රායලේ
දේශයහෙි තිබනෙ ඒ පාළු ඉඩම්වල වසන්නෝ කතා
කොට, 'ආබ්රහම් එක් කනෙකෙු ව සිටි නමුත්,
ඔහුට දේශය උරුම විය. අපි වනාහි බොහෝ
දනෙකේ ය; දේශය ද උරුමයක් කොට අපට දී තිබේ
ය'යි කියති.
25 "එබැවින්, මහෝත්තම දවේ ස්වාමීන් වහන්සේ
මසෙේ වදාරන සේකැ යි ඔවුන්ට කියන්න: 'ලේ
පිටින් මස් කන, රූපවලට නමස්කාර කරන, ලේ
වගුරුවන, නුඹලාට දේශය භුක්ති විඳින්න ලැබේ ද?
26 නුඹලාගේ කඩුව කරෙහෙි විශ්වාසය තබා සිටින,
පිළිකුල් ක්රියා කරන, තම තමාගේ අසල්වැසියාගේ
භාර්යාව දූෂණය කරන නුඹලාට දේශය භුක්ති
විඳින්න ලැබේ ද?'
27 "මහෝත්තම දවේ ස්වාමීන් වහන්සේ මසෙේ
වදාරන සේකැ යි ඔවුන්ට කියන්න: මාගේ ජීවමාන
නාමයනේ දිවුරා මසෙේ කියමි, පාළු ඉඩම්වල
සිටින්නෝ කඩු පහරින් වැටනේනෝ ය; කතෙේ
සිටින අය, වනමෘගයන්ට ගොදුරු පිණිස දනේනමේ;
බලකොටුවල ද ගුහාවල ද සිටින්නෝ වසංගතයනේ
නසින්නෝ ය. 28 මම දේශය පාළුවක් ද නාස්තියක්
ද කරන්නමේ. ඇගේ ශක්තිය කරෙහෙි අභිමානය
අවසාන වන්නේ ය; ඉශ්රායලේ කඳුවලට කිසිවකෙු
යාමට වුවමනා නොවන ලසෙ ඒවා පාළු වන්නේ ය.
29 ඔවුන් කළ සියලු පිළිකුල් ක්රියා නිසා මා දේශය
පාළුවක් ද නාස්තියක් ද කළ විට මා සමිඳාණන්
වහන්සේ බව ඔවුන් දැනගනු ඇත.
30 "තවද, මනුෂ්ය පුත්රය, නුඹේ රටවැසි
සනෙඟගේ පවුරු ළඟ දී ද ගවෙල්වල දොරකඩවල
දී ද නුඹ ගැන කතා කොට, 'එන්න, සමිඳාණන්
වහන්සේගනේ පැමිණනෙ වචනය කුමක් ද කියා
අසන්නැ'යි එකිනකො තම තමාගේ සහෝදරයාට
කියති. 31 එසේ ඔව්හු සනෙඟක් එන්නාක් මනේ
නුඹ ළඟට අවුත්, මාගේ සනෙඟ මනේ නුඹ
ඉදිරියහෙි හිඳගනෙ නුඹේ වචන අසති. එහතේ,
ඔව්හු ඒවා නොපිළිපදිති, මක්නිසා ද, තමන්ගේ
වචනයකින් ඔව්හු බොහෝ ආදරය පනේවති;
එහතේ, ඔවුන්ගේ සිතින් ඔව්හු සිය ලාභය සොයති.
32 නුඹ වනාහි මිහිරි කටහඬක් ඇති, හොඳින්
වාදනය කරන පමේ ගී ගයන්නකෙු වැනි ය. මක්නිසා
ද ඔව්හු නුඹේ වචන අසති; එහතේ ඒවා
නොපිළිපදිති. 33 නුඹ කියන දේ සිදු වන්නේ ම ය.
එය සිදු වන කල තමන් අතරහෙි දිවැසිවරයකෙු
සිටින බව ඔවුන් දැනගනු ඇත."

### ඉශ්රායලේවරුන්ගේ එඬේරු

34 තවද, සමිඳාණන් වහන්සේ මට කතා කොට
මසෙේ වදාළ සේක: 2 "මනුෂ්ය පුත්රය,
ඉශ්රායලේවරුන්ගේ එඬේරුන්ට විරුද්ධ ව දිවැස්
වැකි කියන්න. දිවැස් වැකි කියමින්, මහෝත්තම
දවේ ස්වාමීන් වහන්සේ මසෙේ වදාරන සේකැ යි
ඔවුන්ට එනම්, එඬේරුන්ට කියන්න. තමන් ම
පෝෂණය කරගන්න ඉශ්රායලේ එඬේරුනි, නුඹලාට
වන විපතක මහත! නුඹලා බැටළුවන් පෝෂණය කළ
යුතු නොවන්නහු ද? 3 නුඹලා කිරි බොන්නහු ය;
ලෝම ඇඳුම් ඇඳගන්නහු ය; තර සතුන් මරා
කන්නහු ය. එහතේ, නුඹලා බැටළුවන් පෝෂණය
නොකරන්නහු ය; 4 දුර්වල බැටළුවන් නුඹලා
ශක්තිමත් කළෙේ වත්, ලඩෙ වූ බැටළුවන් සුව
කළෙේ වත්, තුවාළ වූ බැටළුවන්ගේ තුවාළ බැන්දේ
වත් නැත; මුළා ව ගිය බැටළුවන් නැවත ගනොවේ
වත්, නැති වූ බැටළුවන් සවේවේ වත් නැත.
බලයනේ ද කුරිරු ලසෙ ද නුඹලා උන් පාලනය කළහු
ය. 5 ගණන් 27:17; 1 රාජා 22:17; 2 වංශා 18:16;
මතෙ 9:36; මාක් 6:34එඬේරකෙු නැති ව බැටළුවෝ
විසිරී ගොස් සියලු වන මෘගයන්ට ගොදුරු වූ හ.
6 මාගේ බැටළුවෝ සියලු කඳුවල ද උස් වූ සියලු
හලේ පිට ද මුළා ව ගියහ. එසේ ය, මුළු පොළෝ
තලයහෙි මාගේ බැටළුවෝ විසිරී ගියහ. උන්
සොයන්න හෝ බලන්න හෝ කිසිවකේ නොවූ හ.
7 "එබැවින් එඬේරුනි, සමිඳාණන් වහන්සේගේ
වචනය අසන්න. 8 දවේ ස්වාමීන් වහන්සේ මසෙේ
වදාරන සේක. මාගේ ජීවමාන නාමයනේ මසෙේ
දිවුරා කියමි: එඬේරකෙු නැති බැවින් මාගේ
බැටළුවන් වන මෘගයන් විසින් ඩැහැගනෙ යනු ලැබ
උන්ට ගොදුරු වී ඇත; මාගේ එඬේරු මාගේ
බැටළුවන් සොයන්න උත්සාහ නොකර, මාගේ
බැටළුවන් පෝෂණය නොකර, තමන් ම පෝෂණය
කරගත්හ. 9 එබැවින්, එඬේරුනි, සමිඳාණන්
වහන්සේගේ වචනය අසන්න. 10 මහෝත්තම දවේ
ස්වාමීන් වහන්සේ මසෙේ වදාරන සේක. බලන්න,
මම එඬේරුන්ට විරුද්ධ ව සිට මාගේ බැටළුවන්
ඔවුන් අතින් ආපසු ගන්නමේ. ඒ එඬේරුන් බැටළුවන්
රැකබලාගැනීමනේ මම අස් කරන්නමේ. තවත් තමන්
ම පෝෂණය කරගන්න එඬේරුන්ට ඉඩ නොදමේ.
මාගේ බැටළුවන් ඔවුන්ට ගොදුරු නොවන ලසෙ මම
ඔවුන්ගේ කටින් උන් ගළවා ගන්නමේ."

## යහපත් බැටළු එඬේරා

11 “මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක: බලන්න, මම ම මාගේ බැටළුවන්
ගැන සොයා බලා, උන් රැකබලාගන්නෙමි.
12 එඬේරෙකු තමාගේ බැටළු රැළෙන් විසිර ගිය
සමහරකු සොයා යන්නාක් මෙන් මමත් මාගේ
බැටළුවන් සොයා ගොස්, මීදුම සහ අන්ධකාරය ඇති
දවසේ දී උන් විසිරී ගිය සෑම තැන්වලින් උන්
ගළවාගන්නෙමි. 13 මම ජාතීන් අතරෙන් උන් පිටතට
පමුණුවා, ඒ විදේශවලින් උන් රැස් කර, උන්ගේ ම
රටට උන් ගෙනවුත්, ඉශ්රායලේ කඳුවල ද දෙණිවල
ද දේශයේ සියලු වාසස්ථානවල ද උන් පෝෂණය
කරන්නෙමි. 14 හොඳ තෘණවලින් උන් පෝෂණය
කරන්නෙමි. ඉශ්රායලේ කඳුවල උස් තැන්හි උන්ගේ
තණ බිම් වන්නේ ය. එහි හොඳ තණ බිම්වල උන්
ලගිනු ඇත. ඉශ්රායලේ කඳුවල උන් සාරවත් තණ
කනු ඇත. 15 මම ම මාගේ බැටළුවන්ට එඬේරා
වන්නෙමි; මම ම උන්ට ලගින්න තැනක් සොයා
දෙන්නෙමි. මෙසේ වදාරන්නේ දෙවි ස්වාමීන්
වහන්සේ ය.
16 “මම නැති වූ බැටළුවා සොයන්නෙමි; මුළා ව
ගිය බැටළුවා ආපසු ගෙනෙන්නෙමි; තුවාළ වූ
බැටළුවාගේ තුවාළ බඳින්නෙමි; ලෙඩ වූ බැටළුවා
ශක්තිමත් කරන්නෙමි; ශක්තිමත් වූ බැටළුවන්
රැකබලාගන්නෙමි. මම උන්ට සැබෑ එඬේරෙක්
වන්නෙමි.
17 “මාගේ බැටළුවනේ, නුඹලාට දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේක. හොඳ
බැටළුවන්ගෙන් නරක බැටළුවන් මම
වෙන්කරන්නෙමි. 18 නුඹලාගෙන් සමහරු හොඳ තණ
කෑමෙන් සෑහීමට පත් නොවනු පමණක් නොව,
ඉතිරි හොඳ තණ පවා පාගාදමන්නෝ ය; නුඹලා
පිරිසිදු වතුර බොනවා පමණක් නොව හොඳ වතුර
පාගා මඩ කරන්නහු ය. 19 මාගේ සෙසු බැටළුවන්ට
නුඹලා පාගාදැමූ තණ කන්නට ද නුඹලා මඩ කළ
වතුර බොන්නට ද සිදු වී ඇත.”

## අලුත් එඬේරා සහ අලුත් ගිවිසුම

20 “මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
එඬේරුන්ට මෙසේ වදාරන සේක: බලන්න, මම ම
තර බැටළුවන් කෙට්ටු බැටළුවන්ගෙන්
වෙන්කරන්නෙමි. 21 දුර්වල වූ සියල්ලන් විසුරුවාදමන
තුරු නුඹලා ඇලපතෙන් ද උරහිසෙන් ද තල්ලු කර,
නුඹලාගේ අංවලින් උන්ට අනින බැවින්, 22 මාගේ
බැටළුවන් තවත් ගොදුරු නොවන ලෙස මම උන්
ගළවා, බැටළුවන් විනිශ්චය කර හොඳ උන් නරක
උන්ගෙන් වෙන්කරන්නෙමි. 23 එළිද 7:17ඔවුන්
පෝෂණය කිරීමට එක ම එඬේරෙකු වන මාගේ
සේවක දාවිත් වැනි රජ කෙනෙකු ඔවුන් කෙරෙහි
පත් කරන්නෙමි. හෙතෙමෙ ඔවුන් පෝෂණය කොට
ඔවුන්ගේ එඬේරා වන්නේ ය. 24 එසකි
37:24සමිඳාණන් වහන්සේ වන මම ඔවුන්ගේ
දෙවියන් වහන්සේ වන්නෙමි. මාගේ සේවක දාවිත්
ඔවුන් අතරේ අධිපතියා වන්නේ ය; සමිඳාණන්
වහන්සේ වන මම එසේ කීමි.
25 “මම ඔවුන් සමඟ සාමදාන ගිවිසුමක්
කරන්නෙමි, ඔවුන්ට සුව සේ පාළුකරයේ
වසන්නටත්, කැලෑවල නිදා ගන්නටත් පුළුවන් වන
ලෙසෙ මම චණ්ඩ මෘගයන් දේශයෙන් පහකරන්නෙමි.
26 “මම ඔවුන්ට ආශීර්වාද කර, මාගේ ශුද්ධ කන්ද
අවට විසීමට සලසාදෙන්නෙමි. වැස්ස නියම කාලයට
වස්වන්නෙමි. ඒවා ආසිරි වැසි වන්නේ ය. 27 කෙතේ
ගස්වල පල හටගන්නේ ය. දේශයෙන් අස්වැන්න
උපදින්නේ ය. සියලු දෙනෙ සිය දේශයෙහි නිරුපද්‍ර ව
වසන්නෝ ය. මා ඔවුන්ගේ වියගස් කඩා, ඔවුන්
වහල්කරගත් අයගේ අත්වලින් ඔවුන් මුදාගත් විට
මා සමිඳාණන් වහන්සේ බව ඔවුන් දැනගනු ඇත.
28 විජාතීන්ට තවත් ඔව්හු කොල්ලයක් නොවන්නෝ
ය. මේ රටේ වන මෘගයන් උන් කන්නේ නැත;
කිසිවකු ඔවුන් බිය ගන්වන්නේ නැත; ඔවුන් සුව
සේ වාසය කරනු ඇත. 29 මම ඔවුන්ට සශ්රීක වතු
පිටි උපදවන්නෙමි. ඔව්හු තවත් දේශයේ
සාගතයෙන් විනාශ නොවන්නෝ ය. විජාතීන්ගේ
නින්දාවට ලක් නොවන්නෝ ය. 30 මෙසේ ඔවුන්ගේ
මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ වන මා ඔවුන්
සමඟ වැඩසිටින බව ද ඉශ්රායලේ ජාතිය වන ඔවුන්
මාගේ සෙනඟ බව ද ඔව්හු දැනගන්නෝ ය. මෙසේ
වදාරන්නේ දෙවි ස්වාමීන් වහන්සේ ය.
31 “ ‘මාගේ බැටළුවන් වන, මා විසින් පෝෂණය
කරනු ලබන නුඹලා වනාහි මනුෂ්‍යයෝ ය; මම
නුඹලාගේ දෙවියන් වහන්සේ ය’යි මහෝත්තම දෙවි
ස්වාමීන් වහන්සේ වදාරන සේක.”

## ඒදොම්ට දඬුවම් දීම

35 තවද, සමිඳාණන් වහන්සේ මට කතා කොට
මෙසේ වදාළ සේක:
2 යෙසා 34:5-17; 63:1-6; ජෙරෙ 49:7-22; එසකි
25:12-14; ආමො 1:11-12; ඔබදි 1:1-14; මලාකි 1:2-5
“මනුෂ්‍ය පුත්‍රය, නුඹේ මුහුණ සේයිර් කන්ද දෙසට
හරවාගෙන, ඊට විරුද්ධ ව දිවැස් වැකි පවසමින්,
3 මෙසේ කියන්න. ‘මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේක. එම්බා සේයිර්
කන්ද, බලන්න, මම නුඹට විරුද්ධ ව, මාගේ අත
නුඹට දිගු කොට, නුඹ පාළුවක් ද නාස්තියක් ද
කරන්නෙමි. 4 මම නුඹේ නගර නටබුන් ගොඩක්
කරන්නෙමි; නුඹ පිරිහෙන්නට සැලැසූ විට මා
සමිඳාණන් වහන්සේ බව නුඹ දැනගන්නෙහි ය.
5 එ”නුඹ නිරන්තරයෙන් සතුරුකම් කරමින් සිට,
අන්තිම දඬුවමට මූණ පා සිටි ඉශ්රායලේ
සෙනඟගේ විපත්ති කාලයේ දී ඔවුන් කඩුවේ
බලයට පාවා දුන් බැවින්, 6 මාගේ ජීවමාන
නාමයෙන් දිවුරා මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ වන මම මෙසේ වදාරන්නෙමි: මම නුඹ
මරණයට සූදානම් කරන්නෙමි; මරණය නුඹ ලුහුබැඳ
එන්නේ ය. නුඹ මිනී මැරීමට විරුද්ධ නොවූ බැවින්

මරණය නුඹ ලුහුබැඳ එන්නේ ය. 7 මම සේයිර්
කන්ද පාළුවක් ද නාස්තියක් ද කොට, එහි යන එන
කනෙකු නැති ව තිබෙන්න සලස්වන්නෙමි. 8 මැරුම්
කන අයගේ මළකඳන්වලින් නුඹේ කඳු පුරවන්නෙමි.
නුඹේ හෙල්වල ද නුඹේ මිටියාවත්වල ද නුඹේ
සියලු දණ්ඩවල ද කඩුවෙන් මැරුම් කන අය වැටෙනු
ඇත. 9 මම නුඹ සදහට ම පාළුවක් කරන්නෙමි.
නුඹේ නගරවල ද වැසියෝ නොසිටින්නෝ ය.
මෙසේ මා සමිඳාණන් වහන්සේ බව නුඹලා දැනගනු
ඇත.
10 “සමිඳාණන් වහන්සේ මෙහි සිටියදීත් නුඹලා,
මේ ජාති දෙක ද රටවල් දෙක ද මට අයිති වන්නේ
ය කියාත්, අපි එය හිමි කර ගන්නෙමු කියාත් කී
බැවින්, 11 මාගේ ජීවමාන නාමයෙන් දිවුරා
මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ වන මම
මෙසේ වදාරන්නෙමි: ඔවුන් කෙරෙහි තිබෙන නුඹේ
වෛරයෙන් නුඹ මවා පෑවා වූ නුඹේ උදහසේ
හැටියටත්, නුඹේ ඊර්ෂ්‍යාවේ හැටියටත් මම නුඹට
දඬුවම් කරන්නෙමි. මා නුඹ විනිශ්චය කරන කල
නුඹලා අතරෙහි මම ප්‍රකාශ වන්නෙමි. 12 ඒවා පාළු
වී විනාශ කිරීමට අපට පැවරී ඇතැ යි කියමින්, නුඹ
ඉශ්‍රායලේ කඳුවලට විරුද්ධ ව කී නුඹේ සියලු ම
අපහාස කතා සමිඳාණන් වහන්සේ වන මා ඇසූ බව
නුඹ දැනගන්නෙහි ය. 13 නුඹලා මට විරුද්ධ ව නැඟී
සිට මට ගරහන විධියට බොහෝ සේ කතා කර
ඇත. එය මම මාගේ ම කනින් ඇසීමි.”
14 මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ මෙසේ
වදාරන සේක: “මුළු පොළොවට ප්‍රීතියක් වන ලෙස
මම නුඹ පාළුවක් කරවන්නෙමි. 15 මාගේ ම උරුමය
වන ඉශ්‍රායලේ දේශය පාළුවක් වූ විට නුඹ ඊට
ප්‍රීති වුණාක් මෙන් මම නුඹට ද එසේ වීමට
සලසන්නෙමි; එම්බා සේයිර් කන්ද! නුඹ සහ මුළු
ඒදොම් මුළුමනින් ම පාළුවක් වන්නෙහු ය. මෙසේ මා
සමිඳාණන් වහන්සේ බව ඔවුන් දැනගනු ඇත.”

### ඉශ්‍රායලේට දේව ආශීර්වාදය

36 “තවද, මනුෂ්‍ය පුත්‍රය, නුඹ ඉශ්‍රායලේ
කඳුවලට දිවැස් වැකි කියමින් මෙසේ
කියන්න: සමිඳාණන් වහන්සේගේ වචනය අසන්න.
2 දෙවි ස්වාමින් වහන්සේ මෙසේ වදාරන සේක.
ඉශ්‍රායලේගේ සතුරෝ නුඹලා ගැන කතා කොට,
ඔහෝ! පුරාණ උස් ස්ථාන අපට උරුමයක් වී තිබේ
යයි කියති.
3 “එබැවින් නුඹ දිවැස් වැකි කියමින්, දෙවි ස්වාමින්
වහන්සේ මෙසේ වදාරන සේක කියා කියන්න. අවට
ඉතිරි ව සිටින ජාතීන්ට නුඹලා උරුමයක් වන පිණිස
ද විජාතීන්ගේ ඕපාදූප හා ගැරහීමට ලක් වන පිණිස
ද ඔව්හු නුඹලා පාළු කර හැම අතින් ම නුඹලා සුණු
විසුණු කර නුඹලාට නින්දා කළහ. 4 එබැවින් එම්බා
ඉශ්‍රායලේ කඳු! දෙවි ස්වාමින් වහන්සේගේ වචනය
අසන්න. කඳුවලටත්, හෙල්වලටත්, දණ්ඩවලටත්,
මිටියාවත්වලටත්, අවට ඉතිරි ව සිටින ජාතීන්ට
කොල්ලයක් ව කවටකමක් ව තිබෙන පාළු වූ
නාස්ති වූ ඉඩම්වලටත්, ජනහීන ව තිබෙන
නුවරවලටත් දෙවි ස්වාමින් වහන්සේ මෙසේ වදාරන
සේක.
5 “එබැවින් දෙවි ස්වාමින් වහන්සේ මෙසේ
වදාරන සේක. මාගේ දේශය කොල්ලයක් කොට
උදුරාගන්න පිණිස සිතේ මහා සතුටකින් ද ඉමහත්
අහංකාරයකින් ද මාගේ දේශය තමන්ට උරුමයක්
කොට නියම කරගත් ඉතිරි ව සිටින ජාතීන්ටත්,
විශේෂයෙන් මුළු ඒදොම් රටටත් විරුද්ධ ව සැබෑවට
ම මාගේ කෝපාග්නියෙන් මම දිවුරා කියමි.
6 “එබැවින් ඉශ්‍රායලේ රට ගැන දිවැස් වැකි
කියමින්, කඳුවලටත් හෙල්වලටත් දණ්ඩවලටත්
මිටියාවත්වලටත් දෙවි ස්වාමින් වහන්සේ මෙසේ
වදාරන සේක. බලන්න, නුඹලා ජාතීන්ගෙන් වූ
නින්දාව දැරූ නිසා මාගේ කෝපාග්නියෙන් ද මාගේ
උදහසින් ද මම කතා කළෙමි. 7 එබැවින් දෙවි
ස්වාමින් වහන්සේ මෙසේ වදාරන සේක. නුඹලා
අවට සිටින ජාතීන් ම එම නින්දාව දරනු ඇත කියා
දිවිරීමට මම ම මාගේ අත එසවේවමි.
8 “එහෙත් එම්බා ඉශ්‍රායලේ කඳු! නුඹලා මත ඇති
ගස්වල දලු ලියලා මාගේ සෙනඟ වන ඉශ්‍රායලේ
උදෙසා පල දරා දෙනු ඇත; ඔවුන් ආපසු එන්න ළඟ
ය. 9 මම නුඹලා උදෙසා ය, නුඹලා වෙත
හැරෙන්නෙමි. නුඹලා ද අස්වද්දා වපුරන්නහු ය.
10 මම නුඹලා පිට මනුෂ්‍යයන් එනම්, මුළු
ඉශ්‍රායලේ වංශය ම වැඩි වර්ධනය කරන්නෙමි.
නගර ජනාකීර්ණ වනු ඇත. පාළු තැන් ද
ගොඩනගනු ලැබේ. 11 නුඹලාගෙන් රුකෙන මිනිසුන්
ද තිරිසනුන් ද වැඩි වර්ධනය කරන්නෙමි. ඔව්හු වැඩි
වී බෝවෙති. අතීතයේ දී මෙන් නුඹලාගේ නගර
ජනාකීර්ණ කර පෙර කාලවලට වඩා මම නුඹලා
සමෘද්ධිමත් කරන්නෙමි. එවිට නුඹලා ද මා
සමිඳාණන් වහන්සේ බව දැනගනු ඇත. 12 එම්බා
මාගේ ඉශ්‍රායලේ දේශය! නුඹ තුළ මිනිසුන්, එනම්
ඉශ්‍රායලේ සෙනඟ සැරිසරන්නට සලස්වන්නෙමි.
ඔවුන් නුඹ අයිති කරගනු ඇත. නුඹ ඔවුන්ගේ භූමිය
වන්නෙහි ය. නුඹ තවත් මිනිස් දරුවන්ගෙන් හිස් වී
නොසිටින්නෙහි ය.
13 “දෙවි ස්වාමින් වහන්සේ මෙසේ වදාරන සේක.
දේශය, නුඹ මිනිසුන් කාදමා, නුඹේ සෙනඟ නැති
කළෙහි ය කියා නුඹට කියන බැවින්, 14 නුඹ තවත්
මිනිසුන් කාදමන්නේ වත්, නුඹේ සෙනඟ තවත්
නැතිකරන්නේ වත් නැතැ යි දෙවි ස්වාමින් වහන්සේ
වදාරන සේක. 15 නුඹට විරුද්ධ ව විජාතීන්ගේ
අපහාස කතා අසන්න මම තවත් ඉඩ නොදෙන්නෙමි.
ජනයන්ගේ නින්දාව නුඹ තවත් විඳින්නේ වත් නුඹ
තවත් නුඹේ ජාතිය පැකිළෙන්නේ සලස්වන්නේ වත්
නැතැ යි දෙවි ස්වාමින් වහන්සේ වදාරන සේක.”

### ඉශ්‍රායලේවරුන්ගේ නව ජීවනය

16 තවද, සමිඳාණන් වහන්සේ මට කතා කොට
මෙසේ වදාරන සේක: 17 “මනුෂ්‍ය පුත්‍රය,
ඉශ්‍රායලේ වංශය තමන්ගේ රටෙහි වාසය කරද්දී

ඔව්හු තමන්ගේ කල්ක්‍රියාවෙන් ද තමන්ගේ
හැසිරීමෙන් ද ඒ රට අපවිත්‍ර කළෝ ය. ඔවුන්ගේ
කල්ක්‍රියාව කිලි වූ ස්ත්‍රියකගේ අපවිත්‍රකම මෙන්
මා ඉදිරියෙහි විය. 18 ඔවුන් දේශයෙහි මිනී මැරූ
නිසාත්, ඔවුන් තමන්ගේ රූපවලින් එය අපවිත්‍ර කළ
නිසාත් මාගේ කෝපය ඔවුන් කෙරෙහි වගුරුවා,
19 විජාතීන් අතරට මම ඔවුන් පන්නාදැමීමි. ඇරත්
ඔව්හු දේශවල විසුරුවනු ලැබූ හ. ඔවුන්ගේ
කල්ක්‍රියාවේ හැටියට ද ඔවුන්ගේ හැසිරීමේ
ප්‍රකාරයට ද ඔවුන් විනිශ්චය කළෙමි. 20 ඔවුන්
පැමිණි කොතැන වුවත්, ජාතීන් ළඟට ඔවුන් ගිය
කල, ‘මොවුහු සමිඳාණන්ගේ සෙනඟ ය, උන්
වහන්සේගේ දේශයෙන් ඔවුන්ට පිට වීමට සිදු වී
ය’යි මිනිසුන් ඔවුන් ගැන කී නිසා ඔව්හු මාගේ ශුද්ධ
නාමය කෙලෙසූ හ. 21 එහෙත්, ඉශ්‍රායලේ සෙනඟ
ගිය තැන්වල ජාතීන් අතරෙහි මාගේ ශුද්ධ නාමය
කෙලෙසූ නිසා, මාගේ නාමය ගැන මම සැලකිලිමත්
වීමි.
22 “එබැවින් මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
මෙසේ වදාරන සේකැ යි ඉශ්‍රායලේ සෙනඟට
කියන්න: එම්බා ඉශ්‍රායලේ ජනයෙනි! නුඹලා උදෙසා
නොවෙ, නුඹලා ගිය ගිය සෑම තැන්වල ජාතීන්
අතරෙහි නුඹලා මාගේ ශුද්ධ නාමය කෙලෙසූ නිසා
ඒ නාමය උදෙසා මම ක්‍රියා කරමි. 23 ජාතීන්
අතරෙහි කෙලෙසී ඇති නුඹලා විසින් ඔවුන් අතරෙහි
කෙලෙසෙනු ලැබූ මාගේ උදාර නාමය විශුද්ධ
කරන්නෙමි. මා විශුද්ධ බව නුඹලා කරණකොටගෙන
විජාතීන්ගේ ඇස් හමුයෙහි ප්‍රකාශ වන කල මා
සමිඳාණන් වහන්සේ බව ඔවුන් දැනගනු ඇතැ යි
මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ වදාරන සේක.
24 එසේ ය, විජාතීන් අතරෙන් නුඹලා රැගෙන, සියලු
දේශවලින් නුඹලා රැස් කර නුඹලාගේ ම රටට
ගෙනෙන්නෙමි. 25 නුඹලා පිරිසිදු වන ලෙස මම
නුඹලා කෙරෙහි පිරිසිදු දිය ඉසින්නෙමි. නුඹලාගේ
සියලු අපවිත්‍රකම්වලින් ද නුඹලාගේ සියලු
දේවරූපවලින් ද නුඹලා පිරිසිදු කරන්නෙමි.”
26 එසකි 11:19-20 “මම අලුත් හදක් නුඹලාට දී,
අලුත් සිතක් නුඹලා තුළ මවා, නුඹලාගේ මුරණ්ඩු
ගල් සිත පහකොට කීකරු සිතක් නුඹලාට
දෙන්නෙමි. 27 මාගේ ආත්මානුභාවය නුඹලා තුළ
නිදන් කොට, නුඹලා මාගේ පණත් අනුව හැසිර
මාගේ නියමයන් හරියාකාර ඉටු කරන්න
සලස්වන්නෙමි. 28 මා විසින් නුඹලාගේ පියවරුන්ට
දෙන ලද දේශයෙහි නුඹලා වාසය කොට මාගේ ම
සෙනඟ ව සිටිනු ඇත. මම ද නුඹලාගේ දෙවියන්
වහන්සේ වන්නෙමි. 29 මම නුඹලාගේ සියලු
අපවිත්‍රකම්වලින් නුඹලා ගළවන්නෙමි. නුඹලා පිට
සාගතය නොපමුණුවා, බහුල ව ධාන්‍ය උපදවා දී
ඒවා වැඩි කරන්නෙමි. 30 නුඹලා විජාතීන් අතරෙහි
සාගතයේ නින්දාව තවත් නොලබන පිණිස මම
ගස්වල පල ද කෙත්වල අස්වැන්න ද වැඩි
කරන්නෙමි. 31 නුඹලා ද නුඹලාගේ නපුරු මාර්ග සහ
නුඹලාගේ අයහපත් ක්‍රියා සිහිකොට, නුඹලාගේ
පව් ද නුඹලාගේ පිළිකුල් ක්‍රියා ද නිසා නුඹලා ම
පිළිකුල් කරගන්නහු ය. 32 මා මෙසේ ක්‍රියා
කරන්නේ නුඹලා නිසා නොවෙන බව දැනගන්නැ යි
මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ වදාරන සේක.
එම්බා ඉශ්‍රායලේ ජනයෙනි! නුඹලාගේ කල්ක්‍රියාව
නිසා ලජ්ජා වී කැළඹෙන්න.”
33 මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක: “නුඹලාගේ සියලු අපරාධවලින් මා
නුඹලා පිරිසිදු කරන දවසේ දී මම නගරවල මිනිසුන්
ජනාකීර්ණ කරන්නෙමි. නටබුන් නගර ද
ගොඩනඟනු ලබන්නේ ය. 34 මඟ යන සියල්ලන්ගේ
ඇස් හමුයෙහි පාළුවක් ව තිබුණ දේශය අස්වද්දනු
ලබන්නී ය. 35 මිනිසුන් ද කතා කොට, ‘පාළු වී
තිබුණ දේශය ඒදන් උයන මෙන් වී තිබේ; නාස්ති
ව, පාළු ව, ජරාවාස ව තිබුණු නගර බලකොටු වී
වැසියන්ගෙන් ගහණ ව තිබේ ය’යි කියන්නෝ ය.
36 නුඹලා වටකර ඉතිරි වී ඇති ජාතීන් ද සමිඳාණන්
වහන්සේ වන මා විසින් ජරාවාස වූ තැන්
ගොඩනඟන්නටත්, පාළු වූ ඉඩම් වවන්නටත් සලසන
ලද බව දැනගනු ඇත. සමිඳාණන් වහන්සේ වන මම
එය කීවෙමි, එය ඉටු කරන්නෙමි.”
37 මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක: “මාගෙන් උපකාර ඉල්ලීමට යළිත්
වරක් මම ඉශ්‍රායලේ සෙනඟට ඉඩ දෙන්නෙමි.
බැටළු රැළක් මෙන් ඔවුන්ගේ ගණන වැඩි
කරන්නෙමි. 38 පූජා කිරීමට කැප කළ බැටළු රැළ
මෙන්, ජෙරුසලමේ නියමිත මංගල්‍යවල දී එහි සිටින
බැටළු රැළ මෙන්, පාළු නගර ජන සමූහයෙන් පිරෙනු
ඇත. ඔවුන් ද මා සමිඳාණන් වහන්සේ බව දැනගනු
ඇත.”

## වියළි ඇටකටු ඇති මිටියාවත

37 සමිඳාණන් වහන්සේගේ හස්තය මා පිට
පැමිණියේ ය. උන් වහන්සේ සිය
ආත්මානුභාවයෙන් මා පිටතට පමුණුවා
ඇටකටුවලින් පිරී තිබුණ මිටියාවතක් මැද මා සිටවූ
සේක. 2 උන් වහන්සේ මට ඒවා අතරේ ඔබමොබ
යන්න සැලැසූ සේක. එවිට මිටියාවතේ ඇටකටු
බහුල ව තිබෙනු මම දිටිමි. ඒවා හොඳට ම වියළී
තිබුණේ ය. 3 උන් වහන්සේ මට කතා කොට,
“මනුෂ්‍ය පුත්‍රය, මේ ඇටකටුවලට ජීවත් විය හැකි
දැ”යි මාගෙන් ඇසූ සේක. මම ද “මහෝත්තම දෙවි
ස්වාමීන් වහන්ස, එය දන්නේ ඔබ ය”යි උත්තර
දිනිමි.
4 උන් වහන්සේ යළිත් මට කතා කොට, “නුඹ මේ
ඇටකටුවලට දිවැස් වැකි පවසා, මෙසේ කියන්න:
අහෝ වියළි ඇටකටු! සමිඳාණන් වහන්සේගේ
වචනය අසන්න. 5 මේ ඇටකටුවලට මහෝත්තම
දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ වදාරන සේක:
මෙන්න, නුඹලා ජීවත් වන පිණිස නුඹලා තුළට
ජීවන හුස්ම හෙළන්නෙමි. එවිට නුඹලා ජීවත්
වන්නහු ය. 6 මම නුඹලාට නහර දෙමි; නුඹලා පිට
මාංසය හටගන්වා, නුඹලා සමින් වසා, ජීවත් වන
පිණිස නුඹලා තුළ ජීවන හුස්ම හෙළන්නෙමි. එවිට

නුඹලා ජීවත් වන්නහු ය. මා සමිඳාණන් වහන්සේ
බව නුඹලා ද දැනගනු ඇත.”
7 එවිට මට අණ කළ ලෙස මම දිවැස් වැකි
පැවසීමි. මා දිවැස් වැකි පවසද්දී ශබ්දයක් ද සට සට
ගාන හඬක් ද ඇති වී එක එක ඇටය එකට එක
එකතු විය. 8 මම බැලූ විට ඒවාට නහර තිබෙන
බව දිටිමි. මාංසය හටගැනී ඒවා සමින් වැසුණේ ය.
එහෙත්, ඒවා තුළ ජීවන හුස්ම නො වී ය.
9 එවිට උන් වහන්සේ මට කතා කොට, “නුඹ
ජීවන හුස්මට දිවැස් වැකි පවසන්න. මනුෂ්‍ය පුත්‍රය,
දිවැස් වැකි කියමින් ජීවන හුස්මට කතා කොට,
මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ කියන
සේක. එම්බා ජීවන හුස්ම! සතර දිග සුළඟින් අවුත්
මියගිය මොවුන් ජීවත් වන පිණිස මොවුන් තුළට
ජීවන හුස්ම හළෙන්න කියා කියන්නැ යි මට වදාළ
සේක.”
10 එළිද 11:11 මම ද උන් වහන්සේ මට අණ කළ
පරිදි දිවැස් වැකි පැවසීමි. එවිට ජීවන හුස්ම ඔවුන්
තුළට පැමිණ, ඔව්හු ජීවය ලැබ, නැඟිට, ඉතා මහත්
සේනාවක් ව සිටගත්තෝ ය.
11 එවිට උන් වහන්සේ මට කතා කොට මෙසේ
වදාළ සේක: “මනුෂ්‍ය පුත්‍රය, මේ ඇටකටු වනාහි
මුළු ඉශ්‍රායලේ වංශය ය. ‘අපේ ඇටකටු වියළී අපේ
බලාපොරොත්තුව නැති වී තිබේ. අපි සහමුලින් ම
සිඳ දමනු ලැබීමු’යි ඔව්හු කියති. 12 එබැවින් නුඹ
දිවැස් වැකි පවසමින්, ‘මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේකැ’යි කියන්න. ‘මාගේ
ජනයෙනි, මම නුඹලාගේ සොහොන් විවර කොට
නුඹලාගේ සොහොන්වලින් නුඹලා නැඟුටුවා, නුඹලා
ඉශ්‍රායලේ රටට පමුණුවන්නෙමි. 13 එම්බා මාගේ
සෙනඟෙනි! මා නුඹලාගේ සොහොන් විවර කොට,
නුඹලාගේ සොහොන්වලින් නුඹලා නැඟිටවූ විට
මා සමිඳාණන් වහන්සේ බව නුඹලා දැනගනු ඇත.
14 නුඹලා ජීවත් වන පිණිස මම නුඹලා තුළ මාගේ
ආත්මානුභාවය නිදන් කර නුඹලාගේ රටෙහි නුඹලා
පිහිටුවන්නෙමි.’ මෙසේ, ස්වාමීන් වන මා එසේ
වදාළ බව ද එය ඉටු කළ බව ද නුඹලා දැනගන්නහු
ය. සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක.”

## ජුදා සහ ඉශ්‍රායලේ එක රාජ්‍යයක් වීම

15 නැවත සමිඳාණන් වහන්සේ මට කතා කොට
මෙසේ වදාළ සේක: “මනුෂ්‍ය පුත්‍රය, නුඹ ලීයක්
රැගෙන 16 ජුදා රාජ්‍යය සහ එයට සම්බන්ධ
ඉශ්‍රායලේ දරුවන් ගැන ලියන්න. තව ලීයක් රැගෙන
ජෝසෙප් සහ එයට සම්බන්ධ ඉශ්‍රායලේ ගෝත්‍රය
ගැන ඒ පිට ලියන්න. 17 ඉන්පසු ඒ ලී දෙක නුඹේ
අතේ එක ලීයක් වන ලෙස ලී දෙක එකට සම්බන්ධ
කරන්න. 18 නුඹේ සෙනඟ කතා කොට, ‘මෙයින්
නුඹ හඟවන්නේ කිමෙක් ද කියා නුඹ අපට
නොදන්වන්නෙහි දැ’යි නුඹෙන් ඇසූ විට, 19 නුඹ
ඔවුන්ට කතා කොට, ‘මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේකැ’යි කියන්න. මෙන්න
මම ඉශ්‍රායලේ නමැති ලීය රැගෙන ජුදා නමැති
ලීයට එක් කරන්නෙමි. ලී දෙකෙන් එක ලීයක් සාදා
එය මාගේ අතනේ අල්ලාගනිමි.
20 “නුඹ විසින් ලියන ලද ඒ ලී කෑලි දෙක ඔවුන්
ඉදිරියෙහි නුඹේ අතේ තිබිය දී කතා කොට මෙසේ
කියන්න. 21 මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
මෙසේ වදාරන සේක: ඉශ්‍රායලේ සෙනඟ ගොස්
සිටින තැන්වල විජාතීන් අතරෙන් මම ඔවුන් රැගෙන
වටින් පිටින් ඔවුන් රැස් කොට, ඔවුන්ගේ රටට
ඔවුන් පමුණුවන්නෙමි. 22 මම දේශයෙහි ඉශ්‍රායලේ
කඳු පිට ඔවුන් එක ජාතියක් කරන්නෙමි. එක
රජෙක් ද ඔවුන් සියල්ලන්ට ම රජ වන්නේ ය. ඔව්හු
තවත් ජාති දෙකෙක් නොවන්නෝ ය. තවත් රාජ්‍යයන්
දෙකෙකට නොබෙදෙන්නෝ ය. 23 ඔව්හු තමන්ගේ
දේව රූපවලින් වත්, තමන්ගේ පිළිකුල් ක්‍රියාවලින්
වත්, තමන්ගේ සියලු ම පාප ක්‍රියාවලින් වත් තමන්
කිළුටු කර නොගනිති. ඔවුන් කළ පව්වලින් මම
ඔවුන් ගළවා ඔවුන් පිරිසිදු කරන්නෙමි. මෙසේ ඔව්හු
මාගේ සෙනඟ වන්නෝ ය. මම ද ඔවුන්ගේ
දෙවියන් වහන්සේ වන්නෙමි. 24 එසකි 34:24මාගේ
සේවක දාවිත් වැනි රජෙක් ඔවුන් කෙරෙහි රජ
වන්නේ ය; ඔවුන් සියල්ලන්ට ම එක එඬේරෙක්
වන්නේ ය. ඔව්හු මාගේ නියෝග ලෙස හැසිර,
මාගේ පණත් අනුගමනය කර ඒවා ඉටු කරන්නෝ
ය. 25 මාගේ සේවක ජාකොබ්ට මා දුන්, නුඹලාගේ
පියවරුන් වාසය කළ දේශයෙහි ඔවුන් වාසය කරනු
ඇත; එසේ ඔව්හු ද ඔවුන්ගේ දරුවෝ ද ඔවුන්ගේ
දරුවන්ගේ දරුවෝ ද සදාකාලයට ම එහි වාසය
කරන්නෝ ය. මාගේ සේවක දාවිත් වැනි රජෙක්
සදාකාලයට ම ඔවුන්ට අධිපතියා වන්නේ ය.
26 තවද, මම සාමදාන ගිවිසුමක් ඔවුන් සමඟ
කරන්නෙමි. එය ඔවුන් සමඟ සදාකාල ගිවිසුමක්
වන්නේ ය. මම ඔවුන්ට ආසිරි පතා, ඔවුන් වැඩි
වර්ධනය කොට, මාගේ ශුද්ධස්ථානය ඔවුන්
අතරෙහි සදාකාලයට ම පිහිටුවන්නෙමි. 27 2 කොරි
6:16; එළිද 21:3මම ඔවුන් සමඟ වැඩවසන්නෙමි.
මම ඔවුන්ගේ දෙවියන් වහන්සේ වන්නෙමි. ඔව්හු
මාගේ සෙනඟ වන්නෝ ය. 28 මාගේ ශුද්ධස්ථානය
හැම කල්හි ම ඔවුන් අතරෙහි තිබීමෙන් මා
ඉශ්‍රායලේ විශුද්ධ කරන සමිඳාණන් වහන්සේ බව
විජාතීන් දැනගනු ඇත.”

## ගොග් රජු දෙවියන් වහන්සේගේ අතේ ආයුධයක් මෙන්

38 සමිඳාණන් වහන්සේ මට කතා කොට
මෙසේ වදාළ සේක: 2 එළිද 20:8“මනුෂ්‍ය
පුත්‍රය, රොෂ්හි ද මෙෂෙක්හි ද තුබල්හි ද අධිපතියා
වන මාගොග් දේශයේ ගොග් රජුට විරුද්ධ ව නුඹේ
මුහුණ යොමු කර, ඔහුට විරුද්ධ ව දිවැස් වැකි
කියමින්, මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
මෙසේ වදාරන සේකැ යි කියන්න. 3 එම්බා රොෂ්හි
ද මෙෂෙක්හි ද තුබල්හි ද අධිපතියා වන ගොග්, මම
නුඹට විරුද්ධ වෙමි. 4 මම නුඹ ආපසු හරවා, නුඹේ
හකුවල කොකු දමා, නුඹ සහ නුඹේ මුළු සේනාව ද

අසුන් ද අසරුවන් ද පිටතට ගෙන යන්නෙමි. ඔව්හු
සියල්ලෝ ම යුද ඇඳුමෙන් සැරසී, පලිස් ද කුඩා
පලිස් ද ලෙළ දෙන කඩු ද අතට ගත් මහ සමූහයකි.
5 ඔවුන් සමඟ පාර්සිවරු ද ඒතියෝපිවරු ද පූට්වරු ද
සිටිති. ඔවුන් සියල්ලන්ට පලිස් ද යුද්ධ තොප්පි ද
තිබේ. 6 ගොමෙර් සහ එහි සියලු හමුදා ද උතුරේ
දුර බැහැර සිටින තොගර්මා වංශය සහ එහි සියලු
හමුදා ද යන බොහෝ ජනයෝ නුඹ සමඟ සිටිති.
7 නුඹ සූදානම් වී, එසේ ය, නුඹ වෙත රැස් ව සිටින
නුඹේ සියලු සමූහයන් සමඟ සියල්ල සූදානම්
කරගෙන, ඔවුන්ගේ ආරක්ෂකයා වන්න. 8 බොහෝ
දවස් ගත වූ පසු, මතු අවුරුදුවල නුඹ යුද්ධයෙන්
දිනාගත් මේ දේශයට විරුද්ධ ව සටන් කරනු ඇත.
බොහෝ කාලයක් පාළු ව තිබුණ ඉශ්රායලේ
කඳුවලට ඔවුන් මරණයෙන් බේරී, නොයෙක්
දේශවලින් එක්රැස් කරනු ලැබූ බැවින්, එහි වැසියෝ
සෙසු සියලු සෙනඟගෙන් ඈත් වී හිරිහැරයක් නැති
ව විසුවෝ වෙති. 9 එවිට නුඹ කුණාටුවක් මෙන්
ඉදිරියට පැමිණෙනු ඇත. නුඹ සහ නුඹ සමඟ නුඹේ
සියලු හමුදාවන් ද බොහෝ ජනයන් ද වලාකුළකින්
මෙන් දේශය වසාගනු ඇත.”
10 මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ ගොග්
රජුට මෙසේ වදාරන සේක: “ඒ කාලයෙහි නුඹේ
සිතට පහළ වූ අදහසින් නුඹ නපුරු ක්රම
යොදාගත්තෙහි ය. 11 නුඹ කතා කොට, මම පවුරු
රහිත ගම් ඇති දේශයට විරුද්ධ ව නැඟී ගොස්,
සාමකාමී ව කරදර රහිත ව වාසය කරන අයට
විරුද්ධ ව පැමිණෙන්නෙමි. ඔව්හු සියල්ලෝ ම පවුරු
නැති ව වාසය කරති. ඔවුන්ට අගුල් ද දොරවල් ද
නැතැ යි කියනු ඇත. 12 නුඹ එසේ පැමිණෙන්නේ
කොල්ලකෑමටත්, සම්පත් උදුරාගැනීමටත් මිනිසුන්
වාසය කරන පාළු ව තිබුණු ස්ථානවලට ද විජාතීන්
අතරෙන් අවුත් සිටින සිව්පාවුන් සහ සම්පත්
ලබාගෙන පොළොවේ මැද ස්ථානයෙහි වාසය කරන
සෙනඟට ද විරුද්ධ ව නුඹේ අත ඔසවනු පිණිස ය.
13 ෂෙබාවරු සහ දදොන්වරු ද තර්ෂිෂ්හි වෙළෙන්දෝ
ද එහි අධිපතියෝ ද නුඹට කතා කොට, ‘නුඹ
කොල්ලකන්න පැමිණියෙහි ද? නුඹේ සේනාව නුඹ
රැස් කරගන්නේ සම්පත් උදුරා ගනිමින්, රන් රිදී
රැගෙන, සිව්පාවුන් ද සම්පත් ද අල්ලා, බොහෝ
කොල්ල ලබා යන පිණිස දැ’යි අසන්නෝ ය.
14 “එබැවින් මනුෂ්ය පුත්රය, නුඹ දිවැස් වැකි
පවසමින්, මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
මෙසේ වදාරන සේකැ යි ගොග් රජුට කියන්න.
‘මාගේ සෙනඟ වන ඉශ්රායලේ සෙනඟ සුරැකි ව
වාසය කරන කාලයේ දී නුඹ ඉදිරියට යන්නෙහි ය.
15 ඈත උතුරේ නුඹලාගේ වාසස්ථාන අත්හැරදමා
නුඹ සහ නුඹ සමඟ බොහෝ ජාතීන් සියල්ලක් ම
අසුන් පිට නැඟී මහා සමූහයක් ව, බලවත්
සේනාවක් ව එනු ඇත. 16 නුඹ, දේශය වසාගන්න
වලාකුළක් මෙන් මාගේ සෙනඟ වන ඉශ්රායලේට
විරුද්ධ ව නැඟී එනු ඇත. එය මතු දවස්වල දී සිදු
වන්නේ ය. එම්බා ගොග් රජ! මා ශුද්ධ බව නුඹ
කරණකොටගෙන විජාතීන්ගේ ඇස්වලට පෙනෙන
කල ඔවුන් මා ඇඳිනගන්න පිණිස මම නුඹ, මාගේ
දේශයට විරුද්ධ ව පමුණුවන්නෙමි.’ 17 මහෝත්තම
දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ වදාරන සේක:
‘ඉශ්රායලේවරුන්ට විරුද්ධ ව නුඹ පමුණුවන්නෙමි යි
පෙර කාලයේ දිවැස් වැකි කී මාගේ දාසයන් වූ
ඉශ්රායලේ දිවැසිවරුන් මඟින් මා ඒ දවස්වල කීවේ
නුඹ ගැන නොවේ ද?’ ”

### ගොග් රජුට දඬුවම

18 මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක: “ගොග් රජ ඉශ්රායලේ රටට විරුද්ධ
ව එන ඒ කාලයේ දී මාගේ උදහස දැල්වෙනු ඇත.
19 මන්ද, මාගේ උදහසින් ද මාගේ කෝපාග්නියෙන්
ද මෙසේ කියමි. සැබැවින් ම ඒ කාලයේ දී
ඉශ්රායලේ රටෙහි මහා කම්පාවක් ඇති වන්නේ ය.
20 මුහුදේ මත්ස්යයෝ ද ආකාශයේ පක්ෂීහු ද
වනයේ මෘගයෝ ද භූමියෙහි බඩගාන සියලු ම
සත්ත්වයෝ ද භූමිය මතුපිට සිටින සියලු
මනුෂ්යයෝ ද මා ඉදිරියෙහි වෙවුළන්නෝ ය. කඳු
හළො දමනු ලබන්නටත්, උස් තැන් වැටෙන්නටත්,
සියලු පවුරු බිම වැටෙන්නටත් යෙදෙනු ඇත.
21 නොයෙක් ආපදාවන් ඇති කර මම ගොග් රජු
භීතියට පත් කරන්නෙමි. මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේක. එක එක
මිනිසාගේ කඩුව ඔහුගේ සහෝදරයාට විරුද්ධ ව
ලෙළ දෙනු ඇත. 22 මම වසංගතයෙන් ද ලේ
වැගිරීමෙන් ද ඔහුට දඬුවම් කරන්නෙමි. ඔහු සහ
ඔහුගේ හමුදාවන් ද ඔහු සමඟ සිටින බොහෝ
ජාතීන් ද පිට මොරසූරන වැහි ද මහා ගල් වර්ෂාවක්
ද ගිනි ද ගෙන්දගම් ද වස්වන්නෙමි. 23 මෙසේ මම
ශ්රේෂ්ඨත්වය ද විශුද්ධත්වය ද පෙන්වා, මා
සමිඳාණන් වහන්සේ බව බොහෝ විජාතීන්
දැනගන්න පිණිස ඔවුන් ඉදිරියෙහි ප්රකාශ
වන්නෙමි.”

### ගොග් රජුගේ පරාජය

39 මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාළ සේක: “තවද, මනුෂ්ය පුත්රය, නුඹ
ගොග් රජුට විරුද්ධ ව දිවැස් වැකි පවසමින්,
මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ වදාරන
සේකැ යි කියන්න. ‘බලන්න, රොෂ්හි ද මෙෂෙක්හි ද
තුබල්හි ද අධිපතියා වන ගොග් රජු වන නුඹට මම
විරුද්ධ ව සිටිමි. 2 මම නුඹ අන් දසෙකට හරවා,
නුඹ ඉදිරියට ගෙන ගොස් උතුරේ දුරස්ථානවලින්
නුඹ ගෙනවුත් ඉශ්රායලේ කඳු පිටට නුඹ
පමුණුවන්නෙමි. 3 නුඹේ දුන්න නුඹේ වමතින්
ගසාදමා, නුඹේ ඊගස් නුඹේ දකුණතින් වැටෙන්නට
සලස්වන්නෙමි. 4 ඉශ්රායලේ කඳුවල නුඹ සහ නුඹේ
සියලු හමුදා ද නුඹ සමඟ සිටින ජනයන් ද වැටෙනු
ඇත. සියලු ආකාර ගොදුරුවලට ගිජු පක්ෂීන්ටත්,
වනයේ මෘගයන්ටත් නුඹ ගොදුරු පිණිස දෙන්නෙමි.
5 නුඹ පොළොව මතුපිට වැටෙනු ඇත. මන්ද, මම
එය කීයෙමි’යි මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ

වදාරන සේක. 6 මම මාගොග් පිටත්, මුහුදුබඩ
සුරැකි ව වාසය කරන්නන් පිටත් ගින්නක්
යවන්නෙමි. මෙසේ මා සමිඳාණන් වහන්සේ බව
ඔවුන් දැනගනු ඇත. 7 මාගේ ශුද්ධ නාමය තවත්
කෙලෙසෙන්න ඉඩනෑර, මම මාගේ ශුද්ධ නාමය
මාගේ සෙනඟ වන ඉශ්‍රායලේවරුන් අතරෙහි
ප්‍රකාශ කරන්නෙමි. විජාතීන් ද සමිඳාණන් වහන්සේ
වන මා ඉශ්‍රායලේවරුන් අතරෙහි ශුද්ධ ව සිටින බව
දැනගනු ඇත.”
8 මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක. “බලන්න, මා කී දවස! එය
පැමිණියේ ය. එය සිදු වේ ම ය. 9 එවිට ඉශ්‍රායලේ
නගරවල වැසියෝ පිටතට ගොස්, ගිනි අවුළුවා,
ආයුධ වන පලිස් ද මහ පලිස් ද දුනු ද ඊගස් ද
මුගුරු ද හෙල්ල ද දවන්නෝ ය. සත් අවුරුද්දක්
ඒවායින් ගිනි දැල්වෙනු ඇත. 10 ඔවුන් වනයෙන් දර
ගෙනෙන්නේ වත්, මූකළාන්වලින් ඒවා කපාගන්නේ
වත් නැත. මන්ද, ඔව්හු ආයුධවලින් ගිනි දල්වන්නෝ
ය. තමන්ගෙන් කොල්ල කෑ අයගෙන් ඔව්හු
කොල්ලකන්නෝ ය. තමන්ගේ සම්පත් උදුරාගත්
අයගෙන් සම්පත් උදුරාගන්නෝ ය. මෙසේ
වදාරන්නේ මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ ය.”

## ගොග් රජු භූමදාන කරනු ලැබීම

11 “තවද, ඒ කාලයේ දී මම මිනී වැළලීමට
ඉශ්‍රායලේ දේශයෙන් ඉඩමක් ගොග්ට දෙන්නෙමි.
එය මුහුදට නැගෙනහිරෙන් තිබෙන සංචාරකයන්ගේ
මිටියාවත ය. එය එහි ගමන් කරන්නන් වළක්වනු
ඇත. එහි ගොග් සහ ඔහුගේ මුළු සමූහය වළලනු
ලැබ, ඊට ගොග්සමූහ-මිටියාවත යන අරුත ඇති
හාමොන්ගොග් යයි නම් තබනු ලැබේ.
12 ඉශ්‍රායලේ සෙනඟ සිය දේශය පිරිසිදු කරන
පිණිස සත් මසක් ඔවුන් වළලමින් සිටින්නෝ ය.
13 එසේ ය, දේශයේ සියලු සෙනඟ ඔවුන්
වළලන්නෝ ය. එය වූ කලී මාගේ මහිමය ප්‍රකාශ
වන සමයේ දී ඔවුන්ට කීර්තියක් වන්නේ යයි
මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ වදාරන සේක.
14 තවද, ඔව්හු දේශය පිරිසිදු කිරීමට එය
මුළුල්ලෙහි ඇවිදිමින් දේශය මතුපිට ඉතුරු වන අය
වැළලීමෙහි නිතර ම යෙදී සිටීමට මිනිසුන්
තෝරාගනිති. ඔව්හු සත් මසකට පසු එසේ සොයා
ඇවිදින්නෝ ය. 15 දේශයෙහි එසේ ඇවිදින්නන්ගෙන්
යමෙක් මිනී ඇට දුටු විට, වළලන්නන් ඒක
හාමොන්ගොග්හි වළලන තෙක් ඒ ළඟ ලකුණක්
තබන්නෝ ය. 16 තවද, නුවරෙහි නමත් ‘සමූහයක්’
යන අරුත ඇති ‘හාමොනා’ වන්නේ ය. මෙසේ ඔවුන්
දේශය පිරිසිදු කරනු ඇත.
17 එළිද 19:17-18 “මනුෂ්‍ය පුත්‍රය, මහෝත්තම
දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ වදාරන සේක. නුඹ
සියලු ආකාර පක්ෂීන්ට ද වනයේ සියලු මෘගයන්ට ද
කතා කොට, තෙපි රැස් වී වරෙන්න, මා ඉශ්‍රායලේ
කඳු පිට තොපෙ උදෙසා සූදානම් කරන මහා පූජාවක්
වන මාගේ පූජාව වටා හාත්පසින් එකතු වී, මස් කා
ලේ බොන්න. 18 තෙපි බලවතුන්ගේ මාංස කන්නහු
ය. පොළොවේ අධිපතීන්ගේ ද බැටළුවන්ගේ ද
බැටළු පැටවුන්ගේ ද එළුවන්ගේ ද ගවයන්ගේ ද
ලේ බොන්නහු ය. උන් සියල්ලෝ ම බාෂාන්හි තර
සත්තු ය. 19 මා තොපෙ උදෙසා සූදානම් කර තිබෙන
මාගේ පූජාවෙන් තෙපි තෘප්තිමත් ලෙස තෙල
කන්නහු ය. මත් වන තුරු ලේ ද බොන්නහු ය,
20 මාගේ මේසය ළඟ තෙපි අශ්වයන්ගේ ද
අසරුවන්ගේ ද බලවතුන්ගේ ද සියලු යුද්ධ
භටයන්ගේ ද මාංස අනුභව කොට තෘප්තියට
පැමිණෙන්නහු ය. මෙසේ වදාරන්නේ මහෝත්තම
දෙවි ස්වාමීන් වහන්සේ ය.”

## ඉශ්‍රායලේවරුන්ගේ පුනරුත්ථාපනය

21 සමිඳාණන් වහන්සේ මෙසේ වදාළ සේක: “මම
ද මාගේ තේජස විජාතීන් අතරෙහි පනේවන්නෙමි.
සියලු විජාතීහු මා ඉටු කළ මාගේ විනිශ්චය සහ මා
ඔවුන් කෙරෙහි දිගු කළ මාගේ බලවත් හස්තය
දකින්නෝ ය. 22 ඉශ්‍රායලේ සෙනඟ ද මා ඔවුන්ගේ
දෙවි ස්වාමීන් වහන්සේ බව ඒ දවසේ පටන් සදහට
ම දැනගෙන සිටිනු ඇත. 23 තවද, ඉශ්‍රායලේ සෙනඟ
විප්‍රවාසගත වූයේ, ඔවුන්ගේ පාප ක්‍රියා නිසා බව
සෑම ජාතීන් දැනගනු ඇත. මන්ද, ඔව්හු මට විරුද්ධ
ව ද්‍රෝහිකම් කළෝ ය. මම ද මාගේ මුහුණ ඔවුන්
වෙතින් හරවාගෙන, ඔවුන්ගේ එදිරිකාරයන්ගේ
අතට ඔවුන් පාවා දුන්නෙමි. ඔව්හු සියල්ලෝ කඩු
පහරින් නැසුණෝ ය. 24 ඔවුන්ගේ අපවිත්‍රකමේ
සහ ඔවුන්ගේ වරදේ හැටියට මම ඔවුන්ට දඬුවම්
කර, මාගේ මුහුණ ඔවුන් වෙතින් හරවාගතිමි.
25 “එබැවින් මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
මෙසේ වදාරන සේක. දැන් මම ජාකොබ්ගේ
වංශයේ හිරකරුවන් ආපසු ගෙනෙන්න යන්නෙමි. මුළු
ඉශ්‍රායලේ සෙනඟට අනුකම්පා කරමි; මාගේ
සුවිශුද්ධ නාමය ආරක්ෂා කරන්නෙමි. 26 මා ජනයන්
අතරෙන් ඔවුන් නැවත ගෙනෙවුත්, ඔවුන්ගේ
සතුරන්ගේ දේශවලින් ඔවුන් රැස් කොට, මා
සුවිශුද්ධ බව ඔවුන් කරණකොටගෙන බොහෝ
විජාතීන් ඉදිරියෙහි ඔප්පු වූ විට, 27 ඔවුන්
කිසිවකුට බිය නොවී, තමන්ගේ රටෙහි සුව සේ
වාසය කරන විට, ඔවුන් තමන්ගේ ලජ්ජාවත්, ඔවුන්
මට විරුද්ධ ව කළ තමන්ගේ සියලු ද්‍රෝහිකමත්
අමතක කරනු ඇත. 28 ඔවුන් විප්‍රවාසීන් මෙන්
විජාතීන් අතර විසුරුවා, මා ඔවුන්ගෙන් කිසිවකු
තවත් එහි අත්නෑර ඔවුන්ගේ රටට ඔවුන් රැස්
කරන කල මා ඔවුන්ගේ මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ බව ඔවුන් දැනගනු ඇත. 29 මා මාගේ
ආත්මානුභාවය ඉශ්‍රායලේ සෙනඟ මත වැගිරවූ
විට මාගේ මුහුණ තවත් ඔවුන්ගෙන් සඟවා
නොගන්නෙමි. මෙසේ වදාරන්නේ මහෝත්තම දෙවි
ස්වාමීන් වහන්සේ ය.”

### අනාගත දේව මාලිගාව පිළිබඳ දර්ශනය

40 නගරය සතුරන්ට අසු වීමෙනේ පසු, දසසතර
වන අවුරුද්දේ අප විප්‍රවාසයට ගනෙ ගාෙස්
විසිපස් වන වසර පටන්ගැන්මේ දී මාසයේ දස වන
දින සමිඳාණන් වහන්සේගේ බලය මා පිට
පැමිණියේ ය. 2 එළිද 21:10දවේයන් වහන්සේගේ
දර්ශන මඟින් ඉශ්රායලේ දේශයට මා පමුණුවා,
ඉතා උස් වූ කන්දක් මත මා සිටවූෙ සේක. ඒ කන්ද
පිට නුවරක් වැනි නිර්මාණයක් මා ඉදිරියහෙි තිබිණි.
3 එළිද 11:1; 21:15උන් වහන්සේ මා එතැනට
පැමිණවූෙ විට, ලෝකඩ නිර්මාණයක් වැනි පනේමක්
ඇති මිනිසකු තමාගේ අතේ හණ ලණුවක් ද
මනින දණ්ඩක් ද ඇති ව දොරටුව ළඟ සිටිනු දිටිමි.
4 ඒ මිනිසා මට කතා කරොට, “මනුෂ්‍ය පුත්‍රය,
නුඹේ නතේවලින් බලා, කන්වලින් අසා මා නුඹට
පනේවන සියල්ල දසෙ නුඹේ සිත යොමු කරන්න.
මන්ද, නුඹ මේ ස්ථානයට පමුණුවනු ලැබුවේ ඒවා
නුඹට පනේවන පිණිස ය. නුඹ දකින සියල්ල
ඉශ්රායලේ සනෙඟට දන්වන්නැ”යි කීවේ ය.

### නැගනෙහිර දොරටුව

5 1 රාජා 6:1-38; 2 වංශා 3:1-9 දේව මාලිගාව
පිහිටි භූමියට පිටින් වටේට තාප්පයක් තිබුණේ ය.
ඒ මිනිසාගේ අතේ මීටර් තුනක් දිග ඇති මිණුම්
දණ්ඩක් විය. මීටර් භාගයක දිග රියනකුත් වියතකි.
එවිට ඔහු තාප්පයේ පළලත් දිගත් මැන්නේ ය. එහි
පළල මීටර් තුනක් ය. උසත් මීටර් තුනකි. 6 ඔහු
නැගනෙහිර දසෙට තිබනෙ දොරටුවට අවුත්, එහි
පඩිවලින් නැගී එළිපත්ත මැන්නේ ය. එය මීටර්
තුනක් උස ය. 7 එහි එක එක මුර කාමරයේ දිග
මීටර් තුනකි. පළලත් මීටර් තුනකි. මුර කාමර අතර
පරතරය මීටර් දකෙහමාරකි. දොරටුවේ ඇතුළු
පැත්තේ එළිපත්තේ සිට ප්‍රවේශ ශාලාවේ දිග
මීටර් තුනකි. 8 ඉන්පසු ඔහු ප්‍රවේශ ශාලාව
මැන්නේ ය. එය මීටර් හතරකි. 9 එහි උළුවහු
කණුවල උස මීටර් එකකි. ප්‍රවේශ ශාලාව දේව
මාලිගාව දසෙට තිබුණේ ය. 10 නැගනෙහිරට තිබුණු
දොරටුවේ එක පැත්තක කුඩා මුර කාමර තුනක් ද
අනකේ පැත්තේ තුනක් ද තිබුණේ ය. ඒ කාමර එක
ප්‍රමාණයට සාදා තිබිණි.
11 ඔහු දොරකඩ පළලත් මැන්නේ ය. එය මීටර්
පහකි. දොරටුවේ දිග මීටර් හයහමාරකි. 12 මුර
කාමරය ඉදිරිපිට මීටර් භාගයක ගරාදි වැටක්
තිබුණේ ය. අනික් පැත්තේ ද මීටර් භාගයක් දිග
ගරාදි වැටක් තිබුණේ ය. මුර කාමරයක එක
පැත්තක් මීටර් තුනක් ද අනික් පැත්ත මීටර් තුනක් ද
බැගින් විය. 13 ඔහු එක කාමරයක පියස්සේ සිට
අනික් කාමරයේ පියස්ස දක්වා දොරටුව මැන්නේ
ය. එක දොරකඩක සිට අනික් දොරකඩ දක්වා දුර
මීටර් දකෙහමාරකි. 14 ඔහු ප්‍රවේශ ශාලාව
මැන්නේ ය. එය මීටර් දහයකි. ප්‍රවේශ ශාලාව
වටේට මළුව තිබුණේ ය. 15 ඇතුළු වන දොරටුවේ
ඉස්සරහ පැත්තේ සිට ඇතුළු ප්‍රවේශ ශාලාවේ
ඉස්සරහ පැත්ත දක්වා මීටර් විසිපහකි. 16 ඒ කුඩා
මුර කාමරවලටත්, ඒවායේ කණුවලටත් ප්‍රවේශ
ශාලාවේ ඇතුළු පැත්තේ වටේට පටු කවුළු තිබුණේ
ය. කණුවල තල් ගස් කැටයම් කර තිබුණේ ය.

### පිට මළුව

17 එවිට ඔහු පිට මළුවට මා ගනොවේ ය. ඒ
මළුවේ කාමර සහ ඒවා වටකර ගල් ඇල්ලූ
වේදිකාවක් තිබුණේ ය. ඒ ගල් බිම පිට කාමර
තිහක් තිබුණේ ය. 18 දොරටු පැත්තට තිබුණු
කවුළුවල දිග ගල් බිමේ ප්‍රමාණයට තිබුණේ ය.
එය පහළ ගල් වේදිකාව ය.
19 ඔහු ද පහළ දොරටුවේ ඉස්සරහ පැත්තේ සිට
ඇතුළු මළුවේ ඉස්සරහ පැත්ත දක්වා පිටතින් පළල
මැන්නේ ය. නැගනෙහිරටත්, උතුරටත් මීටර් පණහක්
තිබුණේ ය.

### උතුරු දොරටුව

20 ඔහු මා ඉදිරියනේ උතුරට ගමන් ගත්තේ ය.
එහි උතුරු දසෙට හැරුණු දොරටුවක් තිබිණි. උතුරට
තිබුණු පිට මළුවේ දොරටුවේ දිගත් පළලත් ඔහු
මැන්නේ ය. 21 එහි එක පැත්තක මුර ගවෙල් තුනක්
ද අනික් පැත්තහෙි තුනක් ද තිබුණේ ය. එහි කණු ද
එහි ශාලා ද පළමු වන දොරටුවේ මිම්මේ
ප්‍රකාරයට තිබුණේ ය. එහි දිග මීටර් විසිපහක් ය.
එහි පළල මීටර් දොළහමාරක් ය. 22 එහි කවුළු ද
එහි ශාලා ද තල් ගස් ද නැගනෙහිරට තිබුණු
දොරටුවේ මිම්මේ ප්‍රකාරයට තිබුණේ ය. එයට
නඟින්නට පඩි සතක් විය. එහි ශාලා ද ඒවා
ඉදිරිපිට තිබුණේ ය. 23 නැගනෙහිරට මනේ ම උතුරු
දොරටුවට ඉදිරිපිටින් ඇතුළු මළුවට දොරටුවක්
තිබුණේ ය. ඔහු දොරටුවනේ දොරටුවට මැන්නේ
ය. එය මීටර් පණහක් විය.

### දකුණු දොරටුව

24 ඔහු දකුණු පැත්තටත් මා ගනෙ ගියේ ය. දකුණු
දසෙටත් දොරටුවක් තිබුණේ ය. එහි කණු ද එහි
ශාලා ද මැන්නේ ය. ඒවා පරෙ ගාෙඩනැඟිලිවල
මිම්මට සමාන ය. 25 ඒ කවුළු මනේ ම වටකර
මයෙටත්, මහෙි ශාලාවලටත් කවුළු තිබිණි. ඒවායේ
දිග මීටර් විසිපහකි. පළල මීටර් දොළහමාරකි.
26 එයට නඟින්නට පඩි සතක් තිබිණි. එහි ශාලා ද
ඒවා ඉදිරිපිට තිබිණි. එක පැත්තක එකක් ද අනික්
පැත්තහෙි එකක් ද බැගින් එහි කණුවල තල් ගස්
කැටයම් කර තිබුණේ ය. 27 ඇතුළු මළුවටත් දකුණු
දසෙට දොරටුවක් තිබිණි. ඔහු දකුණු දසෙට
දොරටුවනේ දොරටුවට මැන්නේ ය. එය මීටර්
පණහකි.

### ඇතුළු මළුව: දකුණු දොරටුව

28 ඔහු දකුණු දොරටුවෙන් ඇතුළු මළුවට මා
පැමිණව්වී ය. ඔහු දකුණු දොරටුව මැන්නේ ය. දකුණු
දොරටුව පෙර දොරටුව ප්‍රමාණයට තිබිණි. 29 එහි
මුරගවෙල් ද එහි කණු ද එහි ශාලා ද ඒ මිම්වල
ප්‍රකාරයට තිබුණේ ය. වටකර ම එයටත් එහි
ශාලාවලටත් කවුළු තිබුණේ ය. එහි දිග මීටර්
විසිපහක් ය, පළල මීටර් දොළහමාරකි; 30 වටකර
ම ශාලා තිබිණි. ඒවායේ දිග මීටර් විසිපහකි. පළල
මීටර් දොළහමාරකි. 31 එහි ශාලා පිට මළුව දෙසට
තිබිණි. එහි කණුවලට තල් ගස් ද එයට නඟින්නට
පඩි අටක් ද තිබිණි.

### ඇතුළු මළුව: නැගෙනහිර දොරටුව

32 එවිට නැගෙනහිර මාර්ගයෙන් ඔහු ඇතුළු
මළුවට මා පමුණුවා දොරටුව මැන්නේ ය. එය ද
පෙර දොරටුවල ප්‍රමාණයට තිබිණි. 33 එහි මුර
ගවෙල් ද එහි කණු ද ශාලා ද පෙර ගොඩනැඟිලි
ප්‍රමාණයට තිබිණි. එයටත්, එහි ශාලාවලටත්
වටකර කවුළු තිබිණි. ඒවායේ දිග මීටර් විසිපහක්
ය. පළල මීටර් දොළහමාරකි. 34 එහි ශාලා පිට
මළුව දෙසට තිබිණි. එහි කණුවල දෙපැත්තෙහි තල්
ගස් ද එයට නඟින්නට පඩි අටක් ද විය.

### ඇතුළු මළුව: උතුරු දොරටුව

35 ඔහු උතුරු දොරටුවට මා පමුණුවා එය මැන්නේ
ය. එය ද පෙර දොරටුවල ප්‍රමාණයට තිබිණි.
36 එය සහ එහි මුර ගවෙල් ද එහි කණු ද එහි
ශාලා ද මැන්නේ ය. වටකර ඊට කවුළු තිබිණි.
ඒවායේ දිග මීටර් විසිපහක් ය, පළල මීටර්
දොළහමාරකි. 37 එහි ශාලා පිට මළුව දෙසට තිබිණි.
එහි කණුවල දෙපැත්තෙහි තල් ගස් ද ඒකට
නඟින්නට පඩි අටක් ද විය.

### උතුරු දොරටුව ළඟ ගොඩනැඟිලි

38 ප්‍රවේශ ශාලාවේ කණු ළඟ කාමරයක් ද එහි
දොරකඩක් ද තිබුණේ ය. එය තිබුණේ එහි දවන
පූජාව සෝදන පිණිස ය. 39 දොරටුවේ ශාලාවේ
එක පැත්තක මේස දෙකක් ද අනික් පැත්තෙහි
මේස දෙකක් ද තිබිණි. ඒවා තිබුණේ ඒ මත දවන
පූජාව ද පාප පූජාව ද අපරාධ පූජාව ද සඳහා සතුන්
මරණ පිණිස ය. 40 උතුරු දොරකඩට නඟින තැන,
මළුවෙහි එක පැත්තක මේස දෙකක් ද අනික්
පැත්තේ මේස දෙකක් ද තිබිණි. 41 දොරටුවේ එක
පැත්තක මේස හතරක් ද අනික් පැත්තේ මේස
හතරක් ද බැගින් මේස අටක් විය. මේ මේස යාග
සතුන්ගේ මාංස තබන පිණිස ය. 42 සෙන්ටිමීටර්
හැත්තෑපහක් දිග ද සෙන්ටිමීටර් හැත්තෑපහක් පළල
ද සෙන්ටිමීටර් පණහක් උස ද ඇති කැපූ ගල් මේස
හතරකුත් තිබිණි. ඒවා තිබුණේ ඒ මත දවන පූජා ද
වෙනත් පූජා ද සඳහා යාග සතුන් මරන්න පාවිච්චි
කරන ආයුධ තැබීමට ය. 43 ශාලාව ඇතුළේ වටේට
අල්ලක පළල ඇති කොකු සවිකර තිබිණි. පූජා
මාංස තබන පිණිස මේස තිබිණි.
44 ඉක්බිති ඔහු මා පිටතින් ඇතුළු මළුවට
කැඳෙව්වේ ය; ඇතුළු දොරටුවට පිටතින් උතුරු දිග
දොර ළඟ ඇතුළු මළුවේ ගී ගයන්නන්ගේ කාමර
දෙකක් තිබුණේ ය. ඒවා එකක් දකුණු දෙසට විය.
අනික පෙරදිග දොර ළඟ උතුරු දිගට විය. 45 ඔහු ද,
"ඉස්සරහ පැත්ත දකුණු දෙසට තිබෙන මේ කාමරය
ගෘහයේ සේවය පවත්වන පූජකයන්ටත් 46 ඉස්සරහ
පැත්ත උතුරු දෙසට තිබෙන, කාමරය පූජාසනයේ
සේවය පවත්වන පූජකයන්ටත් ය. ඔව්හු වනාහි
සමිඳාණන් වහන්සේට සේවය කරන්න උන්
වහන්සේ ළඟට යන්ටත් ය. ඔව්හු වනාහි සමිඳාණන්
වහන්සේට සේවය කරන්න උන් වහන්සේ ළඟට
පැමිණෙන ලෙවීගේ පුත්‍රයන්ගෙන් වූ සාදොක්ගේ
පුත්‍රයෝ ය"යි මට කී ය.

### ඇතුළු මළුව සහ දේව මාලිගාව

47 එවිට ඔහු මළුව මැන්නේ ය. දිග මීටර් පණහක්
ය, පළල මීටර් පණහක් ය. එය හරි හතරැස් ව
තිබුණේ ය. පූජාසනය ගෘහයට ඉදිරිපිටින් තිබුණේ
ය. 48 ඔහු දේව මාලිගාවේ ශාලාවට මා පමුණුවා,
ශාලාවේ කණු එක එක මැන්නේ ය. එක පැත්තක්
මීටර් දෙකහමාරක් බැගින් විය. දොරටුවේ පළල
මීටර් හතක් විය. දොරටුවේ පැති මීටර් එකහමාරක්
බැගින් විය. 49 ශාලාවේ දිග මීටර් දහයකි. පළල
මීටර් හයකි. ඊට නඟින්න පඩි දහයක් තිබිණි.
කුළුණුවලට කණු එක පැත්තක එකක් ද අනික්
පැත්තෙහි එකක් ද බැගින් තිබුණේ ය.

### අතිශුද්ධස්ථානය

41 එවිට ඔහු දේව මාලිගාවට මා ගෙනවුත්
එහි කණු මැන්නේ ය. ඒවා එක පැත්තක්
මීටර් තුනක් පළලට ද අනික් පැත්ත මීටර් තුනක්
පළලට ද තිබුණේ ය. එය කුඩාරමේ පළල ය.
2 දොරකඩ පළල මීටර් පහක් විය. දොරකඩ එක
පැත්තක කණු මීටර් දෙකහමාරක් පළල ය. ඔහු
මාලිගාව මැන්නේ ය. එහි දිග මීටර් විස්සකි, පළල
මීටර් දහයක් ය.
3 එවිට ඔහු ඇතුළට ගොස් දොරකඩ එක එක
කණුව මැන්නේ ය. එය මීටර් එකක් ය. දොරකඩ
දිග මීටර් තුනක් ය, දොරකඩ පළල මීටර්
තුනහමාරක් ය. 4 ඔහු මාලිගාවට ඉදිරිපිටින් එහි
දිගට මීටර් දහයක් ද පළලට මීටර් දහයක් ද මැන,
'මෙය අතිශුද්ධස්ථානය'යි මට කීවේ ය.

### දේව මාලිගාවේ කාමර

5 ඔහු මාලිගාවේ බිත්තියත් මැන්නේ ය. එය මීටර්
තුනක් ය, වටකර ම මාලිගාවට තිබුණු කාමරවල
පළල මීටර් දෙකක් ය. 6 ඒ කාමර එක පිට එක
උඩින් මහල් තුනක් ද එක එක පේළියේ කාමර
තිහක් ද බැගින් තිබිණි. කාමර වනාහි මාලිගාවේ
බිත්තියට වද්දන්නේ නැති ව ඒවා පිහිටුවීමට

වටකර කුළුණු සිටුවා තිබිණි. 7 මහලනේ මහලට
නඟින විට ඒ ඒ පේළියේ කාමර වටකරින් වඩා
පළල් ව තිබිණි. මන්ද මාලිගාව වටේට ම ඉහළින්
ඉහළට කාමරවලින් වටවී තිබිණි. එබැවින්
මාලිගාවේ පළල ඉහළින් වැඩි වී තිබිණි. එසේ යට
තට්ටුවේ සිට මැද තට්ටුව මැදින් ඉහළ තට්ටුවට
මාලිගාවේ පැත්තක පිහිටි පඩි පෙළෙන් නඟින්න
හැකි විය.
8 මාලිගාව වටකර උස් වූ වේදිකාවක් දිටිමි.
කාමරවල අත්තිවාරම සම්පූර්ණ මීටර් තුනකින් යුත්
ලී දණ්ඩකි. 9 පිට පැත්ත දක්වා කාමරවලට තිබුණු
බිත්තියේ පළල මීටර් දකෙහමාරක් ය. ගෘහයට
තිබුණු කාමර පේළි ඇතුළේ හිස් බිමක් තිබිණි.
10 ඒවාටත්, මළුවේ කාමරවලටත් අතරේ ගෘහය
වටකරින් ම මීටර් දහයක් පළල ඇති බිමක් තිබිණි.
11 කාමරවල දොරකඩ හිස් බිම දසෙට තිබුණේ ය.
එක දොරකඩක් උතුරු දසෙටත්, එක දොරකඩක්
දකුණු දසෙටත් තිබිණි. හිස් බිමේ පළල වටකර
මීටර් දකෙහමාරක් ය.

## බස්නාහිර ගොඩනැඟිල්ල

12 බස්නාහිර පැත්තහෙි වනේ වූ මළුවහෙි මිදුල
ඉදිරිපිට තිබුණු ගොඩනැඟිල්ලේ දිග මීටර්
හතළිස්පහක් ය, පළල මීටර් තිස්පහක් ය. ඒ
ගොඩනැඟිල්ලේ බිත්තියේ පළල වටකර මීටර්
දකෙහමාරක් ය.

## දේව මාලිගාවේ සැලැස්මේ විස්තර

13 ඔහු මාලිගාවත් මැන්නේ ය. එහි දිග මීටර්
පණහක් ය, වනේ වූ මළුවේ ද එහි තිබුණු
ගොඩනැඟිල්ලේ ද එහි බිත්තිවල ද දිග මීටර්
පණහක් ය. 14 නැගනෙහිරට තිබුණු ගයෙි ඉස්සරහ
පැත්තේ ද වනේ වූ මළුවේ ද පළල මීටර් පණහක්
ය. 15 වනේ වූ මළුවට ඉදිරිපිටින් ඊට පිටුපසින්
තිබුණු ගොඩනැඟිල්ලේ දිග ද දපෙැත්තහෙි තිබුණු
එහි පිට ශාලා ද මැන්නේ ය. ඒවා මීටර් පණහකි.
16 ඇතුළු මාලිගාව ද මළුවේ ශාලා ද එළිපත්ත ද
පටු කවුළු ද මහල් තුනට ම එළිපත්ත ඉස්සරහ
වටකර තිබුණු පිට ශාලා ද තුනී ලෑලිවලින් වසා
තිබුණේ ය. බිම සිට කවුළු දක්වාත් එසේ ම
තිබුණේ ය. කවුළුත් වසා තිබුණේ ය. 17 දොරකඩට
ඉහළින් ද ඇතුළු මාලිගාව දක්වා ද පිටතින් වටකර
ඇතුළත සහ පිටත මුළු බිත්තිය ද මැන්නේ ය.
18 එහි කරුබ්වරුන් ද තල් ගස් ද කැටයම් කර
තිබිණි. කරුබ්වරුන් දදෙනෙකු අතරේ තල් ගසක්
බැගින් තිබිණි. එක එක කරුබ්වරයකුට මුහුණු
දකෙක් තිබිණි. 19 එනම්, එක පැත්තක තල් ගහ
දසෙට මනුෂ්‍ය මුහුණක් ද අනික් පැත්තහෙි තල් ගහ
දසෙට තරුණ සිංහ මුහුණක් ද තිබුණේ ය. වටකර
මුළු ගෘහයහෙි එසේ සාදා තිබුණේ ය. 20 බිම සිට
දොරකඩ ඉහළ දක්වා දේව මාලිගාවේ බිත්තියහෙි
කරුබ්වරුන් සහ තල් ගස් ද සාදා තිබුණේ ය.
21 දේව මාලිගාවේ උළුවහු කණු සතරැස් ව
තිබුණේ ය. ශුද්ධස්ථානය ඉදිරිපිට දිස් වූයේ; 22 ලී
පූජාසනය මනෙි. එහි උස මීටර් එකහමාරක් ය, දිග
මීටර් එකක් ය. එහි කොන් ද එහි ඇති අඩිය ද එහි
පැති ද ලීවලින් ය. එවිට ඔහු කතා කරමින්, 'මයෙ
සමිඳාණන් වහන්සේ ඉදිරියහෙි තිබනෙ මේසය ය'යි
මට කී ය.
23 මාලිගාවටත්, ශුද්ධස්ථානයටත් දොරවල් දකෙක්
තිබුණේ ය. 24 දොරටුවලට දපෙියන් එනම්,
දපෙැත්තට ඇරනෙ පියන් දකෙක් තිබිණි. එක
දොරකට පියන් දකෙක් ද අනික් එකට පියන් දකෙක්
ද තිබුණේ ය. 25 බිත්තිවල සාදා තිබුණාක් මනේ
දේව මාලිගාවේ දොරවල් පිටත් කරුබ්වරුන් සහ
තල් ගස් සාදා තිබිණි. ශාලාව ඉස්සරහ පිටතින් ඝන
ලීවලින් තැනූ උඩු වියනක් තිබිණි. 26 ශාලාවේ
දපෙැත්තහෙි ද කාමරවල ද ඝන ලී උඩුවියනේ ද
දපෙැත්තේ බිත්තිවල ද පටු කවුළු සහ තල් ගස්
තිබිණි. ඝන ලී පඩි කඳන් ද තිබිණි.

## තේවා කුටි

42 තවද, ඔහු උතුරු දසෙ පිට මළුවට මා ගනෙ
ගොස් වනේ වූ මළුවටත්, උතුරු දසෙට තිබුණු
ගොඩනැඟිල්ලටත් ඉදිරිපිට තිබුණු කාමරයට මා
පැමිණවේවේ ය. 2 උතුරු දොරකඩ මීටර් පණහක්
දිග ඉස්සරහ පිට තිබුණේ ය. පළල ද මීටර්
විසිපහක් ය. 3 ඇතුළු මළුවේ මීටර් දහයකට
ඉදිරිපිටත්, පිට මළුවේ ගල් බිම ඉදිරිපිටත් නවාතැන්
ශාලාවක් බැගින් මහල් තුනක් තිබිණි. 4 කාමර
ඉස්සරහ මීටර් පහක් පළල ඇති මාර්ගයක් ද
ඇතුළට යාමට මීටර් භාගයක් පළල ඇති පාරක් ද
තිබිණි. ඒවායේ ඉහළ කාමර කොට ව තිබිණි.
5 මන්ද, ඒ ගොඩනැඟිල්ලේ පහළ සහ මැද
කොටස්වලින් ඉඩ අසු වුණාට වඩා, ඒවායනේ පිට
ශාලාවට ඉඩ අසු විය. 6 මසේ වූයේ ඒවා මහල්
තුනක් ව තිබුණු නමුත්, මළුවල කුළුණු වාගේ ඒවාට
කුළුණු නොතිබුණු නිසා ය. එබැවින් පහළ ඒවාටත්,
මැද ඒවාටත් වඩා ඒවා බිම සිට ඉහළට යන්න
යන්න පටු ව තිබිණි. 7 කාමර දිගට පිට මළුව දසෙට
කාමරවලට ඉදිරිපිට පිටතින් තිබුණු තාප්පයේ දිග
මීටර් විසිපහක් ය. 8 මන්ද, පිට මළුවේ කාමරවල
දිග මීටර් විසිපහක් ය. එහතේ, දේව මාලිගාව
ඉදිරිපිට තිබුණු ඒවායේ දිග මීටර් පණහක් ය. 9 පිට
මළුවනේ මේ කාමරවලට පැමිණනේන නැගනෙහිර
පැත්තනේ ඇතුළු වන තැන ඒවාට යටින් තිබිණි.
10 නැගනෙහිර දසෙට තිබුණු මළුවේ තාප්පයේ
පළලට ම වනේ වූ මළුවටත්, ගොඩනැඟිල්ලටත්
ඉදිරිපිට කාමර තිබිණි. 11 මේවා ඉස්සරහ පිට උතුරු
පැත්තේ කාමරවල අන්දමට ම පාරක් තිබිණි.
ඒවායේ දිග ද පළල ද ඒවාට ඇතුළු වන සියලු තැන්
ද ඒවායේ වීථි ද ඒවායේ දොරටු ද මනේ මේවාටත්
තිබිණි. 12 දකුණු පැත්තේ කාමරවල දොරකඩවල
වාගේ ඇතුළු වන තැන නැගනෙහිර දසෙට තාප්පය
ඉදිරිපිට ම තිබුණු මාර්ගයේ මුල දොරකඩක් තිබිණි.

13 එවිට ඔහු මට කතා කොට, “වනේ වූ මළුවට
ඉදිරිපිට තිබනෙ උතුරු කාමර ද දකුණු කාමර ද
ශුද්ධ කාමර වේ. එහි සමිඳාණන් වහන්සේ ළඟට
පැමිණනෙ පූජකයෝ අතිශුද්ධ දේ අනුභව
කරන්නෝ ය. එහි ඔව්හු අතිශුද්ධ දේවල් වූ ආහාර
පූජාව ද පාප පූජාව ද අපරාධ පූජාව ද තබන්නෝ
ය. මන්ද, ඒ ස්ථානය ශුද්ධ ය. 14 පූජකයන් එහි
ඇතුළු වුණා ම ඔව්හු ශුද්ධස්ථානයනේ පිට මළුවට
නොයන්නෝ ය. සේවය කිරීමට ඔවුන් අඳින වස්ත්‍ර
ද එහි තබන්නෝ ය. මන්ද, ඒවා ශුද්ධ ය. ඔව්හු
වනෙ වස්ත්‍ර හැඳගනෙ සනෙඟට නියමිත තැන්වලට
පැමිණනේනෝ ය”යි කී ය.

## දේව මාලිගාවේ කොටස් මිම්ම

15 ඔහු ඇතුළු ගෘහය මැන අවසන් කළ විට
නැගනෙහිර කොටස දසෙට තිබනෙ දොරටුවේ
මාර්ගයනේ මා පිටතට ගනෙ ගොස් වටේට ම එය
මැන්නේ ය. 16 මනින දණ්ඩනේ ඔහු නැගනෙහිර
පැත්ත මැන්නේ ය. එය මනින දණ්ඩනේ වටේට
පන්සියයක් ව තිබුණේ ය. 17 ඔහු උතුරු පැත්ත
මැන්නේ ය. එය වටේට මනින දණ්ඩනේ පන්සියයක්
ව තිබුණේ ය. 18 ඔහු දකුණු පැත්ත මැන්නේ ය.
එය මනින දණ්ඩනේ පන්සියයක් ව තිබුණේ ය.
19 ඔහු බස්නාහිර පැත්තට හැරී ගොස් එය මැන්නේ
ය. එය මනින දණ්ඩනේ පන්සියයක් ව තිබුණේ ය.
20 ඔහු එහි සතර පැත්ත ම මැන්නේ ය.
ශුද්ධස්ථානය පොදු ස්ථානයනේ වනේ කරන පිණිස
දඩු පන්සියයක් දිග අතටත්, පන්සියයක් පළල
අතටත් ඇති පවුරක් ඒ වටකරින් තිබුණේ ය.

## දවේයන් වහන්සේ දේව මාලිගාවට පැමිණීම

43 තවද, ඔහු නැගනෙහිර දසෙට තිබුණු
දොරටුව ළඟට මා ගනෙ ගියේ ය. 2 එසකි
10:3-4,18-19; 11:22-23; එළිද 1:15එවිට
ඉශ්‍රායලේවරුන්ගේ දවේයන් වහන්සේගේ
තේජොලංකාරය නැගනෙහිර දිශාවනේ පැමිණනෙු
දිටිමි. උන් වහන්සේගේ ශබ්දය බොහෝ ජල
ඝෝෂාවක ශබ්දය මනේ විය. පොළොව ද උන්
වහන්සේගේ තේජොලංකාරයනේ බැබළුණේ ය. 3 මා
දුටු දර්ශනය නම්, මා නුවර විනාශ කරන්න එද්දී මා
දුටු දර්ශනය හා සමාන ය. ඒ දර්ශනය කබොර්
ඉවුරේ මා දුටු දර්ශනය හා සමාන ය. එවිට මම
මුණින්තළා වී වැටුණමේ. 4 සමිඳාණන් වහන්සේගේ
තේජොලංකාරය නැගනෙහිර දසෙට තිබුණු
දොරටුවේ මාර්ගයනේ ගෘහයට ඇතුළු විය.
5 එවිට ආත්මානුභාවය මා ඔසවාගනෙ ඇතුළු
මළුවට මා පැමිණවේවේ ය. මාලිගාව සමිඳාණන්
වහන්සේගේ තේජොලංකාරයනේ පිරී තිබනෙ බව
දිටිමි. 6 මනුෂ්‍යයකේ ද මා ළඟ සිටියේ ය. කනෙකෙු
මාලිගාවේ සිට මට කතා කරනු මට ඇසිණි. ඒ හඬ
මා අමතා, 7 “මනුෂ්‍ය පුත්‍රය, මයෙ මාගේ
සිංහාසනය ඇති ස්ථානය ය. මා වැඩමකරන
ස්ථානය ය. මම මහෙි ඉශ්‍රායලේවරුන් අතරහෙි
සදාකාලේට ම වාසය කරන්නමේ. ඉශ්‍රායලේ
වංශයටත්, ඔවුන්ගේ රජවරුන්ටත් තමන්ගේ
වේශ්‍යාකම්වලින් ද තමන්ගේ රජවරුන්ගේ
මළකඳන් වැළලීමනේ ද මාගේ සුවිශුද්ධ නාමය
අපවිත්‍ර කරන්නට තවත් ඉඩ නොදනේනමේ.
8 ඔව්හු තමන්ගේ එළිපත්ත මාගේ එළිපත්ත ළඟ ද
තමන්ගේ උළුවහු කණු මාගේ උළුවහු කණු ළඟ ද
තැබූ හ. මා සහ ඔවුන් අතරේ තිබුණේ බිත්තිය
පමණක් ය; එසේ ඔවුන් කළ තමන්ගේ පිළිකුල්
ක්‍රියා මඟින් ඔව්හු මාගේ සුවිශුද්ධ නාමය කලෙසෙූ
හ. මම ද මාගේ උදහසින් ඔවුන් විනාශ කළෙමේ.
9 දැන් ඔව්හු තමන්ගේ වේශ්‍යාකම් ද තමන්ගේ
රජවරුන්ගේ මළකඳන් ද මා වතෙින් පහකරත් වා!
එවිට මම ඔවුන් අතරහෙි සදාකාලේට ම වාසය
කරන්නමේ.
10 “මනුෂ්‍ය පුත්‍රය, ඉශ්‍රායලේ සනෙඟ තමන්ගේ
අපරාධ ගැන ලජ්ජා වන පිණිසත්, දේව මාලිගාවේ
ආදර්ශ සැලැස්ම මනින පිණිසත් දේව මාලිගාව
ඔවුන්ට පනේවන්න. 11 ඔව්හු තමන් කළ සියල්ල
ගැන ලජ්ජා වී සිටිත් නම්, දේව මාලිගාවේ සැලැස්ම
ද එහි පිළිවළෙ ද ඇතුළට පිටතට යන එන තැන් ද
එහි මුළු හැඩය ද එහි සියලු ම නීති රීති ද එහි මුළු
සැලැස්ම ද එහි සියලු ම නීති රීති ද අනුගමනය
කරමින් ඒවා ක්‍රියාත්මක කරන පිණිස ඔවුන්
ඉදිරියේ දී ඒවා ලියන්න. 12 දේව මාලිගාව පිළිබඳ
නියමාවලිය මසෙේ ය. කන්ද මුදුනහෙි වටකර ම
එහි මුළු සීමාව ඉතා ශුද්ධ ය. දේව මාලිගාවේ
නියමාවලිය එය වේ.”

## පූජාසනය

13 නික්ම 27:1-2; 2 වංශා 4:1 තවද, උන් වහන්සේ
මසෙේ වදාළ සේක: “ දේව මාලිගාව මැන්න මිම්ම
අනුව ම පූජාසනයේ මිමි මේවා ය: එහි අඩිතාලමේ
උස සනේටිමීටර් පණහකි. පළලත් සනේටිමීටර්
පණහකි. වටකර එහි ගැට්ය අද්දර දක්වා
සනේටිමීටර් විසිපහකි. 14 මයෙ පූජාසනයේ
අඩිතාලම ය. බිම පටන් පහළ පිළට මීටරයක් ය,
පළල සනේටිමීටර් පණහක් ය, කුඩා පිළ පටන්
ලොකු පිළට මීටර් දකෙක් ය, පළල ද සනේටිමීටර්
පණහකි. 15 පූජාසනයේ උඩ කොටස මීටර් දකෙකි;
උඩ කොටස සිට ඉහළට අං සතරක් වැනි කොන්
ඇත්තේ ය. 16 උඩ කොටසේ දිග මීටර් හයකි.
පළලත් මීටර් හයකි, හතර පැත්ත හතරැස් ය.
17 එහි සතර පැත්තේ පිළේ දිග මීටර් හතකි, එහි
පළලත් මීටර් හතකි, එය වටකර තිබනෙ ගැට්ය
සනේටිමීටර් විසිපහකි. එය වටකර තිබනෙ
අඩිතාලම සනේටිමීටර් පණහකි. එහි පඩිය
නැගනෙහිර දසෙට ය.”

## පූජාසනය කැප කිරීම

18 නික්ම 29:35-37 තවද, උන් වහන්සේ මට කතා
කොට මසෙේ වදාළ සේක: “මනුෂ්‍ය පුත්‍රය,
පූජාසනය පිට දවන යාග පූජා ඔප්පු කරන්නටත්,

එය පිට ලේ ඉසින්නටත් පූජාසනය ඉදි කළ විට ඒ
ගැන නියෝග මේ වා ය. 19 එදින මට සේවය
කරන්න මා ළඟට පැමිණෙනෙ ශාදොක්ගේ වංශයේ
ලේවීවරුන් වන පූජකයන්ට පූජාසනය මත දවන පාප
පූජාවක් පිණිස ගොන් වස්සකු දෙන්නැ යි
මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ වදාරන සේක.
20 නුඹ උගේ ලේවලින් ස්වල්පයක් රැගෙන එහි අං
වැනි කොන් සතරේ ද මැද කොටසේ කොන්
සතරේ ද වටකර ගැට්යේ ද ගා, එසේ පූජාසනයේ
දෝෂ පහකර, පිරිසිදු කර, ඒ උදෙසා සමඟිකමේ
පූජාවක් ඔප්පු කරන්න. 21 තවද, පාප පූජාව සඳහා
කැප කළ ගොනා රැගෙන ශුද්ධස්ථානයට පිටතින්
මාලිගාවේ නියම තැන ඌ පුළුස්සන්න. 22 දෙ වන
දවසේ පාප පූජාවක් පිණිස එළුවන්ගෙන් කැළලක්
නැති පිරිමි සතකු ගෙනෙන්න. ගොනා පූජා
කිරීමෙන් පූජාසනය පවිත්‍ර කළාක් මෙන් එයින් එය
පවිත්‍ර කරත් වා. 23 නුඹ එය පවිත්‍ර කර අවසාන
වූ විට කැළලක් නැති වස්සකු ද රැළෙන් කැළලක්
නැති බැටළුවකු ද ගෙන්වා 24 උන් සමිඳාණන්
වහන්සේ ඉදිරිපිටට පමුණුවන්න, එවිට පූජකයෝ
උන් පිට ලුණු දමා, දවන යාග පූජාවක් කොට
සමිඳාණන් වහන්සේට උන් ඔප්පු කරත් වා.
25 දිනපතා ම සත් දවසක් පූජාවක් වශයෙන්
එළුවකු පූජා කරන්න. එසේ ම කැළලක් නැති
ගොන් වස්සකු ද රැළෙන් බැටළුවකු ද ඔව්හු පූජා
කරත් වා. 26 සත් දවසක් ඔව්හු පූජාසනය උදෙසා
සමඟිකමේ පූජා ඔප්පු කොට, පිරිසිදු කර එය කැප
කරත්වා. 27 ඒ කාලය අවසානයේ දී අට වන
දවසේත්, ඉන්පසුත් පූජකයෝ නුඹලාගේ දවන යාග
පූජා ද නුඹලාගේ සහභාගිකමේ පූජා ද පූජාසනය
පිට ඔප්පු කරත් වා. මම ද නුඹලා පිළිගන්නෙමි යි
දෙවි ස්වාමීන් වහන්සේ වදාරන සේක."

## වසා තැබිය යුතු නැඟෙනහිර දොරටුව

44 එවිට ඒ මිනිසා නැඟෙනහිරට තිබෙන
ශුද්ධස්ථානයේ දොරටුව දෙසට යන
මාර්ගයෙන් මා ගෙන ගියේ ය. එහෙත්, ඒ දොරටුව
වසා තිබුණේ ය. 2 සමිඳාණන් වහන්සේ මට කතා
කොට, "මේ දොරටුව නෑර වසා තිබිය යුතු ය.
කිසිවකේ එයින් ඇතුළු නොවන්නේ ය. මන්ද,
ඉශ්‍රායලේවරුන්ගේ දෙවි ස්වාමීන් වහන්සේ එයින්
ඇතුළු වූ සේක. එබැවින් එය වසා තිබිය යුතු ය.
3 අධිපතියාට නම්, ඔහු අධිපතියා බැවින්, එහි
හිඳගෙන සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි කෑම
කන්න ලැබෙනු ඇත. ඔහු ද්වාර මණ්ඩපයෙන්
ඇතුළුවනු ඇත. ඒ මාර්ගයෙන් ම පිටතට යනු
ඇතැ"යි වදාළ සේක.

## දේව මාලිගාවට ඇතුළු වීමේ නීති

4 එවිට ඔහු උතුරු දොරටුවේ මාර්ගයෙන්
මාලිගාවේ ඉස්සරහ පැත්තට මා පැමිණවේවේ ය.
මා බැලූ විට සමිඳාණන් වහන්සේගේ මාලිගාව
සමිඳාණන් වහන්සේගේ තේජාලංකාරයෙන් පිරී
තිබෙන බව දැක මම මුණින්තළා වී වැටුණෙමි.
5 සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ සේක:
"මනුෂ්‍ය පුත්‍රය, සමිඳාණන් වහන්සේගේ
මාලිගාවේ සියලු නීති රීති ගැන ද එහි පිළිවෙළ
ගැන ද මා නුඹට කියන සියල්ල ම නුඹ සිතට ගෙන,
හොඳින් බලා, සාවධාන ව අසන්න. මාලිගාවට ඇතුළු
වන තැනටත්, ශුද්ධස්ථානයෙන් පිටතට යන සියලු
තැන්වලටත් නුඹේ සිත යොමු කරන්න. මාලිගාවට
ඇතුළු වන්නට අවසර ඇති අය ද ශුද්ධස්ථානයෙන්
පිටමං කළ යුතු අය ද ගැන සැලකිල්ලෙන් සිටින්න.
6 "කැරලිකාර ඉශ්‍රායලේ වංශයට මහෝත්තම
දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ වදාරන සේකැ යි
කියන්න. එම්බා ඉශ්‍රායලේ වංශය, නුඹලාගේ සියලු
පිළිකුල් ක්‍රියා සීමාව ඉක්මවා ගොස් ඇත. 7 නුඹලා
මාගේ ආහාර වන තෙල ද ලේ ද ඔප්පු කරන විට,
මාගේ මාලිගාව කලෙසෙන හැටියට මාගේ
ශුද්ධස්ථානයෙහි සිටීමට ගතින් හා සිතින් පාප මල
කපා නොදැමූ විදේශීන් එය ඇතුළට ගෙනාවහු ය.
නුඹලාගේ සියලු පිළිකුල් ක්‍රියා මදිවාට නුඹලා
මාගේ ගිවිසුමත් කඩ කළහු ය. 8 නුඹලා මාගේ
ශුද්ධ සේවය නොපවත්වා, නුඹලා වෙනුවට විජාතීන්
මාගේ ශුද්ධස්ථානයෙහි මාගේ සේවය පවත්වන්නන්
ලෙස පත් කළහු ය.
9 "මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක. ඉශ්‍රායලේවරුන් අතරෙහි සිටින
විදේශීන්ගෙන් ගතින් හා සිතින් පාප මල පහකර
නොදැමූ කිසි ම කෙනෙක් මාගේ ශුද්ධස්ථානයට
ඇතුළු නොවෙත් වා!

## සමිඳුන්ට ද්‍රෝහී ලේවීවරුන් පූජකවරයන් නෙරපීම

10 "තමන්ගේ දේව රූප පස්සේ මුළා වී ගිය
ඉශ්‍රායලේවරුන් මුළා ව ගිය කල මා වෙතින් අහක්
ව ගියා වූ ලේවීවරුන් ඔවුන්ගේ පාපවල විපාකය
දැරිය යුතු ය. 11 එහෙත්, ඔව්හු මාගේ
ශුද්ධස්ථානයෙහි සේවකයන් ව, මාලිගාවේ
දොරටුවල රැකවලුන් ව, මාලිගාවේ සේවකයන් ව
සිටින්නෝ ය. ඔවුන් වනාහි දවන යාග පූජාව සහ
යාග පූජාව උදෙසා සතුන් මරා දෙනු ඇත. සෙනඟට
සේවය කිරීමට ද ඔවුන් ඉදිරියෙහි සිටිනු ඇත.
12 ඔවුන්ගේ දේව රූප ඉදිරියෙහි ඔවුන්ට මොවුන්
සේවය කොට ඉශ්‍රායලේ වංශය පැකිළවන පාපයට
පළෙඹවූ බැවින් මාගේ අත මොවුන්ට විරුද්ධ ව
එසවූවෙමි. මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
මෙසේ වදාරන සේක. ඔවුන් තමන්ගේ පාපයේ
විපාකය දරනු ඇත. 13 මට පූජක සේවය කරමින්
මාගේ සියලු ශුද්ධ දේවල් වන අතිශුද්ධ දේවලින්
යමක් ළඟට වත්, මා ළඟට වත් ඔවුන් නොපැමිණිය
යුතු ය. ඔවුන් තමන් කළ පිළිකුල් ක්‍රියාවල
විපාකයක් වශයෙන් ලජ්ජාව දැරිය යුතු ය. 14 එසේ
මාලිගාවේ මුළු මෙහෙයෙටත්, එහි කෙරෙනෙ
සියල්ලටත් ඔවුන් මාලිගාව බලාගන්න රැකවලුන්
කරන්නෙමි.

## පූජක ලෙවීවරු

15 "එහෙත් ඉශ්රායලේවරුන් මා වෙතින් මුලා වී
ගිය විට, මාගේ ශුද්ධස්ථානයේ සේවය පැවැත්වූ
ලෙවීවරුන් වූ පූජකයන් වන ශාදොක්ගේ පුත්රයන්ට
නම්, මට සේවය කිරීමටත්, මා ළඟට පැමිණෙන්නත්,
තෙල සහ ලේ මට ඔප්පු කිරීමට මා ඉදිරියෙහි
සිටින්නත් අවසර ඇත. මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේක. 16 ඔවුන්ට නම්,
මාගේ ශුද්ධස්ථානයට ඇතුල් වන්නත්, මට සේවය
කිරීමට මාගේ මේසය ළඟට පැමිණෙන්නත්, මාගේ
සේවය පවත්වන්නත් අවසර ඇත. 17 නික්ම
28:39-43; ලෙවී 16:4ඔවුන් ඇතුළු මළුවේ
දොරටුවලට ඇතුළු වන කල හණ වස්ත්ර ඇඳ සිටිය
යුතු ය. ඇතුළු මළුවේ දොරටුවලට ඇතුළතින් ද
මාලිගාවෙහි ද සේවය කරන අතර ඔව්හු ලෝම
රෙදි නෑඳ සිටිත් වා. 18 ඔවුන්ගේ හිස් පිට හණ
තොප්පි ද ඔවුන්ගේ ඉඟටිවල හණ වැසුම් ද තිබේ
වා. ඩහදිය හටගන්වන දයෙක් පොරවා නොගනිත්
වා. 19 ලෙවී 16:23ඔවුන් පිට මළුවට එනම්, පිට
මළුවේ සෙනඟ ළඟට යන කල, ඔවුන් සේවය
කරන්නට අඳින තමන්ගේ වස්ත්ර ගලවා, ඒවා
ශුද්ධස්ථානයේ කාමරවල තබා, තමන්ගේ ශුද්ධ
වස්ත්රවලින් සෙනඟට නපුරක් නොවන ලෙස වෙනෙ
වස්ත්ර ඇඳගනිත් වා.
20 ලෙවී 21:5 "ඔව්හු තමන්ගේ හිස බූගාන්නේ
වත් ඉසකේ දික් වීමට අරින්නේ වත් නැති ව
තමන්ගේ ඉසකේ කපත් වා. 21 ලෙවී 10:9ඇතුළු
මළුවට ඇතුළු වන කල කිසි පූජකයෙක් මුද්රික
පානය නොබී සිටී වා. 22 ඔව්හු වැන්දඹුවන් වත්,
දික්කසාද වූ ස්ත්රීන් වත් නොව, ඉශ්රායලේ
වංශයේ කන්යාවන් සරණ පාවාගනිත් වා! එහෙත්,
පූජකයෙකුගේ වැන්දඹුවක ව සිටින ස්ත්රියක
පාවාගන්නට ඔවුන්ට අවසර ඇත.ලෙවී 21:7,13-14
23 "ලෙවී 10:10කැප දයෙ සහ අකැප දයෙ අතර
තිබෙන වෙනස ඔව්හු මාගේ සෙනඟට පෙන්වා,
අපවිත්ර දයෙ සහ පවිත්ර දයෙ අතරෙනේ තිබෙන
වෙනස ඔවුන්ට දන්වත් වා. 24 පැමිණිල්ලක් ගැන
නම්, ඔව්හු ම විනිශ්චය කිරීමට සිට, මාගේ
විනිශ්චයයන් හැටියට එය විනිශ්චය කරත් වා.
මාගේ ව්යවස්ථා ද මාගේ නියෝග ද මාගේ සියලු
නියමිත මංගලවල දී ඔව්හු රක්ෂා කරත් වා. මාගේ
සබත් දවස් ද ශුද්ධ කොට පවත්වත් වා.
25 ලෙවී 21:1-4 "ඔවුන් මළ කෙනෙකු ළඟට
පැමිණියහොත් අපවිත්ර වනු ඇත. එහෙත්, පියා
හෝ මව හෝ පුත්රයකු හෝ දූවක හෝ
සහෝදරයකු හෝ අවිවාහක සහෝදරියක හෝ
නිසා ඔවුන් අපවිත්ර නොවනු ඇත. 26 යමකු
අපවිත්ර වුවහොත් ඔහු පිරිසිදු වීමට ඔහුට සත්
දවසක් වත් ගත විය යුතු ය. 27 ඔහු ශුද්ධස්ථානයේ
සේවය කරන්න ශුද්ධස්ථානයේ ඇතුළු මළුවට
පිවිසෙන දවසේ ඔහු තමාගේ පාප පූජාව ඔප්පු කළ
යුතු ය. මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක.
28 ගණන් 18:20 "ඔවුන්ට නියම උරුමය නැත.
ඔවුන්ගේ උරුමය මම වෙමි. 29 ගණන්
18:8-19ඉශ්රායලෙයේ කවරකුට වුව ද නුඹලා
උරුමයක් නොවන්නහු ය. ඔවුන්ගේ උරුමය මම
වෙමි. ඔවුන්ට ආහාර පූජාව ද පාප පූජාව ද අපරාධ
පූජාව ද කන්න අවසර ඇත. ඉශ්රායලේවරුන්
අතරෙහි කැප වූ සියල්ල ම ඔවුන්ට වන්නේ ය.
30 සියලු ම දේවල්, සියලු ම ප්රථම පලවලින් පළමු
ඒවා ද නුඹලාගේ සියලු ආකාර දේවල එසවීමේ
පූජා සියල්ල ද පූජකයන්ට වන්නේ ය. නුඹේ පවුලට
ආශීර්වාදයක් ලැබෙන පිණිස නුඹලා ඇනූ පිටියෙනේ
මුල් ම කොටස පූජකයන්ට දෙන්න. 31 ලෙවී
22:8ඉබේ ම මැරුණු නොහොත් මෘගයන් විසින්
ඉරාදමනු ලැබූ කිසි පක්ෂියකු වත්, මෘගයකු වත්
පූජකයකු නොකෑ යුතු ය."

## සමිඳුන්ට පුද කළ යුතු පූජක භූමි කොටස

45 "තවද, නුඹලා දේශය උරුම කරගැනීමට පස
ඇට දමන කල, දේශයෙනේ ශුද්ධ කොටසක්
සමිඳාණන් වහන්සේට ඔප්පු කරන්න. එහි දිග
කිලෝමීටර් දොළහමාරකි. පළල කිලෝමීටර් පහකි.
මේ මුළු කොටස ශුද්ධ භූමියක් විය යුතු ය. 2 එක
පැත්තක් මීටර් දසෙියපණහක් වන චතුරශ්රයක්
ශුද්ධස්ථානයට වේ වා. ඊට තණ බිමක් පිණිස මීටර්
විසිපහකුත් වටේට තිබේ වා. 3 ඒ මිම්මෙනේ
කිලෝමීටර් දොළහමාරක් දිග ද කිලෝමීටර් පහක්
පළල ද ඇති ඉඩමක් මනින්න. ඒක තුළ
ශුද්ධස්ථානය වන අතිශුද්ධස්ථානය වන්නේ ය.
4 එය දේශයෙනේ ශුද්ධ කොටසක් ය. එය සමිඳාණන්
වහන්සේට සේවය කරන්න පැමිණෙනෙ
ශුද්ධස්ථානයේ සේවකයන් වන පූජකයන්ට අයිති
වන්නේ ය. එය ඔවුන්ගේ නිවසේවලට ඉඩමක් ද
ශුද්ධස්ථානයට ශුද්ධ තැනක් ද වන්නේ ය.
5 කිලෝමීටර් දොළහමාරක් දිග ද කිලෝමීටර් පහක්
පළල ද ඇති ඉඩමක් මාලිගාවේ සේවකයන් වන
ලෙවීවරුන් වාසය සඳහා පිහිටුවීමට නගර පිණිස
උරුමයක් වේ වා.
6 "නුවර කොටස පිණිස කිලෝමීටර් දොළහමාරක්
දිග ද කිලෝමීටර් දකෙහමාරක් පළල ද ඇති
ඉඩමක් ශුද්ධ කොටස ළඟ නියම කරන්න. එය මුළු
ඉශ්රායලේ වංශයට අයිති වන්නේ ය."

## අධිපතීන්ට අයිති කොටස

7 "ශුද්ධ කොටසටත්, නුවරට අයිති කොටසටත්
දපෙත්තහෙි එනම්, ශුද්ධ කොටසටත්, නුවරට අයිති
කොටසටත් යාව දිගට ම බස්නාහිර පැත්තහෙි සහ
නැගෙනෙහිර පැත්තහෙි අධිපතියාට කොටස් වේ වා.
ඒවායේ දිග බස්නාහිර සීමාවේ සිට නැගෙනෙහිර
සීමාවට ඇති ගෝත්රයක කොටසට සමාන විය යුතු
ය. 8 දේශයෙහි ඉශ්රායලේවරුන් අතරෙහි එය ඔහුට
කොටසක් වන්නේ ය. එසේ මාගේ අධිපතීන්

මාගේ සෙනඟට තවත් පීඩා නොකර ඉශ්‍රායලේ
වංශයට ඔවුන්ගේ ගෝත්‍ර ප්‍රකාරයට දේශය දෙනු
ඇත.”

### අධිපතියාගේ අයුතුකම්

9 මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක: “එම්බා ඉශ්‍රායලේ අධිපතිවරුනි!
ඉතින් නුඹලා පව් කළ ප්‍රමාණය ඇත.
බලහත්කාරය සහ කොල්ලකෑම ද පහකොට,
යුක්තිය සහ ධර්මිෂ්ඨකම ද කර මාගේ සෙනඟට
බලහත්කාර කිරීමෙන් වැළකෙන්නැ යි මහෝත්තම
දෙවි ස්වාමීන් වහන්සේ වදාරන සේක.
10 ලෙවී 19:36 “හරි තරාදි ද හරි කිරුම් පඩි ද හරි
මිම්මක් ද නුඹලාට තිබේ වා.
11 “බාත් එකකට හෝමෙරේ දසයෙන් කොටසක් ද
ඒපාවට හෝමෙරේ දසයෙන් කොටසක් ද හෝමෙරේ
එකක් ලීටර් එකසිය හැත්තෑපහක් ද අල්ලන පිණිස
ඒපාව හා බාත් එක ප්‍රමාණය වන්නේ ය. ඒවායේ
ප්‍රමාණය හෝමෙරේට හරි ව තිබේ වා.
12 “ෂෙකෙලෙට ගේරා විස්සක් ය. ෂෙකෙලෙය ග්‍රෑම්
එකොළහයි දශම හතරකි. නුඹලාගේ මීනා එක
ෂෙකෙලේ හැටක් වන්නේ ය.
13 “නුඹලා ඔප්පු කළ යුතු වූ එසවීමේ පූජාව නම්,
තිරිඟු අස්වැන්නෙන් හැටෙන් එකකි. යව
අස්වැන්නෙන් හැටෙන් එකකි. 14 තෙලේ සම්බන්ධ
නියමය නම්, ගස්වලින් ලැබෙන තෙලේ ප්‍රමාණයෙන්
සියයෙන් කොටසකි. හෝමෙරේ එකක් බාත් දහයකි;
හෝමෙරේ එක කෝරේ එකකි.
15 “ඉශ්‍රායලේවරුන් උදෙසා සමඟිකමක් කිරීමට
ආහාර පූජාවටත්, දවන යාග පූජාවටත්,
සහභාගිකමේ පූජාවලටත් ඉශ්‍රායලේ පවුල්වලට
අයිති එළු බැටළු පට්ටිවලින් දෙසියයකින් එක
සතකු බැගින් දෙන්නට යෙදේ වා”යි මහෝත්තම
දෙවි ස්වාමීන් වහන්සේ වදාරන සේක.
16 “ දේශයේ මුළු සෙනඟ ඒ පඬුර ඉශ්‍රායලේ
අධිපතියාට දිය යුතු ය. 17 අධිපතියාගේ යුතුකම්
නම්, ඉශ්‍රායලේ වංශයේ සියලු නියම කාලවල
මංගල්‍යවලදීත්, නව සඳ පෝදිනවලදීත්, සබත්
දවස්වලදීත් දවන යාග පූජා ද ආහාර පූජා ද පාන
පූජා ද සපයා දීම ය. ඉශ්‍රායලේ වංශය උදෙසා
සමඟිකමක් කරන්නට පාප පූජා ද දවන යාග පූජාව
ද සහභාගිකමේ පූජාව ද ඔහු පිළියෙළ කළ යුතු ය.”

### මංගල්‍යයන්

(නික්ම 12:4-20;ලෙවී 23:33-43)

18 “මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක: පළමු වන මාසයේ පළමු වන දා
කැළලක් නැති ගොන් වස්සකු රැගෙන
ශුද්ධස්ථානයේ දෝෂ පහකරන්න. 19 පූජකයා ද පාප
පූජාවේ ලේවලින් ස්වල්පයක් රැගෙන මාලිගාවේ
උළුවස්සේ කණුවලත්, පූජාසනයේ අඩිතාලමේ
කොන් සතරේත් ඇතුළු මළුවේ දොරටුවේ උළුවහු
කණුවලත් ගාන්නේ ය. 20 වැරදීමෙන් හෝ
නොදැනුවත්කමෙන් හෝ යමෙකු පව් කළොත්
මාසයේ සත් වන දවසේදීත් මාලිගාවේ එවැනි
පූජාවක් ඔප්පු කළ යුතු ය. එලෙස කිරීමෙන් දේව
මාලිගාව විශුද්ධ කරනු ඇත.
21 නික්ම 12:1-20; ගණන් 28:16-25 “පළමු වන
මාසයේ දහහතර වන දින පටන් පාස්කු මංගල්‍යය
සත් දවසක් පවත්වමින් මුහුන් නැති රොටි කන්න.
22 ඒ දවසේ දී අධිපතියා තමා උදෙසොත්, දේශයේ
මුළු සෙනඟ උදෙසොත් ගොන් වස්සෙකු පාප පූජාවක්
වශයෙන් පිළියෙළ කරන්නේ ය. 23 ඔහු මංගල්‍යය
පවත්වන දවස් සත තුළ සමිඳාණන් වහන්සේට
දවන යාග පූජාවක් ලෙස එක එක දවසට කැළලක්
නැති ගොන් වස්සන් සත්දෙනෙකු ද බැටළුවන්
සත්දෙනෙකු ද පාප පූජාවක් ලෙස දවසට එළුවෙකු ද
පිළියෙළ කරන්නේ ය. 24 ඔහු ආහාර පූජාවක් ලෙස
ගොනෙකුට පිටි ලීටර් දහහතහමාරක් ද
බැටළුවෙකුට ධාන්‍ය ලීටර් දහහතරහමාරක් ද ධාන්‍ය
ලීටරයකට තෙලේ ලීටර් තුනක් ද බැගින් පිළියෙළ
කරන්නේ ය.
25 ලෙවී 23:33-36; ගණන් 29:12-38 “සත් වන
මාසයේ පහළොස් වන දා මංගල්‍යයේ දී ඔහු එසේ
ම සත් දවසක් ඒ පාප පූජාව ද දවන යාග පූජාව ද
ආහාර පූජාව ද තෙලේ ද පූජාව සඳහා පිළියෙළ
කරන්නේ ය.”

### අධිපතියා සහභාගී වන පූජෝත්සව

46 මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක: “නැගෙනහිර දෙසෙ තිබෙන
ඇතුළු මළුවේ දොරටුව වැඩ කරන දවස් හය තුළ
වසා තැබිය යුතු ය. එහෙත්, සබත් දවසේ ද
අමාවක දවසේ ද එය ඇර තිබෙන්නේ ය.
2 අධිපතියා ද පිටත දොරටුවේ ද්වාර මණ්ඩපයෙන්
ඇතුළු වී දොරටුවේ කණුව ළඟ සිටින්නේ ය.
පූජකයෝ ඔහුගේ දවන යාග පූජාව ද ඔහුගේ
සහභාගිකමේ පූජාව ද පිළියෙළ කරන්නෝ ය. ඔහු
දොරටුවේ එළිපත්ත ළඟ නමස්කාර කොට පිටතට
යන්නේ ය. එහෙත්, සවස් වන තුරු දොරටුව
නොවසා තිබිය යුතු ය. 3 දේශයේ සෙනඟ ද
දොරකඩ ළඟ සබත් දවස්වල ද අමාවක් දවස්වල ද
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි නමස්කාර කරන්නෝ
ය.
4 “අධිපතියා සබත් දවසේ දී සමිඳාණන්
වහන්සේට ඔප්පු කළ යුතු දවන යාග පූජාව නම්,
කැළලක් නැති බැටළු පැටියන් හයදෙනෙකුත්,
කැළලක් නැති බැටළුවෙකුත් ය; 5 ආහාර පූජාව නම්,
බැටළුවා සමඟ ධාන්‍ය ලීටර් දහහතහමාරකුත්,
බැටළු පැටවුන් සමඟ ඔහුට දෙන්න හැකි තෙලේ ලීටර්
තුනකුත් ය. 6 අමාවක දවසේ දී කැළලක් නැති
ගොන් වස්සෙකුත්, බැටළු පැටවුන් හයදෙනෙකුත්,
බැටළුවෙකුත් ඔප්පු කළ යුතු ය. උන් කැළලක් නැති
සතුන් විය යුතු ය. 7 ගොනාටත්, බැටළුවාටත් පිටි
ලීටර් දහහතහමාරකුත්, බැටළු පැටවුන්ට තමාගේ
පුළුවන්කමේ හැටියට තෙලේ ලීටර් තුනකුත් පිළියෙළ

කරන්නේ ය. 8 අධිපතියා ඇතුළු වන කල ඔහු
දොරටුවේ ද්වාර මණ්ඩපයෙන් ඇතුළු විය යුතු ය. ඒ
මාර්ගයෙන් ම පිටතට යා යුතු ය.
9 "එහෙත්, දේශයේ සෙනඟ නියම කාලවල දී
සමිඳාණන් වහන්සේ ඉදිරියට ඇතුළු වන කල,
නමස්කාර කරන්න උතුරු ද්වාර මණ්ඩපයෙන් ඇතුළු
වන අය දකුණු ද්වාර මණ්ඩපයෙන් පිටතට යා යුතු
ය. දකුණු ද්වාර මණ්ඩපයෙන් ඇතුළු වන අය උතුරු
ද්වාර මණ්ඩපයෙන් පිටතට යා යුතු ය. කවුරු නමුත්,
ඇතුළු වන ද්වාර මණ්ඩපයෙන් හැරී නොගොස් ඊට
ඉදිරියට ගමන් කළ යුතු ය. 10 ඔවුන් ඇතුළු වන
කල අධිපතියාත් ඔවුන් අතරේ ඇතුළු වන්නේ ය.
ඔවුන් පිටතට යන කල ඔහුත් පිටතට යන්නේ ය.
11 මංගල්‍යවල දී ද නියම කාලවල දී ද ඔප්පු කරන
ආහාර පූජාව ගොනකුටත් බැටළුවකුටත් ලීටර්
දහහතහමාරකුත් බැටළු පැටවුන්ට ඔහු දෙන
පමණකුත් ඒ සමඟ තෙල් ලීටර් තුනකුත් වන්නේ ය.
12 "අධිපතියා ස්වේච්ඡා දවන පූජාවක් වත්,
ස්වේච්ඡා සහභාගිකමේ පූජාවක් වත් සමිඳාණන්
වහන්සේට පිළියෙළ කරන්න එන කල, නැඟෙනහිරට
තිබෙන දොර ඔහුට ඇර දිය යුතු ය. ඔහු සබත්
දවසේ දී කරන ප්‍රකාරයට තමාගේ දවන යාග
පූජාව ද සහභාගිකමේ පූජාව ද පිළියෙළ කර
පිටතට යන්නේ ය. ඔහු ගිය පසු දොරටුව වසනු
ලබන්නේ ය."

## දෛනික පූජා

13 "තවද, කැළලක් නැති අවුරුද්දක බැටළු පැටවකු
දවන යාග පූජාවක් කොට දිනපතා ම සමිඳාණන්
වහන්සේට ඔප්පු කරන්න. සෑම උදයක් පාසා එසේ
පිළියෙළ කරන්න. 14 ඌ සමඟ සෑම උදයක් පාසා ම
ආහාර පූජාවක් වන පිටි කිලෝග්රෑම් දෙකෙක් ද
සිහින් ධාන්‍ය තෙමෙන්න තෙල් ලීටරයක් ද සමිඳාණන්
වහන්සේට ආහාර පූජාවක් කොට පිළියෙළ කරන්න.
ඒක නිරන්තර දවන යාග පූජාවට නියෝගයක්
වන්නේ ය. 15 එසේ නිරන්තර දවන යාග පූජාවක්
කොට බැටළු පැටවා ද ආහාර පූජාව ද තෙල් ද සෑම
උදයක් පාසා උදයක් පිළියෙළ කළ යුතු ය."

## අධිපතියා සහ දේපළ

16 මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ මෙසේ
වදාරන සේක: "අධිපතියා තමන්ගේ උරුමයෙන් තෑගි
වශයෙන් යම් පුත්‍රයකුට තෑග්ගක් දුන්නොත්, එය
ඔහුගේ උරුමය වන කොටස වන්නේ ය. එය
ඔහුගේ පුත්‍රයන්ට අයිති වන්නේ ය. උරුම වීමෙන්
එය ඔවුන්ගේ කොටස වේ. 17 ලෙවී 25:10එහෙත්,
තමාගේ උරුමයෙන් තෑග්ගක් තමාගේ
සේවකයන්ගෙන් යමකුට දුන්නොත් එය නිදහස්
වීමේ අවුරුද්ද දක්වා ඔහුට අයිති වන්නේ ය. ඉන්පසු
එය අධිපතියාට නැවත අයිති වන්නේ ය. ඔහුගේ
උරුමය ඔහුගේ පුත්‍රයන්ට පමණක් අයිති වන්නේ
ය. 18 සෙනඟ ඔවුන්ගේ උරුම කොටස්වලින් අහක්
කරන හැටියට අධිපතියා ඔවුන්ගේ උරුමයෙන්
කිසිවක් නොගනී වා. මගේ සෙනඟ තම තමන්ගේ
උරුම කොටස්වලින් පන්නාදමනු නොලබන පිණිස
තමාගේ ම කොටසෙන් තමාගේ ම පුත්‍රයන්ට
උරුමයක් දේ වා!"

## දේව මාලිගාවේ මුළුතැන් ගෙය

19 එවිට ඒ මිනිසා දොරටුව පැත්තෙන් ඇතුළු වීමට
තිබුණු මගින් උතුරු දෙසට පූජකයන්ට තිබුණු ශුද්ධ
කාමරවලට මා පැමිණෙව්වේ ය. එහි පිටුපස
බස්නාහිර දෙසට බිමක් තිබුණේ ය. 20 ඔහු ද කතා
කරමින්, "මේක පූජකයන් අපරාධ පූජාව සහ පාප
පූජාව තම්බන්නටත්, ආහාර පූජාව බදින්නටත් වෙන්
කර ඇති ස්ථානය වේ. එසේ කරන්නේ, සෙනඟ
ශුද්ධ කරන පිණිස ඒවා පිට මළුවට නොගෙන යන
පිණිස ය"යි මට කීවේ ය.
21 එවිට ඔහු පිට මළුවට මා පමුණුවා, මළුවේ මුලු
හතර ළඟින් මා ගෙන ගියේ ය. එවිට මළුවේ එක
එක මුල්ලෙහි මළුවක් තිබෙන බව දිටිමි. 22 මළුවේ
මුලු හතරේ මළු සවේලිකර, මීටර් විස්සක් දිග ද
මීටර් පහළොවක් පළල ද විය. ඒ සතර ම එක
මිම්මට තිබුණේ ය. 23 ඒ සතර ම වටේට ඒවා
ඇතුළෙහි බැම්මක් බැඟින් තිබුණේ ය. ඒ බැමි
පහතින් වටේට මැටි උදුන් සාදා තිබුණේ ය.
24 එවිට ඔහු කතා කරමින්, "මේවා මාලිගාවේ
සේවකයන් විසින් සෙනඟගේ පූජා තම්බනු ලබන්න
ඕනෑ වූ මුළුතැන් ගෙවල් ය"යි මට කීවේ ය.

## දේව මාලිගාවෙන් නික්මෙන ජීවන ගඟ

47 සකෙරි 14:8; ජොහ 7:38; එළිද 22:1 පසු ව
ඒ මනුෂ්‍යයා දේව මාලිගාවේ දොරකඩ
ළඟට මා නැවත පැමිණෙව්වේ ය. එවිට දේව
මාලිගාවේ එළිපත්තට යටින් නැඟෙනහිර දෙසට
වතුර ගලා යන බව මම දිටිමි. මන්ද, දේව
මාලිගාවේ ඉස්සරහ පැත්ත නැඟෙනහිර දෙසට
තිබුණේ ය. ඒ වතුර දේව මාලිගාවට දකුණු
පැත්තෙන් පූජාසනයට දකුණෙන් එළිපත්ත යටින්
ගලා ආවේ ය. 2 එකල ඔහු මා උතුරු ද්වාර
මණ්ඩපයෙන් පිටතට ගෙනගොස්, නැඟෙනහිරට
මුහුණ පා තිබුණු පිටත දොරටුව ළඟට වටකරින් මා
පැමිණෙව්වේ ය. එවිට වතුර දකුණු පැත්තෙන්
වැගිරෙනු දිටිමි. 3 ඒ මනුෂ්‍යයා තමාගේ අතින්
ලණුව රැගෙන නැඟෙනහිර දෙසට යමින් මීටර්
පන්සියයක් මැන්නේ ය. එවිට ඔහු මට වතුර මැදින්
එගොඩට යන්න කීවේ ය. වතුර වළලුකර දක්වා
තිබුණේ ය. 4 ඔහු තව මීටර් පන්සියයක් මැන වතුර
මැදින් මට යන්න කීවේ ය. වතුර දණ හිස් දක්වා
තිබුණේ ය. ඔහු තව මීටර් පන්සියයක් මැන වතුර
මැදින් මා යැව්වේ ය. එතැන වතුර ඉඟටිය දක්වා
තිබුණේ ය. 5 ඔහු තව මීටර් පන්සියයක් මැන්නේ
ය. එවිට එය මට බැස යන්න බැරි ගඟක් ව
තිබුණේ ය. මන්ද, බැස යන්න බැරි ගඟක් ව
පීනන්න වුවමනා තරමට වතුර ඉහළට නැඟ
තිබුණේ ය. 6 එවිට ඔහු කතා කරමින්, "මනුෂ්‍ය

පුත්‍රය, නුඹ මෙය දුටුවෙහි දැ"යි මාගෙන් අසා, මා
කැඳවාගෙන නැවත ගං ඉවුරට පැමිණෙව්වේ ය.
7 මම හැරී ගිය කල, ගං ඉවුර දෙපැත්තේ ම
බොහෝ ගස් තිබෙනු දිටිමි. 8 ඔහු කතා කරමින්,
"මේ වතුර නැගෙනහිර දිශාවට ගලා ගොස්, අරබා
සමභූමියට බැස ගොස්, එහි මළ මුහුදට ඇතුළු වූ
විට ජලය මිරිදියට හැරුණේ ය. 9 මේ ගංගා ගලා
යන සෑම තැන ම රාශි ගණන් පණ ඇති සියලු ම
සත්ත්වයෝ ජීවත් වන්නෝ ය. එසේ මත්ස්‍යයන්
මහා ගණනක් හටගනු ඇත. මන්ද, මේ වතුර එහි
පැමිණි විට අනික් ඒවා මිරිදිය වන්නේ ය. ගංගාව
ගලා යන කොතැනක වුව ද සිටින සියල්ලන් ජීවත්
ව සිටිනු ඇත. 10 මසුන් අල්ලන්නන් එය අද්දර සිටිනු
ඇත. ඒන්-ගෙදියේ සිට ඒන්-එග්ලයිම් දක්වා දැල්
අතුරන ස්ථාන ඇති වන්නේ ය. එහි මත්ස්‍යයෝ
මුහුදේ මත්ස්‍යයන් මෙන් එක එක වර්ගයේ
හැටියට මහා ගණනක් සිටිති. 11 එහෙත්, එහි
වගුරුබිම් සහ ගොහොරු බිම්වල වතුර මිරිදිය
නොවී ලුණු ලබාගන්න පිණිස හරිනු ලබන්නේ ය.
12 එළිද 22:2ගඟ ඉවුරේ දෙපැත්තේ ම සියලු ආකාර
පලතුරු වැවෙන්නේ ය. ඒවායේ කොළ වේළෙන්නේ
වත්, ඒවායේ පල වරන්නේ වත් නැති ව හැම
මාසයේ ම අලුත් පල දරන්නේ ය. මන්ද, ඒවායේ
වතුර ශුද්ධස්ථානයෙන් ම නික්ම එන්නේ ය. ඒවායේ
පල ආහාර පිණිසත්, ඒවායේ කොළ ඖෂධ පිණිසත්
වන්නේ ය"යි කී ය.

### දේශ සීමා

13 මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක: "ඉශ්‍රායෙලේ ගෝත්‍ර දොළොසට
නුඹලා දේශය බෙදා දිය යුතු මේ සීමා අනුව ය.
ජෝසෙප්ට කොටස් දෙකෙක් ලැබෙන්නේ ය.
14 නුඹලා අතර සම සම ව දේශය බෙදාගන්නහු ය;
මන්ද, නුඹලාගේ පියවරුන්ට එය දෙන හැටියට
මාගේ අත එසවුවෙමි. එසේ මේ දේශය උරුමයක්
පිණිස නුඹලාට ලැබෙන්නේ ය.
15 " දේශයේ සීමා මෙසේ ය: උතුරු දිශාවේ
මධ්‍යධරණී මුහුදේ සිට සෙදාද්ට පැමිණෙන
හෙත්ලොන් මාර්ගයේ තිබෙන ලෙබෝ හමාත් ද
බේරෝතා ද 16 දමස්කයේ සීමාවටත්, හමාත්හි
සීමාවටත් අතරේ තිබෙන සිබ්රායිම් ද හවුරාන්හි
සීමාවේ තිබෙන මධ්‍ය හාශරේ ද යන ඒවා ය.
17 මෙසේ මුහුදේ සිට දමස්කයේ උතුරු මායිමේ
පිහිටි හශර්-ඒනොන් දක්වා උතුරට හමාත්හි සීමාව
ද වේ. උතුරු පැත්ත එය වේ.
18 "දමස්කයටත්, ගිලියද්ටත් අතර පිහිටි
නැගෙනහිර පැත්තේ හවුරාන් දක්වා සීමාවටත්,
ඉශ්‍රායෙලේ දේශයටත් අතරේ ජෝර්දාන ගඟ
ඔස්සේ වන්නේ ය. උතුරු සීමාවේ පටන් නැගෙනහිර
මුහුද දක්වා මනින්න. ඒක නැගෙනහිර පැත්ත වේ.
19 "දකුණු දේශ සීමාව නම්, තාමාර් පටන්
මෙරිබොත්-කාදෙෂ්හි ජලයත්, ඉක්බිති මිසර ඔය
දිගේ මධ්‍යධරණී මුහුදත් දක්වා තිබේ. දකුණු
දිශාවේ දකුණු සීමාව එය වේ.
20 "බස්නාහිර දේශ සීමාව නම්, මධ්‍යධරණී මුහුද
පටන් හමාත් ඉදිරිපිටට පැමිණෙන තුරු මධ්‍යධරණී
මුහුද වේ. බස්නාහිර සීමාව එය වේ.
21 "මේ දේශය ද ඉශ්‍රායෙලේ ගෝත්‍ර ප්‍රකාරයට
නුඹලා අතරේ බෙදාගන්න. 22 නුඹලාටත්, නුඹලා
අතරේ වාසය කරන, නුඹලා අතරෙහි දරුවන් ඉපදී
සිටින විදේශීන්ටත් උරුමයක් පිණිස පස ඇට දමා
බෙදාගන්න. ඔව්හු ඉශ්‍රායෙල්වරුන් අතරෙහි
පුරවැසියන් මෙන් නුඹලා සමඟ සිටිත්වා. නුඹලා
සමඟ ඉශ්‍රායෙලේ ගෝත්‍ර අතරෙහි පස ඇට
දැමීමෙන් ඔවුන්ට උරුමයක් වන්නේ ය. 23 වි
දේශිකයා වාසය කරන ගෝත්‍රය අතරේ ම ඔහුගේ
උරුමය ඔහුට දෙන්න. මහෝත්තම දෙවි ස්වාමීන්
වහන්සේ මෙසේ වදාරන සේක."

### දේශය ගෝත්‍ර වශයෙන් බෙදීම

48 "ගෝත්‍රවල නාම මේවා ය: උතුරෙන්
පටන්ගෙන හමාත්ට පැමිණෙන හෙත්ලොන්හි
මාර්ගය ද උතුරෙහි හමාත් ඉදිරිපිට දමස්කයේ
සීමාවේ පිහිටි හශර්-ඒනාන් දක්වා නැගෙනහිර
පැත්තේ පටන් බස්නාහිර දක්වා ද දාන්ට එක
කොටසක් ය. 2 දාන්ගේ සීමාව ළඟ නැගෙනහිර
පැත්තේ පටන් බස්නාහිර පැත්ත දක්වා ආෂේර්ට
එක කොටසක් ය. 3 ආෂේර්ගේ සීමාව ළඟ
නැගෙනහිර පැත්තේ පටන් බස්නාහිර පැත්ත දක්වා
නප්තලීට එක කොටසක් ය. 4 නප්තලීගේ සීමාව
ළඟ නැගෙනහිර පැත්තේ පටන් බස්නාහිර පැත්ත
දක්වා මනස්සේට එක කොටසක් ය. 5 මනස්සේගේ
සීමාව ළඟ නැගෙනහිර පැත්තේ පටන් බස්නාහිර
පැත්ත දක්වා එප්‍රායිම්ට එක කොටසක් ය.
6 එප්‍රායිම්ගේ සීමාව ළඟ නැගෙනහිර පැත්තේ
පටන් බස්නාහිර පැත්ත දක්වා රූබන්ට එක
කොටසක් ය. 7 රූබන්ගේ සීමාව ළඟ නැගෙනහිර
පැත්තේ පටන් බස්නාහිර පැත්ත දක්වා ජුදාට එක
කොටසක් ය.

### ලෙවී ගෝත්‍රයට හිමි විශේෂ භූමි කොටස

8 "ජුදා දේශ සීමාව ළඟ නැගෙනහිර පැත්තේ
පටන් බස්නාහිර පැත්ත දක්වා නුඹලා වෙන් කළ යුතු
විශේෂ කොටස වන්නේ ය. එහි පළල කිලෝමීටර්
දොළහමාරක් ද එහි දිග ගෝත්‍රයකට හිමි
කොටසට සමාන වූ නැගෙනහිර පැත්තේ පටන්
බස්නාහිර පැත්ත දක්වා ද වන්නේ ය. ශුද්ධස්ථානය
එහි මැද වන්නේ ය.
9 "නුඹලා එයින් සමිඳාණන් වහන්සේට ඔප්පු කළ
යුතු සමිඳාණන් වහන්සේට විශේෂ කොටස
කිලෝමීටර් දොළහමාරක් දිග ද කිලෝමීටර් පහක්
පළල ද ඇති ව තිබිය යුතු ය. 10 විශේෂ කොටස
පූජකයන්ට අයිති වන්නේ ය. එනම්, උතුරට

කිලෝමීටර් දොළහමාරක් ද බස්නාහිරට කිලෝමීටර්
පහක් පළල ද නැගෙනහිරට කිලෝමීටර් පහක්
පළල ද දකුණු දෙසට කිලෝමීටර් දොළහමාරක් දිග
ද ඇති කොටසක් වන්නේ ය. එය මැද සමිඳාණන්
වහන්සේගේ ශුද්ධස්ථානය වන්නේ ය. 11 එය
ඉශ්‍රායෙල් පුත්‍රයන් පව්කර මුළා ව ගිය කල,
ලෙවීවරුන් මුළා ව ගියාක් මෙන් මුළා ව නොගොස්
මාගේ සේවය පැවැත්වූ, ශාදොක්ගේ පුත්‍රයන් වූ,
කැප කරනු ලැබූ, පූජකයන්ට වන්නේ ය.
12 ලෙවීවරුන්ගේ සීමාව ළඟ එය දේශයේ විශේෂ
කොටස අතිශුද්ධ විශේෂ කොටස වන්නේ ය.
13 පූජකයන්ගේ සීමාවට යාව කිලෝමීටර්
දොළහමාරක් දිග ද කිලෝමීටර් පහක් පළල ද ඇති
කොටසක් ලෙවීවරුන්ට වන්නේ ය. මුළු දිග
කිලෝමීටර් දොළහමාරක් ද පළල කිලෝමීටර් පහක්
ද විය යුතු ය. 14 ඔව්හු එයින් කිසිවක් විකුණන්නට
වත්, මාරු කරන්නට වත්, වෙන් කර අහිමි කරන්නට
වත් නොයෙදෙත්වා. මන්ද එය සමිඳාණන්
වහන්සේට ශුද්ධ ය.
15 “කිලෝමීටර් දොළහමාරක් ද පළලින්
දෙකහමාරක් ව ද තිබෙන ඉතිරි කොටස ශුද්ධ
නොවේ, එය වාසය කිරීමට නුවර සහ තණ බිම
පිණිස පොදු කොටසක් වන්නේ ය. නුවර වනාහි
එහි මැද වන්නේ ය. 16 එහි ප්‍රමාණය මෙසේ ය.
එය හරි හතරැස් විය යුතු ය. උතුරෙන් මීටර් දෙදොස්
දෙසියපණහක් ද දකුණෙන් මීටර් දෙදොස්
දෙසියපණහක් ද නැගෙනහිරෙන් මීටර් දෙදොස්
දෙසියපණහක් ද බටහිරෙන් මීටර් දෙදොස්
දෙසියපණහක් ද බැගින් දිග ය. 17 නුවර වටේට ම
සෑම අතින් ම තණ බිම් තිබිය යුතු ය. ඒවායේ
ප්‍රමාණය උතුරට මීටර් එකසිය විසිපහක් ය.
දකුණට මීටර් එකසිය විසිපහක් ය. නැගෙනහිරට
මීටර් එකසිය විසිපහක් ය. බස්නාහිරට මීටර්
එකසිය විසිපහක් ය. 18 ශුද්ධ, විශේෂ කොටසට
යාව දිගින් ඉතිරි වන්නේ නැගෙනහිරට කිලෝමීටර්
පහක් ය. බස්නාහිරට කිලෝමීටර් පහක් ය. එය
ශුද්ධ විශේෂ කොටස ළඟ වන්නේ ය. ඒ
කොටස්වල අස්වැන්න නුවර වැඩ කරන්නන්ට කෑම
පිණිස වන්නේ ය. 19 සියලු ඉශ්‍රායෙල් ගෝත්‍රවලින්
නුවර වැඩකරන්නෝ එය අස්වද්දවත්වා.
20 “වෙන් කරන ලද මුළු කොටස කිලෝමීටර්
දොළහමාරක් දිග ව, කිලෝමීටර් දොළහමාරක්
පළල ව තිබිය යුතු ය. එසේ ශුද්ධ විශේෂ කොටස,
නුවර කොටස ඇතුළු ව සතරැස් එකක් කොට වෙන්
කරන්න.
21 “විශේෂ ශුද්ධ කොටසටත්, නුවර කොටසටත්
දෙපැත්තෙන් එනම්, විශේෂ කොටසේ කිලෝමීටර්
දොළහමාර ළඟ සිට නැගෙනහිර සීමාව දක්වා ද
බස්නාහිර දෙසට කිලෝමීටර් දොළහමාර ළඟ සිට
බස්නාහිර සීමාව දක්වා ද ගෝත්‍රවල කොටස්වලට
සමාන්තර ව ඉතිරි වන පංගුව අධිපතියාට වන්නේ
ය. ශුද්ධ විශේෂ කොටස ද මාලිගාවේ ශුද්ධස්ථානය
ද එහි මැද වන්නේ ය. 22 එසේ අධිපතියාට අයිති
කොටසේ මැද තිබෙන ලෙවීවරුන්ගේ කොටසේ සිට
ද නුවර කොටසේ සිට ද ජුදා වංශයේ සීමාවටත්,
බෙන්ජමින් වංශයේ සීමාවටත් අතරේ තිබෙන
කොටස් අධිපතියාට වන්නේ ය.

## සෙසු ගෝත්‍රවලට හිමි භූමි කොටස

23 “ඉතිරි ගෝත්‍රවලින් නම්, නැගෙනහිර පැත්තේ
පටන් බස්නාහිර පැත්ත දක්වා බෙන්ජමින් වංශයට
කොටසක් වේ. 24 බෙන්ජමින්ගේ වංශයේ සීමාව
ළඟට නැගෙනහිර පැත්තේ පටන් බස්නාහිර පැත්ත
දක්වා සිමියොන්ගේ වංශයට කොටසක් වේ.
25 සිමියොන්ගේ වංශයේ දේශ සීමාව ළඟ
නැගෙනහිර පැත්තේ පටන් බස්නාහිර පැත්ත දක්වා
ඉස්සාකර්ට කොටසක් වේ. 26 ඉස්සාකර්ගේ
වංශයේ දේශ සීමාව ළඟ නැගෙනහිර පැත්තේ
පටන් බස්නාහිර පැත්ත දක්වා සාබුලොන්ට
කොටසක් වේ. 27 සාබුලොන්ගේ වංශයේ දේශ
සීමාව ළඟ නැගෙනහිර පැත්තේ පටන් බස්නාහිර
පැත්ත දක්වා ගාද්ට කොටසක් වේ.
28 “ගාද්ගේ වංශයේ දේශ සීමාව ළඟ දකුණු
දිශාවට දකුණු පැත්තේ සීමාව නම්, තාමාර් පටන්
මෙරිබත්-කාදෙශ්හි ජලයත්, මිසර ඔයත්, මධ්‍යධරණි
මුහුදත් දක්වා තිබෙන්නේ ය.
29 “ඉශ්‍රායෙල් ගෝත්‍රවලට උරුමයක් පිණිස
නුඹලා පස ඇට දමා බෙදිය යුතු දේශය එය වේ.
ඔවුන්ගේ කොටස් ඒවා ය.” මෙසේ වදාරන්නේ
මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ ය.

## නුවර දොරටුව

30 එළිද 21:12-13 “නුවරින් පිටතට යන තැන්
මෙසේ ය. මීටර් දෙදොස් දෙසියපණහක් දිග ඇති
උතුරු පැත්තෙහි ඉශ්‍රායෙල් ගෝත්‍රවල නාම
ප්‍රකාරයට නම් ඇති ව, නුවර දොරටු තුනක් උතුරට
වන්නේ ය. 31 රූබෙන්ගේ දොරටුව එකක් ය; ජුදාගේ
දොරටුව එකක් ය; ලෙවීගේ දොරටුව එකක් ය.
32 මීටර් දෙදොස් දෙසියපණහක් දිග ඇති නැගෙනහිර
පැත්තෙහි දොරටු තුනක් වන්නේ ය. ජෝසෙප්ගේ
දොරටුව එකක් ය; බෙන්ජමින්ගේ දොරටුව එකක්
ය; දාන්ගේ දොරටුව එකක් ය. 33 මීටර් දෙදොස්
දෙසියපණහක් දිග ඇති දකුණු පැත්තෙහි දොරටු
තුනක් වන්නේ ය. සිමියොන්ගේ දොරටුව එකක් ය;
ඉස්සාකර්ගේ දොරටුව එකක් ය; සාබුලොන්ගේ
දොරටුව එකක් ය. 34 මීටර් දෙදොස් දෙසියපණහක්
දිග ඇති බස්නාහිර පැත්තෙහි දොරටු තුනක්
වන්නේ ය. ගාද්ගේ දොරටුව එකක් ය; ආෂෙර්ගේ
දොරටුව එකක් ය; නප්තලීගේ දොරටුව එකක් ය.
35 වට ප්‍රමාණය මීටර් දහසක් වේ. ඒ දවසේ
පටන් නුවර නාමය ‘සමිඳාණන් වහන්සේ එහි ය’
යන අරුත ඇති ජෙහෝවා-ෂාමා වන්නේ ය.”

io1 පරිච්ඡේද 1-6 දානියෙල් සහ ඔහුගේ මිත්‍රයෝ.
io1 පරිච්ඡේද 7-11 දානියෙල්ගේ දර්ශන.
io1 (අ) පරිච්ඡේද 7 මෘගයන් සතරදෙනා.
io1 (ආ) පරිච්ඡේද 8-9 බැටළුවා සහ එළුවා.
io1 (ඇ) පරිච්ඡේද 10-11 දිව්‍ය පණිවුඩකාරයා.

io1 පරිච්ඡේද 12 අවසාන කාලය.

# දානියෙල්

### හැඳින්වීම

විදේශික රජ කෙනෙකුගේ කාලයේ දී, ජුදෙව් සෙනඟ අනේක විධ දුක් ගැහැට හා තාඩන පීඩනවලට භාජනය වී සිටි අවධියක දානියෙල් නම් පොත ලියන ලදී. දෙවියන් වහන්සේ මේ දුෂ්ට රජ යටපත් කොට දේව සෙනඟට ස්වාධීනත්වය හිමි කර දෙනු ඇතැ යි යන බලාපොරොත්තුවෙන් කථාන්තර හා දර්ශන මාර්ගයෙන් මේ පොතේ ලේඛකයා සෙනඟ දිරිගන්වයි.
පොතේ කොටස් දෙකක් ඇත.
1. දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ල හා කීකරුකම කරණකොටගෙන සතුරන් පරදා ජයගත් දානියෙල් හා ඔහුගේ සහකාර විප්‍රවාසගත අය පිළිබඳ කථාන්තර.
2. දානියෙල් දුටු දර්ශන. බබිලෝනියෙන් පටන්ගෙන අනුක්‍රමයෙන් නැඟී වැටී යන අධිරාජ්‍යයන් ගැනත්, දුෂ්ට රජුගේ විනාශයත් දේව සෙනඟගේ ජයත් සංකේතාත්මක ව ඒ දර්ශනවලින් දැක්වේ.
මෙහි අඩංගු කරුණු:
පරිච්ඡේද 1-6 දානියෙල් සහ ඔහුගේ මිත්‍රයෝ.
පරිච්ඡේද 7-11 දානියෙල්ගේ දර්ශන.
(අ) පරිච්ඡේද 7 මෘගයන් සතරදෙනා.
(ආ) පරිච්ඡේද 8-9 බැටළුවා සහ එළුවා.
(ඇ) පරිච්ඡේද 10-11 දිව්‍ය පණිවුඩකාරයා.
පරිච්ඡේද 12 අවසාන කාලය.

### ජුදෙව්වරුන් බබිලෝනියේ විසීම

1 2 රාජා 24:1; 2 වංශා 36:5-7 ජුදාහි රජ වූ
ජෙහෝයාකිම්ගේ රාජ්‍ය කාලයෙහි තුන් වන
අවුරුද්දේ දී බබිලෝනියේ රජ වූ නෙබුකද්නෙශර් රජ
ජෙරුසලම ආක්‍රමණය කොට එය වටලාගත්තේ ය.
2 2 රාජා 20:17-18; 24:10-16; 2 වංශා 36:10; යෙසා
39:7-8සමිඳාණන් වහන්සේ ඔහුගේ අතට ජුදාවේ
රජ වූ ජෙහෝයාකිම් පාවා දුන් සේක; ඔහු සමඟ
දෙවියන් වහන්සේගේ මාලිගාවේ බඩු බාහිරාදිය
සමහරක් ද පාවා දුන් සේක. නෙබුකද්නෙශර් ඒ බඩු
බාහිරාදිය ශීනාර් දේශයේ තමාගේ ම දෙවියන්ගේ
දේවාලයට ගෙන ගොස් දේවාල භාණ්ඩාගාරයේ
ඒවා තැන්පත් කළේ ය.
3 රජතුමා අශ්පෙනස් නම් තමාගේ ප්‍රධාන
නපුංසකයා අමතා, ඉශ්‍රායෙල් සෙනඟ අතරෙන් රාජ
වංශයට හා රදළ පෙළපතට අයත් තරුණයන් ස්වල්ප
දෙනෙකු ගෙනෙන්නට ඔහුට නියම කළේ ය.
4 ඔවුන් ශරීරාබාධ නැති, ශෝභා සම්පන්න,
සිප්සතරෙහි සමත්, බොහෝ ඇසූ පිරූ තැන් ඇති,
විචක්ෂණ, රාජ මාලිගාවේ සේවා කරන්නට
සුදුසුකම් ඇති, අය විය යුතු යයි ද ඔවුන් ගෙනා පසු,
කල්දිවරුන්ගේ භාෂාවත් සාහිත්‍යයත් ඔවුන්ට
ඉගැන්විය යුතු යයි ද රජතුමා අශ්පෙනස්ට නියම
කළේ ය. 5 රජ තෙමේ තමා වළඳන භෝජනවලින්
ද තමා පානය කරන මිදියුසින් ද කොටසක් දවස්
පතා ඔවුන්ට දෙන්නටත් නියම කළේ ය. ඔවුන්
තුන් අවුරුද්දක් පුහුණුව ලැබූ පසු රාජ සේවයට
ඇතුළත් කළ යුතු ව තිබිණි.

### තරුණයන් සිව් දෙන රජ බොජුන් ප්‍රතික්ෂේප කිරීම

6 තෝරාගනු ලැබූ අය දානියෙල් ද හනනියා ද
මීෂායෙල් ද අසරියා ද යන නම් ඇති ජුදා ජාතික
තරුණයෝ වූ හ. 7 එහෙත්, ප්‍රධාන නපුංසකයා
ඔවුන්ට වෙනත් නම් දුන්නේ ය; දානියෙල්ට
බෙල්ටෙෂෙසර් කියා ද හනනියාට ෂද්රක් කියා ද
මීෂායෙල්ට මේෂක් කියා ද අසරියාට අබෙද්නෙගෝ
කියා ද නම් තැබුවේ ය.
8 දානියෙල් තෙමේ රජුගේ භෝජනයෙන් වත්, ඔහු
බොන මිදියුසෙන් වත් තමා අපවිත්‍ර නොවී සිටින
පිණිස අධිෂ්ඨාන කරගෙන, එසේ අපවිත්‍ර නොවී
සිටීමට ප්‍රධාන නපුංසකයාගෙන් අවසර අයැද
සිටියේ ය. 9 දෙවියන් වහන්සේ දානියෙල්ට ප්‍රධාන
නපුංසකයාගෙන් කරුණාවත්, අනුකම්පාවත්
ලැබෙන්නට සැලැස්සූ සේක. 10 ප්‍රධාන නපුංසකයා
දානියෙල්ට මෙසේ කී ය: “ඔබේ කෑම ද බීම ද
නියම කළ මාගේ ස්වාමීන් වන රජ්ජුරුවන්ට මම බිය
වෙමි. යම් හෙයකින් ඔබේ වයසේ තරුණයන්ට වඩා

ඔබේ මුහුණ මැලවී ඇති බව එතුමාට පෙනී
ගියොත්, මාගේ හිස ගසාදැමීමෙන් මා අනතුරට
භාජනය විය හැකි ය.”
11 එවිට දානියෙල් තමා ද හනනියා ද මීෂායෙල් ද
අසරියා ද භාර ව සිටීමට ප්‍රධාන නපුංසකයා පත්
කළ භාරකාරයාට කතා කොට, 12 “ඔබේ
මෙහෙකරුවන් වන අපට කෑමට එළවළු ද බීමට
වතුර ද දී දස දිනක් ඇතුළත දී කුමක් වන්නේ දැ යි
සෝදිසි කර බලන්න; 13 ඉන්පසු අපේ පෙනීම ද
රජතුමාගේ භෝජන අනුභව කරන තරුණයන්ගේ
පෙනීම ද සසඳා බලා, ඔබට පෙනී යන හැටියට
ඔබේ මෙහෙකරුවන්ට සුදුස්සක් කළ මැනවැ”යි කී
ය.
14 ඔහු ඒ යෝජනාවට එකඟ වී දස දිනක් තුළ
ඔවුන් සෝදිසි කර බැලුවේ ය. 15 දස දිනකට පසු ඒ
සතරදෙනා රජතුමා නියම කළ භෝජන අනුභව කළ
තරුණයන්ට වඩා හොඳ පෙනීමෙන් හා සනීප
ශක්තියෙන් සිටින බව පෙනී ගියේ ය. 16 එබැවින්
භාරකාරයා ඉන්පසු, ඔවුන්ට කන්න නියම ව තිබූ
ආහාර ද බොන්න නියම ව තිබූ මිදියුස ද නතර කර
එළවළු පමණක් ඔවුන්ට දුන්නේ ය.

## සතරදෙනා රජ්ජුරුවන් වෙත ඉදිරිපත් කිරීම

17 ඒ තරුණයන් සතරදෙනාට දෙවියන් වහන්සේ
සාහිත්‍ය විෂයය හා ශිල්ප ශාස්ත්‍රය පිළිබඳ මනා
දැනුමක් හා අවබෝධයක් දුන් සේක. සියලු ආකාර
දර්ශන හා ස්වප්න තේරුම් කර දීමේ වරම ද
දානියෙල්ට තිබිණි.
18 තරුණයන් පුහුණු කිරීමට නියම ව තිබූ කාලය
හමාර වූ විට, ඔව්හු සියලු දෙනා ප්‍රධාන නපුංසකයා
විසින් නෙබුකද්නෙසර් රජු ඉදිරියට ගෙනෙන ලදී.
19 රජතුමා ඔවුන් සමඟ කතා කළේ ය. ඔවුන්
සියලු දෙනා අතුරෙන් දානියෙල්ටත්, හනනියාටත්,
මීෂායෙල්ටත්, අසරියාටත් සමාන කළ හැකි අන්
කිසිවෙක් නොවූ හ. 20 එබැවින් ඔව්හු රාජ සේවයට
ඇතුළත් කරන ලද හ. තේරුම් පැහැදුම් ඇති ව
විමසිය යුතු යම් යම් කරුණු සම්බන්ධයෙන් රජතුමා
ඔවුන්ගෙන් විමසූ විට, මුළු රාජ්‍යයේ සිටි සියලු
මන්ත්‍රකාරයන්ටත්, අනවිනකාරයන්ටත් වඩා දස
ගුණයකින් ඔවුන් සමත් බව එතුමාට පෙනී ගියේ ය.
21 දානියෙල්, සයිරස් රජුගේ පළමු වන අවුරුද්ද
දක්වා එහි සිටියේ ය.

## නෙබුකද්නෙසර් රජ දුටු ස්වප්නය

2 නෙබුකද්නෙසර් රජකම් කරන දෙ වන
අවුරුද්දේ දී ඔහු ස්වප්න දුටුවේ ය. එයින්
ඔහුගේ සිත බොහෝ සේ කැළඹුණේ ය; නිදාගන්න
වත් ඔහුට නොහැකි විය. 2 එවිට රජු දුටු ස්වප්නය
ඔහුට දන්වන පිණිස මන්ත්‍රකාරයන් ද
අනවිනකාරයන් ද මායාකාරයන් ද කල්දිවරුන් ද
කැඳවන්න රජතුමා අණ කළේ ය. 3 ඔව්හු අවුත්
රජතුමා ඉදිරියේ පෙනී සිටියෝ ය. රජතුමා ඔවුන්
අමතා, “මම ස්වප්නයක් දිටිමි. ඒ ස්වප්නය කුමක් දැ
යි දැනගැනීමට මාගේ සිත කැළඹී ඇතැ”යි ඔවුන්ට
කී ය.
4 එවිට කල්දිවරු අරමීය භාෂාවෙන් කතා කරමින්,
“රජතුමනි, චිරාත් කාලයක් වැජඹෙත්වා! ඔබේ
මෙහෙකරුවන් වන අපට ඔබ දුටු ස්වප්නය කුමක් දැ
යි කිව මැනව, එවිට එහි තේරුම අපි පහදා
දෙන්නෙමු”යි කී හ.
5 රජ තෙමේ ඔවුන්ට පිළිතුරු දෙමින්, “මාගේ
අධිෂ්ඨානය මෙය වේ. ස්වප්නයත්, එහි තේරුමත්
දෙක ම ඔබ මට දැන්විය යුතු යි; නොදැන්නුවොත්
ඔබ කැබලි කොටදමා ඔබේ ගෙවල් කසළ
ගොඩවල් කරන්නෙමි. 6 එහෙත්, ස්වප්නය ද එහි
තේරුම ද ඔබ මට පෙන්වා දුන්නොත්, ඔබට
තෑගිබෝග ද ගරු-නම්බු ද ලැබෙනු ඇත. ඒ නිසා
ස්වප්නය ද එහි තේරුම ද මට පෙන්වන්නැ”යි කී ය.
7 ඔව්හු දෙ වන වර උත්තර දෙමින්, “රජතුමා
තමාගේ මෙහෙකරුවන්ට ස්වප්නය කුමක් දැ යි
කියාවා; එවිට අපි එහි තේරුම දන්වන්නෙමු”යි කී
හ.
8 රජතුමා පිළිතුරු දෙමින්, “මාගේ අධිෂ්ඨානය
ඔබට ප්‍රකාශ කර තිබෙන බැවින්, ඔබ කල් ගන්න
හදන බව මට හොඳට ම පැහැදිලි යි. 9 ඔබ මා දුටු
ස්වප්නය කුමක් දැ යි නොකීවොත්, ඔබට ඇත්තේ
එක ම එක ඉරණම යයි නැවත මතක් කරමි. ඔබ
මට අමූලික බොරු කියා මෙය කල් දමන්න එකඟ වී
ඇති බව මට පෙනේ. එබැවින් ස්වප්නය කුමක් දැ යි
මට කියන්න. එවිට එහි තේරුම පහදා දෙන්න ඔබට
පුළුවන් දැ යි මට දැනගත හැකි ය”යි කී ය.
10 ඔව්හු පිළිතුරු දෙමින්, “රජුගේ ප්‍රශ්නය
නිරාකරණය කිරීමට හැකි සමතෙක් මේ මුළු
පොළෝ තලයෙහි ඇත්තේ නැත. ඇරත්, කිසි ම
රජෙක් හෝ අධිපතියෙක් හෝ ආණ්ඩුකාරයෙක් හෝ
මෙවැනි ඉල්ලීමක් මන්ත්‍රකාරයෙකුගෙන් වත්
අනවිනකාරයෙකුගෙන් වත්, දෛවඥයෙකුගෙන් වත්
කර නැත. 11 රජතුමා අපෙන් ඉල්ලන්නේ නොකළ
හැකි දෙයෙකි. මිනිස් ලොවින් එපිට සිටින දෙවිවරුන්ට
මිස අන් කිසිවෙකුට රජතුමාට එය පෙන්වා දිය
නොහැකි ය”යි කී හ.
12 එවිට රජතුමා අතිශයෙන් කෝපාවිෂ්ඨ වී
බබිලෝනියේ සියලු ශාස්ත්‍රවන්තයන් මරාදමන්න
නියම කළේ ය. 13 ශාස්ත්‍රවන්තයන් මරන ලෙස
නියෝගයක් ද නිකුත් කරන ලදී. ඒ නියමයේ පරිදි
ඔව්හු දානියෙල් සහ ඔහුගේ සහායකයන් ද
මරන්නට සෙව්වෝ ය.

## දානියෙල් රජ්ජුරුවන් ඉදිරියේ සිටීම

14 බබිලෝනියේ ශාස්ත්‍රවන්තයන් මරන පිණිස
පිටත් ව ගිය අරියොක් නම් රජුගේ වධකයාගේ
ප්‍රධානියාට දානියෙල් ස්ථානෝචිත සිහි නුවණින්
කතා කර, 15 “මෙතරම් තද නියෝගයක් රජතුමා
පනවා ඇත්තේ මන්දැ”යි ඇසී ය. අරියොක් ඒ
කාරණය දානියෙල්ට විස්තර කර දුන්නේ ය.

16 එවිට දානියලේ රජු වෙත ගොස්, ස්වප්නයේ
තේරුම පහදා දෙන පිණිස තමාට කල් දෙන හැටියට
ඉල්ලුවේ ය. 17 එකල දානියලේ ගෙදර ගොස්
තමාගේ සහායකයන් වන හනනියාටත්,
මීෂායලේටත්, අසරියාටත් කරුණු සැළ කොට,
18 ඔවුන් බබිලෝනියේ ශාස්ත්‍රවන්තයින් සමග
විනාශ නොවන පිණිස, ස්වර්ගයේ දෙවියන්
වහන්සේ ඔවුන්ට අනුකම්පා කොට, ඒ අබිරහස
දන්වන ලෙස අයැදින්නට කීවේ ය. 19 එදා රාත්‍රියේ
දර්ශනයකින් ඒ අබිරහස දානියලේට එළිදරව් විය.
දානියලේ ස්වර්ගයේ දෙවියන් වහන්සේට ප්‍රශංසා
කරමින් 20 මෙසේ කීවේ ය:
20 “දෙවිඳුන්ගේ නාමයට සදාකාලයෙන් සදාකාලයට
ප්‍රශංසා වේ වා!
q2 20 මන්ද, ප්‍රඥාවත්, බලයත් එතුමන් සතු ය.
21 කාලයන් ද අවස්ථාවන් ද වෙනස් කරන්නේත්,
රජවරුන් පහ කරන්නේත්, පත් කරන්නේත්,
පැණවතුන්ට දැනුම හා නැණවතුන්ට නුවණ
දෙන්නේත් එතුමාණෝ ය.
22 ගැඹුරු වූ අබිරහස් වූ දේ එළි කරන්නේත්,
අඳුරේ ඇති දේ දන්නේත් එතුමාණෝ ය.
q2 22 ආලෝකය උන් වහන්සේ සිසාරා ඇත.
23 මාගේ පියවරුන්ගේ දෙවිඳුනි, මා හට ඥාන
ශක්තිය දුන් බැවින් ද අපේ යැදුමට සවන් දී රජුගේ
පැනය ඔබ අපට පහදා දුන් බැවින් ද ඔබට මම තුති
පැසසුම් කරමි.”
24 එවිට දානියලේ බබිලෝනියේ ශාස්ත්‍රවන්තයන්
නැසීමට රජතුමා පත් කළ අරියොක් වෙත ගොස්,
“බබිලෝනියේ ශාස්ත්‍රවන්තයන් විනාශ
නොකරන්න; රජ්ජුරුවන් ඉදිරියට මා පමුණුවන්න;
ස්වප්නයේ තේරුම මම රජතුමාට පෙන්වන්නෙමි”යි
කී ය.
25 එකල අරියොක් තමෙමේ රජු ඉදිරියට දානියලේ
හනික කැඳවාගෙන ගොස්, “ජුදා රටෙන් අල්ලාගෙන
ආ අය අතරෙහි, රජතුමාගේ සිහිනයේ තේරුම
කියන්න පුළුවන් කෙනෙකු මට සම්බ වී ය”යි කී ය.

## දෙවියන් වහන්සේ දානියලේට ස්වප්නය හෙළි කිරීම

26 රජතුමා බෙල්තෙෂසර් නම් දානියලේ අමතා,
“මා දුටු ස්වප්නයත්, එහි තේරුමත් මට කියා දෙන්න
ඔබට පුළුවන් දැ”යි ඇසී ය.
27 දානියලේ රජුට පිළිතුරු දෙමින් මෙසේ කී ය:
“රජතුමා විමසා ඇති අබිරහස පහදාදීමට
ශාස්ත්‍රවන්තයන්ටත්, අනාවැනකාරයන්ට වත්,
මන්ත්‍රකාරයන්ට වත්, පේන කියන්නන්ට වත්
නොහැකි ය. 28 එහෙත්, රහස් එළිදරව් කරන දෙවි
කෙනෙක් ස්වර්ගයෙහි සිටින සේක. උන් වහන්සේ
අනාගතයේ දී සිදු වන්න යන දේ නබුකද්නෙසර්
රජුට හෙළි කර තිබේ. ඔබ යහනෙහි සැතපී සිටින
විට ඔබේ හිසට නැඟුණු ස්වප්නය හා දර්ශනය
මෙසේ ය:
29 “රජතුමනි, ඔබ යහනෙහි සැතපී සිටින විට
ඔබට ඇති වූයේ, අනාගතයේ දී සිදු වන්න යන දේ
පිළිබඳ සිතුවිලි ය. රහස් එළිදරව් කරන තැනැන්
වහන්සේ සිදු වන්න යන දේ ඔබට දන්වා තිබේ.
30 මේ අබිරහස මටත් එළිදරව් වී ඇත්තේ ජීවත් වී
සිටින සියල්ලන්ට වඩා මට ප්‍රඥාව තිබෙන නිසා
නොව, ඔබේ ස්වප්නයේ තේරුම ඔබට දන්වන
පිණිසත්, ඔබේ සිතේ ඇති සිතිවිලි ඔබ
තේරුම්ගන්න පිණිසත් ය.”
31 “රජතුමනි, ඔබ අතිවිශාල රූපයක් දුටුවෙහි ය.
ඒ විශාල දීප්තිමත් රූපය ඔබ ඉදිරියෙහි තිබුණේ ය.
එහි පෙනීම භයංකාර ය. 32 ඒ රූපයේ හිස දඹ
රනින් ද ළය සහ අත් රිදීයෙන් ද බඩ සහ කලවා
ලෝකඩවලින් ද 33 කෙණ්ඩා යකඩෙන් ද පාදවල
කොටසක් යකඩෙන් ද කොටසක් මැටියෙන් ද කරන
ලදී. 34 ඔබ බලා සිටිය දී මිනිස් අතින් නොකපන
ලද ගලක් කන්දෙන් ගැලවී අවුත් රූපයේ යකඩ සහ
මැටි පාදවල වැදී ඒවා පොඩි කරදැමී ය. 35 එවිට
යකඩ ද මැටි ද ලෝකඩ ද රිදී ද රත්රන් ද එකට
පොඩි වී ගිම්හාන කාලයේ කමතේ බොල් මෙන්
සුළඟට ගසාගෙන ගියේ ය. ඒවායේ ශේෂමාත්‍රයක්
වත් ඉතුරු නොවී ය. රූපයට වැදුණු ගල විශාල
පර්වතයක් විය. එයින් පොළොව පිරී ගියේ ය.
36 “එය ය, ඔබ දුටු ස්වප්න ය. දැන් එහි තේරුම
රජ්ජුරුවන්ට මම කියා දෙන්නෙමි. 37 රජවරුන්ගේ
රජ වූ රජතුමනි, ස්වර්ගයේ දෙවියන් වහන්සේ
ඔබට රාජ්‍යය ද බලය ද පරාක්‍රමය ද තේජස ද දී
තිබේ. 38 සෑම තැන ම වසන මිනිසුන් ද මෘගයන් ද
ආකාශ පක්ෂීන් ද ඔබ අතට භාර දී ඔව්හු සියල්ලෝ
ඔබේ පාලනයට යටත් කරන ලද හ. රත්රන් හිස
නම් ඔබ ය. 39 ඔබට පසු ඔබේ රාජ්‍යයට වඩා
පහත් රාජ්‍යයක් ද ඉන්පසු ලෝකඩවලින් අදහස්
කෙරෙන, ලොවපුරා පාලනය පැතිර පවත්නා තුන්
වන රාජ්‍යයක් ද නැඟී එන්නේ ය. 40 යකඩ මෙන්
සවි ශක්තිය ඇති රාජ්‍යයක් සතර වන වර ඇති
වන්නේ ය. යකඩ සියල්ල කඩා බිඳ සුණු විසුණු
කරන්නාක් මෙන් ඒ රාජ්‍යය අන් සියල්ල කඩා බිඳ
සුණු විසුණු කරන්නේ ය. 41 ඔබ දුටු පාද හා පා
ඇඟිලිවලින් දැක්වෙන්නේ, කොටසක්
කුම්භකාරයාගේ මැටියෙන් ද කොටසක් යකඩෙන් ද
යුක්ත ව ඒ රාජ්‍යය බෙදී යන බව ය. එහෙත්, යකඩ
මැටි හා මිශ්‍ර ව තිබෙනු ඔබ දුටු පරිදි ඒ රාජ්‍යයේ
අයෝමය ශක්තියත් තරමක් දුරට පවතින්නේ ය.
42 පා ඇඟිලිවලින් කොටසක් යකඩෙන් ද කොටසක්
මැටියෙන් ද තිබුණාක් මෙන් ඒ රාජ්‍යයෙන් කොටසක්
ශක්තිමත් වන්නේ ය; කොටසක් බිඳෙනසුලු වන්නේ
ය. 43 යකඩ මැටි මිශ්‍ර ව තිබෙනු ඔබ දුටු ලෙස
මනුෂ්‍යයෝ විවාහයෙන් මිශ්‍ර වන්නෝ ය. එහෙත්,
යකඩ හා මැටි මිශ්‍ර නොවන සේ ඔව්හු එකට බැඳී
නොසිටිති. 44 ඒ රජවරුන්ගේ කාලවල දී ස්වර්ගයේ
දෙවියන් වහන්සේ කිසි කලෙක නැති නොවන
රාජ්‍යයක් පිහිටුවන සේක. ඒ රාජ්‍යය අන් ජාතියකට
යටත් නොවන්නේ ය. එය සියලු රාජ්‍යයන් සුණු
විසුණු කරදමනු ඇත. එය ද සදාකාලයට ම

පවතින්නේ ය. 45 අතින් නොකැපූ ගලක් කන්දෙන්
ගැලවී අවුත් යකඩ ද ලෝකඩ ද මැටි ද රිදී ද
රත්රන් ද පොඩි කරදමනු ඔබ දුටු ලෙස, එය ඒ
සියලු රාජ්‍යයන් පොඩි කර නැති කරන්නේ ය. ඔබ
දුටු දර්ශනයේ තේරුම එය වේ. මහෝත්තම
දෙවියන් වහන්සේ මතු සිද්ධ වන්නට යන දේ රජුට
දන්වා තිබේ. ස්වප්නය සැබෑ ය. එහි තේරුම
නොඅනුමාන ය.”

## රජ දානියෙල්ට ත්‍යාග දීම

46 එකල නෙබුකද්නෙශර් මුණින් වැටී, දානියෙල්ට
වැඳ, ඔහුට පූජාවක් ඔප්පු කරන්නට ද සුවඳ දුම්
අල්ලන්නට ද අණ කෙළේ ය. 47 රජතුමා දානියෙල්ට
කතා කොට, “නුඹට රහස එළිදරව් කිරීමට හැකි
වූයේ, සැබැවින් ම ඔබේ දෙවියන් වහන්සේ
දේවාතිදේව රාජාතිරාජ වූ අබිරහස් එළිදරව් කරන
දෙවියන් වහන්සේ වන බැවිනි”යි කී ය. 48 රජ
තෙමේ දානියෙල් උසස් නිලයකට පත්කොට,
අනේක විධ අගනා තෑගිබෝග ඔහුට දී, මුළු
බබිලෝනි පළාතේ ආණ්ඩුකාරයා ද බබිලෝනියේ
ශාස්ත්‍රවන්තයන් කෙරෙහි ප්‍රධාන අධිපතියා ද
වශයෙන් පත් කෙළේ ය. 49 දානියෙල්ගේ ඉල්ලීම
පිට රජතුමා ෂද්‍රක් ද මේෂක් ද අබෙද්නෙගෝ ද
බබිලෝනියේ පළාත් පරිපාලන කටයුතු සඳහා පත්
කෙළේ ය. දානියෙල් තෙමේ රජ වාසලේ ම විසී ය.

## රන් රූපය

3 නෙබුකද්නෙශර් රජ මීටර් විසිහතක් උස මීටර්
තුනක් පළල රන් රූපයක් සාදවා, බබිලෝනි
පළාතේ දූරා නම් සමභූමියේ එය පිහිටෙව්වේ ය.
2 තමා පිහිටෙවූ ඒ රූපය කැප කරන පිණිස,
දිශාධිපතීන්ට ද අධිපතීන්ට ද ආණ්ඩුකාරයන්ට ද
විනිශ්චයකාරයන්ට ද භාණ්ඩාගාරිකයන්ට ද
මන්ත්‍රීවරුන්ට ද නීතිඥයන්ට ද පළාත්වල සියලු
මුලාදෑනීන්ට ද රැස් වන ලෙස රජතුමා නියෝග
කෙළේ ය. 3 ඔවුන් සියලු දෙනා පැමිණ රන් රූපය
ඉදිරියෙහි සිටියෝ ය. 4 එවිට, රාජ ප්‍රකාශකයා මහ
හඬින්, “විවිධ භාෂා කතා කරන, සියලු ජාතීන්ගෙන්
යුත් ජනයෙනි, මේ රාජාඥාවට සවන් දෙන්න.
5 හොරණෑවේ ද නළාවේ ද වීණාවේ ද මහා
වීණාවේ ද කුඩා වීණාවේ ද මිහිරි නළාවේ ද සියලු
තූර්ය භාණ්ඩවල ද ශබ්දය ඔබට ඇසෙන විට, දණින්
වැටී නෙබුකද්නෙශර් රජතුමා පිහිටුවා තිබෙන රන්
රූපයට නමස්කාර කරන්න රජතුමා අණ කොට ඇත.
6 බිම වැටී නමස්කාර නොකරන කවුරු නමුත්,
එවේලෙහි ම ඇවිලෙන ගිනි උදුනක් මැදට හෙළෙනු
ලබන්නේ ය”යි කීවේ ය. 7 ඒ අණ පරිදි,
හොරණෑවේ ද නළාවේ ද වීණාවේ ද මහා
වීණාවේ ද කුඩා වීණාවේ ද මිහිරි නළාවේ ද සියලු
ආකාර තූර්ය භාණ්ඩවල ද ශබ්දය ඇසුණු වහා ම,
විවිධ භාෂා කතා කරන, සියලු ජාතීන්ගෙන් යුත්
ජනයා බිම වැටී නෙබුකද්නෙශර් රජු පිහිටෙවූ රන්
රූපයට නමස්කාර කළහ.

## නමස්කාර නොකළ ජුදෙව්වරුන් තිදෙනා

8 ඒ අවස්ථාවේ දී කල්දිවරු සමහර දෙනෙක්
ඉදිරිපත් වී ජුදෙව්වරුන්ට විරුද්ධ ව චෝදනාවක්
කළහ. 9 ඔව්හු නෙබුකද්නෙශර් රජුට මෙසේ කී හ:
10 “රජතුමනි, චිරාත් කාලයක් වැජඹෙත්වා!
හොරණෑවේ ද නළාවේ ද වීණාවේ ද මහා
වීණාවේ ද කුඩා වීණාවේ ද මිහිරි නළාවේ ද සියලු
ආකාර තූර්ය භාණ්ඩවල ද ශබ්දය ඇසෙන සියල්ලන්
බිම වැටී රන් රූපයට නමස්කාර කළ යුතු ය කියා ද
11 එසේ බිම වැටී නමස්කාර නොකරන කවරකු
නමුත්, ඇවිලෙන ගිනි උදුනක් මැදට හෙළිය යුතු ය
කියා ද ඔබතුමා ආඥාවක් පණවා ඇත. 12 එහෙත්,
බබිලෝනි පළාත පාලනය කිරීමට ඔබ පත් කළ
ජුදෙව්වරුන් වන ෂද්‍රක්, මේෂක්, අබෙද්නෙගෝ යන
තිදෙනා ඔබේ අණට කීකරු නොවෙති. ඔවුන් ඔබේ
දෙවිවරුන්ට වැඳුම්පිදුම් කරන්නේ වත්, ඔබ පිහිටුවා
තිබෙන රන් රූපයට නමස්කාර කරන්නේ වත් නැත.”
13 ඒ ඇසූ නෙබුකද්නෙශර් රජ ක්‍රෝධයෙන්
දැවමින්, ෂද්‍රක්, මේෂක් හා අබෙද්නෙගෝ ගෙන
එන්න අණ කෙළේ ය. එවිට ඔව්හු ඒ තිදෙනා රජු
ඉදිරියට ගෙනාහ. 14 නෙබුකද්නෙශර් ඔවුන් අමතා
මෙසේ කී ය: “ෂද්‍රක්, මේෂක්, අබෙද්නෙගෝ, ඔබ
මාගේ දෙවිවරුන්ට වැඳුම්පිදුම් කරන්නේ වත්, මා
පිහිටුවා තිබෙන රන් රූපයට නමස්කාර කරන්නේ
වත් නැතැ යි කියන්නේ ඇත්ත ද? 15 හොරණෑවේ ද
නළාවේ ද වීණාවේ ද මහා වීණාවේ ද කුඩා
වීණාවේ ද මිහිරි නළාවේ ද සියලු ආකාර තූර්ය
භාණ්ඩවල ද ශබ්දය ඇසෙන විට බිම වැටී මා සාදා
තිබෙන රූපයට නමස්කාර කරන්නට ඔබ සූදානම් ද?
එසේ නම් යහපති; නැත්නම්, රන් රූපයට ඔබ
නමස්කාර නොකළොත්, එකෙණෙහි ම ඇවිලෙන
ගිනි උදුනක් මැදට ඔබ හෙළෙනු ලබනු ඇත. එවිට
මාගේ අත්වලින් ඔබ ගළවන දෙවියෝ කවුරු ද කියා
බලමු.”
16 ෂද්‍රක්, මේෂක් හා අබෙද්නෙගෝ රජතුමාට
පිළිතුරු දෙමින් මෙසේ කී හ: “රජතුමනි, ඔබේ
ප්‍රශ්නයට පිළිතුරු දීමට අපට වුවමනා නැත.
17 රජතුමනි, ඇවිලෙන ගිනි උදුනෙන් අප
ගළවාගන්නට පුළුවන් දෙවි කෙනෙක් සිටිත් නම්, ඒ
අප වැඳුම්පිදුම් කරන දෙවියන් වහන්සේ ම ය.
ඔබේ අතින් උන් වහන්සේ අප ගළවන සේක.
18 රජතුමනි, උන් වහන්සේ එසේ නොකළත්, අප
ඔබේ දෙවිවරුන්ට වැඳුම්පිදුම් කරන්නේ වත්, ඔබ
පිහිටුවා ඇති රන් රූපයට නමස්කාර කරන්නේ වත්
නැති බව ඔබට දන්වන්නට කැමැත්තෙමු.”

## ගිනි උදුනෙන් ගළවාගනු ලැබීම

19 ඒ ඇසූ නෙබුකද්නෙශර් අතිශයෙන් කෝපාවිෂ්ට
විය. ෂද්‍රක්, මේෂක් හා අබෙද්නෙගෝ දෙස ඔහුගේ
මුහුණේ බැල්ම වෙනස් වී ගිනි උදුන සාමාන්‍ය
ප්‍රමාණයට වඩා සත් ගුණයක් රත් කරන්නට නියම
කෙළේ ය. 20 ෂද්‍රක්, මේෂක් හා අබෙද්නෙගෝ

බැඳ, ඇවිලෙන ගිනි උදුනට හෙළන්නට ඔහු තමාගේ
සේනාවේ ශක්ති සම්පන්න අයට අණ කළේ ය.
21 ඔව්හු ඒ තිදෙනා ඔවුන් ඇඳ සිටි සළුව, කබාය,
හිස වැස්ම යනාදී සියලු ඇඳුම් පිටින් ම බැඳ
ඇවිලෙන ගිනි උදුන මැදට හෙළූ හ.
22 රජ්ජුරුවන්ගේ නියමය වහා ඉටු කළ යුතු ව
තිබුණු බැවින් ද ගිනි උදුන ඉතා රත් ව තිබුණු
බැවින් ද ෂද්රක්, මේෂක්, අබෙද්නගෝ ගෙන ගිය
අය පිටතට විහිදී ආ ගිනි දලුවලින් දැවී මළෝ ය.
23 ෂද්රක්, මේෂක් හා අබෙද්නගෝ යන තිදෙනා
බැමි පිටින් ම ගිනි උදුන මැදට වැටුණෝ ය.
24 නබුකද්නෙසර් රජ පුදුමයට පත් වී, වහා
නැඟිට මන්ත්රීවරුන් අමතා, “අප බැඳ ගින්නට
හෙළුවේ මිනිස්සු තුන්දෙනෙක් නොවෙත් දැ”යි ඇසී
ය. “එසේ ය, රජතුමනි” කියා ඔව්හු පිළිතුරු දුන්හ.
25 එවිට රජතුමා, “අන්න, මිනිසුන් සතරදෙනෙකු
සිටිනු මට පෙනේ, කිසි පීඩාවක් නැති ව ඔව්හු
ගින්න මැද ඇවිදිති. සතරවැනියා පෙනුමෙන් දේව
පුත්රයකු වැනි ය”යි කී ය.
26 එසේ කියා ඔහු ඇවිලෙන ගිනි උදුනේ
දොරකඩට ළං වී, “මහෝත්තම දෙවියන්
වහන්සේගේ සේවකයන් වන ෂද්රක්, මේෂක් හා
අබෙද්නගෝ පිටතට එන්න, මෙහි එන්නැ”යි කී ය.
එවිට ෂද්රක්, මේෂක් හා අබෙද්නගෝ ගින්න මැද
සිට පිටතට ආහ. 27 දිශාධිපතීහු ද අධිපතියෝ ද
ආණ්ඩුකාරයෝ ද රජුගේ මන්ත්රීවරු ද ඔවුන් වටේ
රැස් ව, ඒ තිදෙනාගේ ශරීරවලට ගින්නෙන් කිසි
පීඩාවක් නුවූ බවත්, ඔවුන්ගේ කෙස්ගසක් වත්,
පිළිස්සී නැති බවත්, ඇඳුම්වලට ගින්න වැදී නැති
බවත්, ඔවුන්ගේ ඇඟපතේ ගිනි ගඳක් වත් නොවූ
බවත් දුටුවෝ ය.

### නබුකද්නෙසර් රජුගේ දේව ප්රශංසාව

28 එවිට, නබුකද්නෙසර් මෙසේ කීවේ ය:
“ෂද්රක්ගේත්, මේෂක්ගේ හා අබෙද්නගෝගේත්
දෙවියන් වහන්සේට ප්රශංසා වේ වා! මන්ද, උන්
වහන්සේ සිය දූතයා එවා තමන්ගේ මේ
සේවකයන් තිදෙනා ගළවාගත් සේක. ඔව්හු රජුගේ
නියමයට පිටුපා තමන්ගේ දෙවියන් වහන්සේ
කෙරෙහි විශ්වාසය තැබූ හ. තමන්ගේ දෙවියන්
වහන්සේ හැර අන් දෙවියකුට සේවය කරනවාටත්,
නමස්කාර කරනවාටත් වඩා ගින්නට ගොදුරුවන්නට
ඔව්හු සතුටු වූ හ.
29 “එබැවින්, සියලු ජනයෙනි, ෂද්රක්ගේත්,
මේෂක්ගේත්, අබෙද්නගෝගේත් දෙවියන්
වහන්සේට විරුද්ධ ව දොස් කියන යම් කෙනෙකුට
හෝ ජාතියකට හෝ භාෂාවකට හෝ අයත් යමෙක්
වේ නම්, ඔහු කැබලි කොට ඔහුගේ ගේ-දොර
කසළ ගොඩක් කරන හැටියට මම නියමයක් කරමි.
මන්ද, මේ ආකාරයෙන් ගළවාගන්නට පුළුවන් අන්
දෙවි කෙනෙක් නැත.”
30 ඉන්පසු රජතුමා, ෂද්රක්, මේෂක් හා
අබෙද්නගෝ යන තිදෙනා බබිලෝනි පළාතේ
වඩාත් උසස් තනතුරුවලට පත් කළේ ය.

### නබුකද්නෙසර් රජුගේ දෙවන ස්වප්නය

4 නබුකද්නෙසර් රජ මුළු ලොවේ වාසය කරන
සකල ජනයන් හටත්, ජාතීන් හටත්, ඒ ඒ
භාෂාවන් කතා කරන සියල්ලන් හටත් මෙසේ
නිවේදනය කළේ ය: “ඔබට සාමදානය වේ වා!
2 මහෝත්තම දෙවියන් වහන්සේ මා උදෙසා කළ
හාස්කම් ද අරුමපුදුම දේ ද ඔබට දැන්වීම මැනව යි
මට පෙනිණි. 3 උන් වහන්සේ දැක් වූ හාස්කම්
කොපමණ මහත් ද? උන් වහන්සේ කළ අරුමපුදුම
දේ කොපමණ බලවත් ද? උන් වහන්සේගේ
රාජ්යය සදාකාල රාජ්යයක් ය. උන් වහන්සේගේ
පාලනය පරම්පරාවෙන් පරම්පරාවට පවතිනේ ය.
4 “නබුකද්නෙසර් වන මම මාගේ මාලිගාවේ
සැපසම්පත් භුක්ති විඳිමින් සුව සේ සිටියෙමි.
5 එසේ සිටිය දී මා තැති ගැන්වූ ස්වප්නයක්
දුටුවෙමි. මා යහනේ සිටිය දී මට ඇති වූ සිතිවිලි
හා හිසට නැඟුණු දර්ශන මා බිය ගැන්වී ය.
6 ස්වප්නයේ තේරුම මට දන්වන පිණිස
බබිලෝනියේ සියලු ශාස්ත්රවන්තයන් මා ඉදිරියට
පමුණුවන හැටියට මම අණ කළෙමි. 7 එවිට
මන්ත්රකාරයෝ ද අනවිනකාරයෝ ද දෛවඥයෝ ද
පේන කියන්නෝ ද මා වෙත ආවෝ ය. මම ඔවුන්
ඉදිරියේ මා දුටු ස්වප්නය කීවෙමි. එහෙත්, ඔවුන්ට
එහි තේරුම මට කියා දෙන්නට නොහැකි විය.
8 අන්තිමේ දී මාගේ දෙවියන්ගේ නාමය අනුව
‘බෙල්ටෙෂෙසර්’ කියා නම් කරන ලද
දේවාත්මානුභාවය ඇති දානියෙල් මා ඉදිරියට ආවේ
ය. දුටු ස්වප්නය මම ඔහුට කීවෙමි:
9 මන්ත්රකාරයන්ගේ ප්රධානියා වන බෙල්ටෙෂෙසර්,
ඔබට දේවාත්මානුභාවය ඇති බවත් කිසි අබිරහසක්
විසඳීම ඔබට දුෂ්කර කාර්යයක් නොවන බවත් මම
දනිමි. මා දුටු ස්වප්නය මෙය වේ. එහි තේරුම මට
පහදා දෙන්න.
10 “මා යහනේ සිටිය දී මාගේ හිසට නැඟුණු
දර්ශනය මෙය වේ. ඉතා උස ගහක් පොළොව මැද
තිබෙනු මම දිටිමි. 11 ඒ ගස වැවී ශක්තිමත් වී,
කරටිය අහසේ උසට යන තරම් වැඩුණේ ය.
පොළොවේ සතර දිග් භාගයට ඒ ගස පෙනුණේ ය.
12 එහි අතු සහ කොළ ශෝභන ය. පල බහුල ය.
සියල්ලන්ට සෑහෙන පමණ කෑම එහි තිබුණේ ය.
වන මෘගයෝ ගස යට සෙවණ ලැබුවෝ ය. අහසේ
කුරුල්ලෝ අතුවල ලැගුම් ගත්තෝ ය. සියලු
සත්ත්වයන්ට එයින් කෑම ලැබුණේ ය.
13 “මා එසේ දර්ශනය දකිමින් යහනේ සිටිය දී
තවදුරටත් මෙසේ දිටිමි. ස්වර්ගයෙන් ශුද්ධ
මුරකාරයෙක් බැස ආයේ ය. 14 ඔහු මහ හඬින්
මොරගසා මෙසේ කී ය: ‘ගස සිඳ දමන්න, අතු කපා
දමන්න, කොළ සූරා දමන්න, පල විසුරුවා දමන්න,
වන මෘගයන් ගසේ සෙවණ යටින් ද කුරුල්ලන්

අතුවලින් ද පලවා හරින්න. 15 එහෙත්, ගසේ මුලේ
කඳ කෑල්ල ඉතුරු කර, එයට යකඩ හා ලෝකඩ
වළල්ලක් දමා පොළොවේ ලා තණ අතරේ එය
තිබෙන්නට අරින්න. මේ මිනිහා අහසේ පිනිවලින්
තෙමේ වා; මෘගයන් සමඟ තණ කොළ කෑවා වේ.
16 ඔහුගේ සිත මිනිස් සිතක් නොවන ලෙස වෙනස්
වී මෘග සිතක් ඔහුට ලැබී, ඒ අයුරින් අවුරුදු සතක්
ගතවුණා වේ. 17 මේ තීරණය මුරකාරයන්ගේ
නියමයක් වන්නකි; මේ තීන්දුව ශුද්ධ
තැනැත්තන්ගනේ වන ප්‍රකාශනයකි. මෙසේ වන්නේ
මනුෂ්‍යයන්ගේ රාජ්‍යය මහෝත්තමයාණන් පාලනය
කරන බවත්, තමන් කැමැති කෙනෙකුට උන්
වහන්සේ එය දෙන බවත්, මිනිසුන්ගනේ ඉතා පහත්
කෙනෙකුට වුව ද එහි පාලනය භාර දෙන බවත්
ජීවත් ව සිටින අය දැනගන්න පිණිස ය.
18 "මේ ස්වප්නය, නබෙකද්නෙසර් රජු වන මම
දිටිමි. එම්බා බල්තෙෂෙසර්, එහි තේරුම මට
දන්වන්න. මන්ද, මාගේ රාජ්‍යයේ සිටින සියලු
ශාස්ත්‍රවන්තයන්ගනේ එක් කෙනෙකුට වත් එය
නොකළ හැකි විය. එහෙත්, දේවාත්මානුභාවය
ඔබට ඇති බැවින් ඔබට නම් එය කළ හැකි ය."

## දානියලේ ස්වප්නය තේරුම් කර දීම

19 එකල බල්තෙෂෙසර් නම් ලත් දානියලේ
දර්ශනය ගැන ඇති වූ සිතුවිලිවලින් කැළඹී,
මොහොතකට තුෂ්ණීම්භූත ව සිටියේ ය. රජතුමා
ඔහු අමතා, "බල්තෙෂෙසර් ස්වප්නය ගැන වත්, එහි
තේරුම ගැන වත් නොකැළඹෙන්නැ"යි කී ය.
බල්තෙෂෙසර් මෙසේ පිළිතුරු දුන්නේ ය: "මාගේ
රජතුමනි, ස්වප්නය ඔබට ද්වේෂ කරන්නන්ටත්, එහි
තේරුම ඔබේ සතුරන්ටත් අදාළ වේ වා!
20 රජතුමනි, ඔබ දුටු, වැවී ශක්තිමත් වී කරටිය
අහස උසට යනතෙක් වැඩුණු, පොළොවේ සතර දිග්
භාගයක පෙනුණු, 21 ශෝභන කොළ ද බොහෝ
පල ද සියල්ලන්ට කෑම ද තිබුණු, වන මෘගයන්ට
සෙවණක් වූ, අහසේ පක්ෂීන් ලැගුම් ගත්, අතු
තිබුණු ගස නම් ඔබ ම ය.
22 "ඔබ වර්ධනය වී බලවත් ව සිටින්නහෙි ය.
ඔබේ උතුම්කම වැවී, අහස දක්වා නැඟී ඇත. ඔබේ
පාලනය පොළොවේ සීමාන්තයන් දක්වා පැතිර
ගොස් ඇත. 23 තවද, ශුද්ධ මුරකාරයකු
ස්වර්ගයනේ බැස එනු ඔබ දුටුවහෙි ය. ඔහු මෙසේ
කී ය: 'ගහ සිඳදමා විනාශකරන්න, එහෙත්, එහි මුල්
හා කඳ යකඩ හා ලෝකඩ වළල්ලක් දමා
පොළොවේ ළා තණ අතරේ තිබෙන්නට අරින්න. ඒ
මිනිසා අහසේ පිනිවලින් තෙමේ වා. අවුරුදු සතක්
ගතවන තුරු ඔහු මෘගයන් සමඟ තණ කොළ කෑවා
වේ.'
24 "රජතුමනි, එහි තේරුම මෙය වේ. එය මාගේ
ස්වාමීන් වන රජතුමාට පැමිණ තිබෙන
මහෝත්තමයාණන්ගේ නියමය ය. 25 ඔබ මනුෂ්‍ය
වාසයනේ පන්නාදමනු ලබන්නහෙි ය. ඔබේ වාසය
වනයේ මෘගයන් සමඟ වන්නේ ය. ගවයන්ට මෙන්
ඔබට තණ කොළ කවනු ලබන්නහෙි ය. ඔබ අහසේ
පිනිනනේ තෙමෙනු ලබන්නහෙි ය. මෙසේ
මනුෂ්‍යයන්ගේ රාජ්‍යය මහෝත්තමයාණන්
වහන්සේ පාලනය කරන බවත්, තමන් කැමැති
කෙනෙකුට උන් වහන්සේ එය දෙන බවත් ඔබ
දැනගන්න තුරු, අවුරුදු සතක් ඔබ ගත කරන්නහෙි
ය. 26 කෙසේ වෙතත්, අර මුරකාරයා ගසේ මුලේ
කඳ කොටස ඉතිරි කරන්නට අණ කළේ ය. එහි
තේරුම මෙය යි. මහෝත්තමයාණන් මනුෂ්‍ය
රාජ්‍යයන් පාලනය කරන බව ඔබ දැනගත් පසු
ඔබේ රාජ්‍යය ඔබට ස්ථිර වන්නේ ය. 27 එබැවින්
රජතුමනි, මාගේ දැනමුතුකම පිළිගැනීමට සතුටු වුව
මැනව. දැහැමිකම් කිරීමනේ ඔබේ පාප ද දිළිඳුන්ට
කරුණා කිරීමනේ ඔබේ අපරාධ ද පහකළ මැනව.
එසේ කිරීමනේ සමහර විට දීර්ඝ කාලයක් ඔබට
සාමදානයනේ සිටින්නට පුළුවන් වනු ඇත."

## ස්වප්නය සැබෑ වීම

28 මේ සියල්ල නබෙකද්නෙසර් රජුට සිදු විය.
29 දොළොස් මසක් ගත වූ පසු ඔහු බබිලෝනියේ
රාජ මාලිගාව උඩ සක්මන් කරමින් සිටියේ ය.
30 සක්මන් කරමින් සිටිය දී ඔහු මෙසේ කීවේ ය:
"එම්බා ශ්‍රේෂ්ඨ බබිලෝනිය, මාගේ රජවාසල
වශයනේ ද මාගේ රාජශ්‍රීයේ ගෞරවය උදෙසා ද
මාගේ බලපරාක්‍රමයනේ මා විසින් ගොඩනඟන ලද
නගරය තී නොවේ ද?"
31 ඔහු මේ වචන පවසද්දී ම ස්වර්ගයනේ එන
හඬක් ඇසුණේ ය. ඒ මෙසේ ය: "එම්බා
නබෙකද්නෙසර් රජ, නුඹේ රාජ්‍යය නුඹනේ පහ විය;
32 නුඹ මනුෂ්‍ය වාසයනේ පන්නාදමනු ලබන්නහෙි ය.
නුඹේ වාසය මෘගයන් සමඟ වන්නේ ය; නුඹට
ගවයන්ට මෙන් තණ කොළ කවනු ලබන්නහෙි ය.
මනුෂ්‍යයන්ගේ රාජ්‍යය මහෝත්තමයාණන්
වහන්සේ පාලනය කරන බවත්, තමන් කැමැති
කෙනෙකුට උන් වහන්සේ එය දෙන බවත් නුඹ
දැනගන්න තුරු අවුරුදු සතක් නුඹ එසේ ගත
කරන්නහෙි ය."
33 ඒ කියන ලද දේ එකණෙහෙි ම සම්පූර්ණයනේ
ම ඉෂ්ට විය. ඔහු මනුෂ්‍ය වාසයනේ පන්නාදමනු
ලැබ, ගොනුන්ට මෙන් ඔහුට තණ කොළ කවන ලදී.
ඔහුගේ හිසකේ රාජාලියන්ගේ පිහාටු මෙන් ද
ඔහුගේ නියපොතු පක්ෂීන්ගේ නියපොතු මෙන් ද
වැඩෙන තුරු ඔහුගේ ශරීරය අහසේ පිනිනනේ
තෙමුණේ ය.

## රජුගේ සිත වෙනස් වීම

34 අවුරුදු සත ගත වූ පසු, නබෙකද්නෙසර් රජු වන
මම මාගේ ඇස් ස්වර්ගය දෙසෙ එසවීමි. මාගේ සිහිය
මට නැවත ලැබුණේ ය. මම සදහට ම ජීවත් වන
මහෝත්තමයාණන්ට ප්‍රශංසා කළෙමි; ගෞරව
කළෙමි. මන්ද,
q234 එතුමාණන්ගේ පාලනය සදාතනික ය;

q2 34 එතුමාණන්ගේ රාජ්‍යය පරපුරෙන් පරපුරට
පවත්නේ ය.
35 ලොවේ සියලු වැසියන් කිසි වටිනාකමක් නැති
අය සේ එතුමාණෝ සලකන සේක. උන් වහන්සේ
ස්වර්ගික සේනාවන් හා පොළොවේ වැසියන් අතර
තමන් රිසි දේ කරන සේක. උන් වහන්සේගේ
ක්‍රියාවන් නවත්වන්නට වත්, 'ඔබ කුමක් කරන
සේක් ද' කියා උන් වහන්සේට අභියෝග කරන්නට
වත් පුළුවන් කිසිවෙකු නැත. 36 ඒ වේලාවේ දී ම
මාගේ සිහිය මට නැවත ලැබුණු විට මාගේ
රාජ්‍යයේ ගෞරවය උදෙසා මාගේ රාජශ්‍රීයත්,
ඓශ්වර්යයත් මා වෙත නැවත පැමිණියේ ය. මාගේ
මන්ත්‍රීවරු ද මාගේ උත්තමයෝ ද මා සාදරයෙන්
පිළිගත්හ. මාගේ රාජ්‍යයේ මම යළි පිහිටුවනු
ලැබීමි. මාගේ උතුම්කම පෙරට වඩා වැඩි විය.
37 දැන් නබුකද්නෙශර් රජු වන මම ස්වර්ගයේ
රජ්ජුරුවන් වහන්සේට ප්‍රශංසා කරමි, තුති පුදමි,
ගරු කරමි, මන්ද, උන් වහන්සේගේ පොරොන්දු
ඉෂ්ට වන්නේ ය. උන් වහන්සේගේ ක්‍රියා මාර්ග
සාධාරණ ය. උඩඟුකමින් හැසිරෙන්නන් පහත්
කරන්නට උන් වහන්සේට පුළුවන.

## බෙල්ෂසර් රජුගේ මංගල්‍ය උත්සවය

5 බෙල්ෂසර් රජු සිය උත්තමයන් දහසකට
මහා මංගල උත්සවයක් පිළියෙළ කර ඔවුන්
සමඟ මත්පැන් බීවේ ය. 2 ඔහු බොමින් සිටිය දී,
ඔහුගේ පියා වූ නබුකද්නෙශර් ජෙරුසලමේ දේව
මාළිගාවෙන් කොල්ලකාගත් රන් රිදී භාජනවලින්
තමා ද තමාගේ උත්තමයන් ද සිය භාර්යාවන් ද
උපභාර්යාවන් ද බොන පිණිස ඒවා ගෙනෙන්නට
අණ කළේ ය. 3 එවිට ඔව්හු ජෙරුසලමේ දේව
මාළිගාවේ සිද්ධස්ථානයෙන් පැහැරගෙන එන ලද
රන් රිදී භාජන ගෙනාහ. රජ ද ඔහුගේ උත්තමයෝ
ද භාර්යාවෝ ද උපභාර්යාවෝ ද එයින් බීවෝ ය.
4 ඔව්හු මත්පැන් බී, රන් රිදී, ලෝකඩ, යකඩ, ලී හා
ගල්වලින් තනන ලද දෙවිවරුන්ට ප්‍රශංසා කළහ.

## බිත්තියෙහි සඳහන් වූ ලියවිල්ල

5 එකල හදිසියෙන් පහන් රුක ඉදිරිපිට රාජ
මාළිගාවේ බිත්තියේ බදාම පිට ලියන මිනිස් අතක
ඇඟිලි පෙනිණි. රජ තෙමේ ඒ අත දුටුවේ ය. 6 එකල
රජුගේ මුහුණ මැලවී සිත කැළඹුණේ ය. ඔහුගේ
දකෙකුල් වාරු නැති ව දණහිස් එකට එක වැදුණේ
ය. 7 එකල රජ තෙමේ අනවිනකාරයන් ද කල්දිවරුන්
ද පේන කියන්නන් ද කැඳවාගෙන එන ලෙස කෑ
ගසා කී ය. රජ තෙමේ බබිලෝනියේ
ශාස්ත්‍රවන්තයින් අමතා, "මේ ලියවිල්ල කියවා, එහි
අර්ථය මට පෙන්වා දෙන කවුරු හෝ වේවා, ඔහුට
රත්නිල් වස්ත්‍රයක් අඳවා, ගෙලෙ වටා රන් මාලයක්
පළඳවා, රාජ්‍යයේ තුන් වන ආණ්ඩුකාරයා වශයෙන්
ඔහු පත් කරනු ලබන්නේ ය"යි කී ය. 8 එවිට
රජුගේ සියලු ශාස්ත්‍රවන්තයෝ පැමිණියෝ ය.
එහෙත්, ඒ ලියවිල්ල කියවන්නට වත්, එහි අර්ථය
රජුට පහදා දෙන්නට වත් ඔවුන්ට නොහැකි විය.
9 එවිට බෙල්ෂසර් රජ අතිශයින් කැළඹී, මුහුණ
මැලවී සිටියේ ය. ඔහුගේ උත්තමයෝ ද වියවුල් ව
සිටියෝ ය.
10 රජු සහ උත්තමයන් කතා කරමින් සිටිය දී
බිසොව භෝජන ශාලාවට පැමිණ මෙසේ කීවා ය:
"රජතුමා සදාකාලයේට ම ජීවත් වේ වා!
සිතුවිලිවලින් නොකැළඹී මුහුණ මැලවී නොසිටින්න.
11 දේවාත්මානුභාවය ඇති මනුෂ්‍යයෙකු ඔබේ
රාජ්‍යයේ සිටියි. ඔබේ පියාණන්ගේ කාලයේ දී
මොහු පැහැදිලි කල්පනාව ද නුවණ ද දෙවියන්ගේ
ප්‍රඥාවට සමාන ප්‍රඥාවක් ද ඇති කෙනෙකු ලෙස
ප්‍රසිද්ධ ව සිටියේ ය. ඔබේ පියා වූ
නබුකද්නෙශර්ගේ කාලයේ දී, ඔහු
මන්ත්‍රකාරයන්ගේ ද අනවිනකාරයන්ගේ ද
දෛවඥයන්ගේ ද පේන කියන්නන්ගේ ද ප්‍රධානියා
වශයෙන් පත් කරන ලදී. 12 රජු විසින්
බෙල්ටෂෙසර් යන නම තබන ලද ඒ දානියෙල් උසස්
කුශලතා ඇති, ස්වප්න තේරුම් කර දීමේත්,
තේරවිලි විසඳීමේත්, ගැටපද පහදා දීමේත් ඥානය
ඇති කෙනෙකු විය. දැන් ඔබ මේ දානියෙල්
කැඳවේවොත්, ඔහු ඔය ලියවිල්ලේ අර්ථය පහදා
දෙනු ඇතැ"යි කීවා ය.

## දානියෙල් බිත්තියේ ලියවිල්ල පහදා දීම

13 එකල දානියෙල් තෙමේ රජු ඉදිරියට ගෙන්වන
ලද්දේ ය. රජ තෙමේ දානියෙල් අමතා, "මාගේ පිය
රජ්ජුරුවන් ජුදා රටින් අල්ලාගෙන ආ ජුදෙව්වන්ගෙන්
එක් කෙනෙකු වන දානියෙල් ඔබ ද?
14 දේවාත්මානුභාවය ඔබ තුළ තිබෙන බව ද
පැහැදිලි කල්පනාවත්, නුවණත්, උතුම් ප්‍රඥාවත්
ඔබ තුළ තිබෙන බව ද මා ඔබ ගැන අසා ඇත.
15 මේ ලියවිල්ල කියවා එහි අර්ථය දන්වන පිණිස
ශාස්ත්‍රවන්තයන් ද අනවිනකාරයන් ද මා ඉදිරියට
ගෙනෙනු ලැබූ නමුත්, එහි අර්ථය පහදා දෙන්න
ඔවුන්ට නොහැකි විය. 16 ඔබට අර්ථකථනය
කිරීමටත් ගැටපද විවරණය කිරීමටත් හැකි බව මම
අසා ඇත්තෙමි. මෙම ලියවිල්ල කියවා එහි අර්ථය
පහදා දීමට හැකි නම්, ඔබට රත්නිල් වස්ත්‍ර හඳවා,
ගෙලෙ වටා රන් මාලයක් පළඳවා, රාජ්‍යයේ තුන් වන
ආණ්ඩුකාරයා වශයෙන් මම ඔබ පත් කරමි"යි කී ය.
17 එවිට දානියෙල්, රජු ඉදිරියේ මෙසේ කී ය:
"ඔබේ දීමනා ඔබ ම තබාගනු මැනවි. ඔබේ තෑගි
අන් කෙනෙකුට දෙනු මැනවි. කෙසේ වෙතත් මම
ලියවිල්ල කියවා එය රජ්ජුරුවන්ට පහදා දෙන්නෙමි.
18 "රජතුමනි, මහෝත්තම දෙවියන් වහන්සේ
රජකම ද මහන්තත්ත්වය ද ගෞරවය ද මහිමය ද
ඔබේ පිය වූ නබුකද්නෙශර්ට දුන් සේක. 19 උන්
වහන්සේ ඔහුට දුන් මහන්තත්ත්වය නිසා සියලු
ජනයෝ ද ජාතීහු ද භාෂාවෝ ද ඔහු ඉදිරියේ
වෙවුලා බිය වූවෝ ය. ඔහු කැමැති කෙනෙකු මැරී
ය; කැමැති කෙනෙකු ඉතුරු කළේ ය. ඔහු කැමැති
කෙනෙකු උසස් කළේ ය. කැමැති කෙනෙකු පහත්

කළේ ය. 20 එහෙත්, ඔහුගේ සිත අහංකාරයෙන් ද
අභිමානයෙන් ද දැඩි වූ විට ඔහු රාජ්‍යාසනයෙන් පහ
කරනු ලැබී ය. ඔහුගේ මහිමය ද ඔහුගෙන් පහ
කරනු ලැබී ය. 21 මනුෂ්‍යයන්ගේ රාජ්‍යය
මහෝත්තම දෙවියන් වහන්සේ පාලනය කරන
බවත්, තමන් කැමැති කෙනෙකු උන් වහන්සේ
ඒවායේ පාලනය කිරීමට පත් කරන බවත්
දැනගන්නා තුරු ඔහු ජන සමාජයෙන් පිටමං කරනු
ලැබී ය. ඔහුගේ සිත මෘගයකුගේ සිත මෙන් විය.
වල් කොටළුවන් සමඟ ජීවත් වී, ගොනුන් මෙන්
තණ කොළ කන්නට ඔහුට සිදු විය. ඔහුගේ සිරුර
අහසේ පින්නෙන් තෙමුණේ ය.
22 “ඔහුගේ පුත්‍රයා වන බෙල්ෂස්සර් නම් ඔබ මේ
සියල්ල දැන ගෙන සිටි නමුත්, ඔබේ සිත යටත් කර
නොගෙන, ස්වර්ගයේ ස්වාමීන් වහන්සේට විරුද්ධ
ව උසස් වී, උන් වහන්සේගේ ගෘහයේ භාජන ඔබ
ඉදිරියට ගෙන්වාගෙන, ඔබ ද ඔබේ උත්තමයෝ ද
භාර්යාවෝ ද උපභාර්යාවෝ ද එයින් බීවෝ ය.
23 තවද, කිසි පෙනීමක් වත්, ඇසීමක් වත්, දැනුමක්
වත් නැති, රන් රිදී, ලෝකඩ, යකඩ, ලී සහ ගලින්
සාදන ලද දෙවිවරුන්ට ඔබ ප්‍රශංසා කෙළෙහි ය.
එහෙත්, ඔබේ ප්‍රාණයටත්, ඉරණමටත් කර්තෘ වන
දෙවියන් වහන්සේට ඔබ ගෞරව කළේ නැත.
24 උන් වහන්සේ වෙතින් අතක් එවනු ලැබ මේ
ලියවිල්ල ලියන ලද්දේ ඒ බැවිනි.
25 “ලියන ලද ලියවිල්ල නම්: ‘මෙනේ, මෙනේ,
තෙකේල් උ-පාර්සීන්’ යනු යි. 26 එහි අර්ථය මෙසේ
ය: ‘මෙනේ’ යන්නෙන් දෙවියන් වහන්සේ ඔබේ
රජකමේ කාලය ගණන් කර එය කෙළවර කළ
සේක යි අදහස් කර ඇත. 27 ‘තෙකේල්’ යන්නෙන්
ඔබ තරාදියේ දමා කිරනු ලැබ, බරෙන් අඩු බව
අදහස් කෙරේ. 28 ‘උ-පාර්සීන්’ යන්නෙන් ඔබේ රාජ්‍ය
බෙදා, මේදවරුන්ටත්, පර්සිවරුන්ටත් දෙන ලදැ යි
අදහස් කෙරේ.”
29 එකල බෙල්ෂස්සර්ගේ අණ පිට දානියෙල් රක්ත-
නීල වස්ත්‍රයක් හඳවා, ගෙලෙ වටා රන් මාලයක්
පළඳවා, රාජ්‍යයේ තුන් වන ආණ්ඩුකාරයා ය, කියා
ඔහු ගැන ප්‍රසිද්ධ කරන ලද්දේ ය. 30 එම
රාත්‍රියේ ම කල්දිවරුන්ගේ රජ වූ බෙල්ෂස්සර් මරන
ලද්දේ ය. 31 අවුරුදු හැටදෙකක් පමණ වයස් ව සිටි
මේදීය ජාතික දාරියුස් තමේ රාජ්‍යය භාරගත්තේ
ය.

## දානියෙල් මැරීමට උපාය

6 දාරියුස් රජතුමා තමාගේ මුළු රාජ්‍යය භාර ව
සිටින පිණිස දිශාධිපතීන් එකසිය විසිදෙනෙකු
පත් කිරීමට සතුටු විය. 2 ඔහු ඔවුන්ට ඉහළින්
ප්‍රධාන ඇමතිවරුන් තිදෙනෙකු ද පත් කළේ ය.
මේ තිදෙනාට වගකීම පැවරී තිබුණේ ය. දාරියුස්
මෙසේ කළේ ඔහුට කිසි හානියක් නොවන පිණිස
ය. ඒ අමාත්‍යවරුන්ගෙන් එක් කෙනෙක් දානියෙල්
විය. 3 දානියෙල්ට ඇති පුදුම කුශලතා නිසා, ඔහු
ඇමතිවරුන්ටත්, දිශාධිපතීන්ටත් වඩා උත්කෘෂ්ට බව
පෙනී ගියේ ය. එබැවින් රජතුමා මුළු රාජ්‍යය
පාලනය කිරීම පිණිස දානියෙල් පත් කරන්නට
අදහස් කළේ ය. 4 මෙයට අසතුටු වූ ඇමතිවරු හා
දිශාධිපතිවරු දානියෙල්ගේ පාලනයේ යම් වරදක්
සොයන්නට මාන බැලුවෝ ය. එහෙත්, එවැනි කිසි
ම වරදක් ඔවුන්ට සොයාගත නොහැකි විය. මන්ද,
ඔහු විශ්වාසවන්ත ව කටයුතු කළේ ය. ඔහුගේ
කිසි වරදක් වත්, දෝෂයක් වත් නො වී ය. 5 එවිට
ඔව්හු, “දානියෙල්ට විරුද්ධ ව පැමිණිලි කරන පිණිස
ඔහුගේ ආගම සම්බන්ධයෙන් යම් කරුණක් සොයා
ගත්තොත් මිස, අන් කිසි කරුණක් අපට කිසි කලෙක
සොයාගත නොහැකි ය”යි කී හ.
6 එබැවින් ඇමතිවරු ද දිශාධිපතිවරු ද මෙසේ කී
හ: “රජතුමනි, චිරාත් කාලයක් වැජඹෙත්වා!
7 ඔබේ රාජ්‍යයේ සියලු අමාත්‍යයෝ ද අධිපතිවරු ද
මන්ත්‍රීවරු ද ආණ්ඩුකාරයෝ ද වන අපි ඉදිරිපත්
කරන රාජාඥාව පනවා එය ක්‍රියාත්මක කරන ලෙස
ඔබෙන් ඉල්ලීමට ඒකමතික ව තීරණය කරගනිමු.
එනම්, ‘තිස් දවසක් ඇතුළත දී යම් කෙනෙකු
රජතුමාගෙන් මිස, අන් දෙවි කෙනෙකුගෙන් වත්,
මනුෂ්‍යයකුගෙන් වත් කිසියම් අයැදුමක් කළොත්,
ඔහු සිංහ ගුහාවේ හෙළෙනු ලැබේ ය’ කියා ය.
8 ඉතින් රජතුමනි, මේදවරුන්ගේ ද පර්සිවරුන්ගේ ද
වෙනස් නොකළ හැකි ව්‍යවස්ථාවේ ප්‍රකාරයට මේ
ආඥා පත්‍රය ද වෙනස් නොකළ හැකි වන ලෙස
එය ස්ථිර කර අත්සන් කළ මැනව.” 9 දාරියුස් රජ ඒ
ආඥා පත්‍රය අත්සන් කළේ ය.

## දානියෙල් සිංහ ගුහාවට හෙළෙනු ලැබීම

10 රාජාඥාව පනවා ඇති බව දානියෙල්ට ආරංචි වූ
විට, ඔහු ගෙදර ගොස්, උඩුමහල් මැදුරේ කවුළු
ජෙරුසලම දෙසට ඇරී තිබිය දී, පුරුදු පරිදි දිනකට
තුන් වරක් දණින් වැටී, තමාගේ දෙවියන් වහන්සේ
ඉදිරියෙහි යාච්ඤා කොට ස්තුති පුද කළේ ය.
11 දානියෙල් වරදකට අසු කිරීමට බලා සිටි
විරුද්ධකාරයෝ පැමිණ, දානියෙල් තමාගේ දෙවියන්
වහන්සේ ඉදිරියේ යාච්ඤා හා කන්නලව් කරනු
දුටුවෝ ය. 12 එවිට ඔව්හු රජ්ජුරුවන් ඉදිරියට
පැමිණ රාජාඥාව මතක් කර, “රජතුමනි, තිස් දවසක්
ඇතුළත දී යම් කෙනෙකු ඔබතුමාගෙන් මිස, අන්
දෙවි කෙනෙකුගෙන් වත්, මනුෂ්‍යයකුගෙන් වත්
කිසියම් අයැදුමක් කළොත්, ඔහු සිංහ ගුහාවට
හෙළිය යුතු ය කියා ඔබතුමා ආඥා පත්‍රයක්
අත්සන් කළා නොවේ දැ”යි ඇසූ හ. “එය එසේ ම
යි; වෙනස් නොකළ හැකි මේදවරුන්ගේ ද
පර්සිවරුන්ගේ ද ව්‍යවස්ථාව අනුව එය ස්ථිර ය”යි
රජතුමා පිළිතුරු දුන්නේ ය.
13 එවිට ඔව්හු රජ්ජුරුවන් ඉදිරියෙහි පිළිතුරු
දෙමින්, “රජතුමා ජුදා රටින් අල්ලගනු ලැබූ අයගෙන්
එක් කෙනෙකු වන දානියෙල්, ඔබ හා ඔබතුමා
අත්සන් කළ ආඥාව නොසලකා, දවසකට තුන්
වරක් තමාගේ දෙවියන්ට අයැදුම් කරයි” යයි කී හ.

14 රජතුමා මේ වචන ඇසූ විට, ඉමහත්
සංවේගයට පත් වී, දානියලේ ගළවාගන්නට
ඉටාගෙන, ඉර බසින තුරු ඒ ගැන මොළය වෙහෙසා
කල්පනා කළේ ය. 15 එකල ඒ පිරිස රජු වෙත
පැමිණ, "රජතුමනි, මේදවරුන්ගේ ද පර්සිවරුන්ගේ ද
නීතිය අනුව රජු විසින් පනවන ලද නියෝගයක්
වෙනස් කළ නොහැකි බව ඔබතුමාට මතක් කරනු
කැමැත්තමු"යි කී හ.
16 එවිට රජතුමා දානියලේ ගෙනෙවුත් සිංහ
ගුහාවේ දැමීමට නියමයක් කළේ ය. එහෙත්, ඔහු
දානියලේට කතා කොට, "ඔබ නිරන්තරයෙන් ම
නමස්කාර කරන, ඔබේ දෙවියන් වහන්සේ ඔබ
ගළවන සේක් වා!"යි කී ය. 17 තවද, දානියලේ
සම්බන්ධයෙන් කරන ලද නියමය වෙනස් නොකළ
හැකි වන ලෙස, ගලකින් සිංහ ගුහාවේ කට වසා,
එය රාජ මුද්‍රාවෙන් ද උත්තමයන්ගේ මුද්‍රාවලින් ද
මුද්‍රා කරනු ලැබී ය.

## දානියලේ ගළවනු ලැබීම

18 රජතුමා මාලිගාවට ගොස් නිරාහාරයෙන්
රාත්‍රිය ගත කළේ ය; පුරුදු විනෝද ආස්වාද ද
ප්‍රතික්ෂේප කළේ ය. ඔහුට කිසි නින්දක් නො වී
ය. 19 උදේ පාන්දරින් එළිය වැටෙන එද්දී ම ඔහු
නැඟිට සිංහ ගුහාව ළඟට යුහු යුහු ව ගියේ ය.
20 දානියලේ සිටි සිංහ ගුහාවට ඔහු ළං වූ වහාම,
ඔහු සංවේගජනක හඬකින් මොරගසා, "ජීවමාන
දෙවියන් වහන්සේගේ මෙහෙකරු වන දානියලේ, ඔබ
නොකඩවා ම නමස්කාර කරන ඔබේ දෙවියන්
වහන්සේට සිංහයන්ගෙන් ඔබ ගළවාගන්නට පුළුවන්
වී දැ"යි ඇසුවේ ය.
21 එවිට දානියලේ මෙසේ පිළිතුරු දුන්නේ ය:
"රජතුමනි, චිරාත් කාලයක් වැජඹෙත්වා! 22 මාගේ
දෙවියන් වහන්සේ තමන්ගේ දූතයන් එවා
සිංහයන්ගේ කටවල් පියවූ සේක. එබැවින්
උන්ගෙන් මට කිසි අනතුරක් නො වී ය. මාගේ
දෙවියන් වහන්සේ එසේ කළේ, උන් වහන්සේ
ඉදිරියේ මා නිදොස් කෙනෙකු වන බැවිනි. ඇරත්
රජතුමනි, ඔබ ඉදිරියේ ද මා කිසි වරදක් කර නැත."
23 එවිට රජතුමා ඉතා සන්තෝෂ වී, දානියලේ
ගුහාවෙන් ගොඩට ගන්නට අණ කළේ ය. එසේ
දානියලේ ගුහාවෙන් ගොඩගන්නා ලදී. ඔහුට සුළු
තුවාලයක් වත් සිදු වී තිබුණේ නැත. එසේ වන්නට
හේතුව ඔහු තමාගේ දෙවියන් වහන්සේ කෙරෙහි
විශ්වාස කිරීමයි. 24 ඉන්පසු රජතුමා දානියලේට
විරුද්ධ ව පැමිණිලි කළ අය, ඔවුන්ගේ භාර්යාවන්
හා දරුවන් සමඟ සිංහ ගුහාවට දමන්නට අණ
කළේ ය. ඔවුන් ගුහාවේ පතුළට පැමිණෙන්නටත්
පෙර සිංහයෝ ඔවුන් පිට කඩා පැන ඇටකටු පිටින්
ඔවුන් කැබලිකොට දැමූ හ.

## දාරියුස් රජ රාජාඥාවක් නිකුත් කිරීම

25 දාරියුස් රජ ලොව පුරා සිටි සකල ජනයාටත්,
ජාතීන්ටත්, හැම භාෂාවක් කතා කරන අයටත්
මෙසේ ලියා යැව්වේ ය: "ඔබ හැමට සාමදානය වේ
වා! 26 මාගේ අධිරාජ්‍යයේ සකල විජිතයන්හි සිටින
සියලු දෙනා දානියලේගේ දෙවියන් වහන්සේට
ගරුබිය දක්වා නමස්කාර කළ යුතු යයි මම අණ
කරමි. මන්ද,
q226 එතුමාණෝ ජීවමාන සදාතනික දෙවිඳාණෝ ය.
q226 එතුමාණන්ගේ රාජ්‍යය පහ නොවන්නේ ය;
q226 එතුමාණන්ගේ පාලනය ද අවසන් නොවන්නේ
ය.
27 ගළවන්නේත්, නිදහස් කරන්නේත්, අහසේ ද
පොළොවේ ද හාස්කම් ද අරුමපුදුම දේ ද
කරන්නේත් එතුමාණෝ ය.
q227 සිංහයන්ගේ බලයෙන් දානියලේ මුදාගත්තේත්
එතුමාණෝ ය"
28 මේ නිසා දාරියුස්ගේ රාජ්‍ය කාලයේ දී ද
පර්සියානු ජාතික සයිරස්ගේ රාජ්‍ය කාලයේ දී ද
දානියලේ තමේ සෞභාග්‍යයෙන් වැජඹුණේ ය.

## මෘගයන් සතරදෙනෙකු පිළිබඳ දර්ශනය

7 බබිලෝනියේ රජ වූ බෙල්ෂසෙර්ගේ පළමු
වන අවුරුද්දේ දී දානියලේ සිය යහනේ සිටිය දී
ස්වප්නයක් ද හිසට නැඟුණු දර්ශනයක් ද දුටුවේ ය.
ඔහු ස්වප්නය ලිව්වේ ය; එහි වාර්තාව මේ ය:
2 රාත්‍රියේ මාගේ දර්ශනයේ දී ස්වර්ගයෙන් හමා
ආ මාරුත සතරක් මහ මුහුද කළඹනවාත්,
3 එළිද 13:1; 17:8 එකිනෙකට වෙනස් වූ දැවැන්ත
මෘගයන් සතරදෙනෙකු මුහුදෙන් නැඟී එනවාත් මම
දිටිමි. 4 එළිද 13:2පළමු වන මෘගයා සිංහයෙකු වැනි
ය; ඌට රාජාලි පියාපත් තිබුණේ ය. මා බලා සිටිය
දී උගේ පියාපත් උදුරාදමා, පොළොවෙන් ඔසවා
මනුෂ්‍යයෙකු මෙන් පාද දෙකෙකින් ඌ සිටවනු ලැබී
ය; මනුෂ්‍ය සිතක් ද ඌට දෙන ලද්දේ ය.
5 මා දුටු දෙ වන මෘගයා වලසෙකු හා සමාන ය.
ඌ එක ඇළයකින් කළෙන් වී සිටියේ ය. උගේ
කටේ දත් අතරේ ඉළ ඇට තුනක් තිබුණේ ය.
'නැඟිට බොහෝ මස් කන්නැ'යි ඌට කියන ලද්දේ
ය.
6 ඉන්පසු තවත් මෘගයෙකු දිටිමි. ඌ දිවියෙකු වැනි
ය. පක්ෂි පියාපත් සතරක් උගේ පිටේ තිබුණේ ය.
ඌට හිස් සතරක් ද තිබුණේ ය. ඌට බලය දෙන
ලද්දේ ය.
7 එළිද 12:3; 13:1 මාගේ රාත්‍රී දර්ශනවලින් මා
දුටු සතර වන මෘගයා භයානක, රෞද්‍ර, ඉතා
ශක්තිමත් එකෙකි. ඌට විශාල යකඩ දත් තිබුණේ
ය. ඌ ගොදුර පොඩි කර කා ගිලදැම්මේ ය; ඉතිරි
දේ උගේ පාදවලින් පෑගුවේ ය. කලින් කී මෘගයන්ට
වඩා ඌ වෙනස් ය. ඌට අං දසයක් තිබුණේ ය.
8 එළිද 13:5-6ඒ අං දසෙ මා බලා සිටිය දී, ඒවා
අතරේ තවත් කුඩා අඟක් හටගත්තේ ය. එයට ඉඩ

දනෙ පිණිස පළමු වන අං තුනක් උදුරාදමනු ලැබී ය.
මේ අඟට මනුෂ්‍ය ඇස් වැනි ඇස් ද පුරසාරම්
දොඩන කටක් ද තිබුණේ ය.

### සදාතන පාලකයාණන් පිළිබඳ මහිමාන්විත දර්ශනය

9 එළිද 1:14; 20:4 මා බලා සිටිය දී, සිංහාසන
පිහිටුවනු ලදුව පෞරාණිකයාණෝ අසුන් ගත්හ. උන්
වහන්සේගේ වස්ත්‍ර හිම මෙන් සුදු ය; හිසකේ
පිරිසිදු ලොම් මෙන් සුදු ය. උන් වහන්සේගේ
සිංහාසනය ගිනි ජාලාවකි. එහි රෝද ඇවිලෙන ගිනි
ය. 10 එළිද 5:11; 20:12ගිනිමය ගංගාවක් උන්
වහන්සේ ඉදිරියෙන් ගලාගෙන ගියේ ය. ලක්ෂ
සංඛ්‍යාත පිරිසක් උන් වහන්සේට උපස්ථාන කළහ.
කෝටි ප්‍රකෝටි සංඛ්‍යාත පිරිසක් උන් වහන්සේ
ඉදිරියේ සිටියහ. අධිකරණ සභාව අසුන් ගත්තා ය.
පොත් දිගඇරින ලද්දේ ය.
11 එවිට අර අඟ කතා කරන ආඩම්බර වචන නිසා
මම බලා සිටියෙමි. මා බලා සිටිය දී සතර වන
මෘගයා මරා, උගේ ශරීරය විනාශ කර ඇවිලෙන
ගින්නට දමනු ලැබී ය. 12 සෙසු මෘගයන්ගෙන්
උන්ගේ ආණ්ඩු බලය පහ කරනු ලැබූ නමුත්,
සීමාසහිත කාලයක් උන්ට ජීවත් වන්නට ඉඩ දෙන
ලදී.
13 මතෙ 24:30; 26:64; මාක් 13:26; 14:62; ලූක්
21:27; එළිද 1:7,13; 14:14 තවදුරටත් බලා සිටිය දී
මම රාත්‍රි දර්ශනවල දී මෙසේ දිටිමි. මනුෂ්‍ය-
පුත්‍රයා වැනි කෙනෙක් අහසේ වලාකුළු පිරිවරා
අවුත් පෞරාණිකයාණන් වෙත එළඹුණේ ය. උන්
වහන්සේ පෞරාණිකයාණන් වෙත පමුණුවනු ලැබූ
සේක. 14 එළිද 11:15සියලු ජනයන් ද ජාතීන් ද
භාෂාවන් ද උන් වහන්සේට සේවය කරන පිණිස
පාලන බලය ද ගෞරවය ද රාජ්‍යය ද උන්
වහන්සේට දෙන ලද්දේ ය. උන් වහන්සේගේ
පාලනය පහ නොවන සදාකාලික පාලනයක් ය. උන්
වහන්සේගේ රාජ්‍යය කිසි කලෙක නැති
නොවන්නේ ය."

### දර්ශනවල තේරුම්

15 දානියලේ වන මාගේ සිත ශෝකාකුල විය;
මාගේ හිසට නැඟුණ දර්ශනවලින් මම කැළඹුණෙමි.
16 මම එහි සිටි අයගෙන් එක් කෙනෙකු ළඟට එළඹ
ඒ සියල්ලේ තේරුම මට කියන ලෙස ඔහුගෙන්
ඉල්ලුවෙමි. ඔහු කතා කොට, ඒ සියල්ලේ තේරුම
මෙසේ පහදා දුන්නේ ය: 17 "දැවැන්ත මෘගයන්
සතරදෙනා නම්, රජවරු සතරදෙනෙකි. ඔව්හු
පොළොවෙන් නැඟී එන්නාහ. 18 එළිද 22:5එසේ වුව
ද, මහෝත්තමයාණන්ගේ ශුද්ධවරයෝ රාජ්‍යය ලැබ
සදාකාලයෙන් සදාකාලයට එය භුක්ති විඳින්නෝ ය.
19 ඊළඟට සතර වන මෘගයා ගැන තතු
දැනගන්නට මම කැමැති වීමි. ඒ මෘගයා නම්, සෙසු
සියලු මෘගයන්ට වඩා වෙනස් වූ, ඉතාමත් භයානක
වූ, යකඩ දත් සහ ලෝකඩ නිය ඇති, ගොදුරු
පොඩිකර කාදමා ඉතිරි දේ පයින් පාගාදැමූ මෘගයා
ය. 20 එපමණක් නොව, මෘගයාගේ හිසේ තිබුණු
අං දසය ගැන ද සියල්ලට වඩා මහත් ලෙස පෙනුණ
අඟ, එනම්, හටගත් පසු අං තුනක් හෙළාදැමූ, ඇස්
සහ උඩඟු ලෙස කතා කරන කටක් ඇති අඟ ගැන
ද දැනගන්නට කැමැති වීමි.
21 එළිද 13:7 මා බලා සිටිය දී මේ අඟ
සැදැහැවතුන්ට විරුද්ධ ව යුද්ධ කර ජයගත් බව මම
දිටිමි. 22 එළිද 20:4එසේ වුයේ, පෞරාණිකයාණන්
පැමිණ මහෝත්තමයාණන්ගේ ශුද්ධවරයන්ට
යුක්තිය ඉටු කර දී ශුද්ධවරයන් රාජ්‍යය භුක්ති විඳින
කාලය පැමිණෙන තුරු ය.
23 මනුෂ්‍ය-පුත්‍රයාණෝ පිළිතුරු දමින් මෙසේ
වදාළ සේක: "සතර වන මෘගයා නම්, සියලු
රාජ්‍යවලට වෙනස් වූ, මුළු පොළොව නාස්ති කර
පාගාදමා පොඩි කරන හතර වන රාජ්‍යයක් ය.
24 එළිද 17:12අං දසය නම්, මේ රාජ්‍යයෙන් පැන
නඟින රජවරු දසදෙනෙකි. ඔවුන්ට පසු ව තවත් රජ
කෙනෙක් නැඟිටින්නේ ය. ඔහු පළමු කී රජවරුන්ට
වඩා වෙනස් වන්නේ ය. ඔහු රජවරුන් තුන්දෙනෙකු
පහතට හෙළාදමන්නේ ය. 25 එළිද 12:14; 13:5-6ඔහු
මහෝත්තමයාණන්ට විරුද්ධ ව කතා කරන්නේ ය;
මහෝත්තමයාණන්ගේ සැදැහැවතුන්ට පීඩා
කරන්නේ ය. ඔහු කාලයන් ද ව්‍යවස්ථාව ද වෙනස්
කරන්නට සිතන්නේ ය; සැදැහැවත්හු අවුරුදු
තුනහමාරකට ඔහුගේ අතට භාරදෙනු ලබන්නෝ ය.
26 එහෙත්, අධිකරණ සභාව රැස් වී, ඔහු නැත්තට
ම නැති වී යන පිණිස ඔහුගේ පාලනය ඔහු අතින්
පැහැරගන්නී ය. 27 එළිද 20:4; 22:5ඉන්පසු, අහස
යට තිබෙන සියලු රාජ්‍යවල රජකම ද පාලනය ද
මහන්තත්ත්වය ද මහෝත්තමයාණන්ගේ
සැදැහැවතුන්ට දෙනු ඇත. ඔවුන්ගේ රාජ්‍යය
සදාකාලික ය. සියලු පාලකයන් ඔවුන්ට සේවය කර
කීකරු වනු ඇත."
28 මාගේ ස්වප්නයේ අවසානය එය වේ. මාගේ
සිතිවිලිවලින් මම බොහෝ සේ කැළඹුණෙමි. මාගේ
මුහුණ මලානික විය. ඒ කරුණු සියල්ල මාගේ සිතේ
මම තබාගතිමි.

### බැටළුවා හා එළුවා පිළිබඳ දර්ශනය

8 බෙල්ෂසර් රජුගේ පාලනයේ තුන් වන
අවුරුද්දේ දී දානියලේ වන මට ඉහත කී
දර්ශනයට සමාන තවත් දර්ශනයක් පෙනුණේ ය.
2 ඒ දර්ශනය මා දකින විට, මා ඒලාම් පළාතෙහි
පිහිටි සූසා නම් අග නුවර ඇති ඌලයි නම් ගඟ ළඟ
සිටින බව දුටුවෙමි. 3 මා ඇස් ඔසවා බැලූ විට අං
දෙකක් ඇති බැටළුවෙකු ගං ඉවුරෙහි සිටිනු දිටිමි.
උගේ අං දිග ය. එහෙත්, එකක් අනිකට වඩා දිග ය.
වඩා දිග එක හටගත්තේ පසු ව ය. 4 ඒ බැටළුවා
බස්නාහිර, උතුර හා දකුණ යන දිශාවන්ට අනිනු මම
දිටිමි. ඌට විරුද්ධ ව සිටින්නට කිසි මෘගයෙකුට
නොහැකි විය. උගේ බලයෙන් බේරෙන්න පුළුවන්
කිසිවකේ නොසිටියේ ය. ඌ හිතුමතේ ක්‍රියා කර
බලසම්පන්න විය.

5 මේ ගැන මා කල්පනා කරමින් සිටිය දී, එළුවකේ
බිම අඩි නගා තබා, මුළු පොළොව හරහා
බස්නාහිරින් ආවේ ය. උගේ ඇස් අතරේ විශාල
අඟක් තිබුණේ ය. 6 ගං ඉවුරේ සිටිනු මා දුටු, අං
දකෙක් ඇති බැටළුවා දසෙට ඌ යමින්, අධික
කෝපයනේ බැටළුවා දසෙට දිව්වේ ය. 7 ඌ බැටළුවා
ළඟට එනු මම දිටිමි. මහත් ක්රෝධයනේ ඌ
බැටළුවාට ඇන උගේ අං දකෙ බිඳදැමී ය. ඌට
විරුද්ධ ව සිටින්නට බැටළුවාට කිසි බලයක්
නොතිබුණේ ය. ඌ බැටළුවා බිම දමා පෑගුවේ ය.
උගේ බලයනේ බැටළුවා බේරාගන්නට කිසිවකේ
නොවූ හ.
8 එළුවා මහා ආඩම්බරයනේ සිය දස්කම් පෑවේ ය.
එහතේ, ඌ බලයනේ අගතැන් පත් ව සිටිය දී උගේ
මහ අඟ බිඳී ගියේ ය. ඒ වනෙුවට මහ අං සතරක්
අහසේ සතර දසෙට නරෝ හටගත්තේ ය. 9 එයින්
එකකින් කුඩා අඟක් නික්මී දකුණටත්,
නැගනෙහිරටත්, පලස්තීනය දසෙටත් ඉමහත් බලය
පෑවේ ය. 10 එළිද 12:4එය අහස් සේනාව කරෙහෙි
ද බලය පා, ඒ සේනාවන් සමහරක් ද තාරකාවලින්
සමහරක් ද පොළොවට හළො පාගාදැමුවේ ය.
11 එය සේනාධිපතීන්ටත් විරුද්ධ ව බලය පා, උන්
වහන්සේට පුදන දිනපතා පූජා යටපත්කර ඔහුගේ
ශුද්ධස්ථානය බිඳදැම්මේ ය. 12 අහස් සේනාව
වනසාදැමී ය; දවස්පතා පූජාව කලෙසෙනු ලැබී ය; ඒ
අඟ සත්යය බිම හළෙවේ ය. එය කළ හැම දයෙක්
සඵලවත් විය.
13 එවිට ශුද්ධස්ථානයනේ සැදැහැවතකේ කතා
කොට, 'මේ දර්ශනයනේ පනෙුණු අන්දමට, පූජාවන්
කොපමණ කල් යටපත් කරනු ඇද් ද? විනාශකාරී
අපරාධ කොතකේ කල් පවතී ද? ශුද්ධස්ථානය හා
අහස් සේනාව පාගාදැමීම කොතකේ කල් පවතී
දැ'යි ඇසී ය.
14 ඔහු පිළිතුරු දමේින්, 'රූ දාවල් දදෙහස්
තුන්සියයක් පසු වන තුරු ය, ඉන්පසු ශුද්ධස්ථානය
පවිත්ර කරනු ලබන්නේ ය'යි කීවේ ය.

## ස්වප්නයේ තේරුම

15 දානියලේ වන මම මේ දර්ශනය දුටු විට එහි
තේරුම සවේිමි. එවිට මනුෂ්ය පනෙුමක් ඇති
කනෙකේ මා ඉදිරියේ සිටියේ ය. 16 ලූක්
1:19,26"ගාබ්රියලේ, මොහුට දර්ශනය තේරුම් කර
දනේනැ"යි මොරගසන මනුෂ්ය හඬක් ඌලයි ගං
ඉවුරු අතරින් මට ඇසුණේ ය. 17 එවිට ගාබ්රියලේ
නම් ඔහු මා සිටි තැනට ආවේ ය. ඔහු ආ විට මම
බියපත් වී මුණින් වැටුණමේ. එහතේ ඔහු, "මනුෂ්ය
පුත්රය, දර්ශනය අදාළ වන්නේ අන්තිම කාලයට
බව තේරුම්ගන්නැ"යි මට කීවේ ය.
18 ඔහු මා සමඟ කතා කරද්දී මම සිහිසන් නැති
ව මුණින් වැටී සිටියමේ. එහතේ, ඔහු මාගේ ඇඟට
තට්ටු කර මා කළෙින් සිටුවා මසෙේ කීවේ ය:
19 "දේව උදහස අවසානයේ දී සිදුවන්නට යන දේ
නුඹට දන්වමි. මන්ද, දර්ශනය අදාළ වන්නේ අන්තිම
කාලයට ය.
20 "නුඹ දුටු අං දකෙ ඇති බැටළුවා නම්,
මේදියාවේ ද පර්සියාවේ ද රජවරු ය. 21 එළුවා නම්
ග්රීසියේ රජ ය. උගේ ඇස් අතරේ තිබුණ ලොකු
අඟ පළමු වන රජු ය. 22 ඒ අඟ බිඳී ගිය විට ඒ
වනෙුවට තවත් අං සතරක් හටගත්තාක් මනේ
ග්රීසිය බිඳී ගොස් රාජ්යයන් සතරක් හටගන්නේ ය.
එහතේ, මේ එකක් වත් පළමු රාජ්යය තරම් බලවත්
නොවන්නේ ය. 23 ඒ රාජ්යවල පාලනය අවසානයේ
දී අපරාධකාරයන්ගේ පාප ඉහළට ම නැඟුණු කල,
රෞද්ර පනෙුමක් ඇති, කපටි නුවණක් ඇති රජ
කනෙකේ පැමිණනේනේ ය. 24 ඔහු බලසම්පන්න
වන්නේ ය. ඔහු භයානක ලසෙ නැති නාස්ති
කරන්නේ ය. ඔහු කරන හැම දයෙකින් ම ඔහු ජය
ගන්නේ ය. ඔහු බලවතුන් ද සැදැහැවතුන් ද
වර්ණනා කරන්නේ ය. 25 ඔහු කපටි නුවණින්
තමාගේ උපායයන් සාර්ථක කරගන්නේ ය. ඔහු තම
උපායයන් හිතා මතා බොහෝ දනෙකෙු ඔවුන්
නොදැනුවත් ව සිටිය දී විනාශ කරන්නේ ය. ඔහු
අධිපතීන්ගේ අධිපතියාට විරුද්ධ ව ද නැඟිටිනු ඇත.
එහතේ, ඔහු කිසි පිහිටක් නැති ව බිඳ හළෙනු
ලබයි. 26 උදේ හා හවස දුටු දර්ශනයේ තේරුම
සැබෑ ය. එහතේ, ඒ දර්ශනය රහසක් ව තබාගන්න.
මන්ද, එය සිදුවන්නට පරෙ බොහෝ දවස් ගත විය
යුතු ය."
27 එවිට දානියලේ නම් මම ක්ලාන්ත වී, දවස්
ගණනක් අසනීප ව සිටියමේ. ඉන්පසු මම නැඟිට
රාජ සේවය කළෙමේ. මම දර්ශනය ගැන පුදුමයනේ
පුදුමයට පත් ව සිටියමේ. කිසිවකෙුට එය තේරුම්
ගත නොහැකි විය.

## දානියලේගේ යැදුම

9 මේ වනාහි කල්දිවරුන්ගේ රාජ්යය කරෙහෙි
රජකමට පත් කරනු ලැබූ, මේදවරුන්ගේ
වංශයේ අහෂ්වේරොෂ්ගේ පුත්ර වූ දාරියුස් රජුගේ
පළමු වන අවුරුද්දේ සිදු වූවකි. 2 ජරෙ 25:11;
29:10ඔහුගේ රජ දවස පළමු වන අවුරුද්දේ දී
දානියලේ නම් මම ශුද්ධ ලියවිලි කියවමින්
සමිඳාණන් වහන්සේ දිවැසිවර ජරෙමියාට එළිදරව්
කර තිබුණු පරිදි, 'ජරෙුසලම අවුරුදු සැත්තෑවක් ගත
වන තුරු ජරාවාස ව තිබනේනේ යැ'යි තේරුම්ගතිමි.
3 එවිට මම, නිරාහාර ව, ගෝණි රදෙි හැඳ, අළු
තවරාගනෙ, යාච්ඤාවනෙුත්, කන්නලව්වනෙුත් දවේ
ස්වාමීන් වහන්සේ යදින පිණිස මාගේ මුහුණ උන්
වහන්සේ දසෙට හැරවේවමේ. 4 මාගේ දවේ
ස්වාමීන් වහන්සේට මම පාපොච්චාරණයක් කරමින්
මසෙේ යාච්ඤා කළෙමේ:
4 "අහෝ සමිඳාණන් වහන්ස, ඔබ වහන්සේ
උත්තමතම වූ බියකරු වූ දවේයන් වහන්සේ ය.
ඔබට ප්රේම කොට ඔබේ ආඥා රක්ෂා කරන්නන්ට
ඔබ කරුණා කරන සේක; ගිවිසුම රක්ෂා කරන
සේක. 5 දවේයන් වහන්ස, අපි පව් කළෙමු.

අයුතුකම් කළෙමු; දුෂ්ටකම් කළෙමු; කැරලි ගැසීමු.
ඔබේ ශික්ෂාවලින් ද විනිශ්චයවලින් ද ඉවත් ව
ගියෙමු. 6 ඔබ වහන්සේගේ නාමයෙන් අපගේ
රජවරුන්ටත්, අපගේ අධිපතීන්ටත්, අපගේ පියවරුන්ටත්,
රට වැසියන් සියල්ලන්ටත් කතා කළ ඔබේ සේවක
දිවැසිවරුන්ට අපි ඇහුම්කන් නුදුන්නෙමු. 7 අහෝ
ස්වාමීනි! ධර්මිෂ්ඨකම ඇත්තේ ඔබට ය; එහෙත්,
අප හැමට ඇත්තේ, මුහුණ පෙන්නන්නට බැරි තරම්
ලජ්ජාව ය. ඒ ලජ්ජාවට පත් වී සිටින්නේ, ජුදාවේ
ජනයා හා ජෙරුසලමේ පුරවැසියන් වන අපි හැම ය;
ඔබට විරුද්ධ ව ද්‍රෝහිකම් කළ නිසා ඔබ විසින්
පන්නා දමනු ලැබ, අහලපහල හා දුරබැහැර සියලු
රටවල සිටින සකල ඉශ්‍රායෙල්වරුන් වන අපි හැම
ය. 8 සමිඳාණන් වහන්ස, අප ඔබට විරුද්ධ ව පව්
කර ඇති නිසා, අපට එනම්, අපගේ රජවරුන්ටත්,
අපගේ අධිපතීන්ටත්, අපගේ පියවරුන්ටත්, ඇත්තේ,
මුහුණ පෙන්වන්නට බැරි ලජ්ජාව ය. 9 උන්
වහන්සේට විරුද්ධ ව අප කැරලි ගසා ඇති නමුත්,
අපගේ දෙවි ස්වාමීන් වහන්සේ දයාන්විත ය,
ක්ෂමාගුණයෙන් යුක්ත ය. 10 අපගේ සමිඳාණන්
වහන්සේට අපි කීකරු නොවීමු. උන් වහන්සේ සිය
දිවැසිවරුන් ලවා අප ඉදිරියේ තැබූ උන්
වහන්සේගේ උපදෙස් අනුව අපි නොහැසිරුණෙමු.
11 මුළු ඉශ්‍රායෙල් ජනයා ඔබේ ව්‍යවස්ථාව කඩ
කොට ඔබේ බසට කීකරු නොවී ඔබ වෙතින් හැරී
ගොස් ඇත. මේ අන්දමින් අප පව් කර ඇති බැවින්,
දෙවියන් වහන්සේගේ සේවක මෝසෙස්ගේ
ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති සාපය ද දඬුවම ද
අප පිට පැමිණ ඇත. 12 මෙවැනි මහා විපතක් අප
පිට පමුණුවමින්, උන් වහන්සේ අපටත්, අප පාලනය
කළ පාලකයන්ටත් විරුද්ධ ව වදාළ දේ ඉෂ්ට කළ
සේක. ජෙරුසලම පිට පැමිණි මේ විපත්තිවලට
සමාන විපත්ති මුළු අහස යට කිසි ම තැනක සිදු වී
නැත. 13 මෝසෙස්ගේ ව්‍යවස්ථාවේ ලියා තිබෙන
ලෙසෙ මේ සියලු විපත්ති අප පිට පැමිණි නමුත්,
අපගේ අයුතුකම්වලින් හැරී ඔබේ සැබෑකම
තේරුම්ගන්න පිණිස අපගේ සමිඳාණන් වහන්සේට
අපි කන්නලව් නොකළෙමු. 14 එබැවින් සමිඳාණන්
වහන්සේ බලා සිට මේ විපත්ති අපට පැමිණවූ
සේක. මන්ද, අපගේ සමිඳාණන් වහන්සේ කරන හැම
ක්‍රියාවක් ම යුක්ති සහගත ය. අපි උන්
වහන්සේගේ බසට කීකරු නොවීමු.
15 “දැන් ඉතින් අපගේ දෙවි ස්වාමීන් වහන්ස, ඔබේ
බලය පා මිසරයෙන් ඔබේ සෙනඟ පිටතට
ගෙනවුත්, අද කීර්තිමත් නාමයක් දරන අපගේ දෙවි
ස්වාමීන් වහන්ස, අපි පව් කළෙමු, දුෂ්ටකම්
කළෙමු. 16 අනේ ස්වාමීනි, ඔබේ සාධාරණකම
අනුව, ඔබේ උදහසත් කෝපයත්, ඔබේ ශුද්ධ කන්ද
වන, ශුද්ධ නුවර වන ජෙරුසලමෙන් පහ වේවා.
මන්ද, අපගේ පාප සහ අපගේ පියවරුන්ගේ අපරාධ
නිසා, මුළු ජෙරුසලම සහ ඔබේ සෙනඟ අප අවට
සිටින සියල්ලන්ට නින්දාවක් වී ඇත. 17 එබැවින්
අපගේ දෙවියන් වහන්ස, ඔබේ මෙහෙකරුවාගේ
යාච්ඤාව ද ඔහුගේ කන්නලව්ව ද අසා, ඔබේ ම
ගෞරවය සඳහා පාළු වී ගිය ශුද්ධස්ථානය කෙරෙහි
ඔබේ මුහුණ බැබළවේවා මැනව. 18 මාගේ දෙවියන්
වහන්ස, ඔබේ කන් යොමු කර ඇසූ ව මැනව;
ඔබේ ඇස් ඇර අපගේ අසරණකම ද ඔබේ නාමය
දරන නුවර ද බැලුව මැනව. මන්ද, අපගේ කන්නලව්
අප ඔබ ඉදිරියේ ඔප්පු කරන්නේ, අපගේ ම
ධර්මිෂ්ඨකමක් නිසා නොව, ඔබේ ම මහත් දයාව
නිසා ය. 19 සමිඳාණන් වහන්ස, ඇසුව මැනව,
සමිඳාණන් වහන්ස, කමා වුව මැනව; සමිඳාණන්
වහන්ස, සවන් දී ක්‍රියා කළ මැනව. මාගේ දෙවියන්
වහන්ස, ඔබේ ගෞරවය උදෙසා ප්‍රමාද නුවුව
මැනව. මන්ද, ඔබේ නුවරත්, ඔබේ සෙනඟත් ඔබේ
නාමය දරන බැවිනි.”

## ගාබ්‍රියෙල්ගේ පණිවුඩය පහදා දීම

20 මම මෙසේ කතා කරමින් ද යාච්ඤා කරමින් ද
මාගේ පාපයත්, මාගේ සෙනඟ වන
ඉශ්‍රායෙල්වරුන්ගේ පාපයත් ගැන පාපොච්චාරණය
කරමින් ද මාගේ සමිඳාණන් වහන්සේගේ ශුද්ධ
කන්ද උදෙසා උන් වහන්සේ ඉදිරියේ මාගේ
කන්නලව්ව ඔප්පු කරමින් ද සිටියෙමි. 21 ලූක්
1:19,26එසේ මා යාච්ඤා පවසමින් සිටිය දී ම,
කලින් දර්ශනයෙන් මා දුටු මනුෂ්‍යයා වූ ගාබ්‍රියෙල්
ශීඝ්‍රයෙන් පියාසර කර සවස පූජා වේලාවට පමණ
මා ළඟට පැමිණියේ ය. 22 ඔහු පැහැදිලි ලෙස මට
කතා කොට මෙසේ කී ය: “එම්බා දානියෙල්, මා
පිටතට ආවේ, නුඹට තේරුම්ගැනීමේ තියුණු නුවණ
දෙන පිණිස ය. 23 නුඹ කන්නලව් කරන්නට
පටන්ගත් විට ආඥාවක් දෙන ලද්දේ ය. එය නුඹට
දන්වන්නට මම පැමිණියෙමි. මන්ද, නුඹ විශේෂයෙන්
තෝරා ගනු ලැබූ කෙනෙකි. ඒ නිසා කාරණය සලකා
බලා දර්ශනය තේරුම්ගන්න.
24 “නුඹේ ජාතිය හා නුඹේ ශුද්ධ නුවර
සම්බන්ධයෙන් සති සැත්තෑවක් නියමකර ඇත. එවිට
කැරලි ගැසීම නතර කරනු ලබන්නේ ය; පාපය
කෙළවර කරනු ලබන්නේ ය; අපරාධය සමා කරනු
ලබන්නේ ය; සදාතන යුක්තිය පිහිටුවනු ලබන්නේ
ය; දර්ශන හා දිවැස් වැකි ස්ථිර කරනු ලබන්නේ ය;
අතිශුද්ධස්ථානය සංස්කාර කරනු ලබන්නේ ය.
25 එබැවින් මෙය දැනගෙන තේරුම්ගන්න. ජෙරුසලම
නැවත පිහිටුවා ගොඩනඟන්නට කියා ආඥාව නිකුත්
වූ තැන් පටන්, අභිෂේක ලත් අධිපතියාගේ පැමිණීම
දක්වා සති හතක් ගත වන්නේ ය. ඉන්පසු කරදර
සහිත සති හැටදෙකෙක කාලය තුළ වුව ද එහි වීථි ද
ප්‍රාකාර ද නැවත ගොඩනඟනු ලැබේ. 26 සති
හැටදෙකෙකට පසු අභිෂේක ලත් අධිපතියා සිඳදමනු
ලබන්නේ ය. ඔහුගේ තැන ගන්නට කිසිවෙක්
නොවන්නේ ය. ආක්‍රමණය කරන අධිපතියා සහ
ඔහුගේ පිරිස නුවර සහ ශුද්ධස්ථානය විනාශ
කරදමන්නෝ ය. එය ජල ගැල්මකින් මෙන් කෙළවර
වන්නේ ය. අවසානය දක්වා ම යුද්ධ පවතින්නේ ය.
දරුණු දුක නියම වී ඇත. 27 දානි 11:31; 12:11; මතෙ
24:15; මාක් 13:14ඒ අධිපතියා බොහෝ දෙනෙකු

සමඟ සතියකට වලංගු ගිවිසුමක් කරගන්නේ ය.
සතියේ භාගයක් තුළ යාග ද ආහාර පූජා ද
නවත්වනු ලැබේ. මේ සියල්ලේ උග්‍රාවස්ථාවේ දී
බිහිසුණු දූෂිතය දේව මාලිගාව මත පැමිණෙන්නේ
ය. මෙසේ වන්නේ, අන්තිමේ දී බිහිසුණු දූෂිතයට
නියම කර ඇති විනාශය පැමිණෙන තුරු ය."

### දීප්තිමත් මිනිසකු පිළිබඳ දර්ශනය

10 පර්සියා රජු වූ සයිරස්ගේ තුන් වන
අවුරුද්දේ දී බෙල්තෙෂසර් නම් දානියෙල්ට
දර්ශනයක් එළිදරව් කරන ලදී. එය සත්‍ය වූ
දර්ශනයකි. එය මහා යුද්ධයක් පිළිබඳ ව ය. ඔහු
එහි අර්ථය ගැන මෙනෙහි කර දර්ශනය
තේරුම්ගත්තේ ය.
2 "ඒ කාලයේ දී දානියෙල් නම් මම සති තුනක්
මුළුල්ලේ ම වැලපෙමින් සිටියෙමි. 3 ඒ සති තුන ම
පසු වන තුරු මා රස ආහාර කෑවේ වත්, මස් හෝ
මුද්‍රික පානය හෝ මාගේ කටට ගත්තේ වත්,
තෙල් ගාගත්තේ වත් නැත.
4 "පළමු වන මාසයේ විසිහතර වන දා මම
ටයිග්‍රීස් නම් මහා ගංගාව අසබඩ සිටියෙමි. 5 එළිද
1:13-15; 2:18; 19:12එසේ සිටිය දී මා ඇස් ඔසවා
බැලූ විට, සිනිඳු හණ රෙදි හැඳගත්, දඹ රන් බඳ
පටියකින් ඉඟටිය බැඳගත් මිනිසකු දිටිමි.
6 ඔහුගේ ශරීරය වෛදූර්ය කාන්තිය මෙන් ය;
මුහුණ විදුලියේ පෙනීම වැනි ය. ඇස් ගිනි පහන්
මෙන් ය; අත් පා ඔප් නැඟුවා වූ ලෝකඩ මෙන් ය;
කටහඬ සමූහයක කටහඬ වැනි ය.
7 "ඒ දර්ශනය දුටුවේ දානියෙල් නම් මම
පමණකි. මා සමඟ සිටි අය ඒ දර්ශනය දුටුවේ
නැත. එහෙත්, ඔව්හු මහා භීතියකින් කම්පා වී
සැඟවෙන පිණිස පලා ගියහ. 8 ඉතිරි ව සිටියේ මම
පමණකි. මම ඒ දර්ශනය දිටිමි. මාගේ ශක්තිය
පහ ව ගියේ ය. මාගේ කාන්තිමත් පෙනුම මලානික
විය; කිසි ශක්තියක් මට නොවී ය. 9 එවිට ඔහුගේ
කටහඬ මට ඇසුණේ ය. ඒ කටහඬ මට ඇසුණු විට
මම සිහිසන් නැති ව මුණින්තළා වී බිම වැටුණෙමි.
10 එවිට, කෙනෙක් මා අතින් අල්ලා මට දණින් ද
අත් දෙකෙන් ද සිටින්නට සැලැස්සුවේ ය.
11 "ඔහු මට කතා කොට, 'විශේෂයෙන් තෝරාගනු
ලැබූ මනුෂ්‍යයකු වන දානියෙල්, මා නුඹට
කියන්නට යන වචනවලට සවන් දී, නැඟිට කෙළින්
සිටින්න. මන්ද, නුඹ වෙත මම එවන ලද්දෙමි'යි කී
ය. ඔහු ඒ වචන මට කී විට මම වෙවුලමින්
සිටගත්තෙමි.
12 "ඔහු මට කතා කොට, මෙසේ කී ය: 'දානියෙල්,
බිය නොවන්න. නුඹ කරුණු තේරුම්ගැනීමට සැදී
පැහැදී සිටින්නෙහි ය. නුඹේ දෙවියන් වහන්සේට
නුඹ යටහත් වූ පළමු වන දා පටන් නුඹේ වචන
අසනු ලැබී ය. මා පැමිණියේ නුඹේ වචන නිසා ය.
13 එළිද 12:7පර්සියා රාජ්‍යයේ අධිපතියා විසිඑක්
දවසක් මට විරුද්ධ ව සිටියේ ය. එසේ වුව ද,
ප්‍රධාන අධිපතීන්ගෙන් එක් කෙනෙකු වන මිකායෙල්
තමේ, මා එහි තනි ව' සිටින බව දැක, මට
උපකාර කරන්නට ආයේ ය. 14 දැන් මා මෙහි පැමිණ
සිටින්නේ, මතු දවස නුඹේ සෙනඟට සිදු වන්නට
යන දේ තේරුම් කර දෙන පිණිස ය. මේ දර්ශනය
අනාගතය පිළිබඳ ව ය.' "

### දර්ශනය තේරුම් කර දීම

15 ඔහු මෙලෙස මට කතා කරද්දී මම නිහඬ ව
හිස නමාගෙන සිටියෙමි. 16 එවිට මිනිස් පෙනීමක්
ඇති කෙනෙක් මාගේ තොල් ස්පර්ශ කෙළේ ය. මම
ද මාගේ කට ඇර මා ඉදිරියේ සිටි තැනැත්තාට
කතා කරමින්, "මාගේ ස්වාමීනි, මේ දර්ශනය
දැකීමෙන් මම වේදනාවට පත් ව සිටිමි. ශක්තියක් ද
මා තුළ නැත. 17 කිසි ශක්තියක් මා තුළ නැති
නිසාත්, හුස්ම ටික වත් නැති නිසාත්, මාගේ ස්වාමීන්
වන ඔබ සමඟ කතා කරන්නට ඔබේ මෙහෙකරු
වන මට හැක්කේ කෙසේ දැ"යි ඇසීමි.
18 එවිට මිනිස් පෙනීමක් ඇති කෙනෙක් මා ස්පර්ශ
කර මා ශක්තිමත් කෙළේ ය. 19 ඔහු මට කතා කර,
"විශේෂයෙන් තෝරාගනු ලැබූ මනුෂ්‍යය, බිය
නොවන්න; නුඹට සාමදානය වේවා; ශක්තිමත්
වන්න, ධෛර්යවත් වන්නැ"යි කී ය. ඔහු කතා කළ
විට, මම ශක්තිමත් වී, "ස්වාමීනි කතා කළ මැනව;
ඔබ මා ශක්තිමත් කෙළෙහි ය"යි කීමි.
20 එවිට ඔහු මෙසේ කී ය: "මම නුඹ වෙත කුමන
කරුණක් නිසා ආවෙම් දැ යි නුඹ දන්නෙහි ද? පළමු
කොට මම පර්සියාවේ අධිපතියා සමඟ සටන්
කරන්නට ආපසු යන්නෙමි. ඉන්පසු ග්‍රීසියේ
අධිපතියා එන්නේ ය. 21 කෙසේ වුව ද, සත්‍යතා
පොතේ ලියා ඇති දේ නුඹට දන්වන්නෙමි. ඉහත කී
අයට විරුද්ධ ව සටන් කිරීමට නුඹලාගේ අධිපතියා
වන මිකායෙල් මිස මට උපකාර කරන වෙන
කිසිවෙක් නැත.
11 මම මේදීය ජාතික දාරියුස්ගේ පළමු වන
අවුරුද්දේ දී ඔහුට උපකාරයක් ද ආරක්ෂාවක්
ද පිණිස සිටියෙමි. 2 දැන් මම මේවා පිළිබඳ සත්‍යය
නුඹට දන්වන්නෙමි.

### මිසරය හා සිරියා රාජ්‍යයන්

2 "පර්සියාව තුළ තව රජවරු තුන්දෙනෙක් පහළ
වන්නාහ. සතරවැන්නා සියල්ලන්ට වඩා ධනවත්
වන්නේ ය. ඔහුගේ වස්තුව කරණකොටගෙන ඔහු
බලවත් වූ පසු ග්‍රීක් රාජ්‍යයට විරුද්ධ ව සියල්ලන්
පොළඹවන්නේ ය.
3 "එවිට බලසම්පන්න රජෙක් නැඟිට මහත්
පරාක්‍රමයෙන් ආණ්ඩු කරමින් තමාගේ හිතුමතේ
ක්‍රියා කරන්නේ ය. 4 ඔහු බලයට පත් වූ වහා ම
ඔහුගේ රාජ්‍යය බිඳී කොටස් සතරකට බෙදී
යන්නේ ය. ඔහුගේ දරු පරම්පරාවට කිසි උරුමයක්
නොවන්නේ ය. ඔහුගෙන් පසු එන්නන්ට ඔහුගේ
රාජ්‍යය වැනි රාජ්‍යයක් ඇති නොවන්නේ ය.
ඔහුගේ රාජ්‍යය උදුරා දමනු ලැබ ඔවුන්ට නොව,
අන්‍යයන්ට දෙනු ලබන්නේ ය.

5 “එකල මිසරයේ රජ බලවත් වන්නේ ය. ඔහුගේ
අධිපතීන්ගෙන් එක් කෙනෙක් ඔහුට වඩා බලවත් වී
ආණ්ඩු කරන්නේ ය. ඔහුගේ රාජ්‍යය බලසම්පන්න
රාජ්‍යයක් වන්නේ ය. 6 අවුරුදු ගණනක් ගත වූ පසු
ඒ රජවරු දෙදෙනා සුහද ගිවිසුමක් කරගන්නෝ ය. ඒ
සාම ගිවිසුම ස්ථිර කරන පිණිස මිසරයේ රජුගේ
දුව උතුරු සිරියාවේ රජු සමඟ විවාහ වන්නී ය.
එහෙත්, ඇගේ බලය පෑමට ඇට නොහැකි වන්නේ
ය. රජු ද ඒ දෙපොළගේ දරුවන් ද පවතින්නේ නැත.
ඈ ද ඇගේ සපිරිවර ද දරුවා ද ස්වාමි පුරුෂයා ද
පාවා දෙනු ලබන්නෝ ය. 7 එහෙත්, ඇගේ
ඥාතියෙක් මිසරයේ රජකමට පත් වූ විට, ඔහු
සිරියාවේ රජුට විරුද්ධ ව සේනාවක් ගෙන ගොස්,
ඔහුගේ බලකොටුවට ඇතුල් වී සටන් කොට ඔහු
පරාජය කරන්නේ ය. 8 ඔහු සිරියන්වරුන්ගේ
දේවවරුන් ද වාත්තු රූප ද ඒ දේවවරුන්ට කැප කරන
ලද අනර්ඝ රිදී රත්රන් බඩු ද පැහැරගෙන මිසරයට
යන්නේ ය. ඉන්පසු ඔහු අවුරුදු ගණනකට සිරියාවේ
රජුට පහර දීමෙන් වැළකී සිටින්නේ ය. 9 ඒ අතර,
සිරියාවේ රජු ටික කලකට මිසරය ආක්‍රමණය කර
ආපසු සිය රටට පසු බසින්නේ ය.
10 කෙසේ වෙතත් සිරියා රජුගේ පුත්‍රයන් සටන්
කොට, සේනාවන් මහ රාශියක් රැස්කර, ගලා යන
ගංවතුර සේ කඩා බිඳ ඉදිරියට ගොස් සතුරු රජුගේ
බලකොටුව දක්වා ආක්‍රමණය කරනු ඇත. 11 එවිට
රජු ඉමහත් කෝපයෙන් ඉදිරියට අවුත් සිරියාවේ
රජුට පහර දෙන්නේ ය. සිරියාවේ රජු මහා
සේනාවක් සූදානම් කරගෙන ප්‍රතිප්‍රහාර දෙන
නමුත්, ඒ සේනාව පරාජයට පත්වන්නේ ය. 12 මේ
ජයග්‍රහණයෙන් රජ උද්දාම වී, සතුරු සේනාවල
දසදහස් දෙනා මරාදමන්නේ ය. එහෙත්, ඔහුගේ
ජයග්‍රහණය වැඩි කල් පවත්වාගැනීමට ඔහුට
නොහැකි වන්නේ ය.
13 “මන්ද, අවස්ථාව පැමිණි විට සිරියාවේ රජු
පළමු සේනාවට වඩා විශාල සේනාවක් රැස්
කරගෙන, ඇති තරම් යුද්ධෝපකරණ සහිත ව මහ
සේනාවක් සමඟ ආපසු එන්නේ ය. 14 ඒ කාලවල දී
බොහෝ දෙනෙක් මිසරයේ රජුට විරුද්ධ ව සටනට
එළඹෙන්නෝ ය. දර්ශනයේ දැක්වෙන පරිදි නුඹේ
සෙනඟ වන යුදෙව්වරුන් අතරෙන් ත්‍රස්තවාදීහු ද
ඉදිරිපත් වන්නෝ ය. එහෙත්, ඔවුන්ගේ අදහස ඉෂ්ට
නොවන්නේ ය. 15 එවිට සිරියාවේ රජ පැමිණ,
තරයේ බලකොටු බැඳ ඇති නගරය වටලා එය
අල්ලාගන්නේ ය. මිසරයේ රජුගේ සේනාවන්ටත්,
ඔහුගේ තෝරාගත් හමුදාවන්ටත් විරුද්ධ ව නැඟී
සිටින්නට නොහැකි වන්නේ ය. එසේ කිරීමට
ඔවුන්ට ශක්තියක් නොවන්නේ ය. 16 සිරියාවේ රජ
තමන් රිසි පරිදි කරන්නේ ය. ඔහුට විරුද්ධ ව
සිටින්නට කිසිවෙකුට පුළුවන්කමක් නැත. ඔහු
පලස්තීනයේ සිය බලය පිහිටුවා එය සහමුලින් ම
තම බලයට යටත් කරගන්නේ ය.
17 “මිසරයේ රජුගේ රාජ්‍යයන් යටපත් කිරීමට
සිරියාවේ රජ අධිෂ්ඨාන කරගන්නේ ය. ඒ සඳහා
ඔහු සමඟ සාම ගිවිසුමක් කරගෙන, රාජ්‍යය
පෙරළාදැමීමට කාන්තාවක ඔහුට සරණකොට
දෙන්නේ ය. එහෙත්, ඒ උපාය හරියන්නේ වත්,
ඔහුගේ අදහස ඉෂ්ටවන්නේ වත් නැත. 18 ඉන්පසු
ඔහු සිය අවධානය මුහුදුබඩ පළාත් දෙසට යොමුකර
ඒවා බොහොමයක් අල්ලාගන්නේ ය. එහෙත්,
විදේශීය අධිපතියෙක් ඔහුගේ නින්දිත ක්‍රියා නතර
කොට ඔහු පිටට නින්දාව පමුණුවන්නේ ය. 19 එවිට
ඔහු සිය රටේ බලකොටුවලට හැරී එන්නේ ය.
එහෙත් ඔහු එහි දී විපතට පත් වී වැනසී යන්නේ
ය.
20 “ඒ පුරප්පාඩුව පිරවීමට බලහත්කාරයෙන්
කප්පම් අය කරන පිණිස රාජකීය පිරිවරක් සමඟ ම
නිලධාරියෙකු එවන රජ කෙනෙක් එන්නේ ය.
එහෙත්, ඔහු ස්වල්ප දිනකින් කෝලාහලයකින් වත්,
යුද්ධයකින් වත් නොව අප්‍රසිද්ධියෙන් විනාශයට
පත්වන්නේ ය.”

## සිරියාවේ දුෂ්ට රජ

21 ඒ මිනිසා තවදුරටත් මෙසේ විස්තර කළේ ය:
“ඔහුගේ තැන රජයේ ගෞරවය නොදෙන ලද නීච
කෙනෙක් ගන්නේ ය. ඔහු හදිසියෙන් පැමිණ
කූටෝපක්‍රමයකින් රාජ්‍යය ගන්නේ ය. 22 ඔහු
ඉදිරියෙන් සේනාවක් සහමුලින් ම පන්නාදමනු ලබයි;
ගිවිසුමක් කරගත් අධිපතියා ද බිඳ හෙළෙනු ලබයි.
23 ඔහු වංචනික ගිවිසුම් කරගෙන, ඔහුට පක්ෂ ව
ස්වල්ප දෙනෙකු සිටියත්, බලයට පත්වන්නේ ය.
24 ඔහු දේශයේ ඉසුරුමත් තැන්වලට කඩාවැදී
හත්මුතු පරම්පරාවේ වත් නොකරන ලද දේ
කරන්නේ ය. ඔහු උදුරාගත් බඩු ද පැහැරගත් බඩු ද
වස්තුව ද සිය අනුගාමිකයන්ට බෙදා දෙන්නේ ය.
ඔහු බලකොටුවලට විරුද්ධ ව උපායයන්
යොදාගන්නේ ය. එහෙත්, එය ස්වල්ප කලකට
පමණි.
25 “ඔහු ධෛර්යයත්, බලයත් උපදවාගෙන
මිසරයේ රජුට විරුද්ධ ව මහා සේනාවක් ගෙන
යන්නේ ය. මිසරයේ රජ ද අති විශාල බලසම්පන්න
සේනාවක් සමඟ යුද්ධයට එළඹෙන්නේ ය. එහෙත්,
ද්‍රෝහීන් විසින් ඔහුට විරුද්ධ ව යොදනු ලබන
උපායයන් නිසා ඔහුගේ සටන සාර්ථක නොවන්නේ
ය. 26 ඔහුගේ භෝජනයෙන් වළඳන අය ම ඔහුගේ
වැටීමට හේතු වන්නෝ ය. ඔහුගේ සේනාව
විසුරුවනු ලැබ බොහෝ දෙනෙකු මරණයට පත් වනු
ඇත. 27 මේ රජවරු දෙදෙනා ම වංචා සහගත සිත්
ඇති ව එක මේසයේ හිඳගෙන ඔවුනොවුන්ට බොරු
කියන්නෝ ය. එහෙත්, එයින් කිසි වැඩක් වන්නේ
නැත. මන්ද, නියමිත කාලයක් පැමිණෙන්නට තිබෙන
බැවිනි. 28 එවිට සිරියාවේ රජ බොහෝ වස්තු ඇති
ව සිය දේශයට ආපසු එන්නේ ය. ඔහු එසේ
කරන්නේ, ශුද්ධ ගිවිසුමට විරුද්ධ ව සිතේ බලවත්
කෝපයෙන් තමා කැමැති දේ කරමින් ය.
29 “නියමිත කාලයේ දී ඔහු නැවත මිසරයට
විරුද්ධ ව සටනට යන්නේ ය. එහෙත්, මේ ගමන
පළමු ගමන මෙන් නොවන්නේ ය. 30 මන්ද, ඔහුට

විරුද්ධ ව රෝමවරු නැව්වලින් එන්නෝ ය. ඔහු බිය
වී පසුබසින්නේ ය. ඔහු කලකිරී, කෝප වී, ශුද්ධ
ගිවිසුමට විරුද්ධ ව තමා කැමැති දේ කර ශුද්ධ
ගිවිසුම අත් හළ අයට සැලකිලි දක්වන්නේ ය.
31 දානි 9:27; 12:11; මතෙ 24:15; මාක් 13:14ඔහු
විසින් යවනු ලබන සේනාවන් පැමිණ බලකොටුව ද
ශුද්ධස්ථානය ද කලෙසා දමා දනේක පූජා නතර
කොට බිහිසුණු දූෂිතය පිහිටුවන්නේ ය. 32 ගිවිසුමට
ද්‍රෝහිවන්නන් ඔහු ඉච්ඡා බසින් දිනාගන්නේ ය.
එහෙත්, තමන්ගේ දෙවියන් වහන්සේ හඳුනන අය
ස්ථිර ව සිට ඔහුට විරුද්ධ ව නැඟී සිටින්නෝ ය.
33 ජාතියේ ඥානවන්ත නායකයෝ පොදු ජනයාට
නිසි මඟපෙන්වීම දෙන්නෝ ය. එහෙත්, ටික කලකට
ඔව්හු ද ගින්නටත් කඩුවටත්, දාසකමටත්,
කොල්ලකෑම්වලටත් ගොදුරු වන්නෝ ය. 34 කෙසේ
වෙතත් ඔවුන්ට ස්වල්ප පිහිටක් වුව ද ලැබෙන්නේ
ය. බොහෝ දෙනෙක් වාටුවෙන් ඔවුන්ට බැඳෙන්නෝ
ය. 35 ඥානවන්ත නායකයන්ගෙන් සමහර දෙනෙක්
පරීක්ෂා කරනු ලබන පිණිසත්, පිරිසිදු කරනු ලැබ
දීප්තිමත් කරනු ලබන පිණිසත් උවදුරට ගොදුරු
වන්නෝ ය. එසේ වන්නේ, නියමිත අවසාන කාලය
එන තෙක් පමණි.
36 2 තෙස 2:3-6; එළිද 13:5-6 “රජ ද තමන් රිසි
පරිදි ක්‍රියා කර, සියලු දෙවිවරුන්ට වඩා තමා උසස්
කරගෙන, දේවාතිදෙවියන්ට විරුද්ධ ව භයානක
අපහාසික වචන පවසන්නේ ය. දේව උදහස ඉෂ්ට
වන තුරු ඔහු සඵලවත් වන්නේ ය. මන්ද, නියම කර
ඇති දේ ඉෂ්ට වන්නේ ය. 37 ඔහු තමාගේ
පියවරුන්ගේ දෙවිවරුන් වත්, ස්ත්‍රීන් ප්‍රිය කරන
දෙවියා වත්, අන් කිසි දෙවියකු වත් නොසලකා,
සියල්ලන්ට වඩා තමා උසස් කොට සලකන්නේ ය.
38 එහෙත්, තමාගේ පියවරුන් නොදත්, බලකොටුවල
දෙවියාට ඔහු ගරු කොට රන් රිදීවලින් ද
මැණික්වලින් ද අනර්ඝ දයින් ද ඔහු පුදනු ඇත.
39 තමාගේ බලවත් ම බලකොටු ආරක්ෂා කරගන්න
පිණිස ඔහු විදේශීය දෙවියකු අදහන සෙනඟක්
යොදාගන්නේ ය. ඔහු පිළිගන්න අයට ඔහු ගරුනම්බු
දෙන්නේ ය. ඔවුන් සාමාන්‍ය ජනයා කෙරෙහි
ආණ්ඩුකාරයන් කොට පත් කරන්නේ ය. සිය වාසිය
තකා රටේ ඉඩකඩම් විකුණන්නේ ය.

### පීඩා කරන්නාගේ අවසානය

40 “නියමිත අවසාන කාලයේ දී, මිසරයේ රජ
ඔහුට විරුද්ධ ව පැමිණෙන්නේ ය. එහෙත්, සිරියාවේ
රජු සුළි සුළඟක් සේ රථවාහන ද අසරුවන් ද
බොහෝ නැව් ද සමඟ ඔහුට විරුද්ධ ව සටනට
එළඹෙන්නේ ය. ඔහු ගලා යන ජලගැල්මක් සේ
රටවල් උඩින් කඩා බිඳගෙන යන්නේ ය.
41 පලස්තීන දේශයටත් ඔහු කඩා වදින්නේ ය.
රටවල් බොහොමයක් වැටෙන්නේ ය. එහෙත්,
ඒදොම්, මෝවබ් හා අම්මොන්වරුන්ගේ ප්‍රධාන
කොටස් ඔහුගේ අතින් බේරෙන්නේ ය. 42 ඔහු
රටවලට පහර දෙන්නේ ය. මිසරය ද ඔහුගෙන්
බේරෙන්නේ නැත. 43 මිසරයේ නිදන් කොට ඇති
රන් රිදී හා සකල අනර්ඝ දේ ඔහු සිය බලයට
පවරාගන්නේ ය. ලිබියන්වරු ද එතියෝපියන්වරු ද
ඔහුට බැඳෙන්නෝ ය. 44 එහෙත්, නැගෙනහිරෙන් ද
උතුරෙන් ද පැමිණෙන ආරංචිවලට ඔහු කලබල වී
බොහෝ දෙනෙකු සිඳබිඳදමා සමූලඝාතනය කිරීමට
ක්‍රෝධයෙන් පිටත් වන්නේ ය. 45 ඔහු මාලිගාවක්
වැනි ඔහුගේ මණ්ඩපය මුහුදටත්, අලංකාර
කන්දටත් අතරේ පිහිටුවන්නේ ය. එහෙත්, ඔහුගේ
අවසානය පැමිණෙන්නේ ය. ඔහුට උපකාර කරන්නට
කිසිවකේ නොවන්නේ ය.”

### දුක්පීඩාවල අවසානය

12 මතෙ 24:21; මාක් 13:19; එළිද 7:14; 12:7 ඒ
මිනිසා තවදුරටත් මෙසේ කීවේ ය: ඒ
කාලයේ දී, නුඹේ සෙනඟ භාර ව සිටින උතුම්
අධිපතියා වන මිකායලේ නැඟී සිටින්නේ ය. ඒ
කාලය වනාහි, මනුෂ්‍ය ජාතිය ඇති වූ කාලය පටන්
මේ දක්වා කිසි කලක නුවූ විරූ විපත්ති කාලයක්
වන්නේ ය. එහෙත්, නුඹේ සෙනඟගෙන් පොතේ
නම් ලියා ඇති සියල්ලන් ගැළවෙන්නේ ඒ කාලයේ දී
ය. 2 යෙසා 26:19; මතෙ 25:46; ජොහ
5:29පොළොවේ ධූලියට සැතපෙන්නන්ගෙන්
බොහෝ දෙනෙක්, සමහරෙක් සදාකාල ජීවනයටත්,
සමහරෙක් නින්දාව හා සදාකාල පිළිකුලටත් පිබිද
එන්නෝ ය. 3 නුවණැති ජාතියේ නායකයෝ
ආකාශයේ දීප්තිය මෙන් ද සෙනඟ හරි මඟ ගෙන
ගිය අය තාරකාවන් මෙන් ද සදාකාලයට ම
බැබළෙන්නෝ ය.
4 එළිද 22:10 “එහෙත් දානියලේ, නුඹ මේ වචන
රහසේ තබාගෙන අන්තිම කාලය දක්වා පොත
මුද්‍රා කර තබන්න. බොහෝ දෙනෙකු කිසිවක් කර
කියාගත නොහැකි ව ඒ මේ අත දුවනු ඇත. දඬුවම
බරපතල වන්නේ ය.”

### අවසානය

5 එවිට දානියලේ වන මම බැලූ විට, තවත්
දෙදෙනෙකු සිටිනු දිටිමි. එක් කෙනෙකු ගඟෙන්
මෙගොඩ ද එක් කෙනෙකු ගඟෙන් එගොඩ ද සිටිනු
දිටිමි. 6 එවිට සිහින් හණ රෙදි හැඳගෙන ගංගාවේ
වතුරට උඩින් සිටි මනුෂ්‍යයාට මම කතා කොට,
“මේ අරුමපුදුම දේවල් තීන්දු වීමට කොපමණ කල්
ගතවනු ඇද්දැ”යි ඇසුවෙමි. 7 එළිද 10:5; 12:14එවිට,
හණ රෙදි හැඳගෙන ගඟේ උඩහින් සිටි මිනිසා සිය
දකුණත ද වමත ද අහස දෙසට ඔසවා, සදහට ම
ජීවත් වන තැනැන් වහන්සේගේ නමින් දිවුරා,
“අවුරුදු තුනහමාරකට ඒවා පවතිනු ඇත. ශුද්ධවන්ත
සෙනඟගේ බලය නැති වී ගිය පසු මේ සියල්ල
ඉෂ්ට වන්නේ ය”යි කියනු ඇසීමි.
8 මේ වචන මා ඇසූ නමුත්, තේරුම් නොගතිමි.
එවිට මම කතා කරමින්, “මාගේ ස්වාමීනි, මේ
සියල්ලේ ප්‍රතිඵල කුමක් වන්නේ දැ”යි ඇසීමි.

9 ඔහු මෙසේ පිළිතුරු දුන්නේ ය: “දානියලේ, නුඹ
යන දිහාවට යන්න. මන්ද, මේ වචන රහසක් ව
තබා අන්තිම කාලය දක්වා මුද්‍රා කොට තබා ඇත.
10 එළිද 22:11බොහෝ දනෙකේ තමන් ම ශුද්ධ
පවිත්‍ර කරගනෙ ධවල දීප්තියනේ පිරිසිදු වන්නෝ
ය. දුෂ්ටයෝ දුෂ්ටකමහෙි ම නියැලී සිටින්නෝ ය.
ඔවුන්ගනේ කිසිවකේ තේරුම් නොගන්නෝ ය.
එහතේ, නුවණැති නායකයෝ පමණක් තේරුම්ගනිති.
11 දානි 9:27; 11:31; මතෙ 24:15; මාක් 13:14
“දනෛක පූජා නතර කරනු ලැබ, බීභිසුණු දූෂිතය
පිහිටුවනු ලබන කාලය පටන් එක්දාස් දසේියඅනූ
දවසක් ගත වන්නේ ය. 12 එක්දාස් තුන්සිය තිස්පස්
වන දවස දක්වා ජීවත් වන්නෝ වාසනාවන්තයෝ ය.
13 “දානියලේ, නුඹ දැන් ගොස් අන්තිමය වන තුරු
විශ්වාසවන්ත ව සිටින්න. නුඹ සැතපී, දවස්වල
අන්තිමයේ දී නුඹේ කොටස භුක්ති විඳීමට
නැඟිටින්නහෙි ය”යි කීවේ ය.
io1 පරිච්ඡේද 1:1; 3:5 හොසියාගේ විවාහය සහ
පවුල් ජීවිතය.
io1 පරිච්ඡේද 4:1; 13:16 ඉශ්‍රායලේට විරුද්ධ
පණිවුඩය.
io1 පරිච්ඡේද 14:1-9 පසුතැවී සිත් හරවා ගැනීම හා
පොරොන්දු පිළිබඳ පණිවුඩයක්.

# හොසියා

### හැඳින්වීම

ක්රි.පූ. 721 සමාරියේ වැටීමට පෙර ඇති වූ අර්බුද සහිත කාලයේ දී ඉශ්රායලේහි උතුරු රාජ්යයේ හොසියා සිය මෙහෙය කළේ ය. සෙනඟගේ අභක්තියත්, පිළිම වන්දනාවට ලැදියාවත් ඔහු හෙළා දුටුවේ ය. මෙහි වරද සෙනඟට වටහා දෙන පිණිස ඔහු සිය අවාසනාවන්ත විවාහ ජීවිතය උපමා කොට ගත්තේ ය. ඔහුගේ අවිශ්වාසවන්ත බිරිඳ වූ ගෝමෙර් ඔහු අත්හැර වෙනත් ව ගියාක් මෙන් සෙනඟත් සමිඳාණන් වහන්සේ අත්හැර වෙනත් ව ගියහ. මේ නිසා ඉශ්රායලේ සෙනඟ විනිශ්චයකට යටත් වන්නෝ ය. දෙවියන් වහන්සේගේ තිර ප්රේමය කරණකොටගෙන සෙනඟ ආපසු දිනාගෙන දේව-සබඳතාවට ඇතුළත් කරගත් සේක. මේ මහා දේව ප්රේමය සිත් කා වදින වචනවලින් ඔහු මෙසේ ප්රකාශ කරයි:

“ එප්රායිම් ජනයෙනි, මම කෙසේ ඔබ අත්හරිම් ද?
මා අද්මා නුවරට කළාක් මෙන් ඔබටත් මට කළ හැකි ද?
ශෙබොයිම් නුවරට කළාක් මෙන් ඔබටත් කළ හැකි ද?
එසේ කරන්නට මාගේ සිත ඉඩ නොදෙයි.
ඒ ගැන සිතන විට මාගේ සිත කම්පා වෙයි.”

මෙහි අඩංගු කරුණු:
පරිච්ඡේද 1:1; 3:5 හොසියාගේ විවාහය සහ පවුල් ජීවිතය.
පරිච්ඡේද 4:1; 13:16 ඉශ්රායලේට විරුද්ධ පණිවුඩය.
පරිච්ඡේද 14:1-9 පසුතැවී සිත් හරවා ගැනීම හා පොරොන්දු පිළිබඳ පණිවුඩයක්.

1 2 රාජා 14:23-29; 15:1-7,32-38; 16:1-20;
18:1—20:21; 2 වංශා 26:1-23; 27:1-8; 28:1-27;
29:1—32:33 උස්සියා, ජෝතාම්, ආහාස් සහ
හෙසකියා පිළිවෙළින් ජුදාහි රජවරුන් වූ කාලයේ දී ද
ජෝවාෂ්ගේ පුත් ජෙරොබෝවම් ඉශ්රායලේහි රජ ව
සිටි කාලයේ දී ද බෙයේරිගේ පුත් හොසියාට
සමිඳාණන් වහන්සේ දුන් පණිවුඩය මෙසේ ය:

### හොසියාගේ බිරිඳ හා දරුවෝ

2 සමිඳාණන් වහන්සේ හොසියා මඟින් පළමු වරට
ඉශ්රායලේ සෙනඟට කතා කළ විට මෙසේ වදාළ
සේක: “නුඹ ගොස් වෙසඟනක විවාහ කරගෙන
ඇගේ වේශ්යාකමින් දරුපල ලබාගන්න. මන්ද, මේ
රට සමිඳාණන් වහන්සේ කෙරෙන් වෙන් වී යාමෙන්
වෙසඟනකට සමාන වී ඇත.”
3 එවිට, හොසියා ගොස්, දිබ්ලයිම්ගේ දුව වූ
ගෝමෙර් සරණ පාවා ගත්තේ ය. ඈ ඔහුට දාව
ගැබ්ගෙන දරුවකු ලැබුවා ය. 4 2 රාජා
10:11සමිඳාණන් වහන්සේ හොසියාට කතා කොට,
“ඔහුට ‘දෙවියන් වහන්සේ වපුරන සේක’ යන
අර්ථය ඇති ‘ ජෙශ්රයෙලේ’ යන නම තබන්න. මන්ද,
නොබෝ කලකින් ජෙශ්රයෙලේහි කරන ලද ලේ
වැගිරීම්වලට ජේහුගේ වංශයට දඬුවම් කොට, මම
ඉශ්රායලේ වංශයේ රාජ්යය නැති කරන්නෙමි.
5 තවද, ඒ දවසේ දී ඉශ්රායලයේ යුද්ධ බලය මම
ජෙශ්රයෙලේ මිටියාවතේ දී බිඳදමන්නෙමි”යි වදාළ
සේක.
6 යළිත් ගෝමෙර් ගැබ්ගෙන දුවක ලැබුවා ය.
සමිඳාණන් වහන්සේ හොසියාට කතා කොට, “ඇට
‘අනුකම්පා නොලද්දී’ යන අර්ථය ඇති ‘ලෝ-රුහාමා’
යන නම තබන්න. මන්ද, මා නැවත කිසි කලෙක
ඉශ්රායලේ වංශයට කරුණාව දක්වන්නේ වත්, කමා
කරන්නේ වත් නැත. 7 එහෙත්, මම ජුදා වංශයට
අනුකම්පා කරමි. ඔවුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේ වන මම ඔවුන් ගළවන්නෙමි. එසේ
කරන්නේ දුන්නෙන් වත්, කඩුවෙන් වත්, යුද්ධයෙන්
වත්, අශ්වයන්ගෙන් හෝ අසරුවන්ගෙන් වත්
නොවේ ය”යි වදාළ සේක.
8 ලෝ-රුහාමා කිරි වැරවේවායින් පසු ගෝමෙර්
ගැබ්ගෙන තවත් පුතකු ලැබුවා ය. 9 “ඔහුට ‘මාගේ
සෙනඟ නොවේ’ යන අර්ථය ඇති ‘ලෝ-අම්මි’ යන
නම තබන්න. මන්ද, නුඹලා මාගේ සෙනඟ
නොවන්නහු ය. මමත් නුඹලාගේ දෙවියන් වහන්සේ
නොවෙමි”යි සමිඳාණන් වහන්සේ වදාළ සේක.

### ඉශ්රායලෙය යළි සඵලවත් කරනු ලැබීම

10 රෝම 9:26 “එහෙත්, ඉශ්රායලේ ජනයා මුහුදේ
වැලි මෙන් ගිණිය නොහැකි, මැනිය නොහැකි තරම්
විශාල සංඛ්යාවක් වන්නෝ ය. ‘නුඹලා මාගේ
සෙනඟ නොවන්නහු ය’යි කියනු ලැබූ ස්ථානයේ දී
ම, ‘නුඹලා ජීවමාන දෙවියන් වහන්සේගේ දරුවෝ
ය’යි කියනු ලබන දවස පැමිණෙන්නේ ය. 11 ජුදා ද
ඉශ්රායලේ සෙනඟ ද එක්රුස් වී යළිත් එක ම
නායකයකු පත් කර ගන්නෝ ය. ඔව්හු නැවත
වර්ධනය වී සඵලවත් වන්නෝ ය.

2 එසේ ජශ්රෙයෙලේ හට සෞභාග්යවත්
යුගයක් උදා වන්නේ ය. එබැවින් නුඹලාගේ
සහෝදරයන්ට ‘අම්මි’ කියා ද සහෝදරියන්ට ‘රුහාමා’
කියා ද කියන්න.”

### අවිශ්වාසවත් ගොමරේ වැනි ඉශ්රායලේ දේශය

2 “දරුවනෙි, නුඹලාගේ මවුට කන්නලව් කරන්න;
q2[2] කන්නලව් කරන්න.
q2[2] ඈ මාගේ බිරිඳ නොවන්නී ද?
q2[2] මම ඇගේ පුරුෂයා නොවමේ ද?
q2[2] ඇගේ ගණිකා බැල්ම ද තුරුල්ලට ගත්
පමේවතුන් ද පහකරන්නැ යි ඈට කියන්න.
3 එසේ නොකළොත් මම ඇය නිරුවත් කරමි;
q2[3] උපන් දා මෙන් නග්න කරමි.
q2[3] නිසරු මරුකතරක් මෙන් ද වියළුණු පාළුකරයක්
මෙන් ද වනේනට සලස්වන්නමේ.
q2[3] ඇය පිපාසයෙන් නසන්නමේ.
4 ඇගේ දරුවන්ට ද මම අනුකම්පා නොකරමි.
q2[4] ඔව්හු වේශ්යාකමේ දරුපල වෙති.
5 ඔවුන්ගේ මව වසෙඟනකි;
q2[5] ඔවුන් වැදූ තැනැත්තී විලිබිය නැත්තියකි.
q2[5] ඈ මෙසේ කියයි:
q2[5] ‘මාගේ පමේවතුන් පසුපස මම යමි;
q2[5] ඔව්හු මට කෑම හා බීම ද ලොම් හා හණ ද
මාගේ තලේ හා පානය ද දෙති.’
6 එබැවින් ඇගේ මඟ කටුවලින් අසුරන්නමේ;
q2[6] පාර නොපෙනෙන පරිදි පවුරක්
ගොඩනඟන්නමේ.
7 ඈ සිය පමේවතුන් පසුපස ගියත්, ඔවුන් වෙත
පැමිණෙන්නේ නැත;
q2[7] ඔවුන් සොය සොයා ගියත්, ඔවුන් හමු වන්නේ
නැත.
q2[7] එවිට ඈ මෙසේ කියනු ඇත:
q2[7] ‘මම මාගේ පළමු සැමියා වෙත හැරී යමි. මන්ද,
අදට වඩා එදා යහපත් ව තිබිණි.’
8 ධාන්ය ද මිදියුස ද තලේ ද දුන්නේත්, බාල්ගේ
දේව රූප නළෙීමට ගත් රන් රිදී ඈට නොමසුරු ව
දුන්නේත් මා බව ඈ දැන සිටියේ නැත.
9 එබැවින් අස්වැන්න කාලයේ දී මා ඈට දුන්
ධාන්යත්, පල නළෙන කාලයේ දී ඈට දුන් මිදියුසත්
මම ආපසු ගන්නමේ.
q2[9] ඇගේ නිරුවත වසාගැනීමට මා දුන් ලොම් හා
පිළි ඇගෙන් උදුරා ගන්නමේ.
10 දැන් ඇගේ පමේවතුන් බලා සිටිය දී ඇගේ
සලලෙකම මම හෙළි කරන්නමේ.
q2[10] එවිට මා අතින් ඈ මුදාගැනීමට කිසිවකුට
නොහැකි වේ.
11 ඇගේ හැම විනෝදයක් ද මංගල්යයන් හා
අමාවක් උත්සවයන් ද සබත් දිනයන් හා නියමිත
රැස්වීම් ද මම තහනම් කරන්නමේ.
12 ඈ කී පරිදි ඇගේ පමේවතුන් කුලියක් වශයනේ
ඈට දුන් මිදි වැල් හා අත්තික්කා ගස් විනාශ කර
වන ලැහැබක් කර දමමි.
q2[12] වන මෘගයෝ ඒවා කාදමති.
13 ඈ කනකර අබරණ පළඳිමින්, පමේවතුන් පසුපස
දුවමින්, බාල් දේවතාවන්ට සුවඳ දුම් පුදමින් මා
අමතක කළ බැවින් මම ඈට දඬුවම් කරමි.
q2[13] මෙසේ පවසන්නේ සමිඳාණන් ය.”

### සෙනඟට සමිඳාණන් වහන්සේගේ ප්රේමය

14 “එහෙත්, දැන් මම ඇගේ සිත දිනාගෙන,
මරුකතරට ඈ කැඳවාගෙන කරුණාවෙන් ඈට කතා
කරන්නමේ.
15 ජෝෂු 7:24-26 ඈ සතු ව තිබූ මිදි වතු මම ඈට
ආපසු දමේ.
q2[15] ආකොර් නම් අවාසනා නිම්නය වාසනා
දොරටුවක් බවට පමුණුවන්නමේ.
q2[15] එහි දී ඈ යොවුන් වියේ දී මෙන්, මිසර දෙසින්
ආ කල මෙන් මට පිළිතුරු දනෙු ඇත.”
16 සමිඳාණන් වහන්සේ මෙසේ පවසන සේක:
“එවිට ඈ තවත් මට ‘මාගේ බාල් දවේියා’ කියා
නොකියා, ‘මාගේ සැමියා’ කියා මා අමතන්නී ය.
17 මම බාල් දවේවරුන්ගේ නම් ඇගේ මුවින් ඉවත්
කරන්නමේ. ඒ නාම තවත් පවසනු නොලබන්නේ ය.
18 එවිට මම ඉශ්රායලේ සෙනඟ වනෙුවනේ වන
සතුන් ද අහසේ පක්ෂීන් ද බිම බඩගා යන සතුන් ද
සමඟ ගිවිසුමක් කරන්නමේ. මම දුන්න ද කඩුව ද
යුද අවි ද දේශයනේ පහකර දමා, මාගේ සෙනඟ
සුව සේ විසීමට සලස්වන්නමේ. 19 එම්බා
ඉශ්රායලේ දේශය, මම නුඹ සඳහට ම සරණ පාවා
ගනිමි. දැහැමින් හා යුක්තියනේ, ස්ථිර ප්රේමයනේ
හා අනුකම්පාවනේ මම නුඹ සරණ පාවා ගනිමි.
20 විශ්වාසයනේ නුඹ සරණ පාවා ගනිමි. එවිට මා
සමිඳාණන් වහන්සේ බව නුඹ හැඳිනගන්නෙහි ය.
21 ඒ කාලයේ දී මම මාගේ සෙනඟගේ යැදුම්වලට
පිළිතුරු දනේනමේ. මම අහසින් පොළොවට වැසි
වස්වන්නමේ. 22 ධාන්ය ද මිදි ද ඔලීව ද පොළොවේ
හටගන්නේ ය. එවිට ඉශ්රායලේ සරුසාර වන්නේ ය.
23 රෝම 9:25; 1 පේදු 2:10මාගේ සෙනඟ දේශයේ
ස්ථිර කොට පිහිටුවා වර්ධනය කරන්නමේ. ‘ලෝ-
රුහාමා’යි කී සෙනඟට මම අනුකම්පාව දක්වන්නමේ.
‘ලෝ-අම්මි’යි කී ජනයාට ‘නුඹලා මාගේ සෙනඟ ය’
කියා කියන්නමේ. ඔව්හු පිළිතුරු දමේන්, ‘ඔබ අපගේ
දවේියන් වහන්සේ ය’යි කියන්නෝ ය.”

## චපල ස්ත්‍රිය දිනාගැනීමට තැත

3 සමිඳාණන් වහන්සේ යළිත් මට කතා කොට
මෙසේ වදාළ සේක: “අන් පෙම්වතකු ඇති,
කාමමිථ්‍යාචාරය කරන ස්ත්‍රියක වෙත ගොස්, ඈට
පෙම් කරන්න. අන් දෙවිවරුන් වෙත හැරී යන, වියළි
මිදි පලවලින් සෑදූ පිදේනි දෙවිවරුන් වෙත
ගෙනෙයන්න කැමැති ඉශ්රායෙල් සෙනඟට මා තවමත්
ප්‍රේම කරන්නාක් මෙන් ම ඔබත් ඈට පෙම්
කරන්න.”
2 මම ද, රිදී මිල පසළොසක් ද යව කිලෝග්‍රෑම්
එකසිය පණහක් ද දී ඈ ලබාගෙන, 3 ඈට මෙසේ
කීවෙමි: “ඔබ කාමයෙහි වරදවා නොහැසිරෙමින්, අන්
පුරුෂයකු ඇසුරු නොකරමින් ඉන්න. මම ද ඔබ
කෙරෙහි එලෙසෙ සිටිමි.” 4 මෙලෙසෙ ඉශ්රායෙල්
සෙනඟ බොහෝ දවස් රජ කෙනෙකු වත්,
අධිපතියෙකු වත්, පුද පූජා වත්, රූපස්ථම්භ වත්,
පිළිම වත්, ඉටුදෙවි රූප වත්, නැති ව සිටිනු ඇත.
5 ඉන්පසු ඉශ්රායෙල් සෙනඟ තමන්ගේ දෙවි
සමිඳාණන් වහන්සේ ද දාවිත් නම් තමන්ගේ රජු ද
සොයා එන්නෝ ය. මතු කාලයේ දී ඔව්හු ගරුබිය
ඇති ව සමිඳාණන් වහන්සේ වෙත පැමිණ, උන්
වහන්සේගේ යහපත් දීමනා ලබන්නෝ ය.

## ඉශ්රායෙල්වරුන්ට විරුද්ධ චෝදනා

4 ඉශ්රායෙල් ජනයෙනි, සමිඳාණන් වහන්සේගේ
පණිවුඩයට සවන් දෙන්න. මේ දේශයේ
වැසියන්ට විරුද්ධ ව සමිඳාණන් වහන්සේගේ
චෝදනාවක් ඇත. “විශ්වාසකම වත්, කරුණාව වත්,
දෙවියන් වහන්සේ පිළිබඳ දැනුමක් වත් දේශයේ
නැත. 2 බොරු දිවිරීම ද බොරු කීම ද මිනීමැරීම ද
සොරකම ද කාමමිථ්‍යාචාරය ද මීස වෙන කිසිවක්
නැත. ඇත්තේ ලේ වැගිරීම් පිට ලේ වැගිරීම් ය.
3 එබැවින් දේශය වියළී යන්නේ ය. එහි වසන
වනසතුන් හා ආකාශයේ පක්ෂීන් ඇතුළු සියල්ලෝ
ම මලානික වන්නෝ ය. මුහුදේ මත්ස්‍යයෝ පවා
විනාශ වී යන්නෝ ය.

## පූජකයන්ට විරුද්ධ චෝදනා

4 “සෙනඟට විරුද්ධ ව කිසිවෙකේ චෝදනාවක් වත්,
පැමිණිල්ලක් වත් නොකෙරත් වා! මාගේ චෝදනාව
පූජකයන්ට විරුද්ධ ව ය. 5 නුඹලා රෑ දාවල් දෙකේහි
වැරදි පිට වැරදි කරන්නහු ය. දිවැසිවරු ද නුඹලා
සමඟ එසේ ම කරති. නුඹලාගේ මාතෘ භූමියේ
විනාශය නුඹලා ම ය. 6 මා ගැන දැනුමක් නැති
බැවින් මාගේ සෙනඟ විනාශ වී යති. මා ගැන දැනුම
ද දේවාඥා ද ප්‍රතික්ෂේප කර තිබෙන බැවින් මට
පූජකයන් මෙන් සේවය කිරීමෙහි ලා නුඹලා ද
නුඹලාගේ දරුවන් ද මම ප්‍රතික්ෂේප කරමි.
7 “පූජකයන් වැඩි වෙන්න වැඩි වෙන්න ඔව්හු වැඩි
වැඩියෙන් මට විරුද්ධ ව පව් කළහ. එබැවින් මම
ඔවුන්ගේ කීර්තිය අපකීර්තියට හරවන්නෙමි.
8 ඔව්හු මාගේ සෙනඟගේ පාපයෙන් පෝෂ්ය වෙති.
ඔවුන් වඩ වඩා පව් කරනවාටත් ඔව්හු ආශා වෙති.
9 එබැවින් සෙනඟට වන දේ පූජකයන්ටත් සිදු වේ.
මම ඔවුන්ගේ හැසිරීමට යුතු දඬුවම ද ක්‍රියාවලට
නිසි විපාකය ද දෙන්නෙමි. 10 කොපමණ කෑවත්
ඔව්හු තෘප්තියට නොපැමිණෙති. වේශ්‍යාකම් කළත්
ඔව්හු දරුපල නොලබති. එසේ වන්නේ ඔවුන් අන්
දෙවිවරුන් අනුව යන පිණිස මා කෙරෙන් හැරී ගොස්
ඇති බැවිනි.

## දේවතා නමස්කාරය හෙළා දැකීම

11 “කාමසේවනය, සුරා පානය සහ මිදියුස සිහිය
විකල් කරයි. 12 මාගේ සෙනඟ ලී කැබැල්ලකින්
ගුරුකම් සොයති; සැරයටියක් පිළිතුරු දෙයි. ඔව්හු
දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කොට,
වේශ්‍යාකමට වැටුණ ස්ත්‍රියක මෙන් අන් දෙවිවරුන්
වැළඳගෙන සිටිති. 13 ඔව්හු කඳු මුදුන්වල යාග
කරති; හලේ උඩ ඇති ආලෝන, ලිබ්නා, ඒලා යන
ගස්වල සෙවණ හොඳ නිසා ඒවා යට සුවඳ දුම්
ඔප්පු කරති. එබැවින් නුඹලාගේ දූවරු වේශ්‍යාකම්
කරති. භාර්යාවෝ කාමමිථ්‍යාචාරයේ යෙදෙති.
14 නුඹලාගේ දූවරුන්ගේ වේශ්‍යාකම්වලටත්,
ලේලියන්ගේ කාමමිථ්‍යාචාරකම්වලටත් දඬුවම්
නොකරමි. මන්ද, පුරුෂයන් ද දේවාල වෙසඟනක්
සමඟ පුද පූජා කරන බැවිනි. මෙසේ සිහිනුවණ
නැති සෙනඟ විනාශ වන්නෝ ය.
15 “එම්බා ඉශ්රායෙල්වරුනි, නුඹලා වේශ්‍යාකම්
කරන නමුත්, ජුදා එම වරද නොකෙරේ වා!
ගිල්ගාලයට වත්, බෙත්-ආවෙන්ට වත් ගොස්
නමස්කාර නොකරන්න; ජීවමාන සමිඳාණන්
වහන්සේගේ නාමයෙන් එහි දී නොදිවුරන්න.
16 ඉශ්රායෙල් සෙනඟ කුළු මීහරකෙකු මෙන්
මුරණ්ඩු ය. ඒ නිසා තණ පිට්ටනියක බැටළු
පොව්වකු මෙන් සමිඳාණන් වහන්සේ ඔවුන්
පෝෂණය කරන්නේ කෙසේ ද? 17 එප්‍රායිම් ජනයා
දේව රූපවලට වසඟ වී සිටිති. ඔවුන් එසේ
සිටියාවේ. 18 ඔව්හු සුරාසොඬුන් සමඟ විකාර
කරති; කාමමිථ්‍යාචාරයෙහි ම යෙදී සිටිති; ආත්ම
ගෞරවයට වඩා නින්දිතකමට ඇළුම් වෙති.
19 මාරුතය එහි පියාපත්වලින් ඔවුන් ගසාගෙන යනු
ඇත. ඔවුන්ගේ පූජාවලින් ඔව්හු ලජ්ජාවට
පත්වන්නෝ ය.”

## නියත විනාශය

5 “පූජකයෙනි, මයෙට සවන් දෙන්න. ඉශ්රායෙල්
වැසියෙනි, කන් දෙන්න. රජ පවුලට අයිති ඔබ
හැම දෙනා ද සවන් දෙන්න. ඔබ පිට විනිශ්චය
පැමිණෙනු ඇත; මන්ද, ඔබ මිශ්පාහි මලපතක් ද
තාබෝර් මත අතුරන ලද දැලක් ද වී ඇත; 2 ෂිට්ටිම්
මිටියාවතේ ගැඹුරු පාතාලයක් වී ඇත. මම ඔබ
සියල්ලන්ට ම දඬුවම් කරමි. 3 එප්‍රායිම්ගේ හැටි
මම හොඳින් දනිමි. මාගෙන් සැඟවෙන්නට
ඉශ්රායෙල්වරුන්ට බැරි ය. එම්බා එප්‍රායිම්, ඔබ
වේශ්‍යාකම් කර ඇත. ඉශ්රායෙල් දූෂණය වී ඇත.

4 "ඉශ්රායලේ සෙනඟගේ දූෂණ ක්රියා නිසා
ඔවුන්ගේ දෙවියන් වහන්සේ වෙත හැරී එන්න
ඔව්හු අපොහොසත් ය. වේශ්යාකමට වැටුණු
ස්ත්රියක මෙන් ඔව්හු ඔවුන්ගේ ස්වාමීන් නාඳුනති.
5 ඉශ්රායලේ සෙනඟගේ අහංකාරය ඔවුන්ට විරුද්ධ
ව මොරහඬ දෙයි. එප්රායිම් සෙනඟ තමන්ගේ පාප
නිසා පැකිළ වැටෙති; ජුදා සෙනඟ ද ඔවුන් සමඟ ම
වැටෙති; 6 පූජා කරන පිණිස ඔවුන් බැටළුවන් ද
ගවයන් ද රැගෙන සමිඳාණන් වහන්සේ සොයා යන
නමුත්, උන් වහන්සේ ඔවුන්ට සම්බ වන්නේ නැත.
මන්ද, උන් වහන්සේ ඔවුන් අත්හැර ගොස් ඇති
බැවිනි. 7 ඔව්හු සමිඳාණන් වහන්සේට විරුද්ධ ව
ද්රෝහිකම් කළහ. අවජාතක දරුවෝ ඔවුන්ට ඉපදී
සිටිති. එබැවින් විනාශකයා ඔවුන්ගේ වතුපිටි සමඟ
ඔවුන් විනාශ කරන්නේ ය.
8 "ගිබියාහි හොරණෑවක් ද රාමාහි නළාවක් ද
පිඹින්න. බෙත්-ආවෙන් හි යුද්ධ ඝෝෂා නඟන්න.
අහෝ! බෙන්ජමින් සෙනඟෙනි, සතුරා ඔබ පස්සේ
ය. 9 දඬුවම් කිරීමේ දවසේ දී එප්රායිම් නැති
නාස්ති වන්නේ ය. මා ඉශ්රායලේ ගෝත්ර අතරේ
නියත විනාශය ප්රකාශ කර ඇත.
10 "ජුදාහි අධිපතීහු මායිම් කණු වෙනස් කරන්නන්
වැනි ය. ඔවුන් කෙරෙහි මාගේ උදහස ජලගැල්මක්
මෙන් වගුරුවන්නෙමි. 11 එප්රායිම් නිෂ්ඵල දේ
ලුහුබැඳ ගිය බැවින් ඒ දේශය විනිශ්චයයට යට වී
පොඩි වී ඇත. 12 එබැවින් මම එප්රායිම් සෙනඟට
කාවකු මෙන් ද ජුදා සෙනඟට පිළිකාවක් මෙන් ද
වන්නෙමි.
13 "එප්රායිම් තමාගේ රෝගාතුරකම ද ජුදාව
තමාගේ තුවාළ ද දුටු කල එප්රායිම් අසිරියාවට ගිය
නමුත්, ජුදා විසින් මහ රජතුමාට පණිවුඩයක් යවනු
ලැබූ නමුත්, රෝගය වත් තුවාළය වත් සුව කිරීමට
ඒ රජුට බැරි විය. 14 මම එප්රායිම්ට සිංහයකු
මෙන් ද ජුදාට සිංහ නාම්බකු මෙන් ද වන්නෙමි.
මම, මම ම ඔවුන් පිටට කඩාපැන ඔවුන් ඉරාදමා
ඇදගෙන යන්නෙමි. කිසිවකුට ඔවුන් ගැළවිය
නොහැකි ය.
15 "මාගේ සෙනඟ තමන්ගේ වරද පිළිගෙන මා
සොයා එන තුරු මම ඔවුන් අත්හැර මාගේ
වාසභවනයට යන්නෙමි. සමහර විට ඔවුන් දුක්
විඳින විට ඕනෑකමින් මා සොයා එනු ඇත."

## පසුතැවී සිත් හරවා ගැනීමට කැඳවීම

6 "එන්න; අපි සමිඳාණන් වහන්සේ වෙත හැරී
යමු; අප ඉරාදැම්මේ උන් වහන්සේ ය; අප සුව
කරන්නේත් උන් වහන්සේ ය; අපට පහර දුන්නේත්
උන් වහන්සේ ය; අපේ තුවාළ බඳින්නේත් උන්
වහන්සේ ය. 2 දෙදිනකට පසු උන් වහන්සේ අප
ප්රාණවත් කරන සේක; තුන් වන දා අප නැඟුටුවන
සේක. එවිට අපි උන් වහන්සේ ඉදිරියෙහි ජීවත්
වන්නෙමු. 3 අපි සමිඳාණන් වහන්සේ දැන හැඳින
ගැනීමට වීර්ය කරමු. හිරු උදා වෙන සේ නිසැක ව
ම උන් වහන්සේ අප වෙත පැමිණෙන සේක.
වර්ෂාව මෙන්, පොළොව තමෙන මෝසම් වැසි මෙන්
නිසැක ව ම උන් වහන්සේ අප වෙත පැමිණෙන
සේකැ"යි සෙනඟ කියති.

## පූජාව නොව ස්ථිරසාර ප්රේමය

4 "අහෝ! එප්රායිම්වරුනි, මම නුඹලාට කුමක්
කරම් ද? අහෝ! ජුදාවරුනි, මම නුඹලාට කුමක්
කරම් ද? නුඹලාගේ ප්රේමය අලුයම මීදුම වැනි ය;
වහා නැති වී යන පිනි වැනි ය. 5 එබැවින් මම
විනිශ්චයය ද විනාශයේ පණිවුඩය ද රැගත් මාගේ
දිවැසිවරයන් ඔබට විරුද්ධ ව එව්වෙමි. මාගේ
සෙනඟගෙනේ මා බලාපොරොත්තු වන දේ සක්සුදක්
සේ පැහැදිලි ය. 6 මතෙ 9:13; 12:7මම පූජාවලට
වඩා කරුණාවට කැමැත්තෙමි; දවන යාග පූජාවලට
වඩා දෙවියන් වහන්සේ පිළිබඳ අවබෝධයට
කැමැත්තෙමි."

## ඉශ්රායලේවරුන්ගේ දූෂණ

7 "ඉශ්රායලේ සෙනඟ සමඟ අද්මා නම් ස්ථානයේ
දී මා කළ ගිවිසුම ඔව්හු කඩ කළෝ ය. ඔව්හු මට
විරුද්ධ ව ද්රෝහිකම් කළෝ ය. 8 ගිලියද් වනාහි
නපුරු මිනිසුන්ගෙනේ ද මිනී මරුවන්ගෙනේ ද ගහණ වූ
නගරයකි. 9 පූජක පිරිස වූකලී, මිනිසකුට පහර
දීමට සැඟවී සිටින සොර මුළක් හා සමාන ය.
ෂෙකෙම්ට යන මාර්ගයෙහි ම වුව ද ඔව්හු මිනී
මරති. ඔවුන්ගේ ක්රියා ඉතා සාහසික ය.
10 භයංකර දෙයක් ඉශ්රායලේ සෙනඟ අතරේ මට
දකින්නට ලැබී ඇත. එප්රායිම් සෙනඟ වේශ්යාකම්
කර ඇත. ඉශ්රායලේ දූෂ්ය වී ඇත.
11 "එම්බා ජුදා වැසියෙනි! නුඹලාට දඬුවම් දීමේ
කාලයත් මා නියම කර ඇත.

7 ඉශ්රායලේ සෙනඟට සෞභාග්යයත්, සුවයත්
ආපසු දෙන්න මා බලන හැම විට ම මට
පෙනෙන්නේ එප්රායිම්ගේ අයුතුකම් හා සමාරියේ
දුෂ්ටකම් ය. ඔව්හු වංචාකම් කරති; සොරුන් මෙන්
ගෙවල් බිඳ සොරකම් කරති; එයින් පිට මංකොල්ල
කති. 2 ඔවුන් කරන සියලු නපුරු දේ මා අමතක
නොකරන බව ඔවුන්ගේ සිහියට නොනැඟේ.
පාපයෙනේ වට වී සිටින ඔවුන්ට මාගේ ඇස් හමුවෙනේ
සැඟවෙන්න බැරි ය."

## රජ මාලිගාවේ කුමන්ත්රණය

3 "සෙනඟ තමන්ගේ දුෂ්ටකමෙනේ රජු ද
උපායවලින් අධිපතීන් ද රවටති. 4 ඔව්හු සියල්ලෝ
ම කාමමිථ්යාචාරය කරන්නෝ ය. ඔව්හු වනාහි පාන්
පුළුස්සන්නා රත් කළ, ඇනූ පිටි පිපෙන තුරු ගිනියම්
වමින් පවතින ගිනි උදුනට සමාන ය. 5 රජුගේ
උත්සව දිනයේ දී සිය අධිපතීන් මත්පැන් බී වෙරි වූ
විට, රජ ද ඒ කුහකයන් සමඟ එක් වෙයි.
6 ඔවුන්ගේ සිත් කුමන්ත්රණ චේතනාවෙනේ උදුනක්
මෙන් දැවෙන්නේ ය. ඔවුන්ගේ ක්රෝධය රෑ
මුළුල්ලේ දුම් නඟිමින් ඇවිළී උදෑසන පුපුරා පුපුරා
ගිනි ගනියි.

7 "ඔව්හු ගිනි උදුනක් මෙන් කෝපයෙන් දැවී
තමන්ගේ අධිපතීන් මරාදැමූ හ. රජෙකු පාසා රජෙකු
බැගින් මරනු ලැබූ නමුත්, ඔවුන්ගෙන් එක් කෙනෙක්
වත් අයැදුම් නොකෙළේ ය."

### ඉශ්රායෙල්වරුන් හා අන්‍ය ජාතීහු

8 "එප්‍රායිම් සෙනඟ වනාහි අඩක් පිළිස්සූ
රොටියක් හා සමාන ය. ඔව්හු අන්‍ය ජාතීන් සමඟ
මිශ්‍ර වී සිටිති. 9 විදේශිකයෝ ඔවුන්ගේ ශක්තිය
කාදමති. එහෙත්, ඔව්හු ඒ බව නොදනිති. ඔවුන්ගේ
හිසකෙස් අතරින්පතර පැසී ඇති බවත් ඔව්හු
නොදනිති. 10 ඉශ්රායෙල්වරුන්ගේ අහංකාරය
ඔවුන්ට විරුද්ධ ව මොරහඬ නඟයි. කරුණු මෙසේ
වුව ද ඒ සෙනඟ තමන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේ වෙත හැරී උන් වහන්සේ නොසෙව්වෝ
ය. 11 එප්‍රායිම් නුනුවණ, බොළඳ පරවියෙකු හා
සමාන ය. එහි වැසියෝ මිසරයෙන් පිහිට ඉල්ලති.
ඉන්පසු අසිරියාවට දුවති. 12 ඔවුන් එසේ යන කල,
ඔවුන් පිට මම දැලක් හෙළන්නෙමි; කුරුල්ලන් මෙන්
ඔවුන් පහතට ඇද හෙළන්නෙමි. ඔවුන් කර ඇති
නපුරු ක්‍රියාවලට මම ඔවුන්ට දඬුවම් කරන්නෙමි.
13 "ඔවුන් මාගෙන් පලා ගිය නිසා, ඔවුන්ට වන
විපතක මහත! ඔවුන් මට විරුද්ධ ව කැරලිගැසූ නිසා
ඔවුන්ට වන විනාශයක මහත! මම ඔවුන් මුදාගන්න
කැමැති වීමි; එහෙත්, ඔව්හු මට විරුද්ධ ව බොරු කී
හ. 14 ඔවුන් අවංක සිතින් මට යාච්ඤා කර නැත. ඒ
වෙනුවට ඔව්හු බිය වැදී කෑමොරගසති. ධාන්‍ය ද
මිදියුස ද ඉල්ලන විට, ඔව්හු ඇනකොටාගනිමින් මට
විරුද්ධ ව කැරලිගසති. 15 ඔවුන්ට සවිශක්තිය දෙමින්
ඔවුන් ඇතිදැඩි කළේ මම ය. එහෙත්, ඔව්හු මට
විරුද්ධ ව කුමන්ත්‍රණය කරති. 16 ඔව්හු මා වෙතින්
හැරී බාල් දෙවිවරුන් කරා යති. ඔව්හු වනාහි හරි
නැති දුන්නක් වැනි ය. ඔවුන්ගේ අධිපතීහු අහංකාර
ලෙස කතා කරන නිසා කඩුවෙන් විනාශ වෙති. මිසර
දේශ වැසියන් ඔවුන්ට සිනාසෙනු ඇත."

### දේවතා නමස්කාරය ගැන චෝදනා

8 "හොරණෑව පිඹින්න; මන්ද, රාජාලියෙකු මෙන්
සතුරෝ සමිඳාණන් වහන්සේගේ ගෘහය පිට
පැමිණෙන්නෝ ය. මාගේ සෙනඟ මාගේ ගිවිසුම
කඩ කර, මාගේ ආඥාවලට විරුද්ධ ව කැරලිගැසූ හ.
2 'ඔබ අපේ දෙවියන් වහන්සේ ය, අපි ඔබ හඳුනමු'
කියා ඉශ්රායෙලය මොරගසති. 3 එහෙත්, ඔවුන්
යහපත එපා කර ඇත. එබැවින් සතුරෝ ඔවුන්
ලුහුබැඳ යති.
4 "ඔව්හු මාගේ කැමැත්ත නැති ව රජවරුන්
තෝරාගත්හ; මාගේ අනුමැතිය නැති ව අධිපතීන්
පත් කළහ; ඔවුන්ගේ විනාශයට හේතු වන දේව
පිළිම ඔවුන්ගේ රන් රිදීයෙන් තනාගත්හ.
5 සමාරියේ වැසියෙනි, නුඹලා නමස්කාර කළ රන්
වස්සා මම ප්‍රතික්ෂේප කළෙමි. ඔවුන්ට විරුද්ධ ව
මාගේ උදහස ඇවිළී ඇත. ඔවුන් නිදොස් මඟට
පැමිණෙන්නේ කොපමණ කල් ගත වේ ද? 6 ඒ රන්
වස්සා සෑදුවේ ඉශ්රායෙලේ කම්කරුවෙකි ය. එය
දෙවියෝ නොවෙති. සමාරියෙහි නමස්කාර කරන ඒ
වහු පිළිමය මම කැබලි කර දමමි. 7 ඔව්හු සුළඟ
වපුරා, සුළි සුළඟ කපාගනිති; ගොයම් කරල් නැත,
කරල් තිබුණත් විදේශීන් ඒවා ගිලදමනු ඇත.
8 ඉශ්රායෙලය ගිල ගනු ලැබී ය; දැනට ම අන්‍ය
ජාතීහු ඔවුන් පලක් නැති බඳුනක් සේ සලකති.
9 රැළෙන් වෙන් වූ වල් කොටළුවෙකු සේ ඔවුන්
අසිරියාවට ගොස් ඇත. එප්‍රායිම් ජාතිය පෙම්වතුන්
කුලියට ගන්න පිණිස අන්‍ය ජාතීන්ට මුදල් ගෙවා
ඇත. 10 ඔවුන් ජාතීන් අතරෙන් ජනයා කුලියට
ගන්න නමුත්, දැන් මම ඔවුන් එක්රැස් කොට
ඔවුන්ට දඬුවම් කරමි. අසිරියාවේ රජු නොපෙමා ව
ඔවුන්ට පීඩා කරන විට ඔව්හු වේදනාවෙන් මිරිකී
යන්නෝ ය.
11 "එප්‍රායිම් සෙනඟ පව් කිරීම සඳහා වැඩි
වැඩියෙන් පූජාසන තනාගෙන ඇත. වැඩි වැඩියෙන්
පව් කිරීමට ඒවා හේතු වී තිබේ. 12 සෙනඟ උදෙසා
මාගේ ආඥා දසදහස් ගණන් මා ලියා දුන්නත් ඔව්හු
ඒවා බාහිර දේවල් සේ ප්‍රතික්ෂේප කළහ.
13 මාංස පූජා කිරීමටත්, පූජා කරන මස් කෑමටත්
ඔව්හු කැමැති ය. එහෙත්, සමිඳාණෝ එය ප්‍රිය
නොකරන සේක. දැන් උන් වහන්සේ ඔවුන්ගේ
අයුතුකම් සිහි කොට, ඔවුන්ගේ පාපවලට නිසි
දඬුවම් දෙන සේක. ඔවුන් ආපසු මිසර දේශයට
යනු ඇත.
14 "ඉශ්රායෙලේ දේශයේ සෙනඟ ඔවුන්ගේ
මැවුම්කාරයාණන් අමතක කර, තමන්ට මාලිගා
තනාගත්හ. ජුදා දේශයේ සෙනඟ සුරක්ෂිත වන
පිණිස බලකොටු නගර වැඩි වැඩියෙන් තනාගත්හ.
එවිට සමිඳාණන් වහන්සේ ඔවුන්ගේ ඒ නගර පිට
ගින්නක් එවන සේක, එයින් එහි මාලිගා දැවී
වැනසෙනු ඇත."

### ඉශ්රායෙලේ පිට පැමිණෙන දඬුවම්

9 "ඉශ්රායෙලේ ජනයෙනි, විජාතීන් මෙන් ප්‍රීති
උත්සව නොපවත්වන්න. මන්ද, නුඹලා දෙවියන්
වහන්සේට අවිශ්වාසවන්ත වී අන් දෙවිවරුන්
වැළඳගෙන ඇත. නුඹලා සියලු කමත්වල දී
වේශ්‍යාවන්ගේ පණයම් ලබන්නට ලොල් වූවහු ය.
2 එබැවින් කමත වත් මිදි යන්ත්‍රය වත් නුඹලාට
ආහාර සපයන්නේ නැත; අලුත් මිදියුස කිසිත්
ලැබෙන්නේ නැත. 3 එප්‍රායිම් සෙනඟට සමිඳාණන්
වහන්සේගේ දේශයෙහි වාසය කිරීමට නොහැකි ව
ඔවුන්ට ආපසු මිසර දේශයට යන්න සිදු වන්නේ ය;
අසිරියාවේ දී අපිරිසිදු කෑම කන්න ඔවුන්ට සිදු
වන්නේ ය. 4 සමිඳාණන් වහන්සේට මිදියුස
පුදන්නට වත්, උන් වහන්සේට පුද පූජා කරන්නට
වත් ඔවුන්ට නොහැකි වන්නේ ය. ඔවුන්ගේ කෑම
මළ ගෙවල කෑම මෙන් ය. ඒවා කන සියලු දෙන
අපවිත්‍ර වන්නෝ ය. ඔවුන්ගේ කෑම ඔවුන්ගේ ම
කුසගිනි නිවීමට මිස, සමිඳාණන් වහන්සේගේ
මාලිගාවේ පිදීමට සුදුසු නොවේ. 5 එසේ නම්,

සමිඳාණන් වහන්සේගේ නියමිත උත්සව හා පූජා
මංගල්‍යයන් පැවැත්වීමේ කාලය පැමිණි විට ඔව්හු
කුමක් කරන්නෝ ද? 6 ඔවුන් විනාශයෙන් පලා
ගොස් ඇත. මිසර වැසියෝ ඔවුන් එක්රැස් කර,
මෙම්ෆිස්හි භූමදාන කරන්නෝ ය. ඔවුන්ගේ රිදී
වස්තුව කහඹිලියා පැළවලින් ද ගේ දොරවල්
ගොකටුවලින් ද වැසී යන්නේ ය.
7 ලූක් 21:22 "දඬුවම් දීමේ කාලය පැමිණ තිබේ;
සෙනඟ දුර්විපාක ලැබීමේ කාලය පැමිණ තිබේ.
මේ දිවැසිවරයා මෝඩයෙකේ ය; දේව ආත්මානුභාවය
ඇති මේ මිනිසා පිස්සෙකේ යයි ඉශ්‍රායලේ
දැනගන්නවා ඇත. නුඹලා මට එසේ ද්වේෂ
කරන්නේ නුඹලාගේ අධික පාපය හා දැඩි කෝපය
නිසා ය. 8 දිවැසිවරයකු වශයෙන් ඔහු මා එවා
ඇත්තේ සමිඳාණන් වහන්සේගේ සෙනඟ වන
එප්‍රායිම්ට තදින් අවවාද කිරීමට ය. එහෙත්, පක්ෂි
වැද්දා යන යන තැන පක්ෂියකු මලපතකට අසු
කරගන්න උත්සාහ කරන්නා සේ නුඹලා මා අසු
කරන්නහු ය; දෙවියන් වහන්සේගේ මාලිගාවේ ම
සතුරෝ වී සිටිති. 9 වීරා 19:1-30ගිබියාහි දී මෙන්
ඔව්හු අතිශයෙන් දූෂණය වී සිටිති. දෙවියන්
වහන්සේ ඔවුන්ගේ පව් සිහි කොට ඔවුන්ගේ
පාපවලට දඬුවම් දෙන සේක."

## ඉශ්‍රායලේවරුන්ගේ පාපය සහ එහි විපාකය

10 ගණන් 25:1-5 "ඉශ්‍රායලේ සෙනඟ මට හමු
වූයේ කාන්තාරයේ මුද්‍රික පල මෙන් ය. මා
නුඹලාගේ මුතුන්මිත්තන් මුලින් ම දුටු විට, පළමු
සෘතුවේ අත්තික්කාවල නාඹුල් පල දැකීමක් මෙන්
විය. එහෙත්, බාල්-පයෝරේ නම් ස්ථානයට පැමිණි
විට ඔව්හු නින්දිත බාල් දේවතාවන්ට කැප වූ හ.
එබැවින් ඔවුන් දේවතාවන්ට ඇළුම් වූ තරමට ම මම
ඔවුන් පිළිකුල් කළෙමි. 11 එප්‍රායිම්ගේ තේජස,
ඉගිළී යන කුරුල්ලකු මෙන් පහ වී යන්නේ ය.
දරුවන් ඉපදීමක් වත්, ගැබ් ගැනීමක් වත්, පිළිසිඳ
ගැනීමක් වත් තවත් නොවන්නේ ය. 12 ඔවුන්
දරුවන් ඇතිදැඩි කරතත්, ඉන් එකකු වත් ඉතිරි
නොවන පරිදි මම ඔවුන් තුරන් කරන්නෙමි. මා මේ
සෙනඟ අත් හැරදමා ගිය විට ඔවුන්ට වන විපතක
මහත!"
13 මට දැන් පෙනෙන හැටියට එප්‍රායිම් සෙනඟ
ඔවුන්ගේ දරුවන් ගොදුරු කොට දෙනු ඇත. මරනු
ලබන පිණිස ඔවුන් ගෙන යා යුතු ය. 14 'සමිඳුනි,
මේ සෙනඟට දෙනු මැනව' කියා, මම ඔබෙන් කුමක්
ඉල්ලම් ද? දරුපල නොදෙන ගර්භ ද කිරි නොඑරෙන
තන ද ඔවුන්ට දුන මැනව.

## එප්‍රායිම් පිළිබඳ සමිඳුන්ගේ විනිශ්චය

15 "ඔවුන්ගේ සියලු දුෂ්ට ක්‍රියා පටන් ගත්තේ
ගිල්ගාල්හි දී ය. ඔවුන්ට ද්වේෂ කරන්නට මා
පටන්ගත්තේ එහි දී ය. ඔවුන් කර ඇති නපුරු ක්‍රියා
නිසා මාගේ දේශයෙන් මම ඔවුන් පලවා හරිමි. මම
ඔවුන්ට තවත් ප්‍රේම නොකරමි. ඔවුන්ගේ සියලු
අධිපතීහු මට විරුද්ධ ව කැරලිගැසූ හ. 16 එප්‍රායිම්
සෙනඟ විනාශ වී ඇත; මුල් වියළී ගිය පල නොදරන
ගසක් හා සමාන ය. ඔවුන්ට දරුපල ඇතිවුණත් මම
ඔවුන්ගේ ඒ ප්‍රියාදර දරුවන් විනාශ කර දමමි."
17 ඔවුන් මාගේ දෙවියන් වහන්සේට කීකරු නොවූ
නිසා උන් වහන්සේ ඔවුන් පහකරදමන සේක. ඔව්හු
විජාතීන් අතරේ මුළා වූ අය වන්නෝ ය.

## ඉශ්‍රායලේ ගැන දිවැසිවරයන්ගේ විවේචන

10 ඉශ්‍රායලේ සෙනඟ බොහෝ පල දරන සරු
මිදි වැලක් මෙන් වූ හ. ඔවුන්ගේ පල වැඩි
වන්න වැඩි වන්න ඔව්හු වැඩි වැඩියෙන් පූජාසන
සාදාගත්හ. ඔවුන්ගේ දේශය වර්ධනය වූ පමණට
ඔව්හු පූජනීය රූපස්ථම්භ වැඩි කරගත්හ.
2 ඔවුන්ගේ සිත් භේද භින්න වී ඇත. ඔවුන්
තමන්ගේ පාපයට දඬුවම් විඳිය යුතු ය. දෙවියන්
වහන්සේ ඔවුන්ගේ පූජාසන කඩාදමා ඔවුන්ගේ
පූජනීය රූපස්ථම්භ විනාශ කරනු ඇත.
3 මේ සෙනඟ නොබෝ කලකින් මෙසේ කියනු
ඇත: "අප දෙවියන් වහන්සේට ගරුබිය නොදැක්වූ
බැවින් අපට රජ කෙනෙකේ නැත. එහෙත්, රජ
කෙනෙකුගෙන් අපට වැඩක් ඇද් ද? 4 ඔවුන් හිස්
වචන පවසනු ඇත; බොරු පොරොන්දුවලින් ගිවිසුම්
කරනු ඇත. එබැවින් නඩුහබ කෙතේ ඕවිටිවල විෂ
පැළෑටි මෙන් පැතිර යයි.
5 "සමාරිය වැසියෝ බෙත්-ආවෙන්හි වහු පිළිමය
නිසා වෙව්ලමින් සිටිති. ඔව්හු දුක් වන්නෝ ය.
ඔවුන්ගේ කපුවෝ ද රන් වහු පිළිමයේ අලංකාරය
පහකරනු ලැබූ නිසා හඬා වැලපෙති. 6 එය
අසිරියාවට, එහි මහා රජුට, පඬුරක් වශයෙන්
ගෙනයනු ලබන්නේ ය. එප්‍රායිම් ලජ්ජාවට පත් වනු
ඇත. ඉශ්‍රායලේ සෙනඟ පිළිගත් අවවාද නිසා ඔව්හු
ලජ්ජා වන්නෝ ය. 7 සමාරියේ රජ වතුරට
ගසාගෙන යන ලී පතුරක් සේ පහ වී යන්නේ ය.
8 ලූක් 23:30; එළිද 6:16ඉශ්‍රායලේ සෙනඟගේ පාපය
වන ගිරිකුළු දේවාල වනසනු ලබනවා ඇත. කටු හා
ගොකටුවලින් ඔවුන්ගේ පූජාසන වැසී යන්නේ ය.
'අප සඟවා ගන්නැ'යි කඳුවලටත්, 'අප පිට වැටේ
වා'යි හලේවලටත් සෙනඟ කියනු ඇත."

## ඉශ්‍රායලේ පිළිබඳ සමිඳුන්ගේ තීන්දුව

9 වීරා 19:1-30 "එම්බා ඉශ්‍රායලේ ජනයෙනි,
ගිබියාහි පව් කරන්නට පටන්ගත් දා පටන් නුඹලා
මට විරුද්ධ ව පව් කිරීම නතර කර නැත. ඒ නිසා
ගිබියාහි දී ඔවුන් කරා යුද්ධය පැමිණෙන්නේ නැද් ද?
10 මේ පාපිෂ්ට සෙනඟට දඬුවම් දෙන පිණිස මම
පහර දෙමි. ජාතීන් ඔවුන්ට විරුද්ධ ව නැඟී අවුත්
දෙවැදෑරුම් පාප නිසා ඔවුන්ට දඬුවම් කරනු ඇත."
11 "එප්‍රායිම් වනාහි, ගොයම් පෑගීමට කැමැති
මනා සේ පුහුණු කරන ලද එළ නැම්බියකි. ඇගේ
ශෝභන කර පිට වියගහක් දමා ඇත. එහෙත්,
හාන්නට එප්‍රායිම් යොදා ගැන්මට මම තීරණය
කරගතිමි. ඇගේ නගුල ජුදා විසින් ද ඇගේ දැති

පෝරුව ජාකොබ් විසින් ද අදිනු ලබන්නට මම
සැලැස්සුවෙමි. 12 ජරෙ 4:3ඔබ උදසො ධර්මිෂ්ඨකම
වපුරාගන්න; ස්ථිර ප්‍රේමයට සුදුසු පල නෙළාගන්න.
පුරන් බිම කොටන්න. නුඹේ සමිඳාණන් වහන්සේ
වෙත හැරෙන්නට දැන් කාලය හරි ය. එවිට උන්
වහන්සේ පැමිණ නුඹලා පිට ගැළවීමේ වැසි වස්වන
සේක. 13 එහෙත්, නුඹලා දුෂ්ටකම හෑවහු ය;
අයුතුකම කපාගත්තහු ය; මුසාවාදයේ ප්‍රතිඵල
අනුභව කළහු ය. එසේ වූයේ නුඹලා තමන්ගේ ම
යුද්ධ රථ කෙරෙහි ද නුඹලාගේ විශාල භට
සංඛ්‍යාව කෙරෙහි ද විශ්වාසය තැබූ බැවිනි.
14 එබැවින් නුඹලාගේ සෙනඟ පිට යුද්ධය
පැමිණෙන්නේ ය; නුඹලාගේ සියලු බලකොටු විනාශ
වන්නේ ය. ඒ දවස ෂල්මාන් රජු විසින් යුද්ධයේ දී
බෙත්-අර්බේල් නගරය විනාශ කරනු ලැබූ, මවුවරුන්
ද දරුවන් ද දරුණු ලෙස මරනු ලබන දවසට සමාන
වන්නේ ය. 15 ඉශ්රායලේ ජනයෙනි, නුඹලා කර ඇති
බලවත් නපුරුකම් නිසා නුඹලාටත් වන්නේ මේ
විපත ම ය. යුද ගිනි ඇවිලෙන විට ඉශ්රායලේ
සහමුලින් ම වනසා දමනු ලබනවා ඇත.”

### ද්‍රෝහී සෙනඟට දෙවියන් වහන්සේගේ ප්‍රේමය

11 නික්ම 4:22; මතෙ 2:15 “ඉශ්රායලේ බාල
වියේ දී මම ඔහුට ප්‍රේම කළෙමි;
q2
11 මා පුත් ඔහු මිසරයෙන් කැඳවාගතිමි.
2 මා ඔවුන් පුතකු සේ සලකන්න සලකන්න
ඔව්හු වඩ වඩා මට පිටුපා යන්න ගියෝ ය.
q2[2] ඔව්හු බාල් දේවතාවන්ට පූජා කළහ;
q2[2] කැපූ රූපවලට සුවඳ දුම් ඔප්පු කළහ.
3 එප්‍රායිම් සෙනඟට ඇවිදින්නට ඉගැන්නුවේ මම
ය.
q2[3] දෑතින් ඔවුන් වඩාගත්තේ මම ය.
q2[3] එහෙත්, මා ඔවුන් රැකබලාගත් බව ඔව්හු
නොදැන සිටියෝ ය.
4 දයාවේ රැහැන්වලින් ද ප්‍රේමයේ බැමිවලින් ද
මම ඔවුන්ට මඟ පෙන්නුවෙමි.
q2[4] ළදරුවකු ඔසවන සේ මම ඔවුන් මාගේ
මුහුණට ඔසවාගතිමි;
q2[4] පහතට නැමී ඔවුන්ට කෑම කැව්වෙමි.
5 “ඔවුන් මා වෙත හැරී එන්නට අකමැති නිසා
ඔවුන්ට මිසරයට ආපසු යන්න සිදු වේ. අසිරියා රජු
ඔවුන් පාලනය කරනු ඇත. 6 ඔවුන්ගේ කුමන්ත්‍රණ
නිසා ඔවුන්ගේ නගරවල යුද්ධ හටගෙන, එහි
දොරටුවල පොලු බිඳ වැටී ඔවුන් විනාශ වනු ඇත.
7 ඔවුන් මට පිටුපා ගොස් ඇති බැවින් ඔවුන්ට වන
විපතෙන් ඔවුන්ට බේරෙන්න බැරි ය. ඔවුන් පිට
පැමිණි වියගහ නිසා ඔවුන් වැලපෙනු ඇත. එහෙත්,
එය ඉවත් කරන්නට කිසිවෙක් ඉදිරිපත් නොවෙති.
8 ද්වි.නී. 29:23 “එප්‍රායිම් ජනයෙනි, මම කෙසේ
ඔබ පාවා දෙන්නෙම් ද?
q2[8] ඉශ්රායලේ, ඔබ කෙසේ අත්හරිම් ද?
q2[8] මා අද්මා නුවරට කළාක් මෙන් මට ඔබටත් කළ
හැකි ද?
q2[8] ශබෝයිම් නුවරට කළාක් මෙන් ඔබටත් කළ
හැකි ද?
q2[8] එසේ කරන්නට මාගේ සිත ඉඩ නොදෙයි.
q2[8] ඒ ගැන සිතන විට මාගේ සිත කම්පා වෙයි.
9 දැඩි කෝපයට මම ඉඩ නොදෙමි.
q2[9] මම නැවත එප්‍රායිම් විනාශ නොකරමි.
q2[9] මන්ද, මම මනුෂ්‍යයකු නොව දෙවියන්
වහන්සේ වෙමි.
q2[9] ඔබ සමඟ සිටින ශුද්ධ තැනැන් වහන්සේ මම
ය, විනාශ කරන්නට මට ආශාවක් නැත.
q2[9] කෝපයෙන් මම ඔබ වෙත නොඑමි.
10 “ඔව්හු සමිඳාණන් වහන්සේ පසුපස්සේ
එන්නෝ ය. මම සිංහයකු සේ ගොරවමි. මා
ගොරවන විට දරුවෝ ද වෙව්ලමින් බටහිර සිට
එන්නෝ ය. 11 ඔව්හු කුරුල්ලන් මෙන් මිසර
දේශයෙන් ද පරවියන් මෙන් අසිරියාවෙන් ද විගසින්
එන්නාහ. මම නැවත ඔවුන්, ඔවුන්ගේ නිවාසවලට
ගෙනෙන්නෙමි. සමිඳාණන් වහන්සේ වන මම මෙසේ
කීවෙමි.”

### ඉශ්රායලේට හා ජුදාට විරුද්ධ චෝදනා

12 “එප්‍රායිම් බොරුවෙන් ද ඉශ්රායලේ සෙනඟ
වංචාවෙන් ද මා වට කරගෙන සිටිති; විශ්වාසී, ශුද්ධ
තැනැන් වහන්සේ වන දෙවියන් වහන්සේට විරුද්ධ
ව ජුදා සෙනඟ තවමත් කැරලි ගසමින් සිටිති.
12 එප්‍රායිම් පෙරදිග සුළඟ පස්සේ දුවමින්
එයින් වාසි ගැනීමට මාන බලති. බොරුව ද
අපරාධය ද ඔවුන් අතර අධික වී ඇත. ඔව්හු
අසිරියාව සමඟ ගිවිසුම් ද මිසර දේශය සමඟ තලේ
ගනු දෙනු ද කරගනිති.”
2 උත් 25:26 උත් 32:24-26 ජුදාහි සෙනඟට විරුද්ධ
ව සමිඳාණන් වහන්සේට පැමිණිල්ලක් ඇත. තවද,
උන් වහන්සේ ජාකොබ් සෙනඟගේ හැසිරීමට නිසි
දඬුවම දෙන සේක. ඔවුන්ගේ ක්‍රියාවලට නිසි
විපාකය දෙන සේක. 3 මවු කුසයේ සිටිය දී ම
ජාකොබ් සිය සහෝදරයා රැවටුවේ ය. ඔහු
වැඩිහිටියකු වූ විට දෙවියන් වහන්සේට විරුද්ධ ව
පොරබැදුවේ ය. 4 උත් 28:10-22ඔහු දේව දූතයකු
සමඟ පොරබදා ජයගත්තේ ය. ඔහු හඬා
ආශීර්වාදයක් ඉල්ලුවේ ය. උන් වහන්සේ ඔහුට
සම්බ විය. උන් වහන්සේ බෙතෙල්හි දී ඔහු සමඟ
කතා කළ සේක. 5 මම වනාහි සියලු බලැති දෙවි
සමිඳාණන් වහන්සේ ය. උන් වහන්සේගේ නාමය
සමිඳාණන් වහන්සේ ය. 6 එබැවින් නුඹලා දෙවියන්
වහන්සේ වෙත හැරී, ප්‍රේමයෙන්, යුක්තිගරුක ව
උන් වහන්සේ කෙරෙහි නිරන්තර
බලාපොරොත්තුවෙන් සිටින්න.

## ඉශ්රායලේට විරුද්ධ ව තවත් චෝදනා

7 ඉශ්රායලේ සෙනඟ කානානි ජාතික වෙළෙන්දන්
මෙන් හොර තරාදි ඇති ව අනුන් රුවටීමට ප්රිය
වෙති. 8 එසේ වුව ද, “අපි ධනවත් ය; වස්තු
සම්භාර රැස් කරගෙන සිටිමු; ‘වංචාවෙන් ඔව්හු
පොහොසත් වූ හ’යි අපට චෝදනා කරන්නට
කිසිවෙකුට බැරි ය”යි එප්රායිම් සෙනඟ කියති.
9 ලෙවී 23:42-43මිසර දේශයෙන් ගෙනෙ දා සිට
නුඹලාගේ දෙවි සමිඳාණන් වහන්සේ මම ය.
පාළුකරයේ දී මෙන් නුඹලා කූඩාරම්වල ජීවත් වුණා
සේ ම ඉදිරියටත් නුඹලා කූඩාරම්වල වාසය
කරවන්නෙමි.
10 ඇරත් මම දිවැසිවරයන්ට කතා කොට, “මම ම
බොහෝ දර්ශන පෙන්වා දිවැසිවරුන් මඟින් උපමා
භාවිතා කළෙමි. 11 ගිලියද්හි ඔවුන් අයුතුකම් කර
ඇත. ඔව්හු සහමුලින් ම නිෂ්ඵල ය. ඔව්හු ගිලියද්හි
ගොනුන් පූජා කරති. එසේ ය, ඔවුන්ගේ පූජාසන ද
කෙතේ හීවිටි මත තිබෙන ගල් ගොඩවල් වැනි ය.”
12 උත් 29:1-20 ජාකොබ්ට මෙසොපොතේමියාවට
පලා යන්නට සිදු විය. එහි දී භාර්යාවක ලබාගන්න
පිණිස සේවය කරමින් බැටළුවන් බලාගත්තේ ය.
13 නික්ම 12:50-51සමිඳාණන් වහන්සේ
දිවැසිවරයකු ලවා මිසර දේශයෙන් ඉශ්රායලේ
මුදාගත් සේක. දිවැසිවරයකු ලවා ඔවුන් ආරක්ෂා
කළ සේක. 14 එප්රායිම් සෙනඟ දෙවියන් වහන්සේ
තදින් කෝප කරවා ඇත. එබැවින් ඔවුන්ගේ
අපරාධවලට ඔවුන්ට මරණ දඬුවම දෙනු ඇත. උන්
වහන්සේට කර ඇති නින්දාව, උන් වහන්සේ ඔවුන්
පිට ම පවරන සේක.

## ඉශ්රායලේ පිට අන්තිම විනිශ්චය

13 එප්රායිම් වංශය කතා කළ විට අන්
සියල්ලෝ වෙව්ලුවෝ ය. මන්ද, ඉශ්රායලේ
වංශ අතරේ එප්රායිම් එපමණට උසස් කොට
සලකනු ලැබී ය. එහෙත්, එහි වැසියෝ බාල්
දේවතාවන්ට නමස්කාර කිරීමේ වරදට පත් වූ
බැවින් මරණයට පත් වූ හ. 2 දැන් ඔව්හු තව තවත්
පව් කරමින් නැමදීමට තමන්ගේ රිදීවලින් දක්ෂ
ලෙස වාත්තු කළ දේව රූප තනා ගනිති. ඒවා වනාහි
කම්කරුවන්ගේ නිෂ්පාදන පමණකි. ‘පූජා කරන
මිනිස්සු වහු පිළිම සිඹ ගනිත් වා’යි කියති.
3 එබැවින් ඔව්හු අලුයම මීදුම මෙන් ද ඉක්මනින්
නැති වී යන පිනි මෙන් ද සුළඟට ගසාගෙන යන
කමතේ බොල් මෙන් ද දුම් කවුළුවෙන් පිට වෙන
දුම මෙන් ද වන්නෝ ය.
4 “නුඹලා මිසර දේශයෙන් ගෙනෙ දා සිට ම
නුඹලාගේ දෙවි සමිඳාණන් වහන්සේ මම ය. මා
හැර අන් දෙවි කෙනෙකු ඔබ නොදැන සිටියහු ය. මා
හැර අන් ගැළවුම්කාරයෙක් නුඹලාට නැත. 5 ද්වි.නී.
8:11-17තද ඉඩෝරය ඇති පාළුකරයේ නුඹලා
පෝෂණය කළෙේ මම ය. 6 ඔව්හු පසු ව තෘප්තියට
පැමිණියෝ ය. තෘප්තියට පැමිණ උඩඟු වූ හ. එවිට
ඔව්හු මා අමතක කළෝ ය. 7 එබැවින් මම ඔවුන්ට
සිංහයකු මෙන් වන්නෙමි; මඟ රැක සිටින දිවියකු
මෙන් වන්නෙමි. 8 පැටවුන් නැති වූ වලහින්නියක
මෙන් මම ඔවුන් පිට කඩා පැන ඔවුන් දපෙළු
කරදමන්නෙමි. සිංහයකු මෙන් මම ඔවුන් එතැනදී
ම කාදමන්නෙමි. වන මෘගයකු මෙන්
ඉරාදමන්නෙමි.
9 “අනේ ඉශ්රායලේ ජනයෙනි! මම නුඹලා විනාශ
කරදමන්නෙමි. නුඹලාට පිහිට වන්නේ කවරෙක් ද?
10 1 සාමු 8:5-6නුඹලා රජ කෙනෙකු ද අධිපතීන් ද
ඉල්ලූවහු ය. නුඹලා ගළවාගන්න නුඹලාගේ රජ දැන්
කොහේ ද? නුඹලා ආරක්ෂා කරන්න අධිපතීහු
කොහේ ද? 11 1 සාමු 10:17-24; 15:26මාගේ
උදහසින් මම නුඹලාට රජකු දිනිමි; මම කෝපයෙන්
ඔහු පහ කළෙමි.
12 “එප්රායිම් සෙනඟගේ පාප හා අපරාධ සටහන්
කර ඇත. ඒ සටහන් සුරක්ෂිත ව තැන්පත් කර ඇත.
13 ඉශ්රායලේ වනාහි, බිහි වීමට අවස්ථාව පැමිණ
ඇතත්, මවු කුසයෙන් පිටතට නොඑන මෝඩ
දරුවකු හා සමාන ය. එබැවින් ප්රසූත කාලය
පැමිණියත් ඔහු බිහි නොවෙයි. 14 1 කොරි 15:55මම
මේ සෙනඟ පාතාලයෙන් ගළවන්නෙමේ ද? මරණ
බලයෙන් මුදන්නෙමේ ද? එම්බා මරණය! ඔබේ
වසංගතය කොහේ ද? එම්බා පාතාලය! ඔබේ
විනාශය කොහේ ද? මොවුන් කෙරෙහි මට
අනුකම්පාවක් නැත. 15 ඔවුන් සශ්රීක බට ගස්මෙන්
සරු වෙතෙත්, ඔවුන්ගේ උල්පත් හා ජලාශ වියළී යන
පිණිස සමිඳාණන් වහන්සේ පාළුකරයෙන් පෙරදිග
සුළඟක් එවන සේක. වටිනා සියලු දේ එයින් නැති
වී යන්නේ ය. 16 දෙවියන් වහන්සේට විරුද්ධ ව
කැරලි ගසා ඇති බැවින් සමාරිය දඬුවම් ලබන්නී ය.
සමාරිය වැසියෝ යුද්ධයේ දී විනාශ වන්නාහ. අත
දරුවෝ බිම ගසා මරනු ලබන්නෝ ය. ගර්භණීන්
ඉරාදමනු ඇත.”

## ඉශ්රායලේට හොසියාගේ ආයාචනය

14 ඉශ්රායලේ ජනයෙනි, ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ වෙත හැරී එන්න. ඔබේ අයුතුකම්
නිසා ඔබ වැටී සිටින්නහු ය. 2 සමිඳාණන් වහන්සේ
වෙත හැරී අවුත් මේ යාච්ඤාව උන් වහන්සේට
ඔප්පු කරන්න: “අපේ සියලු අපරාධවලට කමා වී
අපේ යාච්ඤා කරුණාවෙන් පිළිගත මැනව. එවිට අපි
පොරොන්දු වූ පරිදි ඔබට ප්රශංසා කරන්නෙමු.
3 අප ගළවන්න අසිරියාවට නොහැකි ය: යුද්ධ රථ
වාහනවලට අප ආරක්ෂා කළ නොහැකි ය. මින්පසු
කිසි කලෙක අතින් තැනූ දේව රූප අමතා, ‘ඔබ
අපේ දෙවියෝ ය’යි නොකියමු. ස්වාමීනි, අනාථ
අයට ඔබ වහන්සේ දයානුකම්පාව දක්වන සේක.”

## ඉශ්රායලේට නව ජීවනයක්

4 “මම ඔවුන්ගේ අපක්ෂපාතකම සුව කරමි;
q2[4] මාගේ මුළු සිතින් ඔවුන්ට ප්රේම කරමි.

q2[4] මන්ද, ඔවුන් කරෙේ මාගේ උදහස පහ වී
ගොස් ඇත.
5 ඉශ්රායලේට මම පිනි මනේ වන්නමේ.
q2[5] ඔවුන් මානලේ මනේ පිපනෙු ඇත;
q2[5] ලබෙනොන්හි ගස් මනේ මුල් අදිනු ඇත.
6 ඔවුන්ගේ අතු වීහිදී යයි;
q2[6] ඔලීව ගස් මනේ හොබනේ වයේ;
q2[6] ලබෙනොන්හි මනේ සුවඳ පතුරයි.
7 ඔවුන් යළිත් ආපසු පැමිණ මාගේ සවෙණහෙි
වසනු ඇත;
q2[7] උයනක් සේ සමෘද්ධ වී මිදි වැලක් සේ පල
දරනු ඇත;
q2[7] ලබෙනොන්හි මිදියුස මනේ කීර්තිමත් වනු ඇත.
8 එප්රායිම් සනෙඟට දේව රූපවලින් තවත් වැඩක්
ඇද් ද?
q2[8] නුඹලාට පිළිතුරු දී නුඹලා ආරක්ෂා කරන්නේ
මම ය.
q2[8] මම කිසි කලකෙ නොමැලවනෙ දේවදාර ගසකි.
q2[8] නුඹලාගේ රුකවරණය මම ය.
q2[8] නුඹලාගේ සියලු ආසිරිවලට උල්පත මම ය.”

### අවසානය

9 මහෙි ලියා ඇති දේ ප්රඥාවන්තයෝ
තේරුම්ගනිත් වා! බුද්ධිමත්තු දැනගනිත් වා!
සමිඳාණන් වහන්සේගේ මාර්ගය සෘජු ය;
ධර්මිෂ්ඨයෝ ඒ මාර්ගයහෙි ගමන් කරති. එහතේ,
පව්කාරයෝ එහි පැකිළ වැටතේ.

# ජෝවලේ

1 පතෙුයලේගේ පුත් ජෝවලේ වතෙ පැමිණි සමිඳාණන්ගේ පණිවුඩය මයෙ වේ:

## පළඟැටියන්ගනේ දේශයට වූ හානිය

2 “මහල්ලනෙි, සවන් දනේන;
q2[2] දේශයේ සියලු වැසියනෙි, කන් යාොමු කරන්න.
q2[2] මබෙන්දක් ඔබේ කාලයේ වත් ඔබේ
මුතුන්මිත්තන්ගේ කාලයේ වත් සිදු වී ඇද් ද?
3 ඔබේ දරුවන්ට ඒ ගැන කියන්න;
q2[3] ඔව්හු තමන්ගේ දරුවන්ටත් ඒ ගැන කියත් වා!
q2[3] ඔව්හු ද, මතු පරම්පරාවටත් ඒ ගැන කියා දතේ
වා!
4 පළඟැටි පණුවන් කා ඉතිරි කළ දේ වැඩුණු
පළඟැටියෝ කාදැමූ හ.
q2[4] වැඩුණු පළඟැටියන් කා ඉතිරි කළ දේ පනින
පළඟැටියෝ කාදැමූ හ.
q2[4] පනින පළඟැටියන් කා ඉතිරි කළ දේ කපන
පළඟැටියෝ කාදැමූ හ.
5 සුරා සාොඬුනි, පිබිද වැලපවේ!
q2[5] බේබද්දනෙි, කෑමාොරගසවේ!
q2[5] මන්ද, මිදිරස ඔබේ මුවින් පහවී ගාොස් ඇත.
6 එළිද 9:8 ගිණිය නාොහැකි, බලසම්පන්න පළඟැටි
සේනාවක් මාගේ රට ආක්රමණය කර ඇත.
q2[6] ඔවුන්ගේ දත් සිංහ දත් මනේ ය.
q2[6] සිංහ ධේනුවකගේ දළ ඔවුන්ට ඇත.
7 උන් මාගේ මිදි වැල් පාළු කර ඇත;
q2[7] මාගේ අත්තික්කා ගස් විකාදමා ඇත;
q2[7] ඒවායේ පාොතු ගලවා බිම හළො ඇත.
q2[7] එහි අතු දැන් සුදු වී ඇත.
8 සිය යාොවුන් වියේ දී විවා බස් දුන් පමේවතා
මියගිය බැවින් දළ රදෙි හැඳගත් කන්යාවක මනේ
හඬා වැලපනේන.
9 දේව මාලිගාවේ ආහාර පූජාව ද පානීය පූජාව ද
නැත.
q2[9] පූජකවරු, සමිඳුන්ගේ පූජකවරු, වැලපනේනෝ
ය.
10 කතේවතු පාළු වී ගාොසින් ය;
q2[10] භූමිය වැලපනේනේ ය;
q2[10] මන්ද, ගාොයම් වැනසී, මිදි පල වියළී තලේ
හීන වී ගාොස් ඇත.
11 ගාොවියනෙි, දුකින් තැවනේන;
q2[11] මිදි වතුකාරයනෙි, වැලපනේන.
q2[11] මන්ද, තිරිඟු ද බාර්ලි ද කතේ ගාොයම් ද
වැනසී ඇත.
12 මිදි වලු පර වී, අත්තික්කා ගස් මැලවී දළෙම්,
තල්, ජම්බු, සියලු ගස් වියළී ඇත.
q2[12] මිනිසාගේ ප්රීතිය දුරු වී ඇත.

## පසුතැවී සිත් හරවා ගැනීමට කැඳවීම

13 “පූජකවරුනි, ගාෝණි රදෙි ඔතාගනෙ
වැලපනේන.
q2[13] පූදසුනේ සේවකයනෙි, කෑමාොරගසන්න.
q2[13] පූජකවරුනි, ගාෝණි රදෙි පාොරවාගනෙ මුළු
රැයක් වැතිර සිටින්න.
q2[13] මන්ද, ඔබේ දවේ සමිඳාණන් වහන්සේගේ
මාලිගාවේ පිදීමට ආහාර පූජාවත්, පානීය පූජාවත්
කිසිත් නැත.
14 උපවාසයක් නියම කරන්න;
q2[14] අයැදුමට සනෙඟ රැස් කරන්න.
q2[14] ප්රජා මූලිකයන් සහ රටේ සියලු වැසියන්
ඔබේ දවේ සමිඳාණන් වහන්සේගේ මාලිගාවට රැස්
කරවා උන් වහන්සේට මාොරගසන්න.
15 යසො 13:6 අහාෝ!
q2[15] ඒ දවස, සමිඳාණන් වහන්සේගේ දවස,
ආසන්න ව ඇත.
q2[15] එය සර්ව පරාක්රමයාණන් වතෙින් විනාශයක්
සේ පැමිණනෙු ඇත.
16 අප ඇස් හමුයහෙි ම ආහාර පහවී ගාොස් නැද්
ද?
q2[16] දේව මාලිගාවනේ ප්රීති ප්රමාෝදය පහවී
ගාොස් නැද් ද?
17 පස් පිඬලි යට බීජ දිරා යයි;
q2[17] අටු කාොටු පාළු වී ඇත;
q2[17] ගබඩා ගරාවැටී ඇත.
q2[17] මන්ද, ගාොයම් වියළී ගාොස් තිබේ.
18 අනේ!
q2[18] සිවුපා සතුන් කඳෙිරිගාන හැටි!
q2[18] තණකාොළ නැති බැවින් ගව රැළ කැළඹී
ඇවිදිති;
q2[18] බැටළු රැළ පවා දුක් විඳිති.
19 සමිඳුනි, මම ඔබට අයැදුම් කරමි.
q2[19] මන්ද, කතේ තණ බිම් ගින්නනේ දැවී ගාොස්
ඇත;
q2[19] උයන්වල සියලු ගස් ගිනිබත් වී ඇත.
20 වන මෘගයෝ පවා ඔබ දසෙ බලා සිටිති.
q2[20] මන්ද, උල්පත් සිඳී ඇත.
q2[20] කතේ තණ බිම් ගින්නනේ දැවී ගාොස් ඇත.

## සමිඳුන්ගේ දවස ගැන අනතුරු ඇඟවීම

2 "සියොන්හි හොරණෑව පිඹින්න;
q2
2 දෙවිඳුන්ගේ ශුද්ධ කන්දේ අනතුරු හඬ
නඟන්න.
q2
2 දේශයේ සියලු වැසියෝ වෙව්ලත් වා!
q2
2 මන්ද, සමිඳාණන් වහන්සේගේ දවස පැමිණේ.
q2
2 එසේ ය, එය ආසන්න ය.
2 ඒ දවස කළුවර අඳුරු දවසක් ය;
q2[2] වලාකුළු සහිත ගන අඳුරු දවසක් ය.
q2[2] ගන අඳුර කඳු පිට පැතිර යන්නාක් මෙන් මහා
හමුදාවක් පැමිණෙන්නේ ය.
q2[2] එවැන්නක් කිසි කලෙක නො වී ය;
q2[2] මතු පරම්පරාවල කවදා වත් නොවන්නේ ය.
3 උන්ට පෙරටුව වනසාලන ගින්න නාස්ති කරයි;
q2[3] උන්ට පස්සෙන් බුර බුරා නඟින ගිනි ජාලාවක්
ඇවිලෙයි.
q2[3] උන්ට පෙරටුවෙන් දේශය ඒදන් උයන මෙන්
තිබේ.
q2[3] උන්ට පස්සෙන් එය පාළුකරයක් වන්නේ ය.
q2[3] උන්ගෙන් බේරෙන කිසිවකේ නැත.
4 එළිද 9:7-9 පෙනුමට උන් අසුන් වැනි ය;
q2[4] උන් දුවන්නේ රණ අසුන් ලෙසෙ ය.
5 අශ්ව රථ ශබ්දය මෙන් ද ගින්නෙහි දැවෙන
ඉපනැලි මෙන් ද සටනට පෙළෙගැසුණු සේනාවක්
මෙන් ද ගිරි කුළු මත පැන පැන උඟු යති.
6 උන් ඉදිරියේ ජනයෝ වෙව්ලති;
q2[6] සියලු මුහුණු මැලවී යයි.
7 රණ ශූරයන් මෙන් ඔව්හු ඉදිරියට යති;
q2[7] යුද භටයන් මෙන් පවුරට නඟිති;
q2[7] එකිනෙකා නියමිත මඟ ගමන් කරයි.
8 උන් යන විට හැලහැප්පීමක් නැත;
q2[8] මාර්ගයෙන් පිට යාමක් ද නැත.
q2[8] අවි ආයුධ මැදින් කඩා පැන පසු නොබැස
ඉදිරියට ම යති.
9 උන් නගරයට කඩා පනිති;
q2[9] පවුරු පිට නැඟ දුවති;
q2[9] නිවසේ මුදුනට නැඟ සොරුන් මෙන් කවුළුවලින්
රිංගා යති.
10 එළිද 8:12 උන් ඉදිරියෙහි පොළොව කම්පා වෙයි;
q2[10] අහස ගුගුරයි;
q2[10] ඉර හඳ අඳුරු වෙයි;
q2[10] තරු තවත් නොබබළයි.
11 එළිද 6:17 සමිඳුන් සිය සේනාවට මහ හඬින්
අණ දෙන සේක.
q2[11] භට හමුදාව අතිවිශාල ය;
q2[11] ඒ අණට කීකරු වන්නා අතිබලවන්ත ය;
q2[11] සමිඳුන්ගේ දවස ත්‍රාසජනක ය;
q2[11] අතිභයංකර ය.
q2[11] එය දැරිය හැක්කේ කවරකුට ද?"

## පසුතැවී සිත් හරවා ගැනීමට ආරාධනාව

12 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
q2[12] "උපවාසයෙන් ද වැලපීමෙන් ද මුළු සිතින් දැන්
වත් මා වෙත හැරී එන්න.
13 වත ඉරාගෙන නොව, සිත ඉරාගෙන, නුඹේ දෙවි
සමිඳුන් වෙත හැරී එන්න.
q2[13] මන්ද, එතුමාණෝ, කරුණාභරිත, දයාන්විත,
වහා නොකිපෙන, තිර පෙමින් සමන්විත, කමා වීමට
කැමැති දෙවි කෙනෙකි.
14 සමහර විට එතුමාණන් සිය සිත වෙනස්
කරගෙන කමා වී අපට ආශීර්වාද කිරීම නිසා,
q2[14] ආහාර පූජා ද පානීය පූජා ද ඔබේ දෙවි
සමිඳුන්ට ඔප්පු කරන්නට හැකි වනු ඇද්දැ යි
කවරෙකේ දනිත් ද?
15 සියොන් කන්දේ හොරණෑව පිඹින්න;
q2[15] උපවාසයක් පණවා, අයැදුමට සෙනඟ රැස්
කරන්න.
16 සෙනඟ එක්රැස් කරන්න;
q2[16] ශුද්ධ සභාවට ඔවුන් සූදානම් කරන්න.
q2[16] ප්‍රජා මූලිකයන් එකතු කරන්න;
q2[16] ළමයින් ද කිරි දරුවන් ද ගෙන එන්න;
q2[16] මනාලයා තම යහන් ගබඩාවෙන් ද මනාලිය
තම නිදන කුටියෙන් ද පිටත එත් වා!
17 ද්වාර මණ්ඩපය හා පූජාසනය අතර සිටින
සමිඳුන්ගේ සේවක පූජකයෝ හඬා වැලපෙමින්,
'සමිඳුනි, ඔබේ සෙනඟට අනුකම්පා කළ මැනව,
ඔබේ දෙවියෝ කොයි දැ යි ජාතීන් අතරේ කීමට
ඉඩ නොහැරිය මැනවැ'යි කියත් වා!"

## සෞභාග්‍යයේ උදාව

18 එවිට සමිඳාණන් වහන්සේ දේශය ගැන
උද්‍යෝගවත් වී සෙනඟට අනුකම්පා කළ සේක.
19 උන් වහන්සේ ඔවුන්ට මෙසේ පිළිතුරු දුන් සේක.
q2[19] "මෙන්න, නුඹලා තෘප්තියට පැමිණෙන පිණිස
ධාන්‍ය ද මිදියුස ද තෙලේ ද මම නුඹලාට දෙමි.
q2[19] මින්පසු නුඹලාට නින්දා කිරීමට විජාතීන්ට ඉඩ
නොදෙමි.
20 මම උතුරු හමුදාව නුඹලා වෙතින් ඈත් කර,
ඔවුන් නිසරු, පාළු දේශයකට පලවා හරිමි.
q2[20] පෙරමුණෙහි සේනා මළ මුහුදටත් පසුපස
සේනා මධ්‍යධරණී මුහුදටත් පලවා හරිමි.
q2[20] ඔවුන් කළ අහංකාරී ක්‍රියා නිසා ඔවුන්ගේ
මළකඳන්වලින් දුගඳ පැතිරී යනු ඇත.
21 එම්බා දේශය!
q2[21] බිය නොවී ප්‍රීති ප්‍රමෝද වන්න.
q2[21] මන්ද, සමිඳුන් ඉමහත් දේ කර ඇත.
22 වන මෘගයෙනි, බිය නොවවු, මන්ද, කෙතේ
තණ සරුසාර ය;
q2[22] ගස්වල පල හටගන්නේ ය.
q2[22] අත්තික්කා ගස්වලින් හා මිදි වැල්වලින් බහුල
අස්වැන්නක් ලැබේ.

23 සියොන් වැසියනේ, ප්රීති වන්න.
q223 ඔබේ දෙවි සමිඳුන් කෙරෙහි ප්රීති ප්රමෝද
වන්න.
q223 එතුමාණෝ, ඔබට ශරත් කාලයේ නිසි තරමට
වැසි ද ශීත කාලයේ මහා වැසි ද වසන්ත කාලයේ
පෙර මෙන් වැසි ද වස්වන සේක.
24 කමත් ධාන්යයෙන් පිරෙනු ඇත;
q224 මිදියුස ද තෙල් ද භාජනවලින් ඉතිරී යනු ඇත.
25 නුඹලා විනාශ කරන්නට මා විසින් එවන ලද
මහා හමුදාවන් වන වැඩුණු පළඟැටියන් ද පනින
පළඟැටියන් ද කපන පළඟැටියන් ද පළඟැටි පණුවන්
ද කාදැමූ කාලයේ දී විනාශ වී ගිය දේ මම ආපසු
නුඹලාට දෙමි.
26 නුඹලා කා තෘප්තියට පැමිණ නුඹලා උදෙසා
පුදුම දේ කළ නුඹලාගේ දෙවි සමිඳුන්ගේ නාමයට
පැසසුම් කරන්න.
q226 මාගේ සෙනඟ මින්පසු කිසි කලෙක ලජ්ජාවට
නොපැමිණෙති.
27 එවිට මා ඉශ්රායෙලේ සෙනඟ අතරේ වැඩ සිටින
බව ද අන් දෙවි කෙනෙකු නුඹලාට නැති බව ද
නුඹලා දැනගනු ඇත.
q227 මාගේ සෙනඟ මින්පසු කිසි කලෙක ලජ්ජාවට
නොපැමිණෙති.

### ශුද්ධාත්මානුභාව දානය

28 ක්රියා 2:17-21 "ඉන්පසු, සකල මනුෂ්යයන්
කෙරෙහි මාගේ ආත්මානුභාවය ප්රදානය කරමි.
q228 එවිට, නුඹලාගේ දූ පුත්තු දිවැස් වැකි කියති.
q228 මහල්ලෝ ස්වප්න දකිති;
q228 තරුණයෝ දර්ශන දකිති.
29 ඒ කාලයේ දී, දැසිදසුන් කෙරෙහි වුව ද මාගේ
ආත්මානුභාවය ප්රදානය කරන්නෙමි.
30 ඒ දවස ගැන අහස් ගැබෙහි හා පොළෝ
තලයේ මම පෙර නිමිති දක්වාලමි.
q230 ලේ ද ගිනි ද දුම් කඳු ද එකල ඇති වේ.
31 මතෙ 24:29; මාක් 13:24-25; ලූක් 21:25; එළිද
6:12-13 උදාර, අතිභයානක දවස වන සමිඳුන්ගේ
දවස, උදා වන්නට පෙර ඉර අඳුරු වන්නේ ය;
q231 හඳ ලේ පාට වන්නේ ය.
32 රෝම 10:13 එවිට, සමිඳුන්ගේ නාමය කියා
අයැදින කවුරු නමුත් ගළවනු ලබන්නෝ ය.
q232 සමිඳුන් කියා ඇති පරිදි ගැළවෙන අය ද ඉතිරි
අය අතර සමිඳුන් කැඳවන අය ද සියොන් කන්දේ
සහ ජෙරුසලමේ සිටිනු ඇත.

### ජාතීන් විනිශ්චය කරනු ලැබීම

3 "ඒ කාලයේ දී, ඒ දවස්වල දී මා ජුදය හා
ජෙරුසලම පුනරුත්ථාපනය කරන විට,
2 මම සියලු ජාතීන් එක්රැස් කර, විනිසුම් යන අරුත්
ඇති ජෙහෝෂාපාට් නම් මිටියාවතට පමුණුවා,
මාගේ උරුමය වන ඉශ්රායෙලේ සෙනඟට කර ඇති
සියලු දේ ගැන ඔවුන් විනිශ්චය කරමි.
q22 මන්ද, ඔවුන් ඉශ්රායෙල්වරුන් විදේශවල විසුරුවා
හැර, මාගේ දේශය ඔවුන් අතර බෙදාගත් බැවිනි.
3 ඔව්හු මාගේ සෙනඟ බෙදාගන්න පිණිස දාදු දැමූ
හ.
q23 ඔව්හු වේශ්යාවක ගැනීම සඳහා පිරිමි ළමයෙකු
දුන්නෝ ය.
q23 මුද්රික පානය බොන පිණිස ගෑණු ළමයෙකු
වික්කෝ ය.
4 යෙසා 14:29-31; 23:1-18; ජෙරෙ 47:1-7; එසකි
25:15—28:26; ආමො 1:6-10; ශපෙ 2:4-7; සකෙරි
9:1-7; මතෙ 11:21-22; ලූක් 10:13-14 තීර්, සීදොන් හා
පිලිස්තියේ සියලු පළාත්වල වැසියනේ, නුඹලා මට
කරන්න යන්නේ කුමක් ද?
q24 නුඹලා මාගෙනේ පළිගන්නට බලන්නහු ද?
q24 නුඹලා මාගෙනේ පළිගන්නට යන්නහු නම්, මට
කරන්නට යන දේ විගසින් ම නුඹලාට පල දෙන්නට
සලස්වන්නෙමි.
5 මන්ද, නුඹලා මාගෙනේ රන් රිදී ගෙන ගොස් ඇත.
q25 මාගේ වටිනා වස්තු නුඹලාගේ දේවාලවලට
පැහැරගෙන ගොස් ඇත.
6 ජුදාවේ හා ජෙරුසලමේ සෙනඟ දුරබැහැර ගෙන
ගොස් ග්රීක්වරුන්ට විකුණා ඇත.
7 දැන්, නුඹලා ඔවුන් විකුණා ඇති පළාත්වලින් මම
ඔවුන් මුදාගෙන එන්නෙමි.
q27 නුඹලා ඔවුන්ට කළ දේ මම නුඹලාට ම පල
දෙන්නට සලස්වන්නෙමි.
8 නුඹලාගේ දූ දරුවන් මම ජුදා වැසියන් අතට
විකුණන්නෙමි.
q28 ජුදා වැසියන් ඔවුන් දුරබැහැර සබේයන්වරුන්ට
විකුණනු ඇත.
q28 සමිඳාණන් වහන්සේ මෙසේ වදාළ සේක.
9 මේ නිවේදනය ජාතීන් අතර ප්රකාශ කරන්න:
q29 "යුද්ධයට සැරසෙන්න;
q29 බලවතුන් පුබුදුවන්න;
q29 භට හමුදා රැස් කරන්න;
q29 ඔව්හු ඉදිරියට පැමිණෙත්වා!
10 යෙසා 2:4; මීකා 4:3 නඟුල් දැතිවලින් කඩු ද
දෑකැතිවලින් හෙල්ල ද තළාගන්න 'මම
බලවන්තයෙක්මි'යි බෙලෙ හීනයා කියාගනී වා!
11 එම්බා අවට්න් සිටින සකල ජනයෙනි!
q211 කඩිනමින් පැමිණෙන්න;
q211 එහි රැස් වන්න."
q211 සමිඳුනි, ඔබේ බලවත් සේනාවන් එවන්න.
12 "ජාතිහු සැරසී ජෙහෝෂාපාට් මිටියාවතට නැඟිට
එත් වා!
q212 මන්ද, අවට්න් සිටින සකල ජාතීන් විනිශ්චය
කිරීමට මම එහි අසුන් ගන්නෙමි.
13 එළිද 14:14-16,19-20; 19:15 අස්වැන්න පැසී ඇති
බැවින් දෑකැත්ත යොදන්න;
q213 මිදි යන්ත්ර පිරී ඇති බැවින් ඇතුළට ගොස්
පාගන්න;
q213 ඔවුන්ගේ නපුරුකම් අධික බැවින් බඳුන් උතුරා
යයි."

14 කෝටි සංඛ්‍යාත මහා ජනකායක් තීන්දු දීමේ
මිටියාවතේ රැස් වී සිටිති.
q2[14] තීන්දු දීමේ මිටියාවතහෙි සමිඳුන්ගේ දවස ළං
ව ඇත.
15 ඉර හඳ අඳුරු වී ඇත;
q2[15] තරුවල දීප්තිය නිවී ගොස් ඇත.

## ජුදාවට හිමි වන ආසිරි

16 ආමොස් 1:2 සමිඳාණෝ සියොන්හි ගර්ජනා කරන
සේක;
q2[16] ජෙරුසලමේ සිට හඬ නඟන සේක.
q2[16] අහසත් පොළොවත් කම්පා වනු ඇත.
q2[16] එහෙත්, සමිඳාණෝ සිය සෙනඟට රක්ෂා
ස්ථානයක් වන සේක.
q2[16] ඉශ්‍රායලේ ජනයාට බලකොටුවක් වන සේක.
17 "ඉශ්‍රායලේ ජනයෙනි, මසේ මා, ඔබේ දෙවි
සමිඳුන් බව ඔබ දැනගන්නහු ය.
q2[17] මම සියොන් නම් මාගේ ශුද්ධ කන්දේ වැඩ
වාසය කරමි.
q2[17] ජෙරුසලම ශුද්ධ නගරයක් වන්නේ ය.
q2[17] විජාතීහු මින්පසු එය මැදින් නොයන්නාහු ය.
18 ඒ කාලයේ දී, කඳුවලින් මිදියුස වෑස්සෙනු ඇත;
q2[18] හෙල්වලින් කිරි ගලා යනු ඇත.
q2[18] ජුදාහි සියලු ඇල දොළවල වතුර පිරෙනු ඇත.
q2[18] සමිඳුන්ගේ මාලිගාවෙන් උල්පත් නික්ම ෂිට්ටිම්
මිටියාවතට වතුර දෙනු ඇත.
19 ජුදා වැසියන්ට බලහත්කාරකම් කොට, ඒ රටේ
මිනිසුන් මරාදැමූ නිසා මීසර දේශය පාළුකරයක්
වන්නේ ය.
q2[19] ඒදොම් රට මරුකතරක් වන්නේ ය.
20 ජුදාහි සදහට ම ද ජෙරුසලමේ පරම්පරාවෙන්
පරම්පරාවට ද සෙනඟ වාසය කරනු ඇත.
21 මන්ද, සමිඳාණෝ සියොන් කන්දේ වැඩ වාසය
කරන සේක.
q2[21] සියලු වරදකරුවන්ට මම දඬුවම් දෙමි.
q2[21] ඔවුන්ගේ ලේ වැගිරීමේ වරද ගැන මම
පළිගනිමි."

# ආමොස්

1 2 රාජා 14:23-29; 15:1-7; 2 වංශා 26:1-23 මේ
වනාහි තකෝවා ගම්වැසි එඬේරුන්ගනේ
කනෙකු වූ ආමොස් ඉශ්රායලේ දේශය
සම්බන්ධයනේ දුටු දර්ශන පිළිබඳ පැවසූ වචන වේ.
මේ දර්ශන ඔහු දුටුවේ, උශ්ශියා ජුදාහි ද
ජෝවාෂ්ගේ පුත් ජරෙොබෝවම් ඉශ්රායලේහි ද රජ
ව සිටි කාලයේ දී, භූමිකම්පාවට දවෙසරකට පරෙ
ය.
2 ජෝවෙ 3:16 ආමොස් මසෙේ පැවසී ය:
q2[2] "සමිඳාණෝ සියොන් කන්දේ සිට ගර්ජනා
කරති;
q2[2] ජරෙුසලමේ සිට හඬ නඟා ගිගුරුම් දති.
q2[2] එවිට එඬේරුන්ගේ තණ බිම් දැවී යනු ඇත,
කර්මලේ කඳු මුදුන වියළී යනු ඇත."

## සිරියාව පිළිබඳ දේව විනිශ්චය

3 යසො 17:1-3; ජරෙ 49:23-27; සකෙරි 9:1
සමිඳාණන් වහන්සේ මසෙේ වදාරන සේක:
"දමස්කයේ වැසියන් අපරාධ පිට අපරාධ කර ඇත.
ඔවුන් යකඩ කූරු ඇති කුළුගඩේවලින් තළා පළෙන්නා
සේ ගිලියද් වැසියන් තළා පළෙූ නිසා ඔවුන්ට මම
සත්තකින් ම දඬුවම් කරමි. 4 සිරියා රාජ්යය පිට
මම ගින්නක් එවමි. එයින් බනේ-හදද්ගේ බලකොටු
දවා අළු කර දමමි. 5 දමස්කයේ වාසල් දොරටු සුණු
විසුණු කොට, ආවනේ මිටියාවතේ වැසියන් හා
බතේ-ඒදන්හි අධිපතියා ඉවත් කරන්නමේ. සිරියාවේ
ජනයා හිරකරුවන් වශයනේ කීර් දේශයට ගනෙයනු
ලබන්නෝ ය." මේ සමිඳාණන් වහන්සේගේ වචනය
වේ.

## පිලිස්තිය පිළිබඳ දේව විනිශ්චය

6 යසො 14:29-31; ජරෙ 47:1-7; එසකි 25:15-17;
ජෝවෙ 3:4-8; ශපෙ 2:4-7; සකෙරි 9:5-7 සමිඳාණන්
වහන්සේ මසෙේ වදාරන සේක: "ගාසාවේ වැසියන්
අපරාධ පිට අපරාධ කර ඇත. ඔවුන් මුළු ජාතියක් ම
පිටුවහල් කොට ඒදොම් ජනයාට පාවා දුන් නිසා,
සත්තකින් ම ඔවුන්ට මම දඬුවම් කරමි. 7 මම
ගාසාවේ පවුරු පිට ගින්නක් එවමි. එයින් නගරයේ
බලකොටු දවා අළු කර දමමි. 8 අෂ්දොද් නගරයේ
වැසියන් ද අෂ්කලෙොන් නගරයේ අධිපතියා ද මම
නරෙපාදමා, එක්රොන් නගරයට පහර දමේ. ඉතිරි
වන පිලිස්තිවරුන් මිය යනු ඇත." මේ දවේ
සමිඳාණන් වහන්සේගේ වචනය වේ.

## තීර් පිළිබඳ දේව විනිශ්චය

9 යසො 23:1-18; එසකි 26:1—28:19; ජෝවෙ 3:4-8;
සකෙරි 9:1-4; මතෙ 11:21-22; ලූක් 10:13-14
සමිඳාණන් වහන්සේ මසෙේ වදාරන සේක: "තීර්හි
වැසියන් අපරාධ පිට අපරාධ කර ඇත. ඔවුන් මුළු
ජාතියක් ම පිටුවහල් කොට ඒදොම් ජනයාට පාවා
දුන් නිසා, මම සත්තකින් ම ඔවුන්ට දඬුවම් කරමි.
ඔවුන් ගිවිසගත් මිතුරු ගිවිසුම් ඔවුන් අමතක කර
ඇත. 10 තීර්හි පවුරු පිට මම ගින්නක් එවමි. එයින්
නගරයේ බලකොටු දවා අළු කර දමමි."

## ඒදොම් පිළිබඳ දේව විනිශ්චය

11 යසො 34:5-17; 63:1-6; ජරෙ 49:7-22; එසකි
25:12-14; 35:1-15; ඔබදි 1:14; මලාකි 1:2-5
සමිඳාණන් වහන්සේ මසෙේ වදාරන සේක:
11 "ඒදොම්හි වැසියන් අපරාධ පිට අපරාධ කර
ඇත. ඔවුන් නිර්දය ලසෙ ඔවුන්ගේ සහෝදරයන්
වන ඉශ්රායලේවරුන්ට කඩුවනේ පහර දුන් නිසා, මම
සත්තකින් ම ඔවුන්ට දඬුවම් දමේ. ඔවුන්ගේ
ක්රෝධය දිළිහි දිළිහී ද උදහස පැසව පැසවා ද
පැවතිණි. 12 එබැවින් මම තේමාන් පිට ගින්නක්
එවමි. එයින් බොශ්රාහි බලකොටු දවා අළු කර
දමමි."

## අම්මොන් පිළිබඳ දේව විනිශ්චය

13 ජරෙ 49:1-6; එසකි 21:28-32; 25:1-7; ශපෙ
2:8-11 සමිඳාණන් වහන්සේ මසෙේ වදාරන සේක:
13 "අම්මොන්හි වැසියන් අපරාධ පිට අපරාධ කර
ඇත. ඔවුන් තමන්ගේ දේශ සීමාවන් පළල්
කරගන්න පිණිස ගිලියද්හි ගැබිණියන් දපෙළු කර
දැමූ නිසා, මම සත්තකින් ම ඔවුන්ට දඬුවම් කරමි.
14 රබ්බාහි පවුරුවලට මම ගිනි දල්වමි. එයින්
නගරයේ බලකොටු දවා අළු කර දමමි. යුද්ධ දවසේ
දී ගෝරනාඩු ඇති වේ; චණ්ඩ මාරුතයක් සේ යුද්ධය
වේගයනේ පැතිර යනු ඇත. 15 ඔවුන්ගේ රජු හා
රාජ සනෙවේයෝ වහල්කමට යන්නෝ ය." මයෙ
සමිඳාණන් වහන්සේගේ වචනය වේ.

## මෝවබ් පිළිබඳ දේව විනිශ්චය

2 යසො 15:1—16:14; 25:10-12; ජරෙ 48:1-47;
එසකි 25:8-11; ශපෙ 2:8-11 සමිඳාණන්
වහන්සේ මසෙේ වදාරන සේක: "මෝවබ්හි
වැසියන් අපරාධ පිට අපරාධ කර ඇත. ඔවුන්

ඒදොම් රජුගේ ඇට කටු දවා හුණු ලබාගත් නිසා,
මම සත්තකින් ම ඔවුන්ට දඬුවම් කරමි. 2 මම
මෝවබ් දේශය පිට ගින්නක් එවා කරෙයොත්හි
බලකොටු දවා අළු කර දමමි. හේවායන්ගේ
ගෝරනාඩුව හා හොරණෑවල බරෙහන්දීමත් සමඟ
යුද්ධ ඝෝෂාව මැද මෝවබ් වැසියන් විනාශ වනු
ඇත. 3 මෝවබ් රටේ අධිපතියා ද සියලු
සනෙවේයන් ද මම විනාශ කර දමමි."

## ජුදා පිළිබඳ දේව විනිශ්චය

4 සමිඳාණන් වහන්සේ මසෙේ වදාරන සේක:
"ජුදා වැසියන් අපරාධ පිට අපරාධ කර ඇත. ඔවුන්
සමිඳාණන් වහන්සේගේ ව්‍යවස්ථාව එපා කොට,
උන් වහන්සේගේ අණපණත් නොපැවැත්වූ නිසා,
මම ඔවුන්ට සත්තකින් ම දඬුවම් කරමි. ඔවුන්ගේ
පියවරුන් වැඳ පිදූ දවේවරුන්, ඔවුන් නොමඟ ගනෙ
ගොස් ඇත, 5 ඒ නිසා මම ජුදා පිට ගිනි එවා
ජරෙුසලමේ බලකොටු දවා අළු කර දමමි."

## ඉශ්රායලේ පිළිබඳ දේව විනිශ්චය

6 සමිඳාණන් වහන්සේ මසෙේ වදාරන සේක:
"ඉශ්රායලේ වැසියන් අපරාධ පිට අපරාධ කර ඇත.
මම ඔවුන්ට සත්තකින් ම දඬුවම් කරමි. ඔව්හු ණය
ගවොගන්නට බැරි නිදොස් අය මුදලටත්, දුප්පත්
අසරණයන් සරෙප්පෙු දකෙක මිලයට වහල්කමටත්
විකි්කෝ ය. 7 දුබලුන් පොළොවේ ධූලි මත පාගා,
අහිංසකයන් අහකට නරෙපාදමති. පියාත් පුතාත්
දදෙනෙ ම, එක ම දේවාල ගණිකාවන් සේවනය
කර මාගේ ශුද්ධ නාමය කලෙසෙති; 8 හැම
පූජාසනයක් පාසා ඔවුන් උකසට ගත් වස්ත්‍ර
එළාගනෙ ඒ මත දිගා වී සිටිති; දඩයට යටත්
වූවන්ගනේ ගත් මුද්‍රික පානය ඔව්හු තම තමන්ගේ
දේවාලවල දී බොති.
9 ද්වි.නී. 3:8-11 "එහතේ, කිහිරි ගස් මනේ උස,
කළුවර ගස් මනේ ශක්තිමත් අමෝරිවරුන් ඔවුන්
උදසො සහමුලින් ම විනාශ කරදැම්මේ මම ය.
10 "තවද, අමෝරිවරුන්ගේ දේශය නුඹ ම හිමි
කරගන්න පිණිස මිසර දේශයනේ මුදා ගනෙවුත්
සතළිස් වසක් තිස්සේ පාළුකරය මැදින් නුඹ ගනෙ
ගියේ මම ය. 11 ගණන් 6:1-8නුඹේ පුත්‍රයන්ගනේ
සමහරුන් දිවැසිවරයන් වශයනේ ද නුඹේ
තරුණයන්ගනේ සමහරුන් නාසරීයයන් වශයනේ ද
මම තෝරා ගතිමි. ඉශ්රායලේ ජනයනෙි, මා කියන
මේ දේ සැබෑ නොවේ ද? මසෙේ වදාරන්නේ
සමිඳාණන් වහන්සේ වන මම ය.
12 "එහතේ, නුඹලා මුද්‍රික පානය බොන්නට
නාසරීයයන් පළෙඹවේවහු ය; 'දිවැස් දසුෙම්
නොකරන්නැ'යි දිවැසිවරුන්ට අණ කළහු ය.
13 ගොයම් මිටි පිරවූෙ බර කරත්තයකින්
පොළොවේ මැඩනේනාක් මනේ මම නුඹලා
මඩින්නමේ. 14 ශීඝ්‍රයනේ දුවන්නට හැකි අයට වත්
බේරනේන බැරි වේ; සර්වශක්තිය ඇති අයගේ
ශක්තිය ද නැති වේ; හේවායන්ට තමන්ගේ දිවි
රැකගන්න ද නොහැකි වේ. 15 දුනුවායාට නොවැටී
සිටින්න වත්, ශීඝ්‍රයනේ දුවන්නන්ට ගැළවී යන්න
වත්, අසරුවන්ට දිවි බේරාගන්න වත් නොහැකි වේ.
16 හේවායන්ගනේ ඉතා වීරවන්ත අය වුව ද ඒ
දවසේ දී නග්න ව පලා යන්නෝ ය." මසෙේ
වදාරන්නේ සමිඳාණන් වහන්සේ ය.

## ඉශ්රායලේ කරෙහෙි දිව්‍ය කරුණාව

3 "ඉශ්රායලේ ජනයනෙි, නුඹලාට විරුද්ධ ව,
මිසර දේශයනේ මා පිටතට ගනො නුඹලාගේ
මුළු ඉශ්රායලේ වංශයට විරුද්ධ ව සමිඳාණන්
වහන්සේ වදාරන මේ වචනවලට සවන් දනේන:
2 ලොවේ සියලු වංශවලින් මා මැනවින්
දැනහැඳිනගනෙ ඇත්තේ නුඹ පමණකි. ඒ නිසා
නුඹලා කර ඇති සියලු පාපවලට මම දඬුවම් දමේ."

## දිවැසිවරයාගේ වගකීම

3 "දදෙනෙකේ එකට ගමනක් යත් ද එකඟ වී මිස?
4 සිංහයකේ වනයේ ගරෙවුම් දයෙි ද ගොදුරක්
දුටුවොත් මිස?
q2 4 ගුහාවක් තුළ සිංහ නාම්බකේ ගොදුරක් නැති ව
හඬ නඟයි ද?
5 ඇමක් නැති ව කුරුල්ලකේ මලපතකට අසු වයෙි
ද?
q2 5 අසු නොවී කිසිවක් ගැස්සී යයි ද උගුලක්?
6 යුධ සක් හඬ ඇසුණොත් නගරයේ සනෙඟ බිය
නොවතේ ද?
q2 6 සමිඳුන් නොපැමිණවේ විපතක් නගරයේ ඇති
වයෙි ද?
7 මේ රහස් එළිදරව් නොකර සිය සේවක
දිවැසිවරුන් හට, මහෝත්තම දවේ ස්වාමීන්
වහන්සේ සැබැවින් ම කිසිවක් නොකරන සේක.
8 සිංහයකේ ගර්ජනා කරයි;
q2 8 බිය නොවී සිටිය හැක්කේ කවරකුෙට ද?
q2 8 මහෝත්තම දවේ ස්වාමීන් වහන්සේ කතා
කරන සේක;
q2 8 දිවැස් වැකි නොකියා සිටිය හැක්කේ කවරකුෙට
ද?"

## සමාරියේ විනාශය

9 අෂ්දොදේහි ද මිසර දේශයේ ද මාලිගාවල
සිටින්නන්ට මසෙේ ප්‍රකාශ කරන්න:
9 "සමාරියේ කඳුවලට නැඟී එහි ඇති අවුල්
වියවුල් ද නගරයේ කරෙනෙ අපරාධ ද බලන්න."
10 සමිඳාණන් වහන්සේ මසෙේ වදාරන සේක:
10 "මේ සනෙඟ අපරාධ ක්‍රියාවලින් ද
බලහත්කාරයනේ ද ලබාගත් දයෙින් තමන්ගේ
මාලිගා පුරවාගනෙ ඇත. අවංකකම ඔවුන්
කොහොමෙට වත් දන්නේ නැත." 11 එබැවින්
සමිඳාණන් වහන්සේ මසෙේ වදාරන සේක: "සතුරු
සේනාවක් ඔවුන්ගේ රට වට කොට, බලකොටු බිඳ
හළො මාලිගා කොල්ලකන්නෝ ය."

12 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරමින්,
“එඬේරෙකු, සිංහයාගේ කටින් බැටළුවෙකුගේ
කකුල් දෙක හෝ කනින් කෑල්ලක් හෝ
ගළවාගන්නාක් මෙන් දෙවියන් වහන්සේ සමාරියේ
වසන ඉශ්රායලේ ජනයා ගළවාගන්න සේක. ගළවනු
ලබන්නේ, ඇඳක ලී පතුරක් හෝ කෑල්ලක් හෝ
වැනි, ඉතා ස්වල්ප දෙනෙකේ පමණි. 13 සවන් දී,
ජාකොබ්ගේ වංශයට ප්රවේසම් වෙන ලෙස තදින්
අවවාද කරන්නැ”යි වදාළ සේක. මෙසේ වදාරන්නේ
සියලු බලැති දෙවි සමිඳාණන් වහන්සේ ය. 14 2
රාජා 23:15“ඉශ්රායලේ සෙනඟගේ වරද නිසා
ඔවුන්ට දඬුවම් කරන දවසේ දී බෙතෙලේහි පූජාසන
බිඳ හෙළන්නෙමේ; පූජාසනවල අං වැනි නෙරා ඇති
කොන් කපාදමා බිමට හෙළන්නෙමේ; 15 සිසිර නිවාස
හා ග්රීෂ්ම නිවාස සිඳබිඳ දමමි; ඇත්දත් මන්දිර
වැනසී යයි; හැම මහා මන්දිරයක් ම විනාශවනු
ඇතැ”යි සමිඳාණන් වහන්සේ වදාරන සේක.

### අයුක්තිසහගත සමාරිය ස්ත්රීන් පිළිබඳ විනිශ්චය

4 සමාරිය කඳුකරයේ සිටින තරබාරු එළදෙනුනි;
දිළිඳුන් තළා පෙළා, අසරණයින්ට පීඩා කරන,
‘බොන්නට දයෙක් දෙන්න’ කියා සැමියන්ට අණ
කරන ඔබ හැම මයෙට සවන් දෙන්න. 2 මහෝත්තම
දෙවි ස්වාමීන් වහන්සේ තම ශුද්ධ නාමයෙන් මෙසේ
දිවුරන සේක: “නුඹලා කොකුවලින් ඇදගෙන යනු
ලබන දවස පැමිණෙනු සිකුරු ය. නුඹලාගේ හැම
කෙනෙකේ ම බිලි කටුවේ ඇමුණු මාලුවෙකු මෙන්
වන්නෝ ය. 3 තාප්ප කපොලුවලින් එක එකා
ඇදගනු ලැබ, කුණු කසළ ගොඩක් මත වීසි
කරදමනු ඇත.” මයෙ වදාරන්නේ සමිඳාණන්
වහන්සේ ය.

### ඉශ්රායලේ ජනයාගේ ආත්ම වංචාවේ සහ අකීකරුකමේ විපාකය

4 “බෙතෙලේහි සිද්ධස්ථානයට ගොස් පව් කරනු;
ගිල්ගාලයට ගොස් මුළු වීරියෙන් පව් කරනු; උදයක්
උදයක් පාසා පූජාකිරීමට සතුන් ගෙනෙනු; තුදෙනකට
වරක් නුඹලාගේ දසයෙන් එකේ පූජා ගෙනෙනු.
5 මුහුන් මුසු තුති පූජා ඔප්පුකර, ස්වේච්ඡා පූජා
ගැන පුරසාරම් දොඩන්න. මන්ද, ඉශ්රායලේ
ජනයෙනි, මවෙනි දේ කිරීමට නුඹලා බොහෝ සේ
කැමැති ය”යි මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ
වදාරන සේක.
6 “තවද, නුඹලාගේ සියලු නගරවල සාගින්න ද
හැම තැන ම කෑම සාගතය ද ඇති කළෙේ මම ය.
එහෙත්, නුඹලා මා වෙත හැරී නාවහු ය”යි
සමිඳාණන් වහන්සේ වදාරන සේක. 7 “ගොයම්
කැපීමට තුන් මසකට කලින්, වැස්ස ඕනෑ ම කරන
දවස්වල මම එය වළක්වාලීමි. එක නුවරකට
වහින්න සැලැස්සූ අතර තවත් නුවරකට වැස්ස
නොදී ඇරියමේ. එක වලේයායකට වැස්සේ ය,
වැස්ස නොලැබූ වලේයාය වියළී ගියේ ය.
8 පිපාසයෙන් පෙළුණු නගර දෙක තුනක සෙනඟ
වතුර සොයා අසල නගරයකට ගිය නමුත්, බිමට
සෑහෙන තරම් වතුර නොතිබුණේ ය. එහෙත්,
නුඹලා මා වෙත හැරී නාවහු ය”යි සමිඳාණන්
වහන්සේ වදාරන සේක.
9 “මම ගොයම් වියළවන සුළඟක් ද එව්වමේ;
නුඹලාගේ බොහෝ වතුපිටි ද මිදි වතු ද අත්තික්කා
ගස් ද ඔලීව ගස් ද පළඟැටි පණුවෝ කාදැමූ හ.
එහෙත්, නුඹලා මා වෙතට හැරී නාවහු ය”යි
සමිඳාණන් වහන්සේ වදාරන සේක.
10 “මා මිසර දේශයේ ඇති කළ වසංගතයට
සමාන වසංගතයක් නුඹලා අතරේ ද ඇති කළෙමේ;
නුඹලාගේ තරුණයන් ද කඩුවෙන් මරාදමා,
නුඹලාගේ අශ්වයන් පැහැරගෙන ගියමේ; කඳවුරුවල
දුර්ගන්ධයෙන් නුඹලාගේ නාස් පුඩු පිරවේවමේ.
එහෙත්, නුඹලා මා වෙත හැරී නාවහු ය”යි
සමිඳාණන් වහන්සේ වදාරන සේක.
11 උත් 19:24 “දෙවියන් වහන්සේ වන මම
සොදොම් සහ ගොමොරා විනාශ කරදැමුවාක් මෙන්,
නුඹලා අතරෙන් සමහරෙකු විනාශ කොටදැමුවමේ;
නුඹලා ගින්නෙන් ඇදගත් ගිනි පෙනෙලේලක් වැනි ය.
එහෙත්, නුඹලා මා වෙත හැරී නාවහු ය”යි
සමිඳාණන් වහන්සේ වදාරන සේක. 12 “එබැවින්
ඉශ්රායලේ ජනයෙනි, මේ දේ මම නුඹලාට
කරන්නට යමි; ඒ දේ මා කරන්නට යන බැවින්
දෙවියන් වහන්සේගේ විනිශ්චයට මූණපාන්නට
සූදානම්වන්න.”
13 උන් වහන්සේ වනාහි, කඳු සාදන, සුළං මවන,
සිය සිතුවිලි මිනිසා හට පාන, උදයත් රැයත් දෙක ම
මවන, මුළු ලොවට ම අධිපති වන තැනැන්
වහන්සේ ය.
q213 උන් වහන්සේගේ ගරු නාමය සියලු බලැති
දෙවි සමිඳු ය.

### ඉශ්රායලේ ගැන විලාපය

5 අහෝ ඉශ්රායලේ ජනයෙනි! ඔබ හැම ගැන
නඟන මාගේ මේ විලාපයට සවන් දෙන්න:
2 “ඉශ්රායලේ කන්යාව වැටී ඇත, යළි නැඟිටීමක්
ඇට නැත.
q22 පොළොව මත ඈ වැටී සිටියි.
q22 උදව් දෙන්නට කවුරුත් නැත.”
3 මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ
වදාරන සේක:
q23 “ඉශ්රායලේහි එක් නගරයකින් සටනට යන
භටයින් දහසකින් ආපසු එන්නේ සියයකි.
q23 සියයක් යන තව නගරයකින් ආපසු එන්නේ
දසදෙනෙකි.”
4 ඉශ්රායලේ සෙනඟට සමිඳාණන් වහන්සේ
මෙසේ වදාරන සේක:
4 “මා වෙත හැරී එන්න; එසේ ඇවිත් ජීවත් වන්න.
5 එහෙත්, නමදින පිණිස බයෙර්-ෂබොවට
නොයෙන්න; මා සොයන පිණිස බෙතෙලේට නොයෙන්න.
බෙතෙලේ නැත්තට ම නැති වේ. ගිල්ගාලයට වත්

නොයන්න. එහි සෙනඟ වහල්කමට ගෙනයනු
ලබති.”
6 දෙවියන් වහන්සේ වෙත හැරී යන්න; ගොස්
ජීවත් වන්න. නොගියහොත් උන් වහන්සේ ගින්නක්
මෙන් ජෝසෙප්ගේ වංශය පිට පැමිණෙන සේක.
බෙතෙල්හි සෙනඟ ගින්නට දැවී යනු ඇත. එය
නිවීමට හැකි කිසිවෙක් නැත. 7 යුක්තිය නොපිට
පෙරළන, මානව අයිතිවාසිකම් වළක්වන, ඔබට වන
විපතක මහත!
8+AMO ජෝබ් 9:9; 38:31 හත්දින්න ද මුවසිරස ද
මවාලන, රෑ අඳුර එළිය කරන, දිවා එළිය රෑ කරන,
මුහුදු දියට හඬගසා පොළොව පුරා ගලා යවන,
පවුරු හා බලකොටු පිට විනාශය පමුණුවන
එතුමාණන්ගේ නම සමිඳාණෝ වන සේක.
10 ඔබ උසාවිය මඟින් යුක්තිය ඉටු කරන්නාට
වෛර වන්නහු ය; අවංක ලෙස කතා කරන්නාට
පිළිකුල් කරන්නහු ය. 11 ඔබ දුප්පතුන් පාගාදමා,
ඔවුන්ගෙන් අධික ධාන්‍ය කොටසක් බලයෙන්
ගන්නහු ය. ඒ නිසා ඔබ කැපූ ගලින් තනාගත්
මන්දිරවල වාසය කරන්නේ වත්, වගා කළ සරු මිදි
වතුවලින් මිදියුස බොන්නේ වත් නැත. 12 ඔබේ පව්
කොපමණ බරපතල ද කියාත්, ඔබේ අපරාධ
කොපමණ බහුල ද කියාත් මම දනිමි. නුඹලා
දමිටුන්ට පීඩා කරන්නහු ය; අල්ලස් ගෙන උසාවිය
මඟින් යුක්තිය ඉටු කරගැනීමට දුප්පතුන්ට ඉඩ
නොදෙන්නහු ය. 13 කාලය නපුරු බැවින් නැණැතියෝ
වුව ද නිහඬ ව සිටිති.
14 ජීවත් වන පිණිස නපුර නොව යහපත
සොයන්න. එවිට ඔබ සමඟ සිටින සේකැ යි ඔබ
කියන සියලු බලැති දෙවි සමිඳාණන් වහන්සේ
ඇත්තෙන් ම ඔබ සමඟ සිටින සේක. 15 නපුරට
ද්වේෂ කරන්න, යහපතට ප්‍රිය කරන්න, උසාවිය
මඟින් යුක්තිය ඉටු කරවන්න. සමහරවිට, සියලු
බලැති දෙවි සමිඳාණන් වහන්සේ මේ රටේ ඉතිරි ව
සිටින ජනයාට කරුණා කරනු ඇත.

## සමිඳාණන් වහන්සේගේ ආගමන දවස

16 සියලු බලැති දෙවි සමිඳාණන් වහන්සේ මෙසේ
වදාරන සේක:
16 “නගරයේ හැම වීථියක හැඬීමත් වැලපීමත්
ඇති වන්නේ ය; වැලපෙන පිණිස ගම්වැසියන්ටත්,
කුලියට ළතෝනි කියන්නන්ටත් අඬගසනු ලැබේ.
17 සියලු මිදි වතුවලත් වැලපීම වන්නේ ය. මන්ද,
නුඹලාට දඬුවම් කරන පිණිස මම එන්නෙමි.”
18 සමිඳාණන් වහන්සේගේ පැමිණීමේ දවස
ආසාවෙන් බලා සිටින ඔබට වන්නට යන විපතක
මහත! ඒ දවසේ ඔබට කිසි යහපතක් වයි ද? එය
ආලෝකයේ දවසක් නොව, අන්ධකාරයේ දවසක්
වන්නේ ය. 19 ඒ දවසේ දී සිදු වන්නේ,
සිංහයකුගෙන් බේරී දුවන මිනිසකු වලසකුට
අසුවීම වැනි දයෙකි. නැතහොත්, මිනිසකු තම
නිවසෙට පැමිණ බිත්තියේ අත තැබූ විට සර්පයකු
දෂ්ට කිරීම වැනි දයෙකි. 20 සමිඳාණන් වහන්සේගේ
පැමිණීමේ දවසේ දී ඇතිවන්නේ, අන්ධකාරය මිස
ආලෝකය නොවේ. එය දීප්තියක් නැති තිත්ත
කළුවර දවසක් වන්නේ ය.

## ස්වාමීන්ට පිළිකුල් පුද පූජා

21 යසො 1:11-14 “නුඹලාගේ මංගල්‍යවලට මම
ද්වේෂ කරමි. ඒවා මට රුස්සන්නේ නැත. 22 නුඹලා
දවන යාග පූජා ද ආහාර පූජා ද මට ඔප්පු කරන
නමුත්, මම ඒවා නොපිළිගනිමි. සහභාගිකමේ පූජා
වශයෙන් මට ඔප්පු කරන පිණිස නුඹලා තර කළ
සතුන් මම නොපිළිගනිමි. 23 නුඹලාගේ ගීත
ඝෝෂාව නතර කරන්න; නුඹලාගේ වීණා නාදයට
මම සවන් නොදෙමි. 24 යුක්තිය ගලා බහින දිය
දහරක් මෙන් ද ධර්මිෂ්ඨකම නොසිඳී ගලන ගඟක්
මෙන් ද පැවතිය යුතු ය.
25 ක්‍රියා 7:42-43 “ඉශ්‍රායලේ ජනයෙනි, නුඹලා
සතළිස් අවුරුද්දක් මුළුල්ලේ පාළුකරයේ සිටිය මට
පුද පූජා ඔප්පු කළහු ද? නැත. 26 එහෙතේ නුඹලා,
දැන් නුඹලා උදසො ම තනාගත් ‘සක්කුත්’ සහ
‘කයිවාන්’ යන ග්‍රහ දේව රූප කර තබාගෙන
යන්නහු ය; 27 එබැවින් මම දමස්කයෙන් එපිට රටක
වහල්කමට නුඹලා ගෙනයන්නෙමි”යි සියලු බලැති
දෙවියන් යන නම ඇති සමිඳාණන් වහන්සේ වදාරන
සේක.

## අදමිටු සෙනඟට වන විපත

6 සියොන්හි සැප පහසුවෙන් කල් යවන,
සමාරිය කඳුකරේ තමන් සුරක්ෂිත යයි සිතන,
සෙනඟ උදව් පිණිස සොයා යන, ඉශ්‍රායලේ නම්
ශ්‍රේෂ්ඨ ජාතියේ සිල්වතුන් වන ඔබට වන විපතක
මහත! 2 ගොස් කල්නේ නගරය බලන්න; එතැනින්
හමාත් මහා නගරයට යන්න. ඉන්පසු පිලිස්තියේ
ගාත් නගරයට යන්න. ඒවා ඔබේ රාජ්‍යන්ට වඩා
යහපත් ව තිබුණා ද? නැතහොත් ඔබේ දේශයන්ට
වඩා ඒවා විශාල ද? 3 ඔබ පිට පැමිණෙන විපත්ති
දවස කල්දමන්නට ඔබ උත්සාහ කරන නමුත්, ඔබ
කරන දේවල් ම සැහැසිකමට තුඩු දෙන්නේ ය.
4 සුඛෝපභෝගී කදිම යහන්වල හාන්සිවන,
කව්ච්චිවල දිගා වී සිටින්න ප්‍රිය කරන, වහු මස් හා
එළු මස් කාදමන ඔබට වන විපතක මහත! 5 දාවිත්
මෙන් ගී ගොතා වීණාවල වාදනය කරන්න ඔබ
කැමැති ය. 6 ඔබ බඳුන් පුරා මිදිපැන් බොන්නහු ය;
ඉස්තරම් තෙලේ ඇඟ ගාගන්නහු ය. එහෙතේ,
ඉශ්‍රායලේට වන විනාශය ගැන ශෝක නොවන්නහු
ය. 7 එබැවින් සියල්ලන්ට කලින් වහල්කමට
ගෙනයනු ලබන්නේ ඔබ ය. එවිට ඔබේ සැප
ජීවිකාව හා භෝජන උත්සව කළෙවර වන්නේ ය.
8 සියලු බලැති දෙවි සමිඳාණන් වහන්සේ මයෙ
සිය නාමයෙන් දිවුරා මෙසේ වදාරන සේක:
8 “ඉශ්‍රායලේ සෙනඟගේ අහංකාරකම මට
පනේනන්න බැරි ය. ඔවුන්ගේ වලව් ද මම
හළොදකිමි. නගරය ද එහි ඇති සියල්ල ද මම
සතුරාට පාවා දමේ.”

9 පවුලක ඉතිරි වී ඇත්තේ දසදෙනෙකු පමණක්
නම්, ඔවුන් සියල්ලන් ම මැරෙනු ඇත. 10 මළ
කෙනෙකුගේ ඥාතියකු ආදාහනය කරන පිණිස
මළකඳ ගෙනයන්නට ආ විට, ගෙයි සැඟවී සිටින
කෙනෙකුට කතා කොට, ‘මළගිය තව කවුරුත් මෙහි
සිටිනවා දැ’යි අසනු ඇත. එවිට, ‘නැත, නිශ්ශබ්ද
වන්න, සමිඳාණන් වහන්සේගේ නාමය සඳහන්
නොකරන්න අප ප්‍රවේසම් විය යුතු ය’යි ඔහු
පිළිතුරු දෙන්නේ ය.
11 සමිඳාණන් වහන්සේ අණ කරන විට ලොකු
කුඩා ගෙවල් සියල්ල සුණු විසුණු වනු ඇත.
12 අශ්වයන්ට පර්වත මත පැන පැන ගිය හැකි ද?
ගොනුන් ලවා මුහුද සීසාන්නට පුළුවන් ද? එහෙත්
ඔබ යුක්තියට විස පොවා, ඇත්ත නැත්ත කර ඇත.
13 මොන කැකිරි ගඩේයක් ගැන ඔබ ජය ඝෝෂා
කරන්නහු ද? “අප ජයගත්තේ අපේ ම බලයෙන්
නොවේ දැ”යි ඔබ කියන්නහු ය.
14 එහෙත්, සියලු බලැති දෙවි සමිඳාණන් වහන්සේ
මෙසේ පිළිතුරු දෙන සේක: “ඉශ්‍රායලයේ ජනයෙනි,
නුඹලාට විරුද්ධ ව මම ජාතියක් එවන්නෙමි. උතුරේ
ඇති හමාත්ට ඇතුළු වන දුර්ගයේ සිට, දකුණේ
ඇති මළ මුහුද දක්වා ඒ ජාතිය නුඹලාට පීඩා කරනු
ඇත.”

## පළඟැටියන් ගැන දර්ශනය

7 මහෝත්තම දෙවි ස්වාමීන් වන දෙවියන්
වහන්සේ මට දර්ශනයක් දැක්වූ සේක. උන්
වහන්සේ පළඟැටියන් කන්දරාවක් ඇතිවන්න
සලස්වනු මම දිටිමි. එසේ කළේ, රජ්ජුරුවන්ට හිමි
ගොයම කැපූ පසු, යල් කන්නය වැවෙන්න පටන්ගත්
විට ය. 2 ඒ පළඟැටියන් දේශයේ ඇතිතාක් සියලු
පලා වර්ග කාදමනු මම දිටිමි. එවිට මම,
“මහෝත්තම දෙවි ස්වාමීනි, ඔබේ සෙනඟට කමා
වුව මැනව; සෙනඟ ජීවත් වන්නේ කොහොම ද?
ඔව්හු සුළු සෙනඟකි”යි යැදීමි.
3 සමිඳාණන් වහන්සේ සිය අරමුණ වෙනස් කොට,
“නුඹ දුටු දේ සිදු නොවන්නේ ය”යි වදාළ සේක.

## මහ ගින්න ගැන දර්ශනය

4 දෙවි සමිඳාණන් වහන්සේ මට මේ දර්ශනය
දැක්වූ සේක: උන් වහන්සේ ගින්නකින් සෙනඟට
දඬුවම් කරන්න සූදානම් වන බව මම දිටිමි. ඒ
ගින්න ජල පොළොව දවා, ගොඩබිම ද දවන්න
පටන්ගත්තේ ය. 5 එවිට මම, “මහෝත්තම දෙවි
ස්වාමීනි, නතර කළ මැනව; සෙනඟ ජීවත් වන්නේ
කොහොම ද? ඔව්හු සුළු සෙනඟකි”යි යැදීමි.
6 සමිඳාණන් වහන්සේ සිය අරමුණ වෙනස් කොට,
“මෙයත් සිදු නොවන්නේ ය”යි වදාළ සේක.

## ලඹ ලණුව ගැන දර්ශනය

7 දෙවි සමිඳාණන් වහන්සේ මට මේ දර්ශනය
දැක්වූ සේක. ලඹ ලණුව අල්ලා සෑදූ පවුරක් අසල
උන් වහන්සේ තම අතේ ලඹ ලණුවක් ඇති ව
සිටිනු මම දිටිමි. 8 “ආමොස්, නුඹට පෙනෙන්නේ
කුමක් දැ”යි උන් වහන්සේ මාගෙන් ඇසූ සේක.
“ලඹ ලණුවකැ”යි මම පිළිතුරු දිනිමි. එකල උන්
වහන්සේ, “මාගේ සෙනඟගේ ඇදකුද කෙතෙරම් ද
කියා, මේ ලඹ ලණුව ඇල්ලීමෙන් මම නුඹට
පෙන්වමි. ඔවුන්ට දඬුවම් කිරීමට ඇති මාගේ අදහස
මම වෙනස් නොකරමි. 9 ඊසාක්ගේ දරු පරම්පරාව
නමස්කාර කරන ගිරිකුළු දේවාල විනාශ වන්නේ ය.
ඉශ්‍රායලයේහි සිද්ධස්ථාන වැනසෙන්නේ ය.
ජෙරොබෝවම් රජුගේ වංශයට විරුද්ධ ව මම
යුද්ධයක් හටගන්වන්නෙමි”යි වදාළ සේක.

## ආමොස් සහ අමසියා අතර විවාදය

10 බෙතෙලේහි පූජක තැන වූ අමසියා ඉශ්‍රායලයේහි
රජ වූ ජෙරොබෝවම්ට මෙසේ දන්වා යැවී ය:
“ආමොස් ඔබට විරුද්ධ ව, ඉශ්‍රායලයේ ජනයා අතරේ
කුමන්ත්‍රණයක් කර තිබේ. ඔහු ප්‍රකාශ කරන දේ
නිසා රට විනාශ වන්නේ ය. 11 ‘ජෙරොබෝවම් රජ
යුද්ධයේ දී මිය යන්නේ ය’ කියා ද ‘ඉශ්‍රායලයේ
සෙනඟ වහල්කමට ගෙනයනු ලබන්නේ ය’ කියා ද
ඔහු ප්‍රකාශ කරයි.”
12 අමසියා ආමොස් අමතා, “දිවැස් කියන්නා
මෙතැනින් යන්න, ජුදා රටට ගොස් එහි ඔබේ
ජීවිකාව කරගන්න, එහි ඔබේ දිවැස් දෙසුම් කරන්න.
13 මින්පසු දිවැස් දෙසුම් බෙතෙලේහි නොකරන්න.
මෙය රජතුමා නමස්කාර කරන ස්ථානය ය; මෙය
ජාතික සිද්ධස්ථානය ය”යි කීවේ ය.
14 එයට ආමොස් පිළිතුරු දෙමින් මෙසේ කීවේ ය:
“මම රුකියාව වශයෙන් දිවැස් වැකි කියන
දිවැසිවරයකු නොවෙමි; මම ගොපල්ලකෙමි;
අත්තික්කා වගා කරන්නෙකෙමි. 15 එහෙත්, සමිඳාණන්
වහන්සේ එඬේර රුකියාවෙන් පිටත මා කැඳවා,
‘නුඹ ගොස් මාගේ ඉශ්‍රායලයේ සෙනඟට දිවැස් වැකි
දෙසන්නැ’යි මට නියම කළ සේක. 16 එබැවින්
සමිඳාණන් වහන්සේ වදාරන දේට සවන් දෙන්න.
ඉශ්‍රායලයේ සෙනඟට විරුද්ධ ව දිවැස් වැකි කියන්නට
වත්, ඊසාක්ගේ දරු පරම්පරාවට විරුද්ධ ව වචනයක්
කියන්නට වත් එපා යයි ඔබ කියන්නෙහි ය. 17 ඔබ
එසේ කියන බැවින් සමිඳාණන් වහන්සේ ඔබට
මෙසේ වදාරන සේක: ‘නුඹේ භාර්යාව නගරයේ
වෙසඟනක් වන්නී ය; නුඹේ දූ දරුවෝ යුද්ධයේ මිය
යන්නෝ ය; නුඹේ රට මැන බෙදා අන්‍යයන්ට දෙනු
ලබන්නේ ය. නුඹ ද මිසදිටු රටක මිය යන්නෙහි ය.
ඉශ්‍රායලයේ සෙනඟ මවු බිමින් පිටුවහල් කරනු
ලබන්නෝ ය.’ ”

## පැසුණු පලතුරු ගැන දර්ශනය

8 මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මේ
දර්ශනය මට දැක්වූ සේක. මම පැසුණු පලතුරු
ඇති කූඩයක් දිටිමි. 2 එවිට සමිඳාණන් වහන්සේ,
“ආමොස්, නුඹ කුමක් දකින්නෙහි දැ”යි ඇසූ සේක.
“පැසුණු පලතුරු ඇති කූඩයකැ”යි මම පිළිතුරු දුනිමි.
එවිට සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ සේක:

"ඉශ්රායලේ සෙනඟගේ විනාශය පඩිසන් දෙන
කාලය දැන් පැසී ඇත. ඔවුන්ට දඬුවම් කිරීමට ඇති
මාගේ අදහස් මම වෙනස් නොකරමි. 3 ඒ දවසේ දී
මාලිගාවේ ගී ගායනා දුක් ගායනා බවට හැරේ, සෑම
තැන ම මළකඳන් දක්නට ලැබේ. කිසි තැනක
ශබ්දයක් ඇසෙන්නට නැත."

## ඉශ්රායලේ ජාතියේ විනාශය

4 දිළිඳුන් පාගාදමා, අසරණයන්ට පීඩා කරන, ඔබ
මෙයට සවන් දෙන්න. 5 ඔබ ම මෙසේ කියන්නහු ය:
"අපේ ධාන්ය විකුණන පිණිස මාස පෝය
ගෙවෙන්නේ කොයි වේලේ ද? ධාන්යාගාර අරින
පිණිස සබත් දවස ගෙවෙන්නේ කොයි වේලේ ද?
එතකොට අපට වැඩි මිලට බඩු විකිණිය හැකි ය;
හොර කෝදුවෙන් මැන දිය හැකි ය; ගනු දෙනු
කරන්නන් රවටන හොර තරාදි පාවිච්චි කළ හැකි ය;
6 අපට දුප්පතා සල්ලිවලට ද දුගියා සෙරෙප්පු
දෙකෙක මිලයට ද ගත හැකි ය; එවිට බොල් වී
හොඳ ගණනකට විකිණිය හැකි ය."
7 ඉශ්රායලේගේ දෙවි සමිඳාණන් වහන්සේ සිය
නාමයෙන් දිවුරා මෙය වදාළ සේක: "ඔවුන්ගේ නපුරු
ක්රියා කිසි කලෙක මම අමතක නොකරමි.
8 එබැවින් පොළොව දෙදරන්නේ ය; රටවැසි
සියල්ලෝ වැලපෙන්නෝ ය. මුළු රට ම නයිල් ගඟ
මෙන් නැඟී, දගෙොඩ තලා, බැස යනවා ඇත. 9 ඒ
දවසේ දී, මද්දහන වේලාවේ ඉර බසින්නට
සලස්වන්නෙමේ; මහා දවාලේ පොළොව
අන්ධකාරවන්ට සලස්වන්නෙමේ. මේ වචන වදාළේ
දෙවි ස්වාමීන් වන මම ය. 10 නුඹලාගේ සුබ
මංගල්යයන් අවමංගල්යන් කරන්නෙමේ; නුඹලාගේ
තුති ගී ළතෝනි බවට හරවන්නෙමේ. නුඹලාගේ බඳ
වටා ගෝණි හඳවා හිස් මුඩු කරන්නෙමේ. එක ම
පුතාගේ මරණය නිසා වැලපෙන දෙමව්පියන් මෙන්
නුඹලා වැලපෙන්නහු ය. ඒ දවස කළෙවර දක්වා
තිත්ත ම තිත්ත වන්නේ ය.
11 "දේශය මුළුල්ලේ මහා සාගතයන් එවන කාලය
ළං වන්නේ ය. ඒ සාගින්න කෑම සඳහා නොවේ;
පිපාසය වතුර සඳහා නොවේ. එය සමිඳාණන්
වහන්සේගේ වචනය ඇසීමට ඇති වන සාපිපාසය
වේ. මෙසේ කියන්නේ මහෝත්තම දෙවි ස්වාමීන්
වන මම ය. 12 එවිට සෙනඟ සමිඳාණන්
වහන්සේගේ වචනය සොයමින් උතුරේ සිට දකුණට
ද නැගෙනහිර සිට බස්නාහිරට ද ඔබමොබ දුවනවා
ඇත. එහෙත්, එය ඔවුන්ට සම්බ වන්නේ නැත. 13 ඒ
දවසේ දී රූමත් තරුණියෝ ද ශක්තිමත් තරුණයෝ ද
පිපාසයෙන් ක්ලාන්ත වී වැටෙන්නෝ ය. 14 'දාන්හි
ජීවමාන දෙවියන්ගේ නාමයෙන්' කියා ද 'බයෙර්-
ෂෙබොහි ජීවමාන දෙවියන්ගේ නාමයෙන්' කියා ද
සමාරියේ දෙවිවරුන් නමින් ද දිවුරන සියලු දෙනෙ
නැවත නැඟිටින්නට නොහැකි වන ලෙස
වැටෙන්නෝ ය."

## සමිඳාණන් වහන්සේගේ විනිශ්චය

9 සමිඳාණන් වහන්සේ පූජාසනය ළඟ සිටිනු
මම දිටිමි. උන් වහන්සේ මෙසේ අණ කළ
සේක: "උළුවහු සෙලවෙන හැටියට සිද්ධස්ථානයේ
පේකඩවලට පහර දී, ඒවා බිඳදමා, ඔවුන්
සියල්ලන්ගේ හිස් පිට කඩා වැටෙන්න සලස්වන්න.
ඉතිරි වන සියලු දෙනා මම යුද්ධයේ දී මරාදමමි.
එක මිනිහෙක් වත් ඉතුරු නොකරමි. එක් කෙනෙක්
වත් බේරෙන්නේ නැත. 2 ඔවුන් පොළොව හාරා
මළවුන්ගේ ලෝකයට ගියත්, මම ඔවුන් අල්ලාගනිමි.
ඔවුන් සගලොව නැඟී ගියත්, එතැනින් මම ඔවුන්
පහතට හෙළමි. 3 ඔවුන් කර්මලේ කන්ද මුදුනෙහි
සැඟවී සිටියත්, මම ඔවුන් සොයාගෙන අල්ලාගනිමි.
ඔවුන් මට නොපෙනේ මුහුදු පත්ලෙහි සැඟවුණත්,
එහි දී ඔවුන් දෂ්ට කරන පිණිස මුහුදු සර්පයාට මම
අණ කරමි. 4 ඔවුන්ගේ සතුරන් ඔවුන් වහල්කමට
ගෙන ගියොත්, ඔවුන් කඩුවෙන් මරන ලෙස මම
අණ කරමි. ඔවුන්ට පිහිටවන්නට නොව ඔවුන්
විනාශ කරන්න මම අධිෂ්ඨාන කරගෙන සිටිමි.
5 "සව් බලැති දෙවි සමිඳු, අතගසන විට දෙරණට,
දෙරණ සැලෙනු ඇත, සව් ලෝ සත වැලපෙනු ඇත.
q2[5] මිසරයේ ගඟ වන නයිල් නදිය විලසින නඟියි,
බසියි මුළු දෙරණ.
6 සගලොව සිය විමන ද නර ලොව උඩින් අහස්
වියන ද මවන්නේ සමිඳාණෝ ය.
q2[6] මුහුදේ ජලයට හඬගසා පොළොවේ වගුරුවා
යවන සේක.
q2[6] එතුමන්ගේ නාමය සමිඳාණෝ ය."
7 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
"ඉශ්රායලේ ජනයෙනි, මා නුඹලාත්, එතියෝපිවරුනුත්
සලකන්නේ එක හා සමාන ව ය. මා නුඹලා මිසර
දේශයෙන් ගෙනා සේ ම, පිලිස්තිවරුන් ක්රීතයේ
සිට ද සිරියන්වරුන් කීර්හි සිට ද මම ගෙනාවෙමේ.
8 මේ පාපිෂ්ඨ රාජ්යය දෙස මම බල බලා සිටිමි.
මම ඒ රාජ්යය මිහි පිටින් විනාශ කර දමමි. එහෙත්,
ඒ ඉශ්රායලේ සෙනඟ මම සහමුලින් ම විනාශ
නොකරමි.
9 "වැදගැම්මකට නැති අය වෙන් කරන පිණිස,
පෙනේරෙන් ධාන්ය හලන්නා සේ මම ඉශ්රායලේ
සෙනඟ ජාතීන් අතරේ ඒ මේ අත හැලීමට අණ
කරන්නෙමේ. 10 'දෙවියන් වහන්සේ අපට කිසි
හානියක් නොකරන සේකැ'යි කියන සෙනඟ අතරේ
පව්කාරයන් වන සියල්ලන් මම කඩුවෙන් විනාශ කර
දමමි."

## ඉශ්රායලේ ජාතියේ පුනරුත්ථාපනය

11 ක්රියා 15:16-18 "ඒ දවසේ දී, ගරාවැටුණු
ගෙයක් වැනි දාවිත් රජුගේ වංශය මම යළි
පුනරුත්ථාපනය කරන්නෙමේ. එහි බිත්තිවල ඇති
කපොලු අහුරා, නටබුන් ප්රතිසංස්කරණය කර පෙර
තිබුණු තත්ත්වයට පමුණුවන්නෙමේ. 12 එවිට
ඉශ්රායලේ ජනයා, ඒදොම් රටේ ඉතිරි අය ද, මට

හිමි ව තිබුණු ජාතීන් ද අයිති කර ගන්නෝ ය.”
මෙසේ වදාරන්නේ, මෙය ඉටුවන්නට සලස්වන
සමිඳාණන් වහන්සේ ය.
13 තවද සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන
සේක:
q2 13 “සීසා ඉවර වූ වහා ම අස්වැන්න ඇති වේ.
q2 13 බීජ වැපුරූ වහා ම මිදි මිරිකීම ඇති වේ.
q2 13 කඳුවලින් මිහිරි මිදිපැන් වෑස්සේ, සියලු
හලේවලින් මිදිපැන් ගලා යේ.
14 මාගේ සෙනඟ යළි සිය රටට ගෙනෙමි, ඔව්හු
නටබුන් නගර යළි ගොඩනඟා එහි ජීවත් වන්නෝ
ය.
q2 14 ඔව්හු මිදි වතු වවා මිදියුස බොන්නෝ ය.
q2 14 ඔව්හු වතු ද වවා එහි පල කන්නෝ ය.
15 මා ඔවුන්ට දුන් දේශයෙහි මම ඔවුන්
පිහිටුවන්නෙමි.
q2 15 කිසි කලෙක නැවත ඔව්හු එයින් උදුරනු
නොලබන්නෝ ය.”
15 නුඹලාගේ දෙවි සමිඳාණන් වහන්සේ මෙසේ
වදාළ සේක.

# ඔබදියා

### ඒදොම් යටත් කරනු ලැබීම

1 දිවැසිවර ඔබදියාගේ දර්ශනය මෙය වේ.
මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ ඒදොම්
ගැන මෙසේ වදාරන සේක: “ඉදිරියට එන්න; අපි
ඒදොම්ට විරුද්ධ ව යුද්ධයට යමු”යි කියන පිණිස
ජාතීන් අතරට පණිවුඩකාරයෙක් යවනු ලැබී ය. මම
මේ ආරංචිය සමිඳාණන් වහන්සේගෙන් ලදිමි.
2 “මම නුඹ ජාතීන් අතර ඉතා සුළු කරන්නෙමි.
q2² නුඹ අධික ලෙස ද්වේෂ කරනු ලබන්නෙහි ය.
3 ගල් ගුහාවල ජීවත් වන, උස් තැන්හි වාසය
කරන, මා බිම හෙළිය හැක්කේ කවරෙකුට දැ යි
කියාගන්න නුඹ, සිතේ අහංකාරය නිසා රැවටී
සිටින්නෙහි ය.
4 නුඹ, රාජාලියෙකු මෙන් ඉහළට පියාඹා, නුඹේ
කැදැල්ල තාරකා අතරේ පිහිටුවා ගත්තත් එතැනින්
වුව ද මම නුඹ පහතට හෙළාදමන්නෙමි”යි
පවසන්නේ, සමිඳාණන් වහන්සේ වන මම ය.
5 “රාත්රියේ සොරු වත්, කොල්ලකාරයෝ වත් නුඹ
වෙත පැමිණියෝ නම්, ඔවුන්ගේ සිතේ හැටියට
සොරා නොගනිත් ද? මිදි පල නෙළන්නෝ නුඹ වෙත
පැමිණියෝ නම්, මිදි පල සමහරක් වත් ඉතිරි
නොකරත් ද? එහෙත්, අහෝ! ඔවුන් නුඹ විනාශ කර
දමා තිබෙන හැටි! 6 අනේ! ඒසව්; ඔවුන් නුඹේ
වස්තුව සොයාගෙන තිබෙන හැටි! ඒ සඟවන ලද
වස්තුව පැහැරගෙන ගොස් ඇති හැටි! 7 නුඹ සමඟ
ගිවිසුම් කරගත් අය නුඹ රවටා, දේශ සීමාව දක්වා
නුඹ පන්නාදමා ඇත. නුඹ සමඟ සාමදානයෙන් සිටි
අය දැන් නුඹ පරාජය කර ඇත. නුඹේ හිත-මිතුරන්
නුඹට උගුල් අටවා, ‘ඔහුට ඒ ගැන තේරුමක් නැතැ’යි
කියනු ඇත.”
8 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක: “ඒ
කාලයේ දී මම ඒදොමෙන් පැණවතුන් ද ඒසව්ගේ
කඳුකරයෙන් ඥානය ද නැති නොකරම් ද?
9 ඒසව්ගේ කඳුකරයේ සටන් කරන හැම දෙනා ම
මරාදමන තුරු, එම්බා තේමාන්! නුඹේ රණ ශූරයන්
භීතියෙන් ත්රස්ත වනු ඇත.”

### ඒදොම් වැසියන්ගේ පාපය

10 “නුඹ තම සහෝදර ජාකොබ් ඝාතනය කළ
නිසා, නුඹ නින්දා කරනු ලැබ සදහට ම විනාශ
කරනු ලබන්නෙහි ය. 11 නුඹ නිකම් බලාගෙන සිටි
දවසේ දී ද විදේශීන් ඔහුගේ වස්තුව පැහැරගෙන
ගිය දවසේ දී ද පරදේශීන් ජෙරුසලම් දොරටු
කඩාදමා, දාදු දමා ජෙරුසලම බෙදාගත් දවසේ දී ද
නුඹත් ඔවුන්ගෙන් එක් කෙනෙකු මෙන් වූවෙහි ය.
12 නුඹේ සහෝදරයාට පැමිණි විපත්ති ගැන නුඹ
ප්රීති වීම නොහොබනේ ය. ජුදා වැසියන් විපතට
පත් වූ දවසේ දී නුඹ සතුටු වීම හරි නැත. ඔවුන්
දුක් විඳින අතර නුඹ ඔවුන්ට උඩඟුකමෙන් සරදම්
කිරීම වැරදි ය. 13 මාගේ සෙනඟ විපතට පත් වන
දවසේ දී ඔවුන්ගේ නගරයට ඇතුල් නොවන්න.
ඔවුන් විපතට පත් වන දවසේ දී, ඔවුන්ගේ දුක
දැක ප්රීති නොවන්න. ඔවුන් විපතට පත් වන
දවසේ දී ඔවුන්ගේ ධනයට අත වත් නොතබන්න.
14 යෙසා 34:5-17; 63:1-6; ජෙරෙ 49:7-22; එසකි
25:12-14; 35:1-15; ආමො 1:11-12; මලාකි
1:2-5ඔවුන්ගෙන් පලා යන්නන් සිඳ දැමීමට නුඹ
මංසන්ධිවල රැක නොසිටින්න. ඔවුන්ගේ විපත්ති
දවසේ දී ඉතිරි අය පාවා නොදෙන්න.”

### ජාතීන් විනිශ්චය කරනු ලැබීම

15 “සියලු ජාතීන්ට විරුද්ධ ව එන සමිඳාණන්
වහන්සේගේ දවස ළං වී තිබේ. නුඹ කර තිබෙන
හැටියට ම නුඹටත් කරනු ලැබේ. නුඹ අනුන්ට කළ
දේ නුඹටත් පල දේ. 16 මාගේ ශුද්ධ කන්දෙහි නුඹ
මධු පානය කළාක්මෙන් සියලු විජාතීන් නොනවතා
මධු පානය කරනු ඇත. ඔවුන් හොඳට ම බී,
වෙරිමත් වී නැත්තට ම නැතිවනු ඇත.”

### ඉශ්රායලේගේ ජයග්රහණය

17 “කෙසේ වෙතත්, සියොන් කන්දේ සිටින සමහර
දෙනෙකු බේරෙනු ඇත. එය ශුද්ධස්ථානයක් වන්නේ
ය. ජාකොබ්ගේ වංශය තමන්ගේ උරුමය වන
දේශය අයිති කරගන්නේ ය. 18 ජාකොබ්ගේ වංශය
ගින්නක් මෙන් ද ජෝසෙප්ගේ වංශය ගිනි දැල්ලක්
මෙන් ද ඒසව්ගේ වංශය ඉපනැලි මෙන් ද වන්නෝ
ය. ඒසව්ගෙන් පැවැත එන කිසිවෙකු ඉතිරි නොවන
ලෙස ඔව්හු දැවී ගිනිබත් වන්නෝ ය.” මෙසේ
වදාළේ සමිඳාණන් වහන්සේ ය.
19 “නෙගෙබ්හි සිටින අය ඒසව් කන්ද අයිති
කරගන්නෝ ය. පහත රටේ අය පිලිස්තිවරුන්ගේ
දේශය යටත් කරගන්නෝ ය. ඔව්හු එප්රායිම් හා
සමාරියේ ගම්බිම් ද බෙන්ජමින්වරු ගිලියද් දේශය ද
හිමි කරගන්නෝ ය. 20 ඉශ්රායලේ ජනයා අතරේ
වහල්කමට ගෙනෙයනු ලැබූ අය වූ හමුදාව ශාරෙපෙත්
දක්වා ම කානාන් දේශය හිමි කරගන්නෝ ය.
සෙපොරද්හි වහල්කමට ගෙනෙයනු ලැබූ ජෙරුසලමේ
අය නෙගෙබ් නුවරවල් ද හිමි කරගන්නෝ ය.
21 ඒසව් කන්ද පාලනය කරන පිණිස ජයග්රාහික ව

ඔව්හු සියොන් කන්දට නඟින්නෝ ය. රාජ්‍යය ද සමිඳාණන් වහන්සේගේ වන්නේ ය.”
io1 පරිච්ඡේද 1:1-17 ජෝනාගේ කැඳවීම හා අකීකරුකම.
io1 පරිච්ඡේද 2:1-10 ජෝනා පසුතැවී සිත හරවා ගැනීම හා ගැළවීම.
io1 පරිච්ඡේද 3:1-10 නිනිවයට විරුද්ධ ව ජෝනාගේ පණිවුඩය.
io1 පරිච්ඡේද 4:1-11 නිනිවය කරෙහි දේව දයානුකම්පාව.

# ජෝනා

### හැඳින්වීම

මේ පොතේ ඇත්තේ, දෙවියන් වහන්සේගේ ආඥාවන්ට කීකරු නො වූ ජෝනා නම් එක් දිවැසිවරයෙකු පිළිබඳ කථාන්තරයකි. එය කථාන්තරයක ස්වරූපය ගෙන තිබෙන බැවින් අන් දිවැසිවරුන්ගේ පොත්වලට වඩා වෙනස් ය. කථාන්තරයේ සාරාංශය මෙසේ ය. ඉශ්රායෙලේ ජාතියේ භයානක සතුරා වූ අසිරියා අධිරාජ්‍යයේ අග නුවර වන නිනිවයට ගොස් එයට විරුද්ධ ව දේශනා කරන්නට දෙවියන් වහන්සේ ජෝනාට නියම කළ සේක. එහෙත්, දෙවියන් වහන්සේ සිය තර්ජනය පරිදි එම නගරය විනාශ නොකරනු ඇතැ යි විශ්වාස කළ ජෝනා දේව අණට කීකරු නොවී, එය මඟ හැර, අන් අතකට යන පිණිස නැව් නැංගේ ය. එහෙත්, එම ගමනේ දී ඇති වූ යම් සිද්ධීන් නිසා ඔහුට නිනිවයට යන්නට සිදු විය. ඔහු නිනිවයේ විනාශය ගැන දේශනා කළ නමුත්, එය සිදු නො වූ බැවින් කලකිරුණේ ය. දෙවියන් වහන්සේ ප්‍රේමයෙන් හා දයාවෙන් පූර්ණ දෙවි කෙනෙක් බවත්, සතුරන්ට වුවත් දඬුවම් කොට විනාශ කරනවාට වඩා, ඔවුන්ට කමා කොට ඔවුන් ගළවන්නට සූදානම් දෙවි කෙනෙකු බවත් ජෝනාට හෙළි විය. දෙවියන් වහන්සේ පිළිබඳ මේ සත්‍යය ප්‍රකාශ කිරීම යි, මේ පොතේ මූලික අදහස.

මෙහි අඩංගු කරුණු:

පරිච්ඡේද 1:1-17 ජෝනාගේ කැඳවීම හා අකීකරුකම.
පරිච්ඡේද 2:1-10 ජෝනා පසුතැවී සිත හරවා ගැනීම හා ගැළවීම.
පරිච්ඡේද 3:1-10 නිනිවයට විරුද්ධ ව ජෝනාගේ පණිවුඩය.
පරිච්ඡේද 4:1-11 නිනිවය කෙරෙහි දේව දයානුකම්පාව.

### ජෝනා දේව අණට අකීකරු වීම

1 2 රාජා 14:25 සමිඳාණන් වහන්සේගෙන්
අමිත්තයිගේ පුත් ජෝනාට පැමිණි පණිවුඩය
මෙසේ ය: 2 “නැඟිට නිනිවය නම් ශ්‍රේෂ්ඨ
නගරයට ගොස් ඊට විරුද්ධ ව මොරගසන්න; මන්ද,
එහි වැසියන්ගේ දුෂ්ටකම මට ඉතා හොඳින්
පෙනේ.” 3 එහෙත්, ජෝනා සමිඳාණන් වහන්සේ
මඟ හැර පලා යන පිණිස තර්ෂිෂ්ට යන්නට පිටත්
විය. ඒ සඳහා ඔහු ජොප්පාවට ගියේ ය. එහි දී
ඔහුට තර්ෂිෂ්ට යන නැවක් හමු වී, ඊට ගාස්තුව
ගෙවා සමිඳාණන් වහන්සේ වෙතින් පලා යන පිණිස
තර්ෂිෂ් බලා යන නැවකට නැඟුණේ ය.
4 එහෙත්, සමිඳාණන් වහන්සේ මුහුද පිට තද
සුළඟක් හමන්න සැලැසූ සේක. එයින් මුහුදේ මහා
කුණාටුවක් ඇති වී නැව බිඳෙන්නට විය. 5 එවිට
නාවිකයෝ බිය වී, එක එකා තම තමාගේ
දෙවියන්ට මොරගැසුවෝ ය. ඔව්හු නැව සැහැල්ලු
කරගන්න පිණිස එහි තිබුණු බඩු මුහුදට විසි කළෝ
ය. එහෙත්, ජෝනා නැවේ පහත තට්ටුවට බැස
ගොස් බර නින්දකට වැටී හුන්නේ ය.
6 එවිට නැව්පතියා ඔහු ළඟට අවුත්, “ඔබ හොඳට
ම නිදාගෙන සිටීමේ තේරුම කුමක් ද? නැඟිට ඔබේ
දෙවියන්ගෙන් පිහිට ඉල්ලන්න. සමහර විට උන්
වහන්සේ අප විනාශ නොවන ලෙසෙ අප ගැන
සලකනු ඇතැ”යි කී ය.

### ජෝනා මුහුදට බිලි දෙනු ලැබීම

7 එකල නාවික පිරිස තම තමන් අතරේ කතා
කරගනිමින්, “මේ විපත්තිය අපට පැමිණියේ
කවරකු නිසා දැ යි දැනගන්න පිණිස පස ඇට
දමමු”යි කී හ. ඒ අනුව ඔව්හු පස ඇට දැමූ හ. පස
ඇටය ජෝනාට වැටිණි. 8 එවිට ඔව්හු ජෝනාගෙන්
ප්‍රශ්න කරමින්, “අපට පැමිණි මේ වින්නැහියට
වගකිව යුත්තේ කවරෙක් ද? ඔබේ රැකියාව කුමක්
ද? ඔබ කොහේ සිට ආවෙහි ද? ඔබේ රට කුමක්
ද? ඔබේ ජාතිය කුමක් දැ”යි ඇසූ හ.
9 ඔහු පිළිතුරු දෙමින්, “මම හෙබ්‍රෙව්
ජාතිකයෙක්මි. මම මුහුදත්, ගොඩබිමත් මැවූ
ස්වර්ගයේ දෙවි සමිඳාණන් වහන්සේ අදහමි”යි කී
ය. 10 ඔහු සමිඳාණන් වහන්සේ වෙතින් පලා යන
බව ඔවුන් දැනගෙන සිටි නිසා ඔව්හු ඉතා බියපත්
වී, “ඔබ කළ මේ හදිය කුමක් දැ”යි ඇසූ හ.
11 කුණාටුව වඩ වඩාත් වේගවත් වූ බැවින්, “මුහුද
නිශ්චල වන පිණිස අප ඔබට කුමක් කළ යුතු දැ”යි
ඔව්හු ඔහුගෙන් ඇසූ හ.

12 “මා රැගෙන මුහුදට බිලි දන්නේ. එවිට මුහුද
නිශ්චල වනු ඇත. මේ මහ කුණාටුව ඇති වී
තිබෙන්නේ මා නිසා බව මම දනිමි”යි ඔහු ඔවුන්ට
කීවේ ය.
13 කෙසේ වෙතත්, නාවික පිරිස වෙරළට
පැමිණෙන පිණිස වඩාත් වීර්යයෙන් නැව පැදවූ හ.
එහෙත්, මුහුද වඩ වඩා සැරෙන් ඔවුන්ට විරුද්ධ ව
නැඟී ආ බැවින් ඔවුන්ට එසේ කරන්නට බැරි විය.
14 එවිට ඔව්හු සමිඳාණන් වහන්සේට හඬ ගසා,
“අහෝ සමිඳුනි, මේ මිනිසාගේ ප්‍රාණය නිසා අප
පිට විනාශයක් නො වේ වා! නිදොස් කෙනෙකුගේ
මරණයට අපි වගකිව යුත්තෝ නොවෙමේ වා! මන්ද,
සමිඳුනි, ඔබේ කැමැත්ත පරිදි ඔබ ක්‍රියා කළ
සේකැ”යි කී හ.
15 ඉන්පසු ඔව්හු ජෝනා මුහුදට බිලි දුන්හ. එවිට
මුහුදේ කැළඹීම නැවතිණි. 16 මේ හේතුවෙන්
නාවික පිරිස සමිඳාණන් වහන්සේ කෙරෙහි
අතිශයින් බියපත් වී, උන් වහන්සේට පූජාවක් ඔප්පු
කර බාරහාර පිදූ හ.
17 මතෙ 12:40 සමිඳාණන් වහන්සේ ද ජෝනා
ගිලගන්න පිණිස මහා මත්ස්‍යයෙකු සූදානම් කළ
සේක. ඒ මත්ස්‍යයාගේ කුස තුළ ජෝනා දාවල්
තුනක් ද රෑ තුනක් ද සිටියේ ය.

### ජෝනාගේ ස්තුති ප්‍රශංසා යාච්ඤාව

2 ජෝනා මත්ස්‍යයාගේ කුසයේ සිට තම දෙවි
සමිඳාණන් වහන්සේට මෙසේ යාච්ඤා කළේ
ය.
2 “මාගේ පීඩාවේ දී සමිඳුන්ට හඬගැසීමි,
එතුමාණෝ මට පිළිතුරු දුන් සේක.
q2 2 පාතාල ගැබේ සිට කෑගැසීමි, ඔබ මාගේ හඬ
ඇසූ සේක.
3 ඔබ මුහුද මැද ගැඹුරට මා හෙළූ සේක.
q2 3 ජලධාරාවෝ මා සිසාරා සිටගත්හ.
q2 3 තරංග හා ජලකඳ සියල්ල මට උඩින් ගලා
ගියේ ය.
4 එවිට මම මෙසේ කීමි:
q2 4 ‘ඔබ ඇස් හමුයෙන් මම පහකරනු ලැබීමි.
q2 4 එබැවින් ඔබේ ශුද්ධ මාලිගාව දෙස නැවත
බලන්නේ කෙසේ ද?’
5 ජලය මා ගලෙ දක්වා නැඟ ආවේ ය.
q2 5 මුහුද මා වට කරගත්තේ ය.
q2 5 මුහුදු පැළෑටි මාගේ හිස වටේ එතුණේ ය.
6 මම කඳු පත්ලට බැස ගියෙමි;
q2 6 සදහට ම අගුල්වලින් මා හිර කර තබන
ලොවකට බැස ගියෙමි.
q2 6 අහෝ!
q2 6 මාගේ දෙවි සමිඳුනි, එහෙත්, ඔබ මාගේ
ප්‍රාණය පාතාලයෙන් ගොඩගත් සේක.
7 මාගේ පණ කෙන්ද මැලවී යද්දී, මම සමිඳුන් සිහි
කළෙමි.
q2 7 මාගේ අයැදුම ඔබ වෙත නැඟුණේ ය;
q2 7 ඔබේ ශුද්ධ මාලිගාවට පැමිණියේ ය.

8 බොරු දෙවිවරුන් නමදින්නෝ ඔබට ඇති
පක්ෂපාතකම පැහැර හරිති.
9 එහෙත්, මම තුති මුවින් පූජා ඔප්පු කරන්නෙමි.
q2 9 බාර වූ දේ ගෙවෙන්නෙමි.
q2 9 ගැළවීම සමිඳුන්ගෙනේ ය.”
10 සමිඳාණෝ මත්ස්‍යයාට කතා කළ සේක. එවිට
ඌ ජෝනා ගොඩබිමට වැමෑරී ය.

### නිනිවයේ සෙනඟ පසුතැවී සිත්හරවා ගැනීම

3 සමිඳාණන් වහන්සේගේ පණිවුඩය දෙ වන
වරට ජෝනා වෙත පැමිණියේ ය. 2 “නුඹ
නැඟිට නිනිවය නම් ශ්‍රේෂ්ඨ නගරයට ගොස් මා
නුඹට කියන පණිවුඩය එහි ප්‍රකාශ කරන්නැ”යි
සමිඳාණන් වහන්සේ වදාළ සේක. 3 එවිට ජෝනා
නැඟිට සමිඳාණන් වහන්සේ නියම කළ පරිදි
නිනිවයට ගියේ ය. නිනිවය ඉතා විශාල නගරයකි.
එය හරහා යාමට දවස් තුනක් ගත වේ. 4 මතෙ
12:41; ලූක් 11:32ජෝනා නගරයට ඇතුළු වී එක
දවසක් ගමන් කර, “තව දින සතළිසකින් නිනිවය
වැනසෙනු ඇතැ”යි මොරගසා ප්‍රකාශ කළේ ය.
5 නිනිවයේ වැසියෝ දෙවියන් වහන්සේ කෙරෙහි
විශ්වාස කර, උපවාසයක් නියම කොට, ලොකු අය
පටන් කුඩා අය දක්වා දළ රෙදි හැඳගත්තෝ ය.
6 ඒ ආරංචිය නිනිවයේ රජු වෙත පැමිණි විට, ඔහු
සිංහාසනයෙන් බැස, තම සළුව ඉවත ලා දළ රෙදි
පොරවාගෙන අළු පිට හිඳගත්තේ ය. 7 එවිට ඔහු
නිනිවය පුරා නියෝගයක් පළ කළේ ය. ඒ මෙසේ
ය:
7 “මාගේ සහ මාගේ උත්තමයන්ගේ නියෝගය
පරිදි, මිනිසෙකු වත්, මෘගයෙකු වත්, ගවයෙකු වත්,
බැටළුවෙකු වත් කිසි ම දෙයක රස නොබලා වා!
කිසි කෑමක් නොකා වා! වතුර නොබෝ වා!
8 මනුෂ්‍යයෝ ද මෘගයෝ ද දළ රෙදි පොරවාගෙන
දෙවියන් වහන්සේට බලවත් සේ මොරගසත් වා!
ඔව්හු එකිනෙකා තම තමාගේ නපුරු මාර්ගයෙන් ද
තමන්ට ඇබ්බැහි දාමරිකකම්වලින් ද හැරෙත් වා!
9 අප විනාශ නොවන පිණිස සමහර විට දෙවියන්
වහන්සේ හැරී තමන් සිත වෙනස් කරගෙන,
තමන්ගේ බලවත් උදහසින් දුරුවන්න බැරි නැත.”
10 දෙවියන් වහන්සේ ඔවුන් කළ දේත්, ඔවුන්
නපුරු මාර්ගයෙන් ඉවත් වූ අයුරුත් දැක, ඔවුන්ට
කරන්නට අදහස් කළ විපත ගැන සිත වෙනස්
කරගෙන එය නොකළ සේක.

### දෙවියන් වහන්සේගේ අනුකම්පාව

4 ජෝනා ඊට අතිශයින් අප්‍රසන්න ව කෝප
විය. 2 නික්ම 34:6ඔහු සමිඳාණන් වහන්සේට
මෙසේ යාච්ඤා කළේ ය: “අහෝ සමිඳුනි, මාගේ
රටේ මා සිටිය දී, මා කීවේ මෙය ම නොවේ ද?
තර්ෂිෂ්ට පලා යන්නට මා ඉක්මන් වූයේ එබැවිනි.
මන්ද, ඔබ දයාවන්ත, අනුකම්පා සහගත, වහා
නොකිපෙන සුලු, ඉතා කරුණාවන්ත, විපත්ති පැමිණ
වීමට නොකැමැති දෙවි කෙනෙකු බව මම දැනගෙන

සිටියෙමි. 3 1 රාජා 19:4ඉතින් සමිඳුනි, මාගේ
ප්‍රාණය මාගෙන් තුරන් කළ මැනව. ජීවිතයට වඩා
මරණය මට හොඳ ය.”
4 සමිඳාණන් වහන්සේ ජෝනා අමතා, “කෝප වීම
නුඹට යුතු දැ”යි ඇසූ සේක.
5 එවිට ජෝනා නගරයේ පිටතට ගොස් නගරයට
නැගෙනහිරෙන් හිඳගත්තේ ය. ඔහු එහි පැලක්
සාදාගෙන නගරයට කුමක් සිදු වේ ද කියා බලන
පිණිස එහි සෙවණ යට හිඳගත්තේ ය. 6 දෙවි
සමිඳාණන් වහන්සේ, ජෝනා ඔහුගේ දුකින් මුදන
පිණිස ලබු වැලක් වැඩෙන්නට නියම කර, ඔහුගේ
හිසට උඩින් එය සෙවණක් සේ යන්නට සැලැසූ
සේක. ජෝනා ලබු වැල ගැන ඉතා ප්‍රීති විය.
7 එහෙත්, පසු දා පහන් වූ විට ලබු වැල කන
පිණිස පණුවකු ඇති වන්න දෙවියන් වහන්සේ
සැලැසූ සේක. ඌ ලබු වැල කෑ විට එය වියළී ගියේ
ය. 8 තව ද, ඉර උදා වූ කල, ඉතා උෂ්ණ සුළඟක්
පෙරදිගින් හමන්න උන් වහන්සේ නියම කළ සේක.
අව්රශ්මිය ජෝනාගේ හිසට වැදී ඔහු ක්ලාන්ත වී,
“ජීවිතයට වඩා මරණය හොඳ ය” කියා සිය ප්‍රාණය
හානි කරන ලෙස යාච්ඤා කළේ ය.
9 එවිට දෙවියන් වහන්සේ, “ලබු වැල ගැන කෝප
වීමට නුඹට යුතු දැ”යි ජෝනාගෙන් ඇසූ සේක.
“මැරෙන තරම් කෝප වීම මට යුතු ය”යි ඔහු කීවේ
ය.
10 එවිට සමිඳාණන් වහන්සේ ජෝනා අමතා,
“නුඹේ ශ්‍රමය වත්, වගාව වත් නැති ව එක
රැයකින් ඇති වී, එක රැයකින් නැති වී ගිය ලබු වැල
ගැන නුඹ අනුකම්පා කළෙහි නම්, 11 තමන්ගේ
දකුණත් වමත් අතරේ වෙනස නොදන්න එක්
ලක්ෂ විසි දහසකට වඩා මනුෂ්‍යයන් ද ගවයන් ද
සිටින නිනිවය නම් ඒ ශ්‍රේෂ්ඨ නගරය කෙරෙහි
මා අනුකම්පා කළ යුතු නොවේ දැ”යි වදාළ සේක.

# මීකා

1 2 රාජා 15:32-38; 16:1-20; 18:1—20:21; 2
වංශා 27:1-7; 28:1-27; 29:1—32:33 ජෝතාම්,
ආහාස් හා හෙසෙකියා ජුදාහි රජකම් කරන කාලයේ
දී, සමාරිය හා ජෙරුසලම සම්බන්ධ ව දර්ශන මඟින්
මොරෙෂෙත්හි මීකාට සමිඳාණන් වහන්සේ ප්‍රකාශ
කළ පණිවුඩය මෙය වේ:

## සමාරිය හා ජෙරුසලම පිළිබඳ ළතෝනිය

2 සියලු ජනයෙනි, මයෙට සවන් දෙන්න, පොළොව
හා එහි ඇති සියල්ලෙනි, මයෙට ඇහුම්කන් දෙන්න.
q2 2 දෙවී සමිඳාණෝ සිය ශුද්ධ මාලිගාවේ සිට
ඔබට විරුද්ධ ව සාක්ෂි දෙන සේක.
3 බලන්න, සමිඳාණෝ සිය ශුද්ධස්ථානයෙන් පිටත්
වී, බැස අවුත් පොළොවේ කඳු මුදුනෙහි සක්මන්
කරන සේක.
q2 4 එසේ සක්මන් කරන විට, ගින්න ඉදිරියෙහි ඉටි
මෙන් කඳු දිය වී ගොස්, කඳු බෑවුමකින් ගලා බසින
වතුර මෙන් මිටියාවත් කැඩී බිඳී යන්නේ ය.
5 මේ සියල්ල සිදු වන්නේ, ජාකොබ් සෙනඟගේ
අපරාධ හා ඉශ්‍රායලේ වංශයේ පාප නිසා ය.
ජාකොබ්ගේ අපරාධය කුමක් ද? සමාරිය නොවේ
ද? ජුදාහි සෙනඟගේ ගිරිකුළු දේවාල මොනවා ද?
ජෙරුසලම නොවේ ද? 6 "එබැවින් මම සමාරිය
නටබුන් රටක් කරන්නෙමි. එය සුදුසු වන්නේ මිදි
වගාවට පමණි. මම ඒ නගරයේ ගල්, මිටියාවතට
හෙළා දමා එහි අත්තිවාරම මතු කර දක්වන්නෙමි.
7 එහි ඇති සියලු කැපූ රූප සුණු විසුණු කරනු
ලැබේ. ඔවුන් සම්බ කරන සියල්ල ගින්නෙන් විනාශ
කරනු ලැබේ. දේව රූප සුන්බුන් කරනු ලැබේ. මන්ද,
ඒවා වේශ්‍යාකමට අය කළ ගාස්තුවෙන් රැස්
කරගනු ලැබී ය. වේශ්‍යාකමේ පණයම් ගෙවීමට
එය නැවත වැය වන්නේ ය.
8 "මේ නිසා මම හඬා වැලපෙන්නෙමි; පාවහන්
වත්, ඇඳුම් වත් නැති ව යන්නෙමි; සිවලුන් මෙන්
විලාප නඟන්නෙමි; පැස්බරුන් මෙන් වැලපෙන්නෙමි.
9 මන්ද, සමාරියේ තුවාළ අසාධ්‍ය ව තිබේ.
ජුදාවටත් ඒ දේ සිදු විය. මාගේ සෙනඟගේ
දොරටුව වන ජෙරුසලම දක්වා එම විනාශය ළං වී
ඇත."

## සතුරා ජෙරුසලමට ළං වීම

10 "ගාත්හි සෙනඟට එය නොදන්වන්න; නුඹලා
නොවැලපෙන්න; බෙත්-ලෙඅප්‍රාහි දූවිල්ලෙහි
පෙරළෙමින්, සිටින්න. 11 ෂාපීර්හි වැසියෙනි, නග්න
ව, ලජ්ජාවෙන් මඟ යන්න. ශයනාන්හි වැසියෝ
පිටතට නොඑති. බෙත්-ඒශලේහි වැලපීම නිසා එහි
පිහිට නුඹලාගෙන් පහවන්නේ ය. 12 සමිඳාණන්
වහන්සේ විනාශය ජෙරුසලම් දොරටුවට ළං කර
තිබෙන බැවින් මාරොත්හි සෙනඟ සුසුම්ලමින්
සහනයක් බලා සිටිති. 13 අහෝ ලාකීෂ්හි වැසියෙනි!
නුඹලාගේ අශ්වයන් රථවල බැඳගන්න; සියොන්
පුරඟනගේ පාපයේ පටන්ගැන්ම මෙය විය. මන්ද,
ඉශ්‍රායලේ කළ පාපය ම නුඹත් කර ඇත.
14 එබැවින් දැන් නුඹලා මොරෙෂෙත්-ගාත් නගරයට
වෙන් වී යෑමේ ත්‍යාග දිය යුතු ය. අක්සීබ් වංශය
ඉශ්‍රායලේ රජවරුන්ට මලපතක් වන්නේ ය.
15 "එම්බා මරේෂාහි වැසියෙනි! නුඹලා
අල්ලාගන්න සතුරන් නැවත එවන්නෙමි. ඉශ්‍රායලේහි
තේජස අදුල්ලාම් නගරයට පවා පැමිණෙන්නේ ය.
16 නුඹලාගේ ප්‍රියාදර දරුවන් නිසා හිස කෙසේ
කපන්න, හිස බූගාන්න. ඔවුන් නුඹලා වෙතින්
වහල්කමට ගෙනයනු ලබන නිසා ගිජු
ලිහිණියකුගේ හිස මෙන් හිස මුඩු කරගන්න."

## දුගීන් පෙළෙන අයගේ ඉරණම

2 සිය යහන්වල වැතිර, නපුරු උපා හිතන මතන
අයට වන විපතක මහත! පහන් වූ විට
ඔවුන්ගේ අතේ බලය නිසා ඔව්හු ඒවා කරති.
2 ඔව්හු තමන් ආසා කළ කෙත් බලහත්කාරයෙන්
ගනිති; ගෙවල් ද පැහැර ගනිති. ඔව්හු මිනිසුන් සහ
ගේදොර ද දේපළ ද සොරාගනිති.
3 ඒ නිසා සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන
සේක: "නුඹලා පිට එවැනි විපත්ති පමුණුවන්නට
යෝජනා කරන්නේ මම ය. නුඹලාට බේරෙන්න
නොහැකි වන්නේ ය. නුඹලාට උඩඟුකමින්
හැසිරෙන්න නොහැකි වන්නේ ය. මන්ද, එය
නුඹලාට නපුරු කාලයක් වනු ඇත. 4 ඒ කාලයේ දී
නුඹලා පිළිබඳ කථාන්තරය විනාශයේ උදාහරණයක්
වශයෙන් ගෙන ළතෝනි ද ගයන්නෝ ය. 'අපි
නැත්තට ම නැති වී සිටිමු'යි කියමින් ඔව්හු මෙසේ
ද කියති: 'දේශය අප අතින් පැහැරගෙන තිබෙන
හැටි! ඒ දේශය අප වහල්කමට ගත් අයට උන්
වහන්සේ දී ඇත.' "
5 එබැවින් සමිඳාණන් වහන්සේගේ සෙනඟ අතර
දේශය නැවත බෙදා දෙන දවසේ දී, නුඹලාගෙන්
කිසිවකු වත් එයින් කොටසක් නොලබන්නේ ය.
6 'දේශනා නොකරන්න. ඕවා ගැන කිසිත් දේශනා
නොකරන්න. අපට කිසි නින්දාවක් නොවන්නේ ය'යි
සෙනඟ දේශනා කරති. 7 ජාකොබ්ගේ සෙනඟ
සාපයක් යටතේ සිටිත් ද? සමිඳාණන් වහන්සේට

ඉවසිල්ලක් නැද් ද? ඇත්තෙන් ම උන් වහන්සේ
ක්‍රියා කරන්නේ මෙසේ ද? අවංක අයට උන්
වහන්සේ කරුණාවෙන් කතා නොකරන සේක් ද?
8 “එහෙත් මාගේ සතුරන් වී සිටින්නේ නුඹලා ය.
අහිංසකයන්ගේ පොරෝනාව නුඹලා උදුරාගන්නහු
ය; සාමකාමී මිනිසුන් යුද්ධයට පොළඹවන්නහු ය.
9 නුඹලා මාගේ සෙනඟගේ ස්ත්‍රීන්, තමන් ප්‍රිය
කරන ගෙවලින් පන්නා දමන්නහු ය. නුඹලා
ඔවුන්ගේ බාල දරුවන්ගෙන් මාගේ මහිමය සදහට
ම පහකළහු ය. 10 නැඟිට යන්න. මෙය නුඹලාට
විවේක ස්ථානයක් නොවේ. පාපය නිසා නුඹලා
භයානක විපතකට පත් වන්නහු ය.
11 “බොරුවෙන් ද වංචාවෙන් ද පිරුණ, නුඹලාට
‘මුද්‍රික පානයත්, සුරා පානයත් ගලා එනු ඇතැ යි
මම දිවැස් දෙසමි’යි කියමින් සිටින යම් මිනිසෙක්
වේ නම්, සෙනඟ ප්‍රිය කරන දිවැසිවරයා
එවැන්නෙකි.
12 “එම්බා ජාකොබ්ගේ ජනයෙනි! නුඹලා සියලු
දෙනා මම එක්රැස් කරන්නෙමි. ඉශ්‍රායෙලේහි ඉතිරි
අය ද මම එක්රැස් කරන්නෙමි. කොටුවක සිටින
බැටළුවන් මෙන් ද තණ බිම මැද සතුන් රැළක් මෙන්
ද මම නුඹලා එක්රැස් කරන්නෙමි. ඔව්හු කිසිවකුට
භය නොවන්නෝ ය.
13 “දොරටුව බිඳින්නා ඔවුන්ට පෙරටුව යයි. ඔව්හු
නගර දොරටු බිඳගෙන එයින් පිට වී යන්නෝ ය.
ඔවුන්ගේ රජතුමාණන් වන සමිඳාණන් වහන්සේ
ඔවුන්ට පෙරටුවෙන් යනු ඇත.”

### මීකා ඉශ්‍රායෙලේහි පාලකයන් හෙළා දැකීම

3 එවිට මම මෙසේ කීවෙමි: “ජාකොබ්ගේ
නායකයෙනි, ඉශ්‍රායෙලේහි අධිපතියෙනි, සවන්
දෙන්න. යුක්තියට ගරු කිරීම නුඹලා දැනගත යුතු
නොවේ ද? 2 එහෙත්, නුඹලා යහපතට ද්වේෂ කර
අයහපතට ඇලුම් වන්නහු ය. නුඹලා මාගේ
සෙනඟට හඬ ගසා, කටුවලින් ඔවුන්ගේ මස් ඉරා
දමන්නහු ය. 3 නුඹලා මාගේ සෙනඟ කා දමන්නහු
ය. ඔවුන් හමගසා, ඇටකටු පොඩිකර ඇතිලියක සහ
මුට්ටියක දැමීමට මස් මෙන් පතේ ගසන්නහු ය.
4 එවිට ඔව්හු සමිඳාණන් වහන්සේට
මොරගසන්නෝ ය. එහෙත්, උන් වහන්සේ ඔවුන්ට
පිළිතුරු නොදෙන සේක. බොහෝ නපුරු ක්‍රියා කර
තිබෙන බැවින් උන් වහන්සේ ඒ කාලයේ දී ඔවුන්
දෙස නොබලන සේක.
5 “සමිඳාණන් වහන්සේ දිවැසිවරයන්ට විරුද්ධ ව
මෙසේ කියන සේක: ‘බොරු දිවැසිවරයන් සෙනඟ
රවටා ඇත. ඔවුන්ට කෑම දෙන අයට ඔව්හු සාමය
ගැන කතා කරති; කෑම නොදෙන අයට විරුද්ධ ව
යුද්ධයක් ඇති වේ’ ය’යි ඔව්හු තර්ජනය කරති.
6 නුඹලා සෙනඟ රැවටූ නිසා, නුඹලාට මින්පසු
දර්ශන නැති රාත්‍රියක් එනු ඇත. අනාවැකි කීමක්
නැති අන්ධකාරයක් වනු ඇත. නුඹලා කෙරෙහි ඉර
බැස යනු ඇත. දාවල් කාලය කළුවර වනු ඇත.
7 බොරු දිවැසිවරයා ලජ්ජාවෙන් ද පේන කියන්නා
වියවුලෙන් ද මුහුණ වසාගත්තේ ය; ඔවුන්
බලාපොරොත්තු වන පිළිතුර දෙවියන්
වහන්සේගෙන් නොලැබෙන නිසා ඔව්හු කටවල්
වසාගන්නෝ ය.
8 “එහෙත් ජාකොබ්ගේ සෙනඟට ඔවුන්ගේ
දුෂ්ටකම ද ඉශ්‍රායෙලේ සෙනඟට ඔවුන්ගේ පාපය ද
පෙන්වා දෙන පිණිස සමිඳාණන් වහන්සේගේ
ආත්මානුභාවයෙන් හා බලයෙන් ද යුක්තියෙන් ද
ධෛර්යයෙන් ද මම පූර්ණ වී සිටිමි. 9 යුක්තිය
පිළිකුල් කරන, ඇත්ත නැත්ත කරන ජාකොබ්ගේ
වංශයේ නායකයෙනි, ඉශ්‍රායෙලේ වංශයේ
අධිපතියෙනි, මට සවන් දෙන්න. 10 සියොන්, ඔබ
ලේවලින් ද ජෙරුසලම අයුක්තියෙන් ද ගොඩනඟා
ඇත. 11 එහි නායකයෝ අල්ලසට විනිශ්චය කරති;
පූජකයෝත් කුලියට උගන්වති; බොරු දිවැසිවරු
මුදලට පේන කියති. එහෙත්, සමිඳාණන් වහන්සේ
කෙරෙහි රඳා සිටිමින්, ‘සමිඳාණන් වහන්සේ අප
සමඟ නොවේ ද? අපට කිසි විපත්තියක්
නොපැමිණෙන්නේ ය’යි ඔව්හු කියති.
12 ජෙරෙ 26:18 “එබැවින් ඔබ නිසා සියොන් කෙතෙක්
මෙන් හානු ලබන්නේ ය; ජෙරුසලම නටබුන්
ගොඩක් වන්නේ ය; දේව මාලිගාවේ කන්ද
කැළෑවක් සහිත කඳු මුදුනක් වන්නේ ය.”

### සමිඳාණන් උදා කරන සාම යුගය

4 “මතු දවස, සමිඳුන්ගේ මාලිගාව පිහිටි කන්ද
ඉතා ම උස කන්ද මෙන් ද සියලු කඳු
හෙල්වලට වඩා ඉහළින් ද පිහිටුවනු ලබන්නේ ය.
q2
4 ජනයෝ එයට වැල නොකැඩී එන්නෝ ය.
2 ‘එන්න, අපි සමිඳුන්ගේ කන්දට යමු;
q2 2 ජාකොබ්ගේ දෙවිඳුන්ගේ මාලිගාවට යමු.
q2 2 එවිට ස්වකීය මාර්ගය ගැන එතුමාණන් අපට
උගන්වනු ඇත:
q2 2 අපි ද එතුමාණන්ගේ මාර්ගවල ගමන්
කරන්නෙමු’යි කියන්නෝ ය.
q2 2 මන්ද, සමිඳුන්ගේ නීතිය සියොන් කන්දෙන් ද
එතුමාණන්ගේ ඉගැන්වීම ජෙරුසලමෙන් ද නිකුත්
වන්නේ ය.
3 ජෝවෙ 3:10 එතුමාණෝ බොහෝ ජාතීන්
විනිශ්චය කර, බොහෝ දුර සිටින බලවත් ජාතීන්
අතර නඩු හබ විසඳන සේක.
q2 3 ඔව්හු තමන්ගේ කඩුවලින් නඟුල් තල ද
හෙල්ලවලින් දෑකැති ද තලා ගන්නෝ ය.
q2 3 ජාතියක් ජාතියකට විරුද්ධ ව කඩු ගන්නේ
නැත.
q2 3 කිසි කලෙක ඔවුන් යුද්ධයට පුහුණු වන්නේ
නැත.
4 සකෙරි 3:10 ඔවුන්ට කිසිවකුගෙන් බියක් නැත.
q2 4 එකිනෙකා තම තමාගේ මිදි වැල යට ද
අත්තික්කා ගස යට ද යහෙන් වාසය කරනු ඇත.”
q2 4 සව් බලැති සමිඳාණෝ මෙය වදාළ සේක.

5 ඒ ඒ ජාතීන් තම තමන්ගේ දෙවියන් අදහා
නමස්කාර කරන නමුදු, අපි සදහට ම අපගේ දෙවි
සමිඳාණන් වහන්සේ අදහා නමස්කාර කරමු.

### විප්‍රවාසීන් යළි පැමිණීම

6 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක: "ඒ
දවසේ දී නැති වූ අය එක්රැස් කර විප්‍රවාසගත වූ
අය ද මා දඬුවම් කළ අය ද මම නැවත එකතු
කරන්නෙමි. 7 එහෙත්, නැති වූ අයගෙන් ඉතිරි කුඩා
පිරිසක් ඇති කරන්නෙමි. ඉවත දැමූ අය බලවත්
ජාතියක් කරන්නෙමි. මෙතැන් පටන් සදහට ම
සමිඳාණන් වහන්සේ තමන් වහන්සේගේ කන්දේ
ඔවුන් කෙරෙහි රජකම් කරන සේක."
8 එම්බා සෙනඟගේ මුර අට්ටාලය, සියොන්
පුරඟනගේ බලකොටුව, ඔබ වෙත නැවතත් පළමු
ආණ්ඩුව පැමිණෙන්නේ ය. ජෙරුසලම් පුරඟනගේ
රාජ්‍යය පැමිණෙන්නේ ය. 9 දැන් ඔබ කෑගසන්නේ
මන් ද? ඔබට රජකු නැති නිසා ද? වදන වේදනා
විඳින ස්ත්‍රියක මෙන් ඔබ වේදනාව විඳින්නේ මන්
ද? ඔබේ රාජ්‍ය උපදේශකයන් මිය ගොස් සිටින
නිසා ද? 10 වදන වේදනා විඳින ස්ත්‍රියක මෙන්
සියොන් පුරඟන වද වේදනා විඳින්න. මන්ද, ඔබට
දැන් නගරයෙන් පිටත් වී ගොස් ආරක්ෂාවක් නැති
පෙදෙසක ජීවත් වන්න සිදු වනු ඇත. ඔබට
බබිලෝනියට යන්න සිදු වනු ඇත. එහි දී සමිඳාණන්
වහන්සේ ඔබ නිදහස් කර, සතුරන්ගේ අතින් ඔබ
මුදාගනු ඇත. 11 බොහෝ ජාතීන් ඔබට පහර
දෙන්නේ දැන් රැස් වී ඇත. "ජෙරුසලම විනාශ වේ වා!
අපි එහි නටබුන් දෙස බලා සිටිමු"යි ඔව්හු කියති.
12 එහෙත් සමිඳාණන් වහන්සේගේ අදහස කුමක් දැ
යි ඔව්හු නොදනිති. ගොයම් රැස් කරගෙන
මඬින්නාක් මෙන් ඔවුන්ට දඬුවම් කරන්න උන්
වහන්සේ ඔවුන් රැස් කර ඇති බව ඔව්හු නොදනිති.
13 "සියොන් පුරඟන, නැඟිට ගොයම් පාගන්න.
බොහෝ ජාතීන් පොඩි කරන පිණිස ඔබට මම
යකඩ අං හා ලෝකඩ කුර දෙන්නෙමි. ඔවුන්ගේ
ධනය සමිඳාණන් වහන්සේට කැප වන්නේ ය. එය
මුළු ලෝකයේ සමිඳාණන් වහන්සේට කැප වන්නේ
ය."

5 හමුදා රැස් කරන්න. සතුරෝ ජෙරුසලම
වටලාගෙන සිටිති. ඉශ්‍රායෙලෙහි නායකයන්ට
ඔව්හු කෙවිටකින් පහර දෙති.

### ඉශ්‍රායෙලේට අධිපතියෙක්

2 මතෙ 2:6; ජොහ 7:42 "එම්බා බෙත්ලෙහෙමේ
එප්‍රාතා!
q2 තී ජුදාහි ගෝත්‍රවලින් ඉතා අල්ප වන්නෙහි ය.
q2 එහෙත්, ඉශ්‍රායෙලේ කෙරෙහි අධිපතියා වීමට
කෙනෙක් තී කෙරෙන් නැඟී එන්නේ ය.
q2 එතුමන්ගේ පෙළපතේ මුල දුරාතීතයෙන් ද
පැරණි යුගයෙන් ද එන්නකි."

3 එබැවින් ගැබ්ගෙන සිටින ස්ත්‍රිය දරුවකු බිහි
කරන තෙක් සමිඳාණන් වහන්සේ සිය සෙනඟ
සතුරන්ට පාවා දෙන සේක. එවිට ඔවුන්ගේ
සහෝදරයන්ගෙන් ඉතිරි කුඩා පිරිස ඔවුන්ගේ
සෙනඟ සමඟ එක් වන්නෝ ය. 4 එතුමන් පැමිණි
විට, සමිඳාණන් වහන්සේගෙන් ලැබෙන ශක්තියෙන්
ද දෙවි සමිඳාණන් වහන්සේගේ නාමයේ මහිමයෙන්
ද සිය සෙනඟ පෝෂණය කරනු ඇත. පොළොවේ තල
වැසියන් සියලු දෙනා එතුමන්ගේ පාලනය පිළිගන්න
බැවින්, එතුමන්ගේ සෙනඟ ආරක්ෂා සහිත ව
සිටින්නෝ ය. 5 එතුමාණෝ සාමදානය ගෙන දෙන
සේක.

### ගැළවීම සහ දඬුවම

5 අසිරියන්වරුන් අපගේ රට ආක්‍රමණය කොට
අපගේ බලකොටු බිඳගෙන ඇතුළු වූ විට ඔවුන් සමඟ
සටන් කිරීමට අපි අපගේ පාලකයන් සත්දෙනා සහ
ප්‍රධානීන් අටදෙනා යවන්නෙමු. 6 උත් 10:8-11ඔව්හු
සිය කඩුවලින් අසිරියන් රට ද කඩු තලයෙන්
නිම්රොද් දේශය ද ජයගන්නෝ ය. අසිරියන්වරුන්
අපගේ දේශයට පැමිණි විට, අපගේ සීමා බිඳ දමන
විට, ඒ නායකයෝ ඔවුන් අතින් අප බේරා ගන්නෝ
ය.
7 යාකොබ්ගේ සෙනඟ අතරෙන් ඉතිරි කුඩා පිරිස
බොහෝ ජාතීන් උදෙසා සමිඳාණන් වහන්සේ එවා
වදාළ පිනි බිංදු මෙන් ද තණ මත වැහි බිංදු මෙන් ද
වන්නෝ ය. ඔවුන්ගේ විශ්වාසය සමිඳාණන්
වහන්සේ කෙරෙහි මිස මිනිසා කෙරෙහි නොවන්නේ
ය. 8 යාකොබ්ගේ වංශයේ ඉතිරි අය බොහෝ
සෙනඟ වන ජාතීන් අතරේ වනයේ සැරිසරන
සිංහයකු මෙන් ද බැටළු ගාල් අතරේ සිංහ
පැටියකු මෙන් ද වන්නෝ ය. ඔව්හු යන විට
ගොදුරු පිට කඩා පැන, කෑලි කෑලිවලට ඉරා
දමන්නෝ ය. බේරාගන්න කිසිවෙක් නොවන්නේ ය.
9 ඔබ බාහු බලයෙන් ඔබේ සතුරන් පරාජයට පත්
කොට ප්‍රතිවාදීන් සියල්ලන් ම විනාශ කර දමන්නෙහු
ය.
10 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක: "ඒ
කාලයේ දී මම නුඹලාගේ අශ්වයන් පහකොට
නුඹලාගේ රථ විනාශ කරන්නෙමි. 11 නුඹලාගේ
දේශයේ නගර විනාශ කොට සියලු බලකොටු බිඳ
දමන්නෙමි. 12 මම නුඹලා භාවිතා කරන මායම්
නැති කර දමමි. පේන කියන එකකු වත් ඉතිරි
නොකරන්නෙමි. 13 නුඹලාගේ දේව රූප ද
රූපස්ථම්භ ද නුඹලා කෙරෙන් සිඳ දමන්නෙමි. අතින්
තනාගත් දේවලට නුඹලා තවත් නමස්කාර
නොකරන්නෙහු ය. 14 මම නුඹලාගේ රටේ ඇති
අෂේරා කප් කණු බිඳ හෙළා නුඹලාගේ නගර
විනාශ කරන්නෙමි. 15 මට කීකරු නොවූ ජාතීන් හට
මම උදහසෙනුත්, කෝපයෙනුත් දඬුවම් දෙන්නෙමි."

## ඉශ්රායලේට විරුද්ධ චෝදනා

6 සමිඳාණන් වහන්සේ ඉශ්රායලේට විරුද්ධ ව
නඟන චෝදනාවට සවන් දෙන්න. නැඟිට
ඔබේ නඩුව කඳු ඉදිරියේ කියා සිටින්න. ඔබ කියන
දේ කඳුවලට ඇසේ වා!
2 එම්බා කඳු! සමිඳාණන් වහන්සේගේ චෝදනාවට
කන් දෙන්න. පොළොවේ ස්ථිර අත්තිවාරම්, මේ
පැමිණිල්ල අසන්න. මන්ද, සමිඳාණන් වහන්සේ
තමන් සෙනඟට විරුද්ධ ව කරන පැමිණිල්ලක් ඇත.
උන් වහන්සේ ඉශ්රායලේට විරුද්ධ ව චෝදනාවක්
කරන්න යන සේක.
3 “මාගේ සෙනඟෙනි, මම නුඹලාට කුමක් කළෙමේ
ද?
q23 මම කුමකින් නුඹලා වෙහෙසෙට පත් කළෙමේ ද?
q23 මට පිළිතුරු දෙන්න.
4 නික්ම 4:10-16; 12:50-51; 15:20 මම නුඹලා,
මිසරයෙන් පිටතට ගෙනාවෙමි;
q24 වහල්කමේ නිවාසයෙන් මිදුවෙමි.
q24 නුඹලාට මඟපෙන්වන පිණිස මෝසෙස් සමඟ
ආරොන් ද මිරියම් ද නුඹලා වෙත එව්වෙමි.
5 ගණන් 22:2—24:25; ජෝෂු 3:1—4:19 මාගේ
සෙනඟෙනි, මෝවබ්හි රජ වූ බාලාක් නුඹලාට
විරුද්ධ ව කළ මන්ත්රණය කුමක් ද කියාත්,
බයෝර්ගේ පුත් බාලාම් ඔහුට දුන් පිළිතුර කුමක් ද
කියාත්, ෂිට්ටිම්හි සිට ගිල්ගාල් දක්වා සිදු වූයේ
කුමක් ද කියාත් සමිඳුන්ගේ ධර්මිෂ්ඨකම දැනගන්න
පිණිස සිහි කරන්න.”

## සමිඳුන්ට පුදන උත්තරීතර පූජාව

6 මම සමිඳුන් අබිමුවට කුමක් රැගෙන පැමිණමේ
ද?
q26 සගයේ දෙවිඳුන් හට කෙසේ නමදිම් ද?
q26 දවන යාග පූජා ද අවුරුද්දක් වයසැති එළ
වස්සන් ද රැගෙන පැමිණමේ ද?
7 දහස් ගණන් බැටළු පැටවුන්ටත්, දස දහස් ගණන්
තෙලේ ගංගාවලටත් සමිඳාණෝ ප්රසන්න වන සේක්
ද?
q27 මාගේ වරදට වන්දියක් වශයෙන් මාගේ
කුලුඳුලා, මාගේ ආත්මයේ පාපය උදෙසා මාගේ
දරුවා පූජා කරම් ද?
8 එම්බා මනුෂ්යය!
q28 යහපත් දේ කුමක් දැ යි සමිඳාණන් ඔබට
පෙන්වා දී ඇත.
q28 එතුමාණන් ඔබෙන් ඉල්ලන්නේ කුමක් ද?
q28 යුක්තිය ඉටු කිරීමත්, දයා පමෙ දැක්වීමත්,
යටහත් ලෙස ඔබේ සමිඳුන් සමඟ හැසිරීමත්
පමණකි.

## නගරයේ අපරාධකරුවන්ට තර්ජන

9 සමිඳාණන් වහන්සේ නගරයට මොරගසා මෙසේ
වදාරන සේක: “සමිඳාණන් වහන්සේට ගරුබිය පෑම
ඥානවන්ත ය. නාගරිකයෙනි, ගෝත්රිකයෙනි, සවන්
දෙන්න. 10 දුදනන්ගේ නිවසේවල ඔවුන් වංචාවෙන්
ලබාගත් වස්තුව ඇත. මා ද්වේෂ කරන හොර
මිනුම් ඔව්හු පාවිච්චි කරති. 11 හොර තරාදි හා
බොරු පඩි පාවිච්චි කරන අයට සමාව දිය හැකි ද?
12 ධනපතීහු දූප්පතුන් සූරා කති. එහි වැසියෝ
බොරු කියති. ඔවුන්ගේ කතාව වංචනික ය.
13 එබැවින් නුඹලාගේ පාප නිසා නුඹලා වනසාලීමට
මම පටන්ගෙන සිටිමි. 14 නුඹලා කන නමුත්,
තෘප්තියට නොපැමිණෙන්නෝහු ය; නුඹලා රැස් කරන
නමුත්, රැකෙන්නේ නැත; නුඹලා යම් යම් දේ ගෙන
ගියත්, නුඹලාගේ අදහස ඉෂ්ට වන්නේ නැත.
නුඹලා රැකගන්න සියලු දේ මම යුද්ධයේ දී වනසමි.
15 නුඹලා වපුරන නමුත්, අස්වැන්න කපා
නොගන්නෝහු ය. ඔලීව පල මඩින නමුත්, තෙල ඇඟ
ගල්වා නොගන්නෝහු ය. මිදි පල මිරිකන නමුත්,
මිදියුස නොබොන්නෝහු ය. 16 1 රාජා 16:23-34;
21:25-26ඔම්රි රජුගේ අණපණත් ද, ආහබ්ගේ නපුරු
ක්රියා ද නුඹලා අනුගමනය කළහු ය. ඔවුන්ගේ
ප්රතිපත්ති නුඹලා පිළිපැද්දහු ය. ඒ නිසා මම නුඹලා
විනාශයට පත් කර, නුඹලා එපා කළ සෙනඟක්
කරන්නෙමි. හැම තැන සිටින සියලු ජනයා නුඹලාට
අපහාස කරන්නෝ ය.”

## දූෂ්ය වූ සෙනඟ නිසා විලාප කීම

7 අනේ මා වැනි කාලකණ්ණියෙකි. ගිම්හානයේ
පල රැස් කරන්නා ද මිදි පල නෙළන්නා ද වැනි
ය. මන්ද, කන්න එක ම මිදි පොකුරක් වත් මා ආසා
කරන අත්තික්කාවල නාඹුල් පල වත් නැත.
2 දේශයේ කිසි ම අවංක මිනිසෙකු වත්, දේව
භක්තිය ඇති කෙනෙකු වත් ඉතිරි වී නැත. සෑම
දෙනා ම මිනීමැරීමට බලා සිටිති. එක එකා තම
තමාගේ සහෝදරයා දැලකින් අසු කරගන්නට මාන
බලයි. 3 වීර්යයෙන් නපුර කිරීමට ඔවුන් දෑත පොවා
ඇත. අධිපතියා ද විනිශ්චයකාරයා ද අල්ලස් ඉල්ලති.
බලපුළුවන්කම් ඇත්තා ඔහුගේ සිතේ නපුරු
ආසාවන් ප්රකාශ කරයි. ඔව්හු එකට උපා
යොදාගනිති. 4 ඔවුන්ගෙන් හොඳ ම අය වුව ද කටු
ගස් හා සමාන ය. අවංක ම අය වුව ද කටු
වැටකටත් වඩා නරක ය.
4 ඔවුන්ගේ මුරකාරයන් කී දඬුවමේ දවස පැමිණ
ඇත. ඔවුන් වියවුල් වන කාලය ආසන්න ය. 5 ඔබේ
අසල්වැසියා වත්, හිතවත් මිතුරා වත් විශ්වාස
නොකරන්න. ඔබේ භාර්යාවගෙන් වුව ද කට
ප්රවේසම් කරගන්න. 6 මතෙ 10:35-36; ලූක්
12:53මේ වනාහි පුත්රයා පියාට අගෞරව කරන
කාලයකි. දූව ඇගේ මවට විරුද්ධ ව ද ලේලි ඇගේ
නැන්දම්මාට එදිරි ව ද නැඟිටින කාලයකි.
මිනිසකුගේ සතුරෝ සිය පවුලේ අය ම වෙති.
7 එහෙත්, මම සමිඳාණන් වහන්සේ දෙස බලා
සිට, මාගේ ගැළවීම වන දෙවියන් වහන්සේ
කෙරෙහි බලාපොරොත්තු වන්නෙමි. මාගේ දෙවියන්
වහන්සේ මට සවන් දෙන සේක.

### පාපෝච්චාරණයෙන් බලාපොරොත්තුව ඇති වීම

8 මාගේ සතුරෙනි, මාගේ වැටීම ගැන ප්‍රීති
නොවන්න. මම වැටී සිටින නමුත් නැවත
නැඟිටින්නෙමි. මා දැන් අඳුරෙහි සිටින නමුත්
සමිඳාණන් වහන්සේ මාගේ ආලෝකය වන සේක.
9 මා සමිඳාණන් වහන්සේට විරුද්ධ ව පව් කළ
බැවින් මාගේ පැමිණිල්ල ඉදිරිපත් කර විනිශ්චය
ඉටුවන තුරු මම උන් වහන්සේගේ උදහස
ඉවසන්නෙමි. අන්තිමේ දී උන් වහන්සේ මාගේ
සතුරන්ගෙන් මා ආරක්ෂා කොට ඔවුන්ගෙන් මට සිදු
වී ඇති විපත්ති පිළිබඳ විනිශ්චය ඉෂ්ට කරන සේක.
උන් වහන්සේ මා ආලෝකයට පමුණුවනු ඇත. මම
ද උන් වහන්සේගේ ධර්මිෂ්ඨකම දැක ප්‍රීති
ප්‍රමෝද වන්නෙමි. 10 “ඔබේ දෙවි සමිඳාණන්
වහන්සේ කොහේ දැ”යි අසා මට සරදම් කළ
මාගේ සතුරන් එය දැක ලජ්ජාවට පත් වනු ඇත.
ඔවුන්ගේ පරාජයත්, වීථිවල මඩ මෙන් ඔවුන් පාගනු
ලැබීමත් මාගේ ඇස්වලින් දකින්නෙමි.

### නගරය පුනරුත්ථාපනය කිරීම

11 ජෙරුසලම් වැසියෙනි, ඔබේ පවුරු ගොඩනඟන
කාලයක් පැමිණෙන්නේ ය. ඒ කාලයේ දී ඔබේ
සීමාවන් පළල් කරනු ලබනවා ඇත. 12 ඒ කාලයේ දී
අසිරියාවේ සිට මිසරය දක්වා ද තීර් සිට ගංගාව
දක්වා ද, මුහුදින් මුහුද, කන්දෙන් කන්ද දක්වා ද
සිටින ඔබේ සෙනඟ ආපසු පැමිණෙනු ඇත.
13 එහෙත් පොළොව, එහි සිටින්නන්ගේ නපුරුකම්
නිසා කාන්තාරයක් මෙන් වන්නේ ය.

### ඉශ්රායලේ සමිඳුන්ගේ අනුකම්පාව

14 සරුසාර ප්‍රදේශවලින් වට වී, කාන්තාරයක
හුදකලා ව සිටින, ඔබේ උරුමය වන ඔබේ රැළට
එඬේරෙකුගේ කවේටනේ මෙන් මඟ පෙන්නුව
මැනව.
q2 14 පෙර කාලයේ දී මෙන් බාෂාන්හි ද ගිලියද්හි ද
පෝෂණය වන්නට ඔවුන්ට ඉඩ දුන මැනව.
15 මිසරයෙන් පිටතට ආ දවස්වල දී මෙන්
අරුමපුදුම දේ අපට පෙන්නුව මැනව.
16 ජාතීන් එය දැක, ඔවුන් කොතෙක් බලවත් ව
සිටියත්, ලජ්ජාවට පත් වනු ඇත.
q2 16 අතින් කට වසාගනු ඇත;
q2 16 එයින් කන් බිහිරි වනු ඇත.
17 ඔවුන් සර්පයන් මෙන් දූවිල්ල ලෙවකනු ඇත.
q2 17 පොළොවේ බඩ ගා යන සතුන් මෙන්
ඔවුන්ගේ බලකොටුවලින් වෙවුලමින් නික්ම එනු
ඇත.
q2 17 ඔවුන් අපේ දෙවි සමිඳාණන් වෙත බියෙන්
ඇලළී එනු ඇත.
q2 17 ඔබ තුමාණන් නිසා බියපත් වනු ඇත.
18 සමිඳුනි, ඔබේ ඉතිරි කුඩා පිරිසේ අපරාධය
මකා දමා, ඔවුන්ගේ පව් පහකරන, ඔබට සම අන්
දෙවි කෙනෙකේ සිටිත් ද?
q2 18 එතුමාණෝ උදහස සදහට ම තබා නොගන්න
සේක.
q2 18 මන්ද, එතුමාණෝ තිරසර පෙමෙ ප්‍රිය කරන
සේක.
19 එතුමාණෝ අපට යළි අනුකම්පා කරන සේක;
q2 19 අපේ පව් පාගාදමන සේක;
q2 19 අපේ සියලු පව් මුහුදේ පත්ලට හළොදමන
සේක.
20 දුරාතීතයේ සිට අප පියවරුන්ට දිවුළාක් මෙන්
ජාකොබ්ට විශ්වාසකමත්, ආබ්‍රහම්ට තිරසර පෙමෙත්
දක්වන සේක.

# නාහූම්

1 යෙසා 10:5-34; 14:24-27; ශෙප 2:13-15 මෙය
නිනිවය පිළිබඳ දිව්‍ය ප්‍රකාශනයකි; එල්කොෂ්
වැසියකු වූ නාහූම්ගේ දර්ශන පොත ය.

### නිනිවය ගැන සමිඳුන්ගේ උදහස

2 සමිඳාණන් වහන්සේ ප්‍රතිවාදීන් නොඉවසන
දෙවි කෙනෙකි; උන් වහන්සේට විරුද්ධ වන්නන්ට
උන් වහන්සේ දඬුවම් කරන සේක; උදහසින්
ඔවුන්ට දඬුවම් දෙන සේක. උන් වහන්සේ තම
එදිරිකාරයන්ට දඬුවම් කරන සේක; උන් වහන්සේ
තම සතුරන් කෙරෙහි උදහසින් සිටින සේක.
3 සමිඳාණන් වහන්සේ වහා නොකිපෙන සුළු ය;
ඉතා බලවන්ත ය; වරදකාරයන් කිසි කලක නිදොස්
නොකරන සේක. සමිඳාණන් වහන්සේ ගමන් කරන
මාර්ගයෙහි සුළි සුළං කුණාටු ඇති වන්නේ ය.
වලාකුළු වනාහි උන් වහන්සේගේ පාදවලින්
ඇවිස්සුණු ධූලි ය. 4 උන් වහන්සේ මුහුදට තරවටු
කළ විට එය වියළී යයි; උන් වහන්සේ සියලු ගංගා
සිඳවන සේක. බාෂාන්හි ද කර්මෙලේහි ද කෙත්වතු
මැලවී යයි; ලෙබනොන් කඳේ මල් පර වී යයි.
5 උන් වහන්සේ ඉදිරියෙහි කඳු දෙදරා යයි; හෙලේ දිය
වී යයි; උන් වහන්සේ ඉදිරියෙහි පොළොව ද ලොව
ද එහි වැසි සියල්ලෝ ද වෙව්ලති. 6 උන්
වහන්සේගේ කෝපයට මුහුණ පෑ හැක්කේ
කවරකුට ද? උන් වහන්සේගේ ඇවිලෙන උදහසේ
දී නොනැසී සිටිය හැක්කේ කවරකුට ද? උන්
වහන්සේගේ කෝපාග්නිය දැල්වෙන විට පර්වත
පවා ධූලි මෙන් උන් වහන්සේ ඉදිරියෙහි ඇද
හැළෙන්නේ ය.
7 සමිඳාණන් වහන්සේ යහපත් ය. දුක් විපත් ඇති
විට උන් වහන්සේ බලකොටුවක් වන සේක. උන්
වහන්සේ කෙරෙහි විශ්වාස කරන්නන් උන් වහන්සේ
දන්න සේක. 8 එහෙත්, තමන්ගේ සතුරන් ගලා යන
ජල ගැල්මකින් සහමුලින් ම විනාශ කරන සේක;
එදිරිකාරයන් ලුහුබැඳ ගොස් අන්ධකාරයට
නෙරපාදමන සේක. 9 ඔබ සමිඳාණන් වහන්සේට
විරුද්ධ ව කුමන කුමන්ත්‍රණයක් කරන්නහු ද? උන්
වහන්සේ එක පහරකින් ඔබ විනාශ කරන සේක.
දෙවරක් උන් වහන්සේට විරුද්ධවන්න කිසිවකුට
නොහැකි ය. 10 උන් වහන්සේගේ සතුරෝ කටු ගස්
මෙන් පැටලී සුරා පානයෙන් මත් වී සිටිය ද වියළී
ගිය පිදුරු මෙන් ගිනිබත් වන්නෝ ය.
11 සමිඳාණන් වහන්සේට විරුද්ධ ව කූට උපායයන්
සිතාමතාගත්, දුෂ්ට කුමන්ත්‍රණ යොදාගත් කෙනෙක්
නිනිවයෙන් නික්ම ආයේ ය. 12 සමිඳාණන් වහන්සේ
මෙසේ පවසන සේක: “අසිරියානුවරුන් බලවත්
විශාල සංඛ්‍යාවක් වන නමුත්, ඔව්හු විනාශ කරනු
ලැබ නැත්තට ම නැති වී යන්නෝ ය. මාගේ
සෙනඟෙනි, නුඹලාට, මා පීඩා කළ නමුත්, මම තවත්
පීඩා නොකරන්නෙමි. 13 අසිරියන්වරුන් නුඹලා
කෙරෙහි පෑ බලය නැති කර, ඔවුන් නුඹලා බැඳ
තැබූ දම්වැල් මම සිඳ දමන්නෙමි.”
14 අසිරියන්වරුන් සම්බන්ධයෙන් සමිඳාණන්
වහන්සේගේ නියෝගය මෙය වේ: “ඔවුන්ගේ
නාමය තවත් ඉතිරි නොවන්නේ ය. ඔවුන්ගේ
දේවාලවල ඇති කැපූ රූප හා වාත්තු පිළිම මම
විනාශ කර දමන්නෙමි. ඔවුන් නීච නිසා ඔවුන්ගේ
මිනී වළ මම පිළියෙළ කරන්නෙමි.”
15 යෙසා 52:7 අන්න, ශුභාරංචියක් රැගත්
පණිවුඩකාරයෙක් කඳු උඩින් එයි. ඔහු එන්නේ
සාමය ප්‍රකාශ කරන්න ය. ජුදා ජනයෙනි, ඔබේ
මංගල්‍යය පවත්වන්න; බාරහාර ඉටු කරන්න; නපුරු
අය තවත් ඔබේ රට ආක්‍රමණය නොකරන්නෝ ය.
ඔව්හු සහමුලින් ම සිඳදමනු ලැබූ හ.

### නිනිවයේ වැටීම

2 නිනිවය, ඔබ දැන් ආක්‍රමණයකට භාජන වී
ඇත. ඔබ සුණු විසුණු කරන බලය දැන් පැමිණ
ඇත. බලකොටු රැකවල් කර, මාර්ග මුර කර, සැරසී
යුද්ධය සඳහා සූදානම් වන්න. 2 සතුරා
කොල්ලකන්න පෙරෙ ඉශ්‍රායලේ දැරූ තේජස හා
ජාකොබ්ගේ තේජස සමිඳාණන් වහන්සේ නැවත
පිහිටුවන සේක. 3 ඔබ හැමට පහර දෙන
භටයෝ රතු පලිහ දරති; රතු ඇඳුම් හැඳ සිටිති.
ඔව්හු ආක්‍රමණය කිරීමට සූදානම් ය. පැන පැන
යන අශ්වයන් ඇද යන රථ ගිනි දැල් මෙන් විහිදෙයි.
අසරුවෝ සටනට එළඹෙනු බලා සිටිති. 4 රථ වීථිවල
වේගයෙන් යයි; පළල් මාර්ගවල එහා මෙහා දුවයි;
පන්දම් මෙන් දිළිසෙයි; විදුලිය මෙන් ඔබමොබ යයි.
5 නිලධාරීන්ට පැමිණෙන්න අණ කරනු ලැබේ. ඔව්හු
එන විට පැකිළෙති. පවුරට වේගයෙන් දුව ගොස්
මුවාවක් තනා ගනිති. 6 ගංගාවල දිය සොරොව් බිඳී
ගොස් ඇත; මාලිගාව බියෙන් ඇලළී යයි. 7 රැජින
අල්ලාගෙන වහල්කමට ගෙනයනු ලැබේ. ඇගේ
සේවිකාවෝ මහා දුකින් පපුවට ගසාගනිමින්
පරෙවියන් මෙන් සුසුම්ලති. 8 කැඩී ගිය අමුණකින්
වතුර ගලා යන්නාක් මෙන් නිනිවයේ සෙනඟ පලා
යති. “නවතින්න, නවතින්න” කියා කෑගසන නමුත්,
කිසිවකු වත් ආපසු හැරෙන්නේ නැත. 9 රිදී
කොල්ලකාගන්න, රත්රන් කොල්ලකාගන්න, නිමක්

නැති වස්තු ද අනර්ඝ සියලු ආකාර බඩු රාශියක් ද
එහි ඇත; 10 නිනිවය හේද වී, හින්න වී, භංග වී
ඇත; සිත දදෙරා යයි; දණහිස් වෙවුලයි; තුනටිය
කකියයි; ඔවුන් සියල්ලන්ගේ මුහුණු සුදුමැලි වෙයි.
11 සිංහ ගුහාවත්, තරුණ සිංහයා ගොදුරු කෑ
ස්ථානයත් දැන් කොයි ද? එහි මීට පෙර සිංහයාත්,
සිංහ ධේනුවත්, සිංහ පැටවුනුත් අනතුරක් නැති ව
හැසුරුණෝ ය. 12 සිංහයා උගේ ධේනුව හා පැටවුන්
සඳහා ගොදුරු අල්ලා, උන් කැලිවලට ඉරා දුන්නේ ය;
සිංහ ගුහාව ගොදුරුවලින් ද සිංහ ලෙන ඉරන ලද
මස්වලින් ද පුරවා ගත්තේ ය.
13 සියලු බලැති සමිඳාණන් වහන්සේ මෙසේ
වදාරන සේක: "මම නුඹට විරුද්ධ ය; නුඹේ
රථවාහන පුළුස්සා දමමි; නුඹේ තරුණ සිංහයෝ
කඩුවෙන් විනාශ වෙති. නුඹ අනුන්ගෙන් පැහැරගත්
සියල්ල මම නුඹෙන් පැහැරගනිමි. ලෝකයේ නුඹේ
දූතයාගේ හඬ නිහඬ වන්නේ ය."

### නිනිවයට තවත් තර්ජනයක්

3 ලේ වගුරුවන නිනිවය, තිට වන විපතක
මහත! මුළු නගරය වංචාවෙන් ද
බලහත්කාරයෙන් ද පිරී ඇත. එහි කොල්ලකෑම
නිමක් නැත. 2 කසවල සට සට යන ශබ්දයටත්,
රෝදවල කට කට යන ශබ්දයටත් සවන් දෙන්න.
අශ්වයෝ පැන පැන යති; රථ ද හැලහැප්පමින්
යයි. 3 අසරුවෝ පහර දෙති. කඩු ලෙලෙ දෙයි. හෙල්ල
බැබළෙයි. සමූහයක් මැරුම් කා ඇත. මළකඳන්
ගොඩගැසී ඇත. මළමිනීවල නිමක් නැත. මිනිස්සු
මළකඳන්වල හැපී වැටෙති. 4 නිනිවය නම් වෙසඟන
ඇගේ දඬුවම් ලබන්නී ය. මායාකාරී ඈ ඉතා සුරූපී
ය. ඈ ඇගේ වේශ්‍යාකමින් ජාතීන් ද මායම්වලින්
ගෝත්‍ර ද වසඟ කරගත්තා ය.
5 සියලු බලැති දෙවියන් වහන්සේ මෙසේ වදාරන
සේක: "නිනිවය, මම නුඹට දඬුවම් කරමි. මම නුඹ
නිර්වස්ත්‍ර කර, නුඹේ නග්න භාවය ජාතීන්ට ද
විලිලජ්ජාව රාජ්‍යයන්ට ද දක්වන්නෙමි. 6 පිළිකුල්
දේ නුඹ පිට හෙළා නුඹට නින්දා කොට අනුන්
ඉදිරියේ නුඹ කෝලමක් කරන්නෙමි. 7 නුඹ දකින
සියල්ලෝ නුඹ වෙතින් පලා ගොස්, 'නිනිවය නාස්ති
විය; ඈට අනුකම්පාව දක්වන්නේ කවරෙක් ද? ඈ
සනසන්න යමෙකු මා කොතැනින් සොයන්න දැ'යි
කියන්නෝ ය.
8 "එම්බා නිනිවය, තී තීබ්ස් නගරයට වඩා හොඳ
ද? ආරක්ෂාව ගෙන දෙන ගංගාවක් ඈ වටේටත්
තිබිණ. නයිල් ගඟ ඇගේ දිය අගල ද ප්‍රාකාරය ද
විය. 9 ඉතියෝපියාව හා මිසරය ඇගේ බලය විය.
ඇගේ බලය අසීමිත ය. පූට් සහ ලිබියන්වරු ඇගේ
සහකාරයෝ වූ හ. 10 එහෙත්, තීබ්ස් රටේ ජනයා
විප්‍රවාසගත කරනු ලැබ, වහල්කමට ගෙනෙයනු ලැබූ
හ. ඇගේ බිළිඳු දරුවෝ හැම මංසන්ධියක ම බිම
ගසා මරනු ලැබුවෝ ය. ඇගේ වැදගත් සෙනඟ
උදෙසා දාදු දමන ලදී. බලවත් අය දම්වැල්වලින්
බැඳගෙන යනු ලැබූ හ.
11 "නිනිවය, තී මත් සුරාසොඬෙකු මෙන් සිහිසන්
නැති වී යනු ඇත. සතුරාගෙන් ගැළවෙන පිණිස තී
රක්ෂස්ථානයක් සොයන්නෙහි ය. 12 නුඹේ සියලු
බලකොටු, සහමුලින් ම ඉදුණු පල ඇති අත්තික්කා
ගසක් වැනි ය. ගස සෙලෙවූ විට එහි පල කන්නාගේ
කටට වැටෙන්නේ ය. 13 නුඹේ භටයෝ
ගැහැණුන් වැනි ය. සතුරන් ඉදිරියෙහි වාසල් දොරටු
සම්පූර්ණයෙන් ම ඇරී ඇත. නුඹේ දොරටුවල අගුල්
ගිනිබත් වී ඇත. 14 වටලෑමකට පාත්‍රවීමේ
සූදානමක් වශයෙන් වතුර ඇද රැස් කර තබන්න.
බලකොටු ශක්තිමත් කරගන්න. මැටි පාගන්න.
ගඩොල් සාදන්න. 15 එසේ කළත් ගින්නෙන් නුඹ දැවී
යන්නෙහි ය. නැතහොත් යුද්ධයේ දී මරනු
ලබන්නෙහි ය. පළඟැටියන් ගොයම් කාදමන්නාක්
මෙන් නුඹ විනාශ වී යන්නෙහි ය.
15 "නුඹ පළඟැටියන් මෙන් ද පනින පළඟැටියන්
මෙන් ද ගණනින් වැඩි වන්න. 16 අහසේ
තාරකාවලට වඩා නුඹේ වෙළෙඳුන්ගේ ගණන වැඩි වී
ඇත. එහෙත්, ඔවුන් සියල්ලන් තටු විහිදා ඉගිළී යන
පනින පළඟැටියන් මෙන් අතුරුදහන් වී ගොස් ඇත.
17 අධිපතීහු පළඟැටියන් වැනි ය. සෙන්පතීහු පනින
පළඟැටියන් වැනි ය. එහෙත් ශීත දවසක බිත්තිවල
සිටින උන් ඉර උදා වූ විට ඉගිළී යති; ඔවුන් ආගිය
අතක් කිසිවෙක් නොදනිති.
18 "අසිරියාවේ රජ්ජුරුවෙනි, නුඹේ පාලකයෝ
නිදාගනිති; නුඹේ අධිපතීහු සැතපෙති; නුඹේ
සෙනඟ කඳුවලට විසිරී ගොස් ඇත. ඔවුන් නැවත
එක්රැස් කරන්න කිසිවෙක් නැත. 19 නුඹේ
තුවාළවලට පිළියමක් නැත; නුඹේ තුවාළ අසාධ්‍ය ය.
නුඹේ මේ පුවත අසන සියල්ලෝ නුඹේ වැටීම ගැන
අත්පොළසන් දෙති. මන්ද, නුඹේ දරුණු දුෂ්ටකමෙන්
බේරුණ කෙනෙක් ඇද් ද?"

# හබක්කුක්

1 හබක්කුක් නම් දිවැසිවරයා දර්ශනයකින් ලත්
දිව්‍ය ප්‍රකාශනය මෙසේ ය.

## හබක්කුක්ගේ දුක්ගැනවිල්ල

2 සමිඳාණන් වහන්ස, ඔබ සවන් දෙන තෙක්,
සවන් දී බලහත්කාරයෙන් අප මුදන තෙක් මම
කොපමණ කල් ඔබට මොරගසම් ද? 3 තාඩන පීඩන
හා බලහත්කාරය මා අවට්න් ඇත. කලකෝලාහල
හා අඬදබර හැම තැන ම ඇත. මෙවැනි හිරිහැර හා
නපුරුකම් මට බලා සිටින්නට ඔබ වහන්සේ සලසා
ඇත්තේ මන් ද? 4 නීතිය දුර්වල වී ඇත. යුක්තිය
කිසි කලෙක ඉටු නොවේ. දුෂ්ටයන් ධර්මිෂ්ඨයන්
යටපත් කර ඇත. යුක්තිය නොපිට පෙරළා ඇත.

## සමිඳාණන් වහන්සේගේ පළමු වන පිළිතුර

5 ක්‍රියා 13:41 “නුඹ අවට ඇති ජාතීන් දෙස
බලන්න. නුඹ දකින දෙයින් නුඹ පුදුමයට හා
විස්මයට පත් වනු ඇත. මන්ද, නුඹලාගේ කාලයේ දී
මා කරන්න යන්නේ, නුඹට කිවත් විශ්වාස කරන්න
බැරි දෙයකි. 6 2 රාජා 24:2දරුණු, කලබලකාරී
බබිලෝනි ජාතිකයන් මම බලයට පත් කරමි. ඔව්හු
අන්‍ය රටවල් අල්ලාගන්න පිණිස ලෝකය හරහා
ගමන් කරති. 7 ඔව්හු භයානක ය, බිහිසුණු ය.
ඔවුන්ගේ ශක්තිය ඔවුන්ගේ යුක්තිය හා උසස්කම
වේ.
8 “ඔවුන්ගේ අශ්වයෝ දිවියන්ට වඩා ශීඝ්‍රගාමී ය.
ක්ෂුධාවෙන් සිටින අඳුරු වේලේ වෘකයන්ට වඩා
දරුණු ය. ඔවුන්ගේ අසරුවෝ ඉදිරියට යන්නෝ ය;
අසරුවෝ දුර සිට එන්නෝ ය. ගොදුරු කරා
වේගයෙන් යන රාජාලීන් මෙන් ඔව්හු කඩා පැන
එන්නෝ ය.
9 “ඔවුන්ගේ හමුදා සාහසික ලෙස ඉදිරියට එති.
ඔවුන් ආක්‍රමණය කරන විට සෙනඟ තැතිගෙන
සිටිති. ඔවුන් වහල්කමට ගන්න අයගේ ගණන වැලි
හා සමාන ය. 10 ඔව්හු රජුන්ට නින්දා කරති;
අධිපතීන්ට කවටකම් කරති; සෑම බලකොටුවක් ම
සුළු කොට සලකති; පස් ගොඩකර ඒවා අල්ලා
ගනිති. 11 තමන්ගේ බලය ස්වකීය දෙවියන් කොට
ගත් වරදකරුවන් වන මොවුහු සුළඟ මෙන්
ගසාගෙන ගොස් පහ ව යන්නෝ ය.”

## හබක්කුක්ගේ දෙ වන දුක්ගැනවිල්ල

12 ස්වාමීනි, දඬුවම් කරන පිණිස විනිශ්චය කිරීමේ
ආයුධයක් සේ ඔබ ම බබිලෝනිවරුන් තෝරාගෙන
ඔවුන් පර්වතයක් මෙන් ශක්තිමත් කර ඇත. මාගේ
දෙවි සමිඳුනි, මාගේ ශුද්ධ තැනැන් වහන්ස, ඔබ
ආදියේ සිට අමරණීය දෙවියන් වහන්සේ නොවෙන
සේක් ද? 13 නපුර බලන්නට බැරි තරම් පවිත්‍ර ඇස්
ඇති, වැරදි කරන අය නුරුස්සන ඔබ වහන්සේ,
ද්‍රෝහීන් දෙස බලා සිටින්නේත්, දුෂ්ටයා තමාට වඩා
දැහැමි තැනැත්තා විනාශ කරන විට ඔබ නිහඬ ව
සිටින්නේත් මන් ද?
14 ඔබ වහන්සේ මිනිසුන් මුහුදේ මත්ස්‍යයන්
මෙන් ද මූලිකයකු නැති බඩගා යන සතුන් මෙන් ද
සලකන්නේ මන් ද? 15 බබිලෝනිවරු බිලිකටුවලින්
මිනිසුන් අල්ලා ගනිති; දැල් දමා ඇදගෙන,
අතංගුවෙන් ඔවුන් එකතුකර ඒ ගැන ප්‍රීති වෙමින්
උදන් අනති. 16 ඔව්හු දැල්වලට පූජා ද අතංගුවට
සුවඳ දුම් ද ඔප්පු කරති. මන්ද, ඒවායින් ම සැප
විහරණයෙන් කල් යවමින් පුෂ්ටිමත් ආහාර අනුභව
කරන බැවිනි.
17 මේ අයුරින් දැල් හිස් කරමින් නිර්දය ලෙස
ජාතීන් විනාශ කිරීමට ඔබ ඉඩ හරින සේක් ද?

## සමිඳාණන් වහන්සේගේ දෙ වන පිළිතුර

2 මම මාගේ මුර අට්ටාලය උඩට නැඟ,
බලකොටුව උඩ සිටගෙන, සමිඳාණන්
වහන්සේ මට කියන්නේ කුමක් ද කියාත්, මාගේ
පැමිණිල්ල ගැන දෙන පිළිතුර කුමක් ද කියාත් බලා
සිටින්නෙමි.
2 සමිඳාණන් වහන්සේ මට මෙසේ පිළිතුරු දුන්
සේක: “දර්ශනය ලියන්න; එය කියවන්න පුළුවන්
වන පිණිස ගල් පුවරුවල පැහැදිලි ලෙස ලියන්න.
3 හෙබ්‍රෙ 10:37එසේ කළ යුත්තේ දර්ශනය නියම
කාලය වන තෙක් පමාවන බැවිනි. එහෙත්, එය
නිෂ්ඵල නොවී වේගයෙන් ඉටුවනු ඇත. එය
නොවරදවා පැමිණෙන්නේ ම ය. 4 රෝම 1:17; ගලා
3:11; හෙබ්‍රෙ 10:38අදමිටු අය නොපෙවතින්නෝය;
එහෙත්, දමිටු අය දෙවියන් වහන්සේ කෙරෙහි ඇති
ඇදහිල්ලෙන් ජීවත් වන්නෝ ය.”

## අදම්වූ අයගේ විනාශය

5 වස්තුව රවටන සුලු ය. පාතාලය මෙන් කට
අයාගත් තෘෂ්ණාව ඇත; මරණය මෙන් තෘප්තියක්
නොලබන, සියලු ජාතීන් තම ආශාව සඳහා රැස්
කරන්නාවූ සියලු මිනිසුන් තම වාසියට
හරවාගන්නාවූ මිනිසා අහංකාරී නොසංසුන්
කෙනෙකි. 6 සියලු දෙනා ඔහුට අවමන් කොට ඔහුට
විරුද්ධ ව මෙසේ ඇනුම්පද කියනු ඇත; "නුඹලාට
අයිති නැති දේ ගොඩගසාගත්, උකස් බඩු තමා පිට
පටවාගත් අයට වන විපතක මහත!"
7 නුඹලාගේ ණය හිමියන් හදිසියේ නුඹලා පිට
කඩා පනින්නේ නැද් ද? නුඹලාගේ සතුරෝ නුඹලා
තැති නොගන්වන්නෝ ද? එවිට ඔව්හු නුඹලා
කොල්ලකන්නෝ ය. 8 නුඹලා බොහෝ ජාතීන්ගෙන්
කොල්ලකෑ නිසා ද නුඹලා කර ඇති ඝාතන නිසා ද
දේශයටත්, නගරයටත්, එහි වැසියන්ටත් නුඹලා කර
ඇති බලහත්කාරකම් නිසා ද ඉතිරි ව සිටින අය
නුඹලා කොල්ලකන්නෝ ය.
9 තමාගේ නිවසෙ උස් තැනක සාදන පිණිස ද
උපද්‍රවයෙන් මිදෙන පිණිස ද සිය වංශයේ වාසිය
පිණිස සසේසන් සූරාකන තැනැත්තාට වන විපතක
මහත! 10 නුඹලාගේ උපායයන් නිසා නුඹලාගේ
වංශය පිට නින්දාව පමුණුවාගෙන ඇත. බොහෝ
ජාතීන් විනාශ කිරීම නිසා නුඹලා, තමන්ගේ ම
විනාශය පමුණුවාගෙන ඇත. 11 බිත්තියේ ගල් වුව
ද නුඹලාට විරුද්ධ ව මොරහඬ නඟන අතර වහලේ
රීප්ප හා පරාල දෝංකාර නඟනු ඇත.
12 නුඹලා අපරාධයෙන් නුවරක් ද මිනීමැරීමෙන්
නගරයක් ද ගොඩනඟාගෙන ඇති බැවින් නුඹලාට
වන විපතක මහත! 13 ජාතීන් නිකරුණේ වෙහෙසෙ
මහන්සියෙන් ඔවුන් ගොඩනඟා ඇති සියල්ල
ගින්නෙන් දවා නැත්තට නැති කිරීම සියලු බලැති
සමිඳාණන් වහන්සේගේ ක්‍රියාව නොවේ ද?
14 යසො 11:9මුහුද ජලයෙන් පිරී තිබෙන්නාක් මෙන්
සමිඳාණන් වහන්සේගේ තේජස පිළිබඳ
දැනගැන්මෙන් පොළොව පිරී යන්නේ ය.
15 අසල්වාසීන්ගේ නග්න රූප දෙස බලා නින්දා
කරන පිණිස අධික කෝපයෙන් ඔවුන්ට බොන්නට දී
වෙරිමත් කරන්නාවූ නුඹලාට වන විපතක මහත!
16 ඒ අයුරින් නුඹලාත් ගෞරවයෙන් වනුවට
නින්දාවෙන් පිරී සිටින්නහු ය. නුඹලාත් වෙරිමත්
වන්නහු ය. සමිඳාණන් වහන්සේගේ දකුණු අතෙහි
කුසලානෙන් නුඹලාට බොන්න සලස්වා උන්
වහන්සේ නුඹලාගේ ගෞරවය අගෞරවයට
හරවන සේක. 17 නුඹලා කර ඇති මිනීමැරීම්
නිසාත්, දේශයටත් නගරයටත් එහි වැසියන්ටත් කර
ඇති බලහත්කාරකම් නිසාත්, නුඹලා ලෙබනොන්හි
කළ අපරාධ නිසාත් නුඹලා විනාශ කරනු ඇත.
18 පිළිමයකින් ඇති ප්‍රයෝජනය කුමක් ද? එය
මිනිසා විසින් සාදන ලද්දකි. එයට සත්‍යය
පවසන්නට බැරි ය. එය වාත්තු පිළිමයක් පමණකි.
එය කරෙහි විශ්වාසය තැබීමෙන් එය තැනූ
තැනැත්තාට වන යහපත කුමක් ද? 19 ඒ රූපයට
'පිබිදෙන්න' කියාත්, ගලින් නෙළූ ගොළු පිළිමවලට
'නැඟිටින්න' කියාත් කියන නුඹලාට වන විපතක
මහත! පිළිමවලට කිසිවක් එළිදරව් කළ හැකි ද?
අහෝ! රන් රිදීයෙන් එය වසා තිබුණත් එය තුළ
ප්‍රාණයක් ඇත්තේ ම නැත.
20 එහෙත්, සමිඳාණන් වහන්සේ සිය ශුද්ධ
මාලිගාවේ වැඩ සිටින සේක; මුළු පොළොව උන්
වහන්සේ ඉදිරියෙහි නිශ්ශබ්ද වේ වා!

## දයාව සඳහා හබක්කුක්ගේ යාච්ඤාව

3 ශෝක ගීත වෘත්තියට ලියන ලද දිවැසිවර
හබක්කුක්ගේ යාච්ඤාව මෙයෙ වේ.
2 සමිඳාණන් වහන්ස, ඔබ කර ඇති සියලු දේ
ගැන මා අසා ඇත. සමිඳාණන් වහන්ස, ඔබේ ක්‍රියා
මා තුළ ගරුබිය දනවයි. ඔබ වහන්සේ පෙර කළ
බලවත් ක්‍රියා මේ කාලයේදීත් කළ මැනව;
පනේනුව මැනව; උදහසේ දී ඔවුන්ට දයාව දැක්වුව
මැනව.
3 සමිඳාණන් වහන්සේ තේමාන් සිට ද ශුද්ධ
දෙවියන් වහන්සේ පාරාන් කන්දේ සිට ද වඩින
සේක. උන් වහන්සේගේ තේජාලංකාරයෙන්
ස්වර්ගය ප්‍රභාවත් වයි. පොළොව ද උන්
වහන්සේගේ ප්‍රශංසාවෙන් පිරී ඇත.
4 අරුණෝදය මෙන් උන් වහන්සේ වඩින සේක.
රශ්මි දහරා උන් වහන්සේගේ අතින් විහිදයි. එහි
උන් වහන්සේගේ බලය සැඟවී ඇත.
5 උන් වහන්සේ ඉදිරියෙන් වසංගතය ද
පසුපස්සෙන් මාරක රෝගය ද පැමිණේ.
6 උන් වහන්සේ නවතින විට පොළොව කම්පා
කරවන සේක; උන් වහන්සේ බලන විට ජාතීන්
වෙවුළුවා හරින සේක. පුරාතන පර්වත දෙදරා යයි;
සදාකාල කඳු කිඳා බසියි. උන් වහන්සේගේ ගමන්
පුරාණයෙහි මෙන් ය.
7 කුෂාන්හි සෙනඟ බිය වෙනවාත්, මිදියන්හි ජනයා
වෙවුලනවාත් මම දිටිමි.
8 සමිඳුනි, ඔබ උදහස් වුණේ ගංගාවන්ට විරුද්ධ ව
ද? කෝප වුණේ මුහුදට විරුද්ධ ව ද? ඔබ අසුන් පිට
නැඟී එන විට ඔබේ ඒ ගමන ජයග්‍රහණය සඳහා
ය.
9 දුන්න පාවිච්චි කරන්න ඔබ සූදානම් වූ සේක;
කොපුව ඊතලවලින් පිරී තිබුණේ ය. ඔබ විදුලි
පහරින් පොළොව විවර කළ සේක.
10 ඔබ දැක කඳු තැතිගැනුණේ ය. අහසින්
ජලධාරා වැගුරුණේ ය. පාතාලයේ වතුර ඝෝෂා
කළේ ය. ඒවායේ රැළ ඉහළට නැඟ විහිදුණේ ය.
11 ඔබේ ඊතලවලින් විහිදුණු එළිය නිසා ද
දිළිසෙන හෙල්ලයේ දීප්තිය නිසා ද ඉර හඳ ස්වකීය
විමානවල නැවතී සිටියේ ය.
12 ඔබ වහන්සේ කෝපයෙන් ලෝකය හරහා
ගමන්ගත් සේක. උදහසින් ජාතීන් පාගා දැමූ සේක.

13 ඔබේ සෙනඟ ගළවන පිණිසත්, ඔබේ
අභිෂේක ලත් නිරිඳා මුදන පිණිසත් ඔබ පිටත් ව
වැඩිය සේක. ඔබ දුෂ්ටයන්ගේ නායකයා ගසා දමා,
ඔහුගේ අනුගාමිකයන් සහමුලින් ම විනාශ කළ
සේක.
14 ඔබ සබෙළුන්ගේ ප්රධානියාට ඔහුගේ ම
හලේලවලින් ඇන්න සේක. ඔව්හු මා විසුරුවා
දමන්නට සුළි සුළඟක් මෙන් ආවෝ ය. ඔවුන්ගේ
ප්රීතිමත්කම අසරණයන් රහසින් නාස්ති කිරීම ය.
15 ඔබේ අශ්වයන් මඟින් ඔබ මුහුද පාගා දැමූ විට
මහා ජලස්කන්ධය කැළඹී ගියේ ය.
16 මේ සියල්ල අසා මම කැළඹමේ. මාගේ තොල්
බියනේ වෙවුලයි. මාගේ ඇටකටු දිරා යයි. මාගේ
දකෙකුලේ වාරුව නැති වී යයි. එහතේ, අපට විරුද්ධ
ව ආක්රමණය කරන අයට දවේයන් වහන්සේ
දඬුවම් කරන කාලය පැමිණනෙ තකේ මම නිශ්චල
ව බලා සිටිමි.
17 අත්තික්කා ගස පල නොදැරුවත්, මිදි වැල්වල
පලදාව නොතිබුණත්, ඔලීව ගසේ පල හට
නොගත්තත්, කතේවලින් අස්වැන්නක් නොලැබුණත්,
ගාලනේ බැටළු රැළ නැති වී ගියත්, ගව හල් සියල්ල
හිස් ව ගියත්,
18 සමිඳුන් කරෙහෙි මම ප්රීති වන්නමේ. මාගේ
ගැළවීමේ දවේදුන් කරෙහෙි ප්රීති ප්රමෝද
වන්නමේ.
19 2 සාමු 22:34; ගීතා 18:33 දවේ සමිඳාණෝ
මාගේ ශක්තිය වේ.
q2[19] මාගේ පාද මුවකෙුගේ පාද මෙන් ශීඝ්ර කරන
සේක.
q2[19] උස් තැන්වල ඇවිදින්න මට සලස්වන සේක.
q2[19] නායක ගායනාකරුට ය. වීණා ඇති ව ගායනා
කිරීමට ය.
io1 පරිච්ඡේද 1:1; 2:3 සමිඳාණන් වහන්සේගේ
විනිශ්චයයේ දවස.
io1 පරිච්ඡේද 2:4-15 අසල්වැසි ජාතීන්ගේ විනාශය.
io1 පරිච්ඡේද 3:1; 3:20 ජරෙුසලමේ විනාශය හා
පුනරුත්ථාපනය.

# ශපෙනියා

### හැඳින්වීම

ක්‍රි.පූ. 621 දී ජොෂියා රජු සිදුකළ ආගමික සංශෝධනයන්ට දස වසකට පමණ පෙර දිවැසිවර ශපෙනියා දේශනා කළ බව සිතන්නට ඉඩ තිබේ. අන්‍ය දේවවරුන්ට නමස්කාර කිරීම නිසා ජුදා සෙනඟට දඬුවම් පමුණුවන විනාශකාරී දවසක් පැමිණීම පිළිබඳ තර්ජනයක් ද ජාතීන්ටත් දෙවියන් වහන්සේ දඬුවම් කරන බව ද ජෙරුසලමේ ඉරණම කෙසේ වෙතත්, කල් යෑමේ දී නගරය ප්‍රතිසංස්කරණය කරනු ලැබ යටහත් පහත් දැහැමි සෙනඟක් එහි වාසය කරන බව ද ඔහුගේ දේශනාවලින් ප්‍රකාශ කරන ලදී.

මෙහි අඩංගු කරුණු:
පරිච්ඡේද 1:1; 2:3 සමිඳාණන් වහන්සේගේ විනිශ්චයයේ දවස.
පරිච්ඡේද 2:4-15 අසල්වැසි ජාතීන්ගේ විනාශය.
පරිච්ඡේද 3:1; 3:20 ජෙරුසලමේ විනාශය හා පුනරුත්ථාපනය.

1 2 රාජා 22:1—23:30; 2 වංශා 34:1—35:27
ආමොන්ගේ පුත්, ජුදාහි රජ ව සිටි
ජොෂියාගේ කාලයේ දී සමිඳාණන් වහන්සේ
ශපෙනියාට දුන් පණිවුඩය මේ ය. ශපෙනියා වනාහි
හෙසෙකියාගේ පුත් අමරියාගේ පුත්‍රයා වන
ගෙදලියාගේ පුත් වූ කුෂිගේ පුත්‍රයා ය.

### සමිඳාණන් වහන්සේගේ උදහසේ දවස

2 සමිඳාණන් වහන්සේ මෙසේ වදාළ සේක: “මම
මිහි පිට ඇති සියලු දේ සහමුලින් ම විනාශ
කරන්නෙමි. 3 මම සියලු මිනිසුන් ද සත්වයින් ද
අහසේ කුරුල්ලන් ද මුහුදේ මත්ස්‍යයන් ද විනාශ
කරමි. දුෂ්ටයන් වැටෙන්නට සලස්වා, මනුෂ්‍ය
වර්ගයා මිහි පිටින් සහමුලින් ම විනාශ කරන්නෙමි.
මෙසේ පවසන්නේ සමිඳාණන් වහන්සේ ම ය.
4 “මම ජුදාට ද ජෙරුසලමේ සියලු සෙනඟට ද
විරුද්ධ ව මාගේ හස්තය ඔසවා විජාතීන්ගේ
පූජකයන්ගේ නාම මේ ස්ථානයෙන් මකාදමන්නෙමි.
5 ග්‍රහබලධාරීන්ට නමදින පිණිස වහලට නඟින
සෑම දෙනෙකු ද මට දිවුරුම් දී මා නමදින නමුත්,
මල්කොම් දෙවියාගේ නාමයෙන් දිවුරන සියලු දෙනා
ද මම විනාශ කරන්නෙමි. 6 මා වෙතින් වෙන් ව
ගොස් තවත් මා අනුගමනය නො කරන, මා වෙත
නො එන, මාගේ මඟපෙන්වීම නොසොයන අය ද
මම විනාශ කරමි.”
7 සමිඳාණන් වහන්සේගේ විනිශ්චය දවස ආසන්න
ය. එබැවින් උන් වහන්සේ ඉදිරියෙහි නිශ්ශබ්ද වේ
වා! සමිඳාණන් වහන්සේ පූජාවක් පිළියෙළ කළ
සේක. පූජාව සඳහා සිය සෙනඟ කැපකළ සේක.
8 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක: “ඒ
පූජාව ඔප්පු කරන දවසේ දී අධිපතීන්ට ද රජුගේ
පුත්‍රයන්ට ද විදේශීය ඇඳුම් අඳින සියල්ලන්ට ද
මම දඬුවම් කරන්නෙමි. 9 ඒ දවසේ දී විජාතීන්
ලෙසෙ නමදින, සොරකම්කර, මිනී මරා සොරාගත්
දෙයින් තමන්ගේ දේවාල පුරවාගන්න සියලු දෙනාට
මම දඬුවම් කරමි.
10 “ඒ දවසේ දී ‘මත්ස්‍ය ද්වාරයේ’ ඝෝෂාවක් ද
නගරයේ දෙ වන කොටසින් කෑමොරගැසීමක් ද
කඳුවලින් මහා ශබ්දයක් ද නුඹලාට ඇසෙනු ඇත.
11 සියලු වෙළෙඳුන් වැනසූ නිසා ද රිදී කිරන අය
විනාශ කරනු ලැබූ නිසා ද නගරයේ පහත
කොටසේ සිටින නුඹලා හඬා වැලපෙන්න.
12 “ඒ කාලයේ දී මම පහනක් දල්වා ජෙරුසලම
සෝදිසිකර, ‘සමිඳාණන් වහන්සේ යහපතක් වත්,
නපුරක් වත් කරන එකක් නැත’යි කියමින් උදාසීන
ව සැපපහසුකමින් කල් යවන සියලු දෙනාට දඬුවම්
කරමි. 13 ඔවුන්ගේ වස්තුව කොල්ලකනු ලැබේ;
ඔවුන්ගේ ගෙවල් පාළුකරනු ලැබේ; ඔවුන් ගෙවල්
ගොඩනඟන නමුත්, ඒවායේ වාසය කරන්නේ වත්
මිදි වතු වවන නමුත්, ඒවායින් මිදියුස බොන්නේ
වත් නැත.”
14 සමිඳාණන් වහන්සේගේ මහා දවස ළඟ ය; එය
විගසින් ම පැමිණේ. සමිඳාණන් වහන්සේගේ
දවසේ ශබ්දය අමිහිරි ය. ඒ දවසේ දී හේවායෝ
පවා බියෙන් කෑගසති. 15 ඒ දවස උදහසේ දවසක්
ය. දුක් විපත් ඇති දවසක් ය; නාස්තියේ හා
විනාශයේ දවසක් ය; අන්ධකාරයේ හා කළුවරකමේ
දවසක් ය; වලාපටල හා ඝනාන්ධකාරය ඇති දවසක්
ය. 16 පවුරු ඇති නගරවලටත් උස් කොත්වලටත්
විරුද්ධ ව යුද්ධ හොරණෑ පිඹීමේ ද රණ හඬ
නැඟීමේ ද දවසක් ය.

17 “ඔවුන් සමිඳාණන් වහන්සේට විරුද්ධ ව පව්
කළ බැවින් අන්ධයන් මෙන් ඇවිදින හැටියට මම
ඔවුන් පිට විපත්ති පමුණුවන්නෙමි. ඔවුන්ගේ ලේ
ධූලි මෙන් ද මළකඳන් කසළ මෙන් ද විසුරුවනු
ලබන්නේ ය”යි සමිඳාණන් වහන්සේ වදාරන සේක.
18 සමිඳාණන් වහන්සේගේ උදහසේ දවසේ දී
ඔවුන්ගේ රිදී නිසා වත්, රන් නිසා වත් ඔවුන්ට
ගැළවෙන්නට නුපුළුවන. උන් වහන්සේගේ උදහසේ
ගින්නෙන් පොළොව විනාශ වන්නේ ය. මිහි පිට
වසන සියල්ලන් උන් වහන්සේ හදිසියෙන් නැත්තට
ම නැති කරදමන සේක.

## ජාතීන්ට පසුතැවීමට ආරාධනය

2 ලජ්ජා නැති ජාතිය, එකතු වී රැස්වීමක්
පවත්වන්න. 2 නුඹ බොල් මෙන් පහකරනු
ලබන්නට පෙර, සමිඳාණන් වහන්සේගේ බලවත්
උදහස දක්වන දවස පැමිණෙන්නට පෙර එක් වන්න.
3 සමිඳාණන් වහන්සේගේ ආඥා පවත්වන,
දේශයේ සිටින නිහතමානී ජනයෙනි, සමිඳාණන්
වහන්සේ සොයන්න, ධර්මිෂ්ඨකම සොයන්න.
බැගෑපත්කම සොයන්න, සමහර විට සමිඳාණන්
වහන්සේ උදහස දක්වන දවසේ දී නුඹලා
විනිශ්චයයෙන් බේරෙනු ඇත.

## ජාතීන් කෙරෙහි විනිශ්චය පැමිණීම

4 යෙසා 14:29-31; ජෙරෙ 47:1-7; එසකි 25:15-17;
ජෝවෙ 3:4-8; ආමො 1:6-8; සකෙරි 9:5-7 ගාසා
නගරයේ කිසිවකු වත් ඉතුරු වන්නේ නැත.
අෂ්කලෝන් විනාශ වන්නේ ය; අෂ්දෝද්වරු
මද්දහන වේලාව වන විට පලවා හරිනු ලබන්නෝ
ය; එක්රොන් උදුරාදමනු ලබන්නේ ය. 5 මුහුදුබඩ
වසන පිලිස්තිවරුනි, කෙරෙතිවරුනි, අනේ! නුඹලාට
වන විපතක මහත! පිලිස්තිවරුන්ගේ දේශය වන
කානානය, සමිඳාණන් වහන්සේ නුඹ ගැන තීන්දුව දී
හමාර ය. උන් වහන්සේ කිසිවකු ඉතුරු නොවන
සේ නුඹ විනාශ කරන සේක. 6 මුහුදුබඩ දේශයේ
නුඹේ එඬේරුන්ට පැල් ද බැටළු ගාල් ද සහිත
පිට්ටනියක් ඇති වන්නේ ය. 7 ජුදාහි ඉතිරි ව සිටින
කුඩා පිරිස මුහුදුබඩ දේශය අයිතිකර ගනිති. ඔවුන්
තමන්ගේ බැටළුවන් එහි පෝෂණය කරනු ඇත;
සවස අෂ්කලෝන්හි ගෙවල නිදාගනු ඇත.
ඔවුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ ඔවුන් සමඟ
සිට ඔවුන්ට සෞභාග්‍යය අත් කරදෙනු ඇත.
8 යෙසා 15:1; 16:14; 25:10-12; ජෙරෙ 48:1-47;
49:1-6; එසකි 21:28-32; 25:1-11; ආමො 1:13-15
සියලු බලැති සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන
සේක: “මෝවබ්වරුන්ගේ පාරට්ටු කිරීම ද අම්මොන්
වැසියන්ගේ නින්දා කිරීම ද ඔවුන්ගේ දේශය ගැන
පුරසාරම් දෙඩීම ද මාගේ සෙනෙඟට නින්දා කළ
අන්දම ද මා අසා ඇත. 9 උත් 19:24ජීවමාන දෙවියන්
වහන්සේ වන මම මාගේ නාමයෙන් දිවුරා, මෝවබ්,
සොදොම් මෙන් ද අම්මොන්, ගොමොරා මෙන් ද
විනාශ කරමි. ඒ දෙරට කහඹිලියා හා ලුණු වළවල්
ඇති බිමක් ද සදහට ම පාළු වූ ස්ථානයක් ද
කරන්නෙමි. මාගේ සෙනෙඟ අතුරෙන් ඉතිරි ව සිටින
අය ඒ දෙරට කොල්ලකන්නෝ ය. මාගේ
ජාතීන්ගෙන් ඉතිරි වූ අය ඔවුන්ගේ රට උරුම
කරගන්නෝ ය.”
10 ඒ ජාතිකයන්ගේ අහංකාරයත්, පාරට්ටුවත් නිසා
ද සියලු බලැති දෙවියන් වහන්සේගේ සෙනඟට
ඔවුන් නින්දාකළ නිසා ද ඔවුන්ට දඬුවම් පැමිණේ.
11 සමිඳාණන් වහන්සේ ඔවුන් තැතිගන්වන සේක;
ලෝකයේ සියලු දෙවිවරුන් නැත්තට ම නැති කරන
සේක. හැම ජාතීන්ගේ ම රටවල වැසියන් තම
තමන්ගේ ස්ථානවල සිට උන් වහන්සේට නමස්කාර
කරනු ඇත.
12 යෙසා 18:1-7 එතියෝපිවරුනි, නුඹලාත් මාගේ
කඩුවෙන් මැරුම් කන්නහු ය.
13 යෙසා 10:5-34; 14:24-27; නාහුම් 1:1; 3:19
සමිඳාණන් වහන්සේ සිය බලය මෙහෙයවා උතුරෙහි
ඇති අසිරියාව විනාශ කොට, නිනිවය කාන්තාරයක්
මෙන් දිය සීරාව නැති පාළුකරයක් කරනු ඇත.
14 හැම වර්ගයේ ගව මෘග ආදීන් එහි ලගිනු ඇත.
එහි නටබුන් අතරේ බකමූණන් ලගින කවුළු තුළින්
කරවැල් කොකා ද ඉත්තෑවා ද කෑකෝ ගසනු ඇත.
එළිපත් මත කපුටන් කරව් කරනු ඇත.
ගොඩනැඟිලිවල කිහිරි ලී බිඳ හෙළෙනු ඇත. 15 සිය
ශක්තිය ගැන අහංකාරී වූ, ‘අනතුරින් තොර ය’යි
සිතූ නගරයට සිදු වන දේ මෙය වේ. එහි වැසියෝ,
‘ලෝකයේ ඉතා ම උසස් නගරය මෙය ය’යි සිතූ හ.
එහෙත්, එය කුමන විධියේ පාළුකරයක් වන්නේ ද?
එය වන මෘගයන් ලගින ස්ථානයක් වන්නේ ය. ඒ
අසලින් යන හැම දෙන ම අත් මිට මොළවා
කවටකම් කරන්නෝ ය.

## ජෙරුසලම කෙරෙහි විනිශ්චය

3 කැරලිකාර, දූෂ්‍ය, සිය දේශයේ ම වැසියන්ට
පීඩා කරන ජෙරුසලමට වන විපතක මහත!
2 ඈ සමිඳාණන් වහන්සේගේ හඬට සවන් නුදුන්නා
ය; අවවාදය නොපිළිගත්තා ය. ඈ සමිඳාණන්
වහන්සේ කෙරෙහි විශ්වාසය තබන්නේ වත්, ඇගේ
දෙවියන් වහන්සේට ළං වුණේ වත් නැත.
3 ජෙරුසලමේ සිටින අධිපතීහු ගොරවන සිංහයෝ
ය. ඇගේ විනිශ්චයකාරයෝ කෑදර වෘකයෝ ය.
ඔව්හු පසු දිනට කිසිවක් ඉතිරි නොකරති. 4 එහි
සිටින දිවැසිවරයෝ අහංකාර ද්‍රෝහි මනුෂ්‍යයෝ ය.
පූජකයෝ ශුද්ධ දේ කෙලෙසති; ව්‍යවස්ථාව
තමන්ගේ වාසියට පෙරළා ගනිති. 5 ඈ තුළ වැඩ
සිටින සමිඳාණන් වහන්සේ ධර්මිෂ්ඨ ය. උන්
වහන්සේ කිසි කලෙක වැරදි දේ නොකරන සේක.
උදයක් උදයක් පාසා නොවරදවා ම උන් වහන්සේ
සෙනෙඟ වෙත යුක්තිය ගෙන එන සේක. එහෙත්,
අදමිටු අය විලි ලජ්ජා නැති ව අයුතු දේ ම කරති.
6 “මම ජාතීන් වනසාලීමි; ඔවුන්ගේ පවුරු නටබුන්
වී ඇත; වීථිවල කිසිවකුට ගමන් නොකළ හැකි සේ
ඒවා පාළු කළෙමි. ඔවුන්ගේ නගරවල කිසිවකු

වත් නාොවසන ලසෙ ජන ශූන්ය වී ඇත. 7 මාගේ
සනෙඟ මට බිය වී මාගේ උපදසේ පිළිගනු ඇතැ යි
මම බලාපාොරාොත්තුවනේ සිටියමේ. ඔවුන්ට මා
ඉගැන්වූ පාඩම ඔවුන් කිසි කලකෙ අමතක
නාොකරති යි මම සිතුවමේ. එහතේ, ඔව්හු වැඩි
වැඩියනේ දූෂ්ය ලසෙ හැසුරුණාෝ ය.
8 “එබැවින් ජාතීන්ට විරුද්ධ ව මා නැඟී චෝදනා
කරන දවස වන තකේ සිටින්න. මාගේ උදහසේ
වේගය ඔවුන්ට දැනනෙ පිණිස ජාතීන් ද රට
රාජ්යයන් ද එක්රුස් කිරීමට මා තීරණය කර ඇත.
මන්ද, මාගේ කෝපාග්නියනේ මුළු පාොළාොව දැවී
යන්නේ ය.
9 “එකල සියලු ජාතීන් සමිඳුන්ගේ නාමයනේ
යාච්ඤා කරමින් උන් වහන්සේට පමණක් එක
සිතින් නමදින පිණිස මම ඔවුන්ට පිවිතුරු බසක්
දනේනමේ. 10 විසිරී ගාොස් සිටින මාගේ සනෙඟ
ඈත ඉතියෝපියාවනේ වුව ද මා හට පඬුරු ගනෙනෙු
ඇත. 11 ඒ කාලයේ දී, මාගේ සනෙඟ වන නුඹලා
මට විරුද්ධ ව කළ ද්රෝහි ක්රියා නිසා ලජ්ජාවට
පත් නාොවන්නහු ය. මන්ද, අහංකාරි, අභිමානවත්
සියලු දනො මම නුඹලා අතරනේ පහ කරන්නමේ.
ඉන්පසු නුඹලා කිසි කලකෙ මාගේ ශුද්ධ කන්දහේ
කැරලි නාොගසන්නහු ය. 12 නිහතමානී, යටහත්
පහත් සනෙඟක් නුඹලා අතර මම ඉතිරි කරන්නමේ.
ඔව්හු සමිඳාණන් වහන්සේගේ නාමයනේ සරණ
සාොයා යන්නාෝ ය. 13 එළිද 14:5ඉශ්රායලේහි ඉතිරි
වන සනෙඟ තවත් අයුතුකම් නාොකරන්නාෝ ය;
බාොරු නාොකියන්නෝ ය. වංචාව ඔවුන්ගේ
කතාවහි නාොවන්නේ ය. ඔවුන්ට සෞභාග්යය ද
සුරක්ෂිතකම ද ඇති වන්නේ ය. කිසිවකෙු ඔවුන්
බිය ගන්වන්නේ නැත.”

## උදාන ගීයක්

14 සියාොන් පුරඟන, සාොම්නසින් ගී ගයන්න;
q214 ජරුසෙලම් වැසියනෙි, කෑමාොරගසන්න;
q214 ඉශ්රායලේ ජනයනෙි, ප්රීති ප්රමෝද වන්න.
15 සමිඳාණාෝ ඔබට විරුද්ධ ව තිබුණු නඩු තීන්දු
අවලංගු කළ සේක;
q215 ඔබේ සතුරන් නරෙපාදැමූ සේක;
q215 ඉශ්රායලේහි රජ වන සමිඳාණාෝ ඔබ සමඟ
සිටින සේක.
q215 විපතට බිය වීමක් තවත් නැත.”
16 එදින ජරුසෙලම මසෙේ කියනු ඇත.
q216 “සියාොන් නගරය, බිය නාොවන්න;
q216 ඔබ අත දුබල වන්නට ඉඩ නාරින්න.
17 ඔබේ දවේ සමිඳාණාෝ ඔබ සමඟ ය;
q217 ඔබට ජය අත් කර දනෙ සබෙළාණාෝ ය.
q217 එතුමාණාෝ ඔබ ගැන ප්රිය මනාප වන සේක;
q217 සිය පමේන් ඔබට නව ජීවනයක් දනෙ සේක;
q217 ඔබ ගැන සාොම්නස් සිතින් ගී ගයන සේක;
18 මංගල දවසක් මනේ ප්රීති වන සේක;
q218 ඔබ නින්දාව නාොලබන පිණිස ඔබ අතර
විනාශය පහකරන සේක.
19 ඒ කාලය පැමිණි විට නුඹට පීඩා කළ අයට මම
දඬුවම් දනේනමේ.
q219 කාොරගසන අය මුදා හරින්නමේ.
q219 වහල්කමට ගනෙ ගිය අය රුැස් කරන්නමේ.
q219 ඔවුන් නින්දාව ලත් හැම රටවල ඔවුන්ට
ප්රශංසාව හා කීර්තිය ලැබනේනට සලස්වන්නමේ.
20 විසිර ගිය අය නැවත මවු බිමට ගනෙවුත් මා
නුඹලාට මිහි පිට සියලු ජාතීන් අතර කීර්තියත්,
ප්රශංසාවත් ලබා දී සෞභාග්යය ගනෙ දනෙ කාලය
නුඹලා ම දැසින් දකින්නහු ය.”
q220 මසෙේ වදාරන්නේ සමිඳාණන් වහන්සේ ය.
io1 පරිච්ඡේද 1:1-15 දේව මාලිගාව ගාොඩනැඟීමට
ආඥාව.
io1 පරිච්ඡේද 2:1-23 සැනසිල්ලේ හා
බලාපාොරාොත්තුවේ පණිවුඩ.

# හග්ගයි

### හැඳින්වීම

මේ පොතේ ඇත්තේ ක්‍රි.පූ. 520 පමණේ දී හග්ගයි දිවැසිවරයා මඟින් දෙවියන් වහන්සේ දුන් පණිවුඩ එකතුවකි. ඒ කාලයේ දී ජුදවේ සෙනඟ විප්‍රවාසයෙන් ආපසු පැමිණ අවුරුදු ස්වල්පයක් ගත වී තිබුණ නමුත්, දේව මාලිගාව තවමත් ගොඩනඟා නොතිබිණි. එහි තිබුණේ නටබුන් පමණකි. මේ දේව පණිවුඩ මඟින් දේව මාලිගාව යළි ගොඩනඟන ලෙස සෙනඟගේ ප්‍රජා මූලිකයෝ දිරිගන්වන ලදහ. තවද, අලුත් පිරිසිදු ජීවිත කරණකොටගෙන සෞභාග්‍යය හා සාමය සමිඳාණන් වහන්සේ ඒ පණිවුඩ මඟින් පොරොන්දු වූ සේක.

මෙහි අඩංගු කරුණු:
පරිච්ඡේද 1:1-15 දේව මාලිගාව ගොඩනැඟීමට ආඥාව.
පරිච්ඡේද 2:1-23 සැනසිල්ලේ හා බලාපොරොත්තුවේ පණිවුඩ.

### දේව මාලිගාව යළිත් ගොඩනැඟීම

1 එස්රා 4:24—5:2; 6:14 දාරියුස් රජුගේ දෙ වන
අවුරුද්දේ හය වන මාසයේ පළමු වන දා
සමිඳාණන් වහන්සේ දිවැසිවර හග්ගයි මඟින්
ෂයෙල්තියෙල්ගේ පුත් ජුදාහි ආණ්ඩුකාර
සෙරුබ්බාබෙල් වෙතටත්, ජෙහෝශාදාක්ගේ පුත්
උත්තම පූජක ජෝෂුවා වෙතටත් එවූ පණිවුඩය
මෙය වේ.
2 "දේව මාලිගාව නැවත ගොඩනැඟීමට නිසි
කාලය පැමිණ නැතැ යි මේ සෙනඟ කියති"යි සියලු
බලැති සමිඳාණන් වහන්සේ වදාරන සේක. 3 එවිට
මේ පණිවුඩය දිවැසිවර හග්ගයි මඟින් උන්
වහන්සේ ප්‍රකාශ කළ සේක:
4 "මාගේ ජනයෙනි, මාගේ දේව මාලිගාව නටබුන්
වී තිබිය දී නුඹලා මනහර මන්දිරවල ජීවත් වීම
සුදුසු ද? දැන් ඉතින් සර්ව පරාක්‍රම සමිඳාණන්
වහන්සේ මෙසේ වදාරන සේක. 5 නුඹලාගේ ජීවිත
පිළිවෙළ ගැන සිතා බලන්න. 6 නුඹලා බොහෝ සේ
වපුළ නමුත්, ලබාගත් අස්වැන්න සුළු ය. කන නමුත්
තෘප්තියක් නුඹලාට නැත; බොන නමුත්, සෑහීමක්
නැත. අඳින නමුත්, උණුසුමක් නැත. මුදල් හම්බ
කරන්නා එය හම්බ කරන්නේ හිල් ඇති
පසුම්බියකට දමන්නට ය. 7 සර්ව පරාක්‍රම
සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක.
නුඹලාගේ ජීවිත පිළිවෙළ ගැන සිතා බලන්න.
8 කඳුකරයට ගොස් ලී ගෙනැවුත්, මා ප්‍රසන්න වන
පිණිස ද මට නිසි නමස්කාරය ලැබෙන පිණිස ද
දේව මාලිගාව නැවත ගොඩනඟන්න.
9 "නුඹලා බොහෝ බලාපොරොත්තු වූ නමුත්,
නුඹලාට ලැබුණේ ස්වල්පයකි. නුඹලා අස්වැන්න
ගෙදර ගෙනා විට මම එය පිඹ දැම්මෙමි. මා එසේ
කරන්නේ මන් ද? සියලු බලැති සමිඳාණන් වහන්සේ
මෙසේ වදාරන සේක. මාගේ මාලිගාව නටබුන් වී
තිබිය දී ඒ ගැන නොසලකා නුඹලා එකිනෙකා තම
තමාගේ ගෙවල් ගැන සැලකිලිමත් වන නිසා ය.
10 අහසින් වැසි නොවසින්නේත්, පොළොවෙන් පල
හට නොගන්නේත් ඒ නිසා ය. 11 මා දේශය පිට ද
කඳු හලේ පිට ද නියඟයක් පමුණුවා ඇත; තෘණ
භූමි ද මිදි වතු ද ඔලීව වතු ද හැම භවභෝග
වගාවන් ද මිනිසුන් හා සිවුපාවුන් ද ඔවුන් කරන
හැම වගාවන් ද පිට එය පමුණුවා ඇත."
12 එවිට ෂයෙල්තියෙල්ගේ පුත් සෙරුබ්බාබෙල් ද
ජෙහෝශාදාක්ගේ පුත් උත්තම පූජක ජෝෂුවා ද
ඉතිරි වූ කුඩා පිරිස අතර සියල්ලෝ ද ඔවුන්ගේ
දෙවි සමිඳාණන් වහන්සේ නියම කළ දේ කළහ.
ඔව්හු සමිඳාණන් වහන්සේට මහත් සේ ගරුබිය
දැක්වූ හ; සමිඳාණන් වහන්සේගේ දූතයා වන
දිවැසිවර හග්ගයිට කීකරු වූ හ. 13 එවිට සමිඳාණන්
වහන්සේගේ දූතයා වන හග්ගයි, "මම ඔබ සමඟ
සිටිමි; සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක;
එය මාගේ පොරොන්දුව ය"යි සමිඳාණන්
වහන්සේගේ පණිවුඩය සෙනඟට ප්‍රකාශ කළේ
ය. 14 සමිඳාණන් වහන්සේ ජුදාහි ආණ්ඩුකාරයා වූ
ෂයෙල්තියෙල්ගේ පුත් සෙරුබ්බාබෙල්ගේ ද
ජෙහෝශාදාක්ගේ පුත් උත්තම පූජක ජෝෂුවාගේ ද
සෙනඟ අතර ඉතිරි වූ සියලු දෙනාගේ ද සිත්
දිරිගැන්වූ සේක. තමන්ගේ සියලු බලැති දෙවි
සමිඳාණන් වහන්සේගේ ම මාලිගාව ගොඩනැඟීමට
ඔව්හු පටන්ගත්හ. 15 මෙසේ පටන්ගනු ලැබුවේ

දාරියුස් රජුගේ දෙ වන අවුරුද්දේ හය වන මාසයේ
විසිහතර වන දා ය.

## අලුත් මාලිගාවේ අලංකාරය

2 එම අවුරුද්දේ ම හත් වන මාසයේ විසිඑක්
වන දා සමිඳාණන් වහන්සේ දිවැසිවර හග්ගයි
මඟින් කතා කළ සේක. 2 ජුදාහි ආණ්ඩුකාර වූ
ෂයෙල්තියෙල්ගේ පුත් සරුබ්බාබෙල්ටත්,
ජෙහෝශාදාක්ගේ පුත් උත්තම පූජක වූ ජෝෂුවාටත්
සෙනඟ අතර ඉතිරි වූ සියල්ලන්ටත් මෙසේ
කියන්නට උන් වහන්සේ හග්ගයිට නියම කළ
සේක: 3 එස්රා 3:12“මේ දේව මාලිගාවේ මුලින්
තිබූ තේජස දුටු යමකේ නුඹලා අතරෙහි ඉතිරි ව
සිටිත් ද? දැන් නුඹලාට මෙය පෙනෙන්නේ කෙසේ
ද? මේ ගැන නුඹලාගේ ම සිතේ කැක්කුමක් නැද්
ද? 4 එහෙත්, සරුබ්බාබෙල් ධෛර්යවත් වන්න.
සියලු බලැති සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන
සේක. අහෝ! උත්තම පූජක ජෝෂුවා,
ජෙහෝශාදාක්ගේ පුත්රය, ධෛර්යවත් වන්න.
දේශයේ සියලු වැසියෙනි, ධෛර්යවත් වන්න. වැඩ
පටන් ගන්න; මම නුඹලා සමඟ සිටිමි යි සමිඳාණන්
වහන්සේ වදාරන සේක. 5 නික්ම 29:45-46නුඹලා
මිසරයෙන් පිට වී ආ කල මම නුඹලා සමඟ
නිරන්තරයෙන් සිටින බවට පොරොන්දු දුන්
ප්රකාරයට මාගේ ආත්මානුභාවය තවමත්, නුඹලා
සමඟ ය. ඒ නිසා බිය නොවන්න.
6+HAG හෙබ්රෙ 12:26 සියලු බලැති සමිඳාණන්
වහන්සේ මෙසේ වදාරන සේක: “නොබෝ කලකින්
මම අහස සහ පොළොවත්, මුහුද සහ ගොඩබිමත්
සොලවන්නෙමි. සියලු ජාතීන් ද සොලවන්නෙමි.
ඔවුන්ගේ වස්තුව මෙහි ගලා එන්නේ ය. 8 සියලු
බලැති සමිඳාණන් වහන්සේ මෙසේ කියන සේක.
මම දේව මාලිගාව තේජසින් පුරවන්නෙමි. රිදී
මාගේ ය; රන් ද මාගේ ය. 9 අලුත් දේව මාලිගාවේ
තේජාලංකාරය පැරණි දේව මාලිගාවේ අලංකාරය
ඉක්මවා යන්නේ ය. එහි මාගේ සෙනඟට
සෞභාග්යයත්, ශාන්තියත් දෙන්නෙමි. මෙසේ
පවසන්නේ සියලු බලැති සමිඳාණන් වහන්සේ වන
මම ය.”

## අපිරිසිදුකමට හා පමා වීමට දඬුවම්

10 දාරියුස් රජුගේ දෙ වන අවුරුද්දේ නව වන
මාසයේ විසිහතර වන දා සමිඳාණන් වහන්සේ
නැවතත් දිවැසිවර හග්ගයිට කතා කළ සේක.
11 සර්ව පරාක්රම සමිඳාණන් වහන්සේ මෙසේ
වදාරන සේක: “මේ ප්රශ්නය ගැන පූජකයන්ගෙන්
තීරණයක් ඉල්ලන්න. 12 යමෙකු තමාගේ වස්ත්ර
කළෙවරේ කැප කරන ලද මාංසය ගෙන යන විට ඒ
වස්ත්ර කළෙවර රොටිවල හෝ පිදූ හොදිවල හෝ
මිදියුසවල හෝ තෙල්වල හෝ වෙනයම් කෑමක හෝ
ගැවුණොත් ඒවා ඒ හේතුවෙන් කැප කළ ආහාර
වන්නේ ද?” ඒ ප්රශ්නය ඇසූ විට පූජකයෝ,
“නැතැ”යි පිළිතුරු දුන්හ.
13 ගණන් 19:11-22 නැවතත් හග්ගයි මෙසේ ඇසී
ය: “මළමිනියක් ස්පර්ශ කිරීමෙන් අපවිත්ර වූ යම්
කෙනෙකු ඒ ආහාර ස්පර්ශ කළොත් ඒවා අපවිත්ර
වෙයි ද?” ඒ ප්රශ්නයට පූජකයෝ, “අපවිත්ර ය”යි
පිළිතුරු දුන්හ.
14 එවිට හග්ගයි මෙසේ කී ය: “මේ දේ මේ
සෙනඟටත්, මේ රටවැසි සියලු දෙනොටත්, ඔවුන්
නිපදවන සියලු දේටත් අදාළ වන්නේ ය. ඔවුන්
ඔප්පු කරන සෑම දේ ම අපවිත්ර වන්නේ ය යි
සමිඳාණන් වහන්සේ වදාරන සේක.”
15 “නුඹලාට මෙදින සිට ඉදිරි කාලයේ සිදු වන දේ
ගැන මෙනෙහි කරන්න. මාලිගාවේ ගලක් පිට ගලක්
තබන්න පෙරෙ නුඹලාගේ තත්ත්වය මේ ය.
16 කිලෝග්රෑම් දසයයක් ලබන අදහසින් ධාන්ය
ගොඩක් වෙත ගිය නමුත් නුඹලාට ලැබුණේ
කිලෝග්රෑම් සියයක් පමණ ය. මිදියුස ලීටර්
දසයයක් තටාකයකින් ඇදගන්න පිණිස ගිය විට
ලැබුණේ සියයක් පමණ ය. 17 නුඹලා වගා කරන්න
උත්සාහ කළ සියලු දේ විනාශ වන පිණිස මම
ගොයම් රෝගය ද කොළ වියළීම ද ගල් වර්ෂාව ද
එවීමි. එහෙත්, නුඹලා මා වෙත හැරුණේ නැතැ යි
සමිඳාණන් වහන්සේ වදාරන සේක. 18 නව වන
මාසයේ විසිහතර වන දා වන, දේව මාලිගාවේ
අත්තිවාරම් දැමූ මේ දවසේ දී නුඹලාට සිදු වී ඇති
දේ ගැන හොඳට කල්පනා කර බලන්න. 19 අටුවල
ධාන්ය ඉතිරි වී ඇද් ද? එසේ ම මිදි වැල්වලත්
අත්තික්කා ගස්වලත් දෙළුම් ගස්වලත්, ඔලීව
ගස්වලත් පල හටගෙන ඇද් ද? නැත. අද පටන් මම
නුඹලාට ආශිර්වාද කරන්නෙමි.”

## සරුබ්බාබෙල්ට පොරොන්දුව

20 එම දවසේ දී ම එනම්, එම මාසයේ විසිහතර
වන දා සමිඳාණන් වහන්සේ හග්ගයිට දෙ වන වරට
පණිවුඩයක් දෙමින් මෙසේ වදාළ සේක: 21 “ජුදාහි
ආණ්ඩුකාරයා වන සරුබ්බාබෙල්ට මෙසේ කියන්න,
‘මම අහසත් පොළොවත් සොලවන්න යන්නෙමි.
22 රාජ්යයන්ගේ සිහසුන් පෙරළාදමා, ජාතීන්ගේ
ආණ්ඩු බලය නැති කරන්නෙමි. මම රථ සහ
ඒවායේ නැඟී යන්නන් පෙරළා දමන්නෙමි, අශ්වයන්
මරන්නෙමි. උන් පිට යන්නෝ එකිනෙකා තම තමා
කඩුවෙන් මරාගනිති.’ 23 සියලු බලැති සමිඳාණන්
වහන්සේ මෙසේ වදාරන සේක. එම දවසේ දී
මාගේ සේවක ෂයෙල්තියෙල්ගේ පුත්
සරුබ්බාබෙල්, මම නුඹ මාගේ පේරුස් මුද්ද මෙන්
කරන්නෙමි. මා තෝරාගත් තැනැත්තා නුඹ ය.
මෙසේ වදාරන්නේ සියලු බලැති සමිඳාණන්
වහන්සේ ය.”

# සකෙරියා

## සමිඳාණන් වහන්සේ වෙත කැඳවීම

1 එස්රා 4:24; 5:1; 6:14 දාරියුස් රජුගේ දෙ වන
අවුරුද්දේ අට වන මාසයේ දී සමිඳාණන්
වහන්සේ ඉද්දෝගේ පුත්‍ර වන බෙරෙකියාගේ පුත්‍ර
වූ දිවැසිවර සකෙරියාට වදාළ පණිවුඩය මෙයෙ වේ.
2 සියලු බලැති සමිඳාණන් වහන්සේ සකෙරියාට
කතා කොට සෙනඟට මෙසේ ප්‍රකාශ කරන ලෙස
වදාළ සේක: "ස්වාමීන් වන මම, නුඹලාගේ
මුතුන්මිත්තන් ගැන ඉතා අප්‍රසන්න වීමි. 3 එබැවින්
සියලු බලැති සමිඳාණන් වහන්සේ මෙසේ කියන
සේකැ යි කියන්න. 'මා වෙත හැරී එන්න. මම ද
නුඹලා වෙත හැරී එන්නෙමි. 4 නුඹලාගේ
මුතුන්මිත්තන්ට සමාන නොවන්න. පෙර සිටි
දිවැසිවරු ඔවුන් අමතා, 'නුඹලාගේ නපුරු මාර්ගවලින්
ද නපුරු ක්‍රියාවලින් ද හැරෙන්නැ'යි සියලු බලැති
සමිඳාණන් වහන්සේ කියන සේකැ'යි ඔවුන්ට
මොරගැසූ හ. ඔවුන් එයට සවන් දුන්නේ වත්, ඒ
ගැන සැලකුවේ වත් නැත. 5 නුඹලාගේ
මුතුන්මිත්තෝ දැන් කොහේ ද? ඒ දිවැසිවරු
සදාකාලයට ම සිටිත් ද? 6 ඔවුන් දැන් නැති වුවත්
මාගේ මෙහෙකරු දිවැසිවරුන් මඟින් මා ප්‍රකාශ කළ
මාගේ වචනත්, නියෝගත් නුඹලාගේ මුතුන්මිත්තන්
කෙරෙහි බලපෑවේ නැද් ද?" ඒ නිසා ඔව්හු පසුතැවී
සිත් හරවා ගෙන, "සියලු බලැති සමිඳාණන්
වහන්සේ ඉටාගත් පරිදි අපගේ කල්ක්‍රියාව අනුව
අපට දඬුවම් කළ සේකැ"යි කීවෝ ය.

## රතු අශ්වයන් පිළිබඳ දර්ශනය

7 දාරියුස් රජුගේ දෙ වන අවුරුද්දේ, ෂබොට් නම්
එකොළොස් වන මාසයේ විසිහතර වන දා
දර්ශනයක් මඟින් සමිඳාණන් වහන්සේ මගේ
පණිවුඩය මට දුන් සේක. 8 එළිද 6:2,4බලන්න,
රාත්‍රි කාලයේ රතු අශ්වයකු පිට නැඟී සිටි
මිනිසකු මට දර්ශනය විය. මිටියාවතේ තිබුණු
රටමරඳ ගස් අතරේ ඔහු නතර වී සිටියේ ය. ඔහු
පිටිපස්සේ රතු පාට, දුඹුරු පාට හා සුදු පාට
අශ්වයෝ සිටියහ. 9 "ස්වාමීනි, මේ අශ්වයන් මෙහි
සිටීමේ තේරුම කුමක් දැ"යි මම ඇසීමි. මා සමඟ
කතා කළ දූතයා පිළිතුරු දෙමින්, "එහි තේරුම, මම
නුඹට පහදා දෙමි"යි කීවේ ය. 10 එවිට, "සමිඳාණන්
වහන්සේ මේ අශ්වාරෝහකයන් එවා ඇත්තේ
පොළොව පරීක්ෂා කර බලන පිණිස ය"යි රටමරඳ
ගස් අතර සිටි මිනිසා කීවේ ය.

11 ඔව්හු රටමරඳ ගස් අතරේ සිටි සමිඳාණන්
වහන්සේගේ දූතයාට පිළිතුරු දෙමින්, "අපි පොළොව
සැරිසරා, මුළු පොළොව ම නිශ්කලංක ව, නිශ්චල ව
තිබෙන බව දුටිමු"යි සැළ කළහ.
12 එවිට, "සියලු බලැති සමිඳාණන් වහන්ස,
සැත්තෑ වසක් තුළ උන් වහන්සේගේ උදහසට ලක්
වූ ජෙරුසලමට හා ජුදාහි නගරවලට තව කොපමණ
කල් අනුකම්පා නොකර සිටින සේක් දැ"යි
සමිඳාණන් වහන්සේගේ දූතයා ඇසී ය.
13 සමිඳාණන් වහන්සේ මා සමඟ කතා කළ
දූතයාට යහපත්, පැහැදිලි වචනවලින් පිළිතුරු දුන්
සේක. 14 මා සමඟ කතා කළ දේව දූතයා මෙසේ
කී ය: "කෑමොරගසන්න, සියලු බලැති සමිඳාණන්
වහන්සේ මෙසේ වදාරන සේක. ජෙරුසලමට හා
සියොන්ට මම ඉමහත් ප්‍රේමයකින් ප්‍රේම කරමි.
15 එහෙතේ, සැප ජීවිකාවනේ කල් යවන ජාතීන්
කෙරෙහි මම අධික ලෙස උදහස් වී සිටිමි. මාගේ
සෙනඟට මා දැක්වූ උදහස සුළු ව තිබිය දී මේ
ජාතීහු මාගේ සෙනඟට මා සිතුවාට වඩා පීඩා
කළහ. ඒ නිසා සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන
සේක. 16 අනුකම්පාව දක්වන පිණිස මම
ජෙරුසලමට නැවත පැමිණ සිටිමි; මාගේ මාලිගාව
නැවත ගොඩනඟනු ලැබේ. ඒ නගරය
ප්‍රතිසංස්කරණය කරනු ලැබේ.
17 "කෑමොරගසන්න, මාගේ නගරය නැවත
යසඉසුරෙන් පිරී යන්නේ ය. සියොන් නැවත සනසා,
ජෙරුසලම තම තමන්ගේ ම නගරය කරගනු
ලබන්නේ ය කියා සියලු බලැති සමිඳාණන් වහන්සේ
වදාරන සේක."

## අං සතර පිළිබඳ දර්ශනය

18 මා හිස ඔසවා බැලූ විට සතුන්ගේ අං සතරක්
මට දර්ශනය විය. 19 "එහි තේරුම කුමක් දැ"යි මා
සමඟ සිටි දේව දූතයාගෙන් මම ඇසීමි.
19 ඔහු පිළිතුරු දෙමින්, "මේවා ජුදා, ඉශ්රායලේ හා
ජෙරුසලම විසුරුවාදැමූ ලෝක බලවත්තු සතරදෙනො
ය"යි කීවේ ය.
20 එවිට සමිඳාණන් වහන්සේ මට කම්මල්කාරයන්
සතරදෙනෙකු පෙන්වූ සේක. 21 "මොවුන් අවුත්
සිටින්නේ කුමට දැ"යි මම ඇසීමි. උන් වහන්සේ
පිළිතුරු දෙමින්, "කිසිවකු නැවත නොනැඟිටින ලෙස
ජුදා රට විසුරුවාදැමූ ජාතීහු මොවුහු වෙති. ඔවුන්
පැමිණෙන්නේ, ඒ ජාතීන් බිය ගන්වා ජුදා රට
විසුරුවාදමන්නට බලය යෙදූ ජාතීන් මැඩලීමට ය"යි
වදාළ සේක.

### මනින ලණුව පිළිබඳ දර්ශනය

2 මා හිස ඔසවා බැලූ විට සිය අතේ මනින
ලණුවක් ඇති මිනිසකේ මට දර්ශනය විය.
2 "ඔබ කොහේ යනවා දැ"යි මම ඔහුගෙන් ඇසීමි.
2 "ජෙරුසලම මැන, එය කොපමණ දිග ද කියාත්,
කොපමණ පළල ද කියාත් බලන පිණිස මම යමි"යි
ඔහු පිළිතුරු දුන්නේ ය.
3 එවිට මා සමඟ කතා කළ දූතයා පිටත් ව
යනවාත්, වෙනෙ දූතයකෙු ඔහුගේ පරෙමෙගට
එනවාත් මම දිටිමි. 4 ඔහු පළමු දූතයාට මසෙේ කී
ය: "ඔබ දුව ගොස් අර තරුණයාට කතා කොට
මසෙේ කියන්න: ජෙරුසලම පවුරකින් සීමා නොකළ
හැකි නගරයක් වනු ඇත. මන්ද, එහි ජනගහණය ද
ගවමහිෂයන් ද වැඩි වන්නට යන නිසා ය. 5 'මම ඒ
වටා පවුරක් වමෙි. ඒ තුළ තේජාලංකාරයනේ වැඩ
සිටින්නමෙි'යි සමිඳාණන් වහන්සේ වදාරන සේක."

### පිටුවාසගතවූවන් කැඳවීම

6 "එන්න, එන්න, උතුරු දේශයේ සිට පලා එන්න.
මම නුඹලා සතර දිග් භාගයහෙි සුළං මනේ විසුරුවා
හරිමි"යි සමිඳාණන් වහන්සේ වදාරන සේක.
7 "බබිලෝනියහෙි වාසය කරන නුඹලා සියොන්
නගරයට බේරී එන්න."
8 මේ දර්ශනවලින් පසු සියලු බලැති සමිඳාණන්
වහන්සේ තමන්ගේ සනෙඟ කොල්ලකෑ ජාතීන්
වතෙ තේජාන්විත සේවය සඳහා මා යවමින් මසෙේ
වදාරන සේක: 9 "යම් ජාතියක් නුඹලාට පහර
දුන්නොත්, එය සමිඳාණන් වහන්සේගේ ඇස් මනේ
වටිනා දයෙට පහරදීමකි. මම ඔවුන්ට විරුද්ධ ව
සටන් කරන්නමෙි. එක් කලකෙ නුඹලා වහල් ව සිටි
සනෙඟ නුඹලා විසින් කොල්ලකනු ලබති.
9 මසෙේ සිදු වූ විට සියලු බලැති සමිඳාණන්
වහන්සේ මා එවූ බව නුඹලා දැනගනු ඇත.
10 "සියොන් පුරඟන, ප්‍රීතියනේ ගී ගයන්න. මම
නුඹලා සමඟ වාසය කරන පිණිස එන්නමෙි යි කියා
සමිඳාණන් වහන්සේ වන මම කියමි." 11 ඒ
කාලයේ දී බොහෝ ජාතීහු සමිඳාණන් වහන්සේට
එක් වී උන් වහන්සේගේ සනෙඟ වන්නෝ ය. උන්
වහන්සේ ඔවුන් සමඟ වැඩවසන සේක. එවිට උන්
වහන්සේ ඔබ වතෙ මා එවූ බව ඔබ දැනගන්නහු
ය. 12 නැවත වරක් සමිඳාණන් වහන්සේ ශුද්ධ
කන්දහෙි ජුදා රට තමන්ගේ ම විශේෂ උරුමයක්
කරගනෙ, ජෙරුසලම තමන්ගේ ප්‍රියතම නුවර
කරගන්න සේක.
13 සියලු මනුෂ්‍ය ජාතීනි, සමිඳාණන් වහන්සේ
ඉදිරියහෙි නිශ්ශබ්ද වන්න. උන් වහන්සේ ස්වකීය
ශුද්ධස්ථානයනේ නැඟිට වඩින සේක.

### ජෝෂුවා පිළිබඳ දර්ශනය

3 එස්රා 5:2; එළිද 12:10 උත්තම පූජක ජෝෂුවා
සමිඳාණන් වහන්සේගේ දූතයා ඉදිරියේ
සිටිනවාත්, ජෝෂුවාගේ දකුණු පැත්තේ ඔහුට
විරුද්ධ ව චෝදනා නඟන පිණිස සාතන් සූදානමින්
සිටිනවාත් සමිඳාණන් වහන්සේ මට පනේවූ සේක.
2 ජූද් 9සමිඳාණන් වහන්සේගේ දූතයා සාතන්
අමතා, "සාතන්, සමිඳාණන් වහන්සේ නුඹට තරවටු
කරන සේක් වා! ජෙරුසලමට ප්‍රිය කරන සමිඳාණන්
වහන්සේ නුඹට තරවටු කරන සේක් වා! මොහු
ගින්නනේ ඇදගත් ගිනි පනෙලේලක් නොවේ දැ"යි
කී ය.
3 ජෝෂුවා වනාහි කිළුටු ඇඳුම් හැඳගනෙ දේව
දූතයා ඉදිරියහෙි සිටියේ ය. 4 "කිළුටු ඇඳුම්
ඔහුගනේ ඉවත් කරන්නැ"යි දේව දූතයා තමා
පිරිවරා සිටි අයට කී ය. ඉන්පසු, "මම නුඹේ පව්
පහ කළෙමෙි. නුඹට මංගල ඇඳුම් පළඳවමි"යි
ජෝෂුවාට කී ය.
5 "ඔහුගේ හිසේ ශෝභන මකුටයක් තබන්නැ"යි
නියම කළෙේ ය. එසේ ඔවිහු සමිඳාණන්
වහන්සේගේ දූතයා බලා සිටිය දී, ශෝභන
මකුටයක් ඔහුගේ හිසේ තබා, මංගල ඇඳුම් ඔහුට
පැළඳවේවෝ ය.
6 එවිට සමිඳාණන් වහන්සේගේ දූතයා ජෝෂුවාට
අනුශාසනා කරමින්, 7 "සියලු බලැති සමිඳාණන්
වහන්සේ මසෙේ වදාරන සේකැ"යි කී ය. "නුඹ
මාගේ ආඥාවලට කීකරු වී මා නුඹට නියම කරන
යුතුකම් ඉටු කරන්නහෙි නම්, මාගේ මාලිගාවේ හා
එහි මණ්ඩපයේ භාගය නුඹට අයත් වන්නේ ය. මා
ඉදිරියහෙි සිටින අයගේ අයැදුම්වලට සවන්
දනේනාක් මනේ මම නුඹේ අයැදුම්වලට ද සවන්
දනේනමෙි. 8 ජරෙ 23:5; 33:15; සකෙරි 6:12ජෝෂුවා,
උත්තම පූජක වන නුඹ ද සහකාර පූජකයන් වන
නුඹලා ද සවන් දනේන. නුඹලා වනාහි මංගල පරෙ
නිමිති ය. 'පැළැටිය' වන මාගේ මහෙකෙරුවා
පැමිණනේනට සලස්වන්නමෙි. 9 ඇස් සතක් ඇති
ගලක් ජෝෂුවා ඉදිරියේ මම තබමි. ඒ පිට මම
ලේඛනයක් කොටා මේ දේශයේ පාපය එක
දවසකින් පහ කරන්නමෙි. 10 මීකා 4:4ඒ දවස
පැමිණි විට නුඹලාගේ මිදිවැල් හා අත්තික්කා ගස්
යට නුඹලා එකිනකොට සංග්‍රහ කරනු ඇතැ"යි
සමිඳාණන් වහන්සේ වදාරන සේක.

### පහන් රුක පිළිබඳ දර්ශනය

4 මා සමඟ කතා කළ දේව දූතයා නැවත
අවුත්, නින්දනේ පුබුදු කරනු ලබන්නකෙු මනේ
මා පුබුදුවා, 2 "නුඹට කුමක් පනෙේ දැ"යි මාගනේ
ඇසී ය. මම පිළිතුරු දමෙින්, "මුළුමනින් ම
ස්වර්ණමය වූ පහන් රුකක් මට පනෙයෙි. එහි
මුදුනේ පහන් සතකින් යුත් තලේ දැමිය යුතු
භාජනයක් ඇත. එහි මුදුනේ එක එක පහනේ
තිරවලට නළ සතක් ඇත. 3 ඒ ළඟ ඔලීව ගස්
දකෙක් ඇත. එකක් වම් පැත්තනේ ද අනික දකුණු
පැත්තනේ ද වේ ය"යි කීවමෙි. 4 එළිද 11:4"මාගේ
ස්වාමීනි, මේවායහෙි තේරුම කුමක් දැ"යි මම දේව
දූතයාගනේ යළි ඇසීමි. 5 "නුඹ දන්නේ නැද්දැ"යි ඔහු
ඇසී ය. "නැත, ස්වාමීනි"යි මම පිළිතුරු දිනිමි.

## සරෙබ්බාබලේට පොරොන්දු

6 එස්රා 5:2 එකල දේව දූතයා මට කතා කරමින්,
"සරෙබ්බාබලේට සමිඳාණන් වහන්සේගේ මේ
පණිවුඩය දන්නේනැ"යි කී ය. එය මෙසේ ය: "නුඹට
ජය අත් වන්නේ සේනා බලයෙන් වත්, සිය
ශක්තියෙන් වත් නොව, මාගේ ආත්මානුභාවයෙනේ
ය. 7 විශාල කන්දක් වුවත් නුඹ ඉදිරියේ සමතලා
වන්නේ ය. දේව මාලිගාව නැවත ගොඩනඟා,
'කදිම ය, කදිම ය' කියා කෑගසන අතර එහි මුල්
ගල නුඹ තබන්නෙහි ය."
8 සමිඳාණන් වහන්සේගෙන් තවත් පණිවුඩයක් මා
වෙත පැමිණියේ ය. 9 එය මෙසේ ය: "සරෙබ්බාබලේ
දේව මාලිගාවේ අත්තිවාරම් දමා ඇත. ඔහු ම
ගොඩනැඟිල්ල නිම කරනු ඇත. මෙය සිදු වූ විට
මාගේ සෙනඟ වෙත මා නුඹ යැවූ බව ඔවුන්
දැනගනු ඇත. 10 එළිද 5:6කුඩා පටන්ගැන්ම හෙළා
දකින්නට යමෙක් වේ ද? ගොඩනැඟිල්ලේ කටයුතු
පමා ව ඇති නිසා ඔව්හු කලකිරී සිටිති. ඔව්හු
සරෙබ්බාබලේගේ අතේ මුල් ගල ඇති බව දකින
විට ප්‍රීති වන්නෝ ය."

## පහන් රුක පිළිබඳ දර්ශනයේ තේරුම

10 දේව දූතයා මට කතා කොට, "පහන් සත නම්
පොළොවේ සියලු දිශාවන් දකින සමිඳාණන්
වහන්සේගේ ඇස් සත ය"යි කී ය.
11 එළිද 11:4 එවිට මම, "පහන් රුක දෙපැත්තේ
ඇති ඔලීව ගස් දෙකෙන් කුමක් අදහස් කෙරේ දැ"යි
ඇසීමි. 12 "ඔලීව තෙල් ගලා එන රන් නළ දෙකෙ
අසල ඇති ඔලීව අතු දෙකෙන් කුමක් අදහස් කෙරේ
දැ"යි දෙ වන වරටත් ඇසීමි. 13 "නුඹ දන්නේ
නැද්දැ"යි ඔහු මාගෙන් ඇසී ය. "නැත, ස්වාමීනි"යි
මම පිළිතුරු දිනිමි. 14 එවිට ඔහු පිළිතුරු දෙමින්,
"මේ දෙකෙන් අදහස් කරන්නේ මුළු පොළොවේ
සමිඳාණන් වහන්සේට සේවය කරන පිණිස දෙවියන්
වහන්සේ විසින් තෝරාගෙන අභිෂේක කරන ලද
දෙදෙනා ය"යි කී ය.

## පියාඹන පොත පිළිබඳ දර්ශනය

5 මම නැවත බැලූ විට පියාඹන පොතක් දිටිමි.
2 "නුඹට කුමක් පෙනේ දැ"යි දේව දූතයා
මාගෙන් ඇසූ විට, "මීටර් නවයක් දිග මීටර්
හතරහමාරක් පළල පියාඹන පොතක් මට පෙනේ
ය"යි මම කීමි.
3 එවිට ඔහු මෙසේ කීවේ ය: "මුළු දේශය පුරා
පැතිරී යන සාපය මෙය වේ. එක පැත්තක
සොරකම් කරන සියල්ලෝ නෙරපනු ලබන්නෝ ය
කියා ද අනෙක් පැත්තේ බොරුවට දිවුරන්නෝ
නෙරපනු ලබන්නෝ ය කියා ද මෙහි ලියා ඇත.
4 සියලු බලැති සමිඳාණන් වහන්සේ වදාරන පරිදි
උන් වහන්සේ මේ සාපය එවන සේක. එවිට එය
හැම සොරකුගේ ද බොරුවට දිවුරන හැම
කෙනෙකුගේ ද නිවසෙට ඇතුළු වන්නේ ය. එය ඒ
නිවසේවල රුඳී එහි සිටින සියල්ලන් ද එහි ලී දඬු ද
ගඩොල් ද විනාශ කර දමන්නේ ය."

## භාජනය තුළ වූ ස්ත්‍රිය පිළිබඳ දර්ශනය

5 දේව දූතයා නැවතත් ඉදිරියට අවුත්, "හිස ඔසවා
බලන්න. දැන් පිටතට එන දේ දෙස බලන්නැ"යි කී
ය.
6 "එය කුමක් දැ"යි මම ඇසීමි. ඔහු පිළිතුරු දෙමින්,
"එය භාජනයකි. මුළු දේශයේ පාපය එයින් අදහස්
කෙරේ"යි කී ය.
7 ඒ භාජනය ඊයම් පියනකින් වසා තිබිණි. මා බලා
සිටිය දී ඊයම් පියන ඔසවනු ලැබී ය. භාජනය තුළ
ස්ත්‍රියක් වාඩි වී සිටියා ය.
8 "මේ ස්ත්‍රිය වනාහි දුෂ්ටකමේ මූර්තිය ය"යි
දේව දූතයා මට කී ය. ඉන්පසු ඒ ස්ත්‍රිය නැවත
භාජනය තුළට තල්ලු කරදමා, ඔහු එය පියනෙන්
වැසුවේ ය. 9 මම හිස ඔසවා බැලූ විට ස්ත්‍රීන්
දෙදෙනෙකු මා දෙසට එනවා දිටිමි. කණ කොකාගේ
පියාපත් වැනි පියාපත් ඔවුන්ට තිබිණි. ඔවුන්ගේ ඒ
පියාපත්වලට සුළං බැඳී ය. ඔව්හු අහසත්,
පොළොවත් අතරේ ඒ භාජනය උසුලාගෙන ගියෝ
ය. 10 "ඔවුන් එය කොහේ ගෙන යනවා දැ"යි මට
කතා කළ දූතයාගෙන් මම ඇසීමි.
11 "ඔවුන් එය ගෙන යන්නේ ෂිනාර් දේශයට ය;
එහි දේවාලයක් සාදන පිණිස ය; එය තනා නිම වූ
විට ඒ භාජනය එහි තබනු ලබන්නේ ය"යි කී ය.

## රථ සතර පිළිබඳ දර්ශනය

6 මම හිස ඔසවා බැලූ විට කඳු දෙකෙක්
අතරෙන් රථ සතරක් පිට වී එනවා දිටිමි. ඒ
කඳු ලෝකඩ කඳු ය. 2 එළිද 6:4,5පළමු වන රථයට
රතු අශ්වයෝ ද දෙ වැන්නට කළු අශ්වයෝ ද
3 එළිද 6:2තුන් වැන්නට සුදු අශ්වයෝ ද සතර
වැන්නට පුල්ලි ඇති දුඹුරු පාට අශ්වයෝ ද යොදා
සිටියෝ ය. 4 "ස්වාමීනි, මේ රථවලින් කුමක් අදහස්
කෙරේ දැ"යි මට කතා කළ දේව දූතයාගෙන් මම
ඇසීමි.
5 එළිද 7:1 දේව දූතයා මට පිළිතුරු දෙමින් මෙසේ
කී ය: "මේ වනාහි මුළු පොළොවේ සමිඳාණන්
වහන්සේ ඉදිරියෙහි පෙනී සිට, පිටත් ව යන අහසේ
සුළං සතර ය.
6 "කළු අශ්වයන් බැඳ සිටි රථය උතුරු දේශයටත්,
සුදු අශ්වයන් බැඳ සිටි රථය බටහිරටත්, පුල්ලි ඇති
අශ්වයන් බැඳ සිටි රථය දකුණු දේශයටත් දුඹුරු
අශ්වයන් බැඳ සිටි රථය නැගෙනහිරටත් යන්නේ ය."
7 අශ්වයන් පිටතට ආ විට පොළොව පරීක්ෂා කර
බැලීමට ඔවුන්ට ඉවසිල්ලක් නො වී ය. "ගොස්
පොළොව පරීක්ෂා කර බලන්නැ"යි දේව දූතයා කී
ය. ඔව්හු එසේ කළහ. 8 එවිට දේව දූතයා මහා
හඬින් මට කතා කොට, "උතුරු දේශයට ගිය
අශ්වයන් සමිඳාණන් වහන්සේගේ උදහස උතුරු
දේශයේ සංසිඳුවා ඇතැ"යි කී ය.

### ජෝෂුවාට ඔටුනු පැළඳවීම

9 සමිඳාණන් වහන්සේ මේ පණිවුඩය මට දුන්
සේක. 10 “විප්‍රවාසයට ගනෙගිය, බබිලෝනියේ සිට
පැමිණි හලේදයිගනේ ද ටෝබියාගනේ ද
ජදොයාගනේ ද නුඹ රන් රිදී ලබාගනෙ, එම දවසේ
දී ම ශපෙනියාගේ පුත් ජෝෂියාගේ ගදෙරට යන්න.
11 ඔවුන්ගනේ නුඹ ලබාගත් රන් රිදීවලින් ඔටුන්නක්
සාදා, ජෙහෝශාදාක්ගේ පුත්, උත්තම පූජකයා වන
ජෝෂුවාගේ හිසේ පළඳවා 12 ජරෙ 23:5; 33:15;
සකෙරි 3:8‘සියලු බලැති සමිඳාණන් වහන්සේ
මසෙේ කියන සේකැ’යි ඔහුට කියන්න. ‘පැළෑටිය’
කියා නම් කරන ලද තැනැත්තා මොහු ය. ඔහු මේ
ස්ථානයේ වර්ධනය වී සමිඳාණන් වහන්සේගේ
මාලිගාව නැවත ගොඩනඟන්නේ ය. 13 ඔහු ඒ
දේව මාලිගාව ගොඩනඟා රජ කනෙකුෙට හිමි
මහිමය ලැබ සිංහාසනයේ වැඩහිඳ ආණ්ඩු
කරන්නේ ය. ඔහුගේ සිංහාසනය ළඟ පූජකයකේ
සිටින්නේ ය. ඔවුන් දදෙනො ම සමඟි සාමයනේ
එකට වැඩ කරනු ඇත.’ 14 ඒ ඔටුන්න වනාහි,
හලේදියාගේ ද ටෝබියාගේ ද ජදොයාගේ ද
ජෝෂියාගේ ද ගෞරවාන්විත සිහිවටනයක් සේ
සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ තබා තිබේ.
15 දුර බැහැර අය පැමිණ සමිඳාණන් වහන්සේගේ
මාලිගාව ගොඩනැඟීමට උදව් වන්නෝ ය. එවිට
සියලු බලැති සමිඳාණන් වහන්සේ මා නුඹලා වෙත
එවූ බව නුඹලා දැනගන්නහු ය. නුඹලාගේ දවේි
සමිඳාණන් වහන්සේගේ අණට නුඹලා මුළුමනින්
කීකරු වන්නහු නම් මසෙේ සිදු වනු ඇත.”

### උපවාස ප්‍රශ්නය

7 දාරියුස් රජුගේ සතර වන අවුරුද්දේ කිස්ලෙව්
නම් නව වන මාසයේ සතර වන දා සමිඳාණන්
වහන්සේ සකෙරියාට පණිවුඩයක් දුන් සේක.
2 බතෙලේහි වැසියෝ ශරෂෙරේ ද
රගෙමේමලෙකේ ද ඔවුන්ගේ මිනිසුන් ද සමිඳාණන්
වහන්සේ ඉදිරියේ කන්නලව් කරන්න යැව්වෝ ය.
3 සර්ව පරාක්‍රම සියලු බලැති සමිඳාණන්
වහන්සේගේ මාලිගාවේ පූජකයන්ගනේ ද
දිවැසිවරුන්ගනේ ද මසෙේ ප්‍රශ්න කරන්න ඔවුන්ට
නියම විය: “මපෙමණ අවුරුදු ගණනක් තිස්සේ අප
කළාක් මනේ තවදුරටත් හැම පස් වන මාසයේ දී ම
වැලපමේන් උපවාස පැවැත්වීම අප කරගනෙ යා යුතු
ද?”
4 සියලු බලැති සමිඳාණන් වහන්සේ මට මේ
පණිවුඩය දුන් සේක: 5 “දේශයේ සනෙඟටත්
පූජකයන්ටත් කතා කරොට, ඔවුන් මේ අවුරුදු
සැත්තෑව තුළ දී පස් වන හා සත් වන මාසවල
උපවාස පවත්වා වැලපමේන් උපවාස කළෙේ මා
උදසො ද? 6 තවද, ඔවුන් කෑවේත්, බීවේත්
ඔවුන්ගේ ම සන්තුෂ්ටිය උදසො නොවේ ද?
7 ජරෙුසලම සෞභාග්‍යයනේ හා ජනගහණයනේ
පිරී, ඒ නගරය අවට නගර ද දකුණු දිශාව ද පහත
පළාත ද ජනාවාස වී තිබුණු කාලයේ දී පවා
සමිඳාණන් වහන්සේ කලින් සිටි දිවැසිවරුන් මඟින්
කීවේත් මයෙ නොවේ දැ යි කියන්න.”

### අකීකරුකමේ විපාකය

8 සමිඳාණන් වහන්සේ මේ පණිවුඩය සකෙරියාට
දුන් සේක: 9 “සියලු බලැති සමිඳාණන් වහන්සේ
මසෙේ වදාරන සේක: ‘අවංක ලසෙ විනිශ්චය
කරන්න. එකිනකොට කරුණාව ද අනුකම්පාව ද
පනේවන්න. 10 වැන්දඹුවන්ට හා අනාථයන්ටත්
විදේශීන්ටත් පීඩා නොකරන්න. නුඹලා එකිනකොට
හිංසා කිරීමට කූට උපායයන් යොදා නොගන්න.”
11 “එහෙත්, ඔව්හු එයට සවන් දනේන අකමැති වූ
හ. ඔව්හු මුරණ්ඩුකම දැක් වූ හ. නොඇසනෙ පිණිස
කන් වසා ගත්තෝ ය. 12 ඔව්හු ඔවුන්ගේ සිත් ගල්
මනේ දැඩි කරගනෙ, සියලු බලැති සමිඳාණන්
වහන්සේ සිය ආත්මානුභාවය කරණකොටගනෙ
ආදියේ සිටි දිවැසිවරුන් මඟින් දවො වදාළ
ඉගැන්වීම්වලට සහ පණිවුඩවලටත් සවන් නුදුන්හ.
ඒ නිසා සියලු බලැති සමිඳාණන් වහන්සේ අතිශයින්
උදහස් වූ සේක. 13 ‘මා අඬගසන කල ඔවුන් සවන්
නුදුන් නිසා, ඔවුන් අඬගසන කල මම පිළිතුරු
නොදනේනමේ’යි සියලු බලැති සමිඳාණන් වහන්සේ
වදාරන සේක. 14 ‘සුළි සුළඟකින් මනේ මම ඔවුන්
විදේශීය රටවල විසුරුවාදැම්මි. ඒ දේශයට යන එන
කනෙකුෙ නැති නිසා එය පාළු විය. නුඹලා යහපත්
දේශය පාළුකරයක් කළහු ය’යි සියලු බලැති
සමිඳාණන් වහන්සේ වදාරන සේක.”

### ජරෙුසලම ප්‍රතිසංස්කරණය කිරීම

8 සියලු බලැති සමිඳාණන් වහන්සේගේ
පණිවුඩය මා වෙත පැමිණියේ ය. 2 සියලු
බලැති සමිඳාණන් වහන්සේ පැවසූ පණිවුඩය මසෙේ
ය: “සියොන් වැසියන් උදසො මම දැවනෙ
සනෙහෙසකින් ප්‍රමේ කරමි. මේ ප්‍රමේය නිසා
ඔවුන්ගේ සතුරන් කරෙහෙි මම උදහස් වීමි.
3 ජරෙුසලමහෙි සියොන් කන්දට ආපසු පැමිණ මම
එහි වැඩ වාසය කරන්නමේ. ජරෙුසලම
විශ්වාසවන්ත නගරය වශයනේ ද සියලු බලැති
දවේියන් වහන්සේගේ කන්ද ශුද්ධ කන්ද වශයනේ ද
ප්‍රසිද්ධ වන්නේ ය. 4 වයෝවෘද්ධ වූ බැවින් සැරයටි
වාරුවනේ ඇවිදින මහල්ලෝ ද මැහැල්ලෝ ද
ජරෙුසලමේ වීථිවල වාඩි වන්නෝ ය. 5 නගරයේ
වීථි සලේලම් කරන බාලක බාලිකාවන්ගනේ පිරී
යන්නේ ය.
6 “මේ රටේ දැන් ඉතිරි ව සිටින අයට ඒ දවස්වල
දී එය පුදුමයක් ව පනෙුණත් මටත් එය පුදුමයක් ව
පනෙේ දැ”යි සියලු බලැති සමිඳාණන් වහන්සේ
අසන සේක. 7 සියලු බලැති සමිඳාණන් වහන්සේ
මසෙේ වදාරන සේක: “නැගනෙහිර හා බස්නාහිර
සිටින මාගේ සනෙඟ මුදාගනෙ ජරෙුසලමේ ජීවත්

වන පිණිස මම ඔවුන් ආපසු ගෙනෙන්නෙමි. 8 ඔව්හු
මාගේ සෙනඟ වන්නෝ ය. මම ඔවුන්ගේ දෙවියන්
වහන්සේ වන්නෙමි."
9 සියලු බලැති සමිඳාණන් වහන්සේ මෙසේ
වදාරන සේක: "මාගේ මාලිගාව යළි ගොඩනඟන
පිණිස අත්තිවාරම දැමූ දා සිට දිවැසිවරයා කී මේ
වචන දැනුත් අසන නුඹලා ධෛර්යවත් වන්න. 10 ඊට
පෙර දවස්වල දී මිනිසුන් හෝ ගවයන් හෝ කුලියට
ලබාගැනීමට කිසිවකුට වත්කමක් නොවී ය. සතුරු
උවදුරුවලට ගොදුරු නොවී ගමන්බිමන් යාමට
කිසිවකුට නොහැකි විය. අසල්වැසියන් එකිනෙකාට
විරුද්ධ ව සිටින්න මම සැලැස්වීමි. 11 එහෙත්, මම
දැන් මේ රටේ ඉතිරි ව සිටින අයට පෙර මෙන්
ක්‍රියා නොකරමි යි සියලු බලැති සමිඳාණන්
වහන්සේ කියන සේක. 12 ඔවුන් සාමදානයෙන් බීජ
වපුරනු ඇත. මිදි වැල්වල පල හටගන්වනු ඇත;
භූමියෙන් අස්වැන්න ලැබෙනු ඇත; ඇති පමණට වැසි
වසිනු ඇත. මේ සියලු ආසිරි මම මාගේ දේශයේ
ඉතිරි ව සිටින අයට දෙන්නෙමි. 13 ජුදාවේ ජනයෙනි,
ඉශ්‍රායලේ ජනයෙනි, කලින් නුඹලා ජාතීන් අතරේ
සාපයක් ව සිටි නමුත්, ආශීර්වාදයක් වන ලෙස මම
නුඹලා මුදන්නෙමි. බිය නොවන්න. ධෛර්යවත්
වන්න."

## යුක්තිය, සත්‍යය හා සාමදානය

14 සියලු බලැති සමිඳාණන් වහන්සේ මෙසේ
වදාරන සේක: "නුඹලාගේ මුතුන්මිත්තන් මා උදහස්
කළ විට ඔවුන් පිට විපත්තිය පමුණුවන්නට මම
සිතට ගතිමි. මාගේ සිත මම වෙනස් නොකෙළෙමි.
15 එහෙත්, දැන් ජෙරුසලමට හා ජුදා වැසියන්ට
ආශීර්වාද කරන්න මම සිතට ගෙන සිටිමි. ඒ නිසා
බිය නොවන්න. 16 එෆී 4:25නුඹලාගේ යුතුකම්
මේවා ය. එකිනෙකාට සත්‍යය කතා කරන්න.
උසාවිවල දී සාමය සැලසෙන ලෙස නියම යුක්තිය
ඉෂ්ට කරන්න. 17 එකිනෙකාට හිංසා කිරීමට කූට
උපායයන් යොදා නොගන්න. දිවුරුමක් පිට බොරු
සාක්ෂි නොකියන්න. මන්ද, මේ සියල්ල මම හෙළා
දකිමි යි සියලු බලැති සමිඳාණන් වහන්සේ වදාරන
සේක."
18 සියලු බලැති සමිඳාණන් වහන්සේ මේ
පණිවුඩය මට දුන් සේක. 19 සියලු බලැති
සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක: "සතර
වන, පස් වන, සත් වන හා දස වන මාසවල
පවත්වනු ලැබූ උපවාස උත්සව ජුදාහි සෙනඟට
ප්‍රීති ප්‍රමෝදය ගෙන දෙන මංගල උත්සව වන්නේ
ය. එබැවින් නුඹලා සත්‍යයටත්, සාමයටත්
ඇලුම්වන්න."
20 සියලු බලැති සමිඳාණන් වහන්සේ මෙසේ
වදාරන සේක: "බලවත් රටවලින් හා බලවත්
නගරවලින් සෙනඟ ජෙරුසලමට එන කාලය
පැමිණෙන්නේ ය. 21 එක නගරයක සෙනඟ තවත්
නගරයක සෙනඟ අමතා, 'සියලු බලැති සමිඳාණන්
වහන්සේ අයැද, උන් වහන්සේගේ ආසිරි පතන
පිණිස අපි යන්නෙමු; අප සමඟ එන්නැ'යි කියනු
ඇත. 22 විශාල සෙනඟක් ද බලසම්පන්න ජාතීහු ද
සියලු බලැති සමිඳාණන් වහන්සේ අයැද උන්
වහන්සේට ආසිරි පතන පිණිස ජෙරුසලමට
පැමිණෙන්නෝ ය. 23 ඒ දවස්වල දී විදේශීහු
දසදෙනෙක් ජුදෙව්වකු වෙත පැමිණ, ඔහුගේ
වස්ත්‍ර කොන අල්ලාගෙන, දෙවියන් වහන්සේ ඔබ
සමඟ සිටින බව අපි අසා ඇති බැවින් ඔබ සමඟ
යන්න අපි කැමැත්තෙමු යි කියන්නෝ ය."

## සතුරන්ට දඬුවම්

9 යෙසා 17:1-3; ජෙරෙ 49:23-27; ආමො 1:3-5
යෙසා 23:1-18; එසකි 26:1—28:26; ජෝවෙ
3:4-8; ආමො 1:9-10; මතෙ 11:21-22; ලූක් 10:13-14
මෙය දිව්‍ය ප්‍රකාශනය වේ: "සමිඳාණන්
වහන්සේගේ පණිවුඩය හද්‍රාක් දේශයටත්,
දමස්කස් නගරයටත් විරුද්ධ ව පැමිණ ඇත.
ඉශ්‍රායලේහි සියලු ගෝත්‍ර පමණක් නොව,
ආරාම්හි අග නුවරත් සමිඳාණන් වහන්සේට අයිති
ය. 2 හද්‍රාක් දේශයට යාව ඇති හමාත් ද නොයෙක්
ශූර නුවණ ඇති තීර් සහ සීදොන් ද උන් වහන්සේට
අයිති ය. 3 තීර් වනාහි බලකොටු සාදාගෙන ධූලි
ගොඩ ගසන්නාක් මෙන් රිදී ද වීථිවල කුණු කසළ
ගොඩ ගසන්නාක් මෙන් රන් ද රැස් කරගත්තේ ය.
4 එහෙත්, සමිඳාණන් වහන්සේ එහි ඇති සියලු දේ
පැහැරගෙන එහි ඇති වස්තුව මුහුදට හෙළා දමන
සේක. එය ගින්නෙන් විනාශ වන්නේ ය.
5 යෙසා 14:29-31; ජෙරෙ 47:1-7; එසකි 25:15-17;
ජෝවෙ 3:4-8; ආමො 1:6-8; ශෙප 2:4-7
"අෂ්කලෝන් නගරය ඒ දැක බිය වන්නී ය. ගාසාත්
ඒ දැක කම්පා වන්නී ය. එක්‍රෝන්ට ද එසේ ම සිදු
වී බලාපොරොත්තු ශූන්‍ය වන්නේ ය. ගාසාවෙහි රජ
විනාශ වන්නේ ය. අෂ්කලෝන් ජන ශූන්‍ය
පෙදෙසක් වන්නේ ය. 6 අෂ්දෝදෙහි අවජාතක
සෙනඟක් වාසය කරන්නෝ ය. මම පිලිස්තිවරුන්ගේ
ඔද බිඳදමන්නෙමි. 7 ඔව්හු ලේ සහිත මාංස වත්,
තහනම් කරන ලද කෑම වත් තවත් අනුභව
නොකරන්නෝ ය. ඔව්හු ද ඉතිරි ව සිටින සියලු
දෙනා සමඟ දෙවියන් වහන්සේගේ සෙනඟ වන්නෝ
ය; ඔව්හු ජුදාහි ගෝත්‍රයක් මෙන් වන්නෝ ය;
එක්‍රෝන්වරු ද ජෙබුසියයන් මෙන් වන්නෝ ය.
8 එවිට මම මාගේ දේශය ආරක්ෂා කොට ඒ මැදින්
යුද්ධ හමුදාවලට යන්න ඉඩ නොදෙන්නෙමි. ඔවුන්ට
පීඩා කරන්න කිසිවකුට ඉඩ නොදෙන්නෙමි. මාගේ
සෙනඟගේ දුක මම දිටිමි."

## සාම කුමාරයාගේ ආගමනය

9 මතෙ 21:5; ජොහ 12:15 සියොන් පුරඟන, ප්‍රීති
ප්‍රමෝද වන්න;
q2 9 ජෙරුසලම් පුරඟන සොම්නස් හඬ නඟන්න.
q2 9 ඔබේ රජතුමාණෝ ඔබ වෙත වඩින සේක.
q2 9 එතුමාණෝ, ජයාන්විත විජයශ්‍රීයෙන් පැමිණෙන
සේක.

අ29 යටහත් සිතින් කොටළුවකු පිට නැඟ, එසේ ය,
කොටළු දෙනකගේ පැටවකු පිට නැඟ පැමිණෙන
සේක.
10 ගීතා 72:8 මම එප්‍රායිම් කරෙන් රථය ද
ජෙරුසලමෙන් අශ්වයන් ද සිඳදමන්නෙමි. යුද්ධ දුනු
ද කපා හරිනු ලැබේ. උන් වහන්සේ ජාතීන්ට
සාමදානය ප්‍රකාශ කරන සේක. උන් වහන්සේගේ
ආණ්ඩුව මුහුදෙන් මුහුදටත් යුප්‍රටීස් ගංගාවේ පටන්
පොළොවේ සීමා දක්වාත් වන්නේ ය.

### සෙනඟට නිදහස

11 නික්ම 24:8 සමිඳාණන් වහන්සේ මෙසේ
වදාරන සේක: “ලෙයින් මුද්‍රා කරන ලද, නුඹ සමඟ
කළ, මාගේ ගිවිසුම නිසා මම නුඹේ සෙනඟ වතුර
නැති වළෙන් නිදහස් කරන්නෙමි. 12 පිටුවහල් වී
සිටින්නෙනි, දැන් නුඹලාට බලාපොරොත්තු තිබෙන
නිසා, නුඹලාගේ ආරක්ෂා ස්ථානයට පැමිණෙන්න.
නුඹලා විඳි දුක්වලට වන්දි වශයෙන් නුඹලාට
දෙගුණයක් ආශීර්වාද මා දෙන බව ප්‍රකාශ කරමි.
13 මම ජුදා රට දුන්නක් මෙන් ද එප්‍රායිම් ඊතල
මෙන් ද සූදානම් කරගෙන සිටිමි. ග්‍රීසියේ ජනයාට
විරුද්ධ ව සටන් කරන පිණිස මම සියොන්හි ජනයා
රණශූරයකුගේ කඩුවක් මෙන් යොදාගන්නෙමි.
14 “එවිට සමිඳාණන් වහන්සේ ඔවුන්ට ඉහළින්
පෙනෙන සේක. උන් වහන්සේගේ ඊතලය විදුලිය
මෙන් විහිදෙන්නේ ය. දෙවි ස්වාමීන් වහන්සේ සිය
හොරණෑව පිඹ දකුණු දිශාවේ සුළිසුළං සමඟ
ඉදිරියට වඩින සේක. 15 සියලු බලැති සමිඳාණන්
වහන්සේ සිය සෙනඟ ආරක්ෂා කොට, ඔවුන්ගේ
සතුරන් ගල් පටියේ ගල් මෙන් පාගා දමන සේක.
ඔව්හු මිදියුස මෙන් ලේ බොන්නෝ ය. සතුරන්
මරාදමන්නෝ ය. ඔවුන්ගේ ලේ පූජාසනයේ
කොන්වල නෙරා ගිය අං පෙඟී තිබෙන පරිදි ද
භාජනයකින් ලේ උතුරා යන පරිදි ද ඔව්හු ලේවලින්
වෙරිමත් වී සිටින්නෝ ය. 16 ඒ දවස පැමිණි විට,
එඬේරෙකු සිය රැළ ආරක්ෂා කරන ලෙස උන්
වහන්සේ තමන්ගේ සෙනඟ ආරක්ෂා කරන සේක.
ඔටුන්නක ඇති මැණික් මෙන් උන් වහන්සේගේ
දේශයේ ඔව්හු බබළන්නෝ ය. 17 එසේ ය, එය
කොපමණ සාරවත්, අලංකාරවත් දේශයක් වන්නේ
ද! ධාන්‍යයෙන් එහි වෙසෙන තරුණයෝ ද මිදියුසෙන්
එහි වෙසෙන තරුණියෝ ද ශක්ති සම්පන්න වන්නෝ
ය.”

### විමුක්තිය පිළිබඳ පොරොන්දුව

10 වසන්ත කාලයට වර්ෂාව එවන ලෙස
සමිඳාණන් වහන්සේගෙන් අයැදින්න. සියලු
දෙනා සඳහා කුඹුරු සාරවත් කරමින් වැසි වලාකුළු ද
වර්ෂාව ද එවන්නේ සමිඳාණන් වහන්සේ ය. 2 මතෙ
9:36; මාක් 6:34පිළිම අයැදීමෙන් මිනිසුන්ට නිසරු
බොරු පිළිතුරු ලැබෙන නිසා ද පේන කියන්නන්
මිනිසුන් නොමඟ යවන නිසා ද ස්වප්න දකින්නන්
හිස් සැනසිල්ලක් ගෙන දෙන නිසා ද සෙනඟ
බැටළුවන් මෙන් ඉබාගාතේ ඇවිදිති. එඬේරෙකු
නැති නිසා ම ඔව්හු දුකට පත් වී සිටිති.
3 “එඬේරුන්ට විරුද්ධ ව මාගේ උදහස ඇවිළී
තිබේ. මම ඔවුන්ගේ මූලිකයන්ට දඬුවම් කරමි.
එබැවින් සියලු බලැති සමිඳාණන් වහන්සේ ජුදාහි
සෙනඟ වන බැටළු රැළ ආරක්ෂා කරන සේක.
ඔව්හු උන් වහන්සේගේ බලවත් යුද්ධ අශ්වයන්
මෙන් වන්නෝ ය. 4 මුදුන් ගල වැනි පාලකයන් ද
ඇඹ වැනි මූලිකයන් ද යුද්ධ දුනු වැනි නිලධාරීන් ද
සියලු අධිපතීන් ද ඒ දේශයෙන් නික්මෙනු ඇත.
5 වීථිවල ඇති මඩෙහි සතුරන් පාගා දමන බලවත්
හේවායන් මෙන් ජුදාහි සෙනඟ ජයග්‍රාහකයෝ
වන්නෝ ය. සමිඳාණන් වහන්සේ ඔවුන් සමඟ සිටින
නිසා ඔව්හු සටන් කොට සතුරු අශ්වාරෝහකයන්
වුව ද පරාජය කරන්නෝ ය. 6 මම ජුදාහි සෙනඟ
බලවත් කර, ජෝසෙප්ගේ සෙනඟට ජය අත් කර
දෙන්නෙමි. ඔවුන්ට අනුකම්පා කරන නිසා මම ඔවුන්
ආපසු ගෙනෙන්නෙමි. ඔව්හු වනාහි, මා විසින් කිසි
කලෙක ප්‍රතික්ෂේප නොකරන ලද සෙනඟක් මෙන්
වන්නෝ ය. මම ඔවුන්ගේ දෙවි සමිඳාණන්
වහන්සේ ය. ඔවුන්ගේ අයැදුම්වලට මම පිළිතුරු
දෙන්නෙමි. 7 එප්‍රායිම් සෙනඟ බලවන්ත
හේවායකු මෙන් වන්නෝ ය. ඔවුන් මිදියුස පානය
කළ අය මෙන් ප්‍රීති වනු ඇත. ඔවුන්ගේ දරු
පරම්පරාව මේ ජයග්‍රහණය සිහි කොට ප්‍රීති
වන්නෝ ය. සමිඳාණන් වහන්සේ කෙරෙහි ඔව්හු
සන්තෝෂ වන්නෝ ය. 8 මම මාගේ සෙනඟ කැඳවා
ඔවුන් එක්රැස් කරන්නෙමි. මම ඔවුන් ගළවා
ඔවුන්ගේ සංඛ්‍යාව පෙර මෙන් වැඩි කරන්නෙමි.
9 මා ඔවුන් ජාතීන් අතරේ විසුරුවා හරින නමුත්,
ඔවුන් දුර බැහැර රටවල දී මා සිහි කොට,
ඔවුන්ගේ දරුවන් සමඟ ජීවත් ව සිට ආපසු හැරී
එනු ඇත. 10 මම ඔවුන් මිසරයෙන් නැවත
ගෙනෙන්නෙමි; අසිරියාවෙන් ඔවුන් රැස් කර ගිලියද්
දේශයටත්, ලෙබනොන්ටත් පමුණුවන්නෙමි; මුළු
දේශය සෙනඟගෙන් පිරී ඉතිරී යන්නේ ය. 11 ඔවුන්
විපත්තිය නමැති මුහුද මැදින් යන විට, මම මුහුදේ
තරංගවලට පහර දෙන්නෙමි. එවිට නයිල් ගංගාවේ
පත්ල වියළී යන්නේ ය. අසිරියාවේ අහංකාරය
පහත් කරනු ලබන්නේ ය; මිසරයේ ජයකොන්තය
නැති වී යන්නේ ය; 12 ඔවුන්ගේ ශක්තිය සමිඳාණන්
වහන්සේ කෙරෙහි ය. ඔව්හු උන් වහන්සේට කීකරු
වන්නෝ ය.” මෙසේ පවසන්නේ සමිඳාණන්
වහන්සේ ය.

### බලවතුන්ගේ වැටීම

11 “එම්බා ලෙබනොන්, ඔබේ කිහිරි ගස්
ගින්නෙන් දැවී යන පිණිස ඔබේ දොරවල්
අරින්න. 2 දේවදාර ගස් කෑමොරගසන්න; මන්ද,
කිහිරි ගස් වැටී ඇත; ඒ තේජාන්විත ගස් විනාශ වී
ඇත. බාෂාන්හි ආලෝන ගස් කෑමොරගසන්න; මන්ද,
ඝන වනාන්තරය වනසාදමනු ලැබුවේ ය. 3 සවන්
දෙන්න, පාලකයන්ගේ තේජස පහවී ගොස් ඇති

බැවින්, ඔව්හු දුක් බරින් කෑමොරගසති. ජෝර්දාන්හි
වනය පාළු වී ඇති බැවින් තරුණ සිංහයන්ගේ
ගරෙව්මේ හඬ අසන්න.”

### එඬේරාගේ උපමාව

4 මාගේ දෙවි සමිඳාණන් වහන්සේ මට මෙසේ
වදාළ සේක: “මරනු ලබන්න නියම ව සිටින බැටළු
රැළහෙි එඬේරා වන්න. 5 ඔවුන් මිලට ගන්න අය
ඔවුන් මරන නමුත්, ඔව්හු දඬුවම් නොලබන්නෝ ය.
ඔවුන් විකුණන අය, ‘සමිඳාණන් වහන්සේට ප්‍රශංසා
වේ වා! අපි දැන් පොහොසත් ය’යි කියති. ඔවුන්ගේ
ම එඬේරු වුව ද ඔවුන්ට අනුකම්පා නොකරති.”
6 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
“මම දේශයේ වැසියන්ට තවත් අනුකම්පා
නොකරමි. මම හැම මිනිසකු ම ඔහුගේ එඬේරා
වන පාලකයාට හා රජුගේ බලයට පාවා දෙමි.
මොවුහු දේශය නැතිනාස්ති කරති. ඔවුන්ගේ
බලයෙන් මම කිසිවකු බේරා නොගනිමි.
7 “ඒ නිසා බැටළුවන් මිලට ගෙන විකුණන අය
උදෙසා මම ඔවුන් තර කළෙමි. ඒ නිසා මම
මරණයට නියම ව සිටි බැටළු රැළේ එඬේරා වීමි.
මම සැරයටි දෙකක් රැගෙන, එකකට ‘ප්‍රසාදය’
කියා ද අනෙකට ‘සමගිය’ කියා ද නම් තබා බැටළු
රැළ ආරක්ෂා කළෙමි. 8 මට ද්වේෂ කළ එඬේරුන්
තිදෙනෙකු ගැන මට ඉවසාගත නොහැකි ව එක
මාසයක් ඇතුළත දී ඔවුන් නැසුවෙමි. 9 එවිට මම
බැටළු රැළට කතා කොට, ‘මම තවත් නුඹලාගේ
එඬේරා නොවන්නෙමි, නසින අය නසිත් වා!
වැනසෙන අය වැනසෙත් වා! ඉතිරි අය
එකිනෙකාගේ මාංස කාදමත් වා’යි කීමි. 10 එවිට
මම සියලු ජාතීන් සමඟ කළ ගිවිසුම අවලංගු කරන
පිණිස ‘ප්‍රසාදය’ නමැති සැරයටිය ගෙන කඩා
දැමුවෙමි. 11 එසේ ය, ඒ දවසේ දී ගිවිසුම අවලංගු
කරන ලදී. බැටළුවන් මිලට ගෙන විකුණන අය මා
කළ දේ දැක, ඒ ක්‍රියාව මඟින් සමිඳාණන්
වහන්සේ කතා කරන බව තේරුම්ගත්හ. 12 මතෙ
26:15මතෙ 27:9-10මම ඔවුන් අමතා, ‘මට කුලිය
දෙන්න යුතු යයි නුඹලාට සිතේ නම් එය දෙන්න,
නැත්නම් එය තබා ගන්නැ’යි කීමි. එවිට ඔව්හු මට
රිදී කාසි තිහක් කුලී වශයෙන් කිරා දුන්හ. 13 ‘ඒ
මුදල දේව මාලිගාවේ භාණ්ඩාගාරයෙහි දමන්නැ’යි
සමිඳාණන් වහන්සේ මට වදාළ සේක. මම ද,
මාගේ වටිනාකම වශයෙන් ඔවුන් මිල කළ අගේ
ඇති ඒ රිදී මිල තිහ දේව මාලිගාවේ
භාණ්ඩාගාරයෙහි දැමීමි. 14 ඉන්පසු ජුදා හා
ඉශ්රායලේ අතරේ පැවති සමගිය බිඳෙන බව
පෙන්වන පිණිස, ‘සමගිය’ යන නම ඇති සැරයටිය
කැඩීමි.”
15 එවිට සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ
සේක: “නුඹ නැවතත් පලක් නැති එඬේරෙකුගේ
උපකරණ අරගන්න. 16 මම මේ දේශයට මෙවැනි
එඬේරෙකු එවන්නෙමි. ඔහු විනාශයට ගොදුරු වූවන්
ගැන සලකන්නේ වත්, නැති වූවන් සොයන්නේ වත්,
තුවාළ වූවන් සුව කරන්නේ වත්, නොමැරී ඉතිරි
වූවන්ට කෑම දෙන්නේ වත් නැත. ඒ වෙනුවට ඔහු
ඉතා තර බැටළුවාගේ මස් කා උගේ කුර පවා උදුරා
දමන්නේ ය. 17 රැළ අත්හැර ගිය ඒ පලක් නැති
එඬේරාට වන විපතක මහත! යුද්ධය
කරණකොටගෙන ඔහුගේ අතට සහ දකුණු ඇසට
පහර වැදෙන්නේ ය. ඔහුගේ අත් වියළී යන්නේ ය;
ඇස් ද අන්ධ වන්නේ ය.”

### ජෙරුසලමේ විමුක්තිය

12 සමිඳාණන් වහන්සේ ඉශ්රායලේ ගැන කරන
දිව්‍ය ප්‍රකාශනය මෙයෙ වේ. අහස මැවූ,
පොළොවේ අත්තිවාරම දැමූ, මනුෂ්‍යයා තුළ
ආත්මානුභාවය පිහිටවූ සමිඳාණන් වහන්සේ
මෙසේ වදාරන සේක: 2 “ජෙරුසලම, ඒ අවට ජාතීන්
වෙරිමත් කරවන කුසලානක් සේ කරන්නෙමි. ඒ
ජාතීන් ජෙරුසලම වටලන විට ජුදාහි සෙසු නගර ද
වටලනු ලැබේ. 3 මම ඒ දවස පැමිණි විට සියලු
ජාතීන්ට ජෙරුසලම බර ගලක් මෙන් කරන්නෙමි. එය
උස්සන්න යන ජාතිය බොහෝ සේ තුවාළ ලබන්නේ
ය. ලෝකයේ සියලු ජාතීහු එයට විරුද්ධ ව එක්රැස්
වෙති. 4 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක.
ඒ කාලයේ දී මම සියලු අශ්වයන් බිය ගන්වා
අසරුවන් වියරු වැටෙන්න සලස්වන්නෙමි. එහෙත්,
මම ජුදාහි සෙනඟ රැක බලාගෙන ඔවුන්ගේ
සතුරන්ගේ අශ්වයන් අන්ධ කරන්නෙමි. 5 එවිට
ජුදාහි ගෝත්‍ර තම තමන් කතා කර ගනිමින්, ‘සියලු
බලැති සමිඳාණන් වහන්සේ ජෙරුසලමේ වසන සිය
සෙනඟට ශක්තිය දෙන සේකැ’යි කියනු ඇත.
6 “ඒ කාලයේ දී මම ජුදාහි ගෝත්‍රයන්
වනලැහැබක නොහොත් ගොයම් ඇති කුඹුරක ගිනි
හුලක් මෙන් ද පිදුරු මිටි අතර ගිනි පෙනෙල්ලක්
මෙන් ද කරන්නෙමි. ඔව්හු සියලු ජාතීන් හාත්පසින්
ම විනාශ කරන්නෝ ය. ජෙරුසලමේ සෙනඟ සිය
නගරයෙහි සුරුකි ව සිටින්නෝ ය.
7 “දාවිත්ගේ වංශයට හිමි මහිමය ද ජෙරුසලමේ
වැසියන්ට ලැබෙන මහිමය ද ජුදාහි සෙසු කොටසට
වඩා උසස් නොවන පිණිස මම පළමුකොට ජුදාවට
ජය අත් පත් කර දෙන්නෙමි. 8 ඒ කාලයෙහි
සමිඳාණන් වහන්සේ ජෙරුසලමේ වැසියන් ආරක්ෂා
කරන සේක: ඔවුන් අතරෙහි සිටින දුබලයා පවා
දාවිත් මෙන් ප්‍රබල වන්නේ ය. දාවිත්ගේ වංශය ද
දෙවියන් වහන්සේ මෙන් ද සමිඳාණන් වහන්සේගේ
දූතයා මෙන් ද ඔවුන්ට මඟ පෙන්වන්නේ ය. 9 ඒ
කාලයේ දී මම ජෙරුසලමට පහර දෙන්න උත්සාහ
කරන හැම ජාතියක් ම විනාශ කරන්නෙමි.”

### සෙනඟ තමන්ගේ පාපය ගැන වැලපීම

10 ජොහ 19:37; එළිද 1:7 මතෙ 24:30; එළිද 1:7
“මම දාවිත්ගේ වංශයට ද ජෙරුසලමේ සෙනඟට ද
කරුණාවේ හා අයැදීමේ සිතක් දෙන්නෙමි. ඔව්හු
තමන් විසින් ඇන තුවාළ කරන ලද්දා වූ තැනැත්තා
දෙස බලා, නැති වූ එක ම පුත්‍රයා ගැන වැලපෙන

අය මෙනේ වැලපනේනෝ ය; එක ම පුත්‍රයා ගැන
ශෝක වන්නාක් මෙනේ ශෝක වන්නෝ ය. 11 ඒ
කාලයේ දී මගිද්දෝ සමභූමියෙහි දී හදද්-රිම්මොන්
ගැන වැලපනේනාක් මෙනේ ජෙරුසලමේ වැලපීම
මහත් වන්නේ ය. 12 දේශයෙහි එක එක ගෝත්‍ර
වෙනේ වෙනේ වශයෙනේ වැලපෙනු ඇත. දාවිත්ගේ
පෙළෙපතින් පැවත එන පුරුෂයෝ ද ඔවුන්ගේ
භාර්යාවෝ ද වෙනේ වෙනේ වශයෙනේ වැලපනේනෝ ය.
නාතාන්ගේ ගෝත්‍රයෙනේ පැවත එන පුරුෂයෝ ද
ඔවුන්ගේ භාර්යාවෝ ද වෙනේ වෙනේ වශයෙනේ
වැලපනේනෝ ය. 13 ලෙවීගේ පෙළෙපතින් පැවත එන
පුරුෂයෝ හා ඔවුන්ගේ භාර්යාවෝ ද, ෂිමයි
පෙළෙපතින් පැවත එන පුරුෂයෝ හා ඔවුන්ගේ
භාර්යාවෝ ද 14 සෙසු සියලු ගෝත්‍රවල අය ද
ඔවුන්ගේ භාර්යාවෝ ද වෙනේ වෙනේ වශයෙනේ
වැලපනේනෝ ය."

## ජෙරුසලම පවිත්‍ර කරනු ලැබීම

13 සියලු බලැති සමිඳාණන් වහන්සේ මෙසේ
වදාරන සේක: "ඒ කාලයේ දී පාපය හා රූප
වන්දනාවෙනේ දාවිත්ගේ ගෝත්‍රය ද ජෙරුසලමේ
වැසියන් ද පවිත්‍ර කරන පිණිස උල්පතක්
ඇරෙනේනේ ය. 2 ඒ කාලයේ දී දේව රූපවල නම්
තවත් සිහි නොවන පරිදි මම ඒ රූප දේශයෙනේ
බැහැර කරන්නෙමි. බොරු දිවැසිවරුන් ද පහ කරදමා,
මම රූප වන්දනාවේ ආශාව නැති කරදමන්නෙමි.
3 තවදුරටත් දිවැස් දසේීමට යමෙක් තැත් කරයි නම්,
සමිඳාණන් වහන්සේගේ නාමයෙනේ, ඔහු ජනිත කළ
පියාත්, මවත්, 'නුඹ ජීවත් නොවිය යුතු ය. මන්ද
සමිඳාණන් වහන්සේගේ නාමයෙනේ නුඹ බොරු
පවසන්නෙහි ය'යි කියමින් ඔහුට ඇන මරන්නෝ ය.
4 ඒ කාලයේ දී සෑම දිවැසිවරයෙක් තමා දකින
දර්ශන ගැන ලජ්ජා වන්නේ ය; දිවැසිවරයෙකු සේ
අඳින්නේ වත්, තමා දිවැසිවරයෙකු යයි කියාගන්නේ
වත් නැත. 5 ඒ වෙනුවට ඔහු, 'දිවැසිවරයෙකු නොව
මම ගොවියෙකි; මම බාල වියෙහි සිට ම
ගොවිකම් කළෙමි'යි කියන්නේ ය. 6 'නුඹේ පිටේ
තිබෙන ඔය තුවාළ මොනවා දැ'යි යමෙකු ඔහුගෙනේ
ඇසුවොත්, 'ඒවා මාගේ මිත්‍රයාගේ ගෙදර දී මා
ලැබූ තුවාළ ය'යි ඔහු කියන්නේ ය."

## එඬේරා මරන්නට නියමය

7 මතෙ 26:31; මාක් 14:27 සියලු බලැති සමිඳාණන්
වහන්සේ මෙසේ වදාරන සේක: "එම්බා කඩුව!
පිබිද මාගේ එඬේරාට එනම්, සහකාර මිනිසාට
පහර දෙනේන; එඬේරාට පහර දෙනේන. එවිට බැටළු
රැළ විසිර යනු ඇත. මාගේ දුබල වූවන්ට මම පහර
දෙනේනෙමි. 8 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන
සේක. සනෙඟගෙනේ තුනෙනේ දකොටසක් මැරෙනු
ඇත. එක කොටසක් ජීවත් වනු ඇත. දේශය
මුළුල්ලෙහි මෙය සිදු වනු ඇත. 9 එහෙත්, ඉතිරි තුන්
වන කොටස මම ගින්නෙහි දමන්නෙමි; රිදී පවිත්‍ර
කරන්නාක් මෙනේ ඔවුන් පවිත්‍ර කරන්නෙමි; රන්
උරගා බලන්නාක් මෙනේ ඔවුන් උරගා බලන්නෙමි.
ඔවුන් මාගේ නාමයෙනේ මට යාච්ඤා කරන විට මම
ද ඔවුන්ට පිළිතුරු දෙනේනෙමි. 'ඔව්හු මාගේ සෙනඟ
ය'යි මම ඔවුන්ට කියන්නෙමි; 'සමිඳාණන් වහන්සේ
මාගේ දෙවියන් වහන්සේ ය'යි ඔව්හු මට කියන්නෝ
ය."

## ජෙරුසලම උදසො සටන

14 සමිඳාණන් වහන්සේ ක්‍රියා කරන දවස
පැමිණෙනේනේ ය. එකල ඔබ කොල්ලකනු
ලැබ කොල්ලය ඔබේ ඇස් හමුයෙහි බෙදෙනු ලැබේ.
2 ජෙරුසලමට විරුද්ධ ව යුද්ධ කරන පිණිස
සමිඳාණන් වහන්සේ සියලු ජාතීන් එක්රැස් කරන
සේක. නගරය අල්ලාගනු ලැබේ; ගෙවල්
කොල්ලකනු ලැබේ; ස්ත්‍රීහු දූෂණය කරනු ලබති;
සනෙඟගෙනේ දකෙනේ කොටසක් වහල්කමට
ගෙනෙයනු ලබන අතර, ඉතිරි කොටස නුවරින් පිටත
ගෙනෙයනු නොලබති. 3 සමිඳාණන් වහන්සේ ඉදිරියට
ගොස් පසුගිය කාලයෙහි යුද්ධ කළ පරිදි ඒ ජාතීන්ට
විරුද්ධ ව යුද්ධ කරන සේක. 4 ඒ කාලයේ දී
ජෙරුසලමට නැගෙනෙහිරනේ පිහිටි ඔලීව කන්ද මත
සමිඳාණන් වහන්සේ වැඩහිඳින සේක. එකල ඔලීව
කන්ද නැගෙනෙහිර සිට බටහිර දසෙට දපෙළු වී
මැදින් මහත් මිටියාවතක් මතු වන්නේ ය. කන්දනේ
භාගයක් උතුරු දසෙටත්, අනෙක් භාගය දකුණු
දසෙටත් වෙනේ වී යන්නේ ය. 5 නුඹලා ද මාගේ
කන්දේ මිටියාවත මැදින් බේරී පලා යන්නහු ය.
මන්ද, ඒ මිටියාවත කන්දනේ එහා පැත්ත දක්වා
ඇත. ජුදාහි රජ වූ උශ්ශියාගේ කාලයේ දී
භූමිකම්පාවක් ඇති වූ විට නුඹලාගේ මුතුන්මිත්තන්
පලා ගිය පරිදි නුඹලාත් පලා යන්නහු ය. එවිට
මාගේ දෙවි සමිඳාණන් වහන්සේ සියලු
ශුද්ධවන්තයන් පිරිවරා වඩින සේක.

## සමිඳාණන් වහන්සේ රජකම් කරන සේක

6 ඒ කාලයේ දී උෂ්ණය වත්, ශීත වත් ඇති
නොවන්නේ ය. 7 දවාලත්, රැයත් නොවී, සවස්
වේලාවට එළිය ඇත්තා වූ, සමිඳාණන් වහන්සේ
පමණක් දන්නා වූ, එක්තරා දවසක් පැමිණෙනේනේ
ය.
8 එසකි 47:1; ජොහ 7:38; එළිද 22:1 ඒ කාලයේ දී
පිරිසිදු වතුර ජෙරුසලමෙනේ ගලා අවුත් එයින්
භාගයක් මළ මුහුදටත්, ඉතිරි කොටස මධ්‍යධරණී
මුහුදටත් ගලා යන්නේ ය. අවුරුද්ද මුළුල්ලේ ඒ වතුර
ගලන්නේ ය. 9 එකල සමිඳාණන් වහන්සේ මුළු
ලෝකයේ රාජයාණෝ වන සේක. සියලු දෙනෙ උන්
වහන්සේ දෙවියන් වහන්සේ වශයෙනේ නමදිනු ඇත.
එක ම නමකින් උන් වහන්සේ හඳුන්වනු ලබන
සේක.
10 උතුරේ ගෙබා සිට දකුණේ රිම්මොන් දක්වා
ඇති ජෙරුසලම අවට මුළු දේශය සමතලා කරනු
ලබන්නේ ය. ජෙරුසලම ඒ අවට ප්‍රදේශයට ඉහළින්
උස් ව තිබෙනේනේ ය. 'බෙන්ජමින් දොරටුව' සිට

කලින් දොරටුවක් තිබුණු ‘කොනේ දොරටුව’ දක්වා
ද ‘හනනලේ කොත’ සිට රජුගේ මුද්‍රික තටාකය
දක්වා ද නුවර පැතිර පවතින්නේ ය. 11 එළිද
22:3සෙනඟ තවත් විනාශයකට භාජන නොවී සුරැකි
ව එහි වාසය කරන්නෝ ය.
12 ජෙරුසලමට විරුද්ධ ව යුද්ධ කරන සකල ජාතීන්
කෙරෙහි වසංගතයක් සමිඳාණන් වහන්සේ
පමුණුවන සේක. ඔවුන් සිටගෙන සිටිය දී ඔවුන්ගේ
මාංස කුණු වී යන්නේ ය. ඔවුන්ගේ ඇස් ද දිව් ද
ජරාපත් වන්නේ ය.
13 ඒ කාලයේ දී සමිඳාණන් වහන්සේ ඔවුන් අතර
භීතියක් ඇති කරන සේක. ඒ නිසා, එක මිනිසෙකු
තමා ළඟ සිටින මිනිසා අල්ලාගෙන ඔහුට පහර
දෙනු ඇත. 14 ජුදා සෙනඟ පවා ජෙරුසලමේ සිට
සටන් කරනු ඇත. ඔව්හු අවට සියලු ජාතීන්ගේ
සම්පත් වන රන් රිදී ද වස්ත්‍ර ද මහා රාශියක්
එකතු කරගන්නෝ ය. 15 අශ්වයන් ද අශ්වතරයන් ද
ඔටුවන් ද කොටළුවන් ද සතුරු කඳවුරුවල සිටින
සියලු සත්ත්වයන් ද කෙරෙහි වසංගතයක්
පැමිණෙන්නේ ය.

### ජෙරුසලමේ මහිමාලංකාරය

16 ලෙවී 23:39-43 ජෙරුසලමට විරුද්ධ ව සටන්
කරන සියලු ජාතීන්ගෙන් ඉතිරි ව සිටින සියලු දෙනා
සියලු බලැති දෙවියන් වහන්සේට රාජයාණන්
වශයෙන් ම නමස්කාර කරන පිණිසත්, කූඩාරම්
මංගල්‍යය පවත්වන පිණිසත් වසරක් පාසා වසරක්
ජෙරුසලමට පැමිණෙන්නෝ ය. 17 යම් දේශයක
සෙනඟ සියලු බලැති සමිඳාණන් වහන්සේට
රජාණන් වශයෙන් නමස්කාර කරන්න ජෙරුසලමට
නොයන්නෝ නම්, ඒ දේශය පිට වැසි නොවසින්නේ
ය. 18 මිසර ජාතිකයෝ කූඩාරම් මංගල්‍යය
පැවැත්වීමට නොපැමිණතේ නම්, එසේ
නොපැමිණෙන සියලු ජාතීන් කෙරෙහි සමිඳාණන්
වහන්සේ පමුණුවන වසංගතය ඔවුන් පිටත්
පමුණුවනු ලැබේ. 19 කූඩාරම් මංගල්‍යය
පැවැත්වීමට නොපැමිණෙන මිසර හා අවශේෂ
ජාතීන් කෙරෙහි පැමිණෙන දඬුවම මෙය වේ.
20 ඒ කාලයේ දී ‘සමිඳාණන් වහන්සේට කැප ය’
යන වචන අශ්වයන්ගේ මිණිගෙඩිවල කොටා තබනු
ඇත. දේව මාලිගාවේ පිසීමට ගන්න භාජන පූජාසන
ඉදිරියෙහි ඇති පාත්‍ර මෙන් කැප වූ භාජන වන්නේ
ය. 21 ජෙරුසලමේ හා ජුදාවේ ඇති, පිසීමට ගන්න
සියලු භාජන සියලු බලැති සමිඳාණන් වහන්සේගේ
නමස්කාරය සඳහා වෙන් කරනු ලබන්නේ ය. පූජා
ඔප්පු කරන සෙනඟ පැමිණ, පූජාවට ගන්න මාංස
තම්බන පිණිස ඒ භාජන පාවිච්චි කරනු ඇත. ඒ
කාලය පැමිණි විට එක ම වෙළෙන්දෙකු වත් සියලු
බලැති සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ
නොසිටිනු ඇත.

# මලාකි

1 ඉශ්රායලේවරුන්ට දන්වන පිණිස සමිඳාණන්
වහන්සේ මලාකිට දිව්ය ප්රකාශනයකින් දුන්
පණිවුඩය මෙය වේ:

### ඉශ්රායලේවරුන් කෙරෙහි සමිඳාණන් වහන්සේගේ ප්රේමය

2 රෝම 9:13 යෙසා 34:5-17; 63:1-6; ජෙරෙ 49:7-22;
එසකි 25:12-14; 35:1-15; ආමො 1:11-12; ඔබදි 1-14
"මම නුඹලාට ප්රේම කළෙමි"යි සමිඳාණන්
වහන්සේ වදාරන සේක. "එහෙත්, ඔබ වහන්සේ
අපට කෙසේ ප්රේම කළ සේක් දැ"යි නුඹලා
අසන්නහු ය. සමිඳාණන් වහන්සේ පිළිතුරු දෙමින්,
"ඒසව් හා ජාකොබ් සහෝදරයෝ නොවෙත් ද?
එහෙත්, මම ජාකොබ්ට ප්රේම කළෙමි. 3 ඒසව්ට
ද්වේෂ කළෙමි. මම ඒසව්ගේ කඳුකර පළාත
විනාශ කොට, ඔහුගේ උරුමය, වන මෘගයන්ගේ
වාසස්ථානයක් කළෙමි"යි වදාළ සේක.
4 ඒසව්ගේ පරම්පරාවෙන් පැවත එන ඒදොම්වරුන්,
"අපේ නගර විනාශ වී ඇතත් අපි නැවත ඒවා
ගොඩනඟන්නෙමු"යි කීවොත්, සියලු බලැති
සමිඳාණන් වහන්සේ මෙසේ පිළිතුරු දෙන සේක:
"ඔවුන් ගොඩනඟන නමුත් මම නැවත ඒවා
කඩාදමන්නෙමි. ඒදොම් වනාහි 'දුෂ්ට පළාත' කියා ද
'සදහට ම සමිඳාණන් වහන්සේගේ උදහසට ලක් වී
ඇති ජාතියක්' කියා ද සෙනඟ කියනු ඇත. 5 මේ
දේ නුඹලාගේ දෑසින් නුඹලා දකිනු ඇත. එවිට,
'ඉශ්රායලේ දේශයෙන් එපිටත් සමිඳාණන් වහන්සේ
බලවත් ය'යි නුඹලා කියනු ඇත."

### පූජකයන්ට තරවටු කිරීම

6 "පුත්රයා තමාගේ පියාටත්, මෙහෙකරුවා
තමාගේ ස්වාමියාටත් ගෞරව කරති. මා නුඹලාගේ
පියා නම්, නුඹලා මට ගෞරව නොකරන්නේ මන්
ද? මා නුඹලාගේ ස්වාමියා නම් මට ගරුබුහුමන්
නොදෙන්නේ මන්ද කියා අවමන් කරන
පූජකවරුන්ගෙන් සියලු බලැති සමිඳාණන් වහන්සේ
අසන සේක. 'අප ඔබට අවමන් කළේ කෙසේ දැ'යි
නුඹලා අසන්නහු ය. 7 නුඹලා මට අවමන් කර
ඇත්තේ පූජාසන පිට අපවිත්ර ආහාර ඔප්පු
කිරීමෙන් ය. එවිට 'අප ආහාර අපවිත්ර කළේ
කෙසේ දැ'යි නුඹලා අසන්නහු ය. 'සමිඳාණන්
වහන්සේගේ පූජාසනය සුළු යයි නුඹලා කීමෙන් ය.'
8 ද්වි.නී. 15:21'මට පූජා කරන පිණිස නුඹලා අන්ධ
සතකු ගෙන ඒම හරි ද? කොර සතකු හෝ ලෙඩ
සතකු හෝ ඔප්පු කිරීම හරි ද? එවැනි සතකු
නුඹලාගේ ආණ්ඩුකාරයාට දී බලන්න. ඔහු ඒ ගැන
ප්රසන්න වෙයි ද? නුඹලාට උදව් උපකාර දෙයි දැ"යි
සමිඳාණන් වහන්සේ වදාරන සේක.
9 "අපට කරුණා කරන මෙන් දෙවියන්
වහන්සේගෙන් අයැදින්න. එවැනි පූජාවක් ඔබේ
අතින් පිළිගෙන සමිඳාණන් වහන්සේ ඔබට කරුණා
කරන සේක් දැ"යි සමිඳාණන් වහන්සේ වදාරන
සේක. 10 'අහෝ! මාගේ පූජාසනය පිට නිෂ්ඵල
ලෙස ගිනි නොදල්වන පිණිස දොරවල් වසා තබන
එක් කෙනෙකු නුඹලා අතරේ ඇත්නම් කොපමණ
හොඳ ද? නුඹලා ගැන මට සතුටක් නැත; නුඹලා
ගෙනෙන පූජාවක් මම භාර නොගනිමි. 11 ඉර උදා
වන තැන් පටන් ඉර බැස යන තැන් දක්වා සියලු
ජාතීහු මාගේ නාමයට ගෞරව කරති. ඔව්හු සෑම
තැන ම සුවඳ දුම් ද පිරිසිදු පූජා ද මට ඔප්පු කරති.
සියලු ජාතීහු මාගේ නාමයට ගෞරව කරති'යි සියලු
බලැති සමිඳාණන් වහන්සේ වදාරන සේක.
12 "එහෙත් නුඹලා සමිඳාණන් වහන්සේගේ
පූජාසනය පිළිකුල් යයි කියමින් එහි ඔප්පු කරන
ආහාරවලට නිගා කරන බැවින් නුඹලා මාගේ
නාමයට අගෞරව කරන්නහු ය. 13 'මේ මොන
කරදරයක් දැ'යි කියමින් නුඹලා මට අවමන්
කරන්නහු ය"යි සියලු බලැති සමිඳාණන් වහන්සේ
වදාරන සේක. "සොරාගත්තා වූ නොහොත් කොර
වූ හෝ ලෙඩ වූ හෝ සතුන් පූජාවන් වශයෙන්
නුඹලා ගෙනෙන්නහු ය. නුඹලාගේ අතින් මා ඒවා
පිළිගන්නවා ඇතැ යි නුඹලා සිතන්නහු ද? 14 මා හට
පූජා කරන්න පොරොන්දු වූ හොඳ සතුන් රැළේ
සිටිය දී, වැදගැම්මක් නැති සතකු මට පූජා කරන
ප්රයෝගකාරයාට වන විපතක මහත! මන්ද, මම
ශ්රේෂ්ඨ රජෙක්මි. සියලු රටවල සෙනඟ මාගේ
නාමයට ගරුබිය දක්වති"යි සියලු බලැති සමිඳාණන්
වහන්සේ වදාරන සේක.

### පූජකයන්ගේ නොමනා ඉගැන්වීම

2 "පූජකවරුනි, මේ ආඥාව නුඹලාට ය"යි සියලු
බලැති සමිඳාණන් වහන්සේ වදාරන සේක.
2 "නුඹලාගේ ක්රියාවලින් මට ගෞරව
නොකරන්නහු නම්, මා වදාරන දේට නුඹලා සවන්
නොදෙන්නහු නම්, එය හොඳින් සිතට නොගන්නහු
නම්, නුඹලා පිට මම සාපයක් පමුණුවන්නෙමි.
නුඹලා ලබන ආශීර්වාදය සාපයට හරවමි. ඇත්ත
වශයෙන් නුඹලා මාගේ ආඥා තදින් සිතට නොගත්
නිසා දැනටමත් මා ඒවාට සාප කර ඇත. 3 මම
නුඹලාගේ දරු සම්පත වළක්වන්නෙමි. නුඹලාගේ

මුහුණු පිට කසළ එනම්, මංගල්‍ය පූජා පිණිස
ගෙනෙන සතුන්ගේ කසළ තවරා, ඒ සමඟ නුඹලා
ඉවතට හළෙන්නෙමි. 4 ගණන් 3:11-13එවිට ලෙවීගේ
පරම්පරාවේ පූජකයන් සමඟ මා කළ ගිවිසුම ස්ථිර
ව පවතින පිණිස මා මේ ආඥාව නුඹලාට දුන් බව
නුඹලා දැනගන්නහු ය.” මෙසේ පවසන්නේ සියලු
බලැති සමිඳාණන් වහන්සේ ය.
5 ගණන් 25:12 “මාගේ ගිවිසුමක් මඟින් ඔවුන්ට
ජීවිතයත්, සෞභාග්‍යයත් දෙන්නට මම පොරොන්දු
වීමි. ඔවුන් මට ගෞරව කරන පිණිස මේ සියල්ල
මම ඔවුන්ට දිනිමි. එසේ ඔව්හු බිය ඇති ව මාගේ
නාමයට ගරුබිය දැක්වූ හ. 6 ඔව්හු අසත්‍යය නොව
සත්‍යය ඉගැන්වූ හ. ඔව්හු සමගිකමෙන් හා
අවංකකමෙන් මා සමඟ ජීවත් වී බොහෝ දෙනෙකු
අපරාධයෙන් වළක්වාලූ හ. 7 දෙවියන් වහන්සේ
පිළිබඳ සත්‍ය ඥානය දීම හා ඉගැන්වීම
පූජකයන්ගේ යුතුකම් ය. ඔවුන් සියලු බලැති
සමිඳාණන් වහන්සේගේ දූතයන් වන බැවින් මාගේ
කැමැත්ත පිළිබඳ ව ඉගෙනගැනීම සඳහා සෙනඟ
ඔවුන් වෙත යා යුතු ය.
8 “එහෙත්, පූජකයන් වන නුඹලා හරි මාර්ගයෙන්
පිට ගොස් ඇත. නුඹලාගේ ඉගැන්වීම් නිසා
බොහෝ දෙනෙකු වරදට වැටී ඇත. ලෙවී සමඟ මා
කළ ගිවිසුම නුඹලා කඩ කර ඇත. 9 නුඹලා මාගේ
ඉගැන්වීම් නොපිළිපැද, මාගේ කැමැත්ත ගැන
උගන්වන විට සියලු දෙනා එක සේ නොසලකන
බැවින් මම ද ඉශ්රායලේ සෙනඟ විසින් නුඹලා
හෙළාදකිනු ලබන්න සලස්වන්නෙමි.” මෙසේ
පවසන්නේ සියලු බලැති සමිඳාණන් වහන්සේ ය.

## මිශ්‍ර විවාහය හා දික්කසාදය

10 අප සියල්ලන්ට ඇත්තේ එක ම පියාණන්
වහන්සේ නොවේ ද? අප මැව්වේ එක ම දෙවියන්
වහන්සේ නොවේ ද? එසේ නම්, එකිනෙකොට
ද්‍රෝහිකම් කරමින්, අපේ මුතුන්මිත්තන් සමඟ
දෙවියන් වහන්සේ කළ ගිවිසුම අප කෙලෙසන්නේ
මන් ද? 11 ජුදාහි සෙනඟ දෙවියන් වහන්සේට ඔවුන්
දුන් පොරොන්දුව කඩ කර, ඉශ්රායලේහි ද
ජෙරුසලමේ ද භයානක පිළිකුල් ක්‍රියා කර ඇත.
දෙවියන් වහන්සේ ප්‍රේම කරන ශුද්ධස්ථාන පූජා
කෙලෙසා ඇත. ඔව්හු විදේශීය දෙවිවරුන්ට
නමස්කාර කරන ස්ත්‍රීන් සරණ පාවාගෙන සිටිති.
12 මෙසේ කරන යමෙකේ සිටිත් නම්, සමිඳාණන්
වහන්සේ ඔහු විනාශ කරන සේක් වා. ඔහු මින්පසු
කවදා වත් සියලු බලැති සමිඳාණන් වහන්සේට පූජා
ඔප්පු කරන අපේ ජාතියේ සෙනඟට අයිති නො
වේ වා!
13 මෙන්න, ඔබ කරන තව වරදක්! සමිඳාණන්
වහන්සේ ඔබේ පූජාවන් හා දීමනාවන්
නොපිළිගන්න බැවින්, ඔබ හඬා වැලපී උන්
වහන්සේගේ පූජාසනය පිට කඳුළු වගුරුවන්නහු ය.
14 උන් වහන්සේ ඔබේ පූජාවන් නොපිළිගන්නේ
මන්දැ යි ඔබ අසන්නහු ය. එයට හේතුව, ඔබ
තරුණ කාලයෙහි විවාහ කරගත් භාර්යාවට දුන්
පොරොන්දුව කඩ කර තිබෙන බව උන් වහන්සේ
දැනගෙන සිටීම ය. ඔබේ සහකාරී වූ ඈට පක්ෂපාත
ව සිටින බවට දෙවියන් වහන්සේට ඔබ පොරොන්දු
වූ නමුත් ඈට දුන් පොරොන්දුව ඔබ කඩ කර ඇත.
15 එක ම දෙවියන් වහන්සේ ඔබ, ඔබේ භාර්යාව
හා ඒකාබද්ධ නොකළ සේක් ද? එසේ කළේ,
දෙවියන් වහන්සේගේ සැබෑ සෙනඟ වන දරුවන්
අපට ඇති කරන පිණිස ය. ඒ නිසා ප්‍රවේසම්
වන්න. කිසිවෙකේ තමා තරුණ වියේ විවාහ කරගත්
භාර්යාවට දුන් පොරොන්දු කඩ නොකරේ වා!
16 ඉශ්රායලේවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ
මෙසේ වදාරන සේක. “මම දික්කසාදයට දැඩි ලෙස
විරුද්ධ වෙමි. නුඹලාගෙන් කෙනෙකු තම භාර්යාවට
කරන එවැනි නපුරු ක්‍රියා ගැන මම දැඩි ලෙස
විරුද්ධ වෙමි. එබැවින් ඔබේ ආත්මය රැකගන්න.
නුඹේ භාර්යාවට පක්ෂපාත ව සිටීමට දුන්
පොරොන්දුව කඩ නොකරන්න.”

## දේව විනිශ්චය දවස

17 ඔබේ වචනවලින් ඔබ සමිඳාණන් වහන්සේ
වෙහෙසෙන්නහු ය. එහෙත්, ‘අපි කෙසේ උන්
වහන්සේ වෙහෙසෙන්නෙමු දැ’යි ඔබ අසන්නහු ය.
ඔබ උන් වහන්සේ වෙහෙසෙන්නේ, ‘නපුර කරන
සියල්ලෝ ම උන් වහන්සේ ඉදිරියේ යහපත් ය; උන්
වහන්සේ ඔවුන් කෙරෙහි ප්‍රසන්න ය’යි කීමෙන්, හා
‘සර්ව සාධාරණ උන් වහන්සේ කොතැන දැ’යි
ප්‍රශ්න කිරීමෙන් ය.
3 මතෙ 11:10; මාක් 1:2; ලූක් 1:76; 7:27 මෙයට
සියලු බලැති සමිඳාණන් වහන්සේ මෙසේ
පිළිතුරු දෙන සේක: “මට පෙරටු ව ගොස් මාගේ
මාර්ගය පිළියෙළ කරන්නාවූ මාගේ දූතයා මම
එවන්නෙමි. එවිට නුඹලා සොයමින් සිටින සමිඳාණන්
වහන්සේ හදිසියෙන් තමන් දේව මාලිගාවට වඩින
සේක. නුඹලා පුල පුලා බලා සිටින දූතයා පැමිණ
මාගේ ගිවිසුම ප්‍රකාශ කරනු ඇත.”
2 ජෝවෙ 2:11; එළිද 6:17 එහෙත්, උන්
වහන්සේගේ පැමිණීමේ දවස උහුලන්න පුළුවන්
කවරකුට ද? උන් වහන්සේ ප්‍රකාශ වන විට
ගැළවී සිටින්න පුළුවන් කවරකුට ද? උන් වහන්සේ
රන්කරුවෙකුගේ ගින්න මෙන් ද අපුල්ලන්නෙකුගේ
සබන් මෙන් ද වන සේක. 3 උන් වහන්සේ රිදී උණු
කර පිරිසිදු කරන කෙනෙකු මෙන් ලෙවී පුත්‍රයන්
පවිත්‍ර කරන සේක. එවිට ඔව්හු සමිඳාණන්
වහන්සේ වෙත නියම පූජාවක් ගෙනෙන්නෝ ය.
4 ජුදාවේ හා ජෙරුසලමේ සෙනඟ සමිඳාණන්
වහන්සේ වෙත ගෙනෙන පූජා පෙර කාලයේ දී
මෙන් උන් වහන්සේට ප්‍රියමනාප වන්නේ ය.
5 සියලු බලැති සමිඳාණන් වහන්සේ මෙසේ
වදාරන සේක: “මම විනිශ්චය පිණිස නුඹලා ළඟට
අවුත්, මන්ත්‍රකාරයන්ට ද කාමමිථ්‍යාචාරිකයන්ට ද
බොරු සාක්ෂි දෙන්නන්ට ද කුලීකරුවන්ට පීඩා
කරන්නන්ට ද වැන්දඹුවන්ට, අනාථයන්ට හා

විදේශිකයන්ට අයුතු දේ කරන්නන්ට ද මට ගරුබිය
නොදක්වන්නන්ට ද විරුද්ධ ව විගසින් සාක්ෂි
දෙන්නෙමි."

### දසයෙන් කොටස ගෙවීම

6 සියලු බලැති සමිඳාණන් වහන්සේ මෙසේ
වදාරන සේක: "මම සමිඳාණන් වහන්සේ ය; මාගේ
වෙනස් වීමක් නැත. ජාකොබ්ගේ පරම්පරාවෙන්
පැවත එන නුඹලා තවමත් සම්පූර්ණයෙන් විනාශ වී
නැත්තේ ඒ නිසා ය. 7 පෙර සිටි නුඹලාගේ
මුතුන්මිත්තන් සේ නුඹලා ද මාගේ ආඥාවලට
පිටුපා ඒවා කඩ කළහු ය. එහෙත්, මා වෙත හැරී
එන්න; එවිට මමත් නුඹලා වෙත හැරී එන්නෙමි. 'අපි
කෙසේ හැරී එන්නෙමු දැ'යි නුඹලා අසන්නහු ය.
8 දෙවියන් වහන්සේ රැවටීමට මිනිසකුට පුළුවන්
ද? මම නුඹලාගෙන් අසමි. එසේ කිරීම යුතු නැති
වුවත් නුඹලා මා රවටන්නහු ය. නුඹලා මා
රවටන්නේ දසයෙන් කොටස හා පූජාවන් පිදීමෙහි දී
ය. 9 මුළු ජාතිය ම මා රවටන බැවින් නුඹලා
සියල්ලන් පිට සාපයක් පැමිණ ඇත. 10 ලෙවී 27:30;
ගණන් 18:21-24; ද්වි.නී. 12:6; 14:22-29; නෙහෙ
13:12මාගේ මාලිගාවේ භෝජන තිබෙන පිණිස
නුඹලා සම්පූර්ණ දසයෙන් කොටස ගබඩාවට
ගෙනෙන්න. එසේ කළ විට ස්වර්ගයේ කවුළු හැර
බහුල ලෙස මම නුඹලාට ආශීර්වාද නොදෙන්නෙම්
දැ යි සෝදිසි කර බලන්න. 11 ගොයම් මැස්සන්ගෙන්
නුඹලාගේ ගොයම් විනාශ වන්න මම ඉඩ නොදෙමි.
නුඹලාගේ මිදි වැලේ පලදාවත් සාරවන්නේ ය"යි
සියලු බලැති සමිඳාණන් වහන්සේ වදාරන සේක.
12 එවිට නුඹලාගේ දේශය යහපත් දේශයක් වන
බැවින් සියලු ජාතීන් නුඹලා වාසනාවන්තය යි කියනු
ඇත.

### දේව දයාවේ පොරොන්දුව

13 සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක:
"නුඹලා මට විරුද්ධ ව නපුරු දේ කියා ඇත. එසේ
වුවත් 'ඔබට විරුද්ධ ව අපි කුමක් කීවෙමු දැ'යි
නුඹලා අසන්නහු ය. 14 'දෙවියන් වහන්සේට සේවය
කිරීම නිෂ්ඵල ය. උන් වහන්සේගේ ආඥා ඉටු
කිරීමෙන් වත්, කණගාටුවෙන් සියලු බලැති
සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි හැසිරීමෙන් වත්
වැඩක් ඇද් ද? 15 අපට පෙනෙන හැටියට නම්
වාසනාව ඇත්තේ උඩඟු අයට ය; දියුණු වන්නේ
නපුරුකම් කරන අය ය. ඔව්හු දෙවියන් වහන්සේ
පරීක්ෂා කරතත් නිදහස් ව සිටිති'යි නුඹලා
කියන්නහු ය."
16 එකල සමිඳාණන් වහන්සේට ගරුබිය දැක්වූ අය
එකිනෙකා සමඟ කතා කරගත් විට සමිඳාණන්
වහන්සේ ඔවුන් කී දේට සවන් දුන් සේක.
සමිඳාණන් වහන්සේට බිය වන්නා වූ ද උන්
වහන්සේට ගෞරව කරන්නා වූ ද අය
සම්බන්ධයෙන් උන් වහන්සේ ඉදිරියේ පොතක
සටහනක් ලියන ලද්දේ ය. 17 සියලු බලැති
සමිඳාණන් වහන්සේ කී දේ ඒ පොතේ මෙසේ
සටහන් කර ඇත. "ඔව්හු මාගේ සෙනඟ වන්නෝ
ය, මා ක්‍රියා කරන දවසේ දී ඔව්හු මාගේ ම
විශේෂ උරුමය වන්නෝ ය. පියකු තමාට සේවය
කරන පුත්‍රයාට කරුණා කරන්නාක් මෙන් මම
ඔවුන්ට කරුණාව දක්වන්නෙමි. 18 එකල ධර්මිෂ්ඨයා
හා දුෂ්ටයා අතරේ ද දෙවියන් වහන්සේට සේවය
කරන්නා හා උන් වහන්සේට සේවය නොකරන්නා
අතරේ ද ඇති වෙනස නුඹලා දකිනු ඇත."

### ධර්මිෂ්ඨකමේ ජයග්‍රහණය

4 සියලු බලැති සමිඳාණන් වහන්සේ මෙසේ
වදාරන සේක: "උඩඟු අය ද නපුරු අය ද පිදුරු
පෝරණුවක දැවෙන්නාක් මෙන් දැවී යන දවසක්
පැමිණෙන්නේ ය. ඒ දවසේ දී කිසිවෙක් ඉතිරි
නොවන සේ දැවී යන්නෝ ය. 2 එහෙත්, මාගේ
නාමයට ගරුබිය දක්වමින්, ජීවත්වන නුඹලාට
ධර්මිෂ්ඨකම නමැති සූර්යයා සිය රැස්වල සුවසහනය
ඇති ව උදාවන්නේ ය. ගාලෙන් පිට වී දුව පැන යන
වහු පැටවුන් මෙන් නුඹලා ප්‍රීති වන්නහු ය. 3 මා
ක්‍රියා කරන්න යන දවසේ දී නුඹලා දුෂ්ටයන්
පාගාදමන්නහු ය. ඔව්හු නුඹලාගේ පාද යට ධූලි
මෙන් වන්නෝ ය.
4 "ඉශ්‍රායලේහි සියලු සෙනඟ විසින් පිළිපදිනු
ලබන පිණිස හොරෙබ් කන්දේ දී මාගේ සේවක
මෝසෙස්ට මා දුන් ආඥා හා නියෝග සිහි කරන්න.
5 මතෙ 11:14; 17:10-13; මාක් 9:11-13; ලූක් 1:17;
ජොහ 1:21 "සමිඳාණන් වහන්සේගේ මහා භයානක
දවස පැමිණෙන්නට පෙර මම දිවැසිවර එලියා
නුඹලා වෙත එවන්නෙමි. 6 මා පැමිණ නුඹලාගේ
දේශය විනාශ නොකරන පිණිස, ඔහු පියවරුන්ගේ
සිත් දරුවන් වෙතට ද දරුවන්ගේ සිත් පියවරුන්
වෙතට ද හරවනු ලබනවා ඇත."

# ශුද්ධවර මතවේ

### ජේසුස් වහන්සේගේ වංශාවලිය
(ලූක් 3:23-38)

1 ආබ්‍රහම්ගේ ද දාවිත්ගේ ද පුත්‍ර වූ ජේසුස්
ක්‍රිස්තුන් වහන්සේගේ වංශාවලිය මෙසේ ය.
2 ආබ්‍රහම්ට දාව ඊසාක් ද, ඊසාක්ට දාව ජාකොබ්
ද, ජාකොබ්ට දාව ජූදා සහ ඔහුගේ සහෝදරයෝ ද
උපන්හ. 3 ජූදාට දාව තාමාර්ගනේ පෙරෙශ් හා ශෙරා
ද, පෙරෙශ්ට දාව හෙශ්‍රොන් ද, හෙශ්‍රොන්ට දාව
ආරාම් ද, 4 ආරාම්ට දාව අමීනාදාබ් ද, අමීනාදාබ්ට
දාව නාෂොන් ද, නාෂොන්ට දාව සල්මොන් ද,
5 සල්මොන්ට දාව රාහාබ්ගනේ බෝවස් ද, බෝවස්ට
දාව රූත්ගනේ ඕබෙද් ද, ඕබෙද්ට දාව ජෙස්සේ ද,
6 ජෙස්සේට දාව දාවිත් රජ ද උපන්නෝ ය.
6 දාවිත් රජුට දාව උරියාගේ භාර්යාව ව සිටි
ස්ත්‍රියගනේ සලමොන් ද, 7 සලමොන්ට දාව
රෙහොබෝවම් ද, රෙහොබෝවම්ට දාව අබියා ද,
අබියාට දාව ආසප් ද, 8 ආසප්ට දාව ජෙහොෂාපාත්
ද, ජෙහොෂාපාත්ට දාව ජෝරාම් ද, ජෝරාම්ට දාව
උශ්ශියා ද, 9 උශ්ශියාට දාව ජෝතාම් ද, ජෝතාම්ට
දාව ආහස් ද, ආහස්ට දාව හෙසෙකියා ද,
10 හෙසෙකියාට දාව මනස්සේ ද, මනස්සේට දාව
ආමොස් ද, ආමොස්ට දාව ජෝසියා ද, 11 2 රාජා
24:14-15; 2 වංශා 36:10; ජෙරෙ 27:20බබිලෝනියට
විප්‍රවාසගතවීම සිදුවූ මේ කාලයේ දී ජෝසියාට
දාව ජෙකොනියා ද ඔහුගේ සහෝදරයෝ ද
උපන්නෝ ය.
12 බබිලෝනියේ විප්‍රවාසයනේ පසු ජෙකොනියාට
දාව ෂයෙල්තියෙල් ද, ෂයෙල්තියෙල්ට දාව
සරුබ්බාබෙල් ද, 13 සරුබ්බාබෙල්ට දාව අබියුද් ද,
අබියුද්ට දාව එලියාකිම් ද, එලියාකිම්ට දාව ආශෝර්
ද, 14 ආශෝර්ට දාව සාදොක් ද, සාදොක්ට දාව
ආකීම් ද, ආකීම්ට දාව එලියුද් ද, 15 එලියුද්ට දාව
එලයොසර් ද, එලයොසර්ට දාව මත්තාන් ද,
මත්තාන්ට දාව ජාකොබ් ද, 16 ජාකොබ්ට දාව මරිය
තුමීගේ පුරුෂයා වූ ජෝසෙප් ද උපන්නෝ ය; මරිය
තුමීගනේ ක්‍රිස්තුස් නම් වූ ජේසුස් වහන්සේ උපන්
සේක.
17 මෙසේ ආබ්‍රහම් පටන් දාවිත් දක්වා පරම්පරා
සියල්ල දස සතරකි; දාවිත් පටන් බබිලෝනියේ
විප්‍රවාසගතවීම දක්වා පරම්පරා දස සතරකි;
බබිලෝනියේ විප්‍රවාසගතවීමේ කාලයේ පටන්
ක්‍රිස්තුන් වහන්සේ දක්වා පරම්පරා දස සතරකි.

### ජේසුස් වහන්සේගේ උපත
(ලූක් 2:1-7)

18 ලූක් 1:27 ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ උපත
සිදුවූයේ මෙසේ ය. උන් වහන්සේගේ මෑණියන් වූ
මරිය තුමී ජෝසෙප් හා විවාහ ගිවිසගනෙ සිටිය දී,
ඔවුන් එක් වන්න පෙර, ශුද්ධාත්මයාණන් අනුහසින්
ඈ ගැබ්ගනෙ සිටින බව දැනගන්නා ලදී.
19 ඇගේ ස්වාමි පුරුෂයා වන ජෝසෙප්, සත්
පුරුෂයකු වූ බැවින් ඇය ප්‍රසිද්ධියේ නින්දාවට
නොපමුණුවන අදහසින්, රහසින් ඇය අත්හැරදමන්න
සිතාගත්තේ ය. 20 එහෙත්, ඔහු මේ කාරණය ගැන
කල්පනා කරමින් සිටිය දී, සමිඳාණන් වහන්සේගේ
දූතයකේ සිහිනයකින් ඔහුට දර්ශනය වී, “දාවිත්ගේ
පුත් ජෝසෙප්, ඔබේ බිරිඳ වන මරියා පාවාගන්නට
බිය නොවන්න; මන්ද, ඈ ගැබ්ගනෙ ඇත්තේ
ශුද්ධාත්මයාණන් අනුහසින්. 21 ලූක් 1:31ඈ පුතකු
බිහි කරන්නී ය; උන් වහන්සේට ජේසුස් යන නාමය
තැබිය යුතු ය; මන්ද, සිය සෙනඟ ඔවුන්ගේ
පාපවලින් මුදාලන්නේ එතුමාණෝ ය”යි කී ය.
22 මේ සියල්ල සිදුවූයේ සමිඳාණන් වහන්සේ
දිවැසිවරයා ලවා කියවූ කීම ඉටු වන පිණිස ය.
එනම්:
23 යෙසා 7:14 “මනේන, කන්‍යාවක් ගැබ්ගනෙ
පුතකු බිහි කරන්නී ය;
23 උන් වහන්සේට එම්මානුවලේ යන නාමය තබනු
ඇත,”
23 යනු ය. ඒ නාමයේ අර්ථය නම්, “දවේයන්
වහන්සේ අප සමඟ ය” යනුයි.
24 ජෝසෙප් නින්දනේ අවදි වූ විට සමිඳාණන්
වහන්සේගේ දූතයා ඔහුට අණ කළ ලෙස, සිය බිරිඳ
කැන්දාගනෙ ගියේ ය. 25 ලූක් 2:21එහෙත්, ඇයට
පුත්‍රයා ලැබනෙ තුරු ඔහු ඇය සමඟ එක් නො වී
ය. ඔහු උන් වහන්සේට ජේසුස් යන නාමය තැබී ය.

### ශාස්ත්‍රවන්තයන්ගේ පැමිණීම

2 හෙරොද් රජු දවස ජූදයේ බෙත්ලෙහෙමෙහි
ජේසුස් වහන්සේ උපන් කල, පෙරදිගින්
ශාස්ත්‍රවන්තයෝ ජෙරුසලමට අවුත්,
2 “ජුදෙව්වරුන්ට රජ ව උපන් උතුමාණෝ කොතැන්හි
ද? අපි එතුමාණන්ගේ තාරකාව පෙරදිග දී දැක,
එතුමාණන්ට නමස්කාර කරන පිණිස ආවමු”යි කී
හ.

3 එපවත් ඇසූ හරොෙද් රජ ද මුළු ජරෙුසලම්
ජනතාව ද කැළඹුණාහ. 4 එකල ඔහු සනෙඟගේ
සියලු නායක පූජකයන් ද විනයධරයන් ද රැස්
කරවා, “ක්රිස්තුන් වහන්සේ කාෙතැන්හි උපදින
සේක් දැ”යි ඔවුන්ගනේ විචාළේ ය. 5 ඔව්හු කතා
කාෙට, “ජුදයේ බතේලහෙමෙහි ය; ඒ ගැන
දිවැසිවරයා මසෙේ ලියා තිබේ;
6 මීකා 5:2 ‘එම්බා, ජුදා දේශයේ බතේලහෙමෙ!
q2[6] තී ජුදාගේ භූපතීන් අතර කිසි සේත් අල්ප
නාොවන්නී ය.
q2[6] මන්ද;
q2[6] මාගේ ඉශ්රායලේ සනෙඟ පාලනය කරන
මූලිකයකෙු තී කරෙනේ නික්මනෙු ඇතැ’ “යි
6 ඔහුට කී හ.
7 එකල හරොෙද් ශාස්ත්රවන්තයන් රහසින්
කැඳවා, තාරකාව පනෙුණු වේලාව ඔවුන්ගනේ
හාොඳින් දැනගනෙ, 8 “ඔබ ගාොස් ඒ ළදරුවා ගැන
හරි ලසෙ විමසන්න; ඔබ විමසා සාොයාගත් පසු,
මාත් ගාොස් උන් වහන්සේට නමස්කාර කරනු පිණිස
මටත් දන්වන්න” කියා, ඔවුන් බතේලහෙමෙට යැවී
ය. 9 රජුගේ බස් අසා ඔව්හු පිටත් ව ගියහ.
පරෙදිග දී ඔවුන් දුටු තාරකාව, ළදරුවා සිටි තැනට
අවුත් ඉහළින් නවතින තුරු, ඔවුන්ට පරෙටුවනේ
ගියේ ය. 10 තාරකාව දැක ඔව්හු අතිශයින් ප්රීති
ප්රමාොද වූ හ. 11 ඔව්හු ගටෙ පිවිස, ළදරුවා සිය
මව වූ මරිය තුමී හා සමඟ සිටිනු දැක, පසඟ
පිහිටුවා වැඳ, සිය කරඬු ඇර රන් ද, තුවරලා ද,
ගන්ධරස ද යන පඬුරු උන් වහන්සේට පිදූ හ.
12 තවද, හරොෙද් වතෙ ආපසු නාොයන ලසෙ
සිහිනයකින් දන්වනු ලැබූ ඔව්හු අන් මඟකින් සිය
රට බලා ගියහ.

### මිසරයට පලා යාම

13 ඔවුන් ගිය පසු සමිඳාණන් වහන්සේගේ
දූතයකේ සිහිනයකින් ජාොසපේට දර්ශනය වී, ඔහු
අමතා, “නැඟිට ළදරුවා ද උන් වහන්සේගේ
මෑණියන් ද රුගනෙ මිසරයට ගාොස්, මා දන්වන තුරු
එහි නවතින්න. මන්ද, හරොෙද් රජ ළදරුවා
මරාදැමීමට සාොයති”යි කී ය. 14 ඔහු රාත්රියෙහි
නැඟිට ළදරුවා ද උන් වහන්සේගේ මෑණියන් ද
රුගනෙ මිසරයට ගාොස්, 15 හාොසි 11:1හරොෙද්ගේ
මරණය දක්වා එහි සිටියේ ය. මසෙේ වූයේ,
15 “මිසරයනේ මාගේ පුත්රයා කැඳවාගතිමි”යි කියා
සමිඳාණන් වහන්සේ විසින් දිවැසිවරයා
කරණකාොටගනෙ කියන ලද කීම ඉටු වනු පිණිස ය.

### ළදරු ඝාතනය

16 එකල හරොෙද් තමෙේ ශාස්ත්රවන්තයන් විසින්
තමා රවටනු ලැබූ බව දැක, අතිශයින් උදහස් විය.
එවිට ඔහු ශාස්ත්රවන්තයන්ගනේ විමසා, හරියාකාර
දැනගත් කාලය අනුව, දෑවුරුදු වයස් වූ ද, ඊට බාල වූ
ද, බතේලහෙමෙ හා ඒ අවට මුළු පදෙසෙහි සිටි
සියලු පිරිමි දරුවන් මරාදැමීමට අණ කළේ ය.

17 එකල දිවැසිවර ජරෙමියා විසින් කියන ලද මේ
කීම ඉටු විය:
18 ජරෙ 31:15 “හැඬීමේ ද දැඩි වැලපීමේ ද හඬක්
රාමාහි ඇසිණි.
q2[18] රාකලේ ඇගේ දරුවන් ගැන අඬමින්, ඔවුන්
නැති නිසා අස්වැසිල්ලක් ලැබීමට අකමැති වූවා ය.”

### මිසරයනේ හැරී ඒම

19 හරොෙද් මියගිය පසු, සමිඳාණන් වහන්සේගේ
දූතයකේ මිසරයේ දී සිහිනයකින් ජාොසපේට
දර්ශනය වී, ඔහු අමතා, 20 “නැඟිට ළදරුවා ද
ඔහුගේ මෑණියන් ද රුගනෙ ඉශ්රායලේ දේශයට
යන්න; ළදරුවාගේ ජීවිතය නසන්න තැත් කළ අය
මළහ”යි කී ය. 21 එවිට ඔහු නැඟිට ළදරුවා ද උන්
වහන්සේගේ මෑණියන් ද රුගනෙ ඉශ්රායලේ
දේශයට පැමිණියේ ය. 22 එහතේ, අර්කලාෙවුස් සිය
පිය වූ හරොෙද් වනෙුවට ජුදා දේශයේ රජකම්
කරන බව අසා, ඔහු එහි යන්න බිය ව, සිහිනයකින්
දන්වනු ලැබ ගලීලයේ පදෙසේවලට ගාොස්, 23 මාක්
1:24; ලූක් 2:39; ජාොහ 1:45එහි නාසරතේ නුවර විසී
ය. මසෙේ වූයේ,
q2[23] “උන් වහන්සේ නාසරීයයකෙු”යි
23 දිවැසිවරයන් විසින් කියන ලද කීම ඉටු වන
පිණිස ය.

### ස්නාවක ජාොහන්ගේ දේශනාව

(මාක් 1:1-8;ලූක් 3:1-9-15-17;ජාොහ 1:19-28)

3 ඒ දවස්වල දී ස්නාවක ජාොහන් අවුත්, ජුදයේ
පාළුකරයෙහි දේශනා කරමින්, 2 මතෙ 4:17;
මාක් 1:15“පසුතැවී සිත් හරවා ගන්න; මන්ද, ස්වර්ග
රාජ්යය ළඟ ය”යි කී ය. 3 යසො 40:3කුමක් හයෙින්
ද යත්:
q2[3] “ ‘ සමිඳුන්ගේ මාවත පිළියළෙ කරන්න;
q2[3] එතුමන් හට ඇද නැති මාවත් සාදන්නැ’යි
පාළුකරයෙහි මාොරගා කියන හඬක් ය”යි,
3 දිවැසිවර යසොයා පැවසුවේ මාොහු ගැන ය. 4 2
රාජා 1:8මකේ ජාොහන් ඔටු ලාොම් වස්ත්රයක් ඇඳ,
ඉණ වටා හම් පටියක් බැඳ සිටියේ ය. පළඟැටියන්
හා වන මී ඔහුගේ ආහාරය විය. 5 එකල
ජරෙුසලමේ ද මුළු ජුදයේ ද ජාොර්දාන් අවට මුළු
පදෙසෙේ ද වැසියාෙ ඔහු වතෙ පැමිණ,
6 පාපාොච්චාරණය කරමින්, ජාොර්දාන් ගංගාවෙහි
ඔහු අතින් බව්තීස්ම-ස්නාපනයලැබූ හ.
7 මතෙ 12:34; 23:33 එහතේ, බව්තීස්ම-ස්නාපනය
ලබන පිණිස පරිසිවරුන්ගනේ ද සද්දූසිවරුන්ගනේ ද
බාොහාෙ දනෙකෙු එනු දුටු ඔහු ඔවුන්ට කතා කාෙට,
“පාොළාොං වංශය, එන්න තිබනෙ උදහසින් පලා
යාමට ඔබට අවවාද කළේ කවරකේ ද? 8 එසේ
නම්, ඔබ පසුතැවී සිත් හරවා ගත් බව ඔබේ
හැසිරීමනේ පනේවන්න. 9 ජාොහ 8:33‘ආබ්රහම්
අපගේ පියාණාෙ ය’යි කියාගන්නට නාොසිතන්න. ඒ
මන්ද, මේ ගල්වලින් වුව ද ආබ්රහම්ට දරුපරපුරක්
උපදවා දනේන දවෙියන් වහන්සේට පුළුවනැ යි මම

ඔබට කියමි. 10 මතෙ 7:19තවද, දැනට ම පොරොව
ගස් මුල්වලට තබා තිබේ. එබැවින් හොඳ පල
නොදෙන සියලු ගස් කපා ගින්නහි දමනු ලැබේ.
11 මම නම්, පසුතැවී සිත හරවා ගැනීමේ ලකුණක්
වශයෙන් වතුරෙන් බව්තීස්ම-ස්නාපනය කරමි.
එහෙත්, මට පසුව එන තැනැත්තේ මට වඩා
ආනුභාසම්පන්න ය. මම උන් වහන්සේගේ පාවහන්
ගෙන යාමට තරම් වත් නොවටිමි. උන් වහන්සේ
ශුද්ධාත්මයාණන්ගෙන් ද ගින්නෙන් ද ඔබ බව්තීස්ම-
ස්නාපනය කරන සේක. 12 උන් වහන්සේගේ
අතෙහි කුල්ල ඇත. උන් වහන්සේ සිය කමත හොඳ
හැටි පිරිසිදු කර, ධාන්‍ය අටුවල රුස් කොට, බොල්
නොනිවෙන ගින්නෙන් දවන සේකැ"යි කී ය.

### ජේසුස් වහන්සේගේ බව්තීස්ම-ස්නාපනය

(මාක් 1:9-11;ලූක් 3:21-22)

13 එකල ජේසුස් වහන්සේ ස්නාවක ජොහන්
විසින් බව්තීස්ම-ස්නාපනය කරගනු ලබන පිණිස
ගලීලයේ සිට ජොර්දානට වැඩම කළ සේක.
14 එහෙත්, ජොහන් උන් වහන්සේ වළක්වමින්,
"ඔබෙන් බව්තීස්ම-ස්නාපනය ලැබිය යුත්තේ මම ය;
එහෙත්, ඔබ මා වෙත එන සේක් දැ"යි ඇසී ය.
15 ජේසුස් වහන්සේ ඔහුට උත්තර දෙමින්, "දැනට
ඉඩ දෙන්න; මෙසේ දේව කැමැත්ත මුළුමනින් ඉටු
කිරීම අපට සුදුසු ය"යි වදාළ සේක. එවිට ජොහන්
ඊට එකඟ විය. 16 ජේසුස් වහන්සේ බව්තීස්ම-
ස්නාපනය ලැබ, එකෙණෙහි ම දියෙන් ගොඩ ආ
සේක. එවිට ස්වර්ගය විවර විය. දෙවියන්
වහන්සේගේ ආත්මයාණන් පරෙවියෙකු මෙන්
බසිමින් තමන් පිට පැමිණෙනු උන් වහන්සේ දුටු
සේක. 17 උත් 22:2; ගීතා 2:7; යෙසා 42:1; මතෙ
12:18; 17:5; මාක් 1:11; ලූක් 9:35තවද, "මොහු
මාගේ ප්‍රියාදර පුත්‍රයා ය; මොහු කෙරේ මම ඉතා
ප්‍රසන්න වී සිටිමි"යි ස්වර්ගයෙන් හඬක් නික්මිණි.

### ජේසුස් වහන්සේ පරීක්ෂා කරනු ලැබීම

(මාක් 1:12-13;ලූක් 4:1-13)

4 හෙබ්‍රෙ 2:18; 4:15 එකල ජේසුස් වහන්සේ
යක්ෂයා විසින් පරීක්ෂා කරනු ලබන පිණිස
ශුද්ධාත්මයාණන් විසින් පාළුකරයට පමුණුවනු ලැබූ
සේක. 2 දහවල් සතළිසක් ද රෑ සතළිසක් ද
නිරාහාර ව උන් පසු, උන් වහන්සේට සාගිනි ඇති
විය. 3 එවිට පරීක්ෂාකාරයා උන් වහන්සේ වෙත
අවුත්, "ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් මේ
ගල් ගඩේ, පාන් ගඩේ වන්න අණ කළ මැනවැ"යි කී
ය. 4 ද්වි.නී. 8:3උන් වහන්සේ උත්තර දෙමින්,
4 " 'මිනිසා ජීවත් වන්නේ කෑමෙන් පමණක් නොව;
4 දෙවියන් වහන්සේගේ මුවින් නික්මෙන සියලු
වචන වලින් ය'
4 කියා ලියා ඇතැ"යි වදාළ සේක.

5 එවිට යක්ෂයා උන් වහන්සේ ශුද්ධ නුවරට
පමුණුවා දේව මාලිගාවේ කොත මුදුනේ සිටුවා,
6 ගීතා 91:11-12"ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා
නම්, පහතට පනින්න;
q26 'උන් වහන්සේ සිය දූතයන්ට ඔබ ගැන අණ
දෙනු ඇත.
q26 ඔබේ පය කිසිසේත් ගලක නොවදින පිණිස,
ඔව්හු සිය අත්වලින් ඔබ උසුලනු ඇතැ'යි
6 ලියා තිබේ ය"යි උන් වහන්සේට කී ය. 7 ද්වි.නී.
6:16ජේසුස් වහන්සේ ද කතා කොට, " 'තාගේ දෙවි
ස්වාමීන් වහන්සේ පරීක්ෂා නොකරන්න' කියාත්
ලියා ඇතැ"යි වදාළ සේක.
8 යළිත් යක්ෂයා උන් වහන්සේ ඉතා උස් කන්දකට
පමුණුවා, ලෝකයේ සියලු රට රාජ්‍යයන් සහ
ඒවායේ යසශ්‍රිය උන් වහන්සේට පෙන්වා, 9 "ඔබ
දණින් වැටී මට නමස්කාර කරන්නෙහි නම්, මේ
සියල්ල ඔබට දෙන්නෙමි"යි උන් වහන්සේට කී ය.
10 ද්වි.නී. 6:13එවිට ජේසුස් වහන්සේ, කතා
කරමින්, "සාතන් පලා යව!
q210 'නුඹේ දෙවි ස්වාමීන් වහන්සේට නමස්කාර
කරන්න;
q210 උන් වහන්සේට පමණක් සේවය කරන්න'
10 කියා ලියා ඇතැ"යි ඔහුට වදාළ සේක.
11 එකල යක්ෂයා උන් වහන්සේ අත්හැර ගියේ ය.
දේව දූතයෝ අවුත් උන් වහන්සේට උපස්ථාන
කළහ.

### ගලීලයේ සේවය ඇරඹීම

(මාක් 1:14-15;ලූක් 4:14-15)

12 මතෙ 14:3; මාක් 6:17; ලූක් 3:19-20 ජොහන්
හිරභාරයට ගනු ලැබූ බව අසා, ජේසුස් වහන්සේ
ගලීලයට වැඩම කළ සේක. 13 ජොහ 2:12උන්
වහන්සේ නාසරතේ නුවර හැර සාබුලොන් සහ
නප්තලී පෙදෙසෙහි මුහුදුබඩ පිහිටි කපර්ණවුමට
පැමිණ එහි විසූ සේක. 14 මෙසේ කළේ, යෙසායා
දිවැසිවරයා මඟින් කියන ලද දේ ඉටුවන පිණිස ය.
එනම්:
15 යෙසා 9:1-2 "ජොර්දානෙන් එතෙරෙ මුහුදු
මාවතෙහි පිහිටි, එම්බා!
q215 සාබුලොන් රට, නප්තලී රට, විජාතීන්ගේ
ගලීලය!
16 ගනඳුරෙහි කල් යැවූ සෙනෙඟ මහත් එළියක්
දුටහ.
q216 මරණ අඳුර ඇති දේශයෙහි වසෙන්නෙවුන්ට
එළිය උදාවිය"
16 යනු යි. 17 මතෙ 3:2එවක් පටන් ජේසුස්
වහන්සේ, "පසුතැවී සිත් හරවා ගන්න; ස්වර්ග
රාජ්‍යය ආසන්න ය" කියා දේශනා කරන්න පටන්ගත්
සේක.

### ධීවරයන් සතර දනො කැඳවීම
(මාක් 1:16-20;ලූක් 5:1-11)

18 උන් වහන්සේ ගලීලයේ මුහුදුබඩ ඇවිදින විට,
ධීවර සහෝදරයන් දදෙනෙකු වන පේ්දුරු නම් ලත්
සීමොන් ද ඔහුගේ සහොහොයුරු ඇන්ඩෘ ද මුහුදේ
දැළක් හළෙනු දැක, 19 “මා අනුව එන්න; මම ඔබ
මිනිසුන් දිනාගන්නන් කරමි”යි වදාළ සේක.
20 එකණෙහි ම ඔව්හු දැල් හැරදමා උන් වහන්සේ
අනුව ගියහ.
21 උන් වහන්සේ එතැනින් ගොස් තවත්
සහෝදරයන් දදෙනෙකු වන සබෙදීගේ පුත්
ජාකොබ් ද ඔහු සහොහොයුරු ජොහන් ද ඔවුන්ගේ
පියා වන සබෙදී සමඟ ඔරුවේ හිඳ දැල් එලලනු
දැක, ඔවුන් කැඳවා වදාළ සේක. 22 එකණෙහි ම
ඔව්හු ඔරුව ද පියා ද අත්හැර උන් වහන්සේ අනුව
ගියහ.

### මහා ජනකායකට සුව සතෙ
(ලූක් 6:17-19)

23 මතෙ 9:35; මාක් 1:39 තවද, ජේසුස් වහන්සේ
ඔවුන්ගේ ධර්මශාලාවල අනුශාසනා කරමින් ද
රාජ්‍යය පිළිබඳ සුබ අස්න දේශනා කරමින් ද
සනෙඟ අතර සියලු ආකාර ලඩෙ රෝග සුව කරමින්
ද ගලීලය පුරා සැරිසැරූ සේක. 24 උන් වහන්සේගේ
කීර්ති රාවය සිරියාව පුරා පැතිරිණි. නානා රෝග
පීඩාවලින් පළෙණු සියලු රෝගීහු ද දුෂ්ටාත්මාවේශ
වූ අය ද මීමැස්මොර රෝගීහු ද අංසබාග රෝගීහු ද
උන් වහන්සේ වතෙ ගනෙනෙ ලද්දෝ ය. උන්
වහන්සේ ඔවුන් සුවපත් කළ සේක. 25 ගලීලයනේ ද
දකෙපොලිසයනේ ද ජරුසලමනේ ද ජුදයනේ ද
ජොර්දාන් ගඟ එගොඩින් ද මහා ජනකායක් උන්
වහන්සේ පසුපස්සේ ගියහ.

### මංගල වාක්‍ය
(ලූක් 6:20-23)

5 ජේසුස් වහන්සේ ජනකාය දැක කන්දකට
නැඟුණු සේක. උන් වහන්සේ වැඩහුන් කල
ශ්‍රාවකයෝ උන් වහන්සේ වතෙ ආහ. 2 එවිට උන්
වහන්සේ ඔවුන්ට උගන්වමින් මසෙේ වදාළ සේක:
3 “බැගෑ සිතින් දවේ සරණ පතන්නෝ
භාග්‍යවන්තයෝ ය;
q2[3] ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය.
4 යසො 61:2 ශෝක වන්නෝ භාග්‍යවන්තයෝ ය;
q2[4] ඔව්හු සැනසීම ලබන්නෝ ය.
5 ගීතා 37:11 නිහතමානී ගුණ ඇත්තෝ
භාග්‍යවන්තයෝ ය;
q2[5] ඔව්හු දේශය උරුම කර ගන්නෝ ය.
6 යසො 55:1-2 යුක්තියට සාපිපාසා ඇත්තෝ
භාග්‍යවන්තයෝ ය;
q2[6] ඔව්හු තෘප්තිමත් වන්නෝ ය;
7 දයාවන්තයෝ භාග්‍යවන්තයෝ ය;
q2[7] ඔව්හු දයාව ලබන්නෝ ය.
8 ගීතා 24:3-4 නිර්මල සිත් ඇත්තෝ
භාග්‍යවන්තයෝ ය;
q2[8] ඔව්හු දවේයන් වහන්සේ දකින්නෝ ය.
9 සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝ ය;
q2[9] ඔව්හු දවේයන් වහන්සේගේ පුත්‍රයෝ ය යි
කියනු ලබන්නෝ ය.
10 1 පේ්දු 3:14 යුක්තිය උදසො පීඩා විඳින්නෝ
භාග්‍යවන්තයෝ ය;
q2[10] ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය;
11 1 පේ්දු 4:14 මිනිසුන් මා නිසා ඔබට නින්දා පීඩා
කොට, නානා විධ අසත්‍ය චෝදනා නඟන කල ඔබ
භාග්‍යවන්තයෝ ය;
12 2 වංශා 36:16; ක්‍රියා 7:52 ප්‍රීති ප්‍රමෝද
වන්න;
q2[12] මන්ද, ස්වර්ගයහෙි ඔබේ පලවිපාකය ඉමහත්
ය.
q2[12] ඔබට පරෙ සිටි දිවැසිවරයන්ටත් ඔව්හු එලසෙ
ම පීඩා කළහ.”

### පොළොවේ ලුණු සහ ලෝකයේ ආලෝකය
(මාක් 9:50;ලූක් 14:34-35)

13 මාක් 9:50; ලූක් 14:34-35 “ඔබ පොළොවේ
ලුණු ය. ලුණහෙි ලුණු ගතිය නැති වුවහොත්, එයට
ලුණු රස කවන්නේ කුමකින් ද? ඉන්පසු ඒවා ඉවත
දමනු ලබන්නට ද, මිනිසුන්ගේ පයින් පාගනු
ලබන්නට ද මිස, අන් කිසිවකට සුදුසු නැත.
14 ජොහ 8:12; 9:5 “ඔබ ලෝකයේ ආලෝකය ය.
කන්දක් මත පිහිටි නුවරක් සැඟවිය නොහැකි ය.
15 මාක් 4:21; ලූක් 8:16; 11:33මිනිස්සු පහනක් දල්වා
එය බඳුනක් යට නොව පහන් රුකක් මත තබති;
එවිට එය ගදෙර වැසි සියල්ලන්ට එළිය දයෙි. 16 1
පේ්දු 2:12එමනෙේම මිනිසුන් ඔබේ යහපත් ක්‍රියා
දැක ස්වර්ගයහෙි වැඩ වසන ඔබේ පියාණන්
වහන්සේට ප්‍රශංසා කරන පිණිස, ඔබේ ආලෝකය
ඔවුන් ඉදිරියහෙි බබළවන්න.”

### ව්‍යවස්ථාවලිය පිළිබඳ ඉගැන්වීම්

17 “මම ව්‍යවස්ථාවලිය හා දිවැසාවලිය අවලංගු
කරන පිණිස ආවමි යි නොසිතන්න. මා ආයේ,
ඒවා අවලංගු කිරීමට නොව, සම්පූර්ණ කිරීමට ය.
18 ලූක් 16:17සැබැවින් ම මම ඔබට කියමි, අහස හා
පොළොව පහ ව ගියත්, සියල්ල පරිපූර්ණ වන තුරු,
ව්‍යවස්ථාවලියනේ ඉස්පිල්ලක් වත් පාපිල්ලක් වත්
පහ වී නොයන්නේ ම ය. 19 එබැවින් මේ
ආඥාවලින් ඉතා සුළු එකක් වත් කඩ කරන හා කඩ
කරන ලසෙ මිනිසුන්ට උගන්වන කවරකු වුව ද,
ඔහු ස්වර්ග රාජ්‍යයහෙි ඉතා සුළු ය යි කියනු
ලබන්නේ ය. එහතේ, ඒවා පිළිපදින, ඒවා උගන්වන
කවරකු වුව ද, ඔහු ස්වර්ග රාජ්‍යයහෙි උතුම් ය යි
කියනු ලබන්නේ ය. 20 මන්ද, ඔබ ධර්මිෂ්ඨකමින්
විනයධරයන් ද පරිසිවරුන් ද ඉක්මවා නොගියොත්,
ඔබ කිසි සේත් ස්වර්ග රාජ්‍යයට නොපිවිසනේනහු
ය යි ඔබට කියමි.”

### කෝපය පිළිබඳ ඉගැන්වීම්

21 නික්ම 20:13; ද්වි.නී. 5:17 “ ‘මිනී නොමරන්න;
මිනී මරන කවරකු වුව ද විනිශ්චයට යටත් වනු
ඇතැ’යි පැරැන්නන්ට කී බව ඔබ අසා ඇත.
22 එහෙත්, මම ඔබට කියමි, තමාගේ සහෝදරයා
සමඟකෝප වන කවරකු වුව ද ඔහු අධිකරණයට
යටත් වනු ඇත. තමාගේ සහෝදරයාට ‘මෝඩයා’
කියා ගරහන කවරකු වුව ද ඔහු
ශ්‍රේෂ්ඨාධිකරණයට යටත් වනු ඇත; ‘ජඩයා’ කියා
ගරහන කවරකු වුව ද ඔහු නිරා ගින්නට ගොදුරු
වනු ඇත. 23 එබැවින් ඔබ පූජාසනය වෙත පඬුරක්
ගෙනෙන කල, ඔබේ සහෝදරයා ඔබට විරුද්ධ ව
යම් කිසි අමනාපයක් ඇති ව සිටින බව එහි දී සිහි
වී නම්, 24 පඬුර පූජාසනය ඉදිරියෙහි තබා ගොස්,
පළමුකොට සහෝදරයා හා සමගි වී, පසුව අවුත්
පඬුර පුදන්න.
25 “ඔබේ විරුද්ධකාරයා සමඟ උසාවියට යන කල,
මඟ දී ම ඉක්මනින් ඔහු හා සමගි වන්න; නැත්නම්
විරුද්ධකාරයා ඔබ නඩුකාරයාට භාර දෙන්නේ ය;
නඩුකාරයා ඔබ උසාවියේ නිලධාරියාට භාර දෙන්නේ
ය; ඔබ ද හිරගෙයි දමනු ලබන්නහෙි ය. 26 සැබැවින්
ම මම ඔබට කියමි, අන්තිම සතයට ම දඩය ගෙවෙන
තෙක් ඔබ කිසි සේත් එයින් පිට වී නොයන්නහෙි
ය.”

### කාමමිථ්‍යාචාරය පිළිබඳ ඉගැන්වීම්

27 නික්ම 20:14; ද්වි.නී. 5:18 “ ‘ කාමමිථ්‍යාචාරය
නොකරන්නැ’යි කී බව ඔබ අසා ඇත. 28 එහෙත්,
මම ඔබට කියමි, යමකු ස්ත්‍රියක දෙස
කාමරාගයෙන් බැලූ කණෙහි ම ඔහු ඈ සමඟ
සිතින් කාමමිථ්‍යාචාරය කර ඇත. 29 මතෙ 18:9;
මාක් 9:47වරදට වැටීමට හේතුව ඔබේ දකුණැස
නම්, එය උගුලා ඉවත ලන්න; මුළු ශරීරය නිරයෙහි
හෙළෙනු ලැබීමට වඩා ඔබේ අවයවවලින් එකක්
නැති වීම ඔබට යහපත.
30 මතෙ 18:8; මාක් 9:43 වරදට වැටීමට හේතුව
ඔබේ දකුණත නම්, එය කපා දමන්න; මුළු ශරීරය
නිරාගත වීමට වඩා ඔබේ අවයවවලින් එකක් නැති
වීම ඔබට යහපත.

### දික්කසාදය පිළිබඳ ඉගැන්වීම්

(මතෙ 19:9;මාක් 10:11-12;ලූක් 16:18)

31 ද්වි.නී. 24:1-4; මතෙ 19:7; මාක් 10:4 “තවද,
‘තමාගේ භාර්යාව දික්කසාද කරන කවරකු වුව ද
ඇයට දික්කසාද සහතිකයක් දිය යුතු ය’යි කියා
ඇත. 32 මතෙ 19:9; මාක් 10:11-12; ලූක් 16:18; 1
කොරි 7:10-11එහෙත්, මම ඔබට කියමි, වේශ්‍යාකම
හැර අන් කරුණක් නිසා සිය භාර්යාව දික්කසාද
කරන කවරකු වුව ද ඔහු ඇය කාමමිථ්‍යාචාරයට
පමුණු වන්නේ ය. එසේ දික්කසාද කරනු ලැබූ ඇය
විවාහ කරගන්න යමකේ වේ ද, ඔහුත්
කාමමිථ්‍යාචාරය කරන්නේ ය.”

### දිවුරුම් පිළිබඳ ඉගැන්වීම්

33 ලෙවී 19:12; ගණන් 30:2; ද්වි.නී. 23:21 “ ‘
දිවුරුම් කඩ නොකරන්න, සමිඳාණන් වහන්සේට නුඹ
දුන් දිවුරුම ඉටු කරන්නැ’යි පැරැන්නන්ට කී බව ඔබ
අසා ඇත. 34 ජාකො 5:12; යෙසා 66:1; මතෙ
23:22එහෙත්, මම ඔබට කියමි, කොහෙත් ම
නොදිවුරන්න. ස්වර්ගය දෙවියන් වහන්සේගේ
සිංහාසනය බැවින් ඒ නමින් වත්, 35 යෙසා 66:1;
ගීතා 48:2පොළොව දෙවියන් වහන්සේගේ පා පුටුව
බැවින් ඒ නමින් වත්, ජෙරුසලම මහ රජුගේ
රාජධානිය බැවින් ඒ නමින් වත් නොදිවුරන්න.
36 එක හිස කෙසෙක් සුදු කරගන්න හෝ කළු
කරගන්න හෝ ඔබට නුපුළුවන් බැවින් හිස නමින්
වත් නොදිවුරන්න. 37 ඔබේ අදහස ‘එසේ ය’ කීම
නම්, ‘එසේ ය’ කියා ද, ‘නැත’ කීම නම්, ‘නැත’ කියා
ද වේ වා. ඊට වැඩිමනත් යමක් ඇද්ද, එය එන්නේ
නපුරාගෙනේ ය.”

### පළිගැනීම පිළිබඳ ඉගැන්වීම්

(ලූක් 6:29-30)

38 නික්ම 21:24; ලෙවී 24:20; ද්වි.නී. 19:21 “ ‘ඇසට
ඇස ය, දතට දත ය’ යන කීම ඔබ අසා ඇත.
39 එහෙත්, මම ඔබට කියමි, එදිරිකාරයාට විරුද්ධ ව
එකට එක නොකරන්න. යමකු ඔබේ දකුණු
කම්මුලට ගැසුවොත්, ඔහුට අනික් කම්මුල ද
හරවන්න. 40 යමකු නඩු කියා ඔබේ කමිසය ගන්න
කැමැති වුවොත්, ඔහුට ඔබේ කබායත් ගන්න
අවසර දෙන්න.
41 හේවා නිලධාරියකු තම බඩු පොදිය එක
කිලෝමීටරයක් දුර උසුලාගෙන යන්න ඔබට බල
කළොත්, ඔහු සමඟ එය කිලෝමීටර් දෙකෙක්
උසුලාගෙන යන්න. 42 ඔබෙන් ඉල්ලන්නාට දෙන්න;
ඔබෙන් ණයට ගන්න කැමැති අයට පිටු නොපාන්න.”

### සතුරන් කෙරෙහි මෙත් සිත් වැඩීම

(ලූක් 6:27-28,32-36)

43 ලෙවී 19:18 “ ‘නුඹේ අසල්වැසියාට ප්‍රේම
කරන්න, සතුරාට වෛර කරන්නැ’යි කී බව ඔබ අසා
ඇත. 44 එහෙත් මම ඔබට කියමි, ඔබේ සතුරන්ට
ප්‍රේම කරන්න; ඔබට පීඩා කරන්නන් උදෙසා
යාච්ඤා කරන්න. 45 මෙසේ ඔබ ස්වර්ගයෙහි වැඩ
සිටින ඔබේ පියාණන් වහන්සේගේ පුත්‍රයෝ
වන්නහු ය. කුමක් නිසා ද, උන් වහන්සේ දුදනන්
හට හා සුදනන් හට තම හිරු එළිය උදා කරවන
සේක; දැමිටුන් හට හා අදැමිටුන් හට වැසි වස්වන
සේක. 46 ඔබට ප්‍රේම කරන්නන්ට පමණක් ඔබ
ප්‍රේම කරන්නහු නම්, එයින් ඇති විපාකය කුමක්
ද? අයකැමියෝ පවා එසේ නොකරත් ද? 47 ඔබේ
සහෝදරයන්ට පමණක් ඔබ ආචාර කරන්නහු නම්,
එහි ඇති විශේෂය කුමක් ද? විජාතිකයෝ පවා
එසේ නොකරත් ද? 48 ලෙවී 19:2; ද්වි.නී.
18:13එබැවින් ඔබේ ස්වර්ගීය පියාණන් වහන්සේ

සර්ව සම්පූර්ණ ව සිටින්නාක් මෙන් ඔබ ද සර්ව
සම්පූර්ණ වන්න.”

## දන් දීම පිළිබඳ ඉගැන්වීම්

6 මතෙ 23:5 “මිනිසුන්ට පෙනෙන පිණිස
ලෝකයා ඉදිරියෙහි ඔබේ පුණ්‍ය ක්‍රියා
නොකරන්න බලාගන්න. එසේ කළහොත්,
ස්වර්ගයෙහි වැඩ වසන ඔබේ පියාණන්
වහන්සේගෙන් කිසි විපාකයක් ඔබට
නොලැබෙන්නේ ය.
2 “එබැවින් ඔබ දන් දෙන කල, මිනිසුන්ගෙන්
ප්‍රශංසා ලබන පිණිස ධර්මශාලාවල දීත්, වීථිවල
දීත් කරොටිකයන් කරන්නාක් මෙන් ඔබට
පෙරටුවෙන් හොරණෑ නොපිඹින්න. සැබැවින් ම, මම
ඔබට කියමි, ඔවුන්ගේ විපාකය ඔවුන්ට දැනට ම
ලැබී ඇත. 3 එහෙත්, ඔබ දන් දෙන කල, දකුණත
කරන දෙය වමතට නොදැනේ වා. 4 ඒ දන් දීම
රහසක් ව තිබිය යුතු ය. එවිට රහසින් එය දකින
ඔබේ පියාණන් වහන්සේ ඔබට පල විපාක දෙන
සේක.”

## යාච්ඤාව පිළිබඳ ඉගැන්වීම්
(ලූක් 11:2-4)

5 ලූක් 18:10-14 “ඔබ යාච්ඤා කරන කල
කරොටිකයන් කරන්නාක් මෙන් නොකරන්න.
මිනිසුන්ට පෙනෙන පිණිස ඔව්හු ධර්මශාලාවලත්,
මංසන්ධිවලත් සිටගෙන යාච්ඤා කිරීමට ප්‍රිය වෙති.
සැබැවින් ම මම ඔබට කියමි, ඔවුන්ගේ විපාකය
දැනට ම ඔවුන්ට ලැබී ඇත. 6 එහෙත්, ඔබ යාච්ඤා
කරන කල ඔබේ ම ඇතුළු කාමරයට වැද, දොර
වසාගෙන, අදෘශ්‍යමාන ව වසන ඔබේ පියාණන්
වහන්සේට යාච්ඤා කරන්න. එවිට රහසින් ඔබ
කරන දේ දකින ඔබේ පියාණන් වහන්සේ ඔබට
පල විපාක දෙන සේක.
7 “තවද, යාච්ඤා කිරීමේ දී විජාතීන් මෙන් දිගින්
දිගට හිස් වචන නොදොඩන්න. ඔවුන් දොඩන වචන
රාශිය නිසා, දෙවියන් වහන්සේ ඔවුන්ට කන් දෙනු
ඇතැ යි ඔව්හු සිතති. 8 ඔවුන් හා සමාන නොවන්න.
ඔබ ඉල්ලන්නටත් පෙර ඔබේ වුවමනා කවරේ දැ යි
පියාණන් වහන්සේ දන්නා සේක. 9 එහෙයින් මෙසේ
යාච්ඤා කරන්න:
q2 9 ‘ස්වර්ගයෙහි වැඩ වසන අපගේ පියාණෙනි, ඔබ
වහන්සේගේ නාමයට ගෞරව වේ වා,
10 ඔබ වහන්සේගේ රාජ්‍යය පැමිණේ වා, ඔබ
වහන්සේගේ කැමැත්ත ඉටු වේ වා, ස්වර්ගයෙහි
මෙන් පොළොවෙහි ද එසේ ම වේ වා.
11 අපගේ දවස්පතා ආහාරය අද අපට දුන මැනව.
12 අපට වරද කළ අයට අප කමා කළාක් මෙන්
අපේ වරදට අපට කමා වුව මැනව.
13 අප පරීක්ෂාවට නොපමුණුවා, නපුරාගෙන් අප
මිදුව මැනව.
14 මාක් 11:25-26 “ඔබ මිනිසුන්ට ඔවුන්ගේ වරද
කමා කරන්නහු නම්, ඔබේ ස්වර්ගීය පියාණන්
වහන්සේ ඔබටත් කමා කරන සේක. 15 එහෙත්,
ඔබ මිනිසුන්ට ඔවුන්ගේ වරදට කමා නොකරන්නහු
නම්, පියාණන් වහන්සේ ඔබේ වරදටත් කමා
නොකරන සේක.”

## උපවාසය පිළිබඳ ඉගැන්වීම්

16 “ඔබ උපවාස කරන කල කරොටිකයන් මෙන්
දොම්නස් මුහුණු ඇති ව නොසිටින්න. තමන් උපවාස
කරන බව මිනිසුන්ට පෙනෙන පිණිස ඔව්හු මුහුණු
විරූප කරගනිති. සැබැවින් ම මම ඔබට කියමි;
ඔවුන්ගේ පල විපාක දැනට ම ඔවුන්ට ලැබී ඇත.
17 එහෙත්, ඔබ උපවාස කරන කල, හිස තෙල්
ගල්වා, මුහුණ සෝදාගන්න. 18 මෙසේ, අදෘශ්‍යමාන
ව වසන ඔබේ පියාණන් වහන්සේට මිස, ඔබ
උපවාස කරන බව මිනිසුන්ට නොපෙනෙයි. එවිට
රහසින් කරන දේ දකින ඔබේ පියාණන් වහන්සේ
ඔබට පල විපාක දෙන සේක.”

## සග සම්පත්
(ලූක් 12:33-34)

19 ජාකො 5:2-3 “මෙලොව ඔබට වස්තු රැස්කර
නොගන්න. මලකඩ ද කාවෝ ද ඒවා කාදමති. සොරු
ද උමං කැණ ඒවා සොරාගනිති. 20 එහෙත්,
ස්වර්ගයෙහි ඔබට වස්තු රැස්කරගන්න. එහි දී
මලකඩ වත් කාවෝ වත් ඒවා නාස්ති නොකරති.
සොරු ද උමං කැණ ඒවා සොරා නොගනිති.
21 ඔබේ වස්තුව කොතැන ද ඔබේ සිතත් එතැන
ය.”

## සිරුරට පහන ඇස ය
(ලූක් 11:34-36;16:13)

22 “සිරුරට පහන ඇස ය. එහෙයින් ඔබේ ඇස
නීරෝගී නම්, ඔබේ මුළු සිරුර ආලෝකවත් වේ.
23 ඔබේ ඇස රෝගී නම්, ඔබේ මුළු සිරුර ම අඳුරු
වේ. ඔබ තුළ ඇති ආලෝකය අඳුරු වී ගියහොත්,
එය කෙතරම් ඝන අන්ධකාරයක් ද?

## දෙවිඳුන් ද? වස්තුව ද?

24 “ස්වාමිවරුන් දෙදෙනෙකුට මෙහෙවර කිරීමට
කිසිවකුට නුපුළුවන. මන්ද, ඔහු එක් කෙනෙකුට
වෛර බැඳ අනික් අයට ප්‍රේම වන්නේ ය.
නැතහොත්, එක් කෙනෙකුට ළැදි වී, අනික් අය
හෙළා දක්නේ ය. දෙවියන් වහන්සේට සහ වස්තුවට
සේවය කරන්න ඔබට නොහැකි ය.”

## කරදර වීම
(ලූක් 12:22-34)

25 “එහෙයින් මම ඔබට කියමි: කුමක් කමු ද,
කුමක් බොමු ද කියා ජීවිතය ගැන වත්, කුමක් අඳිමු
ද කියා ශරීරය ගැන වත් කරදර නොවන්න. කෑමට
වඩා ජීවිතය ද, ඇඳුමට වඩා ශරීරය ද අගනේ

නාොවේ ද? 26 අහසේ කුරුල්ලන් දසෙ බලන්න. උන්
වපුරන්නේ වත්, කපන්නේ වත්, අටුවල
රැස්කරන්නේ වත් නැත. එහතේ, ඔබේ ස්වර්ගීය
පියාණන් වහන්සේ උන් පෝෂණය කරන සේක.
ඔබ ඔවුන්ට වඩා බාොහාෝ වටිනවා නාොවේ ද?
27 කරදර වීමනේ තමාගේ ආයුප්රමාණය දික්
කරගන්න ඔබ අතරනේ කවරකුෙට පුළුවන් ද?
28 "ඔබ ඇඳුම් ගැන කරදර වන්නේ කුමට ද?
කතේ මානලේ වැඩනෙ හැටි කල්පනා කරන්න;
ඒවා වහෙසෙනේනේ වත්, නූල් කටින්නේ වත් නැත.
29 1 රාජා 10:4-7; 2 වංශා 9:3-6එහතේ, සියලු රාජ
තේජසින් විරාජ මාන වූ සලමාොන් වුව ද, මේ
මල්වලින් එකක් සේ සැරසී නාොසිටියේ යයි ඔබට
කියමි. 30 ඇදහිල්ල හීන තැනැත්තනෙි! අද තිබී හටෙ
උදුනේ දැවීයන කතේ තණ කාොළ දවේියන්
වහන්සේ එසේ සරසන සේක් නම්, ඊට කාොපමණ
වැඩියනේ උන් වහන්සේ ඔබ නාොසරසන සේක් ද?
31 එහයෙින් කුමක් කමු ද, කුමක් බාොමු ද, කුමක්
අඳිමු ද කියමින් කරදර නාොවන්න. 32 විජාතීන් සෑම
විට ම සාොයන්නේත් මේවා ම ය; මේවා ඔබට
ඕනෑ බව ඔබේ ස්වර්ගීය පියාණන් වහන්සේ දන්නා
සේක. 33 එහතේ, පළමු කාොට උන් වහන්සේගේ
රාජ්යය ද ධර්මිෂ්ඨකම ද සාොයන්න; එවිට මේ
සියල්ලත් ඔබට දනෙු ලැබේ. 34 එබැවින් හටෙ දවස
ගැන කරදර නාොවන්න. හටෙ දවසේ කරදර හටෙ
දවසට සෑහේ. එක දවසක කරදරවලට තව කරදර
එකතු නාොකරන්න."

### අනුන් විනිශ්චය කිරීම
(ලූක් 6:37-38-41-42)

7 "විනිශ්චය නාොකරන්න; එවිට ඔබ ද
විනිශ්චය කරනු නාොලබන්නහෙි ය. 2 මාක්
4:24ඔබ දනෙ විනිශ්චයයනේ ම ඔබත් විනිශ්චය
කරනු ලබන්නහෙි ය. ඔබ මනින මිම්මනේ ම
ඔබටත් මැන දනෙු ලැබේ. 3 ඔබේ ම ඇසේ ඇති ලී
කාොටය ගැන නාොතකා ඔබේ සහාෝදරයාගේ
ඇසේ ඇති ලී කුඩ ගැන බලන්නේ මන් ද?
4 නාොහාොත් ඔබේ ම ඇසහෙි ලී කාොටය තිබීය දී,
සහාෝදරයාට කතා කාොට, 'ඔබේ ඇසේ තිබනෙ ලී
කුඩ පහ කරන්න ඉඩ දනේනැ'යි ඔහුට කියන්නේ
කාොහාොම ද? 5 කපටිකය, පළමු කාොට ඔබේ
ඇසනේ ලී කාොටය පහ කරන්න; එවිට
සහාෝදරයාගේ ඇසනේ ලී කුඩ පහ කරන්න ඔබට
හාොඳින් පනෙනෙු ඇත.
6 "පූජනීය දේ බල්ලන්ට නාොදනේන. ඔබේ මුතු
ඇට ඌරන් ඉදිරියහෙි නාොදමන්න. එසේ කළාොත්,
උන් ඒවා පයින් පාගාදමා හැරී අවුත් ඔබ කැබලි
කාොට ඉරාදමනු ඇත."

### ඉල්ලන්න, සාොයන්න, තට්ටු කරන්න
(ලූක් 11:9-13)

7 "ඉල්ලන්න, ඔබට දනෙු ලැබේ; සාොයන්න, ඔබට
සම්බ වේ; තට්ටු කරන්න, ඔබට දාොර අරිනු ලැබේ.
8 මන්ද, ඉල්ලන්නාට ලැබේ; සාොයන්නාට සම්බ වේ;
තට්ටු කරන්නාට දාොර අරිනු ලැබේ. 9 ඔබ අතරනේ
කවර මනුෂ්යයකේ හාෝ තමාගේ පුත්රයා පාන්
ගඩේයක් ඉල්ලුවාොත් ඔහුට ගල් ගඩේයක් දයෙි ද?
10 මාළුවකුෙ ඉල්ලුවාොත්, සර්පයකුෙ දයෙි ද?
11 මසෙේ අයහපත් ඔබ, ඔබේ දරුවන්ට යහපත්
දේ දනේන දන්නහු නම්, ස්වර්ගයහෙි සිටින, ඔබේ
පියාණන් වහන්සේ තමන්ගනේ ඉල්ලන්නන්ට
යහපත් දේ ඊටත් වැඩියනේ නාොදනෙ සේක් ද?"

### රන් අණ
(ලූක් 6:31)

12 ලූක් 6:31 "අනුන් ඔබට යමක් කරනවාට ඔබ
කැමැති ද, ඔබත් ඒ දේ ම ඔවුන්ටත් කරන්න.
ව්යවස්ථාවලියේ හා දිවැසාවලියේ හරය එය වේ."

### පටු දාොරටුව
(ලූක් 13:24)

13 "පටු දාොරටුවනේ ඇතුළු වන්න. විනාශයට යන
දාොරටුව විශාල ය, පාරත් පළල් ය. එයින් ඇතුළු
වන්නාෝ ද බාොහාෝ ය. 14 එහතේ, ජීවනයට යන
දාොරටුව පටු ය; පාර ද අවහිර ය; එය
සාොයාගන්නාෝ ස්වල්ප දනෙකේ පමණකි."

### පලවලින් ගස හැඳින්වේ
(ලූක් 6:43-44)

15 "බාොරු දිවැසිවරයන්ගනේ පරසේසම් වන්න.
පිටතින් බැටළු වසේ ගනෙ පැමිණියත්, ඔව්හු
ඇතුළතින් රෞද්ර වෘකයාෝ ය. 16 ඔවුන්ගේ
ක්රියාවලින් ඔවුන් හඳුනාගත හැකි ය. මනුෂ්යයාෝ
කටු ගස්වලින් මිදි වත්, ගාොකටුවලින් අත්තික්කා
වත් නළාො ගනිත් ද? 17 හාොඳ ගස හාොඳ පල දරයි;
නරක ගස නරක පල දරයි. 18 හාොඳ ගසේ නරක
පල වත්, නරක ගසේ හාොඳ පල වත් හටගන්නේ
නැත. 19 මතෙ 3:10; ලූක් 3:9හාොඳ පල නාොදරන
සියලු ගස් කපා ගින්නට දමනු ලැබේ. 20 මතෙ
12:33"මලෙසෙ, ඔවුන්ගේ පලවලින් නුඹලා ඔවුන්
හැඳින ගන්නහු ය."

### කීම සහ කිරීම
(ලූක් 13:25-27)

21 "ස්වර්ගයහෙි වැඩ වසන මාගේ පියාණන්
වහන්සේගේ කැමැත්ත ඉටු කරන අය මිස මට,
'ස්වාමීනි, ස්වාමීනි'යි කියන සියල්ලාෝ ම ස්වර්ග
රාජ්යයට ඇතුළු නාොවන්නාෝ ය. 22 ඒ දවසේ දී
බාොහාෝ දනෙකේ, 'ස්වාමීනි, ස්වාමීනි, අපි ඔබේ
නාමයනේ දිවැස් වැකි නාොකීවමුෙ ද? ඔබේ
නාමයනේ දුෂ්ටාත්මයන් දුරු නාොකළෙමුෙ ද? ඔබේ

නාමයනේ නොයෙකේ ප්‍රබල ක්‍රියා නොකෙළෙමු
දැ’යි මට කියනු ඇත. 23 ගීතා 6:8එවිට මම, ‘කිසි
කලක ඔබ නොහැඳින්නමේ; දුදනනි, මා වෙතින්
අහක් ව යන්නැ’යි ඔවුන්ට කියන්නමේ.”

## අත්තිවාරම් දෙකෙ
(ලූක් 6:47-49)

24 “එහෙයින් යමකේ මාගේ වචන අසා, ඒවා
පිළිපදී ද, ඔහු පර්වතය මත තමාගේ ගෙයෙ තනාගත්
නැණවතකුෙට සමාන ය. 25 වැසි වැස, ජලය ගලා,
සුළඟ හමා ඒ ගෙටෙ ගැසී ය, එය පර්වතය මත
පිහිටි බැවින් බිඳ නොවැටිණි. 26 තවද, යමකේ
මාගේ මේ වචන අසා, ඒවා නොපිළිපදී ද, ඔහු වැලි
මත ගෙයෙ තනාගත් අනුවණ මනුෂ්‍යයකුෙට සමාන
ය. 27 වැසි වැස, ජලය ගලා, සුළඟ හමා ඒ ගෙටෙ
ගැසී ය, එය බිඳ වැටිණි. එහි වැටීම ද භයංකර
විය.”
28 මාක් 1:22; ලූක් 4:32 ජේසුස් වහන්සේ මේ
වචන කියා නිම කළ කල්හි, සමූහයෝ උන්
වහන්සේගේ අනුශාසනා ගැන විස්මිත වූ හ.
29 මන්ද, උන් වහන්සේ ඔවුන්ගේ විනයධරයන්
මෙනේ නොව, ආධිපත්‍යය ඇත්තකු මෙනේ ඔවුන්ට
අනුශාසනා කළ හයෙනි.

## ලාදුරු රෝගියකුෙ සුව කිරීම
(මාක් 1:40-45;ලූක් 5:12-16)

8 උන් වහන්සේ කන්දනේ බැස ආ කල මහා
ජනකායක් උන් වහන්සේ පසුපස්සේ ගියහ.
2 එකල ලාදුරු රෝගියකේ උන් වහන්සේ වෙත
අවුත්, වැඳ වැටී, “ස්වාමීනි, ඔබ කැමැති සේක් නම්,
මා පවිත්‍ර කරන්න ඔබට පුළුවනැ”යි කී ය. 3 උන්
වහන්සේ අත දිගු කොට, ඔහු පිට තබා, “මම
කැමැත්තමේ, පවිත්‍රවන්නැ”යි වදාළ සේක.
එකණෙහි ම ඔහුගේ ලාදුරු රෝගය සුව විය.
4 ලෙවී 14:1-32ජේසුස් වහන්සේ කතා කොට, “මේ
ගැන කිසිවකුෙට කිසිවක් නොකියන ලෙස වග බලා
ගන්න; එහෙතේ යන්න, පූජකයාට පනේී, මෝසසේ
අණ කළ පඬුර සහතිකයක් පිණිස ඔප්පු කරන්නැ”යි
ඔහුට වදාළ සේක.

## ශතාධිපතියාගේ සේවකයාට සුවය
(ලූක් 7:1-10;ජොහ 4:46-54)

5 උන් වහන්සේ කපර්ණවුමට ඇතුළු වූ කල එක්
ශතාධිපතියකේ උන් වහන්සේ වෙත අවුත්,
කන්නලවු කරමින්, 6 “ස්වාමීනි, මාගේ මෙහෙකරුවා
අංසබාග රෝගයනේ දැඩි වේදනා විඳිමින් ගෙයි
ඔත්පළ ව සිටී ය”යි කී ය. 7 “මම අවුත් ඔහු සුව
කරමි”යි උන් වහන්සේ ඔහුට වදාළ සේක.
8 ශතාධිපතියා උත්තර දෙමින්, “ස්වාමීනි, ඔබ මාගේ
නිවසට පැමිණීමට තරම් මම නොවටිමි. වචන
මාත්‍රයක් පැවසුව මැනව. එවිට මාගේ මෙහෙකරුවා
සුව වනු ඇත. 9 මන්ද, මම ද බලය ලත් අය යටතේ
සිටින මිනිසකේමි. මා යටතේ ද භේවායෝ සිටිති.
මා කෙනෙකුෙට, ‘යන්නැ’යි කී කල, ඔහු යන්නේ ය;
කෙනෙකුෙට, ‘එන්නැ’යි කී කල, ඔහු එන්නේ ය.
මාගේ දාසයාට, ‘මෙයෙ කරන්නැ’යි කී කල ඔහු එය
කරන්නේ ය”යි කීවේ ය. 10 ජේසුස් වහන්සේ ඒ
අසා විස්මිත ව තමා පසුපස්සේ ආ අයට කතා
කොට, “සැබැවින් ම මම ඔබට කියමි, එක ම
ඉශ්‍රායලේ මිනිසකුෙ තුළ වත් මතෙරම් මහත්
ඇදහිල්ලක් මම නුදුටිමි. 11 ලූක් 13:29තවද, ඔබට
කියමි, පරෙ අපර දෙදිගින් බොහෝ දෙනෙකේ අවුත්,
ආබ්‍රහම් ද ඊසාක් ද ජාකොබ් ද සමඟ ස්වර්ග
රාජ්‍යයෙහි අසුන් ගන්නෝ ය. 12 මතෙ 22:13; 25:30;
ලූක් 13:28එහෙතේ, රාජ්‍යයට හිමිකම් ඇත්තෝ පිටත
අන්ධකාරයෙහි හළෙනු ලබන්නෝ ය. එහි හැඬීම ද
දත්මිටි කෑම ද වන්නේ ය”යි වදාළ සේක.
13 ජේසුස් වහන්සේ ශතාධිපතියාට කතා කොට,
“යන්න, ඔබ අදහාගත් ලෙසෙ ම ඔබට වේ වා”යි
වදාළ සේක. ඒ මොහොතේ දී ම මෙහෙකරුවා
සුවපත් විය.

## බොහෝ දෙනෙකුෙ සුව කිරීම
(මාක් 1:29-34;ලූක් 4:38-41)

14 ජේසුස් වහන්සේ පේදුරුගේ ගෙටෙ ඇතුළු වූ
කල ඔහුගේ බිරිඳගේ මව උණ රෝගයනේ ඔත්පල
ව සිටිනු දැක, 15 ඇගේ අත ඇල්ලූ සේක. එවිට
උණ බැස ගියේ ය. ඈ නැඟිට උන් වහන්සේට
උපස්ථාන කළා ය.
16 සවස් වූ කල දුෂ්ටාත්මාවේශ වූ බොහෝ
දෙනෙකේ උන් වහන්සේ වෙත ගෙනෙන ලද්දෝ ය.
උන් වහන්සේ වචන මාත්‍රයකින් අශුද්ධාත්මයන් දුරු
කළ සේක; රෝගාතුර වූ සියල්ලන් සුවපත් කළ
සේක. 17 යසො 53:4මසෙේ වූයේ:
q217 “උන් වහන්සේ ම අපේ දුබලකම් දරා ගත්
සේක;
q217 අපේ රෝ දුක් බර උසුලාගත් සේකැ”යි
17 යසොයා දිවැසිවරයා විසින් කියන ලද කීම ඉටු
වන පිණිස ය.

## අනුගාමිකයන් වීමට බාධා
(ලූක් 9:57-62)

18 ජේසුස් වහන්සේ මහා ජනකායක් තමන්
පිරිවරා සිටිනු දැක මුහුදනේ එගොඩ යන්න අණ දුන්
සේක. 19 එවිට විනයධරයකේ පැමිණ,
“ගුරුදේවයෙනි, ඔබ යන කොතැනකට වුව ද ඔබ
කැටුව එන්නමේ”යි උන් වහන්සේට කී ය. 20 ජේසුස්
වහන්සේ පිළිතුරු දෙමින්, “හිවලුන්ට බෙනෙ ද අහසේ
කුරුල්ලන්ට කැදලි ද ඇත; එහෙතේ, මනුෂ්‍ය-
පුත්‍රයාණන්ට හිස තැබීමට තැනක් නැතැ”යි ඔහුට
වදාළ සේක. 21 ශ්‍රාවකයින්ගනේ තවත් කෙනෙකේ
කතා කරමින්, “ස්වාමීනි, පළමු කොට ගොස් මාගේ
පියා භූමදාන කරන්න මට අවසර දුන මැනවැ”යි කී
ය. 22 ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, “මා අනුව
එන්න; මළවුන්ගේ භූමදානය මළවුන් ම කළාවේ”යයි
ඔහුට වදාළ සේක.

## මාරුත දමනය
(මාක් 4:35-41;ලූක් 8:22-25)

23 උන් වහන්සේ ඔරුවකට නැඟුණු කල,
ශ්‍රාවකයෝ උන් වහන්සේ සමඟ ගියහ. 24 එවිට
ඔරුව රැළ පතරින් වැසී යන තරම් මහා චණ්ඩ
මාරුතයක් මුහුදේ හැමී ය. උන් වහන්සේ ඔරුවේ
සැතපී හුන් සේක. 25 එවිට ඔව්හු අවුත්, උන්
වහන්සේ අවදි කරවා, “ස්වාමීනි, අප ගැළවේව
මැනව; අප විනාශ වන්න ළඟ යැ”යි කී හ. 26 උන්
වහන්සේ ඔවුන්ට කතා කොට, “ඇදහිල්ල මඳකමක
හැටි! බිය වන්නේ මන්ද” කියා, නැඟිට, මාරුතයට
හා මුහුදට නිශ්චල වන්න අණ කළ සේක. එවිට
මහත් නිසංසලයක් විය. 27 ඒ මනුෂ්‍යයෝ විස්මිත
ව, “මතුමා කෙබඳු කෙනෙක් ද? සුළඟ හා මුහුද
පවා මතුමාට කීකරු වෙතෙ”යි කී හ.

## දුෂ්ටාත්මාවේශ වූවන්ට සුවය
(මාක් 5:1-20;ලූක් 8:26-39)

28 උන් වහන්සේ එගොඩ ව, ගදරීන රටට පැමිණි
කල, දුෂ්ටාත්මාවේශ වූ දෙදෙනෙක් සොහොන්
ගෙවලින් නික්ම විත් උන් වහන්සේට මුණ
ගැසුණාහ. ඔවුන් ඉතා දරුණු වූයෙන් ඒ පාරෙන්
කිසිවකුට යන්න නොහැකි විය.
29 ඔව්හු මොරගසමින්, “දෙවියන් වහන්සේගේ
පුත්‍රය, ඔබ හා අප අතර මොන ගනුදෙනුවක් ද?
නියමිත මොහොතට පළමුවෙන් අපට වද දෙන
පිණිස මෙහි ආ සේක් දැ”යි කී හ.
30 ඈතින් මහා ඌරු රැළක් ගොදුරුකමින් සිටියහ.
31 දුෂ්ටාත්ම කතා කරමින්, “ඔබ අප දුරු කරන
සේක් නම්, ඌරු රැළට වැහෙන්නට අප හැරිය
මැනවැ”යි උන් වහන්සේගෙන් අයැද සිටියහ.
32 “පලයව්” කියා උන් වහන්සේ ඔවුන්ට අණ කළ
සේක. එවිට දුෂ්ටාත්ම පිට වී ගොස් ඌරන්ට
වැහුණෝ ය. ඒ මුළු රැළ ප්‍රපාතයෙන් පහළ මුහුදට
වේගයෙන් දිව ගොස් ජලයේ ගිලී මළෝ ය. 33 ඌරු
ගොවුවෝ පලා ගොස් නුවරට පැමිණ ඒ සියල්ල ද
දුෂ්ටාත්මාවේශ වූවන්ට සිදුවූ දේ ද පැවසූ හ.
34 එකල ඒ මුළු නුවර වැසියෝ ජේසුස් වහන්සේ
හමු වීමට අවුත්, උන් වහන්සේ දැක, තමන්ගේ
පළාතෙන් පිට වී යන ලෙස උන් වහන්සේගෙන්
බැගෑපත් ව ඉල්ලා සිටියහ.

## අංසබාග රෝගියකු සුව කිරීම
(මාක් 2:1-12;ලූක් 5:17-26)

9 ජේසුස් වහන්සේ ඔරුවට නැඟී, එගොඩ වී,
සිය නුවරට පැමිණි සේක. 2 එවිට, අංසබාග
රෝගියෙක් උන් වහන්සේ ළඟට යහනක තබා
ගෙනෙන ලද්දේ ය. උන් වහන්සේ ඔවුන්ගේ
ඇදහිල්ල දැක, “පුත්‍රය, ධෛර්යවත් වන්න; ඔබේ
පව් කමා කරන ලද්දේ ය”යි අංසබාග රෝගියාට
වදාළ සේක. 3 එකල විනයධරයන්ගෙන් ඇතැමෙක්,
“මොහු දෙවියන් වහන්සේට අපහාස කරන්නේ ය”යි
තමන්ට ම කියාගත්හ. 4 ජේසුස් වහන්සේ
ඔවුන්ගේ සිතුවිලි දැන, “කුමක් නිසා නපුරු දේ
සිතන්නහු ද? 5 වඩා පහසු කුමක් ද? ‘ඔබේ පව්
කමා කරන ලදැ’යි කීම ද? නැතහොත්, ‘නැඟිට
ඇවිදින්නැ’යි කීම ද? 6 එහෙත්, පොළොවෙහි දී පව්
කමා කිරීමේ බලය මනුෂ්‍ය-පුත්‍රයාණන්ට තිබෙන
බව ඔබට පෙන්වා දෙමි”යි කියමින්, “නැඟිට ඔබේ
යහන රැගෙන ගෙදර යන්නැ”යි අංසබාග රෝගියාට
වදාළ සේක. 7 එවිට ඔහු නැඟිට ගෙදර ගියේ ය.
8 සමූහයා ඒ දැක බිය වී, එබඳු බලය මිනිසුන්ට දුන්
දෙවියන් වහන්සේට ප්‍රශංසා කළහ.

## මතවේ කැඳවීම
(මාක් 2:13-17;ලූක් 5:27-32)

9 ජේසුස් වහන්සේ එතැනින් යද්දී රේගු පොළේ
හුන් මතවේ නම් මිනිසකු දැක, “මා අනුව එන්නැ”යි
ඔහුට වදාළ සේක. ඔහු නැඟිට උන් වහන්සේ අනුව
ගියේ ය.
10 ලූක් 15:1-2 තවද, ජේසුස් වහන්සේ ඔහුගේ
නිවසෙහි වැඩහුන් කල, බොහෝ අයකැමියෝ ද
පව්කාරයෝ ද අවුත් උන් වහන්සේ සහ ශ්‍රාවකයන්
සමඟ හිඳගත්හ. 11 පරිසිවරු ඒ දැක, “ඔබේ ඇදුරු
තුමා අයකැමියන් ද පව්කාරයන් ද සමඟ කෑම
කන්නේ මන්දැ”යි උන් වහන්සේගේ
ශ්‍රාවකයන්ගෙන් ඇසූ හ. 12 උන් වහන්සේ ඒ අසා
ඔවුන්ට කතා කොට, “රෝගීන්ට මිස නිරෝගීන්ට
වෙදකුගෙන් වැඩක් නැත. 13 මතෙ 12:7; හොසී
6:6‘මම යාග පූජාවට නොව, දයාවට කැමැත්තෙමි’යි
යන කීමේ අර්ථය ඔබ ගොස් තේරුම්ගන්න. මා
ආයේ දැමිටුන් නොව පව්ටුන් කැඳවීමට ය”යි වදාළ
සේක.

## උපවාස ප්‍රශ්නය
(මාක් 2:18-22;ලූක් 5:33-39)

14 එකල ජොහන්ගේ ගෝලයෝ උන් වහන්සේ
වෙත අවුත්, “පරිසිවරුත්, අපිත් නිතර උපවාස කරමු.
එහෙත්, ඔබේ ශ්‍රාවකයන් උපවාස නොකරන්නේ
මන්දැ”යි ඇසූ හ. 15 ජේසුස් වහන්සේ ඔවුන්ට කතා
කොට මෙසේ වදාළ සේක: “මනාලයා තමන් සමඟ
සිටිය දී ඔහුගේ ඥාතිමිත්‍රාදීන්ට ශෝක විය හැකි
ද? නොහැකි ය. එහෙත්, මනාලයා ඔවුන් කෙරෙන්
වෙන් කරනු ලබන දවසක් පැමිණේ. ඔවුන් ඒ
දවසේ දී උපවාස කරනු ඇත.
16 “තාන් රෙදිකඩකින් පරණ වස්ත්‍රයකට
අණ්ඩයක් දමන කිසිවෙක් නැත; මන්ද, එසේ
කළොත්, අණ්ඩයට ගත් රෙදි කඩින් වස්ත්‍රය ඇදී,
ඉරුම වඩා ලොකු වේ. 17 නව මිදියුස පරණ
බඳුන්වල වත් කරන කිසිවෙක් නැත. වත් කළොත්,
බඳුන පැළී, මිදියුස ඉහිරී, බඳුනුත් නාස්ති වන්නේ ය.
එසේ නොව, ඔව්හු නව මිදියුස නව බඳුන්වල වත්
කරති; එවිට ඒ දෙක ම ආරක්ෂා වේ.”

### ධර්මශාලා ප්‍රධානියාගේ දුව: සළුවට අත ගැසූ ස්ත්‍රිය
(මාක් 5:21-43;ලූක් 8:40-56)

18 උන් වහන්සේ මේ කරුණු කියමින් සිටිය දී
එක්තරා ප්‍රධානියෙක් අවුත් උන් වහන්සේ නැමඳ,
“මාගේ දුව මේ දැන් මළා ය. එහෙත්, ඔබ වහන්සේ
අවුත් ඈ මත අත තැබුව මැනව; එවිට ඈ ජීවත් වනු
ඇතැ”යි කී ය. 19 ජේසුස් වහන්සේ නැඟිට ඔහු
පසුපස්සේ ගිය සේක, උන් වහන්සේගේ
ශ්‍රාවකයෝ ද එසේ ම කළහ.
20 එවිට දොළොස් වසක් මහ ලේ රෝගයෙනේ
පෙළුණු ස්ත්‍රියක් උන් වහන්සේ පසුපස්සේ අවුත්
උන් වහන්සේගේ සළුවේ දාවල්ලට අත තැබුවා ය.
21 එසේ කළේ, ‘උන් වහන්සේගේ සළුවට පමණ
වත් අත තැබුවහොත් මට සුවය ලැබෙනු ඇතැ’යි ඈ
සිතාගත් බැවිනි. 22 ජේසුස් වහන්සේ හැරී ඈ දැක,
“දියණියනි, ධෛර්‍ය ගන්න; ඔබේ ඇදහිල්ල ඔබ
සුවපත් කළේ යැ”යි වදාළ සේක. ඒ ස්ත්‍රිය ඒ
මොහොතේ පටන් සුවපත් වූවා ය.
23 ජේසුස් වහන්සේ ප්‍රධානියාගේ ගෙට ඇතුළු වී,
24 නළාකාරයන් ද ඝෝෂා කරමින් සිටි සමූහයා ද
දැක, “අහකට යන්න; දැරිය මැරී නැත; ඈ නිදන්නී
යැ”යි වදාළ සේක. එවිට ඔව්හු උන් වහන්සේට
සරදම් කළහ. 25 එහෙත්, සමූහයා පිට කරනු ලැබූ
පසු උන් වහන්සේ ඇතුළු වී ඇගේ අත ඇල්ලූසේක.
26 දැරිය නැඟිට්ටා ය. මේ සිද්ධිය පිළිබඳ පුවත මුළු
රට පුරා පතළ විය.

### අන්ධයින් දදෙනෙකුට සුවය

27 ජේසුස් වහන්සේ එතැනින් යන කල අන්ධයෝ
දදෙනෙක් මොරගසමින්, “දාවිත්ගේ පුත්‍රයාණෙනි,
අපට අනුකම්පා කළ මැනව” කියමින් උන් වහන්සේ
පසුපස ගියහ. 28 උන් වහන්සේ ගෙට පැමිණි කල
ඒ අන්ධයෝ උන් වහන්සේ වෙත ආහ. “මට මෙය
කළ හැකි බව ඔබ විශ්වාස කරන්නහු දැ”යි ජේසුස්
වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක. “එසේය,
ස්වාමීනි”යි ඔව්හු කී හ. 29 එවිට උන් වහන්සේ
ඔවුන්ගේ ඇස් ස්පර්ශ කොට, “ඔබ විශ්වාස කළ
ලෙසෙ ම ඔබට වේ වා”යි වදාළ සේක. 30 ඔවුන්ගේ
ඇස් පෑදිණි. “කිසිවකුට මෙපෙවත් නොකියන්නැ”යි
ජේසුස් වහන්සේ ඔවුන්ට තදින් අණ කළ සේක.
31 එහෙත්, ඔව්හු නික්ම ගොස් උන් වහන්සේ ගැන
ඒ පුවත මුළු රට පුරා පතළ කළහ.

### ගොළුවකුට සුවය

32 ඔවුන් පිටත් ව යද්දී දුෂ්ටාත්මාවේශ වූ
ගොළුවෙක් උන් වහන්සේ වෙත ගෙනෙනු ලද්දේ ය.
33 දුෂ්ටාත්මය දුරු කරනු ලැබූ විට ගොළුවා කතා
කරන්නට වන. එකල ජනකාය මවිත ව,
“මෙවැන්නක් ඉශ්‍රායලේ රටේ කිසි කලෙක දක්නට
නොලැබිණි”යි කී හ. 34 මතෙ 10:25; 12:24; මාක්
3:22; ලූක් 11:15එහෙත් පරිසිවරු කතා කරමින්,
“මොහු දුෂ්ටාත්මයන් දුරු කරන්නේ
දුෂ්ටාත්මාධිපතියාගේ අනුහසින් ය”යි කී හ.

### මහා කාරුණිකයාණෝ

35 මතෙ 4:23; මාක් 1:39; ලූක් 4:44 ජේසුස්
වහන්සේ ඔවුන්ගේ ධර්මශාලාවල උගන්වමින් ද,
රාජ්‍යය පිළිබඳ සුබ අස්න දේශනා කරමින් ද, හැම
අන්දමේ ලෙඩ රෝග සුව කරමින් ද සියලු නුවරවල
හා ගම්වල සැරිසැරූ සේක.
36 ගණන් 27:17; 1 රාජා 22:17; 2 වංශා 18:16;
එසකි 34:5; මාක් 6:34 ජේසුස් වහන්සේ ජනකාය
දැක, ඔවුන් එඬේරකු නැති බැටළුවන් මෙන්
දුක්ගැහැට විඳිමින් විසිර ගොස් සිටි බැවින් ඔවුන්ට
අනුකම්පා කළ සේක. 37 ලූක් 10:2එවිට උන්
වහන්සේ සිය ශ්‍රාවකයන්ට කතා කොට,
“අස්වැන්න බහුල ය; ගොවීහු විරල ය. 38 එහයෙන්
අස්වැන්න කැපීමට ගොවීන් එවන ලෙස අස්වැන්න
භාර හිමියා හට අයැදින්නැ”යි වදාළ සේක.

### දොළොස් දෙනොගේ ධර්මදූත මෙහෙයෙ
(මාක් 3:13-19;ලූක් 6:12-16)

10 ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන්
දොළොස් දෙනා තමන් වෙත කැඳවා,
අශුද්ධාත්මයන් දුරු කරන පිණිස ද සියලු ආකාර
ලෙඩ රෝග සුව කරන පිණිස ද ඔවුන්ට බලය පවරා
දුන් සේක.
2 ප්‍රේරිතයන් දොළොස් දෙනාගේ නම් මෙසේ ය:
පළමු ව පේදුරු නම් ලත් සීමොන් සහ ඔහුගේ
සොහොයුරු ඇන්ඩෘ ය; සබෙදීගේ පුත් ජාකොබ් සහ
ඔහුගේ සොහොයුරු ජොහන් ය; 3 පිලිප් සහ
බර්තොලමේව් ය; තෝමස් සහ අයකැමියා වන
මතවේ ය; අල්පවුස්ගේ පුත් ජාකොබ් සහ
තද්දවුස් ය; 4 අන්ත ජාතිවාදී සීමොන් සහ උන්
වහන්සේ පාවා දුන් ජූදස් ඉස්කාරියොත් යන
මොවුහු ය.

### ධර්මදූත සේවාව
(මාක් 6:7-13;ලූක් 9:1-6)

5 ජේසුස් වහන්සේ මකේ දොළොස් දෙනා යවමින්
ඔවුන්ට මෙසේ අණ දුන් සේක: “විජාතීන්ගේ
මාවතකට පා නොතබන්න; සමාරියයන්ගේ
නුවරකට ඇතුළු නොවන්න; 6 ඉශ්‍රායලේ වංශයේ
නැති වූ බැටළුවන් වෙතට යන්න. 7 ලූක්
10:4-12එසේ ගොස්, ‘ස්වර්ග රාජ්‍යය ළං වී ඇතැ’යි
දේශනා කරන්න. 8 රෝගීන් සුව කරන්න, මළවුන්
නැඟුටුවන්න, ලාදුරු රෝගීන් පවිත්‍ර කරන්න.
දුෂ්ටාත්මයන් දුරු කරන්න. ඔබ නොමිලයේ ලැබුවහු
ය, නොමිලයේ දෙන්න. 9 ඔබේ පසුම්බිවල රන්
හෝ රිදී හෝ තඹ කාසි හෝ ගෙන නොයන්න. 10 1
කොරි 9:14; 1 තිමෝ 5:18ගමන් මල්ලක් වත්, කමිස
දකෙක් වත්, වහන් සඟලක් වත්, සැරයටියක් වත්
සපයා නොගන්න. මන්ද, සේවකයාට අවශ්‍ය දේ
ඔහු ලැබිය යුතු ය. 11 ඔබ කවර නුවරකට හෝ

ගමකට හෝ ඇතුළු වූ කල ඔබ පිළිගන්නට සතුටු
කනෙකු සොයාගෙන, ඉන් නික්ම යන තුරු එහි ම
නැවතී ඉන්න. 12 ගෙදරකට ඇතුළු වන විට එයට
සුබ පතන්න. 13 ගෙයි වැසියෝ සුදුසු අය නම්, ඔබේ
ඒ සුබ පැතුම ඔවුන් පිට පැමිණේ වා. එහෙත්,
නුසුදුසු නම්, ඔබගේ ඒ සුබ පැතුම, යළි ඔබ වෙත
පැමිණේ වා. 14 ක්‍රියා 13:51කවරකු වුව ද ඔබ
පිළිගන්නේ වත්, ඔබගේ වචන අසන්නේ වත් නැත්
නම්, ඒ ගෙදරින් හෝ ඒ නුවරින් හෝ නික්ම යන
කල ඔබේ පාදවල දූවිලි ගසාදමන්න. 15 උත්
19:24-28; මත 11:24සැබැවින් ම මම ඔබට කියමි:
දේව විනිශ්චය දවසේ දී ඒ නුවරට වඩා සොදොම්
සහ ගොමොරා රටට සහනය ලැබෙන්නේ ය.”

## ඇති විය හැකි පීඩා
(මාක් 13:9-13;ලූක් 21:12-17)

16 ලූක් 10:3 “සවන් දෙන්න: මම වෘකයන් මැදට
බැටළුවන් යවන්නාක් මෙන් ඔබ යවමි. එහෙයින්
සර්පයන් මෙන් නැණවත් ව පරවියන් මෙන්
අහිංසක ව සිටින්න. 17 මාක් 13:9-11; ලූක් 12:11-12;
21:12-15ඒ නිසා මිනිසුන්ගෙන් පරෙස්සම් වන්න.
මන්ද, ඔවුන් ඔබ උසාවිවලට පාවා දී, ඔවුන්ගේ
ධර්මශාලාවල දී ඔබට තළනු ඇත. 18 ඔවුන්ට හා
විජාතීන්ට සාක්ෂියක් පිණිස ඔබ මා නිසා
ආණ්ඩුකාරයන් ද රජුන් ද ඉදිරියට ගෙනයනු ලබනු
ඇත. 19 එහෙත්, ඔවුන් ඔබ පාවා දෙන කල, ඔබ
කතා කළ යුත්තේ කෙසේ ද, කිව යුත්තේ කුමක් දැ
යි සිතමින් කරදර නොවන්න. මන්ද, ඔබ කිව යුතු
දේ නියම වේලාවේ දී ම ඔබට දෙනු ලැබේ.
20 කතා කරන්නේ ඔබ නොව, ඔබ තුළින් කතා
කරන ඔබේ පියාණන්ගේ ආත්මයාණෝ ය.
21 මාක් 13:12; ලූක් 21:16 “තවද, සහෝදරයා තම
සහෝදරයා ද පියා තම දරුවා ද මරණයට පාවා
දෙන්නෝ ය. දරුවෝ ද මවුපියන්ට විරුද්ධ ව නැඟී
සිට ඔවුන් මරණයට පත් කරවන්නෝ ය. 22 මත
24:9,13; මාක් 13:13; ලූක් 21:17මාගේ නාමය නිසා
සියල්ලන් ඔබට වෛර කරනු ඇත. එහෙත්, අන්තිම
දක්වා ස්ථිර ව සිටින්නා ගැළවෙන්නේ ය. 23 ඔවුන්
එක් නුවරක දී ඔබට පීඩා කළහොත්, ඊළඟ නුවරට
දිව යන්න. සැබැවින් ම මම ඔබට කියමි, මනුෂ්‍ය-
පුත්‍රයාණන් එන්න පෙර, ඉශ්‍රායෙල්හි සියලු
නුවරවල සැරිසරා නිමකරන්න ඔබට නොහැකි ය.
24 ලූක් 6:40; ජොහ 13:16; 15:20 “ගෝලයකේ සිය
ගුරුවරයාට වඩා උසස් නොවේ. දාසයකේ සිය
ස්වාමියාට වඩා උසස් නොවේ. 25 මත 9:34; 12:24;
මාක් 3:22; ලූක් 11:15ගෝලයා සිය ගුරුවරයාට
සමාන වීමෙන් ද, සේවකයා සිය ස්වාමියාට සමාන
වීමෙන් ද සෑහීමට පත් විය යුතු ය. ඔව්හු ගෘහ
මූලිකයාට ‘බෙල්සෙබුල්’ යයි කීවොත්, ගෙයි
වැසියන්ට ඊටත් වැඩියෙන් අපහාස නොකරත් ද?”

## බිය විය යුතු කවරකුටද?
(ලූක් 12:2-7)

26 මාක් 4:22; ලූක් 8:17 “එබැවින් මිනිසුන්ට බිය
නොවන්න. මන්ද, දැන් සැඟ වී ඇති සෑම දේ ම
හෙළි කරනු ලැබේ. සෑම රහසක් ම ප්‍රකට කරනු
ලැබේ. 27 මා විසින් ඔබට අඳුරේ දී පවසන ලද
දයෙ ඔබ දවාලේ දී කියන්න. ඔබේ කනට රහසින්
ඇසෙන දයෙ, ගෙමුදුන්වලින් ප්‍රකාශ කරන්න.
28 ශරීරය නැසුවත්, ආත්මය නසන්න නුපුළුවන් අයට
බිය නොවන්න. එහෙත්, ආත්මය ද ශරීරය ද
නිරයෙහි විනාශ කරන්න පුළුවන් තැනැන් වහන්සේට
ම බිය වන්න. 29 ගේ කුරුල්ලන් දදෙනෙකු
තුට්ටුවකට විකුණනවා නොවේ ද? එහෙත්, එයින්
එකකේ වත් ඔබේ පියාණන් වහන්සේ නොදැනුවත්
ව බිමට නොවැටෙන්නේ ය. 30 ඔබේ හිසකේ
සියල්ල පවා ගණන් කොට ඇත. 31 එබැවින් බිය
නොවන්න; ගේ කුරුල්ලන් රාශියකට වඩා ඔබ
අගනේ ය.

## ක්‍රිස්තුන් වහන්සේ පිළිගැනීම හා ප්‍රතික්ෂේප කිරීම
(ලූක් 12:8-9)

32 යමකේ මනුෂ්‍යයන් අබිමුවෙහි මා පිළිගත් බවට
සාක්ෂි දරන්නේ ද, මමත් ස්වර්ගයෙහි සිටින මාගේ
පියාණන් වහන්සේ අබිමුවෙහි ඔහු පිළිගත් බවට
සාක්ෂි දරන්නෙමි. 33 2 තිමෝ 2:12එහෙත්, යමකේ
මනුෂ්‍යයන් අබිමුවෙහි මා ප්‍රතික්ෂේප කරන්නේ ද,
මමත් ස්වර්ගයේ වැඩ සිටින මාගේ පියාණන්
වහන්සේ අබිමුවෙහි ඔහු ප්‍රතික්ෂේප කරන්නෙමි.”

## සාමය නොව කඩුව
(ලූක් 12:51-53;14:26-27)

34 “මම මිහි පිට සාමය දෙන පිණිස ආවෙමි යි
නොසිතන්න; සාමය නොව කඩුවක් දෙන පිණිස
ආවෙමි. 35 මීකා 7:6මන්ද, තම පුතා පියා සමඟ ද,
දුව සිය මවු සමඟ ද, ලේලී සිය නැන්දම්මා සමඟ
ද, භේද කරවන පිණිස ආවෙමි. 36 මිනිසකුගේ
සතුරෝ නම් ඔහුගේ ම ගෙදර වැසියෝ ය. 37 මට
වඩා පියාට වත්, මවුට වත් ප්‍රේම කරන්නා මට
සුදුසු නො වේ. මට වඩා පුතාට වත්, දුවට වත්
ප්‍රේම කරන්නා මට සුදුසු නො වේ. 38 මත
16:24; මාක් 8:34; ලූක් 9:23සිය කුරුසිය දරා ගෙන
මා අනුගමනය නොකරන තැනැත්තා මට සුදුසු නො
වේ. 39 මත 16:25; මාක් 8:35; ලූක් 9:24; 17:33;
ජොහ 12:25සිය දිවි රැකගන්නා එය නැති කරගනී.
මා නිසා සිය දිවි නැති කරගන්නා එය රැකගනී.”

## ආගන්තුක සත්කාරයේ විපාක
(මාක් 9:41)

40 මාක් 9:37; ලූක් 9:48; 10:16; ජොහ 13:20 “ඔබ
පිළිගන්නා මා පිළිගන්නේ ය; මා පිළිගන්නා මා එවූ
තැනැන් වහන්සේ පිළිගන්නේ ය. 41 දිවැසිවරයකු

වන නිසා දිවැසිවරයකු පිළිගන්නා
දිවැසිවරයකුගේ විපාකය ලබයි; සත් පුරුෂයකු
වන නිසා සත් පුරුෂයකු පිළිගන්නා සත්
පුරුෂයකුගේ විපාකය ලබයි. 42 මේ මාගේ
ශ්‍රාවකයන්ගෙන් ඉතා සුළු කෙනෙකුට වුව ද ඔහු
ශ්‍රාවකයකු වන නිසා බොන්න ඇල් වතුර
කෝප්පයක් වත් යමෙක් දෙන්නේ ද, සැබැවින් ම
මම ඔබට කියමි, ඔහුගේ විපාකය කිසිසේත් නැති
නොවන්නේ ය.”
nb
11 ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් දොළොස්
දෙනාට උවදෙස් දී නිම කළ පසු එතැනින් පිටත්
ව, ඔවුන්ගේ නුවරවල අනුශාසනා කරන පිණිසත්,
දහම් දෙසන පිණිසත් ගිය සේක.

## ස්නාවක ජොහන්ගේ ප්‍රශ්න

(ලූක් 7:18-35)

2 ක්‍රිස්තුන් වහන්සේගේ මෙහෙයෙ ගැන හිරගෙයි
දී ජොහන් හට ආරංචි වී, 3 “එන්න සිටින
තැනැත්තේ ඔබ ද? නොහොත් අප වෙන කෙනෙකු
ගැන බලා සිටිය යුතු දැ”යි ඇසීමට ඔහු සිය
ගෝලයන් උන් වහන්සේ වෙත යැවී ය. 4 ජේසුස්
වහන්සේ උත්තර දෙමින්, “ඔබ ගොස් අසන දකින
දේ ජොහන් හට දන්වන්න. 5 යෙසා 35:5-6;
61:1අන්ධයෝ පෙනීම ලබති; කොරු ඇවිදිති; ලාදුරු
රෝගීහු පවිත්‍ර කරනු ලබති; බිහිරන්ට ඇසෙයි;
මළාහු නැඟිටුවනු ලබති; දිළිඳුන්ට සුබ අස්න
ප්‍රකාශ කරනු ලැබේ. 6 මා කෙරෙහි විශ්වාසය
නැති කර නොගන්න තැනැත්තේ
භාග්‍යවන්තයෙකි”යි ඔවුන්ට වදාළ සේක. 7 ඔවුන්
යද්දී ජේසුස් වහන්සේ ජොහන් ගැන සමූහයාට
කතා කරන්න පටන්ගෙන, මෙසේ වදාළ සේක: “ඔබ
කුමක් බලන පිණිස පාළුකරයට ගියහු ද? සුළඟින්
සැලෙන බට ගසක් ද? 8 නැතහොත් කුමක් බලන්න
ගියහු ද? පට පිළියෙන් සැරසුණු මනුෂ්‍යයෙක් ද?
බලන්න, පට පිළියෙන් සැරසුණු අය රජ මැදුරුවල
සිටිති. 9 එහෙත්, කුමක් සඳහා පිටත් ව ගියහු ද?
දිවැසිවරයකු බලන පිණිස ද? එසේය යි මම ඔබට
කියමි. දිවැසිවරයකුටත් වඩා බොහෝ උතුම්
කෙනෙකු බලන පිණිස ය. 10 මලාකි 3:1මන්ද,
කීවොත්:
10 ‘මෙන්න, මාගේ දූතයා ඔබට පෙරටුව යවමි,
හෙතෙම ඔබ වඩිනා මඟ ඔබ ඉදිරියෙහි පිළියෙළ
කරන්නේ ය’යි
10 ලියා තිබෙන්නේ මොහු ගැන නිසා ය.
11 සැබැවින් ම මම ඔබට කියමි, මුළු මිනිස් සංහතිය
තුළ ජොහන්ට වඩා උතුම් කෙනෙක් පහළ නො වී
ය. එහෙත් ස්වර්ග රාජ්‍යයෙහි ඉතා සුළු තැනැත්තේ
වුව ද, ඔහුට වඩා උතුම් ය. 12 ලූක් 16:16ස්නාවක
ජොහන්ගේ කාලයේ පටන් මේ දක්වා ස්වර්ග
රාජ්‍යය බලහත්කාරකමට යට වී ඇත.
බලහත්කාරකම් කරන්නෝ එය බලයෙන් අත්පත්
කරගනිති. 13 මන්ද, දිවැසිවරු හා ව්‍යවස්ථාවලිය
ජොහන් දක්වා දිවැස් වැකි කී හ. 14 මලාකි 4:5;
මතෙ 17:10-13; මාක් 9:11-13ඔබ පිළිගන්න කැමැති
නම්, එන්න සිටින එලියා මොහු ය. 15 සවන්
ඇත්තෝ සවන් දෙත් වා!
16 මේ පරම්පරාව කුමකට සමාන කරම් ද?
q216 වෙළෙඳ පොළේ හිඳ තමන්ගේ යහළුවන්ට
හඬගා,
17 ‘අපි ඔබට නළා පිඹීමු, ඔබ නැටුවේ නැත;
q217 අපි ඔබට විලාප කීමු, ඔබ හැඬුවේ නැත’
17 කියන දරුවන්ට එය සමාන ය. 18 ජොහන් කමින්
බොමින් ආවේ නැත. එබැවින්, ‘ඔහු දුෂ්ටාත්මාවේශ
වූවෙකේ’යි ඔව්හු කියති. 19 මනුෂ්‍ය-පුත්‍රයාණෝ
කමින් බොමින් ආ සේක. එබැවින්, ‘බලන්න, ඔහු
කෑදර මනුෂ්‍යයෙකි; මුද්‍රික පානය බොන්නෙකි;
අයකැමියන්ගේ ද පව්කාරයන්ගේ ද යහළුවෙකේ’යි
ඔව්හු කියති. එහෙත්, දේව ප්‍රඥාව නිවැරදි බව
එහි ක්‍රියාවලින් දිස්වේ.”

## පසුතැවී සිත් හරවා නොගත් නගරවලට විපත්

(ලූක් 10:13-15)

20 එකල උන් වහන්සේගේ ප්‍රබල ක්‍රියාවලින්
බොහොමයක් කරනු ලැබූ නගරවල වැසියන්
පසුතැවී සිත් හරවා නොගත් බැවින්, උන් වහන්සේ
ඒවාට වරද තබන්න පටන්ගෙන මෙසේ වදාළ
සේක: 21 යෙසා 23:1-18; එසකි 26:1; 28:26; ජෝවෙ
3:4-8; ආමො 1:9-10; සකෙරි 9:2-4“එම්බා
කොරොශීනය, ඔබට වන විපතක මහත! එම්බා
බෙත්සයිදාව, ඔබට වන විපතක මහත! ඔබ තුළ
කළ ප්‍රබල ක්‍රියා, තීර්හි හා සීදොන්හි කළා නම්,
ඒ නගර වැසියන් මීට බොහෝ කලින් ගෝණි රෙදි
ඇඳ, අළුයෙහි හිඳ පසුතැවී සිත් හරවාගත් බව
පෙන්වනු ඇත. 22 එසේ වුව ද දේව විනිශ්චය
දවසේ දී ඔබට වඩා තීර් හා සීදොනයට සහනය
ලැබෙන්නේ යයි කියමි. 23 උත් 19:24-28; යෙසා
14:13-15එම්බා කපර්ණවුම, ඔබ සගලොව දක්වා
උසස් කරනු ලබන්නෙහි ද? නැත, පාතාලය දක්වා
පහත හෙළෙනු ලබන්නෙහි ය. ඔබ තුළ කරන ලද
ප්‍රබල ක්‍රියා සොදොම්හි කරන ලද්දේ නම්, එය
අද වන තුරු පවතිනු ඇත. 24 මතෙ 10:15; ලූක්
10:12එසේ වුව ද දේව විනිශ්චය දවසේ දී ඔබට
වඩා සොදොම් රටට සහනය ලැබෙන්නේ ය.”

## දේවානාවරණය ගැන ජේසුස් වහන්සේගේ තුති පිදුම

(ලූක් 10:21-22)

25 ඒ අවස්ථාවේ දී ජේසුස් වහන්සේ උත්තර
දෙමින් මෙසේ වදාළ සේක: “ස්වර්ගයටත්,
පොළොවටත් ස්වාමින් වන පියාණන් වහන්ස, ඔබ
වහන්සේ මේ කරුණු පැණවතුන් හා නැණවතුන්
කෙරෙන් ආවරණය කොට, බාලයන්ට අනාවරණය
කළ හෙයින් ඔබට තුති පුදමි. 26 එසේ ය,
පියාණෙනි, ඔබට ප්‍රිය මනාප එය ම ය. 27 ජොහ
1:18; 3:35; 10:15මාගේ පියාණන් වහන්සේ සියල්ල
මට පවරා දී ඇත. පියාණන් වහන්සේ හැර, අන්

කිසිවකේ පුත්‍රයාණන් නොහඳුනති. පුත්‍රයාණන්
සහ පියාණන් වහන්සේ එළිදරව් කිරීමට
පුත්‍රයාණන් විසින් තෝරාගනු ලැබූ යමකේ වේ ද,
ඔහු හැර අන් කිසිවකේ පියාණන් වහන්සේ
නොහඳුනති.
28 “වෙහෙසෙ වන, බර උසුලන සියල්ලෙනි, මා වෙත
එන්න; මම ඔබට සහනය දෙමි. 29 ජෙරෙ 6:16මා
ගුණවත්, මෘදු, නිහතමානී කෙනෙකු බැවින් මාගේ
වියගහ කරට ගෙන මාගෙන් ඉගෙනගන්න. එවිට
ඔබට සහනය ලැබෙනු ඇත. 30 මාගේ වියගහ
පහසු ය; මාගේ බර ද සැහැල්ලු ය.”

### සබත කඩ කිරීමේ ප්‍රශ්නය
(මාක් 2:23-28;ලූක් 6:1-5)

12 ද්වි.නී. 23:25 එකල සබත් දිනක දී ජේසුස්
වහන්සේ කෙතේ යායක් මැදින් වැඩිය සේක.
උන් වහන්සේගේ ශ්‍රාවකයෝ බඩගිනි ව කරල්
කඩා කන්නට පටන්ගත්හ. 2 පරිසිවරු ඒ දැක,
“බලන්න, ඔබේ ශ්‍රාවකයෝ සබත් දිනයේ දී
නොකටයුත්තක් කරති”යි කී හ. 3+MAT 1 සාමු
21:1-6ලෙවී 24:9උන් වහන්සේ කතා කොට ඔවුන්ට
මෙසේ වදාළ සේක: “දාවිත් රජු තමාට ද සිය
පිරිවරට ද බඩගිනි වූ කල්හි කළ දේ, එනම්,
දෙවියන් වහන්සේගේ ගෘහයට ඇතුළු ව,
පූජකයන්ට මිස තමාට වත්, තම පිරිවරට වත්
කන්න යුතු නැති පිදූ රොටි කෑ බව ඔබ කියවා නැද්
ද? 5 ගණන් 28:9-10නොහොත් දේව මාලිගාවෙහි
පූජකයන් සබත් දවසේ දී සබත් නීතිය කඩ කළත්,
නිදොස් ව සිටින බව ව්‍යවස්ථාවලියෙහි කියවා නැද්
ද? 6 එහෙත්, මම ඔබට කියමි, දේව මාලිගාවට
වඩා උතුම් කෙනෙක් මෙහි සිටිති. 7 මතෙ 9:13;
හොසි 6:6‘මම යාග පූජාවට නොව, දයානුකම්පාවට
කැමැත්තෙමි’ යන කීමේ තේරුම ඔබ දැන සිටියහු
නම්, නිදොස් අය පිට වරද නොතබනු ඇත. 8 මන්ද,
මනුෂ්‍ය-පුත්‍රයාණෝ සබත් දිනට පවා අධිපතියාණෝ
ය.”

### අතක් පණ නැති මිනිසා
(මාක් 3:1-6;ලූක් 6:6-11)

9 උන් වහන්සේ එතැනින් නික්ම ගොස් ඔවුන්ගේ
ධර්මශාලාවට පැමිණි සේක. 10 එහි අතක් පණ
නැති මිනිසෙක් විය. සමහර අය උන් වහන්සේට
වරද තබන පිණිස, “සබත් දිනයේ දී සුව කරන්න
යුතු දැ”යි උන් වහන්සේගෙන් ප්‍රශ්න කළහ. 11 ලූක්
14:5උන් වහන්සේ ඔවුන්ට කතා කොට, “ඔබ
අතරෙන් එක බැටළුවෙකු පමණක් හිමි මිනිසෙකු ඒ
බැටළුවා සබත් දිනක දී වළක වැටුණොත්, ඌ ඔසවා
ගොඩ ගන්නේ නැද් ද? 12 ඉතින්, මිනිසෙකු
බැටළුවෙකුට වඩා බොහෝ වටින්නේ නැද් ද?
එබැවින් සබත් දිනයේ දී යහපත කරන්න යුතු ය”යි
ඔවුන්ට වදාරා, 13 “ඔබේ අත දිගු කරන්නැ”යි ඒ
මිනිසාට වදාළ සේක. ඔහු අත දිගු කළේ ය. එවිට
එය අනික් අත මෙන් ම සුව විය. 14 එවිට පරිසිවරු
නික්ම ගොස් උන් වහන්සේ නසන්නේ කෙසේ දැ යි
කුමන්ත්‍රණය කළහ.

### තෝරාගත් සේවකයා

15 ජේසුස් වහන්සේ එපවත් දැන එතැනින් නික්ම
ගිය සේක. විශාල ජනකායක් උන් වහන්සේ
පසුපස්සේ ගියහ. උන් වහන්සේ සියල්ලන් සුව
කොට, 16 තමන් වහන්සේ ගැන ප්‍රචාරය
නොකරන ලෙස ඔවුන්ට අණ කළ සේක. 17 එසේ
වූයේ, යෙසායා දිවැසිවරයා පවසන ලද මේ කීම ඉටු
වන පිණිස ය:
18 යෙසා 42:1-4 “මෙන්න, මා තෝරාගත් මාගේ
මෙහෙකරුවා, මා සිත්ගත් මාගේ පෙම්වතා, මාගේ
ආත්මානුභාවය ඔහුට ප්‍රදානය කරමි;
q218 එකල ඔහු විජාතීන් හට යුක්තිය දන්වයි.
19 ඔහු කලහ කරන්නේ නැත;
q219 මොරගසන්නේ නැත;
q219 ඔහුගේ කටහඬ ද වීදිවල කිසිවෙකුට
ඇසෙන්නේ නැත.
20 ඔහු යුක්තිය ජයට පමුණුවන තුරු තැළුණු බට
දණ්ඩක් බිඳින්නේ නැත;
q220 දුම් නඟින පහන් තිරයක් නිවන්නේ නැත.
21 විජාතීහු ඔහු කෙරෙහි බලාපොරොත්තු තබති.”

### ජේසුස් වහන්සේ සහ දුෂ්ටාත්මාධිපතියා
(මාක් 3:20-30;ලූක් 11:14-23;12:10)

22 එවිට දුෂ්ටාත්මාවේශ වූ, අන්ධ, ගොළු
මිනිසෙක් උන් වහන්සේ වෙත ගෙනෙන ලද්දේ ය.
උන් වහන්සේ ඔහු සුව කළ සේක. ඒ ගොළුවාට
කතා ශක්තිය සහ ඇස් පෙනීම ලැබිණි. 23 මුළු
ජනකාය විස්මපත් වූ හ. ඔව්හු, “මෙතුමාණන්
දාවිත්ගේ පුත්‍රයා විය හැකි දැ”යි ඇසූ හ. 24 මතෙ
9:34; 10:25එවිට පරිසිවරු ඒ අසා, “මොහු
දුෂ්ටාත්මාධිපතියා වන බෙල්සෙබුල්ගේ අනුහසින්
මිස වෙන විධියකින් දුෂ්ටාත්මයන් දුරු නොකරති”යි
කී හ. 25 උන් වහන්සේ ඔවුන්ගේ සිතුවිලි දැන
ඔවුන්ට කතා කොට, මෙසේ වදාළ සේක:
25 “යම් රාජ්‍යයක් ඊට ම විරෝධී ව භේද
වුවහොත්, ඒ රාජ්‍යය වැනසී යයි; යම් නුවරක් හෝ
යම් ගෙදරක් හෝ ඊට ම විරෝධී ව භේද
වුවහොත්, ඒවා නොපවතියි. 26 සාතන් විසින් ම
සාතන් දුරු කරනු ලැබේ නම්, ඔහු ඔහුට ම විරෝධී
ව භේද වී සිටියි. එසේ නම්, ඔහුගේ රාජ්‍යය
පවතින්නේ කෙසේ ද? 27 මා දුෂ්ටාත්මයන් දුරු
කරන්නේ බෙල්සෙබුල්ගේ අනුහසින් නම්, ඔබේ ම
අනුගාමිකයන් දුෂ්ටාත්මයන් දුරු කරන්නේ
කවරකුගේ අනුහසින් ද? මේ අනුව ඔව්හු ම ඔබේ
තර්කය බිඳදමති. 28 එහෙත්, මම දෙවියන්
වහන්සේගේ ආත්මයාණන් අනුහසින් දුෂ්ටාත්මයන්
දුරු කරෙමි නම් දෙවියන් වහන්සේගේ රාජ්‍යය
ඒකාන්තයෙන් ම ඔබ කෙරේ උදා වී තිබේ.

29 "තවද, බලවතකු පළමු කොට බැඳදමා මිස,
ඔහුගේ ගෙට වැද, වස්තුව කොල්ලකන්ට
කිසිවකුට හැකි වේ ද? ඔහු බැඳදැමූ පසු ඔහුගේ
ගෙය කොල්ලකන්නේ ය. 30 මාක් 9:40මට පක්ෂ
නොවන්නා, මට විපක්ෂ ය; මා සමඟ රැස් කිරීමට
මට උදව් නොකරන්නා, එය විසුරුවා හරියි.
31 එහෙයින් මම ඔබට කියමි, හැම පාපය ම, හැම
දේවාපහාසය ම මිනිසුන්ට කමා කරනු ලබන්නේ ය.
එහෙත් ආත්මයාණන් වහන්සේට විරුද්ධ ව කරන
අපහාසයට කමාවක් නැත. 32 ලූක් 12:10යමෙක්
මනුෂ්‍ය-පුත්‍රයාණන්ට විරුද්ධ ව වචනයක් කියන්නේ
ද, එය ඔහුට කමා කරනු ලබන්නේ ය. එහෙත්,
යමෙක් ශුද්ධාත්මයාණන්ට විරුද්ධ ව කතා කරන්නේ
ද, එය ඔහුට මේ යුගයේ දී වත්, එන යුගයේ දී
වත් කමා කරනු නොලබන්නේ ය."

## ගස හා එහි පල
(ලූක් 6:43-45)

33 මතෙ 7:20; ලූක් 6:44 "ගස හොඳ නම්, පල
හොඳ ය; ගස නරක නම්, පල නරක ය. ගස
හැඳින්වෙන්නේ එහි පලවලිනි. 34 මතෙ 3:7; 15:18;
23:22; ලූක් 3:7; 6:45එම්බා පොළොං වංශය; නපුරු
ඔබ, යහපත් දෙයක් කියන්නේ කෙසේ ද? මන්ද
සිතින් උතුරා යන දෙය කටින් පිට වේ. 35 යහපත්
මිනිසා තමා රැස් කළ යහපත් දෙයින් යහපත් දේ
පිටතට ගෙනෙයි. නපුරු මිනිසා තමා රැස් කළ නපුරු
දෙයින් නපුරු දේ පිටතට ගෙනෙයි. 36 තවද, මිනිසුන්
දොඩන සියලු ප්‍රලාප ගැන දේව විනිශ්චය දවසේ
දී ඔවුන් වගකිවයුතු යයි ඔබට කියමි. 37 ඔබේ ම
වචන අනුව ඔබ නිදොස් බව ප්‍රකාශ කරනු ඇත;
ඔබේ ම වචන අනුව ඔබ වරදට පත්වනු ඇත."

## හාස්කමක් ඉල්ලීම
(මාක් 8:11-12;ලූක් 11:29-32)

38 මතෙ 16:1; මාක් 8:11; ලූක් 11:16 එවිට
විනයධරයන් හා පරිසිවරුන්ගෙන් සමහරෙක් කතා
කරමින්, "ගුරුදේවයෙනි, ඔබ හාස්කමක් කරනු
දකින්න අපි කැමැත්තමු"යි කී හ. 39 මතෙ 16:4;
මාක් 8:12උන් වහන්සේ උත්තර දෙමින්, මෙසේ
වදාළ සේක: "හාස්කමක් සොයන්නේ අදමිටු
අදේවදෘෂ්ටික පරම්පරාවකි. එහෙත්, ජෝනා
දිවැසිවරයා පිළිබඳ හාස්කම හැර වෙන හාස්කමක්
ඔවුන්ට නොදෙනු ලැබේ. 40 ජෝනා 1:17ජෝනා
තල්මසාගේ උදරයෙහි දහවල් තුනක් ද රෑ තුනක් ද
සිටියාක් මෙන්, මනුෂ්‍ය-පුත්‍රයාණන් ද පොළොවේ
ගැබෙහි දාවල් තුනක් ද රෑ තුනක් ද සිටිනු ඇත.
41 ජෝනා 3:5දේව විනිශ්චය දවසේ දී නිනිවයේ
මිනිසුන් මේ පරම්පරාවට විරුද්ධ ව නැඟිට එය
වරදට පත් කරනු ඇත. මන්ද, ජෝනාගේ දේශනා
කිරීමෙන් ඔව්හු පසුතැවී සිත් හරවා ගත් හ. මෙන්න,
ජෝනාට වඩා ශ්‍රේෂ්ඨ දෙයක් මෙහි තිබේ. 42 1
රාජා 10:1-10; 2 වංශා 9:1-12දේව විනිශ්චය දවසේ
දී දකුණු දිශාවේ රැජිනිය මේ පරම්පරාවට විරුද්ධ ව
නැඟිට එය වරදට පත් කරනු ඇත. මන්ද, එතුමිය
සලමොන්ගේ ප්‍රඥාව අසනු වස් පොළොවේ
සීමාවේ සිට පැමිණියා ය. මෙන්න, සලමොන්ගේ
ප්‍රඥාවට වඩා ශ්‍රේෂ්ඨ දෙයක් මෙහි ඇත."

## අශුද්ධාත්මය පෙරළා පැමිණීම
(ලූක් 11:24-26)

43 "අශුද්ධාත්මයක් මිනිසකුගෙන් දුරුව ගිය කල,
ඔහු දිය නැති තැන්වල ඇවිද, විවේකයක් සොයා
යන්නේ ය. එය නොලදහොත්, 44 'මම නික්ම ආ
මාගේ ගෙදරට පෙරළා යමි'යි කියයි. ඔහු එහි
පැමිණි කල, ඒ ගෙදර හිස්ව, අතුගා, සකස් කොට
තිබෙන බව දකියි. 45 එවිට ඔහු ගොස් තමාට වඩා
අශුද්ධ වෙන ආත්මයන් සත් දෙනෙකු කැඳවාගෙන
එන්නේ ය. ඔව්හු, එහි පිවිස එය අරක්ගනිති.
මෙසේ ඒ මිනිසාගේ දෙ වන තත්ත්වය පළමු
තත්ත්වයට වඩා නපුරු වන්නේ ය. මේ නපුරු
පරම්පරාවට ද එසේ ම වනු ඇත."

## ජේසුස් වහන්සේගේ මෑණියෝ සහ සහෝදරයෝ
(මාක් 3:31-35;ලූක් 8:19-21)

46 උන් වහන්සේ සමූහයාට කතා කරමින් සිටිය දී
ම උන් වහන්සේගේ මෑණියෝ ද සහෝදරයෝ ද
උන් වහන්සේ හා සමඟ කතා කරන්න ප්‍රස්තාවක්
සොයමින් පිටත සිටියහ. 47 එවිට එක් කෙනෙක් උන්
වහන්සේට කතා කොට, "බලන්න, ඔබේ මෑණියෝ
ද සහෝදරයෝ ද ඔබ සමඟ කතා කරන්න
ප්‍රස්තාවක් සොයමින් පිටත සිටිති"යි කී ය.
48 එහෙත්, උන් වහන්සේ එසේ කී අයට උත්තර
දෙමින්, "මාගේ මෑණියෝ කවුරු ද? මාගේ
සහෝදරයෝ කවුරු ද?" කියා 49 සිය ශ්‍රාවකයන්
දෙසට අත දිගු කොට, "මෙන්න, මාගේ මෑණියෝ
සහ සහෝදරයෝ! 50 ස්වර්ගයෙහි සිටින මාගේ
පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන කවුරුන්
වුව ද, ඔව්හු මාගේ සහෝදරයාත්, මාගේ
සහෝදරීත්, මාගේ මෑණියෝත් ය"යි වදාළ සේක.

## වපුරන්නා පිළිබඳ උපමාව
(මාක් 4:1-9;ලූක් 8:4-8)

13 එදින ම ජේසුස් වහන්සේ ගෙදරින් නික්ම
ගොස් මුහුද අද්දර වැඩහුන් සේක. 2 ලූක්
5:1-3අතිවිශාල සමූහයක් උන් වහන්සේ වෙත රැස්
වූ බැවින් උන් වහන්සේ ඔරුවකට නැඟී හිඳගත්
සේක. මුළු ජනකාය වෙරළෙහි සිටියහ. 3 උන්
වහන්සේ ඔවුන්ට බොහෝ දේ උපමාවලින් පහදා
දෙමින්, මෙසේ වදාළ සේක: "බලන්න, වපුරන්නෙක්
වපුරන්නට ගියේ ය. 4 ඔහු වපුරන කල මෙසේ
සිදුවිය: බීජ සමහරක් මඟ දිගේ වැටිණි. කුරුල්ලෝ
අවුත් ඒවා අවුලාගෙන කෑහ. 5 සමහරක් පස තුනී
ගල් බිම්වල වැටී, පස ගැඹුරු නුවූ බැවින් වහා ම
පැළ විය. 6 එහෙත්, හිරු නැඟුණු කල, ඒවා දැවී මුල්
නැති බැවින් වියළී ගියේ ය. 7 අන් සමහරක් කටු
ගස් අතර වැටිණි; කටු ගස් වැවී ඒවා යටකර දැමී

ය. 8 තවත් සමහරක් සරු බිමෙහි වැටී එකකින් සිය
ගුණයක් ද එකකින් සැට ගුණයක් ද එකකින් තිස්
ගුණයක් ද බැගින් පල දැරී ය. 9 සවන් ඇත්තෝ
සවන් දෙත් වා!"

### උපමාවල අදහස
(මාක් 4:10-12;ලූක් 8:9-10)

10 එවිට ශ්‍රාවකයෝ අවුත්, "ඔබ වහන්සේ
ඔවුන්ට උපමාවලින් කතා කරන්නේ මන්දැ"යි ඇසූ
හ. 11 උන් වහන්සේ මෙසේ උත්තර දුන් සේක:
"ස්වර්ග රාජ්‍යය පිළිබඳ අබිරහස ඔබට දන්වා දී
ඇත. එහෙත්, ඔවුන්ට එසේ දී නැත. 12 මතෙ 25:29;
මාක් 4:25; ලූක් 8:18; 19:26යමකුට ඇත්තේ ද
ඔහුට දෙනු ලැබේ; පමණටත් වඩා ඔහුට ලැබේ.
යමකුට නැත්තේ ද ඔහුට ඇති දයෙත් ඔහුගෙනේ
ගනු ලැබේ. 13 එහයෙින් ඔවුන් දැක දැකත්
නොදක්නා නිසා ද, අසා අසාත් නොඅසන නිසා ද,
වටහා නොගන්න නිසා ද ඔවුන්ට උපමා මඟින් කතා
කරමි. 14 යෙසා 6:9-10මෙසේ, යෙසායාගේ දිවැස්
කීම ඔවුන් කෙරේ ඉෂ්ට වනු ඇත. එනම්:
q214 'ඔබ අසා අසාත් තේරුම් නොගන්නහු ය;
q214 දැක දැකත් නොදක්නහු ය.
15 මේ සෙනඟගේ සිත් අඳුරු ය;
q215 ඔවුන්ගේ කන් වැසී ඇත.
q215 ඔවුන්ගේ ඇස් පිය වී ඇත.
q215 එසේ නොවී නම්, ඔවුන් ඇසින් බලා, කනින්
අසා, සිතින් තේරුම්ගෙන හැරෙනු ඇත.
q215 මම ද ඔවුන් සුවපත් කරමි'
15 යනු යි. 16 ලූක් 10:23-24එහෙත්, ඔබට ඇසින්
පෙනෙන නිසා ද, කනින් ඇසෙන නිසා ද, ඔබ
භාග්‍යවන්ත ය. 17 සැබැවින් ම මම ඔබට කියමි,
බොහෝ දිවැසිවරයන් ද දැහැමි අය ද ඔබ දකින
දේ දකින්නටත්, අසන දේ අසන්නටත් ආසා වූ නමුත්,
ඔවුන් ඒවා දුටුවේ වත්, ඇසුවේ වත් නැත."

### උපමාවේ විවරණය
(මාක් 4:13-20;ලූක් 8:11-15)

18 "එබැවින් වපුරන්නා පිළිබඳ උපමාව
තේරුම්ගන්න. 19 යමකේ රාජ්‍යය පිළිබඳ පණිවුඩය
අසා එය වටහා නොගෙනී නම්, ඔහුගේ සිතේ වැපුරූ
දේ නපුරා අවුත් පැහැරගනියි. මඟ දිගේ වැටුණු බීජ
යන්නෙන් අදහස් කරනුයේ එවැනි අය ය.
20+MAT පණිවුඩය ඇසූ කෙණෙහි ම එය සතුටින්
පිළිගනිතත්, සිත්හි තැන්පත් වී නැති බැවින්, මඳ
කලක් පැවත, පණිවුඩය නිසා හිංසාවක් හෝ
පීඩාවක් හෝ පැමිණි වහා ම කෙනෙකේ පැකිළී
වැටෙති. ගල් බිම්වල වැටුණු බීජ යන්නෙන් අදහස්
කරනුයේ එවැනි අය ය. 22 පණිවුඩය අසා, මේ
ජීවිතයේ කරදරවලින් ද වස්තු මායාවෙනේ ද
පණිවුඩය යටපත් වීම නිසා, කෙනෙකේ පල නොදරති.
කටු අතර වැටුණ බීජ යන්නෙන් අදහස් කරනුයේ
එවැනි අය ය. 23 පණිවුඩය අසා එය වටහා ගෙනෙ
සිය ගුණයක් ද හැට ගුණයක් ද තිස් ගුණයක් ද
බැගින් කෙනෙකේ පල දරති. සරු බිමෙහි වැපුරූ බීජ
යන්නෙන් අදහස් කරනුයේ එවැනි අය ය."

### කිරිඳි පිළිබඳ උපමාව

24 උන් වහන්සේ තවත් උපමාවක් මෙසේ වදාළ
සේක: 25 "ස්වර්ග රාජ්‍යය හොඳ බීජ වපුළ
මිනිසකුට සමාන ය. මිනිසුන් නිදා සිටිය දී ඔහුගේ
සතුරා අවුත් තිරිඟු අතර කිරිඳි වපුරා ගියේ ය.
26 තිරිඟු පැල නැඟී, කරල් හටගත් කල කිරිඳිත් මතු
විය. 27 එවිට ගෘහ මූලිකයාගේ දාසයෝ අවුත්,
'ස්වාමීනි, ඔබේ කෙතෙහි ඔබ හොඳ බීජ වපුළා
නොවේ ද? එසේ නම් කිරිඳි කොහෙනේ දැ'යි
ඔහුගෙනේ ඇසූ හ. 28 'මයෙ සතුරකුගේ වැඩක් ය'යි
ඔහු කී ය. එවිට දාසයෝ කතා කොට, 'එසේ නම්,
අප ගොස් ඒවා උදුරාදමන්න දැ'යි ඔහුගෙනේ ඇසූ හ.
29 එහෙත්, ඔහු උත්තර දමෙින්, 'එසේ නොකරන්න.
ඔබ කිරිඳි උදුරද්දී ඒ සමඟ තිරිඟුත් ඉදිරෙන්නට
පුළුවන. 30 ගොයම් කපන කාලය දක්වා දවෙගේ ම
එකට වැඩෙන්න හරින්න. ඉන්පසු ගොයම් කපන
කාලයේ දී පළමු කොට කිරිඳි එකතු කොට දවන
පිණිස මිටි බඳින්න. තිරිඟු මාගේ අටුවේ රැස්
කරන්නැ යි කපන්නන්ට කියමි'යි කීවේ ය."

### අබ ඇටය සහ මුහුන් පිළිබඳ උපමා
(මාක් 4:30-32;ලූක් 13:18-21)

31 උන් වහන්සේ ඔවුන් ඉදිරියෙහි තවත් උපමාවක්
වදාරමින්, "ස්වර්ග රාජ්‍යය මෙබඳු ය. එක්තරා
මිනිසකේ සිය කෙතෙහි අබ ඇටයක් වපුළේ ය.
32 එය සියලු ම බීජවලට වඩා කුඩා වුවත්, වැඩුණු
කල හැම පලා වර්ගවලට වඩා විශාල වී, අහසේ
කුරුල්ලන් අවුත් එහි අතුවල ලැගුම් ගන්න තරම්
ලොකු ගසක් වන්නේ ය"යි කී සේක.
33 උන් වහන්සේ තවත් උපමාවක් වදාරමින්,
"ස්ත්‍රියක විසින් පිටි නැළි තුනක් සහමුලින් ම
පිපෙන තුරු එහි දමන ලද මුහුන් පිඩකට ස්වර්ග
රාජ්‍යය සමාන ය"යි කී සේක.

### උපමාවල අරමුණ
(මාක් 4:33-34)

34 ජේසුස් වහන්සේ මේ සියල්ල ජනකායට උපමා
මඟින් පැවසූ සේක. උපමාවක් නැති ව කිසිවක්
ඔවුන්ට නොවදාළ සේක. 35 ගීතා 78:2මෙසේ වූයේ:
q235 "මම උපමා මඟින් කතා කරමි, ලෝකයේ මුල
සිට ම රහස් ව තිබුණු දේ හෙළි කරන්නමේ"යි
35 දිවැසිවරයන් ලවා පවසන ලද කරුණු ඉටු වන
පිණිස ය.

### කිරිඳි උපමා විවරණය

36 එවිට උන් වහන්සේ ජනකාය යන්න හැර ගෙට
වැඩිය සේක. ශ්‍රාවකයෝ උන් වහන්සේ වෙත
අවුත්, "කෙතේ කිරිඳි පිළිබඳ උපමාව අපට පහදා
දුන මැනව"යි කී හ.

37 උන් වහන්සේ උත්තර දමේන්, මසෙේ වදාළ
සේක: "හාොඳ බීජ වපුරන තැනැත්තේ නම්, මනුෂ්‍ය-
පුත්‍රයාණෝ ය; 38 කතෙ නම් ලෝකය ය; හාොඳ
බීජ නම් රාජ්‍යයට අයිති අය ය; කිරිඳි නම් නපුරාට
අයිති අය ය. 39 ඒවා වපුළ සතුරා නම් යක්ෂයා ය;
කපන කාලය නම් යුගාන්තය ය; කපන්නෝ නම්
දේව දූතයෝ ය. 40 කිරිඳි එක් කාොට ගින්නහෙි
දවන්නේ යම් සේ ද, යුගාන්තයේ දී එසේ ම
වන්නේ ය. 41 මනුෂ්‍ය-පුත්‍රයාණෝ ස්වකීය දූතයන්
එවන සේක. ඔව්හු උන් වහන්සේගේ රාජ්‍යයේ
බාධා උපදවන සියල්ල ද අදමිටුකම් කරන්නන් ද
එක් කාොට, 42 ගිනි උදුනහෙි හළෙන්නෝ ය. එහි දී
වැලපීම ද දත්මිටි කෑම ද වන්නේ ය. 43 එකල
දැහැමි අය තම පියාණන් වහන්සේගේ රාජ්‍යයහෙි
සූර්යයා මනේ බබළන්නෝ ය. සවන් ඇත්තෝ සවන්
දතේ වා!"

### උපමා තුනක්: නිධානය, මුතු ඇටය හා දැල

44 "ස්වර්ග රාජ්‍යය, කතෙක සඟවා තිබුණු
නිධානයකට සමාන ය. එක්තරා මිනිසකුෙට එය
සම්බ විය. ඔහුත් එය සඟවා තබා, මහත්
ප්‍රීතියනේ ගාොස් තමා සන්තක සියල්ල විකුණා ඒ
කතෙ මිළ දී ගත්තේ ය.
45 "ස්වර්ග රාජ්‍යය, අගනා මුතු සාොයා ගිය
වළෙන්දකුෙට සමාන ය. 46 ඉතා අගනා මුතු
ඇටයක් සම්බ වූ විට ඔහු ගාොස් තමා සන්තක
සියල්ල විකුණා එය මිලට ගත්තේ ය.
47 "ස්වර්ග රාජ්‍යය වනාහි, මුහුදේ හළෙන ලද,
සියලු වර්ගවල මසුන් හසු කරගත් දැලකට සමාන
ය. 48 ඒ දැල පිරුණු කල, ධීවරයෝ එය වරෙළට
ඇද, හිඳගනෙ, හාොඳ මසුන් භාජනවලට එකතු
කාොට නරක මසුන් ඉවත දැමූ හ. 49 යුගාන්තයේ දී
එසේ ම වන්නේ ය. දේව දූතයෝ නික්ම අවුත්,
දමිටුන් කරෙනේ අදමිටුන් වනේ කාොට, 50 අදමිටුන්
ගිනි උදුනහෙි හළෙන්නෝ ය. එහි වැලපීම ද දත්මිටි
කෑම ද වන්නේ ය.
51 "ඔබ මේ සියල්ල වටහා ගත්තහු දැ"යි උන්
වහන්සේ ඇසූ සේක. "එසේ ය"යි ඔව්හු කී හ.
52 එවිට උන් වහන්සේ ඔවුන්ට කතා කාොට,
"එහයෙින් ස්වර්ග රාජ්‍යයහෙි ගෝලයකුෙ බවට පත්
වන යම් විනයධරයකේ වේ ද, ඔහු සිය ගබඩාවනේ
නවීන දේත්, පැරණි දේත් පිටතට ගනෙනෙ ගෘහ
මූලිකයකුෙට සමාන ය"යි වදාළ සේක.

### නාසරතේ නුවර දී ජේසුස් වහන්සේ ප්‍රතික්ෂේප කරනු ලැබීම

(මාක් 6:1-6;ලූක් 4:16-30)

53 ජේසුස් වහන්සේ මේ උපමා කියා නිම කළ
පසු එතැනින් නික්ම ගිය සේක. 54 උන් වහන්සේ
සිය රටට පැමිණ, ධර්මශාලාවේ දී ඔවුන්ට ඉගැන් වූ
සේක. ඔව්හු විස්මයට පත් ව, "මාොහුට මේ
ප්‍රඥාව හා හාස්කම් කිරීමේ බලය කාොහනේ
ලැබුණේ ද? 55 මාොහු වඩුවාගේ පුතා නාොවේ ද?
මාොහුගේ මවගේ නම මරියා නාොවේ ද?
මාොහුගේ සහාෝදරයෝ ජාකාොබ්, ජෝසප්,
සීමාොන් සහ ජූදස් නාොවතේ ද? 56 මාොහුගේ සියලු
සහාෝදරියෝත් අප අතරහෙි නාොවතේ ද? එසේ
නම්, මේ සියල්ල මාොහුට කාොහනේ පහළ වී ද?"
කියා, 57 ජාොහ 4:44උන් වහන්සේ ප්‍රතික්ෂේප
කළහ. එහතේ ජේසුස් වහන්සේ කතා කාොට,
"දිවැසිවරයකුෙට ගරුබුහුමන් නාොලැබනේනේ සිය
රටේ දීත්, සිය ගදෙර දීත් පමණකැ"යි වදාළ සේක.
58 ඔවුන්ගේ අවිශ්වාසය නිසා උන් වහන්සේ එහි දී
බාොහෝ හාස්කම් නාොකළ සේක.

### ස්නාවක ජාොහන්ගේ මරණය

(මාක් 6:14-29;ලූක් 9:7-9)

14 එසමයහෙි යුව රජ වූ හරොොද් ජේසුස්
වහන්සේගේ කීර්තිය ගැන අසා, 2 ලූක්
3:19-20"මේ, මළවුන් කරෙනේ නැඟිට සිටින ස්නාවක
ජාොහන් ය. මාොහුට මේ ප්‍රබල ක්‍රියා කළ
හැක්කේ ඒ නිසා ය"යි තමාගේ මහෙකෙරුවන්ට කී
ය. 3 මන්ද, හරොොද් සිය සාොහාොයුරු පිලිප්ගේ
භාර්යාව වූ හරෙෝදියස් නිසා ජාොහන් අල්ලා බැඳ,
හිර අඩස්සි කර තිබුණේ ය. 4 ලවේ 18:16;
20:21මසෙේ කළෙේ, "ඇය තබාගැනීම ඔබට යුතු
නැතැ"යි ජාොහන් ඔහුට කී බැවිනි. 5 ඔහු ජාොහන්
මැරීමට අදහස් කළ නමුත්, ජනතාව ජාොහන්
දිවැසිවරයකුෙ ලසෙ සැලකූ නිසා, ඔහු ඔවුන්ට බිය
ව සිටියේ ය.
6 එහතේ, හරොොද්ගේ උපන් දිනය පැමිණි කල
හරෙෝදියස්ගේ දුව පිරිස ඉදිරියහෙි රඟ පා
හරොොද්ගේ මන පිනවූවා ය. 7 එහයෙින් ඇය
ඉල්ලන කවර දයෙක් හෝ ඇයට දීමට දිවුරුමකින්
ඔහු පාොරාොන්දු විය. 8 ඈ ද සිය මවගේ උපදසේ
අනුව, "ස්නාවක ජාොහන්ගේ හිස තැටියක ලා මහෙි
දී මට දුන මැනවැ"යි කීවා ය. 9 ඒ ඇසූ රජ
අතිශයින් ශෝක විය. එහතේ, තමාගේ දිවුරුම
නිසාත්, තමා සමඟ සිටි අමුත්තන් නිසාත්, ඔහු ඒ
ඉල්ලීම ඉටු කිරීමට අණ දී, 10 කනෙකුෙ යවා
හිරගදෙර දී ජාොහන්ගේ හිස සිඳ වී ය. 11 ඒ හිස
තැටියක ලා ගනෙවිත් තරුණියට දනෙ ලද්දේ ය. ඈ
එය සිය මව වතෙ ගනොවා ය. 12 ජාොහන්ගේ
ගෝලයෝ අවුත් මෘත දේහය ගනෙ ගාොස්,
තැන්පත් කාොට, ඉක්බිති ජේසුස් වහන්සේට ඒ බව
දැන්වූ හ.

### පන්දහසකට කෑම

(මාක් 6:30-44;ලූක් 9:10-17;ජාොහ 6:1-14)

13 ජේසුස් වහන්සේ ඒ අසා එතැනින් නික්ම,
ඔරුවකින් හුදකලා තැනකට වනේ ව වැඩිය සේක.
ජනකාය ඒ අසා නුවරවලින් පිටත් ව අවුත් උන්
වහන්සේ පස්සේ පයින් ගියහ. 14 උන් වහන්සේ
ගාොඩ බැස, විශාල ජනකායක් දැක, ඔවුන් කරෙහෙි
අනුකම්පා කාොට, ඔවුන්ගේ රෝගීන් සුවපත් කළ
සේක.

15 සවස් වූ කල ශ්‍රාවකයෝ උන් වහන්සේ වෙත
අවුත්, “මයෙ පාළු තැනකි; දැන් රෑ බෝ වී ඇත;
ගම්වලට ගොස්, කෑම මිලට ගන්නා පිණිස, සමූහයා
යන්න හැරිය මැනවැ”යි කී හ. 16 “ඔවුන් යවන්නට
වුවමනාවක් නැත; ඔබ ඔවුන්ට කන්න දෙන්නැ”යි
ජේසුස් වහන්සේ ඔවුන්ට වදාළ සේක. 17 ඔව්හු ද,
“අප ළඟ මෙහි ඇත්තේ රොටි පහකුත් මසුන්
දෙදෙනෙකුත් පමණකැ”යි උන් වහන්සේට කී හ.
18 “ඒවා මෙහි මා වෙත ගෙනෙන්නැ”යි උන්
වහන්සේ වදාළ සේක. 19 තණ කොළ මත
හිඳගන්නට ජනකායට අණ කොට, උන් වහන්සේ
රොටි පහත්, මසුන් දෙදෙනාත් ගෙන, ස්වර්ගය දෙස
බලා ආශීර්වාදය පවසා, රොටි කඩා ශ්‍රාවකයන්ට
දුන් සේක. ශ්‍රාවකයෝ ද එය සෙනඟට දුන්හ.
20 හැම දෙනම කා තෘප්තියට පැමිණියහ. ඔව්හු
ඉතිරි කැබලි එක් කොට කූඩා දොළසක්
පුරවාගත්හ. 21 ස්ත්‍රීන් හා දරුවන් හැර, කෑම කෑ
පුරුෂයෝ පන්දහසක් පමණ වූ හ.

## මුහුද මත ඇවිදීම
(මාක් 6:45-52;ජොහ 6:15-21)

22 ඉන්පසු උන් වහන්සේ සමූහයා පිටත් කර හරින
අතර, ඔරුවට නැඟී, තමන්ට පළමුවෙනේ එගොඩට
යන ලෙස ශ්‍රාවකයන්ට නියම කළ සේක. 23 උන්
වහන්සේ ජනකාය යැවූ පසු, යාච්ඤා කරන පිණිස
වෙනේ ව කන්දට වැඩිය සේක. සවස් වූ කල්හි උන්
වහන්සේ තනි ව එහි සිටි සේක. 24 සුළඟ තදින්
හැමූ බැවින් ඔරුව එවේලෙහි තරංගවල හැපමේන්,
ගැටමේන් මුහුද මැද තිබිණි. 25 අලුයම තුනටත්
හයටත් අතර උන් වහන්සේ ඔවුන් වෙත මුහුද
මතුපිට ඇවිදගෙන ආ සේක. 26 ශ්‍රාවකයෝ උන්
වහන්සේ මුහුද මත ඇවිදගෙන එනු දැක, කලබල
වී, “ඒ අවතාරයකැ”යි කියමින්, බියෙනේ මොරගැසූ හ.
27 එහතේ, ජේසුස් වහන්සේ එකණෙහි ම ඔවුන්ට
කතා කොට, “ධෛර්යවත් වන්න; මේ මම ය; බිය
නොවන්නැ”යි වදාළ සේක. 28 පේදුරු උත්තර
දමේන්, “ස්වාමීනි, ඔය ඔබ වහන්සේ නම්, වතුර
මත ඔබ වෙත එන්න මට අණ කළ මැනවැ”යි කී ය.
29 “එන්නැ”යි උන් වහන්සේ වදාළ සේක. එවිට
පේදුරු ඔරුවෙනේ බැස, ජේසුස් වහන්සේ වෙත වතුර
මත ඇවිදගෙන ගියේ ය. 30 එහතේ, ඔහු මාරුතය
වේගවත් බව දැක, බිය වී ගිලෙන්න පටන්ගෙන,
“ස්වාමීනි, මා බේරාගත මැනවැ”යි මොරගැසී ය.
31 ජේසුස් වහන්සේ වහා ම අත දිගු කොට ඔහු
අල්ලාගෙන, “ඔබේ ඇදහිල්ල කොතරම් හීන ද?
සැක කළෙේ මන්දැ”යි විචාළ සේක. 32 ඔවුන්
දෙදෙන ඔරුවට නැඟුණු කල සුළඟ නැවතිණි.
33 එවිට ඔරුවේ උන් අය, “ඒකාන්තයෙනේ ම ඔබ
දවේයන් වහන්සේගේ පුත්‍රයාණෝ ය”යි කියමින්
උන් වහන්සේට පසඟ පිහිටුවා වැඳ නමස්කාර
කළහ.

## ගෙනේසරතේහි රෝගීන් සුව කිරීම
(මාක් 6:53-56)

34 ඔව්හු එගොඩ වී ගෙනේසරතේ රටට
පැමිණියහ. 35 ඒ රටේ මිනිස්සු උන් වහන්සේ
ඇඳින, අවට පදෙසෙ පුරා පණිවුඩ යවා, සියලු
රෝගීන් උන් වහන්සේ වෙත ගෙනේවා, 36 උන්
වහන්සේගේ සළුවේ දාවල්ල පමණ වත් ස්පර්ශ
කරන්න රෝගීන්ට ඉඩ දෙන ලෙස, උන්
වහන්සේගෙනේ ඉල්ලා සිටියහ. එසේ ස්පර්ශ කළ
සියල්ලෝ ම සුවපත් වූ හ.

## සම්ප්‍රදායයන් ගැන විවාදය
(මාක් 7:1-13)

15 එකල ජරෙුසලමෙනේ පරිසිවරු ද
විනයධරයෝ ද ජේසුස් වහන්සේ වෙත අවුත්
2 “ඔබේ ශ්‍රාවකයන් පරම්පරාගත සම්ප්‍රදායයන්
කඩ කරන්නේ මන් ද? ඔව්හු අත් නොසෝදා ආහාර
අනුභව කරති”යි කී හ. 3 උන් වහන්සේ ඔවුන්ට
උත්තර දමේන්, මසෙේ වදාළ සේක: “ඔබේ
පරම්පරාගත සම්ප්‍රදායයන් පිළිපදින පිණිස ඔබ
දවේයන් වහන්සේගේ ආඥාව කඩ කරන්නේ මන්
ද? 4 නික්ම 20:12; 21:17; ද්වි.නී. 5:16; ලෙවී
20:9‘නුඹේ පියාට ද මවට ද ගෞරව කරන්න; පියා
ගැන හෝ මවු ගැන හෝ අපවාද කියන්නා මරණය
විඳිද යුතු ම ය’යි දවේයන් වහන්සේ වදාළ සේක.
5 එහතේ, කවරකේ වුව ද පියාට හෝ මවට හෝ
කතා කොට, ‘මම ඔබේ යහපත පිණිස දිය යුතු ව
තිබුණු දීමනාව දවේයන්ට පඬුරක් ලෙස කැප
කළෙමේ’යි කීමෙනේ පසුව, 6 පියාට ගෞරව කිරීමට
ඔහු බැඳී නැතැ යි ඔබ කියන්නහු ය. මසෙේ ඔබ
තමන්ගේ පරම්පරාගත සම්ප්‍රදාය නිසා දවේයන්
වහන්සේගේ ආඥා අවලංගු කළහු ය.
7 කෛරාටිකයෙනි, යසොයා ඔබ ගැන කී මේ දිවැස්
වැකිය මැනවින් ඔබට ගැළපේ.
8 යසො 29:13 ‘මුවින් මේ සෙනඟ මට ගරු කරති;
q28 සිතින් නම් මාගෙනේ දුරු ව සිටිති.
9 මිනිස් ඔවා දවේ දහම් සේ උගන්වමින්,
නිකරුණේ මා නමදිති.’ “

## මිනිසා කලෙසෙනු ලැබීමට හේතු වන දේ
(මාක් 7:14-23)

10 උන් වහන්සේ සමූහයා කැඳවා ඔවුන්ට කතා
කොට, “ඔබ සවන් දී හොඳින් තේරුම්ගන්න.
11 මිනිසා කලෙසෙනු ලැබීමට හේතු වන්නේ කටට
ඇතුළු වන දේ නොව, කටින් නික්මෙන දේ ය”යි
වදාළ සේක. 12 එවිට ශ්‍රාවකයෝ අවුත්, “ඔබගේ
ඒ කීම අසා, පරිසිවරුන් තදින් අමනාප වූ බව ඔබ
වහන්සේ දන්නා සේක් දැ”යි උන් වහන්සේගෙනේ
ප්‍රශ්න කළහ. 13 උන් වහන්සේ පිළිතුරු දමේන්,
“මාගේ ස්වර්ගීය පියාණන් වහන්සේ විසින්
රෝපණය නොකරන ලද සියලු පැළෑටි උදුරා දමනු
ලබන්නේ ය. 14 ලූක් 6:39පරිසිවරුන්ගෙනේ අපට

කමක් නැත. ඔව්හු අන්ධයන්ගේ අන්ධ
මාර්ගෝපදේශකයෝ ය. අන්ධයකු තව
අන්ධයකුට මඟ පනේවන්නට ගියොත්, දදෙනෙ ම
වළක වැටනෙු ඇතැ"යි වදාළ සේක. 15 එවිට පේදුරු
කතා කොට, "මේ උපමාව අපට පහදා දුන
මැනවැ"යි උන් වහන්සේට කී ය. 16 උන් වහන්සේ
කතා කොට මසෙේ වදාළ සේක: "ඔබට තවමත්
තේරනේනේ නැද් ද? 17 කටට ඇතුළු වන සියල්ල
උදරයට බැස, වැසිකිළියට යන බව ඔබට
වැටහනේනේ නැද් ද? 18 මතෙ 12:34එහතේ, කටින්
පිටවන දේ නික්මනේනේ සිතින් ය; මිනිසා
කලෙසෙනු ලබන්නේ එයින් ය. 19 නපුරු චේතනා,
මිනීමැරුම්, කාමරාග, සල්ලාලකම්, සොරකම්, බොරු
සාක්ෂි සහ අපහාස නික්මනේනේ හදවතින් ය.
20 මිනිසා කලෙසෙනු ලබන්නේ මකේ දේවලින්.
එහතේ, අත් නොසෝදා කෑමනේ මිනිසා කලෙසෙනු
නොලබන්නේ ය."

## කානානිය ස්ත්රියකගේ ඇදහිල්ල
(මාක් 7:24-30)

21 ජේසුස් වහන්සේ එතැනින් නික්ම තීර් හා
සීදොන් පදෙසේවලට වැඩිය සේක. 22 එක්
කානානිය ස්ත්රියක් ඒ පදෙසේවල සිට අවුත්,
"දාවිත්ගේ පුත්ර වූ ස්වාමීනි, මට අනුකම්පා කළ
මැනව; මාගේ දුව බලවත් සේ දුෂ්ටාත්මාවේශ ව
සිටින්නී ය"යි කියමින් මොරගැසුවා ය. 23 එහතේ
උන් වහන්සේ ඇයට වචනයකින් වත් පිළිතුරු නුදුන්
සේක. උන් වහන්සේගේ ශ්රාවකයෝ අවුත්, "මේ
ස්ත්රිය මොරගසමින් අප පස්සේ එන බැවින්, ඇයට
යන්න කිව මැනවැ"යි උන් වහන්සේගනේ ඉල්ලූ හ.
24 උන් වහන්සේ කතා කරමින්, "මා එවන ලද්දේ
ඉශ්රායලේ වංශයේ නැති වූ බැටළුවන් වතෙ
පමණකැ"යි වදාළ සේක. 25 එහතේ, ඈ අවුත් පසඟ
පිහිටුවා උන් වහන්සේට වැඳ, "ස්වාමීනි, මට පිහිට
වුව මැනවැ"යි කීවා ය. 26 උන් වහන්සේ උත්තර
දමේන්, "දරුවන්ගේ කෑම ගනෙ බල්ලන්ට දැමීම යුතු
නැතැ"යි වදාළ සේක. 27 එහතේ ඈ කතා කොට,
"එසේ ය, ස්වාමීනි, බල්ලන් පවා තම
ස්වාමිවරුන්ගේ මේසයනේ වැටනෙ කැබලි අවුලා
කති"යි කීවා ය. 28 එවිට ජේසුස් වහන්සේ උත්තර
දමේන්, "ස්ත්රිය, ඔබේ ඇදහිල්ල මහත් ය. ඔබේ
කැමැත්ත ලසෙ ම ඔබට වේ වා"යි වදාළ සේක. ඒ
මොහොතේ පටන් ඇගේ දුව සුවපත් වූවා ය.

## සමූහයකට සුවය

29 ජේසුස් වහන්සේ එතැනින් නික්ම, ගලීලයේ
මුහුද ළඟට ගොස්, කන්දකට නැඟී වැඩහුන් සේක.
30 මහත් ජනකායක්, කොරුන් ද අබ්බාගාතයන් ද
අන්ධයන් ද ගොළුවන් හා වනෙත් බොහෝ
දනෙකුන් ද රැගනෙ, ජේසුස් වහන්සේ වතෙ අවුත්
ඔවුන් උන් වහන්සේගේ පාමුල තැබූ හ. උන්
වහන්සේ ඔවුන් සුවපත් කළ සේක. 31 එවිට
ගොළුවන් කතා කරන බව ද, අබ්බාගාතයන් සුවපත්
වී ඉන්න බව ද, කොරුන් ඇවිදින බව ද, අන්ධයන්ට
ඇස් පනෙනෙ බව ද දුටු ජනකාය පුදුම වී
ඉශ්රායලේවරුන්ගේ දවේයන් වහන්සේට ප්රශංසා
කළහ.

## හාර දහසකට කෑම
(මාක් 8:1-10)

32 ජේසුස් වහන්සේ සිය ශ්රාවකයන් තමන් වතෙ
කැඳවා, "මේ සමූහයා ගැන මට ඉතා කණගාටු ය;
ඔව්හු දැන් තුන් දවසක් ම මා සමඟ ය; ඔවුන්ට
කෑමක් නැත; ඔවුන් බඩගින්නේ පිටත් කර යවන්න
අකමැත්තමේ; එසේ යැව්වොත්, මඟ දී ඔවුන්
ක්ලාන්ත විය හැකි යැ"යි වදාළ සේක.
33 ශ්රාවකයෝ උන් වහන්සේට කතා කොට,
"මතෙරම් මහත් සමූහයකට සෑහනෙ තරම් කන්න
දීමට මේ පාළුකරයහෙි අපට කෑම කොයින් දැ"යි
ඇසූ හ. 34 ජේසුස් වහන්සේ කතා කොට, "ඔබ
ළඟ රොටි කීයක් තිබේ දැ"යි ඇසූ සේක. "රොටි
සතකුත් කුඩා මසුන් ස්වල්පයකුත් ය"යි ඔව්හු කී හ.
35 උන් වහන්සේ සමූහයාට බිම ඉඳගන්න අණ දී,
36 රොටි සත ද මසුන් ද ගනෙ තුති පුදා, කඩා,
ශ්රාවකයන්ට දුන් සේක. ශ්රාවකයෝ ඒවා
සමූහයාට දුන්හ. 37 හැම දනෙ ම කා සෑහීමට
පැමිණියහ. ඔව්හු ඉතිරි වූ කැබලේ එක් කොට කූඩා
සතක් පුරවා ගත්හ. 38 ස්ත්රීන් හා දරුවන් හැර කෑම
කෑ පුරුෂයෝ සාර දහසකි. 39 උන් වහන්සේ
සමූහයා විසුරුවා හැර ඔරුවකට නැඟී මගදන් දේශ
සීමාවලට වැඩිය සේක.

## ස්වර්ගයනේ හාස්කමක් ඉල්ලීම
(මාක් 8:11-13;ලූක් 12:54-56)

16 මතෙ 12:38; ලූක් 11:16 පරිසිවරු ද සද්දූසිවරු
ද අවුත්, උන් වහන්සේ වචනයකින් අසු
කරගනු පිණිස තමන්ට ස්වර්ගයනේ හාස්කමක්
පනේවන මනේ උන් වහන්සේගනේ ඉල්ලූහ. 2 උන්
වහන්සේ උත්තර දමේන්, "සවස් කාලයහෙි අහස
රතු පැහැය ගන්නා නිසා කාලගුණය හොඳ ය කියා
ද, 3 උදයහෙි අහස රතු හා අඳුරු ව තිබනෙ නිසා අද
කුණාටු ඇති දවසක් වන්නේ ය කියා ද ඔබ දන්නහු
ය. ඔබ අහස බලා කාලගුණය තීරණය කරන්න
දන්නහු ය. එහතේ, තත්කාලීන ලකුණු විමසා
දැනගන්න ඔබට නුපුළුවන. 4 මතෙ 12:39; ලූක්
11:29අදම්ටු අදේවදෘෂ්ටික පරම්පරාවක් හාස්කමක්
සොයන්නේ ය. එහතේ, දිවැසිවර ජෝනා පිළිබඳ
හාස්කම හැර වනෙ හාස්කමක් නොදක්වනු ලැබේ
ය"යි කියා ඔවුන් අත්හැර නික්ම ගිය සේක.

## කපටි ඉගැන්වීම්වලින් පරස්සේම් වීම
(මාක් 8:14-21)

5 ශ්රාවකයන් එගොඩට යද්දී රොටි ගනෙ යන්න
ඔවුන්ට අමතක විය. 6 ලූක් 12:1ජේසුස් වහන්සේ
ඔවුන්ට කතා කොට, "පරිසිවරුන්ගේ ද
සද්දූසිවරුන්ගේ ද මුහුන්වලින් පරස්සේම් වන්නැ"යි

වදාළ සේක. 7 “උන් වහන්සේ එසේ කියන්නේ අප
රොටි නොගෙනා නිසා ය”යි ඔව්හු තම තමන් අතර
කතා කරගත්හ. 8 ජේසුස් වහන්සේ ඒ බව දැන,
“ඇදහිල්ල හීන තැනැත්තනේ, ඔබට රොටි නැති නිසා
ඔබ එසේ කතා කරන්නේ මන් ද? 9 මතෙ
14:17-21ඔබට තව ම තේරුම් ගොස් නැද් ද?
පන්දහසකට දුන් රොටි පහ ගැනත්, පසුව කූඩා
කීයක් පුරවා ගත්තහු ද කියාත්, 10 මතෙ
15:34-38සාර දහසකට දුන් රොටි හත ගැනත්, පසුව
කූඩා කීයක් පුරවා ගත්තහු ද කියාත් මතක නැද් ද?
11 රොටි ගැන මා ඔබට කතා නොකළ බව තේරුම්
නොගියේ කෙසේ ද? එහෙත්, පරිසිවරුන්ගේ ද
සද්දූසිවරුන්ගේ ද මුහුන්වලින් පරෙස්සම් වන්නැ”යි
වදාළ සේක. 12 මයින් උන් වහන්සේ අදහස්
කළේ රොටි සාදන මුහුන්වලින් පරෙස්සම් වීම
නොව, පරිසිවරුන්ගේ ද සද්දූසිවරුන්ගේ ද
ඉගැන්වීම්වලින් පරෙස්සම් වීම බව ඔව්හු තේරුම්
ගත්හ.

### පේදුරුගේ මහා ප්‍රකාශනය
(මාක් 8:27-30;ලූක් 9:18-21)

13 ජේසුස් වහන්සේ පිලිප්පි කායිසාරියේ
පෙදෙස්වලට පැමිණි කල, “මනුෂ්‍ය-පුත්‍රයාණෝ
කවරකේ ය කියා මිනිස්සු කියත් දැ”යි සිය
ශ්‍රාවකයන්ගෙනේ ඇසූ සේක. 14 මතෙ 14:1-2; මාක්
6:14-15; ලූක් 9:7-8ඔව්හු කතා කොට, “සමහරකේ,
‘ස්නාවක ජොහන් ය’ කියා ද සමහරකේ, ‘එලියා ය’
කියා ද, අන් සමහරකේ ‘ජෙරෙමියා නොහොත්
දිවැසිවරයන්ගෙනේ කෙනෙකේ ය’ කියා ද කියති”යි කී
හ. 15 “එහෙත් ඔබ මා කවරකු කියා කියන්නහු
දැ”යි උන් වහන්සේ ඔවුන්ගෙනේ ඇසූ සේක.
16 ජොහ 6:68-69සීමොන් පේදුරු උත්තර දමේන්,
“ඔබ ක්‍රිස්තුවරයාණෝ ය, ජීවමාන දවේයන්
වහන්සේගේ පුත්‍රයාණෝ ය”යි කී ය. 17 ජේසුස්
වහන්සේ උත්තර දමේන්, “ජෝනාගේ පුත් සීමොන්,
ඔබ ඉතා භාග්‍යවන්ත ය. මන්ද, ස්වර්ගයෙහි
වැඩවසන මාගේ පියාණන් වහන්සේ විසින් මිස
මනුෂ්‍ය මඟකින් මයෙ ඔබට එළිදරව් නොකරන
ලද්දේ ය. 18 මම ඔබට කියමි: ඔබ පේදුරු ය. මේ
පර්වතය පිට මාගේ සභාව ගොඩනඟන්නමේ.
පාතාලයේ දොරටුවලට වුව ද, එය පරාජය නොකළ
හැකි ය. 19 මතෙ 18:18; ජොහ 20:23ස්වර්ග
රාජ්‍යයේ යතුරු ඔබට දනේනමේ. ඔබ පොළොවෙහි
දී යමක් බඳින්නහෙි ද, එය ස්වර්ගයෙහි දී බඳිනු
ලබන්නේ ය. ඔබ පොළොවෙහි දී යමක් මුදන්නහෙි
ද එය ස්වර්ගයෙහි දී මුදනු ලබන්නේ ය”යි වදාළ
සේක. 20 තවද, තමන් ක්‍රිස්තුන් වහන්සේ බව
කිසිවකුට නොකියන ලසෙ උන් වහන්සේ
ශ්‍රාවකයන්ට අණ දුන් සේක.

### ජේසුස් වහන්සේ සිය මරණය හා පුනරුජ්ජීවනය ගැන කලින් කීම
(මාක් 8:31;9:1;ලූක් 9:21-27)

21 එවක් පටන් ජේසුස් වහන්සේ, තමන්
ජෙරුසලමට වැඩම කර, ප්‍රජා මූලිකයන්ගෙනේ හා
නායක පූජකයන්ගෙනේ ද විනයධරයන්ගෙනේ ද
බොහෝ දුක් වේදනා විඳින්ටත් මරනු ලබන්ටත්,
තුන් වන දා උත්ථාන කරනු ලබන්ටත් යන බව සිය
ශ්‍රාවකයන්ට දන්වන්න පටන්ගත් සේක. 22 එවිට
පේදුරු උන් වහන්සේ පැත්තකට කැඳවා තරවටු
කරන්න පටන් ගනෙ, “ස්වාමීනි, එය දුරින් ම දුරුවේ
වා! එවැන්නක් ඔබට කවදාවත් සිදු නො වේ වා”යි
කී ය. 23 එහෙත්, උන් වහන්සේ හැරී, පේදුරුට කතා
කොට, “සාතන්, අහකට යව; නුඹ මට බාධාවකි;
නුඹ සිතන්නේ මිනිසුන් සිතන විධියට මිස දවේයන්
වහන්සේ සිතන විධියට නොවේ ය”යි වදාළ සේක.

### තමකම නැසීම පිළිබඳ අනුශාසනා

24 මතෙ 10:38; ලූක් 14:27 එවිට ජේසුස් වහන්සේ
සිය ශ්‍රාවකයන්ට කතා කොට මසෙේ වදාළ සේක:
“යමකේ මා අනුව එන්න කැමැත්තේ ද, ඔහු තමකම
නසා කුරුසිය දරමින් මා අනුව ඒවා! 25 මතෙ 10:39;
ලූක් 17:33; ජොහ 12:25මන්ද, සිය දිවි රැකගන්න
කැමැති තැනැත්තේ එය නැති කරගන්නේ ය. මා
උදසො සිය දිවි නැති කරගන්නා එය රැක ගන්නේ
ය. 26 යමකු මුළු ලෝකය ම ලබාගත්තත්, සිය දිවි
නැති කරගත්තොත් ඔහුට කිනම් ප්‍රයෝජනයක් ද?
නොහොත් යමකුට සිය දිවි වනුවෙට කුමක් දිය
හැකි ද? 27 මතෙ 25:31; ගීතා 62:12; රෝම
2:6මනුෂ්‍ය-පුත්‍රයාණෝ සිය පියාණන්ගේ
තේජශ්‍රීයනේ තම දූතයන් පිරිවරා වඩින සේක.
එකල උන් වහන්සේ එකිනකොට තම තමන්ගේ
ක්‍රියා අනුව පල විපාක දනෙ සේක. 28 සැබැවින් ම
මම ඔබට කියමි, මනුෂ්‍ය-පුත්‍රයාණන් ස්වකීය
රාජ්‍යශ්‍රීයනේ වඩිනු දක්නා තකේ මහෙි
සිටින්නවුන්ගෙනේ සමහරකේ කිසි සේත් මරණයට
පත් නොවෙති.”

### රූප විපර්යාසය
(මාක් 9:2-13;ලූක් 9:28-36)

17 2 පේදු 1:17-18 සදවසකට පසු ජේසුස්
වහන්සේ පේදුරු ද ජාකොබ් ද ඔහුගේ
සහෝදර ජොහන් ද කැඳවාගනෙ, වනේ ව උස්
කන්දකට වැඩිය සේක. 2 උන් වහන්සේ ඔවුන්
අබිමුවහෙි අන්වසෙක් වූ සේක. උන් වහන්සේගේ
මුහුණ හිරු මනේ බැබළිණි; වස්ත්‍ර ද ආලෝකය
මනේ සුදු විය. 3 එකණෙහෙි ම මෝසසේ ද එලියා ද
උන් වහන්සේ සමඟ කතා කරමින් සිටිනු ඔවුන්ට
පනේිණි. 4 පේදුරු ජේසුස් වහන්සේට කතා කොට,
“ස්වාමීනි, අපට මහෙි සිටින්න ලැබීම වාසනාවකි;
ඔබ කැමැති සේක් නම්, මණ්ඩප තුනක්, එකක්
ඔබට ද එකක් මෝසසේට ද එකක් එලියාට ද

සාදන්නමේ"යි කී ය. 5 උත් 22:2; ද්වි.නී. 18:15; ගීතා
2:7; යසො 42:1; මතෙ 3:17; 12:18; මාක් 1:11; ලූක්
3:22ඔහු කතා කරද්දී දීප්තිමත් වලාකුළක් ඔවුන්
සිසාරා, පැතිරිණි. තවද, "මේ මාගේ ප්‍රියාදර
පුත්‍රයාණෝ ය; මම මොහු කෙරෙහි ඉතා ප්‍රසන්න
වී සිටිමි; මොහුට සවන් දෙන්නැ"යි කියන හඬක්
නික්මිණි. 6 ශ්‍රාවකයෝ ඒ අසා, අතිශයින් බියපත්
වී මුහුණින් වැටුණාහ. 7 ජේසුස් වහන්සේ අවුත්,
ඔවුන්ට අත ගසා, "නැඟිටින්න, බිය නොවෙන්නැ"යි
වදාළ සේක. 8 ඇස් ඔසවා බැලූ කල ඔව්හු ජේසුස්
වහන්සේ හැර වෙන කිසිවකු නුදුටුවෝ ය.
9 ඔවුන් කන්දෙන් බැස එද්දී ජේසුස් වහන්සේ
කතා කරමින්, "මනුෂ්‍ය-පුත්‍රයාණන් මළවුන් කෙරෙන්
නැඟිටින තුරු මේ දර්ශනය කිසිවකුට
නොකියන්නැ"යි ඔවුන්ට අණ කළ සේක. 10 මලාකි
4:5උන් වහන්සේගේ ශ්‍රාවකයෝ කතා කොට,
"එසේ නම්, එලියා පළමුවෙන් එන්න යුතු ය යි
විනයධරයන් කියන්නේ මන්දැ"යි උන් වහන්සේගෙන්
ඇසූ හ. 11 උන් වහන්සේ උත්තර දෙමින්, "එලියා
එන බව ඒකාන්ත ය. ඔහු අවුත් සියල්ල යළි
පිහිටුවන්නේ ය. 12 මතෙ 11:14එහෙත්, ඔබට කියමි:
එලියා දැනට ම පැමිණ සිටී, ඔව්හු ඔහු නොහැඳින,
තමන් රිසි දයෙ ඔහුට කළහ. එලෙසෙ ම ඔවුන්
මනුෂ්‍ය-පුත්‍රයාණන්ට ද පීඩා කරනු ඇතැ"යි ඔවුන්ට
වදාළ සේක. 13 උන් වහන්සේ මෙයෙ කීවේ ස්නාවක
ජොහන් ගැන බව ශ්‍රාවකයෝ තේරුම්ගත්හ.

## මීමැස්මොර රෝගී ළමයකු සුව කිරීම
(මාක් 9:14-29;ලූක් 9:37-43)

14 ඔවුන් සමූහයා ළඟට ආ කල, එක් මිනිසෙක්
උන් වහන්සේ වෙත අවුත්, උන් වහන්සේ ඉදිරියෙහි
දණින් වැටී, 15 "ස්වාමීනි, මාගේ පුත්‍රයාට
අනුකම්පා කළ මැනව. ඔහු මීමැස්මොර රෝගයෙන්
තදබල ලෙස පීඩා විඳියි; බොහෝ වර ගින්නෙහි ද
වතුරෙහි ද වැටිණි; 16 මම ඔහු ඔබගේ ශ්‍රාවකයන්
වෙත ගෙනාවෙමි; එහෙත්, ඔහු සුවපත් කිරීමට
ඔවුන්ට නුපුළුවන් වී ය"යි කී ය. 17 ජේසුස්
වහන්සේ උත්තර දෙමින්, "අහෝ! ඇදහිල්ල
නොමැති හිතුවක්කාර පරම්පරාව, මා කොපමණ
කල් ඔබ සමඟ සිටින්න ද? කොපමණ කල් ඔබ
ගැන ඉවසන්න ද? ඔහු මා වෙත ගෙනෙන්නැ"යි
වදාළ සේක. 18 ජේසුස් වහන්සේ දුෂ්ටාත්මයට
තරවටු කළ සේක. එවිට දුෂ්ටාත්මය ඔහුගෙන් දුරු
ව ගියේ ය. ඒ මොහොතේ පටන් ළමයා සුවපත්
විය.
19 එවිට ශ්‍රාවකයෝ පෞද්ගලික ව ජේසුස්
වහන්සේ වෙතට අවුත්, "ඒ දුෂ්ටාත්මය දුරු කරන්න
අපට බැරි වූයේ මන්දැ"යි ඇසූහ. 20 මතෙ 21:21;
මාක් 11:23; 1 කොරි 13:2උන් වහන්සේ කතා කොට
මෙසේ වදාළ සේක: "ඔබගේ ඇදහිල්ල මදිකම
නිසා ය. සැබැවින් ම මම ඔබට කියමි: අබ මල්
රේණුවක් පමණ වත් ඇදහිල්ල ඔබට ඇත්නම් මේ
කන්දට, 'මෙතැනින් එතැනට යව'යි කීවොත් එය
යන්නේ ය; ඔබට නොකළ හැකි කිසිවක් නැත."

## මරණය හා පුනරුජ්ජීවනය ගැන යළිත් පැවසීම
(මාක් 9:30-32;ලූක් 9:43-45)

22 ඔවුන් ගලීලයේ නැවතී සිටින අතර උන්
වහන්සේ සිය ශ්‍රාවකයන්ට කතා කොට, "මනුෂ්‍ය-
පුත්‍රයාණෝ මිනිසුන් අතට පාවාදෙනු ලබන සේක.
23 ඔව්හු එතුමාණන් මරන්නෝ ය. එහෙත් තුන් වන
දා එතුමාණෝ උත්ථාන කරනු ලබන සේකැ"යි වදාළ
සේක. ඒ ඇසූ ඔව්හු අතිශයින් ශෝක වූ හ.

## දේව මාලිගා බද්ද ගෙවීම

24 නික්ම 30:13; 38:26 ඔවුන් කපර්ණවුමට ආ කල
දේව මාලිගා බද්ද අය කරන්නෝ පේදුරු වෙතට
අවුත්, "ඔබගේ ගුරුදේවයන් දේව මාලිගා බද්ද
ගෙවන්නේ නැද්දැ"යි ඇසූහ. 25 "ගෙවන සේකැ"යි
ඔහු කී ය. ඔහු ගෙට පිවිසි කල, යමක් කියන්න
පෙරෙ, ජේසුස් වහන්සේ ඔහුට කතා කොට,
"සීමොන්, මේ ගැන ඔබගේ අදහස කුමක් ද?
මෙලොව රජවරුන් සුංගම් නොහොත් ආදායම්
ගන්නේ කාගෙන් ද? සිය සෙනෙඟගෙන් ද නොහොත්
විදේශීන්ගෙන් දැ"යි ඇසූ සේක. 26 "විදේශීන්ගෙන්
ය"යි ඔහු කී කල, ජේසුස් වහන්සේ කතා කොට,
"එසේ නම් ස්වදේශීය සෙනෙඟ නිදහස් ය.
27 එහෙත්, අප ඔවුන්ට බාධාවක් නොවෙන පිණිස,
ඔබ මුහුදට ගොස් බිලී බා, මුලින් ම අසුවන මාළුවා
ගෙන, උගේ කට ඇරිය විට රිදී කාසියක් ඔබට
සම්බ වන්නේ ය. එය ගෙන මා සහ ඔබ වෙනුවෙන්
ඔවුන්ට දෙන්නැ"යි වදාළ සේක.

## සැබෑ උතුම්කම
(මාක් 9:33-37;ලූක් 9:46-48)

18 ලූක් 22:24 එවේලෙහි ශ්‍රාවකයෝ ජේසුස්
වහන්සේ වෙතට අවුත්, "ස්වර්ග රාජ්‍යයෙහි
ඉතා ම උතුම් වන්නේ කවරෙක් දැ"යි ඇසූහ. 2 එවිට
උන් වහන්සේ කුඩා දරුවකු තමන් වෙතට කැඳවා
ඔවුන් මැද සිටුවා මෙසේ වදාළ සේක: 3 මාක්
10:15; ලූක් 18:17"සැබැවින් ම මම ඔබට කියමි, ඔබ
වෙනස් වී කුඩා දරුවන් මෙන් නොවූවොත්, කිසි
සේත් ස්වර්ග රාජ්‍යයට ඇතුළු නො වන්නහු ය.
4 එබැවින් මේ කුඩා දරුවා මෙන් යටහත් වන
යමෙක් ඇද්ද, ස්වර්ග රාජ්‍යයෙහි ඉතා ම උතුම්
වන්නේ ඔහු ය. 5 තවද, යමෙක් මාගේ නාමයෙන්
මෙවැනි කුඩා දරුවකු පිළිගන්නේ ද ඔහු මා
පිළිගන්නේ ය."

## පාපයට පෙළඹීම
(මාක් 9:42-48;ලූක් 17:1-2)

6 "මා කෙරෙහි අදහාගත් මේ බාලයන්ගෙන්
එකෙකු වත් නොමඟ යවන යමෙක් වේ ද, ඔහුගේ
ගෙළෙ වටා මහා ඇඹරුම් ගලක් එල්ලා මුහුදු
ගැඹුරෙහි ගිල්වා දැමීම ඔහුට යහපත. 7 මෙවැනි
බාධා ලොවේ ඇතිවීම කොතරම් දුකක් ද? බාධා
ඇතිවීම නියත ය; එසේ වුව ද යමෙකු නිසා බාධා

ඇති වේ ද, ඒ තැනැත්තාට වන විපතක මහත!
8 මතෙ 5:30ඔබගේ වැටීමට හේතුව ඔබගේ අත
හෝ පය හෝ වේ නම්, එය කපා ඉවත ලන්න. දෑත
දපො ඇති ව සදාතන ගින්නට හළෙනු ලැබීමට වඩා
අබ්බාගාත ව නොහොත් කොර ව ජීවනයට පිවිසීම
ඔබට යහපත ය. 9 මතෙ 5:29ඔබගේ වැටීමට
හේතුව ඔබගේ ඇස නම්, එය උපුටා අහක දමන්න.
දෑස ඇති ව නිරාගින්නට හළෙනු ලැබීමට වඩා එක
ඇසක් ඇති ව ජීවනයට පිවිසීම ඔබට යහපත."

## නැති වූ බැටළුවා පිළිබඳ උපමාව

(ලූක් 15:3-7)

10 "මේ බාලයන්ගනේ එකකෙු වත් හළො
නොදැකීමට වගබලාගන්න. මන්ද, 'ස්වර්ගයෙහි
ඔවුන්ගේ දේව දූතයෝ ස්වර්ගයෙහි වැඩ වසන
මාගේ පියාණන් වහන්සේ ඉදිරියෙහි නිරතුරු ම
සිටිති'යි මම ඔබට කියමි. 11 ලූක් 19:10මනුෂ්‍ය-
පුත්‍රයාණන් වැඩියේ, නැති වූවන් ගළවා ගන්නා
පිණිස ය.
12 "ඔබ කුමක් සිතන්නහු ද? බැටළුවන් සියයක්
ඇති යම් මිනිසකේ, උන්ගනේ එකකෙු මුළා ව
ගියොත්, ඉතිරි අනූ නවදනො කඳුකරයේ ඉන්න
හැර, මුළා ව ගිය එකා සොයා යන්නේ නැද් ද?
13 සැබැවින් ම ඔබට කියමි, ඌ සම්බ වුනොත් මුළා
ව නොගිය අනූනව දනො ගැන ප්‍රීති වනෙවාට වඩා
ඌ ගැන ප්‍රීති වන්නේ ය. 14 එසේ ම මේ බාලයන්
එක් කනෙකෙු වත් විනාශ වීම ස්වර්ගයෙහි වැඩ
වසන ඔබගේ පියාණන් වහන්සේගේ කැමැත්ත
නො වේ."

## පව් කළ සහෝදරයා

(ලූක් 17:3)

15 ලූක් 17:3 "ඔබගේ සහෝදරයා ඔබට විරුද්ධ ව
පව් කළොත්, පෞද්ගලික ව ඔහු හමු වී ඔහුගේ
වරද පනේවා දනේන. ඔබ කියන දේ ඔහු
පිළිගත්තොත්, ඔබ ඔබේ සහෝදරයා දිනාගත්තෙහි
ය. 16 ද්වි.නී. 19:15නොපිළිගත්තොත්, සාක්ෂිකාරයන්
දදෙනෙකෙුගේ හෝ තුන් දනෙකෙුගේ හෝ
සාක්ෂියනේ හැම පැමිණිල්ලක් ම ස්ථිර වන පිණිස
ඔබ සමඟ තවත් එක් කනෙකෙු නොහොත්
දදෙනෙකෙු කැඳවාගනෙ යන්න. 17 ඔහු ඔවුන් කියන
දේත් නොපිළිගත්තොත්, සභාවට දන්වන්න. සභාව
කියන දේත් නොපිළිගත්තොත්, ඔහු විජාතිකයකෙු
හෝ අයකැමියකෙු මනේ සලකන්න.
18 මතෙ 16:19; ජොහ 20:23 "සැබැවින් ම මම
ඔබට කියමි, ඔබ පොළොවෙහි දී යමක් බඳින්නහු
ද, එය ස්වර්ගයෙහි දී බඳිනු ලබන්නේ ය. ඔබ
පොළොවෙහි දී යමක් මුදන්නහු ද, එය ස්වර්ගයෙහි
දී මුදනු ලබන්නේ ය.
19 "නැවතත් මම ඔබට කියමි, පොළොවෙහි
ඔබනේ දදෙනෙකේ තමන් අයැදින කවර දයෙක් ගැන
වුව ද එකඟ වන්නෝ නම්, ස්වර්ගයෙහි වසන
මාගේ පියාණන් වහන්සේගනේ ඒ දයෙ ඔවුන්ට
ලැබනේනේ ය. 20 මන්ද, යම් තැනක දදෙනෙකේ
හෝ තුන්දනෙකේ හෝ මාගේ නාමයනේ රුස් ව
සිටිත් ද එතැන ඔවුන් මැද මමත් වැඩ සිටිමි."

## කමා නොවූ දාසයා පිළිබඳ උපමාව

21 ලූක් 17:3-4 එකල පේදුරු උන් වහන්සේ වතෙට
අවුත්, "ස්වාමීනි, මට විරුද්ධ ව පව් කරන මාගේ
සහෝදරයාට මා කී වාරයක් කමා විය යුතු ද? සත්
වාරයක් දක්වා දැ"යි උන් වහන්සේගනේ ඇසී ය.
22 උත් 4:24ජේසුස් වහන්සේ ඔහුට කතා කොට,
"සත් වාරයක් නොව, සත් වාර සැත්තෑවකි.
23 "මන්ද, ස්වර්ග රාජ්‍යය මවෙන්නකට උපමා කළ
හැකි ය: සිය දාසයන් සමඟ ගණන් හිලව් බැලීමට
තීරණය කරගත් රජකේ විය. 24 ඔහු එසේ කරන්න
පටන්ගත් කල රුපියල් දකෝටියක් පමණ ණය වූ
කනෙකේ ඔහු වතෙ ගනෙනෙ ලද්දේ ය. 25 ණය
ගෙවීමට ඔහුට කිසිවක් නොතිබුණු බැවින්, ස්වාමියා
ඔහු ද ඔහුගේ බිරිඳ හා දරුවන් ද ඔහු සන්තක
සියල්ල ද විකුණා ණය ගවෙන්න අණ කළෙේ ය.
26 එවිට ඒ දාසයා දණින් වැටී, 'මා ගැන ඉවසන්න,
මුළු ණය ගවෙන්නමේ'යි කී ය. 27 ඒ දාසයාගේ
ස්වාමියා ඔහු ගැන අනුකම්පාවනේ පිරී, ඔහු ණයනේ
නිදහස් කොට කමාව දුන්නේ ය.
28 එහතේ, ඒ දාසයා නික්ම ගොස්, තම සහකාර
දාසයන්ගනේ තමාට රුපියල් දසේයක් පමණ ණය ව
සිටි කනෙකෙු දැක, ඔහුගේ බලේල මිරිකා ඔහු
අල්ලාගනෙ, 'මගේ ණය ගවොපන්නැ'යි කී ය.
29 එවිට ඔහුගේ සහකාර දාසයා බිම වැටී, 'මා ගැන
ඉවසන්න, ණය ගවෙන්නමේ'යි කන්නලව් කරමින් කී
ය. 30 එහතේ, ඔහු නොඉවසා ණය ගවෙන තකේ
ඔහු හිර අඩස්සි කළෙේ ය.
31 ඔහුගේ සහකාර දාසයෝ සිදුවූ දේ දැක,
අතිශයින් ශෝක වී, අවුත් සිදුවූ සියල්ල තම
ස්වාමියාට දැන්වූ හ. 32 එවිට ඔහුගේ ස්වාමියා ඔහු
කැඳවා කතා කොට, 'දුෂ්ට දාසය, නුඹේ ඉල්ලීම
නිසා මම ඒ ණය සියල්ල නුඹට කමා කළෙමි.
33 මා නුඹට අනුකම්පා කළාක් මනේ ම, නුඹත්
නුඹේ සහකාර දාසයාට අනුකම්පා කළ යුතුව
තිබුණා නොවේ දැ'යි ඇසී ය. 34 ඔහුගේ ස්වාමියා
කෝප ව ඔහු තමාට ගවේය යුතු සම්පූර්ණ ණය
ගවෙන තකේ ඔහු වධකයන්ට භාර දුන්නේ ය.
35 ඔබත් එකිනකො තමාගේ සහෝදරයාට මුළු
සිතින් කමා නොකරන්නහු නම්, ස්වර්ගයෙහි වැඩ
වසන මාගේ පියාණන් වහන්සේ ද, එසේ ම
ඔබටත් කමා නොකරනු ඇත."

## දික්කසාදය පිළිබඳ අනුශාසනා

(මාක් 10:1-12)

19 තවද ජේසුස් වහන්සේ මේ වචන වදාරා
නිම කොට, ගලීලයනේ නික්ම ජොර්දානනේ
එගොඩ ජුදයේ පළාත්වලට පැමිණි සේක. 2 මහා
ජනකායක් උන් වහන්සේ පසුපස්සේ ගියහ. උන්
වහන්සේ එහි දී ඔවුන් සුවපත් කළ සේක.

3 පරිසිවරු උන් වහන්සේ වෙතට පැමිණ උන්
වහන්සේ වචනයකින් අල්ලාගන්නා පිණිස, “යමකු
විසින් කුමන කරුණක් නිසා වත් සිය භාර්යාව
දික්කසාද කිරීම නීතියට අනුකූල දැ”යි උන්
වහන්සේගෙනේ ඇසූ හ. 4 උත් 1:27; 5:2උන්
වහන්සේ උත්තර දෙමින්, “පටන් ගැන්මේ සිට ම
මැවුම්කාරයාණන් පිරිමි ගැහැණු වශයෙනේ මනුෂ්‍ය
වර්ගයා මැවූ බව ඔබ කියවා නැද් ද? 5 උත් 2:24ඒ
නිසා මිනිසකු තම පියා ද මව ද අත්හැර සිය
භාර්යාවට ඇලුම් වන බවත්, ඒ යුවල එක් කෙනෙකු
වන බවත් දෙවියන් වහන්සේ වදාළ සේක.
6 මෙසේ ඔව්හු එවක් පටන් දෙදෙනෙකු නොව එක්
කෙනෙකේ වෙති. එබැවින් දෙවියන් වහන්සේ එක්
කළ අය මනුෂ්‍යයා වෙනේ නොකරේවා”යි වදාළ
සේක. 7 ද්වි.නී. 24:1-4; මතෙ 5:31ඔව්හු කතා
කොට, “එසේ වී නම් දික්කසාද සහතිකයක් දී ඇය
අත් හරින්න මෝසෙසේ අණ කළේ මන්දැ”යි උන්
වහන්සේගෙනේ ඇසූ හ.
8 උන් වහන්සේ පිළිතුරු දෙමින්, “මෝසෙසේ ඔබගේ
භාර්යාවන් දික්කසාද කිරීමට අවසර දුන්නේ ඔබගේ
සිත් දැඩිකම නිසා ය. එහෙත්, පටන් ගැන්මේ සිට
එසේ නො වී ය”යි ඔවුන්ට වදාළ සේක. 9 මතෙ
5:32; 1 කොරි 7:10-11“තවදුරටත් මම ඔබට මෙසේ
කියමි: වේශ්‍යාකම නිසා මිස තම භාර්යාව
දික්කසාද කොට වෙනෙ ස්ත්‍රියක සරණ පාවා ගන්න
කවරෙකේ නමුත් කාමමිථ්‍යාචාරය කරන්නේ ය;
දික්කසාද කරනු ලැබූ ඒ ස්ත්‍රිය විවාහ කරගන්නා ද
කාමමිථ්‍යාචාරය කරන්නේ ය.”
10 ශ්‍රාවකයෝ උන් වහන්සේට කතා කොට,
“ස්ත්‍රිය හා පුරුෂයා අතර සම්බන්ධය මෙසේ නම්,
විවාහ නොවී සිටීම වඩා හොඳ ය”යි කීහ.
11 එහෙත්, උන් වහන්සේ ඔවුන්ට කතා කරමින්,
“දේව වරමක් ලැබූ අයට මිස, හැම දෙනොට ම මේ
ප්‍රතිපත්තිය පිළිපැදිය නොහැකි ය. 12 මන්ද,
උත්පත්තියෙනේ ම විවාහ විය නොහැකි අය සිටිති;
මනුෂ්‍ය බලපෑම නිසා විවාහ විය නොහැකි අය ද
සිටිති; ස්වර්ග රාජ්‍යය අරභයා සිය කැමැත්තෙනේ ම
විවාහ නොවන අයත් සිටිති. මේ තත්ත්වය
පිළිගන්න හැකි තැනැත්තේ පිළිගනී වා”යි වදාළ
සේක.

## ළදරුවන්ට ආශීර්වාද කිරීම
(මාක් 10:13-16;ලූක් 18:15-17)

13 එකල උන් වහන්සේගේ අත් ළදරුවන් පිට තබා
යාච්ඤා කරන පිණිස, සමහරු උන් වහන්සේ වෙතට
ඔවුන් ගෙනොහ. ශ්‍රාවකයෝ ඔවුන්ට තරවටු කළහ.
14 එහෙත්, ජේසුස් වහන්සේ කතා කොට,
“ළදරුවන්ට මා වෙත එන්න ඉඩ හරින්න; ඔවුන්
නොවළක්වන්න; මන්ද, ස්වර්ග රාජ්‍යය
මෙවැන්නන්ගේ ය”යි වදාළ සේක. 15 උන් වහන්සේ
ඔවුන් පිට අත් තබා එතැනින් නික්ම ගිය සේක.

## පොහොසත් තරුණයා
(මාක් 10:17-31;ලූක් 18:18-30)

16 වරක් එක් මිනිසෙකේ උන් වහන්සේ වෙත අවුත්,
“ගුරුදේවයෙනි, සදාතන ජීවනය ලබනු වස්, මා
කුමන යහපතක් කළ යුතු දැ”යි උන් වහන්සේගෙනේ
ඇසී ය. 17 උන් වහන්සේ පිළිතුරු දෙමින්, “ඔබ
යහපත ගැන මාගෙනේ විචාරන්නේ මන් ද? යහපත්
ව සිටින්නේ එක ම එක කෙනෙකි. එහෙත්, ඔබ
ජීවනයට ඇතුළු වන්න කැමැත්තෙහි නම් ආඥා
පිළිපදින්නැ”යි ඔහුට වදාළ සේක. 18 නික්ම
20:13-16; ද්වි.නී. 5:17-20“කොයි ආඥා දැ”යි ඔහු උන්
වහන්සේගෙනේ ඇසී ය. ජේසුස් වහන්සේ පිළිතුරු
දෙමින්, “මිනී නොමරන්න; කාමමිථ්‍යාචාරය
නොකරන්න; සොරකම් නොකරන්න; බොරු සාක්ෂි
නොකියන්න; 19 නික්ම 20:12; ලෙවී 19:18; ද්වි.නී.
5:16නුඹේ පියාට ද මවට ද ගෞරව කරන්න; නුඹ,
නුඹට ප්‍රේම කරන්නාක් මෙනේ නුඹේ අසල්වැසියාට
ප්‍රේම කරන්න යන මේවා ය”යි වදාළ සේක.
20 තරුණයා කතා කරමින්, “මේ සියල්ලක් ම
පිළිපැදීමි; තව මට අඩු කිමෙකේ දැ”යි උන්
වහන්සේගෙනේ ඇසී ය. 21 උන් වහන්සේ පිළිතුරු
දෙමින්, “ඔබ සර්ව සම්පූර්ණ වන්න කැමැත්තෙහි
නම්, ගොස් ඔබ සතු සියල්ල විකුණා, දිළිඳුන්ට
දෙනේන; එවිට ස්වර්ගයෙහි ඔබට සම්පත් ඇති
වන්නේ ය; එන්න, ඔබ මා අනුගාමී වන්නැ”යි ඔහුට
වදාළ සේක. 22 එහෙත්, ඒ තරුණයා ඒ කීම අසා,
දොම්නස් සිතින් යන්න ගියේ ය. මන්ද, ඔහු
බොහෝ ධනසම්පත් ඇති කෙනෙකු වූ බැවිනි.

## පරිත්‍යාගයේ පල

23 එවිට ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන්ට කතා
කොට, “සැබැවින් ම මම ඔබට කියමි.
ධනපතියකුට දෙවියන් වහන්සේගේ රාජ්‍යයට
ඇතුළුවීම දුෂ්කර ය. 24 යළිත් මම ඔබට කියමි,
ධනපතියකුට දෙවියන් වහන්සේගේ රාජ්‍යයට
ඇතුළු වීමට වඩා ඔටුවකුට ඉඳිකටු මලින් රිංගා
යාම පහසු ය”යි වදාළ සේක. 25 ශ්‍රාවකයෝ ඒ
අසා අතිශයින් මවිත වී, “එසේ නම් ගැළවීම ලැබිය
හැක්කේ කවරෙකුට දැ”යි ඇසූ හ. 26 ජේසුස්
වහන්සේ ඔවුන් දෙස බලා, “මිනිසුන්ට නම් එසේ
කළ නොහැකි ය; එහෙත් දෙවියන් වහන්සේට
සියල්ල කළ හැකිය”යි වදාළ සේක.
27 එවිට පේදුරු කතා කරමින්, “බලන්න, අපි නම්
සියල්ල අත්හැර දමා ඔබ අනුව ආවමු; එහයින්
අපට කුමක් ලැබේ දැ”යි උන් වහන්සේගෙනේ ඇසී ය.
28 මතෙ 25:31; ලූක් 22:30ජේසුස් වහන්සේ ඔවුන්ට
කතා කොට, මෙසේ වදාළ සේක: “සැබැවින් ම මම
ඔබට කියමි, මතු ඇති වන නව යුගයේ දී මනුෂ්‍ය-
පුත්‍රයාණන් මහිමාන්විත ව සිංහාසනයේ වැඩ
හිඳින කල, මා අනුගාමී වූ ඔබත් ඉශ්‍රායලේ ගෝත්‍ර
දොළොස විනිශ්චය කරමින් සිංහාසන දොළොසක්
පිට හිඳින්නහු ය. 29 ඇරත් මාගේ නාමය නිසා,

ගේදොර හෝ සහොහොයුරන් හෝ සහොහොයුරියන්
හෝ පියා හෝ මව හෝ දූ පුතුන් හෝ ගම්බිම් හෝ
අත්හළ කවරකු වුව ද, ඔහු ඒ වෙනුවට සිය
ගුණයක් ලබන්නේ ය; සදාතන ජීවනය ද හිමි
කරගන්නේ ය. 30 මතෙ 20:16; ලූක් 13:30එහෙත්
ප්‍රථමයෝ බොහෝ දෙනෙක් අන්තිමයෝ ද
අන්තිමයෝ ප්‍රථමයෝ ද වන්නෝ ය.”

### මිදි වත්තේ සේවකයන් පිළිබඳ උපමාව

20 උන් වහන්සේ මෙසේ ද වදාළ සේක:
“ස්වර්ග රාජ්‍යය වූකලී තමාගේ මිදි වත්තට
කුලීකරුවන් ගන්නා පිණිස එක් දිනක් අලුයම පිටත්
ව ගිය ඉඩම් හිමියකුට සමාන ය. 2 ඔහු දිනකට
රිදී කාසියක් බැගින් ගෙවීමට කුලීකරුවන්ට
පොරොන්දු වී, තමාගේ මිදි වත්තට ඔවුන් යැවී ය.
3 උදේ නවයට පමණ ඔහු පිටත් ව ගොස්,
කඩමණ්ඩියේ වැඩක් නැති ව සිටි තවත් අය දැක,
4 ‘ඔබත් මිදි වත්තට යන්න, සෑහෙන කුලියක් ඔබට
දෙමි’යි කී ය. 5 ඔව්හු වැඩට ගියහ. නැවත
මද්දහනේ දී ද අපර භාග තුනට පමණ ද ඔහු පිටත්
ව ගොස් එසේ ම කළේ ය. 6 සවස පහට පමණ
ද පිටත් ව ගොස් එහි තවත් අය සිටිනු දැක, ‘ඔබ
මෙතැන දවස තිස්සේ නිකම් සිටින්නේ මන්දැ’යි
ඔවුන්ගෙන් ඇසී ය. 7 ‘කිසිවකු අප වැඩට නොගත්
නිසා ය’යි ඔව්හු කී හ. ‘ඔබත් මිදි වත්තට යන්නැ’යි
ඔහු ඔවුන්ට කී ය.
8 ලෙවී 19:13; ද්වි.නී. 24:15 “සවස් වූ කල මිදි
වත්ත හිමියා සිය කළමනාකාරයාට කතා කොට,
‘කුලීකරුවන් කැඳවා අන්තිමට ආ අයගෙන්
පටන්ගෙන පළමු වැන්නා දක්වා ඔවුන් හැමට කුලිය
ගෙවන්නැ’යි කී ය. 9 එවිට සවස පහට පමණ වැඩට
ආ අය අවුත් එක එක මිනිසා රිදී කාසිය බැගින්
ලැබූ හ. 10 මුලින් ම වැඩට ගිය අය ආ විට තමන්ට
ඊට වැඩියෙන් ලැබෙනු ඇතැයි සිතූ හ. එහෙත්, ඔව්හු
ද එක එක මිනිසා රිදී කාසියක් බැගින් ලැබූ හ.
11 එසේ ලැබූ ඔව්හු ඉඩම් හිමියාට විරුද්ධ ව දොස්
කියමින්, 12 ‘මේ අන්තිමට ආ අය වැඩ කළේ එක
පැයක් පමණි. එහෙත්, අවු රස්නය නොබලා මුළු
දවසේ ම වෙහෙස මහන්සි වූ අපටත් ඔබ රිදී
කාසියක කුලිය ම ගෙවන්නෙහි ය’යි කී හ.
13 එහෙත්, ඔහු ඔවුන්ගෙන් කෙනෙකුට උත්තර
දෙමින්, ‘යහළුව, මා ඔබට අයුත්තක් කරනවා
නොවේ. ඔබ මා සමඟ රිදී කාසියක කුලියට එකඟ
වුණා නොවේ ද? 14 ඔබට දුන් කුලිය රැගෙන
යන්න; ඔබට ගෙවූ ලෙස ම මේ අන්තිමයාටත්
ගෙවීම මාගේ කැමැත්ත ය. 15 මා සන්තක දෙයින්
මා කැමැති දෙයක් කිරීමට මට අයිතියක් තිබෙනවා
නොවේ ද? මා කාරුණික බැවින් ඔබ ඊර්ෂ්‍යා
වන්නේ මන්දැ’යි ඇසී ය. 16 මතෙ 19:30; මාක්
10:31; ලූක් 13:30මෙසේ අන්තිමයෝ ප්‍රථමයෝ ද
ප්‍රථමයෝ අන්තිමයෝ ද වන්නෝ ය.”

### මරණය හා පුනරුජ්ජීවනය ගැන තෙවෙනි වරටත් කීම

(මාක් 10:32-34;ලූක් 18:31-34)

17 ජේසුස් වහන්සේ ජෙරුසලමට යමින් සිටි සේක්,
අතරමඟ දී ප්‍රේරිතයන් දොළොස් දෙනා වෙනේ
කොට ගෙන ඔවුන්ට කතා කොට, 18 “දැන් අපි
ජෙරුසලමට යම්හ. මනුෂ්‍ය-පුත්‍රයාණෝ නායක
පූජකයන්ටත්, විනයධරයන්ටත් පාවා දෙනු ලබන
සේක. ඔව්හු එතුමාණන් මරණයට නියම කොට,
19 කවටකම් කිරීම ද තැලීම ද කුරුසියෙහි ඇණ
ගැසීම ද සඳහා විජාතීන්ට පාවා දෙති. එහෙත්, තුන්
වන දා එතුමාණෝ උත්ථාන කරනු ලබන සේකැ”යි
වදාළ සේක.

### මවකගේ අයැදුම

(මාක් 10:35-45)

20 එකල සෙබෙදීගේ පුත්‍රයන්ගේ මව ඇගේ
පුත්‍රයන් හා සමඟ උන් වහන්සේ වෙත අවුත්,
දණින් වැටී, එක් වරයක් ඉල්ලුවා ය. 21 උන්
වහන්සේ කතා කරමින්, “ඔබ කුමක් ඉල්ලන්නෙහි
දැ”යි ඇයගෙන් ඇසූ සේක. ඈ පිළිතුරු දෙමින්,
“ඔබගේ රාජ්‍යයෙහි දී මේ මාගේ පුතුන්
දදෙනාගෙන් එක් කෙනෙකු ඔබගේ දකුණු පසෙහි
ද එක් කෙනෙකු වම් පසෙහි ද හිඳගැනීමට නියම
කළ මැනවැ”යි කීවා ය. 22 එහෙත්, ජේසුස්
වහන්සේ උත්තර දෙමින්, “ඔබ ඉල්ලන්නේ කුමක් දැ
යි ඔබ ම දන්නේ නැත. මා බොන්න යන දුක්
වේදනා නමැති කුසලානෙන් බොන්න ඔබට හැකි
දැ”යි ඇසූ සේක. “අපට හැකි ය”යි ඔව්හු පිළිතුරු
දුන්හ. 23 උන් වහන්සේ ඔවුන්ට කතා කොට,
“සැබැවින් ඔබ මාගේ කුසලානෙන් බොන්නහු ය.
එහෙත් මාගේ දකුණු පසෙහි ද වම් පසෙහි ද
හිඳගන්න දීම මා සතු දෙයක් නොවේ. මාගේ
පියාණන් විසින් ඒවා යම් අය සඳහා නියම කරන
ලද්දේ ද ඒවා අයිති ඔවුන්ට ය”යි වදාළ සේක.
24 දස දෙනා එපවත් ඇසූ විට ඒ සහොහොයුරන්
දදෙනා ගැන කෝප වූ හ.
25 ලූක් 22:25-26 එහෙත්, ජේසුස් වහන්සේ ඔවුන්
තමන් වෙත කැඳවා මෙසේ වදාළ සේක:
“විජාතීන්ගේ ආණ්ඩුකාරයින් ඔවුන් කෙරේ
ආධිපත්‍යය පවත්වන බවත්, ඔවුන්ගේ ප්‍රධානීන්
ඔවුන් කෙරේ බලය පවත්වන බවත් ඔබ දන්නහු ය.
26 මතෙ 23:11; මාක් 9:35; ලූක් 22:26එහෙත්, ඔබ
අතර එසේ නොවිය යුතු යි. ඔබ අතර යමෙක්
නායකයා වන්න කැමැත්තේ නම්, ඔහු ඔබේ
සේවකයා වන්නේ ය. 27 ඔබ අතර යමෙක්
ප්‍රධානියා වන්න කැමැත්තේ නම්, ඔහු ඔබේ දාසයා
වන්නේ ය. 28 මනුෂ්‍ය-පුත්‍රයාණන් වැඩියේ සේවය
ලබන්න නොව, සේවය කරන්නටත්, බොහෝ
දෙනෙකුගේ මිදීම උදෙසා සිය දිවි පිදීමටත් ය.”

### අන්ධයන් දදෙනෙකුට පනේම දීම
(මාක් 10:46-52;ලූක් 18:35-43)

29 ඔවුන් ජරිකෝවනේ පිටත් ව යද්දී මහා
ජනකායක් උන් වහන්සේ පසුපස්සේ ගියහ. 30 පාර
අද්දර හිඳගනෙ උන් අන්ධයන් දදෙනෙකේ ජේසුස්
වහන්සේ ඒ අසලින් යන බව අසා, “ස්වාමීනි,
දාවිත්ගේ පුත්‍රයාණනෙි, අපට අනුකම්පා කළ
මැනවැ”යි මොරගැසූ හ. 31 එවිට සමූහයා ඔවුන්ට
නිහඬ වන ලසෙ සැර කළහ. එහතේ ඔව්හු,
“ස්වාමීනි, දාවිත්ගේ පුත්‍රයාණනෙි, අපට අනුකම්පා
කළ මැනව” කියා වැඩි වැඩියනේ මොරගැසූ හ.
32 ජේසුස් වහන්සේ නැවතී ඔවුන් කැඳවා, “මා
ඔබට කුමක් කරදනෙවාට ඔබ කැමැති දැ”යි ඇසූ
සේක. 33 “ස්වාමීනි, අපට පනේම දුන මැනවැ”යි
ඔව්හු උන් වහන්සේට කී හ. 34 ජේසුස් වහන්සේ
ඔවුන්ට අනුකම්පා කර, ඔවුන්ගේ ඇස් ස්පර්ශ කළ
සේක. එකණෙහෙි ම ඔව්හු පනේම ලැබ උන්
වහන්සේ පසුපස්සේ ගියහ.

### රාජ තේජසින් ජරෙුසලමට පිවිසීම
(මාක් 11:1-11;ලූක් 19:28-38;ජාොහ 12:12-19)

21 ඔව්හු ජරෙුසලමට ළං ව ඔලීව කන්ද
සමීපයහෙි වූ බතේපාගයට පැමිණියහ.
ජේසුස් වහන්සේ ශ්‍රාවකයන් දදෙනෙකු යවමින්,
2 “ඉදිරිපිට තිබනෙ ගමට යන්න, ගිය කණෙහෙි ම
එහි බැඳ සිටින කොටළු දනෙක හා ඈ සමඟ
කොටළු නාම්බකු ඔබට සම්බ වනු ඇත. උන් ලිහා
මා වතෙට ගනෙනේන. 3 යම් කනෙකු යමක්
කීවොත්, ‘සමිඳාණන් වහන්සේට උන්ගනේ වැඩක්
ඇතැ’යි කියන්න; එවිට ඔහු වහාම උන් එවනු
ඇතැ”යි ඔවුන්ට වදාළ සේක. 4 මසෙේ වූයේ
දිවැසිවරයා ලවා කියවන ලද මේ දයෙ ඉටු වන
පිණිස ය. එනම්:
5 සකෙරි 9:9 “බලන්න, ඔබේ රජ කොටළුවකු
පිට, එසේ ය, කොටළු වස්සකු පිට නැඟී, යටහත්
පහත් ලසෙ ඔබ වතෙ එන්නේ යයි සියොන්
වැසියන්ට දන්වන්න”
5 යනුයි. 6 ‘ශ්‍රාවකයෝ ගොස් ජේසුස් වහන්සේ
නියම කළ ලසෙ කළහ: 7 කොටළු දනෙ ද පැටියා ද
ගනෙවුත් තමන්ගේ උතුරුසළු උන් පිට එළාලූහ. උන්
වහන්සේ හිඳගත් සේක. 8 සමූහයාගනේ බොහෝ
දනෙකේ තමන්ගේ උතුරුසළු මඟ අතුළෝ ය; තවත්
සමහරු ගස්වලින් අතු කපා මඟ අතුළෝ ය. 9 ගීතා
118:25-26පරෙටුව හා පසුව ගමන් කළ සමූහයෝ,
“දාවිත් රජුගේ පුත්‍රයාණන්ට හෝසන්නා!
සමිඳුන්ගේ නමින් වඩිනා මතෙුමාණන් හට, ආසිරි
වේ වා! ඉතා උසස් තැන්හි හෝසන්නා!” කියා
මොරගැසූ හ.
10 උන් වහන්සේ ජරෙුසලමට පිවිසි කල, මුළු
නුවර වැසියෝ කැළඹී, “මේ කවරකේ දැ”යි ඇසූ හ.
11 සමූහයෝ ද, “මතෙුමාණෝ ගලීලයේ නාසරතේ
නුවර දිවැසිවර ජේසුස් වහන්සේ ය”යි පිළිතුරු දුන්හ.

### දේව මාලිගාව පවිත්‍ර කිරීම
(මාක් 11:15-19;ලූක් 19:45-48;ජාොහ 2:13-22)

12 ජේසුස් වහන්සේ දේව මාලිගාවට ඇතුළු ව,
එහි වළෙහළෙඳාම් කරමින් සිටි සියල්ලන් පිටතට
පලවා හැර, මුදල් මාරු කරන්නන්ගේ මේස ද පරවේ
වළෙඳුන්ගේ ආසන ද පරෙළා දමා, 13 “ ‘මාගේ
ගෘහය යාච්ඤාවේ ගෘහය කැ යි කියනු ලබන්නේ
ය’යි ලියා ඇත. එහතේ, ඔබ එය සොරුන්ගේ
ගුහාවක් කරන්නහු ය”යි ඔවුන්ට වදාළ සේක.යසො
56:7; ජරෙ 7:11
14 අන්ධයෝ ද කොරු ද දේව මාලිගාවහෙි උන්
වහන්සේ වතෙට ආහ. උන් වහන්සේ ඔවුන් සුවපත්
කළ සේක. 15 එහතේ, නායක පූජකවරු හා
විනයධරයෝ උන් වහන්සේ කළ අරුමපුදුම දේ ද,
“දාවිත් රජුගේ පුත්‍රයාණන්ට හෝසන්නා” කියමින්
දේව මාලිගාවේ මොරගසන දරුවන් ද දැක කෝප
වී, 16 ගීතා 8:2“මොවුන් කියන දේ ඔබට ඇසනෙවා
දැ”යි උන් වහන්සේගනේ ඇසූ හ. ජේසුස් වහන්සේ,
“එසේ ය, බිළිඳුන්ගේ ද කිරි දරුවන්ගේ ද මුවින් ඔබ
තුති පිදීම සලසා ඇත යන පාඨය කවදාවත් කියවා
නැද්දැ”යි ඔවුන්ගනේ ඇසූ සේක. 17 උන් වහන්සේ
ඔවුන්ගනේ වනේ වී, නුවරින් නික්ම බතොනියට
ගොස් එහි රාත්‍රිය ගත කළ සේක.

### අත්තික්කා ගසට සාපය
(මාක් 11:12-14,20-24)

18 පසු දින උදෑසන නුවරට නැවත යන අතර උන්
වහන්සේට සාගිනි වීය. 19 උන් වහන්සේ පාර අද්දර
තිබුණු අත්තික්කා ගසක් දැක, ළඟට ගොස්, එහි
කොළ මිස අන් කිසිවක් නොදැක, “මතෙන් පටන්
කිසි කලකෙ තාගනේ පලදාවක් නො වේ වා”යි ඒ
ගසට වදාළ සේක. අත්තික්කා ගස ඒ ඇසිල්ලහෙි ම
වියළී ගියේ ය. 20 ශ්‍රාවකයෝ ඒ දැක, අත්තික්කා
ගස ඒ ඇසිල්ලහෙි ම වියළුණේ කසෙේ දැ යි මවිත
වූ හ. 21 මතෙ 17:20; 1 කොරි 13:2ජේසුස්
වහන්සේ උත්තර දමේන්, “සැබැවින් ම මම ඔබට
කියමි, ඔබ සැක නොකොට, ඇදහිල්ල ඇති ව
සිටින්නහු නම්, මේ අත්තික්කා ගසට මා කළ දයෙ
ඔබත් කරනු ඇත. එපමණක් නොව, මේ කන්දට,
‘ඉදිරී ගොස් මුහුදේ වැටේ වා’යි කීවොත් එය ද
සිදුවනු ඇත. 22 තවද, ඔබට ඇදහිල්ල ඇත්නම්,
කවර දයෙක් ඉල්ලා යාච්ඤා කළත් එය ඔබට
ලැබනෙු ඇතැ”යි ඔවුන්ට වදාළ සේක.

### ජේසුස් වහන්සේගේ අධිකාරි බලය ගැන ප්‍රශ්න කිරීම
(මාක් 11:27-33;ලූක් 20:1-8)

23 උන් වහන්සේ දේව මාලිගාවට ඇතුළු ව
උගන්වමින් සිටිය දී නායක පූජකවරු ද ප්‍රජා
මූලිකයෝ ද උන් වහන්සේ වතෙට අවුත්, “ඔබ මේ
දේ කරන්නේ කුමන අධිකාරි බලයකින් ද? මේ
බලය ඔබට පැවරුවේ කවරකේ දැ”යි ප්‍රශ්න කළහ.

24 ජේසුස් වහන්සේ උත්තර දෙමින්, “මමත්
ඔබගෙන් ප්‍රශ්නයක් විචාරමි. ඔබ එය මට
කියන්නහු නම්, මේ දේවල් කරන්නේ කුමන
අධිකාරි බලයකින් දැ යි මමත් ඔබට කියමි.
25 බව්තීස්ම-ස්නාපනය කිරීමේ බලය ජොහන්
ලැබුවේ කවරකුගෙන් ද? දෙවියන් වහන්සේගෙන්
ද? නොහොත් මනුෂ්‍යයන්ගෙන් දැ”යි ඇසූ සේක.
ඔව්හු තම තමන් අතර තර්ක කරමින්, “ ‘දෙවියන්
වහන්සේගෙන් ය’යි කීවොත්, ‘එසේ නම් ඔබ
ජොහන් විශ්වාස නොකළේ මන්දැ’යි අපෙන් අසනු
ඇත. 26 ‘මනුෂ්‍යයන්ගෙන් ය’යි කීවොත්, ජොහන්
දිවැසිවරයකු බව සියලු දෙනාම පිළිගෙන ඇති
හෙයින් සමූහයාට මුහුණ දීමට අපට නො හැකිවනු
ඇත” යනුවෙන් තම තමන් අතර තර්ක කරමින් සිට,
බියෙන්, “අපි නොදනිමු”යි ජේසුස් වහන්සේට
උත්තර දුන්හ. 27 උන් වහන්සේ කතා කරමින්,
“කවර අධිකාරි බලයකින් මම මේ දේවල් කරම් දැ
යි මමත් ඔබට නොකියමි”යි ඔවුන්ට වදාළ සේක.

## පුතුන් දෙදෙනා පිළිබඳ උපමාව

28 තවදුරටත් ජේසුස් වහන්සේ කතා කරමින්,
“ඔබ මේ ගැන කුමක් සිතන්නහු ද? එක් මිනිසකුට
පුත්‍රයෝ දෙදෙනෙක් සිටියහ; ඔහු වැඩිමලා ළඟට
ගොස්, ‘දරුවා යන්න; අද මිදි වත්තේ වැඩ
කරන්නැ’යි කී ය. 29 ඔහු උත්තර දෙමින්, ‘නොයෙමි’යි
කී ය. එහෙත්, පසුව පසුතැවිලි වී වැඩට ගියේ ය.
30 පියා දෙවෙන්නා ළඟට ගොස් ඔහුටත් මුලින් කී
දේ ම කී ය. ඔහු උත්තර දෙමින්, ‘ස්වාමිනි, යමි’යි කී
ය, එහෙත් නොගියේ ය. 31 ඒ දෙදෙනාගෙන්
පියාගේ කැමැත්ත ඉටු කළේ කවරකේ දැ”යි ඇසූ
සේක. “වැඩිමලා”යි ඔව්හු කී හ. ජේසුස් වහන්සේ
ඔවුන්ට කතා කොට, “සැබැවින් ම මම ඔබට කියමි,
අයකැමියෝත්, වෙසඟනෝත් ඔබට පළමුවෙන්
දෙවියන් වහන්සේගේ රාජ්‍යයට පැමිණෙති. 32 ලූක්
3:12; 7:29-30මන්ද, ජොහන් ධර්මිෂ්ඨ මාර්ගය
පෙන්වන පිණිස ඔබ වෙත ආවේ ය. ඔබ ඔහු
විශ්වාස කළේ නැත. එහෙත්, අයකැමියෝත්
වෙසඟනෝත් ඔහු විශ්වාස කළහ. ඔබ එය දැක
ඉන්පසුව වත් ඔහු කෙරෙහි විශ්වාස කරන පිණිස
පසුතැවී සිත් හරවා නොගත්තහු ය”යි වදාළ සේක.

## මිදි වත්ත හා වැවිලිකරුවන් පිළිබඳ උපමාව

(මාක් 12:1-12;ලූක් 20:9-19)

33 යෙසා 5:1-2 ජේසුස් වහන්සේ නැවතත් කතා
කොට මෙසේ වදාළ සේක: “මේ උපමාවත් අසන්න.
එක් වතු හිමියකේ මිදි වත්තක් වවා එය වටා වැට
බැඳ, එහි මිදි යන්ත්‍රයකට වළක් කැණ, මුර
අට්ටාලයක් ඉදි කොට, එය ගොවීන්ට අඳේට දී
පිටරට ගියේ ය. 34 අස්වැන්න කාලය ළං වූ කල,
පලදාවෙන් තම කොටස ගන්නා පිණිස ඔහු තම
දාසයන් ගොවීන් වෙත යැවී ය. 35 එවිට ගොවීහු
ඔහුගේ දාසයන් අල්ලා එකකුට තැළූ හ; එකකු
මැරූ හ; තව එකකුට ගල් ගැසූ හ. 36 යළිත්, ඔහු
මුලින් යැවූ අයට වඩා දාසයන් වැඩි ගණනක් යැවී
ය. ඒ ගොවීහු ඔවුන්ටත් පරෙ සේ ම කළහ.
37 අන්තිමට ඔහු, ‘මාගේ පුතණුවන්ට ඔවුන්
ගෞරව කරනු ඇත’ කියා සිය පුත්‍රයා ඔවුන් වෙත
යැවී ය. 38 එහෙත්, ගොවීහු පුත්‍රයා දැක, ‘මේ
උරුමක්කාරයා ය; එන්න, මොහු මරාදමා මොහුගේ
උරුමය ගනිමු’යි ඔවුනොවුන් අතර කතා කොට,
39 ඔහු අල්ලා මිදි වත්තෙන් පිටතට දමා මැරූ හ.
40 එහෙයින් ස්වාමියා ආ කල ඒ ගොවීන්ට කුමක්
කරනු ඇද් ද?” 41 ඔව්හු කතා කොට, “ඔහු ඒ නපුරු
මිනිසුන් දරුණු ලෙස විනාශ කොට, නියම කන්නයේ
දී තමාගේ අස්වැන්න කොටස දෙන, වෙන ගොවීන්ට
මිදි වත්ත භාර දෙනු ඇතැ”යි කී හ. 42 ගීතා
118:22-23ජේසුස් වහන්සේ ඔවුන් අමතා මෙසේ
වදාළ සේක:
q242 “ ‘ගෘහ ශිල්පීන් ඉවත ලූ ගල ම, කොණේ
ප්‍රධාන ගල වී ඇත.
q242 මෙය සමිඳුන්ගේ ක්‍රියාවකි.
q242 අපේ ඇස් හමුයෙහි එය විස්මයජනක ය’
42 යන්න ශුද්ධ ලියවිල්ලෙහි ඔබ කවදාවත් කියවා
නැද් ද? 43 එබැවින් මම ඔබට කියමි, දෙවියන්
වහන්සේගේ රාජ්‍යය ඔබ කෙරෙන් ඉවත් කොට
එය නියම පල උපදවන ජාතියකට දෙනු ලබන්නේ
ය. 44 මේ ගල පිට වැටෙන්නා සුණු විසුණු වී
යන්නේ ය. එහෙත්, එය යමකු පිට වැටුණොත්,
එය ඔහුධූලිමෙන් පොඩි කර දමන්නේ ය.”
45 නායක පූජකවරුත්, පරිසිවරුත්, උන්
වහන්සේගේ උපමා අසා, ඒවා එල්ල කළේ
තමන්ට බව දැන, 46 උන් වහන්සේ අල්ලාගන්න
තැත් කළහ. එහෙත්, ‘උන් වහන්සේ
දිවැසිවරයකැ’යි ජනතාව සැලකූ හෙයින් ඔව්හු
ඔවුන්ට බිය වූ හ.

## සරණ මංගල්‍යය පිළිබඳ උපමාව

(ලූක් 14:15-24)

22 යළිත්, උන් වහන්සේ සෙනඟට කතා
කරමින් උපමා මඟින් මෙසේ වදාළ සේක:
2 “ස්වර්ග රාජ්‍යය මෙවැන්නකට උපමා කළ හැකි ය.
එක්තරා රජකේ තමාගේ පුත්‍රයාට සරණ
මංගල්‍යයක් පිළියෙළ කළේ ය. 3 ඔහු සරණ
මංගල්‍යයට ආරාධිතයන් කැඳවාගෙන එන පිණිස
දාසයන් යැවී ය. එහෙත්, ඔව්හු එන්න අකමැති වූ හ.
4 යළිත් ඔහු වෙන දාසයන් යවා, ‘මෙන්න, මාගේ
මංගල භෝජනය පිළියෙළ කර තිබේ. ගොනුන් හා
තර කළ සතුන් මරා, කෑම සාදා ඇත. හැම දෙය ම
සූදානම් ව තිබේ. මංගල්‍යයට එන්න කියා
ආරාධිතයන්ට කියන්නැ’යි කී ය. 5 එහෙත්, ඔව්හු
එය නොසලකා, කෙනෙකේ තමාගේ කෙතෙටත්, තව
කෙනෙකේ තමාගේ වෙළෙඳාමටත් ගියහ. 6 සෙසෙසෝ
ඔහුගේ දාසයන් අල්ලා, ඔවුන්ට නිග්‍රහ කොට, මැරූ
හ. 7 රජතුමා උදහස් වී, තමාගේ යුද්ධ සේනා යවා
ඒ මිනීමරුවන් විනාශ කොට ඔවුන්ගේ නුවර ගිනි
ලැවී ය. 8 එවිට ඔහු තම දාසයන්ට කතා කොට,
‘මංගල්‍යය සූදානම් කර තිබේ. එහෙත්, ආරාධිතයෝ

සුදුස්සෝ නොවෙති. 9 එබැවින් ඔබ මංසන්ධිවලට
ගොස් හමු වන සියල්ලන් මංගල්යයට කැඳවා
ගෙනෙන්නේනැ'යි කී ය. 10 ඒ දාසයෝ මාවත්වලට
ගොස් හමු වූ යහපත් අයහපත් දගෙගොල්ල ම රැස්
කළහ. අමුත්තන්ගනේ මඟුල් මඩුව පිරී ගියේ ය.
11 එහතේ, රජතුමා අමුත්තන් බැලීමට පැමිණි කල,
එහි මඟුල් ඇඳුම් නොහැඳ සිටි මිනිසකු දැක,
12 'මිත්රය, මඟුල් ඇඳුමක් නොහැඳ මතෙනට
ආවේ කසෙේ දැ'යි ඔහුගනේ ඇසී ය. ඔහු නිහඬ
විය. 13 මතෙ 8:12; 25:30; ලූක් 13:28එවිට රජතුමා
කතා කොට, 'මොහුගේ අත් පා බැඳ, පිටත
අන්ධකාරයෙහි දමන්න; එහි දී විලාප කීමත් දත්මිටි
කෑමත් වන්නේ ය'යි සේවකයන්ට කී ය. 14 මන්ද,
කැඳවනු ලැබුවෝ බොහෝ ය. තෝරාගනු ලැබුවෝ
ස්වල්ප ය."

### අධිරාජයාට බදු ගෙවීම
(මාක් 12:13-17;ලූක් 20:19-26)

15 එවිට පරිසිවරු උන් වහන්සේ කටවචනයනේ
අල්ලාගන්නේ කසෙේ දැ යි කුමන්ත්රණය කළහ.
16 ඔව්හු හරෝදිවරුන් සමඟ තමන්ගේ ගෝලයන්
උන් වහන්සේ වෙත යැවූ හ. ඔව්හු කතා කොට,
"ගුරුදේවයෙනි, ඔබ අවංක කෙනෙකු බවත්, දෙවියන්
වහන්සේගේ මාර්ගය හරි ලසෙ උගන්වන බවත්,
මිනිසුන්ගේ තරාතිරම් නොබලන බැවින් කිසිවකු
නොතකන බවත් අපි දනිමු. 17 එබැවින් ඔබ
සිතන්නේ කුමක් ද? සීසර් අධිරාජයාට අයබදු ගෙවීම
යුතු ද අයුතු දැ යි අපට කිව මැනවැ"යි කී හ.
18 එහතේ, ජේසුස් වහන්සේ ඔවුන්ගේ නපුරු
අදහස දැන, "කරෝටිකයෙනි, ඔබ මා පරීක්ෂා
කරන්නේ මන් ද? 19 බදු ගෙවන කාසියක් මට
පනේවන්නැ"යි වදාළ සේක. ඔව්හු රිදී කාසියක්
ගෙනැවිත් උන් වහන්සේගේ අතට දුන්හ. 20 "මේ
රූපය හා සටහන කවරකුගේ දැ"යි උන් වහන්සේ
ඔවුන්ගනේ ඇසූ සේක. 21 "සීසර් අධිරාජයාගේ ය"යි
ඔව්හු කී හ. එවිට උන් වහන්සේ, "එසේ නම්
රජුගේ දේ රජුටත්, දෙවියන් වහන්සේගේ දේ
දෙවියන් වහන්සේටත් දනේනැ"යි වදාළ සේක.
22 ඔව්හු ඒ අසා මවිත ව උන් වහන්සේ අත්හැර
ගියහ.

### පුනරුජ්ජීවන ප්රශ්නය
(මාක් 12:18-27;ලූක් 20:27-40)

23 ක්රියා 23:8 'පුනරුජ්ජීවනයක් නැතැ'යි කියන
සද්දුසිවරුන්ගනේ සමහරු එම දවසේ ම උන්
වහන්සේ වෙතට අවුත් මසෙේ ඇසූ හ. 24 ද්වි.නී.
25:5"ගුරුදේවයෙනි, 'යමකු දරුවන් නොලැබ
මියගියොත්, ඔහුගේ සහෝදරයා ඒ තැනැත්තාගේ
භාර්යාව පාවාගනෙ, සිය සහෝදරයා නමට දරුවන්
ඉපදවිය යුතු ය'යි මෝසසේ කියා ඇත. 25 අප අතර
සහෝදරයෝ සත් දනෙකේ සිටියහ. පළමුවැන්නා
භාර්යාවක සරණ පාවාගනෙ දරුවන් නැතිව මියගිය
බැවින් ඔහුගේ භාර්යාව සහෝදරයාට භාර වූවා ය.
26 ඒ දවෙැන්නා ද මළේ ය. තුන්වැන්නා ද මළේ ය;
සත් වැනි සහෝදරයා දක්වා හැම දනෙ ම මළෝ ය.
27 සියල්ලන්ට පසුව ස්ත්රිය ද මළා ය. 28 ඒ හැම
දනො ම ඇය පාවාගත් හයෙින් පුනරුජ්ජීවනයේ දී ඇ
ඒ සත් දනොගනේ කාගේ භාර්යාව වන්නී ද?"
29 ජේසුස් වහන්සේ උත්තර දමේින් මසෙේ වදාළ
සේක: "ඔබ ශුද්ධ ලියවිලි වත්, දෙවියන්
වහන්සේගේ බලපරාක්රමය වත් නොදත්කමනේ
නොමඟ යන්නහු ය. 30 මන්ද, පුනරුජ්ජීවනයේ දී
මිනිසුන්ට ආවාහ වීමක් හෝ විවාහ වීමක් හෝ
නැත; ඔව්හු ස්වර්ගයෙහි දේව දූතයන් මනේ වෙති.
31 තවද, පුනරුජ්ජීවනය සම්බන්ධයනේ දෙවියන්
වහන්සේ ඔබට වදාළ මේ දේ ඔබ කියවා නැද් ද?
32 'නික්ම 3:6මම ආබ්රහම්ගේ දෙවියන් වහන්සේ
ය; ඊසාක්ගේ දෙවියන් වහන්සේ ය; ජාකොබ්ගේ
දෙවියන් වහන්සේ ය. උන් වහන්සේ මළවුන්ගේ
දෙවියන් වහන්සේ නොව ජීවතුන්ගේ දෙවියන්
වහන්සේ ය." 33 සමූහයෝ ඒ අසා, උන්
වහන්සේගේ ඉගැන්වීම් ගැන විස්මපත් වූ හ.

### ශ්රේෂ්ඨතම ආඥාව
(මාක් 12:28-34;ලූක් 10:25-28)

34 උන් වහන්සේ සද්දුසිවරුන් නිරුත්තර කළ බව
අසා පරිසිවරු එක්රැස් වූ හ. 35 ලූක් 10:25-28ඔවුන්
අතරනේ විනයධරයකේ උන් වහන්සේ පරීක්ෂා
කරමින්, 36 "ගුරුදේවයිනි, ව්යවස්ථාවලියෙහි
ශ්රේෂ්ඨතම ආඥාව කිමකේ දැ"යි ඇසී ය. 37 ද්වි.නී.
6:5උන් වහන්සේ ඔහුට කතා කොට, " 'නුඹේ මුළු
හෘදයනේ ද නුඹේ මුළු සිතින් ද නුඹේ මුළු
බුද්ධියනේ ද නුඹේ දවේ ස්වාමීන් වහන්සේට
ප්රේම කරන්න.' 38 මයෙ ශ්රේෂ්ඨතම පළමු වන
ආඥාව ය. 39 ලවේ 19:18දෙ වන ආඥාව ද එයට
සමාන ය. එනම්, 'නුඹ, නුඹට ප්රේම කරන්නාක්
මනේ නුඹේ අසල්වැසියාටත් ප්රේම කරන්න' යනුයි.
40 මුළු ව්යවස්ථාවලිය හා දිවැසාවලිය රඳා ඇත්තේ
මේ ආඥා දකෙ මත ය"යි වදාළ සේක.

### දාවිත්ගේ පුත්රයා මනේ ම ස්වාමීන් ද වන ක්රිස්තුස් වහන්සේ
(මාක් 12:35-37;ලූක් 20:41-44)

41 පරිසිවරුන් රැස් ව සිටිය දී ජේසුස් වහන්සේ
ඔවුන් අමතා, 42 "ක්රිස්තුස් ගැන ඔබ කුමක්
සිතන්නහු ද? උන් වහන්සේ කවරකුගේ පුත්රයා
දැ"යි ඇසූ සේක. "දාවිත් රජුගේ පුත්රයා ය"යි ඔව්හු
කී හ. 43 උන් වහන්සේ ඔවුන්ගනේ මසෙේ ඇසූ
සේක: "එසේ නම්, දාවිත් ශුද්ධාත්මානුභාවයනේ
පළෙඹී උන් වහන්සේට 'සමිඳාණන් ය'යි කීවේ
කසෙේ ද? මන්ද,
44 ගීතා 110:1 'මා ඔබ සතුරන් ඔබ පාද යට ලන
තකේ මා දකුණු පස අසුන් ගන්න කියා සමිඳාණෝ
සමිඳුන්ට කී සේකැ'යි

44 දාවිත් කී ය. 45 මෙසේ දාවිත් උන් වහන්සේට,
'සමිඳාණන් ය'යි කියන්නේ නම්, උන් වහන්සේ
ඔහුගේ පුත්‍රයා වන්නේ කෙසේ ද?" 46 එක වචන
මාත්‍රයකින් වත් උන් වහන්සේට පිළිතුරු දීමට
කිසිවකුට නොහැකි විය. එදා පටන් උන්
වහන්සේගෙන් තවත් ප්‍රශ්න අසන්න කිසිවකුට
ධෛර්යය නොතිබිණි.

### විනයධරයන්ට හා පරිසිවරුන්ට චෝදනා

(මාක් 12:38-40;ලූක් 11:37-52;20:45-47)

23 එකල ජේසුස් වහන්සේ සමූහයාටත්, සිය
ශ්‍රාවකයන්ටත් කතා කොට මෙසේ වදාළ
සේක: 2 "විනයධරයෝ ද පරිසිවරු ද මෝසෙස්ගේ
ව්‍යවස්ථාවලිය පිළිබඳ බලය ලත් අටුවාචාරීහු වෙති.
3 එබැවින් ඔවුන් ඔබට අණ කරන සියල්ල
නොපිරිහෙළා පිළිපදින්න. එහෙත්, ඔවුන්ගේ ක්‍රියා
අනුව නොයන්න. ඔව්හු එකක් කියති, අනිකක්
කරති. 4 ඔව්හු ඉසිලිය නොහැකි මහ බර පොදි
බැඳ මිනිසුන්ගේ කරේ තබති. එහෙත්, ඒ බර පොදි
ඉසිලීමට සුළැඟිල්ලක තරම වත් ආධාරයක් දීමට
කැමැති නොවෙති. 5 ගණන් 15:38; ද්වි.නී. 6:8; මතෙ
6:1ඔවුන් හැම දෙය ම කරන්නේ මිනිසුන්ට පෙනෙන
පිණිස ය. ඔව්හු ශුද්ධ ලියවිලි පාඨ සඳහන් බඳන
පළල් කරගෙන නළලෙහි ද බාහුවල ද පළඳිති.
වස්ත්‍රවල දාවලු මහත් කරති. 6 මංගල්‍යය
භෝජනවල දී මූලාසනයට ද ධර්මශාලාවල දී
ප්‍රධාන අසුන්වලට ද, 7 වෙළෙඳ පොළවල දී
ගෞරවාචාර ලැබීමට ද, මිනිසුන් විසින් 'ගුරුදේව'
කියා අමතනු ලැබීමට ද ප්‍රිය කරති. 8 එහෙත්, ඔබ
'ගුරුදේව' යයි කියවා නොගන්න. ඔබගේ
ගුරුදේවයාණෝ එක් කෙනෙකේ ම ය. ඔබ කවුරුත්
සහෝදරයෝ ය. 9 මිහි පිට කිසිවකුට 'පියාණෝ' යි
නොකියන්න. ඔබට ඇත්තේ ස්වර්ගයෙහි වැඩ වසන
එක ම පියාණන් වහන්සේ ය. 10 ඔබ 'නායකයෝ' යි
කියවා නොගන්න. ඔබගේ නායකයාණෝ එක්
කෙනෙකේ ම ය, එනම්, ක්‍රිස්තුන් වහන්සේ ය.
11 මතෙ 20:26-27; මාක් 9:35; 10:43-44; ලූක්
22:26එහෙත්, ඔබ අතරෙන් ඉතා උතුම් තැනැත්තා
ඔබගේ සේවකයා වන්නේ ය. 12 ලූක් 14:11;
18:14තමා ම උසස් කරගන්නා කවරකු වුව ද,
පහත් කරනු ලබන්නේ ය; තමා ම පහත් කරගන්නා
කවරකු වුව ද, ඔහු උසස් කරනු ලබන්නේ ය.
13 "විනයධරයෙනි, පරිසිවරුනි, කෛරාටිකයන් වූ
ඔබට වන විපතක මහත! මන්ද, ඔබ මිනිසුන්ගේ
ඇස් හමුයෙහි ස්වර්ග රාජ්‍යයේ දොරටු වසන්නහු
ය; ඔබ ම ඇතුළු වන්නේ වත්, ඇතුළුවන්න සොයන
අයට ඉඩ දෙන්නේ වත් නැත.
14 විනයධරයෙනි, පරිසිවරුනි, කෛරාටිකයෙනි
ඔබට වන විපතක මහත! මන්ද, ඔබ බොරු
පෙනුමට දිගින් දිගට යාච්ඤා කරතත්, ඔබ
වැන්දඹුවන්ගේ ගේදොර කාදමති. ඔබට ඉතා
බරපතල දඬුවමක් ලැබෙනු ඇත.
15 "විනයධරයෙනි, පරිසිවරුනි, කෛරාටිකයන් වූ
ඔබට වන විපතක මහත! මන්ද, එක් කෙනෙකු
ආගමට හරවා ගන්න පිණිස ඔබ මුහුදෙන් හා
ගොඩින් හැම තැන ම ගමන් කරන්නහු ය. එසේ
හරවාගත් පසු, ඔහු ඔබ මෙන් තව දෙගුණයක්
නිරාදුකට සුදුස්සකු කරන්නහු ය.
16 "අන්ධ මාර්ගෝපදේශකයෙනි, ඔබට වන
විපතක මහත! මන්ද, 'යමෙකු දේව මාලිගාවේ
නාමයෙන් දිවුළොත් එහි කිසි වරදක් නැත කියා ද,
යමෙකු දේව මාලිගාවේ රන්වල නාමයෙන්
දිවුළොත්, ඒ දිවුරුමෙන් ඔහු බැඳී සිටී'යි කියා ද ඔබ
කියන්නහු ය. 17 අන්ධ අඥානයෙනි, වඩා උතුම්
කොයි එක ද? රන් ද? රන් විශුද්ධ කළ දේව
මාලිගාව ද? 18 තවද, යමෙකු පූජාසනයේ නාමයෙන්
දිවුළොත් එහි කිසි වරදක් නැත කියා ද, යමෙක් ඒ
පිට තිබෙන පඬුරුවල නාමයෙන් දිවුළොත් ඔහු ඒ
දිවුරුමෙන් බැඳී සිටී'යි කියා ද ඔබ කියන්නහු ය.
19 අන්ධයෙනි, වඩා උතුම් කොයි එක ද? පඬුරු ද,
පඬුර විශුද්ධ කරන පූජාසනය ද? 20 එබැවින්
පූජාසනයේ නාමයෙන් දිවුරන තැනැත්තේ එහි හා ඒ
පිට තිබෙන සියල්ලේ නාමයෙන් දිවුරන්නේ ය,
21 දේව මාලිගාවේ නාමයෙන් දිවුරන්නා එහි ද, එහි
වැඩ වසන තැනැන් වහන්සේගේ ද නාමයෙන්
දිවුරන්නේ ය. 22 යෙසා 66:1; මතෙ 5:34ස්වර්ගයේ
නාමයෙන් දිවුරන්නා ද දෙවියන් වහන්සේගේත්,
සිංහාසනයේත් නාමයෙන් හා එහි වැඩ හිඳින
තැනැන් වහන්සේගේ නාමයෙන් දිවුරන්නේ ය.
23 ලෙවී 27:30 "විනයධරයෙනි, පරිසිවරුනි,
කෛරාටිකයන් වූ ඔබට වන විපතක මහත! මන්ද,
ඔබ සුවඳතලා, ශතපුෂ්ප, සුදුදුරු යන මයින්
දසයෙන් කොටස දෙන්නහු ය. එහෙත්, යුක්තිය ද
දයාව ද ඇදහිල්ල ද යන ව්‍යවස්ථාවලියේ වඩා
බරපතල කාරණා ඔබ පැහැර හරින්නහු ය. ඒවාත්
පැහැර නොහැර, මේවාත් පිළිපැදිය යුතු ව තිබිණි.
24 අන්ධ මාර්ගෝපදේශකයෙනි, ඔබ කෝඳුරුවා
පෙරොදමා ඔටුවා ගිල දමන්නහු ය.
25 "විනයධරයෙනි, පරිසිවරුනි, කෛරාටිකයන් වූ
ඔබට වන විපතක මහත! මන්ද, ඔබ කෝප්පය සහ
පිඟාන පිටතින් පවිත්‍ර කරන්නහු ය. එහෙත්,
ඇතුළත බලහත්කාරකමෙනුත්, තෘෂ්ණාවෙනුත් පිරී
තිබේ. 26 අන්ධ පරිසිවරය, කෝප්පයත් පිඟානත්
පිටතින් පවිත්‍ර වන පිණිස පළමුකොට ඒවා ඇතුළත
පවිත්‍ර කරන්න.
27 ක්‍රියා 23:3 "විනයධරයෙනි, පරිසිවරුනි,
කෛරාටිකයන් වූ ඔබට වන විපතක මහත! මන්ද,
ඔබ හුණු ගා සුදු කළ සොහොන්වලට සමාන ය.
ඒවා පිටතින් ශෝභන ව පෙනෙතත් ඇතුළත
මළවුන්ගේ ඇටකටුවලින් ද සියලු ආකාර
කැලිකසළින් ද පිරී තිබේ. 28 එලෙස ම ඔබත්
මිනිසුන් අබිමුවෙහි පෙනුමට පිටතින් සිල්වත් ය.
එහෙත්, ඇතුළතින් කුහකකමින් හා දාමරිකකමින්
පිරී සිටින්නහු ය.

29 “විනයධරයනි, පරිසිවරුනි, කරොටිකයන් වූ
ඔබට වන විපතක මහත! මන්ද, ‘ඔබ දිවැසිවරයන්ට
සොහොන් ඉදි කොට, සිල්වතුන්ගේ සොහොන්
කොත් අලංකාර කරමින්, 30 අපේ මුතුන්මිත්තන්
ජීවත් ව සිටි කාලයේ දී අපිත් සිටියමු නම්,
දිවැසිවරයන් මැරීමට අපි සහාය නොවන්නමු’යි
කියන්නහු ය. 31 මසේ ඔබ දිවැසිවරයන් මැරූ
අයගේ පුත්‍රයන් බව ඔබ ම පිළිගන්නහු ය.
32 එබැවින් ඔබගේ මුතුන්මිත්තන් පටන්ගත් දයෙ
ඔබ දැන් නිමාවට පත් කරන්න.
33 මතෙ 3:7; 12:34; ලූක් 3:7 “සර්පයනි, පොළොං
වංශයනි, ඔබ නිරයේ දඬුවමින් ගැළවෙන්නේ
කසේ ද? 34 එබැවින් මම දිවැසිවරයන් ද
ප්‍රඥාවන්තයන් ද විනයධරයන් ද ඔබ වෙතට එවමි.
ඔබ ඔවුන්ගෙන් ඇතමකු මරන්නහු ය; ඇතමකු
කුරුසියෙහි ඇණ ගසන්නහු ය; ඇතමකුට ඔබගේ
ධර්මශාලාවල දී තළා, ඔවුන් නුවරින් නුවරට පලවා
හරින්නහු ය. 35 උත් 4:8; 2 වංශා 24:20-21මසේ
මිහි පිට අහිංසක වූ ආබලේ පටන්, ශුද්ධස්ථානය හා
පූජාසනය අතර ඔබ විසින් මරන ලද බරාකියාගේ
පුත් සකෙරියා දක්වා, සියලු අහිංසකයන් මැරීමේ
විපාකය ඔබ පිට පැමිණෙන්නේ ය. 36 සැබැවින් ම
මම ඔබට කියමි, ඒ මුළු දඬුවම මේ පරම්පරාවේ
අය පිට පැමිණෙනු ඇත.”

### ජෙරුසලම ගැන අඳෝනා
(ලූක් 13:34-35)

37 “අහෝ ජෙරුසලම! දිවැසිවරයන් නසන, නුඹ
වෙත එවූ දූතයන්ට ගල් ගසන ජෙරුසලම! කිකිළියක්
ඇගේ පැටවුන් සිය පියාපත් යටට එක්රැස්
කරගන්නාක් මෙන් නුඹේ දරු කැල එක්රැස්
කරගන්න මම කීවරක් කැමැති වූයෙම් ද? එහෙත්,
නුඹ කැමැති නොවූවා ය. 38 ජෙරෙ 22:5බලන්න,
නුඹේ දේව මාලිගාව පාළු කරදමනු ලැබේ. 39 ගීතා
118:26මම නුඹට කියමි, ‘සමිඳාණන් වහන්සේගේ
නාමයෙන් වඩින තැනැත්තා හට ආසිරි වේ වා’යි
නුඹ පවසන කාලය එන තුරු මතුයෙන් සිට නුඹ මා
තවත් නොදකින්නී ය.”

### දේව මාලිගාවේ විනාශය ගැන කලින් කීම
(මාක් 13:1-2;ලූක් 21:5-6)

24 ජේසුස් වහන්සේ දේව මාලිගාවෙන් නික්ම
යද්දී, එහි ගොඩනැඟිලි උන් වහන්සේට
පෙන්වන පිණිස ශ්‍රාවකයෝ උන් වහන්සේ වෙත
ආහ. 2 එහෙත්, උන් වහන්සේ ඔවුන්ට උත්තර
දෙමින්, “මේ සියල්ල ඔබට පෙනෙනවා නො වේ ද?
සැබැවින් ම මම ඔබට කියමි, ගලක් මත ගලක්
ඉතිරි නොවන ලෙස ඒවා සියල්ල ම බිඳ හෙළෙනු
ඇතැ”යි වදාළ සේක.

### පීඩාවල පෙර ලකුණු
(මාක් 13:3-13;ලූක් 21:7-19)

3 උන් වහන්සේ ඔලීව කන්දේ වැඩසිටි කල
ශ්‍රාවකයෝ උන් වහන්සේ වෙත අවුත්, පෞද්ගලික
ලෙස කතා කර, “ඒ දේ සිදුවන්නේ කවදා ද? ඔබේ
පුනරාගමනය හා කල්පාන්තය පිළිබඳ පෙර ලකුණු
මොනවා ද කියා අපට කිව මැනව”යි කී හ.
4 ජේසුස් වහන්සේ ඔවුන්ට උත්තර දෙමින් මසේ
වදාළ සේක: “ඔබ කිසිවකු අතින් මුළා නොවන
හැටියට බලාගන්න. 5 මන්ද, බොහෝ දෙනෙක්, ‘මම
ක්‍රිස්තුස් වෙමි’ කියමින් මාගේ නාමයෙන් ඉදිරිපත්
වී බොහෝ දෙනෙකු මුළා කරති. 6 යුද්ධ හා යුද්ධ
පිළිබඳ කටකතා ඔබට ඇසෙනු ඇත. ඒවාට බිය
නොවන්න. මන්ද, මේ සියල්ල සිදුවනු නියත ය.
එහෙත්, අවසානය තව ම පැමිණ නැත. 7 ජාතියක්
ජාතියකට විරුද්ධ ව ද රාජ්‍යයක් රාජ්‍යයකට විරුද්ධ
ව ද නැඟී සිටිනු ඇත. නොයෙක් තැන්හි සාගත ද
භූමිකම්පා ද සිදුවනු ඇත. 8 මේ සියල්ල නව යුගය
බිහි කරවන ප්‍රසව වේදනාවේ පටන්ගැන්ම ය.
9 මතෙ 10:22එකල ඔව්හු ඔබ වධබන්ධනවලට
පාවා දී මරන්නෝ ය. මා නිසා සියලු ජාතීහු ඔබට
වෛර කරන්නාහ. 10 එකල බොහෝ දෙනෙකුගේ
ඇදහිල්ල බිඳ වැටෙනු ඇත. ඔව්හු ඔවුනොවුන් පාවා
දෙන්නාහ; ඔවුනොවුන් කෙරෙහි වෛර බැඳගන්නාහ.
11 බොහෝ බොරු දිවැසිවරු නැඟිට බොහෝ දෙනෙ
මුළා කරන්නාහ. 12 අධර්මය වැඩීතේ ම බොහෝ
දෙනාගේ ප්‍රේමය පිරිහෙන්නේ ය. 13 මතෙ
10:22එහෙත්, අවසානය දක්වා ම ස්ථිර ව සිටින්නා
ගැළවෙන්නේ ය. 14 රාජ්‍යය පිළිබඳ මේ සුබ අස්න
සියලු ජාතීන් හට සාක්ෂියක් වන පිණිස ලොව පුරා
ප්‍රකාශ කරනු ලබන්නේ ය. එවිට අවසානය
පැමිණෙන්නේ ය.”

### බිහිසුණු දූක් ගාවීනා
(මාක් 13:14-23;ලූක් 21:20-24)

15 දානි 9:27; 11:31; 12:11 “එබැවින් දානියෙල්
දිවැසිවරයා සඳහන් කළ, ‘බිහිසුණු දූෂිතය,
ශුද්ධස්ථානයෙහි තිබෙනු ඔබ යම් කලෙක දකින්නහු
ද, (පාඨකයා තේරුම්ගනීවා) 16 එකල ජුදයෙහි සිටින
අය කඳුවලට පලා යත්වා. 17 ලූක් 17:31පියස්ස
මත සිටින්නා තම ගයේ තිබෙන තමා සතු කිසිවක්
ගන්නා පිණිස නොබසී වා. 18 කෙතෙහි සිටින්නා ද
තමාගේ ඇඳුම් ගැනීමට පෙරළා නොයේ වා, 19 ඒ
දවස්වල දී ගර්භණීන්ට ද කිරි මවුවරුන්ට ද ඇතිවන
දුකක මහත! 20 හේමන්තයේ දී වත් සබත් දිනක දී
වත් මයෙ සිදු නොවන ලෙස යාච්ඤා කරන්න.
21 දානි 12:1; එළිද 7:14මන්ද, ලෝකයේ
පටන්ගැන්මේ සිට මේ දක්වා නොවූ විරූ, මතු ද සිදු
නොවන විරූ දරුණු පීඩාවක් එකල්හි සිදුවන්නේ ය.
22 ඒ කාලය කෙටි නොකරන ලද්දේ නම්, කිසිවකේ
වත් නොගැළවෙන්නෝ ය. එහෙත්, තෝරාගත්තවුන්
උදසො ඒ කාලය කෙටි කරනු ලබන්නේ ය.

23 එකල, 'බලන්න, ක්රිස්තුන් වහන්සේ මනේන,
මතෙන ය' නැත්නම් 'අන්න, අතන ය'යි යමකු
ඔබට කීවොත් විශ්වාස නොකරන්න. 24 කුමක්නිසා
ද ව්යාජ ක්රිස්තුවරයන් ද ව්යාජ දිවැසිවරයන් ද
පහළ වී, හැකි නම්, තෝරාගත්තවුන් පවා මුළා
කරන ලසෙ ලකුණු හා අරුමපුදුම දේ දක්වනු ඇත.
25 බලන්න, මම ඔබට කල්තියා කීවමේ. 26 ලූක්
17:23-24'අන්න, උන් වහන්සේ පාළුකරයේ සිටින
සේකැ'යි ඔවුන් ඔබට කීවොත්, පිටත් ව නොයන්න,
'උන් වහන්සේ කාමරයක සැඟවී සිටින සේකැ'යි
කීවත්, විශ්වාස නොකරන්න. 27 මන්ද, විදුලිය
පරෙදිගින් නික්ම අපරදිග දක්වා විහිදනේනේ යම්
සේ ද, මනුෂ්ය-පුත්රයාණන්ගේ පුනරාගමනය එසේ
ම වන්නේ ය.
28 ලූක් 17:37 "මළසිරුර යම් තැනකේහි ද එතැනට
ගිජු ලිහිණියෝ රැස් වති."

### මනුෂ්ය-පුත්රයාණන්ගේ පුනරාගමනය
(මාක් 13:24-27;ලූක් 21:25-28)

29 යසො 13:10; 34:4; එසකි 32:7; ජෝවෙ 2:10-31;
3:15; එළිද 6:12-13 "ඒ දවස්වල පීඩා නිම වූ
කණෙහි ම, හිරු අඳුරු වන්නේ ය; සඳ එළිය
නොදනේනේ ය; තාරකාවෝ අහසින් පතිත
වන්නාහ; අහසේ බලපරාක්රම දදෙරා යයි. 30 දානි
7:13; සකෙරි 12:10-14; එළිද 1:7එකල මනුෂ්ය-
පුත්රයාණන්ගේ සලකුණ අහසහෙි පහළ වයෙි.
එවිට පොළොවේ සියලු ගෝත්රයෝ වැලපනේනෝ
ය. ඔව්හු මනුෂ්ය-පුත්රයාණන් බලපරාක්රමයනේ ද
මහා තේජශ්රීයනේ ද අහසේ වලාකුළු මත වඩිනු
දකින්නෝ ය. 31 උන් වහන්සේ මහත් හොරණෑ
හඬක් සහිත ව තම දූතයන් එවන සේක. ඔව්හු
අහසේ එක් කළෙවරක සිට අනික් කළෙවර දක්වා
සිව් දිගින් තෝරාගත්තවුන් රැස් කරන්නෝ ය."

### අත්තික්කා ගසනේ පාඩමක්
(මාක් 13:28-31;ලූක් 21:29-33)

32 "අත්තික්කා ගසනේ පාඩමක් ඉගනෙගන්න. එහි
ළපටි අතු මතු වී, කොළ ලියලන කල ගිම්හානය
ළඟ යයි ඔබ දන්නහු ය. 33 එලසෙ ම ඔබත් මේ
සියල්ල සිදුවනු දකින විට උන් වහන්සේ දොරකඩ
ම යයි දැන ගන්න. 34 සැබැවින් ම මම ඔබට කියමි,
මේ සියල්ල සිදුවන තුරු මේ පරම්පරාව පහ වී
නොයන්නේ ය. 35 අහසත්, පොළොවත් පහ වී
යන්නේ ය. එහතේ, මාගේ වචන කිසි දා පහ වී
නොයන්නේ ම ය."

### අවදි ව සිටීම
(මාක් 13:32-37;ලූක් 17:26-30-34-36)

36 "මාගේ පියාණන් වහන්සේ මිස, ඒ දිනය හා
පැය අන් කිසිවකේ නොදනිති; ස්වර්ගයහෙි දේව
දූතයෝ වත්, පුත්රයාණෝ වත් නොදනිති. 37 උත්
6:5-8තවද නෝවාගේ දවස්වල සිදු වූ ලසෙ ම
මනුෂ්ය-පුත්රයාණන්ගේ පුනරාගමනය වන්නේ ය.
38 එකල, ජල ගැල්මට ප්රථමයනේ, නෝවා නැවට
ඇතුළු වූ දිනය දක්වා, ඔව්හු කමින් බොමින්, ආවාහ
විවාහ වමෙින් කල් යැවූ හ. 39 උත් 7:6-24ජල ගැල්ම
පැමිණ සියල්ලන් ගසා ගනෙ යන තුරු ඔව්හු කිසිවක්
නොදත්හ; මනුෂ්ය-පුත්රයාණන්ගේ පුනරාගමනය ද
එලසෙ ම වනු ඇත. 40 එකල මනුෂ්යයෝ
දදෙනෙකේ කතෙහෙි සිටිති; එක් තැනැත්තකේ ගනු
ලබන්නේ ය; අනික් තැනැත්තා හැරදමනු ලබන්නේ
ය. 41 ස්ත්රීහු දදෙනෙකේ ඇඹරුම් ගලේ අඹරමින්
සිටිති; එක් තැනැත්තියක් ගනු ලබන්නී ය; අනික්
තැනැත්තිය හැරදමනු ලබන්නී ය. 42 එබැවින් අවදි
ව ඉන්න. ඔබගේ සමිඳාණන් වහන්සේ කිනම්
දවසක එන සේක් දැ යි ඔබ නොදන්නහු ය. 43 ලූක්
12:39-40සොරා කොයි යාමයේ එන්නේ දැ යි ගදෙර
ස්වාමියා දැන සිටියේ නම්, ඔහු නොනිදා සිට
තමාගේ ගයෙ බිඳීමට ඉඩ නොදනෙ බව දැනගන්න.
44 එබැවින් ඔබත් සූදානම් ව සිටින්න. කුමක්නිසා ද
ඔබ බලාපොරොත්තු නොවන පැයක දී මනුෂ්ය-
පුත්රයාණෝ වඩින සේක."

### විශ්වාසී සහ අවිශ්වාසී දාසයෝ
(ලූක් 12:41-48)

45 "තම ගයෙි වැසියන්ට නියම වේලාවට ආහාර
කොටස සපයන පිණිස ස්වාමියා විසින් පත් කරන
ලද විශ්වාසී, සිහි නුවණ ඇති දාසයා කවරකේ ද?
46 ස්වාමියා ආ කල යම් දාසයකු සිය සේවයහෙි
යදේී සිටිනු දුටුවොත්, ඒ දාසයා භාග්යවන්තයකේ ය.
47 සැබැවින් ම මම ඔබට කියමි, ඒ ස්වාමියා තමා
සන්තක සියල්ලේ භාරකාරයා කොට ඔහු පත්
කරන්නේ ය. 48 එහතේ, ඔහු අයහපත් දාසයකු
නම්, 'මාගේ ස්වාමියා පමාවනු ඇතැ'යි සිතින් සිතා,
49 තම දැසිදසුන්ට තළන්න පටන්ගනෙ, බේබද්දන්
සමඟ කමින් බොමින් සිටියොත්, 50 ඔහු
බලාපොරොත්තු නොවන දිනක දී, නොදන්නා පැයක
දී, ඔහුගේ ස්වාමියා අවුත්, 51 ඔහුට දරුණු ලසෙ
දඬුවම් කර, කරොටිකයන්ට නියමිත තැන ඔහුටත්
නියම කරනු ඇත. එහි දී වැලපීමත් දත්මිටිකෑමත්
වන්නේ ය."

### යුවතියන් දස දනො පිළිබඳ උපමාව

25 ලූක් 12:35 "ස්වර්ග රාජ්යය මසෙේ උපමා
කළ හැකි ය. තලේ පහන් රැගනෙ මනාලයා
පරෙමඟට යුවතියෝ දස දනෙකේ ගියෝ ය. 2 ඔවුන්
අතරනේ පස් දනෙකේ නුවණ නැති අය ය; පස්
දනෙකේ නුවණ ඇති අය ය. 3 නුවණ නැති අය සිය
පහන් ගනෙ යද්දී ඒ සමඟ තලේ ගනෙ ගියේ නැත.
4 එහතේ, නුවණ ඇති අය සිය පහන් ගනෙ යද්දී ඒ
සමඟ බඳුන්හි තලේ ගනෙ ගියහ. 5 මනාලයාගේ
පැමිණීම පමා වූ කල ඒ සියල්ලෝ ම නිදිබර වී
නිදාගත්හ.
6 "මධ්යම රාත්රියේ 'අන්න, මනාලයා! ඔහු
පරෙමඟට යන්නැ'යි හඬක් විය. 7 එවිට ඒ සියලු
යුවතියෝ නැඟිට සිය පහන්වල තිර සකස් කළහ.

8 එකල නුවණ නැති අය, ‘අපේ පහන් නිවීගන යයි,
ඔබගේ තලේවලින් ටිකක් අපට දනේනැ’යි නුවණ
ඇති අයට කී හ. 9 එහතේ, නුවණ ඇති අය, ‘එසේ
කළ නොහැක; අප දගෙොල්ලන්ට ම සෑහනෙ තරම්
තලේ මෙහි නැත; එබැවින් වළෙඳුෙන් වෙත ගොස්
ඔබ ම මිල දී තලේ ගන්නැ’යි පිළිතුරු දුන්හ.
10 ඔවුන් ගිය පසු මනාලයා ආවේ ය; සූදානම් ව
සිටි පස් දනො ඔහු හා සමඟ මංගලෝත්සවයට
ගියහ. ඔවුන් ඇතුළු වූ විට දොර වසන ලදී.
11 ලූක් 13:25 “පසුව අනිත් යුවතියෝ අවුත්,
‘ස්වාමීනි, ස්වාමීනි, අපට දොර ඇරිය මැනවැ’යි කී
හ. 12 එහතේ මනාලයා ‘මම ඔබ කිසි සේත්
නොහඳුනමි’යි පිළිතුරු දුන්නේ ය. 13 එබැවින් දවස
වත්, පැය වත් ඔබ නොදන්න නිසා අවදි ව ඉන්න.”

### දාසයන් තිදනො පිළිබඳ උපමාව
(ලූක් 19:11-27)

14 ලූක් 19:11-27 “ස්වර්ග රාජ්‍යය මසෙේ උපමා
කළ හැකි ය. එක් මිනිසකේ සිය දාසයන් කැඳවා,
තමා සතු දේ ඔවුන්ට භාර දී පිටරට බලා ගියේ ය.
15 ඔහු එකිනකොගේ හැකියාව අනුව, එක්
කනෙකුෙට රිදී කාසි පන්දාහක් ද තව කනෙකුෙට
දදොහක් ද, තව කනෙකුෙට එක් දාහක් ද බැගින් දී,
තමා යන ගමන ගියේ ය. 16 රිදී කාසි පන්දාහ ලැබූ
තැනැත්තේ වහා ම ගොස් එයින් වළෙඳොම් කොට
තවත් රිදී කාසි පන්දාහක් උපදවා ගත්තේ ය.
17 එලසෙ ම රිදී දදොහ ලැබූ තැනැත්තේ ද තවත්
දදොහක් උපදවා ගත්තේ ය. 18 එහතේ දාහක් ලැබූ
තැනැත්තේ ගොස්, පොළොවේ වළක් හාරා,
ස්වාමියාගේ මුදල සඟවා තැබී ය.
19 බොහෝ කලකට පසු ඒ දාසයන්ගේ ස්වාමියා
අවුත් ඔවුන් සමඟ ගණන් හිලව් බැලී ය. 20 රිදී
කාසි පන්දාහ ලැබූ තැනැත්තේ තවත් රිදී කාසි
පන්දාහක් ගනෙවුත්, ‘ස්වාමීනි, ඔබ මට රිදී කාසි
පන්දාහක් භාර දුන්නහෙි ය. මනේන, තවත් රිදී කාසි
පන්දාහක් උපදවා ගතිමි’යි කී ය. 21 ඔහුගේ
ස්වාමියා ඔහුට කතා කොට, ‘යහපත්, විශ්වාසී
දාසය, ඉතා අගයෙි; ඔබ ස්වල්පයක් ගැන විශ්වාසී වූ
බැවින් බොහෝ දේ කරෙහෙි අධිපති කරමි. ඔබ
දැන් අවුත් ඔබේ ස්වාමියාගේ ප්‍රීතියට සහභාගි
වන්නැ’යි කී ය. 22 රිදී කාසි දදොහක් ලැබූ
තැනැත්තේ ද අවුත්, ‘ස්වාමීනි, ඔබ රිදී කාසි
දදොහක් මට භාර දුන්නහෙි ය; මනේන, තවත් රිදී
කාසි දදොහක් උපදවා ගතිමි’යි කී ය. 23 ඔහුගේ
ස්වාමියා ඔහුට කතා කොට, ‘යහපත්, විශ්වාසී
දාසය, ඉතා අගයෙි; ස්වල්පයක් ගැන ඔබ විශ්වාසී වූ
බැවින් බොහෝ දේ කරෙහෙි ඔබ අධිපති කරමි.
ඔබ දැන් අවුත් ඔබේ ස්වාමියාගේ ප්‍රීතියට
සහභාගි වන්නැ’යි කී ය. 24 ඉන්පසු රිදී කාසි එක්
දහක් ලැබූ තැනැත්තේ ද අවුත්, ‘ස්වාමීනි, ඔබ
නොවපුළ තැනින් කපන, වගා නොකළ තැනින් පල
රැස් කරන, තදහිතක් ඇති මනුෂ්‍යයකු බව
දැනගතිමි. 25 එබැවින් මම බියනේ ගොස් ඔබගේ
රිදී කාසි පොළොවේ වළක සඟවා තැබීමි. මනේන,
ඔබ සතුදේ’යි කී ය. 26 ඔහුගේ ස්වාමියා ඔහුට
උත්තර දමෙින්, ‘කම්මැලි කපටි දාසය, මා නොවපුළ
තැනින් කපාගන්නා බවත්, වගා නොකළ තැනින් පල
රැස් කරගන්න, බවත් ඔබ දැන සිටියහෙි ද! 27 එසේ
නම්, මාගේ මුදල බැංකුවේ තැන්පත් කළ යුතු ව
තිබුණේ ය. එසේ කළෙේ නම්, මා ආ විට මගේ
මුදල පොළියත් සමඟ ලබාගන්න පුළුවන්කම තිබිණි.
28 එබැවින් ඒ රිදී කාසි ඔහුගනේ ගනෙ රිදී කාසි
පන්දාහ ඇති තැනැත්තාට දනේන. 29 මතෙ 13:12;
මාක් 4:25; ලූක් 8:18යමක් ඇති තැනැත්තාට දනෙු
ලැබේ; ඔහුට පමණටත් වඩා ලැබේ. යමක් නැති
තැනැත්තාගනේ ඔහුට ඇති ටිකත් ගනු ලැබේ.
30 මතෙ 8:12; 22:13; ලූක් 13:28මේ පලක් නැති
දාසයා පිටත අන්ධකාරයට නරෙපොදමන්න. එහි දී
වැලපීමත් දත්මිටි කෑමත් වන්නේ ය’යි කියනු ඇත.”

### ජාතීන්ගේ විනිශ්චය දවස

31 මතෙ 16:27; 19:28 “මනුෂ්‍ය-පුත්‍රයාණන් සියලු
දේව දූතයන් පිරිවරාගනෙ තජේශ්රීයනේ පැමිණනෙ
කල, එතුමාණෝ තමන්ගේ මහිමාන්විත
සිංහාසනයේ වැඩහිඳින සේක. 32 එවිට සියලු
ජාතීහු උන් වහන්සේ අබිමුවහෙි රැස් කරනු
ලබන්නෝ ය. එඬේරකෙු, එළුවන්ගනේ බැටළුවන්
වනේ කරන්නාක් මනේ උන් වහන්සේ ද ඔවුන් වනේ
කොට, 33 බැටළුවන් සිය දකුණු පැත්තහෙි ද එළුවන්
වම් පැත්තහෙි ද සිටුවන සේක. 34 එවිට රජ්ජුරුවන්
වහන්සේ සිය දකුණු පසහෙි සිටින්නන්ට කතා
කොට, ‘මාගේ පියාණන්ගනේ ආශීර්වාද ලද්දනෙි,
එන්න, ලෝකය පටන්ගැන්මේ සිට ඔබට සූදානම්
කර තිබනෙ රාජ්‍යය උරුම කරගන්න. 35 මන්ද, මම
සාගිනි ව සිටියමේ; ඔබ මට කන්න දුන්නහු ය.
පිපාසා වී සිටියමේ; ඔබ මට බොන්න දුන්නහු ය.
ආගන්තුක ව සිටියමේ; ඔබ මා ගදෙරට පිළිගත්තහු
ය. 36 වස්ත්‍ර නැති ව සිටියමේ; ඔබ මට වස්ත්‍ර
දුන්නහු ය. රෝගාතුර ව සිටියමේ; ඔබ මා
බලාගත්තහු ය. හිරගදෙර සිටියමේ; ඔබ මා බලන්න
ආවහු ය’යි වදාරන සේක. 37 එකල දැහැමියන්
උත්තර දමෙින්, ‘ස්වාමීනි, කවර කලකෙ ඔබ
වහන්සේ සාගිනි ව සිටිය දී අපි ඔබට කෑම දුනිමු
ද? පිපාසා වී සිටිය දී බොන්න දුනිමු ද? 38 කවර
කලකෙ ඔබ වහන්සේ ආගන්තුක ව සිටිය දී ඔබ
ගදෙරට පිළිගතිමු ද? නොහොත් වස්ත්‍ර නැති ව
සිටිය දී ඇඳුම් දුනිමු ද? 39 කවර කලකෙ ඔබ
රෝගාතුර ව හෝ හිරගදෙර හෝ සිටිය දී ඔබ
බලන්න ආවමෙු දැ’යි කියනු ඇත. 40 එවිට
රජ්ජුරුවන් වහන්සේ උත්තර දමෙින්, ‘සැබැවින් ම
මම ඔබට කියමි, මාගේ මේ සහෝදරයන්ගනේ
ඉතා ම සුළු තැනැත්තාට වුව ද ඔබ එසේ කළා නම්
එය කළෙේ මට යැ’යි වදාරන සේක.
41 “එවිට උන් වහන්සේ වම් පසහෙි සිටින්නන්ට
කතා කොට, ‘සාප ලද්දනෙි, මා වතෙින් ඉවත් වී
යක්ෂයාට ද ඔහුගේ දූතයන්ට ද සූදානම් කර
තිබනෙ සදාතන ගින්නට යන්න. 42 මන්ද, මම

සාගිනි ව සිටියමේ; ඔබ මට කන්න නුදුන්නහු ය.
පිපාසා වී සිටියමේ; ඔබ මට බොන්න නුදුන්නහු ය.
43 ආගන්තුක ව සිටියමේ; ඔබ මා ගදෙරට
නොපිළිගත්තහු ය. වස්ත්‍ර නැති ව සිටියමේ; ඔබ
මට වස්ත්‍ර නුදුන්නහු ය. රෝගාතුර ව සිටියමේ;
හිරගදෙර ද සිටියමේ; ඔබ මා බලන්න ආවේ
නැතැ'යි වදාරන සේක. 44 එවිට ඔවුන් උත්තර
දමේින්, 'ස්වාමීනි, කවර කලකෙ ඔබ සාගිනි ව හෝ
පිපාසා වී හෝ ආගන්තුක ව හෝ වස්ත්‍ර නැති ව
හෝ රෝගාතුර ව හෝ හිරගදෙර හෝ සිටිනු දැක
අපි ඔබ වහන්සේට උපස්ථාන නොකළෙමු දැ'යි
අසනු ඇත. 45 එවිට උන් වහන්සේ ඔවුන්ට උත්තර
දමේින්, සැබැවින් ම මම ඔබට කියමි, මොවුන්ගනේ
ඉතා ම සුළු තැනැත්තාට වුව ද එසේ නොකළා නම්
එය නොකළේ මට ය'යි වදාරන සේක. 46 දානි
12:2මොවුහු සදාතන දඬුවමට ද, දැහැමියෝ
සදාතන ජීවනයට ද යන්නෝ ය."

### ජේසුස් වහන්සේ නැසීමට කුමන්ත්‍රණය
(මාක් 14:1-2;ලූක් 22:1-2;ජොහ 11:45-53)

26 තවද ජේසුස් වහන්සේ මේ සියල්ල වදාරා
නිම කොට සිය ශ්‍රාවකයන් අමතා, 2 නික්ම
12:1-27"තව දදේනකින් පාස්කු මංගල්‍යය පැමිණනෙ
බව ඔබ දන්නහු ය; මනුෂ්‍ය-පුත්‍රයාණන් කුරුසියහෙි
ඇණ ගසනු ලැබීමට පාවා දනෙු ඇතැ"යි වදාළ
සේක. 3 එකල නායක පූජකවරු ද ප්‍රජා මූලිකයෝ
ද කායාපස් නම් මහා නායක පූජකවරයාගේ
මන්දිරයට රැස් වී, 4 ජේසුස් වහන්සේ
ප්‍රයෝගයනේ අල්ලා මැරීමට කුමන්ත්‍රණය කළහ;
5 එහතේ, "සනෙඟ අතර කෝලාහලයක් සිදු
නොවන පිණිස මංගල්‍යය කාලයේ දී එය
නොකරමු"යි කී හ.

### බතොනියේ දී ආලේප කරනු ලැබීම
(මාක් 14:3-9;ජොහ 12:1-8)

6 ජේසුස් වහන්සේ බතොනියහෙි කුෂ්ඨ රෝගී වූ
සීමොන්ගේ ගදෙර සිටිය දී, 7 ලූක් 7:37-38එක්
ස්ත්‍රියක් ඉතා අගනා සුවඳ විලවුන් පිරුණු කිරිගල්
කරඬුවක් ගනෙ උන් වහන්සේ වතෙට අවුත්, කෑමට
හිඳගනෙ හුන් උන් වහන්සේගේ හිස මත වත් කළා
ය. 8 ඒ දුටු ශ්‍රාවකයෝ කෝප වී, "මෙවැනි
නාස්තියක් කළෙේ මන් ද? 9 මේ විලේපනය විශාල
මුදලකට විකුණා දිළිඳුන්ට දිය හැකි ව තිබුණා
නොවේ දැ"යි කී හ. 10 එහතේ, ජේසුස් වහන්සේ
එය දැන මසෙේ වදාළ සේක: "ඔබ මේ ස්ත්‍රියට
කරදර කරන්නේ මන් ද? ඇය මා හට කළෙේ
මනහර දයෙකි. 11 ද්වි.නී. 15:11මන්ද, දුගීහු ඔබ
සමඟ හැමදා ම සිටිති. එහතේ, මම හැමදා ම ඔබ
සමඟ නොසිටිමි. 12 ඇය මේ විලේපනය මාගේ
සිරුරේ වත් කළෙේ අවමංගල්‍යය සඳහා මා සූදානම්
කරන පිණිස ය. 13 සැබැවින් ම මම ඔබට කියමි,
ලොව පුරා මේ සුබ අස්න ප්‍රකාශ කරන හැම
තැනක දී ම මේ ස්ත්‍රිය කළ මේ ක්‍රියාව ඇය
සැමරීම පිණිස කියනු ලබන්නේ ය."

### ජූදස්ගේ ද්‍රෝහි ක්‍රියාව
(මාක් 14:10-11;ලූක් 22:3-6)

14 තවද දොළොස් දනොගනේ කනෙකෙු වූ ජූදස්
ඉස්කාරියොත් නායක පූජකයන් වතෙ ගොස්,
15 සකෙරි 11:12"ජේසුස් වහන්සේ ඔබට පාවා
දුන්නොත් ඔබ මට දනේනේ කුමක් දැ"යි ඇසී ය.
ඔව්හු රිදී කාසි තිහක් කිරා ඔහුට දුන්හ. 16 එතැන්
පටන් ඔහු උන් වහන්සේ පාවා දීමට සුදුසු
අවස්ථාවක් සවේ ය.

### ශ්‍රාවකයන් සමඟ පාස්කු භෝජනය
(මාක් 14:12-21;ලූක් 22:7-13-21-23;ජොහ 13:21-30)

17 නුමුහුන් රොටි මංගල්‍යයේ පළමු වන දින
ශ්‍රාවකයෝ ජේසුස් වහන්සේ වතෙට අවුත්,
"පාස්කු භෝජනය වළඳන පිණිස අප කොතැන
පිළියළෙ කරනවාට ඔබ කැමැති සේක් දැ"යි ඇසූ හ.
18 ජේසුස් වහන්සේ ද, "ඔබ නගරයේ සිටින
අසවල් මනුෂ්‍යයා වතෙට ගොස්, 'මාගේ නියමිත
මොහොත ළං ව ඇත; මාගේ ශ්‍රාවකයන් සමඟ
ඔබේ නිවසේ දී පාස්කු භෝජනය පවත්වමි යි
ගුරුදේවයන් වහන්සේ කියන සේකැ'යි ඔහුට
දන්වන්නැ"යි වදාළ සේක. 19 ශ්‍රාවකයෝ ජේසුස්
වහන්සේ ඔවුන්ට අණ කළ ලසෙ පාස්කු භෝජනය
පිළියළෙ කළහ. 20 සවස් වූ කල උන් වහන්සේ
ප්‍රේරිතයන් දොළොස් දනො සමඟ කෑමට හිඳගත්
සේක. 21 ඔවුන් කෑම කමින් සිටිය දී, උන් වහන්සේ
කතා කොට, "සැබැවින් ම මම ඔබට කියමි, ඔබනේ
කනෙකේ මා පාවා දනේනේ ය"යි වදාළ සේක.
22 ඔව්හු අතිශයින් ශෝක ව එකිනකො, "ස්වාමීනි,
ඒ මම දැ"යි අසන්න පටන් ගත්හ. 23 ගීතා 41:9උන්
වහන්සේ උත්තර දමේින්, "මා සමඟ එක පාත්‍රයේ
අතලන තැනැත්තේ මා පාවා දනේනේ ය.
24 මනුෂ්‍ය-පුත්‍රයාණන් ගැන ශුද්ධ ලියවිල්ලේ ලියා
තිබනෙ ලසෙ ම ඔහු නියමිත ගමන යන්නේ ය.
එහතේ, මනුෂ්‍ය-පුත්‍රයාණන් පාවා දනෙ යම්
මනුෂ්‍යයකේ වේ ද, ඔහුට වන විපතක මහත! ඒ
මිනිසා නූපන්නේ නම් වඩා හොඳ ය"යි වදාළ සේක.
25 උන් වහන්සේ පාවා දුන් ජූදස් උත්තර දමේින්,
"ගුරුදේවයනෙි, ඒ මම දැ"යි ඇසී ය. "වනෙ කවුදැ"යි
උන් වහන්සේ ඔහුට වදාළ සේක.

### අන්තිම රාත්‍රි භෝජනය
(මාක් 14:22-26;ලූක් 22:14-20;1 කොරි 11:23-25)

26 ඔවුන් කෑම කමින් සිටිය දී ජේසුස් වහන්සේ
රොටි ගනෙ ආශීර්වාදය පවසා ඒවා කඩා
ශ්‍රාවකයන්ට දී, "රැගනෙ වළඳන්න, මේ මාගේ
ශරීරය"යි වදාළ සේක. 27 උන් වහන්සේ කුසලානක්
ද ගනෙ තුති පුදා ඔවුන්ට දී, 28 "ඔබ සියල්ලෝ ම
මයෙින් පානය කරන්න. මයෙ පව් කමාව පිණිස
බොහෝ දනො උදසො වගුරුවනු ලබන මාගේ

ගිවිසුම් රුධිරය වේ. 29 නික්ම 24:8; ජරෙ
31:31-34මාගේ පියාණන්ගේ රාජ්‍යයෙහි දී මා ඔබ
සමඟ අලුත් මිදියුස පානය කරන දවස එන තුරු
මතෙන් පටන් මේ මිදියුස තවත් නොබොන්නෙමි යි
ඔබට කියමි”යි වදාළ සේක. 30 ඔව්හු ගීතයක් ගයා
නිම කොට ඔලීව කන්දට නික්ම ගියහ.

### පේදුරුගේ අපලාපය ගැන කලින් කීම

(මාක් 14:27-31;ලූක් 22:31-34;ජොහ 13:36-38)

31 සකෙරි 13:7 තවද ජේසුස් වහන්සේ
ශ්‍රාවකයන්ට කතා කොට, “ඔබ හැම දනෙ ම අද
රාත්‍රියෙහි මා නිසා අධරෛයයට පත් වන්නහු ය.
මන්ද, ‘මම එඬේරාට පහර දනේනමේ, එවිට රැළේ
බැටළුවෝ විසුරුවනු ලබන්නෝ ය’යි ශුද්ධ
ලියවිල්ලහෙි ලියා තිබේ. 32 මතෙ 28:16“එහතේ,
මම උත්ථාන කරනු ලැබූ පසු ඔබට පරෙටුව
ගලීලයට යමි”යි වදාළ සේක. 33 පේදුරු උන්
වහන්සේට උත්තර දමේින්, “අන් හැම දනෙ ම ඔබ
නිසා අධරෛය වුවත් මම නම් කවදාවත් අධරෛය
නොවන්නමේ”යි කී ය. 34 ජේසුස් වහන්සේ ද,
“සැබැවින් ම මම ඔබට කියමි, අද රෑ කුකුළා
අඬලන්නට පරෙ ඔබ මා හඳුනන්නේ නැත කියා
තුන් වරක් කියන්නහෙි ය”යි ඔහුට වදාළ සේක.
35 පේදුරු, “ඔබ සමඟ මැරනේන සිදුවුණත්, මම ඔබ
නාඳුනමි යි කවදාවත් කියන්නේ නැතැ”යි උන්
වහන්සේට කී ය. සියලු ශ්‍රාවකයෝ ද එසේ ම කී
හ.

### ගතේසමනෙහෙි යාච්ඤාව

(මාක් 14:32-42;ලූක් 22:39-46)

36 එකල ජේසුස් වහන්සේ ඔවුන් හා සමඟ
ගතේසමෙන නම් වූ තැනට පැමිණ, “මා එතැනට
ගොස් යාච්ඤා කරන අතර ඔබ මෙහි සිටින්නැ”යි
සිය ශ්‍රාවකයන්ට වදාළ සේක. 37 උන් වහන්සේ
පේදුරු ද සබෙදීගේ පුත්‍රයන් දදෙනො ද
කැඳවාගනෙ ගිය සේක. ඉන්පසු උන් වහන්සේ
ශෝක වන්ටත්, සන්තාප වන්ටත් පටන්ගත් සේක.
38 එකල උන් වහන්සේ ඔවුන් අමතමින්, “මැරනෙ
තරමට මාගේ සිත අතිශයින් ශෝකාන්විත ය. ඔබ
මෙහි නැවතී මා සමඟ අවදි ව ඉන්නැ”යි වදාළ
සේක. 39 උන් වහන්සේ මඳක් ඉදිරියට ගොස්
මුණින් වැටී, “අහෝ මාගේ පියාණනෙි, හැකි නම්
මේ කුසලාන මා කරෙනේ පහ කළ මැනව. එහතේ,
මා කැමැති ලසෙ නොව, ඔබ කැමැති ලසෙ වේ
වා”යි යාච්ඤා කළ සේක. 40 උන් වහන්සේ
ශ්‍රාවකයන් වතෙ අවුත් ඔවුන් නිදා හිඳිනු දැක,
පේදුරුට කතා කොට, “සැබැවින් ම මා සමඟ එක
පැයක් වත් අවදි ව ඉන්න ඔබට බැරිවුණා ද? 41 ඔබ
පරීක්ෂාවට නොවැටනෙ පිණිස අවදි ව සිට යාච්ඤා
කරන්න. හිත නම් කැමැති ය; ගත නම් දුබල ය”යි
වදාළ සේක. 42 උන් වහන්සේ නැවත දවෙන
වරටත් නික්ම ගොස්, “අහෝ මාගේ පියාණනෙි, මා
විසින් පානය නොකොට මේ කුසලාන පහ කළ
නොහැකි නම්, ඔබගේ කැමැත්ත වේ වා”යි කියා
යාච්ඤා කළ සේක. 43 උන් වහන්සේ නැවත ආ
කල ඔවුන් නිදා හිඳිනු දුටු සේක. ඔවුන්ගේ ඇස්
නිදිබර ව තිබිණි. 44 යළිත් උන් වහන්සේ ඔවුන්
හැර ගොස්, තුන් වන වරත් එම වචන කියා යාච්ඤා
කළ සේක. 45 ඉන්පසු උන් වහන්සේ ශ්‍රාවකයන්
වතෙට අවුත්, “ඔබ තවමත් නිදාගනෙ විඩා හරිමින්
සිටින්නහු ද? මනේන, නියමිත මොහොත ළං වී
ඇත; මනුෂ්‍ය-පුත්‍රයාණෝ පව්කරුවන් අතට පාවා දනු
ලබන සේක. 46 නැඟිටින්න, අපි යමු. අන්න, මා
පාවා දනේනා ඉතා ළඟ ය”යි වදාළ සේක.

### ජේසුස් වහන්සේ පාවා දීම

(මාක් 14:43-50;ලූක් 22:47-53;ජොහ 18:3-11)

47 උන් වහන්සේ කතා කරද්දී, දොළොස්
දනොගනේ කනෙකෙු වන ජූදස් ද, ඔහු සමඟ නායක
පූජකයන් හා ජ්‍රජා මූලිකයන් වතෙින් යවන ලද
කඩු මුගුරු ගත් මහත් ජනකායක් ද එහි පැමිණියහ.
48 උන් වහන්සේ පාවා දනේනා, “මම යමකෙු සිඹිම්
ද, ඔබ සොයන තැනැත්තා ඔහු ය; ඔහු අල්ලාගන්න”
කියා ඔවුන්ට ලකුණක් දී තිබිණි. 49 එකණෙහෙි ම
ඔහු ජේසුස් වහන්සේ වතෙට අවුත්, “ගුරුදේවයනෙි,
ඔබට සතේ වේ!” කියා උන් වහන්සේ සිඹගත්තේ
ය. 50 ජේසුස් වහන්සේ ද, “මිත්‍රය, ඔබ කරන්න ආ
දයෙ කරන්නැ”යි ඔහුට වදාළ සේක. එවිට ඔව්හු
අවුත්, ජේසුස් වහන්සේ අත්අඩංගුවට ගනෙ, තදින්
අල්ලාගත්හ. 51 උන් වහන්සේ හා සමඟ සිටි
අයගනේ කනෙකේ, අතින් කඩුව ගනෙ නායක
පූජකයාගේ දාසයාට ගසා ඔහුගේ කන කපා දැමී ය.
52 එවිට ජේසුස් වහන්සේ කතා කොට, “ඔබගේ
කඩුව කොපුවේ දමන්න, කඩු ගන්නා සියල්ලෝ ම
කඩුවනේ ම නසිති. 53 දේව දූතයන් සේනාංක
දොළොසකට වඩා වහා ම එවන ලසෙ මාගේ
පියාණන්ගනේ ඉල්ලන්න මට නොහැකි ය යි ඔබ
සිතන්නහෙි ද? 54 එහතේ, එසේ කළොත්, මේ දයෙ
මලෙසෙ ම විය යුතු යයි ශුද්ධ ලියවිලිවල කියන දේ
ඉටු වන්නේ කසෙේ දැ”යි ඔහුට වදාළ සේක.
55 ලූක් 19:47; 21:37ඒ පැයේ දී ම ජේසුස් වහන්සේ
ජනකායට කතා කොට, “ඔබ සොරකෙුට විරුද්ධ ව
මනේ කඩු මුගුරු ගනෙ මා අල්ලන්නට ආවහු ද? මම
දිනපතා ම දේව මාලිගාවහෙි උගන්වමින් සිටියමේ.
එහතේ, ඔබ මා අල්ලාගත්තේ නැත. 56 මේ සියල්ල
සිදුවූයේ දිවැසිවරයන්ගේ ලියවිලි ඉෂ්ට වන පිණිස
ය”යි වදාළ සේක. එවිට ශ්‍රාවකයෝ සියල්ලෝ ම
උන් වහන්සේ අත්හැර පලා ගියහ.

### ජේසුස් වහන්සේ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියහෙි සිටීම

(මාක් 14:53-65;ලූක් 22:54-55-63-71;ජොහ 18:13-14-19-24)

57 ජේසුස් වහන්සේ අල්ලාගත් අය උත්තම පූජක
කායාපස් වතෙට උන් වහන්සේ ගනෙ ගියහ.
විනයධරයෝ ද ජ්‍රජා මූලිකයෝ ද එහි රැස් වී
සිටියහ. 58 එහතේ පේදුරු, උත්තම පූජකයාගේ

මළුව දක්වා උන් වහන්සේ පසුපස්සේ දුරින් ගොස්,
එහි ඇතුළු වී, කුමකින් කුමක් වේ දැ යි බලන
පිණිස මුර සේවකයන් හා සමඟ හිඳගත්තේ ය.
59 නායක පූජකවරු ද මුළු ශ්‍රේෂ්ඨාධිකරණය ද
ජේසුස් වහන්සේ මරණයට පත් කරන පිණිස උන්
වහන්සේට විරුද්ධ ව බොරු සාක්ෂි සෙවූ හ.
60 බොහෝ බොරු සාක්ෂිකාරයන් ඉදිරිපත් වූ නමුත්,
කිසි සාක්ෂියක් සම්බ නො වී ය. පසුව දදෙනෙකේ
ඉදිරිපත් වී, 61 ජොහ 2:19“ ‘දේව මාලිගාව කඩාදමා
එය තුන් දිනකින් යළි ගොඩනඟන්න මට පුළුවන’
කියා මොහු කීවේ ය”යි කී හ. 62 එවිට උත්තම
පූජකයා නැඟිට, “ඔබ කිසි උත්තරයක් දනේනේ නැද්
ද? මොවුන් ඔබට විරුද්ධ ව ගනෙනෙ මේ සාක්ෂිය
කුමක් දැ”යි උන් වහන්සේගනේ ඇසී ය. 63 එහතේ,
උන් වහන්සේ නිශ්ශබ්ද ව සිටි සේක. එවිට උත්තම
පූජකයා, “ඔබ දවේයන් වහන්සේගේ පුත්‍ර වන
ක්‍රිස්තුවරයාණෝ දැ යි දිවුරා අපට කියන ලසෙ
ජීවමාන දවේයන් වහන්සේගේ නාමයනේ ඔබට අණ
කරමි”යි උන් වහන්සේට කී ය. 64 දානි 7:13ජේසුස්
වහන්සේ ද, “ඔබ කියන දයෙ හරි ය. තවදුරටත්
මම ඔබට කියමි, මතෙන් පටන් මනුෂ්‍ය-පුත්‍රයාණන්
පරාක්‍රමයාණන්ගේ දකුණු පස වැඩ සිටිනවාත්,
අහසේ වළාකුළු මත වඩිනවාත් ඔබ දකින්නහෙි
ය”යි ඔහුට වදාළ සේක. 65 ලවේ 24:16එවිට
උත්තම පූජකයා සන්තාපයනේ යුතු ව තමාගේ
වස්ත්‍ර ඉරාගනෙ මොහු දේවාපහාසයක් කළෙේ ය.
තවත් අපට සාක්ෂිකාරයන්ගනේ වැඩක් නැත,
මොහුගේ දේවාපහාසය දැන් ඔබට ඇසුණේ ය.
66 ඔබ කුමක් සිතන්නහු දැ”යි කී ය. ඔව්හු උත්තර
දමේින්, “මොහු මරණයට සුදුසු ය”යි කී හ.
67 යසො 50:6 එවිට ඔව්හු උන් වහන්සේගේ
මුහුණට කළෙ ගසා, මිට මොලෙවා පහර දුන්හ.
සමහරකේ උන් වහන්සේට අතුල් පහර දී,
68 “ක්‍රිස්තුවරයාණනෙි, ඔබට ගැසුවේ කවරකේ දැ
යි දිවැසින් බලා අපට කියන්නැ”යි කී හ.

### පේදුරුගේ අපලාපය
(මාක් 14:66-72;ලූක් 22:56-62;ජොහ 18:15-18-25-27)

69 පේදුරු මළුවහෙි පිටත වාඩි වී සිටියේ ය.
සේවිකාවක් ඔහු වතෙ අවුත්, “ඔබත් ඒ ජේසුස් නම්
ගලීලයා සමඟ සිටියහෙි ය”යි කීවා ය. 70 “මොන
බොරු ද? ඔය කතාව මට තේරනේනේ නැතැ”යි ඔහු
සියල්ලන් ඉදිරියහෙි කී ය. 71 ඔහු පිටත දොරටුව
ළඟට ගිය කල, තව සේවිකාවක් ඔහු දැක,
“මොහුත් නාසරතේහි ජේසුස් සමඟ සිටියේ ය”යි
එහි සිටියවුන්ට කීවා ය. 72 ඔහු යළිත්, “මා ඒ
මනුෂ්‍යයා අඳුනනන්නේ නැතැ”යි දිවුරා කී ය. 73 මඳ
වේලාවකට පසු එතැන සිටි අය අවුත්, “සැබැවින් ම
ඔබත් ඔවුන්ගනේ එක් කනෙකේ ය; ඒ බව ඔබගේ
කතා ලීලාවනේ පනෙේ ය”යි පේදුරුට කී හ.
74 එවිට ඔහු, “ඒ මිනිසා නාඳුනමි”යි කියමින් දසේ
තබාගන්න ද දිවුරන්න ද පටන්ගත්තේ ය.
එකණෙහෙි ම කුකුළා හැඬලී ය. 75 “කුකුළා
හඬලන්න පළමු ඔබ මා හඳුනන්නේ නැත කියා තුන්
වරක් කියනු ඇතැ”යි ජේසුස් වහන්සේ වදාළ
වචනය සිහි කොට පේදුරු පිටතට ගොස් ඉකි
බිඳිමින් හැඬී ය.

### ජේසුස් වහන්සේ පිලාත් ඉදිරියහෙි
(මාක් 15:1;ලූක් 23:1-2;ජොහ 18:28-32)

27 පහන් වූ කල සියලු නායක පූජකවරු ද
ප්‍රජා මූලිකයෝ ද ජේසුස් වහන්සේ
මරණයට පත් කරන පිණිස උන් වහන්සේට විරුද්ධ
ව මන්ත්‍රණය කළහ. 2 ඔව්හු උන් වහන්සේට
විලංගු ලා ගනෙ ගොස් ආණ්ඩුකාර පිලාත්ට භාර
දුන්හ.

### ජූදස්ගේ මරණය
(ක්‍රියා 1:18-19)

3 ක්‍රියා 1:18-19 උන් වහන්සේ පාවා දුන් ජූදස්,
උන් වහන්සේ වරදට පත් කරනු ලැබූ බව දැක,
ශෝකයනේ පළෙී, රිදී මිල තිහ නායක පූජකවරුන් ද
ප්‍රජා මූලිකයන් ද වතෙ ආපසු ගනෙ ගොස්,
4 “නිදොස් කනෙකෙු මරණයට පාවා දීමනේ මම පව්
කළෙමේ”යි කී ය. එහතේ ඔව්හු, “එයින් අපට කමක්
නැත, ඔබ ම එය බලාගන්නැ”යි කී හ. 5 එවිට ඔහු
ඒ රිදී මිල ශුද්ධස්ථානයහෙි විසි කොට දමා, නික්ම
ගොස් එල්ලී මළේ ය.
6 නායක පූජකවරු ඒ රිදී මිල ගනෙ, “මේවා ලේ-
මිල බැවින් දේව මාලිගාවේ මුදල් ගබඩාවට දැමීම
යුතු නැතැ”යි කී හ. 7 එසේ කියා ඔව්හු මන්ත්‍රණය
කොට, විජාතීන් සඳහා සුසාන භූමියක් වන පිණිස ඒ
මුදලින් ‘කුඹල් කතෙ’ මිල දී ගත්හ. 8 එහයෙින් අද
දක්වා ඒ කතෙට ‘ලේ කතෙ’ යයි කියනු ලැබේ.
9 සකෙරි 11:12-13 මසෙේ දිවැසිවර ජරෙමියාගේ
කීමක් සැබෑ විය. එනම්: “යම් කිසි කනෙකෙුගේ
වටිනාකමේ හැටියට ඉශ්‍රායලේ ජනතාව අතර
සම්මත ව තිබූ මිලය වන රිදී මිල තිහ,
10 සමිඳාණන් වහන්සේ මට අණ දුන් පරිදි, කුඹල්
කතෙ සඳහා දුනිමි” යනු යි.

### ජේසුස් වහන්සේ පිලාත් ඉදිරියහෙි සිටීම
(මාක් 15:2-5;ලූක් 23:3-5;ජොහ 18:33-38)

11 ජේසුස් වහන්සේ ආණ්ඩුකාරයා ඉදිරියහෙි පනෙී
සිටි සේක. “ඔබ ජුදවේවන්ගේ රජ දැ”යි ඔහු උන්
වහන්සේගනේ ප්‍රශ්න කළෙේ ය. “එසේ කියන්නේ
ඔබ ය”යි ජේසුස් වහන්සේ උත්තර දුන් සේක.
12 නායක පූජකවරුන් ද ප්‍රජා මූලිකයන් ද උන්
වහන්සේට වරද තැබූ විට, උන් වහන්සේ කිසි
උත්තරයක් නුදුන් සේක. 13 එවිට පිලාත්, “මොවුන්
ඔබට විරුද්ධ ව නඟන චෝදනා ඇසනේනේ නැද්දැ”යි
ඇසී ය. 14 එහතේ, ජේසුස් වහන්සේ එක
වචනයකින් පමණ වත් උත්තර නුදුන් සේක.
එබැවින් ආණ්ඩුකාරයා අතිශයින් මවිත විය.

## ජේසුස් වහන්සේට මරණීය දඬුවම
(මාක් 15:6-15;ලූක් 23:13-25;ජොහ 18:39;19:16)

15 මංගල්‍යයේ දී ජනතාව ඉල්ලා සිටින
සිරකරුවකු ආණ්ඩුකාරයා විසින් නිදහස් කර හරිනු
ලැබීමේ සිරිතක් තිබිණි. 16 එකල්හි ජේසුස්
බරබ්බස් යයි නම් දැරූ ප්‍රසිද්ධ සිරකරුවකේ විය.
17 එහෙයින් සෙනඟ රැස් වූ විට, "මා ඔබට
කවරකු නිදහස් කර දෙනවාට ඔබ කැමැති ද?
බරබ්බස් කියන ජේසුස් ද? නැතහොත් ක්‍රිස්තුස්
කියන ජේසුස් දැ"යි පිලාත් ඔවුන්ගෙන් ඇසී ය.
18 එසේ ඇසුවේ, ඔවුන් ඊර්ෂ්‍යාවෙන් උන් වහන්සේ
පාවා දුන් බව පිලාත් දැන සිටි හෙයිනි.
19 තවද, ඔහු විනිශ්චයාසනයෙහි සිටිය දී, ඔහුගේ
භාර්යාව, "ඒ නිදොස් මනුෂ්‍යයාට කිසිවක්
නොකරන්න. ඊයේ රෑ ඔහු නිසා මම සිහිනයකින්
බොහෝ දුක් වින්දෙමි"යි පිලාත්ට කියා යැවුවා ය.
20 එහෙත්, නායක පූජකවරු ද ප්‍රජා මූලිකයෝ ද
බරබ්බස් ම ඉල්ලන්නටත්, ජේසුස් වහන්සේ
නසාලන්නටත් ජනකාය කැමැති කරවාගත්හ.
21 ආණ්ඩුකාරයා ඔවුන්ට උත්තර දෙමින්, "මේ
දෙදෙනාගෙන් කවරකු මා ඔබට නිදහස් කර
දෙනවාට කැමැති දැ"යි ඔවුන්ගෙන් ඇසී ය.
"බරබ්බස්" යයි ඔව්හු කී හ. 22 "එසේ නම්
ක්‍රිස්තුස් ය කියන ජේසුස්ට මා කුමක් කරන්න දැ"යි
පිලාත් ඔවුන්ගෙන් ඇසී ය. "ඔහු කුරුසියේ ඇණ
ගසන්නැ"යි සියල්ලෝ ම එක හඬින් කී හ. 23 එවිට
ඔහු, "මන් ද? මොහු මොන අපරාධයක් කළේ
දැ"යි ඇසී ය. එහෙත්, "ඔහු කුරුසියෙහි ඇණ
ගසන්නැ"යි ඔව්හු වැඩි වැඩියෙන් හඬ නඟමින්
මොරගැසූ හ. 24 ද්වි.නී. 21:6-9මෙසේ
කෝලාහලයක් හට ගනු මිස, තමාගේ
ප්‍රයත්නයෙන් වැඩක් සිදු නොවන බව දුටු පිලාත්,
වතුර ගෙන, ජනකාය ඉදිරියේ අත් සෝදමින්, "මේ
මනුෂ්‍යයාගේ ලේ ගැන මම නිදොස් ය. ඔබ ම
වගබලා ගන්නැ"යි කී ය. 25 මුළු සමූහයා උත්තර
දෙමින්, "ඔහුගේ ලේවල පල විපාකය අප පිට ද
අපේ දරුවන් පිට ද වේ වා"යි කී හ. 26 එකල
පිලාත්, ඔවුන්ට බරබ්බස් නිදහස් කර දුන්නේ ය.
එහෙත්, ඔහු ජේසුස් වහන්සේට තළවා, කුරුසියෙහි
ඇණ ගැසීමට භාර දුන්නේ ය.

## සබෙළුන්ගෙන් නිග්‍රහ
(මාක් 15:16-20;ජොහ 19:2-3)

27 එකල ආණ්ඩුකාරයාගේ මුරසබෙළෝ ජේසුස්
වහන්සේ ප්‍රතෝරියම් නම් රජ වාසලට ගෙන
ගොස් මුළු සේනාංකය උන් වහන්සේ වටෙ රැස්
කළහ. 28 ඔව්හු උන් වහන්සේගේ ඇඳුම් ගලවාදමා,
නීල-රක්ත සළුවක් උන් වහන්සේට ඇන්දෙව්වෝ ය.
29 තවද ඔව්හු කටු ඔටුන්නක් ගොතා උන්
වහන්සේගේ හිස මත තබා, බට දණ්ඩක් දකුණතට
දී, උන් වහන්සේ අබිමුවෙහි දණ නමා,
"ජුදෙව්වන්ගේ රජුනි, සැරදේ!" කියා උන් වහන්සේට
සරදම් කළහ. 30 ඔව්හු උන් වහන්සේට කෙළ ගසා,
බට දණ්ඩ ගෙන, උන් වහන්සේගේ හිසට ගැසූ හ.
31 මෙසේ ගැරහුම් කළ පසු ඔව්හු උන් වහන්සේට
ඇන්දූ සළුව ගලවා, උන් වහන්සේගේ ම ඇඳුම්
අඳවා, උන් වහන්සේ කුරුසියෙහි ඇණ ගසන පිණිස
ගෙන ගියහ.

## කුරුසියෙහි ඇණ ගැසීම
(මාක් 15:21-32;ලූක් 23:26-43;ජොහ 19:17-27)

32 ඔවුන් නික්ම යද්දී සීමොන් නම් කිරේනියේ
මනුෂ්‍යයකු සම්බ වී, උන් වහන්සේගේ කුරුසිය
උසුලාගෙන යන්න ඔව්හු ඔහුට බල කළහ. 33 ඔව්හු
කපාල පිටිය යන අර්ථ ඇති 'ගොල්ගොතා' නම්
ස්ථානයට පැමිණ, 34 ගීතා 69:21තිත්ත මිශ්‍ර කළ
මුද්‍රික පානය උන් වහන්සේට බොන්න දුන්හ. උන්
වහන්සේ එය දිව ගා බලා බොන්න අකමැති වූ
සේක. 35 ගීතා 22:18උන් වහන්සේ කුරුසියෙහි ඇණ
ගැසූ පසු, ඔව්හු උන් වහන්සේගේ ඇඳුම් දාදු දමා
බෙදාගත්හ. 36 ඔව්හු එහි හිඳගෙන උන් වහන්සේ
මුර කළහ. 37 තවද, "මොහු ජුදෙව්වරුන්ගේ රජ වන
ජේසුස් ය" කියා උන් වහන්සේ පිළිබඳ චෝදනා
පත්‍රය ලියා උන් වහන්සේගේ හිසට ඉහළින් තැබූ
හ.
38 එවිට සොරු දෙදෙනෙකේ, එක් කෙනෙකේ දකුණු
පසෙහි ද එක් කෙනෙකේ වම් පසෙහි ද උන්
වහන්සේ හා සමඟ කුරුසියෙහි ඇණ ගසනු ලැබූ හ.
39 ගීතා 22:7; 109:25මඟ යන්නෝ තමන් හිස් වන
වනා උන් වහන්සේට නින්දා කරමින්, 40 මතෙ 26:61;
ජොහ 2:19"දේව මාලිගාව කඩාදමා තුන් දවසකින්
එය ගොඩනඟන ඔබ, ඔබ ම ගළවාගන්න; ඔබ
දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම්, කුරුසියෙන් බැස
එන්නැ"යි කී හ. 41 එම අයුරින් නායක පූජකවරු ද
විනයධරයන් හා ප්‍රජා මූලිකයන් සමඟ උන්
වහන්සේට කවටකම් කොට, 42 "මොහු අනුන්
ගැළවේවේ ය; දැන් තමාට ම ගැළවෙන්ට නුපුළුවන;
මොහු ඉශ්රායලේවරුන්ගේ රජ නොවේ ද? එසේ
නම් දැන් කුරුසියෙන් බසී වා, එවිට අපි මොහු
විශ්වාස කරන්නෙමු. 43 ගීතා 22:8මොහු දෙවියන්
වහන්සේ විශ්වාස කරන්නේ ය; උන් වහන්සේ
ඔහුට කැමැති සේක් නම් දැන් ඔහු මුදා හරින
සේක් වා. මන්ද, 'මම දෙවියන් වහන්සේගේ
පුත්‍රයා වෙමි'යි මොහු කීවේ ය"යි කී හ. 44 උන්
වහන්සේ සමඟ කුරුසියෙහි ඇණ ගසනු ලැබූ සොරු
ද එසේ ම උන් වහන්සේට නින්දා කළහ.

## ජේසුස් වහන්සේගේ මරණය
(මාක් 15:33-41;ලූක් 23:44-49;ජොහ 19:28-30)

45 මද්දහනේ සිට අපරභාග තුන දක්වා රට පුරා
තද අන්ධකාරයක් පහළ විය. 46 ගීතා 22:1තුනට
පමණ ජේසුස් වහන්සේ, "ඒලී, ඒලී, ලාමා
සබක්තානී" කියා මහහඬින් මොරගැසූ හ. එහි
අර්ථය "මාගේ දෙවියනි, මාගේ දෙවියනි, ඔබ මා
අත්හැරියේ මක්නිසා ද" යනු යි. 47 එහි

සිටියවුන්ගනේ සමහරකේ ඒ අසා, “මොහු එලියා
අමතන්නේ ය”යි කී හ. 48 ගීතා 69:21එකණෙහෙි ම
ඔවුන්ගනේ එක් කනෙකුෙ දිව ගොස්, මුදු
හත්තක්ගනෙ ඇඹුල් මිදියුසවල පොඟවා බට
දණ්ඩක ගසා, උන් වහන්සේට බොන්න දුන්නේ ය.
49 සසේසෝ කතා කොට, “නිකම් ඉන්න, මොහු
ගළවන්ට එලියා එන්නේ දැ යි බලමු”යි කී හ.
50 ජේසුස් වහන්සේ යළිත් මහහඬින් හඬගා
අවසන් හුස්ම හළෙු සේක. 51 නික්ම 26:31-33දේව
මාලිගාවේ තිරය ඉහළ පටන් පහළ දක්වා දකෙඩ ව
ඉරුණේ ය; පොළොව කම්පා විය; ගිරිකුළු දදෙරිණි;
52 සොහොන් ගවෙල් විවර විය; දිවංගත
ශුද්ධවරයෝ උත්ථාන කරනු ලැබූ හ. 53 උන්
වහන්සේගේ පුනරුප්පීවනයනේ පසු, ඔව්හු
සොහොන් ගවෙලින් නික්ම ශුද්ධ නුවරට ඇතුළු ව,
බොහෝ දනෙකුෙට පනෙුණොහ. 54 ශතාධිපතියා ද
ඔහු සමඟ ජේසුස් වහන්සේ මුර කරමින් සිටි අය ද
පොළෝකම්පාවත්, සිදු වූ දේත් දැක ඉතා බියපත්
ව, “සැබැවින් ම මේ මනුෂ්‍යයා දවේයන්
වහන්සේගේ පුත්‍රයා ය”යි කී හ. 55 ලූක්
8:2-3ගලීලයේ සිට උන් වහන්සේ කැටුව අවුත්, උන්
වහන්සේට ආවතේව කළ බොහෝ කාන්තාවෝ ද
එහි දුරින් සිට බලා සිටියහ. 56 මග්දලායේ මරියා ද
ජාකොබ්ගේ සහ ජෝසෙප්ගේ මව වූ මරියා ද
සබෙදීගේ පුත්‍රයන්ගේ මව ද ඔවුන් අතර වූ හ.

### භූමදානය
(මාක් 15:42-47;ලූක් 23:50-56;ජොහ 19:38-42)

57 සවස් වූ කල ජේසුස් වහන්සේගේ
ශ්‍රාවකයකෙු ව සිටි ජෝසෙප් නම් ධනවත්
මනුෂ්‍යයකේ අරිමාතියේ සිට අවුත්, 58 පිලාත් වතෙ
ගොස්, උන් වහන්සේගේ මෘත ශරීරය ඉල්ලී ය.
එවිට පිලාත් එය භාර දනේන අණ කළේ ය.
59 ජෝසෙප් ඒ මෘත ශරීරය ගනෙ පිරිසිදු හණ
රදේදකින් වළො, 60 පර්වතයහෙි කප්පා තිබුණු
තමාගේ ම අලුත් සොහොන් ගැබහෙි තබා, එහි
දොරකඩට විශාල ගලක් පරෙළා තබා යන්න ගියේ
ය. 61 මග්දලායේ මරියා ද අනික් මරියා ද එතැන
සොහොන් ගයෙ ඉදිරියහෙි හිඳගනෙ උන්හ.

### සොහොන් ගයෙ මුර කිරීම

62 පසු දා එනම් සිකුරාදාට පසු දා, නායක
පූජකවරු ද පරිසිවරු ද පිලාත් වතෙ රැස් ව, 63 මතෙ
16:21; 17:23; 20:19; මාක් 8:31; 9:31; 10:33-34; ලූක්
9:22; 18:31-33“ස්වාමීනි, ඒ වංචාකාරයා ජීවත් ව
සිටිය දී, ‘මම තුන් දවසකට පසු මරණින් උත්ථාන
වන්නමේ’යි කී බව අපට මතක ය. 64 එහයෙින් තුන්
වන දවස දක්වා සොහොන් ගයෙ ආරක්ෂා කරන්න
අණ දුන මැනවි. නැතහොත්, සමහර විට ඔහුගේ
ශ්‍රාවකයන් අවුත් ඔහු සොරොගනෙ ගොස්, ‘ඔහු
මරණින් උත්ථාන වී ය’යි සනෙඟට කියනු ඇත.
මසෙේ අවසාන වංචාව මුල් වංචාවට වඩා
මහත්වන්නේ ය”යි කී හ. 65 “වුවමනා නම්, මුර
කණ්ඩායමක් රැගනෙ ගොස් සොහොන හැකි පමණ
සුරක්ෂිත කොට තබන්නැ”යි පිලාත් ඔවුන්ට කී ය.
66 ඔව්හු ගොස් සොහොන් ගල පිට මුද්‍රාව තබා,
මුර කණ්ඩායම එහි සිටුවා, සොහොන් ගයෙ
සුරක්ෂිත කළහ.

### පුනරුප්පීවනය
(මාක් 16:1-8;ලූක් 24:1-12;ජොහ 20:1-10)

28 සබත් දින නිම වී සතියේ පළමු වන දින
එළිවන වේලහෙි මග්දලායේ මරියා ද අනික්
මරියා ද සොහොන් ගයෙ බලන්න ගියහ. 2 එවිට
මහා භූමිකම්පාවක් විය. සමිඳාණන් වහන්සේගේ
දූතයකේ ස්වර්ගයනේ බැස අවුත්, ගල ඉවතට
පරෙළා ඒ මත හිඳගත්තේ ය. 3 ඔහුගේ පනෙුම
විදුලිය වැනි ය, ඔහුගේ වස්ත්‍ර හිම මනේ සුදු ය.
4 මුර සබෙළු ඔහුට භයින් වවුෙලා, මළවුන් මනේ වූ
හ. 5 දේව දූතයා ඒ ස්ත්‍රීන්ට කතා කරමින්, “බිය
නොවන්න, ඔබ කුරුසියහෙි ඇණ ගැසූ ජේසුස්
වහන්සේ සොයන බව දනිමි; 6 උන් වහන්සේ මහෙි
නැත; උන් වහන්සේ වදාළ ලසෙ ම උත්ථාන වූ
සේක. එන්න, සමිඳාණන් වහන්සේ තැන්පත් කළ
ස්ථානය බලා, 7 වහා ම ගොස්, ‘උන් වහන්සේ
මළවුන්ගනේ උත්ථාන වූ සේක. උන් වහන්සේ ඔබට
පළමු ව ගලීලයට යන සේක. එහි දී ඔබ උන්
වහන්සේ දකින්නහු ය’යි ශ්‍රාවකයන්ට දන්වන්න. මා
කී දේ මතක තබා ගන්නැ”යි කී ය. 8 එවිට ඔව්හු
භයින් ද මහත් ප්‍රීතියනේ ද යුක්ත ව සොහොන්
ගයෙින් වහා ම නික්ම ගොස්, උන් වහන්සේගේ
ශ්‍රාවකයන්ට දන්වන පිණිස දිවූ හ. 9 එකල ජේසුස්
වහන්සේ හදිසියේ ඔවුන්ට මුණ ගැසී, “සතේ වේ
වා!”යි වදාළ සේක. ඔව්හු ළං වී උන් වහන්සේගේ
පා වැළඳගනෙ, උන් වහන්සේට පසඟ පිහිටුවා
නමස්කාර කළහ. 10 එවිට උන් වහන්සේ ඔවුන්ට
කතා කොට, “බිය නොවන්න; මාගේ සහෝදරයන්
වතෙට ගොස්, ගලීලය බලා යන්න ඔවුන්ට කියන්න;
එහි දී ඔවුන් මා දකිනු ඇතැ”යි වදාළ සේක.

### මුර සබෙළුන් ගනෙූ බොරුව

11 ස්ත්‍රීවරුන් මඟ යද්දී මුර සබෙළුන්ගනේ
සමහරකේ නුවරට පැමිණ, ඒ මුළු සිද්ධිය නායක
පූජකවරුන්ට දැන්වූ හ. 12 එවිට, ඔව්හු ප්‍රජා
මූලිකයන් හා සමඟ රැස් ව කුමන්ත්‍රණය කොට
භේවායන්ට බොහෝ මුදල් දී, 13 “අප රෑ නිදා සිටිය
දී, ඔහුගේ ශ්‍රාවකයෝ අවුත්, ඔහු සොරොගනෙ
ගියහ’යි කියන්න. 14 මේ බව ආණ්ඩුකාරයාට ආරංචි
වුණොත්, අපි ඔහු කැමැති කරවාගනෙ ඔබ බේරා
ගන්නමෙු”යි කී හ. 15 ඔව්හු මුදල් රැගනෙ තමන්ට
ඉගැන්වූ ලසෙ කළහ. මසෙේ ඒ කීම ජුදවේවන්
අතරේ ප්‍රසිද්ධ වී, අද දක්වාත් පැවත එයි.

### ධර්මදූත සේවාව පැවරීම
(මාක් 16:14-18;ලූක් 24:36-49;ජොහ 20:19-23;ක්රියා 1:6-8)

16 මතෙ 26:32; මාක් 14:28 ශ්රාවකයෝ
එකොළොස් දනො ජේසුස් වහන්සේ ඔවුන්ට නියම
කළ පරිදි ගලීලයේ කන්දට ගියහ. 17 ඔව්හු උන්
වහන්සේ දැක පසඟ පිහිටුවා වැන්දෝ ය; එහෙත්
සමහරකේ සැක කළහ. 18 ජේසුස් වහන්සේ ඔවුන්
වෙතෙට අවුත් කතා කොට, “ස්වර්ගයෙහි ද
පොළොවෙහි ද සියලු බලය මට පවරා තිබේ.
19 ක්රියා 1:8එබැවින් ඔබ ගොස්, සකල ජාතීන්
ශ්රාවකයන් කරන්න; පියාණන්ගේ ද
පුත්රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද නාමයනේ
ඔවුන් බව්තීස්ම-ස්නාපනය කරන්න; 20 මා ඔබට
අණ කළ සියල්ල රක්ෂා කරන්න ඔවුන්ට
උගන්වන්න. මම ද යුගාන්තය දක්වා සදහට ම ඔබ
හා සමඟ සිටිමි”යි වදාළ සේක.

### අංසබාග රෝගියකු සුව කිරීම
(මතෙ 9:1-8;ලූක් 5:17-26)

2 දින ගණනකට පසු ජේසුස් වහන්සේ යළිත්
කපර්ණවුමට පිවිසුණු සේක. උන් වහන්සේ
ගදෙර සිටින බව පතළ විය. 2 එවිට දොරකඩ
අසලවත් ඉඩක් නැති තරමට මහ පිරිසක් එහි රැස්
වූ හ. උන් වහන්සේ ඔවුන්ට දහම් දසමින් සිටි
සේක. 3 එකල සතර දනෙකේ අංසබාග රෝගියකු
උසුලාගනෙ උන් වහන්සේ වෙත ආහ. 4 සමූහය
නිසා උන් වහන්සේ වෙත යාගත නොහැකි වූයනේ
ඔව්හු උන් වහන්සේ සිටි තැනට ඉහළින් පියස්සේ
සවේල්ල හැර, පියස්ස කඩා, අංසබාග රෝගියා ඔත්
යහන පහතට බැස්වූ හ. 5 ජේසුස් වහන්සේ
ඔවුන්ගේ ඇදහිල්ල දැක, “පුත්රය, ඔබේ පව් කමා
කර තිබේ” යයි අංසබාග රෝගියාට වදාළ සේක.
6 එහෙත් එතැන හුන් විනයධරයන්ගනේ සමහරකේ
තර්ක කරමින්, 7 “මේ මිනිහා මසෙේ කතා
කරන්නේ මක්නිසා ද? මේ දේවාපහාසයකි! දවේයන්
වහන්සේට මිස පව් කමා කරන්න පුළුවන් වනෙ
කාට දැ”යි සිතූ හ. 8 ඔවුන් මසෙේ තර්ක කරන බව
ජේසුස් වහන්සේගේ සිතට එකණෙහෙි ම දැනී,
ඔවුන්ට කතා කොට, “ඔබ කුමක් නිසා ඔබේ සිත්
තුළ මසෙේ තර්ක කරන්නහු ද? 9 වඩා පහසු කුමක්
ද? අංසබාග රෝගියාට ‘ඔබේ පව් කමා කරන
ලදැ’යි කීම ද? නැතහොත්, ‘නැඟිට ඔබේ යහන
රැගනෙ යන්නැ’යි කීම ද? 10 එහෙත්, මලෙොව දී
පව් කමා කිරීමේ බලය මනුෂ්ය-පුත්රයාණන්ට ඇති
බැව් ඔබ දැනගන්නා පිණිස මම මසෙේ කරමි”යි
කියා උන් වහන්සේ අංසබාග රෝගියාට කතා
කොට, 11 “නැඟිට ඔබේ යහන රැගනෙ ගදෙර
යන්නැ යි මම ඔබට කියමි”යි වදාළ සේක. 12 ඔහු
නැඟිට එකණෙහෙි ම යහන රැගනෙ පිරිස බලා
සිටිය දී ම නික්ම ගියේ ය. සියල්ලෝ ම විස්මිත ව,
“මවෙන්නක් අප කවදාවත් දැක නැතැ”යි කියමින්
දවේයන් වහන්සේට ප්රශංසා කළහ.

### ලවේ කැඳවීම
(මතෙ 9:9-13;ලූක් 5:27-32)

13 නැවත උන් වහන්සේ පිටත් ව මුහුද අසලින්
ගිය සේක. මුළු සමූහයා උන් වහන්සේ වෙත රැස් වූ
හ. උන් වහන්සේ ඔවුන්ට ඉගැන්වූ සේක. 14 උන්
වහන්සේ මඟ වඩින විට, අල්පයෙුස්ගේ පුත් ලවේ
නැමැත්තා රේගු පොළේ හිඳිනු දැක, “මා අනුව
එන්නැ”යි ඔහුට වදාළ සේක. ඔහු නැඟිට උන්
වහන්සේ අනුව ගියේ ය.
15 තවද, උන් වහන්සේ ඔහුගේ නිවසෙහි කෑමට
වැඩහුන් කල අයකැමියන් සහ පව්කාරයන් බොහෝ
දනෙකේ ද උන් වහන්සේ සහ උන් වහන්සේගේ
ශ්රාවකයන් සමඟ හිඳගත්හ. ඔවුන්ගනේ බොහෝ
දනෙකේ උන් වහන්සේගේ අනුගාමිකයෝ වූ හ.
16 උන් වහන්සේ පව්කාරයන් හා අයකැමියන් සමඟ
ආහාර වළඳනු දුටු පරිසිවරුන්ගේ පක්ෂයේ
විනයධරයෝ, “බලන්න, උන් වහන්සේ අයකැමියන්
හා පව්කාරයන් සමඟ කන බොන සැටි”යි
ශ්රාවකයන්ට කී හ. 17 ජේසුස් වහන්සේ ඒ අසා,
“රෝගීන්ට මිස නිරෝගීන්ට වදෙකුගනේ වැඩක්
නැත; මා ආයේ දමිටුන් නොව අදමිටුන් කැඳවීමට
ය”යි වදාළ සේක.

### උපවාස ප්රශ්නය
(මතෙ 9:14-17;ලූක් 5:33-39)

18 වරක් ජොහන්ගේ ගෝලයෝ ද පරිසිවරු ද
උපවාසයෙහි යදෙුණාහ. එවිට සමහරකේ,
“ජොහන්ගේ ගෝලයෝ ද පරිසිවරුන්ගේ ගෝලයෝ
ද උපවාස කරති; ඔබේ ශ්රාවකයන් උපවාස
නොකරන්නේ මන්දැ”යි ජේසුස් වහන්සේගනේ ඇසූ
හ.
19 උන් වහන්සේ ඔවුන් අමතා මසෙේ වදාළ
සේක: “මනාලයා ඔවුන් සමඟ සිටිය දී ඔහුගේ
ඥාති මිත්රාදීන්ට උපවාස කළ හැකි ද? මනාලයා
ඔවුන් සමඟ සිටින තුරු ඔවුන්ට උපවාස කළ
නොහැකි ය. 20 එහෙත්, මනාලයා ඔවුන් කරෙනේ
වනේ කරනු ලබන දවසක් පැමිණයෙි. ඒ දවසේ දී
ඔවුන් උපවාස කරනු ඇත. 21 තාන් රෙදි කඩකින්
පරණ වස්ත්රයකට අණ්ඩයක් දමන කිසිවකේ නැත,
එසේ කළොත්, අලුත් රෙදි කඩට පරණ රෙද්ද ඇදී
ඉරුම වඩා ලොකු වේ. 22 අලුත් මිදියුස පැරණි සම්
බඳුන්වල වක්කරන කිසිවකේ නැත. එසේ කළොත්,
මිදියුසින් සම් බඳුන් පැළී, මිදියුසත් බඳුනුත් දකෙ ම
නැති වේ. නව මිදියුස දැමිය යුත්තේ නව
බඳුන්වලට ම ය.”

### සබත කඩ කිරීමේ ප්රශ්නය
(මතෙ 12:1-8;ලූක් 6:1-5)

23 ද්වි.නී. 23:25 තවද, උන් වහන්සේ සබත් දිනයේ
දී වලේයායක් මැදින් වඩින විට, උන් වහන්සේගේ
ශ්රාවකයෝ කරල් කඩ කඩා ගියහ. 24 පරිසිවරු ඒ
දැක, “බලන්න, මොවුන් සබත් දිනයෙහි නොකට

යුත්තක් කරන්නේ මක්නිසා දැ"යි උන්
වහන්සේගෙන් ඇසූ හ. 25 1 සාමු 21:1-6උන්
වහන්සේ උත්තර දෙමින්, දාවිත් රජ තමාට ද සිය
පිරිවරට ද කෑමට කිසිවක් නැති ව බඩගිනි වූ කල
කළ දේ, 26 ලෙවී 24:9එනම්, අබියාතර් නායක පූජක
ව සිටිය දී දාවිත් දෙවියන් වහන්සේගේ ගෘහයට
පිවිස පූජකයන් මිස අන් කිසිවකු නොකෑ යුතු පිදූ
රොටි කා, සිය පිරිවරටත් දුන් වග, ඔබ කවදාවත්
කියවා නැද්දැ"යි ඇසූ සේක. 27 උන් වහන්සේ
ඔවුන්ට කතා කොට, සබත පිහිටුවන ලද්දේ මිනිසා
උදෙසා ය; මිනිසා සබත උදෙසා නොවේ;
28 එහෙයින් මනුෂ්‍ය-පුත්‍රයාණෝ සබත් දිනට පවා
අධිපතියාණෝ ය"යි වදාළ සේක.

## අතක් පණ නැති මිනිසා

(මතෙ 12:9-14;ලූක් 6:6-11)

3 තවත් දිනක උන් වහන්සේ ධර්මශාලාවට
වැඩිය විට, අතක් පණ නැති මිනිසෙක් එහි
විය. 2 එවිට එහි රැස් ව සිටි අය උන් වහන්සේට
වරද තබන පිණිස, සබත් දිනයේ දී උන් වහන්සේ
ඔහු සුව කරනු ඇද්දැ යි බල බලා උන්හ. 3 උන්
වහන්සේ අත පණ නැති මිනිසාට කතා කොට,
"නැඟිට ඉදිරියට එන්නැ"යි වදාරා 4 ඉන්පසු, "සබත්
දිනයේ දී කළ යුත්තේ යහපත ද අයහපත ද,
ප්‍රාණයක් ගැළවීම ද නැසීම දැ"යි සෙනඟගෙන් ඇසූ
සේක. එහෙත්, ඔව්හු නිහඬ ව සිටියහ. 5 උන්
වහන්සේ ඔවුන්ගේ සිත් දැඩිකම ගැන දුක් ව,
උදහසින් වටේට බලා "ඔබේ අත දිග හරින්නැ"යි ඒ
මිනිසාට වදාළ සේක. ඔහු එය දිග හැරියේ ය.
එකණෙහි ම ඔහුගේ අත සුව විය. 6 එවිට
පරිසිවරු පිටත් ව ගොස් උන් වහන්සේ කෙසේ
නසමු දැ යි උන් වහන්සේට විරුද්ධ ව හෙරෝදියයන්
සමඟ එකණෙහි ම කුමන්ත්‍රණය කළහ.

## මුහුදුබඩ රැස් වූ මහ පිරිස

7 ජේසුස් වහන්සේ එතැනින් නික්ම සිය
ශ්‍රාවකයන් සමඟ මුහුදු වෙරළට වැඩිය සේක.
ගලීලයෙන් සහ ජුදයෙන් ද 8 ජෙරුසලමෙන් ද
ඉදුමයෙන් ද ජොර්දාන් එගොඩින් ද තීර් සහ
සීදොනය අවටින් ද මහා ජනකායක් උන් වහන්සේ
කළ සියල්ල ගැන අසා උන් වහන්සේ වෙත ආහ.
9 මාක් 4:1; ලූක් 5:1-3සමූහයා උන් වහන්සේ
නොතෙරපෙන පිණිස තමන් හට ඔරුවක් සූදානම් ව
තිබිය යුතු යයි උන් වහන්සේ ශ්‍රාවකයන්ට වදාළ
සේක. 10 එසේ කීවේ, උන් වහන්සේ බොහෝ
දෙනෙකු සුව කළ හෙයින්, රෝගී වූ සියලු දෙනා
එතුමන් ස්පර්ශ කරන්නට රැස් කකා ආ බැවිනි.
11 අශුද්ධාත්මයෝ ද උන් වහන්සේ දුටු හැම විට ම
උන් වහන්සේගේ පාමුල වැද වැටී, "ඔබ දෙවියන්
වහන්සේගේ පුත්‍රයාණෝ ය"යි මොරගා කී හ.
12 තමා කවරකේ දැ යි හෙළි නොකරන ලෙස උන්
වහන්සේ ඔවුන්ට තදින් අණ කළ සේක.

## ප්‍රේරිතයන් දොළොස් දෙනා පත් කිරීම

(මතෙ 10:1-4;ලූක් 6:12-16)

13 උන් වහන්සේ කඳුකරයට වැඩම කර, තමන්
කැමැති වූවන් තමන් වෙත කැඳවූ සේක. ඔව්හු උන්
වහන්සේ වෙත ආවෝ ය. 14 උන් වහන්සේ
දොළොස් දෙනෙකු පත් කළ සේක; ඔවුන්ට
ප්‍රේරිතයෝ යයි නම් තැබූ සේක. උන් වහන්සේ
එසේ කළේ, ඔවුන් තමන් හා සමඟ සිටින
පිණිසත්, සුබ අස්න දේශනා කිරීමට යවන පිණිසත්,
15 දුෂ්ටාත්මයන් දුරු කිරීමේ බලය ඇති ව සිටින
පිණිසත් ය, 16 එසේ පත් කළ දොළොස් දෙනා කවුරු
ද යත්: පේදුරු යයි උන් වහන්සේ නම් කළ සීමොන්
ද, 17 'ගර්ජනා පුත්‍රයෝ' යන අර්ථය දෙන
'බෝවනර්ගස්' යයි උන් වහන්සේ නම් කළ
සෙබෙදීගේ පුත් ජාකොබ් සහ ඔහුගේ සොහොයුරු
ජොහන් ද 18 ඇන්ඩෲ සහ පිලිප් ද බර්තොලමවේ
සහ මතවේ ද තෝමස් සහ අල්පවෙස්ගේ පුත්
ජාකොබ් ද තද්දවෙස් සහ අන්ත ජාතිවාදී සීමොන් ද
19 උන් වහන්සේ පාවා දුන් ජුදස් ඉස්කාරියොත් ද
යන මොවුහු ය.

## ජේසුස් වහන්සේ සහ දුෂ්ටාත්මාධිපතියා

(මතෙ 12:22-32;ලූක් 11:14-23;12:10)

20 උන් වහන්සේ ගෙදර ගිය සේක. ඔවුන්ට කෑම
කන්න වත් අවකාශ නැති වන තරමට සමූහයක්
යළිත් රැස් වූ හ. 21 උන් වහන්සේගේ නෑදෑයෝ ඒ
අසා උන් වහන්සේ අල්ලාගැනීමට ගියහ. එසේ
ගියේ, "උන් වහන්සේ සිහිවිකල් වී සිටිති"යි
සමහරුන් කී බැවිනි.
22 මතෙ 9:34; 10:25 ජෙරුසලමෙන් ආ
විනයධරයෝ, "මොහුට බෙල්සෙබුල් ආවේශ වී
ඇතැ යි"ද, "දුෂ්ටාත්මාධිපති බලයෙන් ඔහු
දුෂ්ටාත්මයන් දුරු කරති"යි ද කී හ. 23 එවිට උන්
වහන්සේ ඔවුන් තමන් වෙත කැඳවා, උපමාවලින්
කතා කරමින් මෙසේ වදාළ සේක: "සාතන් දුරු
කරන්න සාතන්ට ම පුළුවන් ද? 24 යම් රාජ්‍යයක් ඊට
ම විරෝධී ව භේද වුවහොත්, ඒ රාජ්‍යයට
පවතින්න නොහැකි ය. 25 යම් ගෙදරක් ඊට ම
විරෝධී ව භේද වුවහොත්, ඒ ගෙදරට පැවැත්මක්
නැත්තේ ම ය. 26 සාතන් තමාට ම විරෝධී ව නැඟී
භේද වුවහොත්, ඔහුට පැවැත්මක් නැත. එය
අවසානය වේ. 27 එහෙත්, බලවතකු පළමුකොට
බැඳදමා මිස, ඔහුගේ ගෙට වැද බඩු කොල්ලකන්න
කිසිවකුට නොහැකි ය. ඔහුගේ ගෙයෙ
කොල්ලකන්න හැකි වන්නේ, එසේ කළොත්
පමණකි.
28 "සැබැවින් ම මම ඔබට කියමි, මිනිසුන්ගේ සෑම
පාපයන් ද සියලු ආකාර දේව අපහාසයන් ද කමා
කරනු ලබන්නේ ය. 29 ලූක් 12:10එහෙත්,
ශුද්ධාත්මයාණන්ට අපහාස කරන කිසිවකුට කවර
කලක වත් කමාවක් නැත්තේ ය. ඔහු සදාතන
පාපයක් ගැන වරදකරුවෙකි." 30 මෙසේ වදාළේ,

"උන් වහන්සේට අශුද්ධාත්මයක් වැහී ඇතැ"යි ඔවුන් පැවසූ බැවිනි.

### ජේසුස් වහන්සේගේ මෑණියන් සහ සහෝදරයෝ
(මතෙ 12:46-50;ලූක් 8:19-21)

31 එවිට උන් වහන්සේගේ මෑණියෝ ද
සහෝදරයෝ ද අවුත් පිටත සිට, උන් වහන්සේ
කැඳවා පණිවුඩයක් යැවූ හ. 32 සමූහයක් උන්
වහන්සේ අවට වාඩි වී උන්හ. ඔව්හු, "අන්න, ඔබේ
මෑණියෝත්, සහෝදරයෝත්, සහෝදරියෝත් පිටත
සිට ඔබ සොයති"යි උන් වහන්සේට කී හ. 33 උන්
වහන්සේ උත්තර දමින්, "මාගේ මෑණියෝත්,
මාගේ සහෝදරයෝත් කවුරු ද" කියා පනේවමින්,
34 තමන් පිරිවරා අවට වාඩි වී සිටියවුන් දසෙ
වටේට බලා, "මනේන මාගේ මෑණියෝ, මනේන
මාගේ සහෝදරයෝ! 35 දවේයන් වහන්සේගේ
කැමැත්ත ඉටු කරන කවරකේ හෝ වතේ වා, ඔව්හු
මාගේ සහෝදරයාත්, මාගේ සහෝදරීත්, මාගේ
මෑණියෝත් ය"යි වදාළ සේක.

### වපුරන්නා පිළිබඳ උපමාව
(මතෙ 13:1-9;ලූක් 8:4-8)

4 ලූක් 5:1-3 නැවත උන් වහන්සේ මුහුද අද්දර
උගන්වන්න පටන්ගත් සේක. එකල ඉතා
මහත් ජනකායක් රැස් වූ බැවින් උන් වහන්සේ
මුහුදේ ඔරුවකට නැඟී වැඩහුන් සේක. මුළු සමූහයා
ද වරෙළ දිගේ සිටියෝ ය. 2 උන් වහන්සේ
උපමාවලින් ඔවුන්ට බොහෝ කාරණා ඉගැන්වූ
සේක. සිය ඉගැන්වීමේ දී උන් වහන්සේ ඔවුන්ට
කතා කොට මසෙේ වදාළ සේක: 3 "සවන් දනේන!
වපුරන්නකේ වපුරන්නට නික්මිණි. 4 ඔහු වපුරන
කල මසෙේ සිදුවිය. බීජ සමහරක් මඟ අද්දර
වැටිණි. කුරුල්ලෝ අවුත් ඒවා අවුලා කෑවෝ ය.
5 තව සමහරක් පස තුනී ගල් බිමේ වැටී, පස
ගැඹුරු නුවූ නිසා වහා පැළ විය. 6 හිරු නැඟුණු කල
ඒවා දැවී, මුල් නැති බැවින් වියළී ගියේ ය. 7 අන්
සමහරක් කටු පැළ අතර වැටිණි. කටු පැළ වැවී,
ඒවා යටපත් කළ බැවින් ඒවා පල නොදැරී ය.
8 තවත් සමහරක් සරු බිමේ වැටිණි. ඒවා පැළ වී,
වැඩී, පල දරමින්, එකකින් තිස් ගුණයක් ද එකකින්
සැට ගුණයක් ද එකකින් සිය ගුණයක් ද බැගින්
අස්වැන්න ඉපදවිය. 9 සවන් ඇත්තෝ සවන් දතේ
වා!"

### උපමාවල අදහස
(මතෙ 13:10-17;ලූක් 8:9-10)

10 උන් වහන්සේ තනියම සිටිය දී, දොළොස් දනො
සමඟ උන් වහන්සේ පිරිවරා සිටි අය උපමා ගැන
උන් වහන්සේගනේ ඇසූ හ. 11 උන් වහන්සේ
උත්තර දමින් මසෙේ වදාළ සේක: "දවේයන්
වහන්සේගේ රාජ්‍යය පිළිබඳ අබිරහස ඔබට දන්වා
දී ඇත. එහතේ, පිටත සිටින අයට සියල්ලක් ම
උපමා මඟින් දන්වනු ලැබේ. 12 යසො 6:9-10එසේ
වන්නේ:
 q212 'දැක දැක නොදක්නා පිණිසත්, අස අසා වටහා
නොගන්නා පිණිසත් ය.
q212 මන්ද, යම් හයෙකින් එසේ වුවහොත්, ඔවුන්
දවේයන් වහන්සේ වතෙ හැරී කමාව ලබන්න
පුළුවන් නිසා ය.' "

### උපමාවේ විවරණය
(මතෙ 13:18-23;ලූක් 8:11-15)

13 තවද, උන් වහන්සේ ඔවුන්ට කතා කොට
මසෙේ වදාළ සේක: "මේ උපමාව ඔබට
වැටහනේනේ නැද් ද? එසේ නම්, කවර උපමාවක්
වත් තේරුම්ගන්නේ කසෙේ ද? 14 වපුරන්නා වචනය
වපුරයි. 15 මඟ අසල වූවෝ යන්නනේ අදහස්
කරනුයේ වචනය වපුරනු ලැබූ කල එය ඇසූ වහා ම
සාතන් විත් සිතහෙි වපුරන ලද වචනය පැහැරගනු
ලැබූ අය ය. 16 ගල් බිමහෙි වැටුණු බීජ යන්නනේ
අදහස් කරනුයේ වචනය ඇසූ කණෙහෙි ම, එය
සතුටින් පිළිගන්න නමුත්, 17 තමන් සිත්හි කිඳා
නොබසින බැවින් මඳ කලක් පැවත, වචනය නිසා
විපතක් හෝ පීඩාවක් හෝ පැමිණි කල, වහා ම
පැකිළී වැටනෙ අය ය. 18 සසේසෝ, කටු අතරේ
වැපුරු බීජවලට සමාන ය. ඔවුන් වචනය ඇසූ නමුත්,
19 මේ ලෝකයේ කම්කටොලු හා වස්තු මායාව ද
අනිකුත් දයෙට තණ්හාව ද ඔවුන් තුළට ඇතුළු
වමින් වචනය හිර කරයි. ඔව්හු ද පල නොදරති.
20 සරු බිමහෙි වැපුරු බීජ යන්නනේ අදහස් කරනුයේ
වචනය අසා, එය පිළිගනෙ, තිස් ගුණයක් ද සැට
ගුණයක් ද සිය ගුණයක් ද බැගින් පල දරන අය ය."

### බඳුනකින් සැඟවූ පහන
(ලූක් 8:16-18)

21 මතෙ 5:15; ලූක් 11:33 තවදුරටත් උන් වහන්සේ
කතා කරමින්, "පහනක් ගනෙනේනේ බඳුනක් හෝ
යහනක් හෝ යට තබන පිණිස ද? පහන් රුක උඩ
තැබීමට නොවේ ද? 22 මතෙ 10:26; ලූක් 12:2මන්ද
යත්, හෙළි නොකරනු ලබන සැඟවුණු දයෙක් වත්,
පළ නොකරනු ලබන රහසක් වත් නැති හයෙිනි.
23 සවන් ඇත්තෝ සවන් දතේ වා!"යි වදාළ සේක.
24 මතෙ 7:2; ලූක් 6:38තවද, උන් වහන්සේ ඔවුන්
අමතා, "ඔබ අසන දේ හොඳින් සිතට ගන්න. ඔබ
මැන දනෙ මිනුමනේ ම ඔබටත් මැන දනු ලැබේ;
වැඩියනුෙත් දනු ලැබේ. 25 මතෙ 13:12; 25:29; ලූක්
19:26යමක් ඇති තැනැත්තාට වැඩියනුෙත් දනු
ලැබේ; නැති තැනැත්තාගනේ ඇති දයෙත් ගනු
ලැබේ" යයි වදාළ සේක.

### වැඩනෙ බීජය පිළිබඳ උපමාව

26 තවද, උන් වහන්සේ කතා කරමින්, "දවේයන්
වහන්සේගේ රාජ්‍යය මබෙඳු ය. මිනිසකේ
පොළොවෙහෙි බීජ වපුරයි; 27 රෑ දාවල් දකේහි ඔහු
නිදා සිටිය දීත්, අවදිව සිටිය දීත්, ඔහු නොදන්නා

අයුරින් බීජ පැළවී වැඩයෙි. 28 පොළොව එහි
ස්වභාවයනේ ම පල හටගන්වයි. පළමුව දලුව ද
දවෙනුව කරල ද ඉන්පසු කරල පුරා ධාන්ය ද
හටගනියි. 29 ජෝවෙ 3:13ගොයම පැසුණු කල
අස්වැන්න කාලය පැමිණියනේ, ඔහු වහා ම දෑකැත්ත
යොදන්නේ ය"යි වදාළ සේක.

### අබ ඇටය පිළිබඳ උපමාව
(මතෙ 13:31-32;ලූක් 13:18-19)

30 තවද උන් වහන්සේ මසෙේ වදාළ සේක: "මම
දවේයන් වහන්සේගේ රාජ්යය කුමකට සමාන කරම්
ද? නැතහොත් කවර උපමාවකින් එය පහදා දමේ ද?
31 එය අබ ඇටයකට සමාන ය. එය පොළොවේ
වපුරන කල මිහි පිට සියලු බීජවලට වඩා කුඩා
වුවත්, 32 වපුළායින් පසුව වැඩී, සියලු ම පැළෑටිවලට
වඩා ලොකු වේ. එහි සවෙණෙහි අහසේ
කුරුල්ලන්ට ලගින්න හැකි වන තරම් විශාල අතු එය
විහිදුවන්නේ ය."

### උපමා භාවිතය
(මතෙ 13:34-35)

33 උන් වහන්සේ මවෙනි උපමා රුසක් මඟින්,
අසන්නන්ට තේරුම්ගත හැකි පමණට දහම් දසූෙ
සේක. 34 උපමාවක් නැති ව උන් වහන්සේ ඔවුන්ට
කිසිත් නොවදාළ සේක. එහතේ, උන් වහන්සේ
තමන්ගේ ශ්රාවකයන්ට පෞද්ගලික ලසෙ සියල්ල
පහදා දුන් සේක.

### මාරුත දමනය
(මතෙ 8:23-27;ලූක් 8:22-25)

35 එදා සවස් වූ කල, "අපි එගොඩ යමු"යි උන්
වහන්සේ ශ්රාවකයන්ට වදාළ සේක. 36 ඔව්හු
සමූහයා පිටත් කර යවා, උන් වහන්සේ ඔරුවේ හුන්
ලසෙ ම තමන් සමඟ ගනෙ ගියෝ ය. ඒ සමඟ
තවත් ඔරු තිබිණි. 37 එවිට චණ්ඩ මාරුතයක් හමා,
ඔරුව පිරී යන තරමට එයට රැළ ගැසී ය. 38 උන්
වහන්සේ ඔරුවේ අවරයහෙි, මතේතය මත නිදා
හුන් සේක. ඔව්හු උන් වහන්සේ පුබුදුවා,
"ගුරුදේවයනෙි, අප විනාශ වන්න ළඟ ය, ඔබට කිසි
ගණනක් නැද්දැ"යි ඇසූ හ. 39 උන් වහන්සේ අවදි ව
සුළඟට තර්ජනය කොට, "නිශ්ශබ්ද වවෙ, නිශ්චල
වවෙ"යි මුහුදට අණ කළ සේක. සුළඟ නැවතිණි.
මහා නිශ්චලයක් විය. 40 උන් වහන්සේ ද, "ඔබ මය
තරම් බිය වන්නේ මන් ද? තව ම ඔබට ඇදහිල්ල
නැද්දැ"යි ඇසූ සේක. 41 ඔව්හු මහත් භීතියකින්
ඇලළී, "මේ කවරකේ ද? සුළඟ සහ මුහුද පවා උන්
වහන්සේට කීකරු වන්නේ ය"යි එකිනකොට කී හ.

### ගරෙසීන් රටේ අශුද්ධාත්ම ආවේශ වූවකු සුව කිරීම
(මතෙ 8:28-34;ලූක් 8:26-39)

5 ඔව්හු මුහුදින් එතරෙ ගරෙසීනයන්ගේ රටට
පැමිණියහ. 2 උන් වහන්සේ ඔරුවනේ බැස ආ
කණෙහෙි ම අශුද්ධාත්මයක් ආවේශ වූවකේ
සොහොනේ ගුහා අතරින් නික්ම එනු උන් වහන්සේට
හමු විය. 3 ඔහු වාසය කළෙේ සොහොන් ගුහාවල
ය. කිසිවකුටෙ ඔහු කිසි සේත් දමනය කළ නොහැකි
විය; යදමකින් වත් එය කළ නොහැකි විය.
4 බොහෝ වර විලංගුවලින් ද යදම්වලින් ද බඳිනු
ලැබූ නමුත්, ඔහු යදම් කැබලි කොට කඩා, විලංගු
සුණු විසුණු කොට දැමී ය. ඔහු මැඩලීමට තරම්
ශක්තිය කිසිවකුටෙ නො වී ය. 5 ඔහු දිවා රෑ
දකේහි ම, කෑකෝගසමින් ද ගල්වලින් කපාගනිමින්
ද සොහොන් ගුහා අතරත්, කඳු බෑවුම්වලත් සිටියේ
ය.
6 ඔහු ජේසුස් වහන්සේ වඩිනු දුරතියා දැක, දිව
අවුත්, පසඟ පිහිටුවා වැඳ, 7 මහහඬින් මොරගා,
"පරමෝත්තම දවේයන්ගේ පුත්ර වූ, ජේසුස්
වහන්ස, ඔබත් මාත් අතර මොන ගනුදනෙුවක් ද?
මට වද නොදනෙ මනේ දවේයන්ගේ නාමයනේ
අයැදිමි"යි කී ය. 8 එසේ කීවේ "අශුද්ධාත්මය, මේ
මිනිසාගනේ දුරුවවෙ"යි උන් වහන්සේ ඔහුට කී
බැවිනි. 9 "නුඹේ නම කුමක් දැ"යි උන් වහන්සේ
ඔහුගනේ ඇසූ සේක. "මගේ නම සේනා ය, අපි
සේනාංකයක් වම්හ"යි ඔහු කී ය. 10 තමන් රටනේ
පිට නොකරන ලසෙ ඔහු උන් වහන්සේගනේ උදක්
ම අයැද සිටියේ ය.
11 එතැන කන්ද අද්දර මහත් ඌරු රැළක් ගොදුරු
කමින් සිටියෝ ය. 12 අශුද්ධාත්මයෝ ද, "ඌරන්ට
වැහනෙ පිණිස අප උන් මැදට යැවුව මැනවැ"යි අයැද
සිටියහ. 13 උන් වහන්සේ අවසර දුන් සේක.
අශුද්ධාත්මයෝ නික්ම අවුත් ඌරන්ට වැහුණෝ ය.
දෙ දහසක් පමණ වූ ඒ ඌරු රැළ ප්රපාතයනේ පහත
මුහුදට වේගයනේ දිව ගොස් මුහුදේ ගිලී මළෝ ය.
14 ඌරු ගොවුවෝ පලා ගොස්, නුවර ද
ගම්මානයේ ද එපවත් පතළ කළෝ ය. එවිට සිදුවූ
දේ කුමක් දැ යි බලන පිණිස මිනිස්සු නික්ම ආහ.
15 ඔව්හු ජේසුස් වහන්සේ වතෙ පැමිණ,
අශුද්ධාත්මාවේශ වූ මිනිසා, එනම්, දුෂ්ටාත්ම
සේනාංකය වැහී සිටි මිනිසා දැන් වස්ත්ර හැඳ හොඳ
සිහිකල්පනාවනේ හිඳිනු දැක භීතියට පත් වූ හ.
16 එය සියැසින් දුටු අය අශුද්ධාත්මාවේශ වූ
මනුෂ්යයාට සිදුවූ දයෙ ද ඌරන් පිළිබඳ සිද්ධිය ද
ඔවුන්ට කියා දුන්හ. 17 ඔව්හු ද සිය දේශ සීමාවලින්
පිට වී යන මනේ උන් වහන්සේගනේ බැගෑපත්ව
ඉල්ලා සිටියෝ ය.
18 උන් වහන්සේ ඔරුවට නගිද්දී, අශුද්ධාත්මාවේශ
ව සිටි මිනිසා තමාටත් උන් වහන්සේ සමඟ යාමට
අවසර දනෙ මනේ ආයාචනා කළෙේ ය. 19 උන්
වහන්සේ ඊට අවසර නුදුන් සේක. "එහතේ, ඔබ
ගදෙර නෑ මිතුරන් වතෙ ගොස්, සමිඳාණන්

වහන්සේ ඔබට කොතරම් මහත් දේ කළ සේක් ද
කොතරම් අනුකම්පාව පනේවූ සේක් ද කියා ඔවුන්ට
දන්වන්නැ"යි වදාළ සේක. 20 ඔහු නික්ම ගොස්,
ජේසුස් වහන්සේ තමාට කොතරම් මහත් දේ කළ
සේක් දැ යි දකෙපොලිසහෙි ප්රසිද්ධ කරන්න වුනි.
සියල්ලෝ ම විස්මිත වූ හ.

### යායිරස්ගේ දුව; සළුවට අතගැසූ ස්ත්රිය
(මතෙ 9:18-26;ලූක් 8:40-56)

21 ජේසුස් වහන්සේ යළිත් ඔරුවනේ එතරෙ වූ කල
මහා ජනකායක් උන් වහන්සේ වතෙ රැස් වූ හ. උන්
වහන්සේ ද මුහුදු වරෙළහෙි වැඩසිටි සේක.
22 එකල ධර්මශාලා ප්රධානීන් අතුරනේ යායිරස්
නමැත්තකේ අවුත්, උන් වහන්සේ දැක, පාමුල වැටී,
23 "මගේ පුංචි දුව මරණාසන්න ව සිටියි. ඈ සුවය
ලබා ජීවත් වන පිණිස, ඔබ අවුත් ඈ පිට අත තැබුව
මැනවැ"යි උන් වහන්සේට ආයාචනා කළෙේ ය.
24 උන් වහන්සේ ඔහු සමඟ වැඩිය සේක. මහත්
සමූහයක් උන් වහන්සේ තරෙපමින් උන් වහන්සේ
පිරිවරා ගියහ.
25 දොළොස් වසරක් ම මහා ලේ රෝගයනේ
පළෙණු ස්ත්රියක් එහි වූවා ය. 26 ඈ බොහෝ
වදෙුන් අතින් අපමණ දුක් විඳ, තමා සතු සියල්ල
වියදම් කොටත්, කිසි ගුණයක් නොලැබුවා ය.
එපමණක් නොව ඇගේ තත්ත්වය අනුක්රමයනේ
වඩ වඩාත් උග්ර විය. 27 ඈ ජේසුස් වහන්සේ ගැන
අසා, සමූහයා අතර පිටුපසින් ඇවිත්, උන්
වහන්සේගේ වස්ත්රයට අත තැබුවා ය. 28 උන්
වහන්සේගේ වස්ත්රවලට පමණ වත් අත
තැබුවොත්, තමාට සුවය ලැබනෙු ඇතැ යි ඈ සිතුවා
ය. 29 එකණෙහෙි ම ලේ ධාරාව නැවතී ඒ පීඩාවනේ
ඈට සුවය ලැබුණු බව ඇගේ ම ඇඟට දැනිණි.
30 එවලේ ම ජේසුස් වහන්සේ තමන් කරෙනේ
අනුහස නික්ම ගිය බව දැන, සමූහයා මැද හැරී,
"මාගේ වස්ත්රවලට අත තැබුවේ කවරකේ දැ"යි
ඇසූ සේක. 31 උන් වහන්සේගේ ශ්රාවකයෝ
උත්තර දමේින්, "සමූහයා ඔබට තරෙපි තරෙපී සිටිනු
දැක දැකත්, මට අත ගැසුවේ කවරකේ ද කියා
අසන සේක් දැ"යි කී හ. 32 ඒ දේ කළෙේ කවරකේ
දැ යි සොයනු වස් උන් වහන්සේ අවට බැලූ සේක.
33 එහතේ ස්ත්රිය සිදු වූ දේ දැක බිය වී, වවෙුළ
වවෙුළා අවුත්, උන් වහන්සේ ඉදිරියෙහි වැඳ වැටී,
මුළු ඇත්ත උන් වහන්සේට කීවා ය. 34 උන්
වහන්සේ කතා කරමින්, "දියණියනි, ඔබේ ඇදහිල්ල
ඔබ සුවපත් කළෙේ ය; ශාන්ත සිතින් යන්න; ඔබේ
පීඩාවනේ මිදී වසන්නැ"යි ඈට වදාළ සේක.
35 උන් වහන්සේ මවෙදන් පවසත්ම ධර්මශාලා
නායකයාගේ ගදෙරින් සමහරු අවුත්, "ඔබේ දුව මළා
ය. ඉතින් ගුරුදේවයන් තවත් වහෙසෙන්නේ කුමට
දැ"යි කී හ. 36 එහතේ, ජේසුස් වහන්සේ ඒ කීම
නොසලකා ධර්මශාලා නායකයාට කතා කොට, "බිය
නොවන්න, ඇදහිල්ල ඇති ව සිටින්නැ"යි වදාළ
සේක. 37 උන් වහන්සේ පේදුරු ද ජාකොබ් ද
ජාකොබ්ගේ සහෝදර වූ ජොහන් ද හැර අන්
කිසිවකුෙට තමන් සමඟ එන්න ඉඩ නුදුන් සේක.
38 ඔව්හු ධර්මශාලා නායකයාගේ නිවසෙට
පැමිණියෝ ය. එවිට උන් වහන්සේ කලබලයක් ද
විලාප හා ළතෝනි නඟන්නන් ද දැක, 39 ගටෙ
පිවිස, "ඔබ කලබල වන්නේත්, විලාප කියන්නේත්
මන් ද? දැරිය මැරී නැත; ඈ නිදන්නී ය"යි ඔවුන්ට
වදාළ සේක. 40 එවිට ඔව්හු උන් වහන්සේට සරදම්
කළහ. එහතේ, උන් වහන්සේ සියල්ලන් බැහැර
කොට, දරුවාගේ පියා ද මව ද තමන් සමඟ
සිටියවුන් ද කැඳවාගනෙ දරුවා හුන් තැනට ගොස්
41 ඇය අතින් අල්ලා, "තලිතාකුම්"යි ඈට වදාළ
සේක. එහි අර්ථය: "දැරිය, මම ඔබට කියමි,
නැඟිටින්න" යනු ය. 42 දොළොස් හැවිරිදි ඒ දැරිය,
එකණෙහෙි ම නැඟිට ඇවිද්දා ය. ඔව්හු ද ඉමහත්
විස්මයකින් භ්රාන්ත වූ හ. 43 මයෙ කිසිවකුෙට
නොදන්වන ලසෙ ඔවුන්ට තදින් අණ දී, උන්
වහන්සේ ඈට කෑමට යමක් දනේන නියම කළ
සේක.

### නාසරතේහි දී ජේසුස් වහන්සේ ප්රතික්ෂේප කරනු ලැබීම
(මතෙ 13:53-58;ලූක් 4:16-30)

6 උන් වහන්සේ එතැනින් නික්ම සිය රටට
පැමිණි සේක. ශ්රාවකයෝ ද උන් වහන්සේ
පිරිවරා ගියහ. 2 එය සබත් දින වූයනේ උන්
වහන්සේ ධර්මශාලාවහෙි උගන්වන්න පටන්ගත්
සේක. උන් වහන්සේට සවන් දුන් සමූහයා විස්මිත
ව, "මොහුට මේ දේවල් පහළ වූයේ කොහනේ ද?
මොහුට දී තිබනෙ මේ ප්රඥාව කිමකේ ද? මොහු
අතින් කරනු ලබන හාස්කම් කවරේ ද? 3 මොහු
වඩුවා නොවේ ද? මරියාගේ පුතා නොවේ ද?
ජාකොබ්, ජෝසපේ, ජූදස් හා සීමොන් යන අයගේ
සහෝදරයා නොවේ ද? මොහුගේ සහෝදරියනුත්
අප අතර සිටිනවා නොවේ ද?" කියා ඔව්හු උන්
වහන්සේ ප්රතික්ෂේප කළහ. 4 ජොහ 4:44ජේසුස්
වහන්සේ කතා කරමින්, "දිවැසිවරයකුෙට
ගරුබුහුමන් නැත්තේ සිය ගමේ දීත්, නෑදෑයන් අතර
දීත්, තම ගදෙර දීත් පමණකැ"යි වදාළ සේක. 5 එහි
දී රෝගීන් ස්වල්ප දනෙකුෙ පිට අත් තබා සුව කිරීම
හැර, අන් කිසි හාස්කමක් කරන්න උන් වහන්සේට
නොහැකි විය. 6 ඔවුන්ගේ අවිශ්වාසය ගැන උන්
වහන්සේ මවිත වූ සේක.

### ධර්මදූත සේවාව
(මතෙ 10:5-15;ලූක් 9:1-6)

6 උන් වහන්සේ අනුශාසනා කරමින් අවට ගම්වල
සැරිසැරූ සේක. 7 එකල උන් වහන්සේ දොළොස්
දනො තමන් වතෙ කැඳවා ඔවුන් දදෙනො බැගින්
පිටත් කර යැවූ සේක. අශුද්ධාත්මයන් කරෙහෙි
ඔවුන්ට බලය ද දුන් සේක. 8 ලූක් 10:4-11ගමනට
සැරයටියක් හැර, රොටී වත්, මල්ලක් වත්,
පසුම්බිවල මුදල් වත් යන කිසිවක් නොගනෙ, වහන්
පය ලා, 9 කමිස දකෙක් නොගනෙ යන ලසෙ

ඔවුන්ට අණ කළ සේක. 10 තවද, උන් වහන්සේ
ඔවුන්ට කතා කොට, “ඔබ යම් කිසි නිවසකට පිවිසි
කල, එතැනින් පිට වී යන තෙක් එහි ම නවතින්න.
11 ක්‍රියා 13:51යම් තැනක දී, ඔවුන් ඔබ පිළිගන්නේ
වත් ඔබේ වචන අසන්නේ වත් නැත්නම්, එතැනින්
පිට වී යන කල ඔවුන්ට විරුද්ධ ව සාක්ෂියක් වන
පිණිස ඔබේ පාදවල තිබෙන ධූලි ගසා දමන්නැ”යි
වදාළ සේක. 12 එලෙසෙ ඔව්හු පිටත් ව ගොස්
සෙනඟ පසුතැවී සිත් හරවා ගත යුතු ය යි දේශනා
කළහ. 13 ජාකො 5:14තවද, ඔව්හු බොහෝ
දුෂ්ටාත්මයන් දුරු කොට, බොහෝ රෝගීන් ද තෙලෙන්
ආලේප කොට සුවපත් කළහ.

## ස්නාවක ජොහන්ගේ මරණය

(මතෙ 14:1-12;ලූක් 9:7-9)

14 මතෙ 16:14; මාක් 8:28; ලූක් 9:19 එකල ජේසුස්
වහන්සේගේ කීර්තිරාවය පතළ වී ගිය බැවින්
හෙරොද් රජුට එපවත් සැළ විය. සමහරු, “ස්නාවක
ජොහන් මළවුන් කෙරෙනේ උත්ථාන වී ඇත; මේ
බලමහිම ඔහු තුළ ක්‍රියා කරන්නේ ඒ නිසා ය”යි කී
හ. 15 එහෙතේ සමහරු, “මොහු එලියා ය”යි කී හ.
අන් සමහරු, “මොහු පෙරෙ සිටි දිවැසිවරයන් වැනි
දිවැසිවරයකෙු”යි කී හ. 16 එහෙතේ, හෙරොද් ඒ ඇසූ
කල, “මේ මා විසින් හිස ගසාදම්මන ලද ජොහන්
ය; මොහු මළවුන්ගෙනේ නැඟිට සිටී” යයි කී ය.
17 ලූක් 3:19-20 හෙරොද් සිය සොහොයුරා වන
පිලිප්ගේ භාර්යාව වූ හෙරෝදියස් සරණ පාවාගත්
බැවින්, ඇය නිසා මිනිසුන් යවා ජොහන් අල්ලා බැඳ
හිර අඩස්සි කළෙේ ය. 18 “ඔබේ සහෝදරයාගේ
භාර්යාව තබාගැනීම ඔබට යුතු නැතැ”යි ජොහන්
හෙරොද්ට කී බැවින්, 19 හෙරෝදියස් ඔහු කෙරේ
වෛර බැඳ, ඔහු මරවන්නට අදහස් කරගෙන සිටියා
ය. එහෙතේ, එය කළ නොහැකි විය. 20 මන්ද,
ජොහන් සත්ගුණවත් දැහැමි මිනිසකෙු බව හෙරොද්
දැන, ඔහුට බිය ව, ඔහු ආරක්ෂා කළ හයෙිනි. තවද,
ඔහුගේ බස් අසා හෙරොද් බොහෝ වියවුල් වුව ද
සන්තෝෂයෙනේ ඔහුට කන් දුන්නේ ය.
21 සුදුසු අවස්ථාවක් පැමිණියෙනේ, හෙරොද් සිය
ජන්මෝත්සව දින, තමාගේ උසස් නිලධාරීන්ට ද
ප්‍රධාන සේනාධිපතීන්ට ද ගලීලයේ ප්‍රභූවරයන්ට
ද මංගල භෝජනයක් පිළියෙළ කළෙේ ය. 22 එවිට
හෙරෝදියස්ගේ දුව එහි පිවිස රඟ පා, හෙරොද්ගේ
සහ ඔහු සමඟ භෝජන සංග්‍රහයට පැමිණ සිටි
අමුත්තන්ගේ නෙතේ සිත් පිනවූවා ය. එකල රජතුමා
තරුණියට කතා කොට, “ඔබ කැමැති ඕනෑම දයෙක්
මාගෙනේ ඉල්ලන්න, එය ඔබට දමේ”යි කී ය.
23 තවද, “ඉල්ලන ඕනෑම දයෙක්, මාගේ රාජ්‍යයෙනේ
අඩක් වුවත්, ඔබට දමේ”යි ඔහු ඇයට දිවුරුම්
දුන්නේ ය. 24 ඈ පිටතට ගොස්, “මම කුමක් ඉල්ලම්
දැ”යි ඇගේ මවගෙනේ ඇසුවා ය. “ස්නාවක
ජොහන්ගේ හිස” යයි ඈ කීවා ය. 25 එවිට තරුණිය
වහා ම රජු වෙත පැමිණ, “ඔබ ස්නාවක
ජොහන්ගේ හිස තැටියක ලා දැන් මට දනෙු
මැනව”යි කීවා ය. 26 රජතුමා අතිශයින් ශෝක විය.
එහෙතේ, ඔහුගේ දිවුරුම නිසා ද, අමුත්තන් නිසා ද,
ඈට දුන් පොරොන්දුව කඩ කරන්න අකමැති විය.
27 එකණෙහෙි ම රජතුමා මුර සබෙළකෙු යවමින්
ජොහන්ගේ හිස ගනෙනේන අණ කළෙේ ය. ඔහු ද
ගොස් හිර ගයෙි දී ජොහන්ගේ හිස ගසාදමා 28 එය
තැටියක ලා ගනෙවුත්, තරුණියට දුන්නේ ය; තරුණිය
ද එය මවට දුන්නා ය. 29 ජොහන්ගේ ගෝලයෝ ඒ
ගැන අසා අවුත්, ඔහුගේ මෘත දේහය ගනෙ ගොස්,
සොහොන් ගයෙක තැන්පත් කළහ.

## පන්දහසකට කෑම

(මතෙ 14:13-21;ලූක් 9:10-17;ජොහ 6:1-14)

30 ප්‍රේරිතයෝ ජේසුස් වහන්සේ වෙත රැස් ව
තමන් කළ සියල්ල ද ඉගැන්වූ සියල්ල ද උන්
වහන්සේට සැළ කළහ. 31 එවිට උන් වහන්සේ
කතා කරමින්, “ඔබ පමණක් වනේ ව, හුදකලා
තැනකට අවුත් මඳ වේලාවක් විවේක ගන්නැ”යි
ඔවුන්ට වදාළ සේක. එසේ කීවේ, ඔවුන්ට කෑම
කන්න වත් අවකාශයක් නැති තරමට යන එන අය
බොහෝ වූ බැවිනි. 32 එවිට ඔව්හු පමණක්
ඔරුවනේ හුදකලා තැනකට ගියෝ ය.
33 බොහෝ දනෙකේ ඔවුන් යනවා දැක, ඔව්හු
කවරහු දැ යි හැඳින, සියලු නුවරවලින් එක් වී
ගොඩින් දිව අවුත්, ඔවුන්ට පෙරෙ එහි පැමිණියහ.
34 ගණන් 27:17; 1 රාජා 22:17; 2 වංශා 18:16;
එසකි 34:5; මතෙ 9:36උන් වහන්සේ ගොඩට ආ
කල, මහ පිරිසක් දැක, එඬේරකෙු නැති බැටළුවන්
වැනි වූ, ඔවුන්ට අනුකම්පා කොට, ඔවුන්ට බොහෝ
දේ උගන්වන්න පටන්ගත් සේක. 35 දවස ගවෙී යත්
ම ශ්‍රාවකයෝ උන් වහන්සේ වෙත අවුත්, “මයෙ
පාළු තැනකි; දැන් රෑ බෝ වී ඇත; 36 එබැවින් අවට
ගම් නියම්ගම් වලට ගොස් තමන්ට කෑමට යමක්
මිලයට ගන්න පිණිස මොවුන් යන්න හැරිය
මැනවැ”යි කී හ. 37 එහෙතේ උන් වහන්සේ උත්තර
දමේින්, “ඔබ ම ඔවුන්ට කෑමට යමක් දනේනැ”යි
වදාළ සේක. එවිට ඔව්හු පිළිතුරු දමේින්, “අප ගොස්
රිදී කාසි දසෙියයක රොටි මිල දී ගනෙ ඔවුන්ට
කෑමට දනේන දැ”යි උන් වහන්සේගෙනේ ඇසූ හ.
38 “ඔබ ළඟ රොටි කීයක් තිබේ ද කියා ගොස්
බලන්නැ”යි උන් වහන්සේ ඔවුන්ට වදාළ සේක.
ඔව්හු සොයා බලා අවුත්, “රොටි පහක් හා මසුන්
දදෙනෙකෙු”යි කී හ.
39 උන් වහන්සේ ඔවුන් සියල්ලන් කාණ්ඩ වශයෙනේ
නිල් තණ බිම පිට හිඳුවන්න ශ්‍රාවකයන්ට අණ කළ
සේක. 40 ඔව්හු සියය සියය හා පණස පණස
බැගින්, පේළි වශයෙනේ හිඳගත්හ. 41 උන් වහන්සේ
රොටි පහත්, මසුන් දදෙනොත් ගනෙ ස්වර්ගය දසෙ
බලා, ආශීර්වාදය පවසා, රොටි කඩා, ඔවුන්
ඉදිරියෙහි තබන්න ශ්‍රාවකයන්ට දී, මසුන් දදෙනොත්
ඒ සැමට බදෙො දුන් සේක. 42 සෑම දනෙ ම කා
තෘප්තියට පැමිණියහ. 43 ඉතිරි රොටි කැබලිවලින් ද
මසුන්ගෙනේ ද කූඩා දොළොසක් පිරනෙ තරම්
රැස්කරගත්හ. 44 රොටි කෑ පුරුෂයෝ පන්දහසක් වූ
හ.

### මුහුද මත ඇවිදීම
(මතෛ 14:22-33;ජොහෙ 6:15-21)

45 එකණෙහෙි ම උන් වහන්සේ සමූහයා විසුරුවා
හැරිය සේක. සිය ශ්‍රාවකයන්ට ද ඔරුවට නැඟී
තමන්ට පරෙටුව බතේසයිදාව බලා එගාඩෙට යන්න
අණ දුන් සේක. 46 උන් වහන්සේ ඔවුන්ගනේ වනේ
වූ පසු යාච්ඤා කරනු වස් කන්දට නැඟුණු සේක.
47 සවස් වූ කල ඔරුව මුහුද මැද විය. උන් වහන්සේ
තනි ව ගොඩ සිටි සේක. 48 සුළඟ ඔවුන්ට විරුද්ධ
ව හැමූ බැවින්, ඔවුන් ඔරු පැදීමනේ වහෙසෙනෙු දුටු
උන් වහන්සේ, රෑ සතර වැනි යාමයපමණ දී මුහුද
පිට ඇවිදිමින් ම ඔවුන් වතෙ අවුත් ඔවුන් පසු කර
යන්න තැත් කළ සේක. 49 ඔව්හු උන් වහන්සේ
මුහුද පිට ඇවිදිනු දැක, "ඒ අවතාරයකැ"යි සිතා
බියනේ මොරගැසූ හ. 50 සියල්ලෝ ම උන් වහන්සේ
දැක බිය වූ හ. එහතේ උන් වහන්සේ එකණෙහෙි
ම, "ධරෛය ගන්න; ඒ මම ය; බිය නොවන්නැ"යි
ඔවුන්ට කියා 51 ඔවුන් සිටි ඔරුවට නැඟුණු සේක.
සුළඟ නැවතිණි. ඔව්හු විස්මයනේ විස්මයට පත් වූ
හ. 52 ඔවුන්ගේ මනස අඳුරු වී තිබිණි. මක්නිසා ද
රොටි පිළිබඳ සිද්ධිය ඔවුන්ට අවබෝධ නොවූ
බැවිනි.

### ගනේනසෙරෙතේහි රෝගීන් සුව කිරීම
(මතෛ 14:34-36)

53 ඔව්හු එගොඩ වී ගනේනසෙරෙතේ රටට පැමිණ
ඔරුව වරෙළහෙි බැන්දෝ ය. 54 ඔවුන් ඔරුවනේ
නික්මුණු කණෙහෙි ම ජනයා උන් වහන්සේ
හැඳිනගත්හ. 55 ඔව්හු ඒ අවට රට පුරා දිව ගොස්,
උන් වහන්සේ යම් තැනකට ආ බව පතළ වී ද,
එතැනට රෝගීන් යහන් පිටින් උසුලා ගනෙනේන
පටන්ගත්හ. 56 උන් වහන්සේ යම් කිසි
ගම්මානයකට හෝ ගොවිපොළකට හෝ නුවරකට
හෝ ඇතුළු වූ සේක් ද, එහි ඔව්හු රෝගීන්
කඩපිල්වල තබා, ඔවුන්ට උන් වහන්සේගේ සළුවේ
දාවල්ල පමණ වත් ස්පර්ශ කරන්න ඉඩ දනෙ ලසෙ
ඉල්ලූ හ. එසේ ස්පර්ශ කළ හැම දනොට ම සුවය
ලැබිණි.

### සම්ප්‍රදායයන් ගැන විවාදය
(මතෛ 15:1-9)

7 තවද, ජරෙුසලමනේ පරිසිවරු ඇතැම්
විනයධරයන් හා සමඟ උන් වහන්සේ වතෙට
පැමිණ, 2 උන් වහන්සේගේ ශ්‍රාවකයන්ගනේ
සමහරුන්, අපවිත්‍ර අත්වලින්, එනම්, වත්පිළිවතේ
අනුව අත් නොසෝදා, කෑම කනවා දුටුවෝ ය.
3 පරිසිවරුත්, සියලු ජුදවේවරුත් පරම්පරාගත
සම්ප්‍රදායයන් පිළිපදින බැවින් වත්පිළිවතේ අනුව
අත් සෝදාගනෙ මිස කෑම නොකන්නෝ ය. 4 වළෙඳ
පොළේ සිට ආ විට, ධෝවනය නිමවා මිස, ඔව්හු
කෑමට නොයති. ඔවුන් පිළිපැදීමට බැඳී සිටින තවත්
බොහෝ සම්ප්‍රදායයන් ඇත. එනම්, පිඟන්,
කළගඩේ සහ ලෝකඩ හැළිවළං සේදීම ය.
5 පරිසිවරු ද විනයධරයෝ ද උන් වහන්සේ අමතා,
"ඔබේ ශ්‍රාවකයන් පරම්පරාගත සම්ප්‍රදාය අනුව
නොහැසිර, වත්පිළිවතේ අනුව අත් නොසෝදා කෑම
කන්නේ මන්දැ"යි ඇසූ හ. 6 යසො 29:13උන්
වහන්සේ පිළිතුරු දමේන්, "කරොටිකයනෙි, ශුද්ධ
ලියවිල්ලේ ලියා ඇති ලසෙ, ඔබ ගැන යසොයා කී
මේ දිවැස් වැකිය මැනවින් ඔබට ගැළපේ:
q2[6] 'මුවින් මේ සනෙඟ මට ගරු කරති;
q2[6] සිතින් නම් මගනේ දුරු ව සිටිති.
7 මිනිස් ඔවා, දවේ දහම් ලසෙ උගන්වා නිසරු ලසෙ
මා නමදිති.'
8 ඔබ දවේයන් වහන්සේගේ ආඥාව ඉවත ලා,
මනුෂ්‍යයන්ගේ සම්ප්‍රදායයන් පිළිපදින්නහු ය"යි
වදාළ සේක.
9 උන් වහන්සේ තවදුරටත් කතා කරමින් මසෙේ
වදාළ සේක: "ඔබේ සම්ප්‍රදායයන් පිළිපදින පිණිස
ඔබ දවේයන් වහන්සේගේ ආඥාව ප්‍රතික්ෂේප
කිරීමට හරි දක්ෂයෝ ය. 10 නික්ම 20:12; 21:17;
ලවේ 20:9; ද්වි.නී. 5:16මක්නිසා ද 'ඔබේ පියාට ද
මවට ද, ගෞරව කරන්නැ'යි ද, 'පියාට හෝ මවට
නිග්‍රහ කරන්නා මරණ දඬුවම ලැබිය යුතු ය'යි ද
මෝසසේ පවසා ඇත. 11 එහතේ, යමකෙු තම පියාට
හෝ මවට හෝ කතා කොට, 'මා විසින් ඔබේ
ප්‍රයෝජනය සඳහා වනේ කරන ලද කොයි දයෙක්
වුවත් දේව පඬුරකැ'යි කී පසු 12 එතැන් සිට පියාට
වත් මවට වත් කිසි උපකාරයක් කිරීමට ඔහුට ඉඩ
නොදිය යුතු ය යි ඔබ කියන්නහු ය. 13 මසෙේ
කීමනේ ඔබ අතර පැවත එන ඔබේ ම
සම්ප්‍රදායයනේ ඔබ දවේයන් වහන්සේගේ වචන
අවලංගු කරන්නහු ය. එවැනි තවත් දේ ඔබ
කරන්නහු ය"යි වදාළ සේක.

### මිනිසා කලෙසෙනු ලැබීමට හේතු වන දේ
(මතෛ 15:10-20)

14 උන් වහන්සේ යළිත් සමූහයා තමන් වතෙට
කැඳවා, "ඔබ හැම මට සවන් දී තේරුම්ගන්න.
15 පිටතින් මිනිසා තුළට පිවිස ඔහු කලෙසෙිය හැකි,
කිසි දයෙක් නැත. මිනිසා තුළින් නික්මනෙ දයෙින්
ඔහු කලෙසෙනු ලබයි; 16 සවන් ඇත්තෝ සවන්
දතේ වා"යි කී සේක.
17 උන් වහන්සේ සමූහයා කරෙනේ වනේ ව ගටෙ
පිවිසි කල ශ්‍රාවකයෝ ඒ උපමාව ගැන උන්
වහන්සේගනේ විචාළහ. 18 උන් වහන්සේ පිළිතුරු
දමේන්, "ඔබත් වනෙ අය සේ ම අවබෝධයක් නැති
ව සිටින්නහු ද? පිටතින් මිනිසා තුළට පිවිසනෙ කවර
දයෙක් වත්, 19 ඔහුගේ උදරයට මිස හෘදයට ඇතුළු
නොවී පහ ව යන බැවින්, ඔහු කලෙසෙන්නට
අපොහොසත් බව ඔබට තේරෙනේනේ නැද්දැ"යි ඇසූ
සේක. මසෙේ කීමනේ උන් වහන්සේ සියලු ආහාර
වර්ග පවිත්‍ර බව ප්‍රකාශ කළ සේක. 20 තවදුරටත්
උන් වහන්සේ කතා කරමින්, "එහතේ, මිනිසා
කලෙසෙනු ලබන්නේ ඔහු තුළින් නිකුත් වන දයෙින්
ම ය. 21 ඇතුළතින්, එනම්, මිනිස් හදවතින්, නපුරු

චේතනා, කාම රාග, සොරකම්, මිනී මැරුම්,
22 සල්ලාලකම්, තණ්හා, දුෂ්ටකම්, වංචා, හිරි ඔතප්
නැති බව, ඊර්ෂ්යාව, අපහාසය, අහංකාරය සහ
මෝහය නික්මයයි. 23 මකේ සියලු නපුරු දේ
ඇතුළතින් නික්ම ඒවායින් මිනිසා කලෙසෙනු ලැබේ
ය"යි වදාළ සේක.

### විජාතික ස්ත්රියගේ ඇදහිල්ල

(මතේ 15:21-28)

24 උන් වහන්සේ එතැනින් නික්ම තීර් පදෙසේ බලා
පිටත් ව ගොස්, ගයෙකට ඇතුළු වූ සේක. කිසිවකු
ඒ බව දැනගන්නවාට අකමැති වූ නමුත්, සැඟවී
සිටීමට උන් වහන්සේට නොහැකි විය.
25 එකණෙහි ම අශුද්ධාත්මයක් ආවේශ වූ කුඩා
දූවක ඇති ස්ත්රියක් උන් වහන්සේ ගැන අසා අවුත්
උන් වහන්සේගේ පාමුල වැටුණා ය. 26 ඈ සිරියාවේ
පිනීසිය නම් පදෙසේහි උපන් ග්රීක් ජාතික ස්ත්රියකි.
ඇගේ දූවගනේ දුෂ්ටාත්මය දුරු කරන ලසෙ ඈ උන්
වහන්සේගනේ අයැද සිටියා ය. 27 උන් වහන්සේ
ඈට උත්තර දමේන්, "පළමුකොට දරුවෝ තෘප්තියට
පැමිණාතේ වා! දරුවන්ගේ කෑම ගනෙ බල්ලන්ට
දැමීම හරි නැතැ"යි වදාළ සේක. 28 එහතේ ඈ
උත්තර දමේන්, "එසේය, ස්වාමීනි, මේසය යට සිටින
බල්ලෝ වුව ද දරුවන්ගේ කෑමනේ වැටනෙ කැබලේි
අවුලා කති"යි උන් වහන්සේට කීවා ය. 29 උන්
වහන්සේ ද කතා කරමින්, "මේ පිළිතුර නිසා
ප්රීතියනේ යන්න, දුෂ්ටාත්මය ඔබේ දූවගනේ දුරු ව
ගියේ ය"යි ඈට වදාළ සේක. 30 ඈ ගදෙර ගිය කල,
ඇගේ දූව ඇඳේ හාන්සි වී සිටින බවත්, දුෂ්ටාත්මය
දුරු වූ බවත් දුටුවා ය.

### ගොළු බිහිරකුෙට සුවය

31 යළිත් උන් වහන්සේ තීර් පදෙසෙින් පිටත් ව,
සීදොනය මැදින් ගොස්, දකෙපොලිස පදෙසෙ පසු
කොට ගලීල මුහුද ළඟට පැමිණි සේක. 32 එකල
සනෙඟ විකිකල් බිහිරකුෙ උන් වහන්සේ වතෙ
ගනෙවුත් ඔහු පිට අත තබන ලසෙ උන්
වහන්සේගනේ උදක්ම ඉල්ලූ හ. 33 උන් වහන්සේ
ඔහු සමූහයා කරෙනේ වනේ කොට ඉවතට ගනෙ
ගොස්, ඔහුගේ කන්වල උන් වහන්සේගේ ඇඟිලි
බහා, කළෙ ගසා, ඔහුගේ දිව ස්පර්ශ කළ සේක.
34 ඉන්පසු ස්වර්ගය දසෙ බලා, සුසුම් ලා,
"එප්පාතා"යි ඔහුට වදාළ සේක. එහි අර්ථය,
'ඇරේවා' යනු යි. 35 එවිට ඔහුගේ කන් ඇරී, දිවේ
බැඳුම ලිහී, ඔහු පැහැදිලි ලසෙ කතා කළෙේ ය.
36 ඒ බව කිසිවකුෙට නොකියන්න උන් වහන්සේ
ඔවුන්ට අණ දුන් සේක. එහතේ, උන් වහන්සේ එය
යම් පමණ තහනම් කළ සේක් ද, ඔව්හු එපමණටත්
වඩා එය පතළ කළහ. 37 එය ඇසුවෝ අතිශයින්
මවිත ව, "උන් වහන්සේ හැම දයෙ ම යස ලසෙ
කරන සේක; බිහිරන්ට ඇසීම ද ගොළුවන්ට බිණීම
ද පවා සලසා දනෙ සේකැ"යි කී හ.

### හාරදහසකට කෑම

(මතේ 15:32-39)

8 ඒ දවස්වල දී නැවත මහත් සමූහයක් රුස්
වූයනේ, ඔවුන්ට කෑමට කිසිවක් නොතිබුණු
නිසා උන් වහන්සේ සිය ශ්රාවකයන් කැඳවා, 2 "මේ
සමූහයා ගැන මට ඉතා කණගාටු ය. ඔව්හු දැනට
තුන් දිනක් මා සමඟ සිටිති. කෑමට කිසිවක් ඔවුන්ට
නැත. 3 කුසගින්නනේ ගදෙර යන්න හැරියොත්,
ඔවුන් මඟ දී ක්ලාන්ත වනු ඇත, ඔවුන්ගනේ
සමහරකේ දුර සිට ඇවිත් සිටිති"යි වදාළ සේක.
4 උන් වහන්සේගේ ශ්රාවකයෝ උත්තර දමේන්,
"මවෙනි පාළුකරයක මොවුන්ට කොහොන් කෑම
සපයා දනේන දැ"යි උන් වහන්සේගනේ ඇසුවෝ ය.
5 "ඔබ ළඟ රොටී කීයක් තිබේ දැ"යි උන් වහන්සේ
ඔවුන්ගනේ ඇසූ සේක. "සතක්"යයි ඔව්හු කී හ.
6 එවිට උන් වහන්සේ සමූහයාට බිම ඉඳගන්න
අණ දී, රොටී සත ගනෙ තුති පුදා කඩා, ඒවා ඔවුන්
ඉදිරියේ තබන පිණිස ශ්රාවකයන්ට දුන් සේක.
ඔව්හු එය සමූහයා ඉදිරියේ තැබූ හ. 7 ඔවුන් ළඟ
කුඩා මසුන් ස්වල්පයක් ද විය. උන් වහන්සේ
ආශීර්වාදය පවසා, එය ද ඔවුන් ඉදිරියේ තබන්න
අණ කළ සේක. 8 ඔව්හු ද කා තෘප්තියට
පැමිණියාහ. ඉතිරි වූ කැබලේි එක් කොට කූඩා
සතක් පුරවාගත්හ. 9 එහි සනෙඟ හාරදහසක්
පමණ වූ හ. උන් වහන්සේ ඔවුන් යන්න හැරිය
සේක. 10 එකණෙහි ම උන් වහන්සේ සිය
ශ්රාවකයන් සමඟ ඔරුවකට නැඟී දල්මනූතා
පළාතට වැඩිය සේක.

### ස්වර්ගයනේ හාස්කමක් ඉල්ලීම

(මතේ 16:1-4)

11 මතේ 12:38; ලූක් 11:16 එකල පරිසිවරු අවුත්
උන් වහන්සේ වචනයකින් අල්ලාගන්න පිණිස
ස්වර්ගයනේ හාස්කමක් ඉල්ලා විවාදයට එළඹුණාහ.
12 මතේ 12:39; ලූක් 11:29උන් වහන්සේ හද
පත්ලනේ බලවත් ලසෙ සුසුම් ලා, "මේ පරම්පරාව
හාස්කමක් සොයන්නේ මන් ද? සැබැවින් ම මම
ඔබට කියමි, මේ පරම්පරාවට හාස්කමක් නොදනෙු
ලැබේ ය"යි වදාරා, 13 ඔවුන් අත්හැර යළිත් ඔරුවට
නැඟී එතරෙට වැඩිය සේක.

### කපටි ඉගැන්වීම්වලින් පරසේසම් වීම

(මතේ 16:5-12)

14 රොටී ගනෙ යන්න ශ්රාවකයන්ට අමතක විය.
ඔරුවේ ඔවුන් ළඟ එක රොටියක් මිස වනෙ කිසිවක්
නො තිබිණි. 15 ලූක් 12:1උන් වහන්සේ කතා කොට,
"සිහි කල්පනාවනේ යුතුව, පරිසිවරුන්ගේ මුහුන්වලින්
ද හරෝදේගේ මුහුන්වලින් ද පරසේසම් වන්නැ"යි
ඔවුන්ට අණ කළ සේක. 16 "එසේ කීවේ අප ළඟ
රොටී නැති නිසා වන්න ඇතැ"යි ඔව්හු තම තමන්
අතර කතා කරගත්හ. 17 ජේසුස් වහන්සේ එපවත්
දැන, "රොටී නැති නිසා ඔබ අතරේ විවාද කරන්නේ

මන් ද? ඔබට තව ම තේරුම් පැහැදුම් නැද් ද? ඔබේ
සිතත් අඳුරු වී ඇද් ද? 18 ජෙරෙ 5:21; එසකි 12:2;
මාක් 4:12ඇස් තිබියදීත් ඔබට පෙනෙන්නේ නැද් ද?
කන් තිබියදීත් ඔබට ඇසෙන්නේ නැද් ද? ඔබට
මතක නැද් ද? 19 මා රොටි පහ කඩා පන්දහසකට
දුන් විට ඉතිරි කැබලිවලින් ඔබ කූඩා කීයක් පුරවා
ගත්තහු දැ”යි ඇසූ සේක. “දොළොසකැ”යි ඔව්හු කී
හ. 20 “රොටි සත හාරදහසක් අතර බෙදා දුන් විට
කැබලිවලින් කූඩා කීයක් පුරවාගත්තහු දැ”යි ඇසූ
සේක. “සතක්” යයි ඔව්හු කී හ. 21 “තවමත් ඔබට
තේරුම් ගියේ නැද්දැ”යි උන් වහන්සේ ඔවුන්ගෙන්
ඇසූ සේක.

### බෙත්සයිදාවේ අන්ධයකු සුව කිරීම

22 ඔව්හු බෙත්සයිදාවට පැමිණියහ. එවිට
ඇතැමෙක් උන් වහන්සේ වෙත අන්ධයකු ගෙනවුත්
ඔහු පිට අත් තබන මෙන් ආයාචනා කළහ. 23 උන්
වහන්සේ අන්ධයා අතින් අල්ලාගෙන ගමෙන් පිටතට
ගෙන ගොස්, ඔහුගේ ඇස්වල කෙළ තවරා, ඔහු පිට
අත් තබා, “ඔබට කිසිවක් පෙනේ දැ”යි ඇසූ සේක.
24 ඔහු ද ඇස් ඔසවා, “මිනිස්සු මට පෙනේ; ඔව්හු
ගස් වාගේ ය; ඔවුන් ඇවිදිනු මට පෙනේ!” යයි කී
ය. 25 උන් වහන්සේ ඔහුගේ ඇස් පිට යළිත් අත්
තැබූ සේක. එවිට ඔහු ඕනෑකමින් බැලී ය; පෙනුම
ලැබී ය; සියල්ල පැහැදිලි ලෙස දිටී ය. 26 උන්
වහන්සේ ඔහු ගෙදර පිටත් කර යවමින්, “ගමේ
කිසිවකුට මේ ගැන නොකියන්නැ”යි වදාළ සේක.

### පේදුරුගේ මහා ප්‍රකාශනය
(මතෙ 16:13-20;ලූක් 9:18-21)

27 ජේසුස් වහන්සේ ද ශ්‍රාවකයෝ ද පිලිප්පි
කායිසාරියේ ගම්වලට නික්ම ගියහ. මඟ දී උන්
වහන්සේ, කතා කරමින්, “මා කවරකු කියා මිනිස්සු
කියත් දැ”යි ශ්‍රාවකයන්ගෙන් ඇසූ සේක. 28 මාක්
6:14-15; ලූක් 9:7-8ඔව්හු උත්තර දෙමින්, “සමහරෙක්,
‘ස්නාවක ජොහන් ය’යි කියති; සමහරෙක්, ‘එලියා
ය’යි කියති; අන් සමහරෙක්, ‘දිවැසිවරයන්ගෙන්
කෙනෙකැ’යි කියති”යි පැවසූ හ. 29 ජොහ
6:68-69“මා කවරකු කියා ඔබ කියන්නහු දැ”යි උන්
වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක. “ඔබ
ක්‍රිස්තුවරයාණෝ ය”යි පේදුරු පිළිතුරු දුන්නේ ය.
30 උන් වහන්සේ ද තමන් ගැන කිසිවකුට
නොකියන ලෙස ඔවුන්ට අණ කළ සේක.

### ජේසුස් වහන්සේ සිය මරණය හා පුනරුජ්ජීවනය ගැන කලින් කීම
(මතෙ 16:21-28;ලූක් 9:22-27)

31 එවිට උන් වහන්සේ මනුෂ්‍ය-පුත්‍රයාණන්
බොහෝ දුක් වේදනා විඳින්නටත්, ප්‍රජා මූලිකයන්
ද නායක පූජකයන් ද විනයධරයන් ද විසින්
ප්‍රතික්ෂේප කරනු ලබන්නටත් මරනු ලබන්නටත්,
තෙ දිනකට පසු නැවත නැඟිටින්නටත් නියම බව
ඔවුන්ට උගන්වන්න පටන්ගත් සේක. 32 උන්
වහන්සේ මේ ගැන ප්‍රසිද්ධියේ ම කතා කළ සේක.
එකල පේදුරු උන් වහන්සේ පසෙකට ගෙන, උන්
වහන්සේට තදින් චෝදනා කළේ ය. 33 උන්
වහන්සේ හැරී, සිය ශ්‍රාවකයන් දෙස බලා, පේදුරුට
තදින් චෝදනා කරමින්, “සාතන්, අහකට යව, නුඹ
සිතන්නේ, මිනිසුන් සිතන විධියට මිස දෙවියන්
වහන්සේ සිතන විධියට නොවේ ය”යි වදාළ සේක.
34 මතෙ 10:38; ලූක් 14:27 එවිට උන් වහන්සේ
සිය ශ්‍රාවකයන් කැටුව සමූහයා තමන් වෙත කැඳවා
ඔවුන් අමතා මෙසේ වදාළ සේක: “යමෙක් මා අනුව
එන්න කැමැත්තේ ද, ඔහු තමකම නසා කුරුසිය දරා,
මා අනුව ඒ වා! 35 මතෙ 10:39; ලූක් 17:33; ජොහ
12:25සිය ජීවිතය රැකගන්න තැත් කරන යමෙක් වේ
ද ඔහු එය නැති කරගනියි. මා උදෙසාත්, සුබ අස්න
උදෙසාත් සිය ජීවිතය පුදන යමෙක් වේ ද, ඔහු එය
රැකගනියි. 36 යමෙක් මුළු ලෝකය ම ලබාගත්තත්,
සිය ජීවිතය නැති කරගත්තොත් ඔහුට කිනම්
ප්‍රයෝජනයක් ද? 37 නොහොත් යමෙකුට සිය දිවි
වෙනුවට කුමක් දිය හැකි ද? 38 එසේ හෙයින් මේ
දේව ද්‍රෝහී, පාපිෂ්ඨ පරම්පරාවේ දී යම් කෙනෙක්
මා ගැනත්, මාගේ ධර්මය ගැනත් ලජ්ජා වන්නේ ද,
මනුෂ්‍ය-පුත්‍රයාණන් පියාණන්ගේ තේජශ්‍රීයෙන්
ශුද්ධ දූතයන් පිරිවරා වඩිනා කල උන් වහන්සේ ඔහු
ගැනත් ලජ්ජා වනු ඇත.”

9 තවද, උන් වහන්සේ ඔවුන්ට කතා කොට,
“සැබැවින් ම මම ඔබට කියමි, දෙවියන්
වහන්සේගේ රාජ්‍යය බලපරාක්‍රම සහිත ව පහළ
වූ බව දකින්න පෙර, මෙහි සිටින්නන්ගෙන්
ඇතැමෙක් කිසි සේත් මරණයට පත් නොවන්නාහ”යි
වදාළ සේක.

### රූප විපර්යාසය
(මතෙ 17:1-13;ලූක් 9:28-36)

2 2 පේදු 1:17-18 සදවසකට පසු ජේසුස්
වහන්සේ පේදුරු ද ජාකොබ් ද ජොහන් ද වෙන්
කොට ගෙන, ඔවුන් තමන් සමඟ උස් කන්දකට
ගෙන ගිය සේක. උන් වහන්සේ ඔවුන් ඉදිරියෙහි
අන් වෙසෙක් වූ සේක. 3 මිහි පිට කිසිවකුටවත්
සෝදා සුදු කළ නොහැකි තරම් ධවල දීප්තියකින්
උන් වහන්සේගේ වස්ත්‍ර බැබළිණි. 4 එවිට එලියා ද
මෝසෙස් ද ඔවුන්ට දර්ශනය වූ හ. ඔව්හු ජේසුස්
වහන්සේ සමඟ කතා කරමින් සිටියහ. 5 එවිට
පේදුරු ජේසුස් වහන්සේට කතා කොට,
“ගුරුදේවයෙනි, අපට මෙහි සිටින්න ලැබීම මහත්
වාසනාවකි. අපි මණ්ඩප තුනක්, එකක් ඔබටත්,
එකක් මෝසෙස්ටත්, එකක් එලියාටත් සාදමු”යි කී
ය. 6 ඔවුන් මහා භීතියකින් ඇලළී ගියෙන්, කුමක්
කියන්න දැ යි ඔහු නොදැන සිටියේ ය. 7 මතෙ 3:17;
මාක් 1:11; ලූක් 3:22තවද වලාකුළක් නැඟී ඔවුන්
සිසාරා පැතිරිණි. එවිට, “මේ මාගේ ප්‍රියාදර
පුත්‍රයාණෝ ය; මොහුට සවන් දෙන්නැ”යි
වලාකුළෙන් හඬක් නික්මිණි. 8 හදිසියෙන් අවට බැලූ
විට, ඔව්හු තමන් සමඟ ජේසුස් වහන්සේ හැර අන්
කිසිවකු නුදුටුවෝ ය.

9 ඔවුන් කන්දනේ බසින කල, මනුෂ්ය-පුත්රයාණන්
මළවුන්ගනේ උත්ථාන වන තුරු තමන් දුටු දේ
කිසිවකුෙට නාෙකියන ලසෙ උන් වහන්සේ ඔවුන්ට
අණ කළ සේක. 10 එබැවින් ඔවුන් මේ නියමය
තදින් සිතට ගත් නමුත්, ඔව්හු, “මළවුන්ගනේ
උත්ථාන වීම යනු කුමක් දැ”යි ඔවුනාෙවුන් අතර
විමසමින් සිටියහ. 11 මලාකි 4:5; මතෙ 11:14තවද
ඔව්හු කතා කාෙට, “පළමුවනේ එලියා ආ යුතු ය යි
විනයධරයන් කියන්නේ මන්දැ”යි උන් වහන්සේගනේ
ඇසූ හ. 12 උන් වහන්සේ කතා කාෙට, “එසේ ය,
එලියා පළමුවනේ පැමිණ සියල්ල නිසි ලසෙ පිළියළෙ
කරනු ඇත. මනුෂ්ය-පුත්රයාණන් බාෙහාෝ දුක්
වේදනා විඳින්ටත්, නිග්රහ ලබන්නත් යුතු ය යි ඔහු
ගැන සඳහන් ව තිබනේනේ කසෙේ ද? 13 එහතේ
මම ඔබට කියමි, එලියා දැනට ම පැමිණ ඇත, ඔහු
ගැන ශුද්ධ ලියවිල්ලේ කියා ඇති පරිදි ඔව්හු තමන්
රිසි දේ ඔහුට කළහ”යි වදාළ සේක.

### මීමැස්මාෙර රාෝගී ළමයකු සුව කිරීම

(මතෙ 17:14-20;ලූක් 9:37-43)

14 ඔව්හු ශ්රාවකයන් වතෙ ආ කල ඔවුන්
වටකරගනෙ මහත් සමූහයක් සිටිනවාත්,
විනයධරයන් ඔවුන් සමඟ විවාද කරනවාත් දුටුවාෝ
ය. 15 එකණෙහි ම මුළු සමූහයා උන් වහන්සේ
දැක ඉතා විස්මිත ව, උන් වහන්සේ සමීපයට දිව
ගාෙස් ආචාර කළහ. 16 “ඔබ ඔවුන් සමඟ කුමක්
ගැන වාද කරන්නහු දැ”යි උන් වහන්සේ
විනයධරයන්ගනේ ඇසූ සේක. 17 සමූහයාගනේ එක්
කනෙකේ උන් වහන්සේට උත්තර දමෙින්,
“ගුරුදේවයනෙි, මාගේ පුත්රයා ඔබ වතෙට
ගනොවමේ; ඔහුට ගාෙළු ආත්මයක් ආවේශ වී ඇත.
18 ඒ ආත්මය ඔහු මැඩලන කාෙතැනක දී වුව ද
ඔහු බිම හළෙයි. එවිට ඔහු කටින් පණෙ දමයි;
දත්මිටි කයි; දරදඬු වයෙි. මේ ආත්මය දුරු කරන
ලසෙ මම ඔබේ ශ්රාවකයන්ගනේ ඉල්ලුවමේ.
එහතේ ඔවුන්ට එය කළ නාෙහැකි වී ය”යි කී ය.
19 උන් වහන්සේ ඔවුන්ට උත්තර දමෙින්, “අහාෝ!
ඇදහිලි හීන පරම්පරාව, මා කාෙපමණ කල් ඔබ
සමඟ සිටින්න ද? කාෙපමණ කල් ඔබ ගැන
ඉවසන්න ද? ඔහු මා වතෙ ගනෙනේනැ”යි වදාළ
සේක. 20 ඔව්හු උන් වහන්සේ වතෙට ළමයා
ගනොහ. උන් වහන්සේ දුටු කණෙහි ම ඒ ආත්මය
ඔහු තදින් සලිත කරලී ය. ඔහු ද බිම වැටී පරළෙි
පරළෙී කටින් පණෙ දමන්න වන. 21 “මාෙහුට මයෙ
සිදු වී කාෙපමණ කල් දැ”යි උන් වහන්සේ පියාගනේ
ඇසූ සේක. ඔහු උත්තර දමෙින්, “ළමා වයසේ පටන්
ය, 22 තවද, ඒ ආත්මය ඔහු විනාශ කරන පිණිස
වරින් වර ගින්නහෙි ද වතුරහෙි ද හළෙයි. ඔබට
යමක් කළ හැකි නම්, අපට අනුකම්පා කාෙට පිහිට
වුව මැනවැ”යි කී ය. 23 ජේසුස් වහන්සේ උත්තර
දමෙින්, “ඔබට හැකි නම්, කියා ඔබ කීවහෙි ද?
අදහන්නාට සියල්ල හැකි ය”යි වදාළ සේක.
24 එකණෙහි ම දරුවාගේ පියා, “මම අදහමි,
මාගේ ඇදහිල්ල මදිකම ගැන පිහිටවුව මැනවැ”යි
මාෙරගා කීවේ ය.
25 සමූහයා එක් ව දුවගනෙ එන බව ජේසුස්
වහන්සේ දුටු කල උන් වහන්සේ අශුද්ධාත්මයට
තරවටු කාෙට, “ගාෙළු බිහිරි ආත්මය, මාෙහු
කරෙනේ දුරු වවෙ, තවත් මාෙහුට ආවේශ
නාෙවන්නට තට අණ දමේ”යි වදාළ සේක. 26 එවිට
දුෂ්ට ආත්මය මාෙරගසා ඔහු බාෙහාෝ සේ සලිත
කාෙට පිටතට ආවේ ය. ළමයා ද මළකඳක් මනේ
විය. ඒ නිසා වැඩි දනො “ඔහු මැරිලා ය”යි කී හ.
27 එහතේ ජේසුස් වහන්සේ ඔහු අතින් අල්ලා
එසවූෙ සේක. ඔහු සිටගත්තේ ය.
28 උන් වහන්සේ ගටෙ පිවිසි කල ශ්රාවකයාෝ
කතා කාෙට, “ඒ ආත්මය දුරු කරන්න අපට
නාෙහැකි වූයේ මන්දැ”යි උන් වහන්සේගනේ
රහසින් විචාළහ. 29 උන් වහන්සේ ද “යාච්ඤාවනේ
මිස අන් මඟකින් මවෙනි ආත්ම දුරු කළ නාෙහැකි
ය”යි ඔවුන්ට වදාළ සේක.

### මරණය හා පුනරුජ්ජීවනය ගැන යළිත් පැවසීම

(මතෙ 17:22-23;ලූක් 9:43-45)

30 ඔව්හු එතැනින් නික්ම ගලීලය මැදින් ගියහ. ඒ
බව කිසිවකුෙ දැනගැනීම උන් වහන්සේගේ
කැමැත්ත නාෙ වී ය. 31 කුමක්නිසා ද, උන්
වහන්සේ, “මනුෂ්ය-පුත්රයාණාෝ මිනිසුන් අතට පාවා
දනෙු ලබති; ඔව්හු එතුමාණන් මරන්නාෝ ය. මරනු
ලැබූ පසු එතුමාණාෝ තෙ දිනකින් නැවත
නැඟිටින්නාහ”යි ශ්රාවකයන්ට ඉගැන්වූ බැවිනි.
32 එහතේ ඒ කීම ඔවුන්ට අවබාෝධ නාෙ වී ය. උන්
වහන්සේගනේ අසන්නටත් ඔව්හු බිය වූ හ.

### සැබෑ උතුම්කම

(මතෙ 18:1-5;ලූක් 9:46-48)

33 ඔව්හු කපර්ණාවුමට පැමිණියහ. උන් වහන්සේ
ගයෙි සිටි කල, “ඔබ මඟ දී කුමක් ගැන විවාද
කළහු දැ”යි ඔවුන්ගනේ ඇසූ සේක. 34 ලූක්
22:24එහතේ ඔව්හු නිහඬ වූ හ. මන්ද, වඩා උසස්
කවරකේ දැ යි මඟ දී තම තමන් අතර ඔවුන් විවාද
කළ බැවිනි. 35 මතෙ 20:26-27; 23:11; මාක්
10:43-44; ලූක් 22:26එකල උන් වහන්සේ වැඩහිඳ
දාෙළාෙස් දනො කැඳවා, “ප්රථමයා වන්න
කැමැත්තේ හැමට ම අන්තිමයාත්, හැමගේ
සේවකයාත් විය යුතු ය”යි ඔවුන්ට වදාළ සේක.
36 උන් වහන්සේ කුඩා දරුවකු ගනෙ ඔවුන් මැද
සිටුවා ඔහු තුරුල් කරගනෙ, 37 මතෙ 10:40; ලූක්
10:16; ජාෙහ 13:20“මබෙඳු කුඩා දරුවන්ගනේ
එකකු මාගේ නාමයනේ පිළිගන්නා, මා පිළිගන්නේ
ය. මා පිළිගන්නා, පිළිගන්නේ මා නාෙව, මා එවා
වදාළ තැනැන් වහන්සේ ය”යි ඔවුන්ට වදාළ සේක.

### අපට විපක්ෂ නාොවන්නා අපට පක්ෂ ය
(ලූක් 9:49-50)

38 ජාොහන් උන් වහන්සාේට කතා කාොට,
“ගුරුදාේවයනේ, අප අනුගමනය නාොකරන කනෙකු
ඔබාේ නාමයනේ දුෂ්ටාත්මයන් දුරු කරනු දුටිමු; ඔහු
අප අනුගමනය නාොකරන නිසා අපි ඔහුට එය
තහනම් කළෙමු”යි කීවාේ ය. 39 එහතේ ජාේසුස්
වහන්සාේ “තහනම් නාොකරන්න. මාගාේ නාමයනේ
ප්රබල ක්රියාවක් කරන කවරකුටවත් ඒ හුස්මනේ
ම මා ගැන අපවාදයක් කරන්න නාොහැකි ය.
40 මතෙ 12:30; ලූක් 11:23අපට විපක්ෂ නාොවන්නා
අපාේ පක්ෂයහෙි ය. 41 මතෙ 10:42ඔබ ක්රිස්තුන්
වහන්සාේට අයිති බැවින් ඒ නාමයනේ යමකේ ඔබට
වතුර කාෝප්පයක් වුව ද බාොන්න දනේනාේ නම්,
එහි ආනිශංසය ඔහුගනේ කිසි සාේත් නැති
නාොවන්නාේ යයි සැබැවින් ම මම ඔබට කියමි”යි
වදාළ සාේක.

### පාපයට පළෙඹවීම
(මතෙ 18:6-9;ලූක් 17:1-2)

42 “තවද, උන් වහන්සාේ කතා කරමින් මා කරෙහෙි
අදහාගත් මාේ බාලයන්ගනේ එකකු වත් නාොමඟ
යවන යම් කනෙකේ ඇද්ද, ඔහුගාේ ගලෙ වටා මහා
ඇඹරුම් ගලක් එල්ලා මුහුදාේ හළොදැමීම ඔහුට
යහපත. 43 මතෙ 5:30ඔබාේ වැටීමට හාේතුව ඔබාේ
අත නම් එය කපා දමන්න. දෑත ඇතිව අපායහෙි
නාොනිවනෙ ගින්නට යාමට වඩා අබ්බාගාත ව
ජීවනයට ඇතුළුවීම ඔබට යහපත. 44 අපායාේ දී
ඔවුන් කාදමන පණුවා නාොනසියි. ඔවුන් දවාලන
ගින්න නාොනිවයෙි. 45 ඔබාේ වැටීමට හාේතුව ඔබාේ
පාදය නම් එය කපා දමන්න. දපො ඇතිව අපායට
හළෙනු ලැබීමට වඩා කාොර ව ජීවනයට ඇතුළුවීම
ඔබට යහපත. 46 අපායාේ දී ඔවුන් කාදමන පණුවා
නාොනසියි. ඔවුන් දවාලන ගින්න ද නාොනිවයෙි.
47 මතෙ 5:29ඔබාේ වැටීමට හාේතුව ඔබාේ ඇස නම්
එය උපුටා දමන්න. දෑස ඇතිව අපායාේ හළෙනු
ලැබීමට වඩා එක ඇසක් ඇතිව දවේයන්
වහන්සාේගාේ රාජ්යයට ඇතුළුවීම ඔබට යහපත.
48 යසො 66:24අපායාේ දී ඔවුන් කාදමන පණුවා
නාොනසියි, ඔවුන් දවාලන ගින්න ද නාොනිවයෙි.
49 ලුණනේ පවිත්රවීම ඇති වන සාේ, සියල්ලාෝ ම
ගින්නනේ පවිත්ර කරනු ලබති. 50 මතෙ 5:13; ලූක්
14:34-35ලුණු හාොඳ ය. එහතේ ලුණහෙි ලුණු ගතිය
නැති වුවහාොත්, එයට ලුණු රස කවන්නාේ කුමකින්
ද? ඔබ තුළ සුහදතාව නමැති ලුණු ගතිය ඇතිව
එකිනකො සමඟ සාමකාමී ව සිටින්නැ”යි වදාළ
සාේක.

### දික්කසාදය පිළිබඳ අනුශාසනා
(මතෙ 19:1-12;ලූක් 16:18)

10 උන් වහන්සාේ එතැනින් නික්ම ජුදයට සහ
ජාොර්දානනේ එගාොඩ පළාත්වලට පැමිණි
සාේක. යළිත් සමූහයාෝ උන් වහන්සාේ වතෙ රුස් වූ
හ. උන් වහන්සාේ සිරිත් පරිදි ඔවුන්ට ඉගැන්වූ
සාේක.
2 පරිසිවරු අවුත් උන් වහන්සාේ වචනයකින්
අල්ලාගනු පිණිස, “පුරුෂයකු විසින් සිය භාර්යාව
දික්කසාද කිරීම නීතියට අනුකූල දැ”යි උන්
වහන්සාේගනේ ප්රශ්න කළහ. 3 උන් වහන්සාේ
උත්තර දමේන්, “මාෝසසේ ඔබට කුමක් අණ කළොේ
දැ”යි ඔවුන්ගනේ ඇසූ සාේක. 4 ද්වි.නී. 24:1-4; මතෙ
5:31“දික්කසාද සහතිකයක් ලියා ඇය අත්හැර
දමන්න මාෝසසේ අවසර දුන්නාේ ය”යි ඔව්හු කී හ.
5 එහතේ, ජාේසුස් වහන්සාේ ඔවුන්ට කතා කාොට,
“ඔහු මාේ ආඥා පැණවූයාේ, ඔබාේ සිත් දැඩිකම
නිසා ය. 6 උත් 1:27; 5:2එහතේ, මැවීමාේ මුල සිට ම
දවේයන් වහන්සාේ ඔවුන් ස්ත්රී-පුරුෂ වශයනේ මැවූ
සාේක. 7 උත් 2:24ඒ හාේතුකාොට ගනෙ මිනිසකේ
තම පියා ද මව ද අතහැර සිය භාර්යාවට ඇලුම්
වන්නාේ ය. 8 ඒ යුවළ ද එක ම මාංසයක් වතේ.
මසොේ ඔව්හු එවක් පටන් දදෙනෙකේ නාොව එක්
කනෙකේ වන්නාෝ ය. 9 එබැවින් දවේයන් වහන්සාේ
එක්කළ අය මනුෂ්යයා වනේ නාොකරොේ වා!”යි
වදාළ සාේක.
10 ශ්රාවකයාෝ ගදෙර දී මාේ කාරණය ගැන යළිත්
උන් වහන්සාේගනේ ඇසූ හ. 11 මතෙ 5:32; 1 කාොරි
7:10-11උන් වහන්සාේ ඔවුන්ට කතා කාොට, “සිය
භාර්යාව අත්හැර වනෙ ස්ත්රියක පාවාගන්න
කවරකු නමුත් ඔහු ඈට විරුද්ධ ව කාමමිථ්යාචාරය
කරයි. 12 ස්ත්රියක් ඇගාේ පුරුෂයා අත්හැර වනෙ
කනෙකු සරණ පාවා ගන්නී නම්, ඈ ද
කාමමිථ්යාචාරය කරන්නී ය”යි වදාළ සාේක.

### ළදරුවන්ට ආශීර්වාද කිරීම
(මතෙ 19:13-15;ලූක් 18:15-17)

13 සමහරු තමන්ගාේ ළදරුවන් පිට ජාේසුස්
වහන්සාේගාේ අත් තබවා ගන්නා පිණිස, උන්
වහන්සාේ වතෙ ඔවුන් ගනොහ. එවිට ශ්රාවකයාෝ
ඔවුන්ට තරවටු කළහ. 14 ජාේසුස් වහන්සාේ ඒ දැක
ඉතා අමනාප වී, “ළදරුවන්ට මා වතෙ එන්න ඉඩ
හරින්න; ඔවුන් නාොවළක්වන්න. දවේයන්
වහන්සාේගාේ රාජ්යය මබෙඳු අය සන්තක ය.
15 මතෙ 18:3සැබැවින් ම මම ඔබට කියමි, යම්
කනෙකු දවේයන් වහන්සාේගාේ රාජ්යය ළදරුවකු
සාේ නාොපිළිගත්තාොත්, ඔහු කිසි සාේත් එහි ඇතුළු
නාොවන්නාේ ය”යි ඔවුන්ට වදාළ සාේක. 16 උන්
වහන්සාේ ඔවුන් තුරුළු කරගනෙ ඔවුන් පිට අත් තබා
ඔවුන්ට ආශීර්වාද කළ සාේක.

### පොහොසත් තරුණයා
(මතෙ 19:16-30;ලූක් 18:18-30)

17 උන් වහන්සේ මඟ බැස ගමන් ගනිත් ම එක්
මිනිසෙක් දිව අවුත් උන් වහන්සේ ඉදිරියෙහි දණින්
වැටී, “යහපත් ගුරුදේවයෙනි, සදාතන ජීවනය උරුම
කරගන්නා පිණිස මා කුමක් කළ යුතු දැ”යි උන්
වහන්සේගෙන් ඇසී ය. 18 ජේසුස් වහන්සේ ඔහුට
කතා කොට, “මා යහපත් යයි ඔබ කියන්නේ මන්
ද? හුදකේ දවේයන් වහන්සේ මිස අන් කිසිවකේ
යහපත් නොවේ. 19 නික්ම 20:12-16; ද්වි.නී.
5:16-20ඔබ ආඥා දන්නහෙි ය. මිනී නොමරන්න;
කාමමිථ්‍යාචාරය නොකරන්න; සොරකම්
නොකරන්න; බොරු සාක්ෂි නොකියන්න; වංචා
නොකරන්න; නුඹේ පියාටත්, මවටත් ගෞරව
කරන්න යනු”යි වදාළ සේක. 20 ඔහු ද උත්තර
දමෙින්, “ගුරුදේවයෙනි, මම මේ සියල්ලක් ම
යොවුන් වියේ සිට රක්ෂා කළෙමේ”යි උන්
වහන්සේට කීවේ ය. 21 ජේසුස් වහන්සේ ඔහු දසෙ
බලා, ඔහු කෙරෙහි මතේ සිත් වඩා, “ඔබට එක අඩු
පාඩුවක් ඇත; යන්න, ඔබ සතු සියල්ල විකුණන්න;
විකුණා දිළිඳුන්ට දනේන; ස්වර්ගයෙහි ඔබට සම්පත්
ඇති වන්නේ ය. එන්න, මා අනුගාමී වන්නැ”යි ඔහුට
වදාළ සේක. 22 එහතේ ඔහු ඒ කීම නිසා මලානික
වී, දොම්නසින් පිරී එතැනින් නික්ම ගියේ ය. එසේ
කළෙේ, ඔහුට වස්තු සම්භාරයක් තිබුණු බැවිනි.
23 එවිට ජේසුස් වහන්සේ අවට බලා,
“ධනවතුන්ට දවේයන් වහන්සේගේ රාජ්‍යයට
ඇතුළුවීම කොතරම් දුෂ්කර දැ”යි ශ්‍රාවකයන්ට
වදාළ සේක. 24 ශ්‍රාවකයෝ ද ඒ අසා විස්මයට
පත්වූ හ. ජේසුස් වහන්සේ නැවතත් මෙසේ වදාළ
සේක; “දරුවනෙි, දවේයන් වහන්සේගේ රාජ්‍යයට
ඇතුළුවීම කොතරම් දුෂ්කර ද? 25 ධනවතකුෙට
දවේයන් වහන්සේගේ රාජ්‍යයට ඇතුළුවීමට වඩා
ඔටුවකුෙට ඉඳිකටු මලින් රිංගා යාම පහසු ය.”
26 ඔව්හු අතිශයින් මවිත වී, “එසේ නම් ගැළවීම
ලැබිය හැක්කේ කවරකුෙට දැ”යි ඔවුනොවුන් අතර
කියාගත්හ. 27 ජේසුස් වහන්සේ ඔවුන් දසෙ බලා,
“මිනිසුන්ට නම් එය කළ නොහැකි ය. දවේයන්
වහන්සේට එසේ නොවේ; දවේයන් වහන්සේට
සියල්ල කළ හැකි ය”යි වදාළ සේක.
28 පේදුරු කතා කරමින්, “බලන්න, අපි සියල්ලම
අත්හැර දමා ඔබ අනුව ආවමු”යි කී ය. 29 ජේසුස්
වහන්සේ ද, “සැබැවින් ම මම ඔබට කියමි; මා නිසා
ද සුබ අස්න නිසා ද, ගේදොර හෝ සොහොයුරන්
හෝ සොහොයුරියන් හෝ මව හෝ පියා හෝ
දරුවන් හෝ ගම්බිම් හෝ අත්හළ කවරකු වුව ද,
30 ඔහු දැන් මේ කාලයේ දී ම සිය ගුණයක්
ගේදොර ද සොහොයුරන් ද සොහොයුරියන් ද
මවුවරුන් ද දරුවන් ද ගම්බිම් ද ඒ සමඟ පීඩා ද,
එන යුගයේ දී සදාතන ජීවනය ද නොලබා
නොසිටින්නෝ ය. 31 මතෙ 20:16; ලූක් 13:30එහතේ
ප්‍රථමයෝ බොහෝ දනෙකේ අන්තිමයෝ ද
අන්තිමයෝ ප්‍රථමයෝ ද වන්නෝ ය”යි වදාළ
සේක.

### මරණය සහ පුනරුජ්ජීවනය ගැන තෙවන වරටත් කීම
(මතෙ 20:17-19;ලූක් 18:31-34)

32 ජේසුස් වහන්සේ සහ ශ්‍රාවකයෝ ජෙරුසලමට
යන මාර්ගයෙහි යමින් සිටියහ. ජේසුස් වහන්සේ
විස්මිතව සිටි ශ්‍රාවකයින්ට පෙරටුව වැඩිය සේක.
පසුපස්සේ ගිය සෙනඟ භීත වී සිටියහ. උන්
වහන්සේ යළිත් දොළොස් දනො කැඳවා තමන්
වහන්සේට සිදු වන්න යන දේ කියන්න පටන්ගනෙ,
33 “බලන්න, අපි ජෙරුසලමට යම්හ. මනුෂ්‍ය-
පුත්‍රයාණෝ නායක පූජකවරුන්ටත්, විනයධරයන්ටත්
පාවා දනෙු ලබති. ඔව්හු එතුමාණන් මරණයට නියම
කොට විජාතීන්ට පාවා දනේනෝ ය. 34 ඔව්හු
එතුමාණන්ට නින්දා කොට, කළෙ ගසා, කසවලින්
තළා මරණයට පත් කරන්නෝ ය. තෙ දිනකට පසු
එතුමාණෝ උත්ථාන වන සේකැ”යි වදාළ සේක.

### ජාකොබ් සහ ජොහන්ගේ අයැදුම
(මතෙ 20:20-28)

35 සබෙදීගේ පුත් ජාකොබ් ද ජොහන් ද උන්
වහන්සේ වතෙ අවුත්, “ගුරුදේවයෙනි, අප ඉල්ලන
දේ ඔබ අපට ඉටුකර දනෙ සේක් නම් අපි
කැමැත්තමු”යි කී හ. 36 “මා ඔබට කුමක් කර
දනෙවාට ඔබ කැමැත්තහු දැ”යි උන් වහන්සේ
ඔවුන්ගනේ ඇසූ සේක. 37 “ඔබගේ තේජශ්‍රීයෙහි
දී, අපනේ එක් කනෙකුෙට ඔබගේ දකුණු පස ද,
එක් කනෙකුෙට වම් පස ද හිඳගන්නට වර දුන
මැනවැ”යි ඔව්හු උන් වහන්සේට කී හ. 38 ලූක්
12:50එහතේ ජේසුස් වහන්සේ, “ඔබ ඉල්ලන්නේ
කුමක් දැ යි ඔබ ම නොදන්නහු ය. මා බොන දුක්
වේදනා නමැති කුසලානනේ බොන්න හෝ මා ලබන
බව්තීස්ම-ස්නාපනය ලබන්නට හෝ ඔබට හැකි දැ”යි
ඔවුන්ගනේ ඇසූ සේක. 39 “අපට හැකිය”යි ඔව්හු
උන් වහන්සේට කී හ. ජේසුස් වහන්සේ ද, “මා
බොන කුසලානනේ ඔබත් බොනු ඇත. මා ලබන
බව්තීස්ම-ස්නාපනයනේ ඔබත් බව්තීස්ම-ස්නාපනය
ලබනු ඇත. 40 එහතේ, මාගේ දකුණු පස ද වම් පස
ද ඉඳගන්න දීම මා සතු දයෙක් නොවේ. යම් අය
සඳහා එය නියම කර ඇද්ද, එය අයිතිවන්නේ
ඔවුන්ට ය”යි වදාළ සේක.
41 එවිට අනික් දස දනො ඒ අසා ජාකොබ් සහ
ජොහන් සමඟ අතිශයින් කෝප වූ හ.
42 ලූක් 22:25-26 ජේසුස් වහන්සේ ඔවුන් තමන්
වතෙට කැඳවා මෙසේ වදාළ සේක: “විජාතීන් අතර
ආණ්ඩුකාරයන් වශයනේ සම්මත වූවන් ඔවුන්
කෙරේ ආධිපත්‍යය පවත්වන බවත්, ඔවුන්ගේ
ප්‍රධානීන් ඔවුන් කෙරෙහි බලය පාන බවත් ඔබ
දන්නහු ය. 43 මතෙ 23:11; මාක් 9:35; ලූක්
22:26එහතේ, ඔබ අතර එසේ නොවේ. ඔබ අතර
ප්‍රධානියා වන්න කැමැති යමකේ ඇද්ද, ඔහු ඔබේ

සේවකයා විය යුතු ය. 44 ඔබ අතර ස්වාමියා වන්න
කැමැති යමෙක් ඇද්ද, ඔහු සියල්ලන්ගේ දාසයා විය
යුතු ය. 45 කුමක් හයෙින් ද මනුෂ්‍ය-පුත්‍රයාණන් වුව
ද වැඩියේ, සේවය ලැබීමට නොව සේවය කිරීමට
ය; බොහෝ දනො උදසො මිදීමේ මිලයක් වී සිය දිවි
පිදීමට ය."

### අන්ධ බර්තිමේයස්ට පනේම දීම
(මතෙ 20:29-34;ලූක් 18:35-43)

46 ඔව්හු ජෙරිකෝවට පැමිණියෝ ය. උන්
වහන්සේ සිය ශ්‍රාවකයන් හා මහා සමූහයක් ද
සමඟ ජෙරිකෝවෙනේ නික්ම යන කල, තිමේයස්ගේ
පුත් බර්තිමේයස් නම් අන්ධ හිඟන්නෙක් පාර අද්දර
වාඩි වී සිටියේ ය. 47 "මේ වඩින්නේ නාසරතේහි
ජේසුස් වහන්සේ ය"යි අසා, "දාවිත්ගේ පුත් ජේසුස්
වහන්ස, මට අනුකම්පා කළ මැනවැ"යි ඔහු
මොරගසන්න විය. 48 නිහඬ වන ලසෙ බොහෝ
දනෙක් ඔහුට තරවටු කළහ. එහතේ ඔහු,
"දාවිත්ගේ පුත්‍රයාණනෙි, මට අනුකම්පා කළ
මැනවැ"යි වැඩි වැඩියෙන් මොරගැසී ය. 49 ජේසුස්
වහන්සේ නැවතී, "ඔහුට හඬගසන්නැ"යි වදාළ
සේක. ඔව්හු අන්ධයාට හඬගසා, "ධරෙය ගන්න,
නැඟිටින්න, එතුමාණෝ ඔබ කැඳවන සේකැ"යි කී
හ. 50 ඔහු එවිට තමාගේ සළුව ගසාදමා, පැන නැඟී
ජේසුස් වහන්සේ වතෙට ආවේ ය. 51 ජේසුස්
වහන්සේ ඔහුට කතා කොට, "මා ඔබට කුමක් කර
දනෙවාට ඔබ කැමැති දැ"යි ඔහුගනේ ඇසූ සේක.
"ගුරුදේවයනෙි, මට පනේම දුන මැනවැ"යි අන්ධයා
උන් වහන්සේට කී ය. 52 ජේසුස් වහන්සේ ද,
"යන්න, ඔබේ ඇදහිල්ල ඔබට සුවසම්පත ලබා දී
ඇතැ"යි ඔහුට වදාළ සේක. ඒ ඇසිල්ලහෙි ම ඔහු
පනේම ලබා මඟ දිගේ උන් වහන්සේ පසුපස්සේ
ගියේ ය.

### රාජ තේජසින් ජෙරුසලමට පිවිසීම
(මතෙ 21:1-11;ලූක් 19:28-40;ජොහ 12:12-19)

11 ඔව්හු ජෙරුසලමට ළං ව ඔලීව කන්දට නුදුරු
බෙත්පාගයට හා බෙතානියට පැමිණියහ. උන්
වහන්සේ සිය ශ්‍රාවකයන් දදෙනෙකු යවමින්,
2 "ඔබ ඉදිරියේ ඇති ගමට යන්න; ගිය කණෙහෙි ම
කිසිවකු කිසි කලක නොනැඟුණු, බැඳ සිටින
කොටළු නාම්බකු ඔබට සම්බ වනු ඇත; ඌ ලිහා
මහෙි ගනෙන්න. 3 'ඔබ මයෙ කරන්නේ මන්දැ'යි
යමකු ඇසුවොත්, 'සමිඳාණන් වහන්සේ හට උගනේ
වැඩක් ඇත; නොපමාව ඌ ආපසු එවනු ඇතැ'යි
ඔවුන්ට කියන්නැ"යි වදාළ සේක. 4 ඔව්හු ගොස්,
දොර ළඟ පිටත වීදියහෙි දිගේලි කොට සිටි
කොටළු නාම්බකු දැක ඌ ලිහුවෝ ය. 5 එහි සිටි
අයගනේ ඇතැමකේ කතා කොට, "කොටළු නාම්බා
ලිහන්නේ මන්දැ"යි ඇසූහ. 6 ජේසුස් වහන්සේ
වදාළ ලසෙම ඔව්හු ඔවුන්ට පිළිතුරු දුන්හ. එවිට
ඔව්හු ඔවුන්ට ඉඩ දුන්නෝ ය. 7 ඔව්හු කොටළු
නාම්බා ජේසුස් වහන්සේ වතෙට ගනෙවුත්
තමන්ගේ උතුරු සළු ඌ පිට එළාලූ හ. උන්
වහන්සේ ද ඌ පිට හිඳගත් සේක. 8 එවිට
බොහෝ දනෙක් තමන්ගේ සළු ද, අන් අය
වතුපිටිවලින් කපා ගත් කොළ අතු ද මඟ අතුළෝ
ය. 9 ගීතා 118:25-26පරෙටුවනේ හා පිටුපසින් ගිය
අය "හෝසන්නා! සමිඳුන් නමින් වඩිනා මතුමාණන්
හට ආසිරි වේ වා!, 10 අපේ පිය වූ දාවිත්ගේ මතු
පැමිණනෙ රාජ්‍යයට ආසිරි වේ වා!, අති උසස්
තැන්හි හෝසන්නා!" කියා මොරගැසූහ.
11 ජේසුස් වහන්සේ ජෙරුසලමට පැමිණ දේව
මාලිගාවට ඇතුළු ව අවට සියල්ල නරඹා, සවස් වූ
බැවින් දොළොස් දනො සමඟ බතොනිය බලා නික්ම
ගිය සේක.

### අත්තික්කා ගසට සාපය
(මතෙ 21:18-19)

12 පසු දා ඔවුන් බතොනියනේ නික්ම ගිය කල උන්
වහන්සේට බඩගිනි විය. 13 උන් වහන්සේ කොළ
ඇති අත්තික්කා ගසක් දුර දී දැක, ඉන් යමක් ලැබේ
දෝ යි සිතමින් එහි වැඩිය සේක. ගස ළඟට පැමිණි
කල, කොළ මිස අන් කිසිවක් සම්බ නො වී ය. ඒ
අත්තික්කා වාරය නුවූ බැවිනි. 14 උන් වහන්සේ,
"මවෙක් පටන් සදහට ම කිසිවකේ කිසි කලකෙ
තාගනේ පල අනුභව නොකරත්වා"යි ගසට වදාළ
සේක. එය උන් වහන්සේගේ ශ්‍රාවකයන්ට ඇසිණි.

### දේව මාලිගාව පවිත්‍ර කිරීම
(මතෙ 21:12-17;ලූක් 19:45-48;ජොහ 2:13-22)

15 ඔව්හු ජෙරුසලමට පැමිණියෝ ය. උන් වහන්සේ
දේව මාලිගාවට පිවිස එහි වළෙහළෙඳාම් කළවුන්
පිටතට පලවා හරින්න පටන්ගනෙ, මුදල් මාරු
කරන්නන්ගේ මේස ද පරවේ වළෙඳුන්ගේ ආසන ද
පරෙළා දමා, 16 දේව මාලිගාව මැදින් කිසිදු දයෙක්
ගනෙ යන්න කිසිවකුෙට ඉඩ නුදුන් සේක. 17 යසො
56:7; ජරෙ 7:11උන් වහන්සේ ඔවුන්ට උගන්වමින්, "
'මාගේ ගෘහය සියලු ජාතීන්ට යාච්ඤාවේ
ගෘහයකැ'යි කියනු ලබන බව ලියා නැද් ද? එහතේ
ඔබ එය හොරුන්ගේ ගුහාවක් කර ඇතැ"යි වදාළ
සේක. 18 නායක පූජකවරු ද විනයධරයෝ ද ඒ අසා
උන් වහන්සේ නසාදැමීමට මඟක් සවේූ හ. මන්ද,
උන් වහන්සේගේ අනුශාසනා ගැන මුළු සමූහයා
විස්මිත වූ බැවින් ඔව්හු උන් වහන්සේට බිය වූ හ.
19 සවස් වූ විට උන් වහන්සේ නුවරින් නික්ම ගිය
සේක.

### වියළී අත්තික්කා ගසනේ පාඩමක්
(මතෙ 21:20-22)

20 ඔව්හු පසු දා උදේ යද්දී, අත්තික්කා ගස; මුල
පටන් වියළී තිබනෙු දුටුවෝ ය. 21 ඒ සිද්ධිය මතක්
වී, පේදුරු කතා කරමින්, "බලන්න ගුරුදේවයනෙි,
ඔබ සාප කළ අත්තික්කා ගස වියළී තිබේ ය"යි කී
ය. 22 ජේසුස් වහන්සේ ඔවුන්ට උත්තර දමේින්,
මසෙේ වදාළ සේක: "දවේියන් වහන්සේ

අදහාගන්න. 23 මතෙ 17:20; 1 කොරි 13:2සැබැවින්
ම මම ඔබට කියමි, කවරෙක් නමුත් මේ කන්දට,
‘ඉදිරීගොස්, මුහුදෙහි පතිත වේ වා’යි කියා, තමා
කියන ඒ දේ සිදු වන්නේ ම යයි නිසැක සිතින්
අදහන්නේ නම් එය සිදු වන්නේ ම ය. 24 එබැවින්
මම ඔබට කියමි, ඔබ යාච්ඤාවෙන් අයැදින කවර
දෙයක් වුව ද, එය ඔබට ලැබුණේ යයි අදහන්න.
එවිට එය ඔබට ලැබෙන්නේ ම ය. 25 මතෙ
6:14-15ඔබ නැඟිට යාච්ඤා කරන විට කිසිවකුට
විරුද්ධ ව කිසිවක් ඇත්නම් කමා කරන්න. එසේ කළ
යුත්තේ ස්වර්ගයෙහි වැඩ වසන පියාණන්
වහන්සේත් ඔබේ වැරදිවලට කමා කරන පිණිස ය.
26 එහෙත් ඔබ කමා නොකරන්නහු නම්,
ස්වර්ගයෙහි වැඩ වසන පියාණන් වහන්සේ ද ඔබේ
වැරදිවලට කමා නොවන සේක.”

### ජේසුස් වහන්සේගේ අධිකාරී බලය ගැන ප්‍රශ්න කිරීම

(මතෙ 21:23-27;ලූක් 20:1-8)

27 ඔව්හු යළිත් ජෙරුසලමට පැමිණියෝ ය. උන්
වහන්සේ දේව මාලිගාවෙහි සක්මන් කරන කල,
නායක පූජකවරු ද විනයධරයෝ ද ප්‍රජා මූලිකයෝ
ද උන් වහන්සේ වෙත අවුත්, 28 “ඔබ මේ දේවල්
කරන්නේ කවර අධිකාරී බලයකින් ද? මේ දේවල්
කිරීමට මේ බලය ඔබට පැවරුවේ කවරෙක් දැ”යි
උන් වහන්සේගෙන් ඇසූ හ. 29 ජේසුස් වහන්සේ
ඔවුන්ට කතා කොට, “මමත් ඔබෙන් ප්‍රශ්නයක්
අසමි. මට පිළිතුරු දෙන්න; එවිට මේ දේවල්
කරන්නේ කවර බලයකින් දැ යි මම ඔබට
කියන්නෙමි. 30 ජොහන් බව්තීස්ම-ස්නාපනය කිරීමේ
බලය ලැබුවේ දෙවියන් වහන්සේගෙන් ද
නැතහොත් මනුෂ්‍යයන්ගෙන් ද? මට පිළිතුරු
දෙන්නැ”යි වදාළ සේක. 31 ඔව්හු තම තමන් අතර
විවාද කරමින්, “ ‘දෙවියන් වහන්සේගෙන් ය’යි අප
කීවොත්, ‘ඔහු අදහා නොගත්තේ මන්දැ’යි අපට
කියනු ඇත. 32 එසේ නම්, ‘මනුෂ්‍යයන්ගෙන් ය’යි
කියමු ද?” ජොහන් සැබැවින් ම ‘දිවැසිවරයෙකැ’යි
කොයි කවුරුනුත් පිළිගත් බැවින් ඔව්හු සෙනඟට
භයින්, “එසේ නොකියමු”යි තීරණය කොට, 33 “අපි
නොදනිමු”යි ජේසුස් වහන්සේට පිළිතුරු දුන්හ.
ජේසුස් වහන්සේ ද, “මේ දේවල් කරන්නේ කවර
අධිකාරී බලයකින් දැ යි මමත් ඔබට නොකියමි”යි
වදාළ සේක.

### මිදි වත්ත හා වැවිලිකරුවන් පිළිබඳ උපමාව

(මතෙ 21:33-46;ලූක් 20:9-18)

12 යසො 5:1-2 ජේසුස් වහන්සේ ඔවුන්ට
තවදුරටත් උපමා මඟින් කතා කරමින් මෙසේ
වදාළ සේක: “එක් මිනිසෙක් මිදි වත්තක් වගා
කොට, එය වටා වැටක් බැඳ, මිදි යන්ත්‍රයට වළක්
කැණ, මුර අට්ටාලයක් ඉදි කොට, ගොවීන්ට අඳයට
දී පිට රට ගියේ ය. 2 ඔහු මිදි වත්තේ පලදාවෙන්
සිය කොටස අඳකාරයන්ගෙන් ගන්නා පිණිස
අස්වැන්න වාරයේ දී ගොවීන් වෙත දාසයෙකු යැවී
ය. 3 ඔව්හු දාසයා අල්ලා තළා පළවා, ඔහු හිස්
අතින් හැරියෝ ය. 4 යළිත් ඔහු වෙනෙ දාසයෙකු
ඔවුන් වෙත යැවී ය. ඔව්හු ඔහුගේ හිස තුවාළ
කොට ඔහුට නින්දා අපහාස ද කළහ. 5 ඔහු තවත්
කෙනෙකු යැවී ය. ඔව්හු ඔහු ද මැරූ හ; තවත්
බොහෝ දෙනෙකුන්ට එසේ ම කළහ. සමහරු තැළුම්
කෑ හ; සෙසු අය මැරුම් කෑ හ. 6 ඔහුට තව එක්
කෙනෙක්, එනම්, ප්‍රේමාන්විත පුත්‍ර රත්නයක්
සිටියේ ය. ‘ඔවුන් මාගේ පුත්‍රයාට ගරු කරනු
ඇතැ’යි කියා, අවසාන වශයෙන් ඔහු ද ඔවුන් වෙත
යැවී ය. 7 එහෙත්, ඒ ගොවීහු තමන් අතර කතා වී,
‘මේ උරුමක්කාරයා ය. එන්න, මොහු මරමු. එවිට
උරුමය අප සතු වන්නේ ය’ කියා 8 ඔහු අල්ලා, මරා,
මිදි වත්තෙන් බැහැරට ඇද දැමූ හ. 9 ඉතින් මිදි වතු
හිමියා කුමක් කරනු ඇද් ද? ඔහු ඇවිත් ඒ ගොවීන්
නසා දමා මිදි වත්ත අන් අයට පවරනු ඇත. 10 ගීතා
118:22-23මේ ශුද්ධ ලියවිලි පදයවත් ඔබ කියවා,
නැද් ද?
අ2 10 ‘ගෘහ ශිල්පීන් ඉවත ලූ ගල ම කොණේ මුල්
ගල වී ඇත;
11 මෙය සමිඳුන්ගේ ම ක්‍රියාවකි, අප ඇස්
හමුයෙහි එය විස්මයජනක ය.’ “
12 මේ උපමාව තමන්ට විරුද්ධ ව එල්ල කළ බව
තේරුම්ගත් ඔව්හු උන් වහන්සේ අල්ලන්නට තැත්
කළහ. එහෙත්, ජනකායට බිය වූයෙන් ඔව්හු උන්
වහන්සේ අත්හැර යන්න ගියහ.

### අධිරාජයාට බදු ගෙවීම

(මතෙ 22:15-22;ලූක් 20:20-26)

13 වචනයකින් උන් වහන්සේ අසු කර ගන්නා
පිණිස ඔව්හු පරිසිවරුන්ගෙන් ද හෙරෝදිවරුන්ගෙන් ද
සමහරෙකු උන් වහන්සේ වෙත යැවූ හ. 14 ඔව්හු
අවුත්, “ගුරුදේවයෙනි, ඔබ අවංක මිනිසෙකු බවත්,
කිසිවකු නොතකන බවත් අපි දනිමු; ඔබ
මිනිසුන්ගේ තරාතිරම් නොබලා, දෙවියන්
වහන්සේගේ මාර්ගය සැබෑ ලෙස උගන්වන සේක.
සීසර් අධිරාජයාට බදු දීම යුතු ද අයුතු ද? දෙමු ද,
නොදෙමු දැ”යි උන් වහන්සේගෙන් ඇසූ හ.
15 එහෙත් උන් වහන්සේ ඔවුන්ගේ කෛරාටිකකම
දැන, “කුමට මා පරීක්ෂා කරන්නහු ද? මට බලන්න
රිදී කාසියක් මෙහි ගෙනෙන්නැ”යි වදාළ සේක.
16 ඔව්හු කාසියක් ගෙනාහ. “මේ රූපයත්, සටහනත්
කාගේ දැ”යි උන් වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක.
“සීසර් අධිරාජයාගේ ය”යි ඔව්හු කී හ. 17 එවිට
ජේසුස් වහන්සේ උත්තර දෙමින්, “රජුගේ දේ රජුට
ද දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේට ද
දෙන්නැ”යි ඔවුන්ට වදාළ සේක. ඔව්හු උන්
වහන්සේ ගැන අතිශයින් පුදුම වූ හ.

### පුනරුප්පීවන ප්‍රශ්නය
(මතෞ 22:23-33;ලූක් 20:27-40)

18 ක්‍රියා 23:8 පුනරුප්පීවනයක් නැතැ යි උගන්වන
සද්දූසිවරුන්ගනේ සමහරු උන් වහන්සේ වතෙ අවුත්
ප්‍රශ්න කරමින්, උන් වහන්සේගනේ මසෙේ ඇසූ හ:
19 ද්වි.නී. 25:5“ගුරුදේවයනෙි, යමකුෙගේ
සහෝදරයකේ දරුවකුෙ නලොැබ, සිය භාර්යාව
ජීවත් ව සිටිය දී මියගියහොත්, ඔහුගේ සහෝදරයා
ඒ ස්ත්‍රිය පාවාගනෙ සිය සහෝදරයාගේ නමට
දරුවන් ඉපදවිය යුතු ය යි මෝසසේ විසින් අපට අණ
දී තිබේ. 20 වරක් සහෝදරයෝ සත් දනෙකේ
සිටියහ. පළමුවැන්නා භාර්යාවක පාවාගනෙ දරුපල
නැති ව මළේ ය. 21 දවෙැන්නාත් ඇය පාවාගනෙ
දරුපල නැති ව මළේ ය. තවෙැන්නාටත් එසේ ම
විය. 22 සත්දනෙ ම දරුපල නැති ව මළෝ ය. හැමට
ම පසු ස්ත්‍රිය ද මළා ය. 23 සත් දනො ම ඇය
භාර්යාව කොට පාවාගත් බැවින් පුනරුප්පීවනයේ දී,
ඔවුන් මළවුන්ගනේ නැඟිටින කල ඈ ඔවුන්ගනේ
කවරකුෙගේ භාර්යාව වන්නී ද?”
24 ජේසුස් වහන්සේ ඔවුන්ට කතා කොට මසෙේ
වදාළ සේක: “ඔබ මුළා වන්නේ ශුද්ධ ලියවිලි වත්
දවේයන් වහන්සේගේ බලපරාක්‍රමය වත්
නොදන්නා නිසා නොවේ ද? 25 මා එසේ කියන්නේ
මළවුන්ගනේ උත්ථානවීමේ දී ආවාහ වීමක් හෝ
විවාහ වීමක් හෝ නැති බැවිනි; ඔව්හු ස්වර්ගයහෙි
දේව දූතයන් මනේ වති. 26 නික්ම 3:6තවෙද මළවුන්
නැඟිටුවනු ලැබීම ගැන, ‘මම ආබ්‍රහම්ගේ දවේයන්
වහන්සේ ය, ඊසාක්ගේ දවේයන් වහන්සේ ය,
ජාකොබ්ගේ දවේයන් වහන්සේ ය’යි දවේයන්
වහන්සේ මෝසසේට වදාළ බව ඔහුගේ පොතේ
ගිනිගත් පඳුර ගැන සඳහන් වන පාඨයහෙි ඔබ
කියවා නැද් ද? 27 උන් වහන්සේ මළවුන්ගේ
දවේයන් වහන්සේ නොව ජීවතුන්ගේ දවේයන්
වහන්සේ ය. ඔබ බොහෝ සේ මුළා ව ගොස්
ඇත.”

### ශ්‍රේෂ්ඨතම ආඥාව
(මතෞ 22:34-40;ලූක් 10:25-28)

28 ලූක් 10:25-28 විනයධරයන්ගනේ කනෙකේ
පැමිණ, ඔවුන් එකතු වී උන් වහන්සේ සමඟ විවාද
කරනු අසා, උන් වහන්සේ ඔවුන්ට මැනවින් පිළිතුරු
දුන් බව ද දැක, “සියලු ආඥා අතරනේ ශ්‍රේෂ්ඨතම
ආඥාව කිමකේ දැ”යි උන් වහන්සේගනේ ප්‍රශ්න
කළේ ය. 29 ද්වි.නී. 6:4-5ජේසුස් වහන්සේ උත්තර
දමෙින්, “ශ්‍රේෂ්ඨතම ආඥාව මේ ය: ‘ඉශ්රායලේ
වැසියනෙි, අසන්න, අපේ ස්වාමින් වන දවේයන්
වහන්සේ එක ම සමිඳාණන් වහන්සේ ය. 30 නුඹේ
මුළු හෘදයනේ ද නුඹේ මුළු ආත්මයනේ ද නුඹේ මුළු
බුද්ධියනේ ද නුඹේ මුළු වීර්යයනේ ද නුඹේ දවේ
ස්වාමින් වහන්සේට ප්‍රමේ කරන්න.’ 31 ලවේ
19:18දවෙැන්න මේ ය: ‘නුඹ නුඹට ම ප්‍රමේ
කරන්නාක් මනේ නුඹේ අසල්වැසියාට ප්‍රමේ
කරන්න.’ මයෙට වඩා ශ්‍රේෂ්ඨ අන් කිසි ආඥාවක්
නැතැ”යි වදාළ සේක. 32 ද්වි.නී. 4:35එවිට
විනයධරයා උන් වහන්සේට පිළිතුරු දමෙින්,
“ගුරුදේවයනෙි, එය සැබෑ ය. ‘උන් වහන්සේ එක ම
තැනැන් වහන්සේ ය’යි ඔබ කීවා හරි ය. උන්
වහන්සේ හැර අන් දවේ කනෙකේ නැත. 33 හොසි
6:6මුළු හෘදයනේ ද මුළු ආත්මයනේ ද මුළු බුද්ධියනේ
ද මුළු වීර්යයනේ ද උන් වහන්සේට ප්‍රමේ කිරීම
සහ තමාට මනේ ම තම අසල්වැසියාට ප්‍රමේ
කිරීම, දවන යාග පූජා හා වනෙත් පූජා සියල්ලට ම
වඩා ශ්‍රේෂ්ඨය”යි කීවේ ය. 34 ඔහු කොතරම්
තේරුම් පැහැදුම් ඇතුව පිළිතුරු දුන්නේ දැ යි ජේසුස්
වහන්සේ දැක “ඔබ දවේයන් වහන්සේගේ
රාජ්‍යයට නුදුරු ව සිටින්නහෙි ය”යි ඔහුට වදාළ
සේක. ඉන්පසු උන් වහන්සේගනේ කිසි ප්‍රශ්නයක්
අසන්න කිසිවකුෙට ධරෛයයක් නොවී ය.

### දාවිත්ගේ පුත්‍රයා මනේ ම ස්වාමීන් ද වන ක්‍රිස්තුස් වහන්සේ
(මතෞ 22:41-46;ලූක් 20:41-44)

35 ජේසුස් වහන්සේ දේව මාලිගාවහෙි අනුශාසනා
කරමින්, “ක්‍රිස්තුන් වහන්සේ දාවිත්ගේ පුත්‍රයා යයි
විනයධරයෝ කසෙේ කියත් ද? 36 ගීතා 110:1දාවිත්
ම ශුද්ධාත්මානුභාවයනේ කතා කරමින්:
q136 ‘මා ඔබ සතුරන් ඔබ පාද යට ලන තකේ මා
දකුණු පස අසුන් ගන්න කියා සමිඳාණෝ මා
සමිඳුන්ට වදාළ සේකැ’යි
36 කී ය. 37 දාවිත් උන් වහන්සේට ‘සමිඳුන්’ කියා
අමතයි. එසේ නම්, උන් වහන්සේ ඔහුගේ පුත්‍රයා
වන්නේ කසෙේ දැ”යි ඇසූ සේක. මහා ජනකායක්
උන් වහන්සේට සතුටින් සවන් දුන්හ.

### විනයධරයන් හට චෝදනා
(මතෞ 23:1-36;ලූක් 20:45-47)

38 උන් වහන්සේ සිය අනුශාසනාවේ දී කතා
කරමින්, “විනයධරයන්ගනේ පරස්සෙම් වන්න. ඔව්හු
දිග උතුරු සළු හැඳ සක්මන් කරන්න ද
වළෙඳපොළවල දී ගෞරවාචාර ලබන්න ද ප්‍රිය
වති; 39 ධර්මශාලාවල දී මූලාසනවලටත්, මංගල
භෝජනවල දී සම්භාවනීය ආසන ලබන්ටත් ප්‍රිය
වති; 40 වැන්දඹුවන්ගේ ගේදොර කාදමති;
පනෙුමට දිගින් දිගට යාච්ඤා කරති; මොවුහු වඩාත්
බරපතල දඬුවමක් ලබති”යි වදාළ සේක.

### වැන්දඹුවගේ පඬුර
(ලූක් 21:1-4)

41 උන් වහන්සේ දේව මාලිගාවේ මුදල් ගබඩාව
ඉදිරියේ වැඩ හිඳ සනෙඟ එයට මුදල් දමනු බලා
හුන් සේක. ධනපතීහු බොහෝ දනෙකේ බොහෝ
මුදල් දැමූ හ. 42 එක් දිළිඳු වැන්දඹුවක් අවුත්,
සතයක් පමණ වටිනා තඹ සල්ලි දකෙක් දැමුවා ය.
43 උන් වහන්සේ ශ්‍රාවකයන් තමන් වතෙ කැඳවා,
“සැබැවින් ම මම ඔබට කියමි, මේ දිළිඳු වැන්දඹුව

ගබඩාවට මුදල් දැමූ අනික් හැම දෙනාට ම
වැඩියෙන් දැමුවා ය. 44 ඒ කවුරුත් තමන්ගේ වැඩිපුර
මුදලින් යමක් දැමූ හ. එහෙත් මෑ, දුප්පත් ව සිටිය
දීත් සිය දිවිපවෙතෙ සඳහා තිබුණු මුළු වත්කම ම
දැමුවා ය"යි වදාළ සේක.

### දේව මාලිගාවේ විනාශය ගැන කලින් කීම

(මතෙ 24:1-2;ලූක් 21:5-6)

13 උන් වහන්සේ දේව මාලිගාවෙන් නික්ම යද්දී
ශ්‍රාවකයන්ගෙන් එක් කෙනෙක්,
"ගුරුදේවයෙනි, බලන්න! මොන තරම් විශාල ගල් ද,
මොන තරම් විශාල ගොඩනැඟිලි දැ!"යි උන්
වහන්සේට කී ය. 2 ජේසුස් වහන්සේ ඔහු අමතා,
"මේ විශාල ගොඩනැඟිලි ඔබට පෙනෙනවා නොවේ
ද? ගලක් මත ගලක් ඉතිරි නොවන සේ ඒවා බිඳ
හෙළෙනු ලැබේ ය"යි වදාළ සේක.

### පීඩාවල පෙර ලකුණු

(මතෙ 24:3-14;ලූක් 21:7-19)

3 උන් වහන්සේ දේව මාලිගාව ඉදිරියෙහි වූ ඔලීව
කන්දේ වැඩහුන් කල පේදුරු ද ජාකොබ් ද ජොහන්
ද ඇන්ඩෘ ද පෞද්ගලික ව උන් වහන්සේට කතා
කොට, 4 "මේ දේ කවදා සිදුවනු ඇද් ද? ඒ සියල්ල
ඉෂ්ට වන්න යන කල කුමන ලකුණක් ඇති වේ දැ
යි අපට කිව මැනවැ"යි කී හ.
5 ජේසුස් වහන්සේ ඔවුන්ට කතා කරන්න
පටන්ගෙන මෙසේ වදාළ සේක: "කිසිවකු ඔබ මුළා
නොකරන හැටියට බලාගන්න. 6 බොහෝ දෙනෙක්
මාගේ නාමයෙන් අවුත්, 'මම එතුමා ය' කියා
බොහෝ දෙන මුළා කරන්නාහ. 7 යුද්ධ ගැන ද යුද්ධ
පිළිබඳ දූසමාන ආරංචි ද ඔබ අසන කල
සන්ත්‍රාසයට පත් නොවන්න. මේ දේවල් සිදුවනු
ඒකාන්ත ය. එහෙත් අවසානය තව ම නැත. 8 මන්ද,
ජාතියක් ජාතියකට විරුද්ධ ව ද රාජ්‍යයක්
රාජ්‍යයකට විරුද්ධ ව ද නැඟී සිටිනු ඇත. නොයෙක්
තැන්හි භූමි කම්පා ඇති වේ. සාගත ද ඇති වේ.
මේ වූකලී නව යුගය බිහි කරවන ප්‍රසව
වේදනාවේ පටන්ගැන්ම ය.
9 මතෙ 10:17-20; ලූක් 12:11-12 "එහෙත් පරෙස්සම්
වන්න. ඔවුන් උසාවිවලට ඔබ පාවා දෙනු ඇත.
ධර්මශාලාවලට ගෙනවුත් ඔබට තළනු ඇත. ඔබ මා
නිසා, ආණ්ඩුකාරයන් ද රජුන් ද අබිමුවෙහි, ඔවුන්ට
සාක්ෂි වන පිණිස පෙනී සිටිනු ඇත. 10 පළමු කොට
සියලු ජාතීන් හට සුබ අස්න දේශනා කළ යුතු ය.
11 ඔවුන් ඔබ පාවා දෙන්න ගෙන යන කල කුමක්
කියන්න දැ යි කල් තියා කරදර නොවන්න. ඒ පැයේ
දී ම ඔබට දෙනු ලබන දයෙ කියන්න. මන්ද, කතා
කරන්නේ ඔබ නොව ශුද්ධාත්මයාණන් වහන්සේ ය.
12 තවද සහෝදරයා සහෝදරයා ද පියා දරුවා ද
මරණයට පාවා දෙනු ඇත. දරුවෝ මවුපියන්ට
විරුද්ධව නැඟී සිට ඔවුන් මරණයට පත් කරන්නෝ
ය. 13 මතෙ 10:22මාගේ නාමය නිසා සියල්ලන් ම
ඔබට වෛර කරනු ඇත. එහෙත්, අග දක්වා ම
ස්ථිරව සිටින්නා ගළවනු ලැබේ."

### බිහිසුණු දුක් ගාවිනා

(මතෙ 24:15-28;ලූක් 21:20-24)

14 දානි 9:27; 11:31; 12:11 "තවද, 'බිහිසුණු දූෂිතය'
එයට නොහිමි තැන සිටිනු ඔබ යම් කලෙක
දකින්නහු ද, (පාඨකයා තේරුම් ගනී වා), එකල
ජුදයෙහි සිටින අය කඳුවලට පලා යත් වා. 15 ලූක්
17:31පියස්ස මත සිටින්නා පහතට නොබසී වා; තම
ගෙයින් කිසිවක් ගන්නා පිණිස එහි ඇතුළු නොවේ
වා. 16 කෙතෙහි සිටින්නා තම උතුරු සළුව ගැනීමට
පෙරළා නොයේ වා; 17 අහෝ, ඒ දවස්වල දී
ගර්භණීන්ට ද කිරි දෙන මවුවරුන්ට ද ඇති වන
විපතක මහත! 18 හේමන්තයේ දී මෙය සිදු
නොවන පිණිස යාච්ඤා කරන්න. 19 දානි 12:1; එළිද
7:14මන්ද, දෙවියන් වහන්සේ මැවූ ලෝකයේ
පටන්ගැන්මේ සිට මේ දක්වා නුවූ විරූ, මතු ද
නොවන විරූ, දුක් පීඩා ඒ දවස් වල දී පැමිණෙන
බැවිනි. 20 සමිඳාණන් වහන්සේ විසින් ඒ කාලය
කෙටි නොකරන ලද්දේ නම්, කිසිවකේ ගළවනු
නොලබන්නෝ ය. එහෙත්, උන් වහන්සේ තෝරා
වෙන් කොට ගත් අය වෙනුවෙන් ඒ කාලය කෙටි
කළ සේක.
21 "එකල, 'බලන්න, ක්‍රිස්තුන් වහන්සේ මෙහි ය;
බලන්න, එහි ය'යි යමෙකු ඔබට කීවොත් විශ්වාස
නොකරන්න. 22 මක්නිසා ද බොරු ක්‍රිස්තුවරයන් ද
බොරු දිවැසිවරයන් ද පහළ වී, හැකි නම්,
තෝරාගත් අය මුළා කරන පිණිස හාස්කම් හා
අරුමපුදුම දේ දක්වනු ඇත. 23 එහෙත් සෝදිසියෙන්
සිටින්න! මම කල් තියා සියල්ල ඔබට කීවෙමි."

### මනුෂ්‍ය-පුත්‍රයාණන්ගේ පුනරාගමනය

(මතෙ 24:29-31;ලූක් 21:25-28)

24 යෙසා 13:10; එසකි 32:7; ජෝවෙ 2:10,31; 3:15;
එළිද 6:12 "තවද, ඒ දවස්වල දී දුක් ගාවිනාවලින්
පසු ව, හිරු මඬල අඳුරු වන්නේ ය; සඳ මඬල එළිය
නොදෙන්නේ ය. 25 යෙසා 34:4; ජෝවෙ 2:10; එළිද
6:13අහසින් තාරකාවෝ පතිත වන්නාහ; අහසේ
බලපරාක්‍රමයෝ චංචල වන්නාහ. 26 දානි 7:13;
එළිද 1:7එකල මනුෂ්‍ය-පුත්‍රයාණන් මහා
බලපරාක්‍රමයෙන් හා තේජශ්‍රියෙන් විරාජමාන ව,
වලාකුළු මත වඩිනු ඔව්හු දකිති. 27 එවිට උන්
වහන්සේ තම දූතයන් යවා පොළොවේ සීමාන්තයේ
පටන් අහසේ සීමාන්තය දක්වා සිවු දිගින් තමන්
වහන්සේ තෝරාගත් අය රැස් කරනු ඇත."

### අත්තික්කා ගසෙන් පාඩමක්

(මතෙ 24:32-35;ලූක් 21:29-33)

28 "අත්තික්කා ගසෙන් පාඩමක් ඉගෙනගන්න. එහි
ළපටි අතු මතු වී, කොළ ලියලන කල ගිම්හානය
ළඟ බව ඔබ දන්නහු ය. 29 එලෙසෙ ම මේ දෙය සිදු
වනු ඔබ දකිත් ම, උන් වහන්සේ දොරකඩ ළඟ ම

ය යි දැනගන්න. 30 සැබැවින් ම මම ඔබට කියමි, ඒ
සියල්ල සිදු වන තෙක් මේ පරම්පරාව පහ ව
නොයන්නේ ය. 31 අහසත් පොළොවත් පහ ව
යන්නේ ය, එහෙත් මාගේ වචනය කිසි දා පහ ව
නොයන්නේ ම ය."

### අවදි ව සිටීම
(මතෙ 24:36-44)

32 මතෙ 24:36 "ඒ දිනය පිළිබඳ ව හෝ ඒ පැය
පිළිබඳ ව හෝ කිසිවෙක් නොදනිති; ස්වර්ගයෙහි
දූතයෝ වත්, පුත්‍රයාණෝ වත් නොදනිති; එය
දන්නේ පියාණන් වහන්සේ පමණක් ය. 33 නියමිත
මොහොත කවදා දැ යි ඔබ නොදන්න බැවින්,
පරෙස්සම් වන්න, අවදි ව ඉන්න. 34 ලූක් 12:36-38ඒ
වනාහි සිය දාසයන්ට බලය ද එකිනෙකාට තම
තමන්ගේ වැඩ ද පවරා, 'අවදි ව ඉන්නැ'යි දොරටු
පාලයාට අණ දී සිය නිවසින් පිට වී ගමනක
යෙදෙන මනුෂ්‍යයෙකුගේ ආපසු පැමිණීම හා සමාන
ය. 35 ඒ ගෘහපතියා කොයි වේලේ එයි ද, සවස ද
මධ්‍යම රාත්‍රියේ ද කුකුළා හඬලන වේලේ ද
අලුයම දැ යි, ඔබ නොදන්නා හෙයින්, 36 ඔහු
හදිසියෙන් අවුත් ඔබ නිදා හිඳිනු නොදක්නා පිණිස,
අවදි ව සිටින්න. 37 ඔබට කියන දෙය හැමට ම
කියමි, අවදි ව සිටින්න."

### ජේසුස් වහන්සේ නැසීමට කුමන්ත්‍රණය
(මතෙ 26:1-5;ලූක් 22:1-2;ජොහ 11:45-53)

14 නික්ම 12:1-27 පාස්කුවට ද නුමුහුන් රොටි
මංගල්‍යයට ද ඇත්තේ තව දෙදවසකි.
නායක පූජකවරු ද විනයධරයෝ ද උන් වහන්සේ
අල්ලා මැරීමට කපටි උපායක් සෙවූ හ. 2 "එහෙත්,
සෙනඟ අතර කලකෝලාහල ඇති නොවන පිණිස
මංගල්‍යයේ දී එය සිදු නොකරමු"යි ඔව්හු කී හ.

### බෙතානියේ දී ආලේප කරනු ලැබීම
(මතෙ 26:6-13;ජොහ 12:1-8)

3 ලූක් 7:37-38 උන් වහන්සේ බෙතානියෙහි ලාදුරු
රෝගී සීමොන්ගේ ගෙදර කෑමට හිඳගෙන සිටිය දී,
එක් ස්ත්‍රියක් ඉතා අගනා සුපිරිසිදු සුවඳ විලවුන්
පිරුණු කිරිගල් කරඬුවක් ගෙන'වුත්, එය බිඳ උන්
වහන්සේගේ හිස මත ඒ සුවඳ විලවුන් වත් කළා
ය. 4 එහෙත් එහි සිටි ඇතැමෙක් කෝප වී, "මේ
විලේපනය නාස්ති කළේ කුමට ද? 5 මේ
විලේපනය රිදී කාසි තුන්සියයකට වැඩියෙන් විකුණා,
ඒ මුදල දිළිඳුන්ට දිය හැකි ව තිබුණේ ය"යි තම
තමන් අතර කියාගනිමින් ඇට බැණ වැදුණෝ ය.
6 එහෙත් ජේසුස් වහන්සේ කතා කොට, "ඇට
නිකම් ඉන්න දෙන්න, ඇට කරදර කරන්නේ මන් ද?
ඈ මා හට කළේ මනහර දෙයකි. 7 ද්වි.නී.
15:11දුගීහු ඔබ සමඟ හැම දා ම සිටිති. ඔබ කැමැති
හැම විටක ම ඔවුන්ට යහපත කරන්න ඔබට
පුළුවන. එහෙත්, මම හැම දා ම ඔබ සමඟ
නොසිටිමි. 8 ඇයට හැකි දෙය ඈ කළා ය. තැන්පත්
කිරීම සඳහා, කල්තියා, ඈ මාගේ සිරුර ආලේප කර
ඇත. 9 සැබැවින් ම මම ඔබට කියමි, සුබ අස්න
ලොව පුරා දේශනා කරනු ලබන හැම තැන්හි ම
මේ ස්ත්‍රියගේ මේ ක්‍රියාව ද ඇය ගැන සැමරුමක්
වශයෙන් කියනු ලැබේ ය"යි වදාළ සේක.

### ජූදස්ගේ ද්‍රෝහි ක්‍රියාව
(මතෙ 26:14-16;ලූක් 22:3-6)

10 දොළොස් දෙනාගෙන් එක් කෙනෙකු වූ ජූදස්
ඉස්කාරියොත් ජේසුස් වහන්සේ නායක පූජකවරුන්ට
පාවා දෙනු පිණිස ඔවුන් වෙතට ගියේ ය. 11 ඔව්හු
එපවත් අසා තුටුපහටු වී ඔහුට මුදල් දෙන්නට
පොරොන්දු වූහ. එවිට ඔහු උන් වහන්සේ පාවා
දෙන්න සුදුසු අවස්ථාවක් සෙව් ය.

### ශ්‍රාවකයන් සමඟ පාස්කු භෝජනය වැළඳීම
(මතෙ 26:17-25;ලූක් 22:7-14-21-23;ජොහ 13:21-30)

12 පාස්කු බැටළු පෝතකයා පූජා කරනු ලබන,
නුමුහුන් රොටි මංගල්‍යයේ පළමු වන දින උන්
වහන්සේගේ ශ්‍රාවකයෝ, "පාස්කු භෝජනය
වළඳන පිණිස අප ගොස් කොතැන පිළියෙළ
කරනවාට ඔබ කැමැති සේක් දැ"යි උන්
වහන්සේගෙන් ඇසූ හ. 13 එවිට උන් වහන්සේ තම
ශ්‍රාවකයන් දෙදෙනෙකු යවමින්, "නුවරට යන්න; ගිය
විට, වතුර කළයක් ගෙන යන මිනිසෙක් ඔබට හමු
වන්නේ ය; ඔහු පස්සේ යන්න. 14 ඔහු යම්
ගෙදරකට ඇතුළු වන්නේ ද ඒ ගෙහිමියාට කතා
කොට, 'මාගේ ශ්‍රාවකයන් සමඟ පාස්කු භෝජනය
වළඳන පිණිස මට වෙන් කළ කාමරය කොයි ද කියා
සමිඳාණන් වහන්සේ අසන සේකැ'යි කියන්න.
15 එවිට සකස් කොට සූදානම් ව ඇති ලොකු
උඩුමහල් කාමරයක් ඔහු ඔබට පෙන්වනු ඇත. එහි
අපට පාස්කු භෝජනය පිළියෙළ කරන්නැ"යි ඔවුන්ට
වදාළ සේක. 16 ශ්‍රාවකයෝ පිටත් ව නුවරට ගියහ.
උන් වහන්සේ ඔවුන්ට කී ලෙස සියල්ල ම සම්බ
වීය; ඔව්හු ද පාස්කු භෝජනය පිළියෙළ කළහ.
17 සවස් වූ කල උන් වහන්සේ දොළොස් දෙනා
කැටුව වැඩිය සේක. 18 ගීතා 41:9ඔවුන් වාඩි වී
භෝජන වළඳමින් සිටිය දී ජේසුස් වහන්සේ,
"සැබැවින් ම මම ඔබට කියමි, ඔබෙන් එක්
කෙනෙක්; මා හා සමඟ වළඳන කෙනෙක්; මා පාවා
දෙන්නේ ය"යි වදාළ සේක. 19 ඔව්හු දුක් වන්නට ද,
එක් එක්කෙනා "ඒ මම දැ"යි උන් වහන්සේගෙන්
අසන්නට ද පටන්ගත්හ. 20 උන් වහන්සේ ද පිළිතුරු
දෙමින්, "ඒ තැනැත්තා දොළොස් දෙනාගෙන් එක්
කෙනෙක් ය; මා සමඟ එක පාත්‍රයෙහි අත ලන
තැනැත්තේ ය. 21 ශුද්ධ ලියවිල්ලෙහි තමන් ගැන
ලියා තිබෙන ලෙස ම මනුෂ්‍ය-පුත්‍රයාණෝ නියමිත
ගමන යන සේක් ම ය; එහෙත් මනුෂ්‍ය-පුත්‍රයාණන්
පාවා දෙන යම් මිනිසෙක් වේ ද ඔහුට වන විපතක
මහත! ඒ මිනිසා නූපන්නේ නම් වඩා හොඳ ය"යි
වදාළ සේක.

## අන්තිම රාත්‍රි භෝජනය
(මතෙ 26:26-30;ලූක් 22:14-20;1 කොරි 11:23-25)

22 ඔවුන් ආහාර වළඳමින් සිටිය දී උන් වහන්සේ
රොටි ගෙන, ආශීර්වාදය පවසා, ඒවා කඩා ඔවුන්ට
දී, “ගන්න, මේ මාගේ ශරීරය ය”යි වදාළ සේක.
23 උන් වහන්සේ කුසලානක් ද ගෙන, තුති පුදා,
ඔවුන්ට දුන් සේක. සියල්ලෝම එයින් පානය කළහ.
24 නික්ම 24:8; ජෙරෙ 31:31-34තවද උන් වහන්සේ
ඔවුන්ට කතා කොට, “මෙය බොහෝ දෙනා
වෙනුවෙන් වගුරුවනු ලබන මාගේ ගිවිසුම්-රුධිරය
වේ. 25 සැබැවින් ම මම ඔබට කියමි, දෙවියන්
වහන්සේගේ රාජ්‍යයෙහි දී මම නැවත මිදියුස
පානය කරන දිනය එන තෙක්, මම මේ මිදියුස
යළිත් පානය නොකරන්නෙමි”යි වදාළ සේක.
26 ඔව්හු ගීතයක් ගයා ඔලීව කන්දට නික්ම ගියහ.

## පේදුරුගේ අපලාපය ගැන කලින් කීම
(මතෙ 26:31-35;ලූක් 22:31-34;ජොහ 13:36-38)

27 සෙකරි 13:7 තවද, ජේසුස් වහන්සේ කතා
කරමින්, “ඔබ හැම දෙන ම පැකිළෙන්නෙහු ය; මන්ද,
‘මම එඬේරාට පහර දෙන්නෙමි. එවිට බැටළුවෝ
විසුරුවනු ලබන්නෝ ය’යි ලියා තිබේ. 28 මතෙ
28:16කෙසේ වුව ද උත්ථාන කරනු ලැබූ පසු, මම
ඔබට පෙරටුව ගලීලයට යන්නෙමි”යි ඔවුන්ට වදාළ
සේක. 29 පේදුරු කතා කොට, “අන් හැම දෙනා ම
අධෛර්යයට පත් වුණත්, මම නම් එසේ
නොවන්නෙමි”යි උන් වහන්සේට කී ය. 30 ජේසුස්
වහන්සේ ද, “සැබැවින් ම මම ඔබට කියමි. අද ම,
මේ රාත්‍රියේ දී ම කුකුළා දෙ වරක් හඬලන්න
පෙර, මා හඳුනන්නේ නැතැ යි ඔබ තෙ වරක්
කියන්නෙහි ය”යි ඔහුට වදාළ සේක. 31 එහෙත්,
ඔහු “මට ඔබ වහන්සේ සමඟ මැරෙන්න සිදු වුණත්
‘ඔබ නාඳුනමි’යි කියන්නේ ම නැතැ”යි තරයේ ම
කියා සිටියේ ය. සෙසු සියල්ලෝ ද එසේ ම කී හ.

## ගෙත්සෙමනෙහි යාච්ඤාව
(මතෙ 26:36-46;ලූක් 22:39-46)

32 ශ්‍රාවකයෝ ගෙත්සෙමනෙ නම් වූ තැනට
පැමිණියෝ ය. උන් වහන්සේ ද, “මා යාච්ඤා කරන
අතර, ඔබ මෙහි සිටින්නැ”යි ශ්‍රාවකයන්ට වදාළ
සේක. 33 උන් වහන්සේ පේදුරු ද ජාකොබ් ද
ජොහන් ද කැඳවාගෙන ගිය සේක. ඉන්පසු උන්
වහන්සේ අතිශයින් බියපත් වන්න ද ශෝක වන්න
ද පටන් ගත් සේක. 34 උන් වහන්සේ ඔවුන් අමතා,
“මැරෙණ තරමට මාගේ සිත අතිශයින් ශෝකාකූල
ය; මෙහි නැවතී අවදි ව සිටින්න” කියා, 35 මඳක්
පෙරට ගොස් මුණින්තලා වී, හැකි නම්, ඒ පැය
තමන් කෙරෙන් පහ ව යන ලෙස යාච්ඤා කරමින්,
36 “අබ්බා, පියාණෙනි, ඔබට සියල්ලක් ම හැකි ය;
මේ කුසලාන මා කෙරෙන් ඉවත් කළ මැනව; එහෙත්
මාගේ කැමැත්ත නොව, ඔබගේ කැමැත්ත වේ
වා”යි වදාළ සේක.

37 පසුව උන් වහන්සේ අවුත්, ඔවුන් නිදා හිඳිනු
දැක, පේදුරු අමතා, “සීමොන් ඔබ නිදි ද? පැයක්
වත් අවදි ව ඉන්න ඔබට නොහැකි වූයේ ද?
38 පරීක්ෂාවට නොවැටෙන පිණිස අවදි ව හිඳ
යාච්ඤා කරන්න; හිත නම් කැමැතිය, එහෙත් ගත
නම් දුබලය”යි වදාළ සේක.
39 උන් වහන්සේ යළිත් ගොස් එම වචන ම
පවසමින් යාච්ඤා කළ සේක. 40 ඉන්පසු නැවතත්
හැරී අවුත් ඔවුන් නිදා හිඳිනු දුටු සේක. ඔවුන්ගේ
ඇස් නිදිබර ව තිබිණි. උන් වහන්සේට කුමන
පිළිතුරක් දෙන්නේ දැ යි ඔව්හු නොදත්හ.
41 උන් වහන්සේ තෙ වන වරත් අවුත් ඔවුන්
අමතමින්, “තවමත් නිදි ද? තවමත් විවේකයෙන් ද?
ඉතින් ඇති; නියමිත මොහොත පැමිණ තිබේ;
මෙන්න, මනුෂ්‍ය-පුත්‍රයාණෝ පව්ටුන්ගේ අත්වලට
පාවා දෙනු ලබන සේක; 42 නැඟිටින්න; අපි යමු;
මෙන්න මා පාවා දෙන්නා ළඟ ම ය”යි වදාළ සේක.

## ජේසුස් වහන්සේ පාවා දෙනු ලැබීම
(මතෙ 26:47-56;ලූක් 22:47-53;ජොහ 18:3-12)

43 ජේසුස් වහන්සේ කතා කරමින් සිටිය දී,
දොළොස් දෙනාගෙන් කෙනෙකු වූ ජූදස් ද ඔහු
කැටුව නායක පූජකවරු ද විනයධරයන් හා ප්‍රජා
මූලිකයන් විසින් එවන ලද සමූහයක් ද කඩු මුගුරු
රැගෙන ආහ. 44 “මම යමකු සිඹිම් ද ඒ ඔබ
සොයන තැනැත්තා ය. ඔහු අල්ලා පරෙස්සමින් ගෙන
යන්න” කියා උන් වහන්සේ පාවා දෙන්නා ඔවුන්ට
ලකුණක් දී තිබිණි.
45 ජූදස් අවුත් වහා ම උන් වහන්සේ වෙත ගොස්,
“රබ්බි” කියා උන් වහන්සේ සිඹගත්තේ ය. 46 ඔව්හු
උන් වහන්සේ අල්ලාගෙන අත්අඩංගුවට ගත්හ.
47 ළඟ සිටි අයගෙන් කෙනෙක් කඩුව ඇද මහා
නායක පූජකවරයාගේ දාසයාට ගසා ඔහුගේ කන
කපාලී ය. 48 ජේසුස් වහන්සේ ඔවුන්ට උත්තර
දෙමින්, “ඔබ සොරෙකුට විරුද්ධ ව මෙන් කඩු මුගුරු
ගෙන මා අල්ලන්න ආවාහු ද? 49 ලූක් 19:47;
21:37මම දිනපතා ම දේව මාලිගාවෙහි අනුශාසනා
කරමින් ඔබ සමඟ සිටියෙමි; එහෙත් ඔබ මා අල්ලා
නොගත්තහු ය; මෙසේ වන්නේ ශුද්ධ ලියවිල්ලේ
ලියා ඇති දේ සම්පූර්ණ වන පිණිස ය”යි වදාළ
සේක. 50 එවිට සියල්ලෝ ම උන් වහන්සේ හැරපියා
පලා ගියහ.

## පලා ගිය තරුණයා

51 සිහින් හණ රෙද්දක් පමණක් පොරවාගත්
තරුණයෙකු උන් වහන්සේ පසුපස්සේ ගියේ ය.
ඔව්හු ඔහු අල්ලාගත්හ. 52 එහෙත්, ඔහු ඒ රෙද්ද
හැර දමා නග්න ව පලා ගියේ ය.

### ජේසුස් වහන්සේ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියෙහි සිටීම
(මතෙ 26:57-68;ලූක් 22:54-55-63-71;ජොහ 18:13-14-19-24)

53 ඔව්හු ජේසුස් වහන්සේ උත්තම පූජකයා වෙත
ගෙන ගියහ. සියලු නායක පූජකවරු ද ප්‍රජා
මූලිකයෝ ද විනයධරයෝ ද එහි රැස් වූ හ.
54 පේදුරු ද උත්තම පූජකයාගේ මළුව දක්වා ම
දුරින් උන් වහන්සේ පසුපස්සේ ගියේ ය. ඔහු මුර
සේවකයන් සමඟ වාඩි වී ගිනි තපිමින් සිටියේ ය.
55 නායක පූජකවරු ද මුළු ශ්‍රේෂ්ඨාධිකරණය ද
ජේසුස් වහන්සේ මරණයට පත් කරවන පිණිස උන්
වහන්සේට විරුද්ධ ව සාක්ෂි සෙව්වූ හ. එහෙත්, කිසි
සාක්ෂියක් සම්බ නො වී ය. 56 බොහෝ දෙනෙකු
උන් වහන්සේට විරුද්ධ ව බොරු සාක්ෂි කී නමුත්,
ඔවුන්ගේ සාක්ෂි එකට එකක් නොගැළපිණි.
57 එවිට සමහරු ඉදිරිපත් වී උන් වහන්සේට
විරුද්ධ ව බොරු සාක්ෂි කියමින්, 58 ජොහ 2:19“
‘මිනිස් අතින් තැනූ මේ දේව මාලිගාව බිඳදමා අතින්
නොතැනූ අනිකක් මම තෙ දිනකින් ගොඩනඟමි’යි
මොහු කියනු අපි ඇසීමු”යි කී හ. 59 එහෙත්, මේ
ලෙසින් ද ඔවුන්ගේ සාක්ෂි එකට එක විරුද්ධ විය.
60 උත්තම පූජකයා ද ඔවුන් ඉදිරියෙහි නැඟිට,
“ඔබ පිළිතුරක් දෙන්නේ නැද් ද? මොවුන් ඔබට
විරුද්ධ ව ගෙනෙන සාක්ෂි මොනවා දැ”යි ජේසුස්
වහන්සේගෙන් ඇසී ය. 61 එහෙත්, ජේසුස් වහන්සේ
නිශ්ශබ්ද ව කිසි පිළිතුරක් නොදී සිටි සේක. යළිත්
උත්තම පූජකයා කතා කොට, “ඔබ
ක්‍රිස්තුවරයාණෝ ද? ආශීර්වාදිතයාණන්ගේ
පුත්‍රයාණෝ දැ”යි උන් වහන්සේගෙන් ඇසී ය.
62 දානි 7:13ජේසුස් වහන්සේ ද, “එසේ ය, තවද
මනුෂ්‍ය-පුත්‍රයාණන් බලපරාක්‍රමයාණන්ගේ දකුණු
පස වැඩහිඳිනවාත්, අහසේ වලාකුළු පිරිවරා
වඩිනවාත් ඔබ හැම දකිනු ඇතැ”යි වදාළ සේක.
63 එකල උත්තම පූජකයා තම සළුව ඉරාගෙන,
“තවත් සාක්ෂිකරුවන්ගෙන් අපට මොන වැඩක් ද?
64 ලෙවී 24:16දේවාපහාසය ඔබට ම ඇසුණේ ය;
ඔබේ තීරණය කිමෙක් දැ”යි ඇසුවේ ය. සියල්ලෝ
ම ඒකමතික ව උන් වහන්සේ මරණයට සුදුස්සෙකැ
යි එකහෙළා තීරණය කළහ.
65 එකල ඇතැමෙක් උන් වහන්සේට කෙළ
ගසන්නට ද උන් වහන්සේගේ මුහුණ වසා අතින්
පහර දෙමින්, “ඉතින් දිවැසින් කියන්නැ”යි උන්
වහන්සේට කියන්නට ද පටන්ගත්හ. මුර
සේවකයෝ ද උන් වහන්සේ භාරගෙන, අතුල් පහර
දුන්හ.

### පේදුරුගේ අපලාපය
(මතෙ 26:69-75;ලූක් 22:56-62;ජොහ 18:15-18-25-27)

66 පේදුරු, පහළ මළුවේ සිටිය දී, උත්තම
පූජකයාගේ එක් සේවිකාවක් අවුත් 67 පේදුරු ගිනි
තපිනු දැක ඔහු දෙස හොඳින් බලා, “ඔබත්
නාසරතේහි ඒ ජේසුස් සමඟ සිටියෙහි ය”යි කීවා ය.
68 ඔහු අපලාප කරමින්, “ඔබ කියන දේ කුමක් දැ
යි මම නොදනිමි, මට නොතේරේ” කියා නික්ම,
ද්වාර මණ්ඩපයට ගියේ ය. එකල කුකුළා හැඬලී ය.
69 ඒ තරුණිය නැවතත් ඔහු දැක, “මොහු
ඔවුන්ගෙන් කෙනෙකැ”යි ළඟ සිටියවුන්ට කියන්නට
පටන් ගත්තා ය. 70 එහෙත් ඔහු යළිත්, “නැතැ”යි
කීවේ ය. මඳ වේලාවකට පසු නැවතත් ළඟ සිටි
අය, “සැබැවින් ම ඔබ ඔවුන්ගෙන් එක් කෙනෙක් ම
ය, ඔබත් ගලීලයෙක් ම ය”යි පේදුරුට කී හ.
71 එහෙත් ඔහු, “ඔබ කියන ඒ මනුෂ්‍යයා මම
නාඳුනමි”යි කියමින් තමාට ම සාප කරගන්නට ද
දිවුරන්නට ද පටන්ගත්තේ ය. 72 එකෙණෙහි ම
කුකුළා දෙ වන වර හැඬලී ය. පේදුරු ද, “කුකුළා දෙ
වරක් හඬලන්නට පළමු, ‘ඔහු නාඳුනමි’යි ඔබ තෙ
වරක් මා ගැන කියන්නෙහි ය”යි ජේසුස් වහන්සේ
තමාට පැවසූ කීම සිහි කොට මහ හඬින් හැඬී ය.

### ජේසුස් වහන්සේ පිලාත් ඉදිරියෙහි සිටීම
(මතෙ 27:1-2-11-14;ලූක් 23:1-5;ජොහ 18:28-38)

15 පහන් වූ කෙණෙහි ම නායක පූජකවරු,
ප්‍රජා මූලිකයන් ද විනයධරයන් ද මුළු
ශ්‍රේෂ්ඨාධිකරණය ද සමඟ මන්ත්‍රණය කොට
ජේසුස් වහන්සේට විලංගුදමා ගෙන ගොස්, පිලාත්
හට භාර දුන්හ. 2 පිලාත් ද, “ජුදෙව්වරුන්ගේ රජ
ඔබ දැ”යි උන් වහන්සේගෙන් ප්‍රශ්න කළේ ය.
උන් වහන්සේ උත්තර දෙමින්, “එසේ කියන්නේ ඔබ
ය”යි වදාළ සේක. 3 නායක පූජකවරු බොහෝ දේ
ගැන උන් වහන්සේට චෝදනා කළහ. 4 පිලාත්
නැවත කතා කොට, “ඔබ කිසි ම පිළිතුරක් දෙන්නේ
නැද් ද? බලන්න, මොවුහු ඔබට කෙතරම් චෝදනා
කරත් දැ”යි උන් වහන්සේට කී ය. 5 එහෙත්, ජේසුස්
වහන්සේ ඉන්පසු කිසි පිළිතුරක් නුදුන් සේක. ඒ
ගැන පිලාත් ද මවිත විය.

### ජේසුස් වහන්සේට මරණීය දඬුවම
(මතෙ 27:15-26;ලූක් 23:13-25;ජොහ 18:39;19:16)

6 මංගල්‍යයේ දී සෙනඟ ඉල්ලා සිටින සිරකරුවෙකු
නිදහස් කරදීම, පිලාත්ගේ සිරිත විය. 7 කැරලි
කෝලාහල කොට, මිනී මැරීමේ වරදට හිර කරනු
ලැබූ කැරලිකරුවන් අතර බරබ්බස් නම් කෙනෙක්
විය. 8 සමූහයා එක් ව ගොස්, පරෙසිරිත ඉටු කරන
ලෙස පිලාත්ගෙන් අයැදින්නට පටන්ගත්හ. 9 පිලාත්
උත්තර දෙමින්, “මා ජුදෙව්වරුන්ගේ රජු නිදහස් කර
දෙනවාට ඔබ කැමැති දැ”යි ඔවුන්ගෙන් ඇසී ය.
10 එසේ කළේ, නායක පූජකවරුන් ඊර්ෂ්‍යාවෙන්
උන් වහන්සේ පාවා දුන් බව ඔහුට වැටහී තිබුණු
බැවිනි. 11 එහෙත්, උන් වහන්සේ වෙනුවට බරබ්බස්
නිදහස් කර දෙන ලෙස ඉල්ලන්න නායක පූජකවරු
ජනයා පෙළෙඹවූ හ. 12 පිලාත් ඔවුන්ට නැවත පිළිතුරු
දෙමින්, “එසේ නම්, ‘ජුදෙව්වරුන්ගේ රජ ය’යි ඔබ
කියන මොහු ගැන කුමක් කරන්න දැ”යි ඇසී ය.
13 “කුරුසියෙහි ඇණ ගසන්නැ”යි ඔව්හු යළිත්
මොරගැසූ හ. 14 එකල පිලාත්: “කිමෙක් ද? මොහු

කුමන අපරාධයක් කළේ දැ”යි ඔවුන්ගෙන් ඇසී ය.
එහෙත් ඔව්හු “කුරුසියෙහි ඇණ ගසන්නැ”යි වැඩි
වැඩියෙන් මොරගැසූ හ. 15 පිලාත් ජනතාව සතුටු
කරන්නට කැමැති ව, බරබ්බස් ඔවුන්ට නිදහස් කර
දී, ජේසුස් වහන්සේට කසයෙන් තළවා, කුරුසියෙහි
ඇණ ගසනු පිණිස භාර දුන්නේ ය.

### සබෙළුන්ගෙන් නිග්‍රහ
(මතෙ 27:27-31;ජොහ 19:2-3)

16 මුර සබෙළෝ උන් වහන්සේ ප්‍රතෝරියම් නම්
රජ වාසලට ගෙන ගොස් මුළු සේනාංකය රැස් කරවූ
හ. 17 ඔව්හු උන් වහන්සේට නීල-රක්ත වස්ත්‍රයක්
හඳවා, කටු කිරුළක් ගොතා උන් වහන්සේගේ හිස
මත තබා, 18 “ජුදෙව්වන්ගේ රජුනි, සැරදේ!” කියා
උන් වහන්සේට ආචාර කරන්න පටන් ගත්හ.
19 ඔව්හු බට දණ්ඩකින් උන් වහන්සේගේ හිසට
ගසා, උන් වහන්සේට කෙළ ගසා, දණ නමා උන්
වහන්සේ ඉදිරියෙහි වැඳ වැටුණාහ. 20 උන්
වහන්සේට ගැරහුම් කළ පසු ඔව්හු නීල-රක්ත
වස්ත්‍රය ගලවා, උන් වහන්සේගේ ම ඇඳුම් අන්දවා,
කුරුසියෙහි ඇණ ගසනු පිණිස ගෙන ගියහ.

### කුරුසියේ ඇණ ගැසීම
(මතෙ 27:32-44;ලූක් 23:26-43;ජොහ 19:17-27)

21 රෝම 16:13 අලෙක්සන්දර්ගේ ද රූපස්ගේ ද
පිය වූ පිටිසරින් ආ සිරේනියේ සීමොන් නම්
මිනිසෙකුට උන් වහන්සේගේ කුරුසිය උසුලාගෙන
යන්න ඔව්හු බල කළහ. 22 ඔව්හු කපාලපිටිය යන
අර්ථ ඇති ‘ගොල්ගොතා’ නම් තැනට උන් වහන්සේ
ගෙන ගියහ. 23 සුවඳලාටු මුසු මුද්‍රික පානය උන්
වහන්සේට දෙන ලද්දේ ය. එහෙත්, උන් වහන්සේ
එය නොපිළිගත් සේක. 24 ගීතා 22:18ඔව්හු උන්
වහන්සේ කුරුසියෙහි ඇණ ගසා, උන් වහන්සේගේ
ඇඳුම් තම තමන් අතර බෙදාගනිමින්, එක්
එක්කෙනා කුමක් ගන්න දැ යි බලන පිණිස ඒවා
ගැන දාදු දැමූ හ. 25 ඔවුන් උන් වහන්සේ කුරුසියෙහි
ඇණ ගැසුවේ හිරු උදා වී තුන් පැයකට පසුව ය.
26 “ජුදෙව්වරුන්ගේ රජ ය”යි උන් වහන්සේ පිළිබඳ
චෝදනා පුවරුව ලියා තිබිණි. 27 තවද, ඔව්හු
සොරුන් දෙදෙනෙකු එක් කෙනෙකු දකුණු පසෙහි ද
එක් කෙනෙකු වම් පසෙහි ද උන් වහන්සේ සමඟ
කුරුසියෙහි ඇණ ගැසූ හ. 28 යෙසා 53:12‘උන්
වහන්සේ අපරාධකරුවන් සමඟ ගණන්ගනු ලැබූ
සේක’ යන ශුද්ධ ලියවිල්ල මෙසේ ඉටු විය.
29 ගීතා 22:7; 109:25; මාක් 14:58; ජොහ 2:19
මඟ යන අය හිස් වන වනා උන් වහන්සේට අපහාස
කරමින්, “හහා! දේව මාලිගාව වනසාදමා
තදිනකින් එය ගොඩනගන 30 ඔබ ම, ගැළවී
කුරුසියෙන් බැස එන්නැ”යි කී හ. 31 එලෙසෙ ම
නායක පූජකවරු විනයධරයන් සමඟ තම තමන්
අතර උන් වහන්සේට කවටකම් කරමින්, “මොහු
අනුන් ගැළවී ය, එහෙත් තමා ම ගළවාගන්නට
මොහුට නොහැකි ය. 32 අප විසින් දැක අදහන
පිණිස, ඉශ්රායලේහි රජ වන ක්‍රිස්තුස් දැන්
කුරුසියෙන් බසින්නැ”යි කී හ. උන් වහන්සේ සමඟ
කුරුසියෙහි ඇණ ගසනු ලැබුවෝ ද උන් වහන්සේට
ගැරහුම් කළහ.

### ජේසුස් වහන්සේගේ මරණය
(මතෙ 27:45-56;ලූක් 23:44-49;ජොහ 19:28-30)

33 මද්දහනේ දී රට පුරා අන්ධකාරයක් පහළ විය.
එය සවස තුන වන තෙක් පැවතිණි. 34 ගීතා
22:1සවස තුනට ජේසුස් වහන්සේ, “එලොයි,
එලොයි, ලාමා සබහ්(ත්)තානි” කියා මහ හඬින්
මොරගැසූ සේක. එහි අර්ථය, “මාගේ දෙවියනි,
මාගේ දෙවියනි, ඔබ මා අත් හැරියේ මක්නිසා ද?”
යනුයි. 35 බලා සිටි අයගෙන් සමහරකේ ඒ අසා,
“අන්න, ඔහු එලියාට හඬගසයි” කී හ. 36 ගීතා
69:21කෙනෙක් දිව ගොස් මුදුහත්තක් විනාකිරෙහි
පොඟවා, බට ලීයක ගසා උන් වහන්සේට බොන්න
දී, “ටිකක් ඉන්න, මොහු බස්වාලීමට එලියා එන්නේ
ද කියා බලමු”යි කී හ. 37 ජේසුස් වහන්සේ මහ
හඬක් නගා අවසන් හුස්ම මුදා හැරිය සේක.
38 නික්ම 26:31-33 එවිට දේව මාලිගාවේ තිරය
ඉහළ පටන් පහළ දක්වා දෙකට ඉරී ගියේ ය.
39 උන් වහන්සේ අබිමුවෙහි සිටි ශතාධිපතියා උන්
වහන්සේ මෙසේ අවසන් හුස්ම හළ බව දුටු කල,
“සැබැවින් ම මේ මනුෂ්‍යයා දෙවියන් වහන්සේගේ
පුත්‍රයාණෝ ම ය”යි කී ය. 40 ලූක් 8:2-3ස්ත්‍රීහු ද
දුරින් බලා සිටියහ. ඔවුන් අතර, ගලීලයේ සිටිය දී
උන් වහන්සේ පිරිවරා ගොස් උපස්ථාන කළ
මග්දලායේ මරියාත්, කුඩා ජාකොබ්ගේ ද
ජෝසෙපේගේ ද මව වූ මරියාත්, සලෝමීත්, 41 උන්
වහන්සේ සමඟ ජෙරුසලමට ආ බොහෝ
කාන්තාවෝත් සිටියහ.

### භූමදානය
(මතෙ 27:57-61;ලූක් 23:50-56;ජොහ 19:38-42)

42 එය සබතට පෙර සූදානම් වීමේ දිනය වූ
බැවින්, හිරු බැස ගිය කල, 43 ජුදා මන්ත්‍රණ
සභාවෙහි ගරුතර සාමාජිකයෙකු වන, දෙවියන්
වහන්සේගේ රාජ්‍යය ගැන අපේක්ෂාවෙන් සිටි,
අරිමාතියේ ජෝසෙපේ එහි පැමිණ, ධෛර්ය ගෙන,
පිලාත් වෙත ගොස් ජේසුස් වහන්සේගේ මෘත
දේහය ඉල්ලා සිටියේ ය. 44 පිලාත් ද උන් වහන්සේ
එතරම් ඉක්මනින් මියගිය බව අසා පුදුම වී,
ශතාධිපතියා කැඳවා, “උන් වහන්සේ මේ ඉක්මනින්
මළ සේක් දැ”යි ඇසී ය. 45 ඒ බව ශතාධිපතියාගෙන්
සහතික ලෙස දැනගත් පසු පිලාත් තමේ
ජෝසෙපේට මෘත දේහය බාර දුන්නේ ය. 46 ඔහු
හණ රෙද්දක් මිලට ගෙන, උන් වහන්සේ පහතට
බා, ඒ රෙද්දෙන් ඔතා, පර්වතයෙහි කණින ලද
සොහොන් ගැබක තබා, දොරකඩට ගලක් පෙරළා
තැබී ය. 47 මග්දලායේ මරියා ද ජෝසෙපේගේ මව වූ
මරියා ද උන් වහන්සේ තැන්පත් කළ ස්ථානය
බලාගත්හ.

### පුනරුජ්ජීවනය
(මතෙ 28:1-8;ලූක් 24:1-12;ජොහ 20:1-10)

16 සබත් දින ගවෙුණු පසු මග්දලායේ මරියා ද
ජාකොබ්ගේ මව වූ මරියා ද සලෝමේ ද
ගොස්, උන් වහන්සේ ආලේප කරන පිණිස සුවඳ
ද්රව්ය මිලට ගත්හ. 2 ඔව්හු සතියේ පළමු වන දා
පාන්දර, හිරු උදා වූ විගස ම, සොහොන් ගේ ළඟට
ආහ. 3 ඔව්හු, "අපට සොහොන් ගයේ දොරෙකඩින්
ගල ඉවතට පරෙළා දනේනේ කවරකේ දැ"යි
ඔවුනොවුන් අතර විමසූ හ. 4 හොඳින් බැලූ කල, ඒ
ගල අති විශාල එකක් වුව ද අහකට පරෙළා
තිබනුෙ ඔව්හු දුටුවෝ ය. 5 එකල ඔව්හු සොහොන්
ගටෙ පිවිස, සුදු සළුවක් හැඳගත් තරුණයකුෙ දකුණු
පස ඉඳගනෙ සිටිනු දැක භීත වූ හ. 6 ඔහු ඔවුන්
අමතා, "බිය නොවන්න; ඔබ සොයන්නේ කුරුසියහේ
ඇණ ගසනු ලැබූ නාසරතේහි ජේසුස් වහන්සේ ය;
උන් වහන්සේ උත්ථාන වූ සේක; උන් වහන්සේ
මහේ නැත; මේ බලන්න, ඔවුන් උන් වහන්සේ
තැන්පත් කළ ස්ථානය; 7 මතෙ 26:32; මාක්
14:28යන්න, ඔබට කී ලසෙ ම උන් වහන්සේ ඔබට
කලින් ගලීලයට වඩිනා බවත්, එහි දී ඔබ උන්
වහන්සේ දක්නා බවත්, ශ්රාවකයන්ට ද පේදුරුට ද
දන්වන්නැ"යි කී ය. 8 ඔව්හු කම්පිත ව, විස්මිත ව
සොහොන් ගයෙින් පිට වී පලා ගියහ. තවද, ඔව්හු
භීත ව සිටි බැවින්, කිසිවකුෙට කිසිවක් නොකී හ.

### මග්දලායේ මරියාට දර්ශනය වීම
(මතෙ 28:9-10;ජොහ 20:11-18)

9 සතියේ පළමු වන දා අලුයම ජේසුස් වහන්සේ
නැඟිට වදාළ කල, උන් වහන්සේ තමන් විසින්
දුෂ්ටාත්මයන් සත් දනෙකුෙ දුරු කරනු ලැබූ
මග්දලායේ මරියාට මුලින් ම දර්ශනය වූ සේක.
10 ඈ ගොස්, අඬමින් වැලපමේන් සිටි උන්
වහන්සේගේ හිතවතුන්ට එපවත් සැළ කළා ය.
11 එහතේ, උන් වහන්සේ ජීවමාන ව සිටින බව ද
ඇයට දර්ශනය වූ බව ද ඇසූ විට ඔව්හු එය
විශ්වාස නො කළහ.

### ශ්රාවකයන් දදෙනෙකුෙට දර්ශනය වීම
(ලූක් 24:13-35)

12 ඉක්බිති ඔවුන්ගනේ දදෙනෙකුෙ පිටිසරට යන
කල උන් වහන්සේ අන් විලසකින් ඔවුන්ට දර්ශනය
වූ සේක. 13 ඒ දදෙනෙ ආපසු ගොස් අනික් අයට
එපවත් දැන්වූ හ. ඔව්හු ඔවුන් කී දයෙ ද විශ්වාස
නො කළහ.

### ධර්මදූත සේවාව පැවරීම
(මතෙ 28:16-20;ලූක් 24:36-49;ජොහ 20:19-23;ක්රියා 1:6-8)

14 පසුව ජේසුස් වහන්සේ, එකොළොස් දනො
ආහාර වළඳමින් සිටිය දී ඔවුන්ට ද දර්ශනය වී, උන්
වහන්සේ උත්ථාන වූ පසු තමන් වහන්සේ දුටුවන්
කීදේ ඔවුන් නොඇදහූ නිසා, ඔවුන්ගේ අවිශ්වාසය
හා සිත් දැඩි කම ගැන ඔවුන්ට දොස් පැවරූ සේක.
15 ක්රියා 1:8උන් වහන්සේ ඔවුන් අමතා, "ලොව
පුරා ගොස් සකල සත්ත්වයා හට සුබ අස්න දේශනා
කරන්න; 16 අදහා බව්තීස්ම-ස්නාපනය ලබන
තැනැත්තේ ගැළවීම ලබන්නේ ය; එහතේ, අදහා
නොගත් තැනැත්තේ වරදකරු යයි තීන්දුව ලබන්නේ
ය. 17 අදහන්නන් ඇසුරු කොටගත් හාස්කම් මේ ය:
ඔව්හු මාගේ නාමයනේ දුෂ්ටාත්ම දුරු කරති; අමුතු
භාෂාවලින් කතා කරති; 18 සර්පයන් අතින්
අල්ලාගනිති; යම් මාරක විසක් බීවත් ඉන් කිසි
අනතුරකට පත් නොවතේ; රෝගීන් පිට අත් තැබූ
විට, ඔව්හු සුවය ලබති"යි වදාළ සේක.

### ස්වර්ගාරෝහණය
(ලූක් 24:50-53;ක්රියා 1:9-11)

19 ක්රියා 1:9-11 මසෙේ ජේසුස් ස්වාමීන් වහන්සේ
ඔවුන්ට කතා කළ පසු, ස්වර්ගයට ඔසවාගනු ලැබ,
දවේියන් වහන්සේගේ දකුණු පස අසුන් ගත් සේක.
20 ඔව්හු නික්ම ගොස් සෑම තැන ම දේශනා කළහ.
සමිඳාණන් වහන්සේ ද ඔවුන් සමඟ ක්රියා කරමින්,
ඔවුන් අතර සිදු කළ හාස්කම් මඟින් ඒ දේශනය
සහතික කර වදාළ සේක.
20 ඔව්හු මකේී අවවාදානුශාසනා පේදුරුට ද
ඔහුගේ සහචරයන්ට ද සැකවනේ් පැවසූ හ. ඉක්බිති
ජේසුස් වහන්සේ ම සදාතන ගැළවීම පිළිබඳ
සුවිශුද්ධ, අජරාමර පණිවුඩය ඔවුන් ලවා පරෙදිග
සිට අපරදිග දක්වා යවා වදාළ සේක. ආමනේ.

### ජේසුස් වහන්සේගේ උපත
(මතෙ 1:18-25)

2 තවද එසමයහේි, අධිරාජ්යයේ සියලු
වැසියන්ගේ සංගණනයක් ගැනීමට අගොස්තුස්
අධිරාජයා වතේින් නියෝගයක් නික්මිණි. 2 මේ
වනාහි කුරේනියස් සිරියාවේ ආණ්ඩුකාරයා ව සිටිය
දී කරන ලද පළමු වන සංගණනය යි. 3 සියල්ලෝ
ලියාපදිංචි වනු පිණිස තම තමන්ගේ නුවරවලට
ගියහ. 4 ජෝසපේ ද දාවිත්ගේ වංශය හා පළෙපතට
අයිති වූයනේ, ගලීලයේ නාසරතේ නුවරින් නික්ම
ජුදයේ බතේලහෙමේ නම් දාවිත්ගේ නුවර බලා
ගියේ ය. 5 ඔහු ගියේ, තමාට විවාහ ගිවිසුම් දූන්,
ගැබ්ගනෙ සිටි මරිය තුමී සමඟ ලියාපදිංචි වන
පිණිස ය. 6 තවද, ඔවුන් එහි සිටිය දී ඇගේ ප්රසව
කාලය සම්පූර්ණ විය. 7 ඈ කුලුඳුල් පුත්රයා බිහි
කොට රදෙිවලින් ඔතා, නවාතැන්ගයෙි ඉඩකඩ
නොතිබුණු බැවින්, ගව ඔරුවක බෑවුවා ය.

### එඬේරු සහ දේව දූතයෝ

8 තවද, එම පළාතහේි එඬේරු රූ යාමයහේි සිය
බැටළු රැළ රකිමින් පිට්ටනියහේි සිටියහ. 9 එවිට
සමිඳාණන් වහන්සේගේ දූතයකේ ඔවුන්ට දර්ශනය
විය: සමිඳාණන් වහන්සේගේ තේජශ්රීය ඔවුන්
සිසාරා බැබළිණි; ඔව්හු අතිශයින් බියපත් වූ හ.
10 එහතේ දේව දූතයා ඔවුන්ට කතා කොටෙ, "බිය

නාෙවන්න; මනේන, සකල ජනයා හට ඉතා
ආනන්දජනක මංගල පුවතක් මම ඔබ වතෙ
ගනෙමේ. 11 මක්නිසා ද, ස්වාමීන් වන ක්රිස්තුස් නම්
ගැළවුම්කාරයකේ ඔබ හට දාවිත්ගේ නුවර අද
උපන්නේ ය. 12 රදේවලින් ඔතා ගව ඔරුවක බාවා
සිටින බිළිඳකේ ඔබට සම්බ වන්නේ ය. එය ඔබට
සලකුණ ය"යි කී ය. 13 ඒ ඇසිල්ලහෙි ම දේව දූතයා
සමඟ ස්වර්ග සේනා සමූහයක් දවේයන් වහන්සේ
පසසමින්,
14 "අති උසස් තැන්හි දවේදුන්ට මහිමය ද මිහි පිට
දේව ප්රසාදය ලත් ජනයා අතර සාමය ද වේ වා"යි
ගැයූ හ.
15 තවද, දේව දූතයන් ඔවුන් කරෙනේ සගලාෙවට
ගිය කල, එඬේරු, "අපි වහාම බතේලහෙමෙට
ගොස් සමිඳාණන් වහන්සේ අපට දන්වා වදාළ මේ
සිද්ධිය බලමු"යි ඔවුනාෙවුන් අතර කතා කරගත්හ.
16 ඔව්හු යුහුව ගොස් මරිය තුමී ද ජෝසපේ ද ගව
ඔරුවක සතප්වා උන් බිළිඳා ද දුටුවෝ ය. 17 ඔව්හු ඒ
දැක මේ දරුවා ගැන තමන්ට දන්වන ලද දේ පළ
කළහ. 18 ඒ ඇසූ සියල්ලෝ, එඬේරුන් පැවසූ සියල්ල
ගැන මවිත වූ හ. 19 එහතේ, මරිය තුමී එකී සියල්ල
සිත්හි නිදන් කාෙට ඒවා මනෙහෙි කළා ය.
20 එඬේරු ද තමන්ට දන්වන ලද ලසෙ ම ඇසූ දුටු
සියල්ල ගැන දවේයන් වහන්සේට ගෞරව කරමින්
ද ප්රශංසා කරමින් ද පරෙළා ගියහ.
21 ලවේ 12:3; ලූක් 1:31 උන් වහන්සේගේ
චර්මඡේදන පිළිවතෙ සඳහා අට දවස පිරුණු කල,
උන් වහන්සේ කුසහෙි පිළිසිඳගැනීමට පරෙ දේව
දූතයා විසින් දනෙ ලද, 'ජේසුස්' යන නාමය උන්
වහන්සේට තබන ලද්දේ ය.

### ජේසුස් වහන්සේ කැප කිරීම

22 ලවේ 12:6-8 මෝසසේගේ ව්යවස්ථාව අනුව
ඔවුන්ගේ පවිත්ර වීමේ කාලය පැමිණියනේ, ඔව්හු
උන් වහන්සේ සමිඳාණන් වහන්සේට කැප කරනු
වස්, ජරෙුසලමට ගනොහ. 23 නික්ම 13:2,12එසේ
කළෙේ, "හැම කුලුඳුල් පිරිමි දරුවකේ ම සමිඳාණන්
වහන්සේට කැප ය"යි සමිඳාණන් වහන්සේගේ
ව්යවස්ථාවලියහෙි ලියා ඇති ලසෙ, දරුවා සමිඳාණන්
වහන්සේට ඔප්පු කරන පිණිසත්, 24 එහි ම කියා
ඇති පරිදි කාෙබෙයියන් දදෙනෙකු හෝ පරවේ
පැටවුන් දදෙනෙකු හෝ පූජා කරන පිණිසත් ය.
25 එකල, සිමියාෙන් නම් මිනිසකේ ජරෙුසලමහෙි
විසී ය. ඔහු ඉශ්රායලේවරුන්ගේ විමුක්තිය
අපේක්ෂාවනෙ සිටි දැහැමි බැතිමතකේ.
ශුද්ධාත්මයාණෝ ඔහු කරෙහෙි වැඩහුන්හ.
26 සමිඳාණන් වහන්සේ අභිෂේක කළ 'ක්රිස්තුන්
වහන්සේ දක්නට පළමුවනෙ ඔහු මරණය
නාෙදක්නේ ය'යි ශුද්ධාත්මයාණන් විසින් ඔහුට
අනාවරණය කරනු ලැබ තිබිණි. 27 ඔහු
ශුද්ධාත්මානුභාවයනෙ දේව මාලිගාවට පැමිණියේ
ය. ළදරු ජේසුස් වහන්සේ පිළිබඳ ව ව්යවස්ථාවහෙි
සඳහන් වත්පිළිවතෙ ඉටු කරනු වස්, දමෙවුපියන් උන්
වහන්සේ ගනො විට, 28 ඔහු උන් වහන්සේ දෝතින්
වඩාගනෙ මසෙේ දවේයන් වහන්සේට ප්රශංසා
කළෙේ ය:
29 "සමිඳුනි, ඔබ පාෙරාෙන්දු වූ ලසෙ ම දැන් ඔබ
දාසයා හට, ශාන්ති සිතින් යාමට ඔබ නිදහස දී
ඇත,
30 මන්ද, ගැළවීම මාගේ දනෙතේන් දිටිමි.
31 එය සකල ජාතීන් අබිමුව කළ ගැළවීම ද
32 යසො 42:6; 49:6; 52:10 විජාතීන්ට එළිය දනෙ
ආලෝකය ද ඔබේ සනෙඟ වන ඉශ්රායලේවරුන්ගේ
මහිමය ද වේ."
33 උන් වහන්සේ පිළිබඳ ව කී දේ ගැන උන්
වහන්සේගේ පියා ද මවු ද මවිත වූ හ.
34 සිමියාෙන් ඔවුන්ට ආශීර්වාද කරමින් උන්
වහන්සේගේ මව වූ මරිය තුමිට කතා කාෙට, "මේ
දරුවා ඉශ්රායලේහි බාෙහෝ දනෙකුගේ වැටීම හා
නැඟීම පිණිසත්, ප්රතික්ෂේපයට ලක් වන දේව
සලකුණක් වන පිණිසත්, නියම ව සිටී. 35 එසේ ය,
ඔබේ ම හදවත කඩුවකින් අනිනු ලැබුවාක් මනේ
තුවාළ වනු ඇත. මසෙේ වන්නේ, බාෙහෝ
දනෙකුගේ සිත්හි රහස් කල්පනා එළිදරව් වන
පිණිස ය"යි කී ය.
36 තවද, ආෂරේගේ පළෙපතින් ආ පානුවලේගේ
දූවක වන බාෙහෝ වයස්ගත අන්නා නම්
දිවැසිවරියක් වූවා ය. විවාහයනෙ පසු සත් වසක්
සැමියා සමඟ විසූ ඇ 37 අසූ හතර අවුරුද්දක් වයස්
වන තුරු වැන්දඹුවක් ව සිටියා ය. ඇ දේව
මාලිගාවනෙ අහක් ව නාෙ ගොස් දිවා රූ දකේහි
උපවාස හා යාච්ඤා පවත්වමින් නමස්කාර කළා ය.
38 ඇ ද ඒ මාෙහාෙතේ දී ම අවුත්, දවේයන්
වහන්සේට තුති පුදා, ජරෙුසලමේ විමුක්තිය
අපේක්ෂා කළ සියලු දනො හට උන් වහන්සේ ගැන
කතා කළා ය.

### නාසරතේ නුවරට යාම

39 මතෙ 2:23 ජෝසපේ සහ මරියා සමිඳාණන්
වහන්සේගේ ව්යවස්ථාවලිය අනුව සියල්ල ඉටු කළ
පසු ගලීලයහෙි නාසරතේ නම් සිය නුවරට පරෙළා
ගියහ. 40 දරුවා වැඩී ශක්තිමත් ව ප්රඥාවනෙ
පූර්ණ විය; දවේයන් වහන්සේගේ ප්රසාදය උන්
වහන්සේ කරෙහෙි විය.

### ජේසුස් කුමරුන් දේව මාලිගයට යෑම

41 නික්ම 12:1-27; ද්වි.නී. 16:1-8 ජේසුස්
වහන්සේගේ මවුපියෝ අවුරුදු පතා පාස්කු උළලෙ
සඳහා ජරෙුසලමට ගියහ. 42 උන් වහන්සේ
දාෙළාෙසැවිරිදි වූ කල, ඔව්හු සිරිත් ලසෙ ඒ
මංගල්යයට ගියහ. 43 ඔවුන් නියමිත දවස් ගවො
පරෙළා එන අතර, ජේසුස් කුමරාණෝ ජරෙුසලමහෙි
රැඳුණු සේක; එහතේ, උන් වහන්සේගේ
දමෙවුපියෝ ඒ බව නාෙදැන, 44 උන් වහන්සේ
වන්දනාකාර පිරිස සමඟ ඇතැ යි සිතාගනෙ, දවසක
ගමන් ගොස්, නෑ මිතුරන් අතරහෙි උන් වහන්සේ

සවූ හ. 45 එහතේ සම්බ නොවූයනේ, ඔව්හු උන්
වහන්සේ සොයමින් ජරුසලමට පරළා ගියහ.
46 තදෙිනකට පසු ඔව්හු උන් වහන්සේ දේව
මාලිගාවහෙි පඬිවරයන් මැද වැඩහිඳ ඔවුන් කී දේ
අසමින් ද ඔවුන්ගනේ ප්රශ්න විචාරමින් ද සිටිනු
දුටුවෝ ය. 47 ඒ ඇසූ සියල්ලෝ ම උන් වහන්සේගේ
බුද්ධි මහිමය හා පිළිතුරු ගැන විස්මිත වූ හ.
48 දමෙවුපියෝ උන් වහන්සේ දුටු කල මවිත වූ හ.
උන් වහන්සේගේ මෑණියෝ, “පුතා, කුමක් නිසා
අපට මසේ කළෙහෙි ද? බලන්න, ඔබේ පියා ද මම
ද දුකින් තැවී තැවී ඔබ සවේමු”යි කී හ. 49 එවිට
උන් වහන්සේ පිළිතුරු දමේින්, “ඔබ මා සවේවේ මන්
ද? මා පියාණන්ගේ මැදුරහෙි මා සිටිය යුතු බව ඔබ
නොදන්නහු දැ”යි ඔවුන්ට වදාළ සේක. 50 එහතේ,
උන් වහන්සේගේ ඒ කීම ඔවුන්ට අවබෝධ නො වී
ය.
51 උන් වහන්සේ ඔවුන් කැටුව ගොස් නාසරතේ
නුවරට පැමිණ ඔවුන්ට කීකරු වී විසූ සේක. උන්
වහන්සේගේ මෑණියෝ මේ සියල්ලක් ම සිත්හි
නිදන් කරගත්හ. 52 1 සාමු 2:26; හිතෝ 3:4ජේසුස්
වහන්සේ ප්රඥා මහිමයනේ හා කාය ශක්තියනේ ද
දවේයන් වහන්සේගනේ හා මිනිසුන්ගනේ ප්රසාදය
ලබමින් ද වැඩුණු සේක.

### ස්නාවක ජොහන්ගේ දේශනාව

(මතෙ 3:1-12;මාක් 1:1-8;ජොහ 1:19-28)

3 තිබේරියස් අධිරාජයා රජ පැමිණි පසළොස්
වන අවුරුද්දහෙි පොන්තියස් පිලාත් ජුදයට
ආණ්ඩුකාරයා ව ද හරෙොද් ගලීලයට යුවරජ ව ද
ඔහුගේ සහෝදර පිලිප් ඉතුරයටත්, ත්රිකොනියටත්
යුවරජ ව ද ලුසානියස් අබිලේනියට යුවරජ ව ද
අන්නස් හා කායාපස් උත්තම පූජකවරයන් ව ද සිටි
සමයහෙි, 2 දවේයන් වහන්සේගේ පණිවුඩය
පාළුකරයහෙි සකෙරියස්ගේ පුත් ජොහන් වතෙ
පැමිණියේ ය. 3 තවද, ඔහු ජොර්දාන් ගඟ අවට
පදෙසෙ මුළුල්ලහෙි සැරිසරමින්, පව් කමාව පිණිස
පසුතැවී සිත් හරවා ගනෙ බව්තීස්ම-
ස්නාපනයලබන්නැ යි ප්රකාශ කළේ ය. 4 යසො
40:3-5එපවත්දිවැසිවර යසොයාගේ ලියවිලිවල
මසේ ලියා ඇත:
4 “සමිඳුන්ගේ මඟ පිළියළෙ කරන්න, එතුමන් හට
ඇද නැති මාවත් සාදන්න.
5 සියලු කඳුරැළි පුරවනු ලැබේ;
6 සියලු කඳු හා හලේ සමතලා කරනු ලැබේ;
6 සියලු වංගු ඇද හරිනු ලැබේ;
q26 රළු මාවත් මට්ටම් කරනු ලැබේ.
q26 දවේයන් කරෙනේ වන විමුත් මඟ මනු සත
දකිනු ඇතැ යි
6 පාළුකරයහෙි මොරගා කියන හඬකේ.”
7 මතෙ 12:34; 23:33 එකල ඔහු තමාගනේ
බව්තීස්ම-ස්නාපනය ලබන්ට ආ ජනතාවට කතා
කොට, “එම්බා පොළොං වංශය, එන්න තිබනෙ
උදහසින් පලා යන්න නුඹලාට අවවාද කළේ
කවරකේ ද? 8 එබැවින් ආබ්රහම් අපේ පියාණෝ
යයි සිතින් කියාගන්න පටන් නොගනෙ පසුතැවී සිත්
හරවා ගත් බව දැක්වනෙ ලසෙ හැසිරනේන; මන්ද,
මේ ගල්වලින් ආබ්රහම්ට දරු පරපුරක් උපදවා
දනේනට දවේයන් වහන්සේට හැකි යයි මම ඔබට
කියමි.ජොහ 8:33 9 මතෙ 7:19තවද, දැනටමත්
පොරොව ගස් මුල්වලට එල්ල කර ඇත. එබැවින්
හොඳ පල නොදරන සියලු ගස් කපා ගින්නහෙි
හළෙනු ඇතැ”යි කී ය.
10 එවිට ජනකාය, “එසේ නම් අප කුමක් කළ යුතු
දැ”යි ඔහුගනේ ඇසූ හ. 11 ඔහු උත්තර දමේින්,
“අඳන දකෙක් ඇති අය නැති අයට දතේ වා; කෑම
ඇති අය කෑම නැති අයට දතේ වා”යි කී ය. 12 ලූක්
7:29අයකැමියෝ ද බව්තීස්ම-ස්නාපනය ලබන්ට
අවුත්, “ගුරුදේවයිනි, අප කුමක් කළ යුතු දැ”යි
ඔහුගනේ ඇසූ හ. 13 “නියමිත පමණට වැඩියනේ අය
බදු නොගන්නැ”යි ඔහු ඔවුන්ට කී ය. 14 භේවායෝ
ද, “ඉතින් අප කළ යුත්තේ කුමක් දැ”යි ඇසූ හ.
“කිසිවකුගනේ බලහත්කාරයනේ වත් බොරු
චෝදනා නැඟීමනේ වත් කිසිවක් පැහැර නොගන්න.
ඔබට ලැබනෙ වැටුපනේ සෑහී සිටින්නැ”යි ඔහු
ඔවුන්ට කී ය.
15 “මේ ක්රිස්තුවරයා විය හැකි දැ”යි සනෙඟ
අපේක්ෂාවනේ බලා සිටිය දීත්, හැම දනෙ ජොහන්
ගැන විවාද කරමින් සිටිය දීත්, 16 ජොහන්
සියල්ලන්ට පිළිතුරු දමේින්, “මම නම්, ඔබ වතුරනේ
බව්තීස්ම-ස්නාපනය කරමි; එහතේ මට වඩා
ආනුභාව සම්පන්න උතුමකේ එන්නේ ය; එතුමන්ගේ
පාවහන් පටි මුදන්ට වත් මම නොවටිමි; එතුමාණෝ
ශුද්ධාත්මයාණන්ගනේ ද ගින්නනේ ද ඔබ බව්තීස්ම-
ස්නාපනය කරවන සේක. 17 කමත හොඳ හැටි
පිරිසිදු කරන පිණිසත්, ධාන්ය පොළා සිය අටුවහෙි
රැස් කරන පිණිසත්, උන් වහන්සේගේ අතහෙි
කුල්ල ඇත; එහතේ බොල් නොනිවනෙ ගින්නනේ
දවනු ලැබේ ය”යි කී ය.
18 මසේ තවත් බොහෝ අනුශාසනා මඟින් ඔහු
සමූහයාට සුබ අස්න දේශනා කළේ ය. 19 මතෙ
14:3-4; මාක් 6:17-18එහතේ, හරෙොද් යුවරජු සිය
සොහොයුරාගේ බිරිඳ වූ හරෙොදියස් විවාහ
කරගත් නිසා ද ඔහු කළ සියලු දුෂ්ටකම් නිසා ද
ජොහන් ඔහුට තරවටු කළේ ය. 20 ඒ නිසා
හරෙොද් ඔහු හිරගටෙ යැවී ය. එසේ කිරීමනේ ඔහු
අනිත් සියල්ලටත් වඩා දරුණු දුෂ්ටකමක් කළේ ය.

### ජේසුස් වහන්සේගේ බව්තීස්ම-ස්නාපනය

(මතෙ 3:13-17;මාක් 1:9-11)

21 තවද මුළු සනෙඟ බව්තීස්ම-ස්නාපනය ලැබූ විට,
ජේසුස් වහන්සේත් බව්තීස්ම-ස්නාපනය ලබා
යාච්ඤා කරමින් සිටිය දී ස්වර්ගය විවර වී, 22 උත්
22:2; ගීතා 2:7; යසො 42:1; මතෙ 3:17; මාක් 1:11;
ලූක් 9:35ශුද්ධාත්මයාණෝ පරවේයකුගේ
රූපාකාරයනේ උන් වහන්සේ කරෙහෙි පහළ වූ
සේක. එවිට: “ඔබ මාගේ ප්රියාදර පුත්රයාණෝ ය;
ඔබ කරෙහෙි ඉතා ප්රසන්න වී සිටිමි”යි අහසින්
හඬක් නික්මිණි.

### ජේසුස් වහන්සේගේ වංශාවලිය
(මතෙ 1:1-17)

23 ජේසුස් වහන්සේ සිය සේවය අරඹන විට
අවුරුදු තිහක් පමණ වයස් ව සිටි සේක. උන්
වහන්සේ ජෝසෙප්ගේ පුත්‍රයා යයි ඔව්හු සිතූ හ.
ජෝසෙප් හේලීගේ පුත්‍රයා ය, 24 ඔහු මත්තාත්ගේ
පුත්‍රයා ය, ඔහු ලෙවීගේ පුත්‍රයා ය, ඔහු
මෙල්කීගේ පුත්‍රයා ය, ඔහු ජන්නයිගේ පුත්‍රයා ය,
ඔහු ජෝසෙප්ගේ පුත්‍රයා ය, 25 ඔහු
මත්තාතියස්ගේ පුත්‍රයා ය, ඔහු ආමොස්ගේ
පුත්‍රයා ය, ඔහු නාහුම්ගේ පුත්‍රයා ය, ඔහු
එස්ලීගේ පුත්‍රයා ය, ඔහු නග්ගයිගේ පුත්‍රයා ය,
26 ඔහු මායත්ගේ පුත්‍රයා ය, ඔහු මත්තාතියස්ගේ
පුත්‍රයා ය, ඔහු සෙමෙයින්ගේ පුත්‍රයා ය, ඔහු
ජෝසෙප්ගේ පුත්‍රයා ය, ඔහු ජෝදාගේ පුත්‍රයා ය,
27 ඔහු ජොවානන්ගේ පුත්‍රයා ය, ඔහු රෙසාගේ
පුත්‍රයා ය, ඔහු සෙරුබ්බාබෙල්ගේ පුත්‍රයා ය, ඔහු
ෂයෙල්තියෙල්ගේ පුත්‍රයා ය, ඔහු නේරිගේ
පුත්‍රයා ය, 28 ඔහු මෙල්කිගේ පුත්‍රයා ය, ඔහු
අද්දිගේ පුත්‍රයා ය, ඔහු කෝසම්ගේ පුත්‍රයා ය,
ඔහු එල්මාදම්ගේ පුත්‍රයා ය, ඔහු ඒර්ගේ පුත්‍රයා
ය, 29 ඔහු ජෝෂුවාගේ පුත්‍රයා ය, ඔහු
එලියේසර්ගේ පුත්‍රයා ය, ඔහු ජෝරිම්ගේ
පුත්‍රයා ය, ඔහු මත්තාත්ගේ පුත්‍රයා ය, ඔහු
ලෙවීගේ පුත්‍රයා ය, 30 ඔහු සිමියොන්ගේ පුත්‍රයා
ය, ඔහු ජූදාගේ පුත්‍රයා ය, ඔහු ජෝසෙප්ගේ
පුත්‍රයා ය, ඔහු ජෝනාම්ගේ පුත්‍රයා ය, ඔහු
එලියාකිම්ගේ පුත්‍රයා ය, 31 ඔහු මෙලෙයාගේ
පුත්‍රයා ය, ඔහු මෙන්නාගේ පුත්‍රයා ය, ඔහු
මත්තතාගේ පුත්‍රයා ය, ඔහු නාතන්ගේ පුත්‍රයා ය,
ඔහු දාවිත්ගේ පුත්‍රයා ය, 32 ඔහු ජෙස්සේගේ
පුත්‍රයා ය, ඔහු ඕබෙද්ගේ පුත්‍රයා ය, ඔහු
බෝවස්ගේ පුත්‍රයා ය, ඔහු සල්මොන්ගේ පුත්‍රයා
ය, ඔහු නාෂොන්ගේ පුත්‍රයා ය, 33 ඔහු
අම්මිනාදාබ්ගේ පුත්‍රයා ය, ඔහු අද්මින්ගේ පුත්‍රයා
ය, ඔහු අර්නීගේ පුත්‍රයා ය, ඔහු හෙස්රොන්ගේ
පුත්‍රයා ය, ඔහු පෙරෙෂ්ගේ පුත්‍රයා ය, ඔහු
ජූදාගේ පුත්‍රයා ය, 34 ඔහු ජාකොබ්ගේ පුත්‍රයා ය,
ඔහු ඊසාක්ගේ පුත්‍රයා ය, ඔහු ආබ්‍රහම්ගේ
පුත්‍රයා ය, ඔහු තේරාගේ පුත්‍රයා ය, ඔහු
නාහෝර්ගේ පුත්‍රයා ය, 35 ඔහු සෙරුග්ගේ පුත්‍රයා
ය, ඔහු රෙවීගේ පුත්‍රයා ය, ඔහු පෙලෙග්ගේ
පුත්‍රයා ය, ඔහු ඒබර්ගේ පුත්‍රයා ය, ඔහු ෂෙලාගේ
පුත්‍රයා ය, ඔහු කායිනන්ගේ පුත්‍රයා ය. 36 ඔහු
අර්පක්සද්ගේ පුත්‍රයා ය, ඔහු ෂෙම්ගේ පුත්‍රයා ය,
ඔහු නෝවාගේ පුත්‍රයා ය, ඔහු ලාමෙක්ගේ
පුත්‍රයා ය, 37 ඔහු මෙතුසෙලාගේ පුත්‍රයා ය,
38 ඔහු ඒනොක්ගේ පුත්‍රයා ය, ඔහු ජාරෙද්ගේ
පුත්‍රයා ය, ඔහු මාලලෙයෙල්ගේ පුත්‍රයා ය, ඔහු
කේනාන්ගේ පුත්‍රයා ය, ඔහු ඒනොෂ්ගේ පුත්‍රයා
ය, ඔහු සෙත්ගේ පුත්‍රයා ය, ඔහු ආදම්ගේ පුත්‍රයා
ය, ඔහු දෙවියන් වහන්සේගේ පුත්‍රයා ය.

### ජේසුස් වහන්සේ පරීක්ෂා කරනු ලැබීම
(මතෙ 4:1-11;මාක් 1:12-13)

4 ජේසුස් වහන්සේ ශුද්ධාත්මානුභාවයෙන්
පූර්ණ ව ජොර්දානෙන් ආපසු ආ විට,
ආත්මයාණන් වහන්සේ විසින් උන් වහන්සේ
පාළුකරයට ගෙනයනු ලැබූ සේක. 2 එහි දී දින
සතළිසක් මුළුල්ලේ යක්ෂයා උන් වහන්සේ පරීක්ෂා
කෙළේ ය. ඒ දවස්වල දී උන් වහන්සේ කිසිවක්
නොවැළඳූ සේක. ඒ කාලය නිම වූ පසු උන්
වහන්සේට කුසගිනි ඇති විය.
3 එකල යක්ෂයා කතා කරමින්, “ඔබ දෙවියන්
වහන්සේගේ පුත්‍රයා නම්, මේ ගල් ගඩේය පාන්
ගඩේයක් වන්නට අණ කළ මැනවැ”යි උන්
වහන්සේට කී ය. 4 ද්වි.නී. 8:3ජේසුස් වහන්සේ
පිළිතුරු දෙමින්,
q24 “ ‘මිනිසා කෑමෙන් පමණක් ජීවත් නොවන්නේ
ය’ කියා ලියා ඇතැ”යි
4 ඔහුට වදාළ සේක.
5 එවිට යක්ෂයා උන් වහන්සේ උස් තැනකට
පමුණුවා, ක්ෂණයකින් ලෝකයේ සියලු රට
රාජ්‍යයන් උන් වහන්සේට පෙන්වා, 6 “මේවා
කෙරෙහි මුළු ආධිපත්‍යය ද ඒවායේ යස ඉසුරු ද
ඔබට දෙන්නෙමි; ඒවා මට පවරා දී ඇති හෙයින් මා
කැමැති කෙනෙකුට ඒවා දෙමි; 7 එබැවින් ඔබ මා
ඉදිරියෙහි නමස්කාර කරන්නෙහි නම් ඒ සියල්ල ම
ඔබ සන්තක වන්නේ ය”යි උන් වහන්සේට කී ය.
8 ද්වි.නී. 6:13ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, “
‘නුඹේ දෙවි වන සමිඳාණන් වහන්සේට නමස්කාර
කරන්න;
q28 උන් වහන්සේට පමණක් සේවය කරන්න’ කියා
ලියා ඇතැ”යි
8 ඔහුට වදාළ සේක.
9 ඉන්පසු ඔහු උන් වහන්සේ ජෙරුසලමට ගෙන
ගොස්, දේව මාලිගාවේ කොත මුදුනේ සිටුවා, “ඔබ
දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් මෙතැනින්
පහතට පනින්න. 10 ගීතා 91:11එසේ කියන්නේ,
q210 ‘ඔබට රැකවරණ සලසනු වස් උන් වහන්සේ
සිය දූතයන් හට අණ දෙනු ඇතැ’යි ද
11 ගීතා 91:12 ‘යම් ලෙසෙකින් ඔබේ පය ගලක
නොවදින පිණිස ඔවුන් සිය දෝතින් ඔබ උසුලනු
ඇතැ’යි ද කියා
11 ලියා ඇති බැවිනැ”යි උන් වහන්සේට කී ය.
12 ද්වි.නී. 6:16 ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්,
q212 “ ‘නුඹේ දෙවි වන සමිඳාණන් වහන්සේ
පරීක්ෂා නොකරන්න,’ කියා ද ලියා ඇතැ”යි
12 වදාළ සේක. 13 යක්ෂයා මෙකී පරීක්ෂා නිමවා,
සුදුසු අවස්ථාවක් යළිත් එළඹෙන තුරු උන් වහන්සේ
අත්හැර ගියේ ය.

### ගලීලයේ සේවය ඇරඹීම
(මතෙ 4:12-17;මාක් 1:14-15)

14 තවද, ජේසුස් වහන්සේ ශුද්ධාත්මානුභාවයෙනේ
යුක්ත ව ගලීලයට පෙරළා වැඩිය සේක. උන්
වහන්සේ පිළිබඳ ආරංචිය අවට මුළු පෙදෙස පුරා
පැතිරිණි. 15 උන් වහන්සේ සියල්ලන්ගනේ ප්රශංසා
ලබමින්, ඔවුන්ගේ ධර්මශාලාවල ඉගැන්වූ සේක.

### නාසරතේහි මූලික දේශනය හා ජනතාවගේ විරෝධය
(මතෙ 13:53-58;මාක් 6:1-6)

16 උන් වහන්සේ තමන් ඇතිදැඩි වූ නාසරතේ
නුවරට පැමිණ සිරිත් පරිදි සබත් දවසේ දී
ධර්මශාලාවට වැඩම කර කියවීම පිණිස නැඟිට සිටි
සේක. 17 එවිට දිවැසිවර යසොයාගේ ග්රන්ථය උන්
වහන්සේට දනෙ ලද්දේ ය. උන් වහන්සේ ග්රන්ථය
දිගහැර, මසේ ලියා ඇති තැන සොයාගත් සේක:
18 යසො 61:1-2 “සමිඳාණන් වහන්සේගේ ආත්මය
මා කෙරෙහි ඇත. මක්නිසා ද දිළිඳුන් හට සුබ
ආරංචිය දේශනා කරනු වස්, උන් වහන්සේ මා
ආලේප කළ සේක.
18 වහලුන්ට මිදීම ද අන්ධයන්ට පනේීම ද ලැබනෙ
බව දන්වන්ටත්, පීඩිත වූවන් මුදන්ටත්, 19 සමිඳාණන්
වහන්සේගේ ප්රසාදය ලත් වසර ප්රකාශ කරන්ටත්
මා එවා වදාළ සේක.”
20 උන් වහන්සේ එය කියවා, ග්රන්ථය අකුළා,
උපස්ථායක තැනට දී වැඩහුන් සේක. එකල
ධර්මශාලාවහෙි සිටි සියල්ලෝ උන් වහන්සේ
කෙරෙහි නතේ යොමා සිටියහ. 21 උන් වහන්සේ
ඔවුන්ට කතා කරන්න පටන් ගනෙ, “අද ඔබ සවන් දී
සිටිය දී ම මේ ශුද්ධ ලියවිලි පාඨය ඉෂ්ට වී ය”යි
වදාළ සේක. 22 සියල්ලෝ ම උන් වහන්සේට
ප්රශංසා කරමින්, උන් වහන්සේගේ මුවින් පහළ වූ
කාරුණික වචන ගැන පුදුම ව, “මේ ජෝසෙප්ගේ
පුතා නොවේ දැ”යි කී හ. 23 එවිට උන් වහන්සේ
කතා කොට, “ ‘වදෙ තුමාණනෙි, ඔබ, ඔබම සුව
කරගන්න’ යන ප්රස්තා පිරුළ ඔබ නිසැක ව ම මට
ගනෙ හැර පා, 24 ජොහ 4:44‘කපර්ණවුමහෙි දී ඔබ
විසින් කරන ලදැ යි අප ඇසූ ක්රියා ඔබේ උපන් ගම
වන මහෙිදීත් කරන්නැ’යි මට කියනු ඇත. සැබැවින්
ම මම ඔබට කියමි, ගමේ දිවැසිවරයා ගමට අගේ
නැත. 25 1 රාජා 17:1සහතික ලසෙ මම ඔබට කියමි,
එලියාගේ කාලයේ දී තුන් අවුරුදු සමසක් මුළුල්ලහෙි
අහස පියවී, රට පුරා දැඩි සාගතයක් පැවති අතර,
26 1 රාජා 17:8-16ඉශ්රායලේ රටේ බොහෝ
වැන්දඹුවන් සිටි නමුත්, සීදොන් පළාතහෙි
ශාරපෙත්හි වැන්දඹුව වතෙ මිස අන් කිසිවකු
වතෙට එලියා නොයවන ලද්දේ ය. 27 2 රාජා
5:1-14දිවැසිවර එලිෂාගේ කාලයේ දී ඉශ්රායලේ
රටේ බොහෝ කුෂ්ඨ රෝගීන් සිටි නමුත්, සිරියානු
ජාතික නාමන් මිස අන් කිසිවකේ සුවය නොලැබී
ය”යි වදාළ සේක. 28 ධර්මශාලාවහෙි සිටි මුළු
සමූහයා ඒ අසා කෝපාවිෂ්ට වූ හ. 29 ඔව්හු වහා
නැඟිට උන් වහන්සේ නුවරින් පිටතට නෙරපා,
ප්රපාතයට හළෙනුවස් ඔවුන්ගේ නුවර ගොඩනඟා
තිබුණු කන්ද අද්දරට ගනෙ ගියහ. 30 එහතේ උන්
වහන්සේ ජනකාය මැදින් ගමන් කර නික්ම ගිය
සේක.

### අශුද්ධාත්මයක් ආවේශ වූවකුට සුවය
(මාක් 1:21-28)

31 උන් වහන්සේ ගලීලයේ නුවරක් වන
කපර්ණවුමට පැමිණ, සබත් දිනයේ දී අනුශාසනා
කරමින් සිටි සේක. 32 මතෙ 7:28-29උන් වහන්සේ
බලධාරි කනෙකුන් මනේ කතා කළ බැවින් ඒ
අනුශාසනා ගැන සනෙඟ විස්මිත වූ හ.
33 අශුද්ධාත්මයක් ආවේශ වූ මිනිසකේ
ධර්මශාලාවහෙි සිටියේ ය. ඔහු මහ හඬින්
මොරගසා, 34 “අහෝ! නාසරතේහි ජේසුස් තුමනෙි
ඔබත් අපත් අතර මොන ගනුදනෙුවක් ද? ඔබ ආවේ
අප වනසන්ට ද? ඔබ කවරකේ දැ යි දනිමි. ඔබ
දවේියන් වහන්සේගේ ශුද්ධවරයාණෝ ය”යි කී ය.
35 ජේසුස් වහන්සේ ඔහුට තරවටු කරමින්, “කට
පියාගනෙ මොහුගනේ දුරු වවෙ”යි වදාළ සේක.
එවිට දුෂ්ටාත්මය සමූහයා ඉදිරියහෙි ඔහු බිම හළො,
ඔහුට තුවාළ නොකොට ඔහුගනේ දුරු වී ය.
36 සියල්ලෝ ම විස්මිත ව “මේ මොන ධර්මයක් ද?
මතුෙමා බලධාරී ව ද මහානුභාව ඇති ව ද
අශුද්ධාත්මයන්ට අණ දනෙ සේක; ඔව්හු පලා
යති”යි තම තමන් අතර කතා කරගත් හ. 37 උන්
වහන්සේ පිළිබඳ මපුෙවත අවට පදෙස පුරා
පැතිරිණි.

### පේදුරුගේ භාර්යාවගේ මව සහ වනෙත් අය සුව කිරීම
(මතෙ 8:14-17;මාක් 1:29-34)

38 උන් වහන්සේ ධර්මශාලාවනේ නැඟිට ගොස්
සීමොන්ගේ ගදෙරට ඇතුළු වූ සේක. සීමොන්ගේ
බිරිඳගේ මවට බලවත් උණ රෝගයක් වැළඳී තිබිණි.
ඔව්හු ඈ උදසො උන් වහන්සේට කන්නලව් කළහ.
39 උන් වහන්සේ ද ඈ ළඟ සිට උණ රෝගය පහ ව
යන්න අණ කළ සේක, උණ රෝගය ඇගනේ පහ ව
ගියේ ය. එකණෙහෙි ම ඈ නැඟිට ඔවුන්ට උපස්ථාන
කළා ය.
40 හිරු බැස යද්දී, නොයකේ රෝගවලින් පීඩිත වූ
අය භාර ව සිටි සියල්ලෝ ම උන් වහන්සේ වතෙ
ඔවුන් ගනොහ. උන් වහන්සේ එකිනකො පිට අත
තබා ඔවුන් සුවපත් කළ සේක. 41 දුෂ්ටාත්මයෝ ද,
“ඔබ දවේියන් වහන්සේගේ පුත්රයාණෝ ය”යි
බරෙහන් දමේින් බොහෝ දනෙකුගනේ දුරු වූ හ.
තමන් ක්රිස්තුන් වහන්සේ යයි ඔවුන් දැන සිටි නිසා
උන් වහන්සේ ඔවුන්ට තරවටු කොට, කතා කිරීම
තහනම් කළ සේක.

### ධර්මදූත චාරිකාවක්
(මාක් 1:35-39)

42 පසුදින පහන් වූ කල උන් වහන්සේ පිටත් ව
හුදකලා තැනකට වැඩිය සේක. සමූහයා උන්
වහන්සේ සොයා ගොස්, හමු වූ පසු, තමන් වෙතින්
යන්න නොදී උන් වහන්සේ නවතාගන්න තැත්
කළහ. 43 උන් වහන්සේ කතා කොට, “මා වෙනත්
නුවරවල ද දෙවියන් වහන්සේගේ රාජ්‍යය පිළිබඳ
සුබ අස්න දේශනා කළ යුතු ය; මා එවන ලද්දේ ඒ
සඳහා ය”යි ඔවුන්ට වදාළ සේක.
44 තවද, උන් වහන්සේ ජුදයේ ධර්මශාලාවල
දේශනා කරමින් සිටි සේක.

### ප්‍රථම ශ්‍රාවකයන් කැඳවීම
(මතෙ 4:18-22;මාක් 1:16-20)

5 මතෙ 13:1-2; මාක් 3:9-10; 4:1 දිනක් උන්
වහන්සේ ගෙනේසරෙත් විල අසල සිටිය දී,
සමූහයා දෙවියන් වහන්සේගේ දහම් පණිවුඩය
අසනු පිණිස උන් වහන්සේ වටා තෙරපී තෙරපී සිටි
කල, 2 විල අයිනේ ඔරු දෙකක් තිබෙනු උන්
වහන්සේ දුටු සේක. ධීවරයෝ ඒවායින් බැස වීත්
දැල් සෝදමින් සිටියහ. 3 උන් වහන්සේ ඒ ඔරුවලින්
එකක් වූ සීමොන්ගේ ඔරුවට නැඟී එය වෙරළින්
මඳක් ඈතට දියත් කරන්න කියා එහි වැඩහිඳ,
සමූහයාට අනුශාසනා කළ සේක. 4 එය නිම වූ කල
උන් වහන්සේ සීමොන්ට කතා කොට, “මසුන්
අල්ලන පිණිස දියඹට ගොස් දැල් හෙළෙන්නැ”යි වදාළ
සේක. 5 ජොහ 21:3සීමොන් පිළිතුරු දෙමින්,
“ස්වාමීනි, රෑ මුළුල්ලේ ම වෙහෙසෙ වූ නමුත් අපි
කිසිවක් නොලෙද්දිමු. එහෙත් ඔබ කියන සේක් නම්
දැල් හෙළෙමි”යි කී ය. 6 ජොහ 21:6එසේ කළ විට
ඔව්හු මසුන් මහා රාශියක් අල්ලාගත්හ. ඔවුන්ගේ
දැල් ද ඉරෙන්නේනට වන. 7 ඔව්හු ද තමන්ගේ උදව්වට
එන ලෙසෙ අනික් ඔරුවෙහි සිටි හවුල් කාරයන්ට
සංඥා කළහ. ඔව්හු අවුත් ඔරු දෙකෙ කිඳා බසින
තරමට පුරවාගත්හ. 8 සීමොන් පේදුරු ඒ දැක,
ජේසුස් වහන්සේගේ පාමුල දණින් වැටී, “ස්වාමීනි,
මා වෙතින් ඉවත් වනු මැනව, මම පව්කාර
මිනිසෙකෙ”යි කී ය. 9 මන්ද, ඔහු ද ඔහු සමඟ සිටි
සියල්ලෝ ද තමන් ඇල්ලූ මසුන් රාශිය දැක විස්මිත
වූ හ. 10 සීමොන්ගේ හවුල්කාරයන් වූ සෙබෙදීගේ
පුත් ජාකොබ් ද ජොහන් ද එසේ ම විස්මිත වූ හ.
ජේසුස් වහන්සේ සීමොන්ට කතා කරමින්, “බිය
නොවන්න, මතෙන් සිට ඔබ මිනිසුන් දිනනු ඇතැ”යි
වදාළ සේක. 11 ඔව්හු තමන්ගේ ඔරු වෙරළට ඇද
ඒ සියල්ල හැරදමා උන් වහන්සේ අනුව ගියහ.

### ලාදුරු රෝගියකු සුව කිරීම
(මතෙ 8:1-4;මාක් 1:40-45)

12 තවද උන් වහන්සේ එක් නුවරක සිටිය දී,
සර්වාංගයෙහි ලාදුරු තිබුණු මිනිසෙක් එහි විය. ඔහු
ජේසුස් වහන්සේ අබිමුවෙහි වැඳ වැටී, “ස්වාමීනි,
ඔබ කැමැති සේක් නම්, මා පවිත්‍ර කරන්න ඔබට
හැකි ය” කියමින් උන් වහන්සේට කන්නලව් කළේ
ය. 13 උන් වහන්සේ අත දිගු කොට ඔහු මත තබා,
“මම කැමැත්තෙමි, පවිත්‍ර වන්නැ”යි වදාළ සේක.
ලාදුරු රෝගය එකෙණෙහි ම ඔහුගෙන් පහ ව ගියේ
ය. 14 ලෙවී 14:1-32එය කිසිවකුට නොකියන ලෙසෙ
උන් වහන්සේ ඔහුට අණ දී, “ඔබ ගොස් පූජකයාට
පෙනී, ඔබේ පවිත්‍ර වීම සඳහා ඔවුන්ට සාක්ෂියක්
වන පිණිස මෝසෙස් අණ කළ දේවල් ඔප්පු
කරන්නැ”යි වදාළ සේක. 15 එහෙත්, උන් වහන්සේ
ගැන ප්‍රවෘත්තිය වඩ වඩා පතළ විය; බොහෝ
සමූහයෝ උන් වහන්සේට සවන් දෙනෙ පිණිස ද
සියලු රෝග සුව කරවාගන්න පිණිස ද රැස් වූ හ.
16 එහෙත්, උන් වහන්සේ හුදකලා පෙදෙසෙකට
ගොස් යාච්ඤා කළ සේක.

### අංසබාග රෝගියකු සුව කිරීම
(මතෙ 9:1-8;මාක් 2:1-12)

17 එක් දිනක් උන් වහන්සේ උගන්වමින් සිටිය දී,
ගලීලයේ සහ ජුදයේ සෑම ගම්වලින් ද
ජෙරුසලමෙන් ද ආ පරිසිවරු හා විනයධරයෝ එහි
හිඳගෙන උන්හ. රෝගීන් සුව කිරීමේ දේවානුභාවය
උන් වහන්සේට තිබිණ. 18 එකල මිනිස්සු අංසබාග
රෝගියකු යහනක තබා ගෙනොහ. ඔව්හු ඔහු
ඇතුළට ගෙනෙවුත් උන් වහන්සේ ඉදිරියෙහි තබන්න
සෙවූ හ. 19 එහෙත්, සමූහයා නිසා ඇතුළට ගෙනෙ
යන්නට මඟක් නොදැක පියස්සට නැඟී සෙවිල්ල
ඇර, ජේසුස් වහන්සේ ඉදිරියෙහි පිරිස මැදට
මෙට්ටයත් සමඟ රෝගියා බැස්වූ හ. 20 උන්
වහන්සේ ඔවුන්ගේ ඇදහිල්ල දැක, “මිත්‍රය, ඔබේ
පව් ඔබට කමා කරන ලදැ”යි වදාළ සේක. 21 එවිට
විනයධරයෝ ද පරිසිවරු ද, “දේවාපහාස වචන
කියන මේ මිනිහා කවරෙක් ද? දෙවියන් වහන්සේට
මිස පව් කමා කරන්න පුළුවන් අන් කාට දැ”යි විවාද
කරන්න පටන්ගත්හ. 22 ජේසුස් වහන්සේ ඔවුන්ගේ
කල්පනා දැන ඔවුන්ට උත්තර දෙමින්, “ඔබේ සිත්
තුළ මෙසේ විවාද කරන්නේ මන් ද? 23 වඩා පහසු
කොයි එක ද? ඔබේ පව් ඔබට කමා කරන ලදැ යි
කීම ද, නැතහොත් නැඟිට ඇවිදින්නැ යි කීම ද?
24 එහෙත්, පොළොවෙහි දී පව් කමා කරන්න
මනුෂ්‍ය-පුත්‍රයාණන්ට බලය ඇති බව ඔබ දැනගන්න
පිණිස මම මෙය කරමි”යි කියා, උන් වහන්සේ,
“මෙට්ටය රැගෙන යන්නැ යි මම ඔබට කියමි”යි
අංසබාග රෝගියාට වදාළ සේක. 25 එකෙණෙහි ම
ඔහු ඔවුන් ඉදිරියෙහි නැඟිට, තමා වැතිර හුන්
මෙට්ටය රැගෙන, දෙවියන් වහන්සේට ප්‍රශංසා
කරමින් ගෙදර ගියේ ය. 26 සියල්ලෝ විස්මිත ව
දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් බියෙන් ඇලළී,
“අද අපි හරි පුදුම දේ දුටුවමෝ”යි කී හ.

### ලවේ කැඳවීම
(මතෙ 9:9-13;මාක් 2:13-17)

27 ඉක්බිති උන් වහන්සේ නික්ම ගොස් ලවේ නම්
අයකැමියකු බදුපොළේ හිඳිනු දැක, “මා අනුව
එන්නැ”යි ඔහුට වදාළ සේක. 28 ඔහු සියල්ල
අත්හැරදමා නැඟිට උන් වහන්සේ අනුව ගියේ ය.
29 ලවේ සිය නිවසෙහි උන් වහන්සේට මහා
භෝජන සංග්‍රහයක් පිළියෙළ කළේ ය.
අයකැමියන් හා වනෙත් අයගනේ මහත් පිරිසක්
ඔවුන් සමඟ කෑමට හිඳගත්හ. 30 ලූක් 15:1-2එකල
පරිසිවරු ද ඔවුන්ගේ විනයධරයෝ ද උන්
වහන්සේගේ ශ්‍රාවකයන්ට විරුද්ධ ව චෝදනා
කරමින්, “ඔබ අයකැමියන් ද පව්කාරයන් ද සමඟ
කන්නේත් බොන්නේත් මන්දැ”යි ඇසූ හ. 31 ජේසුස්
වහන්සේ ඔවුන්ට පිළිතුරු දෙමින්, “රෝගීන්ට මිස
නිරෝගීන්ට වෙදාගනේ වැඩක් නැත. 32 මා ආයේ,
පව්වුන් මිස දමිටුන් පසුතැවී සිත් හරවා ගැනීමට
කැඳවීම පිණිස නොවේ ය”යි වදාළ සේක.

### උපවාස ප්‍රශ්නය
(මතෙ 9:14-17;මාක් 2:18-22)

33 එවිට ඔව්හු උන් වහන්සේට කතා කොට,
“ජොහන්ගේ ගෝලයෝ නොයෙකේ වර උපවාස
පවත්වා යාච්ඤා පුද කරති; පරිසිවරුන්ගේ
ගෝලයෝත් එසේ ම කරති. එහතේ ඔබේ
ශ්‍රාවකයෝ කමින් බොමින් සිටිති”යි කී හ.
34 ජේසුස් වහන්සේ, පිළිතුරු දෙමින්, “මනාලයා
මඟුල් ගෙදර සිටිය දී මනාල පිරිස උපවාසයහෙි
යදෙවිය හැකි ද? 35 එහතේ, මනාලයා ඔවුන්
කරෙනේ වනේ කරනු ලබන දවස එයි, ඒ දවසේ දී
ඔවුන් උපවාස කරනු ඇතැ”යි වදාළ සේක.
36 උන් වහන්සේ ඔවුන්ට මේ උපමාව ද වදාළ
සේක: “කිසිවකෙු අලුත් ඇඳුමකින් රදෙිකඩක් ඉරා
පරණ ඇඳුමකට අල්ලා මහන්නේ නැත. එසේ
කළොත් අලුත් ඇඳුම ඉරී යනවා පමණක් නොව,
අලුත් ඇඳුමනේ ගත් කෑල්ල පරණ ඇඳුමට
කැපනේනේ ද නැත. 37 කිසිවකෙු නව මිදියුස,
පැරණි බඳුන්වලට වත් කරන්නේ නැත; වත්
කළොත්, නව මිදියුසින් බඳුන් පැළී මිදියුස වැගිරී,
බඳුනුත් නාස්ති වයේ. 38 නව මිදියුස වත් කළ
යුත්තේ නව බඳුන්වල ම ය. 39 තවද, පරණ මිදියුස
පානය කළ කිසි මිනිසකේ නව මිදියුස රුචි
නොකරයි; පරණ මිදියුස ම රසය යි ඔහු කියන්නේ
ය.”

### සබත කඩ කිරීමේ ප්‍රශ්නය
(මතෙ 12:1-8;මාක් 2:23-28)

6 ද්වි.නී. 23:25 එක් සබත් දිනක ජේසුස්
වහන්සේ කතේ යායක් මැදින් ගමන් කරන
විට උන් වහන්සේගේ ශ්‍රාවකයෝ කරල් කඩා
අතින් පොඩි කර කෑ හ. 2 එවිට පරිසිවරුන්ගනේ
සමහරකේ, “සබත් දිනයේ දී නොකටයුත්තක් ඔබ
කරන්නේ මන්දැ”යි ඇසූ හ. 3 1 සාමු 21:1-6ජේසුස්
වහන්සේ උත්තර දෙමින්, “දාවිත් රජු තමන්ට ද සිය
පිරිවරට ද බඩගිනි වූ විට කළ දේ, 4 ලවේ
24:9එනම්, දවේයන් වහන්සේගේ ගෘහයට ඇතුළු ව,
පූජකයන් මිස අන් කනෙකෙුන් අනුභව නොකළ යුතු,
පිදූ රොටි කා, සිය පිරිවරටත් දුන් පුවත ඔබ කියවා
නැද්දැ”යි ඔවුන්ගනේ ඇසූ සේක. 5 උන් වහන්සේ
තවදුරටත් කතා කරමින්, “මනුෂ්‍ය-පුත්‍රයාණෝ
සබත් දිනට පවා අධිපතියාණෝ ය”යි ඔවුන්ට වදාළ
සේක.

### අත පණ නැති මිනිසා
(මතෙ 12:9-14;මාක් 3:1-6)

6 තවත් සබත් දිනකෙ උන් වහන්සේ ධර්මශාලාවට
ඇතුළු ව ඉගැන්වූ සේක. දකුණු අත පණ නැති
මිනිසකේ එහි විය. 7 එවිට විනයධරයෝ ද පරිසිවරු
ද උන් වහන්සේට විරුද්ධ ව චෝදනාවක් එල්ල
කරන අටියනේ උන් වහන්සේ සබත් දිනයේ දී සුව
කරනු ඇද්දැ යි බලමින් සිටියහ. 8 එහතේ, උන්
වහන්සේ ඔවුන්ගේ සිතිවිලි දැන, “නැඟිට මෙහි මැද
සිටින්නැ”යි අත පණ නැති මිනිසාට වදාළ සේක.
ඔහු එහි නැඟිට සිටියේ ය. 9 එකල ජේසුස්
වහන්සේ, “සබත් දිනයේ දී අප කළ යුත්තේ
යහපත ද නොහොත් අයහපත ද, ප්‍රාණයක්
ගැළවීම ද නොහොත් නැසීම ද යන ප්‍රශ්නය මම
ඔබනේ අසමි”යි වදාළ සේක. 10 උන් වහන්සේ
ඔවුන් සියල්ලන් දසෙ වටේට බලා, “ඔබේ අත
දිගහරින්නැ”යි ඔහුට වදාළ සේක. ඔහු එසේ
කළේ ය; අත සුව විය. 11 එවිට ඔව්හු කෝපයනේ
උමතු වී, “ජේසුස් වහන්සේට කුමක් කරමු දැ”යි
තම තමන් අතර කතා කරගන්නට වූ හ.

### ප්‍රේරිතයන් දොළොස්දනො තෝරා ගැනීම
(මතෙ 10:1-4;මාක් 3:13-19)

12 තවද, ඒ දවස්වල දී උන් වහන්සේ යාච්ඤා
කරන පිණිස කන්දකට නැඟී දවේයන් වහන්සේට
යාච්ඤා කරමින් මුළු රැය ගවෙූ සේක. 13 පහන් වූ
කල උන් වහන්සේ සිය ශ්‍රාවකයන් කැඳවා, ඔවුන්
අතරනේ දොළොස් දනෙකෙු තෝරාගනෙ, ඔවුන්ට
ප්‍රේරිතයෝ යයි නම් තැබූ සේක. 14 ඔව්හු කවුරු ද
යත්: උන් වහන්සේ විසින් පේදුරු යයි නම් කරන ලද
සීමොන් සහ ඔහුගේ සොහොයුරු ඇන්ඩෘ ද
ජාකොබ් සහ ජොහන් ද පිලිප් සහ බර්තොලමවේ
ද 15 මතවේ සහ තෝමස් ද අල්පවෙුස්ගේ පුත්
ජාකොබ් සහ අන්ත ජාතිවාදියා යි නම් ලත් සීමොන්
ද 16 ජාකොබ්ගේ පුත් ජූදස් සහ පසුව දෝහියා වූ
ජූදස් ඉස්කාරියොත් ද යන මොවුහු ය.

### මහා ජනකායට සුව සතෙ
(මතෙ 4:23-25)

17 උන් වහන්සේ ඔවුන් සමඟ කන්දනේ බැස
තැනිතලා බිමක නැවතී සිටි සේක; උන්
වහන්සේගේ ශ්‍රාවකයන්ගනේ මහා සමූහයක් ද,

මුළු ජුදයනේ හා ජරෙුසලමනෙුත්, තීර්හි සහ
සීදොනයහෙි මුහුදුකරයනෙුත් උන් වහන්සේගේ
දේශනා අසන්නට හා සිය රෝග සුව කරවාගන්නට
ආ බොහෝ දනෙකේ ද එහි වූ හ.
18 අශුද්ධාත්මයන්ගනේ පීඩිත වූවෝ සුව කරනු ලැබූ
හ. 19 උන් වහන්සේ කරෙනේ අනුහස නික්ම ඔවුන්
සියල්ලන් සුව කළ බැවින්, මුළු සමූහයා උන්
වහන්සේගේ ඇඟට අත තබන්නට උත්සාහ කළහ.

### සැපත හා විපත
(මතෙ 5:1-12)

20 එකල උන් වහන්සේ සිය ශ්රාවකයන් දසෙ බලා
මසෙේ වදාළ සේක:
20 “දිළිඳු වූ ඔබ භාග්යවන්තයෝ ය;
q220 මන්ද, දවේයන් වහන්සේගේ රාජ්යය ඔබගේ
ය.
21 දැන් සාගිනි ඇති ඔබ භාග්යවන්තයෝ ය;
q221 මන්ද, ඔබ තෘප්තිමත් වනු ඇත.
21 දැන් කඳුළු හළෙන ඔබ භාග්යවන්තයෝ ය;
q221 මන්ද, ඔබ සිනාසනෙු ඇත.
22 1 පේදු 4:14 මනුෂ්ය-පුත්රයාණන් නිසා මිනිසුන්
ඔබට වරෙ බැඳ, ඔබ ප්රතික්ෂේප කොට, ඔබට
නින්දා කොට, ඔබේ නාමය හළො දකින කල ඔබ
භාග්යවන්තයෝ ය. 23 2 වංශා 36:16; ක්රියා 7:52ඒ
දවස්වල දී ප්රමෝද වන්න, ප්රීතියනේ නටන්න;
මක්නිසා ද යත්, ස්වර්ගයහෙි ඔබගේ පල විපාක
ඉමහත් වනු ඇත; ඔවුන්ගේ පියවරු දිවැසිවරයන්ට ද
එසේ ම කළහ.
24 අහෝ, ධනවත් ඔබට වන විපතක මහත!
q224 ඔබේ සැපවත් ජීවිතය ඔබ විඳ හමාර ය.
25 අහෝ, දැන් පුෂ්ටිමත් ව සිටින ඔබට වන
විපතක මහත!
q225 ඔබට, සාගිනි වනු ඇත.
25 අහෝ දැන් සිනාසනෙ ඔබට වන විපතක මහත!
q225 ඔබ හඬා වැලපනෙු ඇත.
26 අහෝ, මිනිසුන් ඔබ පසසන විට ඔබට වන
විපතක මහත!
q226 ඔවුන්ගේ පියවරුන් බොරු දිවැසිවරයන්ටත්
කළෙේ එය ම ය.”

### සතුරන් කරෙහෙි මතේ සිත් වැඩීම
(මතෙ 5:38-48;7:12)

27 “මට සවන් දනෙ ඔබට මයෙ කියමි: ඔබේ
සතුරන්ට ප්රේම කරන්න; ඔබට වරෙ කරන්නන්ට
යහපත කරන්න; 28 ඔබට සාප කරන්නන්ට සතේ
පතන්න; ඔබට ගැරහුම් කරන්නන් උදසො යාච්ඤා
කරන්න; 29 ඔබේ එක කම්මුලකට අතුල් පහර දනෙ
අයට අනික් කම්මුල පාන්න; ඔබේ උතුරු සළුව
පැහැර ගන්නාගනේ ඔබේ අඳනය වුව ද වළක්වා
නොගන්න. 30 ඔබනේ ඉල්ලන හැමට ම දනේන; ඔබ
සතු දේ පැහැර ගන්නාගනේ යළිත් එය
නොඉල්ලන්න. 31 මතෙ 7:12අනුන් ඔබට යමක්
කරනවාට ඔබ කැමැත්තහු ද ඔබත් ඔවුන්ට ඒ දේ
ම කරන්න.
32 “ඔබට ප්රේම කරන්නන්ට පමණක් ඔබ ප්රේම
කරන්නහු නම්, ඉන් ඔබට කවර නම් ප්රශංසාවක්
වේ ද? පව්කාරයෝ පවා තමන්ට ප්රේම
කරන්නන්ට ප්රේම කරති. 33 ඔබට යහපත
කරන්නන්ට පමණක් ඔබ යහපත කරන්නහු නම්,
ඉන් ඔබට කවර නම් ප්රශංසාවක් වේ ද?
පව්කාරයෝ පවා එසේ කරති. 34 ඔබ නැවත ලබනෙ
බලාපොරොත්තුවනේ ණයට දනේනහු නම්, ඉන්
ඔබට කවර නම් ප්රශංසාවක් වේ ද? පව්කාරයෝ
පවා දනෙ ප්රමාණය නැවත ලබන පිණිස
පව්කාරයන්ට ණයට දති. 35 එහතේ, ඔබේ
සතුරන්ට ප්රේම කරන්න, යහපත කරන්න, ආපසු
ලබන බලාපොරොත්තුවක් නැති ව ම ණයට දනේන.
එවිට ඔබේ පල විපාක මහත් වේ; ඔබ
පරමෝත්තමයාණන්ගේ පුත්රයෝ වන්නහු ය. මන්ද,
කළෙහෙි ගුණ නොදත් අයට ද දුෂ්ටයන්ට ද උන්
වහන්සේ කාරුණික ය. 36 ඔබේ පියාණන් වහන්සේ
දයානුකම්පා ඇති ව සිටින්නාක් මනේ ම ඔබ ද
දයානුකම්පා ඇති ව සිටින්න.”

### අනුන් විනිශ්චය කිරීම
(මතෙ 7:1-5)

37 “අනුන් විනිශ්චය නොකරන්න; එවිට ඔබත්
විනිශ්චය කරනු නොලැබේ. අනුන් වරදට පත්
නොකරන්න; එවිට ඔබත් වරදට පත් කරනු
නොලැබේ; සමාව දනේන; එවිට ඔබට ද සමාව
දනෙු ලැබේ. 38 අනුන්ට දනේන, එවිට ඔබටත් දනෙු
ලැබේ. ඔව්හු නියම මිම්ම පිරී ඉතිරී යන තරමට
එය සොලව සොලවා, තද තදා ඔබගේ
ඔඩොක්කුවට මැන දමන්නහු ය. ඔබ යම් මිම්මකින්
මැන දනේනහු ද, ඒ මිම්මනේ ම ඔබටත් ආපසු මැන
දනෙු ලැබේ ය”යි වදාළ සේක.
39 මතෙ 15:14 තවද, උන් වහන්සේ ඔවුන්ට මේ
උපමාව වදාළ සේක: “අන්ධයකෙුට මඟ පනේවීමට
අන්ධයකෙුට හැකි ද? ඔවුන් දදෙනො ම වළක
වැටනේනේ නැද් ද? 40 මතෙ 10:24-25; ජොහ 13:16;
15:20ගෝලයා ගුරුවරයාට වඩා උසස් නොවේ.
එහතේ, පූර්ණ පුහුණුව ලත් සැම දනෙ ම තම
ගුරුවරයා හා සම වන්නෝ ය. 41 ඔබේ ම ඇසහෙි
තිබනෙ ලී කොටය නොබලා සහෝදරයාගේ ඇසහෙි
තිබනෙ ලී කුඩ සොයන්නේ මන් ද? 42 නොහොත්
ඔබේ ම ඇසහෙි තිබනෙ ලී කොටය නොබලා,
‘සහෝදරය, ඔබේ ඇසහෙි තිබනෙ ලී කුඩ ඉවත
ලන්නට ඉඩ දනේනැ’යි සහෝදරයාට කියන්නට ඔබට
කසෙේ හැකි වේ ද? කරොටික ය, පළමු කොට
ඔබේ ම ඇසින් ලී කොටය ඉවත ලන්න. එවිට
සහෝදරයාගේ ඇසහෙි තිබනෙ ලී කුඩ ඉවත ලන්න
ඔබට මැනවින් පනෙනෙු ඇත.”

## පලවලින් ගස හැඳින්වමේ
(මතෙ 7:16-20;12:33-35)

43 “නරක පල දනෙ හාොඳ ගසක් වත්, හාොඳ පල
දනෙ නරක ගසක් වත් නැත. 44 මතෙ 12:33එක එක
ගස එහි පලවලින් හඳුනාගනු ලැබමේ. මිනිස්සු කටු
ගස්වලින් අත්තික්කා පල නළො නාොගනිති; ගාොකටු
පඳුරකින් මිදි පල කඩා නාොගනිති. 45 මතෙ
12:34යහපත් මිනිසා තම සිතහෙි නිදන් කළ යහපත්
දයෙින් යහපත් දයෙ ද, අයහපත් මිනිසා අයහපත්
දයෙින් අයහපත් දයෙ ද උපදවයි. මන්ද, සිතනේ
උතුරා යන දයෙ කටින් පිට වමේ.”

## අත්තිවාරම් දකෙ
(මතෙ 7:24-27)

46 “මා වදාරන දයෙ නාොකර, මට ‘ස්වාමීනි,
ස්වාමීනි’යි කියන්නමේ මන් ද? 47 මා වතෙට විත්
මාගමේ අනුශාසනා අසා ඒවා පිළිපදින අය කවරකුෙට
සමාන දැ යි ඔබට පනේවමි. 48 ඔහු ගැඹුරට
පාොළාොව කැණ, පර්වතය මත අත්තිවාරම දමා,
ගයෙක් සෑදූ මිනිසකුෙට සමාන ය. ජල ගැල්මක්
පැමිණ, සැඩ පහර ඒ ගටෙ ගැසූ නමුත් එය මනා
ලසෙ ඉදි කාොට තිබුණු බැවින් සාොලවන්න
නාොහැකි විය. 49 එහතේ වචනය අසා, නාොපිළිපදින
තැනැත්තා අත්තිවාරමක් නැති බිමහෙි ගයෙක් තැනූ
මිනිසකුෙට සමාන ය. සැඩ පහර ඒ ගටෙ ගැසී ය,
එවලේමේ ම එය ඇද වැටුණමේ ය. එහි විනාශය ද
භයංකර විය.”

## ශතාධිපතියාගමේ සමේවකයාට සුවය
(මතෙ 8:5-13;ජාොහ 4:46-54)

7 ජමේසුස් වහන්සමේ තමන් අදහස් කළ සියල්ල
සනෙඟෙට කියා නිම කළ පසු කපර්ණවුමට
ඇතුළු වූ සමේක.
2 එක් ශතාධිපතියකුගමේ ඉතා හිතවත් දාසයකේ
රමෝගී ව මරණාසන්න ව සිටියමේ ය. 3 ඔහු ජමේසුස්
වහන්සමේ ගැන අසා, සිය දාසයා සුව කරන පිණිස
වඩින මනේ උන් වහන්සමේට අයැදිනු වස් ජුදවේ
ප්‍රජා මූලිකයන් උන් වහන්සමේ වතෙ යැවී ය.
4 ඔව්හු ජමේසුස් වහන්සමේ වතෙ පැමිණ,
5 “ඔබගනේ ඒ වරය ලබන්න ඔහු සුදුස්සකේ, ඔහු
අපමේ ජාතියට හිත ඇති කනෙකේ; තවද අපමේ
ධර්මශාලාව තනා දුන්නතේ් ඔහු ය” කියා, උන්
වහන්සමේගනේ උදක් ම ඉල්ලා සිටියහ. 6 එවිට
ජමේසුස් වහන්සමේ ඔවුන් සමඟ වැඩිය සමේක. උන්
වහන්සමේ ගදෙරට නුදුරු ව සිටිය දී ශතාධිපතියා
මසෙමේ කියා උන් වහන්සමේ වතෙට මිත්‍රයන් යැවී
ය, “ස්වාමීනි, වහෙසෙ නාොවන්න, ඔබ මාගමේ
පියස්ස යටට වැඩමවාගැනීමට මම නාොවටිමි. 7 මා
ඔබ වතෙට නාොපැමිණියමේ ඒ නිසා ය. එහතේ වචන
මාත්‍රයක් පැවසුව මැනව. එවිට මාගමේ මහෙකෙරුවා
සුවපත් වනු ඇත. 8 මම ද බලය ලත් අය යටතහෙි
සිටින මිනිසකේමි. මා යටතහෙි ද භමේවායමෝ සිටිති.
එක් අයකුෙට යන්නැ යි මා කී කල, ඔහු යයි; තව
අයකුෙට එන්නැ යි කී කල, ඔහු එයි; මාගමේ
දාසයාට මයෙ කරව යි කී කල, ඔහු එය කරයි.”
9 ජමේසුස් වහන්සමේ ඒ අසා, ඔහු ගැන මවිත වී,
හැරී, තමන් පසුපස්සමේ ආ පිරිසට; “මුළු ඉශ්‍රායලේ
ජනතාව අතර වත් මතෙරම් මහා ඇදහිල්ලක් මා
දැක නැතැ යි නුඹලාට කියමි”යි වදාළ සමේක.
10 පණිවුඩකාරයමෝ හැරී ගිය කල, ඒ දාසයා සුවපත්
ව සිටිනු දුටහ.

## නායින් නුවර පුනරුත්ථාන සිද්ධිය

11 ඉන්පසු ජමේසුස් වහන්සමේ නායින් නම් නුවරකට
වැඩිය සමේක. උන් වහන්සමේගමේ ශ්‍රාවකයමෝ ද
මහත් සමූහයක් ද උන් වහන්සමේ පිරිවරා ගියහ.
12 උන් වහන්සමේ නුවර දාොරටුවට ළං වූ කල, මළ
මිනියක් පිටතට ගනෙනෙ ලද්දමේ ය. මළ තැනැත්තමේ,
සිය මවගමේ එක ම පුත්‍රයා ය. ඈ ද වැන්දඹුවකි.
නුවරවාසී විශාල පිරිසක් ඈ සමඟ ආහ.
13 සමිඳාණන් වහන්සමේ ඈ දැක අනුකම්පා කාොට,
“හැඬීම නවත්වන්නැ”යි වදාළ සමේක. 14 උන්
වහන්සමේ ළං වී දණෙට අත තැබූ සමේක. එවිට දණෙ
උසුලන්නමෝ නැවතුණාොහ. උන් වහන්සමේ, “යෞවනය,
නැඟිටින්නැ යි මම ඔබට කියමි”යි වදාළ සමේක.
15 එවිට මළ මිනිසා නැඟිට හිඳගනෙ කතා කරන්න
පටන්ගත්තමේ ය. උන් වහන්සමේ ඔහු සිය මෑණියන්ට
භාර දුන් සමේක. 16 එකල සියල්ලමෝ ම බිය පත් ව,
“ශ්‍රමේෂ්ඨ දිවැසිවරයකේ අප අතර පහළ වී සිටියි.
දවෙියන් වහන්සමේ සිය සනෙඟ ගළවන්න වැඩිය
සමේකැ”යි කියමින් දවෙියන් වහන්සමේට ප්‍රශංසා
කළහ. 17 උන් වහන්සමේ ගැන මමේ පුවත මුළු
ජුදයහෙි ද අවට පදෙසේවල ද පැතිර ගියමේ ය.

## ස්නාවක ජාොහන්ගමේ ප්‍රශ්න
(මතෙ 11:2-19)

18 ජාොහන්ගමේ ගමෝලයමෝ ඔහුට මමේ සියල්ල
දැන්වූ හ. එවිට ජාොහන් සිය ගමෝලයන්ගනේ
දදෙනෙකුෙ කැඳවා, 19 “වඩින්ට සිටින තැනැන්
වහන්සමේ ඔබ ද? නාොහාොත් වනෙ කනෙකුෙ
අපමේක්ෂා කරමු දැ”යි අසනු පිණිස සමිඳාණන්
වහන්සමේ වතෙ ඔවුන් යැවී ය. 20 ඔව්හු උන්
වහන්සමේ වතෙ පැමිණ, “ ‘වඩින්ට සිටින තැනැන්
වහන්සමේ ඔබ ද? නාොහාොත් වනෙ කනෙකුෙ
අපමේක්ෂා කරමු දැ’යි විමසනු වස් ස්නාවක ජාොහන්
අප ඔබ වතෙ එව් ය”යි කී හ. 21 ඒ වලේාවමේ දී ම
උන් වහන්සමේ බාොහමෝ දනෙකුෙගමේ ලඩෙ රමෝග
සුව කර, අශුද්ධාත්ම දුරු කර, අන්ධයන් බාොහමෝ
දනෙකුෙට පනෙීම දුන් සමේක. 22 යසො 35:5-6;
61:1උන් වහන්සමේ උත්තර දමෙින්, “යන්න, ඔබ ඇසූ
දුටු දයෙ ජාොහන්ට දන්වන්න; අන්ධයමෝ පනෙීම
ලබති, කාොරු ඇවිදිති, ලාදුරු රමෝගීහු පවිත්‍ර කරනු
ලබති, බිහිරමෝ ඇසීම ලබති, මළාොහු නැඟිටුවනු
ලබති; දිළිඳුන්ට සුබ අස්න ප්‍රකාශ කරනු ලැබමේ.
23 මා කරෙහෙි විශ්වාසය නැති කර නාොගන්නා

තැනැත්තෝ භාග්‍යවන්තයකෙ”යි ඔවුන්ට වදාළ
සේක.
24 ජොහන්ගේ දූතයන් නික්ම ගිය විට උන්
වහන්සේ ජොහන් ගැන පිරිසට කතා කරමින්, “ඔබ
කුමක් බැලීමට වනයට ගියහු ද? සුළඟින් සැලනෙ
බට ගසක් ද? 25 කුමක් බැලීමට ගියහු ද? සිනිඳු
පිළියනේ සැරසුණු මිනිසකුෙ ද? බලන්න, විසිතුරු
වස්ත්‍ර හැඳ, සැප විහරණයනේ කල් යවන්නෝ නම්
රජ මැඳුරුවල සිටිති. 26 එසේ නම් ඔබ කුමක්
බැලීමට ගියහු ද? දිවැසිවරයකුෙ බැලීමට ද? එසේ
ය, මම ඔබට කියමි; ඔහු දිවැසිවරයකුෙටත් වඩා
ශ්‍රේෂ්ඨයකෙි,
27 මලාකි 3:1 'බලන්න, මාගේ දූතයා ඔබ පරෙටුව
යවමි, හතෙමෙ ඔබ වඩිනා මඟ ඔබ ඉදිරියහෙි
පිළියළෙ කරන්නේ ය'යි
27 ශුද්ධ ලියවිල්ලේ ලියා ඇත්තේ මොහු ගැන ය.
28 මුළු මිනිස් සංහතිය තුළ ජොහන්ට වඩා ශ්‍රේෂ්ඨ
කනෙකේ නැතැ යි මම ඔබට කියමි. එහතේ දවේයන්
වහන්සේගේ රාජ්‍යයහෙි ඉතා සුළු තැනැත්තේ වුව
ද ඔහුට වඩා ශ්‍රේෂ්ඨය”යි වදාළ සේක. 29 මතෙ
21:32; ලූක් 3:12ඒ ඇසූ මුළු පිරිස ද අයකැමියෝ ද
තමන් ජොහන්ගේ බව්තීස්ම-ස්නාපනය ලැබූ බැවින්,
දවේයන් වහන්සේ ධාර්මික බව පිළිගත්හ.
30 එහතේ පරිසිවරු ද විනයධරයෝ ද ඔහුගනේ
බව්තීස්ම-ස්නාපනය නොලැබූ බැවින් තමන් පිළිබඳ
දවේයන් වහන්සේගේ අභිප්‍රාය ප්‍රතික්ෂේප කළහ.
31 තවදුරටත් උන් වහන්සේ මසෙේ වදාළ සේක:
“මේ පරම්පරාවහෙි මිනිසුන් කුමකට සමාන කරම්
ද? කුමන දයෙකට මොවුහු සමාන ද? ඔව්හු වනාහි,
වළෙඳ පොළේ හිඳ ඔවුනොවුන්ට හඬගා,
32 'අපි ඔබට නළා පිම්බමෙු.
q232 ඔබ නැටුවේ නැත;
q232 අපි ඔබට විලාප කීමු, ඔබ හැඬුවේ නැතැ'යි
32 කියන දරුවන් හා සමාන වති. 33 ස්නාවක
ජොහන් නිරාහාර ව ද මිදියුසින් තොර ව ද සිටි
කනෙකේ; එබැවින් 'ඔහු දුෂ්ටාත්මාවේශ වූවකෙ'යි
ඔබ කියන්නහු ය. 34 මනුෂ්‍ය-පුත්‍රයාණෝ කමින්
බොමින් ආ සේක; 'බලන්න, ඔහු කෑදරයකෙි,
බේබද්දකෙි, අයකැමියන්ගේත්, පව්කාරයන්ගේත්
යහළුවකෙ'යි ඔබ කියන්නහු ය. 35 දවේයන්
වහන්සේගේ ප්‍රඥාව නිවැරැදි බව එය පිළිගන්න
සියලු දරුවන් මඟින් දිස් වන්නේ ය.”

## පව්වූ අඟනකට කමාව

36 එක් පරිසිවරයකේ තමා සමඟ ආහාර වළඳන
පිණිස ජේසුස් වහන්සේට ආරාධනා කළෙේ ය. උන්
වහන්සේ පරිසිවරයාගේ ගදෙරට වැඩම කර, කෑමට
හිඳගත් සේක. 37 මතෙ 26:7; මාක් 14:3; ජොහ
12:3ඒ නුවර විසූ පව්කාර ස්ත්‍රියක් උන් වහන්සේ
පරිසිවරයාගේ ගදෙර කෑමට වැඩහුන් බව දැන,
සුවඳ විලවුන් පිරුණු කිරිගරුඬ කරඬුවක් රැගනෙ
එතැනට ආවා ය. 38 ඈ උන් වහන්සේ පිටිපසින්
පාමුල සිට හඬ හඬා, උන් වහන්සේගේ පාද
කඳුළනේ තමෙන්ට පටන්ගනෙ, ඇගේ හිසකේවලින්
පිසදමා, උන් වහන්සේගේ පාද සිඹ, සුවඳ
විලේපනයනේ ආලේප කළා ය. 39 උන් වහන්සේට
ආරාධනා කළ පරිසිවරයා ඒ දැක: “මොහු
දිවැසිවරයකේ නම් තමාගේ ඇඟට අත තබන මේ
පව්කාර ස්ත්‍රිය කවර තැනැත්තියක් ද කබෙඳු
අඟනක් ද කියා දැනගනු ඇතැ”යි සිය සිතින් සිතුවේ
ය. 40 ජේසුස් වහන්සේ උත්තර දමේින්, “සීමොන්,
ඔබට කිය යුතු කරුණක් ඇතැ”යි වදාළ සේක. ඔහු
ද, “ගුරුදේවයනෙි, වදාළ මැනවැ”යි කී ය. 41 උන්
වහන්සේ කතා කොට, “මුදල් ණයට දනෙ එක්තරා
මිනිසකුෙට ණයකාරයෝ දදෙනෙකේ සිටියහ. එක්
කනෙකේ රිදී කාසි පන් සියයක් ද, අනිත් තැනැත්තා
පණසක් ද ණය ව සිටියෝ ය. 42 ණය ගවේීමට
ඔවුන්ට කිසි වත්කමක් නැති වූයනේ ඔහු ඒ
දදෙනොට ම කමා කළෙේ ය. එබැවින් ඒ
දදෙනොගනේ කවරකේ ඔහුට වැඩියනේ ප්‍රේම
කරනු ඇද්දැ”යි ඇසූ සේක. 43 සීමොන් උත්තර
දමේින්, “ඔහු, යමකුෙට වැඩියනේ කමා වූයේ ද, ඒ
තැනැත්තා යයි මම සිතමි”යි කී ය. එවිට උන්
වහන්සේ, “ඔබේ පිළිතුර හරි ය”යි ඔහුට කියා,
44 ස්ත්‍රිය දසෙට හැරී, සීමොන්ට කතා කොට, “මේ
ස්ත්‍රිය ඔබට පනෙනෙවා නොවේ ද? මම ඔබේ
ගදෙරට ඇතුළු වුණමේ, ඔබ මාගේ පාද සේදීමට
වතුර නුදුන්නහෙි ය. එහතේ මෑ සිය කඳුලින් මාගේ
පාද තමො සිය හිසකේවලින් ඒවා පිසදැමුවා ය.
45 ඔබ මා සිම්බේ නැත. එහතේ, මෑ මා ආවලේලේ
පටන් මාගේ පාද සිඹීම නතර නොකළා ය. 46 ඔබ
මාගේ හිස තලෙින් ආලේප නොකළෙහෙි ය.
එහතේ, මෑ මාගේ පාද සුවඳ විලේපනයනේ ආලේප
කළා ය. 47 එබැවින් මම ඔබට කියමි, ඇගේ
බොහෝ වූ පව් ඇයට කමා කරන ලද බව ඈ මට
දැක් වූ ඇගේ ඉමහත් ප්‍රේමයනේ ඔප්පු වේ.
එහතේ, යමකුෙට ස්වල්ප වශයනේ කමා කරනු
ඇද්ද, ඔහු ස්වල්ප වශයනේ ප්‍රේමය දක්වනු
ඇතැ”යි වදාළ සේක. 48 එවිට උන් වහන්සේ,
“ඔබේ පව් ඔබට කමා කරන ලදැ”යි ඇයට වදාළ
සේක. 49 උන් වහන්සේ සමඟ කෑමට සිටි අය, “පව්
කමාව පවා දනෙ මොහු කවරකේ දැ”යි තම තමන්
අතර විමසූ හ. 50 එහතේ උන් වහන්සේ, “ඔබේ
ඇදහිල්ල ඔබට ගැළවීම ගනෙ දුන්නේ ය, ශාන්ති
සිතින් යන්නැ”යි ඒ ස්ත්‍රියට වදාළ සේක.

## උපස්ථායිකාවෝ

8 ඉන්පසු ජේසුස් වහන්සේ ධර්ම දේශනා
කරමින් ද දවේයන් වහන්සේගේ රාජ්‍යය
පිළිබඳ සුබ අස්න ප්‍රකාශ කරමින් ද නගර සහ
ගම්වල සැරිසැරූ සේක. උන් වහන්සේ සමඟ
ශ්‍රාවකයෝ දොළොස්දනො ද 2 මතෙ 27:55-56;
මාක් 15:40-41; ලූක් 23:49අශුද්ධාත්ම කරෙනේ හා
ලඩෙ රෝගවලින් සුවය ලත් සමහර ස්ත්‍රීහු ද
තමන් කරෙනේ දුෂ්ටාත්මයන් හත් දනෙකුෙ දුරු
කරනු ලැබූ මග්දලේනා නම් ලත් මරියා ද

3 හරොද්ගේ භාණ්ඩාගාරික වන කූසාගේ භාර්යාව
වන ජෝවන්නා ද සූසානා ද සිය සම්පතින් උන්
වහන්සේට උපස්ථාන කළ තවත් බොහෝ ස්ත්‍රීහු ද
සිටියහ.

### වපුරන්නා පිළිබඳ උපමාව
(මතෙ 13:1-9;මාක් 4:1-9)

4 ඒ ඒ නුවරින් මිනිසුන් උන් වහන්සේ වෙත
පැමිණ, මහා පිරිසක් රැස්වූ කල උන් වහන්සේ
උපමාවකින් මෙසේ වදාළ සේක: 5 “වපුරන්නෙක්
බීජ වපුරන්න නික්මිණි; ඔහු වපුරන කල බීජ
සමහරක් මඟ දිගේ වැටී පයින් පෑගිණි; අහසේ
කුරුල්ලෝ ඒවා අවුළා කෑහ. 6 අන් සමහරක් ගල්
බිමෙහි වැටී පැළ වූ කණෙහි ම දිය සීරාව නැති
බැවින් වියළී ගියේ ය. 7 අන් සමහරක් කටු පැළ
අතර වැටිණි. කටු පැළ ද ඒ සමඟ ම වැඩී ඒවා
යටපත් කර දැමී ය. 8 අන් සමහරක් සරු බිමේ වැටී,
පැළ වූ විට එකකින් සිය ගුණයක් අස්වැන්න ඇති
විය.” උන් වහන්සේ මෙසේ වදාරා, තවදුරටත්,
“සවන් ඇත්තෝ සවන් දෙත් වා!”යි හඬ නඟා වදාළ
සේක.

### උපමාවල අදහස
(මතෙ 13:10-17;මාක් 4:10-12)

9 උන් වහන්සේගේ ශ්‍රාවකයෝ, “ඒ උපමාවේ
තේරුම කිමෙක් දැ”යි උන් වහන්සේගෙන් විමසූ හ.
10 යෙසා 6:9-10උන් වහන්සේ ඔවුන්ට මෙසේ වදාළ
සේක: “දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ අබිරහස්
පිළිබඳ අවබෝධය ඔබට දී ඇත. එහෙත්, දැක
දැකත් නොදක්නා පිණිස ද අස අසාත්
නොවටහාගන්නා පිණිස ද සෙසු අයට ඒවා උපමා
මඟින් දෙනු ලැබේ.”

### උපමාවේ විවරණය
(මතෙ 13:18-23;මාක් 4:13-20)

11 “උපමාවේ තේරුම මේ ය: බීජ නම් දෙවියන්
වහන්සේගේ වචනය ය. 12 මඟ අසල වූවෝ නම්
වචනය ඇසූ අය ය. එහෙත්, ඔවුන් අදහා ගැළවීම
නොලබන පිණිස, යක්ෂයා අවුත් ඔවුන්ගේ
සිත්වලින් වචනය පැහැර ගන්නේ ය. 13 ගල් බිමෙහි
වූවෝ නම්, වචනය අසා සතුටින් පිළිගන්න නමුත්,
සිත්හි රඳා නොපවතින බැවින් කලකට පමණක්
අදහා, පරීක්ෂා කාලයෙහි වැටී යන අය ය. 14 කටු
අතර වැටුණු බීජ යන්නෙන් අදහස් කරනුයේ වචනය
අසා ජීවිතයේ කම්කටොලුවලින් ද වස්තුවෙන් ද
ඉඳුරන් පිනවීමෙන් ද වචනය හිර වී සම්පූර්ණ පල
නොදරන අය ය. 15 සරු බිමේ වැපුරූ බීජ යන්නෙන්
අදහස් කරනුයේ අවංක, පිරිසිදු සිතකින් වචනය
අසා, පිළිපැද, නොපසුබට වීර්යයෙන් පල දරන අය
ය.”

### බඳුනකින් වැසූ පහන
(මාක් 4:21-25)

16 මතෙ 5:15; ලූක් 11:33 “කිසිවෙකු පහනක් දල්වා
බඳුනකින් වසන්නේ වත් යහනක් යට තබන්නේ
වත් නැත; එහෙත්, ඇතුළු වන්නන්ට එළිය පෙනෙන
පිණිස පහන්රුක උඩ තබති. 17 මතෙ 10:26; ලූක්
12:2ඒ නිසා හෙළි කරනු නොලබන සැඟවුණු දෙයක්
නැත; නොහොත් ප්‍රකාශයට පත් නොවන, හෙළි
නොවන කිසි රහසක් ද නැත. 18 මතෙ 25:29; ලූක්
19:26එබැවින් ඔබ සවන් දෙන්නේ කෙසේ දැ යි
විමසිල්ලෙන් සිටින්න. මන්ද, යමක් ඇති තැනැත්තාට
දෙනු ලැබේ; යමක් නැති තැනැත්තාගෙන්, තමාට
ඇතැ යි සිතන දෙය පවා පැහැරගනු ලැබේ.”

### ජේසුස් වහන්සේගේ මෑණියෝ සහ සහෝදරයෝ
(මතෙ 12:46-50;මාක් 3:31-35)

19 උන් වහන්සේගේ මෑණියෝ ද සහෝදරයෝ ද
උන් වහන්සේ වෙත ආහ. එහෙත්, සමූහයා නිසා
උන් වහන්සේට ළං වන්න ඔවුන්ට නොහැකි විය.
20 එවිට, “ඔබේ මෑණියෝ ද සහෝදරයෝ ද ඔබ
දකිනු රිසියෙන් පිටත සිටිති”යි උන් වහන්සේට
දන්වනු ලැබී ය. 21 එහෙත් උන් වහන්සේ ඔවුන්ට
උත්තර දෙමින්, “මාගේ මෑණියෝත් මාගේ
සහෝදරයෝත් නම් දෙවියන් වහන්සේගේ වචනය
අසා එය පිළිපදින්නෝ වෙති”යි වදාළ සේක.

### මාරුත දමනය
(මතෙ 8:23-27;මාක් 4:35-41)

22 එක් දිනක් ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන්
සමඟ ඔරුවකට නැඟී, “අපි එගොඩට යමු”යි ඔවුන්ට
වදාළ සේක. එවිට ඔව්හු ඔරුව දියත් කළහ.
23 ඔවුන් යාත්‍රා කරද්දී උන් වහන්සේ නිදාගත්
සේක. එකල චණ්ඩ මාරුතයක් නැඟී විල මත හැමී
ය; ඔරුවට වතුර පිරෙත් ම ඔව්හු මහ අනතුරකට
පත් ව සිටියහ. 24 ඔව්හු අවුත් උන් වහන්සේ
පුබුදුවා, “ස්වාමීනි, ස්වාමීනි, අප විනාශ වන්නේ ළඟ
ය”යි කී හ. උන් වහන්සේ පිබිද, මාරුතයට ද රළු
තරංගවලට ද තර්ජනය කළ සේක. එවිට මාරුතය
සංසිඳී නිශ්චලත්වයක් ඇති විය. 25 “ඔබේ ඇදහිල්ල
කොයි දැ”යි උන් වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක.
ඔව්හු බිය ව, විස්මයට පත් වී, “මේ මොන විධියේ
කෙනෙක් ද? සුළඟට හා ජලයට පවා මෙතුමාණෝ
අණ දෙති; ඒවා ද කීකරු වන්නේ ය”යි එකිනෙකාට
කියාගත්හ.

### ගෙරසේනයේ දුෂ්ටාත්මාවේශ වූවෙකු සුව කිරීම
(මතෙ 8:28-34;මාක් 5:1-20)

26 ඔව්හු ගලීලය ඉදිරියෙහි වූ ගෙරසේනයන්ගේ
රටට පැමිණියහ. 27 උන් වහන්සේ ගොඩ බසිත් ම,
නුවරින් ආ දුෂ්ටාත්මාවේශ වූ මිනිසෙක් උන්
වහන්සේට හමු විය. ඔහු බොහෝ කලක් ම
නිර්වස්ත්‍ර ව, ගෙයක නොව, සොහොන් ගෙවල

වාසය කළේ ය. 28 ඔහු ජේසුස් වහන්සේ දැක,
මොරගසා, උන් වහන්සේ ඉදිරියෙහි වැඳ වැටී,
“පරමෝත්තම දෙවියන්ගේ පුත් ජේසුස් වහන්ස,
ඔබත්, මාත් අතර මොන ගනුදෙනුවක් ද? මට වද
නොදෙන මෙන් අයැදිමි”යි මහ හඬින් කීවේ ය.
29 මෙසේ කීවේ, ඒ මිනිසාගෙන් දුරු වන්න උන්
වහන්සේ අශුද්ධාත්මයට අණ කළ බැවිනි. ඒ
අශුද්ධාත්මය නොයෙකේ වර ඔහුට ආවේශ වූ
බැවින්, යදම්වලින් ද විලංගුවලින් ද බැඳ ඔහු මුර
කරන ලද්දේ ය; එහෙත්, ඔහු ඒ බැඳුම් කඩා දැමී ය.
දුෂ්ටාත්මය විසින් ඔහු පාළුකරයට පලවා හරින
ලද්දේ ය. 30 “තාගේ නම කුමක් දැ”යි ජේසුස්
වහන්සේ ඔහුගෙන් ඇසූ සේක. බොහෝ
දුෂ්ටාත්මයන් ආවේශ ව සිටි නිසා, ඔහු,
“සේනා”යිකී ය. 31 එවිට දුෂ්ටාත්මයෝ පාතාලයට
යන පරිදි තමන් හට අණ නොකරන ලෙස උන්
වහන්සේගෙන් ඉල්ලූ හ.
32 එතැන කන්දේ මහා ඌරු රැළක් ගොදුරු කමින්
සිටියෝ ය. ඌරන්ට වැහෙනෙ පිණිස දුෂ්ටාත්මයෝ
උන් වහන්සේගෙන් අවසර ඉල්ලූ හ. උන් වහන්සේ
අවසර දුන් සේක. 33 දුෂ්ටාත්මයෝ ඒ මිනිසාගෙන්
දුරු ව ගොස් ඌරන්ට ආවේශ වූ හ; එකල ඌරු රැළ
ප්‍රපාතයෙන් පහළ විලට වේගයෙන් දිව ගොස් ගිලී
මළෝ ය. 34 ඌරු ගොව්වෝ සිදු වූ දේ දැක, පලා
ගොස් නුවරහි ද ගම්මානයෙහි ද එපවත් දැන්වූ හ.
35 ඒ සිද්ධිය බලන පිණිස මිනිස්සු පිටත් ව අවුත්,
ජේසුස් වහන්සේ වෙත පැමිණ, දුෂ්ටාත්මයන් දුරු
කරනු ලැබූ මිනිසා ඇඳුම් ඇඳ, හොඳ සිහි
කල්පනාවෙන් ජේසුස් වහන්සේගේ පාමුල ඉඳිනු
දැක බිය වූ හ. 36 එය සියැසින් දුටු අය
දුෂ්ටාත්මාවේශ ව සිටි මිනිසා සුවය ලැබූ සැටි
ඔවුන්ට කී හ. 37 එවිට ගෙරසේනයන්ගේ ප්‍රදේශය
අවටින් වූ මුළු සෙනඟ මහා භීතියට පැමිණ, තමන්
වෙතින් අහක් ව යන ලෙස උන් වහන්සේගෙන්
අයැදියහ. උන් වහන්සේ ද ඔරුවකට නැඟී පෙරළා
වැඩිය සේක. 38 දුෂ්ටාත්මයන් දුරු කරනු ලැබූ මිනිසා
උන් වහන්සේ සමඟ නවතින්න අවසර ඉල්ලී ය.
එහෙත්, උන් වහන්සේ ඔහු යවමින්, 39 “ඔබේ
ගෙදරට හැරී ගොස්, දෙවියන් වහන්සේ ඔබට කළ
සියල්ල ම ප්‍රකාශ කරන්නැ”යි වදාළ සේක. ඔහු
ගොස්, ජේසුස් වහන්සේ තමාට කොපමණ මහත්
දේ කළ සේක් දැ යි නුවර පුරා ප්‍රචාරය කළේ ය.

### යායිරස්ගේ දුවණිය. සළුවට අතගැසූ ස්ත්‍රිය

(මතෙ 9:18-26;මාක් 5:21-43)

40 ජේසුස් වහන්සේ ආපසු පැමිණි කල සමූහයා
උන් වහන්සේ පිළිගත්හ. සියල්ලෝ ම උන්
වහන්සේගේ පැමිණීම බලා සිටියහ. 41 එවිට,
ධර්මශාලා ප්‍රධානියකු වන යායිරස් නම් කෙනෙක්
අවුත්, ජේසුස් වහන්සේගේ පාමුල වැටී සිය
නිවසෙට වඩින ලෙස උන් වහන්සේගෙන් උදක් ම
ඉල්ලී ය. 42 එසේ කළේ දොළොස් වසරක් පමණ
වයස් වන ඔහුගේ එක ම දියණියන් මරණාසන්න ව
සිටි බැවිනි. උන් වහන්සේ වඩිනා කල සමූහයා උන්
වහන්සේ ව තෙරපෙමින් ගියහ.
43 එකල කිසිවකුට සුව කළ නොහැකි වූ,
දොළොස් වසරක් මහලේ රෝගයෙන් පෙළෙණු
ස්ත්‍රියක් 44 පසුපස්සෙන් අවුත්, උන් වහන්සේගේ
සළුවේ දාවල්ල ස්පර්ශ කළා ය. ඒ ඇසිල්ලෙහි ම
ඇගේ ලේ ගැලීම නැවතිණි. 45 එවිට ජේසුස්
වහන්සේ, “මගේ ඇඟට අත තැබුවේ කවරකේ
දැ”යි ඇසූ සේක. එසේ නොකළ බව හැම දෙනෙ ම
කී කල්හි, පේදුරු කතා කොට, “ස්වාමීනි, සමූහයා
ඔබට හැපමේන් තෙරපෙමේන් සිටිති”යි කී ය.
46 එහෙත්, ජේසුස් වහන්සේ, “කවුරු නමුත් මගේ
ඇඟට අත තැබී ය; මන්ද මගෙන් අනුහස නික්ම
ගිය බව මට දැනුණේ ය”යි වදාළ සේක. 47 කරුණ
හෙළි වූ බව දුටු ඒ ස්ත්‍රිය වෙවුලමින් අවුත්, උන්
වහන්සේ ඉදිරියෙහි වැඳ වැටී ඈ උන් වහන්සේට
අත තැබුවේ මන්ද කියාත්, එකණෙහි ම ඈ සුව වූ
හැටිත් මුළු සමූහයා ඉදිරියෙහි ප්‍රකාශ කළා ය.
48 දියණියෙනි, ඔබේ ඇදහිල්ල ඔබ සුවපත් කළේ
ය; ශාන්ත සිතින් යන්නැ”යි උන් වහන්සේ ඇයට
වදාළ සේක.
49 උන් වහන්සේ මෙවෙදන් පවසද්දී ම, ධර්මශාලා
නායකයාගේ ගෙදරින් කෙනෙක් අවුත්, “ඔබේ දුව
මළා ය; ගුරුදේවයන් නොවෙහෙසෙන්නැ”යි කී ය.
50 ජේසුස් වහන්සේ ඒ අසා, “බිය නොවන්න,
ඇදහිල්ලෙන් ම සිටින්න, ඈ සුව වනු ඇතැ”යි උත්තර
දුන් සේක. 51 උන් වහන්සේ ගෙදරට පිවිසි කල,
පේදුරු ද ජොහන් ද ජාකොබ් ද දැරියගේ පියා ද
මව ද හැර අන් කිසිවකුට තමන් සමඟ ඇතුළු
වන්න අවසර නුදුන් සේක. 52 සියල්ලෝ ම ඈ ගැන
හඬමින් වැලපෙමින් සිටියහ. එහෙත්, උන් වහන්සේ
කතා කොට, “නාඬන්න, ඈ මැරී නැත, ඈ නිදන්නී
ය”යි වදාළ සේක. 53 ඔව්හු ඈ මළ බව දැන උන්
වහන්සේ උපහාසයට ලක් කළහ. 54 එහෙත්, උන්
වහන්සේ ඇගේ අත අල්ලා, “දැරිය නැඟිටින්නැ”යි
ශබ්ද නඟා වදාළ සේක. 55 එවිට ඇගේ ප්‍රාණය
නැවත ආයේ ය. ඈ එකණෙහි ම නැඟිට්ටා ය.
ඇයට යමක් කන්න දෙනෙ ලෙස උන් වහන්සේ අණ
කළ සේක. 56 ඇගේ මවුපියෝ විස්මිත වූ හ;
එහෙත්, මේ සිද්ධිය කිසිවකුට නොකියන ලෙසෙ
උන් වහන්සේ ඔවුන්ට අණ දුන් සේක.

### ධර්මදූත සේවාව

(මතෙ 10:5-15;මාක් 6:7-13)

9 එකල උන් වහන්සේ ශ්‍රාවකයන් දොළොස්
දෙනා කැඳවා, සියලු දුෂ්ටාත්මයන් කෙරෙහි
බලය හා ආධිපත්‍යය ද රෝග සුව කිරීමේ වරය ද
පවරා දී 2 දෙවියන් වහන්සේගේ රාජ්‍යය ප්‍රකාශ
කරන පිණිසත්, රෝගීන් සුව කරන පිණිසත් ඔවුන්
යැවූ සේක. 3 ලූක් 10:4-11තවද උන් වහන්සේ
ඔවුන්ට කතා කොට, “චාරිකාව සඳහා කිසිවක්
නොගන්න; සැරයටියක් වත්, මල්ලක් වත්, රොටි
වත්, මිලමුදල් වත්, කමිස දෙකක් වත් නොගන්න.
4 ඔබ යම් කිසි නිවසෙකට පිවිසි කල, එතැනින්

පිටත් ව යන තුරු එහි ම නැවතී සිටින්න. 5 ක්‍රියා
13:51ඔබ නොපිළිගන්නා යම් පමණ දනෙකේ ඇද්ද,
ඒ නුවරින් නික්ම යන කල ඔවුන්ට විරුද්ධ ව
සාක්ෂියක් වන පිණිස, ඔබගේ පාද යට තිබෙන ධූලි
ගසා දමන්නැ"යි වදාළ සේක. 6 ඔව්හු පිටත් ව රට
පුරා සුබ අස්න දේශනා කරමින් ද රෝග සුව
කරමින් ද ගමින් ගමට ගියහ.

### උප රජ හෙරොද්ගේ වියවුල

(මතෙ 14:1-12;මාක් 6:14-29)

7 මතෙ 16:14; මාක් 8:28; ලූක් 9:19 යුවරජ
හෙරොද්, උන් වහන්සේ කළ සියල්ල අසා, අතිශයින්
වියවුල් විය. එසේ වූයේ, 'ජොහන් මළවුන් කෙරෙනේ
උත්ථාන වී ය' කියාත්, 8 සමහරුන්, 'එලියා පහළ
වූයේ ය' කියාත්, අන් සමහරුන්, 'පෙර සිටි
දිවැසිවරයන්ගෙන් කෙනෙකේ උත්ථාන වී ය' කියාත් කී
බැවිනි. 9 එවිට හෙරොද්, "මම ජොහන්ගේ හිස සිඳ
දැමීමි; එහෙත්, මට සැළ වී ඇති මෙබඳු දේ කරන
මේ තැනැත්තා කවරෙකේ දැ"යි ඇසී ය. ඔහු උන්
වහන්සේ දැකීමට වෑයම් කළේ ය.

### පන්දහසකට කෑම දීම

(මතෙ 14:13-21;මාක් 6:30-44;ජොහ 6:1-14)

10 ප්‍රේරිතයෝ ආපසු පැමිණ, තමන් කළ සියලු
දේ උන් වහන්සේට දැන් වූ හ. එවිට උන් වහන්සේ
ඔවුන් වෙනේකොට බෙත්සයිදා නම් නුවරකට ඉවත්
ව ගිය සේක. 11 එහෙත් සමූහයෝ එපවත් අසා උන්
වහන්සේ පසුපස්සේ ගියහ, උන් වහන්සේ ඔවුන්
පිළිගෙන, දෙවියන් වහන්සේගේ රාජ්‍යය ගැන
ඔවුන්ට වදාරා, සුවය අවශ්‍ය වූ අය සුව කළ සේක.
12 සවස් වේගෙන එත් ම, දොළොස් දෙනා උන්
වහන්සේ වෙත අවුත්, "මෙහි අප සිටින්නේ පාළු
පෙදෙසෙක බැවින්, අවට නියම්ගම් හා ගොවි
ජනපදවලට ගොස් නවාතැන් හා කෑම සපයාගන්නා
පිණිස සමූහයා හැරිය මැනවැ"යි කී හ. 13 උන්
වහන්සේ, "ඔබ ඔවුන්ට කෑමට යමක් දෙන්නැ"යි
වදාළ සේක. "අප ළඟ නම්, රොටි පහකට හා
මසුන් දදෙනෙකුට වඩා නැත; කළ යුතු දේ නම්,
අප ගොස් මේ මුළු සෙනඟට කෑම මිල දී ගැනීම
ය"යි ඔව්හු කී හ. 14 එසේ කීවේ, පුරුෂයන්
පන්දහසක් පමණ එහි සිටි බැවිනි. එවිට උන්
වහන්සේ, "ඔවුන් පණස් දෙනා බැගින් කාණ්ඩ
වශයෙන් හිඳුවන්නැ"යි ශ්‍රාවකයන්ට වදාළ සේක.
15 ඔව්හු එසේ කොට, හැම දෙන ම හිඳගන්න
සැලැස්සූ හ. 16 එකල උන් වහන්සේ රොටි පහත්
මසුන් දදෙනාත් ගෙන, ස්වර්ගය දෙසෙ බලා,
ආශීර්වාදය පවසා, ඒවා කඩා, සමූහයා ඉදිරියෙහි
තබන පිණිස ශ්‍රාවකයන්ට දුන් සේක. 17 සියල්ලෝ
ම කා තෘප්තියට පැමිණියහ. ඔවුන් කෑ පසු ඉතිරි වූ
කැබලිවලින් කූඩා දොළොසක් රැස් කරගන්නා ලදී.

### පේදුරුගේ මහා ප්‍රකාශනය

(මතෙ 16:13-19;මාක් 8:27-29)

18 ඉන්පසු උන් වහන්සේ තනියම යාච්ඤා කරද්දී
ශ්‍රාවකයෝ උන් වහන්සේ සමඟ සිටියහ. එවිට උන්
වහන්සේ, "මහජනයා මා කවරකෙැ යි කියද්දැ"යි
ඔවුන්ගෙන් ඇසූ සේක. 19 මතෙ 14:1-2; මාක්
6:14-15; ලූක් 9:7-8ඔව්හු, "සමහරු 'ස්නාවක-ජොහන්
ය' කියාත් සමහරු 'එලියා ය' කියාත් අන් සමහරු,
'ආදියෙහි සිටි දිවැසිවරයන්ගෙන් කෙනෙකේ නැවත
උත්ථාන වී ය' කියාත් කියති"යි පිළිතුරු දුන්හ.
20 ජොහ 6:68-69"එහෙත්, ඔබ! ඔබ මා කවරෙකු
කියා කියන්නහු දැ"යි උන් වහන්සේ ඔවුන්ගෙන් ඇසූ
සේක. "ඔබ දෙවියන් වහන්සේගේ
ක්‍රිස්තුවරයාණෝ ය"යි පේදුරු පිළිතුරු දුන්නේ ය.

### ජේසුස් වහන්සේ සිය මරණය හා පුනරුජ්ජීවනය ගැන කලින් කීම

(මතෙ 16:20-28;මාක් 8:30;9:1)

21 උන් වහන්සේ මෙය කිසිවකුට නොකියන
ලෙසෙ ඔවුන්ට තදින් අණ දුන් සේක. 22 තවද,
"මනුෂ්‍ය-පුත්‍රයාණන් බොහෝ දුක් වේදනා
විඳින්ටත්, ප්‍රජා මූලිකයන් ද නායක පූජකවරයන් ද
විනයධරයන් ද විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්න
හා මරනු ලබන්ටත් තෙ වන දින යළි මරණින්
උත්ථාන කරනු ලබන්ටත් නියම ව ඇතැ"යි වදාළ
සේක.
23 මතෙ 10:38; ලූක් 14:27 ජේසුස් වහන්සේ
සියල්ලන්ට කතා කොට, "යමකේ මා අනුව එන්න
කැමැත්තේ ද, ඔහු තමකම නසා, දිනපතා සිය
කුරුසිය දරාගෙන මා අනුව ආවා වේ. 24 මතෙ
10:39; ලූක් 17:33; ජොහ 12:25සිය ජීවිතය රැක
ගන්න කැමැති යමකේ වේ ද, ඔහු එය නැති
කරගනියි; මා නිසා සිය ජීවිතය නැති කරගන්න
යමකේ වේ ද ඔහු එය රැකගනියි. 25 යමකු මුළු
ලෝකය ලබාගත්තත් සිය ජීවිතය නැති
කරගතහොත්, නැත්නම්, විනාශ කර ගතහොත්
ඔහුට කුමන ලාභයක් ද? 26 යම් කෙනෙකේ මා
ගැනත්, මාගේ ධර්මය ගැනත් ලජ්ජා වන්නේ ද,
මනුෂ්‍ය-පුත්‍රයාණන් තමන්ගේ ද පියාණන්ගේ ද
ශුද්ධ දූතයන්ගේ ද තේජශ්‍රීයෙන් යුක්ත ව වඩිනා
කල ඔහු ගැනත් ලජ්ජා වනු ඇත. 27 එහෙත්, මෙහි
සිටින්නන්ගෙන් ඇතැමෙකේ දෙවියන් වහන්සේගේ
රාජ්‍යය දකින තුරු කිසි සේත් මරණයට පත්
නොවන්නාහ යි ඒකාන්ත ලෙසෙ මම ඔබට කියමි"යි
වදාළ සේක.

### රූප විපර්යාසය

(මතෙ 17:1-8;මාක් 9:2-8)

28 2 පේදු 1:17-18 මේ වචන පවසා අට දිනකට
පමණ පසු උන් වහන්සේ පේදුරු ද ජොහන් ද
ජාකොබ් ද කැඳවාගෙන යාච්ඤා කරන පිණිස
කන්දට නැඟුණු සේක. 29 යාච්ඤා කරද්දී, උන්

වහන්සේගේ මූණුවර වෙනස් විය; උන්
වහන්සේගේ වස්ත්‍ර ධවල කාන්තියෙන් බැබළිණි.
30 හදිසියේ මනුෂ්‍යයෝ දදෙනෙකේ උන් වහන්සේ
සමඟ කතා කරමින් උන්හ. ඔව්හු නම්: මෝසෙසේ
සහ එලියා ය. 31 ඔව්හු තේජශ්‍රීයෙන් යුක්ත ව
පෙනී උන් වහන්සේ ජෙරුසලමෙහි දී ඉටු කරන්න
යන ජීවිත පූජාව ගැන කතා කරමින් සිටියහ.
32 පේදුරු ද ඔහු සමඟ වූවෝ ද නිදිබර ව උන්හ.
එහෙත් ඔව්හු නින්දෙන් අවදි ව, උන් වහන්සේගේ
තේජශ්‍රීය ද උන් වහන්සේ සමඟ සිටි මිනිසුන්
දදෙනා ද දුටහ. 33 තවද, මෝසෙසේ සහ එලියා උන්
වහන්සේ වෙතින් වෙන් ව යද්දී, පේදුරු තමා කුමක්
කියන්නේ දැ යි නොදැන, "ස්වාමීනි, මෙහි සිටීම
අපට වාසනාවකි. එබැවින් මණ්ඩප තුනක් සාදමු;
එකක් ඔබට ය, එකක් මෝසෙසේට ය; එකක් එලියාට
ය"යි කී ය. 34 ඔහු මෙයෙ කියද්දී ම වලාකුළක් නැඟී
ඔවුන් සිසාරා පැතිරිණි. වලාකුළ ඔවුන් වසාගත් කල
ඔව්හු භීතියට පත් වූ හ. 35 යෙසා 42:1; මතෙ 3:17;
12:18; මාක් 1:11; ලූක් 3:22එවිට, "මේ මාගේ
පුත්‍රයාණෝ ය, මේ මා තෝරාගත් තැනැත්තාණෝ
ය; මොහුට සවන් දෙන්නැ"යි වලාකුළෙන් හඬක්
නික්මිණි. 36 ඒ හඬ නැඟුණු කල ජේසුස් වහන්සේ
පමණක් සිටිනු දක්නා ලදී. ඔව්හු නිහඬ ව සියැසින්
දුටු කිසිවක් ඒ දවස්වල දී කිසිවකුට නොපැවසූ හ.

### මීමැස්මොර රෝගී ළමයකු සුව කිරීම
(මතෙ 17:14-18;මාක් 9:14-27)

37 පසුදින ඔවුන් කන්දෙන් බැස ආ කල උන්
වහන්සේට මහ පිරිසක් හමු වූ හ. 38 ඒ පිරිසෙන්
කෙනෙක් මොරගා, "ගුරුදේවයෙනි, මාගේ පුත්‍රයා
දෙස අනුකම්පාවෙන් බලාවදාරන මෙන් ඔබෙන්
ඉල්ලමි. මේ මාගේ එක ම දරුවා ය. 39 ඔහුට
ආත්මයක් ආවේශවයෙි, ඔහු හදිසියේ ම
මොරගසයි. ඒ ආත්මය ඔහු පණෙ දමවමින්, සලිත
කොට, බොහෝ සේ තළා පළො මිස, පහසුවෙන්
ඔහු කරෙන් වෙන් ව නොයෙ යි. 40 ඔහු දුරු කරන
ලෙසෙ ඔබේ ශ්‍රාවකයන්ගෙන් ඉල්ලීමි. එහෙත්
ඔවුන්ට නොහැකි වී ය"යි කී ය. 41 ජේසුස්
වහන්සේ උත්තර දෙමින්, "අහෝ! ඇදහිලි හීන
මුරණ්ඩු පරම්පරාව, මා කොතෙක් කල් ඔබ සමඟ
සිටිමින් ඔබ ගැන ඉවසන්න ද? ඔබේ පුත්‍රයා මෙහි
ගෙනෙන්නැ"යි වදාළ සේක. 42 ඒ දරුවා එද්දී ම,
දුෂ්ටාත්මය ඔහු බිම හළොදමා, දැඩි ලෙසෙ ඔහු
සලිත කළෙේ ය. එහෙත්, ජේසුස් වහන්සේ
අශුද්ධාත්මයට තරවටු කොට, දරුවාට සුවය දී, ඔහු
පියාට භාර දුන් සේක. 43 ඔවුන් සියල්ලෝ ම
දෙවියන් වහන්සේගේ මහානුභාව ගැන විස්මිත වූ
හ.

### මරණය හා පුනරුජ්ජීවනය ගැන යළිත් කලින් කීම
(මතෙ 17:22-23;මාක් 9:30-32)

43 උන් වහන්සේ සිදු කළ සියල්ල ගැන හැම දෙනා
ම පුදුම ව සිටිය දී, උන් වහන්සේ සිය ශ්‍රාවකයන්ට
කතා කොට, 44 "මා කියන දේ සාවධාන ව සිතට
ගන්න, මනුෂ්‍ය-පුත්‍රයාණෝ මිනිසුන් අතට පාවා
දෙනු ලබන සේකැ"යි වදාළ සේක. 45 එහෙත්
ඔවුන්ට ඒ කීම අවබෝධ නො වී ය. එය ඔවුන්ට
නොවැටහෙන ලෙසින් සැඟවී තිබිණි. ඔව්හු ඒ කීම
ගැන උන් වහන්සේගෙන් ඇසීමටත් බිය වූ හ.

### සැබෑ උතුම්කම
(මතෙ 18:1-5;මාක් 9:33-37)

46 ලූක් 22:24 තමන් අතරෙන් ශ්‍රේෂ්ඨතම
තැනැත්තේ කවරෙක් දැ යි ඔවුන් අතර විවාදයක්
මතු විය. 47 ජේසුස් වහන්සේ ඔවුන්ගේ සිත්හි
නැඟුණු ඒ විවාදය දැන, කුඩා දරුවකු ගෙන තමන්
ළඟ සිටුවා, 48 මතෙ 10:40; ලූක් 10:16; ජොහ
13:20"මාගේ නාමයෙන් මේ කුඩා දරුවා පිළිගන්න
යමෙක් වේ ද, ඔහු මා පිළිගන්නේ ය; යමෙක් මා
පිළිගන්නේ ද, ඔහු මා එවා වදාළ තැනැන් වහන්සේ
පිළිගන්නේ ය. කුමක් හයෙින් ද, ඔබ හැම අතර
ඉතා ම සුළු තැනැත්තා ශ්‍රේෂ්ඨතම තැනැත්තා ය"යි
වදාළ සේක.

### අපට විපක්ෂ නොවෙන්නා අපට පක්ෂය
(මාක් 9:38-40)

49 ජොහන් කතා කරමින්, "ස්වාමීනි, එක් මිනිසෙක්
ඔබගේ නාමයෙන් දුෂ්ටාත්මයන් දුරු කරනු දුටිමු;
ඔහු අපේ පක්ෂයට අයිති නැති නිසා ඔහුට තහනම්
කළෙමු"යි කී ය. 50 එහෙත් ජේසුස් වහන්සේ,
"තහනම් නොකරන්න, මන්ද; ඔබට විපක්ෂ නොවෙන
තැනැත්තේ ඔබට පක්ෂ ය"යි වදාළ සේක.

### සමාරිය ගමකින් විරෝධය

51 තවද, උන් වහන්සේගේ ස්වර්ගාරෝහණ දිනය
ආසන්න වූ කල, උන් වහන්සේ ජෙරුසලම බලා යන
අධිෂ්ඨානයෙන් 52 තමන්ට පෙරටුව දූතයන් යැවූ
සේක. ඔව්හු ගොස් උන් වහන්සේට අවශ්‍ය දේ
පිළියෙළ කරන පිණිස සමාරියයන්ගේ ගමකට ඇතුළු
වූ හ. 53 එහෙත්, උන් වහන්සේ හුදෙක් ජෙරුසලමට
ම යන්නට අදහස් කර සිටි බැවින් ඔව්හු උන්
වහන්සේ නොපිළිගත්හ. 54 2 රාජා 1:9-16 උන්
වහන්සේගේ ශ්‍රාවකයන් වූ ජාකොබ් ද ජොහන් ද
ඒ දැක, "ස්වාමීනි, මොවුන් විනාශ කරන පිණිස
අහසින් ගිනි වැටෙන්නට අප අණ කරනවාට ඔබ
කැමැති සේක් දැ"යි ඇසූ හ. 55 උන් වහන්සේ හැරී
ඔවුන්ට තරවටු කළ සේක. 56 ඉන්පසු ඔව්හු අන්
ගමකට ගියහ.

## අනුගාමිකයන් වීමට නුසුදුස්සෝ
(මතෞ 8:19-22)

57 ඔවුන් මඟ බැස යද්දී එක් මිනිසෙකේ, "ඔබ
වහන්සේ යන ඕනෑ ම තැනකට වුව ද මමත් ඔබ
අනුව එන්නමේ"යි කී ය. 58 ජේසුස් වහන්සේ කතා
කොට, "හිවලුන්ට බනෙ ද අහසේ කුරුල්ලන්ට
කැදලි ද ඇත; එහතේ මනුෂ්‍ය-පුත්‍රයාණන්ට හිස
තැබීමට වත් තැනක් නැතැ"යි ඔහුට වදාළ සේක.
59 උන් වහන්සේ තව කනෙකුෙට, "මා අනුව
එන්නැ"යි වදාළ සේක. ඔහු: "ස්වාමිනි පළමුකොට
මාගේ පියා භූමදාන කරන පිණිස යන්නට මට
අවසර දුන මැනවැ"යි කී ය. 60 උන් වහන්සේ
උත්තර දමේින්, "මළවුන්ගේ භූමදානය මළවුන් ම
කළා වේ; ඔබ ගොස් දවේියන් වහන්සේගේ රාජ්‍යය
ප්‍රකාශ කරන්නැ"යි ඔහුට වදාළ සේක. 61 1 රාජා
19:20තවත් කනෙකේ, "ස්වාමිනි ඔබ අනුව එන්නමේ;
එහතේ පළමුකොට මාගේ ගදෙර උදවියගනේ සමු
ගනෙ ඊමට අවසර දුන මැනවැ"යි කී ය. 62 ජේසුස්
වහන්සේ, "නගුලට අත තබා ආපසු බලන කිසිවකේ
දවේියන් වහන්සේගේ රාජ්‍යයට සුදුසු නැතැ"යි
ඔහුට වදාළ සේක.

## සැත්තෑ දනොගේ ධර්මදූත මහෙයෙ

10 ඉන්පසු සමිඳාණන් වහන්සේ තවත්
සැත්තෑදනෙකු පත් කොට තමන් යන්න
අදහස් කළ සියලු නගර හා පදෙස්වලට ඔවුන්
දදෙනො බැගින් තමන්ට කලින් යැවූ සේක. 2 මතෞ
9:37-38උන් වහන්සේ ඔවුන්ට මසෙේ වදාළ සේක:
"ගොයම නම් බහුල ය. ගොවීහු විරල ය. එබැවින්
ගොයම් කැපීමට මහෙකෙරුවන් එවන මනේ
ගොයමේ හිමියාණන්ට යාච්ඤා කරන්න. 3 මතෞ
10:16ඉතින් යන්න. වගවලසුන් මැදට බැටළු පැටවුන්
යවන්නාක් මනේ මම ඔබ යවමි. 4 මතෞ 10:7-14;
මාක් 6:8-11; ලූක් 9:3-5පසුම්බියක් හෝ මල්ලක්
හෝ පා වහන් හෝ නොගනෙ යන්න. මඟ දී ආචාර
කිරීම් සඳහා පමා නොවන්න. 5 ඔබ යම් ගදෙරකට
ඇතුළු වූ කල, පළමුකොට 'මේ ගදෙරට සාමය වේ
වා!'යි පතන්න. 6 සාමය ලබන්නට සුදුසු කනෙකේ
එහි සිටිත් නම් ඔබගේ සාම පැතුම ඔහු පිට රුඳනෙු
ඇත. නැතහොත් එය ඔබ වතෙ පරෙළා එනු ඇත.
7 1 කොරි 9:14; 1 තිමෝ 5:18ඔවුන් දනෙ දයෙ
කමින් බොමින් ඒ ගදෙර ම නැවතී සිටින්න. මන්ද,
මහෙකෙරුවා සිය වේතනය ලැබිය යුතු ය; ගදෙරින්
ගදෙරට නොයන්න. 8 ඔබ යම් නුවරකට ඇතුළු වූ
කල ඔවුන් ඔබ පිළිගත්තොත්, ඔබ ඉදිරියහෙි තබන
දේ වළඳන්න. 9 එහි සිටින රෝගීන් සුව කරන්න.
'දවේියන් වහන්සේගේ රාජ්‍යය ඔබ වතෙ පැමිණියේ
ය'යි ඔවුන්ට ප්‍රකාශ කරන්න. 10 ක්‍රියා
13:51එහතේ යම් නුවරකට ඇතුළු වූ කල ඔවුන් ඔබ
නොපිළිගත්තොත්, ඒ නුවර වීදිවලට ගොස්,
11 'අපේ පාදවල වැකුණු මේ නුවර දූවිලි පවා ඔබට
විරුද්ධ ව අපි ගසා දමමු; ඒ කසෙේ වුවත් දවේියන්
වහන්සේගේ රාජ්‍යය ළං ව ඇති බව දැනගන්නැ'යි
කියන්න. 12 උත් 19:24-28; මතෞ 10:15; 11:24මයෙ
මම ඔබට කියමි, ඒ දවසේ දී ඒ නුවරට වඩා
සොදොමට සහනය ඇති වන්නේ ය."

## පසුතැවී සිත් හරවා නොගත් නුවරවලට විපත්
(මතෞ 11:20-24)

13 යසො 23:1-18; එසකි 26:1; 28:26; ජෝවෙ 3:4-8;
ආමො 1:9-10; සකෙරි 9:2-4 "එම්බා කොරොශීනය,
ඔබට වන විපතක මහත! එම්බා බතේසයිදාව,
ඔබට වන විපතක මහත! ඔබ තුළ කළ ප්‍රබල
ක්‍රියා තීර්හි හා සීදොන්හි කළා නම්, මීට කලින්
ගෝනි රදෙි හැඳ අළු තවරා ගනෙ පසුතැවී සිත්
හරවා ගැනීමට ඔවුන්ට ඉඩ තිබිණි. 14 එසේ වුව ද
දේව විනිශ්චය දවසේ දී ඔබට වඩා තීර්ට හා
සීදොනට සහනය ලැබනේනේ ය. 15 යසො
14:13-15එම්බා කපර්ණවුම, ඔබ සගලොව දක්වා
උසස් කරනු ලබන්නහෙි ද? නැත, පාතාලය දක්වා
පහත හළෙනු ලබන්නහෙි ය. 16 මතෞ 10:40; මාක්
9:37; ලූක් 9:48; ජොහ 13:20ඔබගේ වචන අසන්නා
මාගේ වචන අසයි; ඔබ ප්‍රතික්ෂේප කරන්නා මා
ප්‍රතික්ෂේප කරයි; මා ප්‍රතික්ෂේප කරන්නා මා
එවූ තැනැන් වහන්සේ ප්‍රතික්ෂේප කරන්නේ ය."

## සැත්තෑ දනො හැරී ඊම

17 ඉන්පසු සැත්තෑදනො ප්‍රීතියනේ හැරී අවුත්,
"ස්වාමිනි, ඔබගේ නාමයේ අනුහසින් දුෂ්ටාත්මයෝ
පවා අපට අවනත වතේ"යි කී හ. 18 උන් වහන්සේ
ඔවුන්ට කතා කොට, "සාතන් විදුලියක් මනේ අහසින්
වැටනෙු දිටිමි. 19 ගීතා 91:13බලන්න, සර්පයන් ද
ගෝනුස්සන් ද පාගන්ටත්, සතුරාගේ මුළු ශක්තිය
මැඩලන්ටත් මා ඔබට බලය පවරා ඇත; කිසිවකින්
ඔබට අනතුරක් නොවයෙි. 20 එසේ වුව ද
අශුද්ධාත්මයන් ඔබට යටත් වන නිසා සන්තෝෂ
නොවන්න; ඔබගේ නාම ස්වර්ගයහෙි ලියා ඇති
නිසා සන්තෝෂ වන්නැ"යි වදාළ සේක.

## දේවානාවරණය ගැන ජේසුස් වහන්සේගේ තුති පිදුම
(මතෞ 11:25-27;13:16-17)

21 ඒ පැයේ දී ම උන් වහන්සේ ශුද්ධාත්මයනේ
පූර්ණ වී උදන් අනමින්, "ස්වර්ගයටත් පොළොවටත්
අධිපති වූ පියාණනෙි, ඔබ මේ දේවල් පැණවතුන්
හා නැණවතුන් කරෙනේ ආවරණය කොට බාලයන්ට
අනාවරණය කළ බැවින් ඔබට තුති පුදමි. එසේය
පියාණනෙි, ඔබට ප්‍රිය මනාප වූයේත් එය ම ය.
22 ජොහ 3:35; 10:15මාගේ පියාණන් වහන්සේ
සියල්ල ම මට පවරා දී තිබේ. පුත්‍රයාණෝ
කවරකේ දැ යි පියාණන් වහන්සේ හැර අන්
කිසිවකේ නොදනිති. එසේ ම පුත්‍රයාණනුත්,
පුත්‍රයාණන් විසින් පියාණන් වහන්සේ එළිදරව්
කිරීමට තෝරාගනු ලැබූ අයත් හැර අන් කිසිවකේ
පියාණන් වහන්සේ කවරකේ දැ යි නොදනිති"යි

වදාළ සේක. 23 එවිට උන් වහන්සේ ශ්‍රාවකයන්
සමඟ තනියම සිටිය දී ඔවුන්ට කතා කොට, “ඔබ
නරඹන දේ දකින ඇස් භාග්‍යවන්ත ය. 24 මයෙ මම
ඔබට කියමි, ඔබ දකින දේ දකින්නටත්, ඔබ අසන
දේ අසන්නටත් බොහෝ දිවැසිවරු ද රජවරු ද
අපේක්ෂාවනේ සිටියහ. එහතේ ඔවුන් එය දුටුවේ
වත් නැත, ඇසුවේ වත් නැතැ”යි වදාළ සේක.

### යහපත් සමාරියයා

25 මතෙ 22:35-40; මාක් 12:28-34 එක්තරා
විනයධරයකේ නැඟිට, උන් වහන්සේ පරීක්ෂා
කරමින් “ගුරුදේවයනෙි, සදාතන ජීවනය හිමි
කරගනු සඳහා මා කුමක් කටයුතු දැ”යි ඇසී ය.
26 උන් වහන්සේ ද ඔහුට පිළිතුරු දමේින්,
“ව්‍යවස්ථාවලියහෙි ලියා ඇත්තේ කිමකේ ද? ඔබ
එය තේරුම්ගන්නේ කසෙේ දැ”යි ඇසූ සේක.
27 ලවේ 19:18; ද්වි.නී. 6:5ඔහු උත්තර දමේින්,
“නුඹේ මුළු හෘදයනේ ද නුඹේ මුළු ආත්මයනේ ද
නුඹේ මුළු වීර්යයනේ ද නුඹේ මුළු බුද්ධියනේ ද
නුඹේ දවේ වූ සමිඳාණන් වහන්සේටත්, නුඹ නුඹට
ප්‍රේම කරන්නාක් මනේ නුඹේ අසල්වැසියාටත්
ප්‍රේම කරන්න යනුයි” කී ය. 28 ලවේ 18:5උන්
වහන්සේ, “ඔබේ උත්තරය හරි ය. එසේ කරන්න,
එවිට ඔබ ජීවත් වන්නහෙි ය”යි ඔහුට වදාළ සේක.
29 එහතේ ඔහු තමන් නිවැරදි බව දක්වන්ට කැමැති
ව “මාගේ අසල්වැසියා කවරකේ දැ”යි ජේසුස්
වහන්සේගනේ ප්‍රශ්න කළේ ය.
30 ජේසුස් වහන්සේ පිළිතුරු දමේින් මසෙේ වදාළ
සේක: “එක් මිනිසකේ ජරෙුසලමනේ ජරෙිකෝව
බලා යද්දී, සොර මුළකට අසුවිය; සොරු ඔහුගේ
වස්ත්‍ර පැහැරගනෙ, ඔහුට තළා පළො, ඔහු අඩ
පණ කොට දමා යන්නට ගියහ. 31 ඒ අතර එක්
පූජකයකේ අහම්බනේ ඒ මඟ යනුයේ, ඔහු දැක
පාරේ අනකේ පැත්තනේ ගියේ ය. 32 එසේ ම
ලවේියයකේ ද, එතැනට පැමිණ ඔහු දැක පාරේ
අනකේ පැත්තනේ ගියේ ය. 33 2 වංශා 28:15එහතේ,
ඒ මඟින් ගමන්ගත් එක් සමාරිය ජාතික මිනිසකේ
ඔහු හුන් තැනට අවුත්, ඔහු දැක, අනුකම්පා උපදවා,
34 ඔහු වතෙට ගොස්, තලේ හා මිදියුස ගල්වා,
තුවාළ බැඳ, තමාගේ ම මෘගයා පිට හිඳුවා,
තානායමට ගනෙ ගොස් ඔහු බලාගත්තේ ය.
35 පසුවදා ඔහු රිදී කාසි දකෙක් ගනෙ
තානායම්කාරයාට දී, ‘මොහු බලාගන්න; මයෙට
වැඩියනේ ඔබ වියදම් කරන යම් තරමක් ඇද්ද,
නැවත ආ විට මම එය ඔබට ගවෙන්නමේ’යි කී ය.
36 ඉදින් සොරුන් අතට අසුවූ ඒ තැනැත්තාට මකේී
තිදනෙොගනේ අසල්වැසියා වූයේ කවරකේ ද කියා
ඔබ සිතන්නහෙි ද? 37 “ඔහුට දයාව දැක්වූ
තැනැත්තා ය”යි විනයධරයා කී ය. “ඔබත් ගොස්
එසේ ම කරන්නැ”යි ජේසුස් වහන්සේ ඔහුට වදාළ
සේක.

### මාර්තා සහ මරියා

38 ජොහ 11:1 තවද ජේසුස් වහන්සේ සිය
ශ්‍රාවකයන් සමඟ යද්දී, උන් වහන්සේ එක් ගමකට
ඇතුළු වූ සේක. එවිට මාර්තා නම් එක් ස්ත්‍රියක්
සිය නිවසට උන් වහන්සේ පිළිගත්තා ය. 39 ඇයට
මරියා නම් සහෝදරියක් වූවා ය. ඈ සමිඳාණන්
වහන්සේගේ පාමුල හිඳ උන් වහන්සේගේ
ඉගැන්වීමට සවන් දුන්නා ය. 40 එහතේ මාර්තා
සත්කාර කටයුතු වැඩි වීමනේ කරදර වී සිටියා ය. ඈ
උන් වහන්සේ වතෙට පැමිණ, “ස්වාමීනි, මාගේ
සහෝදරිය පැත්තකට වී සත්කාර කටයුතු මා පිට ම
පවරා සිටින හැටි ඔබ සලකන්නේ නැද් ද? එබැවින්
මට උදව් කරන්නට ඈට කිව මැනවැ”යි කීවා ය.
41 එහතේ සමිඳාණන් වහන්සේ උත්තර දමේින්,
“මාර්තා, මාර්තා, ඔබ බොහෝ දේ ගැන කරදර
වමේින් නළංගු වන්නහෙි ය. 42 එහතේ අවශ්‍ය එක
දයෙකි. මරියා යහපත් දයෙ තෝරාගනෙ ඇත; එය
ඈ කරෙනේ පැහැරගනු නොලැබේ ය”යි වදාළ
සේක.

### යාච්ඤාව පිළිබඳ අනුශාසනා

(මතෙ 6:9-13;7:7-11)

11 උන් වහන්සේ එක් තැනක යාච්ඤා කරමින්
සිටි සේක. එය නිම වූ පසු උන්
වහන්සේගේ ශ්‍රාවකයන්ගනේ එක් තැනැත්තකේ
කතා කොට, “ස්වාමීනි, ජොහන් තම ගෝලයන්ට
ඉගැන්වූ ලසෙ, අපටත් යාච්ඤා කරන්නට ඉගැන්නුව
මැනවැ”යි කීවේ ය. 2 උන් වහන්සේ ඔවුන්ට මසෙේ
වදාළ සේක: “ඔබ යාච්ඤා කරන කල මසෙේ
කියන්න:
q2[2] ‘පියාණනෙි, ඔබ වහන්සේගේ නාමයට ගෞරව
වේ වා, ඔබ වහන්සේගේ රාජ්‍යය පැමිණේ වා.
3 අපේ දිනපතා ආහාරය දිනනේ දින අපට දුන
මැනව.
4 අපේ පව් අපට කමා කළ මැනව;
q2[4] මන්ද, අපට ණයගැති ව සිටින හැමට අප කමා
වන බැවිනි.
q2[4] අප පරීක්ෂාවට නොපමුණුවනු මැනව.’ “
5 තවද උන් වහන්සේ ඔවුන්ට කතා කරමින්, “ඔබ
අතර මිතුරකෙු ඇති තැනැත්තකේ මහ රෑ ඔහු වතෙ
ගොස්, ‘මිත්‍රය, මට රොටි තුනක් දනේන; 6 ගමනක්
යන මාගේ මිත්‍රයකේ මා වතෙ අවුත් සිටියි; ඔහුට
දනේන කිසිවක් මා ළඟ නැතැ’යි කියන්නේ නම්,
7 ගේ ඇතුළේ සිට ඒ මිතුරා, උත්තර දමේින්, ‘මට
කරදර නොකරන්න, දැන් දොර වසා තිබේ; මාගේ
දරුවෝ ද මා සමඟ ඇඳේ නිදා සිටිති; නැඟිට යමක්
ඔබට දනේනට නොහැකි ය’යි කියයි ද? 8 මම ඔබට
මයෙ කියමි, ඔහු සිය මිත්‍රකම සලකා නැඟිට ඔහු
ඉල්ලන දේ ඔහුට නොදතෙත් ඔහුගේ ලජ්ජා නැති
පරෙත්තය නිසා නැඟිට, වුවමනා පමණ ඔහුට දනෙු
ඇතැ”යි වදාළ සේක. 9 “මම ද ඔබට කියමි,
ඉල්ලන්න, ඔබට දනෙු ලැබේ; සොයන්න, ඔබට

සම්බ වේ; තට්ටු කරන්න, ඔබට දොර අරිනු ලැබේ.
10 මන්ද ඉල්ලන හැමට ලැබේ; සොයන්නාට සම්බ
වේ; තට්ටුකරන්නාට දොර හරිනු ලැබේ. 11 ඔබ
අතරෙන් කවර පියකේ තම පුත්රයා මාළුවකු ඉල්ලූ
විට මාළුවා වෙනුවට සර්පයකු දෙයි ද?
12 නොහොත් බිත්තරයක් ඉල්ලූ විට ඔහුට
ගෝනුස්සකු දෙයි ද? 13 මෙසේ අයහපත් වූ ඔබ,
ඔබේ දරුවන්ට යහපත් දේ දෙන්නට දන්නාහු නම්,
ඊට කොපමණ වැඩියෙන්, ඔබේ ස්වර්ගීය පියාණන්
වහන්සේ තමන් වහන්සේගෙන් ඉල්ලන්නන්ට
ශුද්ධාත්මයාණන් නොදෙන සේක් ද?”

### ජේසුස් වහන්සේ සහ දුෂ්ටාත්මාධිපතියා

(මතෙ 12:22-30;මාක් 3:20-27)

14 වරක්, උන් වහන්සේ ගොළු දුෂ්ටාත්මයකු දුරු
කරමින් සිටි සේක. දුෂ්ටාත්මය දුරුවතේ ම ගොළු
මිනිසා කතා කළේ ය. සමූහයෝ පුදුම වූ හ.
15 මතෙ 9:34; 10:25එහතේ ඔවුන්ගෙන් සමහරකේ
කතා කොට, “මොහු දුෂ්ටාත්මයන් දුරු කරන්නේ
දුෂ්ටාත්මාධිපති වූ බෙල්සෙබුල්ගේ අනුහසින් ය”යි
කී හ. 16 මතෙ 12:38; 16:1; මාක් 8:11අන් සමහරු
උන් වහන්සේ වචනයකින් අල්ලාගන්න පිණිස,
ස්වර්ගයෙන් හාස්කමක් උන් වහන්සේගෙන් ඉල්ලූ
හ. 17 උන් වහන්සේ ඔවුන්ගේ සිතුවිලි දැන මෙසේ
වදාළ සේක: “ඊට ම විරෝධී ව භේද වූ යම්
රාජ්යයක් ඇද්ද එය පාළු වන්නේ ය, ඊට ම විරෝධී
ව භේද වූ යම් ගෙදරක් ඇද්ද එය පිරිහී යන්නේ ය.
18 සාතන් ඔහුට ම විරෝධී ව භේද ව සිටී නම්
ඔහුගේ රාජ්යය පවතින්නේ කෙසේ ද? මා
දුෂ්ටාත්මයන් දුරු කරන්නේ බෙල්සෙබුල්ගේ
අනුහසින් යයි ඔබ කියන්නාහු ය. 19 එහතේ මම
බෙල්සෙබුල්ගේ අනුහසින් දුෂ්ටාත්මයන් දුරු කරම්
නම්, ඔබගේ අනුගාමිකයෝ කවරකුගේ අනුහසින්
ඔවුන් දුරු කරද් ද? මලෙසෙ ඔබේ අනුගාමිකයෝ ම
ඔබේ තර්කය බිඳදමති. 20 එහතේ මම දෙවියන්
වහන්සේගේ අනුහසින් දුෂ්ටාත්මයන් දුරු කරම් නම්,
සැබැවින් ම දෙවියන් වහන්සේගේ රාජ්යය ඔබ
කරෙහි උදා වී ඇත. 21 අවිආයුධ ගත් බලවන්තයකු
සිය නිවස රක්නා කල ඔහු සතු දේපළ සුරක්ෂිත ව
ඇත. 22 එහතේ ඔහුට වඩා බලවන්තයකේ අවුත්
ඔහු මැඩපවත්වන්නේ නම්, ඔහු විශ්වාසය තැබූ
ආයුධ පැහැරගෙන, කොල්ලකාගත් දේ බෙදාගන්නේ
ය. 23 මාක් 9:40මාගේ පක්ෂයට නොවන්නා මට
විපක්ෂ ය; මා සමඟ රැස් කිරීමට උදව් නොකරන්නා
විසුරුවා දමන්නේ ය.”

### අශුද්ධාත්මය පෙරළා පැමිණීම

(මතෙ 12:43-45)

24 “අශුද්ධාත්මය මිනිසකුගෙන් දුරු ව ගිය කල,
ඔහු දිය නැති තැන්වල සැරිසරමින්, නවාතැනක්
සොයන්නේ ය, එය නොලදහොත් ‘මා නික්ම ආ
මාගේ නිවසට ආපසු යමි’යි කියන්නේ ය. 25 ඔහු
එහි පැමිණි කල, නිවස අතුගා අස්පස් කොට
තිබෙනු දකියි. 26 එවිට ඔහු ගොස් තමාට වඩා
අශුද්ධ වූ තවත් ආත්මයන් සත් දෙනෙකු තමා කැටුව
ගෙන එන්නේ ය. ඔව්හු ඒ නිවසට පිවිස එය
අරක්ගනිති. එවිට ඒ පුද්ගලයාගේ දෙ වන තත්ත්වය
පළමු තත්ත්වයට වඩා නපුරු වන්නේ ය.”

### සැබෑ සැපත

27 උන් වහන්සේ මෙවදෙන් පවසද්දී, සමූහයා
කෙරෙන් එක් ස්ත්රියක් හඬනඟා, “ඔබ දැරූ කුසය ද
ඔබට කිරි දුන් පියයුරු ද භාග්යවන්ත ය”යි උන්
වහන්සේට කීවා ය. 28 උන් වහන්සේ ද, “එසේ ය,
දෙවියන් වහන්සේගේ වචනය අසා එය පිළිපදින
අය ඊටත් වඩා භාග්යවන්ත ය”යි වදාළ සේක.

### හාස්කමක් ඉල්ලීම

(මතෙ 12:38-42;මාක් 8:12)

29 මතෙ 16:4; මාක් 8:12 සමූහයා උන් වහන්සේ
වෙත රැස් කකා එද්දී උන් වහන්සේ මෙසේ වදාළ
සේක: “මේ පරම්පරාව නපුරු එකකි; ඔව්හු
හාස්කමක් සොයති. එහතේ ජෝනා හැර වෙන
හාස්කමක් ඔවුන්ට නොදෙනු ඇත. 30 ජෝනා
3:4ජෝනා නිනිවයේ වැසියන්ට යම්සේ ලකුණක් වී
ද එසේ ම මනුෂ්ය-පුත්රයාණෝ මේ පරම්පරාවට
ලකුණක් වන සේක. 31 1 රාජා 10:1-10; 2 වංශා
9:1-12දේව විනිශ්චය දවසේ දී, දකුණු දිශාවේ
රැජින මේ පරම්පරාවේ මනුෂ්යයන්ට විරුද්ධ ව
නැඟිට ඔවුන් වරදට පත් කරන්නී ය; ඈ
සලමොන්ගේ ප්රඥාව අසනු වස් පොළොවේ
සීමාන්තවල සිට පැමිණියා ය. බලන්න,
සලමොන්ගේ ප්රඥාවට වඩා ශ්රේෂ්ඨ දෙයක් මෙහි
තිබේ. 32 ජෝනා 3:5නිනිවයේ මනුෂ්යයෝ විනිශ්චය
දවසේ දී මේ පරම්පරාව සමඟ නැඟී සිට ඔවුන්
වරදට පත් කරන්නෝ ය; මන්ද, ජෝනාගේ ධර්ම
දේශනා අසා ඔව්හු පසුතැවී සිත් හරවා ගත්හ.
බලන්න, ජෝනාට වඩා ශ්රේෂ්ඨ දෙයක් මෙහි
තිබේ.”

### සිරුරට පහන ඇස ය

(මතෙ 5:15;6:22-23)

33 මතෙ 5:15; මාක් 4:21; ලූක් 8:16 “යමකේ
පහනක් දල්වා ඇතුළු වන අයට එළිය දෙන පිණිස
පහන්රුක මත තබනු මිස මුල්ලක වත්, බඳුනක් යට
වත් එය නොතබයි. 34 ඔබේ සිරුරට පහන ඔබේ
ඇස ය; ඇස් පෙනුම හොඳ නම් ඔබේ මුළු සිරුර
ආලෝකවත් ය; ඇස් පෙනුම අඳුරු නම්, ඔබේ සිරුර
අඳුරු වේ. 35 එබැවින් ඔබ තුළ ඇති එළිය අඳුරු
නොවන ලෙස බලාගන්න. 36 එහයෙින් ඔබේ මුළු
සිරුර කිසිදු අඳුරක් නැති ව බැබළේ නම්, දීප්තියෙන්
දිළෙන පහනක් ඔබට එළිය දෙන්නාක් මෙන්, එය
සම්පූර්ණයෙන් ම එළිය වන්නේ ය.”

## පරිසිවරයන්ට හා විනයධරයන්ට තරවටු
(මතෙ 23:1-36;මාක් 12:38-40;ලූක් 20:45-47)

37 උන් වහන්සේගේ දේශනාවනේ පසු එක්
පරිසිවරයකේ තමා සමඟ කෑමට වඩින මනේ උන්
වහන්සේට ආරාධනා කළෙේ ය. උන් වහන්සේ
ඇතුළු ව කෑමට වැඩහුන් සේක. 38 කෑම කන්නට
පළමු ව උන් වහන්සේ අත් සේදීමේ පිළිවතෙ ඉටු
නොකළ බැවි දුටු පරිසිවරයා පුදුම විය.
39 සමිඳාණන් වහන්සේ ඔහුට මසෙේ වදාළ සේක:
“පරිසිවරුනි, ඔබ කෝප්පයේ ද පිඟානේ ද
පිටපැත්ත සෝදා පිරිසුදු කරන්නාහු ය; එහතේ
ඔබගේ ඇතුළත තණ්හාවනේ ද දුෂ්ට චේතනාවනේ
ද පිරී ඇත. 40 අඥානයනෙි, පිටපැත්ත මැවූ තැනැන්
වහන්සේ ඇතුළු පැත්තත් නොමැවූ සේක් ද?
41 එසේ නම් ඔබට ඇති දයෙින් දන් දනේන. එවිට
සියල්ල ම ඔබට පිරිසුදු වන්නේ ය.
42 ලෙවී 27:30 “පරිසිවරුනි, ඔබට වන විපතක
මහත! ඔබ සුවඳතලාවලින් ද සුදුදුරුවලින් ද සියලු
පලාවලින් ද දසයනේ කොටස දනෙ නමුත් යුක්ති
ධර්මය ද දවේයන් වහන්සේ කරෙහි ප්රේමය ද
නොසලකා හරින්නාහු ය. ඔබ කළ යුතු ව තිබුණේ
ඒ දේත් හැර නොදමා මේ දේත් ඉටු කිරීම ය.
43 පරිසිවරුනි, ඔබට වන විපතක මහත! ඔබ
ධර්මශාලාවල දී උසස් ආසන ද වළෙඳොම් පළවල දී
ගෞරවාචාර ද ලැබීමට ආශා ඇත්තාහු ය. 44 ඔබට
වන විපතක මහත! ඔබ නොපනෙනෙ සොහොන්
ගවෙලට සමාන ය; ඒ මත ඇවිදින අය, නොදැන
එසේ කරති.”
45 විනයධරයන්ගනේ එක් තැනැත්තකේ උත්තර
දමේන්, “ගුරුදේවයනෙි, ඔබ මසෙේ කීමනේ අපටත්
අපහාසයක්, කරන සේකැ”යි කී ය. 46 උන් වහන්සේ
ඔහුට මසෙේ පිළිතුරු දුන් සේක: “විනයධරයනෙි,
ඔබට වන විපතක මහත! ඉසිලිය නොහැකි බර ඔබ
මිනිසුන් පිට පටවන්නාහු ය. එහතේ ඒ බරට
ඔබගේ එක ඇඟිල්ලක් වත් නොතබන්නාහු ය.
47 ඔබට වන විපතක මහත! ඔබගේ පියවරුන්
අතින් මැරුම්කෑ දිවැසිවරයන්ගේ සොහොන් කොත්
ඔබ ගොඩනඟන්නාහු ය. 48 එසේ කිරීමනේ ඔබගේ
පියවරුන්ගේ ඒ ක්රියා ඔබ අනුමත කරන බව
සහතික කරන්නාහු ය; ඔව්හු ඔවුන් මැරූ හ. ඔබ
ඔවුන්ගේ සොහොන් කොත් ගොඩනඟන්නාහු ය.
49 එහයෙින් දවේයන් වහන්සේගේ ප්රඥාව පවසන
ලසෙ: ‘දිවැසිවරයන් ද ප්රේරිතයන් ද ඔවුන් වතෙ
යවන්නමේ; මනුෂ්යයෝ ඔවුන්ගනේ ඇතැමකෙුට
තළා පළො ඇතැමකෙු මරාදමති.’ 50 මසෙේ
ආබලේගේ මරණයේ පටන්, පූජාසනය හා
ශුද්ධස්ථානය අතර මරන ලද සකෙරියස්ගේ මරණය
දක්වා, 51 උත් 4:8; 2 වංශා 24:20-21ලෝකය
මැවීමේ සිට වගුරුවන ලද සියලු දිවැසිවරයන්ගේ
ලේ ගැන මේ පරම්පරාව වගකිව යුතු ය. එසේ ය,
මේ පරම්පරාව ඒ ගැන වගකිව යුතු යයි මම ඔබට
කියමි. 52 විනයධරයනෙි, ඔබට වන විපතක මහත!
විද්යාවේ යතුරු ඔබ ගනෙ ගියාහු ය; එහතේ ඔබ ම
ඇතුළු නොවූවහු ය; ඇතුළු වන්නන් ද වළක්වාලූවහු
ය.”
53 උන් වහන්සේ එතැනින් ආ කල්හි විනයධරයෝ
ද පරිසිවරු ද උන් වහන්සේ කටවචනයනේ
අල්ලාගනු වස් මාන බලමින්, 54 බොහෝ දේ ගැන,
විවාදයට පොළඹවනු පිණිස උන් වහන්සේ
අවුස්සාලීමට පටන්ගත්හ.

## කුහකකම හළො දැක්ම
(මතෙ 10:26-27)

12 මතෙ 16:6; මාක් 8:15 ඒ අතරතුරේ දී
ඔවුනොවුන් පෑගනෙ තරමට දහස් ගණන්
සමූහයක් රැස් ව සිටිය දී, උන් වහන්සේ පළමුකොට
සිය ශ්රාවකයන්ට මසෙේ වදාරන්න පටන්ගත්
සේක: “පරිසිවරුන්ගේ කුහකකම නමැති මුහුන්වලින්
පරසේසම් වන්න. 2 මාක් 4:22; ලූක් 8:17සැඟවී ඇති
සෑම දේ ම හළෙි කරනු ලැබේ; සෑම රහසක් ම
ප්රකාශ කරනු ලැබේ. 3 එබැවින් ඔබ අඳුරහෙි
පැවසූ දේ එළියහෙි අසන්න ලැබේ; ඇතුළු ගබඩා
වල දී කනට කොඳුරන ලද දයෙ පියසි මුදුනනේ පළ
කරනු ලැබේ.”

## බිය විය යුතු කාට ද?
(මතෙ 10:28-31)

4 “මාගේ මිත්රවරුනි, ශරීරය නසා ඉන්පසු අන්
කිසිවක් කළ නොහැකි අයට බිය නොවන්නැ යි මම
ඔබට කියමි. 5 එහතේ ඔබ බිය විය යුත්තේ
කවරකුට දැ යි මම ඔබට පනේවමි. ඔබ නැසුණු පසු
නිරයේ හළෙීමට බලය ඇති තැනැන් වහන්සේට බිය
වන්න; එසේ ය, උන් වහන්සේට බිය වන්නැ යි මම
ඔබට කියමි.
6 “තුට්ටු දකෙකට ගේකුරුල්ලන් පස් දනෙකෙු
විකුණනවා නොවේ ද? දවේයන් වහන්සේ උන්ගනේ
එකකු වත් අමතක නොකරන සේක. 7 ඔබගේ
හිසකසේ සියල්ල පවා ගණන් කොට ඇත. බිය
නොවන්න; ඔබ ගේකුරුල්ලන් රාශියකට වඩා
අගනේ ය.”

## ක්රිස්තුන් වහන්සේ පිළිගැනීම හා ප්රතික්ෂේප කිරීම
(මතෙ 10:32-33;12:32;10:19-20)

8 “තවද යමකේ මනුෂ්යයන් අබිමුවහෙි මා පිළිගත්
බවට සාක්ෂි දරන්නේ ද, මනුෂ්ය-පුත්රයාණෝත්
දවේයන් වහන්සේගේ දූතයන් අබිමුවහෙි ඔහු
පිළිගත් බවට සාක්ෂි දරන සේක. 9 එහතේ,
මනුෂ්යයන් අබිමුවහෙි මා ප්රතික්ෂේප කරන
තැනැත්තේ දවේයන් වහන්සේගේ දූතයන්
අබිමුවහෙි දී ප්රතික්ෂේප කරනු ලැබේ යයි මම
ඔබට කියමි. 10 මතෙ 12:32; මාක් 3:29මනුෂ්ය-
පුත්රයාණන්ට විරුද්ධ ව යමක් කියන කවරකෙුට වුව
ද කමාව ලැබනේනේ ය; එහතේ ශුද්ධාත්මයාණන්ට,
විරුද්ධ ව අපහාස කරන්නාට නම් කමාවක්
නොලැබනේනේ ය. 11 මතෙ 10:19-20; මාක් 13:11;

ලූක් 21:14-15ඔවුන් ධර්මශාලාවලට ද අධිපතීන් හා
ආණ්ඩුකාරයන් ඉදිරියට ද ඔබ ගෙන යන කල,
ඔවුන්ට උත්තර දෙන්නේ කෙසේ ද කියා වත්,
කියන්නේ කුමක් ද කියා වත්, සිතමින් කරදර
නොවන්න. 12 ඔබ කිය යුතු දේ ඒ මොහොතේ දී
ම ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබට දන්වනු ඇත."

### පොහොසත් මෝඩයා පිළිබඳ උපමාව

13 සමූහයා අතරෙන් එක් තැනැත්තෙක් කතා
කොට, "ගුරුදේවයෙනි, මා සමඟ අපේ උරුමය
බෙදාගන්න මාගේ සහෝදරයාට කිව මැනවැ"යි උන්
වහන්සේට කී ය. 14 එහෙත් උන් වහන්සේ කතා
කරමින්, "මිත්‍රය, ඔබ කෙරෙහි නඩුකාරයකු,
නොහොත් දේපළ බෙදන්නෙකු කොට මා පත්
කළේ කවරෙක් දැ"යි ඔහුගෙන් ඇසූ සේක.
15 "තවද, සියලු ආකාර තණ්හාවලින් පරෙස්සම්
වන්නට බලාගන්න; මනුෂ්‍යයකුට කොතරම් දේපළ
තිබුණත් ඔහුගේ ජීවිතය ඒ පිට රඳා නැතැ"යි
ඔවුන්ට වදාළ සේක. උන් වහන්සේ උපමාවක්
කියමින් මෙසේ වදාළ සේක; 16 "එක්
ධනවතකුගේ වතුපිටිවල බොහෝ පලදාව ඇති
විය. 17 එවිට ඔහු තම සිතින් කල්පනා කරමින්, මම
කුමක් කරම් ද? මාගේ භවභෝග රුස් කර තබන්න
ඉඩකඩ නැත. 18 මම මෙසේ කරමි: මාගේ
අටුකොටු කඩා දමා වඩා විශාල ඒවා ගොඩනඟා,
ඒවායේ මාගේ සියලු ධනධාන්‍ය රුස් කොට තබා,
19 'අවුරුදු ගණනාවකට සෑහෙන තරම් අගනා වස්තු
සම්භාරයක් මෙහි රුස් කොට තිබේ. විවේක
සුවයෙන් කා බී ප්‍රීති වන්නැ'යි මට ම කියාගනිමි.
20 එහෙත් දෙවියන් වහන්සේ ඔහුට කතා කොට,
'අඥානය, අද රාත්‍රියේ දී ඔබගේ ප්‍රාණය ඔබෙන්
ගනු ලැබේ; එවිට ඔබ රුස් කොටගත් දෙය
කවරෙකුට අයිති වන්නේ දැ'යි වදාළ සේක.
21 දෙවියන් වහන්සේ ඉදිරියෙහි පොහොසත් නොවී
තමාට ම වස්තු රුස් කරගන්නා අය එවැනි ය."

### පෞද්ගලික ඕනෑකම් ගැන කරදර වීම

(මතෙ 6:25-34-19-21)

22 තවද උන් වහන්සේ සිය ශ්‍රාවකයන්ට මෙසේ
වදාරන සේක්: "එහෙයින් මම ඔබට කියමි, කුමක්
කමු ද කියා ජීවිතය ගැන වත්, කුමක් අඳිමු ද කියා
ශරීරය ගැන වත් කරදර නොවන්න. 23 කෑමට වඩා
ජීවිතය ද ඇඳුමට වඩා ශරීරය ද උතුම් ය.
24 කපුටන් ගැන කල්පනා කරන්න: උන් වපුරන්නේ
නැත, කපන්නේත් නැත, උන්ට අටුකොටු නැත,
ගබඩාවක් ද නැත. එහෙත් දෙවියන් වහන්සේ උන්
පෝෂණය කරන සේක. ඔබ පක්ෂීන්ට වඩා
කොතරම් අගනේ ද? 25 සිත් තැවුළෙන් ඔබගේ ආයු
ප්‍රමාණය දික්කරගන්න ඔබ අතරෙන් කවරෙකුට
පුළුවන් ද? 26 ඉදින් එවැනි සුළු දෙයක් වත්
කරගන්නට ඔබට නොහැකි නම්, ඔබ අනෙක්
කාරණා ගැන කරදර වන්නේ මන් ද? 27 1 රාජා
10:4-7; 2 වංශා 9:3-6මානෙලේ මල් ගැන කල්පනා
කරන්න; ඒවා නූල් කටින්නේ වත් වියන්නේ වත්
නැත. එහෙත්, තමාගේ සකල රාජ තේජසින් සැරසී
සිටි සලමොන් වුව ද මානෙලේ මලක් සේ, විරාජමාන
නොවී යයි මම ඔබට කියමි. 28 ඇදහිලි හීන
තැනැත්තෙනි! කෙතෙහි අද තිබී හෙට උදුනෙහි දමනු
ලබන තෘණ දෙවියන් වහන්සේ මෙසේ සරසන
සේක් නම්, ඊට කොපමණ වැඩියෙන් ඔබ
නොසරසන සේක් ද? 29 එබැවින් ඔබ කුමක්
කන්නේ ද කියා වත්, කුමක් බොන්නේ ද කියා වත්
සොයමින් කරදර නොවන්න. 30 මේ සියල්ල
ලෝකයේ සියලු ජාතීහු මුළු සිතින් සොයා යති; මේ
දේවල් ඔබට අවශ්‍ය බව ඔබේ පියාණන් වහන්සේ
දන්නා සේක. 31 එසේ නොව උන් වහන්සේගේ
රාජ්‍යය සොයා යන්න, එවිට මේ දේවල් ද ඔබට
දෙනු ලැබේ.
32 "කුඩා රැළ, බිය නොවන්න, ඔබට රාජ්‍යය
දෙන්නට ඔබගේ පියාණන් වහන්සේ සෑදී පැහැදී
සිටින සේක. 33 ඔබ සතුදේ විකුණා දන් දෙන්න;
නොදිරන පසුම්බි ද නොපිරිහෙන වස්තු ද
ස්වර්ගයෙහි ඔබට සපයාගන්න. එහි දී ඒවාට සොරු
ළං නොවෙති, කාවෝ ද නාස්ති නොකරති. 34 මන්ද,
ඔබගේ වස්තුව කොතැන ද, ඔබගේ සිතත් එතැන
ම ය."

### විශ්වාසදායක දාසයෝ

35 මතෙ 25:1-13 "ඔබගේ ඉඟ පටි බැඳගන්න,
පහන් ද දල්වා තබාගන්න. 36 මාක් 13:34-36තම
ස්වාමියා සරණ මංගල්‍යයෙන් පසු, පරෙළා අවුත්
දොරට තට්ටු කළ වහා ම දොර හරිනු වස් ඔහුගේ
ඊම බල බලා සිටින මනුෂ්‍යයන් හා සමාන ව
සිටින්න. 37 ස්වාමියා එන කල දාසයන් අවදි ව සිටිනු
ඔහු දුටුවොත් ඒ දාසයෝ භාග්‍යවන්තයෝ ය.
ඇත්තෙන් ම මම ඔබට කියමි, ඔහු තමාගේ ඉඟ
පටිය බැඳ ඔවුන් කෑමට හිඳුවා ඔවුන්ට උපස්ථාන
කරන්නේ ය. 38 ඔහු දෙ වන යාමයේ දී හෝ තුන්
වන යාමයේ දී හෝ අවුත් එලෙසෙ ම දකින්නේ නම්
ඒ දාසයෝ භාග්‍යවන්තයෝ ය. 39 මතෙ
24:43-44එහෙත්, සොරා කොයි පැයේ දී එන්නේ දැ
යි ගෙදර ස්වාමියා දැන සිටියේ නම්, ඔහු නොනිදා
හිඳ, තමාගේ ගෙයෙ බිඳීමට ඉඩ නොදෙන බව
දැනගන්න. 40 එබැවින් ඔබත් සූදානම් ව සිටින්න.
මෙසේ කියන්නේ, ඔබ බලාපොරොත්තු නොවන
පැයක දී මනුෂ්‍ය-පුත්‍රයාණන් වඩින නිසා ය."

### විශ්වාසී හා අවිශ්වාසී දාසයෝ

(මතෙ 24:45-51)

41 එවිට පේදුරු කතා කරමින්, "ස්වාමීනි, මේ
උපමාව වදාරන්නේ අප උදෙසා ද, නැතහොත්
සියල්ලන් උදෙසා දැ"යි උන් වහන්සේගෙන් ඇසී ය.
42 එවිට සමිඳාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්
සේක: "ඉදින් ස්වාමියා විසින් තම ගෙයි වැසියන්ට
නියම වේලාවට ආහාර කොටස සපයන පිණිස
ඔවුන් කෙරේ පත් කරනු ලබන විශ්වාසී, සිහි නුවණ

ඇති ගබඩාකාරයා කවරකේ ද? 43 ස්වාමියා ආ කල
යම් දාසයකු සිය සේවයෙහි සිටිනු ඔහු දුටුවොත් ඒ
දාසයා භාග්‍යවන්තයකේ ය. 44 ඒ ස්වාමියා තමා
සන්තක සියල්ල භාර ව ඔහු පත් කරන්නේ යයි
ඇත්තෙන් ම මම කියමි. 45 එහෙත් ඒ දාසයා,
‘මාගේ ස්වාමියාගේ ඊම පමාවනු ඇතැ’යි සිතමින්
දැසිදසුන්ට පහර දෙන්නටත් කා බී මත් වන්නටත්
පටන් ගතහොත්, 46 ඔහු බලාපොරොත්තු නොවන
දිනක දී, නොදන්නා පැයක දී ඒ දාසයාගේ ස්වාමියා
අවුත් ඔහුට දරුණු ලෙස දඬුවම් කොට,
අවිශ්වාසීන්ට නියම ඉරණම ඔහුටත් නියම
කරන්නේ ය. 47 සිය ස්වාමියාගේ අදහස
දැනගෙනෙත්, ඒ අදහස පරිදි කටයුතු සංවිධානය
නොකළාවූ ද ක්‍රියා නොකළාවූ ද දාසයා බොහෝ
පහර ලබන්නේ ය. 48 එහෙත් ඒ අදහස නොදැන,
පහර ලැබීමට නිසි දේ කළ අය ස්වල්ප වශයෙන්
පහර ලබන්නෝ ය. යමකුට බොහෝ දේ දෙනු
ලද්දේ ද, ඔහුගෙන් බොහෝ දේ බලාපොරොත්තු
වනු ලැබේ; යමකුට බොහෝ දේ පවරන ලද්දේ ද,
ඔහුගෙන් ඊටත් වැඩියෙන් බලාපොරොත්තු වනු
ලැබේ.”

### භේදයට හේතුව ජේසුස් වහන්සේ ය
(මතෞ 10:34-36)

49 “පොළොව මත ගිනි ලන්න ආවෙමි. ගින්න
දැනට ම ඇවිළී තිබේ නම් කොපමණ හොඳ ද!
50 මාක් 10:38මට එක්තරා බව්තීස්ම-ස්නාපනයක්
ලබන්න තිබේ; එය ඉටු වන තුරු මම දැඩි සිත්
වේදනාවෙන් පසු වෙමි. 51 පොළොවෙහි සාමය දෙන
පිණිස ආවෙමි යි ඔබ සිතන්නාහු ද? එසේ නොවේ.
මා ආවේ භේද ඇති කරන පිණිස යයි මම ඔබට
කියමි. 52 මෙවෙක් පටන් එක ගෙදර වසන පස්
දෙනෙකුගෙන් දෙදෙනෙකුට විරුද්ධ ව තිදෙනෙක් ද
තිදෙනෙකුට විරුද්ධ ව දෙදෙනෙක් ද භේද වන්නෝ
ය. 53 මීකා 7:6පියා පුතාටත්, පුතා පියාටත්, මව
දුවටත්, දුව මවටත්, නැන්දම්මා ලේලිටත්, ලේලිය
නැන්දම්මාටත් විරුද්ධ ව භේද වන්නෝ ය.”

### අවස්ථාව තේරුම්ගැනීම
(මතෞ 16:2-3)

54 තවද උන් වහන්සේ සමූහයන්ට කතා කොට,
“අවර දිගින් වලාකුළක් නඟිනු ඔබ දක්නා විට,
‘වර්ෂාවක් එන්නේ ය’යි ඔබ එවලේ ම කියන්නහු
ය; එසේ ම වහින්නේ ය. 55 දකුණු දිගින් සුළඟ
හමන විට, ‘දැඩි ග්‍රීෂ්මයක් වන්නේ ය’යි ඔබ
කියන්නහු ය; එසේ ම වන්නේ ය.
56 කරොට්කයෙනි, අහසේ ද පොළොවේ ද ලකුණු
තේරා දීමට ඔබ දන්නාහු ය; එහෙත් මේ නියමිත
මොහොත ඔබ නොදන්නේ කෙසේ ද?”

### පැමිණිලිකරු සමඟ සමගි වීම
(මතෞ 5:25-26)

57 “හරි දයෙ කුමක් දැ යි ඔබ ම විනිශ්චය
නොකරන්නේ මන් ද? 58 ඔබේ පැමිණිලිකාරයා
සමඟ උසාවියට යන විට, මඟ දී ම ඔහු සමඟ
බේරුමක් කර ගැනීමට බොහෝ වෙහෙස මහන්සි
ගන්න. එසේ නොකළොත් සමහරවිට ඔහු ඔබ
නඩුකාරයා වෙත ඇදගෙන යන්නේ ය; නඩුකාරයා ද
ඔබ උසාවියේ නිලධාරියාට භාර දෙන්නේ ය;
උසාවියේ නිලධාරියා ඔබ හිරගෙට යවන්නේ ය.
59 අන්තිම සතයට ගෙවෙන තුරු ඔබ එතැනින් පිටතට
නොඑන්නෙහි යයි ඔබට කියමි.”

### පසුතැවී සිත් හරවා නොගැනීමේ විපත

13 ඒ අවස්ථාවෙහි එහි සිටි සමහරෙක් කතා
කොට, පිලාත් විසින් ගලීලයන් මරා
ඔවුන්ගේ ලේ ඔවුන්ගේ ම යාග සමඟ මිශ්‍ර කළ
අන්දම ගැන උන් වහන්සේට දැන්වූ හ. 2 උන්
වහන්සේ ඔවුන්ට උත්තර දෙමින්, “ඒ ගලීලයන්
එබඳු විපතක් වින්ද බැවින් ඔව්හු අන් හැමට ම වඩා
පාපී වූ හ යි ඔබ සිතන්නහු ද? එසේ නොවේ ය යි
මම ඔබට කියමි. 3 පසුතැවී සිත් හරවා
නොගතහොත් ඔබ හැම ද එසේ ම විනාශ වන්නහු
ය. 4 සිලෝවම් හී බලකොටුව වැටී ඊට යට වී මළ
දසඅට දෙනෙ ජෙරුසලමෙහි විසූ අන් හැමට ම වඩා
දුෂ්ට වූ හ යි ඔබ සිතන්නාහු ද? 5 එසේ නොවේ ය
යි ඔබට කියමි. පසුතැවී සිත් හරවා නොගතහොත්
ඔබ හැමට වන්නේත් එම විපත්තිය ම ය”යි වදාළ
සේක.

### පලදාව නැති අත්තික්කා ගස ගැන උපමාව

6 උන් වහන්සේ උපමාවක් වදාරමින්, “එක්
මිනිසකුගේ මිදි වත්තෙහි වැඩුණු අත්තික්කා ගසක්
විය. ඔහු ඒ ගසේ ගෙඩි සොයා ආවේ ය. එහෙත්
කිසිවක් සම්බ නො වී ය. 7 එවිට ඔහු
උයන්ගොව්වාට කතා කරමින්, ‘බලන්න, දැන් අවුරුදු
තුනක් ම මේ අත්තික්කා ගසේ ගෙඩි සොයා ආ
නමුත් කිසිවක් සම්බ නො වී ය. ගස කපා දමන්න;
එය පොළොවට බරක් ව තිබිය යුතු මන්දැ’යි කී ය.
8 ඔහු උත්තර දෙමින්, ‘ස්වාමීනි, එය වටකර හාරා
පෝර දමන පිණිස මේ අවුරුද්දටත් තිබුණා වේ.
9 ඉන්පසු පල දැරුවොත් හොඳ ය; නැති නම් එය
කපා දමන්නට පුළුවනැ’ “යි කී බව වදාළ සේක.

### කුදු ස්ත්‍රිය සබත් දින දී සුව කිරීම

10 උන් වහන්සේ සබත් දිනක එක් ධර්මශාලාවක
අනුශාසනා කරමින් සිටි සේක. 11 එහි දසඅට වසක්
තිස්සේ අශුද්ධාත්මයක් නිසා දුර්වලකමින් පෙළුණු,
කොයි අන්දමකින් වත් කෙළින් වන්නට බැරි
ස්ත්‍රියක් වූවා ය. 12 ජේසුස් වහන්සේ ඈ දැක
කැඳවා, “ස්ත්‍රිය, ඔබේ දුර්වල කමින් ඔබ මිදුණෙහි
ය”යි කියා 13 ඈ පිට අත් තැබූ සේක. එකණෙහි ම

ඈ කෙළින් සිට, දෙවියන් වහන්සේට ප්‍රශංසා කළා
ය. 14 නික්ම 20:9-10; ද්වි.නී. 5:13-14ජේසුස්
වහන්සේ සබත් දිනයේ දී සුව කළ බැවින්
ධර්මශාලා නායකයා කෝප ව සමූහයා අමතා,
"වැඩපල සඳහා සදවසක් ඇත. සබත් දිනයේ නොව
වෙනෙ දවස්වල අවුත් සුවය ලබාගන්නැ"යි ඔවුන්ට කී
ය. 15 සමිඳාණන් වහන්සේ ඔහුට උත්තර දෙමින්,
"කපටිකයෙනි, ඔබ හැම කෙනෙකු ම සබත්
දිනයේ දී තමාගේ ගොනා හෝ කොටළුවා හෝ
ගාලෙන් ලිහා වතුර දීමට ගෙන යනවා නොවේ ද?
16 එසේ නම්, දසඅට වසක් තිස්සේ සාතන් විසින්
බඳිනු ලැබ සිටි, ආබ්‍රහම්ගේ දියණියක වූ මේ
ස්ත්‍රිය ඒ බන්ධනයෙන් සබත් දිනයේ දී මුදන්න යුතු
ව තිබුණා නොවේ දැ"යි වදාළ සේක. 17 මෙසේ
වදාළ විට උන් වහන්සේගේ සියලු විරුද්ධවාදීහු
ලජ්ජාවට පත් වූ හ. මුළු සමූහයා ද උන් වහන්සේ
කළ මහිමාන්විත ක්‍රියා සියල්ල ගැන
අමන්දානන්දයට පත් වූ හ.

### අබ ඇටය සහ මුහුන් පිළිබඳ උපමා
(මතෙ 13:31-33;මාක් 4:30-32)

18 උන් වහන්සේ තවදුරටත් කතා කරමින්,
"දෙවියන් වහන්සේගේ රාජ්‍යය කුමකට සමාන ද?
එය කුමකට උපමා කරම් ද? 19 එක්තරා මිනිසෙකු
තම වත්තෙහි රෝපණය කළ පසු වැඩී, මහ ගසක්
වූ අබ ඇටයකට එය සමාන ය. අහසේ කුරුල්ලෝ
අවුත් එහි අතු පතරෙහි ලැගුම් ගත්හ"යි වදාළ
සේක. 20 යළිදු උන් වහන්සේ කතා කොට,
"දෙවියන් වහන්සේගේ රාජ්‍යය කුමකට උපමා කරම්
ද? 21 ස්ත්‍රියක විසින් පිටි නැළි තුනක් මුළුමනින් ම
පිපෙනෙතෙක් එහි දමන ලද මුහුන් පිඬකට එය
සමාන ය"යි වදාළ සේක.

### ජීවනයේ පටු මඟ
(මතෙ 7:13-14-21-23)

22 උන් වහන්සේ ජෙරුසලම බලා යද්දී නගර හා
ගම් නියම්ගම් මැදින් අනුශාසනා කරමින් වැඩි සේක.
23 එක් කෙනෙක් කතා කොට, "ස්වාමීනි, ගැළවීම
ලබන්නෝ ස්වල්ප දෙනෙක් පමණක් දැ"යි උන්
වහන්සේගෙන් ඇසී ය. උන් වහන්සේ ඔවුන්ට කතා
කොට මෙසේ වදාළ සේක: 24 "පටු දොරෙන් ඇතුළු
වන්නට වීර්ය කරන්න. මන්ද, බොහෝ දෙනෙක්
ඇතුළු වන්නට සොයන නමුත් ඔවුන්ට නොහැකි වේ
ය යි මම ඔබට කියමි. 25 ගෙදර ස්වාමියා නැඟිට
දොර වැසූ පසු ඔබ පිටත සිට දොරට තට්ටු
කරමින්, 'ස්වාමීනි, අපට දොර හැරිය මැනවැ'යි
කියන කල, 'නුඹලා කොතැනින් ආවාහු දැ යි
නොදනිමි'යි ඔහු පිළිතුරු දෙනු ඇත. 26 එවිට ඔබ:
'අපි ඔබ සමඟ කෑවෙමු, බීවෙමු, ඔබ අපේ වීදිවල
ඉගැන්වූ සේකැ'යි කියන්නහු ය. 27 ගීතා 6:8එහෙත්
ඔහු කතා කොට, 'නුඹලා කොතැනින් ආවාහු දැ යි
මම නොදනිමි. අදමිටුකම් කරන නුඹලා සියලු දෙනා
ම මා කරෙන් පලා යව්' යයි කියන්නේ ය. 28 මතෙ
22:13; 25:30මතෙ 8:11-12ආබ්‍රහම් ද ඊසාක් ද
ජාකොබ් ද සියලු දිවැසිවරයන් ද දෙවියන්
වහන්සේගේ රාජ්‍යයෙහි සිටිය දී ඔබ පිටතට දමනු
ලබන කල එහි විලාප කීම ද දත්මිටිකෑම ද ඇති
වේ. 29 තවද, මනුෂ්‍යයෝ පෙරදිගින් හා අපරදිගින්
ද උතුරු දිගින් හා දකුණු දිගින් ද පැමිණ දෙවියන්
වහන්සේගේ රාජ්‍යයෙහි මංගල භෝජනයට අසුන්
ගන්නෝ ය. 30 මතෙ 19:30; 20:16; මාක්
10:31මෙන්න, දැන් අන්තිමයන් ව සිටින සමහරු
ප්‍රථමයෝ ද දැන් ප්‍රථමයන් ව සිටින සමහරු
අන්තිමයෝ ද වන්නෝ ය."

### ජෙරුසලම ගැන අඳෝනා
(මතෙ 23:37-39)

31 ඒ මොහොතේ දී ම පරිසිවරුන්ගෙන් සමහරෙක්
පැමිණ, "මෙතැනින් අහක් ව ගිය මැනව. මන්ද,
හෙරොද් ඔබ මරනු රිසියෙන් සිටින්නේ ය"යි කී හ.
32 උන් වහන්සේ ඔවුන්ට කතා කොට මෙසේ වදාළ
සේක: "ඔබ ගොස් ඒ හිවලාට මෙසේ කියන්න:
අදත්, හෙටත් මම දුෂ්ටාත්මයන් දුරු කොට රෝග
සුව කරමි. තුන් වැනිදා මාගේ පරමාර්ථය මුදුන් පත්
කරගන්නෙමි. 33 එසේ වුව ද, අදත්, හෙටත්,
අනිද්දාත් මා චාරිකාවෙහි යෙදිය යුතු ය: කුමක්
හයින් ද, දිවැසිවරයකුගේ මරණය ජෙරුසලමෙන්
පිටත දී සිදුවිය නොහැකි ය."
34 "අහෝ! ජෙරුසලම, දිවැසිවරයන් නසන, තී වෙත
එවූ දූතයන්ට ගල් ගසන ජෙරුසලම! කිකිළියක
ඇගේ පැටවුන් සිය පියාපත් යටට එක්රැස්
කරගන්නාක් මෙන්, තිගේ දරු කැල එක්රැස්
කරගන්නට මම කී වරක් කැමැති වීම් ද? එහෙත්
ඔබ කැමැති වූයේ නැත. 35 ගීතා 118:26; ජෙරෙ
22:5බලන්න, ඔබේ දේව මාලිගාව පාළු කරදමා
තිබෙනෙ හැටි! තවද, 'සමිඳාණන් වහන්සේගේ
නාමයෙන් එන තැනැත්තාට ආසිරි වේ වා'යි පවසන
තුරු ඔබ මා යළි නොදක්නහු ය යි මම ඔබට
කියමි."

### දිය උදර රෝගියකුට සුවය

14 සබත් දිනක උන් වහන්සේ නායක
පරිසිවරයකුගේ ගෙදරට කෑම පිණිස වැඩිය
සේක. හැම දෙනෙ ම උන් වහන්සේ දෙස
සෝදිසියෙන් බලා සිටියහ. 2 දිය උදර රෝගයෙන්
පෙළෙනෙ මිනිසෙක් උන් වහන්සේ ඉදිරියෙහි සිටියේ
ය. 3 ජේසුස් වහන්සේ කතා කරමින්, "සබත් දිනයේ
දී සුව කිරීම යුතු ද අයුතු දැ"යි විනයධරයන් හා
පරිසිවරුන්ගෙන් ප්‍රශ්න කළ සේක. 4 ඔව්හු නිහඬ
ව සිටියහ. උන් වහන්සේ රෝගියා අතින් ගෙනෙ
ඔහුට සුවය දී යන්නට හැරිය සේක. 5 මතෙ
12:11පසුව උන් වහන්සේ ඔවුන්ට කතා කරමින්,
"යමකුට අයත් කොටළුවකුහෝ ගොනෙකු හෝ
සබත් දවසේ දී ළිඳේ වැටුණොත් එවේලේ ම ඌ
ගොඩට අදින්නේ නැද්දැ"යි ඇසූ සේක. 6 පිළිතුරක්
දෙන්නට ඔව්හු අපොහොසත් වූ හ.

### ආගන්තුක සත්කාරය පිළිබඳ අනුශාසනා

7 ආරාධනා ලත් අය ප්‍රධාන ආසන ලබාගන්නට
සොයන බව දැක, උන් වහන්සේ ඔවුන්ට මේ
උපමාව කියමින්, 8 හිතෝ 25:6-7"යමකුගේ විවාහ
මඟුලකට කැඳවීමක් ඔබට ලැබුණොත් ප්‍රධාන
ආසනයේ හිඳ නොගන්න. 9 යම් හයෙකින් ඔබට
වඩා උසස් කෙනෙකු ද කැඳවනු ලැබුවොත්, ඔබ
දදෙනො ම කැඳවූ තැනැත්තා අවුත්, 'ඔය ස්ථානය
මොහුට දෙන්නැ'යි ඔබට කීවොත්, ලජ්ජාවෙන් යුක්ත
ව පහත් ම ස්ථානයට යන්නට සිදු වේ. 10 එහෙත්,
ඔබ කැඳවනු ලැබූ කල ගොස් පහත් ම ස්ථානයෙහි
හිඳගන්න; එවිට ඔබ කැඳවූ තැනැත්තේ අවුත්,
'මිත්‍රය, ඉහළ තැනකට එන්නැ'යි ඔබට කීවොත්
ඔබ සමඟ කෑමට හිඳින සියල්ලන් ඉදිරියෙහි ඔබ
ගෞරව ලබන්නෙහි ය. 11 මතෙ 23:12; ලූක්
18:14තමා ම උසස් කරගන්න හැම දෙනා ම පහත්
කරනු ලබති; තමා ම පහත් කරගන්නා උසස් කරනු
ලැබේ ය"යි වදාළ සේක.
12 උන් වහන්සේ තමන්ට ආරාධනා කළ
තැනැත්තාට කතා කොට, "ඔබ රෑ කෑමක් හෝ දවල්
කෑමක් හෝ පිළියෙළ කරන කල, ඔබේ මිතුරන්,
සහෝදරයන්, නෑයන් හෝ පොහොසත් අසල්වාසීන්
හෝ නොකැඳවන්න; එසේ කළොත් ඔවුන් ද එසේ
ම ඔබත් කැඳවනු ඇත. එයින් ඔබට එහි විපාකය
ලැබෙයි. 13 එහෙත් ඔබ භෝජන සංග්‍රහයක්
පිළියෙළ කරන කල, දිළිඳුන් ද අබ්බගාතයන් ද
කොරුන් ද අන්ධයන් ද කැඳවන්න. 14 ඔබට
ප්‍රතිවිපාකයක් දෙන්නට ඔවුන්ට නොහැකි බැවින්
ඔබ භාග්‍යවන්ත වන්නෙහි ය. ධර්මිෂ්ඨයන්ගේ
පුනරුජ්ජීවනයේ දී ඔබට ප්‍රතිවිපාකයක් ලැබෙන්නේ
ය"යි වදාළ සේක.

### මහා මංගල භෝජනය පිළිබඳ උපමාව
(මතෙ 22:1-10)

15 එහි සිටි අයගෙන් කෙනෙක් එවදන් අසා,
"දෙවියන් වහන්සේගේ රාජ්‍යයෙහි දී ආහාර වළඳන
තැනැත්තේ භාග්‍යවන්තයෙකැ"යි ජේසුස් වහන්සේට
කී ය. 16 එහෙත් උන් වහන්සේ කතා කරමින්
මෙසේ වදාළ සේක: "එක් මිනිසෙක් මහා මංගල
භෝජනයක් පිළියෙළ කොට බොහෝ දෙනෙකු
කැඳැවී ය. 17 භෝජන වේලාව පැමිණි තේ ම,
'එන්න, දැන් සියල්ල සූදානම් ව ඇතැ'යි කැඳවනු
ලැබූවන්ට කියනු පිණිස ඔහු සිය දාසයා යැවී ය.
18 එහෙත්, ඔව්හු සියල්ලෝ ම නෑවිත් සිටීමට
එකහෙළා කරුණු කියන්නට පටන් ගත්හ.
පළමුවැන්නා, 'මම කෙතෙක් මිළ දී ගතිමි, එය
බලන්නට යාම අවශ්‍ය ම ය. මට කමා වන මෙන්
ඉල්ලමි'යි ඔහුට කී ය. 19 තව කෙනෙක්, 'මම ගොන්
පස් බානක් මිළ දී ගතිමි; ඔවුන් වැඩට හොඳ ද කියා
අත්හදා බලන්න යමි; මට කමා වන මෙන් ඉල්ලමි'යි
ඔහුට කී ය. 20 තවත් කෙනෙක්, 'මම ස්ත්‍රියක
විවාහ කර ගතිමි; එබැවින් එන්න නොහැකි ය'යි කී
ය. 21 ඒ දාසයා පෙරළා පැමිණ සිය ස්වාමියාට
එපවත් දැන්වී ය. එවිට ගෘහපතියා කෝප ව, 'වහා
ම නුවර වීදිවලට ද පටු මාවත්වලට ද යව, දිළිඳුන් ද
අබ්බගාතයන් ද අන්ධයන් ද කොරුන් ද මෙහි
ගෙනෙව'යි සිය දාසයාට කී ය. 22 දාසයා ද, 'ස්වාමිනි
ඔබ අණ කළ ලෙසෙ කළෙමේ. එහෙත් තවත් ඉඩකඩ
ඇතැ'යි කී ය. 23 එවිට ස්වාමියා දාසයාට කතා
කොට, 'මහ මාවත්වලට ද දවෙටවලට ද යව,
මාගේ ගෙයෙ පිරී යන තරම් සෙනඟට එන්නට බල
කරව, 'යි කී ය. 24 මම ඔබට කියමි, ආරාධිතයන්
අතුරෙන් එකෙක් වත් මාගේ මංගල භෝජනයේ
රස නොබලන්නේ ය."

### ශ්‍රාවකයෙකු වීමේ බාරදූරකම
(මතෙ 10:37-38)

25 තවද මහා ජනකායක් ජේසුස් වහන්සේ සමඟ
ගමන් ගත්හ. උන් වහන්සේ හැරී ඔවුන්ට මෙසේ
වදාළ සේක: 26 මතෙ 10:37"මා වෙත එන
තැනැත්තේ මට වඩා තම පියාට ද මවට ද
භාර්යාවට ද දරුවන්ට ද සහෝදරයන්ට ද
සහෝදරියන්ට ද තමාගේ ම ජීවිතයට වුව ද ප්‍රේම
කරන්නේ නම්, ඔහුට මාගේ ශ්‍රාවකයෙකු විය
නොහැකි ය. 27 මතෙ 10:38; 16:24; මාක් 8:34; ලූක්
9:23කුරුසිය දරා ගෙන, මා අනුව නොඑන
තැනැත්තාට මාගේ ශ්‍රාවකයෙකු විය නොහැකි ය.
28 ඔබ අතුරෙන් යමෙක් මුර අටල්ලක්
ගොඩනැඟීමට අදහස් කරයි නම්, එය නිම කරලීමට
කොතරම් වියහියදම් ඇද්දැ යි පළමුකොට හිඳ
ගණන් නො බලන්නේ ද? 29 එසේ නොකළොත්,
අත්තිවාරම දමා ඒ අටල්ල නිමකරන්නට නොහැකි
වූ විට, එය දකින සියල්ලන්, 30 'මේ මිනිසා
ගොඩනඟන්නට පටන්ගත් නමුත් නිම කරන්නට
ඔහුට බැරි වී යයි කියා සරදම් කරනු ඇත. 31 තවද,
තමන්ට විරුද්ධ ව විසි දහසක් රැගෙන යුද පිණිස
එන රජකුට මුහුණ පෑමට දස දහසක් රැගෙන යා
හැකි දැ යි පළමුකොට හිඳ නොවිමසන කිසි යම්
රජෙක් ඇද් ද? 32 එසේ කළ නොහැකි නම්, ඔහු ඒ
රජ දුර සිටිය දී ම, රාජ දූතයන් යවා, සාම ගිවිසුමක්
ඉල්ලා සිටිනු ඇත. 33 එමෙන් ම ඔබ අතුරෙන් තමන්
සතු සියල්ල අත් නොහරින කිසිවකුට මාගේ
ශ්‍රාවකයෙකු වන්නට බැරි ය."

### වැඩකට නැති ලුණු
(මතෙ 5:13;මාක් 9:50)

34 "ලුණු හොඳ දෙයකි; එහෙත් ලුණෙහි වුව ද,
ලුණු ගතිය නැති වුවහොත්, එයට ලුණු රස
කවන්නේ කුමකින් ද? 35 පසට වත්, කසළ ගොඩට
වත් එයින් වැඩක් නැත; මිනිස්සු ඒවා ඉවත දමති.
සවන් ඇත්තෝ සවන් දෙත්වා!"

## නැති වුණු බැටළුවා පිළිබඳ උපමාව
(මතෙ 18:12-14)

15 ලූක් 5:29-30 එක් දිනක් සියලු අයකැමියෝ ද
පව්කාරයෝ ද ජේසුස් වහන්සේට සවන්
දෙන පිණිස උන් වහන්සේ සමීපයට ආහ. 2 පරිසිවරු
ද විනයධරයෝ ද කතා කොට, “මොහු පව්කාරයන්
පිළිගෙන ඔවුන් සමඟ කන්නේ ය, බොන්නේ ය”යි
මැසිවිලි කීවෝ ය.
3 එවිට උන් වහන්සේ ඔවුන්ට මේ උපමාව වදාළ
සේක: 4 “ඔබ අතුරෙන් බැටළුවන් සියයක් ඇති
කවර මනුෂ්‍යයෙකේ, උන්ගෙන් එකකු නැති
වුවහොත්, අනූ නව දෙනා පාළුකරයෙහි හැරදමා,
නැති වූ එකා පසුපස්සේ ගොස්, ඌ සම්බ වන තුරු
සොයන්නේ නැද් ද? 5 ඒ බැටළුවා සම්බ වූ විට ඔහු
ප්‍රීති වමින්, ඌ කර තබාගෙන, 6 ගෙදර අවුත්
මිතුරන් ද අසල්වැසියන් ද කැඳවා, ‘මා සමඟ ප්‍රීති
වන්න, මාගේ නැති වූ බැටළුවා සම්බ වී ය’යි
ඔවුන්ට කියයි. 7 එලෙසම පසුතැවී සිත් හරවා
ගැනීමට වුවමනා ව නැතැ යි සිතන සිල්වතුන් අනූ
නව දෙනෙකුට වඩා පසුතැවී සිත හරවා ගන්න එක
පව්කාරයකු ගැන ස්වර්ගයෙහි ප්‍රීතිය ඇති වන්නේ
ය යි මම ඔබට කියමි.”

## නැති වුණු කාසිය පිළිබඳ උපමාව

8 තවද උන් වහන්සේ මෙසේ වදාළ සේක: “රිදී
කාසි දසයක් ඇති කවර ස්ත්‍රියක හෝ ඉන් එකක්
නැති වුවහොත් පහනක් දල්වා, ගෙය අතුගා, එය
සම්බ වන තුරු අස්සක් මුල්ලක් නෑර ඕනෑකමින්
සොයන්නේ නැද් ද? 9 එය සම්බ වූ විට ඈ මිතුරන්
ද අසල්වැසියන් ද කැඳවා, ‘මා සමඟ ප්‍රීති වන්න;
මාගේ නැති වූ රිදී කාසිය සම්බ වී ය’යි ඔවුන්ට
කියන්නී ය. 10 එලෙසම පසුතැවී සිත හරවා ගන්නා
වූ එක පව්කාරයකු ගැන දෙවියන් වහන්සේගේ
දූතයන් අතර ප්‍රීතිය ඇති වන්නේ ය යි මම ඔබට
කියමි.”

## නැති වුණු පුත්‍රයා පිළිබඳ උපමාව

11 තවද උන් වහන්සේ මෙසේ වදාළ සේක: “එක්
මනුෂ්‍යයකුට පුත්‍රයෝ දදෙනෙකේ සිටියෝ ය.
12 ඔවුන්ගෙන් බාලයා, ‘පියාණෙනි, ඔබගේ
දේපළවලින් මට අයිති කොටස දුන මැනවැ’යි පියාට
කී ය. එවිට ඔහු තමාගේ දේපළ ඔවුන් අතර බෙදා
දුන්නේ ය. 13 නොබෝ දිනකට පසු බාල පුත්‍රයා
සියල්ල එකතු කොටගෙන, දුර රටකට ගොස්, එහිදී
දුරාචාරයෙහි යෙදෙමින්, තමාගේ සම්පත නාස්ති
කරදැමී ය. 14 සියල්ල වියදම් කළ පසු, ඒ රටේ
මහත් සාගතයක් ඇති වූයෙන් ඔහුට අග හිඟකම්
දැනෙන්නේ විය. 15 එවිට ඔහු ගොස් ඒ රටේ
පුරවැසියෙකුට අතවැසි වී ය; ඒ පුරවැසියා ඌරන්
බලන පිණිස තමාගේ ගොවිපළට ඔහු යැවී ය.
16 ඌරන් කන කරල්වලින් වුව ද තමාගේ කුස
පුරවාගන්න ඔහු කැමැති විය. කිසිවකේ ඔහුට
කිසිවක් නොදුන්නෝ ය. 17 එවිට ඔහු හරි සිහි
කල්පනාවට පැමිණ; මාගේ පියාගේ කුලීකාරයන්
එපමණ දෙනෙකුට ඕනෑ පමණටත් වඩා කෑම තිබේ.
එහෙත් මම මෙහි සාගින්නෙන් නසිමි! 18 මම නැඟිට
මාගේ පියාණන් වෙත ගොස්, ‘පියාණෙනි, දෙවියන්
වහන්සේට විරුද්ධ ව ද ඔබට විරුද්ධ ව ද පව්
කළෙමි. 19 මින් මතු ඔබගේ පුත්‍රයා යයි කියනු
ලබන්න නොවටිමි. ඔබගේ කුලීකාරයන්ගෙන්
එකකු මෙන් මා තබාගත මැනවැ යි ඔහුට
කියන්නෙමි’යි සිතා, 20 පිටත් ව, තම පියා වෙත
ගියේ ය. ඔහුගේ පියා දුරතියා ම ඔහු දැක,
අනුකම්පාවෙන් ඇලළී දුව ගොස්, දෑතින් ඔහුගේ
ගෙළෙ වැළඳ, සිපගත්තේ ය. 21 එවිට පුත්‍රයා ඔහුට
කතා කොට, ‘පියාණෙනි, දෙවියන් වහන්සේට විරුද්ධ
ව ද ඔබට විරුද්ධ ව ද මම පව් කළෙමි. මින් මතු
ඔබගේ පුත්‍රයා යයි කියනු ලබන්නට නොවටිමි’යි
කී ය. 22 එහෙත් පියා සිය මෙහෙකරුවන් කැඳවා,
‘වහා හොඳ ම සළුව ගෙනැවිත් මොහුට අඳවන්න;
මොහුගේ ඇඟිල්ලෙහි මුදුවක් පළඳවා පාදවල වහන්
ද දමන්න; 23 තර කළ වස්සා ගෙනැවිත් මරන්න; අපි
කා බී ප්‍රීති ප්‍රමෝද වමු. 24 මන්ද, මේ මාගේ
පුත්‍රයා මැරී සිට යළි ජීවත් ව සිටියි; නැතිවී සිට
සම්බ වී ය’යි කී ය. එවිට ඔව්හු ප්‍රීති ප්‍රමෝද
වන්න පටන්ගත්හ.
25 ඔහුගේ වැඩිමල් පුත්‍රයා ගොවිපළට ගොස්
සිටියේ ය. ඔහු පෙරළා එන්නේ ගෙදරට ළං වූ කල,
නැටුම් ගැයුම් වැයුම් හඬ අසා, 26 දාසයන්ගෙන් එක්
කෙනෙකුට අඬගසා, ‘මෙහි තේරුම කිමෙකේ දැ’යි
විචාළේ ය. 27 ඔහු ද, ‘ඔබේ සහෝදරයා ඇවිත්
සිටියි; ඔබේ පියා ඔහු සුවසේ ආපසු ලත් බැවින්,
තර කළ වස්සා මැරවේවේ ය’යි කී ය. 28 එහෙත්
ඔහු කිපී, ගෙට ඇතුළු වන්නට වත් නොකැමැති විය.
එබැවින් ඔහුගේ පියා පිටතට අවුත්, ඇතුළට එන
මෙන් ඔහුගෙන් ඉල්ලා සිටියේ ය. 29 ඔහු උත්තර
දෙමින්, ‘මෙපමණ අවුරුදු ගණනක් මුළුල්ලේ මම
ඔබට සේවය කරමින් සිටියෙමි; කවදාවත් ඔබගේ
නියමයන් කඩ නොකළෙමි. එසේ වුවත් මාගේ
මිතුරන් සමඟ ප්‍රීති වන්නට ඔබ එක එළු පැටවකු
පමණ වත් කිසි කලෙක මට නුදුන්නෙහි ය.
30 එහෙත්, ඔබගේ මුළු වත්කම පරස්ත්‍රීන් සමඟ
නැති නාස්ති කළ මේ ඔබගේ පුතා ආ හැටියේ ම,
ඔහු නිසා තර කළ වස්සා මැරවේවෙහි ය’යි පියාට
කී ය. 31 ඔහු ද පිළිතුරු දෙමින්, ‘පුතේ, ඔබ නිතොර
ම මා සමඟ ය, මා සතු සියල්ල ඔබ සතු ය. 32 අප
ප්‍රීති සන්තෝෂ විය යුතු ම ය. මන්ද, මේ ඔබේ
මල්ලී මැරී සිටි නමුත් නැවත ජීවත් ව සිටී’ “යි; නැති
වී සිටි නමුත් නැවත සම්බ වී ය’යි කීයේ ය.

## වංචනික ගබඩාකාරයා පිළිබඳ උපමාව

16 ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන්ට මෙසේ
වදාළ සේක: “එක් ධනවතකුට
ගබඩාකාරයෙකේ සිටියේ ය. ඒ ගබඩාකාරයා ඔහුගේ
වස්තුව නාස්ති කරති යි ඔහුට පැමිණිලි ලැබිණ.

2 එවිට ඔහු ඒ ගබඩාකරු කැඳවා, 'ඔබ ගැන මට
ආරංචි වන මේ කාරණය කුමක් ද? ඔබේ
ගබඩාකාර නිලය පිළිබඳ අය වැය මට භාර දෙන්න;
මින්පසු ඔබට ගබඩාකාර නිලය දැරිය නොහැකි ය'යි
කී ය. 3 ගබඩාකාරයා ද, 'මාගේ ස්වාමියා ගබඩාකාර
නිලයෙන් මා අස්කරන්නට යන නිසා මම කුමක්
කරම් ද? බිම් කටේමට මට ශක්තිය නැත;
හිඟාකෑමට ලජ්ජා වෙමි. 4 ගබඩාකාර නිලයෙන් මා
අස් කළ විට මිනිසුන්ගේ ගෙවල ඉඳුම්හිටුම්
ලබාගැනීමට කළ යුතු දේ මම දනිමි'යි සිතින්
සිතාගත්තේ ය. 5 මෙසේ ඔහු තම ස්වාමියාගේ
ණයකාරයන් එක් එක්කෙනා බැගින් කැඳවා,
පළමුවැනියාට කතා කොට, 'මාගේ ස්වාමියාට ඔබ
කොපමණ ණය දැ'යි ඇසී ය. 6 'තෙල් පීප්ප
සියයකැ'යි ඔහු කීවේ ය. ගබඩාකාරයා කතා කොට,
'ඔබේ බිල ගෙන වහා ම හිඳගෙන පණසක් කියා
ලියන්නැ'යි ඔහුට කී ය. 7 තවත් කෙනෙකුගෙන්, 'ඔබ
කොපමණ ණය දැ'යි ඇසී ය. 'තිරිඟු බුසල් දහස
කැ'යි ඔහු කී ය. 'ඔබ බිල ගෙන අට සියයක් කියා
ලියන්නැ'යි ඔහුට කී ය. 8 ඒ වංචනික ගබඩාකාරයා
එතරම් ශූර නුවණින් ක්‍රියා කළ නිසා ඔහුගේ
ස්වාමියා ඔහුට ප්‍රශංසා කළේ ය. මන්ද,
ආලෝකයේ පුත්‍රයන්ට වඩා මේ ලෝකයේ
පුත්‍රයෝ, සිය කටයුතු සම්බන්ධයෙන් ශූර නුවණ
ඇත්තෝ ය.
9 "එබැවින් මම ඔබට කියමි, ලෞකික වස්තුවෙන්
මිතුරන් සපයාගන්න; වස්තුව නිම ව ගිය කල ඔවුන්
ඔබ සදාතන විමානවලට පිළිගනු ඇත. 10 අල්ප දේ
ගැන විශ්වාසී තැනැත්තේ මහත් දේ ගැනත් විශ්වාසී
වෙයි. අල්ප දේ ගැන වංචනික තැනැත්තේ මහත්
දේ ගැනත් වංචනික වෙයි. 11 එබැවින් ඔබ
ලෞකික වස්තුව ගැන විශ්වාස ව නොසිටියහු නම්
සැබෑ වස්තුව ඔබට භාර දෙන්නෝ කවුරු ද? 12 අන්
සතු දේ ගැන ඔබ විශ්වාස ව නොසිටියහු නම්
ඔබට අයිති වන්න යන දේ ඔබට දෙන්නෝ කවුරු ද?
13 මතෙ 6:24ස්වාමිවරුන් දෙදෙනෙකුට සේවය
කරන්න කිසි සේවකයකුට නුපුළුවන; මන්ද, ඔහු
එක් කෙනෙකුට වෛර කරන්නේ ය; අනෙකේ අයට
ප්‍රේම කරන්නේ ය. නොහොත් එක් කෙනෙකුට
ලැදි වන්නේ ය; අනික් අය හෙළා දකින්නේ ය.
දෙවියන් වහන්සේට හා වස්තුවට එකවිට ම සේවය
කරන්නට ඔබට බැරි ය."

### ව්‍යවස්ථාවලිය හා ස්වර්ග රාජ්‍යය

(මතෙ 11:12-13;5:31-32;මාක් 10:11-12)

14 පරිසිවරු ධනලෝභී අය වූ හෙයින් මේවෙදන් අසා
උන් වහන්සේට සරදම් කළහ. 15 එවිට උන්
වහන්සේ මෙසේ වදාළ සේක. "ඔබ නම් මිනිසුන්
ඉදිරියෙහි ඔබගේ ම දමිටුකම ගැන පාරට්ටු
කරගන්නා අය ය; එහෙත් දෙවියන් වහන්සේ
ඔබගේ සිත් දන්නා සේක. මනුෂ්‍යයන් විශිෂ්ට යයි
සලකනු ලබන දෙය දෙවියන් වහන්සේ ඉදිරියෙහි
පිළිකුලකි. 16 මතෙ 11:12-13ව්‍යවස්ථාවලිය හා
දිවැසාවලිය ජොහන්ගේ කාලය දක්වා විය. එතැන්
සිට දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ සුබ අස්න
දේශනා කරනු ලැබේ. සියල්ලෝ ම බලවත්
ඕනෑකමින් ඊට ඇතුළු වෙති.
17 මතෙ 5:18 එහෙත්, ව්‍යවස්ථාවලියෙන් බින්දු
මාත්‍රයක් වත් අහෝසි වී යාමට වඩා අහස හා
පොළොව පහව් යාම පහසු ය.
18 මතෙ 5:32; 1 කොරි 7:10-11 "සිය බිරිඳ
දික්කසාද කොට, අන් ස්ත්‍රියක පාවාගන්නා
කවරකේ වුව ද කාමමිථ්‍යාචාරය කරයි. පුරුෂයකු
විසින් දික්කසාද කරන ලද ස්ත්‍රියක පාවාගන්න
තැනැත්තේ ද කාමමිථ්‍යාචාරය කරයි."

### ධනපතියා සහ ලාසරස්

19 "අගනා නීල-රක්ත වස්ත්‍ර හා සිනිඳු සේද රෙදි
හැඳගත්, හැමදා සැප විහරණයෙන් කල් යැවූ එක්
ධනපතියෙක් වී ය. 20 ඔහුගේ නිවසේ දොරටුව
ළඟ ඇඟ පුරාම වණ තිබූ ලාසරස් නම් එක්
හිඟන්නෙක් ගෙනවුත් තබන ලදී. 21 ඔහු
ධනපතියාගේ කෑම මේසයෙන් වැටෙන කැබැලිවලින්
වුව ද සාගිනි නිවා ගැනීමට සතුටු විය. බල්ලෝ පවා
ඔහුගේ වණ ලෙව කෑවෝ ය. 22 ඒ හිඟන්නා
මියගිය පසු දේව දූතයන් විසින් ඔහු ආබ්‍රහම්
ළඟට ගෙන යන ලද්දේ ය. ධනපතියාත් මැරී
භූමිදාන කරන ලද්දේ ය. 23 ඔහු ආත්ම භවනෙහි
වධ විඳිමින් ඇස් ඔසවා ආබ්‍රහම් ද ඔහුගේ
තුරුල්ලේ හුන් ලාසරස් ද දුරින් දැක, 24 මොරගසා,
'ආබ්‍රහම් පිය තුමනි, මට කරුණා කොට, තම
ඇඟිලි තුඩ දියේ ගල්වා, මාගේ දිව තෙමොලන
පිණිස ලාසරස් එවනු මැනව: මන්ද, මම මේ ගිනි
ජාලාවෙහි දහ දුක් විඳිමි'යි කී ය. 25 එහෙත්
ආබ්‍රහම් පිළිතුරු දෙමින්, 'පුත්‍රය, ඔබ ජීවත් ව
සිටිය දී, හැම සැපත ම ඔබට තිබුණු බව ද එලෙසෙ
ම හැම විපත ම ලාසරස්ට තිබුණු බව ද සිහි
කරන්න. එහෙත් දැන් ඔහු මෙහි සැනසිලි ලබයි; ඔබ
දහ දුක් විඳින්නෙහි ය. 26 එපමණකුත් නොවේ.
මෙබින් ඔබ වෙත යාමට වත් ඔබින් අප වෙත
ඒමට වත් කැමැති වූවන්ට එය කළ නොහැකි වන
සේ ඔබ හා අප හා අතර පරතරයක් පිහිටුවා
ඇතැ'යි කී ය. 27 එවිට ධනවතා, 'එසේ නම් පිය
තුමනි, මාගේ සහෝදරයෝ පස් දෙනෙක් සිටිති;
28 ඔවුන් ද මේ වධ වේදනා ඇති ස්ථානයට
නොපැමිණෙන පිණිස, ඔවුන්ට අවවාද දෙන්නට
ලාසරස් මාගේ පියාගේ ගෙදරට යවන මෙන්
ඉල්ලමි'යි කී ය. 29 එහෙත්, ආබ්‍රහම් කතා කොට:
'මෝසෙස් සහ දිවැසිවරයෝ ඔවුන්ට සිටිති. ඔව්හු
ඔවුන්ට සවන් දෙත් වා'යි කී ය. 30 ඔහු කතා කොට,
'එසේ නොවේ, ආබ්‍රහම් පිය තුමනි, මළවුන්
කෙරෙන් එකකු ඔවුන් වෙත ගියොත් ඔවුන් පසුතැවී
සිත් හරවා ගනු ඇතැ'යි කී ය. 31 ආබ්‍රහම් පිළිතුරු
දෙමින්, 'ඔව්හු මෝසෙස්ටත් දිවැසිවරයන්ටත් සවන්
නොදෙත් නම්, මළවුන්ගෙන් උත්ථානයට පැමිණියකු
වුව ද ඔව්හු විශ්වාස නොකරති'යි ඔහුට කී ය."

## ජේසුස් වහන්සේගේ තවත් දේශනා
(මතෙ 18:6-7-21-22;මාක් 9:42)

17 උන් වහන්සේ ශ්‍රාවකයන්ට කතා කරමින්,
“මිනිසුන් පාපයට පමුණුවන හේතූන් ඇති
වීම නියත ය. එහෙත් යමකෙු නිසා ඒ හේතු
පැමිණේ ද, ඔහුට වන විපතක මහත! 2 මේ කුඩා
අයගෙන් කෙනෙකුගේ වැටීමට යමෙක් හේතු වනු
ඇද්ද, ඔහුගේ ගෙළෙ වටා ඇඹරුම් ගලක් එල්ලා
මුහුදේ හෙළෙනු ලැබීම ඔහුට ඊට වඩා යහපති.
3 මතෙ 18:15කපරිස්සම් වන්න; ඔබේ සහෝදරයා
පව්ළොත් ඔහුට තරවටු කරන්න; ඔහු පසුතැවී සිත්
හරවා ගනී නම් ඔහුට කමා වන්න. 4 දවසකට සත්
වරක් ඔබට විරුද්ධ ව පව් කොට, සත් වරක් ඔබ
වෙතට හැරී, ‘මම පසුතැවී සිත හරවා ගතිමි’යි
කීවොත්, ඒත් ඔහුට කමා වන්නැ”යි වදාළ සේක.
5 එවිට ප්‍රේරිතයෝ කතා කොට, “අපේ ඇදහිල්ල
වැඩි කළ මැනවැ”යි සමිඳාණන් වහන්සේට කී හ.
6 සමිඳාණන් වහන්සේ කතා කොට, “අබ ඇටයක්
පමණ ඇදහිල්ල ඇති ව, මේ ඇඹිල්ල ගහට, ‘ඉදිරී
ගොස්, මුහුදේ පැලවවෙ’යි කියන්නහු නම්, එය
ඔබට කීකරු වනු ඇත. 7 එහෙත්, ඔබ අතරෙන්
යමකුට සීසාන හෝ බැටළුවන් බලන හෝ
දාසයෙක් සිටී නම් කෙතේ සිට ආ කල, ‘වහාම
ඇවිත් කෑමට ඉඳ ගන්නැ’යි කියන්නෙහි ද? 8 එසේ
නොව, ‘මට කෑම බීම පිළියෙළෙ කොට, ඇඳගෙන
ලෑස්ති වී, කා බී නිම වන තුරු මට උපස්ථාන
කරන්න; ඉන්පසු ඔබ කන්න බොන්නැ’යි කියන්නේ
නැද් ද? 9 ඒ දාසයා තමාට අණ කළ දේ කළ බැවින්
ස්වාමියා ඔහුට ස්තුති කරයි ද? නැත. 10 එසේ ම
ඔබත් ඔබට අණ කළ සියල්ල කළ පසු, ‘අපි දාසයෝ
ය, ස්තුතියක් අපට හිමි නැත, කළ යුතු දයෙ
පමණක් අපි කළෙමු’යි කියන්නැ”යි වදාළ සේක.

## ලාදුරු රෝගීන් දස දෙනාට සුවය

11 ජේසුස් වහන්සේ ජෙරුසලම බලා යද්දී, සමාරිය
හා ගලීලය මැදින් ගමන් ගත් සේක. 12 උන්
වහන්සේ එක් ගමකට ඇතුළු වූ කල, ලාදුරු රෝගීහු
දස දෙනෙක් උන් වහන්සේට හමු වූ හ. 13 ඔව්හු
දුරින් සිට, “ජේසුස් වහන්ස, ආචාරීනි, අපට කරුණා
කළ මැනවැ”යි හඬ නගා කී හ. 14 ලෙවී 14:1-32උන්
වහන්සේ ඔවුන් දැක, “ඔබ ගොස් පූජකවරුන්
අබිමුවෙහි පෙනී සිටින්නැ”යි වදාළ සේක. 15 ඔව්හු
එසේ යද්දී පවිත්‍ර වූ හ. ඔවුන්ගෙන් එක් කෙනෙක්
තමා සුව වූ බව දැක, මහ හඬින් දෙවියන්
වහන්සේට ගෞරව කරමින් පෙරළා අවුත්, 16 උන්
වහන්සේගේ පාමුල වැඳ වැටී උන් වහන්සේට
ස්තුති කළේ ය. ඔහු වනාහි සමාරිය ජාතිකයෙකි.
17 ජේසුස් වහන්සේ කතා කරමින්, “දහ දෙනෙක් ම
පවිත්‍ර වූවා නොවේ ද? අනෙක් නව දෙනා කොහේ
ද? 18 මේ විජාතිකයා හැර, දෙවියන් වහන්සේට
ගෞරව කරන පිණිස වෙන කිසිවෙක් හැරී ආවේ
නැද් ද” කියා, 19 ඔහුට කතා කොට, “නැඟිට යන්න,
ඔබේ ඇදහිල්ල ඔබ සුව කළේ ය”යි වදාළ සේක.

## දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ උදාව
(මතෙ 24:23-28-37-41)

20 “දෙවියන් වහන්සේගේ රාජ්‍යය කවර කලෙක
පහළ වන්නේ දැ”යි පරිසිවරුන් ඇසූ බැවින්, උන්
වහන්සේ ඔවුන්ට උත්තර දෙමින්, “දෙවියන්
වහන්සේගේ රාජ්‍යය ඇසට පෙනෙන අයුරින්
නොපැමිණෙයි. 21 මෙන්න මෙතැන ය, අන්න අතැන
යයි කිසිවකුට කිව නොහැකි ය; මන්ද, දෙවියන්
වහන්සේගේ රාජ්‍යය ඔබ අතරෙහිය”යි වදාළ
සේක.
22 උන් වහන්සේ ශ්‍රාවකයන්ට මෙසේ වදාළ
සේක: “මනුෂ්‍ය-පුත්‍රයාණන් වැඩ සිටින දවස්වලින්
එකක් වුව ද දැකීමට ඔබ ආශාවන කාලයක්
පැමිණෙයි; එහෙත් ඔබ එය නොදක්නාහු ය.
23 ‘අන්න, එතැන ය! මෙන්න මෙතැන ය!’යි ඔවුන්
කියන කල, පිටත් වී එය පසුපස්සේ නොයන්න.
24 අහසෙහි එක් දිශාවකින් පහළ වන විදුලිය
අහසේ අනෙක් දිශාව දක්වා බබළන්නාක් මෙන්,
මනුෂ්‍ය-පුත්‍රයාණෝ පහළ වන දවසේ දී බබළන
සේක. 25 එහෙත් පළමුකොට එතුමාණෝ බොහෝ
දුක් විඳ මේ පරම්පරාව විසින් ප්‍රතික්ෂේප කරනු
ලැබිය යුත්තාහ. 26 උත් 6:5-8තවද නෝවාගේ
දවස්වල දී වූ ලෙසෙ ම, මනුෂ්‍ය-පුත්‍රයාණන්ගේ
දවස්වල දී ද වන්නේ ය. 27 උත් 7:6-24නෝවා
නැවට පිවිසුණු දිනය දක්වා මිනිස්සු කමින්, බොමින්,
ආවාහ විවාහ වමෙින් කල් යැවූ හ. එවිට ජල ගැල්ම
පැමිණ ඔවුන් සියල්ලන් විනාශ කර දැමී ය. 28 උත්
18:20; 19:25ලොත්ගේ දවස්වල දී ද එසේ ම විය;
ඔව්හු කමින්, බොමින්, වෙළෙහෙළෙඳාම් කරමින්,
වවමින්, ගෙවල් සාදමින් කල් යැවූ හ: 29 එහෙත්
ලොත් සොදොම්හි සිට නික්ම ගිය දා, අහසින් ගිනි
සහ ගෙන්දගම් වැසි වැස, සියල්ලන් විනාශ කර දැමී
ය. 30 මනුෂ්‍ය-පුත්‍රයාණන් ප්‍රකාශ වන දිනයේ දී ද
ඒ අයුරින් ම වන්නේ ය. 31 මතෙ 24:17-18; මාක්
13:15-16ඒ දවසේ දී පියස්ස මත සිටින්නා ගයෙි
තිබෙන තම බඩු බාහිරාදිය ගෙනෙයනු පිණිස බීමට
නොබසීවා. එසේ ම කෙතේ සිටින්නා පෙරළා
නොඒවා. 32 උත් 19:26ලොත්ගේ භාර්යාව සිහි
කරන්න. 33 මතෙ 10:39; 16:25; මාක් 8:35; ලූක්
9:24; ජොහ 12:25සිය ජීවිතය රැකගන්නට
සොයන්නා එය නැති කර ගන්නේ ය. සිය ජීවිතය
නැති කරගන්නා එය රැක ගන්නේ ය. 34 මයෙ ඔබට
කියමි, ඒ රැයේ දී මනුෂ්‍යයන් දදෙනෙක් එක
යහනක සිටිති; එක් කෙනෙක් ගනු ලබන්නේ ය,
අනෙකා හැර දමනු ලබන්නේ ය. 35 ස්ත්‍රීහු
දදෙනෙක් එකට ධාන්‍ය අඹරමින් සිටිති; එක
තැනැත්තියක් ගනු ලබන්නී ය, අනෙක් තැනැත්තිය
හැර දමනු ලබන්නී ය. 36 මනුෂ්‍යයන් දදෙනෙක්
කෙතෙහි සිටිති; එක් කෙනෙක් ගනු ලබන්නේ ය;
අනෙකා හැර දමනු ලබන්නේ ය.” 37 එවිට ඔව්හු
උත්තර දෙමින්, “ස්වාමීනි, ඒ කොතැන්හි දැ”යි උන්
වහන්සේගෙන් ඇසූ හ. උන් වහන්සේ උත්තර

දමේන්, “මළකුණ කොතැන ද, ගිජු ලිහිණියෝ
එතැන රුස්වෙති”යි වදාළ සේක.

### වැන්දඹුව හා විනිශ්චයකාරයා පිළිබඳ උපමාව

18 තවද ඔවුන් අධෛර්ය නොවී නොකඩවා
යාච්ඤාවෙහි යෙදිය යුතු බව දක්වන පිණිස
උන් වහන්සේ ඔවුන්ට මේ උපමාව වදාළ සේක:
2 “එක් නුවරක දෙවියන්ට බිය නැති, මිනිසුන්ට ගරු
නොකරන විනිශ්චයකාරයෙක් වී ය. 3 එම නුවර
වැන්දඹුවක් ද වූවා ය; ඈ නොයෙක් වර ඔහු වෙත
ගොස්, ‘මාගේ විරුද්ධකාරයා මට කළ අයුක්තියට,
යුක්තිය ඉෂ්ට කළ මැනවැ’යි කීවා ය. 4 ඔහු කලක්
ඒ ඉල්ලීම නොසලකා හැරියේ ය. පසුව ඔහු තමාට
ම මෙසේ කියාගත්තේ ය, ‘මා දෙවියන් වහන්සේට
ගරුබිය නොපෑවත්, මනුෂ්‍යයන්ට ගරු සරු නොකළත්,
5 මේ වැන්දඹුවගේ, කරදරය නිසා ඈ නිතර පැමිණ
මා නොවෙහෙසෙන පිණිස, ඈට යුක්තිය ඉටු කර
දමේ’යි කීයේ ය.” 6 තවද, සමිඳාණන් වහන්සේ
කතා කොට, “මේ අධාර්මික විනිශ්චයකාරයා කියන
දේ අසන්න. 7 දෙවියන් වහන්සේත්, දිවා රෑ දෙකේහි
තමන් හට අයැදින, තමන් තෝරාගත් අය ගැන
යුක්තිය ඉටු නොකරන සේක් ද? උන් වහන්සේ
ඔවුන් ගැන බොහෝ නොඉවසන සේක් ද? 8 උන්
වහන්සේ ඔවුන්ට වහා ම යුක්තිය ඉටු කරන සේකැ
යි, මම ඔබට කියමි. එසේ වුව ද, මනුෂ්‍ය-
පුත්‍රයාණන් වඩිනා කල මිහි පිට ඇදහිල්ල ඇති අය
උන් වහන්සේට සම්බ වනු ඇද්දැ”යි ඇසූ සේක.

### පරිසිවරයා සහ අයකැමියා පිළිබඳ උපමාව

9 තමා සිල්වත් යයි සිතමින්, අන් හැම දෙනෙ හෙළා
දුටු ඇතැම් අයට උන් වහන්සේ මේ උපමාව ද වදාළ
සේක. 10 “මිනිසුන් දදෙනෙකේ යාච්ඤාව පිණිස
දේව මාලිගාවට නැඟී ගියහ; එක් කෙනෙකේ
පරිසිවරයෙකි; අනික් තැනැත්තා අයකැමියෙකි.
11 පරිසිවරයා නැඟී සිට පසකෙට වී තනියම
යාච්ඤා කරමින්, ‘දෙවියන් වහන්ස, මා අන් මිනිසුන්
මෙනේ වස්තු ලෝභී, වංචනික, කාමමිථ්‍යාචාරී
තැනැත්තකු නොවන බැවින් ඔබට තුති පුදමි. මම
මේ අයකැමියා වැන්නකේ ද නොවෙමේ. 12 සතියකට
දෙවරක් උපවාස කරමි; මා උපයන සියල්ලනේ
දහයෙනේ කොටස දමේ’යි කී ය. 13 එහෙතේ
අයකැමියා ඈතින් සිට ස්වර්ගය දෙසෙ ඇස් ඔසවා
බලන්නට වත් නොසිතා, තමාගේ ළයට
ගසාගනිමින්, ‘දෙවියන් වහන්ස, පව්කාර වූ මා හට
කරුණා කළ මැනවැ’යි කී ය. 14 මතෙ 23:12; ලූක්
14:11මයෙ මම ඔබට කියමි; දමිටු යයි ගණන් ගනු
ලැබ ගදෙර ගියේ පරිසිවරයා නොව, මේ අයකැමියා
ය. තමා ම උසස් කරගන්නා හැම දෙනෙ ම පහත්
කරනු ලබති; තමා ම පහත් කරගන්නා උසස් කරනු
ලබන්නේ ය.”

### ළදරුවන්ට ආශීර්වාද කිරීම

(මතෙ 19:13-15;මාක් 10:13-16)

15 සමහරු උන් වහන්සේගේ අත්, ඔවුන් පිට
තබවා ගනු පිණිස, තම ළදරුවන් පවා උන් වහන්සේ
වෙත ගනෙවෝ ය. ශ්‍රාවකයෝ ඒ දැක ඔවුන්ට
තරවටු කළහ. 16 එහෙත් ජේසුස් වහන්සේ ඔවුන්
තමන් වෙත කැඳවා, “ළදරුවන්ට මා වෙත එන්නට
ඉඩ දෙන්න; ඔවුන් නොවළක්වන්න; මන්ද, දෙවියන්
වහන්සේගේ රාජ්‍යය මබෙඳුවන්ගේ ය.
17 ඇත්තෙනේ ම මම ඔබට කියමි, යමකේ දෙවියන්
වහන්සේගේ රාජ්‍යය ළදරුවකු මෙනේ
නොපිළිගන්නේ ද, ඔහු කිසි සේත් එහි ඇතුළු
නොවන්නේ ය”යි වදාළ සේක.

### ධනවත් ප්‍රධානියා

(මතෙ 19:16-30;මාක් 10:17-31)

18 එවිට එක් ප්‍රධානියකේ උන් වහන්සේට කතා
කොට, “යහපත් ගුරුදේවයෙනි, සදාතන ජීවනය
උරුම කර ගන්නා පිණිස මා කුමක් කළ යුතු දැ”යි
ඇසී ය. 19 ජේසුස් වහන්සේ පිළිතුරු දමේන්, “මා
‘යහපත් ය’යි ඔබ කියන්නේ මන් ද? හුදකේ දෙවියන්
වහන්සේ මිස අන් කිසිවකේ යහපත් නොවේ.
20 නික්ම 20:12-16; ද්වි.නී. 5:16-20කාමමිථ්‍යාචාරය
නොකරන්න, මිනී නොමරන්න, සොරකම්
නොකරන්න. බොරු සාක්ෂි නොකියන්න, නුඹේ
පියාට ද මවට ද ගෞරව කරන්න යන ආඥා ඔබ
දන්නහෙි ය”යි ඔහුට වදාළ සේක. 21 “මේ සියල්ලක්
ම මාගේ යොවුන් වියේ පටන් රක්ෂා කළෙමේ”යි
ඔහු කී ය. 22 ජේසුස් වහන්සේ ඒ අසා, “ඔබට තව
එක අඩුපාඩුවක් ඇත. ඔබ සතු සියල්ල විකුණන්න,
විකුණා දිළිඳුන්ට දෙන්න, එවිට ස්වර්ගයෙහි ඔබට
සම්පත් ඇති වන්නේ ය; එන්න, මා අනුගාමී
වන්නැ”යි ඔහුට වදාළ සේක. 23 එහෙත් ඔහු ඒ කීම
අසා අතිශයින් ශෝක විය; එසේ වූයේ ඔහු
බොහෝ ධනවත් ව සිටි බැවිනි.
24 ජේසුස් වහන්සේ ඒ දැක, “ධනවතුන්ට දෙවියන්
වහන්සේගේ රාජ්‍යයට ඇතුළු වීම කොතරම් දුෂ්කර
ද! 25 ධනවතකු දෙවියන් වහන්සේගේ රාජ්‍යයට
ඇතුළු වීමට වඩා ඔටුවකුට ඉඳිකටු මලින් රිංගා
යාම පහසු ය”යි වදාළ සේක. 26 ඒ ඇසූ අය, “එසේ
නම් ගැළවීම ලැබිය හැක්කේ කවරකුට දැ”යි ඇසූ
හ. ජේසුස් වහන්සේ පිළිතුරු දමේන්,
27 “මනුෂ්‍යයන්ට නොහැකි දේ දෙවියන් වහන්සේට
හැකි ය”යි වදාළ සේක.
28 එවිට පේදුරු කතා කොට, “අපි නම් අප සතු
සියල්ල අත්හැර ඔබ වහන්සේ අනුව ආවමු”යි කී
ය. 29 උන් වහන්සේ කතා කරමින්, “ඇත්තෙනේ ම
මම ඔබට කියමි, දෙවියන් වහන්සේගේ රාජ්‍යය
නිසා ගේදොර හෝ භාර්යාව හෝ සහෝදරයන්
හෝ දෙමව්පියන් හෝ දූදරුවන් හෝ අත්හළ
කවරකේ වුව ද, 30 මේ යුගයේ දී ම ඊට බොහෝ

වැඩියනේ ද එන යුගයේ දී සදාතන ජීවනය ද
ලබන්නේ ම ය”යි වදාළ සේක.

### මරණය සහ පුනරුජ්ජීවනය ගැන තෙ වන වරටත් කීම

(මතෙ 20:17-19;මාක් 10:32-34)

31 උන් වහන්සේ දොළොස් දෙනා තමන් වෙත
කැඳවා ඔවුන්ට කතා කරමින්, “මෙන්න, දැන් අපි
ජෙරුසලමට යම්හ; මනුෂ්‍ය-පුත්‍රයාණන් ගැන
දිවැසිවරයන් විසින් ලියා ඇති සියල්ල ඉෂ්ට වන්නේ
ම ය. 32 කුමක්නිසා ද උන් වහන්සේ විජාතීන්ට
පාවා දෙනු ලබන සේක. ඔව්හු උන් වහන්සේට
සරදම් කර, අපහාස කර, කෙළ ගසන්නාහ. 33 ඔව්හු
උන් වහන්සේ කසවලින් තළා මරන්නෝ ය. එහෙත්
තුන්වනදා නැවත උත්ථාන වන සේකැ”යි වදාළ
සේක. 34 මේ දේවලින් කිසිවක් ඔවුන්ට අවබෝධ
නො වී ය. උන් වහන්සේ පැවසූ දෙය නොවැටහෙන
සේ එය ඔවුන් කෙරෙන් සැඟවී තිබිණි.

### ජෙරිකෝවේ අන්ධයකුට පෙනීම දීම

(මතෙ 20:29-34;මාක් 10:46-52)

35 ජේසුස් වහන්සේ ජෙරිකෝවට සමීප වූ කල,
එක් අන්ධයෙක් සිඟමින් පාර අයිනේ ඉඳගෙන
සිටියේ ය. 36 ජනකායක් ඒ ළඟින් යනවා ඔහුට
ඇසී, “ඒ කුමක් දැ”යි විමසී ය. 37 එවිට ඔව්හු
නාසරත්හි ජේසුස් වහන්සේ ඒ ළඟින් යන බව
ඔහුට කී හ. 38 ඔහු ද, “ජේසුස් වහන්ස, දාවිත්ගේ
පුත්‍රය, මට අනුකම්පා කළ මැනවැ”යි මොරගැසී ය.
39 ඉදිරියෙන් ගිය අය නිශ්ශබ්ද වන ලෙස ඔහුට සැර
කළහ. එහෙත් ඔහු ශබ්ද නගා: “දාවිත්ගේ පුත්‍රය,
මට අනුකම්පා කළ මැනවැ”යි වැඩි වැඩියෙන්
මොරගැසී ය. 40 ජේසුස් වහන්සේ නැවතී, ඔහු
තමන් ළඟට ගෙනෙන්න අණ කළ සේක. ඔහු ළඟට
ආ කල, 41 “මා ඔබට කුමක් කර දෙනවාට
කැමැත්තෙහි දැ”යි ඔහුගෙන් ඇසූ සේක. “ස්වාමීනි
මාගේ පෙනීම මට ලබා දුන මැනවැ”යි ඔහු කී ය.
ජේසුස් වහන්සේ කතා කරමින්, 42 “පෙනීම
ලබන්න, ඔබේ ඇදහිල්ල ඔබ සුව කළේ ය”යි
වදාළ සේක. 43 එකෙණෙහි ම ඔහු ඇස් පෙනීම
ලබා දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින්, උන්
වහන්සේ පසුපස්සේ ගියේ ය. මුළු ජනතාව තමන්
දුටු දේ ගැන දෙවියන් වහන්සේට ප්‍රශංසා කළහ.

### ජේසුස් වහන්සේ සහ සාකෙවුස්

19 උන් වහන්සේ ජෙරිකෝවට පිවිස, ඒ මැදින්
ගිය සේක. 2 සාකෙවුස් නම් ධනවත් ප්‍රධාන
අයකැමියෙක් එහි විය. 3 ඔහු ජේසුස් වහන්සේ
කවුරුන් දැ යි බැලීමට සවේ ය. එහෙත් ඔහු
මිටිකෙනෙකු වූයෙන් සමූහයා නිසා එය කළ
නොහැකි විය. 4 ජේසුස් වහන්සේ ඒ පාරෙන් යන්න
සිටි බැවින්, ඔහු පෙරටුව දුව ගොස්, උන් වහන්සේ
දක්නා පිණිස අත්තික්කා ගසකට නැංගේ ය.
5 ජේසුස් වහන්සේ ඒ ස්ථානයට පැමිණ, උඩ බලා,
ඔහුට කතා කොට, “සාකෙවුස්, වහා ම බිමට
බසින්න, අද මට ඔබේ ගෙදර නවාතැන් ගන්න ඕනෑ
ය”යි ඔහුට වදාළ සේක. 6 ඔහු වහා ම බැස, අවුත්,
ප්‍රීතියෙන් උන් වහන්සේ පිළිගත්තේ ය. 7 ඒ දුටු
සියල්ලෝ, “උන් වහන්සේ පව්කාර මනුෂ්‍යයකු
සමඟ නවාතැන් ගන්නට ගිය සේකැ”යි කියමින්
කොඳුළෝ ය. 8 සාකෙවුස් නැඟිට, “ස්වාමීනි, මා
සන්තක දෙයින් දෙකෙන් කොටසක් දිළිඳුන්ට දෙමි,
යමකුගෙන් අයුතු ලෙසෙ යමක් ගෙන තිබේ නම්,
ඔහුට සතර ගුණයක් ආපසු දෙමි”යි සමිඳාණන්
වහන්සේට කී ය. 9 ජේසුස් වහන්සේ කතා කරමින්,
“ගැළවීම අද මේ ගෙදරට පැමිණ ඇත; මොහු
ආබ්‍රහම්ගේ පුත්‍රයෙකි. 10 මතෙ 18:11මනුෂ්‍ය-
පුත්‍රයාණෝ නැති වූ දේ සොයන්නට ද
ගළවාගන්නට ද වැඩම කළ සේකැ”යි වදාළ සේක.

### රන් කාසි දසය පිළිබඳ උපමාව

(මතෙ 25:14-30)

11 මතෙ 25:14-30 ඔවුන් මෙබස් අසා සිටිය දී, උන්
වහන්සේ තවත් උපමාවක් වදාළ සේක. එය
වදාළේ, උන් වහන්සේ ජෙරුසලමට සමීප ව සිටි
බැවින් හා දෙවියන් වහන්සේගේ රාජ්‍යය වහා ම
එළිදරව් වනු ඇතැ යි ඔවුන් සිතූ බැවිනි.
12 “රදළපෙළෙහි වූ එක් මනුෂ්‍යයෙක් රාජ පදවියක්
ලබා එනු පිණිස දුර රටකට පිටත් ව ගියේ ය.
13 ඔහු තමාගේ දාසයන් දස දෙනෙකු කැඳවා, ඔවුන්
එකිනකොට රන් කාසියක් බැගින් දී, ‘මා එන තුරු
මෙයින් වෙළෙහෙළෙඳාම් කරන්නැ’යි කී ය. 14 එහෙත්
ඔහුගේ නගරවැසියෝ ඔහුට වෛර වී, ‘මේ
මනුෂ්‍යයා අප කෙරේ රජකම් කිරීම අපේ කැමැත්ත
නොවේ ය’යි කියනු පිණිස නියෝජිත පිරිසක් ඔහු
පස්සේ යැවූ හ. 15 ඔහු රාජ පදවිය ලබා පෙරළා ආ
විට, තමා මුදල් දුන් දාසයෝ වෙළෙහෙළෙඳාමෙන්
කොපමණ උපදවා ගත්තෝ දැ යි දැනගන්නා පිණිස
ඔවුන් තමන් වෙත කැඳවන්න අණ කළේ ය.
16 පළමුවැන්නා ඔහු ඉදිරියට අවුත්, ‘ස්වාමීනි, ඔබේ
එක රන් කාසියෙන් රන් කාසි දසයක් උපදවා
ගතිමි’යි කී ය. 17 ඔහු කතා කොට, ‘ඉතා හොඳ ය,
යහපත් වූ දාසය, ඔබ ඉතා සුළු දෙයෙක් ගැන
විශ්වාසී වූ බැවින් නගර දසයක් කෙරේ අධිපති
වන්නැ’යි ඔහුට කී ය. 18 දෙවෙන්නා ද අවුත්,
‘ස්වාමීනි, ඔබ දුන් රන් කාසියෙන් පහක්
උපදවාගතිමි’යි කී ය. 19 එවිට ඔහු, ‘ඔබත් නගර
පහක් කෙරේ අධිපති වන්නැ’යි ඔහුට කී ය.
20 තවත් කෙනෙක් අවුත්, ‘ස්වාමීනි, මෙන්න ඔබේ
රන් කාසිය! එය රෙදි කඩක ඔතා තැබීමි. 21 මන්ද,
ඔබ නුදුන් දෙය ගන්නා වූ, නොවපුළ දෙය කපන්නා
වූ දැඩි සිතක් ඇති කෙනෙකු බැවින් ඔබට බිය
වූවෙමි’යි කී ය. 22 එවිට ඔහු කතා කොට, ‘නපුරු
දාසය, ඔබේ ම වචනවලින් ඔබ විනිශ්චය කරමි. මා
නුදුන් දෙය ගන්නා වූ, නොවපුළ දෙය කපන්නා වූ,
දැඩි සිතක් ඇති කෙනෙකු බව ඔබ දැන සිටියෙහි ය.
23 එසේ නම් මා ආ විට පොළියත් සමඟ අය
කරගනු පිණිස මාගේ මුදල් බැංකුවේ තැන්පත්

නොකළෙළේ මන් ද?' කියා, 24 ළඟ සිටියවුන්ට කතා
කොට, 'ඒ කාසිය ඔහුගනේ ගනෙ කාසි දසය
ඇත්තාට දනේනැ'යි කී ය. 25 එවිට ඔව්හු, 'ස්වාමීනි
ඔහුට කාසි දසයක් ඇතැ'යි කී හ. 26 මතෙ 13:12;
මාක් 4:25; ලූක් 8:18'ඇති හැමට වැඩියෙනුත් දනෙු
ලැබේ'; නැති අයගනේ ඇති දයෙත් ගනු ලැබේ' ය යි
මම ඔබට කියමි. 27 එසේ වුව ද මා තමන් කරෙේ
රජකම් කරනවාට කැමැති නුවූ මේ මාගේ සතුරන්
මහෙි ගනෙවුත් මා ඉදිරියහෙි ම මරා දමන්නැ'යි
කීවේ ය."

## රාජ තේජසින් ජරෙුසලමට පිවිසීම

(මතෙ 21:1-11;මාක් 11:1-11;ජොහ 12:12-19)

28 උන් වහන්සේ මවෙදන් දසො ජරෙුසලමට යන
පිණිස ඔවුන්ට පරෙටුව වැඩී සේක. 29 උන්
වහන්සේ ඔලීව නම් කන්දට නුදුරු බතේෆාගයට ද
බතොනියට ද ළං වූ කල, සිය ශ්‍රාවකයන්ගනේ
දදෙනෙකු යවමින්, 30 "ඔබ ඉදිරිපිට තිබනෙ ගමට
යන්න; එහි ඇතුළු වූ විට, කිසි කලකෙ කිසිවකෙු
නොනැඟුණු කොටළු නාම්බකෙු බැඳ සිටිනු ඔබට
සම්බවන්නේ ය. 31 ඌ ලිහා මහෙි ගනෙනේන. ඌ
ලිහන්නේ මන්දැ යි යමකෙු ඇසුවොත්, සමිඳාණන්
වහන්සේ හට උගනේ වැඩක් ඇතැ යි කියන්නැ"යි
වදාළ සේක. 32 යවනු ලැබුවෝ ගොස් උන්
වහන්සේ ඔවුන්ට වදාළ ලසෙ ම දුටුවෝ ය.
33 ඔවුන් කොටළු නාම්බා ලිහන කල අයිතිකාරයෝ
"ඔබ කොටළු නාම්බා ලිහන්නේ මන්දැ"යි ඇසූ හ.
34 "සමිඳාණන් වහන්සේ හට උගනේ වැඩක් ඇතැ"යි
ඔව්හු කී හ. 35 ඔව්හු කොටළු නාම්බා උන්
වහන්සේ වතෙ ගනෙවුත්, තමන්ගේ උතුරු සළු ඌ
පිට අතුරා, ජේසුස් වහන්සේ ඌ පිට හිඳවූ හ.
36 උන් වහන්සේ යද්දී, ඔව්හු තමන්ගේ උතුරු සළු
මඟ එලා ලූ හ. 37 උන් වහන්සේ ඔලීව කන්දේ
බෑවුම ළඟට පැමිණි කල්හි, මුළු ශ්‍රාවක සමූහයා
ප්‍රීති වන්නටත් තමන් දුටු සියලු ප්‍රබල ක්‍රියා ගැන
මහත් ශබ්දයකින් දවෙියන් වහන්සේට ප්‍රශංසා
කරන්නටත් පටන් ගනෙ, 38 ගීතා 118:26"සමිඳුන්
නමින් වඩිනා රජුට ආසිරි වේ වා! ස්වර්ගයහෙි
සාමය ද අති උසස් තැන්හි මහිමය ද වේ වා!"යි කී
හ. 39 එවිට සමූහයා අතරනේ සමහර පරිසිවරු,
"ගුරුදේවයනෙි, ඔබගේ ශ්‍රාවකයන්ට තරවටු කළ
මැනවැ"යි උන් වහන්සේට කී හ. 40 උන් වහන්සේ
උත්තර දමේින්, "ඔවුන් නිහඬ වුවොත්, ගල්,
මොරගසනු ඇතැ යි මම ඔබට කියමි"යි වදාළ
සේක.

## ජේසුස් වහන්සේ ජරෙුසලම ගැන කම්පා වීම

41 උන් වහන්සේ අගනුවරට ළඟා වී එය දුටු විට
නුවර ගැන හඬමින් මසෙේ වදාළ සේක: 42 "අහෝ,
ඔබට ශාන්තිය සලසන දේ ගැන මේ උදාර දිනයේ
දී වත් ඔබ දැන සිටියා නම්! එහතේ එසේ නො වී
ය, එය ඔබේ දනෙතේින් සැඟවී ඇත. 43 ඔබේ
සතුරන් බලකොටු තනා, ඔබ සිසාරා, සතර දිගින්
ඔබ වටලන දවස් පැමිණනේනේ ය. 44 ඔව්හු ඔබ ද
ඔබ තුළ සිටින දරු කැල ද පොළොවේ ගසා, ගලක්
පිට ගලක් තිබනේට ඉඩ නාරින්නෝ ය. මන්ද,
දවෙියන් වහන්සේ ඔබ ගළවන්නට පැමිණි දවස ඔබ
නොදත් හයෙිනි."

## දේව මාලිගාව පවිත්‍ර කිරීම

(මතෙ 21:12-17;මාක් 11:15-19;ජොහ 2:13-22)

45 උන් වහන්සේ දේව මාලිගාවට ඇතුළු වී, එහි
සිටි වළෙඳුන් පලවා හරින්න පටන්ගනෙ, 46 යසො
56:7; ජරෙ 7:11" 'මාගේ ගෘහය යාච්ඤාවේ
ගෘහයක් වන්නේ ය'යි ලියා ඇත. එහතේ ඔබ එය
සොරුන්ගේ ගුහාවක් කර තිබේ ය"යි ඔවුන්ට වදාළ
සේක.
47 ලූක් 21:37 උන් වහන්සේ දිනපතා දේව
මාලිගාවහෙි ඉගැන්වූ සේක. එහතේ, නායක
පූජකයෝ ද විනයධරයෝ ද ප්‍රභූවරයෝ ද උන්
වහන්සේ නසාලීමට උපක්‍රම සවෙූ හ. 48 මුළු
ජනතාව උන් වහන්සේගේ ඉගැන්වීම්වලට සතුටින්
සවන් දුන් බැවින්, උන් වහන්සේට කිසිවක් කිරීමට
ඔවුන්ට ඉඩක් නොලැබිණි.

## ජේසුස් වහන්සේගේ අධිකාරී බලය ගැන ප්‍රශ්න කිරීම

(මතෙ 21:23-27;මාක් 11:27-33)

20 එක් දිනක් උන් වහන්සේ දේව මාලිගාවහෙි
සනෙඟට අනුශාසනා කරමින් ද සුබ අස්න
දේශනා කරමින් ද සිටිය දී නායක පූජකයෝ ද
විනයධරයෝ ද ප්‍රජා මූලිකයන් හා සමඟ උන්
වහන්සේ වතෙ පැමිණ, 2 "ඔබ මේ දේවල්
කරන්නේ කුමන අධිකාරී බලයකින් ද නොහොත්
මේ අධිකාරී බලය ඔබට පැවරුවේ කවරකේ දැ යි
අපට කියන්නැ"යි උන් වහන්සේට කී හ. 3 උන්
වහන්සේ උත්තර දමේින්, "මමත් ඔබගනේ
ප්‍රශ්නයක් අසමි; 4 ජොහන් බව්තීස්ම-ස්නාපනය
කිරීමේ බලය ලැබුවේ දවෙියන් වහන්සේගනේ ද
නොහොත් මනුෂ්‍යයන්ගනේ දැ"යි ඇසූ සේක.
5 එවිට ඔව්හු තම තමන් අතර කතා කොට, "
'දවෙියන් වහන්සේගනේ ය'යි අප කීවොත්, 'එසේ
නම්, ඔහු අදහා නොගත්තේ මන්දැ'යි මොහු අපනේ
අසනු ඇත. 6 'මනුෂ්‍යයන්ගනේ ය'යි කීවොත්,
ජොහන් දිවැසිවරයකු ලසෙ මුළු ජනතාව විශ්වාස
කරන බැවින්, ඔවුන් අපට ගල් ගසනු ඇතැ"යි කියා,
7 "එය කොතැනින් වූයේ දැ යි අපි නොදනිමු"යි
උත්තර දුන්හ. 8 එවිට උන් වහන්සේ පිළිතුරු දමේින්,
"මා කුමන අධිකාරී බලයකින් මේ දේවල් කරම් දැ
යි මමත් ඔබට නොකියමි"යි වදාළ සේක.

## මිදි වත්ත හා ගොවීන් පිළිබඳ උපමාව

(මතෙ 21:33-46;මාක් 12:1-12)

9 යසො 5:1 උන් වහන්සේ සනෙඟට මේ උපමාව
කියන්නට පටන්ගත් සේක: "මිනිසකේ මිදි වත්තක්
වවා, ගොවීන්ට අඳයට දී, බොහෝ කලකට පිටරට

ගියේ ය. 10 පල නෙළෙන කාලයේ දී, මිදි වත්තේ
අස්වැන්නෙන් කොටසක් ගොවීන්ගෙන්, ලබන
රිසියෙන්, ඔහු දාසයකු ඔවුන් වෙත යැවී ය. එහෙත්
ගොවීහු ඔහුට තළා පෙළා ඔහු හිස් අතින් හැරියෝ
ය. 11 පසුව ඔහු තව දාසයකු යැවී ය. ගොවීහු
ඔහුටත් තළා පෙළා, නිගා කොට, හිස් අතින්
හැරියෝ ය. 12 යළිත් ඔහු තුන්වැනියකු යැවී ය.
ඔව්හු ඔහුටත් තුවාළ කොට එළවා දැමූ හ. 13 එවිට
මිදි වත්තේ හිමියා කතා කොට, ‘මම කුමක් කරම්
ද? මාගේ ප්‍රේමවන්ත පුත්‍රයා යවමි. සමහරවිට
ඔවුන් ඔහුට ගෞරව කරනු ඇතැ’යි කී ය.
14 එහෙත් ගොවීහු ඔහු දැක, ඔවුනොවුන් අතර
කතා කොට, ‘මොහු උරුමක්කාරයා ය. උරුමය අපට
අත් වන පිණිස මොහු මරමු’යි කියා, 15 ඔහු මිදි
වත්තෙන් පිටත දමා මැරූ හ. එහයින් මිදි වත්තේ
හිමියා ඔවුන්ට කුමක් කරනු ඇද් ද? 16 ඔහු අවුත් ඒ
ගොවීන් වනසා, මිදි වත්ත අන්‍යයන්ට දෙනු ඇතැ”යි
වදාළ සේක. 17 ගීතා 118:22ඔව්හු ඒ අසා, “එසේ
නොවේ වා”යි කී හ. එහෙත් උන් වහන්සේ ඔවුන්
දෙස බලා, “එසේ වී නම්: ‘ගෘහ ශිල්පීන් ඉවත ලූ
ගල ම, කොණේ ප්‍රධාන ගල වී ඇත’ යන දහම්
පාඨයේ අර්ථය කුමක් ද? 18 ඒ ගල මත වැටෙන
කවුරු නමුත් දැඩි තුවාළ ලබන්නේ ය; ඒ ගල
යමකු මත වැටෙන්නේ ද, ඔහු එයින් සුණු විසුණු
කරනු ලබන්නේ ය”යි වදාළ සේක.

## අධිරාජයාට බදු ගෙවීම

(මතෙ 22:15-22;මාක් 12:13-17)

19 නායක පූජකයෝ ද විනයධරයෝ ද උන්
වහන්සේ ඒ උපමාව ඔවුන්ට විරුද්ධ ව එල්ල කළ
බව දැන, ඒ පැයේ දී ම උන් වහන්සේ
අල්ලාගන්නට සෙවූ හ; එහෙත් සෙනඟ නිසා බිය වූ
හ. 20 ඔව්හු උන් වහන්සේගේ කටින් වචනයක්
අල්ලාගෙන උන් වහන්සේ රජයට ද
ආණ්ඩුකාරයාගේ බලයට ද බාර දීමට අවස්ථාවක්
සොයමින්, තමන් අවංකයන් සේ පෙනී සිටින
ඔත්තුකාරයන් යැවූ හ. 21 ඔව්හු කතා කොට,
“ගුරුදේවයෙනි, ඔබ යුක්ති සහගත ලෙස කතා
කරන බවත්, අනුශාසනා කරන බවත්, මිනිසුන්ගේ
තරාතිරම් නොබලා, දෙවියන් වහන්සේගේ මාර්ගය
සැබෑ ලෙස උගන්වන බවත් අපි දනිමු. 22 අප සීසර්
අධිරාජයාට අයබදු ගෙවීම යුතු ද, නැද්දැ”යි උන්
වහන්සේගෙන් ඇසූ හ. 23 එහෙත් උන් වහන්සේ
ඔවුන්ගේ කෛරාටිකකම දැන, “කාසියක් මෙහි
ගෙනෙන්න; 24 එහි තිබෙන රූපයත් සටහනත් කාගේ
දැ”යි ඔවුන්ගෙන් ඇසූ සේක. “සීසර් අධිරාජයාගේ”
යයි ඔව්හු කී හ. 25 “එසේ නම් සීසර්ගේ දේ
සීසර්ටත් දෙවියන් වහන්සේගේ දේ දෙවියන්
වහන්සේටත් දෙන්නැ”යි ඔවුන්ට වදාළ සේක.
26 මෙසේ සෙනඟ ඉදිරියෙහි දී උන් වහන්සේ කට
වචනයෙන් අල්ලාගන්නට ඔවුන්ට බැරි විය. ඔව්හු
උන් වහන්සේගේ පිළිතුරට පුදුම ව නිහඬ වූ හ.

## පුනරුප්පත්තිය ප්‍රශ්නය

(මතෙ 22:23-33;මාක් 12:18-27)

27 ක්‍රියා 23:8 පුනරුප්පත්තියක් නැතැ යි කියන
සද්දූසිවරුන්ගෙන් සමහරෙක් ජේසුස් වහන්සේ වෙත
අවුත්, 28 ද්වි.නී. 25:5“ගුරුදේවයෙනි, යම් මිනිසෙකු
භාර්යාව ජීවත් ව සිටිය දී දරුපල නොලැබ මළොත්,
ඔහුගේ සහෝදරයා ඒ භාර්යාව පාවාගෙන, තම
සහෝදරයාගේ නමට දරුවන් ඉපදවිය යුතු යයි
මෝසෙස් ලියා ඇත. 29 ඉදින්, සහෝදරයෝ සත්
දෙනෙක් සිටියහ. පළමුවැන්නා භාර්යාවක පාවාගෙන
දරුපල නොලබා මළේ ය. 30 දෙවැන්නාත්
තුන්වැන්නාත් ඇය පාවා ගත්හ. 31 සත් දෙන ම
එසේ දරුපල නොලබා මළෝ ය. 32 පසුව ඒ
ස්ත්‍රියත් මළා ය. 33 සත් දෙනොම ඇ පාවාගත්
බැවින්, පුනරුප්පත්තියේ දී ඇ ඔවුන්ගෙන් කවරකුගේ
භාර්යාව වන්නී දැ”යි ඇසූ හ. 34 ජේසුස් වහන්සේ
පිළිතුරු දෙමින්, “මේ යුගයට අයත් වූවෝ ආවාහ
විවාහ වන්නාහු ය; 35 එහෙත් එන යුගයට හා
පුනරුප්පත්තියට පැමිණීමට වරම් ලත් අය ආවාහ
වන්නේ වත් විවාහ වන්නේ වත් නැත. 36 ඉන්පසු
ඔවුන්ට මරණයක් නැත. ඔව්හු දේව දූතයන්ට සම
වෙති. පුනරුප්පත්ති වරය ලත් බැවින් ඔව්හු දෙවියන්
වහන්සේගේ පුත්‍රයෝ ය. 37 නික්ම 3:6‘සමිඳාණන්
වහන්සේ ආබ්‍රහම්ගේ දෙවියන් වහන්සේ ය,
ඊසාක්ගේ දෙවියන් වහන්සේ ය, ජාකොබ්ගේ
දෙවියන් වහන්සේ ය’යි කීමෙන් මෝසෙස් පවා,
පුනරුප්පත්තියක් ඇති බව පඳුර පිළිබඳ පාඨයෙහි
පෙන්වා දී ඇත. 38 උන් වහන්සේ මළවුන්ගේ
දෙවියන් වහන්සේ නොව, ජීවතුන්ගේ දෙවියන්
වහන්සේ ය. මන්ද, උන් වහන්සේ උදෙසා සියල්ලෝ
ම ජීවත් වෙති”යි වදාළ සේක. 39 එවිට
විනයධරයන්ගෙන් සමහරෙක් උත්තර දෙමින්,
“ගුරුදේවයෙනි, ඔබේ කතාව කදිම ය”යි කී හ.
40 උන් වහන්සේගෙන් තවත් කිසි ප්‍රශ්නයක්
ඇසීමට ඔවුන්ට ධෛර්ය නොතිබිණි.

## දාවිත්ගේ පුත්‍රයා මෙන් ම ස්වාමීන් ද වන ක්‍රිස්තුස් වහන්සේ

(මතෙ 22:41-46;මාක් 12:35-37)

41 ජේසුස් වහන්සේ ඔවුන්ට කතා කරමින්,
“ක්‍රිස්තුස් දාවිත්ගේ පුත්‍රයා යයි කියන්නේ කෙසේ
ද? 42+LUK ගීතා 110:1මන් ද?
q242+LUK ‘මා විසින් සතුරන් ඔබේ පා යට ලන
තෙක් මා දකුණු පස අසුන් ගන්න කියා සමිඳාණෝ
මා සමිඳුන්ට වදාළ සේකැ’යි
42+LUK දාවිත් ම ගීතාවලියෙහි ලියා තිබේ.
44 මෙසේ දාවිත් ම උන් වහන්සේට ‘සමිඳාණන්’ යයි
කියයි නම් උන් වහන්සේ ඔහුගේ පුත්‍රයා වන්නේ
කෙසේ දැ”යි ඇසූ සේක.

### විනයධරයන්ට චෝදනා
(මතෙ 23:1-36;මාක් 12:38-40;ලූක් 11:37-54)

45 මුළු සනෙඟ සවන් දී සිටිය දී උන් වහන්සේ සිය
ශ්‍රාවකයන්ට කතා කොට, 46 “දිග උතුරු සළු හැඳ
සක්මන් කිරීමට කැමැති, වෙළෙඳ පොළේ දී
ගෞරවාචාරවලට ද ධර්මශාලාවල දී ප්‍රධාන
ආසනවලට ද මංගල භෝජනවල දී ප්‍රධාන
ස්ථානවලට ද ඇලුම් කරන, 47 වැන්දඹුවන්ගේ
ගේදොර කාදමමින්, පෙනුමට දිගින් දිගට යාච්ඤා
පුද කරන, විනයධරයන්ගෙන් පරෙස්සම්වන්න. ඔව්හු
වඩාත් බරපතල දඬුවමකට පත් කරනු ලබන්නෝ
ය”යි වදාළ සේක.

### වැන්දඹුවගේ පඬුර
(මාක් 12:41-44)

21 උන් වහන්සේ අවට බැලූ විට ධනවතුන් සිය
පුදපඬුරු දේව මාලිගා ගබඩාවෙහි දමනු දුටු
සේක. 2 එක් දිළිඳු වැන්දඹු ස්ත්‍රියක් තඹ සල්ලි
දෙකක් දමනු උන් වහන්සේ දැක, 3 “ඇත්තෙන් ම
මම ඔබට කියමි, මේ දිළිඳු වැන්දඹුව අනෙක් හැමට
ම වඩා පඬුරු දැම්මා ය. 4 මන්ද, ඔවුන් සියල්ලෝ ම
තමන්ට තිබුණු වැඩිපුර දයෙින් ගබඩාවට පඬුරු දැමූ
හ. එහෙත් මෑ, දුප්පත් ව සිටියදීත් තම දිවි පැවැත්ම
සඳහා වූ මුළු වත්කම ම පිදුවා ය”යි වදාළ සේක.

### දේව මාලිගාවේ විනාශය ගැන කලින් කීම
(මතෙ 24:1-2;මාක් 13:1-2)

5 සමහරුන් දේව මාලිගාව ගැන කතා කරමින්, එය
මනහර ගලින් හා පූජා වස්තුවලින් ද සරසා තිබෙන
නියාව පැවසූ විට උන් වහන්සේ කතා කොට,
6 “ඔබට පෙනෙන මේ දයෙ, ගලක් පිට ගලක් ඉතිරි
නොවන සේ බිඳ දමනු ලබන කාලයක්
පැමිණෙන්නේ ය”යි වදාළ සේක.

### පීඩාවල පෙර නිමිති
(මතෙ 24:3-14;මාක් 13:3-13)

7 “ගුරුදේවයෙනි, ඒ දයෙ කවර කලෙක වන්නේ ද?
ඒ පිළිබඳ පෙර ලකුණු කවරේ දැ”යි ඔව්හු උන්
වහන්සේගෙන් ඇසූ හ. 8 උන් වහන්සේ කතා
කොට, “මුළා නොවෙන්ට බලාගන්න; කුමක් නිසා ද
මාගේ නාමයෙන් බොහෝ දෙනෙක් ඉදිරිපත් වී ‘ඒ
මම ය, නියමිත මොහොත පැමිණ ඇතැ’යි
කියන්නෝ ය; ඔවුන් අනුව නොයන්න. 9 යුද්ධ සහ
විප්ලව ගැන ආරංචි වන විට, භයින් ත්‍රස්ත
නොවන්න; මන්ද, මේ දේවල් පළමුකොට සිදුවිය
යුතු ය; එහෙත් අවසානය එකෙණෙහි ම
නොපැමිණෙන්නේ ය”යි වදාළ සේක.
10 එවිට උන් වහන්සේ ඔවුන්ට කතා කොට,
“ජාතියක් ජාතියකට විරුද්ධ ව ද රාජ්‍යයක්
රාජ්‍යයකට විරුද්ධ ව ද නැඟිටිනු ඇත. 11 මහා
භූමිකම්පා ද නොයෙක් තැන්වල සාගත හා වසංගත
ද වන්නේ ය; ත්‍රාසජනක දර්ශන ද පුදුම ලකුණු ද
අහසෙහි වන්නේ ය. 12 එහෙත් ඒ සියල්ලට පෙර,
මාගේ නාමය නිසා ඔව්හු ඔබ අල්ලාගෙන,
ධර්මශාලාවටත්, හිර ගෙවලටත් ඔබ පාවාදෙමින්,
ඔබට පීඩා කරන්නෝ ය; ඔබ රජුන් හා
ආණ්ඩුකාරයන් ඉදිරියට ගෙන යන්නෝ ය. 13 ඔබට
එය සාක්ෂි දැරීමේ අවස්ථාවක් වන්නේ ය. 14 ලූක්
12:11-12ඔබ වගඋත්තර දිය යුත්තේ කෙසේ දැ යි
කල් තියා සූදානම් නොවන්නට සිතට ගන්න.
15 මන්ද, ඔබගේ විරුද්ධවාදීන් කිසිවකුට නොබිඳිය
හැකි වූ ද නිෂ්ප්‍රභා කළ නොහැකි වූ ද වාග්
චතුරතාවක් හා ප්‍රඥාවක් මම ඔබට දෙන්නෙමි.
16 දෙමව්පියන්, සහෝදරයන් හා නෑ මිතුරන් විසින්
ම ඔබ පාවා දෙනු ලබන්නහු ය; ඔව්හු ඔබගෙන්
සමහරකු මරණයට පත් කරන්නෝ ය. 17 මාගේ
නාමය නිසා සියල්ලෝ ම ඔබට වෛර කරන්නෝ ය.
18 එහෙත් ඔබගේ කෙස් ගසක් පමණ වත් නාස්ති
නොවන්නේ ය. 19 ස්ථිර ව සිටීමෙන් ඔබ ජීවනය
දිනා ගන්නහු ය.”

### ජෙරුසලමේ විනාශය කලින් කීම
(මතෙ 24:15-21;මාක් 13:14-19)

20 “යම් කලෙක යුද හමුදා ජෙරුසලම වටලනු ඔබ
දකින්නාහු ද, එකල එහි විනාශය ආසන්න බව
දැනගන්න. 21 එකල ජුදයෙහි වසන්නෝ කඳුකරයට
පලා යත්වා; නගරය තුළ සිටින්නෝ පිටතට යත්වා;
ගම්බද ව සිටින්නෝ නුවරට, ඇතුළු නොවෙත්වා.
22 හොසි 9:7මන්ද, ලියා ඇති සියල්ල සම්පූර්ණ වන
පිණිස එය විනිශ්චය දවස වන්නේ ය. 23 ඒ දවස්වල
දී ගර්භණීන්ට ද කිරි දෙන මව්වරුන්ට ද වන විපතක
මහත! මන්ද, දේශය පිට දැඩි ආපදා හා වේදනා ද
මේ සෙනඟ කෙරෙහි දේව සාපය ද වන්නේ ය.
24 ඔව්හු කඩු මුවහතින් වැටෙන්නෝ ය; සියලු
විජාතීන්ගේ රටවලට වහලුන් මෙන් ගෙනෙයනු
ලබන්නෝ ය; විදේශීන්ගේ පාලන අවදිය නිම
වනතෙක් ජෙරුසලම විජාතීන් විසින් මඩිනු ලබන්නී
ය.”

### මනුෂ්‍ය-පුත්‍රයාණන්ගේ පුනරාගමනය
(මතෙ 24:29-31;මාක් 13:24-27)

25 යෙසා 13:10; එසකි 32:7; ජෝවෙ 2:31; එළිද
6:12-13 “හිරු, සඳ හා තාරකාවල ලකුණු පහළ
වන්නේ ය. මුහුදේ හා රළ පතරෙහි ඝෝෂාවෙන්
වන වියවුලින් ජාතීන් හට සිත් වේදනා වන්නේ ය.
26 අහසේ බලවේගයන් සොලවනු ලබන බැවින්,
ලෝකයට සිදුවන්න යන ආපදා ගැන බලා සිටීමෙන්
මිනිසුන්ගේ සිත් බියෙන් ක්ලාන්ත වන්නේ ය.
27 දානි 7:13; එළිද 1:7එකල මනුෂ්‍ය-පුත්‍රයාණන්
බලපරාක්‍රමයෙන් ද මහා තේජශ්‍රීයෙන් ද
වලාකුළක් මත වඩිනු ඔව්හු දකින්නෝ ය. 28 මේ
දේ සිදුවන්න පටන්ගන්නා කල ඔබේ විමුක්තිය ළං
වෙමින් එන බැවින් නැඟී සිට හිස් ඔසවන්නැ”යි
වදාළ සේක.

### අත්තික්කා ගසනේ පාඩමක්
(මතෙ 24:32-35;මාක් 13:28-31)

29 තවද ජ්ේසුස් වහන්සේ ඔවුන්ට උපමාවක් වදාළ
සේක. "අත්තික්කා ගස හෝ අන් කිසි ගසක් හෝ
ගැන සිතන්න. 30 ඒවා දලු ලන විට, එය දුටු
හැටියේ ම ගිම්හානය දැන් ළං වී ඇතැ යි ඔබ
දන්නහු ය. 31 එලසෙ ම, මේ දේ සිදුවනු දක්නා
කල, දවේයන් වහන්සේගේ රාජ්යය ළං වී ඇතැ යි
දැනගන්න. 32 ඇත්තනේ ම මම ඔබට කියමි, මේ
සියල්ල සිදුවන තුරු මේ පරම්පරාව පහ ව
නායෙන්නේ ය. 33 අහසත්, පාෙළාෙවත් පහ ව
යන්නේ ය. එහතේ මාගේ කිසිදු වචනයක් පහ ව
නායෙන්නේ ම ය."

### අවදි ව සිටීමට අවවාද

34 "ඒ දවස මලපතක් මනේ හදිසියනේ ඔබ අසුකර
නාෙගන්නා පිණිස කම්සැපනේ ද බීමත්කමනේ ද
මේ ජීවිතයේ කරදරවලින් ද ඔබේ සිත්
නාෙවහෙසෙනෙ හැටියට බලාගන්න. 35 මන්ද, එය
මුළු පාෙළාෙවහෙි සකල ලෝක වාසීන් පිට
පැමිණනේනේ ය. 36 එබැවින් ඒ සිදුවන ආපදා
සියල්ලනේ ජයාන්විත ව ගැළවනෙ පිණිස ද මනුෂ්ය-
පුත්රයාණන් ඉදිරියහෙි පනේී සිටින පිණිස ද
අයැදිමින්, හැම වලේාවේ ම අවදි ව සිටින්න."
37 ලූක් 19:47 දිවා භාගයහෙි උන් වහන්සේ දේව
මාලිගාවහෙි අනුශාසනය කළ සේක. රාත්රියහෙි
නුවරින් නික්ම ගාෙස්, ඔලීව නම් කන්දහෙි නැවතුණ
සේක. 38 මුළු ජනතාව දේව මාලිගාවහෙි දී උන්
වහන්සේට සවන් දනෙු පිණිස අලුයම් වලේහෙි උන්
වහන්සේ වතෙ රුස්වූ හ.

### ජ්ේසුස් වහන්සේ නැසීමට කුමන්ත්රණය
(මතෙ 26:1-5-14-16;මාක් 14:1-2-10-11;ජ්ාෙහ 11:45-53)

22 නික්ම 12:1-27 පාස්කුව නම් වූ නුමුහුන්
රාෙටි මංගල්යය ළං විය. 2 නායක පූජකයෝ
ද විනයධරයෝ ද උන් වහන්සේ නැසීමට උපා සවෙූ
හ; එසේ කළෙේ ඔවුන් ජනතාවට භයින් සිටි
බැවිනි.
3 ඒ අතර දාෙළාෙස් දනොෙගනේ කනෙකේ වූ
ඉස්කාරියාෙත් නම් ජූදස්ගේ සිතට සාතන් ඇතුළු
විය. 4 ඔහු ගාෙස් උන් වහන්සේ පාවා දනේනේ
කසෙේ ද කියා නායක පූජකයන් හා දේව
මාලිගාවේ මුර සබෙළුන් සමඟ කතා කර ගත්තේ
ය. 5 ඔව්හු ඉතා සතුටු ව ඔහුට මුදල් දීමට
පාෙරාෙන්දු වූ හ. 6 ඔහු ඊට එකඟ වී, සනෙඟ නැති
වලේාවක උන් වහන්සේ ඔවුන් අතට පාවා දනෙු
පිණිස සුදුසු අවස්ථාවක් සවේී ය.

### පාස්කු මංගල්යය සඳහා සූදානම
(මතෙ 26:17-25;මාක් 14:12-21;ජ්ාෙහ 13:21-30)

7 පාස්කු බැටළුවා පූජා කළ යුතු නුමුහුන් රාෙටි
මංගල්යය පවත්වන දවස පැමිණියේ ය. 8 එවිට උන්
වහන්සේ පදේුරු ද ජ්ාෙහන් ද යවමින්, "ඔබ ගාෙස්
අප විසින් පාස්කු භෝජනය වළඳන පිණිස පිළියළෙ
කරන්නැ"යි වදාළ සේක. 9 "කාෙතැන පිළියළෙ
කරනවාට ඔබ වහන්සේ කැමැති සේක් දැ"යි ඔව්හු
ඇසූ හ. 10 උන් වහන්සේ, "ඔබ නුවරට ඇතුළු වූ
විට, වතුර කළයක් ගනෙ යන මිනිසකේ ඔබට හමු
වන්නේ ය; ඔහු පස්සේ ගාෙස් ඔහු යන ගදෙරට
ඇතුළු වී, 11 ගෘහ මූලිකයාට කතා කාෙට, 'මා විසින්
මාගේ ශ්රාවකයන් සමඟ පාස්කු භෝජනය වැළඳීම
සඳහා වනේ කර ඇති කාමරය කාෙයි ද කියා
ගුරුදේවයාණෝ අසන සේකැ'යි කියන්න. 12 සූදානම්
ව ඇති ලාෙකු උඩුමහල් කාමරයක් ඔහු ඔබට
පනේවනු ඇත. එහි පිළියළෙ කරන්නැ"යි වදාළ
සේක. 13 ඔව්හු ගාෙස්, උන් වහන්සේ වදාළ ලසෙ
ම සියල්ල සම්බවූයනේ, පාස්කු භෝජනය පිළියළෙ
කළහ.

### අන්තිම රාත්රි භෝජනය
(මතෙ 26:26-30;මාක් 14:22-26;1 කාෙරි 11:23-25)

14 නියම වලේාව පැමිණි කල, උන් වහන්සේ
කෑමට හිඳගත් සේක. ප්රේරිතයෝ ද උන් වහන්සේ
සමඟ හිඳගත්හ. 15 උන් වහන්සේ ඔවුන්ට කතා
කාෙට, "මා වද විඳීමට පළමුවනේ, මේ පාස්කු
භෝජනය ඔබ සමඟ වළඳන්නට අතිශයින් ආශා
වීමි. 16 ඒ මන්දැ යි මම ඔබට කියමි, දවේයන්
වහන්සේගේ රාජ්යයේ දී එය මුදුන්පත් වනතුරු මම
එය තවත් නාෙවළඳමි"යි වදාළ සේක. 17 උන්
වහන්සේ කුසලානක් ගනිමින්, තුති පුදා, "මයෙ
ගනෙ ඔබ අතරහෙි බදොෙගන්න. 18 මන්ද, මම ඔබට
කියමි, මතෙැන් පටන්, දවේයන් වහන්සේගේ
රාජ්යය පැමිණනෙ තුරු, මම මිදියුස පානය නාෙ
කරන්නමේ"යි වදාළ සේක. 19 උන් වහන්සේ රාෙටි
ගනෙ තුති පුදා, ඒවා කඩා, ඔවුන්ට දී, "ඔබ උදසාෙ
දනෙු ලබන මාගේ ශරීරය මේ ය; මා සිහි කිරීම
පිණිස මයෙ කරන්නැ"යි වදාළ සේක. 20 ජරෙ
31:31-34එලසෙ ම භෝජනයනේ පසු කුසලාන දී,
"මේ කුසලාන ඔබ උදසාෙ වගුරුවනු ලබන මාගේ
රුධිරයනේ කළ නව ගිවිසුම ය. 21 ගීතා 41:9එහතේ,
දැන් මා පාවා දනේනාගේ අත මා ළඟින් ම මේසය
මත තිබේ. 22 මන්ද, මනුෂ්ය-පුත්රයාණෝ නියමිත
ගමන යන සේක් ම ය. එහතේ, ඔහු පාවා දනෙ ඒ
මනුෂ්යයාට වන විපතක මහතැ"යි උන් වහන්සේ
වදාළ සේක. 23 එවිට එය කරන්නට යන්නේ
ඔවුන්ගනේ කවරකේ දැ යි ඔව්හු තම තමන් අතර
විමසන්නට පටන්ගත්හ.

### ශ්‍රේෂ්ඨතම තැනැත්තා පිළිබඳ ප්‍රශ්නය

24 මතෙ 18:1; මාක් 9:34; ලූක් 9:46 තමන්
අතරෙන් ශ්‍රේෂ්ඨතම ලෙස සැලකිය යුත්තේ
කවරෙක් දැ යි ශ්‍රාවකයන් අතර විවාදයක් ඇති
විය. 25 මතෙ 20:25-27; 10:40-42උන් වහන්සේ
ඔවුන්ට මෙසේ වදාළ සේක: “විජාතීන්ගේ රජවරු
වැසියන් කෙරෙහි අධිපති බලය පාන්නාහ; ඔවුන්
කෙරෙහි බලය පවත්වන්නෝ ජාති හිතෛෂීහු යයි
කියනු ලබති. 26 මතෙ 23:11; මාක් 9:35එහෙත් ඔබ
අතර එය එසේ නොවේ. ඔබ අතර ශ්‍රේෂ්ඨ
තැනැත්තා ඉතා සුළු තැනැත්තා මෙන් ද නායකයා
සේවකයා මෙන් ද වේ වා; 27 ජොහ 13:12-15වඩා
උතුම් කවරේ ද, කෑමට හිඳින තැනැත්තා ද,
නැතහොත් සේවකයා ද? කෑමට හිඳින තැනැත්තේ
නොවේ ද? එහෙත්, මම නම්, ඔබ මැද සේවකයා
මෙන් වෙමි. 28 මාගේ පරීක්ෂාවල දී මා සමඟ සිටි
අය ඔබ ම ය. 29 එබැවින් මාගේ පියාණන්
වහන්සේ මට රාජ්‍යය පවරා දුන් සේ ම, 30 මතෙ
19:28මාගේ රාජ්‍යයෙහි මාගේ මේසයේ දී කන
බොන පිණිස ද සිහසුන් අරා ඉශ්‍රායෙලේ ගෝත්‍ර
දොළොස කෙරෙහි විනිශ්චය කරන පිණිස ද වරය
මමත් ඔබට පවරා දෙමි.”

### පේදුරුගේ අපලාපය ගැන කලින් කීම
(මතෙ 26:31-35;මාක් 14:27-31;ජොහ 13:36-38)

31 “සීමොන්, සීමොන්, මෙය අසන්න. තිරිඟු
පොළන්නාක් මෙන් ඔබ සියලු දෙනා පොළොලන්නට
සාතන් අවසර ලබා ඇත. 32 එහෙත්, ඔබේ
ඇදහිල්ල නොබිඳෙන පිණිස ඔබ උදෙසා මම
යාච්ඤා කළෙමි. ඔබ යළිත් හැරුණු පසු, ඔබේ
සහෝදරයන් ධෛර්යවත් කරන්නැ”යි වදාළ සේක.
33 ඔහු උත්තර දෙමින්, “ස්වාමීනි, ඔබ හා සමඟ
හිරේ යාමට හා මරණයට වුව ද මම සූදානම් ව
සිටිමි”යි උන් වහන්සේට කී ය. 34 ජේසුස් වහන්සේ
කතා කරමින්, “පේදුරු, මම මෙය ඔබට කියමි, ඔබ
මා නොදන්නා බව තුන් වරක් කියන තුරු, අද රෑ
කුකුළා නොහඬලන්නේ ය”යි වදාළ සේක.

### පසුම්බිය, මල්ල සහ කඩුව

35 මතෙ 10:9-10; මාක් 6:8-9; ලූක් 9:3; 10:4 උන්
වහන්සේ ඔවුන්ට වදාරමින්, “පසුම්බියක් වත්,
මල්ලක් වත්, පා වහන් වත් නැති ව මා ඔබ යැවූ
කල කිසිවක් හිඟ වී දැ”යි ඇසූ සේක. ඔව්හු උත්තර
දෙමින්, “නැතැ”යි කී හ. 36 උන් වහන්සේ ඔවුන්ට
කතා කොට, “එහෙත් දැන් පසුම්බියක් ඇති
තැනැත්තා එය ගනී වා, එසේ ම මල්ලක් ද ගනී වා,
කඩුවක් නැති තැනැත්තා තම සළුව විකුණා, කඩුවක්
මිළ දී ගනී වා. 37 යෙසා 53:12මම මෙය ඔබට
කියමි, ‘උන් වහන්සේ අපරාධකරුවන් සමඟ ගණන්
ගනු ලැබී ය’යි ලියා තිබෙන ඒ කීම මා තුළින් මුදුන්
පත් විය යුතු ය; මා ගැන ලියා ඇති දෙය සම්පූර්ණ
වන්නේ ම ය”යි වදාළ සේක. 38 ඔව්හු කතා
කරමින්, “ස්වාමීනි, බැලුව මැනව, කඩු දෙකෙක් මෙහි
ඇතැ”යි කී හ. උන් වහන්සේ ද: “ඔය ඇති”යි වදාළ
සේක.

### ඔලීව කන්දෙහි යාච්ඤාව
(මතෙ 26:36-46;මාක් 14:32-42)

39 එවිට ජේසුස් වහන්සේ පිටත් ව සිරිත් පරිදි
ඔලීව කන්දට වැඩිය සේක; ශ්‍රාවකයෝ ද උන්
වහන්සේ පසුපස්සේ ගියහ. 40 උන් වහන්සේ එහි
පැමිණි පසු කතා කොට, “ඔබ පරීක්ෂාවට
නොවැටෙන ලෙස යාච්ඤා කරන්නැ”යි වදාළ සේක.
41 ගලක් ගසන තරම් දුරක් උන් වහන්සේ
ඔවුන්ගෙන් ඈත් වී, දණින් හිඳ යාච්ඤා කරමින්,
42 “පියාණෙනි, ඔබ කැමැති සේක් නම්, මේ
කුසලාන මාගෙන් පහ කළ මැනව. එහෙත්, මාගේ
කැමැත්ත නොව ඔබේ කැමැත්ත වේ වා”යි වදාළ
සේක. 43 එකල දේව දූතයෙක් ස්වර්ගයෙන් පහළ
වී, උන් වහන්සේ ශක්තිමත් කළේ ය. 44 උන්
වහන්සේ දැඩි සිත් වේදනාවෙන් පෙළුණු සේක්,
වඩාත් ඕනෑකමින් යාච්ඤා කළ සේක. උන්
වහන්සේගේ ඩාදිය ලේ බින්දු මෙන් බිම වැටිණි.
45 උන් වහන්සේ යාච්ඤා කරමින් සිට නැඟිට,
ශ්‍රාවකයන් වෙත අවුත්, ඔවුන් ශෝකය නිසා නිදා
හිඳිනු දැක, 46 “ඔබ නිදා ඉන්නේ මන් ද?
පරීක්ෂාවට නොවැටෙන පිණිස නැඟිට යාච්ඤා
කරන්නැ”යි ඔවුන්ට වදාළ සේක.

### ජේසුස් වහන්සේ පාවා දීම
(මතෙ 26:47-56;මාක් 14:43-50;ජොහ 18:3-11)

47 උන් වහන්සේ මෙවදන් පවසත් ම සමූහයක්
පැමිණියහ. දොළොස් දෙනාගෙන් එක් කෙනෙක් වූ
ජූදස් නමැත්තා ඔවුන්ට පෙරටුව අවුත්, ජේසුස්
වහන්සේ සිඹින පිණිස උන් වහන්සේ වෙතට ළං
විය. 48 ජේසුස් වහන්සේ ද “ජූදස්, ඔබ සිඹීමකින්
මනුෂ්‍ය-පුත්‍රයාණන් පාවා දෙන්නෙහි දැ”යි ඇසූ
සේක. 49 උන් වහන්සේ සමඟ සිටි අය සිදු වන්න
යන දෙය දැක, “ස්වාමීනි, කඩු පහරක් දෙමු දැ”යි
උන් වහන්සේගෙන් ඇසූ හ. 50 ඔවුන්ගෙන් එක්
කෙනෙක් උත්තම පූජකයාගේ දාසයාට ගසා,
ඔහුගේ දකුණු කන කපා දැමී ය. 51 එහෙත් ජේසුස්
වහන්සේ, “ඔය ඇති, නවතින්න,” කියා ඔහුගේ කන
අතගා සුව කළ සේක. 52 ජේසුස් වහන්සේ තමන්ට
විරුද්ධ ව ආ නායක පූජකයන්ට ද දේව මාලිගාවේ
මුර සෙබළුන්ට ද ප්‍රජා මූලිකයන්ට ද කතා කොට,
“ඔබ සොරෙකු හා සටනට මෙන් කඩු මුගුරු රැගෙන
ආවාහු ද? 53 ලූක් 19:47; 21:37දිනපතා මා දේව
මාලිගාවෙහි ඔබ හා සමඟ සිටිය දී ඔබ මට විරුද්ධ
ව අත් එසවේවේ නැත. එහෙත් මෙය ඔබගේ
අවස්ථාව ය. අන්ධකාරය රජ කරන මොහොත ය”යි
වදාළ සේක.

### පේදුරුගේ අපලාපය
(මතෙ 26:57-58-69-75;මාක් 14:53-54-66-72;ජොහ 18:12-18-25-27)

54 ඔව්හු ජේසුස් වහන්සේ අල්ලාගනෙ උත්තම
පූජකයාගේ මැදුරට ගනෙ ගියහ. පේදුරු ද ඈතින්
පසුපස්සේ ගියේ ය. 55 ඔවුන් මළුව මැද ගිනි
මැලයක් ගසා එක් ව හිඳගනෙ සිටිය දී, පේදුරු
ඔවුන් මැද හිඳගත්තේ ය. 56 එවිට එක් සේවිකාවක්
ඔහු ගිනි මැලය ළඟ සිටිනු දැක, ඔහු දසෙ හොඳට
බලා, "මේ මිනිසාත් ඔහු සමඟ සිටියේ ය"යි කීවා
ය. 57 "ස්ත්‍රිය, නැත. මම ඔහු නාඳුනමි"යි පේදුරු කී
ය. 58 මඳ වේලාවකට පසු තවත් කනෙකේ ඔහු
දැක, "ඔබත් ඔවුන්ගනේ එක් කනෙකේ ය"යි කී ය.
පේදුරු පිළිතුරු දමේින්, "නැත, නැත, එසේ නොවේ
ය"යි කී ය. 59 පැයකට පමණ පසු තවත් කනෙකේ
කතා කොට, "ඇත්තනේ ම මොහුත් ඔහු සමඟ
සිටියේ ය. මන්ද, මොහු ගලීලයකෙු"යි තරයේ ම
කියා සිටියේ ය. 60 පේදුරු ද, "ඔබ කියන දේ මට
නොතේරේ" යයි කී ය. එකණෙහෙි ම, ඔහු කතා
කරද්දී ම, කුකුළකේ හැඬලී ය. 61 සමිඳාණන්
වහන්සේ හැරී පේදුරු දසෙ බැලූ සේක. පේදුරු ද,
"අද කුකුළා හඬලන්නට පළමුවනේ 'ඔහු නාඳුනමි'යි
තුන් වරක් ඔබ මා ගැන කියන්නහෙි ය"යි සමිඳාණන්
වහන්සේ ඔහුට පැවසූ කීම සිහි කොට, 62 පිටතට
ගොස්, දැඩි දුකින් හැඬී ය.

### නිගා කිරීම හා පහර දීම
(මතෙ 26:67-68;මාක් 14:65)

63 එකල ජේසුස් වහන්සේ අල්ලාගනෙ සිටි
මනුෂ්‍යයෝ උන් වහන්සේට කවට කම් කරමින්
පහර දුන්හ. 64 ඔව්හු ජේසුස් වහන්සේගේ ඇස්
වසා බැඳ, "ඔබට ගැසුවේ කවරකේ ද කියා දිවැසින්
කියන්නැ"යි උන් වහන්සේට කී හ. 65 ඔව්හු තවත්
බොහෝ දේ උන් වහන්සේට විරුද්ධ ව කියමින්,
අපහාස කළහ.

### ජේසුස් වහන්සේ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියහෙි
(මතෙ 26:59-66;මාක් 14:55-64;ජොහ 18:19-24)

66 පහන් වූ කණෙහෙි ම, නායක පූජකයන් ද
විනයධරයන් ද ඇතුළු ප්‍රජා මූලිකයන්ගේ සංගමය
රැස් ව, සිය ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට උන්
වහන්සේ ගනෙ ගොස්, 67 "ඔබ ක්‍රිස්තුස් ද? අපට
කියන්නැ"යි කී හ. උන් වහන්සේ පිළිතුරු දමේින්, "මා
ඔබට කීවත් ඔබ විශ්වාස කරන්නේ නැත; 68 මා
ඔබගනේ ඇසුවත් ඔබ පිළිතුරු දනේනේ නැත.
69 එහතේ මතෙන් පටන් මනුෂ්‍ය-පුත්‍රයාණන්
දවේයන් වහන්සේගේ බලපරාක්‍රමයේ දකුණු පස
වැඩහිඳිනු ඇතැ"යි ඔවුන්ට වදාළ සේක. 70 ඔව්හු
සියල්ලෝ, "එසේ නම් ඔබ දවේයන් වහන්සේගේ
පුත්‍රයාණෝ දැ"යි ඇසූ හ. උන් වහන්සේ ද, "මා
එසේ බැව් පවසන්නේ ඔබ ම ය"යි වදාළ සේක.
71 ඔව්හු ද, "වනෙ සාක්කියක් අපට කුමට ද? මයෙ
ඔහුගේ ම කටින් කියනවා අපගේ ම කණින්
ඇසීමු"යි කී හ.

### ජේසුස් වහන්සේ පිලාත් ඉදිරියහෙි සිටීම
(මතෙ 27:1-2-11-14;මාක් 15:1-5;ජොහ 18:28-38)

23 එවිට ඒ මුළු සමූහයා නැඟිට, උන් වහන්සේ
පිලාත් ඉදිරියට ගනෙ ගියහ. 2 ඔව්හු උන්
වහන්සේ ගැන චෝදනා කරන්නට පටන්ගනෙ,
"මොහු අපේ ජාතිය කැරලිගැසීමට පොළඹවන
බවත්, අධිරාජයාට අයබදු දීම තහනම් කරන බවත්,
තමා ක්‍රිස්තුස් නම් රජකේ යයි කියාගන්න බවත්
අපි දැනගතිමු"යි කී හ. 3 පිලාත් කතා කරමින්, "ඔබ
ජුදෙව්වරුන්ගේ රජු දැ"යි උන් වහන්සේගනේ ඇසී ය.
"එසේ කියන්නේ ඔබ ය"යි උන් වහන්සේ වදාළ
සේක. 4 එවිට පිලාත් නායක පූජකයන්ට ද
සමූහයන්ට ද කතා කොට, "මේ මනුෂ්‍යයා අත කිසි
වරදක් මට නොපනෙේ ය"යි කී ය. 5 එහතේ ඔව්හු
පිළිතුරු දමේින්, "මොහු ගලීලයේ සිට මතෙන දක්වා
ජුදය මුළුල්ලහෙි උගන්වමින් සනෙඟ කළඹන්නේ
ය"යි තරයේ ම කියා සිටියහ.

### ජේසුස් වහන්සේ උප රජ හරෙෝද් ඉදිරියහෙි

6 පිලාත් ඒ අසා, "මේ මනුෂ්‍යයා ගලීලයකේ දැ"යි
විචාළේ ය. 7 එවිට පිලාත් උන් වහන්සේ
හරෙෝද්ගේ ප්‍රදේශයට අයිති බව දැන, හරෙෝද්
ඒ දවස්වල ජරෙුසලමහෙි සිටි බැවින්, උන් වහන්සේ
ඔහු වතෙ යැවී ය. 8 හරෙෝද් ජේසුස් වහන්සේ
දැක, ඉතා සන්තෝෂ විය. මන්ද, ඔහු උන් වහන්සේ
ගැන අසා සිටි බැවින් බොහෝ කලකෙ පටන් උන්
වහන්සේ දකින්න ආශාවනේ සිටියේ ය. උන්
වහන්සේ යම් ආශ්චර්යයක් කරනු දැකීමට ද ඔහු
බලාපොරොත්තු විය. 9 ඔහු උන් වහන්සේගනේ
බොහෝ ප්‍රශ්න ඇසූ නමුත් උන් වහන්සේ කිසි
පිළිතුරක් නුදුන් සේක. 10 නායක පූජකයෝ ද
විනයධරයෝ ද නැඟිට, උන් වහන්සේට තදින් වරද
තැබූ හ. 11 හරෙෝද් තමාගේ සබෙළුන් සමඟ උන්
වහන්සේ හළො දකිමින් සරදම් කොට, විචිත්‍ර
වස්ත්‍රයක් හඳවා, උන් වහන්සේ පිලාත් වතෙ
පරෙළා යැවී ය. 12 ඊට පරෙ, කාලයක් ම මේ
දදෙනො විරුද්ධවාදී ව සිටියත් ඒ දවසේ ම මිත්‍ර
වූහ.

### ජේසුස් වහන්සේට මරණීය දණ්ඩනය
(මතෙ 27:15-26;මාක් 15:6-15;ජොහ 18:39;19:16)

13 පිලාත් නායක පූජකයන් ද ප්‍රධානීන් ද සනෙඟ
ද රැස් කරවා, 14 ඔවුන්ට කියනුයේ, "ඔබ මේ
මනුෂ්‍යයා සනෙඟ කැරලිගැසීමට පොළඹවන්නකෙු
යි කියා මා වතෙ ගනොවහු ය. බලන්න, ඔබ
ඉදිරියහෙි මා ඔහු විභාග කළ විට, ඔබ විසින්
මොහුට විරුද්ධ ව කළ චෝදනාවලින් කිසිවක් ගැන
ඔහු වරදකාරයකෙු යි මට පනෙුණේ නැත;
15 හරෙෝද්ට ද පනෙුණේ නැත. හරෙෝද් මොහු
නැවත අප වතෙ එවුයේ ඒ නිසා ය; බලන්න,

මරණීය දණ්ඩනයට සුදුසු කිසිවක් ඔහු කර නැත.
16 එබැවින් මම ඔහුට තළා නිදහස් කොට හරිමි"යි
කී ය. 17 එසේකීවේ පාස්කු මංගල්‍යයක දී එක
මිනිසකු නිදහස් කර දීමට ඔහු බැඳී සිටි බැවිනි.
18 එහෙත් සියල්ලෝ ම, "මොහු මරාදමන්න,
බරබ්බස් අපට නිදහස් කර දෙන්නැ"යි එක හඬින්
මොරගැසූ හ. 19 බරබ්බස් වනාහි නගරයේ සිදුවූ
කැරලිගැසීමක් ද මිනී මැරීමක් ද නිසා හිරගෙට
යවනු ලැබූවෙකි. 20 පිලාත් ජේසුස් වහන්සේ මුදා
හැරීමට කැමැති ව නැවතත් ඔවුන්ට කතා කළේ
ය. 21 එහෙත් ඔව්හු, "මොහු කුරුසියෙහි ඇණ
ගසන්න! කුරුසියෙහි ඇණ ගසන්න!" කියා මොරගැසූ
හ. 22 ඔහු තෙ වන වරටත් කතා කොට, "කිමෙක්
ද? මොහු කවර අපරාධයක් කළේ ද? මොහු අත
මරණීය දණ්ඩනයට සුදුසු කිසිවක් නැත. එබැවින්
මොහුට තළා මුදා හරිමි"යි කී ය. 23 එහෙත්, උන්
වහන්සේ කුරුසියෙහි ඇණ ගසන ලෙස ම ඉල්ලා
ඔව්හු වැඩි වැඩියෙන් මොරගැසූ හ. ඔවුන්ගේ
උද්ඝෝෂණය සාර්ථක විය. 24 පිලාත් ඔවුන්ගේ
ඉල්ලීම පරිදි තීන්දුව දුන්නේ ය. 25 තවද, ඔහු
කැරලිගැසීම හා මිනී මැරීම නිසා හිර ගෙයි දමා සිටි,
සෙනඟ ඉල්ලූ තැනැත්තා මුදා හැරියේ ය. එහෙත්
ඔහු ජේසුස් වහන්සේ ඔවුන්ගේ හිතුමනාපයට පාවා
දුන්නේ ය.

## කුරුසියෙහි ඇණ ගැසීම
(මතෙ 27:32-44;මාක් 15:21-32;ජොහ 19:17-27)

26 ඔව්හු උන් වහන්සේ ගෙන යන කල, පිටිසරින්
පැමිණි සිරේනියේ සීමොන් නම් මනුෂ්‍යයකු
අල්ලාගෙන, ජේසුස් වහන්සේ පසුපස්සෙන් කුරුසිය
දරාගෙන යන පිණිස එය ඔහු පිට තැබූ හ. 27 පොදු
ජනයාගෙන් ද උන් වහන්සේ නිසා හඬා වැලපෙන
ස්ත්‍රීන්ගෙන් ද යුක්ත වූ විශාල පිරිසක් උන්
වහන්සේ පසුපස්සේ, ගමන් ගත්හ. 28 ජේසුස්
වහන්සේ ඔවුන් දෙසට හැරී, "ජෙරුසලමේ දූවරුනි,
මා නිසා නොහඬන්න, ඔබ සහ ඔබේ දරුවන් නිසා
ම හඬන්න. 29 වඳ ස්ත්‍රීහු ද කිසි කලෙක දරුවන්
නොදැරූ කුස ද කිරි නුදුන් පියයුරු ද භාග්‍යවන්ත යයි
පවසන දවස් පැමිණෙන්නේ ය. 30 හොසි 10:8; එළිද
6:16ඒ දවස්වල දී ඔව්හු කඳු අමතා, 'අප පිට
වැටෙන්න' හලේ අමතා, 'අප වසාගන්නැ'යි කියන්න
පටන්ගන්නෝ ය. 31 මන්ද, ඔව්හු අමු ගසට මේ දේ
කරත් නම්, වියළුණු ගසට කුමක් නො කරනු
ඇද්දැ"යි වදාළ සේක.
32 මරණ දඬුවමට වරදකරුවන් වූ තවත්
දෙදෙනෙක් ද උන් වහන්සේ සමඟ ගෙන යන ලදහ.
33 ඔව්හු කපාලපිටිය නම් ස්ථානයට පැමිණ, එහි දී
උන් වහන්සේ කුරුසියෙහි ඇණ ගැසූ හ.
වරදකරුවන්ගෙන් එක් කෙනෙකු උන් වහන්සේගේ
දකුණු පස ද, අනික් එක්කෙනා වම් පස ද කුරුසිවල
ඇණ ගැසූ හ. 34 ගීතා 22:18ජේසුස් වහන්සේ කතා
කොට, "පියාණෙනි, ඔවුන්ට කමා වුව මැනව; ඔවුන්
කරන දෙය ඔව්හු නොදනිති"යි වදාළ සේක. ඔව්හු
උන් වහන්සේගේ වස්ත්‍ර බෙදාගැනීම පිණිස දාදු
දැමූ හ. 35 ගීතා 22:7සෙනඟ ද බලාගෙන සිටියහ.
ප්‍රධානීහු උන් වහන්සේට ගැරහුම් කරමින්, "මොහු
අනුන් ගැළවීය; මොහු දෙවියන් වහන්සේගේ
ක්‍රිස්තුස් නම්, උන් වහන්සේගේ තෝරාගත්
තැනැත්තේ නම්, තමා ම ගළවා ගනීවා"යි කී හ.
36 ගීතා 69:21මුර සෙබළෝ ද උන් වහන්සේ ළඟට
අවුත් උන් වහන්සේට කාඩි පිළිගන්වා, 37 "ඔබ
ජුදෙව්වරුන්ගේ රජු නම්, ඔබ ඔබ ම ගළවාගන්න"
කියා සරදම් කළහ. 38 "ජුදෙව්වරුන්ගේ රජ මොහු
ය"යි කියා ලියන ලද පුවරු කඩක් උන් වහන්සේට
ඉහළින් තබා තිබිණි.
39 එල්ලා සිටි වරදකරුවන්ගෙන් එක් කෙනෙක් උන්
වහන්සේට අපහාස කරමින්, "ඔබ ක්‍රිස්තුස්
නොවේ ද? ඔබ වත් ගළවාගෙන අප වත් ගළවා
ගන්නැ"යි කී ය. 40 අනෙකා ඔහුට තරවටු කරමින්,
එම දඬුවමට පැමිණ සිටින ඔබ දෙවියන් වහන්සේට
වත් බිය නැද් ද? 41 අපට දඬුවම් ලැබීම සාධාරණ
ය: අපට මේ ලැබෙන්නේ අපේ ක්‍රියාවලට සුදුසු
විපාක හැටියට ය. එහෙත්, මේ තැනැත්තා කිසි ම
වරදක් කර නැතැ"යි උත්තර දුන්නේ ය. 42 තවද
ඔහු, "ජේසුස් වහන්ස, ඔබ රාජශ්‍රීයෙන් වඩිනා කල
මා සිහි කළ මැනවැ"යි කී ය. 43 උන් වහන්සේ ද,
කතා කරමින් "ඇත්තෙන් ම මම ඔබට කියමි, ඔබ
මා සමඟ අද ම පාරාදීසයෙහි සිටින්නෙහි ය"යි වදාළ
සේක.

## ජේසුස් වහන්සේගේ මරණය
(මතෙ 27:45-56;මාක් 15:33-41;ජොහ 19:28-30)

44 එය මද්දහන් වේලාව පමණ විය; රට පුරා
අන්ධකාරයක් පහළ වී, එය සවස තුන දක්වා
පැවතිණි. 45 නික්ම 26:31-33හිරු අඳුරු විය; දේව
මාලිගාවේ තිරය දෙකඩ ව ඉරී ගියේ ය. 46 ගීතා
31:5ජේසුස් වහන්සේ මහ හඬින් මොරගසා,
"පියාණෙනි, ඔබ හස්තයට මාගේ ආත්මය භාර
දෙමි"යි වදාළ සේක. මෙවදන් කියා උන් වහන්සේ
අවසන් හුස්ම හෙළූ සේක. 47 එවිට ශතාධිපතියා
සිදු වූ දෙය දැක දෙවියන් වහන්සේට ප්‍රශංසා
කරමින්, "සැබැවින් ම මේ මනුෂ්‍යයා නිදොස්
කෙනෙකැ"යි කීවේ ය. 48 මේ සිද්ධිය බැලීමට ආ
සමූහයා සිදු වූ සියල්ල දැක, ළයට ගසාගනිමින්
ආපසු ගියහ. 49 ලූක් 8:2-3උන් වහන්සේ දැන හැඳින
සිටි සියල්ලෝ ද ගලීලයේ සිට උන් වහන්සේ සමඟ
ආ ස්ත්‍රීහු ද ඒ දේ නරඹමින් දුරින් සිටියහ.

## භූමදානය
(මතෙ 27:57-61;මාක් 15:42-47;ජොහ 19:38-42)

50+LUK ජුදෙවේ නුවරක් වූ අරිමාතියෙන් පැමිණි
ජෝසපේ නම් මනුෂ්‍යයෙක් විය. ඔහු යහපත් දැහැමි
තැනැත්තෙකි. ජුදා මන්ත්‍රණ සභාවෙහි ගරුතර
සාමාජිකයෙකි. ඔහු ජුදෙව්වරුන්ගේ තීරණය හා
ක්‍රියා කලාපය අනුමත නොකළේ ය; ඔහු දෙවියන්
වහන්සේගේ රාජ්‍යය පිළිබඳ අපේක්ෂාවෙන් සිටියේ
ය. 52 ඔහු පිලාත් වෙත ගොස් ජේසුස් වහන්සේගේ

මෘත දේහය ඉල්ලී ය. 53 ඔහු එය පහතට ගෙන,
සිහින් හණ රෙද්දකින් වෙළා, ඒ දක්වා කිසිවකු
නොතැබූ, ගලක කණින ලද සොහොනක උන්
වහන්සේ තැන්පත් කෙළේ ය. 54 ඒ දවස සබත්
දිනයට සූදානම් වීමේ දවස වන සිකුරාදා විය;
55 ගලීලයේ සිට උන් වහන්සේ සමඟ ආ ස්ත්‍රීහු
ගොස්, සොහොන් ගෙය ද උන් වහන්සේගේ මෘත
දේහය තැන්පත් කළ අන්දම ද බලාගත්හ. 56 නික්ම
20:10; ද්වි.නී. 5:14ඔව්හු ආපසු අවුත් සුගන්ධ ද්‍රව්‍ය
හා විලේපන සූදානම් කළහ.
56 ව්‍යවස්ථාවට අනුකූල ව ඔව්හු සබත් දවසේ
නිවාඩු ගත්හ.

### ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය
(මතෙ 28:1-10;මාක් 16:1-8;ජොහ 20:1-10)

24 සතියේ පළමු වන දින හිමිදිරි උදයේ තමන්
සූදානම් කළ සුවඳ ද්‍රව්‍ය රැගෙන ස්ත්‍රීහු
සොහොන් ගෙය ළඟට ගියාහු, 2 ගල සොහොන්
ගෙයින් ඉවතට පෙරළා තිබෙනු දුටුවෝ ය. 3 ඔව්හු
ඇතුළු වූ කල එහි ජේසුස් ස්වාමීන් වහන්සේගේ
ශරීරය නුදුටුවෝ ය. 4 ඒ ගැන ඔවුන් වියවුල් ව
සිටිය දී, කාන්ති විහිදුවන වස්ත්‍ර හැඳගත්
මනුෂ්‍යයෝ දෙදෙනෙක් ඔවුන් ළඟ සිටියහ. 5 ඒ දුටු
ඔවුන් බියපත් ව තමන්ගේ මුහුණු බිමට හරවාගත්
කල ඒ මනුෂ්‍යයෝ කතා කොට, "ජීවමාන තැනැන්
වහන්සේ මළවුන් අතර සොයන්නේ මන් ද? 6 මතෙ
16:21; 17:22-23; 20:18-19; මාක් 8:31; 9:31;
10:33-34; ලූක් 9:22; 18:31-33උන් වහන්සේ මෙහි
නැත, උන් වහන්සේ උත්ථාන වූ සේක. 7 මනුෂ්‍ය-
පුත්‍රයාණන් පව්කාර මිනිසුන්ගේ අත්වලට පාවාදෙනු
ලබන්නටත්, කුරුසියෙහි ඇණ ගසනු ලබන්නටත්,
තුන් වන දා නැවත නැඟිටින්නටත් යුතු ම යයි කියා
උන් වහන්සේ ගලීලයේ සිටිය දී පැවසූ හැටි සිහි
කරන්නැ"යි ඔවුන්ට කී හ. 8 එකල ඔව්හු උන්
වහන්සේගේ වචන සිහි කොට සොහොන් ගෙයින්
හැරී අවුත්, 9 එපවත් සියල්ල එකොළොස් දෙනාට ද
සෙසු සියල්ලන්ට ද දැන්වූ හ. 10 ඒ ස්ත්‍රීහු නම්:
මග්දලායේ මරියා, ජොවන්නා සහ ජාකොබ්ගේ මව
වූ මරියා ය. ඔවුන් සහ අනිකුත් ස්ත්‍රීහු ද
ප්‍රේරිතයන්ට එපවත් කී හ. 11 මෙපුවත ඔවුන්ට
ප්‍රලාපයක් සේ පෙනී ගියෙන්, ඔව්හු ඔවුන්ගේ කීම
විශ්වාස නොකළහ. 12 එහෙත්, පේදුරු නැඟිට
සොහොන් ගෙය ළඟට දුව ගොස්, නැමී බලා, හණ
රෙදි පමණක් තිබෙනු දැක, සිදුවූ දේ ගැන පුදුම
වෙමින් සිය නිවසෙට ගියේ ය.

### එම්මාවුස් ගමන
(මාක් 16:12-13)

13 එම දවසෙහි ශ්‍රාවකයන්ගෙන් දෙදෙනෙක්
ජෙරුසලමේ සිට කිලෝමීටර් එකොළහක් පමණ දුර
වූ එම්මාවුස් නම් ගමට යමින් සිටියහ. 14 එසේ
යද්දී, ඔව්හු සිදුවූ සියල්ල ගැන කතා කරමින් ගියහ.
15 තවද, ඔවුන් සාකච්ඡා කරමින් යද්දී, ජේසුස්
වහන්සේ ම ඔවුන් සමීපයට වැඩ, ඔවුන් හා සමඟ
ගමන්ගත් සේක. 16 ඔවුන් උන් වහන්සේ දුටු නමුත්,
ඔවුන්ට උන් වහන්සේ හඳුනා ගත නොහැකි විය.
17 උන් වහන්සේ ඔවුන්ට කතා කොට, "මේ ඔබ
තර්ක කරමින් යන්නේ කුමන කාරණා ගැන දැ"යි
ඇසූ සේක. ඔව්හු දුක්මුසු මුහුණින් යුක්ත ව නතර
වූ හ. 18 ඔවුන්ගෙන් ක්ලේයෝපස් නම් තැනැත්තා
උත්තර දෙමින්, "මේ දවස්වල ජෙරුසලමෙහි සිදුවූ
කාරණා නොදැන සිටින අමුත්තා ඔබ පමණක් දැ"යි
උන් වහන්සේට කී ය. 19 "කවර කාරණා දැ"යි උන්
වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක. ඔව්හු උත්තර
දෙමින්, "නාසරතේහි ජේසුස් වහන්සේ පිළිබඳ
කාරණා ය. උන් වහන්සේ දෙවියන් වහන්සේ හා
සකල ජනතාව ඉදිරියෙහි ක්‍රියාවෙහි ද කතාවෙහි ද
බලසම්පන්න දිවැසිවරයකු ව සිටි සේක. 20 නායක
පූජකවරු ද අපගේ ප්‍රධානීහු ද උන් වහන්සේ
මරණයට නියම කොට කුරුසියෙහි ඇණ ගැසූ හ.
21 එහෙත්, ඉශ්රායලේ මුදාලීමට සිටි එක ම තැනැන්
වහන්සේ උන් වහන්සේ ය යනු අපගේ
බලාපොරොත්තුව විය. එපමණක් නොවේ. මේ දේ
සිදුවී අදට තුන් දවසක් ගත වී ඇත. 22 තවද, අපේ
කණ්ඩායමේ ඇතැම් ස්ත්‍රීහු අද හිමිදිරි උදයේ
සොහොන් ගෙය ළඟට ගොස්, 23 උන් වහන්සේගේ
සිරුර නොදැක අවුත්, ඔවුන්ට දර්ශනය වූ දේව
දූතයන් 'උන් වහන්සේ ජීවමාන ව සිටින සේකැ'යි
පැවසූ බව කියා අප විස්මිත කළහ. 24 අප හා
සමඟ සිටි අයගෙන් සමහරෙක් සොහොන් ගෙය
ළඟට ගොස් ඒ ස්ත්‍රීන් කී ලෙසෙ ම දුටුවෝ ය.
එහෙත්, ඔව්හු උන් වහන්සේ නුදුටුවෝ ය"යි කී හ.
25 එවිට උන් වහන්සේ ඔවුන් අමතා, "බුද්ධිහීන වූ ද
දිවැසිවරයන් පැවසූ සියල්ල විශ්වාස කිරීමට මැළි වූ
ද තැනැත්තෙනි, 26 ක්‍රිස්තුන් වහන්සේ ඒ දුක් විඳ
ඉක්බිති ස්වකීය තේජශ්රීයට පැමිණිය යුතු ව
තිබුණා නොවේ ද" කියා, 27 මෝසෙස් හා සියලු
දිවැසිවරයන්ගෙන් පටන්ගෙන, මුළු ශුද්ධ ලියවිල්ලෙහි
තමන් ගැන සඳහන් කරුණු ඔවුන්ට පහදා දුන්
සේක.
28 ඔව්හු යමින් සිටි ගමට ළං වූ හ. එහෙත් උන්
වහන්සේ තවත් දුර යන බවක් දැක්වූ සේක.
29 එවිට ඔව්හු: "දවස ගෙවී සවස් වේගෙන එන
බැවින්, අප සමඟ නතර වුව මැනවැ"යි උන්
වහන්සේට පෙරැත්ත කළහ. උන් වහන්සේ ඔවුන්
සමඟ නතර වීමට ගෙට ඇතුළු වූ සේක. 30 තවද
උන් වහන්සේ ඔවුන් හා සමඟ කෑමට හිඳගත්
කල්හි, රොටි ගෙන ආශීර්වාදය පවසා, කඩා ඔවුන්ට
දුන් සේක. 31 එවිට ඔවුන්ගේ ඇස් ඇරී, ඔව්හු උන්
වහන්සේ කවරෙක් දැ යි හැඳින ගත්හ. එවිට උන්
වහන්සේ ඔවුන් කෙරෙන් අතුරුදහන් වූ සේක.
32 එකල ඔව්හු, "උන් වහන්සේ අප හා සමඟ මඟ
දී කතා කරද්දීත්, ශුද්ධ ලියවිල්ල පහදා දෙද්දීත්,
අපේ හදවත දැවී ඇවිළී ගියා නොවේ දැ"යි
එකිනෙකාට කී හ. 33 ඔව්හු ඒ වේලේ ම නැඟිට
ජෙරුසලමට පෙරළා ගොස්, එකොළොස් දෙනා ද
ඔවුන් සමඟ සිටි අනෙක් අය ද, 34 "ඒකාන්තයෙන් ම

සමිඳාණන් වහන්සේ නැඟිට සිටින සේක, සීමොන්ට
ද පෙනුණු සේකැ"යි කියමින් සිටිනු දුටහ. 35 එවිට
ඔව්හු ද මඟ දී තමන්ට සිදු වූ කාරණා සහ රොටි
කැඞීමෙහි දී ඔවුන්ට උන් වහන්සේ ප්‍රකාශ වූ හැටි
ද පැවසූ හ.

### ශ්‍රාවකයන්ට ප්‍රකාශ වීම

(මතෙ 28:16-20;මාක් 16:14-18;ජොහ 20:19-23;ක්‍රියා 1:6-8)

36 ශ්‍රාවකයන් මෙසේ කතා කරමින් සිටිය දී උන්
වහන්සේ ඔවුන් මැදට වැඩම කර, "ඔබට ශාන්තිය
වේ වා!"යි වදාළ සේක. 37 එහෙත් ඔව්හු ත්‍රස්ත ව
භීතියට පත් ව, ඒ අවතාරයකැ යි සිතූ හ. 38 උන්
වහන්සේ ඔවුන්ට කතා කොට, "ඔබ කැළඹී
සිටින්නේ මන් ද? ඔබගේ සිත්වල සැක උපදින්නේත්
මන් ද? 39 මාගේ අත් හා පා බලන්න; මේ මා ම
බව තේරුම්ගන්න; මා ස්පර්ශ කොට, බලන්න; ඔබට
පෙනෙන ලෙස ඇට මස් සහිත සිරුරක් මට ඇත.
අවතාරයකට නම් ඒවා නැතැ"යි වදාළ සේක. 40 උන්
වහන්සේ මෙවදන් කියා, තම අත් හා පා ඔවුන්ට
පෙන්වූ සේක. 41 ඔවුන් ප්‍රීතිය නිසා විශ්වාස
නොකොට පුදුම වෙමින් සිටිය දී, උන් වහන්සේ
ඔවුන්ට කතා කොට, "කෑමට යමක් මෙහි ඔබ වෙත
තිබේ දැ"යි ඇසූ සේක. 42 ඔව්හු බැදපු මාළු
කැල්ලක් උන් වහන්සේට පිළිගැන්වූ හ. 43 උන්
වහන්සේ එය පිළිගෙන ඔවුන් ඉදිරිපිට දී වැළඳූ
සේක.

44 තවද උන් වහන්සේ කතා කරමින්, "මා පිළිබඳ
මෝසෙස්ගේ ව්‍යවස්ථාවලියෙහි ද දිවැසාවලියෙහි ද
ගීතාවලියෙහි ද ලියා ඇති හැම දයෙ ම ඉෂ්ට විය
යුතු යයි මා ඔබ සමඟ සිටිය දී ඔබට පැවසූ
වචනයෙහි තේරුම මේ ය"යි වදාළ සේක. 45 එවිට
උන් වහන්සේ ශුද්ධ ලියවිලි ඔවුන්ට වැටහෙන
පිණිස ඔවුන්ගේ සිත් පහදවා කතා කොට,
46 "මෙසේ ක්‍රිස්තුන් වහන්සේ වද විඳින්නටත් තුන්
වන දා මළවුන්ගෙන් නැඟිටින්නටත්, 47 ජෙරුසලමෙන්
පටන්ගෙන සකල ලෝකවාසීන්ට පසුතැවී සිත් හරවා
ගැනීම ද පව් කමාව ද, උන් වහන්සේගේ නාමයෙන්
ප්‍රකාශ කරනු ලබන්නට ද යුතු ම යයි ලියා ඇත.
48 ඔබ මේ දේවලට සාක්ෂිකාරයෝ වන්නහු ය.
49 ක්‍රියා 1:4බලන්න, මම මාගේ පියාණන්
වහන්සේගේ පොරොන්දුව ඔබ වෙත ගෙනෙමි.
එහෙත්, ඉහළින් වන බලපරාක්‍රමයෙන් ඔබ හැම
සන්නද්ධ කරනු ලබන තුරු නගරයෙහි නැවතී
සිටින්නැ"යි වදාළ සේක.

### ස්වර්ගාරෝහණය

(මාක් 16:19-20;ක්‍රියා 1:9-11)

50 ක්‍රියා 1:9-11 උන් වහන්සේ බෙතානිය දක්වා,
ඔවුන් කැඳවාගෙන ගොස්, තමන්ගේ අත් ඔසවා
ඔවුන්ට ආශීර්වාද කළ සේක. 51 එසේ ආශීර්වාද
කරද්දී ම, උන් වහන්සේ ඔවුන් කෙරෙන් වෙන් ව,
ස්වර්ගයට ඔසවාගනු ලැබූ සේක. 52 ඔව්හු උන්
වහන්සේට නමස්කාර කොට, ඉමහත් ප්‍රීතියකින්
ජෙරුසලමට හැරී අවුත්, 53 නිරතුරු දේව
මාලිගාවෙහි දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින්
කල් ගත කළහ.

# ශුද්ධවර ජොහන්

### ධර්මයාණන් මිනිසත් බව ගැනීම

1 ආරම්භයේ දී, ධර්මයාණෝසිටි සේක;
q2
1 ධර්මයාණෝ දවියන් වහන්සේ සමඟ සිටි
සේක;
q2
1 ධර්මයාණෝ දවියන් වහන්සේ ව ම සිටි
සේක.
2 ආරම්භයේ දී උන් වහන්සේ, දවියන් වහන්සේ
සමඟ සිටි සේක.
3 සියල්ල උන් වහන්සේ කරණකොටගෙන මවන
ලදී;
q2 3 උන් වහන්සේ නොමැති ව මවන ලද කිසිවක්
නො වී ය.
4 උන් වහන්සේ තුළ ජීවය විය;
q2 4 ඒ ජීවය මනුෂ්‍යයන්ගේ ආලෝකය විය.
5 ආලෝකය අන්ධකාරයෙහි බබළයි;
q2 5 අන්ධකාරය කිසි කලෙක එය ග්‍රහණය
නොකළේ ය.
6 මතෙ 3:1; මාක් 1:4; ලූක් 3:1-2 දවියන්
වහන්සේ එවා වදාළ මනුෂ්‍යයෙක් වී ය. ඔහුගේ
නම ජොහන් ය. 7 ඔහු පැමිණියේ, තමා මඟින්
සියලු දෙනා අදහාගනු පිණිස ආලෝකය ගැන සාක්ෂි
දැරීමට, සාක්ෂිකරුවකු වශයෙනි. 8 ඔහු ඒ
ආලෝකය නොව, ඒ ආලෝකය ගැන සාක්ෂි දරන
පිණිස ආ තැනැත්තේ ය.
9 සියලු මනුෂ්‍යයන් ආලෝකවත් කරවන සත්‍ය
ආලෝකයාණෝ, ලොවට උදා වමින් සිටි සේක.
10 උන් වහන්සේ ලෝකයෙහි සිටි සේක;
q2 10 ලෝකය ඇති වූයේ ද උන් වහන්සේ
කරණකොටගෙන ය.
q2 10 එහෙත්, ලෝකයා උන් වහන්සේ හඳුනා
නොගත්හ.
11 උන් වහන්සේ සිය දේශයට වැඩම කළ සේක,
එහෙත්, ස්වකීය ජනතාව උන් වහන්සේ
නොපිළිගත්හ.
12 එසේ වුව ද උන් වහන්සේ පිළිගත් සියල්ලන්ට
එනම්, උන් වහන්සේගේ නාමය අදහාගත් අයට,
දවියන් වහන්සේගේ දරුවන් ලෙස උපත ලැබීමේ
වරම උන් වහන්සේ දවො වදාළ සේක.
13 එසේ උපත ලැබුයේ, මානව සන්තතියෙන් වත්,
කායික සබඳතාවෙන් වත්, මිනිස් පියෙකුගෙන් වත්
නොව, දවියන් වහන්සේගෙන් ම ය.
14 ධර්මයාණෝ මාංසගත ව අප සමඟ වැඩ විසූ
සේක.
q2 14 දේව වරප්‍රසාදයෙන් ද සත්‍යයෙන් ද පූර්ණ
උන් වහන්සේගේ තේජශ්‍රීය, එනම්, පියාණන්
වහන්සේ කෙරෙන් වූ එක ම පුත්‍රයාණන්ගේ
තේජශ්‍රීය, අපි දුටුවෙමු.
15 ජොහන් උන් වහන්සේ ගැන සාක්ෂි දෙමින්,
“මට පසුව එන තැනැන් වහන්සේ මට පෙර වූ
බැවින්, මට වඩා උතුම් ය යි මා කීවේ මුන්
වහන්සේ ගැන ය”යි මොරගසා කී ය.
16 උන් වහන්සේගේ පූර්ණතාවෙන් අපි සියල්ලෝ
ම වරප්‍රසාද පිට වරප්‍රසාද ලැබීමු. 17 කුමක්හෙයින්
ද, ව්‍යවස්ථාව මෝසෙස් මඟින් දෙන ලද්දේ ය;
එහෙත් දේව වරප්‍රසාදය හා සත්‍යය ජේසුස්
ක්‍රිස්තුන් වහන්සේ මඟින් පැමිණියේ ය.
18 කිසිවකු කවදාවත් දවියන් වහන්සේ දුටුවේ
නැත. පියාණන්ගේ ළයෙහි වැඩවසන, උන්
වහන්සේගේ එක ම පුත්‍රයාණෝ ම උන් වහන්සේ
ප්‍රකාශ කර වදාළ සේක.

### ස්නාවක ජොහන්ගේ සාක්ෂිය

(මතෙ 3:1-12;මාක් 1:2-8;ලූක් 3:15-17)

19 “ඔබ කවරෙක් දැ”යි අසන පිණිස ජුදවෙවරුන්
විසින් ජෙරුසලමෙන් පූජකයන් ද ලෙවීයයන් ද යැවූ
කල, ජොහන් සාක්ෂි දෙමින්, 20 “මම ක්‍රිස්තුස්
නොවෙමි”යි නොසඟවා ම ප්‍රකාශ කළේ ය.
21 ද්වි.නී. 18:15,18; මලාකි 4:5“එසේ නම් කිමෙක්
ද? ඔබ එලියා දැ”යි ඔව්හු ඇසූ හ. “නැතැ”යි ඔහු කී
ය. “ඔබ ඒ දිවැසිවරයා ද?” යන ප්‍රශ්නයටත්,
“නැතැ”යි ඔහු කී ය. 22 “එසේ නම්, ඔබ කවරෙක්
ද? අප එවූ අයට පිළිතුරක් දිය යුතු යි; ඔබ ගැන ම
ඔබ කියන්නේ කිමෙක් දැ”යි ඔව්හු ඇසූ හ. 23 යසො
40:3“මම නම්, යසොයා දිවැසිවරයා කී පරිදි,
‘සමිඳාණන්ගේ මඟ පිළියෙළ කරන්නැ’යි
පාළුකරයෙහි මොරගසන්නෙකුගේ හඬ වෙමි”යි
ජොහන් පිළිතුරු දුනි.
24 එවන ලද සමහරෙක් පරිසිවරු ය. 25 ඔව්හු
ප්‍රශ්න කරමින්, “ඉදින් ඔබ ක්‍රිස්තුස් වත්, එලියා
වත්, ඒ දිවැසිවරයා වත් නොවන්නෙහි නම්,
බව්තීස්ම-ස්නාපනයකරන්නේ කුමක් නිසා දැ”යි ඇසූ
හ. 26 ජොහන් ද පිළිතුරු දෙමින්, “මම වතුරෙන්
බව්තීස්ම-ස්නාපනය කරමි; එහෙත්, ඔබ නාඳුනන
කෙනෙක් ඔබ මැද වැඩ සිටිති. 27 එනම්, මට පසුව
වඩින තැනැන් වහන්සේ ය; උන් වහන්සේගේ
පාවහන් පටි මුදන්නට වත් මම නොවටිමි”යි කී ය.

28 මයෙ සිදුවූයේ, ජොහන් බව්තීස්ම-ස්නාපනය
කරමින් සිටි ජෝර්දානනේ එතරෙ බතොනියේ දී ය.

## දවේයන් වහන්සේගේ බැටළු පෝතකයාණෝ

29 පසු දින ජොහන් තමෙේ ජේසුස් වහන්සේ
තමා සමීපයට වඩිනු දැක, "මනේන, ලෝකයේ
පාපය දුරලන දවේයන් වහන්සේගේ බැටළු
පෝතකයාණෝ! 30 මට පසු ව එන තැනැත්
වහන්සේ මට පරෙ සිටි බැවින් මට වඩා උතුම් යයි
යමකෙු ගැන මම කීවමේ ද? ඒ මුන් වහන්සේ ය;
31 මම උන් වහන්සේ නොහැඳින සිටියමේ; එහතේ,
වතුරනේ බව්තීස්ම-ස්නාපනය කරමින්, මා පැමිණියේ
උන් වහන්සේ ඉශ්රායලේවරුන්ට ප්රකාශ වන පිණිස
ය"යි කී ය.
32 තවද, ජොහන් සාක්ෂි දරමින්, "ආත්මයාණන්
පරවේයකෙු මනේ අහසින් බැස උන් වහන්සේ මත
වැඩ හිඳිනු මම දිටිමි; 33 මම උන් වහන්සේ
නොහැඳින සිටියමේ; එහතේ, වතුරනේ බව්තීස්ම-
ස්නාපනය කරන්නට මා එවා වදාළ තැනැත්
වහන්සේ ම මට කතා කොට, 'ආත්මයාණන් යමකෙු
පිට බැස වීත් වැඩ හිඳිනු ඔබ දකින්නහෙි ද, ඒ
වනාහි ශුද්ධාත්මයාණන්ගනේ බව්තීස්ම-ස්නාපනය
කරන තැනැත් වහන්සේ ය'යි වදාළ සේක. 34 ඒ දේ
මම ම දිටිමි; දැක, උන් වහන්සේ දවේයන්
වහන්සේගේ පුත්රයාණෝ යයි සාක්ෂි දැරුවමේ"යි
කීවේ ය.

## මුල් ශ්රාවක පිරිස

35 පසු දින නැවතත් ජොහන් සිය ගෝලයන්
දදෙනෙකු සමඟ සිටිය දී 36 මඟ වඩිනා ජේසුස්
වහන්සේ දසෙ බලා, "බලන්න, දවේයන්
වහන්සේගේ බැටළු පෝතකයාණෝ"යි කී ය.
37 ගෝලයෝ දදෙනෙ ඔහු කී දේ අසා ජේසුස්
වහන්සේ පසුපස ගියහ. 38 ජේසුස් වහන්සේ හැරී
ඔවුන් තමන් පසුපස එනු දැක, "ඔබ කුමක්
සොයන්නහු දැ"යි ඇසූ සේක. ඔව්හු ද, "රබ්බී, (එහි
තේරුම ගුරුදේවයනෙි, යනු යි.) ඔබ වැඩ වසන්නේ
කොතැන දැ"යි ඇසූ හ. 39 "ඇවිත් බලන්නැ"යි උන්
වහන්සේ ඔවුන්ට වදාළ සේක. එසේ ඔව්හු අවුත්
උන් වහන්සේ වැඩ වසන ස්ථානය දැක, එදින උන්
වහන්සේ සමඟ ගත කළහ. වේලාව සවස හතරට
පමණ වී ය.
40 ජොහන්ගේ කීම අසා උන් වහන්සේ පසුපස
ගිය දදෙනොගනේ එක් තැනැත්තකේ නම්, සීමොන්
පේදුරුගේ සොහොයුරු ඇන්ඩෲ ය. 41 ඔහු
පළමුවනේ තම සොහොයුරා මුණගැසී, "අපට
මසෙියස් වහන්සේ හමු වූ හ"යි කී ය. ('මසෙියස්'
යන්නහෙි අර්ථය 'ක්රිස්තුස්' යනු යි.) 42 ඔහු ජේසුස්
වහන්සේ වතෙ සීමොන් කැඳවාගනෙ ආවේ ය.
ජේසුස් වහන්සේ ඔහු දසෙ බලා, "ඔබ ජොහන්ගේ
පුත් සීමොන් ය; ඔබට 'කේපස්' යයි කියනු ඇතැ"යි
වදාළ සේක. ('කේපස්' යන්නහෙි අර්ථය
'පර්වතය'යනු යි.)

## පිලිප් සහ නතානියලේ කැඳවීම

43 පසු දින ජේසුස් වහන්සේ ගලීලයට යන්නට
ඉටාගත් සේක. එහි දී පිලිප් හමු වී, "මා අනුගාමී
වන්නැ"යි ඔහුට වදාළ සේක. 44 පිලිප් වනාහි
ඇන්ඩෲගේ සහ පේදුරුගේ ගම වූ බතේසයිදාවනේ
ආ තැනැත්තකේ. 45 පිලිප් ද නතානියලේ සොයා
ගනෙ, "මෝසසේ ව්යවස්ථාවලියහෙි හා
දිවැසාවලියහෙි සඳහන් කර ඇති තැනැත් වහන්සේ,
එනම්, ජෝසපේගේ පුත් නාසරතේහි ජේසුස්
වහන්සේ අපට හමු වූ සේකැ"යි කී ය.
46 නතානියලේ ද කතා කරමින්, "වැදගැම්මක් ඇති
කිසිවක් නාසරතේන් නික්මේ දැ"යි ඇසී ය. "ඇවිත්
බලන්නැ"යි පිලිප් කී ය. 47 ජේසුස් වහන්සේ
නතානියලේ තමන් වතෙ එනු දැක, "මනේන,
හොරබොරු නැති, සැබෑ ඉශ්රායලේ ජාතිකයකෙ"යි
ඔහු ගැන වදාළ සේක. 48 "ඔබ මා ගැන කසෙේ
දන්නහෙි දැ"යි නතානියලේ උන් වහන්සේගනේ ඇසී
ය. ජේසුස් වහන්සේ පිළිතුරු දමේන්, "පිලිප් ඔබ
කැඳවන්නටත් පරෙ, අත්තික්කා ගස යට ඔබ සිටිනු
මම දිටිමි"යි වදාළ සේක. 49 නතානියලේ උත්තර
දමේන්, "ගුරුදේවයනෙි, ඔබ වහන්සේ නම්, දවේයන්
වහන්සේගේ පුත්රයාණෝ ය; ඔබ වහන්සේ නම්,
ඉශ්රායලේහි රජිඳාණෝ ය"යි කී ය. 50 ජේසුස්
වහන්සේ ද පිළිතුරු දමේන්, "ඔබ අත්තික්කා ගස
යට සිටිනු මම දිටිමි, යි මා ඔබට වදාළ බැවින් ද,
ඔබ අදහා ගත්තේ? මීට වඩා මහත් දේ ඔබ
දකින්නහෙි ය"යි වදාළ සේක. 51 උත්
28:12තවදුරටත් උන් වහන්සේ කතා කරමින්,
"ඒකාන්තයනේ මම ඔබට කියමි; ස්වර්ගය විවර වී,
මනුෂ්ය-පුත්රයාණන් වතෙ දවේයන් වහන්සේගේ
දූතයන් නැඟ යනවාත්, බැස එනවාත් ඔබ
දකින්නහෙි ය"යි වදාළ සේක.

## කානාහි සරණ මංගල්යය

2 තුන් වන දවසහෙි, ගලීලයේ කානාහි විවාහ
මංගල්යයක් විය; ජේසුස් වහන්සේගේ
මෑණියෝ ද එහි සිටියහ. 2 සිය ශ්රාවකයන් සමඟ
ජේසුස් වහන්සේ ද මංගල්යයට කැඳවනු ලැබූ
සේක. 3 මිදියුස හිඟ වූ විට, ජේසුස් වහන්සේගේ
මෑණියෝ, "මිදියුස නැතැ"යි උන් වහන්සේට කී හ.
4 ජේසුස් වහන්සේ ද කතා කොට, "ස්ත්රිය, ඔබත්
මාත් මේ ගැන කරදර වන්නේ කුමට ද? මාගේ
මොහොත තව ම පැමිණ නැතැ"යි වදාළ සේක.
5 උන් වහන්සේගේ මෑණියෝ මහෙකෙරුවන් අමතා,
'මතෙුමාණන් ඔබට කියන කොයි දයෙක් වුව ද
කරන්නැ'යි කී හ.
6 ජුදවේවරුන්ගේ පවිත්ර වීමේ වත්පිළිවතේ සඳහා
ලීටර් සියයක් පමණ අල්ලන ගල් භාජන සයක් එහි
තබා තිබිණි. 7 "භාජනවලට වතුර පුරවන්නැ"යි
ජේසුස් වහන්සේ සේවකයන්ට වදාළ සේක. ඔව්හු
ද ඒවා ගැටිය දක්වා ම පිරවේවෝ ය. 8 "දැන්
මයෙින් ටිකක් සංවිධායක තැන වතෙ ගනෙ

යන්නැ"යි උන් වහන්සේ ඔවුන්ට වදාළ සේක. ඔව්හු
එය ගෙන ගියහ. 9 සංවිධායක තැන මිදියුස බවට
හැරුණු වතුර ගෙන රස බැලී ය. එය කෙසේ ලැබිණි
දැ යි වතුර ගෙනා සේවකයන් දැන සිටි නමුත්, ඔහු
නොදත්තේ ය. එබැවින් ඔහු මනාලයා කැඳවා,
10 "හැම කෙනෙක් ම පළමුකොට හොඳ මිදියුසයනේ
සංග්‍රහ කරති; කවුරුනුත් සෑහෙන තරමට පානය
කළ පසු බාල මිදියුසයනේ සංග්‍රහ කරති. එහෙත්,
ඔබ මේ වන තුරු හොඳ මිදියුස තබාගෙන සිටියෙහි
ය"යි ඔහුට කී ය.
11 මේ වනාහි ජේසුස් වහන්සේ ලකුණක් පිණිස
කළ හාස්කම්වලින් පළමු වැන්න ය. එය සිදු කරන
ලද්දේ ගලීලයේ කානාහි දී ය. එසේ කිරීමෙන් උන්
වහන්සේ සිය තේජශ්‍රීය ප්‍රකාශ කළ සේක;
ශ්‍රාවකයෝ ද උන් වහන්සේ අදහාගත්හ. 12 මතෙ
4:13ඉන්පසු උන් වහන්සේ සිය මෑණියන් ද
සහොදරයන් ද ශ්‍රාවකයන් ද සමඟ කපර්ණවුමට
වැඩිය සේක; එහෙත්, ඔව්හු එහි වැඩි කලක්
නොසිටියහ.

### දේව මාලිගාව පවිත්‍ර කිරීම

(මතෙ 21:12-13;මාක් 11:15-19;ලූක් 19:45-46)

13 නික්ම 12:1-27 ජුදෙව්වරුන්ගේ පාස්කු මංගල්‍යය
ආසන්න ව තිබුණු බැවින්, ජේසුස් වහන්සේ
ජෙරුසලමට වැඩම කළ සේක. 14 එවිට, දේව
මාලිගාවේ ගව, බැටළු හා පරෙවි වෙළෙන්දන් ද
මුදල් මාරු කරන්නන් ද ගනුදෙනුවෙහි යෙදී හිඳිනු
උන් වහන්සේ දැක, 15 ලණුවලින් කසයක් සාදාගෙන
ගවයන් හා බැටළුවන් හා සියල්ලන් දේව
මාලිගාවෙන් පිටතට පලවා හැර, මුදල් මාරු
කරන්නන්ගේ කාසි විසුරුවා ඔවුන්ගේ මේස පෙරළා
දැමූ සේක. 16 ඉන්පසු උන් වහන්සේ පරෙවි
වෙළෙඳුන් අමතා, "මේවා අහකට ගෙන යන්න;
මාගේ පියාණන්ගේ ගෘහය වෙළෙඳ පොළක් නො
කරන්නැ"යි වදාළ සේක. 17 ගීතා 69:9"ඔබගේ
ගෘහයට ඇති උද්‍යෝගයෙන් මම දැවෙමි"යි ලියා
තිබෙන බව එවිට ශ්‍රාවකයන්ට මතක් විය.
18 එකල ජුදෙව්වරු, "ඔබ මේ දේවල් කරන බැවින්
ලකුණක් පිණිස කුමන හාස්කමක් අපට දක්වන්නෙහි
දැ"යි ඇසූ හ. 19 මතෙ 26:61; 27:40; මාක් 14:58;
15:29ජේසුස් වහන්සේ ඔවුන්ට පිළිතුරු දෙමින්, "මේ
දේව මාලිගාව කඩාදමන්න. තෙදිනකින් එය මම
ගොඩනඟන්නෙමි"යි වදාළ සේක. 20 එවිට ජුදෙව්වරු
කතා කොට, "මේ දේව මාලිගාව ගොඩනඟන්නට
හතළිස් හය වසක් ගත විය. ඔබ එය තෙදිනකින්
ගොඩනඟන්නෙහි දැ"යි ඇසූ හ. 21 එහෙත්, උන්
වහන්සේ කතා කළේ, තමන්ගේ ශරීරය නමැති
දේව මාලිගාව ගැන ය. 22 උන් වහන්සේ මරණින්
නැඟිටුවනු ලැබූ පසු, ශ්‍රාවකයෝ, උන් වහන්සේ
මේ දේ කී බව සිහි කොට ශුද්ධ ලියවිල්ල ද උන්
වහන්සේගේ වචනය ද විශ්වාස කළහ.

### සියලු සිත් දන්නා ජේසුස් වහන්සේ

23 උන් වහන්සේ පාස්කු මංගල්‍යයේ දී
ජෙරුසලමෙහි සිටි කල්හි, බොහෝ දෙනෙක් උන්
වහන්සේ කළ හාස්කම් දැක, උන් වහන්සේ
අදහාගත්හ. 24 එහෙත්, ජේසුස් වහන්සේ ඔවුන්
කෙරෙහි විශ්වාසය නොතැබූ සේක. මන්ද, උන්
වහන්සේ සියල්ල දත් නිසා ය. 25 මිනිස් සිතෙහි
ඇති දැය උන් වහන්සේ දැන සිටි බැවින්, මනුෂ්‍යයා
ගැන කිසිවකුගේ සාක්ෂියක් උන් වහන්සේට
අවශ්‍ය නො වී ය.

### ජේසුස් වහන්සේ සහ නිකොදේමුස්

3 එකල පරිසිවරුන්ගෙන් කෙනෙක් වූ ද,
ජුදෙව්වරුන්ගේ ප්‍රධානියෙක් වූ ද,
නිකොදේමුස් නම් මිනිසෙක් විය. 2 ඔහු එක් රැයක
උන් වහන්සේ වෙත අවුත්, "ගුරුදේවයෙනි, ඔබ
දෙවියන් වහන්සේ වෙතින් වැඩම කළ ගුරුවරයෙකු
යි අපි දනිමු; මන්ද, දෙවියන් වහන්සේ තමා සමඟ
වැඩ නොසිටින සේක් නම්, කිසිවකුට ඔබ කරන
මේ හාස්කම් කළ නොහැකි ය"යි කී ය. 3 ජේසුස්
වහන්සේ පිළිතුරු දෙමින්, "ඒකාන්තයෙන් මම ඔබට
කියමි; යමෙක් නැවත නූපන්නොත්, ඔහුට දෙවියන්
වහන්සේගේ රාජ්‍යය දැකගත නොහැකි ය"යි ඔහුට
වදාළ සේක. 4 නිකොදේමුස්, කතා කරමින්,
"මනුෂ්‍යයෙකු මහලු ව සිටිය දී, උපදින්නට පුළුවන්
කොහොම ද? දෙ වන වරටත් මවු කුසට පිවිස
උපත ලැබිය හැකි දැ"යි ඇසී ය. 5 ජේසුස් වහන්සේ
පිළිතුරු දෙමින්, "ඒකාන්තයෙන් මම ඔබට කියමි;
යමකු වතුරෙන් ද ආත්මයාණන්ගෙන් ද
නූපන්නොත්, ඔහුට ස්වර්ග රාජ්‍යයට පිවිසිය
නොහැකි ය. 6 කයින් උපදින දේ කායික ය;
ආත්මයාණන්ගෙන් උපදින දේ ආත්මික ය; 7 'ඔබ
නැවත උපදින්නට ඕනෑ ය'යි මා කීවාට පුදුම
නොවන්න. 8 සුළඟ සිතූ සිතූ තැන් වල හමයි; එහි
ශබ්දය ඔබට ඇසෙයි. එහෙත්, එය කොතැනින්
එන්නේ ද කොතැනට යන්නේ දැ යි ඔබ
නොදන්නහු ය. ආත්මයාණන්ගෙන් ජනිත වූ හැම
කෙනෙකුන් ද එසේ ම ය"යි වදාළ සේක.
9 "මේ දේ සිදුවිය හැක්කේ කෙසේ දැ"යි
නිකොදේමුස් පිළිවිසී ය. 10 ජේසුස් වහන්සේ
පිළිතුරු දෙමින්, "ඔබ ඉශ්‍රායලේහි කීර්තිමත්
ගුරුවරයකු ව සිටියදීත් මේ දේ ඔබට තේරුම් ගත
නොහැකි ද? 11 ඒකාන්තයෙන් මම ඔබට කියමි; අපි
දන්නා දේ කියමු, දුටු දේ ගැන සාක්ෂි දරමු. එහෙත්,
අපේ සාක්ෂිය ඔබ නොපිළිගන්නහු ය. 12 මා ඔබට
ලෞකික දේ ගැන කී කල්හි ඔබ විශ්වාස
නොකරන්නෙහි නම්, ලෝකෝත්තර දේ ප්‍රකාශ
කළහොත් කෙසේ විශ්වාස කරන්නෙහි ද?
13 ස්වර්ගයෙන් බැස වදාළ මනුෂ්‍ය-පුත්‍රයාණන් හැර,
අන් කිසිවෙක් ස්වර්ගයට නොනැංගේ ය. 14 ගණන්
21:9පාළුකරයෙහි දී මෝසෙස් සර්පයා එසවූ ලෙස ම
මනුෂ්‍ය-පුත්‍රයාණන් ද, 15 උන් වහන්සේ කෙරෙහි

අදහාගන්නා සෑම දනෙ ම සදාතන ජීවනය ලබන
පිණිස, ඔසවනු ලබන්නට ඕනෑ ය.”
16 “දවේයන් වහන්සේ ලෝකයාට කොතරම්
ප්‍රමේ කළ සේක් ද කීවොත්, ස්වකීය ඒක ජාතක
පුත්‍රයාණන් වුව ද ලොවට දවො වදාළ සේක.
එසේ කළෙේ, උන් වහන්සේ කෙරෙහි අදහන සියලු
දනො ම විනාශ නොවී සදාතන ජීවනය ලබන පිණිස
ය. 17 දවේයන් වහන්සේ ස්වකීය පුත්‍රයාණන්
ලොවට එවා වදාළෙේ, ලෝකයා විනිශ්චය කරන
පිණිස නොව, උන් වහන්සේ කරණකොටගනෙ
ලෝකයා ගළවනු ලබන පිණිස ය. 18 උන් වහන්සේ
අදහාගන්නා විනිශ්චය කරනු නො ලැබේ. අදහා
නොගන්නා දවේයන් වහන්සේගේ ඒක ජාතක
පුත්‍රයාණන් අදහා නොගන්නා බැවින් දැනට ම
විනිශ්චය ලබා ඇත.
19 “විනිශ්චය නම් මේ ය: ලෝකයට ආලෝකය
පැමිණ තිබේ; එහතේ, තමන්ගේ ක්‍රියා නපුරු
බැවින් මනුෂ්‍යයෝ ආලෝකයට වඩා අන්ධකාරයට
ප්‍රිය කළහ. 20 නපුරු ක්‍රියා කරන හැම දනෙ ම
ආලෝකයට ද්වෙේෂ කරති; ඔවුන්ගේ ක්‍රියා එළි වන
බැවින් ඔව්හු ආලෝකයට නොපැමිණෙති.
21 එහතේ, සත්‍ය දේ කරන තැනැත්තා තමාගේ
ක්‍රියා දවේයන් වහන්සේට කීකරු ව කරන ලද බව
පනෙනෙ පිණිස ආලෝකයට පැමිණේ ය”යි වදාළ
සේක.

## ජොහන්ගේ සාක්ෂිය

22 ඉන්පසු ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන්
කැටුව ජුදා දේශයට පැමිණි සේක. එහි උන්
වහන්සේ ඔවුන් සමඟ නැවතී සිට බව්තීස්ම-
ස්නාපනය කළ සේක. 23 ජොහන් ද සාලිම්
සමීපයහෙි ඒනොන් යන ස්ථානයහෙි ජලය අධික ව
තිබුණු බැවින් බව්තීස්ම-ස්නාපනය කරමින් සිටියේ
ය. මිනිස්සු පැමිණ බව්තීස්ම-ස්නාපනය ලැබූ හ.
24 මතෙ 14:3; මාක් 6:17; ලූක් 3:19-20මයෙ සිදු
වූයේ ජොහන් හිර අඩස්සි කරනු ලැබීමට පරෙ ය.
25 එකල ජොහන්ගේ ගෝලයන් හා ජුදවෙව්වකෙු
අතර පවිත්‍ර වීම ගැන වාදයක් හටගති. 26 එවිට
ඔව්හු ජොහන් වතෙට පැමිණ, “ඇදුරිඳුනි,
ජෝර්දානනේ එගොඩ ඔබ සමඟ සිටියාවූ ද ඔබ
විසින් සාක්ෂි දරනු ලැබුවාවූ ද තැනැත්තේ ම
බව්තීස්ම-ස්නාපනය කරයි. සියල්ලෝ ම ඔහු වතෙට
යති”යි කී හ. 27 ජොහන් පිළිතුරු දමේින් මසෙේ කී
ය: “ස්වර්ගයනේ දනෙ ලද දයෙක් මිස අන් කිසිවක්
මිනිසකුෙට ලැබිය නො හැකි ය. 28 ජොහෙ 1:20මම
ක්‍රිස්තුස් නොවමේ; එහතේ, ‘මම උන් වහන්සේට
ප්‍රථමයනේ එවන ලද්දමේ’යි මා කී බවට ඔබ ම
සාක්ෂිකාරයෝ ය. 29 මනාලිය අයිති මනාලයාට ය,
මනාලයා ළඟ සිට සවන් දනෙ ඔහුගේ මිත්‍රයා,
මනාලයාගේ කටහඬ අසා අතිශයින් ප්‍රමුදිත වයේ.
මේ මාගේ ප්‍රීතිය පිරී ඇත්තේ එබැවිනි. 30 උන්
වහන්සේගේ නැඟීමත්, මාගේ බැසීමත් සිදුවිය යුතු
ය.”

## ස්වර්ගයනේ එන තැනැත්තා

31 “ඉහළින් වඩිනා තැනැත්තේ සියල්ලනට වඩා
උතුම් ය. භූමියනේ වන තැනැත්තේ භූමියට අයිති
වේ; ඔහු භෞමික දේ ගැන කතා කරයි.
ස්වර්ගයනේ එන තැනැන් වහන්සේ සියල්ලනට ම
වඩා උතුම් ය; 32 උන් වහන්සේ තමන් ඇසූ දුටු දේ
ගැන සාක්ෂි දරන සේක. එහතේ, කිසිවකේ උන්
වහන්සේගේ සාක්ෂිය නොපිළිගනිති. 33 උන්
වහන්සේගේ සාක්ෂිය පිළිගන්නා තැනැත්තේ
දවේයන් වහන්සේ සත්‍යවාදි බව සහතික කරයි.
34 දවේයන් වහන්සේ එවා වදාළ තැනැන් වහන්සේ,
දවේයන් වහන්සේගේ වදන් පවසන සේක. එසේ
වන්නේ දවේයන් වහන්සේ ශුද්ධාත්මය සීමා රහිත
ව දානය කරන බැවිනි. 35 මතෙ 11:27; ලූක්
10:22පියාණන් වහන්සේ පුත්‍රයාණන්ට ප්‍රමේ
කරන සේක. සියල්ල උන් වහන්සේ අතට භාර දී
ඇත. 36 යමකේ පුත්‍රයාණන් අදහන්නේ ද ඔහුට
සදාතන ජීවනය ඇත. එහතේ යමකේ පුත්‍රයාණන්
ප්‍රතික්ෂපේ කරන්නේ ද ඔහුට ජීවනය නොලැබේ.
දවේ උදහස ඔහු පිට රඳා පවති යි.”

## සමාරීය ස්ත්‍රිය

4 ජේසුස් වහන්සේ ජොහන්ට වඩා ශ්‍රාවකයන්
බඳවාගනෙ බව්තීස්ම-ස්නාපනය කරති යි
පරිසිවරුන්ට සැළ විය. 2 (ඇත්ත වශයනේ උන්
වහන්සේගේ ශ්‍රාවකයන් මිස, උන් වහන්සේ ම
බව්තීස්ම-ස්නාපනය නොකළ සේක.) 3 ඒ බව
දැනගත් කල, සමිඳාණන් වහන්සේ ජුදයනේ පිට වී
යළිත් ගලීලයට වැඩම කළ සේක. 4 සමාරිය පසු
කොට යා යුතු ව තිබුණු බැවින් 5 උත් 33:19; ජෝෂු
24:32උන් වහන්සේ, ජාකොබ් තම පුත් ජෝසපේට
දුන් ඉඩම ළඟ වූ සිකාර් නම් සමාරියේ නගරයකට
පැමිණි සේක. 6 ජාකොබ්ගේ ළිඳ එහි විය. ගමන්
විඩාවනේ සිටි උන් වහන්සේ ළිඳ ළඟ හිඳගත්
සේක. එය මධ්‍යාහ්න වලේාව පමණ විය.
7 එකල, සමාරීය ස්ත්‍රියක් වතුර අදිනු පිණිස
පැමිණියා ය. “මට වතුර ටිකක් දනේනැ”යි උන්
වහන්සේ ඇයට වදාළ සේක. 8 එවලේ, උන්
වහන්සේගේ ශ්‍රාවකයෝ කෑම මිලයට ගනු පිණිස,
නගරයට ගොස් සිටියෝ ය. 9 එස්රා 4:1-5; නහෙෙ
4:1-2සමාරීය ස්ත්‍රිය ද, “ජුදවෙව්වකෙු වන ඔබ,
සමාරීය ස්ත්‍රියක වන මගනේ බොන්නට
ඉල්ලන්නේ, කසෙේ දැ”යි උන් වහන්සේගනේ ඇසුවා
ය. එසේ කීවේ, ජුදවෙව්වරුන් හා සමාරියයන් අතර
ගනුදනෙුවක් නුවූ බැවිනි. 10 ජේසුස් වහන්සේ ඇයට
පිළිතුරු දමේින්, “දවේයන් වහන්සේගේ දීමනාවත්,
‘මට වතුර ටිකක් දනේනැ’යි ඔබට කියන්නේ
කවරකේ ද කියාත් ඔබ දැන සිටියහෙි නම්, ඔබ
ඔහුගනේ ඉල්ලනු ඇත; එවිට ඔහු ජීවන ජලය ඔබට
දනෙු ඇතැ”යි වදාළ සේක.

11 ස්ත්‍රිය ද, “මහතාණෙනි, වතුර අදින්නට ඔබට
භාජනයක් නැත; ළිඳත් ගැඹුරු ය; එබැවින් ඒ ජීවන
ජලය ඔබට කොයින් ද? 12 මේ ළිඳ අපට දුන්නේ
අපේ පියා වන ජාකොබ් ය. ඔහු ද, ඔහුගේ
පුත්‍රයෝ ද ගවයෝ ද මයින් පානය කළෝ ය. ඔබ
ඔහුට වඩා උතුම් දැ?”යි විචාළා ය.
13 ජේසුස් වහන්සේ ඇයට පිළිතුරු දමේන්, “මේ
වතුර බොන හැම කෙනෙකුට ම නැවත පිපාසය
ඇති වන්නේ ය. 14 එහෙත් මා දෙන වතුර බොන
කවර කෙනෙකුට වුවත් කිසි කලෙක පිපාසය ඇති
නොවන්නේ ය. මා ඔහුට දෙන වතුර සදාතන
ජීවනය පිණිස ඔහු තුළ දිය උල්පතක් වන්නේ ය”යි
වදාළ සේක. 15 ස්ත්‍රිය කතා කරමින්,
“මහතාණෙනි, මට තවත් පිපාසය ඇති නො වන
පිණිසත්, වතුර ඇදීමට මපෙමණ දුර නැවත නොඑන
පිණිසත් ඒ වතුර මට දුන මැනවැ”යි කීවා ය.
16 ජේසුස් වහන්සේ ඈ අමතා, “යන්න, ඔබේ
ස්වාමි පුරුෂයා කැඳවාගෙන මෙහි එන්නැ”යි වදාළ
සේක. 17 ස්ත්‍රිය පිළිතුරු දමේන්, “මට ස්වාමි
පුරුෂයෙක් නැතැ”යි කීවා ය. ජේසුස් වහන්සේ ද, “
‘මට ස්වාමි පුරුෂයෙක් නැතැ’යි ඔබ කීවා හරි ය;
18 මන්ද, ඔබට පුරුෂයෝ පස් දෙනෙක් සිටියාහ; දැන්
සිටින තැනැත්තේ ඔබේ පුරුෂයා නො වේ; මේ දේ
ඔබ සැබෑ ලෙස පැවසුවෙහි ය”යි වදාළ සේක.
19 ස්ත්‍රිය උන් වහන්සේ අමතමින්, “මහතාණෙනි,
ඔබ දිවැසිවරයකු බව මට පෙනේ; අපේ පියවරු මේ
කන්ද මත නමස්කාර කළහ. 20 එහෙත්, මිනිසුන්
නමස්කාර කළ යුතු ජෙරුසලමෙහි ය යි ඔබතුමන්ලා
කියන්නහු ය”යි කීවා ය. 21 ජේසුස් වහන්සේ
පිළිතුරු දමේන්, “ස්ත්‍රිය, මා විශ්වාස කරන්න. මේ
කන්දේ දී වත්, ජෙරුසලමේ දී වත් ඔබ පියාණන්
වහන්සේට නමස්කාර නොකරන කාලයක්
පැමිණෙන්නේ ය. 22 ඔබ නමස්කාර කරන්නේ ඔබ
හරියට ම නො දන්නා කෙනෙකුට ය; අප නමස්කාර
කරන්නේ අප දන්නා කෙනෙකුට ය. මන්ද, ගැළවීම
පැමිණෙන්නේ ජුදෙව්වරුන්ගෙන් ය. 23 එහෙත්,
නමස්කාර කරන්නන්, ආත්මානුභාවයෙන් ද අවංක
සිතින් ද, පියාණන් වහන්සේට නමස්කාර කරන
කාලයක් සැබැවින් ම පැමිණෙන්නේ ය; දැනටමත්
පැමිණ ඇත. තමන් වහන්සේට නමදින පිණිස
පියාණන් වහන්සේ සොයන්නේ එවැන්නන් ය.
24 දෙවියන් වහන්සේ ආත්මය ය; උන් වහන්සේට
නමස්කාර කරන්නන් ආත්මයෙන් ද අවංක සිතින් ද
නමස්කාර කළ යුතු ය”යි වදාළ සේක.
25 ස්ත්‍රිය පිළිතුරු දමේන්; “ ‘ක්‍රිස්තුස් වහන්සේ’
ය යි කියන මසේයස් තුමාණන් එන බව දනිමි; උන්
වහන්සේ පැමිණි කල සියල්ල අපට දන්වා වදාරන
සේකැ”යි කීවා ය. 26 “මේ ඔබ සමඟ කතා කරන
මම, ඒ තැනැත්තා වමේ”යි ජේසුස් වහන්සේ වදාළ
සේක.
27 ඒ මොහොතේ දී, පැමිණි උන් වහන්සේගේ
ශ්‍රාවකයෝ උන් වහන්සේ ස්ත්‍රියක සමඟ කතා
කරනු දැක මවිත වූ හ. එහෙත් කිසිවෙක්, “ඔබ
කුමක් සොයන්නෙහි ද” කියාවත්, “ඔබ ඈ සමඟ
කතා කරන්නේ මන් ද?” කියාවත් ඇසුවේ නැත.
28 ස්ත්‍රිය ඇගේ වතුර කළය එතැන තබා, නුවරට
ගොස්, 29 “එන්න ඇවිත් බලන්න, මා කළ සියල්ල
මට කී මනුෂ්‍යයෙක් සිටියි. එතුමා ක්‍රිස්තුස් විය
නොහැකි දැ”යි සෙනඟට කීවා ය. 30 ඔව්හු නුවරින්
නික්ම ජේසුස් වහන්සේ වෙත එන්නට පටන්ගත්හ.
31 ඒ අතර ශ්‍රාවකයෝ, “ගුරුදේවයෙනි, වළඳනු
මැනවැ”යි උන් වහන්සේගෙන් අයැද සිටියෝ ය.
32 එහෙත් උන් වහන්සේ, “ඔබ නො දන්නා
භෝජනයක් වැළඳීමට මට ඇතැ”යි ඔවුන්ට වදාළ
සේක. 33 “යම් කිසිවෙක් උන් වහන්සේට ආහාර
ගෙනවුත් දුන්නේ දැ”යි එවිට ශ්‍රාවකයෝ තම
තමන් අතරේ විමසූ හ. 34 ජේසුස් වහන්සේ ඔවුන්
අමතා, “මාගේ භෝජනය නම්, මා එවූ තැනැන්
වහන්සේගේ කැමැත්ත කිරීමත්, උන් වහන්සේගේ
කාර්යය නිමාවට පත් කිරීමත් ය.
35 “තව භාරමාසයක් ගත වූ විට අස්වැන්න
පැමිණේ යයි ඔබ කියන්නේ නැද් ද? එහෙත් මම
ඔබට කියමි: බලන්න, ඔබේ ඇස් ඇර කුඹුරු
නරඹන්න; මන් ද? ඒවා දැනට ම අස්වැන්න සඳහා
පැසී ඇත. 36 ගොයම් කපන්නා කුලිය ලබා, සදාතන
ජීවනය සඳහා අස්වැන්න එකතු කරයි; එසේ
වන්නේ, වපුරන්නාත්, කපන්නාත් එක්ව ප්‍රීතිමත්
වන පිණිස ය. 37 මයෙින්, ‘එක් කෙනෙක් වපුරයි,
තව කෙනෙක් කපයි’ යන කීම සැබෑ වයෙි. 38 ඔබ
වගා නො කළ කතෙක අස්වැන්න කැපීමට මම ඔබ
යැවීමි. අන්‍යයෝ වගා කළහ. ඔබ ඔවුන්ගේ
වගාවේ ප්‍රතිඵල භුක්ති විඳින්නහු ය”යි වදාළ
සේක.
39 “මා කළ සියල්ල උන් වහන්සේ මට වදාළ
සේකැ”යි සාක්ෂි දුන් ස්ත්‍රියගේ කීම නිසා, ඒ නුවර
සමාරියයන්ගෙන් බොහෝ දෙනෙක් උන් වහන්සේ
අදහාගත්හ. 40 එබැවින් සමාරියයෝ උන් වහන්සේ
වෙතට පැමිණි කල, තමන් සමඟ නවතින ලෙස උන්
වහන්සේගෙන් ඉල්ලූ හ. උන් වහන්සේ ද දෙදෙවසක්
එහි නැවතුණ සේක.
41 තවත් බොහෝ දෙනෙක් උන් වහන්සේගේ ම
වචනය නිසා අදහාගත්තෝ ය. 42 ඔව්හු ස්ත්‍රියට
කතා කොට, “දැන් අප අදහන්නේ ඔබේ කීම නිසා
නොවේ; අප ම උන් වහන්සේගේ බස් අසා, උන්
වහන්සේ සැබැවින් ම ලෝකයේ ගැළවුම්කාරයාණන්
බව දැනගත් නිසා ය”යි කී හ.
43 ඒ දෙදෙවසට පසු, උන් වහන්සේ එතැනින් නික්ම
ගලීලයට වැඩම කළ සේක. 44 මතෙ 13:57; මාක්
6:4; ලූක් 4:24මන්ද, “ගමේ දිවැසිවරයා ගමට අගේ
නැතැ”යි කීවේ උන් වහන්සේ ම ය. 45 ජොහ
2:23එහෙත් ජෙරුසලමෙහි මංගල්‍යයේ දී උන්
වහන්සේ කළ සියල්ල දුටු බැවින්, ගලීලයෝ උන්
වහන්සේ උත්සවාකාරයෙන් හොඳින් පිළිගත්හ.

### රාජ්‍ය නිලධාරියකුගේ පුත්‍රයා සුව කිරීම
(මතෙ 8:5-13;ලූක් 7:1-10)

46 ජොහ 2:1-11 යළිත් උන් වහන්සේ ගලීලයේ
කානා නම් ගමට වැඩම කළ සේක. උන් වහන්සේ
විසින් වතුර මිදියුස බවට හරවන ලද්දේ එහි දී ය.
එකල, එහි එක්තරා රාජ්‍ය නිලධාරියකේ විය.
ඔහුගේ පුත්‍රයා රෝගාතුර ව කපර්ණවුමහෙි
සිටියේ ය. 47 ජේසුස් වහන්සේ ජුදයේ සිට
ගලීලයට වැඩම කළ බව අසා, ඔහු උන් වහන්සේ
වෙතට ගොස්, තම පුත්‍රයා මරණාසන්න ව සිටින
බැවින්, අවුත් ඔහු සුව කරන මෙන් උන්
වහන්සේගෙන් අයැද සිටියේ ය. 48 ජේසුස්
වහන්සේ, "ඔබ ලකුණු ද අරුමපුදුම දේ ද දුටුවොත්
මිස විශ්වාස නො කරන්නාහු ය"යි ඔහුට වදාළ
සේක. 49 රාජ්‍ය නිලධාරියා ද, "මහතාණනි, මාගේ
දරුවා මියයන්නට පෙර වැඩිය මැනවැ"යි අයැදී ය.
50 ජේසුස් වහන්සේ කතා කරමින්, "යන්න, ඔබගේ
පුත්‍රයා ජීවත් වන්නේ ය"යි ඔහුට වදාළ සේක. ඒ
තැනැත්තා ජේසුස් වහන්සේ වදාළ වචනය විශ්වාස
කරගෙන ගියේ ය.
51 ඔහු යන කල, ඔහුගේ දාසයෝ පෙරමඟට
අවුදින්, "ඔබගේ පුත්‍රයා ජීවත් වන්නේ ය"යි කී හ.
52 එවිට, "පුත්‍රයා සුවය ලබන්න පටන්ගත්තේ
කොයි වේලාවේ දැ"යි ඔහු ඔවුන්ගෙන් විමසී ය.
"ඊයේ පස්වරු එකට පමණ උණ බැස්සේ ය"යි ඔව්හු
කී හ. 53 "ඔබගේ පුත්‍රයා ජීවත් වන්නේ ය"යි
ජේසුස් වහන්සේ ඔහුට වදාළේ, ඒ මොහොතේ දී
යයි දැනගත් බැවින්, ඔහු ද, ඔහුගේ ගෙයි වැසි
සියල්ලෝ ද එතුමන් අදහාගත්හ.
54 මේ වනාහි, ජේසුස් වහන්සේ ජුදයේ සිට
ගලීලයට පැමිණි පසු, කළ දෙ වන දේව බල
ප්‍රකාශනය වේ.

### බෙතෙසේදා පොකුණ අසල කොරා සුව කිරීම

5 ඉන්පසු ජුදවේවරුන්ගේ මංගල්‍යයක් විය.
ජේසුස් වහන්සේ ද ජෙරුසලමට වැඩම කළ
සේක. 2 ජෙරුසලමෙහි බැටළු දොරටුව ළඟ,
හෙබ්රෙව් බසින් 'බෙතෙසේදා' යයි නම් ලත්
පොකුණක් විය. එය අවට ද්වාර මණ්ඩප පහක් විය.
3 ඒවායෙහි අන්ධ වූ ද කොර වූ ද අංශභාග වූ ද
රෝගීන් සමූහයක් ඔත්පළ ව සිටියෝ ය. 4 ඔව්හු
වතුර කැළඹෙන තෙක් බලා සිටියාහ. මන්ද,
සමිඳාණන් වහන්සේගේ දූතයෙක් කලින් කල
පොකුණට බැස වතුර කැළඹුවේ ය. වතුර කළඹනු
ලැබූ පසු එහි බට පළමුවැන්නා කවර රෝගයකින්
පෙළුණු නමුත් සුවකරනු ලැබී ය. 5 එහි තිස් අට
අවුරුද්දක් රෝගී ව සිටි එක් මිනිසෙක් විය. 6 ඒ
මිනිසා හාන්සි වී සිටිනු ජේසුස් වහන්සේ දැක, ඔහු
බොහෝ කලක් එහි සිටි බව දැන, "ඔබ සුව වීමට
කැමැති දැ"යි ඔහුගෙන් ඇසූ සේක. 7 රෝගියා උන්
වහන්සේට උත්තර දෙමින්, "ස්වාමිනි, වතුර
කැළඹෙන විට මා පොකුණට බස්වන්නට කිසිවෙක්
නැත. මා එන අතර, අන් කෙනෙක් මට පළමුවෙන්
බසින්නේ ය"යි කීවේ ය. 8 "නැඟිට ඔබේ පැදුර
රැගෙන යන්නැ"යි ජේසුස් වහන්සේ ඔහුට වදාළ
සේක. 9 එකෙණෙහි ම මිනිසා සුවපත් වී, සිය පැදුර
රැගෙන යන්නට ගියේ ය.
9 එය සබත් දවස විය. 10 නෙහෙ 13:19; ජෙරෙ
17:21එබැවින් ජුදවේවරු, "අද සබත් දවස ය, පැදුර
රැගෙන යෑම නීති විරෝධී ය"යි සුවය ලැබූ මිනිසාට
කී හ. 11 එහෙත්, ඔහු ඔවුන්ට පිළිතුරු දෙමින්, "මා
සුවපත් කළ තැනැත්තා ම 'ඔබේ පැදුර රැගෙන
යන්නැ'යි මට කීවේ ය"යි කී ය. 12 " 'පැදුර රැගෙන
යන්නැ'යි ඔබට කී මිනිසා කවරෙක් දැ"යි ඔව්හු
විමසූ හ. 13 එහෙත් සුවපත් කරනු ලැබූ මිනිසා, ඔහු
කවරෙක් දැ යි නොදත්තේ ය. මන්ද, ඒ ස්ථානයේ
සමූහයා අතරින් ජේසුස් වහන්සේ සොයාගත නො
හැකි වූ බැවිනි. 14 ඉන්පසු, ජේසුස් වහන්සේ දේව
මාලිගාවේ දී ඔහු මුණගැසී, "බලන්න, ඔබ සුවපත්
වී ඇත. මීට වඩා භයානක දෙයක් සිදු නොවන
පිණිස තවත් පව් නොකරන්නැ"යි වදාළ සේක. 15 ඒ
මිනිසා ද ගොස්, තමා සුවපත් කළේ, ජේසුස්
වහන්සේ බව ජුදවේවරුන් හට සැළ කළේ ය.
16 ජේසුස් වහන්සේ මවෙනි දේ සබත් දවසේ දී
කළ බැවින්, ජුදවේවරු උන් වහන්සේට පීඩා කළහ.
17 එහෙත්, ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්,
"මාගේ පියාණන් වහන්සේ නොනැවතී ම වැඩ
කරන සේක; මමත් වැඩකරමි"යි වදාළ සේක.
18 මේ කරුණ නිසා ජුදවේවරු උන් වහන්සේ
මරන්නට වඩ වඩා උත්සාහ දැරූ හ. මන්ද, උන්
වහන්සේ සබත කඩ කළා පමණක් නොව, "දෙවියන්
වහන්සේ තමන්ගේ ම පියාණෝ ය"යි කියමින්,
තමාත් දෙවියන් වහන්සේට සමාන යයි ප්‍රකාශ කළ
නිසා ය.

### පුත්‍රයාණන්ගේ අධිකාරිත්වය

19 ජේසුස් වහන්සේ ඔවුන්ට මෙසේ පිළිතුරු දුන්
සේක: "ඒකාන්තයෙන් ම මම ඔබට කියමි:
පුත්‍රයාණන්ට කිසිවක් තනි බලයෙන් කළ නොහැකි
ය; පියාණන් වහන්සේ යමක් කරනවා පුත්‍රයා
දකින්නේ ද, ඒ දෙය මිස තනි ව ම කිසිවක්
කරන්නට උන් වහන්සේට නො හැකි ය. මන්ද, උන්
වහන්සේ යම් දෙයක් කරන සේක් ද, ඒ දෙය
පුත්‍රයාණෝ ද එසේ ම කරන සේක. 20 මන්ද,
පියාණන් වහන්සේ පුත්‍රයාණන්ට ප්‍රේම කරන
බැවින්, තමන් වහන්සේ කරන සියලු ක්‍රියා උන්
වහන්සේට දක්වා වදාරන සේක. තවද, ඔබ මවිත
කරවන සුලු, මීටත් වඩා මහත් ක්‍රියා ද දක්වා
වදාරන සේක. 21 පියාණන් වහන්සේ මළවුන්
උත්ථාන කොට ජීවත් කරවන්නාක් මෙන්,
පුත්‍රයාණෝ ද තමන්ට අභිමත වූවන් ජීවත් කරවන
සේක. 22 සැබැවින් ම පියාණන් වහන්සේ කිසිවකු
විනිශ්චය නොකරන සේක. සම්පූර්ණ විනිශ්චය
පුත්‍රයාණන් හට පවරා ඇත. 23 එසේ කළේ,
සියලු දෙනා පියාණන්ට මෙන් ම පුත්‍රයාණන්ට ද

ගෞරව කරන පිණිස ය. පුත්රයාණන්ට ගෞරව
නොකරන්නා, පුත්රයාණන් එවා වදාළ පියාණන්ට ද
ගෞරව නොකරන්නේ ය.
24 “ඒකාන්තයෙන් මම ඔබට කියමි: මාගේ වචනය
අසා, මා එවා වදාළ තැනැන් වහන්සේ අදහාගන්නාට
සදාතන ජීවනය ඇත; ඔහු විනිශ්චයට
නොපැමිණයයි; ඔහු මරණයෙන් ජීවනයට පැමිණ
සිටියි. 25 ඒකාන්තයෙන් මම ඔබට කියමි: දේව
පුත්රයාණන්ගේ හඬ මළවුන් හට ඇසෙන පැය
පැමිණෙන්නේ ය; දැනට ම පැමිණ ඇත; සවන් දෙන
අය ජීවත් වෙති. 26 පියාණන් වහන්සේට තමන් තුළ
ම ජීවනය තිබෙන්නාක් මෙන් ම, පුත්රයාණන්ටත්
තමන් තුළ ජීවනය ඇති ව සිටින්නට උන් වහන්සේ
වරය දුන් සේක. 27 තවද, උන් වහන්සේ මනුෂ්ය-
පුත්රයාණන් වන බැවින් විනිශ්චය කිරීමේ අධිකාරි
බලය ද උන් වහන්සේට දවො වදාළ සේක. 28 මේ
ගැන මවිත නොවන්න; මන්ද, සොහොන්ගත
සියල්ලන්ට උන් වහන්සේගේ හඬ ඇසෙන පැය
පැමිණෙන්නේ ය. 29 දානි 12:2එවිට, යහපත කළ
අය සදාතන ජීවනය සඳහා උත්ථාන කරනු ලබති;
අයහපත කළ අය විනිශ්චය සඳහා උත්ථාන කරනු
ලබති.
30 “මාගේ තනි බලයෙන් මට කිසිත් කළ නො
හැකි ය. අණ ලත් පරිද්දෙන් ම මම විනිශ්චය කරමි.
මාගේ විනිශ්චය සාධාරණ ය. මන්ද, මාගේ අරමුණ,
මාගේ ම කැමැත්ත ඉටු කිරීම නොව, මා එවා වදාළ
උන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීම ය.”

## දේව පුත්රයාණන් පිළිබඳ සාක්ෂි

31 “මම, මා ගැන ම සාක්ෂි දෙන්නෙමේ නම්, මාගේ
සාක්ෂිය සැබෑ නොවේ. 32 එහෙත්, මා ගැන සාක්ෂි
දරන වෙන කෙනෙක් වෙති. උන් වහන්සේ මා ගැන
දරන සාක්ෂිය සැබෑ බව මම දනිමි. 33 ජොහ
1:19-27; 3:27-30ඔබ ජොහන් වෙත මිනිසුන් යැව්වහු
ය. ඔහු සත්යය පිළිබඳ සාක්ෂිය දරා ඇත.
34 එහෙත්, මා මේ දේ ඔබට කියන්නේ,
මිනිසාගෙන් සාක්ෂියක් ලබන පිණිස නොව, ඔබ
ගැළවීම ලබන පිණිස ය. 35 ජොහන් වනාහි, දිළෙන,
බැබළෙන පහනක් විය. ඔබ කලක් ඔහුගේ
ආලෝකයෙහි ප්රමුදිත වන්නට කැමැති වූවහු ය.
36 එහෙත් මට ඇති සාක්ෂිය ජොහන්ගේ සාක්ෂියට
වඩා උතුම් එකකි. මන්ද, මා විසින් පරිපූර්ණ කරනු
ලබන පිණිස පියාණන් වහන්සේ මට පැවරූ කටයුතු,
එනම්, මා කරන කටයුතු ම, පියාණන් වහන්සේ මා
එවා වදාළ බවට සාක්ෂි වෙයි. 37 මත 3:17; මාක්
1:11; ලූක් 3:22තවද, මා එවා වදාළ පියාණන්
වහන්සේ ම මා පිළිබඳව සාක්ෂි දරා ඇත. උන්
වහන්සේගේ හඬ කිසි කලෙක ඔබ අසා නැත.
ස්වරූපය ද දැක නැත. 38 තවද, උන් වහන්සේගේ
වචනය ඔබ තුළ නිදන්ගත වී නැත. මන්ද, ඔබ උන්
වහන්සේ එවා වදාළ තැනැන් වහන්සේ විශ්වාස
නොකරන බැවිනි. 39 ඔබ ශුද්ධ ලියවිල්ල
හදාරන්නහු ය. එසේ කරන්නේ, ඒවායෙහි ඔබට
සදාතන ජීවනය ඇතැ යි ඔබ සිතන බැවිනි. ඒවා ම
මා ගැන සාක්ෂි දරන්නේ ය. 40 එහෙත්, ජීවනය
ලබන පිණිස මා වෙතට එන්නට ඔබ කැමැති
නොවන්නහු ය.
41 “මම මිනිසුන්ගෙන් ගෞරවය නොසොයමි.
42 එහෙත් මම ඔබ හොඳින් අඳුනමි. ඔබ තුළ
දෙවියන් වහන්සේගේ ප්රේමය නොමැති බව මම
දනිමි. 43 මම මාගේ පියාණන් වහන්සේගේ
නාමයෙන් පැමිණියෙමි. එහෙත්, ඔබ මා
නොපිළිගන්නහු ය. වෙන තැනැත්තෙකු තමාගේ ම
නාමයෙන් පැමිණියහොත්, ඔබ ඔහු පිළිගනු ඇත.
44 එක ම දෙවියන් වහන්සේගේ ගෞරවය
නොසොයන, එකිනෙකාගෙන් ගෞරව ලබන්නට
ප්රිය කරන ඔබ, අදහාගන්නේ කෙසේ ද? 45 ඔබට
විරුද්ධ ව මම පියාණන් වහන්සේට චෝදනා
කරන්නෙමි යි නො සිතන්න. ඔබට විරුද්ධ ව
චෝදනා කරන්නෙක් ඇත; එනම්, මෝසෙස් ය. ඔබේ
බලාපොරොත්තුව ඔබ තබා ඇත්තේ ඔහු පිට ය.
46 ඔබ මෝසෙස් විශ්වාස කළාහු නම්, මා ද විශ්වාස
කරන්නහු ය. මන්ද, මෝසෙස් මා ගැන ලියූ බැවිනි.
47 ඔබ මෝසෙස්ගේ ලියවිලි විශ්වාස නොකරන්නහු
නම්, මාගේ වචන විශ්වාස කරන්නේ කෙසේ ද?”

## පන්දහසකට කෑම

(මතෙ 14:13-21;මාක් 6:30-44;ලූක් 9:10-17)

6 ඉන්පසු ජේසුස් වහන්සේ ගලීල මුහුදෙන්,
හෙවත් තිබේරියස් මුහුදෙන් එගොඩට වැඩම
කළ සේක. 2 උන් වහන්සේ රෝගීන් සුව කරමින්
කළ හාස්කම් දුටු බැවින් මහා සමූහයක් උන්
වහන්සේ පසුපස්සේ ගියහ. 3 එවිට ජේසුස්
වහන්සේ කන්දකට නැඟී තමන්ගේ ශ්රාවකයන්
සමඟ එහි වැඩහුන් සේක. 4 ජුදෙව්වරුන්ගේ
මංගල්යය වූ පාස්කුව ළං ව තිබිණි. 5 ජේසුස්
වහන්සේ ඇස් ඔසවා බැලූ කල, තමන් ළඟට මහා
සමූහයක් ඇදී එනු දැක, “මොවුන් හැම දෙනාට ම
කන්නට දීමට අපි කොතැනින් රොටි මිලේට ගනිමු
දැ”යි පිලිප්ගෙන් ඇසූ සේක. 6 උන් වහන්සේ මෙසේ
වදාළේ ඔහු පරීක්ෂා කරන පිණිස ය. මන්ද, තමන්
කරන්න යන්නේ කුමක් දැ යි උන් වහන්සේ ම දැන
සිටි බැවිනි. 7 පිලිප් පිළිතුරු දෙමින්, “එකිනෙකාට
ටික ටිකවත් දීමට රිදී කාසි දෙසියයක රොටි වුවත්
නොසෑහේ ය”යි කී ය. 8 ශ්රාවකයන්ගෙන් එක්
කෙනෙක් වූ සීමොන් පේදුරුගේ සොහොයුරු ඇන්ඩෘ
උන් වහන්සේ අමතා, 9 “යව රොටි පහක් ද මසුන්
දදෙනෙකු ද ඇති කොලුවෙක් මෙහි සිටියි. එහෙත්
මෙපමණ දෙනෙකුන්ට එයින් කුමන පලක් දැ”යි ඇසී
ය. 10 “මිනිසුන් හිඳුවන්නැ”යි ජේසුස් වහන්සේ වදාළ
සේක. එතැන බොහෝ තණකොළ විය. ගණනින්
පන්දහසක් පමණ පිරිමි එහි හිඳගත්හ. 11 එවිට
ජේසුස් වහන්සේ රොටි ගෙන තුති පුදා, හිඳගෙන
සිටි අයට බෙදා දුන් සේක. එලෙසෙ ම මසුන්ගෙන් ද
දුන් සේක. සියල්ලන්ට කැමැති තරම් කෑම ලැබුණේ
ය. 12 ඔවුන් කා තෘප්තියට පැමිණි පසු, උන්
වහන්සේ සිය ශ්රාවකයන් අමතා, “කිසිවක් නාස්ති

නොවන ලෙස කැබලි එකතු කර ගන්නැ"යි වදාළ
සේක. 13 මෙසේ කෑම වැළඳූ අය, යව රොටි පහනේ
ඉතිරි කළ කැබලි එකතු කොට මලු දොළසක්
පුරවාගන්නා ලදී.
14 සමූහයා මේ හාස්කම දුටු කල "සැබෑවට ම
මනුෂ්‍යයා ලොවට වඩින්නට සිටින
දිවැසිවරයාණෝ ය"යි කී හ. 15 තමන්
බලහත්කාරයෙන් අල්ලාගෙන, රජකමට පත්
කරන්නට ඔවුන් සැරසෙන බව ජේසුස් වහන්සේ
දැනගෙන, නැවත තනියම කන්දට වැඩිය සේක.

### මුහුද මත ඇවිදීම

(මතෙ 14:22-33;මාක් 6:45-52)

16 සවස් වූ කල, උන් වහන්සේගේ ශ්‍රාවකයෝ
මුහුදට ගොස්, 17 ඔරුවට නැඟී මුහුදෙන් එතරෙ
කපර්ණවුමට යන්නට පිටත් වූ හ. රෑ බෝ වී තිබුණ
නමුත්, ජේසුස් වහන්සේ ඒ තාක් ඔවුන් වෙත නො
පැමිණි සේක. 18 තද සුළඟක් හැමූ බැවින් මුහුද
කැළඹිණි. 19 ඔව්හු කිලෝමීටර් පහක් පමණ ඔරුව
පැදගෙන ගිය කල, ජේසුස් වහන්සේ මුහුද මත
ඇවිදිමින් ඔරුව ළඟට වඩින බව දැක බියපත් වූ හ.
20 එහෙත්, උන් වහන්සේ ඔවුන් අමතා, "මේ මම
ය, බිය නො වන්නැ"යි වදාළ සේක. 21 ඔව්හු උන්
වහන්සේ ඔරුවට පිළිගන්නට සතුටු වූ හ.
එකෙණෙහි ම ඔරුව ඔවුන් යමින් සිටි රටට
පැමිණියේ ය.

### ජීවනදායක ආහාරය

22 පසු දින උදේ මුහුදෙන් එගොඩ සිටි සමූහයා,
එහි තිබුණේ එක ම ඔරුවක් පමණක් බවත්,
ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් සමඟ එයට නො
නැඟුණු බවත්, ශ්‍රාවක පිරිස පමණක් එයට නැඟී
ගිය බවත් දැක සිටියහ. 23 කෙසේ වුව ද,
සමිඳාණන් වහන්සේ තුති පිදූ පසු රොටි වළඳන ලද
ස්ථානය සමීපයට තිබේරියස් සිට ඔරු පැමිණියේ ය.
24 ජේසුස් වහන්සේ වත්, ශ්‍රාවකයන් වත් එහි
නො සිටි බව සමූහයා දුටු කල, ඔව්හු ඒ ඔරුවලට
නැඟී ජේසුස් වහන්සේ සොයමින් කපර්ණවුමට
පැමිණියාහ.
25 මුහුදෙන් එගොඩ දී උන් වහන්සේ හමු වී,
"ගුරුදේවයෙනි, ඔබ මෙහි වැඩියේ කොයි වේලේ
දැ"යි ඔව්හු ඇසූ හ. 26 ජේසුස් වහන්සේ පිළිතුරු
දෙමින්, "ඒකාන්තයෙන් මම ඔබට කියමි, ඔබ මා
සොයන්නේ හාස්කම් දුටු නිසා නොව, රොටි කා
තෘප්තියට පැමිණි නිසා ය. 27 නැති වී යන ආහාරය
සඳහා නොව, සදාතන ජීවනයට ඉවහල් වන
ආහාරය සඳහා වීර්ය වඩන්න. මේ ආහාරය ඔබට
ප්‍රදානය කරන්නේ මනුෂ්‍ය-පුත්‍රයාණෝ ය.
පියාණන් වන දෙවියන් වහන්සේ මුද්‍රාව තබා
ඇත්තේ උන් වහන්සේ මත ය"යි වදාළ සේක.
28 එබැවින් ඔව්හු, "දෙවියන් වහන්සේගේ අභිප්‍රාය
අනුව වැඩ කරන පිණිස අප කුමක් කටයුතු දැ"යි
ඇසූ හ. 29 ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්,
"දෙවියන් වහන්සේගේ අභිප්‍රාය වනුයේ, උන්
වහන්සේ එවා වදාළ තැනැත්තාණන් ඔබ විසින්
අදහාගැනීම ය"යි වදාළ සේක.
30 එවිට ඔව්හු, "එසේ නම්, අප විසින් දැක
අදහාගන්නා පිණිස ඔබ කවර හාස්කමක් දක්වන
සේක් ද? කවර ක්‍රියාවක් කරන සේක් ද? 31 නික්ම
16:4,15; ගීතා 78:24අපේ පියවරු පාළුකරයෙහි දී
මන්නා කෑහ. 'බුදින පිණිස එතුමෝ ඔවුන්ට
ස්වර්ගයෙන් ආහාර සැපයූහ'යි ලියා ඇතැ"යි උන්
වහන්සේට කී හ. 32 එවිට ජේසුස් වහන්සේ,
"ඒකාන්තයෙන් මම ඔබට කියමි, ස්වර්ගයෙන් ඔබට
ආහාරය දුන්නේ මෝසෙස් නොවේ; ස්වර්ගයෙන්
සැබෑ ආහාරය දෙන්නේ මාගේ පියාණන් වහන්සේ
ය. 33 මන්ද, දෙවියන් වහන්සේ දෙන ආහාරය
වනාහි, ස්වර්ගයෙන් පහළ වී ලෝකයට ජීවනය
දෙන ආහාර ය"යි වදාළ සේක. 34 ඔව්හු ද,
"ස්වාමීනි, ඒ ආහාරය නිතර ම අපට දුන මැනවැ"යි
කී හ.
35 ජේසුස් වහන්සේ කතා කොට, "ජීවනදායක
ආහාරය මම ය, මා වෙත පැමිණෙන යමෙක් වේ ද,
ඔහුට සාගිනි නොවන්නේ ය. මා අදහන යමෙක්
වේ ද, ඔහුට කිසි කලෙකත් පිපාසය නොවන්නේ ය.
36 එහෙත් මා කී ලෙස ම, ඔබ මා දුටු නමුත් මා
නොඅදහන්නහු ය. 37 පියාණන් වහන්සේ මට දෙන
සියල්ලෝ ම මා වෙතට පැමිණෙති; මා වෙතට
පැමිණෙන්නා මම කිසි සේත් ඉවත නොදමමි. 38 මා
ස්වර්ගයෙන් පහළ වූයේ මාගේ ම කැමැත්ත කරන
පිණිස නොව, මා එවා වදාළ තැනැන් වහන්සේගේ
කැමැත්ත කරන පිණිස ය. 39 මා එවා වදාළ උන්
වහන්සේගේ කැමැත්ත නම්, උන් වහන්සේ මට දුන්
සියල්ලන්ගෙන් එක් කෙනෙකු වත් නැති වන්නට
නෑර, සියල්ලන් ම අන්තිම දවසේ දී මා විසින්
උත්ථාන කරනු ලැබීම ය. 40 පුත්‍රයාණන් වහන්සේ
දැක උන් වහන්සේ අදහාගන්නා හැම කෙනෙකු ම
සදාතන ජීවනය ලැබීම මාගේ පියාණන්
වහන්සේගේ කැමැත්ත ය. මම ද අන්තිම දවසේ දී
ඔවුන් උත්ථාන කරන්නෙමි"යි වදාළ සේක.
41 එවිට, 'ස්වර්ගයෙන් පහළ වූ ආහාරය මම ය'යි
උන් වහන්සේ වදාළ බැවින්, ජුදෙව්වරු උන් වහන්සේ
ගැන මැසිවිලි කියමින්, 42 "මොහු ජෝසෙප්ගේ පුත්
ජේසුස් නොවේ ද? අප මොහුගේ මව ද පියා ද
අඳුනන්නේ නැද් ද? 'මම ස්වර්ගයෙන් බැස්සෙමි'යි
ඔහු දැන් කියන්නේ කෙසේ දැ"යි කී හ. 43 ජේසුස්
වහන්සේ ඔවුන් අමතමින්, "ඔබ අතරෙහි මැසිවිලි
නොදොඩන්න. 44 මා එවා වදාළ පියාණන් වහන්සේ
තමන් වෙත ඇද ගන්නා අයකුට මිස, අන්
කිසිවකුට මා වෙතට පැමිණිය නොහැකි ය. මම
අන්තිම දවසේ දී ඔහු උත්ථාන කරන්නෙමි. 45 යෙසා
54:13'සියල්ලෝ ම දෙවියන් වහන්සේ විසින්
උගන්වනු ලබති'යි දිවැසාවලියෙහි ලියා ඇත.
දෙවියන් වහන්සේට සවන් දී, උන් වහන්සේගෙන්
ඉගෙනගත් සියල්ලෝ ම මා වෙත එති. 46 දෙවියන්
වහන්සේ වෙතින් පැමිණි තැනැන් වහන්සේ හැර,
අන් කිසිවකු දෙවියන් වහන්සේ දැක ඇතැ යි

මෙයින් අදහස් නොකෙරෙමි, උන් වහන්සේ පමණක්
පියාණන් වහන්සේ දැක ඇත. 47 ඒකාන්තයෙන් ම
මම ඔබට කියමි, අදහන්නාට සදාතන ජීවනය ඇත.
48 ජීවනදායක ආහාරය මම ය. 49 ඔබේ පියවරු
කාන්තාරයේ දී මන්නා කෑහ; එහෙත් ඔව්හු
මියගියහ. 50 මෙය වනාහි, ස්වර්ගයෙන් බැස එන
ආහාරය බැවින් එයින් පෝෂණය වන කිසිදු
මිනිසෙක් නො මැරෙන්නේ ය. 51 ස්වර්ගයෙන් පහළ
වන ජීවනදායක ආහාරය මම ය. යමෙක් මේ
ආහාරයෙන් වැළඳුවොත්, ඔහු සදහට ම ජීවත්
වන්නේ ය. මා විසින් දෙනු ලබන ඒ ආහාරය මාගේ
මාංසය වේ. මා එය දෙන්නේ ලෝකයාගේ ජීවනය
පිණිස ය”යි වදාළ සේක.
52 එවිට ජුදෙව්වරු ඔවුනොවුන් අතර විවාද
කරමින්, “මේ මිනිසා, ඔහුගේ මාංසය අනුභව කරන
පිණිස අපට දෙන්නේ කෙසේ දැ”යි කී හ.
53 එබැවින් ජේසුස් වහන්සේ ඔවුන් මෙසේ ඇමතූ
සේක: “ඒකාන්තයෙන් මම ඔබට කියමි, ඔබ
මනුෂ්‍ය-පුත්‍රයාණන්ගේ මාංසය අනුභව
නොකරන්නහු නම්, ඔහුගේ රුධිරය පානය
නොකරන්නහු නම්, ඔබ තුළ ජීවනය නැත.
54 යමෙක් මාගේ මාංසය අනුභව කරන්නේ ද,
මාගේ රුධිරය පානය කරන්නේ ද, ඔහුට සදාතන
ජීවනය ඇත. තවද, මම ඔහු අන්තිම දවසේ දී
උත්ථාන කරන්නෙමි. 55 මන්ද, මාගේ මාංසය සැබෑ
ආහාරය වේ; මාගේ රුධිරය සැබෑ පානය වේ.
56 මාගේ මාංසය අනුභව කරන, මාගේ රුධිරය
පානය කරන තැනැත්තේ මා තුළ ජීවත් වන්නේ ය;
මම ද ඔහු තුළ ජීවත් වන්නෙමි. 57 ජීවමාන
පියාණන් වහන්සේ මා එවා වදාළ බැවින්, මා
පියාණන් වහන්සේ නිසා ජීවත් වන ලෙස ම, මා
අනුභව කරන තැනැත්තේ, මා නිසා ජීවත් වෙයි.
58 මේ වනාහි ස්වර්ගයෙන් පහළ වූ ආහාරය වේ.
එය අපේ පියවරුන් වැළඳූ ආහාර මෙන් නොවේ. ඒ
ආහාරය වැළඳූ ඔව්හු මළහ. එහෙත්, මේ ආහාරය
වළඳන තැනැත්තේ සදහට ම ජීවත් වන්නේ ය.”
59 උන් වහන්සේ කපර්ණවුමේ ධර්මශාලාවෙහි
උගන්වමින් සිටිය දී මේ සියල්ල වදාළ සේක.

## සදාතන ජීවනය පිළිබඳ කියුම්

60 එය ඇසූ විට, උන් වහන්සේගේ ශ්‍රාවකයෝ
බොහෝ දෙනෙක් “මෙය දරාගන්නට බැරි කීමකි,
එතුමාණන්ට සවන් දී සිටිය හැක්කේ කාට දැ”යි
තමන් අතරේ කතා කරගත්හ. 61 ශ්‍රාවකයන්
මෙසේ මැසිවිලි කියන බව ජේසුස් වහන්සේ
දිවැසින් දැන ඔවුන් අමතා, “මෙය ඔබට අධෛර්යයට
පත්වීමට හේතුවක් ද? 62 එසේ නම්, මනුෂ්‍ය-
පුත්‍රයාණන් පෙර සිටි තැනට නඟිනු බව ඔබ
දුටුවොත් කෙසේ ද? 63 ජීවනය දෙන්නේ ආත්මය
වේ. මාංසයෙන් කිසි ප්‍රයෝජනයක් නැත. මා ඔබට
වදාළ වචන ආත්මය ද ජීවනය ද වෙයි. 64 එහෙත්
නොඅදහන සමහරෙක් ඔබ අතරෙහි සිටිති”යි වදාළ
සේක. එසේ වදාළේ, නොඅදහන්නෝ කවුරු ද
කියාත්, තමන් වහන්සේ පාවා දෙන්නට යන්නේ
කවරෙක් ද කියාත්, ජේසුස් වහන්සේ මුල සිට ම
දැනගෙන සිටි බැවිනි. 65 එහෙයින් උන් වහන්සේ
ඔවුන් අමතා, “මාගේ පියාණන් වහන්සේගෙන් වරය
ලැබූ කෙනෙකුට මිස, අන් කිසිවෙකුට මා වෙතට
පැමිණිය නො හැකි බව මා කීවේ ඒ නිසා ය”යි
වදාළ සේක.
66 මේ නිසා එවක් පටන් උන් වහන්සේගේ
ශ්‍රාවකයන්ගෙන් බොහෝ දෙනෙක් පසුබට වී,
තවත් උන් වහන්සේ අනුව නොගියහ.

## පේදුරුගේ ඇදහිල්ල

67 ජේසුස් වහන්සේ දොළොස් දෙනා අමතා,
“ඔබත් ඉවත් ව යන්නට සිතන්නහු දැ”යි ඇසූ සේක.
68 මතෙ 16:16; මාක් 8:29; ලූක් 9:20සීමොන් පේදුරු
පිළිතුරු දෙමින්, “ස්වාමීනි, අප කවරකු වෙතට
යන්න ද? සදාතන ජීවනයේ වචන ඇත්තේ ඔබ
වහන්සේ වෙත ය. 69 ඔබ දෙවියන් වහන්සේගේ
ශුද්ධවරයාණන් වහන්සේ බව අපි අදහමු. එසේ ම
ඒ බව දනිමු”යි කී ය. 70 ජේසුස් වහන්සේ කතා
කොට, “ඔබ දොළොස් දෙනා තෝරාගත්තේ මම
නොවෙමි ද? ඒ නමුත් ඔබෙන් එක් කෙනෙක්
යක්ෂයෙක් ය”යි වදාළ සේක. 71 එසේ වදාළේ,
සීමොන් ඉස්කාරියොත්ගේ පුත්‍ර වූ ජූදස් ගැන ය.
ජේසුස් වහන්සේ පාවා දෙන්නට සිටියේ දොළොස්
දෙනාගෙන් එක් කෙනෙක් වූ ඔහු ය.

## සහෝදරයන්ගේ අවිශ්වාසය

7 ඉන්පසු ජේසුස් වහන්සේ ගලීලයේ
සැරිසරමින් සිටි සේක. ජුදෙව්වරුන් තමන්
මරන්නට සෙවූ බැවින්, උන් වහන්සේ ජුදයෙහි
සැරිසරන්ට නොකැමැති වූ සේක. 2 ලෙවී 23:34;
ද්වි.නී. 16:13එකල ජුදෙව්වරුන්ගේ කූඩාරම්
මංගල්‍යය ළං ව තිබිණි. 3 එබැවින් උන්
වහන්සේගේ සහෝදරයෝ කතා කොට, “ඔබ කරන
ක්‍රියා ඔබේ ශ්‍රාවකයන් ද දකින පිණිස මෙතැනින්
පිටත් ව ජුදයට යන්න. 4 එසේ කියන්නේ, ප්‍රසිද්ධ
වන්නට කැමැති කිසිවෙකු රහසින් කිසිත් නොකරන
බැවිනි. ඔබ මේ දේවල් කරන්නෙහි නම්, ලෝකයාට
ප්‍රකාශ වුව මැනවැ”යි කී හ. 5 මන්ද, සිය
සහෝදරයෝ පවා උන් වහන්සේ අදහාගත්තේ
නැත. 6 ජේසුස් වහන්සේ ඔවුන් අමතා, “මගේ
නියමිත මොහොත තව ම පැමිණ නැත. එහෙත්
ඔබට නම් කොයි වේලාවත් සුදුසු ය. 7 ඔබට
ද්වේෂ කරන්නට ලෝකයාට නොහැකි ය. එහෙත්,
ලෝකයා මට ද්වේෂ කරති. මන්ද, ‘ලෝකයාගේ
ක්‍රියා නපුරු ය’යි මා සාක්ෂි දරන බැවිනි. 8 ඔබ
කැමැති නම් මංගල්‍යයට යන්න. මාගේ නියමිත
මොහොත තව ම පැමිණ නැති බැවින් මම නම්
නොයෙමි”යි වදාළ සේක. 9 උන් වහන්සේ මෙසේ
වදාරා ගලීලයෙහි ම නැවතී සිටි සේක.

### ජේසුස් වහන්සේ කූඩාරම් මංගල්‍යයට යාම

10 එහෙත්, තමන්ගේ සහෝදරයන් මංගල්‍යයට
ගිය පසු, උන් වහන්සේ ද ප්‍රසිද්ධියේ නොව,
රහසින් මංගල්‍යයට වැඩිය සේක. 11 එකල
ජුදෙව්වරු මංගල්‍යයේ දී උන් වහන්සේ සොය
සොයා “ඔහු කොහේ දැ”යි විමසූ හ. 12 සමූහයා
අතර උන් වහන්සේ ගැන මහා කසුකුසුවක් ඇති
විය. සමහරුන් “උන් වහන්සේ සත්පුරුෂයකැ”යි කී
අතර, සමහරු, “එසේ නොවේ, ඔහු මහජනයා මුළා
කරතී”යි කී හ. 13 එහෙත්, ජුදෙව්වරුන්ට බියෙන්
කිසිවෙක් උන් වහන්සේ ගැන එළිපිට කතා
නොකළහ.
14 මංගල්‍යයේ මැද හරියේ දී ජේසුස් වහන්සේ
දේව මාලිගාවට වැඩම කර අනුශාසනා කරන්නට
පටන්ගත් සේක. 15 ඒ ගැන ජුදෙව්වරු මවිත ව
“කිසිකලෙක ඉගෙන නොගත් මේ මිනිසාට මේ සා
උගත්කමක් කොයින් දැ”යි කී හ. 16 එහෙයින්
ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, “මාගේ ඉගැන්වීම
මාගේ ම නොව, මා එවා වදාළ තැනැන්
වහන්සේගේ ය. 17 යමෙක් දෙවියන් වහන්සේගේ
කැමැත්ත කරන්නට කැමැති වන්නේ නම්, ඔහු ඒ
ඉගැන්වීම දෙවියන් වහන්සේගෙන් වූවක් ද
නැතහොත් මාගෙන් ම වූවක් දැ යි දැනගන්නේ ය.
18 තමාගේ ම අධිකාරී බලයෙන් අදහස් පවසන
තැනැත්තේ තමාගේ ම ගෞරවය සොයන්නෙකි.
එහෙත්, තමන් එවා වදාළ තැනැන් වහන්සේගේ
ගෞරවය සොයන්නා අවංක තැනැත්තෙකි. වංක
බවක් ඔහු තුළ නැත.
19 “මෝසෙස් ඔබට ව්‍යවස්ථාවලිය දුන්නා නොවේ
ද? එහෙත් ඔබගෙන් කිසිවෙක් ව්‍යවස්ථාවලිය
නොපිළිපදිති. ඔබ මා මරන්නට සොයන්නේ
මන්දැ”යි ඇසූ සේක. 20 සෙනඟ පිළිතුරු දෙමින්,
“ඔබට දුෂ්ටාත්මයක් වැහී සිටියි; ඔබව මරන්න
සොයන්නේ කවරෙක් දැ”යි ඇසූ හ. 21 ජේසුස්
වහන්සේ පිළිතුරු දෙමින්, “මම එක් ක්‍රියාවක් සබත්
දවසේ දී කළෙමි; ඊට ඔබ සියල්ලෝ ම තවමත්
මවිත වී සිටිති. 22 උත් 17:10; ලෙවී 12:3මෝසෙස්
චර්මඡේදන නීතිය ඔබට දී ඇත. (එය
මෝසෙස්ගෙන් පැවත එන්නක් නොව, පියවරුන්ගෙන්
පැවත එන්නකි). එහෙත්, ඔබ සබත් දවසේ වුව ද
චර්මඡේදනය කරන්නහු ය. 23 ජොහ 5:9ඉදින්,
මෝසෙස්ගේ ව්‍යවස්ථාව කඩ නො වන පරිදි,
මිනිසෙක් සබත් දවසේ දී චර්මඡේදනය ලබන්නේ
නම්, සබත් දවසේ දී මා මිනිසෙකු සම්පූර්ණයෙන් ම
සුවපත් කළ බැවින්, ඔබ කෝප වන්නේ මන් ද?
24 බැලූ බැල්මට විනිශ්චය නොකරන්න; සාධාරණ
විනිශ්චයක් ම කරන්නැ”යි වදාළ සේක.

### මොහු ක්‍රිස්තුවරයාණෝ ද?

25 එබැවින්, ජෙරුසලම් වැසි ඇතැමෙක්, “ඔවුන්
මරන්නට සොයන්නේ මේ මිනිසා නොවේ ද?
26 එසේ වුව ද ඔහු එළිපිට ම කතා කරයි. එහෙත්,
ඔව්හු කිසිවක් ඔහුට නොකියති. මේ
ක්‍රිස්තුවරයාණන් බව ප්‍රධානීන් දැන සිටිනවා විය
හැකි ද? 27 කෙසේ වෙතත්, මොහු පැමිණියේ
කොහෙන් දැ යි අපි දනිමු. එහෙත් ක්‍රිස්තුවරයාණන්
පැමිණි විට උන් වහන්සේ කොතැනින් වඩින සේක්
දැ යි කිසිවෙක් දැන නොගනිති”යි කී හ.
28 එවිට ජේසුස් වහන්සේ දේව මාලිගාවේ දී
හඬනගා අනුශාසනා කරමින් මෙසේ වදාළ සේක:
“ඔබ සැම මා දන්නහු ය, මා පැමිණියේ කොතැනින්
ද කියාත් දන්නහු ය. එහෙත් මා පැමිණියේ, මාගේ
ම කැමැත්තෙන් නොවේ. මා එවා වදාළේ සත්‍යය ම
වන තැනැන් වහන්සේ ය. ඔබ උන් වහන්සේ
නොදන්නහු ය. 29 එහෙත් මම උන් වහන්සේ දනිමි;
කුමක් හෙයින් ද, මම උන් වහන්සේ කෙරෙන්
පැමිණියෙමි; මා එවා වදාළේ උන් වහන්සේ ය.”
30 මෙසේ වදාළ විට, ඔව්හු උන් වහන්සේ
අල්ලාගන්නට උත්සාහ කළහ. ඒ නමුත්, උන්
වහන්සේගේ නියමිත මොහොත නොපැමිණි බැවින්
කිසිවෙක් උන් වහන්සේ පිට අත් නොතැබූ හ.
31 එසේ වුව ද, සෙනඟගෙන් බොහෝ දෙනෙක් උන්
වහන්සේ අදහාගෙන, “ක්‍රිස්තුවරයාණන් වැඩම කළ
විට, මේ මිනිසා කර ඇති හාස්කම්වලට වඩා යමක්
එතුමාණන් කරනු ඇද්දැ”යි ඇසූ හ.

### ජේසුස් වහන්සේ අල්ලාගැනීමට මුර සේවකයන් යැවීම

32 සමූහයා උන් වහන්සේ ගැන මේ දේ කියමින්
කෙඳුරනු ඇසූ පරිසිවරු ද නායක පූජකයෝ ද උන්
වහන්සේ අල්ලාගන්නට මුර සේවකයන් යැවූ හ.
33 ජේසුස් වහන්සේ ඔවුන් අමතා, “තව ටික කලක්
මම ඔබ සමඟ සිටිමි; ඉන්පසු මා එවා වදාළ
තැනැන් වහන්සේ වෙතට යමි. 34 ඔබ මා
සොයන්නහු ය; එහෙත් ඔබට මා සම්බ වන්නේ
නැත. ඔබට මා සිටින තැනට පැමිණිය නොහැකි
ය”යි වදාළ සේක. 35 එබැවින් ජුදෙව්වරු ඔවුනොවුන්
අතර කතා කරමින්, “මොහු අපට සම්බ නොවන
පරිදි, කොතැනට යන්නේ ද? ග්‍රීකයන් අතර විසිර
සිටින ජුදෙව්වරුන් වෙත ගොස් ග්‍රීකයන්ට උගන්වනු
ඇද් ද? 36 ‘ඔබ මා සොයන්නහු ය, එහෙත් ඔබට මා
සම්බ වන්නේ නැත; ඔබට මා සිටින තැනට
පැමිණිය නොහැකි ය’යි ඔහු කී කියමනේ තේරුම
කුමක් දැ”යි ඇසූ හ.

### ජීවනදායක ජලධාරා

37 ලෙවී 23:36 මංගල්‍යයේ අවසාන මහා දවසේ
දී, ජේසුස් වහන්සේ නැගිට, හඬනගා, “යමෙක්
පිපාසයෙන් සිටිත් නම්, ඔහු මා වෙතට පැමිණ
පානය කරේ වා! 38 එසකි 47:1; සකරි 14:8 ශුද්ධ
ලියවිල්ලෙහි කියා තිබෙන පරිදි මා කෙරෙහි
අදහන්නා තුළින් ජීවනදායක ජලධාරා ගලන්නේ
ය”යි ප්‍රකාශ කළ සේක. 39 උන් වහන්සේ මෙසේ
වදාළේ තමන් වහන්සේ කෙරෙහි අදහාගත්තවුන්
මතු ලබන්නට සිටි ශුද්ධාත්මයාණන් වහන්සේ

පිළිබඳ ව ය. ශුද්ධාත්මයාණන් ඒ තාක් නොදෙන
ලද්දේ ය; මන්ද, ජේසුස් වහන්සේ ඒ තාක් මහිමයට
පත් නොවූ බැවිනි.

### මිනිසුන් අතර මතභේද

40 මේ වචන ඇසූ කල සෙනඟගෙනේ සමහරු,
“මොහු, සැබැවින් ම ඒ දිවැසිවරයාණෝ ය”යි කී හ.
41 අන් සමහරු, “මේ ක්‍රිස්තුස් ය”යි කී හ. තවත්
සමහරු “ක්‍රිස්තුවරයාණන් වඩින්නේ ගලීලයෙනේ ද?
42 2 සාමු 7:12; මීකා 5:2ක්‍රිස්තුවරයාණන් දාවිත්ගේ
වංශයෙනේ, දාවිත් විසූ ගම වන බෙත්ලෙහෙමෙනේ,
වඩින බව ශුද්ධ ලියවිල්ලෙහි ලියා නැද්දැ”යි ඇසූ හ.
43 මෙසේ උන් වහන්සේ නිසා සමූහයා අතර
භේදයක් හටගත්තේ ය. 44 ඔවුන් අතරෙනේ
සමහරකේ උන් වහන්සේ අල්ලාගන්නට සිතූ හ.
එහෙත්, කිසිවකේ උන් වහන්සේ පිට අත නොතැබූ
හ.

### අධිකාරි බලය ඇත්තන්ගේ අවිශ්වාසය

45 ඉක්බිති, මුර සේවකයෝ නායක පූජකයන් ද
පරිසිවරුන් ද වෙතට පෙරළා පැමිණියහ. ඔව්හු ද,
“නුඹලා ඔහු නොගෙනොවේ මන්දැ”යි ඇසූ හ.
46 “කවර මිනිසෙකේ වත් මෙසේ කතා නොකෙළේ
ය”යි මුර සේවකයෝ පිළිතුරු දුන්හ. 47 පරිසිවරු
පිළිතුරු දෙමින්, “නුඹලාත් මුළා වූවාහු ද?
48 ප්‍රධානීන්ගෙනේ වත් පරිසිවරුන්ගෙනේ වත්
කිසිවකේ ඔහු අදහාගත්තෝ ද? 49 ව්‍යවස්ථාව
නොදත් මේ සෙනඟ සාප ලද්දෝ ය”යි කී හ.
50 ජොහ 3:1-2ඔවුන්ගෙනේ එක් කෙනෙකේ වූ, මීට
පෙර උන් වහන්සේ වෙත ගිය නිකොදේමුස් කතා
කොට, 51 “පළමුකොට යම් මිනිසකුගෙනේ කරුණු
නොවිමසා, ඔහු කරන්නේ කුමක් දැ යි තේරුම්
නොගෙන, අපේ ව්‍යවස්ථාව අනුව ඔහු විනිශ්චය
කළ හැකි දැ”යි ඔවුන්ගෙනේ ඇසී ය. 52 ඔව්හු පිළිතුරු
දෙමින්, “ඔබත් ගලීලයෙකේ ද? ගලීලයෙනේ
දිවැසිවරයෙකේ එන්නේ ද කියා සොයා බලන්නැ”යි කී
හ. 53 එවිට සියල්ලෝ ම තම තමන්ගේ ගෙවලට
ගිය හ.

### පව්කාරියට ගල් ගැසීම

8 එහෙත්, ජේසුස් වහන්සේ ඔලීව කන්දට
වැඩම කළ සේක. 2 අලුයම උන් වහන්සේ
දේව මාලිගාවට වැඩිය සේක. මුළු සෙනඟ උන්
වහන්සේ වෙත පැමිණියහ. උන් වහන්සේ වැඩහිඳ
ඔවුන්ට උගන්වා වදාළ සේක. 3 එවිට විනයධරයෝ
හා පරිසිවරු කාමමිථ්‍යාචාරයේ හැසිරදේදී ම අසු වූ
ස්ත්‍රියක ගෙනැවිත් ඔවුන් මැද සිටුවා,
4 “ගුරුදේවයෙනි, මේ ස්ත්‍රිය කාමමිථ්‍යාචාරයෙහි
යෙදී සිටිය දී ම අල්ලාගන්නා ලද්දී ය. 5 ලෙවී 20:10;
ද්වි.නී. 22:22-24මෙබඳු අය ගල් ගසා මරන්නට
මෝසෙසේ විසින් ව්‍යවස්ථාවෙහි අපට අණ කර ඇත;
එහෙත් මැය ගැන ඔබ කියන්නේ කිමෙකේ දැ”යි උන්
වහන්සේගෙනේ ඇසූ හ. 6 ඔවුන් මෙසේ ඇසුවේ,
උන් වහන්සේ පරීක්ෂා කර උන් වහන්සේට වරද
තබන්නට කරුණක් සොයාගන්නා අටියෙනි. එහෙත්,
උන් වහන්සේ නැමී සිය ඇඟිල්ලෙනේ බිම ලියූ සේක.
7 ඔවුන් උන් වහන්සේගෙනේ දිගින් දිගට ප්‍රශ්න
කරද්දී, උන් වහන්සේ කෙළින් සිට, ඔවුන් අමතා,
“ඔබ අතරෙනේ පවක් නැති තැනැත්තා පළමුකොට
ඈට ගලක් ගසන්නැ”යි වදාරා 8 නැවතත් නැමී සිය
ඇඟිල්ලෙනේ බිම ලියූ සේක. 9 ඔවුන් ඒ වචන ඇසූ
විට, වැඩිහිටියන්ගෙනේ පටන්ගෙන එකකො බැගින්
යන්නට ගියේ ය. ඉතිරි වූයේ ජේසුස් වහන්සේ ද,
ඒ ස්ත්‍රිය ද පමණකි. 10 ජේසුස් වහන්සේ කෙළින්
සිට, ඈට කතා කොට, “ස්ත්‍රිය, ඔව්හු කොහේ ද?
කිසිවකු ඔබට වරද තැබුවේ නැද්දැ”යි ඇසූ සේක.
11 “ස්වාමීනි නැතැ”යි ඈ කීවා ය. “මමත් ඔබට වරද
නොතබමි; යන්න, මින්පසු තවත් පව්
නොකරන්නැ”යි උන් වහන්සේ ඈයට වදාළ සේක.

### ලෝකාලෝකයාණෝ

12 මතෙ 5:14; ජොහ 9:5 යළිත් අවස්ථාවක
ජේසුස් වහන්සේ ඔවුන්ට කතා කොට, “ලෝකයේ
ආලෝකය මම ය; මා අනුගමනය කරන්නා අඳුරෙහි
නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේ ය”යි
වදාළ සේක. 13 ජොහ 5:31එවිට පරිසිවරු උන්
වහන්සේට කතා කරමින්, “ඔබ තමා ගැන ම සාක්ෂි
දරන්නෙහි ය; ඒ නිසා ඔබේ සාක්ෂිය වලංගු
නැතැ”යි කී හ. 14 ජේසුස් වහන්සේ ඔවුන්ට පිළිතුරු
දෙමින්, “මා ගැන ම මා සාක්ෂි දරන නමුදු, මාගේ
සාක්ෂිය වලංගු ය; මන්ද මම කොතැනින් ආයෙමි ද,
කොතැනට යන්නෙමි දැ යි දනිමි. එහෙත්, මා
එන්නේ කොතැනින් ද; යන්නේ කොතැනට ද කියා
ඔබ නොදන්නහු ය. 15 ඔබ මනුෂ්‍ය මිම්මෙනේ
විනිශ්චය කරන්නහු ය; මම කිසිවකු විනිශ්චය
නොකරමි. 16 එහෙත් මා විනිශ්චය කළත්, මාගේ
විනිශ්චය සැබෑ ය. මන්ද, මා විනිශ්චය කරන්නේ
තනියම නොව, මා එවා වදාළ පියාණන් වහන්සේත්
සමඟ ය. 17 ‘දෙදෙනෙකුගේ සාක්ෂිය වලංගු ය’යි
ඔබේ ව්‍යවස්ථාවෙහි ලියා ඇත. 18 මම මා ගැන ම
සාක්ෂි දරමි; මා එවා වදාළ පියාණන් වහන්සේ ද මා
ගැන සාක්ෂි දරන සේකැ”යි වදාළ සේක.
19 එබැවින් ඔව්හු “ඔබේ පියා කොහේ දැ”යි ඇසූ
හ. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, “ඔබ මා
හඳුනන්නේ නැත, මාගේ පියාණන් හඳුනන්නේත්
නැත. ඔබ මා හඳුනන්නහු නම් මාගේ පියාණන්
වහන්සේත් හඳුනනවා ඇතැ”යි වදාළ සේක.
20 උන් වහන්සේ මේ වචන වදාළේ දේව
මාලිගාවේ උගන්වන අතර, පඬුරු ගබඩාවේ දී ය.
එහෙත් කිසිවකේ උන් වහන්සේ අල්ලා ගත්තේ
නැත. මන්ද, උන් වහන්සේගේ නියමිත මොහොත
ඒ තාක් නොපැමිණි බැවිනි.

## මම දෙවියන් වහන්සේ ම ය

21 ජේසුස් වහන්සේ යළිත් ඔවුන්ට කතා කොට,
“මම ඉවත් ව යමි. ඔබ මා සොයන්නහු ය. එහෙත්
ඔබ ඔබේ පාපයෙහි මැරෙන්නෙහු ය. මා යන
ස්ථානයට ඔබට එන්නට නොහැකි ය”යි වදාළ
සේක. 22 එවිට ජුදෙව්වරු, “ ‘ මා යන ස්ථානයට
ඔබට එන්නට නොහැකි ය’යි මොහු කියන්නේ සිය
පණ හානි කරගන්නට යන නිසා වත් දැ”යි ඇසූ හ.
23 එබැවින් උන් වහන්සේ, කතා කොට, “ඔබ
මෙලොවින් වන්නහු ය; මම එලොවින් වන්නෙමි.
ඔබ මේ ලෝකයෙන් ය; මම මේ ලෝකයෙන්
නොවෙමි. 24 ඔබේ පාපයෙහි ම ඔබ මැරෙන්නෙහු
යයි මා කීවේ එබැවිනි. මම උන් වහන්සේ ම යයි
ඔබ පිළිගත්තොත් මිස ඔබේ පාපයෙහි ම ඔබ
මැරෙන්නෙහු ය”යි වදාළ සේක. 25 එබැවින් ඔව්හු,
“ඔබ කවරහු දැ”යි ඇසූ හ. ජේසුස් වහන්සේ
පිළිතුරු දෙමින්, “මා ඔබට කී පරිදි, මම මුල සිට ම
ඔබට කී තැනැත්තා ම ය. 26 ඔබ ගැන කියන්නටත්
විනිශ්චය කරන්නටත් බොහෝ දේ මට ඇත.
එහෙත් මා එවා වදාළ තැනැන් වහන්සේ සත්‍යය
බැවින් උන් වහන්සේගෙන් මා ඇසූ දේ මම
ලෝකයාට ප්‍රකාශ කරමි”යි වදාළ සේක.
27 උන් වහන්සේ පියාණන් වහන්සේ ගැන කතා
කළ බව ඔවුන්ට අවබෝධ නො වී ය. 28 එබැවින්
ජේසුස් වහන්සේ කතා කොට, “ඔබ මනුෂ්‍ය-
පුත්‍රයාණන් ඔසවා ලූ කල මා උන් වහන්සේ ම
බවත්, පියාණන් වහන්සේ මට ඉගැන්වූ ලෙස
මෙසේ කතා කරනවා මිස, මාගේ ම
අධිකාරිත්වයෙන් මා කිසිවක් නොකරන බවත්, ඔබට
අවබෝධ වනු ඇත. 29 මා එවා වදාළ තැනැන්
වහන්සේ මා සමඟ වැඩ වසන සේක. උන්
වහන්සේ මා තනි වන්නට නොහැරිය සේක. මන්ද,
මා නිරතුරු උන් වහන්සේට ප්‍රිය මනාප දේ කරන
බැවිනි”යි වදාළ සේක. 30 උන් වහන්සේ මෙසේ
කතා කරන අතර, බොහෝ දෙනෙක් උන් වහන්සේ
අදහාගත්හ.

## විමුක්තිදායක සත්‍යය

31 එබැවින්, තමන් වහන්සේ අදහාගත්
ජුදෙව්වරුන්ට ජේසුස් වහන්සේ කතා කොට, “ඔබ
මාගේ ධර්මයෙහි පිහිටා පවතින්නහු නම්, සැබැවින්
ම ඔබ මාගේ ශ්‍රාවකයෝ ය; 32 ඔබ සත්‍යය
අවබෝධ කරගන්නහු ය; සත්‍යය ඔබ නිදහස්
කරන්නේ ය”යි වදාළ සේක. 33 මතෙ 3:9; ලූක්
3:8ඔව්හු පිළිතුරු දෙමින්, “අපි ආබ්‍රහම්ගේ
වංශයෙන් වම්හ; කිසි කලෙක කිසිවකුට අපි වහල්
නොවීමු. එබැවින් ‘අප නිදහස් වනු ඇත’ කියා ඔබ
කියන්නේ කෙසේ දැ”යි ඇසූ හ.
34 ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්,
“ඒකාන්තයෙන් මම ඔබට කියමි, පව් කරන හැම
කෙනෙක් ම පාපයට වහලෙකි. 35 වහලකුට
පවුලේ විසීමට නිත්‍ය හිමිකමක් නැත. එහෙත්
පුත්‍රයකුට නිත්‍ය හිමිකමක් ඇත. 36 එබැවින්
පුත්‍රයාණෝ ඔබ නිදහස් කරන සේක් නම්, ඔබ
සැබැවින් ම නිදහස් ය. 37 ඔබ ආබ්‍රහම්ගේ
වංශයෙන් පැවත එන බව මම දනිමි. එසේ වුව ද,
ඔබ තුළ මාගේ දහමට ඉඩක් නොවන බැවින් ඔබ
මා මරන්නට සොයන්නහු ය. 38 මාගේ පියාණන්
වහන්සේ ඉදිරියෙහි මා දුටු දේ මම පවසමි; ඔබේ
පියාගෙන් ඇසූ දේ ඔබ කරන්නහු ය”යි වදාළ සේක.
39 “අපේ පියාණෝ ආබ්‍රහම් ය”යි ඔව්හු උන්
වහන්සේට පිළිතුරු දුන්හ. උන් වහන්සේ ද, “ඔබ
ආබ්‍රහම්ගේ දරුවෝ නම් ආබ්‍රහම් කළ ක්‍රියා
ඔබත් කරනු ඇත. 40 එසේ වුව ද, දෙවියන්
වහන්සේගෙන් අසා දැනගත් සත්‍යය ප්‍රකාශ කළ
මිනිසකු වන මා මරන්නට ඔබ සොයන්නහු ය.
ආබ්‍රහම් නම් එසේ කළේ නැත. 41 ඔබ කරන්නේ
ඔබේ පියාගේ ක්‍රියා ය”යි වදාළ සේක. එවිට
ඔව්හු; “අපි අවජාතක දරුවෝ නොවෙමු. අපට
ඇත්තේ එක ම පියෙකි; එනම්, දෙවියන් වහන්සේ
ම ය”යි කී හ. 42 ජේසුස් වහන්සේ ඔවුන්ට පිළිතුරු
දෙමින්, “දෙවියන් වහන්සේ ඔබේ පියාණෝ නම්
ඔබ මට ප්‍රේම කරනු ඇත. මන්ද, මම දෙවියන්
වහන්සේ කෙරෙන් පහළ වී දැන් මෙහි සිටිමි. මාගේ
ම කැමැත්තෙන් මා පැමිණියා නොව, උන් වහන්සේ
මා එවා වදාළ සේක. 43 මා කියන දේ ඔබට
අවබෝධ නොවන්නේ මන් ද? මාගේ දහම තේරුම්
ගැනීමට ඔබ අපොහොසත් බැවිනි. 44 ඔබේ පියා
යක්ෂයා ය. එබැවින් ඔබේ කැමැත්ත ඔබේ පියාගේ
ආශාවන් ඉටු කිරීම ය. මුල සිට ම ඔහු මිනීමරුවෙකි.
සත්‍යය ඔහු තුළ පිහිටා නැති බැවින්, ඔහු
සත්‍යයෙහි නොපිහිටියේ ය. ඔහු බොරු කියන කල
ඔහුගේ නියම ගතියෙන් ම කතා කරයි. මන්ද, ඔහු
බොරුකාරයෙකි. ඔහු බොරුවේ පියා ය. 45 මා ඔබට
සත්‍යය පවසන බැවින් ඔබ මා විශ්වාස
නොකරන්නහු ය. 46 පාපය ගැන මට විරුද්ධ ව
චෝදනා කළ හැක්කේ ඔබ අතුරෙන් කවරකුට ද?
මම සත්‍යය පවසන්නෙම් නම්, ඔබ මා විශ්වාස
නොකරන්නේ මන් ද? 47 දෙවියන් වහන්සේගෙන්
පැවතෙන තැනැත්තේ දෙවියන් වහන්සේගේ වචන
අසයි. ඔබ සවන් නොදෙන්නේ ඔබ දෙවියන්
වහන්සේගෙන් නොවන බැවිනැ”යි වදාළ සේක.

## ආබ්‍රහම්ට පළමුවෙන් මම වීමි

48 ජුදෙව්වරු උත්තර දෙමින්, “ඔබ සමාරියයකු
බවත්, ඔබට දුෂ්ටාත්මයකු ආවේශ වී ඇති බවත්
අප කියන විට එය ඇත්ත නොවේ දැ”යි ඇසූ හ.
49 උන් වහන්සේ එයට පිළිතුරු දෙමින්, “මට
දුෂ්ටාත්මයක් ආවේශ වී නැත. මා ගෞරව
කරන්නේ මාගේ පියාණන් වහන්සේට ය. එහෙත්
ඔබ මට අගෞරව කරන්නහු ය. 50 එසේ වුව ද,
මම මාගේ ම ගෞරවය නොසොයමි. එය සොයන,
විනිශ්චය කරන, කෙනෙක් සිටිති. 51 ඒකාන්තයෙන්
ම මම ඔබට කියමි, යමෙක් මාගේ ධර්මය

පිළිපදින්නෝ නම්, ඔහු කිසි කලක මරණය
නොදකින්නේ ය"යි වදාළ සේක.
52 ජුදෙව්වරු කතා කරමින්, "ඔබට දුෂ්ටාත්මයකු
ආවේශ වී ඇති බව දැන් අපි දනිමු. ආබ්‍රහම්
මියගියේ ය; දිවැසිවරයෝ ද මියගියහ. එහෙත් ඔබ,
'යමෙක් මාගේ ධර්මය පිළිගන්නේ නම්, ඔහු කිසි
කලක නොමැරෙන්නේ ය'යි කියන්නෙහි ය.
53 මියගියා වූ අපගේ පිය වූ ආබ්‍රහම්ට වඩා ඔබ
උතුම් ද? දිවැසිවරයෝ පවා මියගියහ. ඔබ කවරකු
කියා සිතන්නෙහි දැ"යි ඇසූ හ.
54 ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "මම මට ම
ගෞරව කරන්නේ නම්, මාගේ ගෞරවයෙහි
වැදගැම්මක් නැත. මට ගෞරව කරන්නේ මාගේ
පියාණන් වහන්සේ ය. ඔබේ දෙවියන් වහන්සේ යයි
ඔබ කියන්නේ උන් වහන්සේ ගැන ම ය. 55 ඔබ
උන් වහන්සේ නොහඳුනන්නහු ය. එහෙත් මම උන්
වහන්සේ හඳුනමි. මම උන් වහන්සේ නොහඳුනමි
යි කීවොත්, මමත් ඔබ හා සමාන බොරුකාරයෙක්
වන්නෙමි. එහෙත් මම උන් වහන්සේ හඳුනමි; උන්
වහන්සේගේ වචනය ද පිළිපදිමි. 56 ඔබේ පිය වූ
ආබ්‍රහම් මාගේ පැමිණීමේ දවස දැකීමට පුල පුලා
සිටියේ ය. ඔහු එය දැක ප්‍රීති වී ය"යි වදාළ සේක.
57 ජුදෙව්වරු පිළිතුරු දෙමින්, "තව ම වයස අවුරුදු
පණහක් වත් නැති ඔබ ආබ්‍රහම් දුටුවේ කෙසේ
දැ"යි ඇසූ හ. 58 "ඒකාන්තයෙන් ම මම ඔබට කියමි,
ආබ්‍රහම් උපදින්නටත් පෙර මම වෙමි"යි උන්
වහන්සේ වදාළ සේක.
59 ඔව්හු උන් වහන්සේට ගසන පිණිස ගල් අතට
ගත්හ. එහෙත් ජේසුස් වහන්සේ රහසිගත ව, දේව
මාළිගාවෙන් පිට වී ගිය සේක.

## ජාත්‍යන්ධයකු සුවපත් කිරීම

9 උන් වහන්සේ වඩිනා කල්හි, උපන් දා සිට
අන්ධ වූ මිනිසකු දුටු සේක. 2 "ගුරුදේවයෙනි,
මොහු අන්ධ ව ඉපදුණේ මොහු හෝ මොහුගේ
දෙමවුපියන් හෝ පව් කළ නිසා දැ"යි ශ්‍රාවකයෝ
උන් වහන්සේගෙන් ඇසූ හ. 3 ජේසුස් වහන්සේ
පිළිතුරු දෙමින්, "මොහු අන්ධ ව ඉපදුණේ මොහු
වත් මොහුගේ දෙමවුපියන් වත් පව් කළ නිසා
නොවෙ; දෙවියන් වහන්සේගේ බලය මොහු තුළ
ප්‍රකාශ වන පිණිස ය. 4 දිවා කාලය තිබෙන තුරු මා
එවා වදාළ තැනැන් වහන්සේගේ ක්‍රියා අප විසින්
කළ යුතු ය. රාත්‍රි කාලය පැමිණෙයි; එවිට
කිසිවකුට ක්‍රියා කළ නොහැකි ය. 5 මතෙ 5:14;
ජොහ 8:12මම ලෝකයෙහි සිටින තුරු ලෝකයේ
ආලෝකය වෙමි"යි වදාළ සේක.
6 මෙසේ කියමින් උන් වහන්සේ බිමට කෙළ
පිඬක් ගසා, එයින් මඩ සාදා, ඔහුගේ නෙත්වල
ගල්වා, 7 "ගොස් සිලෝවම් පොකුණෙහි සෝදා
ගන්නැ"යි වදාළ සේක. (සිලෝවම් යන්නෙහි අර්ථය
'එවන ලද්දේ ය' යනු යි.) එවිට ඔහු ගොස්
සෝදාගෙන පෙනීම ලැබ ආපසු පැමිණියේ ය.
8 අසල්වාසීහු ද, පෙර ඔහු සිඟනු දුටු අය ද, "මේ,
අර හිඳගෙන සිඟා කෑ මිනිසා නොවේ දැ"යි ඇසූ හ.
9 "මේ ඔහු ම ය"යි සමහරු කී හ. "නැත, ඔහු
නොවේ, ඔහුට සමාන අන් අයෙකැ"යි වෙනත් අය,
කී හ. එහෙත්, "මම ඒ මිනිසා ම ය"යි ඔහු කී ය.
10 "එසේ නම් නුඹේ ඇස් පෑදුණේ කෙසේ දැ"යි
ඔව්හු ඔහුගෙන් ඇසූ හ. 11 ඔහු පිළිතුරු දෙමින්,
"ජේසුස් නම් කෙනෙක් මඩ සාදා මගේ ඇස්වල
ගල්වා, 'සිලෝවම් පොකුණට ගොස් සෝදාගන්නැ'යි
මට කී හ. මම ගොස් සෝදාගෙන පෙනීම
ලබාගතිමි"යි කී ය. 12 "ඒ තැනැත්තා කොහේ දැ"යි
ඔව්හු ඇසූ හ. "මම නොදනිමි"යි ඔහු කී ය.

## අන්ධයාගේ සුවය ගැන වගවිභාගය

13 ඔව්හු කලින් අන්ධ ව සිටි ඒ තැනැත්තා
පරිසිවරුන් වෙතට ගෙන ගියහ. 14 ජේසුස් වහන්සේ
මඩ පිඬක් සාදා ඔහුගේ ඇස් පෑදුවේ සබත් දවසක
දී ය. 15 එබැවින් ඔහුට පෙනීම ලැබුණේ කොහොම
දැ යි නැවතත් පරිසිවරු ඔහුගෙන් ඇසූ හ. ඔහු
පිළිතුරු දෙමින්, "උන් වහන්සේ මාගේ ඇස්වල මඩ
ගැල්වූ සේක: මම සෝදාගතිමි; එවිට පෙනීම
ලදිමි"යි කී ය.
16 එබැවින් පරිසිවරුන්ගෙන් සමහරෙක්, "ඒ මිනිසා
සබත් විනය කඩ කරන බැවින් ඔහු දෙවියන්
වහන්සේ වෙතින් පැමිණියෙක් නොවේ ය"යි කී හ.
එහෙත් අන් සමහරෙක්, "පව්කාර මිනිසකුට මෙබඳු
හාස්කම් කළ හැක්කේ කෙසේ දැ"යි ඇසූ හ. මෙසේ
ඔවුන් අතර භේදයක් ඇති විය. 17 එබැවින් ඔව්හු
නැවතත් අන්ධයාට කතා කොට, "නුඹේ ඇස්
පෑදුවේ ඒ මිනිසා නම්, ඔහු ගැන නුඹේ අදහස
කුමක් දැ"යි ඇසූ හ. "ඔහු නම් දිවැසිවරයෙකැ"යි
හෙතෙමේ පිළිතුරු දුන්නේ ය.
18 ඔහු අන්ධ ව සිටි බවත්, පසුව පෙනීම ලැබූ
බවත්, පෙනීම ලැබූ මිනිසාගේ දෙමවුපියන් කැඳවා
විමසන තුරු විශ්වාස කිරීමට ජුදෙව්වරු මැළි වූ හ.
19 "මේ මිනිසා ඔබේ පුතා ද? ඇත්තට ම ඔහු අන්ධ
ව උපන්නේ ද? එසේ නම් දැන් ඔහුට පෙනෙන්නේ
කෙසේ දැ"යි ඔව්හු දෙමවුපියන්ගෙන් ප්‍රශ්න කළහ.
20 ඔහුගේ මවුපියෝ පිළිතුරු දෙමින්, "මේ අපගේ
පුත්‍රයා බව අපි දනිමු, ඔහු අන්ධ ව උපන් බවත්
අපි දනිමු. 21 එහෙත් දැන් ඔහුට පෙනෙන්නේ
කොහොම දැ යි අපි නොදනිමු. ඔහුගේ ඇස්
පෑදුවේ කවරෙක් ද කියාත් අපි නොදනිමු. ඔහුගෙන්
ම අසන්න; දැන් ඔහු තරුණ වයසැති කෙනෙකි.
තමා ගැන ම කතා කරන්නට ඔහුට පුළුවනැ"යි කී
හ. 22 ඔහුගේ දෙමවුපියන් මෙසේ කීවේ
ජුදෙව්වරුන්ට බියෙනි. මන්ද, 'යමෙක් උන් වහන්සේ
ක්‍රිස්තුවරයාණෝ යයි ඒත්තුගන්නේ නම් ඔහු
ධර්මශාලාවෙන් නෙරපාදැමිය යුතු ය'යි ජුදෙව්වරුන්
නියම කරගෙන සිටි හෙයිනි. 23 ඒ නිසා ඔහුගේ
මවුපියෝ, "ඔහු තරුණ වයසැති කෙනෙකි;
ඔහුගෙන් අසන්නැ"යි කී හ.

24 ඔව්හු අන්ධ ව සිටි මිනිසා නැවතත් ගනේවා,
“දවේයන් වහන්සේ ඉදිරියේ ඇත්තකියන්න; මේ
මිනිසා නම් පව්කාරයකෙු බව අපි දනිමු”යයි කී හ.
25 එවිට ඔහු පිළිතුරු දමේන්, “ඒ තැනැත්තා
පව්කාරයකේ ද නැද්ද යි මම නාොදනිමි; එහතේ එක
දයෙක් මම දනිමි; මම අන්ධ ව සිටියමේ, දැන් මට
පනෙේ!” යයි කී ය. 26 එවිට ඔව්හු, “ඔහු ඔබට
කුමක් කළෙේ ද? ඔබේ ඇස් පැහැදුවේ කාොහාොම
දැ”යි ඔහුගනේ ඇසූ හ. 27 ඔහු පිළිතුරු දමේන්, “මම
කලින් ඔබට කීවමේ, එහතේ ඔබ මගේ කීම
ඇසුවේ නැත. ඔබ එය නැවතත් අසන්නට තැත්
කරන්නේ මන් ද? ඔබත් උන් වහන්සේගේ
ශ්‍රාවකයන් වනේනට අදහස් කරන නිසා වත් දැ”යි
ඇසී ය.
28 ඔව්හු ඔහුට බැණවදිමින්, “ඔබ යි ඔහුගේ
ශ්‍රාවකයා; අපි නම් මාෝසසේගේ ශ්‍රාවකයෝ
වම්හ. 29 දවේයන් වහන්සේ මාෝසසේට කතා කළ
බව අපි දනිමු. එහතේ මේ මිනිසා ගැන නම්, මාොහු
කාොහනේ වී දැ යි අපි නාොදනිමු”යි කී හ.
30 ඒ මිනිසා පිළිතුරු දමේන්, “මයෙ මහ පුදුමයක්!
ඔහු කාොතැනින් ආවේ දැ යි ඔබ නාොදන්නහු ය;
එහතේ මාගේ ඇස් පෑදුවේ ඔහු ය. 31 දවේයන්
වහන්සේ පව්කාරයන්ගේ බස් නාොඅසන බවත්,
දේව භක්තිය ඇති, දේව කැමැත්ත කරන, යමකෙු
ඇත්නම් ඔහුගේ බස් අසන බවත් අපි දනිමු. 32 යම්
කිසිවකෙු අන්ධ ව උපන් කනෙකෙුගේ ඇස් පෑදූ බව
ලාෝකයේ පටන්ගැන්මේ සිට කවදාවත් ඇසූ දයෙක්
නාොවේ. 33 මේ තැනැත්තා දවේයන් වහන්සේ
වතේන් නාොපැමිණියකේ නම් කිසිවක් කරන්නට
ඔහුට නාොහැකි ය”යි කී ය. 34 ඔව්හු පිළිතුරු දමේන්,
“උපන් දා සිට ම පාපයේ සිටින ඔබ අපට
උගන්වන්නට එන්නහෙි දැ”යි කියා ඔහු
ධර්මශාලාවනේ නරෙපාදැමූ හ.

## ආධ්‍යාත්මික අන්ධකම

35 ඔවුන් ඒ මිනිසා නරෙපාදැමූ බව ජේසුස්
වහන්සේට ආරංචි වී, ඔහු හමු වූ පසු, “ඔබ
මනුෂ්‍ය-පුත්‍රයාණන් අදහන්නහෙි දැ”යි ඇසූ සේක.
36 “ස්වාමීනි, ඒ කවරකේ ද? එතුමා අදහාගන්න
පිණිස මට කියන්නැ”යි ඔහු යැදී ය. 37 “ඔබ එතුමා
දැක ඇත; දැන් ඔබ සමඟ කතා කරන තැනැත්තේ
එතුමා ය”යි පිළිතුරු දුන් සේක. 38 ඔහු ද, “ස්වාමීනි,
මම අදහමි”යි කියා පසඟ පිහිටුවා උන් වහන්සේට
වැන්දේ ය.
39 ජේසුස් වහන්සේ කතා කාොට: “මා මලොෙවට
වැඩියේ විනිශ්චය සඳහා ය. එයින්, පනේීම
නැත්තන්ට පනේීම ඇති වනු ඇත, පනේීම ඇත්තන්ට
පනේීම නැති වනු ඇතැ”යි වදාළ සේක.
40 උන් වහන්සේ සමඟ සිටි පරිසිවරුන්ගනේ
ඇතැමකේ එය අසා, “අපිත් අන්ධයෝ දැ?”යි උන්
වහන්සේගනේ ඇසූ හ. 41 උන් වහන්සේ පිළිතුරු
දමේන්, “ඔබ අන්ධ ව සිටියා නම් ඔබට පාපයක්
නැත. එහතේ දැන් ‘අපට පනෙේ ය’යි ඔබ කියන
නිසා ඔබේ පාපය එසේ ම පවතී ය”යි ඔවුන්ට
වදාළ සේක.

## බැටළු ගාල පිළිබඳ උපමාව

10 ජේසුස් වහන්සේ කතා කරමින්,
“ඒකාන්තයනේ ම මම ඔබට කියමි,
දාොරටුවනේ බැටළු ගාලට ඇතුළු නාොවී අන්
තැනකින් නැඟී පැන එන්නා සාොරකේ ද
කාොල්ලකන්නකේ ද වේ. 2 එහතේ දාොරටුවනේ
ඇතුළු වනේනා බැටළුවන්ගේ එඬේරා ය. 3 දාොරටු
පාලයා ඔහුට දාොර හරියි; බැටළුවෝ ඔහුගේ
කටහඬ අඳුනති. ඔහු තමාගේ ම බැටළුවන්ට නම්
කියා අඬගසා උන් පිටතට ආ විට, 4 උන්ට පරෙටුව
යයි; බැටළුවෝ ද ඔහුගේ කටහඬ අඳුනන බැවින්
ඔහු පසුපස්සේ යති. 5 එහතේ බැටළුවෝ
අමුත්තකෙු පසුපස්සේ නාොයති; එපමණක් නාොව,
ඔහු වතේන් පලා යති. මන්ද, උන් අමුත්තන්ගේ
කටහඬ නාඳුනන බැවිනි”යි වදාළ සේක.
6 ජේසුස් වහන්සේ මේ උපමාව ඔවුන්ට වදාළ
නමුත්, එයින් කුමක් අදහස් කළ සේක් දැ යි ඔව්හු
තේරුම් නාොගත්හ.

## යහපත් එඬේරාණෝ

7 එහයෙින්, යළිත් ජේසුස් වහන්සේ ඔවුන් අමතා,
“ඒකාන්තයනේ ම මම ඔබට කියමි. බැටළුවන්ට
දාොරටුව මම ය. 8 මට පළමුව ආ සියල්ලෝ ම
සාොරු ද කාොල්ලකන්නෝ ද වති. බැටළුවෝ
ඔවුන්ට ඇහුම්කන් නුදුන්හ. 9 දාොරටුව මම ය; මා
තුළින් යමකේ ඇතුළු වන්නේ ද ඔහු ගළවනු ලැබ
ඇතුළට හා පිටතට ගාොස් ආහාර ලබන්නේ ය.
10 සාොරා එන්නේ සාොරකම් කරන්නටත්,
මරන්නටත්, විනාශ කරන්නටත් පමණකි. මා
පැමිණියේ ඔවුන් හට ජීවනය ලැබනෙ පිණිස ය.
සපුරා ම එය ලැබනෙ පිණිස ය.
11 “යහපත් එඬේරා මම වමේ. යහපත් එඬේරා,
තම ජීවිතය බැටළුවන් උදසො පූජා කරන්නේ ය.
12 එඬේරකෙු නාොවන, එසේ ම බැටළුවන්ගේ
අයිතිකාරයා ද නාොවන කුලීකාරයා, වෘකයා එනු
දැක බැටළුවන් හැරදමා පලා යන්නේ ය. වෘකයා ද
උන් වතෙ කඩා පැන විසුරුවා හරින්නේ ය. 13 ඔහු
පලා යන්නේ ඔහු කුලීකාරයකෙු වන නිසාත්,
බැටළුවන් ගැන සැලකිල්ලක් ඔහුට නැති නිසාත් ය.
14 “යහපත් බැටළු එඬේරා මම වමේ; මම මගේ
බැටළුවන් අඳුනමි; ඔව්හු ද මා අඳුනති. 15 මතෙ
11:27; ලූක් 10:22පියාණන් වහන්සේ මා ද, මා
පියාණන් වහන්සේ ද අඳුනන්නාක් මනේ, මම මාගේ
බැටළුවන් අඳුනමි. බැටළුවන් උදසො මාගේ දිවි පුදමි.
16 තවද, මේ රැළට අයිති නාොවූ අන් බැටළුවෝ ද
මට ඇත්තාහ. මා ඔවුන් ද ගනෙ ආ යුතු ය. ඔව්හු
මාගේ හඬට ඇහුම්කන් දති. මසෙේ එක රැළක් ද
එක එඬේරකේ ද වන්නාහ.

17 “මා පියාණන් මට ප්‍රේම කරන්නේ, මා නැවත
ලබන පිණිස මාගේ දිවි පුදන බැවිනි. 18 කිසිවෙක්
එය මගෙන් පැහැර නොගනිති. මාගේ ම
කැමැත්තෙන් මම එය පුදමි. එය පුදන්නට මට බලය
තිබේ. එය යළි ලබන්නට ද මට බලය තිබේ. මේ
නියමය මාගේ පියාණන් වහන්සේගෙන් ම ලදිමි”යි
වදාළ සේක.
19 මේ වදන් නිසා ජුදෙව්වරුන් අතර නැවත
භේදයක් හටගත්තේ ය. 20 ඔවුන්ගෙන් බොහෝ
දෙනෙක්, “ඔහුට දුෂ්ටාත්මයක් වැහී ඇත; සිහිවිකල
වී ඇත; ඔහුට කන්දෙන්නේ කුමට දැ”යි කී හ.
21 “මේවා දුෂ්ටාත්මාවේශ වූවකුගේ කීම් නොවේ;
අන්ධයන්ගේ ඇස් පහදන්නට දුෂ්ටාත්මයකට පුළුවන්
දැ”යි සෙසු අය කී හ.

### ජේසුස් වහන්සේ ප්‍රතික්ෂේප කරනු ලැබීම

22 එකල ජෙරුසලමේ, කැප කිරීමේ මංගල්‍යය
පවත්වනු ලැබී ය. 23 ඒ ශීත සෘතුව විය. ජේසුස්
වහන්සේ දේව මාලිගාවේ සලමොන්ගේ ද්වාර
මණ්ඩපයේ සක්මන් කරමින් සිටි සේක. 24 එබැවින්
ජුදෙව්වරු පැමිණ උන් වහන්සේ වටකරගෙන, “ඔබ
කොතෙක් කල් අප සැක පිට තබන සේක් ද? ඔබ
ක්‍රිස්තුවරයාණෝ නම් පැහැදිලි ලෙස අපට කිව
මැනවැ”යි කී හ.
25 ජේසුස් වහන්සේ ඔවුන්ට පිළිතුරු දෙමින්,
“ඔබට මම කීවෙමි; එහෙත් ඔබ විශ්වාස
නොකරන්නහු ය. මාගේ පියාණන් වහන්සේගේ
නාමයෙන් මා කරන ක්‍රියාවෝ ම මා ගැන සාක්ෂි
දෙති. 26 එහෙත්, ඔබ මාගේ බැටළුවන් නොවන
බැවින්, මා විශ්වාස නොකරන්නහු ය. 27 මාගේ
බැටළුවෝ මාගේ කටහඬ අසති. මම ද ඔවුන්
අඳුනමි; ඔව්හු ද මා පසුපස්සේ එති. 28 මම ඔවුන්ට
සදාතන ජීවනය දෙමි. ඔව්හු කිසි කලෙකත් විනාශ
නොවෙති. කිසිවෙක් ඔවුන් මා අතින් පැහැර
නොගනිති. 29 ඔවුන් මා හට දෙවා වදාළ මාගේ
පියාණන් වහන්සේ සියල්ලන්ට ම වඩා ශ්‍රේෂ්ඨ ය.
පියාණන් වහන්සේගේ අතින් ඔවුන් පැහැර ගන්නට
කිසිවෙකුට නොහැකි ය. 30 මාත් මාගේ පියාණන්
වහන්සේත් එක ම ය”යි වදාළ සේක.
31 උන් වහන්සේට ගසන්නට ජුදෙව්වරු නැවත ගල්
අතට ගත්හ. 32 එවිට ජේසුස් වහන්සේ කතා
කොට, “පියාණන් වහන්සේ කරණකොටගෙන
බොහෝ යහපත් ක්‍රියා ඔබට දැක්වීමි. එයින් කවර
ක්‍රියාවක් නිසා ඔබ මට ගල් ගසන්නහු දැ”යි ඇසූ
සේක. 33 ලෙවී 24:16ජුදෙව්වරු උන් වහන්සේට
පිළිතුරු දෙමින්, “අප ඔබට ගල් ගසන්නේ යහපත්
ක්‍රියාවක් නිසා නොව, ඔබ කළ දේවාපහාසය නිසා
ය; මිනිසකු වන ඔබ දෙවියන් වහන්සේ වෙන්නට
බලන නිසා ය”යි කී හ.
34 ගීතා 82:6 ජේසුස් වහන්සේ ඔවුන්ට පිළිතුරු
දෙමින්, “ ‘ඔබ දෙවිවරු ය’යි කීමි යි ඔබේ
ව්‍යවස්ථාවලියේ ලියා තිබෙනවා නොවේ ද? 35 එය
ප්‍රතික්ෂේප කළ නොහැකි ය. ඒ ශුද්ධ ලියවිල්ලේ
කියා ඇති පරිදි, දෙවියන් වහන්සේගේ වචනය දෙනු
ලැබූවන්ට දෙවිවරු යයි උන් වහන්සේ වදාළ සේක.
ඒ ශුද්ධ ලියවිල්ල ප්‍රතික්ෂේප කළ නොහැකි ය.
36 එසේ නම්, දෙවියන් වහන්සේ විසින් කැප කරනු
ලැබ ලොවට එවන ලද තැනැත්තා වන මා ‘මම
දෙවියන් වහන්සේගේ පුත්‍රයා’යි කී නිසා, ‘ඔබ
දේවාපහාස කරන්නෙහි ය’යි මා ගැන කියන්නහු ද?
37 මම මාගේ පියාණන් වහන්සේගේ ක්‍රියා
නොකරම් නම්, මා විශ්වාස නොකරන්න. 38 එහෙත්
මම ඒවා කරම් නම්, ඔබ මා විශ්වාස නොකරතත්,
මාගේ ක්‍රියා විශ්වාස කර පියාණන් වහන්සේ මා
තුළ ද, මා පියාණන් වහන්සේ තුළ ද සිටින බව
අවසාන වශයෙන් දැනගන්නැ”යි වදාළ සේක.
39 නැවතත් ඔව්හු උන් වහන්සේ අල්ලාගන්නට
උත්සාහ කළහ. එහෙත් උන් වහන්සේ ඔවුන් අතින්
මිදී ගිය සේක.
40 ජොහ 1:28 උන් වහන්සේ ජොර්දානෙන්
එගොඩ ජොහන් පළමුවෙන් බව්තීස්ම-ස්නාපනය
කරමින් සිටි ස්ථානයට යළිත් ගොස්, එහි නැවතී සිටි
සේක. 41 බොහෝ දෙනෙක් උන් වහන්සේ වෙතට
පැමිණ: “ජොහන් කිසි හාස්කමක් නොකළ නමුත්
ජේසුස් වහන්සේ ගැන ජොහන් කී සියල්ල ම සැබෑ
ය”යි කී හ. 42 එහි දී බොහෝ දෙනෙක් උන්
වහන්සේ අදහාගත්හ.

### ලාසරස්ගේ මරණය

11 ලූක් 10:38-39 මරියා සහ ඇගේ
සොහොයුරිය වූ මාර්තාගේ ගම වන
බෙතානියෙහි ලාසරස් නම් එක්තරා මිනිසෙක්
අසනීපයෙන් සිටියේ ය. 2 ජොහ 12:3මේ මරියා
වනාහි, සමිඳාණන් වහන්සේ සුවඳ විලේපනයෙන්
ආලේප කර, සිය හිසකේවලින් උන් වහන්සේගේ
පාද පිස දැමූ තැනැත්තිය ය. රෝගාතුර ව සිටි
ලාසරස් ඇගේ සහෝදරයා ය. 3 එබැවින් ඒ
සොහොයුරියෝ, “ස්වාමීනි, ඔබගේ හිතමිතුරා
අසනීපයෙන් සිටී ය”යි උන් වහන්සේට දන්වා යැවූ
හ. 4 ඒ ඇසූ කල ජේසුස් වහන්සේ කතා කොට,
“මේ රෝගය මරණයෙන් කෙළවර වන්නක් නොවේ;
මෙය දේව මහිමය සඳහා ය; මෙයින් දෙවියන්
වහන්සේගේ පුත්‍රයාණෝ මහිමයට පමුණුවනු
ලබන සේකැ”යි වදාළ සේක.
5 ජේසුස් වහන්සේ මාර්තාට ද ඇගේ
සොහොයුරියට ද ලාසරස්ට ද ප්‍රේම කළ සේක.
6 එහෙත් ඔහු අසනීපයෙන් සිටින බව උන්
වහන්සේට සැළ වූ පසු, තමන් සිටි ස්ථානයෙහි ම
දෙදිනක් නතර වී සිටි සේක. 7 ඉන්පසු උන්
වහන්සේ ශ්‍රාවකයන් අමතා, “අපි යළිත් ජුදා
දේශයට යමු”යි වදාළ සේක. 8 ශ්‍රාවකයෝ ද,
“ගුරුදේවයෙනි, මේ ළඟ දී ජුදෙව්වරු ඔබට ගල්
ගසන්නට මාන බැලූ හ. ඉදින් ඔබ නැවතත් එහි
වඩින සේක් දැ”යි ඇසූ හ.

9 ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "දිවා කාලයට
දොළොස් පැයක් තිබෙනවා නොවේ ද? යමෙක්
දවල් කාලයෙහි ඇවිදින්නේ නම්, මෙලොව එළිය
ඔහුට පෙනෙන බැවින් ඔහු නොපැකිළෙයි. 10 එහෙත්
යමෙක් රාත්‍රි කාලයෙහි ඇවිදින්නේ නම්, ඔහු තුළ
එළිය නැති නිසා ඔහු පැකිළේ ය"යි පැවසූ ජේසුස්
වහන්සේ නැවතත් ඔවුන් අමතා, 11 "අප හිතමිත්‍ර
ලාසරස් සැතපී සිටියි; ඔහු පුබුදුවන පිණිස
යන්නෙමි"යි වදාළ සේක.
12 එවිට ශ්‍රාවකයෝ කතා කොට, "ස්වාමීනි, ඔහු
සැතපී සිටී නම් ඔහුට සුව වනු ඇතැ"යි කී හ.
13 සැතපීම යන්නෙන් ජේසුස් වහන්සේ අදහස්
කළේ ලාසරස්ගේ මරණය ය. එහෙත් ඔවුන් එය
තේරුම්ගත්තේ නිදාගැන්ම යනුවෙනි. 14 එබැවින්
ජේසුස් වහන්සේ පැහැදිලි ලෙස කතා කරමින්,
"ලාසරස් මියගොස් ඇත. 15 ඔබ විශ්වාස කරන
පිණිස, ඔබගේ ම යහපත සඳහා, මා එහි නොසිටීම
ගැන ප්‍රීති වෙමි. එසේ වී නමුත්, අපි ඔහු වෙතට
යමු"යි වදාළ සේක. 16 'නිවුන්නා' යයි නම් ලත්
තෝමස් අනෙක් ශ්‍රාවකයන් අමතා, "උන් වහන්සේ
සමඟ නසින පිණිස අපිත් යමු"යි කී හ.

### පුනරුජ්ජීවනය ද ජීවනය ද වන ජේසුස් වහන්සේ

17 ජේසුස් වහන්සේ වැඩම කළ විට, ලාසරස්
සොහොන් ගෙයි තබා එදිනට දින සතරක් වූ බව
දැනගත් සේක. 18 බෙතානිය ජෙරුසලමට ආසන්න
ය; දුර කිලෝමීටර් තුනක් පමණ ය. 19 මාර්තාගේ
හා මරියාගේ සහෝදරයාගේ මරණය ගැන අසා,
ඔවුන් සනසන පිණිස ජුදෙව්වරුන්ගෙන් බොහෝ
දෙනෙක් පැමිණ සිටියහ. 20 ජේසුස් වහන්සේ වඩින
බව මාර්තාට ආරංචි වූ විට, ඈ උන් වහන්සේ
හමුවන්නට පෙරමඟට ගියා ය. එහෙත් මරියා ගෙදර
නැවතී සිටියා ය.
21 මාර්තා කතා කරමින්, "ස්වාමීනි, ඔබ වහන්සේ
මෙහි සිටි සේක් නම් මාගේ සහෝදරයා මැරෙන්නේ
නැත. 22 දැන් වුවත් ඔබ දෙවියන් වහන්සේගෙන්
යමක් ඉල්ලුවොත්, දෙවියන් වහන්සේ ඔබට එය
දෙන බව මම දනිමි"යි කීවා ය. 23 "ඔබේ
සහෝදරයා නැවත නැඟිටින්නේ ය"යි ජේසුස්
වහන්සේ ඇයට වදාළ සේක. 24 මාර්තා පිළිතුරු
දෙමින්, "අන්තිම දවසේ, පුනරුජ්ජීවනයේ දී ඔහු
නැවත නැඟිටින බව මම දනිමි"යි කීවා ය.
25 ජේසුස් වහන්සේ කතා කරමින්, පුනරුජ්ජීවනය
ද, ජීවනය ද මම වෙමි; මා අදහාගන්නා මැරුණත්
ජීවත් වන්නේ ය; 26 ජීවත් ව සිටින, මා අදහාගන්න
කිසිවෙක් කිසි කලෙක නො මැරෙන්නේ ය. ඔබ
මෙය අදහන්නෙහි දැ"යි ඇසූ සේක.
27 ඈ පිළිතුරු දෙමින්, "ඔබ ක්‍රිස්තුවරයාණන්
බවත්, දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් බවත්,
ලෝකයට වැඩම කරන්නට සිටි තැනැන් වහන්සේ
බවත් මම අදහමි"යි කීවා ය.

### ජේසුස් වහන්සේ දුක් වීම

28 මාර්තා මෙසේ පවසා, ගොස්, ඇගේ
සොහොයුරිය වූ මරියා කැඳවා, "ගුරුදේවයාණෝ
වැඩම කර සිටිති; උන් වහන්සේ ඔබ කැඳවති"යි
රහසින් කීවා ය. 29 ඈ ඒ අසා නැඟිට වහා ම උන්
වහන්සේ වෙතට ගියා ය. 30 ඒ වන තුරු ජේසුස්
වහන්සේ ගමට ඇතුළු නොවී, උන් වහන්සේට
මාර්තා හමු වූ ස්ථානයෙහි ම නතර වී සිටි සේක.
31 එවිට මරියා සනසමින් ඈ සමඟ ගෙයි සිටි
ජුදෙව්වරු, ඈ වේගස නැඟිට බැහැර යනු දැක, ඈ
හඬන පිණිස සොහොන් ගේ ළඟට යන්නී යයි සිතා
ඈ පස්සේ ගියහ.
32 මරියා ජේසුස් වහන්සේ සිටි තැනට අවුත්, උන්
වහන්සේ දුටු කෙණෙහි පාමුල වැටී, "ස්වාමීනි, ඔබ
වහන්සේ මෙහි සිටි සේක් නම් මාගේ සහෝදරයා
මැරෙන්නේ නැතැ"යි කීවා ය. 33 ජේසුස් වහන්සේ,
ඈ ද ඈ සමඟ ආ ජුදෙව්වරුන් ද හඬනු දැක, සිතින්
සුසුම්ලා කැළඹී, 34 "ඔහු කොතැන තැන්පත් කළාහු
දැ"යි ඇසූ සේක. "ස්වාමීනි, ඇවිත් බැලුව මැනවැ"යි
ඔව්හු කී හ.
35 ජේසුස් වහන්සේ හැඬූ සේක. 36 එබැවින්
ජුදෙව්වරු, "බලන්න, උන් වහන්සේ ඔහුට ප්‍රේම
කළ තරම ය"යි කී හ. 37 එහෙත් ඔවුන්ගෙන්
සමහරෙක්, "අන්ධයාගේ ඇස් පෑදුවේ උන් වහන්සේ
නොවේ ද? එසේ නම්, මේ මිනිසාගේ මරණය
වළක්වන්නට උන් වහන්සේට නොහැකි වී දැ"යි කී
හ.

### ලාසරස් මරණයෙන් උත්ථාන කිරීම

38 එවිට, නැවතත් ජේසුස් වහන්සේ අතිශයින්
කැළඹී, සොහොන් ගේ ළඟට පැමිණි සේක. එය
වනාහි ගල් ගුහාවකි. එහි කට ගලකින් වසා තිබිණි.
39 "ගල ඉවත් කරන්නැ"යි ජේසුස් වහන්සේ වදාළ
සේක. "ස්වාමීනි, ඔහු මියගොස් සතර දිනකි, දැන්
දුගඳත් ඇතැ"යි මළ තැනැත්තාගේ සොහොයුරියක
වූ මාර්තා කීවා ය.
40 ජේසුස් වහන්සේ කතා කොට, "ඔබට ඇදහිල්ල
ඇත්නම් ඔබ දෙවියන් වහන්සේගේ තේජශ්‍රීය
අත්දකින බව මා කීවා නොවේ දැ"යි ඇට වදාළ
සේක. 41 එවිට ඔව්හු ගල ඉවත් කළහ. ජේසුස්
වහන්සේ ඇස් ඔසවා, "පියාණෙනි, ඔබ මට සවන්
දුන් නිසා මම ඔබට ස්තුති කරමි. 42 සැමවිට ම ඔබ
මට සවන් දෙන බව මම දැන සිටියෙමි. එහෙත් මා
මේ දේ කීවේ ඔබ මා එවා වදාළ බවට අවට සිටින
සමූහයා අදහාගන්න පිණිස ය"යි වදාළ සේක.
43 උන් වහන්සේ මෙසේ කියා, "ලාසරස් පිටතට
එන්නැ"යි මහ හඬින් වදාළ සේක. 44 මැරී සිටි
තැනැත්තා පිටතට ආවේ ය; ඔහුගේ අත් පා රෙදි
පටිවලින් වෙළා තිබුණේ ය; මුහුණ රෙදි කඩකින්
ඔතා තිබුණේ ය. "මොහුගේ බැමි ලිහා, යන්නට
හරින්නැ"යි ජේසුස් වහන්සේ වදාළ සේක.

45 මරියා වෙතට ආ ජුදවේවරුන්ගෙන් බොහෝ
දෙනෙක් ජේසුස් වහන්සේ කළ දේ දැක උන්
වහන්සේ අදහාගත්හ. 46 එහෙත් ඔවුන්ගෙන්
ඇතැමෙක් පරිසිවරුන් වෙතට ගොස් ජේසුස්
වහන්සේ කළ දේවල් ඔවුන්ට සැළ කළහ.

### ජේසුස් වහන්සේ නැසීමේ කුමන්ත්‍රණය
(මතෙ 26:1-5;මාක් 14:1-2;ලූක් 22:1-2)

47 එවිට නායක පූජකයෝ ද, පරිසිවරු ද
ශ්‍රේෂ්ඨාධිකරණය රැස් කරවා, “අපි කුමක් කරමු
ද? මේ මිනිසා බොහෝ හාස්කම් කරයි. 48 අප
ඔහුට මෙසේ ඉඩ හැරියොත්, සියල්ලන් ම ඔහු
අදහාගනු ඇත. එවිට රෝමවරුන් පැමිණ අපේ
ශුද්ධස්ථානයත්, අපේ ජාතියත් වනසනු ඇතැ”යි කී
හ.
49 ඔවුන්ගෙන් එක් කෙනෙක් වූ, ඒ අවුරුද්දේ
උත්තම පූජකයා වූ කායාපස් කතා කොට, 50 “ඔබ
දන්නා දෙයක් නැත; මුළු ජාතියේ විනාශයට වඩා,
ජනතාව උදෙසා එක මිනිසකුගේ මරණය යෝග්‍ය
බව ඔබට තේරෙන්නේ නැතැ”යි කී ය. 51 මෙය ඔහු
ම හිතා කී දෙයක් නොවේ. ඒ වනාහි, ඔහු ඒ
අවුරුද්දට උත්තම පූජකයා ව සිටි බැවින්, ජේසුස්
වහන්සේ ජාතිය උදෙසා ද, 52 ජාතිය උදෙසා
පමණක් නොව, දෙවියන් වහන්සේගේ විසිරී ගිය
දරුවන් එක්රැස් කරන පිණිස ද, දිවි පිදිය යුතු බවට
ඔහු පැවසූ දිවැසි කීමකි. 53 එබැවින් එදා පටන්
ඔව්හු උන් වහන්සේ මරන්නට කුමන්ත්‍රණය කළහ.
54 ඒ නිසා ජේසුස් වහන්සේ ජුදවේවරුන් අතරෙහි
තවත් ප්‍රසිද්ධියේ නොගැවසී, එයින් ඉවත් ව
පාළුකරයට යාබද පෙදෙසෙහි, එප්‍රායිම් නම් නුවරට
වැඩම කර ශ්‍රාවකයන් සමඟ එහි නැවතී සිටි
සේක.
55 එකල ජුදවේවරුන්ගේ පාස්කු මංගල්‍යය ළං ව
තිබිණි. මංගල්‍යයට තම තමන් පවිත්‍ර කරගන්නා
පිණිස බොහෝ දෙනෙක් පිටිසරින් නික්ම
ජෙරුසලමට ගියහ. 56 එවිට, ඔව්හු ජේසුස්
වහන්සේ සොයමින් දේව මාලිගාවේ සිටිය දී, “ඔබ
කුමක් සිතන්නහු ද? ඔහු මංගල්‍යයට නෑවිත් සිටී
දැ”යි ඔවුනොවුන් අතර කතා කරගත්හ. 57 උන්
වහන්සේ සිටින තැන යමෙක් දනිතොත්,
අත්අඩංගුවට ගන්නා පිණිස, ඒ බව දන්වන මෙන්
නායක පූජකයන් හා පරිසිවරුන් විසින් අණ දී තිබිණි.

### බෙතානියේ දී ආලේප කරනු ලැබීම
(මතෙ 26:6-13;මාක් 14:3-9)

12 ජේසුස් වහන්සේ පාස්කු මංගල්‍යයට
සදවසකට පෙර, උන් වහන්සේ විසින්
මරණයෙන් උත්ථාන කරන ලද ලාසරස් වීසූ
බෙතානියට වැඩම කළ සේක. 2 ඔව්හු උන්
වහන්සේට එහි භෝජන සංග්‍රහයක් පිළියෙළ
කළහ. මාර්තා උපස්ථාන කළා ය; ලාසරස් උන්
වහන්සේ සමඟ කෑමට හිඳගත් අයගෙන් කෙනෙකි.
3 ලූක් 7:37-38එවිට මරියා ඉතා වටිනා සුවඳ විලවුන්
ලීටර් භාගයක් රැගෙන, උන් වහන්සේගේ පාද
ආලේප කොට, ඇගේ කෙස් කළඹින් පිසදැමුවා ය.
එහි සුවඳින් ගෙය පිරීගියේ ය. 4 එවිට, උන්
වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් එක් කෙනෙක් වූ,
උන් වහන්සේ පාවා දීමට සිටි, ජුදස් ඉස්කාරියොත්
කතා කොට, 5 “මේ විලවුන් රිදී කාසි තුන් සියයකට
විකුණා දිළිඳුන්ට නුදුන්නේ මන් දැ?”යි ඇසී ය. 6 ඔහු
මෙසේ කීවේ දිළිඳුන් ගැන කැක්කුමක් තිබුණ නිසා
නොව, ඔහු සොරෙකු වූ බැවිනි. පොදු මුදල්
පසුම්බිය භාර ව සිටි ඔහු, එහි දමන ලද දේ
සොරාගන්නට පුරුදු ව සිටියේ ය. 7 ජේසුස්
වහන්සේ පිළිතුරු දෙමින්, “ඈට කරදර නොකරන්න.
මා භූමදාන කරන දවස සඳහා ඈ එය
තබාගත්තාවේ. 8 ද්වි.නී. 15:11දිළින්දෝ නම් ඔබ
සමඟ නිතර ම සිටිති; එහෙත් මම ඔබ සමඟ නිතර
ම නොසිටිමි”යි වදාළ සේක.

### ලාසරස් මරන්නට කුමන්ත්‍රණය

9 ජුදවේවරුන්ගෙන් මහා සමූහයක් ජේසුස්
වහන්සේ එහි සිටින බව අසා උන් වහන්සේ
දැකීමට පමණක් නොව, උන් වහන්සේ විසින්
මරණයෙන් උත්ථාන කරන ලද ලාසරස් දැකීමට ද
පැමිණියහ. 10 එබැවින්, ලාසරස් ද මරන්නට නායක
පූජකයෝ කුමන්ත්‍රණය කළහ. 11 මන්ද, ඔහු නිසා
ජුදවේවරුන් බොහෝ දෙනෙකු ඔවුන්ගෙන් අහක් ව
ගොස් ජේසුස් වහන්සේ අදහාගත් නිසා ය.

### රාජ තේජසින් ජෙරුසලමට ප්‍රවේශ වීම
(මතෙ 21:1-11;මාක් 11:1-11;ලූක් 19:28-40)

12 පසුදා, මංගල්‍යයට පැමිණ සිටි මහා සමූහයක්
ජේසුස් වහන්සේ ජෙරුසලමට වඩිනා සේකැ යි අසා,
13 ගීතා 118:25,26තල් අතු රැගෙන:
q213 “හෝසන්නා!
q213 සමිඳාණන්ගේ නාමයෙන් වඩිනා තැනැන්
වහන්සේට ආසිරි වේ වා!
q213 ඉශ්‍රායලේ රජු හට ආසිරි වේ වා!”යි
q213 ඔල්වර හඬ නඟමින් උන් වහන්සේගේ
පෙරමඟට පැමිණියහ.
14+JHN සෙකරි 9:9 “සියොන් පුරඟන, බිය
නොවන්න, මෙන්න!
q214+JHN ඔබේ රජ
14+JHN කොටළු වස්සකු පිට නැඟ එන්නේ ය”යි
ලියා තිබෙන ලෙස, උන් වහන්සේ කොටළු
නාම්බෙකු සොයාගෙන ඌ පිට හිඳගත් සේක.
16 උන් වහන්සේගේ ශ්‍රාවකයෝ මේ සිද්ධිය කලින්
තේරුම් නොගත් නමුත්, ජේසුස් වහන්සේ මහිම
ප්‍රාප්ත වූ විට, උන් වහන්සේ ගැන මෙසේ ලියා
තිබුණු බවත්, සෙනඟ මේ සියල්ල උන් වහන්සේ
උදෙසා කළ බවත් සිහි කළහ. 17 උන් වහන්සේ
ලාසරස් සොහොන් ගෙයින් පිටතට කැඳවා, ඔහු
මරණයෙන් උත්ථාන කළ අවස්ථාවේ දී උන්
වහන්සේ සමඟ සිටි සමූහයා ඒ ගැන සාක්ෂි දැරූ හ.
18 සමූහයා උන් වහන්සේගේ පෙරමඟට ගියේ උන්

වහන්සේ මේ හාස්කම කළ බව ඔවුන්ට සැළ වූ
හයෙිනි. 19 එබැවින් පරිසිවරු ඔවුනොවුන් අතර කතා
කරගනිමින්, “අපට කිසිවක් නොකළ හැකි බව
පනෙනෙවා නොවේ ද? බලන්න, මුළු ලෝකය ම
ඔහු පසුපස්සේ ගොස් ඇතැ”යි කී හ.

## ඇතැම් ග්‍රීකයෝ සමිඳුන් සොයති

20 මංගල්‍යයේ දී නමස්කාර කරන පිණිස ගියවුන්
අතර, ග්‍රීකයෝ සමහර දනෙකේ ද සිටියහ.
21 ඔව්හු, ගලීලයේ බෙත්සයිදාවේ පිලිප් වෙතට
පැමිණ, “මහතාණනෙි, අපි ජේසුස් වහන්සේ
දකින්නට කැමැත්තමෙු”යි කී හ. 22 පිලිප් එය
ඇන්ඩෘට කී ය; ඇන්ඩෘ ද පිලිප් ද ජේසුස්
වහන්සේට සැළ කළහ. 23 ජේසුස් වහන්සේ පිළිතුරු
දමෙින්, “මනුෂ්‍ය-පුත්‍රයාණන් මහිමයට පමුණුවනු
ලබන නියමිත මොහොත පැමිණ තිබේ.
24 ඒකාන්තයනේ ම මම ඔබට කියමි, තිරිඟු බීජය
පොළොවෙහි වැටී නොමළොත් එය තනි බීජයක්
පමණක් වේ. එහතේ එය මළොත් සරු ලසෙ පල
දරයි. 25 මතෙ 10:39; 16:25; මාක් 8:35; ලූක් 9:24;
17:33තම ජීවිතයට ඇලුම් කරන්නා එය නැති
කරගනියි; මලෙොව තම ජීවිතයට ද්වේශ කරන්නා
එය සදාතන ජීවනය සඳහා රැකගනියි. 26 යමකේ
මට සේවය කරන්නේ ද, ඔහු මා අනුගාමී විය යුතු
යි. මම යම් තැනකෙ සිටිම් ද මාගේ සේවකයා ද
එහි ම සිටිනු ඇත. යමකේ මට සේවය කරන්නේ ද
මාගේ පියාණෝ ඔහුට ගෞරව කරන සේක.”

## කුරුසිගත වීමේ අවශ්‍යතාව

27 “දැන් මාගේ සිත කැළඹී ඇත; ඉදින් මම කුමක්
කියම් ද? ‘පියාණනෙි, මේ මොහොතනේ මා ගැළවුව
මැනවැ’යි කියම් ද? නැත, මා මේ මොහොතට
පැමිණියේ මේ උදසො ම ය. 28 පියාණනෙි, ඔබගේ
නාමය මහිමයට පැමිණවුව මැනවැ”යි වදාළ සේක.
එවිට, “මම එය මහිමයට පැමිණවීමි, යළිත්
මහිමයට පමුණුවන්නමේ”යි ස්වර්ගයනේ හඬක්
නික්මිණි. 29 එහි සිටි සමූහයා එය අසා,
“ගිගුරුමකැ”යි කී හ. ඇතැමකේ, “දේව දූතයකේ උන්
වහන්සේට කතා කළෙේ ය”යි කී හ. 30 ජේසුස්
වහන්සේ පිළිතුරු දමෙින්, “මේ හඬ පැමිණියේ මා
උදසො නොව ඔබ උදසො ය. 31 මේ ලෝකය
පිළිබඳ විනිශ්චය මොහොත දැන් ය; මේ ලෝකයේ
අධිපතියා දැන් පරාජය කරනු ලැබේ. 32 තවද මා
පොළොවනේ ඔසවනු ලැබූ කල, සියල්ලන් මා
වෙතට ඇදගන්නමේ”යි වදාළ සේක. 33 උන්
වහන්සේ මසෙේ වදාළේ, තමන් වහන්සේ විඳින්නට
යන්නේ කබෙඳු මරණයක් දැ යි හඟවන පිණිස ය.
34 ගීතා 110:4; යසො 9:7; එසකි 37:25; දානි 7:14
සමූහයා උන් වහන්සේට පිළිතුරු දමෙින්, “
‘ක්‍රිස්තුවරයාණෝ සදහට ම වැඩවසති’යි
ව්‍යවස්ථාවලියනේ අප අසා ඇත. එසේ නම් මනුෂ්‍ය-
පුත්‍රයාණන් ඔසවනු ලැබිය යුතු යයි ඔබ කියන්නේ
කසෙේ ද? මේ මනුෂ්‍ය-පුත්‍රයාණෝ කවරකේ දැ”යි
ඇසූ හ. 35 ජේසුස් වහන්සේ පිළිතුරු දමෙින්, “තව
මඳ කලක් ආලෝකය ඔබ අතර පවතිනු ඇත.
අන්ධකාරය ඔබ ග්‍රහණය නොකරන පිණිස,
ආලෝකය තිබිය දී ඇවිදින්න. අන්ධකාරයේ ඇවිදින
තැනැත්තේ ඔහු යන්නේ කොහේ දැ යි නොදනී.
36 ඔබ ආලෝකයේ පුත්‍රයන් වන පිණිස ඒ
ආලෝකය අදහාගන්නැ”යි වදාළ සේක.
36 ජේසුස් වහන්සේ මසෙේ වදාළ පසු ඔවුන්ගනේ
වනේ වී සැඟවී වැඩහුන් සේක.

## ජුදෙව්වරුන්ගේ අවිශ්වාසය

37 උන් වහන්සේ ඔවුන් ඉදිරියේ එපමණ හාස්කම්
සිදු කළ නමුදු, ඔවුන් උන් වහන්සේ අදහාගත්තේ
නැත. 38 යසො 53:1එසේ සිදුවූයේ:
38 “සමිඳාණනෙි, අපේ පුවත විශ්වාස කළෙේ
කවරකේ ද? සමිඳාණන්ගේ බලය කවරකුෙට
ප්‍රකාශ කරන ලද්දේ ද?”
38 යනුවනේ, යසොයා දිවැසිවරයා කී වචන ඉටු
වන පිණිස ය. 39 ඒ නිසා ඔවුන්ට අදහාගත
නොහැකි විය. මන්ද, යසොයා නැවතත් මසෙේ කී
ය:
40 යසො 6:10 “උන් වහන්සේ ඔවුන්ගේ ඇස් අන්ධ
කළ සේක.
q240 සිත් දැඩි කළ සේක, එසේ කළෙේ, ඔවුන්
ඇසින් නොදැක, සිතින් තේරුම් නොගනෙ, මාගනේ
සුවය ලැබීමට මා වතෙ නොහැරනෙ පිණිස ය.”
41 යසොයා මසෙේ කීවේ, ඔහු උන් වහන්සේගේ
තේජශ්‍රීය දැක උන් වහන්සේ ගැන කතා කළ නිසා
ය. 42 එසේ වුව ද, ප්‍රධානීන්ගනේ බොහෝ
දනෙකේ උන් වහන්සේ අදහාගත්හ. එහතේ තමන්
ධර්මශාලාවනේ නරෙපනු ලබති යි පරිසිවරුන්ට
බියනේ එය එළිපිට නොකී හ. 43 මන්ද, ඔව්හු
දවෙියන් වහන්සේගනේ ලැබනෙ ගෞරවයට වඩා
මිනිසුන්ගනේ ලැබනෙ ගෞරවයට ඇලුම් වූ හ.

## ධර්මය අනුව විනිශ්චය

44 එවිට ජේසුස් වහන්සේ මහ හඬින් කතා
කරමින්, “මා අදහන තැනැත්තේ, මා නොව, මා එවා
වදාළ තැනැන් වහන්සේ අදහාගනියි. 45 එසේ ම මා
දකින තැනැත්තේ, මා එවා වදාළ තැනැන් වහන්සේ
දකියි. 46 මා ලෝකයට ආලෝකයක් ව වැඩියේ මා
අදහන කවරකුෙ නමුදු අන්ධකාරයහෙි නොවසන
පිණිස ය. 47 තවද, යමකේ මාගේ වචන අසා ඒවා
නොපිළිපදින්නේ නම්, මම ඔහු විනිශ්චය නොකරමි.
මා ආවේ ලෝකය ගළවන්ට මිස විනිශ්චය
කරන්නට නොවේ. 48 මා ප්‍රතික්ෂේප කර මාගේ
වචන නොපිළිගන්නා අය විනිශ්චය කරන්නකේ
සිටියි. මා වදාළ ධර්මය ම අන්තිම දවසේ දී ඔහු
විනිශ්චය කරන්නේ ය. 49 මන්ද, මම මාගේ ම
අධිකාරී බලයනේ කතා නොකළෙමේ; මා එවා වදාළ
පියාණන් වහන්සේ මා කිව යුතු දයෙත්, දසෙිය යුතු
දයෙත් ගැන මට ආඥාවක් දී තිබේ. 50 උන්
වහන්සේගේ ආඥාව සදාතන ජීවනය වන බව මම

දනිමි. එබැවින් මා පවසන දේ, පියාණන් වහන්සේ
මට පැවසූ ලෙසින් ම මමත් පවසමි"යි වදාළ සේක.

### ශ්‍රාවකයන්ගේ පාද සේදීම

13 තමන් මෙලොවින් ඉකුත් ව පියාණන් වෙතට
යාමේ නියමිත මොහොත පැමිණ තිබෙන
බව පාස්කු මංගල්‍යයට පෙර, ජේසුස් වහන්සේ
දැනගත් සේක. උන් වහන්සේ මෙලොව තම
හිතවතුන්ට ප්‍රේම කළ සේක; අන්තිම දක්වා ම
ඔවුන්ට ප්‍රේම කළ සේක.
2 රාත්‍රී භෝජනය වළඳන වේලාව පැමිණියේ ය.
යක්ෂයා උන් වහන්සේ පාවා දීමට සීමොන්ගේ පුත්
ජූදස් ඉස්කාරියොත්ගේ සිත ඒ වන විටත් පොළඹවා
තිබිණි. 3 පියාණන් වහන්සේ තමන් අතට සියල්ල
පවරා දී තිබෙන බව ද තමන් දෙවියන් වහන්සේ
වෙතින් වැඩම කළ බව ද තමන් දෙවියන් වහන්සේ
වෙතට වැඩම කරන බව ද දැන, 4 රාත්‍රී
භෝජනයෙන් පසු උන් වහන්සේ නැඟිට තම සළුව
ගලවා තබා, තුවායක් ගෙන ඉණ වටා බැඳගත්
සේක. 5 ඉන්පසු උන් වහන්සේ භාජනයකට වතුර
වත්කොට, ශ්‍රාවකයන්ගේ පාද සෝදන්නටත්, තමන්
ඉණ බැඳගෙන සිටි තුවායෙන් පිසදමන්නටත්
පටන්ගත් සේක. 6 උන් වහන්සේ සීමොන් පේදුරු
ළඟට ආ විට, "ස්වාමීනි, ඔබ වහන්සේ මාගේ
පාදත් සෝදන සේක් දැ"යි ඔහු ඇසී ය. 7 ජේසුස්
වහන්සේ පිළිතුරු දෙමින්, "මා කරන්නේ කුමක් දැ යි
ඔබ දැන් නොදන්නහෙි ය; එහෙත් පසුව ඔබට
වැටහෙනු ඇතැ"යි වදාළ සේක. 8 එවිට පේදුරු, "මා
දිවි ඇතිතෙක් කවදාවත් මාගේ පාද සෝදන්නට නම්
ඔබ වහන්සේට ඉඩ නොදෙමි"යි කී ය. ජේසුස්
වහන්සේ පිළිතුරු දෙමින්, "මා ඔබ නොසේදුවොත්
මා සමඟ සම්බන්ධකමක් ඔබට නැතැ"යි ඔහුට
වදාළ සේක. 9 එවිට සීමොන් පේදුරු, "ස්වාමීනි,
මාගේ පාද පමණක් නොව අත් ද හිස ද සේදුව
මැනවැ"යි කී ය. 10 ජේසුස් වහන්සේ ද, "ස්නානය
කළ තැනැත්තේ මුළුමනින් ම පවිත්‍ර ය; පාද සේදීම
හැර ඔහු තවත් සෝදනු ලබන්න වුවමනා නැත. ඔබ
ද පවිත්‍ර ය; එහෙත් හැම කෙනෙක් ම එසේ
නොවෙති"යි වදාළ සේක. 11 "හැම කෙනෙක් ම
පවිත්‍ර නොවෙති"යි උන් වහන්සේ වදාළේ, තමන්
පාවා දෙන්නා කවරෙක් දැ යි දැන සිටි බැවිනි.
12 ලූක් 22:27 මෙසේ උන් වහන්සේ ඔවුන්ගේ පාද
සෝදා, තමන් උතුරු සළුව හැඳගෙන නැවත හිඳගත්
කල, ඔවුන්ට මෙසේ වදාළ සේක: "මා ඔබට කළ
දේ කිමෙක් දැ යි ඔබ දන්නහු ද? 13 'ගුරුදේවයෙනි',
'ස්වාමීනි' කියා ඔබ මා අමතන්නහු ය. එසේ කීම
හරි ය; මම එසේ ම වෙමි. 14 ඔබේ ස්වාමීන් ද
ගුරුදේවයන් ද වන මම ඔබේ පාද සේදුවෙමේ නම්,
ඔබත් එකිනෙකාගේ පාද සේදිය යුතු ය. 15 මා
ඔබට, කළාක් මෙන් ඔබත් කළ යුතු බවට
ආදර්ශයක් මම දුනිමි. 16 මතෙ 10:24; ලූක් 6:40;
ජොහ 15:20ඒකාන්තයෙන් ම මම ඔබට කියමි,
දාසයෙක් තම ස්වාමියාට වඩා උසස් නොවේ.
එමෙන් ම, යවන ලද්දෙක් ඔහු යවන්නාට වඩා උසස්
නොවේ. 17 ඉදින් ඔබ මේ දේවල් දන්නහු නම්,
දැන ඒවා පිළිපදින්නහු නම්, ඔබ භාග්‍යවන්තයෝ ය.
18 ගීතා 41:9මා කතා කරන්නේ ඔබ හැම දෙනා
ගැන ම නොවේ. මා තෝරාගත් අය මම හඳුනමි.
එහෙත්, 'මාගේ භෝජන වළඳන තැනැත්තා මට
විරුද්ධ ව නැඟී ඇත' යන ශුද්ධ ලියවිල්ල ඉෂ්ට විය
යුතු ය. 19 එය ඉටු වූ විට, මම උන් වහන්සේ ම
යයි ඔබ විශ්වාස කරන පිණිස එය ඉටු වන්න පෙර
දැන් පවසමි. 20 මතෙ 10:40; මාක් 9:37; ලූක් 9:48;
10:16ඒකාන්තයෙන් ම මම ඔබට කියමි, මා යවන
කවරෙකු නමුත් පිළිගන්නා මා පිළිගනියි; මා
පිළිගන්නා මා එවා වදාළ තැනැන් වහන්සේ
පිළිගනියි."

### පාවා දීම කලින් දැන්වීම

(මතෙ 26:20-25;මාක් 14:17-21;ලූක් 22:21-23)

21 ජේසුස් වහන්සේ මෙසේ පවසා, බොහෝ සේ
කැළඹී, "ඒකාන්තයෙන් ම මම ඔබට කියමි, ඔබ
අතරෙන් කෙනෙක් මා පාවා දෙන්නේ ය"යි ප්‍රකාශ
කළ සේක. 22 උන් වහන්සේ එසේ කීමෙන්
කවරෙකු අදහස් කළ සේක් දැ යි වියවුල් වූ
ශ්‍රාවකයෝ එකිනෙකා දෙස බැලූ හ. 23 ජේසුස්
වහන්සේගේ ශ්‍රාවකයන් අතරෙන් උන් වහන්සේ
ප්‍රේම කළ තැනැත්තා උන් වහන්සේගේ ළයට ළං
ව හාන්සි වී සිටියේ ය. 24 එබැවින් සීමොන් පේදුරු
ඔහුට සංඥා කොට, "උන් වහන්සේ කවරෙකු
අදහස් කළ සේක් දැ යි කිව මැනවැ"යි ඔහුට කී ය.
25 ඔහු ද, සිටි ලෙසෙ ම ජේසුස් වහන්සේගේ ළයට
නැඹුරු වී, "ස්වාමීනි, ඒ කවුරු දැ"යි ඇසී ය. 26 එවිට
උන් වහන්සේ පිළිතුරු දෙමින්, "මම රොටි කෑල්ලක්
පොඟවා යමෙකුට දෙමේ ද, ඒ ඔහු ය"යි වදාළ
සේක. මෙසේ උන් වහන්සේ ඒ කෑල්ල පොඟවා
සීමොන් ඉස්කාරියොත්ගේ පුත් ජූදස්ට දුන් සේක.
27 ඔහු ඒ කෑල්ල අතට ගත් විගස ඔහුට සාතන්
ආවේශ විය. එවිට ජේසුස් වහන්සේ ඔහු අමතා,
"ඔබේ අදහස වහා ම ඉටු කරන්නැ"යි වදාළ සේක.
28 උන් වහන්සේ කුමක් නිසා මෙසේ වදාළ සේක්
දැ යි කෑමට හිඳගත් අයගෙන් කිසිවෙක් තේරුම්
නොගත්හ. 29 ජූදස් පොදු මුදල් පසුම්බිය භාර ව
සිටි බැවින්, මංගල්‍යයට වුවමනා දේ මිල දී ගන්න
කියා හෝ දිළිඳුන්ට යමක් දෙන්න කියා හෝ ජේසුස්
වහන්සේ ඔහුට වදාළ සේකැ යි සමහරු සිතූ හ.
30 ඔහු ඒ රොටි කෑල්ල අතට ගත් පසු, නොපමා ව
පිටතට ගියේ ය. එය රෑ කාලය වී ය.

### අලුත් ආඥාව

31 ජූදස් පිටතට ගිය කල, ජේසුස් වහන්සේ කතා
කොට, "දැන් මනුෂ්‍ය-පුත්‍රයාණන් මහිමයට පැමිණ
ඇත. 32 එතුමාණන් තුළින් දෙවියන් වහන්සේ ද
මහිමයට පැමිණි සේක් නම්, දෙවියන් වහන්සේ
තමන් තුළින් ඔහු ද මහිමයට පමුණුවන සේක. එය
වහා ම කරන සේක. 33 ජොහ 7:34දරුවෙනි, මා ඔබ

සමඟ සිටින්නේ තව ටික වේලාවක් පමණකි. ඔබ
මා සොයනු ඇත. එහෙත් මා ජුදෙව්වරුන්ට කීවාක්
මෙන් දැන් ඔබටත් කියමි: මා යන තැනට ඔබට
පැමිණිය නොහැකි ය; 34 ජොහ 15:12,17; 1 ජොහ
3:23; 2 ජොහ 5මම ඔබට අලුත් ආඥාවක් දමේ.
එකිනකොට ප්‍රේම කරන්න. මා ඔබට ප්‍රේම
කළාක් මෙන් ඔබත් එකිනකොට ප්‍රේම කරන්න.
35 ඔබ එකිනකොට ප්‍රේම කරන්නහු නම්, එයින්
ඔබ මාගේ ශ්‍රාවකයන් බව සියල්ලෝ දැනගනිති"යි
වදාළ සේක.

### පේදුරුගේ අපලාපය කලින් කීම
(මතෙ 26:31-35;මාක් 14:27-31;ලූක් 22:31-34)

36 සීමොන් පේදුරු කතා කොට, "ස්වාමීනි, ඔබ
කොතැනට වඩින සේක් දැ"යි ඇසී ය. ජේසුස්
වහන්සේ පිළිතුරු දමේන්, "මා යන තැනට ඔබට දැන්
පැමිණිය නොහැකි ය; එහෙත් පසුව ඔබ පැමිණෙනු
ඇතැ"යි වදාළ සේක. 37 පේදුරු උන් වහන්සේ
අමතා: "ස්වාමීනි, දැන් ම ඔබ අනුව එන්න මට බැරි
මන් ද? ඔබ නිසා මාගේ දිවි පුදමි"යි කී ය.
38 ජේසුස් වහන්සේ පිළිතුරු දමේන්, "ඔබ මා නිසා
ඔබේ දිවි පුදන්නහෙි ද? ඒකාන්තයෙන් ම මම ඔබට
කියමි, කුකුළා හඬලන්නට පෙර, ඔබ මා
නොහඳුනති යි තුන් වරක් කියනු ඇතැ"යි වදාළ
සේක.

### ස්වර්ග මාර්ගය

14 "ඔබේ සිත් නොකැළඹේ වා! දවේයන්
වහන්සේ අදහාගන්නමා ද අදහාගන්න.
2 මාගේ පියාණන් වහන්සේගේ නිවාසයෙහි වාසය
කිරීමට ඉඩපහසු තැන් බොහෝ ඇත. එසේ
නොවේ නම් ඒ බව මම ඔබට නොකියම් ද? ඔබට
ස්ථානයක් සූදානම් කරන පිණිස යමි. 3 මා ගොස්
ඔබට ස්ථානයක් සූදානම් කළ විට, මා සිටින තැන
ඔබත් සිටින පිණිස ඔබ කැඳවාගෙන යාමට මම
නැවත එන්නමේ. 4 මා යන ස්ථානයට මාර්ගය ඔබ
දන්නහු ය"යි වදාළ සේක.
5 තෝමස් කතා කොට, "ස්වාමීනි, ඔබ කොතැනට
වඩින සේක් දැ යි අපි නොදනිමු; එසේ නම් මාර්ගය
දැනගන්නේ කෙසේ දැ"යි ඇසී ය. 6 ජේසුස්
වහන්සේ පිළිතුරු දමේන්, "මාර්ගය ද සත්‍යය ද
ජීවනය ද මම වමේ; මා මඟින් මිස කිසිවකේ
පියාණන් වහන්සේ වෙත නොපැමිණෙන්නෝ ය.
7 ඔබ මා හඳුනන්නහු නම්, මාගේ පියාණන්
වහන්සේත් හඳුනන්නහු ය. මෙතැන් පටන් ඔබ උන්
වහන්සේ හඳුනන්නහු ය; උන් වහන්සේ දැක
ඇතැ"යි වදාළ සේක.
8 පිලිප් කතා කොට, "ස්වාමීනි, පියාණන් වහන්සේ
අපට පෙන්වා වදාළ මැනව; එය අපට හොඳට ම
ඇතැ"යි උන් වහන්සේට කී ය. 9 ජේසුස් වහන්සේ
පිළිතුරු දමේන්, "පිලිප්, මෙපමණ කලක් මා ඔබ
සමඟ විසූ නමුදු, තවමත් ඔබ මා හඳුනන්නේ නැද්
ද? මා දුටු තැනැත්තේ, පියාණන් වහන්සේ දුටුවේ
ය. එසේ නම්, 'පියාණන් වහන්සේ අපට පෙන්වා
වදාළ මැනවැ'යි ඔබ කියන්නේ කෙසේ ද? 10 මා
පියාණන් වහන්සේ තුළ ද පියාණන් වහන්සේ මා
තුළ ද සිටින බව ඔබ විශ්වාස නොකරන්නහෙි ද?
මා ඔබ හට වදාරන වචන මාගේ ම අධිකාරී
බලයෙන් නොවදාරමි; පියාණන් වහන්සේ ම මා තුළ
වැඩවසමින් ස්වකීය ක්‍රියා ඉටු කරන සේක. 11 මා
පියාණන් වහන්සේ තුළ ද පියාණන් වහන්සේ මා
තුළ ද සිටින බවට මාගේ වචනය විශ්වාස කරන්න;
එසේ නැත්නම් මාගේ ක්‍රියා නිසා වත් මා විශ්වාස
කරන්න.
12 "ඒකාන්තයෙන් ම මම එසේ, ඔබට කියමි, මා
අදහන්නා මා කරන ක්‍රියා ද කරන්නේ ය. තවද මා
පියාණන් වහන්සේ වෙතට වඩින බැවින් ඔහු මීටත්
වඩා මහත් ක්‍රියා කරන්නේ ය. 13 පුත්‍රයා තුළ
පියාණන් වහන්සේ මහිමයට පමුණුවනු ලබන
පිණිස, ඔබ මාගේ නාමයෙන් අයැදින කවර දයෙක්
වුව ද මම ඉටු කරන්නමේ. 14 ඔබ මාගේ නාමයෙන්
අයැදින කවර දයෙක් වුව ද මම ඉටු කරන්නමේ."

### සහායදායකයාණන් එවීම ගැන පොරොන්දුව

15 "ඔබ මට ප්‍රේම කරන්නහු නම්, ඔබ මාගේ
ආඥා පිළිපදින්නහු ය. 16 එවිට මම පියාණන්
වහන්සේගෙන් අයැදින්නමේ; උන් වහන්සේ ද ඔබ
සමඟ සදහට ම සිටින පිණිස වනෙත්
සහායදායකයකු දනෙ සේක. 17 ඒ
සහායදායකයාණෝ, සත්‍යයේ ආත්මයාණෝ ය. උන්
වහන්සේ පිළිගැනීමට ලෝකයා අපොහොසත් ය.
මන්ද, ලෝකයා උන් වහන්සේ දකින්නේ වත්
හඳුනන්නේ වත් නැත. එහෙත්, ඔබ උන් වහන්සේ
හඳුනන්නහු ය. මන්ද, උන් වහන්සේ ඔබ සමඟ
නැවතී සිටිමින්, ඔබ තුළ වැඩ වසන සේක.
18 "ඔබ අනාථ වීමට ඉඩ නොදනේනමේ, මම
නැවත ඔබ වෙතට එන්නමේ. 19 තව ස්වල්ප
වේලාවකින් ලෝකයා මා තවත් නොදකිති. එහෙත්
ඔබ මා දකින්නහු ය; කුමක් හයෙින් ද, මා ජීවත්
වන නිසා ඔබත් ජීවත් වන බැවිනි. 20 ඒ දවසේ දී,
මා පියාණන් වහන්සේ තුළ ද ඔබ මා තුළ ද මා ඔබ
තුළ ද සිටින බව ඔබ දැනගන්නහු ය.
21 "මාගේ ආඥා පිළිගෙන ඒවා පිළිපදින යම්
තැනැත්තකේ වේ ද, මට ප්‍රේම කරන්නේ ඔහු ය.
යම් තැනැත්තකේ මට ප්‍රේම කරන්නේ ද මාගේ
පියාණන් වහන්සේත් ඔහුට ප්‍රේම කරන සේක.
මම ද ඔහුට ප්‍රේම කොට ඔහුට එළිදරව්
වන්නමේ"යි වදාළ සේක.
22 ජූදස් ඉස්කාරියොත් නොවන අනකේ ජූදස් උන්
වහන්සේ අමතා: "ස්වාමීනි, ඔබ වහන්සේ අපට
එළිදරව් වී ලෝකයාට එළිදරව් නොවන්නේ කෙසේ
දැ"යි ඇසී ය. 23 ජේසුස් වහන්සේ ඔහුට පිළිතුරු
දමේන්, "යමකේ මට ප්‍රේම කරන්නේ නම්,
හතෙමෙ මාගේ ධර්මය පිළිපදින්නේ ය. මාගේ
පියාණන් වහන්සේ ද ඔහුට ප්‍රේම කරන සේක.
අපි ඔහු වෙතට පැමිණ ඔහු සමඟ වාසය

කරන්නමෙ. 24 මට ප්‍රේම නොකරන්නා මාගේ
ධර්මය නොපිළිපදියි. ඔබ අසන ධර්මය මාගේ
නොව, මා එවා වදාළ පියාණන් වහන්සේගේ
ධර්මය ය.
25 “ඔබ සමඟ සිටින අතර මම මේ දේවල් ඔබට
කීවමේ. 26 එහෙත් මාගේ නාමයනේ පියාණන්
වහන්සේ එවන සහායදායකයාණන් වහන්සේ,
එනම්, ශුද්ධාත්මයාණන් වහන්සේ සියල්ල ඔබට
උගන්වමින්, මා වදාළ සියල්ල ඔබට සිහිපත් කරවන
සේක.
27 “ශාන්තිය ඔබ වෙත ප්‍රදානය කර යමි; මාගේ
ශාන්තිය ඔබට දමේ. මා එය ඔබට දනේනේ
ලෝකයා දනේනාක් මනේ නොවේ. ඔබේ සිත්
කැළඹනේනට වත් බිය වන්නට වත් ඉඩ නොදනේන.
28 මම ගොස් නැවත ඔබ වෙතෙට එමි යි මා ඔබට
කී බව ඔබ ඇසුවාහු ය. ඔබ මට ප්‍රේම කළාහු
නම් මා පියාණන් වහන්සේ වෙතෙට යන බැවින් ඔබ
ප්‍රීති වන්නහු ය. මන්ද, පියාණන් වහන්සේ මට
වඩා උතුම් ය. 29 ඒ දේ සිදු වූ කල ඔබ විශ්වාස
කරන පිණිස, එය සිදු වන්න පරෙ, දැනට ම ඔබට
කියා ඇත. 30 තවදුරටත් ඔබ සමඟ කතා කිරීමට
නුපුළුවන. ලෝකයේ අධිපතියා එන්නේ ය. මා
කරෙහෙි කිසි බලපුළුවන්කාරකමක් ඔහුට නැත.
31 එහෙත් මසෙේ වන්නේ මා පියාණන් වහන්සේට
ප්‍රේම කරන බවත්, පියාණන් වහන්සේ මට අණ
කළ ලසෙ මා කරන බවත් ලෝකයා දැනගන්නා
පිණිස ය. නැඟිටින්න, අපි මතෙැනින් පිටත් ව යමු”යි
වදාළ සේක.

## සැබෑ මිදි වැල

15 “සැබෑ මිදි වැල මම ය; මාගේ පියාණන්
වහන්සේ උද්‍යාන පාලකයාණෝ ය. 2 උන්
වහන්සේ, මා තුළ ඇති, පල නොදරන සියලු අතු
කපා හරින සේක. පල දරන සියලු අතු, වඩා පල
දරන පිණිස පාහින සේක. 3 මා ඔබට වදාළ දහම
කරණකොටගනෙ ඔබ දැනට ම පිරිසිදු ය. 4 මා තුළ
සිටින්න, මම ද ඔබ තුළ සිටිමි. අත්ත මිදි වැලට යා
වී නැත්නම් වනේ ව පල දරන්නට ඊට නොහැකි
සේ, ඔබ මා හා ඒකාබද්ධ නොවන්නහු නම්, පල
දැරීමට ඔබට නොහැකි ය.
5 “මිදි වැල මම ය, ඔබ අතු ය. යමකේ මා තුළ
සිටින්නේ ද, මම ඔහු තුළ සිටිම් ද, ඒ තැනැත්තේ
බොහෝ පල දරයි. මන්ද, මාගනේ වනේ ව කිසිවක්
කරන්නට ඔබට නොහැකි ය. 6 යම් තැනැත්තකේ මා
තුළ නොසිටින්නේ නම් ඔහු අත්තක් මනේ පිටත
දමනු ලැබ වියළී යයි. වියළි අතු එක්රැස් කොට
ගින්නට දමනු ලැබේ; ඒවා දැවී යන්නේ ය. 7 ඔබ
මා තුළ සිටින්නහු නම්, මාගේ වචන ඔබ තුළ පවතී
නම්, ඔබ කැමැති දයෙක් අයැදින්න; එය ඔබට දනෙු
ලැබේ; 8 මාගේ පියාණන් වහන්සේ මහිමයට
පමුණුවනු ලබන්නේ, ඔබ බොහෝ සේ පල දරමින්
මාගේ ශ්‍රාවකයන් වීමනේ ය. 9 පියාණන් වහන්සේ
මට ප්‍රේම කළාක් මනේ ම මම ද ඔබට ප්‍රේම
කළෙමේ. මාගේ ප්‍රේමයහෙි පවතින්න. 10 මා,
මාගේ පියාණන් වහන්සේගේ ආඥා පිළිපැද උන්
වහන්සේගේ ප්‍රේමයහෙි පවතින සේ ම, ඔබත්
මාගේ ආඥා පිළිපදින්නහු නම්, මාගේ ප්‍රේමයහෙි
පවතින්නහු ය.
11 “මේ දේවල් මා ඔබට ප්‍රකාශ කළෙේ, මාගේ
ප්‍රීතිය ඔබ තුළ ඇති වන පිණිසත්, ඔබේ ප්‍රීතිය
පරිපූර්ණ වන පිණිසත් ය.
12 ජොහ 13:34; 15:17; 1 ජොහ 3:23; 2 ජොහ 5
“මාගේ ආඥාව නම්: ‘මා ඔබට ප්‍රේම කළාක් මනේ
ඔබත් එකිනකොට ප්‍රේම කරන්න’ යනුයි.
13 යමකෙු තමාගේ මිතුරන් උදසො දිවි පිදීමට වඩා
උතුම් ප්‍රේමයක් කිසිවකෙුට නැත. 14 මා ඔබට අණ
කරන දේ ඔබ කරන්නහු නම්, ඔබ මාගේ මිතුරෝ
ය. 15 මතෙැන් පටන් මම ඔබට දාසයෝ යයි
නොකියමි; මන්ද, දාසයකේ තමාගේ ස්වාමියා
කරන්නේ කුමක් දැ යි නොදනියි. එහෙත්, මාගේ
පියාණන් වහන්සේගනේ මා ඇසූ සියල්ල ම ඔබට
දන්වා වදාළ බැවින්, මම ඔබට මිත්‍රයෝ යයි
කීවමේ. 16 ඔබ මා තෝරාගත්තේ නැත. මම ඔබ
තෝරාගනෙ පත් කළෙමේ. එසේ කළෙේ ඔබ ගොස්
බොහෝ පල දරන පිණිසත්, ඔබේ පල පවතින
පිණිසත්, මාගේ නාමයනේ ඔබ පියාණන්
වහන්සේගනේ ඉල්ලන කවර දයෙක් වුව ද උන්
වහන්සේ ඔබට දනෙ පිණිසත් ය. 17 මා ඔබට අණ
කරන දේ මේ ය: එකිනකොට ප්‍රේම කරන්න.”

## ලෝකයාගේ ද්වේෂය

18 “ලෝකයා ඔබට ද්වේෂ කරත් නම්, ඔබට පරෙ
මටත් ද්වේෂ කළ බව දැනගන්න. 19 ඔබ ලෝකයට
අයිති නම්, ලෝකයා ස්වකීය අයට මනේ ඔබට
ඇලුම් වනු ඇත. එහෙත් ඔබ ලෝකයට අයිති
නොවන නිසාත්, ලෝකයා කරෙනේ මා ඔබ
තෝරාගත් නිසාත් ලෝකයා ඔබට ද්වේෂ කරති.
20 මතෙ 10:24; ලූක් 6:40; ජොහ 13:16‘දාසයකේ
තම ස්වාමියාට වඩා උතුම් නොවේ ය’යි මා ඔබට
වදාළ වචනය සිහි කරන්න. ඔව්හු මට පීඩා කළෝ
නම්, ඔබටත් පීඩා කරන්නෝ ය; මාගේ වචනය
පිළිපැද්දෝ නම්, ඔබගේ වචනයත් පිළිපදින්නෝ ය.
21 එහෙත් ඔවුන්, මා එවා වදාළ උන් වහන්සේ ව
නාඳුනන බැවින්, මාගේ නාමය නිසා මේ සියල්ල
ඔවුන් ඔබට කරනු ඇත. 22 මම පැමිණ ඔවුන්ට
කතා නොකළෙමේ නම්, ඔවුන්ට පාපයක් නැත.
එහෙත්, දැන් ඔවුන්ගේ පාපය ගැන නිදහසට
කරුණක් ඔවුන්ට නැත. 23 මට ද්වේෂ කරන්නා
මාගේ පියාණන් වහන්සේටත්, ද්වේෂ කරන්නේ ය.
24 වනෙ කිසිවකෙු කවදා වත් නොකළ මවෙනි
ක්‍රියා මම ඔවුන් අතර නොකළෙමේ නම්, ඔවුන්ට
පාපයක් නැත. එහෙත්, දැන් ඔව්හු ඒවා දැක දැකත්,
මට ද මාගේ පියාණන් වහන්සේට ද ද්වේෂ කරති.
25 ගීතා 35:19; 69:4මසෙේ සිදු වන්නේ, ‘ඔව්හු
හේතුවක් නැති ව මට ද්වේෂ කළහ’යි ඔවුන්ගේ

ව්‍යවස්ථාවලියෙහි ලියා ඇති වචනය ඉෂ්ට වන
පිණිස ය.
26 “මා විසින් ඔබ වෙත එවා වදාරන
සහායදායකයාණන්, එනම්, පියාණන් වහන්සේ
වෙතින් නික්මෙන සත්‍යතාවේ ආත්මයාණන් පැමිණි
කල උන් වහන්සේ මා ගැන සාක්ෂි දරන සේක.
27 තවද, මුල සිට ම ඔබ මා සමඟ සිටි බැවින්
ඔබත් සාක්ෂිකාරයෝ වන්නහු ය.
16 “මේ දේවල් මා ඔබට කීවේ ඔබ
අධෛර්යයට පත් නොවන පිණිස ය. 2 ඔවුන්
ධර්මශාලාවලින් ඔබ නෙරපාදමනු ඇත. එපමණක්
නොව, ඔබ මරණයට පත් කරන අය, එය තමන්
විසින් දෙවියන් වහන්සේට කරන පූජාවකැ යි සිතන
කාලයක් පැමිණෙන්නේ ය. 3 ඔවුන් මේ දේවල්
කරන්නේ, ඔවුන් පියාණන් වහන්සේ ද මා ද
නොහඳුනන බැවිනි. 4 තවද, මා මේ දේවල් ඔබට
කීවේ, ඒවා ඉටු වන කාලය පැමිණි විට, ඒවා ගැන
මා කී බව ඔබට සිහි වන පිණිස ය.”

## ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියා

4 “මේ දේවල් මුල සිට ම ඔබට නොකීවේ, මා
ඔබ සමඟ සිටි බැවිනි. 5 එහෙත් දැන් මා එවා වදාළ
තැනැන් වහන්සේ වෙතට යමි. එසේ වුව ද, ‘ඔබ
කොහේ යන්නේ දැ’යි ඔබ අතරෙන් කිසිවෙක්
මගෙන් නොඅසති. 6 එනමුත්, මා මේ දේවල් ඔබට
කී බැවින්, ඔබේ සිත් දුකින් පිරී ඇත. 7 කෙසේ
වෙතත් මම ඔබ හට සැබෑව පවසමි. මාගේ නික්ම
යාම ඔබේ ශුභසිද්ධිය පිණිස ය. මා නික්ම
නොගියොත් සහායදායකයාණන් වහන්සේ ඔබ
වෙත වැඩම නොකරන සේක. එහෙත් මම යන්නෙමි
නම්, උන් වහන්සේ ඔබ වෙත එවන්නෙමි.
8 උන් වහන්සේ පැමිණි කල, පාපය ගැන ද
ධර්මිෂ්ඨකම ගැන ද විනිශ්චය ගැන ද ලෝකයාට
වටහා දෙන සේක. 9 පාපය ගැන යයි කීවේ, ඔවුන්
මා නොඅදහන බැවිනි; 10 ධර්මිෂ්ඨකම ගැන යයි
කීවේ, මින්පසු ඔබ මා නොදකින සේ, මා පියාණන්
වහන්සේ වෙතට යන බැවිනි. 11 විනිශ්චය ගැන යයි
කීවේ, මේ ලෝකයේ අධිපතියා විනිශ්චය කරන
ලද බැවිනි.
12 “ඔබට කීමට තව බොහෝ දේ මට ඇත.
එහෙත්, දැන් ඒවා දරාගැනීමට ඔබට නොහැකි ය.
13 එසේ වී නමුත්, ඒ තැනැන් වහන්සේ, එනම්,
සත්‍යතාවේ ආත්මයාණන් වහන්සේ පැමිණි කල,
උන් වහන්සේ සම්පූර්ණ සත්‍යය කරා යෑමට ඔබට
මඟපෙන්වන සේක. මන්ද, උන් වහන්සේ සිය
කැමැත්තෙන් ම කතා නොකොට, උන් වහන්සේ
අසන දේ ම පවසා, මතු සිදුවන දේ ඔබට ප්‍රකාශ
කරනු ඇත. 14 උන් වහන්සේ මා සතු දෙයින් ගෙන
ඔබට ප්‍රකාශ කරන බැවින්, මා මහිමයට පමුණුවන
සේක. 15 පියාණන් සතු සියල්ල මාගේ ය.
ආත්මයාණන් වහන්සේ මා සතු දෙයින් ගෙන ඔබට
ප්‍රකාශ කරන සේකැ යි මා කීවේ එබැවිනි.”

## දොම්නස සොම්නසට හැරේ

16 “ස්වල්ප වේලාවකින් ඔබ මා තවත්
නොදක්නහු ය; එහෙත් තව ස්වල්ප වේලාවකින්
ඔබ මා දක්නහු ය”යි උන් වහන්සේ වදාළ සේක.
17 එබැවින් උන් වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන්
සමහරෙක් තම තමන් අතර කතා කරගනිමින්: “
‘ස්වල්ප වේලාවකින් ඔබ මා තවත් නොදක්නහු ය;
එහෙත් තව ස්වල්ප වේලාවකින් ඔබ මා දක්නහු ය,’
කියා ද එයට හේතුව ‘මා පියාණන් වහන්සේ
වෙතට යන නිසා ය’ කියා ද උන් වහන්සේ අපට
වදාරන මේ කතාව කුමක් දැ”යි කී හ. 18 “උන්
වහන්සේ ‘ස්වල්ප වේලාවකැ’යි කියන මේ දේ
කුමක් ද? උන් වහන්සේ කියන කතාව අපට
නොතේරේ” යයි කී හ.
19 ඔවුන් තමන් වහන්සේගෙන් ප්‍රශ්න කරන්නට
අදහස් කළ බව ජේසුස් වහන්සේ දැන, මෙසේ
ඔවුන්ට වදාළ සේක: “ ‘ස්වල්ප වේලාවකින් ඔබ මා
තවත් නොදක්නහු ය; එහෙත් තව ස්වල්ප
වේලාවකින් ඔබ මා දක්නහු’යි මා කී මේ කරුණ
ගැන ඔබ එකිනෙකා විචාරන්නහු ද?
20 ඒකාන්තයෙන් ම මම ඔබට කියමි, ඔබ හඬා
වැලපෙන්නහු ය; එහෙත් ලෝකයා ප්‍රීති වන්නාහ.
ඔබ දොම්නස් වන නමුත් ඔබේ දොම්නස
සොම්නසට හැරෙනු ඇත. 21 ස්ත්‍රියකට ප්‍රසව
මොහොත පැමිණි කල, ඇගේ වේලාව පැමිණ
තිබෙන බැවින් ඈට දුක් වේදනා ඇති වේ. එහෙත්
ඈ දරුවා බිහි කළ පසු ලෝකයට දරුවෙක් උපන්නේ
ය යන ප්‍රීතිය නිසා, වේදනාව අමතක කරන්නී ය.
22 එමෙන් ම ඔබ දැන් ශෝක වන්නහු ය. එහෙත්
නැවත මම ඔබ දකින්නෙමි. එවිට ඔබේ සිත්
ප්‍රීතියෙන් පිනා යයි. ඔබේ ප්‍රීතිය ද කිසිවෙක්
ඔබෙන් පැහැර නොගනිති.
23 “ඒ දවසේ දී ඔබ කිසි ප්‍රශ්නයක් මාගෙන්
අසන්නේ නැත. ඒකාන්තයෙන් ම මම ඔබට කියමි,
මාගේ නාමයෙන් ඔබ පියාණන් වහන්සේගෙන්
යමක් ඉල්ලුවොත්, උන් වහන්සේ ඒ දේ ඔබට දෙන
සේක. 24 මේ වනතෙක් ඔබ මාගේ නාමයෙන්
කිසිවක් ඉල්ලා නැත. ඉල්ලන්න, ඔබට ලැබේ;
මෙසේ ඔබගේ ප්‍රීතිය පූර්ණ වන්නේ ය.”

## මම ලෝකය ජයගතිමි

25 “මේ දේවල් උපමා මඟින් මම ඔබට කීවෙමි.
එහෙත් තවත් උපමා මඟින් කතා නොකර, පියාණන්
වහන්සේ ගැන පැහැදිලි ලෙස ඔබට ප්‍රකාශ කරන
කාලය පැමිණෙන්නේ ය. 26 ඒ දවසේ දී ඔබ මාගේ
නාමයෙන් අයැදින්නහු ය. ඔබ උදෙසා පියාණන්
වහන්සේට යාච්ඤා කරන්නෙමි යි මම නොකියමි.
27 ඔබ මට ප්‍රේම කරන බැවින් ද මා පියාණන්
වහන්සේ වෙතින් වැඩම කළ බව ඔබ විශ්වාස
කරන බැවින් ද පියාණන් වහන්සේ ම ඔබට ප්‍රේම
කරන සේක. 28 මම පියාණන් කරෙන් නික්ම
ආවෙමි; ලෝකයට පැමිණ සිටිමි. මම නැවත

ලෝකය අත්හැර පියාණන් වහන්සේ වෙතට
යන්නෙමි"යි වදාළ සේක.
29 උන් වහන්සේගේ ශ්‍රාවකයෝ කතා කොට,
"ආ, දැන් ඔබ උපමා මඟින් නොව, පැහැදිලි ලෙස
කතා කරන සේක. 30 ඔබ සියල්ල දන්නා බව ද
කිසිවකු ඔබගෙන් ප්‍රශ්න අසන්න නුවුවමනා බව ද
දැන් අපි දනිමු. මෙයින්, ඔබ දෙවියන් වහන්සේ
කෙරෙන් පැමිණි බව අපි විශ්වාස කරමු"යි කී හ.
31 ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "ඔබ දැන්
විශ්වාස කරන්නහු ද? 32 ඒ කෙසේ වෙතත් ඔබ මා
තනි කරදමා, තම තමන්ගේ තැන්වලට විසුරුවනු
ලබන පැය පැමිණෙන්නේ ය; දැනටමත් එය පැමිණ
තිබේ. එසේ වුවත් පියාණන් වහන්සේ මා සමඟ
සිටින බැවින් මම තනි නොවෙමි. 33 මේ දේවල් මා
ඔබට කීවේ මා තුළ ඔබට ශාන්තිය ඇති වන පිණිස
ය. ලෝකයෙහි ඔබට දුක්ගැහැට තිබේ. එහෙත්
ධෛර්යවත් වන්න; මම ලෝකය අභිබවා
ජයගතිමි"යි වදාළ සේක.

### ජේසුස් වහන්සේගේ උත්තම පූජක යාච්ඤාව

17 ජේසුස් වහන්සේ මේ දේවල් වදාරා,
ස්වර්ගය දෙසට ඇස් ඔසවා මෙසේ යාච්ඤා
කළ සේක: "පියාණෙනි, දැන් නියමිත මොහොත
පැමිණ තිබේ. පුත්‍රයාණන් විසින් ඔබ මහිමයට
පමුණුවනු ලබන පිණිස, ඔබ ද පුත්‍රයාණන්
මහිමයට පැමිණෙව්ව මැනව. 2 මන්ද, ඔබ විසින්
පුත්‍රයාණන්ට දෙන ලද සියල්ලන් හට සදාතන
ජීවනය දෙන පිණිස, සකල මනුෂ්‍ය වර්ගයා කෙරෙහි
ආධිපත්‍යය ඔබ වහන්සේ පුත්‍රයාණන්ට දුන් සේක.
3 සදාතන ජීවනය මේ ය: එක ම සැබෑ දෙවියන්
වන ඔබ ද, ඔබ විසින් එවන ලද තැනැන් වහන්සේ
වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ද, දැනගැනීම ය.
4 ඔබ වහන්සේ මට භාර දුන් මෙහෙය සම්පූර්ණ
කරමින් මම මිහි පිට ඔබ මහිමයට පැමිණිවීමි.
5 ඉතින් පියාණෙනි, ලොව ඇති වන්නට පෙර ඔබ
හා සමඟ මට තිබුණු තේජශ්‍රීයෙන්, දැන් ඔබ
ඉදිරියෙහි මා තේජශ්‍රීයට පැමිණෙව්ව මැනව.
6 "ඔබ වහන්සේ ලෝකයෙන් වෙන් කොට මට දුන්
මිනිසුන් හට ඔබගේ නාමය මම ප්‍රකාශ කෙළෙමි.
ඔව්හු ඔබට අයිති වූ හ. ඔබ ඔවුන් මට දුන් සේක.
ඔව්හු ඔබගේ දහම පිළිපැද්දාහ. 7 ඔබ මට දුන්
සියල්ල ම ඔබගෙන් පැමිණි බව දැන් ඔව්හු දනිති.
8 මන්ද, ඔබ මට පැවසූ වචන මම ඔවුන්ට පැවසීමි.
ඔව්හු එය පිළිගෙන මා ඔබ වෙතින් පැමිණි බව
සැබැවින් ම දැන, ඔබ මා එවා වදාළ බව විශ්වාස
කරති.
9 "මම ඔවුන් උදෙසා යාච්ඤා කරමි. ඔබ මට දුන්
ඔවුන් උදෙසා මිස, ලෝකයා උදෙසා යාච්ඤා
නොකරමි. මන්ද, ඔව්හු ඔබගේ ය. 10 මා සන්තක
සියල්ල ඔබගේ ය; ඔබ සන්තක සියල්ල මාගේ ය.
ඔවුන් තුළින් මම තේජශ්‍රීයට පැමිණ සිටිමි. 11 මම
තවත් ලෝකයෙහි නොසිටිමි. එහෙත් ඔව්හු
ලෝකයෙහි සිටිති. මම ඔබ වෙතට එන්නෙමි.
සුවිශුද්ධ පියාණෙනි, අප මෙන් ඔවුන් ද, ඒකත්වයක්
වන පිණිස, ඔබ මට දුන් ඔබගේ නාමයේ අනුහසින්
ඔවුන් ආරක්ෂා කළ මැනව. 12 ගීතා 41:9; ජොහ
13:18මම ඔවුන් සමඟ සිටිය දී ඔබ මට දුන් ඔබගේ
නාමයේ අනුහසින් මම ඔවුන් ආරක්ෂා කෙළෙමි. මම
ඔවුන් රැකබලාගතිමි. ශුද්ධ ලියවිල්ල සම්පූර්ණ වන
පිණිස, විනාශයේ පුත්‍රයා හැර අන් කිසිවකේ විනාශ
නොවූ හ. 13 එහෙත් දැන් මම ඔබ වෙතට එමි. මා
ලෝකයෙහි දී මේ දේවල් ප්‍රකාශ කරන්නේ,
මාගේ ප්‍රීතිය ඔවුන් තුළ සම්පූර්ණයෙන් ම ඇති
වන පිණිස ය. 14 මම ඔවුන්ට ඔබගේ දහම දුනිමි.
මා ලෝකයට අයිති නොවන සේ ම, ඔවුන් ද
ලෝකයට අයිති නොවන බැවින්, ලෝකයා ඔවුන්ට
ද්වේෂ කළහ. 15 ඔබ ලෝකයෙන් ඔවුන් වෙන්
කරන මෙන් මම යාච්ඤා නොකරමි; නපුරාගෙන්
ඔවුන් ආරක්ෂා කරන මෙන් යාච්ඤා කරමි. 16 මා
ලෝකයෙන් නොවන්නාක් මෙන් ම ඔව්හු ද
ලෝකයෙන් නොවෙති. 17 සත්‍යයෙහි ඔවුන් කැප
කළ මැනව; සත්‍යය නම් ඔබගේ ධර්මය ය. 18 ඔබ
මා ලෝකයට එවා වදාළාක් මෙන්, මම ද ඔවුන්
ලෝකයට යැවීමි. 19 ඔවුන් සත්‍යයට කැප වන
පිණිස, මම ඔවුන් උදෙසා කැප වෙමි.
20 "මොවුන් ගැන පමණක් නොව, මොවුන්ගේ
වචනය කරණකොටගෙන මා අදහාගන්නා අය
ගැනත් යාච්ඤා කරමි. 21 පියාණෙනි, මා මෙසේ
යාච්ඤා කරන්නේ ඔබ මා තුළ ද මා ඔබ තුළ ද
සිටින්නාක් මෙන්, ඔවුන් ද අප තුළ ඒකත්වයක් වන
පිණිසත්, ඔබ මා එවා වදාළ බව ලෝකයා විශ්වාස
කරන පිණිසත් ය. 22 අප ඒකත්වයක් ව සිටින්නා
සේ ම, ඔවුනුත් ඒකත්වයක් වන පිණිස ඔබ මට දුන්
තේජශ්‍රීය මම ඔවුන්ට දුනිමි. 23 මෙසේ කෙළේ,
මා ඔවුන් තුළ ද ඔබ මා තුළ ද සිටීමෙන්, ඔවුන්
සම්පූර්ණ ලෙස ඒකත්වයට පැමිණෙන පිණිසත්, ඔබ
මා එවා වදාළ බව ද, ඔබ මට ප්‍රේම කළාක් මෙන්
ඔවුන්ටත් ප්‍රේම කළ බව ද ලෝකයා දැනගන්නා
පිණිසත් ය.
24 "පියාණෙනි, ලෝකය මැවීමට පෙර ඔබ මට
ප්‍රේම කළ නිසා මට පැවරූ තේජශ්‍රීය, ඔබ මට
දුන් අය විසින් දකින පිණිස, මා සිටින තැන ඔවුනුත්
සිටිනවාට කැමැත්තෙමි.
25 "ධාර්මික පියාණෙනි, ලෝකයා ඔබ දැනගත්තේ
නැත. එහෙත් මම ඔබ දැනගතිමි. තවද, ඔබ මා
එවා වදාළ බව මොවුහු දනිති. 26 ඔබ මට දැක් වූ
ප්‍රේමය ඔවුන් තුළ වන පිණිසත්, මා ද ඔවුන් තුළ
වන පිණිසත්, ඔබගේ නාමය ඔවුන්ට දන්වා
වදාළෙමි. තවත් දන්වා වදාරන්නෙමි."

### ජේසුස් වහන්සේ පාවා දෙනු ලැබීම
(මතෙ 26:47-56;මාක් 14:43-50;ලූක් 22:47-53)

18 ජේසුස් වහන්සේ යාච්ඤාව නිම කළ පසු,
සිය ශ්‍රාවකයන් සමඟ කිද්‍රොන් ඇළෙන්
එගොඩට වැඩිය සේක. එහි උයනක් විය. උන්
වහන්සේ සිය ශ්‍රාවකයන් සමඟ එයට පිවිසි සේක.
2 ද්‍රෝහියා වූ ජූදස් මේ ස්ථානය දැන සිටියේ ය.

මන්ද, ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් සමඟ එහි
නිතර ම රැස් වූ බැවිනි. 3 ජූදස් තමේ, නායක
පූජකයන්ගනේ ද පරිසිවරුන්ගනේ ද භට
කණ්ඩායමක් සහ මුර සේවකයන් කීප දනෙකුෙත්
ලබාගනෙ, පහන්, පන්දම් හා අවිආයුධ ඇති ව
එතැනට පැමිණියේ ය. 4 තමන් වහන්සේට
සිදුවන්නට යන සියලු දේ දැන සිටි ජේසුස්
වහන්සේ, ඉදිරියට ගොස්, “ඔබ කවරකු
සොයන්නහු දැ”යි ඔවුන්ගනේ ඇසූ සේක. 5 ඔව්හු
පිළිතුරු දමේන්: “නාසරතේහි ජේසුස් ය”යි කී හ. “ඒ
මම ය”යි ජේසුස් වහන්සේ ඔවුන්ට වදාළ සේක.
ද්‍රෝහියා වූ ජූදස් ඔවුන් සමඟ සිටියේ ය. 6 “ඒ
මම” යයි ජේසුස් වහන්සේ ඔවුන්ට කී කල්හි, ඔව්හු
පස්සනේ පස්සට ගොස් බිම වැටුණාහ. 7 යළිත් උන්
වහන්සේ, “ඔබ කවරකු සොයන්නහු දැ”යි
ඔවුන්ගනේ ඇසූ සේක. “නාසරතේහි ජේසුස් ය”යි
ඔව්හු කී හ. 8 ජේසුස් වහන්සේ පිළිතුරු දමේන්, “ඒ
මම යයි ඔබට කීවමේ; ඉදින් ඔබ මා සොයන්නහු
නම්, මොවුන්ට යන්න දනේනැ”යි වදාළ සේක.
9 මසේ වූයේ: ‘ඔබ මට දුන් අයගනේ එක්
කනෙකේ වත් නැති නොවී ය’යි උන් වහන්සේ කී
වචන ඉෂ්ට වන පිණිස ය.
10 සීමොන් පේදුරු ළඟ කඩුවක් තිබිණි. ඔහු එය
ඇද, උත්තම පූජකයාගේ දාසයාට ගසා, ඔහුගේ
දකුණු කන කපා දැමී ය. ඒ දාසයාගේ නම මල්කස්
ය. 11 මතෙ 26:39; මාක් 14:36; ලූක් 22:42එවිට
ජේසුස් වහන්සේ, “කඩුව කොපුවේ දමන්න,
පියාණන් වහන්සේ මට දී තිබනෙ කුසලාන මම
නොබොම් දැ”යි පේදුරුට වදාළ සේක.

### උත්තම පූජකයා ඉදිරියේ
(මතෙ 26:57-58;මාක් 14:53-54;ලූක් 22:54)

12 එකල භට කණ්ඩායම ද ඔවුන්ගේ මහා
සේනාධිපතියා ද ජුදවේවරුන්ගේ මුර සේවකයෝ ද
ජේසුස් වහන්සේ අල්ලා, බැඳගනෙ 13 පළමුකොට
අන්නස් වතෙට ගනෙ ගියෝ ය. ඔහු ඒ වසරේ
උත්තම පූජකයා ව සිටි කායාපස්ගේ මයිලණුවන්
විය. 14 ජොහ 11:49-50මේ කායාපස් වනාහි,
ජනතාව වනුෙවනේ එක් මිනිසකු මරණයට පත්වීම
සුදුසු යයි ජුදවේවරුන්ට උපදසේ දුන් තැනැත්තේ ය.

### පේදුරුගේ අපලාපය
(මතෙ 26:69-75;මාක් 14:66-72;ලූක් 22:56-62)

15 ජේසුස් වහන්සේ පසුපස්සේ සීමොන් පේදුරු ද
තවත් ශ්‍රාවකයකේ ද ගියහ. මේ ශ්‍රාවකයා,
උත්තම පූජකයා දැන සිටි කනෙකු වූ බැවින්, ඔහු
ජේසුස් වහන්සේ සමඟ උත්තම පූජකයාගේ
මැදුරේ මහා මළුවට ඇතුළු විය. 16 පේදුරු දොර
ළඟ පිටත සිටියේ ය. එවිට උත්තම පූජකයා දැන
සිටි අනික් ශ්‍රාවකයා පිටතට ගොස් දොරටුපාලියට
කතා කොට, පේදුරු ඇතුළතට ගනොවේ ය.
17 එවිට දොරටුපාලී, “ඔබත් මේ මිනිසාගේ
ශ්‍රාවකයන්ගනේ එක් කනෙකේ නොවේ දැ”යි
ඇසුවා ය. “නැතැ”යි ඔහු පිළිතුරු දුනි.
18 එය ශීත කාලය වූයනේ, දාසයෝ ද මුර
සේවකයෝ ද අඟුරු දල්වා ගිනි තපිමින් සිටියෝ ය.
පේදුරු ද ඔවුන් සමඟ ගිනි තපිමින් සිටියේ ය.

### උත්තම පූජකයා ඉදිරියේ නඩු විභාගය
(මතෙ 26:59-66;මාක් 14:55-64;ලූක් 22:66-71)

19 එවිට උත්තම පූජකයා, ජේසුස් වහන්සේගේ
ශ්‍රාවකයන් ගැන ද උන් වහන්සේගේ ඉගැන්වීම
ගැන ද ප්‍රශ්න කළෙේ ය. 20 ජේසුස් වහන්සේ
ඔහුට පිළිතුරු දමේන්, “මම එළිපිට ම ලෝකයාට
කතා කළෙමේ: ජුදවේවරුන් සියලු දනො එක්රැස් වන
ධර්මශාලාවලදීත් දේව මාලිගාවේදීත්, නිතර ම
අනුශාසනා කළෙමේ. රහසින් කිසිවක් නොකීවමේ.
21 මාගනේ විචාරන්නේ කුමක්නිසා ද? මා කී දේ
ඇසූ අයගනේ, මා ඔවුන්ට කීවේ කුමක් දැ යි
ප්‍රශ්න කරන්න. මා කීවේ කුමක් දැ යි ඔව්හු
දනිති”යි වදාළ සේක. 22 උන් වහන්සේ මසේ
වදාළ විට, ළඟ සිටි මුර සේවකයන්ගනේ කනෙකේ:
“නුඹ උත්තම පූජකයාට උත්තර දනේනේ මලෙසෙ
ද?” කියා ජේසුස් වහන්සේට අතුල් පහරක් ගැසී ය.
23 ජේසුස් වහන්සේ ඔහුට පිළිතුරු දමේන්: “මා කී
දයෙහි වරදක් ඇත්නම්, එය ඔප්පු කරන්න;
නැත්නම් කුමක් නිසා මට පහර දනේනහෙි දැ”යි ඇසූ
සේක.
24 ඒ ඇසූ අන්නස්, උන් වහන්සේ බැඳ සිටි ලසෙ
ම උත්තම පූජකයා වූ කායාපස් වතෙට යැවී ය.

### පේදුරු යළිත් අපලාප කිරීම
(මතෙ 26:71-75;මාක් 14:69-72;ලූක් 22:58-62)

25 සීමොන් පේදුරු ගිනි තපිමින් සිටියේ ය. එවිට
සසෙු අය කතා කරමින්, “නුඹත් ඔහුගේ
ශ්‍රාවකයන්ගනේ එක් කනෙකේ නොවේ දැ”යි
ඔහුගනේ ඇසූ හ. ඔහු: “නැත, එසේ නොවේ ය”යි
කී ය. 26 එවිට පේදුරු විසින් කන කපන ලද
තැනැත්තාගේ ඥාතියකු වූ, උත්තම පූජකයාගේ
දාසයන්ගනේ එක් කනෙකේ: “නුඹ ඔහු සමඟ
උයනේ සිටිනවා මා දුටුවා නොවේ දැ”යි ඇසී ය.
27 පේදුරු යළිත් අපලාප කළෙේ ය. එකණෙහෙි ම
කුකුළා හැඬලී ය.

### ජේසුස් වහන්සේ පිලාත් ඉදිරියේ සිටීම
(මතෙ 27:1-2-11-14;මාක් 15:1-5;ලූක් 23:1-5)

28 එවිට ඔව්හු, ජේසුස් වහන්සේ කායාපස් වතෙින්
රජවාසලට ගනෙ ගියහ. එය අලුයම් වේලාව විය.
පාස්කු භෝජනය වැළඳීමට නොහැකි වන සේ
තමන් අපවිත්‍ර වතෙි යි සිතා, ඔව්හු රජවාසලට
ඇතුළු නොවූ හ. 29 එබැවින් පිලාත්, පිටත ඔවුන්
සිටි තැනට පැමිණ, “මේ මිනිසාට විරුද්ධ ව ඔබ
ගනෙනෙ චෝදනාව කුමක් දැ”යි ඇසී ය. 30 ඔව්හු
පිළිතුරු දමේන්, “මේ මිනිසා අපරාධකාරයකේ
නොවේ නම්, අප ඔහු ඔබ අතට භාර දනේනේ

නැතැ”යි කී හ. 31 පිලාත් ඔවුන්ට පිළිතුරු දමේන්,
“ඔබ ම ඔහු ගනෙගොස් ඔබේ නීතිය අනුව
විනිශ්චය කරන්නැ”යි කී ය. ජුදවේවරු පිළිතුරු දමේන්,
“කිසිවකෙු මරණයට පත් කිරීමට අපට බලය
නැතැ”යි කී හ. 32 ජොහෙ 3:14; 12:32මසෙේ වූයේ,
‘තමන් වහන්සේ කුමන ආකාරයක මරණයකින්
මැරනෙ සේක් දැ’යි දන්වමින් ජේසුස් වහන්සේ
වදාළ වචන ඉෂ්ට වන පිණිස ය.
33 එබැවින් යළිත් රජවාසලට පිලාත් ඇතුළු වී,
ජේසුස් වහන්සේ කැඳවා, “නුඹ ජුදවේවරුන්ගේ රජ
දැ”යි ඇසී ය. 34 ජේසුස් වහන්සේ පිළිතුරු දමේන්:
“මයෙ ඔබ ම කියන දයෙක් ද, නැතහොත් අන් අය
මා ගැන කී දයෙක් දැ”යි ඇසූ සේක. 35 පිලාත්
පිළිතුරු දමේන්, “මම ජුදවේවකේ ද? නුඹේ ම ජාතිය
ද නායක පූජකයෝ ද නුඹ මා අතට භාර දුන්හ. නුඹ
කුමක් කළෙහෙි ද?”යි ඇසී ය. 36 ජේසුස් වහන්සේ
පිළිතුරු දමේන්, “මාගේ රාජ්‍යය මේ ලෝකයට අයිති
නැත. මාගේ රාජ්‍යය මේ ලෝකයට අයිති වූවක්
නම්, ජුදවේවරුන් අතට මා භාර නොදෙන පිණිස
මාගේ සේවකයන් සටන් කරනු ඇත. ඒ නිසා මාගේ
රාජ්‍යය මලෙොවින් වූවක් නොවේ ය”යි වදාළ
සේක. 37 එවිට පිලාත්, “එසේ නම්, නුඹ රජකේ
දැ”යි උන් වහන්සේගනේ ඇසී ය. ජේසුස් වහන්සේ
පිළිතුරු දමේන්, “මම රජකේ යයි ඔබ ම කියන්නහෙි
ය. මා උපන්නේත්, ලොව පහළ වූයේත්, සත්‍යයට
සාක්ෂි දරන පිණිස ය; සත්‍යයහෙි පිහිටි සියල්ලෝ
මාගේ හඬ අසති”යි වදාළ සේක. 38 “සත්‍යය
කියන්නේ කුමක් දැ”යි පිලාත් උන් වහන්සේගනේ
ඇසී ය.

### ජේසුස් වහන්සේට මරණීය දඬුවම
(මතෙ 27:15-31;මාක් 15:6-20;ලූක් 23:13-25)

38 පිලාත් මසෙේ කියා යළිත් පිටත සිටි
ජුදවේවරුන් වතෙට ගොස්, “මොහු අත කිසි වරදක්
මට නොපනෙේ. 39 පාස්කු මංගල්‍යයේ දී ඔබ හට
එක් මිනිසකෙු මා විසින් නිදහස් කර දීමේ සිරිතක්
ඔබ අතර ඇත. එබැවින් ජුදවේවරුන්ගේ රජු ඔබ
හට නිදහස් කර දනෙවාට ඔබ කැමැති දැ”යි
ඔවුන්ගනේ ඇසී ය. 40 එවිට ඔව්හු නැවතත්
මොරගසමින්, “මේ මිනිසා නොවේ, බරබ්බස්
නිදහස් කර දනේනැ”යි කී හ. බරබ්බස් වනාහි
මංකොල්ලකාරයකෙි.

19 ඉක්බිති පිලාත් ජේසුස් වහන්සේට
කසවලින් තැළවේවේ ය. 2 භේවායෝ කටු
ඔටුන්නක් ගොතා, උන් වහන්සේගේ හිසහෙි තබා,
නීල-රක්ත වස්ත්‍රයක් උන් වහන්සේට හඳවා, 3 උන්
වහන්සේ ළඟට පැමිණ, “ජුදවේ රජතුමනෙි,
සැරදේ!” කියමින් උන් වහන්සේට අතුල් පහර දුන්හ.
4 යළිත් පිලාත් පිටතට ගොස්, “මොහු අත කිසි
වරදක් මට නොපනෙනෙ බව ඔබ දැනගන්නා පිණිස,
මනේන, මොහු ඔබ වතෙට ගනෙමේ”යි ඔවුන්ට කී
ය. 5 එවිට ජේසුස් වහන්සේ, කටු ඔටුන්න හිසේ
දරා, නීල-රක්ත වස්ත්‍රය ද හැඳගනෙ, පිටතට ආ
සේක. “මනේන, ඒ මනුෂ්‍යයා” යයි පිලාත් ඔවුන්ට
කී ය. 6 එවිට නායක පූජකවරු ද මුර සේවකයෝ ද
උන් වහන්සේ දුටු කල, “කුරුසියේ ඇණ ගසන්න,
කුරුසියේ ඇණ ගසන්නැ”යි මොරගැසූ හ. පිලාත්
කතා කරමින්, “ඔබ ම මොහු ගනෙ ගොස් කුරුසියේ
ඇණ ගසන්න, මන්ද, මොහු අත කිසි ම වරදක් ඇති
බව මට නම් නොපනෙේ ය”යි කී ය. 7 ජුදවේවරු
පිළිතුරු දමේන්, “නීතියක් අපට ඇත; ඒ අනුව, මොහු
තමා ම දවේයන් වහන්සේගේ පුත්‍රයා යයි කී
බැවින් මරනු ලැබිය යුතු ය”යි කී හ.
8 ඒ කීම ඇසූ කල, පිලාත් වඩාත් බිය වී,
9 රජවාසලට යළිත් ඇතුළු වී, ජේසුස් වහන්සේ
අමතා, “ඔබ කොහනේ එන්නේ දැ”යි ඇසී ය.
එහතේ ජේසුස් වහන්සේ කිසි පිළිතුරක් නුදුන්
සේක. 10 එබැවින් පිලාත් කතා කොට, “ඔබ මට
පිළිතුරක් නොදනේනහෙි ද? ඔබ නිදහස් කර
හරින්නට හෝ කුරුසියේ ඇණ ගසන්නට හෝ මට
බලය ඇති බව ඔබ නොදන්නහෙි දැ”යි උන්
වහන්සේගනේ ඇසී ය. 11 ජේසුස් වහන්සේ පිළිතුරු
දමේන්, “දවේඳුන් විසින් බලය නොදෙන ලද්දේ නම්,
මට විරුද්ධ ව ඔබට කිසි බලයක් නැත. එබැවින් මා
ඔබ අතට පාවා දුන් තැනැත්තාගේ පාපය වඩාත්
බරපතල ය”යි වදාළ සේක.
12 ඒ මොහොතේ පටන් පිලාත් ජේසුස් වහන්සේ
නිදහස් කර හරින්නට මඟක් සවේ ය. එහතේ
ජුදවේවරු මොරගසමින්, “ඔබ මොහු නිදහස් කර
හැරියොත් ඔබ සීසර් අධිරාජයාගේ මිතුරකේ
නොවේ. යම් තැනැත්තකේ තමා රජකෙු යි
කියාගන්නේ ද, ඔහු අධිරාජයාගේ හතුරකේ”යි කී
හ. 13 පිලාත් ඒ බස් අසා, ජේසුස් වහන්සේ පිටතට
ගනෙැවිත් සිටුවා, හබ්රෙවේ බසින් ‘ගබ්බාතා’ කියන
ගල් වේදිකා නම් ස්ථානයේ ඇති විනිශ්චයාසනයහෙි
අසුන් ගත්තේ ය.
14 ඒ වනාහි පාස්කු මංගල්‍යයට සූදානම් වීමේ
දවසේ මද්දහන් වේලාව පමණ විය. ඔහු, “මනේන
ඔබේ රජ ය”යි ජුදවේවරුන්ට කී ය. 15 “ඔහු මරව,
ඔහු මරව, ඔහු කුරුසියේ ඇණ ගසව”යි ඔව්හු
මොරගැසූ හ. “ඔබේ රජු කුරුසියේ ඇණ ගසන්නට
දැ”යි පිලාත් ඔවුන්ගනේ ඇසී ය. නායක පූජකයෝ
පිළිතුරු දමේන්, “සීසර් අධිරාජයා හැර අන් රජකේ
අපට නැතැ”යි කී හ. 16 එකල ඔහු, උන් වහන්සේ
කුරුසියේ ඇණ ගසනු ලබන පිණිස ඔවුන්ට භාර
දුන්නේ ය.

### කුරුසියේ ඇණ ගැසීම
(මතෙ 27:32-44;මාක් 15:21-32;ලූක් 23:26-43)

16 එබැවින් ඔව්හු ජේසුස් වහන්සේ භාර ගත්හ.
17 උන් වහන්සේ ම කුරුසිය උසුලාගනෙ, හබ්රෙවේ
බසින් ගොල්ගොතා යයි කියන කපාලපිටිය නම්
ස්ථානයට වැඩිය සේක. 18 එහි දී ඔව්හු උන්
වහන්සේ කුරුසියේ ඇණ ගැසූ හ; උන් වහන්සේ
සමඟ තවත් දදෙනෙකු දපෙසින් ද උන් වහන්සේ
මැදි ව ද සිටින සේ ඇණ ගැසූ හ. 19 තවද පිලාත්
නාම පුවරුවක් ලියවා කුරුසිය මත තැබවේවේ ය.
‘ජුදවේවරුන්ගේ රජ වූ නාසරතේහි ජේසුස් ය’යි එහි

ලියා තිබිණි. 20 ජේසුස් වහන්සේ කුරුසියේ ඇණ
ගසනු ලැබූ ස්ථානය නුවරට සමීප වූ බැවින්,
ජුදවේවරුන්ගෙනේ බොහෝ දෙනෙකේ, එය කියවේවෝ
ය. හබ්රෙවේ, ලතින්, ග්රීක් යන භාෂාවලින් එය
ලියා තිබිණි. 21 එබැවින් ජුදවේවරුන්ගේ නායක
පූජකයෝ පිලාත්ට කතා කොට, " 'ජුදවේවරුන්ගේ
රජ' යයි නොලියා, 'මම ජුදවේවරුන්ගේ රජ වමේ යි,
මේ මිනිසා, කියාගත්තේ ය'යි ලියවේව මැනවැ"යි කී
හ. 22 පිලාත් පිළිතුරු දමේන්, "මම ලිව්වොත් ලිව්වා
ම ය"යි කී ය.

23 ජේසුස් වහන්සේ කුරුසියේ ඇණ ගැසූ පසු,
හේවායෝ උන් වහන්සේගේ වස්ත්ර ගෙන, එක
හේවායකුට එක කොටසක් බැගින් කොටස්
සතරකට බෙදාගත්හ. ඔව්හු උන් වහන්සේගේ සළුව
ද ගත්හ. ඒ සළුවට මූට්ටුවක් නොදමා, උඩ සිට
පහළට මුළුමනින් ම එකට වියා තිබිණි. 24 ගීතා
22:18එබැවින් ඔව්හු එකිනෙකොට කතා කොට, "අපි
මයෙ නොඉරා, කවරකුට වැටේ ද කියා දාදු දමා
බලමු"යි කී හ. මසෙේ වූයේ:
q2[24] "මාගේ වස්ත්ර ඔව්හු තම තමන් අතර
බෙදාගත්හ;
q2[24] මාගේ සළුව පිණිස දාදු දැමූ හ"
24 යන ශුද්ධ ලියවිල්ල ඉටු වන පිණිස ය. එබැවින්
හේවායෝ මසෙේ කළහ.

25 ජේසුස් වහන්සේගේ මෑණියෝ ද මෑණියන්ගේ
සහෝදරී වූ ක්ලෝපාස්ගේ භාර්යාව වූ මරියා ද
මග්දලායේ මරියා ද උන් වහන්සේගේ කුරුසිය ළඟ
සිටියෝ ය. 26 එකල ජේසුස් වහන්සේ සිය
මෑණියන් ද තමා ප්රේම කළ ශ්රාවකයා ද ළඟ
සිටිනු දැක, "ස්ත්රිය, මනේන ඔබේ පුත්රයා ය"යි
සිය මෑණියන් හට වදාළ සේක. 27 ඉන්පසු උන්
වහන්සේ එම ශ්රාවකයාට කතා කොට, "මනේන
ඔබේ මෑණියෝ ය"යි වදාළ සේක. ඒ මොහොතේ
සිට ඒ ශ්රාවකයා තම නිවසට ඇය පිළිගත්තේ ය.

### ජේසුස් වහන්සේගේ මරණය
(මතෙ 27:45-56;මාක් 15:33-41;ලූක් 23:44-49)

28 ගීතා 22:15; 69:21 ඉන්පසු ජේසුස් වහන්සේ
සියල්ල නිමාවට පත් වූ බව දැන, ශුද්ධ ලියවිල්ල
ඉෂ්ට වන පිණිස, "මට පිපාස ය"යි වදාළ සේක.
29 එහි විනාකිරි පිරූ භාජනයක් තිබිණි. එබැවින්
ඔව්හු විනාකිරි පොඟවන ලද මූදුහත්තක් හිසොප්
දණ්ඩක ගසා, උන් වහන්සේගේ මුඛයට ළං කළහ.
30 ජේසුස් වහන්සේ විනාකිරි පිළිගත් පසු, "සියල්ල
නිම වී ය"යි වදාරා, හිස නමා ස්වකීය ප්රාණය භාර
දුන් සේක.

### හලේලයකින් ඇනීම

31 එය සබත් දිනට පරෙ සූදානම් වීමේ දවස විය.
ඒ සබත් දවස විශේෂ දිනයක් වූ බැවින් එදින ශරීර
කුරුසිවල ම නොතිබනෙ පිණිස, කුරුසියේ ඇණ ගැසූ
අයගේ කකුල් කඩා ඔවුන් ඉවත් කරන මනේ
ජුදවේවරු පිලාත්ගෙනේ ඉල්ලා සිටියහ. 32 එබැවින්
හේවායෝ අවුත්, පළමුවැන්නාගේත්, එමනේ ම ඔහු
සමඟ ඇණගසන ලද දවෙැන්නාගේත් කකුල්
කඩාදැමූ හ. 33 එහතේ ඔව්හු ජේසුස් වහන්සේ
ළඟට පැමිණි විට උන් වහන්සේ මිය ගොස් සිටින
බව දැක, උන් වහන්සේගේ කකුල් නොකැඩූ හ.
34 එහතේ, හේවායන්ගෙනේ කනෙකේ හලේලයකින්
උන් වහන්සේගේ ඇලයට ඇන්නේ ය. එකණෙහෙි
ම, ලේත් වතුරත් ගලා ආවේ ය. 35 එය දුටු
තැනැත්තේ ඒ ගැන සාක්ෂි දරයි. ඔහුගේ සාක්ෂිය
සැබෑ ම ය. ඔබත් විශ්වාස කරන පිණිස ඔහුගේ
සාක්ෂිය සැබෑ බව ඔහු දනියි. 36 නික්ම 12:46;
ගණන් 9:12; ගීතා 34:20මේ දේවල් සිදු වූයේ,
'ඔහුගේ එක ඇටයක් වත් නොබිඳිනු ලැබේ ය'යි
ලියා ඇති ශුද්ධ ලියවිලි පාඨය ඉෂ්ට වන පිණිස ය.
37 සකෙරි 12:10; එළිද 1:7තවද: 'ඔවුන් ඇණ තුවාළ
කළ තැනැත්තා දසෙ, බලනු ඇතැ'යි තවත් ශුද්ධ
ලියවිලි පාඨයක් ඇත.

### භූමදානය
(මතෙ 27:57-61;මාක් 15:42-47;ලූක් 23:50-56)

38 ඉන්පසු, ජුදවේවරුන්ට බිය නිසා, රහසින් ජේසුස්
වහන්සේගේ ශ්රාවකයකු වූ අරිමාතියේ ජෝසපේ,
ජේසුස් වහන්සේගේ මෘත දේහය ගෙන යාමට
පිලාත්ගෙනේ අවසර ඉල්ලී ය. පිලාත් අවසර දුන්නේ
ය. එබැවින් ඔහු අවුත් ජේසුස් වහන්සේගේ මෘත
දේහය ගෙන ගියේ ය. 39 ජොහ 3:1-2මීට කලින්
දිනකෙ උන් වහන්සේ වතෙ රාත්රියහෙි පැමිණි
නිකොදේමුස් ද, කිලෝග්රෑම් තිහක් පමණ බර
ගන්ධරස හා අගිල් මිශ්රණයක් ගෙන ආයේ ය.
40 ඔව්හු ජේසුස් වහන්සේගේ මෘත දේහය ගෙන,
ජුදවේවරුන්ගේ අවමඟුල් සිරිත් පරිදි සුවඳ ද්රව්ය
ගල්වා සිහින් හණ රදෙිවලින් එය වළෙවෝ ය.
41 උන් වහන්සේ කුරුසියේ ඇණ ගසනු ලැබූ
ස්ථානයේ උයනක් විය. ඒ උයනේ, ඒ තාක් කිසි
කලකෙ කිසිවකු තැන්පත් නොකළ අලුත් සොහොන්
ගයෙක් විය. 42 ජුදවේවරුන්ගේ සබත් දිනට පරෙ
දින ආසන්න වූ බැවින් ද ඒ සොහොන් ගයෙ නුදුරු ව
තිබුණු බැවින් ද ඔව්හු ජේසුස් වහන්සේ එහි
තැන්පත් කළහ.

### හිස් වූ සොහොන
(මතෙ 28:1-10;මාක් 16:1-8;ලූක් 24:1-12)

20 සතියේ පළමු වන දා හිමිදිරියේ ම, අඳුර
තිබිය දී, මග්දලායේ මරියා සොහොන් ගයෙ
ළඟට අවුත්, සොහොන් ගයෙින් ගල ඉවත් කොට
තිබනෙ බව දුටුවා ය. 2 එබැවින් ඈ සීමොන් පේදුරු
ද ජේසුස් වහන්සේ ප්රේම කළ අනික් ශ්රාවකයා ද
වතෙ දුව ගොස්, "ඔවුන් සමිඳාණන් වහන්සේ
සොහොන් ගයෙින් ඉවතට ගෙන ගොස් තිබේ;
ඔවුන් උන් වහන්සේ කොතැනක තැබුවා ද කියා අපි
නොදනිමු"යි කීවා ය. 3 එවිට පේදුරු ද අනික්
ශ්රාවකයා ද නික්ම වීත් සොහොන් ගේ දසෙට
ගියහ. 4 දදෙනො ම එක් ව දිව්වෝ ය. අනික්

ශ්‍රාවකයා පේ‍දුරු පසු කර දුව ගොස් පළමුවනේ
සොහොන් ගටෙ පැමිණ, 5 නැමී බලා, සිහින් හණ
රදෙි එහි තිබනෙ බව දිටී ය. එහතේ ඔහු ඇතුළට
නොගියේ ය. 6 සීමොන් පේ‍දුරු ඔහුට පසුව පැමිණ
සොහොන් ගේ ඇතුළට ගොස්, හණ රදෙි එහි
තිබනෙ බවත්, 7 උන් වහන්සේගේ හිස ඔතා තිබූ
රදෙි කඩ, හණ රදෙි සමඟ නොව, වනෙ ම එක්
තැනකෙ අකුළා තිබනෙ බවත් දුටුවේ ය. 8 එකල
සොහොන් ගේ ළඟට පළමුවනේ පැමිණි ඒ අනික්
ශ්‍රාවකයා ද, ඇතුළට ගොස් දැක විශ්වාස කළෙේ
ය. 9 උන් වහන්සේ මළවුන්ගනේ නැඟිට වදාළ යුතු
යයි ලියන ලද ශුද්ධ ලියවිල්ල, ඒ වන තුරු ඔවුන්
තේරුම් ගනෙ සිටියේ නැත. 10 ඉක්බිති ශ්‍රාවකයෝ
තම තමන්ගේ නිවසේවලට හැරී ගියහ.

### ජේසුස් වහන්සේ මග්දලායේ මරියාට දර්ශනය වීම

(මතෙ 28:9-10;මාක් 16:9-11)

11 එහතේ මරියා සොහොන් ගයෙ ළඟ පිටත
හඬමින් සිටියා ය. ඈ මසෙේ හඬමින් ම සොහොන්
ගයෙ ඇතුළට නැමී බැලුවා ය. 12 එවිට ජේසුස්
වහන්සේගේ සිරුර තබා තිබූ ස්ථානයහෙි, සුදු
වස්ත්‍ර හැඳගත් දේව දූතයන් දදෙනෙකු, එක්
කනෙකේ හිස තැබූ තැන ද තව කනෙකේ පාද ළඟ
ද හිඳිනු දුටුවා ය. 13 එකල ඔව්හු: “ස්ත්‍රිය, ඔබ
හඬන්නේ මන්ද”යි ඇගනේ ඇසූ හ. “ඔවුන් මාගේ
සමිඳාණන් වහන්සේ ගනෙ ගොස් කොතැන
තැන්පත් කර ඇද්දැ යි මා නොදන්නා නිසා ය”යි ඈ
පිළිතුරු දුන්නා ය.
14 මසෙේ කියමින් ඈ ආපසු හැරදේදී, ජේසුස්
වහන්සේ එහි සිටින බව දුටුවා ය. එහතේ ඒ
ජේසුස් වහන්සේ බව ඈ නොදත්තී ය. 15 “ස්ත්‍රිය,
ඔබ හඬන්නේ මන් ද? ඔබ කවරකු සොයන්නහෙි
දැ”යි ජේසුස් වහන්සේ ඇගනේ ඇසූ සේක. ඈ උන්
වහන්සේ උයන්ගොව්වා යයි සිතා: “මහතාණනෙි,
ඔබ උන් වහන්සේ ගනෙ ගියා නම්, උන් වහන්සේ
කොතැන තැන්පත් කළෙහෙි දැ යි මට කිව මැනව;
මම උන් වහන්සේ රැගනෙ යමි”යි කීවා ය.
16 ජේසුස් වහන්සේ, “මරියා” කියා ඈ ඇමතූ සේක.
ඈ ද, හැරී, “රබ්බෝනි”යි හබේ‍රවේ බසින් උන්
වහන්සේට පිළිවදන් දුන්නා ය. එහි අර්ථය
‘ගුරුදේවයනෙි’ යනුයි.
17 ජේසුස් වහන්සේ කතා කොට, “මා අල්ලන්නට
එපා; මන්ද, මම තව ම පියාණන් වහන්සේ වතෙට
නොනැංගමේ. ඒ නිසා දැන් ඔබ මාගේ සහෝදරයන්
වතෙට ගොස්, ‘මම, මාගේ පියාණන් වහන්සේ හා
ඔබගේ පියාණන් වහන්සේ ද මාගේ දවේයන්
වහන්සේ හා ඔබගේ දවේයන් වහන්සේ ද වතෙට
නඟින්නමේ’යි ඔවුන්ට කියන්නැ”යි වදාළ සේක.
18 මග්දලායේ මරියා ශ්‍රාවකයන් වතෙට ගොස්,
“මම ජේසුස් වහන්සේ දිටිමි”යි කියා ද, මේ දේවල්
උන් වහන්සේ ඈට වදාළ බව ද, ඔවුන්ට දැන්වූවා ය.

### ශ්‍රාවකයන්ට දර්ශනය වීම

(මතෙ 28:16-20;මාක් 16:14-18;ලූක් 24:36-49)

19 සතියේ පළමු වන දා වූ එදා සවස
ජුදවේවරුන්ට බියනේ ශ්‍රාවකයන් දොරවල්
වසාගනෙ සිටි තැනට ජේසුස් වහන්සේ වැඩම කර
ඔවුන් මැද සිට, “ඔබට ශාන්තිය වේ වා!’යි වදාළ
සේක. 20 උන් වහන්සේ මසෙේ වදාරා තමන් අත් ද
ඇලය ද ඔවුන්ට පනේවූ සේක. ශ්‍රාවකයෝ
සමිඳාණන් වහන්සේ දුටු කල ප්‍රීතියනේ පිනාගියහ.
21 “ඔබට ශාන්තිය වේ වා!”යි යළිත් උන් වහන්සේ
ඔවුන්ට වදාරා “පියාණන් වහන්සේ මා එවා වදාළාක්
මනේ මම ද ඔබ යවමි”යි ඔවුන්ට කී සේක. 22 උන්
වහන්සේ ඉක්බිති ඔවුන් පිට හුස්ම හළො,
“ශුද්ධාත්මයාණන් පිළිගන්න; 23 මතෙ 16:19;
18:18ඔබ යමකුගේ පව් කමා කරන්නහු ද, ඒවා
ඔවුන්ට කමා කරනු ලැබේ; ඔබ යමකුගේ පව්
කමා නොකරන්නහු ද, ඒවා කමා නොකරනු ලැබේ
ය”යි ඔවුන්ට වදාළ සේක.

### තෝමස්ට දර්ශනය වීම

24 ජේසුස් වහන්සේ වැඩිය කල, දොළොස්
දනොගනේ එක් කනෙකේ වූ ‘නිවුන් දරුවා’ යයි නම්
ලත් තෝමස් ඔවුන් සමඟ නොසිටියේ ය.
25 එහයෙින් සසෙු ශ්‍රාවකයෝ, “අපි සමිඳාණන්
වහන්සේ දුටිමු”යි ඔහුට කී හ. එහතේ ඔහු කතා
කොට, “උන් වහන්සේගේ අත්වල ඇණ කැළැල්
දැක, ඇණ ගසා තිබූ තැන්වල මාගේ ඇඟිල්ල තබා,
උන් වහන්සේගේ ඇලයහෙි මාගේ අත දමා
බැලුවොත් මිස, නැත්නම් විශ්වාස නොකරමි”යි කී
ය.
26 අට දවසකට පසු උන් වහන්සේගේ
ශ්‍රාවකයෝ නිවස තුළට වී සිටියෝ ය. තෝමස් ද
ඔවුන් සමඟ සිටියේ ය. දොරවල් වසා තිබිණි.
එහතේ, ජේසුස් වහන්සේ පැමිණ, ඔවුන් මැද වැඩ
සිට: “ඔබට ශාන්තිය වේ වා!”යි වදාළ සේක.
27 ඉන්පසු උන් වහන්සේ තෝමස් අමතා, “ඔබේ
ඇඟිල්ල මහෙි බහා මාගේ අත් බලන්න; ඔබේ අත
දිගු කර මාගේ ඇලයහෙි තබන්න. අවිශ්වාස
නොකර විශ්වාස කරන්නැ”යි වදාළ සේක.
28 තෝමස් පිළිතුරු දමේින්, “මාගේ ස්වාමීනි, මාගේ
දවේයනෙි”යි උන් වහන්සේට කී ය. 29 එවිට ජේසුස්
වහන්සේ, “ඔබ මා දුටු බැවින් අදහාගත්තහෙි ය.
නුදුටු නමුත් අදහන්නෝ භාග්‍යවන්තයෝ ය”යි වදාළ
සේක.

### පොත ලිවීමේ අදහස

30 මේ පොතහෙි ලියා නැති වනෙත් බොහෝ
හාස්කම් ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන්
ඉදිරියහෙි සිදු කළ සේක. 31 එහතේ මේවා ලියන
ලද්දේ, ජේසුස් වහන්සේ දවේයන් වහන්සේගේ
පුත්‍ර වන ක්‍රිස්තුවරයාණන් බව ඔබ අදහාගන්නා
පිණිසත්, ඇදහීමනේ ජීවනය ලබන පිණිසත් ය.

### ශ්‍රාවකයන් සත් දනෙකුට දර්ශනය වීම

21 ඉන්පසු ජේසුස් වහන්සේ තිබේරියස් නම්
මුහුද ළඟ දී ශ්‍රාවකයන්ට නැවත දර්ශනය වූ
සේක. උන් වහන්සේ දර්ශනය වූයේ මේ අයුරින් ය.
2 සීමොන් පේදුරු ද 'නිවුන් දරුවා' නම් වූ තෝමස් ද
ගලීලයේ කානාහි නතානියලේ ද සබෙදීගේ
පුත්‍රයෝ ද උන් වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන්
තවත් දදෙනෙක් ද එක් ව සිටියෝ ය. 3 ලූක්
5:5සීමොන් පේදුරු, "මම මසුන් අල්ලන්න යමි"යි
ඔවුන්ට කී ය. "අපිත් ඔබ සමඟ එමු"යි ඔව්හු ඔහුට
කී හ. ඔව්හු පිටත් ව ගොස් ඔරුවට නැංගා හ.
එහෙත් ඒ රාත්‍රියේ ඔවුන් කිසිවක් ඇල්ලුවේ නැත.
4 පහන් වූ කල ජේසුස් වහන්සේ වෙරළෙහි සිටි
සේක. එසේ වුවත්, ඒ ජේසුස් වහන්සේ බව
ශ්‍රාවකයෝ නොදත්හ. 5 එවිට ජේසුස් වහන්සේ,
"මිත්‍රයෙනි, ඔබ ළඟ මාළු තිබේ දැ"යි ඔවුන්ගෙන්
ඇසූ සේක. ඔව්හු, "නැතැ"යි කී හ. 6 ලූක් 5:6උන්
වහන්සේ ඔවුන් අමතමින්, "ඔරුවේ දකුණු පැත්තෙන්
දැල හෙළන්න, එවිට සම්බ වනු ඇතැ"යි වදාළ
සේක. එසේ දැල හෙළූ කල, අසුවූ මසුන් රාශිය
නිසා දැල ඇද ගන්නට වත් ඔවුන්ට නොහැකි විය.
7 ජේසුස් වහන්සේ ප්‍රේම කළ ශ්‍රාවකයා
පේදුරුට කතා කොට, "අන්න, ඒ ස්වාමීන් වහන්සේ
ය"යි කී ය. එවිට සීමොන් පේදුරු ඒ ස්වාමීන්
වහන්සේ බව අසා, තමා ඉණ රෙද්ද ලිහාදමා සිටි
බැවින්, වහා එය ඇඳගෙන මුහුදට පැන්නේ ය.
8 එහෙත් සෙසු ශ්‍රාවකයෝ මසුන්ගෙන් පිරුණු දැල
ඇදගෙන, කුඩා ඔරුවෙන් ආහ. ඔව්හු වෙරළට නුදුරු
ව මීටර් සියයක් පමණ ඈතින් සිටියහ. 9 ඔව්හු
ගොඩට ආ විට එහි ගිනි අඟුරු ද ඒ පිට මාළු
තිබෙන බව ද රොටි ද දුටුවෝ ය. 10 "ඔබ දැන්
ඇල්ලූ මසුන්ගෙන් ස්වල්පයක් ගෙනෙන්නැ"යි ජේසුස්
වහන්සේ ඔවුන්ට වදාළ සේක.
11 සීමොන් පේදුරු ඔරුවට නැඟී, ලොකු මසුන්
එකසිය පණස්තුන් දෙනෙකුගෙන් පිරුණු දැල ගොඩට
ඇද්දේ ය. එපමණ තිබුණ නමුත් දැල ඉරුණේ නැත.
12 ජේසුස් වහන්සේ කතා කොට, "එන්න, අනුභව
කරන්නැ"යි ඔවුන්ට වදාළ සේක. ඒ සමිඳාණන්
වහන්සේ බව ඔවුන් දැන සිටි හෙයින්, "ඔබ කවුරු
දැ"යි උන් වහන්සේගෙන් අසන්නට ශ්‍රාවකයන්ගෙන්
කිසිවකුට වත් ධෛර්යය නොතිබිණි. 13 ජේසුස්
වහන්සේ ඇවිත්, රොටි රැගෙන ඔවුන්ට දුන් සේක;
එසේ ම මාළුත් දුන් සේක.
14 මේ වනාහි ජේසුස් වහන්සේ මළවුන්ගෙන්
උත්ථාන වූ පසු ශ්‍රාවකයන්ට දර්ශනය වූ තුන් වන
වතාව ය.

### පේදුරුට පැවරූ තුන් ප්‍රකාර භාරය

15 මෙසේ ඔවුන් ආහාර වැළඳූ පසු ජේසුස්
වහන්සේ සීමොන් පේදුරුට කතා කොට,
"ජොහන්ගේ පුත්‍ර වූ සීමොන්, මොවුන්ට වඩා ඔබ
මට ප්‍රේම කරන්නෙහි දැ"යි ඇසූ සේක. ඔහු,
"එසේ ය ස්වාමීනි, මා ඔබට ප්‍රේම කරන බව ඔබ
දන්නා සේකැ"යි පිළිතුරු දුන්නේ ය. උන් වහන්සේ,
"මාගේ බැටළු පැටවුන් පෝෂණය කරන්නැ"යි ඔහුට
වදාළ සේක.
16 නැවත දෙ වන වරටත්, "ජොහන්ගේ පුත්‍ර වූ
සීමොන් ඔබ මට ප්‍රේම කරන්නෙහි දැ"යි ඔහුගෙන්
ඇසූ සේක. ඔහු, "එසේ ය, ස්වාමීනි, මා ඔබට
ප්‍රේම කරන බව ඔබ දන්නා සේකැ"යි පිළිතුරු
දුන්නේ ය. උන් වහන්සේ ද, "මාගේ බැටළුවන්ගේ
එඬේරා වන්නැ"යි වදාළ සේක.
17 උන් වහන්සේ තුන් වන වරටත් ඔහුට කතා
කොට, "ජොහන්ගේ පුත්‍ර වූ සීමොන්, ඔබ මට
ප්‍රේම කරන්නෙහි දැ"යි ඔහුගෙන් ඇසූ සේක. තුන්
වන වරටත්, 'මට ප්‍රේම කරන්නෙහි දැ'යි ජේසුස්
වහන්සේ තමාගෙන් ඇසූ බැවින් පේදුරු ශෝක වී:
"ස්වාමීනි, ඔබ සියල්ල දන්නා සේක; මා ඔබ
වහන්සේට ප්‍රේම කරන බව ඔබ වහන්සේ දන්නා
සේකැ"යි කී ය. "මාගේ බැටළුවන් පෝෂණය
කරන්නැ"යි ජේසුස් වහන්සේ ඔහුට වදාළ සේක.
18 "ඒකාන්තයෙන් මම ඔබට කියමි, ඔබ තරුණ
වියෙහි ඔබේ ඉඟටිය බැඳගෙන කැමැති කැමැති
තැන්වල ඇවිද්දෙහි ය. එහෙත් ඔබ මහලු වූ කල
ඔබේ අත් දිගු කරන්නෙහි ය, වෙන කෙනෙකු ඔබේ
ඉඟටිය බැඳ, ඔබ කැමැති නැති තැනකට ගෙනයනු
ඇතැ"යි වදාළ සේක. 19 ඔහු කෙබඳු මරණයකින්
දෙවියන් වහන්සේ ගෞරවයට පමුණුවනු ඇද්දැ යි
හඟවනු වස් උන් වහන්සේ මෙසේ වදාළ සේක.
ඉක්බිති "මා අනුව එන්නැ"යි නැවතත් ඔහුට කී
සේක.

### හිතවත් ශ්‍රාවකයා

20 ජොහ 13:25 පේදුරු හැරී, ජේසුස් වහන්සේ
ප්‍රේම කළාවූ ද රාත්‍රි භෝජනයෙහි දී උන්
වහන්සේගේ ළයෙහි හාන්සි වී සිට, 'ඔබ පාවා
දෙන්නේ කවරෙක් දැ'යි ඇසුවාවූ ද ශ්‍රාවකයා තමන්
පසුපස්සේ එනු දිටී ය. 21 පේදුරු ඔහු දැක,
"ස්වාමීනි, මොහුට කුමක් වේ දැ"යි ජේසුස්
වහන්සේගෙන් ඇසී ය. 22 ජේසුස් වහන්සේ ද, "මා
එනතෙක් ඔහු සිටිනවාට මා කැමැති නම් ඔබට
මොක ද? 23 ඔබ මා අනුව එන්නැ"යි වදාළ සේක.
එහෙයින් ඒ ශ්‍රාවකයා නොමැරෙන්නේ ය යන කීම
සහෝදරයන් අතර පතළ විය. එසේ වී නමුත්
ජේසුස් වහන්සේ, 'මා එන තුරු ඔහු සිටිනවාට මා
කැමැති නම් ඔබට මොක දැ'යි කීවා මිස, 'ඔහු
නොමැරෙන්නේ ය'යි නොවදාළ සේක.
24 මේ ගැන සාක්ෂි දෙන්නාවූ ද මෙයෙ ලිව්වාවූ ද
ශ්‍රාවකයා ඔහු ය. ඔහුගේ සාක්ෂිය සැබෑ බව අපි
දනිමු.
25 ජේසුස් වහන්සේ කළ තවත් බොහෝ දේ
ඇත. ඒවා එකින් එක ලිව්වොත්, ලියවෙන ඒ
පොත්වලට මුළු ලෝකය වුවත් ඉඩ මදි යයි සිතමි.

## පෙන්තකොස්ත දවසේ ශුද්ධාත්ම දානය

2 ලෙවී 23:15-21; ද්වි.නී. 16:9-11 තවද,
පෙන්තකොස්ත දිනය පැමිණි කල, ඔව්හු
සියල්ලෝ එක් තැනක රැස් ව සිටියාහ. 2 එකල,
සැඩ සුළඟක් හමන්නාක් වැනි හඬක් හදිසියෙන්
අහසින් නික්මුණේ ය. ඔවුන් හිඳගෙන සිටි ගෙයෙ
මුළුමනින් ම එයින් පිරී ගියේ ය. 3 ගිනි දලු වැනි දිව්
බෙදී ගොස් ඔවුන් එකිනෙකා මත පිහිටනු ඔවුන්ට
පෙනිණි. 4 ඔව්හු සියල්ලෝ ම ශුද්ධාත්මයන්ගෙන්
පූර්ණ වී ආත්මයාණන් ඔවුන්ට දුන් කතා ශක්තිය
ලෙසෙ අන්‍ය භාෂාවලින් කතා කරන්නට පටන්ගත්හ.
5 එකල මිහි පිට හැම රටකින් ම පැමිණි බැතිමත්
ජුදෙව්වරු ජෙරුසලමෙහි සිටියෝ ය. 6 මේ ශබ්දය
ඇසුණු කණෙහි ම සමූහයා එක්රැස් වූ හ. එම
කතා ඔවුන් එකිනෙකාට තම තමන්ගේ මවු බසින්
තේරුම් ගත හැකි ලෙසෙ ඇසුණෙන් ඔව්හු වික්ෂිප්ත
වූ හ. 7 ඔව්හු සියල්ලෝ පුදුමයෙන් පුදුමයට පත් ව,
“බලන්න, මේ කතා කරන සියල්ලෝ ගලීලයෝ
නොවෙත් ද? 8 අපට හුරු පුරුදු අපේ ම මවු බසින්
ඔවුන් කතා කරනු අප එකිනෙකාට ඇසෙන්නේ
කෙසේ ද? 9 පාතිවරුන් ද මේදවරුන් ද එලාම්වරුන් ද
මෙසොපොතේමියාවෙහිත් ජුදය සහ
කපදෝකියෙහිත්, පොන්තසය සහ ආසියාවෙහිත්,
10 පිරිගිය සහ පම්පිලියායෙහිත්, මිසරය සහ
සිරේනිය අවට ලිබියේ ප්‍රදේශවලත් යන මෙකී
දේශවාසීන් ද රෝමයෙන් පැමිණි අමුත්තන් වන
ජුදෙව්වරුන් හා ජුදෙව් ආගම වැළඳගත්තවුන් ද
11 ක්‍රීතවරුන් හා අරාබිවරු ද වන අපි, අපේ ම
භාෂාවලින් දෙවියන් වහන්සේගේ බලවත් ක්‍රියා
ගැන ඔවුන් කතා කරනු අසම්හ”යි කී හ. 12 ඔව්හු
සියල්ලෝ ම විස්මිත ව, වියවුල් ව, “මෙහි තේරුම
කිමෙක් දැ”යි ඔවුනොවුන් අතර කතා කරගත්හ.
13 එහෙත් සමහරෙක් සරදම් කරමින්, “මොවුන්
අලුත් මිදියුස පමණට වඩා බී ඇතැ”යි කී හ.

## පෙන්තකොස්ත දවසේ දී පේදුරු තුමාගේ දේශනාව

14 එවිට එකොළොස් දෙනා සමඟ නැඟී සිටි
පේදුරු තුමා ශබ්ද නඟා ඔවුන්ට මෙසේ කී ය:
“ජුදෙව් ජනයිනි, ජෙරුසලමේ වසන සියල්ලෙනි, මෙය
දැනගන්න; මගේ වචනවලට සාවධාන ව සවන්
දෙන්න. 15 තව ම වේලාව උදේ නවය බැවින් ඔබ
සිතන හැටියට මේ අය වෙරි වී නැත. 16 මේ
සිද්ධිය නම් ජොයෙල් දිවැසිවරයා කී දෙය ඉටු වීමකි.
ඒ මෙලෙසෙ ය:
17 ජෝවෙ 2:28-32 “දෙවියන් වහන්සේ මෙසේ
වදාරන සේක:
q2 17 අන්තිම දවස්වල දී සකල මනුෂ්‍යයන් මාගේ
ආත්මානුභාවයෙන් පුරවා ලමි.
q2 17 එවිට ඔබේ දූ පුත්තු දිවැසි වැකි කියති;
q2 17 ඔබේ තරුණයෝ දර්ශන දකිති, ඔබේ
මහල්ලෝ ද පැතුම් පතති.
18 එපමණක් නොව, ඒ දවස්වල දී මාගේ
දැසිදසුන්ට වුව ද මාගේ ආත්මානුභාවය ප්‍රදානය
කරන්නෙමි;
q2 18 ඔව්හු ද දිවැස් වැකි පවසති.
19 තවද, ඉහළ අහසේ අරුමපුදුම දේ ද, පහත
පොළොවේ ලකුණු ද දක්වාලමි.
q2 19 ලේ ද ගිනි ද දුම්වලාපටල ද ඇති වේ.
20 සමිඳාණන් වහන්සේගේ උදාර තේජාන්විත ඒ
දවස පහළ වන්නට පෙරෙ, ඉර අඳුරු වන්නේ ය.
q2 20 හඳ ලේ පාට වන්නේ ය.
21 සමිඳාණන් වහන්සේගේ නාමය කියා අයැදින
කවුරු නමුත් ගළවනු ලබන්නෝ ය.’
22 “ඉශ්රායලේ ජනයිනි, මේ වචනයට සවන්
දෙන්න. ඔබ ම දන්නා ලෙසෙ, නාසරතේහි ජේසුස්
වහන්සේ, දෙවියන් වහන්සේ විසින් තෝරා පත් කළ
මනුෂ්‍යයෙකි. ඒ බව, දෙවියන් වහන්සේ උන්
වහන්සේ මඟින් ඔබ අතර කළ ප්‍රබල ක්‍රියාවලින්
ද අරුමපුදුම දේවලින් ද ලකුණුවලින් ද පෙන්වූ
සේක. 23 මතෙ 27:35; මාක් 15:24; ලූක් 23:33;
ජොහ 19:18එම ජේසුස් වහන්සේ, දෙවියන්
වහන්සේගේ නියමිත අභිප්‍රාය හා පෙරෙ දැනුම
අනුව, පාවා දෙනු ලැබූ සේක. ඔබ අදමිටු මිනිසුන්
ලවා උන් වහන්සේ කුරුසියේ ඇණ ගස්වා මරා
දැමුවහු ය. 24 මතෙ 28:5-6; මාක් 16:6; ලූක්
24:5එහෙත් දෙවියන් වහන්සේ මරණ බන්ධනයෙන්
උන් වහන්සේ මුදා උත්ථාන කර වදාළ සේක. මන්ද,
මරණයට උන් වහන්සේ බැඳ තබාගත නොහැකි
විය. 25 ගීතා 16:8-11දාවිත් උන් වහන්සේ ගැන කතා
කරමින් මෙසේ කී ය:
q2 25 ‘සමිඳාණන් වහන්සේ නිරතුරු මා ඉදිරියේ
සිටිනු දුටිමි;
q2 25 මා නොසැලෙනෙ පිණිස උන් වහන්සේ මාගේ
දකුණු පසෙහි සිටින සේක.
26 එබැවින් මාගේ හද සොම්නස් විය;
q2 26 මාගේ වචන ප්‍රමුදිත විය;
q2 26 මාගේ සිරුර ද බලාපොරොත්තුවෙන් පුල පුලා
සිටින්නේ ය.
27 මන්ද, ඔබ වහන්සේ, මාගේ ජීවිතය පාතාලයේ
දමන්නේ වත්, ඔබගේ දැහැමි තැනැත්තා ජරාපත්
වන්නට ඉඩ දෙන්නේ වත් නැත.
28 ඔබ ජීවනයේ මාර්ගයන් මට දැන් වූ සේක.
q2 28 ඔබගේ වැඩවිසීමෙන් ඔබ මා ප්‍රීතියෙන්
පුරවන සේක.
29 “සහෝදරවරුනි, ආදි පිතෘ වන දාවිත් මළ බවත්,
තැන්පත් කරනු ලැබූ බවත් නොවළහා කියන්නට
කැමැත්තෙමි. ඔහුගේ සොහොන අද දක්වා අප
අතර ඇත. 30 2 සාමු 7:12-13; ගීතා 132:11ඔහු
දිවැසිවරයෙකු වූ බැවින්, ඔහුගේ වංශයෙන්
කෙනෙකු ඔහුගේ සිංහාසනය පිට හිඳුවන සේකැ යි
දෙවියන් වහන්සේ දිවුරුමකින් ඔහුට දිවුළ බව ඔහු
දැන ගත්තේ ය. 31 ඔහු මෙයෙ කල් මත්තෙන් දැක,
ක්‍රිස්තුන් වහන්සේගේ පුනරුජ්ජීවනය ගැන කතා
කරමින්,

අ2 31 ‘උන් වහන්සේ පාතාලයේ හැරදමනු නොලැබූ
බවත්, උන් වහන්සේගේ සිරුර ජරාපත් නොවූ
බවත්’ කී ය.
32 “දෙවියන් වහන්සේ මමෙ ජේසුස් වහන්සේ
මරණයනේ උත්ථාන කොට වදාළ සේක. එයට අපි
සියල්ලෝ සාක්ෂිකාරයෝ වමු. 33 උන් වහන්සේ
දෙවියන් වහන්සේගේ දකුණතින් උසස් කරනු ලැබ,
පියාණන් වහන්සේ පොරොන්දු වූ ශුද්ධාත්මයාණන්
ලබා, ඔබ අසන දකින මේ දේ ප්‍රදානය කළ
සේක. 34+ACT ගීතා 110:1එහතේ දාවිත් ස්වර්ගයට
නැඟුණේ නැත. මන්ද, ඔහු ම,
34+ACT ‘මා ඔබේ සතුරන් ඔබේ පා යට ලන තකේ
මාගේ දකුණු පස අසුන් ගන්න කියා සමිඳාණෝ මා
සමිඳුන්ට වදාළ සේකැ’යි කියයි.
36 “එබැවින් ඔබ කුරුසියහෙි ඇණ ගැසූ මේ
ජේසුස් වහන්සේ, දෙවියන් වහන්සේ විසින් ස්වාමීන්
බවටත්, ක්‍රිස්තුන් බවටත්, පත් කර වදාළ බව මුළු
ඉශ්‍රායලේ ජනතාව සහතික ලසෙ දැන ගනිත් වා.”

## දේශනාවේ ප්‍රතිඵල

37 ඔව්හු ඒ අසා සන්තාපිත සිත් ඇති ව
“සහෝදරවරුනි, අප කුමක් කළ යුතු දැ”යි
පේදුරුගනේ ද අනකේ ප්‍රේරිතයන්ගනේ ද විචාළහ.
38 පේදුරු තුමා පිළිතුරු දමේන්, “ඔබ සියලුදනො ම
පසුතැවී සිත් හරවා ගනෙ පව්කමාව ලබන පිණිස
ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයනේ බව්තීස්ම-
ස්නාපනය ලබන්න. එවිට ඔබ ශුද්ධාත්ම දීමනාව
ලබන්නහු ය. 39 මන්ද, ඒ පොරොන්දුව ඔබටත්,
ඔබගේ දරුවන්ටත්, දුර බැහැර වසෙනෙ අන් අයටත්,
සැබැවින් ම, අපගේ ස්වාමීන් වන දෙවියන් වහන්සේ
විසින් කැඳවනු ලබන සියල්ලන්ටත් ය”යි කී ය.
40 ඔහු තවත් බොහෝ වචනවලින් උදක් ම
අයැදිමින්, “මේ කුහක පරම්පරාවනේ ගැළවනේනැ”යි
ඔවුන්ට අනුශාසනා කළෙේ ය. 41 එවිට ඔහුගේ
වචනය පිළිගත් අය බව්තීස්ම-ස්නාපනය කරනු ලැබූ
හ. ඒ දවසේ දී තුන්දාහක් පමණ පුද්ගලයෝ
ඔවුන්ගේ සංඛ්‍යාවට එකතු කරන ලදහ.

## ක්‍රිස්තියානි සභාවේ ලක්ෂණ

42 ඔව්හු ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීමහෙි ද,
සහභාගිකමහෙි ද රොටි කැඩීමහෙි ද යාච්ඤාවහෙි
ද නිරත ව කල් ගත කළහ. 43 සියලු දනො තුළ
ගෞරවාන්විත භීතියක් ඇති විය. ප්‍රේරිතවරුන්
අතින් බොහෝ අරුමපුදුම දේ හා ලකුණු සිදු විය.
44 ක්‍රියා 4:32-35ඇදහිලිවතුන් සියල්ලෝ එක් වී
හැම දයෙ ම පොදුවේ තබාගත්හ. 45 ඔව්හු
තමන්ගේ ඉඩකඩම් හා දේපළ විකුණා
එකිනකොගේ වුවමනාවේ හැටියට සියලු දනො
අතර බදොගත්හ. 46 තවද, ඔව්හු දිනපතා නොකඩ
ව ම, එක්සිත් ව දේව මාලිගාවේ රැස් වමේින් ද
ගයෙින් ගටෙ යමින් රොටි කඩමින් ද තම තමන්
අතර ප්‍රීතියනෙුත්, ත්‍යාගිවන්ත සිතිනුත් ආහාර
බදොගනිමින් ද 47 දෙවියන් වහන්සේට ප්‍රශංසා
කරමින් හා සියල්ලන්ගේ ප්‍රසාදය ලබමින් ද කල්
යැවූ හ. සමිඳාණන් වහන්සේ ගැළවීම ලබන්නන්ගේ
ගණන දවසින් දවස වැඩිකර වදාළ සේක.

## කොරකෙු සුවපත් කිරීම

3 දිනක් පේදුරු සහ ජොහන් යාච්ඤා වේලාව
වූ සවස තුනට දේව මාලිගයට ගියහ. 2 උපන්
දා පටන් කොර ව සිටි එක්තරා මිනිසකේ විය. දේව
මාලිගාවට ඇතුළු වන්නන්ගනේ සිඟමන් ඉල්ලන
පිණිස, දේව මාලිගාවේ ‘සුදර්ශන’ නම් ලත්
දොරටුව ළඟ දිනපතා ඔහු තබන ලදී. 3 ඔහු පේදුරු
සහ ජොහන් දේව මාලිගාවට ඇතුළුවන්නට යන
බව දැක සිඟමන් ඉල්ලී ය. 4 පේදුරු ජොහන් සමඟ
ඔහු දසෙ නතේ යොමා, “අප දසෙ බලන්නැ”යි කී ය.
5 ඔහු ද ඔවුන්ගනේ යමක් ලබන
බලාපොරොත්තුවනේ ඔවුන් දසෙ ඕනෑකමින් බැලී
ය. 6 එවිට පේදුරු, “රන් වත් රිදී වත් මට නැත.
එහතේ මට ඇති දේ ඔබට දමේ; නාසරතේහි
ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයනේ
ඇවිදින්නැ”යි කී ය. 7 එසේ කියා පේදුරු තුමා
ඔහුගේ දකුණත අල්ලා ඔහු නැඟිටුවාලී ය.
එකණෙහෙි ම ඔහුගේ පාද සහ වළලුකර ශක්ති
සම්පන්න විය. 8 ඔහු උඩ පැන කළෙින් සිට
ඇවිදින්නට විය. තවද, ඇවිදිමින් ද, උඩ පනිමින් ද,
දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් ද ඔහු ඔවුන්
සමඟ දේව මාලිගාවට ඇතුළු විය. 9 ඔහු
ඇවිදිනවාත්, දෙවියන් වහන්සේට ප්‍රශංසා
කරනවාත් සියලු දනො දුටුවෝ ය. 10 දේව
මාලිගාවේ ‘සුදර්ශන’ දොරටුව ළඟ හිඳගනෙ
සිඟමන් ඉල්ලුවේ මේ මිනිසා බව හඳුනා ගත් ඔව්හු
ඔහුට සිදුවූ දේ ගැන පුදුමයනේ පුදුමයට පත් වූ හ.

## පේදුරු තුමාගේ දේශනාව

11 පේදුරු සහ ජොහන් ඔහුගේ අතින් අල්ලාගනෙ
සලමොන්ගේ සක්මන් මළුවහෙි සිටිනු දුටු සමූහයා
අතිශයින් පුදුම වී ඔවුන් වතෙට දිවූ හ. 12 පේදුරු ඒ
සනෙඟට මසෙේ කී ය: “ඉශ්‍රායලේ ජනයිනි, මේ
ගැන ඔබ පුදුම වන්නේ කුමක්නිසා ද? අපේ ම
බලයනේ වත් යහපත්කමින් වත් අප මේ මිනිසා
ඇවිදින්නට සැලසුවාක් මනේ අප දසෙ නතේ යොමා
මවීතයනේ බලන්නේ මන් ද? 13 නික්ම
3:15ආබ්‍රහම්ගේ ද ඊසාක්ගේ ද ජාකොබ්ගේ ද
දවේ වූ අපගේ පියවරුන්ගේ දෙවියන් වහන්සේ
තමන් සේවකයා වූ ජේසුස් වහන්සේ මහිමයට
පැමිණ වූ සේක. එහතේ ඔබ උන් වහන්සේ නඩු
ශාලාවට පැමිණවේවහු ය. තවද පිලාත් උන්
වහන්සේ නිදහස් කරන්නට තීරණය කරගනෙ සිටි
විට ඔහු ඉදිරියේ ම ඔබ උන් වහන්සේ
ප්‍රතික්ෂේප කළහු ය. 14 මතෙ 27:15-23; මාක්
15:6-14; ලූක් 23:13-23; ජොහ 19:12-15ඔබ සුවිශුද්ධ
වූ ධර්මිෂ්ඨ වූ තැනැන් වහන්සේ ප්‍රතික්ෂේප කර
ඒ වනෙුවට මිනීමරුවකෙු මුදා දනෙ මනේ ඉල්ලා
සිටියහු ය. 15 මසෙේ ඔබ ජීවනේශ්වරයාණන්

මරණයට පත් කළහු ය. එහෙත් දෙවියන් වහන්සේ
උන් වහන්සේ මරණයෙන් උත්ථාන කර වදාළ සේක.
අපි ඊට සාක්ෂිකාරයෝ වම්හ. 16 දැන් ඔබ ඉදිරියේ
සිටින ඔබ හඳුනන මේ මිනිසා සම්පූර්ණ සුවය
ලැබුවේ උන් වහන්සේගේ නාමයෙන් හා ඒ නාමය
කෙරෙහි ඇති ඇදහිල්ල කරණකොටගෙන ය.
17 "දැන් ඉතින් සහෝදරවරුනි, ඔබගේ ප්‍රධානීන්
මෙන් ම, ඔබ ද, නොදැනුම්කමින් ක්‍රියා කළ බව
මම දනිමි. 18 එසේ වුවත්, ස්වකීය ක්‍රිස්තුන්
වහන්සේ දුක් විඳිය යුතු යයි දෙවියන් වහන්සේ
සියලු දිවැසිවරයන්ගේ මුවින් පෙර දන්වා වදාළ දේ,
මෙසේ සම්පූර්ණ කළ සේක. 19 එබැවින්, ඔබේ පව්
මකාලන පිණිස ද දෙවියන් වහන්සේ කෙරෙන් නව
ජීවන යුගයක් පැමිණෙන පිණිස ද 20 ඔබ උදෙසා
පෙර නියම කරන ලද ක්‍රිස්තුන් නම් ජේසුස්
වහන්සේ එවා වදාරන පිණිස ද පසුතැවී සිත් හරවා
ගෙන දෙවියන් වහන්සේ වෙතට හැරෙන්න. 21 ආදි
යුගවල සිට දෙවියන් වහන්සේ ස්වකීය ශුද්ධ
දිවැසිවරයන්ගේ මුවින් දැන්වූ, මුළු ලොවට නව
ජීවනය දීමේ කාලය පැමිණෙන තුරු උන් වහන්සේ
ස්වර්ගයේ වැඩ විසිය යුතු ය. 22 ද්වි.නී.
18:15,18මන්ද, 'ඔබගේ දෙවි ස්වාමීන් වහන්සේ මා
එවා වදාළාක් මෙන් ඔබේ සහෝදරයන් අතුරෙන් ම
දිවැසිවරයකු ඔබ හට එවා වදාරන සේක. ඔහු
ඔබට වදාරන සියල්ලට ඔබ සවන් දිය යුතු ය. 23 ඒ
දිවැසිවරයාට සවන් නොදෙන හැම කෙනෙක් ම
සෙනඟ අතරෙන් සහමුලින් ම විනාශ කරනු
ලැබෙතේ'යි මෝසෙස් කී ය.ද්වි.නී. 18:19 24 තවද,
සාමුවෙල් පටන් පහළ වූ සියලු දිවැසිවරු ද එසේ ම
පැවසූ හ; මේ දවස් ගැනත් නිවේදනය කළහ.
25 උත් 22:18ඔබ වනාහි දිවැසිවරුන්ගේ ද 'ඔබේ
වංශය කරණකොටගෙන මිහි පිට සියලු පවුල්
ආශීර්වාද කරනු ලබන්නේ ය'යි දෙවියන් වහන්සේ
ආබ්‍රහම්ට වදාරමින් ඔබේ පියවරුන් සමඟ කළ
ගිවිසුමේ ද පුත්‍රයෝ වන්නහු ය. 26 දෙවියන්
වහන්සේ ස්වකීය සේවකයාණන් උත්ථාන කොට,
පළමුවෙන් ම උන් වහන්සේ එවා වදාළේ ඔබ
වෙතට ය. එසේ කළේ ඔබ හැම කෙනෙකු ම තම
තමාගේ අදමිටුකම්වලින් හරවා ආශීර්වාද කරනු
පිණිස ය."

## පේදුරු තුමා සහ ජොහන් තුමා මන්ත්‍රණ සභාව ඉදිරියේ සිටීම

4 පේදුරු තුමා සහ ජොහන් තුමා සෙනඟට
කතා කරමින් සිටිය දී, පූජකයෝ ද දේව
මාලිගාවේ මුර සබෙළුන්ගේ ප්‍රධානියා ද සද්දුසිවරු
ද ඔවුන් අබිමුවට කඩා වැදුණාහ. 2 ඔවුන් සෙනඟට
අනුශාසනා කළ නිසා ද ජේසුස් වහන්සේගේ
උත්ථානය මඟින් පුනරුජ්ජීවනය ඇති වන බව
ප්‍රකාශ කළ නිසා ද ඔව්හු අතිශයෙන් උදහස් වූ හ.
3 ඔව්හු ඔවුන් අත්අඩංගුවට ගෙන, සවස් වී තිබුණු
බැවින්, පසු දා වන තුරු හිර අඩස්සියේ තැබූ හ.
4 එහෙත් පණිවුඩය ඇසූ බොහෝ දෙනෙක්
අදහාගත්හ. ඒ පිරිමින්ගේ ගණන පන්දහසක් පමණ
විය.
5 පසුවදා ඔවුන්ගේ ප්‍රධානීහු ද ප්‍රජා මූලිකයෝ
ද විනයධරයෝ ද යන මොවුහු, 6 උත්තම පූජක
අන්නස් ද කායාපස් ද ජොහන් ද අලෙක්සන්දර් ද
ඇතුළු උත්තම පූජක පරපුරට අයිති සියලු දෙනා ද
සමඟ ජෙරුසලමේ රැස් වූ හ. 7 ඔව්හු ප්‍රේරිතවරුන්
දදෙනා සභාව මැද සිටුවා, "ඔබ කුමන බලයකින්,
කවරකුගේ නාමයෙන් මෙය කළහු දැ"යි විචාළහ.
8 එවිට පේදුරු ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ ව ඔවුන්
අමතා මෙසේ කී ය: "ප්‍රධානියෙනි, ප්‍රජා
මූලිකයෙනි, 9 කොර මිනිසකුට කරන ලද කාරුණික
ක්‍රියාව ගැන හා ඔහු සුවපත් කරන ලද්දේ කෙසේ
ද යන්න ගැන හා අද අපි විමසනු ලබමු නම්,
10 එයට අපේ පිළිතුර මෙසේ ය: ඔබ විසින්
කුරුසියේ ඇණ ගසන ලද්දා වූ ද දෙවියන් වහන්සේ
විසින් උත්ථාන කරන ලද්දා වූ ද නාසරතේහි ජේසුස්
වහන්සේගේ අනුහසින් ඔබ ඉදිරියේ මේ මිනිසා
සුව සම්පන්න ව සිටියි. ඒ බව ඔබ සියලු දෙනාත්,
මුළු ඉශ්‍රායලේ ජනයාත් දැන ගනිත් වා. 11 ගීතා
118:22උන් වහන්සේ වනාහි 'ගෘහ ශිල්පීන් වන ඔබ
විසින් ප්‍රතික්ෂේප කරන ලද ගල ය. එහෙත් උන්
වහන්සේ ම ප්‍රධාන ගල වූ සේක.' 12 අන්
කිසිවකු මඟින් ගැළවීමක් නැත; මන්ද, අපේ
ගැළවීම සලසා දෙන ලද අන් කිසි නාමයක් මුළු
ලොවෙහි ම මිනිසුන් අතර නැත."
13 උගත්කමක් නැති සාමාන්‍ය මිනිසුන් වශයෙන්
සිටි පේදුරුගේ ද ජොහන්ගේ ද නිර්භීතකම දුටු
ඔව්හු මවිත වූ හ. ඔවුන් ජේසුස් වහන්සේ
ඇසුරෙහි සිටියවුන් බව ද පෙනී ගියේ ය. 14 සුවපත්
කරනු ලැබූ මිනිසා ඔවුන් සමඟ සිටි බැවින්, ඒ
දදෙනාට විරුද්ධ ව කිසිවක් කියන්නට ඔවුන්ට
නොහැකි විය. 15 එබැවින් මන්ත්‍රණ සභාවෙන්
බැහැර යන්නට ඔවුන්ට අණ කර, ඔව්හු තම තමන්
අතර සාකච්ඡා කරමින් මෙසේ කී හ: 16 "අපි මේ
මිනිසුන්ට කුමක් කරමු ද? ඔවුන් විසින් විශිෂ්ඨ,
අරුමපුදුම දෙයක් කරන ලද බව ජෙරුසලමෙහි සියලු
වැසියන්ට පෙනී ගොස් ඇත. එවැන්නක් නැතැ යි
කියන්නට අපට නොහැකි ය. 17 එබැවින්, ජනයා
අතර එය තවදුරටත් පතළ නොවන පිණිස මින්පසු
මේ නාමයෙන් කිසි ම කෙනෙකුට කතා නොකරන
මෙන් අපි ඔවුන්ට තර්ජනය කරමු." 18 ඉන්පසු ඔව්හු
ඔවුන් කැඳවා ජේසුස් වහන්සේගේ නාමයෙන්
කොහෙත් ම කතා නොකරන මෙන් ද නූගන්වන
මෙන් ද ඔවුන්ට අණ කළහ.
19 එහෙත් පේදුරු ද ජොහන් ද පිළිතුරු දෙමින්,
"දෙවියන් වහන්සේට කීකරු වීමට වඩා ඔබට කීකරු
වීම හරි දැ යි, දෙවියන් වහන්සේ ඉදිරියේ ඔබ ම
විනිශ්චය කරගන්න. 20 මන්ද, අප ඇසූ දුටු දේ ගැන
කතා නොකර සිටින්නට අපට නොහැකි ම ය"යි කී
හ. 21 ඔව්හු ඔවුන්ට තවදුරටත් තර්ජනය කොට
නිදහස් කර යන්නට හැරියෝ ය. සිදු වූ දේ ගැන
සියලු දෙනා දෙවියන් වහන්සේට ප්‍රශංසා කළ
බැවින්, ජනයා නිසා ඒ දදෙනාට දඬුවම් කිරීමට

ඔවුන්ට මඟක් නො වී ය. 22 පුදුම ලෙස සුවපත්
කරනු ලැබූ මේ මිනිසා අවුරුදු සතළිසක්
ඉක්මවූවෙකි.

## සභාව යාච්ඤාවේ යෙදී සිටීම

23 පේදුරු හා ජොහන් නිදහස් කරනු ලැබූ පසු,
සිය මිතුරන් වෙතට ගොස්, නායක පූජකයන් ද
ප්‍රජා මූලිකයන් ද තමන්ට කී දේ සැළ කළහ.
24 නික්ම 20:11; නෙහෙ 9:6; ගීතා 146:6මෙය ඇසූ
ඔව්හු, එක හඬින් දෙවියන් වහන්සේට මෙසේ
යාච්ඤා කළහ: “මහෝත්තම ස්වාමීනි, අහසත්,
පොළොවත්, මුහුදත්, එහි ඇති සියල්ලත් මැව්වේ
ඔබ වහන්සේ ය. 25 ගීතා 2:1-2ශුද්ධාත්මයාණන්
කරණකොටගෙන, ඔබගේ දාසයා වූ ද අපගේ පියා
වූ ද දාවිත් රජුගේ මුඛයෙන් කතා කරමින්,
25 ‘විජාතීන් කෝප වූයේ කුමට ද?
q225 ජනයන් නිෂ්ඵල උපා යෙදුයේ කුමට ද?
26 සමිඳාණන් වහන්සේට ද සිය
මෙසියස්වරයාණන්ට ද විරුද්ධ ව, පොළොවේ රජවරු
සැරසී සිටියාහ, අධිපතියෝ ද එක්රැස් වූ හ’යි
26 ඔබ වහන්සේ වදාළ සේක. 27 මතෙ 27:1-2;
මාක් 15:1; ලූක් 23:1,7-11; ජොහ 18:28-29සැබැවින්
ම, ඔබ ආලේප කළ ඔබගේ සුවිශුද්ධ
සේවකයාණන් වූ ජේසුස් වහන්සේට විරුද්ධ ව
හෙරොද් හා පොන්තියුස් පිලාත්, විජාතීන් ද,
ඉශ්රායලේ ජනයා ද සමඟ මේ නුවර රැස් වූ හ.
28 එසේ කළේ ඔබගේ බලයෙන් හා කැමැත්තෙන්
සිදුවන්නට ඔබ පෙර නියම කළ සියල්ල ඉටුවන
පිණිස ය. 29 දැන් ඉතින් ස්වාමීනි, ඔවුන්ගේ තර්ජන
සලකා බලා ඔබගේ වචනය නිර්භීත ව ප්‍රකාශ
කිරීමට ඔබගේ දාසයන්ට වර දුන මැනව. 30 සුව
කිරීමට ඔබගේ හස්තය දිගු කළ මැනව; තවද,
ඔබගේ සුවිශුද්ධ සේවකයාණන් වූ ජේසුස්
වහන්සේගේ නාමානුභාවයෙන් ලකුණු ද අරුමපුදුම
දේ ද සිදු කළ මැනව.” 31 මෙසේ යාච්ඤා කළ පසු,
ඔවුන් රැස් ව සිටි ස්ථානය කම්පා විය. ඔව්හු
සියල්ලෝ ම ශුද්ධාත්මයාණන්ගෙන් පිරී, දෙවියන්
වහන්සේගේ වචනය නිර්භීත ලෙස ප්‍රකාශ කළහ.

## සභාවේ ඒකාත්මතාව

32 එකල ඇදහිලිවතුන් සමූහයා එක්සත් ව,
එක්සිත් ව සිටිය හ; තමන් සතු දෙයින් කිසිවක්
තමාගේ ම යයි කිසිවෙක් නොකී හ; සියල්ල
පොදුවේ තබාගත්හ.ක්‍රියා 2:44-45 33 ස්වාමීන් වන
ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ පුනරුජ්ජීවනය ගැන
ප්‍රේරිතයෝ ප්‍රබල ලෙස සාක්ෂි දුන්හ. ඔවුන්
සියල්ලන් කෙරෙහි දේව වරප්‍රසාදය බහුල ව
පැවැතිණි. 34 අගහිඟ ඇති කිසිවෙක් ඔවුන් අතර
නොවූ හ. මන්ද, වතුපිටි හෝ ගෙවල් හෝ
අයිතිකරුවෝ ඒවා විකුණා, එයින් ලත් මුදල්
ගෙනැවිත්, 35 ප්‍රේරිතයන්ගේ පාමුල තැබූ හ. ඒ
මුදල් එකිනෙකාගේ වුවමනාවේ හැටියට බෙදා දෙන
ලදී. 36 එකල, ‘අනුශාසනාවේ පුත්‍රයා’ යන අර්ථය
ඇති බාර්ණබස් යයි ප්‍රේරිතයන් විසින් නම් කරන
ලද ලෙවීවරයෙකේ වූ ද සයිප්‍රස් වැසියෙකේ වූ ද
ජෝසපේ නම් මනුෂ්‍යයෙකේ විය. 37 ඔහු තමා සතු
කෙතෙක් විකුණා එයින් ලත් මුදල ගෙනැවුත්
ප්‍රේරිතයන්ගේ පාමුල තැබී ය.

## අනනියස් සහ සපිරා

5 අනනියස් නම් එක්තරා මිනිසෙක්, සපිරා නම්
තම භාර්යාව සමඟ ඉඩමක් විකුණා, 2 ඇය
දැනුවත් ව මුදලෙන් කොටසක් තබාගෙන, ඉතිරි
කොටස ගෙනැවිත් ප්‍රේරිතයන්ගේ පාමුල තැබී ය.
3 එවිට පේදුරු කතා කොට, “අනනියස්,
ශුද්ධාත්මයාණන් වහන්සේ රවටා, ඉඩමේ මුදලෙන්
කොටසක් තබාගන්නට සාතන් ඔබේ සිත
පෙළෙඹෙව්වේ කෙසේ ද? 4 විකුණන්නට පෙර ඉඩම
ඔබට ම අයිති ව තිබුණා නොවේ ද? විකුණූ පසු
මුදලත් ඔබගේ ම නොවේ ද? එසේ නම්, මේ
ක්‍රියාව කිරීමට ඔබේ සිත පෙළෙඹුණේ කෙසේ ද?
ඔබ රැවටුවේ මිනිසුන් නොව, දෙවියන් වහන්සේ
ය”යි කී ය. 5 අනනියස් ඒ වචන අසා මැරී වැටුණේ
ය. ඒ ඇසූ සියල්ලෝ අතිශයින් බියපත් වූ හ.
6 තරුණයෝ අවුත් මළ මිනිය ඔතා, පිටතට ගෙන
ගොස් වැළලූ හ.
7 පැය තුනකට පමණ පසු, සිදු වූ දේ නොදැන
ඔහුගේ බිරිඳ එතැනට පිවිසියා ය. 8 පේදුරු ඇය
අමතා, “මට කියන්න, ඔබ ඉඩම විකුණා ලැබූ මුදල
මෙපමණ දැ”යි ඇසී ය. “එසේ ය, එපමණ ය”යි ඈ
පිළිතුරු දුන්නා ය. 9 එවිට පේදුරු ඇය අමතා,
“ස්වාමීන්ගේ ආත්මයාණන් පරීක්ෂා කරන්නට ඔබ
දෙපොල එකඟ වූයේ කෙසේ ද? අන්න, ඔබේ
පුරුෂයා ගෙන ගොස් වැළලූ අය දොර ළඟ සිටිති.
ඔව්හු ඔබ ද එලෙස ම ගෙන යන්නෝ ය”යි කී ය.
10 ඈ එකෙණෙහි ම පේදුරුගේ පාමුල මැරී වැටුණා
ය. තරුණයෝ ඇතුළු වී, ඇය මැරී සිටිනු දැක,
පිටතට ගෙන ගොස් පුරුෂයා ළඟ වැළලූ හ. 11 මුළු
සභාව ද එය ඇසූ සියල්ලෝ ද අතිශයින් බියපත් වූ
හ.

## අරුමපුදුම දේ

12 ප්‍රේරිතයන් විසින් ජනයා අතර කරන ලද
ලකුණු ද අරුමපුදුම දේ ද බොහෝ විය. ඔව්හු සියලු
දෙනා ම එක්සිත් ව සලමොන්ගේ සක්මන් මළුවෙහි
රැස් වූ හ. 13 සෙසු අයගෙන් කිසිවෙක් ඔවුන් හා
එක් වන්නට තරම් ධෛර්යවත් නො වූ හ. එසේ
වුව ද ජනයා ඔවුන් පැසසූ හ. 14 සමිඳාණන්
වහන්සේ අදහාගත් අයගේ සංඛ්‍යාව තව තවත්
වැඩි විය. ඒ මහා ජනකාය ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයෙන්
සමන්විත විය. 15 එබැවින් පේදුරු මඟ යන විට,
ඔහුගේ සෙවණැල්ල වත් රෝගීන් මත වැටෙන
පිණිස, ඔව්හු ඔවුන් මහ මඟට ගෙනැවිත් යහන්වල
ද පැදුරුවල ද තැබූ හ. 16 ජෙරුසලම අවට
නුවරවලින්, රෝගාතුරයන් ද දුෂ්ටාත්මයන්ගෙන්

ජීඩිත වූවන් ද රුගත් ජනකායක් රුස් වූ හ. ඒ
සියල්ලෝ ම සුවය ලැබූ හ.

## ප්‍රේරිතයන්ට පීඩා කිරීම

17 එවිට උත්තම පූජකයා සහ ඔහු සමඟ එහි සිටි
සද්දුසි පක්ෂයේ අය, ඊර්ෂ්‍යාවෙන් පිරී නැඟී සිට,
18 ප්‍රේරිතයන් අල්ලා පොදු හිරගෙයි දැමූ හ.
19 එහෙත් රාත්‍රියේ දී සමිඳාණන් වහන්සේගේ
දූතයෙක් හිරගෙයි දොරවල් ඇර, ඔවුන් පිටතට
ගෙන ගොස්, ඔවුන්ට කතා කොට, 20 "යන්න, දේව
මාලිගාවේ සිට මේ ජීවන මඟ පිළිබඳ සියලු දේ
සෙනඟට ප්‍රකාශ කරන්නැ"යි කී ය. 21 ඔව්හු ඒ
අසා අලුයම දේව මාලිගාවට පිවිස ඉගැන්වූ හ.
21 ඒ අතරතුර, උත්තම පූජකයා ද පිරිවර ද
පැමිණ, මුළු ඉශ්රායලේ උත්තර මණ්ඩලය ඇතුළු
මන්ත්‍රණ සභාව රුස් කරවා, ප්‍රේරිතයන් ගෙනෙන
පිණිස හිරගෙදරට නියෝගයක් යැවූ හ. 22 එහෙත්
මුර සේවකයෝ ගොස්, හිරගෙයි ඔවුන් සිටිනු
නොදැක ආපසු පැමිණ මෙසේ සැළ කළහ:
23 "සිරගෙය ඉතා සුරක්ෂිත ලෙසෙ වසා තිබුණි.
මුරකරුවන් දොරටු ළඟ සිටි බව ද දුටිමු; එහෙත්
දොර ඇරිය කල ඇතුළේ කිසිවෙකේ අපට හමු නො
වූ හ." 24 දේව මාලිගාවේ සේනාධිපතියා ද නායක
පූජකයෝ ද මේ පුවත අසා, කුමකින් කුමක් වේ දැ
යි වික්ෂිප්ත වූ හ. 25 එවිට මිනිසෙක් අවුත්, "අන්න
ඔබ හිරගෙයි දැමූ අය දේව මාලිගාවේ සිට ජනයාට
උගන්වති"යි සැළ කළේ ය. 26 දේව මාලිගාවේ
සේනාධිපතියා සිය මුර සේවකයන් සමඟ පිටත් ව
ගොස් ප්‍රේරිතයන් රැගෙන ආවේ ය. එසේ
ගෙනෙන විට, සෙනඟ ඔවුන්ට ගල් ගසති යි යන
බියෙන් ප්‍රේරිතයන්ට කිසි හිරිහැරයක් නොකළහ.
27 ඔව්හු ඔවුන් ගෙනවුත් මන්ත්‍රණ සභාව
ඉදිරියෙහි සිටවේවෝ ය. උත්තම පූජකයා ඔවුන්
අමතා, 28 මතෙ 27:25"මේ මිනිසාගේ නාමයෙන්
නූගන්වන ලෙසෙ අපි ඔබට අණ කළෙමු. එහෙත්
ඔබ, ඔබගේ මේ ධර්මය ජරුසලම පුරා පතළ කර,
මේ මිනිසාගේ මරණය ගැන අප වගකිව යුත්තන්
කරන්නට අදහස් කරන්නහු දැ"යි ඇසූ හ. 29 එවිට
පේදුරු සහ ප්‍රේරිතයෝ පිළිතුරු දෙමින්, "අප
මිනිසුන්ට නොව දෙවියන් වහන්සේට කීකරු විය
යුතු ය. 30 අප පියවරුන්ගේ දෙවියන් වහන්සේ, ඔබ
විසින් ගසක එල්ලා මරණයට පත් කළ ජේසුස්
වහන්සේ උත්ථාන කොට වදාළ සේක. 31 එම
තැනැන් වහන්සේ නායකයාණන් ද ගැළවුම්
කාරයාණන් ද වන පිණිස දෙවියන් වහන්සේ සිය
දකුණතින් දකුණතට උසස් කර වදාළ සේක. එසේ
කළේ, ඉශ්රායලේට පසුතැවී සිත් හරවා ගැනීමත්
පව් කමාවත් දෙන පිණිස ය. 32 මේ කරුණුවලට අපි
සාක්ෂිකාරයෝ වෙමු. දෙවියන් වහන්සේට කීකරු
වන අයට ප්‍රදානය කර ඇති ශුද්ධාත්මයාණන්
වහන්සේ ද අප සමඟ, සාක්ෂිකාරයෙක් වන
සේකැ"යි කී හ.
33 ඔව්හු ඒ අසා කෝපයෙන් දිළිහී, ඔවුන් මරන්නට
අදහස් කළහ. 34 එහෙත්, විනයධරයෙකු වූ,
සියල්ලන්ගේ ප්‍රශංසාව ලැබූ ගමාලියෙල් නම් එක්
පරිසිවරයෙක්, මන්ත්‍රණ සභාවෙහි නැඟිට,
ප්‍රේරිතයන් ටික වේලාවකට පිටතට ගෙන යන්නට
අණ කොට, මෙසේ කී ය: 35 "ඉශ්රායලේ ජනයිනි,
ඔබ මේ මිනිසුන්ට කරන්නට යන දේ ගැන
පරිස්සම්වන්න. 36 ටික කලකෙට පෙර තියුදාස්, තමා
වැදගත් කෙනෙකැ යි කියමින් ඉදිරිපත් විය. ඔහුට
මිනිසුන් හාරසිය දෙනෙක් පමණ එකතු වූ හ.
එහෙත්, ඔහු මරනු ලැබී ය. ඔහුගේ අනුගාමිකයෝ
සියලු දෙනා විසිර ගොස් නැත්තට ම නැති වූ හ.
37 ඔහුට පසු, සංගණනය කළ දවස්වල ගලීලයේ
ජූදස් ඉදිරිපත් වී ජනයාගෙන් සමහර දෙනෙකු තමා
වෙතට දිනාගත්තේ ය. ඔහු ද විනාශ විය. ඔහුගේ
අනුගාමිකයෝ ද විසුරුවනු ලැබූ හ. 38 ඉදින් මේ
සිද්ධිය ගැන මා ඔබට කියන්නේ, මේ මිනිසුන්ගෙන්
ඈත් වී සිටින්න කියාත්, තමන්ගේ පාඩුවේ ඉන්නට
ඔවුන්ට ඉඩ හරින්න කියාත් ය. ඔවුන්ගේ මේ
ව්‍යාපාරය හෝ ක්‍රියා මාර්ගය හෝ මිනිසාගෙන්
වන දයෙක් නම්, එය කඩාකප්පල් වන්නේ ය.
39 එහෙත් එය දෙවියන් වහන්සේගෙන් වන දයෙක්
නම්, ඔවුන් පරාජය කරන්නට ඔබට නොහැකි ය.
එපමණක් නොව, ඔබ අදහස් කරන දේ, දෙවියන්
වහන්සේට විරුද්ධ ව සටන් කිරීමක් වීමට ද ඉඩ
ඇත." ඔව්හු මේ අවවාදය පිළිගත්හ.
40 ඉන්පසු ඔව්හු ප්‍රේරිතයන් තමන් වෙතට
ගෙන්වා, කස පහර දී, ජේසුස් වහන්සේගේ
නාමයෙන් කතා නොකරන්නට අණ කොට ඔවුන්
නිදහස් කර යැවූ හ. 41 එවිට ප්‍රේරිතයෝ ඒ නාමය
උදෙසා නින්දා විඳීමේ භාග්‍යය ගැන ප්‍රීති වෙමින්,
මන්ත්‍රණ සභාවෙන් ඉවත් ව ගියහ. 42 තවද ඔව්හු,
දිනපතා ම දේව මාලිගාවේ ද ගෙදරක් ගෙදරක්
පාසා ද ඉගැන්වීමෙහිත් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ
පිළිබඳ සුබ අස්න දේශනා කිරීමෙහිත් නිරත වූ හ.

## උපස්ථායකයන් සත්දෙනා පත් කිරීම

6 ඒ දවස්වල දී ශ්‍රාවකයන්ගේ ගණන වැඩි
වන කල, හෙබ්‍රෙව් බස කතා කරන
ජුදෙව්වන්ට විරුද්ධ ව, ග්‍රීක බස කතා කරන
ජුදෙව්වරු පැමිණිල්ලක් ඉදිරිපත් කළහ: දිනපතා
සහනාධාර දීමේ දී, තමන්ගේ වැන්දඹුවන්
නොසලකා හරිනු ලබති යි ඔව්හු කී හ. 2 එවිට
දොළොස් දෙනා ගෝල සමූහය රුස් කරවා, "අප
දෙවි දහම දේශනා කිරීම අතපසු කොට සහනාධාර
කටයුතුවල යෙදී සිටීම කිසිසේත් සුදුසු නැත.
3 එබැවින් සහෝදරයෙනි, මේ තනතුරට පත් කරන
පිණිස, යහපත් යයි පිළිගත්, එසේ ම ශුද්ධාත්මයෙන්
ද ප්‍රඥාවෙන් ද පූර්ණ සත්දෙනෙකු ඔබ අතරෙන්
තෝරා ගන්න. 4 ඉන්පසු අපි යාච්ඤාවෙහි ද ධර්ම
දේශනාවෙහි ද නියුක්ත ව සිටිමු"යි කී හ. 5 මේ
යෝජනාව ගැන මුළු මහත් පිරිස සතුටු වූ හ. එවිට
ඔව්හු, ඇදහිල්ලෙන් හා ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ

මිනිසකු වන ස්තෙපන් ද ඔහු සමඟ පිලිප් ද
ප්‍රොකොරස් ද නිකනොර් ද තිමොන් ද පර්මෙනස්
ද ජුදවේ ආගමට හැරුණු අන්තියෝකියේ
නිකොලොස් ද තෝරාගත්හ. 6 ඔව්හු මේ අය
ප්‍රේරිතයන් වෙත ඉදිරිපත් කළහ. ප්‍රේරිතයෝ
යාච්ඤා කොට ඔවුන් මත අත් තැබූ හ.
7 තවද දෙවියන් වහන්සේගේ වචනය පැතිරී
ගියේ ය. ජෙරුසලමේ ශ්‍රාවකයන්ගේ ගණන
බොහෝ සේ වැඩී විය. පූජකයන්ගෙන් මහත්
සමූහයක් ද ඇදහිල්ල පිළිගත්හ.

### ස්තෙපන් අත්අඩංගුවට ගැනීම

8 ස්තෙපන්, දේව වරප්‍රසාදයෙන් ද ආනුභාවයෙන්
ද පූර්ණ ව මහත් ලකුණු හා අරුමපුදුම දේ ජනතාව
අතර සිදු කළේ ය. 9 එහෙත්, 'ස්වාධීන' යයි නම්
ලත් ධර්මශාලාවට අයත් සිරේනීයයන් සහ
අලෙක්සන්ද්‍රියයන්ගෙන් ඇතැමෙක් ද සිලීසියාවේ
සහ ආසියාවේ සමහරු ද නැඟිට ස්තෙපන් සමඟ
විවාද කළහ. 10 ඔහුගේ කතාවෙහි ගැබ් වූ ප්‍රඥාව
හා ශුද්ධාත්ම බලය අභිබවා නැඟී සිටීමට ඔවුන්ට
නොහැකි විය. 11 එවිට, "මේ මිනිසා මෝසෙස්ටත්
දෙවියන් වහන්සේටත් අපහාස කරනවා අපි ඇසීමු"යි
කියන්නට ඔව්හු මිනිසුන් පෙළඹූවහු ය. 12 තවද
ඔව්හු ජනතාව ද ප්‍රජා මූලිකයන් ද විනයධරයන් ද
උසිගන්වා, ඔහු අත්අඩංගුවට ගෙන මන්ත්‍රණ
සභාව ඉදිරියට ගෙන ගියහ. 13 එහි දී ඔව්හු බොරු
සාක්ෂිකාරයන් ඉදිරිපත් කර, "මේ මිනිසා
ශුද්ධස්ථානයටත් ව්‍යවස්ථාවටත් විරුද්ධ ව
නොනවත්වා ම කතා කරයි. 14 නාසරත්හි ජේසුස්
වහන්සේ මේ ස්ථානය වනසා දමා, මෝසෙස්ගෙන්
අපට උරුම වූ වත්පිළිවෙත් වෙනස් කරන්නේ' යයි
ඔහු කියනවා ඇසීමු"යි කී හ. 15 මන්ත්‍රණ සභාවේ
හිඳගෙන හුන් හැම දෙනා ම ඔහු දෙස බැලූ හ.
ඔහුගේ මුහුණ දේව දූතයකුගේ මුහුණ මෙන්
ඔවුන්ට දර්ශනය විය.

### ස්තෙපන්ගේ පිළිතුරු කතාව

7 එවිට උත්තම පූජකයා, "මේ ඇත්ත දැ"යි ඇසී
ය. 2 උත් 12:1ස්තෙපන් මෙසේ පිළිතුරු දුනි:
"සහෝදරවරුනි, පියවරුනි, සවන් දෙන්න. අපගේ පිය
වූ ආබ්‍රහම් හාරාන්හි පදිංචි වන්නට පෙර
මෙසොපොතේමියාවේ සිටි කාලයෙහි, මහිමාන්විත
දෙවියන් වහන්සේ ඔහුට පෙනී, 3 'ඔබේ රටින් ද
ඥාතීන්ගෙන් ද වෙන් වී මා ඔබට පෙන්වන දේශයට
එන්නැ'යි වදාළ සේක. 4 උත් 11:31; 12:4එවිට ඔහු
කල්දීයයන්ගේ දේශයෙන් නික්ම ගොස් හාරාන්හි
පදිංචි විය. ඔහුගේ පියාගේ ඇවෑමෙන් දෙවියන්
වහන්සේ ඔහු එතැනින් ඉවත් කොට ඔබ දැන්
වසන මේ දේශයට ගෙනා සේක; 5 උත් 12:7;
13:15; 15:18; 17:8එහි අඩියක් පමණ වත් උරුමයක්
ඔහුට නුදුන් සේක. එහෙත්, එවකට ඔහුට දරුවකු
නොසිටි නමුත්, මේ දේශය ඔහුට ද ඔහුගේ දරු
පරම්පරාවට ද උරුම කර දීමට පොරොන්දු වූ සේක.
6 උත් 15:13-14දෙවියන් වහන්සේ වදාළ දේ නම්
මේ ය: 'ඔහුගේ දරු පරම්පරාව අන්‍ය දේශයක
ආගන්තුකයන් ව සිටිනවා ඇත. ඒ දේශවාසීන් ඔවුන්
වහල්කමට ගෙන අවුරුදු හාර සියයක් මුළුල්ලේ
ඔවුන්ට පීඩා කරනු ඇත. 7 නික්ම 3:12ඔව්හු යම්
ජාතියකට වහල් වෙත් ද, මම ඒ ජාතිය විනිශ්චයට
පමුණුවමි; ඉන්පසු ඔව්හු පිටත් ව අවුත් මේ
ස්ථානයෙහි මට නමස්කාර කරති.' 8 උත් 17:10-14;
21:2-4; 25:26; 29:31-35-18තවද, උන් වහන්සේ
ගිවිසුමේ ලකුණක් වශයෙන් චර්මඡේදනය ඔහුට
දුන් සේක. මෙසේ ආබ්‍රහම්ට දාව ඊසාක් ද
උපන්නේ ය. ආබ්‍රහම් අට වන දා ඔහු
චර්මඡේදනය කළේ ය. ඊසාක්ට දාව ජාකොබ් ද,
ජාකොබ්ට දාව කුලපතියෝ දොළොස් දෙනා ද
උපන්හ. ඔව්හු සියල්ලෝ චර්මඡේදනය කරනු ලැබූ
හ.
9 උත් 37:11,28; 39:2,21 "ඒ කුලපතියෝ ජෝසෙප්ට
ඊර්ෂ්‍යා කොට ඔහු මිසරයෙහි වහල්කමට විකුණූ හ.
එහෙත් දෙවියන් වහන්සේ ඔහු සමඟ සිට, 10 උත්
41:39-41සියලු දුක්වලින් ඔහු මුදා, මිසරයේ රජ වූ
පාරාවෝ ඉදිරියෙහි වරප්‍රසාදයත් ප්‍රඥාවත් ඔහුට
දුන් සේක. පාරාවෝ තමේ මිසරයට ද තමාගේ
මුළු රජ ගෙදරට ද, පාලකයා ලෙස ඔහු පත් කළේ
ය. 11 උත් 42:1-2එකල මුළු මිසර දේශයෙහි ද
කානාන්හි ද සාගතයක් ඇති වූයෙන් මහත්
විපත්තියක් ඇති විය. අපගේ පියවරුන්ට කිසි
ආහාරයක් නොමැති විය. 12 එහෙත් මිසරයෙහි
ධාන්‍ය ඇති බව ජාකොබ් අසා, පළමු වරට අපේ
පියවරුන් එහි යැවී ය. 13 උත් 45:1,16දෙ වන
වාරයේ දී ජෝසෙප් තම සහෝදරයන්ට හඳුන්වා
දෙනු ලැබී ය. පාරාවෝට ද ජෝසෙප්ගේ වංශය
හෙළි විය. 14 උත් 45:9-10,17-18; 46:27එකල
ජෝසෙප් තම පිය වූ ජාකොබ් ද
හැත්තෑපස්දෙනෙකුගෙන් යුත් ඔහුගේ සියලු ඥාතීන්
ද කැඳවා යැවී ය. 15 උත් 46:1-7; 49:33ජාකොබ්
මිසරයට ගියේ ය. එහි දී ඔහු ද අපගේ පියවරු ද
මියගියහ. 16 උත් 23:3-16; 33:19; 50:7-13; ජෝෂු
24:32ඔව්හු ෂකෙම් නුවරට ගෙන යන ලදුව,
ෂකෙම්හි හේමෝර්ගේ පුත්‍රයන්ගෙන් ආබ්‍රහම්
රිදී මිල ගණනකට ගත් සොහොන් ගයෙ තුළ
තැන්පත් කරනු ලැබූ හ.
17 නික්ම 1:7-8 "දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට දුන්
පොරොන්දුව ඉටු කිරීමේ කාලය ළංවෙත් ම, අපේ
ජනයා මිසරයෙහි වැඩී වර්ධනය වූ හ. 18 එකල
ජෝසෙප් ගැන නොදත් අන් රජෙක් මිසරයේ
රජකමට පත් විය. 19 නික්ම 1:10-11,22ඔහු අප
ජාතියට විරුද්ධ ව යටිඋගුල් අටවා, අපගේ ළදරුවන්
මැරී යන ලෙස පිටතට දමන්නට අපගේ පියවරුන්ට
බල කළේ ය. 20 නික්ම 2:2මෝසෙස් උපන්නේ මේ
කාලයේ දී ය. ඔහු දෙවියන් වහන්සේට ප්‍රිය වූ
සුන්දර දරුවෙක් විය. ඔහු ස්වකීය පියාගේ ගෙදර
තුන් මසක් ඇතිදැඩි කරනු ලැබී ය. 21 නික්ම
2:3-10ඉන්පසු ඔහු ඉවත දමනු ලැබූ කල
පාරාවෝගේ දුව ඔහු රැගෙන, ඇගේ ම පුත්‍රයා

මනේ ඇතිදැඩි කරගත්තා ය. 22 මෝසසේ
මිසරයන්ගේ සකල සිප්සතරහේ පුහුණු කරනු ලැබ,
කතාවහේ ද ක්රියාවහේ ද දක්ෂපක්ෂ තැනැත්තකේ
විය.
23 නික්ම 2:11-15 “මෝසසේට සතළිස් වසක් පමණ
වූ විට, ඉශ්රායලේ පුත්රයන් වන තම නෑදෑ පිරිස
බලන්නට යාමට ඔහුගේ සිතේ අදහසක් ඇති විය.
24 ඉශ්රායලේවරුන්ගනේ කනෙකෙුට අයුක්තියක්
කරනු දැක, ඔහුට පක්ෂ ව, මිසරයාට පහර දී, පීඩා
කරනු ලැබූ තැනැත්තාට යුක්තිය ඉටු කළෙේ ය.
25 දවේයන් වහන්සේ ඔහු අතින් ඔහුගේ නෑදෑ
පිරිසට විමුක්තිය සලසා දනෙ බව ඔවුන්
තේරුම්ගනෙ ඇතැ යි ඔහු සිතී ය. එහතේ ඔව්හු එය
තේරුම් නොගත්හ. 26 පසුවදා ඉශ්රායලේවරුන්
දදෙනෙකෙු දබර කරනු දැක, ඔවුන් සමඟි කිරීමේ
අදහසින් ඉදිරිපත් වී, ‘මිත්රවරුනි, ඔබ සහෝදරයෝ
ය; එකිනකොට අයුතුකම් කරන්නේ මන්දැ’යි ඇසී ය.
27 එහතේ අසල්වැසියාට අයුතුකම් කරමින් සිටි
මිනිසා මෝසසේ තල්ලු කර දමා, ‘අප කරෙහේ
අධිපතියකෙු ද විනිශ්චයකාරයකෙු ද කර ඔබ පත්
කළෙේ කවරකේ ද? 28 ඔබ ඊයේ මිසරයා මැරූ
ලසෙ, මාත් මරන්නට හදනවා දැ’යි කී ය. 29 නික්ම
18:3-4ඒ කීම නිසා මෝසසේ පලා ගොස්, මිදියන්
දේශයහේ ආගන්තුක ව විසී ය. එහි දී ඔහුට
පුත්රයෝ දදෙනෙකේ උපන්හ.
30 නික්ම 3:1-10 “සතළිස් අවුරුද්දක් ගත වූ පසු,
සීනයි කඳු පාළුකරයේ පඳුරක ගිනි ජාලාවක් තුළ
දේව දූතයකේ ඔහුට දර්ශනය විය. 31 මෝසසේ ඒ
දර්ශනය දැක, පුදුම වී, එය සොයා බලන පිණිස
ළඟට ගිය කල, 32 ‘ඔබේ පියවරුන්ගේ දවේයන්
වහන්සේ මම ය, ආබ්රහම්ගේ ද ඊසාක්ගේ ද
ජාකොබ්ගේ ද දවේයන් වහන්සේ මම වමේ’යි
කියන සමිඳාණන් වහන්සේගේ හඬ ඇසුණේ ය.
මෝසසේ වවේලන්නට වී, වැඩිදුර පරීක්ෂා කරන්නට
බිය විය. 33 සමිඳාණන් වහන්සේ ඔහුට කතා
කොට, ‘නුඹේ පාවහන් ගලවනු; මන්ද, නුඹ සිටින
ස්ථානය ශුද්ධ භූමියකි. 34 මිසරයහේ වසන මාගේ
ජනතාව විඳින පීඩා සැබැවින් ම දිටිමි; ඔවුන්ගේ
සුසුම්ලෑම ඇසීමි; ඔවුන් ගළවන පිණිස බැස ආවමේ;
එනු, මම දැන් නුඹ මිසරයට යවමි’යි වදාළ සේක.
35 නික්ම 2:14 “අප කරෙහේ අධිපතියකෙු හා
විනිශ්චයකාරයකෙු ලසෙ පත් කරන ලද්දේත්, ඔවුන්
විසින් ප්රතික්ෂේප කරන ලද්දේත් මේ මෝසසේ ය.
එහතේ පඳුරහේ දර්ශනය වූ දේව දූතයා මඟින්
අධිපතියකෙු හා මිදුම්කාරයකෙු ද වන පිණිස
දවේයන් වහන්සේ විසින් යවන ලද්දේත් මොහු ම
ය. 36 නික්ම 7:3; 14:21; ගණන් 14:33මිසරයහේදීත්,
රතු මුහුදේදීත්, සතළිස් අවුරුද්දක් මුළුල්ලහේ
පාළුකරයේදීත්, හාස්කම් ද අරුමපුදුම දේ ද කර
ඔවුන් පිටතට ගනෙ ගියේත් මේ මෝසසේ ම ය.
37 ද්වි.නී. 8:15,18‘දවේයන් වහන්සේ මා එවූ ලසෙ ම
ඔබගේ සහෝදරයන් අතරනේ ඔබට දිවැසිවරයකෙු
එවන සේකැ’යි ඉශ්රායලේ පුත්රයන්ට කීවේත්, මේ
මෝසසේ ම ය. 38 නික්ම 19:1; 20:17; ද්වි.නී.
5:1-33සීනයි කන්දේ දී තමාට කතා කළ දේව දූතයා
සමඟ ද අපේ පියවරුන් සමඟ ද පාළුකරයහේ වූ
සභාවේ ද සිටියේත්, අපට ප්රදානය කරන පිණිස
ජීවන දහම ලැබුවේත් මොහු ම ය.
39 “එහතේ අපේ පියවරු ඔහුට කීකරු වන්නට
අකමැති ව ඔහු නරෙපා දමා, ආපසු මිසරයට යන
රිසියනේ, 40 නික්ම 32:1ආරොන්ට කතා කරමින්,
‘අපට පරෙටුව යන පිණිස දවේවරුන් සෑදුව මැනව,
මන්ද, මිසර දේශයනේ අප ගනෙ ආ ඒ මෝසසේට
කුමක් වී ද කියා නොදනිමු’යි කී හ. 41 නික්ම
32:2-6ඔව්හු ඒ දවස්වල දී වස්සකෙු සාදා, ඒ රූපයට
පූජාවක් ඔප්පු කර, තමන් අතින් සෑදූ දේ ගැන ප්රීති
වූ හ. 42 ආමො 5:25-27එවිට දවේයන් වහන්සේ
ඔවුන් වතෙින් හැරී, ග්රහ දේවතා නමස්කාරයට
ඔවුන් අත්හැරදැමූ සේක. දිවැසිවරයන්ගේ පොතේ
ඒ ගැන,
q2 42 ‘ඉශ්රායලේ වංශය, කාන්තාරයහේ සතළිස්
වසක් තුළ ඔබ මට බිලි හා පූජා ඔප්පු කළහු ද?
43 නැත, නමස්කාර කරන පිණිස ඔබ විසින් සාදන
ලද රූප, එනම්, මොලකේගේ දේවාලය ද රෙපොන්
දවේයාගේ තාරකාව ද ඔබ ඔසවාගනෙ ගියහු ය.
q2 43 එබැවින් ඔබ බබිලෝනියනේ එපිටට
නරෙපන්නමේ’ යනුවනේ ලියා තිබේ.
44 නික්ම 25:9,40 “අපේ පියවරුන්ට කාන්තාරයහේ
සාක්ෂි මණ්ඩපය තිබුණේ ය. එය සාදන ලද්දේ,
දවේයන් වහන්සේ විසින් මෝසසේට පනේවන ලද
සැලැස්ම අනුව, ඔහු සමඟ කතා කළ තැනැන්
වහන්සේ නියම කළ ලසෙට ය. 45 ජෝෂු
3:14-17අපගේ පියවරු ජෝෂුවා හා සමඟ, දවේයන්
වහන්සේ ඔවුන් ඉදිරියනේ පන්නාදැමූ විජාතීන්ගේ
දේශය අයිති කරගත් අවස්ථාවේදීත්, ඔවුන් ලබාගත්
මේ කූඩාරම ද ගනෙ ගොස් දාවිත්ගේ කාලය දක්වා
තබාගත්හ. 46 2 සාමු 7:1-16; 1 වංශා 17:1-14දාවිත්
දවේයන් වහන්සේ ඉදිරියහේ ප්රසාදය ලබා,
ජාකොබ්ගේ දවේයන් වහන්සේට වාසස්ථානයක්
සැපයීමට අවසර ඉල්ලී ය. 47 1 රාජා 6:1-38; 2 වංශා
3:1-17එහතේ උන් වහන්සේට මන්දිරයක් තැනුවේ
සලමොන් ය.
48 “එසේ වුවත් අතින් සෑදූ ස්ථානවල
මහෝත්තමයාණන් වහන්සේ වාසය නොකරන
සේක. ඒ බව දිවැසිවරයා මසෙේ කියා ඇත:
49 යසො 66:1-2‘අහස මාගේ සිහසුන ය,
q2 49 පොළොව මාගේ පාපුටුව ය, කබෙඳු ගෘහයක්
ඔබ මට ඉදි කරන්නහු ද?
q2 49 නොහොත්, මාගේ විවේක ස්ථානය කිමකේ
ද?
50 මේ සියල්ල මාගේ අතින් නොසාදන ලද දැ යි
සමිඳාණන් වහන්සේ වදාරන සේක.
51 යසො 63:10 “හිතුවක්කාර, මිසදිටු සිත් හා
බිහිරි කන් ඇත්තනෙි, ඔබගේ පියවරුන් මනේ ඔබත්
නිතර ම ශුද්ධාත්මයාණන්ට එරහෙි ව සිටින්නහු ය.
52 ඔබගේ පියවරුන් පීඩා නොකළ දිවැසිවරයකේ
ඇද් ද? ඔව්හු ධාර්මිකයාණන්ගේ ආගමනය කල්තියා
දැන්වූ අය මරාදැමූ හ. දැන් ඔබ ඒ ධාර්මිකයාණන්

පාවා දී මරාදමා ඇත. 53 දේව දූතයන් විසින් දෙන
ලද ව්‍යවස්ථා ඔබ ලැබූ නමුත් ඒවා නොපිළිපැද්දහු
ය.”

## ස්තේපන්ට ගල් ගැසීම

54 ඔව්හු ඒ අසා, ඔහුට විරුද්ධ ව කෝපයෙන් දිළිහී
දත්මිටි කෑහ. 55 එහෙත් ඔහු ශුද්ධාත්මයෙන් පූර්ණ
ව, ස්වර්ගයට බැල්ම හෙළා, දෙවියන් වහන්සේගේ
තේජශ්‍රීයත් උන් වහන්සේගේ දකුණු පැත්තේ
ජේසුස් වහන්සේ නැඟිට සිටිනවාත් දැක, 56 “අන්න,
ස්වර්ගය විවර වී ඇත, මනුෂ්‍ය-පුත්‍රයාණන් දෙවියන්
වහන්සේගේ දකුණු පස නැඟිට සිටිනවා මට
පෙනේ ය”යි කී ය. 57 එහෙත් ඔව්හු මහත්
ශබ්දයෙන් මොරහඬගසා, තමන්ගේ කන් වසා
ගෙන, එක සිතින් ඔහු පිටට කඩා පැන, 58 ඔහු
නුවරින් පිටතට ඇද ඔහුට ගල් ගැසූ හ.
සාක්ෂිකාරයෝ තමන්ගේ ඇඳුම් සාවුල් නම්
යෞවනයකුගේ පාමුල තැබූ හ. 59 “ජේසුස්
ස්වාමීන් වහන්ස, මාගේ ආත්මය පිළිගත මැනවැ”යි
කියා ස්තේපන් යාච්ඤා කරද්දී ඔව්හු ඔහුට ගල්
ගැසූ හ. 60 ඔහු දණින් වැටී, “සමිඳාණන් වහන්ස,
මේ පාපය ඔවුන් පිට නොතැබුව මැනවැ”යි මහත්
හඬින් මොරගසා කී ය. මෙසේ කියා ඔහු
සැතපුණේ ය.

## සාවුල් සභාවට පීඩා කිරීම

8 ඔහු මරාදැමීම ගැන සාවුල් ද සතුට ප්‍රකාශ
කළේ ය.
8 ඒ දවසේ දී ජෙරුසලමෙහි වූ සභාවට විරුද්ධ
ව දරුණු පීඩාවක් හට ගත්තේ ය. එවිට
ප්‍රේරිතයන් හැර, සෙසු සියල්ලෝ ජුදයේ සහ
සමාරියේ පළාත්වල විසුරුවනු ලැබූ හ. 2 සැදැහැවත්
අය ස්තේපන් භූමදාන කොට, ඔහු ගැන බොහෝ
සෙයින් වැලපුණහ. 3 ක්‍රියා 22:4-5; 26:9-11එහෙත්
සාවුල් ගෙදරින් ගෙදරට ගොස්, පුරුෂයන් ද ස්ත්‍රීන්
ද අල්ලා හිරභාරයට ගනිමින්, සභාව වනසන්නට දිරි
දැරී ය.

## සමාරියේ දහම් දෙසීම

4 විසුරුවනු ලැබූ අය දේශයෙහි සැරිසරමින් දේව
වචනය දේශනා කළහ. 5 පිලිප් සමාරියේ නුවරකට
ගොස් එහි ක්‍රිස්තුන් වහන්සේ ගැන දේශනා
කළේ ය. 6 පිලිප් කී දේ ඇසූ, ඔහු කළ අරුමපුදුම
දේ දුටු, ජන සමූහයෝ ඔහුට එක සිතින් සවන්
දුන්හ. 7 අශුද්ධාත්මයන් වැහී සිටි බොහෝ
දෙනෙකුගෙන් ඒ ආත්මයෝ මහ හඬින් මොරගසමින්
දුරු වී ගියහ. බොහෝ අංශභාග රෝගීහු ද කොරු ද
සුව කරනු ලැබූ හ. 8 ඒ නුවර මහත් ප්‍රීතියක් ඇති
විය.
9 එකල ඒ නුවර ඊට කලින් අනවින කරමින් සිටි,
තමා මහා උත්තමයකු යි පුරසාරම් දෙඩූ, සමාරිය
ජනතාව මවිත කළ, සීමොන් නම් එක්තරා මිනිසෙක්
සිටියේ ය. 10 පරාක්‍රමයාණෝ යයි නම් ලත්
දෙවියන්ගේ බලය මොහු යයි කියමින්, ලොකු කුඩා
හැම දෙනා ම ඔහුට සාවධාන ව සවන් දුන්හ.
11 ඔවුන් ඔහුට එසේ සවන් දුන්නේ ඔහුගේ
අනවිනවලින් කාලයක් තිස්සේ ඔහු ඔවුන් මවිත
කළ නිසා ය. 12 එහෙත් පිලිප් දෙවියන් වහන්සේගේ
රාජ්‍යය ද ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ නාමය ද
ගැන සුබ අස්න දේශනා කළ විට, ඔව්හු ඔහු
විශ්වාස කළහ. ස්ත්‍රීහු ද පුරුෂයෝ ද බව්තීස්ම-
ස්නාපනය කරනු ලැබූ හ. 13 එපමණක් නොව
සීමොන් ද විශ්වාස කොට, බව්තීස්ම-ස්නාපනය
කරනු ලැබ, පිලිප් සමඟ නිරතුරු සිටිමින්, ඔහු කළ
අරුමපුදුම දේ ද ප්‍රබල ක්‍රියා ද දැක මවිත විය.
14 සමාරියයන් දෙවියන් වහන්සේගේ වචනය
පිළිගත් බව ජෙරුසලමේ සිටි ප්‍රේරිතවරයන්ට සැළ
වූයෙන් ඔව්හු පේදුරු සහ ජොහන් ඔවුන් වෙතට
යැවූ හ. 15 ඔව්හු එහි ගොස් ඔවුන්ට
ශුද්ධාත්මයාණන් ලැබෙන ලෙස යාච්ඤා කළහ.
16 මන්ද, ඔවුන් ජේසුස් වහන්සේගේ නාමයට
බව්තීස්ම-ස්නාපනය කරනු ලැබුවා මිස, ඒ වන තුරුත්
ශුද්ධාත්මයාණන් ඔවුන්ගෙන් කිසිවකු කෙරෙහි
පැමිණ තිබුණේ නැත. 17 ප්‍රේරිතවරුන් ඔවුන් පිට
අත් තැබූ කල, ඔවුන්ට ශුද්ධාත්මයාණන් ලැබිණි.
18 ප්‍රේරිතවරුන්ගේ අත් තැබීම කරණකොටගෙන
ශුද්ධාත්මය ලැබෙන බව දුටු සීමොන් ඔවුන්ට මුදල්
දෙමින්, 19 “යමකු පිට මම අත් තබම් ද, ඔහුට
ශුද්ධාත්මයාණන් ලැබෙන පිණිස මේ බලය මටත්
දෙන්නැ”යි කී ය. 20 එහෙත් පේදුරු ඔහුට කතා
කොට, “දෙවියන් වහන්සේගේ දීමනාව මුදලට ගත
හැකි යයි ඔබ සිතූ බැවින්, ඔබේ මුදලත්, ඔබත්
නැතිභංග වේ වා. 21 මේ කාරණයෙහි කොටසක්
වත් පංගුකාරකමක් වත් ඔබට නැත. මන්ද, දෙවියන්
වහන්සේ ඉදිරියෙහි ඔබේ සිත අවංක නැත.
22 එහෙයින් ඔබේ සිතේ අදහස ගැන ඔබට කමා
කරනු ලබන්නේ දැ යි බලනු පිණිස ඒ දුෂ්ටකම
ගැන පසුතැවී සිත හරවා ගෙන, සමිඳාණන්
වහන්සේට යාච්ඤා කරන්න. 23 මන්ද, ඔබ
තික්තකමේ ගැඹුරට කිමිදී පාප බැමිවලින් වෙළී
සිටින බව මට පෙනේ ය”යි කී ය. 24 සීමොන්
පිළිතුරු දෙමින්, “ඔබ කී දෙයින් කිසිවක් මට
සිදුනොවෙන පිණිස, මා උදෙසා සමිඳාණන් වහන්සේට
යාච්ඤා කරන්නැ”යි කී ය.
25 ඔවුන් සාක්ෂි දරා සමිඳාණන් වහන්සේගේ
පණිවුඩය දේශනා කළ ඉක්බිති ජෙරුසලමට පෙරළා
එන අතර සමාරියයන්ගේ බොහෝ ගම්වල දේව
වචනය දේශනා කළෝ ය.

## පිලිප් සහ එතියෝපීය නපුංසකයා

26 එකල සමිඳාණන් වහන්සේගේ දූතයෙක් පිලිප්ට
කතා කොට, “නැඟිට දකුණු දෙසෙ ජෙරුසලමේ සිට
ගාසාවට බසින පාරට යන්නැ”යි කී ය. එය කාන්තාර
පාරකි. 27 ඔහු එහි ගියේ ය. එවිට එතියෝපීය
රටවැසියන්ගේ කන්දකී නම් බිසව යටතේ බොහෝ
බලය ඇත්තා වූ ද ඇගේ මුළු වස්තුවේ අධිකාරී වූ

ද ඒතියෝපීය නපුංසකයෙක් වන්දනාව පිණිස
ජෙරුසලමට ගොස් 28 ආපසු යන විට, තමාගේ
රථයෙහි හිඳ, දිවැසිවර යසොයාගේ පොත කියවමින්
සිටියේ ය. 29 එවිට ආත්මයාණන් වහන්සේ පිලිප්ට
කතා කොට, "ඔබ ඉදිරියට ගොස් රථයට ළං ව
ගමන් කර එක්වන්නැ"යි වදාළ සේක. 30 පිලිප් ඔහු
ළඟට දිවගොස් ඔහු යසොයා දිවැසිවරයාගේ පොත
කියවනු අසා, "ඔබ කියවන දේ ඔබට තේරෙනේනේ
දැ"යි ඇසී ය. 31 "යමකු මඟ පෙන්නුවොත් මිස මට
තේරුම්ගත හැක්කේ කෙසේ දැ"යි ඔහු පිළිතුරු දී,
රථයට නැඟී තමා සමඟ හිඳගන්නට පිලිප්ගෙන්
උදක් ම ඉල්ලී ය. 32 යසො 53:7-8ඔහු කියවමින් සිටි
ශුද්ධ ලියවිලි පාඨය මෙසේ ය:
q232 "මරණයට ගෙනයනු ලබන බැටළුවකු මෙන් ද
උගේ ලොම් කපන්නා ඉදිරිපිට ගොළු ව සිටින
බැටළු පැටවකු මෙන් ද උන් වහන්සේ තමන් මුඛය
නොඇරි සේක.
33 උන් වහන්සේ නින්දා ලැබූ හ;
q233 යුක්තිය නොලැබූ හ.
q233 උන් වහන්සේගේ පෙළපත ගැන ප්‍රකාශ
කරන්නේ කවරෙක් ද? මන්ද, උන් වහන්සේගේ
ජීවිතය මිහි පිටින් පහකරදමන ලදී."
34 නපුංසකයා පිලිප්ගෙන් විචාරමින්, "දිවැසිවරයා
මෙසේ කියන්නේ කවරකු ගැන ද? තමා ම ගැන ද
නැතහොත් අන් කෙනෙකු ගැන දැ යි මට
කියන්නැ"යි කී ය. 35 එවිට පිලිප් පිළිතුරු දෙමින්,
එකී ශුද්ධ ලියවිලි පාඨයෙන් පටන්ගෙන ජේසුස්
වහන්සේ ගැන ඔහුට දේශනා කළේ ය. 36 ඔව්හු
මාර්ගයේ යද්දී, ජලය ඇති තැනකට පැමුණුණාහ.
නපුංසකයා "මෙන්න, ජලය ඇත; බව්තීස්ම-ස්නාපනය
ලැබීමට ඇති බාධාව කුමක් දැ"යි කී ය. 37 පිලිප්
කතා කොට, 'ඔබේ මුළු සිතින් අදහන්නෙහි නම්
එසේ කළ හැකි ය'යි පැවසී ය. ඔහු උත්තර දෙමින්,
"ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේගේ
පුත්‍රයාණන් බව මම අදහමි"යි කී ය. 38 රථය
නවත්වන්නට අණ කළ පසු පිලිප් ද නපුංසකයා ද
දෙදෙනා ම වතුරට බැස්සෝ ය. පිලිප් ඔහු බව්තීස්ම-
ස්නාපනය කළේ ය. 39 ඔවුන් වතුරෙන් ගොඩ ආ
කල සමිඳාණන් වහන්සේගේ ආත්මයාණෝ පිලිප්
හැරගෙන ගිය සේක. නපුංසකයා තවත් ඔහු
නුදුටුවේ ය. ඔහු ප්‍රීතියෙන් තමාගේ ගමන ගියේ
ය. 40 ඉන්පසු පිලිප් දක්නා ලද්දේ අසෝතස්හි දී ය.
ඔහු කායිසාරියට පැමිණෙන තෙක් සියලු නුවරවල
සැරිසරමින් සුබ අස්න ප්‍රකාශ කළේ ය.

### තාර්සස්හි සාවුල්ගේ හැරීම

(ක්‍රියා 22:6-16;26:12-18)

9 එකල සාවුල් තවදුරටත් ස්වාමින්
වහන්සේගේ ශ්‍රාවකයන් මරාදමන පිණිස
ඔවුන්ට විරුද්ධ ව තර්ජනය කරමින් සිටියේ ය. ඔහු
උත්තම පූජකයා වෙත ගොස්, 2 ඒ ඇදහිල්ලට අයත්
පුරුෂයන් හෝ ස්ත්‍රීන් හෝ සම්බ වුණොත්, ඔවුන්
අල්ලා ජෙරුසලමට ගෙන එන පිණිස, දමස්කයේ
ධර්මශාලාවට ඉදිරිපත් කිරීම සඳහා ඔහුගෙන්
බලපත්‍ර ඉල්ලාගත්තේ ය.
3 මෙසේ ඔහු ගමන් කරමින් දමස්කයට ළං වූ
කල, හදිසියෙන් අහසින් ආලෝකයක් ඔහු අවට
බැබළිණි. 4 ඔහු භ්‍රාන්ත වී බිම වැටුණේ ය. එවිට:
"සාවුල්, සාවුල්, ඔබ මට පීඩා කරන්නේ මන්දැ"යි
කියන හඬක් ඔහුට ඇසිණි. 5 "ස්වාමීනි, ඔබ
කවරෙක් දැ"යි ඔහු ඇසී ය. "මම ඔබ විසින් පීඩා
කරනු ලබන ජේසුස් ය. 6 නැඟිට නුවරට ඇතුළු
වන්න, ඔබ කළයුතු දේ ඔබට කියනු ලබන්නේ ය"යි
ඒ හඬ පැවසී ය. 7 ඔහු සමඟ ගමන් කළ මිනිසුන්ට
ඒ හඬ ඇසුණ නමුත්, ඔව්හු කිසිවකු නොදැක
තුෂ්ණිම්භූත ව සිටියෝ ය. 8 සාවුල් නැඟිට ඇස්
ඇරිය කල, ඔහුට කිසිවක් පෙනුණේ නැත. ඔව්හු
ඔහු අතින් අල්ලාගෙන දමස්කයට ගෙන ගියහ.
9 ඔහු තුන් දවසක් ඇස් නොපෙනී, නොකා නොබී
සිටියේ ය.
10 දමස්කයෙහි අනනියස් නම් එක්තරා
ශ්‍රාවකයෙක් සිටියේ ය. සමිඳාණන් වහන්සේ ඔහුට
දර්ශනය වී, "අනනියස්", කියා ඔහු ඇමතූ සේක.
"ස්වාමීනි, මම මෙහි ය"යි ඔහු කී ය. 11 සමිඳාණන්
වහන්සේ ඔහුට කතා කොට, "නැඟිට, කෙළින් නම්
වූ වීදියට ගොස්, තාර්සස්හි වැසියකු වූ සාවුල් නම්
කෙනෙකු ගැන ජූදස්ගේ ගෙදරින් විමසන්න. ඔහු
යාච්ඤා කරමින් සිටියි. 12 තමාට පෙනීම ලැබෙන
පිණිස අනනියස් නම් මිනිසකු පැමිණ තමා පිට අත්
තබනු ඔහුට දර්ශනය වී ය"යි වදාළ සේක.
13 එහෙත් අනනියස් උත්තර දෙමින්, "ස්වාමීනි, මේ
මනුෂ්‍යයා ජෙරුසලමේ දී ඔබගේ ශුද්ධවරයන්ට
කොපමණ හිංසා පීඩා කළේ දැ යි බොහෝ
දෙනෙකුගෙන් ඇසීමි. 14 මෙහිදීත් ඔබගේ නාමයට
යාච්ඤා කරන සියල්ලන් අත්අඩංගුවට ගන්නට ඔහු
නායක පූජකයන්ගෙන් බලය ලැබ සිටී ය"යි කී ය.
15 එහෙත් සමිඳාණන් වහන්සේ ඔහුට කතා කොට,
"යන්න, මන්ද, ඔහු මාගේ නාමය විජාතීන් ද රජුන් ද
ඉශ්රායලේ පුත්‍රයන් ද වෙත ගෙනයාමට මා විසින්
තෝරාගත් භාජනයකි. 16 ඔහු මාගේ නාමය නිසා
කොපමණ දුක් විඳින්න ඕනෑ ද කියා ඔහුට
දක්වන්නෙමි"යි වදාළ සේක.
17 අනනියස් පිටත් ව ගොස් ගෙට ඇතුළු වී, ඔහු
පිට අත් තබා, "සහෝදර සාවුල්, ඔබට පෙනීම
ලැබෙන පිණිස ද ඔබ ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ
කරනු ලබන පිණිස ද සමිඳාණන් වහන්සේ, එනම්,
ඔබ ගමන් කළ මාර්ගයේ දී ඔබට දර්ශනය වූ
ජේසුස් වහන්සේ, මා එවූ සේකැ"යි කී ය.
18 එකෙණෙහි ම ඔහුගේ ඇස්වලින් කොරපොතු
වැන්නක් වැටී ඔහු පෙනීම ලැබී ය; ඔහු නැඟිට
බව්තීස්ම-ස්නාපනය කරනු ලැබ, 19 කෑම කා යළිත්
ශක්තිය ලැබී ය.

## සාවුල් දමස්කයේ දී දේශනා කිරීම

19 සාවුල් දමස්කයේ ශ්‍රාවකයන් සමඟ කීප
දවසක් නතර ව සිටියේ ය. 20 ඔහු නොපමා ව
ජේසුස් වහන්සේ ගැන ධර්මශාලාවල දී දේශනා
කරමින්, "උන් වහන්සේ දෙවියන් වහන්සේගේ
පුත්‍රයා ය"යි ප්‍රකාශ කළේ ය. 21 ඒ ඇසූ
සියල්ලෝ අතිශයින් මවිත ව, "මෙම නාමයෙන්
යාච්ඤා කරන්නන් ජෙරුසලමේ දී වනසා දැමූ
තැනැත්තා මොහු නොවේ ද? මොහු මෙහි ආයේත්
ඔවුන් අත්අඩංගුවට ගෙන නායක පූජකයන් ඉදිරියට
ගෙන යන අදහසින් නොවේ දැ"යි කී හ. 22 එහෙත්
සාවුල් වඩ වඩා බලසම්පන්න ව, ඒ ජේසුස්
වහන්සේ, ක්‍රිස්තුන් වහන්සේ ම යයි ඔප්පු කරමින්,
දමස්කයෙහි විසූ ජුදෙව්වරුන් නිරුත්තර කළේ ය.
23 2 කොරි 11:32-33 කලක් ගත වූ පසු, ජුදෙව්වරු
ඔහු මරන්නට කුමන්ත්‍රණ කළහ. 24 එහෙත්
ඔවුන්ගේ උපාය සාවුල්ට දැනගන්නට ලැබිණි. ඔහු
මරණ පිණිස ඔව්හු රෑ දාවල් දෙකෙහි දොරටුවල
රැකබලා සිටියහ. 25 එහෙත් ඔහුගේ ශ්‍රාවකයෝ
රාත්‍රියේ ඔහු ගෙන ගොස්, කූඩයක බහා, පවුරෙහි
විවරයකින් පහළට බැස්වූ හ.

## සාවුල් ජෙරුසලමට පැමිණීම

26 ඉන්පසු සාවුල් ජෙරුසලමට පැමිණිවිට,
ශ්‍රාවකයන් සමඟ එක්වන්නට උත්සාහ කළේ ය.
එහෙත් ඔහු ශ්‍රාවකයෙකු යි විශ්වාස නොකොට
සියල්ලෝ ඔහුට බිය වූ හ. 27 එවිට බාර්ණබස් ඔහු
කැටුව ප්‍රේරිතයන් ළඟට කැඳවා ගෙන ගොස්,
මාර්ගයේ දී ඔහු සමිඳාණන් වහන්සේ දුටු සැටිත්,
උන් වහන්සේ ඔහුට කතා කළ බවත්, දමස්කයේ දී
ජේසුස් වහන්සේගේ නාමයෙන් ඔහු නිර්භීත ලෙස
දේශනා කළ සැටිත්, ඔවුන්ට විස්තර කළේ ය.
28 සාවුල් ද ඔවුන් සමඟ ජෙරුසලමෙහි සැරිසරමින්,
සමිඳාණන් වහන්සේගේ නාමයෙන් නිර්භීත ව කතා
කළේ ය. 29 ඔහු ග්‍රීක බස කතා කළ ජුදෙව්වරුන්
සමඟ සාකච්ඡාවෙහි ද වාද කිරීමෙහි ද යෙදීම නිසා
ඔව්හු ඔහු මරන්නට අධිෂ්ඨාන කර ගත්හ.
30 සහෝදරයෝ ඒ බව දැන, ඔහු කායිසාරියට ගෙන
ගොස් එතැනින් තාර්සස්ට පිටත් කර යැවූ හ.
31 මෙසේ මුළු ජුදයෙහි ද ගලීලයෙහි ද සමාරියෙහි
ද සභාවට සාමයේ කාලයක් ඇති විය. සභාව
ශක්තිසම්පන්න ව, දේව ගෞරවයෙහි ද ශුද්ධාත්ම
වරප්‍රසාදයෙහි ද පවතිමින් වැඩි වර්ධනය වූවා ය.

## පේදුරු තුමා අයිනයෙස් සුව කිරීම

32 තවද පේදුරු සියලු පළාත්වල සැරිසරා,
ලිද්දායෙහි විසූ සැදැහැවතුන් වෙතට පැමිණියේ ය.
33 එහි අට අවුරුද්දක් අංශභාග රෝගයෙන් ඔත්පළ
ව හුන් අයිනයෙස් නම් මනුෂ්‍යයෙකු ඔහුට හමු විය.
34 පේදුරු ඔහුට කතා කොට, "අයිනයෙස්, ජේසුස්
ක්‍රිස්තුන් වහන්සේ ඔබට සුවය දෙන සේක. නැඟිට
ඔබේ යහන සකස් කරගන්නැ"යි කී ය. එකෙණෙහි
ම ඔහු නැඟිට්ටේ ය. 35 ලිද්දායෙහි ද ශාරොනෙහි ද
විසූ සියල්ලෝ ඔහු දැක, සමිඳාණන් වහන්සේ සරණ
ගියහ.

## දොර්කස් මරණයෙන් උත්ථාන කිරීම

36 දොර්කස්, හෙවත් මුවදෙන යන අර්ථය ඇති,
තබීතා නම් එක්තරා සැදැහැවත් කාන්තාවක්
ජොප්පාවෙහි සිටියා ය. ඈ යහපත කිරීමේ දී හෝ
දන්දීමෙහි දී හෝ කිසි විටෙක වෙහෙසට පත්
නොවූවා ය. 37 එහෙත් ඒ දවස්වල ඈ රෝගී ව මළා
ය. ඔව්හු මිනිය නාවා, උඩුමහලක තැබූ හ.
38 ලිද්දාව ජොප්පාවට සමීප බැවින්, පේදුරු එහි
සිටින බව ඇසූ ශ්‍රාවකයෝ "පමා නොවී අප වෙත
එන්නැ"යි අයැදිමින් මිනිසුන් දදෙනෙකු ඔහු වෙත
යැවූ හ. 39 එවිට පේදුරු පිටත් ව ඔවුන් සමඟ ගියේ
ය. ඔහු පැමිණි කල, ඔව්හු උඩුමහලට ඔහු
කැඳවාගෙන ගියහ. සියලු වැන්දඹුවෝ ඔහු වටා සිට
හඬ හඬා, දොර්කස් ජීවත් ව සිටිය දී මැහූ කමිසත්
කබාත් පෙන්වූ හ. 40 පේදුරු ඔවුන් සියල්ලන් බැහැර
කර, දණින් වැටී යාච්ඤා කර, මෘත දේහය දෙසට
හැරී, "තබීතා, නැඟිටින්නැ"යි කී ය. එවිට ඈ ඇස්
ඇර, පේදුරු දැක, හිඳගත්තා ය. 41 ඔහු ඈ අතින්
අල්ලා නැඟිටුවා, සැදැහැවතුන් ද වැන්දඹුවන් ද
කැඳවා, පණපිටින් සිටි ඇය ඔවුන්ට භාර දුන්නේ ය.
42 ජොප්පාව පුරා මේ පුවත පතළ විය. බොහෝ
දෙනෙක් සමිඳාණන් වහන්සේ අදහා ගත්හ.
43 පේදුරු, සීමොන් නම් සම් පදම් කරන්නෙකු සමඟ
කීප දවසක් ජොප්පාවෙහි නැවතී සිටියේ ය.

## පේදුරු සහ කොර්නේලියස්

10 ඉතාලි යයි නම් ලත් භට හමුදාවේ
ශතාධිපතියෙකු වූ කොර්නේලියස් නම්
එක්තරා මිනිසෙක් කායිසාරියේ සිටියේ ය. 2 ඔහු
බැතිමතෙකි. සිය ගෙදර වැසියන් සමඟ දේව
නමස්කාරයෙහි යෙදෙන කෙනෙකි. සෙනඟට බොහෝ
සේ දන් දෙමින් නොකඩ ව දෙවියන් වහන්සේට
යාච්ඤා කිරීමෙහි නිරත වූවෙකි. 3 දිනක් සවස
තුනට පමණ දෙවියන් වහන්සේගේ දූතයෙක්
ඔහුගේ නිවසට පැමිණ, "කොර්නේලියස්" කියා
තමාට ආමන්ත්‍රණය කරනු ඔහු දර්ශනයකින්
පැහැදිලි ලෙස දැක, 4 දූතයා දෙස නෙත් යොමා
බලා, බියපත් වී, "ස්වාමීනි, කිමෙක් දැ"යි ඇසී ය.
දූතයා කතා කොට, "ඔබේ යාච්ඤා ද දාන ද
සිහිවටන වශයෙන් දෙවියන් වහන්සේ ඉදිරියට නැඟී
ඇත. 5 ඉදින් ජොප්පාවට මිනිසුන් යවා, පේදුරු නම්
සීමොන් කැඳවාගන්න. 6 ඔහු මුහුද අද්දර සීමොන්
නම් සම් පදම් කරන්නෙකුගේ ගෙදර නවාතැන්ගෙන
සිටී ය"යි කී ය. 7 මෙසේ කතා කළ දේව දූතයා ගිය
කල, කොර්නේලියස් තමාගේ ගෙදර
මෙහෙකරුවන්ගෙන් දදෙනෙකු ද තමාගේ
පෞද්ගලික ආවතේව කරන්නන්ගෙන් පක්ෂපාත
භටයෙකු ද කැඳවා, 8 ඔවුනට සියල්ල කියා දී,
ඔවුන් ජොප්පාවට යැවී ය.

9 පසු දින ඔවුන් ගමන් කොට ඒ නුවරට ළං වතේ
ම, පේදුරු මද්දහන වේලාව පමණේ දී යාච්ඤා
කරන පිණිස වහල්තලයට නැඟුණේ ය. 10 එවිට
බඩගිනි ව, කෑම කන්නට ඔහුට ඕනෑ විය. එහෙත්
ඔවුන් කෑම පිළියෙළ කරද්දී ඔහුට දිව්‍ය දර්ශනයක්
ලැබුණි. 11 එවිට අහස විවර ව, මහත් රුවලක් වැනි
යම් දයෙක් එහි සතර කොණින් බැඳ පොළොවට
බස්වනු ඔහු දිටී ය. 12 පොළොවේ සියලු ආකාර
සිවුපාවෝ ද උරග ජාතීහු ද ආකාශ පක්ෂීහු ද එහි
සිටියෝ ය. 13 "පේදුරු නැඟිට මරා කන්න" යන
හඬක් ඔහුට ඇසිණි. 14 එහෙත් පේදුරු, "ස්වාමීනි,
එසේ නොවේ වා; මන්ද, අකැප, අපවිත්‍ර දයෙක්
කිසි කලකෙත් මම නොකෑවෙමි"යි කී ය.
15 "දෙවියන් වහන්සේ පවිත්‍ර කළ දේ, අකැප යයි
නොකියන්නැ"යි දෙ වන වරටත් කියන හඬක්
ඇසිණි. 16 මෙයෙ තුන් වරක් ම සිදු විය. එකණෙහි
ම ඒ දේ අහසට ඔසවාගනු ලැබී ය.
17 තවද, තමා දුටු දර්ශනය කුමක් දැ යි සිත සිතා,
පේදුරු වියවුල් ව සිටිය දී, කොර්නේලියස් විසින්
එවන ලද මනුෂ්‍යයෝ සීමොන්ගේ ගෙදර කොහේ
දැ යි විමසමින් අවුත් එහි දොරටුව ළඟ සිට,
18 "පේදුරු නම් ලත් සීමොන් මෙහි නැවතී සිටී දැ"යි
හඬ නගා ඇසූ හ. 19 පේදුරු තමා දුටු දර්ශනය
ගැන කල්පනා කරමින් සිටිය දී, ආත්මයාණන්
වහන්සේ ඔහු අමතමින්, "අන්න, මිනිස්සු තුන්
දෙනෙක් ඔබ සොයති. 20 එබැවින් නැඟිට, බැස
ගොස් කිසි සැකයක් නැති ව, ඔවුන් සමඟ යන්න.
ඔවුන් එවූයේ මම ය"යි වදාළ සේක. 21 එවිට
පේදුරු ඒ මනුෂ්‍යයන් වෙතට බැස ගොස්: "ඔබ
සොයන තැනැත්තා මම ය, ඔබ ආ කාරණය කිමෙක්
දැ"යි ඇසී ය. 22 ඔව්හු කතා කොට: "දැහැමි, දේව
භය ඇති, මුළු ජුදවේ ජාතිය ම ගරු කරන
ශතාධිපතියකු වූ, කොර්නේලියස් තමේ තමාගේ
ගෙදරට ඔබ කැඳවා ඔබගේ ඔවදන් අසන පිණිස,
දෙවියන් වහන්සේ විසින් ශුද්ධ වූ දේව දූතයකු
ලවා අණ දෙනු ලැබී ය"යි කී හ. 23 එවිට පේදුරු
ඔවුන් ඇතුළට කැඳවා නවාතැන් දුන්නේ ය.
23 පසුවදා ඔහු ඔවුන් සමඟ පිටත් ව ගියේ ය.
ජොප්පාවේ සහෝදරයන්ගෙන් සමහරෙක් ද ඔහු
කැටුව ගියහ. 24 ඊට පසුදා ඔව්හු කායිසාරියට
පැමිණියහ. කොර්නේලියස් තමාගේ නෑයන් ද
හිතමිතුරන් ද කැඳවාගෙන ඔවුන් එන තුරු බලා
සිටියේ ය. 25 පේදුරු ගෙට පිවිසුණු විට,
කොර්නේලියස් ඔහු ඉදිරියට ගොස් ඔහුගේ පාමුල
වැඳ වැටුණේ ය. 26 එහෙත් පේදුරු, "නැඟිටින්න,
මමත් මනුෂ්‍යයෙකැ"යි කියා ඔහු එසවේවේ ය.
27 පේදුරු ඔහු සමඟ කතා කරමින්, ගේ ඇතුළට
ගොස්, බොහෝ දෙනෙකු රැස් ව සිටිනු දැක,
28 ඔවුන් අමතා, "ජුදවේ මිනිසකුට විජාතිකයකු
හා සමඟ සමාගම් පැවැත්වීමත් ඔහු බලන්නට
යාමත් තහනම් බව ඔබ දන්නහු ය. එහෙත් කවර
මිනිසකේ වුව ද පිළිකුල් ය නොහොත් අපවිත්‍ර යයි
නොකිය යුතු බව දෙවියන් වහන්සේ මට පෙන්වා
දුන් සේක. 29 එබැවින් ඔබ මා කැඳවා යැවූ කල මම
කිසි සැකයක් නැති ව ආවෙමි. ඔබ මා කැඳවේවේ
මන්දැ"යි ඇසී ය.
30 එවිට කොර්නේලියස්, "සිව්දිනකට පෙර මවෙනි
වේලාවක දී, සවස තුනට, මම ගෙදර යාච්ඤා
කරමින් සිටියෙමි. එවිට දිළිසෙන වස්ත්‍ර හැඳගත්
මිනිසකේ මා ඉදිරියෙහි සිට, 31 'කොර්නේලියස්,
ඔබේ යාච්ඤා අසන ලද්දේ ය, ඔබේ පුණ්‍ය ක්‍රියා
දෙවියන් වහන්සේ ඉදිරියෙහි සිහි කරන ලද්දේ ය;
32 එබැවින් ජොප්පාවට මිනිසුන් යවා, පේදුරු නම්
ලත් සීමොන් මෙතැනට කැඳවාගන්න; ඔහු මුහුද ළඟ
සම් පදම්කරු සීමොන්ගේ ගයෙි නවාතැන් ගෙන සිටී
ය'යි කී ය. 33 එහෙයින් එකණෙහි ම මම ඔබ
කැඳවා යැවීමි; ඔබේ පැමිණීම ඉතා හොඳ ය. දැන්
සමිඳාණන් වහන්සේ ඔබට අණ කළ සියල්ල අසන
පිණිස අපි සියල්ලෝ මෙහි දෙවියන් වහන්සේ
ඉදිරියෙහි සිටිමු"යි කී ය.

### පේදුරු තුමාගේ කතාව

34 ද්වි.නී. 10:17 එවිට පේදුරු මෙසේ කී ය:
"දෙවියන් වහන්සේ මිනිසුන්ගේ තරාතිරම්
නොබලන බව දැන් මට සැබැවින් ම පැහැදිලි ය.
35 සියලු ජාතීන් අතර උන් වහන්සේ කෙරෙහි බිය
ඇති, හරි දේ කරන තැනැත්තා උන් වහන්සේට
ප්‍රියමනාප ය. 36 උන් වහන්සේ ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේ කරණකොටගෙන සාමයේ සුබ අස්න
ප්‍රකාශ කරමින් ඉශ්‍රායලේ පුත්‍රයනට දහම්
පණිවුඩය දුන් සේක. ඒ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ
සියල්ලන්ගේ සමිඳාණෝ ය. 37 ජොහන් ප්‍රකාශ
කළ බව්තීස්ම-ස්නාපනයට පසු ගලීලය පටන් ජුදය
මුළුල්ලෙහි සිදු වූ දේ ඔබ දන්නහු ය; 38 දෙවියන්
වහන්සේ ශුද්ධාත්මයගේ ද බලයගේ ද නාසරතේහි
ජේසුස් වහන්සේ ආලේප කළ සැටිත්, දෙවියන්
වහන්සේ උන් වහන්සේ සමඟ සිටි බැවින්, උන්
වහන්සේ යහපත් ක්‍රියා කරමින් ද යක්ෂයා විසින්
පීඩා කරන ලද සියල්ලන් සුව කරමින් ද හැසුරුණු
සැටිත් ඔබ දන්නහු ය. 39 උන් වහන්සේ
ජුදවේවරුන්ගේ රටෙහි ද ජෙරුසලමෙහි ද කළ
සියල්ලට අපි සාක්ෂිකරුවෝ වම්හ. ඔව්හු උන්
වහන්සේ ගසක එල්ලා මැරූ හ. 40 එහෙත් දෙවියන්
වහන්සේ තුන් වන දා උන් වහන්සේ උත්ථාන
කොට දර්ශනය වන්නට සැලැස්සූ සේක. 41 උන්
වහන්සේ සියල්ලනට ම පෙනුණේ නැත. පෙනුණේ,
දෙවියන් වහන්සේ විසින් කලින් තෝරාගන්නා ලද
සාක්ෂිකරුවන් වන, උන් වහන්සේ මළවුන්ගෙන්
උත්ථාන වූ පසු උන් වහන්සේ සමඟ එකට කෑවා වූ,
බීවා වූ, අපට ම ය. 42 ජීවත් වන්නවුන්ගේ ද
මළවුන්ගේ ද විනිශ්චයකාරයාණන් වන පිණිස
දෙවියන් වහන්සේ විසින් නියම කරන ලද
තැනැත්තාණන්, උන් වහන්සේ බව සෙනඟට
ප්‍රකාශ කරන්නටත්, සාක්ෂි දෙන්නටත්, උන්
වහන්සේ අපට අණ කළ සේක. 43 උන් වහන්සේ
අදහන සියල්ලනට උන් වහන්සේගේ නාමයේ

අනුහසින් පව් කමාව ලැබෙනෙ බවට සියලු
දිවැසිවරයෝ සාක්ෂි දතේ"යි කී ය.

### විජාතිකයන් ශුද්ධාත්මය ලැබීම

44 පේදුරු මේ වචන කතා කරද්දී ම එය ඇසූ
සියල්ලන් කරෙහෙි ශුද්ධාත්මයාණන් වහන්සේ පහළ
වූ සේක. 45 පේදුරු සමඟ පැමිණි, චර්මඡේදනය
ලත් සැදැහැවත්හු විජාතීන් කරෙහෙි ශුද්ධාත්ම
දීමනාව පහළ වූ බැවින් මවිත වූ හ. 46 ඔවුන් අන්‍ය
භාෂාවලින් කතා කරන සැටිත්, දවේයන්
වහන්සේගේ මහිමය ප්‍රකාශ කරන සැටිත්, ඔවුනට
ඇසිණි. 47 එවිට පේදුරු උත්තර දමේන්, "අප
ලැබුවාක් මනේ ශුද්ධාත්මයාණන් වහන්සේ ලැබූ
ඔවුන් වතුරනේ බව්තීස්ම-ස්නාපනය කිරීම වැළැක්විය
හැක්කේ කවරකුෙට දැ"යි කී ය. 48 ඔහු ජේසුස්
ක්‍රිස්තුන් වහන්සේගේ නාමයනේ ඔවුන් බව්තීස්ම-
ස්නාපනය කරන්නට අණ කළෙේ ය. එවිට ඔව්හු,
කීප දවසක් තමන් සමඟ නැවතී සිටින ලසෙ
ඔහුගනේ ඉල්ලූ හ.

### ජරේුසලමමේ සභාවට පේදුරු තුමාගේ වාර්තාව

11 විජාතීන් විසින් ද දේව වචනය පිළිගනු ලැබූ
බව ජුදයහෙි සිටි ප්‍රරේිතයනටත්
සහෝදරයනටත් ආරංචි විය. 2 පේදුරු ජරේුසලමට
ආ කල චර්මඡේදිතයෝ ඔහුට දොස් පවරමින්,
3 "ඔබ අචර්මඡේදිත මිනිසුන් වතෙට ගොස් ඔවුන්
සමඟ කෑම කෑවේ මන් දැ"යි ඇසූ හ. 4 එවිට
පේදුරු ඒ කාරණය මුල පටන් පිළිවළෙින් පහදා
දනේනට පටන්ගනෙ මසෙේ කී ය:
5 "මම ජොප්පා නුවර යාච්ඤා කරමින් සිටි විට
අහසනේ බස්වන ලද සතර කොණින් බැඳුණු මහත්
රුවලක් වැනි දයෙක් පහත් වනෙවා දර්ශනයකින්
දිටිමි. එය මා ළඟට ම පැමිණියේ ය. 6 මා එය
සෝදිසියනේ බැලූ විට, පොළොවේ සිවුපාවුන් ද වන
මෘගයන් ද උරග ජාතීන් ද ආකාශ පක්ෂීන් ද දිටිමි.
7 එවිට, 'පේදුරු නැඟිට, මරා, කන්නැ'යි මට කියන
ශබ්දයකුත් ඇසීමි. 8 මම ද, 'ස්වාමීනි, එය නම් කළ
නොහැක; අකැප, අපවිත්‍ර දයෙක් කිසි කලකෙත් මා
කටට ගනෙ නැතැ'යි කීවමේ. 9 එහතේ දෙ වන
වරටත් අහසනේ හඬක් මට කතා කරමින්, 'දවේයන්
වහන්සේ පවිත්‍ර කළ දේ, පිළිකුල් යයි
නොකියන්නැ'යි කී ය. 10 තුන් වරක් ම මයෙ සිදු
විය. ඉන්පසු නැවත සියල්ල අහසට ඇද ගන්නා
ලද්දේ ය.
11 "එවේලහෙි ම කායිසාරියනේ මා වතෙ එවන
ලද මිනිස්සු තුන් දනෙකේ මා විසූ නිවසෙ ඉදිරියහෙි
සිටියහ. 12 ආත්මයාණන් වහන්සේ ද, සැකයක් නැති
ව ඔවුන් සමඟ යන ලසෙ මට අණ කළ සේක. මේ
සහෝදරයන් සදනොත් මා සමඟ ගියහ. අපි
කොර්නේලියස්ගේ ගදෙරට ඇතුළු වීමු. 13 එවිට
ඔහු, තමාගේ ගයෙි දේව දූතයා සිටිනු දුටු හැටිත්,
'ජොප්පාවට මිනිසුන් යවා පේදුරු නම් ලත් සීමොන්
කැඳවන්න; 14 ඔහු වනාහි ඔබ සහ ඔබේ ගදෙර
සියල්ලන්ගේ ද, ගැළවීම සලසා දනෙ දහම ඔබට
දසෙන්නේ ය'යි තමාට කී හැටිත් අපට දැන්වී ය.
15 මා කතා කරන්නට පටන්ගත් කල,
ශුද්ධාත්මයාණන් වහන්සේ මුල දී අප කරෙහෙි
පහළ වූ සේ ම ඔවුන් කරෙහෙිත් පහළ වූ සේක.
16 ක්‍රියා 1:5 "එකල, 'ජොහන් බව්තීස්ම-ස්නාපනය
කළෙේ වතුරනේ ය. ඔබ බව්තීස්ම-ස්නාපනය
ලබන්නේ ශුද්ධාත්මයනේ ය'යි සමිඳාණන් වහන්සේ
වදාළ වචනය මට මතක් විය. 17 එබැවින් ස්වාමීන්
වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අදහාගත් කල්හි
අපට දනුෙ ලැබුවාක් මනේ දවේයන් වහන්සේ
ඔවුන්ටත් එම දීමනාව ම දුන් සේක් නම්, දවේයන්
වහන්සේට බාධා කිරීමට මම කවරකේ දැ"යි කී ය.
18 ඔව්හු ඒ අසා නිහඬ වූ හ. "එසේ නම්
විජාතීන්ටත් දවේයන් වහන්සේ ජීවනය සලසන
පසුතැවී සිත් හරවා ගැනීමක් දුන් සේකැ"යි කියමින්
දවේයන් වහන්සේට ප්‍රශංසා කළහ.

### අන්තියෝකියේ සභාව

19 ක්‍රියා 8:1-4 ස්තේපන් නිසා හටගත් පීඩාව
කරණකොටගනෙ විසුරුවනු ලැබූ අය, ජුදවේවරුන්ට
මිස අන් කිසිවකුෙට දහම ප්‍රකාශ නොකොට,
පිනීසිය ද සයිප්‍රසය ද අන්තියෝකිය ද දක්වා ගමන්
කළහ. 20 එහතේ ඔවුන් අතරනේ සයිප්‍රසයේ ද
සිරේනියේ ද වැසියන් වූ සමහරකේ අන්තියෝකියට
පැමිණ, ග්‍රීකයනටත් කතා කරමින්, ජේසුස් ස්වාමීන්
වහන්සේ පිළිබඳ සුබ අස්න ප්‍රකාශ කළහ.
21 සමිඳාණන් වහන්සේගේ බලය ඔවුන් මත පහළ
විය. එකල විශාල සංඛ්‍යාවක් අදහාගනෙ සමිඳාණන්
වහන්සේ වතෙට හැරුණාහ.
22 ඔවුන් පිළිබඳ පුවත ජරේුසලමමේ සභාවට සැළ
විය. එවිට ඔව්හු බාර්ණබස් අන්තියෝකියට යැවූ හ.
23 ඔහු පැමිණ දේව වරප්‍රසාදය දැක, සන්තෝෂ වී,
සමිඳාණන් වහන්සේට පක්ෂපාත ව, ස්ථිර ව,
පවතින සේ සියල්ලනට අනුශාසනා කළෙේ ය.
24 බාර්ණබස්, වනාහි යහපත් වූ ද
ශුද්ධාත්මයාණන්ගනේ හා ඇදහිල්ලනේ පූර්ණ වූ ද
මිනිසකෙි. මසෙේ මහත් සමූහයක් සමිඳාණන්
වහන්සේ සරණ ගියහ.
25 බාර්ණබස් සාවුල් සොයමින් තාර්සසයට ගොස්,
26 ඔහු හමු වී, අන්තියෝකියට කැඳවාගනෙ ආවේ
ය. ඔව්හු අවුරුද්දක් මුළුල්ලහෙි ම සභාව හා එක්රැස්
ව, මහත් සමූහයකට ඉගැන්වූ හ. 'ක්‍රිස්තියානි' යන
නාමය ශ්‍රාවකයනට පළමුකොට දනුෙ ලැබූයේ
අන්තියෝකියේ දී ය.
27 ඒ දවස්වල දී ජරේුසලමනේ දිවැසිවරු
අන්තියෝකියට පැමිණියාහ. 28 ක්‍රියා
21:10ඔවුන්ගනේ අගබස් නම් කනෙකේ නැඟිට,
'ලොව පුරා මහත් සාගතයක් ඇති වන්නේ ය'යි
ආත්මයාණන් කරණකොටගනෙ ප්‍රකාශයක් කළෙේ
ය. ඒ සාගතය ක්ලෞදියස් රජු දවස සිදු විය.
29 එවිට ශ්‍රාවකයෝ එකිනකො තම තමාගේ
වත්කමේ හැටියට ජුදයහෙි සිටි සහෝදරයනට

ආධාර යවන්නට තීරණය කරගත්හ. 30 ඔව්හු ආධාර
එකතු කර, බාර්ණබස් සහ සාවුල් අත සභා
මූලිකයන්ට යැවූ හ.

### ජාකාොබ්ගේ මරණය හා පේදුරු හිරගත වීම

12 ඒ කාලයේ දී හෙරොද් රජ, සභාවේ
සමහරුනට පීඩා කරන්නට පටන්ගත්තේ ය.
2 ඔහු ජාොහන්ගේ සහෝදර වූ ජාකාොබ් කඩුවනේ
මැරී ය. 3 ඊට ජුදවේවරුන් ප්රසන්න වූ බව දැක, ඔහු
පේදුරු ද අල්ලාගැනීමට ප්රයත්න දැරී ය. ඒ වනාහි
නුමුහුන් රොටී වළඳන දවස් ය. 4 නික්ම 12:1-27ඔහු
පේදුරු අල්ලා හිරගයේ දමා, පාස්කු මංගල්යයනේ
පසු සනෙඟ ඉදිරියට ගනෙනේනට සිතා, භේවායින්
සතර දනො බැගින් ඇති කණ්ඩායම් සතරකට ඔහු
රැකවල් කරන්නට භාර දුන්නේ ය. 5 එබැවින් පේදුරු
හිර අඩස්සියේ සිටිය දී සභාව ඔහු උදසො දවේයන්
වහන්සේට උදක් ම යාච්ඤා කළා ය.

### පේදුරු හිරගයෙන් ගැළවී යාම

6 පේදුරු නඩු ශාලාවට පමුණුවන්නට හෙරොද්
අදහස් කරගනෙ සිටි දිනට පරෙ දින රාත්රියේ දී
පේදුරු දම්වැල් දකෙකින් බඳින ලදුව භේවායන්
දදෙනෙකු මැද නිඳා සිටියේ ය. මුර භටයෝ දාොර
ඉදිරියේ හිරගයෙ රැකවල් කළහ. 7 එකණෙහි ම
සමිඳාණන් වහන්සේගේ දූතයකේ එහි පහළ විය.
ආලෝකයක් හිර ගයෙි බැබළිණි. ඔහු පේදුරුගේ
පිටට තට්ටු කර අවදි කරමින්, "වහා ම
නැඟිටින්නැ"යි කී ය. ඔහුගේ අත්වලින් දම්වැල්
ගැලවී වැටුණේ ය. 8 දේව දූතයා ඔහුට කතා
කාොට, "ඉඟපටිය බැඳ, පාවහන් දමා ගන්නැ"යි කී
ය. ඔහු එසේ කළෙේ ය. "ඔබේ සළුව ඇඟලාගනෙ
මා පස්සේ එන්නැ"යි දූතයා ඔහුට කී ය. 9 දූතයා
කළ දේ ඇත්තක් බව නාොදැන, තමා දර්ශනයක්
දකින්නේ යයි සිතමින්, පේදුරු පිටත් ව දූතයා
පසුපසින් ගියේ ය. 10 ඔව්හු පළමු වන, දෙ වන
මුරකාවල් පසු කාොට නුවරට පිවිසීමට ඇති යකඩ
දාොරටුවට ළඟා වූ හ. එය ඔවුන් සඳහා ඉබේ ම
ඇරුණේ ය. ඔවුන් පිටතට ගාොස් එක වීදියක් පසු
කළ කණෙහි ම, දේව දූතයා ඔහු කරෙනේ වනේ ව
ගියේ ය. 11 එවිට පේදුරු පියවි සිහිය ලැබ, කතා
කාොට, "සමිඳාණන් වහන්සේ තමන් දූතයා එවා,
හෙරොද්ගේ බලයනේ ද ජුදවේ ජනතාවගේ සියලු
බලාපාොරාොත්තුවලින් ද මා මිදූ බව සැබැවින් ම
දනිමි"යි කී ය.
12 මයෙ තේරුම්ගත් ඔහු මාක් නම් ලත්
ජාොහන්ගේ මව වූ මරියාගේ ගදෙරට පැමිණියේ ය.
එහි බාොහෝ දනෙකේ රැස් ව යාච්ඤා කරමින්
සිටියහ. 13 පේදුරු පිටත සිට දාොරට තට්ටු කළ විට,
රාොදා නම් යුවතියක් ඒ කවුදැ යි බලන්නට ආවා ය.
14 ඈ පේදුරුගේ කටහඬ ඇඳින, ප්රීතිය නිසා
දාොරවත් නෑර, ඇතුළට දිව ගාොස්, පේදුරු පිටත
දාොරකඩ ළඟ සිටින බව සැළ කළා ය. 15 "ඔබට
පිස්සු ය"යි ඔව්හු කී හ. එහතේ, ඒ ඔහු ම ය යි ඈ
සහතික කාොට කී විට "ඒ ඔහුගේ රැකවල් දූතයා
ය"යි ඔව්හු කී හ. 16 එහතේ පේදුරු දාොරට තට්ටු
කරමින් සිටියේ ය. දාොර ඇරිය කල ඔව්හු පේදුරු
දැක, විස්මිත වූ හ. 17 එහතේ ඔහු ඔවුනට
නිශ්ශබ්ද වන්නට අතින් සංඥා කාොට, සමිඳාණන්
වහන්සේ තමා හිර ගයෙින් පිටතට ගනො හැටි
ඔවුනට විස්තර කාොට, "ජාකාොබ්ට ද අනකේ
සහෝදරයනට ද මපෙවත් දන්වන්නැ"යි කියා, පිටත්
ව වනෙ තැනකට ගියේ ය.
18 පහන් වූ කල, පේදුරුට කුමක් සිදුවී දැ යි
භේවායන් අතර මහත් කැළඹීමක් ඇති විය.
19 හෙරොද් ඔහු සාොයා, සම්බ නාොවූ කල, මුර
සබෙළුන්ගනේ ප්රශ්න කාොට, ඔවුන් මරන්නට අණ
කළෙේ ය. ඉන්පසු ඔහු ජුදයනේ කායිසාරියට ගාොස්,
එහි නැවතී සිටියේ ය.

### හෙරොද් රජුගේ මරණය

20 හෙරොද්, තීර් සහ සීදාොන් වැසියන් කරෙහෙි
දැඩි කෝපයනේ සිටියේ ය. එහතේ ඔව්හු එක්සිත්
ව ඔහු වතෙට පැමිණ, රජවාසල නිලමේ වූ
බ්ලාස්තුස්ගේ සිත දිනා ගනෙ, සාමදානය ඉල්ලුවෝ
ය. මක්නිසා ද යත්, ඔවුන්ගේ රටට ආහාර ලැබුණේ
ඒ රජුගේ රටින් ය.
21 නියම කරගත් දවසක හෙරොද් තමෙේ
රාජාභරණ පැළඳ සිංහාසනාරූඪ වී, ජනතාව
ඇමතුවේ ය. 22 ජනයා කෑගසමින්, "මයෙ
මිනිසකුගේ කටහඬ නාොව, දවේ කනෙකුගේ
හඬ ය"යි කී හ. 23 හෙරොද් දවේයන් වහන්සේට
දිය යුතු ගෞරවය නුදුන් බැවින්, සමිඳාණන්
වහන්සේගේ දූතයකේ එකණෙහි ම ඔහුට පහර
දුන්නේ ය. ඔහු පණුවන් විසින් කාදමන ලදුව මළේ
ය.
24 එහතේ, දවේයන් වහන්සේගේ වචනය
වර්ධනය වී පැතිරී ගියේ ය.
25 බාර්ණබස් ද සාවුල් ද තමන්ගේ මහෙයෙ
නිමවා මාක් නම් ලත් ජාොහන් කැඳවා ගනෙ,
ජරෙුසලමනේ පරෙළා ගියෝ ය.

### බාර්ණබස් සහ සාවුල් ප්රථම ධර්මදූත ගමන ඇරඹීම

13 අන්තියෝකියේ පිහිටි සභාවහෙි දිවැසිවරු ද
ගුරුවරු ද සිටියහ. එනම්, බාර්ණබස් සහ
නීගර් නම් සිමියාොන් ද සිරේනියේ ලුසියස් ද යුව
රජ වූ හෙරොද් සමඟ ඇතිදැඩි වූ මානායින් ද සාවුල්
ද යන මාොවුහු ය. 2 ඔවුන් සමිඳාණන් වහන්සේට
සේවය කරමින් උපවාසයේ යදෙී සිටි විට
ශුද්ධාත්මයාණන් වහන්සේ කතා කාොට, "මා විසින්
බාර්ණබස් ද සාවුල් ද කැඳවනු ලැබූ සේවය සඳහා
ඔවුන් මට වනේ කරන්නැ"යි වදාළ සේක. 3 එවිට
ඔව්හු උපවාසයේ යදෙී යාච්ඤා කාොට ඔවුන් පිට
අත් තබා, ඔවුන් පිටත් කර යැවූ හ.

### සයිප්‍රසයේ ඉන්ද්‍රජාලිකයාගේ විරෝධය

4 මෙසේ ඔව්හු ශුද්ධාත්මයාණන් විසින් යවන ලදුව
සිලූකියට බැස ගොස්, එහි දී නැව් නැඟී සයිප්‍රසයට
ගියහ. 5 සලමීසයට පැමිණි කල, ඔව්හු
ජුදෙව්වරුන්ගේ ධර්මශාලාවල දී දෙවියන්
වහන්සේගේ වචනය ප්‍රකාශ කළහ. ජොහන්
ඔවුන්ගේ සහකාරයා විය. 6 ඔවුන් මුළු දිවයින
හරහා පාපස් දක්වා ගිය විට ‘බාර් ජේසුස්’ නම්
ජුදෙව් ජාතික බොරු දිවැසිවර ඉන්ද්‍රජාලිකයෙක්
ඔවුනට හමු විය. 7 ඔහු සිටියේ බුද්ධිමත් මිනිසෙකු
වූ සර්ගියස් පාවුලස් නම් දේශාධිපතියා සමඟ ය. ඒ
අධිපති තෙමේ බාර්ණබස් සහ සාවුල් කැඳවාගෙන,
දෙවියන් වහන්සේගේ වචනය අසන්නට කැමැති
විය.
8 එහෙත් එලිමස් මැගෝස් යන ග්‍රීක නාමයකින් ද
හඳුන්වනු ලැබූ යථෝක්ත ඉන්ද්‍රජාලිකයා ඒ
ඇදහිල්ලෙන් දේශාධිපතියා වළක්වන අදහසින්,
ඔවුනට විරුද්ධ විය. 9 එහෙත් පාවුලු යන නම ඇති
සාවුල් ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ ව, ඔහු දෙස
නෙත් යොමා, 10 “වංචාකාර, කෛරාටික, හැම
යහපතට ම සතුරුකම් කරන, යක්ෂයාගේ පුත්‍රය,
නුඹ සමිඳාණන් වහන්සේගේ යහ මඟ නොමඟට
පෙරළීම නවත්වන්නේ නැද් ද? 11 මෙන්න,
සමිඳාණන් වහන්සේගේ උදහස නුඹ පිට ය. නුඹ
අන්ධ වී කලකට ඉරු එළිය නොදක්නෙහි ය”යි කී ය.
එකෙණෙහි ම ඇස් පටලයකින් ද අඳුරකින් ද
ඔහුගේ ඇස් වැසිණි. ඔහු ද තමාට කනවැල
අල්ලාගෙන යන්නට කෙනෙකු සොය සොයා ඒ මේ
අත ගියේ ය. 12 එකල දේශාධිපති තෙමේ සිදු වූ
දේ දැක, සමිඳාණන් වහන්සේගේ ඉගැන්වීම ගැන
විස්මයට පත් වී, අදහා ගත්තේ ය.

### පාවුලු සහ බාර්ණබස් පිසිදීය අන්තියෝකියට පැමිණීම

13 පාවුලු සහ පිරිස පාපස්හි සිට නැව් නැඟී
ගොස්, පම්පිලියේ පර්ගායට පැමිණියෝ ය. එවිට
ජොහන් ඔවුන්ගෙන් වෙන් ව ජෙරුසලමට පෙරළා
ගියේ ය. 14 ඔව්හු පර්ගායෙන් පිටත් ව ගමන්
කොට, පිසිදියේ අන්තියෝකියට අවුත්, සබත්
දවසේ දී ධර්මශාලාවට ඇතුළු වී අසුන් ගත්තෝ ය.
15 ව්‍යවස්ථාවලියෙන් ද දිවැසාවලියෙන් ද ධර්ම පාඨ
කියවූ පසු ධර්මශාලා නායකයෝ, “සහෝදරයෙනි,
මේ සෙනඟට ඔබගෙන් යම් කිසි ධර්මානුශාසනාවක්
ඇත්නම් පවසන්නැ”යි ඔවුනට දැන්වූ හ. 16 එවිට
පාවුලු නැඟිට අතින් සංඥා කොට, “ඉශ්‍රායලේ
ජනයෙනි, දේවභය ඇත්තෙනි, සවන් දෙන්න.
17 නික්ම 1:7; 12:51මේ ඉශ්‍රායලේ ජනතාවගේ
දෙවියන් වහන්සේ අපේ පියවරුන් තෝරාගෙන,
මිසර දේශයේ විදේශී ව සිටිය දී ඔවුන් උසස්
කොට, බලසම්පන්න බාහු බලයෙන් ඔවුන් එයින්
පිටතට ගෙනා සේක. 18 ගණන් 14:34; ද්වි.නී.
1:31උන් වහන්සේ හතළිස් අවුරුද්දක් පමණ කාලයක්
පාළුකරයෙහි ඔවුන්ගේ හැසිරීම ගැන ඉවසිල්ලෙන්
සිටි සේක. 19 ද්වි.නී. 7:1; ජෝෂු 14:1උන් වහන්සේ
කානාන් දේශයේ ජාතීන් හතක් විනාශ කොට,
අවුරුදු හාරසිය පණහක පමණ කාලයක් ඒ
ජාතීන්ගේ දේශය ඔවුන්ට උරුම කොට දුන් සේක.
20 විනි 2:16; 1 සාමු 3:20එයින් පසු දිවැසිවර
සාමුවෙල් දක්වා උන් වහන්සේ ඔවුන්ට වීරවරයන්
දුන් සේක.
21 1 සාමු 8:5; 10:21 “ඉන්පසු ඔව්හු රජෙකු ඉල්ලා
සිටියහ. දෙවියන් වහන්සේ බෙන්ජමින්ගේ
ගෝත්‍රයේ මනුෂ්‍යයෙකු වූ කිෂ්ගේ පුත්‍ර වූ සාවුල්,
හතළිස් අවුරුද්දකට ඔවුන්ට දුන් සේක. 22 1 සාමු
13:14; 16:12; ගීතා 89:20උන් වහන්සේ ඔහු අස් කර,
දාවිත් ඔවුන්ගේ රජු හැටියට පත් කළ සේක. උන්
වහන්සේ ඔහු ගැන සාක්ෂි දෙමින්, ‘ජෙසේගේ
පුත්‍ර වූ, මට ප්‍රියමනාප මිනිසෙකු වූ, මාගේ මුළු
කැමැත්ත ඉටු කරන්නෙකු වූ දාවිත් මම
සොයාගතිමි’යි වදාළ සේක. 23 දෙවියන් වහන්සේ
පොරොන්දු දුන් ලෙසෙ, ඔහුගේ පරපුරෙන් ඉශ්‍රායලේ
සෙනඟට ජේසුස් නම් ගැළවුම්කාරයෙකු දෙවා වදාළ
සේක. 24 මාක් 1:4; ලූක් 3:3උන් වහන්සේගේ
පැමිණීමට පෙර ජොහන් ඉශ්‍රායලේහි මුළු සෙනඟට
පසුතැවී සිත් හරවා ගැනීමේ බව්තීස්ම-ස්නාපනය
දේශනා කළේ ය. 25 මතෙ 3:11; මාක් 1:7; ලූක්
3:16; ජොහ 1:20,27තවද ජොහන් සිය මෙහෙයෙ නිම
කරන විට, ‘මම කවරෙක් කියා ඔබ සිතන්නෙහි ද?
මම ඔබ සිතන තැනැත්තා නොවෙමි; මට පසුව
කෙනෙක් එන සේක, උන් වහන්සේගේ පාවහන්
මුදන්නට වත් මම නොවටිමි’යි කී ය.
26 “සහෝදරයෙනි, ආබ්‍රහම් වංශයේ පුත්‍රයෙනි,
දේවභය ඇති සියල්ලෙනි, මේ ගැළවීමේ පණිවුඩය
ඔබ සඳහා ය. 27 කවර හෙයින් ද? ජනතාවත්
ඔවුන්ගේ පාලකයිනුත් උන් වහන්සේ ගැන තේරුම්
නොගත්තත්, උන් වහන්සේ වරදට පත් කිරීමෙන්
සත්තකින් ම කළේ, සෑම සබත් දිනක දී ම අප
විසින් කියවනු ලබන දිවැස් වැකි සම්පූර්ණ කිරීම ය.
28 මතෙ 27:22-23; මාක් 15:13-14; ලූක් 23:21-23;
ජොහ 19:15උන් වහන්සේ අත මරණයට සුදුසු
කිසිවක් සොයා ගත නොහැකි වූ නමුත් උන්
වහන්සේ මරණයට පත් කරන ලෙස ඔව්හු
පිලාත්ගෙන් ඉල්ලූ හ. 29 මතෙ 27:57-61; මාක්
15:42-47; ලූක් 23:50-56; ජොහ 19:38-42මෙසේ උන්
වහන්සේ ගැන ලියා තිබුණු සියල්ල සම්පූර්ණ කළ
විට, ඔව්හු උන් වහන්සේ කුරුසියෙන් බා සොහොන්
ගෙයක තැන්පත් කළහ. 30 එහෙත් දෙවියන්
වහන්සේ උන් වහන්සේ උත්ථාන කළ සේක.
31 ක්‍රියා 1:3උන් වහන්සේ තමන් සමඟ ගලීලයේ
සිට ජෙරුසලමට පැමිණි අයට බොහෝ දවසක්
දර්ශනය වූ සේක. ඔව්හු දැන් උන් වහන්සේ ගැන
ජනතාව ඉදිරියෙහි සාක්ෂිකාරයෝ ව සිටිති.
32+ACT ගීතා 2:7එබැවින් ‘දෙවියන් වහන්සේ
පියවරුනට දුන් පොරොන්දුව ජේසුස් වහන්සේ
උත්ථාන කිරීමෙන් අපේ දරුවනට ඉෂ්ට කළ සේක’
යන සුබ අස්න ඔබ වෙත ගෙනෙමු. ඒ බව,

q2[32+ACT] 'ඔබ මාගේ පුත්‍රයාණෝ ය, අද ඔබ
ජනිත කළෙමේ'යි
32+ACT දෙ වන ගීතයෙහි ලියා තිබේ. 34 යසො
55:3දිරාපත් නොවන ලෙස දෙවියන් වහන්සේ විසින්
උන් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන කර වදාළ බව
පෙන්වීමට,
q2[34] 'දාවිත්ට පොරොන්දු වූ ශුද්ධ, සහතික
ආශීර්වාද ඔබට දෙන්නෙමේ'යි කියා තිබේ.
35 ගීතා 16:10 ඇරත් තවත් ගීතයක:
q2[35] 'ඔබගේ ශුද්ධ තැනැත්තා දිරාපත් වීමට ඉඩ
නොදෙන්නෙමේ'යි
35 වදාරා ඇත. 36 දාවිත් දෙවියන් වහන්සේගේ
අභිප්‍රාය ලෙස සිය පරම්පරාවේ දී මෙහෙ කළ පසු
මරණයට පත් ව තමාගේ පියවරුන් අතර තැන්පත්
කරනු ලැබ, දිරාපත් විය. 37 එහෙත් දෙවියන්
වහන්සේ විසින් උත්ථාන කරන ලද තැනැන්
වහන්සේ දිරාපත් නොවූ සේක. 38 එහයින්,
සහෝදරයෙනි, උන් වහන්සේ කරණකොටගෙන පව්
කමාව අප ඔබට ප්‍රකාශ කරන බව දැන ගන්න.
39 මෝසෙස්ගේ ව්‍යවස්ථාවෙන් ඔබට ලබා ගත
නොහැකි වූ පාපයෙන් නිදහස දැන් උන් වහන්සේ
අදහන සැමට ම සැම අතින් ම අත් වන්නේ ය.
40 එබැවින්, දිවැසිවරුන් කියා ඇති කාරණා ඔබ ගැන
සත්‍ය නොවන පිණිස පරෙස්සම් වන්න. එනම්:
41 හබ 1:5 'හෙළා දකින්නෙනි, බලන්න, පුදුම
වන්න, පුදුම වී වැනසෙන්න;
q2[41] මන්ද, ඔබගේ දවස්වල දී එක් ක්‍රියාවක්
කරමි.
q2[41] ඒ ක්‍රියාව ගැන යමෙක් ඔබට පැවසුවත් ඔබ
එය කිසිසේත් විශ්වාස නොකරන්නෙහු ය,' " යනු යි.
42 ඔවුන් නික්ම යද්දී, ඊළඟ සබත් දවසෙහිත් එම
වචන ප්‍රකාශ කරන ලෙස ඔව්හු ඉල්ලූ හ.
43 සමූහයා විසිර ගිය පසු ජුදෙව්වරුන්ගෙන් ද, ජුදෙව්
ආගමට හැරුණු භක්තිවන්තයන්ගෙන් ද, බොහෝ
දෙනෙක් පාවුළු සහ බාර්ණබස් අනුව ගියහ. ඔව්හු
ඔවුන්ට දෙවියන් වහන්සේගේ වරප්‍රසාදයෙහි
පවතින්නට අවවාද කළහ.
44 ඊළඟ සබත් දවසේ දී දෙවියන් වහන්සේගේ
වචනය අසන පිණිස නුවර වැසි සියල්ලෝ ම වාගේ
රැස් වූ හ. 45 එහෙත් ජුදෙව්වරු එම ජනකාය දැක,
ඊර්ෂ්‍යාවෙන් පිරී, පාවුළු කී කාරණාවලට විරුද්ධ ව
කතා කරමින් අපහාස කළහ. 46 එවිට පාවුළු ද
බාර්ණබස් ද එඩිතර ව කතා කරමින් මෙසේ කී හ:
"දෙවියන් වහන්සේගේ වචනය පළමුකොට ඔබට
ප්‍රකාශ කළ යුතු ව තිබිණි. එහෙත් ඔබ එය
ප්‍රතික්ෂේප කොට, සදාතන ජීවනයට ඔබ
නුසුදුස්සන් බව ඔබ ම නිශ්චය කර ගන්නා හෙයින්,
මෙන්න, අපි විජාතීන් වෙතට හැරමු. 47 යසො 42:6;
49:6මන්ද, සමිඳාණන් වහන්සේ අපට මෙසේ අණ
කළ සේක:
q2[47] 'ලොව පුරා ගැළවීම ගෙන දෙන පිණිස
විජාතීන් අතර පහන් එළියක් ලෙස මම ඔබ
තැබුවෙමි.' "
48 විජාතීහු ඒ අසා සන්තෝෂ ව, දෙවියන්
වහන්සේගේ වචනයට ගෞරව කළහ. සදාතන
ජීවනය ලැබීමට තෝරාගන්නා ලද සියල්ලෝ ම
අදහාගත්හ. 49 සමිඳාණන් වහන්සේගේ දහම ඒ
පළාත මුළුල්ලෙහි ම පැතිරී ගියේ ය. 50 එහෙත්
ජුදෙව්වරු සැදැහැවත් කුල ස්ත්‍රීන් ද නුවර ප්‍රභූන් ද
පොළඹවා, පාවුළු සහ බාර්ණබස්ට විරුද්ධ ව
පීඩාකාරී තත්ත්වයක් ඇති කර, තමන්ගේ
පෙදෙස්වලින් ඔවුන් පිටතට නෙරපාදැමූ හ. 51 මතෙ
10:14; මාක් 6:11; ලූක් 9:5; 10:11එවිට ඔව්හු
තමන්ගේ පාදවල දූවිලි ඔවුන්ට විරුද්ධ ව ගසාදමා,
ඉකෝනියට ගියහ. 52 ශ්‍රාවකයෝ ප්‍රීතියෙන් ද
ශුද්ධාත්මයාණන්ගෙන් ද පූර්ණ වූ හ.

## ඉකෝනියෙහි ධර්මදූත සේවය

14 තවද ඔව්හු ඉකෝනියෙහි දී ජුදෙව්වරුන්ගේ
ධර්මශාලාවලට ඇතුළු වී දේශනා කළහ. ඒ
ඇසූ ජුදෙව්වන්ගෙන් ද ග්‍රීක්වරුන්ගෙන් ද මහත්
සමූහයක් අදහාගත්හ. 2 එහෙත් අදහා නොගත්
ජුදෙව්වරු විජාතීන් කළඹා, ඔවුන්ගේ සිත්
සහෝදරයනට විරුද්ධ ව පෙළෙඹුවෙහු ය. 3 එහයින්
ඔව්හු සමිඳාණන් වහන්සේගේ වරමින් එඩිතර ව
කතා කරමින් බොහෝ කලක් එහි නැවතී සිටියහ.
උන් වහන්සේ ඔවුන් ලවා අරුමපුදුම දේ ද ලකුණු ද
කරවමින් සිය වරප්‍රසාදය පිළිබඳ ධර්මයට සාක්ෂි
දැරූ සේක.
4 ඒ නගරයේ ජනයා දෙකොට බෙදී සමහරෙක්
ජුදෙව්වරුන්ගේ පක්ෂය ද අන් සමහරෙක්
ප්‍රේරිතවරයන්ගේ පක්ෂය ද ගත්හ. 5 විජාතීන් ද
ජුදෙව්වරුන් ද තමන්ගේ ප්‍රධානීන් සමඟ ඔවුන්ට
නිග්‍රහ කරන්නටත් ගල් ගසන්නටත් අදහස් කළ
කල්හි, 6 ඔව්හු ඒ දැන, ලුකොනියාවේ නගර වන
ලුස්ත්‍රාවට ද දර්බයට ද අවට පෙදෙස්වලට ද පලා
ගොස්, 7 එහි දී සුබ අස්න දේශනා කළහ.

## ලුස්ත්‍රාවේ ධර්මදූත සේවය

8 මවුකුස පටන් කොර වූ, පාද දුර්වල වූ, කිසි
කලෙකත් ඇවිදගත නොහැකි වූ එක්තරා මිනිසෙක්
ලුස්ත්‍රාවේ එක් තැනක වාඩිවී සිටියේ ය. 9 ඔහු
පාවුළු කතා කරනු ඇසී ය. පාවුළු ඔහු දෙස බලා,
ඔහු සුවය ලබන්නට තරම් සැදැහැ ඇත්තෙකු බව
දැක, 10 "නැඟිට පය බිම ගසා කෙළින් සිටින්නැ"යි
මහත් හඬින් කී ය. එවිට ඔහු පැන නැඟිට ඇවිද්දේ
ය. 11 එකල සමූහයා පාවුළු කළ දේ දැක ශබ්ද
නඟා, "දෙවිවරු මිනිස් වෙසින් අප වෙතට බැස
සිටිති"යි ලුකෝනීය බසින් කී හ. 12 ඔව්හු
බාර්ණබස්ට සියුස් කියා ද, පාවුළු ප්‍රධාන කථිකයා
බැවින් ඔහුට හර්මේස් කියා ද නම් තැබූ හ.
13 නුවර දොරටුවෙහි පිහිටි සියුස්ගේ දේවාලයේ
පාලක පූජක තැන ගොනුන් ද මල්මාලා ද දොරටුව
ළඟට ගෙනැවිත්, සමූහයන් සමඟ යාග කරන්නට
සූදානම් විය. 14 එහෙත් ප්‍රේරිතවරුන් වූ බාර්ණබස්
ද පාවුළු ද ඒ ගැන අසා, තමන්ගේ වස්ත්‍ර ඉරාගෙන

සමූහයා අතරට දිව ගාොස්, මාොරගසා, 15 නික්ම
20:11; ගීතා 146:6“මනුෂ්‍යයිනි, ඔබ මාේ දාේවල්
කරන්නාේ මන් ද? අපිත් ඔබ හා සමාන මිනිස්සු ය,
ඔබ මාේ නිෂ්ඵල දාේවලින් දුරු ව, අහසත්,
පාොළාොවත්, මුහුදත්, එහි ඇති සියල්ලත් මැවූ,
ජීවමාන දවියන් වහන්සාේ වතෙට හැරනෙ පිණිස
සුබ අස්න ඔබ වතෙ ගනෙමුේ. 16 උන් වහන්සාේ
යටගිය පරම්පරාවල දී සියලු ජාතීන්ට තම තමන්
සිතූ පැතූ ලසෙ හැසිරනේනට ඉඩ හැරිය සාේක.
17 එහතේ උන් වහන්සාේ තමන් වහන්සාේ ගැන
සාක්ෂි නාො දී සිටි කලක් නාො වී ය. මන්ද, උන්
වහන්සාේ අහසින් වර්ෂාව ද සාරවත් කාල සීමාවන්
ද ඔබට දී ආහාරයනේ හා ප්‍රීතියනේ ඔබගාේ සිත්
පුරවමින්, යහපත්කම් කළ සාේකැ”යි කී හ. 18 ඔවුන්
එසාේ කී නමුත්, තමනට පූජා ඔප්පු කිරීමනේ ජනයා
වළක්වා ගත හැකි වූයාේ ඉතා අමාරුවනේ.
19 එහතේ අන්තියාොකියනේ ද ඉකාොනියනේ ද
ජුදවේවරු අවුත් සමූහයන් පාොළඹවා ගනෙ, පාවුලුට
ගල් ගසා, ඔහු මළහ යි සිතා නුවරින් පිටතට ඇද්දාො
ය. 20 එහතේ ශ්‍රාවකයන් ඔහු අවට රුස් ව සිටි
කල, ඔහු නැඟිට නුවරට ඇතුළු වී, පසුදා බාර්ණබස්
සමඟ දර්බයට ගියාේ ය.

### අන්තියාොකියට හැරී යාම

21 ඔව්හු ඒ නුවර සුබ අස්න දාේශනා කාොට,
බාොහාො දනෙකු ශ්‍රාවකයන් කර, ලුස්ත්‍රාවට ද
ඉකාොනියට ද අන්තියාොකියට ද හැරී අවුත්, 22 “අප
බාොහාො දුක් විඳිමින් දවියන් වහන්සාේගාේ
රාජ්‍යයට ඇතුළුවන්නට ඕනෑ ය”යි කියා ශ්‍රාවකයන්
ධරෛ්‍යවත් කර, ඇදහිල්ලාේ ස්ථිර ව පවතින්නට
ඔවුනට අවවාද කළහ. 23 ඔව්හු එක එක සභාවාේ
සැදැහැවතුන් කරෙහෙි සභා මූලිකයන් පත් කාොට,
උපවාසයාේ යදේී යාච්ඤා කර, තමන් අදහා ගත්
සමිඳාණන් වහන්සාේට ඔවුන් භාර දී, 24 පිසිදිය
මැදින් ගාොස්, පම්පිලියට පැමිණියහ.
25 ඔව්හු පර්ගායාේ දී වචනය දාේශනා කාොට,
අත්තාලියට ගාොස් 26 එතැනින් නැව් නැඟී
අන්තියාොකියට පැමිණියහ. ඔවුන් ඉෂ්ට කළ සාේවය
නිසා දවියන් වහන්සාේගාේ වරප්‍රසාදයට ඔවුන්
කල්මත්තනේ භාර දනෙ ලද්දාේ මාේ අන්තියාොකියාේ
දී ය. 27 එහි පැමිණි කල, ඔව්හු සභාව රුස් කරවා
දවියන් වහන්සාේ තමන් ලවා ඉටු කළ සියල්ල ද
විජාතීන්ට උන් වහන්සාේ විශ්වාසය කරා දාොරක්
ඇර දුන් බව ද දැන්වූ හ. 28 තවද, ඔව්හු
ශ්‍රාවකයන් සමඟ බාොහාො කලක් එහි නැවතී
සිටියහ.

### ජරෙුසලමහෙි මන්ත්‍රණ සභාව

15 ලවේී 12:3 ජුදයනේ සමහර දනෙකේ අවුත්,
“මාොසසේගනේ පැවත එන සිරිත ලසෙ ඔබ
චර්මඡාේදනය කරනු නාොලැබුවහාොත් ඔබට ගැළවීම
ලැබිය නාොහැකි ය”යි සහාෝදරයන්ට ඉගැන්වූ හ.
2 එහයෙින් ඔවුන් ද පාවුලු හා බාර්ණබස් ද අතර
වාේගවත් වාද විවාද ඇති විය. මාේ ප්‍රශ්නය ගැන
ප්‍රරේිතයන් සහ සභා මූලිකයන්ගනේ විචාරන
පිණිස පාවුලු සහ බාර්ණබස් ද අන්තියාොකියනේ
තවත් සමහරකේ ද ජරෙුසලමට යැවීමට නියම
කරනු ලැබූ හ. 3 මසොේ ඔව්හු සභාව විසින් යවන
ලදුව, පිනීසිය ද සමාරිය ද මැදින් ගාොස්,
විජාතීන්ගාේ හැරීම ප්‍රකාශ කරමින්, සියලු
සහාෝදරයනට මහත් ප්‍රීතියක් ගනෙ දුන්හ. 4 ඔවුන්
ජරෙුසලමට පැමිණි කල, සභාව ද ප්‍රරේිතයාො ද
සභා මූලිකයාො ද, ඔවුන් පිළිගත්හ. ඉන්පසු ඔව්හු
දවියන් වහන්සාේ තමන් ලවා ඉටු කරුවූ සියලු දාේ
ඔවුන්ට දැන්වූ හ. 5 එවිට පරිසිවරුන්ගාේ
කණ්ඩායමට අයත් ඇදහිලිවතුන් සමහරකේ නැඟිට,
“චර්මඡාේදනය කරන්නටත් මාොසසේගාේ ව්‍යවස්ථාව
පිළිපදින්නටත් ඔවුන්ට නියම කළ යුතු ය”යි කී හ.
6 ප්‍රරේිතවරයාො ද සභා මූලිකයාො ද මාේ
කාරණය ගැන කල්පනා කර බලන පිණිස රුස් වූ හ.
7 ක්‍රියා 10:1-43දීර්ඝ විවාදයක් ඇති වූ පසු පාේදුරු
නැඟිට ඔවුන් අමතා, “සහාෝදරයනි, විජාතීන්
මාගාේ මුඛයනේ පණිවුඩය අසා අදහන පිණිස
බාොහාො කලකට ඉහත දවියන් වහන්සාේ ඔබ
අතරනේ මා තාෝරා ගත් බව ඔබ දන්නහු ය.
8 ක්‍රියා 2:4; 10:44සියලු සිත් දන්නා වූ දවියන්
වහන්සාේ අපට මනේ ම ඔවුන්ටත් ශුද්ධාත්මයාණන්
දී, ඔවුන් ද පිළිගත් අය බවට සාක්ෂි දුන් සාේක.
9 උන් වහන්සාේ, ඔවුන් සහ අප අතර කිසි වනෙසක්
නාොකාොට, ඇදහිල්ල කරණකාොටගනෙ ඔවුන්ගාේ
සිත් පවිත්‍ර කළ සාේක. 10 එබැවින් අපගාේ
පියවරුන්ට වත් අපට වත් දැරිය නාොහැකි වියගසක්
ශ්‍රාවකයන්ගාේ කර පිට තැබීමනේ ඔබ කුමක් නිසා
දවියන් වහන්සාේ පිරික්සන්නහු ද? 11 එසාේ නාොව,
ඔවුන් මනේ ම අපත් ගැළවනේනාේ ජාේසුස් ස්වාමීන්
වහන්සාේගාේ වරප්‍රසාදයනේ බව විශ්වාස කරමු”යි
කී ය.
12 එවිට මුළු සමූහයා නිශ්ශබ්ද වී, තමන් ලවා
දවියන් වහන්සාේ විජාතීන් අතර දැක් වූ ලකුණු ද
අරුමපුදුම දාේ ද ගැන පාවුලු සහ බාර්ණබස් කී
සියල්ලට සවන් දුන්හ. 13 ඒ දදෙනො කතා කර නිම
වූ පසු ජාකාොබ් පිළිතුරු දමෙින්, 14 “සහාෝදරයනි,
මට සවන් දුන මැනව. දවියන් වහන්සාේ තමන්ගාේ
නාමය දැරීමට විජාතීන් අතුරනේ සනෙඟක්
තාෝරාගන්නා පිණිස මුල පටන් ම ක්‍රියා කළ සැටි
සීමාොන් කියා දුන්නාේ ය. 15+ACT ආමාො
9:11-12දිවැසිවරුන්ගාේ වචනයනේ ද එය අනුමත
වාේ, ඒ මසොේ ය:
q2 15+ACT ‘මින්පසු මම හැරී අවුත්, දාවිත්ගාේ වැටී
ගිය මණ්ඩපය නැවත සාදා, එහි නටබුන් තැන් ද
යළිත් ගාොඩනඟා, සවිමත් කරන්නමේ.
q2 15+ACT එවිට අවශාේෂ මනුෂ්‍යයන් ද මාගාේ
නාමය දරන සියලු ජාතීන් ද, සමිඳාණන් වහන්සාේ
සාොයන්නාො ය.
q2 15+ACT ලාෝකයාේ පටන්ගැන්මාේ සිට ක්‍රියා කරන
සමිඳාණන් වහන්සාේ මාේ සියල්ල වදාරන සාේක.’

19 “එබැවින් මාගේ නිගමනය නම්; විජාතීන් අතර
දෙවියන් වහන්සේ වෙතට හැරෙන්නන්ට තවත්
හිරිහැර නොකොට, 20 නික්ම 34:15-17; ලෙවී
17:10-16; 18:6-23රූප සම්බන්ධ දූෂණකම්වලින් ද
කාමමිථ්‍යාචාරයෙන් ද බොටුව මිරිකා මැරූ සතුන්ගේ
මස් කෑමෙන් ද ලෙයින් ද වැළකෙන ලෙස ලිපියකින්
දන්වා යැවිය යුතු ය, යනු යි. 21 මන්ද, ආදි
පරම්පරාවල සිට ම මෝසෙස්ගේ ව්‍යවස්ථාව
ප්‍රකාශ කරන්නෝ සියලු නගරවල සිටිති. ඔව්හු
සියලු සබත් දිනවල එය ධර්මශාලාවල දී කියවති”යි
කී ය.

## මන්ත්‍රණ සභාව යැවූ සන්දේශය

22 එකල තමන් අතරෙන් නියෝජිතයන්
තෝරාගෙන, ඔවුන් පාවුලු සහ බාර්ණබස් සමඟ
අන්තියෝකියට යැවීම යහපතැ යි ප්‍රේරිතයන්ට ද
සභා මූලිකයන්ට ද මුළු සභාවට ද පෙනී ගියේ ය.
තෝරාගනු ලැබුවෝ නම්, සහෝදරයන් අතර
මූලිකයන් වන බර්සබස් නම් ලත් ජූදස් සහ සීලස්
ය. 23 ඔවුන් අත මෙසේ ලියා යවන ලදී:
23 “ප්‍රේරිතවරයෝ ද සහෝදර සභා මූලිකයෝ ද
වන අපි අන්තියෝකියෙහිත් සිරියාවෙහිත්
සිලිසියාවෙහිත් වසන විජාතී වූ සහෝදරයන් වෙත
සුබ පතමින් මෙසේ ලියා එවමු: 24 අපේ අනුමැතිය
නොලත් සමහරෙක් අප අතරෙන් පිටත් ව ගොස්,
නොයෙක් දේ කියා ඔබ කළඹමින් ඔබගේ සිත්
අවුල් කළ බව අපි ඇසීමු. 25+ACT එහෙයින්
තමන්ගේ දිවි නොතකා, අපගේ ස්වාමීන් වන
ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ නාමය නිසා, ජීවිත
කැප කළ අපගේ ප්‍රේමණීය බාර්ණබස් ද පාවුලු ද
සමඟ, නියෝජිතයන් තෝරා ගෙන ඔබ වෙතට
එවීම සුදුසු යයි රැස් වූ අපගේ ඒකමතික තීරණය
විය. 27 එහෙයින් ජූදස් ද සීලස් ද ඔබ වෙත එවමු.
ඔවුන් මේ කාරණා ම ඔබට කට වචනයෙන් ද
කියනු ඇත. 28+ACT එනම්, දේව පිළිමවලට පිදූ
දෙයින් ද ලෙයින් ද බොටුව මිරිකා මැරූ සතුන්
කෑමෙන් ද කාමමිථ්‍යාචාරයෙන් ද ඔබ වැළකිය යුතු
බව මිස, වෙන කිසි බරක් ඔබ පිට නොතැබීම
යහපතැ යි ශුද්ධාත්මයාණන්ටත් අපටත් පෙනී ගියේ
ය. ඔබ මේවායින් වළකින්නහු නම් යහපති. ඔබට
සෙත් වේ වා!”
30 මෙසේ යවනු ලැබූ ඔව්හු, අන්තියෝකියට
පැමිණ, සමූහයා රැස් කරවා ලිපිය භාර දුන්හ.
31 සමූහයා එය කියවා, ඒ අනුශාසනාව ගැන ප්‍රීති
වූ හ. 32 ජූදස් සහ සීලස් යන දෙදෙන දිවැසිවරයන්
වූ බැවින්, බොහෝ වචනවලින් සහෝදරයන්ට
අනුශාසනා කර, ඔවුන් ධෛර්යවත් කළහ. 33 ඔවුන්
කලක් එහි නැවතී සිටි පසු සහෝදරයෝ ඔවුනට
දේව පිහිට පතා, ඔවුන් එවූ අය වෙත ආපසු යැවූ
හ. එහෙත් 34 එහි නැවතීම හොඳ ය යි සීලස්ට
පෙනුණේ ය. 35 පාවුලු ද බාර්ණබස් ද තවත්
බොහෝ දෙනෙකු සමඟ සමිඳාණන් වහන්සේගේ
සුබ අස්න උගන්වමින් ද දේශනා කරමින් ද
අන්තියෝකියෙහි නැවතී සිටියහ.

## බාර්ණබස් පාවුලුගෙන් වෙන් වීම

36 කීප දවසකට පසු පාවුලු බාර්ණබස්ට කතා
කොට: “අපි සමිඳාණන් වහන්සේගේ සුබ අස්න
ප්‍රකාශ කළ සියලු නුවරවල වසන සහෝදරයන්ගේ
දුක් සැප කෙසේ දැ යි බලන පිණිස නැවත යමු”යි
කී ය. 37 තමන් සමඟ මාක් නම් ලත් ජොහන් ද,
කැඳවා ගෙන යන්නට බාර්ණබස් කැමැත්ත දැක්වී ය.
38 ක්‍රියා 13:13එහෙත් තමන් සමඟ සේවයට
නොගොස්, පම්පිලියේ දී අහක් ව ගිය තැනැත්තා
යළිත් කැඳවාගෙන යාම සුදුසු නැතැ යි පාවුලු සිතී ය.
39 ඒ ගැන දැඩි විවාදයක් හටගත් බැවින්, ඔව්හු
එකිනෙකාගෙන් වෙන් ව ගියහ. බාර්ණබස් මාක්
කැඳවාගෙන, සයිප්‍රසයට නැවෙන් ගියේ ය;
40 එහෙත් පාවුලු සීලස් තෝරා ගෙන, සහෝදරයන්
විසින් සමිඳාණන් වහන්සේගේ වරප්‍රසාදයට භාර
දෙන ලදුව, පිටත් වී, 41 සභාවන් ස්ථිර කරමින්,
සිරියාව සහ සිලිසියාව මැදින් ගමන් කළේ ය.

## තිමෝතියස් පාවුලුට එක් වීම

16 තවද පාවුලු දර්බයටත් ලුස්ත්‍රාවටත්
පැමිණියේ ය. කිතු දහම පිළිගත් ජුදෙවේ
ස්ත්‍රියකගේ පුත්‍ර වූ තිමෝතියස් නම්
ශ්‍රාවකයෙක් එහි සිටියේ ය. ඔහුගේ පියා
ග්‍රීකයෙකි. 2 ඔහු ලුස්ත්‍රාවෙහි ද ඉකෝනියෙහි ද
සහෝදරයන් අතර ප්‍රශංසා ලැබූ කෙනෙකි.
3 පාවුලු, තමා සමඟ ඔහු කැඳවාගෙන යන්නට
අදහස් කර, ඒ පළාත්වල සිටි ජුදෙවෙවරුන් නිසා ඔහු
චර්මඡේදනය කළේ ය. මන්ද, ඔහුගේ පියා
ග්‍රීකයෙකු බව සියල්ලන් දැන සිටි හෙයිනි. 4 ඔව්හු
නුවරින් නුවරට ගමන් කරද්දී ජෙරුසලමේ සිටි
ප්‍රේරිතයන් විසින් ද සභා මූලිකයන් විසින් ද
පනවන ලද නියෝග පවත්වන්නට ඔවුන්ට භාර
දුන්හ. 5 මෙසේ සභාවෝ ඇදහිල්ලෙහි වර්ධනය වූ
හ. දිනෙන් දින සෙනඟගේ ගණන ද වැඩි විය.

## පාවුලු තුමා දුටු දර්ශනය

6 ආසියාවෙහි වචනය දේශනා කිරීම
ශුද්ධාත්මයාණන් විසින් තහනම් කරන ලද බැවින්,
ඔව්හු පිරිගිය සහ ගලාතිය ප්‍රදේශයන් මැදින්
ගියහ. 7 ඔව්හු මීසියේ සීමාව තෙක් අවුත්,
බිතිනියට යන්නට උත්සාහ කළහ. එහෙත් ජේසුස්
වහන්සේගේ ආත්මයාණෝ ඔවුන්ට ඉඩ නුදුන්හ.
8 එවිට ඔව්හු මීසිය පසු කොට ත්‍රෝවසට බැස
ආහ. 9 එහි දී පාවුලු රාත්‍රියෙහි දර්ශනයක් දුටුවේ
ය; එනම්: “මසිදෝනියට අවුත් අපට ආධාර
කරන්නැ”යි මසිදෝනියේ මනුෂ්‍යයෙක් නැඟිට සිට
ඔහුගෙන් අයැදී ය. 10 ඔවුන්ට සුබ අස්න දේශනා
කරන්නට දෙවියන් වහන්සේ අප කැඳවූ බව
ඔහුගේ දර්ශනයෙන් තේරුම් ගත් අපි එකෙණෙහි ම
මසිදෝනියට යන්නට සැරසුණෙමු.

### ලිදියාගේ හැරීම

11 එහයෙින් අපි ත්‍රෝවසනේ නැව් නැඟී, කළෙින්
ම සමොත්‍රාසියට ද පසුවදා නයොපොලිසියට ද
යාත්‍රා කර, 12 එයින් මසිදෝනියේ දිස්ත්‍රික්කයක
ප්‍රධාන නගරය වූ ද, රෝම ජනපදයක් වූ ද
පිලිප්පියට අවුත්, එහි කීප දවසක් නැවතී සිටියමෙු.
13 සබත් දවසේ දී, නුවර වාසලනේ පිට යාච්ඤා
ස්ථානයක් ඇතැ යි අපට සිතුණු බැවින්, අප පිටත් ව
ගං තරෙකට ගොස් එහි රැස් ව සිටි ස්ත්‍රීනට කතා
කළෙමෙු. 14 ඔවුන් අතර ලිදියා නම් ස්ත්‍රියක් අපට
සවන් දමේන් සිටියා ය. ඈ තියාතිරා නුවරින් පැමිණි,
දම්පාට සායම් බඩු විකුණු වළෙඳේදියකි; දවේයන්
වහන්සේට නමස්කාර කළ ස්ත්‍රියකි. පාවුලු කී
කරුණු සිතට ගන්නා ලසෙ දවේයන් වහන්සේ ඇගේ
සිත පැහැදූ සේක. 15 ඈ ද ඇගේ ගයෙි වැසියන් ද
බව්තීස්ම-ස්නාපනය ලැබූ පසු, ඈ කතා කොට, "මම
සැබැවින් ම සමිඳාණන් වහන්සේ අදහන කනෙකෙැ
යි ඔබ පිළිගන්නවා නම්, මාගේ ගදෙරට අවුත් එහි
නැවතුණ මැනවැ"යි අපනේ උදක් ම ඉල්ලා, අප
කැමැති කරවා ගත්තා ය.

### පිලිප්පියේ දී සිර කරනු ලැබීම

16 අප යාච්ඤා කරන තැනට යද්දී, ගුප්ත දෑ හළෙි
කරන ආත්මයක් ආවේශ වූ, පේන කීමනේ ස්වකීය
ස්වාමිවරුන්ට බොහෝ ලාභ උපදවා දුන්, එක්තරා
වහල් තරුණියක් අපට හමු වූවා ය. 17 ඈ පාවුලුත්
අපත් පසුපස එමින්, "මේ අය ගැළවීමේ මාර්ගය
අපට ප්‍රකාශ කරන, පරමෝත්තම දවේයන්
වහන්සේගේ දාසයෝ" යයි මොරගසා කීවා ය.
18 ඈ දවස් කීපයක් ම මසෙේ කළා ය. එවිට පාවුලු
අතිශයින් අප්‍රසන්න වී, ආත්මයට කතා කොට,
"ඇගනේ අහක් වී යන්නට ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේගේ නාමයනේ නුඹට අණ කරමි"යි කී ය.
ඒ මොහොතේ දී ම ඒ ආත්මය අහක් ව ගියේ ය.
19 එහතේ ඇගේ ස්වාමිවරු, මුදල් ගරා ගැනීමේ තම
බලාපොරොත්තුව නැති වූ බව දැක, පාවුලු සහ
සීලස් අල්ලා වළෙඳොම්පළට ඇද ගනෙ ගොස්,
ප්‍රධානීන් ඉදිරියහෙි සිටවේවෝ ය. 20 ඉන්පසු
නඩුකාරයන් ළඟට ද ඔවුන් ගනෙ ගොස්,
"ජුදවේවරුන් වන මේ මනුෂ්‍යයෝ අපගේ නුවර
අතිශයින් කළඹමින්, 21 රෝමවරුන් වන අපට
පිළිගන්නට වත් පිළිපදින්නට වත් බැරි නීතිවිරෝධී
චාරිත්‍ර උගන්වති යි කී හ. 22 එවිට ජනයා ඔවුන්ට
විරුද්ධ ව එක්ව නැඟී සිටියහ. නඩුකාරයෝ ද,
ඔවුන්ගේ වස්ත්‍ර ඉරා දමා, කෝටුවලින් ඔවුන්ට
තළන්නට අණ කළෝ ය. 23 ඔවුන්ට බොහෝ පහර
දුන් පසු, හිරගයෙි දමා ඔවුන් පරිස්සමනේ රැක
බලාගන්නා ලසෙ හිරගයෙි මුලාදෑනියාට අණ කළහ.
24 මසෙේ අණ ලැබූ ඔහු, ඔවුන් ඇතුළු සිරකාමරයේ
දමා, ඔවුන්ගේ පාද දඬුකඳන්වල සවි කළෙේ ය.

25 එහතේ මධ්‍යම රාත්‍රිය පමණේ දී, පාවුලු ද
සීලස් ද යාච්ඤා කරමින් දවේයන් වහන්සේට ගී
ගැයූ හ. හිරකාරයෝ ද ඔවුන්ට ඇහුම්කන් දීගනෙ
සිටියහ. 26 හදිසියනේ මහත් පොළොකම්පාවක් විය.
හිරගයෙි අත්තිවාරම් සලෙවිණි. එකණෙහි ම සියලු
දොරවල් ඇරිණි; සියල්ලන්ගේ බැඳුම් ද ලිහිණි.
27 එකල හිරගයෙි මුලාදෑනියා නින්දනේ අවදි ව,
හිරගයෙි දොරවල් ඇරී තිබනෙ බව දැක, හිරකරුවන්
පැන ගියහ යි සිතා, කඩුව ඇද, සිය පණ හානි
කරගන්නට සැරසුණේ ය. 28 එහතේ පාවුලු, කතා
කරමින් "ඔබට කිසි අනතුරක් කර නොගන්න; අපි
සියල්ලෝ ම මහෙි ය"යි මහත් හඬින් මොරගසා කී
ය.
29 එකල ඔහු පහනක් ඉල්ලා ගනෙ ඇතුළට පැන,
බියනේ වවෙුලමින්, පාවුලු සහ සීලස් ඉදිරියහෙි වැටී,
30 ඔවුන් පිටතට කැඳවා, "ගැළවීම ලබන පිණිස මා
කුමක් කළ යුතු දැ"යි ඇසී ය. 31 ඔව්හු පිළිතුරු
දමේන්, "ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ
අදහා ගන්න. එවිට ඔබ ගැළවනේනහෙි ය; ඔබ ද
ඔබේ ගයෙි වැසියෝ ද ගැළවනේනාහ"යි කී හ.
32 තවද ඔව්හු ඒ මුලාදෑනියාට ද ඔහුගේ ගදෙර
වැසි සියල්ලන්ට ද සමිඳාණන් වහන්සේගේ වචනය
පහදා දුන්හ. 33 මුලාදෑනියා රාත්‍රියේ ඒ පැයේ දී ම
ඔවුන් රැගනෙ, ඔවුන්ගේ තුවාළ සේදුවේ ය. ඔහු ද
ඔහුගේ ගයෙි වැසි සියල්ලෝ ද එවලේ ම
බව්තීස්ම-ස්නාපනය ලැබූ හ. 34 ඔහු තමාගේ ගටෙ
ඔවුන් කැඳවා ගනෙ ගොස්, කෑමනේ සංග්‍රහ කොට
තමා දවේයන් වහන්සේ අදහා ගත් බැවින් සිය ගයෙි
වැසි සියල්ලන් සමඟ අතිශයින් ප්‍රීති විය.
35 පහන් වූ කල නඩුකාරයෝ, "ඒ මනුෂ්‍යයන්
නිදහස් කර හරින්නැ"යි පොලිස් සේවකයන් අත
කියා යැවූ හ. 36 එවිට හිරගයෙි මුලාදෑනියා එපවත්
පාවුලුට දන්වා, "ඔබ මුදා හරින්නට නඩුකාරවරු කියා
එවූ හ. එබැවින් පිටතට අවුත් සාමදානයනේ
යන්නැ"යි කී ය. 37 එහතේ පාවුලු ඔවුන්ට කතා
කොට, "ඔව්හු, රෝම පුරවැසියන් වන අප විනිශ්චය
නොකොට ප්‍රසිද්ධියේ අපට තළා අප හිරගයෙි දැමූ
හ; දැන් ඔවුන් හදන්නේ රහසින් අප පිටත් කර
හරින්නට ද? එසේ කරන්නට බැරි ය, ඔව්හු ම අවුත්
අප පිටතට ගනෙ යත්වා"යි කී ය.
38 පොලිස් සේවකයෝ එපවත් නඩුකාරයන්ට සැළ
කළහ. ඔවුන් රෝමවරුන් බව ඇසූ විට නඩුකාරයෝ
බිය වී, 39 අවුත් ඔවුනට කන්නලව් කර පිටතට
කැඳවා, නුවරින් නික්ම යන ලසෙ ඉල්ලා සිටියහ.
40 එවිට ඔව්හු හිර ගයෙින් පිටත් ව ගොස්
ලිදියාගේ ගදෙරට පැමිණියහ. එහි දී ඔව්හු
සහෝදරයන් හමු වී, ඔවුන් දිරි ගන්වා පිටත් ව
ගියහ.

### තසෙලෝනිකයේ කලබලය

17 ඔවුහු අම්පිපොලිසිය සහ අපොලෝනිය
මැදින් ගොස් තසෙලෝනිකයට ආහ. එහි
ජුදවේවරුන්ගේ ධර්මශාලාවක් තිබුණි. 2 පාවුලු සිය

සිරිත ලෙස ඔවුන් වෙතට ගොස්, සබත් දින තුනක්
ඔවුන් සමඟ වාද කරමින්, 3 ක්‍රිස්තුන් වහන්සේ දුක්
විඳින්නටත්, මළවුන්ගෙන් උත්ථාන වන්නටත් යුතු ව
තිබුණු බව ශුද්ධ ලියවිල්ලෙන් පාඨ ගෙනහැරපාමින්
පැහැදිලි කර දුන්නේ ය. “තවද මා ඔබට ප්‍රකාශ
කරන මේ ජේසුස් වහන්සේ වනාහි ක්‍රිස්තුන්
වහන්සේ ම ය”යි පාවුලු ඔවුනට පහදා දුන්නේ ය.
4 ඔවුන්ගෙන් සමහරෙක් ද භක්තිවන්ත
ග්‍රීකවරුන්ගෙන් මහත් සමූහයක් ද වැදගත්
ස්ත්‍රීන්ගෙන් කීප දෙනෙක් ද ඒ අදහා ගෙන, පාවුලු
සහ සීලස් සමඟ එක් වූ හ.
5 එහෙත් ජුදෙව්වරු ඊර්ෂ්‍යාවෙන් පිරී,
රස්තියාදුකාරයන් අතරෙන් සමහර මැරවරයන්
කැඳවාගෙන, සෙනඟ රැස් කර, නුවර කළඹා,
ජාසොන්ගේ නිවස ළඟට පැමිණ, පාවුලු සහ සීලස්
ඉන් පිට කර ජනකාය මැදට ගෙන්වා ගන්නට තැත්
කළහ. 6 එහෙත් ඒ දෙදෙනා සොයා ගත නොහැකි
වූ බැවින්, ඒ වෙනුවට ජාසොන් සහ සමහර
සහෝදරයන් ද, නුවර මුළාදෑනීන් ළඟට ඇද ගෙන
ගොස්, “ලෝකය පෙරළූ මේ අය මෙහි ද පැමිණ
සිටිති; ජාසොන් ඔවුන් පිළිගත්තේ ය. 7 මොවුහු
සියල්ලෝ ජේසුස් නම් වෙන රජෙක් ඇතැ යි කියා,
සීසර් අධිරාජයාගේ නියෝගවලට විරුද්ධ ව ක්‍රියා
කරති”යි මොරගසා කී හ. 8 මේ ඇසූ සමූහයා ද
නුවර මුළාදෑනිහු ද කැළඹුණාහ. 9 ඔව්හු ජාසොන් ද
අනෙක් අය ද ඇප පිට නිදහස් කළහ.

## බෙරියාවට පැමිණීම

10 රෑ වූ විගස සහෝදරයෝ පාවුලු ද සීලස් ද
බෙරියාවට යැවූ හ. ඔව්හු එහි පැමිණ
ජුදෙව්වරුන්ගේ ධර්මශාලාවට ඇතුළු වූ හ. 11 එහි
සිටි අය තෙසලෝනිකයෙහි අයට වඩා උදාර
ගතිගුණ ඇත්තෝ වූ හ. ඔව්හු කරුණු හරි හැටි දැන
ගන්නා පිණිස, දවස්පතා ශුද්ධ ලියවිල්ල පිරික්සමින්
මුළු සිතින් ධර්මය පිළිගත්හ. 12 එහෙයින්
ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ද ග්‍රීක් කුල
කාන්තාවන්ගෙන් සහ පුරුෂයන්ගෙන් කීප දෙනෙක් ද
අදහා ගත්හ. 13 එහෙත් පාවුලු බෙරියාවෙහිදීත්
දෙවියන් වහන්සේගේ වචනය ප්‍රකාශ කළ බව
ඇසූ තෙසලෝනිකයේ ජුදෙව්වරු එතැනට පැමිණ,
සමූහයා අවුස්සා කැළඹීමක් ඇති කළෝ ය. 14 එවිට
සහෝදරයෝ එවේලේ ම පාවුලු මුහුදු වෙරළට
පිටත් කර යැවූ හ. සීලස් ද තිමෝතියස් ද එහි ම
නැවතී සිටියහ. 15 පාවුලු ඇරලීමට ගිය අය ඇතන්ස්
නගරය දක්වා ඔහු පිරිවරා ගියහ. හැකි පමණ
ඉක්මනින් තමා වෙතට එන මෙන්, සීලස්ට ද
තිමෝතියස්ට ද පාවුලුගෙන් නියමයක් රැගෙන ඔව්හු
ආපසු ගියහ.

## ඇතන්ස්හි දේශනාව

16 පාවුලු ඇතන්ස්හි ඔවුන්ගේ පැමිණීම බලා සිටිය
දී, ඒ නුවර දේව රූපවලින් පිරී තිබෙන බව දැක
ඔහුගේ සිත කැළඹී ගියේ ය. 17 එබැවින් ඔහු
ධර්මශාලාවේ දී ජුදෙව්වරුන් හා භක්තිවන්තයන්
සමඟ ද, වෙළෙඳොම් පොළේ දී දිනපතා හමු වූවන්
සමඟ ද වාද කළේ ය. 18 එපිකූරිය සහ ස්තෝයික
දාර්ශනිකයන්ගෙන් සමහරෙක් ද ඔහුට මුණ
ගැසුණාහ. ඇතැමෙක්, “මේ වාචාලයා කුමක්
කියන්නට හදනවා දැ”යි කී හ. “ඔහු අන්‍ය
දෙවිදේවතාවන් ප්‍රචාරය කරන්නකු මෙන් පෙනේ
ය”යි සමහරු කී හ. මෙසේ කීවේ ඔහු ජේසුස්
වහන්සේ හා උන් වහන්සේගේ පුනරුජ්ජීවනය
ප්‍රකාශ කළ බැවිනි.
19 එබැවින් ඔව්හු අරියෝපගයේ රැස්වීමට ඔහු
ගෙන ගොස්, “ඔබ උගන්වන මේ අලුත් ධර්මය
අපටත් දැනගන්නට පුළුවන් ද? 20 මන්ද, සමහර
අපූරු කාරණා ඔබ අපේ කන්වල හළෙන්නෙහි ය.
එහෙයින් මේ කාරණාවල අර්ථය කිමෙක් දැ යි
දැනගන්ට කැමැත්තෙමු”යි කී හ. 21 සියලු ඇතන්ස්
වැසියෝ ද එහි පදිංචි ව සිටි විදේශිහු ද අලුත්
මතිමතාන්තර ගැන කතාබහ කරමින් හෝ ඒවාට
සවන් දීමෙන් හෝ මිස වෙන අයුරකින් කාලය ගත
නොකළහ.
22 එවිට පාවුලු, අරියෝපග ශාලාව මැද සිට
මෙසේ දෙසී ය: “ඇතන්ස් වැසියෙනි, ඔබ හැම අතින්
ම ආගම ධර්මයට ලැදිකම් ඇති අය බව මට
පෙනේ. 23 ඔබ නමස්කාර කරන වස්තු නරඹමින් මා
යන අතර, ‘නාඳුනන දෙවියන්ට ය’ යන ලේඛනයක්
ඇති පූජාසනයක් ද දිටිමි. ඔබ නොදැන නමස්කාර
කරන ඒ දෙවියන් මම ඔබට ප්‍රකාශ කරමි. 24 1
රාජා 8:27; යෙසා 42:5; ක්‍රියා 8:40ලෝකය ද එහි
සියල්ල ද මවා වදාළ දෙවියන් වහන්සේ
ස්වර්ගයටත් පොළොවටත් ස්වාමීන් ව සිටින බැවින්,
උන් වහන්සේ මිනිස් අතින් සාදන ලද මාලිගාවල
නොවසන සේක. 25 උදව්උපකාරයෙන් යැපෙන
අයකු සේ උන් වහන්සේ මිනිස් අත්වලින්
උපස්ථාන නොලබන සේක. මන්ද, සියල්ලන්ට
ජීවිතය ද හුස්ම ද අන් සියලු දේ ද දෙන්නේ උන්
වහන්සේ ය. 26 උන් වහන්සේ එක් මිනිසකුගෙන්
සකල මිනිස් සංහතිය මවා වදාළ සේක. මිහි පිට
වාසය කරන පිණිස නියමිත කාලයන් ද
වාසස්ථානවල සීමා ද නියම කළ සේක. 27 මෙසේ
කළේ දෙවියන් වහන්සේ ගැන හැඟීමකින් ද,
හමුවන බලාපොරොත්තුවෙන් යුතුව ද උන්
වහන්සේ සොයන පිණිස ය. උන් වහන්සේ අප
එකිනකොට නුදුරු ව සිටින සේක.
28 “මන්ද, කියා තිබෙන පරිදි, ‘අපි උන් වහන්සේ
තුළ ජීවත් වෙමු, හැසිරෙමු, පවතිමු.’
q2 28 තවද, ඔබගේ කිවිවරයන්ගෙන් සමහරකු පවා
කියා තිබෙන පරිදි, ‘අපි උන් වහන්සේගේ දරුවෝ
වෙමු.’
29 අප දෙවියන් වහන්සේගේ දරුවන් වන බැවින්
දේවත්වය වනාහි මිනිස් කලාශිල්පයෙන් හා
දක්ෂකමින් හා කැටයම් කළ රනට වත් රිදීයට වත්
ගලට වත් සමාන යයි නොසිතිය යුතු ය. 30 ඉතින්
මේ නොදැනුම් කමේ කාලයන් දෙවියන් වහන්සේ
නොතකා හැරිය නමුත් දැන් සියලු මනුෂ්‍යයන්ට

සියලු තැන්හි පසුතැවී සිත් හරවා ගන්නට දැන් අණ
කරන සේක. 31 මන්ද, තමන් වහන්සේ විසින් පත්
කරන ලද මනුෂ්‍යයකු ලවා ලෝකයා
ධර්මිෂ්ඨකමින් විනිශ්චය කිරීමට එක් දවසක් නියම
කර තිබේ. උන් වහන්සේ ඒ මනුෂ්‍යයා මළවුන්ගෙන්
උත්ථාන කිරීමෙන් සියල්ලන්ට ඒ ගැන සහතිකයක් දී
තිබේ."
32 මළවුන්ගෙන් උත්ථාන වීම ගැන ඔවුන්ට ඇසුණ
කල, සමහරු සරදම් කළහ. සමහරු, "මේ ගැන ඔබ
කියන දේ අපි නැවත වරක් අසන්නෙමු"යි කී හ.
33 එවිට පාවුලු ඔවුන් කෙරෙන් අහක් ව ගියේ ය.
34 එහෙත් සමහර අය ඔහුට එකතු වී අදහා ගත්හ.
ඔවුන් අතරෙහි අරියෝපගීය දියොනිසියස් ද දමරිස්
නම් ස්ත්‍රියක් ද තවත් අය ද වූ හ.

### කොරින්තියේ ධර්මදූත සේවය

18 මින්පසු පාවුලු ඇතන්ස් නුවරින් පිටත්ව,
කොරින්තියට පැමිණියේ ය. 2 එහි දී ඔහුට
මෑතක දී ඉතාලියට පැමිණි, පොන්තස්හි උපන් අකිලා
නම් එක්තරා ජුදෙව්වරයකු මුණගැසුණේ ය.
ක්ලෞදියස් සියලු ජුදෙව්වරුන්ට රෝමයෙන් අහක් ව
යන්නට අණ කර තිබුණු බැවින්, ඔහු ප්‍රිස්කිලා නම්
සිය බිරිඳ සමඟ කොරින්තියට පැමිණ සිටියේ ය.
පාවුලු ඔහු හමු වීමට ගියේ ය. 3 දගෙවොල්ල ම එක
ම කර්මාන්තය කරන්නන් වූ බැවින්, පාවුලු ඔවුන්
සමඟ නැවතී වැඩ කළේ ය. ඔවුන්ගේ කර්මාන්තය
කූඩාරම් සෑදීම ය. 4 පාවුලු සියලු සබත් දවස්වල
ධර්මශාලාවෙහි දී වාද කර, ජුදෙව්වරුන් ද
ග්‍රීක්වරුන් ද ඇදහිල්ලට පමුණුවාගන්නට උත්සාහ
කළේ ය.
5 සීලස් ද තිමෝතියස් ද මසිදෝනියෙන් ආ කල
ජේසුස් වහන්සේ ක්‍රිස්තුන් වහන්සේ ම යයි පාවුලු
ජුදෙව්වරුන්ට සාක්ෂි දෙමින්, ධර්මය දේශනා කිරීමේ
කාර්යයෙහි ම නිරත විය. 6 එහෙත් ඔවුන් විරුද්ධ ව
සිට, අපහාස කළ කල්හි, පාවුලු තමාගේ වස්ත්‍රවල
ධූලි ගසාදමා, ඔවුන්ට කතා කොට, "ඔබගේ ලේ
ඔබගේ ම හිස් පිට වැගිරේ වා; මම නිදොස් වෙමි.
මතුන් පටන් විජාතීන් වෙතට යමි"යි කී ය. 7 ඔහු
එතැනින් නික්ම ගොස් දෙවියන් වහන්සේට
නමස්කාර කළ තීතස් ජුස්තස් නම් මිනිසකුගේ
ගෙදරට ගියේ ය. ඔහුගේ නිවස ධර්මශාලාවලට
යාව තිබිණි. 8 ධර්මශාලා මුළාදෑනියා වූ ක්‍රිස්පස්
තමාගේ ගයි වැසි සියල්ලන් සමඟ සමිඳාණන්
වහන්සේ අදහා ගත්තේ ය. කොරින්තිවරුන්ගෙන්
බොහෝ දෙනෙක් ද පාවුලුගේ බස් අසා අදහා ගෙන
බව්තීස්ම-ස්නාපනය ලැබූ හ.
9 සමිඳාණන් වහන්සේ රාත්‍රියේ දී දර්ශනයකින්
පාවුලුට කතා කොට, "ඔබ බිය නොවී, නිශ්ශබ්ද ව
නොසිට කතා කරන්න. 10 මන්ද, මම ඔබ සමඟ
සිටිමි; ඔබට අනතුරු කරන ලෙස කිසිවෙකේ ඔබට
විරුද්ධ ව නො එන්නේ ය. මට මේ නුවර බොහෝ
සෙනඟ සිටිති"යි වදාළ සේක. 11 ඔහු දෙවියන්
වහන්සේගේ වචනය ඔවුන් අතර උගන්වමින් එක්
අවුරුදු සමසක් එහි වාසය කළේ ය.
12 එහෙත් ගලියෝ අකයියාවේ අධිපතියා ව සිටිය
දී ජුදෙව්වරු එක්සිත් ව පාවුලුට විරුද්ධ ව නැඟී සිට,
ඔහු විනිශ්චයාසනය ඉදිරියට ගෙනැවිත්, 13 "මොහු
ව්‍යවස්ථාවලියට විරුද්ධ ව දෙවියන් වහන්සේට
නමස්කාර කරන්නට මිනිසුන් පොළඹවන්නේ ය"යි
පැමිණිලි කළහ. 14 පාවුලු කතා කරන්නට සැරසෙන
විට ගලියෝ ජුදෙව්වරුන් අමතමින්, "ජුදෙව්වරුනි,
මේ කාරණය අපරාධයක් වත් නපුරු දුෂ්ට කමක්
වත් වී නම්, මා ඔබේ පැමිණිල්ලට සවන් දීම යුතු
ය. 15 එහෙත් මේ වනාහි ඇතැම් වචන ගැන ද
ඇතැම් නාම ගැන ද ඔබගේ ම ව්‍යවස්ථාවලිය ගැන
ද වූ ප්‍රශ්න වන බැවින් ඒ ගැන ඔබ ම
වගබලාගන්න; මේ දේවල් ගැන මම
විනිශ්චයකාරයෙක් නොවෙන්නෙමි"යි කියා, 16 ඔවුන්
නඩු ආසනය වෙතින් එලවාදැමුවේ ය. 17 එවිට ඒ
සියල්ලෝ ධර්මශාලාවේ මුළාදෑනියා වූ
සොස්තනේස් අල්ලා නඩු ආසනය ඉදිරියේ ඔහුට
තැළූහ. එහෙත් ගලියෝ මේ ගැන සැලකුවේ නැත.

### අන්තියෝකියට හැරී ඒම

18 ගණන් 6:18 පාවුලු එහි තවත් කලක් නැවතී
සිටි පසු, සහෝදරයන්ගෙන් සමුගෙන, සිරියාවට
යන්නට නැව් නැංගේ ය. ප්‍රිස්කිලා ද අකිලා ද ඔහු
සමඟ ගියහ. පාවුලු බාරයක් වී සිටි බැවින්
කෙන්ක්‍රියොයේ දී හිස මුඩු කරගත්තේ ය.
19 ඔවුන් එපීසයට පැමිණි විට, පාවුලු ඔවුන් එහි
නැවැත් වී ය. එහෙත් ඔහු ධර්මශාලාවට ගොස්
ජුදෙව්වරුන් සමඟ තර්ක කළේ ය. 20 තවත්
කාලයක් එහි නැවතී සිටින ලෙස ඔවුන් ඉල්ලූ නමුත්,
ඔහු ඊට එකඟ නොවී, 21 ඔවුන්ගෙන් සමුගනිමින්,
"දෙවියන් වහන්සේ කැමැති සේක් නම් ඔබ වෙතට
නැවත එන්නෙමි" කියා එපීසයෙන් නැව් නැංගේ ය.
22 ඔහු කායිසාරියට ගොඩ බැස, ජෙරුසලමට ගොස්,
සභාවට ආචාර කොට, අන්තියෝකියට ගියේ ය.
23 ඔහු එහි කලක් ගත කළ පසු පිටත් ව ගලාතිය
සහ ප්‍රිගිය යන පළාත් මැදින් යමින් සියලු
ශ්‍රාවකයන් ධෛර්යවත් කළේ ය.

### අපොල්ලොස් එපීසයේ සිටීම

24 අලෙක්සන්ද්‍රියාවෙහි උපන් අපොල්ලොස් නම්
එක්තරා ජුදෙව්වරයකු එපීසයට ආවේ ය; ඔහු
ව්‍යක්ත කථිකයෙකි; බහුශ්‍රැත ධර්ම දේශකයෙකි.
25 මේ මිනිසා සමිඳාණන් වහන්සේගේ මාර්ගය
ගැන ඉගෙනීම ලැබූවෙකි. ඔහු ජ්වලිත සිතින්,
දෙවියන් වහන්සේ පිළිබඳ කරුණු හරි ලෙස
උගන්වමින් දේශනා කළේ ය. එහෙත් ඔහු දැන
ගෙන සිටියේ ජොහන්ගේ බව්තීස්ම-ස්නාපනය
පමණකි. 26 ඔහු ධර්මශාලාවෙහි දී නිර්භීත ව කතා
කරන්නට පටන් ගත්තේ ය. ප්‍රිස්කිලා ද අකිලා ද
ඔහුගේ බස් අසා, ඔහු තමන් ළඟට කැඳවාගෙන,
දෙවියන් වහන්සේගේ මාර්ගය වඩා හරි ලෙස ඔහුට

පහදා දුන්හ. 27 තවද ඔහු ග්‍රීසියට යන්නට අදහස්
කළ කල්හි, සහෝදරයෝ ඔහු ධෛර්යවත් කොට,
ඔහු පිළිගන්නා ලෙස ශ්‍රාවකයනට ලියා යැව්වෝ ය.
ඔහු එහි පැමිණි කල, දේව වරප්‍රසාදය
කරණකොටගෙන අදහාගෙන සිටි අයට බොහෝ
උපකාර කෙළේ ය. 28 මන්ද, ඔහු ජේසුස් වහන්සේ
ක්‍රිස්තුස් බව ශුද්ධ ලියවිල්ලෙන් පෙන්වා දෙමින්,
ජුදෙව්වරුන්ගේ තර්ක ප්‍රසිද්ධියේ ම එඩිතර ලෙස
බිඳහරිමින් පරාජය කෙළේ ය.

### එපීසයේ ස්නාවක ජොහන්ගේ ගෝලයෝ

19 තවද අපලෝල්ලොස් කොරින්තියෙහි සිටිය දී,
පාවුලු ඉහළ පළාත් මැදින් ගමන් කොට,
එපීසයට පැමිණියේ ය. එහි දී ඔහුට සමහර
ශ්‍රාවකයෝ හමු වූ හ. 2 පාවුලු ඔවුන් අමතා: "ඔබ
අදහා ගත් කල ශුද්ධාත්මයාණන් වහන්සේ ලැබුවහු
දැ"යි ඔවුන්ගෙන් ඇසී ය. ඔව්හු, "නැත,
ශුද්ධාත්මයාණන් වහන්සේ ඇති බවක් වත්
නොඇසීමු"යි කී හ. 3 "එසේ වී නම්, ඔබ කුමන
බව්තීස්ම-ස්නාපනයක් ලැබුවහු දැ"යි ඔහු ඇසී ය.
"ජොහන්ගේ බව්තීස්ම-ස්නාපනය"යි ඔව්හු කී හ.
4 මතෙ 3:11; මාක් 1:4,7-8; ලූක් 3:4-16; ජොහ
1:26-27පාවුලු කතා කොට, "ජොහන් පසුතැවී සිත්
හරවා ගැනීමේ බව්තීස්ම-ස්නාපනයෙන් බව්තීස්ම-
ස්නාපනය කොට සෙනඟට කතා කරමින්, තමන්ට
පසු ව එන තැනැන් වහන්සේ කෙරෙහි, එනම්
ජේසුස් වහන්සේ කෙරෙහි අදහාගන්නා ලෙස
සෙනඟට කී ය"යි පැවසී ය. 5 ඔව්හු ඒ අසා ස්වාමීන්
වන ජේසුස් වහන්සේගේ නාමයෙන් බව්තීස්ම-
ස්නාපනය කරනු ලැබූ හ. 6 පාවුලු ඔවුන් පිට අත්
තැබූ කල ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන් කෙරෙහි
පැමිණි සේක. ඔව්හු අන්‍ය භාෂාවලින් කතා කරමින්
දිවැස් වැකි පැවසූ හ. 7 ඒ මනුෂ්‍යයෝ දොළොස්
දෙනෙක් පමණ වූ හ.
8 පාවුලු ධර්මශාලාවට ඇතුළු වී තුන් මසක්
අතරතුරේ දෙවියන් වහන්සේගේ රාජ්‍යය ගැන
නිර්භීත ලෙස තර්ක කරමින් ද සිත් දිනාගැනීමට
උත්සාහ කරමින් ද සාකච්ඡා කෙළේ ය. 9 එහෙත්
සමහරුන් මුරණ්ඩු ව, අකීකරු ව, සමූහයා ඉදිරියෙහි
ඒ ධර්ම මාර්ගය හෙළා දකිමින් කතා කළ කල්හි
ඔහු ඔවුන්ගෙන් ඈත් වී, ශ්‍රාවකයන් වෙන් කරගෙන,
තුරානස්ගේ ශිල්පශාලාවෙහි දවස්පතා තර්ක
කරමින් සිටියේ ය. 10 මෙය දෙවසක් කරගෙන
ගියේ ය. මෙසේ ආසියාවේ වීසූ සියලු ජුදෙව්වරු ද
ග්‍රීක්වරු ද සමිඳාණන් වහන්සේගේ වචනය ඇසූ හ.

### ස්කේවාගේ පුත්‍රයෝ

11 දෙවියන් වහන්සේ පාවුලුගේ අත්වලින් පුදුම
හාස්කම් සිදු කළ සේක. 12 ඔහුගේ ශරීර ස්පර්ශය
ලැබූ තුවායක් වත් රෙදිකඩක් වත් ලෙඩුන් ළඟට
ගෙන ගිය කල රෝග ඔවුන්ගෙන් දුරු විය, නපුරු
ආත්මයෝ ද පහ ව ගියහ. 13 එහෙත් සමහර
සංචාරක ජුදෙව් යකැදුරෝ අශුද්ධාත්ම වැහී සිටි අය
කෙරෙහි ස්වාමීන් වන ජේසුස් වහන්සේගේ නාමය
කියන්නට පටන් ගෙන, "පාවුලු දේශනා කරන
ජේසුස් වහන්සේගේ නාමයෙන් ඔබට අණ කරමි"යි
කී හ. 14 නායක පූජකයෙකු වූ ස්කේවා නම්
ජුදෙව්වරයෙකුගේ පුත්‍රයෝ සත් දෙනෙක් මෙසේ
කළහ. 15 එහෙත් අශුද්ධාත්මය උත්තර දෙමින්, "මම
ජේසුස් වහන්සේ අඳුනමි, පාවුලු ද දනිමි, එහෙත්
ඔබ කවුරු දැ"යි ඔවුනට කීවේ ය.
16 අශුද්ධාත්මය වැහී සිටි මිනිසා ඔවුන් වෙතට
පැන සියලු දෙනා ම දමනය කොට අඩන්තේට්ටම්
කෙළේ ය. ඔව්හු තුවාළ වී, නග්න ව, ඒ ගෙයින්
පලා ගියහ. 17 මෙය එපීසයෙහි වීසූ සියලු
ජුදෙව්වරුනට ද ග්‍රීකයනට ද සැළ විය. ඔව්හු
බොහෝ සේ බියපත් වූ හ. ජේසුස් ස්වාමීන්
වහන්සේගේ නාමයට ද ගෞරවය ඇති විය.
18 අදහාගත්තවුන්ගෙන් බොහෝ දෙනෙක් අවුත්
තමන් ද මන්ත්‍රගුරුකම්වල යෙදී සිටි බව ප්‍රකාශ
කළහ. 19 යන්ත්‍ර මන්ත්‍ර අභ්‍යාස කළ බොහෝ
දෙනෙක් ද, තමන්ගේ පොත් එක් කොට ගෙනැවිත්
සියල්ලන් ඉදිරියෙහි පුළුස්සාදැමූ හ. ඒවායේ මිල
ගණන් බලා, රිදී මිල පණස් දහසක් බව දැන ගන්නා
ලදී. 20 මෙසේ සමිඳාණන් වහන්සේගේ වචනය
බලවත් සේ වැඩී පැතිරී ගියේ ය.
21 මේ සියල්ල නිම වූ කල, පාවුලු කතා කරමින්,
"මා ජෙරුසලමට ගිය පසු, රෝමය ද දකින්න ඕනෑ
ය" කියා, මසිදෝනිය සහ ග්‍රීසිය මැදින් ගොස්,
ජෙරුසලමට යන්නට අධිෂ්ඨාන කරගත්තේ ය.
22 ඔහු තමාට සේවය කළ අයගෙන් දෙදෙනෙකු වන
තිමෝතියස් ද එරස්තස් ද මසිදෝනියට යවා තමා ම
කලක් ආසියාවෙහි නැවතී සිටියේ ය.

### එපීසයේ කෝලාහලය

23 ඒ කාලයේ මේ ධර්ම මාර්ගය ගැන මහත්
කැළඹීමක් හටගත්තේ ය. 24 මන්ද, අර්තමේස්ගේ
දේවාලයයේ රිදී රූප සාදන දෙමෙත්‍රියස් නම් රිදී
කලාකරුවෙක් කර්මාන්තකාරයන්ට බොහෝ ලාභ
උපදවා දුන්නේ ය. 25 ඔහු, ඔවුන් ද එබඳු වූ වෙනත්
කම්කරුවන් ද රැස් කරවා "භවතුනි, අපට වස්තුව
ලැබෙන්නේ මේ කර්මාන්තයෙන් බව ඔබ දන්නහු
ය. 26 මේ පාවුලු වනාහි 'අත්වලින් සෑදූ දෙවිවරු,
දෙවිවරු නොවෙති'යි කියමින් එපීසයේ පමණක්
නොව මුළු ආසියාවේ හැම තැන ම පාහේ බොහෝ
සෙනඟට උගන්වා ඔවුන් හරවා ගත් බව ඔබට
දකින්නට ද අසන්නට ද ලැබී ඇත. 27 ඒ නිසා අපේ
මේ කර්මාන්තය අපකීර්තියට පත් විය හැකි ය.
එපමණක් නොව, මුළු ආසියාවත් ලෝකයත්
නමස්කාර කරන උත්තරීතර දේවතාවිය වූ
අර්තමේස්ගේ දේවාලය අභාවයට පත් වීමට ද
ඇගේ අභිමානය පවා නැති වී යාමට ද ඉඩ තිබේ
ය"යි කී ය.
28 ඔව්හු ඒ අසා කෝපයෙන් පිරී, "එපීසයන්ගේ
අර්තමේස් අති උසස් ය"යි කියමින් මොරගැසූ හ.
29 එවිට මුළු නුවර කැළඹිණ. ඔව්හු, පාවුලු සමඟ

ගමන් කළ ගායස් ද අරිස්තාර්කස් ද යන
මසිදෝනිවරුන් දෙදෙනා අල්ලා ගෙන නෘත්‍ය
ශාලාවට වේගයෙන් දිවූ හ. 30 පාවුලු සෙනඟ මැදට
යන්නට සිතූ නමුත් ශ්‍රාවකයෝ ඔහුට ඉඩ නුදුන්හ.
31 ඔහු සමඟ මිත්‍ර ව සිටි ආසියාතික
අධිපතීන්ගෙන් සමහරෙක් ද, නෘත්‍ය ශාලාවට කොයි
ආකාරයකින් වත් ඇතුළු නොවන සේ ඉල්ලමින්
කන්නලව් කළහ. 32 සභාව වියවුල් වූ බැවින්,
සමහරෙක් එකක් ද, අන් සමහරෙක් තවත් එකක් ද
කියමින් මොරගැසූ හ. ඔවුන්ගෙන් වැඩි කොටස
තමන් රැස්වුණේ කුමන කරුණක් නිසා දැ යි
නොදත්හ. 33 ජුදෙව්වරුන් විසින් අලෙක්සන්දර්
ඉදිරිපත් කරනු ලැබූ බැවින්, සමූහයාගෙන්
සමහරෙක්, වගකිවයුත්තා ඔහු යයි නිගමනය කළහ.
අලෙක්සන්දර් අතින් සංඥා කොට, සමූහයාට පිළිතුරු
දෙන්නට කැමැත්ත දැක්වී ය. 34 එහෙත් ඔහු
ජුදෙව්වරයෙකු බව දැනගත් විට: “එපීසියන්ගේ
අර්තමේස් අතිඋතුම් ය”යි කියමින් දෙපැයක් පමණ
ඔව්හු සියල්ලෝ ම එක හඬින් මොරගැසූ හ.
35 නගර සභා ලේකම් තැන සමූහයා සන්සිඳුවා,
“එපීසයේ මනුෂ්‍යයිනි, එපීසවරුන්ගේ නුවර වනාහි
ශ්‍රේෂ්ඨ අර්තමේස්ගේ මාලිගාවේ ද ස්වර්ගයෙන්
පතිත වූ රූපයේ ද රැකවලී බව නොදන්නා
මනුෂ්‍යයා කවරෙක් ද? 36 මෙසේ මේ දේවලට
විරුද්ධ ව යමක් කියන්නට කවරෙකුට වත් බැරි
හෙයින් ඔබ ඉක්මන් වී සැහැසිකමක් නොකළ යුතු
ය. 37 මන්ද ඔබ මෙහි ගෙනා මේ මනුෂ්‍යයෝ
දේවාලවලින් සොරකම් කරන්නෝ වත්, මේ
දේවතාවියට අපහාස කරන්නෝ වත් නොවෙති.
38 එසේ හෙයින්, යමෙකුට විරුද්ධ ව
දෙමේත්‍රියස්ගේ ද ඔහු සමඟ සිටින
කර්මාන්තකාරයන්ගේ ද පැමිණිල්ලක් ඇත් නම්, නඩු
දවස් තිබේ, අධිපතියෝ ද සිටිති. ඔව්හු එකිනෙකාට
විරුද්ධ ව පැමිණිලි කරත් වා. 39 එහෙත්, ඔබ එයට
වැඩි යමක් සොයන්නහු නම්, එය නීත්‍යනුකූල
සභාවේ දී තීරණය කරනු ලැබේ. 40 මන්ද අපට
මේ කලබලයට යුක්තිසහගත හේතුවක් ඉදිරිපත්
කළ නොහැකි බැවින්, අද ඇති වූ මේ කෝලාහලය
ගැන අපට විරුද්ධ ව චෝදනාවක් ඉදිරිපත් වෙන්නට
ඉඩ තිබේ”යයි කී ය. 41 ඔහු මෙසේ කියා සභාව
විසුරුවා හැරියේ ය.

## මසිදෝනියට හා ග්‍රීසියට යාම

20 කෝලාහලය සංසිඳුන පසු පාවුලු
ශ්‍රාවකයන් කැඳවා ඔවුන් ධෛර්යවත්
කොට, ඔවුන්ගෙන් සමුගෙන මසිදෝනිය බලා නික්ම
ගියේ ය. 2 ඔහු ඒ පළාත් මැදින් ගොස්, ඔවුන්
බොහෝ සේ ධෛර්යවත් කොට, ග්‍රීසියට
පැමිණියේ ය. 3 ඔහු එහි තුන් මසක් ගත කොට,
නැවෙන් සිරියාවට යන්නට සූදානම් ව සිටිය දී, ඔහුට
විරුද්ධ ව ජුදෙව්වරුන් විසින් කූට උපායයක් යොදන
ලදී. එහෙයින් මසිදෝනිය ඔස්සේ හැරී යන්නට ඔහු
නියම කරගත්තේ ය. 4 පුරස්ගේ පුත්‍ර වූ
බෙරියාවේ සෝපතර් ද තෙසලෝනිකවරුන්ගෙන්
අරිස්තාර්කස් සහ සෙකුන්දස් ද දර්බයේ ගායස් ද
තිමෝතියස් ද ආසියාවේ තුකිකස් සහ ත්‍රොපිමස් ද
ඔහු සමඟ ආසියාව දක්වා ගියහ. 5 මොවුහු
පෙරටුව ගොස්, අප එන තෙක් ත්‍රෝවසයේ බලා
සිටියහ. 6 නුමුහුන් රොටි මංගල්‍ය දවස්වලට පසු
අපි පිලිප්පියෙන් නැව් නැඟී, පස් දවසකින්
ත්‍රෝවසයෙහි සිටි ඔවුන් වෙතට ගොස්, එහි සත්
දවසක් නැවතී සිටියෙමු.

## යුතිකස්ට පණ දීම

7 සතියේ පළමු වැනි දා අප රොටි කඩන්නට රැස්
වූ කල, පාවුලු පසුවදා යන්නට අදහස් කළ බැවින්,
මැදියම් රැය දක්වා, ඔහු ඔවුන්ට අනුශාසනා කෙළේ
ය; 8 අප රැස් ව සිටි උඩු මහලේ බොහෝ පහන්
දල්වා තිබිණි. 9 යුතිකස් නම් එක් තරුණයෙක් නිදි
කිරා වැටෙමින් කවුළුව උඩ උන්නේ ය; පාවුලු දිගින්
දිගට අනුශාසනා කරද්දී යුතිකස් බර නින්ද නිසා
තුන්වැනි මහලින් පහළට වැටිණි. ඔහු ඔසවා ගත්
කල මැරී සිටියේ ය. 10 එවිට පාවුලු බැස, ඔහු පිට
වැටී, ඔහු වැළඳ ගෙන: “කරදර නොවන්න, මොහුට
තව ම පණ තිබේ ය”යි කී ය. 11 ඔහු නැවත
උඩුමහලට ගොස්, රොටි කඩා වළඳා, ඔවුන් සමඟ
පහන් වන තුරු බොහෝ වේලාවක් කතා කර, පසුව
පිටත් ව ගියේ ය. 12 ඔව්හු ඒ තරුණයා පණපිටින්
කැඳවා ගෙන ගොස්, බොහෝ සේ සැනසුණාහ.

## මිලේතසට ගමන

13 අපි අසොස්හි දී පාවුලු නැවට කැඳවාගන්නට
අදහස් කර, පෙරටුව ගොස්, නැව් නැඟී, එහි ගියෙමු.
මන්ද, පාවුලු ගොඩින් යන්නට අදහස් කළෙන් එසේ
යාමට අපට නියම කර තිබුණි. 14 අසොස්හි දී අපට
ඔහු හමු වූයෙන්, අපි ඔහු නැවට නංවා ගෙන
මිතුලේනට පැමිණියෙමු. 15 අපි එතැනින් යාත්‍රා
කොට, පසුවදා කියොසය ඉදිරියට පැමිණ, ඊට
පසුවදා සාමොසයට ළඟා වී, ඊළඟ දවසේ
මිලේතසට පැමිණියෙමු. 16 ආසියාවෙහි කල් ගත
කරන්නට සිදු නොවන පිණිස, එපීසය පසු කර
යන්නට ඔහු තීරණය කරගෙන සිටියේ ය. එසේ
කෙළේ, හැකි නම් පෙන්තකොස්ත දවසේ
ජෙරුසලමේ සිටින්නට පාවුලු ඉක්මන් කළ බැවිනි.

## එපීසයේ දී සභා මූලිකයන්ගෙන් සමුගැනීම

17 ඔහු මිලේතසෙන් එපීසයට පණිවුඩ යවා,
සභාවේ මූලිකයන් කැඳෙව්වේ ය. 18 ඔවුන් තමා
වෙතට ආ කල ඔහු මෙසේ පැවසී ය, “මා ආසියාවට
පැමිණි පළමු වැනි දා පටන් මුළු කාලය ඔබ සමඟ
ගත කළ සැටි ඔබ දන්නහු ය. 19 මම සියලු ආකාර
යටහත්පහත්කමින් ද ශෝකයෙන් ද ජුදෙව්වරුන්ගේ
උපායයන් නිසා පැමිණි දුෂ්කරතාවලින් ද යුක්ත ව
සමිඳාණන් වහන්සේට සේවය කෙළෙමි. 20 ඔබට
වැඩදායක වූ කිසිවක් කීමෙන් නොවැළකී,
ප්‍රසිද්ධියේ ද ගෙයින් ගෙට යමින් ද ඔබට

උගන්වමින්, 21 පසුතැවී සිත් හරවා ගැනීමනේ
දවේයන් වහන්සේ වතෙ හැරනෙ ලසෙත්, අපගේ
ස්වාමීන් වන ජේසුස් ක්රිස්තුන් වහන්සේ කරෙහෙි
විශ්වාස කරන ලසෙත් ජුදවේවරුන්ට හා අන්ය
ජාතිකයන්ට ද තදින් අනුශාසනා කළෙමේ. 22 දැන්
ඉතින් ආත්මයාණන් විසින් බලපානා ලදුව, මම
ජරේුසලමට යමි; එහි දී මට කුමකින් කුමක් වේ දැ
යි නාොදනිමි. 23 එහතේ සිරගත වීම් හා පීඩා ද මට
පැමිණාේ යයි, ශුද්ධාත්මයාණන් වහන්සේ සියලු
නගරවල දී දැනුම් දුන් බව හැර අන් කිසිවක්
නාොදනිමි. 24 2 තිමාෝ 4:7එහතේ මාගේ ජීවිතය
වැදගත් ය, නාොහාොත් මට ම අගේ ය කියා මම
කිසිසේත් නාොසලකමි. එහතේ මාගේ පරමාර්ථය
වූකලී දවේයන් වහන්සේගේ කරුණාවේ සුබ අස්නට
සාක්ෂි දීමනේ ස්වාමීන් වන ජේසුස් වහන්සේගනේ
මට පැවරුණ දූත මහෙයෙ සපුරා ලීම ය.
25 "මේ වන තකේ මම දවේයන් වහන්සේගේ
රාජ්යය ගැන දේශනා කරමින් ඔබ අතර
ගැවසුණමේ. දැන් ඉතින් මින්පසු ඔබගනේ කිසිවකෙු
මගේ මුහුණ තවත් නාොදකින බව දනිමි.
26 එහයෙින් ඔබ අතරනේ කිසිවකෙු විනාශයට පත්
වුවහාොත්, ඒ ගැන මා වගකිවයුත්තකු නාොවන බව
තරයේ ප්රකාශ කරමි. 27 මන්ද, දවේයන්
වහන්සේගේ මුළු අභිප්රාය නාොවළහා ඔබට
ප්රකාශ කළෙමේ. 28 ඔබ තමන් ම ද,
ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් ගබඩාකාරයකේ
ලසෙ පත් කරනු ලැබ ඔබට භාර දී ඇති රැළ ද
රැකබලාගන්න. දවේයන් වහන්සේ සිය
පුත්රයාණන්ගේ යාගික රුධිරය හේතුවනේ දිනා ගත්
උන් වහන්සේගේ සභාවේ නායකයන් වන්න. 29 මා
ගියායින් පසු, රැළට අනුකම්පා නාොකරන, රෞද්ර
වෘකයන් ඔබ අතරට පැමිණනෙ බව දනිමි. 30 ඔබ
අතරනේ සමහරුන් ඉදිරිපත් ව, තමන් අනුව යන්නට
ශ්රාවකයන් ඇදගන්නා පිණිස දුර්මත පළ කරනු
ඇත. 31 එබැවින් මා අවුරුදු තුනක් තිස්සේ දිවා රෑ
දකෙේ කඳුළු හළෙමින් සියලු දනොට නිතර ම
අවවාද කළ බව සිහි කර අවදිව සිටින්න.
32 "දැන් මම දවේයන් වහන්සේටත් උන්
වහන්සේගේ වරප්රසාදදායක පණිවුඩයටත් ඔබ
භාර කරමි. ඔබ වැඩි වර්ධනය කිරීමටත්, කැප වූ
සියලු අය සමඟ ඔබට උරුමය සාදා දීමටත් ඒ
පණිවුඩයට හැකි ය. 33 මම කාගේ වත් රන් රිදීයට
හෝ ඇඳුම් පැළඳුම්වලට හෝ ආශාවක් නාොදැක්වීමි.
34 මාගේත් මා සමඟ සිටි අයගේත් අවශ්යතා
පිරිමසාගැනීමට මේ දෑතින් මා වැඩ කළ හැටි ඔබ
ම දන්නහු ය. 35 'ලැබීමට වඩා දීම භාග්යවන්ත
යැ'යි ස්වාමීන් වන ජේසුස් වහන්සේ ම වදාළ වචන
සිහි කර, දුබලයන්ට උපකාර කළ යුතු බව මසෙේ
වැඩ කිරීමනේ මම ඔබට පනේවා දුනිමි."
36 ඔහු මසෙේ කියා ඔවුන් සියල්ලන් සමඟ දණින්
වැටී යාච්ඤා කළෙේ ය. 37 ඔවුන් සියලු දනො
හඬමින් පාවුලුගේ ගලෙ වැළඳ ගනෙ සාදරයනේ සිඹ
ගත්තෝ ය. 38 අනකේ හැම දේට ම වඩා, තමාගේ
මුහුණ යළිත් ඔවුන් නාොදකිති යි ඔහු කී වචන
ගැන, ඔව්හු ශාෝක වූ හ. ඉන්පසු ඔව්හු ඔහු සමඟ
නැව කරා ගියහ.

### පාවුලු ජරේුසලම බලා යයි

21 අපි ඔවුන්ගනේ වනේ ව නැව් නැඟී කළෙින්
ම ගාොස්, කෝස්ට ද පසුවදා රෝදස්ට ද
එතැනින් පතාරාට ද ආවමෙු. 2 එහි දී ෆිනීසියා ව
බලා යන නැවක් සම්බ වී එහි නැඟී පිටත් වුණමෙු.
3 සයිප්රසය පනෙනෙ තකේ මානයට ආවායින් පසු,
ඉන් දකුණු දසෙට යාත්රා කාොට සිරියාවට පැමිණ,
තීර්හි දී ගාොඩ බැස්සමෙු. මන්ද, එහි බඩු
ගාොඩබාන්නට තිබුණේ ය. 4 අපි එහි දී ශ්රාවකයන්
සායාගනෙ සත් දවසක් නැවතී සිටියමෙු.
ජරේුසලමට නාොයන ලසෙ ඔව්හු ආත්මයාණන්
වහන්සේගනේ අවවාද ලැබ, පාවුලුට එපවත් කී හ.
5 එහතේ ඒ දවස් ගත වූ පසු අපි පිටත් ව අපගේ
ගමන ගියමෙු. අප නුවරින් පිට වන තුරු ඔව්හු සියලු
දනො ම තමන්ගේ භාර්යාවන් හා දරුවන් ද සමඟ
අප කැටුව ආහ. අපි වරෙළහෙි දණින් වැටී යාච්ඤා
කර, 6 එකිනකොට සුබපතා, නැව් නැඟුණමෙු. ඔව්හු
තම නිවසේ කරා හැරී ගියහ.
7 අපි තීර් සිට පිටත් ව ගාොස් අපගේ මුහුදු ගමන
නිම කාොට, තාොලිමයිසයට පැමිණියමෙු. එහි දී
සහාෝදරයන්ට ආචාර කාොට ඔවුන් සමඟ දවසක්
නැවතී සිටියමෙු. 8 ක්රියා 6:5; 8:5පසුදා අපි පිටත් ව
කායිසාරියට අවුත්, සත් දනොගනේ එක් කනෙකෙු වූ
ධර්මදූත පිලිප්ගේ ගටෙ පැමිණ, ඔහු සමඟ නැවතී
සිටියමෙු. 9 දිවැස් වැකි කීමේ වරය ලත්, කන්යා
දූවරු සතර දනෙකේ ඔහුට සිටියෝ ය. 10 ක්රියා
11:28බාොහෝ දවස් අප එහි නැවතුණ අතර, අගබස්
නම් එක් දිවැසිවරයකේ ජුදයනේ අප වතෙ
පැමිණියේ ය. 11 ඔහු පාවුලුගේ ඉඟපටිය රැගනෙ
එයින් තමාගේ ම අත් පා බැඳ ගනෙ, "ජුදවේවරුන්
මේ ඉඟපටිය අයිති මිනිසා ජරේුසලමේ දී මේ
ආකාරයනේ බැඳ විජාතීන්ගේ අත්වලට පාවා දති යි
ශුද්ධාත්මයාණන් වහන්සේ කියන සේකැ"යි පැවසී
ය.
12 අප මේ දේ ඇසූ කල, ඒ ස්ථානයේ සිටි අය ද
අපි ද ජරේුසලමට නාොයන ලසෙ ඔහුගනේ උදක් ම
ඉල්ලීමු. 13 එවිට පාවුලු උත්තර දමෙින්, "ඔබ කුමක්
කරන්නහු ද? හැඬීමනේ මාගේ අධිෂ්ඨානය දුර්වල
කරන්නේ මන් ද? මම ජරේුසලමේ දී ස්වාමීන් වන
ජේසුස් වහන්සේගේ නාමය නිසා හිරගටෙ පමණක්
නාොව මැරනේනට වුවත් සූදානම් ව සිටිමි"යි කී ය.
14 ඔහු කැමැති කරවාගන්නට නාොහැකි වූයනේ,
"සමිඳාණන් වහන්සේගේ කැමැත්ත වේ වා!"යි
කියමින් අපි නිහඬ වීමු.
15 ටික දවසකට පසු අපි බඩුබාහිරාදිය රැගනෙ
ජරේුසලම බලා ගියමෙු. 16 කායිසාරියේ
ශ්රාවකයන්ගනේ සමහරකේ අප සමඟ අවුත්
බාොහෝ කලකෙ පටන් ශ්රාවකයකෙු ව සිටි
සයිප්රසයේ මිනාසාොන් නම් කනෙකෙු වතෙ
නවාතැන් ගන්නට අප කැඳවාගනෙ ගියහ.

### පාවුලු ජාකාෙබ් හමු වීම

17 අප ජරුෙසලමට පැමිණි කල සහාෙදරයාෙ
ප්රීතියෙන් අප පිළිගත්හ. 18 පසුවදා පාවුලු අප
සමඟ ජාකාෙබ් හමු වීමට ගියේ ය. සභා මූලිකයාෙ
සියලු දනො ම එහි සිටියහ. 19 ඔහු ඔවුන්ට ආචාර
කාෙට, තමාගේ සේවය මඟින් දවියන් වහන්සේ
විජාතීන් අතර සිදු කළ දේ ගැන සවිස්තර
වාර්තාවක් ඉදිරිපත් කළෙේ ය. 20 ඔව්හු ඒ අසා
දවියන් වහන්සේට ප්රශංසා කළහ. තවද ඔව්හු
ඔහුට කතා කාෙට, “සහාෙදරය, ජුදවේවරුන් අතර,
අදහාගත්තවුන් කාෙපමණ දහස් ගණනක් ඇද්ද යි
ඔබ දන්නහෙි ය. ඔව්හු සියල්ලාෙ ම ව්යවස්ථාවලිය
ගැන දැඩි භක්තියක් දක්වන අය වති. 21 තමන්ගේ
දරුවන් චර්මඡේදනය නාෙකරන්නටත්, ජුදවේ
චත්පිළිවතේ නාෙපවත්වන්නටත් උගන්වමින්
මාෙසසේට පිටුපා යන්නට විජාතීන් අතර සිටින
ජුදවේවරුන්ට ඔබ උපදෙස් දනෙ බව ඔවුන්ට සැළ වී
තිබේ. 22 දැන් ඉතින් කළ යුතු දේ කුමක් ද? ඔබ
මෙහි ඇවිත් සිටින බව ඔවුන් නිසැකව ම දැනගනු
ඇත. 23 ගණන් 6:13-21එබැවින් අප කියන දේ
කරන්න. අප අතර බාරයක් වූ මනුෂ්යයාෙ සතර
දනෙකේ සිටිති. 24 ඔබ ද ඔවුන් හා එකතු වී පවිත්ර
වීමේ පිළිවතෙ පවත්වන්න. ඔවුන්ගේ හිස් මුඩු
කිරීම සඳහා යන වියහියදම් ඔබ ම දරන්න. එසේ
කළ විට ඔබ ගැන ඔවුනට සැළ වූ කාරණාවලින්
එකක් වත් සැබෑ නාෙවන බවත්, ඔබ ව්යවස්ථාවලිය
අනුව ජීවත් වන බවත් සියල්ලන් ම දැනගනු ඇත.
25 ක්රියා 15:29එහතේ ඇදහිල්ල පිළිගත් විජාතීන්
ගැන නම්, ඔවුන් රූපවලට පුදන ලද දයෙින් ද ලයෙින්
ද බාෙටුව මිරිකා මැරූ සතුන්ගේ මස් කෑමනේ ද
වේශ්යාකමින් ද වැළකී සිටින ලසෙ අපි ම තීරණය
කර ඔවුන්ට ලියා හැරියමු”යි කී හ. 26 පසුවදා
පාවුලු ඒ මනුෂ්යයන් හා එක් වී, ඔවුන් හා සමඟ
පවිත්ර වීමේ පිළිවතෙ පැවැත්විය. ඉන්පසු පාවුලු
පවිත්ර වීම අවසාන වන කාලය ද ඔවුන් එකිනකාෙ
උදසාෙ ඔප්පු කළ යුතු පූජාව ද දැනුම් දනෙ පිණිස
දේව මාලිගාවට ඇතුළු විය.

### දේව මාලිගාවේ දී පාවුලු අත්අඩංගුවට ගනු ලැබීම

27 ඒ දවස් සත සම්පූර්ණ වතේ ම, ආසියාවනෙ
පැමිණි ජුදවේවරු දේව මාලිගාවේ දී පාවුලු දැක,
මුළු ජනකාය කළඹා, ඔහු අල්ලා ගනෙ,
28 “ඉශ්රායලේ ජනයනෙි, උදව් දනේන. අපේ
ජනතාවටත්, අපේ ව්යවස්ථාවලියටත්, මේ
ස්ථානයටත් විරාෙධී ව හැම තැන ම, හැම අයට ම
උගන්වන මිනිසා මාෙහු ය. ඒ විතරක් නාෙවේ,
මාෙහු ග්රීකයන් ද දේව මාලිගාවට කැඳවා ගනෙ
අවුත් මේ ශුද්ධස්ථානය කලෙසාෙ ඇතැ”යි
මාෙරගසා කී හ. 29 ක්රියා 20:4ඔවුන් මසෙේ කීවේ
එපීසයකෙු වූ ත්රාෙපිමස් ඔහු සමඟ නුවර සිටිනු
ඔවුන් කලින් දැක තිබුණු නිසා, පාවුලු ඔහු දේව
මාලිගාවට කැඳවා ගනෙ යන්නට ඇතැ යි සිතූ
බැවිනි. 30 එවිට මුළු නුවර කැළඹිණි; ජනකාය
එකාවන් ව දිව අවුත්, පාවුලු අල්ලා ගනෙ දේව
මාලිගාවනේ පිටතට ඇදදැමූ හ. එකණෙහෙි ම
දාෙරවල් වසා දමන ලදී. 31 ඔවුන් ඔහු මරන්නට
අදහස් කරගනෙ සිටින අතර මුළු ජරුෙසලම කැළඹී
ඇතැ යි සේනාධිපතියාට දන්වන ලදී. 32 ඔහු
එකණෙහෙි ම භේවායන් ද ශතාධිපතියන් ද කැඳවා
ගනෙ ඔවුන් වතෙට දිවී ය. ඔව්හු සේනාධිපතියා හා
භේවායන් දැක, පාවුලුට තැළීම නතර කළහ.
33 එවිට සේනාධිපතියා ළං වී ඔහු අල්ලා, දම්වැල්
දකෙකින් බඳින්නට අණ කාෙට, “මාෙහු කවරකේ ද?
කුමක් කළෙේ දැ”යි විචාළේ ය. 34 එවිට සමූහයා
අතර සමහරකේ එකක් ද තවත් සමහරකේ
අනකෙක් ද මාෙරගසා කී හ. මේ කාෝලාහලය නිසා
ඇත්ත නැත්ත දැනගන්නට ඔහුට බැරි වූයනේ, පාවුලු
බලකාෙටුවට ගනෙ යන්නට ඔහු අණ කළෙේ ය.
35 පාවුලු එහි තිබුණු පඩි පළෙ උඩට පැමිණි කල,
සමූහයාගේ බලහත්කාරකම නිසා භේවායන්ට ඔහු
උසුලා ගනෙ යන්නට සිදු විය. 36 මන්ද, “මාෙහු
මරාදමන්නැ”යි මාෙරගසමින් ජනකාය ඔවුන්
පස්සනේ ගියහ.

### පාවුලුගේ පිළිතුර

37 පාවුලු බලකාෙටුව ඇතුළට ගනෙයනු ලබද්දී,
“ඔබට වචනයක් කීමට අවසර ඇද්දැ”යි ඔහු
සේනාධිපතියාගනේ ඇසී ය. එවිට සේනාධිපතියා
“ඔබ ග්රීක් භාෂාව දන්නහෙි ද? 38 එසේ නම් මෑත
දී කැරැල්ලක් ඇති කර, ත්රස්තවාදීන් සාරදහසක්
වනයට ගනෙ ගිය මිසර ජාතිකයා ඔබ නාෙවේ
දැ”යි ඇසී ය. 39 එහතේ පාවුලු පිළිතුරු දමේින්, “මම
නම් සත්කීර්තිමත් නුවරක් වන සිලිසියාවේ
තාර්සස්හි ජුදවේවකේමි. සනෙඟ අමතා කතා කිරීමට
අවසර දනෙ ලසෙ ඔබගනේ ඉල්ලමි”යි කී ය. 40 ඔහු
අවසර දුන් කල, පාවුලු පඩි පළෙ මත්තේ සිට
සනෙඟට අතින් සංඥා කළෙේ ය. මහා
නිශ්ශබ්දතාවයක් ඇති විය. ඔහු හබේ්රවේ
භාෂාවනේ ඔවුන් අමතා,

22 “සහාෙදරයනෙි, පියවරුනි, දැන් ඉතින් මාගේ
නිදහසට මා කියන කරුණුවලට සවන්
දනේනැ”යි කී ය. 2 ඔහු හබේ්රවේ භාෂාවනේ කතා
කරන බව ඔවුන්ට ඇසුණ විට ඔව්හු වඩාත්
නිශ්ශබ්ද වූ හ. එවිට පාවුලු කතා කාෙට මසෙේ කී
ය: 3 ක්රියා 5:34-39“මම සිලිසියාවේ තාර්සස්හි
උපන් ජුදවේවකේමි, එහතේ මේ නුවර ඇතිදැඩි වී,
පියවරුන්ගේ ව්යවස්ථාවේ නියම පිළිවළෙේ හැටියට
ගමාලියලේගේ පාමුල ඉගනෙීම ලැබ, අද ඔබ
සියල්ලන් සිටින්නාක් මනේ මමත් දවියන් වහන්සේ
ගැන බැති සිතින් සිටියමේ; 4 ක්රියා 8:3; 26:9-11මේ
ධර්ම මාර්ගයට අයිති වූවනට මැරනෙ තුරු පීඩා
කළෙමේ; 5 පුරුෂයන් ද ස්ත්රීන් ද අත්අඩංගුවට
ගනෙ හිරගවෙලට භාර දුනිමි. ඒ ගැන උත්තම
පූජකයා ද මුළු මන්ත්රණ සභාව ද මට සාක්ෂි දරති.
ඔවුන්ගනේ ද දමස්කයේ ජුදවේ සහාෙදරයන්ට ලියුම්

ලබාගෙන එහි සිටි අයටත් දඬුවම් කරන පිණිස
ඔවුන් බැඳ ජෙරුසලමට ගෙනෙන්නට මම එහි
ගියෙමි.”

### සිය හැරීම ගැන පාවුලුගේ විස්තරය
(ක්‍රියා 9:1-19;26:12-18)

6 “මා ගමන් කරමින් දමස්කයට ළං වූ කල, ඉර
මුදුන් වේලාව පමණේ දී හදිසියෙන් අහසින්
අතිදීප්තිමත් ආලෝකයක් මා වටකර බැබළිණි.
7 මම බිම වැටුණෙමි. එවිට, ‘සාවුල්, සාවුල්, ඔබ මට
පීඩා කරන්නේ මන්දැ’යි කියන හඬක් ඇසුණි. 8 මම
ද ‘ස්වාමීනි, ඔබ කවරෙක් දැ’යි ඇසීමි. ‘මම නම් නුඹ
පීඩා කරන නාසරත්හි ජේසුස් ය’යි උන් වහන්සේ
මට වදාළ සේක. 9 මා සමඟ සිටි අය ආලෝකය
දුටුවෝ ය. එහෙත් මට කතා කළ තැනැන්
වහන්සේගේ හඬ ඔවුනට ඇසුණේ නැත.
10 ‘ස්වාමීනි, මම කුමක් කරම් දැ’යි මම ඇසීමි.
සමිඳාණන් වහන්සේ මට කතා කොට, ‘නැඟිට
දමස්කයට යන්න; දෙවියන් වහන්සේ නියම කර
ඇති අන්දමට ඔබ කළ යුතු සියල්ල ඔබට එහි දී
දන්වනු ලැබේ ය’යි වදාළ සේක. 11 ඒ ආලෝකයේ
උද්දීප්තිය නිසා මාගේ ඇස් නොපෙනී ගියේ ය.
එබැවින් මාගේ සහචරයෝ මා අතින් අල්ලා ගෙන
දමස්කයට ගෙන ගියහ.
12 “ව්‍යවස්ථාවලිය මනා සේ පිළිපැද්ද, එසේ ම
එහි වසන සියලු ජුදෙව්වරුන්ගේ ප්‍රසාදය දිනා ගත්
අනනියස් නම් මනුෂ්‍යයෙක් මා වෙත අවුත්,
13 ‘සහෝදර සාවුල්, පෙනීම ලබන්නැ’යි මට කී ය.
මම ද එවේලේ ම පෙනීම ලැබ ඔහු දෙස බැලීමි.
14 ඔහු කතා කොට, ‘අපේ පියවරුන්ගේ දෙවියන්
වහන්සේ තමන් වහන්සේගේ කැමැත්ත
දැනගන්නටත්, ධර්මිෂ්ඨයාණන් දකින්නටත්, උන්
වහන්සේගේ මුඛයෙන් වචනය අසන්නටත් ඔබ
තෝරා ගත් සේක. 15 මන්ද, ඔබ ඇසූ දුටු දේ ගැන
සියලු මනුෂ්‍යයන්ට ඔබ උන් වහන්සේගේ
සාක්ෂිකාරයෙක් වන්නෙහි ය. 16 ඉදින් පමා වන්නේ
මන් ද? නැඟිට උන් වහන්සේගේ නාමයෙන් යාච්ඤා
කරමින්, බව්තීස්ම-ස්නාපනය ලැබ, ඔබේ පව් සෝදා
හරින්නැ’යි කී ය.”

### විජාතීන් වෙත යවනු ලැබීම

17 “තවද මම ජෙරුසලමට හැරී අවුත් දේව
මාලිගාවේ දී ධ්‍යානශීලී ව යාච්ඤා කරමින් සිටිය දී
දර්ශනයක් දුටිමි. 18 උන් වහන්සේ මට දර්ශනය වී:
‘මා ගැන ඔබේ සාක්ෂිය ඔවුන් නොපිළිගන්නා
බැවින් පමා නොවී ජෙරුසලමෙන් යන්නැ’යි මට වදාළ
සේක. 19 එකල මම කතා කොට, ‘ස්වාමීනි, මා
ධර්මශාලාවලට ගොස් ඔබ අදහාගත්තවුන්
අත්අඬංගුවට ගෙන ඔවුන්ට තැළූ බව කවුරුත් දනිති.
20 ක්‍රියා 7:58ඔබගේ සාක්ෂිකාර වූ ස්තේපන් මරනු
ලැබූ කල, මමත් ළඟ සිට, එය අනුමත කරමින් ඔහු
මැරුවන්ගේ වස්ත්‍ර බලාගත්තෙමි’යි කීවෙමි.
21 එවිට උන් වහන්සේ මට කතා කොට, ‘යන්න,
මම ඔබ බොහෝ ඈත, විජාතීන් වෙත යවන්නෙමි’යි
වදාළ සේකැ’යි පැවසී ය.
22 ඔහු මෙයෙ කියන තෙක් ඔව්හු සවන් දුන්හ;
ඉන්පසු ඔව්හු “මෙවැන්නෙකු නැත්තට ම නැති
කරන්න! මොහු ජීවත් විය යුතු නැතැ”යි මොරගැසූ
හ. 23 ඔව්හු කෑගසමින්, තමන්ගේ උතුරු සළු ගලවා
උඩ වීසි කරමින් ධූලි ඉහළට දමමින් සිටියෝ ය.
24 එබැවින් සේනාධිපතියා ඔහු බලකොටුවට ගෙන
යන්නට අණ කොට, කුමන කාරණයක් නිසා ඔව්හු
ඔහුට විරුද්ධ ව එසේ මොරගැසුවෝ දැ යි දැන
ගන්නා පිණිස, ඔහුට කසයෙන් තළා විභාග
කරන්නට නියම කළේ ය. 25 එහෙත් කසයෙන්
තැළීම සඳහා ඔවුන් ඔහු බැන්ද විට පාවුලු කතා
කොට, “රෝම පුරවැසියකු විනිශ්චය නොකොට
ඔහුට කසයෙන් තළවන්නට ඔබට නීතියෙන් බලයක්
තිබේ දැ”යි ළඟ සිටි ශතාධිපතියාට කී ය.
26 ශතාධිපතියා ඒ අසා, සේනාධිපතියා ළඟට ගොස්,
“ඔබ කුමක් කරන්නට යන්නෙහි ද? මේ මනුෂ්‍යයා
රෝම පුරවැසියෙකැ”යි කී ය. 27 එවිට
සේනාධිපතියා අවුත්, “ඔබ රෝම පුරවැසියෙක් දැ”යි
ඔහුගෙන් ඇසී ය. “එසේ ය”යි පාවුලු කී ය.
28 සේනාධිපතියා, “මම බොහෝ මිල දී මේ
පුරවැසිකම ලබා ගතිමි”යි කී ය. පාවුලු ද “මම
උත්පත්තියෙන් ම රෝම පුරවැසියෙක්මි”යි කී ය.
29 ඔහු විභාග කරන්නට සිටි අය එවේලේ ම ඔහු
වෙතින් අහක් ව ගියහ. පාවුලු රෝම පුරවැසියකු
බව දැන ගත් කල සේනාධිපතියා ඔහු බැඳ තැබීම
ගැන බියට පත් විය.

### පාවුලු ජුදෙව් මන්ත්‍රණ සභාව ඉදිරිපිට සිටීම

30 පසුවදා ජුදෙව්වරුන් කුමන කාරණයක් ගැන
පාවුලුට වරද තබත් දැ යි හරියාකාර දැනගන්න
සේනාධිපතියා කැමැති විය. එබැවින් ඔහු පාවුලු
මුදා, නායක පූජකයන් සහ මුළු මන්ත්‍රණ සභාව
රැස් කරවා ඔවුන් ඉදිරියට කැඳෙව්වේ ය.
23 පාවුලු ඉතා ඕනෑකමින් මන්ත්‍රණ සභාව
දෙස නෙතේ යොමා, “සහෝදරයෙනි, මම අද
දක්වා දෙවියන් වහන්සේ ඉදිරියෙහි නිදොස් හෘදය
සාක්ෂියක් ඇති ව හැසුරුණෙමි”යි කී ය. 2 එවිට
උත්තම පූජක අනනියස් ඔහුගේ කටට ගසන ලෙස
ළඟ සිටියවුනට අණ කළේ ය. 3 මතෙ
23:27-28එවිට පාවුලු, “කරෝටිකයෙකු වූ ඔබට
දෙවියන් වහන්සේ පහර දෙනු ඇත. ව්‍යවස්ථාව
අනුව මා විනිශ්චය කිරීමට වාඩි වී සිටින ඔබ
ව්‍යවස්ථාවට විරුද්ධ ව මට පහර දෙන්නට අණ
කරන්නෙහි දැ”යි ඇසී ය. 4 එවිට ළඟ සිටි අය, “ඔබ
දෙවියන් වහන්සේගේ උත්තම පූජකයාට අපහාස
කරන්නෙහි දැ”යි ඇසූ හ. 5 නික්ම 22:28පාවුලු ද
“සහෝදරවරුනි, ඔහු උත්තම පූජකයාණන් බව මම
නොදැන සිටියෙමි. මන්ද, ‘ඔබේ සෙනඟගේ
ප්‍රධානියා ගැන අපවාද නොකියන්නැ’යි ලියා තිබේ
ය”යි කී ය.

6 ක්රියා 26:5; පිලිප් 3:5 සනෙඟගනේ එක්
කොටසක් සද්දූසිවරුන් ද අනකේ කොටස පරිසිවරුන්
ද බව පාවුලු දැක, මන්ත්රණ සභාවහෙි මොරගසා,
“සහෝදරයනි, මම පරිසියකේමි, පරිසිවරුන්ගේ
පුත්රයකේමි. මළවුන් උත්ථාන වීමේ
බලාපොරොත්තුව ගැන මම විනිශ්චයාසනය
ඉදිරියහෙි සිටිමි”යි කී ය. 7 ඔහු මසෙේ කී කණෙහෙි
ම, පරිසිවරුන් හා සද්දූසිවරුන් අතර භේදයක් පැන
නැඟුණි. රුස් ව සිටි අය දපෙිලකට බදුෙණාහ.
8 මතෙ 22:23; මාක් 12:18; ලූක් 20:27මන්ද,
සද්දූසිවරු පුනරුජ්ජීවනයක් වත්, දේව දූතයන් වත්,
ආත්මයක් වත් නැතැ යි කී නමුත් පරිසිවරු ඒ තුන ම
ඇතැ යි කී හ. 9 එවිට කලබලය වඩාත් උග්ර විය.
පරිසිවරුන්ගේ පක්ෂයේ විනයධරයන්ගනේ
සමහරකේ නැඟිට තරයේ විරෝධය පාමින්: “මේ
මිනිසා අත කිසි නපුරක් අපට නොපනෙේ. සමහර
විට ආත්මයක් හෝ දේව දූතයකේ හෝ ඔහුට කතා
කරන්නට ඇතැ”යි කී හ.
10 එවිට භේදය වඩාත් වේගවත් විය. ඔවුන්
පාවුලු කැබැලි කොට ඉරාදමනු ඇතැ යි
සේනාධිපතියා බිය වී, භේවායන්ට කතා කොට,
ඔවුන් වතෙින් ඔහු පැහැර ගනෙ බලකොටුවට ගනෙ
යාමට අණ කළෙේ ය.
11 එදා රාත්රියේ සමිඳාණන් වහන්සේ පාවුලු ළඟ
සිට, “ධරෛයවත් වන්නේ ඔබ ජරුසෙලමේ දී මා
ගැන සාක්ෂි දුන් සේ ම, රෝමයේ දීත් සාක්ෂි දිය
යුතු ය”යි වදාළ සේක.

## පාවුලු නැසීමට කුමන්ත්රණයක්

12 පහන් වූ කල ජුදවේවරු කුමන්ත්රණයක් කර,
පාවුලු මරනතුරු නොකා නොබී සිටීමට දිවුරුමකින්
බැඳුණෝ ය. 13 මේ කුමන්ත්රණය කළ අය
සතළිස්දනෙකුෙට වැඩි වූ හ. 14 ඔව්හු නායක
පූජකයන් ද ප්රජා මූලිකයන් ද ළඟට ගොස්, “පාවුලු
මරනතුරු අපි කිසිවක් කටේ නොතියන්නට තද
දිවුරුමකින් බැඳී සිටිමු. 15 එබැවින් ඔබ මන්ත්රණ
සභාව සමඟ, ඔහු පිළිබඳ තතු වඩා හරි ලසෙ
වගවිභාග කරන්නට යන්නාක් මනේ, හටෙ ඔබ
වතෙට ඔහු ගනෙනෙ ලසෙ සේනාධිපතියාට දන්වා
හරින්න. ඔහු මතෙනට පැමිණනේනට පරෙ අපි ඔහු
මරන්නට සූදානම් කරමු”යි කී හ.
16 ඔවුන්ගේ ඒ උපාය ගැන ඇසූ පාවුලුගේ
සහෝදරීගේ පුත්රයා අවුත්, බලකොටුවට ඇතුළු වී,
පාවුලුට එපවත් සැළ කළෙේ ය. 17 එවිට පාවුලු
ශතාධිපතියන්ගනේ කනෙකුෙ කැඳවා, “මේ තරුණයා
ප්රධාන සේනාධිපතියා ළඟට ගනෙ යන්න; ඔහුට
දැන්විය යුතු යම් කාරණයක් ඇතැ”යි කී ය. 18 එවිට
ඔහු සේනාධිපතියා ළඟට තරුණයා ගනෙ ගොස්:
“පාවුලු නම් හිරකරුවා මා කැඳවා, ඔබට දන්වන්නට
කාරණයක් ඇති හයෙින් මේ තරුණයා ඔබ වතෙ
ගනෙනේනට මාගනේ ඉල්ලුවේ ය”යි කී ය. 19 එකල
සේනාධිපතියා ඔහු අතින් අල්ලා ගනෙ පසකෙට
ගොස්, “මට දන්වන්නට තිබනෙ කාරණය කුමක්
දැ”යි ඇසී ය. 20 ඔහු කතා කොට, “පාවුලු ගැන
මන්ත්රණ සභාව වැඩිදුරටත් වගවිභාග කරන්නට
යන්නාක් මනේ, ඔහු හටෙ සභාවට ගනෙනෙ ලසෙ
ජුදවේවරු ඔබගනේ ඉල්ලීමට නියම කරගනෙ සිටිති.
21 එහතේ ඔවුන්ගේ කැමැත්තට ඉඩ නුදුන මැනවි.
මන්ද, ඔවුන්ගනේ හතළිහකට වැඩි ගණනක් ඔහු
මරනතුරු නොකා නොබී සිටීමට දිවුරුමකින් බැඳී
සැඟවී, බලා ගනෙ සිටිති. දැන් ඔව්හු සූදානම් ව ඔබ
තීරණය දනෙ තකේ බලා සිටිති”යි කී හ. 22 එවිට
සේනාධිපතියා, “ඔබ මේ දේවල් මට දැන් වූ බව
කිසිවකුෙට නොකියන්න”යි අණ කොට තරුණයා
යන්නට හැරියේ ය.

## පාවුලු ආණ්ඩුකාරයා වතෙ යවනු ලැබීම

23 ඉක්බිති ඔහු ශතාධිපතීන් දදෙනෙකුෙ කැඳවා,
“කායිසාරිය දක්වා යන පිණිස භේවායන් දසෙියයක්
ද අසරුවන් සැත්තෑවක් ද කුන්තධරයන් දසෙියයක් ද
රෑ නවයට සූදානම් කරන්නැ”යි කී ය. 24 ෆීලික්ස්
නම් ආණ්ඩුකාරයා වතෙ ප්රවේසමනේ පාවුලු ගනෙ
යන පිණිස අශ්වයන් සපයා තබන්නට ද අණ කළෙේ
ය. 25 තවද, ඔහු මසෙේ ලිපියක් ලීවේ ය:
26 “ක්ලෞඩියස් ලිසියස්, ශ්රීමත් ෆීලික්ස් නම්
ආණ්ඩුකාරයාණන්ට සුබ පතමින් ලියා එවන වග
නම්: 27 ජුදවේවරුන් මේ මනුෂ්යයා අල්ලා මරන්නට
තැත් කළ විට, ඔහු රෝම පුරවැසියකුෙ බව දැන
ගනෙ, මම භේවායන් සමඟ ගොස් ඔහු මුදා ගතිමි.
28 ඔවුන් ඔහුට විරුද්ධ ව කළ චෝදනා දැන ගන්නා
පිණිස, ඔවුන්ගේ මන්ත්රණ සභාවට ඔහු ගනෙ
ගියමේ. 29 එවිට ඔවුන්ගේ ව්යවස්ථාවලියේ ප්රශ්න
ගැන ඔහුට වැරදි තබන බව මිස, මරණයට වත්,
සිරගත කිරීමට වත් සුදුසු කිසිවක් ගැන ඔහුට
චෝදනා නොකළ බව දැන ගතිමි. 30 එහතේ ඒ
මනුෂ්යයාට විරුද්ධ ව කූට උපායක් යොදන්නට යන
බව මට දන්වනු ලැබූ බැවින් එවලේේ ම ඔහු ඔබ
වතෙට එවා, ඔහුට විරුද්ධ ව ඇති චෝදනා ඔබ
ඉදිරියේ තබන්නට පැමිණිලිකරුවන්ට අණ කළෙමේ.”
31 මසෙේ භේවායන්ට අණ කළ ලසෙ ඔව්හු
පාවුලු රුගනෙ එම රාත්රියේ ම අන්තිපත්රිසයට
ගියහ. 32 පසුවදා අසරුවන් ඔහු සමඟ යන්නට හැර,
භේවායෝ බලකොටුවට හැරී ආහ. 33 අසරුවෝ
කායිසාරියට අවුත් ලිපියත් සමඟ, පාවුලු
ආණ්ඩුකාරයාට භාර දුන්හ. 34 එවිට ඔහු ඒ ලිපිය
කියවා, පාවුලු කොයි පළාතේ කනෙකේ දැ යි අසා,
සිලිසියාවේ තැනැත්තකුෙ බව දැන ගත් විට,
35 “ඔබේ පැමිණිලිකරුවන් පැමිණි විට ඔබට
කියන්නට ඇති දේ අසමි”යි කියා හරෙොද්ගේ
මාලිගාවේ ඔහු රුකවලහෙි තබන්නට අණ කළෙේ
ය.

## පාවුලුට විරුද්ධ ව චෝදනා

24 පස් දවසකට පසු උත්තම පූජක අනනියස්,
සමහර ප්රජා මූලිකයන් ද තරේතුලස් නම්
එක්තරා අධි නීතිඥයකුෙ සමඟ අවුත් පාවුලුට

විරුද්ධ ව ආණ්ඩුකාරයාට පැමිණිලි කළේ ය. 2 ඔහු
කැඳවනු ලැබූ කල, තරේතුලස් පාවුලුට විරුද්ධ ව
පැමිණිලි දේශනය මෙසේ අරඹමින්:
2 “ශ්‍රීමත් ෆීලික්ස් තුමනි, ඔබ තුමන් නිසා අපට
ස්ථිරසාර සාම යුගයක් ද ඔබගේ දූරදර්ශී
පාලනයෙන් මේ ජාතිය උදෙසා ප්‍රතිසංස්කරණ
යුගයක් ද පහළ වී ඇති බව, 3 සෑම විට ම, සෑම
තැන්හි ම, සියලු අයුරින් කෘතඥතාපූර්වක ව අපි
පිළිගනිමු. 4 එහෙත් ඔබ තවදුරටත් පමා නොකර,
මා ලුහුඬින් කියන දේ කරුණාවෙන් අසන ලෙස
අයැදිමි. 5 මන්ද, මේ මිනිසා කරදරකාරයෙකු බව ද
ලොව පුරා සියලු ජුදෙව්වරුන් අතර කැරලි
උපදවන්නෙකු බව ද නාසරීයයන්ගේ නිකායේ
කැරලිනායකයෙකු බව ද දැනගතිමු. 6 මොහු දේව
මාලිගාව කලෙසෙන්නටත් උත්සාහ කළේ ය.
එහෙත් අපි ඔහු අල්ලා ගතිමු. අපගේ ම ව්‍යවස්ථාව
අනුව ඔහු විනිශ්චය කිරීම අපගේ තීරණය විය.
7 එහෙත් ප්‍රධාන සේනාධිපතියා වන ලිසියස් අවුත්
මහත් බලහත්කාරයෙන් ඔහු පැහැර ගෙන, 8 ඔහුට
වරද තබන පිණිස ඔබ වෙතට ඒමට අණ කළේ ය.
අප මොහුට විරුද්ධ ව ගෙනෙන පැමිණිලි සියල්ල
ගැන මොහුගෙන් ම විචාරා දැනගන්නට ඔබට
පුළුවනැ”යි කී ය. 9 ජුදෙව්වරු ද ඊට එකඟ ව
පැමිණිලි කරමින්, “ඒ සියල්ල සැබෑ ය”යි සම්මත
කළහ.

## ෆීලික්ස් ඉදිරියේ පාවුලුගේ පිළිතුර

10 කතා කරන පිණිස ආණ්ඩුකාරයා පාවුලුට සංඥා
කළ කල්හි ඔහු මෙසේ පිළිතුරු දුනි: “ඔබ බොහෝ
අවුරුදු ගණනක් මේ ජනතාවට විනිශ්චයකාරයෙකු ව
සිටින බව මම දනිමි. එබැවින් මාගේ නිදහස ගැන
මා උත්තර දෙන්නේ ඉතා සතුටිනි. 11 නමස්කාරය
පිණිස මා ජෙරුසලමට ගොස් දැනට දොළොස්
දවසකට වඩා නැති බව ඔබට ම දැන ගත හැකි ය.
12 දේව මාලිගාවේ දී වත්, ධර්මශාලාවල දී වත්,
නගරයේ දී වත්, කිසි කෙනෙකු සමඟ මා වාද
කරනවා හෝ සෙනඟ කලබල කරනවා හෝ ඔව්හු
නුදුටුවෝ ය. 13 ඔවුන් දැන් මා පිට තබන වරද
ඔප්පු කරන්නට ඔවුන්ට නොහැකි ය. 14 එහෙත් ඔබ
ඉදිරියෙහි දැන් මා කියන්නට යන මේ දේ එනම්,
නිකායක් යයි ඔවුන් සලකන ධර්ම මාර්ගය මම
තරයේ පිළිගනිමි: ව්‍යවස්ථාවලියේ හා දිවැසාවලියේ
ලියා තිබෙන සියල්ල විශ්වාස කරමින් අපේ
පියවරුන්ගේ දෙවියන් වහන්සේට සේවය කරමි.
15 මා මෙසේ විශ්වාස කරන බැවින් දමිටුන්ගේ ද
අදමිටුන්ගේ ද පුනරුජ්ජීවනයක් ඇතැ යි මොවුන්
බලාසිටින්නාක් මෙන්, මමත් බලාපොරොත්තුවෙන්
සිටිමි. 16 ඒ නිසා මමත් ඔවුන් මෙන් ම දෙවියන්
වහන්සේ හා මනුෂ්‍යයන් ඉදිරියෙහි නිදොස් හෘදය
සාක්ෂියක් ඇති ව සිටින්නට ද නිතර ම උත්සහ
කරමි.

17 ක්‍රියා 21:17-28 “අවුරුදු කීපයකට පසු මාගේ
සෙනඟට සම්මාදම් බාර දී පූජා පවත්වනු සඳහා
මෙහි ආවෙමි. 18 මේ සම්බන්ධයෙන් ඔවුන් දේව
මාලිගාවේ දී මා දුටුවේ මා පවිත්‍ර කිරීමේ පිළිවෙත
ඉටු කළායින් පසුව ය. එහි මා සමඟ සෙනඟක්
සිටියේ නැත; කලබලයක් ද නොතිබිණි. එහෙත්
ආසියාවෙන් පැමිණි සමහර ජුදෙව්වරු එහි සිටියෝ
ය. 19 මට විරුද්ධ ව යමක් තිබුණා නම්, මට
දෝෂාරෝපණය කරන පිණිස මෙහි ඔබ ඉදිරියට
ඒම ඔවුන්ගේ යුතුකම ය. 20+ACT ක්‍රියා
23:6නැතහොත්, මා මන්ත්‍රණ සභාව ඉදිරියේ
කුමන අපරාධයක් කළේ දැ යි මෙහි සිටින මොවුහු
කියත් වා. ඔවුන් ඉදිරියේ මා කියා ඇත්තේ එක ම
එක දෙයෙයි. එනම්, ‘මළවුන්ගේ උත්ථාන වීම මා
අදහන නිසා අද ඔබ විසින් විනිශ්චය කරනු ලබමි’
“යි යනු යි.
22 එහෙත් ෆීලික්ස් ඒ ධර්ම මාර්ගය ගැන කාරණා
මැනවින් දැන සිටි බැවින්, “ලිසියස් නම්
සේනාධිපතියා ආ කල ඔබගේ නඩුව තීන්දු
කරන්නෙමි”යි කියා නඩුව කල් දැමී ය. 23 තවද
පාවුලු රැකවලෙහි තබන්නටත් ඔහුට තරමක
නිදහසක් දෙන්නටත්, ඔහුගේ මිත්‍රයන් ඔහුට
උපස්ථාන කිරීම තහනම් නොකරන්නටත්
ශතාධිපතියාට ඔහු අණ කළේ ය.
24 කීප දවසකට පසු ෆීලික්ස් ජුදෙව් ස්ත්‍රියක වූ
ඩෘසිල්ලා නම් තම භාර්යාව සමඟ අවුත් පාවුලු
ගෙන්වා, ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ කෙරෙහි ඇති
ඇදහිල්ල ගැන ඔහු කතා කරනු ඇසී ය. 25 පාවුලු,
සුචරිතය ගැන ද ආත්ම දමනය ගැන ද මතු
පැමිණෙන විනිශ්චය ගැන ද කතා කරද්දී ෆීලික්ස්
බියපත් ව, “දැනට යන්න, මට ඉඩ ප්‍රස්ථාවක්
ලැබුණු විට ඔබ නැවත කැඳවන්නෙමි”යි කී ය. 26 ඒ
ඇරත් තමාට පාවුලු මුදල් දෙනවා ඇතැ යි ඔහු
බලාපොරොත්තුවෙන් සිටියේ ය. ඒ නිසා පාවුලු
නැවත නැවත කැඳවා ඔහු සමඟ කතා කළේ ය.
27 එහෙත් දෑවුරුද්දක් ගත වූ පසු, ෆීලික්ස්ගේ
නිලයට පෝර්කියුස් ෆෙස්තුස් පත් කරන ලදී.
ෆීලික්ස් වනාහි ජුදෙව්වරුන් සතුටු කරන්නට කැමැති
ව, පාවුලු හිරබාරයෙහි තබා ගියේ ය.

## පාවුලු සීසර් අගරජුගේ විනිශ්චය ඉල්ලා සිටීම

25 ෆෙස්තුස් ඒ පළාතට පැමිණ තුන් දවසක්
ගත වූ පසු කායිසාරියේ සිට ජෙරුසලමට
ගියේ ය. 2 නායක පූජකයෝ ද ජුදෙව්වරුන්ගේ
ප්‍රධානීහු ද පාවුලුට විරුද්ධ ව ෆෙස්තුස්ට පැමිණිලි
කළහ. 3 තමන්ට විශේෂ සැලකිලි දැක්වීමක්
වශයෙන් පාවුලු ජෙරුසලමට යවන ලෙස ඔව්හු
ෆෙස්තුස්ගෙන් ඉල්ලූ හ. එසේ කළේ ඔවුන්
මාර්ගයේ රැක සිට ඔහු මැරීමට උපායක් යෙදූ
බැවිනි. 4 එහෙත් ෆෙස්තුස් උත්තර දෙමින්, “පාවුලු
කායිසාරියේ සිරභාරයේ සිටින බවත්, තමා ද
ඉක්මනින් එහි යන්නට අදහස් කරන බවත් කී ය.
5 එහෙයින් ඔබ අතර සැලකිය යුතු අය, මා සමඟ

ගොස් ඒ මනුෂ්යයා අත යම් වරදක් ඇත්නම්, ඔහුට
විරුද්ධ ව චෝදනා කරත් වා"යි කී ය.
6 ඔහු ඔවුන් අතරෙහි දවස් අටක් හෝ දහයක්
හෝ පමණ නතර වී, කායිසාරියට ගොස් පසුවදා
විනිශ්චයාසනයෙහි හිඳ පාවුලු ගෙනෙන්නට අණ
කළේ ය. 7 ඔහු ආ කල, ජරුසලමෙන් පැමිණි
ජුදවේවරු පාවුලු වටකර සිට ඔහුට විරුද්ධ ව, ඔප්පු
කළ නොහැකි, බරපතල වූ බොහෝ චෝදනා
ඉදිරිපත් කළහ. 8 පාවුලු තමාගේ නිදහසට උත්තර
දමින්, "මම ජුදවේවරුන්ගේ ව්යවස්ථාවලියට වත්,
දේව මාලිගාවට වත්, සීසර් අධිරාජයාට වත් විරුද්ධ
ව කිසි වරදක් නොකළෙමි"යි කී ය. 9 එහෙත්
ෆෙස්තුස් ජුදවේවරුන් සතුටු කරන අදහසින් පාවුලුට
කතා කොට, "ඔබ ජරුසලමට ගොස්, එහි දී මේ
චෝදනා ගැන මා ඉදිරියෙහි විනිශ්චය කරනු
ලබන්නට කැමැත්තෙහි දැ"යි ඇසී ය. 10 එහෙත්
පාවුලු, "මම සීසර් අධිරාජයාගේ විනිශ්චයාසනය
ඉදිරියෙහි සිටිමි; මා විනිශ්චය කළ යුත්තේ මෙහි දී
ය. ජුදවේවරුන්ට මා කිසි වරදක් කළේ නැත; ඒ
බව ඔබටත් හොඳාකාර පෙනේ යනු ඇත. 11 ඉදින්
මම වරදකාරයෙක් නම්, මරණයට සුදුසු යමක් මා
කර තිබේ නම්, මා මරණ දඬුවමින් මුදන ලෙස
නො ඉල්ලමි. එහෙත් මොවුන් මට තබන
චෝදනාවල කිසි සත්යයක් නැත්නම්, මා ඔවුන් අතට
පාවා දීමට කිසිවකුට බැරි ය. මම සීසර්
අධිරාජයාගේ විනිශ්චය ඉල්ලමි"යි කී ය. 12 එවිට
ෆෙස්තුස් උපදේශක මණ්ඩලය සමඟ සාකච්ඡා
කොට, "ඔබ සීසර් අධිරාජයාගේ විනිශ්චය
ඉල්ලුවෙහි ය. ඔබ සීසර් අධිරාජයා වෙත යන්නෙහි
ය"යි පාවුලුට කී ය.

## අග්රිපා රජ සහ බර්නිස් ඉදිරියෙහි

13 කීප දවසකට පසු අග්රිපා රජ ද බර්නිස් ද
ෆෙස්තුස්ට ආචාර කරන පිණිස කායිසාරියට පැමිණිය
හ. 14 ඔවුන් බොහෝ දවස් එහි නැවතී සිටිය දී
ෆෙස්තුස් පාවුලු පිළිබඳ කාරණය රජුට දන්වමින්,
"ෆීලික්ස් නිදහස් නොකර ගිය එක් සිරකරුවෙක්
මෙහි සිටියි. 15 මා ජරුසලමට ගිය විට නායක
පූජකයෝ ද ජුදවේවන්ගේ සභා මූලිකයෝ ද ඔහු
ගැන මට චෝදනා කරමින්, ඔහු වරදකරුවෙකු යි
තීන්දු කරන ලෙස මගෙන් ඉල්ලූ හ. 16 මම ඔවුන්ට
පිළිතුරු දමින්, 'පැමිණිලිකරුවන් ඉදිරියෙහි තම
චෝදනා ගැන උත්තර දීම හා තම නිදහසට කරුණු
ඉදිරිපත් කිරීමක් නැති ව, කිසි ම වරදකරුවකු පාවා
දීම රෝමවරුන්ගේ සම්ප්රදායයක් නොවේ ය'යි
කීවෙමි. 17 එහෙයින් ඔවුන් මෙහි රැස් වූ කල මම
නොපමා ව පසුදා විනිශ්චයාසනයෙහි හිඳ ඒ මිනිසා
ගෙනෙන්නට අණ කළෙමි. 18 එහෙත් ඔහුගේ
පැමිණිලිකරුවෝ, මා සිතූ අන්දමේ කිසි වරදක් ඔහු
පිට නොතැබූ හ. 19 ඔහුට විරුද්ධ ව ඔවුන් ඉදිරිපත්
කළේ තම ආගම ගැනත්, ජේසුස් නම් මළගිය
කෙනෙකු යළි ජීවත් ව සිටිති යි යන පාවුලුගේ කීම
ගැනත් විවාද සමහරක් පමණකි. 20 මේ දේවල්
ගැන විභාග කරන්නේ කෙසේ දැ යි සිතින් වියවුල්
වූ මම, ජරුසලමට ගොස්, එහි දී මේ කාරණා ගැන
විනිශ්චය කරනු ලබන්නට කැමැති දැ යි ඔහුගෙන්
ඇසුවෙමි. 21 එහෙත් අධිරාජයාගේ තීරණයට නඩුව
ඉදිරිපත් කරන මෙන් පාවුලු ඉල්ලූ විට, ඔහු සීසර්
අධිරාජයා ළඟට යන තුරු රැකවලෙහි තැබීමට මම
අණ කළෙමි"යි කී ය. 22 එවිට අග්රිපා: "මමත් ඒ
මනුෂ්යයා කතා කරනවා අසන්නට කැමැත්තෙමි"යි
ෆෙස්තුස්ට කී ය. "හෙට ඔබට අසන්නට ලැබේ ය"යි
ඔහු පිළිතුරු දුනි.
23 එසේ පසුවදා අග්රිපා ද බර්නිස් ද මහත්
හරසරින් අවුත් ප්රධාන සේනාධිපතීන් හා නුවර
ප්රභූන් හා සමඟ නඩු ශාලාවට පැමිණි කල,
ෆෙස්තුස්ගේ ආඥාවෙන් පාවුලු එහි ගෙන්වන ලදී.
24 ෆෙස්තුස් කතා කොට: "අග්රිපා රජතුමනි, මෙහි
අප සමඟ සිටින සියලු භවතුනි, මොහු තවත් ජීවත්
ව සිටින්නට නොවටනේ යයි ජරුසලමේදීත්
මෙහේදීත් ජුදවේ සමූහයා මොරගසමින් මට පැමිණිලි
කළේ ඔබට පෙනෙන මේ මිනිසා ගැන ය.
25 එහෙත් මරණ දඬුවමට සුදුසු කිසිවක් මොහු
නොකළ බව මට පෙනී ගියේ ය. ඇරත්, මොහු ම
අධිරාජයාගේ විනිශ්චය ඉල්ලූ බැවින් ඔහු එහි
යැවීමට මම නියම කළෙමි. 26 ඔහු ගැන
අධිරාජයාට ලියා යැවීමට නිසැක කිසිවක් මට නැත.
එබැවින් මේ විභාගය කළ පසු ලියා ඇරීමට යම්
යම් කරුණු මට ලැබෙන පිණිස ඔබ හැම ඉදිරියට,
විශේෂයෙන් අග්රිපා රජතුමනි, ඔබ ඉදිරියට ද ඔහු
ගෙනොවෙමි. 27 සිරකරුට විරුද්ධ ව ඇති චෝදනා
නොදන්වා ඔහු යැවීම අනුවණ ක්රියාවක් බව මට
පෙනේ ය"යි කී ය.

## අග්රිපා රජ ඉදිරිපිට පාවුලු නිදහසට කරුණු කියා පෑම

26 එවිට අග්රිපා රජු, "ඔබේ නිදහසට කරුණු
කීමට දැන් අවසර තිබේ ය"යි පාවුලුට කී ය.
එකල පාවුලු අත දිගු කොට තමාගේ නිදහසට
මෙසේ කරුණු කියා පෑවේ ය: 2 "අග්රිපා රජතුමනි,
ජුදවේවරුන් විසින් මට විරුද්ධ ව නඟන හැම
චෝදනා ගැන ම අද ඔබ ඉදිරියේ උත්තර දීමට මා
සිටින බැවින් මම භාග්යවන්තයෙකු යි සිතමි.
3 විශේෂයෙන් ම මෙසේ සිතන්නේ ජුදවේවරුන්
අතර පවතින සියලු සිරිත් ද මතභේද ද ඔබ
හොඳාකාර දන්න නිසා ය. එහෙයින් මා කියන දේට
ඉවසිල්ලෙන් සවන් දෙන මෙන් ඉල්ලමි.
4 "යොවුන් වියේ පටන් මාගේ රට වැසියන් අතර
හා ජරුසලමෙහි ද මාගේ හැසිරීම ගැන මුල පටන්
සියලු ජුදවේවරු දනිති. 5 ක්රියා 23:6; පිලිප් 3:5අපේ
ආගමේ ඉතා දැඩිතර නිකාය අනුව, මා
පරිසිවරයකු ව ජීවත් වූ බව ඔව්හු බොහෝ
කලකෙ සිට දනිති; කැමැති නම් ඔවුන්ට ඒ ගැන
සාක්ෂි දෙත හැකි ය. 6 එහෙත් දෙවියන් වහන්සේ
අපේ පියවරුන්ට දුන් පොරොන්දුව කරෙහි විශ්වාසය
තැබීම ගැන දැන් මම විනිශ්චය කරනු ලබන්නට

සිටිමි. 7 අපගේ ගෝත්‍ර දොළොස රෑ දාවල්
උද්‍යෝගිමත් ව දෙවියන් වහන්සේට නමස්කාර
කරන්නේ මේ පොරොන්දුව කෙරේ විශ්වාසයෙනි.
රජතුමනි, ජුදෙව්වරුන් මට වරද තබන්නේ මේ
බලාපොරොත්තුව නිසා ය. 8 දෙවියන් වහන්සේ
මළවුන් උත්ථාන කරන බව විශ්වාස කළ නොහැකි
යයි ඔබ අතරෙන් කිසිවකු සිතන්නේ මන් ද?
9 ක්‍රියා 8:3; 22:4-5 "නාසරතේහි ජේසුස්
වහන්සේගේ නාමයට විරුද්ධ ව බොහෝ දේ මා
විසින් කළ යුතු යයි වරක් මමත් සිතුවෙමි.
10 ජෙරුසලමේ දී මා කළේත් එයම ය. නායක
පූජකයන්ගෙන් බලය ලැබ, ඇදහූ අයගෙන් බොහෝ
දෙනෙකු සිරගෙවල දැමුවෙමි; ඔවුන් මරණ දඬුවමට
පත් කරන කල්හි ඊට එකඟ ව ඡන්දය ද දුනිමි.
11 තවද සියලු ධර්මශාලාවල දී නොයෙක් විට
ඔවුන්ට දඬුවම් කරමින්, ඔවුන් ලවා දේවාපහාස
කරවන්නට උත්සාහ කළෙමි; මම ඔවුන් ගැන
කෝපයෙන් දිළිහෙමින්, අන් නුවරවලට ද ගොස්
ඔවුන්ට පීඩා කළෙමි."

### පාවුලුගේ හැරීම ගැන පැවසීම

(ක්‍රියා 9:1-19;22:6-16)

12 "ඒ සඳහා නායක පූජකයන්ගෙන් බලය ද
අවසරය ද ලැබ, දමස්කයට මා ගමන් කරද්දී,
13 රජතුමනි, ඉර මුදුන් වේලෙහි මා ද මා සමඟ
ගියවුන් ද වට කර සූර්ය තේජසට වඩා දීප්තිමත්
එළියක් බබළනවා දුටිමි. 14 අප සියල්ලන් ම බිම
වැටුණු කල, 'සාවුල්, සාවුල්, ඔබ මට පීඩා කරන්නේ
මන් ද? කවේටට පයින් ගැසීම ඔබට අන්තරායදායක
ය'යි හෙබ්‍රෙව් භාෂාවෙන් මට කියන හඬක් ඇසිණි.
15 මම ද, 'ස්වාමීනි, ඔබ කවරෙක් දැ'යි ඇසුවෙමි.
සමිඳාණන් වහන්සේ ද; 'මම නම් ඔබ පීඩා කරන
ජේසුස් වෙමි. 16 නැඟිට කළෙන් සිටින්න. මන්ද, මා
ඔබට දර්ශනය වූයේ මේ නිසා ය. එනම්, ඔබ දුටු
දර්ශනය ගැන ද, තවත් ඔබට ප්‍රකාශ කරන්නට
යන දේවල් ගැන ද ඔබ සේවකයෙකු හා
සාක්ෂිකරුවෙකු කිරීමට ය. 17 මේ සඳහා ජුදෙව්
සෙනඟගෙන් ද විජාතීන්ගෙන් ද මම ඔබ
ගළවන්නෙමි. 18 මා අදහාගැනීමෙන් ඔවුන් පව්
කමාව ද, දෙවියන් වහන්සේගේ ම ජනතාව
අතරෙහි උරුමයක් ද ලබන පිණිස ඔවුන්
අන්ධකාරයෙන් ආලෝකයට ද, සාතන්ගේ බලයෙන්
දෙවියන් වහන්සේ වෙතට ද හැරෙන ලෙස ඔවුන්ගේ
ඇස් පැහැදවීමට ඔවුන් වෙතට ඔබ යවමි'යි වදාළ
සේක.

### පාවුලුගේ ධර්මදූත ස්ථාවරය

19 "එහයින්, අග්‍රිපා රජතුමනි, ස්වර්ගීය
දර්ශනයට අකීකරු වීම මට නොහැකි විය. 20 ක්‍රියා
9:20,28-29පළමුකොට දමස්කයේ හා ජෙරුසලමේ ද
පසුව ජුදා රට මුළුල්ලෙහි ද වැසියන්ටත්,
විජාතීන්ටත්, පසුතැවී සිත් හරවා ගෙන දෙවියන්
වහන්සේ වෙත හැරී, පසුතැවී සිත් හරවා ගත් බව
දක්වන ක්‍රියා කරන්නැ යි ප්‍රකාශ කළෙමි. 21 මේ
කාරණය නිසා ජුදෙව්වරු දේව මාලිගාවේ දී මා
අල්ලා මරන්නට තැත් කළහ. 22 එසේ වුව ද දේව
වරප්‍රසාදයෙන් අද දක්වා ලොකු කුඩා කාටත්
සාක්ෂි දෙමින් මම මෙහි සිටිමි. මා කියන්නේත්
අනාගතයේ දී සිදුවනු ඇතැ යි දිවැසිවරුන් හා
මෝසෙස් කී දේ ම ය. 23 යෙසා 42:6; 49:6; 1 කොරි
15:20එනම්, ක්‍රිස්තුන් වහන්සේ දුක් විඳින්නට ඕනෑ
බවත්, සෙනඟට හා විජාතීන්ට ආලෝකය ප්‍රකාශ
කිරීම සඳහා, සියල්ලනට පළමුවෙන් උන් වහන්සේ
මළවුන්ගෙන් උත්ථාන වන්නට ඕනෑ බවත් ය."
24 ඔහු මෙසේ තමාගේ නිදහසට කාරණා කියද්දී:
"පාවුලු, ඔබට පිස්සු ය; බොහෝ උගත්කම ඔබ
පිස්සෙකු කර ඇතැ"යි ෆෙස්තුස් මහා හඬින් කී ය.
25 එහෙත් පාවුලු, "ගරුතර ෆෙස්තුස් තුමනි, මට
පිස්සු නැත; මා කියන්නේ නියම ඇත්ත ය. 26 මේ
දේවල් ගැන රජතුමාට මනා දැනුමක් ඇත. එබැවින්
නොබිය ව එතුමාට කතා කරමි. මන්ද, මේ
දේවලින් කිසිවක් අස්සක මුල්ලක සිදු නොවූ බැවින්
ඒවා එතුමාගෙන් සැඟවී නැතැ යි විශ්වාස කරමි.
27 අග්‍රිපා රජතුමනි, ඔබ දිවැසිවරුන් විශ්වාස
කරන්නෙහි ද? ඔබ විශ්වාස කරන බව මම දනිමි"යි
කී ය. 28 එවිට අග්‍රිපා රජ කතා කොට: "ඔබ
පහසුවෙන් මා ක්‍රිස්තියානිකාරයෙකු කරන්නට
සිතනවා වගේ ය"යි පාවුලුට කී ය. 29 පාවුලු කතා
කොට, "ඔබ පමණක් නොව, අද මාගේ වචනය
අසන සියල්ලන් ද, පහසුවෙන් හෝ අපහසුවෙන්
හෝ මාගේ මේ යදම් නැති ව, මා වාගේ ම වන
ලෙස දෙවියන් වහන්සේට යාච්ඤා කරමි"යි කී ය.
30 එවිට රජ ද ආණ්ඩුකාරයා ද බර්නිස් ද ඔවුන්
සමඟ සිටි අය ද නැඟිට, 31 පිටතට ගොස්, "මේ
මිනිසා මරණයට වත් යදම්වලින් බඳිනු ලැබීමට වත්
සුදුසු කිසි දෙයක් කර නැතැ"යි ඔවුනොවුන් අතර
කතා කරගත්හ. 32 අග්‍රිපා තමෙේ ෆෙස්තුස්ට කතා
කොට, "මේ මිනිසා සීසර් අධිරාජයාගේ විනිශ්චය
නොඉල්ලුවා නම් ඔහු මුදා හැරීමට හැකි ව තිබුණේ
ය"යි කී ය.

### පාවුලු ඉතාලිය බලා නැව් නැඟීම

27 ඉතාලියට නැව් නැඟී යන්නට තීරණය කරනු
ලැබූ විට, පාවුලු සමඟ තවත් සිරකාරයෝ
සමහර දෙනෙක්, අගොස්තීනු නම් බලඇණියේ,
ජූලියස් නම් ශතාධිපතියාට භාර දෙන ලද්දෝ ය.
2 අපි ආසියාවේ මුහුදුබඩ වරායවලට යාත්‍රා
කරන්නට සූදානම් ව තිබුණු අද්‍රාමුත්තියේ නැවකට
නැඟී පිටත් වුණෙමු. තෙසලෝනිකයේ මසිදෝනි
වැසියෙක් වූ අරිස්තාර්කස් අප සමඟ සිටියේ ය.
3 පසුවදා අපි සීදොනට ළඟා වීමු. ජූලියස් පාවුලුට
කරුණාව දක්වමින් ඔහුගේ මිත්‍රයන් හමු වීමට
යන්නටත්, ඔවුන්ගෙන් සත්කාර ලබන්නටත් ඔහුට
ඉඩ දුන්නේ ය. 4 එතැනින් පිටත් වී යන විට, සුළඟ
අපට විරුද්ධ ව හැමූ බැවින් සයිප්‍රසයේ
වරෙළාසන්නයෙන් යාත්‍රා කළෙමු. 5 සිලිසිය සහ

පම්පිලියාවේ වෙරළාසන්න මුහුද මැදින් යාත්‍රා කර,
මුරා නම් ලිසියාවේ නුවරකට පැමිණියෙමු. 6 එහි දී
ශතාධිපතියා ඉතාලියට යන අලෙක්සන්ද්‍රියාවේ
නැවක් දැක අප එහි නැංවී ය.
7 කීප දිනක් ම හෙමින් යාත්‍රා කිරීමට සිදු වූ
බැවින්, බොහෝ අමාරුවෙන් කනීදස ඉදිරියට
පැමිණියෙමු. සුළඟ නිසා ගොඩබසින්නට නොහැකි
වූ හයින්, අපි ක්‍රීතයේ වෙරළට ළං ව සල්මොන්
තුඩුව වතෙට ගියෙමු. 8 අමාරුවෙන් එය ද පසු කර
ලසේය නුවර අසල පිහිටි සුන්දර වරාය නම්
තැනකට පැමිණියෙමු.
9 බොහෝ කල් ගත වී, උපවාස කාලය ද ගෙවී
ගිය බැවින්, මුහුදු ගමන අන්තරාය සහිත වූයෙන්,
පාවුලු ඔවුන්ට දැනමුතුකම් දෙමින්, 10 "හවතුනි, මේ
ගමන බඩුවලට සහ නැවට පමණක් නොව, අපේ
ජීවිතවලටත් අන්තරායදායක වූ, බොහෝ අලාභ
හානි පමුණුවන්නක් බව මට පෙනේ ය"යි කී ය.
11 එහෙත් ශතාධිපතියා පාවුලු කී දේවලට වඩා
නැව්පතියාගේ ද නැව් අයිතිකාරයාගේ ද කීම්
සැලකුවේ ය. 12 ශීත කාලයේ නැවතී සිටීමට ඒ
වරාය අහිතකර වූයෙන්, එතැනින් පිටත් වී පුළුවන්
නම් ඊසානට හා ගිනිකොණට මුහුණ දුන් ක්‍රීතයේ
වරායක් වූ පෙනීකියට පැමිණ එහි ශීත කාලය ගත
කරන ලෙස වැඩිදෙනා කැමැත්ත දැක්වූ හ.

## කුණාටුව හා නැව බිඳීයාම

13 දකුණෙන් මඳ සුළඟක් හැමූ කල, ඔව්හු
තමන්ගේ අදහස ඉටු වී යයි සිතා නැංගුරම් ඔසවා
ක්‍රීතයේ වෙරළ ළඟින් ම ගියහ. 14 එහෙත්
නොබෝ වේලාවකින් 'එව්රකුලොන්, නම් චණ්ඩ
මාරුතයක් දිවයින හරහා හැමුවේ ය. 15 නැව ඊට
අසු වී, සුළඟට මුහුණ පා යන්නට බැරි වූ බැවින්,
අපි එය සුළඟට ගසාගෙන යන්නට ඉඩ හැරියෙමු.
16 තවද, ක්ලෞද නම් සුළු දිවයිනක මුවාවට දුව
ගොස් අමාරුවෙන් නැවේ ඔරුව රැකගත්තෙමු.
17 ඔව්හු එය නැවට ඔසවා, ආධාර කඹ නැව යටින්
දමා බැන්දාහ; සර්ටිස්හි වැලි කණ්ඩිවල ගැටේ ය
යන බියෙන් ඔව්හු කුඹදැව බා, නැව ගසා ගෙන
යන්නට ඉඩ දුන්හ. 18 තද කුණාටුවකට අසු වී සිටි
බැවින් පසුවදා ඔව්හු නැව සැහැල්ලු කරන්නට
පටන්ගත්හ. 19 තුන් වන දා ඔව්හු තමන්ගේ ම
අත්වලින් නැවේ බඩු බාහිරාදිය මුහුදට වීසි කළහ.
20 බොහෝ දවස් ඉර වත් තාරකා වත් නොපෙනුණ
බැවින් ද, තද කුණාටුවක් පැවතුණ බැවින් ද අපේ
ආරක්ෂාව ගැන තිබුණු සියලු බලාපොරොත්තු
එතැන් පටන් සුන් වී ගියේ ය.
21 අප බොහෝ දිනක් කෑම නොගෙන සිටි බැවින්,
පාවුලු ඔවුන් මැද සිට, "හවතුනි, ක්‍රීතයෙන් පිටත්
නොවන ලෙස මා දුන් අවවාදයට ඇහුම්කන් දිය යුතු
ව තිබිණි. එසේ කළේ නම් මෙවැනි අන්තරාවක්
හා අලාභයක් පැමිණෙන්නේ නැත. 22 කෙසේ
වෙතත් දැන් ඉතින් ධෛර්යවත් ව සිටින ලෙස ඔබට
අවවාද කරමි. මන්ද, නැවට මිස ඔබ අතර
ජීවිතහානියක් නොවන්නේ ය. 23 මා වැඳුම්පිදුම්
කරන මාගේ ම දෙවියන් වහන්සේගේ දූතයෙක්
ඊයේ රාත්‍රියේ මා ළඟ සිට, 24 'පාවුලු බිය
නොවන්න; ඔබ අධිරාජයා ඉදිරියෙහි සිටින්නට ම
ඕනෑ ය. මෙන්න, ඔබ සමඟ නැවෙන් යන
සියල්ලන්ගේ ද ආරක්ෂාව දෙවියන් වහන්සේ ඔබට
දුන් සේකැ'යි කී ය. 25 එබැවින්, හවතුනි,
ධෛර්යවත් වන්න. මන්ද, මම දෙවියන් වහන්සේ
විශ්වාස කරමි; මට කී ලෙසෙ ම සිද්ධ වන්නේ යයි
විශ්වාස කරමි. 26 එසේ වුවත් අප යම් දිවයිනකට
ගසා ගෙන යා යුතු ය"යි කී ය.
27 දසසතර වන රාත්‍රියේ දී අප මධ්‍යධරණි
මුහුදේ ඔබමොබ ගෙනයනු ලබන කල, මධ්‍යම
රාත්‍රිය පමණේ දී නැව්කාරයන් අප වෙරළකට ළං
වෙතේ යි සිතා, ගැඹුර බලා, මීටර් සතළිසක් බව
දැනගත්හ. 28 තව ටිකක් ඈතට ගොස් නැවතත්
ගැඹුර බලා මීටර් තිහක් බව දැනගත්හ. 29 එකල
අප ගල්පරවල හැපේ ය යන බියෙන් ඔව්හු අවරෙන්
නැංගුරම් සතරක් දමා, පහන් වන තෙක් ආශාවෙන්
බලා සිටියහ. 30 නැවියන් නැවෙන් පලා යන්නට
මඟක් සොයමින් ඇණියෙන් නැංගුරම් දමන්නට
යන්නාක් මෙන් ඔරුව මුහුදට පහත් කළ විට පාවුලු
කතා කර, 31 "මොවුන් නැවේ සිටියොත් මිස
නැත්නම් ඔබට ගැළවෙන්නට නොපිළිවනැ"යි
ශතාධිපතියාට ද හේවායනට ද කී ය. 32 එකල
හේවායෝ ඔරුවේ යොත් කපා ඔරුව පාවී යන්නට
ඇරියහ.
33 පහන් වේගෙන එන විට පාවුලු ඔවුන්
සියල්ලන්ට ම කෑම කන්නට අවවාද කරමින්, "ඔබ
කිසිත් නොකා නිරාහාර ව බල බලා සිට අදට
දසසතරවෙනි දවස ය. 34 එබැවින් කෑම කන මෙන්
ඔබට අවවාද කරමි. මන්ද, ඔබගේ දිවි රැකගැනීම
සඳහා එසේ කිරීම අවශ්‍ය ය. ඔබ කිසිවකුගේ
ඉසකේ ගහක් තරමට වත් කිසිත් නැති නොවන්නේ
ය"යි කී ය. 35 ඔහු මෙසේ කියා රොටි රැගෙන
සියල්ලන් ඉදිරියෙහි දෙවියන් වහන්සේට ස්තුති
කොට කඩා කන්නට පටන් ගත්තේ ය. 36 එවිට
ඔව්හු සියල්ලෝ ම ධෛර්යවත් වී, තුමූ ද කෑම
කෑහ. 37 නැවේ සිටි අපි සියල්ලෝ ම දෙසිය
සැත්තෑසදෙනෙකි. 38 කෑම කා සෑහීමට පැමිණි ඔව්හු
ධාන්‍ය මුහුදට දමා නැව සැහැල්ලු කළහ.

## නැව බිඳීයාම

39 පහන් වූ කල ඒ දේශය කිමෙක් දැ යි බැලූ
නැවියන්ට එය හඳුනාගත නොහැකි විය. එහෙත්
වෙරළක් ඇති මුහුදු බොක්කක් දැක, 40 පුළුවන් නම්,
නැව එහි ගෙන යන්නට තීරණය කරගත්හ.
නැංගුරම් පහ කර මුහුදේ තිබෙන්නට හැර, ඒ සමඟ
ම සුක්කානම්වල බැඳුම් මුදා, ඉස්සරහ රුවල සුළඟට
නඟා වෙරළ බලා ගියෝ ය. 41 එහෙත් සැඩ පහරින්
ගසාගෙන ගිය නැව වැලි කණ්ඩියක හැපුණේ ය.
එවිට ඇණිය එරී තද වුණේ ය, රැළ වේගය නිසා
අවරය බිඳෙන්න පටන් ගත්තේ ය. 42 තවද

හිරකාරයන්ගනේ කිසිවකුෙ පීනා පැන නොයෙන
පිණිස ඔවුන් මැරීමට භ්ෙවායෝ අදහස් කළහ.
43 එහතේ ශතාධිපතියා පාවුලු ආරක්ෂා කරනු
කැමැති ව ඒ අදහසින් ඔවුන් වළක්වා පීනන්නට
පුළුවන් අය පළමුකොට මුහුදට පැන ගොඩට
යන්නටත්, 44 සසේසන්ට ලෑලිවල ආධාරයනේ හෝ
නැවේ කැබලි ආධාරයනේ හෝ ගොඩට යන්නටත්
අණ කළෙේ ය. මසෙේ සියල්ලෝ ම ගැළවී ගොඩට
පැමිණියහ.

## මෝල්ටාවේ දී සිදු වූ කරුණු

28 මසෙේ ගැළවී ගොඩට පැමිණි කල ඒ
ද්වීපයේ නම මෝල්ටාව යයි දැනගතිමු.
2 දිවයිනේ වැසියෝ අපට බොහෝ කරුණාව දැක්වූ
හ. වහින වැස්ස හා ශීතලය නිසා ඔව්හු
ගිනිමැලයක් ගසා අප සියල්ලන් පිළිගත්හ. 3 පාවුලු
දර මිටියක් එකතු කර ගින්නහෙි ලූ කල ගිනි
රස්නයට සර්පයකේ එයින් පිට වී අවුත් ඔහුගේ
අතේ එල්ලුණේ ය. 4 ඒ සතා ඔහුගේ අතේ එල්ලී
සිටිනවා දුටු රටවැසියෝ "ඒකාන්තයනේ මේ
මනුෂ්යයා මිනීමරුවකෙි, ඔහු මුහුදනේ ගැළවුණ
නමුත් ඔහුට ජීවත් වන්නට දවෙය ඉඩ නොහරී"යි
කියා කතා කරගත්හ. 5 එහතේ ඔහු ඒ සතා ගින්නට
ගසා දමා කිසි හානියක් නැතිව සිටියේ ය. 6 ඔහු
ඉදිමනුෙ ඇතැ යි නොහොත් හදිසියනේ මැරී වැටනුෙ
ඇතැ යි ඔව්හු බලා සිටියහ. බොහෝ වේලා බලා
සිට, ඔහුට කිසි අනතුරක් නොවන බව දුටු කල,
ඔව්හු සිය කල්පනාව වනෙස් කොට, "ඔහු දවේ
කනෙකෙ"යි කී හ.
7 ඒ දිවයිනේ ප්රධානියා වූ පබ්ලියස් හට අයිති
ඉඩම් ඒ අසල තිබුණේ ය. ඔහු අප පිළිගනෙ තුන්
දවසක් ආදරයනේ අපට ආගන්තුක සත්කාර කළෙේ
ය. 8 තවද පබ්ලියස්ගේ පියා උණනේ සහ
අතීසාරයනේ පළෙමේන් ඔත්පල ව සිටියේ ය. පාවුලු
ඔහු උන් තැනට ගොස් යාච්ඤා කොට, ඔහු පිට අත්
තබා, ඔහු සුව කළෙේ ය. 9 මයෙ සිදු වූ කල
දිවයිනේ අනකේ රෝගීහු ද පැමිණ සුව කරනු ලැබූ
හ. 10 ඔව්හු අපට බොහෝ ගරු සම්මාන කොට, අප
පිටත් ව යන කල අපට වුවමනා දේ නැවේ
පැටවේවෝ ය.

## රෝමයට පැමිණීම

11 ඒ දිවයිනේ ශීත කාලය ගත කර තුන්
මාසයකට පසු, 'නිඹුල් සොහොයුරු' යන සලකුණ
ඇති අලක්සෙන්ද්රියාවේ නැවකට නැඟී අපි පිටත්
වුණාමු. 12 අපි සිරාකූසයට පැමිණ, එහි තුන් දවසක්
සිටියමු. 13 එතැනින් පිටත් ව වරෙළ අසලින් ගොස්,
රගියොනට පැමිණ, එක් දිනකට පසු දකුණු සුළඟ
හැමූ බැවින්, දව වන දා පතොියොලට ආවමු.
14 එහි දී අපට සහෝදරයන් හමු වී, තමන් සමඟ
සත් දවසක් නැවතී සිටින ලසෙ ඔව්හු අපගනේ
ඉල්ලූ හ. ඉන්පසු අපි රෝමයට පැමිණියමු.
15 රෝමයේ සිටි සහෝදරයෝ අප ගැන අසා,
එතැනින් අපියුස්ගේ වළෙඳාම්පළ ද තුන් තානායම ද
දක්වා අප පරෙමඟට ආහ. පාවුලු ඔවුන් දැක,
දවෙියන් වහන්සේට ස්තුති කොට, ධරෛ්යවත් විය.
16 අප රෝමයට පැමිණි කල, තමා මුර කළ
භ්ෙවායා සමඟ තනියම සිටින්නට පාවුලුට අවසර
ලැබුණේ ය.

## පාවුලු රෝමයේ සිටීම

17 තුන් දවසකට පසු පාවුලු ජුදවේ ප්රධානියන්
රැස් කරවාගත්තේ ය. ඔවුන් රැස් වූ කල ඔහු
ඔවුන්ට කතා කොට: "සහෝදරයනි, මම සනෙඟට
වත් අපේ පරම්පරාගත සිරිත්විරිත් වලට වත් විරුද්ධ
ව කිසි දයෙක් නොකළෙමි. එහතේ හිරකරුවකුෙ
මනේ ජරුසලමනේ රෝමවරුන්ගේ අත්වලට භාර
දනුෙ ලැබීමි. 18 ඔව්හු මා ගැන විභාග කර මරණයට
සුදුසු කිසි වරදක් කර නතොිබුණු බැවින් මා නිදහස්
කරන්නට කැමැති වූ හ. 19 ක්රියා 25:11එහතේ
ජුදවේවරුන් ඊට විරුද්ධ ව කතා කළ කල්හි
අධිරාජයාගේ විනිශ්චය ඉල්ලන්නට මට සිදු විය.
එහතේ එසේ කළෙේ මාගේ සනෙඟට, කිසි
චෝදනාවක් කරන අදහසින් නොවේ. 20 මේ
කාරණය නිසා ඔබ දකින්නට ද, ඔබ හමු වී, කතා
කරන්නට ද ඔබ කැඳවේවමි. මන්ද, මා මේ
දම්වැලනේ බඳිනු ලැබ සිටින්නේ ඉශ්රායලේ
ජනතාවගේ බලාපොරොත්තුව නිසා ය"යි කී ය.
21 එවිට ඔව්හු කතා කොට: "ජුදයනේ ඔබ ගැන
අපට ලියුම් ලැබුණේ වත්, ආවා වූ
සහෝදරයන්ගනේ කවුරුන් වත් ඔබ ගැන කිසි
නරකක් දැන්නුවේ වත් නැත. 22 එහතේ ඔබේ මේ
ලබ්ධිය ගැන සියලු තැන්හි විරුද්ධ ව කතා කරන
බව නම් අපි දනිමු. එබැවින් ඔබේ අදහස කුමක් දැ
යි අසන්නට අපි කැමැත්තමු"යි කී හ.
23 තවද ඔවුන් පාවුලුට දවසක් නියම කොට
බොහෝ දනෙකේ එදා ඔහුගේ නවාතැනට ආහ;
ඔහු උදය පටන් සවස දක්වා දවෙියන් වහන්සේගේ
රාජ්යය ගැන ඔවුන්ට සාක්ෂි දමින්, ජේසුස්
වහන්සේ ගැන ඔවුන් පහදන පිණිස මෝසසේගේ
ව්යවස්ථාවලියනේ හා දිවැසිවරයන්ගේ පොත්වලින්
කාරණා තේරුම් කර දුන්නේ ය. 24 ඔහු කී දේ
සමහරු විශ්වාස කළහ; සමහරු අවිශ්වාස කළහ.
25 ඔවුන් අතර මතභ්ෙද ඇති වූ බැවින් ඔව්හු
යන්නට ගියහ. එසේ යන්නට පරෙ පාවුලු මේ
කරුණ කී ය. එනම්: "දිවැසිවර යසොයා මඟින්
ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබේ පියවරුන්ට කී දේ
කොපමණ සැබෑ ද? 26 යසො 6:9-10ඔබගේ ජනතාව
වතෙ ගොස් මසෙේ කියන්න:
q2 26 'අස අසාත් ඔබ කිසි සේත් තේරුම්
නොගන්නහු ය;
q2 26 දැක දැකත් කිසි සේත් නොපැහැදනේනහු ය.
27 මන්ද, මේ සනෙඟගේ සිත් අඳුරු ය, ඔව්හු කන්
හොඳට වසා ගනෙ, ඇස් පියා ගනෙ සිටිති.

q2 27 එසේ කර ඇත්තේ, තමන්ගේ ඇස්වලින්
නොදක්නා පිණිසත්, කන්වලින් නොඅසන පිණිසත්,
සිතින් තේරුම් ගනෙ නොහැරනෙ පිණිසත්, මා විසින්
ඔවුන් සුව නොකරන පිණිසත් ය.' "
28 පාවුලු තවදුරටත් කතා කරමින්: "එහයෙින්
දවේයන් වහන්සේගේ මේ ගැළවීම විජාතීන් වතෙ
යවන ලද බව තේරුම්ගන්න. ඔවුන් එයට සවන්
දනෙු ඇතැ"යි කියා කතාව නිම කළෙේ ය. 29 ඔහු
මසෙේ කී පසු ජුදවේවෝ තමන් අතරහෙි තදින්
විවාද කරමින් යන්නට ගියහ.

### අවසානය

30 පාවුලු තමා කුලියට ගත් ගයෙි දැවුරුද්දක් වාසය
කරමින්, තමා වතෙ පැමිණි සියල්ලන් පිළිගනෙ,
31 නොබියව, ප්‍රසිද්ධියේ ම, දවේයන්
වහන්සේගේ රාජ්‍යය දේශනා කරමින්, ස්වාමීන් වන
ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ගැන අනුශාසනා කළෙේ
ය.

# රෝම

## ආචාරය

1 ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ දාසයෙකු
වන, උන් වහන්සේගේ සුබ අස්න දේශනා
කිරීම පිණිස ප්‍රේරිතවරයෙකු වීමට දේව වරමින්
කැඳවීම ලත්, පාවුලු වතෙනි.
2 බොහෝ කලකට පෙර දෙවියන් වහන්සේ
ස්වකීය දිවැසිවරයන් මඟින් ඒ සුබ අස්න ගැන ශුද්ධ
ලියවිල්ලෙහි පොරොන්දු දුන් සේක. 3 ඒ සුබ අස්න
උන් වහන්සේගේ පුත්‍ර වූ අපගේ ස්වාමීන් වන
ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ ව ය. පරපුර
අනුව බලන විට උන් වහන්සේ දාවිත් රජුගේ
පෙළපතෙහි උපන් සේක; 4 එහෙත්,
පාරිශුද්ධභාවයේ ආත්මයාණන් කරණකොටගෙන
මරණයෙන් උත්ථාන වීම නිසා දේව පුත්‍රයාණන්
බවට ප්‍රබල සාක්ෂියක් වූ සේක. 5 සියලු ජාතීන්
ඇදහිල්ලට පමුණුවන පිණිස ක්‍රිස්තුන් වහන්සේගේ
නාමයෙන් ප්‍රේරිතවරයෙකු වීමේ වරම මම උන්
වහන්සේ අතින් ලදිමි. 6 ක්‍රිස්තුස් ජේසුස්
වහන්සේගෙන් කැඳවීම ලත් බැවින්, ඔබ ද ඒ
ඇදහිලිවතුන්ගේ සංඛ්‍යාවට අයිති ය. 7 දෙවියන්
වහන්සේට ප්‍රිය වූ, උන් වහන්සේට කැප කරන ලද
සෙනඟක් වන රෝමයෙහි සිටින ඔබ හැම දෙනා
වෙත මෙයෙ ලියා එවමි. අපගේ පියාණන් වන
දෙවියන් වහන්සේගෙන් ද ස්වාමීන් වන ජේසුස්
ක්‍රිස්තුන් වහන්සේගෙන් ද කරුණාවත් ශාන්තියත්
ඔබට වේ වා!

## රෝමය බලා යාමේ අදහස

8 පළමුකොට, ඔබගේ ඇදහිල්ල ලොව පුරා පතළ
වී ඇති බැවින් ඔබ සියල්ලන් ගැන ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේගේ නාමයෙන් මාගේ දෙවියන් වහන්සේට
තුති පුද කරමි. 9 ස්වකීය පුත්‍රයාණන්ගේ සුබ අස්න
දේශනා කිරීමෙන් මා මුළු සිතින් සේවය කරන
දෙවියන් වහන්සේ ම, මෙහි මා කියන දේ සත්‍ය
බවට සාක්ෂි දරනු ඇත. 10 මාගේ යාච්ඤාවල දී
නිරන්තරයෙන් ඔබ ගැන සඳහන් කරන විට දෙවියන්
වහන්සේගේ කැමැත්තෙන් ඔබ දැකගැන්මට ඊමේ
අවස්ථාවක් සැලසෙන ලෙස මා නිතර ම අයැදින බව
දෙවියන් වහන්සේ දන්නා සේක. 11 ඔබ ධෛර්යවත්
කරවන පිණිස යම්කිසි ආධ්‍යාත්මික ආශීර්වාදයක්
හවුලේ භුක්ති විඳීමට ඔබ දැකගැනීමේ තද
ආශාවක් මට ඇත. 12 ඉන් මා අදහස් කරන්නේ,
මාගේ ඇදහිල්ල නිසා ඔබ ද ඔබේ ඇදහිල්ල නිසා
මා ද ශක්තිසම්පන්න වීම ය. 13 ක්‍රියා 19:21මාගේ
සහෝදරවරුනි, අන්‍ය ජාතීන් අතර මෙන් ඔබ
අතරෙහිත් යම් ප්‍රතිඵලයක් අත්පත් කරගන්නා
පිණිස, මම ඔබ වෙත ඊමට බොහෝ වර උත්සාහ
දැරීමි. එහෙත් මේ වන තුරු එය සාර්ථක නොවූ
බව ඔබට දන්වනු කැමැත්තෙමි. 14 ග්‍රීකයන් හා
අන්‍යයන් ද උගතුන් හා නූගතුන් ද සම්බන්ධයෙන්
මට වගකීමක් ඇත. 15 රෝමයෙහි වසන ඔබටත්
සුබ අස්න දේශනා කිරීමෙහි දැඩි ආශාවක් මට
ඇත්තේ ඒ නිසා ය.

## සුබ අස්නෙහි බලය

16 මාක් 8:38 මම සුබ අස්න ගැන කිසිසේත් ලජ්ජා
නොවෙමි. මන්ද, අදහාගන්නා සියල්ලන්ට,
පළමුකොට ජුදෙව්වරුන්ට ද, දෙවෙනු ව ග්‍රීකයන්ට ද
එය ගැළවීම සලසන දෙවියන් වහන්සේගේ බලය
වන හෙයිනි. 17 හබ 2:4මනුෂ්‍යයන් දමිටු කරනු
ලැබීමේ මාර්ගය, මුල සිට අග දක්වා ම
ඇදහිල්ලෙන් වන බව දැන් සුබ අස්න නිසා එළිදරව්
වී ඇත. ශුද්ධ ලියවිලිවල සඳහන් පරිදි:
“ඇදහිල්ලෙන් දමිටු බවට පැමිණි අය ජීවනය
අත්කරගනිති.”

## පාපිෂ්ඨ ලෝකය

18 අධර්මයෙන් සත්‍යයට අකුල් හෙළෙන මිනිසුන්ගේ
අභක්තිය හා අධර්මිෂ්ඨකමට විරුද්ධ ව දේව උදහස
ස්වර්ගයෙන් ප්‍රකාශ වන්නේ ය. 19 දෙවියන්
වහන්සේ ගැන දත හැකි සියල්ල ඔවුන් ඉදිරියේ
සක්සුදක් සේ පැහැදිලි ය; දෙවියන් වහන්සේ ම එය
ඔවුනට අනාවරණය කර දී ඇත. 20 ලෝකය මැවූ
තැන් සිට, ඇසට නොපෙනෙන උන් වහන්සේගේ
දිව්‍ය ලක්ෂණ වන උන් වහන්සේගේ සදාතන බල
මහිමයත් දේවත්වයත් ඔවුන්ගේ මනසට පෙනී යන
පරිදි උන් වහන්සේගේ මැවිලිවලින් ප්‍රකාශ කර
ඇත. එබැවින් ඔවුන්ගේ නිදහසට ඉදිරිපත් කළ
හැකි කරුණු කිසිවක් නැත. 21 එෆී 4:17-18දෙවියන්
වහන්සේ ගැන දැන දැනත්, උන් වහන්සේට පිදිය
යුතු ගෞරවය වත්, තුතිපැසසුම් වත් ඔව්හු උන්
වහන්සේට නොපිදූ හ. මෙසේ ඔවුන්ගේ තර්ක
විතර්ක නිස්සාර බවට පත් වී, ඔවුන්ගේ මුළා ව ගිය
මනස අඳුරු විය. 22 සිය ප්‍රඥාව ගැන පුරසාරම්
දොඩූ ඔවුන් අඥානයන් වී ඇත. 23 ද්වි.නී.
4:16-18ඔව්හු අජරාමර දෙවියන් වහන්සේගේ
තේජශ්‍රීය වෙනුවට, ජරාපත් වන මිනිසුන්ගේ ද
පක්ෂීන්ගේ ද සිව්පාවුන්ගේ ද උරගයන්ගේ ද
සමානකම් ඇති පිළිරූ යොදාගත්හ.

24 එබැවින් දෙවියන් වහන්සේ ඔවුන්ගේ මාංසික
තෘෂ්ණාවලට ද කායික දූෂණවලට ද ඔවුන් පාවා
දුන් සේක. 25 එසේ කළේ ඔවුන් දෙවියන්
වහන්සේගේ සත්‍යය වෙනුවට මිථ්‍යාවක් වැළඳ
ගෙන, මැවුම්කාරයාණන් වෙනුවට මැවිල්ලට
වැඳුම්පිදුම් හා ගැතිකම් කළ නිසා ය. උන්
වහන්සේට සදහට ම ප්‍රශංසා වේ වා! ආමෙන්.
26 ඒ නිසා දෙවියන් වහන්සේ ඔවුන් නින්දිත කාම
තෘෂ්ණාවලට වහල් කළ සේක. ඔවුන්ගේ ස්ත්‍රීහු
ස්වාභාවික පුරුෂ සේවනය වෙනුවට තම තමන්
අතර අස්වාභාවික ස්ත්‍රී සේවනයෙහි ම යෙදුණා හ.
27 එසේ ම පුරුෂයෝ ද ස්වාභාවික ස්ත්‍රී සේවනය
වෙනුවට තම තමන් අතර කාම තෘෂ්ණාවෙන්
දැවුණෝ ය; පුරුෂයන් සමඟ නින්දිත ක්‍රියාවල යෙදී,
තමන්ගේ දුරාචාරයට සුදුසු දඬුවම් ලැබූ හ.
28 තවද ඔවුන් සිය බුද්ධියෙහි දෙවියන් වහන්සේට
තැනක් දීම නුසුදුසු යයි සිතූ බැවින්, නුසුදුසු දේ
කරන පිණිස තමන්ගේ ම දූෂිත චේතනාවන්ට
ගොදුරු වීමට දෙවියන් වහන්සේ ඉඩ හැරිය සේක.
29 ඔව්හු සියලු ආකාර දුෂ්ටකමින් ද නපුරෙන් ද
ලෝභයෙන් හා ද්වේෂයෙන් ද ඊර්ෂ්‍යාවෙන් ද මිනී
මැරීමෙන් ද දබරයෙන් ද වංචාවෙන් ද ක්‍රෝධයෙන්
ද පූර්ණ ව සිටිති. ඔව්හු ඕපාදූප දොඩන, කේළාම්
කියන, 30 දෙවියන් වහන්සේට වෛර කරන, නින්දා
කරන, උඩඟු වූ, පාරට්ටු කරගන්න, නපුරු උපා
යොදන, මව්පියන්ට අකීකරු වන, 31 පොරොන්දු
කඩ කරන, අඥාන වූ, අනුකම්පාව නැති, දයාව
නැති, අය ව සිටිති. 32 මෙබඳු දේ කරන්නෝ
මරණයට සුදුසු ය, යන දෙවියන් වහන්සේගේ
නියෝගය දැන දැනත් ඒ දේ ම කරති. එපමණක්
නොව, ඒ දේ කරන අයට අනුබල ද දෙති.

## දේව විනිශ්චය

2 මතෙ 7:1; ලූක් 6:37 එබැවින් අන්‍යයන්
විනිශ්චය කරන ඔබ කවරෙක් වුව ද, ඔබේ
නිදහසට උත්තරයක් ඔබට නැත. මන්ද, අන්
කෙනෙකු විනිශ්චය කරන විට ඔහු කරන දේ ම ඔබ
ද කරන නිසා ඔබ වරදකරුවෙකු බවට තීන්දු වී
සිටින්නෙහි ය. 2 එවැනි දේ කරන්නන්ට විරුද්ධ ව
දෙවියන් වහන්සේගේ විනිශ්චය සාධාරණ බව අපි
දනිමු. 3 ඔබ එබඳු දේ කරන්නන් විනිශ්චය කරමින්,
ඔබත් එම දේ ම කරන්නෙහි නම්, ඔබ දෙවියන්
වහන්සේගේ විනිශ්චයෙන් බේරෙනු ඇතැ යි
සිතන්නෙහි ද? 4 නැත්නම්, දෙවියන් වහන්සේගේ
මහා කරුණාව, ශාන්තිය හා ඉවසීම සුළු කොට ඔබ
සිතන්නෙහි ද? ඒ දිව්‍ය කරුණාවේ අරමුණ පසුතැවී
සිත් හරවා ගැනීමකට ඔබ පැමිණවීම බව දන්නේ
නැද් ද? 5 ගීතා 62:12; හිතෝ 24:12එහෙත් ඔබ
මුරණ්ඩු ය; දරදඬු සිතක් ඔබට ඇත. දෙවියන්
වහන්සේ ස්වකීය සාධාරණ විනිශ්චය එළිදරව්
කරන්නට යන දේව උදහසේ දවසට ඔබ දුර්විපාක
රැස් කරන්නෙහි ද? 6 ඒ දවසේ දී උන් වහන්සේ
හැම මිනිසෙකුට ම ඔහුගේ ක්‍රියා අනුව විපාක
නියම කරනු ඇත. 7 නොපසුබස්නා වීර්යයෙන්
යහපත කරමින් කීර්තිය ද ගෞරවය ද
අමරණීයත්වය ද සොයන්නන්ට උන් වහන්සේ
සදාතන ජීවනය දෙන සේක. 8 ආත්මාර්ථකාමී වූ,
සත්‍යයට පිටුපා අධර්මයට හිස නැමූ, අය මත දේව
උදහස හා කෝපය ඇවිලෙයි. 9 ජුදෙව්වා වේවා,
ග්‍රීකයා වේවා, නපුර කරන කා හට වුවත්,
පළමුකොට ජුදෙව්වාට ද, දෙවෙනු ව ග්‍රීකයාට ද
ප්‍රතිවිපාකය, පීඩාව හා සිත් වේදනාව වන්නේ ය.
10 යහපත කරන කා හට වුවත්, පළමු ව ජුදෙව්වාට
ද, එලෙසෙ ම ග්‍රීකයාට ද, ඔහුගේ ප්‍රතිවිපාකය,
කීර්තිය, ගෞරවය හා ශාන්තිය වන්නේ ය.
11 ද්වි.නී. 10:17දෙවියන් වහන්සේ මිනිසාගේ
තරාතිරම් නොබලන සේක.
12 මෝසෙස්ගේ ව්‍යවස්ථාවෙන් බැහැර ව පව්
කරන අය ඒ ව්‍යවස්ථාව අනුව විනිශ්චයක් නොලබා
විනාශ වන්නෝ ය. මෝසෙස්ගේ ව්‍යවස්ථාව
දැනගෙනත් පව් කරන අය ඒ ව්‍යවස්ථාවෙන් ම
විනිශ්චය කරනු ලබති. 13 දෙවියන් වහන්සේ
ඉදිරියෙහි යමෙකු දමිටු බවට පත්වන්නේ
ව්‍යවස්ථාව ඇසීමෙන් නොව එය පිළිපැදීමෙනි.
14 මෝසෙස්ගේ ව්‍යවස්ථාව නොදත් විජාතිකයන්
එහි නියම වූ දේ සහජයෙන් ම පිළිපදින විට, ඔවුන්
ඒ ව්‍යවස්ථාව නොදත් නමුත්, ඔවුන්ගේ සිත ම
ඔවුන්ට නීතිය වී ඇත. 15+ROM ව්‍යවස්ථාවේ
නියමයන් ඔවුන්ගේ සිත්හි ලියවී ඇති බව ඔවුන්ගේ
පැවැත්මෙන් පෙනේ. ඔවුන්ගේ හෘදය සාක්ෂිය එය
සැබෑ බව සහතික කරයි. මන්ද, ඔවුන්ගේ සිතුවිලි
සමහර විටක ඔවුන් සදොස් බවත් සමහර විටක
ඔවුන් නිදොස් බවත් හඟවන බැවිනි. දෙවියන්
වහන්සේ ක්‍රිස්තුන් වහන්සේ ලවා මිනිසුන්ගේ
සිත්වල අබිරහස් විනිශ්චය කරවන සේක. මාගේ
සුබ අස්න මෙයෙ යි.

## ජුදෙව්වරුන් සහ විනය නීති

17 ඔබ ජුදෙව් නාමය දරන්නෙහු ය; ඔබ
ව්‍යවස්ථාවෙහි පිහිටා දෙවියන් වහන්සේ ගැන
පාරට්ටු කරන්නෙහු ය. 18 ඔබ උන් වහන්සේගේ
කැමැත්ත දන්නෙහු ය; ඔබ ව්‍යවස්ථාවෙහි ඉගෙනීම
ලැබ හරි දෙය අනුමත කරන්නෙහු ය. 19 ඔබ එය
අන්ධයන්ට මඟපෙන්වන්නෙකු ද අඳුරෙහි
වසන්නවුන්ට ආලෝකයක් ද 20 නූගතුන්ට
ගුරුවරයෙකු ද දැනුම් නැත්තවුන්ට උපදේශකයෙකු ද
බව නිසැක ව විශ්වාස කරන්නෙහු ය. ව්‍යවස්ථාවෙහි
සැබෑ ප්‍රඥාව හා සත්‍යය ගැබ් වී ඇති බව ඔබට
සහතික ය. 21 ඔබ අන්‍යයන්ට ගුරූපදේශ දෙන්නෙහු
ය; එහෙත් ඔබ තමන්ට ම ගුරූපදේශ නො දෙන්නේ
මන් ද? “සොරකම් නොකරව”යි ඔබ දේශනා
කරන්නෙහු ය, එහෙත් ඔබ ම සොරකම් කරන්නෙහු ද?
22 “කාමමිථ්‍යාචාරය නොකරන්නැ”යි ඔබ කියන්නෙහු
ය; එහෙත් ඔබ ම කාමමිථ්‍යාචාරය කරන්නෙහු ද?
ඔබ රූප නමස්කාරය පිළිකුල් කරන්නෙහු ය; එහෙත්,
ඔබ ම දේවගෘහයන් කොල්ල කන්නෙහු ද? 23 ඔබ

ව්‍යවස්ථාව ගැන පාරට්ටු කරන්නහු ය; එහෙත්, ඔබ
ම ව්‍යවස්ථාව කඩ කිරීමෙන් දෙවියන් වහන්සේට
අගෞරව කරන්නහු ද? 24 යෙසා 52:5එබැවින් ශුද්ධ
ලියවිලිවල කියා ඇති පරිදි: “ඔබ නිසා විජාතීන්
අතර දෙවියන් වහන්සේගේ නාමය අපකීර්තියට
පත් වී ඇත.”

### සැබෑ ජුදෙව්වා කවරෙක් ද?

25 ඔබ ව්‍යවස්ථාව පිළිපදින්නහු නම් ඔබේ
චර්මඡේදන පිළිවෙතින් වැඩක් ඇත. එහෙත්, ඔබ
ව්‍යවස්ථාව කඩ කරන්නාහු නම්, ඔබේ චර්මඡේදන
පිළිවෙතෙහි තේරුමක් නැත. 26 චර්මඡේදනය
නොලත් කෙනෙකේ ව්‍යවස්ථාවෙහි නියෝග පිළිපදිත්
නම් ඔහු චර්මඡේදනය නොලැබුවත් එය ලත්
කෙනෙකු මෙන් සලකනු නොලැබේ ද? 27 ශාරීරික
වශයෙන් චර්මඡේදනය නොලැබුව ද, ව්‍යවස්ථාව
පිළිපදින තැනැත්තා විසින්, ලියවිල්ලත්
චර්මඡේදනයත් ඇතිව ව්‍යවස්ථාව කඩ කරන ඔබ
විනිශ්චය කරනු ලබන්නේ ය. 28 පෙනුමට පමණක්
වූ ජුදෙව්වා සැබෑ ජුදෙව්වෙකේ නොවේ.
චර්මඡේදනය ද බාහිර ශාරීරික කරුණක් නොවේ.
29 ද්වි.නී. 30:6සැබෑ ජුදෙව්වා හඳුනාගනු ලබන්නේ
අභ්‍යන්තර ලක්ෂණවලිනි. සැබෑ චර්මඡේදනය ද
වනාහි සිතේ පවතින දෙයෙකි; එය නීතිගත දෙයක්
නොව, ආධ්‍යාත්මික දෙයෙකි. එවැනි ජුදෙව්වෙකුට
ප්‍රශංසාව ලැබෙන්නේ මිනිසාගෙන් නොව, දෙවියන්
වහන්සේගෙන් ය.

3 එසේ නම්, ජුදෙව්වාට විශේෂ වාසියක් ඇද්
ද? චර්මඡේදනයෙන් පලක් ඇද් ද? 2 එසේ ය,
බොහෝ සේ ඇත. දෙවියන් වහන්සේගේ පණිවුඩය
භාර කරන ලද්දේ ජුදෙව්වරුන්ට බව මුලින් ම කිව
යුතු ය. 3 හොඳයි, සමහරෙක් එය අවිශ්වාස කළාහු
නම්, ඒ අවිශ්වාසය නිසා දෙවියන් වහන්සේගේ
විශ්වාසවන්තකම නිෂ්ප්‍රභ වන්නේ ද? 4 ගීතා
51:4සැබැවින් ම එසේ නොවනු ඇත. මිනිසුන් හැම
දෙනා ම බොරුකාරයන් වුවත්, දෙවියන් වහන්සේ
ධර්මිෂ්ඨ බව නිසැක ය. ඒ බවට ශුද්ධ ලියවිල්ල
මෙසේ කියයි:
q24 “ඔබ වදාරන වචනයෙන් ඔබේ ධර්මිෂ්ඨ බව
ප්‍රකාශ වන්නේ ය,
q24 ඔබ විනිශ්චය කරනු ලබන කල ඔබට ජය අත්
වන්නේ ය.”
5 අපේ අධර්මිෂ්ඨකම නිසා දෙවියන් වහන්සේගේ
ධර්මිෂ්ඨකම කැපී පෙනේ නම්, අපි කුමක් කියමු ද?
අපට දඬුවම් දෙන විට දෙවියන් වහන්සේ
අසාධාරණ යයි ලෝක ව්‍යවහාරය අනුව කිය හැකි
ද? 6 කිසි සේත් ම කිව නොහැකි ය. දෙවියන්
වහන්සේ අසාධාරණ නම්, උන් වහන්සේ ලෝකය
විනිශ්චය කරන්නේ කෙසේ ද? 7 ඉතින්, මාගේ
අසත්‍යය නිසා දෙවියන් වහන්සේගේ සත්‍යය වඩාත්
කැපී පෙනේ, එය උන් වහන්සේගේ ගෞරවයට
ඉවහල් වේ නම්, මා පව්කරුවකු යි තීන්දු
කරන්නේ මන් ද? 8 එසේ නම්: “යහපත සිදුවන
ලෙසෙ නපුර කරමු”යි කියමු ද? අප එසේ කියති යි
සමහරු අපට අපහාස කරති. එවැනි අයට ලැබිය
යුතු දඬුවම ලැබෙනු ඇත.

### පාපයෙන් තොර කිසිවෙකේ නැත

9 හොඳයි, එසේ නම්, ජුදෙව්වරුන් වන අප
විජාතීන්ට වඩා උසස් ද? කොහෙත් ම නැත.
ජුදෙව්වරුන් ද විජාතීන් ද යන දෙපක්ෂය ම පාපයේ
බලයට යටත් වී ඇතැ යි අපි කලින් පෙන්වා දුනිමු.
10 ගීතා 14:1-3; 53:1-3ඒ ගැන ශුද්ධ ලියවිල්ල
මෙසේ කියයි:
q210 “ධර්මිෂ්ඨ වූ කිසිවෙකේ නැත, එක් කෙනෙකේ
වත් නැත;
11 හරි දැනුම ඇති එක් කෙනෙකේ වත් නැත;
q211 දෙවියන් වහන්සේ සොයන එක් කෙනෙකේ වත්
නැත.
12 හැම දෙන ම මුළා ව ගොස් සිටිති, හැම දෙන ම
එක සේ නොමඟ ගොස් සිටිති. යහපත කරන
කිසිවෙකේ නැත, එක් කෙනෙකේ වත් නැත.
13 ගීතා 5:9; 140:3 ඔවුන්ගේ උගුර විවර වූ මිනී
වළක් වැනි ය.
q213 ඔව්හු සිය දිව්වලින් මුසාවාද පවසති.
q213 ඔවුන්ගේ තොල් යට පොළොං විස ඇත.
14 ගීතා 10:7 ඔවුන්ගේ මුඛය කටුක සාපයෙන් පිරී
ඇත.
15 යෙසා 59:7-8 ඔවුන්ගේ පාද ලේ වැගිරීමට යුහුව
දුවයි.
16 ඔවුන් යන යන තැන විනාශයත්
කාලකණ්ණිකමත් ඇත.
17 සාම මාවත ගැන ඔවුන්ට දැනුමක් නැත,
18 ගීතා 36:1 ඔවුන්ගේ ඇස් ඉදිරියේ දේව බිය
නොමැත.”
19 ඉදින් ව්‍යවස්ථාවෙහි කියන ලද සියල්ල ම
ව්‍යවස්ථාව යටතෙහි සිටින්නන්ට කියන ලද බව අපි
දනිමුව. එසේ වන්නේ සියල්ලන්ගේ කටවල් පියවනු
ලබන පිණිසත්, මුළු ලෝකයා දෙවියන් වහන්සේගේ
විනිශ්චයට යටත් කරනු ලබන පිණිසත් ය. 20 ගීතා
143:2; ගලා 2:16ඊට හේතුව මේ ය; ව්‍යවස්ථාව
පිළිපැදීමෙන් කිසි ම මනුෂ්‍යයෙකේ දමිටු බවට පත්
කරනු නොලබයි. ව්‍යවස්ථාවෙන් සිදුවන්නේ පාපය
පිළිබඳ හැඟීම ඇති කිරීම ය.

### දමිටු බව ඇති කිරීම

21 එහෙත්, දැන් මිනිසුන් දමිටු බවට පමුණුවාලීම
පිළිබඳ දෙවියන් වහන්සේගේ ක්‍රියා මාර්ගය
එළිදරව් වී තිබේ. ව්‍යවස්ථාව හා දිවැසාවලිය ඊට
සාක්ෂි දුන් නමුත් එය කිසි සේත් ව්‍යවස්ථාව පිට
රඳා නැත. 22 ගලා 2:16ඒ වනාහි ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේ කෙරෙහි ඇදහිල්ල කරණකොටගෙන
අදහන සියල්ලන් දෙවියන් වහන්සේ විසින් දමිටු
බවට පමුණුවනු ලැබීමේ මාර්ගය වේ. එය කිසි
වෙනසක් නැති ව, අදහන්නා වූ හැම දෙනොට ම
ලබාගත හැකි ය. 23 සියල්ලෝ ම පව් කොට

දෙවියන් වහන්සේගේ ගැළවීමේ මාර්ගයෙන් ඉවත්
වී සිටිති. 24 දෙවියන් වහන්සේගේ වරප්‍රසාදයෙන්
ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ අත් කර දුන් ගැළවීම
කරණකොටගෙන, සියල්ලෝ ම නොමිලයේ දමිටු
බවට පත් කරනු ලැබ සිටිති. 25+ROM ඇදහිල්ලෙන්
පව් කමාව ලබනු සඳහා, ක්‍රිස්තුන් වහන්සේ
ස්වකීය මරණයෙන්පව් නසන පූජාවක් වීමට
දෙවියන් වහන්සේ නියම කළ සේක. එසේ කළේ,
උන් වහන්සේගේ ධර්මිෂ්ඨකම පෙන්වන පිණිස ය.
පෙර කාලවල උන් වහන්සේගේ ඉවසීමෙන්,
මිනිසුන්ගේ පව් ගණන් නොගෙන හැරිය සේක.
එහෙත් මේ කාලයේ දී උන් වහන්සේ ධර්මිෂ්ඨකම
පෙන්වන පිණිස මිනිසුන්ගේ පව් සලකා බලන
සේක. දෙවියන් වහන්සේ මෙලෙස කිරීමෙන් උන්
වහන්සේ ධර්මිෂ්ඨ බවත්, ක්‍රිස්තුන් වහන්සේ
අදහන කවරකු වුවත් දමිටු බවට පමුණුවන බවත්
පෙන්වන සේක. 27 එසේ නම්, අපට පුරසාරම්
දෙඩීමට ඉඩක් ඇද් ද? කොහෙත් ම නැත. එසේ
කියන්නේ කුමන ප්‍රතිපත්තියක් අනුව ද?
ව්‍යවස්ථාව පිළිබඳ ප්‍රතිපත්ති අනුව ද? එසේ
නොව ඇදහීමේ ප්‍රතිපත්තිය අනුව ය. 28 මන්ද,
මනුෂ්‍යයකු දමිටු බවට පමුණුවනු ලබන්නේ
ව්‍යවස්ථාවේ නියමයන් පිළිපැදීමෙන් නොව,
ඇදහිල්ලෙන් පමණක් බව අපි නිගමනය කරමු.
29 දෙවියන් වහන්සේ ජුදෙව්වරුන්ගේ දෙවියන්
වහන්සේ පමණක් ද? විජාතීන්ගේත් දෙවියන්
වහන්සේ නොවන සේක් ද? එසේ ය,
විජාතීන්ගේත් දෙවියන් වහන්සේ ය. 30 ද්වි.නී. 6:4;
ගලා 3:20මන්ද, වැඩ සිටින්නේ එක ම දෙවියන්
වහන්සේ ය. උන් වහන්සේ චර්මඡේදිතයන්
ඔවුන්ගේ ඇදහීම නිසාත්, එසේ ම අචර්මඡේදිතයන්
ඔවුන්ගේ ඇදහීම නිසාත්, දමිටු බවට පමුණුවන
සේක. 31 එසේ නම් ඇදහිල්ල අවධාරණය කිරීමෙන්
අපි ව්‍යවස්ථාව අවලංගු කරමු ද? කොහෙත් ම
නැත. අපි ව්‍යවස්ථාව වඩාත් තහවුරු කරමු.

## ආබ්‍රහම්ගේ ආදර්ශය

4 එසේ නම්, අපේ ජාතියේ පියා වූ ආබ්‍රහම්
ගැන අපි කුමක් කියමු ද? ඔහු දමිටු බවට
පමුණුවනු ලැබුවේ කෙසේ ද? 2 ආබ්‍රහම් සිය
ක්‍රියා නිසා දමිටු බවට පමුණුවනු ලැබුවේ නම්,
පාරට්ටු කරගැනීමට හේතුවක් ඔහුට ඇත. එහෙත්
දෙවියන් වහන්සේ ඉදිරියෙහි එසේ කිරීමට ඉඩක්
නැත. 3 ශුද්ධ ලියවිල්ලෙහි කියා ඇති පරිදි:
“ආබ්‍රහම් දෙවියන් වහන්සේ අදහාගත්තේ ය; ඒ
ඇදහිල්ල නිසා ඔහු දමිටු කෙනෙකු බව උන්
වහන්සේ පිළිගත් සේක.”උත් 15:6; ගලා 3:6 4 යම්
වැඩක් කරන කෙනෙකුට දෙන වේතනය
පාරිතෝෂික දීමනාවක් හැටියට නොව, ඔහුට ගෙවිය
යුත්තක් හැටියට සලකනු ලැබේ. 5 එහෙත් එවැනි
යමක් නොකරන අභක්තිකයන් දමිටු බවට
පමුණුවන දෙවියන් වහන්සේ අදහන තැනැත්තා,
ඔහුගේ ඇදහිල්ල නිසා දමිටු ලෙස පිළිගනු ලැබේ.
6 ඒ හැටියට, කෙනෙකුගේ පුණ්‍ය ක්‍රියා ගණන්
නොගෙන දෙවියන් වහන්සේ විසින් දමිටු බවට
පමුණුවනු ලබන මිනිසාගේ භාග්‍යවන්තකම ගැන
දාවිත් රජු මෙසේ කියයි:
7 ගීතා 32:1-2 “තමන්ගේ අධාර්මික ක්‍රියාවලට
කමාවත්, පාපවලින් නිදහසත් ලැබූ අය
භාග්‍යවන්තයෝ ය.
8 සමිඳාණන් වහන්සේ විසින් පාපය ගණන්
නොගෙන හරිනු ලබන තැනැත්තා භාග්‍යවන්ත ය.”
9 ඉතින්, මේ භාග්‍යවන්තකම දෙන ලද්දේ
චර්මඡේදනය ලැබූ අයට පමණක් ද? නැතහොත්
චර්මඡේදනය නොලැබූ අයටත් ද? “ආබ්‍රහම්ගේ
ඇදහිල්ල ඔහුගේ ධර්මිෂ්ඨකම වශයෙන් දෙවියන්
වහන්සේ පිළිගත් සේකැ”යි අපි කීවෙමු. 10 එසේ
පිළිගනු ලැබුවේ චර්මඡේදනය ලබා සිටිය දී ද,
නැතහොත් නොලබා සිටිය දී ද? ලබා සිටිය දී
නොව, එය නොලබා සිටිය දී ය. 11 උත් 17:10ඔහු
චර්මඡේදනය පසුව ලැබුවේ, චර්මඡේදනය
නොලබා සිටි අවස්ථාවේ දී, ඔහුගේ ඇදහිල්ල
දමිටුකම වශයෙන් දෙවියන් වහන්සේ පිළිගත් බව
සහතික කිරීමේ සලකුණක් වශයෙනි. මෙසේ ඔහු
එක අතකින් ඇදහිල්ල නිසා දමිටු කරනු ලැබූ අය
වශයෙන්, දෙවියන් වහන්සේ පිළිගත්, චර්මඡේදනය
නොලැබූ අයගේ පියාණෝ ය. 12 අනෙක් අතට ඔහු
චර්මඡේදනය ලැබූ අයගේ ද පියාණෝ ය. ඒ අය
නම්, චර්මඡේදනය ලැබීමට පෙර ඔහුගේ
ඇදහිල්ලේ ජීවිතය අනුගමනය කරන අය වේ.

## ඇදහිල්ලෙන් උරුම වන පොරොන්දුව

13 උත් 17:4-6; 22:17-18; ගලා 3:29 ආබ්‍රහම්ට
හෝ ඔහුගේ දරු පළපුරට හෝ ලෝකය උරුම
වන්නේ ය යන පොරොන්දුව කිසි සේත් නීතිය
පිළිපැදීම නිසා ඇති වූවක් නොවේ. එය ඇති වූයේ
ඇදහිල්ල නිසා සිදු වන දමිටු බව හේතුකොටගෙන
ය. 14 ගලා 3:18ඒ උරුමය හිමි වන්නේ නීතිය
පිළිපදින අයට පමණක් නම්, ඇදහිල්ල නිරර්ථක ය,
පොරොන්දුව නිෂ්ඵල ය. 15 නීතිය දේව උදහස
නිපදවයි; නීතිය නැති තැන නීතිය කඩ කිරීමකුත්
නැත.
16 ගලා 3:7 මේ නිසා දේව පොරොන්දුව
වරප්‍රසාදයේ ප්‍රතිඵලයක් වන පිණිස එය ඇදහිල්ල
මත රඳා පවතී. එසේ වන්නේ, ආබ්‍රහම්ගේ දරු
පළපුරට අයත් හැමට ම, එනම්, නීතිය අනුව ජීවත්
වන අයට පමණක් නොව, අපගේ පියාණන් වන
ආබ්‍රහම්ගේ ඇදහිල්ල අනුව ජීවත් වන අයටත්, ඒ
පොරොන්දුව වලංගු වන බව සහතික කරන පිණිස
ය. 17 උත් 17:5“මම ඔබ බොහෝ ජාතීන්ගේ පියා
කොට පත් කළෙමි”යි ශුද්ධ ලියවිල්ලෙහි ලියා
ඇත්තේ මේ නිසා ය. ඒ පොරොන්දුව ආබ්‍රහම්
ලැබුවේ තමා අදහන, මළවුන් හට ජීවිතය දෙන,
නැති දේ ඇති කරන, දෙවියන් වහන්සේගෙන් ය.
18 උත් 15:5බලාපොරොත්තු රහිත තත්ත්වයක දී
වුව ද ඔහු දෙවියන් වහන්සේගේ පොරොන්දුව

විශ්වාස කළේ ය. ඔහු බොහෝ ජාතීන්ගේ පියා
වූයේ, “එබඳු මහා පළෙපතක් ඔබට ඇති වන්නේ
ය” යන කීම පරිදි ය. 19 උත් 17:17එවකට ඔහු
අවුරුදු සියයක් පමණ වයස් ගත ව සිය පුරුෂ
ශක්තියත් සාරාගේ පිළිසිඳ ගැනීමේ ශක්තියත්
අප්‍රාණික ලසෙ ඔහුට පනෙුණු නමුත්, ඔහුගේ
ඇදහිල්ල කිසි සේත් නොසලේවිණි. 20 ඔහු සිය
අවිශ්වාසය නිසා කිසි විටකෙ දේව පොරොන්දුව
සැක නොකොට ඇදහිල්ලහෙි බලවත් ව, උන්
වහන්සේට ගෞරව කළේ ය. 21 පොරොන්දු වූ
දයෙ ඉෂ්ට කිරීමට දවේයන් වහන්සේ පොහොසත්
බව ඔහු ඒකාන්තයනේ ම විශ්වාස කළේ ය.
22 එබැවින් දවේයන් වහන්සේ ඔහුගේ ඇදහිල්ල
නිසා ඔහු දමිටු බව පිළිගත් සේක. 23 “දවේයන්
වහන්සේ ඔහු ධර්මිෂ්ඨ ලසෙ පිළිගත් සේක” යන්න
ලියන ලද්දේ ඔහු උදසො පමණක් නොව, 24 අප
උදසොත් ය; අපගේ ස්වාමීන් වන ජේසුස් වහන්සේ
මළවුන්ගනේ උත්ථාන කළ තැනැන් වහන්සේ අදහන
අප ද එසේ ම පිළිගනු ලැබ ඇත. 25 යසො
53:4-5උන් වහන්සේ වනාහි අපේ පව් නිසා
මරණයට පාවා දනෙු ලැබ, අප දවේයන් වහන්සේ
හා සමඟ දමිටු බවට පමුණුවනු පිණිස උත්ථාන
කරනු ලැබූ සේක.

## දමිටු බව

5 අප ඇදහිල්ලනේ දමිටු බවට පමුණුවනු ලැබූ
බැවින් අපේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේ මඟින් දවේයන් වහන්සේ හා සමඟ අපට
සාමදානය ඇත. 2 තවද ඇදහිල්ලනේ අපට ලැබී ඇති
මේ දේව වරප්‍රසාදයට පිවිසනෙ මඟ අපට සලසා
දුන්නේ උන් වහන්සේ ය. ඒ නිසා අපට හිමි වන්නට
යන දේව මහිමයේ බලාපොරොත්තු ගැන අපි
අතිශයින් ප්‍රීති ප්‍රමෝද වමෙු. 3 එපමණක් නොව,
පීඩා විඳීමනේ ඉවසිල්ල ද, 4 ඉවසිල්ලනේ තැන්පත්
බව ද, තැන්පත් බවනේ බලාපොරොත්තුව ද උපදින
බව දැන, අප විඳින පීඩාවල දී වුව ද, අපි ප්‍රීති
ප්‍රමෝද වමෙු. 5 එබඳු බලාපොරොත්තුවකින් කිසි
ම කලකිරීමක් ඇති නොවයෙි. මන්ද, අපට දනෙ ලද
ශුද්ධාත්මයාණෝ දේව ප්‍රේමයනේ අපේ සිත්
පුරවන සේක.
6 අප අනාථ ව සිටිය දී ම ක්‍රිස්තුන් වහන්සේ
පව්කාරයන් උදසො නියමිත කාලයේ දී සිය දිවි පිදූ
සේක. 7 සත් ගුණවත් කනෙකෙු උදසො දිවි පිදීමට
යමකෙු තුළ ධරෛයය තිබුනත් එවැන්නකෙු උදසො
දිවි පිදීමක් සිදුවන්නේ කලාතුරකිනි. 8 අප උදසො
ඇති දවේයන් වහන්සේගේ ප්‍රේමය ප්‍රත්‍යක්ෂ
වන්නේ අප පව්කාරයන් ව සිටිය දී ම ක්‍රිස්තුන්
වහන්සේ අප උදසො දිවි පිදූ බැවිනි. 9 ක්‍රිස්තුන්
වහන්සේගේ යාගික රුධිරයහේතුවනේ දමිටු බවට
පමුණුවනු ලැබ, උන් වහන්සේ කරණකොටගනෙ
දේව උදහසින් මිදීම ගැන අපට වඩාත් සහතික ය.
10 අපි සතුරන් ව සිටිය දී ම දේව පුත්‍රයාණන්ගේ
මරණය නිසා උන් වහන්සේ සමඟ සමඟි කරනු
ලැබුවමෙු නම්, එසේ සමඟි කරනු ලැබූ අපි, දැන්
ඊටත් වඩා ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය නිසා
ගැළවීම ලබමු. 11 එපමණකුත් නොව, දවේයන්
වහන්සේ හා සමඟ නැවත අපට සමඟිය අත් කර
දුන් ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මඟින්
අපි දවේයන් වහන්සේ කරේ අතිශයින් ප්‍රීති
ප්‍රමෝද වමෙු.

## ආදම් සහ ක්‍රිස්තුන් වහන්සේ

12 උත් 3:6 එක මනුෂ්‍යයකෙු නිසා පාපයත්, පාපය
නිසා මරණයත් ලෝකයට පිවිසියාක් මනේ, සියලු
මනුෂ්‍යයන් පව් කළ බැවින්, මරණය මුළු මිනිස්
සංහතියට ම පොදු ව පවතී. 13 කිසි ම නීතියක්
ඇති වීමට පරෙ ලෝකයහෙි පාපය තිබිණි. එහතේ
නීතියක් නැති තැන මිනිසාට විරුද්ධ ව පාපය ගණන්
ගනු නොලැබේ. 14 එසේ ව තිබියදීත්, ආදම් පටන්
මෝසසේ දක්වා, ආදම් මනේ ආඥා කඩ කිරීමනේ
පව් නොකළ අය කරේ පවා මරණය රජකම්
කළේ ය. ආදම් වනාහි එන්නට සිටින තැනැන්
වහන්සේ පිළිබඳ පූර්ව ආදර්ශයක් විය.
15 එහතේ දවේයන් වහන්සේගේ වරප්‍රසාදයේ
ක්‍රියාවත්, ආදම්ගේ පාපී ක්‍රියාවත් අතර
සමානත්වයක් නැත. එසේ කියන්නේ, එක
මිනිසකෙුගේ පාපය හැම මිනිසාගේ ම මරණයට
හේතු වූ නමුත්, දවේයන් වහන්සේගේ වරප්‍රසාදය
හා ජේසුස් ක්‍රිස්තුස් නම් එක මනුෂ්‍යයාගේ
දයාන්විත දීමනාව බොහෝ දනෙකෙුට විපුල ආසිරි
ගනෙ දීමේ අමුතු ම හේතුවක් වූ බැවිනි.
16 දවේයන් වහන්සේගේ දීමනාව හා එක
පුද්ගලයකෙුගේ පාපී ක්‍රියාව අතර සමානත්වයක්
නැත. මන්ද, එක පාපී ක්‍රියාවක් නිසා ඇති වන
දේව විනිශ්චය, දඬුවමට හේතු විය; එහතේ
බොහෝ පාපී ක්‍රියා සම්බන්ධයනේ ඇති වූ උන්
වහන්සේගේ දයාන්විත දීමනාව, වරදින් නිදහස්
කිරීමේ තීන්දුව දයෙි. 17 එක මනුෂ්‍යයකෙුගේ පාපය
නිසා එක ම තැනැත්තකෙු මඟින් මරණය සියල්ලන්
කරෙහෙි රජකම් කළේ නම්, කොතරම් අධිකතර
ලසෙ දේව වරප්‍රසාදය හා දමිටු බවට පැමිණවීමේ
දීමනාව ලබන හැම දනෙ ම එක ම ජේසුස්
ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගනෙ ජීවනයේ
රජකම අත් කර නොගනිද් ද? 18 මසේ එක
මිනිසකෙුගේ පාපී ක්‍රියාව නිසා හැම මිනිසාට ම
දඬුවමේ ඉරණම පැමිණියේ නම්, එක මිනිසකෙුගේ
දමිටු ක්‍රියාව නිසා හැමට ම ජීවනදායක
නිදොස්කමේ වරප්‍රසාදය ලැබනෙු ඇත. 19 එක
මිනිසකෙුගේ අකීකරුකමින් සියල්ලන් ම පව්කාරයන්
වූ සේ ම, එක මිනිසකෙුගේ කීකරුකමින් සියල්ලෝ
ම දමිටු බවට පමුණුවනු ලබන්නෝ ය.
20 ව්‍යවස්ථාව පැමිණි පසු පාපය වැඩි විය. එහතේ
පාපය වැඩි වූ තැන දේව වරප්‍රසාදය ඊටත් වැඩි
විය. 21 මසේ මරණය සලසමින් පාපය රජකම්
කළාක් මනේ දමිටු බව සලසමින් දේව වරප්‍රසාදය
රජකම් කළේ ය. ඒ දමිටු බව අපේ ස්වාමීන් වන

ජේසුස් ක්රිස්තුන් වහන්සේ කරණකොටගෙන
සදාතන ජීවනයට අප ගෙන යයි.

### පාපයෙන් මිදී ජීවනය ලැබීම

6 එසේ නම් කුමක් කියමු ද? දේව වරප්රසාදය
වැඩි වන පිණිස පාපයෙහි නිරත වී සිටිමු ද?
2 නැත, කොහෙත් ම නැත; පාපයෙන් විමුක්තිය ලැබූ
අප එහි තවදුරටත් ජීවත් වන්නේ කෙසේ ද?
3 බව්තීස්ම-ස්නාපනයෙන් ක්රිස්තුස් ජේසුස්
වහන්සේ හා සමඟ ඒකාබද්ධ වූ අප සියල්ලන් ම
එම බව්තීස්ම-ස්නාපනයෙන් උන් වහන්සේගේ
මරණයෙහි, උන් වහන්සේ හා සමඟ ඒකාබද්ධ වූ
බව ඔබ නොදන්නහු ද? 4 කොලොෙ 2:12එබැවින්
අපේ බව්තීස්ම-ස්නාපනයෙන් අපිත් උන්
වහන්සේගේ මරණයට, සම්බන්ධ වී උන් වහන්සේ
සමඟ වළලනු ලැබුවෙමු. එසේ කරනු ලැබුවේ
පියාණන් වහන්සේගේ මහිමාන්විත ක්රියාවෙන්
ක්රිස්තුන් වහන්සේ මළවුන්ගෙන් උත්ථානය ලැබූ
සේ ම, අප ද නව ජීවන මඟක ගමන් කරනු සඳහා
ය.
5 උන් වහන්සේගේ මරණය වැනි සිද්ධියකින් අපි
උන් වහන්සේ හා සමඟ එක් වුණාමෙු නම්, උන්
වහන්සේගේ උත්ථානය වැනි සිද්ධියකින් ද අපි උන්
වහන්සේ හා සමඟ එක් වන්නෙමු. 6 මින් මතු අප
පාපයට වහල් නොවන පිණිස අපේ පාපී ස්වභාවය
නැති වන සේ අපේ පූර්ව මිනිස් ගතිය උන්
වහන්සේ සමඟ කුරුසියෙහි ඇණ ගසනු ලැබූ බව
අපි දනිමු. 7 මන්ද, මළා වූ තැනැත්තාට පාපය ගැන
වගකීමක් නැත. 8 අපි ක්රිස්තුන් වහන්සේ සමඟ
මැරුණාමෙු නම්, උන් වහන්සේ සමඟ ජීවත් වන බව
ද විශ්වාස කරමු. 9 උත්ථාන කරනු ලැබූ ක්රිස්තුන්
වහන්සේ යළිත් නොමැරෙනෙ බව ද අපි දනිමු. මින්
මතු මරණය උන් වහන්සේ කෙරෙහි බල
පවත්වන්නේ නැත. 10 උන් වහන්සේ මරණයට පත්
වීමෙන් එක ම වරක් පාපය නිසා මළ සේක; එහෙත්
දැන් ජීවත් වන ජීවිතයෙන් දෙවියන් වහන්සේ
උදෙසා ජීවත් වන සේක. 11 ඔබත් එසේ ම පාප
විමුක්තිය ලත් අය බව ද, ක්රිස්තුස් ජේසුස්
වහන්සේ තුළ දෙවියන් වහන්සේ උදෙසා ජීවත් ව
සිටින්නන් බව ද සිතට ගන්න.
12 ඔබ කායික තෘෂ්ණාවලට අවනත නොවන
ලෙස මින් මතු ඔබගේ මැරෙනෙ සුලු ශරීරයෙහි
පාපය රජකම් නොකෙරේ වා. 13 තවද ඔබේ
ඉන්ද්රියයන් අදමිටුකමේ ආයුධ වන ලෙස පාපයට
භාර නොදෙන්න. එසේ නොකර මළවුන් කෙරෙන්
උත්ථාන වූ අය මෙන් දෙවියන් වහන්සේට කැප වී,
ඔබේ ඉඳුරන් දැමිටුකමෙහි ආයුධ වන ලෙස උන්
වහන්සේට භාර කරන්න. 14 මින් මතු ඔබේ
ස්වාමියා, පාපය නොවේ; මන්ද, ඔබ නීතිය යටතෙහි
නොව, දේව වරප්රසාදය යටතෙහි ජීවත් වන
බැවිනි.

### ධාර්මික සේවයට කැප වීම

15 එසේ නම් කුමක් කරමු ද? නීතිය යටතෙහි
නොව, දේව වරප්රසාදය යටතෙහි සිටින බැවින් අපි
පව් කරමු ද? කොහෙත්ම නැත. 16 ඔබ යමකුෙ
යටතේ වහල් සේවයට බැඳුණොත්, ඔබ ඒ
ස්වාමියාගේ දාසයන් වන බව නොදන්නහු ද? පාපය
ඔබේ ස්වාමියා වුවහොත්, එහි විපාකය මරණය
වේ. දෙවියන් වහන්සේට කීකරුකම ඔබේ ස්වාමියා
වුවහොත් එහි විපාකය දැමිටු බව වේ. 17 වරක්
පාපයට දාසයන් ව සිටි ඔබ, දැන් ඔබට භාර දී ඇති
ඉගැන්වීමට මුළු සිතින් කීකරු වූ බැවින් දෙවියන්
වහන්සේට ස්තුති වේ වා! 18 ඔබ පාපයෙන් නිදහස
ලැබූ විට දැමිටුකමේ දාසයෝ වූවහු ය. 19 ඔබගේ
තේරුම් ගැනීමේ දුර්වලතා මා දන්න නිසා නිදර්ශන
දක්වමින් ඔබට කතා කරමි. එනම්, ඔබ වරක්
අයුතුකම් කරන ලෙස ඔබේ ඉන්ද්රියයන්
අපිරිසුදුකමේත් අයුක්තියේත් වහල් සේවයට භාර
දුන්නාක් මෙන්, දැන් පාරිශුද්ධත්වය සඳහා ඔබේ
ඉඳුරන් දැමිටුකමේ වහල් සේවයට භාර දෙන්න.
20 ඔබ පාපයට දාසයන් ව සිටිය දී දැමිටුකමේ
නියමයන්ට නොබැඳී සිටියහු ය. 21 එයින් කුමන
ප්රතිඵලයක් ඇති වී ද? ඇති වූයේ ඔබ දැන්
ලජ්ජාවට පමුණුවන, මරණයෙන් කෙළවර වන
ප්රතිඵලය යි. 22 එහෙත් දැන් ඔබ පාපයෙන් නිදහස
ලබා දෙවියන් වහන්සේගේ දාසයන් ව සිටින බැවින්
සදාතන ජීවිතයෙන් කෙළෙවර වන, විශුද්ධි
මාර්ගයෙහි පල දරන්නහු ය. 23 පාපයේ විපාකය
මරණය යි, එහෙත් දෙවියන් වහන්සේගේ දීමනාව
නම් අපගේ ස්වාමීන් වන ක්රිස්තුස් ජේසුස්
වහන්සේ තුළ සදාතන ජීවනය යි.

### විවාහ ජීවිතයෙන් නිදර්ශනයක්

7 සහෝදරවරුනි, නීතිය මිනිසකුෙ කෙරේ
බලපාන්නේ ඔහු ජීවත් ව සිටින තුරු පමණක්
බව ඔබ නොදන්නහු ද? (මා කතා කරන්නේ නීතිය
දන්නා ඇත්තන්ට ය.) 2 විවාහ වූ ස්ත්රිය ස්වාමි
පුරුෂයා ජීවත් ව සිටින තුරු නීත්යනුකූල ව බැඳී
සිටියි. එහෙත් ස්වාමි පුරුෂයා මැරුණොත් ඈ විවාහ
බැම්මෙන් නිදහස් ය. 3 ස්වාමි පුරුෂයා ජීවත් ව සිටිය
දී ඈ පරපුරුෂ සේවනයෙහි යෙදුණොත් ඇයට
කාමමිථ්යාචාරයේ යෙදෙන්නී ය යි කියනු ලැබේ.
එහෙත් සිය හිමියා මළ පසු ඈ විවාහ බැම්මෙන්
නිදහස ලබයි. ඉන්පසු ඈ වෙන කෙනෙකු සමඟ
විවාහ වුවත් කාමමිථ්යාචාරය නොකරන්නී ය.
4 මාගේ සහෝදරවරුනි, ඔබ ද එලෙසෙ ම ක්රිස්තුන්
වහන්සේගේ ශරීරයට සම්බන්ධ වීමෙන්
ව්යවස්ථාවෙන් නිදහස ලබා ඇත. ඒ හේතුවෙන්
දෙවියන් වහන්සේට වැඩදායක වන පිණිස, ඔබ
වෙන කෙනෙකුට, එනම් උත්ථානය ලැබූ තැනැන්
වහන්සේට බැඳී සිටින්නහු ය. 5 ලෞකික පළෙඹීම්
අනුව අප ජීවත් ව සිටිය දී ව්යවස්ථාව නිසා
ඇවිස්සුණු කාම තෘෂ්ණා අප ඉඳුරන් තුළ

ක්‍රියාත්මක විය. එහි ප්‍රතිඵලය මරණය යි.
6 එහෙත් දැන්, වරක් අප තරයේ බැඳ තැබූ
බැම්මෙන් මිදීම ලබා, අපි නීතියෙන් නිදහස් ව සිටිමු.
එබැවින් අපි දැන් පැරණි ලිඛිත නීතිය යටතේ
නොව, ආත්මයාණන්ගේ නව ජීවනය තුළ සේවය
කරමු.

### ව්‍යවස්ථාව හා පාපය

7 නික්ම 20:17; ද්වි.නී. 5:21 එසේ නම්
ව්‍යවස්ථාවත් පාපයත් එක ම යයි නිගමනය කළ
හැකි ද? කොහෙත් ම නැත; එහෙත් ව්‍යවස්ථාව
නොතිබෙන්නට, පාපය කුමක් දැ යි දැනුමක් මට
ඇති විය නොහැක. “තණ්හා නොකරන්නැ”යි
ව්‍යවස්ථාවෙහි නොකියන්නට, තණ්හාව කුමක් දැ යි
දැනුමක් මට නැත. 8 එහෙත් පාපය, ආඥාව මඟින්
පාප ක්‍රියාවට ඉඩප්‍රස්ථාවක් සාදාගෙන විවිධාකාර
තණ්හා මා තුළ නිපදවී ය. ව්‍යවස්ථාව නොවී නම්,
පාපය ක්‍රියා විරහිත මළ දයෙකි. 9 නීතිය නොදැන
මා ජීවත් වූ කාලයක් විය. එහෙත් මට ආඥාව
දැනගන්න ලැබුණු කල, පාපය වහා ම පණ ලැබී ය.
10 මම ද මැරුණෙමි. ජීවිතය සඳහා පැන වූ ආඥාව
ම මා මරණයට පැමිණ වී ය. 11 උත් 3:13මන්ද,
පාපය, ආඥාව මඟින් ක්‍රියාවට ඉඩප්‍රස්ථාවක්
සලසාගෙන, මා රවටා, ආඥාව උපයෝගී
කොටගෙන, මා මැරී ය.
12 එසේ වුව ද ව්‍යවස්ථාව ශුද්ධ ය, ආඥාව ද
ශුද්ධ ය, සාධාරණ ය, යහපත් ය. 13 එසේ නම්
යහපත පිණිස පැන වූ ව්‍යවස්ථාව ම මට මරණය
පැමිණ වී ද? කොහෙත් ම නැත; මා මරණයට පත්
කළේ පාපය ය. මයෙන් පාපයේ පාපී ගතිය හෙළි
විය. එය, යහපත් දයෙක් උපයෝගී කොටගෙන මා
මරණයට පත් කළේ ය. මෙසේ ආඥාව මඟින්
පාපය වඩාත් පාපිෂ්ඨ විය.

### සිත තුළ සටන

14 නීතිය ආධ්‍යාත්මික බව අපි දනිමු. එහෙත්
ලෞකික වූ මම පාපයට වහල් වී සිටිමි. 15 ගලා
5:17මා කරන දේ මට ම නොතේරේ. මා කරන්නේ
මා කරන්නට කැමැති දේ නොව, මා ද්වේෂ කරන
දේ ය. 16 මා කරන්නේ මා අකමැති දයෙ බව මට
හැඟේ නම්, එයින් නීතිය යහපත් බව මම ඒත්තු
ගනිමි. 17 සැබැවින් ම මා කරන දයෙ කරන්නේ මා
නොව මා තුළ ඇති පාපය වේ. 18 මා තුළ, එනම්,
මාගේ මිනිස් ගතිය තුළ කිසි යහපතක් නැති බව
දනිමි. මන්ද, යහපත කිරීමට කැමැත්තක් මට ඇතත්,
එය ඉටු කිරීමට ශක්තියක් මට නැත. 19 මා කැමැති
වන යහපත නොකර, මා අකමැති වන අයහපත
මම කරමි. 20 ඉදින් මා කරන්නේ මා අකමැති වන
දයෙ නම්, එය කරන්නේ මා නොව, මා තුළ ඇති
පාපය ය. 21 එබැවින් යහපත කිරීමේ කැමැත්ත මට
ඇති අතර, නපුර මා නොමඟට පොළඹවන්නේ ය
යන ප්‍රතිපත්තියක් මට පෙනේ. 22 මාගේ හද
පත්ලෙන් මම දෙවියන් වහන්සේගේ ආඥාවට ප්‍රිය
කරමි. 23 එහෙත් මාගේ මනසෙහි ඇති ඒ නීතියට
විරුද්ධ ව සටන් කරන මාගේ ඉන්ද්‍රියයන් තුළ වූ
පාප නීතියේ වහල්කමට මා හෙළෙන, වෙනෙ
ප්‍රතිපත්තියක් මාගේ ඉන්ද්‍රියයන් තුළ ඇති බව
මට පෙනේ. 24 අනේ, මා වැනි කාලකණ්ණි
මිනිහෙක්! මේ මරණීය ශරීරයෙන් මා මුදන්නේ
කවරෙක් ද? 25 අපේ ස්වාමීන් වන ජේසුස්
ක්‍රිස්තුන් වහන්සේ තුළින් දෙවියන් වහන්සේට
ස්තුති වේ වා! කොටින් කියතොත්, මනසින් මා
දේව ආඥාව පිළිගනිතත්, මිනිස් ගතිය අනුව මා
යටත් ව සිටින්නේ පාප ආඥාවට ය.

### ශුද්ධාත්මානුභාවයෙන් ජීවත් වීම

8 මෙසේ ක්‍රිස්තුන් වහන්සේ තුළ
ජීවත්වන්නවුනට විරුද්ධ ව නඩු තීන්දුවක්
නැත. 2 ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ වූ
ජීවනදායක ආත්මයාණන්ගේ ආධ්‍යාත්මික
ප්‍රතිපත්ති, පාපයේ හා මරණයේ නියමයෙන් ඔබ
නිදහස් කර ඇත. 3 මිනිස් දුර්වලතා නිසා,
ව්‍යවස්ථාවට ඉටු කළ නොහැකි දයෙ දෙවියන්
වහන්සේ ඉටු කළ සේක. එසේ කළේ, පාපයේ
බලය බිඳින පිණිස, ස්වකීය පුත්‍රයාණන්ට අපේ
පාපී වූ මිනිස් කයට සමාන කයක් දී එවමින්, ඒ
මිනිස් කයේ සිටිය දී දෙවියන් වහන්සේ විසින්
පාපයට විරුද්ධ ව තීන්දුව දීමෙනි. 4 උන් වහන්සේ
එසේ කළේ මාංසය අනුව නොව, ආත්මයාණන්
අනුව හැසිරෙන අප තුළ නීතියේ නියමයන් ඉටු වන
පිණිස ය. 5 මාංසික ලෙස ජීවත් වන්නෝ මාංසික
දේවලට ද ආත්මයාණන් අනුව ජීවත් වන්නෝ
ආධ්‍යාත්මික දේවලට ද මුළු සිතින් ප්‍රිය කරති.
6 මාංසික චේතනාවේ විපාකය මරණය වේ;
ආධ්‍යාත්මික චේතනාවේ විපාකය ජීවනය හා
ශාන්තිය වේ. 7 මාංසික චේතනාව දේව
විරෝධකමකි. එය දෙවියන් වහන්සේගේ ආඥාවට
යටත් නොවූවකි. එසේ ම යටත් නොවන්නකි.
8 මාංසික තෘෂ්ණාවලට වසඟවූවන්ට දෙවියන්
වහන්සේ සතුටු කළ නොහැකි ය.
9 එහෙත් දෙවියන් වහන්සේගේ ආත්මයාණෝ
සැබැවින් ම ඔබ තුළ වාසය කරන සේක් නම්, ඔබ
ජීවත් වන්නේ මාංසික තෘෂ්ණාවල නොව,
ආත්මයාණන් තුළ ය. යම් කෙනෙකුට ක්‍රිස්තුන්
වහන්සේගේ ආත්මයාණන් නැති නම්, ඔහු උන්
වහන්සේට අයිති නැත. 10 එහෙත් ක්‍රිස්තුන්
වහන්සේ ඔබ තුළ වැඩ වසන සේක් නම්, පාපය
නිසා ඔබේ ශරීරය මැරී ඇතත්, දැමිටු බව නිසා
ඔබේ ආධ්‍යාත්මය ජීවමාන ය. 11 1 කොරි
3:16තවද, ජේසුස් වහන්සේ මළවුන් කෙරෙන්
උත්ථාන කළ තැනැන් වහන්සේ ඔබ තුළ වැඩ වසන
සේක් නම්, ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ මළවුන්
කෙරෙන් උත්ථාන කළ තැනැන් වහන්සේ ඔබ තුළ
වසන ආත්මයාණන් වහන්සේ කරණකොටගෙන
ඔබගේ මරණීය ශරීර ජීවමාන කරන සේක.

12 එබැවින් සහෝදරවරුනි, මාංසයට ගැති ව ජීවත්
වීමට අප මාංසයට බැඳී නැත. 13 ඔබ මාංසයට ගැති
ව ජීවත් වන්නහු නම් මරණයට පත් වනු ඇත.
එහෙත් ආත්මයාණන් මඟින් ඔබ මාංසික ක්‍රියා
නසන්නහු නම්, ඔබ සැබැවින් ම ජීවත් වන්නහු ය.
14 දේවාත්මයාණන් විසින් මඟ පෙන්වනු ලබන්නෝ
දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ ය. 15 මාක් 14:36;
ගලා 4:6ගලා 4:5-7මන්ද, ඔබ ලබා ඇත්තේ නැවතත්
බිය ගෙන දෙන වහල් සේවයේ තත්ත්වය නොව,
“අබ්බා, පියාණෙනි”යි අමතා යාච්ඤා කිරීමට ඉඩ
ඇති පුත්‍රකම ලැබීමේ තත්ත්වයකි. 16 අප දෙවියන්
වහන්සේගේ දරුවන් බවට ශුද්ධාත්මයාණෝ ම අප
ආත්මය හා එක් ව සාක්ෂි දරති. 17 අපි දරුවෝ නම්
උරුමක්කාරයෝ ද වම්හ. දෙවියන් වහන්සේගේ
උරුමක්කාරයෝ ද ක්‍රිස්තුන් වහන්සේ හා සමඟ
හවුල් උරුමක්කාරයෝ ද වම්හ. මන්ද, දැන් උන්
වහන්සේගේ දුක් විඳීමේ පංගුකාරයන් වීමෙන්,
අනාගතයේ දී උන් වහන්සේගේ මහිමයේ
පංගුකාරයෝ ද වම්හ.

## පාරලෞකික මහිමශ්‍රීය

18 මේ ජීවිතයේ දුක් වේදනා, අපට මතු එළිදරව්
වන්නට යන මහිමය සමඟ කිසි සේත් සැසඳිය
නොහැකි ය යි කල්පනා කරමි. 19 මවා ඇති මේ
විශ්වය වුව ද දේව පුත්‍රයන්ගේ එළිදරව් වීම පුල
පුලා බලා සිටියි. 20 උත් 3:17-19මන්ද, විශ්වය,
ශූන්‍යතාවට යටත් කළ තැනැන් වහන්සේ එසේ
කළේ, විශ්වයේ කැමැත්තෙන් නොව, එසේ යටත්
කළ උන් වහන්සේගේ ම බලාපොරොත්තු සහගත
කැමැත්තෙනි. 21 ඒ බලාපොරොත්තුව නම් මවා ඇති
මේ විශ්වය ජරාපත් වීමේ වහල්කමෙන් මිදී දේව
දරුවන්ට හිමි මහිමාන්විත නිදහස ලැබීම ය. 22 මවා
ඇති මුළු විශ්වය මේ දක්වා ම ප්‍රසව වේදනාවෙන්
කෙඳිරිගානා බව අපි දනිමු. 23 2 කොරි
5:2-4එපමණක් නොව, ආත්මයාණන් වහන්සේ
කෙරෙන් වන දීමනාවේ නාඹුල් පල ලැබූ අපි ද,
අපේ කායික මිදීම වන, පුත්‍රකමට පිළිගනු ලැබීමේ
බලාපොරොත්තුවෙන් අප තුළ ම සුසුම් ලමු. 24 අප
ගැළවීම ලබාගත්තේ බලාපොරොත්තුව
කරණකොටගෙන ය. පෙනෙන දේ ගැන
බලාපොරොත්තුව, බලාපොරොත්තුවක් නොවේ.
පෙනෙන දෙයක් ගැන බලාපොරොත්තු වන්නේ
කුමට ද? 25 එහෙත් අපි නොපෙනෙන දෙයක්
බලාපොරොත්තු වෙමු නම්, එය ඉවසිල්ලෙන් යුතුව
බලා සිටිමු.
26 එලෙස ම ශුද්ධාත්මයාණන් වහන්සේත් අපගේ
දුර්වලකමේ දී අපට ආධාර දෙන සේක. නිසි ලෙස
යාච්ඤා කළ යුත්තේ කෙසේ දැ යි අපි නොදනිමු.
එහෙත් ශුද්ධාත්මයාණන් වහන්සේ ම වචනවලින්
කිය නොහැකි සුසුම්ලෑම්වලින් දෙවියන් වහන්සේ
වෙත අප වෙනුවෙන් අයැදින සේක. 27 අප
සිත්සතන්හි ඇති සියල්ල විමසා බලන දෙවියන්
වහන්සේ ශුද්ධාත්මයාණන්ගේ අයැදුම් දන්නා සේක.
මන්ද, ශුද්ධාත්මයාණන්, සැදැහැවතුන් උදෙසා කරන
අයැදුම් දේව අදහසට එකඟ වන බැවිනි.
28 තවද දෙවියන් වහන්සේගේ අදහස ලෙස
කැඳවනු ලැබූවන්ට, එනම්, උන් වහන්සේට ප්‍රේම
කරන අයට, සියල්ලෙහි දී ම උන් වහන්සේ
ඔවුන්ගේ යහපත පිණිස ක්‍රියා කරන බව අපි
දනිමු. 29 මන්ද, උන් වහන්සේ කලින් තෝරාගත් අය
ස්වකීය පුත්‍රයාණන්ගේ ස්වරූපයට සමාන වන
පිණිස කල්තියා වෙන් කරගත් සේක. එසේ කළේ
තමන් වහන්සේගේ පුත්‍රයාණන් බොහෝ
සහෝදරයන් අතර ජ්‍යෙෂ්ඨයාණන් වන පිණිස ය.
30 එසේ, කලින් තෝරාගත් අය උන් වහන්සේ
කැඳවාගත් සේක; කැඳවාගත් අය උන් වහන්සේ
දමිටු බවට පැමිණවූ සේක; දමිටු බවට පැමිණවූ
අය උන් වහන්සේ මහිමයට පැමිණවූ සේක.

## අනභිභවනීය දේව ප්‍රේමය

31 කරුණු මෙසේ නම් කුමක් නිගමනය කරමු ද?
දෙවියන් වහන්සේ අපේ පක්ෂයට නම් අපට විපක්ෂ
වන්නේ කවරෙක් ද? 32 උන් වහන්සේ තමන්ගේ ම
පුත්‍රයාණන් වුව ද ඉතිරි කර නොගෙන, අප හැම
උදෙසා පරිත්‍යාග කළ සේක. එසේ නම්, ඒ දීමනාව
සමඟ උන් වහන්සේ අන් හැම දෙයක් ම අපට
නොමසුරු ව නොදෙන සේක් ද? 33 දෙවියන්
වහන්සේ විසින් තෝරාගනු ලැබූ අය වරදට පත්
කරන්නේ කවරෙක් ද? ඔවුන් නිවැරදි බව ප්‍රකාශ
කරන්නේ දෙවියන් වහන්සේ ය. 34 එසේ නම්
ඔවුන් වැරදිකරුවන් බවට තීන්දු කරන්නේ කවරෙක්
ද? අප උදෙසා මැරුණේත්, අප උදෙසා මරණයෙන්
උත්ථාන වූයේත් ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ ය.
දෙවියන් වහන්සේගේ දකුණු පස වැඩසිටිමින් අප
වෙනුවෙන් මැදහත් වන්නේත් උන් වහන්සේ ය.
35 ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන්
කළ හැකි කිසිවක් ඇද් ද? විපතට වත්, දුක්
වේදනාවට වත්, පීඩාවට වත්, සාගින්නට වත්, දුගී
බවට වත්, උවදුරට වත්, කඩුවට වත් අප වෙන් කළ
හැකි ද? 36 ගීතා 44:22ශුද්ධ ලියවිල්ලෙහි ලියා ඇති
ලෙස:
q2 36 “දවස පුරා අපි ඔබ නිසා මරුමුවට පත් වෙමු.
q2 36 ඝාතනයට වෙන් කළ බැටළුවන් මෙන් ගණන්
ගනු ලැබුවෙමු.”
37 එහෙත් අපට ප්‍රේම කළ තැනැන් වහන්සේ නිසා
අපි මේ සියල්ලේ දී ම විජයග්‍රාහී වෙමු. 38 මන්ද,
මරණයට වත්, ජීවිතයට වත්, දේව දූතයන්ට වත්,
භූතාධිපතීන්ට වත්, බලධාරීන්ට වත්, දැන් තිබෙන
කිසිවකට වත්, මතු පැමිණෙන කිසිවකට වත්,
39 අතී උසට වත්, මහා ගැඹුරට වත්, මුළු විශ්වයෙහි
අන් කිසි මැවිල්ලකට වත් අපගේ ස්වාමීන් වන
ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ ඇති දේව
ප්‍රේමයෙන් අප වෙන් කළ නොහැකි බව මම
ඒකාන්තයෙන් ම දනිමි.

### දෙවියන් වහන්සේ තෝරා ගත් සෙනඟ

9 මම ක්‍රිතුනුවකු වශයෙන් සත්‍යය පවසමි.
මයෙ මුසාවක් නොවේ. ඒ බවට
ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ මාගේ හෘදය
සාක්ෂිය සහතික කරයි. 2 මා තුළ බලවත්
ශෝකයක් ද හදවතහෙි නිරන්තර වේදනාවක් ද
ඇත. 3 මාගේ ලේ නෑයන් වූ සහෝදරයන් උදසො,
ක්‍රිස්තුන් වහන්සේගෙන් වෙන් වී සාප ලද්දකු
වීමට හැකි නම් ඊට වුවත් මම කැමැති වමේ.
4 නික්ම 9:4ඔව්හු ඉශ්‍රායලේවරු ය, දේව පුත්‍රකමට
පිළිගනු ලැබීම හා මහිමය ඔවුන්ගේ ය. ගිවිසුම් හා
ව්‍යවස්ථාව ද දේව සේවය හා පොරොන්දු ද ඔවුන්
සතු ය. 5 ඔවුන් ජාතියේ පීතෘවරුන්ගේ පළෙපතට
අයිති ය. මනුෂ්‍යයකු ලසෙ ක්‍රිස්තුන් වහන්සේ
උපන්නේත් එම පළෙපතහෙි ම ය. මුළු විශ්වයට
අධිපති වූ දෙවියන් වහන්සේට සදහට ම ප්‍රශංසා
වේ වා! ආමනේ.
6 එහතේ දෙවියන් වහන්සේගේ පොරොන්දුව
නිරර්ථක වූවා නොවේ. මන්ද, ඉශ්‍රායලේ
පළෙපතනේ පැවත එන සියල්ලෝ ම තෝරාගත්
සෙනඟ නොවෙති. 7 උත් 21:12එමනේ ම
ආබ්‍රහම්ගනේ පැවත එන සියල්ලෝ ම ඒ නිසා ම
ඔහුගේ දරුවෝ නොවෙති. කසෙේ වතෙත්, “ඔබට
පළෙපත ලැබනේනේ ඊසාක් ගනේ ය”යි ලියා ඇත.
8 ඉන් අදහස් කරනුයේ, ස්වාභාවික ලසෙ උපන්
දරුවන් දෙවියන් වහන්සේගේ දරුවන් නොවෙන
බවත්, ආබ්‍රහම්ගේ පළෙපත වශයනේ ගණන්
ගැනනේනේ පොරොන්දුව අනුව උපන් දරුවන් බවත්
ය. 9 උත් 18:10ඒ පොරොන්දුව නම්, “නියමිත
කාලයේ දී මම එන්නමේ, එවිට සාරාට පුතකු
ලැබනෙු ඇත” යනු යි. 10 එපමණකුත් නොවේ,
රබෙකොගේ දරුවන් දදෙනොට ඊසාක් නම් එක ම
පියකේ විය. 11 එහතේ ඔවුන් උපදින්න කලින්,
යහපත හෝ අයහපත හෝ කරන්නටත් පරෙ,
12 උත් 25:23“වැඩිමලා බාලයාට සේවය කරනු
ඇතැ”යි ඇට කියන ලදී. එසේ කියන ලද්දේ,
දෙවියන් වහන්සේගේ තෝරා ගැනීම, උන්
වහන්සේගේ කැඳවීම අනුව මිස, මනුෂ්‍යයාගේ
ක්‍රියා මත රඳා නැති බව ස්ථිර වන පිණිස ය.
13 “මම ජාකොබ්ට ප්‍රමේ කළෙමේ. ඒසව්ට ද්වේෂ
කළෙමේ”යි ලියා තිබනේනේත් ඒ නිසා ය.මලාකි
1:2-3
14 එසේ නම් අපි කුමක් නිගමනය කරමු ද?
දෙවියන් වහන්සේගේ තීන්දුව අසාධාරණ ද?
කොහතේ ම නැත. 15 නික්ම 33:19මන්ද, “මම දයාව
දක්වන්නට කැමැති අයට දයාව දක්වන්නමේ;
අනුකම්පාව දක්වන්නට කැමැති අයට අනුකම්පාව
දක්වන්නමේ”යි උන් වහන්සේ මෝසසේට වදාළ
සේක. 16 එහයෙින් සියල්ල රඳා ඇත්තේ මිනිසාගේ
කැමැත්ත පිට වත්, ශ්‍රමය පිට වත් නොව, දෙවියන්
වහන්සේගේ දයානුකම්පාව පිට ය. 17 නික්ම
9:16මන්ද, “මා නුඹ පත් කළේ හුදකේ නුඹ
කරණකොටගනෙ මාගේ බලය පා මාගේ නාමය
ලොව පුරා ප්‍රකාශ කරන පිණිස ය”යි ශුද්ධ
ලියවිල්ලහෙි පාරාවෝට කියා ඇත. 18 මසෙේ සිය
කැමැත්ත අනුව උන් වහන්සේ ඇතැමකුෙට දයාව
දක්වන සේක; ඇත්මකුෙගේ සිත් දැඩි කරන සේක.

### දේව දයාව හා සාධාරණත්වය

19 උන් වහන්සේගේ කැමැත්තට විරුද්ධ ව සිටීමට
කිසිවකුෙට නොහැකි නම්, “උන් වහන්සේ තවමත්
මිනිසාට දොස් නඟන්නේ මන්දැ”යි ඔබ මගනේ
ප්‍රශ්න කරනු ඇත. 20 යසො 29:16; 45:9අනේ
ඇත්තට ම, මිනිසකු වන ඔබ දෙවියන් වහන්සේ
සමඟ එකට එක කීමට තරම් කවරකේ ද? “මා
මසෙේ තැනුවේ මන්දැ”යි මැටි බඳුන එය තැනූ
කුම්භකාරයාට කියනු ඇද් ද? 21 එක මැටි පිඩකින්
එක බඳුනක් ඉස්තරම් ලසෙත්, අනකෙ සාමාන්‍ය
භාවිතය පිණිසත් තැනීමට කුම්භකාරයාට බලයක්
නැද් ද? 22 දෙවියන් වහන්සේ ක්‍රියා කර ඇත්තේත්
එසේ ම ය. උන් වහන්සේ සිය උදහස පනේවන්නට
ද සිය බලය ප්‍රකාශ කරන්නට ද කැමැති වූ සේක.
නමුත්, විනාශයට නියම වූ උදහසට ලක්විය යුතු වූ
අය කරෙහෙි මහත් ඉවසීමක් දැක්වූ සේක. 23 තවද,
උන් වහන්සේගේ මහිමය ලැබීම පිණිස කලින්
තමන් වහන්සේ සූදානම් කළ දයාව ලැබිය යුතු අය
වූ, 24 ජුදෙව්වරුන්ගනේ පමණක් නොව
විජාතීන්ගනේ ද කැඳවන ලද අප කරෙහෙි, තමන්
වහන්සේගේ මහිමයේ සම්පත ප්‍රකාශ කරන්නට
උන් වහන්සේ කැමැති වූ සේක. 25 හොසි 2:23උන්
වහන්සේ ඒ බව හොසියාගේ පොතේ මසෙේ කියා
ඇත:
q225 “මාගේ සෙනඟ ව නොසිටි අයට ‘මාගේ
සෙනඟ ය’ කියාත් මා ප්‍රිය නොකළ ජාතියකට
‘මාගේ ප්‍රියාවී ය’ කියාත්,
26 හොසි 1:10 ඔබ මාගේ සෙනඟ නොවෙති යි
ඔවුන්ට කියා ඇති තැන, ‘ඔබ ජීවමාන දෙවියන්
වහන්සේගේ පුත්‍රයෝ ය’ කියාත් කියනු ලබන්නහු
ය.”
27 යසො 10:22-23 තවද යසොයා ඉශ්‍රායලේ ගැන
ප්‍රකාශයක් කරමින්: “ඉශ්‍රායලේ දරුවන්ගේ ගණන
මුහුදු වරෙළේ වැලි මනේ වුව ද, ගැළවනේනේ
ස්වල්ප දනෙකේ පමණකෙි. 28 මන්ද, සමිඳාණන්
වහන්සේ සිය අදහස අප්‍රමාද ව හා තීරණාත්මක
ලසෙ මිහි පිට ඉටු කරන සේකැ”යි කියයි. 29 යසො
1:9කලිනුත් යසොයා මසෙේ පවසා ඇත:
q229 “සව් බලැති සමිඳාණන් වහන්සේ අපට
වංශයක් ඉතිරි නොකළ සේක් නම්, අපට වන්නේ
සොදොමට වූ දයෙ ම ය;
q229 ගොමෝරාවට වූ දයෙ ම ය.”

### ඇදහිල්ලේ මාර්ගය හා ක්‍රියා මාර්ගය

30 එසේ නම් අපි කුමක් කියමු ද? දමිටු බව
නොසොයා සිටි විජාතීහු එවැනි දමිටු බවට, එනම්,
ඇදහිල්ලේ ප්‍රතිඵලය වන දමිටු බවට පැමිණියහ.

31 එහෙත් නීතිය අනුව දමිටු බව සොයා ගිය
ඉශ්රායලේ සෙනඟ නීත්යනුකූල දමිටු බවට
නොපැමිණියහ. 32 එසේ වුයේ, ඔවුන් එය
ඇදහිල්ලේ මාර්ගයෙනේ නොව ක්රියා මාර්ගයෙනේ
සෙවූ බැවිනි. ඔව්හු පැකිලීම් ගලෙහි ගැටී වැටුණෝ
ය.
33 යසො 28:16 ශුද්ධ ලියවිල්ලෙහි මෙසේ ලියා ඇත:
q2 33 “සෙනඟ පැකිලී වැටෙන පිණිස ගලක් ද
ඔවුන්ට බාධා වන පිණිස පර්වතයක් ද සියොනෙහි
තබමි, උන් වහන්සේ කෙරෙහි අදහාගන්නා අය කිසි
සේත් ලජ්ජාවට නොපැමිණෙති.”

10 සහෝදරයෙනි, මාගේ සිතෙහි ඇති බලවත්
ආශාව නම් ජුදවේවරුන්ගේ ගැළවීම ය;
දවේයන් වහන්සේට මා කරන ආයාචනය ඒ උදසො
ය. 2 දවේයන් වහන්සේට අධික ලැදියාවක් ඔවුන්
තුළ ඇති බවට මම සාක්ෂි දරමි; එහෙත් එය හරි
පැහැදීමක් නැති ලැදියාවකි. 3 දමිටු බවට පැමිණීමේ
මාර්ගය නොදත් ඔව්හු, තමන්ගේ ම මාර්ගයක්
සලසාගැනීමට ප්රයත්න දරමින් දමිටු කරනු ලැබීමට
යටත් නොවූ හ. 4 මන්ද, අදහන සියල්ලන් ම දමිටු
බවට පැමිණවීමෙනේ ක්රිස්තුන් වහන්සේ
ව්යවස්ථාවේ පරමාර්ථය සපුරාලූ සේක.

### සියල්ලන්ට ගැළවීමේ මාර්ගය

5 ලවේ 18:5 ව්යවස්ථාව පිළිපැදීමෙනේ ඇති වන
දමිටු බව පිළිබඳ ව මෝසසේ මෙසේ ලියා ඇත:
“ව්යවස්ථාව පිළිපදින තැනැත්තා එයින් ජීවත්
වන්නේ ය.” 6 ද්වි.නී. 30:12-14එහෙත් ඇදහිල්ලෙනේ
ඇති වන දමිටු බවෙනේ පැවසෙන්නේ මෙයෙ යි:
“ක්රිස්තුන් වහන්සේ පහතට වැඩමවාගැනීමට
ස්වර්ගයට නගින්නේ කවරෙක් ද? 7 නැතහොත්
ක්රිස්තුන් වහන්සේ මළවුන් කෙරෙනේ ගෙනෙන
පිණිස පාතාලයට බසින්නේ කවරෙක් දැ”යි සිතින්
නොසිතන්න. 8 එයින් තව කුමක් පැවසේ ද?
පැවසෙන්නේ: “වාක්යය ඔබේ මුවෙහි ය, ඔබේ
සිතෙහි ය, ඔබ ළඟ ම ය” කියා ය. ඒ වාක්යය අප
ප්රකාශ කරන ඇදහිල්ලේ පණිවුඩය වේ. 9 ඔබ
‘ජේසුස් වහන්සේ සමිඳාණන් වහන්සේ ය’යි
ප්රසිද්ධියේ ප්රකාශ කරන්නෙහි නම්, දවේයන්
වහන්සේ උන් වහන්සේ මළවුන්ගෙනේ උත්ථාන කළ
බව සිතින් අදහන්නෙහි නම්, ඔබ ගැළවීම
ලබන්නෙහි ය. 10 යසො 28:16මනුෂ්යයකේ සිතින්
ඇදහීමෙනේ දමිටු බවට පැමිණෙන්නේ ය; මුවින්
පැවසීමෙනේ ගළවනු ලබන්නේ ය. 11 “උන් වහන්සේ
අදහන කිසිවකේ ලජ්ජාවට නොපැමිණෙතේ”යි ශුද්ධ
ලියවිල්ලෙහි සඳහන් ව ඇත. 12 ජුදවේවා හා
ග්රීකයා අතර වනෙසක් නැත. එක ම සමිඳාණන්
වහන්සේ සියල්ලන්ගේ ම සමිඳාණන් වහන්සේ ය;
උන් වහන්සේගේ පිහිට අයැදින සියල්ලන්ට උන්
වහන්සේ සියලු යසඉසුරු සලසා දෙන සේක.
13 ජෝවෙ 2:32මන්ද: “සමිඳාණන් වහන්සේගේ
නාමය කියා අයැදින කවරකේ නමුත් ගැළවීම
ලබති”යි ශුද්ධ ලියවිල්ලෙහි කියා ඇත.

14 අදහා නොගත් කෙනෙකුට යැදුම් පුදන්නේ
කෙසේ ද? නෑසූ කෙනෙකු අදහන්නේ කෙසේ ද?
දේශකයකු නැති ව අසන්නේ කෙසේ ද? 15 යසො
52:7යවනු නොලැබුවොත් දේශනා කරන්නේ කෙසේ
ද? මේ පිළිබඳ ව: “සුබ අස්න ගෙන එන ධර්ම
දූතයන්ගේ පාද කොතරම් මනහර ද?” කියා ශුද්ධ
ලියවිල්ලෙහි සඳහන් ව ඇත.
16 යසො 53:1 එහෙත් හැම දෙනා ම ඒ සුබ
අස්නට සවන් දුන්නේ නැත. මන්ද, “සමිඳාණන්
වහන්ස, අපේ පණිවුඩය විශ්වාස කළේ කවරෙකේ
දැ”යි යසොයා අසයි. 17 ඇදහිල්ල ඇති වන්නේ
පණිවුඩය ඇසීමෙනි, පණිවුඩය ඇති වන්නේ
ක්රිස්තුන් වහන්සේ ගැන දසීමෙනි.
18 ගීතා 19:4 එහෙත් ඔව්හු සවන් නුදුන්නාහු දැ යි
මම ප්රශ්න කරමි. සැබැවින් ම ඔව්හු සවන් දුන්නාහු
ය. ශුද්ධ ලියවිල්ලේ ලියා ඇති පරිදි:
q2 18 “දූතයන්ගේ දහම් හඬ පොළොව පුරා පැතිරී
ඇත;
q2 18 ඔවුන්ගේ වචන ලෝක සීමා දක්වා විසිරී
ඇත.”
19 ද්වි.නී. 32:21 එහෙත් ඉශ්රායලේ ජාතිය එය
නොදැන සිටියා දැ යි මම යළි යළිත් ප්රශ්න කරමි:
q2 19 “නියම ජාතියක් නොවන ජනතාවක් කෙරෙහි
ඊර්ෂ්යා කිරීමට මම නුඹලා තදින් පොළඹවන්නමේ;
q2 19 අනුවණ ජාතියක් කෙරේ නුඹලාගේ කෝපය
අවුස්සන්නමේ”යි
19 පළමුකොට මෝසසේ කියයි. 20 යසො
65:1තවද, යසොයා නිර්භය ව කතා කරමින්:
q2 20 “නොසෙවූ අයට මම හමු වීමි;
q2 20 මා ගැන නොවිමසූ අයට මම ප්රකාශ වීමි”යි
20 කියයි. 21 යසො 65:2එහෙත් ඔහු ඉශ්රායලේ
ජනතාව ගැන කතා කොට:
q2 21 “අකීකරු, කැරලිකාර සෙනඟක් දසෙට දවස
මුලුල්ලේ ම මාගේ අත් දිගු කළෙමේ”යි කියයි.

### ඉශ්රායලේ ජාතියේ වැටීම හා නැඟීම

11 පිලිප් 3:5 එසේ නම් දවේයන් වහන්සේ සිය
සෙනඟ අත් හළ සේක් දැ යි මම ප්රශ්න
කරමි. කොහෙත් ම නැත. මන්ද, මමත් ආබ්රහම්ගේ
පළෙපතට ද බෙන්ජමින්ගේ ගෝත්රයට ද අයත්
ඉශ්රායලේ ජාතිකයකේමි. 2 දවේයන් වහන්සේ
ආදියේ දී තෝරාගත් සිය සෙනඟ අත් නොහළ
සේක. ශුද්ධ ලියවිල්ලේ එලියා ගැන ලියා තිබෙන
පරිදි ඔහු ඉශ්රායලේවරුන්ට විරුද්ධ ව දවේයන්
වහන්සේට චෝදනා කළ සැටි ඔබ දන්නවා නොවේ
ද? 3 1 රාජා 19:10,14එනම්, “ස්වාමීනි, ඔව්හු ඔබගේ
දිවැසිවරයන් මැරූ හ, ඔබගේ පූජාසන බිඳලූ හ, මම
පමණක් ඉතිරි වී සිටිමි, ඔව්හු මාගේත් දිවි
නසන්නට සොයති” යනුයි. 4 1 රාජා 19:18එහෙත්
ඔහුට දවේයන් වහන්සේ දුන් පිළිතුර කුමක් ද?
“බාල් දේවතාවාට දණ නොනැමූ සත් දහසක්
මනුෂ්යයන් මම ඉතිරි කරගතිමි” යනුයි. 5 එසේ ම
දැනුත්, දේව වරප්රසාදයෙනේ තෝරාගනු ලැබූ ඉතිරි

කුඩා පිරිසක් ඇත. 6 එසේ වූයේ ඔවුන්ගේ ක්‍රියා
නිසා නොව දේව වරප්‍රසාදයෙනේ ය. ක්‍රියා නිසා
එසේ සිදුවුණි නම්, දේව වරප්‍රසාදය කිසි සේත්
දේව වරප්‍රසාදය නොවේ. 7 මයෙින් අපි කුමක්
නිගමනය කරමු ද? ඉශ්‍රායලේ ජනතාව සෙවූ දේ
ඔවුන්ට නොලැබිණි. තෝරාගත් ඉතිරි වූ පිරිසකට
එය ලැබිණි. සෙසු අයගේ සිත් දැඩි කරනු ලැබී ය.
8 ද්වි.නී. 29:4; යෙසා 29:10ශුද්ධ ලියවිල්ලෙහි ලියා
ඇති පරිදි: “දෙවියන් වහන්සේ අද දක්වා ම ඔවුන්ට
උදාසීනකමක් ද, පෙනීමක් නැති ඇස් ද ඇසීමක් නැති
කන් ද දුන් සේක. 9 ගීතා 69:22-23තවද දාවිත් කතා
කොට:
q29 “ඔවුන්ගේ කෑම් බීම් ඔවුන්ට මලපතක් හා
උගුලක් ද බාධකයක් හා දුර්විපාකයක් ද කරනු
ලැබේ වා.
10 නොපෙනෙන සේ ඔවුන්ගේ ඇස් ඇඳිරි වේ වා,
නිතර ම ඔවුන්ගේ පිටකොන්ද බරනේ නැමුව
මැනව”යි
10 කියයි. 11 එසේ වී නම්, ඔවුන් පැකිළුණේ
වැටෙන පිණිස දැ යි ප්‍රශ්න කරමි. එසේ නොවේ.
ඉශ්‍රායලේ ජාතියේ වැටීම හේතුකොටගෙන
විජාතීන්ට ගැළවීම පැමිණ තිබේ. එසේ වූයේ
ඉශ්‍රායලේවරුන් තුළ උනන්දුව පුබුදුවන පිණිස ය.
12 ඉදින් ඔවුන්ගේ වැටීම ලෝකයාට සුබ සෙත
පිණිස ද ඔවුන්ගේ පිරිහීම විජාතීන්ට සුබ සෙත
පිණිස ද වේ නම්, ඔවුන්ගේ සම්පූර්ණ නැඟීම
කොපමණ වැඩියෙනේ සුබ සෙත පිණිස නොවන්නේ
ද?

## විජාතීන්ගේ ගැළවීම

13 දැන් මා කතා කරන්නේ විජාතීන් වන ඔබට ය.
විජාතීන්ට ප්‍රේරිතයකෙු ව සිටින බැවින් මම මාගේ
මෙහෙය උසස් කොට සලකමි. 14 එසේ සලකන්නේ,
යම් හයෙකින් මාගේ ම ජාතියේ සනෙඟ උනන්දු
කරවා ඔවුන්ගෙනේ සමහරකෙු ගළවාගන්නා පිණිස ය.
15 මන්ද, ඔවුන් ප්‍රතික්ෂේප කිරීම, ලෝකයා
දෙවියන් වහන්සේ හා සමඟි කිරීමට මඟක් වී නම්,
ඔවුන් පිළිගැනීම, මරණයෙනේ ජීවනය ලැබීමක් විනා,
අන් කුමක් වන්නේ ද?
16 තවද මුලින් දමන පිටි අහුර දෙවියන්ට කැප
කර ඇත්නම්, පිපෙන මුළු පිඩ ද කැප වී ඇත. ගසේ
මුල කැප කර ඇත්නම්, අතු ද කැප වී ඇත.
17 එහතේ ඔලීව ගසේ සමහර අතු කපාදමනු ලැබ,
වල් ඔලීව ගසක් වන ඔබ ඊට බද්ධ කර, පළමු
ඔලීව ගසේ සාරයට හා මුලට මසෙේ යාවුණි නම්,
18 ඒ අතු ගැන පාරට්ටු නොකරන්න. ඔබ එසේ
සිතන්නහු නම්, ඔබ මුල උසුලනවා නොව, මුල ඔබ
උසුලන බව සිතට ගන්න.
19 එසේ වී නම්, මා බද්ධ කරන පිණිස අතු කපනු
ලැබී යයි ඔබ කියනු විය හැකි ය. 20 එය සැබෑ ම
ය. ඒවා කපනු ලැබුවේ අවිශ්වාසය නිසා ය. එහතේ
ඔබ ස්ථිර ව සිටින්නේ විශ්වාසය නිසා ය. ඒ නිසා
අහංකාර නොවී දේව ගරුබිය ඇති ව සිටින්න.
21 මන්ද, දෙවියන් වහන්සේ මුල් ගසේ අතු වනේ
කළ සේක් නම්, ඔබ ද ඉවත් කරන සේක.
22 එබැවින් දෙවියන් වහන්සේගේ කරුණාවත්, තද
ගතියත් තේරුම්ගන්න. වැටී ගිය අය කෙරෙහි උන්
වහන්සේ තදින් ක්‍රියා කරන සේක; එහතේ උන්
වහන්සේගේ කරුණාවෙහි පවතින ඔබ ගැන
කරුණාවනේ ක්‍රියා කරන සේක. එසේ
නොපවතින්නහු නම් ඔබත් කපා ඉවත් කරනු ඇත.
23 අවිශ්වාසයෙහි නොපැවතුණොත් ජුදෙව්වරුන් ද
බද්ධ කරනු ඇත. ඔවුන් නැවත බද්ධ කිරීමට
දෙවියන් වහන්සේට පුළුවන. 24 මන්ද, විජාතීන් වන
ඔබ ස්වභාවයෙනේ ම අයිති වූ වල් ඔලීව ගසින්
කපනු ලැබ, ස්වභාවයට විරුද්ධ ව හොඳ ඔලීව
ගසකට බද්ධ කරනු ලද්දාහු නම් ස්වාභාවික අතු
වන ජුදෙව්වරුන් ඔවුන්ගේ ම ඔලීව ගසට නැවත
බද්ධ කිරීම ඊටත් වඩා පහසු නොවේ ද?

## සියල්ලන් හට දේව කරුණාව

25 සහෝදරයෙනි, ඔබ ඥානවන්තයෝ යයි සිතමින්
අහංකාර නොවන පිණිස ඔබ දත යුතු අබිරහසක්
ඇතැ යි සිතමි. එනම්, ඉශ්‍රායලේ ජනතාව තුළ
තරමක සිත් දැඩිකමක් පවතින්නේ විජාතීන් සියලු
දනො ම ගැළවීම ලබන තුරු පමණකි. 26 යෙසා
59:20ඉන්පසු මුළු ඉශ්‍රායලේ ජනතාව ම ගැළවීම
ලබන්නෝ ය. ඒ බවට:
q226 “සියොන්හි සිට ගැළවුම්කාරයාණෝ වඩින
සේක;
q226 උන් වහන්සේ ජාකොබ්ගේ පළෙපතින්
දුෂ්ටකම දුරු කරන සේක.
27 ජරෙ 31:33-34 ඔවුන්ගේ පාප දුර ලන කල,
ඔවුන් සමඟ මම මේ ගිවිසුම කරගතිමි”යි
27 ශුද්ධ ලියවිල්ලෙහි කියා ඇත. 28 ජුදෙව්වරුන් සුබ
අස්න ප්‍රතික්ෂේප කළ නිසා ඔව්හු දෙවියන්
වහන්සේගේ සතුරෝ වූ හ. එය ඔබගේ යහපතට
හැරුණි. එහතේ ඔවුන්ගේ පියවරුන් නිසා දෙවියන්
වහන්සේ ඔවුන් තෝරාගත් බැවින්, ඔව්හු දෙවියන්
වහන්සේගේ මිත්‍රයෝ වූ හ. 29 දෙවියන් වහන්සේ
සිය දීමනා ද කැඳවීම ද වනෙස් නොකරන සේක.
30 විජාතීන් වන ඔබ යටගිය දවස, දෙවියන්
වහන්සේට අකීකරු ව සිටි නමුත්, ජුදෙව්වරුන්ගේ
අකීකරුකම නිසා දැන් ඔබ කරුණාව ලබා ඇත.
31 එසේ ම, ඔවුන් දැන් අකීකරු ව සිටින්නේ, ඔබට
දක්වන ලද කරුණාව නිසා ඔවුනුත් කරුණාව ලබන
පිණිස ය. 32 මන්ද, දෙවියන් වහන්සේ සකල
සත්වයන්ට කරුණාව දක්වන පිණිස, සකල සත්වයන්
අකීකරුකම නමැති බන්ධනාගාරයෙහි තැබූ සේක.

## දේව ගුණ ගායනය

33 යෙසා 55:8 දෙවියන් වහන්සේගේ වරප්‍රසාද
සම්භාරය කතෙරම් විශාල ද? උන් වහන්සේගේ
ප්‍රඥාව සහ ඥානය කතෙරම් ගැඹුරු ද? උන්
වහන්සේගේ විනිශ්චයන් කතෙරම් අචින්ත්‍ය ද? උන්
වහන්සේගේ ක්‍රියා මාර්ග කතෙරම් වර්ණනා

විෂයාතික්රාන්ත ද? ශුද්ධ ලියවිල්ලහෙි මසේ කියා
ඇත:
34 යසො 40:13 “සමිඳාණන් වහන්සේගේ සිත
තේරුම්ගත්තේ කවරකේ ද?
q234 උන් වහන්සේට පුරෝහිතයා වූයේ කවරකේ
ද?
35 ජෝබ් 41:11 උන් වහන්සේගනේ ප්රතිඵලයක්
ලබන පිණිස පළමුකාොට උන් වහන්සේට යමක්
දුන්නේ කවරකේ ද?”
36 1 කාොරි 8:6 මන්ද සියල්ල මවා වදාරන්නේ උන්
වහන්සේ ය; සියල්ල රක්ෂා කරන්නේ උන්
වහන්සේ ය; සියල්ල අර්ථාන්විත කරන්නේ උන්
වහන්සේ ය. උන් වහන්සේට සදහට ම මහිමය වේ
වා! ආමනේ.

## ක්රිස්තුන් වහන්සේ තුළ නව ජීවනය

12 සහෝදරයනෙි, දවේයන් වහන්සේ ඉමහත්
දයාවක් පනේ වූ බැවින්, ඔබගේ ශරීර
දවේයන් වහන්සේට කැප කළ, උන් වහන්සේට
ප්රසන්න වූ ජීවමාන යාගයක් කාොට ඔප්පු කරන
මනේ ඔබගනේ උදක් ම ඉල්ලමි. සැබෑ බුද්ධිමය
නමස්කාරය එය වේ. 2 ඔබ ලෝක ව්යවහාරය
අනුව හැඩ නාොගැසී, සිත අලුත් කරගැනීමනේ
වනෙස් අය වන්න. එවිට, දවේයන් වහන්සේගේ
කැමැත්ත, එනම්, යහපත් වූ, පිළිගත යුතු වූ,
සම්පූර්ණ වූ දේ කුමක් ද කියා ඔබට තේරුම්ගත
හැකි ය.
3 ඔබ එකිනකො පමණට වඩා තමන් ගැන ඉහළින්
නාොසිතන ලසෙත්, දවේයන් වහන්සේ එකිනකොට
ප්රදානය කළ ඇදහිල්ලේ ප්රමාණයට තැන්පත්
සිතින් සිතන ලසෙත්, මට දී ඇති දේව වරප්රසාදය
අනුව ඔබ එකිනකොට කියමි. 4 1 කාොරි 12:12එක
ම මිනිස් සිරුරහෙි අපට බාොහෝ අවයව ඇතත්, ඒ
අවයවයෝ එක ම කාර්යය නාොකරති. 5 එසේ ම
බාොහෝ දනෙකේ වූ අපිත් ක්රිස්තුන් වහන්සේ හා
සම්බන්ධ ව එක ශරීරයක් වී, එහි වනේ වනේ
වශයනේ අන්යාොන්ය අවයවයෝ වම්හ. 6 1 කාොරි
12:4-11අපට දනෙ ලද දේව වරප්රසාදය අනුව අපේ
කුශලතා විවිධ ය. ඒ කුශලතාව දහම් දසේීම පිණිස
නම්, අපේ ඇදහිල්ලේ ප්රමාණය අනුව දහම්
දසෙමු. 7 එය ශුභ සාධක සේවය නම්, ඒ
සේවයහෙි නිරත වමෙු. ගුරුවරයා ගුරු සේවයහෙි
යදෙේ වා. 8 අනුශාසකයා තම අනුශාසනා දීමට කැප
වේ වා; ආධාර දනේනා ත්යාගශීලී ව දේ වා;
මූලිකත්වය දරන්නා උද්යෝගිමත් ව සිටී වා;
ලඩෙදූකට පිහිට වන්නා ප්රීතියනේ එසේ කරෙේ
වා.

## ක්රිස්තියානි ජීවිතයේ ප්රතිපත්ති

9 ප්රමේය අවංක වේ වා. නපුර පිළිකුල් කාොට,
යහපතට ඇලුම් වන්න. 10 සුහද සහෝදර
ප්රමේයනේ එකිනකොට ප්රමේ කරන්න.
ගෞරවයනේ තමාට වඩා අනකේ අය උතුම් කාොට
සලකන්න. 11 අලසකමින් තාොර ව, කාර්යශීලී
වන්න; උද්යෝගිමත් හදකින් සමිඳාණන් වහන්සේට
සේවය කරන්න; 12 බලාපාොරාොත්තුවහෙි ප්රීති
වන්න; විපතේ දී ඉවසිලිමත් වන්න; යාච්ඤාවහෙි
නාොකඩව යදෙනේන; 13 සැදැහැවතුන්ගේ
ඕනෑඑපාකම් වල දී උපකාර කරන්න. ආගන්තුක
සත්කාරයට ලැදි ව සිටින්න.
14 මතෙ 5:44; ලූක් 6:28 ඔබට පීඩා කරන්නන්ට
ආශීර්වාද කරන්න, සාප නාොකර ආශීර්වාද ම
කරන්න. 15 ප්රීති වන්නන් සමඟ ප්රීති වන්න,
ශෝක වන්නන් සමඟ ශෝක වන්න. 16 හිතෝ
3:7හැම දනො සමඟ එක් සිත් ව ඉන්න, අහංකාර
නාොවී, යටහත් පහත් අය ආශ්රය කරන්න. ඔබ
ප්රඥාවන්ත යයි සිතා උඩඟු නාොවන්න.
17 කිසිවකුෙට නපුරට නපුර නාොකරන්න. සියල්ලන්
ඉදිරියහෙි උසස් යයි සම්මත දේ කිරීමට සිතට
ගන්න. 18 ඔබට හැකි පමණට හැම දනො සමඟ
සාමකාමී ව සිටීමට උත්සාහ කරන්න. 19 ද්වි.නී.
32:35මිත්රවරුනි, පළි ගැනීමනේ තාොර ව, දේව
උදහස ක්රියා කිරීමට ඉඩ හරින්න. මන්ද: “
‘පළිගැනීම මා සතු ය, මම විපාක දමේ’යි සමිඳාණන්
වහන්සේ පවසන සේකැ”යි ශුද්ධ ලියවිල්ලහෙි ලියා
ඇත. 20 හිතෝ 25:21-22මසෙේ ද ලියා ඇත: “ඔබේ
සතුරාට බඩගිනි නම් කන්නට දනේන. පිපාස නම්
බාොන්නට දනේන; එවිට ඔහු හිස ගිනිගත් කනෙකුෙ
මනේ ලජ්ජාවනේ දැවනෙු ඇත.” 21 නපුරනේ පරාජය
නාොවී, යහපතින් නපුර පරාජය කරන්න.

## පාලකයන්ට කීකරු වීම

13 බලය ලත් රාජ්ය පාලකයන්ට සෑම දනො ම
කීකරු වතේ වා! දවේයන් වහන්සේගනේ
ලැබනෙ බලය හැර අන් බලයක් නැත. දැනට සිටින
රාජ්ය පාලකයෝ දවේයන් වහන්සේ විසින් පත්
කරනු ලැබූ අය වති. 2 එබැවින් පාලක බලයට
විරුද්ධ වන අය දේව නියමයට විරුද්ධ වති. එසේ
විරුද්ධ වන අය තමන්ට ම දඬුවම් පමුණුවාගනිති.
3 රාජ්ය පාලකයෝ අයහපතට මිස යහපතට බිය
උපදවන්නෝ නාොවති. ඔබ රාජ්ය පාලකයාට බිය
නාොවී ඉන්නට කැමැත්තහෙි ද? එසේ නම්, යහපත
කරන්න. එවිට ඔහුගනේ ඔබට ප්රශංසාව ලැබයෙි.
4 මන්ද, ඔහු ඔබගේ යහපත පිණිස දවේයන්
වහන්සේ පත් කළ සේවකයා වේ. එහතේ ඔබ
වරද කරන්නහෙි නම්, බිය වන්න. මන්ද, ඔහු, කඩුව
දරන්නේ නිකමට නාොවේ; ඔහු දවේයන්
වහන්සේගේ සේවකයකේ ව, වරද කරන්නාට දේව
උදහස විදහා පාන දඬුවම් දීමේ ආයුධයකි.
5 එහතේ දේව උදහස නිසා පමණක් නාොව,
ඔබගේ හෘදය සාක්ෂිය නිසා ද ඔහුට කීකරු විය
යුතු ය. 6 මතෙ 22:21; මාක් 12:17; ලූක් 20:25ඔබ
අයබදු ගවෙන්නේත් ඒ නිසා ය. රාජ්ය පාලකයෝ
සිය යුතුකම් නාොපිරි හළො ඉටු කරන දවේයන්
වහන්සේගේ සේවකයෝ වති. 7 එබැවින් හැමට
ම දිය යුතු දයෙ දනේන; වරිපනම්, ගවේය යුත්තාට

වරිපනම් ද අයබදු ගෙවිය යුත්තාට අයබදු ද දෙන්න.
පිදිය යුත්තාට පුදන්න, ගරු කළ යුත්තාට ගරු
කරන්න.

### සහෝදර ප්‍රේමය

8 එකිනෙකාට ප්‍රේම කිරීම හැර අන් කිසිවක්
ගැන කිසිවකුට ණය ගැති නොවන්න. අසල්වැසියාට
ප්‍රේම කරන්නෝ ව්‍යවස්ථාව ඉටු කරති. 9 නික්ම
20:13-15,17; ද්වි.නී. 5:17-19,21; ලෙවී 19:18මන්ද,
“කාමමිථ්‍යාචාරය නොකරන්න, මිනී නොමරන්න,
සොරකම් නොකරන්න, ලෝභ නොවන්න” යන
ආඥා ද තවත් අමතර ආඥා ඇත්නම් ඒවා ද, “නුඹ
නුඹට ප්‍රේම කරන්නාක් මෙන් නුඹේ අසල්වැසියාට
ප්‍රේම කරන්න” යන පාඨයෙහි සම්පිණ්ඩනය වී
ඇත. 10 ප්‍රේමය අසල්වැසියාට නපුරක් නොකරයි.
එබැවින් ප්‍රේමය නම් ව්‍යවස්ථාව සම්පූර්ණයෙන්
ඉටු කිරීම ය.

### ඉන්ද්‍රිය දමනය

11 මේ සියල්ලෙහි දී, තීරණාත්මක කාලය පැමිණ
ඇති බව සිතට ගන්න. මයෙ නින්දෙන් පිබිද සිටිය
යුතු වේලාව ය. මන්ද, අප ඇදහීමට පටන්ගත්
කාලයට වඩා, අපේ ගැළවීම දැන් ළං වී ඇත.
12 රැය බොහෝ දුරට ගෙවී ඇත. දිවා කාලය ළඟ
ය; එබැවින් අන්ධකාරයේ ක්‍රියා ඉවත ලා,
ආලෝකයේ අවිආයුධ පැළඳගනිමු. 13 අපේ
කල්ක්‍රියාව දිවා කාලයට ඔබින සේ විය යුතු යි;
අශෝභන උත්සවවලින් ද මධුපානෝත්සවයෙන් ද
කාම තෘෂ්ණාවෙන් ද සල්ලාලකමින් ද අඩදබර හා
ඊර්ෂ්‍යාවෙන් ද වැළකී සිටිමු. 14 ස්වාමීන් වන ජේසුස්
ක්‍රිස්තුන් වහන්සේ නමැති සන්නාහයෙන් සන්නද්ධ
වන්න. මින් මතු පසිඳුරන් පිනවන පිණිස පාප
ආශාවනට ඉඩ නොදෙන්න.

### අනුන් විනිශ්චය කිරීමේ වරද

14 කොලො 2:16 ඇදහිල්ලෙහි දුර්වල
තැනැත්තා සතුටින් පිළිගන්න; එසේ කළ
යුත්තේ ඔහු දරන මත ගැන වාද විවාද කිරීම පිණිස
නොවේ. 2 කොයි දේත් කන්න නිදහස ඇතැ යි
කෙනෙක් සිතයි. ඇදහිල්ලෙහි දුර්වල වූ තැනැත්තා
එළවළු පමණක් කන්නේ ය. 3 කොයි දේත් කන
තැනැත්තා එසේ නොකන තැනැත්තාට අවමන්
නොකෙරේ වා; නොකන තැනැත්තා ද කන
තැනැත්තා විනිශ්චය නොකෙරේ වා. මන්ද, දෙවියන්
වහන්සේ ඔහු පිළිගෙන ඇත. 4 අන් කෙනෙකුගේ
මෙහෙකරුවා විනිශ්චය කිරීමට ඔබ කවරෙක් ද?
ඔහුගේ නැඟීම හෝ වැටීම හෝ පිළිබඳ තීරණය
ඔහුගේ ම ස්වාමියා සතු ය. ඔහුගේ නැඟීම ගැන
සැකයක් නැත, ඔහු නඟා සිටු වීමට සමිඳාණන්
වහන්සේට පුළුවන්කම ඇත.
5 එක් කෙනෙක් එක දවසක් වෙන දවසකට වඩා
සුබ යයි සිතයි; වෙන කෙනෙක් හැම දවසක් ම එක
සමාන යයි සිතයි. මෙවැනි කරුණු ගැන එකිනෙකා
තම තමාගේ ම සිතට එකඟ ව නිසැක තීරණයක්
ගත යුතු ය. 6 යම් දවසක් උසස් කොට සලකන්නා
එසේ කරන්නේ සමිඳාණන් වහන්සේ උදෙසා ය.
කොයි දේත් කන තැනැත්තා ද දෙවියන් වහන්සේට
ස්තුති දී කන බැවින්, කන්නේ සමිඳාණන් වහන්සේ
උදෙසා ය. එසේ නොකන තැනැත්තාත් දෙවියන්
වහන්සේට ස්තුති දී නොකා සිටින බැවින් එය
කරන්නේ ද සමිඳාණන් වහන්සේ උදෙසා ය.
7 අපෙන් කිසිවකු තමා ම උදෙසා ජීවත් වන්නේ
වත්, තමා ම උදෙසා නසින්නේ වත් නැත. 8 අපි
ජීවත් වමු නම් සමිඳාණන් වහන්සේ උදෙසා ජීවත්
වමු. නසිමු නම් සමිඳාණන් වහන්සේ උදෙසා නසිමු.
අපි ජීවිතයේදීත් මරණයේදීත් සමිඳාණන්
වහන්සේගේ ම වමු. 9 ක්‍රිස්තුන් වහන්සේ
මැරුණාතේ, යළි උත්ථාන වූයේත් මළවුන්ගේ ද
ජීවතුන්ගේ ද සමිඳාණන් වහන්සේ වන පිණිස ය.
10 2 කොරි 5:10 එසේ නම් ඔබ ඔබේ සහෝදරයා
විනිශ්චය කරන්නේ මන් ද? ඔබේ සහෝදරයා
හෙළා දකින්නේ මන් ද? අප සියල්ලන් ම දෙවියන්
වහන්සේගේ විනිශ්චයාසනය ඉදිරියෙහි පෙනී සිටිනු
ඇත. 11 යෙසා 45:23තවද:
q2 11 “මා ජීවත් ව සිටින බව සැබෑ වන්නා සේ ම,
හැම දනො ම මට දණ නමනු ඇත, හැම දනො ම
මා දෙවියන් වහන්සේ බව ප්‍රකාශ කරනු ඇතැ යි
සමිඳාණන් වහන්සේ වදාරන සේකැ”යි
11 ශුද්ධ ලියවිල්ලෙහි ලියා ඇත. 12 එහෙයින් අප
එකිනෙකා තම තමා ගැන දෙවියන් වහන්සේට
ගණන් දෙනු ඇත.

### අනුන්ට බාධාවක් වීමේ වරද

13 එබැවින් අපි එකිනෙකා විනිශ්චය කිරීමෙන්
වැළකෙමු. එසේ නොකර, සහෝදරයකුගේ
පැකිළීමට හෝ වැටීමට හෝ හේතු වන කිසිවක්
නොකර සිටීමට තීරණය කරගනිමු. 14 ස්වභාවයෙන්
ම අපවිත්‍ර වූ කිසිවක් නැතැ යි කිතුනුවකු වශයෙන්
මම සහතික ලෙස දනිමි. යමක් අපවිත්‍ර යයි සිතන
තැනැත්තාට එය අපවිත්‍ර ය. 15 ඔබ කන කෑමක්
නිසා ඔබේ සහෝදරයාට තද සිත් වේදනාවක් ඇති
වේ නම්, ඔබේ හැසිරීම ප්‍රේමයෙන් තොර ය. ඔහු
උදෙසා ක්‍රිස්තුන් වහන්සේ දිවි පිදූ බැවින්, ඔබ කන
දේ නිසා ඔහු විනාශ වීමට ඉඩ නොහරින්න.
16 ඔබට යහපත සේ පෙනෙන දේ අපවාදයකට
හේතුවක් නොවේ වා. 17 දෙවියන් වහන්සේගේ
රාජ්‍යය වනාහි කා බී ප්‍රීතිවීමක් නොව, යුක්තිය ද
සාමය ද ශුද්ධාත්මයාණන් වහන්සේ කරෙන් එන
ප්‍රීතිය ද වේ. 18 එලෙස ක්‍රිස්තුන් වහන්සේට
සේවය කරන්නා දෙවියන් වහන්සේගෙන් ප්‍රසාදයත්,
මිනිසුන්ගෙන් ප්‍රශංසා වත් දිනාගනී.
19 එබැවින් අපි සාමය උපදවන අන්‍යෝන්‍ය
ශුභසිද්ධිය සලසන දෙය අනුගමනය කරමු. 20 කෑම
නිසා දේව සේවය කඩාකප්පල් නොකරන්න. හැම
කෑමක් ම පවිත්‍ර ය; එහෙත් අන්කෙනෙකුගේ
වැටීමට හේතු වන සේ කෑම කන මනුෂ්‍යයාට

අවැඩක් සිදු වේ. 21 මස් කෑමෙන් වත්,
මද්‍යපානයෙන් වත්, අන් කිසි දයෙකින් වත් ඔබේ
සහෝදරයාට බාධාවක් වේ නම්, එයින් වැළකී සිටීම
යහපති. 22 ඔබගේ පෞද්ගලික මත දවියන්
වහන්සේත්, ඔබත් අතර තබාගන්න. තමා හරි යයි
පිළිගන්නා දේ ගැන යමකුගේ සිත දොස්
නොකියයි නම් ඒ මිනිසා වාසනාවන්තයෙකි.
23 එහෙත් සැක සිතින් කන තැනැත්තා විශ්වාසයට
විරුද්ධ ව කන බැවින්, වරදකරුවකු බවට තීන්දු
වේ. විශ්වාසයට එකඟ නොවන හැම දයෙ ම
පාපයකි.

### අනුන්ගේ ශුභසිද්ධිය සවීම

15 තවද ඇදහිල්ලෙහි ශක්තිමත් වූ අපි, අප
ගැන ම නොසිතා ඇදහිල්ලෙහි දුර්වල
වූවන්ගේ ප්‍රමාද දෝෂ ඉවසීමෙන් දරාගනිමු. 2 අප
එකිනෙකා තම අසල්වැසියාගේ ශුභසිද්ධිය සලසන
සේ, ඔහුගේ යහපත තකා ඔහු සතුටු කළ යුතු ය.
3 ගීතා 69:9“ඔබට නින්දා කළ අයගේ නින්දාව මා
පිට පැමිණියේ ය”යි ලියා ඇති ලසෙ, ක්‍රිස්තුන්
වහන්සේ වුව ද තමන්ගේ ම සතුට නොසවේ
සේක. 4 ආදියෙහි ශුද්ධ ලියවිල්ලේ ලියන ලද
සියල්ල, එයින් ඇති වන ඉවසීමෙන් ද සැනසීමෙන් ද
අපට බලාපොරොත්තුව උදා වන පිණිස, අපේ
ඉගනේීම සඳහා ලියන ලද්දේ ය. 5 ඔබ එක සිතින්,
එක මුවින් ඔබගේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේගේ පිය වූ දවියන් වහන්සේට ගෞරව
කරන පිණිස, 6 ක්‍රිස්තුන් වහන්සේගේ ආදර්ශය
ලසෙ ඔබ එකිනෙකා සමඟ එක්සිත් ව විසීමට,
ඉවසිල්ලේ හා ධරෛයයේ උල්පත වූ දවියන්
වහන්සේ ඔබට වරම් දනෙ සේක් වා!

### සියලු ජාතීන්ට පොදු සුබ අස්න

7 එහයෙින් දවියන් වහන්සේගේ තේජශ්‍රීය
දක්වන පිණිස ක්‍රිස්තුන් වහන්සේ ඔබ පිළිගත්
ලසෙ ම, ඔබත් එකිනෙකා පිළිගන්න. 8 මන්ද,
ක්‍රිස්තුන් වහන්සේ දවියන් වහන්සේගේ
සත්‍යතාවය දක්වන පිණිස ජුදවේ ජනතාවගේ
සේවකයකු වූ සේකැ යි කියමි. එසේ වූයේ
පිතෘවරයන්ට දුන් පොරොන්දු ස්ථිර කරන පිණිසත්,
9 2 සාමු 22:50; ගීතා 18:49විජාතීන් විසින් දවියන්
වහන්සේගේ දයාව ගැන උන් වහන්සේට ගෞරව
කරන පිණිසත් ය. ශුද්ධ ලියවිල්ලෙහි:
q29 “එබැවින් විජාතීන් අතර ඔබ පසසන්නෙමි.
q29 ඔබගේ නාමයට ගී ගයන්නෙමි”යි
9 ලියා ඇත. 10 ද්වි.නී. 32:43නැවතත්:
q210 “විජාතීනි, උන් වහන්සේගේ සනෙඟ සමඟ
ප්‍රීති ප්‍රමෝද වන්නැ”යි
10 කියා ඇත. 11 ගීතා 117:1තවදුරටත්:
q211 “සියලු විජාතීනි, සමිඳාණන් වහන්සේට
ප්‍රශංසා කරන්න;
q211 සියලු ජාතීහු උන් වහන්සේට ප්‍රශංසා
කරත්වා”යි
11 ලියා ඇත. 12 යසො 11:10තවද:
q212 “ජසේසේගේ පළෙපෙතින් පැවත එන්නා වූ ද,
විජාතීන් පාලනය කිරීමට නැඟ එන්නා වූ ද, තැනැන්
වහන්සේ වඩින සේක;
12 උන් වහන්සේ තුළ විජාතීන් බලාපොරොත්තු
වනු ඇතැ”යි යසොයා කියයි.
13 තවද ශුද්ධාත්මයාණන්ගේ බලයෙන් ඔබගේ
බලාපොරොත්තුව පිරී ඉතිරී යන පිණිස,
බලාපොරොත්තුවේ උල්පත වූ දවියන් වහන්සේ
ඔබේ ඇදහීම නිසා සියලු ප්‍රීතියෙන් හා
සාමදානයෙන් ඔබ පූර්ණ කරන සේක් වා.

### පාවුලු තුමාගේ ධර්මදූත සේවය

14 සහෝදරයෙනි, ඔබ යහපත්කමින් පිරුණු,
ප්‍රඥාසම්පන්න ව, එකිනෙකොට අවවාදානුශාසනා
දීමෙහි පොහොසත් අය බව මම ඒකාන්තයෙන්
දනිමි. 15 එහෙත් ඔබට ඇතැම් කරුණු සිහි කර
දීමක් වශයෙන් මේ හසුනේ සමහර තැන්වල
නිර්භීත ලසෙ ඔබ වෙත ලියා ඇත. 16 එසේ
ලියන්නේ, විජාතීන් උදෙසා ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේගේ සේවකයකු වීමට දවියන් වහන්සේ
මට දවො වදාළ වරප්‍රසාදය නිසා ය. ඒ පූජක
සේවය, විජාතීන් ශුද්ධාත්මයාණන් විසින් කැප කරනු
ලැබ, දවියන් වහන්සේට ප්‍රියමනාප පූජාවක් වන
අයුරින් සුබ අස්න දේශනා කිරීම ය. 17 ක්‍රිස්තුස්
ජේසුස් වහන්සේට අයත් කනෙකෙු ලසෙ දේව
සේවාව ගැන මම උදන් අනමි. 18 වචනයෙන් හා
ක්‍රියාවෙන් ද හාස්කම් හා අරුමපුදුමවල අනුහසින් ද
19 ශුද්ධාත්මයාණන්ගේ බලයෙන් ද විජාතීන් තමන්
වහන්සේට පක්ෂපාත කරවන ලසෙ ක්‍රිස්තුන්
වහන්සේ මා ලවා කළ අරුමපුදුම දේ ද ලකුණු ද
ගැන මිස අන් කිසිවක් ගැන කතා කිරීමට මම
ධරෛයවත් නොවෙමි. මසෙේ මම ජරෙුසලමේ සිට
ඉල්ලුරිකය දක්වා ක්‍රිස්තුන් වහන්සේගේ සුබ අස්න
දේශනා කොට නිම කළෙමි. 20 හැම විට ම මාගේ
පරමාර්ථය වූයේ, අන් කනෙකෙු දැමූ පදනමක් පිට
ගොඩනැඟීමෙන් වැළකනෙ පිණිස, කවරදා වත්
ක්‍රිස්තුන් වහන්සේගේ නාමය සඳහන් නොවූ
තැන්වල සුබ අස්න දේශනා කිරීම ය.
21 යසො 52:15 මන්ද:
q221 “උන් වහන්සේ ගැන ආරංචියක් නොලත් අය
උන් වහන්සේ දකිති.
q221 උන් වහන්සේ ගැන නෑසූ අය උන් වහන්සේ
තේරුම්ගනිති”යි
21 ශුද්ධ ලියවිල්ලෙහි ලියා ඇත.

### රෝමය බලා යාමේ අදහස

22 රෝම 1:13 ඔබ වෙත මාගේ පැමිණීම කීප
වරක් වැළකුණේ ඒ නිසා ය. 23 එහෙත් දැන් මේ
පදෙසේවල මාගේ සේවයට තවත් ඉඩක් නැති
බැවින් ද කවදා හෝ ස්පාඤ්ඤයට යන ගමන් ඔබ
වෙත එන්නට ආශාවක් අවුරුදු ගණනාවක් තුළ මට
තිබුණු බැවින් ද එහි යන විට රෝමයට එන්නට

බලාපොරොත්තු වමේ. 24 එසේ යද්දී ඔබ දකින්ට ද,
ටික කලක් ඔබ සමඟ නැවතීමේ ප්‍රීතිය විඳින්න ද
ඉන්පසු ඔබේ ආධාරත් ඇති ව ඒ ගමන යන්න ද
බලාපොරොත්තු වමේ. 25 1 කොරි 16:1-4එහෙතේ
දැන් ජෙරුසලමේ දවේයන් වහන්සේගේ සනෙඟට
උපස්ථාන කරන පිණිස එහි යමි. 26 මන්ද,
ජෙරුසලමහෙි දවේයන් වහන්සේගේ සනෙඟ අතර
සිටින දිළිඳුන් උදසො සම්මාදමක් කිරීමට
මසිදොනියේත් ග්‍රීසියේත් සභාවන් තීරණය කර
ඇත. 27 1 කොරි 9:11එය ඔවුන් සිය කැමැත්තනේ
කළ තීරණයකි. ඒ ඇරත්, එසේ කිරීම ඔවුන්ගේ
යුතුකම ය. මන්ද, විජාතීන් ජුදවේවරුන්ගේ
ආධ්‍යාත්මික ආශීර්වාදවලින් ප්‍රයෝජන ලැබුවා සේ
ම, ජුදවේවරුන්ගේ භෞතික අවශ්‍යතාවල දී ඔවුන්ට
ආධාර දීමට විජාතීහු බැඳී සිටිති. 28 එබැවින් මම
මේ කාර්යය ඉටු කර, මේ සම්මාදම් මුදල ඔවුන්ට
සුරක්ෂිත කොට බාර දුන් පසු රෝමය පසු කර
ස්පාඤ්ඤයට යන්නමේ. 29 මා ඔබ වතෙ එන විට
ක්‍රිස්තුන් වහන්සේගේ ආශීර්වාද රාශියක් ඇති ව
එන බව මට සහතික ය.
30 සහෝදරවරුනි, අපගේ ස්වාමීන් වන ජේසුස්
ක්‍රිස්තුන් වහන්සේගේ නාමය නිසා ද
ශුද්ධාත්මයාණන්ගනේ නික්මනෙ ප්‍රේමය නිසා ද
මම ඔබගනේ බැගෑපත් ව ඉල්ලීමක් කරමි. ඒ
ඉල්ලීම නම් ජුදයහෙි සිටින අභක්තිකයන් අතට මා
අසු නොවන පිණිසත්, 31 ජෙරුසලම උදසො මා
කරන උපස්ථානය දවේයන් වහන්සේගේ සනෙඟට
පිළිගත හැකි දයෙක් වන පිණිසත්, දේව කැමැත්ත
අනුව ප්‍රීතියනේ ඔබ වතෙ පැමිණ, ඔබ සමඟ
විවේක සුවය ලබන පිණිසත්, 32 මා උදසො ඔබ
දවේයන් වහන්සේට පුද කරන යාච්ඤාවල දී මා
සමඟ වීර්යයනේ යාච්ඤා කරන ලසෙ ය.
33 ශාන්තිදායක දවේයන් වහන්සේ ඔබ සමඟ වේ
වා! ආමනේ.

## හිත මිතුරන්ට ආචාර

16 කනේක්‍රයො සභාවේ සේවිකාවක වන ෆීබී
නම් අපේ සහෝදරිය මම ඔබට සාදරයනේ
පිළිගන්වමි. 2 කිතුනු සොහොයුරියක මනේ, දවේයන්
වහන්සේගේ සනෙඟට ඔබ්න සේ, ඇය පිළිගන්නා
ලසෙත් ඇයගේ කවර වුවමනාවක දී හෝ ඇයට
ආධාරෝපකාර කරන ලසෙත් ඉල්ලමි. මන්ද, ඈ මා
ඇතුළු තවත් බොහෝ දනෙකුට උදව් උපකාර කළ
කනෙකි.
3 ක්‍රියා 18:2 ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ
මාගේ සහකාර සේවකයන් වූ, මා උදසො දිවි
පිදීමට වුව ද කැමැත්ත පනේ වූ, ප්‍රිස්කාට ද
අකිලාට ද මාගේ ආචාරය පිරිනමන්න. 4 මා
පමණක් නොව, සියලු විජාතික සභාවෝ ද ඔවුන්ට
කෘතඥතාව දක්වති. 5 ඔවුන්ගේ නිවසේ රැස් වන
සභාවටත් මාගේ ආචාරය පිරිනමන්න. ආසියාවනේ
ක්‍රිස්තුන් වහන්සේ වතෙ මුලින් ම හැරුණු මාගේ
කල්‍යාණ මිත්‍රයකු වූ එපීනතස්ට ද 6 ඔබ උදසො
අධික ලසෙ වහෙසෙ දැරූ මරියාට ද මාගේ ආචාරය
පිරිනමන්න. 7 මගේ ම රටවැසියන් වූ මා සමඟ
සිරගත ව සිටි, අන්ද්‍රොනිකස්ට හා ජුනියස්ට මාගේ
ආචාරය පිරිනමන්න. ප්‍රේරිතයන් අතර කීර්තියක්
දරන මොවුහු මට පළමුවනේ කිතුනුවෝ වූ හ.
8 ස්වාමීන් වන ක්‍රිස්තුන් වහන්සේ තුළ මාගේ හිත
මිතුරු අම්ප්ලියාතුස්ට ද 9 ක්‍රිස්තුන් වහන්සේ තුළ
අපගේ සහකාර සේවකයකු වූ උර්බානස්ට ද
මාගේ හිත මිතුරු ස්තාකිස්ට ද මාගේ ආචාරය
පිරිනමන්න. 10 ක්‍රිස්තුන් වහන්සේ කරෙහෙි අචල
බැතිමතකු වන අපොල්ලස්ට මාගේ ආචාරය
පිරිනමන්න. අරිස්තොබුලස්ගේ ගෘහවාසීන්ට ද
11 මාගේ නෑයකු වන හෙරෝදියෝන්ට ද මාගේ
ආචාරය පිරිනමන්න. නාර්කිසස්ගේ ගෘහවාසී
කිතුනුවන්ට මාගේ ආචාරය පිරිනමන්න. 12 කිතුනු
සේවයහෙි නිරත වූ තෘපේනාට ද තෘපෝසාට ද
කිතුනුවකු මනේ බොහෝ වහෙසෙ දරා සේවය
කළ හිතවත් පර්සිස්ට ද මාගේ ආචාරය පිරිනමන්න.
13 මාක් 15:21සමිඳාණන් වහන්සේගේ විශිෂ්ටතම
කිතුනුවකු වූ රූපස්ට ද මටත් මවක වැනි වූ
ඔහුගේ මවට ද මාගේ ආචාරය පිරිනමන්න.
14 අසින්ක්‍රිතස්ට ද ප්ලෙගෝන්ට ද හර්මේස්ට ද
පත්‍රබෙස්ට ද හර්මස්ට ද ඔහු හා එක් ව වසන
සහෝදරයන්ට ද මාගේ ආචාරය පිරිනමන්න.
15 පිලොලොගස්ට ද ජූලියාට ද නේරියස්ට හා
ඔහුගේ සහෝදරියට ද ඔලිම්පස්ට ද ඔවුන් හා එක්
ව වසන දවේයන් වහන්සේගේ සනෙඟට ද මාගේ
ආචාරය පිරිනමන්න. 16 සාම සිඹීමකින් එකිනකොට
මාගේ ආචාරය පිරිනමන්න. ක්‍රිස්තුන් වහන්සේගේ
සියලු සභාවෝ ඔබට ආචාර කරති.

## අවසාන උපදසේ

17 සහෝදරයනෙි, ඔබ පිළිගත් ධර්මයට විරුද්ධ ව
භේද උපදවා අකුල් හළෙන අය ගැන හොඳිසියනේ
සිට, ඔවුන්ගනේ වැළකී සිටින්න. 18 එබඳු අය
අපගේ ස්වාමීන් වන ක්‍රිස්තුන් වහන්සේට නොව,
උදරයට සේවය කරති; මිහිරි ඉච්චා බසින් අහිංසක
අය මුළා කරති. 19 සුබ අස්න කරෙහෙි ඔබගේ
කීකරුකම පිළිබඳ කීර්තිය දසදිග පැතිර ඇත. එය
මට මහත් ප්‍රීතියකි. එසේ වුව ද, ඔබ යහපතහෙි
දක්ෂයන් වී නපුරහෙි අදක්ෂයන් වනු දැක්ම මාගේ
ආශාවයි. 20 ශාන්තිදායක දවේයන් වහන්සේ
නොබෝ කලකින් සාතන් ඔබගේ පාද යට සුණු
විසුණු කරන සේක. අපගේ ස්වාමීන් වන ජේසුස්
ක්‍රිස්තුන් වහන්සේගේ වරප්‍රසාදය ඔබ සමඟ වේ
වා.
21 ක්‍රියා 16:1 මාගේ සහකාර සේවකයකු වන
තිමෝතියස් ද මාගේ නෑයන් වන ලුසියස් ද
ජාසෝන් ද සෝසිපාතර් ද ඔබ වතෙ ඔවුන්ගේ
ආචාරය එවති. 22 (මේ හසුන ලියන තිර්තියස් නම්
මම, මාගේත් ආචාරය, සමිඳාණන් වහන්සේගේ
නාමයනේ ඔබ වතෙ මේ සමඟ එවමි.) 23 ක්‍රියා
19:29; 1 කොරි 1:14; 2 තිමෝ 4:20මට ද මුළු

සභාවට ද ආගන්තුක සත්කාරය කරන ගායස් ඔබ
වෙත ඔහුගේ ආචාරය එවයි. නගර භාණ්ඩාගාරික
තැන්පත් එරස්තස් ද සහෝදර ක්වර්තස් ද ඔබ වෙත
ඔවුන්ගේ ආචාර එවති. 24 අපගේ ස්වාමීන් වන
ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ වරප්‍රසාදය ඔබ
සමඟ වේ වා! ආමෙන්.

### අවසාන යැදුම හා තුති දීම

25 දෙවියන් වහන්සේට මහිමය වේ වා! ජේසුස්
ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ පණිවුඩය හා මා
දේශනා කළ සුබ අස්න අනුව ද දීර්ඝ යුගයන්හි
සැඟවී තිබී දැන් එළිදරව් කොට ඇති අබිරහස අනුව
ද ඔබ ඇදහිල්ලෙහි ස්ථිර ලෙස පිහිටුවීමට උන්
වහන්සේ පොහොසත් වන සේක. 26 දැන් වනාහි ඒ
අබිරහස දිවැසිවරයන්ගේ ලියවිලිවලින් අනාවරණය
කර ඇත. සියල්ලන් ම අදහා කීකරු වන පිණිස,
සදාතන දෙවියන් වහන්සේගේ ආඥාවෙන් එය
සකල ජාතීන්ට ප්‍රකාශකොට ඇත. 27 සකල
ප්‍රඥාවෙන් යුක්ත වූ අසමසම දෙවියන් වහන්සේට
ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන
සදහට ම මහිමය වේ වා! ආමෙන්.

### කුරුසියේ පණිවුඩය

2 සහෝදරයෙනි, මා ඔබ වෙත පැමිණ දෙවියන්
වහන්සේ පිළිබඳ සාක්ෂිය ප්‍රකාශ කළේ,
චතුර කථිකත්වයක් හෝ ප්‍රඥාවක් හෝ පෙන්වමින්
නොවේ. 2 මා ඔබ අතර සිටිය දී, මාගේ එක ම
අධිෂ්ඨානය වූයේ අන් හැම දෙයක් ම අමතක කර,
ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ හා උන් වහන්සේගේ
කුරුසිගතවීම ගැන පමණක් සිතීම ය. 3 ක්‍රියා
18:9මම දුර්වලකමින් ද බියෙන් ද අධික
තැතිගැනීමෙන් ද ඔබ සමඟ සිටියෙමි. 4 මාගේ
කතාව හා දෙසුම මා ප්‍රකාශ කළේ සිත්
පොළඹවන සුලු, ප්‍රඥාවන්ත වචනවලින් නොව,
ආත්මයාණන් වහන්සේගේ බලයෙනි, 5 එසේ වූයේ
ඔබගේ ඇදහිල්ල මිනිස් ප්‍රඥාව මත නොව
දෙවියන් වහන්සේගේ බලය මත පිහිටන පිණිස ය.

### දේව ප්‍රඥාව

6 ඒ කෙසේ වෙතත් මුහුකුරා ගිය අය අතර අපි
ප්‍රඥා සහගත ව කතා කරමු. එහෙත් ඒ ප්‍රඥාව
මේ ලෝකයට අයිති ප්‍රඥාවක් වත් මේ යුගයේ
විනාශ වී යන අධිපතීන්ට අයිති ප්‍රඥාවක් වත්
නොවේ. 7 අප ප්‍රකාශ කරන්නේ අනාදියේ පටන්
දෙවියන් වහන්සේ අපේ ගෞරවය සඳහා කලින්
නියම කළ, උන් වහන්සේගේ අබිරහස් ප්‍රඥාව ය.
8 ඒ ප්‍රඥාව මෙලොව අධිපතීන්ගෙන් කිසිවෙක්
නොදත්හ. එය ඔවුන් දැන සිටියා නම්, මහිමාන්විත
සමිඳාණන් වහන්සේ කුරුසියේ ඇණ ගසන්නේ
නැත. 9 යෙසා 64:4ශුද්ධ ලියවිල්ලෙහි ලියා ඇති
ලෙසෙ:

q29 “දෙවියන් වහන්සේට ප්‍රේම කරන්නන් හට
උන් වහන්සේ සූදානම් කර ඇත්තේ කිසිවකු
කවදාවත් ඇසින් නුදුටු, කණින් නොඇසූ, සිතින්
නොසිතූ දෙයකි.”

10 මේ දේ දෙවියන් වහන්සේ ස්වකීය
ආත්මයාණන් වහන්සේ කරණකොටගෙන අපට
එළිදරව් කළ සේක. මන්ද, ආත්මයාණන් වහන්සේ
දෙවියන් වහන්සේ පිළිබඳ ගාම්භීර දේ ඇතුළු
සියල්ල විමසන සේක. 11 මිනිසාගේ ස්වභාවය
දන්නේ මිනිසා ම තුළ වන ඔහුගේ ආධ්‍යාත්මය යි.
අන් කිසිවෙක් එය නොදනිති. එමෙන් ම දෙවියන්
වහන්සේගේ ස්වභාවය දන්නේ උන් වහන්සේගේ
ආත්මයාණෝ ය. අන් කිසිවෙක් එය නොදනිති.
12 එහෙත් දෙවියන් වහන්සේ නොමසුරු ව අපට දුන්
සියල්ල තේරුම් ගන්නා පිණිස, අප ලබා ඇත්තේ
මෙලොවේ ප්‍රඥාවක් නොව, දෙවියන්
වහන්සේගෙන් නික්ම එන ශුද්ධාත්මයාණෝ ය.

13 අප මේ සියල්ල පවසන්නේ මිනිස් ප්‍රඥාවෙන්
උපදින වචනවලින් නොව, ආධ්‍යාත්මික දේ,
ආධ්‍යාත්මික සත්‍යයන් හා සසඳමින්
ශුද්ධාත්මයාණන් අපට උගන්වන වචනවලින් ය.
14 එහෙත් ශුද්ධාත්මයාණන් ලබා නැති තැනැත්තාට
දෙවියන් වහන්සේගේ ශුද්ධාත්මයාණන්ගෙන් එන
සත්‍යයන් පිළිගත නොහැකි ය. ඒවා ඔහුට
ප්‍රලාපයකි. ඒවා ආධ්‍යාත්මික ලෙස විමසා දැනගත
යුතු නිසා ඒවා ඔහුට නොතේරේ.
15 ශුද්ධාත්මයාණන් ලබා ඇති තැනැත්තා සියල්ල
විමසයි. එහෙත් කිසිවකුට ඔහු විමසිය නොහැකි
ය. 16 යෙසා 40:13ශුද්ධ ලියවිල්ලෙහි මෙසේ ලියා
ඇත:

q216 “සමිඳාණන් වහන්සේගේ සිත කවුරු දනිත් ද?
q216 උන් වහන්සේට උපදෙස් දිය හැක්කේ කවුරුන්
විසින් ද?”

16 එහෙත් ක්‍රිස්තුන් වහන්සේගේ සිත අපට තිබේ.

### දෙවියන් වහන්සේගේ සහකාර සේවකයෝ

3 සහෝදරයෙනි, ශුද්ධාත්ම වරම ලත් අයට
මෙන් ඔබට කතාකිරීමට මට නොහැකි බැවින්,
පෘථග්ජනයන්ට, ළා බාල කිතුනුවන්ට මෙන් මම
ඔබට කතා කළෙමි. 2 හෙබ්‍රෙ 5:12-13මම ඔබ දැඩි
ආහාරයෙන් නොව කිරෙන් පෝෂණය කළෙමි.
එසේ කළේ ඔබට ඒවා දැරීමට නොහැකි වූ
බැවිනි. ඒවා දැරීම තවමත් ඔබට බැරි ය. 3 තවමත්
ඔබ පෘථග්ජන තත්ත්වයේ ය. ඔබ අතර ඊර්ෂ්‍යාව
හා විවාදය හා පවතින විට, ඔබ පෘථග්ජන අය
මෙන් ලෞකික තත්ත්වයේ හැසිරෙනවා නොවේ ද?
4 1 කොරි 1:12කෙනෙක් මම පාවුලුගේ පැත්තට යයි
ද තව කෙනෙක්, මම අපොල්ලොස්ගේ පැත්තට යයි
ද කියන විට ඔබ සාමාන්‍ය මිනිස්සු නොවෙත් ද?

5 අපොල්ලොස් කවරෙක් ද? පාවුලු කවරෙක් ද?
ඔව්හු සමිඳාණන් වහන්සේ ඒ අයට දුන් ප්‍රකාර
ඔබ ඇදහිල්ලට පැමිණවූ සේවකයෝ ය. 6 ක්‍රියා
18:4-11-24-28මම පැළ කළෙමි, අපොල්ලොස් වතුර

දැම්මේ ය. එහෙත් එහි වැඩීම සැලසුයේ දෙවියන්
වහන්සේ ය. 7 වැදගත් වන්නේ පැළ කළ තැනැත්තා
වත්, වතුර දැමූ තැනැත්තා වත් නොව, වැඩීම සැලැසූ
දෙවියන් වහන්සේ ය. 8 පැළ කළ තැනැත්තා හා
වතුර දැමූ තැනැත්තා අතර වෙනසක් නැත.
එකිනෙකා තම තමාගේ වැඩය අනුව නිසි විපාකය
ලබන්නේ ය. 9 මන්ද, අපි දෙවියන් වහන්සේ සමඟ
සහකාර සේවකයෝ වෙමු. ඔබ දෙවියන්
වහන්සේගේ කෙත ය, දෙවියන් වහන්සේගේ
ගොඩනැඟිල්ල ය.
10 මට දෙන ලද දේව වරප්‍රසාදය පරිදි මම දක්ෂ
ගෘහ නිර්මාණ ශිල්පියකු මෙන් අත්තිවාරමක්
දැමීමි. වෙන කෙනෙක් ඒ මත ගොඩනඟයි. එහෙත්
එකිනෙකා එය මත ගොඩනඟන ආකාරය ගැන
විමසිලිමත් විය යුතු ය. 11 මන්ද, දැනට ම දමා ඇති
අත්තිවාරම හැර වෙන අත්තිවාරමක් දැමීමට
කිසිවකුට නුපුළුවන. ඒ අත්තිවාරම නම් ජේසුස්
ක්‍රිස්තුන් වහන්සේ ය. 12 මේ අත්තිවාරම මත
ගොඩනැඟීමට යම් යම් අය යොදන්නේ රන්, රිදී,
අගනා මැණික්, දැව, තෘණ හෝ පිදුරු නම්,
13 ඔවුන්ගේ කර්මාන්තයේ තත්ත්වය, හෙළිදරව්
වන්නේ ය. ඒ දවස ගින්න සහිත ව උදා වේ. ඒ
ගින්නෙන් ඒ ඒ කර්මාන්ත පරීක්ෂා කරනු ලැබීමෙන්
ඒවායේ නියම ස්වාභාවය හෙළි වේ. 14 ඒ
අත්තිවාරම මත ගොඩනඟන ලද යමකුගේ
කර්මාන්තය නොදැවී පවතී නම්, ඔහු විපාකයක්
ලබයි. 15 යමකුගේ කර්මාන්තය දැවී යන්නේ නම්
ඔහුට අලාභයක් සිදු වේ. එහෙත් ඔහු ගිනි මැදින්
මිදී ආ කෙනෙකු මෙන් ගැළවෙනු ඇත.
16 1 කොරි 6:19; 2 කොරි 6:16 ඔබ දෙවියන්
වහන්සේගේ මන්දිරය බවත්, ඔබ තුළ දෙවියන්
වහන්සේගේ ආත්මයාණන් වැඩ වසන බවත්
නොදන්නහු ද? 17 කිසිවකු දේව මන්දිරය
වැනසුවොත් දෙවියන් වහන්සේ ඒ තැනැත්තා
වනසන සේක. දෙවියන් වහන්සේගේ මන්දිරය
විශුද්ධ ය. ඒ මන්දිරය නම් ඔබ ය.
18 කිසිවෙක් තමා ම රවටා නොගනිත් වා. ඔබ
අතර යමෙක් තමා ප්‍රඥාවන්තයෙක් යයි සිතන්නේ
නම්, ඔහු නියම ප්‍රඥාවන්තයකු වන පිණිස,
ලෝක මිම්ම අනුව ඔහු මෝඩයෙක් වේ වා.
19 ජෝබ් 5:13මන්ද, මේ ලෝකයේ ප්‍රඥාව
දෙවියන් වහන්සේ ඉදිරියෙහි මෝඩකමකි. උන්
වහන්සේ: “ප්‍රඥාවන්තයන් ඔවුන්ගේ ම උපායවලින්
අසු කරගන්නා සේකැ”යි ලියා ඇත. 20 ගීතා
94:11තවද, “සමිඳාණන් වහන්සේ
ප්‍රඥාවන්තයන්ගේ කල්පනා නිස්සාර බව දන්නා
සේකැ”යි කියා ද ලියා ඇත. 21 එහෙයින් කිසිවෙක්
යම් යම් පුද්ගලයන් ගැන පාරට්ටු කර නොගනිත් වා.
මන්ද, සියල්ලෝ ම ඔබගේ ය. 22 පාවුලු,
අපොල්ලොස්, කේපස් යන සියල්ලන් ද, ලෝකය,
ජීවනය, මරණය, වර්තමානය, අනාගතය යන
සියල්ල ද ඔබගේ ය. 23 ඔබ ක්‍රිස්තුන්
වහන්සේගේ ය. ක්‍රිස්තුන් වහන්සේ දෙවියන්
වහන්සේගේ ය.

## ප්‍රේරිතයන්ගේ වගකීම්

4 ඔබ අප ගැන සිතිය යුත්තේ, ක්‍රිස්තුන්
වහන්සේගේ සේවකයන් ද දෙවියන්
වහන්සේගේ අබිරහස් පිළිබඳ භාරකාරයන් ද
හැටියට ය. 2 භාරකාරයන්ගෙන් බලාපොරොත්තු
වන්නේ ඔවුන් විශ්වාසවන්ත ව සිටී ම ය. 3 එහෙත්
ඔබ විසින් හෝ මනුෂ්‍ය අධිකරණයකින් හෝ මා
විනිශ්චය කරනු ලැබීම, මා සලකන්නේ ඉතා සුළු
දෙයක් ලෙස ය. තවද, මම මා ම විනිශ්චය කර
නොගනිමි. 4 මන්ද, මට විරුද්ධ ව කිසිවක් ඇති බව
මම නොදනිමි. ඒ නිසා ම මම නිදොස් නොවෙමි. මා
විනිශ්චය කරන්නේ සමිඳාණන් වහන්සේ ය.
5 එබැවින් සමිඳාණන් වහන්සේ එන තුරු නියම
කාලයට පෙර කිසි විනිශ්චයක් නොකරන්න. උන්
වහන්සේ අඳුරෙහි සැඟවුණු දේ ආලෝකයට
පමුණුවා, සිත් සතන්හි අදහස් හෙළි කරන සේක.
එවිට හැම දෙනෙක් ම තම තමන්ට හිමි ප්‍රශංසාව
දෙවියන් වහන්සේගෙන් ලබති.
6 සහෝදරයෙනි, මම ඔබ උදෙසා මේ දේ
උපමානුසාරයෙන්, අපොල්ලොස්ටත් මටත් අදාළ
කොට කීමි. එසේ කීවේ නීතිරීති කඩ නොකිරීමට
ඔබ අපෙන් ඉගෙනගන්නා පිණිසත්, ඔබෙන් කවරකු
වත් එක් කෙනෙකු ගැන ආඩම්බර වී අන් කෙනෙකු
හෙළා නොදකින පිණිසත් ය. 7 ඔබට එතරම්
ප්‍රමුඛත්වයක් දුන්නේ කවරෙක් ද? දෙවියන්
වහන්සේ දුන් දේ හැර අන් කිසිවක් ඇද් ද? ඉතින්,
එය දෙන ලද දෙයක් නම් ඔබ සතු දෙයක් සේ ම
සලකා පාරට්ටු කරගන්නේ මන් ද?
8 අවශ්‍ය හැම දේ ම දැනට ම ඔබට ඇත; දැනට
ම ඔබ ධනවත් ය. දැනට ම අප නැතුව ඔබ රජවරු
ය. ඔබ සැබෑවට ම රජවරු නම් මම කෙතරම්
කැමැති වෙමේ ද? එවිට අපටත් ඔබ සමඟ රජවරුන්
වෙන්න ඉඩ තිබිණි. 9 මට පෙනෙන්නේ, දෙවියන්
වහන්සේ ප්‍රේරිතවරයන් වන අප මරණයට නියම
කළ අය මෙන්, අන්තිම තැන අපට දී තිබෙන බව යි.
මෙලෙස අපි දේව දූතයන් හා මනුෂ්‍යයන් හා ඇතුළු
මුළු ලොවට ම ප්‍රසිද්ධ ප්‍රදර්ශනයක් වී සිටිමු.
10 ක්‍රිස්තුන් වහන්සේ උදෙසා අපි මෝඩයෝ ය,
එහෙත් ඔබ උගත් කිතුනුවෝ ය. අපි දුබල ය; ඔබ
බලවත් ය, ඔබට ගෞරවය ඇත, අපට අගෞරවය
ඇත. 11 මේ මොහොත දක්වා ම අපි කුසගින්නෙන්
හා පිපාසයෙන් පෙළෙමු. වැරහැලි අඳිමු; පහර ලබමු;
ගෙයක්දොරක් අපට නැත. 12 ක්‍රියා 18:3දෑතින් වැඩ
කර වෙහෙස මහන්සි වෙමු. නින්දා ලබන කල, අපි
ආශීර්වාද කරමු; පීඩා ලබන කල, අපි ඉවසමු;
13 අපකීර්තිය ලබන කල අපි මෙත් සිත් වඩමු. මේ
දක්වා ම අපි කුණුකසළ මෙන් වී සිටිමු.
14 මා මෙලෙස ලියන්නේ ඔබ ලජ්ජා කරන
අදහසින් නොව, මාගේ ප්‍රියාදර දරුවන්ට මෙන්
ඔබට අවවාද කරන පිණිස ය. 15 කිතුනු ජීවිතයේ
ඔබට දස දහසක් ගුරුවරුන් සිටියත්, පියවරු වැඩි
දෙනෙක් නැත. මන්ද, සුබ අස්න දේශනා කිරීමෙන්

ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ ඔබගේ පියා වූයේ
මම ය. 16 1 කොරි 11:1; පිලිප් 3:17එහයින් මාගේ
ආදර්ශය අනුගමනය කරන මෙන් උදක් ම ඉල්ලමි.
17 එබැවින් මේ සඳහා සමිඳාණන් වහන්සේ තුළ
මට ප්‍රියාදර, විශ්වාසවන්ත පුත්‍රයකු වන
තිමෝතියස් ඔබ වෙත එවමි. ඔහු හැමතැන, හැම
සභාවල මා උගන්වන ක්‍රිස්තුන් වහන්සේ තුළ වූ
මාගේ සදාචාර පිළිවෙත් ඔබට සිහිගන්වනු ඇත.
18 මා ඔබ වෙත නොඑති යි කියමින් සමහරුන්
අහංකාර වී ඇත. 19 එහෙත් සමිඳාණන් වහන්සේ
කැමැති වන සේක් නම්, මම නොපමා ව ඔබ වෙත
අවුත්, අහංකාර අයගේ කථිකත්වය නොව
ඔවුන්ගේ බලයේ තරම දැනගන්නෙමි. 20 මන්ද,
දෙවියන් වහන්සේගේ රාජ්‍යය වනාහි කතා
ශක්තියෙන් නොව දේව බලයෙන් ක්‍රියා කරන්නකි.
21 ඔබ කැමැති කුමකට ද? කෝටුවක් රැගෙන මා
ඔබ වෙත එනවාට ද? නැත්නම් මෛත්‍රී කරුණා
සහගත ව ඔබ වෙත එනවාට ද?

## සභාව අනාචාරයෙන් වැළැක්වීම

5 ද්වි.නී. 22:30 මිසදිටුවන් වුව ද නුරුස්සන
තරමේ අනාචාර ක්‍රියාවක් ඔබ අතර ඇති
බව මට ඇත්තට ම ආරංචි වී ඇත. එනම්, ඔබගෙන්
කෙනෙකු සිය පියාගේ බිරිඳ තබාගෙන ඉන්න බව
ය. 2 එවැනි ක්‍රියාවක් ගැන ඔබට ආඩම්බර විය
හැකි ද? නැත, ඒ ගැන ඔබ දුක් විය යුතු ය. ඔහු
ඔබ වෙතින් නෙරපා දැමිය යුතු ය. 3 සැබැවින් ම
මම ගතින් ඔබගෙන් ඈත් ව සිටියත්, සිතින් ඔබ
සමඟ සිටිමි. එලෙස ඔබ සමඟ සිටින්නාක් මෙන් ම
මා දැනටමත් මේ දේ කරන පුද්ගලයා විනිශ්චය කර
ඇත. 4 එබැවින් සිතින් ඔබ අතර සිටින මා සමඟ,
අපගේ ස්වාමීන් වන ජේසුස් වහන්සේගේ
නාමයෙන් ඔබ එක්රැස් වූ විට, 5 අපගේ ස්වාමීන්
වන ජේසුස් වහන්සේගේ බලයෙන් ඒ පුද්ගලයාගේ
ආත්මය සමිඳාණන් වහන්සේගේ දවසේ දී
ගැළවෙන පිණිස, ඔහුගේ ශරීරය නාස්ති වන පිණිස
ඔහු සාතන්ට භාර කළ යුතු ය.
6 ගලා 5:9 ඔබගේ පාරට්ටුව නොහොබී. මුහුන්
බිඳකින් මුළු පිටි පිඬක් පිපෙන බව ඔබ නොදන්නහු
ද? 7 නික්ම 12:5ඔබ හැම අතින් ම පිරිසිදු වන
පිණිස පාපය නමැති මුහුන් ඉවත් කරන්න. එවිට
ඔබ අලුත් නුමුහුන් පිටි පිඬක් මෙන් වන්නහු ය. ඔබ
දැනට ම එසේ බව මම දනිමි, එසේ වන්නේ
අපගේ පාස්කු බැටළුවා වන ක්‍රිස්තුන් වහන්සේ
පූජා කර ඇති බැවිනි. 8 නික්ම 13:7; ද්වි.නී.
16:3එබැවින් පරණ මුහුන්වලින් වත්, ඊර්ෂ්‍යාව සහ
දුෂ්ටකම නමැති මුහුන්වලින් වත් නොව, අවංකකම
ද සත්‍යය ද නමැති නුමුහුන් රොටියෙන් පාස්කු
මංගල්‍යය පවත්වමු.
9 මා ඔබ වෙත එවූ ලිපියේ අනාචාරයේ හැසිරෙන
මිනිසුන් ඇසුරු නොකරන ලෙස, ලීවෙමි. 10 එයින් මා
අදහස් කළේ මේ ලෝකයේ මිසදිටුවන් අතර
සිටින, අනාචාරයේ හැසිරෙන අයගෙන් ද වස්තු
තෘෂ්ණාව ඇති අයගෙන් ද කොල්ලකන අයගෙන් ද
රූප වඳින අයගෙන් ද සම්පූර්ණයෙන් ම වෙන් වීම
නොවේ. එසේ කිරීමට නම් ඔබ ලෝකයෙන් වෙන්
විය යුතු ය. 11 එයින් මා ඇත්තට ම අදහස් කළේ
කිතුනුවකු යි කියා ගනිමින් අනාචාරයේ
හැසිරෙන්නෙකු හෝ වස්තු තෘෂ්ණාව ඇති කෙනෙකු
හෝ රූප වඳින්නකු හෝ නින්දා කරන්නකු හෝ
බේබද්දකු හෝ කොල්ලකන්නකු හෝ ඇසුරු
නොකිරීම පමණක් නොව, එවැන්නකු සමඟ
ආහාර වත් නොවැළඳීමයි.
12 සභාවෙන් පිටත වූවන් විනිශ්චය කිරීම මාගේ
වැඩක් ද? දෙවියන් වහන්සේ ඔවුන් විනිශ්චය කරන
සේක. 13 ද්වි.නී. 13:5; 17:7සභාව තුළ සිටින්නවුන්
විනිශ්චය කිරීම ඔබේ යුතුකම නොවේ ද? එසේ
නම් ඔබ අතරින් ඒ දුෂ්ටයා පහ කරන්න.

## නඩුහබවලින් වැළකීම

6 ඔබගේ සහෝදරයා සමඟ ආරාවුලක් හටගත්
විට එය විනිශ්චය කිරීමට කිතුනු සෙනඟ
ඉදිරියට නොගොස්, කිතුනු නොවන උසාවියක්
ඉදිරියට යන්නට භය නැද් ද? 2 කිතුනු සෙනඟ
ලෝකයා විනිශ්චය කරන බව ඔබ නොදන්නහු ද?
ලෝකයා විනිශ්චය කරන්නේ ඔබ නම්, සුළු
ආරාවුලක් විසඳීමට ඔබ අපොහොසත් ද? 3 අප,
දේව දූතයන් පවා විනිශ්චය කරන්නට යන බව ඔබ
නොදන්නහු ද? එසේ නම් එදිනෙදා ජීවිතයට අයත්
දේ විනිශ්චය කිරීම අපට කළ නොහැකි ද? 4 එබඳු
කාරණා මතු වූ විට, ඒවා විසඳීම සඳහා, සභාව කිසි
සේත් ගණන් නොගන්නා අය වෙත ඔබ යන්නහු ද?
5 මයෙ මොන නින්දාවක් ද? ඇත්තට ම
සහෝදරයන් අතර ආරාවුලක් විසඳීමට සමත් එක
නැණවතෙක් වත් ඔබ අතර නැද් ද? 6 සහෝදරයකු
තවත් සහෝදරයකුට විරුද්ධ ව, නඩු කියාගැනීමට
විශේෂයෙන් මිසදිටුවන් ඉදිරියට නඩු කියාගැනීමට
යෑම සුදුසු ද?
7 මෙසේ ඔබ එකිනෙකා සමඟ නඩු කියාගැනීම,
දැනට ම ඔබට පරාජයකි. අයුක්තිය ඉවසීම, ඊට
වඩා හොඳ නැද් ද? අලාභයක් ඉවසීම, ඊට වඩා
හොඳ නැද් ද? 8 ඒ වෙනුවට ඔබ කරන්නේ
අයුක්තියත් අලාභයත් ය. ඒකත් කරන්නේ
සහෝදරයන්ට ම ය. 9 අධර්මිෂ්ඨයන් දෙවියන්
වහන්සේගේ රාජ්‍යය උරුම කරගන්නේ නැති බව
ඔබ දන්නේ නැද් ද? නොරැවටෙන්න. අනාචාරකම්
කරන්නෝ වත්, රූප වඳින්නෝ වත්,
කාමමිථ්‍යාචාරිකයෝ වත්, සම ලිංගික සේවනයේ
යෙදෙන්නෝ වත්, 10 සොරුවත්, කොල්ලකන්නෝ
වත්, ලෝභියෝ වත්, බේබද්දෝ වත්, නින්දා
කරන්නෝ වත්, ගසා කන්නෝ වත්, දෙවියන්
වහන්සේගේ රාජ්‍යය උරුම කර නොගන්නෝ ය.
11 තවද ඔබ අතරෙන් සමහරෙක් එවැන්නෝ වූ හ.
එහෙත් අපගේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේගේ නාමයෙන් ද අපගේ දෙවියන්
වහන්සේගේ ආත්මයාණන් මඟින් ද ඔබ සෝදනු

ලැබුවහු ය; ශුද්ධ කරනු ලැබුවහු ය; දමිටු කරනු
ලැබුවහු ය.

## ශරීරය දේව මහිමයට කැප කිරීම

12 1 කොරි 10:23 “මා කැමැති දයෙක් කිරීමට මට
නිදහස ඇතැ”යි කීවත් හැම දේ ම මගේ යහපත
පිණිස නොවේ. එසේ ම “කැමැති දයෙක් කිරීමට
මට නිදහස ඇතැ”යි කීවත් මම කිසිවකට වසඟ
නොවෙමි. 13 “ආහාර උදරය සඳහා ය, උදරය ආහාර
සඳහා ය”යි කීවත් දෙවියන් වහන්සේ ඒ දකෙ ම
නැති කරන සේක. තවද ශරීරය අනාචාරය පිණිස
නොවේ. එය සමිඳාණන් වහන්සේ උදසො ය.
14 දෙවියන් වහන්සේ ස්වාමීන් වහන්සේ මරණයනේ
උත්ථාන කළ සේක. ස්වකීය බලයනේ අපත් උන්
වහන්සේ එසේ උත්ථාන කරන සේක.
15 ඔබගේ ශරීර ක්‍රිස්තුන් වහන්සේගේ
අවයවයන් බව නොදන්නහු ද? එසේ නම් මම
ක්‍රිස්තුන් වහන්සේගේ අවයවයන් පැහැර ගනෙ
ඒවා ගණිකාවකගේ අවයවයන් කරම් ද? 16 උත්
2:24එසේ නොවේ වා. ගණිකාවකට සම්බන්ධ වන
තැනැත්තේ කායික ලසෙ ඈ හා එක් වන බව ඔබ
නොදන්නහු ද? ශුද්ධ ලියවිල්ලහේ කියා ඇති පරිදි
‘දදෙනො ම එක් කනෙකේ වන්නෝ ය.’ 17 එහතේ
ස්වාමීන් වහන්සේට සම්බන්ධ වන තැනැත්තේ උන්
වහන්සේ සමඟ ඒකාත්මයක් වන්නේ ය.
18 අනාචාරයනේ පලා යන්න. අන් හැම පාපයක් ම
මිනිසා කරන්නේ ශරීරයනේ බැහැර ය. එහතේ
අනාචාරය කරන්නා තමාගේ ම ශරීරයට විරුද්ධ ව
පව් කරයි. 19 1 කොරි 3:16; 2 කොරි 6:16ඔබගේ
ශරීරය, ඔබට දෙවියන් වහන්සේ දවො වදාළ, ඔබ
තුළ වැඩ වසන ශුද්ධාත්මයාණන්ගේ මන්දිරය වන
බව ඔබ නොදන්නහු ද? ඔබ ඔබට ම අයිති නැත.
20 ඔබ මිලයකට ගත් අය වන්නහු ය. එබැවින්
ඔබගේ ශරීර දේව මහිමය සඳහා යොදවන්න.

## විවාහය පිළිබඳ ගැටළු

7 ඔබ ලියූ කරුණු ගැන දැන් සිතා බලමු. ස්ත්‍රී
සේවනයනේ වැළකී සිටීම මිනිසාට යහපති.
2 එහතේ, අනාචාරය බහුල ව පවතින නිසා හැම
මිනිසකුෙට ම භාර්යාවක් ද හැම ස්ත්‍රියකට ම
ස්වාමි පුරුෂයකු ද සිටිය යුතු ය. 3 පුරුෂයා සිය
භාර්යාවට විවාහ ජීවිතයේ යුතුකම් ඉටු කළ යුතු යි.
භාර්යාව ද සිය පුරුෂයාට විවාහ ජීවිතයේ යුතුකම්
ඉටු කළ යුතු යි. 4 භාර්යාවගේ ශරීරයට අයිතිය
ඇත්තේ, ඇයට නොව පුරුෂයාට ය. එලසෙ ම
පුරුෂයාගේ ශරීරයට අයිතිය ඇත්තේ, ඔහුට නොව
භාර්යාවට ය. 5 යාච්ඤාවේ යදෙනෙ පිණිස ස්ත්‍රී-
පුරුෂ දදෙනොගේ ම කැමැත්තනේ කලකට වනේ වී
සිටිනවා මිස, නැත්නම් වනේ වී නොසිටිය යුතු ය.
එසේ වුව ද ඔබගේ ආත්ම දමනය හීන වීමනේ,
සාතන්ගේ පළෙඹීම්වලට අසු නොවන පිණිස නැවත
එක් වතේ වා.
6 මා මසෙේ කියන්නේ ආඥාවක් වශයනේ නොව
අවවාදයක් වශයනේ. 7 ඔබ හැමට මා මනේ සිටිය
හැකි නම් මම කැමැත්තමේ. එක් කනෙකුෙට එක
විධියකට ද තව කනෙකුෙට තවත් විධියකට ද තම
තමන්ට ම විශේෂ වූ දීමනාවක් එකිනකො දෙවියන්
වහන්සේගනේ ලබා ඇත.
8 අවිවාහකයන්ට ද වැන්දඹුවන්ට ද මා කියන්නේ
මා මනේ ඔවුන් ද, දැන් ඔවුන් සිටින්නාක් මනේ සිටීම
හොඳ බව ය. 9 එහතේ ඔවුන්ට ආත්ම දමනය
නොහැකි දයෙක් නම් ඔව්හු විවාහ වතේ වා.
කාමරාගයනේ දැවනෙවාට වඩා විවාහ වීම යහපති.
10 මතෙ 5:32; 19:9; මාක් 10:11-12; ලූක් 16:18
විවාහකයන්ට මම මසෙේ අණකරමි. එහතේ අණ
කරන්නේ මා නොව සමිඳාණන් වහන්සේ ය. එනම්
භාර්යාව ස්වාමි පුරුෂයාගනේ වනේ ව නොයේ වා.
11 වනේ ව ගියහොත් ඈ තනි ව සිටී වා. නැතහොත්
ස්වාමි පුරුෂයා හා සමගි වේ වා. ස්වාමි පුරුෂයා ද
සිය භාර්යාව දික්කසාද නොකළ යුතු ය.

## කිතුනු, කිතුනු නොවන විවාහ

12 සසෙු අයට සමිඳාණන් වහන්සේ නොව මම
මසෙේ කියමි. යම් සහෝදරයකුෙට කිතුනු නොවන
භාර්යාවක් සිටී නම්, ඈ ඔහු සමඟ වාසය කිරීමට
කැමැති නම්, ඔහු ඇය දික්කසාද නොකරේ වා.
13 එසේ ම යම් ස්ත්‍රියකට කිතුනු නොවන ස්වාමි
පුරුෂයකේ සිටී නම්, ඔහු ඈ සමඟ වාසය කිරීමට
කැමැති නම් ඈ ඔහු දික්කසාද නොකරේ වා.
14 මන්ද, කිතුනු නොවන ස්වාමි පුරුෂයා භාර්යාව
නිසා දෙවියන් වහන්සේට කැප වී සිටී. කිතුනු
නොවන භාර්යාව ද, ස්වාමි පුරුෂයා නිසා දෙවියන්
වහන්සේට කැප වී සිටී. එසේ නොවී නම් ඔවුන්ගේ
දරුවෝ දෙවියන් වහන්සේට අයිති නොවතේ.
එහතේ දැන් ඔව්හු දෙවියන් වහන්සේට අයිති ය.
15 එහතේ කිතුනු නොවන විවාහකයා වනේ වන්නට
කැමැති නම්, වනේ වේ වා. මවෙනි අවස්ථාවලින්
කිතුනු සහෝදරයා හෝ සහෝදරිය හෝ විවාහ
බැඳුමනේ බැඳී නැත. දෙවියන් වහන්සේ ඔබ කැඳවා
ඇත්තේ සාමදානයනේ ජීවත් වීමට ය. 16 ඔබ කිතුනු
භාර්යාවක් නම් ඔබ තම ස්වාමි පුරුෂයාගේ ගැළවීම
සලසනු විය හැකි ය. ඔබ කිතුනු ස්වාමි පුරුෂයකේ
නම් ඔබ තම භාර්යාවගේ ගැළවීම සලසනු විය
හැකි ය.

## දේව කැඳවීම අනුව ජීවත් වීම

17 එසේ වුව ද සමිඳාණන් වහන්සේ එකිනකොට
නියම කොට ඇති ප්‍රකාරයට හා දෙවියන් වහන්සේ
එකිනකො කැඳවා ඇති ප්‍රකාරයට ජීවත් වන්න.
සැම සභාවකට ම මා දනෙ නියෝගය මේ ය.
18 යමකු චර්මඡේදනය ලබා සිටිය දී කැඳවීම
ලැබූයේ නම්, ඔහු චර්මඡේදනයේ ලකුණු පහ
නොකරේවා. යමකු චර්මඡේදනය නොලබා සිටිය
දී කැඳවීම ලැබූයේ නම්, ඔහු චර්මඡේදනය
නොලබාවා. 19 චර්මඡේදනය වත්, අචර්මඡේදනය

වත්, වැදගත් වන්නේ නැත. වැදගත් වන්නේ
දෙවියන් වහන්සේගේ ආඥා පිළිපැදීම ය. 20 සෑම
කෙනෙක් ම සිය කැඳවීම ලැබූ තත්ත්වයෙහි ම
පවතිත් වා. 21 ඔබ කැඳවීම ලැබූයේ වහලෙකු ව
සිටිය දී නම්, ඒ ගැන කරදර නොවන්න. එහෙත්
නිදහස ලබාගැනීමට ඉඩක් ඇත්නම් එයින්
ප්‍රයෝජන ගන්න. 22 වහලෙකු ව සිටිය දී
සමිඳාණන් වහන්සේගෙන් කැඳවීම ලැබූ තැනැත්තා
සමිඳාණන් වහන්සේගේ නිවහලෙකි. එසේ ම
නිවහල් ව සිටිය දී කැඳවීම ලැබූ තැනැත්තා
ක්‍රිස්තුන් වහන්සේගේ වහලෙකි. 23 ඔබ මිලයකට
ගනු ලැබූ අය වෙති. එබැවින් මිනිසුන්ගේ වහලුන්
නොවන්න. 24 සහෝදරයෙනි, සෑම කෙනෙක් ම තමා
කැඳවීම ලැබූ තත්ත්වයෙහි දෙවියන් වහන්සේ සමඟ
පවතිත් වා.

### අවිවාහකයන් හා වැන්දඹුවන් පිළිබඳ ප්‍රශ්නය

25 අවිවාහකයන් ගැන මට සමිඳාණන්
වහන්සේගෙන් ආඥාවක් ලැබී නැත. එහෙත්,
සමිඳාණන් වහන්සේගේ කරුණාවෙන් විශ්වාස
කටයුතු තැනැත්තෙකු වන මම, මගේ අදහස කියනු
කැමැත්තෙමි.
26 මේ කාලයේ ඇති දුක් විපත් නිසා යමෙක් තමා
සිටින තත්ත්වයෙහි ම සිටින්නේ නම් යහපතැ යි
සිතමි. 27 ඔබ ස්ත්‍රියක සමඟ විවාහ වී සිටින්නෙහි
නම් ඇයගෙන් නිදහස් වන්නට නොසොයන්න. ඔබ
ස්ත්‍රියක සමඟ විවාහ වී නැත්නම් භාර්යාවක්
නොසොයන්න. 28 එහෙත් ඔබ විවාහ වුවත් එයින්
ඔබට පාපයක් නැත. කන්‍යාවක විවාහ වුවත් එයින්
ඇයට පාපයක් නැත. එසේ වුව ද එවැනි අයට මේ
ලෝකයෙහි දුක් විපත් ඇති වන්නේ ය. මම ඔබ
ඒවායින් වළක්වාලීමට කැමැත්තෙමි.
29 සහෝදරවරුනි, මේ දේ කියනු කැමැත්තෙමි.
එනම් වැඩි කාලයක් ඉතිරි වී නැත. මෙතැන් සිට,
30 භාර්යාවන් ඇත්තන්, භාර්යාවන් නැත්තන් මෙන් ද,
හඬන්නන් නොහඬන්නන් මෙන් ද, ප්‍රීති වන්නන්
ප්‍රීති නොවන්නන් මෙන් ද, මිලයට ගන්නන් ගත්
දෙයට අයිතියක් නැති අය මෙන් ද, 31 මෙලොව
සැපසම්පත් භුක්ති විඳින්නන්, ඒවායේ ම ඇලීගැලී
නොසිටින්නන් මෙන් ද සිටිය යුතු යයි මම ඔබට
කියමි. මන්ද, දැන් පවතින මේ ලෝකය පහ වී
යන්නේ ය.
32 ඔබ සිත් තැවුලින් තොර ව සිටිනවාට මම
කැමැත්තෙමි. අවිවාහක තැනැත්තේ සමිඳාණන්
වහන්සේ ප්‍රසන්න කරන්නේ කෙසේ දැ යි සිතමින්
උන් වහන්සේගේ කාරණා ගැන අධික සැලකිල්ලක්
දක්වන්නේ ය. 33 විවාහක තැනැත්තේ තම භාර්යාව
සතුටු කරන්නේ කෙසේ දැ යි සිතමින් ලෝකයේ
කාරණා ගැන අධික සැලකිල්ලක් දක්වන්නේ ය.
34 මෙලෙසෙ ඔහුගේ සිතහෙි දෙගිඩියාවක් පවතී.
අවිවාහක ස්ත්‍රිය හෝ කන්‍යාව හෝ ඈ ශාරීරික
ලෙසෙ හා ආධ්‍යාත්මික ලෙසෙ සමිඳාණන් වහන්සේට
කැප ව සිටින සේ උන් වහන්සේගේ කාරණා ගැන
අධික සැලකිල්ලක් දක්වන්නී ය. එහෙත් විවාහක
ස්ත්‍රිය තම පුරුෂයා සතුටු කරන්නේ කෙසේ දැ යි
සිතමින් ලෝකයේ කාරණා ගැන අධික සැලකිල්ලක්
දක්වන්නී ය.
35 මා මෙයෙ කියන්නේ ඔබගේ ම යහපත පිණිස
ය. ඔබගේ නිදහස සීමා කිරීමට මගේ අදහසක්
නැත. මගේ කැමැත්ත නම් ඔබ විනීත ලෙසෙ ඉත
සිතින් සමිඳාණන් වහන්සේට සේවය කිරීම ය.
36 යමෙක් දැඩි රාගික ඇල්ම නිසා තම විවාහ
අපේක්ෂිකාව පිළිබඳ ව තමා සුදුසු ලෙසෙ ක්‍රියා
නොකරන බවත්, විවාහ වීම යුතු බවත් ඔහුට
හැඟේ නම්, ඔහුගේ කැමැත්ත අනුව, ඔව්හු විවාහ
වෙත් වා. එහි පාපයක් නැත. 37 යමෙක් විවාහ
නොවීමට ස්ථිර ලෙසෙ අදහස් කර ඇත්නම්, යම් කිසි
බලපෑමක් ද නැත්නම්, තමාගේ සිත සම්පූර්ණයෙන්
දමනය කිරීමට ද ඔහුට හැකි නම්, සිය විවාහ
අපේක්ෂිකාව සමඟ විවාහ නොවීම යහපති.
38 මෙසේ විවාහ අපේක්ෂිකාව සමඟ විවාහ වන්නා
කරන්නේ හොඳ දෙයෙකි. විවාහ නොවන්නා
කරන්නේ වඩාත් හොඳ දෙයෙකි.
39 භාර්යාවක් සිය ස්වාමි පුරුෂයා ජීවත් ව සිටින
තුරු ඔහුට බැඳී සිටින්නී ය. ස්වාමි පුරුෂයා මළහොත්
ඈ කැමැති කෙනෙකු සමඟ විවාහ වීමට ඈට
නිදහස ඇත. එහෙත් එය ක්‍රිස්තියානි විවාහයක්
විය යුතු ය. 40 ඈ සිටින ලෙසෙ ම සිටින්නී නම්, වඩා
වාසනාවන්ත ය. එය මගේ අදහසයි. එපමණක්
නොව, දෙවියන් වහන්සේගේ ආත්මයාණන් මා තුළ
වැඩ වසන බව ද, මම විශ්වාස කරමි.

### දේවතා පිදේනි පිළිබඳ ප්‍රශ්නයක්

8 දේවතාවන්ට පුදන පිදේනි ගැන මම දැන්
කතා කරමි. අප සියල්ලන්ට ම ඥානය ඇති
බව අපි දනිමු. ඥානය අහංකාරය උපදවයි. එහෙත්
ප්‍රේමය ශුභසිද්ධිය සලසයි. 2 යමෙක් තමා
යමක්කමක් දන්නේ යයි සිතයි නම්, දත යුතු
අන්දමට ඔහු තව ම දැනගෙන නැත. 3 එහෙත්
යමෙක් දෙවියන් වහන්සේට ප්‍රේම කරයි නම්
දෙවියන් වහන්සේ ඔහු දන්නා සේක.
4 දේවතාවන්ට පුදන පිදේනි වැළඳීම ගැන කුමක්
කියමු ද? දේවතා පිළිමයකින් නිරූපණය වන
කිසිවෙකු නැති බවත්, එක ම දෙවි කෙනෙකු මිස
අන් දෙවි කෙනෙකු නැති බවත් අපි දනිමු.
5 සුරලොව හා නරලොව ‘දෙවිවරුන්’ යයි කියන අය
ඇතත් මෙවැනි ‘දෙවිවරුන්’ හා ‘ස්වාමිවරුන්’ බොහෝ
දෙනෙකු සිටියත්, 6 අපට ඇත්තේ එක ම දෙවි වන
පියාණන් වහන්සේ ය. සියල්ල මවා ඇත්තේ උන්
වහන්සේ ය. අප ජීවත් වන්නේත් උන් වහන්සේ
උදෙසා ය. තවද, අපට ඇත්තේ ජේසුස් ක්‍රිස්තුස්
නම් එක ම සමිඳාණන් වහන්සේ ය. සියල්ල මවා
ඇත්තේත්, අප ජීවත් වන්නේත් උන් වහන්සේ
කරණකොටගෙන ය.

7 එහෙත් හැම දෙන ම එය නොදනිති. දේවතා
පූජාවට පුරුදු වී සිටින සමහරු ඔවුන් වළඳන ආහාර
දේවතාවන්ට පිදූ පිදේනි යයි තවමත් සිතති.
මලෙසෙ ඔවුන්ගේ හෘදය සාක්ෂිය දුර්වල බැවින්,
එය කලෙසේ ඇත. 8 ආහාරය නිසා දෙවියන්
වහන්සේ සමඟ සම්බන්ධයක් ඇති නොවේ.
නොකෑමෙන් වන අවැඩක් නැත; කෑමෙන් වන වැඩක්
ද නැත.
9 ඔබට ඇති මේ නිදහස කිසි ලෙසකින් දුබලයනට
බාධාවක් නොවන්නට වග බලාගන්න. 10 දැනුම ඇති
ඔබ, දේවාලයක කෑමට වාඩි වී සිටින බව දුර්වල
යමකු දුටුවොත්, දේවතාවන්ට පිදූ පිදේනි කෑමට,
ඔහුගේ හෘදය සාක්ෂියටත් ඉන් අනුබල නොලැබේ
ද? 11 එසේ නම් ඒ සහෝදරයා උදෙසා ක්‍රිස්තුන්
වහන්සේ මළ නමුත් දුර්වල වූ ඔහු, ඔබගේ
දැනගැන්ම නිසා විනාශයට පත් වේ. 12 මසේ
ඔබගේ සහෝදරයන්ට විරුද්ධ ව පව් කොට
ඔවුන්ගේ දුර්වල හෘදය සාක්ෂිය තුවාළ කරන කල්හි
ඔබ පව් කරන්නේ ක්‍රිස්තුන් වහන්සේට විරුද්ධ ව
ය. 13 එබැවින් ආහාරය නිසා මාගේ සහෝදරයාට
බාධාවක් වේ නම්, මාගේ සහෝදරයාට බාධාවක්
නොපැමිණෙනෙ පිණිස මින් මතු කිසි කලෙක මාංස
නොවළඳමි.

## ප්‍රේරිතවරයකුට හිමි වරප්‍රසාද

9 මම නිදහස් කෙනෙක් නොවෙමේ ද? මම
ප්‍රේරිතවරයෙක් නොවෙමේ ද? අපගේ ස්වාමීන්
වන ජේසුස් වහන්සේ මම නුදුටිම් ද? ඔබ හැම,
සමිඳාණන් වහන්සේ උදෙසා මා කළ සේවයේ
ප්‍රතිඵල නොවන්නහු ද? 2 අන්‍යයන්ට මා
ප්‍රේරිතවරයකු නොවෙතෙත්, යටත් පිරිසයෙන්
ඔබට මම ප්‍රේරිතවරයෙක් වමි. මන්ද, සමිඳාණන්
වහන්සේ තුළ මාගේ ප්‍රේරිතකම පිළිබඳ
සහතිකයේ මුද්‍රාව ඔබ ය. 3 මට අභියෝග
කරන්නන්ට මගේ පිළිතුර මේ ය. 4 කන්නත්
බොන්නත් අපට අවසර නැද් ද? 5 සෙසු
ප්‍රේරිතවරුන් ද සමිඳාණන් වහන්සේගේ
සහෝදරයන් ද, කේපස් ද මෙන් කිතුනු බිරිඳක
කැටුව යාමට අපටත් අවසර නැද් ද? 6 දිව් පවෙතෙ
සඳහා වැඩ කිරීමට බැඳී සිටින්නේ මා හා බාර්ණබස්
පමණක් ද? 7 සිය වියදමෙන් යුද හමුදාවේ සේවයට
යන කෙනෙක් ඇද් ද? මිදි වත්තක් වවා එහි පල
නොකන කෙනෙක් ඇද් ද? ගව රැළක් ඇති කර
උන්ගේ කිරි නොබොන්නේ කවරෙක් ද?
8 මේවා පොදු ජීවිතයෙන් ගත් උපහැරණ යයි
නොසිතන්න. ව්‍යවස්ථාවත් එම දේ ම නොකියයි ද?
9 ද්වි.නී. 25:4; 1 තිමෝ 5:18මන්ද, මෝසෙස්ගේ
ව්‍යවස්ථාවේ ලියා ඇත්තේ: “ගොයම් පාගන
ගවයාගේ කට නොබඳිනු” කියා ය. මයෙන්
හැඟෙන්නේ දෙවියන් වහන්සේ ගවයන් ගැන සිතන
බව ද? 10 සැබැවින් ම උන් වහන්සේ මයෙ පවසා
ඇත්තේ අප උදෙසා නොවේ ද? නිසැක ව ම එය
ලියන ලද්දේ අප උදෙසා ය. හාන්නා හෑ යුත්තේ ද,
ගොයම් පාගන්නා පැඟිය යුත්තේ ද, අස්වැන්නෙන්
හිමි කොටස ලැබීමේ බලාපොරොත්තුවෙන් යයි
ලියා ඇත. 11 රෝම 15:27අපි ඔබ අතර ආධ්‍යාත්මික
දේ වපුළමු නම්, එහි අස්වැන්න වශයෙන් ලෞකික
ලාභයක් නෙළාගැනීම එතරම් ලොකු දෙයක් ද?
12 අනිත් අයට ඔබ කෙරේ මවෙනි අයිතියක්
ඇත්නම් ඊටත් වඩා ලොකු අයිතියක් අපට නැද් ද?
12 එසේ වුව ද මේ අයිතියෙන් ප්‍රයෝජනයක්
නොගෙන ක්‍රිස්තුන් වහන්සේගේ සුබ අස්නට කිසිදු
බාධාවක් නොවන සේ අපි සියල්ල දරාගනිමු.
13 ද්වි.නී. 18:1දේව මාලිගාවේ සේවය කරන්නන්
දේව මාලිගාවෙන් ආහාර ලබන බවත්, පූජාසනය
මත පුදපූජා ඔප්පු කිරීමට සහාය වන්නන් පූජාවලින්
කොටසක් ලබන බවත් ඔබ නොදන්නහු ද? 14 මතෙ
10:10; ලූක් 10:7එසේ ම සුබ අස්න දේශනා
කරන්නන්, ඒ සුබ අස්නේ සේවයෙන් තමන්ගේ දිවි
පවෙතෙ සලසාගත යුතු ය කියා සමිඳාණන්
වහන්සේ නියෝග කර ඇත.
15 එහෙත් මේ අයිතිවාසිකම් කිසිවකින් මා
ප්‍රයෝජන ගත්තේ නැත. මේ කාරණා මා
ලියන්නේ එවැනි ප්‍රයෝජනයක් ලබාගැනීමේ
අදහසින් නොවේ. එසේ කිරීමට වඩා මරණය මට
හොඳ ය. කිසිවකේ මාගේ මේ පාරට්ටුව නිෂ්ප්‍රභා
නොකෙරෙතේ වා! 16 මා සුබ අස්න දේශනා කරන
නමුත් එය පාරට්ටු කරගැනීමට කාරණයක් නොවේ.
මන්ද, සුබ අස්න දේශනා කිරීමට මම බැඳී සිටිමි.
සුබ අස්න දේශනා නොකළොත් මම මහා
කාලකණ්ණියෙක් වමේ. 17 මාගේ ම කැමැත්තෙන්
මම සුබ අස්න දේශනා කරම් නම්, වැටුපක්
ලබාගැනීමේ අයිතියක් මට ඇත. එහෙත් මම මාගේ
කැමැත්ත නොතකා, එම සේවය කරම් නම්, මා
එසේ කරන්නේ දෙවියන් වහන්සේ මට පැවරූ
කාර්යයක් ලෙසෙ ය. 18 එසේ නම් මාගේ වැටුප
කුමක් ද? ඒ වැටුප නම්, අය කිරීමක් නැති ව, සුබ
අස්නේ සේවය වෙනුවෙන් වැටුපක් ලැබීමේ අයිතිය
පැහැර හැර, සුබ අස්න දේශනා කිරීමයි.

## මිනිසුන් දිනාගැනීමේ ආශාව

19 මම සියල්ලන් අතර නිවහල් කෙනෙක් වුවත්,
බොහෝ දෙනෙකු දිනාගන්නා පිණිස සියල්ලන්ගේ
වහලෙක් වීමි. 20 ජුදෙව්වරුන් දිනාගන්නා පිණිස මම
ජුදෙව්වරුන්ට ජුදෙව්වෙක් වීමි. ව්‍යවස්ථාව යටතේ
සිටින ඔවුන් දිනාගන්නා පිණිස, ව්‍යවස්ථාවට යටත්
නොවූ මම, ව්‍යවස්ථාවට යටත් වූ කෙනෙක් වීමි.
21 ව්‍යවස්ථාවෙන් බැහැර වූවන් දිනාගන්නා පිණිස,
ව්‍යවස්ථාවෙන් බැහැර වූවන්ට, මම ව්‍යවස්ථාවෙන්
බැහැර වූ කෙනෙක් වීමි. මා එසේ කළේ දෙවියන්
වහන්සේගේ ව්‍යවස්ථාවෙන් බැහැර නොවූවත්,
ක්‍රිස්තුන් වහන්සේගේ ව්‍යවස්ථාවට ඇතුළත් වී
සිටින කෙනෙකු වශයෙනි. 22 දුර්වලයන් දිනාගන්නා
පිණිස, මම දුර්වලයන්ට දුර්වලයෙක් වීමි. කෙසේ
හෝ වේවා ටික දෙනෙකු වුවත් දිනාගන්නා පිණිස,
මම සියල්ලෙහි දී ඒ ඒ තැනට ඔබින ලෙසෙ ක්‍රියා

කළෙමේ. 23 මා මේ සියල්ල කරන්නේ, සුබ අස්න
උදෙසා එහි ආශීර්වාදවලට හවුල්කාරයකු වන
පිණිස ය.

### දිනුම් කණුව බලා දිවීම

24 දිවීම් තරඟයක දී බොහෝ දෙනෙකු දුවන
නමුත්, ත්‍යාගය දිනා ගන්නේ එක් කෙනෙකු පමණක්
බව ඔබ නොදන්නහු ද? එසේ ම ඔබත් දිනන
පිණිස දුවන්න. 25 දිනන පිණිස වීර්ය කරන සෑම
ක්‍රීඩකයෙක් ම හැම අතින් ම දැඩි පුහුණුවක් ලබයි.
ඔවුන් එසේ කරන්නේ පර වී යන මල් ඔටුන්නක්
ලබාගන්නා පිණිස ය. අප එසේ කරන්නේ පර වී
නොයන ඔටුන්නක් ලබාගන්නා පිණිස ය.
26 එහෙයින් මා දුවන්නේ දිනුම් කණුව දෙස
නොබලා දුවන්නෙකු මෙන් නොවේ. පහර දෙන්නේ
සුළඟට පහර දෙන මල්ලව ක්‍රීඩකයෙකු මෙන්
නොවේ. 27 මම මාගේ ශරීරය දැඩි ලෙස දමනය
කර එය වහල් කරගනිමි. එසේ කරන්නේ
අන්‍යයන්ට දේශනා කළායින් පසු, කිසි ලෙසකින්
වත් මා ප්‍රතික්ෂේප කරනු නොලබන පිණිස ය.

### ජුදෙව් ඉතිහාසයෙන් පාඩමක්

10 නික්ම 13:21-22; 14:22-29 සහෝදරවරුනි,
අපේ පියවරුන්ට කුමක් වී දැ යි ඔබට මතක්
කර දීමට මම කැමැත්තෙමි. ඔව්හු සියල්ලෝ ම
වලාකුළක මඟ පෙන්වීම ලැබූ හ. ඔව්හු සියල්ලෝ
ම රතු මුහුදින් එතෙරෙ වූ හ. 2 සියල්ලෝ ම
වලාකුළක ද රතු මුහුදෙහි ද මෝසෙස් සමඟ
සහභාගිකමට බව්තීස්ම-ස්නාපනය ලැබූ හ. 3 නික්ම
16:35සියල්ලෝ ම එක ම දිව බොජුන් වැළඳූ හ.
4 නික්ම 17:6; ගණන් 20:11සියල්ලෝ ම එක ම අමා
පැන් පානය කළහ. ඔවුන් පානය කළේ ඔවුන්
කැටුව ගිය දිව්‍ය පර්වතයකින් ය. ඒ පර්වතය නම්
ක්‍රිස්තුන් වහන්සේ ය. 5 ගණන් 14:29-30එහෙත්
දෙවියන් වහන්සේ ඔවුන්ගෙන් වැඩි දෙනෙකු ප්‍රිය
නොකළ සේක. එබැවින් ඔව්හු කාන්තාරයෙහි දී
විනාශ වූ හ.
6 ගණන් 11:4 ඔවුන් නපුරු දෙයට ඇලුම් කළාක්
මෙන්, අපත් නපුරු දෙයට ඇලුම් නොකරන පිණිස,
මේ සියල්ල සිදු වූයේ අපට පාඩමක් වශයෙනි.
7 නික්ම 32:6“සෙනඟ කෑමටත් බීමටත් වාඩි වී රූප
වන්දනා උත්සවයට නැඟී සිටියෝ ය” කියා ලියා
ඇත. ඔවුන්ගෙන් සමහරෙකු මෙන් රූප වඳින්නන්
නොවන්න. 8 ගණන් 25:1-18ඔවුන්ගෙන් සමහරෙකු
අනාචාරයෙහි යෙදුණාක් මෙන් අපි අනාචාරයෙහි
නොයෙදෙමු. එසේ යෙදුන අයගෙන් විසි තුන් දහසක්
එක දවසෙහි ම මළහ. 9 ගණන් 21:5-6ඔවුන්ගෙන්
සමහරෙකු සමිඳාණන් වහන්සේ පරීක්ෂා කළාක්
මෙන් අපි උන් වහන්සේ පරීක්ෂා නොකරමු. එසේ
කිරීමෙන් ඔව්හු සර්පයන්ගෙන් විනාශ වූ හ.
10 ගණන් 16:41-49ඔවුන්ගෙන් සමහරෙකු මැසිවිලි
කීවාක් මෙන් මැසිවිලි නොකියන්න. මැසිවිලි කීමෙන්
ඔව්හු මාර දූතයා විසින් විනාශ කරනු ලැබූ හ.
11 මේ සියල්ල ඔවුන්ට සිදු වූයේ පාඩමක් වන
පිණිස ය. ඒවා ලියන ලද්දේ යුගාන්තයට පැමිණ
සිටින අපට අනතුරු ඇඟවීමක් වශයෙනි. 12 තමා
ස්ථිර ව සිටින්නේ යයි සිතන්නා නොවැටෙන ලෙස
පරෙස්සම් වන්න. 13 පොදුවේ හැම මිනිසෙකුට ම
මුහුණ පාන්නට ඇති පරීක්ෂා හැර අනෙකක් ඔබ වෙත
පැමිණ නැත. ඔබට දරාගත නොහැකි පරීක්ෂා ඔබ
පිට පැමිණීමට ඉඩ නොහැර, ඔබට පරීක්ෂා දැරිය
හැකි වන සේ ඒ සමඟ ම ගැළවීමේ මඟක් ඔබට
සලසා දෙන දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය
තැබිය හැකි ය.
14 එබැවින්, මාගේ ප්‍රේමවන්තයෙනි, රූප
නමස්කාරය වෙතින් පලා යන්න. 15 සිහි නුවණ
ඇත්තන්ට මෙන් මම ඔබට කතා කරමි. මා කියන
දේ ඔබ ම විනිශ්චය කරන්න. 16 මතෙ 26:26-28;
මාක් 14:22-24; ලූක් 22:19-20අප ආසිරි කුසලාන
ගෙන ආශීර්වාද කරන විට ඉන් අදහස් වන්නේ
ක්‍රිස්තුන් වහන්සේගේ රුධිරයේ සහභාගිකම
නොවේ ද? අප රොටි කඩන විට ඉන් අදහස්
වන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයේ
සහභාගිකම නොවේ ද? 17 රොටිය එකක් වන
බැවින් අපි බොහෝ දෙනෙක් වුව ද, එකම ශරීරයක්
වෙමු. මන්ද, අප එක රොටියක් බෙදාගන්නා බැවිනි.
18 ලෙවී 7:6 ජුදෙව් ආගමික සිරිත ගැන සිතා
බලන්න. පිදේනි වළඳන අය, ඒවායින් පුදනු ලබන
දෙවියන් වහන්සේ සමඟ සහභාගි නොවෙත් ද?
19 එයින් මා අදහස් කරන්නේ කුමක් ද? දේවතා
පිදේනිවල හෝ දේවතාවන්ගේ හෝ යම්
වටිනාකමක් ඇතැයි කියා ද? 20 ද්වි.නී. 32:17නැත.
මා එයින් අදහස් කරන්නේ මිසදිටුවන් පුදන පිදේනි
ඔවුන් පූජා කරන්නේ දෙවියන් වහන්සේට නොව
දුෂ්ටාත්මයන්ට බවයි. දුෂ්ටාත්මයන් සමඟ ඔබ
සහභාගි වෙනවාට මම කැමැති නොවෙමි. 21 ඔබට
සමිඳාණන් වහන්සේගේ කුසලානෙන් ද
දුෂ්ටාත්මයන්ගේ කුසලානෙන් ද පානය කළ
නොහැක. සමිඳාණන් වහන්සේගේ මේසයට ද
දුෂ්ටාත්මයන්ගේ මේසයට ද ඔබට සහභාගි විය
නොහැක. 22 ද්වි.නී. 32:21අපි සමිඳාණන් වහන්සේ
කෝප කරමු ද? අපි උන් වහන්සේට වඩා බලවත්
වෙමු ද?

### දේව ගෞරවය සඳහා සියල්ල කිරීම

23 1 කොරි 6:12 “කැමැති දෙයක් කිරීමට නිදහස
ඇතැ”යි කීවත් හැම දේ ම යෝග්‍ය නැත. කැමැති
දෙයක් කිරීමට නිදහස ඇත. එහෙත් හැම දෙය ම
ශුභසිද්ධියට ඉවහල් නොවේ. 24 කිසිවෙකු තමාගේ
ම වාසිය නොසොයා අසල්වාසියාගේ යහපත සෙවිය
යුතු ය. 25 වෙළෙඳ පොළේ විකුණන හැම කෑමක් ම,
හෘදය සාක්ෂියෙන් නැඟෙන ප්‍රශ්න නොවිමසා
වළඳන්න. 26 ගීතා 24:1මන්ද, පොළොවත් එහි ඇති
සියල්ලත් සමිඳාණන් වහන්සේගේ ය.
27 නොඇදහන්නන්ගෙන් යමෙකු ඔබට ආරාධනා
කළොත්, ඔබ යන්නට කැමැති නම්, එහි ගොස්, ඔබ

ඉදිරියෙහි තබා ඇති කොයි දෙයක් වුවත්, හෘදය
සාක්ෂියෙන් නැඟෙන ප්‍රශ්න නොවිමසා වළඳන්න.
28 එහෙත් “මෙය දේවතා පිදේනියකැ”යි යමෙකු
ඔබට කීවොත්, එසේ දැන්වූ තැනැත්තා නිසාත්,
හෘදය සාක්ෂිය නිසාත්, ඒ ආහාර නොවළඳන්න.
29 හෘදය සාක්ෂිය නිසා යයි මා කියන්නේ ඔබගේ
නොව අනිත් අයගේ හෘදය සාක්ෂිය ගැන ය. කෑම
පිළිබඳ මට ඇති නිදහස, අන් කෙනෙකුගේ හෘදය
සාක්ෂිය මත රඳා පවතින්න ඇති උවමනාව කුමක්
ද? 30 මම ස්තුති දී වළඳන්නමේ නම් එසේ ස්තුති දී
වළඳන දේ ගැන මට දොස් තබන්නේ මන් ද?
31 එහෙයින් ඔබ කෑවත් බීවත්, වෙන දෙයක්
කළත්, සියල්ල දේව ගෞරවය පිණිස කරන්න.
32 ජුදෙව්වරුන්ට වත්, ග්‍රීකයන්ට වත්, දෙවියන්
වහන්සේගේ සභාවට වත් බාධාවට හේතුවක්
නොවන්න. 33 මම නම් මාගේ ම ප්‍රයෝජනය
නොසොයා, බොහෝ දෙනෙකුගේ ගැළවීම පිණිස,
ඔවුන්ගේ ප්‍රයෝජනය සොයා, සියල්ලෙහි දී
සියල්ලන් සතුටු කරමි.

11 1 කොරි 4:16; පිලිප් 3:17 මා ක්‍රිස්තුන්
වහන්සේ ආදර්ශයට ගන්නාක් මෙන් ඔබ ද,
මා ආදර්ශයට ගන්න.

## නමස්කාරයේ දී හිස වැසීමේ සිරිත

2 ඔබ නිතර ම මා සිහි කරන බැවින් ද මා ඔබට
බාර දුන් සම්ප්‍රදායයන් ඔබ පවත්වන බැවින් ද මම
ඔබට ප්‍රශංසා කරමි. 3 ක්‍රිස්තුන් වහන්සේ පුරුෂයා
කෙරෙහි ප්‍රධානියා බව ද, පුරුෂයා ස්ත්‍රිය කෙරෙහි
ප්‍රධානියා බව ද, දෙවියන් වහන්සේ ක්‍රිස්තුන්
වහන්සේ කෙරෙහි ප්‍රධානියා බව ද මම ඔබට
දන්වනු කැමැත්තෙමි. 4 හිස වසා යාච්ඤා කරන
හෝ දිවැස් වැකි පවසන හෝ පුරුෂයා, තමාගේ
ප්‍රධානියාට අගෞරව කරයි. 5 හිස නොවසා
යාච්ඤා කරන හෝ දිවැස් වැකි පවසන ස්ත්‍රිය
තමාගේ ප්‍රධානියාට අගෞරව කරයි. එසේ කිරීම
ඈ හිස මුඩු කරගැනීම වැනි ය. 6 ස්ත්‍රියක් හිස වසා
නොගනී නම් ඈ හිසකේ කපා ගනී වා. හිස මුඩු
කිරීම හෝ හිසකේ කැපීම, ස්ත්‍රියකට ලජ්ජාවක්
නම් ඈ හිස වැස්මක් ඇති ව සිටී වා. 7 උත්
1:26-27පුරුෂයා සිය හිස වසා නොගත යුතු ය. මන්ද,
ඔහු දෙවියන් වහන්සේගේ ස්වරූපය හා ගෞරවය
පිළිබිඹු කරන බැවිනි. එහෙත් ස්ත්‍රිය පුරුෂයාගේ
ගෞරවය පිළිබිඹු කරයි. 8 උත් 2:18-23පුරුෂයා ඇති
වූයේ ස්ත්‍රියගෙන් නොවේ. ස්ත්‍රිය ඇති වූයේ
පුරුෂයාගෙන් ය. 9 පුරුෂයා මවන ලද්දේ ස්ත්‍රිය
උදෙසා නොවේ. ස්ත්‍රිය මවන ලද්දේ පුරුෂයා
උදෙසා ය. 10 එබැවින් දේව දූතයන් නිසා, ස්ත්‍රිය
ආධිපත්‍යයේ ලකුණක් හිස ලා ගත යුතු ය. 11 ඒ
කෙසේ වෙතත් කිතුනු ජීවිතයෙහි, ස්ත්‍රියට පුරුෂයා
ද පුරුෂයාට ස්ත්‍රිය ද අවශ්‍ය ම ය. 12 ස්ත්‍රිය
පුරුෂයාගෙන් මවනු ලැබුවාක් මෙන් පුරුෂයා උපත
ලබන්නේ ස්ත්‍රියගෙන් ය. සියල්ල දෙවියන්
වහන්සේගෙන් ය.
13 ස්ත්‍රියක, හිස නොවසා, දෙවියන් වහන්සේට
යාච්ඤා කිරීම හොබනේ ද කියා ඔබ ම විනිශ්චය
කරන්න. 14 පුරුෂයකුට දික් වූ හිසකේ තිබීම ඔහුට
අගෞරවයක් බවත්, 15 ස්ත්‍රියකට දික් වූ හිසකේ
තිබීම ඇට ගෞරවයක් බවත්, එය ඇගේ හිස
වැස්ම කොට ඇති බවත්, ස්වභාව ධර්මය ඔබට
උගන්වා නැද් ද? 16 එහෙත් යමෙකේ වාද කරන්න
කැමැත්තේ නම්, ඒ ගැන කිව යුත්තේ, අපට වත්,
දෙවියන් වහන්සේගේ සභාවලට වත් පෙර කී සිරිත
හැර අන් සිරිතක් නැති බව ය.

## රාත්‍රි භෝජනය නිසි ලෙස පැවැත්වීම

17 මා මේ අනුශාසනා කරන විට මම ඔබට
ප්‍රශංසා නොකරමි. මන්ද, ඔබේ රුස්වීම්වල දී
යහපතට වඩා අයහපත සිදු වන බැවිනි. 18 පළමු ව
ඔබ සභාවක් වශයෙන් රුස් වන විට ඔබ අතර
භේද තිබෙන බව ආරංචි වී ඇත. එය තරමක් දුරට
විශ්වාස කරමි. 19 ඔබ අතර අවංක අය කැපී
පෙනෙන පිණිස, ඔබ අතර භේද තිබිය යුතු ය.
20 ඔබ සභාවක් වශයෙන් එක්රුස් වන විට,
සමිඳාණන් වහන්සේගේ රාත්‍රි භෝජනය වැළඳීමක්
සිදු නොවේ. 21 මන්ද, ඔබ කන විට එකිනෙකා තම
තමාගේ ම කෑම අනික් අයට ප්‍රථමයෙන්
කැදරකමින් කන්නේ ය. ඒ නිසා එක් කෙනෙකු
බඩගිනි ව සිටින අතර තව කෙනෙකේ වෙරි වෙන
තෙක් බොන්නේ ය.
22 ඇත්තට ම, ඔබට කන්නටත් බොන්නටත් ගෙදර
දී බැරි ද? ඔබ දෙවියන් වහන්සේගේ සභාවට නිගා
කරමින්, දිළිඳුන් ලජ්ජාවට පත් කරන්නහු ද? මා
ඔබට කුමක් කියන්න ද? ඔබට ප්‍රශංසා කරම් ද?
මේ ගැන නම් ප්‍රශංසා කළ නොහැකි ය.

## රාත්‍රි භෝජනය පිළිවෙත ස්ථාපනය කිරීම

(මතෙ 26:26-29;මාක් 14:22-25;ලූක් 22:14-20)

23 මා ඔබට ඉගැන් වූ මේ පිළිවෙත ම සමිඳාණන්
වහන්සේගෙන් ම ලැබුවෙමි. එනම්, ස්වාමීන් වන
ජේසුස් වහන්සේ පාවා දෙනු ලැබූ රාත්‍රියේ දී
රොටියක් රැගෙන, 24 ස්තුති කොට, කඩා: “මෙය
ඔබ උදෙසා දෙන මාගේ ශරීරය ය. මා සිහි කිරීම
පිණිස මෙය කරන්නැ”යි වදාළ සේක. 25 නික්ම
24:6-8; ජෙරෙ 31:31-34එලෙසෙ ම රාත්‍රි කෑමෙන් පසු
කුසලාන ද රැගෙන: “මේ කුසලාන මාගේ රුධිරයෙන්
පිහිටුවන නව ගිවිසුම ය. යම් පමණ වර ඔබ
මෙයින් පානය කරන්නහු ද, එපමණ වර මා සිහි
කිරීම පිණිස මෙය කරන්නැ”යි වදාළ සේක. 26 ඔබ
යම් පමණ වර මේ රොටි අනුභව කරන්නහු ද, මේ
කුසලානෙන් පානය කරන්නහු ද, එපමණ වර
සමිඳාණන් වහන්සේ වඩින තුරු, ඔබ උන්
වහන්සේගේ මරණය ප්‍රකාශ කරන්නහු ය.

## රාත්‍රි භෝජනය නොනිසි ලෙස වැළඳීම

27 එහෙයින් නුසුදුසු ලෙස සමිඳාණන් වහන්සේගේ
මේ රොටි වළඳන, මේ කුසලානයේ පානය කරන
කවරෙක් වුව ද, එසේ වැළඳීමෙන් හා පානය
කිරීමෙන් සමිඳාණන් වහන්සේගේ ශරීරයට හා
රුධිරයට විරුද්ධ ව පව් කිරීමේ වරදකරුවෙක්
වන්නේ ය. 28 එබැවින් මේ රොටි වැළඳීමටත්, මේ
කුසලානයේ පානය කිරීමටත් පෙර එක් එක්කෙනා
තම තමා සෝදිසි කරගත යුතු ය. 29 සමිඳාණන්
වහන්සේගේ ශරීරය යන්නෙහි තේරුම නොවිමසා,
රොටි වළඳන, කුසලානයේ පානය කරන තැනැත්තේ
එසේ වැළඳීමෙන් හා පානය කිරීමෙන් තමා ම
වරදකරුවෙක් කරගන්නේ ය. 30 මේ නිසා ඔබ අතර
බොහෝ දෙනෙක් දුබල ව, රෝගී ව සිටිති. සමහර
දෙනෙක් මරණයට ගොදුරු වී සිටිති. 31 එහෙත් අපි
අප ම සෝදිසි කර ගනිමු නම්, අප විනිශ්චය කරනු
ලබන්නේ නැත. 32 එහෙත් සමිඳාණන් වහන්සේ
විසින් විනිශ්චය කරනු ලැබීමෙන්, අප හික්මවනු
ලබන්නේ ලෝකයා සමඟ වරදට පත් නොවන
පිණිස ය.
33 එබැවින් මාගේ සහෝදරවරුනි, ඔබ රාත්‍රි
භෝජනයට එක්රැස් වන විට, අනුන් නොසලකා,
කන්නට ඉක්මන් නොවන්න. 34 යමෙකුට බඩගිනි
නම්, ඔබගේ රැස්වීම දේව දඬුවමට පාත්‍ර නොවන
ලෙස, ඔහු ගෙදර දී කෑවාවේ. අනිත් කරුණු ගැන,
මා පැමිණි විට, මම පිළිවෙළෙක් කරමි.

## ශුද්ධාත්ම දීමනා

12 සහෝදරවරුනි, ශුද්ධාත්ම දීමනා ගැන නියම
තතු ඔබ දැන සිටිනවාට මම කැමැත්තෙමි.
2 ඔබ මිසදිටුවන් ව සිටිය දී, හදිසි පෙළඹීම්වලට අසු
වී, ගොළු දේවතා පිළිම වෙත ඇදී ගිය හැටි ඔබ
දන්නහු ය. 3 එබැවින්, දේවාත්මයාණන්
කරණකොටගෙන කතා කරන කිසිවෙකු 'ජේසුස්
වහන්සේ සාප ලත් කෙනෙකු'යි නොකියන බව ද,
ශුද්ධාත්මයාණන් කරණකොටගෙන මිස "ජේසුස්
වහන්සේ සමිඳාණන් වහන්සේ ය"යි කීමට
කිසිවෙකුට නොහැකි බව ද මම ඔබට තරයේ කියා
සිටිමි.
4 රෝම 12:6-8 විවිධාකාර දීමනා ඇතත්, සිටින්නේ
එක ම ශුද්ධාත්මයාණෝ ය. 5 විවිධාකාර සේවා
ඇතත්, සිටින්නේ එක ම සමිඳාණන් වහන්සේ ය.
6 විවිධාකාර දේව බල ක්‍රියා කරතත්, සිටින්නේ
සියල්ලන් තුළ ක්‍රියා කරන එක ම දෙවියන්
වහන්සේ ය. 7 අන්‍යෝන්‍ය යහපත සඳහා
එකිනෙකාට ආත්මයාණන්ගේ ප්‍රකාශවීමක් දී ඇත.
8 කෙනෙකුට ආත්මයාණන් මඟින් උවදෙස් දීමේ
ප්‍රඥාව ද, තවත් කෙනෙකුට එම ආත්මයාණන්
මඟින් ම ධර්මය පහදා දීමේ ඥානය ද දී ඇත.
9 අන් කෙනෙකුට ආත්මයාණන් තුළ විශ්වාසය ද,
එම ආත්මයාණන් තුළ තවත් කෙනෙකුට සුව කිරීමේ
වරම ද දී ඇත. 10 තවත් කෙනෙකුට හාස්කම්
කිරීමේ බලය ද, තවත් කෙනෙකුට දිවැසි වැකි
කීමේ බලය ද, තවත් කෙනෙකුට ආත්ම විමසීමේ
හැකියාව ද තවත් කෙනෙකුට අන් භාෂාවලින් කතා
කිරීමේ පුළුවන්කම ද තවත් කෙනෙකුට එය පහදා
දීමේ ශක්තිය ද දී ඇත. 11 මේ සියලු දීමනා, තමන්
කැමැති පරිදි, වෙන් වෙන් වශයෙන් එකිනෙකාට
බෙදා දෙන්නේ එක ම ආත්මයාණන් වහන්සේ ය.

## ඒකත්වයෙහි විවිධත්වය

12 රෝම 12:4-5 මනුෂ්‍ය ශරීරයෙහි බොහෝ
අවයව තිබුණත් ඒ අවයව විවිධාකාර වුවත් ඒ
සියල්ල එක ම ශරීරයක් වන්නාක් මෙන් ක්‍රිස්තුන්
වහන්සේත් එක ම ශරීරයක් වන සේක. 13 මන්ද,
ජුදෙව්වරුන් හෝ ග්‍රීකයන් හෝ වේවා, වහලුන්
හෝ නිදහස් අය හෝ වේවා, අපි සියල්ලෝ ම එක
ම ආත්මයාණන් තුළ එක ම ශරීරයක් වන ලෙස,
බව්තීස්ම-ස්නාපනය ලැබීමු. අපි සියල්ලෝ ම එක ම
ආත්මයාණන්ගෙන් පානය කර සිටිමු. 14 ශරීරය එක
අවයවයක් නොව බොහෝ අවයවවලින් යුක්ත
වූවකි. 15 යම් හෙයකින් පාදය: "මම අත නොවන
බැවින් ශරීරයට අයිති නොවෙමි"යි කීවත්, ඒ නිසා
එය ශරීරයට අයිති නොවන්නේ නොවේ. 16 එසේ
ම කණ: "මම ඇස නොවන බැවින් ශරීරයට අයිති
නොවෙමි"යි කීවත්, ඒ නිසා එය ශරීරයට අයිති
නොවන්නේ නොවේ. 17 මුළු ශරීරය ඇසක් නම්
ශ්‍රවණය කොයි ද? මුළු ශරීරය කනක් නම් ගඳ
සුවඳ විඳීම කොයි ද? 18 සැබැවින් ම දෙවියන්
වහන්සේ තමන් කැමැති පරිදි ඒ එක් එක් අවයවය
ශරීරයෙහි පිහිටුවා ඇත. 19 ඒ අවයව සියල්ල ම
එක ම අවයවයක් වේ නම් එවිට ශරීරයක් කොයින්
ද? 20 මේ අනුව බොහෝ අවයව තිබෙන නමුත්
ඇත්තේ එක ම ශරීරයකි.
21 ඒ නිසා "නුඹ මට ඕනෑ නැතැ"යි අත අමතා
ඇසට වත්, "නුඹලා මට ඕනෑ නැතැ"යි පා අමතා
හිසට වත් කීමට නොහැකි ය.
22 සැබැවින් ම, ශරීරයේ දුර්වල යයි සලකන
අවයව අත්‍යවශ්‍ය වේ. 23 තවද අපි, ශරීරයෙහි
සුළුකොට සලකන අවයවයන් වඩාත් ගරු කොට
සලකමු. ඇරත් ශෝභා සම්පන්න නො වූ
අවයවයන්ට වඩාත් ශෝභනත්වයක් දෙමු. 24 මන්ද,
ශෝභා සම්පන්න වූ අවයවයන්ට එවැනි උවමනාවක්
නැත. ගරු කොට නොසලකන අවයවයන්ට දෙවියන්
වහන්සේ වඩා ගරුත්වයක් දෙමින් ශරීරය සංයුක්ත
කළ සේක. 25 එසේ කළේ ශරීරයේ භේදයක්
නොතිබෙන පිණිසත්, සෑම අවයවයක් ම අනෙක්
අවයවයන් එකාකාර ව සලකන පිණිසත් ය.
26 මෙසේ එක අවයවයක් වේදනා විඳී නම් ඒ
සමඟ සියලු ම අවයවයෝ වේදනා විඳිති; එලෙස ම
එක අවයවයක් ගෞරව ලබයි නම්, ඒ සමඟ සියලු
ම අවයවයෝ ප්‍රීති වෙති.
27 එහෙයින් ඔබ ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය ද
වෙන් වෙන් වශයෙන් එහි අවයවයෝ ද වන්නහු ය.
28 එෆී 4:11මෙසේ දෙවියන් වහන්සේ පළමුකොට

ප්‍රේරිතයන් ද දෙවනු ව දිවැසිවරයන් ද තුන්වනු ව
ගුරුවරුන් ද ඉන්පසු හාස්කම් කරන අය ද සුව
කිරීමේ වරම ලත් අය ද උපකාර කරන්නන් ද
පරිපාලනය කරන්නන් ද විවිධ ශබ්ද ව්‍යවහාර
කරන්නන් ද සභාවෙහි පිහිටුවා වදාළ සේක.
29 සියල්ලෝ ම ප්‍රේරිතයෝ ද? සියල්ලෝ ම
දිවැසිවරයෝ ද? සියල්ලෝ ම ගුරුවරු ද? සියල්ලෝ
ම හාස්කම් කරන්නෝ ද? 30 සුව කිරීමේ වරම
සියල්ලන්ට ම තිබේ ද? සියල්ලෝ ම විවිධ ශබ්ද
ව්‍යවහාර කරත් ද? සියල්ලෝ ම ශබ්ද පහදා
දන්නෝ ද? 31 මේවාට වඩා උතුම් දීමනා කෙරෙහි
අතිශයින් ආශා වන්න. දැන් මම ඔබට වඩාත්
විශිෂ්ට මාර්ගයක් පෙන්වමි.

### ප්‍රේමය

13 මා මිනිසුන්ගේ ද දේව දූතයන්ගේ ද
භාෂාවලින් කතා කරතත් ප්‍රේමය මට
නැත්නම් මම ඝෝෂා කරන ඝණ්ඨාරයකට හෝ
කටුක රාවය දෙන කතොලමකට හෝ සමාන වෙමි.
2 මතෙ 17:20; 21:21; මාක් 11:23 දිවැසි වැකි
දෙසීමේ වරම මට තිබුණත්, සියලු අබිරහස් ගැන
අවබෝධය ද සකල ඥානය ද මට ඇතත්, කඳු
සෙලවීමට තරම් බලවත් විශ්වාසයක් මට තිබුණත්
ප්‍රේමය මට නැත්නම් මම හිස් තැනැත්තෙක්මි.
3 දන් දීම සඳහා මා සතු සියල්ල වෙනේ කළත්,
මාගේ සිරුර ගිනි පූජාවක් සඳහා බිලි දුන්නත්,
ප්‍රේමය මට නැත්නම් මට කිසි පලක් නැත.
4 ප්‍රේමය, ඉවසිලිවන්ත ය, කරුණාවන්ත ය;
q24 ප්‍රේමය, ඊර්ෂ්‍යා වන්නේ නැත, පාරට්ටු
කරගන්නේ නැත, උඩඟු වන්නේ නැත;
5 ප්‍රේමය, අවිනීත නොවේ, ආත්මාර්ථකාමී
නොවේ, හනික නොකිපේ, නපුර සිතේ ධාරණය
කර නොගනියි;
6 ප්‍රේමය, අනුන්ගේ වරද ගැන ප්‍රීති නොවී, හරි
දේ ගැන ප්‍රීති වෙයි.
7 ප්‍රේමය, සියල්ල උසුලයි.
q27 ප්‍රේමයෙහි, විශ්වාසයට ඉමක් නැත,
බලාපොරොත්තුවට නිමක් නැත, ඉවසීමට අගක්
නැත.
8 ප්‍රේමය සදාතනික ය.
q28 දිවැස් වැකි වුව ද පහ ව යන්නේ ය;
q28 විවිධ ශබ්ද දෙසීම් වුව ද නිම වන්නේ ය;
q28 ඥානය වුව ද නැති වන්නේ ය.
9 මන්ද, අපේ ඥානය අසම්පූර්ණ ය, දිවැස් වැකි
දෙසීම ද අසම්පූර්ණ ය.
10 සම්පූර්ණ දේ පැමිණි විට, අසම්පූර්ණ දේ පහ
ව යන්නේ ය.
11 බාල වියෙහි දී මම බාලයකු මෙන් කතා
කළෙමි; බාලයකු මෙන් සිතුවෙමි; බාලයකු මෙන්
තේරුම් ගතිමි. එහෙත් මම දැන් වයසින් මුහුකුරා
සිටින බැවින් ළාමක දේ අත් හැර සිටිමි. 12 දැන්
අපට කැඩපතකින් මෙන් නොපැහැදිලි ව
පෙනෙන්නේ ය. මතු අපි මුහුණට මුහුණ ලා
දකින්නෙමු. දැන් මාගේ දැනුම අසම්පූර්ණ ය. එහෙත්
මතු, මා පිළිබඳ දෙවියන් වහන්සේගේ දැනුම මෙන්
මාගේ දැනුම ද සම්පූර්ණ වන්නේ ය.
13 ඇදහිල්ල, බලාපොරොත්තුව හා ප්‍රේමය
සදහට ම පවතින ධර්මතා තුනකි. මෙයින්
ශ්‍රේෂ්ඨතම වන්නේ ප්‍රේමය ය.

### විශිෂ්ට දීමනා

14 ප්‍රේමය ඔබේ පරමාර්ථය කර ගන්න.
ආත්මික දීමනා, ප්‍රධාන කොට දිවැස් වැකි
දෙසීම අත් කරගැනීමට වීර්ය කරන්න. 2 අන් භාෂා
කථනය කරන්නා මිනිසුන්ට නොව දෙවියන්
වහන්සේට කතා කරයි. ඔහු ආත්මයාණන්
කරණකොටගෙන අබිරහස් කතා කරන බැවින්
කිසිවකුට ඔහු තේරුම්ගත නොහැක. 3 එහෙත්
දිවැස් වැකි දෙසෙන්නා, අභිවෘද්ධිය ද ධෛර්යය හා
සැනසීම ද දෙන වචන මිනිසුන්ට කතා කරයි. 4 අන්
භාෂා කථනය කරන්නා තමාගේ ම අභිවෘද්ධිය
සලසාගනියි. එහෙත් දිවැස් වැකි දෙසෙන්නා සභාවේ
අභිවෘද්ධිය සලසන්නේ ය. 5 ඔබ හැම දෙන ම අන්
භාෂා කථනය කරනවාට මම කැමැත්තෙමි. එහෙත්
ඔබ දිවැස් වැකි දෙසෙන්නේ නම් ඊටත් වඩා
කැමැත්තෙමි. අන් භාෂා කථනය කරන්නා, සභාවේ
අභිවෘද්ධිය සඳහා කියන දයෙ විසඳා නොදේ නම්
ඔහුට වඩා දිවැසි වැකි දෙසෙන්නා උතුම් ය.
6 සහෝදරවරුනි, මා ඔබ වෙත පැමිණ එළිදරව්
කිරීමේ ද ප්‍රඥාවේ ද දිවැසි වැකි දෙසීමේ ද
අනුශාසනාවේ ද වචනවලින් ඔබට කතා නොකොට,
අන් භාෂා කථනය කළොත් එයින් ඔබට කුමන
ප්‍රයෝජනයක් ද? 7 එලෙසෙ ම, නළාව හෝ වීණාව
හෝ වැනි අප්‍රාණික භාණ්ඩ වාදනය කරන විට
නික්මෙන සංගීත ස්වර අතර වෙනසක් නැත්නම්,
ඒවායින් කුමන තාලයක් වාදනය වන්නේ දැ යි
හඳුනාගන්නේ කෙසේ ද? 8 යුද හොරණෑව පැහැදිලි
හඬක් නොදේ නම් කවරෙක් සටනට සැරසේ ද?
9 එසේ ම, ඔබ අන් භාෂා කථනය කරන විට,
පැහැදිලි ව කතා නොකරන්නෙහි නම්, ඔබ කියන
දේ තේරුම්ගන්නේ කෙසේ ද? එය ඔබ සුළඟට
කතා කරන්නාක් මෙන් වේ. 10 ලෝකයේ විවිධ
භාෂා ඇතත්, ඉන් එකක් වත් අර්ථ විරහිත නොවේ.
11 ඒ නිසා කතා කරන භාෂාවේ තේරුම නොදනිම්
නම් එය කතා කරන්නාට මම විදේශිකයෙක් වෙමි.
ඔහු ද මට විදේශිකයෙක් වන්නේ ය. 12 එසේ ම
ඔබත් ආධ්‍යාත්මික කුශලතා අත්කර ගැන්මට
උද්‍යෝගිමත් බැවින්, සභා අභිවෘද්ධිය සැලසෙන
ඒවායින් පූර්ණ ව සිටීමට උත්සාහ කරන්න.
13 එබැවින් අන් භාෂාවක් කථනය කරන්නා, එය
විසඳා දීමට ද හැකි වන ලෙසෙ යාච්ඤා කරාවා.
14 මා අන් භාෂාවකින් යාච්ඤා කරන විට මාගේ
ආධ්‍යාත්මය යාච්ඤා කරන නමුත් මාගේ
සිහිකල්පනාව ක්‍රියා විරහිත ය. 15 එසේ නම්
කුමක් කරම් ද? මම ආධ්‍යාත්මයෙන් යාච්ඤා කරමි;
සිහිකල්පනාවෙන් ද යාච්ඤා කරමි; ආධ්‍යාත්මයෙන්

තුති ගී ගයමි, සිහිකල්පනාවෙනේ ද තුති ගී ගයමි.
16 ඔබ ආධ්‍යාත්මයෙනේ තුති පුදන විට, එය පිළිබඳ
උගැනුම නොලත් තැනැත්තා, ඔබ කියන්නේ කුමක්
දැ යි නොදන්නා බැවින්, ඔබගේ තුති පිදීමට
'ආමනේ' යයි කියන්නේ කෙසේ ද? 17 ඔබගේ තුති
පිදීම ඉස්තරම් විය හැකි ය. එහෙත් එයින් අනික්
අයට වන යහපතක් නැත.
18 ඔබ සියල්ලන්ට වඩා මා අන් භාෂා කථනය
කරන බැවින්, මම දෙවියන් වහන්සේට ස්තුති කරමි.
19 එහෙත් සභාවේ දී අන් භාෂාවකින් වචන දහසක්
කථනය කරනවාට වඩා අන්‍යයන්ට උගන්වන පිණිස
මාගේ සිහිකල්පනාවෙනේ වචන පහක් කතා
කරන්නට කැමැත්තෙමි.
20 සහෝදරවරුනි, සිහිබුද්ධියෙනේ ළාමක නොවෙන්න.
නපුර සම්බන්ධයෙනේ බිළිඳුන් වන්න. සිහිබුද්ධියෙනේ
වැඩිහිටියන් වන්න. 21 යසො 28:11-12"අන්
භාෂාවලිනුත්,
q221 අන්‍යයන්ගේ මුවිනුත්, මම මේ සෙනඟට කතා
කරමි.
q221 එසේ වුවත් ඔව්හු මාගේ වචන නොඇසන්නෝ
යයි
21 සමිඳාණන් වහන්සේ වදාරන සේකැ"යි
ව්‍යවස්ථාවලියෙහි ලියා ඇත. 22 ඒ අනුව අන් භාෂා
කථනය, අදහන්නන්ට නොව නොඅදහන්නන්ට
ලකුණක් පිණිස වේ. එහෙත් දිවැසි වැකි දෙසීම
නොඅදහන්නන් උදෙසා නොව අදහන්නන් උදෙසා ය.
23 එබැවින් මුළු සභාව එක්රැස් වූ කල සියල්ලෝ
ම අන් භාෂා කථනය කරත් නම් මේ ගැන උගැනුම
නොලත් අය හෝ නොඅදහන්නන් හෝ එහි
පැමිණියොත් ඔබට ඔල්මාද යයි ඔවුන් කියන්නේ
නැද් ද? 24 එහෙත් සියල්ලෝ ම දිවැස් වැකි දෙසත්
නම්, නොඅදහන්නකු හෝ මේ ගැන උගැනුම
නොලත් කෙනෙකු හෝ එහි පැමිණියොත්, සියල්ලන්
කියන දෙයින් ඔහුගේ පාපය ඔහුට හඟවනු ලැබ,
විනිශ්චය කරනු ලැබේ. 25 තවද ඔහුගේ සිතහෙි
රහස් හෙළිවනු ඇත. එවිට ඔහු මුණින්තලා වී,
"සැබැවින් ම ඔබ අතර දෙවියන් වහන්සේ වැඩ
සිටින සේකැ"යි ප්‍රකාශ කරමින් උන් වහන්සේ
නමදින්නේ ය.

### සභාවේ විනීත හැසිරීම

26 එසේ නම්, සහෝදරවරුනි, කුමක් කළ යුතු ද?
ඔබ එක්රැස් වන විට එක් එක්කෙනොට ගීතයක් ද
අනුශාසනාවක් ද එළිදරව් කිරීමක් ද අන් භාෂා
කථනයක් ද එය විසඳීමක් ද තිබිය හැකි ය. මේ
සියල්ල ම සභාවේ අභිවෘද්ධිය පිණිස වේ වා!
27 අන් භාෂා කථනය කරේ නම්, එය දෙදෙනෙකු
හෝ වැඩිම වුණොත් තිදෙනෙකු හෝ පමණක් කළ
යුතු ය. එය ද කළ යුත්තේ කෙනෙකුට කෙනෙක්
පසුව යි. විසඳා දෙන කෙනෙක් ද විය යුතු ය.
28 විසඳා දෙන කෙනෙක් නැත්නම්, අන් භාෂා
කථනය කරන්නා සභාවේ නිශ්ශබ්ද ව සිටිය යුතු ය.
ඔහු කතා කළ යුත්තේ තමාටත් දෙවියන්
වහන්සේටත් ය. 29 දිවැසි වැකි දෙසන්නෝ
දෙදෙනෙක් හෝ තිදෙනෙක් හෝ කතා කරත් වා.
සෙසු අය ඔවුන් කියන දෙය විමසා බලත් වා.
30 එහෙත් එහි වාඩි වී සිටින යමකුට එළිදරව්වක්
පහළ වුවොත් කතා කරමින් සිටින තැනැත්තා
නිශ්ශබ්ද ව සිටිය යුතු ය. 31 සියල්ලන්ගේ ඉගෙනීම
පිණිසත්, සියල්ලන්ගේ ධෛර්යය පිණිසත්, ඔබ
සැමට ම, පිළිවෙළින් දිවැසි වැකි දෙසීමේ අවස්ථාව
සැලසෙනු ඇත. 32 දිවැස් වැකි දෙසන අයගේ
ආධ්‍යාත්මික කුශලතා ඔවුන්ගේ ම පාලනයෙහි
තිබිය යුතු ය. 33 මන්ද, දෙවියන් වහන්සේ
ව්‍යාකූලත්වයේ නොව සාමයේ දෙවියන් වහන්සේ
ය. කිතුනුවන්ගේ සෑම සභාවල දී මෙනේ 34 ස්ත්‍රීහු
සභා රැස්වීම්වල දී නිශ්ශබ්ද ව සිටිත් වා. මන්ද,
කතා කිරීමට ඔවුන්ට අවසරයක් නැත. ව්‍යවස්ථාවේ
කියා තිබෙන පරිදි ඔව්හු ප්‍රමුඛ ව නොසිටිත් වා.
35 ඔව්හු යමක් දැනගන්නට කැමැති නම් ගෙදර දී
ස්වකීය ස්වාමි පුරුෂයන්ගෙනේ අසා දැනගනිත් වා.
මන්ද, සභා රැස්වීමක දී කතා කිරීම ස්ත්‍රියකට
නොහොබී.
36 දෙවියන් වහන්සේගේ වචනය නික්ම ගියේ
ඔබ කෙරෙනේ ද? නොහොත් එය පැමිණියේ ඔබ
වෙත පමණක් ද? 37 යමෙක් තමා දිවැස් වැකි
දෙසන්නකු හෝ ආධ්‍යාත්මික කුශලතා ඇත්තකු
හෝ යයි සිතන්නේ නම්, මා ඔබට ලියන කරුණු
සමිඳාණන් වහන්සේගෙනේ එන ආඥාවක් බව ඔහු
ඒත්තු ගනී වා. 38 යමෙක් මේ කරුණ
නොසලකන්නේ නම් ඔබ ද ඔහු නොසලකා හැරිය
යුතු ය.
39 එබැවින්, සහෝදරවරුනි, දිවැස් වැකි දෙසීමට
තදින් ආසා වන්න; අන් භාෂා කථනය තහනම්
නොකරන්න. 40 සියල්ල විනීත ව ද විධිමත් ව ද
කළ යුතු ය.

### ක්‍රිස්තුන් වහන්සේගේ පුනරුජ්ජීවනය

15 තවද, සහෝදරවරුනි, මා ඔබට දේශනා කළ
සුබ අස්න වෙත ඔබගේ අවධානය දැන්
යොමු කරනු කැමැත්තෙමි. ඔබ එය පිළිගත්තහු ය;
එහි පිහිටා සිටින්නහු ය. 2 ඒ මඟින් ඔබ ගැළවීම
ලබන්නහු ය. එසේ වන්නේ මා ඔබට දෙසූ ලෙසෙ ම,
ඒ සුබ අස්න නිසැක ව පිළිගෙන, එය නිෂ්ඵල
නොවන ලෙසෙ විශ්වාස කළොත් පමණකි.
3 යසො 53:5-12 මා ඔබට බාර දුන්නේ මා
ලබාගත් දෙයෙ ම බව ප්‍රධාන කොට කිව යුතු ය.
එනම් ශුද්ධ ලියවිල්ල ප්‍රකාර ක්‍රිස්තුන් වහන්සේ
අපගේ පාප උදෙසා මළ බවත්, 4 ගීතා 16:8-10;
මතෙ 12:40; ක්‍රියා 2:24-32වළලනු ලැබූ බවත්, ශුද්ධ
ලියවිලි ප්‍රකාර තුන් වන දා උත්ථාන කරනු ලැබූ
බවත්, 5 මතෙ 28:16-17; මාක් 16:14; ලූක් 24:34-36;
ජොහ 20:19කේපස්ට හා පසුව දොළොස් දෙනොට
දර්ශනය වූ බවත් ය. 6 ඉන්පසු උන් වහන්සේ පන්
සියයකට වැඩි සහෝදර සමූහයකට එක විට ම
දර්ශනය වූ සේක. මොවුන්ගෙනේ සමහරුන් මියගිය

ද, වැඩි දෙනා තවමත් ජීවත් ව සිටිති. 7 ඉන්පසු උන්
වහන්සේ ජාකොබ්ට ද අනතුරුව සියලු
ප්‍රේරිතයන්ට ද දර්ශනය වූ සේක.
8 ක්‍රියා 9:3-6 අවසන් වශයෙන් අකලට උපන්නකු
වැනි මට ද උන් වහන්සේ දර්ශනය වූ සේක.
9 ක්‍රියා 8:3මන්ද, මම ප්‍රේරිතවරයන්ගෙන් ඉතා
සුළු තැනැත්තා ය. දෙවියන් වහන්සේගේ සභාවට
පීඩා කළ බැවින් ප්‍රේරිතයකු යි කියනු ලබන්නට
වත් මම නොවටිමි. 10 එහෙත් මම යම්
තත්ත්වයකට පැමිණ සිටිම් ද, එසේ පැමිණ
සිටින්නේ දෙවියන් වහන්සේගේ වරප්‍රසාදයෙන් ය.
උන් වහන්සේ මට දුන් වරප්‍රසාදය නිෂ්ඵල නො වී
ය. ඇත්තට ම මම ඔවුන් සියල්ලන්ට ම වඩා
බොහෝ සයෙන් වැඩ කළෙමි. එහෙත් එසේ
කළේ මා නොව මා තුළ වූ දෙවියන් වහන්සේගේ
වරප්‍රසාදය ය. 11 එබැවින් මා වේවා, ඔවුන් වේවා,
අප දේශනා කරන්නේ එක ම පණිවුඩය යි. ඔබ එය
අදහාගත්තහු ය.

## මළවුන්ගේ උත්ථානය

12 අප දේශනා කරන්නේ ක්‍රිස්තුන් වහන්සේ
මළවුන්ගෙන් උත්ථාන කරනු ලැබූ බව නම්,
මළවුන්ගෙන් උත්ථාන වීමක් නැතැ යි ඔබගෙන්
සමහරකු කියන්නේ කෙසේ ද? 13 මළවුන්ගෙන්
උත්ථාන වීමක් නැත්නම්, ක්‍රිස්තුන් වහන්සේත්
උත්ථාන කරනු නොලැබූ සේක. 14 ක්‍රිස්තුන්
වහන්සේ උත්ථාන කරනු නොලැබූ සේක් නම්
අපගේ දේශනා කිරීම නිරර්ථක ය; ඔබගේ
ඇදහීමත් නිරර්ථක ය. 15 මළවුන් උත්ථාන කරනු
ලැබීමක් නැත්නම්, දෙවියන් වහන්සේ ක්‍රිස්තුන්
වහන්සේ උත්ථාන කළේත් නැත. එසේ නම්
දෙවියන් වහන්සේ උන් වහන්සේ උත්ථාන කළ
සේකැ යි අප සාක්ෂි දුන් බැවින්, අපි බොරු
සාක්ෂිකාරයෝ වම්හ. 16 මන්ද, මළවුන් උත්ථාන
කරනු ලැබීමක් නැත්නම්, ක්‍රිස්තුන් වහන්සේත්
උත්ථාන කරනු නොලැබූ සේක. 17 ක්‍රිස්තුන්
වහන්සේ උත්ථාන කරනු නොලැබූ සේක් නම්
ඔබගේ ඇදහීම නිරර්ථක ය; ඔබ තවමත් පාපයෙහි
ඇලී සිටින්නහු ය. 18 එපමණක් නොව, ක්‍රිස්තුන්
වහන්සේ අදහාගෙන මියගිය අය ද සදහට ම
විනාශ වී ඇත. 19 ක්‍රිස්තුන් වහන්සේ තුළ අපගේ
බලාපොරොත්තුව මේ ජීවිතයට පමණක් සීමා
වූවක් නම්, අපි සියල්ලන්ට ම වඩා කාලකණ්ණියෝ
වමු.
20 එහෙත් සැබැවින් ම ක්‍රිස්තුන් වහන්සේ
මළවුන්ගෙන් උත්ථාන වී සිටින සේක් ම ය. මෙය
මළවුන් උත්ථාන කරනු ලබන බවටසහතිකය වේ.
21 මන්ද, එක මිනිසකු කරණකොටගෙන මරණය
පැමිණියාක් මෙන් ම, එක මිනිසකු
කරණකොටගෙන මළවුන්ගෙන් උත්ථානය ද
පැමිණියේ ය. 22 ආදම් තුළ සියල්ලන් මැරෙන්නාක්
මෙන් ක්‍රිස්තුන් වහන්සේ තුළ සියල්ලෝ ම
ජීවනයට පමුණුවනු ලබන්නෝ ය. 23 එසේ වන්නේ
එක් එක්කෙනාට හිමි තැන අනුව ය. හැම දෙනාට ම
පළමුවෙන් ක්‍රිස්තුන් වහන්සේ ය. ඉන්පසු ව, උන්
වහන්සේගේ ආගමනයේ දී උන් වහන්සේ සන්තක
අය ය. 24 පසුව අවසානය පැමිණේ. එවිට උන්
වහන්සේ සියලු අධිපතිකම් ද බලය ද පරාක්‍රමය ද
අභිබවා උන් වහන්සේගේ රාජ්‍යය දෙව් පියාණන්
වහන්සේට භාර දෙන සේක. 25 ගීතා 110:1මන්ද,
දෙවියන් වහන්සේ සියලු සතුරන් උන් වහන්සේගේ
පාද යට දමන තුරු ක්‍රිස්තුන් වහන්සේ රජකම් කළ
යුතු ම ය. 26 නැති කිරීමට සිටින අන්තිම සතුරා
මරණය වේ. 27 ගීතා 8:6කුමක් නිසා ද, ශුද්ධ
ලියවිල්ලෙහි ලියා ඇති පරිදි: "දෙවියන් වහන්සේ
ක්‍රිස්තුන් වහන්සේගේ පාදවලට සියල්ල යටත් කළ
සේක." "සියල්ල යටත් කරනු ලැබී ය"යි කීමෙන්
'සියල්ල' යන්නට දෙවියන් වහන්සේ අඩංගු නැති
බව පැහැදිලි ය. එසේ කියන්නේ, ක්‍රිස්තුන්
වහන්සේට සියල්ල යටත් කරන්නේ දෙවියන්
වහන්සේ බැවිනි. 28 සියල්ල ක්‍රිස්තුන් වහන්සේට
යටත් කරනු ලැබූ විට පුත්‍රයාණන් වහන්සේ ද,
සියල්ල තමන්ට යටත් කළ දෙවියන් වහන්සේට
යටත් කරනු ලබන සේක. එසේ වන්නේ දෙවියන්
වහන්සේ සර්ව පරාක්‍රමයෙන් වැජඹෙන පිණිස ය.
29 සැබැවින් ම මළවුන්ගෙන් උත්ථාන වීමක්
නැත්නම් මියගිය අය උදෙසා බව්තීස්ම-ස්නාපනය
ලබන අයට කුමන ප්‍රයෝජනයක් සිදුවේ ද? මියගිය
අය උදෙසා ඔවුන් බව්තීස්ම-ස්නාපනය ලබන්නේ
කුමට ද? 30 එසේ නම් අපත් මොහොතින්
මොහොත අන්තරායවලට මුහුණ පාන්නේ කුමට ද?
31 සහෝදරවරුනි, මම දිනපතා මරණය විඳිමි. මා
එසේ කියන්නේ අප ස්වාමීන් වන ක්‍රිස්තුස් ජේසුස්
වහන්සේ තුළ ඔබ ගැන මට ඇති ආඩම්බරය නිසා
ය. 32 යෙසා 22:13මම මනුෂ්‍යත්වයෙන් කල්පනාකර
එපීසයේ දී 'වන මෘගයන්' සමඟ මෙන් පොර
බැදුවමේ නම් මට ඇති ප්‍රයෝජනය කුමක් ද?
මළවුන් උත්ථාන වීමක් නැත්නම්, එක් කියමනක්
පරිදි, "හෙට අප මැරෙන බැවින්, අද කමු, බොමු."
33 මුළා නොවන්න, "නරක ආශ්‍රයෙන් හොඳ චරිත
වැනසේ." 34 සිහිකල්පනාවෙන් සිටින්න. පව්
නොකරන්න. ඔබෙන් සමහරකු දෙවියන් වහන්සේ
ගැන දන්නා දෙයක් නැත. මා මෙය කියන්නේ ඔබ
ලජ්ජාවට පමුණුවනු පිණිස ය.

## ශරීරයේ පුනරුජ්ජීවනය

35 එහෙත් මළවුන් උත්ථාන වන්නේ කෙසේ ද?
ඔව්හු කුමන ආකාර ශරීරයක් ඇති ව එත් දැ යි
කෙනෙකු අසන්නට පුළුවන. 36 මොන තරම් මෝඩ
ප්‍රශ්නයක් ද? ඔබ ම වපුරන දෙය මළොත් මිස
එයට නව දිවියක් ලැබෙන්නේ නැත. 37 ඔබ
වපුරන්නේ මතු හටගන්නා වැඩුණු පැළය නොව,
තිරිඟු හෝ වෙනත් ධාන්‍ය වර්ගයක හුදු බීජයක්
පමණ ය. 38 දෙවියන් වහන්සේ තමන් කැමැති
හැටියට ඒ පැළයට කඳක් දෙන සේක. එක එක
බීජයට නියම කඳ දෙන සේක.

39 සියලු සත්වයන්ගේ මාංසය ඒකාකාර නොවේ.
මිනිසුන්ගේ මාංසය එක් ආකාරයකි. මෘගයන්ගේ
මාංසය තව ආකාරයකි. පක්ෂීන්ගේ මාංසය තවත්
ආකාරයකි. මත්ස්‍යයන්ගේ මාංසය වෙනත්
ආකාරයකි.
40 ආකාශ වස්තු ද භෞමික වස්තු ද ඇත. ආකාශ
වස්තූන්ගේ ශෝභාව එකකි. භෞමික වස්තූන්ගේ
ශෝභාව අනෙකෙකි. 41 සූර්යයාගේ ශෝභාව එක
විධියකි. චන්ද්‍රයාගේ ශෝභාව තව විධියකි.
තාරකාවන්ගේ ශෝභාව තවත් විධියකි. ශෝභාවෙන්
තාරකාවක් තාරකාවකට වෙනස් ය.
42 මළවුන්ගෙන් උත්ථානය ඊට සමාන ය. වළලනු
ලබන සිරුර දිරා යන්නකි. උත්ථාන කරනු ලබන්නේ
නොදිරන්නකි. 43 වළලනු ලබන්නේ අගෞරවාන්විත
වූවකි, උත්ථාන කරනු ලබන්නේ තේජාන්විත වූවකි.
වළලනු ලබන සිරුර දුබල වූවකි, උත්ථාන කරනු
ලබන්නේ ප්‍රබල වූවකි. 44 වළලනු ලබන්නේ
ස්වාභාවික ශරීරයකි. උත්ථාන කරනු ලබන්නේ
ආත්මික ශරීරයකි. ස්වාභාවික ශරීරයක් ඇති සේ ම
ආත්මික ශරීරයක් ද ඇත. 45 උත් 2:7එසේ ම ශුද්ධ
ලියවිල්ලේ ලියා ඇති පරිදි: “පළමු මිනිසා වන ආදම්
ජීවමාන කෙනෙක් විය.” අන්තිම ආදම් ජීවනදායක
ආත්මයාණන් කෙනෙක් වූ හ. 46 එසේ වුවත් මුලින්
පැමිණියේ ආත්මික දේ නොව, ස්වාභාවික දේ
ය. පසුව ආත්මික දේ පැමිණියේ. 47 පළමු මිනිසා
භූමියෙන් ය; ඔහු භෞමික ය; දෙවෙනි මිනිසා
ස්වර්ගයෙන් ය; (ඔහු ස්වර්ගීක ය), 48 භෞමික
තැනැත්තා යම් සේ ද භෞමික වූවෝත් එසේ ම ය.
ස්වර්ගීක තැනැත්තා යම් සේ ද, ස්වර්ගීක වූවෝත්
එසේ ම ය. 49 අපි භෞමික තැනැත්තාගේ ස්වරූපය
දරන්නා සේ ම, ස්වර්ගීක තැනැත්තාගේ ස්වරූපය ද
දරන්නෙමු.
50 සහෝදරවරුනි, මා කියන්නේ මෙය යි. ලේ මස්
සහිත සිරුරට ස්වර්ග රාජ්‍යය උරුම කරගත
නොහැක. එසේ ම දිරා යන්නකට නොදිරන්නක්
උරුම කරගත නොහැක.
51 1 තෙස 4:15-17 මෙන්න, මම ඔබට අබිරහසක්
පවසමි. අපි සියල්ලෝ ම නොමැරෙන්නෙමු. එහෙත්
අන්තිම හොරණෑව පිඹින කල, 52 මොහොතකින්,
ඇසිපිය හෙළෙන සැණෙකින්, අපි සියල්ලෝ ම වෙනස්
කරනු ලබන්නෙමු. මන්ද, හොරණෑව පිඹිනු ලබයි.
එකල මියගිය අය අජරාමර ස්වභාවයෙන් උත්ථාන
කරනු ලබන්නාහ. අපි ද වෙනස් කරනු ලබන්නෙමු.
53 දිරන සුලු මේ සිරුර නොදිරන සුලු බවට පත් විය
යුතු ය. මැරෙන සුලු මේ සිරුර අමරණීයත්වයට පත්
විය යුතු ය. 54 යෙසා 25:8දිරන සුලු මේ ස්වභාවය
නොදිරන සුලු බවටත්, මැරෙන සුලු මේ ස්වභාවය
අමරණීයත්වයටත් පැමිණි කල්හි “මරණය පැරදිණි;
ජය අත්විණි”යි ශුද්ධ ලියවිල්ලේ ලියා තිබෙන වචන
සම්පූර්ණ වේ.
55 හොසි 13:14 “එම්බා මරණය, තාගේ ජය කොයි
ද?
q255 එම්බා මරණය, තාගේ විෂ දළය කොයි ද?”
56 මරණයේ විෂ දළය පාපයයි. පාපයේ බලය
ව්‍යවස්ථාවයි. 57 එහෙත් අපගේ ස්වාමීන් වන
ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන අපට
ජය අත් කර දෙන දෙවියන් වහන්සේට ස්තුති වේ
වා!
58 එහෙයින් මාගේ ප්‍රේමවන්ත සහෝදරවරුනි,
සමිඳාණන් වහන්සේ තුළ ඔබගේ සේවය නිරර්ථක
නොවන බව ඔබ දන්නා බැවින් ස්ථිර වන්න.
නොසෙලී සිටින්න. සමිඳාණන් වහන්සේගේ
සේවයෙහි අධික ලෙස නිරතවන්න.

### දිළිඳුන් උදෙසා සම්මාදම

16 රෝම 15:25-26 දෙවියන් වහන්සේගේ
සෙනඟ උදෙසා කරන සම්මාදම ගැන
ගලාතියේ සභාවලට මා නියම කළ දෙය ම ඔබත්
කරන්න. 2 සෑම සතියක ම පළමු වන දා ඔබෙන්
එකිනෙකා උපයා ගත් මුදලින් කොටසක් ඉතිරි
කරගෙන තමා ළඟ වෙන් කර තබාගනී වා. එවිට මා
ආ කල සම්මාදමක් කිරීමට උවමනා නැත. 3 මා
පැමිණි විට ඔබ දෙන පඬුර ජෙරුසලමට ගෙන යන
පිණිස සුදුස්සන් යයි ඔබ අනුමත කරන තැනැත්තන්
මගේ ලියුම් ඇතිව, එහි යවන්නෙමි. 4 ඒ ගමන යෑම
සුදුසු යයි මටත් පෙනේ නම් ඔවුන් ද මා සමඟ යනු
ඇත.

### චාරිකා සැලැස්ම

5 ක්‍රියා 19:21 මසිදෝනිය මැදින් යන්නට මා
අදහස් කරන බැවින්, එසේ ගිය පසු, මම ඔබ වෙත
එන්නෙමි. 6 සමහරවිට ටික කලක්, නැත්නම් මුළු
ශීත කාලය වුව ද, ඔබ සමඟ නවතින්නෙමි. එවිට
මා කොහේ ගියත් මගේ ගමනට ඔබට ආධාර දිය
හැකි ය. 7 සමිඳාණන් වහන්සේ අවසර දෙන සේක්
නම් ඔබ සමඟ නතර වීමට බලාපොරොත්තු වෙන
බැවින් දැන් යන ගමනේ දී ටිකකට ගොඩවැදී යන්න
මා කැමැති නැත. 8 ලෙවී 23:15-21; ද්වි.නී.
16:9-11ක්‍රියා 19:8-10එහෙත් පෙන්තකොස්ත දිනය
වන තුරු මම එපීසයෙහි නවතින්නෙමි. 9 ඉමහත්
බලාපොරොත්තු සහිත දොරක් එහි විවෘත වී ඇත.
එහෙත්, විරුද්ධවාදීහු බොහෝ දෙනෙක් ද සිටිති.
10 1 කොරි 4:17 තිමෝතිියස් පැමිණියහොත් ඔහුට
කිසි බියක් නැති ව ඔබ අතර නැවතී සිටීමට ඉඩ
සලසන්න. මන්ද, ඔහු මා වාගේ ම සමිඳාණන්
වහන්සේගේ සේවකයෙකි. 11 එබැවින් කිසිවෙක්
ඔහු හෙළා නොදකී වා. ඔහු මා වෙත එන පිණිස,
ඔහුගේ ගමන සතුටු සිතින් යාමට කටයුතු කරන්න.
මන්ද, මම සහෝදරයන් සමඟ ඔහුගේ පැමිණීම
බලාපොරොත්තුවෙන් සිටිමි. 12 අපොල්ලොස් ගැන
කිව යුත්තේ සහෝදරයන් සමඟ ඔබ වෙත එන
ලෙස ඔහුගෙන් මා උදක් ම ඉල්ලා සිටිය බවයි.
එහෙත් දැන් ම ඒ ගමන යාම කිසිසේත් ඔහුගේ
කැමැත්ත නො වී ය. අවස්ථාවක් පැමිණි විට ඔහු
එනු ඇත.

## අවසාන ආචාර

13 සෝදිසියනේ ඉන්න, ඇදහිල්ලහෙි ස්ථිර වන්න.
වීරවන්ත ව සිටින්න. ශක්තිසම්පන්න වන්න. 14 ඔබ
කරන හැම දයෙක් ම ප්‍රේමයනේ කරන්න. 15 1
කොරි 1:16සහෝදරවරුනි, මම ඔබගනේ ඉල්ලීමක්
කරමි. ස්තෙපනස්ගේ ගෘහවාසීන් ග්‍රීසියේ දී මුලින්
ම හැරුණු අය බව ද ඔවුන් කිතුනු සේවයට සිය
කැමැත්තනේ කැප වූ බව ද ඔබ දන්නහු ය.
16 ඔවුන්ගේ ද ඔවුන් සමඟ සේවයට හවුල් වමෙන්
දිරි දරන සියල්ලන්ගේ ද මූලිකත්වයනේ කරෙනෙ
සේවයට ඔබ ද බැඳනේන. 17 ස්තෙපනස්ගේ ද
පොර්තුනාතුස්ගේ ද අකයිකස්ගේ ද පැමිණීම ගැන
ප්‍රීතිවමේ. ඔබ නැති පාඩුව ඔවුන්ගේ පැමිණීමනේ
පිරිමැසුණි. 18 එයින් මාගේ ද එසේ ම ඔබගේ ද
සිතට සහනයක් ලැබිණි. මවෙනි අය අගය කොට
සලකන්න.
19 ක්‍රියා 18:2 ආසියාවේ සභාවෝ ඔබට ආචාර
කරති. අකිලා ද ප්‍රිස්කා ද, ඔවුන්ගේ නිවසේ රැස්
වන සභාවත් සමඟ සමිඳාණන් වහන්සේ තුළ
හිතවත් ලසෙ ආචාර කරති. 20 සියලු සහෝදරයෝ
ඔබට ආචාර කරති. සාම සිඹීමකින් එකිනකොට
ඔබත් ආචාරය කරන්න.
21 පාවුලු වන මම මාගේ ම අත් අකුරින් ලියා
ඔබට ආචාර කරමි. 22 යමකේ සමිඳාණන්
වහන්සේට ප්‍රමේ නොකරන්නේ නම්, ඔහු සාප
ලද්දකේ වේ වා! 'මරනථා' - සමිඳාණන් වහන්ස,
වැඩිය මැනව.
23 ජේසුස් ක්‍රිස්තුන් සමිඳාණන් වහන්සේගේ
කරුණාව ඔබ සමඟ වේ වා! 24 මාගේ ප්‍රේමය,
ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ ඔබ සියල්ලන්
සමඟ වේ වා! ආමනේ.

2 ඔබට සිත් වේදනා නොදීම පිණිස, යළිත් ඔබ
වතෙ නොඒමට මා තීරණය කළේ එබැවිනි.
2 මා ඔබට සිත් වේදනා දුන්නොත්, මට සතුට
දනේනට ඉන්නේ, මා සිත් වේදනාවට පත් කළ අය
ම හැර, අන් කවරකේ ද? 3 මා ඒ ලිපිය ලිව්වේ මේ
කාරණාව නිසා ම ය. මා සතුටු කළ යුතු අය අතින්
ම මා සිත් වේදනාවට පත් නොවන පිණිස, ඔබ
වතෙ ඒමට මම කැමැති නොවීමි. මා සතුටින් සිටින
විට, ඔබත් සතුටින් සිටින බවට ඔබ ගැන මට
පැහැදීමක් ඇත. 4 මහා දුකින් ද සිත් තැවුලින් ද
කඳුළු සලමින් ද මා ඔබට ලිව්වේ, ඔබට සිත්
වේදනා දීමට නොව ඔබට ඇති මාගේ ප්‍රේමය
කතෙරම් අධික දැ යි ඔබ වටහාගන්නා පිණිස ය.

## වැරදිකරුට කමාව දීම

5 එහතේ යමකේ දුක් දී ඇත්නම් ඔහු දුක් දී
ඇත්තේ මට නොව, තරමක්දුරට ඔබ හැමට ය.
මසෙේ කීම අතිශයෝක්තියක් නොවේ යයි සිතමි.
6 ඔබනේ වැඩිදනො ඒ තැනැත්තාට කර ඇති දඬුවම
සෑහේ. 7 අනකේ අතට ඒ තැනැත්තා ඔහුගේ
අධිකතර ශෝකයහෙි ගිලී නොයෙන පිණිස ඔහුට
කමා වීම හා ධරෛය දීම ඔබගේ නියම යුතුකම
වේ. 8 එබැවින් ඔබ ඔහුට ප්‍රමේ කරන බව
සහතික කර දක්වන්න. 9 මා ඔබ වතෙ ඒ ලිපිය
ලිව්වේ සියලු කාරණාවල දී ඔබ මට කීකරු දැ යි,
පරීක්ෂා කර දැනගන්නා පිණිස ය. 10 යම් කරුණක්
නිසා යමකුෙට ඔබ කමා වන්නහු නම්, මම ද කමා
වමේ. මා එසේ කමා වී ඇත්නම්, කමා වී ඇත්තේ,
ක්‍රිස්තුන් වහන්සේ අබිමුවහෙි ඔබ උදසො ය. 11 මා
එසේ කළෙේ, අප සාතන්ගේ උපා දන්නා බැවින්,
ඔහුගනේ පරාජය වීමට ඉඩ නොතබන පිණිස ය.

## ත්‍රෝවසයනේ මසිදෝනියට

12 ක්‍රියා 20:1 තවද, ක්‍රිස්තුන් වහන්සේගේ සුබ
අස්න දේශනා කිරීමට මා ත්‍රෝවසට පැමිණි කල
සමිඳාණන් වහන්සේගේ සේවයට දොරක් විවෘත වී
තිබුණි. 13 එහතේ මාගේ සහෝදර වූ තීතස් මට
සම්බ නුවූ බැවින් මාගේ සිතට සහනයක් නුවූයනේ
ඔවුන්ගනේ සමුගනෙ මම මසිදෝනියට ගියමේ.

## කිතුනු ජය පරෙහර

14 තවද, කිතුනුවන් වූ අප නිතර ම ජය පරෙහරින්
ගනෙ යන, තමන් වහන්සේ පිළිබඳ දැනගැන්ම
නමැති සුගන්ධය අප ලවා හැම තැන ම පතුරුවන,
දවේයන් වහන්සේට ස්තුති වේ වා! 15 අපි,
ගැළවනේනන් හා විනාශ වනේනන් උදසො, දවේයන්
වහන්සේට ක්‍රිස්තුන් වහන්සේ පිදූ සුගන්ධය වමු.
16 විනාශ වන අයට එය මරණයට පමුණුවන මාරක
දුර්ගන්ධයකි. ගැළවනෙ අයට එය ජීවනයට
පමුණුවන ජීවනදායක සුගන්ධයකි. මවෙනි
කාර්යයකට සමතා කවරකේ ද? 17 බොහෝ
දනෙකු කරන්නාක් මනේ අපි, දවේයන්
වහන්සේගේ වචනය වංචනික ලසෙ භාවිතා
නොකොට, අවංක ව ද දවේයන් වහන්සේගනේ
ලැබූ ලසෙ ද උන් වහන්සේ ඉදිරියහෙි අපි ප්‍රකාශ
කරමු.

## අලුත් ගිවිසුමේ සේවකයෝ

3 මසෙේ අපි, අප ගැන ම රකෙමදාරුවක්
කරන්නට පටන් ගනිමු ද? නැත්නම් සමහරුන්ට
වුවමනා වන සේ අපටත් ඔබට දීමට හෝ ඔබනේ
ලබාගැනීමට හෝ රකෙමදාරු ලිපි වුවමනා ද?
2 නැත. අපට ඇති රකෙමදාරු ලිපිය නම් ඔබ ම ය;
එය අපේ සිත්වල ලියා ඇත. සියල්ලන්ට ම එය
කියවා දැනගත හැකි ය. 3 නික්ම 24:12; ජරෙ 31:33;
එසකි 11:19; 36:26ඔබ වනාහි අප විසින් එවන ලද
'ක්‍රිස්තුන් වහන්සේගේ ලිපිය' බව පැහැදිලි ය. එය
ලියා ඇත්තේ තීන්තනේ නොව, ජීවමාන දවේයන්
වහන්සේගේ ආත්මයාණන් කරණකොටගනෙ ය.
ගල් පුවරුවල නොව, මිනිස් සිත් නමැති පුවරුවල ය.
4 ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගනෙ දවේයන්
වහන්සේ ඉදිරියහෙි අපට එවැනි සහතිකයක් ඇත.
5 එහතේ මේ සියල්ල කිරීමේ හැකියාව අපගේ ම
යයි කීමට පුළුවන්කමක් අපට නැත. අපගේ

හැකියාව එන්නේ දෙවියන් වහන්සේගෙන් ය. 6 ජෙරෙ
31:31අලුත් ගිවිසුමේ සේවකයන් වීමේ හැකියාව
දුන්නේ උන් වහන්සේ ය. ඒ ගිවිසුම ලිඛිත නීතියෙන්
නොව ශුද්ධාත්මයාණන්ගෙනි. ලිඛිත නීතිය මරණය
ගෙන දෙයි. ශුද්ධාත්මයාණෝ ජීවනය ගෙන දෙති.
7 නික්ම 34:29 අකුරින් අකුර ගලේ ලියා කොටන
ලද ව්‍යවස්ථාව මරණය ඇති කළ නමුත්, එය
ප්‍රදානය කරන ලද්දේ මහා තේජසිනි. ඒ තේජස
පහ ව යන්නක් වූ නමුත්, එයින් උද්දීපනය වූ
මෝසෙස්ගේ මුහුණ දෙස නෙත් යොමු කර බලා
සිටීම ඉශ්රායෙලේ සෙනඟට නොහැකි තරමට එය
දීප්තිමත් විය. 8 එය එසේ නම්, ශුද්ධාත්මයාණන්
ප්‍රදානය කිරීම කරණකොටගෙන ඇති වන තේජස
ඊට වඩා කෙතරම් දීප්තිමත් වේ ද? 9 අප වරදට
පත් කළ ව්‍යවස්ථාව ප්‍රදානය කිරීම තේජාන්විත වී
නම්, අප දමිටු කරන ශුද්ධාත්මයාණන් වහන්සේ
ප්‍රදානය කිරීම ඊටත් වඩා තේජාන්විත නොවේ ද?
10 කලින් තේජසින් පැමිණි දේ දැන් පහ ව ගොස්
ඇත. ඒ තේජස පරදවන ඊට වඩා මහා තේජසක්
දැන් පැමිණ තිබේ. 11 පහ ව යන දේ තේජාන්විත
වී නම් සදහට ම පවතින දේ ඊටත් වඩා
තේජාන්විත නොවේ ද?
12 මෙවැනි බලාපොරොත්තුවක් අපට ඇති බැවින්
අපි නිර්භීත ව කතා කරමු. 13 නික්ම 34:33පහ ව
යන තේජස ඉශ්රායෙලේ සෙනඟ නොදකින පිණිස
මුහුණු වැස්මක් දමාගත් මෝසෙස්ට අපි සමාන
නොවෙමු. 14 එහෙත් ඔවුන්ගේ සිත් දැඩි වී තිබිණි.
මන්ද, අද දක්වා ම පුරාණ ගිවිසුමෙන් කියවන විට
එම වැස්ම ඉවත් නොකොට පවතී. ඒ වැස්ම ඉවත්
කරනු ලබන්නේ ක්‍රිස්තුන් වහන්සේ
කරණකොටගෙන පමණ ය. 15 සැබැවින් ම, අද
දක්වා මෝසෙස්ගේ ව්‍යවස්ථාව කියවන විට,
ඔවුන්ගේ සිත් වැස්මකින් ආවරණය වී ඇත.
16 නික්ම 34:34එසේ වුවත් ශුද්ධ ලියවිල්ලේ කියා
ඇති පරිදි, යමෙක් සමිඳාණන් වහන්සේ වෙත
හැරුණු විට, වැස්ම ඉවත් කරනු ලැබේ. 17 ඒ
සමිඳාණන් වහන්සේ ශුද්ධාත්මයාණෝ වන සේක.
සමිඳාණන් වහන්සේගේ ආත්මයාණන් යම් තැනක
ද, එතැන නිදහස ඇත. 18 අපි සියල්ලෝ, වැස්ම
ඉවත ලූ මුහුණුවලින් සමිඳාණන් වහන්සේගේ
තේජස කැඩපතකින් මෙන් පිළිබිඹු කරමු. මෙලෙස
ආත්මයාණන් වන සමිඳාණන් වහන්සේගෙන් එන
තේජස, අප උන් වහන්සේගේ සමානත්වයට වඩ
වඩා තේජාන්විත ව පමුණුවනු ඇත.

### දේවසම්පත් දරන මැටි බඳුන්

4 මේ සේවය දේව වරප්‍රසාදයෙන් අප පිට
පවරා ඇති බැවින් අප අධෛර්ය නොවෙමු.
2 ලජ්ජා සහිත රහසිගත ක්‍රියා අපි අත් හළෙමු;
කපටි කමින් අපි ජීවත් නොවෙමු; දෙවියන්
වහන්සේගේ වචනය වෙනස් නොකර, අපි සත්‍යය
එළිදරව් කරමු. එසේ කරමින්, දෙවියන් වහන්සේ
ඉදිරියෙහි සියලු මනුෂ්‍යයන්ගේ හෘදය සාක්ෂියට අපි
අප ම රෙකමදාරු කරගනිමු. 3 අපගේ සුබ අස්න
සැඟවුණු දෙයක් නම්, එය සැඟවී ඇත්තේ විනාශ
වෙන්නන්ට ය. 4 දෙවියන් වහන්සේගේ ස්වරූපය
වන ක්‍රිස්තුන් වහන්සේගේ තේජාන්විත සුබ
අස්නේ ප්‍රභාව නොපෙනෙන සේ මෙලොව දෙවියා
නොඇදහිලිවන්තයන්ගේ සිත් අඳුරු කර ඇත.
5 මන්ද, අපි අප ගැන ම නොව, ක්‍රිස්තුස් ජේසුස්
වහන්සේ ස්වාමීන් බවත්, ජේසුස් වහන්සේ උදෙසා
අප ඔබගේ දාසයන් බවත් ප්‍රකාශ කරමු. 6 උත්
1:3"අන්ධකාරයෙන් ආලෝකය නික්ම ඒවා"යි වදාළ
එම දෙවියන් වහන්සේ ම, ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේගේ මුහුණෙහි දෙවියන් වහන්සේගේ
තේජස දැනගැන්ම නමැති ආලෝකය, අපගේ සිත්
තුළ බැබළවූ සේක.
7 එහෙත් මේ අති ශ්‍රේෂ්ඨ බලය අපගෙන් නොව
දෙවියන් වහන්සේගෙන් වන බව දක්වන පිණිස, අප
මේ වස්තුව රුස් කර තැබූ මැටි බඳුන් හා සමාන ය.
8 අපි හැම අතින් ම මඩිනු ලැබුවත් කොටු වී
නොසිටිමු. වියවුල් වුවත් බලාපොරොත්තු රහිත
නොවෙමු; 9 ලුහුබඳිනු ලැබුවත් අතරමං නොවෙමු;
පහර ලැබුවත් නොවැනසෙමු. 10 ජේසුස්
වහන්සේගේ ජීවිතය අපේ ශරීරයෙන් ප්‍රකාශ වන
පිණිස උන් වහන්සේ මරණයට භාජනය වූ ලෙසෙ ම,
අපිත් නිතර ම ශාරීරික වශයෙන් මරණයට භාජනය
වෙමින් සිටිමු. 11 අපගේ මැරෙනසුලු ශරීරයේ
ජේසුස් වහන්සේගේ ජීවනය ප්‍රකාශ වන පිණිස,
අපි ජීවත් ව සිටිය දී නිතර ම මරණයට පාවා දෙනු
ලැබ සිටිමු. 12 මෙලෙස අප කෙරෙහි බලපාන්නේ
මරණයයි. ඔබ කෙරෙහි බලපාන්නේ ජීවනයයි.
13 ගීතා 116:10 තවද, "මම විශ්වාස කළ නිසා
කතා කළෙමි"යි ශුද්ධ ලියවිල්ල කියයි. එම
ඇදහිල්ල ඇති අපිත් විශ්වාස කරන නිසා කතා
කරමු. 14 ස්වාමීන් වන ජේසුස් වහන්සේ උත්ථාන
කළ දෙවියන් වහන්සේ, ජේසුස් වහන්සේ සමඟ
අපත් උත්ථාන කරන බව ද, ඔබ සමඟ අපත් උන්
වහන්සේ ඉදිරියට පමුණුවන බව ද අපි දනිමු.
15 මේ සියල්ල ඔබ උදෙසා සලසා ඇත්තේ දේව
වරප්‍රසාදය බොහෝදෙනෙකු වෙත පැතිරී වැඩි වී
යාමෙන් දෙවියන් වහන්සේගේ මහිමය සඳහා ස්තුති
දීම ද අධික වන පිණිස ය.

### ඇදහිල්ලෙන් ජීවත් වීම

16 එබැවින් අපි අධෛර්ය නොවෙමු. බාහිර
වශයෙන් අප දිරාපත් වෙමින් සිටියත්, අභ්‍යන්තරික
වශයෙන් අපි දිනෙන් දින ම අලුත් වෙමින් පවතිමු.
17 දැනට අප විඳින තාවකාලික සුළු දුක, එය
මුළුමනින් ම ඉක්මවා යන සදාතන තේජස්
සම්භාරයකට මඟ පාදයි. 18 මන්ද, අප නෙත්
යොමුකර සිටින්නේ දෘශ්‍යමාන දේ දෙස නොව
අදෘශ්‍යමාන දේ දෙස ය. දෘශ්‍යමාන දේ තාවකාලික
ය; අදෘශ්‍යමාන දේ සදාතනික ය.

5 කූඩාරමක් වන අපගේ භෞමික නිවාසය
ගරා වැටුණත්, දෙවියන් වහන්සේගෙන් වන,
අතින් නොතැනූ, සදාතන නිවාසයක් ස්වර්ගයෙහි
අපට ඇති බව අපි දනිමු. 2 මෙහි දී අපි ස්වර්ගීක
නිවාසයේ ආවරණය ලබාගැනීමේ දැඩි ආශාවෙන්
සුසුම්ලමු. 3 මෙය ලබාගත් විට අපි ආවරණ රහිත
ව නොසිටිමු. 4 කූඩාරමක් වැනි මේ ශරීරයෙහි
සිටින තුරු, අපි දුක් බරින් සුසුම්ලමු. අපගේ ආශාව
නම් ආවරණ රහිත ව සිටීම නොව, මැරෙනසුලු දේ
ජීවනයට පරිවර්තනය වන පිණිස ආවරණ සහිත ව
සිටීම ය. 5 මෙයෙ සඳහා අප සූදානම් කළේ දෙවියන්
වහන්සේ ම ය. එහි අත්තිකාරම වශයෙන් උන්
වහන්සේ අපට ශුද්ධාත්මයාණන් ප්‍රදානය කළ
සේක.
6 එබැවින් අපි සැම විට ම ධෛර්යයෙන් සිටිමු.
ශරීරය නමැති නිවාසයෙහි සිටින තුරු, අපි
සමිඳාණන් වහන්සේගෙන් ඈත් ව සිටින බව දනිමු.
7 අප ජීවත් වනුයේ දැකීමෙන් නොව, ඇදහීමෙන් ය.
8 අප ධෛර්යයෙන් සිටින බව නැවත කියමු. ශරීරය
නමැති නිවාසයෙන් ඈත් වී සමිඳාණන් වහන්සේ තුළ
විසීමට අපි වඩාත් කැමැති වමු. 9 ඒ නිසා අපි, එහි
වේවා, මෙහි වේවා, කොයි නිවාසයෙහි සිටියත්,
සමිඳාණන් වහන්සේ ප්‍රසන්න කිරීමට වඩාත් ආශා
වමු. 10 රෝම 14:10මන්ද, අපි සියලුදෙනා ම තම
තමාගේ ශාරීරික ජීවිතයේ දී කළ හොඳ නොහොඳ
අනුව විපාක ලබන පිණිස, ක්‍රිස්තුන් වහන්සේගේ
විනිශ්චයාසනය ඉදිරියෙහි පෙනී සිටීමට නියම ව
සිටිමු.

### ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමයේ බලය

11 සමිඳාණන් වහන්සේ කෙරෙහි බිය වීම කුමක්
දැ යි අප දන්නා බැවින් මිනිසුන්ට කරුණු පහදා දීමට
අපි උත්සාහ කරමු. දෙවියන් වහන්සේට අපේ නියම
ස්වභාවය පැහැදිලි ව පෙනේ. එලෙසෙ ම ඔබටත්
පෙනෙනු ඇතැ යි මම බලාපොරොත්තු වෙමි. 12 අප
උත්සාහ කරන්නේ යළිත් අප ම ඔබට රෙකමදාරු
කරගැනීමට නොව අප ගැන පාරට්ටු කිරීමට ඉඩ
ප්‍රස්ථාවක් ඔබට සලසා දීමට ය. එවිට චරිතය
අනුව නොව පෙනුම අනුව පාරට්ටු කරගන්නන්ට
පිළිතුරු දීමට ඔබට හැකි වනු ඇත. 13 අපි සිහිවිකල
වී සිටිමු නම්, එය දෙවියන් වහන්සේ උදෙසා ය. අපි
සිහි බුද්ධියෙන් සිටිමු නම්, එය ඔබ උදෙසා ය.
14 සියල්ලන් උදෙසා එක් කෙනෙකු මළ නිසා,
සියල්ලෝ ම මළහ යි අප නිගමනය කරන බැවින්
ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමය අප කෙරෙහි
බොහෝ සෙයින් බලපායි. 15 උන් වහන්සේ දිවි
පිදුවේ ජීවත් වන්නන් තවත් තමන් ම උදෙසා ජීවත්
නොවී, ඔවුන් උදෙසා මැරී, උත්ථාන කරනු ලැබූ
ක්‍රිස්තුන් වහන්සේ උදෙසා ජීවත් වන පිණිස ය.

### ක්‍රිස්තුන් වහන්සේ තුළ නව ජීවනය

16 මෙතැන් සිට අපි කිසිවකු ලෞකික මිම්මෙන්
නොමනිමු. ලෞකික වශයෙන් අප ක්‍රිස්තුන්
වහන්සේ දැන හැඳින සිටියත්, මෙතැන් සිට අපි උන්
වහන්සේ එලෙසෙ හඳුනා නොගනිමු. 17 එබැවින්
යමෙක් ක්‍රිස්තුන් වහන්සේ තුළ සිටී නම්, එතැන
ඇත්තේ නව මැවිල්ලකි. පැරණි දේ පහ ව ගොස්
ඇත. දැන් සියල්ල ම අලුත් වී තිබේ. 18 සියල්ල
පැමිණෙන්නේ දෙවියන් වහන්සේගෙන් ය. උන්
වහන්සේ ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන අප
තමන් වහන්සේට සමඟි කරගෙන, සමඟි කිරීමේ
සේවය අපට දුන් සේක. 19 එහි තේරුම නම්,
මිනිසුන්ගේ පව් ඔවුනට විරුද්ධ ව ගණන් නොගෙන
ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන, දෙවියන්
වහන්සේ, ලෝකය තමන් වහන්සේට සමඟි
කරගනිමින් සිටි බවත්, ඒ සමඟි කිරීමේ සේවය
අපට භාර දුන් බවත් ය.
20 දෙවියන් වහන්සේ ම අප මඟින් ඔබ හට
ආයාචනා කරන්නාක් මෙන්, අපි ක්‍රිස්තුන් වහන්සේ
වෙනුවෙන් තානාපතියන් වී, දෙවියන් වහන්සේ හා
සමඟි වන ලෙස, ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන්
ඔබට ආයාචනා කරමු. 21 දෙවියන් වහන්සේ, පාපය
නොදත් ක්‍රිස්තුන් වහන්සේ, අප උදෙසා මනුෂ්‍ය
පාපී බව හා සම වීමට සැලැසූ සේක. එසේ කළේ
ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන දෙවියන්
වහන්සේගේ ධර්මිෂ්ඨකමට අප පංගුකාර වනු
පිණිස ය.

6 එබැවින් දේව සේවයේ පංගුකාරයන්
වශයෙන් ඔබ ලබා ඇති දෙවියන් වහන්සේගේ
වරප්‍රසාදය අපතේ නොහරින ලෙස අපි ඉල්ලා
සිටිමු. 2 යශා 49:8මන්ද,
q22 “ප්‍රසාදජනක කාලයේ දී මම ඔබට සවන්
දුනිමි, ගැළවීමේ දවසේ දී මම ඔබට පිහිට
වුණෙමි”යි
2 දෙවියන් වහන්සේ වදාරන සේක. මෙයෙ
ප්‍රසාදජනක කාලය යි. මෙයෙ ගැළවීමේ දවස යි.
3 අපේ සේවය දෝෂයට ලක් නොවන පිණිස
කිසිවකුට අපගෙන් බාධා ඇති වීමට ඉඩ
නොතබමු. 4 එසේ නොව, දුක් පීඩා ද අගහිඟකම්
ද විපත්ති ද මහත් ඉවසීමකින් විඳදරා, අපි දෙවියන්
වහන්සේගේ සේවකයන් වශයෙන් ඔබට
ඒත්තුගන්වමු. අපි බොහෝ දේ විඳදරාගත්තෙමු.
5 ක්‍රියා 16:23පහර ලැබුවෙමු; සිරගත වීමු;
අඩන්තේට්ටම් කරනු ලැබුවෙමු. විවේකයක් වත්,
නින්දක් වත් කෑමක් වත් නැති ව සිටියෙමු.
6 පිරිසිදුකමින් ද දැනගැන්මෙන් ද ඉවසීමෙන් ද
කරුණා ගුණයෙන් ද ශුද්ධාත්මයාණන්ගෙන් ද අවංක
ප්‍රේමයෙන් ද සත්‍ය වචනයෙන් ද දේව බලයෙන් ද
අපි දෙවියන් වහන්සේගේ සේවකයන් බව ඔබට
ඒත්තුගන්වමු. 7 දකුණතින් හා වමතින් රැගත්
දැමිටුකම නමැති සන්නාහයෙන් ද සන්නද්ධ ව
සිටියෙමු. 8 ගෞරවය හා අගෞරවය ද, කීර්තිය හා

අපකීර්තිය ද ලැබීමු. වංචාකාරයන් මෙන්
ගණන්ගැනුණත්, සත්‍යවාදීහු වීමු. 9 වැදගැන්මකට
නැති අය මෙන් ගණන්ගැනුණත්, බොහෝ දෙනා
පිළිගත් අය වීමු. මළා වූ අය මෙන් ගණන්ගැනුණත්,
බලන්න, අපි ජීවත් ව සිටිමු. ලබන අය මෙන්
ගණන්ගැනුණත් නොමැරී සිටිමු. 10 ශෝකවන්නන්
මෙන් ගණන්ගැනුණත් නිතර ම ප්‍රීතියෙන් සිටිමු.
දිළිඳුන් මෙන් ගණන්ගැනුණත්, බොහෝ දෙනෙකුන්
ධනවතුන් කරමු. කිසිත් නැත්තන් මෙන්
ගණන්ගැනුණත් සියල්ල ඇත්තන් වී සිටිමු.
11 කොරින්තිවරුනි, අපි අවංක සිතින් කිසිත්
නොසඟවා ඔබට කතා කළෙමු. 12 ඔබ ගැන අපගේ
සිතගේ වෙනසක් සිදු වී නැත. අප ගැන නම් ඔබගේ
සිතගේ වෙනසක් සිදු වී ඇත. 13 එබැවින් අප කර
ඇති සේ ම, ඔබගේ සිත් ද පළල් ලෙස විවෘත
කරන්න. අපගේ සිතගේ වෙනසක් සිදු වී නැතුවාක්
මෙන් අප ගැන ද ඔබගේ සිතගේ වෙනසක් ඇති කර
නොගන්න. දරුවන්ට පියකු කියන්නාක් මෙන් මම
මයෙ ඔබට කියමි.

### නොගැළපෙන සම්බන්ධකම්වලින් වැළකීම

14 නොඇදහිලිවතුන් සමඟ නොගැළපෙන
සම්බන්ධකම්වලින් නොබැඳෙන්න. යුක්තියත්
අයුක්තියත් අතර ඇති සම්බන්ධකම කුමක් ද?
එළියත් අඳුරත් අතර ඇති එකමුතුකම කුමක් ද?
15 ක්‍රිස්තුන් වහන්සේ හා යක්ෂාධිපතියා හා අතර
එකඟ වීමක් තිබිය හැකි ද? ඇදහිලිවන්තයකු හා
නොඇදහිලිවන්තයකු හා අතර පොදුවේ යමක් ඇද්
ද? 16 ලෙවී 26:12; එසකි 37:27; 1 කොරි 3:16;
6:19දේව මාලිගාව හා දේවතා පිළිම අතර
සමානකමක් ඇද් ද? නැත. අපි ජීවමාන දවියන්
වහන්සේගේ මන්දිර වමු. ඒ බව දවියන්
වහන්සේ මසෙේ වදාළ සේක:
q2 16 “මම ඔවුන් සමඟ වාසය කරන්නමේ,
ගැවසෙන්නෙමේ, මම ඔවුන්ගේ දවියන් වහන්සේ
වමේ, ඔව්හු මාගේ සෙනඟ වන්නෝ ය.”
17 යසො 52:11 එබැවින්:
q2 17 “ඔවුන් අතරෙන් නික්මවිත්, වෙන් වී සිටින්න.
q2 17 අපවිත්‍ර කිසිවක් ස්පර්ශ නොකරන්නැ”යි
සමිඳාණන් වහන්සේ වදාරන සේක.
q2 17 “එවිට මම ඔබ පිළිගෙනෙ,
18 2 සාමු 7:14; 1 වංශා 17:13; යසො 43:6; ජරෙ
31:9 ඔබට පියකේ වන්නමේ.
q2 18 ඔබ ද මට දූපුත්තු වන්නහු ය”යි
18 සියලු බලැති සමිඳාණන් වහන්සේ වදාරන සේක.

7 ප්‍රේමවන්ත සහෝදරවරුනි, මවෙනි
පොරොන්දු අපට ඇති බැවින් සිත කය
කලෙසෙන සියලු දයෙින් වැළකී අප ම පවිත්‍ර
කරගනිමින් දේව ගරුබිය ඇති ව අපගේ
ශුද්ධවන්තකම පරිපූර්ණ කරගනිමු.

### ප්‍රීතියට හේතු වූ පසුතැවී සිත හරවා ගැනීම

2 ඔබගේ සිත අප වතෙ විවෘත කරන්න. අපි
කිසිවකුට අයුත්තක් නොකළෙමු; කිසිවකු
විනාශයට පත් නොකළෙමු; කිසිවකුගනේ අයුතු
වාසියක් නොගතිමු. 3 මා එසේ කියන්නේ ඔබට
වරද තබන අදහසින් නොවේ. මා කලින් කී පරිදි,
මැරතෙත් ජීවත් වතෙත් අපි හිතවත්කමින් ඔබ හා
එකට බැඳී සිටිමු. 4 ඔබ මට හොඳට ම විශ්වාස ය.
ඔබ ගැන මම ආඩම්බර වමේ. අපේ සියලු
දුක්විපත්වල දී මම ධරෛයයනේ පිරී ප්‍රීතියනේ
පිනා යමි.
5 2 කොරි 2:13 මසිදෝනියාවට සැපත් වූ විට පවා
අපට කිසි සැනසිල්ලක් නො වී ය. හැම අතින් ම
අපට කරදර ඇති විය. අප අවට කලකෝලාහල ද,
අප සිත තුළ බියසැක ද තිබිණි. 6 එහතේ කලකිරුණු
අය ධරෛයවත් කරවන දවියන් වහන්සේ
තීතස්ගේ පැමිණීමනේ ද, 7 ඔහුගේ පැමිණීමනේ
පමණක් නොව ඔබ අතර ඔහු ලැබූ ධරෛයයනේ ද
අප ධරෛයවත් කළ සේක. මා දැකීමට ඇති
ඔබගේ මහත් ආශාව ද ඔබගේ කණගාටුව ද මට
ඇති ඔබගේ පක්ෂපාතකම ද ගැන ඔහු අපට සැළ
කළ විට මම වඩාත් ප්‍රීති වීමි.
8 මාගේ ලිපිය නිසා ඔබට සිත් වේදනාවක් ඇති වූ
නමුත් ඒ ගැන කණගාටු නොවමේ. ඒ ලිපිය නිසා
ටික කලකට පමණක් සිත් වේදනාවක් ඔබට ඇති වූ
බව මම දනිමි. 9 ඒ ගැන මා කලින් කණගාටු වූ
නමුත් දැන් මම ප්‍රීති වමේ. එසේ වන්නේ ඔබට
සිත් වේදනාවක් ඇති වූ නිසා නොව, ඔබගේ සිත්
වේදනාව පසුතැවී සිත් හරවා ගැනීමකට තුඩු දුන්
නිසා ය. ඔබ දවියන් වහන්සේගේ කැමැත්ත අනුව
ඒ සිත් වේදනාව දැරූ නිසා, අපනේ ඔබට කිසි
විධියකින් හානියක් නො වී ය. 10 දේව කැමැත්ත
අනුව සිත් වේදනාව දරාගැනීමනේ සිත් හරවා
ගැනීමේ පසුතැවිල්ලක් ඇති වී, එය ගැළවීමට මඟ
පාදන බැවින් කණගාටු වීමට ඉඩක් නැත. එහතේ
ලෞකික පිළිවළෙ අනුව සිත් වේදනාව දරාගැනීම
මරණය ගනෙ දයෙි. 11 දේව කැමැත්ත අනුව ඒ සිත්
වේදනාව දැරීමනේ ඔබ තුළ ඇති වූ ප්‍රතිඵල ගැන
සිතා බලන්න. එයින් කතෙරම් මහත් උනන්දුවක් හා
නිදොස් කරගැනීමක් ඇති වී ද? ඒ හැර වරදට
දඬුවම් දීම සඳහා ඇති වූ කෝපය, තැතිගැන්ම, සිත්
වේදනාව හා උද්‍යෝගය කතෙරම් මහත් වී ද? මේ
කරුණ පිළිබඳ ව ඔබ නිදොස් බව සියලු අයුරින්
ඔප්පු කර ඇත.
12 මා ඔබට ලියා එවූ නමුත්, මා එසේ ලීවේ වරද
කළ අය නිසා වත්, වරද වින්ද අය නිසා වත් නොව,
අප කරෙහි ඇති ඔබගේ හිතවත්කම දවියන්
වහන්සේ ඉදිරියෙහි ඔබට ප්‍රකාශ වන පිණිස ය.
13 අප එතරම් ධරෛයවත් වූයේ ඒ නිසා ය.
13 එසේ ධරෛයවත් වීමේ දී අප වඩාත් ප්‍රීති
වූයේ තීතස් දැක්වූ ප්‍රීතිය නිසා ය. මන්ද, ඔබ
සියල්ලන්ගනේ ඔහුට සහනය ලැබුණ නිසා ය.

14 ඔබ ගැන ඔහුට යම් පාරට්ටුවක් කළෙමේ නම්,
මම ඒ ගැන ලජ්ජා නොවීමි. එහතේ ඔබට අප
පැවසූ සියල්ල සැබෑ වූ සේ ම, තීතස්ට අප කළ ඒ
පාරට්ටුවත් සැබෑ වී ඇත. 15 ඔබ සියල්ලන්ගේ
කීකරුකමත් බියනේ හා තැතිගැන්මනේ යුතු ව ඔබ
ඔහු පිළිගත්සැටිත් සිහි කරන විට ඔහුගේ සිත ඔබ
වතෙ ඉමහත් ප්රේමයනේ ඇදී යයි. 16 සියල්ලහෙි දී
ඔබ ගැන මට සම්පූර්ණ විශ්වාසය ඇති බැවින් මම
ප්රීති වමේ.

## පරිත්යාගශීලී දීමනා

8 රෝම 15:26 සහෝදරවරුනි, මසිදෝනියාවේ
සභාවන්ට දවේයන් වහන්සේ දී ඇති
වරප්රසාදය ගැන අපි ඔබට දන්වනු කැමැත්තමෙු.
2 එනම්, බොහෝ දුක් පීඩා මැද ඔවුන් පරීක්ෂා
කරනු ලැබූ නමුත්, ඔවුන්ගේ ප්රීතිය කතෙරම් අධික
වී ද යත්, ඉතා දිළිඳු වුව ද, ඔවුන්ගේ
ත්යාගශීලීවන්තකමින් ඔවුන් පොහොසත් වූ බව ය.
3 ඔවුන් සිය කැමැත්තනේ ම ඔවුන්ට හැකි පමණින්
හා ඊටත් වැඩියනේ දුන් බව මම සහතික කොට
කියමි. 4 තවද, සැදැහැවතුන්ට උපස්ථාන කිරීමට
පංගුකාර වීමේ වරප්රසාදය ඔව්හු අපගනේ උදක් ම
ඉල්ලා සිටියහ. 5 අප සිතූ පමණටත් වඩා, ඔව්හු
මුලින් ම සමිඳාණන් වහන්සේටත්, එමනේ ම දේව
කැමැත්ත අනුව අපටත් භාර වූ හ. 6 එබැවින් තීතස්,
මුලින් ම පටන්ගත් මේ සහනාධාර සේවය ඔබ
අතරහෙි සම්පූර්ණ කරන ලසෙ අපි ඔහුගනේ උදක්
ම ඉල්ලා සිටියමෙු. 7 ඇදහිල්ලනේ ද කතාවනේ ද
දැනගැන්මනේ ද උද්යෝගිමත්භාවයනේ ද අප වතෙ
ඇති ඔබගේ ප්රේමයනේ ද ඔබ පොහොසත් වී
සිටින්නාක් මනේ මේ සහනාධාර සේවයහෙි ද
පොහොසත් වී සිටින්න.
8 මා මයෙ කියන්නේ අණ දීමක් ලසෙ නොව,
අනකෙුත් අය ආධාර කිරීමට කතෙරම් උද්යෝගිමත්
දැ යි මා ඔබට දැන්වීමනේ ඔබගේ ප්රේමයේ
සැබෑකම සෝදිසි කරන පිණිස ය. 9 අපගේ ස්වාමීන්
වන ජේසුස් ක්රිස්තුන් වහන්සේගේ ත්යාගශීලී
කරුණාව ඔබ දන්නහු ය. උන් වහන්සේ ධනවත් ව
සිටි නමුත්, තමන් වහන්සේගේ දිළිඳුකම
කරණකොටගනෙ ඔබ ධනවත් වන පිණිස ඔබ
උදසො දිළිඳු වූ සේක.
10 මේ ගැන මාගේ අදහස මම ඔබට කියමි. ඔබ
අවුරුද්දකට පරෙ ආධාර දීමට කැමැති වී, එය
ක්රියාවේ යදෙවීමට පුරෝගාමී වූවහු ය. 11 ඔබ
පටන්ගත් ඒ දේ දැන් අවසාන කළ යුතු ය. එවකට
ආධාර දීමට ඔබ උද්යෝගිමත් වූ ලසෙ ම එය
නිමකරන්නට ද උද්යෝගිමත් වන්න. ඒ සඳහා හැකි
පමණට දනේන. 12 දීමට උද්යෝගිමත් බවක් ඇති
නම් දවේයන් වහන්සේ, යමකෙුගනේ නැති දේ
නොඉල්ලා, යමකෙුට ඇති පමණින් දනෙ දීමනාව
පිළිගන්නා සේක. 13 මයෙින් අදහස් කරන්නේ ඔබ
අමාරුවේ වැටී අනුන්ට සහනය දීමක් නොව,
සාධාරණකමක් ඇති වීමයි. 14 දැන් ඔබගේ
වැඩිමනත්කමින් ඔවුන්ගේ අඟහිඟකම
පිරිමැසනේනාක් මනේ, මතු ඔවුන්ගේ
වැඩිමනත්කමින් ඔබගේ අඟහිඟකම පිරිමැසනෙු
ඇත. මලෙසෙ දගෙොල්ල අතර සාධාරණකමක් ඇති
වේ. 15 නික්ම 16:18මසෙේ:
අ215 “වැඩියනේ ලැබූ තැනැත්තාට වැඩි වූයේ වත්,
අඩුවනේ ලැබූ තැනැත්තාට අඩු වූයේ වත් නැතැ”යි
15 ශුද්ධ ලියවිල්ලේ ලියා තිබේ.

## තීතස් සහ සහකාර සේවකයෝ

16 ඔබ ගැන අප දක්වන හිතවත්කම ම, තීතස්ට
දැක්වූ දවේයන් වහන්සේට ස්තුති වේ වා! 17 ඔහු
අපගේ ඉල්ලීම පිළිගත්තා පමණක් නොව, සිය
කැමැත්තනේ ම ඔබ වතෙ පැමිණීමට ලොකු
උනන්දුවක් දැක්වී ය. 18 තවද ධර්මදූත සේවය
පිළිබඳ ව සියලු සභාවලින් ප්රශංසාව ලබා ඇති
සහෝදරයකෙු ද අපි ඔහු සමඟ එවමු. 19 එපමණක්
නොව, සමිඳාණන් වහන්සේගේ මහිමය උදසො ද
අපගේ උද්යෝගයේ සාක්ෂියක් වශයනේ ද පුදන
මේ දීමනාව අප සමඟ ගනෙ යන පිණිස අපේ
සහකාරයා වීමට සභාවන් මඟින් ඔහු පත් කර ඇත.
20 මේ නොමසුරු දීමනාව සම්බන්ධ ව ක්රියා
කිරීමනේ කිසිවකෙුගනේ දෝෂාරෝපණයක්
නොලැබීමට අපි පරසේසම් වමෙු. 21 හිතෝ
3:4සමිඳාණන් වහන්සේ ඉදිරියහෙි පමණක් නොව,
මිනිසුන් ඉදිරියහෙි ද අවංක ව ක්රියා කිරීම අපේ
අරමුණ වේ. 22 තවද අපි ඔවුන් සමඟ තවත්
සහෝදරයකෙු එවමු. නොයකේ විට බොහෝ
කාරණාවල දී ඔහුගේ උද්යෝගය අපට ඔප්පු වී ඇත.
ඔබ සම්බන්ධයනේ ඇති ඔහුගේ විශ්වාසය නිසා,
දැන් ඔහු වඩාත් උද්යෝගිමත් ව සිටියි. 23 තීතස්
වනාහි ඔබ උදසො හවුල් සේවකයකෙු වන මාගේ
සහකාරයා ය. සසෙු සහෝදරයෝ වනාහි ක්රිස්තුන්
වහන්සේට ගෞරවයක් ව සිටින සභාවන්හි
නියෝජිතයෝ ය. 24 සියලු සභාවන් ඉදිරියහෙි
ඔබගේ ප්රේමය ගැන ද ඔබට ඇති අපගේ
පාරට්ටුව ගැන ද ඔවුන්ට සාක්ෂි දක්වන්න.

## සැදැහැවතුනට උවටැන්

9 සැදැහැවතුන්ට ආධාර දීම ගැන ඔබට ලියා
එවීම අවශ්ය නැත. 2 ඔබගේ උද්යෝගය ගැන
මම දනිමි. ගිය අවුරුද්දේ සිට ම ග්රීසියේ වාසීන්
වන ඔබ ආධාර දීමට සූදානම් ව සිටි බව කියමින්
මසිදෝනියේ වැසියන්ට ඔබ ගැන පාරට්ටු කළෙමේ.
තවද ඔබගේ උද්යෝගය ඔවුන්ගනේ බොහෝ
දනෙකෙුන් උනන්දු කර ඇත. 3 ඔබ ගැන අප කළ
පාරට්ටුව බොරුවක් නොවන පිණිස මම
සහෝදරයන් එවමි. එසේ කරන්නේ ඔබ සූදානම් ව
සිටිනවා යයි මා කී ලසෙ ම ඔබ සූදානම් ව සිටින
පිණිස ය. 4 නැත්නම්, යම් හයෙකින් මසිදෝනිවරුන්
මා සමඟ පැමිණ ඔබ සූදානම් නැති බව දුටුවොත්,
ඔබට කසෙේ වතෙත්, ඔබ කරෙේ මතෙරම්
විශ්වාසයක් තැබූ අපට කතෙරම් ලජ්ජාවක් ද?

5 එබැවින්, ඔබ පොරොන්දු වී ඇති දීමනාව කල්
තියා සූදානම් කරන පිණිස, මට පෙරටුව යන මේ
සහෝදරයන්ගෙන් ඉල්ලීම අවශ්‍ය යයි සිතුවෙමි.
එවිට, ඒ දීමනාව බල කිරීම නිසා දෙන දෙයක්
නොව ත්‍යාගශීලී ව දෙන්නක් බව පැහැදිලි වනු
ඇත.

## ත්‍යාගශීලීභාවයේ ප්‍රතිඵල

6 මෙය සිතට ගන්න: අඩුවෙන් වපුරන්නා අඩුවෙන්
කපා ගනියි; වැඩියෙන් වපුරන්නා, වැඩියෙන් කපා
ගනියි. 7 එක් එක්කෙනා අකමැත්තෙන් වත් බලකිරීම
නිසා වත් නොව, සිය කැමැත්තෙන් තීරණය කරගත්
ලෙස දිය යුතු ය. සතුටු සිතින් දෙන්නාට දෙවියන්
වහන්සේ ප්‍රේම කරන සේක. 8 සියල්ලෙහි දී ඔබ
නිතර ම සියලු අයුරින් අනූන ව සිටින පිණිසත්,
සියලු යහපත් සේවාවන්ට නොමසුරු ව ආධාර කළ
හැකි වන පිණිසත් උවමනා පමණටත් වඩා අධික
ලෙස ආශීර්වාද ඔබට දෙන්න දෙවියන් වහන්සේට
පුළුවන. 9 ගීතා 112:9මෙසේ, ශුද්ධ ලියවිල්ලෙහි:
q2 9 “උන් වහන්සේ දිළිඳුන්ට නොමසුරු ව දුන් සේක,
උන් වහන්සේගේ කරුණාව සදහට ම පවත්නේ
ය”යි
9 ලියා තිබේ. 10 යෙසා 55:10වපුරන්නාට බීජ ද
කෑමට ආහාර ද සපයා දෙන දෙවියන් වහන්සේ
ඔබට බීජ සපයා දී, ඒවා වැඩෙන්න සලස්වා, ඔබගේ
ත්‍යාගශීලීභාවයේ අස්වැන්න සරුසාර කරන සේක.
11 මෙලෙස ඔබ සියල්ලෙහි දී ත්‍යාගශීලී වන පිණිස
දෙවියන් වහන්සේ ඔබ බහුල ලෙස ධනවත් කරන
සේක. එවිට අප මඟින් කරන ලද මේ දේ නිසා
දෙවියන් වහන්සේට තුති පැසසුම් ඇති වේ.
12 සැදැහැවතුන්ගේ මේ උපස්ථාන සේවාවෙන්
අඟහිඟකම පිරිමැසෙනවා පමණක් නොව දෙවියන්
වහන්සේට බොහෝ ස්තුති දීම ද හටගන්නේ ය.
13 මේ සේවාවෙන්, ඔබ ක්‍රිස්තුන් වහන්සේගේ
සුබ අස්න පිළිගෙන, එය පිළිපදින ආකාරය ද ඔවුන්ට
හා අන් සියල්ලන්ටත් ඔබ දැක්වූ ත්‍යාගශීලීභාවය ද
ඔප්පු වන බැවින් ඔව්හු දෙවියන් වහන්සේට ස්තුති
ප්‍රශංසා කරති. 14 තවද, දෙවියන් වහන්සේ ඔබට
දක්වා ඇති මහා කරුණාව නිසා, ඔවුන් මහත්
ළැදිකමකින් ඔබ උදෙසා යාච්ඤා කරනු ඇත.
15 දෙවියන් වහන්සේගේ කියා නිම කළ නොහැකි
දීමනාව ගැන උන් වහන්සේට ප්‍රශංසා වේ වා!

## චෝදනාවලට පිළිතුරු

10 ඉදිරිපිට සිටිය දී බියසුල්ලෙකු යි ද ඈත්ව
සිටිය දී එඩිතර කෙනෙකු යි ද ඔබ කියන
පාවුලු වන මම ක්‍රිස්තුන් වහන්සේගේ
මුදුමොළොක් බව පෙරදැරි කොටගෙන ඔබගෙන්
ඉල්ලීමක් කරමි. 2 අප ක්‍රියා කරන්නේ ලෞකික
චේතනාවෙන් යයි කියන අයට විරුද්ධ ව එඩිතර ව
ක්‍රියා කිරීමට මට ශක්තිය ඇති බැවින්, ඔබ වෙත
පැමිණි විට, එලෙස එඩිතර ව ක්‍රියා කිරීමට මා
නොපොළඹවන මෙන් ඔබගෙන් මම යටහත් ලෙස
ඉල්ලමි. 3 අප ලෝකයේ ජීවත් වුව ද, අප සටන්
කරන්නේ ලෞකික චේතනාවෙන් නොවේ. 4 අප
සටනට ගන්නා අවිආයුධ ලෞකික ඒවා නොව,
දෙවියන් වහන්සේගේ බලයෙන් බලකොටු බිඳ
හෙළීමට තරම් බලසම්පන්න ඒවා ය. 5 බොරු තර්ක
හා දෙවියන් වහන්සේ පිළිබඳ ව දැනගැන්මට විරුද්ධ
ව නැඟුණු හැම උස් පවුරක් ම බිඳ හෙළමු. තවද,
අපි සෑම සිතුවිල්ලක් ම වහල් කොටගෙන, එය
ක්‍රිස්තුන් වහන්සේ යටතේ කීකරුකමට පත් කරමු.
6 ඔබ සහමුලින් ම කීකරු වූ කල සියලු
අකීකරුකම්වලට දඬුවම් දීමට අපි සූදානම් ව සිටිමු.
7 කරුණු ඇති සැටි සිතා බලන්න. යමෙක් තමා
ක්‍රිස්තුන් වහන්සේට අයිති යයි සිතාගනී නම්, ඔහු
මෙන් අපත් ක්‍රිස්තුන් වහන්සේට අයිති බව සිතට
ගනීවා. 8 විනාශයට නොව ගොඩනැඟීම පිණිස
ස්වාමීන් වහන්සේ මට දුන් ආධිපත්‍යය ගැන මම
සමහර විට පමණට වඩා පාරට්ටු කරගත්තත්, ඒ
ගැන ලජ්ජා නොවෙමි. 9 මාගේ ලියුම්වලින් ඔබ
බියගැන්වීමට උත්සාහ කරනවා යයි නොසිතන්න.
10 ‘ඔහුගේ ලියුම් හරබර ය. වේගවත් ය. එහෙත්
ඔහු අප ළඟ සිටින විට, ඔහුගේ කිසි පෙනුමක්
නැත, කතාවෙහි දක්ෂකමක් නැතැ’යි කෙනෙකු
කියනු ඇත. 11 එහෙත්, අප ඈත් ව සිටින විට ලියන
ලියුම් ද අප ඔබ සමඟ සිටින විට කරන දේ ද අතර
වෙනසක් නැති බව එවැනි අය තේරුම් ගත යුතු යි.
12 තමන්ගේ ම ප්‍රසිද්ධිය ලැබීමට තැත් කරන
අයගේ ගණයට ඇතුළු වීමට හෝ අප එවැන්නන්
හා සසඳා ගැනීමට හෝ ඉදිරිපත් නොවෙමු.
තමන්ගේ මිම්මෙන් තමන් මනින, සැසඳීමේ මිණුම්
දණ්ඩ තමන් තුළ ම යයි සලකන අය අඥානයෝ ය.
13 එහෙත් සීමාව ඉක්මවා අපි අප ගැන ම පාරට්ටු
කර නොගනිමු. දෙවියන් වහන්සේ ම අපේ සීමාව
නියම කර ඇත. ඒ සීමාවට ඔබ ද ඇතුළත් ය.
14 අන් සියල්ලන්ට ම පෙර ක්‍රිස්තුන් වහන්සේගේ
සුබ අස්න රැගෙන ඔබ වෙත පැමිණි අය අපි වෙමු.
එබැවින් ඔබ ගැන පාරට්ටු කරගැනීමෙන් අපි අපේ
සීමාව ඉක්මවා නොයෙමු. 15 අපගේ නියම සීමාවෙන්
පිට අනිකුත් අයගේ සේවාවන් ගැන අපි පාරට්ටු
කර නොගනිමු. එහෙත් අපගේ සීමාව තුළ, ඔබගේ
ඇදහිල්ල වර්ධනය වන විට, ඔබ අතර අපගේ
සේවය බොහෝ සේ වර්ධනය වනු ඇතැ යි අපි
බලාපොරොත්තු වෙමු. 16 එවිට, අන් කෙනෙකුගේ
පෙදෙසෙක කළ සේවයක් ගැන පාරට්ටු කර
නොගෙන, ඔබගෙන් ඈත පෙදෙස්වල ද, අපට සුබ
අස්න දේශනා කළ හැකි ය. 17 ජෙරෙ 9:24“යමෙක්
පාරට්ටු කිරීමට කැමැති නම්, ස්වාමීන් වහන්සේ
ගැන පාරට්ටු කරාවා”යි ශුද්ධ ලියවිල්ලෙහි කියා ඇති
පරිදි, 18 පිළිගත යුත්තේ ආත්ම ප්‍රශංසාව
සොයන්නා නොව දේව ප්‍රශංසාව ලබන්නා ය.

## පාවුලු තුමා සහ ව්‍යාජ ප්‍රේරිතයෝ

11 මාගේ සුළු අනුවණකමක් ගැන ඉවසන
මෙන් ඉල්ලමි. ඔබ ඉවසන බවට මට
සැකයක් නැත. 2 නිර්මල කන්‍යාවක වැනි ඔබ,
ක්‍රිස්තුන් වහන්සේ වන එක ම ස්වාමියා හට සරණ
පාවා දීම පිණිස මා ගිවිසුම් දුන් බැවින්, මම
දිව්‍යමය හිතවත්කමකින් ඔබ ගැන හිතවත් වෙමි.
3 උත් 3:1-5,13එහෙත් සර්පයා, සිය උපායෙන් ඒව
රැවටුවාක් මෙන්, යම් විධියකින්, ඔබේ සිත් දූෂණය
වී, ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි පැවති ඔබේ
අවංක බව හා නිර්මලතාව පිරිහෙනු ඇත්දැ යි මට
භයක් ඇත. 4 යමෙක් ඔබ වෙත පැමිණ අප ප්‍රකාශ
නොකළ වෙන ජේසුස් කෙනෙකුන් ප්‍රකාශ කරයි
නම්, ඔබ කලින් නොලැබූ වෙනත් ආත්මයක් හා ඔබ
නොපිළිගත් වෙන සුබ අස්නක් ඉදිරිපත් කරයි නම්,
එවැන්නකු පිළිගැනීමට ඔබ සූදානම් ය. එය හරි
කදිම යි! 5 එහෙත් ඔබ මහ ඉහළින් සලකන ඔය
ප්‍රේරිතයන්ට වඩා මම කිසිසේත් පහත් යයි
නොසිතමි. 6 මම කතාවෙහි අදක්ෂවූවත්,
දැනුගත්කමින් අදක්ෂ නොවෙමි. මේ බව හැම
අවස්ථාවක දී, හැම අන්දමකින් ම ඔබට පැහැදිලි
ලෙස දැක්වීමි.
7 ඔබ උසස් කරනු පිණිස මා පහත් වීමෙන් ද
දෙවියන් වහන්සේගේ සුබ අස්න ඔබට නොමිලයේ
දේශනා කිරීමෙන් ද මා කළේ වරදක් ද? 8 ඔබට
සේවය කරන පිණිස, අන් සභාවලින් පැහැරගන්නා
සේ ඔවුන්ගෙන් වැටුප් ගතිමි. 9 පිලිප් 4:15-18තවද,
ඔබ අතර සිටිය දී, අඟහිඟකම් ඇති වූ විට
කිසිවකුට බරක් නොවීමි. මසිදෝනියාවෙන් ආ
සහෝදරයෝ මාගේ අඟහිඟකම් පිරිමැසූ හ.
සියල්ලෙහි දී ඔබට බරක් නොවී සිටීමට ඉටාගතිමි.
මතු ද එසේ කරන්නෙමි. 10 ග්‍රීසියේ පෙදෙස්වල මා
මේ කරන පාරට්ටුව නිහඬ කිරීමට කිසිවකුට ඉඩ
නොතබමි යි ක්‍රිස්තුන් වහන්සේගේ සත්‍යය මා
තුළ ඇති සේ ම දිවුරා කියමි. 11 මෙසේ කියන්නේ
මා ඔබට ප්‍රේම නොකරන නිසා ද? නැත. මා ඔබට
ප්‍රේම කරන බව දෙවියන් වහන්සේ දන්නා සේක.
12 අප හා සම තත්ත්වයක් ඇතැ යි පාරට්ටු
කරගැනීමට අවස්ථා සොයන අයට කිසි අවස්ථාවක්
නොදීම පිණිස මා දැන් කරන දේ මතු ද කරගෙන
යමි. 13 එබඳු අය ව්‍යාජ ප්‍රේරිතවරයෝ ය,
ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේරිතවරයන් මෙන් වෙසේ
වළාගත් වංචනික සේවකයෝ ය. 14 එය පුදුමයක්
නොවේ. සාතන් පවා ආලෝකයේ දූතයකු මෙන්
වෙසේ වළාගනියි. 15 ඒ නිසා ඔහුගේ සේවකයන් ද,
දැහැමිකමේ සේවකයන් මෙන් වෙසේ වළාගැනීම
පුදුමයක් නොවේ. ඔවුන්ගේ අවසානය ඔවුන්ගේ
ක්‍රියා අනුව සිදු වේ.

## ප්‍රේරිත තුමාට පැමිණි උවදුරු

16 මම අඥානයෙක් ය කියා කිසිවෙක් නොසිතිය
යුතු යයි මම නැවතත් කියමි. ඔබ එලෙසෙ සිතන්නහු
නම් මට මඳක් පාරට්ටු කරගැන්මට හැකි වන සේ,
අඥානයකු ලෙස වුව ද මා පිළිගන්න. 17 සැක නැති
ව පාරට්ටු කරගැනීමේ දී මා කියන දේ, සමිඳාණන්
වහන්සේගේ කැමැත්ත අනුව නොව අඥානකමකින්
මෙන් පවසන්නකි. 18 බොහෝ දෙනෙකු ලෞකික
ලෙසෙ පාරට්ටු කරගන්නාක් මෙන්, මම ද පාරට්ටු
කරගනිමි. 19 ඔබ ඥානවන්තයෝ ලූ! එහෙත්
අඥානයන් පිළිගන්නහු ය. 20 යමෙකු ඔබ
වහල්කොට ගත්තත්, ගසාකෑවත්, කොන්කළත්,
හළො දැක්කත්, ඔබේ මුහුණට පහර දුන්නත් ඔබ
ඉවසන්නහු ය. 21 මෙසේ කිරීමට තරම් මා දුර්වල වී
නම් මම ලජ්ජා වෙමි. යමක් ගැන යමෙක් ආඩම්බර
වේ නම්, මටත් එලෙසෙ ආඩම්බර විය හැකි ය. මා
එසේ කියන්නේ අඥානකමින් ය.
22 ඔව්හු හෙබ්රෙව්වරු ද? මමත් එසේ ම ය. ඔව්හු
ඉශ්‍රායලේවරු ද? මමත් එසේ ම ය. ඔව්හු
ආබ්‍රහම්ගේ පෙළෙපතින් පැවත එන්නෝ ද? මමත්
එසේ ම ය. 23 ක්‍රියා 16:23ඔව්හු ක්‍රිස්තුන්
වහන්සේගේ සේවකයෝ ද? මම ඊටත් වැඩියෙන්
උන් වහන්සේගේ සේවකයෙක් වෙමි. මා එසේ
කියන්නේ උමතු වූවකු මෙනි. ඔවුන්ට වඩා මම
බොහෝ සේ වෙහෙසමහන්සි වූයෙමි. වඩා වාර
ගණනක් මම සිරගත වූයෙමි. අප්‍රමාණ ව මම කස
පහර ලදිමි. බොහෝ විට මරුමුවට පවා ළං වී
සිටියෙමි. 24 ද්වි.නී. 25:3ජුදෙව්වරුන්ගෙන් මම
‘තිස්නව-කස-පහර’ පස් වරක් ලදිමි. 25 ක්‍රියා 16:22;
14:19තුන් වරක් මම වේවැල්වලින් තැළුම් කෑවෙමි.
එක වරක් ගල් ගසනු ලැබීමි. තුන් වරක් නැව
විනාශ වීමේ උවදුරට භාජන වීමි. මුළු රැයක් හා
දවාලක් මම මුහුදේ සිටියෙමි. 26 ක්‍රියා 9:23;
14:15මාගේ අනේක ගමන්වල දී, ගංගා උවදුරුවලට
ද සොර උවදුරුවලට ද ස්වජාතික ජුදෙව්වරුන්ගෙන්
පැමිණි උවදුරුවලට ද විජාතිකයන්ගෙන් පැමිණි
උවදුරුවලට ද නගරවල උවදුරුවලට ද වනයෙහි
උවදුරුවලට ද මුහුදේ උවදුරුවලට ද ව්‍යාජ
සහෝදරයන්ගෙන් පැමිණෙන උවදුරුවලට ද භාජන
වුණෙමි. 27 මහත් දුෂ්කරතා මැද මම වෙහෙසෙ
මහන්සි වී වැඩ කළෙමි. නොයෙක් විට නිදි
නොලැබ සිටියෙමි; සාගින්නෙන් ද පිපාසයෙන් ද
පෙළුණෙමි; බොහෝ විට ආහාර ද ඉඳුම්හිටුම් ද
ඇඳුම්පැළඳුම් ද නැති ව සිටියෙමි. 28 මේ බාහිර දේ
හැර, සියලු සභාවන් ගැන මාගේ සිතේ බරක්
දිනපතා ම මට ඇත. 29 යමෙක් දුර්වල නම් ඒ
දුර්වලකම මටත් නොදැනේ ද? යමෙක් පාපයට
වැටුණොත් මම සංවේගයෙන් නොදැවෙම් ද?
30 පාරට්ටු කරගැනීම අවශ්‍ය ම නම්, මම මාගේ
දුර්වලකම සම්බන්ධ කාරණා ගැන පාරට්ටු
කරගන්නෙමි. 31 මා බොරු නොකියන බව, අපගේ
ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ

පියාණන් වූ සදහට ම පැසසුම් ලබන දෙවියන්
වහන්සේ දන්නා සේක. 32 ක්‍රියා 9:23-25මා
දමස්කයේ සිටිය දී අරතෙස් රජු යටතේ සිටි
ආණ්ඩුකාරයා මා අල්ලාගන්නා පිණිස දමස්කස්
නගරය මුර කළ නමුත්, 33 මම, කූඩයක බහා,
පවුරේ කපොල්ලකින් බස්වනු ලැබ ඔහු අතින්
ගැළවී ගියෙමි.

## දුර්වලකමේ දී ශක්තිය

12 පාරට්ටු කරගැනීමෙන් වැඩක් නැති වුවත්
මට එසේ නොකර ඉන්න බැරි ය. එහෙත්
සමිඳාණන් වහන්සේගෙන් මා ලත් දර්ශන හා
එළිදරව් කිරීම් ගැන කතා කරමි. 2 දසසතර
වසරකට පෙර, තුන් වන ස්වර්ගය දක්වා ඔසවාගනු
ලැබූ කිතුනුවකු මම දනිමි. එසේ වූයේ ශරීරයෙන්
යුක්ත ව ද, නොහොත් ශරීරයෙන් වියුක්ත ව දැ යි
මම නොදනිමි. දෙවියන් වහන්සේ දන්නා සේක. 3 ඒ
මිනිසා පාරාදීසයට ඔසවාගනු ලැබ, මිනිස් මුවින්
නොපැවසිය යුතු, නොපැවසිය හැකි වචන ඇසූ බව
දනිමි. 4 එසේ වූයේ ශරීරය ඇති ව ද ශරීරය නැති
ව දැ යි මම නොදනිමි. දෙවියන් වහන්සේ දන්නා
සේක. 5 එබඳු මිනිසකු ගැන මම පාරට්ටු කරමි.
එහෙත් මාගේ ම දුර්වලකම් ගැන මිස, මා ගැන ම
පාරට්ටු කර නොගනිමි. 6 පාරට්ටු කරගන්න මා
අදහස් කළත්, මා ඇත්ත පවසන නිසා එසේ කිරීම
අනුවණ කමක් නොවේ. එහෙත්, මා කරන දේ
දැකීමෙන් ද මා ගැන ඇසීමෙන් ද යමකුට ඇති වන
අදහසට වඩා උසස් අදහසක් මා ගැන ඇති නොවන
පිණිස මම එයින් වැළකෙමි.
7 ඒ එළිදරව් කිරීම්වල අති උතුම්කම
කරණකොටගෙන, මා හිස උදුම්මා නොගන්නා
පිණිස, මට පහර දීමට සාතන්ගේ දූතයකු වැනි,
ශරීරයේ කාවැදුණු කටුවක් හා සමාන පීඩාවක් මට
දෙන ලද්දේ ය. එසේ වූයේ මා හිස උදුම්මා
නොගන්නා පිණිස ය. 8 එය ඉවත් කරන මෙන් තුන්
වරක් මම සමිඳාණන් වහන්සේගෙන් ඉල්ලුවෙමි.
9 උන් වහන්සේ පිළිතුරු දෙමින්, “මාගේ බලය
පරිපූර්ණ වන්නේ දුර්වලකමේ දී බැවින්, මාගේ
වරප්‍රසාදය ඔබට සෑහේ”යයි වදාළ සේක. එබැවින්
ක්‍රිස්තුන් වහන්සේගේ ශක්තිය මා කෙරෙහි
පිහිටන පිණිස, මාගේ දුර්වලකම් ගැන ඉතා
සන්තෝෂයෙන් පාරට්ටු කරන්නෙමි. 10 එහෙයින්
ක්‍රිස්තුන් වහන්සේ උදෙසා පැමිණෙන දුර්වලකම් ද
අන්තරා ද අගහිඟකම් ද පීඩා ද විපත්ති ද මම
සතුටින් පිළිගනිමි. මක්නිසා ද යත්, දුර්වල ව සිටිය දී
ම මම ශක්තිසම්පන්න ව සිටිමි.

## කොරින්තිවරුන් ගැන පාවුලු තුමාගේ සංවේගය

11 මා අනුවණයකු මෙන් කතා කළ බව ඇත්ත ය.
එයට වගකිව යුත්තේ ඔබ ම ය. ඔබ කළ යුතු ව
තිබුණේ මා ගැන සාක්ෂි දැරීම ය. මා නිකමකු
වුවත්, මම කිසිසේත් ඔය උත්කෘෂ්ට ප්‍රේරිතවරුන්ට
දෙවන තත්ත්වයේ නොවෙමි. 12 සැබැවින් ම
ලකුණු ද අරුමපුදුම දේ ද ප්‍රබල ක්‍රියා ද ඔබ
අතර නොපිරිහෙළා කිරීමෙන්, ප්‍රේරිතවරයකුගේ
ගුණාංග මට ඇති බව දැක්වීමි. 13 මා ඔබට දැක්වූ
සැලකිල්ල, අන් සභාවලට දැක්වූ සැලකිල්ලට වඩා
කිසි ලෙසෙකින් අඩු වී ද? ඇති වූ එක ම අඩුව නම්,
මා ඔබට බරක් නොවීම ය. ඒ වරද ගැන මට සමා
වන්න.
14 මම දැන් තුන් වන වරටත් ඔබ වෙත එන්නට
සූදානම් ව සිටිමි. එහෙත් මම ඔබට බරක්
නොවෙමි. මට වුවමනා ව තිබෙන්නේ ඔබේ දේපළ
නොව, ඔබ ම ය. එසේ කියන්නේ දරුවන්
දෙමව්පියන් උදෙසා නොව, දෙමව්පියන් දරුවන්
උදෙසා මුදල් ඉතිරි කළ යුතු බැවිනි. 15 ඔබ උදෙසා
මට ඇති දේ වියදම් කරන්ටත්, මම මුළුමනින් ම
වැය වෙන්ටත් ඉතා සතුටු වෙමි. මා ඔබට අධික
ලෙස ප්‍රේම කරන බැවින් ඔබ මට අඩුවෙන් ප්‍රේම
කරන්නහු ද?
16 මා ඔබට බරක් නුවූ බව ඔබ පිළිගන්නා අතර,
මා කපටියකු බැවින් ප්‍රයෝගයෙන් ඔබ
අල්ලාගත්තේ යයි යමකු කියනු ඇත. 17 මා ඔබ
වෙත එවූ අයගෙන් යමකු ලවා ඔබගෙන් අයුතු
වාසියක් ලබාගතිම් ද? 18 ඔබ වෙත යන ලෙස මා
තීතස්ගෙන් උදක් ම ඉල්ලා ඔහු සමඟ ඒ සහෝදරයා
එවීමි. තීතස් ඔබෙන් අයුතු වාසියක් ලබාගත්තේ ද?
අපි එක ම ආත්මයාණන්ගෙන් මඟපෙන්වීම ලබා,
එක ම මාර්ගයේ ගමන් නොකෙළෙමු ද?
19 මෙතෙක් කල් ඔබ ඉදිරියේ අපේ නිදොස් බව
දැක්වීමට අපි තැත් කෙළෙමු යයි ඔබට සිතිය හැකි
ය. එසේ නොවේ; අප කතා කරන්නේ දෙවියන්
වහන්සේ ඉදිරියෙහි කිතුනුවන් මෙන් ය.
ප්‍රේමවන්තයෙනි, මේ සියල්ල ඔබගේ අභිවෘද්ධිය
උදෙසා ය. 20 ඔබ වෙත පැමිණි විට, මා සිතනවාට
වඩා ඔබ වෙනස් වී ඇද්දෝ කියාත්, ඔබ සිතනවාට
වඩා මා වෙනස් වී ඇද්දෝ කියාත් මට බියක් ඇත.
යම් විධියකින් ආරාවුල්, ඊර්ෂ්‍යා, ක්‍රෝධ,
පක්ෂවාදිකම්, කෙළාම්, ඕපාදූප, අහංකාරය හා
අවුල්වියවුල් ආදිය ද, ඔබ අතර තිබේ දෝ යි මට
බියක් තිබේ. 21 මා නැවත ආ කල, මාගේ දෙවියන්
වහන්සේ ඔබ ඉදිරියේ මා පහත් කරනු ඇද්දැ යි
කියා ද, පව්කොට, තමන් කළ අපිරිසිදුකම ද
වේශ්‍යාකම ද සල්ලාලකම ද ගැන මෙතෙක් පසුතැවී
සිත් හරවා නොගත් බොහෝ දෙනා ගැන මට
වැලපෙන්නට වේ දෝ කියා ද බිය වෙමි.

## අවවාද හා සුබ පැතුම්

13 ද්වි.නී. 17:6; 19:15 මා ඔබ වෙත එන තුන්
වන වතාවයි මේ. “හැම පැමිණිල්ලක් ම
සාක්ෂිකරුවන් දෙදෙනෙකුගේ හෝ තුන්දෙනෙකුගේ
සාක්ෂිවලින් ස්ථිර විය යුතු ය”යි ලියා තිබේ. 2 මම
නැවත ඔබ වෙත පැමිණියොත් මේ දක්වා පව් කළ
අයටත්, අනෙක් සියල්ලන්ටත් සත්තකින් ම දඬුවම්
කරන බව කියමි. ඒ බව දෙ වන වතාවේ දී ඔබ
සමඟ සිටිය දී කල් තියා ඔබට කීවෙමි. දැන් ඔබෙන්

ඈත් ව සිටියදීත් එසේ ම කල් තියා ඔබට කියමි.
3 එවිට මා තුළින් ක්‍රිස්තුන් වහන්සේ කතා කරන
බවට ඔබ සොයන සාක්ෂිය ඔබට ලැබෙනු ඇත.
ක්‍රිස්තුන් වහන්සේ ඔබ පිළිබඳ ව දුර්වල ලෙස
නොව, බලවත් ලෙස ක්‍රියා කරන සේක. 4 උන්
වහන්සේ දුර්වලකමින් කුරුසියෙහි ඇණ ගසනු ලැබූ
නමුත්, දෙවියන් වහන්සේගේ බලයෙන් ජීවත්වන
සේක. එසේ ම අපි ද උන් වහන්සේගේ
දුර්වලකමට පංගුකාරයන් ව සිටින නමුත්, දෙවියන්
වහන්සේගේ බලයෙන් උන් වහන්සේ සමඟ ඔබ
උදෙසා ජීවත් වන්නෙමු.
5 ඔබ ඇදහිල්ලේ පවතින්නහු ද කියා ඔබ ම
සෝදිසි කර බලන්න; විමසා බලන්න. ක්‍රිස්තුන්
වහන්සේ ඔබ තුළ වැඩවසන බව ඔබ නොදන්නහු
ද? නොදන්නහු නම් ඔබ පරාජිතයෝ වන්නහු ය.
6 එහෙත් අප පරාජිතයන් නොවන බව ඔබ දැනගනු
ඇතැ යි මම බලාපොරොත්තු වෙමි. 7 ඔබ කිසි
නපුරක් නොකරන ලෙස අපි දෙවියන් වහන්සේට
යාච්ඤා කරමු. එසේ කරන්නේ අප ජයග්‍රාහකයන්
මෙන් පෙනේනුම් කරන පිණිස නොව, අප පරාජිතයන්
මෙන් පෙනුනත් ඔබ යුතු දේ කරන පිණිස ය.
8 සත්‍යයට පක්ෂ ව මිස සත්‍යයට විපක්ෂ ව
කිසිවක් අපට කළ නොහැකි ය. 9 අප දුර්වල ව
සිටිය දී ඔබ ශක්තිමත් ව සිටීම අපට ප්‍රීතියකි.
තවද, ඔබගේ සම්පූර්ණත්වය සඳහා අපි යාච්ඤා
කරමු. 10 මා ඔබෙන් ඈත් ව සිටිය දී, මේ කරුණු
ඔබට ලියා එවන්නේ, මා ඔබ වෙතට පැමිණි විට,
තදින් ක්‍රියා කිරීමට මාගේ අධිකාරි බලය යෙදීම
වුවමනා නොවන පිණිස ය. සමිඳාණන් වහන්සේ
මේ ආධිපත්‍යය මට දෙවො වදාළේ, බිඳ හෙළීමට
නොව, ගොඩනැඟීමට ය.

### ආචාරය

11 ඉතින් සහෝදරවරුනි, ආයුබෝවන්.
පරිපූර්ණත්වය සොයා යන්න; මාගේ අවවාද සිතට
ගන්න; එක්සිත් වන්න; සාමදානයෙන් සිටින්න. එවිට
ප්‍රේමාන්විත හා ශාන්තිදායක දෙවියන් වහන්සේ
ඔබ සමඟ වැඩසිටින සේක. 12 සාම සිඹීමකින්
එකිනෙකාට ආචාර කරන්න.
13 සියලු සැදැහැවත්හු ඔබට ආචාර කරති.
q213 ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ
කරුණාව ද දෙවියන් වහන්සේගේ ප්‍රේමය ද
ශුද්ධාත්මයාණන් වහන්සේගේ සහභාගිකම ද ඔබ
සියල්ලන් සමඟ වේ වා!

### සෙසු ප්‍රේරිතවරුන් පාවුලු තුමා පිළිගැනීම

2 ක්‍රියා 11:30; 15:2 අවුරුදු දහ හතරකට පසු
මම බාර්ණබස් සමඟ තීතස් ද කැඳවාගෙන
නැවත ජෙරුසලමට ගියෙමි. 2 මා එසේ ගියේ, මට
දේව මඟ පෙන්වීමක් ලැබුණු බැවිනි. මා විජාතීන්ට
දේශනා කළ සුබ අස්න එහි සිටි ප්‍රධානීන්
ඉදිරියෙහි රහසිගත ව තැබීමි. එසේ කළේ මා පෙර
කළ, දැන් කරන, සේවය නිෂ්ප්‍රභ නොවන පිණිස
ය. 3 මාගේ සහකාර තීතස්, ග්‍රීකයෙකු වුව ද, ඔහු
චර්මඡේදනය කිරීමට බල නොකරන ලදී. 4 මේ
ප්‍රශ්නය මතු වූයේ කිතුනු සහභාගිකම තුළ අප
භුක්ති විඳින නිදහස ගැන ඔත්තු බලන්න අප
අතරට රිංගාගත් ව්‍යාජ ක්‍රිස්තියානීන් නිසා ය.
මොවුන් අප වහල් කරගැනීමට තැත් කළ නමුත්
5 සුබ අස්නේ සත්‍යතාව ඔබ උදෙසා පවිත්‍ර ව
තබාගන්නා පිණිස, මොහොතක් වත් අපි ඔවුන්ට
යටත් නොවීමු.
6 ද්වි.නී. 10:17 ප්‍රධානීන් යයි සිතූ ඒ අයගෙන්
අමුතු අදහසක් ලැබුණේ නැත. ඔවුන්ගේ
වැදගත්කම ගැන මට කමක් නැත. දෙවියන්
වහන්සේ කිසි ම පුද්ගලයෙකුගේ තරාතිරම්
නොබලන සේක. 7 අනෙක් අතට, චර්මඡේදනය
ලත් අයට සුබ අස්න දේශනා කිරීම පේදුරුට
භාරවූවාක් මෙන්, චර්මඡේදනය නොලත් අයට එය
දේශනා කිරීම මට භාර කරන ලද බව ඔව්හු
පිළිගත්හ. 8 චර්මඡේදනය ලත් අයගේ ප්‍රේරිතයා
වශයෙන් පේදුරු පත් කළ තැනැන් වහන්සේ ම
විජාතීන්ගේ ප්‍රේරිතයා ලෙස මා පත් කළ සේක.
9 මේ සේවය මට භාර දුන් බව පිළිගත් සභා
නායකයන් වන ජාකොබ්, පේදුරු සහ ජොහන් අතට
අත දී බාර්ණබස් ද මා ද පංගුකාරකමට පිළිගෙන,
විජාතීන් වෙත අප ද ජුදෙව්වන් වෙත ඔවුන් ද යා
යුතු යයි තීරණය කළහ. 10 ඔවුන් අපෙන් කළ එක
ම ඉල්ලීම නම් දිළිඳුන් සිහි කරන ලෙස ය. මා
කරන්න ආශාවෙන් සිටියේත් එය ම ය.

### පේදුරු තුමාට තරවටු කිරීම

11 පේදුරු අන්තියෝකියට ආ විට ඔහු වරදක් කර
තිබුණ බැවින් මම එළිපිට ම ඔහුට විරුද්ධ වීමි. 12 ඒ
වරද නම්, ඇතැම් අය ජාකොබ් වෙතින් එන්න
ප්‍රථම ඔහු විජාතීන් සමඟ ආහාර වැළඳූ නමුත්,
ඔවුන් පැමිණියාට පසු චර්මඡේදනවාදීන්ට භය ව,
පසුබැස, වෙන් ව සිටීම යි. 13 ඔහු සමඟ අනෙක්
ජුදෙව්වරු ද චපල ලෙස ක්‍රියා කළහ. බාර්ණබස්
පවා ඔවුන්ගේ චපලකමින් මුළාවිය. 14 එහෙත්
ඔවුන්ගේ හැසිරීම සුබ අස්නේ සත්‍යයට පටහැනි
බව දුටු මම මුළු සමූහයා ඉදිරියේ පේදුරුට මෙසේ
කීවෙමි. “ඔබ ජුදෙව්වරයෙකු වන නමුත්,
ජුදෙව්වරයෙකු සේ නොව, විජාතිකයෙකු සේ ජීවත්
වූවෙහි ය. එසේ නම් විජාතීන් ජුදෙව්වරුන් සේ
ජීවත් විය යුතු යයි ඔබ ඔවුන්ට බල කරන්නේ
කෙසේ ද?”

### ඇදහිල්ලේ විමුක්තිය

15 අපි විජාතික පව්කාරයෝ නොව, උත්පත්තියෙන්
ම ජුදෙව්වරු ය. 16 ගීතා 143:2; රෝම 3:20,22එහෙත්
ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන්
මිස ව්‍යවස්ථාවේ ක්‍රියාවලින් මනුෂ්‍යයෙකු දමිටු
කරනු නොලබන බව අපි දනිමු. ඒ නිසා
ව්‍යවස්ථාවේ ක්‍රියාවලින් නොව, ක්‍රිස්තුන්
වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් දමිටු කරනු ලබන

පිණිස, ක්‍රිස්තුන් වහන්සේ අදහාගතිමු. මන්ද,
ව්‍යවස්ථාවේ ක්‍රියාවලින් කවර මනුෂ්‍යයකේ වත්
දමිටුකරනු නාොලබයි. 17 ක්‍රිස්තුන් වහන්සේ මඟින්
දමිටුකම සායෙන අපි විජාතීන් මනේ පව් කරන්නන්
හැටියට ගණන්ගැනමෙු නම්, ක්‍රිස්තුන් වහන්සේ
පාපයට අනුබල දනෙ සකේැ යි කිව හැකි ද?
කාොහතේ ම නැත. 18 මා බිඳ හළෙු දේ ම මම
නැවත ගාොඩනඟන්නමේ නම්, මා ව්‍යවස්ථාව කඩ
කරන්නකෙු බව මා අතින් ම ඔප්පු වේ. 19 ඇරත්
දවේයන් වහන්සේ උදසො ජීවත් වන පිණිස මම
ව්‍යවස්ථාවට කීකරු වන අතර ව්‍යවස්ථාව මළ
දයෙක් ලසෙ සලකා එය ප්‍රතික්ෂේප කළෙමේ.
20 මම ක්‍රිස්තුන් වහන්සේ සමඟ කුරුසියහෙි ඇණ
ගසනු ලැබ සිටිමි; ඉතින් දැන් ජීවත් වන්නේ මා
නාොවේ; ක්‍රිස්තුන් වහන්සේ මා තුළ ජීවත් වන
සකේ. තවද මා දැන් මාංසයහෙි ජීවත් වන ජීවිතය
මට ප්‍රමේ කළ මා උදසො සිය දිවි දුන්, දවේයන්
වහන්සගේේ පුත්‍රයාණන් වහන්සේ කරෙහෙි
ඇදහිල්ලනේ ජීවත් වමේ. 21 දවේයන් වහන්සගේේ
කරුණාව නිෂ්ප්‍රභ නාොකරමි. මන්ද, ව්‍යවස්ථාව
මඟින් දමිටු බව ඇතිකර ගත හැකි නම් ක්‍රිස්තුන්
වහන්සගේේ මරණයේ තර්ේුමක් නැත.

## ව්‍යවස්ථාව ඉක්මවන ඇදහිල්ල

3 අඥාන ගලාතිවරුනි, ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේ කුරුසියහෙි ඇණ ගසන ලද වග
ඔබගේ ඇස් ඉදිරියහෙි ප්‍රසිද්ධ ලසෙ දක්වනු ලැබූ
නමුත් ඔබ ඇස් බැන්දුමකින් මුළා කළහෝ කවරහු ද?
2 ඔබනේ මයෙ පමණක් දැනගනු කැමැත්තමේ. ඔබ
ආත්මයාණන් වහන්සේ ලැබවුේ ව්‍යවස්ථාවේ
ක්‍රියා කරණකාොටගනෙ ද? නැතහාොත් සුබ අස්නේ
පණිවුඩය පිළිගැනීමනේ ද? 3 ඇත්තට ම ඔබ ඔය
තරම් මෝඩ ද? ඔබ දේවාත්මානුභාවයනේ
පටන්ගනෙ, පිටස්තර, චාරිත්‍රයකින් ගැළවීම ලබන්න
සිතන්නහු ද? 4 ඔබට ඇති වූ සියලු අත්දැකීම්
නිෂ්ඵල වී ගියේ ද? එසේ නාොවිය හැකි ය.
5 දවේයන් වහන්සේ ආත්මයාණන් එවා, ඔබ අතර
හාස්කම් කරන්නේ ඔබ ව්‍යවස්ථාව පිළිපදින නිසා ද,
නැත්නම් සුබ අස්නේ පණිවුඩය අසා එය අදහන
නිසා ද?
6 උත් 15:6; රෝම 4:3 ආබ්‍රහම් ගැන සිතන්න.
ඔහු දවේයන් වහන්සේ අදහාගත්තේ ය. ඒ ඇදහීම
දමිටු බව හැටියට ගණන්ගන්නා ලදී. 7 රෝම
4:16එබැවින් ආබ්‍රහම්ගේ සැබෑ පුත්‍රයෝ ඇදහිල්ල
ඇති අය වති. 8 උත් 12:3තවද දවේයන් වහන්සේ
ඇදහිල්ල කරණකාොටගනෙ විජාතීන් දමිටු බවට පත්
කරන බව ශුද්ධ ලියවිල්ල කල්මත්තනේ දැක, “ඔබ
තුළ සියලු ම ජාතීහු ආශීර්වාද ලබන්නෝ ය” කියා
සුබ අස්න කලින් ආබ්‍රහම්ට ප්‍රකාශ කළේ ය.
9 මසෙේ ඇදහිල්ලහෙි පිහිටි සියල්ලෝ ඇදහිල්ලේ
පිහිටි ආබ්‍රහම් සමඟ ආශීර්වාද ලබති.
10 ද්වි.නී. 27:26 අනකේ අතට, ව්‍යවස්ථාව කරෙහෙි
විශ්වාසය තබන්නෝ සාපයට යටත් ව සිටිති. එසේ
වන්නේ: “ව්‍යවස්ථාව පාොතහෙි ලියා ඇති සියල්ල ම
නාොකඩවා නාොරකින සියලු දනොට ම සාපයක්
ඇතැ”යි ලියා තිබනෙ බැවිනි. 11 හබ 2:4ව්‍යවස්ථාව
කරණකාොටගනෙ කිසිවකෙු දමිටු බවට පත් කරනු
නාොලබන බව එයින් පැහැදිලි ය. මන්ද,
ඇදහිල්ලනේ දමිටු බවට පැමිණි අය ජීවත් වන්නෝ
ය. 12 ලවේ 18:5ව්‍යවස්ථාව ඇදහිල්ල පිට රඳා
පවතින්නක් නාොවේ. එහතේ ව්‍යවස්ථාව පිළිපදින
තැනැත්තා එයින් ජීවත් වන්නේ ය කියා ශුද්ධ
ලියවිල්ලේ ලියා ඇත.
13 ද්වි.නී. 21:23 “ගසක එල්ලනු ලබන සියල්ලෝ
සාප ලද්දෝ ය”යි ශුද්ධ ලියවිල්ලේ ලියා තිබනෙ
ලසෙ, ක්‍රිස්තුන් වහන්සේ අප උදසො එම සාපය
විඳ, ව්‍යවස්ථාවේ සාපයනේ අප මුදාගත් සකේ.
14 මසෙේ කළෙේ ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ
මඟින් ආබ්‍රහම් ලත් ආශීර්වාදය අන්‍ය විජාතීන්
කරෙහෙි පැමිණනෙ පිණිසත් ඇදහිල්ල
කරණකාොටගනෙ ආත්මයාණන් වහන්සගේේ
පාොරාොන්දුව අප විසින් ලබාගන්නා පිණිසත් ය.

## ව්‍යවස්ථාව හා පාොරාොන්දුව

15 සහෝදරවරුනි, මම එදිනදො ජීවිතයනේ
උදාහරණයක් දක්වමි. යම් කනෙකෙුගේ ගිවිසුම්
පත්‍රයක් ස්ථිර කරනු ලැබූ පසු, වනෙ කනෙකෙුට
එය අවලංගු කරන්න වත්, ඊට යමක් එකතු කරන්න
වත් බැරි ය. 16 උත් 12:7පාොරාොන්දු දනෙ ලද්දේ
ආබ්‍රහම්ට හා ඔහුගේ වංශයට ය.
බහුවචනාර්ථයනේ ‘වංශයන්ට ය’ නාොකියා ඒක
වචනාර්ථයනේ ‘නුඹේ වංශයට ය’යි උන් වහන්සේ
වදාළ සකේ. ‘වංශය’ යන්නනේ අදහස් කරන ලද්දේ
ක්‍රිස්තුන් වහන්සේ ය. 17 නික්ම 12:40මා කියන්නේ
මයෙ යි: දවේයන් වහන්සේ විසින් කලින් ස්ථිර
කරන ලද ගිවිසුමක් ඊට හාරසිය තිස් අවුරුද්දකට
පසු පැමිණි ව්‍යවස්ථාවනේ අවලංගු කරන්න වත්,
පාොරාොන්දු නිෂ්ප්‍රභ කරන්න වත් නාොහැකි ය.
18 රෝම 4:14උරුමයක් හිමි වන්නේ ව්‍යවස්ථාවනේ
නම්, එය පාොරාොන්දුවේ ප්‍රතිඵලයක් නාොවේ.
දවේයන් වහන්සේ ආබ්‍රහම්ට ඒ උරුමය දුන්නේ
පාොරාොන්දුවක් අනුව ය.
19 එසේ නම් ව්‍යවස්ථාව කුමට ද? එය දනෙ
ලද්දේ පාොරාොන්දුව ලැබූ ‘වංශය’ වූ ක්‍රිස්තුන්
වහන්සේ එන තකේ නීති විරෝධී ක්‍රියා මේ යයි
පනේවා දනෙ පිණිස ය. තවද, එය දනෙ ලද්දේ
මැදහත්කාරයකෙු අතින් දේව දූතයන් විසිනි. 20 එක්
කනෙකෙු උදසො මැදහත්කාරයකේ වුවමනා නැත.
දවේයන් වහන්සේ එක් කනෙකේ ම ය.

## ව්‍යවස්ථාව හා ඇදහිල්ල

21 එසේ නම් ව්‍යවස්ථාව දවේයන් වහන්සගේේ
පාොරාොන්දුවලට විරුද්ධ ද? කාොහතේ ම නැත,
මන්ද, ජීවනය දිය හැකි ව්‍යවස්ථාවක් දනෙ ලද්දේ

නම්, ඒ මඟින් දමිටු බවට පත් කරනු ලැබීමට
පුළුවන්කම තිබිණි. 22 එහෙත් මුළු ලොව ම
පාපයෙහි සිරගත වී ඇතැ යි ශුද්ධ ලියවිල්ලෙහි කියා
ඇති බැවින්, අදහන අයට පමණක් ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේ තුළින් ඇදහිල්ල කරණකොටගෙන
පොරොන්දුව ලබාගත හැකි ය.
23 පැමිණෙන්ට තිබුණු ඇදහීම එළිදරව් වන තෙක්,
ඒ ඇදහීම පැමිණෙන්ට පෙරෙ, අපි හිර අඩස්සි වී
ව්‍යවස්ථාව යටතේ රැකවල් කරනු ලැබුවෙමු.
24 මෙසේ ව්‍යවස්ථාව වනාහි අප ඇදහිල්ල
කරණකොටගෙන දමිටු බවට පත් කරනු ලබන
පිණිස, අප ක්‍රිස්තුන් වහන්සේ ළඟට පමුණුවන
අපේ අනුශාසකයකු වැනි ය. 25 එහෙත් දැන්
ඇදහිල්ල පැමිණ තිබෙන බැවින්, අපි තවත්
අනුශාසකයකු යටතේ නොවෙමු.
26 ඔබ සියල්ලෝ ම ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ
තුළ ඇදහිල්ල කරණකොටගෙන දෙවියන්
වහන්සේගේ පුත්‍රයෝ ය. 27 ඔබ අතරෙන්
ක්‍රිස්තුන් වහන්සේගේ නාමයට බව්තීස්ම-ස්නාපනය
කරනු ලැබූ සියල්ලෝ ක්‍රිස්තුන් වහන්සේගේ
ජීවිතයෙන් සැරසී සිටිති. 28 ඔබ සියල්ලන් ක්‍රිස්තුස්
ජේසුස් වහන්සේ තුළ එක් කෙනෙකු මෙන් සිටින
නිසා, ජුදෙව්-ග්‍රීක භේදය වත්, දාස-නිර්දාස භේදය
වත්, ස්ත්‍රී-පුරුෂ භේදය වත් නැත. 29 රෝම
4:13ඔබ ක්‍රිස්තුන් වහන්සේට අයිති නම්, ඔබ
ආබ්‍රහම්ගේ වංශයට අයිති ව, පොරොන්දුව ලෙසෙ
උරුමක්කාරයෝ ද වන්නහු ය.

### දේව දරුකම ලැබීම

4 මා අදහස් කරන්නේ මෙයෙ යි: උරුමක්කාරයා
සියල්ලට ම හිමිකාරයා වන නමුත්, ඔහු බාල
වයස් කාරයකු ව සිටින තාක්, දාසයකුට වඩා
වෙනසක් නැත. 2 පියා නියම කළ වයසට පැමිණෙන
තුරු උරුමක්කාරයා භාරකාරයන් හා වගකිව යුතු අය
යටතෙහි සිටියි. 3 එසේ ම අපිත් බාල වයස්කාරයන්
ව සිටිය දී විශ්වයේ දේවදේවතාවන්ට වහල් ව
සිටියෙමු. 4 එහෙත් කාලය සම්පූර්ණ වූ කල,
දෙවියන් වහන්සේ ස්ත්‍රියකගෙන් උපත ලත්,
ව්‍යවස්ථාව යටතේ උපන්, සිය පුත්‍රයාණන් එවා
වදාළ සේක. 5 රෝම 8:15-17එසේ කළේ අප
දරුකම ලබනු වස් උන් වහන්සේ විසින් ව්‍යවස්ථාව
යටතෙහි සිටි අය මුදාගන්නා පිණිස ය. 6 තවද ඔබ
පුත්‍රයන් බව ඔප්පු කරන පිණිස, “අබ්බා,
පියාණෙනි,” කියා හඬ ගසන තම පුත්‍රයාණන්ගේ
ආත්මය දෙවියන් වහන්සේ අපේ සිත්වලට එවා
වදාළ සේක. 7 මෙසේ ඔබ තවදුරටත් දාසයකු
නොව පුත්‍රයෙකි. පුත්‍රයෙකු නම්, දේව වරමින්
උරුමක්කාරයෙකි.

### ගලාතිවරුන් ගැන සැලකිල්ල

8 එසේ වුව ද ඔබ ඒ කාලයේ දී දෙවියන්
වහන්සේ නොහැඳින, සැබැවින් ම දෙවිවරුන්
නොවන අයට වහල් ව සිටියහු ය. 9 එහෙත් දැන්
ඔබ දෙවියන් වහන්සේ පිළිගෙන තිබිය දී,
නොහොත් දෙවියන් වහන්සේ ඔබ පිළිගෙන තිබිය
දී, ඔබ ඒ දුර්වල, නිෂ්ඵල දේවදේවතාවුන්ට
වහල්වීමේ ආශාවෙන්, නැවත ඔවුන් දෙසට
හැරෙන්නේ කෙසේ ද? 10 ඔබ විශේෂ දවස්, මාස,
කාල හා අවුරුදු පවත්වන්නහු ය. 11 සමහර විට ඔබ
උදෙසා මා දැරූ වෙහෙස නිෂ්ඵල වී දැ යි ඔබ ගැන
මට බියක් ඇත.
12 සහෝදරවරුනි, මා ඔබෙන් උදක් ම ඉල්ලන්නේ
ඔබත් මා හා සමාන වන්නට කියා ය. වරක් මමත්
ඔබ හා සමාන ව සිටියෙමි. ඔබ මට කිසි වරදක්
කළේ නැත. 13 මා මුලින් සුබ අස්න ගෙනාවේ මට
ශරීරාබාධයක් තිබූ නිසා බව ඔබ දන්නහු ය.
14 එහෙත් මාගේ ආබාධය ඔබට කරදරයක් වුව ද,
ඒ නිසා ඔබ මා පිළිකුල් කළේවත්, මට ද්වේෂ
කළේවත් නැත. එසේ නොව දෙවියන් වහන්සේගේ
දූතයකු මෙන් ද එපමණක් නොව ක්‍රිස්තුස් ජේසුස්
වහන්සේ ම මෙන් ද ඔබ මා පිළිගත්තහු ය.
15 එසේ නම්, ඔබට තිබුණු ඒ ප්‍රීතිය දැන් කොයි
ද? ඔබගේ ඇස් උගුළා මට දෙන තරමට වුව ද ඔබ
සූදානම් ව සිටි බව සහතික ලෙසෙ කිව හැකි ය.
16 දැන් මා ඇත්ත කතා කරන නිසා ම මම ඔබට
සතුරෙකු වී සිටිම් ද?
17 මා ඉහත සඳහන් කළ පුද්ගලයන් ඔබට
හිතවත්කමක් දක්වන නමුත්, එසේ කරන්නේ හොඳ
අදහසකින් නොවේ. ඔවුන්ගේ අදහස නම්, ඔබ මා
කෙරෙන් වෙන් කොටගෙන ඔබගේ සිත් දිනා ගැනීම
යි. 18 යහපත සඳහා මිනිසුන්ගේ සිත් දිනාගැනීම, මා
ඔබ සමඟ සිටින විට පමණක් නොව, කොයි
වේලේත් හොඳ දෙයෙකි. 19 මාගේ දරුවෙනි, ඔබ
තුළ ක්‍රිස්තු ගතිගුණ හැඩගැසෙන තුරු, ඔබ උදෙසා
නැවතත් මම ප්‍රසව වේදනා විඳිමි. 20 ඒ නිසා හැකි
නම් ඔබ සමඟ සිට වෙන පිළිවෙළෙකට ඔබට කතා
කරන්න කැමැත්තෙමි. මන්ද, ඔබ ගැන මාගේ සිත
වියවුල් වී තිබේ.

### ගිවිසුමේ පූර්වාදර්ශ: සාරා හා හාගර්

21 ව්‍යවස්ථාව පිළිපැදීමට ඔපමණ ආශා ඇති ඔබ,
ව්‍යවස්ථාවේ ප්‍රකාශ කරන දේ අසන්නේ නැද් ද?
මේ දේ මට කියන්න. 22 උත් 16:15; 21:2ආබ්‍රහම්ට
පුත්‍රයන් දෙදෙනෙකු සිටි බව එහි කියා ඇත. එක්
දරුවෙකු වහල් ස්ත්‍රියගෙනි. අනික් දරුවා නිවහල්
ස්ත්‍රියගෙනි. 23 වහල් ස්ත්‍රියගේ පුතා ස්වාභාවික
ලෙසෙ ද, නිවහල් ස්ත්‍රියගේ පුතා දේව පොරොන්දුව
අනුව ද උපන්නෝ ය. 24 මෙයෙ උපමාවකි. ස්ත්‍රීහු
දෙදෙනා ගිවිසුම් දෙකෙකි. වහල් කමට දරුවන් දැරූ
ස්ත්‍රිය, සීනයි කන්දෙන් පැමිණෙන ගිවිසුම ය. ඒ
හාගර් ය. 25 සීනයි කන්ද අරාබියෙහි ඇත. එය දැන්
තිබෙන ජෙරුසලමට අදාළ වේ. මන්ද, ඈ තමාගේ
දරුවන් සමඟ දාස කමෙහි සිටින්නී ය. 26 එහෙත්
නිවහල් ස්ත්‍රිය නම් ස්වර්ගීය ජෙරුසලම යි. ඒ
අපගේ මාතාව ය. 27 යෙසා 54:1ඒ ගැන ශුද්ධ
ලියවිල්ලේ මෙසේ ලියා ඇත:

අ2 27 “දරුවන් නොලැබූ වඳ ස්ත්‍රිය, ප්‍රීති වන්න,
ප්‍රසව වේදනා නොවිඳින ස්ත්‍රිය, ප්‍රීතියෙන්
මොරදන්න.
අ2 27 මන්ද, පුරුෂයා ඇති ස්ත්‍රියට වඩා හැරදමනු
ලැබූ ස්ත්‍රියට දරුවෝ බොහෝ ය.”
28 සහෝදරයෙනි, ඔබ ඊසාක් ලෙසෙ පොරොන්දුවේ
දරුවෝ ය. 29 උත් 21:9එහෙත් ස්වාභාවික ලෙසෙ
උපන් තැනැත්තා ආත්මයාණන් කරණකොටගෙන
උපන් තැනැත්තාට ඒ කාලයේ දී පීඩා කළ ලෙසෙ,
දැනුත් පීඩා කරනු ලැබේ. 30 උත් 21:10එහෙත් ශුද්ධ
ලියවිල්ලෙහි කුමක් කියා ඇද් ද? “වහල් ස්ත්‍රිය හා
ඇගේ දරුවා පන්නාදමන්න; මන්ද, නිවහල්
ස්ත්‍රියගේ පුත්‍රයාට, වහල් ස්ත්‍රියගේ පුත්‍රයා
සමඟ උරුමය නොලැබෙන්නේ ය” යනුයි.
31 එබැවින්, සහෝදරවරුනි, අපි වහල් ස්ත්‍රියකගේ
නොව, නිවහල් ස්ත්‍රියකගේ දරුවෝ වමු.

## ක්‍රිස්තියානි නිදහස

5 ක්‍රිස්තුන් වහන්සේ අප මුදාගත්තේ
නිදහස්කම ඇතුව සිටීමට ය. එබැවින් දාසකම
නමැති වියගහකට නැවත යටත් නොවී ස්ථිර ව
සිටින්න.
2 ඔබ චර්මඡේදනය ලබන්නහු නම්, ක්‍රිස්තුන්
වහන්සේගෙන් ඔබට කිසි ප්‍රයෝජනයක්
නොලැබෙනෙ බව පාවුලු නම් මම ඔබට කියමි,
3 එසේ ය, චර්මඡේදනය ලබන සෑම දෙනෙ ම මුළු
ව්‍යවස්ථාව පැවැත්වීමට බැඳී සිටින බව නැවතත්
මම සහතික කොට කියමි. 4 ව්‍යවස්ථාව මඟින්
දමිටු බවට පත් වන්නෙ සොයන ඔබ ක්‍රිස්තුන්
වහන්සේගෙන් වෙන් කරන ලද්දහු ය. ඔබ දේව
වරප්‍රසාදය නැති කරගෙන සිටින්නහු ය. 5 මන්ද,
අපි ආත්මයාණන් වහන්සේ කරණකොටගෙන
ඇදහිල්ලෙන් දමිටු කරනු ලැබීමේ බලාපොරොත්තුව
ගැන පුල පුලා බලා සිටිමු. 6 ක්‍රිස්තුස් ජේසුස්
වහන්සේ තුළින් ප්‍රේමය කරණකොටගෙන ක්‍රියා
කරන ඇදහිල්ලෙන් මිස, චර්මඡේදනයෙන් වත්,
අචර්මඡේදනයෙන් වත් ප්‍රයෝජනයක් නැත. 7 ඔබ
මැනැවින් ඉදිරියට දිව්වහු ය. එහෙත් සත්‍යයට
කීකරුවීම සඳහා ඔබට බාධා කළේ කවරෙක් ද?
8 ඔබට බාධා කළේ ඔබ කැඳවූ දෙවියන්
වහන්සේ නොවේ. 9 1 කොරි 5:6මුහුන් ටිකකින්
මුළු පිටි පිඩ පිපේ. 10 ඔබ මට වඩා වෙනස්
ආකාරයකින් කල්පනා නොකරන බවට ස්වාමීන්
කෙරෙන් වන සහතිකයක් මට ඇත. ඔබ වියවුල්
කරන තැනැත්තා කවරෙක් වුවත්, ඔහු තමාට හිමි
දඬුවම ලබනු ඇත.
11 සහෝදරවරුනි, චර්මඡේදනය අවශ්‍ය බව මම
තවමත් ප්‍රකාශ කරම් නම්, කුමක් නිසා තව ම
පීඩා කරනු ලබම් ද? එය ඇත්තක් නම් කුරුසිය
පිළිබඳ මා ප්‍රකාශ කරන දේ තවත් බාධාවට
හේතුවක් නොවේ. 12 මේ චර්මඡේදනවාදී
වියවුල්කාරයන් සම්පූර්ණ ඡේදනයකින් නපුංසකයන්
වීම වඩා හොඳය.
13 සහෝදරවරුනි, ඔබ නිදහස්කමට කැඳවනු
ලැබුවහු ය; ඔබගේ ඒ නිදහස මාංසික තෘෂ්ණා
සඳහා වැය නොකොට, ප්‍රේමයෙන් එකිනෙකොට
සේවය කරන්න. 14 ලේවී 19:18මන්ද, ඔබට මෙන්
ඔබේ අසල්වැසියාට ප්‍රේම කරන්න යන එක
ශික්ෂා පදය මුළු ව්‍යවස්ථාවෙහි සම්පිණ්ඩනය වෙයි.
15 එහෙත් ඔබ එකිනෙකා උනුනුන් කුළල් කාගන්නහු
නම්, ඔබ එකිනෙකාගෙන් විනාශ නොවන හැටියට
වග බලාගන්න.

## ආත්මයාණන්ගේ මඟපෙන්වීම

16 ආත්මයාණන් වහන්සේගේ මඟ පෙන්වීම ඇති
ව හැසිරෙන්න. එවිට ඔබ මාංසික තෘෂ්ණාවලට
වසඟ වන්නේ නැත. 17 රෝම 7:15-23මන්ද, මාංසික
තෘෂ්ණා ආත්මයාණන් වහන්සේට විරුද්ධ ය.
ආත්මයාණන් වහන්සේ ද මාංසික තෘෂ්ණාවලට
විරුද්ධ ය. දපෙක්ෂය අතර ඇති මේ විරෝධය නිසා,
ඔබ කැමැති දේ ඔබට කළ නොහැකි ය. 18 එහෙත්
ඔබ ආත්මයාණන් වහන්සේ විසින් මඟ පෙන්වනු
ලබන්නහු නම්, ඔබ ව්‍යවස්ථාව යටතේ
නොසිටින්නහු ය. 19 මාංසික තෘෂ්ණාවල පලවිපාක
පැහැදිලි ය: එනම්, කාමමිථ්‍යාචාරය, අපවිත්‍රකම,
සල්ලාලකම, 20 රූප වැඳීම, කොඩිවින, සතුරුකම්,
විවාදය, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, යශස්කාමය, පක්ෂ
භේද, ආරාවුල්, 21 වෛරය, බීමත්කම, සූරාධූර්ත
උත්සව හා එවැනි තවත් දේ ය. මබඳු දේ
කරන්නන්ට දෙවියන් වහන්සේගේ රාජ්‍යයෙහි උරුම
නොලැබෙනෙ බව මම පෙර කී ලෙසෙ ම, දැනුත්
කියමි.

## ආත්මයාණන්ගේ පල

22 එහෙත් ආත්මයාණන් වහන්සේ
කරණකොටගෙන ඇති වන ප්‍රතිඵල නම්: ප්‍රේමය,
ප්‍රීතිය, සාමය, ඉවසීම, කරුණාව, යහපත්කම,
විශ්වාසකම, 23 මෘදුකම හා ආත්ම දමනය යන
මේවා ය. මේවා ගැන නීතිරීති නැත. 24 ක්‍රිස්තුන්
වහන්සේට අයිති වූ අය ඔවුන්ගේ රාග, ක්ලේශ
සහිත මාංසික ජීවිතය කුරුසියෙහි ඇණ ගසා ඇත.
25 අපි ආත්මයාණන් වහන්සේ කරණකොටගෙන
ජීවත් වමු නම්, ආත්මයාණන් වහන්සේගෙන්
මඟපෙන්වීම ලබමු. 26 නිෂ්ඵල පාරට්ටු කර
නොගනිමු. එකිනෙකා කෝප නොකරමු. එකිනෙකොට
ඊර්ෂ්‍යා නොකරමු.

## අන්‍යෝන්‍ය පිහිටාධාර

6 සහෝදරයෙනි, මිනිසෙකු යම් වරදක් කරද්දී
අසු වුණොත් ශුද්ධාත්ම දායාදය ඇති ඔබ
මෘදුකමින් ඔහු යහමඟට හරවාගත යුතු ය. ඔබ ද
පරීක්ෂාවට නොවැටෙනෙ පිණිස ප්‍රවේසම් වන්න.
2 එකිනෙකාගේ බර උසුලා, එසේ ක්‍රිස්තුන්
වහන්සේගේ ආඥාව පිළිපදින්න. 3 කිසි
වැදගැම්මකට නැති කෙනෙක් තමා වැදගත් කෙනෙක්
යයි සිතන්නේ නම්, ඔහු තමා ම රවටා ගනියි.

4 එකිනකො තම තමාගේ කල්ක්‍රියාව තමා විසින්
ම සෝදිසි කර බැලිය යුතු ය. එය යහපත් නම්, එය
තමා ම අත් කරගත් දයෙක් බැවින්, අනුන්ගේ
කල්ක්‍රියාවට සමාන නොකොට, තමාට ම ඒ ගැන
පාරට්ටු විය හැකි ය. 5 තමා විසින් ම ඉසිලිය යුතු
බරක් හැම මිනිසකුට ම ඇත.
6 ධර්ම වාක්‍ය ඉගනෙගන්නා, උගන්වන්නාට තමා
සතු සියලු යහපත් දයෙන් සංග්‍රහ කරේ වා.
7 මුළා නොවනේන, කිසිවකුට දවේයන් වහන්සේ
රැවටිය නොහැකි ය. මන්ද, මිනිසකේ තමා වපුරන
දයෙ ම කපාගන්නේ ය. 8 කලෙසේ මල නමැති
කතෙහේ වපුරන්නා, කලෙසේ මලින් ජරාවට පත්
වන මරණය නමැති අස්වැන්න නළොගන්නේ ය.
ආත්මයාණන් නමැති කතෙහේ වපුරන්නා
ආත්මයාණන්ගනේ සදාතන ජීවනය නමැති අස්වැන්න
නළොගන්නේ ය. 9 ඒ නිසා යහපත කිරීමට මැළි
නොවමෙු. මන්ද, මන්දෝත්සාහී නුවූවොත් අපි යථා
කාලයේ දී අස්වැන්න නළොගන්නමෙු. 10 එබැවින්
අපට ඉඩ ප්‍රස්ථා ඇති හැටියට සියල්ලන්ට ම,
ප්‍රධානකොට ඇදහිලිවන්තයන්ගේ පවුලට අයිති වූ
අයට, යහපත්කම් කරමු.

## අවවාද හා සුබ පැතුම්

11 කොපමණ ලොකු අකුරුවලින් මාගේ ම අතින්
ඔබට ලියා ඇද්ද කියා බලන්න. 12 මාංසික ලකුණක්
අනුව තම උතුම්කම පනේවීමට කැමැති අය
චර්මඡේදනය ලබන්න ඔබට බල කරති. එසේ
කරන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ කුරුසිය නිසා ඇති
වන පීඩාවලින් වළකින පිණිස පමණක් ය.
13 චර්මඡේදනය ලබන්නෝ පවා ව්‍යවස්ථාව
නොපිළිපදිති. එහතේ ඔබ චර්මඡේදනය කරවීමට
ඔවුන් අදහස් කරන්නේ, ඒ ගැන ඔවුන් පාරට්ටු කර
ගන්නා පිණිස ය. 14 එහතේ මම නම් අප ස්වාමීන්
වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ කුරුසිය ගැන
මිස අන් කිසිවක් ගැන පාරට්ටු කර නොගනිමි.
මන්ද, කුරුසිය කරණකොටගනෙ ලෝකය ගැන
මාගේ ආශාව ද, මා ගැන ලෝකයාගේ ආශාව ද
මැරුණා හා සමාන ය. 15 චර්මඡේදනය වත්
අචර්මඡේදනය වත් වැදගත් නැත; වැදගත් දයෙ
නම්, අලුත් මැවිල්ලක් වීම ය. 16 යම් පමණ දනෙකේ
මේ ප්‍රතිපත්තිය අනුගමනය කරන්නෝ ද ඒ හැමට
සාමදානයත්, දයාවත් වේ වා! දවේයන් වහන්සේගේ
මුළු සනෙඟටත් එසේ ම වේ වා!
17 මින් මතු කිසිවකේ මට කරදර නොකරේ වා.
මන්ද, මම මාගේ ශරීරයේ ජේසුස් වහන්සේගේ
නිවරණ දරමි.
18 සහෝදරයනේි, අපගේ ස්වාමීන් වන ජේසුස්
ක්‍රිස්තුන් වහන්සේගේ වරප්‍රසාදය ඔබ සමඟ වේ
වා! ආමනේ.

# එපීස

### ආචාරය

1 ක්රියා 18:19-21; 19:1 ද්ෙව කැමැත්තනේ
ක්රිස්තුස් ජ්ෙසුස් වහන්සේගේ
ප්ර්ෙරිතවරයකෙු වන පාවුලු නම් මම, එපීසයේ
සිටින, ජ්ෙසුස් ක්රිස්තුන් වහන්සේ අදහන
සැදැහැවතුන් වතෙ ලියමි. 2 අපගේ දවෙි පියාණන්
වහන්සේගනේ ද ස්වාමීන් වන ජ්ෙසුස් ක්රිස්තුන්
වහන්සේගනේ ද කරුණාව හා ශාන්තිය ඔබ හට
වේ වා!

### ආධ්යාත්මික ආශිර්වාද

3 ක්රිස්තුන් වහන්සේ තුළින් ස්වර්ගීය ස්ථානවල
සියලු ආධ්යාත්මික ආශිර්වාද අපට දවො වදාළ,
අපගේ ස්වාමීන් වන, ජ්ෙසුස් ක්රිස්තුන්
වහන්සේගේ පියාණන් වූ දවෙියන් වහන්සේට
ප්රශංසා වේ වා! 4 ප්ර්ෙමයනේ උන් වහන්සේ
ඉදිරියහෙි අප ශුද්ධ ව නාෙකැළැල් ව සිටින පිණිස,
ලාෙකය මැවීමට ප්රථමයනේ ක්රිස්තුන් වහන්සේ
තුළ දවෙියන් වහන්සේ අප තාෙරාගත් සේක.
5 තවද ස්වකීය ප්රසාදය හා අරමුණ අනුව, ජ්ෙසුස්
ක්රිස්තුන් වහන්සේ කරණකාෙටගනෙ, උන්
වහන්සේ, අප දරුකමට පිළිගන්න පිණිස, දවෙියන්
වහන්සේ පරෙ නියම කළ සේක. 6 උන් වහන්සේ
එසේ කළේ තමන් වහන්සේගේ ප්ර්ෙමයාණන්
වහන්සේ තුළ අපට ද්ෙව වරප්රසාදය අනුව
ලබාදුන් මහිමාන්විත කරුණාවේ ප්රශංසාව සඳහා
ය.
7 කාෙලාෙ 1:14 ක්රිස්තුන් වහන්සේගේ යාගික
රුධිරය කරණකාෙටගනෙ, දවෙියන් වහන්සේගේ
වරප්රසාද සම්පතේ ප්රකාරයට අපට මිදීමත්, පව්
කමාවත් ලැබී ඇත. 8 ඒ වරප්රසාදය, සියලු
ප්රඥාවනේ හා නුවණින් උන් වහන්සේ අපට බහුල
ව ප්රදානය කර, 9 උන් වහන්සේගේ කැමැත්තේ
අබිරහස අපට දන්වා වදාළ සේක. එසේ කරන
ලද්දේ, තමන් වහන්සේ ක්රිස්තුන් වහන්සේ තුළ,
සිය කැමැත්තනේ නියම කරගත් ස්වකීය අභිප්රාය
අනුව ය. 10 දවෙියන් වහන්සේගේ ඒ අභිප්රාය නම්,
නියමිත කාලයේ දී ස්වර්ගයහෙි ද පාෙළාෙවහෙි ද,
එනම් මුළු විශ්වයහෙි ඇති සියල්ල, ක්රිස්තුන්
වහන්සේ යටතේ එක්සත් කිරීම ය.
11 අපි මමෙ ක්රිස්තුන් වහන්සේ තුළින් තාෙරාගත්
සනෙඟක් වමෙු. එසේ වන්නේ, දවෙියන් වහන්සේ
පරෙ නියම කරගත් සැලැස්ම ලසෙ, සියල්ල සිදු
කරන ස්වකීය අභිප්රාය අනුව ය. 12 මසෙේ වූයේ
ක්රිස්තුන් වහන්සේ තුළින් ප්රථමයනේ
බලාපාෙරාෙත්තු ලැබූ අප, උන් වහන්සේගේ
මහිමයේ ප්රශංසාව සඳහා සිටින පිණිස ය.
13 ඉදින්, උන් වහන්සේ තුළින් ඔබ ද, සත්ය
ධර්මය වන ඔබගේ ගැළවීම සලසන සුබ අස්න අසා
අදහාගනෙ, පාෙරාෙන්දු වූ ශුද්ධාත්මයාණන්
වහන්සේගනේ සහතිකකමේ මුද්රාව ලැබුවහු ය.
14 ඒ ශුද්ධාත්මයාණන් වනාහි, දවෙියන්
වහන්සේගේ මහිමයේ ප්රශංසාව සඳහා, උන්
වහන්සේට අයිති අයට ගැළවීම සලසා දනෙ අපේ
උරුමයේ අත්තිකාරම ය. 15 ස්වාමීන් වන ජ්ෙසුස්
ක්රිස්තුන් වහන්සේ කරෙහෙි ඇති ඔබේ ඇදහිල්ල
ගැන ද සැදැහැවතුන්ට ඔබ දක්වන ප්ර්ෙමය ගැන ද
යන කරුණු අසා, 16 මම ඔබ ගැන මාගේ
යාච්ඤාවල දී සිහි කරමින් නාෙකඩවා දවෙියන්
වහන්සේට ස්තුති කරමි. 17 තජ්ෙසේ පියාණන් වූ,
අපගේ ස්වාමීන් වන ජ්ෙසුස් ක්රිස්තුන්
වහන්සේගේ දවෙියන් වහන්සේ, උන් වහන්සේ
අවබාෙධ කරගැනීම පිණිස, ප්රඥාව හා විදර්ශන
ශක්තිය ඔබට දනෙ මනේ මම යාච්ඤා කරමි.
18 තවද, උන් වහන්සේගේ කැඳවීමේ
බලාපාෙරාෙත්තුව කිමකේ ද කියාත්, සැදැහැවතුන්ට
හිමි වන තජ්ොන්විත උරුමයේ ධන සම්භාරය
කිමකේ ද කියාත්, 19 ඇදහිලිවන්තයන් වන අප තුළ
ක්රියා කරන, උන් වහන්සේගේ බලපරාක්රමයේ
උදාරබව කිමකේ ද කියාත්, ඔබ දැන ගන්නා පිණිස
ඔබේ මනස පැහැදනෙසේ මම යාච්ඤා කරමි.

### සභාවේ මහශ්ොක්ය නායකයාණාෙ

20 ගීතා 8:6 දවෙියන් වහන්සේගේ ඒ
වික්රමාන්විත බලපරාක්රමය නම්, උන් වහන්සේ
ක්රිස්තුන් වහන්සේ මරණයනේ උත්ථාන කර,
ස්වර්ග ලාෙකයහෙි ස්වකීය දකුණු පස සිංහාසනාරූඪ
කිරීමනේ, ක්රිස්තුන් වහන්සේ තුළ උන් වහන්සේ
ඉටු කළ ක්රියාකාරී බලය ම ය. 21 එම ක්රිස්තුන්
වහන්සේ සියලු අධිපතීන්ටත්, බලධාරීන්ටත්,
පරාක්රමවලටත්, අධිකාරීන්ටත්, එසේ ම, මේ
යුගයේ පමණක් නාෙව, මතු පැමිණනෙ යුගයහෙි ද,
නම් කළ හැකි තාක් සියලු ප්රභූ නාමයන්ටත්
ඉහළින් වැජඹනෙ සේක. 22 කාෙලාෙ 1:18දවෙියන්
වහන්සේ සියලු දේ ක්රිස්තුන් වහන්සේගේ
පාදවලට යටත් කර, උන් වහන්සේ සභාවේ
මහශ්ොක්ය නායකයාණන් කාෙට පත් කළ සේක.
23 සභාව උන් වහන්සේගේ ශරීරය ය. ශරීරය එහි
හිස වන, සියල්ල බද්ධ කරන, ක්රිස්තුන් වහන්සේට

සම්බන්ධ වූ විට, එක ම සර්ව සම්පූර්ණත්වයක්
ඇති වේ.

## මරණයෙන් ජීවනයට

2 කොලොසි 2:13 වැරදි ක්‍රියා හා පාප
හේතුකොටගෙන ඔබ මැරී සිටි කාලයක් විය.
2 එකල ඔබ අනුගමනය කළේ මේ යුගයේ පවිටු
මඟ ය. තවද, අකීකරු අය තුළ ක්‍රියා කරන
බලවේගය වන, ආකාශ බලධාරීන්ගේ අධිපතියාට ද
ඔබ යටත් ව සිටියහු ය. 3 එකල අපිත් ඔවුන්ගේ
ගණයට අයිති ව, මාංසික තෘෂ්ණාවලට වහල් ව
ජීවත් වෙමින්, සිතෙත් කයෙත් ආශාවන් පිනවමින්,
සෙසු අය මෙන් අපේ ගතිපැවතුම් අනුව දේව
උදහසට ලක් වී සිටියෙමු.
4 එහෙත් දයාවෙන් සමෘද්ධ වූ දෙවියන් වහන්සේ,
අධික ප්‍රේමයකින් අපට ප්‍රේම කළ බැවින්,
5 අපේ වැරදි ක්‍රියා හේතුකොටගෙන අප මැරී
සිටිය දී පවා, ක්‍රිස්තුන් වහන්සේ සමඟ අප ජීවත්
කර වදාළ සේක. ඔබ ගැළවී සිටින්නේ දේව
වරප්‍රසාදයෙන් ය. 6 තවද, දෙවියන් වහන්සේ
ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළින් උන් වහන්සේ
සමඟ අප උත්ථාන කර, උන් වහන්සේ සමඟ සග
ලොවෙහි අපට අසුන් ගැනීමට සැලැසූ සේක.
7 එසේ කළේ ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ
අපට දැක්වූ කරුණාව කරණකොටගෙන උන්
වහන්සේගේ වරප්‍රසාදයේ මහා ධන සම්භාරය
මතු යුගවලට පෙන්වන පිණිස ය.
8 ඔබ ගැළවී සිටින්නේ දේව වරප්‍රසාදය මඟින් වූ
ඇදහීම කරණකොටගෙන ය. එය ඔබගේ ම
ක්‍රියාවක් නොව, දෙවියන් වහන්සේගේ දීමනාව ය.
9 ගැළවීම පුණ්‍ය ක්‍රියාවල ප්‍රතිඵලයක් නොවන
බැවින්, කිසිවකුට පාරට්ටුවට ඉඩක් නැත. 10 මන්ද,
අපි වනාහි යහපත් ක්‍රියා කරන පිණිස දෙවියන්
වහන්සේ විසින් ක්‍රිස්තුන් වහන්සේ තුළ මවනු ලැබූ
මැවිලි වෙමු. ඒ යහපත් ක්‍රියා කරන පිණිස දෙවියන්
වහන්සේ කල් තියා අප සූදානම් කළ සේක.

## ක්‍රිස්තුන් වහන්සේ තුළ ඒකත්වය

11 එබැවින් ඔබේ පෙර තත්ත්වය සිහි කරන්න. ඒ
කාලයේ දී ඔබ ශාරීරික ලකුණක් නොලත් බැවින්
විජාතිකයෝ ව සිටියහු ය. බාහිර පිළිවෙතෙක් නිසා
තුමූ චර්මඡේදිතයෝ යයි කියාගත් අය විසින් ඔබ
අචර්මඡේදිතයෝ යයි අවමන් කරනු ලැබුවහු ය.
12 තවද ඒ කාලයේ දී ඔබ ක්‍රිස්තුන් වහන්සේ
නැති ව, තෝරාගත් ඉශ්‍රායෙල් ජාතියෙන් බැහැර ව,
පොරොන්දුවේ ගිවිසුම්වල පංගුකාරකමක් නොමැති
ව, බලාපොරොත්තු රහිත ව, දෙවියන්
වහන්සේගෙන් ඉවත් ව, ලෝකයෙහි ජීවත් වූ බව
සිහි කරන්න. 13 එහෙත් ක්‍රිස්තුන් වහන්සේ තුළින්,
වරක් දුර සිටියා වූ ඔබ, දැන් උන් වහන්සේගේ දිවි
පිදීම කරණකොටගෙන ළං කරනු ලැබුවහු ය.

14 ජුදෙව්වරුන් හා විජාතිකයන් එක්කරමින් උන්
වහන්සේ අප අතර සමඟිය ඇති කළ සේක. උන්
වහන්සේ මිනිසත් බව ගෙන, ඔවුන් වෙන් කළ,
ඔවුන් අතර වෛරය ඇති කළ, මැද බිත්තිය කඩා
දැමූ සේක. 15 කොලොසි 2:14මේ දෙජාතිය, නව
මනුෂ්‍යත්වයක් කොට මවා, සමඟිය ඇති කරන
පිණිස, උන් වහන්සේ නීති නියෝග ඇතුළත්
ව්‍යවස්ථාව අවලංගු කළ සේක. 16 කොලොසි
1:20කුරුසිය කරණකොටගෙන උන් වහන්සේ
වෛරය නැති කර, දෙවියන් වහන්සේ උදෙසා ඒ
දෙජාතිය එක ම ශරීරයක් වන පිණිස සමඟි කර
වදාළ සේක. 17 යෙසා 57:19එසේ උන් වහන්සේ
වැඩම කර, දුර සිටියා වූ ඔබටත්, ළඟ සිටියා වූ
අයටත්, සාමයේ පණිවුඩය දේශනා කර වදාළ
සේක. 18 එක ම ආත්මයාණන් වහන්සේ තුළ,
ජුදෙව්වරුන් හා විජාතීන් යන දෙපක්ෂයට, පියාණන්
වහන්සේ වෙතට පිවිසීමේ වරය ලැබිය හැක්කේ,
ක්‍රිස්තුන් වහන්සේ නිසා ය.
19 එබැවින් ඔබ තවත් විදේශිකයෝ වත්,
ආගන්තුකයෝ වත් නොව, ශුද්ධ වන්තයන් සමඟ
සහකාර පුරවැසියෝ ද දෙවියන් වහන්සේගේ
පවුලේ දූදරුවෝ ද වෙති. 20 ඔබ ප්‍රේරිතයන්ගේ ද,
දිවැසිවරයන්ගේ ද අත්තිවාරම පිට ඉදි කරනු ලැබ
සිටින්නහු ය. එහි කොණේ ප්‍රධාන ගල නම්
ක්‍රිස්තුන් වහන්සේ ම ය. 21 උන් වහන්සේ තුළ මුළු
ගොඩනැඟිල්ල ඒකාබද්ධ ව, සමිඳාණන් වහන්සේ
තුළ ශුද්ධ මන්දිරයක් සේ වර්ධනය වන්නේ ය.
22 උන් වහන්සේ තුළ ඔබත්, ආත්මයාණන්
වහන්සේ කරණකොටගෙන දෙවියන් වහන්සේගේ
වාසස්ථානය සඳහා එක් කොට ගොඩනඟනු ලැබේ.

## විජාතීන් උදෙසා පාවුලු තුමාගේ සේවය

3 මේ කාරණය නිසා ක්‍රිස්තුස් ජේසුස්
වහන්සේගේ හිරකාරයකු වන පාවුලු නම්
මම, විජාතීන් වූ ඔබ උදෙසා යාච්ඤා කරමි. 2 ඔබේ
යහපත පිණිස සේවය කිරීමේ වරප්‍රසාදය දෙවියන්
වහන්සේ මට බාර දී ඇති බව ඔබ ඇත්තෙන්ම අසා
ඇත. 3 මා ලුහුඬින් ලියා තිබෙන ලෙස, මේ රහස
එළිදරව් වීමකින් මට ප්‍රකාශ කරන ලදී. 4 කොලොසි
1:26-27මා ලියා ඇති ඒ දේ කියවීමෙන්, ක්‍රිස්තුන්
වහන්සේ පිළිබඳ අභිරහස ගැන මට ඇති
අවබෝධය ඔබට තේරුම් ගත හැකි ය. 5 ආදි
පරම්පරාවල මනුෂ්‍ය වර්ගයාට ඒ අභිරහස ප්‍රකාශ
නොකරන ලදී. එහෙත් දැන් ආත්මයාණන්
කරණකොටගෙන ශුද්ධ ප්‍රේරිතයනටත්,
දිවැසිවරයනටත් එය එළිදරව් කර ඇත. 6 ඒ
අභිරහස නම්, සුබ අස්න කරණකොටගෙන,
ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ විජාතීන්
ජුදෙව්වරුන් සමඟ හවුල් උරුමක්කාරයන් ද සහා
ශරීරයේ හවුල් සාමාජිකයන් ද පොරොන්දුවේ හවුල්
පංගුකාරයන් ද වන බව ය.

7 දවේයන් වහන්සේගේ බලයේ ක්‍රියා කිරීමේ
ප්‍රකාරයට, මට දනෙ ලද උන් වහන්සේගේ
කරුණාවේ දීමනාව ලසෙ, මම ඒ සුබ අස්නේ
සේවකයකේ කරනු ලැබීමි. 8 සැදැහැවතුන්ගනේ ඉතා
සුළු තැනැත්තාටත් වඩා සුළු වූ මට, මේ වරප්‍රසාදය
දනෙ ලද්දේ, ක්‍රිස්තුන් වහන්සේගේ අසීමිත ධන
සම්භාරය, විජාතීන්ට දේශනා කිරීමටත්, 9 මේ
අබිරහස් අරමුණ ක්‍රියාත්මක කරනු ලබන ආකාරය
එළිදරව් කිරීමටත් ය. යුග ගණනාවක් මුළුල්ලේ ඒ
අබිරහස විශ්වයේ මැවුම්කාරයාණන් වන දවේයන්
වහන්සේ තුළ සැඟවී තිබිණි. 10 එසේ වූයේ, මේ
කාලයේ දී, ශුද්ධ සභාව මඟින් ස්වර්ග ලෝකවල
අධිපතීන්ටත්, බලධාරීන්ටත්, දවේයන් වහන්සේගේ
විවිධාකාර ප්‍රඥාව දන්වනු ලබන පිණිස ය.
11 දවේයන් වහන්සේ මසෙේ කළේ, අපගේ
ස්වාමීන් වන ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළින් උන්
වහන්සේ ඉටු කළ ස්වකීය සදාතන අභිප්‍රායට
අනුකූල ව ය. 12 ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි අපේ
ඇදහිල්ල කරණකොටගනෙ නිර්භීතකමත්, සැක
නැතිව දවේයන් වහන්සේ වෙත ළඟා වීමේ
නිදහසත්, උන් වහන්සේ තුළ අපට ඇත.
13 එහයෙින් ඔබ නිසා මා දුක් විඳින බැවින්,
අධරෛ්‍ය නොවන ලසෙ ඉල්ලමි. ඒ ගැන ඔබ
ආඩම්බර විය යුතු ය.

### ප්‍රේමය අරබයා යැදුම

14 මේ හේතුව නිසා, ස්වර්ගයෙහි ද පොළොවෙහි
ද සියලු පළෙපත්වලට නාමය දනේනා වූ,
15 පියාණන් වහන්සේ ඉදිරියෙහි මම දණින් වැටී
යාච්ඤා කරමි. 16 උන් වහන්සේගේ මහිමතාවේ
සම්පතේ හැටියට, ස්වකීය ආත්මයාණන් වහන්සේ
කරණකොටගනෙ ඔබේ ආධ්‍යාත්මික භාවය
ශක්තිසම්පන්න වන පිණිස ඔබට බලය දනෙ ලසෙ
ද, 17 ඇදහිල්ල කරණකොටගනෙ ක්‍රිස්තුන්
වහන්සේ ඔබේ සිත් තුළ වාසය කරන පිණිස ද,
යාච්ඤා කරමි. තවද, ප්‍රේමයේ මුල් බැස, ස්ථිර ව
පිහිටා සිටින පිණිස ද, යාච්ඤා කරමි. 18 සියලු
සැදැහැවතුන් සමඟ ක්‍රිස්තුන් වහන්සේගේ
ප්‍රේමයේ දිගත්, පළලත්, උසත්, ගැඹුරත් වටහා
ගැනීමට ශක්තිය ලබා, 19 ක්‍රිස්තුන් වහන්සේගේ
ඥානාතික්‍රාන්ත ප්‍රේමය අවබෝධ කරගනෙ,
දවේයන් වහන්සේගේ පරිපූර්ණතාවනේ ඔබ පූර්ණ
වන පිණිස ද යාච්ඤා කරමි.
20 අප තුළ ක්‍රියා කරන බලය කරණකොටගනෙ
අප ඉල්ලන, සිතන සියලු දේට වඩා අධික ලසෙ
කරන්නට බලය ඇති 21 දවේයන් වහන්සේට සභාව
තුළ ද ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ ද යුගයනේ
යුගයට, සදහට ම මහිමය වේ වා! ආමනේ.

### ශරීරයේ ඒකත්වය

4 එබැවින්, දවේයන් වහන්සේගනේ ඔබ ලත්
කැඳවීමට ඔබින ලසෙ හැසිරනෙ මනේ
සමිඳාණන් වහන්සේ උදසො හිරකාරයකෙු වන මම
ඔබනේ උදක් ම ඉල්ලමි. 2 කොලො 3:12-13සැම විට
ම නිහතමානි ව, විනීත ව, ඉවසිලිවන්ත ව සිටින්න;
ප්‍රේමයනේ එකිනකො සමඟ පෑහී සිටින්න;
3 ආත්මයාණන් වහන්සේගනේ වන එක්සත්කම,
සමඟිකමේ බැම්මනේ පවත්වාගන්ට උත්සාහ
කරන්න. 4 ඔබ කැඳවනු ලැබූ කල එක ම
බලාපොරොත්තුවකට කැඳවනු ලැබූ ලසෙ, ඇත්තේ
එක ම ශරීරයත්, එක ම ආත්මයාණන් වහන්සේත්
ය; 5 එක ම සමිඳාණන් වහන්සේත්, එක ම
ඇදහිල්ලත්, එක ම බව්තීස්ම-ස්නාපනයත් ය;
6 සියල්ලන්ට ඉහළින් සිටින, සියල්ලන් තුළින්
ක්‍රියා කරන, සියල්ලන් තුළ වැඩවසන එක ම දවේ
පියාණන් වහන්සේත් ය.
7 එහතේ ක්‍රිස්තුන් වහන්සේ සිය දීමනාවේ
ප්‍රමාණය අනුව අප එකිනකොට දේව වරප්‍රසාදය
ප්‍රදානය කර ඇත. 8 ගීතා 68:18ඒ ගැන මසෙේ
කියා තිබේ:
q28 “උන් වහන්සේ අග්‍රස්ථානයට නැඟුණු කල,
පරදවා ජයගත් සතුරු සේනාව ගනෙ ගොස්,
මිනිසුන්ට දීමනා පිරිනැමූ සේක.”
9 උන් වහන්සේ නැඟුණ සේකැ යි කීමනේ කුමක්
අදහස් කරේ ද? එයින් අදහස් කරන්නේ උන්
වහන්සේ ප්‍රථමයනේ පොළොවේ පහත් ම තැන්
වලට බැස්ස බව ය. 10 පහළට බැස වදාළ තැනැන්
වහන්සේ නම්, මුළු විශ්වය පූර්ණ කරන පිණිස
සියලු ස්වර්ග ලෝක ඉක්මවා ඉහළට නැඟුණු
තැනැන් වහන්සේ ම ය. 11 මේ ක්‍රිස්තුන් වහන්සේ,
සමහරුන් ප්‍රේරිතයන් ද සමහරුන් දිවැසිවරුන් ද
සමහරුන් ධර්ම දේශකයන් ද සමහරුන් සභා
පාලකයන් ද සමහරුන් ගුරුවරුන් ද වශයනේ පත් කළ
සේක. 12 එසේ කළේ දවේයන් වහන්සේගේ
සනෙඟ දේව සේවය සඳහා සම්පූර්ණයනේ පුහුණු
කිරීමටත්, ක්‍රිස්තු ශරීරය වර්ධනය කිරීමටත් ය.
13 මේ ආකාරයනේ ඇදහිල්ලේ ද දවේයන්
වහන්සේගේ පුත්‍රයාණන් දැනගැනීමේ ද
එකමුතුකමටත්, ක්‍රිස්තුන් වහන්සේගේ
පරිණතභාවයනේ වන පරිපූර්ණ පෞරුෂත්වයටත්
අපි පත් වන්නමෙු. 14 එසේ වූ විට, අපි තවත්
මනුෂ්‍යයන්ගේ වංචාවනේ ද ප්‍රයෝගයනේ ද මුළා
කරන සුලු උපායනේ ද හටගන්නා, සියලු ආකාර
ඉගැන්වීම් නමැති සුළඟින් ඔබමොබ විසි වනෙ,
තරංගවලින් ගසාගනෙ යන බාලයෝ නොවමෙු.
15 එසේ නොවී, අපි ප්‍රේමයනේ සත්‍යය කතා
කරමින් ක්‍රිස්තුන් වහන්සේ තුළ හැම අයුරින් ම
වර්ධනය වන්නමෙු. 16 කොලො 2:19හිස වන උන්
වහන්සේ කරණකොටගනෙ මුළු ශරීරය, ඊට සපයා
ඇති එක එක අවයවයයනේ සන්ධි කොට, ඒකාබද්ධ
කරනු ලැබේ. එක එක අවයවය ඊට යුතු ලසෙ
ක්‍රියා කළ විට මුළු ශරීරය ප්‍රේමයනේ වැඩී,
වර්ධනය වේ.

## නව ජීවනය

17 එබැවින්, සමිඳාණන් වහන්සේගේ නාමයෙන්
මම තදින් ම ඔබට මෙසේ කියමි: පුහු අදහස් ඇති
මිසදිටුවන් මෙන් තවත් නොහැසිරෙන්න. 18 අවිද්‍යාව
හා මුරණ්ඩුකම නිසා ඔවුන්ගේ සිත් අඳුරු වී, ඔව්හු
දෙවියන් වහන්සේගේ ජීවනයෙන් වෙන් ව සිටිති.
19 විළිබිය නැති ව ඔව්හු සල්ලාලකමෙහි ඇලීගැලී
සිටිමින්, ඉවක්බවක් නැති ව අනාචාරකම් කරති.
20 එහෙත් ක්‍රිස්තුන් වහන්සේ ගැන ඔබ ඉගෙනගත්
දේ එවැන්නක් නොවේ. 21 සැබැවින් ම උන්
වහන්සේ ගැන ඔබ ඇසුවා පමණක් නොව,
කිතුනුවන් වශයෙන් උන් වහන්සේ තුළ වූ සත්‍යය ද
ඔබට උගන්වන ලදී. 22 කොලො 3:9එබැවින් ඔබේ
පසුගිය පැවැත්මට අයිති වූ තෘෂ්ණාවලින් මුළා වී
විනාශ වන්නා වූ පරණ ස්වභාවය අහක දමා,
23 ආධ්‍යාත්මික නවතාවයක් ඇති කරගන්න. 24 උත්
1:26; කොලො 3:10දෙවියන් වහන්සේගේ ස්වරූපය
අනුව මවන ලද, දැමිටුකමින් ද ශුද්ධවන්තකමින් ද
ප්‍රකාශ වන අලුත් ස්වභාවය පැළඳගන්න.
25 සකෙරි 8:16 එබැවින් බොරු කීම අත්හැරදමා,
අසල්වාසි එකිනෙකා සමඟ සත්‍යය කතා කරන්න.
මන්ද, අපි එකිනෙකා අන්‍යෝන්‍ය අවයවයෝ වෙමු.
26 ගීතා 4:4කෝප වුවත් පව් නොකරන්න. ඉර බහින
තුරු හිතේ කෝපය තබා නොගන්න. 27 යක්ෂයාට
ඉඩ නොදෙන්න. 28 සොරකම් කළ අය තවත්
සොරකම් නොකරත් වා. ඒ වෙනුවට දුගීන්ට උපකාර
කළ හැකිවන සේ වෙහෙසෙ මහන්සි දරා අවංක
වැඩක් කරත් වා. 29 කිසි දූෂිත වචනයක් ඔබේ
කටින් පිට වෙන්න ඉඩ නෑර, අසන්නන්ගේ වර්ධනය
සඳහා අවස්ථාවෝචිත මනහර වචන කතා කරන්න.
30 ශුද්ධාත්මයාණන් වහන්සේට දුක් නොදෙන්න.
මන්ද, මිදීමේ දවසට සූදානමක් වශයෙන් ඔබ ලබා
ඇති, සහතිකයේ මුද්‍රාව උන් වහන්සේ ය.
31 තිත්තකම්, කෝපය, උදහස, කෝලාහල, අපහාස
හා සියලු ආකාර ද්වේෂ පහ කරදමන්න.
32 කොලො 3:13එකිනෙකා කෙරෙහි කරුණාව ද
දයානුකම්පාව ද ඇති ව සිට, දෙවියන් වහන්සේ
ක්‍රිස්තුන් වහන්සේ තුළින් ඔබට කමා කළාක් මෙන්
ඔබත් එකිනෙකාට කමා කරන්න.

## ආලෝකයේ ජීවත් වීම

5 ඔබ දෙවියන් වහන්සේගේ ප්‍රේමණීය
දරුවන් වන බැවින්, උන් වහන්සේ මෙන්
වන්නට උත්සාහ කරන්න. 2 නික්ම 29:18; ගීතා
40:6ක්‍රිස්තුන් වහන්සේ අපට ප්‍රේම කොට, මිහිරි
සුගන්ධ පූජාවක් ද යාගයක් ද හැටියට අප
වෙනුවෙන් දෙවියන් වහන්සේට සිය ජීවිතය
පරිත්‍යාග කළාක් මෙන්, ඔබත් ප්‍රේමයෙන් ජීවත්
වන්න.
3 ඔබ දෙවියන් වහන්සේගේ සෙනඟ වන බැවින්,
කාමමිථ්‍යාචාරය හෝ සියලු ආකාර අශිෂ්ටකම් හෝ
තණ්හාව හෝ ඔබ අතර සඳහන් කිරීමවත් සුදුසු
නැත. 4 අශික්ෂිත, මෝඩ කතා හා නීච කවටකම්
යන මේවාත් සුදුසු නැත. ඒ වෙනුවට ස්තුති දීමේ
වචන පවසන්න. 5 මේ දේ තරයේ සිතට ගන්න:
කාමමිථ්‍යාචාරය කරන්නකුට වත්, අශිෂ්ට
කෙනෙකුට වත්, ලෝභයකුට වත්, මෙවැනි රූප
වන්දනාවන් කරන කෙනෙකුට වත්, ක්‍රිස්තුන්
වහන්සේගේ ද දෙවියන් වහන්සේගේ ද රාජ්‍යයෙහි
උරුමයක් නොලැබෙන්නේ ම ය.
6 පුහු තර්කවලින් ඔබ රවටන්ට කිසිවෙකුට ඉඩ
නොදෙන්න. මන්ද, අකීකරුවූවන් පිට දේව උදහස
පැමිණෙන්නේ මේ කාරණා නිසා ම ය. 7 එවැන්නන්
සමඟ කිසි ම ගනු දෙනුවක් නොකරන්න. 8 මන්ද,
වරක් ඔබ අන්ධකාරයෙහි සිටිය නමුත්, දැන්
සමිඳාණන් වහන්සේ තුළ ආලෝකයෙහි සිටින්නහු
ය. 9 ආලෝකයට අයිති දරුවන් මෙන් හැසිරෙන්න.
ආලෝකයේ ප්‍රතිඵල නම්, සියලු ආකාර
යහපත්කමත්, දැමිටුකමත්, සැබෑකමත් ය.
10 සමිඳාණන් වහන්සේට ප්‍රිය මනාප දේ කුමක් දැ
යි විමසා බලන්න. 11 අන්ධකාරයේ නිෂ්ඵල
ක්‍රියාවලට හවුල් නොවී, ඒවා එළිකරන්න.
12 සැබැවින් ම ඔවුන් රහසිගත ව කරන දේ ගැන
කතා කිරීම පවා පිළිකුලකි. 13 එහෙත් ආලෝකයෙන්
එළි වන සියල්ලේ නියම ස්වභාවය සක්සුදක් සේ
පැහැදිලි ව පෙනෙයි. 14 එසේ එළි වන දේ
ආලෝකය බවට හැරේ. එබැවින් මෙසේ කියා ඇත:
q2 14 “නිදා සිටින ඔබ අවදි වන්න, මරණින්
නැඟිටින්න, එවිට ක්‍රිස්තුන් වහන්සේ ඔබගේ
ආලෝකය වන සේක.”
15 එබැවින් ඔබ ජීවත් වන පිළිවෙළ ගැන ඉතා
සැලකිලිමත් වන්න. අඥානයන් මෙන් නොව,
ඥානවන්තයන් මෙන් ජීවත් වන්න. 16 කොලො
4:5කාලය නපුරු බැවින්, ඇති හැම අවස්ථාවකින් ම
ප්‍රයෝජන ගන්න. 17 එබැවින් අනුවණයන් නොවී,
සමිඳාණන් වහන්සේගේ කැමැත්ත කිමෙක් ද කියා
තේරුම්ගන්න.
18 මුද්‍රික පානයෙන් මත් නොවන්න. එයින්
අනාචාරකම් හටගන්නේ ය. ඒ වෙනුවට
ආත්මයාණන්ගෙන් පූර්ණ වන්න. 19 ගීතිකා, තුති ගී
හා ශුද්ධ ගී එකිනෙකාට ගයන්න. ඔබ හදවත් තුළ
තුති නද දෙමින් සමිඳුන්ට ගී ගයන්න. 20 කොලො
3:16-17අපගේ සමිඳාණන් වන ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේගේ නාමයෙන්, දෙවි පියාණන් වහන්සේට
සෑම විට ම සෑම දේ ගැන ම, ස්තුති කරන්න.

## භාර්යාව හා ස්වාමි පුරුෂයා

21 ක්‍රිස්තුන් වහන්සේට ඇති ගෞරවය නිසා
එකිනෙකාට යටත් වන්න.
22 කොලො 3:18; 1 පේද්‍රු 3:1 භාර්යාවෙනි, ඔබ
සමිඳාණන් වහන්සේට මෙන්, තම ස්වාමි පුරුෂයන්ට
යටත් ව සිටින්න. 23 මන්ද, ක්‍රිස්තුන් වහන්සේ
සභාවේ, එනම් උන් වහන්සේගේ ශරීරයේ, හිස
වන්නාක් මෙන්, පුරුෂයා භාර්යාවගේ හිස ය. උන්
වහන්සේ එම ශරීරයේ ගැළවුම්කාරයාණෝ වන

සේක. 24 එබැවින් සභාව ක්‍රිස්තුන් වහන්සේට
යටත් වන්නාක් මෙන්, භාර්යාවන් ද සියලු දේවල දී
පුරුෂයන්ට යටත් විය යුතු ය.
25 කොලො 3:19; 1 පේද්‍රු 3:7 පුරුෂයෙනි, ක්‍රිස්තුන්
වහන්සේ සභාවට ප්‍රේම කොට සභාව වෙනුවෙන්
සිය දිවි පුද කළාක් මෙන්, ඔබත් ඔබගේ
භාර්යාවන්ට ප්‍රේම කරන්න. 26 උන් වහන්සේ
එසේ කළේ, වචනය නමැති වතුරෙන් ද සභාව
සෝදා පිරිසුදු කර, කැප කර, 27 එය තේජාන්විත
සභාවක් වශයෙන් කැළලක් වත්, රැල්ලක් වත්, එබඳු
කිසිවක් වත් නැති ව විශුද්ධ ව, නිකලෙසේ ව,
තමන්ට ම ප්‍රදානය කරගැනීමට ය. 28 එසේ ම
පුරුෂයන් විසින් ද සිය භාර්යාවන්ට තම ශරීරයට
මෙන් ප්‍රේම කටයුතු ය. සිය භාර්යාවට ප්‍රේම
කරන තැනැත්තා තමාට ම ප්‍රේම කරගන්නේ ය.
29 කවරකුවත් කිසි ම කලෙක තමාගේ ශරීරයට
ද්වේෂ කරගනෙ නැත. එසේ නොව, ඔහු එය
පෝෂණය කරගනෙ ආරක්ෂා කරයි. ක්‍රිස්තුන්
වහන්සේ සභාව ගැන සලකන්නේත් එසේ ම ය.
මන්ද, එය උන් වහන්සේගේ ශරීරය වන බැවිනි.
30 අපි ඒ ශරීරයේ අවයවයෝ වෙමු. 31 උත්
2:24මේ නිසා මිනිසකේ තමාගේ පියා ද මව ද
අත්හැර සිය භාර්යාවට ඇලුම් වන්නේ ය. ඒ දදෙනෙ
එක් කෙනෙකේ වන්නෝ ය. 32 මයෙ මහා අබිරහසකි.
මට හැඟනෙ පරිදි එය අදාළ වන්නේ ක්‍රිස්තුන්
වහන්සේට සහ සභාවට ය. 33 එහතේ එය
පෞද්ගලික වශයෙන් ඔබටත් අදාළ වන්නේ ය. හැම
පුරුෂයකු ම තමාට මෙන් තම භාර්යාවට ප්‍රේම
කළ යුතු ය. හැම භාර්යාවක් ම තම ස්වාමි පුරුෂයාට
ගෞරව දැක්විය යුතු ය.

## දෙමව්පියන් හා දරුවෝ

6 කොලො 3:20 දරුවෙනි, ඔබේ දෙමව්පියන්ට
සමිඳාණන් වහන්සේ තුළ කීකරු වන්න. එය
ඔබගේ යුතුකම ය. 2 නික්ම 20:12; ද්වි.නී.
5:16"ඔබේ පියාටත් මවටත් ගෞරව කරන්න" යනු
පොරොන්දුවක් ඇති පළමු වන ආඥාව ය. 3 එනම්,
එසේ කිරීමෙන් ඔබට සෙත සැලසෙනු ඇත; ඔබ මිහි
පිට බොහෝ කල් ජීවත් වනු ද ඇත යනුයි.
4 කොලො 3:21 පියවරුනි, ඔබේ දරුවන් කෝප
නොකරන්න. එසේ නොකර ඔවුන් සමිඳාණන්
වහන්සේ තුළ විනයෙන් ද අවවාදයෙන් ද ඇතිදැඩි
කරන්න.

## දාසයන් හා ස්වාමිවරු

5 කොලො 3:22-25 දාසයෙනි, ඔබ ක්‍රිස්තුන්
වහන්සේට මෙන්, මෙලොව ඔබේ ස්වාමිවරුන්ට
අවංක සිතින්, බයාදුකමින් හා ගෞරවයෙන් සේවය
කරන්න. 6 මිනිසුන් සතුටු කරන අදහසින්
මූනිච්චාවට වැඩ නොකර, ක්‍රිස්තුන් වහන්සේගේ
දාසයන් මෙන් දෙවියන් වහන්සේගේ කැමැත්ත මුළු
සිතින් ම කරන්න. 7 මනුෂ්‍යයන්ට සේවය කරන්නාක්
මෙන් නොව, සමිඳාණන් වහන්සේගේ දාසයන් මෙන්
ප්‍රසන්න සිතින් සේවය කරන්න. 8 දාසයෙක් හෝ
නිර්දාසයෙක් හෝ වේවා, යමෙකු කරන යහපත් දේ
අනුව දෙවියන් වහන්සේ ඔහුට විපාක දෙන බව
මතක තබාගන්න.
9 ද්වි.නී. 10:17; කොලො 3:25; 4:1 ස්වාමිවරුනි,
ඔබේ දාසයන්ටත් එලෙසෙ ම සලකා, ඔවුනට
තර්ජනය කිරීමෙන් වැළකෙන්න. ඔවුන්ටත් ඇත්තේ,
මිනිසුන්ගේ තරාතිරම් නොබලන, ස්වර්ගයේ සිටින
එක ම ස්වාමීන් බව මතක තබාගන්න.

## සැදැහැවතුන්ගේ යුද්ධායුධ

10 අවසාන වශයෙන් සමිඳාණන් වහන්සේ තුළ ද
උන් වහන්සේගේ ප්‍රබල ශක්තියෙහි ද බලවත්
වන්න. 11 යක්ෂයාගේ සියලු උපායවලට විරුද්ධ ව
සිටින්නට ඔබට පිළිවන් වන පිණිස දෙවියන්
වහන්සේගේ සන්නාහයෙන් සන්නද්ධ වන්න.
12 මන්ද, අපගේ සටන, මිනිස් සතුරන්ට විරුද්ධ ව
නොව, අධිපතිකම් වලටත් පරාක්‍රමධාරීන්ටත් මේ
අන්ධකාරයේ ලෝක මුලාදෑනීන්ටත් ස්වර්ගීය
ස්ථානවල සිටින සකල දුෂ්ට බලවේගයන්ට ද
විරුද්ධ ව ය. 13 එබැවින් නපුරු දවස පැමිණි විට ඊට
විරුද්ධ ව සිටින්න පුළුවන් වන පිණිසත්, කළහැකි
හැම දෙයක් ම කර, ස්ථිර ව සිටින්න පුළුවන් වන
පිණිසත්, දෙවියන් වහන්සේගේ සන්නාහයෙන්
සන්නද්ධ ව සිටින්න.
14 යෙසා 11:5; 59:17 එබැවින් ස්ථිර ව ඉන්න.
ඔබගේ ඉඟටිය, සත්‍යය නමැති පටියෙන් බැඳ
ගන්න. දමිටුකම නමැති ළයවැස්ම පැළඳගන්න.
15 යෙසා 52:7සාම සුබ අස්න නමැති වහන් පය ලා
සූදානම් ව සිටින්න. 16 තවද ඇදහිල්ල නමැති පලිහ
ගන්න. එයින් නපුරාගේ සියලු ගිනිමය ඊතල
මැඬලන්නට ඔබට හැකි වන්නේ ය. 17 යෙසා
59:17ගැළවීම නමැති හිස් වැස්ම ද ශුද්ධාත්මයාණන්
වහන්සේගෙන් වන දේව වචනය නමැති කඩුව ද
ගන්න. 18 සෑමවිට ම, මුළු සිතින් යාච්ඤාවේ ද
අයැදීමේ ද යදේී සිටින්න. ආත්මයාණන්
වහන්සේගේ බලයෙන් යාච්ඤා කරන්න. මේ කරුණ
නිසා නිතර අවදි ව නොකඩ ව දෙවියන්
වහන්සේගේ සියලු සෙනඟ උදෙසා, යාච්ඤා
කරන්න. 19 සුබ අස්නේ අබිරහස ප්‍රකාශ කරන
පිණිස, කතා කරන කොයි විටත්, නිර්භය ව එසේ
කිරීමේ ශක්තිය මට ලැබෙන ලෙස යාච්ඤා කරන්න.
20 සිරගත ව සිටින මම, ඒ සුබ අස්න වෙනුවෙන්
තානාපතියෙක් වෙමි. ඒ ගැන යුතු ලෙස අභීත ව
කතා කිරීමට මට හැකි වනු පිණිස යාච්ඤා කරන්න.

## අවසාන සුබ පැතුම්

21 ක්‍රියා 20:4; 2 තිමෝ 4:12 කොලො 4:7-8මාගේ
සුව දුක් ගැන ද වැඩ කටයුතු ගැන ද දැනගැන්මට
ඔබ ආශාවෙන් සිටිනු ඇත. අපගේ හිතවත්
සහෝදරයා ද සමිඳාණන් වහන්සේ තුළ විශ්වාසවත්
සේවකයා ද වූ, තුකිකස් සියලු තොරතුරු ඔබට
දන්වනු ඇත. 22 මා ඔහු ඔබ වෙතට එවන්නේ මේ

සඳහා ම ය; අප ගැන ආරංචි ඔබට දනෙ පිණිසත්,
ඔබ ධරෛයවත් කරන පිණිසත් ය.
23 පියාණන් වන දවේයන් වහන්සේගනේ ද
ස්වාමීන් වන ජේසුස් ක්රිස්තුන් වහන්සේගනේ ද
සහෝදරයන් හට සාමයත්, ප්රේමයත්, ඇදහිල්ලත්
වේ වා! 24 අමරණීය ප්රේමයකින් අපගේ ස්වාමීන්
වන ජේසුස් ක්රිස්තුන් වහන්සේට ප්රේම කරන
සියලු දනොට කරුණාව වේ වා!

# පිලිප්පි

## ආචාරය

1 ක්‍රියා 16:12 ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ
සේවකයන් වන පාවුලු ද තිමෝතියස් ද යන
අපි, පිලිප්පියෙහි වසන සභා නායකයන් සහ
උපස්ථායකවරුන් ඇතුළු සකල කිතුනු සැදැහැවතුන්
වෙත ලියා එවමු. 2 අපගේ දෙවි පියාණන්
වහන්සේගෙන් ද ජේසුස් ක්‍රිස්තුස් ස්වාමීන්
වහන්සේගෙන් ද කරුණාවත් ශාන්තියත් ඔබ හට
වේ වා!

## පාවුලු තුමාගේ යාච්ඤාව

3 මට ඔබ සිහි වන සෑම විට ම මම මාගේ
දෙවියන් වහන්සේට ස්තුති කරමි; 4 මා යාච්ඤා
කරන සෑම විට ම, ඔබ සියලු දෙනා උදෙසා යාච්ඤා
කරමින් ප්‍රීතියෙන් පිරී සිටිමි. 5 මා එසේ කරන්නේ
පළමු දවස පටන් මේ වන තුරු ධර්මදූත සේවයට
ඔබ සහභාගි වූ නිසා ය. 6 ඔබ තුළ යහපත්
කාර්යයක් ඇරඹූ උන් වහන්සේ, ක්‍රිස්තුස් ජේසුස්
වහන්සේගේ පැමිණීමේ දවස දක්වා එය සම්පූර්ණ
කරනු ඇතැ යි මම ඒකාන්තයෙන් ම විශ්වාස කරමි.
7 ඔබ මට ඉතා හිතවත් බැවින් ද මා සිරගත ව
සිටිය දී ද සුබ අස්න ගැන වගඋත්තර දීමේ දී හා
එය ස්ථිර කිරීමේ දී ද මා ලැබූ දේව
වරප්‍රසාදයන්ට ඔබ පංගුකාරයන් වූ බැවින් ද ඔබ
හැම ගැන මා මෙසේ සිතීම යුතු ය. 8 ක්‍රිස්තුස්
ජේසුස් වහන්සේගේ සෙනෙහසින් මා ඔබට
සැබැවින් ම ප්‍රේම කරන බව දෙවියන් වහන්සේ
දන්නා සේක. 9 ඔබ උදෙසා මාගේ යාච්ඤාව මේ
ය: විශිෂ්ටතම දේවල් වටහාගැනීමට හැකි වන
පිණිස, දැනගැන්මෙන් හා සියලු ආකාර විමසීමෙන්
ඔබගේ ප්‍රේමය බොහෝසෙයින් වර්ධනය වේ වා.
10 ක්‍රිස්තුන් වහන්සේගේ දවස දක්වා අවංක ව හා
නිදොස් ව සිටීමට ඔබට හැකි වේ වා. 11 ජේසුස්
ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන දෙවියන්
වහන්සේගේ ගෞරවය හා ප්‍රශංසාව පිණිස ඔබ
දැහැමි ජීවිතයක ඵලවලින් පූර්ණ වේ වා.

## ක්‍රිස්තුන් වහන්සේ උදෙසා ජීවත් වීම

12 සහෝදරවරුනි, මට සිදු වූ කාරණා සුබ අස්නේ
ම දියුණුවට හැරී තිබෙන බව ඔබට දන්වනු
කැමැත්තෙමි. 13 ක්‍රියා 28:30මා සිරගත වීම
ක්‍රිස්තුන් වහන්සේ නිසා වූ බව රාජකීය මුර
සෙබළුන් ද සෙසු අය ද දැනගෙන ඇත. 14 මාගේ
සිර අඩස්සි වීම හේතුකොටගෙන කිතුනු
සහෝදරයන්ගෙන් වැඩි දෙනෙකේ ධෛර්ය ලැබ දේව
වචනය අභීත ව ප්‍රකාශ කිරීමට අධික ලෙස
නිර්භීත ව සිටිති.
15 සමහරු ඊර්ෂ්‍යාවෙන් හා විරුද්ධ වාදිකමින් ද
සමහරු හොඳ සිතින් ද ක්‍රිස්තුන් වහන්සේ ප්‍රකාශ
කරති. 16 පසුව කී අය, මා සිරගත ව සිටින්නේ සුබ
අස්න ආරක්ෂා කිරීමට බව දැන ප්‍රේමයෙන් ද
17 මුලින් කී අය, මා සිරගත ව සිටින විට වඩාත්
කරදර ඇති කරවීමේ අදහසින්, අවංක ලෙස නොව,
ආත්මාර්ථකාමී චේතනාවෙන් ද ක්‍රිස්තුන් වහන්සේ
ප්‍රකාශ කරති.
18 කෙසේ වුවත් කමක් නැත. වංක ලෙස වේ වා,
අවංක ලෙස වේ වා, හැම අයුරින් ම ක්‍රිස්තුන්
වහන්සේ දේශනා කරනු ලබන බැවින් ඒ ගැන ප්‍රීති
වෙමි. මතු ද ප්‍රීති වන්නෙමි. 19 ඔබගේ යාච්ඤා
නිසා ද, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ
ආත්මයාණන්ගෙන් මට ලැබෙන ආධාරය නිසා ද, මේ
කරුණු මාගේ නිදහසට ඉවහල් වන බව මම දනිමි.
20 මාගේ දැඩි බලාපොරොත්තුව හා පැතීම මෙයෙ
වේ: මා කිසිවක් ගැන ලජ්ජාවට නොපැමිණ, හැම
අයුරින් ම නිර්භීත ව සිට, මැරෙතත්, ජීවත් වෙතත්,
මාගේ ජීවිතයෙන්, පෙර සේ ම දැනුත් ක්‍රිස්තුන්
වහන්සේ මහිමයට පැමිණවීම ය. 21 මට ජීවත් වීම
නම්, ක්‍රිස්තුන් වහන්සේ උදෙසා ජීවත් වීම ය.
මරණය මට වාසියකි. 22 එහෙත් මිහි පිට
ජීවත්වීමෙන් යම් වැඩදායි සේවයක් කළ හැකි නම්,
මේ දෙකෙන් කුමක් තෝරාගන්නට දැ යි මම
නොදනිමි. 23 මම මේ දෙකෙ මැද හිර වී සිටිමි.
මාගේ ආශාව නම් මෙලොවින් තුරන් වී ගොස්,
ක්‍රිස්තුන් වහන්සේ සමඟ විසීම ය. මෙයෙ වඩාත්
හොඳ ය. 24 එහෙත් ඔබ උදෙසා මිහි පිට විසීම
ඊටත් වඩා අවශ්‍ය වේ. 25 මේ ගැන මට සහතික
ය. එබැවින් මා ජීවතුන් අතර සිට, ඔබගේ ඇදහීමේ
වර්ධනය හා ප්‍රීතිය සඳහා ඔබ සියල්ලන් සමඟ
සිටින්නට යන බව මම දනිමි. 26 මෙලෙසෙ, මා ඔබ
වෙත නැවත පැමිණීම කරණකොටගෙන ක්‍රිස්තුස්
ජේසුස් වහන්සේ තුළ වැඩි වන ඔබගේ පාරට්ටුව
මට ද භුක්ති විඳීමට හැකි වනු ඇත.
27 කෙසේ වෙතත්, ඔබ ක්‍රිස්තුන් වහන්සේගේ
සුබ අස්නට ඔබින ලෙස ම හැසිරෙන්න. එවිට ඔබ
දැකීමට මා ආවත්, නාවත්, ඔබ ස්ථිර ව, එක්සත් ව
සිටින බව ද, ඔබ හැම, එකකු මෙන් සුබ අස්නේ
ඇදහිල්ල සඳහා වීර්ය කරන බව ද, 28 ඔබේ
විරුද්ධවාදීන්ට අභීත ව මූණ පාන බව ද, ඇසීමට

මට හැකි වනු ඇත. ඒ අභීතකම ඔවුන්ට විනාශයේ
ලකුණක් ද ඔබට විමුක්තියේ ලකුණක් ද ලෙස
දෙවියන් වහන්සේගෙන් ම පැමිණෙන්නේ ය.
29 මන්ද, ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි අදහන්නට
පමණක් නොව, උන් වහන්සේ උදෙසා දුක්
විඳින්නටත් වරප්‍රසාදයක් ඔබට දෙන ලද්දේ ය.
30 ක්‍රියා 16:19-40වරක් මා යෙදී සිටි සටන ඔබ
දුටුවහු ය. තවමත් මා ඒ සටනෙහි යෙදෙන බව ඔබ
අසා ඇත. ඔබට ඇත්තේත් එම සටන ම ය.

### ක්‍රිස්තුන් වහන්සේගේ පහත් වීම හා උසස් වීම

2 ක්‍රිස්තුන් වහන්සේට අයිති වීමෙන් ඔබට යම්
ශක්තියක් තිබේ ද? ප්‍රේමයෙහි යම්
අස්වැසිල්ලක් තිබේ ද? ආත්මයාණන් වහන්සේ
සමඟ යම් සහභාගිකමක් තිබේ ද? එකිනෙකා
කෙරෙහි ආදරයක් හා දයාබරකමක් තිබේ ද?
2 එසේ නම්, ඔබ එක සමාන චේතනා ඇති ව, එක
ම ප්‍රේමයෙන් බැඳී, එක ම අරමුණකින් එක්සිත් ව
සිටීමෙන් මාගේ ප්‍රීතිය සම්පූර්ණ කරන්න.
3 පක්ෂවාදීකමින් වත් පුහු මාන්නයෙන් වත් කිසිවක්
නොකරන්න. එකිනෙකා තම තමාට වඩා අන් අය
උතුම් යයි යටහත්කමින් සිතන්න. 4 සැමදෙන තම
තමාගේ ම යහපත පමණක් නොසොයා, අනුන්ගේ
යහපත ගැන ද සලකන්න. 5 ක්‍රිස්තුස් ජේසුස්
වහන්සේ තුළ පැවති ජීවිතාකල්පය ම ඔබ තුළත්
පවතී වා!
6 උන් වහන්සේ, දෙවියන් වහන්සේගේ ස්වරූපය
දැරූ නමුත්, දෙවියන් වහන්සේ හා සමානත්වය
තමන් විසින් බදාගෙන ම තබාගත යුතු වස්තුවකැ යි
නොසිතා,
7 තමන් වහන්සේ ම ත්‍යාජ කරගනිමින්,
වහලකුගේ ස්වරූපයක් ගෙන, අප හා සමාන මිනිස්
කෙනෙකේ වූ සේක.
8 මනුෂ්‍යාකාරයෙන් සිටිමින්, උන් වහන්සේ,
මරණය, එනම් කුරුසියේ මරණය දක්වා, පහත් වී
කීකරු වූ සේක.
9 එබැවින් දෙවියන් වහන්සේ උන් වහන්සේ අති
උසස් තැනට නංවා, සියලු නාමයන්ට වඩා අග්‍ර
නාමය උන් වහන්සේට දුන් සේක.
10 යෙසා 45:23 එසේ කළේ, ස්වර්ගයෙහි ද
පොළොවෙහි ද, පාතාල ලෝකයෙහි ද සියල්ලන්,
‘ජේසුස්’ යන නාමයට දණ නමන පිණිසත්,
11 ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සමිඳාණන්
වහන්සේ යයි දෙවී පියාණන් වහන්සේගේ මහිමය
සඳහා, සෑම දිවකින් ම ප්‍රකාශ කරන පිණිසත් ය.

### අඳුරු ලොවෙක තාරකා මෙන් බැබළීම

12 සැබැවින් මාගේ ප්‍රේමවන්තයෙනි, මා ඔබ
වෙත සිටිය දී, ඔබ කීකරු ව සිටියාක් මෙන් ම, දැන්
මා ඔබෙන් ඈත් ව සිටින විටත්, ඊටත් වඩා කීකරු ව
සිටිය යුතු ය. ඔබ බියෙන් හා වෙව්ලීමෙන් යුතු ව
ඔබේ විමුක්තිය සලසාගන්න. 13 මන්ද, ඔබ දෙවියන්
වහන්සේගේ යහපත් කැමැත්තට අවනත වී, එය
ඉෂ්ට කරවීමට උන් වහන්සේ ම ඔබ තුළ ක්‍රියා
කරන සේක. 14 ඔබ කුමන දෙයක් කළත්, මැසිවිලි
කීමක් වත් විවාදයක් වත් නැති ව එය කරන්න.
15 ද්වි.නී. 32:5එවිට ඔබ නිදොස් හා අහිංසක
වන්නහු ය. ඔබ වංක, හිතුවක්කාර පරම්පරාවක්
මධ්‍යයෙහි, දෙවියන් වහන්සේගේ නිර්දෝෂ දරුවන්
ව, 16 ඔවුන් අතර ජීවන පණිවුඩය ප්‍රදානය
කරමින්, අඳුරු ලෝකයක දීප්තිමත් තාරකා මෙන්
බබළන්නහු ය. ඔබ එසේ කළොත්, ‘මම නිෂ්ඵල
ලෙස නොදිව්වෙමි, නිෂ්ඵල ලෙස වීර්ය
නොකෙළෙමි’යි ක්‍රිස්තුන් වහන්සේගේ දවසේ දී
ඔබ ගැන මට පාරට්ටු කරගත හැකි වේ.
17 ඔබගේ ඇදහිල්ල නමැති පූජාවත් සේවයත්
මත මා ද පූජාවක් ලෙස ඔප්පු කරනු ලැබුවත්
සන්තෝෂ වෙමි. ඔබ හැම සමඟ ප්‍රීති වෙමි.
18 එලෙස ම ඔබත් සන්තෝෂ වන්න, මා සමඟ
ප්‍රීති වන්න.

### සහා සේවක තිමෝතියස් සහ එපප්‍රොදිතස්

19 ඔබ ගැන තොරතුරු අසා ධෛර්ය වත් වන
පිණිස, ජේසුස් ස්වාමීන් වහන්සේ කැමැති සේක්
නම් තිමෝතියස් ඔබ වෙත නොපමා ව එවීමට මම
බලාපොරොත්තු වෙමි. 20 ඔබගේ යහපත ගැන
අවංක සැලකිල්ලක් දක්වන, ඔහු වැනි වෙන
තැනැත්තකේ මට නැත. 21 සියල්ලෝම තම
තමන්ගේ ම කාරිය ගැන මිස, ක්‍රිස්තුස් ජේසුස්
වහන්සේගේ කාරණා ගැන නොවෙහෙසෙති. 22 ඔහු
නම්, පුත්‍රයකු සිය පියා හා සමඟ සේවය
කරන්නාක් මෙන්, සුබ අස්නේ අභිවෘද්ධිය සඳහා මා
සමඟ සේවය කළ බවට ඔහුගේ සාක්ෂිය ඔබ
දන්නහු ය. 23 එබැවින් මාගේ කාරණා කෙසේ අතට
හැරේ දැ යි දුටු කෙණෙහි ම ඔහු ඔබ වෙත එවීමට
මම බලාපොරොත්තු වෙමි. 24 සමිඳාණන් වහන්සේ
කැමැති සේක් නම් නොබෝ කලකින් මටත් ඔබ
වෙතට එන්න ලැබෙනු ඇතැ යි මම විශ්වාස කරමි.
25 මා සොහොයුරු එපප්‍රොදිතස් ද ආපසු ඔබ
වෙත එවීම මැනවැ යි මට කල්පනා වී ඇත. ඔහු
වනාහි මට ආධාරෝපකාර කිරීමට ඔබ මා වෙත එවූ
ඔබේ දූතයකු වන මාගේ සේවකයකු ද හවුල්
භේවායකු ද වේ. 26 ඔහු ඔබ හැම දෙනා දැකීමට
තද ආශාවක් ඇති ව සිටියේ ය, තමා රෝගාතුර ව
සිටිය බව ඔබට සැළ වූ බැවින් ඉතා කණගාටු විය.
27 ඔහු සැබැවින් ම මරණාසන්න වන තරමට
රෝගාතුර ව සිටියේ ය. එහෙත් දෙවියන් වහන්සේ
ඔහුට කරුණා කළ සේක. ඔහුට පමණක් නොව, දුක
පිට දුක මා වෙත නොඑන පිණිස මටත් කරුණා කළ
සේක. 28 එබැවින් ඔබ ඔහු නැවත දැක ප්‍රීති වන
පිණිසත්, මාගේ ශෝකය අඩු වන පිණිසත් ඔහු
එවීමට වඩාත් ආශාවෙන් සිටිමි. 29 කිතුනු සහෝදර
ප්‍රීතියෙන් ඔහු පිළිගන්න. එබඳු අය ගෞරවයෙන්
සලකන්න. 30 මන්ද, ඔහු ක්‍රිස්තුන් වහන්සේගේ
සේවය සඳහා දිවි පිදීමට පවා සූදානම් ව මරුමුවට

ළඟා වූයේ ඔබ විසින් දීමට නොහැකි වූ සහාය මට
දීමට යි.

## නියම දැහැමි ජීවිතය

3 ඉතින් සහෝදරවරුනි, සමිඳාණන් වහන්සේ
තුළ ප්‍රීතියෙන් පවතින්න. කලින් ඔබට කී දේ
ම යළිත් සඳහන් කිරීම මට කරදරයක් නොවේ.
ඔබේ පරෙස්සමටත් එය හොඳ ය. 2 බල්ලන් වැනි
අයගෙන් ද ඔවුන්ගේ දුරාචාරකම්වලින් ද පරෙස්සම්
වන්න. චර්මඡේදනය යයි කියා ශාරීරික ඡේදනයක්
අදහස් කරන්නන්ගෙන් පරෙස්සම් වන්න. 3 නියම
චර්මඡේදිතයෝ නම්, දෙවියන් වහන්සේගේ
ආත්මයාණන් මඟින් උන් වහන්සේට නමස්කාර
කරන, ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ පාරට්ටු
කරගන්න, බාහිර වත්පිළිවෙත් පිට විශ්වාසයක්
නොතබන අපි වම්හ.
4 ඕනෑ නම් මට බාහිර වත්පිළිවෙත් කෙරෙහි පවා
විශ්වාසය තැබීමට පිළිවන. යමෙක් බාහිර
වත්පිළිවෙත් කෙරෙහි විශ්වාසය තබන්නට පිළිවනැ
යි සිතන්නේ නම්, මට ඊටත් වඩා එසේ කළ හැකි
ය. 5 ක්‍රියා 23:6; 26:5; රෝම 11:1මම අට වන දා
චර්මඡේදනය ලැබීමි; ඉශ්‍රායලේ වංශයේ ද
බෙන්ජමින් ගෝත්‍රයේ ද තැනැත්තකෙමි; හෙබ්‍රෙව්
පළෙපතින් එන නියම හෙබ්‍රෙව්වකෙමි; ව්‍යවස්ථාව
පිළිපැදීමෙන් නම් පරිසියකෙමි; 6 ක්‍රියා 8:3; 22:4;
26:9-11උද්‍යෝගය අතින් නම් සභාවට පීඩා කළ
තැනැත්තකෙමි. ව්‍යවස්ථාවෙන් පැමිණෙන දමිටුකම
අතින් නම් නිදොස් වූවකෙමි.
7 එහෙත් මට වාසියක් ව තිබූ දේ ම, ක්‍රිස්තුන්
වහන්සේ උදෙසා දැන් අවාසියකැ යි සිතන්නට
පටන්ගතිමි. 8 එපමණකුත් නොවේ, මාගේ ස්වාමීන්
වන ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ දැනගැන්මේ
විශිෂ්ටතාව නිසා ඒ සියල්ල අවාසියකැ යි
ගණන්ගනිමි. උන් වහන්සේ නිසා සියලු දේ මට
නැති වී ගියා පමණක් නොව, ඒ සියල්ල කුණු කසළ
යයි සලකමි. මාගේ කැමැත්ත නම් ක්‍රිස්තුන්
වහන්සේ අත්කරගැනීමත්, 9 උන් වහන්සේ හා
ඒකාබද්ධ වීමත් ය; ව්‍යවස්ථාවෙන් වන මාගේ ම
දමිටුකම නොව, ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි
ඇදහීම කරණකොටගෙන ඇදහිල්ල නිසා, දෙවියන්
වහන්සේගෙන් වන දමිටුකම ලබාගැනීම ය. 10 මට
ඕනෑ එක ම දේ නම් ක්‍රිස්තුන් වහන්සේ හා උන්
වහන්සේගේ පුනරුජ්ජීවනයේ බලය දැනගැනීම හා
ක්‍රිස්තුන් වහන්සේගේ මරණයට සමාන වීමෙන්
උන් වහන්සේගේ දුක්වේදනාවලට පංගුකාර වීමත්,
11 යම් අන්දමකින් මළවුන්ගෙන් උත්ථාන වීමට
පැමිණීමත් ය.

## දිනුම් කණුව බලා දිවීම

12 මේ සියල්ල දැනට ම මට ලැබී තිබෙන බවක්
වත්, දැනට ම මා සම්පූර්ණ වී සිටින බවක් වත් මම
නොකියමි. යමක් පිණිස ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ
මා අත්කරගත් සේක් ද, ඒ දේ අත්කර ගැනීම
පිණිස මමත් වීර්යයෙන් දුවමි. 13 සහෝදරයෙනි, මම
තවමත් ඒ දේ අත්කරගෙන ඇතැ යි නොසිතමි. එක
දෙයක් මට වැදගත් ය: පසුගිය දේ අමතක කරදමා,
ඉදිරියෙහි තිබෙන දේ දෙස ම නෙතේ යොමා,
14 ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ මඟින් දෙවියන්
වහන්සේ දෙන්නට අදහස් කරන ස්වර්ගීය ත්‍යාගය
ලබන පිණිස දිනුම් කණුව කරා මම දුව යමි.
15 එබැවින් අප අතරෙන් මුහුකුරා ගිය අයවලුන්
ඒකාකාර ව කල්පනා කළ යුතු ය. එහෙත් ඔබ යමක්
ගැන වෙනස් ලෙස සිතන්නහු නම්, ඒ ගැනත්
දෙවියන් වහන්සේ ඔබගේ සිත් පහදවනු ඇත.
16 කෙසේ වෙතත් අපි යම් තත්ත්වයකට පැමිණ
සිටිමු ද ඒ තත්ත්වය අනුව හැසිරෙමු.
17 1 කොරි 4:16; 11:1 සහෝදරවරුනි, ඔබ හැම
දෙන ම මා අනුගමනය කිරීමට එකඟ වන්න. අපි
ඔබට ආදර්ශයක් වී සිටිමු. ඒ ආදර්ශය අනුව
හැසිරෙන්නන් හොඳින් කල්පනාවට ගන්න. 18 මන්ද,
මා බොහෝ වර ඔබට කියා ඇති ලෙසත්, දැන් කඳුළු
හලමින් කියන ලෙසත්, බොහෝ දෙනෙක් ක්‍රිස්තුන්
වහන්සේගේ කුරුසියේ සතුරන් මෙන් හැසිරෙති.
19 ඔවුන්ගේ අවසානය විනාශය වේ; ඔවුන්ගේ
දෙවියෝ මාංසික තෘෂ්ණාවෝ වෙති; ලජ්ජා විය යුතු
දේ ගැන ඔව්හු පාරට්ටු කර ගනිති; ඔවුන්ගේ
කල්පනාව මෙලෝ දේ ගැන පමණ ය. 20 එහෙත්
අපි ස්වර්ගයේ පුරවැසියෝ වම්හ; අප ගළවන
පිණිස ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ
ස්වර්ගයෙන් වඩින තෙක් අපි බලා සිටිමු. 21 සියල්ල
තමන්ට වසඟ කර ගැනීමට ඇති ස්වකීය බලය
අනුව, දැනට අපට ඇති පහත්කමේ ශරීර, තමන්
වහන්සේගේ තේජාන්විත ශරීරයට සමාන වන
පිණිස, උන් වහන්සේ ඒවා, වෙනස් කරන සේක.

## අවවාදානුශාසනා

4 එහෙයින් මාගේ ප්‍රේමවන්ත, හිතවත්
සහෝදරවරුනි, මාගේ ප්‍රීතියත්, ඔටුන්නත්
වන ප්‍රේමවන්තයෙනි, මෙසේ සමිඳාණන් වහන්සේ
තුළ ස්ථිර ව සිටින්න.
2 අමනාපකම් ඉවත ලා, සමිඳාණන් වහන්සේ තුළ
එක්සිත් වන ලෙස එවෝදියාගෙන් ද සින්තිකීගෙන් ද
ඉල්ලමි. 3 එසේ ය, මේ ස්ත්‍රීවරුන්ට උපකාර කරන
ලෙස මාගේ සැබෑ පංගුකාරයකු වන ඔබෙනුත්
ඉල්ලමි. ඔව්හු ක්ලෙමෙන්ත් ද මාගේ අනෙක් හවුල්
සේවකයන් ද ඇතුළු ව මා සමඟ සුබ අස්න සඳහා
සේවය කළෝ ය. ඔවුන්ගේ නාම ජීවන පොතෙහි
ලියා ඇත.
4 සමිඳාණන් වහන්සේ තුළ නිතර ම ප්‍රීති වන්න.
ප්‍රීති වන්නැ යි නැවතත් කියමි. 5 ඔබගේ ගුණ
යහපත්කම සියලු මනුෂ්‍යයන්ට දැනගන්නට ලැබේ
වා. සමිඳාණන් වහන්සේ විගස වඩින සේක. 6 ඔබ
කිසිවක් ගැන කරදර නොවී, සියල්ලෙහි දී ස්තුති
පූර්වක ව, යාච්ඤාවෙන් හා කන්නලව්වෙන් ඔබගේ
අයැදීම් දෙවියන් වහන්සේට දන්වන්න. 7 එවිට සියලු
නැණනුවණ ඉක්මවා යන දෙවියන් වහන්සේගේ

සාමදානය, ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළින්
ඔබගේ සිතුම් පැතුම් ආරක්ෂා කරන්නේ ය.
8 අවසන් කොට, සහෝදරවරුනි, සත්‍ය වූ හා උදාර
වූ කොයි දේ ගැනත්, සාධාරණ වූ හා පිරිසිදු වූ
කොයි දේ ගැනත්, ප්‍රිය වඩන හා මනහර කොයි
දේ ගැනත් සදාචාරාත්මක යයි ප්‍රශංසනීය යයි
සිතිය හැකි යමක් ඇද්ද, ඒවා ගැනත් සිත
යොදවන්න. 9 ඔබ මාගෙන් ඉගෙනගත්, මා ඔබට
භාරදුන්, මා කියනු ඇසූ, මා කරනු දුටු, සියල්ල
ක්‍රියාවෙහි යොදවන්න. එවිට සාමදානයේ දෙවියන්
වහන්සේ ඔබ සමඟ වන සේක.

### තුති පඬුරු පිළිගැනීම

10 බොහෝ කලකට පසු මා ගැන කල්පනා කිරීමට
ඔබ නැවත පිබිදුණු බැවින් සමිඳාණන් වහන්සේ තුළ
මම අතිශයින් ප්‍රීති වෙමි. කවදත් ඒ කල්පනාව ඔබ
තුළ තිබිණි. එහෙත් එය පෙන්වීමට ඉඩප්‍රස්තාවක්
නො වී ය. 11 මා මෙය කියන්නේ මට ඇති හිඟ
කමක් නිසා නොවේ. මන්ද, මම කුමන තත්ත්වයක
සිටියත් ඇති දෙයින් සතුටු වීමට ඉගෙනගෙන සිටිමි.
12 මම පහත් තත්ත්වයක සිටින්නට ද සමෘද්ධ ව,
සිටින්නට ද දනිමි. මා කුමන තත්ත්වයක කොහි
සිටියත් සෑහීමට පැමිණ සිටින්නටත්, සාගින්නෙන්
සිටින්නටත්, සමෘද්ධ ව සිටින්නටත්, අඟහිඟකම් ඇති
ව සිටින්නටත් හැකි, රහස ඉගෙනගෙන සිටිමි. 13 මා
බලවත් කරන තැනැන් වහන්සේ තුළ මට සියලු දේ
කළ හැකි ය. 14 කෙසේ වුව ද, මාගේ පීඩාවල දී
ඔබ මට උපකාර කිරීම කොතරම් හොඳ ද?
15 2 කොරි 11:9 පිලිප්පිවරුනි, මාගේ ධර්මදූත
සේවයේ මුල් අවදියේ දී මා මසිදෝනියෙන් නික්ම
ගිය විට, ඔබ හැර අන් කිසි සභාවක් මගේ අය වැය
සම්බන්ධයෙන් මට හවුල් නො වූ බව ඔබ ම
දන්නහු ය. 16 ක්‍රියා 17:1තවද මා තෙසලෝනිකයේ
සිටිය දී පවා මාගේ ඕනෑඑපාකම් පිරිමැසීමට කීප
වරක් ඔබ මට මුදල් එව්වහු ය. 17 මා දීමනාව
සොයනවා නොවේ. මා සොයන්නේ ඔබගේ ගිණුම
අධික ලෙස වැඩි කරන විපාකය යි. 18 නික්ම
29:18දැන් මට සියල්ල වුවමනාවටත් වැඩියෙන් ලැබී
ඇති බවට සහතික කරමි. ඔබ එපප්‍රොදිතස් අත
මා වෙත එවූ දේවල් ද ලබා පූර්ණ වී සිටිමි. ඒවා
දෙවියන් වහන්සේට මිහිරි සුගන්ධයක් හා
ප්‍රියමනාප පූජාවක් වී ඇත. 19 මාගේ දෙවියන්
වහන්සේ, ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ, ස්වකීය
තේජාන්විත වස්තු සම්භාරය අනුව ඔබගේ සියලු
අඟහිඟකම් සපුරාලන සේක. 20 අපගේ පිය වූ
දෙවියන් වහන්සේට සදහට ම මහිමය වේ වා!
ආමෙන්.

### අවසාන ආචාරය

21 ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ සියලු
සැදැහැවතුන්ට ආචාර කරන්න. මා සමඟ සිටින
සහෝදරයෝ ඔබට ආචාර කරති. 22 සියලු
සැදැහැවත්හු ද, ප්‍රධාන කොට සීසර්ගේ රාජ
භවනයේ සැදැහැවත්හු ද ඔබට ආචාර කරති.
23 ජේසුස් ක්‍රිස්තුස් ස්වාමීන් වහන්සේගේ
කරුණාව ඔබ සියල්ලන් සමඟ වේ වා!

### පාවුලු තුමා කොලොසේසිවරුන් වෙනුවෙන් වෙහෙසීම

2 ඔබ උදෙසාත්, ලවොදිසියේ වැසියන් උදෙසාත්,
පෞද්ගලික වශයෙන් මා නුදුටු සියල්ලන්
උදෙසාත් මා කෙතරම් අධික ලෙස වෙහෙස මහන්සි
දරනවා දැ යි ඔබට දන්වන්නට කැමැත්තෙමි. 2 මා
එසේ කරන්නේ ඔවුන්ගේ සිත් ධෛර්යවත් වන
පිණිසත්, ඔවුන් ප්‍රේමයෙන් එකට බැඳී සිටින
පිණිසත්, අවබෝධයෙන් ඇති වන සම්පූර්ණ
සහතිකකමේ සම්පත උරුම කරගෙන, දෙවියන්
වහන්සේගේ රහස තේරුම්ගන්නා පිණිසත් ය. ඒ
රහස ක්‍රිස්තුන් වහන්සේ ම ය. 3 උන් වහන්සේ
තුළ ප්‍රඥාවේත් දැනගැන්මේත් සකල ධන
සම්භාරය නිදන් වී ඇත.
4 මා මෙසේ කියන්නේ කිසිවකුගේ බොරු
චාටුවලින් ඔබ මුළා නොවන පිණිස ය. 5 මම
ශරීරාකාරයෙන් ඈත් ව සිටින නමුත්, ආධ්‍යාත්මයෙන්
ඔබ සමඟ සිටිමින්, ඔබගේ විනයානුකූල හැසිරීමත්,
ක්‍රිස්තුන් වහන්සේ තුළ ඇති ඔබගේ ඇදහිල්ලේ
ස්ථිරකමත් දැක ප්‍රීති වෙමි.

### පරිපූර්ණ ක්‍රිස්තියානි ජීවිතය

6 එබැවින් ඔබ ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ
සමිඳාණන් වහන්සේ වශයෙන් පිළිගෙන තිබෙන
බැවින් උන් වහන්සේ හා ඒකාබද්ධ වී ජීවත් වන්න.
7 උන් වහන්සේ තුළ මුල් ඇදගන්න පරිදි ස්ථිර ව
සිටින්න; උන් වහන්සේ මත ඔබේ ජීවිත නිර්මාණය
කරගන්න; ඔබට උගන්වන ලද ඇදහිල්ලේ පිහිටා
සිටින්න. බෙහෙවින් තුති පුදන්න.
8 ක්‍රිස්තුන් වහන්සේගෙන් නොවන, මිනිස්
සම්ප්‍රදායයන් හා ලෝක භූතාධිපතීන්
පදනම්කොටගත් දර්ශනවාදවලින් හා
සම්ප්‍රලාපවලින් උගුල් අටවන අයගෙන් පරිස්සම්
වන්න. 9 මන්ද, ක්‍රිස්තුන් වහන්සේ තුළ, උන්
වහන්සේගේ මිනිස් බවෙහි ම දේවත්වයේ
පරිපූර්ණතාව වැඩ වාසය කරයි. 10 සකල
භූතාධිපතීන්ට හා බලධාරීන්ට ඉහළින් පරමෝත්තම
වන උන් වහන්සේ හා ඒකාබද්ධ වීමෙන් ඔබේ
පූර්ණත්වය සැලසී ඇත.
11 උන් වහන්සේ හා ඒකාබද්ධ වීමෙන් ඔබ
චර්මඡේදනය කරනු ලැබුවහු ය. ඒ වනාහි
සැත්කමකින් කරන ලද චර්මඡේදනයක් නොව,
මාංසික ක්ලේශයන් ඉවත් කිරීමේ චර්මඡේදනයකි.
ක්‍රිස්තුන් වහන්සේගේ චර්මඡේදන පිළිවෙත එය
යි. 12 රෝම 6:4මන්ද, බව්තීස්ම-ස්නාපනයේ දී ඔබ
උන් වහන්සේ සමඟ වළලනු ලැබ, උන් වහන්සේ
මරණයෙන් උත්ථාන කළ දෙවියන් වහන්සේගේ
ක්‍රියාකාරී බලය තුළ ඇති විශ්වාසය
කරණකොටගෙන ක්‍රිස්තුන් වහන්සේ සමඟ

උත්ථාන කරනු ලැබුවහු ය. 13 එෆී 2:1-5ඔබ
පව්කාරයන් නිසාත්, අචර්මඡේදිතයන් වූ නිසාත් මැරී
සිටි නමුත්, දවෙියන් වහන්සේ ඔබ ක්රිස්තුන්
වහන්සේ සමඟ ජීවත් කර ඔබේ සියලු පව් කමා
කළ සේක. 14 එෆී 2:15අණපණත්වලට අප බැඳ
තැබූ අපට අහිතකර ඇපකරය උන් වහන්සේ
අවලංගු කළ සේක. එය කුරුසියේ ඇණ ගසා අපනේ
ඉවත් කළ සේක. 15 මලෙසෙ උන් වහන්සේ
භූතාධිපතීන් ද බලධාරීන් ද නිරායුධ කොට ඔවුන්
ප්රසිද්ධියේ ජය පරෙහරින් ගනෙ ගොස් ප්රදර්ශනය
කළ සේක.
16 රෝම 14:1-6 එබැවින් කෑම ගැන වත්, බීම ගැන
වත්, මංගල දවසක් ගැන වත්, අමාවක දවසක් ගැන
වත්, සබත් දවස් ගැන වත් ඔබ විනිශ්චය කරන්නට
කිසිවකුෙට ඉඩ නොදනේන. 17 ඒවා පැමිණනේනට
තිබුණු දේවල ඡායාවක් පමණි. ඒ දේවල යථා
තත්ත්වය ක්රිස්තුන් වහන්සේ ය. 18 තපස් රැකීම
නිසා හෝ දේවදූත වන්දනා මාන නිසා හෝ විශේෂ
දර්ශන නිසා හෝ උඩඟු වූ කිසිවකුෙට, ඔබට හිමි
තැනින් ඔබ පහ කිරීමට ඉඩ නොදනේන. එබඳු අය
කලෙසේ සිතින් බැඳී පුහු අභිමානයනේ උද්දාම වී
සිටිති. 19 එෆී 4:16ඔව්හු සභාවේ හිස වන ක්රිස්තුන්
වහන්සේට සම්බන්ධ නොවති. එහතේ ඇට කටු
හා නහරවලින් ශරීරය ඒකාබද්ධ කොට, පෝෂණය
කර, දවෙියන් වහන්සේගේ කැමැත්ත අනුව එය
වර්ධනය වන්නට සලසන්නේ ඒ හිස ය.

### ලෝකයනේ ජය ගැනීම

20 ඔබ ක්රිස්තුන් වහන්සේ සමඟ මැරී, ලෝකයේ
භූතාධිපතීන්ගනේ ජය ගත්තහු නම් තව ම
ලෝකයට අයිති වූවන් මනේ ජීවත් වමේන්,
21 'මේවාට අත නොගසනු', 'මේවා අනුභව
නොකරනු', 'මේවා ස්පර්ශ නොකරනු' යන නියෝග
වලට යටත් වන්නේ මන් ද? 22 මනුෂ්යයා පැනවූ
මේ නියෝග, භාවිතා කළ පසු කුණු වී යන දේ
පිළිබඳ ව ය. 23 තමන් ම මවාගත් නමස්කාර ක්රම
නිසාත්, ව්යාජ නිහතමානීකම නිසාත්, ශරීරයට වද
දීම නිසාත්, බැලූ බැල්මට ඒ නියෝගවල
වටිනාකමක් ඇති සේ පනෙුනත් මාංසික තෘෂ්ණා
මැඩලීමට ඒවායින් කිසි ඵලක් නොලැබේ.

### පරණ ජීවිතය සහ අලුත් ජීවිතය

3 ගීතා 110:1 ඔබ ක්රිස්තුන් වහන්සේ සමඟ
උත්ථාන කරනු ලැබූ බැවින්, දවෙියන්
වහන්සේගේ දකුණු පස වැඩ හිඳින ක්රිස්තුන්
වහන්සේ වැඩ සිටින තැන ඇති, ලොව්තුරු දේ
ප්රාර්ථනා කරන්න. 2 ලෞකික දේ කරෙහි නොව,
ලොව්තුරු දේ කරෙහි ඔබේ සිත යොමු කරන්න.
3 මන්ද, ඔබ මැරුණු බැවින් දැන් ඔබේ ජීවිතය
ක්රිස්තුන් වහන්සේ සමඟ දවෙියන් වහන්සේ තුළ
සැඟවී පවතියි. 4 අපේ ජීවනය වන ක්රිස්තුන්
වහන්සේ ප්රකාශ වන විට, ඔබත් උන් වහන්සේ
සමඟ තේජසින් ප්රකාශ වනු ඇත.

5 එබැවින් කාමමිථ්යාචාරය, අපිරිසිදුකම,
කාමරාගය, නපුරු තෘෂ්ණා සහ රූප වැඳීමක් වැනි
තණ්හාව යන කාමුක දුසිරිත් නසාදමන්න. 6 මේ දේ
නිසා අකීකරු වන අය පිට දේව උදහස පැමිණනෙු
ඇත. 7 ඔබත් එක් කාලයක දී ඔවුන් මනේ මේ
දුසිරිත්වල ඇලීගැලී ජීවත් වූවහු ය.
8 එහතේ දැන් ඔබ ඒ සියල්ල, එනම්, උදහස,
කෝපය, කුඩුකේඩුකම, අපවාදය, අසභ්ය කතා
මුලිනුපුටා දමන්න. 9 එෆී 4:22එකිනකොට බොරු
නොකියන්න. මන්ද ඔබ පරණ ස්වභාවය එහි දුසිරිත්
සමඟ ඉවත ලා, 10 උත් 1:26; එෆී 4:24අලුත්
ස්වභාවයකින් සැරසී සිටින්නහු ය. දවෙියන්
වහන්සේ පිළිබඳ සම්පූර්ණ දැනගැන්මට ඔබ
පමුණුවන පිණිස, ඒ අලුත් ස්වභාවය එහි
මැවුම්කාරයාණන්ගේ රූපය අනුව උන් වහන්සේ
නිරන්තරයනේ අලුත් කරන සේක. 11 ඒ අලුත්
ජීවිතයහෙි ග්රීක ජුදවේ කියා වත්, චර්මඡේදිත
අචර්මඡේදිත කියා වත්, ම්ලේච්ඡ ශිෂ්ට කියා වත්,
දාස නිර්දාස කියා වත් භේදයක් නැත. ඇත්තේ
සියල්ලන් තුළ, සියල්ල වන, ක්රිස්තුන් වහන්සේ
පමණකෙි.
12 එෆී 4:2 එබැවින් දවෙියන් වහන්සේගේ
තෝරාගත්, සැදැහැවත්, ප්රේමවන්ත අය වශයනේ,
දයානුකම්පාවනේ ද කරුණාවනේ ද නිහතමානිකමනේ
ද මෘදුකමනේ ද ඉවසිලිවන්තකමනේ ද සැරසී
සිටින්න. 13 එෆී 4:32එකිනකො ගැන ඉවසමින්
යමකුෙට විරුද්ධ ව පැමිණිල්ලක් ඇත්නම්,
එකිනකොට කමා කරන්න. සමිඳාණන් වහන්සේ
ඔබට කමා කළාක් මනේ ඔබත් එකිනකොට කමා
කළ යුතු ය. 14 මේ සියල්ලට ඉහළින්, සියල්ල
සම්පූර්ණ ලසෙ ඒකාබද්ධ කරන ප්රේමයනේ
සැරසනේන. 15 ක්රිස්තුන් වහන්සේගේ සාමය ඔබේ
සිත් තුළ රජකම් කරේවා! එක ම ශරීරයේ
කොටස් වශයනේ ඔබ කැඳවන ලද්දේ මේ සඳහා
ය. කෘතඥතාව ද දක්වන්න. 16 එෆී 5:19-20ක්රිස්තුන්
වහන්සේගේ දහම් පණිවුඩය ඔබ තුළ සියලු
ප්රඥාවනේ සමෘද්ධ ව පවතීවා. එකිනකොට
ඥානවන්ත ලසෙ අවවාදානුශාසනා කරන්න.
ගීතිකාවලින් ද ගායනාවලින් ද ශුද්ධ ගීවලින් ද
සිතහෙි ස්තුතිවන්තකමින් ද දවෙියන් වහන්සේට
ගායනා කරන්න. 17 තවද, ඔබ වචනයනේ හෝ
ක්රියාවනේ හෝ කුමක් කරතත්, ඒ සියල්ල ජේසුස්
ස්වාමීන් වහන්සේගේ නාමයනේ කරමින් උන්
වහන්සේ තුළින් දවේ පියාණන් වහන්සේට ස්තුති
කරන්න.

### පවුලේ හා සමාජයේ යුතුකම්

18 එෆී 5:22; 1 පේදු 3:1 භාර්යාවනෙි,
කිතුනුවන්ගේ යුතුකම ලසෙ ඔබේ පුරුෂයන්ට යටත්
ව සිටින්න.
19 එෆී 5:25; 1 පේදු 3:7 පුරුෂයනෙි, රළු පරුෂ
නොවී ඔබේ භාර්යාවන්ට ප්රේම කරන්න.

20 එපී 6:1 දරුවනෙි, සියලු කාරණාවල දී
දමෙව්පියන්ට කීකරු වන්න. මන්ද, ඔබ එසේ කිරීම
සමි්දාණන් වහන්සේට ප්‍රීතියකි.
21 එපී 6:4 පියවරුනි, ඔබේ දරුවන් කුපිත
නොකරන්න. එසේ කළොත් ඔවුන් කලකිරෙනු ඇත.
22 එපී 6:5-8 දාසයනෙි, ඔබේ සමි්දාණන්
වහන්සේට ගෞරව දැක්වීමක් වශයනේ ඔබේ
මලෙොව ස්වාමිවරුන්ට සියලු කාරණාවල දී කීකරු
වන්න. මූණිච්චාවට ඔවුන් සතුටු කරන අදහසින්
නොව, අවංක සිතින් සේවය කරන්න. 23 ඔබ කරන
කොයි දයෙක් වුවත්, මනුෂ්‍යයන් උදසො නොව,
සමි්දාණන් වහන්සේ උදසො කරන දයෙක් මනේ මුළු
සිතින් කරන්න. 24 සමි්දාණන් වහන්සේ පොරොන්දු
වූ විපාකය ඔබට දනෙ බව සිහි කරන්න. මන්ද, ඔබ
සේවය කරන්නේ ඔබේ ස්වාමීන් වන ක්‍රිස්තුන්
වහන්සේට ය. 25 ද්වි.නී. 10:17; එපී 6:9වැරදි
කරන්නා තමා කරන වැරදිවල පල විපාකය
ලබන්නේ ය. දවේියන් වහන්සේ මිනිසුන්ගේ
තරාතිරම් නොබලන සේක.

4 එපී 6:9 ස්වාමිවරුනි, ස්වර්ගයහෙි ඔබටත්
ස්වාමිවරයකෙු සිටින බව සිතට ගනෙ, ඔබේ
දාසයන්ට යුතු ලසෙ හා සාධාරණ ලසෙ සලකන්න.

## ධර්මානුශාසනා

2 අවදිව, ස්තුතිවන්තකමනේ යුක්ත ව නොකඩව
යාච්ඤාවේ යදෙී සිටින්න. 3 ඒ සමඟ ම ක්‍රිස්තුන්
වහන්සේ පිළිබඳ අබිරහස ප්‍රකාශ කරන පිණිස
දහම් පණිවුඩය දේශනා කරන්නට දවේියන්
වහන්සේ අපට දොරක් ඇර දනෙ ලසෙ යාච්ඤා
කරන්න. මා දැන් හිරභාරයේ සිටින්නේ ඒ සඳහා ම
ය. 4 හැකි පමණ පැහැදිලි ලසෙ එය ප්‍රකාශ
කිරීමට මට වරම් ලැබනෙ සේ යාච්ඤා කරන්න.
5 එපී 5:16 ක්‍රිස්තියානි නොවන අය
සම්බන්ධයනේ සිහි නුවණින් ක්‍රියා කරන්න. ඒ
සඳහා හැම අවස්ථාවකින් ම ප්‍රයෝජන ගන්න.
6 රස මුසු, සිත් පිණවන බසින් කතා කරන්න. හැම
කනෙකෙුට නිසි පිළිතුරු දිය යුත්තේ කසෙේ දැ යි
දැන ගන්න.

## අවසාන සුබ පැතුම්

7 ක්‍රියා 20:4; 2 තිමෝ 4:12 එපී 6:21-22සමි්දාණන්
වහන්සේගේ සේවයහෙි ප්‍රමේවන්ත
සහෝදරයකෙු ද විශ්වාසවන්ත සේවකයකෙු ද
හවුල් දාසයකෙු ද වන තුකිකස් මා ගැන සියලු
තොරතුරු ඔබට දන්වනු ඇත. 8 ඔහු ඔබ වතෙ
එවන්නේ අප ගැන ආරංචි ඔබට දන්වා, ඔබේ සිත්
ධරෛයවත් කරන පිණිස ය. 9 පිලමෙ 10-12ඔබේ ම
කනෙකෙු වන, විශ්වාසවන්ත ප්‍රමේවන්ත
සහෝදරයා වන ඔනසේිමස් ද, තුකිකස් සමඟ ඔබ
වතෙ එවමි. මහෙි තොරතුරු ඔවුන් ඔබට දන්වනු
ඇත.

10 ක්‍රියා 12:12,25; 13:13; 15:37-39; 19:29; 27:2;
පිලමෙ 24 මා සමඟ එකට හිරකාරයකෙු ව සිටින
අරිස්තාර්කස් ද බාර්ණබස්ගේ මස්සිනා වන මාක් ද
ඔබට ආචාර කරති. මාක් සම්බන්ධයනේ ඔබ
උපදසෙ ලබා ඇත. ඔහු ඔබ වතෙට ආවොත්
සාදරයනේ පිළිගන්න. 11 යුස්තස් කියන ජේසුස් ද,
එසේ ම ආචාර කරයි. චර්මඡේදිත ජුදවෙවන්ගනේ
හැරුණු අය අතුරනේ මේ තිදනො පමණක් මා සමඟ
දවේියන් වහන්සේගේ රාජ්‍යය උදසො සේවය
කරති. ඔව්හු මට මහත් සැනසිල්ලකි.
12 කොලොෙ 1:7; පිලමෙ 23 ඔබේ ම කනෙකෙු වන,
ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ දාසයකෙු වන,
එපප්‍රස් ද ඔබට ආචාර කරයි. ඔබ දවේියන්
වහන්සේගේ කැමැත්තට සම්පූර්ණයනේ ගැති ව,
ස්ථිර අධිෂ්ඨානයනේ සිටින පිණිස ඔහු ඉතා
ඕනෑකමින් නොකඩව යාච්ඤා කරයි. 13 ඔහු ඔබ
උදසොත් ලවෝදිසයහෙි හා හියරපොලිසහෙි
සිටින්නන් උදසොත් බොහෝ සේ වහෙසෙනෙ බවට
මම පෞද්ගලික වශයනේ සාක්ෂි දරමි. 14 2 තිමෝ
4:10,11; පිලමෙ 24අපේ හිතවත් ලූක් නම්
වදෛ්‍යවරයා ද දේමස් ද ඔබට ආචාර කරති.
15 ලවෝදිසයහෙි සිටින සහෝදරයන්ටත්,
නිම්පාටත්, ඇගේ ගදෙර රැස් වන සභාවටත් ආචාර
කරන්න. 16 මේ ලියුම ඔබ අතර කියවූ පසු
ලවෝදිසයේ සභාවහෙි ද එය කියවන්නට
සලස්වන්න. එසේ ම ලවෝදිසයනේ ලැබනෙ ලියුම ද
ඔබ අතර කියවන්න. 17 පිලමෙ 2“සමි්දාණන්
වහන්සේ ඔබට පැවරූ සේවය සම්පූර්ණ කිරීමට
වගබලාගන්නැ”යි අර්කිපස්ට කියන්න.
18 පාවුලු නම් මම, මාගේ ම අතින් මේ ආචාරය
ලියමි. සිරගත වී සිටින මා සිහි කරන්න. ඔබට
කරුණාව වේ වා!

## තසෙලෝනිකයහෙි පාවුලු තුමාගේ සේවය

2 සහෝදරවරුනි, ඔබ වතෙ අපේ පැමිණීම
නිෂ්ඵල නුවූ බව ඔබ ම දන්නහු ය. 2 ක්‍රියා
16:19-24; 17:1-9ඔබ දන්නා පරිදි, ඊට පරෙ
පිලිප්පියහෙි දී, අපි දුකට හා නිග්‍රහයට භාජනය
වීමු. එහතේ බොහෝ විරුද්ධවාදිකම්වලට මුහුණ
පාමින් වුව ද, ඔබට සුබ අස්න දේශනා කිරීමට
දවේියන් වහන්සේ අප ධරෛයවත් කළ සේක.
3 අපගේ අයැදීම මුළාවනේ හෝ, අපිරිසුදු
චේතනාවනේ හෝ වන්නක් නොවේ. රැවටීමට
උත්සාහයක් ද අප තුළ නැත. 4 එහතේ ධර්මදූත
සේවය පැවරීමට අප සුදුස්සන් යයි දවේියන්
වහන්සේ අප අනුමත කළ ලසෙින් ඒ අනුව අපි
කතා කරමු. මිනිසුන් සතුටු කිරීමට නොව, නිතර ම
අපගේ සිත් විමසන දවේියන් වහන්සේ සතුටු
කිරීමට උත්සාහ කරමු. 5 ඔබ දන්නා පරිදි අප කිසි
කලකෙ ඉච්ඡා වචන ව්‍යවහාර කළේත්, අපගේ
තණ්හාව සැඟවීමට උපා යදෙවුේත් නැත. ඒ බවට
දවේියන් වහන්සේ සාක්ෂි දරන සේක. 6 අපි කිසි
දිනක ඔබගනේ හෝ, අන්‍යයන්ගනේ හෝ, මනුෂ්‍ය

ප්‍රශංසාව නොසෙව්වෙමු. 7 ක්‍රිස්තුන් වහන්සේගේ
ප්‍රේරිතයන් මෙන් එසේ සෙවීමට අපට අයිතියක්
තිබුණ නමුත් අපි එසේ නොකළෙමු. කිරි මවක්
සිය දරුවන් මෘදු ලෙස පෝෂණය කරන්නාක් මෙන්
අපි ඔබ අතරෙහි මෘදු ලෙස සිටියෙමු. 8 ඔබ අපට
කෙතරම් ප්‍රේමාන්විත වූවහු ද යත්, දෙවියන්
වහන්සේගේ සුබ අස්න දීමට පමණක් නොව,
අපගේ ම ජීවිත පවා ඔබට දීමට සතුටු ව සිටියෙමු.
ඔබ අපට එතරම් ප්‍රිය මනාප වූවහු ය. 9 මන්ද,
සහෝදරවරුනි, අපි කෙතරම් වීර්යයෙන් හා වෙහෙසෙ
මහන්සියෙන් සේවය කළෙමු දැ යි ඔබට මතක
ඇත. අපි ඔබෙන් කිසිවකුට බරක් නොවන පිණිස
දිවා රෑ දෙකේහි රැකියාවක යෙදෙමින් දෙවියන්
වහන්සේගේ සුබ අස්න ඔබට දේශනා කළෙමු.
10 ඇදහිලිවතුන් වන ඔබ අතරෙහි අපි කෙතරම්
ශුද්ධ ව, දැහැමි ව, නිදොස් ව හැසුරුණෙමු ද කියා
ඔබ පමණක් නොව දෙවියන් වහන්සේත් සාක්ෂි
දරන සේක. 11 පියකු සිය දරුවන්ට සලකන පරිදි
අප ඔබ ගැන සැලකූ හැටි ඔබ දන්නහු ය.
12 දෙවියන් වහන්සේගේ රාජ්‍යයටත් මහිමයටත්
කැඳවනු ලැබූ ඔබ, උන් වහන්සේට ඔබින පරිදි
ජීවත් වන ලෙස අපි ඔබ එකිනකොට අනුශාසනා
කළෙමු, ධෛර්යය දුනිමු, ආයාචනා කළෙමු.

### තෙසලෝනිකවරුන්ගේ ඇදහිල්ල හා ඉවසීම

13 තවත් කරුණක් ගැන අපි දෙවියන් වහන්සේට
නොකඩවා තුති පුදමු. දෙවියන් වහන්සේගේ
පණිවුඩය අප ඔබ වෙත ගෙනා කල, ඔබ එය අසා
පිළිගත්තේ මනුෂ්‍යයන්ගෙන් එන පණිවුඩයක් මෙන්
නොව, ඇත්තෙන් ම දෙවියන් වහන්සේගෙන් ම එන
පණිවුඩයක් හැටියට ය. මන්ද, අදහන ඔබ අතර
ක්‍රියා කරන්නේ දෙවියන් වහන්සේ ය. 14 ක්‍රියා
17:5සහෝදරවරුනි, ක්‍රිස්තියානි සහභාගිකමට
ඇතුළත් ජුදයේ දෙවියන් වහන්සේගේ සභාවන්ට
සිදු වූ දයෙ ම ඔබටත් සිදු විය. ඔවුන්
ජුදවෙවරුන්ගෙන් පීඩා ලැබූ ලෙසෙ ම ඔබත් ඔබගේ
ම රටවැසියන්ගෙන් පීඩා ලැබුවහු ය. 15 ක්‍රියා
9:23,29; 13:45,50; 14:2,5,19; 17:5,13; 18:12ඒ
ජුදවෙවරු ජේසුස් ස්වාමීන් වහන්සේ ද, දිවැසිවරයන්
ද මරණයට පත් කර, අප පලවා හැරියහ. ඔව්හු
දේව කැමැත්තට පිටුපා සියලු මනුෂ්‍යයන්ට සතුරු ව
සිටිති. 16 විජාතීන්ට ගැළවීම සලසන පණිවුඩය
දේශනා කිරීම පවා අපට තහනම් කර ඇත. මෙසේ
ඔව්හු තමන්ගේ පාපවල කළෙවරට ම පැමිණ සිටිති.
අවසාන කොට, දැන් දේව උදහස ඔවුන් පිට පැමිණ
තිබේ.

### තෙසලෝනිකවරුන් බැහැදැකීමේ ආශාව

17 සහෝදරවරුනි, ටික කලකට අපි ඔබ ඇසින්
නුදුටුවත්, සිතින් අමතක නොකළෙමු. ඒ කාලයේ දී
ඔබගේ මුහුණ දැකීමට අපි ඉමහත් ආශාවකින්
බොහෝ සේ උත්සාහ කළෙමු. 18 ඔබ වෙත
පැමිණීමට අපි පුල පුලා සිටියෙමු. ඇත්තට ම, පාවුලු
වන මම කීප වරක් ම උත්සාහ කළෙමි. එහෙත්
සාතන් අපට බාධා කළේ ය. 19 අපගේ ජේසුස්
ස්වාමීන් වහන්සේගේ ආගමනයේ දී, උන් වහන්සේ
ඉදිරියෙහි අපගේ බලාපොරොත්තුවත්, ප්‍රීතියත්
ප්‍රෞඪ කිරීටයත් කවරෙක් ද? ඔබ ම නොවන්නහු
ද? 20 එසේ ය, ඔබ අපගේ ගෞරවයත් ප්‍රීතියත්
ය.

### තෙසලෝනිකයෙන් හොඳ ආරංචි

3 ක්‍රියා 17:15 අපට එය තවත් ඉවසාගන්නට
නොහැකි වූ බැවින් ඇතන්ස්හි නතර වීමට
තීරණය කරගෙන, 2 අපි තිමෝතියස් එව්වෙමු. ඔහු
වනාහි අපගේ සහෝදරයා ද, ක්‍රිස්තුන්
වහන්සේගේ සුබ අස්න ප්‍රකාශ කිරීමේ දෙවියන්
වහන්සේගේ හවුල් සේවකයා ද වේ. අප ඔහු
එවූයේ මේ පීඩාවලින් කිසිවකු චංචල නොවන
ලෙස, ඔබගේ ඇදහිල්ලෙහි ස්ථිර ව සිටීමට ඔබට
ධෛර්ය දෙනෙ පිණිස ය. 3 දුක් විඳීම අපට නියම
දයෙක් බව ඔබ ම දන්නහු ය. 4 අපට දුක් විඳින්නට
සිදු වන බව අපි ඔබ සමඟ සිටිය දී කල්තියා ඔබට
කීවෙමු. එලෙසෙ ම සිදු වූ බව ඔබ දන්නහු ය. 5 මේ
කරුණ තවදුරටත් ඉවසාගත නොහැකි ව,
පරීක්ෂාකාරයා සමහර විට ඔබ පරීක්ෂා කර, අපගේ
සේවය නිෂ්ප්‍රභා කර ඇද්දැ යි බිය වී ඔබගේ
ඇදහිල්ල ගැන සොයා බැලීමට ඔහු ඔබ වෙත
එව්වෙමි.
6 ක්‍රියා 18:5 එහෙත් දැන් තිමෝතියස් පෙරළා අප
වෙත පැමිණ ඔබගේ ඇදහිල්ලත් ප්‍රේමයත් ගැන
හොඳ ආරංචියක් අපට සැළ කළේ ය. ඇරත්, අප
ඔබ දැකීමට ආශාවෙන් සිටින්නාක් මෙන් ම ඔබත්
අප දැකීමට ආශාවෙන් සිටින බව ද, ඔබ නිතර ම
අප ගැන කරුණාවෙන් සිහි කරන බව ද ඔහු අපට
දැන්වී ය. 7 සහෝදරවරුනි, අපගේ සියලු
අමාරුකම්වලදීත් පීඩාවලදීත් ඔබගේ ඇදහිල්ල ගැන
අසා අපි ධෛර්යවත් වීමු. 8 ඔබ සමිඳාණන්
වහන්සේ තුළ ස්ථිර ව සිටින්නහු නම්, එය අපේ
ජීවිතයේ පණ නළ වේ. 9 ඔබ නිසා අපට ලැබී ඇති
සකල ප්‍රීතිය ගැන දෙවියන් වහන්සේ ඉදිරියෙහි අපි
කෙසේ ස්තුති කර සෑහීමකට පත් වමෙු ද?
10 ඔබගේ මුහුණ දක්නා පිණිස ද, ඇදහිල්ලේ
ඌනතා සම්පූර්ණ කරන පිණිස ද, දිවා රෑ දෙකේහි
අපි අධික ලෙස යාච්ඤා කරමු.
11 අපගේ පිය වූ දෙවියන් වහන්සේ ම ද අපගේ
ස්වාමීන් වූ ජේසුස් සමිඳාණන් වහන්සේ ද ඔබලා
වෙතට එන්න අපට මාර්ගය සලස්වා දෙනෙ සේක් වා!
12 අප ඔබට ප්‍රේම කරන්නාක් මෙන් සමිඳාණන්
වහන්සේත් ඔබ එකිනෙකා කෙරෙහිත්, අන්
සියල්ලන් කෙරෙහිත්, ඔබගේ ප්‍රේමය පිරී ඉතිරී
යන්නට සලස්වන සේක් වා! 13 අපගේ ස්වාමීන් වන
ජේසුස් වහන්සේ සිය සැදැහැවතුන් සමඟ වඩින
විට, ඔබගේ සිත් අපගේ දෙවි පියාණන් වහන්සේ
ඉදිරියෙහි ශුද්ධ ව ද, නිදොස් ව ද තිබෙනෙ ලෙස
ශක්තිමත් කරන සේක් වා!

### යහපත් ජීවිතයේ ප්‍රතිපත්ති

4 සහෝදරවරුනි, දෙවියන් වහන්සේ ප්‍රසන්න
කිරීමට කෙසේ හැසිරිය යුතු දැ යි ඔබ
අපගෙන් ඉගෙනගත්තහු ය. ඔබ එසේ හැසිරෙන්නෙහු
ය. එහෙත් ඔබ වැඩි වැඩියෙන් එසේ කරන ලෙස,
අපි සහකාර කිතුනුවන් වශයෙන් ඔබගෙන් ඉල්ලා
අවවාද කරමු. 2 ජේසුස් ස්වාමීන් වහන්සේගේ
නාමයෙන් අපි ඔබට කුමන අවවාද අනුශාසනා දුනිමු
දැ යි ඔබ දන්නහු ය. 3 දෙවියන් වහන්සේගේ
කැමැත්ත නම් ඔබ ශුද්ධ ව සිටීම ය; ඔබ කාමයෙහි
වරදවා හැසිරීමෙන් වැළකී සිටිය යුතු ය. 4 ඔබ
එකිනෙකා තම තමාගේ ශරීරය දමනය කරගෙන
එය ශුද්ධ ව ද, ගෞරවයෙන් යුක්ත ව ද,
තබාගැනීමට දැනගත යුතු ය. 5 දෙවියන් වහන්සේ
නොදන්නා විජාතීන් මෙන්, ඔබ කාම තෘෂ්ණාවෙහි
ගැලී නොසිටිය යුතු ය. 6 මේ කාරණයේ දී
කිසිවකු තම සහෝදරයා රවටා, වාසියක් නොගත
යුතු ය. මන්ද, අප ඔබට කලින් කියා තදින් අවවාද
කළ ලෙස, මෙබඳු අයට සමිඳාණන් වහන්සේ විපාක
දෙන සේක. 7 දෙවියන් වහන්සේ අප කැඳවූයේ
අපවිත්‍රකමට නොව, පවිත්‍රකමට ය. 8 එබැවින්
මේ ඉගැන්වීම ප්‍රතික්ෂේප කරන්නා විසින්
ප්‍රතික්ෂේප කරනු ලබන්නේ මනුෂ්‍යයා නොව,
ස්වකීය ශුද්ධාත්මයාණන් ඔබට ප්‍රදානය කරන
දෙවියන් වහන්සේ ය.
9 එහෙත් සහෝදර ප්‍රේමය ගැන ඔබට ලියා
එවීම වුවමනා නැත. කුමක් හෙයින් ද, එකිනෙකාට
ප්‍රේම කිරීමට ඔබ දෙවියන් වහන්සේගෙන්
ඉගෙනගෙන සිටින්නහු ය. 10 සැබැවින් ම ඔබ
මසිදෝනිය මුළුල්ලෙහි සිටින සියලු සහෝදරයන්ට
එසේ කරන්නහු ය. එහෙත්, සහෝදරවරුනි, තව වඩ
වඩා ඉදිරියට යන මෙන් අපි ඔබෙන් ඉල්ලා සිටිමු.
11 ඔබට අප කලින් අවවාද කළ පරිදි, උපශාන්ත
ජීවිතයක් ගත කිරීමටත්, තම තමාගේ කාරණා
බලාගැනීමටත්, දහඩිය මහන්සියෙන් ජීවිකාව කර
ගැනීමටත් අරමුණු කරගන්න. 12 මෙසේ කිරීමෙන්
ඔබට සභාවෙන් පිටත සිටින්නන්ගේ ගෞරවය
දිනාගෙන, අන්‍යයන්ගේ පිහිටාධාර පිට නොරැඳී
සිටීමට හැකි වේ.

### ඇදහිලිවතුන්ගේ මරණින් මතු බලාපොරොත්තුව

13 සහෝදරවරුනි, මතු බලාපොරොත්තුවක් නැති
සෙසු අය මෙන් ඔබ ශෝක නොවන පිණිස,
මියගියවුන් ගැන ඔබ නොදැන සිටීම කිසිසේත්
අපගේ කැමැත්ත නොවේ. 14 ජේසුස් වහන්සේ
නැසී නැවත උත්ථාන වූ සේකැ යි අපි අදහමු: එසේ
ම, ජේසුස් වහන්සේ කෙරෙහි විශ්වාස කරමින් උන්
වහන්සේ තුළ සැතපුණු අය, උන් වහන්සේ මඟින්
දෙවියන් වහන්සේ නැවත ගෙනෙන සේකැ යි ද
අදහමු.
15 1 කොරි 15:51-52 අප දැන් ඔබට කියන්නේ
සමිඳාණන් වහන්සේ ම වදාළ කරුණකි. එනම්:
සමිඳාණන් වහන්සේගේ ආගමනයේ දී ජීවත් ව
සිටින අපට, උන් වහන්සේ තුළ සැතපුණු අයට
නොමැති විශේෂ වාසියක් නැති බව ය. 16 මන්ද,
සමිඳාණන් වහන්සේ ම අණ දීමේ ශබ්දය ද, අග්‍ර
දේව දූතයකුගේ හඬ ද, දෙවියන් වහන්සේගේ
හොරණෑ නාදය ද ඇතිව ස්වර්ගයෙන් බැස වදාරන
සේක. ක්‍රිස්තුන් වහන්සේ අදහමින් උන් වහන්සේ
තුළ සැතපුණු අය පළමුකොට නැඟිටින්නෝ ය.
17 එවිට ජීවතුන් අතර සිටින අපි, ඔවුන් සමඟ
සමිඳාණන් වහන්සේ හමු වන පිණිස, වලාකුළුවලින්
අහසට ඔසවාගනු ලබන්නෙමු. මෙසේ අපි නිතර ම
සමිඳාණන් වහන්සේ සමඟ සිටින්නෙමු. 18 එහෙයින්
මේ වචනවලින් එකිනෙකා සනසන්න.

### පුනරාගමනයට සූදානම් වීම

5 සහෝදරවරුනි, මේවා සිදුවන කාලවේලා හා
අවස්ථා ගැන ඔබට ලියා එවීම අවශ්‍ය නැත.
2 මතෙ 24:43; ලූක් 12:39; 2 පේදු 3:10මන්ද,
රාත්‍රියෙහි පැමිණෙන සොරකු මෙන් සමිඳාණන්
වහන්සේගේ දවස පැමිණෙන බව ඔබ ම හොඳ
හැටි දන්නහු ය. 3 ‘සාමය ඇත; අනතුරක් නැතැ’යි
ඔවුන් කියන විට, ගැබිණියකට විළිරුජා
පැමිණෙන්නාක් මෙන්, ක්ෂණික විනාශය ඔවුන් පිට
පැමිණේ; ඔවුන්ට කිසි ගැළවීමක් නැත.
4 එහෙත්, සහෝදරවරුනි, ඔබ අන්ධකාරයේ
නොසිටින නිසා, ඒ දවස සොරකු මෙන් ඔබ වෙත
පැමිණීමට හේතුවක් නැත. 5 ඔබ සැම, ආලෝකයේ
දරුවෝ ද, දිවා කාලයේ දරුවෝ ද වන්නහු ය; අපි
රාත්‍රි කාලයේ වත්, අන්ධකාරයේ වත් දරුවෝ
නොවන්නෙමු. 6 ඒ නිසා අපි, අන් අය මෙන් නිඳා
නොසිට අවදි ව, සිහිකල්පනාව ඇතිව සිටිමු.
7 නිඳන්නන් නිඳන්නේ රාත්‍රියේ දී ය; මත් පැන්
බොන්නන් මත් වන්නේ රාත්‍රියේ දී ය. 8 යෙසා
59:17; එෆී 6:13-17එහෙත් දවාලට අයිති අපි, සිහි
කල්පනාව ඇතිව සිටිමු. ඇදහිල්ලත් ප්‍රේමයත්
නමැති ළය වැස්ම ද, ගැළවීමේ බලාපොරොත්තුව
නමැති යුද්ධ තොප්පිය ද පැළඳගනිමු. 9 දෙවියන්
වහන්සේ අපට නියම කළේ දේව උදහස නොව,
අපගේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ
කරණකොටගෙන, ගැළවීම ලබාගැනීම ය. 10 අප
අවදි ව සිටියත්, නිඳා සිටියත්, තමන් වහන්සේ
සමඟ එක් ව ජීවත් වන පිණිස ක්‍රිස්තුන් වහන්සේ
අප උදෙසා මළ සේක. 11 එබැවින් ඔබ දැනට ම
කරන්නාක් මෙන්, එකිනෙකාට ධෛර්‍ය දෙන්න,
එකිනෙකා ශක්තිමත් කරන්න.

### අනුශාසනා හා සුබ පැතුම්

12 සහෝදරවරුනි, ඔබ අතර වෙහෙස මහන්සි
දරන, ක්‍රිස්තියානි සභාවෙහි මූලිකත්වය දරන,
ඔබට අවවාද අනුශාසනා කරන තැනැත්තන් නිසි
ලෙස සලකන්න. 13 ඔවුන්ගේ සේවය නිසා ඔවුනට

උසස් ම ගෞරවාදරය පිරිනමන ලෙස අපි ඔබගෙන්
ඉල්ලමු. එකිනෙකා හා සමඟ සාමදානයෙන් සිටින්න.
14 සහෝදරවරුනි, අලසයන්ට අවවාද දෙන්න;
බියසුල්ලන් දිරිගන්වන්න; දුබලයන්ට සහයවන්න.
මේ සියල්ලන් ගැන ඉවසිලිවන්ත ව සිටින මෙන් අපි
ඔබගෙන් උදක් ම ඉල්ලමු. 15 කිසිවකුටත් නපුරට
නපුර නොකරන ලෙස ද, එකිනෙකා ගැනත්,
සියල්ලන් ගැනත් නිතර ම යහපත් දේ කරන ලෙස
ද වගබලාගන්න.
16 නිතර ම ප්‍රීති වන්න, 17 නොකඩව යාච්ඤා
කරන්න, 18 සියල්ලෙහි දී ස්තුති දෙන්න. කිතුනුවන්
වශයෙන් දෙවියන් වහන්සේ ඔබගෙන්
බලාපොරොත්තු වන්නේ මෙය වේ.
19 ශුද්ධාත්මානුභාවයට අවහිර නොකරන්න;
20 දිවැස් වැකි සුළු කොට නොතකන්න. 21 සියල්ල
විමසා බලා, යහපත් දේ තදින් අල්ලාගන්න.
22 සියලු ආකාර නපුරෙන් වළකින්න.
23 සාමදානයේ දෙවියන් වහන්සේ ම ඔබ
මුළුමනින් ම පවිත්‍ර කරන සේක් වා! ඔබගේ මුළු
ආත්මය ද ප්‍රාණය ද ශරීරය ද අපගේ ස්වාමීන් වන
ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ පුනරාගමනයේ දී
නිදොස් ව තිබෙන ලෙස ආරක්ෂා කරනු ලැබේ වා!
24 ඔබ කැඳවන තැනැන් වහන්සේ විශ්වාසවන්ත ය;
උන් වහන්සේ එය ඉෂ්ට කරනු නියත ය.
25 සහෝදරවරුනි, අප උදෙසා යාච්ඤා කරන්න.
26 සියලු සහෝදරයන්ට සාම සිඹීමකින් ආචාර
කරන්න. 27 මේ හසුන සියලු සහෝදරයන් ඉදිරියෙහි
කියවන ලෙස සමිඳාණන් වහන්සේගේ නාමයෙන්
ඔබට අණ කරමි.
28 අපගේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේගේ කරුණාව ඔබ සමඟ වේ වා!

## මුළාකරන්නාගේ පැමිණීම

2 1 තෙස 4:15-17 සහෝදරවරුනි, අප ස්වාමීන්
වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ආගමනය
ගැන ද උන් වහන්සේ හමුවෙහි අප එක් රැස් වීම
ගැන ද දැන් අප කතා කළ යුතු ය. 2 සමිඳාණන්
වහන්සේගේ දවස දැනට ම පැමිණ ඇතැ යි
දැක්වෙන දිවැස් වැකියකින් හෝ, ආරංචියකින් හෝ,
අපෙන් යයි කියන හසුනකින් හෝ, පහසුවෙන්
වියවුල් නොවන හැටියටත්, නොකැළඹෙන
හැටියටත්, අපි ඔබගෙන් උදක් ම ඉල්ලමු.
3 කිසිවකුට කිසිසේත් ඔබ රවටන්නට ඉඩ
නාරින්න. මන්ද, ඇදහිල්ලෙන් වැටී යෑම ද, විනාශයේ
පුත්‍රයා වන නොපනත්කමේ මනුෂ්‍යයා එළිදරව් වීම
වන තුරු ද, ඒ දවස නොපැමිණේ. 4 දානි 11:36;
එසකි 28:2ඔහු මිනිසුන් දෙවියන් කොට සලකන
සියල්ලන්ට ද, මිනිසුන් නමස්කාර කරන සියල්ලන්ට
ද විරුද්ධ ව සිට, ඒ හැමට වඩා තමා උසස්
කරගනිමින්, දේව මාලිගාවෙහි වැඩහිඳ තමා
දෙවියන් වහන්සේ යයි ප්‍රකාශ කරන්නේ ය.
5 මා ඔබ සමඟ සිටිය දී මේ කාරණා ඔබට කී
බව මතක නැද් ද? 6 ඒ නොපනත්කමේ මනුෂ්‍යයා
නියම කාලයේ දී ප්‍රකාශ වන පිණිස, දැනට ඔහු
වළක්වාලන්නේ කිමෙක් දැ යි ඔබ දන්නහු ය.
7 නොපනත්කමේ අබිරහස දැනුදු එසේ ම ක්‍රියා
කරයි. එහෙත් වළක්වා ලන තැනැත්තා ඉවත් කරනු
ලැබුවායින් පසු, රහසිගත කිසිවක් නොපවතී.
8 යෙසා 11:4එවිට නොපනත්කමේ මනුෂ්‍යයා
එළිදරව් වේ. ජේසුස් ස්වාමීන් වහන්සේ ස්වකීය
මුඛයේ හුස්මෙන් ඔහු නසා, උන් වහන්සේගේ
ආගමනයේ තේජශ්රීයෙන් ඔහු වනසා ලන සේක.
9 මතෙ 24:24නොපනත්කමේ මනුෂ්‍යයා සාතන්ගේ
බලයෙන් යුක්ත ව පැමිණ, සියලු ආකාර ව්‍යාජ
ප්‍රාතිහාර්ය ද අරුමපුදුම දේ ද ප්‍රබල ක්‍රියා ද
කරන්නේ ය. 10 විනාශයට නියම වූ අය, ගැළවීම
අත්කර දෙන සත්‍යය ප්‍රේමයෙන් නොපිළිගත්
බැවින්, දුෂ්ට ලෙස රවටනු ලබන්නෝ ය. 11 ඔවුන්
අසත්‍ය දේ විශ්වාස කරන පිණිස, ඔවුන් තුළ ක්‍රියා
කිරීමට දෙවියන් වහන්සේ මුළාවේ බලය එවන
සේක. 12 මෙසේ, සත්‍යය විශ්වාස නොකොට
පාපයට ප්‍රිය කරන සියලු දෙන විනිශ්චය කරනු
ලබති.

## ගැළවීම සඳහා තෝරාගනු ලැබීම

13 සමිඳාණන් වහන්සේගේ ප්‍රේමවන්ත
සහෝදරවරුනි, අප නිතර ම ඔබ ගැන දෙවියන්
වහන්සේට ස්තුති පිදිය යුතු ය. මන්ද, ආත්මයාණන්
විසින් ඔබ පිරිසිදු කරනු ලැබීමත්, සත්‍යය විශ්වාස
කිරීමත් කරණකොටගෙන ඔබ ගැළවෙන පිණිස,
දෙවියන් වහන්සේ ආරම්භයේ සිට ම ඔබ
තෝරාගත් නිසා ය. 14 එසේ දෙවියන් වහන්සේ ඔබ
කැඳෙව්වේ අප ඔබ වෙතට ගෙනා සුබ අස්න මඟින්
ය. ඒ කැඳවීම ඔබ ලැබුවේ අපගේ ස්වාමීන් වන
ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මහිමයට ඔබ
පංගුකාරයන් වන පිණිස ය. 15 එබැවින්
සහෝදරවරුනි; ස්ථිර ව සිට, අපගේ දේශනා
කිරීමෙන් හෝ අපගේ හසුනින් හෝ අප ඔබට
ඉගැන්වූ සත්‍යයන් හොඳින් සිතට ගන්න.
16 අපගේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේ ද, අපට ප්‍රේම කොට සදාතන
ධෛර්යයත්, යහපත් බලාපොරොත්තුවත්,
වරප්‍රසාදයත් මඟින් අපට දුන් අපගේ දෙව්
පියාණන් වහන්සේ ද 17 ඔබගේ සිත් ධෛර්යවත්
කර, සියලු යහපත් දේ කීමට ද කිරීමට ද ඔබ
ශක්තිමත් කරන සේක් වා!

## යාච්ඤා කරන මෙන් ඉල්ලීමක්

3 අවසන්කොට, සහෝදරවරුනි, ඔබ අතර සිදු
වූ ලෙස ම අන් තැන්වලත් සමිඳාණන්
වහන්සේගේ පණිවුඩය ශීඝ්‍ර ලෙස පැතිරී ගොස්
ගෞරවයට පැමිණෙන පිණිස, අප උදෙසා යාච්ඤා
කරන්න. 2 හිතුවක්කාර නපුරු මිනිසුන්ගෙන් අප
ගැළවෙන පිණිස ද යාච්ඤා කරන්න. මන්ද, ඇදහීම

සියල්ලන්ට ම ලැබී නැත. 3 එහෙත් සමිඳාණන්
වහන්සේ විශ්වාසවන්ත ය. උන් වහන්සේ ඔබ
ශක්තිමත් කොට නපුරාගෙන් ඔබ ආරක්ෂා කරන
සේක. 4 තවද, අප ඔබට අණ කරන දේ ඔබ
දැනටත්, මතුවටත් ඉටු කරනු ඇතැ යි සමිඳාණන්
වහන්සේ ඔබ ගැන අපට සහතිකයක් දී ඇත.
5 සමිඳාණන් වහන්සේ ඔබගේ සිත් දෙවියන්
වහන්සේගේ ප්‍රේමයටත්, ක්‍රිස්තුන් වහන්සේගෙන්
වන ඉවසීමටත් පමුණුවන සේක් වා!

## රැකියාවක් කිරීමේ යුතුකම

6 තවද, සහෝදරවරුනි, අපෙන් ලැබූ උපදෙස් අනුව
නොව, අලසකමින් හැසිරෙන සියලු
සහෝදරයන්ගෙන් වෙන් ව සිටින මෙන් අපගේ
ජේසුස් ක්‍රිස්තුස් සමිඳාණන් වහන්සේගේ
නාමයෙන් අපි ඔබට අණ කරමු. 7 අපේ ආදර්ශය
ඔබ අනුගමනය කළ යුත්තේ කෙසේ දැ යි ඔබ ම
දන්නහු ය. අප ඔබ අතර අලසකමින් හැසුරුණේ
නැත. 8 අපි කිසිවකුගෙන් පිනට කෑම නොකෑවෙමු.
ඔබෙන් කිසිවකුට බරක් නො වන පිණිස, අපි
වෙහෙස මහන්සියෙන් දිවා රෑ දෙකේහි වැඩ කළෙමු.
9 අප මෙසේ කළේ ඔබෙන් ආධාර ලැබීමට අපට
අයිතියක් නැති නිසා නොව, අනුගමනය කිරීම සඳහා
ඔබට ආදර්ශයක් දෙන පිණිස ය. 10 “වැඩ
නොකරන්නෝ ආහාර නොවළඳත් වා”යි අපි ඔබ
අතර සිටිය දී පවා ඔබට අණ කළෙමු. 11 ඔබෙන්
සමහරෙකු කිසි වැඩක් නොකර, අනුන්ගේ
කාරණාවලට ඇඟිලි ගසමින් අලසකමින් හැසිරෙන
බව අපට සැළ වී ඇත. 12 එබඳු අය සන්සුන් ලෙස
වැඩ කොට, සිය දිවි පෙවෙත උපයාගන්නා ලෙස
ජේසුස් ක්‍රිස්තුස් ස්වාමීන් වහන්සේගේ නාමයෙන්
අණ දී අවවාද කරමු.
13 එහෙත් සහෝදරවරුනි, ඔබ යහපත කිරීමට
මැළි නොවන්න. 14 යමෙකු මේ හසුනේ සඳහන්
අපගේ අවවාදවලට කීකරු නොවන්නේ නම් ඔහු
සිතේ තබා ගෙන, ඔහු ලජ්ජාවට පමුණුවන පිණිස
ඔහු ඇසුරු නොකරන්න. 15 එහෙත් ඔහු සතුරෙකු
මෙන් නොසලකා, සහෝදරයෙකුට මෙන් ඔහුට
දැනමුතුකම් දෙන්න.

## අවසානය

16 සාමදානයේ සමිඳාණන් වහන්සේ ම, නිතර ම,
සියලු අයුරින් ම ඔබට සාමදානය දෙන සේක් වා!
සමිඳාණන් වහන්සේ ඔබ සියල්ලන් සමඟ වන
සේක් වා! 17 හැම හසුනක ම මා අත්සන් තබන
පරිදි, පාවුලු නම් මම, මාගේ ම අතින් මේ ආචාරය
ලියා එවමි.
18 අප ජේසුස් ක්‍රිස්තුස් ස්වාමීන් වහන්සේගේ
කරුණාව ඔබ සියල්ලන් සමඟ වේ වා!

# 1 තිමෝති

### ආචාරය

1 අපගේ ගැළවුම්කාරයාණන් වන දෙවියන්
වහන්සේගේ ද, අපගේ බලාපොරොත්තුව වන
ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ ද නියෝගය පරිදි,
ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ ප්‍රේරිතවරයකු
වන පාවුලුගෙන්, ඇදහිල්ලෙහි මාගේ සැබෑ දරුවකු
වන තිමෝතියස් වෙතට ය. 2 ක්‍රියා 16:1දෙවි
පියාණන් වහන්සේගෙන් ද, අපගේ ස්වාමීන් වන
ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගෙන් ද, වරප්‍රසාදයත්,
දයාවත්, ශාන්තියත් ඔබට වේ වා!

### වැරදි ඉගැන්වීම් ගැන අවවාද

3 මා මසිදෝනියට යන විට ඔබට අවවාද කළ
පරිදි ඔබ එපීසයේ නැවතී සිටින්න. මා එසේ
කියන්නේ වැරදි ධර්ම ඉගැන්වීමෙන් ද,
4 ඇදහිල්ලෙන් ප්‍රකාශිත වූ දෙවියන් වහන්සේගේ
සැලැස්ම සපුරාලනු වෙනුවට විවාද උපදවන, ඉමක්
නැති මිථ්‍යා හා පෙළපත් කතා සැලකීමෙන් ද
වළකින ලෙස, සමහරුන්ට ඔබ අවවාද දෙන පිණිස
ය. 5 මේ අවවාදයේ අදහස නම්, පිරිසිදු සිතකින් ද,
යහපත් හෘදය සාක්ෂියෙන් ද, අවංක ඇදහිල්ලෙන් ද
නික්මෙන ප්‍රේමය වර්ධනය කිරීම යි. 6 සමහරු
මේවායින් බැහැර ව නිරර්ථක විවාදවල නියැලී ඇත.
7 ඔවුන් විනයාචාරීන් වෙන්නට කැමැති වුවත්, තමන්
කියන දේ ගැන වත්, උගන්වන කරුණු ගැන වත්
ඔවුන්ට අවබෝධයක් නැත.
8 යමෙක් ව්‍යවස්ථාව නියම ලෙස භාවිත කරන්නේ
නම්, ව්‍යවස්ථාව යහපත් බව අපි දනිමු.
9 ව්‍යවස්ථාව පනවා ඇත්තේ දැමිටුවන් උදෙසා
නොව, අදැමිටුවන් හා දාමරිකයන් ද, අභක්තිකයන්
හා පව්කාරයන් ද, අපිරිසිදුවූවන් හා ශුද්ධ දේ
කෙලෙසෙන්නන් ද, පීතෘ ඝාතකයන් හා මාතෘ
ඝාතකයන් ද, මිනීමරුවන් ද, 10 වේශ්‍යාකම්
කරන්නන් ද, පුරුෂයන් සමඟ අනාචාරයෙහි
හැසිරෙන්නන් ද, මිනිසුන් පැහැරගෙන යන්නන් ද,
බොරුකාරයන් ද, බොරුවට දිවුරන්නන් ද, 11 මට
භාර දෙන ලද ආශීර්වාදලත් දෙවියන් වහන්සේගේ
මහිමාන්විත සුබ අස්න ප්‍රකාශ කරන සම්යක්
ධර්මයට විරුද්ධ වූ අනෙකුත් හැම දේ කරන්නන් ද
උදෙසා ය.

### දේව දයාව ගැන ස්තුතිය

12 මා ශක්තිමත් කළා වූ ද, උන් වහන්සේගේ
සේවය සඳහා පත් කිරීමට තරම් මා ඇදහිලිවන්ත
යයි සැලකුවා වූ ද, අපගේ ස්වාමීන් වන ක්‍රිස්තුස්
ජේසුස් වහන්සේට මම ස්තුති කරමි. 13 ක්‍රියා 8:3;
9:4-5පළමුවෙන් මම උන් වහන්සේට අපහාස
කරන්නෙකු ව, පීඩා කරන්නෙකු ව, නින්දා
කරන්නෙකු ව සිටිය නමුත්, නොදන්නාකමින් හා
ඇදහිල්ල නැතිකමින් එසේ කළ ද මම දයාව
ලැබුවෙමි. 14 අපගේ සමිඳාණන් වහන්සේගේ
වරප්‍රසාදය, ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ වූ
අපගේ ඇදහිල්ල ද ප්‍රේමය ද සමඟ අධික ලෙස
මට දෙනලද්දේ ය. 15 පව්කාරයන් ගළවන්නට
ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ ලෝකයට වැඩිය සේක
යන කීම විශ්වාසකටයුතු, සියල්ලන් විසින් පිළිගත
යුතු කියමනකි. ඔවුන් අතරෙන් ප්‍රධාන පව්කාරයා
මම ය. 16 එසේ වූ නමුත් මට දයාව ලැබුණේ මේ
නිසා ම ය. එසේ කිරීමෙන් ක්‍රිස්තුස් ජේසුස්
වහන්සේගේ ඉවසීම අසීමිත බව උන් වහන්සේ
පැහැදිලි කළ සේක. සදාතන ජීවනය ලබාගැනීම
පිණිස උන් වහන්සේ කෙරෙහි අදහන සියල්ලන්ට ම
මා ආදර්ශයක් වෙන්නට උන් වහන්සේ සැලැස් වූ
සේක. 17 අමරණීය වූ, අදෘශ්‍යමාන වූ, සදාතන රජ
වූ එක ම දෙවියන් වහන්සේට ගෞරවයත්
මහිමයත් සදහට ම වේ වා! ආමෙන්.
18 තිමෝතියස්, මාගේ පුත්‍රය, ඔබ ගැන කලින්
කියන ලද දිවැස් වැකි අනුව මේ වගකීම ඔබට භාර
දෙමි. 19 එනම්, ඒ වාක්‍යයන් ආයුධ කොට ගෙන,
ඇදහිල්ල ද නිදොස් හෘදය සාක්ෂියක් ද ඇති ව,
ධර්ම යුද්ධය කරන්න. සමහරු මෙයට පිටුපා ගොස්,
ඇදහිල්ල නමැති නැව බිඳ ගත්තෝ ය.
20 හිමෙනෙයස් ද අලෙක්සන්දර් ද එබඳු තැනැත්තෝ
ය. ඔවුන් දේව අපහාස නොකරන පිණිස පාඩමක්
වශයෙන් මම ඔවුන් සාතන් හට බාර දුනිමි.

### නමස්කාරය ගැන උපදෙස්

2 සියල්ලට ම ප්‍රථමයෙන්, සෑම දෙනා
වෙනුවෙන් අයැදුම් ද යාච්ඤා ද ඉල්ලීම් ද
ස්තුති දීම් ද ඔප්පු කළ යුතු බව මගේ අවවාදය යි.
2 භක්තියෙන් හා ගෞරවයෙන් යුක්ත ව, සාමකාමී
තැන්පත් ජීවිතයක් අපට ගත කළ හැකි වන පිණිස,
රජවරුන් හා උසස් තනතුරු දරන සියල්ලන් උදෙසා ද
යාච්ඤා කළ යුතු ය. 3 මෙයෙ මිදුම්කාර දෙවියන්
වහන්සේ ඉදිරියෙහි යහපත් ය. ප්‍රසන්න ය. 4 සියලු

මනුෂ්‍යයන්ගේ මිදීමත්, ඔවුන් සත්‍යය දැනගැනීමත්
දෙවියන් වහන්සේගේ කැමැත්ත ය. 5 ඇත්තේ එක
ම දෙවියන් වහන්සේ ය. දෙවියන් වහන්සේ හා
මනුෂ්‍යයන් අතර වනුයේ එක ම මැදහත්කාරයෙකි.
එනම්, මනුෂ්‍යයෙකු වූ ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ
ය. 6 සියල්ලන්ගේ මිදීම පිණිස උන් වහන්සේ සිය
දිවි පිදූ සේක. මෙසේ නියමිත කාලයේ දී උන්
වහන්සේ සාක්ෂි දැරූ සේක. 7 2 තිමෝ 1:11ඒ
පිළිබඳ දේශනාකාරයෙකු ද ප්‍රේරිතයෙකු ද ලෙස
මා පත් කරනු ලැබුවේ විජාතීන්ට සත්‍ය ඇදහිල්ල
උගන්වන පිණිස ය. මා මේ කියන්නේ බොරුවක්
නොව සත්‍යයක් ම ය.
8 එහෙයින් පිරිමි පක්ෂය සෑම තැන්හි ම
කෝපයෙන් හා වාදයෙන් තොර ව, සැදෑ සිතින්
දොහොත් නඟා, යාච්ඤා කරන්නේ නම් මම
කැමැති වෙමි.
9 1 පේතු 3:3 එසේ ම, ස්ත්‍රී පක්ෂය කොණ්ඩ
මෝස්තර ද, රන් මුතු අබරණ ද, මිල අධික වස්ත්‍ර
ද යන මේවායින් වැළකී ඔබින, විනීත ඇඳුම් ඇඳගත
යුතු යි. 10 ඔවුන්ගේ ආභරණය විය යුත්තේ
භක්තිමත් ස්ත්‍රීන්ට ඔබින යහපත් ක්‍රියා කිරීම ය.
11 ස්ත්‍රීහු නිශ්ශබ්ද ව යටත්කමින් ඉගෙනගනිත් වා.
12 ඉගැන්වීමට වත් පුරුෂයා කෙරේ බලය දැක්වීමට
වත් ස්ත්‍රියට මම ඉඩ නොදෙමි. ස්ත්‍රිය නිශ්ශබ්ද
ව සිටිය යුතු යි. 13 උත් 2:7,21-22මන්ද, ප්‍රථමයෙන්
ආදම් ද පසුව ඒව ද මවනු ලැබූ හ. 14 උත්
3:1-6තවද, ආදම් රැවටුණේ නැත, නමුත් ස්ත්‍රිය
රැවටී වරදට පත් වූවා ය. 15 එහෙත් ඇදහිල්ලෙන් ද
ප්‍රේමයෙන් ද ශුද්ධකමින් ද විනීත ලෙස ජීවත්
වුවොත්, ඈ නිරුපද්‍රිතව දරුවන් ලබන්නී ය.

## සභා නායකයන්ට උපදෙස්

3 යමෙක් සභාවේ නායක තනතුර දැරීමට ආශා
වන්නේ නම්, ඔහු යහපත් වැඩක් කිරීමට
කැමැති වන්නේ ය යන කීම සැබෑ වේ. 2 තීතස්
1:6-9එහෙයින් සභා නායක තමෙේ නිදොස්
චරිතයකින් යුත්, එක භාර්යාවක් ඇති පුරුෂයෙකු ද,
තැන්පත්, සන්සුන්, ආචාර සම්පන්න, ආගන්තුක
සත්කාරයට කැමැති, උගන්වන්නට සමර්ථ
තැනැත්තෙකු ද විය යුතු යි. 3 ඔහු බීමත්කමින්
තොර, හිංසාකාරී නො වූ ඉවසිලිවන්ත, සාමකාමී,
4 මුදල් තණ්හාව නොමැති, සිය පවුල මැනැවින්
පාලනය කරන, තම දරුවන් ගෞරව සම්ප්‍රයුක්ත
බියෙන් හික්මවා ගන්න, තැනැත්තෙකු විය යුතු යි.
5 යමෙක් තමාගේ ම පවුල හසුරුවාගන්නට
නොදන්නේ නම්, ඔහු දෙවියන් වහන්සේගේ
සභාවේ වගකීම දරන්නේ කෙසේ ද? 6 ඔහු ළඟ දී
ක්‍රිස්තු භක්තිය වැළඳගත්තෙකු නොවිය යුතු යි.
මන්ද, එවැන්නෙකු උඩඟුකමින්, යක්ෂයාට පැමිණි
දඬුවමට පත් විය හැකි නිසා ය. 7 ඔහු සභාවෙන්
පිට අය විසින් ගරු කොට සලකනු ලබන්නෙකු ද විය
යුතු යි. එසේ නොවේ නම් ඔහු හොඳ නම නැති
කරගෙන, යක්ෂයාගේ උගුලට අසු වන්නේ ය.

## උපස්ථායකයන්ට උපදෙස්

8 එසේ ම, උපස්ථායකයන් සන්සුන්, දිව දකෙ‍ේ
කතා නැති, පමණ ඉක්මවා මත්පැන් පානය
නොකරන, අයුතු ලාභයට ලොල් නො වූ,
9 ඇදහිල්ලේ අබිරහස පිරිසිදු හෘදය සාක්ෂියකින්
දරන තැනැත්තන් විය යුතු ය. 10 උපස්ථායකයන්
ලෙස සේවය කිරීමට ඉඩ දිය යුත්තේ, කලින්
සෝදිසි කර බලා, ඔවුන්ට විරුද්ධ ව කිසිවක්
නොමැති අයට පමණි. 11 එසේ ම ස්ත්‍රීවරුන් ද,
ගෞරවය ලැබීමට සුදුසු වූ, ඕපාදූප නොකියන,
තැන්පත්, විශ්වාස කටයුතු අය විය යුතු ය.
12 උපස්ථායකයා එක භාර්යාවක් ඇති පුරුෂයෙකු ද,
සිය දරුපවුල මැනැවින් රැකබලාගන්නා වූ ද
තැනැත්තෙකු විය යුතු ය. 13 යහපත් ලෙස සේවය
කර, උසස් තත්ත්වයක් ලබාගන්නා උපස්ථායකයන්ට,
ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ කෙරෙහි වූ ඇදහිල්ල
තුළින් මහත් නිර්භීතකමක් ලබා ගැනීමට පුළුවන්
වෙයි.

## අපේ ඇදහිල්ලේ අබිරහස

14 ඉක්මනින් ඔබ වෙත එන්නට බලාපොරොත්තු
වෙමි. එහෙත් ඔබට මේ අනුශාසනා ලියා එවන්නේ
15 මා ප්‍රමාද වුණොත්, දෙවියන් වහන්සේගේ
පවුලෙහි අය කෙසේ හැසිරිය යුතු ද කියා ඔබ
දැනගන්නා පිණිස ය. ඒ පවුල වනාහි ජීවමාන
දෙවියන් වහන්සේගේ සභාව ය; එය සත්‍යයේ
කණුව හා මුල් ගල වේ. 16 අපේ ඇදහිල්ලේ
අබිරහස නිසැක ව ම ගැඹුරු එකකි. ඒ අබිරහස මේ
ය:
q216 උන් වහන්සේ මිනිසත්බව ගෙන, ආත්මයාණන්
විසින් සහතික කරනු ලැබ, දූතයන්ට දිස් වූ සේක.
q216 විජාතීන්ට ප්‍රකාශ කරනු ලැබ, ලොව පුරා
අදහාගනු ලැබ, මහිමයෙන් ඔසවනු ලැබූ සේක.

## ව්‍යාජ ගුරුවරුන් ගැන අවවාද

4 පසු කාලවල දී සමහරුන්, මුළා කරවන
භූතයනටත්, දුෂ්ටාත්මයන්ගේ ගුරුකම්වලටත්
සවන් දී, ඇදහිල්ලෙන් වැටී යනු ඇතැ යි
ආත්මයාණෝ නිසැක ව ම කියති. 2 එසේ වන්නේ
යක්ෂයාගේ බොරුව නමැති සලකුණ හංවඩු ගසන
ලද හෘදය සාක්ෂියක් ඇති අය තුළින් ය. 3 ඔව්හු
විවාහය තහනම් දෙයක් බව කියති. කෑමවලින්
වළකින ලෙස ද අවවාද කරති. එහෙත් දෙවියන්
වහන්සේ ඒවා මැවූයේ, සත්‍යය දැනගත්
සැදැහැවතුන් ස්තුති පූර්වක ව ඒවා භුක්ති විඳින
පිණිස ය. 4 දෙවියන් වහන්සේ මවා ඇති සියල්ල ම
යහපත් ය. ස්තුතිවන්ත ව පිළිගන්නවා නම්, කිසිවක්
ප්‍රතික්ෂේප නොකළ යුතු ය. 5 මන්ද, ඒවා දේව
වචනයෙන් ද යාච්ඤාවෙන් ද සංස්කාර කරනු
ලබන්නේ ය.

## ක්‍රිස්තුන් වහන්සේගේ හොඳ සේවකයකේ

6 මේවා සහෝදරයන්ට ප්‍රකාශ කරන්නහෙි නම්,
ඔබ ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ හොඳ
සේවකයකේ වන්නහෙි ය. එවිට ඔබ අනුගමනය
කරන ඇදහිල්ලේ වචන ද සම්යක් ධර්මය ද
ඉගැන්වීමනේ පෝෂණය වන්නේ ය. 7 අභක්තික
මිථ්‍යා කථා ද, මැහැලියන්ගේ ප්‍රලාප ද නොතකා,
දේව භක්තිය සඳහා ව්‍යායාම කරන්න. 8 මන්ද,
ශාරීරික ව්‍යායාමයනේ ලැබනේනේ මඳ
ප්‍රයෝජනයකි. එහතේ දේව භක්තික ව්‍යායාම
හැම අතින් ම ප්‍රයෝජනවත් වේ. කුමක් හයෙින් ද
යත්, එය මලෙොව ජීවිතයටත් මතු ජීවිතයටත්
බලාපොරොත්තු ඇති කරන හයෙිනි. 9 මයෙ
විශ්වාස කටයුතු, සියල්ලන් විසින් පිළිගත යුතු
කීමකි. 10 අප වහෙසෙ වන්නේත්, සටන්
කරන්නේත්, සියලු මිනිසුන්ගේ, විශේෂයනේ
අදහන්නන්ගේ, මිදුම්කාර වූ ජීවමාන දවේයන්
වහන්සේ කරෙහෙි අපගේ බලාපොරොත්තුව තබා
තිබනෙ නිසා ය.
11 ඔබේ ඉගැන්වීම්වල දී මේවා අණ කරන්න.
12 ඔබගේ තරුණකම නිසා ඔබ සුළු කොට
සැලකීමට කිසිවකුෙට ඉඩ නොදනේන. ඔබේ
කතාවනේ ද හැසිරීමනේ ද ප්‍රමේයනේ ද
ඇදහිල්ලනේ හා පිරිසිදුකමින් ද අදහන්නන්ට
ආදර්ශයක් වන්න. 13 මා එන තුරු ප්‍රසිද්ධියේ ශුද්ධ
ලියවිලි කියවීමට ද අනුශාසනා කිරීමට ද
ඉගැන්වීමට ද අවධානය යොමු කරන්න. 14 දිවැස්
වැකි පැවසීමනේ සභා මූලිකයන්ගේ අත්තැබීම
ඇතුව ඔබට දනෙ ලද ආත්මික වරම භාවිත කිරීම
පැහැර නොහරින්න. 15 මයෙ සිතට ගනෙ ක්‍රියා
කරන්න. එවිට ඔබේ දියුණුව කාටත් පනෙනෙු ඇත.
16 ඔබ ගැනත් ඔබේ ඉගැන්වීම ගැනත් සැලකිලිමත්
වන්න. මේ දේවල නිරත ව සිටින්න. ඔබ මසෙේ
කිරීමනේ ඔබ ද ඔබට සවන් දනේනන් ද ගළවා
ගන්නහෙි ය.

## සැදැහැවතුන් පිළිබඳ වගකීම්

5 වැඩිමහල්ලකුෙට සැරනේ කතා නොකරන්න,
පියකුෙට මනේ ඔහුට අවවාද කරන්න.
තරුණයන් සහෝදරයන් මනේ ද, 2 වැඩිමහල්
ස්ත්‍රීන් මවුවරුන් මනේ ද තරුණියන් සහෝදරියන්
මනේ ද සෑම විට ම පිරිසිදු සිතින් සලකන්න.
3 ඇත්තට ම අසරණ ව සිටින වැන්දඹුවන් පිළිබඳ
වගකීම භාරගන්න. 4 එහතේ යම් වැන්දඹුවකට
දරුවන් හෝ මුණුබුරන් හෝ ඇත්නම්, තම පවුල්
වතෙ යුතුකම් දැන ප්‍රථමයනේ සිය දමෙව්පියන්
පිළිබඳ යුක්තිය ඉෂ්ට කළ යුත්තෝ ඔව්හු ය. මන්ද,
එය දවේයන් වහන්සේට ප්‍රිය හයෙිනි. 5 එහතේ
ඇත්තනේ ම අසරණ ව සිටින වැන්දඹුව දවේයන්
වහන්සේට කැප වී, දිවා රෑ දකේහි ආයාචනාවල ද
යාච්ඤාවල ද යදෙයෙි. 6 කම්සැපහෙි ලොල් වූ
තැනැත්තී, ජීවත් ව සිටිය දී ම මැරී සිටින්නී ය.
7 ඔවුන්ගේ ජීවිත නිදොස් වන ලසෙ මේවා ඔවුන්ට
සිහිපත් කරවන්න. 8 යමකේ තමාගේ නෑයන්,
විශේෂයනේ තමාගේ පවුලේ අය, නොසලකා
හරින්නේ නම්, ඔහු ඇදහිල්ල අත්හැර දැමූවකේ;
මිථ්‍යාදෘෂ්ටිකයකුෙට වඩා අයහපත් තැනැත්තකේ.
9 වැන්දඹුවක ලසෙ නාම ලේඛනයහෙි ඇතුළත්
කළ යුත්තේ අවුරුදු හැටක් වත් වයසැති, එක ම
පුරුෂයකුෙට භාර්යාව වී සිටි ස්ත්‍රියකේ. 10 ඈ
යහපත් ක්‍රියාවනේ සාක්ෂි දැරීම ද, දරුවන් ඇතිදැඩි
කිරීම ද ආගන්තුක සත්කාර කිරීම ද
සැදැහැවතුන්ගේ පා සේදීම ද පීඩා විඳින්නන්ට
උපකාර කිරීම ද සියලු ආකාර යහපත් ක්‍රියාවල
යදේීම ද පිළිබඳ ප්‍රසිද්ධියක් දරන තැනැත්තියක් විය
යුතු යි.
11 එහතේ යෞවන වැන්දඹුවන් නාම ලේඛනයහෙි
ඇතුළත් නොකරන්න. ස්වාභාවික කාමතෘෂ්ණාවල
බලපෑම නිසා, ක්‍රිස්තුන් වහන්සේගනේ වනේ වී,
ඔවුන් නැවත විවාහයට පළෙඹනේනට පිළිවන.
12 මේ නිසා ඔව්හු පළමු පොරොන්දුව කඩකර
වරදට පැමිණතෙි. 13 තවද ඔව්හු, ගනේ-ගටෙ යමින්
අලස වීමට පුරුදු වතෙි. අලස වනෙවා පමණක්
නොව, වාචාලකමින් අනුන්ගේ දේවලට ඇඟිලි
ගැසීමට ද, නුසුදුසු දේ දඩේීමට ද පුරුදු වතෙි.
14 යෞවන වැන්දඹුවන් විවාහ වී දරුවන්
ලබනවාටත්, ගේදොර රැකබලාගන්නවාටත් මම
කැමැති වමේි. එවිට නින්දා කිරීම සඳහා
විරුද්ධවාදීන්ට කිසි ඉඩක් නොලැබේ. 15 මන්ද,
දැනටමත් සමහරු අභක් වී සාතන් අනුව ගොස්
සිටිති. 16 යම් කිසි ක්‍රිස්තු භක්තික ස්ත්‍රියකට,
වැන්දඹු නෑයින් ඇත්නම්, සභාවට වියදම් දරන්නට
ඉඩ නොහැර, ඇය ඔවුන් නඩත්තු කළ යුතු ය. එවිට
කාත් කවුරුනුත් නැති වැන්දඹුවන්ට උපකාර
කරන්නට සභාවට පුළුවන් වේ.
17 යහපත් ලසෙ මූලිකයන් වශයනේ කටයුතු කරන
සභාමූලිකයන්ට, එනම්, විශේෂයනේ දේශනා
කිරීමහෙිත්, ඉගැන්වීමහෙිත් වහෙසෙ දරන අයට
දගුෙණයක් වේතන ගවේිය යුතු යි. 18 ද්වි.නී. 25:4;
මතෙ 10:10; ලූක් 10:7ගොයම් පාගන විට ගවයාගේ
කට නොබැඳිය යුතු ය කියා ද, වැඩ කරන්නාට
කුලියක් ලැබිය යුතු ය කියා ද, ශුද්ධ ලියවිල්ලේ
සඳහන් කොට ඇත. 19 ද්වි.නී. 17:6; 19:15දතෙුන්
දනෙකුෙගේ සාක්ෂි නැත්නම්, සභාමූලිකයකුෙට
විරුද්ධ ව ඉදිරිපත් කරන කිසි ම චෝදනාවකට සවන්
නොදනේන. 20 අන් අය භය වන පිණිස පව්
කරන්නන්ට සියල්ලන් ඉදිරියහෙි තරවටු කරන්න.
21 කලින් ගත් තීරණයක් අනුව වත්,
පක්ෂපාතකමින් වත් කිසිවක් නොකර, සාධාරණ ව
ක්‍රියා කිරීම ඔබේ යුතුකමක් ලසෙ දවේයන්
වහන්සේ ද ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ ද
තෝරාගත් දේව දූතයන් ද ඉදිරියහෙි ඔබට අණ
කරමි. 22 ඉක්මන් වී කිසිවකුෙ හස්තාලේපනය
නොකරන්න; අනුන්ගේ වැරදිවලට පංගුකාරයකේ
නොවන්න; ඔබත් පිරිසිදු ව සිටින්න.

23 වතුර පමණක් නොබී, කෑම දිරවීම පිණිසත්,
නිතර ඇති වන අසනීප ගතිය නිසාත්, මිදියුස ටිකක්
භාවිතා කරන්න. 24 සමහරුන්ගේ වැරදි, විනිශ්චයක්
කිරීමටත් පරෙ, පැහැදිලි ය. එහතේ සමහරුන්ගේ
වැරදි, එළිදරව් වන්නේ පසු ව ය. 25 එසේ ම
පැහැදිලි ව පනෙනෙ යහපත් ක්රියා ද ඇත. එසේ
නොපනෙණුත්, ඒවා සැඟවී තිබනේනට නොහැකි ය.
6 වහල්කමට බැඳී සිටින සියලු දාසයෝ තම
ස්වාමිවරුන්ට නිසි ගෞරවය දැක්විය යුත්තෝ
ය. එසේ නොකළොත් දවේයන් වහන්සේගේ
නාමයටත් ඉගැන්වීමටත් අපහාස ඇති වයේ.
2 කිතුනු ස්වාමිවරුන් ඇති දාසයෝ, ඔවුන් දගෙොල්ල
ම සහෝදරයන් වන නිසා, තම ස්වාමිවරුන් සුළු
කොට නොසැලකිය යුත්තෝ ය. එසේ නොකර,
තමන්ගේ වැඩවලින් ප්රයෝජන ලබන ස්වාමිවරුන්ට
ඔවුන් වඩාත් හොඳින් සවේය කළ යුතු ය. කවර
හයෙින් ද? ඔවුන් ද තමන් ප්රමේ කරන කිතුනුවන්
වන බැවිනි. ඔබේ ඉගැන්වීම් වල දී මේ කාරණා
තරයේ කියන්න.

## මිසදිටු ඉගැන්වීම හා සැබෑ ධනවත්කම

3 යමකේ වනෙස් ධර්මයක් උගන්වමින්, අපගේ
වැඩදායක ධර්මය වන, අපේ ස්වාමීන් වන ජේසුස්
ක්රිස්තුන් වහන්සේගේ වචනවලටත්, විශ්වාසවන්ත
ඉගැන්වීමටත් විරුද්ධ ව යන්නේ නම්, ඔහු
අඥානයකෙි; 4 උඩඟුකමින් පිරුණු තැනැත්තකෙි; ඔහු
සෑම දේ ගැන සැක කිරීමනේ ද, වචන ගැන ප්රශ්න
කිරීමනේ ද උමතු වූවකෙි. එයින් ඊර්ෂ්යාව ද කලහ
ද අපහාසය ද කූට අවිශ්වාසය ද 5 මිථ්යා අදහස්
ඇති, සත්යය නොදන්න, දවේ භක්තිය ලාභයට
මඟකැ යි සිතන මිනිසුන්ගනේ කළෙවරක් නැති වාද
විවාද ද උපදින්නේ ය. 6 ලද පමණින් සතුටු වීම
සහිත දවේ භක්තිය මහත් ලාභයකි. 7 අප
මලෙොවට පැමිණියේ හිස් අතිනි. හිස් අතින් එය
හැර යන්නට ද ඕනෑ ය. 8 කන්නට අඳින්නට
ඇත්නම්, අපට සෑහයේි. 9 ධනවත් වීමට ආශා
වන්නෝ පරීක්ෂාවලටත්, උගුල්වලටත්, අසු වන්නෝ
ය. නාස්තියටත්, විනාශයටත් පමුණුවන, නොයකෙුත්
මෝඩ නිෂ්ඵල තෘෂ්ණාවන්ට ඔව්හු වසඟ වන්නෝ
ය. 10 මුදල් තණ්හාව සැම නපුරට මුල ය. සමහරු
මුදලට ආලය වී, ඇදහිල්ලනේ වැටී, තමන්ට ම
බොහෝ දරුණු ලසෙ තුවාළ කරගත්හ.

## ඇදහිල්ල උදසො නිර්භීත සටන

11 එහතේ දවේයන් වහන්සේට කැපවූවකු වන
ඔබ, මේ දවේලින් වැළකී සිටිය යුතු ය. දමිටුකමට
ද භක්තිවන්තකමට ද ඇදහිල්ලට ද ප්රමේයට ද
ඉවසිලිවන්තකමට ද ශාන්තදාන්තකමට ද, අවධානය
යොමු කරන්න. 12 ඇදහිල්ල නමැති මහා ධාවනය
වීරියයනේ දුවන්න. සදාතන ජීවනය අත් කරගන්න.
ඔබ එයට කැඳවනු ලැබූයේ සාක්ෂිකාරයන් කීප
දනෙකෙු ඉදිරියහෙි ඔබේ ඇදහීම නිර්භීත ලසෙ
සහතික කොට ප්රකාශ කළ විට ය. 13 සකල
ජීවයට උල්පත වූ දවේයන් වහන්සේ ද, පොන්තියුස්
පිලාත් ඉදිරියහෙි ඇදහීම නිර්භීත ලසෙ ප්රකාශ කළ
ක්රිස්තුස් ජේසුස් වහන්සේ ද අබිමුවහෙි මා ඔබට
භාර දනෙ කටයුත්ත මයෙ යි:ජොහ 18:37 14 අපේ
ස්වාමීන් වන ක්රිස්තුස් ජේසුස් වහන්සේගේ
ආගමනය තකේ මේ ආඥාව කිසි ම දෝෂයක් හෝ
කැළලක් හෝ නැති ව පිළිපදින්න. 15 දවේයන්
වහන්සේ එම ආගමනය නියමිත කාලයේ දී
එළිදරව් කරන සේක. උන් වහන්සේ වනාහි
භාග්යවත්, අසහාය අධිපති, රාජාති රාජ,
ස්වාමිවරුන්ගේ ස්වාමීන් වන තැනැන් වහන්සේ ය.
16 උන් වහන්සේ පමණක් අමරණීය ය. කිසිවකෙුට
ළඟා විය නොහැකි ආලෝකයහෙි උන් වහන්සේ
වසන සේක. කිසිවකේ කිසි කලකෙ උන් වහන්සේ
දැක නැත; දකින්නටත් බැරි ය. උන් වහන්සේට
ගෞරවයත්, සදාතන පරාක්රමයත් වේ වා! ආමනේ.
17 උඩඟු නොවී, අස්ථිර ධනය කරෙහෙි නොව,
සියල්ල අපට භුක්ති විඳීමට දනෙ දවේයන් වහන්සේ
කරෙහෙි බලාපොරොත්තු තබන ලසෙ මේ
ලෝකයේ ධනවතුන්ට, අවවාද කරන්න. 18 ඔවුන්
දැහැමි ක්රියාවල යදේී සිටින ලසෙ ද දැහැමි
ක්රියාවලින් ධනවත් වන ලසෙ ද, සියල්ල අනුන් හා
සමඟ ත්යාගශීලී ව බදොගැනීමට ළැදි වන ලසෙ ද
අවවාද කරන්න. 19 මසෙේ කිරීමනේ ඔව්හු
අනාගතය සඳහා ස්ථිර පදනමක් වන ධන
සම්භාරයක් රැස් කරගන්නෝ ය. එවිට ඔව්හු නියම
සැබෑ ජීවනය ලබා ගන්නෝ ය.
20 තිමෝතියස්, ඔබට භාර දුන් දයෙ ආරක්ෂා
කරන්න. දැනුම ලසෙ සැලකනෙ මිථ්යාදෘෂ්ටික
අදහස්වලින් ද අර්ථයක් නැති හිස් දඩෙවිලිවලින් ද
පරස්පර විරෝධී මතවලින් ද වළකින්න. 21 එවැනි
සමහරු ඇදහිල්ලනේ ඈත් ව සිටිති.
q2 21 ඔබ හැමට කරුණාව වේ වා!

# 2 තිමෝති

### ආචාරය

1 මේ හසුන, ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ
ඉටු වී ඇති ජීවනයේ පොරොන්දුව ලෙස,
දෙවියන් වහන්සේගේ කැමැත්ත හේතුකොටගෙන,
ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ ප්‍රේරිතවරයකු
වන පාවුළුගෙන්, ප්‍රේමවන්ත දරුවා වන
තිමෝතියස් වෙතට ය.
2 ක්‍රියා 16:1 දෙවි පියාණන් වහන්සේගෙන් ද,
අපේ ස්වාමීන් වන ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගෙන්
ද වරප්‍රසාදයත්, දයාවත්, ශාන්තියත් ඔබට වේ වා!

### සුබ අස්න කෙරෙහි විශ්වාසය

3 මම දිවා රෑ දෙකේහි ම නිතර මාගේ යාච්ඤාවල
දී ඔබ සිහි කරමින්, මාගේ මුතුන්මිත්තන් කළාක්
මෙන් පිරිසිදු හෘදය සාක්ෂියකින් මා සේවය කරන
දෙවියන් වහන්සේට ස්තුති කරමි. 4 ඔබේ කඳුළු
සිහි කර මාගේ ප්‍රීතිය සම්පූර්ණ කරගැනීම පිණිස
මම ඔබ දකින්නට ආශාවෙමි. ඔබ තුළ තිබෙන
අවංක ඇදහිල්ල මට සිහි වෙයි. 5 ක්‍රියා 16:1ඒ
ඇදහිල්ල ප්‍රථමයෙන් ඔබේ ආච්චි වූ ලොයිස්
කෙරෙහි ද, ඔබේ අම්මා වූ යූනිස් කෙරෙහි ද
පිහිටියේ ය. ඔබ තුළත් එය ඇති බව මම විශ්වාස
කරමි. 6 ඒ නිසා මාගේ හස්තාලේපනය
හේතුකොටගෙන ඔබ කෙරෙහි තිබෙන දෙවියන්
වහන්සේගේ දීමනාව ගිනි දැල්ලක් සේ දල්වාගන්නා
ලෙස ඔබට සිහි කරවමි. 7 දෙවියන් වහන්සේ අපට
දුන්නේ, බියාදු ගතිය නොව, බලසම්පන්න,
ප්‍රේමාන්විත, හික්මුණු ආත්මානුභාවය ය.
8 එහෙයින් අපේ සමිඳාණන් වහන්සේ උදෙසා
සාක්ෂි දැරීම ගැනත්, උන් වහන්සේගේ සිරකරුවා
වන මා ගැනත්, ලජ්ජා නොවන්න. එහෙත් දෙවියන්
වහන්සේගේ බලය කෙරෙහි විශ්වාසය තබා, සුබ
අස්න වෙනුවෙන් දුක් විඳීමෙහි පංගුකාරයකු වන්න.
9 උන් වහන්සේ අප ගළවා, කැපවූ ජීවිතයකට අප
කැඳවූ සේක. එසේ කළේ අපේ ම පුණ්‍ය
ක්‍රියාවක් නිසා නොව, උන් වහන්සේගේ ම
අභිප්‍රායත් දේව වරප්‍රසාදයත් අනුව ය. මෙය,
කාලයාගේ පටන්ගැන්මට පෙර ක්‍රිස්තුස් ජේසුස්
වහන්සේ විසින් දෙනලද්දකි. 10 එහෙත් මෙය දැන්
එළිදරව් කරන ලද්දේ අපේ මිදුම්කාරයාණන් වන
ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ ප්‍රකාශ වීමෙන් ය.
උන් වහන්සේ මරණයේ බලය බිඳදමා, ජීවනයත්,
අමරණීය භාවයත්, සුබ අස්න මඟින් හෙළි කර
වදාළ සේක.
11 1 තිමෝ 2:7 ඒ සුබ අස්න පිළිබඳ
දේශනාකරුවකු ද ප්‍රේරිතයකු ද, ගුරුවරයකු ද
ලෙස මම පත් කරනු ලැබුවෙමි. 12 මා දුක් විඳින්නේ
ඒ නිසා ම ය. එහෙත් මම ලජ්ජා නොවෙමි. මන්ද,
මා අදහන්නේ කවරකු ද කියා මම දනිමි. මට භාර
දී තිබෙන දෙය, ඒ මහා දවස දක්වා ආරක්ෂා කිරීමට
උන් වහන්සේට හැකි බව මම සැක නොකරමි.
13 ඔබ මාගෙන් ලබාගත් සාරගර්භ ධර්මයේ
ආදර්ශය ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ කෙරෙහි
ඇදහිල්ලෙන් හා ප්‍රේමයෙන් යුතු ව සිතෙහි නිදන්
කරගන්න. 14 අපට භාර දුන් මේ අගනා දෙය අප
තුළ වාසය කරන ශුද්ධාත්මයාණන්ගේ උපකාරයෙන්
ආරක්ෂා කරන්න.
15 ෆිගලෙස්, හර්මොගෙනෙස් සහ ආසියාවේ සිටින
සියල්ලන් මා හැරදමා ගිය බව ඔබ දන්නෙහි ය.
16 ඔනේසිපොරොස්ගේ පවුලේ අයට සමිඳාණන්
වහන්සේගේ කරුණාව ලැබේ වා! මන්ද, ඔහු
බොහෝ වර මට සැනසිල්ලක් විය. ඔහු මා සිරගත
වීම ගැන ලජ්ජා නොවූවා පමණක් නොව, 17 ඔහු
රෝමයට ආ කෙණෙහි ම, මා හමු වන තෙක් ම
බොහෝ වෑයමෙන් මා සෙව්වේ ය. 18 ඒ මහා දවසේ දී
ඔහුට සමිඳාණන් වහන්සේගෙන් කරුණාව
ලැබෙන්නට උන් වහන්සේ සලස්වන සේක් වා! ඔහු
එපීසයෙහි දී මට කෙතරම් උපස්ථාන කළේ දැ යි
මට වඩා හොඳින් ඔබ දන්නෙහි ය.

### ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ විශ්වාසවන්ත භේවායෙකු

2 මා ප්‍රිය පුත්‍රය, ක්‍රිස්තුස් ජේසුස්
වහන්සේගේ වරප්‍රසාදයෙන් ශක්තිමත් වන්න.
2 බොහෝ සාක්ෂිකරුවන් ඉදිරියෙහි ඔබ මගෙන්
අසා දැනගත් දේ, අන්‍යයන්ට ඉගැන්වීමට හැකි,
විශ්වාසවන්ත පුද්ගලයන්ට පවරා දෙන්න.
3 ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ විශ්වාසී
භේවායෙකු සේ දුක් විඳීමට පංගුකාරයකු වන්න.
4 ඕනෑ ම භේවායෙක් ජන සමාජයේ කටයුතුවල
පැටලෙන්නේ නැති ව, තමා බඳවාගත් තැනැත්තා
සතුටු කරන්නට බලයි. 5 තවද, තරඟයේ සියලු නීති
රීති අනුව ක්‍රියා නොකළොත්, ක්‍රීඩකයකුට ජය
කිරුළක් පැළඳගැනීමට ලැබෙන්නේ නැත.
6 අස්වැන්න කපා භුක්ති විඳීමේ අයිතිය මුලින් ම
ඇත්තේ ඒ සඳහා වෙහෙසෙ වූ ගොවියාට ය. 7 මා
කියන දේ ගැන කල්පනා කරන්න. මන්ද, සියල්ල
තේරුම්ගැනීමේ හැකියාව සමිඳාණන් වහන්සේ
ඔබට දෙනු ඇත.

8 මාගේ සුබ අස්නේ තේමාව නම්; “දාවිත්ගේ
වංශයෙන් උපන්, මරණයෙන් උත්ථාන වූ ජේසුස්
ක්‍රිස්තුන් වහන්සේ ය.” 9 අපරාධකරුවකු මෙන්
යදම්න් බඳිනු ලැබ දුක් විඳින්නට මට සිදු වී
තිබෙන්නේ ඒ නිසා ය. එහෙත් දේව වාක්‍යය, බැඳ
තැබිය නොහැකි ය. 10 එබැවින් තෝරා ගත් අයට
ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළින් වන ගැළවීමත්, ඒ
සමඟ ම වූ සදාතන මහිමයත් ලැබෙන සේ ඔවුන්
නිසා සියල්ල ඉවසමි. 11 පහත දැක්වෙන්නේ
විශ්වාස කටයුතු කීමක් ය.
q211 “අපි උන් වහන්සේ සමඟ මැරුමෙු නම්, අපි
උන් වහන්සේ සමඟ ජීවත් වන්නමෙු;
12 මතෙ 10:33; ලූක් 12:9 අපි ස්ථිර ව සිටිමු නම්,
උන් වහන්සේ සමඟ රජකම් කරන්නමෙු;
q212 අපි උන් වහන්සේ ප්‍රතික්ෂේප කරමු නම්,
උන් වහන්සේ අපත් ප්‍රතික්ෂේප කරන සේක.
13 අප අවිශ්වාසවන්ත වුවත්, උන් වහන්සේ
විශ්වාසවන්ත ව, සිටින සේක.
q213 මන්ද, උන් වහන්සේට තමන් ම ප්‍රතික්ෂේප
කිරීම නොකළ හැකි ය.”

## පිළිගත් සේවකයෙක්

14 මේවා ඔවුන්ට මතක් කරමින්, වැඩක් නැති,
අසන්නන්ට හානි ගෙන දෙන වචන ගැන විවාද
නොකිරීමට දෙවියන් වහන්සේ ඉදිරියෙහි තරයේ
අණ කරන්න. 15 ඔබත් සත්‍ය ධර්මය නියම ලෙස
ප්‍රකාශ කරන්න, ලජ්ජා වීමට හේතුවක් නැති
සේවකයෙකු ලෙස දෙවියන් වහන්සේට ප්‍රිය
තැනැත්තකු මෙන් පෙනී සිටීමට උත්සාහ කරන්න.
16 තේරුමක් නැති හිස් දෙඩවිලිවලින් වැළකී
සිටින්න. මන්ද, ඒවා නිසා භක්තිවන්තකම වැඩි
වැඩියෙන් නැති වේ. 17 ඔවුන්ගේ ඒ ඉගැන්වීම්
පිළිකාවක් මෙන් ඔඩු දුවන්නේ ය. හිමෙනෙයිස් ද
පිලේතස් ද එවැනි අය වෙති. 18 ඔව්හු
පුනරුප්පත්තිය දැනට ම සිදු වී තිබෙන බව කියමින්,
සත්‍යයෙන් බැහැර ගොස්, සමහරුන්ගේ විශ්වාසය
අවුල් කරති. 19 ගණන් 16:5කෙසේ වුවත්, දෙවියන්
වහන්සේ දැමූ සවි අත්තිවාරම ස්ථිර ව පවතී. ඒ
මත මෙසේ ලියා ඇත: “සමිඳාණන් වහන්සේ
තමන්ට අයිති අය දන්නා සේක; සමිඳාණන්
වහන්සේගේ නම කියා උන් වහන්සේ අමතන
සියල්ලෝ ම අධර්මිෂ්ඨකමින් වැළකිය යුත්තෝ ය.”
20 විශාල ගෙයක රන් රිදී භාජන පමණක් නොව,
ලී හා මැටි භාජනත් තිබේ. මුලින් කී ඒවා වටිනා
ලෙසත් සෙසු ඒවා නොවටිනා ලෙසත් සැලකිය හැකි
ය. 21 එහෙයින් යමෙක් නපුරු දේ අත්හැර, තමා ම
පවිත්‍ර කරගනී නම්, ඔහු පිරිසිදු කරන ලද,
සමිඳාණන් වහන්සේගේ භාවිතයට සුදුසු වටිනා
දෙයකට යෙදෙන, ඕනෑ ම යහපත් සේවයකට
යෝග්‍ය භාජනයක් වන්නේ ය. 22 යොවුන් වියේ
ඇති වන කාමතෘෂ්ණාවලින් ඉවත් වී, පිරිසිදු සිතින්
සමිඳාණන් වහන්සේගේ නම අමතන අය සමඟ
දැමිටුකමත්, විශ්වාසයත්, ප්‍රේමයත්, සාමයත් සොයා
යන්න. 23 හිස්, අනුවණ විවාදවලින් කලහ
හටගන්නා බව දැන, ඒවායින් වළකින්න.
24 සමිඳාණන් වහන්සේගේ දාසයා කලහකාරයෙකු
නොව, සියල්ලන්ට ම කරුණාවන්ත, උගන්වන්නට
සමත්, ඉවසිලිවන්ත තැනැත්තකු විය යුතු ය.
25 විරුද්ධවාදීන් සෞම්‍ය ලෙස යහමඟ යැවිය
යුත්තේ දෙවියන් වහන්සේ ඔවුන්ට සිත් හරවා
ගැනීමේ පසුතැවිල්ලක් දිය හැකි නිසා ය. එවිට
ඔවුන්ට සත්‍යය හඳුනාගන්නට පිළිවන් වෙයි.
26 මෙසේ ඔවුන්ට සිහිකල්පනාව ආ විට, ඔව්හු,
යක්ෂයා විසින් සිය කැමැත්ත කරවාගන්න පිණිස
තමන් අසු කරගන්නා ලද උගුලෙන් මිදෙන්නෝ ය.

## අවසාන කාලයේ උවදුරු

3 මෙය හිතට ගන්න: අවසාන කාලයේ දී උවදුරු
අවස්ථා ඇති වෙයි. 2 ඒ කාලයේ දී මිනිස්සු
ආත්මාර්ථකාමී, මිලමුදලට ආලය කරන, පුරසාරම්
දොඩන, අහංකාර, දේව අපහාස කරන,
දෙමව්පියන්ට අකීකරු, කළෙහිගුණ නොසලකන,
අධර්මිෂ්ඨ, 3 අනුකම්පා රහිත, දයාවිරහිත, ඕපාදූප
කියන, අසංවර, කුරිරු, හොඳ දේට අකමැති,
4 ද්‍රෝහී, හිතුවක්කාර, හිස උදුම්මාගත්, දෙවියන්
වහන්සේට ප්‍රේම කරනවාට වඩා විනෝදයට
ඇලුම් වූ අය වන්නෝ ය. 5 දේව භක්තික පෙනුම
ඔවුන්ට තිබුණත්, එහි බලය ප්‍රතික්ෂේප කරති.
එබඳු අයගෙන් අහක් වී සිටින්න. 6 මන්ද,
මොවුන්ගෙන් සමහරු ගෙවලට ඇතුළු වී, පවින් බර
වූ, අනේක කාමතෘෂ්ණාවලින් බැඳුණු 7 නිතර ම
ඉගෙනගන්න නමුත් කිසිකලෙක සත්‍යය දැනගන්නට
බැරි, ළාමක ස්ත්‍රීන් වසඟ කරගන්න අය වෙති.
8 නික්ම 7:11යන්නෙස් සහ යම්බ්‍රෙස් මෝසෙස්ට
විරුද්ධ වූවාක් මෙන්, මොවුහු සත්‍යයට විරුද්ධ ව
සිටිති. ඔවුන්ගේ සිත් දූෂණය වී ඇත. ඔවුන්ගේ
ඇදහිල්ල හිස් දෙයකි. 9 එහෙත් ඔවුනට වැඩි දුර
යන්නට නොලැබේ. මන්ද, ඒ දෙදෙනාට සිදු වූවාක්
මෙන්, මොවුන්ගේ මෝඩකම කාටත් හෙළි වන
බැවිනි.

## තිමෝතියස්ට අවසාන උපදෙස්

10 එහෙත් මගේ ඉගැන්වීම ද හැසිරීම ද අරමුණ ද
ඇදහිල්ල ද ඉවසිලිවන්තකම ද ප්‍රේමය ද ශාන්තිය
ද 11 ක්‍රියා 13:14-52; 14:1-7,8-20අන්තියෝකියේදීත්,
ලුස්ත්‍රාවේදීත්, ඉකොනියේදීත්, මට ඇති වුණු පීඩා
හා දුක්විඳීම් ද ඔබ දන්නෙහි ය. ඒ සියල්ලෙන් ම
සමිඳාණන් වහන්සේ මා මිදූ සේක. 12 ක්‍රිස්තුස්
ජේසුස් වහන්සේ තුළ දේව භක්තික ව ජීවත්
වන්නට කැමැති සියල්ලෝ ම පීඩා විඳින්නෝ ය.
13 එහෙත් නපුරු මිනිස්සු ප්‍රයෝගයෙන් අනුන්
රවටා, තමන් ද රැවටී, වැඩි වැඩියෙන් නරක්
වන්නෝ ය. 14 එහෙත් ඔබ ඉගෙනගත්, ඔබ සහතික
ලෙස අදහන දේවල් සිතේ තබාගන්න. ඔබේ
ගුරුවරුන් අමතක නොකරන්න. 15 ළමාවියේ සිට
ඔබ ශුද්ධ ලියවිලි දැනගත් බව ද අමතක

නොකරන්න. ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ කෙරෙහි
ඇදහිල්ලත්, ගැළවීමේ මාර්ගයත්, ඒවායින්
ඉගෙනගත හැකි ය. 16 දේවානුභාවයෙන් යුත් මුළු
ශුද්ධ ලියවිල්ල, ඉගැන්වීමට ද දුර්මත දුරු කිරීමට ද
හික්මවීමට ද දමිටු ජීවිතයක් ගත කිරීම පිණිස
උපදෙස් දීමට ද ප්‍රයෝජනවත් වෙයි. 17 දෙවියන්
වහන්සේට කැප වූ පුද්ගලයා සම්පූර්ණ වශයෙන්
පුහුණු වී, ඕනෑ ම යහපත් සේවයකට සූදානම් ව
සිටින්නේ එසේ ය.

4 දෙවියන් වහන්සේ ඉදිරියෙහි ද, ජීවතුන්ගේ
ද, මළවුන්ගේ ද විනිශ්චයකාරයාණන් වන
ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ ඉදිරියෙහි ද,
එතුමාණන්ගේ ආගමනයේ හා රාජ්‍යයේ ද
නාමයෙන් මා ඔබට පවරන භාරදූර කටයුත්ත මේ
ය: 2 දේව වචනය දේශනා කරන්න. කලටත්
අකලටත් එහි නිරතව සිටින්න; ඉවසිලිවන්ත ව
උගන්වමින් සත්‍යය පහදා දෙන්න. තරවටු කරන්න,
දිරි ගන්වන්න. 3 මන්ද, සාර ධර්මය නොතකා, තමන්
රිසි රිසි දෙය ඇසීමේ ආශාවෙන් ගුරුවරුන්
රැස්කරගන්නා කාලයක් පැමිණෙන්නේ ය. 4 එවිට
ඔව්හු සත්‍යයට කන් නොදී, මිථ්‍යා ප්‍රබන්ධවලට
හැරෙන්නෝ ය. 5 එහෙත් ඔබ සියලු අවස්ථාවල දී
සන්සුන් ලෙස ක්‍රියා කරන්න, දුක් ඉවසන්න,
ධර්මදූත සේවයේ යෙදෙන්න. ඔබට පැවරී ඇති
වගකීම් මනා ලෙස ඉටු කරන්න.
6 මා ගැන කියතොත්, මගේ ජීවිතය දැනට ම
පානීය පූජාවක් මෙන් පිදීමට සූදානම් ව ඇත. මාගේ
වියෝ වීමේ කාලය දැන් පැමිණ තිබේ. 7 මම
යහපත් සටනෙහි සටන් කළෙමි. මම දිවීම අවසන්
කළෙමි, මම ඇදහිල්ල රක්ෂා කළෙමි. 8 දැහැමි
ජීවිතයක කිරීටය මට දැන් වෙන් කර තිබේ. ඒ මහා
දවසේ දී සාධාරණ විනිශ්චයකාර සමිඳාණන්
වහන්සේ එය මට දෙන සේක. මට පමණක් නොව,
උන් වහන්සේගේ ප්‍රකාශ වීම ආශාවෙන්
බලාපොරොත්තු වන සියල්ලන්ට ද එය දෙන සේක.

## පෞද්ගලික උපදෙස්

9 ඉක්මනින් මා වෙත එන්නට උත්සාහ කරන්න.
10 2 කොරි 8:23; ගලා 2:3; කොලො 4:14; පිලෙ 24;
තීතස් 1:4මන්ද, දේමස් ලෞකික ජීවිතයට ඇලුම් වී,
මා අත්හැර, තෙසලෝනිකයට ගියේ ය.
ක්‍රෙස්කේන්ස් ගලාතියටත්, තීතස් දල්මතියාවටත්
ගියෝ ය. 11 ක්‍රියා 12:12,25; 13:13; 15:37-39;
කොලො 4:10,14; පිලෙ 24ලූක් පමණක් මා සමඟ
සිටී. මාක් ඔබ සමඟ කැඳවාගෙන එන්න. මගේ
වැඩට ඔහු ප්‍රයෝජනවත් සහකාරයෙකි. 12 ක්‍රියා
20:4; එෆී 6:21-22; කොලො 4:7-8තුකිකස් එෆීසයට
යැවීමි. 13 ක්‍රියා 20:6ත්‍රෝවෙස්හි දී කාර්පස් ළඟ මා
තබා ආ සළුව ද පොත් ද විශේෂයෙන් සටහන්
පොත් ද ඔබ එන විට ගෙනෙන්න.
14 ගීතා 62:12; රෝම 2:6; 1 තිමෝ 1:20 තඹකරු
ඇලෙක්සැන්දර් මට බොහෝ නපුරුකම් පෑවේ ය.
සමිඳාණන් වහන්සේ ඔහු කළ දෙයට නිසි විපාක
දෙන සේක. 15 ඔබත් ඔහුගෙන් පරිස්සම් වෙන්න.
මන්ද ඔහු අප දුන් පණිවුඩයට දරුණු ලෙස විරුද්ධ වූ
බැවිනි.
16 මගේ පළමු නඩු විභාගයේ දී කිසිවෙක් මා
සමඟ නොසිටියහ. සියල්ලෝම මා අත්හැර ගියෝ
ය. ඒ ගැන ඔවුන්ට වරදක් නොපැමිණේ වා.
17 එහෙත් සමිඳාණන් වහන්සේ මා අත්හැර
නොගොස් මා ශක්තිමත් කළ සේක. මෙසේ මා
මඟින් සුබ අස්න සම්පූර්ණ ලෙස සියලු විජාතීන්ට
ඇසෙන සේ ප්‍රකාශ වනු ඇත. එසේ සිංහයාගේ
කටින් මම මුදා ගනු ලැබුවෙමි. 18 සමිඳාණන්
වහන්සේ සියලු දරුණු උවදුරුවලින් මා මුදා, උන්
වහන්සේගේ ස්වර්ග රාජ්‍යයට මා පමුණුවන සේක.
උන් වහන්සේට සදහට ම මහිමය වේ වා! ආමෙන්.

## අවසාන ආශීර්වාදය

19 ක්‍රියා 18:2; 2 තිමෝ 1:16-17 ප්‍රිස්කාට ද
අකිලාට ද ඔනෙසිෆොරෙස්ගේ පවුලේ අයට ද ආචාර
කරමි. 20 ක්‍රියා 19:22; 20:4; 21:29; රෝම
16:23එරස්තස් කොරින්තියෙහි නතර විය.
ත්‍රොෆිමස් අසනීප වූ නිසා මිලේතසහි නවත්වා
ආවෙමි. 21 ශීත කාලයට පෙර එන්නට උත්සාහ
කරන්න, ජුබුලස් ද පුදෙන්ස් ද ලීනස් ද ක්ලෝඩියා ද
සහෝදර පිරිස ද ඔබට ආචාර කරති.
22 සමිඳාණන් වහන්සේ ඔබ සමඟ වේ වා! ඔබ
සැමට කරුණාව වේ වා!

## ක්‍රිස්තියානි හැසිරීම පිළිබඳ උපදෙස්

2 ඔබ නම්, නිවැරදි ධර්මයට අනුකූල දේ
ඉගැන්විය යුතු ය. 2 වයස්ගත පුරුෂයන්,
තැන්පත්, තලතුනා, දැමුණු, තිරසර ඇදහිල්ලක් ද
ප්‍රේමය ද ඉවසිල්ල ද ඇති අය විය යුතු ය. 3 එසේ
ම වයස්ගත ස්ත්‍රීන් ද ශුද්ධ ජීවිතයකට ඔබින ලෙස
හැසිරෙන, අපහාස නොනඟන, මත්පැනට ඇබ්බැහි
නො වූ, යහපත් දේ උගන්වන අය විය යුතු ය.
4 මෙසේ විය යුතු වන්නේ, දේව වචනයට
අපහාසයක් නොවන පිණිස, සිය පුරුෂයන්ටත්,
දරුවන්ටත් ප්‍රේම කරමින්, 5 ආත්ම දමනය ඇති,
නිර්මල ගෘහණියන් ලෙස, කරුණාවන්ත ව, සිය
ස්වාමි පුරුෂයන්ට යටත් ව සිටීමට යෞවන
භාර්යාවන් පුහුණු කරවනු පිණිස ය.
6 එසේ ම ආත්ම දමනය ඇති ව සිටීමට
තරුණයන්ට අවවාද කරන්න. 7 සියල්ලෙහි දී ඔබ ම
යහපත් ක්‍රියාවන්හි ආදර්ශයක් වන්න. ඔබ
උගන්වන විට අවංක ව ප්‍රතිපත්තිගරුක ව සිටින්න.
8 විරුද්ධවාදීන්ට අප ගැන කිසි නපුරක් කීමට ඉඩක්
නොතබා ඔවුන් ලජ්ජාවට පත් වන පිණිස,
දෝෂාරෝපණයට ලක් කළ නොහැකි අයුරින්
සාරවත් ගුරුකම් දෙන්න.
9 සියලු කාරණාවල දී තම ස්වාමිවරුන්ට යටත් ව
සිටීමටත්, වාද නොකොට ඔවුන් සතුටු කිරීමටත්
දාසයන්ට අවවාද කරන්න. 10 එසේ ම, සොරකම්
නොකොට, සම්පූර්ණ විශ්වාසය ඇති ව සිටිමින්

හැම අයුරින් ම අපගේ ගැළවුම්කාර දෙවියන්
වහන්සේගේ ධර්මය බැබළවිය යුතු බව ඔවුන්ට
උගන්වන්න.

### කිතුනු සදාචාරයේ පදනම

11 සියලු මනුෂ්‍යයන්ට ගැළවීම ගෙන දෙන දෙවියන්
වහන්සේගේ වරප්‍රසාදය ප්‍රකාශ වී ඇත.
12+TIT අභක්තිය ද ලෞකික තෘෂ්ණා ද හැරදමා,
ආශීර්වාද ලත් බලාපොරොත්තුව ගැනත්, අපගේ
මහෝත්තම දෙවියන් වහන්සේ හා ගැළවුම්කාර
ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ තේජාන්විත
ආගමනය ගැනත් බලා සිටිමින්, සිහිනුවණින් යුතු ව
දැහැමි ලෙසත් භක්තිවන්ත ලෙසත් මෙලොව ජීවත්
වන පිණිස ඒ දේව වරප්‍රසාදය අපට අනුශාසනා
කරන්නේ ය. 14 සියලු අධර්මිෂ්ඨකම්වලින් අප
පවිත්‍ර කරන පිණිසත්, අප උන් වහන්සේගේ
තෝරාගත් සෙනඟක් කරන පිණිසත් යහපත කිරීමට
අප උද්‍යෝගිමත් කරවන පිණිසත්, අප නිදහස් කරන
පිණිසත්, උන් වහන්සේ අප උදෙසා දිවි පිදූ
සේක.නික්ම 19:5; ද්වි.නී. 4:20; 7:6; 14:2; ගීතා
130:8; 1 පේදු 2:9
15 සම්පූර්ණ බලය ඇති ව මේ දේවල්
උගන්වන්න, අනුශාසනා කරන්න, තරවටු කරන්න,
ඔබ සුළු කොට සිතන්නට කිසිවකුට ඉඩ
නොදෙන්න.

### කිතුනු යුතුකම්

3 නිලධාරීන්ට හා ආණ්ඩු බලය ඇත්තන්ට යටත්
වී, කීකරු වීමට ද, සියලු යහපත් වැඩට
සූදානම් ව සිටීමට ද ඔබේ සෙනඟට මතක් කරන්න.
2 එසේ ම කිසිවකු ගැන අගුණ නොකියන්නට ද
කලහකාරී නොවී, සියලු මනුෂ්‍යයන් කෙරෙහි හැම
අයුරින් කාරුණික ව, ආචාරශීලී ව සිටීමට ද මතක්
කරන්න. 3 මන්ද, අපිත් වරක් අඥාන ව, අකීකරු ව
සිටියෙමු. මුළා ව ගොස්, අනේකාකාර
තෘෂ්ණාවලටත්, සැප සෙල්ලමටත් වහල් ව සිටියෙමු.
කුඩුකේඩුකමිනුත් ඊර්ෂ්‍යාවෙනුත් හැසිරෙමින්,
අන්‍යයන්ගේ වෛරය ලැබීමට සුදුස්සන් ව
එකිනෙකොට වෛර කරමින් සිටියෙමු. 4 එහෙත්
අපගේ ගැළවුම්කාර දෙවියන් වහන්සේගේ
ගුණවත්කම හා ප්‍රේමය මනුෂ්‍යයන් කෙරෙහි
ප්‍රකාශ වූ කල, 5 අප විසින් ම කළ දැහැමි
ක්‍රියාවලින් නොව, හුදෙක් ස්වකීය දයාව ලෙස,
පුනරුත්පාදනය නමැති ධෝවනයෙන් ද
ශුද්ධාත්මයාණන් වහන්සේගේ අලුත් කිරීමෙන් ද
උන් වහන්සේ අප ගැළවූ සේක. 6 උන්
වහන්සේගේ වරප්‍රසාදයෙන් අප දමිටු කරනු ලැබ,
සදාතන ජීවනයේ බලාපොරොත්තුවට
උරුමක්කාරයන් වන පිණිස, 7 උන් වහන්සේ අප
ගැළවුම්කාර ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ
කරණකොටගෙන ශුද්ධාත්මයාණන් අධික ලෙස අප
පිට වැගිරවූ සේක.
8 මේ සියල්ල විශ්වාස කටයුතු ය; දෙවියන්
වහන්සේ කෙරෙහි ඇදහීමට පැමිණි අය, යහපත්
ක්‍රියාවන්හි යෙදී සිටීමට උනන්දුවක් ම දක්වන
පිණිස ඔබ මේ දේවල් සහතික ලෙස කියන්නෙහි
නම් මම කැමැත්තෙමි. මේ කී දේ මිනිසුන්ට යහපත්
ය; වැඩදායක ය. 9 එහෙත්, අනුවණ තර්ක, පෙළෙපත්
පිළිබඳ කතා, ආරාවුල්, ව්‍යවස්ථාව ගැන වාද විවාද
යන මේවායින් වැළකී සිටින්න. මන්ද, ඒවා නිෂ්ඵල
ය, නිරර්ථක ය. 10 භේදකාරී මනුෂ්‍යයාට වරක්
දෙවරක් අවවාද කළ පසු ඔහුගෙන් අහක් වෙන්න.
11 මෙබඳු මනුෂ්‍යයා සිතින් දූෂ්‍ය වී සිටින බවත්,
දැන දැන ම පව් කරන බවත්, තමා පිට විනිශ්චය
පමුණුවා ගන්නා බවත් ඔබ දන්නෙහි ය.

### අවසාන උවදෙස්

12 ක්‍රියා 20:4; එපී 6:21-22; කොලො 4:7-8; 2
තිමෝ 4:12 මා නිකපොලිසියෙහි ශීත කාලය ගත
කරන්නට තීරණය කරගත් බැවින්, අර්තිමස් හෝ
තුකිකස් හෝ ඔබ වෙත එවූ විට, ඔබ මා වෙත
නොපමා ව එන්නට උත්සාහ කරන්න. 13 ක්‍රියා
18:24; 1 කොරි 16:12නීතිඥයකු වූ සේනාස්ට ද
අපොල්ලොස්ට ද කිසිවකින් හිඟයක් නැති ව,
ඔවුන්ගේ ගමන ඉක්මන් වන පිණිස හැකි තරමින්
උපකාර කරන්න. 14 තවද, අපේ සෙනඟ නිෂ්ඵල ව
කල් නොයවා, නියම අවශ්‍යතා සඳහා යහපත්
වැඩවල යෙදී සිටීමට ඉගෙනගත යුතු ය.
15 මා සමඟ සිටින සියල්ලෝ ඔබට ආචාර කරති.
ඇදහිල්ලෙහි අපගේ හිත මිතුරන් වන අයට ආචාර
කරන්න.
q215 කරුණාව ඔබ සියල්ලන් සමඟ වේ වා!

# පිලෙමොන්

## ආචාරය

1 ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ උදෙසා
හිරකාරයෙකු වන පාවුලු ද සහෝදර
තිමෝතියස් ද යන අපි, අපගේ ප්‍රේමණීය සහකාර
සේවකයෙකු වන පිලෙමොන් වෙතට ද ඔබගේ ගෙදර
රැස් වන සභාවට ද 2 කොලො 4:17අපගේ
සහෝදරී වූ අපියාට ද අපගේ සහකාර හේවායෙකු
වන අර්කිප්පස්ට ද මෙය ලියා එවමු. 3 අපගේ
පියාණන් වන දෙවියන් වහන්සේගෙන් ද ජේසුස්
ක්‍රිස්තුස් ස්වාමීන් වහන්සේගෙන් ද කරුණාවත්
ශාන්තියත් ඔබ හට වේ වා!

## පිලෙමොන්ගේ ප්‍රේමය හා ඇදහිල්ල

4 මාගේ යාච්ඤාවල දී ඔබ සිහි කරමින් මම
මාගේ දෙවියන් වහන්සේට ස්තුති කරමි. 5 එසේ
කරන්නේ ස්වාමීන් වන ජේසුස් වහන්සේ කෙරෙහි
ද, සියලු සැදැහැවතුන් කෙරෙහි ද ඇති ඔබගේ
ප්‍රේමයත්, ඇදහිල්ලත් ගැන මා අසා තිබෙන බැවිනි.
6 මාගේ යාච්ඤාව නම්, නුඹ තුළ පවතින සියලු
යහපත් දේ ගැන දැන ගැනීමෙන් නුඹේ ඇදහිල්ලේ
සහභාගිකම ක්‍රිස්තුන් වහන්සේ උදෙසා පලදායී
වීමයි. 7 සහෝදරය, මට ඉමහත් ප්‍රීතියක් ද
සැනසිල්ලක් ද ගෙන දෙන්නේ ඔබ නිසා
සැදැහැවතුන්ගේ සිත් ප්‍රාණවත් වී ඇති බැවිනි.

## ඔනේසිමස් උදෙසා ඉල්ලීමක්

8 මේ නිසා, කළ යුතු දේ පිළිබඳ ව ඔබට අණ
කරන්නට ක්‍රිස්තුන් වහන්සේ තුළ මට නිදහස ඇති
නමුත්, 9 එසේ නොකර, ක්‍රිස්තුස් ජේසුස්
වහන්සේගේ තානාපතියෙකු වන, දැන් උන්
වහන්සේ උදෙසා හිරකාරයෙකු ව සිටින, පාවුලු නම්
මම, ඉතා ආදරයෙන් ඔබගෙන් ඉල්ලීමක් කරමි.
10 කොලො 4:9ඒ ඉල්ලීම නම්, මා හිරගෙදර සිටිය
දී මාගේ දරුකමට පත් වූ ඔනේසිමස් ගැන ය.
11 වරක් ඔහු ඔබට නිෂ්ප්‍රයෝජන ව සිටි නමුත්,
දැන් ඔහු ඔබටත් මටත් ප්‍රයෝජනවත් වී සිටියි.
12 මාගේ හදවත වැනි ඔහු ඔබ වෙත ආපසු
එවමි. 13 සුබ අස්න නිසා මා හිර අඩස්සියේ සිටිය දී
ඔබ වෙනුවෙන් මට උපස්ථාන කරන පිණිස ඔහු මා
ළඟ නවතාගැනීමට මම කැමැත්තෙමි. 14 එහෙත්
ඔබගේ අනුමැතිය නැති ව කිසිත් කරන්නට මම
කැමැති නොවෙමි. මන්ද, ඔබගේ උපකාරය බල
කිරීමෙන් නොව, සිය කැමැත්තෙන් ම දෙන දෙයක්
විය යුතු යි.
15 සමහර විට ඔනේසිමස් ඔබෙන් ටික කලකට
වෙන් වූයේ, නැවත ඔහු ඔබට නිත්‍ය ලෙස අයිති
වන පිණිස විය හැකි ය. 16 එහෙත් මෙතැන් පටන්
ඔහු දාසයෙකු නොව, දාසකම ඉක්ම වූ ප්‍රේමණීය
සහෝදරයෙකි. මට එසේ වන ඔහු මිනිසෙකු
වශයෙන් ද සමිඳාණන් වහන්සේ තුළ ද ඔබට ඊටත්
වඩා අගනා විය යුතු ය.
17 ඔබ මා ගැන ඇදහිල්ල පිළිබඳ සහකාරයෙකු
හැටියට සිතන්නෙහි නම්, ඔබ මා පිළිගන්නාක් මෙන්
ඔනේසිමස් ද පිළිගන්න. 18 ඔහු ඔබට යම් වරදක්
කර ඇත්නම්, නොහොත් ඔබට ණය ව සිටී නම් ඒ
වගකීම මම භාරගනිමි. 19 පාවුලු නම් මම මාගේ
අතින් ම මෙසේ ලියා සහතික කරමි. ඒ ණය මම
ගෙවමි. එසේ ලියන අතර, ඔබගේ ජීවිතය ගැන ඔබ
මට ණයගැති ව සිටින බව මතක් කළාට වරදක්
නැත. 20 මාගේ සහෝදරය, සමිඳාණන් වහන්සේ
තුළ මට මේ උපකාරය කරන්න; කිතුනුවෙකු
වශයෙන් මාගේ සිත සනසන්න.
21 මා මෙය ලියන විට, මා ඉල්ලන දේ ඔබ ම ඉටු
කරන බවත් ඉල්ලනවාටත් වඩා ඔබ ඉටු කරන
බවත් මට සහතික ය. 22 ඒ හැර, මට නවාතැනක් ද
සූදානම් කරන්න. මන්ද, ඔබ හැමගේ යාච්ඤා
කරණකොටගෙන දෙවියන් වහන්සේ ඔබ වෙත මා
පමුණුවනු ඇතැ යි මම බලාපොරොත්තු වෙමි.

## ආචාර හා සුබ පැතුම්

23 කොලො 1:7; 4:12 ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ
උදෙසා මා සමඟ හිරකාරයෙකු වන එපප්‍රස් ද
24 ක්‍රියා 12:12,25; 13:13; 15:37-39; 19:29; 27:2;
කොලො 4:10,14; 2 තිමෝ 4:10,11මාගේ හවුල්
සේවකයන් වන මාක් ද අරිස්තර්කස් ද දේමස් ද
ලූක් ද ඔබට ආචාර කරති.
25 අපගේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේගේ කරුණාව ඔබ හැම සමඟ පවතී වා!

# හබ්රවේ

### පුත්‍රයාණන් මඟින් කළ අවසාන ප්‍රකාශනය

1 දවේයන් වහන්සේ ආදි යුගවල දී, නොයකේ
වට ද විවිධාකාරයනේ ද, දිවැසිවරයන් මඟින්
අපගේ පියවරුන්ට කතා කළ සේක. 2 එහතේ දැන්
මේ අවසාන කාලයේ දී උන් වහන්සේ සිය
පුත්‍රයාණන් මඟින් අපට කතා කළ සේක. උන්
වහන්සේ කරණකොටගනෙ දවේයන් වහන්සේ මුළු
විශ්වය මවා, සියල්ලේ උරුමකාරයාණන් කොට උන්
වහන්සේ පත් කළ සේක. 3 උන් වහන්සේ දවේයන්
වහන්සේගේ මහිමතාවයේ ප්‍රභාවය ද
දේවත්වයේ ස්වරූපය ද වන සේක්, තමන්ගේ
ප්‍රබල වචනයනේ සියල්ල දරන සේක. පාප
ශෝධනය ඉටු කළ පසු, උන් වහන්සේ උත්තම
ස්ථානයහෙි මහෝත්තමයාණන්ගේ දකුණත අසුන්
ගත් සේක.

### පුත්‍රයාණන්ගේ ශ්‍රේෂ්ඨත්වය

4 මසෙේ දේව දූතයන්ට වඩා ශ්‍රේෂ්ඨ නාමයක්
පුත්‍රයාණන් වහන්සේට උරුම වූ බැවින් උන්
වහන්සේ ඔවුන්ට වඩා බොහෝ සේ උතුම් වන
සේක. 5 2 සාමු 7:14; 1 වංශා 17:13; ගීතා 2:7මන්ද:
q2 5 “ඔබ මාගේ පුත්‍රයා ය;
q2 5 මම අද ඔබ ජනිත කළෙමේ”යි
5 කියාත්, “මම ඔහුට පියකේ වන්නමේ, ඔහු මට
පුත්‍රයකේ වන්නේ ය”
5 කියාත්, උන් වහන්සේ දේව දූතයන්ගනේ
කවරකුෙට කවදාවත් නොවදාළ සේක. 6 ද්වි.නී.
32:43උන් වහන්සේ තමන්ගේ කුලුඳුල් පුත්‍රයාණන්
ලෝකයට නැවත එවන කල:
q2 6 ‘දවේයන් වහන්සේගේ සියලු දූතයෝ උන්
වහන්සේට නමස්කාර කරත්වා”යි
6 වදාරන සේක. 7 ගීතා 104:4දේව දූතයන් ගැන:
q2 7 “උන් වහන්සේ ස්වකීය දූතයන් සුළං ද, ස්වකීය
සේවකයන් ගිනි ජාලාවක් ද කරන සේකැ”යි
7 වදාරන සේක. 8 ගීතා 45:6-7එහතේ පුත්‍රයාණන්
ගැන:
q2 8 “දවේයන් වහන්ස, ඔබගේ සිංහාසනය සදහට
ම පවත්නේ ය;
q2 8 ධර්මිෂ්ඨකමේ ජයකොන්තය ඔබගේ රාජ්‍යයේ
ජයකොන්තය වේ.
9 ඔබ ධර්මිෂ්ඨකමට ප්‍රිය ව අධර්මිෂ්ඨකමට
ද්වේෂ කළ සේක;
q2 9 එබැවින් දවේයන් වහන්සේ, ඔබගේ ම දවේයන්
වහන්සේ, ප්‍රීතිය නමැති තලෙයනේ ඔබගේ
සහකාරයන්ට ඉහළින් ඔබ අභිෂේක කළ සේකැ”යි
9 වදාරන සේක. 10 ගීතා 102:25-27යළිත්:
q2 10 “ස්වාමීනි, ආරම්භයේ දී ඔබ පොළොවේ
අත්තිවාරම් ලූ සේක, ස්වර්ගලෝක ඔබගේ මැවිලි
ය.
11 ඒවා පහ ව යන්නේ ය, එහතේ ඔබ පවතින
සේක.
q2 11 ඒ සියල්ල වස්ත්‍ර මනේ පරණ වන්නේ ය;
12 ඔබ ඒවා සළුවක් මනේ අකුළන සේක, වස්ත්‍ර
මනේ ඒවා මාරු කරනු ලබයි.
q2 12 එහතේ ඔබ ඒකාකාර ම ය, ඔබගේ වයසට
සීමාවක් නැතැ”යි
12 වදාරන සේක. 13 ගීතා 110:1එහතේ:
q2 13 “මා විසින් ඔබගේ සතුරන් ඔබට පා පුටුවක්
කරනු ලබන තකේ, මාගේ දකුණත අසුන් ගන්නැ”යි
13 උන් වහන්සේ, දේව දූතයන්ගනේ කවරකුෙට
කවදා වදාළ සේක් ද? 14 එසේ නම් දේව දූතයෝ
කවරහු ද? ඔව්හු සියල්ලෝ ම ගැළවීමේ උරුමය
ලබන්නට සිටින්නවුන් උදසො සේවය පිණිස එවන
ලද ආත්මයෝ ය.

### උදාර ගැළවීම

2 එබැවින් අප ඇසූ ඉගැන්වීම්වලින් ඈත් ව
නොයන පිණිස ඒවා ගැන ඔබ වඩා
සැලකිල්ලක් දැක්විය යුතු ය. 2 මන්ද, දේව දූතයන්
මඟින් ප්‍රකාශ කරන ලද ව්‍යවස්ථාව කතෙරම් දැඩි
වී ද යත්, සියලු වැරදිවලටත්, අකීකරුකම්වලටත්
සාධාරණ ප්‍රතිවිපාක ලැබුණු බව අපි දනිමු. 3 එසේ
නම්, පළමුවනේ සමිඳාණන් වහන්සේ මඟින් ප්‍රකාශ
කරන ලද, එය ඇසූවන් විසින් අපට සහතික කර
දනෙ ලද, මේ සා උදාර ගැළවීමක් අප නොසලකා
සිටියොත්, අපි කසෙේ ගැළවමුෙ ද? 4 දවේයන්
වහන්සේත් ලකුණුවලින් ද අරුමපුදුම දේවලින් ද
විවිධ ප්‍රාතිහාර්යවලින් ද ස්වකීය කැමැත්ත අනුව
ශුද්ධාත්මයාණන් වහන්සේගේ වරප්‍රසාද දීමනේ ද
ඊට සාක්ෂි දුන් සේක.

### විමුක්තිදායකයාණන් වූ ක්‍රිස්තුන් වහන්සේ

5 අප කතා කරන්නේ පැමිණනේනට තිබනෙ
ලෝකයක් ගැන ය. ඒ ලෝකය දවේයන් වහන්සේ
දේව දූතයන්ට යටත් නොකළ සේක. 6 ගීතා
8:4-6එසේ නොව, ශුද්ධ ලියවිල්ලහෙි යම් තැනක
යම් තැනැත්තකේ මසෙේ සාක්ෂි දරයි.

q2 6 “ඔබ, මිනිසා ගැන සිතන්නට තරම් ඔහු
කවරකේ ද?
q2 6 නොහොත්, යම් මිනිසකු ගැන සලකන්නට
තරම් ඔහු සතු වටිනාකම කිමකේ ද?
7 ඔබ ඔහු, ටික කලකට දේව දූතයන්ට වඩා පහත්
කළ සේක.
q2 7 ඔබ තජේස ද ගෞරවය ද නමැති කිරුළ ඔහුට
පැළඳ වූ සේක.
8 ඔබ ඔහුගේ පාදවලට සියල්ල ම යටත් කළ
සේක.”
8 එසේ ය, උන් වහන්සේ සියල්ල මිනිසාට යටත්
කළ සේකැ යි කීමනේ යටත් නොකළ කිසිවක් තවත්
ඉතිරි වී නැති බව ප්‍රකාශ වේ. කසෙේ වතෙත්
සියල්ල මිනිසාට යටත් කර තිබනෙ බව තව ම අපට
නොපනෙේ. 9 එහතේ අපට පනෙනේනේ, දේව
දූතයන්ට වඩා මඳක් පහත් කරනු ලැබූ නමුත්, දිවි
පිදූ නිසා, තේජස හා ගෞරවය නමැති කිරුළ පැළඳ
සිටින ජේසුස් වහන්සේ ය. එසේ වූයේ දවේයන්
වහන්සේගේ කරුණාවනේ සියල්ලන් උදසො දිවි
පුදන නිසා ය.
10 මන්ද, බොහෝ පුත්‍රයන් තේජසට ගනෙ යන
කල, ඔවුන්ගේ විමුක්තිදායකයාණන් වහන්සේ දුක්
විඳීමනේ පරිපූර්ණ කිරීමට, සියල්ල මවා ආරක්ෂා
කරන දවේයන් වහන්සේට යුතු ව තිබිණි.
11 මන්ද, පිරිසිදු කරන්නා ද පිරිසිදු කරනු
ලබන්නෝ ද යන සියල්ලෝ ම එක ම පියාණන්
වහන්සේගනේ වති. ඒ කාරණය නිසා ජේසුස්
වහන්සේ ඔවුන්ට සහෝදරයන් යයි කීමට ලජ්ජා
නොවී:
12 ගීතා 22:22 “මම මාගේ සහෝදරයන්ට ඔබගේ
නාමය ප්‍රකාශ කරන්නමේ,
q2 12 සබ මැද ඔබට පැසසුම් ගී ගයන්නමේ”යි
12 වදාරන සේක. 13 නැවතත්:
q2 13 යසො 8:17-18 “මම උන් වහන්සේ කරෙහෙි
විශ්වාස කරන්නමේ”යි කියා ද, යළිත්:
q2 13 “මනේන, මමත් දවේයන් වහන්සේ මට දුන්
දූදරුවෝත්” ය කියා ද වදාළ සේක.
14 එහයෙින් පවුලේ සියලු දරුවන්ට එක ම
මාංසයත් රුධිරයත් පොදුවේ ඇතිවා සේ ම උන්
වහන්සේත් එම මිනිස් ස්වභාවයට පංගුකාර වූ
සේක. එසේ කළෙේ මරණය කරෙහෙි බලය ඇත්තා
වන යක්ෂයා මරණය මඟින් විනාශ කොට, 15 දිවි
ඇති තාක් මරණ භයින් වහල්කමට යටත් ව සිටින
සියල්ලන් නිදහස් කරන පිණිස ය. 16 මන්ද, උන්
වහන්සේගේ සැලකිල්ලට භාජන වන්නේ දේව
දූතයන් නොව, ආබ්‍රහම්ගේ පළෙපෙතනේ පැවත එන
අය ය. 17 එබැවින් ජනතාවගේ පව් කමා කිරීමට
දවේයන් වහන්සේගේ සේවයහෙි දයාන්විත,
විශ්වාසවන්ත උත්තම පූජකයකු වන පිණිස, හැම
අතින් ම සිය සහෝදරයන් හා සමාන වන්නට උන්
වහන්සේට යුතු ව තිබිණි. 18 උන් වහන්සේ ම
පරීක්ෂා කරනු ලැබ, දුක් වින්ද බැවින්, පරීක්ෂා
කරනු ලබන්නන්ට සරණ වීමට උන් වහන්සේට
පිළිවන.

## මෝසසේට වඩා ශ්‍රෂේ්ඨ ජේසුස් වහන්සේ

3 ස්වර්ගීය කැඳවීමට පංගුකාර වූ කිතුනු
සහෝදරයනි, අපගේ ඇදහිල්ලේ
ප්‍රරේිතයාණන් හා උත්තම පූජකයාණන් ද වන
ජේසුස් වහන්සේ ගැන කල්පනා කරන්න. 2 ගණන්
12:7මෝසසේ දවේයන් වහන්සේගේ ගෘහයහෙි
විශ්වාස ව සිටි සේ ම, ජේසුස් වහන්සේ ද තමන්
පත් කළ තැනැන් වහන්සේට විශ්වාස ව සිටින
සේක. 3 ගෘහයට වඩා ගෘහය තැනූ තැනැත්තාට
ගෞරවය ඇත්තේ යම් සේ ද, එසේ ම මෝසසේට
වඩා ජේසුස් වහන්සේ ගෞරවය ලැබීමට සුදුසු යයි
ඒත්තුගන්නා ලදී. 4 මන්ද, සෑම ගෘහයක් ම
නිර්මාණය කරන්නකේ සිටියි. එහතේ සියල්ල
නිර්මාණය කරන්නේ දවේයන් වහන්සේ ය.
5 සැබැවින් ම මෝසසේ, දවේයන් වහන්සේ මතු
දවස කියන්නට යන දේ ගැන සාක්ෂියක් ලසෙ උන්
වහන්සේගේ සේවකයකු මනේ මුළු ගෘහයහෙි
විශ්වාසී ව සිටියේ ය. 6 එහතේ ක්‍රිස්තුන් වහන්සේ
දවේයන් වහන්සේගේ ගෘහය පාලනය කරන
පුත්‍රයකු මනේ විශ්වාසී ව සිටි සේක. අග දක්වා
අපගේ උදාර බලාපොරොත්තුවහෙි නිසැක ව පවතිමු
නම්, අපි උන් වහන්සේගේ ගෘහවාසීහු වම්හ.

## දේව සනෙඟට විශ්‍රාම ශාන්තිය

7 ගීතා 95:7-11 එබැවින් ශුද්ධාත්මයාණෝ මසෙේ
වදාරන සේක:
q2 7 “අද නුඹලා උන් වහන්සේගේ හඬට සවන්
දනේනහු නම්,
8 පාළුකරයේ දී නුඹලා
q2 8 උන් වහන්සේ පරීක්ෂා කළ දවසේ දී මනේ
නුඹලාගේ සිත් දැඩි කර නොගන්න.
9 එහි දී නුඹලාගේ පියවරු
q2 9 සතළිස් අවුරුද්දක් මාගේ ක්‍රියා දැක දැකත් මා
සෝදිසි කිරීමනේ පරීක්ෂා කළහ.
10 එබැවින් මම ඒ පරම්පරාවට උදහස් වී:
q2 10 ‘ඔව්හු නිතර ම සිතින් මුළා වති;
q2 10 මාගේ මාර්ග ද ඔව්හු තේරුම් නොගත්හ.
11 ඔව්හු මාගේ විශ්‍රාමයට ඇතුළු
q2 11 නොවන්නෝ ය යි මාගේ උදහසින් දිවුළමේ
ය’යි කීවමේ.”
12 එබැවින් සහෝදරයනි, ජීවමාන දවේයන්
වහන්සේ කරෙනේ වනේවීමට හතේු වන,
ඇදහිල්ලක් නැති නපුරු සිතක් ඇති කිසිවකු, ඔබ
අතර නොසිටින හැටියට බලාගන්න. 13 ඔබගනේ
කිසිවකු පාප මායාවනේ දැඩි නොවන පිණිස, ‘අද
දවස’ යයි කිව හැකි කාල සීමාව තුළ, දවසින් දවස
එකිනකොට අවවාද කරන්න. 14 මන්ද, මුලදී අප තුළ
වූ විශ්වාසය, අග දක්වා අපි තරයේ පවත්වාගනිමු
නම්, අපි ක්‍රිස්තුන් වහන්සේගේ උරුමක්කාරයෝ
වම්හ. 15 ගීතා 95:7-8ශුද්ධ ලියවිල්ල මසෙේ කියයි.

q215 “අද නුඹලා උන් වහන්සේගේ හඬ අසන්නහු
නම්, කැරලි ගැසූ දවසේ දී මෙන් නුඹලාගේ සිත්
දැඩි කර නොගන්න.”
16 ගණන් 14:1-35 දේව හඬ අසා, ඉන්පසු කැරලි
ගැසුවෝ කවරහු ද? ඔව්හු මෝසෙස්ගේ
මඟපෙන්වීම ඇති ව මිසරයෙන් නික්ම ආ සියල්ලෝ
නොවෙත් ද? 17 උන් වහන්සේ සතළිස් අවුරුද්දක් ම
උදහස් ව සිටියේ කවුරුන් සමඟ ද? පව් කොට,
කාන්තාරයේ මළ අය සමඟ නොවේ ද? 18 තමන්
වහන්සේගේ විශ්රාමයට ඇතුළු නොවන්නෝ ය යි
උන් වහන්සේ දිවුරා කීවේ කවුරුන් ගැන ද? අකීකරු
වූවන් ගැන නොවේ ද? 19 එබැවින් ඔවුන්ගේ
අවිශ්වාසය නිසා ඔවුන්ට ඒ විශ්රාමයට ඇතුළු
වන්නට නුපුළුවන් වූ බව අපට පෙනේ.

## දෙවියන් වහන්සේගේ විශ්රාමය

4 එබැවින් දෙවියන් වහන්සේගේ විශ්රාමයට
ඇතුළු වීමේ පොරොන්දුව තවමත් තිබිය දී
ඔබගෙන් යමෙකුට ඊට ඇතුළු වන්නට බැරි වේ දෝ
කියා අපි බියක් ඇති කර ගනිමු. 2 මන්ද, ඔවුන්ට
මෙන් අපටත් සුබ අස්න දේශනා කරන ලදී. එහෙත්
ඔවුන් ඇසූ දේ ඇදහිල්ලෙන් නොපිළිගත් බැවින්,
ඇසූ වචනයෙන් ඔවුන්ට වැඩක් නො වී ය. 3 ගීතා
95:11ශුද්ධ ලියවිල්ලෙහි මෙසේ කියා ඇත.
q23 “මාගේ උදහසින් දිවුළ ලෙස, ඔව්හු මාගේ
විශ්රාමයට ඇතුළු නොවන්නෝ ය.”
3 එසේ වුව ද, අදහාගත් අපි ඒ විශ්රාමයට ඇතුළු
වෙමු. සැබැවින් ම ලෝකය මැවීමේ සිට, දෙවියන්
වහන්සේගේ වැඩ නිම වී තිබුණේ ය. 4 උත් 2:2උන්
වහන්සේ එක් තැනක සත් වන දවස ගැන කතා
කොට, “දෙවියන් වහන්සේ තමන් සියලු
කටයුතුවලින් සත් වන දවසේ දී නිවාඩු ගත්
සේක”යි කියා තිබේ. 5 ගීතා 95:11නැවත මේ
පාඨයෙහිත්:
5 “ඔව්හු මාගේ විශ්රාමයට ඇතුළු නොවන්නෝ
ය”යි කියා ඇත. 6 එබැවින් සමහරුන් ඊට ඇතුළු විය
යුතු බැවින් ද, ඒ සුබ අස්න පළමුකොට ඇසූ අය,
අකීකරුකම නිසා ඇතුළු නො වූ බැවින් ද, 7 ගීතා
95:7-8උන් වහන්සේ බොහෝ කලකට පසු දාවිත්
මඟින් ඉහත කී ලෙස කතා කරවමින්:
q27 “අද නුඹලා උන් වහන්සේගේ හඬ අසන්නහු
නම්, නුඹලාගේ සිත් දැඩි කර නොගන්න,”
7 යන පාඨයෙහි ‘අද’ කියා එක්තරා දවසක් නියම
කරන සේක. 8 ද්වි.නී. 31:7; ජෝෂුවා 22:4මන්ද,
ජෝෂුවා ඔවුන්ට නිවාඩු දුන්නේ නම්, ඉන්පසු වෙන
විශ්රාම දවසක් ගැන උන් වහන්සේ කතා කරන්නේ
නැත. 9 එබැවින් දෙවියන් වහන්සේගේ සෙනඟට
සබත් නිවාඩුවක් ඉතිරි ව ඇත. 10 උත් 2:2දෙවියන්
වහන්සේ සිය කටයුතුවලින් නිවාඩු ගත්තාක් මෙන්,
උන් වහන්සේගේ විශ්රාමයට ඇතුළු වූ තැනැත්තා ද,
සිය කටයුතුවලින් නිවාඩු ගන්නේ ය. 11 එබැවින් අපි
ඔවුන් මෙන් අකීකරු වී නොවැටෙන පිණිස ඒ
විශ්රාමයට ඇතුළු වන්නට උත්සාහ කරමු.

12 දෙවියන් වහන්සේගේ වචනය ජීවමාන ය;
ක්රියාශීලී ය; දෙමුවහත් කඩුවකටත් වඩා තියුණු ය;
ආත්මය ප්රාණයෙන් ද, සන්ධි ඇටමිදුලුවලින් ද වෙන්
කරන තරම් විනිවිද යන්නේ ය; සිතේ සිතුවිලි ද
අරමුණු ද විමසන්නේ ය. 13 උන් වහන්සේ කෙරෙන්
සැඟවිය හැකි කිසිවක් මුළු විශ්වයේ ම නැත. උන්
වහන්සේගේ ඇස් ඉදිරියෙහි සියල්ල වැස්මක් නැති
ව විවෘත ව තිබේ. අප ගණන් දිය යුත්තේ උන්
වහන්සේට ය.

## ශ්රේෂ්ඨතම උත්තම පූජකයාණෝ

14 එබැවින් අහස් මඬල ඉක්මවා ගිය දෙවියන්
වහන්සේගේ පුත්රයාණන් වන ජේසුස් නම්
ශ්රේෂ්ඨ උත්තම පූජකයකු අපට සිටින නිසා, අපේ
ඇදහිල්ලෙහි නොසෙල්වී පවතිමු. 15 මන්ද, අපට
ඇත්තේ අපේ දුබලකම් ගැන අනුකම්පාවක් නැති
උත්තම පූජකයකු නොව, හැම අයුරින් ම අප
වාගේ පරීක්ෂාවලට මුහුණ පෑ පාප රහිත උත්තම
පූජකයෙකි. 16 එබැවින් අපේ අවශ්යතාවන්හි දී
අපේ සරණ සඳහා දයානුකම්පාව ලබන පිණිස බිය
සැක නැති ව කරුණාවේ සිංහාසනය වෙත ළඟා
වෙමු.

5 සෑම නායක පූජකයෙක් ම, පඬුරුත් පාප
පූජාත් ඔප්පු කිරීම පිණිස ස්වකීය සෙනඟ
අතුරින් තෝරාගෙන ඔවුන් වෙනුවෙන් දෙවියන්
වහන්සේ සඳහා වූ කටයුතු කිරීම පිණිස පත් කරනු
ලබයි. 2 ඔහුත් දුර්වලකම්වලට භාජන වී සිටින
බැවින් අනුවණයන් ද මුළාවන්නන් ද ගැන
ඉවසිල්ලෙන් ක්රියා කිරීමට ඔහුට පිළිවන. 3 ලෙවී
9:7ඒ දුර්වලකම් නිසා සෙනඟ උදෙසා මෙන් ම තමා
උදෙසාත් ඔහු විසින් පාප පූජා ඔප්පු කරනු ලැබීම
අවශ්ය ව ඇත. 4 නික්ම 28:1තවද ආරොන් මෙන්,
දෙවියන් වහන්සේ විසින් කැඳවන ලද අය මිස, අන්
කිසිවෙක් ඒ නිලය තමාට ම පවරා නොගන්නේ ය.
5 ගීතා 2:7 එසේ ම ක්රිස්තුන් වහන්සේත් නායක
පූජකයකු වීමේ ගෞරවය තමන් වහන්සේ ම
පවරා නොගත් සේක. එහෙත්:
q25 “ඔබ මාගේ පුත්රයා ය;
q25 අද මම ඔබ ජනිත කළෙමි”යි
5 උන් වහන්සේට කී තැනැන් වහන්සේ ම ඒ
ගෞරවය පැවරූ සේක. 6 ගීතා 110:4එලෙසම වෙන
තැනක:
q26 “ඔබ මෙල්කිසදෙක් පූජක පරපුර අනුව, සදහට
ම පූජකයෙක් වන්නෙහි ය”යි
6 ඒ තැනැන් වහන්සේ වදාරන සේක.
7 මතෙ 26:36-46; මාක් 14:32-42; ලූක් 22:39-46
ක්රිස්තුන් වහන්සේ මිනිසත්බව ගෙන සිටිය දී
තමන් මරණයෙන් ගළවන්නට පිළිවන් වූ තැනැන්
වහන්සේට බලවත් හැඬීමෙනුත් කඳුළු සැලීමෙනුත්,
යාච්ඤා ද කන්නලවු ද ඔප්පු කළ සේක. උන්
වහන්සේගේ දේව ගරුබිය නිසා, දෙවියන් වහන්සේ
එයට සවන් දුන් සේක. 8 උන් වහන්සේ
පුත්රයාණන් වූ නමුත්, තමන්ගේ දුක් විඳීමෙන්

කීකරුකම ඉගනෙගත් සේක. 9 මසෙේ උන්
වහන්සේ සම්පූර්ණත්වය ලැබ, තමන් වහන්සේට
කීකරු වන සියල්ලන්ගේ සදාතන
විමුක්තිදායකයාණෝ වූ සේක. 10 තවද
මලේකිසදකේ පූජක පරපුර අනුව, උත්තම පූජක
නාමය ද දවේයන් වහන්සේගනේ ලත් සේක.

## ධර්මය හා කල්ක්රියාව

11 මේ ගැන බොහෝ දේ කීමට ඇතත් ඔබේ
ඇසීමට ඇති ආශාව හීන වී ඇති බැවින්, ඒවා පහදා
දීම දුෂ්කර කරුණකි. 12 1 කොරි 3:2ඔබ ගුරුවරුන්
විය යුතු කාලය දැන් පැමිණ ඇතත්, දේව පණිවුඩය
'අ' යන්නේ පටන් යමකෙු විසින් ඔබට ඉගැන්විය
යුතු ව තිබේ. ඉන් අදහස් කරන්නේ, ඔබට ඝන
ආහාර නොව කිරි දිය යුතු බව ය. 13 කිරි බීමනේ
ජීවත් වන්නා ළදරුවකෙු බැවින් ඔහුට ධර්මිෂ්ඨකම
පිළිබඳ හැඟීමක් නැත. 14 එහතේ ඝන ආහාර
අවශ්ය වන්නේ හොඳ නරක විමසා බැලීමට
අත්දැකීමනේ තියුණු වූ ඉඳුරන් ඇති මුහුකුරා ගිය
පුද්ගලයන්ට ය.
nb

6 එබැවින් ක්රිස්තුන් වහන්සේගේ මූලික
ඉගැන්වීම් පසුකර යමු. නිෂ්ඵල ක්රියාවලින්
හැරීම ද දවේයන් වහන්සේ කරෙේ ඇදහීම ද
2 බව්තීස්ම-ස්නාපනය ද අත් තැබීම ද මළවුන්ගේ
උත්ථානය ද සදාතන විනිශ්චය ද යන මේවා පිළිබඳ
ඉගැන්වීම් ගැන නැවත වහෙසීමට වුවමනාවක්
නැත. ඒ වනෙුවට පරිණත ධර්මය කරා ඉදිරියට යමු.
3 දවේයන් වහන්සේ කැමැති සේක් නම් අපි එසේ
කරමු.

4 වරක් දහම් එළියනේ පැහැදීම ලැබූවන් වැටී ගිය
විට ඔවුන් නැවත පසුතැවී සිත් හරවා ගැනීමට
පැමිණවීම කළ නොහැකි ය. ඔව්හු ස්වර්ගීය දීමනාව
රසාස්වාදනය කර, ශුද්ධාත්මයාණන් සමඟ
පංගුකාරයෝ වූ හ. 5 දේව වචනය යහපත් බව ද,
එන්නට තිබනෙ යුගයේ බලවේගයන් ද ඔව්හු
අත්දැකීමනේ දැනගත්හ. 6 ඔවුන් නැවත වැටී
ගියොත් නැවත පාපයනේ හරවාගැනීමට නුපුළුවන,
මන්ද ඔව්හු දවේයන් වහන්සේගේ පුත්රයාණන්,
නැවතත් කුරුසියේ ඇණ ගසා උන් වහන්සේට
ප්රසිද්ධියේ නින්දා කරති. 7 වරින් වර වහින වැහි
වතුර උරාගනිමින් ගොවීන්ට සුදුසු අස්වැන්නක් දනෙ
පොළොවට දවේයන් වහන්සේගනේ ආශීර්වාද
ලැබේ. 8 උත් 3:17-18එහතේ ඒ පොළොව කටු ගස්
ද, ගොකටු ද දරයි නම් ඉන් වැදගැම්මක් නැත;
සාපය ඒ පිට පැමිණයේ. දැවී යාමනේ එය අවසන්
වේ.

9 එහතේ ප්රේමවන්තයනේි, අප මසෙේ කතා
කළත්, ගැළවීම ගනෙ දනෙ වඩා යහපත් දේ ඔබට
ඇති බව අපි නිසැක ව ම විශ්වාස කරමු. 10 මන්ද,
ඔබගේ සේවය ද, ඔබ සැදැහැවතුන්ට කළා වූ,
කරන්නා වූ උපස්ථානයනේ දවේයන් වහන්සේගේ
නාමයට පනේවූ ප්රේමය ද අමතක කිරීමට තරම්
උන් වහන්සේ අසාධාරණ නොවන සේක. 11 එහතේ
ඔබ එකිනකො අග දක්වා ම බලාපොරොත්තු
මුදුන්පත් වන තකේ, එම උද්යෝගය පනේවනවාට
අපි ආශා වමෙු. 12 තවද ඔබ අලස නොවී,
ඇදහීමනේ හා ඉවසීමනේ යුතු ව පොරොන්දු උරුම
කරගන්නන් අනුගමනය කිරීම අපේ ආශාව ය.

## දේව පොරොන්දුව හා දිවුරුම

13 මසෙේ දවේයන් වහන්සේ ආබ්රහම්ට ප්රතිඥා
දුන් කල, දිවුරුම් දීම සඳහා තමන්ට වඩා ශ්රේෂ්ඨ
නාමයක් නැති බැවින් තමන්ගේ ම නාමයනේ
දිවුරමින්; 14 උත් 22:16-17"සැබැවින් ම නුඹට
අතිශයින් ආශීර්වාද කරන්නමේ, නුඹේ දරු පරම්පරා
බොහෝ වැඩි කරන්නමේ"යි වදාළ සේක. 15 එසේ
ඔහු ඉවසිල්ලනේ සිට ඒ පොරොන්දුව ලබා ගත්තේ
ය. 16 සැබැවින් ම මනුෂ්යයෝ තමන්ට වඩා
ශ්රේෂ්ඨයකෙුගේ නාමයනේ දිවුරති. ඔවුන්ගේ සියලු
වාද විවාද නිමාවකට ගනෙනේනේ දිවුරා දනෙ
සහතිකයකිනි. 17 එමනේ ම දවේයන් වහන්සේ:
පොරොන්දුව උරුම කරගන්නන්ට තමන්
වහන්සේගේ අරමුණ වනෙස් නොවන බව පැහැදිලි
ලසෙ පනේවන පිණිස, දිවුරුමකින් එය සහතික කළ
සේක. 18 මසෙේ දවේයන් වහන්සේ විසින් බොරු
කළ නොහැකි වනෙස් කළ නොහැකි පොරොන්දුව ද
දිවිරීම ද යන කරුණු දකෙක් ඇත. ඒ නිසා අප
ඉදිරියේ තබා තිබනෙ බලාපොරොත්තුව
අත්කරගැනීමට, ආරක්ෂාව සොයා පැමිණි අපට
මහත් ධරෛයයක් ලැබී ඇත. 19 ලවේ 16:2අප සතු
මේ බලාපොරොත්තුව ආත්මයේ නැංගුරමක් වැනි
ය. එය සුරක්ෂිත ය, ස්ථිර ය. එය වනාහි දේව
මාලිගාවේ තිරයනේ ඇතුළට, ශුද්ධස්ථානයට අප
පමුණුවන බලාපොරොත්තුව ය. 20 ගීතා
110:4ජේසුස් වහන්සේ මලේකිසදකේගේ පූජක
පිළිවළෙ අනුව, සදහට ම උත්තම පූජකයකෙු වී අප
උදසො පුරෝගාමීයකෙු වශයනේ එතැනට පිවිසි
සේක.

## මලේකිසදකේ

7 උත් 14:17-20 මේ මලේකිසදකේ තමෙේ
සාලමේහි රජ ද පරමෝත්තම දවේයන්
වහන්සේගේ පූජකයකේ ද විය. ආබ්රහම් රජවරුන්
පලවා හැර පරෙළා එද්දී මේ මලේකිසදකේ ඔහු හමු
වී ඔහුට ආශීර්වාද කළෙේ ය. 2 ආබ්රහම් තමා සතු
සියල්ලනේ දසයනේ කොටස ඔහුට දුන්නේ ය. පළමු
ව මලේකිසදකේ යන නාමයේ අර්ථය
'ධර්මිෂ්ඨකමේ රජු' යනුයි. දවෙනු ව, ඔහු සාලමේහි
රජ වූ බැවින්, ඔහුගේ නාමයේ අර්ථය 'සාමයේ රජු'
යනු ද විය. 3 තවද ඔහුගේ පියාගේ හෝ මවගේ
හෝ පළෙපත ගැනවත්, උපත හෝ මරණය හෝ
ගැනවත් සටහනක් නැත. මේ තමෙේ දවේයන්
වහන්සේගේ පුත්රයාණන් හා සමාන ය; ඔහු සදහට
ම පූජකයකේ ව සිටියි.

4 මෙසේ මොහු කොතරම් ශ්‍රේෂ්ඨ දැ යි
කල්පනා කරන්න. 5 ගණන් 18:21ආදි පිතෘවර
ආබ්‍රහම් පවා තමා පැහැරගත් දයෙින් දසයනේ
කොටස ඔහුට දුන්නේ ය. ලෙවීගේ පුත්‍රයන්
අතරනේ පූජක පදවිය ලබන්නෝ ව්‍යවස්ථාව අනුව
ජනතාවගනේ, එනම්, ආබ්‍රහම්ගනේ පැවත එන සිය
සහොදරයුරන්ගනේ පවා, දසයනේ කොටස ගන්නට
බලය ලැබ සිටිති. 6 එහතේ ඔවුන්ගේ පළෙපතට
ඇතුළත් නො වූ මේ තැනැත්තා දසයනේ කොටස
ආබ්‍රහම්ගනේ ලබාගනෙ, පොරොන්දු හිමි වූ ඔහුට
ආශීර්වාද කළෙේ ය. 7 ආශීර්වාද කරන්නේ උසස්
අය විසින් පහත් අයට බව වාද රහිත ය. 8 එක
අතකින් දසයනේ කොටස ලබන පූජකයෝ මිය
යන්නෝ වති; අනකේ අතින් දසයනේ කොටස ලැබූ
මලේකිසදකේ ජීවමාන ව සිටින බවට සහතිකයක්
ලද්දකේ. 9 ඇරත් දසයනේ කොටස ලැබූ ලවේී පවා
ආබ්‍රහම් හතේුකොටගනෙ දසයනේ කොටස ගවේූ
බව කිව හැකි ය. 10 මන්ද, මලේකිසදකේ
ආබ්‍රහම්ට හමු වූ විට ලවේී තම ආදි පියා තුළ
සිටියේ ය.
11 ඉශ්‍රායලේ සනෙඟට ව්‍යවස්ථාව දනෙ ලද්දේ
ලවේීගේ පූජකත්වය සම්බන්ධ කරගනෙ ය. ඒ
පූජකත්වය හතේුකොටගනෙ පූර්ණත්වය ලැබී නම්,
ආරොන්ගේ පූජක පිළිවළෙ අනුව නො වූ,
මලේකිසදකේගේ පූජක පිළිවළෙ අනුව වනෙ
පූජකයකෙුගේ පහළ වීම ගැන කතා කරන්නේ
කසෙේ ද? 12 මන්ද, පූජකත්වය වනෙස් වුවහොත්
ව්‍යවස්ථාවත් වනෙස් විය යුතු ම ය. 13 එසේය,
යමකෙු ගැන මේ දේ කියන ලද්දේ ද, ඒ තැනැන්
වහන්සේ වනෙ ගෝත්‍රයකට අයිති වූ සේක. ඒ
ගෝත්‍රයනේ කිසිවකේ පූජාසනය ළඟ සවේය
නොකළෙේ ය. 14 මන්ද, අපගේ සමිඳාණන්
වහන්සේ ජුදා ගෝත්‍රයනේ පහළ වූ බව ඉතා
පැහැදිලි ය. පූජකයන් ගැන කතා කිරීමේ දී
මෝසසේ ඒ ගෝත්‍රය ගැන කිසිවක් කීවේ නැත.

## මලේකිසදකේ වැනි උත්තම පූජකයකේ

15 මලේකිසදකේට සමාන අන් පූජකයකෙු පැමිණි
නිසා මේ කරුණ වඩාත් පැහැදිලි ය. 16 උන්
වහන්සේ පූජකයකෙු වූයේ මනුෂ්‍ය නීති රීති අනුව
නොව, අමරණීය ජීවිතයක බල මහිමය අනුව ය.
17 ගීතා 110:4මන්ද:
q217 “ඔබ මලේකිසදකේගේ පූජක පිළිවළෙ අනුව
සදහට ම පූජකයකේ වන සේකැ”යි
17 උන් වහන්සේ ගැන සාක්ෂි දී තිබේ. 18 පළමු
තිබුණු ව්‍යවස්ථාවේ දුර්වලත්වයත් නිෂ්ඵලකමත්
නිසා එය අවලංගු වී ඇත. මන්ද, ව්‍යවස්ථාව මඟින්
කිසිවක් සම්පූර්ණ නො වී ය. 19 එහතේ දැන් වඩා
අගනා බලාපොරොත්තුවක් උදා වී ඇත. ඒ
බලාපොරොත්තුව මඟින් අපි දවේියන් වහන්සේ
වතෙ ළඟා වමෙු. 20 තවද, දිවුරුම් දීමක් ද ඇත.
ලවේීය පූජකයන් පත් කිරීමේ දී දිවුරුම් දීමක් නො
වී ය. 21 ගීතා 110:4එහතේ උන් වහන්සේ
පූජකයකෙු වූයේ දිවුරුම් දීමක් ඇති ව ය. ඒ බව
ශුද්ධ ලියවිල්ලහෙි මසෙේ කියා ඇත:
q221 “ ‘ඔබ සදහට ම පූජකයකෙ’යි සමිඳාණන්
වහන්සේ දිවුරුම් දුන් සේක, ඒ දිවුරුම උන් වහන්සේ
නිෂ්ප්‍රභ නොකරන සේක.”
22 මසෙේ ජේසුස් වහන්සේ වඩා උතුම් ගිවිසුමක
ඇපකාරයාණන් ද වී සිටින සේක.
23 තවද, මරණය හතේුකොටගනෙ පූජක
පදවියහෙි පවතින්නට පූජකවරුන්ට නොහැකි වූ
බැවින් පූජක සංඛ්‍යාව, විශාල විය. 24 එහතේ
ජේසුස් වහන්සේ සදහට ම පවතින හයෙින් උන්
වහන්සගේේ පූජක ධූරය අන් කනෙකෙුට පැවරිය
නොහැකි ය. 25 එබැවින් උන් වහන්සේ මඟින්
දවේියන් වහන්සේ වතෙට ළඟා වන්නන් සදහට ම
ගළවන්නට උන් වහන්සට්ෙ පිළිවන. මන්ද, ඔවුන්
උදසො මැදහත් වීමට උන් වහන්සේ සදහට ම ජීවත්
වන බැවිනි.
26 අපට යෝග්‍ය වන්නතේ එබඳු ධාර්මික,
නිර්දෝෂ, නිර්මල, පව්කාරයන්ගනේ වනේ වූ, අහස්
මඬල ඉක්මවා වැජඹනෙ උත්තම පූජකයකේ ම ය.
27 ලවේී 9:7අන් උත්තම පූජකයන් මනේ, පළමු
කොට තමන්ගේ ම පව් උදසොත්, දවෙනු ව
ජනතාවගේ පව් උදසොත් දිනපතා පූජා ඔප්පු
කිරීමට උන් වහන්සට්ෙ වුවමනාවක් නැත. මන්ද,
උන් වහන්සේ තමන් ම එක ම වරක් පූජා වීමනේ ඒ
වුවමනාව ඉටු කළ සේක. 28 දුර්වලකම් ඇති
මනුෂ්‍යයෝ උත්තම පූජකයන් කොට ව්‍යවස්ථාවනේ
පත් කරනු ලැබතේ. එහතේ ව්‍යවස්ථාවනේ පසුව
පැමිණි දිවුරුමේ වචනයනේ සදහට ම සම්පූර්ණ ව
සිටින පුත්‍රයාණෝ පත් කරනු ලැබූ හ.

## අලුත් ගිවිසුමේ උත්තම පූජකයාණෝ

8 ගීතා 110:1 අප කියන ප්‍රධාන දයෙ නම්,
එවැනි උත්තම පූජකයකෙු අපට සිටින බව ය.
උන් වහන්සේ ස්වර්ගවල මහෝත්තමයාණන්ගේ
සිංහාසනයේ, දකුණත අසුන් ගනෙ, 2 මනුෂ්‍යයා
විසින් නොව සමිඳාණන් වහන්සේ විසින් සාදන ලද
ශුද්ධස්ථානය වන සැබෑ මණ්ඩපයේ සවේය කරන
සේක. 3 සියලු නායක පූජකයෝ පඬුරු හා පූජා
ඔප්පු කරන පිණිස පත් කරනු ලබන්නාහ. එහයෙින්
පූජා ඔප්පු කිරීමට මේ නායක පූජකයාටත් යම්
කිසිවක් තිබිය යුතු ය. 4 උන් වහන්සේ තවමත් මිහි
පිට සිටින සේක් නම්, උන් වහන්සට්ෙ කිසි සේත්
පූජකයකෙු විය නොහැකි ය. මන්ද, ව්‍යවස්ථා අනුව
පඬුරු ඔප්පු කරන පූජකයන් සිටින බැවිනි.
5 නික්ම 25:40 මෝසසේ මණ්ඩපය සාදන්නට යන
කල: “කන්දේ දී නුඹට පනේවන ලද සැලැස්ම අනුව
සියල්ල සාදන්නට බලාගනින්නැ”යි දවේියන්
වහන්සේ ආඥා කළ සේක. ඒ පූජකයෝ එලසෙ
ස්වර්ගීය දේවල සටහන හා ඡායාවක් ව තිබනෙ
දේවලට සවේය කරති. 6 එහතේ දැන් උන්
වහන්සේ වඩා උතුම් පොරොන්දු පිට පිහිටුවන ලද
වඩා විශිෂ්ට ගිවිසුමක මැදහත්කාරයාණන් ව සිටින

සේ ම උන් වහන්සේ වඩා උතුම් සේවක ධුරයක්
ලැබූ සේක:
7 පළමු වන ගිවිසුම නිදොස් ව තිබුණා නම්, දෙ
වන ගිවිසුමක් සෙවීම අවශ්‍ය නොවේ. 8 ජෙරෙ
31:31-34එහෙත් දෙවියන් වහන්සේ ඔවුන්ට දොස්
නඟමින් මෙසේ වදාරන සේක:
q28 “බලන්න, මා ඉශ්‍රායෙලේ වංශය හා ජුදා වංශය
සමඟ අලුත් ගිවිසුමක් කරන දිනයක් පැමිණෙන්නේ
ය.
q29 එය මිසර දේශයෙන් ඔවුන්ගේ පියවරුන්
ගෙනෙන පිණිස මා ඔවුන් අතින් අල්ලාගත් දවසේ දී
ඔවුන් සමඟ කළ ගිවිසුම මෙන් නොවේ;
q29 මන්ද, ඔව්හු මාගේ ගිවිසුමෙහි නොපැවතුණාහ,
මම ද ඔවුන් නොසලකා හැරියෙමි.
10 ඒ දවස්වලට පසු මා විසින් ඉශ්‍රායෙලේ වංශය
සමඟ කරන ගිවිසුම නම්:
q210 මාගේ ව්‍යවස්ථාව ඔවුන්ගේ මනසෙහි සටහන්
කර, ඒවා ඔවුන්ගේ සිත්වල ලියන්නෙමි.
q210 මම ඔවුන්ගේ දෙවියන් වහන්සේ වන්නෙමි,
ඔව්හු ද මාගේ සෙනඟ වන්නෝ ය.
11 සමිඳාණන් වහන්සේ දැනගන්න කියා එකිනෙකා
තමාගේ පුරවැසියාටත්, සහෝදරයාටත්
නූගන්වන්නෝ ය.
q211 මන්ද, ඔවුන් අතර ලොකු කුඩා සියල්ලෝ ම
මා දැනගන්නෝ ය.
12 මම ඔවුන්ගේ අදමිටුකම් දයාවෙන් ඉවසමි.
q212 ඔවුන්ගේ පව් ද තවත් සිහි නොකරන්නෙමි.”
13 අලුත් ගිවිසුම යයි කීමෙන් පළමු වැනි ගිවිසුම
පරණ වූවක් කළ සේක. පරණ වෙමින් දිරා යන
දෙය අතුරුදහන් වීමට ළඟ ය.

### අලුත් ගිවිසුමේ මැදහත්කාරයාණෝ

9 සැබැවින් ම පළමු වන ගිවිසුම සම්බන්ධයෙන්
පවා පූජා විධාන ද භෞමික ශුද්ධස්ථානයක් ද
තිබුණේ ය. 2 නික්ම 25:23-40; 26:1-30එතැන
මණ්ඩපයක් ඉදි කරන ලදී. එහි පළමු වන
කොටසෙහි පහන් රුක ද මේසය ද පිදුම් රොටි ද
තිබුණේ ය. එය ශුද්ධස්ථානය නම් විය. 3 නික්ම
26:31-33දෙ වන තිරය පිටුපස අතිශුද්ධස්ථානය යයි
නම් ලත් මණ්ඩපය තිබිණි. 4 නික්ම 16:33; 25:10-16;
30:1-6; ගණන් 17:8-10; ද්වි.නී. 10:3-5එහි රන්මුවා
ධූම පූජාසනය ද සහමුලින් රන් ආලේප කළ ගිවිසුම්
කරඬුව ද තිබුණේ ය. ඒ කරඬුවේ මන්නා දැමූ රන්
බඳුන ද ආරොන්ගේ දලු ලෑ සැරයටිය ද ගිවිසුමේ
ශිලාලේඛන ද විය. 5 නික්ම 25:18-22ඒ මත
කෙරුබ්වරු දිව්‍ය තේජසින් කරුණාසනය වසා සිටියහ.
දැන් මේවා ගැන දීර්ඝ විස්තරයක් කිරීමට ඉඩක්
නැත.
6 ගණන් 18:2-6 මේ දේවල් මෙසේ පිළියෙළ
කොට තිබිය දී, පූජකයෝ සිය පුදපූජා ඉටු කිරීමට
පළමු වන මණ්ඩපයට ඇතුළු වෙති. 7 ලේවී
16:2-34එහෙත් දෙ වන මණ්ඩපයට නායක පූජකයා
පමණක් වසරකට වරක් ඇතුළු වේ. ඔහු තමා
උදෙසාත්, සෙනඟගේ පව් උදෙසාත් ඔප්පු කරන
පිණිස ලේ රැගෙන එහි ඇතුළු වෙයි. 8 ඒ පළමු වන
මණ්ඩපය තිබෙන තුරු ශුද්ධස්ථානයට පැමිණෙන
මාර්ගය ප්‍රකාශ වී නැති බව මෙයින්
ශුද්ධාත්මයාණන් වහන්සේ පැහැදිලි ව පෙන්වන
සේක. 9 මේ සියල්ල වර්තමාන තත්ත්වය හඟවන
සංකේතයකි. එහි නියම කර ඇති පඬුරු හා පූජා
ඒවා ඔප්පු කරන්නා හට අභ්‍යන්තර
පරිපූර්ණත්වයක් ගෙන නොදෙයි. 10 මේවා
කෑමබීමවලින් හා විවිධාකාර ආගමික ධෝවනවලින්
සමන්විත බාහිර වත්පිළිවෙත් පමණකි. මේවා
පවතින්නේ දෙවියන් වහන්සේ සියල්ල සංශෝධනය
කරන තුරු පමණ ය.
11 එහෙත් ක්‍රිස්තුන් වහන්සේ දැනට ම ඇති
යහපත් දේ පිළිබඳ උත්තම පූජකයාණන් වශයෙන්
පැමිණි විට, උන් වහන්සේ වඩා උතුම් හා වඩා
සම්පූර්ණ, මිනිස් අතින් නොසෑදූ, එනම්, මේ
භෞතික මැවිල්ලට අයිති නොවන මණ්ඩපය මැදින්
වැඩිය සේක. 12 උන් වහන්සේ එළුවන්ගේත්,
වස්සන්ගේත් ලෙයින් නොව, තමන්ගේ ම ලෙයින්
අප උදෙසා සදාතන විමුක්තිය ලබා සදහට ම එක
වරක් ශුද්ධස්ථානයට ඇතුළු වූ සේක. 13 ලේවී
16:15-16; ගණන් 19:9,17-19මන්ද, වත්පිළිවෙතේ අනුව
අපවිත්‍ර යයි සලකන අය මත එළුවන්ගේත්,
ගොනුන්ගේත් ලේ ද, එළ වැස්සියකගේ අළු ද
ඉසීමෙන්, ඔව්හු පාරිශුද්ධිය ලබන්නාහු ය. 14 එසේ
නම්, ජීවමාන දෙවියන් වහන්සේට සේවය කරන
පිණිස ඔබගේ හෘදය සාක්ෂිය නිෂ්ඵල ක්‍රියාවලින්
පිරිසිදු කරනු ලැබීම, සදාතන ආත්මයාණන් මඟින්
තමන් ම කැළලක් නැති ව දෙවියන් වහන්සේට පූජා
වූ, ක්‍රිස්තුන් වහන්සේගේ ලේ කරණකොටගෙන,
ඊටත් ඉතා වැඩියෙන් පිරිසිදු නොවන්නේ ද? 15 මේ
කාරණය නිසා, කැඳවනු ලැබූවන්ට සදාතන උරුමයේ
පොරොන්දුව ලැබෙන පිණිස උන් වහන්සේ අලුත්
ගිවිසුමක මැදහත් කාරයාණෝ වන සේක. එසේ
වන්නේ පළමු වන ගිවිසුමේ කාලයේ දී කළ පාප
ක්‍රියාවලින් මුදනු ලැබීම පිණිස මරණයක් සිදු වූ
බැවිනි.
16 අන්තිම කැමැති පත්‍රයක් වලංගු වීමට නම්,
එහි අත්සන් කළ තැනැත්තා මළ බව ඔප්පු කළ යුතු
ය. 17 එවැනි ගිවිසුමක් ස්ථිර වන්නේ මරණයෙන්
පසු ව ය. ගිවිසුම කළ තැනැත්තා ජීවත් ව සිටිනතුරු
එය කොහෙත් ම වලංගු නැත. 18 පළමු වන ගිවිසුම
වුව ද ලේ නැති ව පිහිටුවනු නොලැබුවේ ඒ නිසා
ය. 19 නික්ම 24:6-8මන්ද, මෝසෙස් ව්‍යවස්ථාව අනුව
මුළු ජනතාවට සියලු ආඥා කියා දුන් පසු,
වස්සන්ගේත්, එළුවන්ගේත් ලේ සමඟ වතුර ද රතු
ලොම් ද හිසොප් ද ගෙන: 20 “මේවා දෙවියන්
වහන්සේ විසින් ඔබ ගැන නියෝග කළ ගිවිසුමේ
ලේ ය”යි කියමින් පොතත් මුළු ජනතාවත් මත
ඉස්සේ ය. 21 ලේවී 8:15එසේ ම ඔහු මණ්ඩපයටත්,
සියලු තේවා භාජනවලටත් ලේ ඉස්සේ ය. 22 ලේවී
17:11ව්‍යවස්ථාව අනුව සියලු දෙය ම ලෙයින් පවිත්‍ර

කරනු ලැබේ යයි කිව හැකි ය. ලේ වැගිරීමක් නැති
ව පව් කමාවක් නැත.

### සදහට ම පව් නසන පූජාව

23 එබැවින් ස්වර්ගීක දේවල අනුරූ පූජාවලින්
පවිත්‍ර කිරීම අවශ්‍ය වී නම්, ස්වර්ගීක දේවල් මීට
වඩා උතුම් පූජාවලින් පවිත්‍ර කරනු ලැබිය යුතු ය.
24 මන්ද, ක්‍රිස්තුන් වහන්සේ අප උදසො දවේයන්
වහන්සේ අබිමුවෙහි දැන් පනේ සිටින පිණිස, නියම
ශුද්ධස්ථානයේ ආදර්ශය ලසෙ අතින් සෑදූ
ශුද්ධස්ථානයකට නාෙව, ස්වර්ගයට ම ඇතුළු වූ
සේක. 25 නායක පූජකයා අනුන්ගේ ලේ රැගනෙ
අවුරුදුපතා ශුද්ධස්ථානයට, ඇතුළු වන්නාක් මනේ,
උන් වහන්සේ නැවත නැවතත් තමන් ම ඔප්පු කරන
පිණිස ඇතුළු නාෙ වූ සේක. 26 එසේ නාෙවූයේ
නම්, ලෝකය මැවීමේ පටන් නාෙයකේ වර, උන්
වහන්සේට වද වේදනා විඳීම අවශ්‍ය වනු ඇත.
එහතේ උන් වහන්සේ තමන් ම පූජා කිරීමනේ පාපය
දුරු කරන පිණිස මේ යුගාන්තයේ දී සදහට ම එක
වරක් ප්‍රකාශ වූ සේක. 27 තවද එක වරක්
මරණයත්, ඉන්පසු විනිශ්චයත් මිනිසාට නියම ව
ඇති සේ ම, 28 යසො 53:12බාෙහෝ දනෙකුගේ
පව් දුරු කරන පිණිස එක ම වරක් ක්‍රිස්තුන්
වහන්සේ දිවි පිදූ සේක. තවද, පාපය දුරු කරන
පිණිස නාෙව, උන් වහන්සේගේ ආගමනය බලා
සිටින්නන්ට ගැළවීම දනෙ පිණිස, උන් වහන්සේ ද
වන වර ප්‍රකාශ වන සේක.
nb
10 ව්‍යවස්ථාව වනාහි මතු පැමිණනෙ යහපත්
දේවල ඡායාවක් මිස එහි නියම රූපය ම
නාෙවේ. ඔවුන් වසරක් පාසා, නැවත නැවත ඔප්පු
කරන එම පූජාවලින් පුදපූජා කරන්නන් පරිපූර්ණ
කිරීමට කවදාවත් ව්‍යවස්ථාවට නාෙහැකි ය. එසේ
කළ හැකි නම්, 2 පුදපූජා කරන්නන් වරක් පවිත්‍ර
කරනු ලැබූ නිසා, තවත් ඔවුන්ට පාප හැඟීමක් නැති
බැවින්, ඒ පූජා ඔප්පු කිරීම නවතින්නේ ය.
3 එහතේ ඒ යාගවලින් සිදුවන්නේ අවුරුදුපතා
මිනිසුන්ට ඔවුන්ගේ පව් සිහි කර දීමකි.
4 ගාෙනුන්ගේත්, එළුවන්ගේත් ලයෙින් පව් පහකර
දැමීමක් සිදු නාෙවේ. 5 ගීතා 40:6-8එහයෙින්,
ක්‍රිස්තුන් වහන්සේ ලෝකයට වඩින කල දවේයන්
වහන්සේට මසෙේ වදාළ සේක:
q25 "ඔබට පුද පඬුරු රිසි නැත.
q25 එහතේ ඔබ මට සිරුරක් සූදානම් කළ සේක;
6 දවන පූජා හා පාප පූජා කිසිත් ඔබ සිත්
නාෙගනියි,
7 එසේ හයෙින්: දවේඳුනි, පාෙත් වළෙමේ මා ගැන
ලියා ඇති සේ, ඔබ රිසි දේ කරනු වස් මනේන, මම
ඇවිත් සිටිමි."
8 ව්‍යවස්ථාව අනුව ඔප්පු කරන පුදපඬුරුවලටත්,
දවන පූජාවලටත්, පාප පූජාවලටත් ඔබ කැමැති
වන්නේ වත් සතුටු වන්නේ වත් නැතැ යි ඉහත
කියා: 9 "මනේන ඔබගේ කැමැත්ත කරන්නට මම
පැමිණ සිටිමි"යි උන් වහන්සේ දවෙනු ව වදාළ
සේක. උන් වහන්සේ දවෙන්න පිහිටුවන පිණිස
පළමුවැන්න අවලංගු කරන සේක. 10 ඒ කැමැත්ත
පරිදි ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය සදහට
ම එක වරක් පූජා කිරීමනේ අපි පාරිශුද්ධිය ලැබ
සිටිමු.
11 නික්ම 29:38 තවද හැම පූජකයකේ ම සිටගනෙ,
දවස්පතා තේවා ඉටු කරමින්, කිසිකලකෙත් පව්
නසාලීමට නාෙහැකි වූ එම පූජාවන් බාෙහාෙ වර
ඔප්පු කරයි. 12 ගීතා 110:1එහතේ උන් වහන්සේ
පව් උදසො සදහට ම එක ම පූජාවක් ඔප්පු කාෙට,
දවේයන් වහන්සේගේ දකුණු පස අසුන් ගත් සේක.
13 එහි උන් වහන්සේ සිය සතුරන් තම පාපුටුව
කරනු ලබන තුරු බලා සිටින සේක. 14 මන්ද, උන්
වහන්සේ පවිත්‍ර කරනු ලබන්නන් එක ම පූජාවකින්
සදාතනික පරිපූර්ණත්වයට ගනො සේක.
15 ශුද්ධාත්මයාණන් වහන්සේත් අපට සාක්ෂි දමේින්:
16 ජරෙ 31:33 "ඒ දවස්වලින් පසු මා ඔවුන් සමඟ
කරන ගිවිසුම නම්, මාගේ ව්‍යවස්ථා ඔවුන්ගේ
සිත්වල තබා, ඒවා ඔවුන්ගේ මනසහෙි ලියන්නමේ
යි සමිඳාණන් වහන්සේ වදාරන සේකැ"යි කී
16 පසු, යළිත්:
17 ජරෙ 31:34 "ඔවුන්ගේ පාප සහ අධර්මිෂ්ඨකම්
තවත් සිහි නාෙකරන්නමේ"යි
17 කියන සේක. 18 කමාව ඇති තැන පාප පූජා
ඔප්පු කිරීමක් තවත් නැත.

### අවවාදානුශාසනා

19 එබැවින් සහෝදරවරුනි, උන් වහන්සේගේ
යාගික රුධිරය හේතුකාෙටගනෙ ශුද්ධස්ථානයට
ඇතුළු වීමට අපට නිදහස තිබේ. 20 උන් වහන්සේ
ස්වකීය ශරීරය නමැති තිරය මැදින් අප උදසො අලුත්
ජීවමාන මාර්ගයක් විවෘත කර දුන් සේක. 21 තවද
දවේයන් වහන්සේගේ ගෘහවාසීන් කරෙහෙි උතුම්
පූජකයකේ ද අපට සිටියි. 22 ලවේ 8:30; එසකි
36:25එබැවින් අපි නපුරු හෘදය සාක්ෂියකින් පවිත්‍ර
කරනු ලැබූ සිත් ද, පිරිසිදු වතුරනේ ධෝවනය කළ
ශරීර ද ඇති ව අවංක සිතක් හා ඒකාන්ත ඇදහීමේ
සහතිකය ද ඇති ව, දවේයන් වහන්සේ වතෙ ළඟා
වමෙු. 23 පාෙරාෙන්දුව දුන් තැනැන් වහන්සේ
විශ්වාසවන්ත බැවින් අප පිළිගත්
බලාපාෙරාෙත්තුවහෙි නාෙසලේවී, ස්ථිර ව පිහිටා
සිටිමු. 24 තවද ප්‍රමේයට හා යහපත් ක්‍රියාවලට
අන්යයන් පාෙළඹවන පිණිස එකිනකො ගැන
සලකමු. 25 ඇතැම් අය කරන ලසෙ අපේ ම
රැස්වීම්වලින් ඈත් ව නාෙසිට, සමිඳාණන්
වහන්සේගේ දිනය ළං වන බව ඔබට පනෙනෙ
බැවින් වැඩි වැඩියනේ එකිනකොට ධරෛය දමෙු.
26 සත්‍යය අවබෝධ වූ පසු අපි දැන දැන ම පව්
කරමු නම්, පව් දුර ලන පූජාවක් අපට තවත් නැත.
27 යසො 26:11අපට ඇත්තේ විනිශ්චය ගැනත්,
විරුද්ධවාදීන් දවාලන උදහස් ගින්න ගැනත් බියනේ
බලා සිටීම පමණකි. 28 ද්වි.නී. 17:6;

19:15මෝසෙස්ගේ ව්‍යවස්ථාව නොතකා හරින අය
දෙදෙනෙකුගේ හෝ තිදෙනෙකුගේ හෝ සාක්ෂි පිට
අනුකම්පාවක් නැති ව මරණයට පත් වනු ඇත.
29 නික්ම 24:8එසේ නම් දේව පුත්‍රයාණන් පයින්
පාගාදමන, තමාට විශුද්ධිය දුන් ගිවිසුම් ලේ, අශුද්ධ
දෙයක් කොට සිතන, වරප්‍රසාදයේ ආත්මයාණන්
වහන්සේට අපහාස කරන අපි ඊටත් වඩා තද
දඬුවමකට සුදුස්සෝ නොවෙමු ද? 30 ද්වි.නී.
32:35,36මන්ද; "පළිගැනීම මා සතු ය, විපාක
දෙන්නේ මම ය"යි ද, "සමිඳාණන් වහන්සේ
තමන්ගේ සෙනඟ විනිශ්චය කරන සේක"යි ද,
වදාළ තැනැන් වහන්සේ අපි දනිමු. 31 ජීවමාන
දෙවියන් වහන්සේගේ අත්වලට අසු වීම භයංකර
දෙයකි.
32 ඔබ සත්‍යාලෝකය ලැබූවායින් පසු, දුක් පීඩා
හා සමඟ මහා සටනක යෙදෙමින් ස්ථිර ව සිටි ඒ
මුල් කාලය සිහි කරන්න. 33 නින්දා සහ පීඩා නිසා
ඔබ උපහාසයට ලක් කරනු ලැබුවා පමණක් නොව,
එසේ ලක් කරනු ලැබූවන් සමඟ හවුල්කාරයෝ ද
වූවහු ය. 34 ඔබ සිරකරුවන් ව සිටි අයගේ දුක්
වේදනාවලට සහභාගි වූවා පමණක් නොව, වඩා
විශිෂ්ට දිරා නොයන වස්තුවක් ඔබට ඇති බව දැන,
ඔබේ දේපළ කොල්ලකෑම ප්‍රීතියෙන් ඉවසාගත්තහු
ය. 35 මහත් විපාකයක් ඔබට ඇති බැවින් ඔබේ
විශ්වාසය අත් නොහරින්න. 36 දෙවියන්
වහන්සේගේ කැමැත්ත ඉටු කොට උන්
වහන්සේගේ පොරොන්දුව ලැබීමට නම් ඉවසීම
ඔබට අවශ්‍ය ය. 37 හබ 2:3-4ශුද්ධ ලියවිල්ලෙහි
මෙසේ කියා ඇත:
q2 37 "එන්නට සිටින තැනැන් වහන්සේ පමා නොවේ,
තව මඳ කලකින් වඩින සේක.
38 ඉදින් මාගේ දැහැමි තැනැත්තා ඇදහිල්ලෙන්
ජීවත් වේ.
q2 38 එහෙත් ඔහු පසුබට වන්නේ නම්, ඔහු ගැන
මට සතුටක් නැත."
39 එසේ වුව ද පසුබට වී විනාශ වන අයගේ
ගණයට අපි අයිති නොවෙමු. විමුක්තිය ගෙන දෙන
ඇදහීම අපට ඇත.

## වීරෝදාර ඇදහිල්ල

11 ඇදහිල්ල වනාහි බලාපොරොත්තු වන දේ
පිළිබඳ සහතිකය යි. අදෘශ්‍යමාන දේ පිළිබඳ
නිසැකකම යි. 2 තමන්ගේ ඇදහිල්ල නිසා අපේ
මුතුන්මිත්තෝ දෙවියන් වහන්සේට ප්‍රිය මනාප වූ
හ.
3 උත් 1:1; ගීතා 33:6,9; ජොහ 1:3 දෙවියන්
වහන්සේගේ වචනයෙන් විශ්වය මවනු ලැබූ බව
අප තේරුම් ගන්නේ ඇදහිල්ලෙන් ය. මෙසේ
දෘශ්‍යමාන දෙය, අදෘශ්‍යමාන දෙයින් පහළ වූ බව
පෙනේ යයි.
4 උත් 4:3-10 ඇදහිල්ලෙන්, ආබෙල් කායින්ට වඩා
විශිෂ්ට පූජාවක් දෙවියන් වහන්සේට පුද කෙළේ ය.
ඔහුගේ පූජා ගැන දෙවියන් වහන්සේ ප්‍රසන්න වූ
බැවින්, ඇදහිල්ලෙන් ඔහු ධර්මිෂ්ඨයකු බවට පත්
කරනු ලැබී ය. ඔහු මියගිය ද ඇදහිල්ලෙන් දැනුත්
කතා කරයි.
5 උත් 5:21-24 ඇදහිල්ලෙන්, ඒනොක් මරණය
නොවිඳ ගෙනයනු ලැබී ය; දෙවියන් වහන්සේ ඔහු
ගෙන ගිය බැවින් ඔහු ජීවතුන් අතර නො වී ය.
ඔහුගේ තුරන් වීමට පෙර, ඔහු දෙවියන්
වහන්සේගේ ප්‍රසාදය දිනාගත් බවට සහතිකය
ලැබී ය. 6 ඇදහිල්ල නැති ව උන් වහන්සේගේ
ප්‍රසාදය දිනාගැනීමට පුළුවන්කමක් නැත. මන්ද,
දෙවියන් වහන්සේ වෙත ළඟා වන්නා උන් වහන්සේ
ජීවත් වන බවත්, උන් වහන්සේ සොයා එන්නවුන්ට
ඉෂ්ට විපාක දෙන කෙනෙකු බවත් විශ්වාස කළ යුතු
ය.
7 උත් 6:13-22 ඇදහිල්ලෙන්, නෝවා දැකගත
නොහැකි දේ ගැන දෙවියන් වහන්සේ විසින් දන්වනු
ලැබ, දේව ගරුබියෙන් ඇලළී සිය පවුලේ අය
ගළවාගැනීම සඳහා නැවක් සෑදුවේ ය. ඒ
ඇදහිල්ලෙන් ඔහු ලෝකයා වරදට පත්කොට,
ඇදහිල්ලෙන් පැමිණෙන දමිටු බවට උරුමක්කාරයෙක්
විය.
8 ඇදහිල්ලෙන්, ආබ්‍රහම් කැඳවීම ලැබූ කල, තමා
යන්නේ කොහේ දැ යි නොදැන, තමාට උරුමයක්
පිණිස පසු ව ලැබෙන්නට යන ස්ථානයකට පිටත් ව
යන ලෙස කීකරු වී, නික්ම ගියේ ය.උත් 12:1-5
9 ඇදහිල්ලෙන්, ඔහු ආගන්තුකයකු මෙන් දෙවියන්
වහන්සේ පොරොන්දු වූ දේශයෙහි පදිංචි වී, එම
පොරොන්දුවට හිමිකාරයන් වූ ඊසාක් සහ ජාකොබ්
සමඟ කූඩාරම්වල වාසය කෙළේ ය.උත් 35:27
10 මන්ද, දෙවියන් වහන්සේ ම, සිය සැලැස්ම අනුව
සාදා නිම කළ අත්තිවාරම් ඇති, නගරය ගැන ඔහු
බලා සිටියේ ය.
11 උත් 18:11-14; 21:2 ඇදහිල්ලෙන්, සාරා
පොරොන්දුව දුන් තැනැන් වහන්සේ විශ්වාස
කටයුතු කෙනෙකු යි පිළිගත් නිසා, නිසි වයස
ඉක්මවා ගිය ද පිළිසිඳගැනීමේ ශක්තිය ලැබුවා ය.
12 උත් 15:5; 22:17; 32:12එහෙයින් මළ කෙනෙකු
වැනි තැනැත්තකුගෙන් පවා, ගණනින් අහසේ තරු
මෙන් ද, මුහුදු වෙරළේ අසංඛ්‍ය වැලි ඇට මෙන් ද වූ
විශාල පරපුරක් ඇති විය.
13 උත් 23:4; 1 වංශා 29:15; ගීතා 39:12
ඇදහිල්ලෙහි පිහිටා සිටි මොවුහු සියල්ලෝ ම
මියගිය හ. ඔව්හු පොරොන්දු වූ දේ නොලැබූ
නමුත්, ඒවා කල්තියා දැක සතුටින් පිළිගෙන, මිහි
පිට තමන් ආගන්තුකයන් ද කලක් නේවාසිකයන් ද
බව ප්‍රකාශ කළහ. 14 මෙබඳු දේ ප්‍රකාශ කරන
අය, තමන්ගේ ම මවුබිමක් සොයන බව මැනවින්
පැහැදිලි කරති. 15 ඔව්හු තමන් හැරදමා ආ රට
ගැන ම සිත සිතා සිටියහු නම්, පෙරළා එහි යාමට
ඔවුන්ට අවස්ථා තිබිණි. 16 එහෙත් ඔව්හු දැන් වඩා
උතුම් රටක්, එනම් ස්වර්ගීය රටක් දෙස සිත් යොමු
කරති. දෙවියන් වහන්සේ ඔවුන්ගේ දෙවිඳාණෝ යයි
කියනු ලබනවාට උන් වහන්සේ ලජ්ජා නොවන්නේ

උන් වහන්සේ ඔවුන්ට නුවරක් පිළියෙළ කර තිබෙන
නිසා ය.
17 උත් 22:1-14 ආබ්‍රහම් පරීක්ෂා කරනු ලැබූ කල,
ඔහු ඇදහිල්ලෙන් ඊසාක් පූජා කළේ ය. 18 උත්
21:12“ඔබේ වංශය ඊසාක්ගෙන් පැවත එන්නේ ය”
යන දේව පොරොන්දුව ආබ්‍රහම් සතුටින් පිළිගත්
නමුත්, සිය ඒකජාතක පුත්‍රයා පූජා කිරීමට සූදානම්
ව සිටියේ ය. 19 මළවුන් උත්ථාන කිරීමට වුව ද
දෙවියන් වහන්සේට හැකි බව ඔහු සිතට ගත්තේ
ය. උපමානුසාරයෙන් කියතොත්, ඔහු ඊසාක්
මරණයෙන් නැවත ලබාගත්තේ ය.
20 උත් 27:27-29,39-40 ඇදහිල්ලෙන්, ඊසාක් එන්නට
ඇති දේ පිළිබඳව යාකොබ්ට සහ ඒසව්ට ආශීර්වාද
කළේ ය. 21 උත් 47:31; 48:20සිය මරණ
මොහොතේ දී යාකොබ්, ඇදහිල්ලෙන් ජෝසෙප්ගේ
පුතුන්ගෙන් එක් එක්කෙනාට ආශීර්වාද කොට, සිය
සැරයටිය මත හිස නමා නමස්කාර කළේ ය.
22 උත් 50:24-25; නික්ම 13:19ජෝසෙප් තමාගේ
අවසානය ළං වූ විට, ඇදහිල්ලෙන්, ඉශ්‍රායෙල්
පුත්‍රයන්ගේ නික්මයාම සඳහන් කොට, තමාගේ
ඇටකටු පිළිබඳ උපදෙස් දුන්නේ ය.
23 නික්ම 1:22; 2:2 මෝසෙස් උපන් කල ඔහුගේ
දෙමවුපියෝ ඔහු සුන්දර දරුවෙකු බව දැක,
රාජාඥාවට බිය නොවී, ඇදහිල්ලෙන් ඔහු තුන් මසක්
සඟවාගත්තෝ ය. 24 නික්ම 2:10-12මෝසෙස් වැඩුණු
පසු, පාරාවෝ රජුගේ දියණියන්ගේ පුත්‍රයා යයි
කියනු ලැබීම ඔහු ඇදහිල්ලෙන් ප්‍රතික්ෂේප කළේ
ය. 25 ඔහු කලකට පස්කම් සැප විඳීමට වඩා
දෙවියන් වහන්සේගේ සෙනඟ හා සමඟ දුක් විඳීම
තෝරාගත්තේ ය. 26 මන්ද, මතු එන්නට තිබෙන
ඉෂ්ට විපාකය හිත ගත් බැවින්, මිසරයේ
යසඉසුරුවලට වඩා විමුක්ති දායකයාණන් නමින් එන
අවමානය මහත් සම්පතකැයි ඔහු සිතී ය.
27 නික්ම 2:15 ඇදහිල්ලෙන්, ඔහු රාජ උදහසට බිය
නොවී, මිසරය අත්හැර ගියේ ය. අදෘශ්‍යමාන
දෙවියන් වහන්සේ දෙනෙතින් දකින්නාක් මෙන් ඔහු
ස්ථිර ව සිටියේ ය. 28 නික්ම 12:21-30මාර දූතයා
ඔවුන්ගේ කුලුඳුලන් විනාශ නොකරන පිණිස, ඔහු
පාස්කුව හා ලේ ඉසීම ද ඇදහිල්ලෙන් පැවැත්වී ය.
29 නික්ම 14:21-31 ඇදහිල්ලෙන්, ඔව්හු රතු මුහුද
මැදින් වියළි බිමක මෙන් ගමන් කළෝ ය. එසේ
යාමට කළ ප්‍රයත්නයේ දී මිසරවරු දියේ ගිලී මළෝ
ය. 30 ජෝෂු 6:12-21සත් දිනක්, ජෙරිකෝවේ පවුරු
වටා ගමන් කළ පසු, ඔවුන්ගේ ඇදහිල්ලෙන් ඒ පවුරු
බිඳ වැටුණේ ය.
31 ජෝෂු 2:1-21; 6:22-25 ගණිකාවක වූ රාහාබ්,
ඇදහිල්ලෙන්, චරපුරුෂයන් හොඳ සිතින් පිළිගත්
බැවින්, අකීකරු වූවන් සමඟ විනාශ නොවී ඉතිරි
වූවා ය.
32 විනි 4:6—5:31; 6:11—8:32; 11:1—12:7;
13:2—16:31; 1 සාමු 1:1—1 රාජා 2:11 තවදුරටත්
කීම අවශ්‍ය ද? ගිඩියොන් ද බාරක් ද සම්සොන් ද
ජෙප්තා ද දාවිත් ද සාමුවෙල් ද දිවැසිවරයන් ද ගැන
කීමට කල් වේලා නැත. 33 දානි 6:1-27ඔව්හු
ඇදහිල්ලෙන් රාජ්‍යයන් පරාජය කළහ. යුක්තිය ඉටු
කළහ. දේව පොරොන්දු අත් කර ගත්හ,
සිංහයන්ගේ කට වැසූ හ. 34 දානි 3:1-30රෞද්‍ර ගිනි
ජාලා නිවාලූ හ, කඩුපතින් නොමළහ, දුබල ව සිටි
නමුත් ප්‍රබල වූ හ, රණ බිම්හි ජය කොඩි නැංවූ
හ, පර සතුරු සේනා නෙරපූ හ. 35 1 රාජා 17:17-24;
2 රාජා 4:25-37ස්ත්‍රීහු සිය මළවුන් පුනරුත්ථානයෙන්
නැවත ලැබූ හ. තවත් අය වඩා විශිෂ්ට
පුනරුත්ථානයක් ලබන පිණිස, බේරීමක් නොසොයා
මාරක වද වේදනා වින්දහ. 36 1 රාජා 22:26-27; 2
වංශා 18:25-26; ජෙර 20:2; 37:15; 38:6තවත් අය
අපහාස හා කස පහරවලට ද විලංගු සහ හිර
අඩස්සියට ද මුහුණ පෑ හ. 37 2 වංශා 24:21ඔව්හු
ගල් පහර ලැබූ හ. කියතෙන් දෙකට ඉරනු ලැබූ හ,
කඩුවෙන් මරනු ලැබූ හ. ඔව්හු අනාථ ව දුක් පීඩා
විඳිමින්, බැටළු හම් හා එළු හම් ඇඳ, ඔබමොබ
ගියහ. 38 එවැන්නන් දැරීමට මේ ලෝකය වටින්නේ
නැත. ඔව්හු මරුකතරෙහි හා කඳුකරවල ද ගුහාවල
ද බිම්ගෙවල ද ගැවසුණ හ.
39 මොවුහු සියල්ලෝ ම ඇදහිල්ල ගැන පැසසුම්
ලැබූ නමුත්, පොරොන්දු නොලදහ. 40 එසේ වූයේ,
දෙවියන් වහන්සේ අප ගැන සලකා, ඔවුන්
පරිපූර්ණත්වය ලැබිය යුත්තේ අප හා සමඟ
පමණකැ යි යන වඩා හොඳ සැලැස්මක් කල්තියා
පිළියෙළ කොට තිබූ හයිනි.

## හික්මවීමෙන් දැහැමි ජීවිත

12 මේ සා විශාල සාක්ෂිකාර සේනාවකින් අප
වට වී සිටින නිසා, සියලු අවහිර ද,
පහසුවෙන් අප වෙළා ගන්නා පාපයන් ද ඉවත ලා,
2 ඇදහිල්ලේ කර්තෘවරයාණන් ද එහි
පරිපූරකයාණන් ද වන ජේසුස් වහන්සේ දෙස ම
නෙත් යොමා, අපට දිවීමට ඇති ධාවනය
නොපසුබට, වීර්යයෙන් දුවමු. උන් වහන්සේ තමන්
ඉදිරියෙහි වූ ප්‍රීතිය නිසා, කුරුසියේ අවමානය
නොතකා, එහි වධ විඳ දෙවියන් වහන්සේගේ
සිංහාසනයේ දකුණත අසුන් ගත් සේක.
3 ඒ නිසා ඔබ අධෛර්ය ව විඩාවට පත් නොවන
පිණිස, තමාට විරුද්ධ ව නැඟී සිටි පව්කරුවන්ගෙන්
එතරම් විරෝධය ඉවසූ තැනැන් වහන්සේ ගැන සිතා
බලන්න.
4 පාපයට විරුද්ධ ව කරන සටනෙහි දී ඔබ තව ම
ලේ වගුරුවන තැනට පත් වී නැත. 5 ජෝබ් 5:17;
හිතෝ 3:11-12දරුවන්ට මෙන් දෙවියන් වහන්සේ
ඔබට වදාළ සිත් දිරිගන්වන මේ වචන ඔබ අමතක
කළහු ද?
q25 “මාගේ පුත්‍රය, සමිඳාණන් වහන්සේගේ
හික්මවීම් සුළු කොට නොසිතන්න, උන් වහන්සේ
තරවටු කරන කල මලානික නොවන්න:
6 මන්ද, සමිඳාණන් වහන්සේට ප්‍රේම කරන අය
උන් වහන්සේ හික්මවන සේක;
q26 පුත්‍රයන් මෙන් තමන් වහන්සේ පිළිගන්න අයට
උන් වහන්සේ දඬුවම් කරන සේක.”

[7] ඔබගේ හික්මවීම පිණිස ඒ දඬුවම ඉවසන්න;
දෙවියන් වහන්සේ ඔබ ගැන පුත්‍රයන්ට මෙන්
ක්‍රියා කරන සේක. තම පුත්‍රයාට දඬුවම්
නොකරන පියෙක් ඇද් ද? [8] හැම දරුවෙකු ම ලබන
දඬුවමට ඔබ පංගුකාරයෝ නොවන්නහු නම්, ඔබ
පුත්‍රයන් නොව, අවජාතක දරුවෝ ය, [9] තවද අප
හික්මවූ මාංසික පියවරුන්ට අපි ගරුබුහුමන් කරමු
නම් ඊට බොහෝ වැඩියෙන් අප ආත්මික පියාණන්
වහන්සේට අවනත ව ජීවත් විය යුතු නොවේ ද?
[10] අපේ මලෙලෝ පියවරු තමන්ට හරි යයි පෙනුණු
ලෙස මඳ කලකට අපට දඬුවම් කළහ; එහෙත් උන්
වහන්සේ තමන්ගේ පරිශුද්ධත්වයට අප
පංගුකාරයන් වන පිණිස, අපේ යහපත සඳහා
දඬුවම් කරන සේක. [11] දඬුවමක් ලබන කල එය
දුකට මිස ප්‍රීතියට කාරණාවක් මෙන් නොපෙනේ.
එහෙත් එයින් හික්මුණු අයට පසු ව දැහැමි සාමකාමී
ජීවිතයක පල අත් වේ. [12] යෙසා 35:3එබැවින්
පහතට වැටී ඇති අත් ද දුබල දණහිස් ද ශක්තිමත්
කරගන්න. [13] හිතෝ 4:26කොර කකුල් අබලන්
නොවී, සුවය ලබන පිණිස ඇද නැති මාවත්වල
ගමන් කරන්න.

## උවදෙස් හා අවවාද

[14] සියල්ලන් සමඟ සාමදානයෙන් සිටින්නටත්,
ශුද්ධකම නැති ව කිසිවෙක් සමිඳාණන් වහන්සේ
නොදක්නා බැවින්, ශුද්ධකම අනුව යන්නත් උත්සාහ
කරන්න. [15] ද්වි.නී. 29:18කිසිවෙකු දේව
වරප්‍රසාදයෙන් බැහැර නොයන ලෙස ද, කිසිවෙකු
තිත්තකමේ මූලයක් වී ගැටළු මතුකර, බොහෝ
දෙනා දූෂ්‍ය නොකරන ලෙස ද, [16] උත්
25:29-34දුශ්ශීල කෙනෙකු හෝ එක කෑම වේලක්
නිසා සිය ජන්ම උරුමය විකුණූ ඒසව් වැනි දේව
අභක්තික කෙනෙකු හෝ නොවන ලෙස ද පරෙස්සම්
වන්න. [17] උත් 27:30-40පසු ව ඔහු ඒ ආශීර්වාදය
යළි උරුම කරගැනීමට කැමැති වුව ද, ඔහු
ප්‍රතික්ෂේප කරනු ලැබූ හැටි ඔබ දන්නහු ය.
ඉන්පසු ඔහු කඳුළු සලමින් එය ලබාගැනීමට
අවස්ථාවක් ඉතා ඕනෑකමින් සෙවූ නමුත්
එවැන්නකට ඉඩක් නොලැබිණි.

## භයංකර පුරාණ ගිවිසුම හා තේජාන්විත නව ගිවිසුම

[18] නික්ම 19:16-22; 20:18-21; ද්වි.නී. 4:11-12;
5:22-27 ඔබ පැමිණ සිටින්නේ, ස්පර්ශ කළ හැකි
ගිනි ජාලාවකට වත්, කළුවරට වත්, ඝන
අන්ධකාරයට වත්, චණ්ඩ මාරුතයට වත්,
[19] හොරණෑ ශබ්දයට වත්, හඬකින් නික්මෙන
වචනවලට වත් නොවේ. ඒ හඬ ඇසූ අය තවත්
ඔවුන්ට එසේ කතා නොකරන ලෙස ඉල්ලා සිටියහ.
[20] නික්ම 19:12-13මන්ද, “මෘගයෙකු වුව ද කන්දෙහි
ගැටුණොත්, ඌට ගල් ගසා මැරිය යුතු ය”යි කී අණ
ඔවුන්ට දැරිය නොහැකි විය. [21] ද්වි.නී. 9:19ඒ
දර්ශනය කෙතරම් බියකරු වී ද යත්, “මම බියෙන්
වෙව්ලමි”යි මෝසෙස් කී ය.
[22] එහෙත් ඔබ ළඟා වී සිටින්නේ සියොන් කන්දට
ය; ජීවමාන දෙවියන් වහන්සේගේ නගරය වූ
ස්වර්ගීය ජෙරුසලමට ය; කෝටි සංඛ්‍යාත දේව දූත
සේනාවන්ගෙන් යුත් මහා රැස්වීමට ය;
[23] සඟලොවෙහි නම් ලියා ඇති කුළුඳුලන්ගේ
සභාවට ය; සියල්ලන්ගේ විනිශ්චයකාර දෙවියන්
වහන්සේ වෙතට ය; සම්පූර්ණ ලෙස ධර්මිෂ්ඨ කරන
ලද අයගේ ආත්ම වෙතට ය; [24] උත් 4:10නව
ගිවිසුමක මැදහත්කාරයාණන් වූ ජේසුස් වහන්සේ
වෙතට ය. ආබෙල්ගේ ලයෙට වඩා උතුම් ලෙස කතා
කරන උන් වහන්සේගේ ඉසීමේ ලයෙ ද වෙතටත්
ය. [25] නික්ම 20:22එසේ නම් කතා කරන තැනැන්
වහන්සේ ප්‍රතික්ෂේප නොකරන්නට වග බලා
ගන්න. මන්ද, මිහි පිට අනුශාසනා කළ තැනැන්
වහන්සේ එපා කළ විට, ඔව්හු නොගැළවුණෝ නම්,
ස්වර්ගයෙන් අනුශාසනා කරන තැනැන් වහන්සේ
කෙරෙන් අපහක් ව ගියොත් අපි කෙසේ ගැළවෙමු ද?
[26] හග් 2:6උන් වහන්සේගේ ශබ්දය ඒ කාලයේ දී
පොළොව කම්පා කළේ ය. එහෙත් දැන් උන්
වහන්සේ, “මම පොළොව පමණක් නොව,
ස්වර්ගයත් තව වරක් කම්පා කරවන්නෙමි”යි
පොරොන්දු වී තිබේ. [27] ‘තව වරක්’ ය කීමෙන්
අදහස් කරන්නේ නොසෙල්වෙන දේ පවත්නා පිණිස
සෙලවෙන දේ, එනම්, මවන ලද සියල්ල පහ වන
බව ය. [28] එහෙයින් නොසෙල්විය හැකි රාජ්‍යයක්
අප ලබන බැවින් ස්තුතිවන්ත වෙමු. එමඟින්
ගෞරවයෙන් හා දේව ගරුබියෙන් දෙවියන්
වහන්සේ ප්‍රසන්න වන ලෙස නමස්කාර කරමු.
[29] ද්වි.නී. 4:24මන්ද, අපගේ දෙවියන් වහන්සේ
වනාහි සියල්ල දවාලන ගින්නකි.

## දෙවියන්ට ප්‍රිය මනාප සේවය

**13** සහෝදරයන් ලෙස එකිනෙකාට නොකඩව
ප්‍රේම කරන්න. [2] උත් 18:1-8;
19:1-3ආගන්තුක සත්කාරය අමතක නොකරන්න.
මන්ද, ආගන්තුක සත්කාර කළ ඇතැම් අය
නොදැනුවත් ව ම දේව දූතයන්ට සත්කාර කළහ.
[3] සිර ගෙයි සිටින අය සමඟ ඔබත් සිටිනවා යයි
සිතා, ඔවුන් සිහි කරන්න. ඔබටත් ශරීරයක් ඇති
බැවින්, දුක් පීඩා විඳින්නන් සිහි කරන්න.
[4] විවාහය සියල්ලන් අතර ගෞරවණීය ව ද විවාහ
බැම්ම නොකැළැල් ව ද පවතී වා. මන්ද,
අවකල්ක්‍රියා කරන්නන් ද කාමමිථ්‍යාචාරිකයන් ද
දේව විනිශ්චයට ලක් වනු ඇත.
[5] ද්වි.නී. 31:6,8; ජෝෂු 1:5 ලත් පමණින් සතුටු
වන්න, වස්තු තණ්හාවෙන් තොර ව ඉන්න. මන්ද,
“මම කිසි සේත් නුඹෙන් අපහක් ව නොයෙමි; කිසි
අයුරකින් නුඹ අත් නොහරිමි”යි දෙවියන් වහන්සේ
ම වදාරා තිබේ.
[6] ගීතා 118:6 මෙසේ:

ගී2[6] "සමිඳාණන් වහන්සේ මාගේ සරණය ය, මම
බිය නොවන්නෙමි.
ගී2[6] මිනිසා මට කුමක් කරයි ද?"
6 කියා ධෛර්ය සම්පන්න ව කීමට අපට පිළිවන.

## සභා නායකයන්ට යටත් වීම

7 දෙවියන් වහන්සේගේ වචනය ඔබ වෙත ගෙනෙ
ඔබගේ නායකයන් සිහි කරන්න. ඔවුන්ගේ ජීවිත
පැවැත්මේ ප්‍රතිඵල දෙස බලමින්, එම ඇදහිල්ල
අනුගමනය කරන්න. 8 ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ
ඊයේත් අදත් සදහටමත් ඒකාකාර ම ය. 9 නා නා
ප්‍රකාර අමුතු ඉගැන්වීම් සොයා ගොස් මුළා
නොවන්න. ආහාර පිළිබඳ නීතිරීතිවලින් නොව,
දේව වරප්‍රසාදයෙන් සිත් ශක්තිමත් කර ගැනීම
යහපති. ඒ නීතිරීතිවලින් කිසිවෙකුට යහපතක් නො
වී ය.
10 අපට පූජාසනයක් ඇත. පූජා මණ්ඩපයෙහි
සේවය කරන්නන්ට එයින් වළඳන්ට අවසර නැත.
11 ලෙවී 16:27මන්ද, නායක පූජකයා විසින් පාප
පූජාවක් සඳහා සතුන්ගේ ලේ ශුද්ධස්ථානයට ගෙන
ගිය පසු, ඒ සතුන්ගේ මළසිරුරු කඳවුරෙන් පිටත දී
පුළුස්සා දමනු ලැබේ. 12 එහෙත් ජේසුස් වහන්සේ
ද තමන් රුධිරයෙන් සෙනඟ පවිත්‍ර කරන පිණිස
වාසල් දොරින් පිටත දී වද වින්දේ ඒ නිසා ය. 13 ඒ
නිසා උන් වහන්සේ දැරූ නින්දාව උසුලාගෙන අපිත්
කඳවුරෙන් පිටත උන් වහන්සේ වෙත යමු.
14 සදාතන නුවරක් මෙහි පිට අපට නැත. අප
සොයන්නේ මතු පැමිණෙන්නට තිබෙන නුවර ය.
15 එබැවින් උන් වහන්සේ මඟින් දෙවියන්
වහන්සේට අපගේ පැසසුම් පූජාව නොකඩව පුද
කරමු. ඒ පූජාව නම්, උන් වහන්සේගේ නාමයට
අපගේ මුවින් ම පැසසුම් දීමයි. 16 යහපත කිරීමට ද,
ඔබ සතු දෙය අනුන් සමඟ බෙදාහදා ගැනීමට ද
අමතක නොකරන්න. එවැනි පූජාවලට දෙවියන්
වහන්සේ ප්‍රසන්න වන සේක.

17 ඔබගේ නායකයන්ට කීකරු වී යටත් වන්න. මන්ද,
ඔබ ගැන ඔවුන් ගණන් දිය යුතු බැවින්, ඔබගේ
ආත්ම රැක බලාගැනීමට ඔව්හු නිරතුරු වෙහෙසෙති.
එසේ කිරීම ඔවුන්ට බරක් නොව, ප්‍රීතියක් වීමට
සලසන්න. එය බරක් වුවහොත්, ඔබට යහපතක් සිදු
නොවේ.

## අවසන් උවදෙස් හා ආචාර

18 අප ගැන යාච්ඤා කරන්න. මන්ද, සියල්ලේ දී
යහපත කිරීමට ආශාවෙන් යුත් නිදොස් හෘදය
සාක්ෂියක් අපට ඇති බව සහතික ය. 19 නොපමා ව
මා ඔබ වෙත නැවත එන පිණිස, වඩාත් උනන්දු
ලෙස යාච්ඤා කරන මෙන් ඉල්ලමි.
20 සදාතන ගිවිසුමේ ලේ කරණකොටගෙන
බැටළුවන්ගේ මහා එඬේරාණන් වන, අප ජේසුස්
සමිඳාණන් වහන්සේ මළවුන් කෙරෙන් උත්ථාන කළ
සාමදානයේ දෙවියන් වහන්සේ, 21 ඔබ උන්
වහන්සේගේ කැමැත්ත ඉටු කරන පිණිස, සියලු
යහපත් ක්‍රියාවලින් ඔබ පරිපූර්ණ කරන සේක් වා!
තමන්ට ප්‍රසන්න දේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ
කරණකොටගෙන උන් වහන්සේ අප තුළ ඉටු කරන
සේක් වා! උන් වහන්සේට සදහට ම මහිමය වේ
වා! ආමෙන්.
22 සහෝදරවරුනි, මේ අවවාදාත්මක පණිවුඩය
ඉවසිල්ලෙන් අසන මෙන් ඉල්ලමි. මා මෙය ලියා
ඇත්තේ ලුහුඬින් ය. 23 අපගේ සහෝදර තිමෝතියස්
නිදහස් කරනු ලැබූ බව දන්වනු කැමැත්තෙමි. ඔහු
පමා නොවී ආවොත්, මම ඔහු සමඟ ඔබ බලන්නට
එන්නෙමි.
24 ඔබගේ සියලු නායකයන් ඇතුළු දෙවියන්
වහන්සේගේ සියලු ජනතාවට මා වෙනුවෙන් ආචාර
කරන්න. ඉතාලියේ හිතමිතුරෝ ඔබට සුබ පතති.
25 දේව කරුණාව ඔබ සියල්ලන් සමඟ වේ වා!

# ජාකොබ්

## ආචාරය

1 මතෙ 13:55; මාක් 6:3; ක්‍රියා 15:13; ගලා
1:19 දෙවියන් වහන්සේගේත් ජේසුස්
ක්‍රිස්තුස් ස්වාමීන් වහන්සේගේත් සේවකයකු වන
ජාකොබ් නම් මම, ලොව පුරා විසිර සිටින ගෝත්‍ර
දොළොසට සුබ පතමින් මෙය ලියා එවමි.

## ඇදහිල්ල හා ප්‍රඥාව

2 මාගේ සහෝදරයෙනි, ඔබගේ ඇදහිල්ල පරීක්ෂා
කරනු ලැබීමෙන් ඉවසිල්ල ඇති වන බව සිතට
ගෙන, 3 විවිධ දුෂ්කරතාවන්ට මුහුණ පාන කල එය
වාසනාවකැ යි සලකන්න. 4 ඔබ කිසිවකින් ඌන ව
නොසිට, සියලු අයුරින් පරිපූර්ණ ව සිටින පිණිස
ඉවසීමේ ගුණය සම්පූර්ණ ලෙස ක්‍රියා කරේ වා.
5 ඔබගෙන් යමෙකුට ප්‍රඥාව නැත්නම්, ඔහු
දෙවියන් වහන්සේගෙන් එය ඉල්ලා සිටී වා. එවිට
සියල්ලන්ට නොමසුරුව, දොස් නොතබා දෙන
දෙවියන් වහන්සේ එය ඔහුට ප්‍රදානය කරන
සේක. 6 එහෙත් සැක නොකර ඇදහිල්ලෙන් ඔහු
එය අයැදී වා. මන්ද, සැක කරන තැනැත්තේ සුළඟින්
කැළඹී නඟින බසින මුහුදු රැල්ලට සමාන ය. 7 එබඳු
මනුෂ්‍යයා තමාට සමිඳාණන් වහන්සේගෙන් කිසිවක්
ලැබේ යයි නොසිතා වා. 8 ඔහු සිත් දෙගිඩියාවෙන්
පසුවන මනුෂ්‍යයෙකු ව තමාගේ සියලු ක්‍රියා
මාර්ගවල දී අස්ථිර ව සිටින්නේ ය.

## දිළිඳු සහෝදරයා සහ ධනපතියා

9 පීඩිත තත්ත්වයක සිටින සහෝදරයා තමා උසස්
කරනු ලැබීම ගැන ද, 10 යෙසා 40:6-7ධනපතියා තමා
පහත් කරනු ලැබීම ගැන ද උදන් අනා වා. මන්ද,
ධනවතා තණ මලක් මෙන් පහ ව යන්නේ ය.
11 දැවෙන හිරු කිරණින් තණ කොළ වියළී යයි;
ඒවායේ මල් පෙති වැටී යයි. එහි සෞන්දර්යය පහ
වී යයි. එලෙස ම ධනවතා සිය උපාය මාර්ගවල දී
මැල වී යයි.

## පරීක්ෂාව හා පෙළඹීම

12 කම්කටොලු ඉවසන මනුෂ්‍යයා
භාග්‍යවන්තයෙකි. මන්ද, ඔහු පරීක්ෂාවෙන් ජය ලැබූ
කල, දෙවියන් වහන්සේට ප්‍රේම කරන්නවුන්ට උන්
වහන්සේ පොරොන්දු වූ, ජීවන කිරීටය ලබන්නේ
ය. 13 පරීක්ෂා කරනු ලබන කල, “මා
පොළඹවන්නේ දෙවියන් වහන්සේ ය”යි කිසිවෙක්
නොකියා වා. දෙවියන් වහන්සේ නපුරෙන්
පෙළෙඹෙන්නේ නැත. කිසිවකු පොළඹවන්නේත්
නැත. 14 ඒ ඒ මිනිසාට පරීක්ෂාව පැමිණෙන්නේ තම
තමාගේ ම තෘෂ්ණාවෙන් මුළා වී පෙළෙඹෙන විට ය.
15 මෙසේ තෘෂ්ණාව පිළිසිඳ, පාපය බිහි කරයි.
පාපය ද මුහුකුරා ගොස් මරණය සිදු කරයි.
16 මාගේ ප්‍රේමවන්ත සහෝදරයෙනි,
නොරැවටෙන්න. 17 සෑම යහපත් දීමනා ද සියලු
අගනා ත්‍යාග ද නොවෙනස් වන සුලු, පහ ව යන
බවට ඡායා මාත්‍රයකුදු නැති ආලෝකයේ පියාණන්
වහන්සේ කෙරෙන් ඉහළින් බැස එන්නේ ය. 18 උන්
වහන්සේ මැවූ සත්ත්වයන් අතර අප මුදුන් මල්කඩ
වීමේ පෙර ලකුණු වශයෙන්, සිය අරමුණ අනුව උන්
වහන්සේ සත්‍ය වචනයෙන් අප ජනිත කළ සේක.

## ධර්මය අසා පිළිපැදීම

19 මාගේ ප්‍රේමවන්ත සහෝදරයෙනි, මෙය
තේරුම්ගන්න. ඔබ එකිනෙකා සවන් දීමට ඉක්මන්
වන්න, කතා කිරීමටත් කෝප වීමටත් පමා වන්න.
20 මන්ද, මනුෂ්‍යයාගේ කෝපයෙන් දෙවියන්
වහන්සේගේ යුක්තිය ඉටු වන්නේ නැත.
21 එහෙයින් සියලු අධම දෙය ද දමනය කළ
නොහැකි දුෂ්ටකම ද ඉවත ලා ඔබට ගැළවීම සාදා
දිය හැකි, ඔබ සිත් සතන්හි මුල් බැසගත් දහම්
පණිවුඩය යටහත් ලෙස පිළිගන්න.
22 එහෙත්, තමන් ම රවටා නොගෙන දහම්
පණිවුඩය අසන්නන් පමණක් නොවී, එය
පිළිපදින්නෝ වන්න. 23 මන්ද යමෙක් දහම්
පණිවුඩය අසන නමුත් එය නොපිළිපදින්නේ නම්,
ඔහු කැඩපතකින් තමාගේ මුහුණ ඇති සැටියෙන්
බලන මනුෂ්‍යයෙකුට සමාන ය. 24 ඔහු තම රූපය
දෙස බලා අහක් ව ගිය පසු, තමා කෙබඳු
මනුෂ්‍යයෙක් දැ යි වහා ම අමතක කරයි. 25 එහෙත්
නිදහස ගෙනදෙන සර්ව සම්පූර්ණ ව්‍යවස්ථාව දෙස
මැනැවින් බලා, එය අසා අමතක කරන්නෙකු නොවී
එය ක්‍රියාවෙහි යොදමින් ඒ අනුව ජීවත් වන
තැනැත්තේ එසේ කිරීමෙන් ආසිරි ලබන්නේ ය.
26 යමෙක් තමාගේ දිව දමනය නොකර, තම සිත
රවටාගැනීමෙන්, තමා භක්තිවන්තයෙකැ යි
සිතන්නේ නම්, ඔහුගේ ආගමෙන් වැඩක් නැත.
27 අපගේ පියාණන් වන දෙවියන් වහන්සේ
ඉදිරියෙහි පිරිසිදු නිර්මල භක්තිය නම්, මව්පියන්
නැති දරුවන්ට ද වැන්දඹුවන්ට ද ඔවුන්ගේ
විපත්තිවල දී පිහිට වීමත්, ලෝකයෙන් තමා ම
කිළුටු නොවී ආරක්ෂා වීමත් ය.

## තරාතිරම් බැලීමේ වරද

2 මාගේ සහෝදරයෙනි, ඔබ තේජශ්‍රීයෙන්
වැජඹෙන, අපගේ ස්වාමීන් වන ජේසුස්
ක්‍රිස්තුන් වහන්සේ අදහන නිසා, මිනිසුන්ගේ
තරාතිරම් බැලීමෙන් වැළකෙන්න. 2 රන් මුදු පැළඳ,
ඉස්තරම් වස්ත්‍ර ඇඳගත් කෙනෙකේ ද වැරහැලි
ඇඳගත් දිළින්දෙකේ ද ඔබගේ ධර්මශාලාවට
පැමිණියෝ යයි සිතමු. 3 ඔබ ඉස්තරම් වස්ත්‍ර
ඇඳගත් අයට විශේෂ සැලකිලි දක්වා, “කරුණාකර
මෙහි, අසුන් ගන්න” කියා ද, දිළින්දාට, “උඹ ඔතන
හිටපන්”, නැත්නම් “මාගේ පාපුටුව ළඟ බිම
හිඳගන්නැ”යි කියා ද කීවොත්, 4 ඔබ අතරෙ ම
පක්ෂවාදිකම් ඇති කරන නපුරු සිතුවිලි සහිත
විනිශ්චයකරුවන් නොවන්නේ ද?
5 මාගේ ප්‍රේමවන්ත සහෝදරයෙනි, සවන්
දෙන්න, ඇදහිල්ලෙහි ධනවතුන් වන පිණිසත්,
දෙවියන් වහන්සේට ප්‍රේම කරන්නන් හට
පොරොන්දු වූ රාජ්‍යයේ උරුමක්කාරයන් වන
පිණිසත්, උන් වහන්සේ ලෝකයේ දිළිඳුන් තෝරා
ගත්තේ කුමක්නිසා ද? 6 එහෙතේ ඔබ දිළිඳුන්ට
අවමන් කළහු ය. ඔබට පීඩා කරන්නෝ ධනවත්තු
නොවෙතේ ද? නඩු ශාලාවලට ඔබ ඇදගෙන
යන්නෝත්, 7 ඔබ දරන උතුම් නාමයට අපහාස
කරන්නෝත් ඔව්හු නොවෙතේ ද?
8 ලෙවී 19:18 එසේ වුව ද, ශුද්ධ ලියවිල්ලේ
සඳහන් පරිදි: “ඔබට මෙන් ඔබේ අසල්වැසියාට
ප්‍රේම කරන්න” යන රාජ නීතිය පවත් වන්නහු
නම්, ඔබ කරන දෙය කදිම යි. 9 එහෙතේ මිනිසුන්ගේ
තරාතිරම් සලකන්නහු නම්, ඔබ වරදකාරයන් බව
ව්‍යවස්ථාව අනුව ඔප්පු වන බැවින් ඔබ කරන දෙය
පාපයකි. 10 මන්ද, යමකු මුළු ව්‍යවස්ථාව
පිළිපැද්දත්, ඉන් එක අණක්වත් කඩ කළොත්, ඔහු
සියල්ල ගැන වරදකාරයකේ වෙයි. 11 නික්ම
20:13,14; ද්වි.නී. 5:17,18“කාමමිථ්‍යාචාරය
නොකරව”යි වදාළ තැනැන් වහන්සේ ම, “මිනී
නොමරන්න” කියාත් කී සේක. ඉදින් ඔබ
කාමමිථ්‍යාචාරය නොකළත්, මිනී මරන්නෙහි නම්,
ව්‍යවස්ථාව කඩ කරන්නකේ වන්නෙහි ය. 12 නිදහස
සලසන ව්‍යවස්ථාවකින් විනිශ්චය ලැබීමට සිටින අය
මෙන් කතා කරන්න. ක්‍රියා කරන්න. 13 දයාව
නොපෙන්වූ තැනැත්තාට දයා විරහිත විනිශ්චයක්
පැමිණෙන්නේ ය. දයාව, විනිශ්චය පසුබා ජය ගනී.

## ක්‍රියාකාරී ඇදහිල්ල

14 මාගේ සහෝදරයෙනි, තමාට ඇදහිල්ල ඇතැ යි
යමකු කීවත් ක්‍රියාවලින් එය ප්‍රකාශ නොවේ
නම්, ඉන් වැඩක් ඇද් ද? එවැනි ඇදහිල්ලක් ඔහුට
ගැළවීම ගෙනෙ දෙයි ද? 15 යම් සහෝදරයකු හෝ
සහෝදරියක හෝ ඇඳුම් නැති ව, දිනපතා කෑම
නැති ව සිටිය දී, 16 ඔබගෙන් යමකේ ඔවුන්ගේ
ශාරීරික අවශ්‍යතා සපයා නොදී: “ඔබට දෙවි පිහිට
යි, උණුසුමට ඇඳ පැළඳ, කා බී සතුටු වන්නැ”යි
ඔවුන්ට කියන්නේ නම්, එයින් මොන යහපතක් ද?
17 ඇදහිල්ල ගැන කිය යුත්තේත් එය ම යි. ක්‍රියා
විරහිත ඇදහිල්ල මළ ඇදහිල්ලකි.
18 “ඔබට ඇත්තේ ඇදහිල්ල ය, මට ඇත්තේ
යහපත් ක්‍රියා ය. හොඳයි, ඔබ ක්‍රියා නැති ව
ඔබේ ඇදහිල්ල පෙන්වන්න. මම මාගේ ක්‍රියාවලින්
මාගේ ඇදහිල්ල පෙන්වමි”යි කියන්නට යමකුට
පුළුවන්කම තිබෙනෙවා විය හැකි ය. 19 ඇත්තේ එක
ම දෙවි කෙනෙකු බව ඔබ අදහන්නෙහි ය; එය
කදිම යි. දුෂ්ටාත්මයෝත් එසේ අදහා බියෙන්
වෙවුලති. 20 අඥානය, ක්‍රියාවලින් තොර ඇදහිල්ල
නිෂ්ඵල බව ඔබ නොදන්නෙහි ද? 21 උත්
22:1-14අපේ පිය වූ ආබ්‍රහම් සිය පුත් ඊසාක්
පූජාසනය පිට ඔප්පු කළ විට, ඔහු දමිටුකමට
පමුණුවනු ලැබුවේ ඔහුගේ යහපත් ක්‍රියා නිසා
නොවේ ද? 22 ඇදහිල්ල, ඔහුගේ යහපත් ක්‍රියා හා
සමඟ එක් ව ක්‍රියා කළ බවත්, ඇදහිල්ල ක්‍රියා
නිසා සම්පූර්ණ වූ බවත් ඔබට පෙනෙනු ඇත. 23 උත්
15:6; 2 වංශා 20:7; යෙසා 41:8මසේ: “ආබ්‍රහම්
දෙවියන් වහන්සේ අදහාගත්තේ ය. ඒ ඇදහිල්ල
ඔහුගේ දමිටුකම හැටියට පිළිගනු ලැබී ය”යි කියන
ශුද්ධ ලියවිල්ල ඉටු විය. එපමණකුත් නොව, ඔහු
දෙවියන් වහන්සේගේ මිත්‍රයා යයි කියනු ලැබී ය.
24 මනුෂ්‍යයකු දමිටුකමට පමුණුවනු ලබන්නේ
ක්‍රියාවලින් බවත්, ඇදහිල්ලෙන් පමණක් නොවන
බවත්, ඔබට පෙනෙනු ඇත.
25 ජෝෂු 2:1-21 රාහාබ් වෙසඟනක වුව ද, දූතයන්
පිළිගෙන අන් මඟකින් යාමට ඔවුන්ට පිහිට වූ
බැවින්, ඈ දමිටුකමට පමුණුවනු ලැබුවේ ඒ
ක්‍රියාවලින් නොවේ ද? 26 හුස්ම නැති සිරුර
මළසිරුරක් වන සේ ම ක්‍රියා නැති ඇදහිල්ල මළ
ඇදහිල්ලකි.

## දිව දමනය

3 මාගේ සහෝදරයෙනි, ඔබගෙන් බොහෝ
දෙනෙකේ ගුරුවරුන් වීමට නොසිතන්න. ඔබ
දන්නා පරිදි ගුරුවරුන් වන අපි වඩාත් බරපතල
මිම්මකින් විනිශ්චය කරනු ලබමු. 2 අපි සියල්ලෝ ම
බොහෝ විට වරදට වැටමු. යමකේ වචනයෙන්
වරදක් නොකරන්නේ නම්, ඔහු මුළු ශරීරය දමනය
කරගන්නට සමත්, සර්ව සම්පූර්ණ මනුෂ්‍යයකේ.
3 අශ්වයන් කීකරු කරගන්නා පිණිස උන්ට කටකලියා
දැමූ විට අපි උන්ගේ මුළු ශරීරය ම දමනය
කරගනිමු. 4 නැව් ගැන සිතන්න, නැවක් කෙතරම්
විශාල වුව ද, සැඬ සුළඟට ගසාගෙන යන විට, ඉතා
කුඩා සුක්කානමකින් නැව්පතියා එය තමා රිසි සේ
හරවාගෙන යයි. 5 එලෙසෙ ම දිව කුඩා අවයවයක්
වුව ද එය ලොකුවට පුරසාරම් දොඩයි. කුඩා ගිනි
පුපුරකින් කොපමණ මහත් ළැව් ගින්නක් හටගනී ද?
6 දිව ද ගින්නකි. එය අපේ ඉඳුරන් අතර,
අදමිටුකමින් පිරුණු ලෝකයකි. එය මුළු ශරීරය
දූෂණය කොට, නිරා ගින්නෙන් සකල ලෝකයට ගිනි
දල්වයි. 7 සියලු ආකාර වන මෘගයන් ද කුරුල්ලන් ද

උරග ජාතීන් ද මුහුදු සතුන් ද පරෙ මනේ දැනුත්,
මිනිසාට දමනය කළ හැකි ය.
8 එහතේ දිව දමනය කිරීම කිසිවකුෙට නුපුළුවන.
එය හික්මවිය නාොහැකි විෂඝාෝර නපුරු
ඉන්ද්‍රියයකි. 9 උත් 1:26එයින් අපි ස්වාමීන් වන
පියාණන් වහන්සේ පසසමු; එයින් ම දිව්‍ය
සමානත්වයනේ මවන ලද මනුෂ්‍යයන්ට සාප කරමු.
10 ප්‍රශංසාවත් සාපයත් එක ම මුඛයනේ නික්මයි.
මාගේ සහාෝදරයනි, මසෙේ වීම හරි නැත. 11 දිය
උල්පතේ එක සිදුරනේ මිරිදියත් කරදියත් නික්ම එයි
ද? 12 මාගේ සහාෝදරයනි, දිවුල් ගසේ රට වරෙළු
වත්, මිදි වැලේ දිවුල් වත් හටගනී ද? කරදිය
උල්පතනේ මිරිදිය නික්මනේනේ නැත.

## ලාෝකාෝත්තර ප්‍රඥාව

13 ඔබ අතර පැණවත් නැණවත් යමකේ සිටී ද?
එසේ නම් ඔහු තමාගේ සදාචාරයනේ ද ප්‍රඥාවනේ
ඇති වන විනීත ක්‍රියාවලින් ද එය ප්‍රකාශ කරේේ
වා. 14 එහතේ ඔබගේ සිත්වල දැඩි ඊර්ෂ්‍යාව ද,
උන්නතිකාමය ද, ඇත්නම් පුරසාරම් දාොඩමින්
සත්‍යයට විරුද්ධ ව ක්‍රියා නාොකරන්න. 15 එවැනි
ප්‍රඥාව ඉහළින් පැමිණනේනක් නාොවේ. එය
ලාෞකික ය, කාමුක ය, අමානුෂික ය. 16 මන්ද,
ඊර්ෂ්‍යාවත් උන්නතිකාමයත් කාොතැන ද එතැන
අවුල්වියවුල් ද සියලු නපුරු ක්‍රියා ද ඇත්තේ ය.
17 එහතේ ලාෝකාෝත්තර ප්‍රඥාව පළමුකාොට
නිර්මල ය, ඊළඟට සාමකාමී ය, සානුකම්පිත ය,
යුක්ති සහගත ය; එය දයාවනේ හා යහපත්
ඵලවලින් පූර්ණ ව, පක්ෂවාදිකමින් ද කුහකකමින් ද
තාොර ව පවතී. 18 සැබෑ දමිටුකම වූකලී සාම
දූතයන් සාමයනේ වපුළ බීජවලින් නිපදවන
අස්වැන්නකි.

## ලාෞකික ඇල්ම

4 ඔබ අතර ආරාවුල් හා කලකාෝලාහල ඇති
වනේනේ කසෙේ ද? ඒවා හටගන්නේ ඔබගේ
ඉඳුරන් තුළ සටන් කරන තෘෂ්ණාවලින් නාොවේ ද?
2 ඔබ යමකට ආසා වන්නහු ය; එහතේ එය ඔබට
ලැබනේනේ නැත; ඒ නිසා ඔබ මිනී මරන්නහු ය.
ඔබ ඊර්ෂ්‍යා කරන්නහු ය; ඔබට තෘප්තියක් නැත.
ඔබ දබර කරන්නහු ය; සටන් කරන්නහු ය. නාො
ඉල්ලන නිසා ඔබට ලැබනේනේ නැත. 3 ඔබ
ඉල්ලුවත්, වැරදි ලසෙ ද ආත්මාර්ථකාමී තෘප්තිය
සඳහා ද ඉල්ලන බැවින් එය නාොලැබනේනේ ය.
4 අවිශ්වාසී ජනයනි, ලාෝකය සමඟ මිතුරුකම,
දවේිඳුන් සමඟ සතුරුකම බව ඔබ දන්නේ නැද් ද?
එබැවින් කවරකේ වුවත් ලාෝකය හා මිත්‍ර වන්නට
කැමැත්තේ නම්, ඔහු දවේිඳුන්ට සතුරකේ වන්නේ
ය. 5 "දවේියන් වහන්සේ අප තුළ පිහිටුවා වදාළ
ආත්මය උන් වහන්සේ දැඩි ආශාවකින් රකින
සේකැ"යි ශුද්ධ ලියවිල්ලේ ඇති කීම නිෂ්ඵල
කතාවකැ යි ඔබ සිතන්නහු ද? 6 හිතාෝ 3:34එහතේ
උන් වහන්සේගනේ එන වරප්‍රසාදය එයටත් වඩා
බලවත් ය. එබැවින්: "දවේියන් වහන්සේ උඩඟු
වූවන්ට විරුද්ධ වී, යටහත් පහත් අයට කරුණාව
දනෙ සේකැ"යි ශුද්ධ ලියවිල්ල පවසයි.
7 ඒ නිසා දවේියන් වහන්සේට යටහත් ව සිටින්න;
යක්ෂයාට විරුද්ධ ව සිටින්න. එවිට ඔහු ඔබ වතේින්
පලා යනු ඇත. 8 දවේියන් වහන්සේට ළං වන්න,
එවිට දවේියන් වහන්සේ ඔබට ළං වන සේක.
පව්කාරයනි, ඔබගේ අත් පවිත්‍ර කරගන්න; දසෙිත්
ඇත්තනි, ඔබගේ සිත් පිරිසිදු කරගන්න. 9 දුක්
වන්න, ශාෝක වන්න, හඬා වැලපනේන, ඔබගේ
සිනහව හැඬීමටත්, ඔබගේ ප්‍රීතිය දුකටත් හැරේ
වා. 10 සමිඳාණන් වහන්සේ ඉදිරියහේි යටහත් පහත්
වන්න. එවිට උන් වහන්සේ ඔබ උසස් කරන සේක.

## අනුන් විනිශ්චය කිරීම

11 සහාෝදරයනි, එකිනකොට විරුද්ධ ව ඕපාදූප
නාොදාොඩන්න. සහාෝදරයකුෙට විරුද්ධ ව ඕපාදූප
කියන්නා, නැතහාොත් තමාගේ සහාෝදරයා විනිශ්චය
කරන්නා ව්‍යවස්ථාවට අපහාස කරන්නේ ය;
ව්‍යවස්ථාව විනිශ්චය කරන්නේ ය. ඉදින් ඔබ
ව්‍යවස්ථාව විනිශ්චය කරන්නහේි නම්, ඔබ
ව්‍යවස්ථාව පිළිපදින්නකේ නාොව එය විනිශ්චය
කරන්නකේ. 12 ඇත්තේ එක ම නීති දායකයකේ;
එක ම විනිශ්චයකාරයකේ. ගළවන්නට ද විනාශ
කරන්නට ද පුළුවන්කම ඇත්තේ උන් වහන්සේට
පමණකි. එසේ නම් ඔබේ අසල්වැසියා විනිශ්චය
කිරීමට ඔබ කවරකේ ද?

## පුරසාරම් දඩීම ගැන අවවාද

13 හිතාෝ 27:1 "අද හාෝ හටෙ හාෝ අපි අසවල්
නගරයට ගාොස් එහි අවුරුද්දක් නැවතී වළෙහළෙඳාම්
කාොට ලාභ උපයාගන්නමු"යි කියන තැනැත්තනි,
සවන් දනේන. 14 හටෙ කුමක් වේ දැ යි ඔබ
නාොදන්නහු ය. ඔබගේ ජීවිතය කුමක් ද? ඔබ මඳ
වලේාවක් පනේී, පසු ව නාොපනේී යන මීදුමක්
වැන්න. 15 එබැවින් ඔබ කිය යුත්තේ: "සමිඳාණන්
වහන්සේ කැමැති සේක් නම්, අපි ජීවත් වී ඒ දයෙ
හාෝ මේ දයෙ හාෝ කරන්නමු"යි කියා ය.
16 එහතේ දැන් ඔබ පුරසාරම් දාොඩමින්
අහංකාරයනේ පාරට්ටු කරගන්නහු ය. එවැනි සියලු
පුරසාරම් දඩීම් නපුරු ය. 17 එබැවින් යමකේ කළ
යුතු යහපත දැන දැනත් එය නාොකරන්නේ නම්,
ඔහු පව්කාරයකේ.

## ධනපතීන්ට අවවාද

5 දැන් ඉතින් ධනවතුනි, ඔබ පිට පැමිණනේනට
තිබනෙ අවාසනාවන්ත ඉරණම ගැන හඬා
වැලපනේන. 2 මතෙ 6:19ඔබගේ ධනධාන්‍ය
දිරාගාොස් ඇත, ඔබගේ වස්ත්‍ර කාවුන් කාදමා ඇත.
3 ඔබේ රන් රිදී මලකඩ කා ඇත; ඒ මලකඩ ඔබට
විරුද්ධ ව සාක්ෂියක් වී, ගින්නක් මනේ ඔබගේ
මාංස කාදමනු ඇත. ඔබ වස්තු ගාොඩගසා ඇත්තේ
නිම වේගනෙ යන යුගයක ය. 4 ද්වි.නී.

24:14-15බලන්න, ඔබගේ කතේ වතුවල අස්වැන්න
නෙළූ ගොවීන්ට නොගෙවා ඔබ වංචා කරගත්
ඔවුන්ගේ කුලිය ඔබට විරුද්ධ ව මොරගසයි.
ගොවීන්ගේ මොරගැසීම සේනාවල සමිඳාණන්
වහන්සේගේ කන්වල වැටෙන්නේ ය. 5 ඔබ
මෙලොව කම් සැප විහරණයෙහි ඇලී ගැලී,
මරන්නට තර කරන සතුන් මෙන් පුෂ්ටිමත් වෙමින්
කල් යැවූවහු ය. ඒ දිනය දැන් පැමිණ ඇත.
6 විරෝධයක් නොපෑ නිදොස් මිනිසාට වුව ද ඔබ
වරද එල්ල කොට ඔහු මරාදැමුවහු ය.

### ඉවසිල්ල හා යාච්ඤාව

7 එබැවින් සහෝදරයෙනි, සමිඳාණන් වහන්සේගේ
ආගමනය දක්වා ඉවසිල්ලෙන් සිටින්න. පළමු සහ
අන්තිම වර්ෂාව වහින තුරු ගොවියා පොළොවේ
සරුසාර පලදාව ගැන බලා ඉවසිල්ලෙන් සිටියි.
8 එසේ ම ඔබ ද ඉවසිල්ලෙන් සිටින්න; සමිඳාණන්
වහන්සේගේ ආගමනය දැන් ළං ව ඇති බැවින්
ඔබේ සිත් තිරසර ව තබාගන්න.
9 සහෝදරයෙනි, ඔබ විනිශ්චයට ලක් නොවන
පිණිස එකිනෙකොට විරුද්ධ ව චෝදනා නොකරන්න.
මෙන්න, විනිශ්චයකාරයාණෝ දොරකඩ සිටින
සේක. 10 සහෝදරයෙනි, සමිඳාණන් වහන්සේගේ
නාමයෙන් කතා කළ දිවැසිවරයන්ගේ පීඩා විඳීම ද
ඉවසීම ද ආදර්ශයට ගන්න. 11 ජෝබ් 1:21-22; 2:10;
ගීතා 103:8ස්ථිර ව සිටි අය ආශීර්වාද ලද්දෝ යයි
අපි කියමු. ජෝබ් ස්ථිර ව සිටි හැටි ඔබ අසා ඇත.
ඔහු ගැන සමිඳාණන් වහන්සේගේ තීරණය ද ඔබට
පැහැදිලි ය, සමිඳාණන් වහන්සේ දයානුකම්පාවෙන්
අධික ලෙසෙ පොහොසත් වී සිටින සේක.
12 මතෙ 5:34-37 මේ සියල්ලට වඩා, මාගේ
සහෝදරයෙනි, අහස ගැනවත්, පොළොව ගැනවත්,
අන් කිසිවක් ගැනවත් නොදිවුරන්න, ඔබ වරදට පත්
නොවන පිණිස ඔබගේ වචනය “එසේ” නම් “එසේ
ය” කියා ද, “නැත” නම් “නැත” කියා ද වේ වා.
13 ඔබ අතරෙන් යමෙක් දුක් විඳින්නේ නම් ඔහු
යාච්ඤා කරේ වා. යමෙක් ප්‍රීතියෙන් සිටින්නේ
නම් ඔහු තුති ගී ගයා වා. 14 මාක් 6:13ඔබ අතරෙන්
යමෙක් රෝගී ව සිටින්නේ නම්, ඔහු සභා මූලිකයන්
කැඳවාගනී වා. ඒ මූලිකයෝ සමිඳාණන්
වහන්සේගේ නාමයෙන් ඔහු තෙලින් ආලේප
කොට, ඔහු උදෙසා යාච්ඤා කරත් වා. 15 එවිට
ඇදහිල්ලෙන් පුදන යාච්ඤාවෙන් රෝගියාට සුවය
ලැබේ. සමිඳාණන් වහන්සේ ඔහු නැඟිටුවනු ඇත.
ඔහු පව් කර තිබේ නම්, ඒ පව් ඔහුට කමා කරනු
ලැබේ. 16 එබැවින් ඔබ එකිනෙකොට
පාපෝච්චාරණය කර, සුවය ලබන පිණිස, එකිනෙකො
උදෙසා යාච්ඤා කරන්න. දැහැමි මිනිසෙකු යදින
යැදුම බලවත් ය; පලදායක ය; 17 1 රාජා 17:1;
18:1දිවැසිවර එලියා අප හා සමාන ගති ඇති
මනුෂ්‍යයෙකු වුව ද, වැසි නොවසින පිණිස ඔහු
උනන්දුවෙන් යාච්ඤා කළේ ය. එවිට තුන් අවුරුදු
සමසක් රටට වැසි නොවැස්සේ ය. 18 1 රාජා
18:42-45ඉන්පසු ඔහු නැවත යාච්ඤා කළේ ය.
එවිට අහසින් වැසි වැස, පොළොවේ පලදාව ඇති
විය.
19 මාගේ සහෝදරයෙනි, ඔබ අතරෙන් යමෙකු
සත්‍යයෙන් මුළා ව ගියොත්, වෙන තැනැත්තෙකු ඔහු
සත්‍යයට හරවා ගත්තොත් ඉතා මැනවි. 20 හිතෝ
10:12; 1 පේද්‍රු 4:8නොමඟ ගිය පව්කරුවෙකු යළි
සත්‍යයට හරවන තැනැත්තේ ප්‍රාණයක් මරණයෙන්
මුදා, පව් රාශියක් මකා හරින බව දැනගනී වා.

### ජීවමාන ගල හා තෝරාගත් සෙනඟ

2 එබැවින් සියලු ආකාර ක්‍රෝධ ද සියලු ආකාර
රැවටිලි ද වංකකම් ද, ඊර්ෂ්‍යා ද අගුණ කතා ද
පහ කරදමන්න. 2+1PE ගීතා 34:8සැබැවින් ම
සමිඳාණන් වහන්සේ යහපත් බව ඔබ අත්දැකීමෙන්
දන්නා බැවින්, ඔබ වර්ධනය වී ගැළවීම ලබන පිණිස
අලුත උපන් බිළිඳුන් මෙන් පිරිසිදු ආධ්‍යාත්මික
කිරිවලට බොහෝ සයින් ආශා වන්න.
4 මිනිසුන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවත්
දෙවියන් වහන්සේ විසින් තෝරාගනු ලැබූ, අනර්ඝ
ජීවමාන ගලක් වැනි, උන් වහන්සේ වෙත
පැමිණෙන්න. 5 ආත්මික ගෘහයක් ගොඩනඟන ලෙසෙ
ඔබ ජීවමාන ගල් මෙන් උන් වහන්සේ වෙත පැමිණ,
එහි ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මඟින්, දෙවියන්
වහන්සේට ප්‍රසන්න ආත්මික පූජා පුද කරන පිණිස
ශුද්ධ පූජක පිරිසක් වන්න. 6 යසො 28:16එබැවින්:
q2[6] “බලන්න, තෝරාගත් ඉතා අනගි, කොණේ
ප්‍රධාන ගලක් සියොන්හි තබමි;
q2[6] උන් වහන්සේ අදහන්නා ලජ්ජාවට
නොපැමිණෙන්නේ ය”යි
6 ශුද්ධ ලියවිල්ලෙහි කියා ඇත. 7 ගීතා
118:22එබැවින් ඒ ගලෙහි වටිනාකමක් ඇත්තේ
අදහන ඔබ උදෙසා ය; එහෙත් අදහානොගත් අයට:
q2[7] “ගෙවෙල් සාදන්නන් ප්‍රතික්ෂේප කළ ගල ම
කොණේ ප්‍රධාන ගල වී ඇත.”
8 යසො 8:14-15 තවද:
q2[8] “එය පැකිළී වැටෙන පිණිස ගලක් ද, බාධා වන
පිණිස පර්වතයක් ද වී ඇත.”
8 මන්ද, ඔව්හු වචනයට අකීකරු වෙමින් පැකිළෙති.
එය ඔවුන්ට නියමිත දේ විය.
9 නික්ම 19:5-6; ද්වි.නී. 4:20; 7:6; 14:2; යසො 9:2;
43:20,21; තීතස් 2:14 එහෙයින්, අන්ධකාරයෙන්
ස්වකීය විස්මපත් ආලෝකයට ඔබ කැඳවාගත්
තැනැන් වහන්සේගේ මහිමාන්විත ක්‍රියා දන්වනු
පිණිස ඔබ වනාහි තෝරාගත් වංශයක් ද රාජකීය
පූජක පළෙක් ද ශුද්ධ ජාතියක් ද දෙවියන් වහන්සේ
සතු සෙනඟක් ද වන්නහු ය. 10 හොසි 2:23වරක්
ඔබ දෙවියන් වහන්සේගේ සෙනඟ ව නොසිටියහ;
දැන් ඔබ උන් වහන්සේගේ සෙනඟ ව සිටින්නහු ය.
වරක් ඔබ දයාව නොලැබ සිටියහු ය; දැන් ඔබ
දයාව ලැබ සිටින්නහු ය.

## දේව දාසයෝ

11 ප්‍රේමවන්තයෙනි, ඔබ ආගන්තුකයන් හා
විදේශීන් මෙන්, ආත්මයට විරුද්ධ ව සටන් කරන
මාංසික තෘෂ්ණාවලින් වැළකී සිටින ලෙස ඔබගෙන්
උදක් ම ඉල්ලමි. 12 ඔබ නපුර කරන්නෝ යයි
විජාතිකයන් ඔබට විරුද්ධ ව කතා කරන නමුත්,
ඔවුන් ඔබගේ යහපත් ක්‍රියා දැක විනිශ්චය දවසේ
දී දෙවියන් වහන්සේට ගෞරව කරන පිණිස ඔවුන්
අතර යහපත් හැසිරීමකින් කල් යවන්න.
13 අතිශ්‍රේෂ්ඨ බලය ඇති රජුට වේවා,
අපරාධකරුවන්ට දඬුවම් දීම පිණිසත්, යහපත
කරන්නන්ට ප්‍රශංසා කිරීම පිණිසත් රජු විසින් එවන
ලද ආණ්ඩුකාරයන්ට වේවා, 14 සියලු මනුෂ්‍ය
නියෝගවලට, සමිඳාණන් වහන්සේ නිසා යටත්
වන්නේ. 15 මන්ද, මෙසේ ඔබ කරන යහපත නිසා
අනුවණයන්ගේ අඥානකම නිශ්ශබ්ද කිරීම දෙවියන්
වහන්සේගේ කැමැත්ත ය. 16 නිදහස් අය මෙන්
ජීවත් වන්න. එහෙත් ඒ නිදහස, නපුර වසා ගැනීමට
මඟක් කර නොගෙන දෙවියන් වහන්සේගේ දාසයන්
මෙන් එය භාවිත කරන්න. 17 සියල්ලන්ට ගරු
කරන්න; ඇදහිලිවන්ත සමාජයට ප්‍රේම කරන්න;
දෙවියන් වහන්සේට ගෞරවාදර භය පිරිනමන්න;
රජුට ගෞරව දක්වන්න.

## ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීමේ ආදර්ශය

18 සේවකයෙනි, යහපත්, කාරුණික ස්වාමිවරුන්ට
පමණක් නොව ඔබගේ සැර පරුෂ ස්වාමිවරුන්ටත්
ගෞරව කරමින් යටත් වන්නේ. 19 මන්ද, යමෙක්
තමන් දෙවියන් වහන්සේ අබිමුවෙහි සිටින බව
සිතාගෙන, අසාධාරණ ලෙස දුක් පීඩා විඳින්නේ නම්
එය ප්‍රශංසනීය දෙයෙකි. 20 ඔබ වරද කොට, ඊට
සුදුසු දඬුවම ලබන කල්හි ඉවසන්නහු නම් එහි
කුමන වටිනාකමක් තිබේ ද? එහෙත් ඔබ යහපත
කොට, ඒ ගැන දුක් විඳිමින් ඉවසන්නහු නම්, එය
දෙවියන් වහන්සේ ඉදිරියෙහි ප්‍රසන්න දෙයෙකි.
21 ඔබ කැඳවනු ලැබූයේ මේ සඳහා ය. මන්ද
ක්‍රිස්තුන් වහන්සේ ඔබ උදෙසා වද වින්ද, ඔබ උන්
වහන්සේගේ අඩි පාරේ යන පිණිස ඔබට
ආදර්ශයක් දුන් සේක. 22 යෙසා 53:9උන් වහන්සේ
කිසි පවක් නොකළ සේක. කවදා වත් බොරුවක් ද
නොවදාළ සේක. 23 යෙසා 53:7උන් වහන්සේට
නින්දා කරනු ලැබූ කල, නින්දා නොකළ සේක. වද
වින්ද කල තර්ජනය නොකර, දැහැමි ලෙස විනිශ්චය
කරන තැනැන් වහන්සේට තමන් ම භාර දුන් සේක.
24 යෙසා 53:5පාපවලට අප නැසී, දැහැමි ජීවිතයක්
ගත කරන පිණිස, උන් වහන්සේ ම තමන්ගේ
ශරීරයෙන් කුරුසිය මත අපගේ පාප ඉසුලූ සේක.
ඔබ සුව කරනු ලැබුවේ උන් වහන්සේගේ තුවාළ
නිසා ය. 25 යෙසා 53:6ඔබ බැටළුවන් මෙන් මංමුළා
ව යමින් සිටියහු ය. එහෙත් දැන් ඔබගේ ජීවිතවල
එඬේරා ද භාරකාරයා ද වෙතට ඔබ හැරී සිටින්නහු
ය.

## ස්ත්‍රී පුරුෂයන්ට යුතු හැසිරීම

3 එපී 5:22; කොලො 3:18 එසේ ම
භාර්යාවෙනි, ඔබගේ ස්වාමි පුරුෂයන්ට යටත්
වන්න. එවිට ඔවුන්ගෙන් සමහරෙක් සුබ අස්න
නොඅදහන්නන් වුවත්, 2 ඔබගේ නිර්මල, විනීත
හැසිරීමෙන් ඔවුන් දිනාගැනීමට හැකි වනු ඇත. 3 1
තිමෝ 2:9ඔබගේ අලංකාරය, කොණ්ඩා මෝස්තර ද
රන් රිදී ආභරණ ද ඇඳුම් පැළඳුම් ද යන බාහිර දේ
පිට රඳා නොතිබිය යුතුයි. 4 එය පනේවිය යුත්තේ
අභ්‍යන්තරයෙහි, හදවතින් නඟින කාරුණික තැන්පත්
ගතිපැවතුම් මඟිනි. ඒ අලංකාර ය; දිරා නොයන සුලු
ය; දෙවියන් වහන්සේ ඉදිරියේ ඉතා අගනේ ය.
5 පුරාණ කාලයේ දෙවියන් වහන්සේ කෙරෙහි
බලාපොරොත්තුව තැබූ භක්තිවන්ත ස්ත්‍රීවරු
ස්වකීය ස්වාමි පුරුෂයන්ට යටත් ව මෙලෙසෙ
අලංකාරවත් වූ හ. 6 උත් 18:12ඒ අයුරින් සාරා
ආබ්‍රහම්ට “මාගේ ස්වාමියා” යයි කියමින් කීකරු
වූවා ය. ඔබත්, බිය නොවී යහපත කරන්නහු නම්
ඇගේ දරුවෝ වන්නහු ය.
7 එපී 5:25; කොලො 3:19 එසේ ම පුරුෂයෙනි,
ඔබගේ විවාහ ජීවිතයේ දී ඔබත් ඔබගේ
භාර්යාවන් සමඟ අවබෝධයෙන් යුතු ව හැසිරෙන්නේ.
ඔවුන් දුබල පක්ෂය වන බැවින් ඔවුන්ට ගෞරව
කරන්න. මන්ද, ඔබ හා සමඟ ඔව්හු ද දෙවියන්
වහන්සේ නොමිලයේ දෙන දීමනාව වූ ජීවිතයට
හවුල් උරුමක්කාරයෝ වන්නහු ය. එවිට ඔබේ
යාච්ඤාවලට බාධා නොපැමිණෙයි.

## ධර්මිෂ්ඨකම නිසා දුක් විඳීම

8 අවසාන කොට ඔබ සියල්ලෝ ම එක්සිත් ව ද
සානුකම්පික ව ද සහෝදර ස්නේහය ඇති ව ද
සිටින්න. දයාව ද යටහත්කම ද ඇති ව සිට,
9 නපුරට නපුර වත්, නින්දාවට නින්දාව වත්
නොකරන්න. ඒ වෙනුවට, ආශීර්වාදයක් උරුම වන
පිණිස ඔබ කැඳවනු ලැබූ බැවින්, ආශීර්වාද ම
කරන්න. 10 ගීතා 34:12-16ශුද්ධ ලියවිල්ලෙහි මෙසේ
කියා ඇත:
q210 “ජීවිතයට ප්‍රේම කරන, වාසනාවන්ත දවස්
දැකීමට කැමැති තැනැත්තේ තමාගේ දිව නපුරෙන් ද
තොල් වංචා සහගත වදනින් ද වළක්වාගනී වා!
11 නපුරට පිටුපා යහපත කරා වා!
q211 සාමය සොයා එය ලුහුබඳී වා!
12 මන්ද, ස්වාමීන්ගේ දෙනෙත් දමිටුන් දෙසටත්,
දෙසවන් ඔවුන්ගේ යැදුම් දෙසටත් යොමා ඇත.
q212 එහෙත් ස්වාමීන්ගේ වත දුදනන්ට එරෙහි ව
ඇත.”
13 ඔබ යහපතට කැප වී සිටින්නහු නම් ඔබට
අනතුරු කරන්නේ කවරෙක් ද? 14 මතෙ 5:10යෙසා
8:12-13එහෙත් ඔබ දමිටුකම නිසා දුක් විඳින්නහු
නම් ඔබ ආසිරි ලද්දහු ය. ඔවුන්ට බිය නොවී,
නොකැළඹී සිටින්න. 15 ඔබගේ සිතින් ක්‍රිස්තුන්
වහන්සේට සමිඳාණන් වහන්සේ හැටියට, ගෞරව

කරන්න. ඔබට ඇති බලාපොරොත්තුව ගැන ඔබනේ
ප්රශ්න කරන සියල්ලන්ට පිළිතුරු දීමට නිතර
සූදානම් ව සිටින්න. 16 එහෙත් ආචාරශීලී ව ද
ගෞරවයනේ යුක්ත ව ද එසේ කළ යුතු ය. ඔබ
නිදොස් හෘදය සාක්ෂියක් ඇති ව සිටින්න. එවිට
ඔබට අපහාස කරමින් ඔබට විරුද්ධ ව කතා කරන
අය, ක්රිස්තුන් වහන්සේගේ අනුගාමිකයන් වශයනේ
ඔබේ යහපත් හැසිරීම දැක ලජ්ජාවට පැමිණනෙු
ඇත. 17 ඔබ යහපත කර දුක් විඳීම දේව කැමැත්ත
වේ නම්, එය නපුර කර දුක් විඳීමට වඩා හොඳ ය.
18 ක්රිස්තුන් වහන්සේ ඔබේ පව් උදසො වරක්
දිවි පිදූ සේක. උන් වහන්සේ ධර්මිෂ්ඨ ව සිටි නමුත්
දවේයන් වහන්සේ වෙතට ඔබ පමුණුවන පිණිස
අධර්මිෂ්ඨයන් වනෙුවනේ දිවි පිදූ සේක. උන්
වහන්සේ මනුෂ්ය ස්වභාවයනේ මරණයට පත් කරනු
ලැබූ සේක; ආත්මික ස්වභාවයනේ උත්ථාන කරනු
ලැබූ සේක. 19 එම ආත්මික ස්වභාවයනේ උන්
වහන්සේ ගොස් සිර ගයෙි සිටි ආත්මයන්ට ප්රකාශ
කළ සේක. 20 උත් 6:1—7:24ඔව්හු වනාහි
නෝවාගේ කාලයේ දී ඔහු නැව සාදන අතර,
දවේයන් වහන්සේ ඉවසිල්ලනේ සිටිය දී උන්
වහන්සේට අකීකරු වූ ආත්මයන් වෙති. ඒ නැවට
ඇතුළු වූ, ස්වල්ප දනෙකේ, එනම්, අට දනෙකේ
වතුරනේ ගළවනු ලැබුවෝ ය. 21 මෙහි වතුර
යන්නනේ අදහස් කරනු ලබන්නේ අපට ගැළවීම
ලබා දනෙ බව්තීස්ම-ස්නාපනය යි. එය වනාහි
ශරීරයේ කිළුටු සේදීමක් නොව, ජේසුස් ක්රිස්තුන්
වහන්සේගේ පුනරුප්ජීවනය කරණකොටගනෙ
නිදොස් හෘදය සාක්ෂියකින් දවේයන් වහන්සේට
කරන පොරොන්දුවක් ය. 22 උන් වහන්සේ
ස්වර්ගයට වැඩම කර දවේයන් වහන්සේගේ
දකුණත වැඩ සිටින සේක. දේව දූතයෝ ද
බලතාවයෝ ද අනුභාවයෝ ද උන් වහන්සේට යටත්
කරනු ලැබූ හ.

### දේව කැමැත්ත අනුව ජීවත් වීම

4 ක්රිස්තුන් වහන්සේ ශාරීරික වශයනේ දුක්
වින්ද බැවින්, ඔබත් එවැනි අධිෂ්ඨානයකින්
සැරසී සිටින්න. මන්ද, ඒ අන්දමින් ශාරීරික ලසෙ දුක්
වින්ද තැනැත්තේ පාපයනේ නිදහස් වී සිටියි. 2 එවිට
මේ ජීවිතයේ ඉතිරි කාලයේ තවදුරටත් මනුෂ්ය
තෘෂ්ණා අනුව නොව, දේව කැමැත්ත ලසෙ ඔහුට
ජීවත් විය හැකි ය. 3 මන්ද, විජාතීන් කැමැති දේ
කිරීමට පසුගිය කාලයේ දී ඔබටත් ඇති තරම් කල්
වේලා තිබිණි. ඒ කාලයේ දී ඔබ අනාචාරකමින් ද
සල්ලාලකමින් ද බීමත්කමින් ද අශෝභන
උත්සවවලින් ද මධුපානෝත්සවවලින් ද පිළිකුල් රූප
ඇදහිල්ලනේ ද ජීවිතය ගත කළහු ය. 4 විජාතීන්
සමඟ ඔබ අධික අවකල් ක්රියාවල නොයදෙනෙ
බැවින් ඔව්හු ඒ ගැන පුදුම වී ඔබට අපහාස කරති.
5 ජීවතුන් හා මළවුන් විනිශ්චය කරන්නට සිටින
තැනැන් වහන්සේට ඔවුන් වග උත්තර දිය යුතු ව
ඇත. 6 මක්නිසා ද මළවුන්ට පවා ශුභාරංචිය
දේශනා කරනු ලැබී ය. මන්ද, සියලු මනුෂ්යයන්
විනිශ්චය කරන ආකාරයට මාංසයනේ විනිශ්චය
කරනු ලබන නමුත්, ආත්මයනේ දවේයන් වහන්සේ
මනේ ජීවත් වන පිණිස ය.
7 සියලු දේවල අවසානය ළං වී ඇත. එබැවින් ඔබ
සිහි කල්පනාවනේ යුතු ව යාච්ඤාව සඳහා අවදිව
සිටින්න. 8 හිතෝ 10:12ප්රමේය පව් රාශියක් කමා
කිරීමට හේතු වන බැවින්, සියලු දේට වඩා
එකිනකො කරෙහෙි ඉමහත් ප්රමේයක් ඇති ව
සිටින්න. 9 මැසිවිලි නොකියා එකිනකොට ආගන්තුක
සත්කාර කරන්න. 10 දවේයන් වහන්සේගේ
විවිධාකාර වරප්රසාදවල විශ්වාසී ගබඩාකාරයන්
මනේ, එකිනකො ලබා ඇති කුශලතා එකිනකොට
සේවය කරන පිණිස යොදන්න. 11 යමකේ දේශනා
කරන්නේ නම් දේව වචනය දේශනා කරේ වා!
යමකේ සේවය කරන්නේ නම්, දවේයන් වහන්සේ
ප්රදානය කරන ශක්තිය අනුව ඔහු සේවය කරා වා!
ජේසුස් ක්රිස්තුන් වහන්සේ කරණකොටගනෙ
දවේයන් වහන්සේට සියලු කාරණාවල දී ගෞරව
පැමිණනෙ පිණිස එසේ කළ යුතු ය. මහිමයත්,
පරාක්රමයත් සදහට ම උන් වහන්සේගේ ය.
ආමනේ.

### කිතුනුවන් වශයනේ දුක් විඳීම

12 ප්රමේවන්තයනෙි, ඔබ පරීක්ෂා කර බලන
පිණිස පැමිණනෙ, ඔබ අතර ඇති පීඩා නමැති ගින්න
ගැන, නොසිතූ දයෙක් ඔබට සිදු වන්නාක් මනේ
පුදුම නොවන්න. 13 එසේ නොව, ඔබ ක්රිස්තුන්
වහන්සේගේ දුක් විඳීමට පංගුකාරයන් වන තරමට
ප්රීති වන්න. මසෙේ උන් වහන්සේගේ තජේාන්විත
එළිදරව්වීමේ දී ඔබ ප්රීතියනේ ප්රමුදිත වනු ඇත.
14 ක්රිස්තුන් වහන්සේගේ නාමය නිසා නින්දා කරනු
ලබන්නහු නම් ඔබ ආශීර්වාද ලද්දහු ය. මන්ද,
තජේාන්විත ආත්මයාණන් වහන්සේ වන දවේයන්
වහන්සේගේ ආත්මයාණෝ ඔබ කරෙහෙි රඳන
සේක. 15 ඔබනේ කිසිවකෙු මිනී මරන්නකෙු හෝ,
සොරකෙු හෝ, අපරාධකරුවකෙු හෝ අනුන්ගේ
කාරණාවලට මැදිවන්නකෙු හෝ ලසෙ දුක් නොවිඳිය
යුතු ය. 16 එහෙත් යමකේ කිතුනුවකෙු මනේ දුක් විඳී
නම්, ඒ ගැන ලජ්ජා නොවී, ඔබ කිතුනු නාමය දරන
බැවින් දවේයන් වහන්සේට ගෞරව කරන්න.
17 විනිශ්චය කිරීමේ කාලය පැමිණ ඇත;
පළමුකොට විනිශ්චය කරනු ලබන්නේ දවේයන්
වහන්සේගේ ම සනෙඟ ය. එය අපනේ
පටන්ගන්නේ නම්, දවේයන් වහන්සේගේ සුබ
අස්නට කීකරු නොවන්නන්ගේ ඉරණම කුමක් වනු
ඇද් ද? 18 හිතෝ 11:31ශුද්ධ ලියවිල්ලේ කියා ඇති
පරිදි:
q218 "දැහැමි කනෙකුට ගැළවීම දුෂ්කර වේ නම්,
අභක්තිකයාට හා පාපිෂ්ඨයාට කුමකින් කුමක් වයෙි
ද?"

19 එහෙයින් දෙවියන් වහන්සේගේ කැමැත්ත අනුව
දුක් විඳින්නෝ යහපත කරමින්, විශ්වාස කටයුතු
මැවුම්කාරයාණන්ට තමන් ම භාර වෙත්වා!

### දෙවියන් වහන්සේගේ රැළ පෝෂණය කිරීම

5 ජොහ 21:15-17 ක්‍රිස්තුන් වහන්සේගේ දුක්
විඳීමට සාක්ෂිකාරයෙකු ද එළිදරව් වන්නට
තිබෙන උන් වහන්සේගේ තේජසට පංගුකාරයෙකු
ද වන්නට බලාපොරොත්තුවෙන් සිටින සභා
මූලිකයෙකු වන මම, ඔබ අතර සිටින සභා
මූලිකයන්ගෙන් ඉල්ලීමක් කරමි: 2 ඔබට භාර දෙන
ලද දෙවියන් වහන්සේගේ බැටළු රැළ පෝෂණය
කරන්න; බල කිරීමක් නිසා නොව දේව කැමැත්ත
අනුව සතුටු සිතින් එසේ කරන්න; මුදලට ඇති
ගිජුකමින් නොව, සේවයට ළැදියාවෙන් එසේ
කරන්න. 3 ඔබට භාර ව සිටින අය කෙරෙහි
ආධිපත්‍යය පෑමෙන් වැළකී රැළට ආදර්ශයක් වන්න.
4 එවිට ප්‍රධාන එඬේරාණන් ප්‍රකාශ වන කල්හි
ඔබ නොමැලවෙන මහිමාන්විත කිරුළ ලබන්නහු ය.
5 හිතෝ 3:34 තවද, තරුණයෙනි, සභා මූලිකයන්ට
යටත් වන්න. ඔබ සියල්ලන් එකිනෙකා කෙරෙහි
යටහත්කමින් සැරසී සිටින්න. මන්ද, දෙවියන්
වහන්සේ උඩඟු අයට විරුද්ධ ව සිට යටහත් අයට
කරුණාව දක්වන සේක. 6 මතෙ 23:12; ලූක් 14:11;
18:14එබැවින් දෙවියන් වහන්සේ සුදුසු කාලයෙහි දී
ඔබ උසස් කරනු පිණිස උන් වහන්සේගේ බලවත්
හස්තයට යටත් වන්න. 7 උන් වහන්සේ ඔබ ගැන
සලකන හෙයින්, ඔබගේ හැම කරදරයක් ම උන්
වහන්සේට භාර දෙන්න.
8 සිහිසන් ඇති ව අවදි ව ඉන්න. ඔබගේ
විරුද්ධකාරයා වන යක්ෂයා, ගොරවන සිංහයෙකු
මෙන් කවරෙකු ගිලගනිම් දෝ හෝ යි සොයමින්
ඔබමොබ ඇවිදින්නේ ය. 9 ලොව පුරා සිටින
ඔබගේ සහෝදරයන් එම දුක් කරදරවලට ම භාජන
වන බව ඔබ දන්නා බැවින්, ඔබගේ ඇදහිල්ලෙහි
ස්ථිර ව සිට, යක්ෂයාට විරුද්ධ වන්න. 10 එවිට
ක්‍රිස්තුන් වහන්සේ මඟින් ස්වකීය සදාතන
තේජසට ඔබ කැඳවූ සියලු වරප්‍රසාද දෙන දෙවියන්
වහන්සේ ම ඔබ ස්වල්ප කලක් දුක් වින්ද පසු, ඔබ
සම්පූර්ණ කර, ස්ථිර, ශක්තිමත් පදනමක් මත
පිහිටුවන සේක. 11 උන් වහන්සේට සදහට ම
පරාක්‍රමය වේ වා! ආමෙන්.

### අවසාන සුබ පැතුම

12 ක්‍රියා 15:22,40 මේ ලුහුඬු හසුන, අපගේ
විශ්වාස කටයුතු සහෝදරයෙකු වශයෙන් මා
සලකන සිල්වානස්ගේ උපකාරයෙන් ලියා ඔහු අත
ඔබ වෙත එවීමි. එසේ එවන්නේ, ඔබ ධෛර්යවත්
කර මේ සියල්ල සත්‍යය දේව වරප්‍රසාදය බවට
සාක්ෂි දෙන පිණිස ය. එහි ස්ථිර ව පිහිටා සිටින්න.
13 ක්‍රියා 12:12,25; 13:13; 15:37-39; කොලො
4:10; පිලෙ 24 ඔබ සමඟ තෝරාගනු ලැබූ
බබිලෝනියෙහි ඇති සභා තොමෝ ඔබට ආචාර
කරන්නී ය. මාගේ පුත්‍ර මාක් ද එසේ ම ඔබට
ආචාර කරයි. 14 ප්‍රේම සිඹීමකින් එකිනෙකාට
ආචාර කරන්න.
14 ක්‍රිස්තුන් වහන්සේට අයිති ඔබ සියල්ලනට
සාමදානය වේ වා!

# 2 පේදුරු

### ආචාරය

1 මේ හසුන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ
සේවකයෙකු ද ප්‍රේරිතවරයෙකු ද වන
සීමොන් පේදුරුගෙනි. මෙය ලියා එවන්නේ, අපගේ
දෙවියන් වහන්සේ ද ගැළවුම්කාරයාණන් ද වන,
ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ධර්මිෂ්ඨකමින් අප
මෙන් ම අනර්ඝ ඇදහිල්ලක් ලැබූ ඔබ වෙතට ය.
2 දෙවියන් වහන්සේ ද අපගේ ස්වාමීන් වන
ජේසුස් වහන්සේ ද දැනගැන්මෙන්, කරුණාවත්
සාමදානයත් බහුල ලෙස ඔබට ලැබේ වා!

### දේව කැඳවීම හා තෝරාගනු ලැබීම

3 උන් වහන්සේ ස්වකීය දිව්‍ය බලයෙන් ජීවිතයට
හා භක්තිවන්තකමට අදාළ වන සියලු දේ අපට දී
ඇත. එසේ දී ඇත්තේ තමන් වහන්සේගේ
මහිමයට හා යහපත්කමට පංගුකාරයන් වීමට අප
කැඳවාගත් තැනැන් වහන්සේ දැනගැනීම
කරණකොටගෙන ය. 4 මෙලෙස උන් වහන්සේ ඉතා
අගනා, අතිඋතුම් පොරොන්දු අපට දානය කර ඇත.
එසේ කළේ තෘෂ්ණාව නිසා ලෝකයෙහි ඇති
දූෂ්‍යකමින් ඔබ ගැළවී ඒ පොරොන්දු මඟින් දේව
ස්වභාවයට පංගුකාරයන් වන පිණිස ය. 5 එබැවින්
ඔබේ මුළු වීර්යයෙන් ඇදහිල්ලට යහපත්කම ද
යහපත්කමට දැනගැන්ම ද, 6 දැනගැන්මට ආත්ම
දමනය ද, ආත්ම දමනයට ඉවසිල්ල ද ඉවසිල්ලට
දේව භක්තිය ද 7 දේව භක්තියට සහෝදර
ස්නේහය ද, සහෝදර ස්නේහයට ප්‍රේමය ද එකතු
කරන්න. 8 මේ ගුණ දහම් ඔබ තුළ වර්ධනය
වෙමින් පවතී නම්, ඒවා අපගේ ස්වාමීන් වන
ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ දැන ගැනීමෙහි ලා,
අලස වීමට වත්, නිෂ්ඵල වීමට වත්, ඔබට ඉඩ
නොදෙයි. 9 මේ ගුණ දහම් නැති තැනැත්තේ
අදූරදර්ශී අන්ධ කෙනෙකි. ඔහු, තමා අතීතයේ කළ
පව්වලින් පවිත්‍ර කරනු ලැබූ බව අමතක කර ඇත.
10 එබැවින් සහෝදරවරුනි, ඔබගේ කැඳවීම ද
තෝරාගනු ලැබීම ද තහවුරු කරන පිණිස වඩාත්
උද්‍යෝගී ව ක්‍රියා කරන්න. මෙසේ කළොත් ඔබ
කිසි කලෙක ඇදහිල්ල අත්හරින්නේ නැත.
11 මෙසේ අපගේ ස්වාමීන් ද ගැළවුම්කාරයාණන් ද
වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ සදාතන
රාජ්‍යයට පිවිසීමේ අයිතිය සම්පූර්ණයෙන් ම ඔබට
සහතික කරනු ලැබේ.
12 එබැවින් ඔබ මේ දේවල් දැනටමත් දැන, ඔබ
ලබා ඇති මේ සත්‍යයෙහි ස්ථිර ව පවතින නමුත්,
නැවත නැවත ඒවා ඔබට සිහි කරවීමට මම අදහස්
කරමි. 13 මා ජීවත් ව සිටින තුරු, මේ දේවල් ඔබට
සිහිගැන්වීම මාගේ යුතුකම යයි මම සිතමි.
14 මන්ද, අපගේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේ වටහා දුන් ලෙස, නොබෝ කලකින්
කූඩාරමක් වැනි මේ ශරීරය හැරපියා යන බව මම
දනිමි. 15 එබැවින් මාගේ ඇවෑමෙන් පසු ඔබට මේ
දේවල් හැම කල්හි ම සිහි කරගැන්මට පිළිවන් වන
පිණිස මට හැකි හැම දේ ම මම කරමි.

### ක්‍රිස්තුන් වහන්සේගේ මහිමය හා දිවැස් වැකිය

16 අපගේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේගේ බලයත් තේජාන්විත ආගමනයත් ගැන
අප ඔබට දැන්වූ කල, අප එසේ කළේ හිතා මතා
ගෙතූ ප්‍රබන්ධ අනුව නොව, උන් වහන්සේගේ
මහිමශ්‍රීය අපගේ ම ඇස්වලින් දුටු අය ලෙසිනි.
17 මතෙ 17:1-5; මාක් 9:2-7; ලූක් 9:28-35“මොහු
මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාණෝ ය; මොහු
කෙරෙහි මම ප්‍රසන්න ව සිටිමි” කියන හඬක්
උත්කෘෂ්ට තේජසින් උන් වහන්සේ කරා පහළ වූ
කල්හි දෙවි පියාණන් වහන්සේගේ ගෞරවයත්
මහිමයත් උන් වහන්සේ ලැබූ සේක. 18 උන්
වහන්සේ සමඟ ශුද්ධ කන්ද මත සිටිය දී මේ හඬ
ස්වර්ගයෙන් නික්ම එනු අපි අපේ ම කන්වලින්
ඇසීමු.
19 ඒ නිසා දිවැසිවරුන් ප්‍රකාශ කළ පණිවුඩය
වඩාත් ස්ථිර ලෙස අප සතු ව ඇත. ඔබේ අවධානය
ඊට යොමු කිරීම යහෙකි. මන්ද, එය අලුයම
පැමිණ, පහන් තරුව ඔබගේ සිත්හි උදා වන තුරු,
අඳුරු තැනක බබළන පහනක් මෙනි. 20 එහෙත් ශුද්ධ
ලියවිල්ලෙහි එන දිවැස් වැකියක් කිසිවෙකුට තමා
විසින් ම විසඳාගැනීම නොහැකි බව පළමුකොට ඔබ
දැනගත යුතු ය. 21 මන්ද කිසි ම දිවැස් වැකියක් කිසි
කලෙක මනුෂ්‍ය ප්‍රයත්නයකින් ඇති නො වී ය.
මනුෂ්‍යයෝ ශුද්ධාත්මානුභාවයෙන් පොළඹවනු ලැබ
දෙවියන් වහන්සේගේ වචනය කතා කළහ.

### ව්‍යාජ ගුරුවරු

2 පෙර කාලයේ ජනතාව අතර බොරු
දිවැසිවරුන් පහළ වූවාක් මෙන් ඔබ අතර
බොරු ගුරුවරුන් පහළ වනු ඇත. ඔව්හු විනාශකාරී
අසත්‍ය ධර්ම උපදවමින්, තමන් මිදූ සමිඳාණන්
වහන්සේ ප්‍රතික්ෂේප කරමින්, තමන් පිට හදිසි

විනාශය පමුණුවාගන්නෝ ය. 2 බොහෝ දෙනෙක්
ඔවුන්ගේ දුරාචාරය අනුගමනය කරන්නෝ ය. ඔවුන්
නිසා සත්‍ය මාර්ගය අපකීර්තියට පැමිණෙනු ඇත.
3 ඔවුන්ගේ තණ්හාව නිසා ඔව්හු වංචනික
ඉගැන්වීම්වලින්, ඔබ වළෙඳ බඩු බවට පත්
කරගන්නෝ ය. ඔවුන්ගේ විනිශ්චය පුරාණයේ සිට
ම පැවත එයි. එය අවලංගු වී නැත. ඔවුන්ගේ
විනාශකයා නොනිඳා සිටියි.
4 පව් කළ දේව දූතයන්ට දෙවියන් වහන්සේ
දඬුවම් දීමනේ නොවැළකී, ඔවුන්ගේ විනිශ්චය
සඳහා ඔවුන් වනේ කර තැබීමට නිරයෙහි හළො,
අන්ධකාර ගුහාවලට භාර දුන් සේක. 5 උත්
6:1—7:24උන් වහන්සේ පුරාණ ලෝකයට අනුකම්පා
නොකොට අභක්තිකයන්ගනේ පිරුණු ලෝකය පිට
ජලගැල්මක් පැමිණවූ නමුත්, ධර්මිෂ්ඨකම දේශනා
කළ නෝවා සහ තවත් සත් දනෙකු පමණක්
ආරක්ෂා කළ සේක. 6 උත් 19:24තවද උන් වහන්සේ
සොදොම් සහ ගොමොරා නගර විනාශයට තීන්දු
කරමින් ගිනිබත් කොට අනාගතයේ දී අභක්තිකයන්
ලසෙ හැසිරනේනන්ට අනතුරු හැඟවීමක් කළ සේක.
7 උත් 19:1-16එහතේ උන් වහන්සේ අභක්තික
මනුෂ්‍යයන්ගේ අනාචාර හැසිරීම ගැන සංවේගයට
පත් වූ දැහැමි මිනිසකු වන ලොත් ගළවාගත්
සේක. 8 ඒ යහපත් මනුෂ්‍යයා ඔවුන් මැද ජීවත් වූ
අතර, දිනපතා එහි සිදු වූ දේවල් දැකීමනේ ද
ඇසීමනේ ද ඔවුන්ගේ අසභ්‍ය ජීවිතය නිසා ඔහුගේ
යහපත් සිත දැඩි දුකින් පළෙණේ ය. 9 මයෙින්
පනෙනේනේ, සමිඳාණන් වහන්සේ භක්තිවන්තයන්
පරීක්ෂාවලින් ගළවන්නට ද අභක්තිකයන්
විනිශ්චයේ දවස දක්වා දඬුවම යටතේ තබන්නට ද
දන්නා බව ය. 10 විශේෂයනේ ශාරීරික ලසෙ
අපිරිසිදුකමේ තෘෂ්ණාව අනුව හැසිරනේනන්ට ද
ආධිපත්‍යයට අපහාස කරන්නන්ට ද උන් වහන්සේ
එසේ කරන සේක.
10 සාහසික අහංකාරී මොවුහු, ස්වර්ගයේ
උත්තමයන්ට නින්දා කිරීමට බිය නොවති.
11 පරාක්‍රමයනේ හා බලයනේ ඔවුන්ට වඩා උතුම්
දේව දූතයෝ වුව ද, සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි
ස්වර්ගයේ උත්තමයන්ට නින්දා සහගත චෝදනාවක්
නොකරති. 12 එහතේ අල්ලාගනෙ විනාශ කරනු
ලැබීමට උපන් නුවණ නැති තිරිසනුන් වැනි මොවුහු,
තමන් නොදන්නා දයෙට අපහාස කරති. ඔව්හු වන
මෘගයන් මනේ විනාශ කරනු ලබති. 13 ඔවුන් ඇති
කළ දුකෙහි විපාකය ඔව්හු ම විඳිති. දිවා කාලයෙහි
කම් සැප සේවනය ඔවුන්ගේ ප්‍රීතිය වේ. ඔව්හු
ඔබගේ සමාගමට කැළලක් හා පලුද්දක් වති.
ඔවුන් ඔබ සමඟ මංගල භෝජන වළඳන විට ඔව්හු
ඔබ රවටා ප්‍රීති වති. 14 ඔවුන්ගේ ඇස් කාමුක
බැල්මනේ පිරී ඇත. ඔවුන්ගේ පාපාශාවන්ට
තෘප්තියක් නැත. ඔව්හු වැනනෙ සුලු පුද්ගලයන්
වරදට පොළඹවන්නෝ ය. ඔව්හු තණ්හාවට
ඇබ්බැහි වූ සිත් ඇත්තෝ ය. සාප ලත් දරුවෝ ය.
15 ගණන් 22:4-35ඔව්හු හරිමඟ හැර දමා මුළා වූ හ.
මුදලට තණ්හාවනේ අයුතුකම් කිරීමට කැමැති වූ
බයෙෝර්ගේ පුත් බාලාම් දිවැසිවරයාගේ මාර්ගයේ
ඔව්හු ගියහ. 16 එහතේ බාලාම් තමා කළ අපරාධය
ගැන තරවටු ලැබී ය. ගොළු කොටළුවකේ මිනිස්
හඬින් කතා කොට ඒ දිවැසිවරයාගේ ඔල්මාදය
වැළැක්විය.
17 ඔව්හු දිය සිඳුණු උල්පත් වැනි ය. සැඬ සුළඟින්
ගසාගනෙ යන මීදුම් පටල වැනි ය. ඔවුන්ට
ඝනාන්ධකාරයෙහි ස්ථානයක් වනේ කර ඇත.
18 ඔව්හු අහංකාර නිෂ්ඵල වචන දොඩමින්, වරදෙහි
වසන්නන් කරෙනේ යන්තම් ගැළවී යන අය, කාම
තෘෂ්ණාවනේ පොළඹවා ගනිති. 19 තමන් ම
දූෂ්‍යකමට වහල් ව සිටින ඔව්හු, අන්‍යයන්ට නිදහස
දීමට පොරොන්දු වති. මන්ද, යමකට වසඟ වන
තැනැත්තා, එයට වහලකේ වයේ. 20 අප ස්වාමීන් ද
ගැළවුම්කාරයාණන් ද වන ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේ දැනගැනීමනේ, ලෝකයේ දූෂණවලින්
මිදුණායින් පසු, ඔවුන් යළිත් ඒවාට පටලැවී වසඟ
වුණොත්, ඔවුන්ගේ දැන් තත්ත්වය පළමු තත්ත්වයට
වඩා භයානක ය. 21 ඔවුන් දැහැමි මඟ
දැනගත්තායින් පසු ඔවුන්ට භාර දුන් ශුද්ධ වූ
ව්‍යවස්ථාවට පිටුපා යාමට වඩා, ඒ මාර්ගය ඔවුන්
නොදැන සිටියා නම් වඩා හොඳ ය. 22 හිතෝ
26:11“බල්ලා උගේ ම වමනයට හැරී එයි; සේදූ
පසුත් ඊරි මඬ වගුරෙහි පරෙළයේ” යන මේ ප්‍රස්තා
පිරුළ ඔවුන් ගැන සැබෑ ය.

## පුනරාගමනය

3 ප්‍රේමවන්තයනෙි, දැන් මයෙ මා ඔබ වතෙ
ලියා එවන දෙ වන හසුන ය. මාගේ මේ
හසුන් දකෙින් ම ඔබට යම් යම් දේ සිහිගන්වා, ඔබ
තුළ සිත් පිබිදවීමක් ඇති කිරීමට උත්සාහ කළෙමි.
2 ශුද්ධ දිවැසිවරුන් විසින් පළමුවනේ කියන ලද
වචන ද, ඔබගේ ප්‍රේරිතයන් විසින් ඔබට දනෙ ලද
ගැළවුම්කාර සමිඳාණන් වහන්සේගේ ආඥා ද
සිහියට ගන්න. 3 ජූඩ් 18මයෙ පළමුකොට දැනගන්න;
අන්තිම දවස්වල දී තමන්ගේ තෘෂ්ණා අනුව
හැසිරනෙ, ඔබට සරදම් කරන ගරහන්නන් පැමිණ
මසෙේ කියනු ඇත. 4 “උන් වහන්සේගේ ආගමනය
පිළිබඳ පොරොන්දුවට කිමකේ වී ද? පියවරුන් මළ
පසු සියලු දේ මැවීමේ පටන්ගැන්මේ සිට තිබුණු
ලසෙ ම තවමත් පවතිනවා නොවේ ද?” 5 උත්
1:6-9මසෙේ කීමනේ ඔව්හු ඕනෑකමින් ම මේ
දේවල් අමතක කරති. එනම්, දේව වචනය
කරණකොටගනෙ, පුරාණයේ පටන් අහසක් ද,
වතුරට යා වූ, වතුර මධ්‍යයෙහි වූ පොළවක් ද
තිබුණ බවත්, 6 උත් 7:11එම වචනය
කරණකොටගනෙ එකල පැවති ලෝකය ජල
ගැල්මනේ විනාශ වූ බවත් අමතක කරති. 7 දැන්
පවතින අහස හා පොළොව, එම වචනයනේ ම,
විනිශ්චයේ හා අභක්තිකයන්ගේ විනාශයේ දවස
දක්වා, ගිනිබත් කිරීම පිණිස ඉතිරි කොට තබා ඇති
බව ද ඔව්හු අමතක කරති.

8 ගීතා 90:4 එහෙත් ප්‍රේමවන්තයෙනි, ‘සමිඳාණන්
වහන්සේට එක දවසක් අවුරුදු දහසක් මෙන් ය,
අවුරුදු දහසක් එක දවසක් මෙන් ය,’ යන වැදගත්
සත්‍යය අමතක නොකරන්න. 9 පමා වී ඇතැ යි
සමහරුන් සිතන නමුත්, සමිඳාණන් වහන්සේ සිය
පොරොන්දු ඉටු කිරීමට පමා වී නැත. එහෙත්,
කිසිවකු විනාශ වීම උන් වහන්සේගේ කැමැත්ත
නොවන බැවින්, සියල්ලනට පසුතැවී සිත් හරවා
ගැනීම සඳහා අවස්ථාවක් ලැබෙනු පිණිස උන්
වහන්සේ ඔබ ගැන බොහෝ කල් ඉවසන සේක.
10 මතෙ 24:43; ලූක් 12:39; 1 තෙස 5:2; එළිද
16:15 එහෙත් සමිඳාණන් වහන්සේගේ දවස
සොරකු මෙන් හදිසියෙන් පැමිණෙයි. ඒ දවසේ දී
අහස ගිගුරුම් හඬ දමමින් පහ වී යන්නේ ය; මහා
භූතයෝ ද ගිනිගෙන උණු වී යන්නෝ ය; පොළොව
ද එහි ඇති සියල්ල ද දැවී විනාශ වී යන්නේ ය.
11 මේ මුළු විශ්වය මේ අයුරින් විනාශ වී යන
බැවින්, ඔබ කොයි ආකාර අය විය යුතු ද? ඔබ
ශුද්ධ හැසිරීමකින් භක්තිවන්ත ලෙස ජීවත් විය යුතු
ය. 12 දෙවියන් වහන්සේගේ දවස පැමිණීම බලා
සිට, එය ඉක්මන් කිරීමට උත්සාහ කරන්න. ඒ
දවසේ දී අහස ගිනිගෙන විනාශ වනු ඇත. මහා
භූතයන් දැවී උණු වී යනු ඇත. 13 යෙසා 65:17;
66:22; එළිද 21:1එහෙත් ධර්මිෂ්ඨකමට වාස භූමිය
වූ නව අහසක් ද නව පොළොවක් ද දෙවියන්
වහන්සේ අපට පොරොන්දු වී ඇත. අපි එය
බලාපොරොත්තුවෙන් සිටිමු.
14 එබැවින්, ප්‍රේමවන්තයෙනි, ඔබ මේ දේවල්
බලාපොරොත්තුවෙන් සිටින අතර, උන් වහන්සේ
ඉදිරියෙහි නොකැළැල් ව, නිදොස් ව සිටින්නට දැඩි
උත්සාහයක් ගෙන, උන් වහන්සේ සමඟ
සාමදානයෙන් සිටින්න. 15 අපගේ සමිඳාණන්
වහන්සේ බොහෝ කල් ඉවසන්නේ ඔබට ගැළවීමට
අවස්ථාවක් දෙන පිණිස බව සිහි කරන්න. අපගේ
ප්‍රේමවන්ත සහෝදර පාවුලු, තමා ලත් ප්‍රඥාව
අනුව ඔබට ලියා එව්වේත් මේ දේ ම ය. 16 තවද,
මේ කාරණා ගැන ලියන විට, ඔහු තමාගේ
හසුන්වල කියන්නේත් මේ දේ ම ය. ඒවායේ
තේරුම්ගැනීමට දුෂ්කර සමහර දේ ඇත. නූගත්
අස්ථිර අය ශුද්ධ ලියවිල්ලේ සෙසු කොටස්වල මෙන්
මේවායේත් අර්ථය නොපිට පෙරළාගනිති. එයින්
ඔවුන්ගේ විනාශය සිදු වේ.
17 එහෙත් ප්‍රේමවන්තයෙනි, ඔබට මේ දේවල්
කල්තියා ම දන්වා ඇත. ඒ නිසා ප්‍රතිපත්ති රහිත
අයගේ දූර්මතවලින් මුළා නොවී, ඔබගේ ස්ථිර
භාවයෙන් නොවෙටනේනට බලාගන්න. 18 අපගේ
ස්වාමීන් ද ගැළවුම්කාරයාණන් ද වන, ජේසුස්
ක්‍රිස්තුන් වහන්සේගේ වරප්‍රසාදයෙහි ද උන්
වහන්සේ දැනගැන්මෙහි ද වැඩිවර්ධනය වන්න.
දැනුත් සදහටත් උන් වහන්සේට මහිමය වේ වා!
ආමෙන්.

## මැදහත්කාරයාණෝ

2 මාගේ ප්‍රිය දරුවෙනි, මේ කාරණා මා ඔබට
ලියා එවන්නේ, ඔබ පව් නොකරන පිණිස ය.
එහෙත් යමෙකු පව් කළොත්, ධර්මිෂ්ඨ වූ ජේසුස්
ක්‍රිස්තුන් වහන්සේ නම් මැදහත්කාරයාණන්
කෙනෙක් අප වෙනුවෙන් පියාණන් වහන්සේ වෙත
සිටින සේක. 2 අපේ පාපයන් මිදීමේ මිලය උන්
වහන්සේ ය; එය අපේ පව් උදෙසා පමණක් නොව
සකල ලෝකයාගේ ද පව් උදෙසා ය.
3 අපි උන් වහන්සේගේ ආඥා පිළිපදිමු නම්, එයින්
අප උන් වහන්සේ දන්නා බව සහතික වේ. 4 “මම
උන් වහන්සේ දනිමි”යි කියමින් උන් වහන්සේගේ
ආඥා නොපිළිපදින තැනැත්තා බොරුකාරයෙකි;
සත්‍යය ඔහු තුළ නැත. 5 එහෙත් යමෙක් උන්
වහන්සේගේ දහම පිළිපදින්නේ ද, ඒකාන්තයෙන් ම
ඔහු තුළ දෙවියන් වහන්සේගේ ප්‍රේමය සම්පූර්ණ
වී ඇත. අප උන් වහන්සේ තුළ සිටින බව
දැනගන්නේ මෙසේ ය: 6 උන් වහන්සේ තුළ ජීවත්
වන්නේ යයි කියන තැනැත්තා, ක්‍රිස්තුන් වහන්සේ
ජීවත් වුණාක් මෙන් ජීවත් විය යුතු ය.

## අලුත් ආඥාව

7 ජොහ 13:34 ප්‍රේමවන්තයෙනි, මා ඔබ හට
ලියා එවන්නේ අලුත් ආඥාවක් නොව,
පටන්ගැන්මේ සිට ම ඔබ අතර තිබුණු පැරණි
ආඥාව ය. ඒ පැරණි ආඥාව නම් ඔබ අසා ඇති
පණිවුඩය ම ය. 8 කෙසේ වෙතත් මා ඔබ වෙත
ලියා එවන මෙම ආඥාව අලුත් එකකි. එහි සත්‍යය
ක්‍රිස්තුන් වහන්සේ තුළ ද ඔබ තුළ ද විද්‍යමාන වී
ඇත. මන්ද, අන්ධකාරය පහ ව යන්නේ ය. සැබෑ
ආලෝකය දැනටමත් බැබළෙන්නේ ය.
9 ආලෝකයෙහි පවතිමි යි කියමින් සිය
සහෝදරයාට වෛර කරන්නා තවමත් අන්ධකාරයෙහි
සිටියි. 10 සිය සහෝදරයාට ප්‍රේම කරන්නා
ආලෝකයෙහි සිටියි. ඒ නිසා පැකිළී වැටීමට
හේතුවක් ඔහුට නැත. 11 එහෙත් සිය සහෝදරයාට
වෛර කරන්නා අන්ධකාරයෙහි හැසිරෙයි.
අන්ධකාරයෙන් ඔහුගේ ඇස් අන්ධ වී තිබෙන
බැවින්, තමා යන්නේ කොහේ දැ යි ඔහු නොදනියි.
12 මාගේ ප්‍රියාදර දරුවෙනි, මා ඔබට ලියන්නේ
උන් වහන්සේගේ නාමය නිසා ඔබේ පව් කමා කර
ඇති බැවිනි. 13 පියවරුනි, මා ඔබට ලියන්නේ,
මූලාරම්භයේ සිට වැඩසිටින තැනැන් වහන්සේ ඔබ
දන්නා බැවිනි. තරුණයිනි, මා ඔබට ලියන්නේ, ඔබ
නපුරා දමනය කර ඇති බැවිනි. 14 දරුවෙනි, මා
ඔබට ලියා එවූයේ, ඔබ පියාණන් වහන්සේ දන්නා
බැවිනි. පියවරුනි, මා ඔබට ලියා එවූයේ,
මූලාරම්භයේ සිට වැඩසිටින තැනැන් වහන්සේ ඔබ
දන්නා බැවිනි. තරුණයෙනි, මා ඔබට ලියා එවූයේ,
ඔබ ශක්තිමත් බැවිනුත්, දෙවියන් වහන්සේගේ
වචනය ඔබ තුළ ඇති බැවිනුත්, ඔබ නපුරා දමනය
කර ඇති බැවිනුත් ය.

15 මේ ලෝකයට වත්, එහි ඇති දේ වලට වත්
ආලය නොකරන්න. යමෙක් ලෝකයට ආලය
කරන්නේ ද, දෙවියන් වහන්සේ කෙරෙහි ප්‍රේමය
ඔහු තුළ නැත. 16 මන්ද, ලෝකයෙහි තිබෙන
සියල්ල, එනම්, කාමරාගයත්, මාංසික තෘෂ්ණාවත්,
අහංකාරකමත් ඇතිවන්නේ පියාණන් වහන්සේගෙන්
නොව ලෝකයෙන් ය. 17 ලෝකයත්
ලෝකානුරාගයත් පහ වී යන්නේ ය. එහෙත්
දෙවියන් වහන්සේගේ කැමැත්ත කරන්නා සදහට ම
ජීවත් වන්නේ ය.

## ක්‍රිස්තු-විරෝධියා

18 ප්‍රිය දරුවෙනි, අවසාන මොහොත පැමිණ ඇත.
මේ කාලයේ දී ක්‍රිස්තු-විරෝධියා එන බව ඔබ අසා
ඇත. දැනට ම බොහෝ ක්‍රිස්තු-විරෝධීහු පහළ වී
සිටිති. මේ කරුණින් මෙය අන්තිම මොහොත බව
අපට පෙනේ. 19 මේ ක්‍රිස්තු-විරෝධීන් අපෙන් වෙන්
ව ගිය නමුත් අපට අයිති ව සිටියේ නැත. ඔවුන්
අපට අයිති ව සිටියා නම්, අප සමඟ නැවතී සිටිනු
ඇත. එහෙත් ඔවුන් වෙන් වී ගිය කරුණෙන්
පෙනෙන්නේ ඔවුන්ගෙන් කිසිවකුවත් අපට සැබෑ
ලෙස අයිති නුවූ බව ය.
20 එහෙත් ඔබ වනාහි ශුද්ධ තැනැන්
වහන්සේගෙන් ආලේපය ලබා ඇත. එයින් ඔබ
හැමට ප්‍රඥාව ලැබී ඇත. 21 මා ඔබට ලියා එවූයේ
ඔබ සත්‍යය නොදන්නා නිසා නොව, එය දන්නා
නිසාත්, සත්‍යයෙන් කිසි බොරුවක් හට නොගන්නා
බව දන්නා නිසාත් ය.
22 බොරුකාරයා කවරෙක් ද? ඔහු අන් කිසිවකු
නොව, ජේසුස් වහන්සේ ක්‍රිස්තුස් නොවේ යයි
කියන තැනැත්තා ය. ක්‍රිස්තු-විරෝධියාත් ඔහු ම ය.
ඔහු පියාණන් වහන්සේත් පුත්‍රයාණන් වහන්සේත්
ප්‍රතික්ෂේප කරන්නේ ය. 23 යමෙක් පුත්‍රයාණන්
වහන්සේ ප්‍රතික්ෂේප කරන්නේ ද, ඔහු පියාණන්
වහන්සේත් ප්‍රතික්ෂේප කරයි; යමෙක් පුත්‍රයාණන්
වහන්සේ පිළිගන්නේ ද, ඔහු පියාණන් වහන්සේත්
පිළිගන්නේ ය. 24 ඔබ මුල සිට ම ඇසූ දේ සිතෙහි
නිදන් කරගන්න. මුල සිට ම ඔබ ඇසූ දේ ඔබ තුළ
පවතී නම් ඔබ පුත්‍රයාණන් වහන්සේ තුළත්,
පියාණන් වහන්සේ තුළත් ජීවමාන ව සිටින්නහු ය.
25 උන් වහන්සේ අපට දුන් පොරොන්දුව නම් මේ
සදාතන ජීවනය ය.
26 මා මේ කාරණා ඔබට ලිව්වේ ඔබ මුළා
කරන්නට උත්සාහ කරන අය සම්බන්ධයෙන් ය.
27 උන් වහන්සේගෙන් ලැබූ ආලේපය ඔබ තුළ
පවතින හෙයින් ඔබට ඉගැන්වීමට අන් කිසිවෙක්
වුවමනා නැත. උන් වහන්සේගේ ඒ ආලේපය ඔබට
සියල්ල උගන්වනු ඇත. එය සත්‍යම ය; අසත්‍යයක්
නොවේ. ඒ ආලේපය ඔබට ඉගැන්වූ පරිදි, උන්
වහන්සේ තුළ පැවතී සිටින්න.
28 ඉතින් මාගේ ප්‍රිය දරුවෙනි, උන් වහන්සේ තුළ
පවතින්න. එසේ කළ යුත්තේ උන් වහන්සේ
ප්‍රකාශ වූ විට ඔබ නිසැක ව සිටින පිණිසත්, උන්
වහන්සේගේ ආගමනයේ දී ඔබ උන් වහන්සේ
ඉදිරියේ ලජ්ජා රහිත ව සිටින පිණිසත් ය. 29 උන්
වහන්සේ ධර්මිෂ්ඨ බව ඔබ දන්නහු නම්, දමිටුකම්
කරන සියල්ලන් උන් වහන්සේගෙන් උපත ලබා
සිටින බව ඔබට තේරුම් යනු ඇත.

## දෙවියන් වහන්සේගේ දරුවෝ

3 ජොහ 1:12 බලන්න, පියාණන් වහන්සේ අපට
කෙතරම් ප්‍රේම කර ඇද් ද? අපි දෙවියන්
වහන්සේගේ දරුවෝ යයි කියන තරමට උන්
වහන්සේ අපට ප්‍රේම කළ සේක. ඇත්තෙන් ම අපි
උන් වහන්සේගේ දරුවෝ ම ය. ලෝකයා දෙවියන්
වහන්සේ නොහඳුනන බැවින්, ඔව්හු අප ද
නොහඳුනති. 2 ප්‍රේමවන්තයෙනි, අපි දැනට ම
දෙවියන් වහන්සේගේ දරුවෝ ය. එහෙත්
අනාගතයේ දී අපි කොයි ආකාර අය වන්නමෙු දැ යි
තව ම ප්‍රකාශ වී නැත. කෙසේ වෙතත් උන්
වහන්සේ ප්‍රකාශ වන විට අපි උන් වහන්සේට
සමාන වන බව දනිමු. මන්ද, උන් වහන්සේගේ
ප්‍රකෘති ස්වභාවයෙහි ම අපි උන් වහන්සේ
දකින්නෙමු. 3 උන් වහන්සේ පිළිබඳ මේ
බලාපොරොත්තුව ඇති හැම කෙනෙක් ම, උන්
වහන්සේ පිරිසිදු ව සිටින්නාක් මෙන්, තමන් ද
පිරිසිදු කරගනිති.
4 පව් කරන සෑම දෙන ම දේව නීතිය කඩ කරති.
පාපය නම් දේව නීතිය කඩ කිරීම ය. 5 ජොහ
1:29ක්‍රිස්තුන් වහන්සේ පැමිණියේ පව් දුරු කරන
පිණිස බව ඔබ දන්නහු ය. උන් වහන්සේ තුළ
පාපයක් නැත. 6 යමෙක් උන් වහන්සේ තුළ ජීවත්
වන්නේ ද ඔහු පව් නොකරයි. පව් කරන කිසිවෙක්
උන් වහන්සේ දුටුවේ වත්, උන් වහන්සේ
අඳුනන්නේ වත් නැත.
7 මාගේ ප්‍රිය දරුවෙනි, ඔබ මුළා කරන්නට
කිසිවකුට ඉඩ නොදෙන්න. උන් වහන්සේ ධර්මිෂ්ඨ
ව සිටින්නාක් මෙන්, දමිටුකම් කරන්නා දමිටු ව
සිටියි. 8 පව් කරන තැනැත්තා යක්ෂයාට අයිති ය.
මන්ද, පටන්ගැන්මේ සිට ම යක්ෂයා පව් කර ඇත.
දෙවියන් වහන්සේගේ පුත්‍රයා ප්‍රකාශ වූයේ
යක්ෂයාගේ ක්‍රියා විනාශ කිරීම පිණිස ය.
9 දෙවියන් වහන්සේගෙන් උපත ලැබූ කිසිවෙක්
පව් නොකරති. මන්ද, උන් වහන්සේගේ ජීවය ඔහු
තුළ පවතියි. ඔහු දෙවියන් වහන්සේගෙන් උපත
ලැබ සිටින බැවින් ඔහුට පව් කළ නොහැකි ය.
10 දෙවියන් වහන්සේගේ දරුවන් ද යක්ෂයාගේ
දරුවන් ද හඳුනාගත හැක්කේ මෙසේ ය: යුතු දේ
නොකරන, තම සහෝදරයාට ප්‍රේම නොකරන,
කිසිවෙක් දෙවියන් වහන්සේගේ දරුවෝ නොවෙති.

## සහෝදර ප්‍රේමය

11 ජොහ 13:34 පටන්ගැන්මේ සිට ඔබ ඇසූ
පණිවුඩය නම්, අප එකිනෙකාට ප්‍රේම කළ යුතු ය
යනු යි. 12 උත් 4:8සිය සහෝදරයා මැරූ, නපුරාට
අයිති වූ කායින් මෙන් අප නොවිය යුතු ය. කායින්

සිය සහෝදරයා මැරුවේ මන් ද? තමාගේ ක්‍රියා
නපුරු ව ද සහෝදරයාගේ ක්‍රියා යහපත් ව ද
තිබුණු බැවිනි.
13 සහෝදරයෙනි, ලෝකයා ඔබට වෛර කරන්නේ
නම් පුදුම නොවන්න. 14 ජොහ 5:24අපි
සහෝදරයන්ට ප්‍රේම කරන බැවින් මරණයෙන්
ජීවනයට පැමිණ සිටින බව දනිමු. ප්‍රේම
නොකරන්නා මරණයෙහි පවතියි. 15 තම
සහෝදරයාට වෛර කරන කවරෙක් නමුත් මිනී
මරන්නෙකි. කිසි මිනී මරන්නෙකු තුළ සදාතන
ජීවනය නොමැති බව ඔබ දන්නහු ය. 16 ප්‍රේමය
යනු කිමෙක් දැ යි අප දන්නේ, ක්‍රිස්තුන් වහන්සේ
සිය ජීවිතය අප උදෙසා පරිත්‍යාග කළ බැවිනි. අප ද,
සහෝදරයන් උදෙසා අපේ ජීවිත පරිත්‍යාග කළ යුතු
ය. 17 ලෞකික සම්පත් ඇති කෙනෙක්, තම
සහෝදරයාගේ අගහිඟකම දැක දැකත්, ඔහුට
අනුකම්පා නොකරත් නම්, දෙවියන් වහන්සේගේ
ප්‍රේමය ඔහු තුළ පවතින්නේ කෙසේ ද? 18 මාගේ
ප්‍රිය දරුවෙනි, අපගේ ප්‍රේමය වචනයෙන් වත්,
කතාවෙන් වත් නොව, ක්‍රියාවෙන් ප්‍රකාශ වන
සත්‍ය ප්‍රේමයක් විය යුතු ය.

## දෙවියන් වහන්සේ ඉදිරියේ නිර්භීතකම

19 අප සත්‍යයේ පිහිටා සිටින බව දන්නේත්, ඒ
ගැන දෙවියන් වහන්සේ ඉදිරියේ අපේ සිතේ
සහතිකයක් අපට ඇති විය හැක්කේත් මෙසේ ය:
20 අපේ සිත අපට දෝෂාරෝපණය කරයි නම්,
දෙවියන් වහන්සේ අපේ සිතට වඩා උතුම් බවත්,
උන් වහන්සේ සියල්ල දන්නා බවත් අපි දනිමු.
21 ප්‍රේමවන්තයෙනි, අපේ සිත අපට
දෝෂාරෝපණය නොකරයි නම්, දෙවියන් වහන්සේ
ඉදිරියේ අපට බියවීමට කරුණක් නැත. 22 තවද, අපි
උන් වහන්සේගේ ආඥා පිළිපදින නිසා ද, උන්
වහන්සේට ප්‍රියමනාප දේ කරන නිසා ද, උන්
වහන්සේගෙන් ඉල්ලන සියල්ල ලබමු. 23 ජොහ
13:34; 15:12,17උන් වහන්සේගේ ආඥාව නම්, උන්
වහන්සේගේ පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේ ඇදහීමත්, උන් වහන්සේ අපට අණ කළ
ලෙස එකිනෙකාට ප්‍රේම කිරීමත් ය. 24 උන්
වහන්සේගේ ආඥා පිළිපදින්නා, උන් වහන්සේ තුළ
වසෙයි; උන් වහන්සේ ද ඔහු තුළ වැඩවසන සේක.
උන් වහන්සේ අප තුළ වැඩවසන බව අප දන්නේ
උන් වහන්සේ අපට දුන් ශුද්ධාත්මයාණන්
කරණකොටගෙන ය.

## සැබෑ දිවැසිවරු හා බොරු දිවැසිවරු

4 ප්‍රේමවන්තයෙනි, තමන්ට ආත්මයාණන් ඇතැ
යි කියන හැම කෙනෙකු ම විශ්වාස
නොකොට, ඔවුන්ට ආත්මයාණන් ලැබී ඇත්තේ
දෙවියන් වහන්සේගෙන් දැ යි පරීක්ෂා කර බලන්න.
එසේ කියන්නේ, බොරු දිවැසිවරුන් බොහෝ
දෙනෙකු ලෝකයේ විසිර ගොස් සිටින නිසා ය.
2 ඔබ දෙවියන් වහන්සේගේ ආත්මයාණන්
වහන්සේ දැනගන්නේ මෙසේ ය: ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේ මිනිස්බව ගෙන වැඩම කළ බව ඒත්තු
ගන්නාවූ සියලු දෙනා දෙවියන් වහන්සේගෙන් ය.
3 එසේ ජේසුස් වහන්සේ ඒත්තු නොගන්නා වූ
සියලු දෙනා දෙවියන් වහන්සේගෙන් නොවෙති. මේ
ක්‍රිස්තු-විරෝධියාගේ ක්‍රියා ය. ඔහු එන බව ඔබ
අසා ඇත. දැනටමත් ඔහු ලෝකයෙහි සිටියි.
4 ප්‍රිය දරුවෙනි, ඔබ දෙවියන් වහන්සේට අයිති
වෙමින් බොරු දිවැසිවරුන් පරාජය කර ඇත. මන්ද,
ඔබ තුළ වැඩවසන දෙවියන් වහන්සේ ලෝකයේ
සිටින ක්‍රිස්තු-විරෝධියාට වඩා උතුම් ය. 5 ඒ බොරු
දිවැසිවරු ලෝකයට අයිති ය; ඔව්හු ලෝක
ව්‍යවහාරය අනුව කතා කරති. එබැවින් ලෝකයා
ඔවුන්ට සවන් දෙති. 6 අප දෙවියන් වහන්සේට
අයිති ය. දෙවියන් වහන්සේ අඳුනන තැනැත්තා අපට
සවන් දෙයි. දෙවියන් වහන්සේට අයිති නොවන්නා
අපට සවන් නොදෙයි. සත්‍යයත් අසත්‍යයත් අපට
හඳුනාගත හැක්කේ මේ ලෙසිනි.

## දෙවියන් වහන්සේගේ ප්‍රේමය

7 ප්‍රේමවන්තයෙනි, අපි එකිනෙකාට ප්‍රේම
කරමු. මන්ද, ප්‍රේමය දෙවියන් වහන්සේගෙන් ය.
ප්‍රේම කරන සෑම දෙන ම දෙවියන් වහන්සේගෙන්
උපත ලබා සිටින බැවින් උන් වහන්සේ අඳුනති.
8 ප්‍රේම නොකරන්නා දෙවියන් වහන්සේ නාඳුනයි.
මන්ද, දෙවියන් වහන්සේ ප්‍රේමය ය. 9 අප
කෙරෙහි දෙවියන් වහන්සේගේ ප්‍රේමය ප්‍රකාශ
කරනු ලැබුවේ දෙවියන් වහන්සේ ස්වකීය
ඒකජාතක පුත්‍රයාණන්, අප උන් වහන්සේ
කරණකොටගෙන ජීවත් වන පිණිස, ලෝකයට එවා
වදාළ කාරණයෙන් ය. 10 ප්‍රේමය යන්නෙන් මා
අදහස් කරන්නේ අප දෙවියන් වහන්සේට ප්‍රේම
කිරීම නොව, උන් වහන්සේ අපට ප්‍රේම කර සිය
පුත්‍රයාණන් අපේ පාපයෙන් මිදීමේ මිලය වශයෙන්
එවීම ය.
11 ප්‍රේමවන්තයෙනි, දෙවියන් වහන්සේ අපට
මෙසේ ප්‍රේම කළ සේක් නම්, අපත් එකිනෙකාට
ප්‍රේම කළ යුතු ය. 12 ජොහ 1:18කිසිවෙකු කිසි
කලෙක දෙවියන් වහන්සේ දුටුවේ නැත. එහෙත්,
අපි එකිනෙකාට ප්‍රේම කරමු නම්, දෙවියන්
වහන්සේ අප තුළ වැඩවසන සේක. උන්
වහන්සේගේ ප්‍රේමය ද අප තුළ පරිපූර්ණ වන්නේ
ය.
13 අප උන් වහන්සේ තුළ ද, උන් වහන්සේ අප
තුළ ද සිටින බව අප දන්නේ, උන් වහන්සේ සිය
ආත්මයාණන් වහන්සේ අපට ප්‍රදානය කර ඇති
බැවිනි. 14 තවද, පියාණන් වහන්සේ තමන්
පුත්‍රයාණන් ලෝකයාගේ ගැළවුම්කාරයාණන් වන
පිණිස එවා වදාළ බව අපි දුටිමු. ඊට සාක්ෂි දරමු.
15 යමෙක් ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ
පුත්‍රයාණන් බව අදහාගනිමින් ප්‍රකාශ කරන්නේ ද,
දෙවියන් වහන්සේ ඔහු තුළත්, ඔහු දෙවියන්
වහන්සේ තුළත් වාසය කරති. 16 මෙසේ අප

කරෙහි ඇති දෙවියන් වහන්සේගේ ප්‍රේමය දැන
හැඳින අපි එය විශ්වාස කර සිටිමු.
16 දෙවියන් වහන්සේ ප්‍රේමය ය. ප්‍රේමයෙහි
ජීවත් වන්නා උන් වහන්සේ තුළ ජීවත් වෙයි.
දෙවියන් වහන්සේ ද ඔහු තුළ ජීවත් වන සේක.
17 ප්‍රේමය අප තුළ පරිපූර්ණ වූ කල, විනිශ්චය
දවසේ දී අපට නිසැකකම ඇති වේ. මන්ද ක්‍රිස්තුන්
වහන්සේ මෙලොව ජීවත් ව සිටින සේ ම අපිත්
ජීවත් වෙමු. 18 ප්‍රේමයෙහි බියක් ඇති නොවේ.
ප්‍රේමය බිය දුරු කරයි. බිය වීම දඬුවම් ලැබීමට
සම්බන්ධ බැවින්, බිය වන්නා ප්‍රේමයෙහි පරිපූර්ණ
වී නැත.
19 අප ප්‍රේම කරන්නේ උන් වහන්සේ
පළමුකොට අපට ප්‍රේම කළ බැවිනි. 20 යමෙක්
“මම දෙවියන් වහන්සේට ප්‍රේම කරමි”යි කියමින්,
තම සහෝදරයාට වෛර කරයි නම්, ඔහු
බොරුකාරයෙකි. පෙනෙන සහෝදරයාට ප්‍රේම
නොකරන්නාට, නොපෙනෙන දෙවියන් වහන්සේට
ප්‍රේම කළ නොහැකි ය. 21 දෙවියන් වහන්සේට
ප්‍රේම කරන තැනැත්තා තම සහෝදරයාටත් ප්‍රේම
කළ යුතු ය යන ආඥාව අපි උන් වහන්සේගෙන්
ලැබීමු.

## ලෝකය ජයගැනීම

5 ජේසුස් වහන්සේ ක්‍රිස්තුන් වහන්සේ බව
අදහන කවරෙක් නමුත් දෙවියන් වහන්සේගේ
දරුවෙකි. පිය කෙනෙකුට ප්‍රේම කරන්නා ඔහුගෙන්
උපන් පුත්‍රයාටත් ප්‍රේම කරයි. 2 දෙවියන්
වහන්සේට ප්‍රේම කිරීමෙන් ද, උන් වහන්සේගේ
ආඥා පිළිපැදීමෙන් ද අපි උන් වහන්සේගේ දරුවන්ට
ප්‍රේම කරන බව දැනගනිමු. 3 ජොහ 14:15දෙවියන්
වහන්සේට ප්‍රේම කිරීම යනු උන් වහන්සේගේ
ආඥා පිළිපැදීම යි. උන් වහන්සේගේ ආඥා පිළිපැදීම
දුෂ්කර නොවේ. 4 මන්ද, දෙවියන් වහන්සේගෙන්
උපන් හැම කෙනෙකු ම ලෝකයෙන් ජයගෙන ඇත.
ලෝකය පරදවන වික්‍රමය නම් ඇදහිල්ල යි.
5 ලෝකයෙන් ජයගත හැක්කේ, ජේසුස් වහන්සේ
දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් යයි අදහන
තැනැත්තාට මිස අන් කවරෙකුට ද?

## පුත්‍රයාණන් පිළිබඳ ත්‍රිවිධ සාක්ෂිය

6 ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ, වතුර හා රුධිරය
කරණකොටගෙන පැමිණි තැනැන් වහන්සේ ය.
එසේ පැමිණියේ වතුර පමණක් නොව වතුරත්
රුධිරයත් ඇතිව ය. මෙය සත්‍ය බවට ආත්මයාණන්
වහන්සේ සාක්ෂි දරන සේක. මන්ද, ආත්මයාණන්
වහන්සේ සත්‍යය වන බැවිනි. 7 එබැවින් සාක්ෂි
තුනක් ඇත: 8 ආත්මයාණන් වහන්සේ, වතුර හා
රුධිරය යන මේ තුන ය. මේ සාක්ෂි තුන අතරේ
එකඟත්වයක් ඇත. 9 අපි මනුෂ්‍යයන්ගේ සාක්ෂිය
පිළිගනිමු. එහෙත් දෙවියන් වහන්සේගේ සාක්ෂිය
ඊට වඩා බලගතු ය. දෙවියන් වහන්සේගේ ම
සාක්ෂිය නම්, සිය පුත්‍රයාණන් පිළිබඳ ව දුන්
සාක්ෂිය වේ. 10 දෙවියන් වහන්සේගේ පුත්‍රයා
අදහාගන්නාට තමා තුළ ම සාක්ෂිය ඇත. දෙවියන්
වහන්සේ අදහානොගන්නා, උන් වහන්සේ තමන්
පුත්‍රයාණන් පිළිබඳ ව දී ඇති සාක්ෂි විශ්වාස
නොකරන බැවින්, උන් වහන්සේ බොරුකාරයකු
කරයි. 11 ජොහ 3:36ඒ සාක්ෂිය නම්, දෙවියන්
වහන්සේ අපට සදාතන ජීවනය දුන් බවත්, ඒ
ජීවනය තම පුත්‍රයාණන් තුළ ඇති බවත් ය.
12 පුත්‍රයාණන් වහන්සේ පිළිගත් තැනැත්තාට මේ
ජීවනය ඇත. දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන්
නොපිළිගත් තැනැත්තාට ඒ ජීවනය නැත.

## සදාතන ජීවන ඥානය

13 මෙය මා ඔබ වෙත ලියා එවන්නේ දෙවියන්
වහන්සේගේ පුත්‍රයාණන් අදහන ඔබ හැමට
සදාතන ජීවනය ඇති බව ඔබ නිසැක ව දැනගන්නා
පිණිස ය. 14 උන් වහන්සේ ඉදිරියෙහි අපට තිබෙන
නිසැකකම නම්, අප උන් වහන්සේගේ කැමැත්ත
ලෙස යමක් ඉල්ලුවොත්, උන් වහන්සේ අපේ
ඉල්ලීම අසන බව ය. 15 ඒ ඉල්ලීමට උන් වහන්සේ
සවන් දෙන බව අපි දනිමු නම්, අප උන්
වහන්සේගෙන් ඉල්ලන දේ අපට ලැබෙන බව අපි
දනිමු.
16 යමෙකු තම සහෝදරයා මරණීය නොවන
පාපයක් කරන බව දුටුවොත්, ඔහු යාච්ඤා කරේ
වා! එවිට, එය මරණයට නොපමුණුවන පාපයක්
නම්, දෙවියන් වහන්සේ ඔහුට ජීවනය දෙන සේක.
මරණයට පමුණුවන පාපයක් ඇත්තේ ය. ඒ ගැන
ඔබ යාච්ඤා කළ යුතු යයි මම නොකියමි. 17 සියලු
අදමිටුකම් පව් ය. එහෙත් සියලු ම පාප මරණයට
පමුණුවන පව් නොවේ.
18 දෙවියන් වහන්සේගෙන් උපත ලැබූ කිසිවකු
පාපයෙහි නිරත ව නොසිටින බව අපි දනිමු.
දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ඔහු රක්ෂා
කරන සේක. ඔහුට හානියක් කරන්නට නපුරාට බැරි
ය.
19 අප දෙවියන් වහන්සේට අයිති බවත්, මුළු
ලෝකය නපුරාට යටත් බවත් දනිමු. 20 තවද,
දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් පැමිණ, සැබෑ
දෙවියන් දැනගැනීමට ප්‍රඥාව අපට දුන් බව අපි
දනිමු. ඇත්තෙන් ම අප සැබෑ දෙවියන් තුළ, එනම්,
උන් වහන්සේගේ පුත්‍රයාණන් වන ජේසුස්
ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවත් වෙමු. ක්‍රිස්තුන්
වහන්සේ සැබෑ වූ දෙවියන් ද සදාතන ජීවනය ද වන
සේක. 21 මාගේ ප්‍රිය දරුවෙනි, බොරු
දෙවිවරුන්ගෙන් පරිස්සම් වී සිටින්න.

# එළිදරව්ව

1 දෙවියන් වහන්සේ, ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේට දැක්වූ එළිදරව්ව මේ ය. එය උන්
වහන්සේට දෙන ලද්දේ ඉක්මනින් සිදු වන්නට
තිබෙන දේවල් ස්වකීය සේවකයන්ට පෙන්වන
පිණිස ය. ක්‍රිස්තුන් වහන්සේ ස්වකීය දූතයා එවමින්
ඒ දේවල් තමන් සේවක ජොහන් හට දැන්වූ සේක.
2 ජොහන් ද දෙවියන් වහන්සේගේ පණිවුඩය
ගැනත්, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ සාක්ෂිය
ගැනත්, එනම්, තමන් දුටු සියල්ල ගැන සාක්ෂි
දුන්නේ ය. 3 මේ දිවැසි වාක්‍යය කියවන්නා ද, එහි
වචනවලට සවන් දී ඒවා පිළිපදින්නෝ ද
භාග්‍යවන්තයෝ ය. මන්ද, නියමිත කාලය ආසන්න
ය.

## සභා සතට ආචාර

4 නික්ම 3:14; එළිද 4:5 ආසියාවේ සභා සතට
මෙසේ ලියා එවන්නේ ජොහන් නම් මම ය. වැඩ
සිටින, වැඩ සිටිය, මතු වඩින දෙවියන්
වහන්සේගෙන් ද, උන් වහන්සේගේ සිහසුන
ඉදිරියෙහි සිටින ආත්මයන් සත් දෙනාගෙන් ද,
විශ්වාසවන්ත සාක්ෂිකරුත් 5 යෙසා 55:4; ගීතා
89:27මළවුන්ගෙන් උත්ථාන වූ කුලුඳුලාත්, මිහි පිට
රජුන්ගේ අධිපතියාත් වන, ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේගෙන් ද, ඔබට කරුණාව හා ශාන්තිය වේ
වා! උන් වහන්සේ අපට ප්‍රේම කරන සේක; සිය
යාගික රුධිරයෙන් අප පවින් මිදූ සේක. 6 නික්ම
19:6; එළිද 5:10තම පියාණන් වන දෙවියන්
වහන්සේට සේවය කරන පිණිස උන් වහන්සේ අප
රාජකීය පූජක වංශයක් කළ සේක. ඒ තැනැන්
වහන්සේට, මහිමය ද බලපරාක්‍රමය ද සදහට ම
වේ වා! ආමෙන්.
7 දානි 7:13; සෙකරි 12:10; මතෙ 24:30; මාක්
13:26; ලූක් 21:27; ජොහ 19:34,37; 1 තෙස 4:17
බලන්න, උන් වහන්සේ වලාකුළු පිරිවරා වඩින
සේක. සියල්ලෝ උන් වහන්සේ දකින්නෝ ය.
කුරුසියේ ඇණ ගැසූ අය ද උන් වහන්සේ දකින්නෝ
ය. මිහි පිට සියලු ජාතීහු උන් වහන්සේ නිසා
වැලපෙන්නෝ ය. එය සැබෑ ම ය. ආමෙන්.
8 නික්ම 3:14; එළිද 22:13 “ආරම්භය ද අවසානය
ද මම වෙමි”යි වැඩ සිටින, වැඩ සිටිය, මතු වඩින
සර්ව පරාක්‍රම ස්වාමීන් වන දෙවියන් වහන්සේ
වදාරන සේක.

## ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ දර්ශනය

9 ඔබගේ සහෝදරයා වන, ජේසුස් ක්‍රිස්තුන්
වහන්සේගේ දුක් පීඩාවල ද, උන් වහන්සේගේ
රාජ්‍යයේ ද, ඔබේ ඉවසිල්ලේ ද පංගුකාරයා වන,
ජොහන් නම් මම, පැට්මොස් නම් දිවයිනෙහි
සිටියෙමි. මා එහි සිටියේ දෙවියන් වහන්සේගේ
පණිවුඩය දේශනා කිරීම නිසාත්, ජේසුස් වහන්සේ
ගැන සාක්ෂි දීම නිසාත් ය. 10 සමිඳාණන්
වහන්සේගේ දවසේ දී මම ආත්මයාණන් වහන්සේ
තුළ සිටියෙමි. එවිට හොරණෑ හඬක් වැනි මහත්
ශබ්දයක් මා පිටුපසින් ඇසිණි. 11 “ඔබ දකින දර්ශන
පොතක ලියා, එපීසය, ස්මර්ණය, පර්ගමම්,
තියාතිරා, සර්දිස්, පිලදෙල්පියාව, ලවෝදිසය යන මේ
සභා සතට යවන්නැ”යි ඒ හඬ පැවසී ය.
12 එකල මට කතා කළ ඒ ශබ්දය කිමෙක් දැ යි
බලන පිණිස මම හැරුණෙමි. එසේ හැරුණු කල, රන්
පහන් රුක් සතක් ද, 13 දානි 7:13; 10:5ඒ පහන් රුක්
මැද, පාද දක්වා වස්ත්‍රයක් හැඳ, ළය රන් පටියක්
බැඳගෙන සිටි, මනුෂ්‍ය පුත්‍රයකු වැනි තැනැත්තකු
ද දිටිමි. 14 දානි 7:9දානි 10:6උන් වහන්සේගේ හිස
ද හිසකෙස් ද ලෝම මෙන් ද හිම මෙන් ද සුදෝසුදු
ය; ඇස් ගිනි දැල්ලක් හා සමාන ය; 15 එසකි 1:24;
43:2පාද උදුනක ගිනියම් කළ දිළිසෙන ලෝකඩ වැනි
ය; උන් වහන්සේගේ කටහඬ සමුද්‍ර ඝෝෂයක් හා
සමාන ය; 16 දකුණතෙහි තාරකා සතක් විය; උන්
වහන්සේගේ මුඛයෙන් දෙමුවහත් තියුණු කඩුවක්
නික්මිණි. උන් වහන්සේගේ මුහුණ මද්දහනේ හිරු
මෙන් දීප්තිමත් ව බැබළිණි.
17 යෙසා 44:6; 48:12; එළිද 2:8; 22:13 උන්
වහන්සේ දුටු කල, මම මළ තැනැත්තකු මෙන් උන්
වහන්සේ පාමුල වැටුණෙමි. උන් වහන්සේ සිය
දකුණත මා පිට තබා මෙසේ වදාළ සේක: “බිය
නොවන්න. මම පළමුවැන්නා සහ අන්තිමයා ය,
18 ජීවමාන තැනැත්තා ය. මම මැරුණෙමි; එහෙත්
බලන්න, මම සදහට ම ජීවත් ව සිටිමි. මරණයේ ද
පාතාල ලෝකයේ ද යතුරු මට ඇත. 19 එබැවින් ඔබ
දුටු දේ ද දැන් තිබෙන දේ ද මතු සිදු වන්නට යන
දේ ද වන ඔබ දකින මේ දේවල් ගැන ලියන්න.
20 මාගේ දකුණතෙහි ඔබ දුටු තාරකා සතෙහි ද රන්
පහන් රුක් සතෙහි ද ගුප්තාර්ථය මේ ය; තාරකා
සත නම් සභා සතේ දූතයෝ ය; පහන් රුක් සත
නම් සභා සත ය.

## සභා සතට හසුන්: ප්‍රේම හීන සභාව

2 “එපීස සභාවේ දූතයා වෙත මෙසේ ලියන්න:
2 ‘සිය දකුණතෙහි තාරකා සත දරන, රන්
පහන් රුක් සත මැද සක්මන් කරන
තැනැන් වහන්සේ, මෙසේ වදාරන සේක. 2 ඔබේ
ක්‍රියා ද ඔබේ වෙහෙසීම් ද ඔබේ ඉවසීම ද මම
දනිමි. ඔබ දුදනන් නුරුස්සන බව ද,
ප්‍රේරිතවරුන්ගේ පදවිය අයුතු ලෙසෙ පවරාගත් අය
සෝදිසි කර බලා ඔබ ඔවුන් බොරුකාරයන් යයි
දැනගත් බව ද මම දනිමි. 3 මාගේ නාමය නිසා, ඔබ
ඉවසිල්ලෙනේ දුක් ඉසිලීමේ දී පසුබට නො වූ බව ද
මම දනිමි.
4 ‘එහෙත් ඔබට විරුද්ධ ව එක චෝදනාවක් මට
ඇත. මුලින් ඔබ මට දැක්වූ ප්‍රේමය දැන් නැත.
5 ඔබ කෙතෙරම් පහතට වැටී ඇත් දැ යි සිහියට
ගෙන, පසුතැවී සිත හරවා ගන්න. මුලින් කළ ක්‍රියා
නැවත කරන්න; එසේ නොකළොත්, පසුතැවී සිත
හරවා නොගතහොත්, මම ඔබ වෙත පැමිණ, ඔබේ
පහන් රුක තිබෙන තැනින් එය ඉවත් කරන්නෙමි.
6 එහෙත් ඔබේ වාසියට එක දෙයෙක් ඇත. එනම්, මා
මෙනේ ම ඔබත් නිකොලයිතයන්ගේ ක්‍රියාවලට
ද්වේෂ කිරීම ය.
7 උත් 2:9; එසකි 28:13; 31:8; එළිද 22:2
‘ආත්මයාණන් වහන්සේ සභාවලට වදාරන දේ කන්
ඇත්තෝ අසා වා! ජයග්‍රාහකයාට දෙවියන්
වහන්සේගේ පාරාදීසයෙහි තිබෙන ජීවන
වෘක්ෂයෙනේ අනුභව කරන්නට දෙන්නෙමි.’

## පීඩා විඳින සභාව

8 යෙසා 44:6; 48:12; එළිද 1:17; 22:13
“ස්මර්ණායේ සභාවේ දූතයා වෙත මෙසේ ලියන්න:
8 ‘පළමුවැන්නා ද අන්තිමයා ද වන, මැරුණ නමුත්
ජීවත් ව සිටින තැනැන් වහන්සේ, මෙසේ වදාරන
සේක. 9 ඔබ විඳින බලවත් පීඩාව ද දිළිඳුකම ද මම
දනිමි. එහෙත් ඔබ ධනවත් ය. ජුදෙව්වරුන් නොවෙන
නමුත්, තුමූ ජුදෙව්වරුන් යයි කියාගන්නා, සාතන්ගේ
හවුලක් වන අයගේ අපවාද මම දනිමි. 10 ඔබ
විඳින්නට යන දේවලට බිය නොවන්න. බලන්න, ඔබ
විමසන පිණිස, යක්ෂයා ඔබෙනේ සමහරකු සිරගත
කිරීමට අර අඳිමින් සිටියි. දස දවසක් ඔබ පීඩා
විඳින්නහු ය. මරණය දක්වා විශ්වාසී ව සිටින්න;
එවිට මම ඔබට ජීවන කිරුළ ප්‍රදානය කරමි.
11 එළිද 20:14; 21:8 ‘ආත්මයාණන් වහන්සේ
සභාවලට වදාරන දේ කන් ඇත්තෝ අසා වා!
ජයග්‍රාහකයාට දෙ වන මරණයෙනේ අනතුරක්
නොවන්නේ ය.’

## චපල සභාව

12 “පර්ගමම් සභාවේ දූතයා වෙත මෙසේ
ලියන්න:
12 ‘දෙමුවහත් තියුණු කඩුව දරන තැනැන්
වහන්සේ මෙසේ වදාරන සේක. 13 ඔබ වාසය
කරන තැන මම දනිමි. එය සාතන්ගේ සිංහාසනය
පිහිටි ස්ථානය යි. එහෙත් ඔබ මට පක්ෂපාත ව
සිටින්නහු ය. මාගේ විශ්වාසවන්ත සාක්ෂිකාරයකු
වූ අන්තිපාස්, සාතන්ගේ වාසභූමිය වන ඔබේ
නගරයේ දී මරනු ලැබූ කාලයේ දී පවා, ඔබ මා
කෙරෙහි විශ්වාසය ප්‍රතික්ෂේප නොකළහු ය.
14 ගණන් 22:5,7; 25:1-3; 31:16; ද්වි.නී. 23:4එහෙත්
ඔබට විරුද්ධ ව චෝදනා ස්වල්පයක් මට ඇත. ඔබ
අතර බාලාම්ගේ ඉගැන්වීම් පිළිගත් අය සිටිති.
බාලාම්, දේවතා රූපවලට පිදූ පිදේනි කෑමටත්,
කාමමිථ්‍යාචාරය කිරීමටත්, ඉශ්‍රායලේ සෙනඟ
පළෙඹවීමට බාලාක්ට ඉගැන්වී ය. 15 එලෙසෙ ම
නිකොලයිතයන්ගේ ඉගැන්වීම් පිළිගත් අයත් ඔබ
අතර සිටිති. 16 එබැවින්, පසුතැවී සිත හරවා ගන්න.
එසේ නුවූවොත්, මම විගසින් ඔබ වෙත පැමිණ,
මාගේ මුඛයෙනේ නික්මෙනෙ කඩුවෙනේ ඔවුන්ට විරුද්ධ
ව සටන් කරන්නෙමි.
17 නික්ම 16:14-15,33-34; යෙසා 62:2; 65:15; ජොහ
6:48-50 ‘ආත්මයාණන් වහන්සේ සභාවලට වදාරන
දේ කන් ඇත්තෝ අසා වා! සැඟවී තිබෙනෙ මන්නා
ආහාරයෙනේ ජයග්‍රාහකයාට දෙන්නෙමි. තවද
ලබන්නා මිස අන් කිසිවකු නොදන්නා අලුත්
නාමයක් ලියා තිබෙනෙ සුදු ගලක් ද මම ඔහුට
දෙන්නෙමි.’

## දෑතට වැනෙනෙ සභාව

18 “තියාතිරා සභාවේ දූතයා වෙත මෙසේ ලියන්න:
18 ‘ගිනි දැල්ලක් වැනි ඇස් ද, ඔපයෙනේ දිළිසෙනෙ
ලෝකඩ වැනි පාද ද ඇති දෙවියන් වහන්සේගේ
පුත්‍රයාණෝ මෙසේ වදාරන සේක. 19 ඔබේ ක්‍රියා
ද ප්‍රේමය ද විශ්වාසවන්තකම ද සේවය ද
ඉවසිල්ල ද මම දනිමි. තවද, මෑතක දී ඔබ කළ
ක්‍රියා පෙරෙට වඩා හොඳ බව ද දනිමි. 20 1 රාජා
16:31; 2 රාජා 9:22,30එහෙත් ඔබට විරුද්ධ ව මේ
චෝදනාව මට ඇත. තමා දිවැස්වරියකැ යි
කියාගන්නා ජෙසෙබෙල් නම් ස්ත්‍රියට ඔබ අනුබල
දෙන්නහු ය. කාමමිථ්‍යාචාරය කරන්නට ද දේවතා
රූපවලට පිදූ පිදේනි කන්නට ද උගන්වමින් ඈ
මාගේ සේවකයන් මුළා කරන්නී ය. 21 පසුතැවී සිත
හරවා ගැනීමට මා ඇයට කාලය දී ඇත. එහෙත් ඈ
කාමමිථ්‍යාචාරය ගැන පසුතැවී සිත හරවා ගැනීමට
අකමැති වන්නී ය. 22 එබැවින් මම ඇය දුක් යහනක
හෙළා, ඇය සමඟ කාමමිථ්‍යාචාරය කරන්නන්
පසුතැවී සිත් හරවා නොගතහොත්, ඔවුන් ද ඇය
සමඟ දරුණු පීඩාවකට පත් කරන්නෙමි. 23 ගීතා 7:9;
62:12; ජෙරෙ 17:10තවද මම ඇගේ දරුවන්
වනසාලන්නෙමි. එවිට, මිනිසුන්ගේ සිතුම්පැතුම්
විමසන තැනැන් වහන්සේ මා බව, සියලු සභාවෝ
දැන ගන්නහු ය. තවද, මම ඔබට එකිනෙකාගේ
ක්‍රියා අනුව විපාක දෙන්නෙමි.

24 'එහෙත් මගේ ඉගැන්වීම් නොපිළිගත්, සාතන්ගේ
යයි හඳුන්වනු ලබන ගුප්ත කරුණු නොදත්,
තියාතිරාවෙහි සිටින සසෙසු අයට මම මෙසේ කියමි.
25 මා එන තුරු ඔබට ඇති දේ තුළ ස්ථිර ව
පවතින්න. වෙන බරක් ඔබ පිට මම නොතබමි.
26 ගීතා 2:8-9අග දක්වා මාගේ ක්‍රියා නොපිරිහෙළා
ඉටු කරන ජයග්‍රාහකයාට පියාණන් වහන්සේගෙන්
මා ලැබූ ලෙසෙ, ජාතීන් කෙරෙහි බලය පවරා
දෙන්නෙමි, 27 මැටි බඳුන් බිඳ සුණු විසුණු කරන්නාක්
මෙන්, ඔහු ඔවුන් යගදාවකින් පාලනය කරන්නේ ය.
28 මම ඔහුට පහන් තාරකාව ද දෙන්නෙමි.
29 'ආත්මයාණන් වහන්සේ සභාවලට වදාරන දේ
කන් ඇත්තේ අසා වා!'

## නිඳා වැටෙන සභාව

3 "සර්දිස් සභාවේ දූතයා වෙත මෙසේ ලියන්න:
3 'දෙවියන් වහන්සේගේ ආත්මයන් සත්
දෙනා හා තාරකා සත දරන තැනැන්
වහන්සේ, මෙසේ වදාරන සේක. ඔබේ ක්‍රියා මම
දනිමි. නමින් ඔබ ජීවත් ව සිටියත්, සැබැවින් ම ඔබ
මළ කෙනෙකි. 2 පිබිදෙන්න. තවමත් ඉතිරි ව ඇති
දේ මැරී යාමට පෙර පණගන්වන්න. මන්ද, මාගේ
දෙවියන් වහන්සේ ඉදිරියෙහි, සම්පූර්ණ යයි කිව
හැකි ඔබේ කිසි ක්‍රියාවක් මට නොපෙනේ. 3 මතෙ
24:43-44; ලූක් 12:39-40; එළිද 16:15එබැවින්, ඔබ
අසා පිළිගත් වචනය සිහි කර, ඊට කීකරු වී, පසුතැවී
සිත හරවා ගන්න. ඔබ අවදි ව නොසිටින්නහු නම්,
සොරෙකු මෙන් ඔබ වෙත එන්නෙමි. මා ඔබ වෙත
පැමිණෙන වේලාව ඔබ නොදන්නහු ය. 4 එහෙත්
තමන්ගේ වස්ත්‍ර අපවිත්‍ර කර නොගත් ස්වල්ප
දෙනෙක් සර්දිස්හි ඔබ අතර සිටිති. ඔව්හු සුදුසුසන්
බැවින් ධවල වස්ත්‍ර ඇඳ මා සමඟ ඇවිදින්නෝ ය.
5 නික්ම 32:32-33; ගීතා 69:28; මතෙ 10:32; ලූක්
12:8; එළිද 20:12ජයග්‍රාහකයා මෙලෙසෙ ධවල
වස්ත්‍රයෙන් සරසනු ලබන්නේ ය. මම ඔහුගේ
නාමය ජීවන පොතෙන් මකා නොහරින්නෙමි. මාගේ
පියාණන් වහන්සේ ද, උන් වහන්සේගේ දූතයන් ද
ඉදිරියෙහි මම ඔහුගේ නාමය පිළිගන්නෙමි.
6 'ආත්මයාණන් වහන්සේ සභාවලට වදාරන දේ
කන් ඇත්තේ අසා වා!'

## විවෘත දොරක් ඇති සභාව

7 ජෝබ් 12:14; යෙසා 22:22 "පිලදෙල්පියා සභාවේ
දූතයා වෙත මෙසේ ලියන්න:
7 'ශුද්ධ වූ, සත්‍ය වූ, දාවිත්ගේ යතුර ඇත්තා වූ ද,
කිසිවකු නොපියන ලෙස දොර අරින්නා වූ ද
කිසිවකු නාරින ලෙස එය පියන්නා වූ ද තැනැන්
වහන්සේ මෙසේ වදාරන සේක. 8 මම ඔබේ ක්‍රියා
දනිමි. බලන්න, කිසිවකුට වැසිය නොහැකි විවෘත
දොරක් මම ඔබ ඉදිරියෙහි තැබුවෙමි. ඔබට ඇති
ශක්තිය ස්වල්ප වූ නමුත්, ඔබ මාගේ වචනය
පිළිපැද්දහු ය. මාගේ නාමය ප්‍රතික්ෂේප නොකළහු
ය. 9 යෙසා 43:4; 49:23; 60:14බලන්න, ජුදෙව්වරුන්
නොවෙන නමුත්, තුමූ ජුදෙව්වරු යයි බොරුවට කියා
ගන්නා වූ සාතන්ගේ හවුලේ අයට පැමිණ ඔබේ පා
ඉදිරියෙහි වැඳ වැටෙන්නෙටත්, මා ඔබට ප්‍රේම කළ
බව දැනගන්නටත් සලසන්නෙමි. 10 ඉවසීමෙන්
සිටින්නැ යි මා කළ නියමය ඔබ රක්ෂා කළ බැවින්,
ලෝකවාසීන් පරීක්ෂා කිරීමට මුළු ලෝකය පිට
පැමිණෙන්නට තිබෙන පරීක්ෂාවේ පැයෙන් මමත්
ඔබ ආරක්ෂා කරන්නෙමි. 11 මම වහා ම එමි. ඔබේ
කිරුළ කිසිවකු පැහැර නොගන්න ලෙස, ඔබ සතු
දයෙ තදින් අල්ලාගන්න. 12 යෙසා 62:2; 65:15; එළිද
21:2ජයග්‍රාහකයා මාගේ දෙවියන් වහන්සේගේ
මාලිගාවෙහි කණුවක් කරන්නෙමි. ඔහු එතැනින් කිසි
කලෙක පිටත නොයන්නේ ය. මාගේ දෙවියන්
වහන්සේගේ නාමය ද, මාගේ දෙවියන් වහන්සේ
කෙරෙන් ස්වර්ගයෙන් බසින නව ජෙරුසලම වන
මාගේ දෙවියන් වහන්සේගේ නගරයේ නාමය ද,
මාගේ ම අලුත් නාමය ද ඔහු පිට කැටයම්
කරන්නෙමි.
13 'ආත්මයාණන් වහන්සේ සභාවලට වදාරන දේ
කන් ඇත්තේ අසා වා!'

## ඇල්මැරුණු සභාව

14 හිතෝ 8:22 "ලවෝදීසයේ සභාවේ දූතයා වෙත
මෙසේ ලියන්න:
14 'විශ්වාසවන්ත, සත්‍ය සාක්ෂිකාරයාණන් වන
දෙවියන් වහන්සේගේ මැවිල්ලේ කර්තෘ වූ ආමෙන්
නම් තැනැන් වහන්සේ මෙසේ වදාරන සේක.
15 මම ඔබේ ක්‍රියා දනිමි. ඔබ ශීතල ගතියෙන් වත්
උණුසුම් ගතියෙන් වත් නොසිටින බව මම දනිමි.
ඔබ ශීතල ව හෝ උණුසුම් ව හෝ සිටියා නම් මම
කැමැත්තෙමි. 16 ඔබ උණුසුම් ව හෝ ශීතල ව හෝ
නොසිට, ඇල්මැරී සිටින බැවින් මම මාගේ මුඛයෙන්
ඔබ වමාරන්නෙමි. 17 'මම ධනවත් ය, මට මහත්
සම්පත් ඇත. මට කිසි හිඟයක් නැතැ'යි ඔබ
කියන්නහු ය. එහෙත්, ඔබ කාලකණ්ණියෙකි,
දුඃඛිතයෙකි, දිළින්දෙකි, අන්ධයෙකි, නග්නය, මේ
කිසිවක් ඔබ නොදන්නහු ය. 18 එහයින් ඔබ
ධනවත් වන පිණිස ගින්නෙන් පවිත්‍ර කළ රන් ද,
නග්න භාවයේ විළිලජ්ජාව එළි නොවන පිණිස
ඇඳගන්නට ධවල වස්ත්‍ර ද, ඇස් පෙනෙනෙ පිණිස
ආලේප කිරීමට අඳුන් ද, මාගෙන් මිලට ගන්නා ලෙස
මම අවවාද කරමි. 19 හිතෝ 3:12; හෙබ්‍රෙ 12:6මා
ප්‍රේම කරන සියල්ලන්ට තරවටු කර මම ඔවුන්
හික්මවමි. එබැවින් උද්‍යෝගිමත් ව, පසුතැවී සිත්
හරවා ගන්න. 20 මෙන්න, මම දොර ළඟ සිට තට්ටු
කරමි. යමෙක් මාගේ හඬ අසා දොර අරින්නේ නම්
මම ඇතුළු වී, ඔහු සමඟ කෑම කන්නෙමි. ඔහු ද මා
සමඟ කෑම කන්නේ ය. 21 මා ජයගෙන, පියාණන්
වහන්සේ සමඟ, උන් වහන්සේගේ සිංහාසනයෙහි
හිඳගත්තාක් මෙන්, ජයග්‍රාහකයාට ද මාගේ
සිංහාසනයෙහි මා සමඟ හිඳගැන්මට දෙන්නෙමි.
22 'ආත්මයාණන් වහන්සේ සභාවලට වදාරන දේ
කන් ඇත්තේ අසා වා!' "

## ස්වර්ගයේ දේව නමස්කාරය

4 ඉන්පසු මෙන්න, අහසේ දොරක් ඇරී තිබෙනු
මම දිටිමි. හොරණෑ හඬක් මෙන් කලින් මට
කතා කළ එම හඬ, “මෙහි නැඟී එන්න. මින්පසු සිදු
වන්නට යන දේ මම ඔබට පෙන්වන්නෙමි”යි කී ය.
2 එසකි 1:26-28; 10:1එකෙණෙහි ම මම
ආත්මයාණන් වහන්සේගේ බලයට යටත් වී
සිටියෙමි. ස්වර්ගයෙහි සිංහාසනයක් තිබිණි. ඒ
සිංහාසනයෙහි කෙනෙක් වැඩ උන්හ. 3 එහි වැඩහුන්
තැනැන් වහන්සේ පෙනුමෙන් සූර්යකාන්තයට හා
පුෂ්පරාගයට සමාන වූ සේක. සිංහාසනය වටා
මරකත මෙන් දිළෙන දේදුන්නක් විය. 4 මේ
සිංහාසනය වටේ තව සිංහාසන විසිසතරක් විය. ඒ
සිංහාසනවල කුලදෙටුවන් විසිසතරදෙනෙකු ධවල
වස්ත්‍ර හැඳ, සිය හිස් මත රන් ඔටුනු දරාගෙන වාඩි
වී සිටිනු මම දිටිමි. 5 නික්ම 19:16; එසකි 1:13;
සකෙරි 4:2; එළිද 1:4; 8:5; 11:19;
16:18සිංහාසනයෙන් විදුලිය ද ශබ්ද ද අහස් ගිගුරුම්
ද නික්මිණි. සිංහාසනය ඉදිරියෙහි ගිනි පහන් සතක්
දැල්වෙමින් තිබිණි. ඒ සත නම් දෙවියන්
වහන්සේගේ ආත්මයෝ සත් දෙනා ය. 6 එසකි
1:22එසකි 1:5-10; 10:14සිංහාසනය ඉදිරියෙහි පළිඟු
හා සමාන වීදුරු සමුද්‍රයක් වැනි දර්ශනයක් විය.
6 ඒ සිංහාසනය මැද හා අවටින්, ඉදිරියෙන් හා
පිටුපසින්, ඇස් රාශියක් ඇති ජීවමාන සත්ත්වයෝ
සතර දෙනෙක් වූ හ. 7 පළමු වන සත්ත්වයා
සිංහයකුට සමාන ය. දෙ වන සත්ත්වයා වස්සකුට
සමාන ය. තුන් වන සත්ත්වයාට මනුෂ්‍යයකුගේ
මෙන් මුහුණක් තිබිණි. සතර වන සත්ත්වයා පියාසර
කරන රාජාලියකුට සමාන ය. 8 යෙසා 6:2-3; එසකි
1:18; 10:12ඒ සත්ත්වයන් සතර දෙනාගෙන්
එකිනෙකාට පියාපත් හය බැගින් තිබිණි. ඔවුන්
වටකර ද ඇතුළත ද ඇස්වලින් පිරී තිබුණේ ය.
ඔව්හු, “වැඩ සිටි, වැඩ සිටින, මතු වඩින
සර්වපරාක්‍රම ස්වාමීන් වන දෙවියන් වහන්සේ,
සුවිශුද්ධ ය, සුවිශුද්ධ ය, සුවිශුද්ධ ය”යි දිවා රෑ
දෙකෙහි නොනැවතී ගයන්නාහ. 9 ඒ ජීවමාන
සත්ත්වයන් සිංහාසනයෙහි වැඩ හිඳින, සදහට ම
ජීවත් වන තැනැන් වහන්සේට ප්‍රශංසාව ද
ගෞරවය ද ස්තුතිය ද දෙන හැම විට ම,
10 කුලදෙටුවෝ විසිහතර දෙනා ද, සිංහාසනයෙහි
වැඩ සිටින තැනැන් වහන්සේ ඉදිරියෙහි වැඳ වැටී,
සදහට ම ජීවත් වන තැනැන් වහන්සේට නමස්කාර
කරති. එසේ කරමින් ඔව්හු සිය ඔටුනු සිංහාසනය
ඉදිරියෙහි හෙළා:
11 “අපගේ සමිඳාණන් වහන්ස, අපගේ දෙවියන්
වහන්ස, ඔබ ප්‍රශංසාව ද ගෞරවය ද බලය ද,
ලබන්නට වටින තැනැන් වහන්සේ ය.
q2 11 මන්ද, ඔබ සියලු දේ මවා වදාළ සේක.
q2 11 ඔබගේ කැමැත්ත නිසා, සියලු දේ ඇති විය.
q2 11 සියලු දේ මවන ලද්දේ ය”යි
11 කියන්නාහ.

## ජීවන පොත සහ බැටළු පෝතකයාණෝ

5 යෙසා 29:11; එසකි 2:9-10 එවිට ඇතුළත හා
පිටත ලියන ලද, මුද්‍රා සතකින් මුද්‍රා තැබූ
පොතක් සිංහාසනයෙහි වැඩහුන් තැනැන්
වහන්සේගේ දකුණතෙහි තිබෙනු දිටිමි. 2 “ඒ පොත
දිග අරින්නටත්, මුද්‍රා කඩන්නටත් සුදුස්සා කවරෙක්
දැ”යි කියමින් මහ හඬින් හඬගසන බලවත් දේව
දූතයෙකු දිටිමි. 3 එහෙත් ඒ පොත දිග හරින්නට
වත්, එය බලන්නට වත් හැකි කිසිවෙක් ස්වර්ගයෙහි
වත්, මිහි පිට වත්, පොළොවෙන් යට වත්
නොසිටියේ ය. 4 පොත දිග අරින්නට වත්, එය
බලන්නට වත්, සුදුසු කිසිවෙකු හමු නො වූ බැවින්
මම බොහෝසේ හැඬුවෙමි. 5 උත් 49:9; යෙසා
11:1,10එවිට එක් කුලදෙටුවෙක් මට කතා කර,
“නාඬන්න, පොත ඇරීමේ සහ එහි මුද්‍රා සත
කැඞීමේ වරම දාවිත්ගේ පෙළෙපතින් පැවත එන ජුදා
ගෝත්‍රයේ සිංහයාණෝ දිනාගත්හ”යි මට කී ය.
6 යෙසා 53:7; සකෙරි 4:10 එවිට සිංහාසනය ද
ජීවමාන සත්ත්වයන් සතර දෙනා ද කුලදෙටුවන් ද
මධ්‍යයෙහි මරනු ලැබුවාක් මෙන් පෙනුණු බැටළු
පෝතකයෙකු සිටිනු මම දිටිමි. ඒ බැටළු
පෝතකයාට අං සතක් ද ඇස් සතක් ද විය. ඇස්
සත නම්, ලොව පුරා යවනු ලැබූ දෙවියන්
වහන්සේගේ ආත්මයෝ සත් දෙනා ය. 7 බැටළු
පෝතකයාණෝ අවුත් සිංහාසනයෙහි වැඩහුන්
තැනැන් වහන්සේගේ දකුණතින් පොත ගත්හ.
8 ගීතා 141:2එසේ පොත ගත් කල ජීවමාන
සත්ත්වයෝ සතර දෙනා හා කුලදෙටුවෝ විසිසතර
දෙනා, එකිනෙකා වීණාවක් ද, සුවඳ ද්‍රව්‍යයෙන්
පිරුණු රන් පාත්‍ර ද රැගෙන බැටළු පෝතකයාණන්
ඉදිරියෙහි වැඳ වැටුණෝ ය. ඒ සුවඳ ද්‍රව්‍ය නම්
සැදැහැවතුන්ගේ යාච්ඤා ය.
9 ගීතා 33:3; 98:1; යෙසා 42:10 ඔව්හු මේ අලුත්
ගීතය ගායනා කළහ:
q2 9 “පොත ගන්නටත් එහි මුද්‍රා කඩන්නටත් සුදුසු
තැනැන් වහන්සේ ඔබ ය.
q2 9 මන්ද, ඔබ මරනු ලැබ, ඒ මරණයෙනමැති
මිලයෙන් සියලු ගෝත්‍රවලින් ද භාෂාවලින් ද
ජනයාගෙන් ද ජාතීන්ගෙන් ද මිනිසුන්, දෙවියන්
වහන්සේ උදෙසා ලබාගත් සේක.
10 නික්ම 19:6; එළිද 1:6 අපගේ දෙවියන්
වහන්සේට සේවය කරන පිණිස ඔබ ඔවුන් රාජකීය
පූජක වංශයක් කළ සේක;
q2 10 ඔව්හු මිහි පිට රජකම් කරන්නාහ,”
11 දානි 7:10 එවිට මා බැලූ කල, සිංහාසනය ද
ජීවමාන සත්ත්වයන් ද කුලදෙටුවන් ද සිසාරා සිටි
මහා දේව දූත පිරිසක් දිටිමි. ඔවුන්ගේ හඬ ද මට
ඇසුණේ ය. ඔවුන්ගේ ගණන දස දහසක් වර දස
දහසක් ද දහස් වර දහසක් ද විය. 12 ඔව්හු මහ
හඬින් මෙසේ කී හ:

q2 12 "මරනු ලැබූ බැටළු පෝතකයාණෝ බලය ද
ධනය ද ප්‍රඥාව ද පරාක්‍රමය ද ගෞරවය ද
මහිමය ද ප්‍රශංසාව ද ලබන්නට සුදුසු තැනැන්
වහන්සේ ය."
13 තවද, ස්වර්ගයෙහි ද පොළොවෙහි ද පොළොව
යට ද මුහුදෙහි ද යන මුළු ලෝකයෙහි ඇති සියලු
සත්ත්වයන්:
q2 13 "සිංහාසනයෙහි වැඩ සිටින තැනැන්
වහන්සේටත්, බැටළු පෝතකයාණන්ටත් ප්‍රශංසාව
ද ගෞරවය ද මහිමය ද පරාක්‍රමය ද සදහට ම
වේ වා!"යි
13 කියනු ඇසීමි. 14 ජීවමාන සත්ත්වයෝ සතර දෙනො
ද "ආමෙන්" යයි කී හ. කුලදෙටුවෝ වැඳ වැටී
නමස්කාර කළහ.

## මුද්‍රා කැඩීම

6 එවිට බැටළු පෝතකයාණන් මුද්‍රා සතින්
පළමුවැන්න කඩනවා මම දිටිමි. එකල ජීවමාන
සත්ත්වයන් සතර දෙනොගෙනේ එකකු ගිගුරුම්
හඬකින් මෙන් කතා කොට, "එන්නැ"යි කියනු ඇසීමි.
2 සකෙරි 1:8; 6:3,6එකණෙහි ම මම සුදු අශ්වයකු
දිටිමි. අසු පිට හුන් තැනැත්තා අතේ දුන්නක්
තිබුණේ ය. කිරුළක් ඔහුට දෙනෙ ලදි. ඔහු
ජයග්‍රාහකයකුගේ විලාශයෙන් ජයෙන් ජයට පත්
වන පිණිස නික්ම ගියේ ය.
3 බැටළු පෝතකයාණන් දෙ වන මුද්‍රාව කැඩූ කල,
දෙ වන ජීවමාන සත්ත්වයා කතා කොට, "එන්නැ"යි
කියනු ඇසීමි. 4 සකෙරි 1:8; 6:2එවිට රතු ම රතු,
තවත් අශ්වයෙක් නික්ම ආවේ ය. ඒ අසු පිට හුන්
තැනැත්තාට මනුෂ්‍යයන් ඔවුනොවුන් මරා ගන්නා
පිණිස, පොළොවෙන් සාමදානය දුරු කරන්නට බලය
දෙනෙ ලද්දේ ය. ඔහුට මහා කඩුවක් ද දෙනෙ ලදී.
5 සකෙරි 6:2,6 බැටළු පෝතකයාණන් තුන් වන
මුද්‍රාව කැඩූ කල, තුන් වන ජීවමාන සත්ත්වයා,
"එන්නැ"යි කියනු මම ඇසීමි. එකණෙහි ම කළු
අශ්වයෙක් එහි විය. ඒ අසු පිට හුන් තැනැත්තා
අතේ, තරාදියක් තිබුණේ ය. 6 එවිට ජීවමාන
සත්ත්වයන් සතර දෙනො මධ්‍යයෙන් නික්මුණු හඬක්
වැනි ශබ්දයක් මට ඇසුණේ ය. එය: "තිරිඟු ලීටර්
එකක් දවසේ වේතනයකි; යව ලීටර් තුනක් දවසේ
වේතනයකි; එහෙත් තලේවලටත් මුද්‍රික පානයටත්
අනතුරු නොකරන්නැ"යි කී ය.
7 බැටළු පෝතකයාණන් සතර වන මුද්‍රාව කැඩූ
කල, සතර වන ජීවමාන සත්ත්වයා, "එන්නැ"යි
කියනු මම ඇසීමි. 8 එසකි 14:21එකණෙහි ම මම
සුදුමැලි අශ්වයකු දිටිමි. ඒ අසු පිට හුන්
තැනැත්තාගේ නාමය මාරයා යනු ය. පාතාල
ලෝකය ද ඔහු පසුපස්සේ ගියේ ය. කඩුවෙන් ද
සාගතයෙන් ද වසංගතයෙන් ද පොළොවේ වන
මෘගයන් ලවා ද මරණය පැමිණවීමට පොළොවෙන්
සතරෙන් කොටසක් කෙරෙහි බලය ඔවුන්ට දෙනෙ
ලද්දේ ය.
9 බැටළු පෝතකයාණන් පස් වන මුද්‍රාව කැඩූ කල
දෙවියන් වහන්සේගේ වචනය නිසා ද තමන් දැරූ
සාක්ෂිය නිසා ද මරනු ලැබූවන්ගේ ආත්මයන්
පූජාසනය යට දිටිමි. 10 ඔව්හු කතා කරමින්,
"ස්වාමීනි, ශුද්ධ වූ සත්‍ය වූ තැනැන් වහන්ස, ඔබ
පොළොවෙහි වාසය කරන්නන් විනිශ්චය නොකොට,
අපේ ලේ ගැන ඔවුන්ගෙන් පළි නොගෙනෙ
කොපමණ කල් ප්‍රමාද වන සේක් දැ"යි මහ හඬින්
මොරගසා කී හ. 11 එවිට ඔවුන් එකිනකොට සුදු
සළුවක් දෙනෙ ලද්දේ ය. ඔවුන් මෙන් ම මරනු
ලැබීමට සිටි ඔවුන්ගේ හවුල් මෙහෙකරුවන්ගේ ද
සහෝදරයන්ගේ ද ගණන සම්පූර්ණ වන තුරු තව
ටික කලක් නවතින්නැ යි ඔවුන්ට කියන ලද්දේ ය.
12 යෙසා 13:10; ජෝවෙ 2:10,31; 3:15; මතෙ 24:29;
මාක් 13:24-25; ලූක් 21:25; එළිද 11:13; 16:18 බැටළු
පෝතකයාණන් ස වන මුද්‍රාව කඩනවා මම බලා
සිටියෙමි. එවිට මහත් භූමිකම්පාවක් ඇති විය.
සූර්යයා කළු පැහැති ගෝණියක් මෙන් විය. හඳ
මුළුමනින් ම ලේ මෙන් රතු විය. 13 යෙසා
34:4අත්තික්කා ගසක් සැඩ සුළඟින් සෙලවී එහි
අකල් පල වැටෙන්නාක් මෙන් අහසේ තාරකා
පොළොව පිට වැටිණි. 14 එළිද 16:20අකුළන ලද
පොතක් මෙන් අහස නොපෙනී ගියේ ය. සියලු කඳු
ද දිවයින් ද ඒවා පිහිටි තැන්වලින් පහ කරන ලද්දේ
ය. 15 යෙසා 2:19,21පොළොවේ රජවරු ද
උත්තමයෝ ද සේනාධිපතියෝ ද ධනපතියෝ ද
බලවන්තයෝ ද දාසයෝ ද නිර්දාසයෝ ද යන මේ
සියලු දෙනො ගුහාවලත්, කඳු සහ පර්වත අතරේත්
සැඟවුණෝ ය. 16 හොසි 10:8; ලූක් 23:30ඔව්හු
කඳුවලටත් පර්වතවලටත් කතා කොට, "අප පිට
වැටී සිංහාසනයෙහි වැඩ සිටින තැනැන්
වහන්සේගේ මුහුණ ඉදිරියෙනුත් බැටළු
පෝතකයාණන්ගේ උදහසිනුත් අප සඟවා ගන්න.
17 ජෝවෙ 2:11; මලාකි 3:2මන්ද, ඔවුන් පිට
උදහසේ මහා දවස පැමිණ තිබෙනෙ බැවින්, ඊට
මුහුණ දියහැක්කේ කාට දැ"යි කී හ.

## මුළු ඉශ්රායලේ සංඛ්‍යාව

7 ජෙරෙ 49:36; දානි 7:2; සකෙරි 6:5 ඉන්පසු
දේව දූතයන් සතර දෙනෙකු පොළොවේ සතර
කොණේ සිටිනු දිටිමි. ඔව්හු ගොඩට වත් මුහුදට
වත් කිසි ම ගසකට වත් සුළං නොවදින පිණිස
පොළොවේ සතර දිග සුළඟ අල්ලාගෙන සිටියහ.
2 එවිට තවත් දේව දූතයකු ජීවමාන දෙවියන්
වහන්සේගේ මුද්‍රාව රැගෙන පෙරෙදිගින් නැඟී එනු
දිටිමි. ඔහු ගොඩටත් මුහුදටත් අනතුරු කරන්නට
බලය ලත් දේව දූතයන් සතර දෙනොට මහ හඬකින්
මොරගසා, 3 එසකි 9:4,6"අපේ දෙවියන්
වහන්සේගේ සේවකයන්ගේ නළල් මත මුද්‍රා
සලකුණ තබන තුරු, ගොඩට වත්, මුහුදට වත්,
ගස්වලට වත් අනතුරක් නොකරන්නැ"යි කී ය.
4 තවද, මුද්‍රා සලකුණ ලත් අයගේ ගණන මට
ඇසුණේ ය. සියලු ඉශ්රායලේ ගෝත්‍රවලින් මුද්‍රා

සලකුණු ලත් අය එක් ලක්ෂ සතළිස් සාර දහසක් වූ
හ. 5 ජුදාගේ ගෝත්‍රයෙන් දොළොස් දහසක් මුද්‍රා
කරනු ලැබූ හ. රූබන්ගේ ගෝත්‍රයෙන් දොළොස්
දහසක් ද ගාද්ගේ ගෝත්‍රයෙන් දොළොස් දහසක් ද
6 ආෂේර්ගේ ගෝත්‍රයෙන් දොළොස් දහසක් ද
නප්තලීගේ ගෝත්‍රයෙන් දොළොස් දහසක් ද
මනස්සේගේ ගෝත්‍රයෙන් දොළොස් දහසක් ද
7 සිමියොන්ගේ ගෝත්‍රයෙන් දොළොස් දහසක් ද
ලෙවීගේ ගෝත්‍රයෙන් දොළොස් දහසක් ද
ඉස්සාකර්ගේ ගෝත්‍රයෙන් දොළොස් දහසක් ද
8 සාබුලොන්ගේ ගෝත්‍රයෙන් දොළොස් දහසක් ද
ජෝසෙප්ගේ ගෝත්‍රයෙන් දොළොස් දහසක් ද
බෙන්ජමින්ගේ ගෝත්‍රයෙන් දොළොස් දහසක් ද
මුද්‍රා කරනු ලැබූ හ.

## ජගත් මහා පිරිස

9 ඉන්පසු සියලු ජාතීන්ගෙන් ද ගෝත්‍රවලින් ද ජන
සමූහයාගෙන් ද භාෂාවන්ගෙන් ද කිසිවකුට ගණන්
නොකළ හැකි තරම් ඉමහත් පිරිසක්, සුදු සළු පැළඳ,
තල පත්‍ර අතින් ගෙන, සිංහාසනය හා බැටළු
පෝතකයාණන් ඉදිරියෙහි සිටිනු මම දිටිමි. 10 ඔව්හු
මහ හඬින් මොරගසා “සිංහාසනයෙහි වැඩ හිඳින
අපගේ දෙවියන් වහන්සේගෙන් ද බැටළු
පෝතකයාණන්ගෙන් ද ගැළවීම පැමිණේ ය”යි කී හ.
11 සියලු දේව දූතයෝ සිංහාසනය ද කුලදෙටුවන් ද
ජීවමාන සත්ත්වයන් සතර දෙනා ද සිසාරා,
සිංහාසනය ඉදිරියෙහි වැඳ වැටී, දෙවියන් වහන්සේට
නමස්කාර කරමින්, 12 “ආමෙන්! ප්‍රශංසාව ද
මහිමය ද ප්‍රඥාව ද ස්තුතිය ද ගෞරවය ද බලය ද
පරාක්‍රමය ද අපගේ දෙවියන් වහන්සේට සදහට ම
වේ වා! ආමෙන් ය”යි කී හ.
13 එවිට කුලදෙටුවන්ගෙන් එක් තැනැත්තෙක් මට
කතා කොට, “සුදු සළු පැළඳගත් මොවුහු කවුරු ද?
කොතැනින් ආවෝ දැ”යි මාගෙන් ඇසී ය. 14 දානි
12:1; මතෙ 24:21; මාක් 13:19“මාගේ ස්වාමීනි, ඔබ
එය දන්නහි ය”යි මම ඔහුට කීමි. එවිට ඔහු මා
අමතා, “මොවුහු මහත් පීඩා මැදින් එන්නාහ. ඔව්හු
තම සළු බැටළු පෝතකයාණන්ගේ ලෙයින් සෝදා
සුදු කරගත්තෝ ය. 15 ඔවුන් දිවා රෑ දෙකෙහි
දෙවියන් වහන්සේගේ මාලිගාවෙහි සේවය කරමින්
උන් වහන්සේගේ සිංහාසනය ඉදිරියේ සිටින්නේ ඒ
හෙයිනි. සිංහාසනයේ වැඩ හිඳින තැනැත් වහන්සේ
ඔවුන් සමඟ වැඩ වසන සේක. 16 යෙසා
49:10ඔවුන්ට මින්පසු සාගින්නක් වත් පිපාසයක් වත්
නැත. සූර්ය තාපය වත් දවනෙ ග්‍රීෂ්මය වත් ඔවුන්
පළෙන්නේ නැත. 17 ගීතා 23:1,2; යෙසා 25:8; 49:10;
එසකි 34:23මන්ද, සිංහාසනය මැද සිටින බැටළු
පෝතකයාණෝ ඔවුන්ගේ එඬේරාණන් වී, ජීවන දිය
උල්පත්වලට ඔවුන් ගෙනයන සේක. දෙවියන්
වහන්සේ ද ඔවුන්ගේ ඇස්වලින් සියලු කඳුළු පිස
දමන සේකැ”යි කී ය.

## සත් වන මුද්‍රාව සහ ධූම පාත්‍රය

8 බැටළු පෝතකයාණන් සත් වන මුද්‍රාව කැඩූ
කල ස්වර්ගයෙහි අඩපැයක් පමණ
නිශ්ශබ්දතාවක් ඇති විය. 2 එවිට මම දෙවියන්
වහන්සේ ඉදිරියෙහි සිටින දේව දූතයන් සත් දෙනා
දිටිමි. ඔවුන්ට හොරණෑ සතක් දෙන ලද්දේ ය.
3 නික්ම 30:1,3; ආමො 9:1 තවත් දේව දූතයෙක්
රන් ධූම පාත්‍රයක් රැගෙන පූජාසනය ළඟ සිටියේ
ය. සිංහාසනය ඉදිරියෙහි තිබුණු රන් පූජාසනය පිට
සියලු සැදැහැවතුන්ගේ යාච්ඤා සමඟ ඔප්පු කරන
පිණිස බොහෝ සුගන්ධ ද්‍රව්‍ය ඔහුට දෙන ලද්දේ
ය. 4 සුගන්ධ ද්‍රව්‍යයන්හි දුම සැදැහැවතුන්ගේ
යාච්ඤා සමඟ දේව දූතයාගේ අතින් දෙවියන්
වහන්සේ වෙත නැඟුණි. 5 නික්ම 19:16; ලෙවී
16:12; එසකි 10:2; එළිද 11:19; 16:18දේව දූතයා ද
ධූම පාත්‍රය රැගෙන පූජාසනයේ ගින්නෙන් එය
පුරවා පොළොවට හෙළී ය. එවිට අහස් ගිගුරුම් ද
ශබ්ද ද විදුලි කෙටීම් ද භූමිකම්පාවක් ද විය.

## හොරණෑ පිඹීම

6 හොරණෑ හත අතින් ගත් දේව දූතයෝ සත්
දෙනා ඒවා පිඹින පිණිස සූදානම් වූ හ.
7 නික්ම 9:23-25; එසකි 38:22 පළමු වන දේව
දූතයා හොරණෑව පිම්බේ ය. එවිට ලේ මුසු ගල්
වර්ෂාවක් ද ගිනි ද හටගෙන පොළොව පිට හෙළෙනු
ලැබී ය. පොළොවෙන් තුනෙන් කොටසක් දැවී ගියේ
ය. ගස්වලින් තුනෙන් කොටසක් ද දැවී ගියේ ය. අමු
තණකොළ සියල්ල ද දැවී ගියේ ය.
8 දෙවෙන්නා ද හොරණෑව පිම්බේ ය. එවිට
ගින්නෙන් ඇවිලෙන මහා කන්දක් වැනි දෙයක්
මුහුදේ හෙළෙනු ලැබී ය. මුහුදින් තුනෙන් කොටසක්
ලේ විය. 9 පණ ඇති මුහුදු සත්ත්වයන්ගෙන් තුනෙන්
කොටසක් මළෝ ය. නැව්වලින් ද තුනෙන් කොටසක්
විනාශ විය.
10 යෙසා 14:12 තුන්වැන්නා ද හොරණෑව පිම්බේ
ය. එවිට මහා තාරකාවක් ගිනි පන්දමක් මෙන්
ඇවිලෙමින් අහසින් වැටිණි. එය ගංගාවලින් තුනෙන්
කොටසක් පිට ද දිය උල්පත් පිට ද වැටිණි. 11 ජෙරෙ
9:15තාරකාවේ නාමය ‘තික්ත’ යනුයි. වතුරෙන්
තුනෙන් කොටසක් තික්ත විය. එය තික්ත වී තිබුණු
බැවින් බොහෝ මනුෂ්‍යයෝ ඒ වතුර බී මළෝ ය.
12 යෙසා 13:10; එසකි 32:7; ජෝවෙ 2:10,31; 3:15
සතර වන දූතයා ද හොරණෑව පිම්බේ ය. එවිට
හිරුගෙන් තුනෙන් කොටසක් ද සඳුගෙන් තුනෙන්
කොටසක් ද තාරකාවලින් තුනෙන් කොටසක් ද
පහර ලැබී ය. මෙසේ ඒවායින් තුනෙන් කොටසක්
අඳුරු විය. දවාලෙන් තුනෙන් කොටසක ද එසේ ම
රාත්‍රියෙහි තුනෙන් කොටසක ද ආලෝකය පහ
විය.
13 තවද එක් රාජාලියෙකු මැද අහසේ පියාසර
කරමින්, “මින්පසු දේව දූතයන් තුන් දෙනා පිඹින්නට
යන අන්තිම හොරණෑවල ශබ්දය පැතිර යන විට

පොළොවෙහි වාසය කරන්නන් හට දුක් වේ, දුක්
වේ, දුක් වේ ය”යි මහ හඬින් කියනු මට ඇසිණි.
9 පස් වන දේව දූතයා ද හොරණෑව පිම්බේ ය.
එවිට අහසින් තාරකාවක් පොළොවට වැටී
තිබෙනු මම දිටිමි. එයට පාතාල වළේ යතුර දෙන
ලදී. 2 උත් 19:28එය පාතාල වළ විවෘත කළේ ය.
එවිට එයින් මහත් උදුනකින් මෙන් දුමක් නැඟී, ඉරත්
ආකාශයත් වළේ දුමෙන් අඳුරු විය. 3 නික්ම
10:12-15ඒ දුමෙන් පළඟැටියෝ පොළොව පිටට
නික්ම ආහ. පොළොවේ ගෝනුස්සන්ට මෙන්
බලයක් ඔවුන්ට දෙන ලදී. 4 එසකි 9:4දෙවියන්
වහන්සේගේ මුද්‍රා සලකුණ තමන්ගේ නළල්වල
නැති මනුෂ්‍යයන්ට මිස, පොළොවේ තණ
කොළවලට වත්, පැළෑටිවලට වත්, කිසි ගසකට වත්
අනතුරු නොකරන ලෙස උන්ට කියන ලද්දේ ය.
5 උන්ට අවසර තිබුණේ මිනිසුන් මරන්නට නොව
ඔවුන්ට පස් මසක් පීඩා කරන්නට ය. ඔවුන්ගේ
වේදනාව මනුෂ්‍යයකුට ගෝනුස්සකු ඇන්න විට
හටගන්න වේදනාව මෙන් විය. 6 ජෝබ් 3:21; ජෙරෙ
8:3ඒ දවස්වල දී මනුෂ්‍යයන් මරණය සොයන නමුත්,
කිසිසේත් එය හමු නොවන්නේ ය. ඔවුන් මරණය
පතන නමුත්, මරණය ඔවුන් කෙරෙන් පලා යන්නේ
ය.
7 ජෝවෙ 2:4 පළඟැටියන්ගේ ආකාරය, යුද්ධයට
සැරසී සිටින අශ්වයන්ට සමාන ය. උන්ගේ හිස් පිට
රන් ඔටුනු වැනි යමක් තිබිණි. උන්ගේ මුහුණු
මනුෂ්‍යයන්ගේ මුහුණු හා සමාන ය. 8 ජෝවෙ
1:6උන්ගේ හිසකේ ස්ත්‍රීන්ගේ හිසකේ මෙන් ද
උන්ගේ දත් සිංහයන්ගේ දත් මෙන් ද විය. 9 ජෝවෙ
2:5උන්ගේ ළය වැසුම් යකඩ ළය වැසුම් මෙන් විය.
උන්ගේ පියාපත්වල ශබ්දය යුද්ධයට කඩා පනින
බොහෝ අශ්වරථවල ශබ්දයට සමාන ය.
10 ගෝනුස්සන්ගේ මෙන් වලිග සහ දළ ඔවුන්ට
ඇත. මනුෂ්‍යයන්ට පස් මසක් පීඩා කිරීමේ බලය
උන්ගේ වලිගවල පිහිටා තිබිණි. 11 පාතාලයේ
දූතයා උන්ගේ රජ විය. ඔහුගේ නම හෙබ්‍රෙව්
බසින් අබද්දෝන් ය. ග්‍රීක බසින් අපොල්ලියොන් ය.
(එහි අර්ථය ‘විනාශකයා’ යනුයි)
12 පළමු වන විපත්තිය පහ විය. ඉන්පසු තව
විපත්ති දෙකෙක් පැමිණේ.
13 නික්ම 30:1-3 සය වන දේව දූතයා ද
හොරණෑව පිම්බේ ය. එවිට, “එප්‍රාත් නම් මහා
ගංගාව අසබඩ බඳින ලද දූතයන් සතර දෙනා
මුදන්නැ”යි, 14 හොරණෑව ගෙන සිටි සය වන දේව
දූතයාට කියන හඬක් දෙවියන් වහන්සේ ඉදිරියෙහි
වූ රන් පූජාසනයේ සතර කොණින් මට ඇසුණේ ය.
15 එවිට මනුෂ්‍යයන්ගෙන් තුනෙන් කොටසක් මරන
පිණිස දූතයෝ සතර දෙනා මුදනු ලැබුවෝ ය. ඒ
සඳහා මේ අවුරුද්දේ, මේ මාසයේ, මේ දවසේ,
මේ පැයේ ක්‍රියා කරන පිණිස ඔව්හු සූදානම් කරනු
ලැබ සිටියහ. 16 අසරු සේනාවන්ගේ ගණන විසි
කෝටියකැ යි ඔවුන්ගේ සංඛ්‍යාව කියනු ඇසීමි.
17 මෙසේ අශ්වයන් ද උන් පිට හුන් අය ද මම
දර්ශනයෙන් දිටිමි. ඔව්හු ගිනි ද නිල් කැට ද
ගෙන්දගම් ද පැහැති ළය වැසුම් පැළඳ සිටියහ.
අශ්වයන්ගේ හිස් සිංහයන්ගේ හිස් වැනි ය. උන්ගේ
කටින් ගිනි ද දුම් ද ගෙන්දගම් ද නික්මිණි.
18 උන්ගේ කටින් නික්මුණු ගිනි ද දුම් ද ගෙන්දගම්
ද යන මේ පීඩා තුනෙන් මනුෂ්‍යයන්ගෙන් තුනෙන්
කොටසක් මරනු ලැබූ හ. 19 මන්ද, ඒ අශ්වයන්ගේ
බලය පිහිටියේ උන්ගේ කටවලත්, වලිගවලත් ය.
උන්ගේ වලිග සර්පයනට සමාන ය; හිස් සහිත වූ ඒ
වලිගවලින් ඔව්හු අනතුරු කරති.
20 ගීතා 115:4-7; 135:15-17; දානි 5:23 මේ
පීඩාවලින් නොමැරී ඉතිරි වූ මනුෂ්‍යයෝ තමන්ගේ
අත්වලින් කළ නිර්මාණ අත් නොහළහ; දකින්නටත්,
අසන්නටත්, ඇවිදින්නටත් නොහැකි, රන්, රිදී,
ලෝකඩ, ගල්, ලී ආදියෙන් කළ රූපවලටත්,
දුෂ්ටාත්මයන්ටත් නමස්කාර කිරීමෙන් වැළකී
නොසිටියහ. 21 ඔවුන්ගේ මිනී මැරීම ද අනවින ද
සල්ලාලකම් ද සොරකම් ද ගැන ඔව්හු පසුතැවී සිත්
හරවා නොගත් හ.

### දේව දූතයා හා කුඩා පොත

10 ඉන්පසු තවත් බලවත් දේව දූතයකු
වලාකුළක් පැළඳ, හිස මත දේදුන්නක් දරා
ස්වර්ගයෙන් බසිනු දිටිමි. ඔහුගේ මුහුණ සූර්යයා
මෙන් ද ඔහුගේ කකුල් ගිනි කණු මෙන් ද විය.
2 ඔහුගේ අතේ දිග හළ කුඩා පොතක් විය. ඔහු
සිය දකුණු පය මුහුද පිට ද වම් පය ගොඩබිම පිට
ද තබා, 3 සිංහයකු ගොරවන්නාක් මෙන් මහ
හඬින් මොරගැසී ය. ඔහු මොරගැසූ කල ගිගුරුම්
සත ද කතා කළේ ය. 4 ඒ ගිගුරුම් සත කතා කළ
විට මම ලියන්නට සැරසුණෙමි. එවිට, “ගිගුරුම් සත
කී දේ රහසේ තබාගන්න; එය නොලියන්නැ”යි
ස්වර්ගයෙන් කියන හඬක් මට ඇසිණි. 5 නික්ම
20:11; ද්වි.නී. 32:40; දානි 12:7; ආමො 3:7මුහුද පිට
ද ගොඩබිම ද සිටිනු මා දුටු දේව දූතයා, ස්වර්ගය
දෙසට සිය දකුණත ඔසවා, 6 සදහට ම ජීවත් වන,
ස්වර්ගයත් එහි ඇති දේත්, පොළොවත් එහි ඇති
දේත්, මුහුදත් එහි ඇති දේත් මවා වදාළ තැනැන්
වහන්සේගේ නාමයෙන් දිවුරමින් මෙසේ කී ය:
“තවත් පමා වීමක් නැත. 7 සත් වන දේව දූතයාගේ
හොරණෑව පිඹීමේ වේලාව පැමිණි විට, දෙවියන්
වහන්සේ තම සේවක දිවැසිවරයන්ට ප්‍රකාශ කළ
ලෙස, උන් වහන්සේගේ අබිරහස සම්පූර්ණ වනු
ඇත.”
8 එසකි 2:8; 3:3 ස්වර්ගයෙන් ඇසුණු හඬ නැවතත්
මට කතා කරමින්, “ඔබ ගොස් මුහුද පිට ද
ගොඩබිම ද සිටින දේව දූතයාගේ අතේ දිගහැර
තිබෙන පොත ගන්නැ”යි මට කී ය. 9 මම දේව
දූතයා වෙත ගොස්, “කුඩා පොත මට දෙන්නැ”යි
කීවෙමි. ඔහු ද: “එය රැගෙන කන්න; එයින් ඔබේ
ආමාශය තිත්ත වන්නේ ය. එහෙත් එය ඔබේ
කටෙහි මීපැණි ලෙස මිහිරි වන්නේ ය”යි මට කී ය.
10 මම ද දේව දූතයා අතින් කුඩා පොත රැගෙන
කෑවෙමි. එය මගේ කටේ මීපැණි ලෙස මිහිරි ව

තිබුණේ ය. එය කෑ පසු මාගේ ආමාශය තිත්ත
විය.
11 තවද: “ඔබ බොහෝ සනෙග ද ජාතීන් ද
භාෂාවන් ද රජුන් ද ගැන නැවතත් දිවැස් වැකි
ප්‍රකාශ කළ යුතු ය”යි මට කියන ලද්දේ ය.

## සාක්ෂිකාරයන් දදෙනො

11 එසකි 40:3; සකෙරි 2:1-2 ඉන්පසු දිග
සැරයටියක් වැනි කෝදුවක් මට දනෙ ලද්දේ
ය. “නැඟිට දවේයන් වහන්සේගේ මාලිගාව ද
පූජාසනය ද මැන, එහි නමස්කාර කරන්නන් ගණන්
කරන්න. 2 ලූක් 21:24මාලිගාවනේ පිටත වූ මළුව
විජාතීන්ට දී ඇති බැවින්, එය නොමැන අත් හරින්න.
ඔව්හු සතළිස් දමොසයක් ශුද්ධ නගරය පයින් පාගා
දමන්නෝ ය. 3 තවද මාගේ සාක්ෂිකාරයන් දදෙනො
යවන්නමේ. ඔව්හු ගෝණි රදෙි හැඳ, එක් දහස්
දසෙිය සැට දවසක් දිවැස් වැකි කියන්නෝ ය”යි මට
කියන ලදී.
4 සකෙරි 4:3,11-14 මේ දදෙනො පොළොවේ
සමිඳාණන් වහන්සේ ඉදිරිපිට තිබනෙ ඔලීව ගස්
දකෙ ද පහන් රුක් දකෙ ද වයෙි. 5 යමකේ ඔවුන්ට
අනතුරු කරන්නට සිතන්නේ නම්, ඔවුන්ගේ කටින්
ගිනි නික්ම විත් ඔවුන්ගේ සතුරන් විනාශ කරයි.
ඔවුන්ට අනතුරු කරන්නට සිතන තැනැත්තේ,
මලෙසෙ මරනු ලබන්නේ ය. 6 නික්ම 7:17-19; 1
සාමු 4:8; 1 රාජා 17:1තමන් දිවැස් වැකි පවසන
කාලයේ දී වැසි නොවසින ලසෙ අහස් තලය
වසන්නට මොවුන්ට බලය ඇත. ජලය ලේ
කිරීමටත්, සියලු වසංගතවලින් පොළොවට කැමැති
විටක පහර දීමටත් ඔවුන්ට බලය ඇත.
7 දානි 7:7,21; එළිද 13:5-7; 17:8 ඔවුන් තමන්ගේ
සාක්ෂිය නිම කළ විට පාතාලයනේ නැඟී එන
මෘගයා ඔවුන්ට විරුද්ධ ව සටන් කොට, ඔවුන්
පරාජය කර මරාදමන්නේ ය. 8 යසො
1:9-10ඔවුන්ගේ මළකඳන්, උපමා අර්ථයනේ
සොදොම් නොහොත් මිසරය යයි කියන, ඔවුන්ගේ
සමිඳාණන් වහන්සේ කුරුසියහෙි ඇණ ගැසූ, මහා
නුවර වීදියහෙි හළෙනු ලබන්නේ ය. 9 සියලු
සනෙඟගනේ ද ගෝත්‍රයන්ගනේ ද භාෂාවන්ගනේ ද
ජාතීන්ගනේ ද මනුෂ්‍යයෝ ඔවුන්ගේ මළකඳන් දසෙ
දවස් තුනහමාරක් බලා සිටිමින් ඒවා සොහොනෙක
තබන්නට ඉඩ නොදතෙි. 10 ඒ දිවැසිවරුන් දදෙනො
මිහි පිට වැසියන්ට පීඩා කළ බැවින්, ඔව්හු ප්‍රීති
සන්තොෂ වමේන් තමන් අතරේ තෑගි හුවමාරු
කරගන්නාහ. 11 එසකි 37:10ඒ දවස් තුනහමාරට
පසු දවේයන් වහන්සේ කරෙනේ ජීවන හුස්ම ඔවුන්
තුළට පැමිණි විට ඔව්හු නැඟිට සිටියෝ ය. ඔවුන්
දුටු අය බොහෝ සේ බියපත් වූ හ. 12 2 රාජා
2:11“නැඟිට මහෙි එන්නැ”යි කියන මහ හඬක්
ස්වර්ගයනේ ඔවුන්ට ඇසිණි. එකල ඔවුන්ගේ
සතුරන් බලා සිටිය දී ඔව්හු වලාකුළකින් ස්වර්ගයට
නැඟී ගියහ. 13 එළිද 6:12; 16:18ඒ ඇසිල්ලහෙි ම
මහා භූමිකම්පාවක් ඇති විය. නුවරනේ දසයනේ
කොටසක් බිඳ වැටිණි. භූමිකම්පාවනේ මනුෂ්‍යයෝ
සත් දහසක් මළහ. ඉතිරි අය බියනේ ඇලළී
ස්වර්ගයේ දවේයන් වහන්සේට ගෞරවය පිරිනැමූ
හ.
14 දවෙන විපත පහ විය; මනේන තුන් වන විපත
වහා එන්නේ ය.

## සත් වන හොරණෑව

15 නික්ම 15:18; දානි 2:44; 7:14,27 සත් වන දේව
දූතයා ද හොරණෑව පිඹියේ ය. එවිට: “ලෝකයේ
රාජත්වය අපගේ සමිඳාණන් වහන්සේට ද උන්
වහන්සේගේ ආලේප ලත් ක්‍රිස්තුන් වහන්සේට ද
අත් විය. උන් වහන්සේ සදහට ම රජකම් කරන
සේකැ”යි කියන මහ ශබ්ද ස්වර්ගයහෙි විය.
16 දවේයන් වහන්සේ ඉදිරියහෙි තමන්ගේ
සිහසුන්වල හුන් කුලදටෙුවෝ විසි හතර දනො
මුහුණින් වැටී, දවේයන් වහන්සේට නමස්කාර කර
මසෙේ කී හ:
17 “වැඩ සිටින, වැඩ සිටිය, සර්ව පරාක්‍රම දවේ
සමිඳාණන් වහන්ස, ඔබගේ අතිමහත් බලය
මහෙයෙවා ඔබ රජකම් කළ බැවින් අපි ඔබට ස්තුති
කරමු.
18 ගීතා 2:5; 110:5; 115:13 මනුෂ්‍ය ජාතීහු
කෝපාවිෂ්ට වූ හ.
q218 ඔබගේ උදහස ද මළවුන් විනිශ්චය කිරීමේ
කාලය ද දැන් පැමිණ තිබේ.
q218 ඔබගේ සේවක දිවැසිවරයන්ට හා
සැදැහැවතුන්ට ද ඔබගේ නාමයට භය වන ලොකු
කුඩා සියල්ලන්ට ද විපාක දීමටත් පොළොව
වනසන්නන් වැනසීමටත් කාලය පැමිණ තිබේ.”
19 එළිද 8:5; 16:18,21 එවිට ස්වර්ගයහෙි තිබනෙ
දවේයන් වහන්සේගේ මාලිගාව විවෘත කරන ලද්දේ
ය. උන් වහන්සේගේ ගිවිසුම් කරඬුව මාලිගාව තුළ
පනෙුණේ ය. එවිට විදුලි කටෙීම් ද ශබ්ද ද ගිගුරුම්
ද භූමිකම්පාවක් ද, මහ ගල් වර්ෂාවක් ද විය.

## ස්ත්‍රිය සහ මකරා

12 තවද අහසහෙි පුදුම ලකුණක් විය. එනම්,
සූර්යයා පැළඳගනෙ, පාද යට සඳ මඬල ද
හිස මත තාරකා දොළසකින් යුත් කිරුළක් ද ඇති
ස්ත්‍රියකි. 2 ගැබ්ගනෙ සිටි ඈ, විළිරුජා විඳිමින්
ප්‍රසව වේදනාවනේ කෑගැසුවා ය. 3 දානි
7:7අහසහෙි තවත් පුදුම දර්ශනයක් විය. හිස් සතක්
ද අං දසයක් ද තමන් හිස් මත කිරුළු සතක් ද ඇති
මහා රතු මකරකෙි. 4 දානි 8:10ඌ උගේ වලිගයනේ
අහසේ තරුවලින් තුනනේ කොටසක් ඇද, පොළවට
හළේ ය. උපන් කණෙහෙිම දරුවා කාදමන පිණිස,
මකරා ප්‍රසව වේදනාවනේ සිටි ස්ත්‍රිය ඉදිරියහෙි
සූදානම් ව බලා සිටියේ ය. 5 ගීතා 2:9; යසො
66:7ස්ත්‍රිය ඒ සියලු මනුෂ්‍ය ජාතීන් යගදාවකින්
ආණ්ඩු කරන පිරිමි දරුවකෙු ප්‍රසූත කළා ය. ඇගේ
දරුවා දවේයන් වහන්සේ හා උන් වහන්සේගේ
සිංහාසනය වතෙ ඇදගනෙ යනු ලැබී ය. 6 ස්ත්‍රිය

කාන්තාරයට පලා ගියා ය. එක් දහස් දෙසිය සැට
දවසක් ඇය පෝෂණය කරන පිණිස දෙවියන්
වහන්සේ විසින් පිළියෙළ කරන ලද ස්ථානයක් ඇට
එහි විය.
7 දානි 10:13,21; 12:1; ජූද් 9 තවද ස්වර්ගයෙහි
යුද්ධයක් විය. මීකායෙල් හා ඔහුගේ දූතයෝ
මකරාට විරුද්ධ ව සටන් කළහ. 8 මකරා ද තමාගේ
දූතයන් පිරිවරා සටන් කොට පරාජය විය. ඔවුන්ට
ස්වර්ගයෙහි තැනක් තවත් නො වී ය. 9 උත් 3:1;
ලූක් 10:18මහා මකරා පලවා හරින ලදී. ඔහු නම්
මුළු ලොව රැවටූ යක්ෂයා හෙවත් සාතන් යයි නම්
ලත්, ආදි සර්පයා ය. ඔහු සමඟ ඔහුගේ දූතයෝ ද
පොළොවට හෙළනු ලැබුවෝ ය.
10 ජෝබ් 1:9-11; සකරි 3:1 ඉන්පසු ස්වර්ගයෙහි
මෙසේ කියන මහ හඬක් මට ඇසිණි; එනම්, "අපේ
දෙවියන් වහන්සේගේ ගැළවීම ද බලය ද රාජ්‍යය ද
ස්වකීය ක්‍රිස්තුන් වහන්සේගේ අධිපතිකම ද දැන්
පැමිණ ඇත. මන්ද, අපේ දෙවියන් වහන්සේ
ඉදිරියෙහි දිවා රෑ දකේහි අපගේ සහෝදරයන්ට
චෝදනා කරන පැමිණිලිකාරයා පහතට හෙළෙන ලදි.
11 ඔව්හු බැටළු පෝතකයාණන්ගේ යාගික රුධිරය
නිසා ද, තමන් සාක්ෂි දැරූ පණිවුඩය නිසා ද
ඔහුගෙන් ජය ගත්තෝ ය. මන්ද, ඔව්හු මරණයට
වත් බිය නොවී දිවි දීමට සූදානම් ව සිටියහ.
12 එබැවින් ස්වර්ගයෙනි, එහි වැසියෙනි, ප්‍රීති
සන්තෝෂ වන්න. අහෝ! පොළොවටත් මුහුදටත්
වන විපත! මන්ද, යක්ෂයා තමාට වැඩි කලක් නැති
බව දැන, කෝපාවිෂ්ට ව, ඔබ වෙත බැස ගියේ ය"
යනු යි.
13 තමා පොළොවට හෙළෙනු ලැබූ බව දුටු මකරා,
පිරිමි දරුවා ප්‍රසූත කළ ස්ත්‍රිය ලුහුබැඳ ගියේ ය.
14 දානි 7:25; 12:7එහෙත් මරුකතරෙහි ඇගේ
රක්ෂස්ථානයට සර්පයා වෙතින් පියාඹා යන පිණිස
මහා රාජාලියකුගේ පියාපත් දෙක ඇයට දෙන ලදි.
එහි කාලයක් ද කාල දෙකක් ද අර්ධ කාලයක් ද ඈ
පෝෂණය කරනු ලබයි. 15 එවිට සර්පයා ඒ ස්ත්‍රිය
සැඩ පාරෙන් ගසාගෙන යන පිණිස, ඇය පස්සෙන්
ගංගාවක් මෙන් තමාගේ කටින් වතුර පිට කළේ
ය. 16 එහෙත් පොළොව ස්ත්‍රියට පිහිට වී, කට
ඇර, මකරා තමාගේ කටින් පිට කළ ගංගාව
ගිලගත්තා ය. 17 එවිට මකරා ස්ත්‍රිය කෙරෙහි
කෝපයෙන් දිලිහී දෙවියන් වහන්සේගේ ආඥා
පිළිපදින, ජේසුස් වහන්සේගේ සාක්ෂිය දරන ඇගේ
වංශයේ ඉතිරි අයට විරුද්ධ ව සටනට ගියේ ය.
18 ඔහු මුහුදු වෙරළෙහි සිටියේ ය.

## මුහුදෙන් මතු වූ මෘගයා

13 දානි 7:3; එළිද 17:3,7-12 එවිට අං දසයක් ද
හිස් සතක් ද ඇති මෘගයෙකු මුහුදෙන් මතු වී
එනු දිටිමි. උගේ අං පිට කිරුළු දසයක් ද උගේ
හිස්වල දේවාපහාස නාම ද තිබිණි. 2 දානි 7:4-6මා
දුටු මෘගයා අඳුන් දිවියකුට සමාන ය. උගේ පාද
වලසකුගේ පාද වැනි ය. උගේ කට සිංහයකුගේ
කට වැනි ය. මකරා සිය පරාක්‍රමය ද සිංහාසනය ද
මහා අධිපතිකම ද ඌට දුන්නේ ය. 3 උගේ
හිස්වලින් එකක මාරක තුවාළයක් තිබෙන්නාක්
මෙන් පෙනිණි; එහෙත් උගේ මාරක තුවාළය සුව වී
තිබිණි. මුළු ලෝකයා මවිත වෙමින් මෘගයා
පසුපස්සේ ගියෝ ය. 4 මකරා මෘගයාට අධිපතිකම
පැවරූ නිසා ඔව්හු මකරාට නමස්කාර කළහ. ඔව්හු
මෘගයාටත් නමස්කාර කොට, "මෘගයාට සමාන
කවරෙක් ද? ඌ හා සමඟ සටන් කිරීමට කවරකුට
හැකි දැ"යි කී හ.
5 දානි 7:8,25; 11:36 අහංකාර වචන ද දේව
අපහාස ද පෙතලීමට කටක් ඌට දෙන ලදි. තවද
මාස සතළිස් දෙකක් තමා කැමැති සේ ක්‍රියා
කිරීමට ඌට බලය දෙන ලද්දේ ය. 6 එකල ඌ
දේවාපහාස කීමට ද, උන් වහන්සේගේ නාමයටත්
වාසස්ථානයටත් ස්වර්ග වාසීන්ටත් විරුද්ධ ව අපහාස
කීමට ද මුඛය ඇරියේ ය. 7 දානි 7:21තවද,
සැදැහැවතුන්ට විරුද්ධ ව සටන් කරන්නට ද
ඔවුන්ගෙන් ජයගන්නට ද ඌට ඉඩ දෙන ලදී. සියලු
ගෝත්‍රයන් ද සෙනඟ ද භාෂාවන් ද ජාතීන් ද
කෙරෙහි බලය ද ඌට දෙන ලද්දේ ය. 8 ගීතා
69:28මරණයට පත් කරන ලද, බැටළු
පෝතකයාණන්ගේ ජීවන පොතේ ලෝකාරම්භයේ
සිට නාම නොලියන ලද මිහි පිට සියලු පොළෝ
වාසීහු ඌට නමස්කාර කරන්නෝ ය. 9 කන් ඇත්තේ
අසා වා! 10 ජෙරෙ 15:2; 43:11වහල්කමට නියම
තැනැත්තාට වහල්කම නියත ය. කඩුවෙන් මරන්නා,
කඩුවෙන් ම මැරිය යුතු ය. සැදැහැවතුන්ට
ඉවසිල්ලත් ඇදහීමත් අවශ්‍ය වන්නේ මේ නිසා ය.
11 එවිට තවත් මෘගයෙකු පොළොවෙන් නැඟී එනු
දිටිමි. බැටළු පැටවකුට මෙන් අං දෙකක් ඌට
තිබිණි. ඌ මකරෙකු මෙන් කතා කළේ ය. 12 ඌ
පළමු වැනි මෘගයාගෙන් ආධිපත්‍යය ලබා, එය ඒ
මෘගයා ඉදිරියෙහි මෙහෙයෙ වී ය. මාරක තුවාළයෙන්
සුවය ලැබූ පළමු වන මෘගයාට නමස්කාර කිරීමට
ඌ පොළොවට හා එහි වැසියන්ට බල කළේ ය.
13 සියලු මිනිසුන් ඉදිරියෙහි අහසින් පොළොවට ගිනි
බස්වන තරම් මහා හාස්කම් කළේ ය. 14 මෘගයා
ඉදිරියෙහි කරන්නට ඉඩ දෙන ලද හාස්කම් මඟින්
ඌ ලෝවැසියන් මුළා කළේ ය. කඩුපහර ලැබූ
නමුත් තවමත් ජීවත් වන මෘගයා සඳහා රූපයක්
පිහිටුවීමට පොළෝ වැසි සියල්ලන්ට ඌ නියම
කළේ ය. 15 ඒ ඇර කතා කරන පිණිස මෘගයාගේ
රූපයට පණ දෙන්නටත්, මෘගයාගේ රූපයට
නමස්කාර නොකරන සියල්ලන්ට මරණය
සලසන්නටත් ඌට බලය ලැබුණේ ය. 16 තවද, ඌ
ලොකු කුඩා, දුප්පත් පොහොසත්, දාස නිර්දාස යන
සියල්ලන්ට තමන්ගේ දකුණතේ හෝ නළලේ හෝ
සලකුණක් ලබන්නට සැලැස්වී ය; 17 ඒ සලකුණ වන
මෘගයාගේ නාමය හෝ උගේ නාමය අඟවන අංකය
හෝ ඇත්තාට මිස, අන් කිසිවකුට මිලයට ගන්නට
වත් විකුණන්නට වත් ඉඩක් නොතැබී ය.

18 නැණනුවණ අවශ්‍ය වන්නේ මෙතන දී ය.
නුවණැත්තා, මෘගයාගේ අංකය ගණන් බලා දැනගනී
වා. මන්ද, එය මනුෂ්‍යයකුගේ නාමය දක්වයි. ඒ
ගණන හයසිය හැට හයයි(666).

## විමුක්ති ජය ගීතය

14 එසකි 9:4; එළිද 7:3 තවද, බැටළු
පෝතකයාණන් ද, උන් වහන්සේ සමඟ එක්
ලක්ෂ සතළිස් සාර දහස් දෙනෙකුන් ද සියොන් කන්ද
මත සිටිනු දිටිමි. ඔවුන්ගේ නළල්වල උන්
වහන්සේගේ නාමය ද, උන් වහන්සේගේ
පියාණන්ගේ නාමය ද ලියා තිබිණි. 2 ගලා බසින
මහා ජල ඝෝෂාවක් මෙන් ද, තද හෙණ හඬක්
මෙන් ද වූ, අහසින් නික්මුණු ශබ්දයක් මට ඇසුණේ
ය. මට ඇසුණ ශබ්දය වීණා වාදකයන්ගේ වාදනය
මෙන් විය. 3 ඔව්හු සිංහාසනය ඉදිරියෙහි ද, ජීවමාන
සත්ත්වයන් සතර දෙනා සහ කුලදෙටුවන් ඉදිරියෙහි
ද අලුත් ගීතිකාවක් ගායනය කළහ. ඒ ගීතිකාව,
පොළොවෙන් මුදාගනු ලැබූ එක් ලක්ෂ සතළිස් සාර
දහස් දෙනා හැර, අන් කිසිවකුට ඉගෙන ගත
නොහැකි විය. 4 ඔව්හු ස්ත්‍රී සේවනයෙන්
නොකෙලෙසුණු බ්‍රහ්මචාරීහු ය. ඔව්හු, බැටළු
පෝතකයාණන් යන යන තැන, උන් වහන්සේ අනුව
යන්නෝ වෙති. ඔව්හු දෙවියන් වහන්සේටත්, බැටළු
පෝතකයාණන්ටත් නාඹුල් පල වන පිණිස
මනුෂ්‍යයන් අතරෙන් මුදා ගන්නා ලද්දෝ ය. 5 ශෙප
3:13ඔවුන්ගේ මුඛයෙන් කවදාවත් බොරුවක් පිට
නො වී ය. ඔව්හු නිර්මල ය.

## දේව දූතයන් තිදෙනාගේ පණිවුඩය

6 පොළෝ වාසීන්ට ද සියලු ජාතීන්ට ද
ගෝත්‍රයන්ට ද භාෂාවන්ට ද සෙනඟට ද ප්‍රකාශ
කරන පිණිස සදාතන සුබ අස්නක් ඇති ව, මැද
අහසේ පියාසර කරමින් සිටි තවත් දේව දූතයකු
මම දිටිමි. 7 ඔහු මහ හඬින් මෙසේ කී ය: “දෙවියන්
වහන්සේට බිය වී උන් වහන්සේට ගෞරව කරන්න.
මන්ද, උන් වහන්සේගේ විනිශ්චයේ මොහොත
පැමිණ ඇත. අහස හා පොළොවත්, මුහුද හා දිය
උල්පතුත් මවා වදාළ තැනැන් වහන්සේට නමස්කාර
කරන්න.”
8 යෙසා 21:9; ජෙරෙ 51:8; එළිද 18:2 ඒ දේව දූතයා
පසුපසින් ගිය දෙ වන දේව දූතයෙක්: “තදබල
කාමරාගය නමැති මද්‍යසාරය සියලු ජාතීන්ට පෙවූ
මහා බබිලෝනිය වැටුණා ය, මහා බබිලෝනිය
වැටුණා ය, වැටුණා ය”යි කී ය.
9 තුන් වන දේව දූතයෙක් ද, ඒ දෙදෙනා පස්සේ
යමින් මහ හඬින් මෙසේ කී ය. “යමෙක් මෘගයාටත්
උගේ රූපයටත් නමස්කාර කර, ඔහුගේ නළලේ
හෝ අතේ හෝ ලකුණක් තබනු ලබන්නේ ද,
10 උත් 19:24; යෙසා 51:17; එසකි 38:22ඔහුත්
දෙවියන් වහන්සේගේ උදහස නමැති කුසලානට වත්
කරන ලද උන් වහන්සේගේ කෝපය නමැති අමිශ්‍ර
මුද්‍රික පානය බොන්නේ ය. ඔහු ශුද්ධ දේව දූතයන්
ඉදිරියෙහි ද, බැටළු පෝතකයාණන් ඉදිරියෙහි ද
ගින්නෙන් හා ගෙන්දගම්වලින් වද වේදනා විඳින්නේ
ය. 11 යෙසා 34:10ඔවුන්ගේ වේදනාව නමැති ධූමය
සදහට ම නඟින්නේ ය. මෘගයාටත් උගේ රූපයටත්
නමස්කාර කරන්නෝ ද උගේ නාමයේ සලකුණ
ලබන්නෝ ද දිවා රෑ දෙකෙහි විවේකයක්
නොලබන්නෝ ය.” 12 දෙවියන් වහන්සේගේ ආඥා
ද, ජේසුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ල ද රක්ෂා
කරන සැදැහැවතුන්ට ඉවසීම අවශ්‍ය වන්නේ මේ
නිසා ය.
13 එවිට: “මෙතන් පටන් සමිඳාණන් වහන්සේ තුළ
නසින්නෝ භාග්‍යවන්තයෝ ය කියා ලියන්නැ”යි
ස්වර්ගයෙන් කියන හඬක් මට ඇසුණේ ය. “එසේ
ය, ඔව්හු තමන්ගේ වෙහෙසීම්වලින් නිවාඩු ලබති:
ඔවුන්ගේ ක්‍රියා ඔවුන් කැටුව යන්නේ ය”යි
ආත්මයාණන් වහන්සේ වදාරන සේක.

## පොළොවේ අස්වැන්න නෙළීම

14 දානි 7:13 තවද සුදු වලාකුළක් ද, ඒ වලාකුළ
මත සිය හිසේ රන් කිරුළක් සහ අතේ මුවහත්
දෑකැත්තක් ද ඇති මනුෂ්‍ය පුත්‍රයකු වැනි කෙනෙකු
වැඩ සිටිනු දිටිමි. 15 ජෝවෙ 3:13එවිට තවත් දේව
දූතයෙක් දේව මාළිගාවෙන් නික්ම අවුත්, වලාකුළ
පිට වැඩහුන් තැනැන් වහන්සේට මහ හඬින්
මොරගසා: “ඔබ වහන්සේගේ දෑකැත්ත යොදා
කැපුව මැනව; මන්ද, පොළොවේ ගොයම් හොඳට
ම පැසී තිබෙන බැවින්, කපන කාලය පැමිණ ඇතැ”යි
කී ය. 16 එවිට වලාකුළ පිට වැඩහුන් තැනැන්
වහන්සේ දෑකැත්ත පොළොවෙහි දැමූ සේක.
පොළොවෙහි ගොයම් කපනු ලැබී ය.
17 තවත් දේව දූතයෙක් ස්වර්ගයෙහි වූ දේව
මාළිගාවෙන් නික්ම ආවේ ය. ඔහුට ද මුවහත්
දෑකැත්තක් තිබිණි. 18 එවිට ගින්න බාර ව සිටි
තවත් දේව දූතයෙක් පූජාසනයෙන් නික්ම අවුත්,
මුවහත් දෑකැත්ත ඇති ව සිටි තැනැත්තාට මහ
හඬින් මොරගසා, “ඔබේ මුවහත් දෑකැත්ත යොදා
පොළොවේ මිදි වැලේ මිදි පොකුරු කපා රැස්
කරන්න. මන්ද, මිදි පොකුරු ඉදී ඇතැ”යි කී ය.
19 දේව දූතයා තමාගේ දෑකැත්ත පොළොවෙහි
යොදා, පොළොවෙහි මිදි පල රැස් කොට, දෙවියන්
වහන්සේගේ උදහස නමැති මහා මිදි මිරිකන වළට
හෙළී ය. නුවරින් පිටත ඒ වළේ මිදි පාගන ලදී.
20 යෙසා 63:3; විලාප 1:15; එළිද 19:15එවිට
කිලෝමීටර් තුන් සියයක් පමණ දුරට ද,
අශ්වයකුගේ කටකලියාව දක්වා උසට ද, ඒ වළෙන්
ලේ ගලා ගියේ ය.

## වසංගත සත

15 ස්වර්ගයෙහි තවත් විස්මයජනක මහා
ලකුණක් දිටිමි. දේව දූතයෝ සත් දෙනෙක්
වසංගත සතක් රැගෙන සිටියෝ ය. මේවායින්
දෙවියන් වහන්සේගේ උදහස අවසාන වන බැවින්,
ඒවා අන්තිම වසංගත වේ.

2 ගිනි මුසු වීදුරු සාගරයක් වැනි දයෙක් ද,
මෘගයාගනෙුත්, උගේ රූපයනෙුත්, උගේ නාමයේ
සංඛ්‍යාවනෙුත් දැක්වනෙ ජයගත් අය, දවේයන්
වහන්සේගේ වීණා රුගනෙ වීදුරු සාගරය ළඟ සිටිනු
දිටිමි. 3 නික්ම 15:1ඔව්හු දවේයන් වහන්සේගේ
සේවකයා වූ මෝසසේගේ ගීතිකාව ද බැටළු
පෝතකයාණන්ගේ ගීතිකාව ද ගායනා කරමින්
මසෙේ කී හ:
q2 3 “සර්ව බලැති ස්වාමීන් වන දවේයන් වහන්ස,
ඔබගේ ක්‍රියා උදාර ය, චමත්කාර ජනක ය.
q2 3 ජාතීන්ගේ රජාණනෙි, ඔබගේ මාර්ග සාධාරණ
ය, සැබෑ ය.
4 ගීතා 86:9; ජරෙ 10:7 ස්වාමීනි ඔබ වහන්සේට
බිය නොවන්නනේත්, ඔබ වහන්සේගේ නාමයට
ගෞරව නොකරන්නනේත් කවරකේ ද?
q2 4 ඔබ වහන්සේ පමණක් සුවිශුද්ධ බැවිනි;
q2 4 සියලු ජාතීහු පැමිණ, ඔබ වහන්සේ ඉදිරියේ
නමස්කාර කරති.
q2 4 මන්ද, ඔබ වහන්සේගේ ධර්මිෂ්ඨ ක්‍රියා
ප්‍රකාශ කරන ලද්දේ ය.”
5 නික්ම 38:21 ඉන්පසු ස්වර්ගයහෙි තිබනෙ සාක්ෂි
මණ්ඩපය වන ඇතුළු ශුද්ධස්ථානය ඇරී, 6 වසංගත
සතේ දේව දූතයන් සත් දනො පිටතට ආවෝ ය.
ඔව්හු දිළිසනෙ පිරිසිදු වස්ත්‍ර ඇඳ, තමන්ගේ ළයහෙි
රන් පටි බැඳගනෙ සිටියෝ ය. 7 එවිට ජීවමාන
සත්ත්වයන් සතර දනොගනේ එකකේ, සදහට ම
ජීවත් වන දවේයන් වහන්සේගේ උදහසින් පිරුණු,
රන් පාත්‍ර සතක් දේව දූතයන් සත් දනොට දුන්නේ
ය. 8 නික්ම 40:34; 1 රාජා 8:10-11; 2 වංශා 5:13-14;
යසො 6:4එවිට දේව මාලිගාව දවේයන්
වහන්සේගේ තජේසින් හා බලයනේ නික්මුණු
ධූමයනේ පිරුණේ ය. ඒ නිසා, දේව දූතයන් සත්
දනොගේ වසංගත සත කළෙවර වන තුරු දේව
මාලිගාවට ඇතුළු වීමට කිසිවකෙුට නුපුළුවන් විය.

### වසංගත සත වැගිරවීම

16 “ඔබ ගොස් දවේයන් වහන්සේගේ උදහස
නමැති පාත්‍ර සත පොළොව පිට
වගුරුවන්නැ”යි දේව දූතයන් සත් දනොට කියන මහ
හඬක් දේව මාලිගාවනේ මට ඇසිණි.
2 නික්ම 9:10 එකල පළමුවැන්නා ගොස් තමාගේ
පාත්‍රය පොළොව පිට වැගිරවේවේ ය. එවිට
මෘගයාගේ සලකුණ දැරූ අයට ද, ඔහුගේ රූපයට
නමස්කාර කළ අයට ද දරුණු දුස්සාධ්‍ය වණ හටගති.
3 දවෙැන්නා තමාගේ පාත්‍රය මුහුද පිට
වැගිරවේවේ ය. මුහුදේ වතුර මළ මිනියක ලේ
මනේ විය. මුහුදේ පණ ඇති සියලු සත්ත්වයෝ
මළෝ ය.
4 නික්ම 7:17-21; ගීතා 78:44 තවෙැන්නා තමාගේ
පාත්‍රය ගංගා සහ දිය උල්පත් පිට වැගිරවේවේ ය.
එවිට ඒවා ලේ විය. 5 ජලය භාර ව සිටි දේව
දූතයා කතා කොට, “වැඩ සිටින, වැඩ සිටිය,
සුවිශුද්ධ තැනැන් වහන්ස, ඔබ දුන් විනිශ්චයන්හි
ඔබ සාධාරණ ය. 6 ඔවුන් සැදැහැවතුන්ගේ ද
දිවැසිවරයන්ගේ ද ලේ වැගිරවේ බැවින්, ඔබ
ඔවුන්ට ලේ බොන්නට දුන් සේක. ඔවුන්ට ලැබිය
යුතු විපාකය මේ ය”යි කියනු මට ඇසිණි. 7 “එසේ
ය, සර්ව පරාක්‍රම දවේ ස්වාමීන් වහන්ස, ඔබගේ
විනිශ්චය නිවැරුදි ය, සාධාරණ ය”යි පූජාසනයනේ
කියනු මට ඇසිණි.
8 එවිට සතරවැන්නා තමාගේ පාත්‍රය සූර්යයා පිට
වැගිරවේවේ ය. ගින්නනේ මනුෂ්‍යයන් දවාලීමේ
බලය ඊට දනෙ ලද්දේ ය. 9 මනුෂ්‍යයෝ අධික
උෂ්ණයකින් දවනු ලැබ, මේ වසංගත කරෙහි බලය
ඇති දවේයන් වහන්සේගේ නාමයට සාප කළා මිස,
උන් වහන්සේට ගෞරවය දනෙ පිණිස පසුතැවී සිත්
හරවා නොගත් හ.
10 නික්ම 10:21 පස්වැන්නා තමාගේ පාත්‍රය
මෘගයාගේ සිංහාසනය පිට වැගිරවේවේ ය. ඔහුගේ
රාජ්‍යය අඳුරින් වැසී ගියේ ය. ඔව්හු වදේනා නිසා
දිව් විකාගත්හ. 11 ඔව්හු තමන්ගේ තුවාළ හා
වදේනා නිසා ස්වර්ගයේ දවේයන් වහන්සේට සාප
කළා මිස, තමන්ගේ ක්‍රියා ගැන පසුතැවී සිත්
හරවා නොගත් හ.
12 යසො 11:15 සවැන්නා තමාගේ පාත්‍රය
යුප්‍රටීස් නම් මහා ගංගාව පිට වැගිරවේවේ ය.
එවිට පරෙදිගින් එන රජවරුන්ට මාර්ගයක් පෑදනෙ
පිණිස එහි වතුර සිඳී ගියේ ය. 13 එකල මකරාගේ
කටින් ද, මෘගයාගේ කටින් ද, බොරු දිවැසිවරයාගේ
කටින් ද මැඩියන් වැනි අශුද්ධාත්මයන් තුන් දනෙකු
නික්ම එනු මම දිටිමි. 14 ඔව්හු හාස්කම් කරන
දුෂ්ටාත්මයෝ ය. ඔව්හු සර්ව පරාක්‍රම දවේයන්
වහන්සේගේ මහා දවසේ යුද්ධයට මුළු ලෝකයේ
රජවරුන් රැස් කරන පිණිස ඔවුන් වතෙ යන්නාහ.
15 මතෙ 24:43-44; ලූක් 12:39-40; එළිද 3:3
“මනේන! මම සොරකෙු මනේ එමි. නග්න ව ඇවිද,
තමාගේ විළිලජ්ජාව මිනිසුන්ට නොපනෙනෙ පිණිස
අවදි ව සිට තමාගේ වස්ත්‍ර ආරක්ෂා කරගන්නා
භාග්‍යවන්තයකෙි.”
16 2 රාජා 23:29; සකෙරි 12:11 මලෙසෙ ඔව්හු
හබ්රෙවේ බසින් ආර්මගිදොන් නම් වූ ස්ථානයට
රජවරුන් රැස් කළහ.
17 සත්වැන්නා ද තමාගේ පාත්‍රය අහසහෙි
වැගිරවේවේ ය. එවිට, “අවසානය පැමිණ ඇතැ”යි
කියන මහ හඬක් දේව මාලිගාවේ සිංහාසනයනේ
නික්මිණි. 18 එළිද 8:5; 11:13,19විදුලිය කටෙිම් ද
ශබ්ද ද හණෙ හඬ ද විය. මහා භූමිකම්පාවක් ද
විය. පොළොවේ මනුෂ්‍යයන් බිහි වූ දා පටන් ඒ සා
බලවත්, මහා භූමිකම්පාවක් ඇති නො වී ය.
19 යසො 51:17ඒ මහා නගරය තුන් කොටසකට
කැඩී ගියේ ය. ජාතීන්ගේ නගර ඇද වැටිණි.
දවේයන් වහන්සේ මහා බබිලෝනිය අමතක
නොකර, සිය උදහසේ දරුණුකම නමැති මිදියුස
පාත්‍රය පානය කිරීමට ඇට දුන් සේක. 20 එළිද
6:14සියලු දිවයින් අතුරුදහන් විය. කඳු නොපනේී
ගියේ ය. 21 නික්ම 9:23; එළිද 11:19අහසින් මහත්
ගල් වර්ෂාවක් මනුෂ්‍යයන් පිට වැස්සේ ය. එහි එක

එක ගල කිලෝග්රෑම් පණහක් පමණ බර විය. ඒ
ගල් වර්ෂා වසංගතය එතරම් දරුණු වූ බැවින්
මනුෂ්යයෝ දෙවියන් වහන්සේට සාප කළහ.

## අපකීර්තිමත් වේශ්යාව

17 ජෙරෙ 51:13 පාත්ර සත දැරූ දේව දූතයන්
සත් දෙනාගෙන් එක් කෙනෙක් අවුත් මට
කතා කොට, “මෙහි එන්න, බොහෝ ජල පිට හිඳින
මහා වේශ්යාවගේ විනිශ්චය ඔබට පෙන්වන්නෙමි.
2 යෙසා 23:17; ජෙරෙ 51:7පොළොවේ රජවරු ඈ
සමඟ වේශ්යාකම් කළෝ ය. පොළොවේ වැසියෝ
ද ඇගේ වේශ්යාකම් නමැති මුද්රික පානයෙන් මත්
වුණෝ ය”යි කීවේ ය.
3 එළිද 13:1 දේව දූතයා ආත්මයාණන්ගේ
ආනුභාවයෙන් මරුකතරකට මා ගෙන ගියේ ය. එහි
රතු ම රතු මෘගයකු පිට ස්ත්රියක වාඩි වී සිටිනු
මම දිටිමි. ඒ මෘගයා දේවාපහාස නාමවලින් පිරී
සිටියේ ය. ඌට හිස් සතක් ද අං දසයක් ද විය.
4 ජෙරෙ 51:7ඒ ස්ත්රිය රත්නිල් හා තද රතු වස්ත්ර
හැඳ රන්, මුතු, මැණික් ආභරණවලින් සැරසී සිටියා
ය. පිළිකුල්කමින් ද ඇගේ අශික්ෂිත වේශ්යාකමින් ද
පිරුණු රන් කුසලානක් ඈ අතේ විය. 5 ඇගේ නළල
පිට: “මහා බබිලෝනිය, පොළොවේ වේශ්යාවන්ගේ
ද පිළිකුල්කම් වල ද මව” යන ගුප්ත නාමයක් ලියා
තිබිණි. 6 ඒ ස්ත්රිය සැදැහැවතුන්ගේ ද, ජේසුස්
වහන්සේ නමින් දිවි පිදූවන්ගේ ද ලෙයින් මත් ව
සිටියා ය. ඈ දුටු විට මම අතිශයින් පුදුම වීමි.
7 දේව දූතයා මට කතා කොට, “ඔබ පුදුම වූයේ
මන් ද? ස්ත්රියගේ ද, ඇය උසුලාගෙන යන හිස්
සතක් හා අං දසයක් ඇති මෘගයාගේ ද, අබිරහස
ඔබට කියමි”යි පැවසී ය. 8 ගීතා 69:28; දානි 7:7;
එළිද 11:7ඔබ දුටු මෘගයා වරක් ජීවත් ව සිටියේ ය.
දැන් නැත. ඌ පාතාලයෙන් නැඟී එන්නට ද
විනාශයට යන්නට ද සිටින්නේ ය. ලෝකාරම්භයේ
සිට ජීවන පොතෙහි නම් නොලියවුණු පොළොවෙහි
වාසය කරන්නෝ, මෘගයා සිටි හැටිත්, දැන් නැති
හැටිත්, මතු එන හැටිත් දැක පුදුම වන්නෝ ය.
9 “නැණනුවණ අවශ්ය වන්නේ මෙතැන දී ය. හිස්
සත නම් ස්ත්රිය වාඩි වී සිටින කඳු සත ය. තවද ඒ
හිස් සත රජවරු සත් දෙනෙකි. 10 පස් දෙනෙක්
මළාහ, එක් කෙනෙක් තව ම සිටින්නේ ය, අනෙක්
තැනැත්තා තව ම පැමිණියේ නැත. ඔහු පැමිණි කල
ටික කලක් පමණක් සිටිය යුතු ය. 11 ජීවත් ව සිටියා
වූ ද දැන් නැත්තා වූ ද මෘගයා, සත් දෙනාගෙන්
එකකු වන අතර, අටවැනියෙක් ද වේ. ඔහු
විනාශයට යන්නේ ය.
12 දානි 7:24 “ඔබ දුටු අං දසය නම් තව ම රජකම
නොලත් රජවරු දස දෙනෙකි. එහෙත් ඔව්හු මෘගයා
සමඟ එක පැයකට පමණක් රජවරුන් ලෙස රාජ
බලය ලබන්නෝ ය. 13 මොවුහු එක ම අරමුණක්
ඇති ව, තමන්ගේ පරාක්රමයත් බලයත් මෘගයාට
දෙති. 14 මොවුහු බැටළු පෝතකයාණන්ට විරුද්ධ ව
යුද්ධ කරන්නාහ. එහෙත් බැටළු පෝතකයාණෝ
ඔවුන් පරාජය කරන සේක. මන්ද, උන් වහන්සේ
ස්වාමිවරුන්ගේ ස්වාමීන් වහන්සේ ය; රජවරුන්ගේ
රජාණෝ ය. උන් වහන්සේ සමඟ සිටින, කැඳවාගත්
තෝරාගත් විශ්වාස තැනැත්තෝ ද, ඒ ජයග්රහණයට
පංගුකාරයෝ වන්නාහ.”
15 ඔහු මට තවදුරටත් කතා කොට, “වේශ්යාව
වාඩි වී සිටි තැන ඔබ දුටු ජලය නම් මනුෂ්ය
වර්ගයෝ ද ජනතාවෝ ද ජාතීහු ද භාෂාවෝ ද
වෙති. 16 ඔබ දුටු අං දසය හා මෘගයා නම්
වේශ්යාවට වෛර බැඳ, ඈ සහමුලින් ම නග්න කර,
ඇගේ මාංස කා, ඈ මුළුමනින් ගින්නෙන් දවන අය
වෙති. 17 මන්ද, දෙවියන් වහන්සේගේ වචනය ඉෂ්ට
වන තුරු උන් වහන්සේගේ කැමැත්ත කිරීමට,
තමන්ගේ රාජ්යය එක්සිත් ව මෘගයාට දෙන ලෙස,
උන් වහන්සේ ඔවුන්ගේ සිත් කැමැති කරවූ සේක.
18 ඔබ දුටු ස්ත්රිය නම් පොළොවේ රජුන් කෙරෙහි
රජකම් කරන මහා නගරය”යි කීවේ ය.

## බබිලෝනියේ වැටීම

18 ඉන්පසු තවත් දේව දූතයකු මහා බලයෙන්
යුක්ත ව ස්වර්ගයෙන් බැස එනු දිටිමි;
ඔහුගේ තේජශ්රීයෙන් පොළොව ඒකාලෝක විය.
2 යෙසා 13:21; 21:9; ජෙරෙ 50:39; 51:8; එළිද 14:8ඔහු
මහ හඬින් මොරගසා, “මහා බබිලෝනිය වැටුණා ය,
මහා බබිලෝනිය වැටුණා ය. ඈ දුෂ්ටාත්මයන්ගේ
වාසභවනයක් ද, සියලු අශුද්ධාත්මයන්ගේත් සියලු
තුච්ඡ පිළිකුල් පක්ෂීන්ගේත් හිරගෙයක් ද වූවා ය.
3 යෙසා 23:17; ජෙරෙ 51:7මන්ද, සියලු ජාතීහු ඇගේ
තදබල කාමරාගය නමැති මද්යසාරය පානය කළහ.
මිහි පිට රජවරු ඈ සමඟ කාමමිථ්යාචාරය කළහ.
දේශාන්තර වෙළෙන්දෝ ඇගේ සැප ජීවිකාවේ
අධිකකමින් ධනවත් වූ හ”යි කී ය.
4 යෙසා 48:20; ජෙරෙ 50:8; 51:6,45 තවද, මෙසේ
කියන හඬක් ස්වර්ගයෙන් මට ඇසිණි:
q2 4 “මාගේ සෙනඟෙනි, ඇගේ පාපවලට හවුල්
නොවෙන පිණිසත්, ඇගේ වංසගතවලට අසු නොවෙන
පිණිසත් ඇගෙන් ඉවත් ව එන්න.
5 උත් 18:20-21; ජෙරෙ 51:9 මන්ද, ඇගේ පාප අහස
උසට ගොඩ ගැසී ඇත.
q2 5 දෙවියන් වහන්සේ ඇගේ අපරාධ අමතක
නොකළ සේක.
6 ගීතා 137:8; ජෙරෙ 50:29 ඈ කළ ලෙස ම ඈටත්
කරන්න.
q2 6 ඇගේ ක්රියා අනුව දෙගුණයක් ඈට දෙන්න.
q2 6 ඈ මිශ්ර කර දුන් පාත්රය දෙගුණයකින් දැඩි
කර ඈට දෙන්න.
7 යෙසා 47:7-9 ඇගේ ආත්ම වර්ණනාවේ හා සැප
ජීවිකාවේ ප්රමාණයට, ඈට ශෝකය ද වද වේදනා
ද දෙන්න.
q2 7 මන්ද, ‘මම රැජිනක් ව වැජඹෙමි, මම
වැන්දඹුවක් නොවෙමි, ශෝකය කිසි දිනක
නොවිඳිමි’යි ඈ තමාට ම කියා ගන්නී ය.

8 එබැවින්, මාරක රෝග ද ශෝකය ද සාගතය ද
යන ඇගේ පීඩා එක දවසේ ම ඈට පැමිණෙන්නේ
ය.
q2[8] ඈ සහමුලින් ම ගින්නෙන් දවනු ලබන්නී ය.
q2[8] මන්ද, ඈ විනිශ්චය කළ දෙවි ස්වාමීන් වහන්සේ
බලසම්පන්න ය.”
9 එසකි 26:16-17 ඈ සමඟ කාමමිථ්‍යාචාරය කළ,
සැප ජීවිකාවෙන් විසූ පොළොවේ රජවරු ඈ දවාලන
ගින්නේ දුම දකින කල, 10 ඇගේ වේදනාවට බයින්
ඈතින් සිට, “අහෝ! අහෝ! බබිලෝනිය නම් මහා
නුවර! බලවත් නුවර! එක පැයකින් තිගේ විනාශය
පැමිණියේ ය”යි කියමින් හඬා වැලපෙති.
11 එසකි 27:31,36 කිසිවකු තමන්ගේ වෙළෙඳ
භාණ්ඩ තවදුරටත් මිල දී නොගන්නා බැවින්,
දේශාන්තර වෙළෙන්දෝ ඈ ගැන හඬා ශෝක වෙති.
12 එසකි 27:12,13,22ඒ බඩු නම්, රන් රිදී භාණ්ඩ,
මුතු මැණික්, සිනිඳු රෙදි, රත්නිල් වස්ත්‍ර, පට රෙදි,
රතු විල්ලුද, නා නා විධ සුවඳ දැව, ඇත් දත් බඩු,
ඉතා අනර්ඝ ලීයෙන් ද ලෝකඩින් ද යකඩින් ද
කිරිගරුඬින් ද සෑදූ විවිධ බඩු, 13 කුරුඳු, කුළු බඩු,
සුගන්ධ ද්‍රව්‍ය, සුගන්ධ රස, තුවරලා, මුද්‍රික පානය,
තලේ, සිහින් පිටි, ධාන්‍ය, මහිෂයන්, බැටළුවන්, අසුන්
සහ රථ, වහලුන් හා මිනිස් ජීවිත යන මේවා ය.
14 “තී හදින් පැතූ යසඉසුරු තී කෙරෙන් පහ වී ගියේ
ය. තිගේ සුඛෝපභෝගී බව හා මනා පෙනුම යළි
නොඑන සේ සදහට ම විනාශ වී ඇතැ”යි ඔව්හු
කියති. 15 එසකි 27:31,36ඈ නිසා ධනවත් වූ, මේ
බඩු විකුණූ වෙළෙන්දෝ ඈ විඳින දුක් පීඩාවට බයින්
තැතිගෙන ඈතින් සිට: 16 “අහෝ! අහෝ! මහා
නුවර! සිනිඳු රෙදි, රත්නිල් හා රතු විල්ලු ද හැඳ, රන්
හා මුතු මැණික්වලින් සැරසුණු නුවර! 17 යසො
23:14; එසකි 27:26-30එක පැයකින් මපෙමණ මහා
ධන සම්භාරයක් නැති වී ගිය හැටි!”යි කියමින් හඬා
වැලපෙති. සියලු නැව්පතියෝ ද මගීහු ද නාවිකයෝ
ද මුහුදෙන් ජීවිකාව කරගන්නෝ ද, ඈතින් සිට, ඈ
දවාලන ගින්නේ දුම දැක, 18 එසකි 27:32“මේ
මහත් නුවරට සමාන නුවරක් තවත් ඇත් දැ”යි
කියමින් මොරගෑසූ හ. 19 එසකි 27:30-34; එසකි
26:21ඔව්හු තමන්ගේ හිස් මත ධූලි දමාගෙන, හඬා
වැලපෙමින්, “අහෝ! අහෝ! ඒ මහා නුවර! ඇගේ
වස්තුව හේතුකොටගෙන මුහුදේ නැව් ඇති
සියල්ලෝ ඇගෙන් ධනවත් වූ හ. එක පැයකින් ඈ
නැතිනාස්ති වී ගිය හැටි”යි කියා මොරගෑසුවෝ ය.
20 ස්වර්ගයෙනි, සැදැහැවතුනි, ප්‍රේරිතවරුනි,
දිවැසිවරුනි, ඒ ගැන ප්‍රීති වන්න! මන්ද, ඈ ඔබට
කළ වරද ගැන දෙවියන් වහන්සේ ඈ විනිශ්චය කළ
සේක.
21 එවිට බලසම්පන්න දේව දූතයෙක් මහා ඇඹරුම්
ගලක් වැනි ගලක් ගෙන, මෙසේ කියමින්, එය
මුහුදට හෙළී ය: “මෙලෙස ඒ මහා නුවර වූ
බබිලෝනිය දරුණු අයුරින් හෙළාදමනු ලබන්නේ ය.
එය නැත්තට ම නැති වී යයි. 22 යසො 24:8; එසකි
26:13ජරෙ 7:34; 25:10වීණා වාදකයන්ගේ ද
ගන්ධර්වයන්ගේ ද නළාකාරයන්ගේ ද
හොරණෑකාරයන්ගේ ද ගීත නාදය තී තුළ තවත්
නොඇසේ; කොයි ආකාර කර්මාන්ත කාරයෙක් වත්
තී තුළ තවත් දකිනු නොලැබේ. ඇඹරුම් ගලේ හඬ
තී තුළ තවත් නොඇසේ. 23 පහනක එළිය තී තුළ
තවත් නොබැබළෙයි. මනාලයාගේත් මනාලියගේත්
හඬ තී තුළ තවත් නොඇසේ. තීගේ වෙළෙන්දෝ
පොළොවේ උත්තමයෝ ව සිටියෝ ය. තීගේ
අනවිනවලින් සියලු ජාතීහු මුළා කරනු ලැබුවෝ ය.
24 ජරෙ 51:49 දිවැසිවරයන්ගේ ද සැදැහැවතුන්ගේ
ද මිහි පිට මරනු ලැබූ සියල්ලන්ගේ ද ලේ, ඈ තුළ
දක්නා ලදී.”

19 ඉන්පසු ස්වර්ගයේ විශාල පිරිසකගේ මහා
හඬක් මට ඇසිණි. ඔව්හු මෙසේ කී හ:
“අලේලූයා! විමුක්තිය ද මහිමය ද බලය ද අපගේ
දෙවියන් වහන්සේට හිමි ය. 2 ද්වි.නී. 32:43; 2 රාජා
9:7මන්ද, උන් වහන්සේගේ විනිශ්චය නිවැරදි ය,
සාධාරණ ය, සිය වේශ්‍යාකමින් පොළොව දූෂණය
කළ ප්‍රසිද්ධ වේශ්‍යාව උන් වහන්සේ විනිශ්චය කළ
සේක. තමන් වහන්සේගේ මෙහෙකරුවන් මැරීම
ගැන ඈට විපාක දුන් සේක.” 3 යසො 34:10තව
වරක් ඔව්හු, “අලේලූයා! ඇගේ දුම සදහට ම
නගින්නේ ය”යි කී හ. 4 තවද කුලදෙටුවෝ විසිහතර
දෙනා ද, ජීවමාන සත්ත්වයෝ සතර දෙනා ද
වැඳවැටී, “ආමෙන්, අලේලූයා” කියමින් සිංහාසනයේ
වැඩහුන් දෙවියන් වහන්සේට නමස්කාර කළහ.

### බැටළු පෝතකයාණන්ගේ මංගල උළෙල

5 ගීතා 115:13 තවද, “අපේ දෙවියන් වහන්සේගේ
සියලු සේවකයෙනි, උන් වහන්සේට බිය ඇති ලොකු
කුඩා සියල්ලෙනි, උන් වහන්සේට ප්‍රශංසා
කරන්නැ”යි කියන හඬක් සිංහාසනයෙන් නික්මිණි.
6 ගීතා 93:1; 97:1; 99:1; එසකි 1:24එවිට විශාල ජන
සමූහයකගේ ඝෝෂාව මෙන් ද, සමුද්‍ර ඝෝෂාවක්
මෙන් ද, බලවත් හෙන හඬක් මෙන් ද ශබ්දයක් මට
ඇසිණි. ඒ හඬ මෙසේ කී ය: “අලේලූයා! අපගේ
සර්ව පරාක්‍රම දෙවි ස්වාමීන් වහන්සේ රජකම්
කිරීමට පටන්ගෙන ඇත. 7 අපි අතිශයින් ප්‍රීති
සන්තෝෂවෙමු. උන් වහන්සේට ගෞරවය පිරිනමමු.
මන්ද, බැටළු පෝතකයාණන්ගේ සරණ මංගල්‍යය
පැමිණ ඇත. උන් වහන්සේගේ මනාලිය සැරසී
සිටින්නී ය. 8 බැබළෙන, පිවිතුරු, සිනිඳු වස්ත්‍රයෙන්
සැරසෙන්නට ඈට අවසර දී ඇත.” සිනිඳු
වස්ත්‍රවලින් සැදැහැවතුන්ගේ ධර්මිෂ්ඨ ක්‍රියා
හඟවනු ලැබේ.
9 මතෙ 22:2-3 එවිට දේව දූතයා මට කතා කොට:
“බැටළු පෝතකයාණන්ගේ සරණ මංගල්‍ය
භෝජනයට කැඳවනු ලැබුවෝ භාග්‍යවන්තයෝ ය
කියා ලියන්නැ”යි කී ය. “දෙවියන් වහන්සේගේ මේ
වචන සත්‍යය”යි තවදුරටත් ඔහු මට කී ය. 10 එවිට
නමස්කාර කරන පිණිස මම ඔහුගේ පාමුල
වැටුණෙමි. එහෙත් ඔහු: “මට නමස්කාර
නොකරන්න. මම, ඔබ ද ඔබේ සහෝදරයන් ද
සමඟ හවුල් සේවකයෙක් වෙමි. ජේසුස් වහන්සේ

දැරූ සාක්ෂිය අප හැම සතු ය. ඔබ දෙවියන්
වහන්සේට පමණක් නමස්කාර කළ යුතු ය"යි මට
කී ය. ඒ ජේසුස් වහන්සේ දැරූ සාක්ෂිය
දිවැසිවරයන්ගේ ජීව බලය වන බැවිනි.

## ක්‍රිස්තුන් වහන්සේගේ ජයග්‍රහණය

11 ගීතා 96:13; යසො 11:4; එසකි 1:1 එවිට
ස්වර්ගය ඇරී තිබෙනු දිටිමි. එහි සුදු අශ්වයෙක්
සිටියේ ය. 'විශ්වාසය' 'සත්‍යය' යන නම් දරන
තැනැන් වහන්සේ ඌ පිට වැඩහුන් සේක. උන්
වහන්සේ ධර්මිෂ්ඨකමින් විනිශ්චය කරන සේක;
යුද්ධ කරන සේක. 12 දානි 10:6උන් වහන්සේගේ
නේත්‍ර අග්නි ජාලා මෙනි; උන් වහන්සේගේ හිස
මත බොහෝ කිරුළු ඇත. උන් වහන්සේ හැර අන්
කිසිවකු නොදන්නා නාමයක් එහි ලියා ඇත.
13 ලෙයින් පෙඟුණු වස්ත්‍රයක් උන් වහන්සේ ඇඳ
සිටි සේක. "දෙවියන් වහන්සේගේ ධර්මයාණෝ"
යයි උන් වහන්සේට කියන ලදී. 14 ස්වර්ගීක යුද්ධ
සේනාවෝ සුදු, සිනිඳු, පිවිතුරු වස්ත්‍ර හැඳ, සුදු
අශ්වයන් පිට උන් වහන්සේ පසුපස්සේ ගියහ.
15 ගීතා 2:9; යසො 63:3; ජෝවෙ 3:13; එළිද
14:20ජාතීන්ට පහර දෙනු පිණිස උන් වහන්සේගේ
මුඛයෙන් තියුණු කඩුවක් නික්මේ. උන් වහන්සේ
යගදාවකින් ඔවුන් පාලනය කර, සර්ව පරාක්‍රම
දෙවියන් වහන්සේගේ කෝපයේ උදහස නමැති මිදි
යන්ත්‍රයේ මිදි මඬින සේක. 16 උන් වහන්සේගේ
වස්ත්‍රයෙහි ද කලවයෙහි ද "රජවරුන්ගේ රජ ය,
ස්වාමිවරුන්ගේ ස්වාමි ය" යන නාමය ලියා තිබේ.

## සතුරු සේනාවන්ගේ විනාශය

17 එසකි 39:17-20 තවද හිරු මඬලෙහි දේව
දූතයකු සිටිනු දිටිමි. ඔහු මැද අහසේ පියාසර
කරන සියලු පක්ෂීන්ට මහා හඬකින් මොරගසා:
18 "තපෙි රජුන්ගේ මස් ද සේනාධිපතීන්ගේ මස් ද
බලවත් මිනිසුන්ගේ මස් ද අශ්වයන්ගේත්
අශ්වාරෝහකයන්ගේත් මස් ද දාස නිර්දාස, ලොකු
කුඩා සියලු මිනිසුන්ගේ මස් ද කන පිණිස, දෙවියන්
වහන්සේගේ මහා මංගල්‍ය භෝජනයට පැමිණ
එක්රැස් වයෙව්" යයි කී ය.
19 අශ්වාරෝහක තැනැන් වහන්සේටත්, උන්
වහන්සේගේ යුද්ධ සේනාවටත් විරුද්ධ ව සටන්
කිරීමට මෘගයා ද මිහි පිට රජවරුන් ද ඔවුන්ගේ
යුද්ධ සේනා ද රැස් ව සිටිනු මම දිටිමි. 20 එළිද
13:1-18එකල මෘගයා ද ඌ ඉදිරියෙහි හාස්කම් කර,
උගේ සලකුණ ලැබූවන් සහ උගේ රූපයට නමස්කාර
කළවුන් රැවටූ බොරු දිවැසිවරයා ද අල්ලාගනු ලැබූ
හ. ඔව්හු දදෙනා ම ගන්දගමින් දැවෙන ගිනිවිලට
පණපිටින් හෙළෙනු ලැබූ හ. 21 සෙසු අය
අශ්වාරෝහක තැනැන් වහන්සේගේ මුඛයෙන්
නික්මුණු කඩුවෙන් මරනු ලැබූ හ. සියලු පක්ෂීහු
ඔවුන්ගේ මාංස ගිජු ලෙස ගිලදැමූ හ.

## දහස් වසකට සාතන් බැඳ තැබීම

20 තවද, පාතාලයේ යතුර ද මහත් දම්වැලක් ද
අතින් ගත් දේව දූතයකු ස්වර්ගයෙන් බැස
එනු දිටිමි. 2 උත් 3:1ඔහු යක්ෂයා ද සාතන් ද වන
පුරාතන සර්පයා හෙවත් ඒ මකරා අල්ලා අවුරුදු
දහසකට බැඳ තැබී ය. 3 ඒ අවුරුදු දහස කෙළෙවර
වන තුරු ඔහු විසින් ජාතීන් තවත් නොරවටන
පිණිස, ඔහු පාතාලයට හෙළා, එය වසා, මතුපිට
මුද්‍රා තැබී ය. මින්පසු මඳ කලකට ඔහු මුදා හැරිය
යුතු ය.
4 දානි 7:9,22 එවිට සිංහාසන දිටිමි. ඒවායේ හිඳ
ගත්තවුන්ට විනිශ්චය කිරීමේ වරම දෙන ලද්දේ ය.
තවද, ජේසුස් වහන්සේගේ සාක්ෂිය නිසාත්,
දෙවියන් වහන්සේගේ වචනය නිසාත් හිස් ගසාදමනු
ලැබූවන්ගේ ද, මෘගයාට වත් උගේ රූපයට වත්
නමස්කාර නොකළ, උගේ සලකුණ සිය නළල්වල හා
අත්වල නොදැරූ තැනැත්තන්ගේ ද ආත්මයන් දිටිමි.
ඔව්හු යළි ජීවනය ලබා ක්‍රිස්තුන් වහන්සේ සමඟ
අවුරුදු දහසක් රජකම් කළහ. 5 මළා වූ සෙසු අය
අවුරුදු දහස කෙළෙවර වන තුරු ජීවනය නොලැබූ හ.
මේ පළමු වන පුනරුජ්ජීවනය වේ. 6 පළමු වන
පුනරුජ්ජීවනයට පංගුකාරකම ඇති තැනැත්තා
භාග්‍යවන්තයෙකි, සැදැහැවතෙකි. දෙ වන මරණයට
ඔවුන් කෙරෙහි බලයක් නැත. ඔව්හු දෙවියන්
වහන්සේගේත්, ක්‍රිස්තුන් වහන්සේගේත් පූජකයෝ
ව, උන් වහන්සේ හා සමඟ අවුරුදු දහසක් රජකම්
කරන්නෝ ය.

## සාතන්ගේ පරාජය

7 අවුරුදු දහස කෙළෙවර වූ පසු, සාතන් තමාගේ
සිරගෙයින් මුදනු ලැබ, 8 එසකි 7:2;
38:2,9,15පොළොවේ සතර දිශාවේ සිටින ගොග්
සහ මාගොග් යන ජාතීන් මුළා කරනු පිණිස ද ඔවුන්
යුද්ධයට රැස් කරනු පිණිස ද නික්ම එන්නේ ය. ඒ
ජාතීන්ගේ ගණන මුහුදේ වැලි මෙන් ය. 9 ඔව්හු
පොළොවේ සෑම දිශාවල ම පැතිර ගොස්
සැදැහැවතුන්ගේ කඳවුර ද ප්‍රිය මනාප නුවර ද
වටලාගත්හ. එවිට ස්වර්ගයෙන් ගිනි බැස අවුත්
ඔවුන් වනසාදැමී ය. 10 එවිට ඔවුන් මුළාවට පත්
කළ යක්ෂයා, මෘගයා හා බොරු දිවැසිවරයා සිටින,
ගින්නෙන් හා ගන්දගමින් යුත් විලට හෙළෙනු ලැබී
ය. ඔව්හු සදහට ම, දිවා රෑ දෙකෙහි දරුණු ලෙස
වධයට පත් කරනු ලබන්නෝ ය.

## අවසාන විනිශ්චය

11 දානි 7:9-10 තවද, විශාල ධවල සිංහාසනයක් ද,
එහි වැඩහුන් තැනැන් වහන්සේ ද දිටිමි. උන්
වහන්සේගේ අභිමුඛයෙන් අහසත් පොළොවත් පලා
ගියේ ය. ඒවායේ ලකුණක් වත් ඉතිරි නො වී ය.
12 මළා වූ, ලොකු කුඩා සියල්ලන් සිංහාසනය
ඉදිරියෙහි සිටිනු දිටිමි. පොත් ද දිගහරිනු ලැබී ය.
ජීවන පොත වන තවත් පොතක් ද දිග හරිනු ලැබී

ය. පොතේ ලියා තිබෙන හැටියට ඒ මියගිය අය
තමන්ගේ ක්‍රියා අනුව විනිශ්චය කරනු ලැබුවෝ ය.
13 මහමුහුද එහි වූ මළවුන් භාර දුන්නේ ය.
මරණයත්, පාතාලයත්, එහි උන් මළවුන් භාර දුන්නේ
ය. ඔව්හු එකිනකො තම තමාගේ ක්‍රියා ලෙස
විනිශ්චය කරනු ලැබූ හ. 14 මරණයත්, පාතාලයත්
ගිනි විලට හෙළෙන ලද්දේ ය. මේ ගිනි විල දෙ වන
මරණය වේ. 15 යමකුගේ නම ජීවන පොතෙහි
ලියැවී නැති බව සම්බ වී ද, ඔහු ගිනි විලට හෙළෙනු
ලැබී ය.

## අලුත් අහස සහ අලුත් පොළොව

21 යෙසා 65:17; 66:22; 2 පේද්‍රු 3:13 ඉන්පසු
මම අලුත් අහසක් ද අලුත් පොළොවක් ද
දිටිමි. පළමු අහසත් පළමු පොළොවත් පහ ව ගියේ
ය. මුහුද ද තවත් නො වී ය. 2 යෙසා 52:1; 61:10;
එළිද 3:12තවද, තමාගේ ස්වාමි පුරුෂයාට සරසන
ලද මනාලියක මෙන් සූදානම් කරනු ලැබූ ශුද්ධ
නගරය වන අලුත් ජෙරුසලම, දෙවියන් වහන්සේ
වෙතින් ස්වර්ගයෙන් බැස එනු දිටිමි. 3 ලෙවී
26:11,12; එසකි 37:27සිංහාසනයෙන් මහා හඬක්
මෙසේ කියනු ඇසීමි: “මෙන්න, දෙවියන්
වහන්සේගේ වාසභවනය මනුෂ්‍යයන් සමඟ ය. උන්
වහන්සේ ඔවුන් සමඟ වාසය කරන සේක. ඔව්හු
උන් වහන්සේගේ සෙනෙඟ වන්නෝ ය. දෙවියන්
වහන්සේ ම ඔවුන් සමඟ වැඩවසමින්, ඔවුන්ගේ
දෙවියන් වහන්සේ වන සේක. 4 යෙසා 25:8; 35:10;
65:19උන් වහන්සේ ඔවුන්ගේ දෙනෙතින් සියලු කඳුළු
පිසදමන සේක. මරණය තවත් නැත. වැලපීම ද
හැඬීම ද, වේදනාව ද තවත් නැත. ඒ පළමු පිළිවෙළ
පහ ව ගිය බැවිනි.”
5 එවිට සිංහාසනයෙහි වැඩහුන් තැනැන් වහන්සේ
කතා කොට, “බලව, මම සියල්ල අලුත් කරමි!”යි
වදාළ සේක. උන් වහන්සේ තවදුරටත් කතා කොට,
“ලියන්න, මන්ද, මේ වචන විශ්වාස කටයුතු ය,
සැබෑ ම ය”යි වදාළ සේක. 6 යෙසා 55:1උන්
වහන්සේ මට කතා කොට, “ඒවා ඉෂ්ට වී ඇත. මම
අල්පා සහ ඔමෙගො ය. ආරම්භය සහ අවසානය ය.
පිපාසය ඇත්තාට මම ජීවන දිය උල්පතෙන්
නොමිලයේ බොන්නට දෙන්නෙමි. 7 2 සාමු 7:14;
ගීතා 89:26-27ජයග්‍රාහකයාගේ උරුමය එය යි. මම
ඔහුගේ දෙවියන් වහන්සේ වන්නෙමි. ඔහු මාගේ
පුත්‍රයා වන්නේ ය. 8 එහෙත් බියසුල්ලෝ ද
අවිශ්වාසිකයෝ ද දුරාචාරීහු ද මිනී මරන්නෝ ද
කාමමිථ්‍යාචාරීහු ද අනවින කරන්නෝ ද රූප
වඳින්නෝ ද සියලු ආකාර මුසාවාදීහු ද ගින්නෙන් හා
ගෙන්දගමින් දැවෙන විලෙහි තමන්ගේ විපාකය
ලබන්නෝ ය. එය දෙ වන මරණය”යි මට වදාළ
සේක.

## ස්වර්ගීය ජෙරුසලම

9 අන්තිම වසංගත සතෙන් පිරුණු පාත්‍ර සත දැරූ
දේව දූතයන් සත් දෙනාගෙන් එක් තැනැත්තෙක් මා
වෙත පැමිණ, “එන්න, බැටළු පෝතකයාණන්ගේ
බිරිඳවන මනාලිය ඔබට පෙන්වන්නෙමි”යි කී ය.
10 එසකි 40:2ආත්මයාණන්ගේ ආනුභාවයෙන් ඔහු
මහ උස් කන්දකට මා ගෙන ගොස්, ශුද්ධ නගරය වූ
ජෙරුසලම දේව තේජසින් විරාජමාන ව, දෙවියන්
වහන්සේ වෙතින් ස්වර්ගයෙන් බැස එනු මට පෙන්වී
ය. 11 ඒ නගරයේ දීප්තිය ඉතා අනර්ඝ මාණික්‍යයක්
මෙන් එනම්, පළිඟු මෙන් විනිවිද පෙනෙන
සූර්යකාන්ත ගලක් මෙන් විය. 12 එසකි
48:30-35වාසල් දොරටු දොළොසකින් යුත්, මහ උස්
පවුරක් එය වටේ තිබිණි. ඒ දොරටු ළඟ දේව
දූතයෝ දොළොස් දෙනෙක් වූ හ. ඒවා පිට
ඉශ්රායලේ පුත්‍රයන්ගේ ගෝත්‍ර දොළොසේ නාම
ලියා තිබිණි. 13 නැගෙනහිරින් දොරටු තුනක් ද
උතුරෙන් දොරටු තුනක් ද දකුණෙන් දොරටු තුනක් ද
බස්නාහිරෙන් දොරටු තුනක් ද විය. 14 නුවර
පවුරෙහි අත්තිවාරම් දොළොසක් විය. ඒවා පිට
බැටළු පෝතකයාණන්ගේ ප්‍රේරිතයන් දොළොස්
දෙනාගේ නාම දොළොස ලියා තිබිණි. 15 මා සමඟ
කතා කළ දේව දූතයාට නගරය ද එහි වාසල්
දොරටු ද එහි පවුර ද මනින පිණිස රනින් කළ
මිණුම් දණ්ඩක් තිබිණි. 16 එසකි 40:3මේ නගරය
සම චතුරශ්‍රයකි. එහි දිගත්, පළලත් එක සමාන ය.
ඔහු දණ්ඩෙන් නුවර මැන්නේ ය. එය කිලෝමීටර් දෙ
දහස් හාර සියයක් ය. එහි දිග, පළල හා උස එක
සමාන ය. 17 ඔහු එහි පවුර ද මැන්නේ ය. එය
මීටර් හැටක් විය. දේව දූතයා මැන්නේ ඔහු භාවිත
කළ සම්මත මිම්මෙනි. 18 යෙසා 54:11-12එහි පවුර
සූර්යකාන්තවලින් ගොඩනඟා තිබුණේ ය. නගරය ද
වීදුරු මෙන් පැහැදිලි ව පෙනෙන, පවිත්‍ර රනින් විය.
19 නුවර පවුරේ අත්තිවාරම් වවෙර්ණ මැණික්
ගලින් සරසා තිබිණි. පළමු වන අත්තිවාරම
සූර්යකාන්ත ය. දෙවෙන්න ඉන්ද්‍ර නීල මාණික්‍ය ය.
තුන්වැන්න අගස්ති ය. සතරවැන්න මරකත ය.
20 පස්වැන්න නබ මාණික්‍ය ය. සවැන්න ලෝහිතංක
ය. සත්වැන්න රන් කාන්ති ය. අටවැන්න වෛදූර්ය ය.
නවවැන්න පුෂ්පරාග ය. දසවැන්න ගෝමේද ය.
එකොළොස්වැන්න පද්ම රාග ය. දොළොස්වැන්න
අඹතේස්ත ය. 21 දොරටු දොළොස මුතු
දොළොසකි. එක එක දොරටුව එක එක මුතු
ඇටයකින් සාදා තිබිණි. නුවර වීදිය විනිවිද පෙනෙන
වීදුරු මෙන් පිරිසිදු රන් ය.
22 මම එහි දේව මාලිගාවක් නොදිටිමි. මන්ද,
සර්ව පරාක්‍රම දෙවි ස්වාමීන් වහන්සේත්, බැටළු
පෝතකයාණෝත් ඒ දේව මාලිගාව වූ සේක.
23 යෙසා 60:19-20දේව තේජසින් නුවර ආලෝක වූ
බැවින් ද, බැටළු පෝතකයාණන් එහි පහන වන
බැවින් ද එහි සූර්යයාගේ හෝ චන්ද්‍රයාගේ හෝ
බැබළීමක් අවශ්‍ය නැත. 24 යෙසා 60:3ජාතීහු එහි

ආලෝකයෙහි ඇවිදිති. පොළොවේ රජවරු ස්වකීය
තේජස ඊට ගෙනෙන්නෝ ය. 25 යෙසා 60:11එහි
දොරටු දවාලේ වීවෘතව ඇත. ඒවා කිසිසේත් වසනු
නොලබන්නේ ය; මන්ද, එහි රාත්‍රියක් නොවන්නේ
ය. 26 ඔව්හු, ජාතීන්ගේ ගෞරවය හා ශ්‍රී විභූතිය
ඊට ගෙනෙන්නෝ ය. 27 යෙසා 52:1; එසකි
44:9අපවිත්‍ර දයෙක්වත්, පිළිකුල් දේ කරන, බොරු
කියන කිසිවෙක් වත් එහි ඇතුළු නොවන්නෝ ය. ඒ
නගරයට ඇතුළු වන්නේ බැටළු පෝතකයාණන්ගේ
ජීවන පොතෙහි නම් ලියා ඇති අය පමණකි.

### ජීවන වෘක්ෂය

22 එසකි 47:1; සකෙරි 14:8 දේව දූතයා,
දෙවියන් වහන්සේගේ ද බැටළු
පෝතකයාණන්ගේ ද සිංහාසනයෙන් ගලා එන,
පළිඟුමෙන් විනිවිද දිලෙන, ජීවනදායක වතුර ඇති
ගංගාවක් මට පෙන්වී ය. 2 උත් 2:9; එසකි 47:12එහි
වීදිය මැද, ගඟ දෙපස, මසකට වරක් බැගින්,
දොළොස් මුරයක් පල දරන ජීවන වෘක්ෂය පිහිටා
තිබිණි. ඒ වෘක්ෂයේ කොළ, ජාතීන්ගේ සුවය සඳහා
විය. 3 සකෙරි 14:11; උත් 3:17කිසි සාපයක් තවත්
එහි නොවන්නේ ය. දෙවියන් වහන්සේගේ ද බැටළු
පෝතකයාණන්ගේ ද සිංහාසනය එහි වන්නේ ය.
උන් වහන්සේගේ සේවකයෝ උන් වහන්සේට
නමස්කාර කරන්නෝ ය. 4 ඔව්හු උන් වහන්සේගේ
මුහුණ දකින්නෝ ය. උන් වහන්සේගේ නාමය ද
ඔවුන්ගේ නළල්වල ඇත. 5 යෙසා 60:19; දානි
7:18එහි රාත්‍රියක් තවත් නොවන්නේ ය. පහන්
ආලෝකය වත්, සූර්යාලෝකය වත් ඔවුන්ට අවශ්‍ය
නැත. මන්ද, දෙවි ස්වාමීන් වහන්සේ ඔවුන්ට
ආලෝකය දෙන සේක. ඔව්හු සදහට ම රජකම්
කරන්නෝ ය.

### ක්‍රිස්තුන් වහන්සේගේ පුනරාගමනය

6 එවිට දේව දූතයා මට කතා කොට, "මේ වචන
විශ්වාස කටයුතු ය, සැබෑ ය. මඳ කලකින්
සිදුවන්නට යන දේ තමන්ගේ සේවකයන්ට
පෙන්වනු පිණිස දිවැසිවරුන්ට ආනුභාවය දුන් දෙවි
ස්වාමීන් වහන්සේ ස්වකීය දූතයා එවූ සේක.
7 මෙන්න, මම ඉක්මනින් එමි"යි කී ය. "මේ
පොතේ සඳහන් දිවැස් වැකි රක්ෂා කරන්නා
භාග්‍යවන්තයෙකි"යි උන් වහන්සේ වදාරන සේක.
8 මේ සියල්ල ඇසූ දුටු තැනැත්තා ජොහන් වන
මම ය. එවිට මා ඇසූ දුටු දේ මට පෙන්වූ දේව
දූතයාට නමස්කාර කරන පිණිස මම ඔහුගේ පාමුල
වැටුණෙමි. 9 ඔහු මට කතා කොට, "මට නමස්කාර
නොකරන්න. මම ඔබේ ද, ඔබේ සහෝදර
දිවැසිවරයන්ගේ ද මේ පොතේ වචන
පිළිපදින්නන්ගේ ද හවුල් සේවකයෙක් වෙමි.
දෙවියන් වහන්සේට පමණක් නමස්කාර කරන්නැ"යි
කී ය.
10 තවද ඔහු මට කතා කොට, "මේ පොතේ ඇති
දිවැස් වැකි රහසේ තබා නොගන්න. මන්ද, නියමිත
කාලය ආසන්න ය. 11 දානි 12:10නපුරුකම් කරන්නා,
නපුරුකම් කරමින් ද, අපිරිසිදුකම් කරන්නා,
අපිරිසිදුකම් කරමින් ද සිටී වා! දමිටු තැනැත්තා දමිටු
ක්‍රියා කරමින් ද, ශුද්ධ තැනැත්තා ශුද්ධවන්ත
කමෙහි පවතිමින් ද සිටී වා!"යි කී ය.
12 ගීතා 28:4; යෙසා 40:10; 62:11; ජරෙ 17:10
"මෙන්න, මම ඉක්මනින් එමි. එකිනෙකොට තම
තමන්ගේ ක්‍රියා අනුව විපාක දීම මා සතු ව ඇත.
13 යෙසා 44:6; 48:12; එළිද 1:8,17; 2:8මම අල්ෆා
සහ ඔමෙගො ය. මම පළමුවැන්නා සහ අන්තිමයා ය.
ආරම්භය සහ අවසානය ය"යි උන් වහන්සේ වදාරන
සේක.
14 උත් 2:9; 3:22 ජීවන වෘක්ෂයට ළඟා වීමට
අයිතිය ලැබෙන පිණිසත්, වාසල් දොරටුවලින්
නගරයට ඇතුළු වන්නට හැකි වන පිණිසත්,
තමන්ගේ සළුසෝදාගන්නා තැනැත්තෝ
භාග්‍යවන්තයෝ ය. 15 එහෙත් නුවරින් පිටත
සිටින්නෝ නම් බල්ලෝ ද අනාචාර කරන්නෝ ද
කාමමිථ්‍යාචාරීහු ද මිනී මරන්නෝ ද රූප වඳින්නෝ
ද මුසාවට ප්‍රිය කොට එය භාවිත කරන්නෝ ද යන
මොවුහු ය.
16 යෙසා 11:1,10 "ජේසුස් වහන්සේ වන මම
සභාවන්ගේ යහපත උදෙසා මේ දේවල් ප්‍රකාශ
කරන පිණිස මාගේ දූතයා එවීමි. මම වනාහි
දාවිත්ගේ වංශයේ මුල ද එයින් පැවත එන්නා ද
වෙමි. මම සුදිළුනෙ පහන් තරුව වෙමි."
17 යෙසා 55:1 ආත්මයාණන් වහන්සේ ද මනාලිය
ද "එන්නැ"යි කියති. අසන්නෝ ද, "එන්නැ"යි කියත්
වා! පිපාසය ඇත්තෝ ද එත් වා! කැමැති කෙනෙක්
ජීවන පැන් නොමිලයේ ගනිත් වා!

### අවසානය

18 ද්වි.නී. 4:2; 12:32 මේ පොතේ සඳහන් දිවැස්
වැකි අසන සියල්ලන්ට මම මෙය සහතික ලෙස
කියමි. යමෙක් ඒ වචනවලට යමක් එකතු කරන්නේ
නම්, දෙවියන් වහන්සේ මේ පොතේ ලියන ලද
වසංගත ඔහුට එකතු කරන සේක. 19 යමෙක් මේ
පොතේ දිවැස් වැකිවලින් යමක් අහක් කරන්නේ
නම්, මේ පොතේ සඳහන් ජීවන වෘක්ෂයේ ද ශුද්ධ
නුවරේ ද පංගුකාරකමින් දෙවියන් වහන්සේ ඔහු
පහ කරන සේක.
20 මේ කාරණා ගැන සාක්ෂි දරන තැනැන්
වහන්සේ, "සැබැවින් ම මම ඉක්මනින් එමි"යි
වදාරන සේක.
20 ආමෙන්. ජේසුස් ස්වාමීන් වහන්ස වැඩිය මැනව!
21 ජේසුස් ස්වාමීන් වහන්සේගේ කරුණාව
සියල්ලන් සමඟ වේ වා!